FISHERIES AND AQUATIC RESOURCES (AMENDMENT) BILL

"1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි"

පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මහතා විසිනි.

2015 ජනවාරි මස 29වන බ්‍රහස්පතින්දා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතු යයි ද නියෝග කරන ලදී.

பிரதம அமைச்சரும் கொள்கை உருவாக்கம், பொருளாதார அலுவல்கள், சிறுவர், இளைஞர் மற்றும் கலாசார அலுவல்கள் அமைச்சருமான மாண்புமிகு ரணில் விக்கிரமசிங்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2015 சனவரி 29, வியாழக்கிழமை இரண்டாம்முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப் பட்டது.

Presented by the Hon. Ranil Wickremasinghe, Prime Minister, Minister of Policy Planning, Economic Affairs, Child, Youth and Cultural Affairs;

to be read a Second time upon Thursday, 29th January, 2015 and to be printed.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

I

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Plantation Industries and Leader of the House of Parliament)
I move,

"That notwithstanding the provisions of Standing Order 7(1) and the motion agreed to by Parliament on 09.07.2010, the Parliament shall sit on Thursday, January 29th, 2015. "

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I move,

"That this Parliament at its rising this day do adjourn until 1.00 p.m. on Thursday, January 29th, 2015."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

සන්ධ්‍යා සිරිවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
சந்தியா சிரிவர்தன மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
SANDYA SIRIWARDHANA FOUNDATION (INCORPORATION) BILL

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)

ගරු කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා.

"සන්ධ්‍යා සිරිවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සමාජසේවා සහ සුඛසාධන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.

சட்டமூலம் நிலைக்கட்டளை இல. 47(5) இன்படி சமூக சேவைகள், நலன்புரி அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.

The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Social Services and Welfare for report.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අග්‍රාමාත්‍යතුමා විසින් කරනු ලබන ප්‍රකාශය.

ගරු අග්‍රාමාත්‍යතුමාගේ විශේෂ ප්‍රකාශය
மாண்புமிகு பிரதம அமைச்சரினது விசேட கூற்று
SPECIAL STATEMENT BY HON. PRIME MINISTER

[අ.භා. 1.06]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் கொள்கை உருவாக்கம், பொருளாதார அலுவல்கள், சிறுவர், இளைஞர் மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரும்)

(The Hon. Ranil Wickremasinghe - Prime Minister, Minister of Policy Planning, Economic Affairs, Child, Youth and Cultural Affairs)

ගරු කථානායකතුමනි, අද ශ්‍රී ලංකා ඉතිහාසයේ ඉතාම වැදගත් දිනයක්. මේ රටේ නව දේශපාලන සංස්කෘතියක් ඇති කරන්න, ශීලාචාර ආණ්ඩුවක් බිහි කරන්න, දින සියයකින් අලුත් රටක් ගොඩ නැඟීමේ කටයුතු ආරම්භ කරන්න, පසු ගිය ජනාධිපතිවරණයේදී මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ජනතාව ජන වරමක් දුන්නා. ඒ සඳහා ඇප කැප වී කටයුතු කළ සියලු පාර්ශ්වයන්ට මම මේ අවස්ථාවේ මගේ ස්තුතිය පුද කරනවා. මේ ජන වරමත් සමඟ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සහයෝගය පමණක් නොව නායකත්වයත් එතුමන්ට හිමි වුණා. මේ පාර්ලිමේන්තුව ලංකා ඉතිහාසයේ සුවිශේෂී පාර්ලිමේන්තුවක් වන්නේ ඒ නිසායි.

රටේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක පමණක් නොව, අනෙකුත් දේශපාලන පක්ෂ ගණනාවක් ද එකම අරමුණකින් එක් පොදු ගමනක් යන්නට සැරසෙන්නේ මේ පාර්ලිමේන්තුවේදීයි. මෙය මෙතෙක් අප බොහෝ දෙනෙක් මුහුණ නොදුන් අලුත්ම පසු බිමක්. එම නිසා මේ ගමන සාර්ථක කර ගැනීමට අප හැම දෙනාගේම එකමුතුවත්, සහයෝගයත් අවශ්‍ය වෙනවා. මෙය තනි තනි පුද්ගලයන්ගේ තනි ගමනක් නොවෙයි; රට වෙනුවෙන් යන සාමූහික ගමනක්. ඇත්ත වශයෙන්ම මෙය මුළු කලාපයටම අත්හදා බැලීමක්. විශේෂයෙන්ම අපි එකට එකතු වෙලා මේ රාමුව ක්‍රියාත්මක කරන ගමන් විරුද්ධ පාර්ශ්වයක් හැටියට කටයුතු කරන්නේ කොහොම ද, ආණ්ඩු පාර්ශ්වයක් හැටියට එකට කටයුතු කරන්නේ කොහොම ද කියන එක ගැනත් අවධානය යොමු කළ යුතුයි.

අද අපේ රට පත් වී ඇත්තේ ඉතා දුර්වල තත්ත්වයකටයි. ආර්ථික හා දේශපාලන වශයෙන් දැවැන්ත අර්බුද රාශියක අප සිර වී සිටිනවා. දේශීය හා ජාත්‍යන්තර අභියෝග ගණනාවක් අප ඉදිරියේ තිබෙනවා. අපි ඒවා ජය ගත යුතුයි. දින සියයේ වැඩසටහනට අනුව මේ පාර්ලිමේන්තුවේදී අප සම්මත කර ගත යුතු අණපනත් ගණනාවක් තිබෙනවා. පළමුවෙන්ම ව්‍යවස්ථා සංශෝධනය ගෙන ආ යුතුයි. එය, විධායක ජනාධිපති ක්‍රමය වෙනුවට කැබිනට් මණ්ඩලය හරහා පාර්ලිමේන්තුව හා සම්බන්ධ විධායකයක් සහිත ආණ්ඩු ක්‍රමයක්. ඒ වාගේම දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කරමින්, ස්වාධීන කොමිෂන් සභා ස්ථාපිත කරන දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන ආ යුතුයි. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයන් සහිතව ගෙන එන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් මේ රට ඒකීය රාජ්‍යයක් බවට පත් වන බව මා යළිත් ප්‍රකාශ කරන්නට කැමතියි. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඒ අනුව තමයි ක්‍රියාත්මක වෙන්නේ. අපි කෙසේ හෝ මේ රටේ මේ මූලික ජාතික ප්‍රශ්නයට විසඳුමක් සොයන්නට ඕනෑ.

සිංහල වේවා, දෙමළ වේවා, මුස්ලිම් වේවා, ශ්‍රී ලාංකිකයන් හැටියට අපි අපේ ප්‍රශ්න විසඳා ගන්නට ඕනෑ. මගේ මිත්‍ර විමල් වීරවංශ මැතිතුමා අද කර තිබෙන ප්‍රකාශය ගැන මම පුදුම වුණේ ඒකයි. මම එතුමාට එක දෙයක් කියන්න ඕනෑ. ඔබතුමා මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාව නැති කළා. ඉතුරු ටිකත් නැති කරන්න එපා. මේ තිබෙන ජාතිවාදය අමතක කරලා දමලා අපි බලමු, කොහොමද මේ ප්‍රශ්නය විසඳන්නේ කියලා. අපේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකම එකඟ වෙලා තිබෙන රාමුවක් තිබෙනවා. ඒ රාමුව තුළ ක්‍රියාත්මක වෙන්නේ කොහොමද කියලා බලමු.

ඒ වාගේම ප්‍රශ්න කිහිපයක් තිබෙනවා, සාකච්ඡා කරන්නට. අපේ ද්‍රවිඩ ජාතික සන්ධානයත් ලැහැස්තියි, ඒවා සාකච්ඡා කරන්න. මේ රටේ තිබෙන ප්‍රධාන ප්‍රශ්නයට මුහුණ දීලා, අපි ඔක්කෝටම මේක කරන්න පුළුවන් කියලා අපි රටට පෙන්වන්න ඕනෑ. එතකොට ඒ ගෞරවය ලැබෙන්නේ කැබිනට් මණ්ඩලයට පමණක් නොවෙයි; ද්‍රවිඩ ජාතික සන්ධානයට පමණක් නොවෙයි; ජනතා විමුක්ති පෙරමුණට පමණක් නොවෙයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුළු අපි හැම එක්කෙනාටම ඒ ගෞරවය ලැබෙනවා; ඒ ගෞරවය බුක්ති විඳින්න පුළුවන්. මේ ප්‍රශ්නය අපි මේ පාර්ලිමේන්තුවෙන් පිට යවන්නේ නැතුව මූලික වශයෙන් සාකච්ඡා කරන්න ඕනෑ කියලා මම කියන්න කැමැතියි.

ජාතික ඖෂධ ප්‍රතිපත්ති පනත් කෙටුම්පත සහ ජාතික විගණන පනත් කෙටුම්පත ගෙන ආ යුතුව තිබෙනවා. මේවා දැනට සකස් කර ගෙන යනවා. ඒ වාගේම තොරතුරු දැන ගැනීමේ පනත් කෙටුම්පත ගෙන ඒමටත් අදහස් කරනවා. අපි බලාපොරොත්තු වුණේ, ගරු කරු ජයසූරිය මැතිතුමා ඉදිරිපත් කරපු පනත් කෙටුම්පත නැවත ඉදිරිපත් කරන්නයි. ඒත් ඊයේ මාධ්‍ය අංශවලින් ඇවිල්ලා තවත් සංශෝධන කිහිපයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒවාත් ඇතුළත් කර ගෙන, අපි සියලු දෙනාටම එකඟ වෙන්න පුළුවන් විධියට මෙය ක්‍රියාත්මක කරන්න අපි බලමු. විරුද්ධ පක්ෂයට ගියාම තමයි මෙවැනි පනතක වටිනාකම තේරෙන්නේ. විරුද්ධ පක්ෂයේ ඉඳලා ආණ්ඩු පක්ෂයට ආවා වුණත් අපි මේ වටිනාකම දැන්මම තේරුම් ගෙන මේ පනත් කෙටුම්පත සම්මත කර ගන්න තීරණය කළා. මම එක දෙයක් කියන්න කැමැතියි. විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා සමඟත්, පක්ෂ නායකයින් එක්කත් සාකච්ඡා කරලා අපි එකඟත්වයකට එන්නම්, කොහොමද මේ පනත් කෙටුම්පත් සම්මත කරන්නේ කියලා. මෙවැනි අණපනත් ගණනාවක් අපට සම්මත කරන්නට තිබෙනවා.

ධීවර සහ ජලජ සම්පත් පනතට සංශෝධන කිහිපයකුත් සිදු කළ යුතුව තිබෙනවා. විශේෂයෙන් මම ඉල්ලන්නේ මෙයයි. අපි මෙය හදිසියේ සම්මත කර ගනිමු. මේ වනකොට අපේ ධීවර නිෂ්පාදන පිළිබඳව යුරෝපා සංගමයෙන් තහනමක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ නිසා අද දින ඉදිරිපත් කළ මේ පනත් කෙටුම්පත ඉක්මනින් සම්මත කර ගත්තොත් අපට එය විශාල ලෙස උපයෝගී කර ගන්න පුළුවන් වෙනවා, ඒ තහනම ඉවත් කර ගන්න. අපේ විදේශ ඇමති ගරු මංගල සමරවීර මැතිතුමා බ්‍රසල්ස් නුවරට ගිහින් මේ ගැන සාකච්ඡා කරන්න ලෑස්තියෙන් ඉන්නවා.

අපි මේ අණපනත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළායින් පසුව ඔබ සැමගේම බුද්ධියේ දායකත්වයෙන් ඒවා තව තවත් ශක්තිමත් කරන ලෙසට මම ඔබ සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටිනවා. ඔබතුමන්ලාගේ ධනාත්මක සංශෝධන අපට ඉතා වැදගත් වෙනවා. ඒ සමඟම මේ පාර්ලිමේන්තුවේ අධීක්ෂණ කාරක සභා පිහිටුවීමටත් අප ක්‍රියා කරනවා. දැනටමත් පාර්ලිමේන්තු න්‍යාය පුස්තකයේ යෝජනා දෙකක් තිබෙනවා. ඒ ගැන අපි සාකච්ඡා කරලා, සංශෝධනය කරලා අපි ඒ ගැන එකඟත්වයකට එන්නට වුවමනායි. ඒ වාගේම පාර්ලිමේන්තුවේ මහලේකම්තුමා විසින් පාර්ලිමේන්තුව ශක්තිමත් කිරීමේ යෝජනා කිහිපයක් ඉදිරිපත්

කර තිබෙනවා. අප ඒ ගැනත් සාකච්ඡා කළ යුතුව තිබෙනවා. පක්ෂ නායකතුමන්ලා, සභානායකතුමා ඇතුළු අපි ඔක්කොම එකතු වෙලා ඊළඟ සතිය-දෙක ඇතුළත අප ඒ ගැන සාකච්ඡා කරන්නට බලාපොරොත්තු වෙනවා.

පාර්ලිමේන්තු රැස්වීම් සජීවී ලෙස විකාශනය කිරීමටත් අපි අදහස් කරනවා. අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙනුවෙන් ආචාර ධර්ම පද්ධතියක් සකස් කර ඉදිරිපත් කරන්නත් බලාපොරොත්තු වෙනවා. ඒ ගැන හැම කෙනෙක්ම එකඟ විය යුතුව තිබෙනවා. ඔබතුමන්ලා සියලු දෙනා මීට එකඟ වුණොත්, අපට මේවා ඉක්මනින්ම කරන්න පුළුවන් වෙනවා.

ගරු කථානායකතුමාත්, ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා එදා සභානායකතුමා හැටියටත්, විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා හැටියට එදා මට කථා කරලා, ජේ.ආර්. ජයවර්ධන කේන්ද්‍රයට පාර්ලිමේන්තු පර්යේෂණ අංශයේ වැඩ කටයුතු බාර දෙන්නට සාකච්ඡා කළා. ඒ තුළින් අපේ මන්ත්‍රීවරුන්ට පුහුණුව ලබා දෙන්න පුළුවන්; පළාත් සභා මන්ත්‍රීවරුන්ට පුහුණුව ලබා දෙන්න පුළුවන් ආයතනයක් බවට මෙය පත් කර ගන්නට පුළුවන්. පෙබරවාරි මාසයේ මේ සියල්ලම සම්මත කර ගන්න අපි බලමු.

ඊළඟට, අපේ ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලය නියෝජනය නොකරන මන්ත්‍රීවරුන් හැම පක්ෂයක්ම නියෝජනය වන පරිදි ඒ පත් කරන කොමිටිවල සභාපතිවරුන් ලෙස පත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ජනවාරි 29වැනිදා පාර්ලිමේන්තුවට අතුරු අය වැය යෝජනා ඉදිරිපත් කරනවා. ඒ මඟින් ජනතා සහන රැසක් ලබා දීම අපේ අරමුණයි. පක්ෂ නායකයින් එකඟ වනවා නම් එය ඉදිරිපත් කිරීමෙන් පසුව ඒ යෝජනා ක්‍රියාත්මක කරන්නේ කොහොමද කියන එක ගැන අපට විවාදයක් පවත්වන්න පුළුවන්. මගේ නම් කැමැත්ත තිබෙන්නේ වහාම ඒ විවාදය ආරම්භ කිරීමටයි.

ඊට අමතරව දූෂණය මැඩ පවත්වන්නට අපි විශේෂ පියවර කිහිපයක් ගන්නවා. ඊළඟ සති දෙක තුළදී ඒ ගැන මේ ගරු සභාවට දැනුම් දෙන්න බලාපොරොත්තු වෙනවා. මේ සියලු කටයුතු සඳහා ඔබතුමන්ලාගේ අදහස්, උදහස්, යෝජනා සියල්ල අප ඉතා වැදගත් කොට සලකනවා. අපේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය ආරක්ෂා කිරීමට හා ශක්තිමත් කිරීමට ඔබේ සක්‍රිය දායකත්වය ඉතා වැදගත් වන බව මම අමුතුවෙන් පෙන්වා දිය යුතු නැහැ.

අපට සර්වජන ඡන්ද බලය ලැබුණේ යටත් විජිත පාලන සමයේදීයි. ඒ කාලයේදී රාජ්‍ය මන්ත්‍රණ සභාවට විශාල බලතල තිබුණා. ඒ අනුව අපේ පාර්ලිමේන්තුවටත් විශාල බලතල හිමි වී තිබුණා. එදා ඒ සභාවට -කවුන්සිලයට- යනවා කියන්නේ ඉතා විශිෂ්ට ගෞරවයක්. අද පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් කිව්වාම අපට කවුරුවත් සලකන්නේ නැහැ. අද ඒ තත්ත්වයට ඇවිල්ලා තිබෙන්නේ. එහෙත් මේ ගරු සභාව ශක්තිමත් කර ගන්න අපට පුළුවන්. අපි ඔක්කොම එකඟ වන පියවර මාර්ගයෙන් අපට පුළුවන් මේ ගරු සභාව ශක්තිමත් කර ගන්න. ව්‍යවස්ථාව සංශෝධනය කරන්න වුවමනා නැහැ. එහෙම කරන්නේ නැතිව අපට මේ වගකීම් ඉටු කරන්න පුළුවන්.

පසු ගිය කාලයේ අපේ පාර්ලිමේන්තුව නොසැලකිල්ලට හා හැල්ලුවට ලක් වූ බව අප හැමෝම දන්නවා. පාර්ලිමේන්තුව සතු කිසිදු සැබෑ බලයක් තිබුණේ නැහැ. පාර්ලිමේන්තුව සතු මූල්‍ය බලතල ඇතුළු සියලු බලතල දියාරු කර තිබුණා. පාර්ලිමේන්තුව භාවිත කෙරුණේ කඩතුරාවක් හැටියටයි; සමහර වෙලාවට සැරසිල්ලක් හැටියටයි. නමුත් යළිත් පාර්ලිමේන්තුව බලවත් කරලීම අප සැමගේම වගකීමක් සහ යුතුකමක් වනවා. එය ඔබ සැමගේම අභිලාෂයක් බව මම දන්නවා. ඒ නිසා යළිත් පාර්ලිමේන්තුව ශක්තිමත් කිරීමේ වැයමට එක් වන්න කියා මම ඔබ සැම දෙනාගෙන්ම ඉල්ලා සිටිනවා.

අපේ ඉලක්කය, මේ මුළු පාර්ලිමේන්තුව රාජ්‍ය පාලනය සඳහා දායක කර ගැනීමයි. පාර්ලිමේන්තුවේ ප්‍රශ්න අහන වෙලාවේදී සහ සභාව කල් තබන අවස්ථාවේ යෝජනා ඉදිරිපත් කරන අවස්ථාවේදී ඒවාට පිළිතුරු දීම සඳහා පාර්ලිමේන්තු රැස්වීම්වලට සහභාගි වීමට ඇමතිවරුන්ට විශේෂ යුතුකමක් තිබෙනවා. එම නිසා මම විරුද්ධ පක්ෂය එක්ක කථා කරන්නම්, ඇමතිවරු ඒ සඳහා පැමිණෙන්නේ නැත්නම් අපි මොකක්ද කරන්න ඕනෑ කියන එක ගැන. මෙම ගරු සභාවට ඇමතිවරු පැමිණෙන්න ඕනෑ; නියෝජ්‍ය ඇමතිවරු පැමිණෙන්න ඕනෑ. පුළුවන් තරම් දුරට ඇමතිවරු තමයි මේ ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න ඕනෑ, වෙන අයට බාර දෙන්නේ නැතිව. අපි ඒ සම්ප්‍රදාය මෙතැන් සිට ආරම්භ කරමු, ගරු කථානායකතුමනි. අපි ඒ ගැන කථා කරලා බලමු. කවුද ආවේ නැත්තේ කියලා ඔබතුමා කිව්වොත් අපි ඒක අපේ අවධානයට යොමු කර ගන්නම්. අන්න ඒ විධියට අපි මෙහි කටයුතු ක්‍රියාත්මක කරන්න ඕනෑ.

අපේ රටේ නව දේශපාලන සංස්කෘතියක් බිහි කරන්න, ශීලාචාර ආණ්ඩුවක් නිර්මාණය කරන්න, පවුල්වාදය වෙනුවට ජන සම්මතවාදය ස්ථාපිත කරන්න, දූෂණයෙන් වංචාවෙන් තොර යහ පාලනයක් ඇති කරන්න, ප්‍රජාතන්ත්‍රවාදය හා ප්‍රජාතන්ත්‍රීය ආයතන ශක්තිමත් කරන්න පසු ගිය මැතිවරණයේදී දේශපාලන පක්ෂ, සමාජ සංවිධාන, කණ්ඩායම් හා පුද්ගලයින් ගණනාවක් එකට අත්වැල් බැඳ ගත්තා. මැතිවරණ සමයේදීත් ඉන් පසුවත් තවත් කණ්ඩායම් හා පක්ෂ මේ පොදු අරමුණට එක් වුණා. මේ යහපත් චේතනාව ජය ගැනීමේ අරගළය වෙනුවෙන් සමහරු ජීවිත පරිත්‍යාග කළා; දේපළ හානි කර ගත්තා; දේශපාලන පළි ගැනීම් හා තාඩන පීඩනවලට ලක් වුණා; අසාධාරණයට හා රාජ්‍ය මර්දනයට මුහුණ දුන්නා; රාජ්‍ය මාධ්‍යයන්ගේ කෙනහිලිකම්වලට ලක් වුණා. විවිධ දේශපාලන ප්‍රතිපත්ති තිබුණත් පොදු සමාජ මෙහෙවරක් වෙනුවෙන් ක්‍රියා කළ මේ සියලු දෙනා නොබියව, අඛණ්ඩව තම අරගළය ඉදිරියට ගෙන ගියා. රාජ්‍ය බලයට, මැර බලයට හා ධන බලයට වඩා ජන බලය බලවත් බව ඒ සටනේදී සනාථ වුණා.

මහජන නියෝජිතයින් හැටියට දැන් අප සැමගේ වගකීම වන්නේ ජනතා මතය ක්‍රියාත්මක කිරීමයි. අපේ පක්ෂ වෙනස්. අපේ ප්‍රතිපත්ති වෙනස්. අපේ දර්ශන වෙනස්. නමුත් අපි පොදු අරමුණක් වෙනුවෙන් අත්වැල් බැඳ ගත්තා. අපි රාජ්‍ය පාලනයේදී අනුගමනය කරන්න බලාපොරොත්තු වන්නේ ලිච්ඡවි සම්ප්‍රදායයි. විවිධ අදහස් තිබුණත් අපි සමගියෙන් රැස් වෙමු. සමගියෙන් සාකච්ඡා කරමු. සමගියෙන් විසිර යමු. සම්මුතිවාදයෙන් රට පාලනය කරමු. හොඳ පාර්ලිමේන්තු ක්‍රමයත්, ලිච්ඡවි සම්ප්‍රදායත් මිශ්‍ර කරලා අපි අනාගතයට හොඳ ක්‍රමයක් ඇති කරමු කියලායි මම කියන්නේ. මේ ගරු පාර්ලිමේන්තුවේ දෙපැත්තේම දක්ෂ මන්ත්‍රීතුමන්ලා ඉන්නවා. මම දැකලා තිබෙනවා හොඳ අනාගතයක් තිබෙන තරුණ මන්ත්‍රීවරුන් මේ දෙපැත්තේම ඉන්නවා කියලා. එක්සත් ජාතික පක්ෂයේ වෙන්න පුළුවන්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වෙන්න පුළුවන්, අනාගතයට සැරසෙන්න ඒ වැඩ කටයුතු කරගෙන යන්න අපි ඒ අයටත් අවස්ථාවක් දෙන්න ඕනෑ. අපි හැමදාම මෙතැන ඉන්නේ නැහැ. ලිච්ඡවි සම්මුතියයි, පාර්ලිමේන්තු ක්‍රමයයි එකට එකතු කරන්නේ කොහොමද කියලා බලලා, උවමනා නම් අපට ඒ ක්‍රමය බිහි කරන්න පුළුවන්. ඒ ගැන මට සැකයක් නැහැ.

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

විවිධ වර්ණවලින් යුත් දේදුන්නක් සේ අපි එකට එක් වුණා. මේ ගරු සභාවේ සිටින සියලු මන්ත්‍රීවරුන්ගෙන් මා ඉල්ලා සිටින්නේ මේ වර්ණවත් දේදුන්නට ඔබේ සිතිවිලි ද සම්මාදම් කරන ලෙසයි; ඔබේ අදහස්වලින් මෙම දේදුන්න තවත් අලංකාර කරන ලෙසයි. ඒකාධිපති පවුල්වාදී පාලනයෙන් වියළී ඉරිතලා ගිය අපේ දේශයට අපි ප්‍රජාතන්ත්‍රවාදයේ වැසි දිය වස්සමු. ඒ වැසි දියෙන් පිබිදෙන අපේ දේශයට නව දේශපාලන සංස්කෘතියක් අස්වද්දමු. සියලු දෙනාටම ස්තූතියි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම ස්තූතියි.
මීළඟට ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා.

[අ.භා. 1.18]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா- எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Nimal Siripala de Silva - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, අතිමහත් බහුතරයකින් මේ රටේ විධායක ජනාධිපති ධුරයට පත් වූ, අද මේ සභා ගර්භය වර්ණවත් කරමින් මේ ස්ථානයට පැමිණ සිටින, අප පක්ෂයේ ලේකම්වරයා වශයෙන් කටයුතු කරන ලද අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට පළමුවෙන්ම අපේ ශුභාශිංසන පුද කරනවා. එසේම අග්‍රාමාත්‍ය ධුරය සඳහා පත් වෙමින්, ඉදිරි වැඩ කටයුතු කර ගෙන යෑම පිළිබඳ වූ ඒ ගමන් මඟ සංක්ෂිප්ත වශයෙන් අපට පෙන්වා දෙමින්, මේ රට අලුත් දේශපාලන සංස්කෘතියක් කරා ගෙන යෑමේ ඒ ගමන් මඟ පිළිබඳව යම් විස්තරයක් අද දින ඉදිරිපත් කළ ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත් අපේ ගෞරවය, ස්තූතිය හා ශුභාශිංසන පිරිනමන්න කැමැතියි. එසේම මා දරන ලද සභානායක ධුරයට පත් වුණු, හැම දාමත් අපේ හිත මිත්‍ර ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමාටත්, ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායක ධුරයට පත් වුණු, හැම දාමත් ප්‍රබුද්ධ දේශපාලනයේ යෙදුණු අපේ ගයන්ත කරුණාතිලක මැතිතුමාටත් අපේ විපක්ෂයේ සුබ පැතුම් ද, මාගේ පෞද්ගලික සුබ පැතුම් ද පිරිනමන්න කැමැතියි.

ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රකාශය මඟින් මේ රටේ දේශපාලනය සඳහා අලුත් වැඩ පිළිවෙළක්, නව දේශපාලන සංස්කෘතියක් බිහි කිරීමට අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ඒ ප්‍රතිපත්ති ප්‍රකාශයෙන් ඉදිරිපත් කරන ලද කරුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඒ ගෙන යන ප්‍රයත්නය පිළිබඳව අප පැහැදීමෙන් පසු වෙනවා. විශේෂයෙන්ම දින සියයේ වැඩසටහන පිළිබඳව වරින් වර අපව දැනුවත් කරලා, විපක්ෂයේ මතයත් විමසලා ඉදිරියට යනවා නම් කිසිඳු බාධාවකින්, හිරිහැරයකින් තොරව අපට ඒ සඳහා අවශ්‍ය පූර්ණ සහයෝගය ලබා දෙන්න පුළුවන්. මොකද, මහජන නියෝජිතයන් වශයෙන් අප මේ රටේ ජනතාව නියෝජනය කරන්නේ අපගේ පෞද්ගලික අභිමතාර්ථයන්, තනතුරු සඳහා නොව මේ රටේ ජනතාවට ශුභ සිද්ධියක් සිදු වනු දැන ගැනීම පිණිසයි; ඒ සඳහා අවශ්‍ය කරුණු කාරණා ඉටු කරවා ගැනීම පිණිසයි.

මැති-ඇමතිවරුන් විධියට හිටපු හුඟක් අය අද විරුද්ධ පක්ෂයේ ඉන්නවා. මේ ක්‍රියාවලියේදී අපි සියලු දෙනාම "විරුද්ධ" කියන වචනය පසෙකින් තබා ඒ ඒ අවස්ථාවන්හිදී ඔබතුමන්ලාගේ රජය මඟින් මේ රටේ ජනතාව වෙනුවෙන් කරනු ලබන හොඳ වැඩ පිළිවෙළවල් තිබෙනවා නම් ඒ ක්‍රියාවන්වලදී අපි කකුලෙන් අදින්නේ නැතුව ඒවාට සහයෝගය දීම අපේ යුතුකමක් හා වගකීමක් බව මම ප්‍රකාශ කරන්න කැමැතියි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මධ්‍යම කාරක සභාවත්, ඒ වාගේම විධායක සභාවත් ඉතාම තුලනාත්මකව මේ ප්‍රශ්නය පිළිබඳව ගැඹුරින් සාකච්ඡා කළා. අපේ පසු ගිය දේශපාලන සංස්කෘතීන් තුළත් මෙවැනි සුවිශේෂී අවස්ථාවක් උදා වුණේ නැහැ.

අපි කොයි පැත්තේ ද, කොයි පිලේ ද කියන ප්‍රශ්න සියල්ල අමතක කර දමා, රට වෙනුවෙන් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පූර්ණ සහයෝගය දිය යුතුයි කියලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මධ්‍යම කාරක සභාවත්, විධායක සභාවත් ඒකමතිකව සම්මත කර තිබෙනවා. ඒ නිසා එයින් බැහැර වීමක් නැහැ. ඊටත් අමතරව කාර්ය භාරයන් රාශියක් අපට ඉටු කරන්න සිදු වෙයි. විශේෂයෙන්ම ඒකපාක්ෂික දේශපාලනයක් නැතුව මේ රටේ ජනතාවගේ විවිධ මතිමතාන්තර, ඔවුන්ගේ දුක් වේදනා හා අදෝනා රජයට පෙන්වා දෙන්න ඕනෑ. ජනතාවට යම් අවැඩදායක සිද්ධීන් වනවා නම්, අහිතකර සිද්ධීන් වනවා නම් ඒවා පෙන්වා දෙමින් ජනතාව වෙනුවෙන් හඬක් නැගීම මේ පාර්ලිමේන්තුව තුළ අපි කළ යුතුයි. ඒ යුතුකමින් අපි බැහැර වෙන්නේ නැහැ. ඒ යුතුකම අපි පවත්වා ගෙන යනවා. ඒ නිසා රජය අපව විරුද්ධවාදීන් හැටියට සලකන්නේ නැතුව මේ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහය තුළ රටේ ජනතාවගේ ඒ ප්‍රශ්න ඒ ආකාරයෙන් ඔබගේ අවධානයට යොමු කරවීම සඳහා ඒ අවස්ථාව ලබා දෙමින්, ඒවාට සවන් දෙමින්, විසංවාදී දේශපාලනයක් තුළින් ඔබතුමන්ලා අපේක්ෂා කරන පරිදි මේ වැඩ පිළිවෙළ සාක්ෂාත් කර ගැනීම සඳහා කටයුතු කරන ලෙසත් මා ඉල්ලා සිටින්නට කැමැතියි.

විශේෂයෙන්ම අග්‍රාමාත්‍යතුමා කියූ පරිදි මේ රටට දේශපාලන විසඳුමක් ලබා දීම පිළිබඳ ගැටලුව, දශක ගණනාවක් තිස්සේ රජයන් ගණනාවක ඔඩු දුවපු ප්‍රශ්නයක්. ඒ ප්‍රශ්නය සඳහා සාර්ථක විසඳුමක් ලබා දීමට අපට පුළුවන් වුණේ නැහැ. විවිධ කොමිටි, විවිධ සාකච්ඡා, සම්මන්ත්‍රණ රාශියක් ඇති වුණත් ඒ ප්‍රශ්නය සඳහා සාර්ථක විසඳුමක් ලබා දීමට අපට පුළුවන් වුණේ නැහැ. මේ රටේ ඒකීයභාවය ආරක්ෂා කර ගනිමින්, බෞද්ධවාදය පරාජය කරමින්, මේ රට බෞද්ධවාදය කරා යාමට ඉඩ නොතබන දේශපාලන විසඳුමක් ලබා දීමේ වග කීම රජයටත්, අප සියලු දෙනාටමත් තිබෙනවා. ඒ නිසා එවැනි විසඳුමක් වෙනුවෙනුත් අපි කැප වෙන අතර, එය මා දකින්නේ මේ රටේ ජාතික ප්‍රමුඛතාවක් හැටියටයි. I see that as a national priority; to give a political settlement so that the long-standing, long overdue question could be settled during our era.

අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ මේ කාල පරිච්ඡේදය තුළදී සියලු ජාතීන්ට එකඟ විය හැකි ආකාරයකට එම ප්‍රශ්නයත් විසඳා ගැනීමට අවස්ථාවක් ලැබේවා කියලා අපි ප්‍රාර්ථනා කරන්නට කැමැතියි.

මේ අවස්ථාවේදී අපි මේ කාරණය ප්‍රකාශ කරන්නේ කිසිකෙනකු සමඟ සටනක් කරන්න හෝ කිසිකෙනකු විවේචනයකට භාජනය කරන්න හෝ නොවෙයි. පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිසා මේ රටේ ජනතාවට ඇති වී තිබෙන ශෝචනීය තත්ත්වය ගැන කියන්න අපි, අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාව හමු වුණා. එතුමා ඉතාම සානුකම්පිතව, ඉතාම ඕනෑකමින් ඒවාට සවන් දුන්නා. සමහර ප්‍රශ්නවලට ඒ අවස්ථාවන්හිදී විවිධ නියෝගයන් ලබා දෙමින් ඒවා සමනය කිරීමට ගත් පියවර ගැන අපි එතුමාට ස්තූති කරනවා. මෙම ක්‍රියාවලිය එතැනින් අවසන් වෙලා නැහැ. ගරු කථානායකතුමනි, තවමත් මේ ප්‍රචණ්ඩත්වය අපේ පාක්ෂිකයින්ට එරෙහිව පවත්වාගෙන යනවා.

අපි විසංවාදී දේශපාලනයකට අවතීර්ණ වීමේදී හුදෙක්, පාර්ලිමේන්තු තලය තුළ හෝ පළාත් සභා තලය තුළ හෝ ප්‍රාදේශීය සභා තලය තුළ මන්ත්‍රීවරුන්ගේ එකඟතාව පමණක් ප්‍රමාණවත් වන්නේ නැහැ. අපි එයින් ඔබ්බට ගොස් ජනතාවත් මේ දැවැන්ත ක්‍රියාවලිය සඳහා පාර්ශ්වකරුවන් බවට පත් කර ගත යුතුයි. එම ජනතාව අමතක කර අප සියලු දෙනාට පමණක් එකතු වෙලා මේ කාර්යය ඉටු කිරීමට පුළුවන්කමක් නැහැ.

පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවන් නිසා ජීවිත ගණනාවක් අහිමි වෙලා තිබෙනවා; දේපොළ අහිමි වෙලා තිබෙනවා; වෙළෙඳ ව්‍යාපාර අහිමි වෙලා තිබෙනවා. ඒ වාගේම රැකී රක්ෂාවලට වාර්තා කිරීමට ඉඩ නොදීමේ අවස්ථා සිය ගණනක් ගැන අපට දැන ගන්නට ලැබී තිබෙනවා. අප දැන් ඒ පිළිබඳ සියලු තොරතුරු එකතු කරගෙන යනවා. ඒ ලැබුණු තොරතුරු සමහරක් දැනටමත් අපි අතිගරු ජනාධිපතිතුමාට ඉදිරිපත් කරලා තිබෙනවා. මේ පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා ගැන හෝ අපේ ගරු අගමැතිතුමා ගැන අපට අවිශ්වාසයක් නැහැ. නමුත් මේ තොරතුරු පහළට ගලාගෙන යාමේදී සහ ඒවා ක්‍රියාත්මක කිරීමේදී ගැටලු ඇති වන්නට පුළුවන්. පොලීසිය විසින් පැමිණිලි බාර ගැනීම ප්‍රතික්ෂේප කළ අවස්ථා රාශියක් තිබෙනවා. එම නිසා මේ සඳහා සුදුසු යාන්ත්‍රණයක් සකස් කර දීලා, දේශපාලන ප්‍රචණ්ඩත්වය නිසා හිංසාවට පත් ජනතාවට සහනයක් ලබා දීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කරන ලෙස ඉල්ලා සිටිනවා.

විසංවාදී දේශපාලනය සඳහා අපට ජනතා සහයෝගය ලබා ගැනීමට නම්, අප තව දුරටත් නොබෙදී, එක්ව ඉදිරියට ගමන් කිරීමට නම් මෙම සංස්කෘතිය වචනයට පමණක් සීමා නොකර ඒ සඳහා ක්‍රියා කළ යුතුයි. ඒ සඳහා ඔබතුමන්ලාගේ සෑම තලයකම දේශපාලන නායකත්වයේත්, ආධාරකරුවන්ගේත් සහයෝගය අවශ්‍ය වනවා. නැත්නම් මේක අතිගරු ජනාධිපතිතුමාට හෝ විපක්ෂ නායකතුමාට හෝ පමණක් කළ හැකි කාර්යයක් නොවේ.

අපේ ගරු මහින්ද සමරසිංහ මැතිතුමා යම් කිසි කාරණයක් සම්බන්ධයෙන් මේ ළඟදී දිනක පැමිණිල්ලක් කළා. එහිදී අප ඔබතුමන්ලාගේ අවධානයට යොමු කළා, මේ ප්‍රචණ්ඩත්වය මොන තරම් ආකාරයකින් ක්‍රියාත්මක වනවාද කියන එක ගැන. මේ අති විශිෂ්ට අවස්ථාවේදී මා තුවාල පාරන්නට කැමැති නැහැ. ඒවා පිළිබඳව ඉතාම අඩුවෙන් කථා කරලා ඒවා පිළිබඳව ඔබතුමන්ලාට අවශ්‍ය කරුණු ඉදිරිපත් කරලා ඒ තුළින් මෙය සමනය කර ගැනීමේ අවශ්‍යතාව තිබෙනවා කියන කාරණය ඔබතුමන්ලාට, රජයට පෙන්වා දීමට කැමැතියි.

ඔබතුමන්ලා ගෙන එනු ලබන නීති-රීති, අණපනත් පිළිබඳ කෙටුම්පත් අග්‍රාමාත්‍යතුමා අපට ඉතා ඉක්මනින් ලබා දුන්නොත් විපක්ෂයේ අපත් කමිටු වශයෙන්, වෙන් වෙන් වශයෙන් රැස් වෙලා, ඒවා පිළිබඳව ඉතා ගැඹුරින් අධ්‍යනය කරලා, අනෙකුත් විශේෂඥයන්ගේ දැනුම ද එයට උපයෝගී කරගෙන, ඉතාම පැහැදිලි සංවාදයක් ඔබතුමන්ලා සමඟ ඇති කරගෙන අපට ඉදිරියට යාමට පුළුවන්. ඒ නිසා අන්තිම මොහොත දක්වා සිටින්නේ නැතිව ඉතා ඉක්මනින් -මා හිතනවා, ඔබතුමන්ලා දැනටමත් ඒවා සකස් කර ඇති කියා. අපි තවම ඒවා දැකලා නැහැ. - ඒවා අපට ලබා දෙන්න. අපි ඒවා අධ්‍යයනය කරලා ඒවා නතර කිරීමට නොව, රටේ යහපත සඳහා ඉදිරියට ගෙන යාමට අපේ සහයෝගය ලබා දෙනවා. එහිදී අපි ඉදිරිපත් කරනු ලබන අදහසුත් සැලකිල්ලට ගනිමින් ඉදිරියට යන ලෙස මා ඉල්ලා සිටිනවා.

එහෙම කළොත් කිසිදු බාධාවකින් සහ හිරිහැරයකින් තොරව අගමැතිතුමාගේ බලාපොරොත්තුව පරිදි, අතිගරු ජනාධිපතිතුමාගේ බලාපොරොත්තුව පරිදි දින සියයක් ඇතුළත දී මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම අපට ඉතාම පහසු වෙයි. අවශ්‍ය නම් අපි ඒ සඳහා හැමදාම හෝ මේ පාර්ලිමේන්තුව රැස් වෙමු. හැමදාම හෝ පාර්ලිමේන්තුව රැස් වෙලා අපි මේ වැදගත් නීති-රීති සම්පාදනය සඳහා අවශ්‍ය කටයුතු කරමු. එහෙම කරලා ජනතා අභිප්‍රායයන් හා බලාපොරොත්තු ඉෂ්ට කරමු. ඊට පස්සේ ඔබතුමන්ලා ප්‍රකාශ කරන පරිදි අපගේ දේශපාලන න්‍යායයන් හා ප්‍රතිපත්ති අනුව භාරකාර රජයක් යටතේ අලුතින් ඉදිරිපත් කරනු ලබන ව්‍යවස්ථාව හා එම නීති-රීති අනුව මැතිවරණයක් පවත්වලා -දින සියය ගත වුණාට පස්සේ- මේ රටේ අනාගතය තීන්දු කිරීමේ අවස්ථාව ජනතාවට භාර දෙමු. එවැනි බලාපොරොත්තුවක් සහිතව සුවිශේෂ වූ දේශපාලන සංවාදයකට අද අපි අවතීර්ණ වෙලා තිබෙනවා.

ඇත්ත වශයෙන්ම මේ රට තුළ අලුත් දේශපාලන සංස්කෘතියක් බිහි කිරීම සඳහා අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඉදිරිපත් කරන ලද මේ සංකල්පය ක්‍රියාත්මක කිරීමේ සක්‍රිය අවස්ථාවක් බොහෝ කාලයක් තිස්සේ මේ රටේ ජනතාවට ලැබුණේ නැහැ. ඒ වාගේම විධායක ජනාධිපති ක්‍රමය ඉවත් කිරීම පිළිබඳව බොහෝ කාලයක සිට මේ රටේ සාකච්ඡාවට භාජන වුවත්, ඒ පිළිබඳවත්, මේ රටේ මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම පිළිබඳවත් ඵලදායී වැඩ පිළිවෙළක් ඉදිරිපත් වුණේ නැහැ.

අපි ඉතාම ඉවසිල්ලෙන්, ඒ වාගේම ඕනෑකමින් ඒ වැඩ පිළිවෙළ දෙස බලාගෙන ඉන්නවා. මේ කරුණු රාශියක්ම අප විසින් අගය කරන ලද දේශපාලන න්‍යායයන්; අප විසින් අගය කරන ලද දේශපාලන ස්ථාවර. ඒ නිසා ඒවා වට්ටියෙන් ද ඉටු වුණේ, පෙට්ටියෙන් ද ඉටු වුණේ කියන ප්‍රශ්නයක් ඇති වන්නේ නැහැ. අපට අවශ්‍ය වන්නේ මේ කාරණා ජනතාව වෙනුවෙන් ඉටු කර ගැනීමයි. ඒ අවශ්‍යතාව අප සියලුදෙනා තුළ තිබෙනවා.

ගරු කථානායකතුමනි, මා මීට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. අපේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා ඇතුළු සියලුදෙනාට අපි නැවත වතාවක් සුභ පතනවා. මෙම දේශපාලන සංවාදය පෞද්ගලික වෛරයෙන් තොරව, මඩ ගැසීම්වලින් තොරව, කෙළින් - පෞද්ගලික විවේචන, මඩ ගැසීම් තුළින් නොව- ප්‍රතිපත්තිමය දේශපාලනය පිළිබඳව වූ විවේචන තුළින් කර ගෙන යෑමෙන්, ප්‍රතිපත්තිමය දේශපාලනය සඳහා වූ වැඩ පිළිවෙළකට අවතීර්ණ වෙමු කියා යෝජනා කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තූතියි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු ජනාධිපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, ගරු අගමැතිතුමා ප්‍රකාශ කළ පරිදි අද පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු ආරම්භ වූ අවස්ථාවේ සිටම සජීවී ලෙස විකාශනය වන බව දන්වනු කැමැත්තෙමි.

මීළඟට, ගරු ආර්. සම්පන්දන් මන්ත්‍රීතුමා.

[1.33 p.m.]

ගරු ආර්. සම්පන්දන් මහතා
(மாண்புமிகு ஆர். சம்பந்தன்)
(The Hon. R. Sampanthan)

Mr. Speaker, we extend our warm and sincere congratulations and best wishes to His Excellency Maithripala Sirisena on his election as the President of the Democratic Socialist Republic of Sri Lanka. His election has resulted in other changes: the appointment of

[ගරු ආර්. සම්පන්දන් මහතා]

the Hon. Ranil Wickremasinghe as the Prime Minister and the formation of a new Government. We also extend to the Hon. Ranil Wickremasinghe, the new Prime Minister, and his Government our warm and sincere congratulations and best wishes.

The Tamil National Alliance extended its unconditional support to His Excellency Maithripala Sirisena. We neither sought positions nor any other considerations in return for such support. We knew that efforts would be made to communalize the electoral process and gain electoral advantage by rousing communal feelings. We did not provide anyone with an opportunity to engage in such mischievous propaganda. It is a clear indication of the maturity of our electorate in the whole country that though some efforts were made in that direction, they were not successful.

This election, Mr. Speaker, was not fought on a level playing field. State resources were very extensively used from before the election and during the entire electoral process to support the campaign of the former President. It is to the credit of His Excellency Maithripala Sirisena that despite such extreme abuse of State power and resources, he was able to muster substantial support thoughtout the entire country and emerge victorious.

The Tamils and the Tamil-speaking people of the North and the East and in the whole country responded overwhelmingly to the decision of the Tamil National Alliance that they extend their wholehearted support to His Excellency Maithripala Sirisena, the joint Opposition candidate. We extend our very sincere gratitude to these people. Together with the people in the rest of the country, they have brought about a change in governance that would be greatly beneficial to the whole country in several areas outlined in President Maithripala Sirisena's 100- Day Work Programme.

The Tamil question needs to be addressed so as to evolve a permanent, reasonable, workable and durable political solution within the framework of a united and undivided Sri Lanka. It is the non-resolution of this question for over 60 years and its multifarious consequences that had been the cause of many ills the country has been afflicted with.

In the interests of the whole country, the Tamil question needs to be addressed as a matter of urgency. We shall extend our fullest support to the achievement of this objective. We are confident that the vast majority of all Sri Lankan people will extend their support towards this effort.

Thank you.

[අ.භා. 1.37]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම පසු ගිය ජනවාරි මාසයේ 8වැනි දා අපේ රටේ දේශපාලන ඉතිහාසයේ ඉතාම තීරණාත්මක සන්ධිස්ථානයක් වූ දවසක් වන බව නොඅනුමානයි. අපේ රට ගමන් කරමින් තිබුණේ ප්‍රජාතන්ත්‍රවාදය, ප්‍රජාතන්ත්‍රවාදී මූල ධර්ම ක්‍රියාත්මක කිරීම සඳහා පිහිටුවා තිබෙන පාර්ලිමේන්තුව, අධිකරණය සහ ඒ හා බැඳී තිබුණු ආයතන සියල්ල පොඩි පට්ටම් කරමින් ඒකාධිපති වියරුවක් සහ පාලනයක් දක්වායි. ඒ වාගේම රටේ ආර්ථිකය හුදු කොන්ක්‍රීට් වනාන්තර බවට පත් කරමින්, ආර්ථිකයේ ප්‍රතිලාභ සාමාන්‍ය ජනතාව වෙතට ගලා නොයන, ඉතා කුඩා අතළොස්සක් වෙතට ආර්ථිකයේ ප්‍රතිලාභ එක් රැස් කරමින් තිබුණු ගමනක අපේ රට යමින් තිබුණා. ඒ වාගේම අපේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ ආදී සියලු ජන කොට්ඨාසවල සම අයිතිය පිළිගනිමින්, එක රටක් තුළ ජාතික සමගිය ගොඩනඟමින් ඉදිරියට යනවා වෙනුවට, සිංහල, දෙමළ, මුස්ලිම් ජනයා අතර සැකය, අවිශ්වාසය, ක්‍රෝධය, වෛරය වැඩි කරමින්, ඔවුන් භේද භින්න කරමින් කටයුතු කරන ව්‍යාපෘතියක් සකස් වෙලා තිබුණා. ඒ වාගේම විශාල ලෙසින් වංචාව, දූෂණය, නාස්තිය, අක්‍රමිකතාව පිරුණු, ඒ සඳහා රාජ්‍ය අනුග්‍රහය මුළුමනින්ම ලැබුණු, රාජ්‍යයේ ඉහළ හස්තයේ සිට පහළ දක්වා ඒ සඳහා මෙහෙයුමක් දියත් කරමින් තිබුණු වාතාවරණයක් මේ රටේ පැවතුණා. ඒ වාගේම අධිකරණයේ, මාධ්‍යයේ නිදහස මුළුමනින්ම අවුරමින්, අධිකරණය, මාධ්‍ය ඇතුළු සියලු ආයතනවල බලය ඉතා කුඩා කණ්ඩායමක් අතට අත්පත් කර ගත්ත ගමනක මේ රට යමින් සිටියා.

ජනවාරි මාසයේ 08වන දා මේ රටේ ජනතාවට ඒ ගමන නතර කරන්නට පුළුවන්කම ලැබුණා. එය මේ රටේ ජනතාව ලබා ගත් ශ්‍රේෂ්ඨ ජයග්‍රහණයක් ලෙස අපි විශ්වාස කරනවා. ඒ ගමන ජනවාරි මාසයේ 08වන දා අපට නතර කර ගන්නට බැරි වුණා නම්, මේ විනාශකාරී දොරටුව ජනවාරි මාසයේ 08වන දාත් විවෘත කර ගනු ලැබුවා නම් අපට සාකච්ඡා කරන්නට සිද්ධ වෙන්නේ මෙවැනි පාර්ලිමේන්තුවක් තුළ නොවේ. අපේ රටේ මැතිවරණයකින් පාලනයන් වෙනස් කිරීම, මැතිවරණයකින් පාලකයන් වෙනස් කිරීම මුළුමනින්ම අහුරමින් ඒකාධිපති පාලන වියරුවක් දක්වා ගමන් කරන එක වළක්වන්න බැහැ. ඒ නිසා ජනවාරි මාසයේ 08වන දා මේ රටේ ජනතාව සුවිශේෂී ජයග්‍රහණයක් අත් පත් කර ගෙන තිබෙනවා. ඒ ජයග්‍රහණය වෙනුවෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටපු මහ ලේකම්වරයා හැටියට මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා, එක්සත් ජාතික පක්ෂය, ඒ වාගේම ආණ්ඩුව ඇතුළේ සිටි විවිධ පාර්ශ්ව සහ පිටින් ඉන්නා අපි වාගේ පාර්ශ්වයන් වාගේම ටීළුන්ඒ එක වාගේ පාර්ශ්වයන්ගෙනුත් විශාල දායකත්වයක් ලැබී තිබෙනවා. ඒ නිසා මේ රටේ විනාශකාරී ගමන නතර කොට යළි ප්‍රජාතන්ත්‍රවාදයේ දිශාවට, යළි යහ පාලනයේ දිශාවට දොරටු විවෘත කර ගන්නට දක්වන ලද දායකත්වයට ඒ හැම දේශපාලන ව්‍යාපාරයකටම, ඒ වාගේම මේ රටේ සියලු ජන කොට්ඨාසයන්ටම අපි බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

මෙවර ජනාධිපතිවරණයේ විශේෂත්වයක් අපි දකිනවා. මීට පෙර අපේ රටේ ජාතික නායකයා තෝරා පත් කර ගැනීමේදී උතුරු පළාතේ ජනතාව ඉතා අඩුවෙන් තමයි ඡන්දය පාවිච්චි කරලා තිබුණේ. 1982 ජනාධිපතිවරණය ගත්තොත් ඒ සඳහා වෙනම දෙමළ අපේක්ෂකයෙක් ඉදිරිපත් කරනු ලැබුවා. ඒ නිසා ඔවුන් වෙනම දෙමළ අපේක්ෂකයෙකුට සංකේන්ද්‍රීය වීම වළක්වන්නට බැරිව තිබුණා. 1988 ජනාධිපතිවරණය ගත්තොත් ඉතා කුඩා ප්‍රමාණයකින් තමයි උතුරු පළාතේ ජනතාව ඡන්දය පාවිච්චි කරලා තිබුණේ. 1994 ජනාධිපතිවරණය ගත්තොත්,

එවකට ජනාධිපතිවරියට යාපනය දිස්ත්‍රික්කයෙන් ලැබී තිබුණේ ඡන්ද 16,000යි; වන්නි දිස්ත්‍රික්කයෙන් ලැබී තිබුණේ ඡන්ද 18,000යි. ඒ, ඉතා කුඩා ප්‍රමාණයක්. 2005 ජනාධිපතිවරණය ගත්තොත් උතුරු පළාතේ ජනතාව මුළුමනින්ම පාහේ ඒ මැතිවරණය ප්‍රතික්ෂේප කරලා තිබෙනවා.

2010 පැවැති ජනාධිපතිවරණය ගත්තොත්, කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ ඡන්ද පාවිච්චි වෙලා තිබෙන්නේ සියයට 14ක් වැනි කුඩා ප්‍රමාණයක්. විශේෂයෙන්ම උතුරු පළාතේ ජීවත් වන ජනයා අපේ රටේ මධ්‍යගත පාලනයේ ජාතික නායකයා තෝරා පත් කර ගැනීම ප්‍රතික්ෂේප කර තිබෙනවා. විටෙක බලහත්කාරිත්වය මත, තව විටෙක තමන්ගේ දේශපාලන න්‍යායන් මත ඔවුන් කල්පනා කරනවා, මේ රටේ ජාතික නායකයා තෝරා පත් කර ගැනීම ඔවුන්ගේ කාර්ය භාරයක් නොවේය කියලා. ඔවුන් අපේක්ෂා කරනවා, උතුරු පළාතේ තමන්ගේ නායකත්වයක් තෝරා පත් කර ගැනීම තමයි තමන්ගේ කාර්ය භාරය කියලා. ඒ නිසා රටේ නායකයා තෝරා පත් කර ගැනීම කෙරෙහි ඔවුන්ගේ අඩු අවධානයක් යොමු වෙලා තිබුණා. එය අඩු මැදිහත්වීමක් බවට පත් වෙලා තිබුණා. හැබැයි ලංකාවේ පළමුවැනි වතාවට මධ්‍යගත රාජ්‍යයේ ජාතික නායකයා තෝරා පත් කර ගැනීම සඳහා උතුරු පළාතෙත්, නැඟෙනහිර පළාතෙත්, සෙසු පළාත්වලත් ජනතාව ඒකාබද්ධ වෙලා තිබෙනවා. මෙම මැතිවරණ ප්‍රතිඵලයටත්, මෙම මැතිවරණයේ තිබෙන සුවිශේෂ ජයග්‍රහණයටත් රටේ ජාතික නායකයා තෝරා පත් කර ගැනීම වෙනුවෙන් සියලු ජන කොට්ඨාසයන් දායක වෙලා තිබෙනවා; සම්බන්ධ වෙලා තිබෙනවා.

වර්තමාන රජය ඒ තබන ලද අඩිතාලම පළුදු වන්නට ඉඩ නොදී, ඈත් වන්නට ඉඩ නොදී, සැකය ඇති වන්නට ඉඩ නොදී, වෛරය ඇති වන්නට ඉඩ නොදී, ක්‍රෝධය ඇති වන්නට ඉඩ නොදී අසමගිතාව වර්ධනය කරනවා වෙනුවට මේ ජන කොට්ඨාසයන් අතර සමගිය ගොඩනඟමින් ඉදිරියට යා යුතුව තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය වන දේශපාලන ප්‍රතිසංස්කරණ මේ පාර්ලිමේන්තුව තුළ අපි සාකච්ඡා කරමු; ඒ සඳහා අවශ්‍ය වන තීන්දු තීරණවලට අපි එළඹෙමු. ඒ විතරක් නොවෙයි, ඒ දේශපාලන ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ පමණක් නොවෙයි, ඔවුන්ගේ ජීවිත කාලය තුළ ඔවුන්ට පාරම්පරිකව හිමිව තිබුණු ඉඩම්, ඔවුන්ගේ දේපොළ, ඔවුන්ගේ සංස්කෘතිය, ඔවුන්ගේ භාෂාව, ඒවා පිළිබඳවත් අවශ්‍ය අවධානය යොමු කරමින් ජාතික සමඟිය ගොඩනඟන දිසාවට යහපත් පියවරක් ගන්නට පුළුවන් වේවි කියලා අපි විශ්වාස කරනවා.

ගරු කථානායකතුමනි, මීට පෙර ජනාධිපතිවරයෙක් මාරු වෙලා වෙනත් ජනාධිපතිවරයකු එන විට බොහෝ විට සිදු වුණු දේ තමයි ඒ හා විගසම පාර්ලිමේන්තු මැතිවරණයකට යන එක. එයින් අපේක්ෂා කරනවා, ජනාධිපතිවරයා ලබා ගත් මහා ජයග්‍රහණය තුළ තමන්ට පාර්ලිමේන්තුවෙත් අති විශාල ජයග්‍රහණයක් අත් පත් කර ගැනීමට එය උපයෝගී කර ගත හැකි වේවිය කියලා. නමුත් මෙවර විශේෂත්වයක් තිබෙනවා. ජනාධිපතිවරණය ජනවාරි මාසයේ 08වැනි දා අවසන් වෙලා ක්ෂණිකව මහ මැතිවරණයක් සඳහා යනවා වෙනුවට දින 100කට පසුව මහ මැතිවරණයක් පවත්වන්නට යෝජනා කර තිබෙනවා. ඒ දින 100 ඇත්තටම අන්තර් පාලනයක්; අන්තර් කාල පරිච්ඡේදයක්. ඒ අන්තර් කාල පරිච්ඡේදයේදී අපට කර ගත හැකි, කර ගත යුතු ඉතාමත් වැදගත් සමාජ ප්‍රතිසංස්කරණ, ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ ප්‍රතිසංස්කරණ ගණනාවක් තිබෙනවා.

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නිර්මාතෘ ජේ.ආර්. ජයවර්ධන මහතා පැවසූ පරිදි ගැහැනියක පිරිමියෙකු කරන්න, පිරිමියෙකු ගැහැනියක කරන්න පමණක් බැරි මහා බලගතු තනතුරක් නිර්මාණය කරලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කරලා තිබෙන බව අපි දන්නවා. ඒ තනතුර අපේ රට කවර දිශාවකට ද ගෙන යමින් තිබුණේ? පාර්ලිමේන්තුව හුදු සිග්නල් කණු බවට පත් කරලා තිබුණා. අධිකරණය හුදු, පුටුවල වාඩි වෙලා ඔහේ නිදි කිරන තත්ත්වයට පත් කරලා තිබුණා. මාධ්‍ය ආයතන හුදු, "තමන්ගේ කැමැත්ත" ලියැවෙන තැනක් බවට පත් වෙලා තිබුණා. මේ අසීමිත විධායක බලය තුළින් ගිය ගමන අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයත්, අපේ රටේ යහ පාලනයත්, ජනතාවගේ මූලික වුවමනාවනුත් මුළුමනින්ම යටපත් කරමින් ගිය ගමනක්. ඒ නිසා මේ විධායක බලය අහෝසි කිරීමට මේ පාර්ලිමේන්තුවේ අපට හැකියාවක් ලැබෙනවා නම්, එය 1978න් පසුව මේ රටේ පාර්ලිමේන්තුව තුළ ගනු ලබන ඉතාම සුවිශේෂී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයක් ලෙස අපි සලකනවා. ඒ සඳහා ගනු ලබන තීන්දු තීරණවලට අපේ පාර්ශ්වයෙන් ලබා දිය හැකි උපරිම දායකත්වය ලබා දෙන්න අපි සූදානම්.

මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙන ආ සංශෝධන දහඅටෙන් ප්‍රජාතන්ත්‍රවාදයේ දිශාවට; ජනතාවගේ දිශාවට ගෙන එන ලද එකම සංශෝධනය දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය බව අපට මතකයි. ඒ මොහොතේ පවතින දේශපාලන තත්ත්වයන් උපයෝගී කර ගෙන තමන්ගේ බලය අත් පත් කර ගැනීමේ, තමන්ගේ බලය වැඩි කර ගැනීමේ, තමන්ගේ කාලය දීර්ඝ කර ගැනීමේ අරමුණින් තමයි අනෙක් සියලු ප්‍රතිසංස්කරණ ගොඩ නැඟී තිබුණේ. හැබැයි, ප්‍රජාතන්ත්‍රවාදයේ දිශාවට තබන ලද එකම ප්‍රතිසංස්කරණය තමයි, දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය. නමුත් අවාසනාවන්ත තත්ත්වය වන්නේ මේ පාර්ලිමේන්තුවම දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කරලා දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් යළි ගෙන ඒමයි. අධිපතිවාදී බලයක් තුළින් ස්වාධීන කොමිෂන් සභා අහෝසි කරමින්, ප්‍රජාතන්ත්‍රවාදී ආයතන ව්‍යුහයන් මුළුමනින්ම විනාශ කරමින්, තනි පුද්ගලයෙක් -තනි කල්ලියක්- අතර බලය අත් පත් කර ගැනීම සඳහා ව්‍යායාමයක් දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ලබා ගෙන තිබෙනවා.

මේ පාර්ලිමේන්තුවම 2010 සැප්තැම්බර් මාසයේ 8 වැනිදා ඒ ඒකාධිපති වියරුවක් සඳහා අවශ්‍ය වන ව්‍යවස්ථාපිත බලය අත් පත් කර ගෙන තිබෙනවා. 2010 සැප්තැම්බර් මාසයේ 8 වැනිදා, එනම් මීට අවුරුදු 5කට පමණ පෙර ඉතිහාසයේදී මේ පාර්ලිමේන්තුව විසින් කරන ලද අත්වැරැද්ද, මේ පාර්ලිමේන්තුව විසින් ප්‍රජාතන්ත්‍රවාදය මුළුමනින්ම වළලා දැමීම සඳහා දරන ප්‍රයත්නය, මේ පාර්ලිමේන්තුවටම, ඒ මිනිසුන්ටම, ඒ පුද්ගලයන්ටම මේ පාර්ලිමේන්තුව තුළ එය අහෝසි කර යළි දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අදාළ වූ ව්‍යවස්ථාපිත ප්‍රතිසංස්කරණ ගේන්න පුළුවන් නම්, එය මේ පාර්ලිමේන්තුව අත් පත් කර ගන්නා සුවිශේෂී ජයග්‍රහණයක් වනවා. අපි විශ්වාස කරනවා මේ දින 100 ඇතුළත ඒ ජයග්‍රහණය මේ පාර්ලිමේන්තුවේදී අත් පත් කර ගන්න පුළුවන් වේවි කියලා. ඒ වෙනුවෙන් අපේ උපරිම සහයත්, මැදිහත් වීමත් ලබා දෙන්න අපි සූදානම්.

මට මතකයි, ගරු කරු ජයසූරිය මන්ත්‍රීවරයා විසින් තොරතුරු දැන ගැනීමේ පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අවස්ථාව. සාමාන්‍ය සම්ප්‍රදායයක් හැටියට තිබුණේ පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළාට පසුව එය විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් ඉදිරිපත් කළා නම්, කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර, ඒ සම්බන්ධව අදාළ අමාත්‍යාංශයෙන් විමසලා, ඒ පිළිබඳ විරෝධයක් නැත්නම් විවාදයට ගෙනැල්ලා, සම්මත කරනවාද නැද්ද කියලා ඒ විවාදයේදී තීරණය කිරීමයි. ඒක තමයි ප්‍රජාතන්ත්‍රවාදය. හැබැයි, මා දැක්කා ගරු කරු ජයසූරිය මන්ත්‍රීවරයා විසින් තොරතුරු දැන ගැනීමේ පනත් කෙටුම්පත මේ

[ගරු අනුර දිසානායක මහතා]

පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන කොට, ඒ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න දෙනවාද නැද්ද කියලා ඡන්දයක් විමසුවා. එය ඉතාමත් කනගාටුදායක තත්ත්වයක් නොවේද? ඒ පනත් කෙටුම්පතට එකඟ නොවෙනවා නම් පනත් කෙටුම්පත ප්‍රතික්ෂේප කරන්න පුළුවන්. එම පනත් කෙටුම්පත සම්මත වීම වළක්වන්න පුළුවන්. ඒ සඳහා බහුතර බලය තිබෙනවා. හැබැයි, විපක්ෂ මන්ත්‍රීවරයෙකුට පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන්න තිබෙන අයිතිය මුළුමනින්ම පැහැරගෙන, එම පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න දෙනවාද නැද්ද කියලා ඡන්ද විමසීමක් මේ පාර්ලිමේන්තුව කළා. එදා තමන් විසින් ඉදිරිපත් කරන ලද පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වූ බහුතර අකමැත්ත හේතුකොටගෙන, එම පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට එකඟ නොවීම හේතුකොටගෙන එම පනත් කෙටුම්පත අකුළා ගන්න ගරු කරු ජයසූරිය මන්ත්‍රීතුමාට සිද්ධ වුණා. ඒ පනත් කෙටුම්පත එයිටත් වඩා ශක්තිමත් කරමින්, ඊටත් වඩා බලවත් කරමින් මේ රටේ ජනතාවට තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කළ යුතුව තිබෙනවා.

අපි මේ රටේ ජනතාවගේ නියෝජිතයන්. අපි මේ පාලනයේ භාරකරුවන් පමණයි. ඒ පාලනයේ අයිතිකරුවන් වන ජනතාවට තොරතුරු දැන ගැනීමට අයිතියක් නැද්ද? අධිවේගී මාර්ගයේ දිග කොපමණද, වියදම කොපමණක් ගියාද, ටෙන්ඩර් කැඳෙව්වාද, දුන්නේ කාටද, ණය පොලිය කොච්චරද, ගෙවලා ඉවර වෙන්නේ කවදාද යන තොරතුරු දැන ගන්න අයිතියක් නැද්ද? ඒක මේ රටේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය. ජනාධිපතිවරයා කී පාරක් රට ගියාද, කී දෙනෙක් අර ගෙන ගියාද, ලැබුණු ප්‍රතිලාභ මොනවාද, වියදම කොච්චරද කියලා මේ රටේ ජනතාවට දැන ගන්න අයිතියක් නැද්ද? මේ රටේ මහජනයාගේ ධනය, මහජනයාගේ මුදල්; ඒවා පරිහරණය වෙන්නේ කෙසේද කියලා මේ රටේ ජනතාවට දැන ගන්න අයිතියක් තිබෙනවා. ඒ අයිතිය මේ පාර්ලිමේන්තුව විසින් සම්මත කළ යුතු නැද්ද? ඒ නිසා තොරතුරු දැන ගැනීමේ අයිතිය සම්බන්ධයෙන් වූ පනත් කෙටුම්පත අතිශය වැදගත් පනත් කෙටුම්පතක්. අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයේ දිසාවට තබන, යහ පාලනයේ දිසාවට තබන ඉතාමත් දිගු පියවරක් මේ අවස්ථාව. ඒ දිගු පියවර සාර්ථක කර ගැනීම වෙනුවෙන් තොරතුරු දැන ගැනීමේ පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුව තුළ සම්මත කර ගැනීමට, මේ පාර්ලිමේන්තුව විසින් ඉදිරිපත් කරන්න ඉඩ නොදී අකුළා ගන්නා ලද එම පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුව තුළ යළිත් තවත් ශක්තිමත් කර ගනිමින් සම්මත කර ගන්න ලැබේවි කියලා අපි කල්පනා කරනවා. ඒ වෙනුවෙන් අපේ දායකත්වය, මැදහත්වීම අපි ලබා දෙන්න සූදානම්.

අපේ රටේ විශාල මාෆියාවක් තිබෙනවා. ලෝකයේ ප්‍රධාන වෙළෙඳාම් 3ක් තිබෙනවා. ඒ තමයි, අවි ආයුධ වෙළෙඳාම, බීජ වෙළෙඳාම සහ බෙහෙත් වෙළෙඳාම. බෙහෙත් වෙළෙඳාමේ ජාවාරකරුවන් අපේ රටේ ඈත ගම්මානවල ජීවත් වන ජනතාව විශාල පීඩාවකට පත් කරලා තිබෙනවා. ඒ ජාවාරකරුවන්ගේ ලේබලය යටතේ එන බෙහෙත් විශාල මුදලක් දීලා ගන්නට සිදු වෙලා තිබෙනවා. රුපියලේ පෙත්තට රුපියල් 13ක්, 14ක් වියදම් කරන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ රටත්, මේ පාර්ලිමේන්තුවත් අපි නිහඬව අපේ රටේ ඈත ගම්වල ජීවත් වන ජනතාවගෙන් ලෙඩක් හැදුනාම ගන්න බෙහෙතෙන් අයථා ලෙස මුදල් උපයන්න, අයථා ලෙස මුදල් එක්රැස් කර ගන්න මාෆියාවන්ට, කල්ලිවලට, ව්‍යාපාරිකයන්ට ඉඩකඩ ලබා දීලා තිබුණා. වර්තමාන ජනාධිපති හිටපු සෞඛ්‍ය අමාත්‍යවරයා හැටියට ඒ පනත් කෙටුම්පත සම්මත කර ගැනීම සඳහා විශාල ප්‍රයත්නයක් දරපු බව ඔහු විටින් විට ප්‍රකාශ කරලා තිබුණා. අවසන් මොහොතේදී එම පනත් කෙටුම්පත සම්මත කර ගැනීම සඳහා ඔහු දැරූ ප්‍රයත්නය අසාර්ථක වුණා යැයි කියලා විවිධ අවස්ථාවලදී ප්‍රකාශයට පත් කරලා තිබුණා. මේ රටේ ජනතාව ඖෂධ මාෆියාවක් අතට පත් කරගෙන, එහි උවමනාවන් මත මේ රටේ ජනතාවගේ අයිතිවාසිකම් මුළුමනින්ම කප්පාදු කරමින්, ඖෂධ මාෆියාව වෙත මේ රටේ ජනතාව හිර කරමින් මේ ඖෂධ පනත ක්‍රියාත්මක නොවී තිබුණා. ඒ නිසා අපි හිතනවා, නැවත ඖෂධ පනත් කෙටුම්පත සම්මත කිරීම හරහා මේ රටේ බෙහෙත් මාෆියාව, ඖෂධ මාෆියාව අත් පත් කර ගෙන තිබෙන කුමන්ත්‍රණකාරී පිළිවෙත පරාජයට පත් කළ යුතුය කියා. ඒ සඳහා ඖෂධ පනත ශක්තිමත් කර ඉදිරිපත් කිරීම සඳහා දරන ප්‍රයත්නයට අපි ඉතා වගකීමකින් යුතුව මැදිහත් වෙමින් සහාය ලබා දෙන්න සූදානම්.

අපේ රටේ තිබෙන විගණන ක්‍රියාවලියේ තිබෙන්නේ සැබැවින්ම පසු විපරම් ක්‍රියාවලියක් පමණයි. පසු විපරම් ක්‍රියාවලියෙන් ඔබ්බට යමින් පූර්ව ක්‍රියාවලින් විමර්ශනය කළ යුතුව තිබුණා. පසු විපරම් ක්‍රියාවලියෙන් හොරු හොයන්න පුළුවන් වෙයි. අපරාධය ගැන සොයන්න පුළුවන් වෙයි. හැබැයි විනාශය, නාස්තිය නතර කරන්න බැහැ. එම නිසා අපේ රටේ පසු විපරම් ක්‍රියාවලියක් වෙනුවට පූර්ව විපරම් ක්‍රියාවලියක් ආරම්භ කළ යුතුයි. ඒ සඳහා දැනටත් ජාතික විධායක සභාව තුළ සාකච්ඡා වෙමින් තිබෙන ප්‍රතිසංස්කරණ ක්‍රියාමාර්ග මේ පාර්ලිමේන්තුව තුළ සම්මත කර ගන්න හැකියාවක් ලැබේවිය කියලා අප විශ්වාස කරනවා.

මේ රටේ ජනතාවට ක්ෂණික සහන ගණනාවක් අවශ්‍ය වෙලා තිබෙනවා. ඉතා අක්‍රමවත් බදු පැනවීමක් තුළින් මූලික ලෙසම රාජ්‍ය භාණ්ඩාගාරය පුරවමින් මේ රාජ්‍ය භාණ්ඩාගාරයේ මුදල් ඉතා කුඩා කණ්ඩායමක් සහ කල්ලියක් අතට පත් කර ගනිමින් මේ රටේ බදු ක්‍රියාවලිය දියත් වෙමින් තිබුණා. එදා අපි එළියේ සිට දැක්කාට වඩා, එදා අපි දුර සිට දැක්කාට වඩා අද සමීපව බලන විට මහා භාණ්ඩාගාරයේ ධනයට අත් පත් වෙලා තිබෙන ඉරණම අපට මහා හෙණයක් හැටියට පෙනෙමින් තිබෙනවා. එම නිසා මහජනතාවට සාධාරණයක් ඉටු වන ආකාරයේ බදු ක්‍රියාවලියකට යොමු විය යුතුව තිබෙනවා. ඒ ධනය, පෙරළා මහජනයාගේ සුඛ විහරණය සඳහා යෙදවිය යුතුව තිබෙනවා. මේ බදු ක්‍රියාවලිය යළි ප්‍රතිසංස්කරණය කළ යුතුයි. ඒ සඳහා මේ මාසයේ 29 වැනි දා අතුරු අය වැය ලේඛනයක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වන බව ප්‍රකාශයට පත් කර තිබෙනවා. එම අතුරු අය වැය ක්‍රියාවලියේදී ජනතාව මත අසීමිතව පවරා තිබෙන බදු බර ඉවත් කරමින් ජනතාවගේ අත්‍යවශ්‍ය සේවා සඳහා අවශ්‍ය වන යෝජනා, අවශ්‍ය වන ක්‍රියා මාර්ග ගන්නවා ඇතැයි කියා අපේ විශ්වාසයක් තිබෙනවා. එවැනි යෝජනාවලියක් ගෙන එන අතුරු අය වැය ලේඛනයකට පූර්ණ සහාය සහ මැදිහත් වීම ලබා දෙන්න අපි සූදානම්.

අපි විශ්වාස කරනවා, අපේ රටේ මහජනයාගේ ධනය කෝටි ප්‍රකෝටි ගණනින් නාස්ති කරලා තිබෙනවා; හොරකම් කරලා තිබෙනවා; විනාශ කරලා තිබෙනවා කියා. ගරු කථානායකතුමනි, මේ රටේ මේ මැතිවරණය තමයි වංචාව, දූෂණය, නාස්තිය, අක්‍රමිකතාව වැඩියෙන් සාකච්ඡාවට බඳුන් වුණු මැතිවරණය. අධිවේගී මාර්ගයේ දිග අනුව එයට වියදම් වූ මුදල සාධාරණද? හම්බන්තොට වරායේ දිග සහ පළල අනුව එයට වියදම් වූ මුදල සාධාරණද? එයාර් ලංකා ගුවන් සමාගමට ගෙන එන ලද ගුවන් යානාවල ඇත්ත වටිනාකම සහ ඒවාට වැය කළ මුදල සාධාරණද? වරායට ගෙනෙන ලද කන්ටේනර්වල ඇත්ත මිල අනුව ඒවාට වැය කළ මුදල සාධාරණද? මේ රටේ මහජනයාට අයිති ඉඩම් කෝටි ප්‍රකෝටි හිමිකරුවන්ට අත් පත් කර දීම සාධාරණද? එවැනි සාකච්ඡා ලංකා ඉතිහාසයේ අන් කවරදාටත් වැඩියෙන් මෙවර මැතිවරණ වේදිකාවේදී ප්‍රකාශයට පත් වුණා. මේ හා සමාන නොවුණත්, මෙවැනිම සාකච්ඡාවක් 1994 වර්ෂයේදී මැතිවරණ වේදිකාවේදී ආවා.

අපට මතකයි, ගරු චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියගේ මැතිවරණ වේදිකාවකදී, එවකට අවුරුදු 17ක් රට පාලනය කරන ලද එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ පෞද්ගලීකරණ ක්‍රියාවලිය හරහා මහා පරිමාණ ලෙස සිදු කරන ලද වංචා, දූෂණ, අක්‍රමිකතා පිළිබඳව සාකච්ඡාවක් ඇති වුණු බව. ගබඩාවේ තිබුණු සීනිවල වටිනාකමටත් වඩා අඩු මිලකට සීනි කර්මාන්තශාලාවක් විකුණා තිබුණා. ගබඩාවේ තිබෙන සීනි ප්‍රමාණයේ වටිනාකමටත් වඩා අඩු මිලකට සීනි කර්මාන්තශාලාව ඇස්තමේන්තු කර තිබුණා. ඒවා පිළිබඳ විශාල සාකච්ඡාවක්, විරෝධයක් 1994 වසරේ මැතිවරණ වේදිකාවේදී ආවා. එවකට චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියගේ මැතිවරණ වේදිකාවේ ඇයගේ ප්‍රකාශය බවට පත් වුණේ, "මේ හොරුන් ගෝල්ෆේස් පිට්ටනියට ගෙනැවිත් එල්ලනවා" කියලායි. නමුත් කිසිවෙක් එල්ලුවේ නැහැ. අපි කියන්නේ එල්ලන්න ඕනෑ කියලා නොවෙයි. නමුත් නීතිය හමුවට පමුණුවන්න ඕනෑ. එදා ජනතාවගේ අභිලාෂයක් තිබුණා මේ වංචාවට, දූෂණයට, අක්‍රමිකතාවට, නාස්තියට සම්බන්ධ වුණු පුද්ගලයන් නීතිය හමුවට පැමිණවිය යුතුයි කියා. එය වෛරය නොවෙයි; එය ක්‍රෝධය නොවෙයි; එය පළි ගැනීම නොවෙයි. එය යුක්තියයි; එය සාධාරණයයි. එය මේ රටේ ජනතාව බලා ගෙන ඉන්නවා. එය අත් හරින්න බැරි වග කීමක්. ගරු ජනාධිපති උතුමාටත්, අග්‍රාමාත්‍යතුමා ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයටත්, ආණ්ඩු පක්ෂයටත්, ඒ වාගේම මේ පාර්ලිමේන්තුවටත් ඒ වගකීම දීලා තිබෙනවා. අන් කවරදාටත් වඩා මේ රටේ පසු ගිය මැතිවරණ වේදිකාවේදී මේ හොරුන් පිළිබඳව, මේ වංචාව නාස්තිය අක්‍රමිකතාව පිළිබඳ විශාල විවාදයක්, සංවාදයක් ඇති වෙලා තිබුණා. මහජන මුදල් කෝටි ප්‍රකෝටි ගණන් හොරකම් කරන ලද, නාස්තියට යොදවන ලද, අවභාවිතාවේ යොදවන ලද පුද්ගලයන් නීතිය හමුවට පැමිණ වීම සඳහා මේ පාර්ලිමේන්තුවටත්, ආණ්ඩුවටත්, ජනාධිපතිවරයාටත් වග කීමක් තිබෙනවා. ඒ සඳහා ගනු ලබන යුක්ති සහගත ක්‍රියා මාර්ගවලට උපරිම දායකත්වය සහ මැදිහත් වීම ලබා දෙන්න දේශපාලන ව්‍යාපාරයක් හැටියට අප සූදානම්.

ගරු කථානායකතුමනි, අපේ රටේ ඡන්දවලින් පාලනයන් වෙනස් කරන්න, ඡන්දවලින් පාලකයන් තෝරා පත් කරන්න අයිතියක් තිබෙන්න ඕනෑ. නමුත් ගරු කථානායකතුමනි, පසු ගිය ඉරිදා පුවත් පත්වල සඳහන් කර තිබුණා, ඡන්දයෙන් තෝරා පත් කර ගන්නා ලද පාලකයාට පාලන බලය භාර දෙනවා වෙනුවට, සිටින ලද පාලකයා විසින් කුමන්ත්‍රණකාරි ලෙස බලය අත් පත් කර ගැනීම සඳහා ව්‍යායාමයක් තිබුණා කියා දැන් තොරතුරු වාර්තා වෙමින් තිබෙන බවට. ඉරිදා සිංහල පුවත් පතක, ඒ වාගේම ඉංග්‍රීසි පුවත් පත් ගණනාවක මේ ගැන වාර්තා කර තිබුණා. තවමත් ඒ අදාළ කිසිදු පාර්ශ්වයක කෙනෙක් මෙය ප්‍රතික්ෂේප කර නැහැ. අපේ රටේ තෝරා පත් කර ගන්නා ලද පාලකයාට පාලනය හිමි කරන්නේ නැතිව කුමන්ත්‍රණකාරී ලෙස ඒ පාලනය ඩැහැ ගන්නට උත්සාහ කරනවා නම් ගරු කථානායකතුමනි, අපේ රට පත් වන්නට තිබුණේ කොතැනකට ද? ලේ විලක් බවට පත් වෙන එක, විනාශ වුණු මිනිස් ජීවිත කන්දක් බවට පත් වෙන එක වළක්වන්නට බැහැ. කුමන්ත්‍රණකාරී පිළිවෙතක් දියත් වුණා නම්, නැවත බලය ලබා දීමෙන් කුමන්ත්‍රණය වැහෙන්නේ නැහැ. අඩියක් ඉස්සරහට ගියා නම් අඩි පණහක් පස්සට ආවාය කියා ඉස්සරහට ගිය අඩිය මැකෙන්නේ නැහැ. කුමන්ත්‍රණකාරී පිළිවෙතක් සඳහා ප්‍රයත්නයක් දැරුවා නම්, ඒ සඳහා මැදිහත් වීමක් කර තිබෙනවා නම් ඒක මේ රටේ ජනතාව දැන ගත යුතුයි. විදේශ අමාත්‍යතුමා හැටියට ගරු මංගල සමරවීර මැතිතුමා ඒ ගැන මේ වන විට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබෙනවා. තමන්ගේ පාලකයා මැතිවරණවලින් තෝරා පත් කර ගැනීම, පාලකයා මැතිවරණවලින් වෙනස් කිරීම මේ රටේ ජනතාවට තිබෙන ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක්. ගරු කථානායකතුමනි, අපි කවුරුත් ඒකට ගරු කරන්නට ඕනෑ. ඡන්දයෙන් පැරදෙනවා නම් ගෙදර යන්න ඕනෑ. ඒක තමයි සාධාරණය. ඒ වෙනුවට කුමන්ත්‍රණකාරී ලෙස බලය අත් පත් කර ගන්නට හදනවා නම් ඒ කවර පාලකයෙක්ද? කවර රටක්ද අපට හිමි වෙන්නේ? එය බරපතළ ගණයේ කුමන්ත්‍රණයක්.

මේ වර්ගයේම බලය ඩැහැ ගැනීමේ කුමන්ත්‍රණයක් 1962 දී ක්‍රියාත්මක වුණා. 1962 රාජ්‍ය ද්‍රෝහී කුමන්ත්‍රණයේදී එවකට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායිකාව හැටියට කටයුතු කළ ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය පැය විසිහතරෙන් එම රාජ්‍ය ද්‍රෝහී කුමන්ත්‍රණය පිටුපස හඹා යමින් එය ව්‍යර්ථ කරන්නට සමත් වුණා. එම රාජ්‍ය ද්‍රෝහී කුමන්ත්‍රණය පරාජයට පත් කළේ නැත්නම් ඒ කුමන්ත්‍රණයෙන් අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයේ බොහෝ මුල්ගල් ගැලවී යන එක වළක්වන්නට බැහැ. එදා ඒ සඳහා ධෛර්යයක්, හැකියාවක් සහ වුවමනාවක් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට තිබුණා. එම නිසා ප්‍රජාතන්ත්‍රවාදයේ යම් ඉඩ ප්‍රස්ථා අපට විවෘත කර ගන්නට ඉඩ ලැබී තිබෙනවා. 1962 දී ඒ රජ්‍ය ද්‍රෝහී කුමන්ත්‍රණකරුවන් එළිදරවු කරලා නීතිය හමුවට පමුණුවන්නට එදා පැවැති රජයට පුළුවන්කම ලැබුණා; ධෛර්යය තිබුණා. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව තිබෙන විශ්වාසය කඩ කරමින් කුමන්ත්‍රණකාරී ලෙස බලය අත් පත් කර ගන්නට දරන උත්සාහය, කුමන්ත්‍රණකාරී ලෙස බලය ලබා නොදීමට දරන උත්සාහය මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයටත්, මිනිස් ජීවිතවලටත් කරන මහා බරපතළ හානියක්. එම නිසා මෙතැන සිදු වී තිබෙන්නේ රාජද්‍රෝහී කුමන්ත්‍රණයක්; තමන්ට අත් පත් වී තිබුණු බලය තමන්ගෙන් ගිලිහී යන්නට සූදානම් වෙනකොට එය ලබා නොදී කුමන්ත්‍රණකාරී ලෙස අත් පත් කර ගැනීම සඳහා දැරූ ප්‍රයත්නයක්. දැනට වාර්තා වී තිබෙන තොරතුරු අනුව ඒ මොහොතේදී අග්‍ර විනිශ්චයකාරවරයා එම ස්ථානයේ රැඳී සිට තිබෙනවා. අග්‍ර විනිශ්චයකාරවරයා රැ ගිහිල්ලා නඩු අහනවා ද? ඒක මේ රටේ ජනතාව දැන ගන්නට ඕනෑ නැද්ද? ඒ මොහොතේ එතැන නොසිටිය යුතු පුද්ගලයන් ඉඳලා තිබෙනවා. මෙය සිද්ධ වෙන්නේ කොහොමද? එම නිසා මෙතැන දියත් වී තිබෙන්නේ රාජද්‍රෝහී කුමන්ත්‍රණයක් නම් ඒ කුමන්ත්‍රණය මේ රටට හෙළිදරව් කළ යුතුයි. එය කිසිසේත්ම කාලයේ වැලි තලාව විසින් හෝ බලය ලබා දීම විසින් හෝ යටපත් කළ යුතු එකක් නොවෙයි. මා කලින් කිව්ව පරිදි අඩියක් ඉදිරියට ගියා නම් අඩි පණහක් පස්සට ආවාය කියා ඉදිරියට ගිය අඩිය වැහෙන්නේ නැහැ. ඉදිරියට තියපු අඩිය පිළිබඳව පරීක්ෂණය කළ යුතුයි. කුමන්ත්‍රණකාරි ලෙස බලය අත් පත් කර ගැනීම සඳහා දරන ප්‍රයත්නය පරාජය කිරීමෙන් පමණයි මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කර ගත හැකි වන්නේ. ඒ වෙනුවෙන් මේ ආණ්ඩුව ගනු ලබන ක්‍රියා මාර්ග පිළිබඳව අපි දැඩි උවමනාවෙන් සහ දැඩි අවධානයෙන් යුතුව බලා ගෙන ඉන්නවා.

අද මේ පාර්ලිමේන්තුවේ සුවිශේෂී අවස්ථාවක් නිර්මාණය වෙලා තිබෙනවා. මට ටිකක් තේරුම් ගන්නත් අමාරු අවස්ථාවක්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බොහෝ පිරිසක් ඒ පැත්තේ. අනෙක් පිරිස මේ පැත්තේ. ඒ පැත්තේ ඉන්න අය ආණ්ඩුවේ, මේ පැත්තේ ඉන්න අය විපක්ෂයේ. මම හිතන විධියට අපේ රටේ පාර්ලිමේන්තුව set up කරන්න ඕනෑ නැහැ. කවුරු හරි බලය අර ගෙන, 175 දෙනෙක් ඒ පැත්තට යනවා. ඒ 175 දෙනාගෙන්, 113ක් ආණ්ඩුවේ වාඩි වෙනවා. ඉතුරු 62 මේ පැත්තට එවනවා. මේ පැත්තට ඇවිල්ලා විපක්ෂයක් හදනවා. එහෙම කරන්න එපා. ගරු කථානායකතුමනි, මේ සම්ප්‍රදාය පිළිබඳව සිතා බලන්න ඕනෑ. පාර්ලිමේන්තුවට set up කරන ලද විපක්ෂයක් වැඩක් නැහැ. තීරණය කරන්න ඕනෑ, තමන්ගේ පක්ෂය සහාය දෙන්නේ කාටද, සහාය දුන්නාට පස්සේ ඉතුරු වෙන්නේ කවුද, විපක්ෂය නියෝජනය කරන්නේ කවුද කියලා. ආණ්ඩු පක්ෂය බහුතර බලයක් අත් පත් කර ගත්තාට පසුව 113ක් ඒ පැත්තේ වාඩි කරවා ගෙන ඉතුරු පිරිස මේ පැත්තට එවලා විපක්ෂයේ වැඩි පංගුව කියලා විපක්ෂයේ භූමිකාව අත් පත් කර ගන්නා සම්ප්‍රදායක් හැදුණොත් මොකද වෙන්නේ? ඒ නිසා set up කරපු පාර්ලිමේන්තුවක් අවශ්‍ය නැහැ. සැලසුම් කරන ලද

[ගරු අනුර දිසානායක මහතා]

පාර්ලිමේන්තුවක් අවශ්‍ය නැහැ. මහජනයාගේ ඡන්දය විසින් නියෝජනය කරන ලද පාර්ලිමේන්තුවේ පිළිබිඹුවක් තමයි අවශ්‍ය වන්නේ, ගරු කථානායකතුමනි.

අපි කාටවත් විපක්ෂ නායකත්වය අත් පත් කර ගන්න ඕනෑ නැහැ. ඒක දින සියයකට බලාපොරොත්තු වෙන්නේවත් නැහැ. මේ දින සියයට ඒක අවශ්‍යත් නැහැ. කොටසක් ආණ්ඩුවේ, කොටසක් විපක්ෂයේ. කොටසක් ආණ්ඩුවට සහාය දෙනවා. අනෙක් අය විපක්ෂයේ ඉන්නවා. එහෙම බැහැ. එහෙම set up කරන්න බැහැ. හරියට කියන්න ඕනෑ, තමන්ගේ පක්ෂයේ ස්ථාවරය මොකක්ද කියලා. ජනතා විමුක්ති පෙරමුණේ ස්ථාවරය මේකයි: අපි කැබිනට් මණ්ඩලයේ නැහැ. අපි ආණ්ඩුවේ නැහැ. අපි පාර්ලිමේන්තුවේ විපක්ෂයේ ඉන්නවා. හැබැයි මේ දින සියයේ වැඩ පිළිවෙළට අපි ක්‍රියාකාරීව මැදිහත් වෙමින් සහාය ලබා දෙනවා. මා දන්නා විධියට, මා විටින් විට සාකච්ඡා කළ පරිදි ද්‍රවිඩ ජාතික සන්ධානයත් කැබිනට් මණ්ඩලයේ නැහැ; ආණ්ඩුවේ නැහැ. විපක්ෂයේ ඉන්නවා.

ගරු ආර්. සම්පන්දන් මහතා
(மாண்புமிகு ஆர். சம்பந்தன்)
(The Hon. R. Sampanthan)
එහෙමයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මා දැන ගන්න කැමැතියි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ස්ථාවරය මොකක්ද කියලා. ඒක දැන ගන්න ඕනෑ. එහෙම නැත්නම් සැලසුම් කරන ලද - set-up කරන ලද - විපක්ෂයක් හදන්න පුළුවන්ද පාර්ලිමේන්තුවේ? ඒකට අපි ඉඩ ලබා දිය යුතුද? ඒ නිසා මේ තත්ත්වය පිළිබඳව ගරු කථානායකතුමාගේ අවධානය යොමු කරමින්, මෙම අවස්ථාව ලබා දීම පිළිබඳව බෙහෙවින්ම ස්තුතිවන්ත වෙමින් මම නතර වෙනවා.

[අ.භා. 2.04]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමාට පළමුකොට මම සුබ පතන්න කැමැතියි, තුන් වැනි වරටත් ලංකාවේ අග්‍රාමාත්‍ය ධුරය භාර ගැනීමට එතුමාට පුළුවන් වීම ගැන. ජනාධිපතිතුමා මෙම ගරු සභාවට පැමිණ ටික වේලාවක් සභාවේ රැඳී ඉඳලා ඉවත්ව ගියා.

මේ රටේ රාජ්‍ය නායකයා ලෙස දිවුරුම් දීමට මේ රටේ ජනතාවගේ කැමැත්ත දිනා ගැනීම ගැන අපි ජනාධිපතිතුමාටත් සුබ පතනවා.

ගරු කථානායකතුමනි, කාලයකට පසුව මහජන එක්සත් පෙරමුණ වෙනුවෙන් මේ පාර්ලිමේන්තුවේ කථාවක් කරන්නට ලැබීම ගැන මම ඉත සිතින්ම සතුටු වෙනවා. ඒ ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මොකද, ගරු අග්‍රාමාත්‍යතුමා එතුමාගේ කථාවේදී කිව්වා, දේශපාලන සංස්කෘතියක් ගොඩනැඟීම ගැන. ඒ දේශපාලන සංස්කෘතිය, මේ රටේ පළල්ම දේශපාලන මතවාදයන්ට සවන් දෙන සංස්කෘතියක් විය යුතුයි. එතුමා ඉතා හොඳින් දන්නා දේශපාලන විද්‍යාව ක්‍රියාත්මක කරන්න උත්සාහයක් දරන්නේ නම් එය ඵලදායී බවට පත් වෙන්න බොහෝ සෙයින් ඉඩ තිබෙනවා. ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ජනපති ධුරය ලැබීමත්, ඒ වාගේම ගරු අග්‍රාමාත්‍යතුමා හැටියට රනිල් වික්‍රමසිංහ මැතිතුමාට මේ හවුල් ආණ්ඩුවේ අග්‍රාමාත්‍ය ධුරය ලබා ගැනීමට පුළුවන් වීමත් සැබැවින්ම අලුත් තත්ත්වයක්. මොකද, පාර්ලිමේන්තු මහ මැතිවරණයක් නොමැතිව තමයි ගරු අග්‍රාමාත්‍යතුමා එම ධුරයට පත් වෙලා තිබෙන්නේ. ඒ ගැන අපේ කිසි විරෝධයක් නැහැ. එතුමා පාර්ලිමේන්තු මහ මැතිවරණයකින් ජයග්‍රහණය කර නොවෙයි එම ධුරයට පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා එතුමාට අමුතු දේශපාලන කසාදයක් බැඳ ගැනීමට සිද්ධ වෙලා තිබෙනවා. ඒක තමයි යථාර්ථය. ඒ ගැන අපි සුබ පතනවා. ඒ කසාදය කෙසේ පවතීවිද කියන ප්‍රශ්නය තිබෙනවා. මොකද, එතුමා තමයි මේ ආණ්ඩුවේ නිර්මාතෘවරයා. වෙන කිසිවෙකු නිසා නොවෙයි, රනිල් වික්‍රමසිංහ මැතිතුමා හා එක්සත් ජාතික පක්ෂය නිසායි මේ ජයග්‍රහණය ලබා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට මේ ජනාධිපති ධුරයට එන්නට අවස්ථාව සැලසුණේ. ඒක තමයි සත්‍යය. වසන් කරන්න දෙයක් නැහැ, සත්‍යය එයයි. ඒ පිටුපස නොයෙක් නොයෙක් අය සිටි බව අප දන්නවා. නොයෙක් නොයෙක් අය ඊට එකතු වූ බව මේ ගරු සභාවේදී දැනුත් කිව්වා. මේ මැතිවරණය පැවැත්වීම තුළින් දේශීය හා විදේශීය වශයෙන් එතුමන්ලා කවුරුත් එකට එකතු වුණා. "Regime change" කියන දෙය පසු ගිය අවුරුදු තුන හමාර, හතර, පහ කාලය තුළ විවිධ රටවල ඇති කරපු දෙයක්. පාලන තන්ත්‍රය පෙරළා දැමීම එහෙම නැත්නම් "regime change" කියන එකේ හවුල්කාරයන් බවට හුඟාක් අය එකතු වුණා.

මේ දින සියයේ වැඩසටහන තුළින් අපේ රටේ ජනතාව වෙනුවෙන් කරන හොඳ දේවලට එක්සත් ජනතා නිදහස් සන්ධානයේ කොටස්කාර පක්ෂයක් හැටියට මහජන එක්සත් පෙරමුණ සහයෝගය දෙනවා. නමුත් ජනතාවට අහිතකර දෙයක්, අපේ මව් බිමට අහිතකර දෙයක් සිදු වන්නේ නම් එය එසේ කළ නොහැකි බවත්, ඒ ගැන සාකච්ඡා කරන්නට ඉඩකඩ ලබා දී තිබෙන බවත් අග්‍රාමාත්‍යතුමා කිව්වා. ඒක ඉතාම වැදගත්. අහිතකර දේ කුමක්ද කියන එක ගැන අනෙක් අයගේත් අදහස් දැන ගැනීමට ඉඩ කඩ ඇතිව කටයුතු කිරීමේ වැදගත්කම ප්‍රජාතන්ත්‍රවාදයට ගෙනෙන්නට පුළුවන් නම් මා හිතන්නේ එය පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයට ලබා දිය හැකි වැදගත් පරිච්ඡේදයක් බවට පත් වෙනවා කියායි.

ගරු කථානායකතුමනි, මම මේ අවස්ථාවේ සඳහන් කරන්නට කැමැතියි, ජනාධිපති ලෙස අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලය කිසිවකුට අමතක කරන්න බැහැයි කියන එක. ඔබතුමා දේශපාලන වශයෙන් විරුද්ධ වුණත් ඔබතුමා දිවුරුම් දෙන අවස්ථාවේදීත් අවංකව, නිහතමානීව කිව්වා මහින්ද රාජපක්ෂ රටට කළ දේ, රට ආරක්ෂා කළ දේ ඉතිහාසයට අමතක කළ නොහැකියි කියා. එයයි සත්‍යය. අපි දේශපාලන වශයෙන් එතුමාට පක්ෂ වෙන්න පුළුවන්; විරුද්ධ වෙන්න පුළුවන්; එතුමාට පහර දෙන්න පුළුවන්; නිගා කරන්න පුළුවන්. නමුත් එතුමා 2005 භාර ගත්ත රට - මගේ මිත්‍ර විදේශ කටයුතු ඇමතිතුමා මෙතැන ඉන්නවා.- ඒකීය ලංකාවක් නොවෙයි, අගමැතිතුමනි. ඒකීයභාවයක් නැති ත්‍රස්තවාදීන් උතුරු නැඟෙනහිර පළාත් පාලනය කරමින් තිබුණු රටක්. ත්‍රස්තවාදය තුරන්කොට ඒ රට එක් සේසත් කර භාර දීලා තමයි එතුමා පරාජය පිළිගෙන ගියේ කියන එක මම ඉතාම වැදගත් පණිවිඩයක් හැටියට මතක් කරනවා. ඒ වාගේම හුඟක් අය බොහෝ කතන්දර කියනවා. එතුමා ප්‍රජාතන්ත්‍රවාදයට හිස නැමුවේ නැහැයි කියනවා. උගුරට හොරා කථා කරන්න පුරුදු වුණු අයට ප්‍රජාතන්ත්‍රවාදය ගැන උගුරට හොරා කථා කරන්න පුළුවන්. නමුත් සත්‍යය නම් එතුමා මැතිවරණයට පැමිණියා. ඔබතුමන්ලා අපි අතර මැතිවරණයේ විවිධ උණුසුම් විවාද පවතිනවා. විවිධ විවේචන, විවිධ විග්‍රහයන්, විවිධ අපහාසයන් ඇති වෙනවා. ඒවා අපි සිටින ආසියාවේ දේශපාලන ලෝකයේ සිදු වන දේවල්. අපි ඒවා ප්‍රාර්ථනය

කරන්නේ නැහැ. මම දන්නවා, අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා කවදාවත් එවැනි පෞද්ගලික අපහාසයන් වේදිකාවල කරන්නේ නැහැයි කියා. නමුත් අපහාස කරන මිනිසුන් ඉන්නවා. ඒවා ගැන කියන්න මගේ කාලය ගන්නේ නැහැ. ඔබතුමා උත්සාහ දරන ආදර්ශය අලුතින් හදන්න. පුළුවන් නම් හදන්න. ඒක වැදගත්. ඒක අලුත් පරම්පරාවට දායා ද කර දිය යුතු දෙයක්. නමුත් එය ඔවුන්ට දායාද වී නැහැ.

මම මේ කාරණය කියන්න කැමැතියි, ගරු කථානායකතුමනි.

Hon. Speaker, I would like to quote the press release issued by John Kerry, Secretary of State of the United States on the 8th of January, 2015.

It states:

"The Sri Lankan people deserve great credit on the successful conclusion of their elections. They turned out in great numbers to exercise their democratic rights and every vote was a victory for Sri Lanka."

Whether it is for the Government or for the Opposition, every vote was a victory for democratic rights in Sri Lanka.

It further states, I quote:

"The United States applauds the Sri Lankan Elections Commissioner, the security forces, Sri Lankan civil society, and the candidates themselves for making sure this election was not marred by unrest and for ensuring a significant drop in campaign -related violence. It will be important for that effort to continue in the coming days.

I commend President Rajapaksa for accepting the results of the election in the proud tradition of peaceful and orderly transfers of power in Sri Lanka. His words tonight about accepting the verdict of the people and moving forward are important.

I look forward to working with President-elect Maithripala Sirisena as his new government works to implement its campaign platform of a Sri Lanka that is peaceful, inclusive, democratic, and prosperous."

This is the message John Kerry, the United States' Secretary of State, issued soon after the election and it gives enough thought and enough advice to those who want to make unnecessary allegations about the democratic transfer of power by the ex-President Mahinda Rajapaksa, accepting the verdict and going away. I know ex-President bid adieu to you, Hon. Prime Minister. I was there when you came to "Temple Trees". As a gentleman in politics and as a democrat, you came and discussed with him when he told you that he was ready to transfer power within a matter of minutes. These are facts which are stubborn. These may not be facts that you would like to hear. But, I am sorry to say that this is the stubborn truth that is being debarred from the media today. As you stated in your speech today, and as you have always stood when you were on this side of the House and when you were Leader of the Opposition, I appeal you to stand up for media freedom. I request the Hon. Prime Minister to give the media a free hand to report all what is going on in the country, not this one-sided *mada pahara* that is being orchestrated through the media today. We condemn that. That is not democracy. I am sorry I have to say that I condemn it because the Mahajana Eksath Peramuna always stood for the democratic freedom of media. We have gone into political wilderness by going to protect the media freedom in the years that we have passed but we will stand for the important aspects of media freedom in a democracy.

ගරු කථානායකතුමනි, මහින්ද රාජපක්ෂ මැතිතුමා තරගයට ඉදිරිපත් වුණු වෙලාවේ විශ්වාසයෙන් යුතුව එතුමාට ඡන්දය පාවිච්චි කළ පනස්හත් ලක්ෂයක ජනතාවට අපේ ප්‍රණාමය මම මේ අවස්ථාවේ පුද කරනවා. ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා අග්‍රාමාත්‍යතුමා හැටියට අලුත් සංස්කෘතියක් ආරම්භ කරමින් යන ගමනේදී දේශපාලන වශයෙන් මහින්ද රාජපක්ෂ මැතිතුමාට ඡන්දය පාවිච්චි කළා කියලා කාට හෝ රස්සාවකට යන්න දෙන්නේ නැත්නම් එය ප්‍රජාතන්ත්‍රවාදීද? එය මානව අයිතිවාසිකම් සුරැකීමක්ද? කාගේ හෝ ගෙයක් දොරක් කුඩු පට්ටම් කිරීම, අත පය කැපීම, ජීවිත හානි කිරීම ප්‍රජාතන්ත්‍රවාදී මානව අයිතියක්ද? ගරු කථානායකතුමනි, එය එසේ නොවන බව රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ හෘදය සාක්ෂියත් කියාවි. එවැනි දෙයක් ඇති වෙන්න ඉඩ තියන්න එපා, අගමැතිතුමනි. ජය හා පරාජය තුළින් අද ඔබට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මුළු ජීවිත කාලයම ගත කළ ජනාධිපති කෙනෙකු ඉන්නවා. අපේ පක්ෂයෙන් එතුමා තරග කරන කාලයේ එතුමාට ගහලා, ඔළුව පළලා, අතක් පයක් නැති මිනිහෙක් කළා නම් අද එතුමා ජනාධිපති වෙයිද? පොඩ්ඩක් ඒ ගැන හිතන්න. යම් කෙනෙකුට පක්ෂයක් අත් හැර තව පක්ෂයකට යන්න පුළුවන්; ඒ පක්ෂය අත් හැර මේ පක්ෂයට එන්න පුළුවන්. ඒ අවස්ථාවේ තිබෙන කරුණු මත ඡන්ද දායකයෝ තමන්ගේ ඡන්දය දෙන්නේ කාටද කියා තීරණය කරන්න පුළුවන්.

මිනිස් අයිතිවාසිකම්වල ප්‍රජාතන්ත්‍රවාදයේ උත්තරීතර අයිතියක් වන ඡන්දය පාවිච්චි කිරීම පිළිබඳව කළ කටයුතුවලට ඔවුන් වරදකරුවන් ද? ඒ අයිතියට එරෙහිව කටයුතු කිරීමයි ඒකාධිපතිවාදය කියන්නේ. ප්‍රජාතන්ත්‍රවාදීව ඡන්දය පාවිච්චි කරන්න ඉඩ නොදුන් දේශපාලන ඉතිහාසය; ප්‍රජාතන්ත්‍රවාදීව ඡන්දය පාවිච්චි කරන්න ආව මිනිසුන්ට, ප්‍රජාතන්ත්‍රවාදීව ඡන්දය පාවිච්චි කළ මිනිසුන්ට වෙඩි තියලා පොළොවට දැමූ දේශපාලන ඉතිහාසය; ඡන්දය පාවිච්චි කරන්න එපා කිව්ව දේශපාලන ඉතිහාසය අපි බොහෝම අමාරුවෙන් ගත කරලා 80 දශකයේදී එය හමාර කළා. ලංකා දේශපාලනයට අපි මැරිලා ඉපදිලා නැහැ. හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ අතින්, එතුමාගේ ආණ්ඩුව අතින් වැරදි වෙන්න ඇති. මම මොහොතකටවත් කියන්නේ නැහැ වැරදි වුණේ නැහැ කියලා. වැරදි වෙන්න ඇති. ඔබතුමන්ලාගේ ආණ්ඩුවලිනුත් වැරදි සිද්ධ වුණු බව ඔබතුමන්ලා දන්නවා. නමුත් මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුවේ කාලසීමාව තුළ මේ රටේ ආර්ථිකය සියයට 7ක වර්ධන වේගයකට ගෙනැල්ලා ඔබතුමන්ලාට බාර දීම ගැන අපි ආඩම්බර වනවා. මේ අපි ලබා ගත් ඒකීය රාජ්‍යයයි, අපි ලබා ගත් ප්‍රජාතන්ත්‍රවාදී සමයයි ආරක්ෂා කිරීම දැන් ඔබතුමන්ලාගේ යුතුකම වනවා. මගේ මිත්‍ර ආර්. සම්පන්දන් මැතිතුමාට අපි මතක් කරන්න ඕනෑ, අවුරුදු 30කට පස්සේ උතුරු හා නැඟෙනහිර ජනතාවට ප්‍රජාතන්ත්‍රවාදී ඡන්ද ක්‍රමය දායාද කළේ අපේ ආණ්ඩුව බව. ඡන්දයක් ජීවිතේටම දැක්කේ නැති, ඡන්දය පාවිච්චි කරන්න බැරිව සිටි අයට එම අයිතිය දායාද කළා. එහි ජය පරාජය ප්‍රශ්නයක් නොවෙයි. අපි මුළු රටටම ප්‍රජාතන්ත්‍රවාදී ඡන්දය දායාද කළා. මෙවැනි කරුණු මත තමයි අගමැතිතුමා සඳහන් කළ අදහස් තුළින් අලුත් උත්සාහයකට ගමන් කරන්නට සිද්ධ වී තිබෙන්නේ.

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

එම නිසා මෙවැනි කරුණු ගැන කල්පනා කර කටයුතු කිරීම වඩා හොඳයි. අතීතයට හැරිලා අපි පාර්ලිමේන්තුවේ අතීත කාලය ගැන කථා කර ඇන කොටා ගන්නවාට වඩා හොඳයි ගරු අග්‍රාමාත්‍යතුමනි, අනාගතය වඩා සුභදායී අනාගතයක් කර ගැනීමේ ඔබතුමාගේ ප්‍රාර්ථනාව සාර්ථක කර ගැනීමට පුළුවන් නම් ඒ සඳහා උත්සාහ දැරීම. මොකද, තවමත් මේ ආණ්ඩුවේ වැඩි දෙනා ඉන්නේ ඔබතුමාගේ පක්ෂයේ නොවෙයි. ඒක නිසායි මම කිව්වේ මේ දේශපාලන කසාදය පුදුම කසාදයක් කියලා. Mr. Speaker, it will go into Erskine May as a new chapter on Parliamentary Affairs. I turned the pages of Erskine May to see whether there had been such a situation before. No, there had not been one before. So, Hon. Prime Minister, it is a big responsibility for you to overcome the uphill task of keeping this type of political marriage going, which had never taken place before. I do not want to comment on it more than that.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
A political liaison.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මා වැඩිදුර කථා කරන්න උත්සාහ දරන්නේ නැහැ. මා ඉතාම ඕනෑකමින් තව කාරණාවක් කියන්න කැමැතියි. අපේ රටේ ජනතාවට, රටට, ලෝකයාට ප්‍රකාශ කළ කරුණු ගණනාවක් දින 100 වැඩසටහන තුළ තිබෙනවා. අග්‍රාමාත්‍යතුමනි, ඔබතුමා ඉදිරිපත් කළ කථාවට සම්බන්ධ විවාදයකට නැඟිට්ට නිසා මා ඔබතුමාට කියනවා, කලාපයට අත්හදා බැලීම් කිරීමේ කාල පරිච්ඡේදයක ආරම්භයකට අපි දැන් පිවිසෙනවාය කියලා.

පාර්ලිමේන්තුව පිළිබඳව සහ ඒ පාර්ලිමේන්තුව ඉදිරියට ගමන් කිරීම පිළිබඳව කරුණු කිහිපයක් සඳහන් කළා. විධායක ජනාධිපති ක්‍රමයේ වෙනස්කම්, ආණ්ඩු ක්‍රමයේ විවිධ පාලන ආයතනවල වෙනස්කම්, ඒ වාගේම ජනතාව වෙත ලබා දුන්නු යම් යම් පොරොන්දු ඉෂ්ට කිරීම පිළිබඳව කරුණු ඉදිරිපත් කළා. නමුත් ඔබතුමා සඳහන් කළේ නැහැ, මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම ගැන. ඔබතුමා සමඟ අපි එකඟතාවකට පැමිණියත්, ඔබතුමන්ලාගේ වේදිකාවේ ප්‍රධානතම ජය හඬ වූයේ මැතිවරණ ක්‍රමය වෙනස් කිරීමයි. ඒ බව දින 100 වැඩසටහන තුළ සඳහන් කළා. නමුත් දැන් ඒ සම්බන්ධයෙන් සඳහන් කළේ නැහැ. ඉතින් මෙවැනි දේවල් හළා දැමීම නිසා දින 100 තුළ තව කරුණු කීයක් හළා දැමීමට බලාපොරොත්තු වනවාද කියන ප්‍රශ්නය මා අද දවසේ මතු කරනවා විනා ඒ ගැන විවේචනය කරන්න උත්සාහ දරන්නේ නැහැ. අපට තේරෙනවා, ආණ්ඩුවේ ස්වභාවය, ආණ්ඩුවේ සංයුතිය, ආණ්ඩුවේ හැසිරීම සහ ආණ්ඩුව මුහුණ දෙන ගැටලු පිළිබඳව.

අවසාන වශයෙන් ප්‍රධාන කාරණාවක් මා මතක් කරන්න ඕනෑ. සත්‍ය තොරතුරු වග කීමෙන් වාර්තා කිරීමට කටයුතු කිරීම මා හිතන හැටියට ඉතාම වැදගත්. ඒ සම්බන්ධව එක කාරණාවක් මා කියන්නම්. ඒ තමයි, ඊයේ-පෙරේදා සත්‍ය තොරතුරු වෙනුවට මඩ තොරතුරු ප්‍රචාරය කිරීමට යාමෙන් රටත්, ඔබතුමාත්, එය ප්‍රචාරය කරපු ආයතනත් විහිළුවට පත් වීම. ඒ කාරණය තමයි, අපේ රටේ ගාලු වරායට ආයුධ රැගත් නෞකාවක් පැමිණෙනවා කියා අසත්‍ය කාරණාවන් ප්‍රචාරය කරමින් ව්‍යාජ බියක් ඇති කිරීම.

I would like to quote, if you would give me a few minutes, Hon. Speaker, the online issue of "theguardian" of 10th January, 2013:

> "Private security companies guarding ships against Somali pirates are increasingly storing their weapons on so-called "floating armouries" in international waters, to avoid arms smuggling laws when they dock in ports.
>
> About 20 ships stocked with assault rifles and other small arms as well as ammunition, body armour…"

Then, it goes on to state:

> "…..the Security Association for the Maritime Industry, said that "some armouries are effective and some are not"….
>
> The presence of armed guards on board ships has helped dramatically reduce hijacks by Somali pirates, ….
>
> Before floating armouries were introduced, security companies either went through the costly and complicated process of using a handful of officially approved onshore armouries or got round the problem altogether by buying guns illegally in Yemen and dumping them at sea when going in to dock at a port.
>
> By using armouries private security companies are able to avoid the bureaucracy of local ports, save on port costs and not waste time deviating to ports to collect guards.
>
> Avant Garde Maritime Services (AGMS), a Sri Lankan company that works in partnership with the country's government, is one of the major operators of floating armouries. The company's chairman, Nissanka Senadhipathi, said there were "thousands of weapons" on his company's ships. AGMS charges US$25 a day to store the weapons and ammunition, with 800 to 1,000 movements on and off the armouries each month."

I further quote:

> "Sri Lanka has established itself as a leader on the armouries, which are partly run by the country's navy and have been approved by Security Association for the Maritime Industry."

It is an international association. I again quote:

> " 'The armouries run by Djibouti and Sri Lanka are very professional…'."

This has been recognized by the United Nations agencies too. But, what did you do? You slung mud without knowing the facts. You rushed and accused a company which is doing an operation not only for Sri Lanka, but for the entire Indian Ocean with the concurrence of the United Nations and international associations. Today, you have degraded our country. For what? I ask the Hon. Prime Minister.

මම මීට වඩා ඒ කාරණය ගැන කියන්න යන්නේ නැහැ. මේ වාගේ මඩ ගැසීම සඳහා ජනමාධ්‍ය පාවිච්චි කිරීම වළක්වන්න කියලා මම ඉල්ලා සිටිනවා. පාර්ලිමේන්තුවේදී අහන ප්‍රශ්නවලට උත්තර දෙන්න ඇමතිතුමන්ලාට එන්න කියනවා වාගේම, ඇමතිතුමන්ලාට කියන්න වගකීමක් නැති කථා ජනමාධ්‍යයට ප්‍රකාශ කරන්න එපා කියලා.

ගරු කථානායකතුමනි, ඊළඟ කාරණාවත් මම ඒ සමඟම කියන්න කැමැතියි. ඊළඟ කාරණාව මොකක්ද? බලන්න අද දින - 2015.01.20- "ද අයිලන්ඩ්" පුවත් පත. I would like to quote from its front page. It states:

"GR: 'Bank account allegation an attempt to discredit me' "

Who did this? Your Minister of Finance. මේ මඩ පහර ගහන්න ද ජනමාධ්‍ය පාවිච්චි කරන්නේ? ඒකටද ජන බලය ලැබුණේ? ඒකටද ජන වරම ලැබුණේ? මේවා ඔබගේ ආණ්ඩුවට පාරාවළල්ලක් බවට දවසින් පත් වී තිබෙනවා. එක දවසක් ඇතුළතදී මෙය අසත්‍යයක් බවත්, මෙය ප්‍රෝඩාවක් බවත්, මෙය රට සහ ලෝකය නොමඟ යැවීමේ ප්‍රකාශයක් බවත් පිළිගැනුණා. ආරක්ෂක ලේකම්, බී.එම්.යූ.ඩී. බස්නායක මහතා විසින්ම ඊයේ ප්‍රවෘත්ති ප්‍රකාශයකින් ඒක නිවැරදි කළා. ලජ්ජයි! ලජ්ජයි!!

අගමැතිතුමනි, ඔබ මෙහෙම දෙයක් කරන්නේ නැහැ. මම හිතන්නේ නැහැ ඔබ එහෙම දෙයක් කරයි කියලා. නමුත් ඔබේ ආණ්ඩුවේ ඒක කරපු කෙනාට ඔබ කියපු වචනවලින් දඬුවමක් තිබෙනවා නම් එම දඬුවම මොකක්ද කියා හෙට උදේ පාන්දර රටට කියන්න.

එහෙම දඬුවම් නැත්නම්, Good Governance is a joke; that I have to tell you. I know His Excellency President Maithripala Sirisena. We have been associating for over 30 years; we respect him. He is a man from the village; a son of the peasantry. If he does not take these matters seriously - what is happening around him - it will be too late and too sad for the President and the Prime Minister.

මම කියවන්න කැමැතියි, a letter written by Gotabaya Rajapaksa to His Excellency President Maithripala Sirisena regarding his bank account maintained at the Bank of Ceylon.
It states, I quote:

"It has been reported that I maintain a personal account with a balance of approximately Rs. 8 billion at the Taprobane Branch of the Bank of Ceylon. This is grossly misleading and appears to discredit my reputation.

As far as I know, an account of the Ministry of Defence is maintained at the said bank, which is used to finance the construction of the Defence Headquarters Complex at Akuregoda. This account was created with the approval of the Cabinet, from the revenue received from the disposal of land at Galle Face where the Army Headquarters was located.

Withdrawals were made from this account based on the progress of the construction work at the Defence Headquarters Complex for work undertaken by various contractors and suppliers. The account is operated by the Chief Accountant and other authorized signatories of the Ministry of Defence,…"

It is not a private account.

"…….under the supervision of a committee of which I was the chairman in my official capacity"

- as the Secretary of Defence. Now, obviously, Mr. B.M.U.D. Basnayake holds this position. It further states, I quote:

"All cheques from this account are issued with two signatures upon the receipt of certified payment vouchers."

And, he goes on to state, I quote:

"The names and signatures of the authorized persons are available with the Bank and the Chief Accountant of the Ministry. The balance as at the last day of my holding office was certainly over Rs. 8 billion. The figures can be verified from the Treasury as the annual deposit balance is reported in Government accounts."

It comes before Parliament. There is nothing to hide. Why are you throwing mud at Gotabaya Rajapaksa, who was the strength behind defeating terrorism in our country? If he has done wrong, go ahead; but if he has done not done wrong, apologize. Have the decency of a gentleman to apologize. You and I were in the same class in Royal College. Others who went to Royal College also should be able to behave as Royalists and say, "I am sorry for the mistake done by making a wrong statement". People who now hold office cannot throw mud at every corner without any substance or verification. As an Hon. Minister, you must verify before making a statement. You are not on the pavement of a country to make a statement; you are holding a high office to make a statement.

Finally, it states, I quote:

"Therefore, there is no truth whatsoever in the claim that I have a personal account in the Bank of Ceylon with a balance of approximately Rs. 8 billion. I deny this completely and request the current Secretary to the Ministry of Defence to verify this matter with the Bank and the Treasury and to disclose the correct information regarding this account."

This letter has been signed by Gotabaya Rajapaksa and it has been copied to you, Hon. Prime Minister, to the State Minister for Defence, the Hon. D.R. Wijayawardhana, and the Secretary, Ministry of Defence, Mr. B.M.U.D. Basnayake.

I am sorry that I had to bring this up today in this House, because it is an important day for you. But, it is also important that you are not misled; and also that you do not suppress the media in this manner and throw mud at people when they are not in office. There maybe wrongs done by people and they could be brought before the law. No one is going to say, "No". None of us are going to say, "No" if there are some matters that should be brought before the law, but allow the media to report freely.

අගමැතිතුමනි, මා ඔබතුමාට සුබ පතන අතර, මෙයයි ඔබගෙන් ඉල්ලන ඉල්ලීම. අපි මේ විලම්බිත දේශපාලන හැඩ රුවකට -

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
වෛරී දේශපාලනයක.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
වෛරය අපි පිළිගන්නේ නැහැ. නමුත් විලම්බිත දේශපාලනයකට ඇවිත් තිබෙනවා. මම ඒක ගැඹුරින් කියන්නේ. මගේ මිත්‍ර අමුණුගම මන්ත්‍රීතුමාට එය නොතේරෙනවා ඇති. මේ පාර්ලිමේන්තුව හදිසියේ විලම්බිත දේශපාලනයකට පිවිස තිබෙනවා. කොහේද ඉන්නේ, කොතැනද ඉඳ ගන්න ඕනෑ, කොතැනදීද නැඟිටින්න ඕනෑ කියලා දන්නේ නැති තත්ත්වයකට පාර්ලිමේන්තුව පත් වුණා, ගරු කථානායකතුමනි. ඒකට වගකියන්න ඔබතුමාට බැහැ. වග කිව යුත්තන් ඒකට වග කිව යුතුයි. රටට අවශ්‍ය යහ පාලනය නම්, යහ පාලනයයි ගෙන යන්න ඕනෑ. යහ පාලනය - Good Governance - කියන්නේ මොකක්ද? කැලෑවේ වඳුරෝ ගසින් ගසට පනින්නා සේ මේ යන ක්‍රියාවලියේ "යහ පාලනයක් තිබේද?" යැයි කුඩා දරුවෙකු ඇසුවොතින්, "නැත" යනුවෙනුයි කියන්න තිබෙන්නේ. යහ පාලනය නම් ඊට වඩා උසස් දෙයක් බව කියන්න පුළුවන් අග්‍රාමාත්‍යවරයෙක් ඔබ. තුන්වන වරටත් අගමැති ධුරයට පත්වීම ගැන ඔබතුමාට මම යළිත් සුබ පතනවා. ඔය අනෙක් අයව ටිකක් control කරන්න. නැත්නම් ලොකු අමාරුවක වැටෙනවා.

ගරු අගමැතිතුමනි, ඔබතුමා ලිච්ඡවි රජදරු සම්ප්‍රදාය ගැන කියපු නිසා මම ධම්ම පදයේ ගාථා දෙකක් උපුටා දක්වලා මගේ කථාව අවසන් කරනවා. එහි මෙසේ සඳහන් වනවා:

"අසාරෙ සාරමතිනො - සාරෙ වාසාරදස්සිනො ....."

අසත්‍ය සත්‍ය ලෙස දැකීමත්, සත්‍ය අසත්‍ය ලෙස දැකීමත් තුළින් රටත් ජනතාවත් නොමඟ යාවී.

"සාරං ච සාරතො ඤත්වා - අසාරං ච අසාරතො ..."

සත්‍ය සත්‍ය ලෙස දැකීමත්, අසත්‍ය අසත්‍ය ලෙස දැකීමත් තුළින් රටත් ජනතාවත් ඉදිරියට ගමන් කරවන්න. ස්තුතියි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ස්තුතියි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු කථානායකතුමනි, මට කාරණයක් පැහැදිලි කරන්න අවශ්‍යයි. අලුත් ඡන්ද ක්‍රමය ගැන අපි කමිටුවක් පත් කරන්න ඉන්නේ. පක්ෂ නායකයින් මුණ ගැසුණාට පසුව අපි ඒ ගැන ගරු සභාවට දැනුම් දෙන්නම්. ඒක අමතක කරලා නැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාට මම විශේෂයෙන්ම කියන්න කැමැතියි, මේ අවස්ථාවේදී අපි බලාපොරොත්තු වුණේ නැහැ ඒ කාරණා ටික ඔබතුමා ඉදිරිපත් කරයි කියලා. 29වැනිදා ගරු රවි කරුණානායක ඇමතිතුමාගේ ප්‍රකාශයෙන් පසුව 30වැනිදා හෝ ඊළඟ සතියේ 5, 6 දින අපට ඒ ගැන සාකච්ඡා කරන්න වෙන් කරන්න පුළුවන්. අපි හොඳ විවාදයක් කරමු. ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාගේ කථාවටත් අපි ඇහුම් කන් දුන්නා. දැන් ඔබතුමාත් කරුණු ඉදිරිපත් කළා. ඒ කාරණා සියල්ලම අපට එදාට කථා කරන්න පුළුවන්. අනෙක මඩ ගහන එක මම නම් අනුමත කරන්නේ නැහැ. මට තරම් මඩ වැදුණ කෙනෙක් තවත් නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි.

මීළඟට ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි.

[අ.භා. 2.36]

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ගරු කථානායකතුමනි, අද මේ සභාව රැස් වන මොහොතේදී මා අදහස් කිහිපයක් ජාතික හෙළ උරුමය හැටියට මේ සභාව හමුවේ තැබීමට බලාපොරොත්තු වෙනවා. මේ ආ ගමන් මඟ පිළිබඳව යම් විවරණයක් කිරීම සුදුසුයි කියලා මා මුලින්ම කල්පනා කරනවා. සන්ධානයේ කොටස්කරුවන් හැටියට අපි සෑහෙන උත්සාහයක් කළා, ප්‍රජාතන්ත්‍රවාදීව සාකච්ඡාවක් පවත්වන්නට. ජාතික නිදහස් පෙරමුණත්, අපිත් සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාගෙන් ඉල්ලා සිටියා, සන්ධානයක් හැටියට සහෝදර පක්ෂ සමඟ සාකච්ඡා කරලා, කළ යුතු ගුණාත්මක ප්‍රජාතන්ත්‍රවාදී වෙනස්කම් පිළිබඳව සාධනීය සාකච්ඡාවක් පවත්වන්න කියලා. එහෙම කිසිදු සාකච්ඡාවක් පවත්වන්න සන්ධානයේ නායකයෝ ක්‍රියා නොකිරීම ගැන මම අතිශයින්ම කනගාටුවට පත් වෙනවා.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයා හැටියට, රටේ නායකයා හැටියට, ජනාධිපතිතුමාගෙන් අපි සාකච්ඡා ගණනාවක් ඉල්ලුවා. ඒ කිසිම සාකච්ඡාවක් විනයක් ඇතුව, ඇහුම්කන් දීමක් ඇතුව කරන්න, හික්මීමක් එතුමාට නොතිබීම ගැන අපි කනගාටු වෙනවා. අද මේ කථා කරන සියලු දෙනාම දන්නවා, මා ඇතුළුව අද ආණ්ඩුව පැත්තේත් ඒ වාගේම විපක්ෂයේත් සිටින බොහෝ මන්ත්‍රීවරු අතිශය අසහනයකින් කථා කළ බව. ඒ වාගේම සමසමාජ, කොමියුනිස්ට් පක්ෂ ඇතුළු සියලුම දේශපාලන පක්ෂ සමඟ අපි සාකච්ඡා කළා. ඒ හැම දෙනාම එකඟ වුණ පොදු දේ තමයි, "ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුළේ ප්‍රජාතන්ත්‍රවාදයක් නැහැ, තනි ඒකාධිපතිත්වයක් තිබෙන්නේ" කියලා. ඒක, ඒ සියලු දෙනාම පිළිගත්තා. ඒ පිළිගැනීම වෙනුවෙන් අපි ප්‍රජාතන්ත්‍රවාදී වැඩ පිළිවෙළක් හැටියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඉදිරිපත් කළා.

බහු ජන නිදහස් පෙරමුණ ඇරෙන්න ටිළින්ඒ එක ඇතුළු ලංකාවේ තිබෙන සියලුම දේශපාලන පක්ෂ අපට සාකච්ඡාවක් ලබා දුන්නා. එක්සත් ජාතික පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු සියලුම දේශපාලන පක්ෂ සමඟ අපි සාකච්ඡා කළා. සාකච්ඡා කරලා අපි මේ මැතිවරණය තියන්න කලින් පක්ෂ අතර ජාතික සම්මුතියක් හදන්න උත්සාහ කළා. භික්ෂූන් වහන්සේ කෙනෙකු හැටියටත්, විශේෂයෙන්ම පාර්ලිමේන්තුවේ මහජන නියෝජිතයෙකු හැටියටත් ඒ කාර්ය භාරය ඉටු කරන්න, ඒ සාකච්ඡාවන් සඳහා මඟ පාදන්න පුළුවන් වීම ගැන මා අතිශයින්ම සන්තෝෂයට පත් වෙනවා.

අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට කරුණු 15කින් යුක්ත යෝජනාවක් දුන්නා. ඒ කරුණු 15හි තිබුණු යෝජනාවන්ගෙන් කිහිපයක් කපලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඩලස් අලහප්පෙරුම මැතිතුමා අපට භාර දුන්නා. විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිසංස්කරණ යෝජනා පිළිබඳව ලියවිල්ලක් සකස් කරලා මහලේකම්ගේ අත්සනින් යුතුව එතුමා, අපට නැවත ඒක

භාර දුන්නා. ඒවා සාධනීය යෝජනා හැටියට ඒ හැම දෙනාම පිළිගත්තා. අපි ඉල්ලුවේ එක ඉල්ලීමයි. බැසිල් රාජපක්ෂ මැතිතුමා, එදා ඇමතිතුමා හැටියටයි හිටියේ. එතුමා මේ සභාවේ නැහැ. එතුමා සමඟ සාකච්ඡා දෙකක් පැවැත්වූවා. මොකද, මම දැනගෙන හිටියා, අලංකරණය සඳහා සිටියේ මහින්ද රාජපක්ෂ මහත්මයා වුණාට මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය ඇතුළු මුළු ආර්ථිකය පිළිබඳව, දේශපාලනය පිළිබඳව, පක්ෂ යාන්ත්‍රණය පිළිබඳව, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිළිබඳව තීරණ ගන්නා අනුත්තර නායකයා බැසිල් රාජපක්ෂ මහත්මයා බව. ඒ සඳහා, පක්ෂයේ ලේකම්වරයාවත්, වෙනත් කෙනෙකුවත් නොවෙයි සිටියේ. ජාතික සංවිධායකට බලයක් නැහැ, බැසිල් රාජපක්ෂ මහත්මයා තමයි පක්ෂයේ නායකයා. ඒ නිසා එතුමා සමඟ සාකච්ඡා කරලා, එතුමාට කිව්වා "ඔබතුමාට මේ සම්බන්ධයෙන් ඇහුම් කන් දීමක් කරන්න පුළුවන්" කියලා. මට හිතුණු හැටියට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් අපේ සාකච්ඡාවට ඉතාම සාර්ථක විධියට සහභාගි වුණු නායකයා බැසිල් රාජපක්ෂ මහත්මයායි. එතුමා අපි කියපු දේට ඉතා හොඳින් ඇහුම් කන් දුන්නා; ඉතා හොඳින් පිළිගත්තා. ඒක කළ යුතුයි කියලා කිව්වා. ඉන් පසුව අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා, -අපේ වර්තමාන ජනාධිපතිතුමා- ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම්වරයා වශයෙන් සිටින විට, -13වන දා පමණ- මම බැසිල් රාජපක්ෂ මහත්මයා සමඟ සාකච්ඡා කළා. අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා, -ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම්වරයා- පක්ෂයෙන් ඇවිල්ලා පොදු අපේක්ෂකයා විධියට එන්න කලින් දිනයේ උදේ බැසිල් රාජපක්ෂ මහත්මයාට කෝල් එකක් දාලා ඇහුවා, "අපි ඉදිරිපත් කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරන්න නොවෙයි අඩු ගණනේ ඔබතුමාට ඒක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නවත් බැරිද" කියලා. සම්මත කරන්න අවශ්‍ය නැහැ කියලා කිව්වා. අද, බැසිල් රාජපක්ෂ මැතිතුමා මේ සභාවේ නැහැ. සම්මත කරන්නට බැරි නම් අඩුම ගණනේ ඒක පාර්ලිමේන්තුවටවත් ඉදිරිපත් කරන්න කියලා ඉල්ලා සිටියා. ඒක කරන්න අමාරුයි කියලා කිව්වා. එදා රාත්‍රියේදී තමයි මම කථා කරලා කිව්වේ. ඊට පසු දින තමයි අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා එළියට ඇවිල්ලා පොදු අපේක්ෂකයා වෙන්න නියමිතව තිබුණේ. මම කිව්වා, "අපි දිනනවා, පොදු අපේක්ෂකයා නිර්මාණය කරනවා" කියලා. එදා රාත්‍රියේ මම කෙළින්ම ඒ කථාව කිව්වා. එහෙම කියලා ඉන් පසුව අපි මැතිවරණයට ඉදිරිපත් වුණා.

මේ මැතිවරණය තුළ අපි සෑහෙන්න උත්සාහ කළා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමඟ ඉතාම සුහද සාකච්ඡාවක් කරලා, මේ ගනුදෙනුව බෙරලා රට තුළ ප්‍රජාතන්ත්‍රවාදී වට පිටාවක් ඇති කරන්නට.

අද විවිධ දේවල් ගැන කථා කරනවා. මහජන එක්සත් පෙරමුණ ඇතුළු පසු ගිය ආණ්ඩුව තුළ සිටිය සියලුම දේශපාලන පක්ෂ එකඟ වෙයි කියලා මම හිතනවා දූෂණ, වංචා පිළිබඳව විමර්ශනයක් කිරීමට. මේ සංවර්ධනය තුළින් කළ දූෂණ, වංචා සම්බන්ධයෙන් විමර්ශනයක් කළ යුතුයි කියන කාරණයට මේ කිසි කෙනෙකු විරුද්ධ නැහැයි කියලා මම විශ්වාස කරනවා. මතක තියා ගන්න, ඒ විමර්ශනය නතර කරන්නට රතන හාමුදුරුවන්ටවත්, අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මහත්මයාටවත්, පත් වුණු එක්සත් ජාතික පක්ෂයේ බහුතරය සහිත කැබිනට් එකටවත් බැහැ කියන කාරණය අපි කියන්නට කැමැතියි. මොකද, අද වන විට මහජනයා 30,000කට වැඩිය පැමිණිලි එවලා තිබෙන බව මම කියන්නට කැමැතියි. අද රාජ්‍ය ආයතනවල නිලධාරීන් එළියට ඇවිල්ලා තිබෙනවා; නිර්භයව කථා කරන්නට පටන් ගෙන තිබෙනවා. මතක තියාගන්න, ඒවා මහ ජනයා අතර සාකච්ඡා කිරීම කළ යුතුයි. අද ආණ්ඩු පක්ෂයේ ඉන්න සමහර අයත් හිතාගෙන ඉන්නවා, මේ ගනුදෙනු වහලා ෂේප් එකේ යන්න. එහෙම ෂේප් එකේ යන්න බැහැ. රාජ්‍ය දේපොළ පාවිච්චි කරපු ආකාරය පිළිබඳව රට බලා ගෙන සිටිනවා. අපි ජනතාවට පොරොන්දුවක් දීලා තිබෙනවා. ඒ නිසා මතක තියා ගන්න, ඒ වංචා දූෂණ පිළිබඳව අපි අවධියෙන් සිටින බව. ඒ සෑම දෙයක් පිළිබඳව විමර්ශනයක් කරන්න ඕනෑ. එය කළ යුත්තේ ඒ අයට දඬුවම් දීමේ අභිලාෂයෙන් නොවෙයි. එය කළ යුත්තේ මේ ඉන්න පාලකයින්ටත් පාඩමක් ඉගැන්වීමේ අභිලාෂයෙනුයි. මින් මතුවට හොරකමක් කරන්න කලින් දස වරක් හිතන්නය කියන පාඩම පාලන බලයේ ඉන්න අයටත් ඉගැන්විය යුතුයි. මොකද, පාලන බලයේ ඉන්න අය සුදනන් කියා මා විශ්වාස කරන්නේ නැති නිසා.

ඡන්ද කාලය තුළ සිදු වූ දේවල් සම්බන්ධයෙන් අපේ සිත් තුවාල වෙලා තිබෙනවා. ඒවා සනීප වෙන්න තව සතියක් දෙකක් ගත වේවි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ ආණ්ඩු පක්ෂය අතර සහෝදරත්වය, බැඳීම ගොඩ නඟන්න පුළුවන් වේවි කියා මා විශ්වාස කරනවා. මේ ඡන්ද ක්‍රියාව තුළ සමහර අය සිතනවා, මේක සාධාරණ ඡන්දයක් කියා. මතක තියා ගන්න, ලංකා දේශපාලන ඉතිහාසයේ රාජ්‍ය බලය මෙතරම් කැතට යොදවපු කිසිම මැතිවරණයක් තිබුණේ නැති බව. මේ මැතිවරණය සාධාරණයි කියන ඕනෑම කෙනකුට මා කියනවා, ඒක සාධාරණ මැතිවරණයක් නොවෙයි කියා. බිලියන 400කට කිට්ටු රාජ්‍ය දේපොළ මේ මැතිවරණය සඳහා පාවිච්චි කර තිබෙනවා. අද ඒවා ගැන සොයා ගෙන යනවා. රාජ්‍ය ධනය පාවිච්චි කරලා තිබෙනවා; හමුදාව පාවිච්චි කරලා තිබෙනවා. මේවා එකක්වත් අසත්‍ය නොවෙයි. මේවා පිළිබඳව විධිමත් විමර්ශනයක් කරනවා. පරිපාලන සේවයේ සිටින රාජ්‍ය නිලධාරීන් ගෙන ගිහිල්ලා රජයේ නාලිකාවල දේශන පවත්වා තිබෙනවා. ලංකා දේශපාලන ඉතිහාසයේ කවදාවත් මේක සිද්ධ වුණේ නැහැ. සිදු වෙලා තිබෙනවා නම් අපි ඒවා ගැන ආපසු සාකච්ඡා කරමු.

මේ තරම් පහත් විධියට රජයේ මාධ්‍ය පාවිච්චි කරපු කිසිම මැතිවරණයක් තිබුණේ නැහැ. ජාවාරම්කාරයින්ගේ කෝටි ගණන් සල්ලි, ඒ වාගේම රාජ්‍ය ධනය අත්තනෝමතිකව යොදවා මේ ජන මතය යටපත් කරන්න උත්සාහ කළා. නමුත් අපි කියන්න කැමැතියි, එක්සත් ජාතික පක්ෂය, ජාතික හෙළ උරුමය, TNA එක, මුස්ලිම් කොංග්‍රසය කියන පක්ෂ සීමාව ඉක්මවා ජනතාව ඉදිරියට ආ බව. අපට මුල් සතියේ ලොකු භයක් තිබුණා. එක්සත් ජාතික පක්ෂයේ ක්‍රියාකාරිත්වය මදියි කියලා හිතුණා. මිනිසුන්ගේ ක්‍රියාකාරිත්වය මදියි කියලා හිතුණා. නමුත් ඡන්ද කාල සීමාවේ මැද වෙන කොට මේ ඡන්ද ව්‍යාපාරය මෙහෙයවූවේ කිසිදු මුදලක් බලාපොරොත්තු නැති බහුජන ව්‍යාපාර විසින් කියලා මා සන්තෝෂයෙන් කියන්නට ඕනෑ. ඒ නිසා මේ කාර්ය භාරයේදී දේශපාලන පක්ෂවලට ඉහළින් සියලු බහුජන සංවිධාන ඉටු කළ කාර්ය භාරයන් පිළිබඳව මා මේ අවස්ථාවේදී විශේෂ ඇගැයීමක් කරන්නට කැමැතියි. අද මේ කථා කරන මමත්, මෙයට මුහුණ දුන් සියලු දෙනාමත් පසු ගිය මැතිවරණයේදී සිදු වූ දේ ගැන ලජ්ජා වෙනවා. දැන් යුද්ධය ගැන කථා කරනවා. සරත් ෆොන්සේකා මහතා ඡන්දයෙන් පැරදුණාම එතුමාව හිරේ දාන එක හරියි කියලා කියන්න පුළුවන්ද? කාටද එහෙම කියන්න පුළුවන්. මතක තියා ගන්න, අපි සරත් ෆොන්සේකා මහතාගේ තනතුරු නැවත ලබා දීලා යුද වීරයෙක් හැටියට මේ රටේ ස්ථානගත කරනවා. ඒක මේ ආණ්ඩුවේ වග කීමක්. ඔහුට ජම්පර් අන්දවන්න කිසි කෙනෙකුට අයිතියක් නැහැ. මේ යුද්ධය ජයග්‍රහණය කළේ තනි පුද්ගලයෙක් නොවෙයි. ඒක මහින්ද රාජපක්ෂ මහත්මයාගේ පෞද්ගලික ජයග්‍රහණයක් නොවෙයි. යුද්ධය පිළිබඳව මතවාදයක් නැතුව තිබුණු කාලයේ; ශ්‍රී ලංකා නිදහස් පක්ෂයවත් රටේ ඒකීයභාවය පිළිබඳව ස්ථාවරයක නොසිටි කාලයේ තමයි අපි මේ පිළිබඳව ඉතා දුෂ්කර කාර්යයක් ඉෂ්ට කරලා රටේ ඒකීයභාවය පිළිබඳව ස්ථාවරත්වයක් ගොඩනැඟුවේ. ඒක අපි පැහැදිලිව කියන්නට ඕනෑ. යුද්ධය ජයග්‍රහණය කිරීම තනි පුද්ගලයෙකුගේ කාර්යයක් කියලා එය තනි පුද්ගලයෙකුට සින්න කරනවාට අපි විරුද්ධයි. ඒක සියලු දෙනාගේම සාමූහික ප්‍රයත්නයක්.

[ගරු (පූජ්‍ය) අතුරලියේ රතන මහතා]

මහින්ද රාජපක්ෂ මැතිතුමාට ඉතිහාසය තුළ හිමි වෙන්න ඕනෑ ගෞරවය පිළිබඳවත් අපි කියන්න කැමැතියි. අපි කිසිසේත් ඒ ගෞරවය නොදී ඉන්නේ නැහැ. එතුමා දේශපාලන නායකයෙක් හැටියට ත්‍රස්තවාදී සමය තුළ 2005 වර්ෂයේ පටන් ලබා දුන් දේශපාලන නායකත්වය පිළිබඳව අපේ ගරුත්වය සදාකාලිකව තිබෙනවා. ඒ වාගේම එතුමා ජාත්‍යන්තර අධිකරණයට ගෙන යන්නට හෝ එතුමා කළ කාර්යය පිළිබඳව විවේචනය කරන්නට යමෙක් ඉදිරිපත් වෙනවා නම් ඒක ඒ අය විසින්ම කර ගන්නා දිවි නසා ගැනීමක්. මොකද, ඉතිහාසයේ ඇති වූ ඒ ගරුත්වය අහිමි කරන්න කාටවත් බැහැ. ඒක සාමූහික වගකීමක්. ඒ නිසා එතුමාටත් ඒ ගරුත්වය ලබා දෙන්න අපි කැමැතියි.

ඊළඟට ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයක් පිළිබඳ යුගයකට අපි ඇවිල්ලා තිබෙනවා. මෙය ඒ සඳහා ඉතා හොඳම අවස්ථාව කියලායි අපි හිතන්නේ. අපි මේක මතක තියාගන්න ඕනෑ. එක්සත් ජාතික පක්ෂය හිතන්න හොඳ නැහැ තමන්ට බලය හම්බ වුණා කියලා. තවමත් බහුතර බලය තිබෙන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ පක්ෂවලටයි. ඒ නිසා ප්‍රජාතන්ත්‍රවාදීව සාකච්ඡා නොකොට රහසිගත සාකච්ඡාවලින් මේ ව්‍යවස්ථා සංශෝධනය ඉෂ්ට කරන්න බැහැ කියන එක අපි මතක තියාගන්න ඕනෑ. සිදු වූ සියලු තුවාල සුව කරගෙන මේ ක්‍රියාවලියේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, අනෙකුත් සියලු දේශපාලන පක්ෂත්, අපි සියලු දෙනාමත් පටු බලාපොරොත්තු ඉවත දාලා සාමූහික වග කීමෙන් එක තැනකට ඇවිල්ලා දේශපාලනිකව හිතන්න පුරුදු වෙන්න ඕනෑ. ඉස්සරහට අපි කල්පනා කළ යුත්තේ පෞද්ගලික මතිමතාන්තර ගැන නොවෙයි, ඒ වාගේම තමන්ගේ පෞද්ගලික වුවමනාවන් ගැන නොවෙයි. අපි සියලු දෙනාම එක්ව අපි කරන දේශපාලන ප්‍රතිසංස්කරණය රටට කොච්චර හිතකරද කියන එක පිළිබඳව අපේ සිත් තුළ සම්මුතියක් ඇති කර ගන්නට ඕනෑ.

මේ පාර්ලිමේන්තුවේ අද තිබෙන්නේ ජාතික ආණ්ඩුවක්. මේ රටේ ප්‍රධාන දේශපාලන පක්ෂයේ නායකත්වයට අද පත් වෙලා ඉන්නේ වර්තමාන ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමායි. අතිගරු ජනාධිපතිතුමන්ගේ මූලිකත්වයෙනුයි අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පවතින්නේ. අපි සන්තෝෂ වෙනවා එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වයට පත් වීම පිළිබඳව. ඒ වාගේම, එතුමාගේ නායකත්වය නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ ඒකමතිකභාවයක් ඇති වෙලා තිබෙනවා. කවුරු මොනවා කිව්වත් අපට පිළිගන්න සිද්ධ වෙනවා අද විධායක ජනාධිපතිතුමා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා බව. මෙහි තිබෙන ඉතා වැදගත් කාරණය මේකයි. එක්සත් ජාතික පක්ෂයේ කෙනෙකු විධායක ජනාධිපති ධුරය අහෝසි කරනවා කියලා ජනාධිපති වුණා නම් එම සංශෝධනය කිරීම පිළිබඳ සැක සංකා ඇති වෙන්න පුළුවන්. ඒ වාගේම, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කෙනෙකු එය කරනවා කියා එකඟ වුණා නම් ඒ පිළිබඳවත් සැක සංකා ඇති වෙන්න පුළුවන්. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විධායක ජනාධිපති වෙලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයා වුණත් එතුමාට වගකීමක් තිබෙනවා. ඒ වගකීම මොකක්ද? එතුමා බලයට පත් වුණේ එක්සත් ජාතික පක්ෂයේ බහුතරයෙන් නොවෙයි. බහුතරයක් නියෝජනය කරන එක්සත් ජාතික පක්ෂය ඒ ප්‍රජාතන්ත්‍රවාදි වටපිටාවට සම්පූර්ණයෙන් ඉඩ ලබා දුන්නා. ඒ නිසා තමයි මේ ස්වර්ණමය අවස්ථාව අපට උදා වුණේ. හැබැයි අප මතක තියාගන්න ඕනෑ එයින් ඔබ්බට ගිය ජනතා බලවේගවල ක්‍රියාකාරිත්වයත් තිබුණු නිසා තමයි ඒ ජයග්‍රහණය ලබන්න අපට පුළුවන් වුණේ කියන එක. එක්සත් ජාතික පක්ෂය එය පිළිගන්නවාය කියා මම හිතනවා.

ජාතික ආණ්ඩුවක් ලෙස ක්‍රියා කිරීම පිළිබඳව අද්දැකීමක් අපට නැහැ. අපට තිබෙන්නේ දින 90ක කාර්ය භාරයක්. අප එකඟ නම් මේ දින 90 කාර්ය භාරය දින 30කින් අවසන් කරන්නත් අපට පුළුවන්. මෙහිදී අත්‍යවශ්‍යම වන්නේ, ඉතාම වැදගත් වන්නේ ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ කාරණයයි. ඒ ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ අපගේ එකඟතාව තිබේ නම් මාස තුනක් නොව මාසයක් ඇතුළත වුවත් එය කරන්න අපට පුළුවන්. ඉක්මන් පාර්ලිමේන්තු වාර ගණනාවක් රැස් වන්න අපට පුළුවන්. සම්ප්‍රදායික අච්චුවෙන් ආණ්ඩු පක්ෂය හා විපක්ෂය බෙදී තිබුණු මායිම් අද නැති වෙලා තිබෙනවා. අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, එක්සත් ජාතික පක්ෂයත් එක දෙයකට එකඟ වෙලා තිබෙනවා. ඒ එකම එක කරුණ තමයි ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව ජාතික සම්මුතියක් ඇති කර ගන්න එක. ඒ නිසා අපි විශ්වාස කරනවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අභ්‍යන්තර සාකච්ඡාවක් කරලා, එක්සත් ජාතික පක්ෂය අභ්‍යන්තර සාකච්ඡාවක් කරලා මේ ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ හොඳම හොඳ එකඟතාව බිහි කර ගනීවි කියලා. ඒ එකඟතාව බිහි කර ගන්න ඒ ප්‍රධාන පක්ෂ දෙකට හැකි වේවි කියලා අපි විශ්වාස කරනවා.

විශේෂයෙන්ම මා තව කරුණක් කිව යුතුයි. අපි දෙමළ ජාතික සන්ධානය සමඟ සාකච්ඡා කළාම අපට කිව්වේ අපි කොටින් එක්ක ගියා කියලායි. දෙමළ ජාතික සන්ධානය ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ව්‍යුහයට පිවිසිලා ඉන්නවාය කියන එකත් අපි කියන්න කැමැතියි. එතුමන්ලාගේ අතීතය කෙසේ වෙතත් අපි පිළිගන්න ඕනෑ යථාර්ථයක් තිබෙනවා. ඒ යථාර්ථය තමයි, එතුමන්ලා ප්‍රජාතන්ත්‍රවාදී ඡන්දයෙන් පත් වූ මහජන නියෝජිතයන්ය කියන එක. ඒක අමතක කරලා කටයුතු කරන්න අපට බැරි බව අපි පළමුව ප්‍රජාතන්ත්‍රවාදීව කල්පනා කළ යුතුයි. දෙවනුව අපි දෙමළ ජාතික සන්ධානය සමඟ එදා සාකච්ඡා කරලා එකඟ වුණේ අප සියලු දෙනාටම පොදු ප්‍රශ්න සාකච්ඡා කරන්නටයි. එතුමන්ලාගේ සම්මුතිය ඉතා පැහැදිලිව එතුමන්ලා මාධ්‍යවලට ප්‍රකාශ කළා. මෛත්‍රී පාලනයක් සඳහා වූ ජනාධිපතිතුමාගේ සම්මුතිය ඉතාම පැහැදිලිව එතුමාත් ප්‍රකාශයට පත් කරලා තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයත් ඉතාම පැහැදිලිව තමන්ගේ ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කරලා තිබෙනවා. ඒ නිසා මෙතැන කිසිම රහස් ගිවිසුමක් තිබුණේ නැහැ. අපි ඉතා පැහැදිලිව ඒක කියන්න ඕනෑ. ඒ නිසා අද උතුරත් දකුණත් සියලු දේශපාලන පක්ෂත් එක තැනකට ඇවිල්ලා තිබෙනවා. අප හැමටම පොදු ඡන්ද ක්‍රමය, අධිකරණයේ ස්වාධීනත්වය, ව්‍යවස්ථාදායකයේ ස්වාධීනත්වය, විධායක ජනාධිපති ක්‍රමයේ බලතල අඩු කිරීම හා එය සංශෝධනය කිරීම අරබයා දෙමළ, සිංහල භේදයකින් තොරව අප සියලු දෙනාම එක සම්මුතියකට ඇවිල්ලා තිබෙනවා. අපි කැමති වුණත්, අකැමැති වුණත් මේ උදා වූ ස්වර්ණමය අවස්ථාව වාද භේදයකින් තොරව සිත් තුවාල කර ගෙන අපි සාමූහිකව භාර ගත යුතු වනවා. මේ සම්බන්ධයෙන් ගුණාත්මක හා සංවාදාත්මක සාකච්ඡාවක් සඳහා දෙමළ ජාතික සන්ධානයත්, ජනතා විමුක්ති පෙරමුණ ප්‍රමුඛ පාර්ලිමේන්තුවේ ප්‍රධාන දේශපාලන පක්ෂවලින් තොරව සිටින විකල්ප දේශපාලන ප්‍රවාහත් අද එක තැනකට ඇවිල්ලා තිබෙනවා.

මා මීට අතිරේකව කියනවා නම්, අපි පළමුව කල්පනා කළ යුත්තේ උතුරේ තිබෙන ප්‍රශ්න පිළිබඳවයි. අප විශ්වාස කරන්නේ පළමුව උතුරේ ජනතාව අතර තිබෙන දුගීකම අපි සාකච්ඡා කළ යුතු බවයි. අද කිලිනොච්චිය වාගේ දිස්ත්‍රික්කයක් ගත්තොත් ඒ දිස්ත්‍රික්කයේ ජනතාවගේ දුගීකම විශාල වශයෙන් බලවත් වෙලා තිබෙනවා. ඒ වාගේම ඒ දිස්ත්‍රික්කයේ සැඟවුණු මන්ද පෝෂණය සියයට 40කට තරම් ආසන්න වෙලා තිබෙනවා. ඒ වාගේම විරැකියාව වැඩිම දිස්ත්‍රික්කය බවටත් ඒ දිස්ත්‍රික්කය පත් වෙලා තිබෙනවා. පොදුවේ ගත්තාම සමස්ත රටක් විධියට මේ ප්‍රශ්න පිළිබඳව අපි සාකච්ඡා කළ යුතුයි. ඒ තත්ත්වය තිබෙන්නේ කිලිනොච්චියේ පමණක් නොවෙයි. ඒ තත්ත්වය මොනරාගලත්, නුවරඑළියේත් විශාල වශයෙන් දකින්න තිබෙනවා. මේ පිළිබඳව අපි සාකච්ඡා කළ යුතුයි. ජාතිවාදයට අවශ්‍ය උත්තේජන ලැබෙන්නේ ඔවුන්ට අවශ්‍ය කරන ආර්ථික පසු බිමක් නොමැති විටයි. ඒ නිසා අපේ ප්‍රමුඛතාව ඒ සඳහා අපි ලබා දිය යුතුයි.

යුද්ධයෙන් පසුව අද නැගෙනහිර පළාතේ විශේෂයෙන් මධ්‍යකලපුව, කිලිනොච්චිය ඇතුළු ප්‍රදේශවල විශාල වශයෙන් බාර් සංස්කෘතියක් ඇති කරලා තිබෙනවා. හැම නගරයකම, හැම තැනකම restaurantS දමමින් අද දෙමළ සමාජය සදාචාරාත්මකව විනාශ කිරීමටද පටන් අරගෙන තිබෙනවා. ඔවුන්ගේ හින්දු සංස්කෘතිය කුඩු පට්ටම් කර අද රාජ්‍ය නොවන සංවිධාන විසින් හින්දුත්වය විනාශ කිරීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කර තිබෙනවා. ජාතියක් හැටියට, සමස්ත රටක් හැටියට සදාචාර විරෝධී මේ සියලු ක්‍රියා මැඩ පවත්වලා දෙමළ, සිංහල මිත්‍රත්වය ඉතා ගැඹුරින් ගොඩනඟන්න මේ ස්වර්ණමය අවස්ථාව අප යොදා ගන්න ඕනෑ. තවත් පරම්පරාවකට ත්‍රස්තවාදී කැරලි ඇති කරන්න තිබෙන ඉඩකඩ සම්පූර්ණයෙන්ම අහුරලා, රටේ සියලු දෙනාටම සමානත්වය ලැබෙන සමාජ ක්‍රමයක් සඳහා සාමූහික වග කීමෙන් කටයුතු කළ යුතුය කියා අප කල්පනා කරනවා.

ඉදිරියේදී සිදු කරන්න යන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේදී ඉතා වැදගත්ම කාරණය වන්නේ ඡන්ද ක්‍රමයයි. ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා එම කාරණය මතු කළා. එම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ඡන්ද ක්‍රමය පිළිබඳව අනිවාර්යයෙන්ම ඇතුළත් වෙනවා. ඊළඟ මහ මැතිවරණය මේ වෙනස් කරපු ඡන්ද ක්‍රමය යටතේ පවත්වන්න අප බලාපොරොත්තු වෙනවා. ඒක තමන්ට වාසිද, අවාසිද කියන පුද්ගල පරමාර්ථයෙන් තොරව, වෙනස් කරපු ඡන්ද ක්‍රමයක් යටතේ පවත්වන මැතිවරණයක් අප බලාපොරොත්තු වෙනවා. එය කළ හැකිද, නැද්ද කියන එක පිළිබඳව, ඒ කියන්නේ භූමි නිර්ණය කිරීම, ආසන බෙදීම ආදි තාක්ෂණික කාරණා පිළිබඳව ගැටලුවක් තිබුණත්, පනත් කෙටුම්පත සම්මත වීම පිළිබඳව කිසිම ගැටලුවක් නැති බව අප ඉතා වග කීමෙන් මේ පාර්ලිමේන්තුවේ ප්‍රකාශ කර සිටිනවා. ඒ නිසා කිසි කෙනෙක් සැක සංකා ඇති කර ගන්න අවශ්‍ය වන්නේ නැහැ. ඡන්ද ක්‍රමයේ වෙනසක් ස්ථිරසාර ලෙසම වන බව මා ඉතා පැහැදිලිව ප්‍රකාශ කර සිටින්න කැමැතියි.

ඊළඟට රටේ පවතින වැදගත්, ජාතික ප්‍රශ්න කීපයක් ගනිමු. මීට අවුරුදු දෙකකට කලින් වකුගඩු රෝගය සම්බන්ධයෙන් විශාල ප්‍රශ්නයක් මතු වුණා. අප කිව්වා, "රජය බෙදපු පොහොරවල කැඩ්මියම් සහ ආසනික් අතිවිශාල ප්‍රමාණයක් තිබෙනවා" කියා. ඒවා ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තාවලින් හෙළිදරවු වුණා. අප ගිහින් ජනාධිපතිතුමාට මේ බව කිව්වා. නමුත් පසුව කිව්වේ, "මේක කුමන්ත්‍රණයක්" කියා. අපට කිව්වා, "පාන් පිටි කුමන්ත්‍රණකාරයෝ" කියා. එහෙම කියා මහින්ද රාජපක්ෂ මහත්මයා හිට ගත්තේ අපත් සමඟ නොවෙයි, බහුජාතික සමාගම් හා පොහොර ගෙන්වන ජාවාරම්කාර ඒජන්තයින් සමඟයි.

මතට තිත ව්‍යාපෘතිය යටතේ සිගරට් දුම්කොළ සමාගම්වලට විරුද්ධව අප එදා මේ දේවල් කියා සිටියා. එදා -2005 දී- 120,000ක් වුණු කුඩුකාරයන් අද කිලිනොච්චිය, යාපනය දක්වා පැතිරිලා සිටිනවා. කේරළ ගංජා ඇතුළු හැම දෙයින්ම අද තරුණ පරම්පරාව විනාශ වෙලා. අද 366,000 දක්වා මුළු ගම්බිම් සිසාරා -ජා-ඇල, වත්තල වාගේ නාගරික ප්‍රදේශවලත්- අතිවිශාල ප්‍රමාණයෙන් කුඩු හා මත් ද්‍රව්‍ය වසංගතය පැතිරිලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් ප්‍රතිපත්තියක් හදන්න කියා අප ඉල්ලා සිටියා. මට බොහොම කනගාටුයි, මෙන්න මේ කාරණය කියන්න වීම ගැන. මීට අවුරුදු තුනකට කලින්, කුඩු කිලෝ 400ක් හම්බ වුණු වෙලාවේ එක්තරා වග කිව යුතු ආණ්ඩුවේ ඇමතිවරයෙකුට මම කිව්වා, "හරිම කනගාටුයි; මේ කුඩු ගැන මහජනයාට සැකයක් තිබෙනවා; මේකට දේශපාලන සම්බන්ධයක් තිබෙනවා" කියා. එතකොට ඒ අදාළ වග කිව යුතු ඇමතිවරයා -අවශ්‍ය නම් මට නම කියන්න පුළුවන්; නම කියන එක සුදුසු නැහැ කියා මම හිතනවා.- කිව්වේ, "මේවා මේ ලංකාවට බෙදන්න ගෙනෙන ඒවා නොවෙයි, ලංකාව හරහා යුරෝපයට ගෙන යන ඒවා" කියායි. ඒ කියන්නේ කුඩු ගෙනියන්නේ යුරෝපයට කියලා දන්නවා. ඒ කියන්නේ ගෙනෙන කෙනාත් ඔවුන් දන්නවා. මෙන්න මේ විධියට කුඩු ජාවාරම්කාරයෝත් එක්ක, කැසිනෝකාරයෝත් එක්ක, සූදු කෙළිකාරයෝත් එක්ක තමයි ඒ ආණ්ඩුව ගෙනිච්චේ. පසු ගිය ආණ්ඩුව ප්‍රගතිශීලී ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවක් නොවෙයි. ඒක අන්ත දූෂිත කැසිනෝකාරයන්ගේ, ජාවාරම්කාරයන්ගේ ආණ්ඩුවක්. අපි ඒක වෙනස් කරලා තිබෙනවා. අද තමුන්නාන්සේලාට නිදහසේ හිතන්න පුළුවන් ආණ්ඩුවක් අපි හදලා තිබෙනවා.

ඊළඟට, ඉතා වැදගත් ඖෂධ පනත ගනිමු. අද රෝහල්වල බෙහෙත් නැහැ. එදා සේනක බිබිලේ, දකුණු ආසියාවේ පළමු වතාවට ලංකාවට ඖෂධ ප්‍රතිපත්තියක් හැදුවා. හදලා එතුමා 1976 දී ඝානාවට ගියා, මේ ප්‍රතිපත්තිය අප්‍රිකානු හා වෙනත් රටවලට හඳුන්වා දෙන්න. එතුමා මේ ඖෂධ ප්‍රතිපත්තිය හඳුන්වා දීමේ වරදට කුමන්ත්‍රණකාරීව, වැලි කතරේ ඉතාම අහිංසක ලෙස මිය ගියා. අවාසනාවකට මේ ඖෂධ ප්‍රතිපත්තිය අපට ක්‍රියාවට නඟන්න බැරි වුණේ මහින්ද රාජපක්ෂ මහත්තයා ඇතුළු පිරිස ඖෂධ ජාවාරම්කාරයෝත් එක්ක සිටිය නිසායි කියා අපි භය නැතුව කියනවා. එහෙම නොවෙයි නම්, "එහෙම නොවෙයි" කියා, කොන්ද පණ ඇතුව කියන්න. ඇයි මේ පනත නැති වුණේ, ඇයි මේ පනත නොගෙනාවේ කියා උත්තර දෙන්න ඕනෑ. ඒ කරුණු තමයි අපි ජනතාව අතරට ගෙන ගිය පණිවුඩය.

අපි කිව්වා, "කෘමිනාශක තහනම් කරන්න" කියා. විශේෂයෙන්ම වකුගඩු රෝගය බහුලව තිබෙන ප්‍රදේශවල ග්ලයිෆොසේට් කියන භයානක උග්‍ර විෂ කාරකය තහනම් කරන්න කියලා අපි කිව්වා. කිසිම එකක් තහනම් කළේ නැහැ. මැතිවරණ කාලයේ තහනම් කළා. ඒත් ඒවා තවමත් ගොවි ජනතාව පාවිච්චි කරනවා. අපි කිව්වා, "රජයේ මාධ්‍ය පාවිච්චි කරලා මේ භයානක කෘෂි රසායන පිළිබඳව ජනතාව දැනුවත් කරන්න" කියා. මේ සම්බන්ධයෙන් එවැනි එක වැඩසටහනක්වත් ජාතික රූපවාහිනිය ඇතුළු රූපවාහිනි නාලිකාවල අපට කරන්නට බැරි වුණා. ඒ ගැන අපට හරි ලජ්ජයි; අපට හරි කනගාටුයි.

අවසාන වශයෙන් මම මේ සභාව තුළ මේ කරුණත් කියන්නට කැමැතියි. මේ රටේ ඉතිහාසය තුළ සමාජ කැරලි ගණනාවකට අපි මුහුණ දුන්නා. 1971 කැරැල්ල පිළිබඳ අවසාන විශ්ලේෂණයේදී දැන උගත් හැම දෙනාම කිව්වේ, එය දැන උගත් තරුණයන්ගේ අසහනයෙන් ඇති වුණු කැරැල්ලක් බවයි. 1988 කැරැල්ල උතුරේ ඇති වුණු ප්‍රශ්න මුල් කර ගෙන පැන නැඟුණත්, තරුණ අසහන කොමිසම කිව්වේ, රටේ තිබෙන දුගීකම හා ආර්ථික අසහනය නිසා ඇති වුණු කැරැල්ලක් බවයි. එදා කවුරුත් එය විශ්ලේෂණය කළේ එහෙමයි. මතක තියා ගන්න, අනාගතයේදීත් තරුණයන්ගේ ඒ අසහනය ඒ විධියටම තිබෙන බව. පාරවල් හැදිලා තිබෙනවා තමයි, නගර හැදිලා තිබෙනවා තමයි, චීන කොම්පැනි මහ මුහුදේ මහා නගර හදනවා තමයි, නමුත් අපේ දුගී දුප්පත් ජනතාවගේ ප්‍රශ්න විසඳිලා නැහැ. මිනිසුන් ඉතා අන්ත අසරණ තත්ත්වයකටයි පත් වෙලා සිටින්නේ. ඒ නිසා මේ සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා වැඩ පිළිවෙළක්, ජාතික ප්‍රතිපත්තියක් සකස් කළ යුතු වෙනවා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ප්‍රතිසංස්කරණය වාගේම රටේ සමාජ විෂමතාව තුනී කරලා පහළ සමාජ තට්ටුවලට සාධාරණත්වය ඉටු වන සාමාන්‍ය ජනතාවගේ මූලික ප්‍රශ්න විසඳෙන ප්‍රතිපත්තියක් කරා රට ගෙන යන්නට අප කාටත් වගකීමක් තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ රැස්ව සිටින සියලුම මැති ඇමතිවරුන්, මන්ත්‍රීවරුන්, විශේෂයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, එක්සත් ජාතික පක්ෂයත්, මේ මාස තුන තුළ ආණ්ඩු පක්ෂය හා විපක්ෂය කියන මහා බෙදුම් රේඛාවකින් තොරව මේ මූලික වැදගත් කාරණා ඉටු කළ යුතුව තිබෙනවා කියා මා හිතනවා.

[ගරු (පූජ්‍ය) අතුරලියේ රතන මහතා]

මේ පාර්ලිමේන්තුවේ මමත් අවුරුදු 10ක විතර කාලයක් ගත කර තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ කෙරුණු සාකච්ඡාවලින් සිදු වුණු දේ මොකක්ද? ලැබුණු ප්‍රතිඵලය කුමක්ද? නිකම් කෑ කෝ ගැසීම්, බැණ ගැනීම් විතරයි. ඒ නිසා මේ පාර්ලිමේන්තුව -මහජන නියෝජිතයන්ගේ සභාව- ඉදිරි මාස තුන තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව විධිමත් සාකච්ඡාවක් කරයි කියා බලාපොරොත්තු වනවා. සෑම දෙනාටම ස්තුති කරමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

[3.01 p.m.]

ගරු රවූෆ් හකීම් මහතා (නාගරික සංවර්ධන, ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා)
(மாண்புமிகு றவுப் ஹகீம் - நகர அபிவிருத்தி, நீர்வழங்கல் மற்றும் வடிகாலமைப்பு அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of Urban Development, Water Supply and Drainage)

Mr. Speaker, Hon. Prime Minister, Hon. Leader of the Opposition and other Party Leaders, on this historic day when we are all united in pursuit of the lofty ideals such as good governance and a just society, I find myself at a loss for words to express the joy and relief with which the Sri Lankan citizens of all faiths greeted the election of His Excellency Maithripala Sirisena as our sixth President.

So, I shall borrow the words from Samuel Adams, a political philosopher and a principal architect of Republicanism as we know it today. He says, I quote:

> "It does not take a majority to prevail but rather an irate, tireless minority, keen on setting brushfires of freedom in the minds of men. If men through fear, fraud, or mistake, should in terms renounce or give up any essential natural right, the eternal law of reason and the grand end of society would absolutely vacate such renunciation. The right to freedom being the gift of God Almighty, it is not in the power of man to alienate this gift and voluntarily become a slave."

Mr. Speaker, the verdict of our people expressed on the 8th of January, 2015 is neither a victory of one nor a defeat of another. It most pronouncedly represents a rejection of an artificial ideology of offering a united, unquestioned and unquestionable explanation of everything, including historical events. Any dissent or change would cause serious problems for the safety of the State. A majority of our people rejected that "made-to-measure" ideology.

The post-election consensus that emerged shows that those who did not agree with us are not opposed to our ideals, but perhaps did not share our sense of urgency in bringing in the much-needed constitutional reforms.

What we should celebrate today, Mr. Speaker, is the discovery that there are no perpetual minorities or majorities. Ours is not only a democracy, it is also a Republic. Our common endeavour is to ensure that the power of the State is limited by law. In such a State, minorities - religious, cultural or linguistic - need no special privileges or protection.

In such a Republic, patriotism will inspire and foster collective solidarity with fellow citizens and loyalty to the law. I pray that Allah, the most Merciful and Compassionate, will give us all the courage and wisdom to defend the rights and freedoms that a republican democracy guarantees by its basic law.

Thank you, Mr. Speaker.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු සජීවී ලෙස විකාශය වන නිසා මන්ත්‍රීවරයෙක් තම කථාව කරන අවස්ථාවේ කරුණාකර ගරු මන්ත්‍රීතුමන්ලා නිශ්ශබ්දව තම අසුන්වල ඉන්න.

ගරු රිසාඩ් බදියුදීන් ඇමතිතුමා.

[பி.ப. 3.05]

ගරු රිසාඩ් බදියුදීන් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு றிஸாட் பதியுதீன் - கைத்தொழில், வாணிப அலுவல்கள் அமைச்சர்)
(The Hon. Risad Badhiutheen - Minister of Industry and Commerce)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

இன்று இந்த நாட்டிலே ஒரு புதிய ஆட்சி உருவாகி, எதிர்க்கட்சியும் ஆளும் கட்சியும் சேர்ந்து, ஜனாதிபதி அவர்களின் 100 நாள் வேலைத்திட்டத்துக்கு ஆதரவு அளிப்பது என்ற ஒருமித்த கருத்தோடு இன்று இந்தப் பாராளுமன்றம் கூடியிருப்பது எங்களுக்கு சந்தோஷத்தைத் தருகின்றது. கடந்த ஜனாதிபதித் தேர்தலைப் பொறுத்தவரையிலே பௌத்த, இந்து, இஸ்லாமிய, கிறிஸ்தவ மக்கள் அனைவரும் ஒன்றுபட்டு ஒரு மாற்றத்தைக் கொண்டுவந்திருக்கிறார்கள். அந்தவகையிலே, மேதகு ஜனாதிபதியாகத் தெரிவு செய்யப்பட்டிருக்கின்ற மைத்திரிபால சிறிசேன அவர்களுக்கு இந்த உயர் சபையிலே எனது கட்சி சார்பாகவும் கட்சி ஆதரவாளர்கள் சார்பாகவும் எனது வாழ்த்துக்களைத் தெரிவித்துக்கொள்கின்றேன்.

அதேபோல, புதிய பிரதம அமைச்சராகத் தெரிவு செய்யப்பட்டிருக்கின்ற மாண்புமிகு ரணில் விக்கிரமசிங்க அவர்களுக்கும் மற்றும் அமைச்சர்களுக்கும் இந்த இடத்திலே எனது கட்சி சார்பாக வாழ்த்துக்களைத் தெரிவித்துக் கொள்கின்றேன். அத்துடன், 100 நாள் வேலைத் திட்டத்தை முன்னிறுத்தி இந்த நாட்டு மக்களுக்கு கொடுத்த வாக்குறுதியை நிறைவேற்றுவதற்காக நானும் எனது கட்சிப் பாராளுமன்ற உறுப்பினர்களும் என்னுடைய கட்சியிலுள்ள ஏனையோரும் பூரணமான ஒத்துழைப்பையும் பங்களிப்பையும் வழங்கக் காத்திருக்கின்றோம்.

கடந்த ஓரிரு வருடங்களுக்கு முன்னர் இந்த நாட்டிலே இனவாதம், மதவாதம் என்பன மிக மோசமாகத் தலைதூக்கின. எனவே, இந்த ஆட்சியில் "இது எங்களுடைய நாடு" என்ற எண்ணத்துடன் எல்லோரும் ஒற்றுமையாக,

சந்தோஷமாக, நிம்மதியாக வாழக்கூடிய ஒரு நல்ல சூழ்நிலை ஏற்படும் என்று நாங்கள் நம்புகின்றோம். நான் ஏற்கெனவே சொன்னதுபோல, கடந்த இரண்டு வருட காலமாக இந்த நாட்டிலே இனவாத, மதவாதக் கலாசாரம் உருவாகி, சிறுபான்மைச் சமூகங்கள் அச்சப்படுகின்ற - பயப்படுகின்ற, தங்களது தொழில்களைச் செய்யமுடியாத, மத உரிமைகளைப் பேணமுடியாத ஒரு மோசகரமான சூழ்நிலை ஏற்பட்டது. இவ்வாறானதொரு நிலைமை இந்த நாடு சுதந்திரமடைந்த பிறகு எந்தவொரு காலத்திலும் ஏற்பட்டிருக்கவில்லை. எனவே, எதிர்காலத்தில் இவ்வாறான எந்தவித இனவாத, மதவாத வளர்ச்சிக்கு இந்த நாட்டில் வாழுகின்ற எவரும் இடம்கொடுக்கக்கூடாது என்று நான் இந்த இடத்திலே வேண்டிக்கொள்கின்றேன்.

மேதகு ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்களுடைய தலைமையில், புதிய பிரதம அமைச்சர் மாண்புமிகு ரணில் விக்கிரமசிங்க அவர்களின் அரசாங்கம், இந்த நாட்டிலே வாழுகின்ற தமிழ் பேசும் மக்கள், பௌத்த மக்கள் என எல்லோரையும் அரவணைத்து ஒரு நல்லாட்சியைக் கொண்டுவருவதாக அறிவித்திருக்கின்றார்கள். எனவே, இந்த ஆட்சி எல்லோரும் சந்தோஷப்படக்கூடிய வகையில், ஒரு நல்லாட்சியாக அமையவேண்டுமென எல்லாம் வல்ல இறைவனைப் பிரார்த்தித்து, இந்த மாற்றத்துக்காக வாக்களித்த மக்களுக்கு நன்றிகூறி, விடைபெறுகின்றேன். நன்றி.

[பி.ப. 3.10]

ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා (අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය)
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன் - கல்வி இராஜாங்க அமைச்சர்)
(The Hon. V.S. Radhakrishnan - State Minister of Education)

கௌரவ சபாநாயகர் அவர்களே, மாண்புமிகு பிரதம அமைச்சர் அவர்களே, இங்கிருக்கின்ற ஏனைய அமைச்சர்களே, தற்பொழுது இந்த நாட்டின் அரசியலிலே ஒரு திருப்பம் ஏற்பட்டிருக்கின்றது. இத்திருப்பமானது இலங்கை நாட்டின் வரலாற்றிலே ஒரு மிக முக்கிய திருப்பமாக இருக்கின்றது. கௌரவ மைத்திரிபால சிறிசேன அவர்கள் இந்த நாட்டினுடைய மேதகு ஜனாதிபதியாகத் தெரிவு செய்யப்பட்டுள்ளார். அதேபோல், ரணில் விக்கிரமசிங்க அவர்கள் இந்த நாட்டின் மாண்புமிகு பிரதம அமைச்சராகப் பதவியேற்றுள்ளார். இவ்விருவருக்கும் எங்களுடைய மலையக மக்கள் சார்பிலே வாழ்த்துக்களைத் தெரிவிப்பதற்காக நான் இந்த நேரத்தைப் பயன்படுத்திக்கொள்கின்றேன்.

இப்பொழுது நடைபெற்ற ஜனாதிபதித் தேர்தலில், பொதுவாக மலையகத்திலே தமிழர்கள் வாழுகின்ற பகுதிகளில் அதிகமான வாக்குகள் மாண்புமிகு மைத்திரிபால சிறிசேன அவர்களுக்கே கிடைத்திருக்கின்றது என்பதை நான் இந்த நேரத்திலே ஞாபகப்படுத்த வேண்டும். அவ்வாறு இந்தத் தேர்தலிலே மிக முக்கிய பங்கு வகித்த மலையக மக்களுடைய எதிர்பார்ப்புக்களான வீட்டுப் பிரச்சினை, கல்விப் பிரச்சினை போன்ற பல்வேறு பிரச்சினைகளை நாங்கள் மேதகு ஜனாதிபதி அவர்களிடமும் கௌரவ பிரதம அமைச்சர் அவர்களிடமும் எடுத்துரைத்தோம். அதன் அடிப்படையில், கௌரவ திகாம்பரம் அவர்களுக்கும் எனக்கும் கௌரவ வேலாயுதம் அவர்களுக்கும் அமைச்சுக்களைக் கொடுத்து மலையக மக்களைக் கௌரவித்திருக்கின்றார். இதற்காக நான் கௌரவ ரணில் விக்கிரமசிங்க அவர்களுக்கு எங்களுடைய நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். இத்தேர்தல் நடைபெற்ற பிறகு இந்த நாட்டில் பல்வேறு பிரச்சினைகள் வரும் என்று எல்லோரும் எதிர்பார்த்தார்கள். ஆனால், எந்தவித பிரச்சினையுமின்றி மக்கள் தேர்தல் முடிவை ஏற்றுக்கொண்டு சுமுகமாக வாழ்கின்றார்கள். அந்த வகையிலே, இத்தேர்தலை அனுமதித்து இந்த நாட்டின் எதிர்காலம் நல்ல விதத்தில் அமையவேண்டும் என்று எதிர்பார்த்த எல்லோருமே இன்று சுமுகமான நிலைக்கு வந்துள்ளார்கள் என்பதைப் பார்க்கும் பொழுது மிகவும் சந்தோஷமாக இருக்கின்றது. அந்தளவுக்கு இந்த நாட்டின் அரசியல் கலாசாரம் வளர்ந்திருக்கின்றது என்பது பாராட்டக்கூடிய விடயமாக இருக்கின்றது.

மாண்புமிகு பிரதம அமைச்சர் அவர்கள் பேசும்பொழுது வடக்கு, கிழக்கு தமிழ் மக்களின் இனப் பிரச்சினைக்கு முற்றுப்புள்ளி வைக்கும்வகையில் அதனைத் தீர்த்து வைப்பதற்கு நடவடிக்கை எடுப்பதாகக் கூறினார். இந்த நாட்டிலே 30 வருடகால யுத்தம் நிலவியமைக்கு காரணமாக இருந்த இனப் பிரச்சினையை இப்புதிய அரசாங்கம் தீர்த்து வைக்குமானால், அதுவே அவர்கள் இலங்கைக்குச் செய்கின்ற ஒரு பெரிய கடமையாகும். ஏனென்றால், இந்த யுத்தத்தை வைத்துக்கொண்டுதான் இவ்வளவு நாளும் மற்றவர்கள் அரசியல் செய்தார்கள். ஆகவே, இதற்கு முற்றுப்புள்ளி வைத்து, இந்தப் பிரச்சினையை தீர்க்கவேண்டும் என நாங்கள் எதிர்பார்க்கின்றோம்.

இந்த நாட்டிலே சுதந்திரம், சமாதானம், ஒழுக்கம் என்பவற்றைக் கடைப்பிடிக்கும் வகையில் வெளிப்படுத்தப் பட்ட இந்த அரசாங்கத்தின் கொள்கைத் திட்டம் மிகவும் நன்றாக இருக்கின்றது. ஆகவே, எதிர்காலத்திலே இக்கொள்கையின் அடிப்படையில் முன்னேசென்று, இந்த மக்களுடைய நலனைப் பாதுகாக்கவேண்டும் என்று கேட்டுக்கொள்வதோடு, சுவாமி விவேகானந்தர் அவர்கள் சொன்ன ஒரு விடயத்தையும் நான் இங்கு ஒருகணம் ஞாபகப்படுத்த விரும்புகின்றேன். இந்த நாடு உனக்கு என்ன செய்திருக்கின்றது என்பதைவிட, நாட்டுக்கு உன்னால் என்ன செய்யமுடியும் என்று ஒவ்வொருவரும் சிந்திக்கவேண்டும் என்பதைத்தான் சுவாமி விவேகானந்தர் அவர்கள் சொல்லியிருக்கின்றார்கள். எனவே, நாடு எங்களுக்கு என்ன செய்கின்றது என்பதைப் பார்ப்பதைவிட, நாட்டுக்கு நாங்கள் என்ன செய்தோம் என்பதைத்தான் கவனத்தில் கொள்ள வேண்டும்.

அந்த வகையிலே, இந்த நாட்டுக்கு நன்மையளிக்கின்ற ஒரு நல்ல திட்டத்தை மேதகு ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்களும் மாண்புமிகு பிரதம மந்திரி ரணில் விக்கிரமசிங்க அவர்களும் செய்ய வேண்டுமென்ற எதிர்பார்ப்புடன் மலையக மக்கள் முன்னணியின் சார்பிலும் மலையக மக்களின் சார்பிலும் எனது வாழ்த்துக்களையும் நன்றியையும் மீண்டும் தெரிவித்துக்கொண்டு, விடைபெறுகின்றேன். நன்றி.

[பி.ப. 3.14]

ගරු ඩග්ලස් දේවානන්ද මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ சபாநாயகர் அவர்களே, நீண்டகால ஆட்சியில் எங்கள் மக்களுடைய பிரச்சினைகளை இலகுவாகத் தீர்க்கலாமென்ற எங்களுடைய கோரிக்கைகளை ஏற்று வாக்களித்த மக்களுக்கு நான் முதலில் நன்றி கூறுகின்ற அதேநேரத்தில், ஆட்சி மாற்றம் தேவையென்ற எண்ணத்தோடு வாக்களித்த மக்களுடைய உணர்வுகளுக்கும் மதிப்பளிப்பதோடு, அதன் பயனாக ஏற்படுத்தப்பட்ட புதிய

[ගරු ඩග්ලස් දේවානන්ද මහතා]

அரசின் பிரதமர் மாண்புமிகு ரணில் விக்கிரமசிங்க அவர்களுக்கு என்னுடைய வாழ்த்துக்களையும் தெரிவித்துக் கொள்கின்றேன். புதிய அரசின் 100 நாள் வேலைத்திட்டத்துக்கு நாங்கள் முழு ஆதரவு தருவதாக உறுதியளிக்கின்றோம். முன்னைய அரசிடம் நாங்கள் முன்வைத்த பல கோரிக்கைகள் முன்னெடுக்கப்பட்டு வருகின்ற அதேநேரத்தில், விடுபட்டிருப்பவைகளைத் தொடருமாறும் நாங்கள் புதிய அரசின் மேதகு ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்களிடமும் கௌரவ பிரதமர் ரணில் விக்கிரமசிங்க அவர்களிடமும் வேண்டுகின்றோம்.

தமிழ் மக்களின் அரசியல் பிரச்சினையை நடைமுறைச் சாத்தியமான வழியில் சென்று தீர்ப்பதற்கு 13 ஆவது திருத்தச் சட்டத்தை முழுமையாக நடைமுறைப்படுத்துவதிலிருந்து ஆரம்பித்து, நாடாளுமன்றத் தெரிவுக்குழுவுக்கூடாக அதை மேலும் செழுமைப்படுத்த வேண்டும். அடுத்து, நீண்ட காலமாக விசாரணைகள் இன்றியும் குற்றங்கள் நிரூபிக்கப்படாமலும் மற்றும் புனர்வாழ்வு வழங்கப்பட்டும் சிறைகளில் வாடும் அனைத்து தமிழ் அரசியல் கைதிகளும் பொது மன்னிப்பின் அடிப்படையில் விடுதலை செய்யப்பட வேண்டும். மக்களின் நிலம் மக்களுக்கே சொந்தமென்பதே எமது நிலைப்பாடாகும். பாதுகாப்புக் காரணங்களுக்காக பாதுகாப்பு வலயங்களாக அறிவிக்கப்பட்ட தனியாருக்குச் சொந்தமான அனைத்து நிலங்களும் உரியவர்களிடம் மீள ஒப்படைக்கப்பட வேண்டும். புலம்பெயர்ந்து வாழும் தமிழ் மக்கள் இலங்கைத் தாய் நாட்டினதும் பிரஜைகளாக இருப்பதற்கு இரட்டைக் குடியுரிமையை இலகுபடுத்த வேண்டும். மேலும், வடக்கு நோக்கிப் பயணம் செய்யும் மக்களுக்கு அசௌகரியத்தை ஏற்படுத்தும் ஓமந்தைச் சோதனைச் சாவடியை முற்றாக அகற்ற வேண்டும். வெளிநாட்டவர்களும் வெளிநாடுகளில் வாழும் இலங்கை மக்களும் வட மாகாணம் நோக்கிப் பயணிப்பதைத் தடுக்கும் அல்லது அவர்களுக்கு நெருக்கடியை ஏற்படுத்தும் கடவுச்சீட்டு பரிசோதனை முறைமையை இரத்துச் செய்ய வேண்டும். இந்தச் சந்தர்ப்பத்தில் மேதகு ஜனாதிபதி அவர்களுக்கும் கௌரவ பிரதமர் ரணில் விக்கிரமசிங்க அவர்களுக்கும் நான் என்னுடைய நன்றியைத் தெரிவிக்க கடமைப்பட்டிருக்கின்றேன். ஏனெனில் அந்த நடைமுறை தற்போது இரத்துச் செய்யப்பட்டிருப்பதாக அறிகின்றேன்.

அத்துடன், யுத்த சூழலால் பாதிக்கப்பட்டு பொருளாதாரத்தில் நலிந்துபோன மக்களைத் தூக்கி நிமிர்த்த உதவும் சமூர்த்திக் கொடுப்பனவை மேலும் அதிகரித்து சமூர்த்திப் பயனாளிகளின் எண்ணிக்கையையும் அதிகரிக்க வேண்டும். யுத்தத்திற்குப் பின்னர் சொந்த வாழ்விடம் திரும்பிய மக்களினதும் மீள்குடியேற்றம் செய்யப்பட்ட மக்களினதும் வாழ்வாதாரத்தை மேம்படுத்த உரிய திட்டங்களை நடைமுறைப்படுத்த வேண்டும். வடக்கு, கிழக்கில் யுத்த சூழலால் பாதிக்கப்பட்ட வேலையற்றிருக்கும் எமது இளைஞர், யுவதிகளுக்குத் தகுதிக்கேற்ப வேலைவாய்ப்பைப் பெற்றுக்கொடுக்க வேண்டும். சாத்தியமான அனைத்து முயற்சிகளையும மேற்கொண்டு, மேலும் தொழில் வாய்ப்புக்களை அங்கு ஏற்படுத்தி சொந்த பொருளாதார வளர்ச்சியினூடாக எமது மக்கள் வாழ்வதற்கு வழிசெய்ய வேண்டும்.

எமது கடல் வளத்தை அழித்தும் சுரண்டியும் எமது கடற்றொழிலாளர்களது வாழ்வாதாரத்தைச் சீரழிக்கின்ற எல்லை தாண்டிய மீன்பிடியில் ஈடுபடுகின்ற இந்திய மீனவர்களின் அத்துமீறலைத் தடுப்பதோடு கடற்றொழிலைப் புனரமைப்புச் செய்து நவீனமயப்படுத்தி கடற்றொழிலாளர்களது வாழ்வை மேம்படுத்தல் வேண்டும். விவசாய, உள்ளூர் உற்பத்திகள் மற்றும் கைத்தொழில்கள் என்பவற்றை ஊக்குவித்து ஒவ்வொருவரும் சுய பொருளாதார வளர்ச்சியடைய, நிதி வளம் மற்றும் உள்ளீடுகளை வழங்குதல் வேண்டும்.

நிலத்தடி நீர் மோசமாகப் பாதிப்படைந்துவரும் யாழ். மாவட்டம் உட்பட குடிநீருக்குப் பாரிய நெருக்கடியைச் சந்தித்துவரும் வட மாகாணத்து மக்கள் அனைவரும் பொருத்தமான பொறிமுறை ஊடாகச் சுத்தமான குடிநீர் பெறுவதற்கான ஏற்பாடு செய்யப்பட வேண்டும். முன்னாள் புலிகள் அமைப்பின் உறுப்பினர்கள் உட்பட ஏனைய அமைப்புக்களின் முன்னாள் உறுப்பினர்களுக்கும் அவர்களது வாழ்வாதாரத்தை வளப்படுத்தும் வகையில் திட்டங்கள் வகுக்கப்பட வேண்டும். ஆட்சி உரிமை (விசேட ஏற்பாடுகள்) சட்டத் திருத்தத்தை மீளாய்வுக்கு உட்படுத்த வேண்டும். இல்லாவிட்டால் வட மாகாணத்தில் பல குடும்பங்கள் பாதிக்கப்படுகின்ற நிலைமை ஏற்படும்.

மேலும், இந்தப் புதிய அரசு பழிவாங்கலுக்கு இடம்கொடுக்காது என்று நம்புகின்றேன். இந்தச் சந்தர்ப்பத்தில் தமிழ் ஊடகங்களுக்கு நான் ஒரு வேண்டுகோளை விடுக்க விரும்புகின்றேன். அதாவது கடந்த காலத்தைப்போல் அல்லாமல் நிகழ்காலத்திலும் எதிர்வரும் காலங்களிலும் மாற்றுக் கருத்துக்களுக்கும் இடம் கொடுக்குமாறு கேட்டுக்கொள்கின்றேன். மீண்டும் பிரதம அமைச்சர் அவர்களுக்கு என்னுடைய வாழ்த்துக்களைக் கூறி, இந்த வாய்ப்புக் கொடுத்ததற்கு நன்றி தெரிவித்து, விடைபெறுகின்றேன் நன்றி. வணக்கம்.

[අ.භා. 3.20]

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)

ගරු කථානායකතුමනි, සම සමාජ පක්ෂ වෙනම පක්ෂයක් හැටියට විරුද්ධ පක්ෂයේ වාඩි වෙලා සිටින මෙම අවස්ථාවේදී වචන ස්වල්පයක් කථා කිරීමට මට අවස්ථාව ලබා දීම ගැන පළමුවෙන්ම ඔබතුමාට මාගේ අවංක ආදර ස්තුතිය පළ කරන්න ඕනෑ. අපි සම සමාජ පක්ෂය හැටියට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමඟ එක් වෙලා අප රටේ ප්‍රගතිශීලී ගමන ඉදිරියට ගෙන යෑමට කටයුතු කරලා තිබෙන බව කවුරුත් දන්නවා.

1956 වසරේ පිලිප් ගුණවර්ධන මැතිතුමාගේ පක්ෂයේ යම් කොටසක් එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමාත් එක්ක සම්බන්ධ වෙලා ප්‍රගතිශීලී බලවේගවලට ප්‍රථමවරට ආණ්ඩු බලය ලබා ගෙන, එම බලය පදනම් කර ගෙන අප රටේ දියුණු, දේශ හිතෛෂී, දේශපාලන හා ආර්ථික සංවර්ධන ගමනක් ඇවිත් තිබෙනවා. ඒ ගමන 1970 වසරේදී ශක්තිමත් වුණා. 1972 වසරේ දී Republican ව්‍යවස්ථාව සම්මත කරගෙන, අංග සම්පූර්ණ නිදහස ලබාගෙන ඒ ගමන ඉදිරියට ගිහිල්ලා තිබෙනවා.

අපි හිටපු ජනාධිපති ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එක්ක පිහිටවපු එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුවට සම්බන්ධ වෙලා, ඒ ගමන තවත් ඉදිරියට ගෙන යන්න කටයුතු කරලා තිබෙනවා. පසු ගිය අවුරුදු නවය දහය ඇතුළත මේ තුළින් අපි යම් වැදගත් කර්තව්‍යයන් ඉෂ්ට කරලා තිබෙනවාය කියලා කාටත් පිළිගන්න වෙනවා. ඒ අතර, බෙදිලා තිබුණු රට එක්සේසත් කරලා, ත්‍රස්තවාදය, බෙදුම්වාදය පරාජය කරමින් අපේ රටට ඉදිරියට ගමන් කරන්න පුළුවන් වාතාවරණයක් ගොඩනඟලා තිබෙනවා.

2007 වසරේ සිට ඇමරිකාව, යුරෝපීය රටවල් ප්‍රධාන රටවල පැවැති ආර්ථික අර්බුදයක් මැද -ලෝක ආර්ථික අර්බුදයක් මැද- යුද්ධයක් තිබෙද්දීත් අපේ රටේ නියම සංවර්ධන ගමනක් යන්න ඒ ඇති කරපු පාලනය හරහා පුළුවන් වුණා. හැම අතකින්ම, හැම ආර්ථික කෝදුවකින්ම මැනලා බැලුවොත් කාටත් පිළිගන්න සිද්ධ වෙනවා, ඒ ගමන සාර්ථක ගමනක් කියලා. ඒකෙන් යම් පදනමක් ඇති කරලා තිබෙනවා අපේ රටේ අනාගත දියුණුවට.

යටිතල පහසුකම් පැත්තෙන් පමණක් නොවෙයි, මානව සම්පත් දියුණු කිරීමේ පැත්තෙනුත් යම් පදනමක් ඇති කළා. අධ්‍යාපන ප්‍රතිසංස්කරණත් ඒකට සහාය දීලා තිබෙනවා, ද්විතීයික පාසල් දහසේ වැඩ පිළිවෙළ හරහා. මේ වැඩ පිළිවෙළත් එක්ක විද්‍යාවයි, තාක්ෂණයයි දියුණු කරමින් අපේ අමු ද්‍රව්‍යවලට වැඩි වටිනාකමක් එකතු කරන සංවර්ධන ගමනකුත් ආරම්භ කර තිබෙනවා. ඉතින් මේවා ඉදිරියට ගෙන යනකොට ප්‍රශ්න මතු වෙලා තිබුණා. ඒ ප්‍රශ්න ඇති වීම ගැනත් අපි මතක් කරන්නට ඕනෑ.

1977 දී ඇති වුණු වෙනස් වීමත් එක්ක 1978 ජේ.ආර්. ජයවර්ධන ව්‍යවස්ථාව - අද තිබෙන ව්‍යවස්ථාව - ක්‍රියාත්මක කරන්නට යනකොටම අපේ පක්ෂයේ එදා හිටපු නායක ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමා පැහැදිලිව විස්තර කළා, ඇති වන තත්ත්වය මොකක්ද කියලා. එතුමා කිව්වා, නොයෙකුත් පරස්පර විරෝධී තත්ත්වයන් ඇති වනවා කියලා. එක පුද්ගලයකුට මෙවැනි විශාල බලයක් ලබා දෙනකොට ඇති වන තත්ත්වය මොකක්ද කියලා එතුමා පැහැදිලි කළා. එතුමාගේ වචනවලින්ම කිව්වා "Power corrupts, and absolute power corrupts absolutely" කියලා. ඉතින් එවැනි තත්ත්වයක් මතු වුණා. ඒක මුලින්ම අපට දකින්නට ලැබුණා, 1977 සිට 1994 දක්වා පැවැති එක්සත් ජාතික පක්ෂ පාලන කාලයේ දී. ඒ කාලයේ දී සිදු වුණු දේවල් අපි දන්නවා. 1977 මැතිවරණ ජයග්‍රහණයත් එක්කම පොලීසියට සතියක් නිවාඩු දුන්නා. යටියන්තොට කොට්ඨාසයේ අපේ හිතවතුන්ගේ නිවාස 57ක් පුච්චලා විනාශ කළා. අන්න ඒ වාගේ තත්ත්වයක් එදා ඇති වුණා. 1980 දී ඇති වුණු තත්ත්වයත් අපි දන්නවා. අවුරුදු තුනක් තිස්සේ වැටුප් වැඩි වීමක් නොලැබුණු නිසා රුපියල් 10ක වැටුප් වැඩි වීමක් ඉල්ලා වර්ජනය කරපු කම්කරුවන් දස දහස් ගණනක් රැකියාවලින් දොට්ට දැමුවා. ඒ ආකාරයට පමණක් නොවෙයි, ජාතිවාදය අවුස්සලා එතැනින් එහාට ඇති වුණු තත්ත්වයත් අපි දන්නවා. ඒ තුළින් තමයි ත්‍රස්තවාදය බිහි වෙලා අවුරුදු 30ක යුද්ධයකුත් අන්තිමේ දී ඇති වුණේ. ඉතින් මේ වාගේ තත්ත්වයන් එක්ක භීෂණය දියුණු වුණා, දූෂණය ඇති වුණා.

එදා කිව්වා, මහවැලිය ගමන් කරන්නේ, ඒ ප්‍රධාන සංවර්ධන යෝජනා ක්‍රමය ගමන් කරන්නේ ට්‍රින්කෝවලට නොවෙයි, ෆින්කෝවලට කියලා. ඒ ආකාරයට දූෂණ, වංචා, අක්‍රමිකතා සිද්ධ වුණා. මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර වාගේ බුද්ධිමතෙක් වේදිකාවේ කථා කරන කොට මැරවරයින් යොදවලා පහර දුන්නා. සුප්‍රසිද්ධ මාධ්‍යවේදී රිවඩ් ද සොයිසා ඝාතනය කළා. මේ හදපු ව්‍යවස්ථාව තුළ ඇති කළ විධායක ජනාධිපති ක්‍රමය නිසා මේ වාගේ තත්ත්වයන් ඇති වුණා. මේවා වෙනස් කරන්න ඕනෑය කියලා එදා සිට සම සමාජ පක්ෂයත්, වමත් තදින්ම ඉල්ලීමක් කළා. නමුත් ඒ තත්ත්වය ඇති වුණේ නැහැ. ඒ වෙනස් වීම් සිද්ධ වුණේ නැහැ. පසු ගිය ආණ්ඩුව තුළත් අපි දිගටම ඒ ඉල්ලීම කළා. ඒවා දැන් ක්‍රියාත්මක වීම ගැන අපේ ඉමහත් සතුට පළ කරනවා. මේ තත්ත්වය ඇති වීමට යම් විවිධ හේතූන් බලපා තිබෙනවා. මේවා අපට අමතක කරන්නත් බැහැ. මෙහිදී අපි තේරුම් ගන්න ඕනෑ දෙයක් තිබෙනවා. මේ වෙනස්වීම ඇතිවෙන කොට, ජාත්‍යන්තර වශයෙන් අධිරාජ්‍යවාදීන්ට තමන් මුහුණ දෙන ආර්ථික අර්බුදයෙන් ගොඩ එන්න අවශ්‍ය වෙලා තිබෙනවා. නව යටත්විජිතවාදී ප්‍රතිපත්තියක්, නව ලිබරල්වාදී ප්‍රතිපත්තියක් හරහා සකස් කරන න්‍යාය පත්‍රය අප රටවල්වල ක්‍රියාත්මක කරන්න අවශ්‍ය වෙලා තිබෙනවා. ඒකට සුදුසු පාලනයක් ඇති කරන්න ඕනෑ. ඒකයි එක්සත් ජාතික පක්ෂය "යළි පුබුදමු ශ්‍රී ලංකා" කියලා වැඩ පිළිවෙළක් ඉදිරිපත් කළේ. ඔවුන් 2002 බලයට ඇවිල්ලා, ඒක ක්‍රියාත්මක කරන්න ගිහිල්ලා අපේ රටේ ජනතාව 2004 දී ඒක ප්‍රතික්ෂේප කළා. ඒවා තමයි ජාත්‍යන්තර වශයෙන් මේ ක්‍රියාත්මක වෙන්නේ. මැදපෙරදිග ඉරාකය වෙන්න පුළුවන්, ලිබියාව වෙන්න පුළුවන්, ඊජිප්තුව වෙන්න පුළුවන්, මේ ආකාරයට ආණ්ඩු වෙනස් කිරීමේ වැඩ පිළිවෙළක් දියත් කරනවා. අප්‍රිකාවේ සුඩානය, මාලි, සෝමාලියා, මධ්‍යම අප්‍රිකානු සමූහාණ්ඩුව ඒවා කර ගෙන යනවා. ආසියාවේ තායිලන්තයේ දැන් මිලිටරි පාලනයක් ඇති කරලා, ඒ න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරනවා. ලංකාවේත් ඒ න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමේ වුවමනාව මතුවෙලා තමයි මහින්ද රාජපක්ෂ ආණ්ඩුව -එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුව- පෙරළීමට මේ විශාල බලවේගයක් ගොඩ නැඟුණේ. මේකට අපේ පැත්තෙනුත් වැරදි තිබුණා. ඒවා ආයුධ කර ගත්තා. අපි පිළිගන්න ඕනෑ දූෂණ, වංචා, අක්‍රමිකතා, නාස්තිය, ඥාති සංග්‍රහය ඒ වාගේම නීතිය සහ සාමයේ යම් කඩා වැටීම් සිද්ධ වුණා කියලා. නීතියේ පරමාධිපත්‍ය පිළිබඳ ප්‍රශ්න මතුවෙලා තිබුණා. මේවා අපි හරි ගස්සන්න ඕනෑ කියලා පිට පිටම ආණ්ඩුව තුළ ඉඳගෙන අපි සම සමාජ පක්ෂය වම හැටියට ඉල්ලීම් කළා. මේවා වෙනස් කරන්න බැලුවා. නමුත් මේ තිබෙන රාමුව තුළ ඒවා වෙනස් කරන්න පුළුවන් වුණේ නැහැ.

අපි දන්නවා, හැම ධනපති සමාජයක් තුළ, ජාත්‍යන්තර වශයෙන් බැලුවොතින් ඇමෙරිකාවේ වේවා, බ්‍රිතාන්‍යයේ වේවා, ඉන්දියාවේ වේවා, චීනයේ පවා දැන් ධනපති සංවර්ධන ගමනක් යද්දී මේ ප්‍රශ්න මතුවෙලා තිබෙනවා. චීනයේ කොමියුනිස්ට් පක්ෂයේ ඉහළ පෙළේ නායකයින් වුණත් හිරේ දාන්න සිද්ධ වෙලා තිබෙනවා. ඉන්දියාවේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගෙන් තුනෙන් පංගුවකට විරුද්ධව උසාවිවල නඩු තිබුණා. ඒ තත්ත්වයන් තමයි ජාත්‍යන්තර වශයෙන් තිබෙන්නේ. ඒ තත්ත්වයන් තමයි ලංකාවේත් තිබෙන්නේ. මේවා අපි වෙනස් කරන්න ඕනෑ. මේ ප්‍රශ්නය අපේ බුද්ධිමත් ජනතාවට තේරිලා, මේක වෙනස් කරන්න ඕනෑයි කියන මත ධාරාවක් අප රට තුළ මතු වුණා. ඒක එක හේතුවක් වුණා, මෙවර ජනාධිපතිවරණයේ දී ඇති වුණු වෙනස් වීමට. අපි දැන් මේ අවස්ථාවේදී මිශ්‍ර තත්ත්වයකට පැමිණ සිටිනවා. ගරු දිනේෂ් ගුණවර්ධන හිටපු ඇමතිතුමා අර්ස්කින් මේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය ගැන සඳහන් කළා. දැන් අපේ රටේ රාජ්‍ය නායකයා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ, ඒ අතරම විරුද්ධ පක්ෂයේ නායකයාත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ. මේ වාගේ තත්ත්වයක් දැන් තිබෙනවා. බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු ක්‍රමයේ ඉතිහාසය දිහා බැලුවාම ටෝරීස් සහ විග්ස් කියලා බෙදීමක් තිබුණා. ඒ කාලයේ ඉඳලාම පැහැදිලි බෙදීමක් මේ පාර්ලිමේන්තුව තුළත් තිබුණා. දැන් ඒක නැති වෙලා තිබෙනවා. මෙවැනි තත්ත්වයක් ඇති වීමෙන් වුණත් මම හිතනවා, රටට සෙතක් ඇති වෙන තත්ත්වයක් දැන් ගොඩ නැඟිලා තිබෙන බව. මෙතැනදී පටු විධියට කල්පනා කරන්නේ නැතිව රටට අවශ්‍ය, අපේ ඉදිරි ගමනට අවශ්‍ය වෙනස් වීම ඇති කරන්න අපි බලන්න ඕනෑ. ඒ වෙනස් වීම ඇති කිරීම සඳහා පාර්ලිමේන්තුවේ එකඟත්වයක් තිබෙනවා, එක වුවමනාවක් තිබෙනවා කියලා අද කථාවලට සවන් දෙන කොට අපට පැහැදිලි වෙනවා. මම ඒ ගැන සන්තෝෂ වෙනවා. අපේ ජනතාවගේ වුවමනාවත් මෙතැන මතු වෙලා තිබෙනවා. මේකට ඇහුම් කන් දීලා මේ ව්‍යවස්ථා වෙනස්කම් කරන්නට අපි සියලු දෙනාම එක්ව කටයුතු කරන්න ඕනෑ. අපි නම් තදින්ම ඉන්නේ විධායක ජනාධිපති ක්‍රමය සම්පූර්ණයෙන්ම ඉවත් කරන්න ඕනෑ කියන මතයේයි. නමුත් විධායක ජනාධිපති ක්‍රමය තියා ගෙන ඒකේ තිබෙන බලතල අඩු කරනවා නම් අඩු කිරීමේ ප්‍රමාණය වැඩි වන තරමට හොඳයි කියලා අපි කියනවා. සාමාන්‍යයෙන් බැලුවාම

[ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා]

විධායක බලතල දෙන්න ඕනෑ එක්කෝ ජනාධිපතිතුමාට, නැතිනම් පාර්ලිමේන්තුව පදනම් කර ගත් කැබිනට් මණ්ඩලයක අගමැති කෙනෙකුට. මේ දෙකම මිශ්‍ර කරන්න ගියාම යම් ප්‍රශ්න ඇති වෙන්න පුළුවන්. මම හිතන්නේ ඉදිරියේ අපි කමිටු පිහිටුවලා සාකච්ඡා කරන අවස්ථාවේ මේවා ගැන අදහස් හුවමාරු කරලා නිසි තැනකට එන්න අපට පුළුවන් වේවි.

මේ එක්කම මැතිවරණ ක්‍රමයත් වෙනස් කළ යුතුයි. දැනටමත් ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැති තේරීම් කාරක සභාවට යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවා. ඒවා හැමෝම වාගේ පිළිගත්තා. ඒවා සම්මත කරලා, හැකි ඉක්මනින් ක්‍රියාත්මක කරලා, ලබන මැතිවරණයේදීම ක්‍රියාවේ යොදවන්න කියලා මම ඉතාමත් ඕනෑකමින් ඉල්ලීමක් කරනවා.

දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබුණු අඩු පාඩුකම් නිවැරදි කිරීමට ගරු ඩිව් ගුණසේකර හිටපු ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් තේරීම් කාරක සභාවක් පත් කරලා, ඒ සභාව පාර්ලිමේන්තුවේදී රැස් වෙලා ඒ සඳහා සංශෝධන ගෙනාවා. ඒකත් වැඩි කාලයක් යන්නට ප්‍රථම ක්‍රියාත්මක කරන්නට පුළුවන් වේවි. මේ දින 100 තුළ ක්‍රියාත්මක කරන දේවල් වැදගත් දේවල් හැටියට ඉදිරියට ගෙන යන්නට අප බලන්නට ඕනෑ.

පූජ්‍ය අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ කථා කරද්දී, උන්වහන්සේ උතුරේ ප්‍රශ්නය ගැන කථා කළ ආකාරය ගැන මා සන්තෝෂ වුණා. මා හිතන්නේ අපි හොඳ තැනකට ඇවිත් තිබෙනවාය කියායි. දෙමළ ජාතික සන්ධානයත් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට සහාය දී තිබෙනවා. ඒක පදනම් කරගෙන දෙමළ ජනතාව අවදි වෙලා පසු ගිය ජනාධිපතිවරණයට සම්බන්ධ වෙලා තමන්ගේ ඡන්දය පාවිච්චි කරලා තිබෙනවා. මේක හොඳ නිමිත්තක්. මේක පදනම් කර ගෙන අපි බලන්නට ඕනෑ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරන ගමන් මේ ජාතික ප්‍රශ්නය විසඳන තැනටත් යන්න. ජාති භේද, කුල භේද, ආගම් භේද අවුස්සන්නේ නැතිව අපි සියලු දෙනාම මේ ජාතික ප්‍රශ්නය විසඳීමට අවශ්‍ය ව්‍යවස්ථා සංශෝධන ඇති කිරීමට හා අලුත් ව්‍යවස්ථාවක් පවා සකස් කිරීමට කටයුතු කළ යුතුයි. මා සභාපති හැටියට කටයුතු කළ සර්ව පාක්ෂික කමිටුවේ අපේ යෝජනා තිබෙනවා. මේවාත් සිතට අරගෙන අපට පුළුවන් වේවි මේ ප්‍රශ්නය නිසි ලෙස විසඳන තැනකට ගෙන එන්න. එය කළෝතින් අපේ රටේ අනාගතයට අවශ්‍ය දියුණුව ඇති කිරීම සඳහා අප රට එක ලාංකික ජාතියක් ජීවත් වන රටක් හැටියට අනන්‍යතාවයක් ගොඩ නඟා, ඉදිරි කාලයේදී අපේ රට නියම ලෙස ආසියාවේ ආශ්චර්ය බවට පත් කරන්නට පුළුවන් වේවි. අපේ රටේ දක්ෂයෝ ඉන්නවා. අපට විද්‍යාවයි, තාක්ෂණයයි උපයෝගි කර ගෙන, අපේ අමු ද්‍රව්‍යවලට උපරිම වටිනාකමක් එකතු කරන කර්මාන්තකරණයක් ඇති කිරීමට යම් පදනමකුත් ඇති කර තිබෙනවා. ඒ තත්ත්වය උපයෝගි කර ගෙන අපේ රට දියුණු කාර්මික රටක් කරන්නට පුළුවන් වේවි. අපහසුතාවන් මැද වුවත් අපේ රටේ ජනතාව මේ ජනාධිපතිවරණයට මැදිහත් වෙලා සියයට 81ක් ඡන්දය පාවිච්චි කර, තමන්ගේ මතය තුළින් මේ වාගේ වෙනසක් කිරීමට සුදුසු වාතාවරණයක් ගොඩ නඟා තිබෙනවා. අප ඒක අත් හරින්නට හොඳ නැහැ. අප සියලු දෙනාම හොඳ හිතින් එක් වෙලා මේ දින 100 තුළ අපේ රට අනවශ්‍ය ප්‍රශ්නවලින් බේරා ගෙන, එක ලාංකික අනන්‍යතාවක් පදනම් කර ගෙන ඉදිරියේ රට දියුණු කිරීමට බලමු. අපේ විවිධ දේශපාලන ප්‍රතිපත්ති, ආර්ථික ප්‍රතිපත්ති තිබෙනවා. විවිධ වැඩ පිළිවෙළවල් තිබෙනවා. ඊළඟ මැතිවරණයේදී අප ඒවා රටට ඉදිරිපත් කරමු. ජනතාවට ඒවා අතරින් අවශ්‍ය හොඳ දෙය තෝරන්නට පුළුවන්. ඒවා පදනම් කරගෙන අපේ රට නියම ලෙස සංවර්ධිත පෙහොසත් රටක් කරන්නට අවස්ථාව ඇති වේවායි ප්‍රාර්ථනා කරමින්, මට මේ අවස්ථාව ලබා දීම ගැන ගරු කථානායකතුමාට ස්තූතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති. ඉන් පසුව ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමාගේ කථාව.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.

Whereupon MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *took the Chair.*

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 3.41]

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළමුවෙන්ම මේ පාර්ලිමේන්තුවේ අභිනව අග්‍රාමාත්‍යවරයා හැටියට පත් වුණු ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමන්ට මගේ සුබ පැතුම් එකතු කරන්නට කැමැතියි. එතුමාගේ කථාවේදී එතුමා මගේ නමත් සඳහන් කළා. මට පැහැදිලි නැහැ, එතුමා මගේ නම සඳහන් කළේ මොන කාරණාවක් අදාළ කොට ගෙනද කියා. කොහොම වුණත් එතුමා කිව්වා, හිටපු ජනාධිපතිතුමාගේ පරාජයට වග කියන්නට ඕනෑ මම ය කියා. එහෙම නම් මා හිතනවා, ඔබතුමා මාව මිතුරකු හැටියට සලකාවි කියා. ඔබතුමාගේ දේශපාලන මිතුරකු බවට පත්වීමේ නම් කිසිම අදහසක් මට නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාට සුබ පතන ගමන් මම මේ කාරණයත් කියන්නට ඕනෑ. ගරු අග්‍රාමාත්‍යතුමනි, ඔබතුමා තමයි ලංකා ඉතිහාසයේ ජනාධිපතිවරයා දිවුරුම් දුන් ගමන්ම අග්‍රාමාත්‍යවරයා හැටියට ඒ පත් වීම ලබා ගන්නට වාසනාව තිබුණු පුද්ගලයා. ඒකත් විශේෂ කාරණාවක් හැටියට මේ වෙලාවේ මතක් කරන්නට කැමැතියි.

ඔබතුමන්ලා බලයට එන්නට ප්‍රධාන වශයෙන්ම පාදක කොට ගත්තේ දින සියයක අසිරිමත් වැඩසටහනක් පිළිබඳ ක්‍රියාකාරි කාලසටහනයි. ඒ කාලසටහන මා බැලුවා. දැනටමත් ඒ කාලසටහනේ දීපු වෙලාවලට නම් මෙතෙක් කෙරෙන්නට තිබුණු දේවල් කිහිපයක්ම කෙරිලා නැහැ. කෙසේ වෙතත්, දින සියය ඇතුළත ඒ කියපු සියල්ල තමුන්නාන්සේලා ඉටු කරාවිය කියා අපි බලාපොරොත්තු වෙනවා.

ඒ දින සියයේ වැඩ පිළිවෙළට ලැබුණු ජනවරමට තමුන්නාන්සේලා අවංකවම ප්‍රතිචාර දක්වයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. රටේ යහපත වෙනුවෙන් කරන ඕනෑම කාර්යයකට අපේ සහයෝගය දෙන්න අපි පැකිළෙන්නේ නැහැ කියන එකත් අවධාරණය කරන්න කැමැතියි. හැබැයි, තමුන්නාන්සේලාට සින්න වුණ විරුද්ධ පක්ෂයක් හැටියට නම්

නොවෙයි. විරුද්ධ පක්ෂය කිව්වාම මට පෙනෙන විධියට ප්‍රධාන වශයෙන් මෙතැන කණ්ඩායම් දෙකක් තිබෙනවා. තමුන්නාන්සේලා විසින් hijack කරපු විරුද්ධ පක්ෂයක් තිබෙනවා. එසේ නොවන්නා වූ විරුද්ධ පක්ෂයක් තිබෙනවා. අපි ඒ hijack කරපු විරුද්ධ පක්ෂයට අයිති නැහැ. එහෙම විරුද්ධ පක්ෂයකින් මේ රටට වැඩකුත් නැහැ. තමුන්නාන්සේලා එක අතකින් නව ගුණ වැල අතේ තියා ගෙන අනෙක් අතින් පොලු මුගුරු අතේ තියා ගෙන තමයි මේ සම්මුති කාමයක් ගැන කථා කරන්නේ.

තමුන්නාන්සේලා අද "ජාතික ආණ්ඩුවක්" කියන සංකල්පයක් ගැන කථා කරනවා. ලිච්ඡවි රජ දරුවන් වාගේ මේ වැඩ පිළිවෙළ කර ගෙන යමු කියලා කියනවා. හැබැයි, එහෙම කියද්දී එක අතක නව ගුණ වැල තිබෙනවා. අනෙක් අතේ මුගුර තිබෙනවා. මේ රටේ හැම තැනකම අද ඒ මුගුරෙන් පහර දෙනවා, බුලත් කොළයට ඡන්දය දීපු ලක්ෂ 58ක් පමණ මිනිසුන්ට; ඒ මිනිසුන්ට නායකත්වය දීපු ගම්වල මිනිසුන්ට; වෘත්තීය සමිතිවල සාමාජිකයන්ට. රජයේ කර්මාන්තශාලාවේ -ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වෘත්තීය සමිතියේ සභාපතිට, ලේකම්ට ඊයේ පහර දුන්නා. ඒ වාගේම සමහර මාධ්‍යවේදීන්ට රස්සාවට යන්න දෙන්නේ නැහැ. මා හිතවත් අපේ තරුණ ජනමාධ්‍ය ඇමතිතුමා ඉන්නවා. එතුමාට මම කියන්න කැමැතියි, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ, ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමයේ සභාපති සුනිල් දිසානායකගේ, ඒ වාගේම ප්‍රධාන සංවිධායක ගාල්ලගේ මැතිතුමාගේ කිසිදු හේතුවක් නැතුව වැඩ තහනම් කරලා තිබෙන බව. දේශපාලන පළිගැනීම නග්න ලෙස ගමේ සිදු වෙනවා.

අපේ විපක්ෂ නායකතුමා මෙතැනදී මොන සම්මුති කාමයක් ගැන කථා කළත්, මෙතැනදී තමුන්නාන්සේලා මොන සම්මුති කාමයක් ගැන කථා කළත්, ජනාධිපතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිතුමා වුණත්, විපක්ෂ නායකතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කෙනෙක් වුණත්, මෙතැන තිබෙන අරුමෝසම් සම්මුතිය පොළොවේ නැහැ, ගරු අග්‍රාමාත්‍යතුමනි. මතුගම සිද්ධියෙන් පෙන්නුවේ ඒ පොළොවේ තිබෙන සම්මුතිය. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් දණ ගස්වලා, වන්දලා, ලජ්ජාවට, අවමානයට පත් කරලා, ඒ විධියට කටයුතු කරනවා නම්, එතැන තිබෙන සම්මුතිය මොකක්ද? මෙතැන තිබෙන ව්‍යාජ සම්මුතිය නොවෙයි වැදගත් වන්නේ. අර ලක්ෂ 58ක් පමණ ජනතාවත් එක්ක තිබෙන සම්මුතිය මොකක්ද කියන එකයි වැදගත් වන්නේ. මේක ව්‍යාජ සම්මුති කාමයක්. වෙන මොකක්වත් නොවෙයි මේ කරන්නේ. අර ලක්ෂ 58ක ජනතාව තමුන්නාන්සේලාගේ මුගුරෙන් අමු අමුවේ පහර කෑම දක්වා නිදහසේ ඉඩ කඩ විවෘත කර දීම පමණයි මේ කරන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය වැඩිදියුණු වෙනවාට අපි පක්ෂපාතියි. මැතිවරණ ක්‍රමය වඩා සාධාරණ ක්‍රමයක් වෙනවාට අපි පක්ෂපාතියි. ජනාධිපති ධුරයේ තිබෙන යම් අත්තනෝමතික බලතල ඉවත් වෙනවා නම්, අපි ඒකට පක්ෂපාතියි. හැබැයි, එකක් කියන්න ඕනෑ. ප්‍රජාතන්ත්‍රවාදයේ රෙදි කඩ මාල්ලෙන් ඇස් වහලා, ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ රෙදි කඩ මාල්ලෙන් ඇස් වහලා, මේ රටේ විපක්ෂ බලවේග පොඩි පට්ටම් කරලා, තමුන්නාන්සේලා බෙදුම්වාදී න්‍යාය පත්‍රය කරළියට ගෙනෙන්න හදන බව අපි දන්නවා. ඒක තමයි තමුන්නාන්සේලාගේ සැඟවුණු අරමුණ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තවම දින 10යි ගත වුණේ. මේ දින 10 ඇතුළත සිදු වුණු දේවල් දිහා බලන්න. දින සියයේ වැඩ පිළිවෙළේ තිබෙන එකක්වත් වෙනවා තවම අපි දැක්කේ නැහැ. නමුත් දින 10 ඇතුළත මොකක්ද වුණේ? උතුරේ අධි ආරක්ෂිත කලාප හා හමුදා කඳවුරු ඉවත් කිරීම ගැන දැන් ආරක්ෂක අමාත්‍යාංශය අධ්‍යයනයක් කරනවා. ඊළඟට මොකක්ද වුණේ? ද්‍රවිඩ ජාතික සන්ධානයේ ඉල්ලීම පරිදි උතුරු පළාතේ හිටපු ආණ්ඩුකාරතුමාව ඉවත් කළා. ඊළඟට මොකක්ද වුණේ? ඩග්ලස් දේවානන්ද හිටපු ඇමතිතුමාගේ ආරක්ෂාව සම්පූර්ණයෙන්ම අයින් කළා. මේ රටේ යුද්ධය පැවැති කාලයේ ත්‍රස්තවාදයට විරුද්ධව හිටපු නායකයෙක් එතුමා. ආණ්ඩු වෙනස් වෙන්න පුළුවන්. නමුත් ජාතික යුතුකමක් හා වගකීමක් තිබෙනවා, ජාතිය වෙනුවෙන් එබඳු තීරණාත්මක කාර්යයකට උරදුන් මිනිසුන් පාවා නොදී ඉන්න. ඩග්ලස් දේවානන්ද හිටපු ඇමතිතුමා කියන්නේ, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයට ඇවිල්ලා ත්‍රස්තවාදය මැඩ පවත්වන්න තමන්ගේ ප්‍රායෝගික ජීවිතය කැප කරපු නායකයෙක්. ආණ්ඩුව පෙරළුණු පමණින් එවැනි කෙනෙක්ව අනාරක්ෂිත වාතාවරණයකට තල්ලු කිරීම හරිද? ඔහුගේ ජීවිතය අවදානමට ගොදුරු කිරීම හරිද? ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපට තිබෙන්න පුළුවන්, එක එක දේශපාලනඥයන් පිළිබඳ පෞද්ගලික මැත බැලීම්. ඒ වුණාට අනිවාර්යයෙන් රටක් හැටියට මේ දිහා බලන්න අද බල කෙරිලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. තමුන්නාන්සේලා මේ වෙනකොට "ටැම්ල් නෙට්" වෙබ් අඩවිය බලන්න පුළුවන් තත්ත්වයට හදලා දීලා තිබෙනවා. ඩග්ලස් දේවානන්දගේ ආරක්ෂාව අයින් වෙනවා. "ටැම්ල් නෙට්" වෙබ් අඩවිය බලන්න පුළුවන් වෙනවා. ඒ විතරක් නොවෙයි. උතුරට යන්න තිබෙන සංචාරක බාධා ඉවත් වෙනවා. ඒ විතරක් නොවෙයි. මේ කෙටි කාලය ඇතුළත තමුන්නාන්සේලා ඒ න්‍යාය පත්‍රයට අදාළ ක්‍රියාකාරිත්වය නම් බොහොම වේගයෙන් ඉදිරියට ගෙන යනවා. හැබැයි, ඒක මාධ්‍යවලින් පෙනෙන්න දෙන්නේ නැහැ. ඒවා වහනවා. වහන්නේ මොනවායින්ද? ලැම්බොගිනි හොයන ඒවායින් වහනවා. ලැම්බොගිනි හොය හොයා ගෙවල් අස්සේ රිංගනවා. තිබෙන ලැම්බොගිනියක් තිබෙන තැනකින් සොයා ගන්න, නිකම් මාධ්‍ය සංදර්ශන නොකර. ලැම්බොගිනි කියන්නේ පොල් කට්ටෙන් වහලා තියා ගන්න පුළුවන් දේවල් නොවෙයි.

තමුන්නාන්සේලා නැව් ගැන කියනවා. දෙයියනේ නීත්‍යානුකූලව මේ රටේ අවුරුදු ගණනාවක් ක්‍රියාත්මක වෙච්ච, ආයුධ සහිතව තිබ්බ නැවක් ඒක. ඒක කවුරුත් දන්නා දෙයක්. ඒ නැව අල්ලා ගෙන, මේ රටේ මහා මිලිටරි පාලනයක් එන්න තිබුණාය කියා පෙන්වන්න හදනවා. ගරු අග්‍රාමාත්‍යතුමනි, තමුන්නාන්සේම කිව්වා, "මහින්ද රාජපක්ෂ කියන්නේ යුද්ධය ජයග්‍රහණය කරපු නායකයා; ඔහුට හිමි නිසි ගෞරවය ඔහුට ලබා දිය යුතුයි" කියා. ඒ ප්‍රකාශය කරනකොට මම හිතුවා චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය වැනි අය ඒ ප්‍රකාශය දිහා මොන විධියට බැලුවත්, ඔබතුමා එක්තරා පුළුල් මනසකින් මේ ප්‍රශ්නය දිහා බලන කෙනෙක්ය කියා. කනගාටුයි කියන්න, මගේ ඒ සිතිවිල්ල බොහොම කෙටි කාලයකින් තුරන් වෙලා තිබෙනවා.

මෙතැනදී තමුන්නාන්සේලා එකක් තේරුම් ගන්න ඕනෑ. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා මේ රටේ තවත් එක ජනාධිපතිවරයෙක් විතරක් නොවෙයි. විපක්ෂ නායකතුමාට ඒක කියන්න බැරි වුණාට අපට ඒක කියන්න පුළුවන්. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයා මේ රටේ තවත් එක ජනාධිපතිවරයෙක් නොවෙයි; තවත් එක ජනාධිපතිවරයෙක් නොවෙයි. ජීවිත අවදානමක් අරගෙන, අනාගතයේ තමන්ට මොන යුද අපරාධ අධිකරණවලට යන්න වෙයිද, නොවෙයිද කියන ප්‍රශ්න ගැන නොහිතා, ආරක්ෂක ලේකම්තුමා වැනි අය ජීවිත අවදානමක් අරගෙන මේ රටට අභය දානය දුන්නා. කරුණාකරලා, එහෙම රාජ්‍ය නායකයෙකුට අවමන් කරන්න එපා. අසාධාරණ, අසත්‍ය චෝදනාවලින් දමලා ගහන්න එපා. කේන්තියක්, වෛරයක් තිබෙනවා නම් අපට ඕනෑ තරම් මඩ ගහන්න. ඕනෑ නම් හිරේත් දමන්න. හැබැයි තමුන්නාන්සේලා, අපි කවුරුත් බුක්ති විඳින මේ සාමය ඇති කරන්න, මේ රට බේරා ගන්න, නිදහස් කර ගන්න, තමුන්නාන්සේලා, අපි කවුරුත් බුක්ති විඳින මේ නිදහස, මේ නව ජීවිතය මේ ජාතියට දිනවලා දෙන්න එතුමා පුරෝගාමී වුණා. අතුරලියේ රතන හාමුදුරුවො කිව්වා, මේක මහින්ද රාජපක්ෂගේ තනි වැඩක් නොවෙයි කියා. හැබැයි කොහේ හරි පොලිසියක් හරි, හමුදාවක් හරි උද්ඝෝෂණයකට පහර දුන්නා නම් අන්න, රාජපක්ෂ ඒක මර්දනය කළාය කියනවා. එතකොට ඒක

[ගරු විමල් වීරවංශ මහතා]

රාජපක්ෂලාගේ වැඩක්. ගම්පහ, රතුපස්වල ජනතාව වතුර ඉල්ලා කරපු උද්ඝෝෂණයට පහර දුන්නාම ඒක රාජපක්ෂගේ මැර ප්‍රහාරයක්. එතකොට රාජපක්ෂ.

යුද්ධය දිනුවාම ඒක රාජපක්ෂට විතරක් තනි අයිතියක් නැහැ; ඒක අපි කාගේත්, හැමෝගෙම එකක්. එහෙම නොවෙයි. ඒ වාගේ පටු විධියට මේ දිහා බලන්න එපා. එතුමා මේ රටේ හිටපු ජනාධිපති. එතුමාගේ ගරුත්වය හා ආරක්ෂාව වෙනුවෙන් අපි පෙනී ඉන්නේ කිසිම වාසියක් බලාපොරොත්තුවෙන් නොවෙයි. එතුමා නැවත දේශපාලන ක්‍රියාවලියට ඒවිද නැද්ද කියන එක අපට කියන්න බැහැ. කොහොම වුණත් එතුමා නැවත දේශපාලනයට ආවත්, නැතත් අපට සදාචාරාත්මක බැඳීමක් තිබෙනවා. මේ රටට, මේ ජාතියට සදාචාරාත්මක බැඳීමක් තිබෙනවා, යුතුකමක් තිබෙනවා. එතුමාට අවමන් කරන්න එපා, අවමන් කරන්න එපා. කොටි ත්‍රස්තවාදීන්ට ඕනෑ වුණා, මේ පුද්ගලයා අවමානයට ලක් කරන්න.

ජාත්‍යන්තරව කොටි ත්‍රස්තවාදීන් තමයි හිට්ලර්ගේ රැවුල දමලා, ඒකාධිපතියා, ආඥාදායකයා කියන මේ මතය මුලින් ගොඩ නැගුවේ. පසුව අනික් කට්ටියත් ඒකට සම්මාදම් වෙලා දැන් තවදුරටත් ඒ චරිතය අපකීර්තියට පත් කරලා තිබෙනවා. ඔවුන්ට ඕනෑ කරන නිමාව ඇති කිරීම සඳහා තමුන්නාන්සේලා සහයෝගය දෙන්න එපා. හවුල් වෙන්න එපා. කරුණාකරලා ඒ අවම සදාචාරාත්මක යුතුකම ගැඹුරින් පිළිපදින්නය කියා මම තමුන්නාන්සේගෙන් ඉල්ලනවා, ගරු අග්‍රාමාත්‍යතුමනි. අපි කියන්නේ, එක අතකින් නව ගුණ වැලයි, අනික් අතෙන් පොලු මුගුරයි පාවිච්චි කිරීමේ ක්‍රමවේදය කරුණාකරලා නවත්වන්නය කියන එකයි. පැවතිච්ච ආණ්ඩුවේ හිටපු කවුරු හෝ හොරකම් කරලා තිබෙනවා නම් ඒවාට නීත්‍යානුකූලව පියවර ගන්න. අප ඒවාට බාධා කරන්නේ නැහැ. හැබැයි, මේ රටේ භීෂණයක් ඇති කරන්න එපා.

තමුන්නාන්සේලා තව දවස් සියයකට පසුව මැතිවරණයකට යනවා. තමුන්නාන්සේලා ඒ දින සියයට අපෙන් සම්මුතිය ඉල්ලනවා. සම්මුතිකාමීව යමුය කියනවා. එහෙම සම්මුතිකාමීව කරට අත දමා ගෙන යන ගමන් අනික් පැත්තට ඇදගෙන වැටෙන්න විරුද්ධ පක්ෂයේ මිනිස්සුන්ට කකුලෙන් පහර දෙනවා. ගම්වල විරුද්ධ පක්ෂයේ මිනිස්සු ගුටි කනවා; වෘත්තීය සමිතිවල මිනිස්සු ගුටි කනවා. අපි මෙතැන සම්මුතියක් කථා කළාට වැඩක් වෙන්නේ නැහැ. අද තමුන්නාන්සේලා මේ කවුරුත් හොරු, හොරු කියා පෙන්වනවා. මේ ඔක්කොම හොරු කියා තමයි තමුන්නාන්සේලා පෙන්වන්නේ. එක්සත් ජාතික පක්ෂය හැර අනික් සියල්ලෝම හොරු. එතකොට හොරුන් සහ හොරු අතර සටනක් බවට තමුන්නාන්සේලා මේක පත් කර ගන්න හදනවා. මේක තමයි තමුන්නාන්සේලාගේ ඡන්ද ව්‍යාපාරයේ න්‍යාය පත්‍රය. එහෙම කරලා තමුන්නාන්සේලා පාර්ලිමේන්තුවේ වැඩි බලය අරගෙන එතැන් සිට තමයි ඊළඟ බෙදුම්වාදයේ අසිරිමත් මංගල්‍ය යුගය නිර්මාණය කරන්න හදන්නේ. දේශපාලන විසඳුමක් ගැන කියමින් හිටපු විපක්ෂ නායකතුමනි, -ගරු අග්‍රාමාත්‍යතුමනි- මේ එන්නේ මොකටද කියා අපි දන්නවා. ඒ නිසා අපි ඉතා ඕනෑකමින් මේ ටික කියනවා. අපි තමුන්නාන්සේලාට සුබ පතනවා. තමුන්නාන්සේලා මහජනතාවට දුන්නු බලාපොරොත්තු සහ ඒ අරමුණු අනුව තමුන්නාන්සේලාගේ පාලනය ගෙන යන්න පුළුවන් වේවාය කියා අපි ප්‍රාර්ථනා කරනවා.

හැබැයි, එක දෙයක් කියන්න කැමැතියි. ජීවිත පූජා කර ලේ හලා බේරා ගත්තු රටක්, දසක 3ක් තිස්සේ වද විඳපු රටක්, අවුරුදු 30ක් වද වින්ද රටක්, දුක් විඳපු රටක්, ගම්බද අසරණ අම්මලගෙ තාත්තලගෙ දරුවෝ හමුදාවට බැඳිලා දිවි පුදා බේරා ගත්තු රටක් මේක. ගරු අග්‍රාමාත්‍යතුමනි, ඒ රටට අත තියන්න නම් ලෑස්ති වෙන්න එපා. යහ පාලනයේ නාමයෙන්, යහ පාලනයේ නාමයෙන් එවැනි දෙයකට නම් ලෑස්ති වෙන්න එපා. ඒක මේ රටේ මිනිස්සු ඉවසන්නේ නැහැ. ඔබතුමන්ලා අලුතින් හිර ගෙවල් හදාවි. ඒ හිර ගෙවල්වලට මිනිස්සු පුරවාවි. ඒකට ඉඩ තියන්න අපි ලෑස්ති නැහැ කියන එක ඉතා ඕනෑකමින් කියන්න කැමැතියි.

ඒ විතරක් නොවෙයි, ඔබතුමන්ලා මාධ්‍ය මඟින් ගෙන යන ඒකපාක්ෂික ක්‍රියාවලිය කරුණාකර නතර කරන්න කියා අප ඉල්ලා සිටිනවා. විපක්ෂයේ ඉන්න කාලයේ නම් ඔබතුමන්ලාට "සිරස" තිබුණා; "ටීඑන්එල්" එක -ඔබතුමාගේ සහෝදරයාගේ නාළිකාව- තිබුණා. දැන් "සිරස", "ටීඑන්එල්", "ජාතික රූපවාහිනිය", "අයිටීඑන්" මොකක්ද කියලා සොයා ගන්න බැහැ. "අයිටීඑන්" එකට වඩා ආණ්ඩුවේ කියලා හිතෙනවා, "සිරස" බලන කොට. "සිරස"ට වඩා ආණ්ඩුවේ කියලා හිතෙනවා "ටීඑන්එල්" බලනකොට. "ටීඑන්එල්" එකට වඩා ආණ්ඩුවේ කියලා හිතෙනවා "ජාතික රූපවාහිනිය" බලනකොට. ඒ තුන හතරම -ඔක්කොම- අද සම්පූර්ණයෙන්ම ආණ්ඩුවට පක්ෂග්‍රාහීව හිර වුණු මාධ්‍ය නාළිකා බවට පත් වෙලා තිබෙනවා. බන්දුල පද්මකුමාර මැතිතුමා ඉදිරිපත් කළ ස්වර්ණවාහිනියේ "මුල් පිටුව" වැඩසටහන ගැලවිලා තිබෙනවා. මොකක්ද ඒ භීෂණය? හේතුවක් නැතිව මේවා වෙන්නේ නැහැ. "අපි එහෙම කිසිම බලපෑමක් කරලා නැහැ" කියලා තමුන්නාන්සේලා කියයි. ඒ කියන්නේ බලපෑමක් නොකරත් ආයතන ප්‍රධානීන්ට බයක් ඇති වෙලා තිබෙනවා. කරුණාකරලා ඒ බය ඇති කරන්න එපා. පසු ගිය ආණ්ඩුව කවදාවත් "මුල් පිටුව" වැඩසටහන නැවැත්වුවාද? බන්දුල පද්මකුමාර ආණ්ඩුව විවේචනය කළ ප්‍රවෘත්ති මුල් පිටුවෙන් ගෙනාවේ නැද්ද? ගෙනාවා. අපි ඒවාට විරසක වුණාද? නැහැ. "සිරස" නාළිකාවේ ආණ්ඩුව විවේචනය කරන වැඩසටහන් මොන තරම් ගියාද? පාළු ගෙයි කොච්චර වළං බින්දාද? අපි ඒවා ඉවසන්නේ නැතිව ඒවාට ප්‍රහාර එල්ල කළාද? නැහැ. ඒ නිසා කරුණාකරලා මාධ්‍යයට නිදහස දෙන්න; මාධ්‍යයට ප්‍රජාතන්ත්‍රවාදය දෙන්න; කරුණාකරලා මේ මත දරන්න තිබෙන අවස්ථාව දෙන්න. විරුද්ධ පක්ෂයේ ඉන්න කාලයේ ඔබතුමන්ලාත් ගොඩනඟපු ඒ පරමාදර්ශී මත කරුණාකරලා දැන් ක්‍රියාත්මක කරලා පෙන්වන්න. ඔබතුමන්ලා ඒ පරමාදර්ශී මත ගොඩක් ගෙනාවා. "යහපාලනය" කියන වචනය ඉතාම වැදගත් සංකල්පයක්. ඒ "යහපාලනය" කියන එක "ගව පාලනයක්" බවට පත් වෙන්න දෙන්න එපා. "යහපාලනය" කියන වචනයේ අර්ථයෙන්ම ඒක පවත්වා ගෙන යන්න.

අවසාන වශයෙන් අපි මේ ටික කියන්න කැමැතියි. අපි ඉන්නේ විරුද්ධ පක්ෂයේයි. අපි කවර ලෙසකින්වත් තමුන්නාන්සේලාගේ පාලනයට සින්න වුණු, එහෙම නැත්නම් උකස් කළ විරුද්ධ පක්ෂයකට අයිති නැහැ. මේ රටේ ලක්ෂ 58කට ආසන්න ජනතාව මහින්ද රාජපක්ෂ මැතිතුමා දිනවන්න කටයුතු කළා. දහසකුත් අවලාද බොරු බෙගල් ගහලා, පව වපුරලා, අද කියන ඔය නැව්වල ආයුධ තිබෙනවාය කියනවා වාගේ කථා, ඒ වාගේම කොහේවත් තිබෙන කාර් ඇදලා ඒවා ඒ පවුලේ ලැම්බෝගිනි කියනවා වාගේ කථා, ආරක්ෂක ලේකම් කියන නිල තනතුරට තිබෙන ගිණුම ගෝඨාභය රාජපක්ෂගේ පෞද්ගලික ගිණුමක්ය කියනවා වාගේ කථා සිය දහස් ගණනක් ගොතලා මිනිස්සුන්ගේ ඇස් නිලංකාර කරලා තමුන්නාන්සේලා බලය ගත්තාට කමක් නැහැ. නමුත් ඒ බලය ඒ ආකාරයට පවත්වා ගෙන යන්න බැහැ. ඒ නිසා අපි ඉතාම පැහැදිලිව කියන්න කැමැතියි, ඒ බුලත් කොළය ලකුණට ඡන්ද තව ලක්ෂ දෙකහමාරක් තිබුණා නම් මේ ප්‍රතිඵලය මීට වඩා වෙනස් වන බව. ඔය බොරු ප්‍රචාරක ව්‍යාපාරය තුළින් තමුන්නාන්සේලාට ඒ ඡන්ද ලක්ෂ දෙකහමාර හරවා ගන්න පුළුවන් වුණා. ඒක ප්‍රශ්නයක් නැහැ. හැබැයි, එක දෙයක් කියන්න කැමැතියි. මේ රටේ බහුතර ජනතාවගේ විශ්වාසය තිබෙන්නේ මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා කෙරෙහියි කියන එක තමුන්නාන්සේලා අමතක කරන්න එපා. ඒක අමතක කරලා ක්‍රියා මාර්ග තෝරන්න යන්න

එපා. ඒක ඉතා බරපතළ වරද්දා ගැනීමක්. ඒ නිසා අපි ඉතා ඕනෑකමින් කියනවා ඒ ලක්ෂ 58ක ජනතාව වෙනුවෙන් අපි පෙනී සිටින බව. ඒ විතරක් නොවෙයි, ඒ ජනතාවගේ බලාපොරොත්තු සඵල කරන්න අපි ඇප කැප වෙනවාය කියන එකත් අවධාරණය කරමින් සැබෑ විරුද්ධ පක්ෂයක් ගොඩ නහන්න එක් වෙන්න කියලා මේ සියලුම මන්ත්‍රීවරුන්ට ආරාධනා කරමින් මම මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ඔබ සියලු දෙනාටම සුබ පතනවා.

[අ.භා. 3.56]

ගරු ඩිව් ගුණසේකර මහතා
(மாண்புமிகு டீயூ குணசேகர)
(The Hon. DEW Gunasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ ගරු සභාවට පිවිසි අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට අපේ සතුටත්, අපේ සුබ පැතුමත් මා ප්‍රථමයෙන්ම පිරිනමනවා. ඒ වාගේම නව අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා තුන්වැනි වරටත් මේ රටේ අග්‍රාමාත්‍ය ධුරයට පත් වීම ගැනත් මේ අවස්ථාවේ අපේ සුබ පැතුම් ඉදිරිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට පෙර පැවැති මැතිවරණ හා සාපේක්ෂව බැලුවොත් 2015 ජනාධිපතිවරණය නිදහස්, සාධාරණ, සාමකාමී මැතිවරණයක් කියා කියන්න පුළුවන්. ඒ මැතිවරණය පැවැත්වුණේ අපේ ආණ්ඩුව යටතේයි. ඒ මැතිවරණය මෙහෙයවූ විශේෂයෙන්ම මැතිවරණ කොමසාරිස්තුමා, ඒ වාගේම එතුමාත් එක්ක එයට සෘජුව සහාය දුන් පොලිස්පතිතුමා ඇතුළු අනෙකුත් සියලු නිලධාරීන්ට අපේ ව්‍යවස්ථාදායකයේ ගෞරවය හිමි විය යුතුයි. මම හිතන විධියට එය අපි අපේක්ෂා නොකළ ආකාරයේ ඉතාමත්ම සාමකාමී මැතිවරණයක්. මාගේ තක්සේරුව අනුව නම් මැතිවරණ ඉතිහාසයේ පැවැති සාමකාමීම මැතිවරණය මේ මැතිවරණයයි.

මේ මැතිවරණයේදී ඡන්දදායකයන්ගෙන් සියයට 81ක් ඡන්දය පාවිච්චි කළා. ජනාධිපතිවරණ ඉතිහාසය ගැන බැලූ විට මෙය ඉහළම ප්‍රතිශතයක්. අනිකුත් මැතිවරණ ගැන බැලුවත් ඉහළම ප්‍රතිශතයක්. ඊයේ ජාතික දින උත්සවයකදී යුරෝපා තානාපතිවරු ගණනාවක් මට හමු වුණා. ඔවුන් ඉතාම ඉහළින් අගය කළ කාරණයක් තමයි, සෙසු සියලු රටවල් අබිබවා ශ්‍රී ලංකාවේ ඡන්ද දායකයින් දේශපාලන අවබෝධයකින් සහ හැඟීමකින් යුතුව සියයට 81ක ප්‍රතිශතයක් දක්වා ඡන්දය පාවිච්චි කිරීම. එය ඉදිරි ගමනට සුබ ලකුණක් කියලා ඔවුන් ප්‍රකාශ කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මෙතෙක් ලෝකයේ කිසිම රටක නොවූ ආකාරයෙන්, ප්‍රජාතන්ත්‍රවාදී විධියට තමන්ගේ පරාජය පිළිගෙන නික්ම ගියා. ඒ නිසාම ජනතාවගේ ගෞරවය වඩාත් වැඩි වුණා. ඒ අවස්ථාවේ කුමන්ත්‍රණයක් සිද්ධ වුණාද කියලා විවිධ මත මාධ්‍යය තුළින් මතු කරනවා. කුමන්ත්‍රණ ගැන අපට හොඳ අවබෝධයක් තිබෙනවා; අත් දැකීම් තිබෙනවා. ලෝකයේ තිබුණු කුමන්ත්‍රණ ගැනත් අපට අත් දැකීම් තිබෙනවා. හමුදා කුමන්ත්‍රණයක් සඳහා අග්‍රවිනිශ්චයකාරතුමා කැඳවා ගන්නවාද? හමුදා කුමන්ත්‍රණයක් සඳහා ඇටෝර්නි ජෙනරාල්තුමා කැඳවා ගන්නවාද? ඇත්ත වශයෙන්ම සිදු වූණු දේ පිළිබඳව කවුරුත් දන්නවා. නමුත් මම හිතන හැටියට ජන මාධ්‍යය තුළින් අනවශ්‍ය දේවල් ප්‍රචාරය කරනවා. එතුමා නිහඬවම නික්ම ගියා. එහි අගය අඩු කරලීමට නොයෙක් මාධ්‍යයන් විසින් ගෙනයන වැඩ පිළිවෙළ අපි ප්‍රතික්ෂේප කරනවා. රු දොළහේ ඉඳලා උදේ තුන හතර වන තුරුම විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුත්, අපි ඔක්කොමත් දුරකථන මාර්ගයෙන් කථා කරමින් හිටියේ. ඒ නිසා එවැනි කිසිම දෙයක් සිදු වුණේ නැති බව අප දන්නවා.

මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා 2005 ඉඳලා 2015 දක්වා කාලය තුළ කර තිබෙන වැඩ පිළිබඳව මම කථා කරන්න කැමැතියි. යුද්ධය ජයග්‍රහණය කිරීම ඔහුගේ පෞද්ගලික කාරණයක් නොවෙයි. යුද්ධය ජයග්‍රහණය කිරීමට දේශපාලන නායකත්වය දුන්නු පුද්ගලයා විධියට, රාජ්‍ය නායකයා විධියට, ජනාධිපතිතුමා විධියට කළ මෙහෙවර ඓතිහාසිකයි. ඔහු දේශපාලනයෙන් නික්ම ගිහින් තිබෙන අවස්ථාවේදී එය අපි ගෞරවයෙන් සිහිපත් කිරීම අවශ්‍යයි. ඒ වාගේම පසු ගිය අවුරුදු දහයක -2005 සිට 2015- කාලය තුළ අභියෝගයන් තිබුණා. ජාතික වශයෙන් තිබුණු අභියෝගය තමයි යුද්ධය. අනික් පැත්තෙන් ගත්තාම 2007 වර්ෂයේ ඉඳලා 2013 වර්ෂයේ දෙසැම්බර් දක්වා කාලය තුළ ජාත්‍යන්තර වශයෙන් ආර්ථික අවපාත, ආර්ථික අර්බුද කියන අභියෝගයන් පැවතුණා. ඒ අභියෝගයන් දෙකම තිබෙද්දී 2005 ඉඳලා 2015 දක්වා සියයට හයත්, සියයට අටත් අතරේ ආර්ථික සංවර්ධන වේගයක් ඇති කරලා, විශේෂයෙන්ම භෞතික සම්පත් සංවර්ධනය කිරීම තුළින් අපේ රට විශාල පිම්මක් ඉදිරියට ගියා. ඒක නැහැයි කියලා කාටවත් කියන්න පුළුවන්කමක් ඇත්තේ නැහැ. ඒ වෙනුවෙන් දේශපාලන නායකත්වය දුන්නු හිටපු ජනාධිපතිතුමා දේශපාලනයෙන් නික්ම ගිහින් තිබෙන අවස්ථාවේදී එතුමා අගය කරමින් කථා කිරීම මේ අවස්ථාවේ උචිත යැයි කියලා මම කල්පනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1986 ජූනි මාසයේ 19වැනි දා මේ ආසනයේ ඉඳ ගෙන නව දෙනාගේ විපක්ෂයට සම්බන්ධ වුණු කෙනෙකු හැටියට මා විශේෂයෙන් සන්තෝෂ වනවා, අවුරුදු ගණනාවකට පස්සේ යළිත් වරක් මේ ආසනයේ ඉඳ ගෙනම කථා කරන්න ලැබීම ගැන. එයත් ඓතිහාසික වශයෙන් වැදගත් වනවා. මොකද, එදා -1986 දී- ලෝකයේ තිබුණු පුංචිම විපක්ෂය මා නියෝජනය කළා. අවුරුදු 29කට පස්සේ ලෝකයේ තිබෙන ලොකුම විපක්ෂය නියෝජනය කරමින් අද ඒ ආසනයේ ඉඳගෙනම කථා කරන්න ලැබීම ගැන මා සන්තෝෂ වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප හමුවේ විශේෂ අභියෝග ගණනාවක් තිබෙනවා. දවස් සියයේ වැඩසටහන පිළිබඳව අපේ සහයෝගය අප ප්‍රකාශයට පත් කරලා තිබෙනවා. අපි බලාගෙන ඉන්නවා, මේ කාලය තුළ මේ කාර්ය භාරය කරන්න පුළුවන්ද කියලා. මම මේ කියන්න යන කාරණය වාර්තාගත වන්නත් ඕනෑ; ඉතිහාසයට එක් වන්නත් ඕනෑ. හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට අපි නම් කිව්වේ මැතිවරණයකට යන්න එපාය කියලායි. මැතිවරණය පිළිබඳව විග්‍රහ කරලා, ඒ මැතිවරණය පරාජය වෙන්නට තුඩු දෙන හේතු සියල්ලක්ම මම පැය දෙකක් තිස්සේ මහින්ද රාජපක්ෂ මැතිතුමාට කියා සිටියා.

එතුමාට තව අවුරුදු දෙකක් තිබුණා තනතුරේ ඉන්න. ඒ කාලය තුළ අය වැය දෙකක් ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ වාගේම ජනතාවගේ නොවිසඳුණු ප්‍රශ්න තිබෙනවා. ජනවාර්ගික ප්‍රශ්න, මැතිවරණ ක්‍රමයේ සංශෝධන පිළිබඳ ප්‍රශ්න තිබෙනවා, ව්‍යවස්ථා සංශෝධන පිළිබඳ ප්‍රශ්න තිබෙනවා, අපි කවුරුත් එකතු කරගෙන මේ ප්‍රශ්න විසඳාගෙන යන්න කියලා අපි කිව්වා. අපි ඒක කිව්වාට ගණන් ගත්තේ නැහැ. එතුමා වෙනම කල්පනා කළා. එතුමාට අයිතියක් තිබෙනවා කැමැති දේශපාලන තීරණයක් ගන්න. මම මේ කරුණු සඳහන් කරන්න හේතුව ඉදිරි කාලයේදී දේශපාලන බලවේග, සමාජ බලවේග හැසිරෙන ආකාරය පිළිබඳව තක්සේරුවක් කිරීමට අපේ රටේ ජාතික නායකයන්ට පුළුවන් වෙන්න ඕනෑ නිසායි. රට අනතුරු තත්ත්වයකට පත් කරන්නේ නැතිව, දේශපාලන බලවේග හරියට තක්සේරු කරලා මැතිවරණයකට යන වේලාව මේකද නැද්ද කියලා තීරණය කිරීම පිළිබඳව අවබෝධයක් රටේ ජාතික නායකයන්ට තිබෙන්න ඕනෑ. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාට මම තුන් හතර වතාවක් ගිහින් කිව්වා. සියල්ලක්ම එකින් එක, එකින් එක, එකින් එක

[ගරු ඩිව් ගුණසේකර මහතා]

විස්තර කරලා ඔබතුමාට මේ මැතිවරණය ජයග්‍රහණය කරන්න බැරිය කියන කාරණාව කිව්වා. ඒක දේශපාලන විශ්ලේෂණයක් වශයෙන් කළේ, සියලු සාධක පදනම් කරගෙන ඔප්පු කළ හැකි ආකාරයට. ඒත් එයින් වැඩක් වුණේ නැහැ. මම ඒ ගැන කනගාටු වෙනවා. නමුත් අපේ යුතුකම අපි ඉෂ්ට කළා. අපි ආණ්ඩුව තුළ ඉන්න වමේ කොටස් විධියට ඒ ගැන කිව්වා. නමුත් අනෙක් කවුරුත් ගිහින් කිව්වා දිනනවා, දිනනවා කියලා. හැබැයි අපි නම් ගිහින් එහෙම කිව්වේ නැහැ. අපි, හිටපු ඇමතිවරුන් තුන්දෙනෙක් ඒකට සාක්ෂිකරුවන් වශයෙන් මෙතැන ඉන්නවා. අපි ගිහිල්ලා කිව්වා, දැන් මැතිවරණයකට ගියොත් ඔබතුමාට දිනන්න බැහැ කියලා. අද මම ඒ කරුණු ප්‍රකාශ කළේ මේ සිදුවීම ඉතිහාසයට එක් වෙන්නත් ඕනෑ, වාර්තා වෙන්නත් ඕනෑ, ඉදිරියේදී දේශපාලනය කරන අයට මේක නිසි පාඩමක් වෙන්නත් ඕනෑ නිසා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මේ දින සියයේ වැඩසටහනේදී ඇත්ත වශයෙන්ම අපට දිය හැකි උපරිම සහයෝගය දෙනවා. අපි ඒ පිළිබඳව සන්තෝෂ වනවා. කවුරු බලයේ සිටියත් මේ ප්‍රශ්න විසඳන්නේ නැතිව ඉදිරියට යන්න බැහැ. මේවා 1950 ගණන්වල සිට කැකෑරි කැකෑරී නොවිසඳී ඔඩු දුවලා යුද්ධ බවට පරිවර්තනය වෙච්ච ප්‍රශ්න. මේවා අපේම රටේ ජනතාවගේ ප්‍රශ්න. ගැඹුරට බැහැලා මේ ප්‍රශ්න විසඳීමට අද අවස්ථාවක් ලැබිලා තිබෙනවා. මේ ප්‍රශ්න විසඳන්න බැරි වුණු එකම හේතුව රටේ ප්‍රධාන පක්ෂ දෙක පොදු එකඟත්වයකට ගෙනෙන්න බැරි වුණු එකයි. ශුද්ධ වූ සත්‍යය ඒකයි. අන් කිසිවක් නොවෙයි. මේ පුංචි පක්ෂවල ඉන්න අපි හන්දා නොවෙයි මේ ප්‍රශ්න වැඩි වුණේ.

මේ දවස් සියයේ අන්තර්ගත කාරණාවලට ආණ්ඩු පක්ෂයට හැටඑක් ලක්ෂයක ඡන්ද ලැබිලා තිබෙනවා. විපක්ෂයට පනස්හත් ලක්ෂයක ඡන්ද ලැබිලා තිබෙනවා. අපේ රටේ ඉතිහාසයේ පළමුවැනි වතාවට ජනවරමක් ලැබිලා තිබෙනවා සමහර ජාතික මූලික ප්‍රශ්නවලට පොදු එකඟත්වයකට එන්න. ඒ ජනවරම සලකා බලලා අපි මේ කාලපරිච්ඡේදය තුළ එකතු වෙලා මේ ප්‍රශ්න විසඳමු. ඒක අපහසුවක් නොවෙයි. අපි හෙට අනිද්දා මැරිලා යන්න පුළුවන්. නමුත් ඊළඟ පරම්පරාවට අපි රටක් ඉතිරි කරලා යන්න ඕනෑ. අපි ඒක කළ යුතුයි. ඒ පැත්තෙන් බලනකොට ගරු අගමැතිතුමනි, ඔබතුමා ඒ සම්බන්ධයෙන් ගන්නා උත්සාහයට අපි සහයෝගය දෙන්න සූදානම් කියන එක මේ අවස්ථාවේදී මා ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මැතිවරණ නීති ගැන කතා කරනවා නම්, 1959 දී බණ්ඩාරනායක මහත්මයා ඝාතනය කරන්න මාස කිහිපයකට පෙර එතුමා කියා සිටියා, මේ රටේ දූෂණයෙන් තොර මැතිවරණයක් පවත්වන්න බැහැ, සාධාරණ මැතිවරණයක් පවත්වන්න බැහැ, සාමකාමී මැතිවරණයක් පවත්වන්න බැහැ, ඒ නිසා අපි හැඳුනුම්පතක් හඳුන්වා දෙන්න ඕනෑ, ඡන්දය සඳහා භාවිත කිරීම සඳහා ඒ හැඳුනුම්පත අනිවාර්ය කරන්න ඕනෑ කියලා. එම පනත ඉදිරිපත් කරන වේලාවේදී 1959 දී එතුමා කළ කතාව මම උපුටා දක්වලා ඒ කරුණ කියා සිටියා. අපට ඒක ක්‍රියාත්මක කරන්න අවුරුදු 50ක් ගියා. 1959 දී ගරු බණ්ඩාරනායක මැතිතුමා ඉදිරිපත් කරපු අදහස 2009 වර්ෂයේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ යටතේ ක්‍රියාත්මක කරන්න අපට අවුරුදු 50ක් ගියා. මා එවකට ව්‍යවස්ථාදායක කටයුතු පිළිබඳ විෂය භාර අමාත්‍යවරයා. ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා ඒ Select Committee එකේ සභාපති හැටියට කටයුතු කළා. ගරු අගමැතිතුමාට මතක ඇති මේ යෝජනාව ඉක්මන් කර ක්‍රියාත්මක කිරීම ගැන සාකච්ඡා කිරීමට ඔබතුමාගේ නිවසට අපි දෙදෙනා තුන් වතාවක් පැමිණි බව. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අර්බුදයට ලක් වුණු වේලාවේ අපි දෙදෙනා තමුන්නාන්සේගෙන් පුද්ගලිකව ආයාචනා කළා. නමුත් ප්‍රධාන පක්ෂ දෙක එකඟත්වයකට ගෙනෙන්න අපට බැරි වුණා. ඒ අපේ වරද නිසා නොවෙයි. ඒ ප්‍රශ්නය ඇති වුණේ identity card ප්‍රශ්නය නිසායි. ඒ සම්බන්ධයෙන් දිනේෂ් ගුණවර්ධන හිටපු ඇමතිතුමා සාක්ෂි දරනවා ඇති. ඒ වෙලාවේත් මේ දෙපැත්තේම ප්‍රධාන පක්ෂ ඇවිල්ලා අපෙන් ඇහුවා, "අනේ! මේක කල් දමන්න බැරිද?" කියලා. මේ මන්ත්‍රීවරු ඇවිල්ලා හොර ඡන්ද දමන්න අයිතිය ඉල්ලූ බව අපි දන්නවා. නමුත් දිනේෂ් ගුණවර්ධන හිටපු ඇමතිතුමාත්, මාත් දැඩි ලෙස සිටියා. අවසානයේදී ආණ්ඩු පක්ෂයේයි, විපක්ෂයේයි එකඟත්වය ලබා ගෙන තමයි අපි එය ක්‍රියාත්මක කළේ. ඔබතුමන්ලාත් මේ ගැටලු විසඳන්න එකඟත්වයක් ඇති කර ගන්න කොට මතු වන ප්‍රශ්න ගැන අපි දන්නවා. හැඳුනුම්පත අනිවාර්ය නොකළා නම් පසු ගිය ජනාධිපවරණය කොහොමද පැවැත්වෙන්නේ? පොඩ්ඩක් කල්පනා කර බලන්න. Identity card එක අනිවාර්යය කරලා තිබුණේ නැත්නම් ඒ ජනාධිපතිවරණය යුද්ධයක් බවට පත් වෙනවා. එහෙම නම් සමහර විට හමුදා කුමන්ත්‍රණයකුත් ඇති වන්න ඉඩ තිබුණා. වමේ අපි එදා එය දැකපු නිසා තමයි, දිනේෂ් ගුණවර්ධන හිටපු අමාත්‍යතුමාත්, මාත් ලොකු සටනක් ගෙන ගිහින් ආණ්ඩු පක්ෂයයි, විපක්ෂයයි දෙකම එකතු කරලා ඡන්දය භාවිත කිරීමේදී හැඳුනුම්පත අනිවාර්යය කරන්න අනුමැතිය ලබා ගත්තේ. අපි 2009 දී හැඳුනුම්පත අනිවාර්ය කළ නිසා තමයි මහින්ද දේශප්‍රිය මැතිවරණ කොමසාරිස්තුමාට මේ මැතිවරණය සාධාරණව පවත්වන්න ඉඩකඩ ලැබුණේ. එහෙම නැත්නම් එතුමාට මේ තත්ත්වය පාලනය කරන්න ලැබෙන්නේ නැහැ. වමේ අපි තුන්දෙනා මහින්ද දේශප්‍රිය මැතිවරණ කොමසාරිස්තුමා හම්බ වෙන්න ගියා. එහිදී අපි එතුමාට දැඩි ලෙස කියා සිටියා, "තමුන්නාන්සේ අපක්ෂපාති විධියට, සාධාරණ විධියට, සාමකාමී ලෙස නිදහස් මැතිවරණයක් පවත්වන්න ඕනෑ. මෙය අනාගතය තීරණය කරන මැතිවරණයක් වෙනවා"යි කියලා. අපි අපේ පැත්තෙන් අවශ්‍ය සියලු උපදෙස් දුන්නා. අපි අපේක්ෂා නොකළ ආකාරයෙන්, කිසිම කෙනකුට අත තබන්න බැරි වන විධියට එතුමා ඒ කටයුතු සියල්ලම ක්‍රියාත්මක කිරීම ගැන මා එතුමාට ගරු කරනවා.

ඒ විතරක් නොවෙයි. මා අවංකවම සඳහන් කරන්න ඕනෑ, එතුමාටම හරි යන්න පොලිස්පති ඉලංගකොන් මැතිතුමාත් සිටි බව. ඉලංගකෝන් මැතිතුමා වෙනුවට වෙන පොලිස්පති කෙනෙක් සිටියා නම් මා හිතන හැටියට අද වෙනත් තත්ත්වයක් ඇති වෙන්න තිබුණා. එහෙම නම් මැතිවරණ කොමසාරිස්තුමාට සහාය ලැබෙන්නේ නැහැ. එම නිසා පාර්ලිමේන්තුවේ ඉන්න අපි රජයේ නිලධාරින් ධෛර්යවත් කරන්න ඕනෑ. ඒ දෙදෙනා රජයේ නිලධාරින්. අද රජයේ සේවයේ මෙවැනි නිලධාරින් ඇත්තේ නැහැ. එහෙම අදීන නිලධාරින් ඇත්තේ නැහැ. එහෙම අවංක නිලධාරින් ඇත්තේ නැහැ. එහෙම අව්‍යාජ නිලධාරින් ඇත්තේ නැහැ. තමුන්නාන්සේලා රාජ්‍ය සේවාව යළි ගොඩ නැඟීමට බලාපොරොත්තු වන නිසා මහින්ද දේශප්‍රිය, ඉලංගකෝන් වැනි ආදර්ශවත් රාජ්‍ය සේවකයන් අනුගමනය කරමින්, දේශපාලනයෙන් තොරව, ගෞරවයක් ඇති වන ආකාරයෙන් රාජ්‍ය සේවාව පවත්වා ගෙන යන්න. එය විපක්ෂයටත් හොඳයි. මන්ත්‍රීවරු සමහර ප්‍රශ්න සම්බන්ධයෙන් විපක්ෂයේ සිටින විට කෑ ගහනවා. නමුත් ආණ්ඩු පක්ෂයට ගියාම එතුමන්ලාට ඒවා අමතක වනවා. එසේ නැතිව මේ වාගේ පොදු ප්‍රශ්න, අවශ්‍යම ජාතික ප්‍රශ්න විසඳන්න උත්සාහ කරමු කියා අපි ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යහ පාලනය පැත්තෙන් පියවර ගණනාවක් යෝජනා කර තිබෙනවා. ඒ හැම එකකටම අපේ සහයෝගය දෙනවා. මේ සම්බන්ධයෙන් දිගින් දිගටම කථා කරන්න අවශ්‍ය නැහැ. ගරු අග්‍රාමාත්‍යතුමා අපට ප්‍රතිඥාවක් දුන්නා, ඉදිරි කාලයේදී විවාද සඳහා දින පතා අවස්ථාව ලබා දෙනවාය කියලා. මා එක කාරණාවක් ගරු අග්‍රාමාත්‍යතුමාට

ඉදිරිපත් කර සිටිනවා. මේ දවස්වල TV බලන කොට එක අවස්ථාවක මා දැක්ක සිද්ධියක් කියන්නම්. ඒ ගැන මට ලජ්ජයි. ඔබතුමාගේ ගරු මුදල් ඇමතිතුමා මිරිහානේ යම් තැනකට ගිහින් බඩු සොයනවා. රටේ මුදල් ඇමතිතුමා යනවාද පොලීසියත් එක්ක? එතුමාට තිබෙන්නේ ආරංචියක් ලැබුණාම පොලීසියේ පැමිණිල්ලක් කරන එකයි. රටේ මුදල් ඇමතිතුමා පොලීසියත් එක්ක යනවා, ගිහින් order කරනවා. අපේ රටේ මුදල් ඇමති තනතුරු දැරූ අය ගෞරවනීයයි. එතුමා මගේ මිත්‍රයා. මා එතුමාට මේ සම්බන්ධයෙන් පෞද්ගලිකව කියන්න බලා ගෙනයි සිටියේ. නමුත් දැන් මේ ප්‍රශ්නය මතු වුණු නිසායි මා කියන්නේ. මගේ හොඳ මිත්‍රයෙක්, සුජීව සේනසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. එතුමා කාර් එකක් සොයන්න ගිහින් තිබෙනවා. එතුමා නියෝජ්‍ය ඇමතිවරයෙක් නේ දෙවියනේ! ඒ ගැන පොලීසියට කියන්න. එහෙම නැත්නම් අගමැතිතුමාට කියන්න. අගමැතිතුමා ඒ සම්බන්ධයෙන් නියෝගයක් දෙයි. අමාත්‍ය ධුරය බාල්දු කරන්න එපා. ඒ වාගේ තැන්වලට යන්න එපා. එතැනට ගිහින් කාර් එක සොයා දෙනවා. කාර් එක කාගෙද කියා ප්‍රශ්න කරන්න පොලීසිය බලා ගෙන ඉන්නවා. නමුත් එතුමායි ප්‍රශ්න කරන්නේ. අමාත්‍යවරු ඒ තත්ත්වයට පත් වනවාද? එය යහ පාලනයේ ආරම්භයද? මේවා පසු ගිය දවස් 10 ඇතුළත අපි දුටු දේවල්. අග්‍රාමාත්‍යතුමනි, ඔබතුමා සද්භාවයෙන් යමක් කරන්න බලාපොරොත්තු වනවා. අපි කිසි ලෙසකින් ඒ ගැන ප්‍රශ්න කරන්නේ නැහැ.

මහින්ද රාජපක්ෂ මැතිතුමාටත් බැරි වුණා, මෙය පාලනය කරන්න. එතුමාට ඉක්මනට යන්න සිදු වුණේ, එතුමාගේ වටේම හිටපු කට්ටිය නිසාය කියන එක මම මේ අවස්ථාවේදී කියනවා. එම නිසා මහින්ද රාජපක්ෂ මැතිතුමා මුහුණු දුන් පරාජය තුළින් නිසි පාඩම් වර්තමාන නායකයන්ටත් ඉගෙන ගන්න පුළුවන්. අපි සියලු දෙනාම ඒක තේරුම් ගන්න ඕනෑ. ඒක සියලු දෙනාටම වැදගත්. පසු ගිය කාලයේ උපදෙස් දීලා තිබෙන්නේ එතුමා යහ මගට ගන්න නොවෙයි, එතුමාගේ මිනීවළ පැත්තට හරවන්නයි. මම එතුමාට ඒවා ගැන කිව්වා. මම කථානායකතුමාටත් කියා තිබෙනවා. කියන්න පුළුවන් හැම තැනකටම කිව්වා. ඒවා වළක්වන්න හැම දෙයක්ම කළා. නමුත් ගජ මිතුරන් කටයුතු කරලා තිබෙන්නේ ඒවා වළක්වන පැත්තට නොවෙයි, එතුමා අමාරුවේ දමන පැත්තටයි.

ගරු නවින් දිසානායක මහතා (සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு நவீன் திஸாநாயக்க - சுற்றுலா மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Navin Dissanayake - Minister of Tourism and Sports)
ගරු මන්ත්‍රීතුමනි, වන්දි බට්ටයෝ තමයි ඒක කළේ.

ගරු ඩිව් ගුණසේකර මහතා
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)
ඔව්, ඒක තමයි. මම විශ්‍රාම ගියාට පස්සේ ඒවා ඉතිහාසයට එක් කරන්න පොතක ලියන්නයි ඉන්නේ. මම මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපේ අග්‍රාමාත්‍යතුමා ගන්නා වූ උත්සාහයටත්, ඒ වාගේම අපේ ජනාධිපතිතුමා ගන්නා උත්සාහයටත් යළිත් වරක් සුබ පතනවා. ඒ වාගේම දින සියයේ වැඩසටහනට හැටදෙලක්ෂයක පමණ ජනතාවක් සහ පනස්හත්ලක්ෂයක පමණ ජනතාවක් වන දෙකොට්ඨාසයම ඡන්දය දීලා තිබෙන නිසා මේකට අප අතර වාදයක් කර ගන්න අවශ්‍ය නැහැ. කවුරුත් එකතු වෙලා හැකිතාක් දුරට පොදු එකඟත්වයක් මඟින් මේ ප්‍රශ්නයට විසඳුමක් සොයමුය කියමින්, ඒ සඳහා ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂය වශයෙන් අපේ සහයෝගය ලබා දෙන බවත් ප්‍රකාශ කරනවා. 1986 ජූනි මාසයේ 19වැනිදා මගේ කුලුඳුල් කථාව කරන කොට මම ජාතික ප්‍රශ්නය විසඳිය යුතු ආකාරය සම්බන්ධයෙන් පැය එකහමාරක කථාවක් කළා. නමුත් ඒක කවුරුවත් ගණන් ගත්තේ නැහැ. එදා මා කිව්ව සියල්ලක්ම අද සිදු වෙලා තිබෙනවා. මම එදා කිව්වා, විධායක ජනාධිපති ක්‍රමය තමයි මේ රටේ සියලු අර්බුද, ප්‍රශ්න ඇති කළේ කියලා. එම ක්‍රමය අහෝසි කරනතුරු මේ රටේ අනාගත පරම්පරාවට කිසිම නිදහසක් නැහැ කියන එක ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු වාසුදේව නානායක්කාර මහතා.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට විනාඩියක කාලයක් ලබා දෙන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒක කරන්න බැහැ. සෙනෙවිරත්න මැතිතුමනි, මට ඒක කරන්න බැහැ. මගේ නම කැඳෙව්වා. මම කථා කළ යුතුයි. ඔබතුමාට ප්‍රමුඛත්වයක් දෙන්න මට බැහැ.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ගරු ඩිව් ගුණසේකර මැතිතුමාගේ කථාවෙන් පැන නැඟුණු කරුණක් සම්බන්ධයෙන් -

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
එහෙම උත්තර දෙන්න බැහැනේ. [බාධා කිරීමක්] ඔබතුමා සංවිධායක තමයි. මම ඒක පිළිගන්නවා.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
එහෙම නොවෙයි. කාරණයක් නිවැරදි කිරීම සඳහායි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
හොඳයි, ඔබතුමා නිවැරදි කිරීම කරන්න. I am prepared to give you time, but do it very quickly.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මිත්‍ර ඩිව් ගුණසේකර මැතිතුමාගේ කථාවේදී පැන නැඟුණු එක කාරණයක් තිබෙනවා, නිවැරදි කළ යුතු. ඒ තමයි, හැඳුනුම්පතේ වැදගත්කම ගැන. අපි

[ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා]

ඇත්ත වශයෙන්ම ඒ සම්බන්ධයෙන් එකඟ වෙනවා. නමුත් මේ හැඳුනුම්පත නීත්‍යානුකූල කළේ, 2005 දීයි. 2005 දී හැඳුනුම්පත නීත්‍යානුකූල කරන වෙලාවේ මමයි අධිකරණ ඇමතිවරයා. එම පනත ඉදිරිපත් කළේ මමයි. මට මතකයි, අගමැතිතුමාත් කථානායකතුමාගේ සාකච්ඡා කාමරයට ඇවිල්ලා අපි මේ ගැන සාකච්ඡා ගණනාවක් පැවැත්වූවා. සම්පන්දන් මන්ත්‍රීතුමා ඇවිල්ලා මා සමඟ මේ ගැන සාකච්ඡා කළා. ඒ සාකච්ඡාවල ප්‍රතිඵලයක් වශයෙන් යම් යම් සංශෝධනවලට යටත්ව අපට පුළුවන්කම ලැබුණා, 2005 දී හැඳුනුම්පත අනිවාර්යය කරන්න. ඒක කළේ, 2005 දීයි. 2009 දී පැවැති සාකච්ඡාවට ගරු ඩිව් ගුණසේකර මහතා, දිනේෂ් ගුණවර්ධන මහතා සමඟ මමත් සහභාගි වුණා. මෙතුමාගේ කාර්යාලයට ගියා. ඒ ගියේ ප්‍රධාන වශයෙන්ම සමානුපාතික මැතිවරණ ක්‍රමය අවලංගු කිරීමේදී කොයි ආකාරයෙන්ද මේ මිශ්‍ර ක්‍රමය හදන්නේ කියන එක ගැන කථා කරන්නයි. අපි ගිහින් දෙවතාවක් සාකච්ඡා කළා.

ගරු ඩිව් ගුණසේකර මහතා
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)
I agree with you. පටලැවිල්ලක් වුණා කියන එක මම පිළිගන්නවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු වාසුදේව නානායක්කාර මහතා.

[අ.භා. 4.17]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළමුවෙන්ම චාරිත්‍රානුකූලව නව අගමැතිතුමාට අපේ සුබ පැතුම් පිළිගැන්විය යුතුයි. එය ඉටු කිරීම මගේ සතුටයි. දෙවනුව, මෙහි පැමිණ නික්ම ගිය මගේ ඉතාම හිතාදර මිතුරා වන නව ජනාධිපතිතුමාට එම තනතුරට පත්වීම ගැන මගේ ආශිංසනය මා පළ කළ යුතුයි.

මෙය මේ රටේ පාර්ලිමේන්තු ඉතිහාසයේ අපූරු අවස්ථාවක්. මෙය ඉදිරි කාලයේදී පාර්ලිමේන්තු ඉතිහාසය හදාරන ශිෂ්‍යයන් කොයි විධියට අර්ථ කථනය කර ගෙන විග්‍රහ කර ගනීද කියලා දන්නේ නැහැ.

පළමුවන වතාවට බහුතරයක් තමන්ගේ බලය අත් හරිනවා. බහුතරයක් හැටියට පත් වෙලා, බහුතරය තමන්ගේ බලය අත් හරිනවා. බහුතරයක් නැති නායකයා අගමැති හැටියට පත් වෙනවා. මේ බහුතරයට අයත්ව සිටි නායකයෙක් අවසාන අවස්ථාවේ විපක්ෂයේ සන්ධානයකට එකතු වෙලා මේ රටේ ජනාධිපතිවරයා වනවා. මේ අපූරු සිද්ධීන් තුළ විපක්ෂයේ වෙනම ඉන්නට - ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණ වෙනුවෙන් පාර්ලිමේන්තුවේ ඉන්න එකම මන්ත්‍රීවරයා මම- අපට ලබා දුන් ඉඩකඩ ගැන ගරු කථානායකතුමාට අප ස්තුතිවන්ත වනවා.

කුමක් නිසා මෙසේ සිදු වී දැයි කවුරු හෝ විග්‍රහ කරන්න ගියොත් මෙයට හේතුව, ඇති වුණ ගිවිසුමක් කියලා තීරණයක් ගන්න පුළුවන්කම තිබෙනවා. එවැනි ගිවිසුමක් ඇති වුණේ ඇයි? බහුතරය එකඟ වුණේ, බහුතරයක් නැති කෙනා අගමැති කරන්න. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වය, සභාපතිත්වය නොදී අත්හිටවූවත් එතුමා ජනාධිපති ධුරයට පත් වුණාම ඒ අත්හිටවූ ධුරය එතුමාට නැවතත් ලබා දෙන්නට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තීන්දු කළා. මේවා සාමාන්‍ය සිද්ධීන් නොවෙයි, අසාමාන්‍ය සිද්ධීන්. දැන් මේ කරුණු මම මතක් කළේ අපේ 58 ලක්ෂයකට කිට්ටු ජනතාව ඡන්දය දුන්නේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති කරන්න නොවෙයි. අපි අද ජනමත විචාරණයක් තියලා ඒ 58 ලක්ෂයෙන් ඇහුවොත්, ඔබ එකඟද- [බාධා කිරීමක්] ඒ 58 ලක්ෂය ගැන මම කථා කළේ. ඒ 58 ලක්ෂය මොකක්ද කිව්වේ? "අපට ඕනෑ අපේ මහින්ද රාජපක්ෂ මහතා." එතුමා පරාදයි. දිනුවේ මේ අය කියන හැටියටම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටපු ලේකම්වරයා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ලේකම්වරයා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තහනමට ලක් වෙලා. නමුත් ක්ෂණිකවම ඒ කාරණාව විසඳා ගැනීමත්, මේ විධියට සම්මුතියකට පැමිණීමත්, බහුතරය තමන්ගේ අයිතිය අතහැරලා පාර්ලිමේන්තුවේ අනිකුත් විපක්ෂයට තමන්ගේ බලය පාවා දීමත් මේ රටේ ඉතිහාසයේ එක්තරා කදිම අවස්ථාවක්.

මම මේ වෙලාවේ කියන්න ඕනෑ කුමන්ත්‍රණය ගැන. කුමන්ත්‍රණයක් තිබුණාද කියා මා දන්නේ නැහැ. එවැනි උත්සාහයක් ගත්තාද කියා දන්නේත් නැහැ. ඒකට පුද්ගලයන් කැඳෙව්වාද දන්නේත් නැහැ. ඒවා කිසිවක් අපි දන්නේ නැහැ. ඒවා ගැන සොයා බලන්න ඕනෑ ඔබතුමන්ලා. කඩිනමින් ඒවා ගැන සොයා බලන්න. සොයා බලා ඒවායේ නිසි කටයුතු කිරීමට අප්‍රමාදව ඔබතුමන්ලා යොමු වෙන්න. ඒ ගැන කිසිම වරදක් නැහැ. නමුත් අපි දන්නා වූ දෙයින් අපි කථා කරනවා නම්, ගරු රාජීව විජේසිංහ මහතා එදා රෑ 2ට මට telephone එකෙන් කථා කළා. කථා කරලා කිව්වා, "මොකද මේ වෙන්නේ? ප්‍රතිඵල ඒම නැවතිලා. මැතිවරණ කොමසාරිස්තුමාගේ කාර්යාලයේ මොකක් හෝ වෙමින් තිබෙනවාද?" කියලා. මම වහාම කොමසාරිස්තුමාට කථා කළා. කථා කළාම අතිරේක කොමසාරිස්තුමා පිළිතුරු දුන්නා. මම ඇහුවා, "ඔතැන ඡන්ද ගණන් කිරීමේ ක්‍රියාදාමයට යම් බාධාවක්, අවහිරයක් වෙලා තිබෙනවාද? එහෙම නැත්නම් මොකක් හෝ සිද්ධියක් තිබෙනවාද?" කියලා. එතුමා කිව්වා, "එහෙම මුකුත් නැහැ. ප්‍රතිඵල නිකුත් කරන අතරේ අපි පොඩි විවේකයක් ගත්තා. ඒකයි ප්‍රතිඵල නිකුත් කිරීම නැවැත් වුණේ." කියලා. ඒක තමයි කථාවේ මුල; කථාව පටන් ගන්නා තැන. අපේ නියෝජ්‍ය ඇමතිතුමා වාගේ කෙනෙකුත් මට telephone කරලා ඇහුවා, "කඩා වැදිලා හෝ මොකක් හෝ සිද්ධියක් වෙලා තිබෙනවාද, කොමසාරිස්තුමාගේ කාර්යාලයේ ඡන්ද ගණන් කිරීම නැවැත්වීමේ ප්‍රයත්නයක් හෝ සිදු වීමක් තිබෙනවාද" කියලා. දැන් ඔතැනින් තමයි ඒ කථාව ගොඩ නැඟෙන්නේ. හැබැයි, මට හිතෙන්නේ ඊට වඩා ලොකු කථාවක් ගරු මංගල සමරවීර මහතා දන්න නිසා වෙන්න ඇති පැමිණිල්ලක් කරන්න ඇත්තේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා නම් මෙතෙක් හිටපු ඉතාම ප්‍රජාතන්ත්‍රවාදී ජනාධිපතිවරයා හැටියට මහින්ද රාජපක්ෂ මහතාට කාරණා තුනක් නිසා ඉතිහාස ගත වෙන්න පුළුවන්. එකක් තමයි, ඉතාමත්ම හොඳින් ඡන්ද පැවැත්වීම. එතුමා 2005 දී හා 2010 දී දිනුවාට පස්සේ මේ රටේ විරුද්ධවාදීන්ට කිසිම කරදරයක් වුණේ නැහැ; වෙන්න ඇරියේත් නැහැ.

ඊළඟ කාරණය තමයි, අනෙක් හැම පළාතකම පැවැත්වූවා වාගේ උතුරේ පළාත් පාලන ඡන්දය හා නැඟෙනහිර පළාත් පාලන ඡන්දය පැවැත්වීම. මේවා නිසි ආකාරව පැවැත්වූවා. මේවා කිසිම ආකාරයක දූෂිත මැතිවරණයන් කියලා කවුරුවත් බරපතළ විධියකට චෝදනා කරලා නැහැ. ඊට පස්සේ පැවැත්වූවා, උතුරේ පළාත් සභා මැතිවරණය. අපේම කැබිනට් මණ්ඩලයේ සමහරු ඒකට විරුද්ධ වුණා. විරුද්ධ වෙලා කිව්වා, "ඕක තියන්න එපා. ඕක තියනවා නම් පළාත් සභාවල බලය කපලා දාලා තමයි තියන්න ඕනෑ" කියලා. අපි කිව්වා, "ඒක එහෙම කරන එක වැරැදියි. දැනට තිබෙන පළාත් සභාවලට බලය දීලා තිබෙන ආකාරයට උතුරටත් පළාත් සභා බලය ලැබෙනවා. ඒ නිසා පළාත්

සභා ඡන්දය තියන්න" කියලා. ජනාධිපතිතුමා ඒකට කන් දුන්නා. ජනාධිපතිතුමා ඒකට කන් දීලා උතුරු පළාත් සභා ඡන්දය පැවැත්වූවා. ඒක ඉතාමත්ම සාධාරණ මැතිවරණයක්. කට්ටිය කිව්වා, "හමුදාව මැදිහත් වෙලා ඒ ඡන්දය අවුල් කරයි. හමුදාව මැදිහත් වෙලා ඒ ඡන්දය ගසා කාවි" කියලා. නමුත් එහෙම මොකුත් වුණේ නැහැ. ගරු සම්පන්දන් මන්ත්‍රීතුමන්ලාගේ පක්ෂය සියයට 60කට වැඩි බලයක් ඒ ඡන්දයෙන් ගත්තා. මට මතකයි, මේ ඡන්දයට යන වෙලාවේ අපේ හිටපු ජනාධිපතිතුමා කැබිනට් මණ්ඩලයට කියනවා, "මම උතුරු පළාතේ ඡන්දය තියන්න යනවා. අපි පරදින්න පුළුවන්. හැබැයි අපි හැකි තරම් හොඳින් පරදිමු. මේ ඡන්දයට කිසියම්ම වූ තුවාලයක් වෙන්න තියන්න එපා. මේ ඡන්දය, කිසියම් ආකාරයක අපවාදයකට, චෝදනාවකට ලක් වෙන්න තියන්න එපා. එහෙම වුණොත් ඡන්දය පරාජය වුණාට වඩා නරකයි" කියලා. එතුමා එහෙම කිව්වා. "ඡන්දය උතුරේ තියලා පරාජය වෙන එක හොඳයි, ඒ ඡන්දය දූෂිත ආකාරයකට තියන්න උත්සාහ කරලා ඒ පිළිබඳව චෝදනාවට ලක් වෙනවාට වඩා" කියලා එතුමා කිව්වා.

අපේ මහින්ද රාජපක්ෂ මහතා මෙවර ජනාධිපතිවරණයේ ප්‍රතිඵල පිට වී නොබෝ වේලාවකින් අද ඉන්න ගරු අගමැතිතුමා සමඟ කථා කරලා බලය භාර දීමට එකඟ වෙලා පිට වී ගිය ආකාරය මේ රට එක්තරා විධියකට පරමාදර්ශී රටක් බවට පත් කර තිබෙනවා. අභ්‍යන්තර කථා ගැන මම දන්නේ නැහැ. අභ්‍යන්තර කථා තිබෙනවා නම් ඒවා ඉදිරියට අරගෙන ඒවා ගැන ක්‍රියා කළාම, ඒවා ගැන දැන ගත්තාම ඒ පිළිබඳව මගේ තීන්දුව, මතය ඒ අනුව ගොනු කර ගන්නම්. අදට, අපි දන්නා තොරතුරු අනුව ඉතාමත්ම සාධාරණ, නිදහස් මැතිවරණ පවත්වපු ජනාධිපතිවරයා එතුමායි. උතුරේ තමන් පරදින මැතිවරණ පවා ඉතාම සාධාරණව පවත්වපු ජනාධිපතිතුමා එතුමායි. ජනාධිපතිවරණය පැවැත්වීමේදී කිසිදු දූෂණයකට ඉඩ නොදී, එම මැතිවරණයේ තීරණය තමන්ට විරුද්ධව ආපුවාම, වහාම තමන්ගේ ධුරය භාර දීලා පිට වී ගිය ජනාධිපතිතුමා එතුමායි. මේවා වාර්තාගත වෙන්නට ඕනෑ. ඒ නිසායි මම ඒක කිව්වේ.

මම කැමැතියි, වැඩි වෙලාවක් නොගෙන මේ කාරණය ගැනත් කියන්න. සමහරුන් කථා කරද්දී චෝදනා කළා, දින සියය වැඩ පිළිවෙළ තුළ උතුරේ ආණ්ඩුකාරවරයා අයින් කරලා තිබෙනවා කියා. හමුදාව අල්ලා ගෙන තිබෙන ඒ ඉඩම් ජනයාට දෙන්න නැවතත් කල්පනා කරමින් ඒ ගැන අධ්‍යයනය කරනවා. මේ පියවරයන් ඇත්තටම මේ රටේ විය යුතුව තිබුණු පියවරයන්. ඉතා සාධනීය පියවරයන්. ගරු අගමැතිතුමනි, මේ පියවරයන් නිසා ඔබතුමාගේ ආණ්ඩුවට මේ ප්‍රශ්නය විසඳීමට දොරවල් ඇර ගන්න පුළුවන්. දෙමළ ජාතික සන්ධානයේ විශ්වාසය දිනා ගනිමින් තමයි අපට ජාතික ප්‍රශ්නය විසඳන්නත්, ලාංකීය ජාතිය ගොඩ නඟන්නත් පුළුවන් වන්නේ. ඒ නිසා මම ඉල්ලා සිටිනවා, ඒ ගනු ලැබූ පියවරයන් ඉදිරියට ගෙන යන්න කියලා.

නැඟෙනහිර පළාතේ ඉන්න රජයේ ප්‍රධාන නිලධාරියාට මම නියම කළා, සිංහලෙන් කථා කරන හැම කථාවක්ම දෙමළට පරිවර්තනය කරන්න කියලා. ඒ ප්‍රධාන නිලධාරියා එතැන ඉඳලා ඉවත්ව ගියා, "මේ මොන කරච්චලයක්ද?" කියලා. Simultaneous interpretation නොවෙයි. වචනයෙන් වචනයට නැත්නම් කථාවෙන් කථාවට කරන පරිවර්තනයක්. එවැනි නිලධාරින් තමයි මේ තැන්වල ඉඳලා තිබෙන්නේ. ඒ අනුව තමයි අපට තේරුම් ගන්න තිබෙන්නේ, ඒ පළාත්වල ජනතාවගේ ප්‍රතිචාරය මොකක්ද කියන එක. ඒ නිසා මේ ගත්තා වූ පියවර තවත් ඉදිරියට ගෙන යන්නට ඔබතුමාට ශක්තිය ලැබේවායි කියා අපි ප්‍රාර්ථනා කරනවා. ඒ සඳහා සම්පූර්ණ සහයෝගය දෙන්නට ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණත්, අපේ වමේ පක්ෂත් සූදානමින් සිටින බව ඔබතුමාට කිව යුතුයි. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන එන වෙලාවේ වමේ පක්ෂ එදා ජේ.ආර්. ජයවර්ධන මහතාට සහයෝගය දෙන්න එකඟ වුණා. ඒ වාගේම මම විශ්වාස කරනවා අද වන විට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් මේ පිළිබඳව යම් තේරුමකට ඇවිත් තිබෙන බව. ඒ අනුව අලුත් ජනාධිපතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිතුමා හැටියට පත් වුණා. නව රජය ඇති කර ගත්ත දින සියය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට ඔබතුමන්ලාට විශාල ශක්තියක් තිබෙනවා. මේ ප්‍රශ්නය නිරාකරණය කිරීමට මෙතෙක් ඉතිහාසයේ තිබූ බාධකවලින් තොර විශාල අවකාශයකට ඔබතුමන්ලා පැමිණ තිබෙනවා, ගරු අග්‍රාමාත්‍යතුමනි. ඔබතුමාටත්, ජනාධිපතිතුමාටත් ඒ සඳහා ශක්තිය ලැබේවායි අපි ප්‍රාර්ථනා කරනවා.

දැන් අපි විධායක ජනාධිපති බලය නැති කිරීම ගැන කථා කරමු. එදා සිට අපි කළ ඉල්ලීම එයයි. අද ආපසු හැරිලා බලන විට පෙනෙන කාරණයක් තමයි, තමන්ට විධායක ජනාධිපතිකම නැත්නම් ඒ ධුරයේ බලය අඩු කරන්නට කැමැතියි, ඒ ධුරය නැති කරන්නත් කැමැතියි කියන එක. පසු ගිය කාලයේ එහෙම නේද වුණේ? තමන්ට විධායක ජනාධිපති බලය නැති වුණාම, විධායක ජනාධිපති බලය නැති කරන්නට කැමැතියි. තමන් විධායක ජනාධිපති බලයට පත් වුණාම එය අත් හරින්නට කැමැති නැහැ. ඔන්න ඔය ප්‍රහේලිකාවේ තමයි අපි මුල සිටම කරකැවී කරකැවී හිටියේ. අද පළමුවෙනි වතාවට ජනාධිපතිතුමාගේ බලය අයින් කරලා එහෙම නැත්නම් අඩු කරලා අගමැතිතුමා බලය ගන්න යනවා. අගමැතිතුමා ඒ ගැන සතුටුයි. අපේ ජනාධිපතිතුමාත් ඒ පිළිබඳව දී තිබෙන පොරොන්දුව අනුව එතුමාටත් ඒ ගැන සතුටට පත් වන්නට වෙනවා. මේක අපූරු සන්දර්භයක්. මේ වාගේ අපූරු සන්දර්භයක්, මේ විධියේ ග්‍රහයෝගයක් ලේසියෙන් එන්නේ නැහැ. මේ වාගේ ග්‍රහයෝග හරහා ජනාධිපති බලය නැති කෙනාට බලය ගන්න -එක්සත් ජාතික පක්ෂය මූලික වූ ආණ්ඩුවකට බලය ගන්න- කිහිප වාරයක් ජාතික ආණ්ඩු හරහා උත්සාහ කළා. නමුත් බැරි වුණා. එක් අවස්ථාවකදී මෛත්‍රීපාල සේනානායක මැතිතුමා සහ අනුර බණ්ඩාරනායක මැතිතුමා පක්ෂය තුළ කැරැල්ලක් ගහලා එක්සත් ජාතික පක්ෂය සමඟ ජාතික ආණ්ඩුවක් හදන්නට උත්සාහ කළා. ඊට විරුද්ධව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ විශාල නැඟිටීමක් ඇති වුණා. ඒ නැඟිටීම හරහා එදා ඒ වෙලාවේදී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ බලය තහවුරු කළා.

ඒ වාගේම අපට මතකයි එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහත්මයාව ඝාතනය කළ වෙලාවේත් සී.පී. ද සිල්වා ඇතුළු පිරිසක් එක්සත් ජාතික පක්ෂයට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගැට ගහන්නට උත්සාහ කළා. ඒ වෙලාවේත් මැතිනිය එළියට බැස්සා. ඒ වෙලාවේ ඒක රාශි වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බලය ඒ උත්සාහයත් වැළැක්වූවා. මොකක්ද මේ ජාතික ආණ්ඩුවක් කියන්නේ? ජාතික ආණ්ඩුවක් කියන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරන බලවේග අත් අඩංගුවට ගන්නා උපක්‍රමය. මොකක්ද මේ වර්තමාන ජාතික ආණ්ඩුව කියන්නේ? එක්සත් ජාතික පක්ෂයේ නායකත්වයෙන් පවත්වාගෙන යන්නා වූ ආණ්ඩු බලයට අවශ්‍ය කරන අවනත භාවය විපක්ෂයෙන් ලබා ගන්නා උපක්‍රමය. ඒකයි ජාතික ආණ්ඩුව කියන්නේ. ජනතාවගේ ඉල්ලීම්, ජනතාවගේ බලාපොරොත්තු ඉටු කර දෙන දින සියය ජාතික ආණ්ඩුවට නම් අපිත් ඉන්නවා. එහෙම නම් දින සියෙන් සියයට යමු. ඒ ඒ දින සියයට, ඒ ඒ වැඩ නියම කරන්න. හැබැයි, තමසෙක්වලට නම් එන්න එපා. තමසෙක්වලට එන්න එපා. ඒකත් තිබෙන්නේ දින සියයට. මහින්ද රාජපක්ෂ මහත්මයා මේ රටේ රාජ්‍ය අංශය බොහොම අමාරුවෙන් ගොඩ නැඟුවා. ඒ රාජ්‍ය අංශය ගොඩ නඟලා ඒ රාජ්‍ය අංශය ආර්ථිකය තුළ බලවත් සාධකයක් බවට පත් කළා.

ඊළඟට උසස් අධ්‍යාපනය ලබන දරුවන්ට ණයට සල්ලි දීලා, ඒ අයගෙන් ගාස්තු අය කරන වැඩ පිළිවෙළට එන්න එපා. මේවා මේ රටේ ඇති වුණු ප්‍රතිසංස්කරණ ආපිට හැරවීමක්. ඒවාත්

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

තිබෙනවා ඔබතුමන්ලාගේ වැඩ පිළිවෙළේ. අධ්‍යාපනය පෞද්ගලීකරණයකට ගෙන යාම ඔබතුමන්ලාගේ වැඩ පිළිවෙළ තුළ තිබෙනවා. අපේ ජනාධිපතිතුමා ඇස් ඇරලා බැලිය යුතුයි. එතුමා ජනාධිපතිවරයා ලෙස බලයට පත් වීම සඳහා යම් එකඟතාවන්ට ආවා වෙන්න පුළුවන්. නමුත් අද එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිතුමා හැටියට ඇස් ඇරලා බැලිය යුතුයි. මේ රටේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය 1956 ඉඳලා වමත් එක්ක එකතු වෙලා ගෙනාපු ඒ සමාජ ප්‍රතිසංස්කරණ ආපිට හකුළන්න මේ අලුත් යූඑන්පී ආණ්ඩුවට ඉඩ දෙනවා ද, ඒකට අවනත වෙනවා ද කියලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නැවත කල්පනා කර බැලිය යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිරාජ්‍යවාදින් මෑත කාලයේ ඔවුන්ගේ උපක්‍රමය හැටියට යොදා ගන්නේ ප්‍රජාතන්ත්‍රවාදයයි. හමුදා බලය පමණක් නොවෙයි. ගඩාෆි, සදාම් හුසේන් වැනි අරාබි ලෝකයේ අධිරාජ්‍යවාදයට යටත් නොවූ නායකයන් හිටපු රටවල නැඟිටීම් ඇති කෙරෙව්වා. ඒ අය හොඳ අය නොවන බව ඇත්ත. ඒ අය පෙරළා දැමිය යුතු අය ද? ඔව්. මා ඒකට එකඟ වෙන්නම්. නමුත් ඒ අය පෙරළා දමා ඊට පස්සේ ඇති කරපු ආණ්ඩු මොනවා ද? අධිරාජ්‍යවාදින්ගේ අතකොළු, රූකඩ ආණ්ඩු. ඊජිප්තුවේ මුරුසිගේ ආණ්ඩුව අමු අමුවේම හමුදා කුමන්ත්‍රණයකින් පෙරළුවා. ප්‍රජාතන්ත්‍රවාදය තමයි Trojan Horse හැටියට ඉස්සරහින් ගෙන යන්නේ. ප්‍රජාතන්ත්‍රවාදය පිටුපසින් ඉන්නේ අධිරාජ්‍යවාදයයි. අවාසනාවකට අධිරාජ්‍යවාදින් ප්‍රජාතන්ත්‍රවාදය උපක්‍රමයක් හැටියට භාවිත කරනවා. අපගේ වුවමනාව ප්‍රජාතන්ත්‍රවාදය අනුව ජනාධිපති ක්‍රමය නැති කිරීමයි. අධිරාජ්‍යවාදින්ගේ වුවමනාව ඒ අයට විරුද්ධව මේ රටේ තහවුරු වුණු දේශපාලන ආර්ථිකය තව දුරටත් රැක ගැනීමයි. මේවා එකිනෙකට පැටළුණා. ප්‍රජාතන්ත්‍රවාදය අනුව අපට විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න ඕනෑ. ඒක ඇත්ත. අනෙක් පැත්තෙන් අධිරාජ්‍යවාදින්ට මේ රටේ තිබෙන දේපොළ මං කොල්ලකන්නට, නැවතත් මේ රටේ රාජ්‍ය වස්තුව ඔවුන්ට පාවා දෙන්නට, මේ රටේ ධනපති පන්තියට පාවා දෙන්නට එන්නා වූ වැඩ පිළිවෙළක් එකට ඇමිණිලා තිබෙන්නේ මේ ප්‍රජාතන්ත්‍රවාදයත් එක්කයි. මෙන්න මේ උගුල තුළ තමයි මේ රටේ අද මේ ප්‍රතිඵලය ආවේ. දැන් මේක හොඳ අත්හදා බැලීමක්. ලංකාව අධිරාජ්‍යවාදින්ගේ රසායනාගාරයක්. ඒ වාගේම එක්සත් ජාතික පක්ෂයට බලයට එන්න බැරිවයි හිටියේ. කී පාරක් උත්සාහ කළා ද? කී පාරක් උත්සාහ කළා ද ජනාධිපති වෙන්න. බැරිවයි හිටියේ. මෙන්න, තුරුම්පුව ගැහුවා අධිරාජ්‍යවාදින්. ප්‍රජාතන්ත්‍රවාදයේ තුරුම්පුව. ඒ තුරුම්පුවත් එක්ක අද එක්සත් ජාතික පක්ෂය බලයට ඇවිල්ලා තිබෙනවා, අනේ! අපේ පිහිටෙන්. මගේ නම් නොවෙයි. එතුමා අගමැතිවරයා හැටියට භාර ගන්න තීන්දු කරපු අය පණස්අටලක්ෂයක් ජනතාව වෙනුවෙන් ඒ වගකීම භාර ගන්න ඕනෑ. මේ රටේ ජනතා විරෝධී, ජනතාවගේ හතුරෙක් හැටියට ජනතාව හිතන, එක්සත් ජාතික පක්ෂයට අපි පාර්ලිමේන්තුවේ බලය දුන්නා. අපේ අතේ තිබුණු බලය දුන්නා. මෙන්න මේ පිළිබඳව අපට වග උත්තර කියන්න වෙනවා කියලා මතක තියා ගැනීම වැදගත්.

මා මීට වඩා වේලාව ගන්න බලාපොරොත්තු වන්නේ නැහැ. ගරු තිස්ස විතාරණ මන්ත්‍රීතුමා තායිලන්තය ගැන කිව්වා. ඒ නිසා මා ඒ ගැන මොනවත් කියන්න යන්නේ නැහැ. හැබැයි, තව එක කාරණයක් කියලා මගේ කථාව ඉවර කරන්නම්. ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමනි, ඔබතුමා අගමැතිතුමා හැටියට කියා තිබුණා මහින්ද රාජපක්ෂ මහත්මයා ඉන්දියාවයි, චීනයයි කොටවමින් දෙපැත්තෙන්ම ප්‍රයෝජන ගත්තා කියලා. You have said, "Mahinda Rajapaksa was playing India against China and China against India". මේක හොඳ කථාවක් නොවෙයි, මේ රටේ විදේශ ප්‍රතිපත්තියටත්, මේ රටේ යහපතටත්. චීනයත්, ඉන්දියාවත් කියන රටවල් දෙකම මේ කලාපයේ ප්‍රධාන බලවතුන් බව අපි දන්නවා. ඉතින්, මේ බලවතුන් දෙදෙනා අතරේ සමතුලිතතාවකින් යුතුව කටයුතු කිරීම වරදක් ද? මේ බලවතුන් දෙදෙනා අතරේ තිබෙන්නා වූ ප්‍රතිවිරෝධය කුමක් වුණත් ඒක මැද්දේ අපි වප්ප නොවී ඒ දෙගොල්ලන් එක්කම හොඳ හිත පවත්වා ගන්නට උතුරේ දුම්රිය පාර හදන්න ඉන්දියාවටත්, දකුණේ දුම්රිය පාර හදන්න චීනයටත් දීම වරදක් ද? මේකට කොටවනවා කියා කියන්න තරමට ඔබතුමා පහතට වැටුණා ද? මේ ගැන මට කනගාටුයි. ඔබතුමාට ඒක අපේ රටේ අනාගත විදේශ ප්‍රතිපත්තිය වෙනුවෙන්වත් නිවැරදි කරන්න සිදු වේවි. පාර්ලිමේන්තුව ශක්තිමත් කරන්න සිදු වේවි. හැබැයි, ඒ මඟින් අගමැති ධුරය තවත් ශක්තිමත් කර ගැනීමේ අරමුණ හිතේ තියාගෙන තමුන්නාන්සේ ඒක කියනවාද නැද්ද කියලා අපි දන්නේ නැහැ. කෙසේ හෝ වේවා ඔබතුමා දැන් ජනාධිපතිතුමාගේ බලය තමන්ගේ අතට අරගෙන අගමැති හැටියට ඊළඟට මේ රටේ ජනාධිපති බලය මෙහෙයවන්නට කල්පනා කරනවා නම් ඒ ගැන මට භයක් තිබෙනවා; ඒ ගැන අපි කල්පනාවෙන් ඉඳිමුයි කියලා මම මගේ හිතවතුන්ට දැනුම් දෙනවා.

අපි නීතියේ ආධිපත්‍යයට ගරු කරනවා. ඒ වාගේම අපි පාර්ලිමේන්තුවේ බලය ජනතාවගේ පරමාධිපත්‍ය බලය හැටියට සලකනවා. ඒ නිසා මේ පාර්ලිමේන්තුවට බලවත් තත්ත්වයක් අවශ්‍යයි. ගරු අගමැතිතුමනි, ඔබතුමා මේ පාර්ලිමේන්තුවට ලබා දෙන්න බලාපොරොත්තු වන ඒ බලවත් තත්ත්වය ගැන අපි බොහොම සතුටුයි. ජනතා පරමාධිපත්‍ය ප්‍රකාශ වෙන්නේ මේ පාර්ලිමේන්තුවෙන් කියලා අපි තදින්ම විශ්වාස කරන අය. නීතියේ ආධිපත්‍යයටත් වඩා ජනතා පරමාධිපත්‍ය මූලිකයි කියලා අපි පිළිගන්නා අය. නීති හදන්නේත් මේ පාර්ලිමේන්තුවේ. ඒ නිසා නීතියේ ආධිපත්‍යයත්, ජනතාවගේ පරමාධිපත්‍යයත් එකට බැඳලා ගෙනයන්න ඕනෑ. තමුන්නාන්සේලා මෑත කාලයේ යහ පාලනය ගැන කථා කළා, නීතියේ අධිපත්‍යය ගැන කථා කළා. ජනතාවගේ පරමාධිපත්‍ය මේ පාර්ලිමේන්තුව තුළ තහවුරු කරන ආකාරය ගැන මට නම් තවමත් පැහැදිලි නැහැ. ඒක දැන ගැනීමේ වුවමනාවක් අපට තිබෙනවා. ඉදිරි කාලයේ සිදුවීම් දිගහැරෙන ආකාරය අනුව අපට ඒ ගැන බලන්න පුළුවන්.

අපි ඔබතුමන්ලා සමඟ ජාතික ආණ්ඩුව පිළිබඳව තිබෙන ප්‍රතිවිරෝධය න්‍යායික කාරණයක් පමණක්ම නොවෙයි. අපි දන්නවා ජාතික ආණ්ඩු කියන ඒවා හැදෙන්නේ විපක්ෂය අවනත කර ගැනීම සඳහා අධිරාජ්‍යවාදයට ගැති ධනපති පන්තිය විසින් බව. අපට ඡන්දය දුන්නේ කවුද? ඔබතුමන්ලාට ඡන්දය දුන්නේ කවුද? ඉහළ පන්තියෙන් සියයට 90ක් ඔබතුමන්ලාට ඡන්දය දුන්නා. අපට ලැබුණු ඡන්දවලින් සියයට 90ක් ලැබුණේ අඩු ආදායම් ලබන පන්තියෙන්. ඒකයි ඇත්ත. මේ පන්ති සටන තිබෙනවාය කියන එකයි මම තමුන්නාන්සේට කියන්නේ. මේ පන්ති සටන කෙළවර වෙලා නැහැ. අපි අපේ අයිතිය උදෙසා පෙනී සිටින අතර, ඒ පන්තිය වෙනුවෙන් අපේ අයිතිය පැහැර ගන්න ඔබතුමා පෙනී සිටින බව අපි දන්නවා. අන්න ඒ සටන ඉදිරි කාලයේ මතු වන ආකාරය අනුව පාර්ලිමේන්තුවේත්, පාර්ලිමේන්තුවෙන් එළියේත් මේ ක්‍රියාදාමය පෙරට යනු ඇතැයි කියා මා විශ්වාස කරනවා. [බාධා කිරීමක්]

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ ගණපූරණය නැහැ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
පාර්ලිමේන්තුවේ ගණපූරණය. [බාධා කිරීමක්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාව ඉවර කරන්න ඕනෑ. මගේ අන්තිම වාක්‍ය මේකයි. [බාධා කිරීමක්] න්‍යායික වශයෙන් විතරක් නොවෙයි අපි මේක කියන්නේ. මේක පන්ති ප්‍රශ්නයක් විතරක් නොවෙයි. "තමසෙක්" ආවොත් වෙන්නේ මොකක්ද කියලා අපි දන්නවා. අධ්‍යාපනය පෞද්ගලීකරණයේදී වෙන්නේ මොකක්ද කියලා අපි දන්නවා. මේ රටේ පන්ති සටන නැවත ඇවිළෙනවා. හැබැයි රට බෙදීමේ කථාවලින් රට අවුල් කරන්න හදන එකට අපි නම් එකඟ නැහැ. රට බෙදීමේ කථාවලින් මේ රටේ ජනතාව අවුස්සලා නැවතත් මේ රටේ ගිනි මැල ඇති කරන්න ඉඩ දෙන්න අපි නම් කැමැති නැහැ.

ගරු අගමැතිතුමනි, අවසාන වශයෙන් චාරිත්‍රානුකූලව ඔබතුමාට මගේ සුබ පැතුම් පිළිගන්වමින් "ප්‍රජාතන්ත්‍රවාදය ජීවමානයි" කියන එක කියන්න ඕනෑ. "ජේසුස්වහන්සේ ජීවමානයි" කියනවා වාගේ මට කියන්න තිබෙන්නේ "ප්‍රජාතන්ත්‍රවාදය ජීවමානයි" කියායි. මේ ක්‍රියාදාමය සිදු වුණු ආකාරයෙන්ම එය ජීවමාන තත්ත්වයකින් ක්‍රියාත්මක වී තිබෙනවා. නමුත් ප්‍රජාතන්ත්‍රවාදයට භක්තිමත් නොවී ක්‍රියා කරපු යම් පිරිසක් ඉන්නවා නම් ඒ උදවියට ඒ පිළිබඳ වගඋත්තර කියන්න වෙයි කියමින් මගේ වචන ස්වල්පය හමාර කරනවා.

[4.45 p.m.]

ගරු මහාචාර්ය රාජීව විජේසිංහ මහතා (උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பேராசிரியர் ராஜீவ விஜேசிங்க - உயர் கல்வி இராஜாங்க அமைச்சர்)
(The Hon. (Prof.) Rajiva Wijesinha - State Minister of Higher Education)
Mr. Deputy Speaker, as the former Chief Government Whip also said earlier in the day, it is an unusual pleasure to speak as the Leader of the Liberal Party in Parliament. In that capacity, I extend my congratulations to His Excellency the President on his strength of character in taking up what seemed an impossible challenge and the eminently civilized way in which he has worked after his victory. We also congratulate the Hon. Prime Minister for understanding political realities and thwarting the game plan of the former President by supporting a common candidate. It is salutary that, in addition to being the Prime Minister, he has taken charge of economic development, since I believe we need the careful planning and financial discipline that he will bring to this portfolio, which was singularly lacking in the last few years.

Sir, though the Liberal Party is a small one, we can take credit for having first identified the problems of this Constitution and this electoral system, which our Government is pledged to change. Though I know the parties of the Left objected to the 1978 Constitution, they did so on the basis of a return to the Westminster model. This was foolish - I am afraid the Left parties are consistently foolish on small issues sometimes - because they had been victims of excessive power in the hands of a Prime Minister under the Westminster system during the previous couple of years.

We, or rather the Founder Leader of the Liberal Party, Dr. Chanaka Amaratunga, was the first to clearly identify the dangers of excessive power and to explain the way in which checks and balances could be introduced. In this regard, I am sorry to say that I received very little support from other parties for the changes I proposed to the Standing Orders over a year ago. This Government is pledged to introduce changes and, I hope very much, that the changes I proposed will be discussed; they can, of course, be amended, but at least, it is a start. The Leader of the NLSSP - I am grateful to him - did raise a question on my behalf -

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
It is not NLSSP. It is "ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණ".

ගරු මහාචාර්ය රාජීව විජේසිංහ මහතා
(மாண்புமிகு பேராசிரியர் ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)
I am sorry, I confused you with Dr. Wickramabahu Karunaratne. My apologies.

The Leader of the DLF and the then Chief Government Whip tried valiantly to get some progress on that, no one else in authority seemed to care. In this regard, Sir, I hope that in introducing changes, we work in terms of principles rather than engaging in *ad hoc* measures. We should make sure that Parliamentary Committees are constituted as happens in the rest of the world, with no authority to Ministers, but rather ordinary Members of Parliament being the Chairs. This should be mandatory for Finance Oversight Committees and, while I am sorry that the TNA and the JVP are not in the Cabinet, I believe their commitment to financial integrity should find full play in the chairing of such Committees.

Hasty legislation was the reason for former President Chandrika Bandaranaike Kumaratunga not acting in terms of the Seventeenth Amendment and refusing to appoint the Election Commission suggested by the Constitutional Council. I am glad, therefore, that in getting rid of the Eighteenth Amendment, as to which I trust this House will be unanimous, we replace it with something based on constitutional practice in the rest of the world without blindly returning to the Seventeenth Amendment.

[ගරු මහාචාර්ය රාජීව විජේසිංහ මහතා]

Similarly, Sir, with regard to electoral systems, the Liberal Party was the first, in the '80s, to suggest change and to advocate a mixed system. We were then accused of trying to introduce foreign customs. However, soon enough, all parties agreed on the need for the German System, though twice there were efforts to distort this. I remember discussing this in the '90s with the then Minister of Constitutional Affairs in this very Parliament and him admitting that there were slight changes; changes that, in fact, distorted the principles of the German System. Later in 2002, I urged the Hon. Karu Jayasuriya to act quickly because he had plans for electoral reforms as the Hon. Dinesh Gunawardena also had, but they all delayed, and that Government was dismissed. I am glad, therefore, that the Hon. Prime Minister made clear our commitment to swift reforms in this regard.

Sir, in celebrating the need for reform, the Liberal Party can be proud that, alone in Government, it formally advocated reforms while sitting in Government for the last two years. I should mention here though, the debt owed also to the Hon. Vasantha Senanayake, who along with me drafted a formal letter to the former President at the beginning of last year about the need for reforms, and I am grateful to the Senior Ministers who signed that letter, which was quite brave of them at the time. Had the former President listened to him and accepted, even with amendments, the constitutional change he tabled, perhaps things might have been different. But, instead of taking advice from moderates in the Sri Lanka Freedom Party, which I hope will return to its traditional moderation under its new Leader, he was led astray by extremists and those who thought the State was theirs to plunder.

Sir, the Liberal Party told the former President in writing in October that he should not have a hasty election, but instead, work on the reforms promised in the Manifesto on which the UPFA had won the election. We told him we could not support him in an election without reforms. I know that the Left parties had also advised him not to have a hasty election, and I am sorry that they, whose integrity I used to admire and which I still admire, did not also stand by their beliefs the way a few of us did. In this context, I should note that the Hon. Vasudeva Nanayakkara was slightly misleading in the story he told me on the night of 8th January; he told me then that one of the reasons for the delay in releasing the results was, he had been told, that the present President had wanted it delayed.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Oh, my God!

ගරු මහාචාර්ය රාජීව විජේසිංහ මහතා
(மாண்புமிகு பேராசிரியர் ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)
I know that - [*Interruption.*]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Right now, how can you, the Leader of the Liberal Party, tell an untruth outright? I cannot think of it!

ගරු මහාචාර්ය රාජීව විජේසිංහ මහතා
(மாண்புமிகு பேராசிரியர் ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)
I never told an untruth. Hon. Vasudeva Nanayakkara, you told me that the Hon. Maithripala Sirisena had asked for the delay because he wanted to take office in the morning. You said that. If you have forgotten it - [*Interruption.*]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
I said that the Hon. Maithripala Sirisena, the President -elect, had wanted -

ගරු මහාචාර්ය රාජීව විජේසිංහ මහතා
(மாண்புமிகு பேராசிரியர் ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)
Yes, that is what I said.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Then, with that, I agree.

ගරු මහාචාර්ය රාජීව විජේසිංහ මහතා
(மாண்புமிகு பேராசிரியர் ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)
Exactly.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
But, I thought you said former President Mahinda Rajapaksa.

ගරු මහාචාර්ය රාජීව විජේසිංහ මහතා
(மாண்புமிகு பேராசிரியர் ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)
I did not. I said the "current President".

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Okay.

ගරු මහාචාර්ය රාජීව විජේසිංහ මහතා
(மாண்புமிகு பேராசிரியர் ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)
Hon. Vasudeva Nanayakkara, I would kindly suggest that you never again accuse me of telling an untruth because you know perfectly well that I do not tell untruths.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Yes, I know.

ගරු මහාචාර්ය රාජීව විජේසිංහ මහතා
(மாண்புமிகு பேராசிரியர் ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)
I do not even distort the truth. - [*Interruption.*] Thank you.

So, what I am saying is, the story you told the House was not quite correct.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Wrongly perceived.

ගරු මහාචාර්ය රාජීව විජේසිංහ මහතා
(மாண்புமிகு பேராசிரியர் ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)
Yes. But, you claimed that the Hon. Maithripala Sirisena had wanted the results delayed, which was not true.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Falsehood; that is what I was told.

ගරු මහාචාර්ය රාජීව විජේසිංහ මහතා
(மாண்புமிகு பேராசிரியர் ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)
Yes. But, you should have mentioned that in the House.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Yes, I had to.

ගරු මහාචාර්ය රාජීව විජේසිංහ මහතා
(மாண்புமிகு பேராசிரியர் ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)
Okay.

The other point I want to make is this. As you know, I have asked my friends in the Left why they did not stand by their principles and join the campaign of the Hon. Maithripala Sirisena. I do think that in 2015, this whole idea about imperialism, about the rich, is nonsense. I am personally very proud that I was not together with those people who had manipulated the stock exchange mercilessly in the last few years. I am sorry that people like you, whom I admire and who, I know, are not corrupt in the slightest, stood together with corruption and I told you that it was not correct to stand together with racists. You and I know, perhaps, the former President was not a racist, but the use made of such people was absolutely shocking! I was deeply sorry that my old Friends in the Left were prepared to go along with that because I think you have a lot to contribute to the future of this country in terms of ideas. I hope that you will not stick to the old practice.

Finally, Sir, I was told that I was courageous, but as the former President once said, I was "someone without a political future". As a member of the Liberal Party, I had nothing to lose. The real heroes of today are His Excellency the President, the other members of the SLFP, and in particular, the Hon. Vasantha Senanayake, who spoke out so early, the Leader of the UPF and the other minority Members who left Government in that tumultuous week after the Presidential Election was called. In wishing the Government well, in hoping for the Opposition's cooperation now for reform, I salute them for courage, which I hope will never be necessary again in our political system after we get rid of the excessive authority of the Executive.

Thank you.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
The Hon. Prime Minister, please.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාරණා දෙකක් ගැන පැහැදිලි කරන්න ඕනෑ. විමල් වීරවංශ මන්ත්‍රීතුමා කිව්වා දැන් උතුරේ කඳවුරු ඉවත් කරනවා කියලා. එවැනි කිසිවක් සිදු වෙලා නැහැ. මා එය මෙහිදී විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ.

ගරු ආර්. සම්පන්දන් මහතා
(மாண்புமிகு ஆர். சம்பந்தன்)
(The Hon. R. Sampanthan)
What is wrong about it?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
I am just saying that he mentioned it and that those have not been removed. That is the position as of today. - [*Interruption.*] Hon. Sampanthan, you all have also taken

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

up the question of resettlement of people and the Manifesto states that we will go into the cases of people in the whole country, whose lands had been taken away, and wherever possible in the vast majority of the cases, they will be asked to resettle in the lands. But, we have not removed any camps.

දෙවැනි කාරණය මේකයි. අපට කිව්වා, විරුද්ධ පාර්ශ්වයේ නායකයායි ජනාධිපතියි එක පක්ෂයේ හිටපු අවස්ථාවක් මීට ඉස්සර වෙලා තිබුණේ නැහැ කියලා. මා "අර්ස්කින් මේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය" ගැන මතක් කරන්න කැමැතියි. මට මතක විධියට 1916 ඉඳලා 1918 විතර වන කල්, එංගලන්තයේ අගමැති වූ ලොයිඩ් ජෝර්ජ්, ලිබරල් පක්ෂයේයි. ඒ වාගේම, විරුද්ධ පක්ෂයේ නායක හර්බට් ඇස්ක්විත් ද ලිබරල් පක්ෂයේයි. "අර්ස්කින් මේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය" කියෙව්වොත් ඒ බව දැනගන්න පුළුවන්.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මීළඟට ගරු අතාවුල්ලා මහතා.

Order, please! Before that, the Hon. Deputy Chairman of Committees will take the Chair.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் *அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்* [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] *தலைமை வகித்தார்கள்.*

Whereupon MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

[பி.ப. 4.57]

ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இப்பாராளுமன்றத்திலே புதிதாக நியமிக்கப்பட்டிருக்கின்ற மாண்புமிகு பிரதம அமைச்சர் அவர்களே, சபை முதல்வர் அவர்களே, இன்று இந்த நாட்டிலே என்றுமில்லாதவாறு ஒரு புதுவகையான பாராளுமன்ற அமைப்பு தோற்றுவிக்கப் பட்டிருக்கின்றது. அதாவது, இங்கு எல்லோரும் குறிப்பிட் டதைப்போன்று பெரும்பான்மையானவர்கள் எதிர்க்கட்சி யிலும் சிறுபான்மையானவர்கள் ஆளும் கட்சியிலும் இருக் கின்ற விநோதமான ஓர் அமைப்பு தோற்றுவிக்கப்பட்டிருக் கின்றது. எல்லாம் நலவுக்கே என்ற எண்ணத்தோடு நாங்கள் இந்தப் பாராளுமன்றத்தைப் பார்க்கின்றோம். இந்த நாட்டில் மக்களுடைய வரத்தைப் பெற்று ஜனாதிபதியாகத் தெரிவு செய்யப்பட்ட மேதகு மைத்திரிபால சிறிசேன அவர்களுக்கு முதலிலே எங்களுடைய வாழ்த்துக்களைத் தெரிவித்துக் கொள்கின்றோம். அதேபோன்று அரசாங்கத்தின் பிரதம அமைச்சராக இருக்கின்ற மாண்புமிகு ரணில் விக்கிரமசிங்க அவர்களுக்கும் எங்களுடைய வாழ்த்துக்களைத் தெரிவித்துக் கொள்கின்றோம்.

ஜனாதிபதி முறையிலே மாற்றங்களைக் கொண்டுவந்து, அப்பதவிக்கான அதிகாரங்களைக் குறைத்து, பாராளுமன்றத் துக்குக் கூடுதல் அதிகாரங்களை வழங்குவதாகக் கூறி, இந்த அரசாங்கமானது மக்களிடத்திலே மிக முக்கியமாக 'வரம்' கேட்டிருந்தது. ஜே.ஆர். ஜயவர்தனவுடைய காலத்தில் ஐக்கிய தேசியக் கட்சியினரால் கொண்டுவரப்பட்ட பல திட்டங்கள் கட்டாயம் மாற்றப்பட வேண்டும் என்று, அவற்றில் பல மாற்றப்பட்டன. இறுதியாக ஜனாதிபதியின் அதிகாரம் குறைக்கப்பட வேண்டும் என்கின்ற மாற்றத்துக்கு ஐக்கிய தேசியக் கட்சியினர் உடன்பட்டிருப்பது வியப்பையும் ஆச்சரியத்தையும் அதேநேரம் மகிழ்ச்சியையும் தருகின்றது. அன்று ஜே.ஆர். ஜயவர்தன அவர்கள் அரசாங்கத்திலே இருந்தபோது எடுத்த நடவடிக்கைகள் பிழை என்று இன்றிருக் கின்ற பிரதம அமைச்சர் அவர்களும் ஒத்துக்கொண்டிருக் கின்றார். இருந்தபோதிலும், சிறுபான்மை மக்களைப் பொறுத்தவரையில் நிறைவேற்று அதிகாரம் கொண்ட ஜனாதிபதி முறையை ஒழிப்பது தொடர்பாக சிறுபான்மைக் கட்சிகள் இன்னும் யோசிக்க வேண்டிய தேவை இருக்கின்றது.

இன்று ஒரு ஜனாதிபதியை மாற்றுவதற்குக் காரணமாக இருந்தவர்களும் சிறுபான்மையினரே என்று மார்தட்டுகின்ற அதேநேரம், அவ்வாறான ஓர் அதிகாரம் சிறுபான்மை மக்களி டத்திலே இருக்கின்றபொழுதான் இவைகளைச் சாத்தியமாக்க முடியும் என்பதனை மறந்து சிறுபான்மையினத்தைச் சேர்ந்த சிலர் நிறைவேற்றதிகாரம் கொண்ட ஜனாதிபதி முறையில் மாற்றம் வேண்டும் என்று குறிப்பிடுகின்றனர். என்னைப் பொறுத்தவரையில் அதனை இரட்டை வேடமாகக் கருத வேண்டியிருக்கின்றது. அப்படித்தான் மாற்றியமைத்தாலும் கூட நாங்கள் சிறுபான்மையினருக்குப் பாதுகாப்புத் தரக்கூடிய ஓர் அரசியல் அமைப்பை ஏற்படுத்த வேண்டும் என்பது என்னுடைய நிலைப்பாடாகும்.

பொதுவாக இந்த அரசாங்கத்தைப் பொறுத்தவரையில், பாராளுமன்றில் சிறுபான்மையினராக இருந்து அரசாங்கம் அமைத்திருக்கின்ற ஐக்கிய தேசியக் கட்சியினர், கிடைத்த வாக்குகள் எல்லாம் ஐக்கிய தேசியக்கட்சிக்குத்தான் கிடைத் திருக்கின்றதென்று நினைத்துக்கொள்ளக்கூடாது; அது தவறான ஒரு போக்காக மாறிவிடும். சில வேளைகளில் சில காரணங்களுக்காகச் சிறுபான்மை மக்கள் மாற்று ஆட்சியைப் பற்றி, மாற்றுத் தலைமைத்துவத்தைப்பற்றி யோசிக்கின்ற அதேநேரம், சிலர் அந்த வாக்குகள் தங்களுக்குத்தானே கிடைத்ததென்று யோசிக்கிறார்கள். சில வேளைகளில், 'கரத்தை'க்குக் கீழே போகின்ற நாய், தான்தான் அந்தக் 'கரத்தை'யை இழுத்ததாக நினைப்பது போன்று, நாங்கள்தான் இந்தக் 'கரத்தை'யை இழுத்தோம் என்றுகூடச் சில சிறுபான்மைக்கட்சிகள் யோசிக்கின்றன. இவையெல்லாம் காலத்துக்குக் காலம் நடப்பவை என்பது இங்கு எல்லோருக்கும் தெரிந்த விடயம். அதாவது, அமைச்சுப் பதவிகளைப் பெறுவதற்கான அல்லது ஆட்சி அதிகாரங்களைப் பெறுவதற் கான மாற்றங்களுக்காகவே இவ்வாறு நடந்துகொண்டிருக் கின்றன என்பதனை நாங்கள் மறந்துவிடக்கூடாது.

எனது தேசியக் காங்கிரஸ் கட்சியைப் பொறுத்தவரையில், இந்த நாட்டின் பொதுவான, மிக முக்கியமான தேவை களுக்காக முன்னாள் ஜனாதிபதி சந்திரிகா குமாரதுங்க அவர்களோடும் அதனைத்தொடர்ந்து மஹிந்த ராஜபக்ச அவர்களோடும் ஒன்றிணைந்து செயற்பட்டிருக்கின்றது. அதனைத் தொடர்ந்து இன்று யாரும் எதிர்பாராத விதமாக மேதகு ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்களின் தலைமையின் கீழே எல்லோரும் ஒன்றிணைய வேண்டிய ஒரு சந்தர்ப்பம் ஏற்பட்டிருக்கின்றது. நாங்கள் மாறவில்லை.

நாங்கள் ஒரே இடத்திலிருக்கிறோம். 'பொதுசன எக்சத் பெரமுன' என்று ஒரு கட்சி இருந்தது. அதேபோன்று UPFA என்கின்ற கட்சியிருந்தது. அந்தக் கட்சிகளின் ஆட்சியூடாக நாங்கள் தொடர்ந்து வந்துகொண்டிருக்கின்றோம். ஆனால், தலைவர்கள் மாறியிருக்கிறார்கள். இருந்தாலும் நாங்கள் மகிழ்ச்சியடைகிறோம். இந்த நாட்டின் இன்றைய மேதகு ஜனாதிபதி அவர்கள் இந்த UPFA இல் அங்கம் வகிக்கின்ற கட்சிகளை அழைத்து, "நீங்கள் இந்த 100 நாள் வேலைத் திட்டத்திற்கு முதலிலே ஆதரவு வழங்கவேண்டும்; இந்த அரசு இந்த நாட்டில் பல மாற்றங்களைப் பாராளுமன்றத்திலே செய்ய இருக்கின்றது. நீங்கள் அவற்றுக்கு ஆதரவு தரவேண்டும்" என்று கேட்டுக்கொண்டதற்கிணங்க எங்களுடைய கட்சியும் அதற்கு ஆதரவு கொடுப்பதற்குத் தீர்மானித்திருக்கிறது.

இந்த 100 நாள் வேலைத்திட்டம் என்பது அமைச்சுக்களில் இருந்துகொண்டு அபிவிருத்தி செய்கின்ற வேலைகளைக் குறிப்பதல்ல. அதனையும் இந்த அரசாங்கமும் பிரதம அமைச்சர் அவர்களும் புரிந்துகொள்ள வேண்டும். அந்த 100 நாள் வேலைத்திட்டம் என்பது அரசியல் அமைப்பில் மாற்றம் அல்லது பாராளுமன்றத்துக்கு அதிகாரம் கொடுக்கின்ற விடயங்கள் அல்லது commission கள் அமைக்கின்ற விடயங்கள் தொடர்பான விடயங்களேயன்றி, 3 மாதத்துக்குள் அபிவிருத்தி செய்கின்ற வேலைத்திட்டங்கள் அல்ல. ஆனால், 3 மாதத்துக்குள் அபிவிருத்தி செய்கின்ற வேலைத்திட்டங்கள் என்ற அடிப்படையிலே சில அமைச்சுக்கள் அவற்றின் வேலைகளை முன்னெடுப்பதை நாங்கள் காணக்கூடியதாக இருக்கின்றது. எனவே, அதில் கவனமாக இருக்கவேண்டும் என்ற நிலைப்பாட்டையும் நான் தெரிவித்துக்கொள்கிறேன்.

மேலும், ஆட்சி மாறிய பின்னர் சில பழிவாங்கல் நடவடிக்கைகள் நிகழ்ந்துகொண்டிருக்கின்றன. இந்த நாட்டிலே எந்த ஜனாதிபதியையும் யாருமே பழிவாங்கவில்லை என்பது உங்களுக்குத் தெரியும். முன்னர் ஜனாதிபதியாக இருந்தவர்கள் சந்திரிகா குமாரதுங்கவாக இருந்தாலும் சரி, அதேபோன்று மற்றைய ஜனாதிபதிகளாக இருந்தாலும் சரி, ஜே.ஆர். ஜயவர்தனவாக இருந்தாலும் சரி, யாருமே பழிவாங்கப் படவில்லை. எப்பொழுதுமே நாட்டுக்காக ஒருவர் சேவை செய்திருக்கிறார் என்றால் அவரை நாங்கள் வாழ்த்த வேண்டுமே தவிர, அரசியலுக்காகச் சாயம் பூசுகின்ற அல்லது அவர்களுக்குச் சேறு பூசுகின்ற நடவடிக்கைகளில் ஈடுபடக் கூடாது. அவ்வாறு சேறுபூச எண்ணுபவர்கள், நாளை என்ன நடக்கும் என்பதை நினைத்துக்கொண்டுதான் தங்களுடைய சேறுபூசுகின்ற நடவடிக்கைகளைச் செய்யவேண்டும். எப் பொழுதும் நாங்கள் முன்மாதிரியாக இருந்துகாட்ட வேண்டும். ஐக்கிய தேசியக் கட்சி அரசாங்கம் பல ஆண்டுகள் இருந் திருக்கின்றது. கௌரவ ரணில் விக்கிரமசிங்க அவர்களின் தலைமையில் அரசாங்கம் இருந்திருக்கின்றது. அப்பொழு தெல்லாம் மாறிவந்த அரசாங்கம் உங்களையோ அல்லது யாரையுமோ பழிவாங்கவில்லை. ஆனால், நீங்கள் பழிவாங்குகின்ற நடவடிக்கைகளை மேற்கொண்டிருக்கிறீர்கள். அது உங்களுக்கு நல்லதல்ல. அதாவது, "சரியான நிர்வாகம் செய்யப்போகின்றோம். යහ පාලනය කොන්ඩුවරප் போகிறோம்" என்று சொல்லுகின்ற நீங்களே, அதற்கு முன்மாதிரியாக இருப்பதற்குக் கற்றுக்கொள்ள வேண்டு மென்று சொல்லிக்கொள்வதோடு, மீண்டும் உங்களுக்கு என்னுடைய வாழ்த்துக்களைத் தெரிவித்து, விடைபெறு கின்றேன். நன்றி.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 5.05ට, අද දින සභා සම්මතිය අනුව, 2015 ජනවාරි මස 29 වන බ්‍රහස්පතින්දා අ.භා. 1.00 වන තෙක් කල් ගියේය.

அதன்படி பி.ப. 5.05 மணிக்கு பாராளுமன்றம், அதனது இன்றைய தீர்மானத்துக்கிணங்க, 2015 சனவரி 29ஆம் திகதி வியாழக்கிழமை மு.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Adjourned accordingly at 5.05 p.m. until 1.00 p.m. on Thursday, 29th January, 2015, pursuant to the Resolution of Parliament of this day.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

232 වන කාණ්ඩය - 2 වන කලාපය
தொகுதி 232 - இல. 2
Volume 232 - No. 2

2015 ජනවාරි 29 වන බ්‍රහස්පතින්දා
2015 சனவரி 29, வியாழக்கிழமை
Thursday, 29th January, 2015

පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රතිඥාව :
ගරු ජයසිංහ බණ්ඩාර මහතා

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය :
අග්‍රවිනිශ්චයකාර මොහාන් පීරිස් මහතා පොලීසියට කළ පැමිණිල්ල

සිය දින මෙහෙයුම :
ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රකාශය

සිය දින විප්ලවය :
ගරු මුදල් අමාත්‍යතුමාගේ ප්‍රකාශය

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය

பிரதான உள்ளடக்கம்

உறுதிப்பிரமாணம் :
மாண்புமிகு ஜயசிங்க பண்டார

தனி அறிவித்தல்மூல வினா :
பிரதம நீதியரசர் மொஹான் பீரிஸ் அவர்கள் பொலிஸில் செய்த முறைப்பாடு

நூறு நாள் வேலைத்திட்டம் :
மாண்புமிகு பிரதம அமைச்சரினது கூற்று

நூறு நாள் புரட்சி :
மாண்புமிகு நிதி அமைச்சரினது கூற்று

பாராளுமன்ற நிலையியற் கட்டளைகளில் திருத்தம்

PRINCIPAL CONTENTS

AFFIRMATION:
Hon. Jayasinghe Bandara

QUESTION BY PRIVATE NOTICE:
Complaint to Police by Chief Justice Mohan Peiris

HUNDRED-DAY WORK PROGRAMME:
Statement by Hon. Prime Minister

HUNDRED-DAY REVOLUTION:
Statement by Hon. Minister of Finance

AMENDMENT OF THE STANDING ORDERS OF PARLIAMENT

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2015 ජනවාරි 29 වන බ්‍රහස්පතින්දා
2015 சனவரி 29, வியாழக்கிழமை
Thursday, 29th January, 2015

අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය. කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m., MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] in the Chair.

ප්‍රතිඥාව : ගරු ජයසිංහ බණ්ඩාර මහතා
உறுதிப்பிரமாணம் : மாண்புமிகு ஜயசிங்க பண்டார
AFFIRMATION: HON. JAYASINGHE BANDARA

ගරු ජයසිංහ බණ්ඩාර මහතා නීති ප්‍රකාර ප්‍රතිඥාව දී මේසය මත තිබූ පොතෙහි අත්සන් කළේය.

மாண்புமிகு ஜயசிங்க பண்டார அவர்கள் சட்டத்தினால் வேண்டப்பட்டவாறு உறுதிப்பிரமாணம் செய்து சபாபீடத்திலிருந்த புத்தகத்தில் கையொப்பமிட்டார்.

The Hon. Jayasinghe Bandara made and subscribed the Affirmation required by Law; and signed the Book at the Table.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (ආහාර සුරක්ෂිතතාව අමාත්‍යතුමා)
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - உணவுப் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. Gamini Jayawickrama Perera - Minister of Food Security)

ගරු කථානායකතුමනි, 2010 වර්ෂය සඳහා සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අදාළ උපදේශක කාරක සභාවට යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු රිසාඩ් බදියුදීන් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு றிஸாட் பதியுதீன் - கைத்தொழில், வாணிப அலுவல்கள் அமைச்சர்)
(The Hon. Risad Badhiutheen - Minister of Industry and Commerce)

Hon. Speaker, I present the Annual Report of the Sri Lanka Export Development Board for the year 2012, and move that this Report be referred to the relevant Consultative Committee.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු පී. හැරිසන් මහතා (සමාජ සේවා, සුබසාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு பீ. ஹரிசன் - சமூக சேவைகள், நலன்புரி மற்றும் கால்நடை வளர்ப்பு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. P. Harrison - Minister of Social Services, Welfare and Livestock Development)

ගරු කථානායකතුමනි, මම කහටගස්දිගිලිය, රන්පත්විල - උතුර යන ලිපිනයෙහි පදිංචි එල්.එස්.ඒ. ප්‍රේමසිරි මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා (විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பாலித ரங்கே பண்டார - மின்வலு மற்றும் எரிசக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Palitha Range Bandara - State Minister of Power and Energy)

ගරු කථානායකතුමනි, මම කොට්ටුකච්චිය, වැව අසල පදිංචි පී. පියදාස මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු කරුපයියා වේලායුදම් මහතා (වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கருப்பையா வேலாயுதம் - பெருந்தோட்டக் கைத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Karuppaiah Velayudam - State Minister of Plantation Industries)

Hon. Speaker, I present the following petitions:

1. A petition from Mr. A.G. Dharmathilake of Sri Lanka Insurance Corporation Limited, Kandy Branch;
2. A petition from Mr. B.G.L. Silva of No. 91/155, Gemunu Mawatha, Peellawaththa, Andiambalama;
3. A petition from Mr. C.M. Ihalagama of Sri Lanka Insurance Corporation Limited, Beruwala Branch;
4. A petition from Mr. W.A.S.L.S.A. Jansa of Sri Lanka Insurance Corporation Limited, Marawila Branch;
5. A petition from Mr. W.A.W.N. Weerasinghe of No.143, Aliwalapalla, Walgammulla, Veyangoda;
6. A petition from Mr. W.M.M.K. Wanninayake of Sri Lanka Insurance Corporation Limited, Nikaweratiya Branch;

[ගරු කරුපයියා වේලායුදම් මහතා]

7. A petition from Mrs. C.M. Liyanage of Sri Lanka Insurance Corporation Limited, Elpitiya Branch;

8. A petition from Mrs. D.M. Amara Dissanayake of No. 161/28, Daham Mawatha, Maharagama;

9. A petition from Mrs. G.N.S. Subasingha of No. 30, Rupasingha Road, Nedimala, Dehiwala;

10. A petition from Mrs. K.V.M.M. Kumarasinghe of Arachchigewaththa, Warakamulla, Maha Induruwa;

11. A petition from Ms. G.H. Indrani Silva of Sri Lanka Insurance Corporation Limited, Kandy Branch;

12. A petition from Ms. H.M.D. Priyani of Demodara, Mahagama;

13. A petition from Ms. J.M.T.C. Obesekara of "Mangala", Holeepitiya, Dodampe;

14. A petition from Ms. K.A.K. Sriyalatha of No. 2C7, National Housing Scheme, Maththegoda; and

15. A petition from Ms. W.H.G. Renuka of Sri Lanka Insurance Corporation Limited, Melsiripua Branch.

ගරු රුවන් විජයවර්ධන මහතා (ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ருவன் விஜயவர்தன - பாதுகாப்பு இராஜாங்க அமைச்சர்)
(The Hon. Ruwan Wijayawardhana - State Minister of Defence)

ගරු කථානායකතුමනි, දොම්පේ, වේල්ගම යන ලිපිනයෙහි පදිංචි පී.එම්. පොඩිඅප්පුහාමි මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු එම්.ටී. හසන් අලි මහතා (සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எம்.ரீ. ஹஸன் அலி - சுகாதார இராஜாங்க அமைச்சர்)
(The Hon. M.T. Hasen Ali - State Minister of Health)

Hon. Speaker, I present the following petitions:

1. A petition from Mr. A.M.M. Razeed, Chairman, Karanga West Farmers' Organization, No. 70, Vilinayadi - 03, Ampara Road, Sammanthurai;

2. A petition from Mr. A.P. Thusdick of No. 259, Hipra Street, Marathamunai - 03 and

3. A petition from Mr. A.M.M. Hussain of Kuduvil Kattuveli Kandam Farmers' Association, No. 265, Cassim Road, Kalmunai - 11.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු ඒ.ඩී. චම්පික ප්‍රේමදාස මහතා - පැමිණ නැත.

ගරු වසන්ත අලුවිහාරේ මහතා (මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த அலுவிஹாரே - மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon.Wasantha Aluwihare - Deputy Minister of Mahaweli Development and Environment)

ගරු කථානායකතුමනි, මාතලේ, පල්ලේපොල, අලවත්ත, මානින්ගමුව, මිනුල යන ලිපිනයෙහි පදිංචි එම්.එල්.එම්. ජයවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

ගරු කථානායකතුමනි, කොළඹ 09, කැටවලමුල්ල පටුමග, අංක 149/45 දරන ස්ථානයෙහි පදිංචි ජයසේන ඒකනායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

ගරු කථානායකතුමනි, ජා-ඇල, නිවන්දම, යක්කඩුව, අංක 807 ඒ දරන ස්ථානයෙහි පදිංචි බී.එස්. හරිස්චන්ද්‍ර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා - පැමිණ නැත.

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා - පැමිණ නැත.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

Hon. Speaker, I present a petition received from Ms. Rameela Mervin Clarence of No. 82, Temple Road, Jaffna.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
The Hon. Susantha Punchinilame)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හය පිළිගන්වමි.

(1) රත්නපුර, හිඳැල්ලන, ඇල්ලේගෙදර, "සඳැල්ල" යන ලිපිනයෙහි පදිංචි එම්.ඒ. සරත් ජයවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) බෙන්තොට, වරාහේන විවේකාංගන අවන්හල යන ලිපිනයෙහි පදිංචි පටබැඳි ආරච්චිගේ රත්නසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) කළුතර, නාගොඩ, සුහද මාවත යන ලිපිනයෙහි පදිංචි ප්‍රදීප් ශ්‍රීමන්ත ලියනගේ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) ත්‍රිකුණාමලය, තුල්සිපුර, අංක 10/17 දරන ස්ථානයෙහි පදිංචි ටී.එච්. කරුණාසේන මහතාගෙන් ලැබුණු පෙත්සම;

(5) පදවි ශ්‍රී පුර, කාවන්තිස්සපුර, අංක 882 දරන ස්ථානයෙහි පදිංචි බී.එම්. ප්‍රියංගිකා සුභාෂිණී මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(6) ත්‍රිකුණාමලය, සිංහපුර, නුවර පාර, අංක 36 දරන ස්ථානයෙහි පදිංචි ප්‍රේමා මනවීර මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, බේරුවල, පාදාගොඩ, "රුවනාර" යන ලිපිනයෙහි පදිංචි ඉසුරු සෙනෙවිරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු සරණ ගුණවර්ධන මහතා
(மாண்புமிகு சரண குணவர்தன)
(The Hon. Sarana Gunawardena)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) වේයන්ගොඩ, නාරංවත්ත, 10 වෙනි පටුමග, අංක 183 දරන ස්ථානයෙහි පදිංචි එන්.අයි.ටී. ජයසේකර මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) මීතොටමුල්ල, සිල්වා පටුමග, අංක 32 දරන ස්ථානයෙහි පදිංචි ඩී.කේ.ආර්. හීනටිමුල්ල මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු වී.කේ. ඉන්දික මහතා
(மாண்புமிகு வி.கே. இந்திக)
(The Hon.V.K. Indika)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) අම්බලන්තොට, ලුනම යන ස්ථානයෙහි පදිංචි ච.ම.ස අබේසේකර මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) කටුවන, තල්වත්ත, ජයමිණි යන ලිපිනයෙහි පදිංචි එච්.ඩබ්ලිව්. සමන් මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු මනුෂ නානායක්කාර මහතා
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
ගරු කථානායකතුමනි, ගාල්ල, ගිංතොට, අබ්දුල් අසීස් මාවත, අංක 117/1 දරන ස්ථානයෙහි පදිංචි පී.එම්. පවුසියා මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து)
(The Hon. Arundika Fernando)
ගරු කථානායකතුමනි, දංකොටුව, හාල්දඬුවන, කොබ්බෑකඩුව මාවත යන ලිපිනයෙහි පදිංචි කේ.ඒ.ක්විින්ටන් ඩයස් අප්පුහාමි මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
ගරු කථානායකතුමනි, අලව්ව, නවතල්වත්ත, යක්තල්ගොඩ යන ලිපිනයෙහි පදිංචි එල්.පී.එල්.ටී.පතිරණ මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු ඒ.එම්. චාමික බුද්ධදාස මහතා
(மாண்புமிகு ஏ.எம். சாமிக புத்ததாஸ)
(The Hon. A.M. Chamika Buddhadasa)
ගරු කථානායකතුමනි, පහත සඳහන් පෙත්සම් දෙක මම පිළිගන්වමි.

1. වැලිමඩ, දඹවින්න, 2 කණුව, හපුතලේ පාර යන ලිපිනයෙහි පදිංචි අබේරත්න පතිරණ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

2. ඌව පරණගම, පොලිස් ස්ථානයෙහි සේවය කරන ටී.එම්.බී.තෙන්නකෝන් මහතාගෙන් ලැබුණු පෙත්සම.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා - පැමිණ නැත.

ගරු විදුර වික්‍රමනායක මහතා
(மாண்புமிகு விதுற விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)
ගරු කථානායකතුමනි, ගෝනපොල හන්දිය, පලන්නොරුව, ඔලබොඩුව පාර, අංක 126සී දරන ස්ථානයෙහි පදිංචි ජේ.ඒ.ලාලනී මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා - පැමිණ නැත.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, පහත සඳහන් පෙත්සම් දෙක මම පිළිගන්වමි.

1. පේරාදෙණිය, දෙහිදෙණිය, අංක 53 දරන ස්ථානයෙහි පදිංචි එච්.එම්.ටී.බී. හේරත් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

2. දෙනිපිටිය, වැලිහිඳ, බැද්දේවත්ත යන ලිපිනයෙහි පදිංචි එස්.ජී.එඩ්මන්ඩ් මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, මීගහතැන්න, ජම්බලගහවත්ත යන ලිපිනයෙහි පදිංචි පී.කේ.ඩී. ගුණදාස විජේගුණවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

අග්‍රවිනිශ්චයකාර මොහාන් පීරිස් මහතා පොලීසියට කළ පැමිණිල්ල
பிரதம நீதியரசர் மொஹான் பீரிஸ் அவர்கள் பொலிசில் செய்த முறைப்பாடு
COMPLAINT TO POLICE BY CHIEF JUSTICE MOHAN PEIRIS

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா- எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Nimal Siripala de Silva - Leader of the Opposition)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23/2 යටතේ මෙම ප්‍රශ්නය ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් ඇසීමට අවසර ලබා දීම පිළිබඳව මම ඔබතුමාට ස්තුතිවන්ත වෙමි.

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී ජනරජයේ වර්තමාන අග්‍රවිනිශ්චයකාර මොහාන් පීරිස් මහතාගේ නිවසට පැමිණි පුද්ගලයෙකු එතුමාට අග්‍රවිනිශ්චයකාර ධුරයෙන් ඉල්ලා අස්වන ලෙස තර්ජනය කළ බව පවසමින් එතුමා විසින් ඊයේ දින කුරුඳුවත්ත පොලීසියට පැමිණිල්ලක් කරන ලද බව දැන ගන්නට ලැබී තිබේ.

අග්‍රවිනිශ්චයකාර මොහාන් පීරිස් මහතා විසින් එවැනි පැමිණිල්ලක් කර ඇත්ද යන්නත්, එම පැමිණිල්ලේ එතුමාට තර්ජනය කළ පුද්ගලයා ලෙස නම් කර ඇත්තේ කවුරුන් ද යන්නත් මෙම ගරු සභාවට දන්වන ලෙසත්, අග්‍රවිනිශ්චයකාර ධුරය වැනි ධුරයකින් පුද්ගලයකු ඉවත් කිරීම සඳහා නිශ්චිත ක්‍රියාමාර්ගයක් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පැහැදිලිව දක්වා ඇති හෙයින් එම ක්‍රියා මාර්ගයෙන් බැහැර වූ වෙනත් ක්‍රියා මාර්ගයක් තුළින් අග්‍රවිනිශ්චයකාරවරයා හෝ වෙනත් විනිශ්චයකාරවරයකු ඉවත් කිරීමට කටයුතු කිරීම යහ පාලනයට මෙන්ම නීතියට ද පටහැනි වන බැවින් එවැනි ක්‍රියා වැළැක්වීමට රජය කටයුතු කරන්නේදැයි ගරු අග්‍රාමාත්‍යතුමා මෙම ගරු සභාවට දන්වන්නේ ද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் கொள்கை உருவாக்கம், பொருளாதார அலுவல்கள், சிறுவர், இளைஞர் மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரும்)

(The Hon. Ranil Wickremasinghe - Prime Minister, Minister of Policy Planning, Economic Affairs, Child, Youth and Cultural Affairs)

ගරු කථානායකතුමනි, ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා නැඟූ ප්‍රශ්න පිළිබඳව මා විමසා බලා ඉදිරියේදී පිළිතුරු සපයනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

(மாண்புமிகு தினேஷ் குணவர்தன)

(The Hon. Dinesh Gunawardena)

Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 78 හා 78ඒ යටතේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍රවිනිශ්චයකාරවරයා හා ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් සම්බන්ධව හා ඔවුන් ඉවත් කිරීම සම්බන්ධව ඉතා පැහැදිලිව සඳහන් වෙනවා. ඒ වාගේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මේ පිළිබඳව වූ 107වන ව්‍යවස්ථාව ප්‍රකාරව මේ පිළිබඳව අනුගමනය කළයුතු පිළිවෙත සඳහන් කරනවා. මේ අනුව අප පාර්ලිමේන්තුව විසින් යෝජනා භාර ගෙන පරීක්ෂණ පවත්වා 2013 ජනවාරි 11 වන සිකුරාදා පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතියෙන් එවකට හිටපු අග්‍රවිනිශ්චයකාර ශිරානි බණ්ඩාරනායක මහත්මිය ඉවත් කොට, ගරු කථානායකතුමා විසින් ඒ බව එවකට ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාට දැනුම් දීමෙන් පසු පාර්ලිමේන්තුවේ උත්තරීතර බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාර පාවිච්චි කරමින් පාර්ලිමේන්තුවේ සම්මත ක්‍රියා මාර්ගය අනුව එතුමිය එම තනතුරින් ඉවත් කර, අතිගරු ජනාධිපතිතුමා වෙත පැවරී ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ බලතල පාවිච්චි කරමින් අග්‍රවිනිශ්චයකාරවරයා ලෙස මොහාන් පීරිස් මහතා පත් කරන ලදී. ඒ නිසා අග්‍රවිනිශ්චයකාරවරයකු ඉවත් කිරීමට හැකි එකම ආයතනය පාර්ලිමේන්තුවයි. එය පාර්ලිමේන්තුවේ උත්තරීතර බලයයි. ඒ බලය කිසිවෙකුට ගත නොහැකි බව ගරු කථානායකතුමා විසින් පාර්ලිමේන්තුව හමුවේත් අර්ථ නිරූපණය කොට ප්‍රකාශ කර තිබෙනවා. ගරු කථානායකතුමනි, 2013 ජනවාරි 11 වැනිදා මේ පාර්ලිමේන්තුව විසින් යෝජනාවක් සම්මත කළා. මා මෙය කෙටියෙන් කියා අවසන් කරන්නම්. මම දීර්ඝව කථා කරන්නේ නැහැ. 2013 ජනවාරි 11 වැනිදා මේ පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරුන් 155 දෙනෙක් පක්ෂව යෝජනාවක් සම්මත කළා. ඒ අය අතර සිටින අයගේ නම් ගම් මේ අවස්ථාවේ දී මා සඳහන් නොකළත්, එදින හැන්සාඩ් වාර්තාව එයට සාක්ෂි දරනවා. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව යෝජනාව සභා සම්මත වූ බව ගරු කථානායකතුමා විසින් ගරු සභාවට මෙසේ දැනුම් දී තිබෙනවා.

> "ගරු මන්ත්‍රීවරුනි, අද දින පාර්ලිමේන්තුවේ විෂයය අංක1, එනම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාර ධුරයෙන් ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මිය ඉවත් කිරීම සඳහා අතිගරු ජනාධිපතිවරයා වෙත පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් ඉදිරිපත් කිරීම පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107(2) ව්‍යවස්ථාව ප්‍රකාර යෝජනාව, පක්ෂව ඡන්ද 155ක් හා විරුද්ධව ඡන්ද 49ක් ලැබීමෙන් අද දින සභා සම්මත වූ බව දැනුම් දෙනු කැමැත්තෙමි.
>
> ඒ බව ස්ථාවර නියෝග 78අ.(7) අනුව අතිගරු ජනාධිපතිතුමා වෙත දන්වා යැවීමට කටයුතු කරන බව ද මෙයින් දැනුම් දෙමි."

ගරු කථානායකතුමනි, තත්ත්වය මෙසේ තිබියදී හදිසියේම බලහත්කාරයෙන් අග්‍රවිනිශ්චයකාරතුමා වෙනුවට වෙන කෙනෙකු එම ආසනයේ - අග්‍රවිනිශ්චයකාර ධුරයේ - වාඩි වීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවටත්, පාර්ලිමේන්තුවේ උත්තරීතර බවටත්, පාර්ලිමේන්තුවේ සම්මත අභිමතයට අභියෝග කිරීමක් බවටත් පත් වී තිබෙන අවස්ථාවක් ලෙස අපි සලකනවා. ගරු කථානායකතුමනි, ඒ නිසා මේ බරපතළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම හා පාර්ලිමේන්තුවේ උත්තරීතර බව යටපත් කිරීමට හිතුවක්කාරව කටයුතු කිරීම පිළිබඳව ඉතා ඉක්මනින් පාර්ලිමේන්තුවේ පක්ෂ නායකයන් රැස් කරවා මේ පිළිබඳව ඉදිරි ක්‍රියා මාර්ග ගැනීම සඳහා විශේෂ අවස්ථාවක් ලබා දෙන ලෙස අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ පිළිබඳ ඔබතුමාගේ අර්ථ නිරූපණයටද අවස්ථාව සලසා දෙන බව මේ අවස්ථාවේ මා ඉතාම ගෞරවයෙන් සඳහන් කරනවා. ලංකා පාර්ලිමේන්තු ඉතිහාසයේ ඉතාම ශෝචනීය අවස්ථාව මෙය බව මා ඉතාම ගෞරවයෙන් සඳහන් කරන්න කැමැතියි. [බාධා කිරීම්]

කථානායකතුමා

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

Order, please! [බාධා කිරීම්] කරුණාකර නිශ්ශබ්ද වන්න. පිළිතුරු දීමට ගරු අගමැතිතුමා සිටිනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

(மாண்புமிகு தினேஷ் குணவர்தன)

(The Hon. Dinesh Gunawardena)

අධිකරණයේ ස්වාධීනත්වය රැඳී පවතින්නේ, අධිකරණයේ ස්වාධීනත්වය අපි ආරක්ෂා කළොත් පමණයි. අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා නොකළොත් ප්‍රජාතන්ත්‍රවාදය මැරෙනවා. ඒ බවත් සඳහන් කරමින් - [බාධා කිරීම්] මා ඔබතුමා වෙත මේ කාරණය සුවිශේෂව ඉදිරිපත් කරනවා. අපට මේ පිළිබඳව කටයුතු කරන්න අවස්ථාව සලසා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

කථානායකතුමා

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

ගරු අගමැතිතුමා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා

(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)

(The Hon. Ranil Wickremasinghe)

ගරු කථානායකතුමනි, මේ පිළිබඳ සම්පූර්ණ ප්‍රකාශයක් මම හෙට කරනවා. මම ඒ ගැන අපේ විපක්ෂ නායකතුමාටත් දැනුම්

දුන්නා. මේ කාරණය ගැනත්, පොලිස් සිද්ධිය ගැනත් - ඒ දෙක ගැනම - අපි හෙට ප්‍රකාශ ඉදිරිපත් කරන්නම්. ඊට පස්සේ ඕනෑ නම් ඒ ගැන සාකච්ඡා කරන්න පක්ෂ නායකයින්ට මුණ ගැහෙන්න පුළුවන්.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

If you are going to make the Statement tomorrow, immediately, we would like to go into the Debate because this is a very serious issue from our side. - [*Interruption.*]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

විමල් වීරවංශ මන්ත්‍රීතුමා වාඩි වෙන්න. දැන් නිකම් කෑ ගහන්න එන්න එපා. [බාධා කිරීම්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

කරුණාකර ගරු අගමැතිතුමාට ඇහුම්කන් දෙන්න.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ගරු කථානායකතුමනි, විවාදයකට යාම ගැන අපේ ප්‍රශ්නයක් නැහැ. පක්ෂ නායකයින් මුණ ගැහිලා විවාදය කරන්නේ කොහොමද කියලා තීරණය කරන්න. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කඩලා නැහැ. කවුරුවත් ඉවත් කරලාත් නැහැ. පත් නොකරපු අය ඉවත් කරන්නත් බැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

අමාත්‍යාංශ නිවේදන. ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රකාශය

සිය දින මෙහෙයුම : ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රකාශය

நூறு நாள் வேலைத்திட்டம் : மாண்புமிகு பிரதம அமைச்சரினது கூற்று

HUNDRED-DAY WORK PROGRAMME : STATEMENT BY HON. PRIME MINISTER

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ගරු කථානායකතුමනි, ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ රජයේ සිය දින මෙහෙයුම යටතේ ඉදිරි දෙසතිය තුළ සිදු කිරීමට අපේක්ෂා කරන පියවර පිළිබඳව මේ ගරු සභාව දැනුවත් කිරීම සඳහායි මා මේ ප්‍රකාශය කරන්නේ. මේ ප්‍රකාශයෙන් පසුව ගරු මුදල් ඇමතිතුමා අප ලබා දෙන ජනතා සහන පිළිබඳව මේ ගරු සභාව ඉදිරියේ කරුණු හෙළිදරවු කරන බවත් මම සිහිපත් කරන්න කැමැතියි.

සිය දින මෙහෙයුම අප ඉදිරියේ ඇති දැවැන්ත අභියෝගයක්. ඒ මෙහෙයුම නිසි ලෙසින් ඉටු කරලීමට අප කැප වී සිටිනවා. ඒ අභියෝගය ජය ගැනීමට අප දිවා රෑ නොබලා වෙහෙසෙනවා. ඒ අතර, සමහරු සිය දින මෙහෙයුම විවේචනය කරනවා. සාධනීය විවේචන අපි ගරු කරනවා. සිය දින මෙහෙයුම පෝෂණය කරන ඔබේ අදහස් අපි පිළිගන්නවා. ඒත් තවත් සමහරු අර වැඩේ කරන්න දවසක් ප්‍රමාද වුණා, මේ වැඩේ කරන්න දවස් දෙකක් ප්‍රමාද වුණා කියමින් චෝදනා කරන අවස්ථාවනුත් තිබෙනවා. අප ඒ අයගෙන් ඉල්ලා සිටින්නේ, දවසක දෙකක පමාව ගැන නොව දවසක් දෙකක් පමා වී හෝ ඒ කාර්යය අප නිසි අයුරින් ඉටු කළාද යන්න ගැන අවධානය යොමු කරන ලෙසයි.

අප මේ යන්නේ අලුත්ම ගමනක්. එවැනි ගමනක අත් දැකීම් අප මීට කලින් ලබා නැහැ. අප සියලු දෙනාම මේ ගමන යා යුත්තේ ඉවසීමෙන්, සංයමයෙන්. අපේ පෞද්ගලික අභිලාෂ හා අපේක්ෂාවලට වඩා දේශයේ යහපත ගැන සිතන්නට අප අධිෂ්ඨාන කර ගත යුතුයි. පසු ගිය දා ජනාධිපතිතුමා පොළොන්නරුවේදී ප්‍රකාශ කළා වාගේ අපට මෙහිදී කැප කිරීම් කරන්නට වෙනවා. අඩුලුහුඬුකම්වලට මුහුණ දෙන්නට වෙනවා. ඒ සියල්ල රට වෙනුවෙන් ඉවසන්නටත්, ඒ සියල්ලට සංයමයෙන් මුහුණු දෙන්නත් අවශ්‍යයි.

අප මේ වන විටත් පවුල්වාදය සහ ඒකාධිපතිවාදය මුලිනුපුටා දමා ජනතාවගෙන් උදුරා ගත් පරමාධිපත්‍යය යළි ජනතාවට ලබා දීමේ ක්‍රියාවලිය ආරම්භ කර තිබෙනවා. එක් පුද්ගලයෙක් අත සකලවිධ බලතල කේන්ද්‍රගත කෙරුණු විධායක ජනාධිපති ක්‍රමය වෙනුවට කැබිනට් මණ්ඩලයට හා පාර්ලිමේන්තුවට බලතල ලැබෙන, සමස්ත පාර්ලිමේන්තුව ශක්තිමත් කෙරෙන ආණ්ඩුක්‍රමවේදයක් සැකසීම සඳහා අවශ්‍ය කරන කටයුතු අප ආරම්භ කළා. ව්‍යවස්ථා විශේෂඥයින් හා පරිණත දේශපාලනඥයින් ගණනාවක් ඒ සඳහා එක් වී සිටිනවා.

එදා ලිච්ඡවි රජදරුවන් උදෙසා බුදුරජාණන් වහන්සේ අනුදැන වදාළ පරිදි සමගියෙන් රැස් වී, සමගියෙන් සාකච්ඡා කර, සමගියෙන් තීරණ ගෙන, සමගියෙන් විසිර යාම රාජ්‍ය සම්ප්‍රදාය බවට පත් කර ගැනීම අපගේ අරමුණයි.

ගරු කථානායකතුමනි, පසු ගිය වසර ගණනාවක් තිස්සේ මා මේ පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකවරයා වශයෙන් මේ රටේ අස්සක් මුල්ලක් නැර ගම් නියම්ගම්වල ඇවිදිමින් ජනතාව මුණ ගැසුණා. ඔවුන්ගේ හඬට ඇහුම් කන් දුන්නා. ගැමියන්, නාගරිකයන්, උගතුන්, මධ්‍යම පාන්තිකයන්, ගොවීන්, ලිපිකරුවන්, කම්කරුවන්, ව්‍යාපාරිකයින්, ගෘහිණියන්, තරුණ තරුණියන් ආදී මේ හැම කෙනෙක්ම අපට පැවසුවේ තමන්ට ජීවන බර දරා ගැනීමට නොහැකි බවයි; ඉතා දුකසේ ජීවත් වන බවයි. ජීවිතයට සහනයක් ලබා දෙන ලෙස හැඬූ කඳුලින් ඔවුන් ඉල්ලා සිටි වාර අපමණයි.

මේ ජනතා හඬට ඇහුම්කන් දෙන ලෙස අපි කොතෙක් ආණ්ඩුවට කිව්වත්, ඉල්ලා සිටියත්, බල කළත් ඔවුන් ඒ කිසිවක් ගණන් ගත්තේ නැහැ. එහි ප්‍රතිඵලය වුණේ රට දවසින් දවස පරිහානියට පත් වීමයි. අපි සියලු බලවේග ඒක රාශී කරගෙන මේ මහා ව්‍යසනයෙන් රට මුදා ගැනීමට ප්‍රජාතන්ත්‍රවාදී ජනතා ව්‍යාපාරයක් ආරම්භ කළා. අපේ සටන මෙහෙයවීමට පොදු අපේක්ෂකයා වශයෙන් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා එක් වුණා. අප එහිදී දිගින් දිගටම කියා සිටියේ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කර ජන ජීවිතයට සහනය ලබා දීමට ප්‍රමුඛත්වය දෙන බවයි.

මහජනයා පරාජය වී සිටි නම් අප ලබන කවර ජයග්‍රහණයකින්වත් ප්‍රයෝජනයක් වන්නේ නැහැ. මහජනයා තම දරුවන් සමඟ කා, බී සතුටින් සැනසිල්ලෙන් දුකින් තොරව ජීවත් වේ නම් අන් කවර ජයග්‍රහණයකටත් වඩා එය වටිනවා. මේ හේතුකොටගෙන හදිසි සහන ලබා දී වහාම සමාජ ආර්ථික වැඩ පිළිවෙළක් ක්‍රියාත්මකකොට ජන ජීවිතය යථා තත්ත්වයට පත් කිරීම අපගේ ප්‍රමුඛ කාර්යයක් සේ මා දකිනවා.

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

දින සියයේ වැඩසටහනේ අප සඳහන් කළ පරිදි ජනතාවගේ ආදායම වැඩි කර, බඩු මිල අඩු කර සහන සැලසීමේ වැඩ පිළිවෙළට අපි මුල පිරුවා. අපේ විදුලිබල හා බල ශක්ති ඇමතිතුමා ඩීසල්, පෙට්‍රල්, භූමිතෙල් මිල අඩු කළා. ඒ අනුව යමින් අභ්‍යන්තර ප්‍රවාහන ඇමතිතුමා බස් ගාස්තු අඩු කළා. තහනම් කරන ලද යුරෝපා මාළු අපනයනය යළි ලබා ගැනීම සඳහා අවශ්‍ය මූලික සාකච්ඡා විදේශ කටයුතු ඇමතිතුමා සිදු කළා. ඒ වාගේම අහෝසි කරන ලද GSP Plus සහනය යළි ලබා ගැනීම සඳහා රාජ තන්ත්‍ර ක්‍රියා මාර්ග ආරම්භ කළා. මේ වාසි ඉතා ඉක්මනින් ධීවර ක්ෂේත්‍රයේ නියුතු ජනතාවට ද, ඇඟලුම් ක්ෂේත්‍රයේ නියුතු ජනතාවට ද ලැබෙනවා.

ගරු කථානායකතුමනි, සියදින මෙහෙයුමේ සඳහන් වන පරිදි පසු ගිය දින කිහිපය තුළ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු කරුණු ගණනාවක් තිබුණා, 12 වැනි දා, 20 වැනි දා සහ 21 වැනි දා සහ 28 වැනි දා වශයෙන්. එකී දිනවල පාර්ලිමේන්තුව රැස් නොවුණත් අපි ඒ සියලු කරුණු පිළිබඳව ක්‍රියාත්මක වී ඇති බව මම ඔබ සැමටම දන්වන්න කැමැතියි. මේ පිළිබඳ පාර්ලිමේන්තුවේදී පක්ෂ නායකයින් සමඟ සාකච්ඡා කරන්නට අප කටයුතු කරනවා.

ස්ථාවර නියෝග සංශෝධනයකොට පාර්ලිමේන්තු න්‍යාය පුස්තකයේ තිබෙන පා.67/10 යෝජනාවේ සඳහන් පරිදි පාර්ලිමේන්තු අධීක්ෂණ කාරක සභා පත් කිරීම සඳහා අපි වහාම පියවර ගන්නවා. මේ සභාවන් සඳහා පත් කරන්නේ කැබිනට් මණ්ඩලය නියෝජනය නොකරන මන්ත්‍රීවරුනුයි. එසේම ඒවාට සභාපතිවරුන් පත් කරන්නේ පක්ෂ නායකයන්ගේ එකඟත්වය ඇතිවය. මේ පිළිබඳව අප පක්ෂ නායකයන් සමඟ සාකච්ඡා කරනවා.

අපේ ගරු රාජීව විජේසිංහ රාජ්‍ය ඇමතිතුමාගේ යෝජනාවකුත් න්‍යාය පත්‍රයේ තිබෙන බව මම දැක්කා. ඒකත් අපට සාකච්ඡා කරන්න පුළුවන්.

එක් පුද්ගලයෙක් අත සියලු බලතල ඒක රාශී වූ විධායක ජනාධිපති ක්‍රමය වෙනුවට කැබිනට් මණ්ඩලයට හා පාර්ලිමේන්තුවට බලතල හිමි වන නව ආණ්ඩු ක්‍රමයක් ස්ථාපිත කරලීම සඳහා දැනට අප ව්‍යවස්ථා විශේෂඥයන්ගෙන් සමන්විත කමිටුවක් මේ වන විටත් පත්කොට තිබෙනවා. ඔවුන් සකස් කරන සංවාද ලියවිල්ල ඉතා ඉක්මනින් පක්ෂ නායකයින් වෙත ලබා දීමට අපි බලාපොරොත්තු වෙනවා. අපට එය හෙට දිනයේ ඉටු කරන්න පුළුවන්. එය කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන්නේ පක්ෂ නායකයින් සමඟ සාකච්ඡා කිරීමෙන් පසුවයි. The Cabinet has to take the final decision. අපේ ඒ කමිටුවෙන් කරපු යෝජනා ටික තමයි ඉදිරිපත් කරන්නේ. ඒවා සකච්ඡා කරලා කැබිනට් මණ්ඩලයට යවනවා. එහෙම කරන්නය කියා ජනාධිපතිතුමා උපදෙස් දී තිබෙනවා.

නව මැතිවරණ ක්‍රමය සම්බන්ධ පදනම් වූ ලියවිල්ලක් අපි පක්ෂ නායකයින් වෙත ඉදිරිපත් කරනවා.

පාර්ලිමේන්තුව ශක්තිමත් කරලීම සඳහා අප පියවර ගණනාවක් ගන්නවා. මේ සියලු කරුණු සම්බන්ධයෙන් හෙට දිනයේ පක්ෂ නායකයින් සමඟ සාකච්ඡා කිරීමට මම බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, මේ ලිපි ගොනු සියල්ලම ලෑස්තියි. අපේ විපක්ෂ නායකතුමා කිව්වා, සභාව ආරම්භ වුණායින් පසුව පක්ෂ නායකයින් මුණගැහිලා සාකච්ඡා කරන බව. විරුද්ධ පක්ෂයේ නායකතුමාට මම ඒ ලිපි ගොනු සියල්ල බාර දෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමාටත් ඒ ලිපි ගොනු එවන්න පුළුවන්.

සියදින මෙහෙයුම යටතේ සිදු කරන අනිකුත් කාර්යයන් පිළිබඳවත් වාරානුකූලව මේ ගරු සභාවට දැනුම් දෙන්නට අප බලාපොරොත්තු වනවා.

මා කලිනුත් සඳහන් කළ පරිදි ජනතාවට ලබා දෙන සහන පිළිබඳ සවිස්තර තොරතුරු අද අපේ මුදල් ඇමතිතුමා මේ ගරු සභාව හමුවේ දක්වනවා.

ගෙවී ගිය දසකයක කාලයක් තිස්සේ අපේ රට පත් කර ආර්ථික අගාධය පිළිබඳ සැබෑ තත්ත්වයද එතුමා මේ සභාවට හෙළි කරනවා ඇති. එතුමාගේ ප්‍රකාශයට ප්‍රවේශයක් ලෙස එක් කරුණක් පිළිබඳව මම මේ ගරු සභාවේ අවධානය යොමු කරන්න කැමැතියි. අපේ රටේ අනිකුත් හැම ක්ෂේත්‍රයකම පාහේ සිදු වී ඇති ලෙසට අපේ මූල්‍ය විනය අන්තිමටම පිරිහිලා. මේ රටේ ක්‍රියාත්මක වුණේ කැසිනෝ, එතනෝල් සහ මත් කුඩු ආර්ථිකයක්; පවුල්වාදී ආර්ථිකයක්; ගජ මිතුරන්ගේ සහ හෙංචයියන්ගේ සාක්කු පුරවන ආර්ථිකයක්. මේ කළු ආර්ථිකය වසා දැමීම සඳහා ව්‍යාජ දේශප්‍රේමී සංදර්ශන මවා පෑවා. වංචනිකයන්ට සිහසුන හිමි වුණා. ජනතාව කුණු කූඩයට ඇද වැටුණා.

අපි මේ තත්ත්වය වහාම වෙනස් කරනවා. ඒ අනුව ඊයේ කැබිනට් මණ්ඩලයේදී කැසිනෝ සම්බන්ධයෙන් අප සුවිශේෂී තීරණ ගත් බවත් මම මේ ගරු සභාවට දැනුම් දෙන්නට කැමැතියි. ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නිකුත් කර ඇති ගැසට් නිවේදනය සංශෝධනය කරන්නට කැබිනට් මණ්ඩලය තීරණය කළා. එම ගැසට් නිවේදනය මඟින් ලේක් ලෙෂර් පුද්ගලික සමාගම, වෝටර් ෆ්‍රන්ට් ප්‍රොපටීස් පුද්ගලික සමාගම, ද ක්වීන්ස්බරි ලෙෂර් සමාගම යන ආයතනයන්ට කැසිනෝ සහ සූදු පවත්වා ගෙන යාමටත් ඒ සඳහා වෙනත් ආයතනයන්ට කුලියට ඉඩ කඩ සැපයීමටත් අවසර ලබා දී තිබෙනවා. අප ඒ සියල්ල තහනම් කිරීමට තීරණය කළා. ඒ අයට අනෙක් ව්‍යාපාර සියල්ලම කරන්න පුළුවන්; they can carry on all their other activities and get the tax concession. That has not been reduced.

මූල්‍ය විනයකින් යුතුව ජනතාවාදී ආර්ථිකයක් නිර්මාණය කිරීම අප සැමගේ වගකීමයි. ඒ සඳහා ජනාධිපතිතුමාගේ සිට සියලු ඇමතිවරුන් කැපවීම් කරනවා. ආණ්ඩු පක්ෂයේ සියලුම මන්ත්‍රීතුමන්ලාත් ඒ ලෙසම කැපවීම් කරනවා. විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙනුත් අපි ඒ කැපවීම බලාපොරොත්තු වෙනවා. සමහර මන්ත්‍රීවරු දැනටමත් ඒ බව ප්‍රකාශ කර තිබෙනවා. ඒ අයට මම ස්තුතිවන්ත වෙනවා.

එසේ නම් අපේ ආණ්ඩුවේ ජනතාවාදී මූල්‍ය ප්‍රතිපත්තිය මේ ගරු සභාව හමුවේ ගෙනහැර දක්වන මෙන් මම ගරු මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. එතුමා අද ගෙනහැර දක්වන කරුණුවලට අදාළ පනත් කෙටුම්පත ලබන 5වන දා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිතයි. ඉන් පසුව ඒ පිළිබඳව විවාද කිරීමේ අවස්ථාව ඔබ සැමට හිමි වන බවත් මම මේ අවස්ථාවේදී සිහිපත් කරන්නට කැමැතියි. දැනටමත් පක්ෂ නායකයින් ඒ ගැන එකඟ වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මම එකක් මතක් කරන්න කැමැතියි. මේ ඇමති මණ්ඩලය දිවුරුම් දුන්නේ ජනවාරි මාසයේ 12වැනි දායි. 13වැනි දා, 14වැනි දා, 15වැනි දා ඇත්ත වශයෙන්ම අපි ශුද්ධෝත්තම පාප් වහන්සේගේ ගමන වෙනුවෙන් කාලය ගත කළා. ඊට පසුව අපි වැඩ කටයුතු ආරම්භ කළේ 16වැනි දායි. එහෙම නම් දවස් 14කින් මේ වැඩ කටයුතු කිරීම ලෝක වාර්තාවක් කියලා ඕනෑම ආණ්ඩුවකට මට කියන්න පුළුවන්. අපි ඔක්කොම කථා කරන ෆ්‍රෑන්ක්ලින් ඩී. රූස්වෙල්ට් ජනාධිපතිතුමාගේ ආණ්ඩුව එදා බැංකු බේරා ගන්න පියවර ගත්තා. අපි ඊට වඩා විශාල පියවර කිහිපයක් දවස් 14කින් අර ගෙන

තිබෙනවා. ඉතිරි ඒවාත් මේ කාල සීමාව තුළ කරනවා. මම කැමැතියි, මුළු සභාවේම සහයෝගය අර ගෙන මේ ගරු සභාවම ආණ්ඩුව බවට පත් කරලා විරුද්ධ පක්ෂයේ ඉන්න අයයි, ආණ්ඩු පක්ෂයේ අයයි අපි ඔක්කොම එකට වැඩ කරලා මේ දවස් 100 වැඩසටහන ක්‍රියාත්මක කරන්න.

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ නායකත්වය යටතේ අප මේ ගොඩ නඟන්නේ ශීලාචාර ආණ්ඩුවක්; විනයගරුක ආර්ථිකයක්. අප නිර්මාණය කරන්නේ තෘප්තිමත් සමාජයක්. ඒ සත්කාරය සඳහා ඔබ සැමගේම සහාය අපි බලාපොරොත්තු වෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මීළඟට මුදල් අමාත්‍ය ගරු රවි කරුණානායක මහතා.

සිය දින විප්ලවය : ගරු මුදල් අමාත්‍යතුමාගේ ප්‍රකාශය

நூறு நாள் புரட்சி : மாண்புமிகு நிதி அமைச்சரினது கூற்று

HUNDRED-DAY REVOLUTION: STATEMENT BY HON. MINISTER OF FINANCE

[අ.භා. 1.35]

ගරු රවි කරුණානායක මහතා (මුදල් අමාත්‍යතුමා)
(மாண்புமிகு ரவி கருணாநாயக்க - நிதி அமைச்சர்)
(The Hon. Ravi Karunanayake - Minister of Finance)

හැඳින්වීම

ගරු කථානායකතුමනි, අදට හරියටම දින 21කට පෙර 2015 ජනවාරි 8වෙනි දින මේ රටේ මහජනතාව විශාල වෙනසක් අපේක්ෂාවෙන් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ඡන්දය ලබා දුන්නා. අතිගරු ජනාධිපතිතුමාට පැහැදිලි වරමක් ලබා දෙමින්, වෙනසක් සඳහා ඔවුන්ගේ තිබූ දැඩි අපේක්ෂාව ප්‍රකාශ කළා. මෙය දේශපාලන සහ පෞද්ගලික අභිප්‍රායන්වලට එහා ගිය, මේ රටේ නව දේශපාලන සහ ආර්ථික සංස්කෘතියක් නිර්මාණය කිරීම සඳහා මිනිසා මිනිසාට ආදරය කරන, මිනිසා මිනිසාට ගෞරව කරන සාධාරණ වෙනසක්.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 19වන මුදල් ඇමතිවරයා වශයෙන්, මෙයට පෙර මේ රටේ සිටි ඉතා සුප්‍රසිද්ධ මුදල් ඇමතිවරුන්ගේ අඩි පාරේ යමින් මෙම වාර්තාව අද මේ උත්තරීතර සභාවට ඉදිරිපත් කිරීමට ලැබීම මා ලද මහඟු වරප්‍රසාදයක් බව ප්‍රකාශ කරන්නේ සතුටිනි. මෙම මහජන හිතකාමී ප්‍රකාශය මඟින් දී ඇති සහන ශ්‍රී ලාංකික ජනතාව වෙත උපරිම ප්‍රතිලාභ සහ සහන ලබා දුන් අවස්ථාවක් වශයෙන් ඉතිහාසයට එක්වනු ඇතැයි මා විශ්වාස කරනවා.

අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ මානව හිතවාදී නායකත්වය හා ගරු අග්‍රාමාත්‍යතුමාගේ පරිණත බුද්ධිය තුළින් "මෛත්‍රී පාලනයක්" සඳහා වන පදනම දමා ඇත. මෙමගින් අක්‍රමිකතා නැති අලුත් ශ්‍රී ලංකාවක් බිහි වනු ඇත. අද ඉදිරිපත් කරන ප්‍රකාශය, ජන හිතකාමී රජයක් මහජනයාට සේවය කිරීම සඳහා ඉඩ ප්‍රස්ථා නිර්මාණය කරන ආකාරය පිළිබඳ ඉතා පැහැදිලි ආදර්ශයක් ලබා දෙනු ඇත. මේ අවස්ථාවේ දී, මම සියලු ශ්‍රී ලාංකිකයන්ගෙන් ඉල්ලා සිටිනවා, "දින සියයේ විප්ලවය" තුළින් යහපත් හෙටක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය වෙනස ඇති කිරීමට අපේ රජය සමග අත්වැල් බැඳ ගන්නා ලෙස.

බලය තාවකාලිකයි. නිලතල ද එලෙසමයි. අපට ඡන්දය ලබා දුන් මහ ජනතාවගේ භාරකරුවන් වශයෙන් අපගේ යුතුකම වන්නේ ජාතියට ගෞරවාන්විත ලෙස සේවය කිරීමයි. අප ජනතාවගේ සේවකයන් බව අමතක නොකළ යුතුයි. ඔවුන්ට සේවය කිරීමට අප බැඳී සිටිනවා.

ශ්‍රී ලාංකිකයාට යළිත් සතුටු විය හැකි කාලයක් උදා වී ඇත. මෙම ප්‍රීතිමත්භාවයෙන් නිදහසත්, නිවහල් බවත්, ධෛර්යයත් ජනිත වනු ඇත. පවුල් පාලනයේ සහ ඥාති සංග්‍රහයේ බැඳීම්වලින් නිදහස්ව අප අලුත් වී සිටිමු.

[මෙම අවස්ථාවේදී අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සභා ගර්භයට පැමිණියේය.]

[இச்சந்தர்ப்பத்தில் மேதகு சனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்கள் சபாமண்டபத்துட் பிரவேசித்தார்.]

[At this stage, His Excellency President Maithripala Sirisena entered the Chamber.]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, අප නිවේදනය කිරීමට අපේක්ෂා කරන ප්‍රතිලාභ රැස අපගේ ජනතාවට අත්‍යවශ්‍යයෙන්ම ලැබිය යුතුයි. එමෙන්ම, අනාගත තිරසාර පැවැත්ම, සතුට සහ යහපත් දිවි පෙවෙතක් ඔවුන්ට ලැබිය යුතුයි. ඇති වුණු වෙනසෙහි ප්‍රීතිය සැම දෙනා භුක්ති විඳිමින් සිටියි. මෙම වෙනස සිදු වූයේ යහපත් අනාගතයක් වෙනුවෙනි. එම වෙනස අගය කළ යුතු වෙනසක්. "මෛත්‍රී පාලනයක්" වෙනුවෙන් මෙම වෙනස සිදු වී ඇත.

ශ්‍රී ලංකාවේ පසුගිය වසර ගණනාවක් පුරා දේශපාලන පුරසාරම් අප බහුල වශයෙන් අසා ඇති නමුත් ආර්ථිකමය පුරසාරම් බහුල වශයෙන් දකින්නට ලැබුණේ නැහැ. කෙසේ වෙතත්, පසු ගිය අවුරුදු කිහිපයේ පැවති පාලනය තුළ දී- මම කැමැතියි එය නිවැරැදි කරන්න, අවපාලන කාලය තුළ දී කියලා - මෙවැනි ආර්ථික පුරසාරම් අපට ඕනෑවටත් වඩා අසන්නට ලැබුණා. මෙම ආර්ථික පුරසාරම් තුළින් ඇතැම් අය උද්දාමයට පත් වුණත්, මෙහි තිබෙන තිත්ත ඇත්ත ධාරණය කිරීම පහසු නැහැ. අඩ පණව තිබූ ආර්ථිකය යළි නගා සිටුවීමත්, පුනර්ජීවනය කිරීමත් මේ රජයේ මූලික අරමුණක් වෙනවා.

ගරු කථානායකතුමනි, මෙම ප්‍රකාශය මෙම ජාතික ආණ්ඩුව මඟින් ඉදිරියේ දී ඉදිරිපත් කිරීමට අපේක්ෂිත සියලු අය වැය ඉදිරිපත් කිරීම්වලට අවශ්‍ය පෙර ගමනක් වශයෙන් මා සලකනවා. ඒවා කරුණු සහ දත්ත මත මිස බොරු පුරසාරම් මත ඉදිරිපත් නොකිරීමට අපි වග බලා ගන්නවා.

ගොබෙල්ස් න්‍යාය මඟින් ජනිත පුරසාරම් බස් මඟින් ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය බවට පත් වන බව ජනතාවට දන්වා ඇතත්, අප බොහෝ දෙනෙකු කල්පනා කරන්නේ මෙවැනි පුරසාරම් වචනවලට පදනම් වූ යථාර්ථවාදී කරුණු මොනවාද කියලායි.

බ්‍රිතාන්‍යයන්ගෙන් අපි නිදහස ලබා ගත් අපේ ජාතික දිනය වන පෙබරවාරි 04 වන දිනට තවත් දින හයක පමණ කාලයක් පමණයි තිබෙන්නේ. 2015 ජනවාරි 08 වන දින ජාතිය "යළි දිනාගත් නිදහස් දිනය" ලෙස සැමරිය යුතුයි. පවුල් පාලනයෙන් නිදහස, දූෂිත පාලනයෙන් නිදහස, දූෂිත ගජමිතුරු කල්ලියෙන් ලැබූ නිදහස, අවපාලනයෙන් නිදහස, අධිකරණයේ ස්වාධීනත්වය නැවත ලබා ගැනීම, එකිනෙකාගේ පෞද්ගලික අවශ්‍යතා පරිදි

[ගරු රවි කරුණානායක මහතා]

නීතිය යොදා ගැනීම මඟින් නීතියේ ආධිපත්‍ය අපයෝජනය වීම නිසා ඇති වී ඇති වැරැදි පාලන ක්‍රමය මගින් පොලීසිය සහ රාජ්‍ය සේවය නිදහස් කර ගැනීම අප ලබා ගත් නිදහසට ඇතුළත් වී තිබෙනවා. අප යළි දිනා ගත් නිදහස ආරක්ෂා කර ගැනීම සහ වර්ධනය කර ගැනීම අපගේ පරම යුතුකමයි.

දින සියයේ විප්ලවකාරි වැඩසටහන අලුත් යුගයක් ඇති කිරීම සඳහා අවශ්‍ය පදනම පමණක් නොව "නිදහස සහ නිවහල් බව" සඳහා නව අරුතක් ද සපයනු ඇත. ස්වාධීන කොමිෂන් සභා, තොරතුරු දැන ගැනීමට තිබෙන අයිතිය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන වැනි කටයුතු දින සියයේ වැඩසටහන යටතේ පැහැදිලිවම කිරීමට සැලසුම් කොට ඇති ක්‍රියාමාර්ග ජාතිය යළි ලබා ගත් නිදහසේ ඵල භුක්ති විඳීමට පැහැදිලි පදනමක් වනු ඇත.

පවුල් පාලනය ශ්‍රී ලංකාවේ ආර්ථිකය විනාශය කළා පමණක් නොව, දැහැමි ජාතියක් වශයෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් එකට බැඳී තිබූ සමාජ බැමි ද කඩා දැම්මා. කුඩු සිටුවරු, කැසිනෝකාරයෝ, එතනෝල් රජවරු අපේ දරුවන්ගේ අනාගතය අඳුරු කර දැම්මා. ජනතාවගේ හඬ නිහඬ කර දැම්මා. නිර්භීතව මේ පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීමට ඉදිරිපත් වූ ඇතැම් අය "ආර්ථික ඝාතකයා" වැනි නව යෙදුම් ශබ්ද කෝෂයට එකතු කළා. තිබෙන තොරතුරු සහ සාක්ෂි අනුව අපට පැහැදිලිව කියන්න පුළුවන් එවැනි බොහෝ ආර්ථික ඝාතකයන් මේ ශ්‍රේෂ්ඨ ජාතිය සතු සම්පත් තෝරාගත් සුළු පිරිසකට පමණක් සූරා කෑමට දීමෙන් බහුතරයකට දුක් විඳීමට ඉඩ සලස්වා තිබෙන බව.

ජනාධිපතිවරණයට පසුව මෛත්‍රීපාල - රනිල් සමගි රජයක් පාර්ලිමේන්තුව නියෝජනය කරන පක්ෂවලින් බහුතරයට අයත් ගරු මන්ත්‍රීවරුන්ගේ සහභාගිත්වයෙන් ස්ථාපිත කළා. මෙය මේ රටේ නිදහසින් පසු ඉතිහාසයේ සුවිශේෂී අවස්ථාවක් නිර්මාණය කළා.

අද මම කියන්න ආඩම්බරයි මෙම මූලාරම්භය තුළින් ජාතියට විකල්ප මාවතක් පෙන්වීමට අපට හැකි වෙලා තිබෙන බව. මෙම මාවත දිගේ අප සෙමෙන් ශක්තිමත්ව ගමන් කරනවා. මෙය කරුණා සහගත මෛත්‍රී පාලනයට මාවතක්, ස්ථාවර රටකට මාවතක්, සෞභාග්‍යට මාවතක්. විශේෂයෙන්ම මෙය නිදහසට, මනුෂ්‍යත්වයට සහ අභිමානයට මාවතක්.

විවිධ තර්ජන-ගර්ජන මධ්‍යයේ නිර්භීතව එක හඬින් තමුන්ගේ ඡන්දය මේ ශ්‍රේෂ්ඨ උත්සාහය වෙනුවෙන් ලබා දුන් පූජ්‍ය පක්ෂයට, රජයේ සේවකයන්ට, විශ්‍රාමිකයන්ට, ගොවි ජනතාවට, ගුරුවරුන්ට, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සේවකයන්ට, ධීවර ජනතාවට, ශිෂ්‍යයන් ඇතුළු තරුණ ජන්ද දායකයන්ට, කම්කරු ජනතාවට, ව්‍යාපාරික ප්‍රජාවට, වතු සේවකයන්ට, ත්‍රිවිල් රියදුරන්ට, ප්‍රවාහන ක්ෂේත්‍රයේ සේවකයන්ට, ස්වයං රැකියාවල නියැලී සිටින ජනතාවට, ත්‍රිවිධ හමුදාවේ සාමාජිකයන්ට, පොලීසියේ සහ සිවිල් ආරක්ෂක සේවාවල සාමාජිකයන්ට, ශ්‍රී ලංකාවේ සෑම ජාතියකටම සහ ආගම්වලට අයත් සාමාන්‍ය ජනතාවට අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා සහ රජය වෙනුවෙන් මුදල් අමාත්‍යවරයා වශයෙන් මගේ ස්තූතිය සහ ආචාරය පිරිනමනවා.

පසු ගිය රජය විසින් විශාල වශයෙන් රාජ්‍ය සම්පත් භාවිත කරමින් සහ විවිධ ද්‍රව්‍ය නොමිලේ ලබා දීම වැනි ඡන්ද දායකයන් පොළඹවන ආකාරයේ සාමාන්‍යයෙන් අදහා ගත නොහැකි තරමටම සිදු කළ බලපෑම්වල ප්‍රමාණය සැලකීමේදී ඇත්ත වශයෙන්ම ඔබගේ දායකත්වය අපගේ ආචාරයට ලක් විය යුතුයි. ජනාධිපතිවරණ ඡන්ද ව්‍යාපාරයේදී අපි මේ රටේ ජනතාවට විශාල කැපවීමක් පොරොන්දුවක් දුන්නා. අප බලයට පත්වීමෙන් පසු දින සියයේ විප්ලවකාරී වැඩසටහන මඟින් මේ රටේ සහ මහජනතාවගේ දැවෙන ප්‍රශ්න සඳහා කඩිනම් විසඳුම් ලබා දෙන බවට පොරොන්දු වුණා.

අපි විශ්වාස කරන ආකාරයට මේ රටේ දැවෙන ප්‍රශ්නයක් වන වේගයෙන් ඉහළ යන ජීවන වියදම අඩු කරමින් ජනතාවට සහන ලබාදීමට විශේෂ ක්‍රියා මාර්ග ගන්නා බවට අපි පොරොන්දු වුණා.

වැඩි වන ජීවන බර හේතුවෙන් මේ රටේ බහුතර ජනතාවගේ මූලික අවශ්‍යතාවක් වන ආහාර නියමිත ප්‍රමිතියට අනුව ලබා ගැනීමට නොහැකි වී තිබෙනවා. මෙම ගැටලුවට විසඳුමක් අවශ්‍ය වෙනවා. සියයට 6.7ක් පමණ වූ දරිද්‍රතාව සහ සියයට 21.6ක් පමණ වූ මන්දපෝෂණයෙන් පෙළෙන දරුවන් පිළිබඳ සංඛ්‍යාලේඛන ප්‍රගතිශීලි සංඛ්‍යාලේඛන නොවෙයි. ප්‍රජාතාන්ත්‍රික ඡන්දය මඟින් අපේක්ෂිත වෙනස තුළින් මේ දක්වා අපි අසා නැති මට්ටමක සහන ලබාදෙමින් එම සහන ඉදිරියේදී තව තවත් වැඩි කරමින් දැවෙන ප්‍රශ්න සඳහා විසඳුම් ලබාදීමට අපි කටයුතු කරනවා.

පසු ගිය කාලයේදී විශාල වශයෙන් ඇති වූ දූෂණ චෝදනා පිළිබඳ පරීක්ෂා කිරීම සඳහා විශේෂ කොමිෂන් සභා පත් කිරීම, ස්වාධීන කොමිෂන් සභා ස්ථාපිත කිරීම සහ ඒ සඳහා අවශ්‍ය පත්වීම් කිරීම, ජාතික විගණන පනත සහ තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ පනත හඳුන්වා දීම, ජාතික ඖෂධ ප්‍රතිපත්තිය හඳුන්වා දීම, විධායක ජනාධිපති ක්‍රමය වෙනුවට පාර්ලිමේන්තු ක්‍රමය ඇති කිරීම යන කරුණු අපි ජනතාවට දුන් පොරොන්දු අතර වන ප්‍රධාන කරුණු වේ.

පසු ගිය අවපාලන කාලය තුළ දූෂිත ක්‍රියාකාරකම්වල ප්‍රමාණය ඉහළටම ගොස් ඇත. පිළිගත් ක්‍රමවේද අනුගමනය කරමින් මෙම නාස්තිකාර දූෂිතයන් අධිකරණයට ගෙන ගොස් ඔවුන්ගේ දූෂිත ක්‍රියා සඳහා නිසි දඬුවම් දෙන තෙක් අප සමඟ ඉවසීමෙන් සිටින මෙන් රටේ ජනතාවගෙන් ඉල්ලා සිටිනවා.

මේ වන විට අප මෙම යෝජනා ක්‍රියාත්මක කරමින් සිටිනවා. පසු ගිය දින 21ක කාලය තුළ අප ඉටු කර ඇති කාර්යයන් දෙස බැලීමෙන් ඔබට අපේ කාර්ය සාධනය සහ කැපවීම පිළිබඳ තීරණයක් ගන්න පුළුවන්. දින සියයේ විප්ලවකාරී වැඩසටහනෙහි අරමුණු ළඟා කර ගැනීමේ පැහැදිලි දර්ශනයක් ඔස්සේ අපි කටයුතු කර ගෙන යන බව අවධාරණය කරනවා. අද ඉදිරිපත් කරන දින සියයේ විප්ලවය පිළිබඳ ප්‍රකාශය මෙම උත්සාහයේ තවත් වැදගත් ඉදිරි පියවරක්.

අපේ රජය මහ ජනයා අරමුණු කර ගත් රජයක්. ප්‍රමුඛතා පදනම මත මහ ජනයාට සහන ලබා දීමට අපේ රජය කටයුතු කරනවා. මෙම දින සියයේ විප්ලවය පිළිබඳ ප්‍රකාශය ඉදිරිපත් කිරීමට පෙර ඉන්ධන මිල අඩු කිරීම ජනතාවට ලබා දුන් සහනය මේ සඳහා හොඳ උදාහරණයක්. පසු ගිය ඕනෑම කාලයකදී මෙතෙක් ලබා දී ඇති ඉහළම ඉන්ධන මිල අඩු කිරීම ජාතියට ලබා දීමට අපට හැකි වුණා. මට තේරෙන්නේ නැහැ, ඇයි පසු ගිය රජයට මෙවැනි ඉන්ධන මිල සංශෝධන කිරීම් තුළින් මහ ජනතාවට ප්‍රතිලාභ ලබා දීමට නොහැකි වුණේ කියලා.

මහ ජනතාවට සහන ලබා දීමට යෝජිත පියවරයන් සහ ආදායම් සහ වියදම් යෝජනා ඉදිරිපත් කිරීමට පෙර මේ රටේ පුපුරා යාමට ආසන්න මට්ටමේ තිබෙන ආර්ථික බුබුළ පිළිබඳවත්, පාර්ලිමේන්තුව විසින් වර්ෂ 2015 සඳහා අනුමත කළ අය වැය පිළිබඳවත්, මේ රටේ ආර්ථිකයේ ප්‍රගතිය පිළිබඳවත්, අනිකුත් අදාළ ක්ෂේත්‍ර පිළිබඳවත් කරුණු කිහිපයක් පැහැදිලි කිරීමට මම කැමැතියි.

I think it is my duty to reflect the present situation of the economy and I will just take a few minutes to put you in the proper perspective of what is going on.

The bubble had to burst

Sri Lanka had gone through a period of economic disorder. The statistics until a few days back provided a different picture. A facade of political rhetoric coupled with unrelenting economic bravado created a rosy picture. The weapons of the so-called economic maestros consisted of manipulated charts and graphs.

Much was spoken of a “Wonder of Asia” and “Hubs” of varying descriptions. The average people did not fully fall into the trap of lies and deception. They did observe some "Hubs" which were focused on destroying the nation. The “Kudu Hubs”, “Ethanol Hubs” and the “Casino Hubs” continued to grow. The younger generation, the future of our beloved country and so many innocent children had fallen prey to the wiles of the drug barons, ethanol kings and the casino operators. I am sure the media will give you further corroborative evidence on this.

The Stock Exchange became the laughing stock of the experts who knew stock trading. “Pumping and Dumping” was the order of the day, whilst the small-timers had to face the music. When interest rates were reduced, the hierarchy invited the elderly people to invest in shares. Knowing very well the consequences, the hearts of the people who matter, did not melt. Even the poor pensioners suffered. The super rich “Stock Market Barons” continued to fatten at the expense of the poor.

The circus continued. The clowns played their roles to perfection. The trapeze artists swung to and fro. The economy continued to crumble. The facade artists' “modus operandi” was to dress up the bitter truth. The bitter truth was camouflaged with sweetened falsehoods. “Lies, damn lies and statistics” - the phrase ideally fitted the picture. The GDP and public debt moved benignly in the rich vocabulary.

The system of “Crony Economics” created a segment of society, which was ultra rich and enjoying a life of supreme luxury. They were flaunting not only their ill-gotten wealth but their muscles too. A mere 2 per cent of the entire population continued to prosper at the expense of the others, what of the balance 98 per cent? They were requested to tighten their belts way back in 2005 and they had to continue. Their families fell apart due to economic hardships, jewelleries pawned, family heirlooms sold to ensure that the home fires continued to burn. Some were facing abject poverty. Naval guards had to be stationed at the Matara Mahanama Samaraweera Bridge and at the Kalutara Bridge to save our mothers and fathers, brothers and sisters from jumping into the river to end their lives, strickened with unbearable poverty.

The economic jargon, high-flown language, political and economic rhetoric continued to reverberate louder than ever. Astrologers too played their part conjuring the path of celestial objects at their whims and fancies. The objective was positively singular, merely to foster and nurture the mere 2 per cent of the nation. The 8th of January, 2015 was the day of reckoning. A whiff of freedom, a sweet fragrance of change wafted across the nation.

The officials and the economic experts have looked into the figures and now the economics of deceit and falsehood had surfaced. The bad news is that the economy is in a sad state and the good news is, it is not beyond resurrection and is in the safe and sound hands of the President, the Prime Minister, the Cabinet of Ministers and the Members of Parliament. We had managed to decipher the correct status of the economy which is being explained in detail. We will also investigate and recover ill-gotten gains irrespective of the category of politicians, stock market whiz kids or mere drug dealers. The period of immunity is over for the cronies and the clans; justice supreme will overcome the wicked and the wrongdoers.

Finally, the bubble had to burst. Our Government will now take stock of the situation, prime up the economy and move with finesse. We promise the nation that the correct picture will be portrayed at all times.

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුනි, මෛත්‍රී පාලනයේ යහපත් බව තුළින් යුක්තිය සහ සාධාරණත්වය පිළිබඳව අලුත් ප්‍රතිමානයක් ජාතියට එකතු කරනු ඇත. මේ පිළිබඳව උදාහරණ දෙකක් දීමට කැමැත්තෙමි. 2009 පැවැති මැතිවරණයේ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් අනතුරුව ජයග්‍රාහකයා ජය පැන් බිවූ අතර පරාජිතයා සිරගත කරන ලදි. මෙවර, සිරගත වීමේ දුක්ඛිත වාතාවරණයෙන් මිදීමේ සහනය ජයග්‍රාහකයාට හිමි වූ අතර, ජනතාවගේ මුදලින්, ස්වකීය ගම් පළාත වන මැදමුලනට යාමට නොමිලේ හෙලිකොප්ටර් යානා දෙකක් ලබා දුන්නේ පරාජිතයාටය.

ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට 2015 ජනවාරි මාසයේ 09 වැනි දින නිදහස් චතුරස්‍රයේදී ජනාධිපති දිවිරුම් ප්‍රතිඥා ලබා දීමට වැය වූයේ රුපියල් 6,500ක් වැනි සුළු මුදලකි. එසේ වුවද, 2009 දිවුරුම් දීමේ උත්සවය සඳහා පැවැති රජය රුපියල් මිලියන ගණනාවක් වැය කර ඇත. එම මුදල රුපියල් මිලියන 500කට අධිකය.

මෙම ප්‍රකාශයේ අරමුණ

අද ඉදිරිපත් කරන මේ ප්‍රකාශය, අපේ රටේ රාජ්‍ය මූල්‍ය ක්ෂේත්‍රයේ අලුත් ලක්ෂණයක් විය හැකිය. පාර්ලිමේන්තු මැතිවරණයක් ප්‍රකාශයට පත් කළ යුතු අවස්ථාවක නව රජයට සම්පූර්ණ වර්ෂයක් සඳහා තමාගේ නව ප්‍රතිපත්ති ඇතුළත් කොට අය වැයක් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දීම සඳහා අතුරු සම්මත ගිණුම් මීට පෙර බොහෝ අවස්ථාවල මෙම පාර්ලිමේන්තුවෙන් ඉදිරිපත් කොට ඇති බව අප අසා ඇත.

කෙසේ වෙතත්, අපි රජයේ රේඛීය අමාත්‍යාංශ ව්‍යුහයට විශාල වෙනස්කම් කර ඇති බැවින් අද ඉදිරිපත් කරන ප්‍රකාශය අත්‍යවශ්‍යයි. ඔබ දන්නා පරිදි අප අමාත්‍යවරු ගණන 71 සිට 31 දක්වා අඩු කළා. මෙය පසු ගිය රජයේ පැවැති ක්‍රමවේදයේ විශාල වෙනස්වීමක්.

[ගරු රවි කරුණානායක මහතා]

අමාත්‍ය මණ්ඩලය ස්ථාපිත කිරීමේදී අඩුම පිරිවැයකින් වැඩිම ප්‍රතිලාභ ලබා ගත හැකි වන පරිදි අපේ රේඛීය අමාත්‍යාංශ ව්‍යුහගත කර තිබෙනවා. අලුතින් ඇති කළ අමාත්‍යාංශ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට හැකි වන පරිදි සම්පත් නැවත වෙන් කළ යුතුයි. මෙම නව ව්‍යුහය ස්ථාපිත කිරීම සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ඉදිරියේදී ඉල්ලා සිටිනවා.

මීට අමතරව, විශේෂයෙන්ම ජනතාවට සහන ලබා දීම සඳහා අලුත් ආදායම් සහ වියදම් යෝජනා කිහිපයක් ද මගේ ප්‍රකාශයේ ඉතිරි කොටසේ දී ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා.

2014 ඔක්තෝබර් මාසයේ 24 වැනි දින ඉදිරිපත් කොට, 2014 නොවැම්බර් මාසයේ පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද 2015 අය වැය තුළ මෙම වෙනස්කම් සඳහා යෝජනා ඇතුළත් කළ යුතු අතර, අවශ්‍ය නීති සංශෝධන සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

අය වැය 2015

මීට පෙර ඉදිරිපත් කරන ලද 2015 අය වැය මගින් රජයේ සමස්ත ආදායම වශයෙන් රුපියල් බිලියන 1,594ක් අපේක්ෂා කර ඇත. The expectation of the then Government was to obtain a revenue of Rs. 1,594 billion. That is Rs. 1 trillion and 594 billion. මෙයින් රුපියල් බිලියන 1,400ක් බදු ආදායම් වශයෙන් ද, රුපියල් බිලියන 194ක් බදු නොවන ආදායම වශයෙන් ලැබිය යුතු යැයි ඇස්තමේන්තු කර ඇත. මුළු වියදම් සඳහා ශුද්ධ ණය දීම් රුපියල් බිලියන 2,990ක් වන අතර, එයින් රුපියල් බිලියන 1,465ක් පුනරාවර්තන වියදම් වේ. රුපියල් බිලියන 685ක් ප්‍රාග්ධන වියදම් සහ දළ ණය දීම් වශයෙන් ඇස්තමේන්තු කර ඇත. ඇස්තමේන්තු කොට ඇති පරිදි 2015 අය වැය හිඟය රුපියල් බිලියන 521ක් වන අතර, එය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 4.6ක් පමණ වේ. මම ඒ මතක් කළේ, එවකට ඉදිරිපත් කරපු අය වැය ගැනයි.

මේ අවස්ථාවේ මම ප්‍රකාශ කළ යුතුයි, මෙම හිඟය අදාළ වන්නේ රජයේ ආදායම් සහ වියදම්වලට පමණක් බව. කෙසේ වෙතත්, අපි නැවත නැවතත් මෙම පාර්ලිමේන්තුවට පෙන්වා දී ඇති පරිදි සහ පසු ගිය වසර ගණනාවක් තිස්සේ පාර්ලිමේන්තුවෙන් පිටතදී පවා සාකච්ඡා කොට ඇති පරිදි මෙම හිඟය අද රාජ්‍ය මූල්‍ය සඳහා ඇති සත්‍ය වගකීම නිරූපණය නොකරයි. මෙම හිඟය තුළ රජයේ බොහෝ අය වැය ක්‍රියාකාරකම් ඇතුළත් කොට නැත.

මෙම සත්‍ය වසන් කරන මුළාව ඉවත් කළ යුතු අතර සත්‍ය තත්ත්වය ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සහ සාමාන්‍ය මහ ජනතාවට දැන්විය යුතුය. ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හෝ මහ ජනයා නොමඟ යවන්න අපි අදහස් කරන්නේ නැහැ. අපේ උත්සාහය යහ පාලනය ඇති කිරීමයි. අමාරු තත්ත්වයක් තිබුණත් එය එසේම මේ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම තමයි ජනාධිපතිත්, අගමැතිත් මට නිර්දේශ කර තිබෙන්නේ.

රාජ්‍ය ණය පිළිබඳ තොරතුරු ප්‍රමාණවත් ලෙස ඉදිරිපත් කර නැති අවස්ථා පිළිබඳ වැදගත් කරුණු කිහිපයක් පහතින් දක්වා තිබෙනවා.

මෙම අය වැය හිඟය කිසිම ආකාරයකින් පසු ගිය අවුරුදු කිහිපය තුළ රටේ අසම්භාව්‍ය වගකීම් නිරූපණය කරන්නේ නැහැ. 2014 වර්ෂය අවසාන වන විට රජයට අයත් ව්‍යාපාර මඟින් යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා වාණිජ බැංකු මඟින් ණය ලබා ගැනීමට රුපියල් බිලියන 524ක පමණ භාණ්ඩාගාර ඇපකර රජය විසින් ලබා දී ඇත. ආණ්ඩුවේ guarantees දීලා තිබෙන්නේ කොහොමද කියලා ඇමුණුම් 1 යටතේ අපි සම්පූර්ණයෙන්ම හෙළිදරවු කරලා තිබෙනවා. අදාළ රජය සතු ව්‍යාපාරවලට මෙම ණය ගෙවීමට නොහැකි වූවහොත් රජයට එම ණය මුදල් ගෙවීමට සිදු වේ.

මෙම සංඛ්‍යාවලට 2014 අවසානය වන විට රාජ්‍ය ව්‍යාපාරවලින් බැංකු පද්ධතියට ගෙවිය යුතු රුපියල් බිලියන 593ක් -කෝටි 59,300ක්- පමණ වූ හිඟ ණය මුදල් ද ඇතුළත් විය යුතුය. එමෙන්ම, ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ හෙජින් ගනුදෙනුව වෙනුවෙන් දැනටමත් ගෙවා ඇති ඇමෙරිකන් ඩොලර් මිලියන 60ක්, එනම් රුපියල් බිලියන 7.8ක් පමණ වූ මුදල ද මෙයට ඇතුළත් වී තිබෙනවා. හෙජින් ගනුදෙනුව නිසා රජයට සිදුව ඇති මුළු පාඩුව ඇමෙරිකන් ඩොලර් මිලියන 120ක් -රුපියල් බිලියන 15.7ක්- පමණ වන බව ඇස්තමේන්තු කර තිබෙනවා. මෙම ගනුදෙනුව ශ්‍රී ලාංකික වාණිජ මෙහෙයුම් ඉතිහාසයේ මහ ජනයාට ඉතාමත්ම අයහපත් ලෙස බලපා ඇති අඥානතම ගනුදෙනුවක් වශයෙන් සඳහන් කරන්න පුළුවන්.

ඒ වාගේම, යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා රාජ්‍ය ව්‍යාපාර විසින් ලබා ගෙන ඇති විදේශ ණය ද රජයේ අය වැය හිඟය තුළ නිරූපණය නොවේ. The real loans that have been taken are not reflected under the Government's debt. 2004 වර්ෂය අවසන් වන විට ගෙවීමට ඉතිරිව ඇති ණය ඇමෙරිකන් ඩොලර් මිලියන 2,356ක්, එනම් රුපියල් බිලියන 308ක් පමණ වනවා. මෙම ණය මුදල් පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය, හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය සහ මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපළ ව්‍යාපෘතිය සඳහා ලබා ගෙන ඇත. ඔබ සියලු දෙනාටම දැන ගන්න ඒකේ සම්පූර්ණ පසු බිම ඇමුණුම් II යටතේ තිබෙනවා.

අපි භාණ්ඩාගාර ඇපකර වටිනාකම, රාජ්‍ය ව්‍යාපාර මඟින් බැංකු පද්ධතියෙන් ලබා ගෙන ඇති ණය සහ රාජ්‍ය ව්‍යාපාර මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ලබා ගෙන ඇති විදේශ ණය එකතු කොට ගණන් බැලුවහොත් අය වැය හිඟය දැනට ප්‍රසිද්ධ කර ඇති සංඛ්‍යාවට වඩා විශාල අගයක් ගන්නවා. It has been cosmetically kept back. The off-balance-sheet borrowings have led to an added burden on the country. මේක තමයි සැබෑ තත්ත්වය. රජයක් ණය ගන්න පුළුවන්. රජයේ ආයතන ණය අරගෙන ඒකේ Sovereign guarantee එක දුන්නත් එම එකමයි. මේ හෙළිදරවු කරන්නේ, අද ජනතාව සම්පූර්ණයෙන්ම ණයබරින් පෙළෙන ආකාරයයි.

දැන් ඔබට පසු ගිය පාලන කාලයෙන් අපට දායාද වශයෙන් ලැබී ඇති හිඟයේ ප්‍රමාණය පෙනෙනවා ඇති. පසු ගිය රජයෙන් අපට ලැබී ඇති අයහපත් දායාදය මෙයයි. අපට අපේ ගමන මෙවැනි තත්ත්වයක සිට ආරම්භ කිරීමට සිදු වී තිබෙනවා. අමාරුයි, නමුත් ඉදිරියට ගමන් කරන්න පුළුවන්.

මේ ක්‍රමයට තවත් අවුරුදු කිහිපයක් කටයුතු කර ගෙන ගියේ නම් අපේ රට ආර්ථිකමය වශයෙන් අසාර්ථක ජාතියක් වශයෙන් නම් කිරීමට හැකිව තිබුණා. නැවත වරක් මම මේ "වෙනස" සිදු කළ හැම දෙනාටම මගේ ස්තුතිය පිරිනමන්න කැමැතියි. එසේ නොවුණා නම් අපේ ශ්‍රේෂ්ඨ ජාතියටත්, සමස්ත ආර්ථිකයම දූෂිත පාලකයන්ගේ සූරා කෑමට ලක් වී, කොටස්වලට කැඩී ගිය Banana Republicවලට අත් වූ ඉරණම ඇති වීමට ඉඩ තිබුණා.

දැනට ලැබී ඇති දත්ත අනුව 2014 වර්ෂය අවසාන වන විට රජයේ ණය රුපියල් බිලියන 7,373ක් පමණ වෙනවා. මේ අනුව ඒක පුද්ගල ණය ප්‍රමාණය රුපියල් 357,233ක් පමණ වෙනවා.

ඒ කෙසේ වෙතත්, මම ඉහත සඳහන් කළ අයිතම තුනද ඇතුළත් කළහොත්, සමස්ත ණය ප්‍රමාණය රුපියල් බිලියන 8,817ක් පමණ වෙනවා. ඒ අනුව ඒක පුද්ගල ණය ප්‍රමාණය ද රුපියල් 427,220ක් දක්වා ඉහළ යනවා. නැවතත් ඔබට පෙනෙනවා ඇති පසු ගිය රජය මේ රටේ මහජනතාව මත පටවා ඇති ණය බරෙහි ප්‍රමාණය. බැලූ බැල්මට සියයට 25ක් රජයේ ආයතන තුළින් අරගෙන ඇති ණය ප්‍රමාණය තමයි මෙතැන හෙළිදරව් වෙලා තිබෙන්නේ.

මම අවධාරණය කළ යුතුයි, මේ සම්පූර්ණ ණය මුදල් මේ රටේ අහිංසක මහජනතාව, දැනට සිටින වර්තමාන පරම්පරාව පමණක් නොව අනාගතයේ ඉපදෙන්නට සිටින දරුවන් විසින් ද ගෙවිය යුතු බව. අපිට අවුරුදු 2500කට වැඩි කාලයක අපේ ඉතිහාසයෙන් ලැබුණු දායාද පිළිබඳව ආඩම්බර විය හැකි වුවත්, පසු ගිය රජය විසින් අපට ලබා දී ඇති ණය දායාදය පිළිබඳ අපි කෙසේ ආඩම්බර වෙන්න ද? මෙහිදී ඇති වන ප්‍රශ්නය නම්, මෙය අවශ්‍ය ද නුවණක්කාර ද යන්නයි. පසු ගිය රජය කාලයේ මූල්‍ය කටයුතු කළමනාකරණය කර ඇති ආකාරය පිළිබඳව එම පාලකයන් ලජ්ජා විය යුතුයි. තෝරා ගත් සුළු පිරිසකගේ සුඛ විහරණය සඳහා ලබාගත් ණය පරම්පරා ගණනාවකට ගෙවීමට සිදු වෙලා තිබෙනවා. 2012, 2013, 2014 වර්ෂ සඳහා වූ සමස්ත ණය සහ ඒක පුද්ගල ණය ඇතුළත් සංඛ්‍යා ලේඛනයක් මා මෙහි ඇතුළත් කර තිබෙනවා. ඒ අනුව මේ කියන සියලු දේම මෙහි සාක්ෂි සහිතව සාක්ෂාත් කරලා තිබෙනවා.

සමස්ත ණය සහ ඒක පුද්ගල ණය

අයිතමය	2012	2013	2014
සමස්ත ණය (රු.බිලියන)			
රාජ්‍ය ණය	6,000	6,793	7,373
සමස්ත ණය, භාණ්ඩාගාර ඇපකර, රාජ්‍ය ව්‍යාපාර විසින් බැංකු සහ විදේශ මූලාශ්‍රවලින් ලබා ගත් ණය ඇතුළත්ව	6,853	8,099	8,817
සමස්ත ණය දළ දේශීය නිෂ්පාදිතයෙන් ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ණය	79.2	78.3	74.4
සමස්ත ණය භාණ්ඩාගාර ඇපකර, රාජ්‍ය ව්‍යාපාර විසින් බැංකු සහ විදේශ මූලාශ්‍රවලින් ලබා ගත් ණය ඇතුළත්ව	90.4	93.4	88.9
ඒක පුද්ගල ණය (රු)			
රාජ්‍ය ණය	295,165	331,653	352,869
සමස්ත ණය, භාණ්ඩාගාර ඇපකර, රාජ්‍ය ව්‍යාපාර විසින් බැංකු සහ විදේශ මූලාශ්‍රවලින් ලබා ගත් ණය ඇතුළත්ව	337,140	395,379	427,220

මම එක් නිදසුනක් වශයෙන් රජයේ ණය පිළිබඳ සංඛ්‍යා ඉදිරිපත් කරන්නම්.

රජයේ ණය 2012 වර්ෂයේ රුපියල් බිලියන 6,000යි. 2013 වර්ෂයේ 6,793යි. 2014 වර්ෂයේ 7,373යි. අද වෙනකොට රුපියල් බිලියන 8,817. ඒ කියන්නේ ට්‍රිලියන 8.817යි.

කොතරම් ණය බරක් තිබෙනවාද යන්න පෙනෙන්නේ නැති වන විධියට කටයුතු කර තිබෙනවා කියන එක මේ දවස් 20 තුළින් අපට හෙළිදරවු වුණා, රටේ ජනතාවට පෙන්වන්නට හැකියාවක් ඇති වුණා.

රජයේ සමස්ත ණය 2014 අවසානය වන විට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 74.4ක් පමණ වෙනවා. ජාත්‍යන්තර ප්‍රමිතීන්වලට අනුව මෙම ණය ඉහළම මට්ටමක පවතිනවා. මා මුලින් සඳහන් කළ අයිතම තුන ද ඇතුළත් කළ හොත් සමස්ත ණය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 88.9ක් දක්වා වැඩි වෙනවා. මෙයින් අපට දෙන පණිවිඩය තමයි රටේ අය වැය හිඟය සහ ගෙවීමට ඇති ණය අඩු කිරීම සඳහා ඉදිරියේදී අපට ප්‍රබල හා නිර්මාණශීලී ක්‍රමවේද යොදා ගැනීමට අවශ්‍ය වන බව.

පසු ගිය රජය යටතේ ක්ෂේත්‍ර සුළු ප්‍රමාණයකට රජයේ අය වැයෙන් විශාලතම කොටස වෙන් කර තිබුණා. කෙසේ වෙතත්, 2015 වර්ෂය සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පතෙහි සංශෝධන සිදු කර එම විෂමතාව නිවැරැදි කිරීමට අවශ්‍ය පියවර ගනු ඇත.

නිදසුනක් වශයෙන් මම මේ අවස්ථාවේදී මතක් කරන්නට කැමැතියි, ජනාධිපති කාර්යාලයේ 2009 වර්ෂයේ සම්පූර්ණ වියදම වූයේ රුපියල් බිලියන 6.3යි. නැතහොත් රුපියල් කෝටි 634යි. 2010 වර්ෂයේ රුපියල් කෝටි 765යි. 2011 වර්ෂයේ රුපියල් කෝටි 5063යි. 2012 වර්ෂයේ රුපියල් කෝටි 5936යි. 2013 වර්ෂයේ රුපියල් කෝටි 8,244 යි. 2014 වර්ෂයේ රුපියල් කෝටි 10,497යි. 2015 වර්ෂයේ ඇස්තමේන්තු කරලා තිබුණු ප්‍රමාණය රුපියල් කෝටි 9,593යි. ජනාධිපති නිර්දේශය තුළින් මෙය දැන් අඩු කරලා තිබෙනවා, රුපියල් කෝටි 256කට. මෙයින් බහුතරයක්ම යන්නේ ඒ ජනාධිපති කාර්යාලයට ඒ වියදම් සඳහායි. කොහොමද අපි අනිසි වියදම් අඩු කරලා සම්පූර්ණ වාසිය ජනතාවට ලබා දෙන්නේ කියන එක මෙයින් පෙනෙනවා. පසු ගිය රජය යටතේ ක්ෂේත්‍ර සුළු ප්‍රමාණයකට අය වැයෙන් මුදල් ලැබුණු ආකාරය වෙනස් කරලා නව සංශෝධිත මුදල් ප්‍රමාණය අපි ඇමුණුම් IV යටතේ ඉදිරිපත් කර තිබෙනවා.

මෙවැනි සිදු වීම් යළි යළිත් අනාගතයේ සිදු වීම වළක්වා ගැනීම පිණිස අය වැය හිඟය සහ රටේ දැනට පවතින ණය ප්‍රමාණය අඩු කර ගැනීම සඳහා ශක්තිමත් මෙන්ම නවෝත්පාදක පියවරයන්ගේ අවශ්‍යතාව මෙවැනි සිදුවීම්වලින් පිළිබිඹු කරයි.

අපේ අලුත් යෝජනා ඉදිරිපත් කිරීමට පෙර මම කැමැතියි, ප්‍රධාන සාධක දෙකක් පිළිබඳව සඳහන් කරන්නට. එනම් ආර්ථික වර්ධනය / නාමික වැටුප් සහ ණය ගෙවීමේ බර.

ආර්ථික වර්ධනය සහ නාමික වැටුප්

ශ්‍රී ලංකාව පහළ උද්ධමනයක් සහ පහළ රැකියා වියුක්ති අනුපාතයක් සහිත නැඟී එන වෙළෙඳ ආර්ථිකයක් සහිත රටවල් අතර සාපේක්ෂ වශයෙන් ඉහළ ආර්ථික වර්ධනයක් තිබෙන රටක් වශයෙන් හඳුනා ගෙන තිබෙන බව අපි දන්නවා.

ලෝකයේ ප්‍රධාන ආර්ථික නියමුවන් වශයෙන් කටයුතු කළ බටහිර ලෝකය අබිබවා ආසියානු කලාපයට වර්ධනය වීම සඳහා මේ ශත වර්ෂය විශාල අවස්ථාවක් ලබා දී තිබෙනවා. චීනය සහ ඉන්දියාව ලබා ඇති යෝධ ආර්ථික පියවර ආසියානු රටවල හැකියාව ලෝකයාට ප්‍රදර්ශනය කර තිබෙනවා. ශ්‍රී ලංකාව සියයට 90කට වඩා වැඩි ආසියාවේ ඉහළම සාක්ෂරතාවක් ඇති ජාතියක් වශයෙන් අපි ළඟා කර ගෙන ඇති තත්ත්වය අපේ හැකියාවට සාපේක්ෂව ප්‍රමාණවත්ද යන්න විවේචනාත්මකව විග්‍රහ කළ යුතුව තිබෙනවා.

තිරසාර ආර්ථික වර්ධනය සහ ස්ථාවරත්වය අධිවේගී මාර්ග, ගුවන් තොටුපොළවල්, වරායන් සහ ගොඩනැඟිලි මඟින් පමණක් පවත්වා ගත නොහැකි වෙනවා. කෘෂිකර්මය, කර්මාන්ත, සේවා සහ කර්මාන්ත ආශ්‍රිත අපනයනවල තත්ත්වය කුමක්ද?

පිළිගත් ක්‍රමවේදය නම් සමස්ත සංවර්ධන සැලසුම් තුළ මාර්ග පද්ධති සහ වෙනත් යටිතල පහසුකම් අවශ්‍යතා සඳහා අවශ්‍ය

[ගරු රවි කරුණානායක මහතා]

ප්‍රතිපාදන ලබා දීමයි. නමුත් එවැනි සංවර්ධන සැලැස්මක් තිබී නැහැ. ඒ වෙනුවට තෝරා ගත් සුළු පිරිසකගේ එල ප්‍රයෝජනය සඳහා අවධිමත් ලෙස ව්‍යාපෘති සැලසුම්කොට සමස්ත ආර්ථිකයම අවදානමකට ලක් කර තිබෙනවා. දේශපාලන පවුලක් ඉහළට ඔසවා තැබීම හා අභිමානවත් කිරීම අරමුණු කර ගත් තෝරා ගත් නගර සංවර්ධනය මඟින් ආර්ථිකය නැවත ගොඩනැඟිය නොහැකි මට්ටමකට පත්කොට තිබෙනවා.

ශ්‍රී ලංකාවේ වාර්ෂික මූර්ත ආර්ථික වර්ධන වේගය පසු ගිය අවුරුදු තුනක කාලය තුළ සියයට 7ක් පමණ වූ අතර එම කාලය තුළ දී නාමික ආර්ථික වර්ධන වේගය සියයට 15ක් පමණ වී ඇත.

මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඒක පුද්ගල ආදායමේ සැලකිය යුතු වර්ධනයක් ඇති වී ඇති අතර, එය 2014 දී ඇමෙරිකන් ඩොලර් 3,646ක් එනම්, රුපියල් 477,600ක් වශයෙන් ඇස්තමේන්තු කර ඇත. ජාත්‍යන්තර වර්ගීකරණය අනුව මෙය මැදි ආදායම් රටක ආර්ථික මට්ටමට සමාන වේ.

කෙසේ වෙතත්, ජාතික ආදායමේ නාමික වර්ධනයෙන් රටේ පුරවැසියන්ගේ ජීවන මට්ටමේ වැඩි දියුණුවීම නිරූපණය නොවේ. මේ සඳහා අපි රටේ සාමාන්‍ය පුරවැසියන් දෙස බලා ඔවුන් තුළ ඒක පුද්ගල ආදායම් සංඛ්‍යාවලින් පෙන්වන සෞභාග්‍යතා මට්ටමක් තිබේද යන්න නිරීක්ෂණය කළ යුතුය. එසේ නොවේ නම් මේ කරුණු දෙක අතර සම්බන්ධයක් නැත. අපේ ගරු අග්‍රමාත්‍යතුමා නිතරම සඳහන් කර ඇති පරිදි සංවර්ධනයේ ප්‍රතිලාභ එක් වරප්‍රසාද ලත් පිරිසකට පමණක් සීමා නොකර රටේ සියලුම පුරවැසියන්ට ලබා දීමට මෙම රජය කටයුතු කරනවා. අපි තෝරා ගත් පවුල් කිහිපයක පමණක් සෞභාග්‍ය ළඟා කර ගැනීම විශ්වාස නොකරන අතර ශ්‍රී ලංකා මාතාවගේ සියලුම පුරවැසියන්ගේ දියුණුව උදෙසා කටයුතු කරනවා.

සමහරක් නාමික වැටුප් කාණ්ඩ වැඩි වී ඇත්තේ අඩු අනුපාතයකිනි. උදාහරණයක් වශයෙන් රජයේ සේවයේ නාමික වැටුප සියයට 10කට වඩා අඩු ප්‍රතිශතයකින් පසු ගිය අවුරුදු දෙකක කාලය තුළ වැඩි වී ඇත. එම ප්‍රමාණය උද්ධමනය සමඟ සසඳා බලන විට වාර්ෂික මූර්ත වැටුප් වර්ධනය සියයට 5ක් පමණ වන අතර එමඟින් පවුලක මිල දී ගැනීමේ හැකියාවේ ප්‍රමාණවත් වර්ධනයක් පෙන්නුම් නොකරයි. ඊට අමතරව, ශ්‍රම බලකායේ ඇතැම් කොටස්වල මූර්ත වැටුප අඩු වී ඇත. The purchasing power has reduced owing to the policy that had been adhered to before.

මේ නිසා වැටුප් මට්ටම් සහ මිල මට්ටම්වලට යම් යම් වෙනස්කම් ඇති කළ යුතුය. දින 100 විප්ලවකාරී වැඩසටහන මඟින් මාසික වැටුප රුපියල් 10,000කින් වැඩිකොට එයින් රුපියල් 5,000ක් 2015 පෙබරවාරි මාසයේ දී ලබා දෙන්න නිර්දේශ කරනවා. ඒ වාගේම ඉතිරිය ජූනි මාසයේ දී ලබා දෙනවාය කියන එකත් මේ අවස්ථාවේ දී පොරොන්දු වෙනවා. මේ අනුව රජයේ සේවකයන්ගේ නාමික වැටුප 2015 දී, 2014 වැටුපට සාපේක්ෂව සියයට 47කින් වැඩි වනු ඇත. මූර්ත වැටුපේ වර්ධනයද 2015 දී පසු ගිය වසරට වඩා සියයට 40කින් වැඩි වනු ඇත. මෙය පහළ උද්ධමනකාරී තත්ත්වයක් තුළ සිදුවීම විශේෂත්වයකි.

තෝරාගත් භාණ්ඩ හා සේවාවල මිල අඩු කිරීම් මඟින් සියලුම පවුල්වල මූර්ත ආදායම ඉහළ යනු ඇත. මේ අනුව, ඉදිරියේ දී සියලුම ශ්‍රී ලාංකිකයන්ගේ අනාගතය සමාන අවස්ථා සහ යහපාලන රාමුවක් තුළ වැඩි දියුණු වනු ඇත.

ණය නැවත ගෙවීමේ වගකීම (ණය බර)

අප දන්නා පරිදි ණය සේවාකරණය රජයේ අය වැය මෙහෙයුම් සඳහා විශාල පීඩනයක් ගෙන දෙනවා. 2015 වසර සඳහා පමණක් පොලී ගෙවීම් සඳහා රුපියල් බිලියන 425ක් සහ ණය ආපසු ගෙවීම සඳහා රුපියල් බිලියන 840ක් වශයෙන් සමස්ත ණය සේවාකරණය සඳහා රුපියල් බිලියන 1,265ක් අවශ්‍ය වෙනවා.

මේකෙන් පෙනෙනවා, පසු ගිය ආණ්ඩුව ඇස්තමේන්තු කළ සමස්ත ආදායම රුපියල් මිලියන 1,521යි. ඒකෙන් සියයට 85ක් යන්නේ මෙවැනි debt servicingවලටයි. කොතරම් අවදානම් තත්ත්වයක්ද තිබෙන්නේ කියන කාරණය මා නැවත මතක් කිරීමට අවශ්‍යතාවක් නැත.

මෙය 2015 සංශෝධිත අය වැයේ ආදායමෙන් සියයට 77ක් පමණ වෙනවා. මෙය අය වැය මඟින් ජනතාවට බොහෝ අත්‍යවශ්‍ය සේවා ලබා දීමට ඇති ඉඩ සැලකිය යුතු මට්ටමකින් සීමාවීමට හේතු වෙනවා. ණය ආපසු ගෙවීම් සම්බන්ධව පහත සඳහන් කොන්දේසි කෙරෙහි අවධානය යොමු කිරීමට මා කැමැතියි.

2015 දී ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික ආයතනවලට - bilateral and multilateral agencies - ගෙවීමට ඇති ණය, වාණිජ ණය ගැනීම් සහ අපනයන ණය සඳහා වූ ණය සේවාකරණ ගෙවීම් ඇමෙරිකන් ඩොලර් මිලියන 1,394ක් පමණ වනවා. ඉදිරි වර්ෂ 05 සඳහා මෙම මූලාශ්‍රවලට අදාළ සමස්ත ණය සේවාකරණ ගෙවීම් ඇමෙරිකන් ඩොලර් මිලියන 8,461ක් පමණ වෙනවා. 2014 වසර අවසානයේ දී ගෙවීමට ඇති ජාත්‍යන්තර ස්වෛරිත්ව බැඳුම්කර සහ ඇමෙරිකන් ඩොලර් මිලියන 5,000ක් ද මෙයට ඇතුළත් වන අතර, මෙයින් විශාල ප්‍රමාණයක් 2015 -2020 කාල පරිච්ඡේදය තුළ දී කල් පිරෙනු ඇත.

ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳ පොළේ ඉහළ යන ඵලදා අනුපාත තත්ත්වයක් හමුවේ රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනය කර ඇති විදේශ ආයෝජන කල් පිරීමට පෙර අළෙවි කිරීම සහ භාණ්ඩාගාර බිල්පත්වල සහ බැඳුම්කරවල සිදු කර ඇති විදේශ ආයෝජන ක්‍රමානුකූලව කල් පිරීමද සිදු විය හැක.

විශාල පරිමාණයේ ව්‍යාපෘති සඳහා මෑතකදී ලබා ගෙන ඇති බොහෝ ණයවල ආරම්භක අවුරුදු 3 - 4ක් පමණ වූ සහන කාල සීමාව අවසන් වෙමින් මේ අවුරුද්දේ සිට ණය ගෙවීම ආරම්භ කිරීමට සිදු වනු ඇත.

All loans taken by the last Government with a cost-benefit analysis or not, ලාභයට හෝ පාඩුවට ගත් ණය, දැන් ගෙවන්නට සිදු වී තිබෙන්නේ මේ ආණ්ඩුවටයි.

ආරක්ෂක කටයුතු සඳහා ලබා ගෙන ඇති ඇමෙරිකන් ඩොලර් මිලියන 15ක් පමණ වන ණය ද අපට ගෙවීමට තිබෙනවා. මීට අමතරව හෙජින් ගනුදෙනුව සම්බන්ධව ඇත්ත වශයෙන් අප ගෙවිය යුතු ප්‍රමාණය පිළිබඳව අපට අවබෝධයක් නැහැ. දැනට අපි කෝටි 6,400ක් ණය වෙලා තිබෙනවා. ඉතිරි ඒවා තවමත් contingent liability එකක් වශයෙන් තමයි තිබෙන්නේ.

මෙම ණය සේවාකරණ ගෙවීම් එකතු කළ විට සැලකිය යුතු ප්‍රමාණයක් වන අතර, ඒ තුළින් ඉදිරි වසරවල දී රටින් පිටතට ගලා යන විදේශ මුදල් ප්‍රමාණය ඉහළ යනු ඇත. ඒ අනුව කෙටි කාලීන ණය බර ප්‍රමාණය රටේ විදේශ සංචිත ප්‍රමාණයට සමාන විය හැකි වේ. පසු ගිය අවුරුදු කිහිපය තුළ ලබා දුන් විදේශ ණයවලට අදාළ පොලී අනුප්‍රමාණ ඇමුණුම් iiiහි දැක්වේ.

ඇමුණුම් iiiහි දක්වා තිබෙනවා, කොතරම් ණය ප්‍රමාණයක්, කොතරම් පොලියකට අරන් තිබෙනවාද කියන එක. ඒ නිසා මම ඒවා පෙන්වා දීමට වෙලාව ගත කරන්නේ නැහැ.

මේ තුළින් පැහැදිලිව පෙන්වනවා අද අපේ රටේ ආර්ථිකය කොතරම් අවදානම් තත්ත්වයකට පත් වී තිබේද යන්න. මේක නිකම් grenade එකේ pin එක ගැලෙව්වාම කොයි වෙලාවේ පුපුරයිද දන්නේ නැහැ වාගේ දෙයක්. මේ නිසා අපනයන ආදායම් වැඩි කිරීම සහ කෙටි කාලීන ණය වගකීම් දීර්ඝ කාලීන ණය බවට පත්කොට විදේශ අංශයේ ස්ථාවරත්වය හා අය වැය මෙහෙයුම් කටයුතුවලට ඇති පීඩනය අඩු කිරීමේ දැඩි අවශ්‍යතාව තිබෙනවා.

වියදම් යෝජනා.

අද ඉදිරිපත් කෙරෙන මෙම ප්‍රකාශය "දින සියයේ වැඩ සටහන" තුළ වූ ඉතා වැදගත් පියවරක් ලෙස සැලකිය හැකිය. එබැවින් එය දින 100 විප්ලවය ලෙස හැඳින්වෙනවා. මගේ ඇසින් බලන කල එය, "දින සියයේ අභියෝගයක්". මෙහිදී ඉදිරිපත් කරන මහජනතාව වෙත පිරිනමනු ලබන සහන අප දින සියයේ වැඩ සටහනින් පොරොන්දු වූ ඒවාටත් වඩා ඉදිරියට ගිය වැඩ පිළිවෙළක්.

මෙයට අදාළ වියදම් සඳහා අප ආදායම් ද සොයා ගත යුතුයි. ඒ ඔස්සේ ණය බර වැඩි නොකිරීමට අප අදිටන් කරගෙන සිටිනවා. පුද්ගල ප්‍රතිරූපය නංවාලීම පිණිස කළ වියදම් හා අහිතකර නාස්තිකාර වියදම් සඳහා පසු ගිය කාලයේ දී අය වැය යටතේ ප්‍රතිපාදන ලබාගෙන කුඩා කණ්ඩායම් වඩා පහසු ජීවිතයක් ගත කර ඇති බව කිව යුතුයි.

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරුනි, අහිතකර ජීවන බර හේතුවෙන් කිව නොහැකි තරම් දුෂ්කරතා රැසකට පසු ගිය දශකය පුරා මුහුණ දුන් ශ්‍රී ලංකා වාසී ජනතාව මෙමඟින් සලසන සහන නිසා නිතැතින්ම සතුටට පත් වනු නියතයි. අපගේ ජනතාවගේ දිළිඳුතම කණ්ඩායම්වල ජීවන බර අඩු කිරීමට අප විශේෂයෙන් අවධානය යොමු කර තිබෙනවා. ඔවුන් අපගේ ජාතියේ විශේෂ කොටස්කරුවන්. ධනවතුන් හා සුපිරි ධනවතුන් රටේ උන්නතිය සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දීමට කාලය පැමිණ ඇති බැව් මගේ විශ්වාසයයි. සමහර පුද්ගලයන්ට සහ සංවිධානවලට විශාල වශයෙන් ලාභ උපයා ගැනීමට පසු ගිය රජය පුළුල් පහසුකම් සපයා ඇති බව අප හොඳින් දැන සිටිනවා.

මා මුලින් සඳහන් කළ ආකාරයට, පසු ගිය කාලයේ සිටි 71දෙනෙක් වූ අමාත්‍යවරුන් සංඛ්‍යාව 31දක්වා අඩු කර තිබෙනවා. එම පියවරෙන් පමණක් වාර්ෂිකව රුපියල් බිලියන 2.5ක් නැතහොත් රුපියල් මිලියන 2,500ක් ඉතිරි කර ගැනීමට හැකි වන අතර, එම මුදල් ඵලදායී කටයුතුවලට යොදා ගැනීමට හැකි වෙනවා.

පසු ගිය රජය හුදු දේශපාලන අරමුණු සඳහා කොතරම් මුදල් කන්දරාවක් නාස්ති කළාද යන්න ඉන් පැහැදිලි වෙනවා. අපගේ රජය ජනතාවගේ යහ පැවැත්ම වෙනුවෙන් කටයුතු කිරීමට අරමුණු කර ගෙන තිබෙනවා. අපගේ රජය සහ පසු ගිය රජය අතර වෙනස එයයි.

රාජ්‍ය අංශයේ වැටුප් සංශෝධනය

රාජ්‍ය අංශයේ වැටුප් වැඩි කිරීම -අපගේ දින සියයේ වැඩසටහනෙහි පවත්නා ප්‍රධානතම යෝජනාව- විධිමත් ලෙස දැන් මා ප්‍රකාශ කරනවා. රාජ්‍ය සේවකයින්ගේ මාසික වැටුප රුපියල් 10,000කින් වැඩි කිරීමට අප පොරොන්දු වී තිබෙනවා. එහි ආරම්භක පියවරක් ලෙස රුපියල් 5,000ක් 2015 පෙබරවාරි මාසයේ සිට ලබා දෙනු ඇත.

මිලියන 1.3ක් නැතහොත් ලක්ෂ 13කට වැඩි ස්ථිර රජයේ සේවකයන් ජනවාරි මාසයේ වැටුපට රුපියල් 3,000ක් අතිරේක දීමනාවක් ලෙස ලබා ගත්තා. එම රජයේ සේවකයන්ගේ පෙබරවාරි මස වැටුපට තවත් රුපියල් 5,000ක් එකතු වන බව සතුටින් දන්වා සිටිනවා. එමෙන්ම ඉතිරිය ජූනි මාසයේදී ලබා දීමට කටයුතු කරන්නෙමු. රුපියල් 10,000ක් වන මෙම මුළු වැටුප් වැඩි වීම රාජ්‍ය සේවකයකුගේ මසක වැටුපට එකතු වන දීමනාවක් ලෙස සැලකෙනු ඇත.

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවකයන්ට ලබා දුන් විශාලතම වැටුප් වැඩි වීම ලෙස මෙය වාර්තා ගත වනු ඇත. අප රටේ පරිපාලනය මෙහෙයවන රාජ්‍ය සේවකයන් වෙනුවෙන් මෙවැනි වැටුප් වැඩි කිරීමක් ලබා දීමට හැකි වීම පිළිබඳව උදක්ම සතුටු වෙමි.

වෘත්තීය සමිති, රාජ්‍ය සේවකයන් මෙන්ම රාජ්‍ය අංශයේ සියලුම පාර්ශවකරුවන්ගෙන්, ආසියානු කලාපයේ පවත්නා ප්‍රමිතීන්ට අනුකූල වන පරිද්දෙන් ඵලදායිත්වය නංවාලීමට කටයුතු කරන ලෙස මා කාරුණිකව ඉල්ලා සිටිනවා.

පෞද්ගලික අංශයේ වැටුප් හා වේතන

ජාතික සංහිඳියාව නැංවීමෙහි ලා සහාය වන ලෙස පෞද්ගලික අංශයේ සේව්‍ය පක්ෂයෙන් මා බලවත් වුවමනාවෙන් ඉල්ලා සිටිනවා. මෙම පියවර ඇති නැති පරතරය අඩු කිරීමට විශාල වශයෙන් උදවු වන බැව් සඳහන් කරනු කැමැත්තෙමි. ඔබගේ සමාගමෙහි වැදගත්ම වත්කම සහ වැදගත්ම මෙවලම වනුයේ මානව ප්‍රාග්ධනයයි. එබැවින් ඵලදායකත්වය නංවාලමින් ප්‍රීතිමත් ආයතනික පරිසරයක් ඇති කරමින් සේවක පාර්ශ්වයට තෘප්තිමත් විය හැකි තත්ත්වයක් නිර්මාණය වනු දැකීම අපේක්ෂාවයි.

පෞද්ගලික අංශය මුහුණ දෙන ප්‍රධාන ගැටලු පිළිබඳ අවබෝධයක් අපට ඇත. කෙසේ වුවත්, බල ශක්තිය ඇතුළු යෙදවුම් පිරිවැය අඩු වීම සැලකිල්ලට ගනිමින් සේවකයෙකුගේ මාසික වැටුප රුපියල් 2,500කින් වැඩි කිරීමට සලකා බලන ලෙස පෞද්ගලික අංශයෙන් ඉතාමත් ඕනෑකමින් මේ මොහොතේ ඉල්ලා සිටීමට මා කැමැතියි. මෙම වැටුප් වැඩි වීම ඵලදායකත්වය සමඟ සම්බන්ධ විය යුතුයි. තවදුරටත් යෝජිත වැටුප් වැඩි කිරීමේ කොටසක් වශයෙන් ආයතන විසින් ලබා දෙන ආහාර සඳහා යන වියදම් වැනි මූල්‍ය නොවන ප්‍රතිලාභ මේ සඳහා යොදා ගැනීමට සේව්‍ය පාර්ශ්වයට පුළුවන. දීමනා වැනි ඉන්ධන මිල අඩු කිරීම් ඇතුළු යෙදවුම් මිල අඩු කිරීම් හරහා ආර්ථිකය පුරා පිරිවැය අඩු වන බැව් දනිමු. පෞද්ගලික අංශයේ සේවකයන් රටේ අභිවෘද්ධිය වෙනුවෙන් ලබා දෙන දායකත්වය අගය කළ යුතුය. සේව්‍ය පක්ෂය විසින් මෙම ඉල්ලීම ධනාත්මකව සලකා ක්‍රියා කරනු ඇතැයි අපේක්ෂා කරනවා. රටක වර්ධන යාන්ත්‍රණය වන පෞද්ගලික අංශයට, තම ආයතනවල ජීවනාලිය වූ මානව සම්පත සංවර්ධනය කිරීම සඳහා මෙය යෝග්‍යතම කාලය බව අදහස් කරමි.

ඒ වෙනුවෙන් අපේ ආණ්ඩුව කැපවී සිටිනවා. සියයට 10, සියයට 20, සියයට 30 වැනි අනවශ්‍ය වියදම් මින් පසුව ගෙවන්නට ඕනෑ නැහැ කියන එක මම ඉතාමත් වගකීමෙන් කියන්නට කැමැතියි. ඒ පිරිසිදු පාලනය අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සහ ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඉහළම මට්ටමෙන් ඇති කර තිබෙන බැවින් ඔබතුමන්ලාගේ ආයතනවල තිබෙන වියදම් ශීඝ්‍රයෙන් අඩු වන නිසා ඒ අඩු වන මුදල එම අභිංසක සේවක පිරිසට ලබා දෙන්න කියන එක, පෞද්ගලික අංශයේ සිටි පුද්ගලයෙක් වශයෙන් මා කාරුණිකව ඉල්ලනවා.

නව රජය විසින් GSP Plus පහසුකම් යළි ලබා ගැනීමට කටයුතු කරනු ලබයි. ගරු අග්‍රාමාත්‍යතුමා හා ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා මේ සම්බන්ධයෙන් දැඩි උනන්දුවකින් ක්‍රියා කිරීම ගැන මම සතුටු වෙමි. මෙම සහනය අප රට විසින් අවුරුදු

[ගරු රවි කරුණානායක මහතා]

කිහිපයක් තිස්සේ බුක්ති විඳින ලද අතර, එමඟින් අපගේ කාර්මික අපනයනවලට විශාල දායකත්වයක් සිදු වූ බව කිව යුතුය. අවාසනාවකට පසු ගිය රජය මේ පිළිබඳව ධනාත්මකව සැලකිල්ල යොමු නොකළ අතර එමඟින් රටට දුෂ්කරතා රැසකට මුහුණ දීමට සිදු විය.

මෙම පහසුකම නොලැබීම නිසා පසු ගිය වසර 07 තුළ දී රටට සිදු වූ අලාභය ඇමෙරිකානු ඩොලර් මිලියන 5,000ක් පමණ වේ. ඊට අමතරව විශාල පිරිසකගේ රැකියා අහිමි වූ අතර ඔවුන්ගේ ආදායම් මාර්ග අහිමි වීම නිසා එම පවුල් දරිද්‍රතාවට පත් වූ බව සඳහන් කළ යුතුය. මෙම පහසුකම නොලැබීම හේතුවෙන් අපනයන ක්ෂේත්‍ර තුළද විශාල පසු බැසීමක් සිදු වූ අතර, වෙළෙඳ ශේෂය, ගෙවුම් ශේෂය හා බාහිර සංචිත විෂයෙහි අහිතකර බලපෑම් එල්ල විය.

GSP Plus අලුත් කිරීමත් සමඟ පසු ගිය වර්ෂවල වසා දමන ලද කර්මාන්තශාලා යළි විවෘත කිරීමට හා අලුත් කර්මාන්තශාලා ආරම්භ කිරීමට රජය විසින් සැලසුම් කර ඇත. මේ තුළින් පෞද්ගලික අංශය තුළ විශාල පිබිදීමක් ඇති වනු ඇත.

ගරු කථානායකතුමනි, මේ වන විට යුරෝපා සංගමය විසින් ශ්‍රී ලංකාවෙන් මසුන් සහ මත්ස්‍ය නිෂ්පාදන ආනයනය කිරීම තහනම් කර ඇත. මෙය 2015 ජනවාරි 15 දින සිට බලපවත්වන පරිදි ක්‍රියාත්මකව පවතී.

ජාත්‍යන්තර සමුද්‍ර නීතිය පිළිබඳ පවත්නා බැඳීම අනුව කටයුතු කිරීමෙන්, කාර්යක්ෂම යාත්‍රා සුපරීක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීමෙන් සහ ගැඹුරු මුහුදේ යාත්‍රා වෙනුවෙන් සම්බාධක ක්‍රියාදාම හඳුන්වා දීමෙන් මෙම ගැටලුව සඳහා පිළිතුරු සෙවීමට යුරෝපා සංගමය ශ්‍රී ලංකාවට අවස්ථාව ලබා දී තිබුණි. තහනම පැනවීමට ප්‍රථම මාස 3ක කාලයක් ඉහත පියවර ගැනීම සඳහා ඉඩ ප්‍රස්ථා සලසා දී තිබුණද මේ සඳහා පසු ගිය රජයේ නිසි අවධානය යොමු වූයේ නැත. එබැවින් ඵලදායික පියවර ගනු ලැබේද නැත.

මා දන්නවා, එවකට ධීවර අමාත්‍යවරයාව සිටි ගරු රාජිත සේනාරත්න ඇමතිතුමා ඉමහත් සේවයක් ඉෂ්ට කරමින් මේ කටයුතු කරන්න උත්සාහ කළ බව. නමුත් ඊට පසුව ජනාධිපතිතුමා අගමැතිතුමාත් එක්ක කථා කරමින් මේ කටයුත්ත ඉක්මන් කරන්න වැඩ පිළිවෙළක් යොදා තිබෙන බව මා සතුටින් ප්‍රකාශ කරන්න කැමැතියි.

කෙසේ වුවද මෙය ඉතා බැරූරුම් කරුණකි. විශේෂයෙන් මෙම ගැටලුව සමඟ අපගේ ධීවර ප්‍රජාවන්, ධීවර අපනයනකරුවන් එකට බැඳී ඇත. වගකිව යුතු රජයක් වශයෙන් අප මෙම තහනම ඉවත් කර ගැනීම පිණිස කළ හැකි සෑම දෙයක්ම කරනු ඇත. එමෙන්ම යුරෝපීය රජය වෙත මාළු අපනයනය කිරීම යළි පටන් ගැනීමට අවශ්‍ය සියලු ප්‍රයත්න දරනු ඇත. එලෙස යළි ඇරඹූ පසු පසුගාමී ප්‍රදේශවල ස්වකීය කටයුතු යළිත් පුළුල් කිරීමට පෞද්ගලික අංශයට නව ඉඩප්‍රස්ථා බොහොමයක් නිර්මාණය වනු ඇත.

ශ්‍රම බල ශක්තියෙන් සියයට 78ක් පෞද්ගලික අංශයේ නිසා කරුණාකර, මෙය ආයෝජනයක් ලෙස සලකා කටයුතු කරන්න ඕනෑය කියන එක අප ආණ්ඩුවක් වශයෙන් මතක් කරනවා.

විශ්‍රාම වැටුප් සංශෝධනය

විශ්‍රාමික රාජ්‍ය සේවකයන් ලක් මාතාව පෝෂණය කිරීම පිණිස ඉමහත් දායකත්වයක් ලබා දුන් පිරිසක්. එබැවින් ඔවුන්ගේ විශ්‍රාම දිවිය යහපත්ව ගත කිරීමට උදව් කිරීම අවශ්‍ය කරුණක්.

එබැවින් ඔවුන්ගේ යහපැවැත්ම පිළිබඳව අප විශේෂ අවධානයක් යොමු කරමින් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් වැඩි කිරීමට යෝජනා කරනවා. ඒ අනුව ඔවුන්ගේ විශ්‍රාම වැටුපට 2015 අප්‍රේල් මාසයේ සිට රුපියල් 1,000ක් එකතු කිරීමට මා යෝජනා කරන අතර, එමඟින් මාසිකව ලැබෙන අතිරේක විශ්‍රාම වැටුප මසකට රුපියල් 3,500 දක්වා වැඩි වනු ඇත. 550,000ක් පමණ වන විශ්‍රාමිකයින්ට මෙම ප්‍රතිලාභය අත් වනවා. මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමට රුපියල් මිලියන 4,900ක් අතිරේක වශයෙන් වැය වනවා.

සමෘද්ධි සහන යෝජනා ක්‍රමය - සමෘද්ධි දීමනාව වැඩි කිරීම

සමෘද්ධි ප්‍රතිලාභීන් හඳුනා ගැනීමේ නිසි ක්‍රමවේදයක් මුල සිටම පැවතියේ නැහැ. සමාජයේ දිළිඳු කොටස් හඳුනා ගැනීම පිණිස පූර්ණ සමීක්ෂණයක් කිරීමට අපේක්ෂා කරනවා. ඒ අනුව අනාගතයේදී සමෘද්ධි දීමනා ලබා දීමට වඩා කාර්යක්ෂම ක්‍රමවේදයක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරනවා. එමඟින් සමෘද්ධි දීමනා ලබා දීම වෙනුවෙන් පරිපාලන කටයුතුවලට දැනට වැය කරන රුපියල් බිලියන 10ක මුදල අවම කර ගත හැකි අතර එමගින් වන ඉතිරි සමෘද්ධි වැඩසටහන සඳහා යොදා ගැනීමට හැකි වේ.

සමෘද්ධි දීමනා ලබා දීම වෙනුවෙන් පරිපාලන කටයුතුවලට දැනට රුපියල් බිලියන 10ක මුදලක් වැය කර තිබෙනවා. පරිපාලන වියදම රුපියල් බිලියන 10යි. ඒ කියන්නේ කෝටි 1,000ක් වියදම් කරනවා පරිපාලනයට. ඒ නිසා මේ කටයුතු මීට වඩා විධිමත් කරන්න ඕනෑය කියන එක මා කාරුණිකව මතක් කරනවා.

දින සියයේ විප්ලවයෙන් පොරොන්දු වූ පරිදි සමෘද්ධි දීමනාව 2015 අප්‍රේල් මස සිට සියයට 200කින් වැඩි කරනු ඇත. මෙම සමෘද්ධි දීමනාව 2014 දෙසැම්බර් මසදී දීමනා ලැබූ සමෘද්ධිලාභීන් හා වර්ගීකරණය අනුව සිදු කරලනු ඇත. මේ අනුව 2014 දී රුපියල් බිලියන 13.5 ක්වූ සමෘද්ධි දීමනා සඳහා මුදල් වෙන් කිරීම රුපියල් බිලියන 40.5 දක්වා 2015 දී වැඩි වනු ඇත.

ග්‍රාමීය ප්‍රදේශවල මූල්‍ය පහසුකම් ලබා ගැනීම නැංවීම පිණිස ප්‍රාදේශීය බැංකු සමඟ සමෘද්ධි දිවි නැගුම බැංකු ඒකාබද්ධ කිරීමට අපේක්ෂා කරමි.

ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතුවලට ගෙවන සහන පොලිය

අප රටේ දැනට ක්‍රියාත්මක අඩු පොලී අනුපාත නිසා ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට විශාල බලපෑමක් ඇති කර තිබෙනවා. එවැනි පුරවැසියන්ගෙන් සැලකිය යුතු කොටසක් ස්ථාවර තැන්පතුවලට ලැබෙන පොලී ආදායමින් ජීවත් වන බැව් අප දන්නවා. අප ඔවුන් කෙරේ විශේෂ සැලකිල්ලක් අවධානයක් දක්වනවා. එනිසා ඔවුන්ගේ තැන්පතුවලට ඉහළ පොලියක් ලබා දීමට අප කටයුතු කරන බැව් දින සියයේ වැඩසටහනේ සඳහන් කර තිබෙනවා.

රුපියල් මිලියනයක් හෝ අඩු මුදලක් වන වාණිජ බැංකුවල හෝ විශේෂිත බැංකුවල ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සතු තැන්පතු වෙනුවෙන් සියයට 15 ඉහළ පොලියක් ගෙවීමට කටයුතු කරනු බව සතුටින් දන්වා සිටිමි.

නිරෝගී මාතෘ වැඩසටහන: සෞඛ්‍ය ප්‍රමිතීන් පවත්වා ගැනීමට දායකත්වය

නිරෝගී මෙන්ම සෞඛ්‍ය සම්පන්න සමාජයක් යනු රටකට සම්පතකි. කෙසේ වෙතත් ධනවත් හා මැද පන්තියේ ආදායම් ලබන කණ්ඩායම්වල මව්වරුන්ට වඩා අඩු ආදායම්ලාභී කණ්ඩායම්වල මව්වරුන්ගේ පෝෂණ මට්ටම අඩු මට්ටමක පවතිනවා.

ඉලෙක්ට්‍රොනික් බැංකු කාඩ්පත් ක්‍රමය මඟින් ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළක් හරහා මෙම මව්වරුන්ට සහන ලබා දීමට කටයුතු කරනවා. මෙම දීමනාව වසර දෙකක් තුළ ගෙවීමට කටයුතු කරනවා. ගෙවීම සිදු කිරීමට වැඩිපුර කාලයක් අවශ්‍ය වී ඇත්තේ වැඩ පිළිවෙළ ස්ථාවර කිරීමට මෙන්ම අරමුණුවලට මනාව යෙදවීමේ අපේක්ෂාවෙන්. අලුත උපන් ළදරුවන් මෙන්ම මව්වරුන් අරමුණු කරගෙන මෙම ප්‍රතිලාභ ලැබෙන බවට සහතික වීම සඳහා ගරු ළමා කටයුතු රාජ්‍ය ඇමතිතුමියගේ සහාය අප බලාපොරොත්තු වෙනවා.

මෙම මව්වරුන්ට උපදින දරුවන් සෞඛ්‍ය සම්පන්න බැව් තහවුරු කර ගැනීම අරමුණු කරගෙන රුපියල් 20,000ක දීමනාවක් ගර්භිණී මාතාවන්ට අප පොරොන්දු වූ පරිදිම ලබා දීමට කටයුතු කරනවා. මෙය වහාම ක්‍රියාත්මක කරන්න කටයුතු කරන බවද මේ අවස්ථාවේදී මතක් කරනවා.

මෙලෙස ලබා දෙන රුපියල් 20,000ක මුදල වැරදි භාවිතාවන්ට යෙදවීම වළක්වාලීමට අවශ්‍ය වන උපදෙස් චක්‍රලේඛයක් මඟින් ලබාදෙනු ඇත.

ඒ කියන්නේ එකවරම රුපියල් 20,000 පාවිච්චි කර නාස්ති කර නොගන්නා ආකාරයේ වැඩ පිළිවෙළක් ළමා හා කාන්තා කාර්යාංශය තුළින් ඉදිරිපත් කරනවා.

ගොවි ණය සහන

අපගේ ආර්ථිකයේ උන්නතිය පිණිස ගොවි ජනතාවගේ වටිනා දායකත්වය කෘෂිකර්මය මත පදනම් වූ දේශයක් ලෙස අපට කිසි විටෙක අමතක කළ නොහැකිය. විවිධ මූලාශ්‍රවලින් ඔවුන් ණය ලබා ගන්නවා. ස්වකීය වටිනා භාණ්ඩ උකස් කර බැංකු මූලාශ්‍රවලින් ණය ලබා ගන්නවා. මෑත කාලීනව විවිධ ස්වාභාවික විපත් නිසා භෝග විනාශය සිදු වූ බැවිද, ඒ කරණකොටගෙන විවිධ දුෂ්කරතාවලට ඔවුන් මුහුණ දුන් බැව් අප දන්නවා. එබැවින් බොහෝ දෙනෙකුට ඔවුන්ගේ ණය ආපසු බැංකුවලට ගෙවීමට නොහැකි වූ බැව් අප දන්නවා.

ස්වකීය ණය බැංකුවලට ගෙවීමට අපහසු ගොවි ජනතාව කෙරෙහි අප සංවේදීව බැලිය යුතුයි. එබැවින් ඔවුන්ට "දින සියයේ විප්ලවය" යටතේ සහනයක් දීමට අප යෝජනා කරන්නෙමු. ඒ අනුව ගොවි ජනතාව විසින් වාණිජ බැංකුවලට ගෙවීමට ඇති උපරිම වශයෙන් රුපියල් ලක්ෂයක ණය ප්‍රාග්ධනය සඳහා සියයට 50ක කපා හැරීමක් යෝජනා කිරීමට මම කැමැත්තෙමි. මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා රජයට රුපියල් මිලියන 2,500ක් වැය වේ.

කෘෂි ආර්ථිකය ඉහළ නැංවීම පිණිස සහතික මිල යෝජනා ක්‍රම

ගොවි ජනතාව උනන්දු කරවීමේ තවත් වැදගත් පියවරක් ලෙස තෝරා ගනු ලැබූ භෝග වර්ග කිහිපයකට සහතික මිලක් ලබා දීම දැක්විය හැකියි. මෙය වගා කටයුතුවල නිරත වන ගොවි ජනතාවගේ ආදායම් අවිනිශ්චිතතා අඩු කරලීමට හේතු වනු ඇත. මේ අනුව පහත දැක්වෙන සහතික මිල යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරනු ඇත.

අ. 2015 මහ කන්නයේ සිට වී මිලදී ගැනීම සඳහා වූ සහතික මිල කිලෝවකට රුපියල් 50 දක්වා වැඩි කරනු ඇත. වීවල ප්‍රභේද, තෙතමනය සහ ගුණාත්මක තත්ත්වය අනුව වී වර්ගීකරණය කෙරේ. අවභාවිත සහ දූෂණ වැළැක්වීම පිණිස දැඩි ක්‍රියා පටිපාටි අනුගමනය කරනු ලැබේ. දූෂණ වැළැක්වීමද රජයේ ප්‍රධාන අරමුණකි.

ආ. අර්තාපල් මිලදී ගැනීම සඳහා වූ සහතික මිල කිලෝවකට රුපියල් 80 දක්වා වැඩි කරනු ඇත. මීළඟ අස්වනු කාලයේ සිට මෙය ක්‍රියාත්මක වේ.

ඇ. තේ දළු මිලදී ගැනීම සඳහා වූ සහතික මිල කිලෝවකට රුපියල් 80 දක්වා වැඩි කරනු ඇත.

ඈ. රබර් මිලදී ගැනීම සඳහා වූ සහතික මිල කිලෝවකට රුපියල් 350 දක්වා වැඩි කරනු ඇත.

කෙටි කාලයක් තුළදී සිදු කරනු ලබන කර්මාන්තයට අදාළ පූර්ණ ඇගැයීමකින් අනතුරුව තේ දළු හා රබර් සඳහා යෝජිත සහතික මිල ගණන් ක්‍රියාවට නංවනු ඇත.

ඉහත දක්වා ඇති යෝජිත සහතික මිල ගණන් හඳුන්වා දීම පිණිස වූ යෝග්‍ය ක්‍රමවේදයක ආරම්භය මෙම ක්‍රියාවලිය හරහා පහසු කරවනු ඇත.

සහනදායී මිලකට අත් ට්‍රැක්ටර් ලබා දීම

කෘෂි කාර්මික අංශය නඟා සිටුවීම සඳහා ගොවි ජනතාවට අඩු මිලකට අත් ට්‍රැක්ටර් ලබා දීමට අපගේ රජය සියලු උත්සාහ දරනු ලබයි. සාධාරණ මිලක් නියම කර ගැනීම සඳහා වර්තමානයේ පවතින බදු හා අනෙකුත් වියදම් සාධනයක් පිළිබඳ පූර්ණ ඇගයීමක් කිරීමට අදහස් කරනු ලැබේ. අඩු මුදලකට අත් ට්‍රැක්ටර් ලබා දී ඔවුන්ගේ කාර්යයන් කාර්යක්ෂම කරනවා පමණක් නොව කෘෂිකර්මය යාන්ත්‍රීකරණය කිරීමේ සංකල්පයද ප්‍රවර්ධනය කරනු ලබයි.

පොහොර සහනාධාරය දිගටම පවත්වා ගෙන යන බව සතුටින් දැනුම් දීමට කැමැතියි. කෙසේ වුවත්, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි පොහොරවල ගුණාත්මක තත්ත්වය වැඩිදියුණු කිරීමට කටයුතු කරමි. පැවැති රජය මෙන් නොව අපගේ රජය සමාජමය වශයෙන් දැඩි කැපවීමකින් යුතුව කටයුතු කරනවා. පසු ගිය රජයේ ක්‍රියා කලාපය වකුගඩු අර්බුදය ඇති කිරීමට දායක වී ඇත.

ගොවි ජනතාවට අවශ්‍ය වන ප්‍රශස්ත තාක්ෂණය මෙන්ම මූල්‍යමය කටයුතු සම්පාදනය කිරීම සඳහා ගොවි ප්‍රජාව මෙන්ම අදාළ සමුපකාර සමිති සමඟ සාකච්ඡා කරනු ඇත.

අපගේ ජනාධිපතිතුමා ගොවිජන පසු බිමකින් පැමිණ ඇති අතර මෙකී අලුත් පියවර සම්බන්ධයෙන් අතිශයින් සතුටට පත් වනු ඇත. ශ්‍රී ලංකාවේ ගොවි ජනතාවට මේ අනුව සැනසුම් සුසුමක් හෙළිය හැකි අතර ජාතික ආර්ථිකය නංවාලීම පිණිස පුළුල් දායකත්වයක් ලබා දීමට අවශ්‍ය පසුබිම ඉන් තහවුරු වනු ඇත.

සත්ව නිෂ්පාදන කර්මාන්තය දියුණු කිරීමට කිරි සඳහා සහතික මිල ක්‍රමයක්

නැවුම් කිරි ලීටරයකට දැනට ගෙවනු ලබන්නේ රුපියල් 60කි. එය රුපියල් 10කින් වැඩි කිරීමට මම යෝජනා කරමි. මෙමඟින් දේශීය කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමට පිටිවහලක් සැපයෙන අතර එය කිරි ගොවීන්ගේ ආදායම් තත්ත්වය වැඩි කිරීමට ඉවහල් වනු ඇත. මෙම යෝජනාව 2015 ජූනි 01 දින සිට ක්‍රියාත්මක කරනු ඇත.

යොවුන් පාර්ලිමේන්තුව බල ගැන්වීම

තරුණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා යොවුන් පාර්ලිමේන්තුවට මූල්‍ය බලතල ප්‍රදානය කරනු ඇත. මේ වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීමේ අරමුණින් 2015 වර්ෂය සඳහා රුපියල් මිලියන 250ක ප්‍රතිපාදන වෙන් කරනු ඇත. මෙම අරමුණු සඳහා අරමුදල් යොදවන කාල වකවානුව පිළිබඳ සම්බන්ධීකරණ කටයුතු තරුණ කටයුතු අමාත්‍යාංශය මඟින් සිදු කරනු ඇත.

ස්වකීය කැමැත්ත නොසලකා යළි පදිංචි කරන ලද කොළඹ නගර වැසියන් සඳහා සහන

පසු ගිය රජය විසින් අත්තනෝමතික ලෙස ක්‍රියාත්මක කරන ලද යළි පදිංචි කිරීමේ වැඩසටහන නිසා කොළඹ නගරය තුළ ජීවත් වූ බොහෝ පවුල්වලට සිදුවූ අගතිය අප විසින් පැහැදිලිව

[ගරු රවි කරුණානායක මහතා]

හඳුනාගෙන ඇත. යළි පදිංචි කරන ලද පවුලක් විසින් දරන ලද රුපියල් 100,000ක මූලික අත්තිකාරම අපගේ රජය විසින් දරනු ලබන අතර මාස 240ක කාලයක් සඳහා මසකට රුපියල් 250ක් දක්වා වූ කුලී මුදලෙන් කොටසක් රජය විසින් දරනු ඇත.

මෙම වැඩසටහන මඟින් පසු ගිය රජය විසින් කැමැත්ත නොවිමසා අලුතින් ඉදිකරන ලද මහල් නිවාසවල බලෙන් පදිංචි කරවන ලද පවුල්වලට විශාල සහනයක් සැලසෙන බව මම පෞද්ගලිකව විශ්වාස කරමි. යළි පදිංචි කිරීමේ ක්‍රියාවලිය නිසා අගතියට පත් නිර්ව්‍යාජ කුටුම්භ හිමියන්ට මෙමඟින් සැලකිය යුතු සහනයක් හිමි වන බව සඳහන් කිරීමට කැමැත්තෙමි.

විමධ්‍යගත අරමුදල්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව නියෝජනය කරනු ලබන නියෝජිතයන් හෙවත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට මෙම යෝජනාව සෘජුවම අදාළ වේ. දේශපාලනීකරණය වීම නිසා විමධ්‍යගත අරමුදල් දිගු කාලයක් නොවෙනස්ව පැවතුණි. එබැවින් මෙම අරමුදල් වැඩි කිරීමට යෝජනා කිරීමට ලැබීම ගැන මම සතුටු වෙමි.

ගරු කථානායකතුමනි, මෙම පාර්ලිමේන්තුව විශේෂිත වර්ගයේ එකක් වනු ඇත. ඒ මන්ද යත්, වාර්ගික හා ආගමික එකමුතුකමක් එහි පවත්නා අතර, පෙර නොවූ විරූ පරිදි දේශපාලන එකමුතුතාවක්ද පැහැදිලිව පෙනෙන්න තිබීමයි. අපගේ දින සියයේ වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් දක්වන ලද සහයෝගය මෙහිදී ඉතා අගය කොට සලකමි.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා සපයන විමධ්‍යගත අය වැය තුළින් ජනතාවට -විශේෂයෙන් දුෂ්කර ප්‍රදේශවල වෙසෙන ජනතාවට- විශාල සහනයක් සැලසී ඇත. මෙම වසරේ සිට එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට ලැබෙන විමධ්‍යගත අය වැය මුදල රුපියල් මිලියන 5 සිට රුපියල් මිලියන 10 (සියයට 100ක වැඩිවීමක්) දක්වා වැඩි කරන්න අපේ ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් මට නිර්දේශ කර තිබෙනවා. මේ සඳහා රුපියල් මිලියන 1,125ක අමතර පිරිවැයක් දැරීමට සිදු වුවද එමඟින් තම ප්‍රදේශයේ ජනතාවට වඩා හොඳ සේවාවක් සැපයීමේ හැකියාව මහජන නියෝජිතයින්ට ලැබෙනු ඇත.

මතක තබා ගන්න. මෙය ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ තියලා දණ ගහලා ගන්න ඕනෑ නැහැ. මේක දෙපැත්තටම එක හා සමානව වැඩ කරන්න ඕනෑය කියා ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් කියා තිබෙනවා කියන එක මා මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. ඒ කාලය ජනවාරි මාසයේ 08වන දා ඉඳලා අවසන්.

දැයට කිරුළ - සෘණාත්මක බලපෑම ධනාත්මක බලපෑමක් කරා

පසු ගිය රජයේ වැඩි අවධානයකට ලක් වූ ව්‍යාපෘතියක් වන දැයට කිරුළ තුළ බොහෝ දූෂණ හා වංචා සිදු වී ඇත. දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා 2014 වර්ෂයේ දී මුදල් අමාත්‍යාංශය විසින් වියදම් කිරීමට ඇස්තමේන්තු කර තිබූ මුදල රුපියල් මිලියන 14,000කි. එමෙන්ම අනිකුත් අමාත්‍යාංශද විශාල වියදමක් දරන ලදී. 2015 දී සියලුම අමාත්‍යාංශ මඟින් රුපියල් බිලියන 34ක් -රුපියල් කෝටි 3400ක්- පමණ මේ සඳහා වැය කිරීමට අපේක්ෂා කර තිබුණි.

දැයට කිරුළ සුළු පිරිසකට පමණක් ප්‍රතිලාභ අත් වූ සුදු අලියෙකු ලෙස හැඳින්විය හැකිය. ඒ සඳහා ජාතික ආර්ථිකයට සිදු වූ හානිය අතිවිශාලය. පොදු ජනතාවගේ ගැටලු සැලකිල්ලට නොගෙන සිදු කරන ලද විශාල ප්‍රමාණයේ වියදම් වළක්වා ගත හැකි වූයේ නම් පාරිභෝගික ජනතාවට කිරි හා අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය අඩු මිලකට සැපයීම තුළින් ඔවුන්ට ප්‍රතිලාභ අත්කර දිය හැකිව තිබුණි.

මෙම මුදල් නාස්තිකාරි වැඩසටහන මෙම වසරේදී නතර කර දැමීමට මම යෝජනා කරන අතර ඉදිරියටද එය එසේම වනු ඇත. කෙසේ වුවද, අදාළ ප්‍රදේශයේ සිදු කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතින් අඛණ්ඩව සිදු කර ගෙන යෑම සඳහා රුපියල් බිලියන 01ක මුදලක් වෙන් කර තිබෙන බව සතුටින් ප්‍රකාශ කරන්න කැමැතියි.

දේශපාලනික පවුල් ප්‍රවර්ධනය සඳහා වැය කරන ලද රජයේ මුදල් ජනතාවාදී හා මානවවාදී ව්‍යාපෘති සඳහා යෙදවීමේ හැකියාව දැන් පවතී. අය වැය සම්පාදන කාර්යයේ යෙදෙන රාජ්‍ය නිලධාරීන්ට මෙම ඉතිරි කිරීම් ධනාත්මක සාධකයක් වනු ඇත.

සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වියදම දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 3 දක්වා වැඩි කිරීම

සියලුම පුරවැසියන්ට නොමිලේ සෞඛ්‍ය සේවාවන් සැපයීම මඟින් නිදහසින් පසු බිහි වූ සියලුම රජයන් විසින් සෞඛ්‍ය සේවාව ඉහළ නැංවීමෙහි ලා සුවිශේෂ කාර්ය භාරයක් ඉටු කර ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස කලාපයේ අනෙකුත් රටවලට සාපේක්ෂව වඩා ඉහළ සෞඛ්‍ය දර්ශක කරා ළඟා වීමට ශ්‍රී ලංකාවට හැකි වී තිබේ.

කෙසේ වෙතත්, සෞඛ්‍ය අංශය තුළ පැවති මෙම වාසි සහගත තත්ත්වය ජනගහන සංක්‍රාන්තිය සහ බෝ නොවන රෝගවල ව්‍යාප්තිය නිසා අභියෝගයට ලක් වී ඇත. මෙම රෝග තත්ත්ව ඉහළ මරණ අනුපාතයන්ට හේතු වී ඇති අතර එබැවින් එකී තත්ත්වය පාලනය කර ගැනීම සඳහා දැඩි අවධානය යොමු විය යුතු වේ.

ප්‍රධාන සෞඛ්‍ය සේවා සැපයුම්කරු ලෙස රජයට මෙහි ලා විශේෂ කාර්යයක් සිදු කිරීමට තිබේ. මේ අනුව 2013 දී දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 1.4ක්ව පැවති සෞඛ්‍ය වියදම සියයට 3 දක්වා ක්‍රමානුකූලව ඉහළ නැංවීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ඇත.

සියලුම රෝහල්වල බාහිර රෝගි අංශය පැය 24 පුරා විවෘත කිරීම, වකුගඩු රෝගින් සඳහා ආධාර සැපයීම සහ ශල්‍යකර්ම අපේක්ෂාවෙන් පොරොත්තු ලේඛනයේ සිටින රෝගින් සංඛ්‍යාව පහත හෙළීම වැනි අරමුණු වෙනුවෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදේශකත්වය ඇතිව අරමුදල් වෙන් කරනු ඇත. වකුගඩු රෝගිනට ලබා දෙන විශේෂ දීමනාව සඳහා 2015 වර්ෂය සඳහා රුපියල් මිලියන 2,000ක් වෙන් කර තිබෙන බව සතුටින් ප්‍රකාශ කරන්න කැමැතියි.

සෞඛ්‍ය සේවාවලට අදාළව මහ ජනතාවට අවශ්‍ය කරනු ලබන තොරතුරු ලබා දීම සඳහා වන ක්‍රියා මාර්ග ගනු ලබන අතර වැඩි කරනු ලබන සම්පත් මඟින් ශ්‍රී ලංකාව නීරෝගී ජාතියකින් යුත් රටක් බවට පරිවර්තනය වීම නිසැකයෙන්ම සිදු වනු ඇත. එය සෞඛ්‍ය ඇමතිතුමාට සම්පූර්ණයෙන් භාර දී තිබෙනවා. එම නිසා වැඩි කල් යන්න ඉස්සෙල්ලා අපි මීට වඩා මුදල් වෙන් කරනවාය කියන එකත් මතක් කරන්න කැමැතියි.

අධ්‍යාපන වියදම් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6 දක්වා ඉහළ නැංවීම

ගරු කථානායකතුමනි, ඔබ දන්නා පරිදි අධ්‍යාපනය සඳහා කරනු ලබන වියදම ආර්ථික වර්ධනය හා සමාජ සංගතතාව කෙරෙහි තීරණාත්මක වේ. අධ්‍යාපනය සඳහා වූ ඉහළ වියදම්

තුළින් රටෙහි සියලු දරුවන්ට අධ්‍යාපනය සඳහා සම අවස්ථා සැපයෙන අතර එමඟින් මානව ප්‍රාග්ධන සංවර්ධනයෙහි මට්ටම ඉහළ යනු ඇත. එමඟින් අප රට ජාත්‍යන්තර තරගකාරිත්වයට සූදානම් කරනු ලැබේ.

වර්තමාන ගෝලීය සන්දර්භය තුළ අධ්‍යාපන අවශ්‍යතාවන් නිරතුරුව පරිණාමනය වේ. මෙම තත්ත්වය තුළ කලාපයේ අනෙකුත් රටවල් විසින් අධ්‍යාපනය වෙනුවෙන් සාපේක්ෂව ඉහළ ප්‍රතිශතයක් වෙන් කරනු ලැබේ. දියුණු රටවල් විසින් අධ්‍යාපනය සඳහා දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5.3ක් පමණ වෙන් කරනු ලැබුවද ආසියානු රටවල මෙම අනුපාතය සියයට 2.9ක සාමාන්‍ය අගයක් ගනී.

කෙසේ වුවද, අධ්‍යාපනය සඳහා ශ්‍රී ලංකාව වියදම් කරනුයේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2ක් පමණය. පෞද්ගලික අංශයේ අධ්‍යාපන වියදම් කිසියම් ප්‍රමාණයකට වැඩි වුවද, පවත්නා ලෝක ප්‍රවණතා හමුවේ රජය විසින් අධ්‍යාපනය සඳහා දරනු ලබන වියදම් ද ඉහළ නැංවීම අවශ්‍ය වේ.

ගරු කථානායකතුමනි, අධ්‍යාපනය සඳහා දිළිඳු පවුල්වල ප්‍රවේශය පුළුල් කිරීම හා වර්ධනයේ සම අවස්ථාවන් සහතික කරලීම සඳහා අධ්‍යාපන ක්ෂේත්‍රයේ කරනු ලබන වියදම් ඉහළ නැංවීමට අවශ්‍ය වේ. සෑම දෙනාටම යටිතල පහසුකම් සැපයීම තහවුරු කිරීම මඟින් දිළිඳු ජනතාවට වැඩි වාසි සැලසෙන අතර, එමඟින් ඔවුන්ගේ අධ්‍යාපන හා සෞඛ්‍ය මට්ටම වැඩි දියුණු වනු ඇත. ඒ අනුව අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් ස්වකීය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පෙන්වා දුන් පරිදි අධ්‍යාපනය සඳහා කරනු ලබන වියදම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6 දක්වා ක්‍රමානුකූලව වැඩි කිරීමට හැකි වන පරිදි අදාළ ක්‍රියා මාර්ග හඳුන්වා දෙනු ඇත. අපේ තරුණ අධ්‍යාපන ඇමති මේ අධ්‍යාපනය මීට වඩා ඉහළ ක්ෂේත්‍රයකට ගෙන යාවි කියා අපි මේ අවස්ථාවේ සම්පූර්ණයෙන් විශ්වාස කරනවා.

ජීවන වියදම අඩු කිරීම සඳහා යෝජනා

ගරු කථානායකතුමනි, මම දැන් අපගේ දින සියයේ විප්ලවයේ තවත් වැදගත් අංගයක් කෙරෙහි අවධානය යොමු කරමි. එනම් පසු ගිය රජය කාලයේ පැවැති දැරිය නොහැකි ජීවන වියදම් බරින් අපේ ජනතාව මුදා ගනු පිණිස සහන සැපයීමයි.

ජීවන වියදම් ප්‍රශ්නය නොසලකා හැරීම නිසා බොහෝ පීඩාකාරී තත්ත්වයක් ඇති වූ අතර, මෙම රජය බලයට පත්වී දින 20ක් තුළ සහන සැපයීම තුළින් මෛත්‍රී පාලනයේ පවත්නා යහපත් බව ප්‍රදර්ශනය වේ. ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීවරුනි, ඉදිරි කාලයේදී අප රජය විසින් තවදුරටත් මහ ජනතාවට සහන ලබා දීම සඳහා ක්‍රියා කරනු ඇත.

ඉන්ධන මිල අඩු කිරීම

රජය විසින් මේ වන විටත් දින සියයේ විප්ලවයට අයත් ප්‍රධාන යෝජනාවක් වන ඉන්ධන මිල අඩු කිරීම සැලකිය යුතු ප්‍රමාණයකින් සිදු කර තිබේ.

මේ වන විට ඩීසල් ලීටරයක මිල රුපියල් 95 දක්වා සියයට 14.4කින් අඩු කර ඇත. පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 117ක් වන පරිදි සියයට 22කින් අඩු කර ඇත. එමෙන්ම, භූමි තෙල් ලීටරයක මිල රුපියල් 65 දක්වා සියයට 20කින් පහත හෙළා ඇත. වැවිලි අංශයේ ප්‍රජාව, ධීවර අංශයේ ප්‍රජාව, එළවලු ගොවීන්, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ආදි අංශයන්ට තවදුරටත් සහාය දීමක් වශයෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි භූමි තෙල් ලීටරයක මිල තවත් රුපියල් 6කින් අද සිට අඩු කරනවාය කියන එක මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. එමඟින් භූමි තෙල් ලීටරයක මිල රුපියල් 59 දක්වා අඩු වනු ඇත. මේවා ප්‍රශංසනීය පියවර ලෙස ඔබට නොසිතෙන්නේද? රුපියල් 100ට තිබුණු එක තමයි ඉතාම සුළු කාලයක් තුළ මේ අඩු කර තිබෙන්නේ.

පසු ගිය රජය විසින් 2014 වර්ෂයේ සැප්තැම්බර් හා දෙසැම්බර් යන මාසවල පෙට්‍රල්, ඩීසල් හා භූමි තෙල්වල දේශීය මිල ගණන් අඩු කරනු ලැබුවත් එමඟින් ලෝක වෙළෙඳ පොළේ සිදු වූ මිල පහත බැසීම් මනාව පිළිබිඹු වූයේ නැත.

අප රජය ලෝක වෙළෙඳ පොළේ සිදු වන ඛනිජ තෙල් මිල පහත බැසීමේ වාසිය අප ජනතාවට අත් වන පරිදි අදාළ මිල සංශෝධන සිදු කිරීමට බැඳී සිටියි. ලෝක වෙළෙඳ පොළේ ඛනිජ තෙල් මිල ගණන් අඩු වීමේ සම්පූර්ණ වාසිය මෙරට ජනතාවට ලබා දීමටත්, ඒ මත අය කරන ලද බදු අඩු කිරීමටත් රජය විසින් පියවර ගනු ලැබුවේ එබැවිනි. මෙම පියවර නිසා රජයට බදු ලෙස අය කළ හැකිව තිබූ රුපියල් බිලියන 85ක මුදලක් හෙවත් රුපියල් කෝටි 8,500ක මුදලක් අහිමි වී තිබේ.

ඛනිජ තෙල් මිල පහළ යෑම නිසා සිදු වූ වාසිය පසු ගිය රජය විසින් මහ ජනතාවට ලබා නොදුන් අතර දුක් විඳින ජනතාවගේ මුදල් කොල්ල කෑමේ පිළිවෙතක් අනුගමනය කර තිබේ.

ඉදිරියේදී රජය විසින් ඛනිජ තෙල් මෙන්ම විදුලිය ගාස්තු සඳහා ද ජාත්‍යන්තර මිල පදනම් කරගෙන මිල සූත්‍රයක් අනුගමනය කිරීමට සැලසුම් කර තිබේ. ජාත්‍යන්තර වශයෙන් මිල ගණන්වල සිදු වන උච්චාවචනය නිසා ඇති වන අතිරේක මූල්‍ය බරෙහි ප්‍රතිවිපාකවලට හසු නොවී මහා භාණ්ඩාගාරය, ලංකා ඛනිජ තෙල් සංස්ථාව හා ලංකා විදුලිබල මණ්ඩලය වැනි ආයතනවලට නම්‍යශීලී අයුරින් දේශීය මිල ගණන් තීරණය කිරීමට මෙමඟින් හැකි වනු ඇත.

තවද, විකල්පමය බලශක්ති මූලාශ්‍ර ප්‍රවර්ධනය කිරීම හා රජයේ වියදම් අඩු කරලීම පිණිස වූ ක්‍රියා මාර්ගයක් ලෙස රජයේ ආයතනවල පෞද්ගලික අංශයේ සහභාගිත්වය ඇතිව අඩු පිරිවැයකින් විදුලි බලය ජනනය කිරීමට හැකි සූර්යබලශක්ති ඒකක පිහිටුවීමට මම යෝජනා කරමි. මෙහිදී අවුරුදු හතක කාලයකින් ප්‍රාග්ධන මුදල අයකර ගත හැකි මට්ටමේ විශාල ලෙස විදුලි භාවිතයක් ඇති ආයතන සඳහා මේ ක්‍රමය හඳුන්වා දෙනු ලැබේ. ඒ සඳහා අපේ විදුලිබල හා බලශක්ති ඇමති ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා ඉතා වෙහෙස මහන්සියෙන් කටයුතු කරලා නව අදහස් ඉදිරිපත් කරලා තිබෙන එක අපට සතුටක්. ඒ වාසිය ජනතාවට පුළුවන් තරම් ලැබේවා කියලා අපි ප්‍රාර්ථනා කරනවා.

බස් ගාස්තු සහ පාසල් වෑන් රථවල කුලී ගාස්තු අඩු කිරීම

දැනට සාකච්ඡා කර ඇති පරිදි අවම වශයෙන් සියයට 10කින් බස් ගාස්තු අඩු වනු ඇත. එමෙන්ම පාසල් වෑන් රථවල ගාස්තු සියයට 5කින්වත් අඩු විය යුතුයි. මෙමඟින් ජනතාවට අතිරේක සහනයක් ලැබෙනු ඇත.

අත්‍යවශ්‍ය භාණ්ඩවල බදු අඩු කිරීම

ගරු කථානායකතුමනි, දින සියයේ වැඩසටහන යටතේ අත්‍යවශ්‍ය භාණ්ඩ 10ක මිල අඩු කරලීමට හැකි වන පරිදි ඒවා මත පනවා ඇති අධික බදු අඩු කරන බවට ජනාධිපතිවරණ සමයේදී අප පොරොන්දු වූ බව ඔබට සිහිපත් කරනු කැමැත්තෙමි.

එසේ වුවද, භාණ්ඩ වර්ග 13ක් සඳහා මිල අඩු කරනු ලබන බව සතුටින් දැනුම් දීමට කැමැත්තෙමි. අද මධ්‍යම රාත්‍රියේ සිට පහත දැක්වෙන අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල ගණන් අඩු කරන බව අපි සතුටින් දැනුම් දෙමු.

1. සීනි

අපගේ දෛනික ජීවිතයේදී සීනි යනු ඉතා වැදගත් පාරිභෝගික ද්‍රව්‍යයකි. දැනට සීනි කිලෝවක් මත පනවා ඇති රුපියල් 28ක විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද රුපියල් 10කින් අඩු කරන අතර, එමඟින් රජයට අහිමි වන ආදායම රුපියල් මිලියන 5,243ක් පමණ වේ. මේ අනුව කිලෝ ග්‍රෑමයක සිල්ලර මිල රුපියල් 85ක් දක්වා අඩු විය යුතුය. ඒ අනුව සීනි කිලෝ ග්‍රෑමයක මිල රුපියල් 10කින් වහාම අඩු කරන බව අප මේ අවස්ථාවේදී මතක් කරනවා.

පසු ගිය රජය යටතේ සීනි පිළිබඳ අමාත්‍යාවරයෙකු සිටියද එම අමාත්‍යාංශය මඟින් දිළිඳු ජනතාවට සහන සැලසීම සඳහා පියවර ගනු ලැබුවේ නැත.

2. කිරි පිටි

කිරි පිටි ග්‍රෑම් 400ක පැකට්ටුවක උපරිම සිල්ලර මිල රුපියල් 325 දක්වා අඩු කිරීමට තීන්දු කර ඇත. ඒ අනුව ග්‍රෑම් 400 කිරි පැකට්ටුවක මිල රුපියල් 61කින් අඩු කිරීමක් වහාම සිදු කර තිබෙනවාය කියන එකත් මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

මෙම අවස්ථාවේ කිරි පිටි මිල අඩු කිරීම සඳහා එකඟත්වය පළ කරන ලද කිරි පිටි ආනයනකරුවන්ට මාගේ ස්තුතිය පළ කිරීමට කැමැත්තෙමි. මෛත්‍රී පාලනය යටතේ කිරි පිටි ආනයනයෙන් දේශීය කිරි වෙත තම යෙදවුම් විතැන් කිරීමටත්, අප විසින් ආනයනකරුවන්ගෙන් අපේක්ෂා කරමු. එවැනි ධනාත්මක විතැන්වීම් සඳහා රජය විසින් අනුග්‍රහ දක්වනු ඇත. This is an import substitution process.

ඒ අය සමඟ කථා කළ අවස්ථාවේදී අපේ ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් කෙරෙහි විශ්වාසය ඇති වුණා. ඒ නිසා ඔවුන් කිව්වා, මින් පසුව කිරි පිටි ආනයනය කරනවාට වඩා මාස තුන, හතරකින් import substitution වශයෙන් එහේ තිබෙන කර්මාන්ත මෙහාට ගේන්න තීන්දු කරලා තිබෙනවාය කියන එක. ඒ තුළින් මේ රටේ රැකී රක්ෂා ඇති කරනවා වාගේම, මේ රටේ ජනතාවට විශේෂ ආරක්ෂක තත්ත්වයක්, protective measure එකක් ඇති වනවා කියන එකත් මතක් කරන්න කැමැතියි.

3. සස්ටජන්

සස්ටජන් කිරි පිටි අසාධ්‍ය රෝගීන් සඳහා නිර්දේශිත ශක්තිජනක පානයකි. මෙම කිරි පිටිවල මිල ගණන් දිළිඳු රෝගීනට දැරිය නොහැකි මට්ටමක පවතී. එබැවින් මෙම කිරි පිටි සඳහා පනවා ඇති තීරු බද්ද වන සියයට 15 කපා හරිනු ඇත. ඒ අනුව මෙම කිරි පිටි ග්‍රෑම් 400ක ප්‍රමාණයේ මිල රුපියල් 100කින් පමණ අඩු වන අතර, එය ජනතාවට මහත් සහනයක් වනු ඇත.

දේශීය කිරි කර්මාන්තය උනන්දු කරවීම පිණිස මෙම අවස්ථාවේදී අප කිරි පිටි ආනයනය මත පනවන බදු වෙනස් කිරීමකට ලක් නොකරන අතර, පවත්නා බදු දේශීය කිරි නිෂ්පාදකයන් සඳහා වූ දිරිගැන්වීමක් සේ සලකමු. දියර කිරි ලීටරයකට ගෙවනු ලබන මිල රුපියල් 70 දක්වා වන පරිදි රුපියල් 10කින් වැඩි කිරීම තුළින් දේශීය කිරි නිෂ්පාදනය ප්‍රවර්ධනය වනවාය කියන එක අපි මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

සමුපකාර මට්ටමින් කථා කරලා ඒ සඳහා අවශ්‍ය විධිවිධාන පසුව ඇති කරනවාය කියන එක මේ අවස්ථාවේදී අපි මතක් කරන්න කැමැතියි.

4. තිරිඟු පිටි

තිරිඟු පිටි මිල අඩු වීමට ඉවහල් වන පරිදි තිරිඟු මත පනවා ඇති ආනයන බද්ද කිලෝ ග්‍රෑමයකට රුපියල් 10ක් වන පරිදි අඩු කරනු ඇත. මේ අනුව තිරිඟු පිටි කිලෝ ග්‍රෑමයක මිල රුපියල් 12.50කින් පමණ අඩු වනු ඇත.

මෙය වහාම ක්‍රියාත්මක වන පරිදි සිදු කරන බව මේ අවස්ථාවේදී මම මතක් කරනවා.

5. පාන්

තිරිඟු පිටි මිල අඩුවීමත් සමඟ පාන් ගෙඩියක මිල ද ඊට සමගාමී අයුරින් අඩු වනු ඇත. මෙලෙස තිරිඟු පිටි හා පාන් මිල අඩු වීම පිළිබඳව වතු ශ්‍රමිකයන් සතුටු වන බව මම විශ්වාස කරමි. ඒ මන්ද යත්, මෙම ආහාර ද්‍රව්‍ය ඔවුන්ගේ ජීවන රටාව සමඟ සමීප අයුරින් සම්බන්ධව තිබීමයි.

පාන් ගෙඩියක මිල රුපියල් හයකින් අඩු වෙනවාය කියන එක තමයි අපේ බේකරිහිමියන්ගේ Association එක විසින් අප දැනුවත් කර තිබෙන්නේ.

6. මුං ඇට

දැනට මුං ඇට කිලෝ එකක් මත පනවා ඇති විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද රුපියල් 40ක් වන අතර එය රුපියල් 10ක් වන පරිදි රුපියල් 30කින් අඩු කරනු ඇත. මෙම බදු සහනය සහ තෙල් මිල ගණන් අඩු කිරීම හේතුකොටගෙන මුං ඇට කිලෝවක මිල රුපියල් 40කින් පමණ අඩු වේ යැයි මම විශ්වාස කරමි.

7. හාල්මැස්සන්

දැනට හාල්මැස්සන් මත පනවා ඇති විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද කිලෝවක් සඳහා රුපියල් 26ක් වන අතර, එය රුපියල් 11 ක් වන පරිදි රුපියල් 15කින් අඩු වනු ඇත. මේ තුළින් රජයට අහිමි වන ආදායම රුපියල් මිලියන 657 ක් පමණ වේ. සාමාන්‍යයෙන් පාරිභෝගික ජනතාව විවිධ හේතු මත ලොකු මාළු කෙරෙහි යොමු වන තත්ත්වයක් තුළ හාල්මැස්සන්ගේ මිල අඩුවීම සමාජයේ අඩු ආදායම්ලාභි ස්ථරය තුළ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීමට හේතු වනු ඇත.

8. ටින් මාළු

ටින් මාළු, බදු අඩු කළ යුතු තවත් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යයක් ලෙස හැඳින්විය හැකිය. ඒ අනුව පාරිභෝගික ජනතාවට සෙත සැලසෙන පරිදි ටින් මාළු කිලෝවක් මත අය කරන ලද විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද රුපියල් 102 සිට රුපියල් 50 දක්වා වන පරිදි රුපියල් 52කින් අඩු කෙරේ. මේ නිසා සිදුවන ආදායම් අහිමි වීම රුපියල් මිලියන 1,057ක් පමණ වේ. මෙම බදු සහනය හා තෙල් මිල සහන වැඩිවීම හේතුවෙන් ටින් මාළු මිල අඩු තරමින් රුපියල් 60කින් වත් අඩු විය යුතුයැයි අප බලාපොරොත්තු වෙනවා.

මෙම සන්දර්භය තුළ නිර්ව්‍යාජ එකතු කළ වටිනාකමක් සහිත ටින් මාළු දේශීය වශයෙන් නිපදවීමට ව්‍යවසායකයන් ඉදිරිපත් වන්නේ නම් ඒ සඳහා අනුග්‍රහය දැක්වීමට රජය කැමැත්තෙන් සිටී. මෙය අපගේ මත්ස්‍ය සම්පත ආර්ථික වශයෙන් ඵලදායි ලෙස උපයෝජනය කිරීම සඳහා ඉවහල්වීම එයට හේතුව වේ. ටින් මාළු කර්මාන්තයේ යෙදී සිටින බොහෝ ව්‍යාපාරිකයන් බදු සහන ඉල්ලා ඇත. ඔවුන් විධිමත් යෝජනා ඉදිරිපත් කළහොත් අවශ්‍ය අමතර සහන ලබා දීම සඳහා රජය සූදානම්. පිට පළාත්වල වෙසෙන අඩු ආදායම්ලාභි පවුල් විසින් ටින් මාළු බහුල වශයෙන් පරිභෝජනය කරනු ලබයි. එබැවින් මෙම මිල අඩුවීම මාළු වැඩි වශයෙන් අනුභව කිරීම තුළින් ඔවුන්ගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීමට උපකාරී වනු ඇත.

9. කොත්තමල්ලි

කොත්තමල්ලි මත අය කෙරෙන විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද කිලෝවකට රුපියල් 46ක් වන අතර, එය රුපියල් 26 වන පරිදි රුපියල් 20කින් අඩු කරනු ලැබේ. කුඩු කරන ලද හා පිටි කරන ලද කොත්තමල්ලි මත අය කෙරෙන බද්ද කිලෝ ග්‍රෑමයකට රුපියල් 202 සිට රුපියල් 52 දක්වා රුපියල් 150කින් අඩු කර ඇත. මේ නිසා සිදු වන ආදායම් අහිමි වීම රුපියල් මිලියන 635කි.

කොත්තමල්ලි යනු ළමා කාලයේදී බොහෝ රෝගී තත්ත්ව සඳහා දේශීය වශයෙන් ලබා දෙන ඖෂධයකි. පසු ගිය රජය විසින් මේ සඳහා පවා සහනයක් ලබා නොදීම අභාග්‍ය සම්පන්න තත්ත්වයකි.

10. උඳු

උඳු අප ජනතාව තුළ, විශේෂයෙන් ද්‍රවිඩ ජනයා අතර ඉතා වැදගත් සේ සැලකෙන පාරිභෝගික ද්‍රව්‍යයකි. ද්‍රවිඩ ජනතාව තම ආහාර පිළියෙල කිරීමේදී උඳු බහුලව භාවිතයට ගනු ලබයි. දැනට උඳු කිලෝවක් මත අය කෙරෙන විශේෂ භාණ්ඩ බද්ද රුපියල් 110 ක් වන අතර එය රුපියල් 60ක් වන පරිදි රුපියල් 50කින් අඩු කරනු ලැබේ.

තවද, පිටි කරන ලද උඳු කිලෝවකට අය කරන ලද විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද රුපියල් 300 සිට රුපියල් 200 දක්වා රුපියල් 100කින් අඩු කෙරේ. මා වෙළෙඳුන්ගෙන් ඉල්ලා සිටිනුයේ මෙම අඩු කිරීම්වල පූර්විද ප්‍රතිලාභය පාරිභෝගිකයින් වෙත ලබා දෙන ලෙසයි.

11. උම්බලකඩ

දැනට උම්බලකඩ මත අය කෙරෙන විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද කිලෝවකට රුපියල් 302කි. මෙය රුපියල් 102 දක්වා රුපියල් 200කින් අඩු කරනු ඇත.

බදු අඩුකරලීම සම්බන්ධයෙන් බැලීමේදී අසංවේදී මිල ගණන් පවතින ද්‍රව්‍යයක් බවට මෙය නිරීක්ෂණය කර ඇත. කෙසේ වුවද, උම්බලකඩ වෙළෙඳාම් කටයුතුවල නියැලී සිටින අයගෙන් මා තරයේ ඉල්ලා සිටින්නේ මෙම බදු අඩු කිරීමේ ප්‍රතිලාභ මුළුමනින්ම මහජනතාවට ලබා දෙන ලෙසයි.

දිගු කලක් තිස්සේම ශ්‍රී ලංකාවේ ආහාර පිසීමේ ක්‍රියාවලිය තුළ ගෘහිණියන් විසින් මූලික ද්‍රව්‍යයක් ලෙස උම්බලකඩ භාවිත කරනවා. මෙම තත්ත්වය තුළ උම්බලකඩ මිල අඩු කිරීම පිළිබඳව ශ්‍රී ලාංකික බහුතරය ඉතා සතුටුවන බව මාගේ විශ්වාසයයි.

12. කහ

දැනට කුඩු නොකරන ලද කහ කිලෝවකට අය කරනු ලබන විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද රුපියල් 202කි. මෙය රුපියල් 102 වන පරිදි රුපියල් 100කින් අඩු කෙරේ. මේ නිසා මුදල් අමාත්‍යාංශයට සිදු වන ආදායම් අහිමි වීම රුපියල් මිලියන 426කි.

කුඩු කරන ලද කහවලින් කිලෝවකට අය කෙරෙන බද්ද රුපියල් 360 ක් වන පරිදි රුපියල් 150කින් අඩු කෙරේ. මේවා දැනට ආනයනය නොකරන බැවින් මෙයින් ආදායමට බලපෑමක් සිදු නොවේ.

13. මිරිස්

වර්තමානයේදී කුඩු කරන ලද මිරිස් කිලෝවක සඳහා අය කෙරෙන විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද රුපියල් 150කි. මෙය රුපියල් 125 ක් වන පරිදි රුපියල් 25කින් අඩු කෙරේ. කෙසේ වුවද දේශීය නිෂ්පාදනය සඳහා අනුබල දීමක් වශයෙන් කුඩු නොකරන ලද මිරිස් මත අය කරනු ලබන රුපියල් 25ක බද්ද වෙනස් නොවනු ඇත. මේ සම්බන්ධයෙන් සිදු වන ආදායම් අහිමිවීම වර්ෂයකට සුළු ප්‍රමාණයක් වේ.

මෙම මිල අඩු වීම නිසා මිරිස් ගොවියාට අහිතකර බලපෑමක් සිදු නොවන බව සහතික කොට ඇත.

ඉහත දක්වන ලද යෝජනා නිසා 2015 වර්ෂයේදී රජයේ ආදායම සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු වනු ඇත. මෙම බදු අඩු කිරීම්වලින් ලැබෙන සහන පූර්ණ වශයෙන් මහ ජනතාවට ලැබීම තහවුරු කිරීමට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය කටයුතු කළ යුතු බව මතක් කරමි. මෑතකදී ස්ථාපනය කරන ලද ජීවන වියදම් කමිටුව මඟින් මෙම සහනයන් පාරිභෝගිකයන්ට ලැබීම තහවුරු කිරීම පිණිස සති පතා අධීක්ෂණය කරනු ඇත.

ගරු කථානායකතුමනි, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුනි, අප පොරොන්දු වූවාටත් වඩා වැඩියෙන් සහන ලබා දී ඇත. අප පොරොන්දු වූයේ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය වර්ග 10ක මිල අඩු කිරීමට වුවද, ද්‍රව්‍ය 13ක මිල අඩු කිරීම් සිදු කර ඇත.

අපේ මව් බිමේ ජනතාව විසින් පසු ගිය කාල පරිච්ඡේදයේදී ඉවසීමෙන් දරා ගෙන සිටි දුක් කරදර සඳහා මෙම සහනවලින් විශාල ප්‍රමාණයේ වන්දියක් ලැබෙන බව මම විශ්වාස කරමි.

ස්වර්ණාභරණ උකස් කරන ලද ජනතාවට විශේෂ වූ සහන

ශ්‍රී ලාංකිකයන්ට පීඩා දරා සිටීමේ හැකියාව පවතින අතර, මෙම පීඩා දැරීමේ ප්‍රධාන කුලුන ලෙස පවුලක මව සැලකිය හැකිය. ඇය කිසිදු පැමිණිල්ලක් නොමැතිව සියලු බර දරා සිටින්නීය. ආර්ථික ප්‍රශ්න තිබෙන අවස්ථාවල බැංකුවලට ගිහිල්ලා උකස් කරනු ලබන්නේ තමන් ළඟ තිබෙන රත්රන් ටිකයි. ඉහළ යන ජීවන වියදම හමුවේ ජනතාවට මුහුණ දීමට සිදු වී ඇති ආර්ථික අපහසුකම් පිළිබඳව අප රජය විසින් මැනෙවින් වටහා ගෙන ඇත.

පසු ගිය දශකය තුළදී ජීවන වියදම ඉහළ යෑම නිසා දැඩි සේ පීඩාවට පත් කාන්තාවන්ට සැලසෙන විශේෂ සහනයක් ලෙස රජයේ බැංකුවලට උකස් කරන ලද රුපියල් ලක්ෂ දෙක නොඉක්මවන වටිනාකමින් යුත් උකස් කළ ස්වර්ණාභරණ මත අය කරන පොලිය කපා හරිනු ඇත.

ජන වාර්ගික අර්බුදය පැවැති කාලයේ අත් පත් කර ගන්නා ලද ස්වර්ණාභරණ ජනාධිපතිවරණ කාලය තුළදී ආපසු ලබා ගන්නා අහිංසක පවුල් දුටුවෙමු. ජනරාල් ෆොන්සේකා සහ අපගේ නිර්භීත යුද හමුදාව විසින් රජයට ලබා දුන් කන්ටේනර් හතරක රත්රන් තොග පිළිබඳව අපි අසා ඇත්තෙමු. ඒවායේ ඉතිරි රත්රන් තොගයට කුමක් වූයේද යන්න අප ප්‍රශ්න කරන්නෙමු. වර්තමානයේ කන්ටේනර් භාගයක තරම් ඉතිරි වී තිබෙන රත්රන් පිළිබඳව සාක්ෂි පවතී.

අනෙක් ඒවා කොහේද කියන එක වැඩි කල් යන්න ඉස්සර වෙලා අපි හෙළිදරවු කරන්නෙමු.

එල්. පී. ගෑස් මිල අඩු කිරීම

අද මධ්‍යම රාත්‍රියේ සිට කිලෝග්‍රෑම් 12.5ක ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 1,596ක් වන පරිදි රුපියල් 300කින් අඩු කිරීමට මම යෝජනා කරනවා.

[ගරු රවි කරුණානායක මහතා]

ජාත්‍යන්තර වෙළෙඳ පොළේ ගෑස් මිල ශීඝ්‍රයෙන් අඩු වීමේ වාසිය ශ්‍රී ලංකාවේ ජනතාවට ලබා නොදීම පිළිබඳව අපි මවිතයට පත් වෙමු. නුදුරු අනාගතයේදී හෙළිදරව් විය හැකි මහා පරිමාණයේ දූෂණ පිළිබඳව වූ එක් කතන්දරයක් බවට මෙය ද පත් විය හැකිය.

ආදායම් යෝජනා

ගරු කථානායකතුමනි, ඔබ දන්නා පරිදි මෙම අය වැයේ වියදම් හා ආදායම්වලට අදාළ වෙනස්කම් මඟින් ජනතාවගේ ජීවන බර අඩු කරලීම සඳහා විශේෂිත ක්‍රියා මාර්ගයක් අප විසින් යෝජනා කර ඇත. කෙසේ වුවද රජයේ අය වැයට සිදු වන බලපෑම අවම වන පරිදි මෙම යෝජනා ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.

මේ සඳහා ඇති වඩා සුදුසු ක්‍රමය වනුයේ රජයේ ආදායම වැඩි කිරීම තුළින් අතිරේක අරමුදල් සොයා ගැනීමයි. එසේ කිරීමේදී අපගේ ප්‍රතිපත්තියට අනුගත වන පරිදි වෙනස් මාවතක් තෝරා ගෙන ඇත.

පසු ගිය රජයෙන් ලද අනුග්‍රහයන් යටතේ මෑත අතීතය තුළ විශාල ප්‍රමාණයෙන් ධනය රැස් කරන ලද ඉහළ ආදායම් උපයන පුද්ගලයින් හා සමාගම් මත බදු පැනවීම සිදු කරනු ඇත. එමෙන්ම විවිධ දුෂ්කරතාවන්ට මුහුණ දී සිටින අහිංසක පුද්ගලයින් මත අත්‍යවශ්‍ය බදු බර පැනවීමද සිදු නොකරනු ඇත.

යෝජිත ක්‍රියාමාර්ග යහ පාලනය තුළ ජනතාවට මිත්‍රශීලී වන අතර ජනතාවට අනවශ්‍ය බදු බරක් නොවනු ඇත. අය වැය පරතරය සැලකිය යුතු මට්ටමකින් අඩු කිරීම ඔස්සේ ණය ගැනීම අඩු කර ගැනීමට හැකි වී ඇත. මෙම විශාල ණය ගැනීම් පෙර පැවැති රජයෙන් උරුම වූවකි. අපගේ අරමුණ, අනාගත පරම්පරාව අනවශ්‍ය ණය බරකට හිර කර නොතැබීමයි.

මෛත්‍රී පාලනය තුළ වෛරය හා ඊර්ෂ්‍යාව නොමැති අතර, යහ පාලනයේ යහපත් ප්‍රතිඵල සෑම විටකම සමාජයේ සියලු අංශ හරහා ගමන් කරනු ඇත. එමෙන්ම එහි ආශීර්වාදය විශේෂයකින් තොරව සැමට ලැබෙනු ඇත.

දින සියයේ විප්ලවය තුළ පහත සඳහන් යෝජනා අප විසින් ඉදිරිපත් කරනු ඇත.

බදු ආදායම් යෝජනා මන්දිර බදු (Mansion Tax)

වසර ගණනාවක් මුළුල්ලේ නිවාස හා දේපළ විකිණීමට අදාළව ප්‍රාග්ධන වාසි සඳහා බදු අය කිරීම සිදු කර නොමැත. දැනට පවත්නා තත්ත්වය තුළ ශ්‍රී ලංකාවේ අති සුඛෝපභෝගී නිවාස හිමියන්ගෙන් රජයට ආදායම් ලබා ගැනීමේ ක්‍රමවේදයක් යළි හඳුන්වා දීම අත්‍යවශ්‍ය වේ.

රුපියල් මිලියන 100 හෝ ඊට වැඩියෙන් තක්සේරුවකට ලක් කර ඇති සියලුම නිවාස සහ අධිසුඛෝපභෝගී තට්ටු නිවාසවලින් හෝ වර්ග අඩි 5,000ට වැඩි එවැනි නිවාසවලින් (මෙම නිර්ණායක දෙකින් ඉහළ අගය සලකා බලනු ඇත.) වර්ෂයකට රුපියල් මිලියනයක නව බද්දක් "මන්දිර බද්ද" නමින් අය කරනු ඇත. මෙම බද්ද 2015 වර්ෂයේ සිට වාර්ෂික පදනමකින් පළාත් පාලන ආයතන හරහා එකතු කරනු ඇත. මෙය පළාත් පාලන ආයතනවලින් අය කරනු ලබන වරිපනම් හා බදුවලට අමතරව අය කරනු ලැබේ. මෙමගින් රුපියල් මිලියන 1,000ක පමණ ආදායමක් ලබා ගත හැකි බව මම මේ අවස්ථාවේ මතක් කරනවා.

විගමන බදු (Migration Tax)

විදේශ රටවලට සංක්‍රමණය වන ශ්‍රී ලාංකිකයන් විසින් මෙරට දී ඔවුන් උපයන ලද ධනය වටිනා විදේශ විනිමය බවට පරිවර්තනය කරනු ලබයි. ශ්‍රී ලංකාවෙන් බැහැර වීම වෙනුවට තම උපරිම හැකියාවෙන් රටට සේවය කරන ලෙස අප රජය ඔවුන්ට ඇරයුම් කරනවා. මෙවැනි රටින් පිටතට ගෙන යන විදේශ විනිමයෙන් සියයට 20ක බද්දක් අය කිරීමට මම යෝජනා කරමි. මෙය අය කරන්නේ ලංකාවෙන් migrate කරන අයගෙන් විතරයි. සංක්‍රමණය වන අවස්ථාවේ මෙය අය කරනු ලැබේ. ලංකාවේ පුරවැසිභාවය අතහැරලා වෙන රටකට යනවා නම්, ඒ යන මුදල්වලට යම් විධියකින් සියයට 20ක බද්දක් පනවනවා ඇත. ඒ නිසා මෙහි අපේ අදහස වන්නේ යම් විධියකින් පිටරට යවන පිරිස අඩු කිරීමයි. නමුත් මේ මඟින් රුපියල් මිලියන 200ක් ලබා ගන්න පුළුවන් වෙතැයි අපි ඇස්තමේන්තු කරලා තිබෙනවා.

ද්විත්ව පුරවැසිභාවය

ලාංකික සම්භවයක් ඇති සියලු දෙනාට ද්විත්ව පුරවැසිභාවය ලබා ගත හැකිය. ක්‍රමවත් ඇගයීමකින් පසුව මෙම පහසුකම් ලබා දීමට කටයුතු කරන අතර, එක් අයෙකු විසින් රු.5,00,000ක ගෙවීමක් සිදු කළ යුතුය.

ශ්‍රී ලංකා නේවාසික තත්ත්වය අපේක්ෂා කරන ඇ.ඩොලර් මිලියන 10ක් ආයෝජනය සිදු කළ හැකි විදේශිකයන් සඳහා ඉඩ ප්‍රස්ථා ලබා දෙනු ඇත. එවැනි නේවාසික තත්ත්වයන් ලබා දෙන්නේ ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතියට යටත්ව වන අතර, සෑම වසර 5කට වරක් නේවාසික බව අලුත් කරනු ලැබේ. ඒ සඳහා වීසා ගාස්තු වශයෙන් රු. මිලියන 2.5ක් අය කරනු ලැබේ.

සුපිරි වාසි බද්ද (Super Gain Tax)

ගරු කථානායකතුමනි, පසු ගිය රජයේ විශේෂ අනුග්‍රහය යටතේ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන සමාගම්/ව්‍යාපාර සංඛ්‍යාවක් විසින් අතීත වසර කිහිපයක් තුළ අති ප්‍රමාණික ලාභ උපයා ඇති බව අප විසින් නිරීක්ෂණය කර ඇත. මෙහිදී වෙනත් සමාගම්/ව්‍යාපාරවලට ඒ වෙනුවෙන් පිරිවැයක් දැරීමට සිදු වී ඇත.

මෙය කිසිම අයුරකින් නොතකා හැරිය යුතු තත්ත්වයක් නොවේ. වගකිව යුතු රජයක් ලෙස අප විසින් සුදුසු යන්ත්‍රණයක් හඳුන්වා දීම හරහා සමාජයට සාධාරණය ඉටු කර දිය යුතුයි.

මෙම සන්දර්භය තුළ සුපිරි වාසි බද්දක් යෝජනා කිරීමට මම කැමැත්තෙමි. එය එක්වරක් සිදු කරනු ලබන ගෙවීමකි - one-off payment. මේ අනුව 2013/14 බදු වර්ෂය තුළ රුපියල් මිලියන 2,000කට අධික ලාභයක් උපයන ලද ඕනෑම සමාගමකට හෝ පුද්ගලයෙකුට තම ලාභයෙන් සියයට 25ක් නව බද්දක් ලෙස මෙය මෙම අවස්ථාවේදී පනවනවා ඇත. මෙම සමාගම් විසින් අයුතු ලෙස උපයන ලද වාසි මහජනතාවට ආපසු ලබා ගැනීමට මෙය උපකාරී වනු ඇත. 2015 වර්ෂයේ දී මෙමඟින් උපයා ගැනීමට අපේක්ෂිත ආදායම රුපියල් මිලියන 50,000කි. මෙය companies 35ක්, 40ක් අතර තමයි වැඩියෙන්ම තිබෙන්නේ. රුපියල් මිලියන 2,000කට වැඩි වූ ලාභයක් උපයා ගන්නා ලද සමාගම්වලට තමයි මෙම බද්ද පනවනු ලබන්නේ. නමුත් මෙම බද්ද සුළු හා මධ්‍ය පරිමාණ සමාගම්වලට අදාළ වන්නේ නැහැ.

උපයන විට ගෙවීමේ බද්දෙන් (PAYE) නිදහස් කරන ලද ප්‍රමාණය ඉහළ නැංවීම

වර්තමාන බදු ක්‍රමය යටතේ රැකියා ආදායමේ පළමු රුපියල් 6,00,000 උපයන විට ගෙවීමේ බද්දෙන් නිදහස් කෙරේ. උපයන විට ගෙවීමේ බදු හිමියන් සඳහා තවදුරටත් සහන සැලසීමේ

අපේක්ෂාවෙන් මෙම නිදහස් කෙරෙන සීමාව රුපියල් 7,50,000 දක්වා ඉහළ නංවනු ලැබේ. මෙය 2015 අප්‍රේල් 01 දා සිට බල පැවැත්වේ.

දුෂ්කර ප්‍රදේශ සඳහා ආදායම් බදු සහන

රැකියා අවස්ථා නිර්මාණය කිරීම හා ප්‍රාදේශීය දරිද්‍රතාව අඩු කිරීම සඳහා ඌන සංවර්ධිත ප්‍රදේශවලට යොමු කෙරෙන ආයෝජන ඉහළ නැංවිය යුතුය. එබැවින් එවැනි ප්‍රදේශවල ආයෝජන සිදු කිරීමට කැමැති ආයෝජකයන්ට අනුබල සැපයීම සිදු කළ යුතුය. මෙවැනි අය දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් නම් කළ යුතු වේ.

මේ අනුව, මෙවැනි ව්‍යාපෘතිවලින් උපයනු ලබන ලාභ සඳහා සාමාන්‍ය ආදායම් බදු අනුපාතයෙන් සියයට 50ක ප්‍රමාණයක් අය කෙරේ.

වාහන බදු සංශෝධනය

අඩු ආදායම් පවුල්වල අයට ස්වකීය ජීවන මට්ටම ඉහළ නංවා ගැනීම පිණිස මෝටර් රථයක් මිලට ගැනීම අරමුණු කරගෙන 1,000 cc ධාරිතාවයකට අඩු එන්ජින් සහිත මෝටර් රථවලට අදාළ බදුවලින් සියයට 15ක් පමණ අඩු කිරීමට මම යෝජනා කරමි.

Hybrid සහ සාමාන්‍ය මෝටර් රථවලට අදාළව වර්තමානයේ ක්‍රියාත්මක වන තීරුබදු ව්‍යුහය තුළ විශාල විෂමතාවක් ඇත. මෙම විෂමතාව නිවැරදි කිරීම පිණිස දෙමුහුන් වාහනවලට අදාළ නිෂ්පාදන බදු සංශෝධන කිරීමට යෝජනා කරමි. මෙම වෙනස්කම් අද දින මධ්‍යම රාත්‍රියේ සිට ක්‍රියාත්මක වේ.

ආනයනය කරන අවස්ථාවේ දී මෝටර් රථවල ක්ෂයවීම් පිළිබඳ පවත්නා ක්‍රියාපටිපාටිය තුළින් වාහනවල වටිනාකම අඩුවෙන් තක්සේරු කිරීම සහ ලියා පදිංචි කිරීමේ දිනය වෙනස් කිරීම ආදී බොහෝ අවභාවිතයන් නිර්මාණය වී ඇත. මේ නිසා රජයට විශාල ආදායමක් අහිමි වී ඇත. මෙයට පිළියමක් වශයෙන් ක්ෂයවීම් වගුව අද දින මධ්‍යම රාත්‍රියේ සිට ඉවත් කිරීමට මම යෝජනා කරමි.

ඉදිකිරීම් කර්මාන්තය

සිමෙන්ති, වානේ සහ වැලි වැනි ද්‍රව්‍යවල ඉහළ පිරිවැය කරණකොටගෙන වර්තමානයේ ඉදිකිරීම් කර්මාන්තයේ ප්‍රගතිය අඩාල වී ඇත. මෙම ගැටලුව විසඳීම පිණිස සිමෙන්ති හා වානේ බිලට්වලට අදාළ තීරු බදු ඉවත් කළ යුතු යැයි මම යෝජනා කරමි. මෙයට අමතරව පරිසරයට හානි නොවන අයුරින් ඉදිකිරීම් කර්මාන්තයේ ප්‍රධාන අමු ද්‍රව්‍යයක් වන වැලි ගොඩ දැමීම පිණිස අදාළ සෑම පියවරක්ම ගැනීමට කටයුතු කරනු ඇත.

දේශීය මෝටර් රථ නිෂ්පාදකයන්ගෙන් ලැබිය යුතු බදු අය කර ගැනීම

විවිධ හේතු ඉදිරිපත් කරමින් රජයට ගෙවිය යුතු මුළු බදු ප්‍රමාණය මෝටර් වාහන එකලස් කරන සමහර සමාගම් නොගෙවා ඇති බව නිරීක්ෂණය විය.

මෙරට නිෂ්පාදන ක්‍රියාවලිය තුළ මෙම සමාගම් විසින් එකතු කළ වටිනාකම් පිළිබඳ විමර්ශනයක් කිරීමේ අවශ්‍යතාව මතු වී ඇත. එමෙන්ම මෙම කාලය තුළ එම ආයතන විසින් ගෙවන ලද නිෂ්පාදන බදු ප්‍රමාණය පිළිබඳව විමර්ශනය කිරීමේ අවශ්‍යතාවක් පවතී.

මෙම ආයතන විසින් ප්‍රකාශිත එකතු කළ වටිනාකම් අත් කර ගෙන නොමැති බව තහවුරු වුවහොත් මෙම සමාගම්වලින් අදාළ නියමිත බදු අය කර ගැනීමට ක්‍රියා කරනු ලැබේ. මෙයින් රුපියල් කෝටි 12,000ක ලබා ගැනීමට හැකි වනු ඇතැයි අප ඇස්තමේන්තු කර තිබෙනවා.

පසු ගිය වසර කිහිපය තුළ මෝටර් රථ එකලස් කිරීමේ සමාගම් විසින් අනුමැතිය දෙන අධිකාරින් වෙත ලබා දෙන ලද විස්තරාත්මක තොරතුරුවල නිරාකූලතාවය තහවුරු කර ගැනීම පිණිස පූර්ණ වැඩ පිළිවෙළක් ක්‍රියාවට නංවනු ඇත. මේ සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්, වාණිජ අධ්‍යක්ෂ ජනරාල්, විගණකාධිපති, නීතිපති සහ විගණන අංශවල සාමාජිකයින් ඇතුළත් ඉහළ මට්ටමේ කමිටුවක් පත් කරනු ඇත.

යතුරු පැදි සහ ත්‍රීරෝද රථ දේශීය වශයෙන් නිපදවීම දිරි ගැන්වීම

දේශීය නිෂ්පාදන සහ දේශීය වශයෙන් වටිනාකම් එකතු කිරීම දිරිගැන්වීම පිණිස යතුරු පැදි හා ත්‍රීරෝද රථ නිෂ්පාදනයේ හා එකලස් කිරීමේ නියැළෙන පාර්ශ්වයන් සඳහා අමතර කොටස්වලට අදාළ බදු මුළුමනින්ම ඉවත් කෙරේ.

මගී ප්‍රවාහනයට යොදා ගන්නා බස්රථවල ආනයන උපරිම කාල සීමාව වෙනස් කිරීම

මගී ප්‍රවාහනයට යොදා ගනු ලබන බස් රථවලට අදාළව ආනයන කළ හැකි උපරිම වයස් සීමාව වසර 5 සිට වසර 10 දක්වා දීර්ඝ කෙරේ. මෙම දිගුව ලබා දෙනු ලබන්නේ සංචාරක කර්මාන්තයේ උන්නතිය පිණිස ප්‍රමාණවත් බස් සංඛ්‍යාවක් ලබා දීම අරමුණු කරගෙනයි.

සිමෙන්තිවල බද්ද සියයට හත හමාරකින් අඩු වීමෙන් දළ වශයෙන් සිමෙන්ති මිල රුපියල් 90කින් අඩු වීමේ හැකියාව තිබෙන බවත් මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

ශ්‍රී ලංකා රේගුව

ශ්‍රී ලංකාවේ ජනතාවට ලබා දෙන අදාළ සේවා වැඩිදියුණු කිරීම පිණිස රේගු දෙපාර්තමේන්තුව විසින් ස්වකීය කටයුතු පැය 24 පුරා ක්‍රියාත්මක වනු ඇත. කැපවීමෙන් සේවය සපයන රටේ අභිවෘද්ධිය වෙනුවෙන් විශාල දායකත්වයක් ලබා දෙන ලද රේගු දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට මම ස්තුතිවන්ත වෙනවා. පසු ගිය රජයේ දේශපාලන පීඩනයට මෙන්ම දේශපාලන බලපෑම්වලට එරෙහි වෙමින් සෘජුභාවයෙන් කටයුතු කළ රේගු නිලධාරින්ට ඒ සඳහා මගේ විශේෂ ස්තුතිය පිරිනැමීමට කැමැතියි.

එතනෝල්, මත්ද්‍රව්‍ය සහ අනිකුත් ඉහළ වටිනාකම් සහිත භාණ්ඩ මෑත කාලයේදී බහුලව රට තුළට කාන්දු වූ අතර ඒවා පරීක්ෂා කිරීමට සෑම රේගු ස්ථානයකම ස්කෑනින් යන්ත්‍ර ස්ථාපනය කිරීමට තීරණය කර තිබෙනවා. බහලුම් ස්කෑන් කිරීම අනිවාර්ය කරන අතර එය 2015 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වනු ඇත. මෙම ක්‍රියාමාර්ග මඟින් අතිරේක වශයෙන් රුපියල් බිලියන 50ක් උපයා ගැනීමට නියමිතය.

වටිනාකම නිශ්චය කිරීමේ කමිටුව

රේගු දෙපාර්තමේන්තුවේ වටිනාකම් නිශ්චය කිරීම තුළින් මතු වී ඇති ගැටලු නිරවුල් කිරීම පහසු කිරීම පිණිස වටිනාකම නිශ්චය කිරීමේ කමිටුවක් පත් කරනු ඇත. එය රේගු දෙපාර්තමේන්තුවේ නිලධාරින් දෙදෙනෙක් ද, විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින් දෙදෙනෙක් ද, ගණකාධිකරණ වෘත්තිකයෙක්, නීති වෘත්තිකයෙක් සහ වාණිජ මණ්ඩලයේ නියෝජිතයෙක් යන අයගෙන් සමන්විත කමිටුවක් පත් කර ඒ තුළින් එහි සැබෑ වටිනාකම ලබා ගැනීමට කටයුතු කර ගෙන යනවා.

ව්‍යාපාරික ප්‍රජාව වෙත පහසුකම් වැඩි කිරීම - ආයෝජන මණ්ඩලය

ව්‍යාපාරික ප්‍රජාවට සපයන සේවාවන් නැංවීම පිණිස පහත සඳහන් රජයේ ආයතන ඇතුළත්වන ආකාරයට ව්‍යාපාර සඳහා පහසුකම් සපයන ජාලගත ඒකකයක් නිර්මාණය කෙරෙනු ඇත. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ආයෝජන මණ්ඩලය, වාණිජ දෙපාර්තමේන්තුව, ආනයන සහ අපනයන දෙපාර්තමේන්තුව, මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය යන ආයතනවලින් මෙම ජාලය සැකසෙනු ඇත. මෙම ජාලගත වීමේ ක්‍රියාවලිය තුළින් ව්‍යවසායකයන්ට යෝජනා එවන ලද දිනයේ සිට දින 100 තුළ ඒ සඳහා අනුමැතිය එකම ස්ථානයකින් ලබා ගැනීමට හැකි බව මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

රාජ්‍ය ආයෝජන ප්‍රවර්ධනය

පශ්චාත් යුද කාලය තුළ දේශීය සහ විදේශීය පෞද්ගලික ආයෝජකයන් තුළ ඇති වූ විශ්වාසය තුළින් නිසි ඵල ලබා ගැනීමට ශ්‍රී ලංකාවට හැකි වී නැත. එහි ප්‍රතිඵලයක් වශයෙන් පෞද්ගලික ආයෝජන දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 20ක මට්ටමට සීමා වී ඇත. මෙයට ප්‍රධාන හේතුව රජය දේශීය බැංකු පද්ධතියෙන් සහ දේශීය සහ ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළෙන් විශාල වශයෙන් ණය ලබා ගෙන තිබීමයි. රජය අධික ලෙස ණය ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් පෞද්ගලික අංශයේ ණය ගැනීම සීමා වී තිබෙනවා.

මෙම තත්ත්වය ඉතා ඉක්මනින් ආපසු හැරවිය හැක. අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ නව රජයේ ආර්ථික සංවර්ධන තේමාවට අනුව රාජ්‍ය ආයෝජන මත ක්‍රියාත්මක කරන යටිතල පහසුකම් ව්‍යාපෘති පිළිබඳ අධික ලෙස පදනම් වීම වෙනුවට දේශීය පාරිභෝජනය වැඩි කිරීම සහ රාජ්‍ය, පෞද්ගලික ආයෝජන වැඩි කිරීම පිළිබඳව අවධානය යොමු කොට ඇත - to create Sri Lankan-owned enterprises and businesses.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ මහා පරිමාණ අපනයන සංවර්ධන කලාපයක් කඩිනමින් ඉදි කිරීමට සැලසුම් කෙරේ. පසු ගිය අවුරුදු 10 තුළ මෙබඳු එකම ආයෝජන කලාපයක් හෝ ඉදි කොට නැත. කෙසේ වෙතත් ආයෝජන මණ්ඩලයේ අත්දැකීම්වලට අනුව ඕනෑම වෙලාවක කලාපයක් ඉදි කළ පසු දේශීය හා විදේශීය ආයෝජකයන් ඒ සඳහා ඇදී එනු ඇත. එමෙන්ම දැනට තිබෙන ඌන උපයෝජිත අපනයන කලාපවලින් උපරිම ප්‍රයෝජන ගැනීමට ද අවශ්‍ය සියලු උත්සාහයන් ගනු ඇත.

කැසිනෝ කර්මාන්තයට විශේෂ අය බදු

කැසිනෝ ව්‍යාපාරිකයන්ගෙන් රුපියල් මිලියන 1,000ක විශේෂ අය බද්දක් වහාම ක්‍රියාත්මක වන පරිදි අය කෙරේ. එය එක් වරක් පමණක් අය කරන ගෙවීමක් වන අතර 2015 අප්‍රේල් 15 වන දිනට පෙර ගෙවිය යුතුය.

කැසිනෝ licence එකක් තිබෙන ඕනෑම කෙනකුට රුපියල් මිලියන 1,000ක එක් වරක බද්දක් අය කරනවාය කියන එක මේ අවස්ථාවේ දී මතක් කරනවා. එයින් රුපියල් මිලියන 5,000ක ආදායමක් ඇස්තමේන්තු කරනවා.

ඔට්ටු සහ විනෝද බදු

ඔට්ටු සහ විනෝද බදු පනත යටතේ වාර්ෂිකව ගෙවිය යුතු අය බද්ද දෙගුණ කෙරේ.

මත්පැන් සහ බීර නිෂ්පාදකයන්ගෙන් අය කරන වාර්ෂික අය බද්ද

රටට විශාල වශයෙන් ආදායම් අහිමි වන ආකාරයට මත්පැන් බලපත්‍ර බහුලවම අව භාවිතයට යොදා ගෙන තිබේ.

එබැවින් ටෙන්ඩර් පටිපාටිය ඔස්සේ බලපත්‍ර ලබා දීමට කටයුතු කරනු ඇත. මෙම ක්‍රමය යටතේ එක පුද්ගලයකුට පවත්වා ගෙන යා හැකි අළෙවිහල් ගණන තුනකට සීමා කෙරේ. මේ සඳහා ටෙන්ඩර් ක්‍රියාවලියක් ඔස්සේ වඩාත් නිවැරදි ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවෙනු ඇත.

මෙම ක්‍රමය ක්‍රියාත්මක වන තෙක් මත්පැන් බලපත්‍ර ගාස්තුව දෙගුණ කෙරේ.

මාසික අය බද්දක් ලෙස මසකට රු. මිලියන 200ක් සියලුම මත්පැන් නිෂ්පාදක සහ බීර නිෂ්පාදක සමාගම්වලින් අය කිරීමට යෝජනා කරමි. සුළු පරිමාණ ව්‍යාපාරිකයන් මෙම ක්ෂේත්‍රයට පිවිසීම අධෛර්යවත් කිරීමට මෙම පියවර ගනු ඇත.

නිෂ්පාදන ආයතන 28ක් මේ රටේ තිබෙනවා. ඒ අය අතරින් හත් අට දෙනෙක් විතරයි බදු ගෙවන්නේ. ඒ නිසා අපි මේවාට උනන්දු කරවීම නොවෙයි, අනවශ්‍ය ඒවා නවත්වන්න තමයි කටයුතු කරන්නේ. එක කොම්පැනියකින් අඩු ගණනේ මාසයකට රුපියල් මිලියන 200ක් බදු වශයෙන් ලබා දෙන්න ඕනෑ. ඒක ලබා දුන්නේ නැති වුණොත් ඒ licence එක නැති වන අතර, වෙනත් කෙනකුට licence එක මාරු කරන්න බැහැයි කියන එකත් මේ අවස්ථාවේ මතක් කරන්න කැමැතියි.

2016 සිට ක්‍රියාත්මක වන පරිදි මත්පැන් බලපත්‍ර නිකුත් කිරීමේදී විවෘත ටෙන්ඩර් පටිපාටි යටතේ පාරදෘෂ්‍ය පිළිවෙතක් අනුගමනය කරනු ඇත. අතිගරු ජනාධිපතිතුමාගේත්, ගරු අගමැතිතුමාගේත් අදහස් තුළින් තමයි සම්පූර්ණයෙන්ම මෙය ක්‍රියාත්මක කරන්නේ. මොකද, පුළුවන් තරම් මේවා අඩු කරන්න මිසක් වැඩි කරන්න කිසිසේත්ම මේ ආණ්ඩුව කටයුතු කරන්නේ නැහැයි කියන එක වගකීමෙන් කියන්න කැමැතියි.

මත්පැන් අළෙවිහල් සහ තැබෑරුම් මත විශේෂ අය බද්දක්

අද තැබෑරුම් 4321ක් තිබෙනවා. මෙයින් ලැබෙන ආදායමක් සොච්චමක් බව තමයි අපට දැන ගන්නට තිබෙන්නේ. ඒ නිසා තැබෑරුම් සහ මත්පැන් අළෙවිහල්වලින් රු. 250,000ක එක් වරක් පමණක් ගෙවන විශේෂ අය බද්දක් මේ අවුරුද්ද තුළ අය කිරීමට යෝජනා කෙරේ.

බීඩි කර්මාන්තය විධිමත් කිරීම.

සිගරට් සඳහා අය කරන ඉහළ බදු නිසා මිල අඩු දුම් වැටි සඳහා යොමු වීමේ ප්‍රවණතාවක් ඇත.

මිල අඩු දුම් වැටි අවිධිමත් ලෙස නිෂ්පාදනය කරන බැව් ද ප්‍රකටය. එමෙන්ම ඒවා සෞඛ්‍යයට අහිතකරය. එබැවින් බීඩි කර්මාන්තය විධිමත් කරනු ඇත. එහි දී මෙම කර්මාන්තයේ යෙදී සිටින සේවක පිරිස පිළිබඳ අවධානය යොමු කෙරේ. එමෙන්ම බීඩි නිෂ්පාදකයන්ට දිගටම කර්මාන්තය කරගෙන යාමේ හැකියාව පිළිබඳව අවධානය යොමු කරනු ඇත.

විවාහ ලියාපදිංචි කිරීමේ ගාස්තු අඩු කිරීම

අත්තනෝමතික ලෙස රුපියල් 5,000 දක්වා ඉහළ නැංවූ විවාහ ලියාපදිංචි කිරීමේ ගාස්තුව රුපියල් 1,000 දක්වා අඩු කෙරේ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதார மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)

(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health and Indigenous Medicine)

රුපියල් 4,000කින් අඩුයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අවශ්‍ය නම් ඒක අද ඉඳලා උපයෝගී කර ගන්න පුළුවන්. [බාධා කිරීම්] ඒ කාරණය විතරයි ප්‍රශ්නයකට තුඩු දුන්නේ.

බදු ක්‍රමය යථාවත් කිරීම

ශ්‍රී ලංකාවේ බදු ගෙවන්නන්ට බදු ගෙවීමේ ක්‍රියාවලියේ දී බදු වර්ග රැසකට මුහුණ දීමට සිදු වේ. එබැවින් ඉදිරි වර්ෂයේ දී බදු ක්‍රමය සරල කිරීමට අපේක්ෂා කරමි. එමගින් රටේ බදු ගෙවන ප්‍රජාවට පහසුකම් සැලසීමටත්, බදු පරිපාලනය ඵලදායක කිරීමටත් හැකි වනු ඇත. වර්තමානයේ ක්‍රියාත්මක වන 38 වර්ගයක බදු සහ අය බදු 20කට අඩු කිරීමට අපේක්ෂා කර ඇත. ජනතාවගෙන් අනිසි ලෙස බදු අය කිරීම අඩු කිරීම අපේ අභිලාෂයයි. අපගේ අපේක්ෂාව මෙය ඉතා ඉක්මනින් ක්‍රියාවට නැංවීමයි.

බදු නොවන ආදායම් යෝජනා

ජංගම දුරකථන ලියාපදිංචිකරුවන් සඳහා වන අය බදු

ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී සියලු ජංගම දුරකථන ක්‍රියාකරුවන් වෙත එක් වරක් පමණක් ගෙවන රුපියල් මිලියන 250ක අය බද්දක් පනවනු ලැබේ.

චන්ද්‍රිකා - satellite - හරහා නිවාසවලට සෘජුව සැපයෙන - direct-to-home - සේවා සඳහා අය බදු

ශ්‍රී ලංකාවේ සේවාලාභීන් 50,000කටත් වඩා සිටින චන්ද්‍රිකා මගින් සෘජුව නිවාසවලට සේවා සපයන වාණිජ ක්‍රියාකරුවන් අවුරුදු ගණනාවක් තිස්සේ රජයට ගෙවීමකින් තොරව කටයුතු කරනු ලබයි. එමගින් රජයට විශාල ආදායමක් අහිමි වී ඇත. එවැනි සමාගම් වෙනුවෙන් එක වරක් ගෙවන රුපියල් මිලියන 1,000ක අය බද්දක් පැනවීමට යෝජනා කරන අතර අහිමි වී ගිය ආදායම එමගින් ලබා ගැනීමට අපේක්ෂා කරමු. එයින් ලැබෙන්නට තිබෙන ආදායම රුපියල් මිලියන 2,000ක් පමණ වේ යැයි ඇස්තමේන්තු කර තිබෙනවා.

චන්ද්‍රිකා මධ්‍යස්ථාන භාවිතය සඳහා වන අය බදු

ශ්‍රී ලංකාවට වෙන් කර තබා ඇති චන්ද්‍රිකා පවත්වා ගත හැකි මධ්‍යස්ථාන භාවිතා කරන චන්ද්‍රිකා අයිතිකරුවන් එක වරක් පමණක් ගෙවන රුපියල් බිලියනයක විශේෂ අය බද්දක් පැනවීමට යෝජනා කරමි.

Satellite චීනයට ගියා. ගියාට පස්සේ පෙනෙන්න නැහැ. අපේ තිබෙන spectra පාවිච්චි කළා. නමුත් තඹ සතයක් මේ රටට ඇවිල්ලා නැහැ. මේවා මේ රටේ තිබෙන සම්පත්. අපි ඉන්දියාව දෙස බලද්දී spectrum එක්ක තිබුණු ප්‍රශ්නය අනුව අපටත් මේක හොඳ උදාහරණයක් වුණා. ඒ නිසා ලංකාවේ මේ satellite පාවිච්චි කරන අයගෙන් එක් වතාවකදී පමණක් අය කරන රුපියල් මිලියන දාහක බද්දක් පැනවීමට යෝජනා කරනවා.

ක්‍රීඩා සඳහා වෙන් වූ නාලිකා

ක්‍රීඩා පමණක් සඳහා වෙන් වූ නාලිකා මඟින්ද විශාල ආදායමක් රජයට අහිමි කර ඇත. ඒ අනුව, සන්නිවේදන ස්ථාන පහකට වඩා ඇති දීප ව්‍යාප්තව ක්‍රියාත්මක වන ක්‍රීඩා සඳහා පමණක් වෙන් වූ නාලිකාවලට රුපියල් මිලියන 1,000ක අය බද්දක් පැනවීමට යෝජනා කරමි.

අවුරුදු පහක කාලයක් තඹ සතයක් ගෙවන්නේ නැතිව මේවා ක්‍රියාත්මක කරලා තිබෙනවා. රූපවාහිනියේ තිබෙන දේවලුත් පැහැර ගෙන මේ කටයුතු කරලා තිබෙනවා. අපේ අගමැතිතුමාගේ ඉල්ලීමක් පරිදි බොහොම විවෘතව සියලු දෙනාට තරග කරන්න පුළුවන් වැඩ පිළිවෙළක් අපි ඇති කරනවා. එවැනි ආයතන තිබෙනවා නම් ඒවාට රුපියල් මිලියන 1,000ක බද්දක් පැනවීමට මේ අවස්ථාවේ දී යෝජනා කරනවා.

ජංගම දුරකථන රීලෝඩ් ගාස්තු

දිගින් දිගටම පුළුල් වන ජංගම දුරකථන සේවාවන් රැසක් පිළිබඳව බොහෝ සාකච්ඡා ශ්‍රී ලංකාව තුළ පවතී. වෙනස් වන ලෝකයේ දෛනික කටයුතු සඳහා ජංගම දුරකථනය අවශ්‍ය උපකරණයක් බව අප දනිමු. ශ්‍රී ලාංකිකයින්ට පොදුවේත් විශේෂයෙන් තරුණ පරම්පරාවට ලබා දෙන සහනයක් වශයෙන් දැනට රීලෝඩ් සඳහා පාරිභෝගිකයාගෙන් අය කර රජයට ගෙවනු ලබන සියයට 25ක බද්ද ජංගම දුරකථන පහසුකම් සපයන්නන් විසින් පාරිභෝගිකයාගෙන් අය නොකිරීමට තීරණය කරනු ඇත. එය එම companies විසින් දරා ගැනීම අවශ්‍යයි. මෙම අවස්ථාවේ දී පාරිභෝගිකයන්ගේ දෛනික වියදම් අඩු කිරීම පිණිස ජංගම දුරකථන පහසුකම් සපයන්නන්ගෙන් ලැබෙන සහාය අපගේ රජය අගය කරන බව සඳහන් කරනු කැමැත්තෙමි.

රජයට අයත් ආයතනවලින් ලැබෙන ලාභාංශ, ලාභ සහ අය බදු

රාජ්‍ය ආයතන තම ආදායමෙන් කොටසක් ලාභ, ලාභාංශ සහ අය බදු ගෙවීම් මගින් රජයේ ඒකාබද්ධ අරමුදලට දායක විය යුතුයි.

කෙසේ වෙතත්, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, ජාතික ලොතරැයි මණ්ඩලය, ලිට්‍රෝ ගෑස් සමාගම, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ඇති රක්නා ලංකා ආරක්ෂක සමාගම වැනි රාජ්‍ය ආයතන ගණනාවක් විශාල මුදල් ප්‍රමාණයක් භාණ්ඩාගාරයට නියමානුකූලව ලබා නොදී තමා සතුව තබාගෙන සිටින බව අපට පෙනී ගොස් ඇත. මේ සියලුම මුදල් වහාම Consolidated Fund එකට ලබා ගන්න ක්‍රියා කරනවා.

එම නිසා මෙම රාජ්‍ය ආයතනවලින් අය කරන බදු නොවන ආදායම් වශයෙන් රුපියල් මිලියන 25,000ක් 2015 වර්ෂයේ රාජ්‍ය ආදායමට එකතු කිරීමට මම යෝජනා කරනවා.

රාජ්‍ය ආයතන සතු අබලන් වූ වාහන විකිණීම

රාජ්‍ය ආයතනවලට අයත් භාවිත කිරීමට නොහැකි වාහන විශාල ප්‍රමාණයක් නිකරුණේ තිබෙන බව අපි පුළුල් වශයෙන් පිළිගන්නා කරුණක්. මෙම වාහන කිසි ප්‍රයෝජනයක් නැතිව දිනෙන් දින විනාශ වෙමින් පවතිනවා. එම නිසා මෙම අතහැර දමා ඇති වාහන එකතුකොට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මම යෝජනා කරනවා. මෙමගින් 2015 වසරේ රුපියල් මිලියන 1,000ක ආදායමක් අපේක්ෂා කරනවා.

රජයේ ආයතනවලට අයත් ඇට සැකිලි වාගේ හෝ කොට උඩ තිබෙන සියලුම වාහන වෙන්දේසි කර රජයට සල්ලි ලබා ගන්න කටයුතු කරනවා.

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීවරුනි, විවිධ රාජ්‍ය ආයතනවල කිසිම ප්‍රයෝජනයට නොගෙන අව්වට වැස්සට තෙමෙමින් විශාල වාහන ප්‍රමාණයක් නවත්වා තිබෙන හැටි ඔබතුමන්ලා දැක නැද්ද? මේ වාහන සියල්ල මහජන මුදල්වලින් මිල දී ගත් ඒවා. මෙසේ ජාතික සම්පත් මින් ඉදිරියට නිකරුණේ නාස්ති වීමට ඉඩ නොදීමට අපි සහතික වෙනවා.

එවැනිම ක්‍රියා මාර්ගයක් මඟින් ජනාධිපති ලේකම් කාර්යාලයට සහ තෝරා ගත් රාජ්‍ය ආයතන සඳහා වෙන් කර තිබූ විශාල ප්‍රමාණයක අධි සුඛෝපභෝගී වාහන ද අළෙවි කිරීමෙන් මහජනයාගේ ප්‍රතිලාභ සඳහා මුදල් එකතු කිරීමට අපි අපේක්ෂා කරනවා.

[ගරු රවි කරුණානායක මහතා]

අපේ යහපාලන රාමුව තුළ සිදු කරන විචක්ෂණශීලී මූල්‍ය කළමනාකාර ක්‍රමවේදය යටතේ වසර 2015 තුළ දේශපාලනඥයන්ගේ හෝ රාජ්‍ය නිලධාරින්ගේ භාවිතයට අලුතෙන් කිසිම වාහනයක් ආනයනය නොකිරීමට අපි සහතික වෙනවා.

වාහන ආනයනකරුවන් සඳහා ආනයන බලපත්‍ර

වාහන ආනයන හා අළෙවි කිරීමේ කර්මාන්තයට අදාළව දැනට තිබෙන රෙගුලාසිවල විශාල වශයෙන් අඩුපාඩු තිබෙනවා. විශේෂයෙන් සඳහන් කළොත්, ඇතැම් වාහන ආනයනකරුවන් විවිධ ආයතන විසින් පනවා ඇති රෙගුලාසි අනුගමනය නොකර පිළිගත් ක්‍රමවේදය මඟහැර හැකි සෑම අවස්ථාවකම වැරදි ක්‍රමවලට බලපත්‍ර ලබා ගන්න උත්සාහ කරනවා. මේ තුළින් රජයට විශාල වශයෙන් ආදායම් අහිමි වී තිබෙනවා.

මෙම ගැටලුවට පිළියම් වශයෙන් සහ නිර්ව්‍යාජ වාහන ව්‍යාපාරයේ යෙදෙන පුද්ගලයන් දිරිමත් කිරීමට සුදුසු ක්‍රියා මාර්ගයක් වශයෙන් වාහන ආනයනකරු ආනයනය කරන්නේ අලුත්ම වාහන ද, පාවිච්චි කරන ලද වාහන ද යන්න නොසලකා සියලුම වාහන ආනයනකරුවන්ට වාර්ෂිකව රුපියල් මිලියන 1.5ක බලපත්‍ර ගාස්තුවක් අය කිරීමට මම යෝජනා කරනවා. ඇත්ත වශයෙන්ම මෙම අදහස ඉදිරිපත් වුණේ වාහන ආනයනය කරන සමාගම්වලිනුයි. එවැනි වැදගත් අදහසක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අපි ඔවුන්ට ස්තුතිවන්ත වනවා.

යෝජිත බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා වාහන ආනයනකරුවන්ගේ සංගමය මඟින් ලියාපදිංචි වාහන ආනයනකරුවන්ගේ ලේඛනයක් ලබා ගන්නා බැවින් මින් ඉදිරියට ඕනෑම කෙනෙකුට වාහන ආනයනකරුවෙක් වශයෙන් ඉදිරිපත් විය හැකි වර්තමාන ක්‍රමවේදය නතර වනු ඇත.

වරායෙන් පිටවෙන බහලුම් සඳහා වෙනස් නොකිරීමේ සහතික (Non-Manipulation Certificate)

මේක අවශ්‍ය වන්නේ මේ රට තුළින් පිටවන බහලුම් සඳහා පමණයි. This is only for entrepot trading.

ශ්‍රී ලංකා රේගුව විසින් වරායෙන් පිටවෙන බහලුම් සඳහා වෙනස් නොකිරීමේ සහතික නිකුත් කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරනු ඇත. මේ මඟින් වරාය මෙහෙයුම් කටයුතු වැඩි දියුණු වේ. මෙම සහතිකයක් නිකුත් කිරීම සඳහා බහලුම් එකකට ඇමෙරිකානු ඩොලර් 10ක් අය කරනු ලබනවා. මේ අය කිරීම සිදු කරනු ලබන්නේ ලංකාවේ සිදු කරන අපනයන සහ ආනයනවලට නොවෙයි. පිටරට ඉඳන් ලංකාවේ වරාය පාවිච්චි කරලා entrepot trade කිරීම සඳහා තමයි මේ අය කිරීම සිදු වන්නේ. රේගු දෙපාර්තමේන්තුව මෙවැනි අදහසක් මුදල් අමාත්‍යාංශයට ලබාදීම මා අගය කරනවා.

වෙනත් යෝජනා

ජාතික වකුගඩු අරමුදල

මැතිවරණ ප්‍රචාරණය සඳහා යන වියදම් ජාතික වකුගඩු අරමුදලකට බැර කළ යුතු යැයි අතිගරු ජනාධිපතිතුමා, ස්වකීය මැතිවරණ ව්‍යාපාරයේදී සඳහන් කර තිබුණි. එබැවින් වකුගඩු රෝගීන්ගේ වේදනා ගැන සැලකිල්ලක් දක්වන පරිත්‍යාගශීලී ශ්‍රී ලාංකිකයන් වෙත මෙම අරමුදලට දායක වන ලෙස මම ඉල්ලා සිටිමි. මෙවැනි පරිත්‍යාග බදුවලින් නිදහස් වනු ඇති බව මේ අවස්ථාවේ සහතික කරනවා.

ආබාධිත රණවිරුවන් සඳහා විශේෂ පහසුකම්

ආබාධිත රණවිරුවන් ජාතියට කරන ලද මිල කළ නොහැකි සේවය ඇගයීමක් වශයෙන් ඔවුන්ට "විරුදිරිය" නමින් රුපියල් 500,000ක උපරිමයකට යටත්ව විශේෂ ණය ක්‍රමයක් හඳුන්වා දෙනවා. රාජ්‍ය බැංකු විසින් මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලැබේ.

විශේෂිත හැකියාවන් ඇති පුද්ගලයන් සඳහා ආධාර

විශේෂිත හැකියාවන් ඇති පුද්ගලයන් සඳහා නියමිත පිළිගැනීම ලබා දීමේ වැදගත්කම රජය විසින් හඳුනා ගෙන ඇති බැවින් ඔවුන් වෙනත් අය මත රඳා පැවැත්ම අවම කිරීමට ඔවුන් සවි බල ගැන්වීම පිණිස අවශ්‍ය පියවර ගනු ඇත. එමඟින් ජාතික සංවර්ධනයේ දී සමාන පාර්ශ්වකරුවන් ලෙස නැගී සිටීමට ඔවුන්ට හැකි වනු ඇත.

විදුලිබල මණ්ඩලය, ජලසම්පාදන මණ්ඩලය සහ ශ්‍රී ලංකා ටෙලිකොම්හි බාහිර ශ්‍රම සැපයුම් ආයතනවලින් බඳවා ගත් සේවකයන් අන්තර්ග්‍රහණය කිරීම

යථෝක්ත ආයතනවල වෘත්තීය සමිති නියෝජිතයන් අප වෙත ඉදිරිපත් කරන කරුණු ප්‍රකාර බාහිර ශ්‍රම සැපයුම් ආයතනවලින් බඳවා ගන්නා ලද සේවකයන් අවුරුදු 15කටත් වඩා වැඩි කාලයක් සේවයේ නිරත වී ඇත. ඔවුන් නියමිත සේවක සංඛ්‍යා වෙත අන්තර්ග්‍රහණය කර ගනු නොලැබුණි. වෘත්තීය සමිති මඟින් නිරතුරුවම ඉදිරිපත් කරන ලද කරුණු සලකා බලා මෙම ගැටලු නිරාකරණය කිරීම පිණිස එලෙස බඳවා ගත් අවුරුදු 07කට වඩා වැඩි කාලයක් සේවය කර ඇති සේවකයන් එම ආයතනවල සේවක මණ්ඩලවලට අවශෝෂණය කර ගැනීමට යෝජනා කරමි.

සරසවි මහපොළ ශිෂ්‍යත්වය වැඩි කිරීම

වසර 34කට පෙර මාගේ ගුරු වන දිවංගත ගරු ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා ආරම්භ කළ මහපොළ ශිෂ්‍යත්ව වැඩපිළිවෙල ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට අද වන විට විශාල අනුග්‍රහයක් වී ඇත.

2015 ජූලි මාසයේ සිට මහපොළ මාසික ශිෂ්‍යත්ව දීමනාව රුපියල් 5,000 දක්වා වැඩි කිරීමට යෝජනා කරනවා. මේ මඟින් වැඩි ශිෂ්‍ය පිරිසකට ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා දොරටු විවෘත වෙනු ඇත. මෙම වැඩි කිරීම මහපොළ භාරකාර අරමුදල සමඟ සාකච්ඡා කර ක්‍රියාත්මක කරනු ඇත.

පෙර පාසල් ගුරුවරුන්ට දීමනාවක් ගෙවීම

"ළමා දිරිය" නමින් වැඩසටහනක් ආරම්භ කොට 2015 ජූනි මස 01වැනිදා සිට පෙර පාසල් ගුරුවරුන්ට රුපියල් 250ක මාසික දීමනාවක් ලබා දෙනු ඇත. මෙම දීමනාව ළමා කටයුතු අමාත්‍යාංශයේ ලියා පදිංචි පෙර පාසල් ගුරුවරුන් සඳහා අදාළ වනු ඇත. මෙතෙක් කල් කථා කරලා තිබෙනවා. නමුත් තඹ ශතයක් වෙන් කරලා නැහැ. අතිගරු ජනාධිපතිතුමාත්, ගරු අගමැතිතුමාත් වහාම නිර්දේශ කරලා කිව්වේ, මේ සඳහා මෙවැනි දෙයක් ඉදිරිපත් කරන්න කියලායි.

දහම් පාසල් ගුරුවරුන් සඳහා දීමනා

දහම් පාසල් සඳහා "දැහැමි දිරිය" නමින් ආරම්භ කරන නව වැඩ පිළිවෙළක් යටතේ 2015 ජූනි මස 01වැනිදා සිට දහම් පාසල් ගුරුවරුන්ට රුපියල් 200ක දීමනාවක් මාසිකව ලබා දෙනු ඇත. මෙම දීමනාව සඳහා සුදුසුකම් ලැබීමට දහම් පාසල අදාළ ආගමික

අමාත්‍යාංශයේ ලියා පදිංචි විය යුතුයි. මේ සඳහා රුපියල් මිලියන 100ක මුදලක් තමයි වෙන් කර තිබෙන්නේ.

ස්වයං රැකියා නියුක්තිකයින් සඳහා විශ්‍රාම යෝජනා ක්‍රමය

2015 ජූලි මස සිට ක්‍රියාත්මක වන පරිදි ගොවි ජනතාව, ධීවර ජනතාව, ත්‍රිරෝද රථ රියදුරන්, පෙදරේරු හා වඩු කාර්මිකයන්, පෞද්ගලික ආරක්ෂක නිලධාරීන්, වතු සේවකයින් සහ පදික වෙළඳුන් සහ වඩු කාර්මිකයින් ඇතුළු ස්වයං රැකියාවල නියුක්තිකයන් සඳහා විශ්‍රාම යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ. මෙම යෝජනා ක්‍රමය බැංකු හා රක්ෂණ ආයතනවල සහභාගිත්වයෙන් ක්‍රියාත්මක කරනු ඇත.

ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනය වැඩිවීමේ ගැටලුවට පසු ගිය දශකයක කාලයක් තුළ පාලකයින් ප්‍රමාණවත් විසඳුමක් ලබා දී තිබුණේ නැත. අපේ රජය මේ සඳහා සුදුසු විසඳුමක් ඉදිරිපත් කර තිබෙනවා. මේ යටතේ දැනට විශ්‍රාම වැටුප් හිමිකමක් නැති සේවකයන්ට ඔවුන්ගේ කැමැත්ත පරිදි විශ්‍රාම යෝජනා ක්‍රමයකට දායක වීමට අවස්ථාවක් ලබා දෙනවා. මෙය ජූලි මාසයේ සිට ක්‍රියාත්මක වෙනවා.

ශ්‍රී ලංකන් ගුවන් සමාගම හා මිහින් ලංකා ගුවන් සමාගම ඒකාබද්ධ කිරීම

මේවායේ තිබෙන අධික අලාභය රටට දරා ගන්න බැහැ. පසු ගිය වසර කිහිපයක සිට ශ්‍රී ලංකන් ගුවන් සමාගම විශාල වශයෙන් පාඩු ලබා ඇත. පසු ගිය වසර පහ තුළදී පමණක් ලබා ඇති පාඩුව රුපියල් බිලියන 100කට වැඩියි. පසු ගිය පාලන කාලයේ කළමනාකරණ දුර්වලතා මෙම පාඩුවට ප්‍රධාන හේතුවක් වී ඇත. මෙවැනි විශාල පාඩුවක් අපි දරා තිබුණේ නැත්නම් එම මුදල්වලින් අපට ශ්‍රී ලංකන් ගුවන් සමාගමට අලුත් ගුවන්යානා ගණනාවක් මිලදී ගැනීමට හැකිව තිබුණා.

මිහින් ලංකා ගුවන් සමාගම ද තවත් එවැනි පාඩු ලබන ආයතනයක්. පසු ගිය වසර පහ තුළ එය දරා ඇති සමුච්චිත පාඩුව රුපියල් බිලියන 15ක් පමණ වෙනවා. මේ සියලුම අලාභ මේ රටේ මහ ජනයා විසින් දැරිය යුතුයි. ගෙවීමට ඉතිරිව ඇති සියලුම ණය මහ ජනයා ගෙවිය යුතුයි.

විශාල වශයෙන් පාඩු ලබන මෙම තත්ත්වයට එක් විසඳුමක් වශයෙන් මෙම ගුවන් සමාගම් දෙක ඒකාබද්ධ කිරීමට යෝජනා කරනවා. මෙය සම්පත් කාර්යක්ෂමව යෙදවීමටත් මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි කිරීමටත් යොදවන අතර ඒ තුළින් අලාභය ක්‍රමානුකූලව අඩු කළ හැකි වෙනවා.

දිවයින පුරා බැංකු පහසුකම් වැඩි කිරීම

දිවයිනේ බොහෝ ප්‍රදේශවල සතුටුදායක විය හැකි මට්ටමේ බැංකු සේවා පහසුකම් නොමැති බව අපි දන්නා කරුණක්. නමුත් බොහෝ නාගරික ප්‍රදේශවල සෑම වාණිජ බැංකුවකම ශාඛා ක්‍රියාත්මක වන බව අපි දැක තිබෙනවා.

මේ තත්ත්වය යථාවත් කොට වෙනස් කළ යුතු බව අපි දැඩි ලෙස විශ්වාස කරනවා. මේ නිසා දුෂ්කර ප්‍රදේශවල බැංකු ශාඛා ආරම්භ කරන ලෙස සියලුම වාණිජ බැංකුවලට දන්වා සිටිනවා. එමෙන්ම ආරම්භක තැන්පතුවක් නැතිව අලුත් සේවාදායකයින් සඳහා බැංකු ගිණුම් විවෘත කරන ලෙස ද වාණිජ බැංකුවලට දැනුම් දෙනවා.

මේ රටේ සියලුම පුරවැසියන්ගේ නමින් බැංකු ගිණුමක් ආරම්භ කිරීමට අවශ්‍ය සියලුම පියවර ගැනීමට අපි උත්සාහ ගනු ලබනවා. එමගින් ඉදිරියේදී මහ ජනයාට ලබා දෙන සියලුම දීමනා, ප්‍රදාන හා ගෙවීම් බැංකු පද්ධතිය හරහා සිදු කිරීමට අපට හැකිවෙනු ඇත.

ණය ගැනුම්කරුවන්ගේ පහසුව සඳහා බැංකු විශේෂයෙන් ණය දීම සඳහා යොදා ගන්නා රෙගුලාසි සහ ක්‍රමවේද සරල කරන ලෙස මම සියලුම බැංකුවලින් ඉල්ලා සිටිනවා. එසේ සරල කරන ලද ක්‍රමවේද 2015 සැප්තැම්බර් මස සිට ක්‍රියාත්මක කළ යුතුයි. මින් පසුව - අද සිට - බැංකු ගිණුමක් නැත්නම් ඒ සියලුම දෙනාට වාණිජ බැංකු තුළින් රුපියල් 250ක ආරම්භක මුදලකින් ගිණුම් විවෘත කර දෙන්න ඒ අය පොරොන්දු වී සිටිනවා.

රට තුළට රැගෙන එන විදේශ විනිමය සීමාව වැඩි කිරීම

ශ්‍රී ලංකාවට ගෙන ආ හැකි හෝ ප්‍රේෂණය කරන විදේශ විනිමයේ උපරිම සීමාව ඇමෙරිකන් ඩොලර් 25,000ක් කරනු ලැබේ. මෙහි අරමුණ වන්නේ විදේශ විනිමය ශ්‍රී ලංකාවට ගෙන එන පාර්ශ්වයන්ට වඩාත් පහසු ක්‍රියාවලියක් ඇති කිරීමයි.

විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ගාස්තු

ශ්‍රී ලංකාවේ විගමනික සේවක පිරිස රටේ සංවර්ධනය වෙනුවෙන් විශාල දායකත්වයක් ලබා දේ. එබැවින් දැනට ක්‍රියාත්මක වන විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියා පදිංචි ගාස්තුව රුපියල් 5,000 දක්වා අඩු කිරීමට යෝජනා කරන අතර, එය 2015 මැයි මාසයේ සිට ක්‍රියාත්මක වනු ඇත.

බුද්ධිමය දේපළ වාණිජකරණය කිරීම

කුමන රටකට වුවද, වර්තමාන ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ දී නව නිමැවුම් මෙන්ම විද්‍යාත්මක හා තාක්ෂණික දියුණුව ද අත්‍යවශ්‍යය. නව නිමැවුම් හා සොයා ගැනීම් තුළින් අද ජනතාවගේ ජීවන තත්ත්වය විශාල වශයෙන් වැඩිදියුණු වී වෙනස් වී තිබෙනවා. එමෙන්ම නව නිමැවුම් හා සොයා ගැනීම් ක්‍රියාවලිය දිගින් දිගටම සිදු කෙරෙමින් පවතිනවා.

ශ්‍රී ලංකාවේ නව නිමැවුම්කරුවන් ද විශ්මිත නිර්මාණ බිහිකොට තිබෙනවා. ඔවුන්ට තම නිමැවුම් සඳහා පේටන්ට් අයිතිය ලබා ගැනීමට ද හැකි වී තිබෙනවා. කෙසේ වෙතත්, මෙම නව සොයා ගැනීම් වාණිජකරණය වී ඇති ප්‍රමාණය පිළිබඳව නම් කොහොමටවත් අපට සතුටු වෙන්න බැහැ. මේ නිසා නව නිමැවුම්කරුවන්ට තම නිමැවුම් වාණිජ මට්ටමට ගෙන ඒමට විශේෂිත දිරිගැන්වීමක් ලබා දෙනවා. මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමට රුපියල් මිලියන 100ක් වෙන් කරනවා.

පොදු ප්‍රවාහන පහසුකම් භාවිත කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ පුරවැසියනට මගී ගමන් කාඩ්පතක් ලබා දීම

රටේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ලබා දෙන පහසුකම් වැඩි කිරීම අපි සෑම දෙනාගේම අනිවාර්යය වගකීම බවට පත් වී තිබෙනවා. මේ අනුව, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට බස් ගාස්තුවෙන් සියයට 50ක් පමණක් අය කර ගමන් කිරීමට මගී ගමන් කාඩ් එකක් ලබා දීමට ලංකා පෞද්ගලික බස් රථ හිමිකරුවන්ගේ සංගමය එකඟ වී තිබෙනවා. මෙවැනි වැදගත් යෝජනාවකට සහයෝගය දැක්වීම පිළිබඳ ලංකා පෞද්ගලික බස් රථ හිමිකරුවන්ගේ සංගමයට කෘතගුණ දැක්වීමට මා මේ අවස්ථාව යොදා ගන්න කැමැතියි.

ධීවර ප්‍රජාව සඳහා රක්ෂණ යෝජනා ක්‍රමයක්

දින 100 විප්ලවීය වැඩසටහන මඟින් පොරොන්දු වූ පරිදි ධීවර ප්‍රජාව වෙනුවෙන් මුදල් අමාත්‍යාංශයේ සහයෝගය මත නව රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දෙනවා. මෙම රක්ෂණ යෝජනා ක්‍රමය ධීවර අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ඇත. මෙම යෝජනා ක්‍රමය යටතේ එක් ධීවරයෙකුට රුපියල් මිලියනයක ජීවිත රක්ෂණාවරණයක් ලබා දීමට යෝජනා කරනවා.

අනේවාසික විදේශ මුදල් ගිණුම් හිමියන්ට ලබා දෙන පොලී අනුපාතය වැඩි කිරීම

වාණිජ බැංකුවල ආරම්භ කොට ඇති අනේවාසික විදේශ මුදල් ගිණුම්වල තැන්පත් කොට ඇති ශ්‍රී ලාංකික විගමනික සේවකයන්ගේ ඉතිරි කිරීම් සඳහා ලැබෙන පොලී ප්‍රමාණය වාර්ෂිකව සියයට 3ට වඩා අඩුය. මේ අතර ශ්‍රී ලංකාව සියයට 5.5ක පමණ පොලී අනුපාතයක් යටතේ ස්වෛරීත්ව බැඳුම්කර මඟින් විදේශ ණය ලබා ගෙන ඇත. මේ නිසා ශ්‍රී ලංකාවේ විගමනික සේවකයන් ඉතා දුක් මහන්සියෙන් උපයා ගෙන ඇති මුදල් සඳහා ආකර්ෂණීය පොලී අනුපාතයක් ලබා දීමට අනේවාසික විදේශ මුදල් ගිණුම් සඳහා ගෙවන පොලිය සියයට 5 දක්වා වැඩි කිරීමට මම යෝජනා කරනවා.

අනේවාසික විදේශ මුදල් ගිණුම්වල තැන්පත් කර තිබෙන්නේ දීර්ඝ කාලයක් තිස්සේ තමන්ගේ ආදරණීය සමීපතමයන්ගෙන් බැහැරව දුරබැහැර රටවල සේවයේ යෙදී උපයා ගන්නා මුදල්. මේ අය ජාතික ආර්ථිකයේ දියුණුව සඳහා සිදු කර ඇති දායකත්වය මිල කළ නොහැකියි.

විදේශගත ශ්‍රී ලාංකිකයන් සඳහා ජාතික සංවර්ධන බැඳුම්කර නිකුත් කිරීම

ශ්‍රී ලාංකික පුරවැසියන් දශ ලක්ෂ දෙකක් පමණ විදේශ රටවල්වල ජීවත් වන අතර ඔවුන්ගෙන් විශාල ප්‍රමාණයක් සාපේක්ෂ වශයෙන් ඉහළ ආදායම් උපයන සංවර්ධිත රටවල්වල ජීවත් වෙති. එම රටවල සාපේක්ෂ වශයෙන් අඩු පොලී මට්ටම් පවතින බැවින් ඔවුන්ගේ ඉතිරිකිරීම්වලට ලැබෙන්නේ සියයට 1ට වඩා අඩු පොලී ප්‍රමාණයකි.

මේ තත්ත්වය යටතේ රජය විදේශගත ශ්‍රී ලාංකිකයන්ගෙන්, විශේෂයෙන් උතුරු පළාතෙන් විදේශගතව සිටින ශ්‍රී ලාංකිකයන්ගෙන් මේ රටේ සංවර්ධන ක්‍රියාවලියට දායක වන ලෙස ඉල්ලා සිටිනවා. මේ සඳහා අවුරුදු 5කින් කල් පිරෙන, සියයට 4.5ක ස්ථාවර පොලියකට සහ ඇමෙරිකානු ඩොලර් 25,000ක අවම ආයෝජන සීමාවකට යටත්ව "ජාතික සංවර්ධන බැඳුම්කර" නමින් විශේෂ රජයේ බැඳුම්කර නිකුත් කිරීමට මා යෝජනා කරනවා. මේ තුළින් ඇමෙරිකන් ඩොලර් බිලියන 10ක් අපට හොයා ගන්න පුළුවන් වෙයි කියලා අපි ඇස්තමේන්තු කරනවා.

මෙම බැඳුම්කරවලට අදාළ පොලී ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කරනු ලබනවා. මෙම බැඳුම්කර නිකුතුව සාර්ථක කර ගැනීම සඳහා සක්‍රිය ලෙස දායක වන ලෙස වාණිජ බැංකුවලින් ඉල්ලා සිටිනවා.

ජාතික සංවර්ධන බැඳුම්කර හඳුන්වා දීමෙන් ආයෝජකයන්ට ඉහළ පොලී ආදායමක් ලබා ගැනීමට හැකි වන අතර ඒ තුළින් ජාතික ප්‍රතිසංධානය සහ සංවර්ධනය වැඩිදියුණු කිරීමට ද හැකි වේ. මේ මඟින් රටේ විදේශ සම්පත් සංචිත ශක්තිමත් කර ගැනීමට ද හැකිවේ.

ණය කාඩ්පත් හරහා ලබා දෙන ණය සඳහා පොලී අනුපාත සීමාවක් පැනවීම

ණය කාඩ්පත් හරහා ලබා දෙන ණය සඳහා වාණිජ බැංකු ඉතා ඉහළ පොලී ප්‍රමාණයක් අය කරන බවට පැමිණිලි විශාල වශයෙන් අපට ලැබී තිබෙනවා. මේ තුළින් ණය කාඩ්පත් පාරිභෝගිකයන්ට අහිතකර පරිසරයක් නිර්මාණය වී ඇති අතර ණය කාඩ්පත් කර්මාන්තයේ සංවර්ධනයට ද එය ඉතා අහිතකර ලෙස බලපා ඇත.

මේ නිසා ණය කාඩ්පත් හරහා ලබා දෙන ණය සඳහා සාමාන්‍ය ණය සඳහා අය කරන පොලී අනුපාතයට වඩා උපරිම වශයෙන් සියයට 8ක පොලී අනුපාත සීමාවක් පැනවීමට මම ඉල්ලා සිටිනවා. දැනට අය කරන සියයට 40, 50 පොලිය සියයට 30 දක්වා අඩු කරනවා.

ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් වාණිජ බැංකු මෙම කොන්දේසි ක්‍රියාත්මක කිරීම පිළිබඳ අධීක්ෂණය කිරීමට කටයුතු කරනු ඇත. මෙම කොන්දේසි උල්ලංඝනය කරන අවස්ථාවලදී සුදුසු පරිදි තදින් ක්‍රියා කිරීමට අපට සිදු වෙනවා.

රටේ පොදු ජනතාව ජීවත් කරවීමටත් ඔවුන්ගේ ජීවන මට්ටම ඉහළ දැමීමටත් ණය කාඩ්පත භාවිතය ඉතාමත් හොඳ මෙවලමක් වශයෙන් භාවිත කළ හැකිව තිබුණ ද මේ දක්වා සිටි පාලකයන් ණය කාඩ්පත් හරහා අය කරන පොලී ප්‍රමාණය නියාමනය කිරීමට කිසිදු පියවරක් ගෙන නොමැති වීම ඉතාමත්ම අවාසනාවන්ත තත්ත්වයක්.

ණය කාඩ්පත් භාවිතය තුළින් විශාල ආර්ථික සහ සමාජ ගැටලු ඇති විය හැකි බැවින්, විශේෂයෙන්ම තරුණ පරම්පරාව ණය කාඩ්පත් භාවිත කිරීමේ දී බුද්ධිමත්ව සහ මනා සැලකිල්ලකින් කටයුතු කළ යුතු බවට අවවාදාත්මකව දැන්වීමට කැමැතිය.

ක්ෂුද්‍ර මූල්‍ය ණය සඳහා පොලී අනුපාත සීමාවන් පැනවීම

ක්ෂුද්‍ර මූල්‍ය අංශය රටේ ආර්ථිකයට ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි. මේ වන විට රට තුළ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන 10,000කට වැඩි ප්‍රමාණයක් තිබෙන බවට වාර්තා වී ඇත. මෙම ආයතනවලට රටේ විශාල ජන කොටසක් ආවරණය කිරීමට හැකි වී තිබෙනවා.

මේ රටේ ජනතාවගේ ආදායම් ඉපැයීමේ අවස්ථා වැඩි කිරීමටත් ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ දැමීමටත් ක්ෂුද්‍ර මූල්‍ය අංශයට වැදගත් කාර්ය භාරයක් කළ හැකි බව අප හඳුනා ගෙන තිබෙනවා.

ක්ෂුද්‍ර මූල්‍ය ආයතන අය කරන පොලි අනුපාත විශාල වශයෙන් වෙනස් වෙනවා. මෙම විශාල වශයෙන් වෙනස්වන ඉහළ පොලි අනුපාත ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ දියුණුවට බාධාවක් වී ඇති අතර අනෙක් අතින් සමාජයේ දිළිඳු ජන කොටස දරිද්‍රතාවයෙන් ගලවා ගැනීමට තිබූ හොඳම අවස්ථාවක් ද මේ තුළින් ඇහිරී ගොස් තිබෙනවා.

සියලුම ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් ලබා දෙන ආයතන විසින් සමස්ත සහභාගීත්වය සංකල්පය අනුගමනයකොට ස්වකීය සේවා දායකයන් වෙනුවෙන් වඩා සිත් ගන්නා සුළු පොලි අනුපාතිකයක් යටතේ අරමුදල් ලබා දෙමින් විශාල බලපෑමක් කිරීමට හැකි වී ඇති බවට සඳහන් කරනවා.

ක්ෂුද්‍ර මූල්‍ය සම්පාදන කර්මාන්තයේ සැබෑ පොලි අනුපාතය වසරකට උපරිම වශයෙන් සියයට 40කට සීමා කිරීමට කටයුතු කෙරේ.

සුළු හා මධ්‍ය පරිමාණ ක්ෂේත්‍රයේ ආයතනවලට ඔවුන්ගේ කර්මාන්ත යළි පණ ගැන්වීම සඳහා විශේෂ වැඩසටහන

බැංකු පද්ධතියේ ආධාරයෙන් කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත නඟා සිටුවීම පිණිස නවෝත්පාදන වැඩසටහනක් මුදල් අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කෙරේ. ඒ යටතේ ණය උගුලට හසු වී ඇති එවැනි කර්මාන්තකරුවන්ට සහන ලබා දෙන අතර එමඟින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තයන්හි විභව ශක්තිය මතු කර ගැනීමට ද අපේක්ෂිතය.

ණය තොරතුරු කාර්යාංශයේ ලැයිස්තුගත වී ඇති සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට සහ ණය කාඩ්පත් හිමියන්ගේ දුෂ්කරතා වෙනුවෙන් සහන

ණය තොරතුරු කාර්යාංශයේ ලැයිස්තුගත වී ඇති සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ සහ ණය කාඩ්පත් හිමියන්ගේ පවත්නා පොලි උපලේඛනගත කිරීමට හැකි ණය සඳහා මුදල් අමාත්‍යාංශය මැදිහත්වීමෙන් රුපියල් 250,000 දක්වා වන ණය මුදල්වලට වාණිජ බැංකු හරහා සහන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනු ඇත.

තැන්පතු වගකීම් සහිත අකර්මණ්‍ය වූ බැංකු නොවන මූල්‍ය ආයතන

මහ බැංකුවේ සහ මුදල් අමාත්‍යාංශයේ මැදිහත්වීමෙන් අකර්මණ්‍ය වූ බැංකු නොවන මූල්‍ය ආයතනවල තැන්පතු පැවැති තැන්පතු හිමියනට සහන සලසා දීමට සියලු ප්‍රයත්නයන් දරනු ඇත. මෙම ගැටලුවට සාධාරණ විසඳුමක් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් මෙම දුෂ්කරතාවයන් ජනිත කළ මූල්‍ය ආයතන අධ්‍යක්ෂවරුන් මෙන්ම තැන්පත්කරුවන්ගේ නියෝජිතයන් සමඟ සාකච්ඡා ආරම්භ කිරීමට පියවර ගනු ලැබේ. මෙම ක්‍රියාවලිය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධීක්ෂණය කරනු ඇත. මේ සඳහා විශේෂ පුද්ගලයෙක් සභාපතිවරයෙක් වශයෙන් පත් කර මෙම ප්‍රශ්නය මාස 6ක් අවසන් වීමට කලින් විසඳීමට මම නිර්දේශ කරනවා.

රාජ්‍ය ආයතනවල වෙළෙඳ දැන්වීම් සීමා කිරීම

දේශපාලන නායකයන් වෙනුවෙන් රජයේ ආයතනවල වියදම්වන් පුවත් පත්වල වෙළෙඳ දැන්වීම් ප්‍රචාරය කිරීම බහුල වශයෙන් සිදු වන බව අපට පෙනී ගොස් ඇත. දේශපාලන පසුබිමක් සහිත එවැනි වෙළෙඳ දැන්වීම්වලින් සිදු වී ඇත්තේ රජයේ වියදම්වලට බරක් ඇති කිරීම පමණි.

එබැවින්, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් දේශපාලන ස්වරූපයේ වෙළෙඳ දැන්වීම් පළ කිරීම වහාම ක්‍රියාත්මක වන පරිදි නතර කළ යුතුය. අත්‍යවශ්‍යවන්නා වූ ප්‍රචාරක දැන්වීමක් පළ කිරීමට අවශ්‍ය වන්නා වූ අවස්ථාවක අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් එය අනුමත කළ යුතුවේ.

එමෙන්ම රජයේ ආයතනවල අමාත්‍ය මණ්ඩල සාමාජිකයන් හා සභාපතිවරුන් විසින් දේශපාලන පසු බිමක් සහිත ප්‍රචාරක වෙළෙඳ දැන්වීම් පළ කිරීමෙන් වැලකී සිටිය යුතු වනවා මෙන්ම අනවසරයෙන් එවැනි දැන්වීම් පළ කිරීමේ දී වැය වන මුදල් පුද්ගලිකව දැරිය යුතුව ඇත.

එමෙන්ම, මෙය රාජ්‍ය ආයතන විසින් ප්‍රකාශ කරනු ලබන දේශපාලනඥයින්ගේ රූප හා තොරතුරු ඇතුළත් කැලැන්ඩර්, දින පොත් ආදිය ප්‍රසිද්ධ කිරීම සඳහා ද අදාළ වනු ඇත.

ඖෂධ අංශය

ඖෂධ ආනයනය සඳහා විශාල විදේශ විනිමය ප්‍රමාණයක් වාර්ෂිකව මෙරටින් පිට රටට ගලා යයි. එමෙන්ම, මේ රටේ ඖෂධ නිෂ්පාදනය සඳහා විශාල විභවයක් ද ඇත. මෙම කරුණු සැලකිල්ලට ගෙන දේශීය සහ විදේශීය ඖෂධ නිෂ්පාදකයින්ට මේ රටේ ඖෂධ නිෂ්පාදනය සඳහා ආයෝජනය කිරීම සඳහා උනන්දු කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. ඔවුන්ගේ නිෂ්පාදන සඳහා ස්ථාවර වෙළෙඳ පොළක් සහතික කිරීමට පෙර ගැණුම් ගිවිසුම්- buyback scheme -හදුන්වා දෙනු ලැබේ. මුළු රටටම බිලියන 40ක -මුළු අවශ්‍යතාවයෙන් සියයට 65ක් 70ක්- ඖෂධ ආනයනය කරනවා. මේවා රටේම නිෂ්පාදනය කිරීමට පුළුවන් වන වැඩ පිළිවෙළක් තමයි අපි මේ ඉදිරිපත් කළේ.

යටි වගා කටයුතු සඳහා දිරි ගැන්වීම (Intercropping Activities)

රටේ ඉඩම්වලින් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා කෘෂිකර්ම ක්ෂේත්‍රයේ යටි වගා කටයුතුවල යෙදී සිටින ව්‍යාපාරිකයන්ට බදු සහන ලබා දීමට මම යෝජනා කරනවා. මෙම කටයුතුවලින් උපයා ගන්නා ලාභ සඳහා ගෙවිය යුතු ආදායම් බදු සියයට 50කින් අඩු කිරීමට යෝජනා කරනවා.

එළවලු සහ ආහාර සැකසුම් කර්මාන්ත

දේශීය එළවලු සහ පලතුරු නිෂ්පාදනයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අපතේ යන බවට නිරීක්ෂණය කර ඇත. මේ රටේ එළවලු සහ ආහාර සැකසුම් කර්මාන්තකරුවන් දිරි ගැන්වීම සඳහා එම ක්ෂේත්‍රයේ ව්‍යාපාර ආරම්භ කරන ව්‍යාපාරිකයන්ගේ බදු සියයට 50කින් අඩු කිරීමට මම යෝජනා කරනවා.

දේශීය ඉදි කිරීම් සමාගම් ජාත්‍යන්තර මට්ටමට පුළුල් කිරීමට දිරිගැන්වීම

දේශීය ඉදි කිරීම් කර්මාන්ත සමාගම් තම ධාරිතාවය සහ හැකියාවන් වර්ධනය කරගෙන ඇත. මේ තත්ත්වය යටතේ දේශීය ඉදි කිරීම් සමාගම්වලට තම කටයුතු විදේශීය රටවලට ව්‍යාප්ත කිරීමට අවශ්‍ය දිරිගැන්වීම් කළ යුතුය. ඒ අනුව විදේශීය කටයුතුවලින් දේශීය කොන්ත්‍රාත්කරුවන් උපයන ලාභ ආදායම් බදුවලින් නිදහස් කිරීමට මම යෝජනා කරනවා.

ඒ වාගේම ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තයේ යෙදී සිටින විදේශීය කොන්ත්‍රාත්කරුවන් දේශීය පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධ වී කටයුතු කළ යුතු යැයි ද මම යෝජනා කරනවා. මේ මඟින් රටට අලුත් තාක්ෂණ දැනුමක් ලැබෙන අතර දේශීය ජනතාවට රැකියා අවස්ථා ද නිර්මාණය වේ.

පසු ගිය මාස 6 තුළදී පිරිනමන ලද කොන්ත්‍රාත් පිළිබඳව විමර්ශනය කිරීම

ප්‍රාග්ධන වියදම් ඇතුළත් ප්‍රධාන ගණයේ ව්‍යාපෘති වෙනුවෙන් පිරිනමන ලද කොන්ත්‍රාත් පිළිබඳ විමර්ශනයක් ආරම්භ කරනු ඇත. එවැනි ව්‍යාපෘතිවල පිරිවැය පිළිගත හැකි මට්ටමක පවතීද යන්නත්, කොන්ත්‍රාත් පිරිනැමීමේදී අදාළ පටිපාටි අනුගමනය කර ඇත්ද යන්නත් විමර්ශනයට ලක් කරනු ඇත.

පසු ගිය කාලයේදී ක්‍රියාත්මක කළ බොහොමයක් ව්‍යාපෘති නොකැඳවූ -unsolicited- යෝජනා ක්‍රමය යටතේ විධිමත් ඇගයීමේ යාන්ත්‍රණයක් අනුගමනය නොකර තෝරාගෙන ක්‍රියාත්මකකොට ඇත. කෙසේ වුවද මින් ඉදිරියේදී සියලුම ව්‍යාපෘති විනිවිදභාවයෙන් යුතුව සුදුසු පරිදි ඇගයීම සඳහා ආර්ථික කටයුතු සහ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය යටතේ කමිටුවක් ස්ථාපිත කිරීමට අප පියවර ගන්නවා.

ගොඩනැඟිලි ඉදිකිරීම සහ ඉඩම් මිලදී ගැනීම සඳහා සේවක අර්ථ සාධක අරමුදල් ලබා ගැනීම

ඉඩම් මිලදී ගැනීමට සහ නිවාස ඉදිකිරීම සඳහා සේවක අර්ථ සාධක අරමුදලේ විශේෂයෙන් සියයට 30ක් ලබා දෙන ලෙස සේවකයින් සහ වෘත්තීය සංගම් දීර්ඝ කාලයක සිට ඉල්ලීම් ඉදිරිපත් කර තිබේ. මෙම සේවකයන්ගේ ඉල්ලීම් ලබා දීමට මම යෝජනා කරනවා. මේ සම්බන්ධයෙන් ජෝශප් මයිකල් පෙරේරා ඇමතිතුමා දැඩි වෙහෙස මහන්සියක් දැරුවා. ඒක දැන් ක්‍රියාත්මක කරනවා.

නාස්තිය හා දූෂණය

අපගේ රජය නාස්තිය හා දූෂිත ක්‍රියාකාරකම් පිළිබඳව අවධානයෙන් සිටින අතර ඒවා පිටු දැකීම පිළිබඳව අවධානය යොමු කොට ඇත. පූර්වගාමී රජයේ අදූරදර්ශී පාලන කාලයේදී සිදු කරන ලද මහජන මුදල් අවභාවිතය, අරමුදල් නිසි ලෙස පාලනය කළ යුතු බවට අපට පාඩම් කියා දේ. දූෂණ පිටු දැකීම සඳහා අපගේ රජය සෑම පියවරක්ම ගනිමින් දූෂණය නාස්තිය අඩු කිරීමට නොව එය නැත්තට නැති කිරීමට කටයුතු කරනවා. ජාතික ඉතිරිකිරීමේ බැංකුව, ජාතික ලොතරැයි මණ්ඩලය වාගේ ආයතනවල දූෂණ හෙළිදරව් වෙලා තිබෙනවා. එවැනි දූෂණ ක්‍රියා වහාම නවත්වන්න කටයුතු ක්‍රියාත්මක කරගෙන යනවා. දූෂණය හා නාස්තිය පිළිබඳව උදාහරණ කිහිපයක් පහත දක්වමු.

ජාතික ලොතරැයි මණ්ඩලයේ අරමුදල් දේශපාලන අරමුණු සඳහා යොදවා ගැනීම.

ලැබී ඇති තොරතුරු අනුව දළ වශයෙන් රුපියල් මිලියන 270ක් පමණ ජාතික ලොතරැයි මණ්ඩලයේ අරමුදල් දේශපාලන අරමුණු සඳහා යොදවා ගෙන ඇත. මෙවැනි වැරදි සහගත ලෙස අරමුදල් යෙදවීම අවාසනාවන්ත කරුණකි. ඉතාමත් අවාසනාවන්ත කරුණක් වන්නේ සංවර්ධන ලොතරැයි මණ්ඩලය මහපොළ ප්‍රතිලාභීන් සඳහා අරමුදල් යෙදවීමට උත්සාහ දරා නොතිබීම සහ සෞඛ්‍ය අමාත්‍යාංශයටද හෘදය රෝගීන්ගෙන් ශල්‍යකර්ම සිදු කිරීම සඳහා අරමුදල් නොමැති කමින් රෝගීනට දීර්ඝ කාලයක් පොරොත්තු ලේඛනයේ සිටීමට සිදුවන තත්ත්වයක සිට මෙවැනි නාස්තිකාර කටයුතු සිදු කිරීමයි.

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ කොටස් ගනුදෙනු

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ හා මුදල් අමාත්‍යාංශයේ අවධානයෙන් සිටින නිලධාරින් නිසා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සිදු වන්නට ගිය මහා පරිමාණ කොටස් ගනුදෙනුවක් වැළකී ගොස් ඇත. මෙම ගනුදෙනුවට සම්බන්ධවූවන් අධිකරණ ක්‍රියාවලියකට ගෙන එන බවට අපේ රජය පොරොන්දු වෙනවා.

උතුරු අධිවේගී මාර්ගයේ ඇස්තමේන්තුගත පිරිවැය ඉක්මවා යාම

අප වෙත ලැබී ඇති තොරතුරු අනුව උතුරු අධිවේගී මාර්ගයේ ඇස්තමේන්තුව නැවත අගයීමට ලක් කළ විට රුපියල් බිලියන 50ක පමණ ඇස්තමේන්තුගත පිරිවැය ඉක්ම යාමක් වාර්තා වේ.

දූෂණය ගැන කථා කරනකොට MI 17 හෙලිකොප්ටර් යානා මිලදී ගැනීම ගැනත් පෙන්වා දෙන්න පුළුවන්. මෙවැනි හෙලිකොප්ටර් යානා 17ක් ගෙනැල්ලා තිබෙනවා, ඇමෙරිකන් ඩොලර් මිලියන 450කට. එහි සැබෑ මුදල වශයෙන් දැන් සාක්ෂාත් වෙලා තිබෙන්නේ, මිලියන 200යි. ඒ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදු කරනවා කියන එක මේ අවස්ථාවේදී මා මතක් කරන්න කැමැතියි.

MI 17 හෙලිකොප්ටර් මිලදී ගැනීම

අප වෙත ලැබී ඇති විශ්වාසදායක තොරතුරු අනුව මෙම කාරණය ගැන වියදම් කළ ඇමෙරිකන් ඩොලර් මිලියන 450ක මුදල ඩොලර් මිලියන 200ක් විය හැකි වන පරිදි සාකච්ඡා සම්මුති මඟින් එකඟතාවකට පත් විය හැකිව තිබුණි. ඇමෙරිකන් ඩොලර් මිලියන 250ක් (රුපියල් බිලියන 33ක්) මෙමඟින් අහිමි වී ඇත.

සීෂෙල්ස් - බදු කෙම්බිම

සීෂෙල්ස් රට තුළ ශ්‍රී ලංකාව විසින් සිදු කර ඇති උපායශීලී නොවන ආයෝජන පිළිබඳ විමර්ශනයක් කිරීම සඳහා නිල විගණනයක් සහ පරීක්ෂණ ක්‍රියාවලියක් ආරම්භ කෙරේ. සීෂෙල්ස් රට ලෝකයේ බදු කෙම්බිමක් ලෙස සැලකෙන අතර එහි සුළුතරයක් ශ්‍රී ලාංකිකයන් පදිංචිව සිටියි. මෙහිදී මතුවන තවත් කරුණක් වන්නේ සීෂෙල්ස්හි රාජ්‍ය බැංකුවක ජාත්‍යන්තර ශාඛාවක් පිහිටුවීමේ හේතුව යුක්ති සහගතද යන්නයි. අප රජය මෙවැනි කටයුතු සඳහා හේතු වූ කරුණු පිළිබඳව විග්‍රහයක් කිරීමට හා ගැඹුරු ඇගයීමක් කරන බවට සහතික වෙනවා.

පොදු රාජ්‍ය මණ්ඩලීය තරග සඳහා ලංසු ඉදිරිපත් කිරීම

සම්පත් නාස්තිය රටක ආර්ථිකයකට ඉතාමත් අහිතකර ලෙස බලපාන ආකාරය පිළිබඳ හොඳම උදාහරණ පසු ගිය පාලනය අපට පෙන්වා දී ඇත. රජය විසින් මහජනතාවගේ මුදල් රුපියල් මිලියන 760කට වැඩි ප්‍රමාණයක් පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා ශ්‍රී ලංකාවේ පැවැත්වීමට ලංසු ඉදිරිපත් කිරීම සඳහා වියදම් කොට ඇත. සමහර රාජ්‍ය නිලධාරින්ද මෙම ක්‍රියාවලියට සෘජුව මැදිහත් වී රජය මේ සඳහා පොළඹවා තිබීම කනස්සල්ලට කරුණක්.

ශ්‍රී ලංකන් ගුවන් සමාගම හා ප්‍රභූ පැකේජ

පාඩු ලබන ශ්‍රී ලංකන් ගුවන් සේවය මැතකදී සිදු කරන ලද ගුවන් යානා මිලදී ගැනීම් තවත් අනවශ්‍ය නාස්තිකාර වියදමකි. මෙම ගුවන් යානා සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 15ක් (රුපියල් බිලියන 1.95ක්) වටිනා ප්‍රභූ පැකේජයක් අඩංගු කර ඇති අතර එය නොමිලයේ පිරිනමා ඇත. මෙහිදී මතුවන ගැටලුව වන්නේ ප්‍රභූ පැකේජය නොමැතිව මෙම ගුවන් යානාවේ මිල සාකච්ඡා සම්මුති මඟින් අඩු කර ගැනීමට කටයුතු නොකිරීමයි. මෙය තවත් මහා පරිමාණ ගනුදෙනුවක කොටසක්ද යන්න පිළිබඳව අපට සැක මතුවේ. අපගේ රජය, මේ ආකාරයේ නාස්තිකාර වියදම් නැවත සිදු නොවන බවට වග බලා ගනු ඇත.

සංචාරක වෙළෙඳපොළ සඳහා ඇඟලුම් හා උපාංග

ආනයනය කරන ලද සන්නාම නාම සහිත නිෂ්පාදන හා ශ්‍රී ලාංකික නිෂ්පාදන විදේශීය සංචාරකයන් මිලදී ගනු ලැබේ. ඒ නිසා දැනට පවත්නා සන්නාම නාම සහිත ආනයනික භාණ්ඩවල දැනට පවත්නා බදු නැවත ඇගයීම සඳහා බදු පිළිබඳව විස්තරාත්මක අධ්‍යයනයක් සිදු කිරීමට කටයුතු කෙරේ. එමඟින් ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශීය සංචාරකයන්ට සන්නාම නාම සහිත ආනයනය කරන ලද භාණ්ඩ අඩු මිලකට ලබා ගැනීමට අවස්ථාව සැලසෙනු ඇත.

"වයි-ෆයි" පහසුකම්

අන්තර් ජාල හා සමාජ ජාල වෙබ් පහසුකම් හි වැඩි වීමේ ප්‍රවනතාවක් නිරීක්ෂණය කළ හැකි බැවින් ඒ හරහා දැනුම වර්ධනය සඳහා තොරතුරු හා අධ්‍යාපන ක්ෂේත්‍රයන්හි තීරණාත්මක කාර්ය භාරයක් ඉටු කරයි. මෙම වයි-ෆයි පහසුකම් ශ්‍රී ලංකාවේ සැමටම ලැබෙන පරිදි පුළුල් වීමේ අවශ්‍යතාවක් පවතී. ප්‍රධාන නගර ආශ්‍රිත මධ්‍යස්ථාන සඳහා නොමිලේ වයි-ෆයි පහසුකම් ලබා දීමට රුපියල් මිලියන 500ක් වෙන් කොට ඇත.

යෝජිත ආදායම් සහ වියදම් යෝජනාවල සාරාංශයක් මෙම ප්‍රකාශයේ වගු I සහ IIහි සඳහන් වේ. 2015 විසර්ජන පනත් කෙටුම්පතට අනුව සමස්ත දළ ණය ගැනීමේ සීමාව සහ 2015 සංශෝධිත අය වැයෙහි සාරාංශයක් වගු III සහ IVහි දක්වා ඇත.

"අපට දුප්පතුන් ඉක්මනින් පොහොසතුන් කළ නොහැකිවූවත් නැති බැරිකමින් තොර සමාජයක් ඉක්මනින් ගොඩනැඟිය හැකිය"

සමාප්තිය

අය වැය ලේඛනය සම්පාදනය කිරීම සඳහා අත්‍යවශ්‍ය සාධක ලෙස නියමිත කාල සීමාවක් සහ අවශ්‍ය කරන දත්තයන් දැක්විය

හැක. දින 20ක කාල සීමාවක් තුළ සම්පාදනය වූ මෙම වාර්තාව මගේ අමාත්‍යාංශයේ නිලධාරින්ගේ සාමූහිකත්වය හා කැපවීම විදහා දක්වා ඇත.

"දින සියයේ විප්ලව" කාල සීමාව තුළ මෙම වාර්තාව ඉදිරිපත් කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයේ නිලධාරින් සුවිශාල කාර්ය භාරයක් ඉටුකොට ඇත. තවද, මෙම වාර්තාව සකසාලීමේදී යම් අත්වැරැද්දක් සිදු වී ඇත්නම් එය හුදෙක් සීමා සහිත කාල සීමාවක් තුළ මෙවැනි වාර්තාවක් සම්පාදනය කිරීමට ඇති අපහසුතාව මත සිදු වූවක් ලෙස සලකන ලෙස මෙම උත්තරීතර සභාවේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිමි.

ගරු කථානායකතුමනි, මෙම වාර්තාව සම්පාදනය කළ කාල සීමාව තුළ නිදි වරමින් කළ කැපවීමට මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා සහ ඔහුගේ කාර්ය මණ්ඩලයට මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා.

තවද ගරු කථානායකතුමා, අතිගරු ජනාධිපතිතුමා සහ අපේ ගරු අග්‍රාමාත්‍යතුමා, ගරු විපක්ෂ නායකතුමා සහ මෙම උත්තරීතර සභාවේ රැඳී සිටි සියලුම ගරු මන්ත්‍රීවරුන්ටත් මගේ අවංක ස්තුතිය පුද කරනවා.

අද දින ශ්‍රී ලාංකික ජනතාවට සුවිශේෂි දිනයක් මෙන්ම සතුටු දනවන දිනයක්ද වී ඇති බව මා විශ්වාස කරනවා.

අපේ මව් බිමට තෙරුවන් සරණයි!

අපේ මව් බිමට දෙවියන්ගේ ඉහළම ආශිර්වාදයේ පිහිට ලැබේවා! God Bless Sri Lanka!

ගරු කථානායකතුමාත්, ගරු අගමැතිතුමාත් ඇතුළු සියලුම දෙනාට තේ පැන් සංග්‍රහයට ආරාධනා කරනවා. බොහොම ස්තුතියි.

වගුව I : ආදායම් යෝජනා සාරාංශය

රු. මිලියන

විශේෂ වෙළඳ භාණ්ඩ බදු සංශෝධනය	(8,350)
තිරිගු ඇට ආනයන බදු ඉවත්කිරීම	(8,000)
සුපිරි නිවාස බද්ද	1,000
සංක්‍රමණික බද්ද	100
සුපිරි ලාභ බද්ද	50,000
උ. වි. ගෙ. බද්දට යටත්වන සීමාවන් සංශෝධනය	(575)
ත්‍රිරෝද රථ සහ යතුරු පැදි අමතර කොටස් ආනයන බදු ඉවත්කිරීම	(500)
මෝටර් රථ ආනයනය මත නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු සංශෝධනය	7,000
කැසිනෝ විශේෂ බද්ද	5,000
ඔට්ටු සහ සූදු බලපත්‍ර ගාස්තු	400
මත්පැන් සහ බියර් නිෂ්පාදන විශේෂ බද්ද	5,000
රටබීම හල් සහ තැබෑරුම් විශේෂ බද්ද	1,000
සුරාබදු බලපත්‍ර ගාස්තු සංශෝධනය	600
සිමෙන්ති සහ වානේ ආනයන බදු සංශෝධනය	(3,000)
බලපත්‍රලාභී ජංගම දුරකථන ක්‍රියාකරුවන් මත බදු	1,250
චන්ද්‍රිකා තාක්ෂණය ඔස්සේ සෘජුව නිවසට සැපයෙන සේවා සඳහා වන ගාස්තු	2,000
චන්ද්‍රිකා ස්ථාන ගත කිරීම සඳහා ශ්‍රී ලංකාවේ වෙන්කරන ලද භූමි සඳහා වන බද්ද	1,000
අයකිරීම්/ලාභාංශ	25,000
විදුලි සංදේශ නියාමන කොමිසම	10,000
ගෑස් සමාගම	10,000
ශ්‍රී ලංකා තේ මණ්ඩලය	2,500
සංචාරක මණ්ඩලය	1,000
සමාගම් රෙජිස්ට්‍රාර්	1,500
රාජ්‍ය ආයතනවල අබලි වාහන විකිණීම	1,000
වාහන ආනයනකරුවන් සඳහා බලපත්‍ර ගාස්තු	375
එකතුව	**80,300**

සටහන :

රජයට අහිමිවන ආදායම

සුරාබදු අහිමිවීම	8,000
දේශීයව එකලස් කරන ලද වාහනවලින්	15,000

[ගරු රවි කරුණානායක මහතා]

වගුව II : වියදම් යෝජනා සාරාංශය

	රු. මිලියන
රාජ්‍ය අංශයේ වැටුප් වැඩි කිරීම	89,700
රාජ්‍ය අංශයේ විශ්‍රාම වැටුප් වැඩි කිරීම	4,900
සමෘද්ධි දීමනාව වැඩි කිරීම	8,000
ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ තැන්පතු සඳහා 15% පොලි අනුපාතය	4,000
ගර්භණී මව්වරුන් සඳහා දීමනාව	1,000
ගොවි ණය 50%කින් කපා හැරීම	2,500
තේ සඳහා සහතික මිල	5,000
රබර් සඳහා සහතික මිල	3,600
දියර කිරි සඳහා සහතික මිල	3,000
යොවුන් පාර්ලිමේන්තුව	250
විමධ්‍යගත අය වැය ඉහළ නැංවීම	1,125
ධීවර රක්ෂණ ක්‍රමය සඳහා රාජ්‍ය දායකත්වය	75
රන් භාණ්ඩ උකස්කර සඳහා සහන සැලසීම	7,000
නිදන්ගත වකුගඩු රෝගීන් සඳහා දීමනාව	2,000
පෙර පාසැල් සහ දහම් පාසැල් ගුරුවරුන් සඳහා මාසික දීමනාව	250
කොළඹ නගරයේ පදිංචිකරුවන් සඳහා සහන සැලසීම	1,000
නව නිපැයුම්කරුවන්ගේ කොමිසම ස්ථාපිත කිරීම	100
	500
අනවශ්‍ය වියදම් කපා හැරීම සහ ඉන්ධන, විදුලි මිල අඩු කිරීම තුළින් පරිපාලන වියදම් අඩු කිරීම	(38,000)
එකතුව	96,000

වගුව III: දළ ණය ගැනීමේ අවශ්‍යතාව - 2015
(ගිණුම්කරණ කටයුතු සඳහා ප්‍රතිපාදන)

අයිතමය	රු. බිලියන
මුළු ආදායම් ලැබීම් සහ ප්‍රදාන	1,622
ණය ආපසු ගෙවීම් ද ඇතුළත්ව මුළු ගෙවීම්	3,097
අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා ප්‍රතිපාදන	4
අවදානම් සඳහා වෙන් කිරීම්	60
රාජ්‍ය ව්‍යාපාරවල ශේෂ පත්‍ර ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා බැඳුම්කර නිකුතුව	170
අනපේක්ෂිත වගකීම් සඳහා වෙන් කිරීම්	30
දේශීය ණය සුරැකුම්පත්වල පොත් අගය සඳහා ගැලපුම්	41
රාජ්‍ය ගිණුම් සඳහා මුළු ණය ගැනීමේ අවශ්‍යතාව	1,780
එයින් සමස්ත ණය ආපසු ගෙවීම්	840

වගුව IV : අයවැය සාරාංශය - 2015[1]

රු. බිලියන

	2015 අයවැය	
	මුල්	සංශෝධිත
මුළු ආදායම් සහ ප්‍රදාන	**1,689**	**1,622**
මුළු ආදායම	**1,654**	**1,592**
බදු ආදායම	**1,416**	**1,337**
ආදායම් බදු	322	302
භාණ්ඩ හා සේවා මත බදු	774	763
විදේශ වෙළඳාම මත බදු	321	272
බදු නොවන අදායම	**174**	**195**
පළාත් සභා බදු ආදායම (රජයේ ආදායම් පැවරුම් ද ඇතුළත්ය)	**64**	**60**
ප්‍රදාන	**35**	**30**
මුළු වියදම	**2,210**	**2,121**
වර්තන වියදම	**1,525**	**1,612**
වැටුප් හා වේතන (පළාත් සභා ද ඇතුළත්ව)	558	616
වෙනත් භාණ්ඩ හා සේවා (පළාත් සභා ද ඇතුළත්ව)	163	159
පොළී ගෙවීම්	425	425
සහනාධාර සහ පැවරුම්	379	412
රාජ්‍ය ආයෝජන	**696**	**520**
අධ්‍යාපන සහ සෞඛ්‍ය	120	121
යටිතල පහසුකම්	576	399
අනෙකුත්	(11)	(11)
ආදායම් අතිරික්තය (+)/ හිඟය (-)	**129**	**(20)**
ප්‍රාථමික අතිරික්තය (+)/ හිඟය (-)	**(96)**	**(74)**
අයවැය අතිරික්තය (+)/ හිඟය (-)	**(521)**	**(499)**
මුළු මූල්‍යනය	**521**	**499**
මුළු විදේශ මූල්‍යනය	**251**	**251**
දළ විදේශ ණය ගැනීම්	453	453
විදේශ ණය	258	258
විදේශ වාණිජ ණය	195	195
ණය ආපසු ගෙවීම්	(202)	(202)
මුළු දේශීය මූල්‍යනය	**270**	**248**
බැංකු නොවන මූල්‍යනය	160	138
භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර මත විදේශ ආයෝජනය	40	40
බැංකු ණය ගැනීම්	70	70
මුළු ආදායම් සහ ප්‍රදාන / ද.දේ.නි. (%)	**14.9**	**14.3**
මුළු ආදායම / ද. දේ. නි. (%)	**14.6**	**14.1**
බදු ආදායම/ද.දේ.නි. (%)	12.5	11.8
බදු නොවන ආදායම/ද.දේ.නි.(%)	1.5	1.7
පළාත් සභා බදු ආදායම (රජයේ ආදායම් පැවරුම් ද ඇතුළත්ව)/ද.දේ.නි.(%)	0.6	0.5
ප්‍රදාන / ද. දේ. නි. (%)	**0.3**	**0.3**
මුළු වියදම / ද.දේ.නි (%)	**19.5**	**18.7**
වර්තන වියදම/ ද.දේ. නි (%)	13.5	14.2
පොළී නොවන/ ද. දේ. නි. (%)	9.7	10.5
පොළී ද. දේ. නි (%)	3.8	3.8
රාජ්‍ය ආයෝජන/ ද.දේ. නි (%)	6.2	4.6
ආදායම් අතිරික්තය (+)/ හිඟය (-) / ද.දේ. නි. (%)	1.1	(0.2)
ප්‍රාථමික අතිරික්තය (+)/ හිඟය (-) / ද.දේ. නි. (%)	(0.9)	(0.7)
අයවැය අතිරික්තය (+)/ හිඟය (-) / ද.දේ. නි (%)	**(4.6)**	**(4.4)**

[1] පළාත් සභාවලට පැවරූ ආදායම් සහ වියදම් ද ඇතුළත්ව

[ගරු රවි කරුණානායක මහතා]

ඇමුණුම I : 31.12.2014 දිනට රාජ්‍ය භාණ්ඩාගරය විසින් නිකුත් කරන ලද බැංකු ඇපකර

අනු අංකය	ආයතනයේ නම	භාණ්ඩාගාර ඇපකරවල වටිනාකම (රු. මිලියන)
1	ලංකා විදුලිබල මණ්ඩලය	17,985
2	ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව	206,724
3	සීමාසහිත ඛණිජතෙල් ගබඩා සංකීර්ණය	4,635
4	සීමාසහිත ලංකා නැව් සංස්ථාව	10,670
5	සමූපකාර තොග වෙළඳ සංස්ථාව	157
6	සර් ජෝන් කොතලාවල ආරක්ෂක විද්‍යා පීඨය	27,726
7	සීමාසහිත ලක්දනවි සමාගම	5,984
8	සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්) සමාගම	5,000
9	සීමාසහිත මිහින් ලංකා (පුද්) සමාගම	371
10	ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය	7,550
11	සීමාසහිත ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ජාතික පාසැල	8,600
12	ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය	14,114
13	වී අලෙවි මණ්ඩලය	6,599
14	මහජන බැංකුව විශ්‍රාමික භාරකාර අරමුදල	5,000
15	මාර්ග සංවර්ධන අධිකාරිය	157,319
16	ශ්‍රී ලංකා පාරිභෝගික සමූපකාර සමිති සම්මේලන සමාගම	50
17	ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ මණ්ඩලය	2,000
18	රාජ්‍ය සංවර්ධන හා ඉදිකිරීම් සංස්ථාව	400
19	රාජ්‍ය වෙළෙඳ (ස.තො.ස.) සමාගම	32
20	සීමාසහිත එස්.ටී.සී. ජෙනරල් ට්‍රේඩින් සමාගම	460
21	නාගරික සංවර්ධන අධිකාරිය	21,372
22	වේස්ට් කෝස්ට් පවර් (පුද්) සමාගම	21,994
	එකතුව	**524,741**

මූලාශ්‍ර : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

ඇමුණුම II : යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා රජය සතු ව්‍යාපාර මගින් ලබාගත් විදේශ ණය / ශේෂ පත්‍රයෙන් පිටත ණය ගැනීම්

ව්‍යාපෘතිය	ආයතනය	අගය (රු. මිලියන)
පුත්තලම ගල්අඟුරු බලාගාර ව්‍යාපෘතිය	ලංකා විදුලිබල මණ්ඩලය	160,195
හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය	ශ්‍රී ලංකා වරාය අධිකාරිය	122,568
මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපල ව්‍යාපෘතිය	වරාය හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සීමාසහිත සමාගම	25,909
එකතුව		**308,672**

මූලාශ්‍ර : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

සටහන :

	රු. බිලියන
පහත සඳහන් ණය ගිවිසුම හේතුවෙන් විලම්භිත වගකීම් තවදුරටත් වැඩිවේ.	
හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය - දෙවන අදියර	106
ජපන් ඩිජිටල් සංනිවේදන ව්‍යාපෘතිය	20

ඇමුණුම 111 : දැනට ක්‍රියාත්මක වන විදේශ ආයෝජන මත පදනම් වූ ව්‍යාපෘතිවල පොළී අනුපාත සාරාංශය

සංවර්ධන හවුල්කරු	වාර්ෂික පොළී අනුපාතය	
	ස්ථිර	පාවෙන
ද්වි පාක්ෂික		
ජපානය	0.10% -2.2%	
චීන සංවර්ධන බැංකුව		මාස 06 ක් සඳහා ලයිබො + ඇ.ඩො. 2.90%
ඉන්දියාව		මාස 06 ක් සඳහා ලයිබො + ඇ.ඩො.0.50% සිට 2.0%
කුවේට්	1% - 2.5%	
කොරියාව	0.1% - 1.5%	
ජර්මනිය	2.2%	
සෞදි අරාබි අරමුදල	1.13% - 2.15%	
බහු පාක්ෂික		
ආසියානු සංවර්ධන බැංකුව (ADB)	1% - 1.5%	මාස 06 ක් සඳහා ලයිබො + ඇ.ඩො.0.6%
ලෝක බැංකුව - ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර බැංකුව (IBRD) - ජාත්‍යන්තර සංවර්ධන සමායතනය	0.75%	මාස 06 ක් සඳහා ලයිබො + ඇ.ඩො.0.6%
කෘෂිකර්ම සංවර්ධනය සඳහා වන අන්තර් ජාතික අරමුදල (IFAD)	0.75%	
ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල	4.1% - 4.6%	
අපනයන ණය		
චීන ආනයන අපනයන බැංකුව	2% - 6.5%	මාස 06 ක් සඳහා ලයිබො + ඇ.ඩො.1.0% සිට 3..0%
ස්පාඤ්ඤ බොන්කෝ බිල්බෝ විස්කායා ආජන්ටේරියා S.A.		මාස 06 ක් සඳහා ඉයුරිබෝ + 2.1%
ප්‍රංශ සිලෝන් ක්‍රෙඩිට් ඇග්‍රිකෝල් CIB	4.95%	
Co-op Cenrale Raiffeisen-Boerenleenbank of the Netherlands	4.94% - 5.0%	මාස 06 ක් සඳහා ලයිබො + ඇ.ඩො.1.35% සිට 1.95%
හංගේරියානු ආනයන අපනයන බැංකුව	1.03%	
Fortis Bank " NV/Fortis Banque SA of Belgium	0.80%	
HSBC - එක්සත් රාජධානිය		මාස 06 ක් සඳහා ලයිබො + ඇ.ඩො.2.0%
ඩෙන්මාර්ක් නෝඩියා බැංකුව		මාස 06 ක් සඳහා ලයිබො + ඇ.ඩො.1.0%
ඔස්ට්‍රියා යුනික්‍රෙඩිට් බැංකුව	1.4%	
වාණිජ බැංකු		
ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුව (කල් පිරීමට නියමිත)	5.13% - 6.25%	

මූලාශ්‍ර : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

මුදල් අමාත්‍යතුමාගේ ප්‍රකාශයේ දෙමළ අනුවාදය

நிதி அமைச்சரினது கூற்றின் தமிழாக்கம்

TAMIL TEXT OF STATEMENT MADE BY MINISTER OF FINANCE

அறிமுகம்

கௌரவ சபாநாயகர் அவர்களே, சரியாக 21 நாட்களுக்கு முன்னர், 2015 சனவரி 8ஆம் திகதி இந்நாட்டின் மக்கள் மாற்றமொன்றினைவேண்டி மாண்புமிகு சனாதிபதி மைத்ரி பால சிறிசேன அவர்களுக்கு வாக்களித்தனர். அவர்கள் தெளிவான ஒரு மாற்றத்தினை வலியுறுத்தித் தமது ஆணை யினை வழங்கினர். அம்மாற்றமானது, நாட்டில் புதிய அரசியல் மற்றும் பொருளாதார கலாசாரமொன்றினை உருவாக்குவதற்கு கட்சி அரசியல் மற்றும் தனிமனித விருப்புக்களை விட்டும் அப்பாற்பட்டதாகக் காணப்பட்டது.

இலங்கை சனநாயக சோசலிசக் குடியரசின் 19ஆவது நிதியமைச்சர் என்ற வகையில், முன்னைய நிதி அமைச்சர் களின் சிறப்புமிக்க பாதச்சுவடுகளைப் பின்பற்றி இந்த இடைக்கால வரவு செலவுத்திட்டத்தினைச் சமர்ப்பிப்பதற்கு வாய்ப்புக் கிடைத்ததை யிட்டு மகிழ்ச்சியடைகின்றேன். இந்த மக்கள் நட்பு இடைக்கால வரவு செலவுத்திட்டத்தின் ஏற்பாடுகள் இலங்கை மக்களுக்கு ஆகக்கூடிய நன்மைகளையும் சலுகைகளையும் வழங்குகின்ற வரவு செலவுத்திட்டமொன்றாக வரலாற்றில் பதியப்படும்.

அதிமேதகு சனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்கள் வழங்கிய மனிதாபிமான தலைமைத்துவம் அதனோடு இணைந்த தாக மாண்புமிகு பிரதமரின் ஞானம், முறைகேடான ஆட்சியைத் தவிர்த்து 'மைத்ரி பரிபாலனம்' என்ற புதியதொரு இலங்கையினை உருவாக்குவதற்கு வழிசமைத்தது. இன்று சமர்ப்பிக்கப்படுகின்ற இடைக்கால வரவுசெலவுத் திட்டமானது மக்கள்நேய அரசாங்க மொன்று மக்களுக்குச் சேவையாற்றுவதற்கான சந்தர்ப்பங்களை உருவாக்கியுள்ளது என்பதனை எடுத்துக்காட்டக்கூடிய உதாரண மாகத் திகழ்கின்றது. இந்நிலையில் 'நூறுநாள் புரட்சி'யுடன் ஆரம்பமாகும் சிறந்த நாளையொன்றினை உருவாக்குவதில் 'மாற்றம்' ஒன்றுக்கான பேரணியுடன் இணைந்துகொள்வதற்கு அனைத்து இலங்கையர்களையும் ஒத்துழைப்பு வழங்குமாறு நான் அழைப்பு விடுக்கின்றேன்.

அதிகாரம் என்பது தற்காலிகமானது. உத்தியோகபூர்வ பதவிகளும் தற்காலிகமானவையே. எமக்கு வாக்களித்த மக்களின் நம்பிக்கைப்பொறுப்பாளர்கள் என்றவகையில் கௌரவமான முறையில் நாட்டுக்குச் சேவையாற்றுவது எமது கடமையாகும். நாம் மக்களின் சேவகர்கள் என்பதனை மறந்துவிடமுடியாது. அவர்களுக்குச் சேவையாற்றுவது எமது கடமையாகும்.

இலங்கையர்கள் மீண்டும் சந்தோச பரவசத்தில் காணப் படுகின்றனர். இச்சந்தோசமானது சுதந்திரம், விடுதலை மற்றும் தைரியத்தினைப் பெற்றுக் கொடுத்துள்ளது. குடும்ப ஆட்சி மற்றும் தகாத சலுகைகளைப் பெற்றுக் கொண்டிருந்த குடும்ப ஆதிக்கத்தின் பிடியிலிருந்து விடுதலை பெற்றமை மக்களை மகிழ்ச்சியில் ஆழ்த்தியுள்ளது. கௌரவ சபாநாயகர் அவர்களே, கௌரவ பாராளுமன்ற உறுப்பினர்களே, நான் இவ்வுரையினை முடிப்பதற்குமுன் இந்தச் சந்தோசங்கள் மேலும் அதிகரிக்கும். அவர்கள் இங்கு அறிவிக்கப்படவுள்ள அளவுக்கதிகமான நன்மைகளுக்கு உரித்துடையவர்களாவர். அத்துடன் அவர்கள் நீடித்த எதிர்காலம், மகிழ்ச்சிகரமானதும் சிறந்ததொரு வாழ்க்கைக்கும் உரித்துடையவர்களாக இருப்பர். அனைவரும் மாற்றத்தின் இதமான தென்றலை அனுபவிப்பர். நலனுக்கான மாற்றமொன்று நேசத்திற்கான மாற்றமாக இருக்கும். அதுதான் கருணைமிக்க ஆட்சி - மைத்ரி ஆட்சி.

அரசியல் வாய்வீச்சு இலங்கையில் அனைவரிடமும் சாதாரண மாகக் காணப்படும் அதேவேளை பொருளாதாரம் தொடர்பான வாய்வீச்சானது மிகவும் குறைவாகவே காணப்பட்டது. முன்னைய ஆட்சியில் கடந்த சில வருடங்களாக அவ்வாறான பொருளாதார வாய்வீச்சுக்களை தேவைக்கதிகமாகவே கேட்டோம். இந்த பொருளாதார வாய்வீச்சுக்கள் சிலருக்கு எரிச்சலூட்டுபவையாக இருந்ததுடன் சிலரை வாய்திறக்க முடியாது செய்திருந்தது. ஆனால், உண்மை எப்பொழுதும் கசக்கும் என்பதுடன் அதனை ஏற்றுக்கொள்வது கடினமுமாகும். சீர்குலைந்த பொருளாதார மொன்று எழுச்சியினையும் போராட்டத்தையும் வேண்டி நிற்கின்றமையினால், இவ் அரசாங்கமானது அதற்கு முன்னுரிமை அளித்துள்ளது.

கௌரவ சபாநாயகர் அவர்களே, இந்த தேசிய அரசாங்கத் தினால் எதிர்காலத்தில் சமர்ப்பிக்கப்படவுள்ள பல வரவுசெலவுத் திட்டங்களுக்கு இவ் அறிக்கையானது முன் உதாரணமாக இருப்பதுடன், இவ் அறிக்கையானது யதார்த்தங்களே அன்றி வெறும் வாய்வீச்சுக்கள் அல்ல என்பதை உறுதிசெய்கின்றோம்.

கொப்ல்ஸ் (Gobbells) தத்துவத்தின்மூலம் உந்தப்பட்ட இவ் வாறான பொருளாதார வாய்வீச்சாளர்கள் இலங்கையை 'ஆசியாவின் ஆச்சரியம்' எனக் கூறுவது யதார்த்தத்தினை அடிப்படையாகக்கொண்ட எம்மில் பலரை அதிசயிக்கச் செய்தது.

பெப்ரவரி மாதம் 4ஆந் திகதி பிரித்தானியரிடமிருந்து நாம் சுதந்திரம் பெற்ற அன்றைய தேசிய சுதந்திர தினத்திற்கு இன்றிலிருந்து 6 நாட்கள் உள்ளன. 2015 சனவரி 8 ஆந் திகதியும் இத்தேசம் 'சுதந்திரத்தினை மீளப் பெற்ற' தினமாக நினைவுகூரப்படும். குடும்ப ஆதிக்கத்திலிருந்து சுதந்திரம், ஊழல் நிறைந்த ஆட்சியிலிருந்து சுதந்திரம், ஊழல் கூட்டத்திலிருந்து சுதந்திரம், மோசமான நிர்வாகத்திலிருந்து சுதந்திரம், நீதித்துறை, பொலிஸ், அரசாங்க சேவைகள் என்பவற்றினை மீளப் பெற்றமை மற்றும் சட்டவாட்சி முழுமையாக துஷ்பிரயோகம் செய்யப்பட்ட முறைகேடான ஆட்சியிலிருந்து இந்நாளில் சுதந்திரம் கிடைத்தது. இந்த வகையில் மீளப்பெறப்பட்ட சுதந்திரத்தினைப் பாதுகாப்பதும் வளர்த்தெடுப்பதும் எமது அடிப்படைக் கடமையாகும்.

100 நாள் புரட்சி நிகழ்ச்சித்திட்டம் புதிய தசாப்த மொன்றுக்கான அடிப்படையினை வழங்குவதுடன் 'சுதந்திரம் மற்றும் விடுதலை' என்ற சொற்களுக்கு புதிய அர்த்தத்தினை வழங்குகின்றது. சுயாதீன ஆணைக்குழுக்கள், தகவல் பெறுவதற்கான உரிமை, அரசியலமைப்புத் திருத்தங்கள் என்பன நூறு நாள் நிகழ்ச்சித் திட்டத்திற்குள் தெளிவாக குறிப்பிடப் பட்டுள்ளதுடன் அவ்வாறு மீளப் பெறப்பட்ட சுதந்திரத்தின் விளைவினை அனுபவிப்பதற்கு மக்களுக்கான குறிப்பிடத்தக்களவு பின்புலத்தினை வழங்குகின்றது.

குடும்ப ஆதிக்கமானது இலங்கையின் பொருளாதாரத்தினைப் பாதித்தது மாத்திரமல்லாமல் தேசபக்திமிக்க சமூகமொன்றாகப் பின்னிப் பிணைத்திருந்த இலங்கை மக்களை சீரழித்துவிட்டது. போதைப்பொருள் வியாபாரிகள், கசினோ சூதாட்டக்காரர்கள் மற்றும் எத்தனோல் மன்னர்கள் எமது சிறுவர்களின் எதிர்காலத் தினைப் பாழாக்கினர். மக்களின் குரல் நசுக்கப்பட்டதுடன் அவர்கள் மௌனிகளாக்கப்பட்டனர். எனினும், இறுதியில் சிலர் தமக்குள் சிலவற்றினை வெளிப்படுத்தினர். வார்த்தை ஜாலங்களுக்கு மேலதிகமாக 'பொருளாதாரப் படுகொலை' என்ற வசனம் அகராதியில் சேர்க்கப்பட்டது. உண்மையினை எடுத்துக் காட்டுவதற்கும் கிடைக்கின்ற சான்றுகளின் அடிப்படையிலும் அவ்வாறான பல பொருளாதாரப் படுகொலையாளர்கள் காணப் பட்டனர் எனக்கூறலாம். அவர்கள் நாட்டில் பெரும்பாலோனோர் துன்புறும் வேளையில் இந்நாட்டின் பெருமளவு வளங்களை ஒருசிலர் அனுபவிப்பதை உறுதிசெய்தனர்.

சனாதிபதித் தேர்தலினைத் தொடர்ந்து பாராளுமன்றத்தினைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற பெரும்பாலான கட்சிகளின் உறுப்பினர்களின் பங்குபற்றுதலுடன் மைத்திரிபால - ரணில் தேசிய ஐக்கிய அரசாங்கமொன்று உருவாக்கப்பட்டது. இது எமது

நாட்டின் வரலாற்றில் சுதந்திரத்திற்கு பின்னர் உருவாக்கப்பட்ட தனித்துவமான சந்தர்ப்பமொன்றாகும்.

இன்று, இந்த முன்னெடுப்புகளினால் நாம் இந்நாட்டிற்கு மாற்று வழிமுறையொன்றினைக் காட்டுவதில் வெற்றியடைந் துள்ளதுடன் அப்பாதையில் மிகமெதுவாக ஆனால், உறுதியான பயணத்தினை ஆரம்பித்துள்ளோம் என்பதனைக் கூறிக்கொள்வதில் நான் பெருமையடைகின்றேன். இது கருணை படைத்த மைத்திரி அரசாங்கத்திற்கான பாதையாகும். ஸ்திரமான நாடொன்றினை நோக்கிய பாதையென்பதுடன் சுபிட்சத்திற்கான பாதையுமாகும். அனைத்தினையும்விட முக்கியமாக சுதந்திரம், மனிதாபிமானம் மற்றும் கௌரவம் என்பவற்றிற்கான பாதையொன்றாகும்.

பல்வேறு சவால்களுக்கு மத்தியில் துணிச்சலுடன் முன்வந்து இந்த மகத்தான முயற்சிக்காக ஒரே குரலில் தமது வாக்குகளை அளித்த சமயத் தலைவர்கள், அரசாங்க ஊழியர்கள், ஓய்வூதியம் பெறுநர்கள், விவசாயிகள், ஆசிரியர்கள், சுகாதாரத்துறை ஊழியர்கள், மீனவ சமூகத்தினர், மாணவர்கள் உள்ளடங்கலான இளம் வாக்காளர்கள், ஊழியர்கள், தொழில்முயற்சியாளர்கள், தோட்டத் தொழிலாளர்கள், முச்சக்கரவண்டிச் சாரதிகள், போக்குவரத்து துறை ஊழியர்கள், சுயதொழில் புரிநர்கள், ஆயுதப் படைகளின் உறுப்பினர்கள், பொலிஸ் மற்றும் சிவில் பாதுகாப்புப் படை உறுப்பினர்கள் இலங்கையிலுள்ள அனைத்து இன மற்றும் சமய குழுக்களைச் சேர்ந்த பொதுமக்கள் அனைவருக்கும் கௌரவ சனாதிபதி, கௌரவ பிரதமர் மற்றும் அரசாங்கத்தின் சார்பில் நிதி அமைச்சர் என்ற வகையில் நான் இவ்விடத்தில் நன்றி கூறுவதுடன் எனது மரியாதையினையும் தெரிவித்துக்கொள்கிறேன்.

முன்னைய அரசாங்கத்தினால் சாதாரண கற்பனைக்கெட்டாத வகையில் வாக்காளர்களைக் கவர்ந்திழுப்பதற்காகப் பல்வேறு பொருட்கள் இலவசமாக வழங்கப்பட்டதுடன் அரசாங்க வளங்களை மிதமிஞ்சிய அளவு பயன்படுத்தி மேற்கொள்ளப்பட்ட தடைகளின் அளவுடன் ஒப்பிடுகையில் உங்களது பங்களிப்பு உண்மையில் மரியாதைக்குரியதாகும். சனாதிபதித் தேர்தல் பிரசாரத்தில் நாம் இந்நாட்டு மக்களுக்கு நிறைவேற்றுவதற்கு பாரியதொரு வாக்குறுதியினை வழங்கியிருந்தோம். நாம் ஆட்சிக்கு வந்ததன் பின்னர் இந்த நாட்டில் நிலவுகின்ற பிரச்சினைகளுக்கும் மக்களின் தேவைகளுக்கும் விரைவான தீர்வினை வழங்குவதற்கு 100 நாள் எழுச்சி திட்டமொன்றினை செயற்படுத்துவதாக வாக்குறுதியளித்தோம்.

இந்நாட்டில் நிலவிய பிரதான பிரச்சினையாக நாம் கருதிய அதிகரித்துவரும் வாழ்க்கைச் செலவினைக் குறைப்பதன்மூலம் மக்களுக்கு நிவாரணம் வழங்கக்கூடிய விசேடமான நடவடிக்கை களைச் செயற்படுத்துவோம் என்பது எமது பிரதான வாக்குறுதி யாகக் காணப்பட்டது.

அதிகரித்துவரும் வாழ்க்கைச் செலவானது நாட்டில் பெரும் பாலோனோரை தேவையான அடிப்படை உணவை பெற்றுக் கொள்வதிலிருந்து தவிர்த்துள்ளது. ஆகவே, இதற்கு நாம் தீர்வைத் தேட வேண்டியுள்ளது. வறுமைக்கோடு 6.7 சதவீதமாகக் காணப் பட்டதுடன் போசாக்கு குன்றிய சிறுவர்கள் 21.6 சதவீதம் என்பது புள்ளிவிபரம் மாத்திரமல்லாது தொடர்ந்து அதிகரித்து செல்வதையும் காணமுடிகின்றது. எம்மால் முன்மொழியப்பட்ட மாற்றமும் சனநாயக ரீதியில் அளிக்கப்பட்ட வாக்குகளும் இந்த எரியும் பிரச்சினையினைத் தீர்க்குமென நாம் உறுதியாக நம்புவதுடன் இதற்கு முன்னர் கேள்வியுற்றிராத அளவு நிவார ணங்கள் அடுத்து வரும் வருடங்களிலும் அதிகரிக்கப்படும்.

முன்னைய காலப்பகுதியில் இடம்பெற்றுள்ளதாகக் கூறப்படும் பாரிய ஊழல்களை விசாரிப்பதற்கான விசேட ஆணைக் குழுக்களை நியமித்தல், சுயாதீனமான ஆணைக்குழுக்களை தாபித்தல் மற்றும் தேவையான நியமனங்களை வழங்குதல், தேசிய கணக்காய்வு சட்டமூலம் மற்றும் தகவல் பெறுவதற்கான உரிமைச் சட்டமூலம் என்பவற்றினை அறிமுகப்படுத்துவதுடன் அவை மூன்று வாரங்களுக்குள் பாராளுமன்றத்தில் அங்கீகரிக்கப்படும். தேசிய மருந்துப் பொருட்கள் கொள்கையினை அறிமுகப்படுத்தல், நிறைவேற்று அதிகாரம் கொண்ட சனாதிபதி முறைமைக்குப் பதிலாக பாராளுமன்ற முறைமையினை உருவாக்குதல் என்பன இந்நிகழ்ச்சித்திட்டத்தின்கீழ் நாம் வழங்கிய ஏனைய முக்கிய வாக்குறுதிகளில் சிலவாகும்.

முறைகேடான ஆட்சியில் கடந்த காலங்களில் இடம்பெற்ற ஊழல் நடவடிக்கைகளின் அளவு உச்சத்தினை அடைந்திருந் ததுடன் ஊழலில் தொடர்புற்ற மோசடிக்காரர்களின் குற்றச் செயல்களை சட்டத்தின் ஏற்பாடுகளினூடாக முன்கொண்டுவரப் பட வேண்டியுள்ளது.

தற்பொழுது நாம் இந்த முன்மொழிவுகளைச் செயற்படுத்தும் செயன்முறையில் ஈடுபட்டு வருகின்றோம். கடந்த 21 நாட்களாக நாம் எதனைச் செய்துள்ளோம் என்பதனை அவதானிக்கும் பொழுது எமது செயலாற்றுகையினையும் அர்ப்பணிப்பினையும் பற்றிய தீர்மானமொன்றுக்கு உங்களினால் வர முடியும். 100 நாள் புரட்சி நிகழ்ச்சித்திட்டத்தின் நோக்கத்தை அடைந்து கொள்வதற்கான தெளிவான தூர நோக்கொன்றுடன் நாம் பணியாற்றி வருவது தெளிவாகும். இன்று சமர்ப்பிக்கப்படுகின்ற இடைக்கால வரவுசெலவுத்திட்டமானது அவ்வாறான முயற்சியில் முன்னெடுத்து வைக்கின்ற மிக முக்கிய அடியொன்றாகும்.

எமது அரசாங்கம் மக்கள் நலனில் அக்கறை கொண்டது என்பதுடன் முன்னுரிமை அடிப்படையில் நிவாரணங்களை வழங்குவதனை நோக்கமாகக் கொண்டுள்ளது. இந்த இடைக்கால வரவுசெலவுத்திட்டத்திற்கு முன்னர் எரிபொருள் விலைகளை குறைத்ததனூடாக வழங்கப்பட்ட நிவாரணம் மிகச் சிறந்த உதாரணமாகும். எந்தவொரு காலத்திலும் வழங்கப்படாத அளவு அதிகூடிய எண்ணெய் விலை குறைப்பினை முகாமை செய்வதற்கு எம்மால் முடிந்ததுடன் முன்னைய அரசாங்கம் மக்களுக்கு நன்மையளிக்கக் கூடிய இவ்வாறான திருத்தங்களை ஏன் மேற்கொள்ளவில்லை என்பதை என்னால் விளங்கிக் கொள்ள முடியாதுள்ளது.

பொதுமக்களுக்கு நிவாரணம் வழங்குவதற்கான எமது உத்தேச நடவடிக்கைகள் அதேபோன்று ஏனைய வருமானம் மற்றும் செலவினை முன்மொழிவுகளை நான் சமர்ப்பிப்பதற்கு முன்னர், 2015ஆம் நிதியாண்டுக்காகப் பாராளுமன்றத்தினால் ஏற்கனவே அங்கீகரிக்கப்பட்ட வெடிக்கவிருந்த குமிழாகக் காணப்பட்ட வரவு செலவுத்திட்டம், நாட்டின் பொருளாதார செயலாற்றுகை மற்றும் அது தொடர்பான சில விடயங்களை விளக்குவதற்கு நினைக்கின்றேன்.

வெடிக்கவிருந்த குமிழ்

இலங்கை பொருளாதார ஒழுங்கீனங்களைக்கொண்ட ஒரு காலத்தினைக் கடந்துசென்றுள்ளது. சில நாட்களுக்கு முன்னர்வரை வழங்கப்பட்ட புள்ளிவிபரங்கள் வித்தியாசமான ஒரு நிலையை சித்தரித்துக் காட்டியது. ஒரு போலியான அரசியல் வாய்வீச்சு இடையறா பொருளாதார சாகசங்களுடன் ஒரு நம்பிக்கையூட்டும் வகையில் சித்தரித்துக் காட்டப்பட்டது. பொருளாதார மேதைகள் எனக் கூறிக் கொள்பவர்களின் ஆயுதங்களாக மிகைப்படுத்தப்பட்ட அட்டவணைகளும் வரைபடங்களும் காணப்பட்டன.

அதிகமாகப் பேசப்பட்ட 'ஆசியாவின் ஆச்சரியம்' மற்றும் 'மையங்கள்' வித்தியாசமான விளக்கங்களை வழங்கின. சாதாரண மக்கள் இவர்களின் பொய் மற்றும் ஏமாற்று வலைகளில் முழுமையாக விழவில்லை. அவர்கள் தேசத்தை அழிப்பதில் கவனம் செலுத்தப்பட்ட சில மையங்களிலிருந்து அவர்களது அவதானம் காணப்பட்டது. அவைதான் தொடர்ந்து வளர்ந்து வந்த 'குடு மையங்கள்', 'எத்தனோல் மையங்கள்', மற்றும் 'கசினோ மையங்கள்' என்பனவாகும். எமது நாட்டின் இளம் சந்ததியினர்,

[ගරු රවි කරුණානායක මහතා]

அப்பாவி சிறார்கள் பலர் போதைப்பொருள் முதலாளிகள், எத்தனோல் மன்னர்கள், கசினோ இயக்குனர்களின் தந்திரங்களுக்கு இரையாகினார்கள்.

பங்குச் சந்தை, வியாபாரத்தில் நிபுணத்துவம் பெற்றவர்களின் நகைப்புக்கு இடமாகியது. 'உட்பாய்ச்சல் மற்றும் குவித்தல்' சக்தி பெற்றவரின் தீர்மானமாக இருந்த அதேவேளை சிறுமுதலீட் டாளர்கள் நெருக்கடிகளை எதிர்நோக்கினர். வட்டி விகிதங்கள் குறைக்கப்பட்டபோது தலைமைகள் வயது முதிர்ந்தவர்களை பங்குச் சந்தையில் முதலீடு செய்வதற்கு அழைப்பு விடுத்தனர். இதன் விளைவுகளை நன்கு அறிந்திருந்தும் அவர்களின் உள்ளம் இரங்கவில்லை. இதன்போது அப்பாவி ஓய்வூதியக்காரர்கள்கூடப் பாதிக்கப்பட்டனர். உயர் செல்வந்தர், 'பங்குச்சந்தை முதலாளிகள்' ஏழைகளின் தயவில் தொடர்ந்தும் தமது இலாபங்களை அதிகரித்தனர்.

சாகசம் தொடர்ந்தது. முட்டாள்கள் தமது பங்களிப்பினை கச்சிதமாகச் செய்தனர். பொருளாதாரமானது தொடர்ச்சியாகச் சரிவடைந்தது. போலிக் கலைஞர்கள் உண்மையாளர்களாக நடித்தனர். கசப்பான உண்மைகள் இனிப்பான பொய்க்குள் மறைக்கப்பட்டன. பொய்கள், மட்டமான பொய்கள் மற்றும் புள்ளவிபரங்கள் குறித்த சித்தரிப்புக்கு சரியாகப் பொருந்தியது. மொத்த உள்நாட்டு உற்பத்தி மற்றும் பொதுக் கடன்படுகையானது அவர்களுடைய அகராதியில் எவ்வித பொருட்டும் அல்லாது காணப்பட்டன.

'கள்ளக் கும்பல்'களின் பொருளாதார முறைமையானது சமூகத்தில் மிகக்கூடிய சுகபோக வாழ்வினை அனுபவிக்கும் கொழுத்த பணக்கார வர்க்கத்தினை உருவாக்கியது. அவர்கள் தமது செல்வத்தை மாத்திரமல்லாமல் உடல் சக்தியையும் வெளிக் காட்டினர். முழுச்சனத்தொகையிலும் வெறுமனே 2 சதவீதமான வர்கள் தொடர்ந்தும் ஏனையவர்களின் தயவில் வாழ்ந்துவந்தனர். எஞ்சிய 98 சதவீதமானவர்களின் நிலை என்ன? இவர்கள் 2500ஆம் ஆண்டிலிருந்து தொடர்ந்தும் தமது இடுப்புப் பட்டியை இறுக்கிக் கொள்ளும்படி வேண்டப்பட்டதுடன் அதனை அவர்கள் தொடர்ந்தும் செய்துவந்தனர். பொருளாதார நெருக்கடிகளினால் அவர்களது குடும்பங்கள் சிதைவடைந்தன, ஆபரணங்கள் அடகுவைக்கப்பட்டன, தொடர்ந்தும் தமது வீடுகளில் அடுப்பு எரிவதற்காக அவர்களது பரம்பரைச் சொத்துக்கள் விற்பனை செய்யப்பட்டன. அவர்களில் சிலர் மிகவும் மோசமான வறுமை நிலையினை எதிர்கொண்டனர். தாங்கிக் கொள்ள முடியாத வறுமையின் காரணமாக எமது தாய்மார்கள் மற்றும் தந்தைகள், சகோதர சகோதரிகள் ஆற்றில் குதித்து தற்கொலை செய்து கொள்வதிலிருந்து அவர்களைப் பாதுகாப்பதற்காக மாத்தறை மஹாநாம சமரவீரப் பாலம் மற்றும் களுத்துறைப் பாலங்களில் கடற்படையினரை காவலில் அமர்த்த வேண்டியதாயிற்று.

பொருளாதார வாசகங்கள் உயர்தரமிக்க மொழிநடை, அரசியல் மற்றும் பொருளாதார வாய்வீச்சு என்றுமில்லாதளவில் தொடர்ந்தும் எதிரொலித்தது. சாஸ்திரக்காரர்கள்கூட தமது விருப்பு வெறுப்புகளுக்கேற்ப ராசி பலன்களை நிர்ணயித்தனர். சமூகத்தின் வெறுமனே 2 சதவீதத்தினரை போஷிப்பதற்கும் ஊட்டி வளர்ப்பதற்கும் ராசிகள் சாதகமாகக் காணப்பட்டன. 2015ஆம் ஆண்டு ஜனவரி 8 ஆம் திகதி கேள்விக் கணக்கு நாளாக இருந்தது. சுதந்திரத்துக்கான ஏற்பாடு நாடு பூராகவும் மாற்றத்திற்கான வாசனை வீசியது.

அதிகாரிகள் மற்றும் பொருளாதார நிபுணர்கள் எண்களில் கவனம் செலுத்தினர். ஏமாற்று மற்றும் பொய்யான பொருளாதாரம் வெளிக்கிளம்பியது. துக்ககரமான செய்தி என்னவெனில் பொருளாதாரமானது மோசமான நிலையில் காணப்படுகின்றது. நல்ல செய்தி என்னவெனில் அது பாதுகாப்பான மற்றும் சிறப்பானவர்களின் கையில் கிடைக்கப் பெற்றிருப்பதனால் அது மீட்சிபெறுவது மிகத்தொலைவில் அல்ல. நாட்டின் பொருளா தாரத்தின் உண்மை நிலையை கண்டுபிடிப்பதற்கு முடியுமாக இருக்கின்றது. அதனை விரிவாக விளங்கப்படுத்த முடியும். அரசியல்வாதிகள், பங்குச்சந்தை முதலாளிகள், போதைப்பொருள் விநியோகஸ்தர்கள் என்று பாராமல் சட்டரீதியற்ற முறையில் சம்பாதித்தவற்றினை மீளப் பெறுவதற்கும் விசாரணைகளை நடாத்துவதற்கும் எம்மால் முடியும். கள்ளக் கூட்டம் மற்றும் வாரிசுகளின் சிறப்புரிமைக் காலம் முடிவடைந்துள்ளதுடன் தவறுகளை புரிபவர்கள் மற்றும் துஷ்டர்களை மிகைத்த நிலையில் நீதி மேலோங்கி இருக்கும்.

இறுதியில் குமிழ் உடைக்கப்படும். எமது அரசாங்கமானது தற்பொழுது நிலைமை பற்றி நன்கறிந்துள்ளதுடன் பொருளா தாரத்தினை உயர்த்துவதுடன் சிறப்புக்களுடன் முன்னோக்கிச் செல்லும். எல்லாச் சந்தர்ப்பங்களிலும் உண்மை சித்தரித்துக் காட்டப்படுமென நாட்டு மக்களுக்கு நாங்கள் உறுதியாகக் கூறிக்கொள்கின்றோம்.

கௌரவ சபாநாயகர் அவர்களே, கௌரவ பாராளுமன்ற உறுப்பினர்களே 'மைத்ரி ஆட்சியின்' சிறப்பாவது நீதித்துறைக்குப் புதிய பரிணாமம் ஒன்றினைக் கொண்டு வருவதுடன் நாட்டில் நீதியினை ஏற்படுத்தும். மிகவும் பொருத்தமான இரண்டு உதாரணங்களை முன்வைக்க விரும்புகின்றேன். 2009 இல் இடம்பெற்ற தேர்தலின் முடிவுகள் அறிவிக்கப்பட்டதன் பின்னர் வெற்றியாளர் சந்தோசப்பட தோற்கடிக்கப்பட்டவர் சிறையிலிடப் பட்டார். இம்முறை வெற்றியாளர் தான் சிறைப்பிடிக்கப்படுவேன் என்ற பயத்திலிருந்து விடுதலை பெற்ற அதேவேளை, தோற்கடிக்கப்பட்டவர் மதமுலனையிலுள்ள தனது சொந்த ஊருக்கு செல்வதற்கு மக்களின் செலவில் இலவசமான விமானப் பயணமொன்றினை பெற்றுக்கொண்டார்.

2015 ஜனவரி 9ஆம் திகதி கௌரவ மைத்திரிபால சிறிசேன அவர்கள் சுதந்திர சதுக்கத்தில் சனாதிபதியாக சத்தியப்பிரமாணம் செய்வதற்கான செலவினம் வெறுமனே ரூபா 6,500 ஆகக் காணப்பட்ட அதேவேளை இதற்கு முன்னர் 2009இல் இடம்பெற்ற சத்தியப்பிரமாணம் செய்யும் நிகழ்ச்சிக்காக அதிர்ச்சி தரத்தக்க செலவினம் ரூபா 600 மில்லியன் செலவிடப்பட்டது.

இக்கூற்றின் நோக்கம்

இவ்வாறான சூழ்நிலையில் இடைக்கால வரவுசெலவுத் திட்டமொன்றினைச் சமர்ப்பிப்பது எமது நாட்டின் அரசாங்க நிதிகளில் புதியதொரு தோற்றப்பாடொன்றாக காணப்பட முடியும். இதற்கு முன்னர் பாராளுமன்றத் தேர்தல் அறிவிக்கப்பட்டதுடன் புதிய அரசாங்கம் அவற்றினது புதிய கொள்கைகளை உள்ளடக்கிய முழுமையான வரவுசெலவுத் திட்டமொன்றினைச் சமர்ப்பிப்பதற்கு அனுமதிக்கும் வகையில் இப்பாராளுமன்றத்தில் இதற்கு முன்னர் பல தடவைகள் கணக்கு வாக்குப்பணங்கள் சமர்ப்பிக்கப் பட்டிருப்பதனை நாம் அறிந்திருக்கின்றோம்.

எவ்வாறாயினும், இன்று சமர்ப்பிக்கப்படுகின்ற அறிக்கை யானது அரசாங்கத்திலுள்ள நிரல் அமைச்சுக்களினது கட்ட மைப்பில் குறிப்பிடத்தக்கதொரு மாற்றத்தினை நாம் ஏற்படுத்து வதற்கு முழுமையான தேவைப்பாட்டினை ஏற்படுத்தியுள்ளது. முன்னைய அரசாங்கத்தின் நிர்வாகத்திலிருந்து குறிப்பிடத்தக்களவு மாற்றங்களை செய்கின்ற வகையில் அமைச்சுக்களின் எண்ணிக்கையினை 61 இலிருந்து 31 ஆக நாம் குறைத் திருப்பதனை நீங்கள் அறிவீர்கள்.

அமைச்சரவையினை அதிகூடிய விளைவினைத் தரக் கூடியதாகவும் ஆகக்குறைந்த செலவினத்தினைக் கொண்டிருக்கும் வகையில் நிரல் அமைச்சுக்கள் கட்டமைப்பு செய்யப்பட்டுள்ளன. புதிதாக உருவாக்கப்பட்ட அமைச்சுக்களுக்கான வளங்களை மாற்றம் செய்ய வேண்டிய தேவை ஏற்பட்டுள்ளதுடன் புதிய

கட்டமைப்பினை உருவாக்குவதற்கு பாராளுமன்றத்தின் அங்கீகாரமும் கோரப்படுகின்றது.

பாராளுமன்றத்தின் அங்கீகாரத்துடன், அமைச்சுக்கள் மற்றும் செலவின அலகுகளுக்கு ஒதுக்கீட்டு (திருத்தச்) சட்டமூலத்தில் குறிப்பீடு செய்யப்பட்ட அங்கீகரிக்கப்பட்ட செலவின வரையறைகளின் அடிப்படையில் தயாரிக்கப்பட்ட விபரமான வரவு செலவுத்திட்ட மதிப்பீடுகளை வழங்குவதற்கு திறைசேரி செயலாளருக்கு அங்கீகாரம் வழங்குவதற்கு நான் முன்மொழிகின்றேன்.

இதற்கு மேலதிகமாக, எனது உரையின் பிற்பகுதியில் பல்வேறு புதிய வருமானம் மற்றும் செலவின முன்மொழிவுகள் அதேபோன்று பொதுமக்களுக்கு வழங்கப்படவுள்ள சலுகைகள் பற்றியும் விளக்கப்படுத்துவதற்கு விரும்புகின்றேன்.

இந்த மாற்றங்களும் முன்மொழிவுகளும் 2014 ஒக்டோபர் 24ஆந் திகதி பாராளுமன்றத்தில் சமர்ப்பிக்கப்பட்டு 2014 நவம்பர் 23ஆந் திகதி பாராளுமன்றத்தினால் அங்கீகரிக்கப்பட்ட 2015ஆம் ஆண்டிற்கான வரவுசெலவுத்திட்டத்தில் உள்ளடக்கப்பட வேண்டியுள்ளதுடன் அதற்கான சட்ட ஏற்பாடுகளின் தேவையினைக் கருத்திற்கொண்டு இந்தப் பாராளுமன்றத்தினால் அங்கீகரிக்கப்பட வேண்டிய அவசியம் காணப்படுகின்றது.

வரவு செலவுத்திட்டம் - 2015

2015ஆம் நிதியாண்டிற்கான வரவு செலவுத்திட்டத்தில் எதிர்பார்க்கப்பட்ட மொத்த வருமானம் ரூபா 1,594 பில்லியனாகக் காணப்பட்டதுடன் இதில் ரூபா 1,400 பில்லியன் வரி வருமானமாகவும் ரூபா 194 பில்லியன் வரியல்லாத வருமானமாகவும் காணப்பட்டது. மொத்தச் செலவினமும் தேறிய கடன் மீள் கொடுப்பனவு ரூபா 2,990 பில்லியனாக இருந்ததுடன் இதில் மீண்டெழும் செலவினமாக ரூபா 1,465 பில்லியனும் மூலதனச் செலவினமாகவும் தேறிய கடன் பெறுகையும் ரூபா 685 பில்லியனாகக் காணப்பட்டது. 2015 வரவு செலவுத்திட்டத்தில் மதிப்பிடப்பட்ட பற்றாக்குறை ரூபா 521பில்லியனாகும் அல்லது மொத்த உள்நாட்டு உற்பத்தியில் 4.6 சதவீதமாகும்.

இந்தப் பற்றாக்குறையானது அரசாங்கத்தின் வருமானம் மற்றும் செலவினங்களுடன் மாத்திரம் தொடர்புற்றது என நான் கூறிக் கொள்ள விரும்புகின்றேன். எவ்வாறாயினும், இந்த பற்றாக்குறையானது நாட்டின் இன்றைய பொது நிதிகளில் உண்மையான சுமையைப் பிரதிபலிக்கவில்லை. ஏனெனில், அது அரசாங்கத்தின் பல்வேறு வரவு செலவுத்திட்ட தொழிற்பாடுகளை கவனத்திற் கொள்ளவில்லை என்பதனை இப்பாராளுமன்றத்தில் நாம் அடிக்கடி கூறியுள்ளதுடன் பாராளுமன்றத்திற்கு வெளியிலும் பல வருடங்களாக இதனை கலந்துரையாடியுள்ளோம்.

ஆகவே, உண்மையான நிலைமையினை கௌரவ பாராளுமன்ற உறுப்பினர்களுக்கும் பொதுமக்களுக்கும் தெரியப்படுத்துதல் வேண்டும். நல்லாட்சியினை ஏற்படுத்துகின்ற எமது முயற்சியில் கௌரவ பாராளுமன்ற உறுப்பினர்களையோ அல்லது பொது மக்களையோ பிழையாக வழிநடத்துவதற்கு நாம் நினைக்கவில்லை.

அரசாங்கப்படுகடன் முறையாகச் சமர்ப்பிக்கப்படாத சில முக்கிய பிரச்சினைகள் கீழே பட்டியலிடப்பட்டுள்ளன.

அ. நாடு கடந்த பல வருடங்களின் போது செலவிட்ட நிகழத்தக்க பொறுப்புக்களை இப்பற்றாக்குறையில் எவ்வகையிலும் பிரதிபலிக்கப்பட்டிருக்கவில்லை. 2014இன் இறுதியில் அரசாங்கம் திறைசேரி உத்தரவாதங்களாக அரச உடைமை தொழில்முயற்சிகளினால் உட்கட்டமைப்பு அபிவிருத்திக் கருத்திட்டங்களை செயற்படுத்துவதற்கு வர்த்தக வங்கிகளுக்கு ரூபா 524 பில்லியன் பெறுமதியான திறைசேரி உத்தரவாதமாக வழங்கியுள்ளது. (பின்னிணைப்பு I) இந்த பொறுப்புக்கள் குறித்த அரச உடைமை தொழில்முயற்சிகளினால் செலுத்தப் படாதபோது அரசாங்கம் அவற்றினைச் செலுத்த வேண்டியுள்ளது.

ஆ. 2014இன் இறுதியிலுள்ளவாறு வங்கித்தொழில் முறைமைக்கு செலுத்தப்பட வேண்டிய படுகடன் தொகை ரூபா 593 பில்லியனாகக் காணப்பட்டது. இது ஏற்கனவே செலுத்தப்பட்டுள்ள இலங்கை பெற்றோலியக் கூட்டுத் தாபனத்தின் ஹெஜ்ஜிங் கொடுக்கல் வாங்கலின் ரூபா 7.8 பில்லியனை அல்லது 60 மில்லியன் ஐ.அ.டொலரினையும் உள்ளடக்கியுள்ளது. ஹெஜ்ஜிங் கொடுக்கல் வாங்கல் மூலம் அரசாங்கத்திற்கு ஏற்பட்ட மொத்த நட்டம் ஏறக்குறைய 120 மில்லியன் ஐ.அ.டொலராக (ரூபா 15.7 பில்லியன்) இருக்குமென மதிப்பிடப்பட்டுள்ளது. இது இலங்கையின் வர்த்தக தொழிற்பாடுகளின் வரலாற்றில் பதிவுசெய்யப்பட்ட மிகமோசமான கொடுக்கல் வாங்கல்களில் ஒன்றாக இருப்பதுடன் இறுதியில் இது மக்களின் பொருளாதாரத்தினை வெகுவாகப் பாதித்தது.

இ. அரசாங்கத்தின் வரவு செலவுத்திட்டப் பற்றாக்குறையானது அரசாங்க உடைமைத் தொழில் முயற்சிகளினால் உட்கட்டமைப்பு கருத்திட்டங்களுக்காகப் பெறப்பட்ட வெளிநாட்டுக் கடன்களை உள்ளடக்கியிருக்கவில்லை. 2014 இன் இறுதியில் இவ்வாறு பெறப்பட்ட கடன்களின் மொத்த நிலுவை 2,356 மில்லியன் ஐ.அ.டொலராக அல்லது ரூபா 308 பில்லியனாகக் காணப்பட்டது. இக்கடன்கள் புத்தளம் நிலக்கரி மின் உற்பத்திக் கருத்திட்டம், ஹம்பாந்தோட்டை துறைமுக அபிவிருத்திக் கருத்திட்டம் மற்றும் மத்தள சர்வதேச விமான நிலையக் கருத்திட்டம் என்பவற்றிற்கு நிதியளிப்பதற்காக பெறப்பட்டது. (பின்னிணைப்பு II)

திறைசேரி உத்தரவாதங்கள், வங்கிகளுக்கான அரச தொழிற் முயற்சிகளின் படுகடன் மற்றும் அரச தொழில்முயற்சிகளினால் செயற்படுத்தப்பட்ட கருத்திட்டங்களுக்கான வெளிநாட்டு கடன் தொகை என்பவற்றை நாம் ஒன்று சேர்ப்போமாயின் வரவு செலவுத்திட்டப் பற்றாக்குறையானது பிரசுரிக்கப்பட்ட இலக்கங்களைவிட மிகவும் அதிகமானதாக இருப்பதனைக் காண முடியும்.

தற்பொழுது நீங்கள் முன்னைய ஆட்சியில் எமக்கு விட்டுச் சென்ற வரவு செலவுத்திட்டப் பற்றாக்குறையின் அளவினை அவதானிக்க முடியும். இது முன்னைய அரசாங்கத்தினால் விட்டுச் செல்லப்பட்ட ஆரோக்கியமற்ற ஒரு விடயமென்பதுடன் நாம் அவற்றை அனுபவிக்க வேண்டியுள்ளதுடன் அவ்விடத்திலிருந்து எமது பயணத்தினையும் ஆரம்பிக்க வேண்டியுள்ளது.

இன்னும் சில வருடங்களில் அவ்வாறான செயற்பாடுகளினால் பொருளாதார ரீதியில் தோல்வியடைந்த நாடொன்றாக எமது நாட்டினை முத்திரை பதிக்கின்ற அளவு நிலைமை ஏற்பட்டு விடும். இந்த 'மாற்றம்' இனை சாத்தியப்படுத்திய அனைவருக்கும் நான் மீண்டும் நன்றி தெரிவிப்பதுடன் அவ்வாறு இடம்பெறாவிட்டால் எமது பெருமைக்குரிய தேசம் பேரளவான ஜனநாயகமாக மாறி பொருளாதாரமானது மோசமான ஆட்சியாளர்களினால் சூறையாடப்பட்டிருக்கும்.

தற்காலிக தரவுகளின் அடிப்படையில் 2014இன் இறுதியில் அரசாங்கத்தின் படுகடன் நிலுவை ரூபா 7,373 பில்லியனாகக் காணப்பட்டது. இது தலைக்குரிய படுகடனை ரூபா 357,233 ஆக மாற்றியது.

எவ்வாறாயினும், நான் மேலே சுட்டிக்காட்டிய 3 விடயங்களையும் நாம் உள்ளடக்குவோமாயின் மொத்தப் படுகடன் ரூபா 8,817 பில்லியனாக அதிகரிக்கும். இயல்பாகவே தலைக்குரிய படுகடன் ஏறக்குறைய 427,220 ரூபாவாக அதிகரிக்கும். மீண்டும்

[ගරු රවි කරුණානායක මහතා]

முன்னைய அரசாங்கத்தினால் இந்நாட்டின் மக்கள் மீது சுமத்தப்பட்ட கடன் சுமையினை நீங்கள் நன்கு அவதானிக்க முடியும்.

இந்த அனைத்துப் படுகடன்களும் இந்நாட்டின் அப்பாவி மக்களினால் செலுத்தப்பட வேண்டியுள்ளதுடன் இச்சுமையினை தற்கால சந்ததியினர் மாத்திரமல்லாமல் எதிர்கால சந்ததியினரும் சுமக்க வேண்டிய நிலை ஏற்பட்டுள்ளது என்ற உண்மையினை நான் உங்களுக்குத் தெளிவுபடுத்த வேண்டும். 2,500 வருடங்களுக்கு அதிகமான வரலாற்று சிறப்பம்சங்களைக் கொண்ட நாடு என்ற வகையில் நாம் பெருமைப்படுகின்ற அதேவேளை முன்னைய அரசாங்கத்தினால் உருவாக்கப்பட்டுள்ள இந்த படுகடன் வரலாற்றினைக் கொண்டு நாம் எவ்வாறு பெருமை யடைய முடியும். இது அத்தியாவசியமானதும் வெளிப்படை யானதாகவும் இருந்ததா என்ற கேள்வியும் எம்மில் எழுகின்றது. முன்னைய ஆட்சியாளர்களினால் கையாளப்பட்ட பணக் கொடுக்கல் வாங்கல்கள் எதிர்கால சந்ததியினர் அவற்றினை மீளச் செலுத்த வேண்டிய நிலை ஏற்பட்டுள்ளது என்ற வகையில் அவர்கள் வெட்கப்பட வேண்டியுள்ளனர்.

மொத்தப் படுகடன் மற்றும் தலைக்குரிய படுகடன்

விடயம்	2012	2013	2014
மொத்தப் படுகடன் (ரூபா பில்.)			
அரசாங்கப் படுகடன்	6,000	6,793	7,373
மொத்தப் படுகடன்: அரச படுகடன், திறைசேரி உத்தரவாதங்கள், அரச உடைமை நிறுவனங்களினால் வங்கிகள் மற்றும் வெளிநாட்டு மூலங்களினால் பெற்றுக் கொள்ளப்பட்ட கடன்கள்	6,853	8,099	8,817
මේ කාරණය නැවත වරක් ජනවාරි 10වැනි දා පාර්ලිමේන්තු න්‍යාය පුස්තකයට ඇතුළත් කෙරුණු අතර 2013 ජනවාරි 10 සහ 11 යන දිනවල න්‍යාය පත්‍රයේ අංක 1 යටතේ දක්නට ලැබුණා. 2013 ජනවාරි 10 සහ 11 දිනවල න්‍යාය පත්‍රයේ ඇතුළත් කෙරුණු යෝජනාව 2012 නොවැම්බර් 06වැනි දා පාර්ලිමේන්තු න්‍යාය පුස්තකයට ඇතුළත් කෙරුණු අංක 20 දරන යෝජනාවමයි. ඉන් ප්‍රකාශිත වූයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107. (3) සහ 107. (2) ව්‍යවස්ථා යටතේ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත් කළ යුතු බවට වූ යෝජනාවයි. එකම යෝජනාවයි ඉදිරිපත් වුණේ. තේරීම් කාරක සභාවක් පත් කරන්නත්, එසේ පත් කරලා වැරැදිකරුවකු වුණොත් එම ධුරයෙන් ඉවත් කරන්න කියන යෝජනාවයි ඉදිරිපත් වුණේ. "මේ මේ හේතු උඩ ඉවත් කළ යුතුයි" කියන කාරණය යෝජනාවේ තිබුණේ නැහැ.

මෙම අවස්ථාවේ දී මේ කටයුත්ත සඳහා නිවැරැදි ක්‍රියා පටිපාටිය අනුගමනය කළ යුතු යයි පෙන්වා දුන් අතර ස්ථාවර නියෝග 78අ. සංශෝධනයකොට විවාදය වෙත යොමු විය හැකි යයිද පැහැදිලි කළා. එහෙම නම් කරන්න තිබුණේ ස්ථාවර නියෝග 78අ. සංශෝධනය කරන්නයි. එහෙත් එය සිදු කළේ නැහැ. ඒ වෙනුවට රජය කළේ තේරීම් කාරක සභාවේ සොයා ගැනීම් පදනම් කර ගනිමින් විවාදය පැවැත්වීමයි. මෙහිදී පැහැදිලි කළ යුත්තේ ජනවාරි 10වැනි දා න්‍යාය පත්‍රයට ඇතුළත් කර

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

තිබුණේ අග්‍ර විනිශ්චයකාරතුමිය ඉවත් කිරීම සඳහා පාර්ලිමේන්තුව වෙතින් අතිගරු ජනාධිපතිතුමාට ඉදිරිපත් කිරීමට සැලසුම් කෙරුණු යෝජනාවක් හෝ මෝසමක් නොවන බවයි. එය හුදෙක්ම පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත් කිරීම සඳහා කෙරුණු යෝජනාවක් පමණයි. එම යෝජනාව අවසානයේ මෙසේ සඳහන් වුණා.

"එබැවින්, ඉහත සඳහන් විෂමාචාර චෝදනා හේතුවෙන්, එම විෂමාචාර චෝදනා පිළිබඳව පරීක්ෂාකර එම චෝදනා එකක් හෝ එයට වැඩි ගණනක් ඔප්පුවී ඇතැයි විශේෂ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබුවහොත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍ර විනිශ්චයකාර පදවියෙන්, ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි ඇංගුමාලා බණ්ඩාරනායක මහත්මිය ඉවත් කිරීම සඳහා යෝජනාවක් අතිගරු ජනාධිපතිතුමාට ඉදිරිපත් කළ හැකි වන පරිදි පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත්කළ යුතු යැයි ඉහත නම් සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අපි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 (3) ව්‍යවස්ථාව සමග කියැවෙන 107 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන සහ, 78 අ දරන පාර්ලිමේන්තු ස්ථාවර නියෝග ද ප්‍රකාරව යෝජනා කර සිටිමු."

එම නිසා ජනවාරි 10, 11 දිනවල පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරුණු යෝජනාව හුදෙක්ම පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත් කිරීමට කෙරුණු යෝජනාවක් පමණයි. පසු බිම විතරයි මා කියවන්නේ, දැනුම් දෙන්නේ, විස්තර කරන්නේ, ගරු කථානායකතුමනි.

විනිශ්චයකාරවරයකු ඉවත් කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107. (2) ව්‍යවස්ථාවට අනුව අයථා හැසිරීම හෝ තනතුරේ කටයුතු කිරීමට නොහැකි වීම යන කරුණුවලට එම යෝජනාව අදාළ වන්නේ නැහැ. විපක්ෂයේ මන්ත්‍රීවරු ගණනාවක් මේ පිළිබඳ කථානායකවරයාගේ අවධානය යොමු කළා.

"න්‍යාය පත්‍රයේ සඳහන් කරුණු අප සැලකිල්ලට ගෙන ඡන්දය විමසා එය සම්මත වුවහොත් අපට තවත් තේරීම් කාරක සභාවක් පත් කර ගන්නට සිදුවෙනවා. හේතුව මේ යෝජනාව තේරීම් කාරක සභාවක් පත් කිරීම සඳහා ඉදිරිපත් කළ එකක් වීමයි. ජනාධිපතිතුමාගේ අවධානයට යොමු කළ හැකි යෝජනාවක් ලෙස දක්වා ඇතත් ඒ කොටස ක්‍රියාවට නැංවිය නොහැකියි. ක්‍රියාත්මක කළ හැකි එකම කොටස වන්නේ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත් කිරීමට අප තීරණය කිරීමයි." (648වන කොලම, පාර්ලිමේන්තු විවාද, වෙළුම 214 අංක 4 - 2013 ජනවාරි 11 වැනි සිකුරාදා හැන්සාඩ් වාර්තාව.)

ගරු කථානායකවරයා එදින සභා වාරය ප. ව. 7.34 දක්වා කල් දැම්මා, මේ ගැන සාකච්ඡා කරන්න. ඉන් අනතුරුව රැස්වීම ආරම්භයේදී එතුමා පාර්ලිමේන්තුවට දැන්වූයේ සභාව සාකච්ඡාවට භාජන කර ඇති න්‍යාය පත්‍රයේ අංක 1 යටතේ සඳහන් යෝජනාවට මෙය ප්‍රමාණවත් බවයි. (651 කොලම) ඒ අනුව යෝජනාව සඳහා ඡන්ද විමසීමක් කැඳවූවා. එය පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත් කිරීම සඳහා ඉදිරිපත් කෙරුණු යෝජනාවක් පමණයි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 155 දෙනෙකුගේ ඡන්දයෙන් එය සම්මත වූ අතර 49 දෙනෙකු විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළා.

මෙහිදී කථානායකතුමා ගත් තීරණය පිළිබඳව මා විවේචනය කරන්නේවත්, හැප්පෙන්නේවත් නැහැ. මොකද, එතුමා මේ ගරු සභාවේ සිටියේ නඩුකාරවරයකු හැටියට නීතිය මොකක්ද කියා කියන්න නොවෙයි. න්‍යාය පත්‍රයේ සඳහන් අංක 1 යෝජනාව සම්බන්ධයෙන් මෙය අදාළද, නැද්ද? අංක 1 යෝජනාවේ වැරැද්දක් තිබෙන එක එතුමාට විසඳන්න බැහැ. එය විසඳන්න තිබෙන්නේ වෙනත් ස්ථානයකදීයි. එතුමාට තිබුණේ, අංක 1 යෝජනාව සම්බන්ධයෙන් ස්ථාවර නියෝග 78අ. (1) යටතේ කාරක සභාවක් පත් කර ගන්නයි. ඒකට මේක සම්පූර්ණයි. එහෙම නම් ඒ වුවමනාව ඉටු වෙලා තිබෙනවා. මමයි මේ ප්‍රශ්නය ගත්තේ. මම කියන දේ බැලුවා නම් ඔබතුමාට නඩු අහන්න වෙන්නේ. නඩු අහන්න බලය ඔබතුමාට නැහැ. ඔබතුමා සිදු කළ දෙය එයට අදාළයි, ඒ ගැන මගේ ප්‍රශ්නයක් නැහැ. මම ඔබතුමා සමඟ ඒකට එකඟ වෙනවා.

මෙම ක්‍රියාදායම නිසි අයුරින් සිදු වූවා නම්, ඊළඟ පියවර විය යුතුව තිබුණේ ස්ථාවර නියෝග 78අ.(7) අනුව පාර්ලිමේන්තුව වෙනුවෙන් කථානායකවරයා විසින් ජනාධිපතිවරයා වෙත යොමුවක් ඉදිරිපත් කිරීමයි. නමුත් මේක අනුව එතුමාට සිදු වුණා ඒ සම්මත වුණු යෝජනාව එවන්න. මෙයද සිදු වූ බවක් පෙනෙන්නට තිබුණේ නැහැ. එය සිදු කිරීමට නොහැකි වූයේ විවාද කොට සම්මත කර ගත්තේ තේරීම් කාරක සභාවක් පත් කර ගැනීම සඳහා දෙවැනි වරටත් ඉදිරිපත් කර තිබූ යෝජනාවක් නිසායි.

යෝජනාවේ සිරස්තලය අනුව එය ඉවත් කිරීමේ යෝජනාවක්. කථානායකතුමා ඒ වැඩ කටයුත්ත කළා. ඒක ජනාධිපතිට එව්වා.

2013 ජනවාරි 11වෙනි දා කථානායකතුමා විසින් ජනාධිපතිතුමා වෙත යොමු කරන ලද ලිපියේ සඳහන් වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107වෙනි වගන්තිය හා ස්ථාවර නියෝග 78අ.(2) අනුව මෙය සම්මත කර ගත් බවයි. අනුගමනය කළ ක්‍රමවේදය එයයි. එහි ස්ථාවර නියෝග 78අ.(7) පිළිබඳව කිසිදු සඳහනක් නැහැ. ඇත්තෙන්ම මේ ලිපිය සභාවේ කටයුතු සිදු වූ ආකාරය පිළිබඳව සැබෑ පිළිබිඹුවක්. It is a true and accurate record of what happened in the House.

ඒක බලා ක්‍රියා කළාම කථානායකතුමාගේ වැඩ කොටස එතැනින් අවසානයි. සභාවේ අපටත් ඡන්දය දෙන්න කිව්වා. සමහර අය පක්ෂව ඡන්දය දුන්නා, සමහර අය විරුද්ධව ඡන්දය දුන්නා. අපි විරුද්ධව ඡන්දය දුන්නා. ඔබතුමන්ලා සමහර දෙනෙක් පක්ෂව ඡන්දය දුන්නා. මෙතැන තිබෙන්නේ ඒ කරුණු දිහා බලා වැරදිකාරියද නැද්ද කියලා තීරණය කිරීම නොවෙයි, ඒ යෝජනාව අදාළ විධියට සකස් වුණාද, නැද්ද කියන එකයි. මේ සභාවේ අපි හැම කෙනාම අපේ යුතුකම් කරලා තිබෙනවා.

මේ අනුව බලන විට මුළු දෝෂාභියෝග ක්‍රියාදාමයම දෝෂ සහගතයි. සමස්ත ක්‍රියාවලියේම කිසිදු වලංගු භාවයක් තිබුණේ නැහැ. ඒ නිසා එළැඹිය හැකි එකම අවසන් නිගමනය වන්නේ අග්‍රවිනිශ්චයකාර ආචාර්ය ශිරානි බණ්ඩාරනායක මහත්මියට එරෙහි දෝෂාභියෝගය හෝ එතුමිය තනතුරෙන් ඉවත් කිරීම කිසිසේත් වලංගු නොවන බවයි.

ඇත්ත වශයෙන්ම මේක ජනාධිපති කාර්යාලයට ගියාම, ජනාධිපතිතුමාගේ උපදේශකයන්ට තිබුණා මේ දිහා බලලා මේක දෝෂාභියෝගයක්ද නැද්ද කියලා කියන්න. ස්ථාවර නියෝග 78අ. (7) යටතේ දෝෂාභියෝගයක් නොවේ නම් විකල්ප තුනක් තිබුණා.

ඉන් එක විකල්පයක් තමයි, ආපසු මේ සභාවට එවීම දෝෂාභියෝගයක් හැටියට ගන්න. දෙවෙනි එක තමයි, මේ ස්ථාවර නියෝගය සංශෝධනය කරන්න කියලා සභාවට කීම. ස්ථාවර නියෝග 78අ.(7) මෙතැනට බලපාන්නේ නැහැ කියලා කිව්වා නම් මේක දෝෂාභියෝගයක් විධියට සලකන්න පුළුවන්. එහෙම නැත්නම් තිබුණේ, දෝෂාභියෝගයක් නොවෙයි කියලා මේක ප්‍රතික්ෂේප කිරීම. නීතිවේදී සංගමය සහ අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා මේ ගැන බලලා තීරණයක් අරගෙන තිබෙනවා. ඉන් පසුව ඔබතුමා හිතන්න ඊළඟ පියවර කුමක්ද කියලා.

මේ විග්‍රහය අනුව, එවකට ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ක්‍රියා කර ඇත්තේ අග්‍රවිනිශ්චයකාර ශිරානි බණ්ඩාරනායක

මහත්මිය ඉවත් කිරීම සම්බන්ධ පාර්ලිමේන්තුවේ සිදු කෙරුණු ප්‍රකාශයන් පදනම් කර ගනිමිනුයි. මෙම විග්‍රහය අනුව කෙසේ වෙතත් අග්‍රවිනිශ්චයකාර ආචාර්ය ශිරානි බණ්ඩාරනායකගේ අයථා ක්‍රියා කලාපය හෝ වෙනයම් දුබලතාවක් උඩ එතුමිය තනතුරෙන් ඉවත් කිරීම සඳහා පාර්ලිමේන්තුවේ වැඩි දෙනෙකුගේ ඡන්දයෙන් සම්මත වූ කිසිදු ඇමතුමක් කිසිදා ජනාධිපතිතුමාට ඉදිරිපත් නොවූ බව පැහැදිලියි.

තුනෙන් දෙකක ඡන්දයෙන් යෝජනාවක් සම්මත වුණා. ඒ යෝජනාව දෝෂාභියෝගයක් බවට පත් වන්නේ නැහැ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107.(2) ව්‍යවස්ථාවේ නියෝගයන් හැදෑරීමේදී පෙනී යන්නේ අග්‍රවිනිශ්චයකාරතුමිය ඉවත් කිරීමට ජනාධිපතිවරයා නීති විරෝධි හා හිතුවක්කාරි තීරණයක් ගෙන ඇති බවයි.

මේ කරුණු සලකා බැලීමේදී එවකට අමාත්‍ය මණ්ඩලයේ නීති උපදේශක වශයෙන් කටයුතු කළ මොහාන් පීරිස් මහතා අග්‍රවිනිශ්චයකාරවරයා වශයෙන් පත් කිරීම බල රහිත ක්‍රියාවක් බව ඉතා පැහැදිලියි. ඒ අවස්ථාවේදී ඔහුට ඒ තනතුර ප්‍රදානය කිරීමට අවශ්‍ය නීත්‍යානුකූල ඇබෑර්තුවක් නොතිබීම ඊට හේතුවයි.

ඇත්ත වශයෙන්ම මෙතැනදී සිදු වුණේ මේකයි. උපදෙස් දෙන කෙනා තමයි ඊට පසුව මේ තනතුර ගත්තේ. එහෙම නැත්නම් වෙනත් උපදෙසක් දෙනවා. එතැනයි තිබුණු ගැටේ, මට පෙනෙන හැටියට. ඒක වැරදියි කියලා අපේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මට කිව්වොත්, මම ඒකත් පාර්ලිමේන්තුවේදී කියවන්නම්.

ආචාර්ය ශිරානි බණ්ඩාරනායක මහත්මිය නීත්‍යානුකූලව එම තනතුරෙන් ඉවත් නොකෙරුණු අතර, ඒ නිසා එතුමියට නීත්‍යානුකූලව හා ව්‍යවස්ථානුකූලව පත් කෙරුණු අග්‍රවිනිශ්චයකාරතුමිය වශයෙන් අඛණ්ඩව කටයුතු කළ හැකියි.

ඊළඟට, 2015 ජනවාරි මාසයේ 08වෙනි දින පැවැති ජනාධිපතිවරණයේදී ඇති වූ සිද්ධීන් මේකට සම්බන්ධ නිසා දැන් මම ඒ කාරණා මතු කරන්නම්.

ජනවාරි 09වෙනි දින උදේ පාන්දර, හරියටම කිව්වොත් උදේ පාන්දර 4.00ට පමණ ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාට මා සමඟ සාකච්ඡා කිරීමට අවශ්‍ය වී ඇති බව දැන ගන්නට ලැබුණා. මා එම සාකච්ඡාව සඳහා අරලියගහ මන්දිරයට ගිය විට පුද්ගලයින් ගණනාවක් ජනාධිපතිතුමා අසල සිටිනු මා දුටුවා. දේශපාලනඥයන් සිටියා. අනෙක් නිලධාරීන් සිටියා. ඒක ප්‍රශ්නයක් නොවෙයි. ඉන් එක් අයකු වූයේ මොහාන් පීරිස් මහතායි. එතැන කුමක් කරන්නේදැයි මා ඔහුගෙන් විමසූ විට, තමා යම්කිසි උපදේශයක් දීමට පැමිණි බව කියා ඔහු කාමරයෙන් ඉවත්ව ගියා. නමුත් මට ගරු නීතිපතිතුමාගෙන් දැන ගන්න ලැබුණේ ජනාධිපතිතුමාගෙන් පණිවුඩයක් ලැබ පාන්දර 2.30ට පමණ ඔහු අරලියගහ මන්දිරයට පැමිණෙද්දීත්, ජනාධිපතිතුමා හා අනෙක් අයත් සමඟ මොහාන් පීරිස් ද එහි සිටි බවයි. මොහාන් පීරිස් මහතා පසුව මට දුරකථනයෙන් කථා කොට පැවසුවේ සමහර කොටස් ඔහුව ධුරයෙන් ඉවත් කරලීමට උත්සාහ කරන බවයි. නමුත් අග විනිසුරු ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයේ ඉදිරි සියලු තීරණයන් මඟින් රජයට සහාය ලබා දෙන බවත් ඔහු පැවසුවා. මා විතරක් නොවෙයි සාක්කිකාරයන් හැටියට ඉන්නේ. ඒක අධිකරණ ඇමතිතුමාටත් කිව්වා. ඒක ජනාධිපතිතුමාටත් කිව්වා. සාකච්ඡාවකට අවස්ථාවක් ලබා දෙන මෙන් ඔහු මගෙන් ඉල්ලා සිටියා. තමා ජනාධිපතිතුමන් සමඟ ද සාකච්ඡා කළ බව ඔහු පැවසුවා. එවිට මම පිළිතුරු දෙමින් කියා සිටියේ, අප දෙදෙනා සමඟම සාකච්ඡාවක් පැවැත්වීමේ අවස්ථාවක් ඔහුට සංවිධානය කර දීමට මා සූදානම් බවයි.

ඒ අනුව 2015 ජනවාරි 12වන දා රාත්‍රී 8.00ට, විජේරාම පාරේ ජනාධිපතිතුමාගේ නිවසේදී එතුමා සහ මා සමඟ සාකච්ඡාවක් පැවැත්වීමට මොහාන් පීරිස් මහතාට දින නියම කෙරුණා. එම සාකච්ඡාවට සහභාගි වන ලෙස මා තිලක් මාරපන මහතාට ද ආරාධනා කළා. තිලක් මාරපන මහතා තමයි මොහාන් පීරිස් මැතිතුමාගේ senior. එදින සිය බිරිඳ සහ තවත් දොස්තරවරුන් දෙදෙනකු සමඟ එහි පැමිණි පීරිස් මහතා ඔවුන් අපට හඳුන්වා දුන්නා. හඳුන්වා දීමෙන් පසු අපට සාකච්ඡා කිරීමට ඉඩ කඩ ලබා දී ඔවුන් ඉවත් වී යතැයි සිතුවද දිගටම රැඳී සිටියා. මොහාන් පීරිස් පැවසුවේ අධිකරණය විධායකය සමඟ සමඟියෙන් කටයුතු කිරීම සහ විධායකයේ සහාය අධිකරණයට ලැබීම යහපත් තත්ත්වයක් බවයි. නීති කටයුතු පමා වීම වළකාලන්නට තමා කළ සේවාව ඔහු පහදා දුන්නා. තමා නීති විද්‍යාලය ප්‍රතිසංස්කරණය කිරීම නිසා යම් යම් බලපෑම්වලට ලක් වූ ඇතැම් නීතිඥයන් තමන්ට එරෙහි විරෝධතා පිටුපස සිටින බව ඔහු තවදුරටත් පැවසුවා. නීතිඥ සංගමයේ බහුතරයක් එතුමා එක්ක ඉන්නවා කියලාත් එතුමා කිව්වා. ඉතින්, මේ ගැන අපට වාද කරන්න බැහැ නේ. මේ අවස්ථාවේදී මා පැවසුවේ නීතිඥ සංගමයේ විධායක කමිටුව හමුවී තත්ත්වය සමාලෝචනය කර ඔවුන්ගේ අදහස් ඔහු වෙත දන්වන බවයි. 2015 ජනවාරි 17වන දා මම නීතිඥ සංගමයේ විධායක කමිටුව හමු වුණා. ඔවුන් එක හඬින් කියා සිටියේ අග විනිසුරු ලෙස මොහාන් පීරිස් කෙරෙහි කිසිදු විශ්වාසයක් නැති බව හා එම පත්වීම නීති විරෝධි බවයි. අග විනිසුරු ආචාර්ය ශිරානි බණ්ඩාරනායක මහත්මියට එරෙහි දෝෂාභියෝගයට කිසිදු විධිමත් නෛතික පසු බිමක් නොමැති බව ද ඔවුන් පැවසුවා. 2015 ජනවාරි 19වන දා අරලියගහ මන්දිරයේදී මා හමු වන ලෙස මම මොහාන් පීරිස්ට දැන්වූවා.

ගරු අධිකරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂ මහතා සහ තිලක් මාරපන මහතා මා සමඟ මේ සාකච්ඡාවට එක් වුණා. ඒ අවස්ථාවේදී මට දැනගන්න ලැබුණේ මොහාන් පීරිස් සිය බිරිඳ සහ දොස්තරවරුන් දෙදෙනෙකු සමඟ අරලියගහ මන්දිරයට පැමිණ ඇති බවයි. එවිට අප උපදෙස් දුන්නේ පීරිස් මහතා පමණක් සාකච්ඡාවට කැඳවන ලෙසයි. සාකච්ඡාවේදී ඔහු ඉල්ලා සිටියේ අප්‍රේල් වනතුරු සේවය කරන්නට අවස්ථාව ලබා දෙන ලෙසයි. රජයට එරෙහි කිසිදු තීන්දුවක් ලබා නොදෙන බවත් ඔහු පැවසුවා. ඔහු තවදුරටත් කිව්වා, ඕනෑ නම් රජයට එරෙහි කිසිම නඩුවක ඔහු වාඩි වන්නේ නැතිව ඉන්නම් කියලා; අප කියන නඩුකාරවරුන් පත් කරන්නම් කියලා. මම නීතිඥ සංගමයේ විධායක සභා රැස්වීමේ මතය ඔහුට දැනුම් දුන්නා. එවිට ඔහු පැවසුවේ ස්විට්සර්ලන්තය වැනි රටක -ජිනීවාහි- තානාපති තනතුරක් ලබා දෙන්නේ නම් ඔහු තනතුර අත් හැර යෑමට සූදානම් බවයි. ඒ වනකොට නීතිවේදීන්, විනිශ්චයකාරවරුන් සහ මොහාන් පීරිස් අතර සටටනයක් ඇති වන තැනට ඇවිල්ලායි තිබුණේ. අපි බැලුවේ මොකක් හරි කරලා මේක විසඳාගන්නයි.

ගරු විදේශ ඇමතිතුමා මඟින් එවැනි තනතුරු පුරප්පාඩු ඇතිද යන්න පිළිබඳව සොයා බැලිය යුතු බව මම ඔහුට පැවසුවා. එවැනි පුරප්පාඩු පිළිබඳව දැනුම් දීමෙන් පසු තමා ඉල්ලා අස් වන බවට මොහාන් පීරිස් එකඟ වුණා. බ්‍රසීලයේ සහ වියට්නාමයේ තානාපති තනතුරු පුරප්පාඩුව පවතින බවත්, ඉතාලි තානාපති ධුරය ළඟදීම පුරප්පාඩු වන බවත්, ගරු විදේශ අමාත්‍ය මංගල සමරවීර මහතා මට දැන්වූවා. මම මේ බව මොහාන් පීරිස්ට දන්වා බ්‍රසීලයේ තානාපති ධුරය නිර්දේශ කළා. මම කිව්වා, "අනෙක් පුරප්පාඩුව තිබෙන්නේ වියට්නාමයේ, ඔබතුමා එහේ යන්නේ නැති වේවි කියා හිතුවා' කියා. නමුත් ඔහු සෑහීමකට පත් වුණේ නැහැ. මා විජයදාස රාජපක්ෂ මැතිතුමාට මේ ගැන දැනුම් දුන්නා. ඉතාලියේ -රෝමයේ- තානාපති ධුරය සති කීපයකින් පුරප්පාඩු වන බව මොහාන් පීරිස්ට දන්වන්නැයි මම ගරු අධිකරණ ඇමතිතුමාට පැවසුවා. එවැනි තනතුරක් එතුමා ඉල්ලපු ආකාරයට එක සැරේ දෙන්න බැරි වුණා. සති කීපයකින් දෙන්න පුළුවන් බව. මොහාන් පීරිස්ට දැන්වූ බවත්, පිළිතුරක් අපේක්ෂාවෙන් සිටින බවත් ගරු අධිකරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂ මහතා මට දැනුම් දුන්නා.

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

ජනවාරි 21වන දා ජනාධිපති ලේකම්වරයා මටත්, ජනාධිපතිතුමන්ටත් දැන්වූයේ තමන් තානාපති තනතුරක් සඳහා ඉල්ලීමක් නොකළ බව මොහාන් පීරිස් ප්‍රකාශ කළ බවයි. ඉන් පසු ජනාධිපතිතුමාත්, අධිකරණ අමාත්‍යතුමාත්, මමත් මොහාන් පීරිස් මහතාගෙන් ඉල්ලා සිටියේ එදිනම කැබිනට් රැස්වීමෙන් පසු අප හමුවන ලෙසයි. කැබිනට් රැස්වීම පැවත්වෙමින් තිබියදී පස් වරු 5.00ට පමණ මොහාන් පීරිස් ජනාධිපති ලේකම් කාර්යාලයට පැමිණි බවත්, කැබිනට් රැස්වීම අවසන් වෙද්දී ඔහු පිටව ගොස් ඇති බවත් අපට දැන ගන්නට ලැබුණා.

අපි එතුමාට එන්න කිව්වේ පස්වරු 5.00ට. නමුත් කැබිනට් රැස්වීමට ටිකක් වෙලාව ගත වුණා.

ඒ නිසා පසු දා උදෑසන 8.30ට ජනාධිපතිතුමා සහ මා හමු වීමට පැමිණෙන ලෙස ජනාධිපති ලේකම්වරයා මොහාන් පීරිස්ට දැනුම් දුන්නා. මොකද, අපි බැලුවේ මේ ගැන යම් කිසි තීන්දුවකට එන්නයි. එතුමා තානාපතිකම ගන්නවා නම් අරගෙන ඒ කටයුතු කරන්න. නැත්නම් අපට කරන්න දෙයක් තිබුණේ නැහැ. ඒකයි මම කියන්නේ.

එදින රාත්‍රියේ කිසිම දැනුම් දීමකින් තොරව පීරිස් මහතා සහ මහත්මිය ජනාධිපතිතුමන්ගේ නිවසට පැමිණියා. එහිදී මොකක්ද වුණේ කියලා ජනාධිපතිතුමා මට කිව්වා. ඒ ගැන මම මේ සභාවේ කියන්න යන්නේ නැහැ. එහිදී ජනාධිපතිතුමන් පීරිස් මහතාට දන්වා සිටියේ පසු දා උදෑසන 8.30ට හමු වීම සඳහා වේලාව වෙන් කර ඇති බවයි. ජනාධිපතිතුමාත්, අධිකරණ ඇමතිතුමාත්, මමත් උදෑසන 8.30 වෙද්දි ජනාධිපති ලේකම් කාර්යාලයට පැමිණියා. නමුත් මොහාන් පීරිස් පැමිණියේ නැහැ. උදෑසන 9.15 පමණ වෙද්දී ඔහු සාකච්ඡාව සඳහා නොපැමිණෙන බව අපට ඒත්තු ගියා.

ජනවාරි 26වෙනි දා හැන්දෑවේ නීතිඥ සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් මට දැනුම් දුන්නේ පත් වීම නීත්‍යානුකූල නොවන නිසා මොහාන් පීරිස් වහාම ඉල්ලා අස් විය යුතු බව සහ මේ පත් වීම ජනාධිපතිතුමා යළි සමාලෝචනය කළ යුතු බවයි. ඔවුන් අවධාරණය කළේ නීත්‍යානුකූල ක්‍රමවේදයකින් තොරව ඉවත් කිරීම නිසා තවමත් සැබෑ අග විනිසුරු ශිරානි බණ්ඩාරනායක මහත්මිය බව නීතිඥ සංගමයේ මතය බවයි. ඒ නිසා මොහාන් පීරිස් මහතාගේ පත් වීම කිසිදු නෛතික වලංගුභාවයකින් තොර බවද ඔවුන් පෙන්වා දුන්නා.

මේ වන කොට මොහාන් පීරිස් මැතිතුමා නොපැමිණෙන බව දැනගත්තා. ජ්‍යෙෂ්ඨ ජනාධිපති නීතිඥවරු කිව්වේ "මේක තවත් දුර යන්න දෙන්න එපා. අපි කිව්ව දේ දිහා බලන්න. ඔබතුමන්ලා සහ ජනාධිපතිතුමා ඒ ස්ථාවරයේ ඉන්නවා නම්, මේක වලංගු නැහැ කියලා කියන්න. එහෙම නොවෙයි නම්, පාර්ලිමේන්තුවට දෝෂාභියෝගයක් ඉදිරිපත් කරන්න ඔබතුමන්ලාට සිදු වේවි. එහෙත් අපේ ස්ථාවරය මේකයි. කොහොම හරි මේක දිහා බලා ඊට පස්සේ ඕනෑ තීරණයක් ගන්න" කියායි. මෙතැනදී අධිකරණ ඇමතිතුමාත් ඒකයි කිව්වේ. ඒ ගැන බලන්න තමයි ඊට පස්සේ ජනාධිපතිතුමා සියලු දෙනාම කැඳෙව්වේ.

නීතිපති දෙපාර්තමේන්තුවේ 130වෙනි සංවත්සරය වෙනුවෙන් පැවති නීතිපති සමුළු රාත්‍රී භෝජන සංග්‍රහය සඳහා මොහාන් පීරිස් වෙත යැවූ ආරාධනය ඉවත් කර ගැනීමට සිදු වුණු බව මම දැන සිටියා.

ඒක සිදු වුණේ රජයේ නීතිඥයන් කිව්වා, එතුමා පැමිණියොත් අපි එන්නේ නැහැ කියලා. නීතිවේදී සංගමයත් ඒ වාගේම දැනුම් දීමක් කරලා තිබුණා.

නීතිඥ සංගමය අග විනිසුරු සම්බන්ධයෙන් යෝජනාවක් සම්මත කර ගෙන තිබුණා. 2015 ජනවාරි 9වන දින හිමිදිරියේ මොහාන් පීරිස් අරලියගහ මන්දිරයේ රැඳී සිටීම පිළිබඳව නීතිඥ සංගමය පූර්ණ සැලකිල්ල යොමු කර තිබුණා. මේ ඒ ගොල්ලන්ගේ යෝජනාවේ තිබුණු කරුණු. ඔවුන් ඒ ගැන මගෙන්ද විමසා සැක හැර දැන ගත්තා. ජ්‍යෙෂ්ඨ නීතිවේදීන් සහ නීතිඥ සංගමය පැවසූයේ ඡන්ද ගණන් කරමින් තිබෙන අවස්ථාවක අග විනිසුරුවරයා ජනාධිපති අපේක්ෂකයකු සමඟ සිටීම කිසිසේත්ම සුදුසු ක්‍රියාවක් නොවන බවයි. ගරු විදේශ අමාත්‍යතුමා මේ පිළිබඳව කළ පැමිණිල්ල සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දැන් පරීක්ෂණ පවත්වනවා.

විශේෂයෙන් දැන් කෙරෙන පරීක්ෂණවල මොහාන් පීරිස්ගේ නම සමාගම් ගණනාවක් සමඟ ඇදී තිබෙනවා. රක්නා ලංකා පුද්ගලික සමාගම, ලංකා ලොජිස්ටික්ස් සමාගම ආදියෙහි අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කළා පමණක් නොව, තවමත් ඒවායේ කොටස් හිමිකරුවෙක්. මේ කරුණු ජාතික විධායක කවුන්සිලය මඟින් පත් කළ ඉහළ පෙළේ දූෂණ විරෝධී කමිටුව වෙත ඉදිරිපත් කෙරෙනු ඇති. මේ තත්ත්වයන් රජයේ නීතිඥයන්, අනෙකුත් නීතිඥයන් සහ අධිකරණය අතර මොහාන් පීරිස් පිළිබඳ ගැටුමකට පමණක් නොව, සමස්ත නෛතික පද්ධතියම අර්බුදයකට ඇද දැමීමට හේතු වුණා. ඔහුගේ නීති හා ව්‍යවස්ථා විරෝධී පත් වීම නිසා ආරම්භයේ සිටම එය වලංගු නොවීමට අමතරව අග විනිසුරු නාමය ඔහුගේ ක්‍රියා කලාපයන් නිසා කෙළෙසුණා.

නිවැරදි ක්‍රියා පිළිවෙත වන්නේ අග විනිසුරු ලෙස හිටපු ජනාධිපතිතුමන් විසින් කළ පත් වීම වලංගු නොවන බව මොහාන් පීරිස්ට දැනුම් දීම බව ජාතික විධායක සභාව සහ නීතිපතිවරයා විමසීමෙන් අනතුරුව ජනාධිපතිතුමන් තීරණය කළේ මෙන්න මේ පසු බිම මතයි. මේ ගැන නීති උපදෙස් ලැබුණාට පස්සේ ගත යුතු පියවර මොකක්ද කියලා අපි සාකච්ඡා කළා. එතුමාත් සිතුවේ මේ පත්වීම වලංගු නැහැ කියලායි. එතුමාත් මේ පාර්ලිමේන්තුවේ හිටියා. ප්‍රශ්නය තිබුණේ පාර්ලිමේන්තුවේ නොවෙයි, ඒ යෝජනාව පිළිබඳවයි. ඒ නිසා අපි ජනාධිපතිතුමාට කිව්වා, මේ ගැන දැනුම් දෙන්න කියලා.

ඒ සමඟම සැබෑ අගවිනිසුරු ශිරානි බණ්ඩාරනායක මහත්මියට ජනාධිපතිතුමන් විසින් දැනුම් දුන්නේ නීත්‍යානුකූල අගවිනිසුරු ලෙස යළි රාජකාරි අරඹන ලෙසයි. නීතිඥ සංගමය පසු ගිය වසර දෙකක කාලය පුරා මේ ස්ථාවරය දැරූ බවත්, මොහාන් පීරිස් මහතා නීත්‍යානුකූල අගවිනිසුරු ලෙස පිළිගැනීම ප්‍රතික්ෂේප කළ බවත් මම මේ අවස්ථාවේදී සිහිපත් කරන්න කැමතියි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 119 (2) ව්‍යවස්ථාව පිළිබඳව මේ ගරු සභාවේත් රටේත් අවධානය යොමු කරන්න මා කැමතියි. "ශ්‍රේෂ්ඨාධිකරණයේ යම් විනිශ්චයකාර ධුරයක් හිස්ව තිබුණ ද ශ්‍රේෂ්ඨාධිකරණයට ක්‍රියා කිරීමට බලය ඇත්තේ ය. තව ද, එවැනි යම් ධුරයක් හිස්ව තුබූ පමණින් හෝ විනිශ්චයකාරවරයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබූ පමණින් හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ යම් ක්‍රියාවක් නැතහොත් නඩු කටයුත්තක් නිර්බල නොවන්නේය; නිර්බල වන්නාක් සේ නොසැලකිය යුත්තේ ය."

ඒ නිසා ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් පසු ගිය වසර දෙකක කාලය තුළ ලබා දුන් නඩු තීන්දු සහ නියෝග සම්බන්ධයෙන් සැකයක් හෝ බියක් ඇති කර ගත යුතු නැත.

යළි සිය රාජකාරි ඇරඹීමෙන් පසුව ආචාර්ය ශිරානි බණ්ඩාරනායක මහත්මිය 2015 ජනවාරි 29 වන දා සිට සේවයෙන්

විශ්‍රාම යන බව නිවේදනය කළා. ශ්‍රේෂ්ඨාධිකරණයේ සාම්ප්‍රදායික නිල උත්සවයේදී රජයේ නීතිඥයන්, අනෙකුත් නීතිඥයන් ඇතුළු නීති ක්ෂේත්‍රය සම්බන්ධ සියලු දෙනා එතුමිය උණුසුමින් පිළිගත්තා. එතුමියට උණුසුමින් සමු දුන්නා. විශේෂයෙන් ඊයේ මතු කළ රීති ප්‍රශ්නය ගැන මම කියන්න කැමැතියි. ඒ ගැන වාදයක් නැහැ. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන දෝෂාභියෝගයකින් පස්සේ තමයි ජනාධිපතිතුමාට අග්‍රවිනිශ්චයකාරවරයා හෝ විනිශ්චයකාරයෙක් ඉවත් කරන්න පුළුවන්කම තිබෙන්නේ. නමුත් මෙතැනදී විශේෂයෙන් ජ්‍යෙෂ්ඨ නීතිඥයන් ඇතුළු ඔක්කෝම අය දැනුම් දුන්නේ එහෙම දෝෂාභියෝගයක් ඉදිරිපත් කරලා තිබුණේ නැහැ කියලායි. එදා මේ සභාවේ සිදු වුණු දේ ගැන අපි එක ස්ථාවරයක් ගත්තා. අපි මේ සභාවේදී ඡන්දය දුන්නා. ඔබතුමාත් කිව්වේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරවයි මේ යෝජනාව දුන්නේ කියලා. ඒ අනුව තමයි ජනාධිපතිතුමාට තීරණයක් කරන්න වුණේ මේ දෝෂාභියෝගය නීත්‍යානුකූල ද නැද්ද කියලා. නීත්‍යානුකූල නම් අපට සිද්ධ වෙනවා, මේ සභාවට ඇවිත් යෝජනාවක් ඉදිරිපත් කරලා, ඒ අනුව ඔබතුමා මාර්ගයෙන් කමිටුවක් පත් කරලා යළිත් කාරණා අහන්න.

තව කාරණයක් තිබෙනවා. අද වෙනකොට නීතිඥ සංගමයේ සියලු දෙනාම - සියයට සියයක්- මේ ස්ථාවරයේ ඉන්නේ. එහෙම දිගටම කටයුතු කළා නම් විශාල හැප්පීමක් වෙනවා. [බාධා කිරීමක්] සියයට 90ක්. මමත් නීතිඥවරයෙක් නිසායි මම කියන්නේ. අපි ඒ කරුණු දන්නා නිසා. ඒ අය අප හම්බ වෙන්න ආවා. එතුමා වෙනුවෙන් කවුරුත් හිටියේ නැහැ. කවුරුත් හිටියේ නැහැ. මම පුදුම වුණා. එතුමාගේ යාළුවෝත් කියනවා එතුමා ඉන්න හොඳ නැහැ කියලා. මම දන්නවා නේ එතුමාගේ යාළුවෝ. ඒ තත්ත්වය තමයි තිබුණේ. ඒ විධියට විශාල හැප්පීමක් තිබුණා. එක අතකින් නීතිඥයන් විනිශ්චයකාරවරුන්, මොහාන් පීරිස් මැතිතුමා අතර ප්‍රශ්නයක් ඇති වෙලා. මේකට කොහොම ද ආණ්ඩුව මැදිහත් වෙන්නේ? මේක අපේ ප්‍රශ්නයක් නොවෙයි. මේ සභාවේ කරුණු එකක්වත් මම ප්‍රශ්න කරන්න යන්නේ නැහැ. මම සභාවේදී වාද කළා. මේවා වැරදියි කිව්වා. අපි කළ එක හරි. ඒ යෝජනාවේ තිබුණා දෝෂයක්. ජනාධිපතිතුමාගේ කාර්යාලයට තිබුණා මේ ගැන සොයා බලන්න. ඒ ගැන සොයා බලන්න බැරි වුණේ උපදේශක ඒ තනතුරට පැන්න නිසා.

චන්ද්‍රිකා කුමාරතුංග හිටපු ජනාධිපතිතුමියට එව්ව පණිවුඩ මොනවාද කියලා සොයා ගන්න. එතකොට පෙනෙයි මොකක්ද වුණේ කියලා. එහෙම වුණා නම් තීරණයක් ගන්න පුළුවන් වෙයි ඔබ සියලු දෙනාම හිරේ දාන්න පුළුවන් කියලා. එහෙම වුණා නම්, ඒකත් සිද්ධ වෙනවා. අපට එහෙම කරන්න වුවමනා නැහැ. අපි මෙතැනට ආවේ මේ රටේ අධිකරණය ගැන ස්වාධීනව ක්‍රියා කරන්න. මේ ආණ්ඩුවට විරුද්ධව තීරණ දෙන්න. ආණ්ඩුවට විරුද්ධ තීරණ දෙන්නේ නැත්නම් මේ ආණ්ඩුව දැනුමෙන්ම පිරුණු එකක්. නැත්නම් අපට යටත් වෙන්න ශ්‍රේෂ්ඨාධිකරණයක් තිබෙනවා. ඒක අපට වුවමනා නැහැ. කොහොම හරි මේ තත්ත්වය ඇති වුණු නිසා ඒ තීරණ ගත්තේ.

මා දීර්ඝ කථාවක් කළා. මේ කරුණු සොයා ගන්න වුවමනා වෙයි. සමහර අය ගිහින් මොහාන් පීරිස් මැතිතුමාගෙන් අහයි මේ කරුණු කිව්වා ද නැද්ද කියලා. ඒ කරුණු ඔක්කෝම වුණත් ගෙනෙන්න. අපි ලෑස්තියි විවාද කරන්න. මේක රීතියට සීමා වුණු එකක් නොවෙයි. කරුණාකරලා මොහාන් පීරිස් මැතිතුමාටත් මේ කරුණු පෙන්වලා, කරුණු අහගෙන ඇවිල්ලා [බාධා කිරීම්] අපි ලෑස්තියි. ඕනෑ තරම් ලෑස්තියි. අපි ලෑස්තියි. [බාධා කිරීම්] ඔක්කෝම එක්ක. [බාධා කිරීම්] ඔබතුමා දැක්කේ නැහැ නේ. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, අපි මේ විවාදයට ලෑස්තියි. අපට මේ විවාදය ඕනෑ- [බාධා කිරීම්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නිශ්ශබ්ද වෙලා සභාවේ ඉතුරු වැඩ ටික කර ගෙන යමු. [බාධා කිරීම්] තව කථා කරන්න කරුණු තිබෙනවා. ඇහුම්කන් දෙන්න. [බාධා කිරීම්] ගරු අග්‍රාමාත්‍යතුමා කථා කරන්න. [බාධා කිරීම්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු කථානායකතුමනි, මෙතැනදී එකක් කියන්න ඕනෑ. [බාධා කිරීම්] ඔබතුමාත්, මේ සභාවත් ආරක්ෂා වෙනවා. මම ඒ වැඩ කටයුතු කරලා තිබෙනවා. ඉතුරු අය ගැන වාද කරන්න ඕනෑ නම්, ඕනෑ තරම් කරුණු තිබෙනවා. ඕනෑ තරම් ඒවා ගෙනෙන්න පුළුවන්. අපි දැන් මුණගැහිලා ඒ සඳහා වෙලාවක් දමා ගනිමු; දිනයක් යොදා ගනිමු. අපට කිසිම ප්‍රශ්නයක් නැහැ. ඔබතුමන්ලාගෙන් එක ඉල්ලීමක් කරන්න තිබෙනවා. කරුණාකරලා මගේ කථාව අරගෙන ගිහිල්ලා මොහාන් පීරිස් මැතිතුමාට පෙන්වලා, ඒ සාක්ෂි ඇතිව ඇවිල්ලා කථා කරන්න. [බාධා කිරීම්]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Nimal Siripala de Silva-Leader of the Opposition)
ගරු කථානායකතුමනි, අද දින දවල් දොළහ හමාරට මේ පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා පක්ෂ නායක රැස්වීමක් කැඳෙව්වා. [බාධා කිරීම්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කරුණාකරලා නිශ්ශබ්ද වන්න. [බාධා කිරීම්] දැන් වාඩි වෙන්න. [බාධා කිරීම්]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
එම පක්ෂ නායක රැස්වීම පැවැත්වීමට අපට බැරි වුණු නිසා, ඒ අවස්ථාවේදී, -[බාධා කිරීම්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විපක්ෂ නායකතුමායි දැන් කථා කරන්නේ. අතාවුද සෙනෙවිරත්න මන්ත්‍රීතුමා, සුජීව සේනසිංහ නියෝජ්‍ය ඇමතිතුමා, කරුණාකරලා වාඩි වෙන්න. විපක්ෂ නායකතුමා විතරයි කථා කරන්නේ. [බාධා කිරීම්] කෙහෙළිය රඹුක්වැල්ල මන්ත්‍රීතුමාත් වාඩි වෙන්න.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඒ අවස්ථාවේදී ඔබතුමා තීරණය කළා, ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රකාශය අවසන් වූ වහාම සභාව කල් තබලා පක්ෂ නායක රැස්වීමක් පැවැත්විය යුතුයි කියලා. ඒ අනුව මම ඉල්ලා සිටිනවා, ඒ පක්ෂ නායක රැස්වීම දැන් පැවැත්විය යුතුයි කියලා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු විපක්ෂ නායකතුමනි, ඊට පස්සේ අපි මේ පනත් කෙටුම්පත සම්මත කර ගනිමු. අපට ඒක EU එකට ගෙන යන්න තිබෙනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Plantations and Leader of the House of Parliament)
අපට ඒක කලින් කර ගන්න පුළුවන් නේ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
No, we will meet and come back.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම නම්, සභාවේ කටයුතු විනාඩි 20කට අත් හිටුවනවා.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා 3.05ට නැවත පවත්වන ලදී.
அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 3.05 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.
Sitting accordingly suspended till 3.05 p.m. and then resumed.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්න - ගරු සුසන්ත පුංචිනිලමේ මහතා.

වරප්‍රසාද : කාර්යාලය වටලා සීල් තැබීම
சிறப்புரிமை: காரியாலயம் சுற்றிவளைக்கப்பட்டு 'சீல்' வைக்கப்பட்டமை
PRIVILEGE : RAIDING AND SEALING OF OFFICE

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
ගරු කථානායකතුමනි, ත්‍රිකුණාමලය පොලීසියේ අයුතු මැදිහත්වීම මත මගේ මන්ත්‍රී වරප්‍රසාද කඩ වීමක් සම්බන්ධයෙනුයි ඔබතුමාට මම මේ පැමිණිල්ල කරන්නේ. මා වසර 20කට වැඩි කාලයක් පාර්ලිමේන්තුවට මහජන ඡන්දයෙන් තේරී පත් වූ මන්ත්‍රීවරයෙක් වශයෙන් -දැනට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් වශයෙන්- කටයුතු කරනවා. මගේ කාර්යාලය පවත්වාගෙන යනු ලබන්නේ චීනවරාය, සමනල මාවත අංක 49/1 දරන ස්ථානයේයි. මන්ත්‍රීවරයෙක් වශයෙන් මා වෙත හිමි වී ඇති දුරකථන, ඒ වාගේම මහජනතාවට සේවය ඉටු කිරීමේදී අවශ්‍ය වන සියලු ලිපිද්‍රව්‍ය, මගේ පරිභෝජනය සඳහා පෞද්ගලිකව මා විසින් මිලට ලබා ගෙන තිබෙන සහල්, පරිප්පු, සීනි වාගේ දේවලුත් ඒ ස්ථානයේ තමයි තිබෙන්නේ. පසු ගිය 23වැනි දින පොලීසියේ 25ක, 30ක පමණ පිරිසක් සෝදිසි වරෙන්තුවක් අරගෙන ඇවිල්ලා, කාර්යාලය වට ලා සීල් තබා තිබෙනවා. අද වනකොටත් පොලීසියට මේ කරුණු ඔප්පු කර ගන්න බැරි වෙලා තිබෙනවා.

ඊයේ දිනයේ උසාවියට ගිහින් මහෙස්ත්‍රාත්තුමා හමු වුණායින් පසුව, මහෙස්ත්‍රාත්තුමා පොලීසියට කියා තිබෙනවා, "බඩුත් උසාවියේ නැත්නම්, පොලීසියට ඒවා ගෙනිහිල්ලාත් නැත්නම් ඒවා නිදහස් කරන්න මගෙන් අහන්නේ මොකටද? තමුන්ම ඒ වැඩේ කරන්න" කියා. නමුත් මහජන දිනය පවත්වන්නවත් අද වන තුරුත් මට ඒ කාර්යාලයේ ඉඩ ලබා දීලා නැහැ.

ගරු කථානායකතුමනි, ඒ සම්බන්ධයෙන් මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ වරප්‍රසාද කඩ කර තිබෙන්නේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය භාරව කටයුතු කරන නියෝජ්‍ය පොලිස්පති ජයසේකර නමැති පුද්ගලයායි. ඒ පුද්ගලයන් තමයි එක එක්කෙනාගෙන් ලකුණු දමා ගැනීමට මෙවැනි කටයුතු සිදු කරන්නේ. අපට පරිභෝජනය කරන්න, අපි සල්ලි දීලා ගත්තු භාණ්ඩ මේ විධියට අත් අඩංගුවට අරගෙන අපට හිරිහැර කරන එක යහ පාලනයේ එක ලක්ෂණයක්ද කියා මම අහන්න කැමැතියි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ලියා දුන්නු එක කියෙව්වාම ප්‍රමාණවත්.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
විශේෂයෙන්ම මේ වාතාවරණය තුළ මට ඡන්දය දුන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ජනතාවට සේවය කිරීමට අපහසු තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. ඒ නිසා මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පවත්වා දෙපාර්තමේන්තු මට්ටමෙන් ඒ අයට අවශ්‍ය කරන උපදෙස් ලබා දීලා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් වශයෙන් මහජනතාවට නිදහසේ සේවය කිරීමට මට අවස්ථාව සලසා දෙන ලෙසත්, මේ පිළිබඳව පරීක්ෂණයක් පවත්වා, වග කිව යුතු අයට නීතිමය වශයෙන් දඬුවම් ලබා දෙන ලෙසත් මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. අදාළ -

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I rise to a point of Order.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ඔබතුමා පාර්ලිමේන්තුව මොහොතකට කල් දැම්මා, විරුද්ධ පක්ෂ නායකතුමාත්, අපි කවුරුත් කරපු ඉල්ලීම අනුව. අග්‍රාමාත්‍යතුමාගේ කථාව පිළිබඳව අපි විවාදයක් ඉල්ලා සිටියා. විවාදයට එකඟ වුණා; විපක්ෂ නායකතුමා ඒ බව සඳහන් කළා. ඒ අනුව විවාදයක් පටන් ගැනීමට ඉඩ ප්‍රස්ථාව සලසා දීම ගැන අපට තවම පැහැදිලිතාවක් නැහැ. ඔබතුමා පාර්ලිමේන්තුව තාවකාලිකව කල් තැබුවේ මේ ප්‍රශ්නය විසඳා දීම සඳහායි. නමුත් ඒ ප්‍රශ්නය විසඳී නොමැති වීම ඉතාම බරපතළයි, ගරු කථානායකතුමනි.

අග විනිසුරුගේ කාරණය සම්බන්ධයෙන් අපේ මන්ත්‍රීවරු, පක්ෂ නායකයන් රාශියක් කථා කිරීමට නියමිතයි. මොකද,

අග්‍රාමාත්‍යතුමා කිව්වා වාගේ පාර්ලිමේන්තුව යෝජනාවක් සම්මත කර තිබෙනවා. ඒක අග්‍රාමාත්‍යතුමාත් පිළිගන්නවා. ඒ සම්මත කරන ලද යෝජනාව පාර්ලිමේන්තුව විසිනුයි කර තිබෙන්නේ. ගරු කථානායකතුමා එහි අත්සන් තබා තිබෙනවා. යෝජනාව යවා තිබෙනවා. මේක පාර්ලිමේන්තුව සම්බන්ධ ප්‍රශ්නයක් නිසා අපි යළිත් වරක් ගරු කථානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා. විපක්ෂ නායකතුමා යෝජනා කළා, අද දින පැයකට හෝ මේ විවාදය පවත්වා 2වැනි දාට අපට කාල වේලාව ලබා දෙන්නය කියා.

රටේ ප්‍රධාන ප්‍රශ්නයක් ගැන පාර්ලිමේන්තුව හැසිරෙන්නේ මර්දනයට පාර්ලිමේන්තුව යටත් කිරීමට නම් අපට නම් ඒක අනුමත කරන්න බැහැ; ඊට එකඟ වෙන්නත් බැහැ. මේක පාර්ලිමේන්තුව පිළිබඳ ප්‍රශ්නයක්. අග්‍රාමාත්‍යතුමා විපක්ෂයේ සිටි කාලයේදී අපි එතුමාට හැම තිස්සේම වෙලාව ලබා දුන්නා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා සභානායකතුමා හැටියට, මම ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා හැටියට හැමදාම ඉල්ලන විවාදවලට කාල වේලාව දුන්නා. ඇයි මේ? [බාධා කිරීමක්] මේ ප්‍රශ්නය ප්‍රධානතම ප්‍රශ්නයක්; ලංකාවේ කවදාවත් මතු නොවුණු ප්‍රශ්නයක්, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල අමැතිතුමනි. ඔබතුමා අහගන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
We are willing.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
You are willing, but you are depriving us. Your willingness is always a big question. You want us to wait for one week. For what? - [*Interruption.*] You did not wait for one week. Give us a debate and we will show that you all did not wait for so many years. You listened to the Hon. Prime Minister's speech; read it if you do not understand it. We respect the Hon. Prime Minister in relation to certain matters, which he admitted were correct. That is what you all are trying to suppress now. So, give us a chance to start the debate. You must, at least, give the Hon. Leader of the Opposition a chance to start the debate.

ගරු කථානායකතුමනි, මෙය මේ ගරු සභාව ඉදිරියේ අපි කරපු ඉල්ලීමක්; සභාවට වුණු පොරොන්දුවක්. ගරු කථානායකතුමාගෙන් අපි ඉල්ලනවා, මේ වැදගත් වූ ප්‍රශ්නය, ගරු අග්‍රාමාත්‍යතුමා ඉදිරිපත් කරන ලද මේ Statement එක, අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රකාශය විවාද කරන්නට අපට පළමුවෙන් අවස්ථාව ලබා දෙන්න කියලා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමාගේ point of Order එක මොකක්ද?

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මා මේ කියන කාරණය කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරවන්නට කැමැතියි. ඊයේ ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා මතු කළ ප්‍රශ්නයත්, විපක්ෂ නායක ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා මතු කළ ප්‍රශ්නයත් ගැන අද ගරු අග්‍රාමාත්‍යතුමා ප්‍රකාශයක් කරනවාය කිව්වා. ඒ වෙලාවේ ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ඉල්ලීමක් කළා, ඒ ප්‍රකාශය ගැන අපට හෙට විවාදයක් දෙන්න කියලා. මමත් ඒ අවස්ථාවේ නැඟිටලා ඒ ඉල්ලීම කළා. ඒ අවස්ථාවේ මට මතකයි, පක්ෂ නායකයන් රැස්වෙලා ඒ ගැන තීරණයක් ගන්න කියලා ගරු අග්‍රාමාත්‍යතුමා මේ සභාවේදී ප්‍රකාශ කළ බව. ඒ අනුව පාර්ලිමේන්තුවේ කැඳවීම මත අපි අද 12.30ට පක්ෂ නායක රැස්වීමට ආවා. ඒ අවස්ථාවේදී ආණ්ඩු පක්ෂය වෙනුවෙන් කිසිම නියෝජිතයෙක් ඒ සාකච්ඡාවට සහභාගි වෙලා සිටියේ නැහැ. ඒ නිසා ඒක සාකච්ඡාවකින් තොරව අවසන් වුණා. ඊට පස්සේ තමයි අපි සභාවට ආවේ.

දැන් ගරු අග්‍රාමාත්‍යතුමා එතුමාගේ ප්‍රකාශය කළා. ඔබතුමාගේ කැඳවීමෙන් අපි ඒ පක්ෂ නායක රැස්වීමට ගියේ, අද දවසේ එතුමාගේ ප්‍රකාශය හා සම්බන්ධ කරුණු සාකච්ඡා කරන්න අවස්ථාව ලැබෙයි කියන විශ්වාසයෙන්. නමුත් අවසානයේ ආණ්ඩු පක්ෂයෙන් ඉදිරිපත් කළේ ඉතා ඈත දින; 9වැනිදා, 10වැනිදා වාගේ දින. අන්තිමට තව දිනයක් යෝජනා කළා. ඒකත් අය වැයත් එක්ක සම්බන්ධ සාකච්ඡාව තිබෙන දවසක්.

ගරු කථානායකතුමනි, අපි කියන්නේ මේකයි. මේ ප්‍රශ්නය මතු වෙලා තිබෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාර ධුරය සම්බන්ධයෙන්. අග විනිසුරුතුමා ඒ ආකාරයට ඉවත් කිරීමට පියවර ගැනීමේ ප්‍රතිඵලයක් හැටියට ඊයේ තවත් සිද්ධියක් සිදු වෙලා තිබෙනවා. නීතිඥ සංගමයේ නීතිඥයන් යයි කියන කණ්ඩායමක් ගිහිල්ලා අළුත්කඩේ උසාවි සංකීර්ණයේ අංක 5 දරන මහෙස්ත්‍රාත් උසාවියේ ඉන්න විනිශ්චයකාරතුමාට සෝෂා කරලා, එතුමාට එරෙහිව යම් යම් ප්‍රකාශ කරලා, ඒ විනිශ්චයකාරවරයාත් අයින් වෙන්න ඕනෑ කියන මතයෙන් එතුමාට ඉතා විශාල හිරිහැර කර තිබෙනවා. ඒ උසාවි සංකීර්ණයේ අතිරේක මහෙස්ත්‍රාත්වරු අටක්, නවයක් ඉන්නවා. ඒ අටෙන් නවයෙන් එක්කෙනෙක් එතුමා. ඉතින් දැන් මේක ප්‍රවණතාවක් හැටියට යනවා.

විනිසුරුවරුන් එහෙම කෝලාහල කරලා එළවන ක්‍රමයක් තියෙන්න බැහැ. විනිසුරුවරුන් එහෙම විරෝධතා පවත්වලා එළවන ක්‍රමයක් තියෙන්න බැහැ. එතැන- [බාධා කිරීමක්] මට සමාවෙන්න. මට මේක කියන්න ඉඩ දෙන්න ගරු මන්ත්‍රීතුමා. ගරු කථානායකතුමනි, ඊයේ මහෙස්ත්‍රාත් උසාවියේ එහෙම වුණා නම් හෙට තව තැනක මේක වෙන්න පුළුවන්. මොහාන් පීරිස් මහත්මයා එම තනතුරට සුදුසු නැත්නම් එතුමාව අයින් කරන විධියක් තිබෙනවා. ඒ විධියට අයින් කිරීම ගැන අපේ කිසි විරුද්ධත්වයක් නැහැ. එතුමා ගැන නොවෙයි, මේ අපි පෙනී සිටින්නේ. අපි මේ පෙනී සිටින්නේ මේ සිදු වී තිබෙන ක්‍රියාවලිය; ඒකෙන් පාර්ලිමේන්තුවට සිදු වී තිබෙන මහා හැල්ලු වීම; ඒකෙන් අපි අපිවම ප්‍රශ්න කර ගන්නා තත්ත්වයකට පත් වීම කියන කාරණා ගැනයි.

ඒ නිසා ගරු කථානායකතුමනි, අපි ඉල්ලන්නේ මේකයි. ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රකාශයට අපි ඉතා සාවධානව ඇහුම්කන් දුන්නා. එතුමාගේ ප්‍රකාශය පදනම් කර ගෙන අපි අද මේ විවාදය අඩු ගණනේ පැයක් දෙකක්වත් කරලා, සුදුසු දිනයකට කල් දමමු. ඉතාම මෑත දිනයකට කල් දමමු. කරුණාකරලා පාර්ලිමේන්තුවේ අපට මේ පිළිබඳව අදහස් පළ කරන්න තිබෙන අවස්ථාව දෙන්න. මේක අපේ පෞද්ගලික ප්‍රශ්නයක් නොවෙයි. ජාතියක් හැටියට

[ගරු විමල් වීරවංශ මහතා]

මතු වෙලා තිබෙන අවදානමක් ගැනයි අපි මේ කථා කරන්නේ. ඒ නිසා මම තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා, කරුණාකරලා අද අපේ අදහස් ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන්නය කියලා. [බාධා කිරීමක්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු සභානායකතුමා, තමුන්නාන්සේගේ අදහස් ඉදිරිපත් කරන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අපි විවාදයක් දෙන්න සූදානම්. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. අපේ ගරු අගමැතිතුමාත් කිව්වේ අපි දිනයක් දෙන්නම් කියන එකයි. [බාධා කිරීම්] මමත් මේ පාර්ලිමේන්තුවේ අවුරුදු 25ක් ඉඳලා තිබෙනවා. කවදාවත් එදාම විවාදයක් දුන්නේ නැහැ. විවාදයක් ඉල්ලුවාම එකම දවසේ -එදාම- විවාදයක් දෙන්නේ නැහැ. එදාම විවාදයක් දීලා තිබෙනවාද? [බාධා කිරීමක්] කවදාවත් එකම දවසේ විවාදයක් දෙන්නේ නැහැ. අනෙක් කාරණය Committee on Parliamentary Business රැස්වෙලා 5,6 සහ7 දිනවල වැඩ පිළිවෙළ සාකච්ඡා කරලා අවසන් කළා.

ඉතින් ඉල්ලන දවසේම විවාදයක් දෙන්න බැහැ නේ. අපි ඒකට ලෑස්ති වෙන්න ඕනෑ. මේ ප්‍රශ්නය ගැන හැම එක්කෙනාටම කතා කරන්නත් බැහැ. මේ ප්‍රශ්නයේදී නීතිය සම්බන්ධයෙන් ගැඹුරට යන්න ඕනෑ. මේක හදිසියෙන් කරන්න බැහැ. ඕනෑම කෙනෙකුට අපහාස කරන්න පුළුවන්. නමුත් මේක නෛතික ප්‍රශ්නයක්.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
කොහොම හරි දෙන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
කොහොමටවත් එදාම විවාදයක් දෙන්න බැහැ. මට කියන්න එහෙම දීපු එක අවස්ථාවක්. අපි මේ පාර්ලිමේන්තුව තුළ විපක්ෂය හැටියට සිටියදී විවාදයක් ඉල්ලලා, එදාම දුන්නාද? එදාම දුන්නාද? එහෙම දුන්න එක අවස්ථාවක් මට කියන්න. විවාදයක් ඉල්ලුවත් කිසිම දවසක එදාම අවස්ථාව දීලා නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ගරු කථානායකතුමනි, අගවිනිසුරු මොහාන් පීරිස් මැතිතුමා තනතුරින් ඉවත් කිරීමේ කාරණය අද මේ රටේ උණුසුම් මාතෘකාවක් වෙලා තිබෙනවා. මේ කාරණය පිළිබඳව පාර්ලිමේන්තුව කොයි විධියෙන්ද හැසිරෙන්නේ කියන කාරණය අපි රටට ප්‍රකාශ කරන්න ඕනෑ. අපි ඉල්ලන්නේ අද මේ විවාදය පටන් ගන්න අපට අවස්ථාව දෙන්න කියලායි. විවාදය කල් දැම්මාට කමක් නැහැ. විවාදය පටන් අරගෙන කථිකයෙක් දෙන්නෙක් කථා කළාට පස්සේ වෙනත් දිනයකට කල් දමන්න අපි කැමැතියි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා ඔය යෝජනාව Parliamentary Business Committee එකේදී කළා. අපි පස්වැනි දා පස්වරු හයහමාරට මේ විවාදය ආරම්භ කරන්න සූදානම්. අද බැහැ. [බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
පස්වැනි දා කල් වැඩියි. අද සවස විවාදය ඕනෑ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අද බැහැ. [බාධා කිරීම්]

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මේ සම්බන්ධයෙන් කථා කරන්න අවස්ථාවක් ලැබුණේ නැහැ. මේ වාගේ වැදගත් කාරණයක් ඒ විධියට වෙන්නේ නැහැ. ගරු අග්‍රාමාත්‍යතුමා එතුමාගේ ප්‍රකාශය කළා. ඒ ප්‍රකාශය පිළිබඳවයි අද විවාද කරන්න ඕනෑ.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා (ස්වදේශ කටයුතු හා ධීවර අමාත්‍යතුමා)
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா - உள்நாட்டலுவல்கள் மற்றும் கடற்றொழில் அமைச்சர்)
(The Hon. M. Joseph Michael Perera - Minister of Home Affairs and Fisheries)
ගරු කථානායකතුමනි, අපි සියලු දෙනාම එකඟ වෙලා අද සම්මත කර ගන්න ඕනෑ පනත් කෙටුම්පතක් තිබෙනවා. ඒක ඉතා හදිසියි. ඒක මුළු රටටම බලපානවා. [බාධා කිරීම්] ඒක අපි සවිස්තරව කථා කළ යුතු පනත් කෙටුම්පතක්. ඒ නිසා මේ පනත් කෙටුම්පත පිළිබඳ විවාදය කල් තබනවාට මම අකමැතියි. මොකද, එහෙම වුණොත් මේ රටේ ධීවරයන් විශාල පිරිසකට ලොකු ප්‍රශ්නයක් මතු වනවා. ඒ ධීවරයන් පාරට බහියි. ඒ නිසා වැදගත් වන්නේ ඒ විවාදයයි. [බාධා කිරීම්]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මාළු කන්න කලින් මේ රටේ නීතියක් තිබෙන්න ඕනෑ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අද සාකච්ඡාවට ගන්න තිබෙන්නේ ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත. ඒකට වැදගත්කමක් තිබෙනවා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, මෙතුමන්ලාට අවශ්‍ය වෙලා තිබෙන්නේ ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත සම්මත කර ගන්නනේ. [බාධා කිරීම්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා (නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - வீடமைப்பு மற்றும் சமுர்த்தி அமைச்சர்)
(The Hon. Sajith Premadasa - Minister of Housing and Samurdhi)
ඒ සම්බන්ධයෙන් කථා කරන්න තිබෙනවා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

කථා කරලා අවසානයේදී කරන්නේ සම්මත කරන එක නේ. අපේ සම්පූර්ණ සහයෝගය දීලා ඒ පනත් කෙටුම්පත සම්මත කරලා දෙන්න අපි කැමැති වුණා, ගරු කථානායකතුමනි.

අපේ ගරු දිනේෂ් ගුණවර්ධන හිටපු ඇමතිතුමාත්, අනෙකුත් කථිකයෝත් අප මතු කරන කාරණයේ තිබෙන හදිසි අවශ්‍යතාව පෙන්වලා දුන්නා. අද දින පාර්ලිමේන්තුව තුළ ගරු අග්‍රාමාත්‍යතුමා ප්‍රකාශයක් කළා. අද රටට යන්නේ එතුමා කළ ඒ ප්‍රකාශය විතරයි. ඒ නිසා අපට අසාධාරණයක් වනවා. ඒකයි අපි කිව්වේ, අඩුම තරමින් අපේ එක් කථිකයෙකුට හරි අද ඒ පිළිබඳව කරුණු ඉදිරිපත් කරන්න අවස්ථාවක් දෙන්න කියලා. රනිල් වික්‍රමසිංහ මැතිතුමා හැම වෙලාවේම ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන කෙනෙක් නිසා, එතුමාගෙන් අපි ඉල්ලා සිටිනවා, නම්‍යශීලි වෙලා අද දවසේ එතුමාගේ ප්‍රකාශය පිළිබඳ විවාදය ආරම්භ කිරීමට ඉඩ දෙන්න කියලා. එහෙම බැරිකමක් තිබෙනවා නම්, අපි ඉල්ලා සිටියා අඩුම තරමින් තිබෙන ළඟම දිනය හැටියට පෙබරවාරි දෙවැනි දා ඒ අවස්ථාව ලබා දෙන්න කියලා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ගරු කථානායකතුමනි, මම ඊයේ ප්‍රකාශ කළා, අද මේ සභාවට ඇවිල්ලා කරුණු පැහැදිලි කරන්නම් කියලා. ඒ වාගේම අද දිනය වෙන් කරලා තිබුණා මේ පනත් කෙටුම්පත විවාද කරන්න. ඒ සඳහා පැය දෙකක් ඉල්ලුවේ බොහෝ දෙනෙකුට කථා කරන්න වුවමනා වුණු නිසා. මම අද ප්‍රකාශයක් කළා. එවැනි ප්‍රකාශයක් කළාට පස්සේ, ඊට පසුව එන දිනයක් යොදා ගන්නා සාමාන්‍ය සම්ප්‍රදාය කවදාවත් කඩලා නැහැ.

විශේෂයෙන්ම මම කාරණා දෙක තුනක් කියන්න කැමැතියි. අපට පුළුවන් මීට පස්සේ තිබෙන පළමු දිනය මේ විවාදය සඳහා යොදා ගන්න. අපේ නිදහස් දිනය තිබෙනවා පෙබරවාරි මස 4 වැනි දා. එම නිදහස් උත්සවය පවත්වන්නේ පාර්ලිමේන්තුව ඉදිරිපිට තිබෙන ක්‍රීඩා පිටියේ. සෙනසුරාදා, ඉරිදා නිවාඩු දවස්. ආපසු දෙවැනි දා තුන්වැනි දා පෙරහුරුව කරන්න කියලා අපි ත්‍රිවිධ හමුදාවට කිව්වා. ත්‍රිවිධ හමුදාවෙන් ඉල්ලා සිටි සම්පූර්ණ දවස් ප්‍රමාණය අපි ඔවුන්ට දුන්නේ නැහැ.

ඒ අනුව, ඇත්ත වශයෙන්ම අපට හෙට සිට පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු කරන්න බැහැ. නවම් පෙරහැර නිසා දෙවැනි දා උදේ වරුවේ කොළඹ සමහර පාරවල් වහනවා. එම නිසා අපට ආපසු රැස්වෙන්න පුළුවන් වෙන්නේ පස්වැනි දා යි. ඒ නිසායි පස්වැනි දා දිනයෙන් කොටසක් මේ විවාදය සඳහා වෙන් කළේ. නැත්නම් අපට කියන්න තිබුණා, සෙනසුරාදා උදේ පාර්ලිමේන්තුව රැස් වෙන්න කියලා. නමුත් හෙට උදේ තමයි සම්පූර්ණයෙන් නිදහස් උත්සවයේ පෙරහුරුව පටන් ගන්නේ. ඒ නිසා දෙවැනි දා සහ තුන්වැනි දා අපේ වාහන එන විධිය, කොළඹින් පිටත් වෙන විධිය සම්පූර්ණයෙන් වෙනස් වෙනවා. නැත්නම් දෙවැනි දා විවාදයට කාලය ලබා දෙන එක ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ. එහෙම දුන්නා නම් අපට මෙතැනදී මේ කාරණය සාකච්ඡා කරන්න තිබුණා. අපටත් ඕනෑ ඒ ගැන සාකච්ඡා කරන්නයි. අසාධාරණයක් වෙන්න බැහැ. මගේ ප්‍රකාශය කාටවත් විරුද්ධ එකක් නොවෙයි. තමන් දන්නා හේතු ටික කියලා ඒ ගැන කථා කරන්න. විශේෂයෙන්ම මම එක දෙයක් දැක්කා. විරුද්ධ පක්ෂයේ නායකතුමා බැලුවා, අඩු ගණනේ දෙවැනි දා අවස්ථාව දෙන්න කියලා කියන්න. නමුත් මෙතැන ඉන්න කොටසක් ඒකට කෑ ගැහුවා. එසේ කෑ ගැහුවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු නොවෙයි. [බාධා කිරීම්] ඇයි ප්‍රාණ ඇපකරුවන් බවට ගන්න හදන්නේ? තමුන්නාන්සේලා චන්ද්‍රිකා කුමාරණතුංග ඔය පක්ෂයෙන් පැන්නුවා. [බාධා කිරීම්] මෛත්‍රීපාල සිරිසේන ඔය පක්ෂයෙන් පැන්නුවා. දැන් ඔය පක්ෂය නැති කරන්න හදන්න එපා. ඔය පක්ෂය නැති කර ගන්න එපා. කරුණාකරලා තමන්ගේ කණ්ඩායම කැඳවලා, තමන්ගේ කණ්ඩායමෙන් අහන්න මොකක්ද කරන්න ඕනෑ කියලා. [බාධා කිරීම්] තමන්ගේ කණ්ඩායමෙන් අහන්න. [බාධා කිරීම්]

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

අතාවුද සෙනෙවිරත්න මැතිතුමනි, ඔබතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සිටියේ නැහැ නේ. ඔබතුමා සම සමාජ පක්ෂයේ ඉඳලා පැනපු කෙනෙක් නේ. [බාධා කිරීම්] ඔබතුමා වාඩි වෙන්න. දැනුත් කෑ ගහනවා. වාඩි වෙලා ඉන්න. මම කියන්නේ මේකයි. මම ලෑස්තියි විපක්ෂ නායකතුමාට විවාදය සඳහා අවස්ථාව දෙන්න. ඇයි, මේ පළමුවැනි පේළියේ ඉන්නා අය විපක්ෂ නායකතුමාට කෑ ගැහුවේ? ඇයි අර පේළියේ ඉන්න අය කෑ ගැහුවේ නැත්තේ? මම හිතුවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අය කෑ ගහයි කියලා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එතැන නැහැ. [බාධා කිරීම්] ඕනෑවට වඩා කෑ ගැසුවොත් මම ඔබතුමා ගැන ජනාධිපතිතුමාට වාර්තා කරනවා. වාඩි වෙන්න, වාඩි වෙන්න. ජනාධිපතිතුමාගෙන් ටොක්කක් කන්නේ නැතුව වාඩි වෙන්න. [බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ජනාධිපතිතුමා අපේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නිශ්ශබ්ද වන්න.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ජනාධිපතිතුමා අපේ. [බාධා කිරීම්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ඔබේ නායකයා කවුද? ඔබේ නායකයා අපේ ජනාධිපති.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
හරියට හරි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගිහිල්ලා එතුමාගෙන් අහගන්න. ඔබේ පක්ෂයේ නායකයාගෙන් ගිහින් අහන්න මොකක්ද කරන්න ඕනෑ කියලා. ගරු අතාවුද සෙනෙවිරත්න මැතිතුමා වාඩිවෙන්න. මම ලෑස්තියි ඔබතුමාගේ පක්ෂයේ නායකතුමා සමඟ කථා කරන්න. [බාධා කිරීම්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මුලින්ම ගරු අගමැතිතුමා කියන දෙයට ඇහුම්කන් දීලා, ඊට පසුව කථා කරන්න. එතකොට කියන දෙය පැහැදිලියි.

ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අගමැතිතුමා කිව්වා දෙවැනි දා විවාදයට අවස්ථාව දෙන්න පුළුවන් කියලා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
මම කිව්වේ නැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා දැන් කිව්වා දෙවැනි දා දෙන්න පුළුවන්, - [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න කෝ. ඔබතුමා කලබල වෙන්න එපා. දැන් ඔබතුමා කිව්වා,- [බාධා කිරීම්] - පොඩ්ඩක් ඉන්න.

ගරු අගමැතිතුමනි, මම කියන දෙය අහන්න කෝ. මම කියන දෙය වැරදි නම් වැරදියි කියන්න. ඔබතුමා කිව්වා, දෙවැනි දා දෙන්න පුළුවන්, නමුත් හමුදාව නිදහස් දින උත්සවයට පුරුදු වෙනවා කියලා. පාර්ලිමේන්තුව උත්තරීතරයි. හමුදාව පැය දෙක, තුනක් පැත්තකින් ඉඳියි. [බාධා කිරීම්] මේක ගරු කථානායකතුමාගේ බල පරිශ්‍රය. පාර්ලිමේන්තු වටරවුම කියන්නේ ගරු කථානායකතුමාගේ බලය තිබෙන ප්‍රදේශය. Parliament can decide that we sit on the 2nd. Why can we not decide that we sit on the 2nd? Why are you trying to deprive Parliament of sitting on the 2nd?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු කථානායකතුමනි, අපි සම්ප්‍රදායයක් හැටියට, - [බාධා කිරීම්] Wait till I finish.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මාදිවෙල පැත්තෙනුත් එන්න පුළුවන්.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු කථානායකතුමනි, අපි මෙතැන 1984 අවුරුද්දේ සිට නිදහස් දින උත්සවය පවත්වා තිබෙනවා. ගාලු මුවදොර එම උත්සවය පවත්වා තිබෙනවා. ඇත්ත වශයෙන්ම අපට වැදගත්ම දිනය තමයි අපේ නිදහස් දිනය. දැන් මෙතුමා කියන්නේ නිදහස් උත්සවය පවත්වන්න එපා කියලායි. ඒකනේ කියන්නේ. [බාධා කිරීම්] ඔබතුමා කියන්නේ නිදහස් දින උත්සවය කරන්න එපා කියලායි. බණ්ඩාරනායක, සේනානායක යන මැතිවරුන් ලබා ගත්ත නිදහස් දිනය එපා කියන්නේ සම සමාජයේ අය. එවකට අගමැති ඩී.එස්. සේනානායක මහතා. එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා සභානායක. ඒ දිනය එපා කියන්නේ කවුද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අයවත්, එක්සත් ජාතික පක්ෂයේ අයවත් නොවෙයි. [බාධා කිරීම්] ඒක එපා කියන්නේ වෙනත් අය. අතාවුද සෙනෙවිරත්න මැතිතුමනි, බණ්ඩාරනායක, සේනානායක ලොකුද, නැද්ද කියලා අපට කියන්න. [බාධා කිරීම්]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු අගමැතිතුමා කිව්වා, පාර්ලිමේන්තුව ඉදිරියේ පෙරෙට්ටුවේ පෙරහුරුව තිබෙන නිසා එන්න අමාරුයි කියලා. ඇත්ත තමයි පෙරෙට්ටුවේ පෙරහුරුව පටන් ගත්තොත් මේ පාරෙන් එන්න බැහැ. නමුත් ඒ ඔක්කෝම කෙරෙන්නේ පිට්ටනියේ හා ඒ අවට පාරේ. අපට මාදිවෙල පාරෙන් එන්න ඉඩ හදලා තිබෙන්නේ ඒ නිසායි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම රාජ්‍ය මාර්ගය - State Drive එක - වුවමනායි, ජනාධිපතිතුමාගේ සහ අපේ වාහන ටික එන්න. කථානායකතුමාගේ වාහනය ප්‍රධාන ගේට්ටුවෙන් එන්නේ. තවත් එන වාහන තිබෙනවා. ඒ පාර එදාට වහනවා. මෙතෙක් දවස් වැසුවේ එක කොටසක් විතරයි. ඊළඟ දවස් කීපයේදී මේ පාරේ අනෙක් කොටසත් වහන්න යනවා. ජනාධිපති මන්දිරයේ ඉඳන්- [බාධා කිරීම්] නැහැ, නැහැ. Chopper එකෙන් කියන්නේ? එතුමාට ඕනෑ වෙලා තිබෙන්නේ නිදහස් දිනය පහළට දාන්න ද? Chopperවලින් යන ජනාධිපතිවරු මෙහේ නැහැ. දැන් ඉන්නේ ඇවිද ගෙන යන අය. රජ මන්දිරයට යන්නේ- [බාධා කිරීම්] එතැනට විතරයි.

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
ගරු කථානායකතුමනි, පැය දෙකක් ඇතුළත පනත් කෙටුම්පත සම්මත කරලා දෙනවා. අපි කියන්නේ, "12 වෙනකම්, පැය 5ක් අපට කථා කරන්න දෙන්න" කියලායි. මෙහෙම පාර්ලිමේන්තුවේ වාද විවාද කරලා තිබෙනවා. පෙරහුරුව කර ගන්න හෙටත් පුළුවන්, අනිද්දාත් පුළුවන්. බාධාවක් නැහැ. දිගටම කාලය තිබෙනවා. අපට පැය පහක්, 12 වන තෙක් කාලය දෙන්න ගරු කථානායකතුමනි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඔබේ නායක- [බාධා කිරීම්]

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
ඔබතුමන්ලාට ඕනෑ- [බාධා කිරීම්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ- [බාධා කිරීම්]

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු තිස්ස විතාරණ මන්ත්‍රීතුමා, ඔබතුමා මොකක්ද කියන්නේ?

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
ගරු කථානායකතුමනි, පසු ගිය දිනක අපේ ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාරතුමා එතුමාගේ තනතුරෙන් ඉවත් වන්න පියවරක් හදිසියේ අරගෙන තිබෙන බව අපි දන්නවා. ඒක සුළු දෙයක් නොවෙයි. ඒක අධිකරණයේ අනාගතයට බලපාන දෙයක්. ඒක අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට බලපාන දෙයක්. යහ පාලනය ගැන කථා කරන අය ඒක තේරුම් ගතයුතුයි. මේ අවස්ථාවේදී ගරු අගමැතිතුමා පාර්ලිමේන්තුවට හේතු දැක්වූවා, ඇයි ඒක කළේ කියලා. ඒ මතය විතරයි රටට යන්නේ. ඒක ප්‍රජාතන්ත්‍රවාදයද? ගරු කථානායකතුමනි, විරුද්ධ පක්ෂය හැටියට අපට ඒ සම්බන්ධව යම් අදහසක් ඉදිරිපත් කරන්න අවස්ථාවක් දෙන්න. එපමණයි අපි ඉල්ලන්නේ. විවාදය පටන් ගත්තාට පස්සේ ජනතාවටත් හැඟීමක් එයි, මේ කරලා තිබෙන දේ අපි පිළිගන්නවාද, නැද්ද කියලා. කරුණාකරලා, අඩු වශයෙන් පාර්ලිමේන්තුවේ වුණු සිද්ධියක් සම්බන්ධව අපේ අදහසවත් ඉදිරිපත් කරන්න මේ අවස්ථාව ලබා දෙන්න කියලා ඉතාමත්ම ඕනෑකමින් ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විවාදයක් කරනවා නම් Motion එකකින් එන්න ඕනෑ. ඒ නිසා අදහස ඉදිරිපත් කරන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අපි මුලින්ම කිව්වා, දැන් තිබෙන්නේ අලුත් දේශපාලන සංස්කෘතියක් කියලා. අපේ ජනාධිපති, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති. අපේ ජනාධිපති. [බාධා කිරීම්] අපියි පත් කර ගත්තේ. [බාධා කිරීම්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නිශ්ශබ්ද වන්න. කියන දේ ඇහෙන්නේ නැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපේ ජනාධිපති, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති. මේක අලුත් සංස්කෘතියක්. [බාධා කිරීමක්] අපි එකට වැඩ කරමු. අපි විවාදයකට සූදානම්. නමුත් විවාදය අදම දෙන්න බැහැ. පාර්ලිමේන්තු ඉතිහාසයේ කිසිම දවසක- [බාධා කිරීම්] තමුන්නාන්සේලා ඒක ජනාධිපතිතුමා හමු වෙලා අහන්න කෝ. හෙට ජනාධිපතිතුමා හමු වෙලා අහන්න කෝ, අපි වැරදිද කියලා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
පක්ෂයේ නායකයා හමු වෙන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔව්. පක්ෂයේ නායකයාගෙන් අහන්න කෝ. එතුමා දෙන උත්තරය මොකක්ද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ඊට පස්සේ එන්න අපිත් එක්ක වාද කරන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේ වැදගත් ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පතට-

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ගරු කථානායකතුමනි, අපේ පක්ෂයේ සභාපතිතුමා, ජනාධිපතිතුමායි. නමුත් අද මේ ප්‍රශ්නය උද්ගත වෙලා තිබෙන්නේ ඒ නිසා නොවෙයි. මේ ප්‍රශ්නය උද්ගත වෙලා තිබෙන්නේ, මොහාන් පීරිස් මහතා ඉවත් කිරීම ගැන ගරු අග්‍රාමාත්‍යතුමා කළා. ප්‍රකාශය සම්බන්ධව අපේ විපක්ෂයේ මතය ප්‍රකාශ කරන්නට ඉඩ ලබා දෙන්නේ නැති නිසා. මෙය ඉතාම අසාධාරණ ක්‍රියාවලියක්. මොකද? රටට යන්නේ අගමැතිතුමාගේ ප්‍රකාශය පමණයි. මේ සම්බන්ධයෙන් අපි දරන ප්‍රතිවාදී අදහස් ප්‍රකාශ කිරීම සඳහා අවස්ථාවක් ඕනෑ. එම නිසා තමයි අප කියා සිටින්නේ අඩුම තරමේ එක කථිකයෙක් සඳහාවත් අවස්ථාවක් ලබා දෙන්න කියලා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මා කෙටියෙන් සඳහන් කරන්නම්. අතිගරු ජනාධිපතිතුමා තමයි ලිපිය ලියලා තිබෙන්නේ ගරු ශිරානි බණ්ඩාරණායක මැතිනියට. [බාධා කිරීම්] පොඩ්ඩක් අහගෙන ඉන්නකෝ. ජනාධිපතිතුමා තමයි ලියලා තිබෙන්නේ. අපි නොවෙයි. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, ජනාධිපතිතුමායි ලියුම ලියලා තිබෙන්නේ, ශිරානි බණ්ඩාරණායකට මෙම අග්‍ර විනිශ්චයකාර ධුරයේ වැඩ භාර ගන්න කියලා. අපේ ජනාධිපතිතුමා තමුන්නාන්සේලාගේ පක්ෂයේ සභාපතිතුමා. එතකොට එතුමාගෙන් තමයි මෙය අහගන්න ඕනෑ. [බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කුමන්ත්‍රණය කළා, ජනාධිපති වෙන එක අහෝසි කරන්න. [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි මොනවා කරන්නද? [බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මහින්ද රාජපක්ෂ එක්ක මොහාන් පීරිස් කුමන්ත්‍රණය කළා, මැතිවරණ ප්‍රතිඵල අහෝසි කරන්න. [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපිට කරන්න දෙයක් නැහැ.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වෙනවා. ඉන් පිටස්තරව, සාමාන්‍ය කම්කරුවෙක්වත් ඉවත් නොකරන විධියට තමයි එතුමාව ඉවත් කළේ. ඒ නිසායි, අපේ මේ විරෝධතාව.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු විපක්ෂනායකතුමා

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
දැන් මෙම අවස්ථාවේදී, මෙතැනදී අපේ පක්ෂයේ නායකතුමාගේ නම ඇදුන නිසා, මම මෙය කියන්නට ඕනෑ. අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා අපට ඉතා පැහැදිලිව උපදෙස් ලබා දීලා තිබෙනවා. එතුමා කිව්වා, මෙම දින සියයේ වැඩසටහන වේවා, වෙනත් පාර්ලිමේන්තුවේ කරන වැඩ කටයුත්තක් වේවා ඒ පිළිබඳව අඩුපාඩුකම් තිබෙනවා නම් විවේචනය කිරීමේ පූර්ණ අයිතිය අපටත් දෙනවා; ඒ වාගේම රජයේ ඉන්න ඕනෑම කෙනෙකුටත් දෙනවා කියලා. ඒ නිසා එතුමාට එරෙහිව යන ක්‍රියාවක් නොවෙයි අපි මේ කරන්නේ. අපේ අදහස් පළ කිරීමේ නිදහස මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා අපට තහවුරු කර දීලා තිබෙනවා. ඒ නිදහස ක්‍රියාත්මක කරන්නයි මෙම අවස්ථාව ඉල්ලා සිටින්නේ කියන කාරණාව මම ඉතාම පැහැදිලිව කියන්නට ඕනෑ. [බාධා කිරීම්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු අග්‍රාමාත්‍යතුමා

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු කථානායකතුමනි, දවස් 100යේ වැඩසටහනේ 94වන අංකය හැටියට තිබෙන්නේ ශිරාති බණ්ඩාරනායක මැතිතුමිය යළිත් සේවයේ පිහිටුවා අයිතිවාසිකම් ලබා දෙනවා කියලායි. මෙතැන ප්‍රශ්නය වෙලා තිබෙන්නේ ඒක නොවෙයි. ප්‍රශ්නය වෙලා තිබෙන්නේ, මේ කරන ලද ක්‍රමවේදය හරි ද කියලායි. මේ ක්‍රමවේදය කරන්නට ඕනෑ ද, නැත්නම් පාර්ලිමේන්තුවට කියලා කරන්න ඕනෑ ද කියලායි ප්‍රශ්නය වෙලා තිබෙන්නේ. ඉවත් කරපු එක ගැන වාදයක් නැහැ. ඉතින් ඕකට මොකද හදිස්සිය? අපි 05 වෙනිදාට ඒ විවාදය කරමු. [බාධා කිරීම්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා මෙම පාර්ලිමේන්තුවේදී කරන ලද ප්‍රකාශයේ හරය හැටියට ගන්නවා නම් තිබෙන්නේ, පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව නිසි ආකාරයෙන් සම්මත වුණා ද, ඒ යෝජනාව ස්ථාවර නියෝග යටතේ පත් කරන ලද කමිටුව මඟින් කරන ලද නිර්දේශය මත සිදු වුණාද, ඒක නියමාකාරයෙන් සන්නිවේදනය වුණා ද කියන කාරණායි. දැන් මතු වෙන්නේ මේ පාර්ලිමේන්තුව පිළිබඳ වරප්‍රසාද ප්‍රශ්නයක්. [බාධා කිරීමක්]ඒක නිසා එතුමා මෙතැන නිවැරදිව සඳහන් කළා වාගේ, -ගරු අග්‍රාමාත්‍යතුමාත් පිළිගත්තා නේ මෙතැන ක්‍රම වේදය පිළිබඳවයි ප්‍රශ්නය තිබෙන්නේ කියන එක.- පාර්ලිමේන්තුවේ සිටින ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් සියලුම මන්ත්‍රීවරුන්ට ඒ පිළිබඳව අදහස් දක්වන්නට අයිතියක් තිබෙනවා. පාර්ලිමේන්තුව උත්තරීතරයි. අපි මේ ඉල්ලා සිටින්නේ මුළු පාර්ලිමේන්තුවේම -එක මන්ත්‍රීවරයෙකුගේ නොවෙයි,- වරප්‍රසාදයක් පිළිබඳ ප්‍රශ්නයක් සාකච්ඡා කරන්නටයි. එහෙමනම් ඒ සඳහා අවස්ථාව ලබා දෙන්න කියලා තමයි ඉල්ලා සිටින්නේ. මෙතැනදී විධායකය මේකට සම්බන්ධ කර ගැනීමට අවශ්‍යතාවක් නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අග්‍රාමාත්‍යතුමා කළේ අමාත්‍යාංශ නිවේදනයක්. සාමාන්‍යයෙන් අමාත්‍යාංශ නිවේදනයක් කළාම ඒක- [බාධා කිරීමක්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
මම එක කාරණයක් කියන්නම් ගරු කථානායකතුමනි. මගේ කථාවේදී කිසි විටෙක මෙම සභාවේ සිදු වුණු දෙයක් සම්බන්ධයෙන් මම ප්‍රශ්නයක් ඇති කළේ නැහැ. මම කිව්වා, මම එම යෝජනාවට විරුද්ධ වුණා; විරුද්ධව ඡන්දය දුන්නා කියලා. මෙතැන තිබෙන්නේ අදාළ යෝජනාව නොවෙයි කියලා මම කිව්වා. මෙතැන සිදු වුණ දේ ඒ අනුව සඳහන් කළා.

ඔබතුමා කිව්වේ, පළමුවන යෝජනාවට -Item No. 1 එකට- මේක ඇති කියලා. ඒක ඔබතුමා යැව්වා, ජනාධිපති කාර්යාලයට, ජනාධිපතිතුමාට. මේ ගොඩනැඟිල්ලේ ඇතුළේ සිදු වුණ මොනවා ගැනවත් මම ප්‍රශ්න කරන්නේ නැහැ. ඔබතුමාගේ ලිපියේ ඔබතුමා නියම වශයෙන් කිව්වා, පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 78අ. (2) යටතේ කටයුතු කරගෙන ගියා කියලා.

මේ ගොඩනැඟිල්ල තුළ සිදු වුණු දේ ගැන ප්‍රශ්නයක් නැහැ. ප්‍රශ්න ඇති වුණේ අනෙක් ගොඩනැඟිල්ලේ. ජනාධිපති කාර්යාලයට යුතුකමක් තිබුණා ඒක බලලා කියන්න, ඒක හරියටම වුවමනා දෝෂාභියෝගයක්ද, නොවෙයිද කියලා. අපට වාද කරන්න පුළුවන්, ජනාධිපති කාර්යාලය ඇතුළේ මොකක්ද වුණේ කියලා. මේ සභාව ගැන මම කිසිම විවාදයක් කරන්නේ නැහැ. මම මේකට විරුද්ධ වුණාට, මම මේ ප්‍රශ්නය මතු කළාට මේ සභාව ගැන මොකුත් කියලා නැහැ. මේ සභාව ගත්තු තීරණය හරිද, වැරැදිද කියලා කියන්න මට වැඩක් නැහැ. ඒ නිසා මෙතැන සිදු වුණු දේ ගැන ප්‍රකාශ කරන්න දෙයක් නැහැ. මෙතැන අපට ප්‍රකාශ කරන්න තිබෙන්නේ ජනාධිපති කාර්යාලයේ මොකක්ද සිදු වුණේ කියන එකයි. ඒ ගැන අපි වාද කරමු. ඒ වාගේම ඔබතුමන්ලා දැන් කියන්නේ මේ ක්‍රමවේදය ගැනයි. අපි කියන්නේත් ඒ ක්‍රමවේදය ගැන මිසක් මේ සභාව ගැන නොවෙයි. [බාධා කිරීම්] මෙතැන තිබෙන්නේ, ඒ අවස්ථාවේ ජනාධිපති කාර්යාලය දෝෂාභියෝගයක් ගත්ත එක හරිද, නැද්ද කියන කාරණයත්, දැන් ජනාධිපති කාර්යාලය මේකට දෝෂාභියෝගයක් නොතිබෙනවා

කියන එක හරිද නැද්ද කියන කාරණයත් විමසා බැලීම විතරයි. ඒ දෙකම දිහා බලා වාද කරන්න ඕනෑ. මේක හදිසි එකක්. මමත් ඒක නැහැ කියන්නේ නැහැ. 4වැනි දා නිදහස් දිනය වාගේම 3වැනි දා පෝය දිනයයි. ඒ නිසා මෙතැනට අපට එන්න බැරි වෙනවා. ඒ නිසා මම කියන්නේ 5වැනි දා පස්වරු 6.30ට මේ සම්බන්ධ විවාදය ගනිමුය කියලායි. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි, - [බාධා කිරීම්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඇහුම් කන් දෙන්න.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
අපට අද රැස් වෙලා සාකච්ඡා කරන්න වැදගත් දෙයක් තිබෙනවා. අපි පක්ෂ නායකයින් එක්ක එකඟ වුණු ස්ථාවර නියෝග යෝජනා ඔක්කෝම අපි අද න්‍යාය පත්‍රයට ඉදිරිපත් කර තිබෙනවා. අද ඒ න්‍යාය පත්‍රය අනුව වැඩ කරලා, ඊළඟට එන පළමු වැනි රැස්වීම් දවස වන 5වැනි දා මේ ගැන විවාද කරන්න පුළුවන්. අපි කිව්වේ 9වැනි දා විවාද කරමු කියලායි. නමුත් විපක්ෂ නායකතුමා කිව්වා 5වැනි දා දෙන්න කියලා. 5වැනි දා පස් වරු 6.30 සිට ඕනෑ තරම් වේලාවක් සාකච්ඡා කරන්න, ඊට පස්සේ ආපහු 9වැනි දා නැත්නම් 10 වැනි දා නැවත ගන්න. ඒ ගැන අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, -

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා. [බාධා කිරීම්]

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
එහෙම කරන්න එපා, කරුණාකරලා අපට කථා කරන්න අවස්ථාව දෙන්න. ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රකාශයේ සඳහන් කරුණු මේ පාර්ලිමේන්තුව ඇතුළේ අද අපට සාකච්ඡා කරන්න අවසරය දෙන්න. අපි ඉල්ලන්නේ එච්චරයි. එතුමාගේ ප්‍රකාශයේ සඳහන් වෙච්ච කරුණු ගැන අපි සලකා බලන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම ගත්තොත් ගරු රාජිත සේනාරත්න ඇමතිතුමා ඒ විශේෂ කාරක සභාවේ හිටියා. වර්තමාන විපක්ෂ නායකතුමා, එතුමා ඒකේ සභාපති හැටියට හිටියා. ඒ වාගේම ඒ විවාදයේදී වර්තමාන ජනාධිපතිතුමා ඇතුළු ගොඩක් මන්ත්‍රීවරු ඒ අවස්ථාවේ කථා කරලා ඒ ක්‍රියාවලිය අනුමත කරලා තිබෙනවා. අද එක පාරටම ඒකේ දෝෂයක් හොයාගෙන. මෙතුමන්ලා ඇයි මොහාන් පීරිස් මහත්මයාට ඉල්ලා අස්වෙන්න කියලා ඉල්ලීමක් කළේ, ඒ පත්වීම නීත්‍යානුකූල නැත්නම්? නීත්‍යානුකූලව පත් නොවෙච්ච කෙනෙකුගෙන් ඉල්ලා අස්වෙන්න කියලා ඉල්ලන්න දෙයක් නැහැ. ගරු අගමැතිතුමාගේ ප්‍රකාශයේම කිව්වා, අවස්ථා ගණනාවකදී ඉල්ලා අස්වෙන්න කිව්වා කියලා. එහෙම නම් ඉල්ලා අස්වෙන්න කියලා කියන්න ඕනෑ නැහැ, නීත්‍යානුකූලව පත් වුණේ නැත්නම්. ඇත්ත කථාව වුණේ එක එක මැර කල්ලි යවලා තර්ජනය කරලා, භය ගන්වලා ඉල්ලා අස් කරන්න බැලුවා. [බාධා කිරීම්] බැරි වුණාම තමයි එක පාරටම අලුත් law point එකක් හොයා ගත්තේ. [බාධා කිරීම්] අලුත් law point එකක් හොයා ගත්තා. ඒ නිසා මේක අපි පිළිගන්නේ නැහැ. ඒ නිසා අපි ඉතා ඕනෑකමින් ඉල්ලනවා, මේ අලුත් නීති තර්ක දාලා මේ අකටයුත්ත, - [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, මොහාන් පීරිස් අයින් කරන්න මේ සභාවට යෝජනාවක් ගෙනැල්ලා ඒක කළා නම් අපි ඒ ගැන ප්‍රශ්න කරන්නේ නැහැ. ඒ අයිතිය නැත්තේ නැහැ. මේ කරපු විධියත් එක්ක මේ රටේ මුළු අධිකරණ ක්ෂේත්‍රයම සම්පූර්ණයෙන්ම තුෂ්ණීම්භූත වෙලායි තිබෙන්නේ. [බාධා කිරීම්] මම කලිනුත් කිව්වා, උසාවිවලට ගිහිල්ලා කරන දේවල්. ඒ ගැන විතරයි අපි කථා කරන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු අගමැතිතුමා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ඊට වඩා මට කියන්න වැඩක් නැහැ. [බාධා කිරීම්] මොහාන් පීරිස් මැතිතුමා මට කිව්වේ තානාපතිකමක් දෙනවා නම් ඉල්ලා අස්වෙන්නම් කියලා. මම හිතුවා, මේ ප්‍රශ්නය විසඳා ගන්න ඒක හොඳයි කියලා. [බාධා කිරීම්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මේ සභාවේ මොහාන් පීරිස් මහතා නොමැති වුවත් මම වග කීමෙන් අග්‍රාමාත්‍යතුමාට කියනවා, මොහාන් පීරිස් මහතා ඉල්ලා අස්වීමක් දීමට එකඟ වුණේ නැහැ කියලා. කිසිම අවස්ථාවක ඉල්ලා අස්වීමක් දීමට,- [බාධා කිරීම්] ඔබතුමාත් දන්නවා සත්‍යය; මමත් දන්නවා. එකඟ වුණේ නැහැ. ඒ නිසා අපට වාදයක් දෙන්න. දැන් තමුන්නාන්සේ අලුත් පිටුවක් ආරම්භ කළා. අපට වාදයක් දෙන්න. මොහාන් පීරිස් මැතිතුමාගෙන් ඉල්ලා අස්වීම ඔබතුමා ඉල්ලුවාට, එතුමා ඉල්ලා අස්වීමක් දුන්නේ නැහැ. ඇයි, ඔබතුමා ඉල්ලා අස්වීමක් ඉල්ලුවේ වලංගු නැති මිනිහෙක් නම්? වලංගු නිසා නේ ඉල්ලා අස්වීමක් ඉල්ලුවේ.

Hon. Prime Minister, what I am trying to say is that a retirement is different to a resignation. I am telling you with responsibility. I will present this case with responsibility. That is why we want time. We do not want to get involved personally with the Hon. Prime Minister on any matter. He has tried his best, perhaps in a way to resolve it, but the Bar Association came and forced him to accept their conditions. - [*Interruption.*] You said that the Bar Association forced the Government to accept these conditions of forcibly removing Mohan Peiris. What you said is recorded. You said it just two hours ago. What you said is true. That is what happened. You were trying to resolve, but the Bar Association took the matter into their hands and forced you all to act like thugs and throw out Chief Justice, Mohan Peiris and install a lady in that chair. That is the fact.

ගරු කථානායකතුමනි, අපට මේ ගැන විවාද කරන්න අගමැතිතුමා වෙලාව දීලා දැන් ඉවරයි. මේ වෙලාව අපි තව ටිකක් අරගෙන යමු. විපක්ෂ නායකතුමාට කතා කරන්න දෙන්න, විපක්ෂ නායකතුමා කතා කරයි. මම ඉල්ලා සිටින්නේ ඒකයි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
මා ගැන සඳහන් කළ නිසායි මම මෙය කියන්නේ. විශේෂයෙන්ම කිසි විටෙක මම මොහාන් පීරිස්ට ඉල්ලා අස් වෙන්න කිව්වේ නැහැ. එතුමායි මට කතා කළේ. මම එක පියවරක් ගත්තා, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, [බාධා කිරීම්] මම එතුමා එක්ක තනිවම කතා කළේ නැහැ. මම මොහාන් පීරිස් ගැන දන්නා නිසා සෑම වෙලාවේම සාක්ෂිකාරයින් තියා ගෙනයි කතා කළේ. [බාධා කිරීම්] අනෙක, මොහාන් පීරිස් මැතිතුමා තමන්ගේ භාර්යාව එක්ක ඇයි එදා රෑ ජනාධිපතිතුමා හම්බ වෙන්න ගියේ appointment එකක් නැතිව? [බාධා කිරීම්] අපි දන්නවාද? [බාධා කිරීම්] අපි ඔක්කොම කියන්නම්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු අගමැතිතුමා දැන් මේ ප්‍රශ්නය කතා කරන වෙලාවේ අලුත් දෙයක් එකතු කළා. අපට ඕනෑ විවාදයක්. මේවා විවාදයේදී ගත යුතු කරුණු. නමුත් එතුමා පෙන්වන්න හැදුවා, මේ සභාවේ ක්‍රියා දාමයක් එතුමා ප්‍රශ්නයට ලක් කළේ නැත කියලා. මේ සභාවේ ගත්ත ක්‍රියා දාමය තමයි එදා හිටපු අග්‍ර විනිශ්චයකාරවරිය ඉවත් කිරීම. ඒක තමයි ප්‍රශ්නයට ලක් කරලා තිබෙන්නේ. [බාධා කිරීම්] ඒක තමයි ප්‍රශ්නයට ලක් කරලා තිබෙන්නේ. [බාධා කිරීම්]

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔබතුමා උපදේශකද? [බාධා කිරීම්]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
පන්දම්කාරයා. අද පන්දම්කාරයා. [බාධා කිරීම්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ ප්‍රකාශය පිළිබඳව විවාදයක් දෙන්න එකඟ වෙලා තිබෙනවා. [බාධා කිරීම්]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
අද පන්දම්කාරයා, අද පන්දම්කාරයා. [බාධා කිරීම්] මට කතා කරන්න දෙන්න.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා, කතා කරන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මට කතා කරන්න දෙන්න. [බාධා කිරීම්] කථානායකතුමා මට ඉඩ දීලා තිබෙනවා. මම දන්නේ නැහැ තවත් කථානායක කෙනෙක් මට පිටුපස ආසනයකත් ඉන්නවාද කියලා. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, -[බාධා කිරීම්] අපේ අගමැතිතුමා කිව්වා මේ සභාවේ ක්‍රියා දාමය කිසි ලෙසක දෝෂ දර්ශනයට ලක් කළේ නැහැයි කියලා. එහෙම නම් මේ සභාවේ ක්‍රියා දාමය අනුව ගනු ලැබූ තීරණය කොහොමද ප්‍රශ්නයට ලක් කළේ? ප්‍රශ්නයට ලක් කළේ කවුද? ඒ බලය තිබෙන්නේ කාටද? ඒක තමයි මෙතැන ප්‍රශ්නය. මේ සභාවේ ක්‍රියා දාමය අනුව ඉවත් කරනු ලැබූ අග්‍ර විනිශ්චයකාරතුමියගේ ඉවත් කරනු ලැබීම, කළු කෝට්කාරයන්ගෙන් කෙස් පැලෙන තර්ක ඉගෙන ගෙන ඇවිල්ලා දැන් තමුන්නාන්සේලා හදන්නේ, "පිදුරු ගහට මුවා වෙලා මීනී මැරුවේ නැහැ" කියන්නද? ඒ නිසා මේ ගැන අපි කතා කරමු. මේ සභාවටයි මේ තර්ජනය එල්ල වෙලා තිබෙන්නේ. මේ සභාවේ උත්තරීතරභාවයට, ඔබතුමාගේ අධිකාරියට, මේ සභාවට ව්‍යවස්ථාවෙන් ලබා දී තිබෙන ප්‍රධානත්වයට අද අභියෝගයක් එල්ලවෙලා. ඇයි? මේ සභාවේ ක්‍රියා දාමය අත්හිටුවලා තිබෙනවා ජනාධිපතිතුමා. ජනාධිපතිතුමාට එවැනි බලයක් ව්‍යවස්ථාවෙන් දීලා නැහැ. ඒ නිසා අපි මේ කාරණය හදිසි කාරණයක්, වැදගත් කාරණයක් හැටියට අද විවාදයට ගත යුතුයි කියා මා ඔබතුමාට බැගෑපත් ලෙස කියනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විවාදයක් ඉල්ලන කොට ඒකට Motion එකක් ඉදිරිපත් කරලානේ ඒක කරන්න ඕනෑ. එහෙම නේද?

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
Sir, I rise to a point of Order.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
There is a point of Order being raised by the Hon. Felix Perera. What is your point of Order?

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ගරු කථානායකතුමනි, microphone එක දීලා නැහැ. [බාධා කිරීම්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ෆීලික්ස් පෙරේරා මන්ත්‍රීතුමා.

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ගරු කථානායකතුමනි, අපේ අග්‍ර විනිශ්චයකාරතුමාට threaten කෙරුවාය කියලා දැන් කිව්වා. අපටත් ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. අද වත්තල ප්‍රාදේශීය සභාවේ - [බාධා කිරීම්] මහජන සාමය පිළිබඳ ගරු ඇමතිතුමා - [බාධා කිරීමක්] ඇමතිතුමනි, පොඩ්ඩක් වාඩි වෙන්න. [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න, පොඩ්ඩක් ඉන්න. තවම කිව්වේ නැහැ. [බාධා කිරීම්] කියනකම් ඉන්න. අද වත්තල ප්‍රාදේශීය සභා රැස්වීමේදී හතර දෙනකුට ගහලා තිබෙනවා. ඒ හතර දෙනාව දැන් ඉස්පිරිතාලයට ඇතුළත් කර තිබෙනවා. මා ඔබතුමාගෙන් ඉල්ලනවා, මේ ගැන

පරීක්ෂණයක් කරන්නය කියලා. [බාධා කිරීම්] මේ ගැන ඔබතුමා පරීක්ෂණයක් කරන්න. කොහොමද එහෙම ගහන්නේ? [බාධා කිරීම්] එතකොට කෝ, යහ පාලනය? [බාධා කිරීම්] කරුණාකර, ඒ ගැන පරීක්ෂණයක් කරන්න. [බාධා කිරීම්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අද ප්‍රධාන කටයුතුවලට තිබෙන - [බාධා කිරීම්]

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, ගරු ෆිලික්ස් පෙරේරා මන්ත්‍රීතුමා මොකක්ද සිද්ධියක් ගැන කථා කරනවා. මා අහනවා, එතුමා එතැන සිටියාද කියලා. ඒ සිද්ධිය දකින්න එතුමා ඒ අවස්ථාවේ එතැන සිටියා ද කියලා මා අහනවා. [බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමා ඒ අවස්ථාවේ එතැන සිටියා නම් කියන්න, මා ඒ ගැන විභාග කරන්නම්. [බාධා කිරීම්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු අග්‍රාමාත්‍යතුමා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු කථානායකතුමනි, ඒ ගැන සම්පූර්ණ පරීක්ෂණයක් අපි කරන්නම්. [බාධා කිරීම්] Give me the facts.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු සභානායකතුමා.

යනුවෙන් මේ යෝජනාව සංශෝධනය කළ යුතු යැයි මා යෝජනා කරනවා. ඒකට සභාවේ එකඟතාව ගන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒක ලිඛිතව තිබෙන්න ඕනෑ. [බාධා කිරීම්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ලිඛිතව දෙන්නට ඕනෑ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
I call for a Vote.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
No. You cannot take a Vote like that.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
I call for a Vote. - [*Interruption.*]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සභාවේ වැඩ කටයුතු සියලු දෙනාගේම එකඟතාවෙන් යුතුව සාමකාමීව කරන්නට ඕනෑ. ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ කරුණ පිළිබඳව තව දුරටත් සාකච්ඡා කර බැලීම සඳහා සභාවේ කටයුතු විනාඩි 10කට අත් හිටුවනවා.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ. භා. 4.15ට නැවත පවත්වන ලදී.
அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 4.15 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.
Sitting accordingly suspended till 4.15 p.m. and then resumed.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Hon. Speaker, I move,

"That this Parliament at its rising this day do adjourn until 1.00 p.m. on Thursday, February 05th, 2015."

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Hon. Speaker, we disagree. I request you to get the consent of the House. I propose an amendment to that. [බාධා කිරීම්] "2015 පෙබරවාරි මස 02 වැනි සඳුදා අ.භා 1.00 වන තෙක්"

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Order, please! කරුණාකර, ගරු මන්ත්‍රීතුමන්ලා තමන්ගේ අසුන්වලට යන්න. සභාව ඊළඟ දිනය තෙක් කල් තබන ලද බව දන්වමි.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 4.16 ට, 2015 පෙබරවාරි 05 වන බ්‍රහස්පතින්දා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.

அதன்படி பி. ப. 4.16 மணிக்கு பாராளுமன்றம், 2015 பெப்ருவரி 05, வியாழக்கிழமை பி. ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Adjourned accordingly at 4.16 p.m. until 1.00 p.m. on Thursday, 05th February, 2015.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

232 වන කාණ්ඩය - 4 වන කලාපය
தொகுதி 232 - இல. 4
Volume 232 - No. 4

2015 පෙබරවාරි 02වන සඳුදා
2015 பெப்ருவரி 02, திங்கட்கிழமை
Monday, 02nd February, 2015

පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:

පාර්ලිමේන්තුව කැඳවීම

කල් තැබීමේ යෝජනාව:

අග විනිසුරු ධුරය සම්බන්ධව ගරු අග්‍රාමාත්‍යතුමා කළ ප්‍රකාශය

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:

பாராளுமன்றத்தைக் கூட்டல்

ஒத்திவைப்புப் பிரேரணை:

பிரதம நீதியரசர் பதவி பற்றிய மாண்புமிகு பிரதம அமைச்சரினது கூற்று

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Summoning of Parliament

ADJOURNMENT MOTION:
Statement made by Hon. Prime Minister on Office of Chief Justice

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2015 පෙබරවාරි 02වන සඳුදා
2015 பெப்ருவரி 02, திங்கட்கிழமை
Monday, 02nd February, 2015

අ. භා. 2.00ට පාර්ලිමේන්තුව රැස් විය. කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் பி.ப. 2.00 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.
The Parliament met at 2.00 p.m., MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

පාර්ලිමේන්තුව කැඳවීම
பாராளுமன்றத்தைக் கூட்டல்
SUMMONING OF PARLIAMENT

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පාර්ලිමේන්තුව කැඳවීමේ ගැසට් නිවේදනය පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් දැන් සභාවට කියවනු ලැබේ.

අනතුරුව පහත සඳහන් ගැසට් නිවේදනය පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් කියවන ලදී :
அதன்மேல் பாராளுமன்ற செயலாளர் நாயகம் பின்வரும் வர்த்தமானி அறிவித்தலை வாசித்தார்:
Whereupon the Secretary-General of Parliament read the following Gazette Notification:

"

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ

අංක 1899/45 – 2015 ජනවාරි මස 30 වැනි සිකුරාදා - 2015.01.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

කථානායකතුමාගේ නිවේදනය

2015 පෙබරවාරි මස 02 වැනි සඳුදා ප. ව. 2.00ට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ රැස්වීමක් කැඳවීම

අග්‍රාමාත්‍යතුමාගේ ඉල්ලීම පරිදි පාර්ලිමේන්තුවේ අංක 14 වැනි ස්ථාවර නියෝගය අනුව 2015 පෙබරවාරි මස 02 වැනි සඳුදා අ. භා. 2.00ට රැස්වන සේ පාර්ලිමේන්තුව මා විසින් කැඳවන ලද බව පාර්ලිමේන්තුවේ කථානායක තැන්පත් චමල් රාජපක්ෂ වන මම මෙයින් දැනුම් දෙමි.

චමල් රාජපක්ෂ,
කථානායක .

2015 ජනවාරි මස 30 වැනි දින,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.
"

පාර්ලිමේන්තුවේ කටයුතු
பாராளுமன்ற அலுவல்
BUSINESS OF THE PARLIAMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Plantation Industries and Leader of the House of Parliament)
Hon. Speaker, I move,

"That the Business of Parliament be exempted at this day's sitting from the provisions of Standing Order No. 7 and the motion agreed to by Parliament on 09.07.2010".

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That this Parliament at its rising this day do adjourn until 1.00 p.m. on Thursday, February 05th, 2015".

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කල් තැබීමේ යෝජනාව, ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා.

අග විනිසුරු ධූරය සම්බන්ධව ගරු අග්‍රාමාත්‍යතුමා කළ ප්‍රකාශය
பிரதம நீதியரசர் பதவி பற்றிய மாண்புமிகு பிரதம அமைச்சரினது கூற்று
STATEMENT MADE BY HON. PRIME MINISTER ON OFFICE OF CHIEF JUSTICE

[අ.භා. 2.04]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Nimal Siripala de Silva - Leader of the Opposition)
ගරු කථානායකතුමනි, මා විසින් පාර්ලිමේන්තුව වෙත භාර දී

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

ඇති පහත සඳහන් කල් තැබීමේ යෝජනාව මම සභාවට ඉදිරිපත් කරනවා:

"ගරු අග්‍රාමාත්‍යතුමා විසින් 2015 ජනවාරි 30වන දින පාර්ලිමේන්තුව හමුවේ ඉදිරිපත් කරන ලද අග විනිසුරු තනතුර සම්බන්ධ විශේෂ ප්‍රකාශය විවාද කළ යුතු යැයි ගරු සභාවට යෝජනා කරමි."

ගරු කථානායකතුමනි, මේ කාරණය පිළිබඳව ජනමාධ්‍ය හරහා මේ රටේ ඉදිරිපත් කරන ලද වැරදි කරුණු කිහිපයක් නිවැරදි කිරීමට මා පළමුවෙන්ම ඔබතුමාගේ අවසරය බලාපොරොත්තු වෙනවා.

ඔබතුමාට මතක ඇති 2015.01.30වැනි දා අග්‍රාමාත්‍යතුමා එතුමාගේ ප්‍රකාශය ඉදිරිපත් කළ අවස්ථාවේදී විපක්ෂයට සම්බන්ධ පක්ෂ නායකයින් සහ මන්ත්‍රීවරුන් සියලු දෙනාම "එය එදිනම විවාදයට ගන්න, එහෙම නැත්නම් අඩුම ගණනේ එක කථිකයෙකුටවත් මේ පිළිබඳව කරුණු දැක්වීමට අවසර දෙන්න" කියා එක හඬින් ඉල්ලා සිටියා. ගරු කථානායකතුමනි, අපට එම අවස්ථාව නොලැබුණු නිසා අපි නැවතත් ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් පක්ෂ නායක රැස්වීමක් පවත්වලා, එම පක්ෂ නායක රැස්වීමේදී එහි ඇති වැදගත්කම පිළිබඳව කරුණු ඉදිරිපත් කරලා අපට මේ අවස්ථාව ලබා දෙන්න කියලා ඉල්ලා සිටියා. ඒ අවස්ථාවේදීත් අපි කිව්වා, අඩු තරමින් 2015 පෙබරවාරි 02වැනි දාවත් අපට මෙම විවාදය ලබා දෙන්න කියලා. නමුත් පක්ෂ නායක රැස්වීමේදී සභානායකතුමා හෝ රජය වෙනුවෙන් කිසිවෙකු ඊට යහපත් ප්‍රතිචාරයක් දැක්වූයේ නැහැ. ඒ අවස්ථාවේදී ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා කියා සිටියා, ජනාධිපතිතුමාගේ අවසරය ලැබෙනවා නම් මෙම විවාදය පෙබරවාරි 02වැනි දාට ලබා දෙන්න පුළුවන් කියලා. ඒ අනුව මමත්, ගරු ජෝන් සෙනෙවිරත්න මැතිතුමාත් වහාම ජනාධිපතිතුමාට කථා කරලා මේ විවාදයේ ඇති වැදගත්කම පිළිබඳව එතුමාට කරුණු ඉදිරිපත් කළාම එතුමා කිව්වා, "කිසි ප්‍රශ්නයක් නැහැ, පෙබරවාරි 02වැනි දා මේ විවාදය පවත්වන්න පුළුවන්" කියලා. ඒ නිසා අපට අද මෙම විවාදයට අවස්ථාව සලසා දීම පිළිබඳව මම පළමුවෙන්ම අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ අවස්ථාව සලසා දුන්නේ එතුමායි. එතුමා අපේ සෑම රැස්වීමකදීම අපට කියලා තිබෙනවා, "විවේචනය කරන්න, අඩු පාඩු තිබෙනවා නම් පෙන්වලා දෙන්න, ඒ ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ" කියලා. ඒ නිසා අපට එම කාර්ය භාරය ඉටු කිරීමට එතුමා ලබා දෙන සහයෝගයත් අපි විශේෂයෙන්ම අගය කරන බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට කැමැතියි.

ගරු කථානායකතුමනි, රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඉදිරිපත් කරන ලද මේ දීර්ඝ ප්‍රකාශයේ කාරණා දෙකක් සඳහන් වෙනවා. එක් කාරණයක් තමයි මේ දෝෂාභියෝග ක්‍රියාදාමය දෝෂ සහිතයි, සමස්ත ක්‍රියාවලියේම කිසිදු වලංගුභාවයක් තිබුණේ නැහැ කියන එක. ඒ වාගේම, හිටපු අග්‍රවිනිශ්චයකාරතුමිය ඉවත් කිරීමට ජනාධිපතිවරයා නීති විරෝධී හා හිතුවක්කාර තීරණයක් ගෙන ඇත කියලා කියනවා. ඒ වරද නිවැරදි කරන්නට නම්, කළ යුත්තේ මෙන්න මේ ආකාරයටයි කියලා නීති සංගමය වර්තමාන ජනාධිපතිතුමාට උපදෙස් දුන්නාය කියනවා. ඊට අමතරව, මොහාන් පීරිස් මැතිතුමා ජනාධිපතිතුමා බලන්න ගියාය, අගමැතිතුමා බලන්න ආවාය කියලා මහා වැල්වටාරම් රාශියක් කියලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපි මෙතැනට ආවේ මොහාන් පීරිස් මහත්මයාට කඩේ යන්න නොවෙයි. විපක්ෂය කටයුතු කරන්නේ ප්‍රතිපත්තියක් අනුවයි. පාර්ලිමේන්තුවේ පරමාධිපත්‍යයට පහර දෙන කොට, එය බාල්දු කරන කොට, අපි නියෝජනය කරන පාර්ලිමේන්තුවේ ඒ ගෞරවය ආරක්ෂා කර ගැනීම විපක්ෂයේ

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ යුතුකමක් හා වග කීමක් වෙනවා. ඒ වග කීම ආණ්ඩු පක්ෂයටත් තිබෙනවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මේ පිළිබඳව මම ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමැතියි. මේ ගෙන එන තර්කය අලුත් තර්කයක් නොවෙයි. එදා මේ දෝෂාභියෝග යෝජනාව විවාද කරන අවස්ථාවේදී වර්තමාන සභානායක ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා මේ කියන තර්කය මතු කළා. ඒ තර්කය මතු කරන ලද අවස්ථාවේ එවකට අපේ කාරක සභාවේ හිටපු මගේ මිත්‍ර, ගරු වෛද්‍ය රාජිත සේනාරත්න මැතිතුමා 2013 ජනවාරි 11වන දින පළවූ හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 650 යටතේ මෙන්න මෙහෙමයි කිව්වේ:

ගරු කථානායකතුමනි, අද දින, එනම් 2013.01.11වන දින න්‍යාය පත්‍රයේ පැහැදිලිවම මේ යෝජනාව තිබෙනවා. බලන්න, හතරවන පිටුව. එහි සඳහන්ව තිබෙන්නේ මෙසේයි:

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍රවිනිශ්චයකාර ධුරයෙන් ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මිය ඉවත් කිරීම සඳහා අතිගරු ජනාධිපතිවරයා වෙත පාර්ලිමේන්තු යෝජනා සම්මතයක් ඉදිරිපත් කිරීම පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 (2) ව්‍යවස්ථාව ප්‍රකාර යෝජනාව, -"

ගරු කථානායකතුමනි, අපේ රාජිත සේනාරත්න ඇමතිතුමා ඒ අවස්ථාවේ තවදුරටත් මෙසේ කිව්වා:

"ඊට වඩා මොකක්ද? මේ යෝජනාව. යෝජනාව හරියට කියවා ගන්නවා. [බාධා කිරීම්] කසිප්පු නඩු කථා කළාට හරි යන්නේ නැහැ. [බාධා කිරීම්] කසිප්පු නඩු කථා කළාට වැඩක් නැහැ."

මෙන්න මෙහෙම කියලා ඒ අවස්ථාවේදී එතුමාත් අපට සම්පූර්ණ සහයෝගය දුන්නා. එතුමා කියා සිටියා මේක ව්‍යවස්ථානුකූලයි, මෙතැන වැරැද්දක් වෙලා නැහැ කියලා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதார மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health and Indigenous Medicine)
ඔබතුමා ඒකේ ඉතුරු කොටසත් කියවන්න.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
නැහැ, නැහැ. අන්තිම දක්වාම කියවලා තිබෙනවා. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමනි, අතීතය පොඩ්ඩක් මතක් කිරීම පමණයි මා මේ කළේ.

ගරු කථානායකතුමනි, ඒ අවස්ථාවේදී ඔබතුමා මොකද කළේ? මේ සභාවේ භාරකාරයා වශයෙන් ඔබතුමා මෙහෙම කිව්වා:

"යම් තීන්දුවක් දෙද්දි ස්ථාවර නියෝග, ඊට පෙර සිදුවූ ආකාරයන් පිළිබඳව සොයලා, විශ්ලේෂණය කරලා, හිතලා බලලා තමයි මම තීරණයක් දෙන්න ඕනෑ. ඒ නිසා මම විනාඩි 10කට සභාව අත්හිටුවලා ඊට පස්සේ ඇවිල්ලා තීරණයක් කියන්නම්."

ගරු කථානායකතුමනි, ඉන් පසුව ඔබතුමා පැමිණ ගරු සභාවට මෙන්න මේ තීරණය ඉදිරිපත් කළා:

"ගරු ඇමතිවරුනි, ගරු මන්ත්‍රීවරුනි, අදාළ ස්ථාවර නියෝග හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන මම අධ්‍යයනය කර බැලුවෙමි.

ජනාධිපතිතුමාට යෝජනාවක් ඉදිරිපත් කිරීම සඳහා මා වෙත මන්ත්‍රීවරුන් අත්සන් කොට ලබා දෙන ලද යෝජනා සම්මතයට අමතරව අලුත් යෝජනාවක් ඉදිරිපත් කළ නොහැකි බව මම ප්‍රකාශ කරමි.

දැනට ඉදිරිපත් කර ඇති යෝජනාව හොඳින් අධ්‍යයනය කර බැලීමේදී මෙම යෝජනාව ඉදිරිපත් කොට ඇත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107(2) ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 107(3) ව්‍යවස්ථාව සහ 78(අ) ස්ථාවර නියෝගය යටතේ බව ඉතා පැහැදිලිව සඳහන් කොට ඇත.

තවද, මෙම යෝජනාවෙන් බලාපොරොත්තු වන්නේ ඉහත සඳහන් විෂමාචාර චෝදනා හේතුවෙන් එම විෂමාචාර චෝදනා පිළිබඳ පරීක්ෂණය කොට එම චෝදනා එකක් හෝ ඊට වැඩි ගණනක් ඔප්පු වී ඇතැයි විශේෂ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබුවහොත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රවිනිශ්චයකාර පදවියෙන් ගරු ආචාර්ය උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මිය ඉවත් කිරීම සඳහා යෝජනාවක් අතිගරු ජනාධිපතිතුමාට ඉදිරිපත් කළ යුතු යැයි සඳහන් වන බැවින් මෙම යෝජනාවේ පරමාර්ථය ඉතා පැහැදිලි වන අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107(2) ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 107(3) ව්‍යවස්ථාව ප්‍රකාර යෝජනාවක් ඉදිරිපත් කිරීමට අද දින න්‍යාය පත්‍රයේ අඩංගු කර ඇති යෝජනාව ප්‍රමාණවත් වන බව මම ප්‍රකාශ කරමි.

එම නිසා අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 යෝජනාව දැන් ඡන්ද විමසීම සඳහා ඉදිරිපත් කරමි."

දැන් මොකද කරන්නේ? ඔබතුමා මේ පිළිබඳව ඉතාම පැහැදිලි නියෝගයක් දීලා -තීන්දුවක් දීලා- ඡන්දය විමසා තමයි මේ යෝජනාව සම්මත කරලා යැව්වේ. අද අභියෝගයට ලක් කරලා තිබෙන්නේ ඔබතුමා එදා දුන්න තීන්දුවයි. මේ පාර්ලිමේන්තුවේ කථානායකවරයකු දුන් තීන්දුවක් පාර්ලිමේන්තුවෙන් පිටතදී අභියෝගයට ලක් කරන්න පුළුවන්ද?

ගරු කථානායකතුමනි, අපට මතකයි, විශේෂයෙන්ම අධිකරණය මඟින් මෙවැනිම යම් යම් තහනම් නියෝග ගෙන ආ අවස්ථාවේදී එදා අනුර බණ්ඩාරනායක මැතිතුමා ඉතා හොඳ Ruling එකක් දුන්නු බව. එහිදී එතුමා මෙසේ සඳහන් කර තිබෙනවා. Column No. 1033 of Hansard of 20th June, 2001 states, I quote:

"At page 277 citing the case of Stockdale V. Hansard 1839, 9A&E 1 the same judge observed,… 'Lord Denman says at page 114: whatever is done within the walls of either assembly must pass without question in any other place.'"

මෙම සභාව තුළ තීරණය කරපු දෙයක් මේ සභාවේ බිත්ති හතරට පමණක් සීමා වනවා. එයින් පිටත කිසි කෙනකුට එය අභියෝගයට ලක් කරන්න බැහැ. මේවා තමයි පාර්ලිමේන්තු ඉතිහාසයේ ඉතා පැහැදිලිවම තිබෙන තත්ත්වයන් ගරු කථානායකතුමනි. මේවා අමු-අමුවේ උල්ලංඝනය කරලා තිබෙනවා. අපේ අග්‍රාමාත්‍යතුමා හැම වෙලාවේම කියන්නේ පාර්ලිමේන්තුව ශක්තිමත් කරන්න ඕනෑය, පාර්ලිමේන්තුවට වැඩි බලතල දෙන්න ඕනෑය කියලායි. එහෙම කියලා පාර්ලිමේන්තුවේ තිබෙන බලතල උදුරා ගෙන, සූරා ගෙන, ඒවා විනාශ කිරීමට මේ රජය මේ වාගේ කටයුතු කරනවා. මට කනගාටුයි. ඉතාම කනගාටුදායක තත්ත්වයක් තමයි පාර්ලිමේන්තුවට ඇති වෙලා තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි. ඒ judgment එකේම මෙසේත් සඳහන් වනවා. I quote:

"Patterson, J. said….'Beyond all dispute, it is necessary that the proceedings of each House should not be liable to examination elsewhere.'"

පාර්ලිමේන්තුවක් තුළ, මේ සභාවක් තුළ සිදු වන ඒ ක්‍රියාදාමයන් පිළිබඳව පාර්ලිමේන්තුවෙන් පිටතට ගිහින් සොයා බලන්නට, ඒවා වෙනස් කරන්නට පුළුවන්කමක් නැහැයි කියලා කියනවා.

මූලිකව ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රකාශය පිළිබඳව නිවැරැදි නීති තත්ත්වය, ඒ යෝජනාව සම්මත කිරීම පිළිබඳ නීති තත්ත්වය ගැන බලමු. අපි හිතමු, යෝජනාව වැරැදියට සම්මත කළාය කියලා. ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තු සම්ප්‍රදාය මොකක්ද? මේ පාර්ලිමේන්තුව පනත් කෙටුම්පතක් හෝ යම් දෙයක් වැරැදියට සම්මත කළත්, එය මේ පාර්ලිමේන්තුව තුළින් නිවැරැදි කරනවා විනා එයින් පරිබාහිරව නිවැරැදි කිරීමේ අයිතියක් නැහැ ගරු කථානායකතුමනි. මේක තමයි මේ රටේ තිබෙන නීතිය. නීතිය, යහ පාලනය ගැන අද කථා කරනවා නම් මේ රටේ නීතියට ගරු කරන්න ඕනෑ; ඒ යහ පාලනයට ගරු කරන්න ඕනෑ.

අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රකාශයේ කියනවා, මොහාන් පීරිස් මහත්මයා ජනාධිපතිතුමාගේ නිවසට පාන්දර 2.00ට ආවාය කියලා. අපි දන්නේ නැහැ, ආවාද, නැද්ද කියලා. ඒවා පසුව සිදු වුණු දේවල්. එතුමා ඒ තනතුරට සුදුසු නැත්නම් නීත්‍යානුකූලව impeachment එකක් ගෙනෙන්න. එහෙම ගෙනැල්ලා එතුමාව අස් කරන්න. එහෙම නැතුව මේ විධියට නීතිය උල්ලංඝනය කිරීම සම්පූර්ණයෙන්ම වැරැදි බව මා ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, එපමණක් නොවෙයි. By an act of the Executive, you cannot nullify a decision of the Legislature. ඒ කියන්නේ නීති සම්පාදකයා විසින් ගනු ලබන තීරණය විධායකයාගේ හස්තයෙන් කිසි විටකත් යටපත් කරන්න පුළුවන්කමක් නැහැ. එසේ කරනවා නම් ඒක මේ පාර්ලිමේන්තුවේ බලතල බාල්දු කිරීමක්, හීන කිරීමක්, යට කිරීමක්. විපක්ෂය වශයෙන් අපි අද මූලිකව විරුද්ධ වන්නේ, අන්න ඒ කාරණයටයි.

ඒ වාගේම මේකට මූලික වෙලා තිබෙන්නේ කවුද? According to the doctrine of "null and void", it can only be done by a court of law, not by the Executive.

ගරු කථානායකතුමනි, ඒ වාගේම ගරු අග්‍රාමාත්‍යතුමා 30වෙනි දින කළ ප්‍රකාශයෙන් ඉතා පැහැදිලිවම පේනවා මේ බළල් අත කාගේද කියලා. ඒක ජනාධිපතිතුමාගේ නොවෙයි. උපුල් ජයසූරිය මහත්මයාගේ බළල් අත තමයි මේ ක්‍රියාත්මක වුණේ. මේක ආරම්භ කළේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා. එතුමා කියනවා, "ජනවාරි 26වෙනි දා නීතිඥ සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයින් මට දැනුම් දුන්නේ" -ජනාධිපතිතුමාට කිව්වේත් නැහැ.- 'පත්වීම නීත්‍යානුකූල නොවන නිසා මොහාන් පීරිස් මහතා වහාම ඉල්ලා අස් විය යුතු බවයි. ඒක නීතිඥ සංගමයේ මතය බවයි" කියලා. ඊළඟට කියනවා, "නීතිපතිවරයා විමසීමෙන් අනතුරුව මේක තීන්දු කළා" කියලා. කෝ නීතිපතිතුමාගේ opinion එක? නීතිපතිතුමා සද්භාවයෙන් තීන්දුවක් දුන්නා නම්, මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නට ඕනෑ, නීතිපතිතුමාගේ ඒ මතය. නීතිපතිතුමාගේ මතය binding නැහැ. එහෙම තිබුණා නම් අපට ඒක බලන්න පුළුවන්. මොකක්ද මේ දීලා තිබෙන මතය කියන කාරණය අපට බලා ගන්නට පුළුවන් වෙයි ගරු කථානායකතුමනි.

එතැන වෙන්නේ මොකක්ද? ඒ නිසාම දැන් නීතිඥ සංගමයේ අය ඇවිල්ලා උසාවියේ අනිකුත් විනිශ්චයකාරවරුන්ව එළවනවා. මෙන්න යහ පාලනය; මෙන්න rule of law. මේකද මේ රටේ ජනතාව බලාපොරොත්තු වුණේ? නීතිඥ සංගමය අද මේ කරගෙන යන ක්‍රියා කලාපය තුළින් මේ රටේ නීතිය කැලෑ නීතිය බවට පත් කරනවා.

ඒ වාගේම සමහර දේශපාලනඥයෝ ගිහින්, දේශපාලනඥයින් උසි ගන්වලා, ප්‍රාදේශීය සභාවල සභා රැස්වීම්

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

පවත්වන විට ඔළු පොඩි කරනවා; ගහනවා; කුඩු කරනවා. මෙන්න මේ යහ පාලනය ගේන්නටද මේ රටේ ජනතාව ඡන්දය දුන්නේ? ඒ නිසා අපි විශේෂයෙන් කියන්නට ඕනෑ, අද මෙන්න මේ ආකාරයේ නීතියේ වල් වැදීමක් ඇති වෙලා තිබෙන බව. නීතියේ වල් වැදීමක් ඇති වෙලා තිබෙනවා. ජනාධිපතිතුමාට මේ විධියට ලණු දීලා, වැරදි නීති තර්ක ඉදිරිපත් කරලා, බලපෑම් කරලා තමයි මේ වැඩ කටයුතු කරලා තිබෙන්නේ. ඒ නිසා ඉදිරියටත් Constitutional Court එකක් ඕනෑ නැහැ; ව්‍යවස්ථාදායක උසාවියක් ඕනෑ නැහැ. උපුල් ජයසූරිය මහත්මයායි, එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධ නීතිඥ කණ්ඩායමකුයි Bar Association බෝඩ් එක ගහගෙන නීති උපදෙස් දෙනවා, මේක කරන්න ඕනෑ මේ විධියට කියලා. එතකොට රජය ඒක ක්‍රියාත්මක කරනවා.

ගරු කථානායකතුමනි, මෙන්න මේ සෝචනීය තත්ත්වය පිළිබඳව අපි අවදියෙන් සිටින්නට ඕනෑ. ඒ නිසා, මේක වැරදියි; නීතිඥ සංගමය දුන්නු උපදෙසක් මත කළ ක්‍රියාව වැරදියි; නීතිඥ සංගමය දුන්නු උපදෙස වැරදියි. මේ රටේ අද මේ ආකාරයෙන් කටයුතු කිරීම පිළිබඳව අපි ඉතාමත්ම කනගාටුවට පත් වෙනවා.

අද රට පුරා අපේ පාක්ෂිකයින්ට සිදු කරන හිරිහැර තුළින් අපට පෙනී යන්නේ නීතියේ වල් වැදීම නිසා ඇති වෙලා තිබෙන අලුත් තත්ත්වයයි. අපි අතිගරු ජනාධිපතිතුමාට ඒ පිළිබඳව දන්වලා තිබෙනවා. ඒ වාගේම, ප්‍රාදේශීය දේශපාලනඥයින්, එක්සත් ජාතික පක්ෂය කරන වැරදි වැඩ ගැන විශේෂයෙන්ම නීතිය හා සාමය භාර අමාත්‍යවරයා තමන්ගේ රාජකාරිය හරියට කරන්නේ නැති බව අපට පේනවා. වත්තල සිද්ධිය එයට ඉතා හොඳ උදාහරණයක්. ඒ නිසා අපේ කණ්ඩායම තීරණය කරලා තිබෙනවා මහජන සාමය, ආපදා කළමනාකරණය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කරන්නට. එහිදී අපි මේ රටේ අපේ පාක්ෂිකයින්ට සිදු වූ ඒ කාරණා පිළිබඳව පොලීසියේ නිහඬවීම සහ එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකයින්ගේ ක්‍රියාකාරිත්වය කියන කරුණු පිළිබඳව ඉදිරිපත් කරනවා. ඒ වාගේම අද අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රමුඛ සාමාජිකයින් භිය ගැන්වීම සහ තැති ගැන්වීම සඳහා විවිධ උපක්‍රම යොදනවා. ඒවා පිළිබඳව අපි 10වෙනි දා පවත්වන විවාදයේදී මේ රටේ ජනතාවට ඉදිරිපත් කිරීමට කටයුතු කරනවා, මේ විවාදය සඳහා අපට ලබා දී ඇත්තේ සීමිත කාල සීමාවක් නිසා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම අද දින, -මම දන්නේ නැහැ ඔබතුමාට දැන්වූවාද කියලා-අපේ තිස්ස අත්තනායක පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා අත් අඩංගුවට අරන් තිබෙනවා. එතුමාව, අත් අඩංගුවට අරන් තිබෙනවා.

සාමාන්‍ය සම්ප්‍රදාය වන්නේ, යම් මන්ත්‍රීවරයකු අත් අඩංගුවට ගන්නවා නම්, ඒ සම්බන්ධයෙන් කථානායකතුමාව දැනුවත් කිරීමෙන් පසුව අත් අඩංගුවට ගැනීමයි.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු කථානායකතුමනි, 1994 දී මාව අත් අඩංගුවට ගන්නකොට එදා හිටපු කථානායකතුමා කිව්වා එතුමාව දැනුවත් කිරීමට කිසිදු අවශ්‍යතාවක් නැහැ කියලා. ඒ ආකාරයට එදා ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් මා අත් අඩංගුවට ගත්තා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

යහපාලනය කියන්නේ ඒක නොවෙයි නේ. ඒ කාලයේ වැරැදි කළා කියලා දැනුත් වැරැදි කරන එක හරිද? [බාධා කිරීම්]

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

එදා හිටපු කථානායකතුමා තීන්දුවක් දුන්නා, එතුමාට දැනුම් දීම අවශ්‍ය නැහැ කියලා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

Parliament (Powers and Privileges) Act එකේ තිබෙනවා, පාර්ලිමේන්තුවට එනකොට මන්ත්‍රීවරයකුව අත් අඩංගුවට ගන්න බැහැ කියලා. ඒ පිළිබඳව යම් සම්ප්‍රදායක් තිබෙනවා. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, ඒ නිසා -

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා (විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பாலித ரங்கே பண்டார - மின்வலு மற்றும் எரிசக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Palitha Range Bandara - State Minister of Power and Energy)

ගරු කථානායකතුමනි, මා රීති ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු පාලිත රංගෙ බණ්ඩාර රාජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාගේ රීති ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

ගරු කථානායකතුමනි, අපරාධ චෝදනාවක් එල්ල වුණාම ඒ චෝදනාව මත අත් අඩංගුවට ගන්න එපා, ඒ සම්බන්ධව කථානායකතුමාගෙන් අවසරයක් ගන්න ඕනෑ කියලා සඳහන් කර තිබෙන්නේ කොහේද කියලා මම දැන ගන්න කැමැතියි.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමාව දැනුවත් කරලා - [බාධා කිරීමක්]

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

එහෙම සඳහන් වෙලා තිබෙන්නේ කොහේද කියලා තමුන්නාන්සේ පැහැදිලි කරන්න.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ඔබතුමා Committee on Privileges එකට ආවා නේ. ඔබතුමාට සිදු වුණු අහේනි ගැන කල්පනා කරලා ඒ වෙලාවේ ඔබතුමා ඔය තර්ක ඉදිරිපත් කළේ නැහැ නේ. ගරු කථානායකතුමනි, ඒ නිසා තත්ත්වය ඉතාමත් පැහැදිලියි. අද යහ පාලනය ගැන කථා කරන අය එම යහ පාලනය වචනයට පමණක් සීමා කරන්නේ නැතිව ක්‍රියාවෙනුත් පෙන්වන්න කියලා ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තූතියි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

යෝජනාව ස්ථිර කිරීම, ගරු ජෝන් සෙනෙවිරත්න මන්ත්‍රීතුමා.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ගරු කථානායකතුමනි, අද දින ගරු නිමල් සිරිපාල ද සිල්වා මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තැබීමේ අවස්ථාවේ යෝජනාව මා ස්ථිර කරනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මා රීති ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ රීති ප්‍රශ්නය මොකක්ද?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු පාලිත රංගෙ බණ්ඩාර මැතිතුමා මතු කරපු රීති ප්‍රශ්නයට මම පිළිතුරක් දෙන්නම්. 1971 දී මාව අත් අඩංගුවට ගත්තා. එදා ගරු කථානායකතුමාට නොදන්වා තමයි මා අත් අඩංගුවට ගත්තේ. ඒ වෙලාවේ ගරු ඩබ්ලිව්. දහනායක මැතිතුමා සහ ගරු ප්‍රින්ස් ගුණසේකර මැතිතුමා ඒ ප්‍රශ්නය මතු කළා. ඒ ප්‍රශ්නය මතු කරපු වෙලාවේ හිටපු කථානායක ස්ටැන්ලි තිලකරත්න මැතිතුමා, එසේ කළේ ඇයිද කියලා ප්‍රශ්න කළා. එය වැරදි බව කියා සිටියා. මන්ත්‍රීවරයකු අත් අඩංගුවට ගන්නකොට සම්ප්‍රදායානුකූලව ඒ බව කථානායකවරයාට දැන්විය යුතුයි කියලා එතුමා ප්‍රකාශ කළා. ඒවා වාර්තාගත වෙලා තිබෙනවා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු කථානායකතුමනි, හැන්සාඩ් වාර්තාව අර ගෙන බලන්න. 1994 දී එදා හිටපු කථානායකතුමා මේ ගරු සභාවට වාර්තා කර තිබෙනවා, මන්ත්‍රීවරයකු අත් අඩංගුවට ගැනීම සඳහා කථානායකතුමාගෙන් කිසිම අවසරයක් ගන්නට අවශ්‍ය වන්නේ නැහැ කියලා.

ගරු සුජීව සේනසිංහ මහතා (අධිකරණ හා කම්කරු සබඳතා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சுஜீவ சேனசிங்க - நீதி மற்றும் தொழில் உறவுகள் பிரதி அமைச்சர்)
(The Hon. Sujeewa Senasinghe - Deputy Minister of Justice and Labour Relations)
Sir, I rise to a point of Order.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Hon. Sujeewa Senasinghe, what is your point of Order?

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වශයෙන් මෙය අප සියලු දෙනාටම වැදගත් වන කරුණක්. අපි ආණ්ඩු පක්ෂයේ සිටින්නට පුළුවන්; විරුද්ධ පක්ෂයේ සිටින්නට පුළුවන්. මේ සම්බන්ධයෙන් ඔබතුමා ගන්නා තීන්දුව ප්‍රකාශයට පත් කළොත් එය අපේ ඉදිරි අනාගතයට හොඳයි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු අත් අඩංගුවට ගන්නවා නම් ඒ පිළිබඳ ඔබතුමාව දැනුවත් කරනවා නම් තමයි වඩාත් හොඳ කියන එක තමයි මගේ අදහස. ඔබතුමා ඒ සම්බන්ධයෙන් තීන්දුවක් ලබා දෙනවා නම්, එතකොට හිටපු කථානායකවරුන්ගේ තීන්දු අපට අදාළ වන්නේ නැහැ කියලා මා හිතනවා. ඔබතුමා මේ සම්බන්ධයෙන් අධ්‍යයනය කරලා අපට යම්කිසි ක්‍රියා පිළිවෙතක් පිළිබඳව දැනුම් දෙන්න. මොකද අපට මේ සම්බන්ධයෙන් ප්‍රශ්නසහගත තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ පිළිබඳව දැනුවත් කිරීමක් කළොත් හොඳයි කියන එක තමයි මගේ පෞද්ගලික අදහස. ඒ සම්බන්ධයෙන් අපට තීන්දුවක් ලබා දෙන ලෙස ඉතා ගෞරවයෙන් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පසුගිය කථානායකතුමන්ලා මේ පිළිබඳව දක්වපු නියෝගයන්, උපදෙස් අධ්‍යයනය කරලා පසුවට ඒ පිළිබඳව පැහැදිලි උපදෙසක් ලබා දෙන්නම්.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු කථානායකතුමනි, ඔබතුමා කථානායක ධුරයේ සිටින කාලපරිච්ඡේදයේ දීත් පොලීසිය විසින් අවස්ථා දෙකකදී මා අත් අඩංගුවට ගෙන තිබෙනවා. එතකොට ඒ අවස්ථාවලදී ඔබතුමාව දැනුවත් කිරීමකින් තොරව තමයි පොලීසිය මාව අත් අඩංගුවට ගැනීමටත්, අධිකරණය හමුවට ඉදිරිපත් කිරීමටත් කටයුතු කරලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, තිස්ස අත්තනායක හිටපු අමාත්‍යතුමාව අත් අඩංගුවට ගෙන තිබෙන්නේ බොරු ලියවිලි - කූට ලේඛන- ඉදිරිපත් කිරීම යටතේයි. ඔහු විසින් නිර්මාණය කරන ලද, ඔහු විසින් හොරට [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්නකෝ. ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කාරණයට අදාළවයි මම කථා කරන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කෙටියෙන් දැනුම් දෙන්න. [බාධා කිරීම්]

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු කථානායකතුමා ඒ සම්බන්ධව තීන්දුවක් දෙයි. තමුන්නාන්සේලා නේ දැන් බලය අතට ගන්න හදන්නේ. [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්නකෝ. ගරු කථානායකතුමනි, එතකොට ඒ අන්දමට එදා කටයුතු කර තිබෙනවා. අද අධිකරණයට ඉදිරිපත් කිරීමට අදාළව චෝදනා ලබපු ගරු තිස්ස අත්තනායක මන්ත්‍රීතුමාව කූට ලේඛන ඉදිරිපත් කිරීමේ චෝදනාව මත තමයි අත් අඩංගුවට ගෙන තිබෙන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මම ඒ සම්බන්ධයෙන් කිව්වා, ඒ පිළිබඳව පසුව දැනුම් දෙන්නම් කියලා. ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමා සඳහන් කළා ඔබතුමා අත් අඩංගුවට ගන්න කොට කථානායකවරයාට දැනුම් දුන්නේ නැහැ කියලා. මම ඒ අවස්ථාවේදී ලංකාවේ නොහිටපු එක නම් හොඳයි. ගරු නියෝජ්‍ය කථානායකතුමාට ඒ බව දැනුම් දීලා තිබෙනවා. හැබැයි, පසු ගිය කාලයේම එහෙම ඒවා දැනුම් දුන්නා. අපි ඒ ගැන පසුව බලමු.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු කථානායකතුමනි, ඔබතුමා නිසි තීන්දුවක් ගන්න; නිසි නියෝගයක් දෙන්න.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ ගැන හොඳ නියෝගයක් දෙන්නම්.

මීළඟට ගරු ලක්ෂ්මන් කිරිඇල්ල අමාත්‍යතුමා.

[අ.භා. 2.28]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අද මේ සාකච්ඡා කරන විෂයයට අදාළ තීන්දුව, ඒ කියන්නේ ශිරානි බණ්ඩාරනායක මැතිනිය නැවත අග්‍ර විනිශ්චයකාර ධුරයට පත් කිරීමේ තීන්දුව ගත්තේ ඇත්ත වශයෙන්ම අප නොවෙයි. කවුද ඒ තීන්දුව ගත්තේ?

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කවුද උපදෙස් දුන්නේ?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
කවුරු උපදෙස් දුන්නත්- [බාධා කිරීම්] කවුරු උපදෙස් දුන්නත් මම තමුන්නාන්සේලාගෙන් අහනවා අවසාන වශයෙන් මේ තීන්දුව ගත්තේ කවුද කියලා. [බාධා කිරීම්]

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
එතුමාව නොමඟ යවලා- [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේක දැන දැන, මේ තීන්දුව ගත්තේ කවුද කියලා දැන දැනම නිකම් බබ්බු වෙන්න හදනවා. [බාධා කිරීම්] තමුන්නාන්සේලා බබ්බු වෙන්න හදනවා. [බාධා කිරීම්]

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ඒ වචනය ඉල්ලා අස් කරගන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඇත්ත වශයෙන්ම මේක රෑ 8.00 වන කල් සාකච්ඡා කරන්න ඕනෑ දෙයක් නොවෙයි. පෙරේදා අපේ ජනාධිපතිතුමා ITN එකේත්, රූපවාහිනියේත් කරපු කථාව අහගෙන සිටියා නම්, එහි මේකට උත්තරය තිබෙනවා. මම ඒ කථාවට පැය දෙකක් තිස්සේ සවන් දුන්නා. ජනාධිපතිතුමාගේ කථාවේ මේ උත්තරය තිබෙනවා

ගරු නිමල් සිරිපාල ද සිල්වා විපක්ෂ නායකතුමනි. මොකක්ද ගරු ජනාධිපතිතුමා කිව්වේ? එදා පාර්ලිමේන්තුවේ සම්මත වුණේ තේරීම් කාරක සභාව පත් කිරීමේ යෝජනාවක්ය කියලා තමයි ජනාධිපතිතුමා කිව්වේ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
උපදෙස් දුන්නේ කවුද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
උපදෙස් නොවෙයි. ජනාධිපතිතුමාම කිව්වා නේ.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - நீதி மற்றும் தொழில் உறவுகள் அமைச்சர்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe - Minister of Justice and Labour Relations)
උපදෙස් ඕනෑ නැහැ ඒකට.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
කවුරු උපදෙස් දුන්නත් අවසාන තීරණය ගන්නේ ජනාධිපතිතුමායි. [බාධා කිරීම්]එතුමා මොකක්ද කිව්වේ? ජනවාරි මාසයේ 11වන දා පාර්ලිමේන්තුවේ සම්මත වුණේ තේරීම් කාරක සභාවක් පත් කිරීමේ යෝජනාවක්ය කියලා එතුමා කිව්වා. ඔබතුමාට මතක ඇති- [බාධා කිරීම්]

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
පත් කරන ලද තේරීම් කාරක සභාවේ ආයෙත් පත් කරන්නේ මොකක්ද?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඉතින් ඒක තමයි. කවුද ගෙනාවේ යෝජනාව? අපිද ගෙනාවේ? තමුන්නාන්සේලායි ගෙනාවේ. [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
You can give a reply later. [බාධා කිරීම්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එදා ඒ යෝජනාව ගෙනාපු වෙලාවේ එතුමා ඡන්දයත් දුන්නා. එතුමා කථාවකුත් කළා. එදා 11වන දා එතුමා කථා කළා. හැන්සාඩ් වාර්තාවේ තිබෙනවා, මෛත්‍රීපාල සිරිසේන හිටපු ඇමතිතුමාගේ කථාව. ඒක කියවන්න. එහිදී එතුමා ඡන්දය දුන්නා ඒකට. [බාධා කිරීම්] ඒකයි ඇත්ත තත්ත්වය. ඔබතුමා තේරුමක් නැති කථා කියන්න එපා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේ යෝජනාවේ යටි අරමුණ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජනාධිපතිතුමාට දොස් කීමයි. ඔබතුමාගේ අදහසත් ඒකයි; ජනාධිපතිතුමාට දොස් කියන එකයි. දිනේෂ් ගුණවර්ධන මහත්මයා ජනාධිපතිතුමාට දොස් කියන්නයි මේක ගෙනාවේ. වාසුදේව මැතිතුමා, අපේ විමල් වීරවංශ මැතිතුමා ජනාධිපතිතුමාට මඩ ගහන්න - [බාධා කිරීම්] එහෙම නොවෙයිද? [බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔව්, ඔව්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමන්ලා බබ්බු වෙන්න හදනවා නේ. මේ තීන්දුව ගත්තේ අපිද? කවුද මේ තීන්දුව ගත්තේ? [බාධා කිරීම්] මෙතැන බබ්බු වෙන්න හදනවා. තොත්ත බබාලා. [බාධා කිරීම්]

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ගරු කථානායකතුමනි, මට රීති ප්‍රශ්නයක් නඟන්න තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු සුසිල් ප්‍රේමජයන්ත මන්ත්‍රීතුමා රීති ප්‍රශ්නයක් නඟනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
බබ්බු වෙන්න හදනවා. තොත්ත බබාලා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
රීති ප්‍රශ්නයක් නඟනවා ගරු සුසිල් ප්‍රේමජයන්ත මන්ත්‍රීතුමා.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ගරු කථානායකතුමනි, මට වරප්‍රසාද ප්‍රශ්නයක් නඟන්න තිබෙනවා.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
රජයත්, නීතිඥ සංගමයත් ජනාධිපතිතුමාව නොමඟ යවලා- [බාධා කිරීම්]

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා කිව්වා-

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
අපි ජනාධිපතිතුමාට නොවෙයි දොස් කියන්නේ, රජයටයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන්, ගරු මන්ත්‍රීවරු දෙදෙනෙක් කථා කරනවා.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ගරු කථානායකතුමනි, මට වරප්‍රසාද ප්‍රශ්නයක් නඟන්න තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මොකක්ද වරප්‍රසාද ප්‍රශ්නය?

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා කිව්වා අපි බබ්බු කියලා. ඒ වචනය ඉල්ලා අස් කරගන්න ඕනෑ. බබ්බු නැහැ මෙහි. මන්ත්‍රීවරුයි ඉන්නේ. ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේගේ බබ්බු කොහේ ඉන්නවාද කියලා අපි දන්නේ නැහැ. ඒ වචනය ඉල්ලා අස් කරගන්න ඕනෑ. [බාධා කිරීම්] ඒක ඉල්ලා අස් කරගන්න ඕනෑ. බබ්බු නොවෙයි මේ ඉන්නේ; මන්ත්‍රීවරුයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මොකක්ද ඉල්ලා අස් කර ගන්න ඕනෑ?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම එය ඉල්ලා අස් කරගන්නවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හරි. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා කථාව කරගෙන යන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, 2013 ජනවාරි මාසයේ 11වන දා පාර්ලිමේන්තුවේ ඡන්දයක් තිබුණා. අපි බලන්න ඕනෑ ඒ ඡන්දය දෙන කොට මන්ත්‍රීවරුන්ගේ අරමුණ වුණේ මොකක්ද කියලා. What was the intention of the legislation? මොකක්ද ඒ යෝජනාවේ තිබෙන්නේ? 2013 ජනවාරි මාසයේ 11වන දා න්‍යාය පත්‍රයේ සඳහන් යෝජනාවේ තිබෙන්නේ මේකයි. ඔක්කෝම සඳහන් කරලා එහි අවසාන වශයෙන් සඳහන් කර තිබෙන්නේ, "...පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි ඉහත නම් සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අපි, ... යෝජනා කර සිටිමු." කියලායි.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ඒ ඉහත නම් සඳහන් මන්ත්‍රීවරු කියන්නේ කවුද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
You can speak later. ඇත්තටම එදා පාන්දර තුන වන තෙක් මේ යෝජනාව විභාග කළා. ඒ අවස්ථාවේ සියලු දෙනා නිදිමතේ හිටියේ. ඒක නේ ඇත්ත. එවකට ආණ්ඩුවට බහුතරය තිබුණු නිසා මොකක් හෝ දමා මේ යෝජනාව සම්මත කරමුය කියන මතයේ තමයි ඇත්ත වශයෙන්ම එදා ආණ්ඩු පාර්ශ්වය හිටියේ. ජනාධිපතිතුමා එදා අයිටීඑන් එකේ, ජාතික රූපවාහිනියේ කිව්වා, "2013 ජනවාරි මාසයේ 11 වෙනි දා සම්මත වුණේ තේරීම් කාරක සභාවක් පත් කිරීමේ යෝජනාවක්" කියා. ඒක ඇත්ත. මම දන්නේ නැහැ, මේ වැරැද්ද කවුරු කෙරුවාද කියා. නීතිඥ මහත්වරු කෙරුවාද, වෙන කවුරුවත් කෙරුවාද කියා මම දන්නේ නැහැ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඉදිරිපත් කළේ සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
සභානායකතුමනි, ඔබතුමා තමයි ඉදිරිපත් කෙරුවේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, රීති ප්‍රශ්නයක්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාගේ රීති ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මේ පිළිබඳව ඔබතුමා එදා තීන්දුවක් දුන්නා. ඒ තීන්දුවට විරුද්ධවයි අද මේ කථා කරන්නේ. ගරු කථානායකතුමාගේ තීන්දුවකට විරුද්ධව ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමාට කථා කරන්න බැහැ නේ?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒකටත් පිළිතුරු දීලා ඉන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මම එදා පාර්ලිමේන්තුවේදී නැඟිටලා කිව්වා, "පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි ඉහත නම් සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අපි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව යෝජනා කරමු." කියා. ඡන්දය දෙනකොට අරමුණ වන්නේ මොකක්ද? අරමුණ එන්නේ යෝජනාවෙන්. උසාවියට ගියාම වුණත් පනතක් සම්මත වුණාම අපි කථා කරන්නේ අරමුණ ගැනයි. What is the intention of the legislation? මොකක්ද අරමුණ? අරමුණ වුණේ තේරීම් කාරක සභාවක් පත් කිරීම. ගරු කථානායකතුමනි, එදා මේ යෝජනාව ඉදිරිපත් වුණාම මම ඔබතුමාට කිව්වා, "මේ යෝජනාව ඉදිරියට අරගෙන යන්න බැහැ." කියා. මම ඔබතුමාට එහෙම කිව්වේ නැද්ද? පසුව ඔබතුමා අපව ඔබතුමාගේ කාමරයට අඩගහලා එදා අපට කිව්වා, "මේක දැන් දුරදිග ගිහිල්ලා තිබෙන්නේ, මේක ආපස්සට හරවන්න බැහැ, අපි ඡන්දයට දමමු." කියා. මම ඔබතුමාට ඒ වෙලාවේ කිව්වා, "ඡන්දයට දාලා ප්‍රශ්නය විසඳනවා නම්, බහුතරය තිබුණු පළියට විවාදයක් මොකටද?" කියන කාරණය. මේක පැහැදිලි වැරැද්දක්. එදා ජනාධිපතිතුමා ජාතිය අමතනකොට කිව්වේ, "එදා පාර්ලිමේන්තුවේ සම්මත වුණේ ශිරානි බණ්ඩාරනායක ඉවත් කිරීමේ යෝජනාවක් නොවෙයි, තේරීම් කාරක සභාවක් පත් කිරීමේ යෝජනාවක්." කියා. ඒක ඇත්ත. මේ වාර්තා බැලුවාම එය සක් සුදක් සේ පැහැදිලියි. මේක කවුරු කෙරුවාද කියා අපි දන්නේ නැහැ. පාන්දර තුන වන තෙක් පිටු එක්දහස් ගණනක් අධ්‍යයනය කරන්නේ කොහොමද? අපි එදා මේවා පෙන්වා දුන්නා. මම නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාට කියනවා, රෑ අට වන තෙක් පාර්ලිමේන්තුවේ මේක කථා කරන්න ඕනෑ නැහැ කියා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිතුමා නේ, ජනාධිපතිතුමා. එතුමාගෙන් අහන්න කෝ. තමුන්නාන්සේලා අහන්න බයයි. [බාධා කිරීම්]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
මට විනාඩියක් දෙන්න. මේ විවාදය අපි ලබා ගත්තේ අතිගරු ජනාධිපතිතුමාට කරුණු ඉදිරිපත් කරලායි. එතුමා කිව්වා, "මේක විවාද කරන්න, කිසිම ප්‍රශ්නයක් නැහැ." කියා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
විවාද කරන්න. නමුත්, මම පුන පුනා කියන්නේ ශිරානි බණ්ඩාරනායක මැතිනිය අග්‍ර විනිශ්චයකාර ධුරයේ නැවත ස්ථාපිත කරන්න පියවර ගත්තේ පාර්ලිමේන්තුව නොවෙයි, අතිගරු ජනාධිපතිතුමා කියලායි. එතුමා එදා පාර්ලිමේන්තුවේ සිද්ධ වෙච්ච දේවල් දැක්කා. මේ වාර්තා බැලුවාම, ඒ වාගේම අපි ඉදිරිපත් කරපු තර්ක දිහා බැලුවාම එතුමාට පෙනුණා, එදා විශාල වැරැද්දක් සිද්ධ වෙලා තිබෙනවාය කියා. ශිරානි බණ්ඩාරනායක අග්‍ර විනිශ්චයකාරතුමිය ඉවත් කිරීමේ යෝජනාවක් නැතිව තේරීම් කාරක සභාවක් පත් කිරීමේ යෝජනාවක් සම්මත කරලා එතුමිය ඉවත් කරන්න පුළුවන්ද? අනික් එක, ශිරානි බණ්ඩාරනායක අග්‍ර විනිශ්චයකාරතුමියගේ සමු ගැනීමේ උත්සවය එදා පැවැත්වූවා. අතිගරු ජනාධිපතිතුමා ගත් තීරණය සාධාරණ වන්නේ ඒකට පිළිගැනීමක් තිබෙනවා නම්. එදා ජනාධිපතිතුමා ගත් තීරණය මුළු ශ්‍රේෂ්ඨාධිකරණයම පිළිගත්තා. මුළු ඇපැල් අධිකරණයම පිළිගත්තා. නීතිඥ මහත්වරු සියයට 99.9ක්ම පිළිගත්තා. අධිකරණ සේවා සංගමයේ සියලු විනිශ්චයකාරවරු ඒක පිළිගත්තා. Ultimately, what is important is whether this decision is accepted by the members of the legal fraternity. ඒ තීරණය සියලු දෙනාම වාගේ පිළිගත්තා. මම හිතන හැටියට එදා යෝජනාව ඉදිරිපත් කෙරුවේ අපේ නිමල් සිරිපාල ද සිල්වා සභානායකතුමා. එතුමාට කවුරු උපදෙස් දුන්නා ද මම දන්නේ නැහැ. හැබැයි, ශිරානි බණ්ඩාරනායක මැතිනිය අග්‍ර විනිශ්චයකාර ධුරයට පත් කරන්න තීරණය ගත්තේ අපි නොවෙයි, අතිගරු ජනාධිපතිතුමායි. අතිගරු ජනාධිපතිතුමා ඒ තීරණයට ආවේ, එදා 2013 ජනවාරි 11වන දා අපි ඉදිරිපත් කළ නීති තර්ක එතුමා කියෙව්වායින් පසුවයි. එදා විශාල වැරැද්දක් සිද්ධ වෙලා තිබෙන බව එතුමාට තේරුණා. ඒකයි එතුමා එදා ජාතික රූපවාහිනියේ කිව්වේ. මේ කාරණය මීට වඩා තර්ක කරන්න අවශ්‍ය නැහැ කියා මම හිතනවා. එම නිසා මගේ කථාව මම මෙතැනින් හමාර කරනවා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
Sir, I rise to a point of Order.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු කථානායකතුමනි, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා මෙම විවාදය සම්බන්ධ සමහර කරුණු හරියට අනාවරණය කළේ නැහැ. ගරු කථානායකතුමනි, මම අවධානය යොමු කරවනවා-

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
You can reply later.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
No. මට අවශ්‍ය මේ කාරණාව පැහැදිලි කරන්නයි. [බාධා කිරීම්] Sir, I rise to a point of Order.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Point of Order එක මොකක්ද?

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු කථානායකතුමනි, එදා ඒ සාකච්ඡාවේදී, ඒ යෝජනාව ස්ථිර කළ අවස්ථාවේදී ගරු නිමල් සිරිපාල ද සිල්වා හිටපු ඇමතිතුමා-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමාට කථාවක් තියෙනවා. ඒ අවස්ථාවේදී -

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
මට කථාවක් නැති නිසා මා මේ කාරණය මතු කළේ. [බාධා කිරීම්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම නම් පසුව -[බාධා කිරීම්] හොඳයි. ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මන්ත්‍රීතුමා.

[අ.භා. 2.39]

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින් පසු ගිය 30වන දා මේ පාර්ලිමේන්තුවේදී කරන ලද විශේෂ ප්‍රකාශයෙන් පැන නගින කරුණු සම්බන්ධයෙන් සහ ඒවාට අදාළව මේ විවාදයේදී කරුණු ඉදිරිපත් කිරීමට මම සූදානම් වෙනවා. ගරු කථානායකතුමනි, මට ලැබී තිබෙන කාලය මිනිත්තු 10ක් නිසාත්, මගේ ප්‍රකාශය යතුරු ලියන පිටු 9ක් දක්වා දිවෙන නිසාත් මගේ කථාව අවසානයේදී මේ සම්පූර්ණ ප්‍රකාශය සභාගත කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා මේ ගරු සභාවේ කරන ලද ප්‍රකාශය පදනම් කර ගෙන තමයි මේ විවාදය පැවැත්වෙන්නේ. එම නිසා මෙහිදී මගේ අවධානය යොමු කරන්නේ, එතුමාගේ ප්‍රකාශයෙන් පැන නගින කරුණු සම්බන්ධයෙන් සහ ඒ පැන නගින කරුණුවලට තාර්කික පදනමක් මත පිළිතුරු ඉදිරිපත් කිරීමටයි. ඒ අනුව, එතුමා මූලික වශයෙන් මතු කළ කාරණය මෙන්න මේ ආකාරයට සම්පිණ්ඩනය කර මා ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා. යෝජනාව ඉදිරිපත් කිරීම හා තේරීම් කාරක සභාව පත් කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107.(3) සහ ස්ථාවර නියෝග 78අ. අනුව සිදු වෙලා තිබෙනවා. එම යෝජනාවේ දීර්ඝ වශයෙන් කරුණු සඳහන් වෙනවා. එතුමා කළ ප්‍රකාශයේදී ඒක කොටස් දෙකකට බෙදුවා.

එකක් තමයි යෝජනා සම්මතය. තේරීම් කාරක සභාවේ නිර්දේශ වාර්තාවත් එක්ක ඉදිරිපත් කළාම ඊට සමගාමීව සිදු වන්නා වූ යෝජනා සම්මතය. ඒකේ මුල් කොටස තමයි මන්ත්‍රීවරු 117 දෙනෙකු විසින් අත්සන් කර ඉදිරිපත් කරන ලද මේ විමර්ශනය කිරීම සඳහා තේරීම් කාරක සභාවක් පත් කළ යුතුය කියන කොටස. මේ යෝජනාවේ මේ කොටස් දෙකම තිබෙනවා. ඒ අනුව තමයි 2013 ජනවාරි මාසයේ 11වන දා ඡන්දය විමසන අවස්ථාවේදී සභාව කල් තබා මේ සියලුම කරුණු සලකා බලා ගරු කථානායකතුමාගේ අවසාන තීරණය දැනුම් දුන්නේ. මේ ඡන්ද විමසීම කරන්නේ කුමටද? ඡන්ද විමසීම කරන්නේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු කමිටුවේ වාර්තාව පදනම් කර ගෙන ස්ථාවර නියෝග යටතේ මසක කාලයක් දීලා, මසක කාලය අවසන් වුණායින් පස්සේ විවාද කර මේ සභාවේ ඒ යෝජනාව සම්මත කිරීම සිදු කරන නිසා.

ඊළඟට, ගරු අග්‍රාමාත්‍යතුමාගේ කථාව අරගෙන එහි මුල් කොටස බැලුවාම ඉතාම පැහැදිලිව සඳහන් වෙනවා, -එතුමා කියනවා- තේරීම් කාරක සභාවක් පත් කිරීම සඳහා නැවත ඡන්ද විමසීමක් කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ කියා. එතුමාගේ කථාවේ දෙවන පිටුවේ හතරවන ඡේදයේ ඉතාමත් පැහැදිලිව සඳහන් වෙනවා, "නිරායාසයෙන්ම සිදු වන්නක්" කියා. ඒ කියන්නේ ස්ථාවර නියෝග 78අ.(2) යටතේ තේරීම් කාරක සභාවක් පත් කිරීම නිරායාසයෙන්ම සිදු වන්නක්. "එසේ කිරීම සඳහා වෙනමම යෝජනාවක් අවශ්‍ය වෙන්නේ නැහැ" කියා තිබෙනවා. මේ, එතුමාගේ ප්‍රකාශයේ එක තැනක කියන කාරණයක්. එසේ කියන ගමන්, මේ යෝජනාව කොටස් දෙකක් හැටියට අරගෙන, එතුමාගේ ප්‍රකාශයේ 4වන පිටුවේ කියා තිබෙනවා, දෙවන කොටස ක්‍රියාත්මක වෙලා නැහැ; ඒ නිසා අවසාන ඡන්ද විමසීම පැවැත්වුවේත් තේරීම් කාරක සභාවක් පත් කිරීම සඳහාය කියලා. එතකොට එතුමාම කියනවා, නිරායාසයෙන්ම කමිටුව පත් වෙනවාය කියලා. ඊට පසුව එතුමාගේ ප්‍රකාශයේ අවසාන භාගයේදී නැවත කියනවා, තේරීම් කාරක සභාවට තමයි අවසාන ඡන්ද විමසීම කළේ කියලා. ඒ අනුව ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රකාශයේම තැන් දෙකක කරුණු පරස්පර විරෝධී වෙනවා.

ගරු කථානායකතුමනි, මම දීර්ඝ වශයෙන් ඊළඟ කරුණු කියන්න යන්නේ නැහැ. කරුණු හැටියට පමණක් කියනවා. මම දෙවන කාරණය කියන්නම්. තේරීම් කාරක සභාව සමන්විත වූයේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් 6 දෙනෙක් සහ විපක්ෂයේ මන්ත්‍රීවරුන් 4 දෙනෙකුගෙන්. මෙම ස්ථාවර කාරක සභාව

විපක්ෂය පිළිගත්තා. ඒ නිසා තමයි විපක්ෂය තේරීම් කාරක සභාවට සහභාගි වුණේ. මේ තේරීම් කාරක සභාව හිටපු අග විනිසුරුතුමිය සහ නීතිඥ කණ්ඩායමත් පිළිගත්තා. ඒ නිසා තමයි ඒ අය දින තුනක් තේරීම් කාරක සභාව ඉදිරියට ආවේ. හැබැයි ඉන් පසුව ඒ අය ආවේ නැහැ. එයින් ඉවත් වෙලා ගියා. ඒ සමඟම විපක්ෂයේ මන්ත්‍රීවරුත් ඉවත්ව ගියා. නමුත් තේරීම් කාරක සභාව දිගටම පවත්වාගෙන ගියා. එහෙම නම් තේරීම් කාරක සභාව ස්ථාපනය වූ බවත්, තේරීම් කාරක සභාව පිළිගන්නා බවත් විපක්ෂය සහ අගතියට පත් පාර්ශ්වය කියන ඒ දෙපාර්ශ්වයම පිළිගත්තා. එහෙම නම් මොකටද අපි තේරීම් කාරක සභාවක් පත් කරන්න නැවතත් අවසාන ඡන්ද විමසීමක් කරන්නේ? එයින්ම ගම්‍යමාන වෙනවා, අවසාන ඡන්ද විමසීම පැවැත්වූයේ මේ නිර්දේශය -වාර්තාව- ඉදිරිපත් කරලා ඒ වාර්තාව මේ ගරු සභාවේ යෝජනා සම්මතය කිරීම සඳහා බව.

ඊළඟ කාරණය තමයි, ගරු අග්‍රාමාත්‍යතුමාගේ කථාවේ 4වන පිටුවේ සඳහන් කරනවා, ස්ථාවර නියෝග 78.අ (6) යටතේ වාර්තාවක් මේ ගරු සභාවට ඉදිරිපත් වුණේ නැහැ කියා. ඒක එතුමාගේ ප්‍රකාශයේ සඳහන් වෙනවා. එහෙම නම් ගරු කථානායකතුමනි, ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමාගේ සභාපතිත්වයෙන් තිබූ තේරීම් කාරක සභාවේ, ඔබතුමාගේ කාර්ය මණ්ඩලය සකස් කළ, 2012.12.08 දිනැති පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 187 වෙළුම I හා වෙළුම II කියන්නේ මොකක්ද? ඒක වාර්තාව නොවෙයිද? ගරු අග්‍රාමාත්‍යතුමා කියනවා, වාර්තාවක් ඉදිරිපත් කරලා නැහැ කියා. ඒක වාර්තාවක් නොවෙයි නම් පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 187 වෙළුම I හා වෙළුම II කියන්නේ මොකක්ද කියා මම ප්‍රශ්න කරනවා. මම උපුටනයන් ගන්නේ ඒවායින්මයි.

ඊළඟට, තේරීම් කාරක සභාවේ නිර්දේශ අනුව පාර්ලිමේන්තුවෙන් මේ සඳහා නියමිත ආකාරයෙන් පියවර අරගෙන තිබෙනවා. ඊළඟට, ස්ථාවර නියෝග 78(අ) අනුව ඉදිරිපත් කළ යෝජනාවේ මේ කොටස් ටික අඩංගු වෙනවා.

(1) තේරීම් කාරක සභාවක් පත් කිරීම.

(2) එම තේරීම් කාරක සභාවේ තීරණය අනුව වාර්තාවක් ඉදිරිපත් කිරීම.

(3) එම වාර්තාවේ නිර්දේශ අනුව පාර්ලිමේන්තුවේ යෝජනාවක් සම්මත කිරීම.

(4) එම යෝජනා සම්මතය ස්ථාවර නියෝග 78 (අ) 7 අනුව අතිගරු ජනාධිපතිතුමා වෙත කථානායකතුමා විසින් දන්වා යැවීම.

මේ සියලු කරුණු සැලකිල්ලට අරගෙන තමයි කථානායකතුමාගේ අවසාන තීන්දුව ප්‍රකාශ කරලා ඉන් පසුව ඡන්ද විමසීම සිදු කරනු ලැබුවේ.

ඊළඟට, 43වන අග විනිසුරුතුමිය ධූරයෙන් ඉවත් කිරීමේ පටිපාටිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107(2), 107(3) සහ ස්ථාවර නියෝග 78(අ) අනුව සිදු වෙලා තිබෙනවා. කිසිම දෝෂයක් නැහැ.

ඊළඟට, එම යෝජනා සම්මතයේ තීරණය ස්ථාවර නියෝග 78(අ)(7) අනුව ගරු ජනාධිපතිතුමා වෙත දන්වා යවා තිබෙනවා. ඒකත් නිවැරදිව සිදු වෙලා තිබෙනවා. එම දැන්වීම අනුව හිටපු අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107(2) යටතේ 43 වන අග විනිසුරුතුමිය ධූරයෙන් ඉවත් කර තිබෙනවා. ඒකත් ව්‍යවස්ථානුකූලව කර තිබෙනවා.

ඊළඟට, 2013.01.13 දින වන විට ශ්‍රේෂ්ඨාධිකරණයේ අග විනිසුරු ධූරය හිස් වෙලා තිබෙනවා. ඒ හිස් වූ ධූරයට 44වන අග විනිසුරු මොහාන් පීරිස් මහතා විධිමත්ව පත් කර තිබෙනවා. ඒ

නිසා ගරු අග්‍රාමාත්‍යතුමා 30වැනි දා කරපු ප්‍රකාශය මත එළඹිය හැකි නිගමන මොනවාද?

(1) ගරු අග්‍රාමාත්‍යතුමාට මෙම ප්‍රකාශය කිරීමට පදනම් වූ නෛතික හා සෙසු කරුණු උපකල්පන මත සිය පාණ්ඩිත්‍යය හුවා දැක්වීමට නීති විශාරදයින් යයි කියා ගන්නා අය විසින් හෝ නීතිඥ සංගමය නියෝජනය කරමින් සිය මතය තහවුරු කර ගැනීමට මුල සිටම උත්සාහ දැරූ පිරිසකගේ බලපෑමට යටත්ව ගනු ලැබූ තීරණ සාධාරණීකරණය කිරීමට කරන ලද ප්‍රකාශයක් බව;

(2) ගරු අග්‍රාමාත්‍යතුමාගේ මෙම ප්‍රකාශය තුළම ප්‍රධාන කරුණ සම්බන්ධයෙන් එනම්, පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් සිදු වූවාද යන්න සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 (2), 107 (3) හා ස්ථාවර නියෝග 78 (අ) සම්බන්ධයෙන් පරස්පර විරෝධයක් ඇති බව;

(3) මා ඉහතින් දැක්වූ කරුණු හා තර්ක මත 43වන අගවිනිසුරු ඉවත් කිරීම හා 44වන අගවිනිසුරු පත් කිරීම ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට එකඟව සිදු කොට ඇති බව;

(4) එම නිසා අග විනිසුරු ධූරය හිස්ව නොතිබුණි යන තර්කය ප්‍රතික්ෂේප කරනු ලබන බව;

(5) එම නිසා 2015.01.29 හෝ ආසන්න දිනක දී 43 අගවිනිසුරු නැවත සේවයට පැමිණ විශ්‍රාම යාම සම්පූර්ණයෙන්ම විධි විරෝධී හා ව්‍යවස්ථා විරෝධී බව;.

(6) ක්‍රියා දාමය මේ අයුරින් වන නිසා 45වන අගවිනිසුරු පත් කිරීම ද යමකුට ව්‍යවස්ථානුකූල ද යන්න ප්‍රශ්න කිරීමේ හැකියාවක් ඇති බව;.

(7) 44 වන අග විනිසුරු ධූරය දරමින් 2013.01.13 දින සිට 2015.01.28 දින දක්වා දෙන ලද තීරණ, නියෝග ප්‍රශ්න කිරීමට ලක් වනු ඇත. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 119(2) මඟින් අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රකාශය අනුව "නිර්බල නොවන්නේය" යන්න පිළිගත නොහැකි බව;

හේතුව 119(2) වන ව්‍යවස්ථාව කියවන්න ඕනෑ, 119(1) වන ව්‍යවස්ථාවත් එක්කයි.

(8) ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් පමණක් කළ යුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව අර්ථ නිරූපණ ඇතුළු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 118 වන ව්‍යවස්ථාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකරණ බලය, එසේ බලය නැති අය විසින් ක්‍රියාත්මක කළාද යන ප්‍රශ්නය මතු වන බව.

(9) වර්තමාන ජනාධිපතිතුමා නොමඟ යවා ඇති බව;

(10) අනාගතයේ යම් දිනයක මෙම සමස්ත ක්‍රියා දාමයම එනම් ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රකාශය හා ඊට පදනම් වූ කරුණු ව්‍යවස්ථාදායකය විසින් හා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නැවත සමාලෝචනයකට ලක් කිරීමට ඉඩ ඇති බව;

(11) පාර්ලිමේන්තුවේ උත්තරීතර භාවය අභියෝගයට ලක් කර ඇති බව;

(12) ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රකාශය 44වන අග විනිසුරු මොහාන් පීරිස් සම්බන්ධයෙන් ද්වේශ සහගතය, ව්‍යාජය, සාවද්‍යය. එය එම ප්‍රකාශයේ අන්තර්ගතයෙන් ද එම ප්‍රකාශයේ 5වන පිටුවේ 4වන ඡේදයේ සඳහන් අන්තර්ගතයෙන් ද, එම ප්‍රකාශයේ 5වන පිටුවේ 4වන ඡේදයේ සඳහන් 2015.01.21 දින ජනාධිපති ලේකම්ගේ දැනුම් දීම අනුව මොහාන් පීරිස් මහතා සම්බන්ධයෙන් වූ සඳහන පරස්පර විරෝධි වී ඇති බව;

(13) තම ප්‍රකාශය අනුව, අග විනිසුරු ධූරය හිස්ව තිබුණා නම්, 44වන අග විනිසුරුට ඉල්ලා අස්වැන්නැයි කීවේ ඇයි ද යන්න;

(14) මොහාන් පීරිස් මහතාගේ හැසිරීම අග විනිසුරු ධූරයට නොගැලපේ නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107(2) වන ව්‍යවස්ථාව යටතේ කටයුතු කළ හැකිව තිබුණු බව;

(15) මොහාන් පීරිස් මහතාගේ හැසිරීම එලෙස නම් තානාපති ධූරයට සුදුසු වූයේ කෙසේද යන බව?

ඒ අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රකාශය අනුවමයි.

(16) 43වන අග විනිසුරුතුමියගේ ස්වාමි පුරුෂයා සම්බන්ධයෙන් ප්‍රශ්න කළේ වෙනින් කවුරුවත් නොව, තමුන්නාන්සේලාගේ ආර්ථික කටයුතු පිළිබඳ නියෝජ්‍ය අමාත්‍ය ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමායි. එය වෙළුම 208, 2012.05.23 දින හැන්සාඩ් වාර්තාවේ තීරු 952-960 තීරුවල සඳහන් වෙනවා.

(17) 44වන අග විනිසුරු ලෙස මොහාන් පීරිස් මහතා හැර වෙනත් අයකු පත් වූයේ නම් තත්ත්වය කෙසේද? ඒත් මෙසේම ද? එසේ නොවේ නම් වෙනස් වන්නේද යන බව; ඒ ප්‍රශ්නයටත් තමුන්නාන්සේලා පිළිතුරු දෙන්න.

(18) මෙම රජය අධිකරණයේ ස්වාධීනත්වය බලපෑමක් කර තිබෙනවා. මෙය පොරොන්දු වූ යහපාලනය යන බව;

(19) ගරු අග්‍රාමාත්‍යතුමා, හිටපු අග විනිසුරු නෙවිල් සමරකෝන් මහතා ඉවත් කිරීමේදී විමර්ශනය අතරතුර එතුමාට ඉල්ලා අස්වීමට පසු බිම සැකසූ සිය පූර්වගාමීන්ගේ ආදර්ශය ලබා ගෙන එය අසාර්ථක වූ විට වර්තමාන ජනාධිපතිතුමා නොමඟ යවා විධායක බලය පාවිච්චි කර ඇති බව සමස්ත ප්‍රකාශය කියවූ විට පැහැදිලි වන බව;

ඉතිහාසයේ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන්ට එරෙහිව උද්ඝෝෂණය කර අත් දැකීම් ඇති පක්ෂයක ඉහත දැක්වූ ලෙස තමන් විසින්ම පත් කළ අගවිනිසුරු නෙවිල් සමරකෝන් මහතා ඉවත් කිරීමට ගත් පියවර නැවත සිහි ගන්වමින් ඔවුන් තමන්ගේ අතීතය වෙනස් කිරීමට සූදානම් නැති බවත් අධිකරණය බිය ගන්වා, ජනතාව බිය ගන්වා ගෙන යන එදා ධර්මිෂ්ට පාලනය වෙනුවට අද යහපාලන කඩතුරාවවට මුවා වී ගෙන යන පාලනයක ආරම්භය සනිටුහන් කළ බව ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රකාශයෙන්ම සනාථ කර ඇති බව අවසාන වශයෙන් ප්‍රකාශ කරමි.

ගරු කථානායකතුමනි, මා මුලින් සඳහන් කළ පරිදි මගේ මේ කථාවට අදාළ ලියැවිල්ල **සභාගත*** කරනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මීළඟට ගරු සජිත් ප්‍රේමදාස මහතා

[අ.භා. 3.26]

ගරු සජිත් ප්‍රේමදාස මහතා (නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - வீடமைப்பு மற்றும் சமுர்த்தி அமைச்சர்)
(The Hon. Sajith Premadasa - Minister of Housing and Samurdhi)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මෙය, මේ රටේ අධිකරණයේ ස්වාධීනත්වය කේන්ද්‍ර කර ගත් කටයුතු ගණනාවක් පිළිබඳව සාකච්ඡා වන මොහොත. මම මතක් කරන්නට කැමැතියි, මොන්ටෙස්කිව් කියන ව්‍යවස්ථාදායක ක්ෂේත්‍රය පිළිබඳ දාර්ශනිකයාගේ බලතල පංගු කිරීමේ න්‍යාය ක්‍රියාත්මක වුණේ ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය අතර පැහැදිලි බලතල බෙදීමක්, බල තුලනයක් ක්‍රියාත්මක කරලා ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමේ දර්ශනයක් මත බව. ඒක තමයි ඒ මොන්ටෙස්කිව් දාර්ශනිකයා ලෝකයාට ඉදිරිපත් කළේ.

ස්වාධීන අධිකරණයක් පැවැත්වීම අතිශයින්ම වැදගත් කාරණාවක්. ඒ වාගේම වටිනා කාරණාවක්. අධිකරණයේ ස්වාධීනත්වය ප්‍රජාතන්ත්‍රවාදයේ පදනමට අතිශයින්ම වැදගත් වනවා. ඕස්ට්‍රේලියාවේ 10වැනි අග්‍ර විනිශ්චයකාර ශ්‍රීමත් ජෙරාඩ් බ්‍රෙනන් මැතිතුමා මෙහෙම කියනවා.

"Judicial independence does not exist to serve the judiciary; nor to serve the interests of the other two branches of government. It exists to serve and protect not the governors but the governed".

"අධිකරණයේ ස්වාධීනත්වය පවතිනුයේ අධිකරණයට සේවය කිරීම පිණිස හෝ ආණ්ඩු ක්‍රමයේ අනෙකුත් අංශ දෙකට සේවය කිරීම පිණිස නොව, එය පවතිනුයේ පාලකයාට වඩා පාලිතයා වෙත සේවය සලසමින් ඔහු ආරක්ෂා කිරීමටය"

ගරු කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 වන ව්‍යවස්ථාවට අනුව විනිශ්චයකරුවන් පත් කරන්න පුළුවන්; ඉවත් කරන්න පුළුවන්. 2012 නොවැම්බර් පළමුවැනි දා මන්ත්‍රීවරු 117 දෙනෙක් යෝජනාවක් ඉදිරිපත් කළා, එවකට සිටි අග්‍ර විනිශ්චයකාරවරියට විරුද්ධව. එලෙස දෝෂාභියෝගයක් ඉදිරිපත් කරලා නොවැම්බර් 06වැනි දා එය පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරලා, නොවැම්බර් 14 වැනි දා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළා. ස්ථාවර නියෝග 78අ. යටතේ චෝදනා 14ක් ඉදිරිපත් කරලා, එයින් තුනකට එවකට සිටි අගවිනිසුරුවරිය වැරදිකාරිය බවට පත් කළා. ඒ වාගේම ඒ පාර්ලිමේන්තු විශේෂ කාරක සභා වාර්තාව 2012 දෙසැම්බර් 08වැනි දා පාර්ලිමේන්තුවට ඉදිරිපත් වුණා. 2013 වර්ෂයේ ජනවාරි 10වැනි දා, 11වැනි දා ඒ කරුණ විවාදයට ගත්තා. විශේෂ කාරක සභාව පත් කිරීමට ගත් යෝජනාව එදා පාර්ලිමේන්තුව සම්මත කළා. ගරු කථානායකතුමනි, නමුත් කරන්න තිබුණේ එය නොවෙයි. අග්‍ර විනිශ්චයකාරවරිය ඉවත් කිරීම ඉලක්ක කරගත් යෝජනාවක් මේ උත්තරීතර සභාවට ඉදිරිපත් විය යුතුව තිබුණා. විශේෂයෙන්ම එදා අනුගමනය කළ ක්‍රමවේදය අතිශයින්ම දෝෂ සහිතයි.

ස්ථාවර නියෝගවල 78අ. (5) සහ (6) දෙස බලන කොට ගරු කථානායකතුමනි, මේ ස්ථාවර නියෝගවලට අනුව පාර්ලිමේන්තු සභාවට එදා ඉදිරිපත් වුණේ වාර්තාව පමණයි. නමුත් මේ ස්ථාවර නියෝගවල තිබෙනවා, සාක්ෂිත් ඉදිරිපත් කරන්න ඕනෑය කියලා. මම හිතන හැටියට එදා දින තුන, හතරක දිවා රෑ ක්‍රියාවලිය තුළ සාක්ෂි ඉදිරිපත් කිරීමට බැරි වුණා. එපමණක් නොවෙයි, ගරු කථානායකතුමා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු එකී යෝජනාව විධිමත්ව ජනාධිපතිවරයාට ඉදිරිපත් කරලා තිබුණේ නැහැ. මෙන්න මේ දෝෂ සහිත තත්ත්වය නිසා පැහැදිලිවම එදා ස්ථාවර නියෝග උල්ලංඝනය වුණා. ඒ වාගේම, එදා ක්‍රියාත්මක වුණු ක්‍රියාවලිය ව්‍යවස්ථා විරෝධී ක්‍රියාවලියක්, ස්ථාවර නියෝගවලට පටහැනි වූ ක්‍රියාවලියක් නිසා, අග්‍ර විනිශ්චයකාරවරිය ඉවත් කිරීම අපි කිසිසේත්ම එදා පිළිගත්තේත් නැහැ, අද පිළිගන්නේත් නැහැ, හෙට දවසේ පිළිගන්නේත් නැහැ.

එවකට ගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ශිරානි බණ්ඩාරනායක අග්‍ර විනිශ්චයකාරතුමිය ඉවත් කළේ, ව්‍යවස්ථා විරෝධී පදනමක් තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අමු අමුවේ උල්ලංඝනය කරලා. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අමු අමුවේ උල්ලංඝනය කරලා. අද අපට ඇහෙනවා, පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය රකින්න ඕනෑ, පාර්ලිමේන්තුවේ ස්වෛරීත්වය රකින්න ඕනෑ කියලා කථා කරනවා. පාර්ලිමේන්තුවේ ක්‍රියාකාරකම් වෙනුවෙන් ස්ථාවර නියෝග තිබෙනවා. උත්තරීතරයි, උත්තරීතරයි, උත්තරීතරයි කියලා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග උල්ලංඝනය කරන්නට පාර්ලිමේන්තුවට හැකියාවක් තිබෙනවාද? මේ පාර්ලිමේන්තුවට එහෙම ක්‍රියා කරන්න පුළුවන් ද?

ගරු කථානායකතුමනි, නෛතික පිරුළක් තිබෙනවා, *Lex non a rege est violanda* - the law must not be violated even

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

by the King" - "නීතිය රජු විසින් පවා උල්ලංඝනය නොකළ යුතුයි" කියලා. මේවා ලෝකය පුරාවට ක්‍රියාත්මක වෙන නෛතික සම්ප්‍රදායයන්. අපි එක එක්කෙනාට හිතුමතයට, පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් තිබුණාය කියලා, රටේ පළාත් සභා බලය තිබුණාය කියලා අපට ඕනෑ ඕනෑ විධියට හැසිරෙන්නට බැහැ. [බාධා කිරීම්] එලෙස හැසිරුණු ගුණාංගයන් තුළ, එලෙස හැසිරුණු රටාව තුළ අද විවිධ පුද්ගලයන්ට ඒ හැසිරීම් රටාවේ ඵල විපාක අත්විඳින්න සිදු වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මට කුතුහලයක් තිබෙනවා, මේ ව්‍යවස්ථා විරෝධී ක්‍රියාවලිය, මේ ස්ථාවර නියෝගවලට පටහැනිව ක්‍රියාත්මක වුණු ක්‍රියාවලිය එදා පාලක පක්ෂය -ආණ්ඩු පක්ෂය- අවබෝධ කර ගත්තේ නැත්තේ ඇයි කියලා. ඒ නොහැකියාවද, අනවබෝධයද, ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන පිළිබඳව නොදැනුවත්කමද, කියවීමේ නොහැකියාවද, සාක්ෂරතාවයේ යම් කිසි ඌනතාවක්ද? එහෙම නැත්නම් ආඥාදායකත්වය උපයෝගි කරගෙන, ඒකාධිපතිත්වය උපයෝගි කරගෙන හදිසියේම ඒ අග්‍ර විනිශ්චයකාරතුමිය ඉවත් කිරීම හිතාමතාම ව්‍යවස්ථාව අමු අමුවේම උල්ලංඝනය කිරීමක් නොවෙයිද? රටේ ජනතාව මේ පිළිබඳව හොඳින් දන්නවා ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, උත්තරීතර යැයි කියපු මේ පාර්ලිමේන්තුව එදා පැහැදිලිවම කැන්ගරු උසාවියක් බවට පත් වුණා. ස්වාභාවික යුක්තියේ මූලධර්ම - the rules of natural justice - පැහැදිලිවම, බරපතළ විධියට උල්ලංඝනය කළා. පක්ෂපාතිත්වය මුදුන්පත් කර ගෙනයි කටයුතු කළේ. පැහැදිලි සවන් නොදීමක් ක්‍රියාත්මක වුණා. නින්දා, අපහාස ක්‍රියාත්මක වුණා. පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ පරුෂ වචන පාවිච්චි කළා. ගරු කථානායකතුමනි, කනගාටුවෙන් හෝ කියන්නට ඕනෑ, පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය ගැන කවුරු කථා කළත්, එදා ආඥාදායකත්වයත්, ඒකාධිපතිත්වයත් රජ වුණ බව. ඒකයි සත්‍යය. විශේෂයෙන්ම පාර්ලිමේන්තුවේ බහුතරය උපයෝගි කර ගනිමින් ස්ථාවර නියෝග, ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන සියල්ලක්ම උල්ලංඝනය කරමින් එදා මේ සභාව තුළ කැලෑ නීතිය රජ වුණා. ඒකයි සිද්ධ වුණේ. එදා කැලෑ නීතිය රජ වුණු යුගයේ සිටි බොහෝ දෙනා අද සාධාරණත්වය ගැන කථා කරනවා; ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා; යුක්තිය ගැන කථා කරනවා. කථා කිරීමේ අයිතිය තිබෙනවා, භාෂණයේ අයිතිය තිබෙනවා. නමුත් කථාවට වඩා අප ඒවා ක්‍රියාවට නංවන්නට ඕනෑ.

ගරු කථානායකතුමනි, පසු ගිය දවස්වල මේ ක්‍රියාවලිය කොහොමද ක්‍රියාත්මක වුණේ? වර්තමාන ජනාධිපති ශ්‍රීමත් අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා, අපේ ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් සමඟ සාකච්ඡා කරලා, ප්‍රවීණ නීතිවේදීන්, ව්‍යවස්ථාව පිළිබඳ විශේෂඥයන්, නීතිපතිතුමා යන ඒ සියලු දෙනාගේම අදහස් ලබා ගෙනයි, මේ ඓතිහාසික, ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම නිවැරදි කළේ.

ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු කේ. ශ්‍රීපවන් මැතිතුමා අග්‍රවිනිශ්චයකාරතුමා හැටියට පත් කළේ කවුද? මෛත්‍රීපාල සිරිසේන මැතිතුමායි. අද මොකක්ද, විපක්ෂයේ - ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ - සාමාජික, සාමාජිකාවන් මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ කියන්නේ? එතුමන්ලා කියනවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකතුමාව -අතිගරු ජනාධිපතිතුමාව - නොමඟ යැව්වාලු. එතකොට වෙනත් විධියකට තමුන්නාන්සේලා කියන්නේ, මෛත්‍රීපාල සිරිසේන ශ්‍රීමතාණන් කියන්නේ කරුණක් පිළිබඳව පැහැදිලිව තොරතුරු හොයා ගෙන, අවබෝධයෙන්, පැහැදිලිව, පිරිසිදුව තීන්දුවක්, තීරණයක් ගන්නට බැරි මොළේ කලඳක්වත් නැති, බුද්ධියක්, ඥානයක් නැති පුද්ගලයකු කියලායි. ඔබලාගේම පක්ෂයේ නායකතුමාව එවැනි පුද්ගලයකු ගානට දා කථා කිරීම මම දකිනවා, චින්තන කොන්ත්‍රාත්තුවක් හැටියට. මේක චින්තන කොන්ත්‍රාත්තුවක්. මම පැහැදිලිවම කියනවා, විරුද්ධ පාර්ශවයේ නායකවරයා හැටියට නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමන්, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා හැටියට ජෝන් සෙනෙවිරත්න මැතිතුමන් මේ කරන්නේ කොන්ත්‍රාත්තුවක්.

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
නැහැ, නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මේ කොන්ත්‍රාත්තුව- [බාධා කිරීම්] තමන්ගේ නායකයාට මඩ ගහන කොන්ත්‍රාත්තුවක්. ඒ නිසා තමයි කියන්නේ, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට තීන්දුවක්, තීරණයක් ගන්නට බුද්ධියක්, ඥානයක් නැහැ; හැකියාවක් නැහැ; වුවමනාවක් නැහැ කියලා. [බාධා කිරීම්] හැබැයි, "සිරිසේන ආවොත් කොටියා දිනනවා, සිරිසේන ආවොත් ත්‍රස්තවාදීන් දිනනවා, සිරිසේන ආවොත් රට විනාශ වෙනවා"යි එදා කියපු මේ විපක්ෂය අද එතුමා ළඟට ගිහින් එතුමාගේ සෙරෙප්පු සුප් බොනවා. [බාධා කිරීම්] ඒකයි සිද්ධ වෙලා තිබෙන්නේ. [බාධා කිරීම්] එතුමාගේ සෙරෙප්පු සුප් බොනවා. [බාධා කිරීම්] ඒකයි ඇත්ත. [බාධා කිරීම්] ඒකයි සත්‍යය. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා,-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මුලසුන ගන්නවා ඇති.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.

Whereupon MR. SPEAKER left the Chair, and MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *took the Chair.*

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමා, කථාව කරන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පැහැදිලිවම සඳහන් කළේ ශ්‍රී පවන් මැතිතුමාව අග්‍ර විනිශ්චයකාරවරයා හැටියට පත් කළේ රටේ ජනාධිපතිවරයා හැටියට ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා බවයි. ශ්‍රී පවන් මැතිතුමාගේ පත්වීම වැරදියි කියලා ඔබතුමන්ලා අභියෝග කරනවා නම්, ඔබතුමන්ලා කියනවා නම්,- [බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
ඔව්, කියනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එතුමාව පත් කිරීම වැරදියි කියලා,- [බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
වැරදියි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එහෙම නම් ඔබතුමන්ලා ඇඟිල්ල දික් කරන්නේ ඔබතුමන්ලාගේම පක්ෂයේ නායකතුමාට. එහෙම නම් ඔබතුමන්ලා ඇඟිල්ල දික් කරන්නේ රටේ ජනාධිපතිතුමාටයි. ඒකයි ඇත්ත කථාව. වැරදියි කියලා කියනවා නම්, කොන්දක් තිබෙනවා නම් නමත් එක්ක පළවෙන්න තමුන්නාන්සේලා කියන්න, "වැරදියි" කියලා. හැංගිලා නිකම් "වැරදියි" කියන්න එපා. භය නැතුව කියන්න, "වැරදියි" කියලා. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ශ්‍රී පවන් මැතිතුමාව පත් කළ විධිය වැරදියි කියලා කියනවා නම් කොන්ද කෙළින් තබා ගෙන නැඟිටලා කියන්න. නැඟිටලා කියන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- [බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
වැරදියි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සභාව කල් තැබීමේ විවාදය ඉදිරිපත් කළ නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා අස්වාභාවික විධියට, බොහොම කෙටි කථාවක් කළේ. [බාධා කිරීම්] අපේ ජෝන් සෙනෙවිරත්න මැතිතුමා බොහොම කෙටි කථාවක් කළේ. සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා වග බලා ගත්තා, බොහොම කෙටියෙන් කථා කරන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා, තමුන්නාන්සේලා අද දවසේවත් ජනාධිපතිවරණය ජයග්‍රහණය කළ පුද්ගලයාට නින්දා කරන එක නතර කරන්න; අපහාස කරන එක නතර කරන්න කියලා. [බාධා කිරීම්] තමුන්නාන්සේලා පරාජය පිළිගෙන තිබෙන්නේ. [බාධා කිරීම්] එදා "අයියෝ සිරිසේන", "බයියෝ සිරිසේන" ගෑවා නේද? ඒ නිසා- [බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! ගරු ඇමතිතුමා කථා කරන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
තමුන්නාන්සේලාගේ පාර්ලිමේන්තු කණ්ඩායම් රැස්වීමේ- [බාධා කිරීම්]

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, what is your point of Order?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු ඇමතිතුමා, ඒක මැතිවරණ වේදිකාවේ ඔබතුමා කථා කළාද? පරදිනකම් බලා ගෙන-

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
That is not a point of Order. ගරු ඇමතිතුමා කථා කරන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීතුමන්ලාගෙන් මම ඉල්ලීමක් කරනවා, තමන්ගේ පාර්ලිමේන්තු කණ්ඩායම් රැස්වීමට ගිහින් එක දෙයක් කියලා, මෙතැන ඇවිත් බොරුවට තමන්ගේම ජනාධිපතිතුමාට, තමන්ගේම පක්ෂයේ නායකතුමාට ඇඟිල්ල දික් කරන එක නතර කරන්න කියලා. කොන්දක් තිබෙනවා නම් පාර්ලිමේන්තු කණ්ඩායම් රැස්වීමට ගිහින් තමුන්නාන්සේලා කථා කරන්න. ඒකයි මම කියන්නේ. නිකම් බොරුවට විරුද්ධයි කියනවා: වැරැදියි කියනවා. තමුන්නාන්සේලාගේ කොන්ද කෙළින් තිබෙනවා නම් තමුන්නාන්සේලාගේ වෙලාවෙන් අරගෙන කථාවේ දී කියන්න මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා කළ දේ වැරැදියි කියලා. මම අභියෝග කරනවා. [බාධා කිරීම්] මම අභියෝග කරනවා. [බාධා කිරීම්] නිකම් බොරුවට කෑ කෝ ගහන්නේ නැතිව ඉන්න.

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
ඒක වැරැදියි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- [බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
ඒක වැරැදියි. [බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please!ගරු ඇමතිතුමාගේ කථාවට බාධා කරන්න එපා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මෙම සභා ගර්භය තුළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ හැසිරීම් රටාව සහ mike එකේ හඬ නොවැටෙන ආකාරයට එල්ල කරන කරුණු කාරණා තුළ අපිට පැහැදිලිවම තේරෙනවා මෛත්‍රීපාල සිරිසේන අතිගරු ජනාධිපතිතුමාට අභියෝගයක් එල්ල කරන්නට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් අද කටයුතු කරමින් සිටින බව. ඒක කනගාටුවට කාරණාවක් වෙනවා. තමුන්නාන්සේලා වන්දිභට්ටකම් කරලා, එතුමා ළඟ වැඳ වැටිලා එතුමාගෙන් සමාව ඉල්ලන්නට කොච්චර උත්සාහ කළත් මතක තබා ගන්න, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ජයග්‍රහණයට ලොකුම හයිය ලබා දුන්නේ එක්සත් ජාතික පක්ෂයයි, අනෙකුත් පක්ෂයි කියන එක.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපිට පෙනෙනවා දිව දෙකේ දේශපාලන සංදර්ශනය. දිව දෙකේ සංදර්ශනය. ජනාධිපතිවරණය කාලයේ "චින්තන සරණං ගච්ඡාමි, චින්තන සරණං ගච්ඡාමි."

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයෙක් තමයි නායකයා වුණේ. [බාධා කිරීම්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
සිරිසේන කොටියයි කිව්ව තමුන්නාන්සේලා, ජනාධිපතිවරණයෙන් පස්සේ "සිරිසේන සරණං ගච්ඡාමි." ලජ්ජයි. දිව දෙකේ දේශපාලනය. කොන්දක් නැහැ; ආත්ම ගරුත්වයක් නැහැ; කෙළින් කථා කරන්න බැහැ. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුව තුළ මෙම විවාදය පිළිබඳව පසු ගිය සිකුරාදා මහා ආන්දෝලනයක් ඇති වුණා. විරුද්ධ පාර්ශ්වයේ සිටින ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු මොකක්ද කළේ? එදා සිකුරාදා මේ පාර්ලිමේන්තු සභා ගර්භය තුළ මේ රටේ ධීවර ජනතාවට ඔවුන්ගේ සුභ සාධනය වෙනුවෙන්, ඔවුන්ට ශක්තිය ලබා දෙන්නට ගෙන එන්නට තිබුණු පනත් සංශෝධනයක් හිතාමතාම නතර කළා.

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මන්ත්‍රීතුමා. මොකක්ද point of Order එක?

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මෙම එක්සත් ජාතික පක්ෂ රජය අපේ ජනතාවට කරන මර්දනයට විරුද්ධව, එක්සත් ජාතික පක්ෂයේ මේ වැඩයට විරුද්ධව අපි හැමෝම නැඟී සිටිනවා. [ඝෝෂා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
That is not a point of Order. ගරු ඇමතිතුමා කථා කරන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය සිකුරාදා මොකක්ද කළේ? [ඝෝෂා කිරීම්] මේ රටේ ධීවර ප්‍රජාවට සහන ලබා දෙන්නට තිබුණු පනත් සංශෝධනය සාකච්ඡා කරන්නට නොදී සභාවේ රීති අමු අමුවේ උල්ලංඝනය කරමින් එය සහමුලින්ම ඉවත් කරන්නට කටයුතු කළා. එය මේ රටේ ධීවර ජනතාවට කරන ලද ලොකුම අපහාසයක්. ධීවර ජනතාව ලක්ෂ දහයකට දමා තිබුණු ඒ යුරෝපා හවුලේ සම්බාධක සියල්ලක්ම ඉවත් කරන්නට මේ රජය කටයුතු කරන කොට මොකක්ද විරුද්ධ පාර්ශ්වය කළේ? [ඝෝෂා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! කරුණාකර නිශ්ශබ්ද වෙන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මේ රටේ ධීවරයාට ලබා දුන්නු සහන සියල්ලක්ම කපා හරින්නට මේ විරුද්ධ පාර්ශ්වය ක්‍රියා කළා. [ඝෝෂා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා නිශ්ශබ්ද වෙන්න.

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
ජෝන් පොලිස් අපට එපා! ජෝන් පොලිස් අපට එපා! ජෝන් පොලිස් අපට එපා! [ඝෝෂා කිරීම්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ ජාතික කුමන්ත්‍රණය කළේ යුරෝපා හවුල වෙනුවෙන්. ඒ කුමන්ත්‍රණය කළේ අධිරාජ්‍යවාදීන් වෙනුවෙන්. [ඝෝෂා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පාර්ලිමේන්තුව මිනාඩි 10කට කල් තබනු ලැබේ.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා 3.26ට නැවත පවත්වන ලදී.

அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப 3.26 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.

Sitting accordingly suspended till 3.26 p.m. and then resumed.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කථා කරන්න, ගරු සජිත් ප්‍රේමදාස ඇමතිතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පැහැදිලි කරමින් සිටියේ ඉතා වැදගත් කාරණයක්. විශේෂයෙන්ම පසු ගිය සිකුරාදා විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීතුමන්ලාගේ විරෝධය මැද අපේ රටේ ධීවර ප්‍රජාව ලක්ෂ දහයකට හානියක් සිදු වුණා. ඒ හානිය තමයි ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත විවාදයට ගැනීමේ අවස්ථාව නැති වීම. එම පනත සංශෝධනය කිරීම හරහා යුරෝපා සංගමය අපේ රටේ කෙළවල්ලන්ට, සප්පරා ඇතුළු සියලුම මත්ස්‍ය වර්ගවලට, අපේ රටේ අපනයනවලට දමා තිබුණු සම්බාධක සියල්ලක්ම ඉවත් කරලීමේ ඉඩ ප්‍රස්ථාව මඟ හැරුණා. කුමක් නිසාද? විශේෂයෙන්ම මේ අග්‍ර විනිශ්චයකාර ධුරයට පත් කිරීම්, ධුරයෙන් ඉවත් කිරීම් පිළිබඳව විවාදය තරයේම ඒ අවස්ථාවේම අවශ්‍ය යැයි කියන ඒ ස්ථාවරය මත -ඒ තද ස්ථාවරය මත- මේ රටේ ධීවර ජනතාවට අතිශය විනාශකාරී ක්‍රියාවක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ විරුද්ධ පාර්ශ්වයේ සියලු දෙනාම ඉෂ්ට කළා. ඒ හරහා එතුමන්ලා යුරෝපා හවුලත් එක්ක ලොකුම ලොකු කොන්ත්‍රාත්තුවක් කරලා තිබෙනවා. [බාධා කිරීම්] ඒ කොන්ත්‍රාත්තුව අනුව සම්බාධක ඉවත් කරනවාට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ විරුද්ධ පාර්ශ්වය විරුද්ධයි. ඒ නිසා තමයි සිකුරාදා ඒ පනත් සංශෝධනය ගෙන එන අවස්ථාවේ ඒ පැහැදිලි විරෝධතාව ඉදිරිපත් කළේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතිගරු ජනාධිපතිතුමන්, ගරු අග්‍රාමාත්‍යතුමන් ඒකමතිකව කැබිනට් මණ්ඩලයේ සාමාජිකයන්ට ප්‍රකාශ කළා, හිටපු අග්‍ර විනිශ්චයකාරතුමා එතුමන්ලා දෙපළම හමු වුණාය කියලා. බොහොම එළිපිටම, වග

කීමෙන් කියන්නේ. අතිගරු ජනාධිපතිතුමන්, ගරු අගමැතිතුමන් දෙන්නාම එකම ප්‍රකාශයකුයි කළේ. මොකක්ද ප්‍රකාශය? හිටපු අග්‍ර විනිශ්චයකාරතුමා පැහැදිලිවම කිව්වා ලු, "තව ටික කාලයක් ඉන්න දෙන්න. ආණ්ඩුවට ඕනෑ විධියට තීන්දු දෙන්නම්" කියලා. [බාධා කිරීම්] පැහැදිලිවම එහෙම කිව්වා ලු. [බාධා කිරීම්] දැන් මම මේ කථාව කියන කොට - [බාධා කිරීම්] මම මේ කථාව කියන කොට විරුද්ධ පාර්ශ්වයේ පුද්ගලයෝ කෑ ගහනවා. [බාධා කිරීම්] මම ඒ අයගෙන් ඉල්ලීමක් කරනවා, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා කියපු ප්‍රකාශයට විරුද්ධව ඔබලා කෑ ගහන්න එපා කියලා. [බාධා කිරීම්] ඔබලා කරන්නේ මහා ලොකු වරදක්. [බාධා කිරීම්] මම මේ කියන්නේ, අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා කැබිනට් මණ්ඩලයේ කරපු ප්‍රකාශය. [බාධා කිරීම්] ඒ නිසා එක දෙයක් පැහැදිලි වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. [බාධා කිරීම්] හිටපු අග විනිසුරුතුමා කටයුතු කළේ පැහැදිලිවම විධායකයේ රූකඩයක් හැටියටයි. [බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා නිශ්ශබ්ද වන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
විධායකයේ රූකඩයක් හැටියටයි, හිටපු අග්‍ර විනිශ්චයකාරතුමා කටයුතු කළේ. ඒ වාගේම හිටපු අග්‍ර විනිශ්චයකාරතුමිය තනතුරින් ඉවත් වුණේත් එතුමිය විධායකයේ රූකඩයක් නොවුණු නිසායි; විධායකයට ඕනෑ ඕනෑ විධියට තීන්දු ලබා නොදුන්නු නිසායි. විශේෂයෙන්ම මගේ කථාව අවසන් කරන්නට පෙර පැහැදිලිවම මම මේ අවස්ථාවේ නෛතික පිරුළක් ඉදිරිපත් කරන්නට කැමැතියි. මම දන්නේ නැහැ, විරුද්ධ පාර්ශ්වයේ ඉන්න අය කෑ කෝ ගහන්නේ මේවා ගැන දැනුමක්, මිනුමක්, ඥානයක්, බුද්ධියක් නොමැති නිසා මේවා අහන්නට අකමැති නිසාද කියලා. [බාධා කිරීම්] *"Quod ab initio non valet in tractu temporis non convalesait"* මොකක්ද මේකේ තේරුම? [බාධා කිරීම්] What is not valid at the beginning does not become valid with time. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මොකක්ද මේකේ තේරුම?

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කරුණාකර නිශ්ශබ්ද වන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
"ආරම්භයේදී වලංගු නොවන්නා වූ දෙයට කාලය ගත වූ පසු ද වලංගු භාවයක් නොලැබේ." මෙන්න මේ කරුණ හොඳින් හිතේ තබා ගත්තොත් වැදගත් කියන එක මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

මගේ කථාව අවසන් කිරීමට පෙර මා කනගාටුවෙන් ප්‍රකාශ කරනවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරන විපක්ෂ නායකතුමා යෝජනා කරලා, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ස්ථිර කරලා වක්‍රාකාරයෙන් මේ ගෙනාවේ ඉන්න ජනාධිපතිතුමාට දෝෂාභියෝගයක් බව. [බාධා කිරීම්] ඉන්න ජනාධිපතිතුමාට විරුද්ධව යෝජනාවක්. [බාධා කිරීම්] ඔබතුමන්ලා මේ සභාවේදී මයික් එකෙන් නොවෙයි ඕවා කියන්නේ. [බාධා කිරීම්] මයික් එකෙන් කථා කරන්න බයයි. ඇයි? Nomination හම්බ වෙන්නේ නැති වෙයි කියන බයට. [බාධා කිරීම්] ඒ නිසා පිටු පස්සේ ඉඳගෙන කෑ කෝ ගැහුවා, ඉන්න ජනාධිපතිතුමා අනවබෝධයෙන් කටයුතු කරයි කියලා, තොරතුරු නොදැන කටයුතු කරයි කියලා. එහෙනම් මේ අවස්ථාවේ මම ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගෙන් අහනවා -

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා, what is your point of Order?

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සජිත් ප්‍රේමදාස ඇමතිතුමා සභාව නොමඟ යවනවා. Nomination ගන්න අප දන්නවා. අපට nomination ගන්න අප දන්නවා. [බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, that is not a point of Order. ගරු සජිත් ප්‍රේමදාස මහතා කථා කරන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ බහුතරයක් මන්ත්‍රීවරුන්ගේ හැසිරීම් රටාව දිහා බලන කොට, ගුණාංගයන් දිහා බලන කොට අපට පැහැදිලි වනවා, මේ කැලෑ නීතිය නිසා තමයි එදා ශිරානි බණ්ඩාරනායක මැතිනිය අග්‍ර විනිශ්චයකාරකමින් ඉවත් කළේ කියන කාරණය. එදා ක්‍රියාත්මක වුණේත් මේ කැලෑ නීතිය. තවම මේ අය පාඩමක් ඉගෙන ගෙන නැහැ, ජනාධිපතිවරණ ජයග්‍රහණය පිළිබඳව. තවමත් ඉන්නේ කැලෑ නීති යුගයක. ඒකයි කථා කරන්න දෙන්නේ නැත්තේ; ඒකයි භාෂණයේ නිදහස නැත්තේ; ඒකයි අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස නැත්තේ. බහුතරය හැම විටම උත්සාහ කරනවා, සුළුතරය තළන්න, පෙළන්න. හැබැයි, කොච්චර කෑ ගැහුවත් මේ සජිත් ප්‍රේමදාසගේ කථාව ඔබලාට නතර කරන්න බැහැ.

මෙච්චර කෑ ගහන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයින්ට මම පැහැදිලිවම මේ කාරණය කියන්න කැමැතියි. එතුමන්ලා කියනවා, ශ්‍රී පවන් මැතිතුමාව අග්‍ර විනිශ්චයකාරතුමා හැටියට පත් කරපු එක වැරැදියි කියලා. එහෙම කියන ගමන් තමුන්නාන්සේලාගේ විපක්ෂ නායකතුමා පාර්ලිමේන්තු කවුන්සිලයට ගිහිල්ලා ශ්‍රී පවන් මැතිතුමාගේ පත් වීම සනාථ කරලා තිබෙනවා; එකඟ වෙලා තිබෙනවා; අනුමත කරලා තිබෙනවා. මෙන්න දිව දෙකේ දේශපාලනය; මෙන්න දිව දෙකේ දේශපාලනය.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දැන් කථාව අවසාන කරන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මොහොතකට මේ කාරණයට සවන් දෙන්න. තමුන්නාන්සේලා ශ්‍රී පවන් මැතිතුමා පත් කරපු ක්‍රමවේදයට විරුද්ධ නම් ඔබතුමන්ලාගේ විපක්ෂ නායකතුමා පාර්ලිමේන්තු කවුන්සිලයට ගිහිල්ලා අත උස්සලා තිබෙන්නේ ඇයි? ඇයි අත් උස්සලා තිබෙන්නේ? ඇයි එකඟ වෙලා තිබෙන්නේ? ඇයි මේවාට උත්තර දෙන්නේ නැත්තේ?

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු සජිත් ප්‍රේමදාස මහතා, දැන් කථාව අවසන් කරන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට විනාඩි දෙකක් ලබා දෙන්න මගේ කථාව අවසන් කරන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාව අවසන් කරන්නට පෙර මම ධම්ම පදයේ පොඩි වදනක් කියන්න කැමැතියි. ඒකටවත් අඩු ගණනේ පොඩ්ඩක් සවන් දීලා ඉගෙන ගන්න. ධම්ම පදයේ එන මේ වදන පොඩ්ඩක් අහ ගන්න. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ මෙසේ දේශනා කරලා තිබෙනවා.

"න තං කම්මං කතං සාධු - යං කත්වා අනුතප්පති
යස්ස අස්සුමුඛො රොදං - විපාකං පටිසෙවති"

දැන් ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ ධම්ම පදයටවත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගරු කරන්නේ නැහැ. ඒකට සවන් දෙන්නවත් කොන්දක් නැහැ. ඒකටත් "හූ" කියනවා. ධම්ම පදයටත් "හූ" කියන

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ඉන්නේ. මම කියන්න කැමැතියි, ඒ ධම්ම පදයේ එන ගාථාවේ තේරුම මොකක්ද කියලා. "යම් ක්‍රියාවක් කොට පසුතැවිලි වීමට සිදුවේද, කඳුළු පිරුණු මුවින් යුතුව හඬමින් විපාක විඳීමට සිදුවේද, එවැනි ක්‍රියාවක් නොකිරීම යහපත්ය." අඩු ගණනේ ධම්ම පදයේ වදනින්වත් ඔබතුමන්ලාට බුද්ධිය, ඥානය, ප්‍රඥාව පහළ වේවා කියමින් මගේ කථාව අවසන් කරනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බොහොම ස්තූතියි.

ඊළඟට ගරු විජිත හේරත් මහතා.

[අ.භා. 3.36]

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාමාන්‍යයෙන් අපේ රටේ සම්ප්‍රදාය අනුව ආණ්ඩුවක් මාරු වෙලා තවත් ආණ්ඩුවක් එන කොට CTB එකේ සභාපතිවරයා වෙනස් වෙනවා, Ceylon Petroleum Corporation එකේ සභාපතිවරයා වෙනස් වෙනවා. [බාධා කිරීමක්] ඒ විධියට ශ්‍රේෂ්ඨාධිකරණයේ අග විනිසුරුවරයා වෙනස් වනවා කියන කාරණයට අප කවුරුවත් එකඟ නැහැ. ඒක අනුමත කරන්න බැහැ. අත්පුඩි ගැහුවාද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නමුත් මේ මොහාන් පීරිස් කියන පුද්ගලයා අග්‍ර විනිශ්චයකාරයෙක් නොවෙයි. ඒ පට්ටපල් හොරෙක්. ඔහු මේ රටේ කවදාවත් අග විනිසුරු ධුරයට පත් වුණේ නැහැ. ඒ නිසා බැංකුවේ සභාපති කෙනෙකු මාරු කරන එකයි, CTB එකේ සභාපති මාරු කරන එකයි, Ceylon Petroleum Corporation එකේ සභාපති මාරු කරන එකයි, මේ මොහාන් පීරිස් මාරු කරන එකයි අතර ලොකු වෙනසක් තිබෙනවා. ඒ පැහැදිලි වෙනස තේරුම් ගන්න ඕනෑ. මොකද ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නීතිය වාගේම මේ රටේ ජනතාව යුක්තියත් බලාපොරොත්තු වෙනවා. නීතිය වාගේම යුක්තිය හා සාධාරණත්වයත් මේ රටේ ජනතාවට පෙන්විය යුතුයි.

එදා ශිරානි බණ්ඩාරනායක මහත්මිය ඉවත් කිරීමට ප්‍රධාන හේතුව වුණේ වෙන මොකක්වත් නොවෙයි. එවකට හිටපු මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාට ඕනෑ වුණා, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගත්තාට පස්සේ ඒ දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබුණු අඩු පාඩු ටික වෙනස් කර ගන්න. තමන්ගේ පැත්තෙන් සිදු වුණු අඩුපාඩු ටික නැවත වෙනස් කර ගන්න, ශිරානි බණ්ඩාරනායක මහත්මිය හරහා ඉල්ලීම් කළා. හැබැයි ශිරානි බණ්ඩාරනායක මහත්මිය කිව්වා, "ඒක කරන්න බැහැ" කියා. දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ සිදු වූ වැරැද්ද නිවැරදි කර ගන්න දරපු උත්සාහය අසාර්ථක වුණාට පස්සේ රාජපක්ෂ ආණ්ඩුව තීරණය කළා, බලය පාවිච්චි කරලා; යුක්තියට පයින් ගහලා; නීති විරෝධී ආකාරයට එදා හිටපු අග විනිසුරුතුමිය වූ ශිරානි බණ්ඩාරනායක මහත්මිය ඉවත් කරන්නට. ඒ ඉවත් කිරීම තමයි එදා පාර්ලිමේන්තුවේදී සිදු වුණේ.

හැබැයි, එදා පාර්ලිමේන්තුවේදී සිදු වූ ඒ ක්‍රියාදාමය නීත්‍යානුකූල පදනමක් මත සිදු වුණේ නැහැ. ඒ සඳහා තේරීම් කාරක සභාවක් පත් කළා. තේරීම් කාරක සභාව පත් කරද්දීම අපි කිව්වා, "ඒ තේරීම් කාරක සභාවේ සංයුතිය වැරදියි" කියා. 7:11 සංයුතියට තමයි ඒ තේරීම් කාරක සභාව පත් කළේ. ඒ තේරීම් කාරක සභාවේදී එවකට අග විනිසුරු ධුරය දරපු ශිරානි බණ්ඩාරනායක මහත්මියට අපහාස උපහාස, තර්ජන ගර්ජන ආදී සියලු දේවල්වලට මුහුණු දෙන්නට සිදු වුණා. ඒ තේරීම් කාරක සභාවේදී ඇයට ඇයගේ පැත්තෙන් කරුණු ඉදිරිපත් කරන්නට සාධාරණ ඉඩක් දුන්නේ නැහැ. එතැන යුක්තියක් තිබුණේ නැහැ. එතැන නීතිය හරියට ක්‍රියාත්මක වුණේ නැහැ. ශ්‍රේෂ්ඨාධිකරණ අග විනිසුරුවරිය හැටියට එතුමිය තමන්ගේ නිර්දෝෂීභාවය ඔප්පු කිරීමට, කරුණු ඉදිරිපත් කිරීමට කාලය ඉල්ලුවා. නමුත් සරිලන කාලයක් ලබා දීම සඳහාවත් එදා මේ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව අනුමැතිය දුන්නේ නැහැ. ඒ නිසා ඉතා පැහැදිලිව අපි ඒ තේරීම් කාරක සභාවේ ක්‍රියාදාමයට විරුද්ධව නැගී සිටියා. ඒ තේරීම් කාරක සභාව යන විධිය වැරදි නිසා, එය සදාචාර විරෝධී නිසා, එය යුක්තිය පසිඳලීමේ තේරීම් කාරක සභාවක් නොවන නිසා අපි එයින් ඉවත් වුණා. ඉවත් වුණා විතරක් නොවෙයි, එදා ශිරානි බණ්ඩාරනායක මහත්මියව එලෙස ඉවත් කිරීමට එරෙහිව ප්‍රජාතන්ත්‍රවාදීව ජනතාවත් එක්ක අපි අරගළ කළා, "එය වැරදියි, එය නීති විරෝධියි" කියා. අපි එයට අදාළව විරෝධතාවන් දැක්වූවා. මේ පාර්ලිමේන්තුවේදී ඒ තේරීම් කාරක සභාව ඇතුළේ අපි අපේ විරෝධය දැක්වූවා. ඒ විතරක් නොවෙයි. පාර්ලිමේන්තුවේදී ඇය සම්බන්ධයෙන් ඉදිරිපත් කළ යෝජනාවලදී අපි ඉතා පැහැදිලිව කිව්වා, "මේ තේරීම් කාරක සභා ක්‍රියාවලිය සම්පූර්ණ වැරදියි; ඇයව ඉවත් කරන්න දරන මේ උත්සාහය සම්පූර්ණ වැරදියි; ඒ නිසා අඩුම ගණනේ විවාදයටවත් අපි සම්බන්ධ වෙන්නේ නැහැ." කියා. අපි විවාදයත් වර්ජනය කළා. ඒ නිසා හිටපු අග විනිසුරුතුමිය වූ ශිරානි බණ්ඩාරනායක මහත්මිය ඉවත් කිරීමට එදා මේ රාජපක්ෂ පාලනය දරපු නීති විරෝධී, අත්තනෝමතික උත්සාහය පැරදවීම සඳහා යුක්තිය වෙනුවෙන් ජනතා විමුක්ති පෙරමුණේ අපි අපේ ශක්ති පමණින් මැදිහත් වුණා. ඒ ශක්ති පමණින් ඇයට කවදා හෝ දවසක යුක්තිය, සාධාරණත්වය ඉෂ්ට කරන්න ඕනෑ කියන අරගළයේ අපි දිගටම හිටියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇය ඉසිලුවේ ශිරානි බණ්ඩාරනායක කියන පෞද්ගලික චරිතය නොවෙයි, මේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණයේ අග විනිසුරු ධුරය. ඒ අග විනිසුරු ධුරයට බලපෑම් කරලා, එය දේශපාලන අතකොළුවක් බවට පත් කරන්න හදපු, නීතියේ ආධිපත්‍යය බිඳ හෙළන්න හදපු රාජපක්ෂ ඒකාධිපති පාලනයට විරුද්ධවයි අපි එදා නැඟී සිටියේ. ඒ නිසා වසර දෙකකට පස්සේ හරි හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ අග විනිසුරුතුමිය ධුරයෙන් ඉවත් කිරීමට එරෙහිව අද මේ ගත් ක්‍රියා මාර්ගය අපි දේශපාලන පක්ෂයක් විධියට මුළුමනින්ම අනුමත කරනවා, අනුමත කරනවා. දෙවතාවක්, තුන්වතාවක් නොවෙයි, සිව් වැනි

වතාවටත් අනුමත කරනවා. ඇයව ඉවත් කිරීමට කිසිදු ආකාරයක යෝජනාවක් මේ පාර්ලිමේන්තුවට ගෙනාවේ නැහැ. ඇයව ඉවත් කිරීමේ යෝජනාවක් මේ පාර්ලිමේන්තුවට ගෙනෙන්නේ නැතුව, ඇයට එරෙහිව චෝදනාවක් විතරක් විමර්ශනය කරලා, ඒ චෝදනාව මත පදනම් වූ යෝජනාවක් සම්මත කර ගත්තාට ඇයව ඉවත් කරන්න බැහැ. ඒක අද මේ ඔබතුමන්ලාම කියන, ඔබතුමන්ලාම කථා කරන පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය හැල්ලුවට ලක් කිරීමක්. පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය ආරක්ෂා කරන්න ඕනෑ නම් එදා රාජපක්ෂ පාලනයට තිබුණා, අඩුම ගණනේ ඒ යෝජනාවවත් හරියට ගෙනෙන්න. ඒකවත් හරියට ගෙනෙන්න හැකියාවක් තිබුණේ නැහැ. දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරියට ගෙනෙන්න බැරි වුණා, වරද්දා ගත්තා. ඇයව ඉවත් කිරීමේ යෝජනාවක් ගෙනෙන්න උත්සාහ කළා, ඒකත් වරද්දා ගත්තා. ඒකවත් හරියට කර ගන්න බැරි වුණා. ඒකෙන් මේ පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය හැල්ලු කළේ අපි නොවෙයි. මේ පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය හැල්ලු කළේ, එදා රාජපක්ෂ පාලනය නියෝජනය කරපු තමුන්නාන්සේලා. ඒ නිසා ඒක වැරදියි. අදවත් ඒක ස්වයං විවේචනාත්මකව දකින්න.

එදා රාජපක්ෂ පාලනයට "එහෙයි" කියපු එක අදවත් නතර කරලා, අදවත් මේකේ ඇත්ත තත්ත්වය තේරුම් අර ගෙන මේක වෙනස් කරන්න මැදිහත් වෙන්න කියා අපි ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. එදා තමයි කැලෑ නීතිය ක්‍රියාත්මක වුණේ. එදා තමයි ශ්‍රේෂ්ඨාධිකරණය වැටලුවේ. එදා ශ්‍රේෂ්ඨාධිකරණය වටලන්න - [බාධා කිරීම්] අර පුංචි මහින්දලා; මැර කණ්ඩායම් ගිහිල්ලා කැති, පොලු අර ගෙන එදා ශ්‍රේෂ්ඨාධිකරණය වටලලා අග විනිසුරුතුමියට යන්න ඉඩ දුන්නේ නැහැ. [බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! කරුණාකරලා බාධා කරන්න එපා. මන්ත්‍රීතුමා කතා කරන්න.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
අග විනිසුරුතුමියට ශ්‍රේෂ්ඨාධිකරණයට යන්න දුන්නේ නැහැ. [බාධා කිරීම්] එදා තමයි නියම මැදමුලන කැලෑ නීතිය ක්‍රියාත්මක වුණේ. ඒ කැලෑ නීතිය වෙනස් කරලා යුක්තිය, සාධාරණත්වය ඉටු කිරීමේ වගකීම අද මේ පාර්ලිමේන්තුවට තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. [බාධා කිරීම්] ඒ තේරීම් කාරක සභාවේදී ගත්ත ක්‍රියා මාර්ග, සම්මත කර ගත්ත යෝජනාවල කිසි තැනක ඇයව ඉවත් කිරීමේ වගන්තියක් තිබුණේ නැහැ.

එදා ශ්‍රේෂ්ඨාධිකරණය විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි- [බාධා කිරීම්] එදා අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් මංජුල තිලකරත්න මහත්මයාට ගල්කිස්සේදී ගැහුවා. අද වෙන කල් මංජුල තිලකරත්න මහතාට ගහපු චූදිතයින් කවුද කියා ඔප්පු කර ගන්න බැරි වුණා. [බාධා කිරීම්] ඒ ගැන පරීක්ෂණ නැහැ; ඒ ගැන පොලීසිය මැදිහත් වුණේ නැහැ; ඒ ගැන නියම ආකාරයෙන් නීතිය ක්‍රියාත්මක වුණේ නැහැ. අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් මංජුල තිලකරත්නට පහර දීම පිළිබඳව නීතිය ක්‍රියාත්මක කරන්න පසු ගිය අවුරුදු දෙකක කාලයක් තිබුණා. ඒ කාලය තුළ ඔහුට පහර දුන්නේ කවුද කියලා ඊට අදාළව රාජපක්ෂ පාලනයට නීතිය ක්‍රියාත්මක කරන්න බැරි වුණා. ඒ විතරක් නොවෙයි.

ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපති විජයදාස රාජපක්ෂ මැතිතුමන්ගේ ගෙදරට එදා වෙඩි තිබ්බා. ඒක කැලෑ නීතිය නොවෙයිද? ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපති විජයදාස රාජපක්ෂ මහත්මයාගේ ගෙදරට වෙඩි තියපු එක කැලෑ නීතිය නොවෙයිද? ඒක තමයි කැලෑ නීතිය. [බාධා කිරීම්] ඒ කැලෑ නීතිය ක්‍රියාත්මක කළ මැරයෝ කෝ! අල්ලා ගත්තාද? [බාධා කිරීම්] අල්ලා ගන්න බැරි වුණා. [බාධා කිරීම්] අද කැලෑ නීතිය ගැන කතා කරනවා. [බාධා කිරීම්] අද කැලෑ නීතිය ක්‍රියාත්මක වෙනවා නම් වැරැදියි. [බාධා කිරීම්] වත්තල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට ගහපු එක වැරැදියි. [බාධා කිරීම්] තෙවරප්පෙරුම මන්ත්‍රීවරයාගේ හැසිරීම වැරැදියි. ඒවා නතර කරන්න ඕනෑ. [බාධා කිරීම්] ඒවා වැරැදියි. අද කැලෑ නීතිය ක්‍රියාත්මක වෙනවා නම් ඒ කැලෑ නීතිය නතර කරන්න පුළුවන් වෙන්නේ එදා කැලෑ නීතිය අනුමත කරපු අයට නොවෙයි. ඒකත් මතක තියා ගන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මොහාන් පීරිස් නමැත්තා පත් කිරීම පිළිබඳව අද ඔය කතා කරන අය එදා කිව්වේ, "මොහාන් පීරිස්ව පත් කළොත් අපෙත් රෙදි ගැලවෙනවා, ආණ්ඩුවෙත් රෙදි ගැලවෙනවා" කියායි. [බාධා කිරීම්] එහෙමයි එදා කිව්වේ. [බාධා කිරීම්] අපට මතකයි ඒවා; රටේ ජනතාවට මතකයි ඒවා.[බාධා කිරීම්] මොහාන් පීරිස්ව අග විනිසුරු ධුරයට පත් කළොත් අපෙත් රෙදි ගැලවෙනවා, ආණ්ඩුවෙත් රෙදි ගැලවෙනවා කියලා එදා කිව්ව කට්ටිය, අද මොහාන් පීරිස් වෙනුවෙන් පෙනී සිටිනවා. [බාධා කිරීම්] මොහාන් පීරිස්ගේ රෙදි ගැලෙව්වා විතරක් නොවෙයි, තමන්ගෙත් රෙදි ගලවා ගෙන තිබෙනවා - [බාධා කිරීම්] මේ කෑ ගහන

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

[බාධා කිරීම්] ඒ තත්ත්වයට පත් වුණේ එදා ඒ අත්තනෝමතික ක්‍රියා මාර්ග අනුමත කිරීම නිසායි.

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ මොහාන් පීරිස් නැමැති බැංකු සභාපතිවරයා ශ්‍රේෂ්ඨාධිකරණයේ මුල් පුටුවට පත් කරලා මුළු අධිකරණ පද්ධතියටම ගොඩාක් හානි කරලා තිබෙනවා. ඉස්සෙල්ලාම මොකක්ද කළේ? මහාධිකරණ විනිසුරුවරයෙක් වන සිසිර රත්නායක අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විධියට පත් කළා. නමුත් පත් කළ යුත්තේ දිසා විනිසුරුවරයෙක් බව එහි රීතිවල ඉතා පැහැදිලිව තිබෙනවා. සිසිර රත්නායක පත් කරලා මොකක්ද කළේ? තාවකාලික ලේකම්වරයා විධියට අවුරුදු දෙකක් තියා ගත්තා. ඊට පස්සේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජ්‍යෙෂ්ඨ නීතිඥවරයෙකුගේ දුවව කසාද බැඳපු කණිෂ්ක විජේරත්න අතිරේක ලේකම් හැටියට පත් කළා. එතැනට තමන්ගේ ඥාතීන් පත් කර ගෙන මොකක්ද පසු ගිය අවුරුදු දෙක තුළ කළේ? ඒ අවුරුදු දෙක තුළ මුළු අධිකරණ පද්ධතියම දේශපාලනයට ලක් කළා. [බාධා කිරීම්] විනිසුරුවරුන්ට දුරකථනයෙන් කතා කරලා කියනවා, "අහවල් නඩුවේ තීන්දුව මෙහෙම දෙන්න එපා. අහවල් එක්කෙනාට ඇප දෙන්න එපා" කියා. [බාධා කිරීම්]

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
පෙරටුගාමී පක්ෂයේ- [බාධා කිරීම්]

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
විනිසුරුවරයෙක් තීන්දුවක් දෙනකොට ඒ තීන්දුව ලියන සාමාන්‍ය සිද්ධාන්තයක් තිබෙනවා, "අපරාධයක් ලෙස තහවුරු කළ හැකි විශ්වාසදායි තොරතුරු නැත" කියා. රතුපස්වල සිද්ධිය සම්බන්ධයෙන් අපරාධයක් සිද්ධ වුණේ නැහැයි කියලා නඩු තීන්දුව දෙන්න විනිසුරුවරුන්ට බලපෑම් කළේ කවුද? මේ සිසිර

[ගරු විජිත හේරත් මහතා]

රත්නායකලා, මංජුල විජේරත්නලායි. ඒ, මොහාන් පීරිස්ගේ අනුදැනුමට යටත්වයි. ඒ විතරක් නොවෙයි. අද අධිකරණ පද්ධතියේ විනිශ්චයකාරවරුන් කැඳවා අහන්න, ඔවුන්ගේ හෘදය සාක්ෂියට එකඟව කියාවි, තමන්ට මේ සිසිර රත්නායකලා මේ කණිෂ්ක විජේරත්නලා දූරකථනයෙන් කරපු තර්ජන, නඩු තීන්දු වෙනස් කරන්න කියාපු දේවල්. ඔවුන්ගේ හෘදය සාක්ෂියට එකඟව ඔවුන් අද ඒවා කියනවා. සමහරු රටේ ඉන්න බැරිව ෆිජි දූපත්වලට ගියා. මේ රටේ අධිකරණයේ විනිශ්චයකාරවරයකු විධියට අපක්ෂපාතීව වැඩ කරන්න විධියක් නැහැ. ඒ නිසා ෆිජි දූපත්වලට ඉල්ලලා ගියා. හිතේ සැනසිල්ලේ තීන්දු දෙන්න පුළුවන් නිසා අවුරුදු දෙකකට ගිහිල්ලා වැඩ කරලා එන්නම් කියලා ගියා. එහෙම තත්ත්වයකට අපේ රටේ අධිකරණ පද්ධතිය පත් කළා.

ඒ විතරක් නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අරවින්ද පෙරේරාට විරුද්ධව චෝදනා තිබුණා. ඔහු බැංකු ණයක් ගත්තා; ආපසු ගෙවුවේ නැහැ. ඒ ණය සඳහා රුපියල් මිලියන 19ක් පොලියත් එක්ක ගෙවන්න තිබෙනවා. ගෙවුවේ නැහැ. විනය පරීක්ෂණයක් පැවැත්වූවා. ශිරානි බණ්ඩාරනායක මහත්මිය අග විනිසුරුවරිය ලෙස ඉන්න කාලයේ අධිකරණ සේවා කොමිසම තීන්දුවක් ගත්තා, ඔහුගේ වැඩ තහනම් කරන්න. මොකක්ද කළේ? කැලෑ නීතිය රජ කරපු රාජපක්ෂ පාලනය මොහාන් පීරිස් අග විනිසුරු ධුරයට ආවාට පස්සේ අරවින්ද පෙරේරාව නැවත සේවයේ පිහිටුවා පානදුර උසාවියට දැම්මා. ඔහු අදත් වැඩ කරනවා. රුපියල් මිලියන 19ක් බැංකුවට ගෙවන්න තිබෙනවා. බැංකුවෙන් සිතාසි එවනවා. ඒ සිතාසි භාර ගන්නේ නැහැ. සිතාසි භාර දෙන්න එන නිලධාරින්ව තර්ජනය කරලා එළවනවා. මේකයි අධිකරණයට ඇති කරපු තත්ත්වය. ඒ අරවින්ද පෙරේරාව ඉවත් කරන්න නීතිමය කාරණය වුණේ මොකක්ද? මූල්‍ය ගනුදෙනුවක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නීතිය පිළිබඳව එදා ආචාර්ය ඒ.ආර්.බී. අමරසිංහ මහතා ලියාපු පොතේ 86වැනි පිටුවේ "Judicial Conduct, Ethics and Responsibilities" කියන ඡේදය යටතේ ඉතා පැහැදිලිව මෙසේ සඳහන් වනවා. I quote:

> "Although a judge may manage his or her own financial affairs, if the judge fails to such a degree that he or she is unable to pay his or her debts, the judge should resign and not await bankruptcy proceedings in court,..."

ඉතා පැහැදිලිව තිබෙනවා, "the judge should resign and not await bankruptcy proceedings in court" කියලා.

ඊළඟට මෙසේ කියනවා. I quote:

> "…for that would lead to a public examination, which is undesirable in the case of a judge. Otherwise steps will have to be taken for removal."

ඉතා පැහැදිලිව ඒක කියලා තිබෙනවා. යම් කිසි විනිශ්චයකාරවරයෙක් මූල්‍ය ගනුදෙනුවක් කරලා තිබෙනවා නම්, ණය ගෙවන්නේ නැතිව ඉන්නවා නම් ඔහු ඉල්ලා අස් වෙන්න ඕනෑ. තමන්ට ඒ ණය ගෙවා ගන්න බැරි නිසා ඔහු ස්වයංව ඉල්ලා අස් වෙන්න ඕනෑ. එහෙම නැත්නම් ඔහුව ඉවත් කිරීමේ බලය තිබෙනවා. ඒ ඉවත් කිරීමේ බලය තිබෙනවා කියන පදනම මත තමයි එදා අරවින්ද පෙරේරා ඒ කරපු විනය විරෝධී වැඩේ නිසා ඔහුව ධුරයෙන් ඉවත් කළේ; ඔහුගේ වැඩ තහනම් කළේ. පස්සේ මොහාන් පීරිස් අග විනිසුරු ධුරයට ඇවිල්ලා මොකද කළේ? ඔහුව නැවත සේවයේ පිහිටෙව්වා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම පරිණත භාවයක් නැති, උසාවියේ විනිශ්චයකාරවරයකු විධියට නඩු තීන්දු දෙන්න හැකියාවක්, දැනුමක් නැති තමන්ගේ හිතෛෂීන්ව තැන් තැන්වලට පත් කළා. විශේෂයෙන්ම අද කොළඹ දිසා අධිකරණ,

මහාධිකරණවල වැඩ කරන්නේ ඒ අධිකරණ තීන්දු දෙන්න හැකියාවක්, දැනුමක් නැති මොහාන් පීරිස්ගේ ගෝලයෝයි. ඒ තත්ත්වයට අධිකරණය පත් කළා. නියම හැකියාවක් තිබෙන, පරිණත භාවයක් තිබෙන විනිශ්චයකාරවරුන්ව කුරුණෑගලට, අනුරාධපුරයට, පොළොන්නරුවට මාරු කළා. තවම මහාධිකරණ විනිසුරුවරු පත් කරලා නැති මහාධිකරණ 16ක් විතර තිබෙනවා. ඒ මහාධිකරණවල නඩු කටයුතු සිද්ධ වෙන්නේ නැහැ. ඒවායින් අගතියට පත් වන්නේ සාමාන්‍ය ජනතාවයි. ඒවාට අදාළ විනිසුරුවරුන් පත් කරන්න මොහාන් පීරිස්ලාගේ එදා ඒ ක්‍රියාදාමයට බැරි වුණා. ඔවුන් කළේ මොකක්ද? තමන්ගේ හිතවතුන්, හෙන්චයියලා, දේශපාලන හිතවතුන් පත් කරගෙන ඔවුන්ට අවශ්‍ය විධියට නඩු තීන්දු දුන්නු එකයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මොහාන් පීරිස්ව මේ ධුරයෙන් ඉවත් කරලා විතරක් මදි. වැරදි පුටුවේයි ඔහුව වාඩි කෙරෙව්වේ. එතැනින් ඔහුව ඉවත් කරන්න ඕනෑ. ඒක කළා; ඒක හොඳයි. ඒකෙන් නැවතිලා මදි. ඔහු ඒ අග විනිසුරු ධුරය දැරූ අවුරුදු දෙකක කාලය තුළ ඔහු විසින් අපේ රටේ අධිකරණ පද්ධතියට කළ විනාශය පිළිබඳව හොයා බලන්න වහාම විශේෂ ජනාධිපති විමර්ශන කොමිසමක් පත් කරන්න ඕනෑ. ඒ නිසා අපි ආණ්ඩුවට යෝජනා කරනවා, වහාම, හැකි ඉක්මනින් ඒ පිළිබඳව විශේෂ කොමිසමක් පත් කරන්නය කියලා. ඔහුගේ අනුදැනුම මත ඔහුට හිතවත් විනිශ්චයකාරවරු පත් කළේ කොහොමද, නීති විරෝධී ආකාරයට, විනය විරෝධී ආකාරයට හැසිරුණු නිසා වැඩ තහනම් කළ විනිශ්චයකාරවරු නැවත සේවයේ පිහිටුවූවේ කොහොමද, ඒ විතරක් නොවෙයි, නීතිඥවරුන්ට බලපෑම් කළේ කොහොමද කියන කාරණා පිළිබඳව සොයා බැලීම සඳහා හැකි ඉක්මනින් විශේෂ ජනාධිපති කොමිසමක් පත් කරලා සාධාරණය ඉටු කරන්න, අධිකරණයේ ස්වාධීනත්වය ඇති කරන්න. ඒ වාගේම අධිකරණයේ ස්වාධීනත්වය ඇති කරලා හෙට දවසේ මේ රටේ නීතියට, යුක්තියට සාධාරණත්වයක් ඉටු කරන්න මැදිහත් වෙන්න කියන ඉල්ලීම කරමින් මා නතර වෙනවා.

[3.51 p.m.]

ගරු මංගල සමරවීර මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு மங்கள சமரவீர - வெளிநாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. Mangala Samaraweera - Minister of Foreign Affairs)

Mr. Deputy Speaker, in a statement made to "The Island" and other newspapers yesterday, the outgoing Chief Justice, Mr. Mohan Peiris, has said, I quote:

> "Maintaining the dignity and decorum associated with the office of the Chief Justice and ensuring its respectability and propriety is my prime concern. As the pinnacle of our judicial administration, it should be preciously safeguarded in its pristine purity; now and for the future - in the need to preserve justice as a wholesome entity."

This, Sir, is part of the statement made by the former Chief Justice and I see it almost as if a harlot is extolling the virtues of virginity because Mohan Peiris, who brought international disrespect and condemnation to our judicial system by his scandalous appointment two years ago and his conduct since then, is now shedding tears, if I may quote his own words, for the "pristine purity" of the Office of the Chief Justice.

As you know, two years ago, on Monday, the 14th of January, 2013, a large contingent of military personnel

occupied the Supreme Court Complex - this, I remind to these gentlemen here, who, today, talk about the rule of law - and from the early hours of the following morning, the Supreme Court was cordoned off and riots squads, barricades and water cannons put in place. All this and more to enable Mr. Mohan Peiris to be driven into the Courts Complex through its exit, the most appropriate entry for a fake judge. Outside the court gates, lawyers who had challenged the illegal and immoral eviction of Shirani Bandaranayake lit candles in daylight and, as they called it then, it was "the beginning of darkness at noon".

In fact, there are reasons, both substantial and procedural, which others today have gone into greater depth to point out why Mohan Peiris was not lawfully appointed to the Office of the Chief Justice. I think that has been dealt with by many of my Colleagues. But, since he claims to be an expert on unconstitutional processes, then, he is well aware of the degree of unconstitutionality that attends the eviction of the legitimate Chief Justice from a rightful chair by which, he, escorted by the STF and armed guards, took up and functioned in that chair. He actually, for the first few days and weeks, functioned with STF and armed guards around, like in one of those banana republics in Africa. He is also well aware of all that he had done to degrade the Judiciary, its dignity, independence, objectivity and reputation over these two years.

In fact, Mr. Mohan Peiris recently stated that the separation of powers is a fundamental feature of our Constitution. It is in the spirit of his own words then that I recommend that someone look at the appointment of this person. When he was appointed to this position, he was the Legal Adviser to the Cabinet, the Chairman of the Seylan Bank, a Director of the Lanka Logistics and Technologies Limited, the arms purchasing unit of the Ministry of Defence, and a Director of the Rakna Arakshaka Lanka Limited, a security company established by Mr. Gotabaya Rajapaksa, the then Secretary to the Ministry of Defence. He was also the Legal Adviser to the Ministry of Defence, the Attorney-General, the Government Spokesman before the UN Human Rights Council refuting allegations of war crimes and importantly, a close and partial ally of the former President and he should not hold the post of *de facto* Chief Justice.

He became the Chief Justice of this country while holding all these posts which I mentioned before. In fact, the dignity of the Judiciary, which Mohan so nobly now talks about, is dependent on its impartiality and objectivity as well as its independence from the Executive and the Legislature, as you well know. It also requires that the head of the system commands the respect of the community of lawyers, who, in this case, have been propelled to be the champions of resisting the former Chief Justice.

Under Mohan Peiris' tenure, this illusory dignity and independence was a cobweb of conflicting interest and Mohan Peiris, in actuality, became an appendage or an extension of the State apparatus. In fact, the Bangalore Principles of Judicial Conduct, the International Gold Standard - I am sure, my Friend, the former Justice Minister knows - in fact, states that a judge shall not only be free from inappropriate connections with, and influenced by, the executive and legislative branches of Government, but must also appear to be a reasonable observer to be free therefrom. Did Mohan Peiris give any thoughts to the sanctity of his judicial office when, on the 14th of April last year - we saw pictures all over the newspapers - he, apparently in the company of Gotabaya Rajapaksa joined President Rajapaksa and his immediate family in celebrating the Sinhala and Hindu New Year and joining the feeding of milk rice to each other at the auspicious time? Did Mohan Peiris think it was part of his job to become a member of President Rajapaksa's entourage on an official visit to Italy and the Vatican in September last year, when we all saw on TV and otherwise, that he accompanied the President there? Did Mohan Peiris give any thought to the public perception of the Supreme Court when he begged for a diplomatic appointment from the Executive branch of the Government? In fact, it was only last week since I was sworn-in as the Foreign Minister, within about a week of being sworn-in, I got a call from the Prime Minister asking what stations are available for Mr. Mohan Peiris because he was demanding a diplomatic appointment, the Prime Minister said. I was rather taken aback, but I said, "Okay, if it is to clean the Supreme Court, let us offer him something" and I offered him Brazil. We said he can become the Ambassador for Brazil. Then, two days later, I got a message saying he is not interested in Brazil, that he is insisting on Italy and the Vatican. So, this is the way he bargained with the position he illegally got and he was trying to actually bargain the post of Chief Justice to become an Ambassador in Italy and the Vatican.

I hope the Hon. Members remember that I had made a complaint to the CID based on reliable information and in that complaint I have stated that Mr. Mohan Peiris was there when this conspiracy took place early morning of the 9th of January, along with the former President, along with the Defence Secretary, along with the former External Affairs Minister and the Provincial Councillor, Mr. Gammanpila. Mr. Mohan Peiris was there, as far as we know, taking part in a conspiracy to prevent this Government taking office, attempting to impede the one democratic process most crucial to the proper functioning of our society in any democracy.

It is clear from all that can be seen of this man's outward actions, transactions and relationships -

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Vasudeva Nanayakkara, what is your point of Order?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
This Hon. Minister has made a complaint to the CID and initiated proceedings, thereby, to have this very serious matter investigated and while it is pending, he takes the liberty to talk about it.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
It is not *sub judice*, Hon. Member.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
I am not talking about *sub judice*. I am talking about the morality.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
You are the last person who can talk about morality out of all these persons. The most immoral person I have ever met is now talking about morality. What a joke! It is like Mohan Peiris speaking about purity of the Judiciary. It is like a harlot extolling the virtues of virginity. That is what you are doing.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
There you are! [*Interruption.*]

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
It is clear from all that can be seen of this man's outward actions, transactions and relationships, that he cannot be expected to command the respect and confidence of the international community, or of Sri Lankans expecting accountability and transparency in a court of law. Hon. Members would recall the international backlash that attended the removal of the 43rd Chief Justice Shirani Bandaranayake two years ago. Statements, as you know, condemning the move and calling for her reinstatement were made by several governments, the UN Special Rapporteur on the Independence of the Judiciary, the International Commission of Jurists, the International Bar Association and the Bar Associations of several countries and the Secretary-General of the Commonwealth, which we currently chair, expressed the Commonwealth's profound collective concern at what could be perceived to constitute violations of core Commonwealth values and principles.

In fact, I have the two reports which were never published. These reports were submitted only to the Commonwealth Secretary-General and to the former President Rajapaksa as the incoming Chair-in-office of the Commonwealth, where two of the most eminent Judges in the world were commissioned by the Secretary-General to assess the impeachment of Shirani Bandaranayake. One is, Sir Jeffrey Jowell and the other is the Justice Pius Langa from Johannesburg, South Africa. In the conclusion of the Memorandum it clearly states, I quote:

> "(b) It follows that all subsequent actions flowing from that, by Parliament and the President, namely, the impeachment of the Chief Justice and her removal from office were unconstitutional and unlawful. It also follows that the purported appointment…"

This is the very word "purported appointment", which has been used.

> " …of a new Chief Justice was also unconstitutional and unlawful, since the incumbent Chief Justice had not been validly removed."

So, this is the exact argument on which President Maithripala Sirisena based his decision to remove Mohan Peiris and to appoint a new Chief Justice.

In fact, 45 Judges from all Continents wrote to President Rajapaksa urging him to act immediately to restore the independence of the Judiciary by reinstating the legal Chief Justice and the UN High Commissioner for Human Rights described the removal of the Chief Justice through a "flawed process", as a gross interference with the independence of the Judiciary and a setback for the Rule of Law in Sri Lanka.

She questioned how anyone could have any confidence in the independence and impartiality of Mohan Peiris when handling allegations of serious human rights violations by the authorities. In the two years in which Mohan Peiris was in power, creditability continued to wane. He was, after all, the person who informed the UN Committee against Torture that journalist Ekneligoda was comfortably and safely living in a certain country. Here, the Chief Justice of this country makes this very irresponsible statement and when called upon by a court of law to disclose the country where Mr. Ekneligoda was, the reply Mohan Peiris gave was, "Only God knows". Having said that he knows the country in which this man is living, he finally said, "Only God knows".

The many victims of Mohan Peiris's tenure include, but are not limited to, PTA prisoner Ganesan Nimalaruban, the Slave Island affectees who were banished in the name of development and the victims of the Welikada Prison riots. In a context when a credible judicial system is needed, both for domestic healing and to prevent international intervention in what should be a domestic process of reconciliation, Mr. Peiris would be a very significant hindrance indeed. It is a notorious fact that his former juniors operated and conducted legal

practice from the Chief Justice's official residence. This is a well-known fact. I am sure many Ministers of the former regime are well aware of the fact that he used even his official residence for his private practice.

It is also a notorious fact that appeals listed in different courts were arbitrarily moved to his own court when a party happened to be a friend or a relative. For example, he directed that the Supreme Court case where Asia Asset Finance was the appellant be heard before a Bench of which he was a member despite being well aware that the Chairman is his brother-in-law and his wife is on the board of directors and are major shareholders of the company. This is how he used the position given to him, the position gained by him illegally. It is a notorious fact that in two cases, supporters of the former Government were brought as suspects before Magistrates for assaulting Opposition supporters during the last Presidential campaign; you are talking about people getting assaulted. We condemn it from whichever side it emanates from, but this was what happened then. When our Opposition supporters were assaulted, Mr. Mohan Peiris called his Magistrates and ordered them to grant bail to the suspects. It was never heard of. Mohan Peiris, himself, during the last Presidential Election actually called his Magistrates and instructed them to grant bail to the suspects. Even the records of the Committee against Torture, the Treaty body of the Convention Against Torture, would bear testimony to the fact that Mr. Mohan Peiris stated untruths before it.

This is there in the international arena and he was thereafter called a "liar" by one of its members. The Chief Justice of Sri Lanka was called a "liar" in public by one of its members. This was judicial corruption at its best. Mohan Peiris was, without dispute, at the rotten core of the institutional mechanism that stands accused of committing violations of human rights and crimes against humanity. Not many of you may be aware that in November, 2013 Mohan Peiris attended a Conference of Chief Justices of the Asia and Pacific Region, convened by the Chief Justice of the Republic of Turkey and the United Nations, uninvited. He was not invited. He went there and gatecrashed this Conference. The Sri Lankan Judiciary had been deliberately excluded in view of the events in January of that year. Neither did the United Nations nor the Turkish Judiciary recognize Mohan Peiris as the Chief Justice of Sri Lanka. He just went and sat there in that international Conference. The whole Conference refused to recognize Mohan Peiris as the Chief Justice of Sri Lanka. Yet, he travelled to Istanbul with his wife, demanded that he be accommodated in the Conference hotel, attended the Conference and participated in the discussions without being recognized as a participant. A shameless chap, an absolutely shameless man Mohan Peiris is. On leaving Istanbul, he demanded that his airfare be reimbursed in cash.

The Istanbul Declaration on Transparency in the Judicial Process, which was adopted at that Conference does not bear his name. In fact, the Hon. (Dr.) Wijeyadasa Rajapakshe can check all these details at his Ministry. This is how he misused and abused his powers as the Chief Justice. The Bangalore Principles of Judicial Conduct require judges not to do anything that detracts from the dignity of judicial office. However, what Mohan Peiris has done will detract from the dignity and reputation of our Judiciary for many years to come.

Finally, Sir, as the Minister of Foreign Affairs, now it is my duty and responsibility to promote and safeguard the interests, integrity and the sovereignty of Sri Lanka. One of the principal issues, which you faced and I am facing today, is the question of addressing the ongoing inquiry being conducted under the auspices of the United Nations Human Rights Council into war crimes and violations of the International Human Rights Law and the Humanitarian Law alleged to have been committed in this country during the latter part of the war. If I am to convince, even when we were in the Opposition, it was always our stand that we should be against international interference in such matters, but even during the election - I was hoping to bring our Manifesto, the "Hundred-Day Programme" - we categorically stated that we believe in an internal domestic mechanism to look into these alleged war crimes and under our Government, such an institution will be set in motion.

In fact, many of our foreign friends have admitted that Sri Lanka still has some of the best judges in the world and we still believe - I believe personally - that we can look after many of these questions ourselves. We had a Judiciary which is competent, independent and impartial, a Judiciary which can rank as one of the best amongst the world. In fact, as you know, many of our judges are even serving in countries like Fiji, because of the respect we have been able to garner all over the world during the years. But, that respect was lost during the last few years. An international inquiry initiated last year is currently nearing completion. In fact, the results of this inquiry could lead to Sri Lankan Armed Forces and other civilians appearing before the International Tribunal, unless tangible steps are taken to restore judicial credibility.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Minister, please wind up now.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
Yes, I will be finishing in one minute. This is where the restoration of the credibility of our judicial system is extremely important. Especially, if we are to convince the international community that we do not want an international intervention in our internal affairs of our country, if we are to tell the international community that

[ගරු මංගල සමරවීර මහතා]

we have a judicial system which can take care of our own problems, we have to ensure that the Judiciary is put back in order and the credibility of it restored as soon as possible. It is the previous administration's failure to set up a credible domestic mechanism that has led to our current difficulties. It is the current Government's position that the most effective way of beginning the process of healing between communities and preventing international prosecution, which many would feel will be a violation of sovereignty, would be to institute a credible domestic mechanism as soon as possible. In fact, we are in the process of doing it. The challenge today is to ensure that we are able to effectively enjoy the rights, privileges and benefits of re-entering the community of civilized nations and ensure that we, as a country, do not suffer economic sanctions, ill-dignity and a tarnished reputation because we fear justice or because we are too short-sighted to be able to pursue that justice in a credible manner ourselves. Because of the many regressions we have made, we have a long way to go before we can change perceptions and to prove that we, as a country, can institute a domestic mechanism that is as effective and just as any proposed international mechanism. We hope that under the new Chief Justice and the reforms we propose to introduce, we will be able to raise the Judiciary from the depths to which it has sunk to one that conforms to contemporary international standards and the essential requirements of a democratic multiethnic, multireligious and multilinguistic State. That is the principal reason for my intervention in this Debate.

Thank you.

[අ.භා. 4.14]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ විදේශ ඇමතිතුමා වැරදුණු කුරුමානමක් පිළිබඳව කථා කිරීම ගැන එක්තරා විධියකට මා කනගාටු වනවා. මොකක්ද වැරදුණු කුරුමානම? අද එතුමාගේ කථාවෙන් එතුමා පිළිගත්තා, මොහාන් පීරිස් අග්‍ර විනිශ්චයකාරතුමාට තානාපති තනතුරක් හෝ වෙනත් තනතුරක් දීමේ ගනුදෙනුවකට පැමිණීමට හැම දෙයම කළ බව. ඒ වාගේම ගරු අග්‍රාමාත්‍යතුමාගේ කථාවේදීත් ඒ බවම සඳහන් කළා. ඇයි? ඔබතුමන්ලාට ඕනෑකම තිබුණා, ඔහුගේ ඉල්ලා අස්වීම ලබා ගෙන ඔබතුමන්ලාට අවශ්‍ය අග්‍ර විනිශ්චයකාරවරයකු පත් කරන්න. ඒ සඳහා ඕනෑම තනතුරක් පුද කරන්නට දැරූ උත්සාහය අසාර්ථක වුණා. වැරදුණු කුරුමානමේ කපිතාන්වරයාගේ -මගේ පැරණි මිත්‍රයාගේ- කථාවෙන් කියා පාන්නේ මේ කුරුමානම වැරදුණු හැටියි. අග්‍රාමාත්‍යතුමාත් පාර්ලිමේන්තුවට කථාව කරන කොට කියා සිටියා, එතුමාගෙන් ඉල්ලා අස්වීම ගන්න දවස් ගණනාවක්, සති ගණනාවක් සාකච්ඡා කරමින් ගනුදෙනු කළාය කියලා. ඒ කියන්නේ අග්‍ර විනිශ්චයකාරවරයා හැටියට එතුමාව පිළිගත්තා කියන එකයි. ඒ ගැන කිසි සැකයක් නැහැ. අපේ විදේශ ඇමතිතුමාගේ කථාවේ හෑල්ලක් කියැවුණා. විදේශ ඇමතිතුමා ඒ හෑල්ලේ සියලු දෙයින්ම කියන්නේ ඔහු අග්‍ර විනිශ්චයකාරවරයා හැටියට පිළිගත් බවයි. ඒ අග්‍ර විනිශ්චයකාරතුමාගෙන් ඉල්ලා අස්වීම ගැනීම ගැන එතුමා -මොහාන් පීරිස්- හා ඔබ අතර තිබුණු ගනුදෙනු ගැන හෝ රහස් සාකච්ඡා ගැන මා කථා කරන්න යන්නේ නැහැ. එය සිදු වුණේ නැති නිසා තමුන්නාන්සේලාට තිබුණු එකම පියවර තමයි, මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගරු කිරීම.

අග්‍ර විනිශ්චයකාරවරයකු ඉවත් කරන්නට හෝ ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයකු ඉවත් කරන්නට පුළුවන් වන්නේ, මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 ව්‍යවස්ථාව අනුව කටයුතු කිරීමෙනුයි. ඒ ව්‍යවස්ථාවට අනුව කටයුතු කරන්නට බැරි වීම තමයි අද මතු වී තිබෙන ප්‍රධාන ප්‍රශ්නය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිව, පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවයට පටහැනිව පාර්ලිමේන්තුවට ගරු කිරීමට පයින් ගහලා, අග්‍ර විනිශ්චයකාරවරයකු බලෙන් එළියට දමලා, වෙන කෙනකුව ඒ පුටුවේ දවසකට ඉන්දවා ඇති කළ විලම්බිත නාඩගම ලංකාවේ ශෝචනීයම අවස්ථාවක්ය කියන එක පළමුවෙන්ම මා කියන්න කැමැතියි.

The letter sent to the Chief Justice Mohan Peiris by the Secretary to the President undermines not only the sovereignty or the sanctity of Parliament but also the Judiciary. Because of the unconstitutional nature of the letter, today a lawfully-appointed Chief Justice stands displaced and supplanted by an interloper. I would say this is a historical blunder by a Government that came to power on the promise of Good Governance and the Rule of Law. You will never erase this blight that you have brought upon the Judiciary unless corrective measures are taken immediately.

According to the former Chief Justice Sarath N. Silva, nowhere in the world has anything of this kind happened nor will it ever happen. I think the former Chief Justice should be heard by the leader of the JVP. What the former Chief Justice has to say must be heard by the Front Benchers of the Government, except for the Hon. Rauff Hakeem, who voted with us to evict Mrs. Shirani Bandaranayake. I would like to remind that there were others, my good Friend, the Hon. (Dr.) Rajitha Senaratne, who also served on the Committee. I do not want to take much time because time is limited and I have been given only ten minutes.

The former Chief Justice says, "So, we have set a great example of good governance in ousting a Chief Justice who still remains the Chief Justice of this country". You are not a lawyer, Hon. Foreign Minister, I am not a lawyer. You have never been a judge; I have never been a judge. Here is a person who headed the Supreme Court of this country, Chief Justice Sarath N. Silva, who very clearly states about the violations that you all have done. I will demonstrate with clarity how illogically wrong the Prime Minister had been in receiving advice from a group of lawyers who have an axe to grind against Mohan Peiris.

We see, today, how Upul Jayasuriya settled scores with Mohan Pieris; how he enlisted a group of senior lawyers who had personal interest in ousting the Chief Justice because these wise men who were named by Upul Jayasuriya in his speech recently could not manoeuvre and peddle influence with the Bench.

I do not want to go further into that matter. I would now like to quote what is mentioned in the “Rivira” newspaper.

ගරු විදේශ කටයුතු ඇමතිතුමා කිව්වා, වලංගු නැහැයි කියලා. සරත් එන්. සිල්වා හිටපු අග්‍ර විනිශ්චයකාරතුමා සමඟ පැවති පුවත් පත් සාකච්ඡාවක් 2015 පෙබරවාරි 01වන ඉරිදා "රිවිර" පුවත් පතේ පළ වී තිබෙනවා. එහිදී එතුමාගෙන් අසා ඇති ප්‍රශ්නයක් සහ ඊට දී ඇති පිළිතුර මෙහි සඳහන් කරන්නම්.

"ප්‍ර - කෙසේ වෙතත් දෝෂාභියෝග යෝජනාවක් විනා අගවිනිසුරුතුමිය තනතුරින් ඉවත් කිරීමේ යෝජනාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ නැති බවක් කියනවා නේද?

පි - එහෙම කියන එක වැරදියි. අගවිනිසුරුතුමිය ඉවත් කිරීමේ යෝජනාවක් නැතැයි එදා විපක්ෂය පාර්ලිමේන්තුවේදී විරෝධයක් ඉදිරිපත් කළා. ඒ අවස්ථාවේදී කථානායකවරයාගේ නියෝගයක් අනුව තේරීම් කමිටු ක්‍රියාමාර්ගයක් ගන්නා ලද නිසා බණ්ඩාරනායක මහත්මියට තනතුරින් ඉවත්කිරීමේ යෝජනාවක් සේ සලකා පාර්ලිමේන්තුවේ ඡන්දය විමසන බව කථානායකවරයා ප්‍රකාශ කළා.

ඒ අනුවයි ඡන්දය පැවැත්වුණේ. අදාළ පාර්ලිමේන්තු ක්‍රියාදාමය තීරණය කළ යුත්තේ කථානායකවරයායි. ඊට ඉහළින් අධිකරණයට කිසිවක් කළ නොහැකියි. මේ සියලු කඩඉම් පසු කිරීමෙන් අනතුරුවයි එවක ජනාධිපතිවරයා බණ්ඩාරනායක මහත්මියව තනතුරින් ඉවත් කරන්නේ. අනෙක් වැදගත් කාරණය තමයි බණ්ඩාරනායක මහත්මිය තනතුරින් ඉවත් කිරීමෙන් පසුව ගතවූ අවුරුදු දෙකක කාලය ඇතුළත කිසිදු අවස්ථාවක එකී ක්‍රියාමාර්ගයට එරෙහිව කිසිවකුත් මේ දක්වා උසාවි නොයෑම."

මෙන්න, හිටපු අග්‍ර විනිශ්චයකාර සරත් එන්. සිල්වා මැතිතුමා ඉතා පැහැදිලිව ප්‍රකාශ කර තිබෙන දේ. මේ වාගේම තව කොටසක් කියන්න තිබුණත් මට කාලය මදි. නමුත් එතුමා දෙන පිළිතුරක් සඳහන් කරන්නට ඕනෑ:

"නෑ. ජනාධිපතිවරයාගේ නියෝගයක් මගින් ඔහුගේ තනතුර අහිමි වෙනවා නම් ඔහුට ඊට එරෙහිව පිළිසරණක් නෑ. ඔහු අසරණයි. මේක බරපතළ කාරණයක්. 1802 ඉඳලා මේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණයක් ක්‍රියාත්මක වෙනවා. මේ ආකාරයේ සිදුවීමක් ඉතිහාසයේ කවරදාකවත් වෙලා නෑ. මොහාන් පීරිස් මහතාට එරෙහිව කිසිදු පරීක්ෂණයක් පවත්වලා නෑ. එහෙත් ඔහුට තනතුරින් ඉවත් වන ලෙස බලපෑම් කරලා තියෙනවා. මේක අධිකරණයේ ස්වාධීනත්වයට තර්ජනයක්."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ කාරණා දෙක විශේෂයෙන් සඳහන් කරමින් මා මේ කාරණයත් කියන්න ඕනෑ.

මොහාන් පීරිස් මහතා අග්‍ර විනිශ්චයකාර තනතුරේ සිටියේ නැහැ කියන කතාන්තරය අද ඔබතුමන්ලා කියනවා. පාප්තුමා ලංකාවට ආවාම "මේ අපේ රටේ අග්‍ර විනිශ්චයකාරවරයා" කියලා හඳුන්වා දුන්නේ ඔබේ රජයේ නායකයා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ආරාධනයක් නැතුවයි ආවේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ආරාධනයක් ඇතිව හෝ නැතිව ආපු මිනිහාව හඳුන්වලා දුන්නේ එහෙමයි. මෝඩ කථා කියන්න එපා. ආරාධනයක් ඇතුව හෝ නැතුව ආපු කෙනාව හඳුන්වලා දුන්නේ එහෙමයි. මෝඩ කථා කියන්න එපා. "මෙන්න මගේ රටේ අග්‍ර විනිශ්චයකාරතුමා" කියලා හඳුන්වලා දුන්නා. පාප්තුමා ආගමික නායකයෙක් විතරක් නොවෙයි, ස්වාධීන වතිකානු රාජ්‍යයේ ප්‍රධානියා. ඒ නිසා තමුන්නාන්සේලා මේ බොරුව කියලා කියලා මෙතුමාගෙන් ඉල්ලා අස්වීම ගන්න බැරි වුණාම අර නීතිඥ කණ්ඩායම ගිහිල්ලා ජනාධිපතිතුමාට බලපෑම් කළා, බලෙන් ශිරානි බණ්ඩාරානායක මහත්මියව තනතුරේ ඉන්දවන්න.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති "ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන් පත් කිරීම හා ඉවත් කිරීම" ව්‍යවස්ථාව වන 107වන ව්‍යවස්ථාව අපි කවුරුත් දන්නවා. Article 107 of the Constitution is very clear as to how you could remove a Supreme Court Judge. I repeat it because you all have not followed that procedure, which was followed for the removal of Shirani Bandaranayake.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟ කාරණාව මෙයයි. අපේ කථානායකතුමා මේ පාර්ලිමේන්තුවේ උත්තරීතර බව ආරක්ෂා කරමින් කටයුතු කළාය කියන එක මම යළිත් කියනවා. එදා, 2013 ජනවාරි 11වැනිදා දෝෂාභියෝගය සාකච්ඡා කරන අවස්ථාවේදී ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා ඇතුළු මන්ත්‍රීවරුන් මතු කළ කාරණාව ගැන ගරු කථානායකතුමා කළ ප්‍රකාශය මම කියවන්නම්. එදින හැන්සාඩ් වාර්තාවේ 650වැනි තීරුවේ මෙන්න මේ විධියට තිබෙනවා:

"ගරු ඇමතිවරුනි, ගරු මන්ත්‍රීවරුනි, අදාළ ස්ථාවර නියෝග හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන මම අධ්‍යයනය කර බැලුවෙමි.

ජනාධිපතිතුමාට යෝජනාවක් ඉදිරිපත් කිරීම සඳහා මා වෙත මන්ත්‍රීවරුන් අත්සන් කොට ලබා දෙන ලද යෝජනා සම්මතයට අමතරව අලුත් යෝජනාවක් ඉදිරිපත් කළ නොහැකි බව මම ප්‍රකාශ කරමි.

දැනට ඉදිරිපත් කර ඇති යෝජනාව හොඳින් අධ්‍යයනය කර බැලීමේදී මෙම යෝජනාව ඉදිරිපත් කොට ඇත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107(2) ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 107(3) ව්‍යවස්ථාව සහ 78(අ) ස්ථාවර නියෝගය යටතේ බව ඉතා පැහැදිලිව සඳහන් කොට ඇත.

තවද, මෙම යෝජනාවෙන් බලාපොරොත්තු වන්නේ ඉහත සඳහන් විෂමාචාර චෝදනා හේතුවෙන් එම විෂමාචාර චෝදනා පිළිබඳ පරීක්ෂණය කොට එම චෝදනා එකක් හෝ ඊට වැඩි ගණනක් ඔප්පු වී ඇතැයි විශේෂ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබුවහොත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍ර විනිශ්චයකාර පදවියෙන් ගරු ආචාර්ය උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මිය ඉවත් කිරීම සඳහා යෝජනාවක් අතිගරු ජනාධිපතිතුමාට ඉදිරිපත් කළ යුතු යැයි සඳහන් වන බැවින් මෙම යෝජනාවේ පරමාර්ථය ඉතා පැහැදිලි වන අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107(2) ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 107(3) ව්‍යවස්ථාව ප්‍රකාර යෝජනාවක් ඉදිරිපත් කිරීමට අද දින න්‍යාය පත්‍රයේ අඩංගු කර ඇති යෝජනාව ප්‍රමාණවත් වන බව මම ප්‍රකාශ කරමි."

එය තමයි, ගරු කථානායකතුමා දුන්න නියෝගය. මේ නියෝගය වැරැදියි කියලා පාර්ලිමේන්තුවට නිගා කරන්නට අද කණ්ඩායමක් උත්සාහ දරනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුවේ උත්තරීතර බව ආරක්ෂා කිරීම අප කාගේත් වග කීමක්.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන් වෙමින් තිබෙනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණයත් කියලා මම කථාව අවසන් කරන්නම්.

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

එම යෝජනාව පිළිබඳ ඡන්දය විමසීමෙන් පසුවද, ගරු කථානායකතුමා එම හැන්සාඩ් වාර්තාවේ 666වන තීරුවේ එම තීරණය යළිත් ප්‍රකාශ කර තිබෙනවා. ඒ නිසා මා හිතනවා ගරු අග්‍රාමාත්‍යතුමා පාර්ලිමේන්තුවට කළ ප්‍රකාශය වැරැදියි කියලා. අනෙක් ඇමතිවරුන් පාර්ලිමේන්තුවට කළ ප්‍රකාශයනුත් වැරැදියි. අප ඉතා ඕනෑකමින් කියන්නේ මේ කාරණයයි. චෝදනාවක් තිබෙනවා නම්, අග්‍ර විනිශ්චයකාරවරයා ඉවත් කළ හැක්කේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 ව්‍යවස්ථාව යටතේ පමණයි. එසේ නැතිව, ජනාධිපතිතුමාට හිතෙන විධියට, අගමැතිතුමාට හිතෙන විධියට, උපුල් ජයසූරියට හිතෙන විධියට අග්‍ර විනිශ්චයකාරවරුන් ඉවත් කරන්න බැහැ. තවත් අග්‍ර විනිශ්චයකාරවරයකු පත් කරන්නට පුළුවන් වන්නේ හිටපු අග්‍ර විනිශ්චයකාරවරයාව නීත්‍යානුකූලව ඉවත් කළොත් විතරයි.

What I fear is that we are going into a state of anarchy. You all are violating the Constitution from the day of swearing in under the pretext of Good Governance. There is no good governance. You all are violating the Constitution in the fear that you will not have a majority vote in Parliament. This is the fear that you all have - that you cannot come to Parliament. I state very confidently, had you come to Parliament and had an inquiry on the charges that the Hon. Minister of Foreign Affairs had laid before the House, we, in Parliament would have supported if it was established. We do not want a violation of the Constitution. This is an anarchy that you all are promoting today.

එම කාරණය ප්‍රකාශ කරන අතරම, මේ භයානක තත්ත්වය වළක්වන්න, මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගරු කරන්න, මේ කළ වැරැද්ද නිවැරදි කරන්න කටයුතු කරන්න කියලා අප ඔබට බල කර සිටිනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බොහොම ස්තූතියි.

මීළඟට ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා.

[අ.භා. 4.28]

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதார மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health and Indigenous Medicine)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ අග්‍ර විනිශ්චයකාරවරයකු පිළිබඳ යෝජනාවක් සම්බන්ධයෙන් විවාදයකට මම මේ සහභාගි වන්නේ තුන්වැනි වරටයි.

මා පළමුවෙන්ම කියන්න කැමැතියි, අපේ ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා දිගින් දිගටම කියපු සරත් එන්. සිල්වා හිටපු අග්‍ර විනිශ්චයකාරවරයා ගැන. ඔහු එදා මුළු අධිකරණ ක්ෂේත්‍රයේම දූෂිත අන්දමින් ක්‍රියා කරන වෙලාවේ, අප ඔහුට විරුද්ධව ක්‍රියා කළා. මා හිතන්නේ වික්ටර් අයිවන් මහත්මයාගේ පොතේ මුළු පාර්ලිමේන්තුවෙන්ම ස්තූති කර තිබුණේ අප දෙදෙනෙකුට විතරයි. ඒ වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාට සහ මටයි. අප නොසැලී, අවසාන දිනය දක්වා ඒ දූෂිත අග්‍ර විනිශ්චයකාරවරයාට විරුද්ධව ක්‍රියා කළා. එදා මම මූලික වෙලා තමයි ඒ අග්‍ර විනිශ්චයකාරවරයාට විරුද්ධව මේ පාර්ලිමේන්තුවට දෝෂාභියෝග යෝජනාව ඉදිරිපත් කළේ. ඒ දූෂිත අග්‍ර විනිශ්චයකාරවරුන්ව ආරක්ෂා කරන්න නම් අප කටයුතු කරන්නේ නැහැ.

සමහර මන්ත්‍රීවරුන් ක්‍රමවේදය ගැන මෙතැනදී කථා කළා. ක්‍රමවේදය ගැන අපට කථා කරන්න පුළුවන්. නමුත් දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා මොහාන් පීරිස් - එවැනි දූෂිතයෙක් - වෙනුවෙන් කථා කිරීම ගැන මට කනගාටුයි. එදා හිටපු අග්‍ර විනිශ්චයකාරවරයාට විරුද්ධව අප ඒ කාර්ය භාරය කළා. ඔහු ගියා. ඊට පසුව ආවේ ශිරානි බණ්ඩාරනායක මහත්මියයි. එතුමියගේ වැරැදි අප දැක්කා. මම එදාත් කිව්වා; අදත් කියනවා; හෙටත් කියනවා. මගේ ස්ථාවරයේ වෙනසක් නැහැ.

විජිත හේරත් මන්ත්‍රීතුමා කථාවක් කළා. එතුමාගේ කථාවේ ඒ කොටස මම පිළිගන්නේ නැහැ. මට ඉතාම හොඳින් අවබෝධ වුණා, එතුමිය කරපු වැරැදි ටික. නමුත් එතුමියගේ ඒ චෝදනා ගැන විභාගයේදී කොයි වෙලාවකවත් මම එතුමියට වචනයකින්වත් ගැරහුවේ නැහැ.

මම හැම කිස්සේම එතුමියට කථා කළේ, "Honourable Chief Justice" කියලායි. මම එතුමියට address කළේ, "Your Honour" කියලා. මම එතුමියට වැදගත් විධියට කථා කරලා කරුණු ඉදිරිපත් කළා. එතුමිය කළ වැරදි ගැන, එහි තිබුණු දූෂිත ගනුදෙනු ගැන මම කථා කළා. මම එතුමියට ප්‍රසිද්ධියේ කිව්වා, "මම විශ්ලේෂණය කරන ක්‍රමය වැරදි වෙන්න පුළුවන්" කියලා. මොකද, මේ චෝදනා ඉදිරිපත් වෙලා තිබුණේ අග්‍ර විනිශ්චයකාරවරියකට විරුද්ධවයි. ඉතින් අපි බොහොම පරිස්සම් වන්නට ඕනෑ. සාමාන්‍යයෙන් දේශපාලනඥයන්, දේශපාලනඥයන් බැණ ගන්නවා වාගේ නොවෙයි. රටක අධිකරණයට විරුද්ධව චෝදනා ඉදිරිපත් කරනකොට මුළු අධිකරණ ක්ෂේත්‍රයම කඩාගෙන වැටෙන්නට පුළුවන්. ඒ නිසා දේශපාලනඥයන් විධියට අපි පරිස්සම් වන්නට ඕනෑ. ඒ නිසා මම පැහැදිලිවම එතුමියට කිව්වා, "ඔබතුමියගේ ගනුදෙනු ගැන මම මේ කරන විග්‍රහය වැරදි වන්නට පුළුවන්; මම විශ්ලේෂණය කරන විධිය වැරදි වන්නට පුළුවන්" කියලා. එහෙම නම් ඔබතුමිය අපිට කියන්න, "මේ ගනුදෙනු හරි. නමුත් ඔබතුමා පැහැදිලි කරන ක්‍රමය වැරදියි" කියලා. එහෙම නම් මම ඒ වෙලාවේම සමාව අරගෙන එය පිළිගන්නම් කියලා මා කිව්වා. නමුත් එතුමිය කවදාවත් අපට අපි විශ්ලේෂණය කරපු ක්‍රමය වැරදියි කියලා කිව්වේ නැහැ. ඒ නිසා එතුමියට විරුද්ධවත් මම ඒ රජය තුළ සිටියා. එක් අයකුව ඉවත් කරලා, තවත් වැරදිකාරයකුව ගෙනෙන්න අපට ඕනෑ නැහැ. ඒක නොවෙයි අපේ අභිප්‍රාය වන්නේ. අපට තේරෙන අන්දමින් අපේ අධිකරණය පිරිසිදු කර ගැනීමයි අපේ අභිප්‍රාය වන්නේ. මම හිතන විධියට ඒක තමයි හැම මහජන නියෝජිතයකුම කළ යුත්තේ. එහෙම නැතිව තමන්ගේ පැත්තට ආවාම, "හොඳයි" කියන එක නොවෙයි.

අපේ ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා මේ රටේ මිනිසුන්ගේ සෞඛ්‍ය වෙනුවෙන් දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ගෙනාපු අවස්ථාවේ එදා ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා මේ ආසනයේ ඉඳගෙන හැසිරුණේ කොහොමද? කෑ ගැහුවේ කොහොමද? සමහර වෙලාවට රජයන් සමඟ ඉන්න විට අපිට යම් යම් දේවල් කරන්නට සිදු වෙනවා. නමුත් ඒවාට සීමාවන් තිබිය යුතුයි. අපිට කියලා ප්‍රතිපත්තියක් තිබෙනවා වාගේම අපිට පිට කොන්දකුත් තිබිය යුතුයි. අපේ ආත්ම ගරුත්වය පාවා දීලා නායකයන් රකින්නට අපට බැහැ. ඒ විධියට කරලා ඒ නායකයාව රකින්නත් බැහැ. එතකොට මිනිස්සු අපිව ගණන් ගන්නේ නැහැ; ඉන් පසුව නායකයාව ගණන් ගන්නෙත් නැහැ.

එදා මේ ක්‍රියාදාමය සිදු වුණා. මේ ක්‍රියාදායම සිදු වන විට මම කෙළින්ම බැසිල් රාජපක්ෂ මහත්මයාට කිව්වා, "ඒගොල්ලන් තව දින ඉල්ලනවා. බැසිල්, අපි මේ දින දෙමු" කියලා. මොකද, මම ඒ වනකොට නෙවිල් සමරකෝන් මහත්මයා පිළිබඳව පැවැති පරීක්ෂණය අධ්‍යයනය කරලා තිබුණා. එදා හිටපු ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයාට අවශ්‍ය වෙලා තිබුණා කොහොම හරි නෙවිල් සමරකෝන්ව එළියට දමන්න. නමුත් එදා ඒ විභාගය කළ මැති ඇමතිවරුන්ට ආත්ම ශක්තියක් තිබුණා. තමන්ගේ නායකයාට කොපමණ වුවමනාව තිබුණත්, නෙවිල් සමරකෝන් මහත්මයාට කල් දෙමින්, කල් දෙමින් ඒ පරීක්ෂණය කරන්නට එදා ඒ මිනිසුන්ට පිට කොන්දක් තිබුණා. ඒක දැක්ක නිසා මම කිව්වා, "නෙවිල් සමරකෝන්ටත් මාස ගණනාවක් කල් දුන්නා. ඒ නිසා අපි මෙතුමියටත් කල් දෙමු, එහෙම නැත්නම් හොඳ නැහැ" කියලා.

මොකද, මෙහි ප්‍රශ්නයක් තිබෙනවා. ජේ.ආර්. ජයවර්ධන මහත්මයා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන් පත් කිරීම හා ඉවත් කිරීම සඳහා ඇති කර තිබෙන ක්‍රමවේදය ගැන ප්‍රශ්නයක් තිබෙනවා. මේ ක්‍රමවේදය ඉතා ඉක්මන් විභාගයක්. ඇයි? ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ විනිසුරුවරුන්ව ධුරයෙන් ඉවත් කිරීමේ ක්‍රියාවලියේදී ඔවුන්ගේ සේවය අත් හිටුවන්නේ නැහැ. එතැනින් පහළ සියලු උසාවිවල විනිසුරුවරුන් සම්බන්ධව කටයුතුවලදී අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් මූලික පරීක්ෂණයක් කරලා එදිනම සේවය අත්හිටුවලා තමයි අනෙක් විභාගය කරන්නේ. නමුත් ඉහළ අධිකරණවල විනිසුරුවරුන් සම්බන්ධයෙන් එවැනි ක්‍රමයක් නැති නිසා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා ගත්තේ වැරදි ක්‍රියා මාර්ගයක්. එදා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාට මේ ව්‍යවස්ථාව මඟින් ඒක නොවෙයි කරන්නට තිබුණේ.

එදා මම රජය වෙනුවෙන් ශිරානි බණ්ඩාරනායක මැතිනිය සම්බන්ධ පරීක්ෂණයට සහභාගි වෙමින් -රජයත් ආරක්ෂා කරගෙන- පැහැදිලිව ප්‍රකාශයක් කළා. මොකක්ද? මම එදාත් කිව්වා, මේ ක්‍රමය නොවෙයි නිවැරදිම ක්‍රමය කියලා. ඒක මම පිළිගන්නවා කියලා කිව්වා. මම මේ පරීක්ෂණයට සහභාගි වුණත් මේක නොවෙයි නිවැරදිම ක්‍රමය, නියමිත ක්‍රමය නම්, ඊටත් වඩා උසස් විනිසුරු මඩුල්ලකින් ඒ අග්‍ර විනිශ්චයකාරගේ හරි වැරැද්ද සෙවීමයි කියන එක එදා මා කිව්වා. ඒ සඳහා කල් ගත වෙයි, මාස 6ක්. ඒ නිසා මම එදා පැහැදිලිවම යෝජනා කළා, වහාම අග්‍ර විනිශ්චයකාරවරයාගේ හෝ ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයාගේ සේවය අත්හිටු**වා** විභාගය පැවැත්වීමේ ක්‍රමවේදය පිළිපදින්නට ඕනෑ කියලා. තිබෙන ක්‍රමය හරි, ඒක ක්‍රමවත් වන්න නම් ඒ ක්‍රමවේදය පිළිපදින්නට ඕනෑ. මොකද, විත්තිකරුවෙකුට තව කෙනෙකුගේ නඩුවක් අහන්නට බැහැ.

අපි ශිරානි බණ්ඩාරනායක මහත්මියගේ එම පරීක්ෂණ කටයුතු අවසන් කරලා සිටින විට, එක්තරා ඉරිදා දිනයක මා හිටපු ජනාධිපතිවරයාව හමුවුණා මට මතකයි. මට එතුමාව හමුවන්නට ඕනෑ යි කියලා කිව්වාම, ජනාධිපතිතුමා කිව්වා, "රාජිත උදේ එන්න, මමත් සමඟ උදේ කෑම කන ගමන් අපි කථා කරමු" කියලා. මම ගියා. එදා එතුමා බොහොම නිවී සැනසිල්ලේ සිටියා. අපි දෙදෙනා විතරයි සිටියේ. වෙන කවුරුවත් ජනාධිපති මන්දිරයේ සිටියේ නැහැ. අපි දීර්ඝව කථා කළා.

මගේ වැඩ ටිකත් කථා කරලා ඉවර වෙලා, සෙටියේ වාඩි වෙලා ඉන්න ගමන් එතුමා කිව්වා, "රාජිත දැන් අලුතෙන් අග්‍ර විනිශ්චයකාරවරයෙක් පත් කරන්නට ඕනෑ, මම හදන්නේ මොහාන් පීරිස්ව පත් කරන්න" කියලා. මම කිව්වා, "ඒක නම් කරන්න එපා" කියලා. මම මේ විධියටම අත් දෙක උස්සලා ඒක කරන්න එපා කියලා කිව්වා. මම කිව්වා, එක්දහස් නවසිය අසූ ගණන්වල ඉඳලා මොහාන් මගේ මිත්‍රයා, මොහාන් පීරිස්ව දැම්මොත් telephone call එකකින් නඩුවක් කථා කර ගන්නට තීන්දුවක් ගන්නට මටත් පුළුවන්, හැබැයි අපි මේ කරපු වැඩේ මෝසම් වරුසාවේ ඔරු පදිනවා වාගේ වෙනවා කියලා. මේ සම්බන්ධයෙන් මුළු රටක් අපිට විරුද්ධයි කියලා මම කිව්වා. ශිරානි බණ්ඩාරනායක හරි හෝ වැරදි වේවා ඒ වෙලාවේ අපිට විරුද්ධව රට නැඟී සිටියා. මුළු අධිකරණයම නැඟී සිටියා. නීතිඥවරු විතරක් නොවෙයි ලංකා ඉතිහාසයේ පළමුවෙනි වරට විනිශ්චයකාරවරු නැඟී සිටියා. පහළ මහෙස්ත්‍රාත් උසාවියේ ඉඳලා ශ්‍රේෂ්ඨාධිකරණය දක්වා සියලුම විනිසුරුවරු ඒ වෙලාවේ ශිරානි බණ්ඩාරනායක වෙනුවෙන් නැඟී සිටියා. ඒක තමයි යථාර්ථය. ඒ යථාර්ථය තුළ ඉඳගෙන තමයි අපි වැඩ කළේ.

මම කිව්වා ජනාධිපතිතුමනි, මෝසම් වරුසාවේ ඔරු පදිනවා වාගෙයි අපි වැඩ කරලා තිබෙන්නේ, එහෙම කරලා අපි බොහොම අමාරුවෙන් ගොඩට ආවා, ඒ නිසා මේක කරන්න එපා, මේක කළොත් - මොහාන් පීරිස්ව පත් කළොත්- අපි මේ කළ සියලු ක්‍රියාදාමය දේශපාලන ක්‍රියාදාමයක් බවට සනාථ වෙනවා කියලා. ඒ සැරේ මට මොකක්ද හිටපු ජනාධිපතිතුමා කිව්වේ? "නෑ රාජිත, ඉවරයක් නැහැ නේ, නහින්න හදනවා" කියලා කිව්වා. මම කිව්වා, කොච්චර නහින්න හැදුවත්, මේක කළොත් ඔබතුමාගේ ආත්ම ගරුත්වයත් ඉවරයි, මේකට වාඩි වුණු අපේ ආත්ම ගරුත්වයත් ඉවරයි කියලා. ජනාධිපතිතුමාගෙන් ගිහිල්ලා අහන්න. ජනාධිපතිතුමාට අපි නිවැරදි දේවල් කිව්වා, කළ යුතු දේවල් ගැන කිව්වා. අපි බොරුවට ජනාධිපතිකම්වලට බය වෙලා ඉඳලා ඊට පස්සේ එළියට ඇවිල්ලා කථා කළේ නැහැ. මම කිව්වා, "මොහාන් පීරිස් පත් කරන්න එපා" කියලා. ඔහු දේශපාලන පුද්ගලයෙක්, ඔහු කැබිනට් මණ්ඩලයේ උපදේශකවරයෙක්, ජනාධිපතිතුමාගේ උපදේශක, සමාගම්වල නියෝජිතයෙක්, ඔහු රජයේ ආයතනවලට සම්බන්ධ වෙලා තිබෙනවා, එහෙම කෙනක්ව දැම්මොත් අපිට හොඳ නැහැ, කවුරු හරි ශ්‍රේෂ්ඨාධිකරණයේ සිටින පුද්ගලයෙක් ඔය තනතුරට පත් කරන්න කියලා මම කිව්වා. එතකොට මේක ගැන මිනිසුන්ට ඇති වෙලා තිබෙන සැක සංකාවල් නැති වෙලා, ඇත්තටම මේ ශිරානිගේ වැරැද්ද මිසක් තමන්ගේ මිනිහෙක් appoint කරන්න නොවෙයි මේක කළේ කියලා හිතනවා කියලා මම කිව්වා. නමුත් දවස් හතරකට පහකට පස්සේ මට ආරංචි වුණා ඔහුව පත් කරනවා කියලා. මම දැන ගත්තා බලපෑම වැඩියි කියලා. එතැනින් අර සියලු කටයුතු හේදිලා ගියා. මම දැක්කා මේ මොහාන් පීරිස් මහතා අලුත් අවුරුද්ද දවසේ හිටපු ජනාධිපතිතුමාත් එක්ක කිරි බත් කනවා. මොන විළි ලජ්ජා නැති වැඩක් ද?

අග්‍ර විනිශ්චයකාර ජී.පී.එස්. ද සිල්වා මහතා ප්‍රතිකාර ගැනීම සඳහා දිගටම ආවේ මගේ ළඟට. මම ඒ ප්‍රතිකාර කිරීමේ කටයුතු දේශපාලනය වෙනුවෙන් නවත්වන තුරුම එතුමා මා ළඟටයි ආවේ. අපි දෙන්නා බොහොම මිත්‍ර හින්දා මම එක දවසක් ජී.පී.එස්. ද සිල්වා මහතාට කථා කරලා මගේ පුතාගේ උපන් දින සාදයට එන්න කියලා කිව්වා. රාත්‍රී භෝජන උත්සවයක් අපේ ගෙදර තිබුණේ. එතුමා මගෙන් ඇහුවා "රාජිත, කොච්චර කට්ටිය එනවාද?" කියලා. මම කිව්වා, වෛද්‍යවරු එනවා, මගේ දේශපාලන මිතුරෝ එනවා කියලා. එතුමා කිව්වා "මම කවදාවත් තේ පැන් සංග්‍රහයකට, දිවා භෝජන සංග්‍රහයකට, රාත්‍රී භෝජන සංග්‍රහයකට යන්නේ නැහැ" කියලා. එහෙමයි එදා අග්‍ර විනිශ්චයකාරවරයෙක් කිව්වේ. කිසි දවසක යන්නේ නැහැ. "ඔයා මට වෙනමම ආරාධනා කරන්න ගෙදරට, නැත්නම් මම ඔයාට ආරාධනා කරන්නම්, අපි දෙන්නා හමුවෙලා කාලා බීලා කථා කරමු" කියලා එතුමා කිව්වා. ඔන්න අග්‍ර විනිශ්චයකාරවරු. මේ අග්‍ර විනිශ්චයකාරවරු හැසිරෙන හැටි දැක්කාම මට මේක හැමදාම මතක් වෙනවා. ඒ තමයි ජී.පී.එස්. ද සිල්වා මහතා මගේ යෝජනාව ප්‍රතික්ෂේප කරපු හැටි. එහෙම පොදු තැනකට ඒ ගොල්ලෝ කවදාවත් ආවේ නැහැ. මොකද එතැනට එනවා නඩුහබවලට සම්බන්ධ උදවිය, එතැනට එනවා නඩුවල පැමිණිලිකරුවන්. එතකොට අමාරු තත්ත්වයකට පත් වෙනවා. මම කියන්නේ නැහැ එහෙමම ඉන්න ඕනෑ කියලා. එහෙව් ශ්‍රේෂ්ඨාධිකරණයකට තමයි මේ විපත්තිය පසු ගිය කාලයේ සිදු වුණේ.

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

මේ සිද්ධියේදී ශ්‍රී ලංකා නීතිඥ සංගමය බොහොම වීරෝදාරව සටන් කරනවා මම දැක්කා. විනිශ්චයකාරවරු බොහොම වීරෝදාරව සටන් කරනවා මම දැක්කා. ඒ රජයේ ඉඳිමින්, ඒ ක්‍රියාවලියට සහභාගි වෙමින් ඒ යථාර්ථයත් අපි දැක්කා. බොරු කියන්න ඕනෑ නැහැ. මුළු රටක් නැතී සිටිනකොට ඒක තේරෙන්නේ නැත්නම් අපි දේශපාලන අන්ධයෝ. අපි දේශපාලන අඳ බාලයෝ. ස්වාධීන රූපවාහිනිය මඟින් විකාශය කරන "හත්වෙනි පැය" වැඩසටහනට සහභාගි වුණු වෙලාවේ මම ශිරානි බණ්ඩාරනායක ගැන කථා කළේ බොහොම ආරක්ෂිත අන්දමින්. මොකද මම දන්නවා ඇය පිටුපස තිබුණු බලවේගය මොකක්ද කියලා. ඒ ගැන දැන ගනිමින් තමයි ඇයට විරුද්ධව කථා කළේ. තිරස්චීන විධියට පහර ගහමින් කථා කළේ නැහැ. ඇයට අනුකම්පා වන විධියට මම කොයි වෙලාවෙත් කථා කළේ. මා එහිදී කිව්වේ මොකක්ද? අරගෙන බලන්න ඒ "හත්වෙනි පැය" වැඩසටහන. මම කිව්වේ, "එතුමිය ගරු අග්‍ර විනිශ්චයකාරතුමිය. එතුමිය හරි වෙන්න පුළුවන්. මට හෙට මේක පහදා දෙන්න. මම අනිද්දාට අග්‍ර විනිශ්චයකාරතුමියගෙන් සමාව ඉල්ලලා ප්‍රකාශයක් කරනවා" කියලායි. අන්න එහෙමයි අපි ඇයට විරුද්ධව ක්‍රියා කළේ.

මොහාන් පීරිස් මහත්මයා ඉල්ලුවා සාකච්ඡාවක්, ජනාධිපතිතුමා සහ අගමැතිතුමා එක්ක. එතුමාට එන්න කියලා කිව්වා. මේවා අපට වාර්තා කළේ මේ යෝජනාව ගෙනාපු අද නොවෙයි; එදාමයි. ආරාධනා කළාම ඔහු ආවේ කාත් එක්කද? ඔහුගේ භාර්යාව සහ මිත්‍රයන් වූ වෛද්‍යවරුන් දෙදෙනකු සමඟයි ආවේ. හරි නම් එන්න ඕනෑ නීතිඥවරුන් අරගෙන නීතිය පිළිබඳව කථා කරන්න නේ. එහෙම ආවේ නැහැ. එතැනදී කිසිම සාකච්ඡාවක් කළේ නැහැ මිත්‍රයන් ඉස්සරහා. එතුමා ඇවිල්ලා එතුමා කරපු දේවල් ගැන කිව්වා. එතුමා ඒ වෙලාවේදීත් කිව්වා, "මම රජයට සහයෝගය ලබා දෙමින් රජයත් එක්ක කටයුතු කරන්න කැමැතියි" කියන එක. එතැනදී ඒ කථාව නිම වුණා. 27වන දා උදේ ඔහු ජනාධිපතිතුමාට කථා කරලා තිබෙනවා. එදා තමයි අලුත් කඩේ උසාවියට මේ අර්බුදය ආපු දවස. මට ඒ ගැන කිව්වා. එදා උදේ 7.30ට ජනාධිපතිතුමාට කථා කරලා පැහැදිලිව ඔහු කියලා තිබෙනවා, "මට කිසි දෙයක් කරන්න එපා. ඔබතුමන්ලාට අවශ්‍ය සියලු තීන්දු මම ලබා දෙන්නම්" කියලා. මේ, මොන අග්‍ර විනිශ්චයකාරවරයෙක්ද? මහෙස්ත්‍රාත් අධිකරණයක නඩුකාරයකු හෝ මෙහෙම කිව්වොත්, මම නම් ඔහු සත පහකට ගණන් ගන්නේ නැහැ. මට කොච්චර වාසි වුණත් මම නම් ඔහු සත පහකට ගණන් ගන්නේ නැහැ. වැඩේ කර ගත්තත් ගණන් ගන්නේ නැහැ ඒ වාගේ අය. ඔහු ඒ විධියට බයාදු වුණා; තානාපතිකම්වලට ගනුදෙනු කළා; පස්සෙන් ආවා. පාප් වහන්සේට හඳුන්වා දුන්නාය කිව්වා. ඔබතුමන්ලා දන්නවාද, මෙයාව අපි පිළිගන්නේ නැහැ, මෙයාව ගෙනෙන්න එපා, මෙයාට එන්න දෙන්න එපා කියලා කිව්වා. මොහු බලෙන් ආවා. කතෝලිකයකු වශයෙන් කාදිනල් හිමිපාණන් වහන්සේට කථා කරලා, ඒ හරහා ඉල්ලීම කරලා pass එකක් අරගෙන ආවා. ඔහුට අන්තිම කොනේ පුටුවකුයි දීලා තිබුණේ. තමුන්නාන්සේලා දැක්කා නම් හරි. මමත් එතැන වාඩි වෙලා සිටියා ගරු කථානායකතුමා එක්ක. ගරු කථානායකතුමා සිටියා මාත් එක්කම වාඩි වෙලා. ඊට පස්සේ එතුමා ඉල්ලීමක් කළා මඩු දේවස්ථානයට ඒ ගුවන් යානයේ යන්න. නමුත් ඒකත් ප්‍රතික්ෂේප කළා. ඒ අවස්ථාව දුන්නේත් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප මතක තියාගන්න ඕනෑ කාරණයක් තිබෙනවා. හිටපු ගරු ඩිව් ගුණසේකර ඇමතිතුමාට මෙය මතක ඇති. එදා ගරු විපක්ෂ නායකතුමා මෙතැන ඉඳලා කථා කළා. අවසාන මොහොතේ එතුමා ඔය නීති ප්‍රශ්නය ඉදිරිපත් කළා. එතකොට මම ඉක්මනට මේ Order Paper එක බැලුවා. ඒක බැලුවාම මම මවිතයට පත් වුණා. ඒ යෝජනාව ගෙනාවේ නිමල් සිරිපාල ද සිල්වා මහත්මයායි. වෙනත් කවුරුවත් නොවෙයි. ඒ

වෙලාවේ එතැන සිටියා ඩිව් ගුණසේකර මැතිතුමා. මම කිව්වා, "ඩිව්, මේ බලන්න කෝ! මේකේ ලොකු ප්‍රශ්නයක් තිබෙනවා නේ. කමිටුවක් පත් කිරීම ගැන නේ මේ තිබෙන්නේ" කියලා. එතුමාත් ඒක බලා ඔළුවට අත ගහලා කිව්වා, "ඔව්, ඇත්ත" කියලා. කොහොම හරි එදා බොහොම අමාරුවෙන් අපේ ගරු කථානායකතුමා අපව බේරා ගත්තා. මොකක්ද, මෙහි පැහැදිලිවම තිබෙන්නේ? සියලු නීතිවේදීන් අපට මේක පෙන්වා දුන්නා. මේ රජය මටත් එය නැවත පෙන්වා දුන්නා, මේ අර්බුදය විසඳන්න කථා කරපු වෙලාවේ. ඒ යෝජනාවේ මුල ඉඳලාම පැහැදිලිව කියන්නේ මොකක්ද කියලා බලන්න. එහි මෙසේ සඳහන් වෙනවා:

> "එබැවින්, ඉහත සඳහන් විෂමාචාර චෝදනා හේතුවෙන්, එම විෂමාචාර චෝදනා පිළිබඳව පරීක්ෂාකර එම චෝදනා එකක් හෝ එයට වැඩි ගණනක් ඔප්පුවී ඇතැයි විශේෂ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබුවහොත්,...."

ඒ ඔක්කෝම අනාගත වාක්‍යයයි. වර්තමාන හෝ අතීත හෝ ඒවා නොවෙයි.

> "... ලැබුවහොත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍ර විනිශ්චයකාර පදවියෙන්, ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මිය ඉවත්කිරීම සඳහා යෝජනාවක් අතිගරු ජනාධිපතිතුමාට ඉදිරිපත් කළ හැකි වන පරිදි පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත්කළ යුතු යැයි ඉහත නම් සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අපි, ... යෝජනා කර සිටිමු."

අන්තිමට ආවේ මුලටයි. මේවා බොරු නොවෙයි. මේක තේරුම් ගන්න නීතිය ඕනෑ නැහැ. මේකට ඕනෑ සිංහලයි, ඉංග්‍රීසියි කියවා ගැනීමේ හැකියාවයි. ඉංග්‍රීසි එක ඉංග්‍රීසියෙන් කියවන්න පුළුවන්. සිංහල එක සිංහලෙන් කියවන්න පුළුවන්. මේක කියවන්න LL.B ඕනෑ නැහැ, attorney-at-law ඕනෑත් නැහැ. මට හොඳට සිංහල පුළුවන්. ඒ නිසා මෙහි සිංහල එක කියවන්න පුළුවන්. ඒක දැකපු වෙලාවේම මම උඩ වීසි වෙලා වාගේ සිටියා, දවස් දෙකක් අපි විවාද කළේ මේක කරන්නද, මෙන්න, සභානායකවරයා කරපු වැඩේ කියලා. අපි බැලුවේ නැහැ නේ මේවායේ ඉස්පිලි, පාපිලි. අපි අපට අවශ්‍ය දේ කළා. ඒක හරියට, වැදගත් විධියට කළා. එහෙම කරලා අපි ආවා.

එහිදී කථා පැවැත්වූවා. අපේ ස්ථාවරය කිව්වා. මේවායේ ඇති වැරදි දේවල් කිව්වා. අපි වාඩි වුණා. අවසානයේදී විපක්ෂ නායකවරයා මේ දේ කියනකොට අපට තේරුණා, ඇත්තටම මෙහි ශිරානි බණ්ඩාරනායකව ඉවත් කිරීමේ කිසිදු යෝජනාවක් නැහැ කියා. මෙහි තිබෙන්නේ කමිටුවක් පත් කිරීම පිළිබඳවයි. මට තවම මතකයි, ඒ වෙලාවේ මම මගේ seat එකෙන් නැඟිටලා ඇවිල්ලා මේ සම්බන්ධයෙන් වැඩිදුර අධ්‍යයනය කිරීම සඳහා අපේ ඩිව් ගුණසේකර ඇමතිතුමාට කිව්වා, මේකේ මොකක් හෝ legal දෙයක් තිබෙනවාද කියා ඔබතුමාත් මේක කියවා බලන්න කියා. එතුමා ඔළුවට අත ගහ ගත්තා, ඇත්තටම මේ ගෙනැල්ලා තිබෙන්නේ මුල් යෝජනාව නේ කියා. ඒ අනුව ඇත්තටම ශිරානි බණ්ඩාරනායක නෛතික වශයෙන් මේ ධුරයෙන් ඉවත් වෙලා නැහැ. එහෙම යෝජනාවක් පාර්ලිමේන්තුවේ සම්මත කරලා නැහැ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාව අවසන් කරනවා.

අපි ඔක්කෝම අත් උස්සා තිබෙන්නේ කමිටුවක් පත් කරන්නයි. මෙන්න මේ නිසා සියලු නීතිවේදීන් කිව්වා, "කොයි විධියකටවත් මොහාන් පීරිස්ව පත් වෙලාත් නැහැ, ශිරානි බණ්ඩාරනායක ඉවත් වෙලාත් නැහැ" කියා. නමුත්, ශිරානි බණ්ඩාරනායක පිළිබඳව අපට වෙනම මතයක් තිබුණා. ශිරානි බණ්ඩාරනායකට කොහොමටත් අග්‍ර විනිශ්චයකාර ධුරය දෙන්න බැහැ, මේ තනතුරට කවුරු හෝ පිවිතුරු මනුස්සයෙක් දමන්න කියා අපි කිව්වා. ජ්‍යෙෂ්ඨත්වය අනුව විනිශ්චයකාරවරයෙකුට මේ තනතුර දෙන්න ඕනෑ. මේ අධිකරණය සම්බන්ධ ධුරයක්. අපි අපේ දේශපාලන කටයුතු ඔක්කෝම කර ගන්නම්. මේ රටේ අධිකරණය තිබෙන්න ඕනෑ. මේ අධිකරණය විනාශ කළොත් ඒකේ ඵල විපාක කවදා හෝ අපටම විඳින්න පුළුවන්. මේ කථා කරන මටත් විඳින්න පුළුවන්. මේක මේ විධියටම ජරාජීර්ණ වුණොත් ඒකයි වෙන්නේ. කවදා හෝ අපට වෙන්නේ මොකක්ද? අපි කථා කරලා අන්තිමට අපිටම අපේ දුක්ඛ දෝමනස්සභාවය ප්‍රකාශ කරන්න වෙනවා. ඒ නිසා මේ නීති කටයුත්ත කිරීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව විශේෂඥ දැනුම තිබෙන නීතිඥවරු සියලු දෙනා එකතු වෙලා අපට පෙන්වා දුන්නා, මෙන්න මේකේ නීතිමය අවකාශය තිබෙන්නේ මෙතැනයි කියා. මොහාන් පීරිස්ව පත් වෙලාත් නැහැ, ශිරානි බණ්ඩාරනායකව ඉවත් කරලාත් නැහැ කියා ඔවුන් කිව්වා. එහෙම නම්, එතුමිය මේ ධුරයේ වාඩි වෙන්න ඕනෑ. ඊට පස්සේ නීතිවේදීන්ම කථා කරලා කිව්වා, "එතුමිය සහ ඔබතුමන්ලා අතර තිබෙන ප්‍රශ්නය නිසා එතුමිය මෙතැනට ඇවිල්ලා ඉල්ලා අස් වෙන එක හොඳයි" කියා. ඒක තමයි හොඳම ක්‍රමය. ඒ වෙලාවේ රජයක් වශයෙන් අපි ගත් වැදගත් තීන්දුව තමයි, අපි ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාර ධුරය දෙන්න ඕනෑ ඒකේ ඉන්න ජ්‍යෙෂ්ඨම කෙනාට කියන කාරණය. මොකද, අපේ යහ පාලන යෝජනාවලියේ තිබෙනවා, මීට පස්සේ ජනාධිපතිවරයා විසින් අග්‍ර විනිශ්චයකාරවරයා පත් කරන්නේ නැහැ කියා. ඒක අපේ එක් යෝජනාවක්. අග්‍ර විනිශ්චයකාරවරයා පත් කිරීම ජනාධිපතිවරයා කරන්න අවශ්‍ය නැහැ. ජනාධිපති කවුරු වුණත්, එතුමාත් අපි වාගේ දේශපාලනඥයෙක්. මීට පස්සේ ජනාධිපතිවරයෙකුට මේ තනතුරට පුද්ගලයින් පත් කරන්න දෙන්නේ නැහැ. ව්‍යවස්ථාදායක සභාවට අදාළව වෙනම මණ්ඩලයක් පත් කරලා ඒකෙන් යෝජනා කරලා එන පුද්ගලයා පත් වනවා මිසක් මීට පස්සේ ජනාධිපතිවරයෙකු විසින් අග්‍ර විනිශ්චයකාරවරයා පත් කරන්නේ නැහැ. එය මතක තබා ගන්න.

අප අතර දේශපාලන ගැටුම් තිබෙන්න පුළුවන්. නමුත්, යහ පාලනයට කවුරුවත් විරුද්ධ නැහැ. විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීමන්ලා ඇවිල්ලා ජනාධිපතිතුමා ඉදිරියේ කිව්වේ, "මේ දවස් 100 වැඩසටහනට අකුරක් නැර අපි සහයෝගය දෙනවා" කියායි. එලෙස අකුරක් නැර සහයෝගය දෙනවා නම්, මේ වැඩ පිළිවෙළේ තිබෙන්නේ මොකක්ද? "යහ පාලනය"යි. කථා කරන්න තිබෙන්නේ ඒකේ ක්‍රමවේදය පිළිබඳව නොවෙයි, අග්‍ර ඵලය පිළිබඳවයි. එය මතක තබා ගන්න. බුදු හාමුදුරුවෝ ඒකයි කිව්වේ "චේතනාහං භික්ඛ වේ කම්මං වදාමි" කියා. ඒ ක්‍රියාව නොවෙයි, චේතනාවයි වැදගත් වන්නේ. ඒ චේතනාව හොඳ නම්, කර්මය ගැන කථා කරන්න. පහර ගහලා මේ තරම් ඝෝෂා කරන්නට එපා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාව අවසන් කරන්න ඉස්සෙල්ලා මම තව කරුණක් කියනවා. දකුණු අප්‍රිකාවේ පාර්ලිමේන්තුවේ මෙවැනිම තත්ත්වයක් ඇති වුණා. එදා නෙල්සන් මැන්ඩෙලාව හිරේ දමන්න හිටපු ඩී. ක්ලාක් නැමැති පරාජිත මන්ත්‍රීවරයාට නියෝජ්‍ය ජනාධිපතිකම දෙන්න ඒ නෙල්සන් මැන්ඩෙලාට ආත්ම ශක්තිය තිබුණා. එහෙම ඔහුව නියෝජ්‍ය ජනාධිපති තනතුරට පත් කර සර්ව පාක්ෂික ආණ්ඩුව හැදුවා. ජාතික පක්ෂය විපක්ෂයේ වාඩි වුණා. මම තමුන්නාන්සේලාට දැන් කියනවා, ඒ ජාතික පක්ෂය එදා ඩී. ක්ලාක්ලාගේ තිබුණු සහාගයත් එක්ක ආණ්ඩුවේ වාඩි වුණා වාගේ විපක්ෂය ඒ ක්‍රියාවලිය හරියට හදාරන්න. එතකොට තමුන්නාන්සේලාත් අනාථ වන්නේ නැහැ. තමුන්නාන්සේලාට ඕනෑ නම්, ඩිව් ගුණසේකරලාගෙන්, වාසුදේව නානායක්කාරලාගෙන් ඒ පොත් පත් ඉල්ලා ගන්න. දැනගන්න, ඒ අය කොහොමද හැසිරුණේ කියා. අන්න ඒ හැසිරීම පමණයි තමුන්නාන්සේලාගේ අනාගතයට තිබෙන්නේ. එය මතක තබා ගන්න. නැත්නම් හදිසි මැතිවරණ ඒවි. ඒකෙන් මහා විශාල විනාශ ඇති වෙයි. අපි ඔක්කෝම ඇවිල්ලා තිබෙන්නේ එක තැනකට. දේශපාලන වශයෙන් මරා ගන්න නොවෙයි. අපි සියලු දෙනා හැම දාම ජීවත් වන්නේ නැහැ. අපිට ලබා ගන්න අවශ්‍ය දේවල් තිබෙනවා. අපට ජීවිතයේ ඉතිරි වෙලා තිබෙන්නේ තව ටික කාලයයි. මේ කාලයේදී අපි ඔක්කෝම එකතු වෙලා මේ ගරු සභාවේ අපි ඒ කටයුත්ත කරමු. ඊට පස්සේ අපි දේශපාලනය කරමු. බොහොම ස්තූතියි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

The next speaker is the Hon. M.A. Sumanthiran. Order, please! Before that, the Hon. Deputy Chairman of Committees will take the Chair.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] தலைமை வகித்தார்கள்.

Whereupon MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. Sumanthiran, you may commence your speech.

[4.50 p.m.]

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Thank you, Mr. Deputy Chairman of Committees, for the opportunity given to speak on this Adjournment Motion. I wish to thank the Hon. Leader of the Opposition for bringing up this Adjournment Motion for the reason that there seems to be some uncertainty in the minds of the people of the country as to the procedure by which these changes took place last week.

Firstly, let me remind the House that, in terms of Article 107 of our Constitution, it is the President who appoints the Chief Justice amongst others. There are various conditions that must be fulfilled before he appoints the Chief Justice. Presently, the name must be approved by the Parliamentary Council. Before that, the name had to be approved by the Constitutional Council. Although it is the President who appoints the Chief Justice, without the recommendation of the Parliamentary Council, or previously, the Constitutional Council, the President cannot appoint the Chief Justice. If the President had appointed His Lordship Justice Sripavan as the Chief Justice without the approval of the Parliamentary Council, that would be null and void and of

[ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා]

no force or effect in law. Merely because the President appointed, that does not become a valid act because the Constitution says, "prior to the appointment, the Parliamentary Council must grant its recommendation". Similarly, in terms of the same Article of the Constitution, it is the President who can remove the Chief Justice, not the Parliament. The Parliament cannot remove the Chief Justice. We seem to be labouring under a misconception that we, as a Parliament, removed the Chief Justice. No, the Constitution says that it is the President who can remove the Chief Justice. But, prior to the President being able to remove the Chief Justice, there must be a condition that must be fulfilled. What is that condition? The Parliament must, by a Resolution, make an address to the President for the removal of the Chief Justice. So, like the example that I gave about the appointment, if the President removed a Chief Justice without an address of Parliament being passed as a Resolution, that act of the President is invalid and will not be of any force or effect in law in terms of the Constitution. This is the simple fact. This is easily understood. That is why I cited the example of the appointment procedure. All of us will agree that the President cannot simply appoint somebody. He has to have the recommendations of the Parliamentary Council. Similarly, the President cannot remove unless there is an address to the President by Parliament.

I must thank the Hon. Ajith P. Perera who is here today because, as I recalled, it was he who spotted what was in the Order Paper and brought it to the notice of other Seniors in the United National Party, the then Leader of the Opposition, the former Speaker, the Hon. Joseph Michael Perera, the Hon. Lakshman Kiriella and I too was there. It was he who saw that Item 1 on the Order Papers of the 10th and the 11th of January, 2013 was not an address to the President for the removal of the Chief Justice. What had appeared as Item 20 on the Order Paper of 6th of November, 2012, resolving to appoint a Parliamentary Select Committee to inquire into the allegations was reproduced again in January, 2013. The same Resolution which appeared on the Order Paper -

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Sir, I rise to a point of Order.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
What is the point of Order?

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Hon. Vasudeva Nanayakara, what is your point of Order?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
The Hon. Speaker gave a Ruling on the matter.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Sir, that is not a point of Order.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
That is a point of Order.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Sir, let him not take my time. Hon. Vasudeva Nanayakkara, you reply later if you want to.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
The Hon. Speaker's Ruling -

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
I am coming to the Ruling. I am talking about the Ruling.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Sir, I am raising my point of Order. Hon. Sumanthiran, you are not the Speaker.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
I am on my feet. Do not take my time.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
I am raising a point of Order.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
What is the point of Order? There is no point of Order in that.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Please let me do that. The Hon. Speaker gave a Ruling after the matter was raised. So, that Ruling stands conclusive. How can he argue against it?

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Sumanthiran, you can carry on.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Sir, say today in the Order Paper, there is an item that is printed. The Hon. Speaker or whoever is in the Chair can put Item No. 1 to vote. That is all the Chair can do, put Item No. 1 to vote, and we vote. Can you or anybody in the Chair say that what was voted was for something else and not for what was printed and actually put to vote? No, you cannot do that. The Hon. Speaker's saying anything, with utmost respect to the Chair, I say, is wholly irrelevant because with what was put - I have the Hansard of 11th January, 2013 - he said, “Item No. 1, put to vote.” That is what the Hon. Speaker said : "Item No. 1, put to vote". I have the Order Paper of the 11th of January, 2013 and Item No. 1 of it states to appoint a Parliamentary Select Committee, nothing else. That is all that matters. So, it was Item No. 1 that was put to vote.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
What is the point of Order, Hon. Vasudeva Nanayakkara?

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
The Hon. Vasudeva Nanayakkara cannot say that something else was put to vote.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Sir, I would like to bring to your attention that there was a Ruling given by the Hon. Speaker. He merely did not put Item No. 1 to vote. He, having given a Ruling on the matter, put Item No. 1 to vote. So, the Hon. Member must combine the two; he must be honest.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
He did not put something else to vote; he cannot put something else to vote. He put Item No. 1 to vote and that was carried. So, the Resolution that was carried only resolved to appoint a Parliamentary Select Committee to inquire into the allegations against the then Chief Justice. The matter went to the President. Article 107 of the Constitution states, as I said at the beginning, that it is the President who can remove the Chief Justice, but only if there is an address of Parliament sent to him for the removal. There was no address of Parliament sent to him because what was passed was a Resolution to appoint a Parliamentary Select Committee.

But, only when the Hon. Prime Minister made a Statement last Thursday, it dawned on all of us that the Legal Adviser at that time to the then President was none other than Mohan Peiris, who wanted to occupy that seat, had misled the then President and advised him to remove the Chief Justice without legal authority, a wholly unconstitutional act. Then, he went and occupied that seat.

The present Leader of the Opposition has very clearly stated that they are supporting the "Hundred-Day Programme" of the Government. The "Hundred-Day Programme" of this Government has 100 points and in those 100 points, point No. 94 is to restore Shirani Bandaranayake to the position of Chief Justice. You say you are supporting entirely the "Hundred-Day Programme". In the "Hundred-Day Programme", it is very specifically stated that she would be restored to the position of Chief Justice. Then, why are you raising this issue now? It not only has your support, but it had the support of the people because the "Hundred-Day Programme" was put as a mandate before the people. It was revealed to the people before the election that this would be done. If a person has not been appointed to a post, he need not be removed from that; he never occupied that post.

This has constantly been the position of the entire Bar of Sri Lanka. I want to put on record that when the Hon. (Dr.) Wijeyadasa Rajapakshe, Minister of Justice and Labour Relations, was the President of the Bar Association of Sri Lanka, an unprecedented meeting of the Bar Association took place, where more than 3,000 lawyers assembled. Never before did we have 3,000 lawyers assembling! And, what is more? A unanimous resolution was carried saying that the removal of Shirani Bandaranayake was illegal and the Bar Association would not welcome anybody who would be appointed as Chief Justice consequent to her removal, and the Bar Association stuck to it for two years. When Mohan Peiris was appointed, he was not welcomed. He could not have had a ceremonial welcome. He had a ceremonial welcome, he got some private lawyer to welcome him. The President of the Bar Association did not welcome him. When the Bar Association’s President's Convocation took place in March, 2013 - customarily, it is the Chief Justice who places the Bar Association President in that place - he invited Dr. Shirani Bandaranayake to do that act and the present Chief Minister of the Northern Province, retired Supreme Court Judge, Justice C.V. Wigneswaran, delivered a speech, in which he articulated very clearly that there is a *de facto* Chief Justice in this country. He compared the situation to the time when LTTE ruled certain areas of this country and there were

[ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා]

judges appointed by the LTTE and judgments given. He said those were *de facto* situations. That is the situation that prevailed.

I also would like to claim some credit for this position because on the 22nd of November 2012, just after Mohan Peiris was purported to have been appointed to that post, I took an objection to that. I will **table*** the case record in SC (FR) No. 665 of 2012, in which references were made to SC (FR) 666 and SC (FR) 667 of 2012.

The Judges headed by Justice J. Amaratunga had this recorded in that and I want to read that. It states, I quote:

> "Mr. Sumanthiran, who appears for the Petitioner in SC (F/R) 667/2012 insists that his objections should be recorded as follows;
>
> He states that,
>
> 'I object to the present application made by the learned Deputy Solicitor General on the basis that the person occupying the Chamber's of the Chief Justice de-facto is a usurper in that office in terms of the pronouncement of this Court itself and therefore I have to object to an application under Article 132(3) (III) being sent to that person'."

We considered him a pretender. We did not consider him a *de jure* Chief Justice right through these two years. The legal community of this country protested at every turn.

The crowning moment came last Thursday when a farewell was accorded to Chief Justice Shirani Bandaranayake in the Ceremonial Court, when the entire Supreme Court, the entire Court of Appeal and all the Judges of the High Court assembled. I have witnessed ceremonial sittings for 25 years, but I have never seen such a situation before, where more than 100 judges of the minor Judiciary, judges from all parts of the country came to the Supreme Court last Thursday. The decision to have a ceremonial sitting was made after 2.00 p.m. the previous day. In less than 20 hours, judges, magistrates, district judges and primary court judges from the length and breadth of this country came in their numbers. They could not find seats for them in the dais and they were accommodated on the side. The entire ceremonial Supreme Court was full and we accorded a farewell to her. That is because a grave injustice was done; that is because the entire Bar, without exception, recognizes the fact that what was said to have been the removal was no removal in law. We refuse to recognize that that was a removal in law.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
We only addressed "Mohan Peiris", because he was there by force. As was stated by the Hon. Minister of Foreign Affairs today, he came there by force. That day, all the lawyers' cars and boots were examined; they checked whether Shirani Bandaranayake was coming to Court. She was kept out by force. But, when she came back to resume her rightful place, there was no force; there was not a single arm to be seen; there was no police; there was no STF; there was no army. The entire civil society and the lawyers took her to her Chamber and she resumed her place.

Therefore, I thank the Hon. Leader of the Opposition for bringing this Motion because this clarifies the position that Shirani Bandaranayake was never removed from her office in terms of the law and Mohan Peiris was never appointed to that position. He occupied it as a usurper in office.

Thank you very much.

[අ.භා. 5.05]

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විපක්ෂ නායක කාර්යාලයෙන් මට ලැබී තිබෙන්නේ විනාඩි දහයක තරම් බොහොම සීමිත කාලයක් නිසා මා ඉතා කෙටියෙන් කරුණු කිහිපයක් මේ ඉතා වැදගත් විවාදයට එකතු කරන්නට කැමැතියි.

මෙතැනදී ආණ්ඩු පක්ෂය වෙනුවෙන් කථා කරපු විපක්ෂයේ, ජනතා විමුක්ති පෙරමුණේ සහ දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීතුමන්ලාගේ අදහසුත් ඇතුළුව, මේ ක්‍රියාදාමය සාධාරණීකරණය කරමින් කරපු බොහෝ කථාවලදී මතු කරපු ප්‍රධාන තර්කය වුණේ, හිටපු අග විනිසුරුතුමිය සම්බන්ධයෙන් වූ දෝෂාභියෝගය එදා පාර්ලිමේන්තුවේදී විවාදයට අරගෙන අවසානයේදී ගත්තු තීන්දුව වැරදිය, එහෙම යෝජනාවක් තිබුණේ නැහැ කියන එකයි. ඒ කරුණ මත පදනම් වෙලා තමුන්නාන්සේලා උපකල්පනයකට එනවා, හිටපු අග විනිසුරුවරිය ඉවත් කිරීමක් වෙලාත් නැහැ, ඉවත් වෙලා නැත්නම් අලුතින් කෙනෙක් පත් වෙලාත් නැහැ කියලා. ඒ නිසා හිටපු අග විනිසුරුතුමිය ඇවිල්ලා පුටුවේ වාඩි වෙලා එයා ඉන්නවා කියලා පෙන්වලා, ඊට පස්සේ එතුමිය ඉල්ලා අස් වුණාය කියලා පෙන්වලා, එතුමිය ඉල්ලා අස් වෙලා ගියාට පසුව අලුතින් කෙනෙක් පත් කරන වාතාවරණය හදා ගන්න එකයි කළේ.

අපි අහලා තිබෙන විධියට නම් යම්කිසි විවාද සම්පන්න කරුණක් සම්බන්ධයෙන් කථානායකතුමා මේ පාර්ලිමේන්තුවේදී තීන්දුවක් දෙනවා නම්, ඒ තීන්දුව අවසානාත්මක තීන්දුවක් හැටියට භාර ගන්න අපි සියලු දෙනාම එකඟ වෙලා තිබෙනවා. කථානායකතුමාගේ ඒ තීන්දුව අපි පිළිගන්න කැමැති වුණත් නැතත්, ඒක අවසානාත්මක තීන්දුවක් හැටියට පිළිගැනෙනවා. ඒක තමයි අතීතයේ සිට පාර්ලිමේන්තුවේ පැවතුණු සම්ප්‍රදාය. ඔය කියන තර්කය එදාත් තමුන්නාන්සේලා මතු කළා. එදා ඒ තර්කය මතු කළාම ඒ ගැන විවාදාත්මක වාතාවරණයක් ඇති වුණා. ඒ විවාදය අවසානයේදී කථානායකතුමා තීන්දුවක් දුන්නා. තමුන්නාන්සේලාගේ තර්කවලටත් ඇහුම්කන් දීලා ඒ තීන්දුවේ කථානායකතුමා පැහැදිලිව මෙහෙම කියා තිබෙනවා:

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

"ගරු ඇමතිවරුනි, ගරු මන්ත්‍රීවරුනි, අදාළ ස්ථාවර නියෝග හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන මම අධ්‍යයනය කර බැලුවෙමි.

ජනාධිපතිතුමාට යෝජනාවක් ඉදිරිපත් කිරීම සඳහා මා වෙත මන්ත්‍රීවරුන් අත්සන් කොට ලබා දෙන ලද යෝජනා සම්මතයට අමතරව අලුත් යෝජනාවක් ඉදිරිපත් කළ නොහැකි බව මම ප්‍රකාශ කරමි.

දැනට ඉදිරිපත් කර ඇති යෝජනාව හොඳින් අධ්‍යයනය කර බැලීමේදී මෙම යෝජනාව ඉදිරිපත් කොට ඇත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107(2) ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 107(3) ව්‍යවස්ථාව සහ 78(අ) ස්ථාවර නියෝගය යටතේ බව ඉතා පැහැදිලිව සඳහන් කොට ඇත.

තවද, මෙම යෝජනාවෙන් බලාපොරොත්තු වන්නේ ඉහත සඳහන් විෂමාචාර චෝදනා හේතුවෙන් එම විෂමාචාර චෝදනා පිළිබඳ පරීක්ෂණය කොට එම චෝදනා එකක් හෝ ඊට වැඩි ගණනක් ඔප්පු වී ඇතැයි විශේෂ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබුව හොත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍ර විනිශ්චයකාර පදවියෙන් ගරු ආචාර්ය උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරාති අංශුමාලා බණ්ඩාරනායක මහත්මිය ඉවත් කිරීම සඳහා යෝජනාවක් අතිගරු ජනාධිපතිතුමාට ඉදිරිපත් කළ යුතු යැයි සඳහන් වන බැවින් මෙම යෝජනාවේ පරමාර්ථය ඉතා පැහැදිලි වන අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107(2) ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 107(3) ව්‍යවස්ථාව ප්‍රකාර යෝජනාවක් ඉදිරිපත් කිරීමට අද දින න්‍යාය පත්‍රයේ අඩංගු කර ඇති යෝජනාව ප්‍රමාණවත් වන බව මම ප්‍රකාශ කරමි.

එම නිසා අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 යෝජනාව දැන් ඡන්ද විමසීම සඳහා ඉදිරිපත් කරමි."

තමුන්නාන්සේලා එදා ඒ මතය දැරුවා; කථානායකතුමා තීන්දුව දුන්නා. තමුන්නාන්සේලා ඒ තීන්දුව පිළිගත්තේ නැත්නම්, ඒක වලංගු නැත්නම් තමුන්නාන්සේලාට තිබුණා එතැනින් එහාට ඒ ක්‍රියාදාමයට සහභාගි නොවී ඉන්න. නමුත් තමුන්නාන්සේලා මොකක්ද කළේ?

යෝජනාව ගැන ඡන්ද විමසීමක් ආවා. කථානායකතුමා ඡන්ද විමසීමෙන් පසුව මෙහෙම කියා තිබෙනවා:

"ගරු මන්ත්‍රීවරුනි, අද දින පාර්ලිමේන්තුවේ විෂයය අංක 1, එනම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාර ධුරයෙන් ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරාති අංශුමාලා බණ්ඩාරනායක මහත්මිය ඉවත් කිරීම සඳහා අතිගරු ජනාධිපතිවරයා වෙත පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් ඉදිරිපත් කිරීම පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107(2) ව්‍යවස්ථාව ප්‍රකාර යෝජනාව, පක්ෂව ඡන්ද 155ක් හා විරුද්ධව ඡන්ද 49ක් ලැබීමෙන් අද දින සභා සම්මත වූ බව දැනුම් දෙනු කැමැත්තෙමි.

ඒ බව ස්ථාවර නියෝග 78 අ.(7) අනුව අතිගරු ජනාධිපතිතුමා වෙත දන්වා යැවීමට කටයුතු කරන බව ද මෙයින් දැනුම් දෙමි."

ඒ විදිහට කථානායකතුමා තීන්දුවක් දුන්නා. අපි දන්නා ක්‍රමයට අනුව නම් කථානායකතුමාගේ තීන්දුව අවසාන තීන්දුවයි. ඒකට අභියෝග කරන්න පුළුවන් කාටද? ඒකට අභියෝග කරන්න විධායකයට පුළුවන්ද? ඒකට අභියෝග කරන්න අධිකරණයට පුළුවන්ද? මේ පාර්ලිමේන්තුවේම ගරු අනුර බණ්ඩාරනායක හිටපු කථානායකතුමා, ගරු චමල් රාජපක්ෂ කථානායකතුමා දීලා තිබෙන තීරණ දෙකකින් පැහැදිලිව ප්‍රකාශ කර තිබෙනවා, පාර්ලිමේන්තුව සතු බලය අභිභවා යන්න, අත පොවන්න, ඒකට ඇඟිලි ගහන්න වෙන කවර බල අධිකාරයකටවත් බැහැ කියලා. අපි හිතමු, පාර්ලිමේන්තුව එදා ගත්තු තීන්දුව වැරදියි, ඒ තීන්දුව ප්‍රකාරව එදා හිටපු ජනාධිපතිතුමා අරගෙන තිබෙන තීන්දුව වැරදියි කියලා. ඒක නේ දැන් මේ කියන්නේ. එදා ගරු රවුෆ් හකීම් මැතිතුමාත් අත ඉස්සුවා. එදා ඒ පක්ෂ ඡන්ද 155 අතරේ ඔබතුමාගේ ඡන්දයත් තිබුණා. ඒ ඡන්ද 155 අතරේ රාජිත සේනාරත්න මැතිතුමාගේ ඡන්දයත් තිබුණා.

වර්තමාන ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ඡන්දයත් තිබුණා, ඒ 155 ඇතුළේ. එතුමා එදා කථාවකුත් පැවැත්වූවා. දැන් එකපාරට නින්දෙන් අවදිවෙලා ආවා වාගේ තමුන්නාන්සේලා කොහොමද එක වරම කියන්නේ, "හරි වැඩේ. ඒක හරියට වෙලා නැහැනේ. හරියට වෙලා නැති නිසා අපි දැන් හරියට එක් කෙනෙක් දානවා" කියලා. මේක කවුද පිළිගන්නේ?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ශිරාති බණ්ඩාරනායක මැතිනිය අග විනිසුරු ධුරයෙන් ඉවත් කරනු ලැබුවේ නීත්‍යානුකූලව නොවෙයි කියලා නේ මෙතුමන්ලා කියන්නේ. ඒක වෙලා නැහැ කියලා නේ කියන්නේ. දැන් අපි අහන්නේ මෙයයි. එදා ගත්තු තීන්දුව වැරදි නම්, අඩු ගණනේ තමුන්නාන්සේලාට තිබුණා මේ පාර්ලිමේන්තුවට යෝජනාවක් ගෙනෙන්න. ඒ වැරැද්ද නිවැරදි කරන්නත් ඕනෑ මෙතැනින්මයි. ඒ වැරැද්ද මෙතැනින් නිවැරදි නොකර, පාර්ලිමේන්තුවේ කථානායකතුමා අවසාන තීන්දුවක් අරගෙන ඡන්ද විමසීමක් කරලා, ප්‍රජාතාන්ත්‍රිකව, නීත්‍යානුකූලව ගත්ත තීන්දුව, විධායකයේ බලය පාවිච්චි කරලා කියනවා, "ඒක අපි පිළිගන්නේ නැහැ. ඒ තීන්දුව වැරදියි "කියලා. කවුද මේ අර්ථ නිරූපණය දුන්නේ? කොහෙන් ද? මොන උසාවියෙන් ද? මොන ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ද? අඩු ගණනේ එහෙම අර්ථ නිරූපණයක් ගන්න ඕනෑ නැද්ද? කවුරු හරි විනිසුරුවරු කණ්ඩායමක් ඇවිත් කිව්වාය කියලා, ඒ මත පුළුවන්ද මේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණයේ මුල් පුටුව සම්බන්ධ තීරණ ගන්න? එහෙම ගන්නවා නම් ඒ තීරණ හරිද? ඒ තීරණ ගැනීම යහපාලන ක්‍රමවේදවලට අනුකූල ද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි. මා තමුන්නාන්ස්ට පැහැදිලිව කියන්නම්. මේ පාර්ලිමේන්තුවේ යමක් නිවැරදි නොවන ආකාරයට සිදු වෙලා නම් තමුන්නාන්සේලා කළ යුතුව තිබුණේ, නැවත පාර්ලිමේන්තුව තුළින්ම ඒක නිවැරදි වන ආකාරයට ඉටු කර ගැනීමයි. ඒ සදාචාරත්මක යුතුකම තමුන්නාන්සේලා පැහැර හැරියා.

ඊළඟ ප්‍රශ්නය. දැන් තමුන්නාන්සේලා කියනවා, විනිසුරුවරයකුගේ යම් දෝෂයක් තිබෙනවා නම් ඔහු ලබා දුන් තීන්දු තවදුරටත් වලංගුයි කියලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 119 වන ව්‍යවස්ථාවේ දක්වා තිබෙනවා කියලා. ඔව්, තිබෙනවා. හැබැයි, තමුන්නාන්සේලාගේ තර්කයට අනුව මේ කථා කරන්නේ පත් නොවූ විනිසුරුවරයකු ගැන. 119 ව්‍යවස්ථාවෙන් කියන්නේ පත් වූ කෙනෙකුගේ මොනවා හරි ප්‍රශ්නයක් තිබෙනවා නම් ඔහු දුන් තීන්දු අවලංගු වෙන්නේ නැහැ කියලා. හැබැයි, තමුන්නාන්සේලා අද මේ කියන්නේ පත් නොවූ අග විනිසුරුවරයකු ගැන. ඔබතුමන්ලාට අනුව ඔහු පත් වෙලා නැහැ. එහෙම නම් ඔබතුමන්ලාට අනුව, පත් වෙලා නැති මේ අග විනිසුරුවරයා දුන් තීන්දුත් තීන්දු හැටියට ඔබතුමන්ලාට පිළිගන්න බැහැ. පත් වූ කෙනෙකුගේ නුසුදුසුභාවය මත ඔහු ඉවත් කරද්දී ඔහු දුන් තීන්දු අවලංගු නැහැ කියන එක හැබෑව. හැබැයි, තමුන්නාන්සේලා මේ කියන්නේ මොහු පත්වෙලා නැහැ කියලායි. පත් නොවුණු කෙනෙකු තීන්දු දීලා. ඒ තීන්දු අද තමුන්නාන්සේලා පිළිගන්නවාද? පත් නොවූ ඒ අග විනිසුරුවරයා විනිසුරුවරුන් පත් කරලා; නීතිඥයන් දෙදාහකට තුන්දාහකට විතර පත්වීම් දීලා. එතකොට මේ පත් නොවූ අග විනිසුරුවරයා විසින් පත් කරන ලද මිනිසුන්ගේ රක්ෂාවලට මොකද වෙන්නේ? ඒ තනතුරු නීත්‍යානුකූලද? වලංගු ද?

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
What is your point of Order, Hon. Nalin Bandara?

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙතුමා පාස්පෝට් උගුලෙන් බේරෙන්නද මේ මොහාන් පීරිස් මහත්මයා බේරා ගන්න යන්නේ කියලා මා අහනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
That is not a point of Order.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඒක රීති ප්‍රශ්නයක් නොවෙයි. මන්ත්‍රීතුමා කරුණාකර අහගෙන ඉන්න.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු මන්ත්‍රීතුමා මෙතැන තිබෙන්නේ, මොහාන් පීරිස් හොඳ ද, ශිරානි බණ්ඩාරනායක හොඳ ද, සරත් නන්ද සිල්වා හොඳ ද කියන ප්‍රශ්නය නොවෙයි. චරිතවලින් කවුද වඩා හොඳ කියන විවාදයකට අපි එන්නේ නැහැ. හොඳ කියෙන අයත් ඇති. අඩු පාඩු තිබෙන අයත් ඇති. අපට ප්‍රශ්නය තිබෙන්නේ ශිරානි බණ්ඩාරනායක අග විනිසුරුවරියට වඩා මොහාන් පීරිස් අග විනිසුරුතුමා හොඳ ද කියන ප්‍රශ්නය නොවෙයි. මොහාන් පීරිස් මහත්තයාට වඩා තව කවුරු හරි හොඳ ද කියන ප්‍රශ්නය නොවෙයි. ඒ වාගේම අද ශ්‍රේෂ්ඨාධිකරණය භාර දීලා තිබෙන ශ්‍රීපවන් මැතිතුමාට අපේ තිබෙන විරුද්ධත්වයකුත් නොවෙයි මේක. අපි මේ කියන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත් එක්ක, පාර්ලිමේන්තුවේ බලයත් එක්ක ගැට ගැහිච්ච ප්‍රශ්නයක්. මෙතැන ඔය විදියට පූර්වාදර්ශයක් දුන්නොත් අනාගතයේ දවසක තව ජනාධිපති කෙනෙකුට පුළුවන්, "අහවල් එකත් හරියට පාර්ලිමේන්තුවේ වෙලා නැහැ. ඒකෙත් තිබෙනවා පොඩි හුටපටයක්" කියලා ඒ තීන්දු බල්ලාට දාලා, තමන්ට ඕනෑ කරන විධියට වැඩ කරන්න. ඒක වැරදියි. ඒ ක්‍රමය වැරදියි. අපි කියන්නේ, පාර්ලිමේන්තුවේ වරදක් වෙලා තිබෙනවාය කියලා තමුන්නාන්සේලා කියනවා නම්, ඒක නිවැරදි කරන්නත් ඕනෑ මේ පාර්ලිමේන්තුවෙන්මයි කියන එකයි. ඒක නොකරපු එකේ වැරැද්දයි අපි කියන්නේ. කොණ්ඩය කපන්න ගිහින් බෙල්ල කපා ගත්තා වාගේ වැඩක් මේ වෙලා තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි. මොහාන් පීරිස් අග විනිසුරුවරයා දුන් පත්වීම් නීත්‍යානුකූල නොවන්නේ නම් -

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
කථාව අවසාන කරන්න.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම අවසාන කරනවා. අපි ඉතා ඕනෑකමින් කියන්නේ මේකයි. අධිකරණයට හෝ විධායකට බැහැ, පාර්ලිමේන්තුවේ බලයට අත පොවන්න. ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාර ධුරයට තමන්ට අවශ්‍ය කෙනෙක් පත් කර ගැනීමට දරන ලද ඉතාම සාහසික උත්සාහයක් මිසක් මෙතැන කිසිම නීත්‍යානුකූල වලංගුභාවයක් නැහැ. ඒ වාගේම පාර්ලිමේන්තුව ගත්ත තීන්දුවක් වලංගු නැහැ කියලා කියන්න පුළුවන් ජගතෙකුත් නැහැ. එහෙම කරන්න බලයක් ව්‍යවස්ථාවේ කොහේවත් සඳහන් වෙලා නැහැ; කාටවත් දීලා නැහැ. ඒ නිසා තමුන්නාන්සේලා මේ අභියෝග කරලා තිබෙන්නේ පාර්ලිමේන්තුවේ බලයට; පාර්ලිමේන්තුව ගත්ත තීන්දුවකට. ඒ තීන්දුව අවලංගුයි කියන පදනමින්, -ඒ තීන්දුව වලංගු නැහැ කියන පදනමින්- තමුන්නාන්සේලාට අවශ්‍ය කරන විධියට ක්‍රියාත්මක වෙලා තිබෙනවා. ඒක වැරදියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ නිසා අපි ඉතා ඕනෑකමින් කියනවා,- [බාධා කිරීමක්]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The Hon. Member is going to wind up now. Hon. Nalin Bandara, what is your point of Order?

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නෝනාගෙයි, මහත්තයාගෙයි වයස අඩු කරන්නත් පුළුවන්ද මොහාන් පීරිස් මහත්තයාට කියලා?

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඒ දේවල් තමුන්නාන්සේලා බලන්න. ඕවාට අපි යටත් වෙන්නේ නැහැ.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
That is not a point of Order. Hon. Wimal Weerawansa, please wind up now.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඕවා කියලා අපව දණ ගස්සවන්න බැහැ. යටත් වෙන්නේත් නැහැ, දණ ගහන්නේත් නැහැ. ඕනෑ විකාරයක් කරන්න. මන්ත්‍රීතුමා නිකම් ලජ්ජා නැතිව කෑ ගහන්න එපා, වාඩි වෙන්න. භූමිතෙල් මිල අඩු කරපු හින්දා ගැරඩියා වාගේ දඟලන්නේ නැතිව වාඩි වෙන්න.

මම කථාව අවසන් කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පෙන්වන්නේ ඉතා භයානක පෙරනිමිත්තක්. ලාංකිකයෙක් නොවන කෙනෙක් මහ බැංකුවේ අධිපති කරනවා. ලාංකිකයෙක් නොවන කෙනෙක් නීතියට අනුව මහ බැංකුවේ අධිපති කරන්න පුළුවන්ද? පාර්ලිමේන්තුව දුන්නු තීන්දු පැත්තකට දාලා, බල්ලාට දාලා, අද තමන්ට ඕනෑ විධියට ශ්‍රේෂ්ඨාධිකරණයේ

ඉහළ පුටුවලට පත් කරනවා නම් ඒක වැරදියි. ඒ වැරැද්දට ඉඩ දෙන්න එපා කියලා ඉල්ලමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි. [බාධා කිරීම්]

[අ.භා. 5.16]

ගරු රවූෆ් හකීම් මහතා (නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා)
(மாண்புமிகு றவுப் ஹகீம் - நகர அபிவிருத்தி, நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்பு அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of Urban Development, Water Supply and Drainage)
බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කෙස් පැළෙන තර්ක කොච්චර ඉදිරිපත් කළත් සමහර න්‍යායන් කියන්න අපට සිදු වෙනවා. විශේෂයෙන්ම මම සුවිශේෂී පුද්ගලයෙක්. හිටපු අග්‍ර විනිශ්චයකාරතුමා ඒ පදවිය දරපු කාල සීමාවකදී මම අධිකරණ අමාත්‍ය ධුරය දරපු නිසා සාමූහික වගකීමට එරෙහි වෙන්නේ නැති කථාවකුයි මට කරන්න සිදු වෙන්නේ. මොකද, විරුද්ධ පාර්ශ්වයේ මුල් පෙළේ, වමේ නායකයින් හැටියට වාඩි වෙලා ඉන්න තිස්ස විතාරණ මැතිතුමා, ඩිව් ගුණසේකර මැතිතුමා, වාසුදේව නානායක්කාර මැතිතුමා සමඟ මම එකම කැබිනට් මණ්ඩලයේ මේ කාරණා පිළිබඳව බොහෝ දේවල් කථා කරලා තිබෙනවා. ඒ කාල වකවානුවේ මගේ ස්ථාවරය කුමක්ද කියන එක පිළිබඳව එතුමන්ලා දන්නවා. එතුමන්ලාගේ ස්ථාවරයත් මම හොඳට දැන ගෙන සිටියා. නමුත් අපිට කියන්න බැරි සමහර කරුණු තිබෙනවා. ඒ සාමූහික වගකීමට එරෙහි වෙන්නේ නැති කථාවක් තමයි මේ සභා ගර්භය තුළත් මට කරන්න සිදු වෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වැරදුණු කුරුමානමක් පිළිබඳව ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා මෙතැන කථා කළා. ඒ වාගේම විපක්ෂ නායක ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා කථා කරද්දී එතුමාත් මේ පිළිබඳව ඉතාම ආවේගශීලීව නොයෙකුත් දේවල් කියා පෑවා. විශේෂයෙන්ම මේ පාර්ලිමේන්තුවේ ජනතා පරමාධිපත්‍ය රැක ගැනීමට කරන සටනක් හැටියට එතුමා මේ කරුණ පිළිබඳව සඳහන් කළා. ඒ වාගේම නීතිඥ සංගමයේ වර්තමාන නායකත්වය දරන උපුල් ජයසූරිය මැතිතුමා බළල් අතක් හැටියට කටයුතු කරනවා කියලා දෝෂාරෝපණය කළා. හිටපු අධිකරණ අමාත්‍යතුමා හැටියට මම හිටපු අග්‍ර විනිශ්චයකාරතුමා සමඟ, -ඒ තනතුර සමඟ- කටයුතු කළා. ඒ වාගේම නීතිඥ සංගමයත් එක්කත්, එහි සභාපතිතුමා එක්කත් කටයුතු කරන්න මට සිදු වුණා. නමුත් එදා මට කියන්න බැරි දෙයක් තිබුණා. එතුමා විනිශ්චයකාරවරුන්ගේ උත්සවාකාර පිළිගැනීම්වලදී - ceremonial sittingsවලදී - කරපු කථා දිහා බලපුවාම ඒකට නීතිඥවරුන්ගෙන් ලැබුණු ප්‍රතිචාරය දෙස බලද්දී අපි කාටත් එදා දැනුණා, එතුමා ඒ සංගමයේ සභාපතිත්වය දරද්දී කළ යුතු කථා තමයි එතුමා කළේ කියලා. මොකද, ඒවා මේ රටේ නීතියේ ආධිපත්‍ය රැක ගැනීම සඳහා කරපු කථා කියන එක අපි කවුරුත් පිළිගන්න ඕනෑ. නමුත් අද මෙතැන ඇති වෙලා තිබෙන ප්‍රශ්නය පිළිබඳව මට එක දෙයයි කියන්න සිදු වෙන්නේ. මම ඒක ඉංග්‍රීසි භාෂාවෙන් කියන්නම්.

Judges hold office during good behaviour and liable to be removed on ground of proved misbehaviour and incapacity. Therefore, it is clear, the removal is solely based on personal conduct. Mr. Mohan Peiris was informed that he was not duly appointed to the Office of the Chief Justice. This is the position taken by the current Government. Mrs. Shirani Bandaranayake was informed that she had never ceased to be the Chief Justice. This is the position the Hon. Sumanthiran also enunciated in his speech. The resulting position is that the reinstalling of Mrs. Shirani Bandaranayake was carried out not by the removal of Mr. Mohan Peiris. The position was that Mr. Mohan Peiris was not properly appointed as there was no vacancy and therefore Article 107(2) of the Constitution is not applicable to the circumstances of the subject matter. That is the simple explanation of this whole situation. There was no vacancy and therefore, it was *void ab initio* and that is what all of us in legal parlance say. So, when you take that position, it is very clear that the Executive - because the Executive is the appointing authority - has made the appointment for a position which was vacant. That matter has to be borne in mind.

Now, merely going into other areas, I think I need to also advert to another issue. Now, what we have to focus mostly is - I expected this to be said by the Hon. Lakshman Kiriella, the Leader of the House, because I have been at the receiving end of his arguments when I was the Minister of Justice defending the previous administration's mode of administration of justice in this country. The Hon. Lakshman Kiriella quite often would point fingers at me and talk about Latimer House Principles. He said it is a shame that former President Mahinda Rajapaksa, being the Head of the Commonwealth Heads of Government, was not honouring the Latimer House Principles. Now, it is time for us to revisit the Latimer House Principles. The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, the current Minister of Justice and Labour Relations, my Colleague in this Government has presented that to be included.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Please permit me to speak.

ගරු රවූෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
No, let me not be -

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Is this action of the President now in terms of Latimer House Principles?

ගරු රවූෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
No, I am not talking about that. Let this House deliberate on the need to have a proper procedure for the removal of the Chief Justice because there never existed a proper procedure. There is a lacuna. My argument is not about having removed the Chief Justice. My argument is that there was certainly a lacuna. Therefore, the lacuna has to be addressed and that is why, for all purposes, the

[ගරු රවුෆ් හකීම් මහතා]

existing position is that the removal procedure is through a Parliamentary Select Committee. However, during the impeachment of Mrs. Shirani Bandaranayake, allegations were bias, non-adherence to principles of natural justice and many other reasons were alleged. The Hon. Vasudeva Nanayakkara himself was quite affected by what was happening, I know that for all purposes.

Therefore, Parliament must provide procedure by legislation for removal of judges or, at least, we must amend the Standing Orders and set a procedure for removal of judges. It may also be advisable that the judge against whom allegations are made should be allowed to choose the procedure. Further, when a judge is impeached, the inquiry panel must consist of independent representation such as internationally-reputed individuals to ensure justice and impartiality.

එතකොට මොකද වෙන්නේ? නඩුත් හාමුදුරුවන්ගේ, බඩුත් හාමුදුරුවන්ගේ වාගේ වැඩක් තමයි අපි කරන්නේ. අපි Select Committee එකෙන් පත් කළාම ඒකයි මෙතැන සිදු වෙන්නේ. ඒක කවුරුත් දන්නවා. ඒ හින්දා තමයි මේ වාගේ ක්‍රමවේදයක් පිළිබඳව අපි පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග වෙනස් කරමින් - එම කමිටුවේ සභාපති හැටියට කටයුතු කළ, ගරු අනුර ප්‍රියදර්ශන යාපා හිටපු අමාත්‍යතුමාත් මේ ගරු සභාවේ සිටින එක හොඳයි. - අපි ඔක්කෝම -දෙපාර්ශ්වයම- එකතු වෙලා මේ දේ කරමු. මොකද, අපේ ස්ථාවර නියෝග වෙනස් කරලා මින් ඉදිරියට මෙවැනි දේවල් සිදු නොවෙන්නත් වගබලා ගනිමු. එච්චරයි, අපට දැන් කරන්න තිබෙන්නේ.

Mr. Deputy Chairman of Committees, how many more minutes do I have?

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
You have three more minutes and in addition to that, you have been given another five more minutes from the time allotted to the Hon. (Dr.) Wijeyadasa Rajapakshe. So, altogether you have eight more minutes.

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
Thank you very much, Sir.

As you know, I have been an emissary between the former Chief Justice Shirani Bandaranayake and former President Mahinda Rajapaksa trying to resolve the conflict. I have run between both of them; I have spoken to them; I have shared this with my Colleagues in the Front Benches several times, but it was a futile attempt. The intransigence on both sides perhaps contributed to what happened.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! A point of Order is being raised by the Hon. Sujeewa Senasinghe.

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
Let me not be disturbed.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Sujeewa Senasinghe, what is your point of Order? - [*Interruption.*] It is okay, you may continue.

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
Having ventilated my pain and agony which became more pronounced as a result of my abortive attempts to broker peace in that constitutional convulsion, which saw this House debate a botched resolution in January, 2013 to impeach Mrs. Shirani Bandaranayake, I next dealt with the trajectory of the litigation that sought to dispose of the issues that cropped up in challenge to the Select Committee proceedings. In the crux of my speech during the impeachment proceedings, I focused on the rulings of the Court of Appeal and the Supreme Court drawing on some comparative jurisprudence from countries such as the United States. But, it has to be pointed out that when the Court of Appeal comprising late Justice Sri Skandarajah, the then President of the Court of Appeal, His Lordship Justice Anil Gooneratne, who has now been promoted to the Supreme Court after having been unfairly kept in the doghouse - I am very sorry to say this having been the Minister of Justice in the former administration, all of us felt that he was unfairly kept in the doghouse - for having associated himself with the final decision of the court then, and His Lordship Justice Salam, one of the most respected judges, later the President of the Court of Appeal, perhaps, he was denied the chance to get elevated to the Supreme Court because of his association with that Bench - these are all unfortunate events - issued a Writ of Certiorari in a Writ Application No. 41 of 2012 quashing the findings and/or the decision contained in the Report of the Parliamentary Select Committee; their attention exclusively focused on preliminary issues such as whether a writ can lie against Select Committee findings.

I still stand vindicated with my speech I made on the last occasion. Even when this matter went up in appeal at the instance of the Attorney-General, the Supreme Court considered two questions of law, which I can simply summarize as one. Did the Court of Appeal err in holding that the writ jurisdiction embodied in Article 140 of the Constitution extend to the proceedings of Parliament or a Select Committee of Parliament? It was the question that was put up, framed by the then Court of Appeal Bench.

When the Supreme Court answered the above question in the negative, I have to point out that it did not go into the question that we are debating today, and I still stand by what the Supreme Court Bench said because it was wrong for the Court of Appeal to have quashed the Parliamentary Proceedings. It never possessed that authority and I have quoted extensive authorities on that when I spoke during the earlier Debate.

The question of invalidity of the Motion to impeach Mrs. Bandaranayake and the consequent illegality that flowed therefrom were never questions that were focused upon by the Supreme Court. I would summarize the all-important issue before us today.

Article 172 of the Constitution clearly declares that an address of Parliament supported by a majority of the total number of Members of Parliament, including those not present must be presented to the President before a Judge of the Supreme Court or a Court of Appeal is removed. "Was there such an address?" This is the simple question. The said Article uses the word "shall" and thus imports a mandatory requirement for Parliament to present an address to the President. Was this mandatory requirement complied with by this House when we debated the Motion to impeach the 43rd Chief Justice? That is the simple question. The answer is a mandatory, "No". If there is such a non-compliance with the mandatory provisions of the Constitution, what is the effect of such non-compliance? That is the question.

The established principle is that it results in procedures that are null and void. The consequence follows that all subsequent acts taken in consequence of the non-existent address mandated by the Constitution will necessarily become *void ab initio* and that is how today measures had to be taken to rectify this injustice.

As students of Administrative Law, we recall the words of Lord Diplock's in the Civil Service Union case, Council of Civil Services Union v Minister for the Civil Service (1985). This case followed the age-old case of Associated Provincial Picture Houses Ltd. v Wednesbury Corporation (1948). This case rules when we talk about reasonableness in writ jurisdiction. Lord Diplock was quoted by the Hon. Leader of the Opposition as well in a different context. Lord Diplock gave a summary of the grounds of judicial review namely, illegality, irrationality and procedural impropriety. He defined "procedural impropriety" to mean a failure to follow mandatory provisions of law or to act with procedural fairness that would result in decisions becoming *void ab initio*.

There cannot be a more classic instance of such a procedural impropriety than the manifest illegality we committed in 2013, including me who voted for it, when we grievously voted to oust Mrs. Bandaranayake with scant disregard for the mandatory requirement of an address to the President. That is why I feel cathartic today to comment on this and rest my case at that. This impropriety has been remedied in the case of the 43rd Chief Justice and I would commend that we put an end to this filibustering exercise.

Thank you very much.

[අ.භා. 5.34]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ හිතවත් ගරු රවුෆ් හකීම් ඇමතිතුමාගේ කථාවේ අවසාන වචන මට ඇහුණේ, "මේ පිස්සු වැඩේ අපි දැන් නවත්වමු" කියලායි. ඒක තමයි මට තේරුණේ "...put an end to this filibustering exercise". ඔක්කෝම පිස්සු වැඩ කරලා දැන් කියනවා, "ඒ පිස්සු වැඩේ ඉදිරියට නවත්වමු." කියලා.

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
ඔබතුමාත් එරෙහි වුණා නේද, මොහාන් පීරිස් මැතිතුමා පත් කිරීම පිළිබඳව.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔව්. මම දැන් ඒක කියන්නයි යන්නේ. මොහාන් පීරිස් මහතාට විරුද්ධව මේ ගරු සභාවට දෝෂාභියෝගයක් ගෙනාවා නම් ඒකට සාක්ෂි කියන එක් කෙනෙක් මම. හේතුවක් තිබෙනවා. එතුමාව පත් කරන්න එපාය කියලා මම ගරු කථානායකතුමාට ලියවිලි පවා ඉදිරිපත් කළා. මම ජනාධිපතිතුමාටත් ඉදිරිපත් කළා. නමුත් එතුමාව පත් කළා. මොහාන් පීරිස් මැතිතුමා වෙනුවෙන් මම වචනයක් කථා කරන්නේ නැහැ. මම කථා කරන්නේ, පාර්ලිමේන්තුව වෙනුවෙන්. පාර්ලිමේන්තුවේ ජනතා පරමාධිපත්‍යය වෙනුවෙන්. මම කියන්නේ මේකයි. පිස්සු කෙළලා, ඒ සියලුම දේ යටපත් කරලා දැන් ඇවිත් කියනවා, "පිස්සුව නවත්වමු" කියලා.

මේ රටේ උසාවියක් ඉදිරියේ අහන නඩු දෙකක් ශිරානි බණ්ඩාරනායක මහත්මියට තිබුණේ නැද්ද? ඒ මේ රටේ අධිකරණ නොවෙයිද? ඒ අධිකරණවල නඩු විභාග වෙද්දී, අස් නොවූවා යැයි සැලකෙන සේ එතුමිය කොහොමද නැවත අග්‍ර විනිශ්චයකාර ධුරයට එන්නේ? එතුමියට විරුද්ධව නඩු තිබෙනවාය කියන එක සැලකිල්ලට ගත්තේ නැද්ද? එතුමියට විරුද්ධව අනෙක් නඩු තිබෙනවා නේද මහෙස්ත්‍රාත් උසාවිවල. ඒවා නොසලකා අධිකරණයට විනිශ්චයකාරවරු ගෙනෙන්න පුළුවන්ද? හොඳයි, අපි ගනිමු, ඔබතුමන්ලා කියපු ක්‍රමය තමයි එකම ක්‍රමය කියලා. දැන් අපේ රාජිත සේනාරත්න ඇමතිතුමා කිව්වා, "ක්‍රමවේදයෙන් වැඩක් නැහැ. ප්‍රතිඵලය පමණි අවශ්‍ය" කියලා. ඒක නම් නියමයි. ප්‍රතිඵලය පමණි අවශ්‍ය. එතකොට කිසිම ක්‍රමවේදයක් ඕනෑ නැහැ, ප්‍රතිඵලය ඉෂ්ට කර ගන්නයි තිබෙන්නේ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ප්‍රතිඵලය ක්‍රමවේදයකට අනුව.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ක්‍රමවේදයෙන් වැඩක් නැහැ කිව්වා නේ. Justice is according to law. ඒක තමයි ඉස්සෙල්ලාම ඉගෙන ගන්න ඕනෑ. යුක්තිය ඉටු

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

කරන්න බැහැ නීතිය ප්‍රකාරව හැර. දැන් නීතිය ප්‍රකාරව ඉටු කරනවාය කියන්නේ මොකක්ද කියලා මෙතැන හුඟ දෙනෙක් කිව්වා. ඒ නිසා මම ඒක ගැන කියන්න යන්නේ නැහැ. හැබැයි, මම අහන්නේ මේකයි. දැන් ඔබතුමන්ලා කියනවා, "ඇය ඉවත් කරනු ලැබූ සේ සැලකිය නොහැක" කියා. "එහෙම නම් එතැන තිබිලා තියෙන්නේ අවතාර ක්‍රියාකාරිත්වයක්, ඇය ඉවත් නොකරනු ලැබුවා සේ සැලකිය යුතුයි" කියා. These are legal fictions. අනෙක් පැත්තෙන් ඔබතුමන්ලා කියනවා, මොහාන් පීරිස් පත් නොවුණා සේ සැලකිය යුතුයි. ඒ දෙකම නොවුණා සේ. සැබෑ ලෝකයේ -භෞතික ලෝකයේ- ඒ දෙකම වුණේ නැහැ. නැත්නම් නෛතික ලෝකයේ ඒ දෙකම වුණේ නැහැ. ඒ නිසා ඒවා තිබුණු තැන්වලම දැන් තිබෙනවාය. අපි මේකට විරුද්ධයි. හැබැයි, ඒකම අපිත් භාර අරගෙන අපි කියනවා, පාර්ලිමේන්තුවට ඇවිත් නොවෙයි මේක කළේ; මේ කළේ හිතුවක්කාර වැඩක්. අගමැතිතුමා විසින් අපේ ජනාධිපතිතුමාව පොලඹවා ගෙන හෝ අපේ ජනාධිපතිතුමා මඟින් කළේ කියා. [බාධා කිරීම්] අපේ හෝ ඔබේ. [බාධා කිරීම්] ඔය විධියට අපි හිතන්න පටන් ගත්තොත් දැන් අපි කියනවා, ඔබ විසින් කියන ඔය ප්‍රවාදය අසත්‍යක් කියලා. එය ද නොවූවා සේ සැලකිය යුතුය කියලා අපි කියනවා. ඔබ විසින් කියා තිබෙන පරිදි එතුමාවත් ඉවත් කරනු නොලැබූවා සේ සැලකිය යුතුය කියලා අපි කියනවා. එයද නොකෙරුණා සේ සැලකිය යුතුය කියලා. එහෙම කියලා -

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ කථා කරන දේ - [බාධා කිරීමක්]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මා එය පැහැදිලි කරන්නම්. මම කියන්නේ මෙහි තිබෙන absurdity එක ගැනයි. You can reduce this to absurdity. That is what I am trying to impress upon you, those who will understand. If you treat anything as *void ab initio*, and thereafter if we repeat what you have done, that is also *void ab initio* and then we proceed to act with direct action. Then, what happens? You have opened the doors to anarchy. අරාජිකවාදයට ඔබ දොර ඇරලා තිබෙනවා. එච්චරයි, මම මේ කියන්නේ. ඒ නිසා ඔබ අතගසා තිබෙන්නේ භයානක තැනකට. මෙය පාර්ලිමේන්තුවේ බලයට අභියෝග කිරීමක් පමණක් නොවෙයි. ඒ වාගේම ජනතා පරමාධිපත්‍යයට අභියෝග කිරීමක් පමණක් නොවෙයි, මේක රාජ්‍ය විරෝධී ක්‍රියාවක්. ඉතින් ඔබ මේ ආකාරයට ක්‍රියා කිරීම නිසා ඇති කරන මේ පූර්වාදර්ශය මඟින් මේ රටට භයානක ප්‍රතිඵල ඇති වන්නට පුළුවන්. ඊට පසුව හැම දෙනාම resort to direct action. All that you have to say is, *void ab initio.* And, who determines? Some executive authority. එහෙම කරන්න පුළුවන්ද? එහෙම කරන්න ගියොත්, සාමාන්‍ය ජීවිතයේ දී, සාමාන්‍ය ලෝකයේදී අපට කුමක් සිදු වෙයිද? අපි හිතමු, යම් නිලධාරියෙක් අපට යම් වැරදි තීරණයක් දෙනවා කියලා. මම කියනවා, "ඔය තීරණය වැරැදියි, ඕක ආරම්භයේ සිටම බල ශූන්‍යයි, එම නිසා ඔබගේ තීරණය මම නොපිළිගනිමි." කියලා. එහෙම වෙන්න පුළුවන්ද? එහෙම ගියොත් එය කෙළවර වන්නේ කොතැනින්ද? Is it not far better and safe that we all follow the procedure and act according to the procedure that is laid down? මම කියන්නේ මේකයි. මුල ඉඳලාම ඔබට අදහසක් තිබුණා, මේක බල ශූන්‍යයි කියලා - *void ab initio.* Therefore, you had the right to do what you have done. අපි මොහොතකටවත් එහෙම හිතමු. එහෙම හැකියාවක් තිබුණත්, එය කිරීම වෙනුවට වගකිව යුත්තන් හැටියට ඔබ කළ යුතුව තිබුණේ මේ පාර්ලිමේන්තුවට එන එක නොවෙයිද? අර තවත් කවුදෝ කියලා තිබුණා වාගේ කළ යුතුව තිබුණේ, ශ්‍රේෂ්ඨාධිකරණයට ගොස් මෙය ඉදිරිපත් කරන එක නොවෙයිද?

මම මේ කරුණු මෙසේ කියන්නේ, ඇත්තටම ඔබට තිබුණු ගැටලුවත් නොදැන නොවෙයි. ඔබතුමන්ලාගේ අගමැතිතුමාට මේ පාර්ලිමේන්තුවේ බහුතර බලයක් නැහැ. ඔබතුමන්ලාගේ අගමැතිතුමාව පත් කර තිබෙන්නේ බහුතරයකගේ විශ්වාසය ඇති අගමැතිවරයා හැටියට තීරණය කරලා නොවෙයි. ඉතින් එහෙම වුණාම බහුතරයකගේ බලය නැතිව එතුමා අගමැති ධුරය ගත්තා වාගේම, පිළිකන්නෙන් ඇවිල්ලා තමයි හැම දේම කර ගන්න සිදු වන්නේ. [බාධා කිරීම්] පිළිකන්නෙන් එන්න වෙන්නේ. අගමැතිකමට ආවේ පිළිකන්නෙන්. අගමැතිකමට ආවේ බහුතරයකගේ විශ්වාසය ඇති අගමැතිවරයා හැටියටද? නැහැ. සුළුතරයකගේ විශ්වාසය ඇති අගමැතිවරයකු හැටියටයි. එතකොට දිනීමේ අභිප්‍රාය ඇතුව මේ පාර්ලිමේන්තුවට යෝජනාවක් ගෙනෙන්නේ කොහොමද? දිනීමේ අභිප්‍රාය ඇතුව මේ පාර්ලිමේන්තුවට යෝජනාවක් ගෙනෙන්න බැරි වුණාම, ඊළඟට කරන්නේ ආයෙමත් පිළිකන්නෙන් ගිහිල්ලා මේ රටේ නීතිය විකෘති කරන එකයි. දැන් මොකක්ද මේ කළේ? ඒකම නේ? බහුතර බලයක් නැති අගමැතිවරයකු පත්වීමෙන් ඇති වුණු විපාකයක් තමයි අද අපි මේ අත්විඳලා තිබෙන්නේ. ඒ නිසා දැන් එතුමා හැම එකකින්ම මේ පාර්ලිමේන්තුව මඟහැරලා යනවා. දැන් මම බලා ගෙන ඉන්නේ දින 100යේ වැඩ පිළිවෙළේ දී මොන මොනවා වෙයි ද කියන එකයි. ඇයි? පාර්ලිමේන්තුව ඕනෑ නැහැ. පාර්ලිමේන්තුව මඟහැරලා යන්න පුළුවන්. [බාධා කිරීම්] ඇයි?

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
පාර්ලිමේන්තුව විසුරුවා හරිමු.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මා කියන්නේ, මේ පාර්ලිමේන්තුවෙන් එතුමා ඉල්ලා අස්විය යුතුයි. එතුමාට බහුතර බලයක් නැහැ. අපේ ස්ථාවර නියෝග අනුව සාමාන්‍යයෙන් මේ වාගේ විවාදයකින් පසුව අපි ඡන්දයක් කැඳවන්නේ නැහැ. මා කියනවා, "මේ විවාදය ගරු සභාවේ බහුතර කැමැත්ත අනුව ඡන්දයට දාන්න" කියලා. [බාධා කිරීම්]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
අපි කැමැතියි. ඡන්දයකට දමමු.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඡන්දයට දැමීමෙන් පසුව- [බාධා කිරීම්] එතුමාට බහුතරයේ විශ්වාසය තිබෙනවා ද කියලා බලා ගන්න පුළුවන්.[බාධා කිරීම්] එතකොට එතුමාට ඒ පිළිබඳව ලැබෙන තීරණය අනුව එතුමා අගමැති ධුරයෙන් අස් විය යුතුයි කියලා මම කියනවා. හැබැයි එය පරාජය වුණොත්. [බාධා කිරීම්] මම කියන්නේ නැහැ, පරාජය වුණේ නැත්නම් කියලා.

ඊළඟට මම කැමැතියි මේ වාර්තා කළා ද කියන ප්‍රශ්නය ගැන -

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, you have one more minute.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

One more minute නම්, මට මෙම ප්‍රකාශය - ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණ විසින් 2015.01.28 දින නිකුත් කරන ලද ජනමාධ්‍ය නිවේදනය - කියවන්න ඉඩ ලබා දෙන්න ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මට ඒ සඳහා විනාඩියක කාලයයි ගතවන්නේ. "එදා UNP හිතමිතුරෙකුව සිටි අධි නීතිඥ නෙවිල් සමරකෝන් මහතා අග විනිසුරුතුමා ලෙස පත්කොට ඉන් පසුව රජය සමග ඔහු විරසක විය. එය කරන කොටගෙන ඔහුව ඉවත් කිරීමට ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මහතා අයුතු බලපෑම් කළේය. ශිරානි බණ්ඩාරනායක අග විනිසුරුවරිය ඉවත් කිරීමට ද දෝෂාභියෝගයක් මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ කාලයේ ගෙන එනු ලැබුවේය" කියන කාරණා අපි පිළිගන්නවා. ඒ මොහොතේ දී අප විසින් පෙන්වා දෙනු ලැබුවේ මේ ඉවත් කිරීමේ ක්‍රියාදාමය මීට වඩා පරිපූර්ණ සංවර්ධනයකට ගෙන යා යුතු බවයි. එසේ වුවද, පාර්ලිමේන්තුවේ බලයට අභියෝග කරමින් එදා අධිකරණය ක්‍රියාත්මක වූ ආකාරය අපි මේ පාර්ලිමේන්තුවේ පරාජය කළ යුතුය. එදා අධිකරණය මේ පාර්ලිමේන්තුව යටත් කර ගන්න හදන වෙලාවේදීත් අපි මේ පාර්ලිමේන්තුව වෙනුවෙන් පෙනී සිටියා. එසේ පෙනී සිටිමින් තමයි මේ පාර්ලිමේන්තුවට අග විනිසුරුතුමිය ඉවත් කිරීමට බලයක් තිබෙන බව අප පිළිගෙන ඒ අනුව ක්‍රියා කළේ. මෙය තවදුරටත් කියවා ගෙන යන්නට මට වේලාව නොමැති නිසා මා මෙම නිවේදනය **සභාගත*** කරමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 5.46]

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම විවාදය අවස්ථාවේ දී අග විනිසුරුවරුන් දෙදෙනෙකු පිළිබඳව බොහෝ අය දිගින් දිගටම කථා කළා. මේ වෙලාවේ විනාඩි කිහිපයක කාලයක් පමණක් මා හට ලැබී තිබෙන නිසා, මම ඒ සම්බන්ධයෙන් කථා කරන්නේ නැහැ. හිටපු අග විනිසුරුතුමිය වන ශිරානි බණ්ඩාරනායක මැතිනිය දෝෂාභියෝගයකින් ඉවත් කරන වෙලාවේ මා සඳහන් කළ එක කරුණක් ගැන පමණක් මම කියන්නම්. හැමතිස්සෙම ඒ වෙලාවේ ඉන්න පාලකයා නීතිය තමන්ගේ වුවමනාව වෙනුවෙන් පාවිච්චි කරනවා. මට මේ වෙලාවේ කියන්න තිබෙන්නෙත් ඒකම තමයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෛත්‍රීපාල-රනිල් පාලනය -යහ පාලනය- විශේෂයෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය පදනම් කර ගත් සාකච්ඡාවක් තමයි මේ රටට ගෙනාවේ. එහිදී මේ සමාජයේ අපි කාගේත් ප්‍රධාන විවේචනය තිබුණේ මහින්ද රාජපක්ෂ පාලනය භීෂණය වපුරමින්, නීතියේ ආධිපත්‍ය බිඳ හෙළමින් මේ රටේ කැලෑ නීතියක් රජ කළාය කියන එකයි. එහි ගොදුරක් බවට පත්වුණු, එහි බේදවාචකයන්ට හසුවුණු පිරිසක් හැටියට අපි එය විවේචනය කළා. ඊට එරෙහිව තමයි මෛත්‍රීපාල-රනිල් පාලනය මේ රටේ ජනතාව තෝරා පත් කර ගත්තේ. එහෙම නම්, ඒ වෙනුවෙන් කටයුතු කිරීමේ වගකීම ඔවුන්ට තිබෙනවා. මා මේ අවස්ථාවේ දී ඒ ගැන පක්ෂ විපක්ෂ සියලු දෙනාගේම අවධානයට ලක් කරනවා. පසු ගිය කාලය තුළ මේ රටේ ජනතා සංවිධාන, දේශපාලන පක්ෂ නායකයන් විසින් විවිධ දූෂකයන් පිළිබඳව, හොරුන් පිළිබඳව ආරක්ෂක ප්‍රධානීන්ට, රජයට - මේ යහ පාලන රජයට - පැමිණිලි කළ බව අපි දන්නවා.

මේ යහපාලන රජයට පැමිණිලි කළා. මේ වන කොට කුඩු ජාවාරම් පිළිබඳ චෝදනා, විවිධ ආයුධ අපහරණය පිළිබඳ චෝදනා, වංචා දූෂණ පිළිබඳ චෝදනා ආවා අපි දැක්කා. මේ පිළිබඳ පරීක්ෂණ නැහැ. ඒ අයගේ බලපුළුවන්කාරකම් අනුව කටඋත්තරයක්වත් නැහැ. සාමාන්‍ය ගමේ මිනිහෙකුට විරුද්ධව පැමිණිල්ලක් කළා නම් අත පය කඩලා කුඩු කරලා තමයි ඔක්කෝම පටන් ගන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එහෙම නැති වුණාට මේ වෙලාවේ ජනාධිපතිතුමා යටතේ තිබෙන රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා පළමුවැනි පැමිණිල්ල කරලා තිබෙනවා. ඒ, කාට විරුද්ධවද? පසු ගිය ආණ්ඩු කාලයේ මේ රටේ දේශපාලනය කරන්න අයිතිය නැති වෙලා මේ රටෙන් පිටත් වෙන්න සිදු වෙච්ච කුමාර් ගුණරත්නම් සහෝදරයාට විරුද්ධව. මොකක්ද පැමිණිල්ල? මේ රටේ නීති කැඩුවා කියන එක තමයි පැමිණිල්ල.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ආණ්ඩුව පත් වන වෙලාවේ කරපු එක ආයාචනයක් -ඉල්ලීමක්- තමයි පසු ගිය කාලයේ වෙච්ච නීති විරෝධී ක්‍රියා නිසා, මර්දනය නිසා විවිධ ක්‍රමවලින් විදෙස් ගත වූ අයට ලංකාවට එන්න අවස්ථාව විවර කර දෙන්න කියන එක. පසු ගිය කාලයේ තිබුණු මර්දන තත්ත්වය නිසා පෝද්දල ජයන්ත, සනත් බාලසූරිය, සරත් ෆොන්සේකා මැතිතුමාගේ මිත්‍රයෙක් වුණු ප්‍රසන්න ෆොන්සේකා, ශාන්ත, විවිධ මාධ්‍යවේදීන්, කලාකරුවන්, ජෙයපාලන් කවියා ඇතුළු බොහෝ දෙනා අපේ රට අත ඇරලා ගියා. බොහෝ අයට යන්න සිදු වුණේ වෙනත් නම්වලින්; නීති විරෝධී ක්‍රමවලින්; එහෙම නැත්නම් බෝට්ටුවලින්; මොකක් හරි ක්‍රමයකින්. මේ පාලනය කිව්ව දේ තමයි, ඒ සියලු දෙනාට මේ රටට එන්න විවෘත ආරාධනයක් කරනවාය කියන එක. නමුත් මොකක්ද කරලා තිබෙන්නේ? ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා පළමුවැනි පැමිණිල්ල කරනවා, කුමාර් ගුණරත්නම්ට විරුද්ධව. ඒ ගොල්ලන්ට තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි ඔහුට චෝදනා කරන එක. පරීක්ෂණවලට දවස් ගණනක් කැඳෙව්වා. අපි පරීක්ෂණවලට ගියා. කටඋත්තර දුන්නා. අපි කිව්වේ මොකක්ද? මේ රටේ දේශපාලනය කිරීමේ අයිතිය සියලු දෙනාටම තිබෙනවා. මේ කාරණය ආණ්ඩුව හරියට පැහැදිලි කරන්න ඕනෑ.

මහ බැංකුවේ අධිපති බවට පත් කරලා තිබෙනවා, අර්ජුන් මහේන්ද්‍රන් මහත්තයා. ඔහුට ලංකාවේ පුරවැසිභාවයක් නැහැ කියලා වාර්තා කරනවා. ගිය සතියේ දුන්නාද දන්නේ නැහැ. මේ රටේ මූල්‍ය පරිපාලනය සම්පූර්ණයෙන් භාර දෙනවා අර්ජුන් මහේන්ද්‍රන්ට. රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති විධියට ඒක නිර්දේශ කරනවා. හැබැයි මේ රටේ ඉපදුණු, ඉගෙන ගත්ත, දේශපාලනය කරපු, හිරගත වෙච්ච, ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කරපු, විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය හදාරපු, මේ රටේ තිබුණු මර්දනයන් නිසා විදේශගත වෙලා ජීවිතය බේරා ගත්ත කුමාර් ගුණරත්නම්ට දේශපාලනය කරන්න අයිතියක් නැහැ කියලා, දේශපාලනය කිරීම වැරැද්දක් විධියට සලකලා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයෙන් ඔහුට විරුද්ධව පැමිණිලි කරනවා. මහජන සාමය පිළිබඳ අමාත්‍යවරයා ඔහුව පිටුවහල් කරන්න නියෝගය ගහනවා. අපි අහනවා, "මේකද යහපාලනය?" කියලා. තමුන්නාන්සේලා කිව්වේ, වෙච්ච අනීතික දේවල් -නීති විරෝධී දේවල්- නිවැරැදි කරන්න කටයුතු කරනවා කියලායි. ඒ අනුව තමුන්නාන්සේලා යම් දේවල් කළා. සරත් ෆොන්සේකා මැතිතුමාට දේශපාලනය කරන්න අයිතිය තිබෙනවා. ඔහුට පුරවැසියෙක් විධියට ඒ අයිතිය තිබෙනවා කියලා ඔහුගේ සියලු තනතුරු තානාන්තර දුන්නා. අපි ඒක අනුමත කරනවා. ඒක හොඳයි. ඒක කළ යුතු දෙයක්. ඒක පසු ගිය කාලයේ ඡන්දය දීපු නොදීපු සියලුම දෙනාගේම බලාපොරොත්තුවක්. ඒක කළ යුතු දෙයක්. හැබැයි ඇයි, මේ දෙවිධියකට කටයුතු කරන්නේ? ඇයි, නීතිය දෙවිධියකට ක්‍රියාත්මක කරන්නේ? ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ, යහපාලනය කියන්නේ, දේශපාලනය කිරීමේ අයිතිය කියන්නේ තමන්ට හිතවත්, තමන්ට මිතුරු, තමන්ගේ මතය දරන අයට විතරක් දේශපාලනය කිරීමේ අයිතිය දීම නොවෙයි. මේ

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

රටේ සියලු දෙනාට දේශපාලනය කිරීමේ අයිතිය, ඒ අවස්ථාව දෙන්න ඕනෑ. මොකක්ද මේ කරන්නේ? මේ රටේ පසු ගිය මර්දන තත්ත්වයන් හමුවේ රට අතහැර ගිහිපු අයට එන්න ආරාධනා කරන ගමන්, අනෙක් පැත්තෙන් ආපු කෙනාට දේශපාලනය කිරීමේ අයිතිය, නිදහස දෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි විශේෂයෙන් මේ රජයට අවධාරණය කරනවා, දේශපාලනය කරලා, මාධ්‍ය හසුරුවලා, තමන්ගේ නිර්මාණ කාර්යයේ යෙදිලා, පසු ගිය මර්දනයට විරුද්ධව හඬක් නඟපු විදෙස්ගත වුණු සියලු දෙනාට මේ රටේ දේශපාලනය කිරීමේ අයිතිය, ඔවුන් ඉල්ලා සිටින අයිතිය දෙන්න ක්‍රමවේදයක් හදන්න කියලා. ඒ ක්‍රමවේදය හදන එක මේ රටේ වගකීම. එහෙම නැතුව තමන්ට විරුද්ධ මතයක් දරපු නිසා කුමාර් ගුණරත්නම්ට විරුද්ධව පළමුවැනි පැමිණිල්ල කරලා, පළමුවැනි නඩුව විධියට ඒක විභාග කරලා ඔහුව පිටුවහල් කරන්න, ඔහුගේ දේශපාලනය කිරීමේ අයිතිය වළ දමන්න ලැහැස්ති වෙන්න එපා. එහෙම වුණෝතින් මේ රටේ ජනතාව ඒකට විරුද්ධව පෙළ ගැසෙයි. දැනටමත් තමුන්නාන්සේලාට සහයෝගය දීපු අයම තමුන්නාන්සේලා මේ කරපු දේ හෙළා දකින තත්ත්වයට පත් වෙලා තිබෙනවා. අපි දන්නේ නැහැ, මේක කාගේ වුවමනාවට කළාද කියලා. රජයේ වගකීමක් ඒක හොයන එක. විදේශ කටයුතු අමාත්‍යාංශය ඒ වාගේම මහජන සාමය පිළිබඳ අමාත්‍යාංශය මැදිහත් වෙලා, අගමැතිතුමා මැදිහත් වෙලා විවෘතව කළ ආරාධනය අනුව ඔවුන්ගේ දේශපාලන අයිතිය තහවුරු කරන්නත් මැදිහත් වෙන්න කියන ඉල්ලීම කරනවා. එහෙම නැත්නම් ආපසු අපට කියන්න වෙන්නේ, නීතිය හැම තිස්සේම පාලකයාගේ වුවමනාව අනුව, තමන්ගේ වුවමනාව අනුව, තමන්ගේ පැවැත්ම අනුව පාවිච්චි කරනවා කියලායි. ඒක කරන්න එපා. එහෙම වුණොත් තමුන්නාන්සේලාගෙන් මේ රටේ ජනතාව බලාපොරොත්තු වුණු යහපාලනය කෙරෙන්නේ නැහැ. ඒ නිසා කුමාර් ගුණරත්නම් සහෝදරයා ඇතුළු මේ රටේ දේශපාලනය කිරීම නිසා වරදට, දඬුවමට හසු වුණු සියලු දෙනාට, දේශපාලන සිරකරුවන් ඇතුළු සියලු දෙනාට ඒ අයිතිය ලබා දෙන්න මැදිහත් වන්න. එසේ නොවුණොත් මේ රටේ ජනතාව ඒකට විරුද්ධව පෙළ ගැසෙයි කියන කාරණය මම මතක් කරනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 5.53]

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - வெளிநாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Ajith P. Perera - Deputy Minister of Foreign Affairs)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය අවුරුදු පහක පමණ කාලය තුළ අපේ රටේ දේශපාලනයේ වුණු විවිධ දේ මේ පාර්ලිමේන්තුව තුළ මම දුටුවා. මේ රටේ ඉතිහාසය ගත් විට අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳව ප්‍රධානතම ප්‍රහාරය එල්ල වුණේ ශිරානි බණ්ඩාරනායක අග්‍ර විනිශ්චයකාරතුමියව ඉවත් කිරීමේ යෝජනාව ඉදිරිපත් කරපු ආකාරය සහ ඒ විභාගය පවත්වා ගෙන ගිය ක්‍රමය අනුවයි. මේ රටේ මමත් සාමාජිකයෙකු වන ශ්‍රී ලංකා නීතිඥ සංගමය සියයට 99.99ක් ශිරානි බණ්ඩාරනායක විනිශ්චයකාරතුමියව ඉවත් කිරීම සඳහා පසු ගිය රජය ගෙන ගිය ඒ ක්‍රියාදාමය ප්‍රතික්ෂේප කළා. නීතිඥ ප්‍රජාව විවිධ දේශපාලන මත දරනවා. එය අදත් තිබෙනවා; එදාත් තිබුණා. හැබැයි, ශිරානි බණ්ඩාරනායක විනිශ්චයකාරතුමියව ඉවත් කිරීමේ ක්‍රියාදාමය පිළිබඳව ඒකමතික භාවයක් මේ ලංකාවේ නීතිඥ වෘත්තිය තුළ තිබුණා. ඒ පසු බිම ඇති වුණේ ඇයි කියන කාරණය තේරුම් ගනිද්දී ඒ සිදු වුණු සමස්ත ක්‍රියාදාමය නීතියට විරුද්ධයි; සදාචාරයට විරුද්ධයි; පිළිගත් ක්‍රමවේදයට විරුද්ධයි; පාර්ලිමේන්තු සම්ප්‍රදායටත් විරුද්ධයි.

අපි ඒ කාලයේ බොහොම ලොකුවට මේ පාර්ලිමේන්තුව උත්තරීතරයි කියලා කිව්වා. ඇත්ත කථාව නම් මේ පාර්ලිමේන්තුව උත්තරීතර කළ යුතු වෙනවා. නමුත් අද මේ මොහොතේ පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ආකෘතිය තුළ පාර්ලිමේන්තුවේ ඇති උත්තරීතර භාවයක් නැහැ. ඒක තමයි ඇත්ත. වාසනාවට මේ මොහොතේ විධායක ජනාධිපති ධුරය දරන ජනාධිපතිතුමා පාර්ලිමේන්තුව මත තමන්ගේ අධිපතිවාදී බලය පාවිච්චි නොකරන නිසා මේ මොහොතේ මේ පාර්ලිමේන්තුවට එහෙම දැනෙන්න පුළුවන්. හැබැයි, එහෙම නොකරපු ජනාධිපතිවරු මේ රට පාලනය කරන වෙලාවල්වල මේ පාර්ලිමේන්තුව එහෙම උත්තරීතර වුණේ නැහැ. ඒ නිසා මේ දින සියයක කාලය තුළ ඉතා ඉක්මනින් පාර්ලිමේන්තුව උත්තරීතර කර ගැනීම සඳහා වූ වැඩ පිළිවෙළ අපි කවුරුත් කල්පනාවෙන්, එකමුතුවෙන් සම්මත කර ගත යුතු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වාසුදේව නානායක්කාර මැතිතුමා කිව්වා, "අග්‍රාමාත්‍යවරයාට මේ පාර්ලිමේන්තුවේ බහුතරයක් නැහැ" කියලා. හැබැයි, යම් ප්‍රතිපත්තියක් මත මේ රටේ ජනතාවගෙන් වරමක් ඉල්ලලා ඒ ප්‍රතිපත්තිය ජයග්‍රහණය කරපු නිසා මේ රටේ විධායක ජනාධිපති ධුරය සඳහා අප සමග තරග කරපු, අපේ ප්‍රතිපත්තිය මත තරග කරපු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මේ රටේ ජනතාව බහුතර ඡන්දයෙන් තෝරා පත් කර ගත්තා. ඒ ප්‍රතිපත්තිය අනුව, එයින් ලැබුණු ශක්තිය මත සහ එයින් ලැබුණු සදාචාරාත්මක අයිතිය මත අපට මේ පාර්ලිමේන්තුවේ මේ රජය දරන්නට ශක්තිය තිබෙනවා.

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து)
(The Hon. Arundika Fernando)
අපේ ශක්තිය මත.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි. මීට සතියකට කලින් වර්තමාන ජනාධිපතිතුමා අග්‍ර විනිශ්චයකාර ධුරය සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයේ සිටින කේ. ශ්‍රීපවන් විනිශ්චයකාරතුමාගේ නම යෝජනා කරනු ලැබූ විට මේ පාර්ලිමේන්තුවේ අග්‍රාමාත්‍යවරයා, විපක්ෂ නායකවරයා -නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා- ඇතුළත් වූ පාර්ලිමේන්තු සභාව විසින් ඒකමතිකව කේ. ශ්‍රීපවන් විනිශ්චයකාරතුමා අග්‍ර විනිශ්චයකාර ධුරයට පත් කිරීම අනුමත කළා. ඒකමතිකව -විරුද්ධතාවක් නැතිව- අනුමත වුණු, කේ. ශ්‍රීපවන් විනිශ්චයකාරතුමා පත් කිරීමට හේතු භූත වුණු ගරු ජනාධිපතිතුමාගේ විධානය වැරැදියි කියලා අද ගරු විපක්ෂ නායකතුමාට හීනෙන් නැඟිටලා වාගේ කියන්න පුළුවන්කම තිබෙනවාද? එහෙම කියන්නට තිබෙන සදාචාරය මොකක්ද?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒ චාරිත්‍රානුකූලව.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
එය චාරිත්‍රානුකූල වෙන්නේ කොහොමද?

රටේ විපක්ෂ නායකවරයා එම ධුරය දරන විට පාර්ලිමේන්තු සභාවේ කටයුතු කළ යුත්තේ වගකීමෙන්. මම විශ්වාස කරනවා, ඔබතුමා වගකීමෙන් කටයුතු කළා කියා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔව්, කළා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
හැබැයි වගකීමෙන් කටයුතු කරලා නිවැරදි තීරණයට ඇවිල්ලා, පසුව පීඩනයට ලක් වුණාම, "කමක් නැහැ, ඔන්න ඔහේ යෝජනාවක් දමමු" කියා යෝජනාවක් දමනවා. මේකේ එතැනින් එහාට දෙයක් නැහැ. නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාගේ තීරණය හරි. නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විපක්ෂ නායකවරයා හැටියට ජනාධිපතිතුමාගේ නාම යෝජනාව ඒකමතිකව අනුමත කරලා පාර්ලිමේන්තු සභාවේ ගත්ත තීරණය හරි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒ තීරණ දෙකම හරි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, දෙකක් හරි වෙන්න බැහැ නේ. හරි නම් හරි වන්නේ එකයි. දෙකක් හරි වෙන්නේ කොහොමද? [බාධා කිරීමක්] ප්‍රතිවිරුද්ධ මත දරන්න බැහැ. අද ඉදිරිපත් වෙලා තිබෙන යෝජනාව මේ පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාගේ ස්ථාවරයට පටහැනියි. එහෙම නම් අද විපක්ෂයේ කණ්ඩායම් දෙකක් ඉන්න ඕනෑ. එකක් තමයි දිනේෂ් ගුණවර්ධන මැතිතුමා නායකත්වය දරන විපක්ෂ කණ්ඩායම. අනෙක් එක තමයි නිල වශයෙන් අපේ නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා නායකත්වය දරන විපක්ෂ කණ්ඩායම. හැබැයි, අපි පිළිගන්නේ නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාව. මොකද, එතුමා නිවැරදිව කටයුතු කරනවා. නීත්‍යානුකූලව කටයුතු කරනවා. එතුමා මේ අවස්ථාවේදීත් නීත්‍යානුකූලව කටයුතු කරලා කේ. ශ්‍රීපවන් විනිශ්චයකාරතුමාගේ පත් කිරීමට එකඟ වුණා. එහෙම නම් කේ. ශ්‍රීපවන් විනිශ්චයකාරතුමා අග්‍ර විනිශ්චයකාරකමට සුදුසුයි කියා යෝජනා කරලා, ඒක ඒකමතිකව සම්මත වෙලා තිබෙද්දි කාර්ය පටිපාටිය වැරදියි කියා දැන් මොනවාද මේ කියන්නේ? එහෙම කියන්න බැහැ. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තවත් කාරණා දෙකක් කියන්න අවශ්‍යයි. 2013 ජනවාරි මාසයේ 11 වැනිදා මෙයට අදාළව ඉදිරිපත් කරපු යෝජනාවේ තිබුණු අඩු පාඩුව පිළිබඳව -ඒ ඉතිහාසය ගැන- මතක තිබෙන ගරු මන්ත්‍රීවරයෙක් මේ පාර්ලිමේන්තුවේ හිටපු එක ගැන මට සතුටුයි. ඒ ගැන ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා මතක් කළා. එදා ඒ තේරීම් කාරක සභාව පත් කිරීමේ යෝජනාව හැර වෙනත් යෝජනාවක් නොමැතියි කියන කාරණය. එනම්, "ඉවත් කිරීම සඳහා වූ යෝජනාවක් ඉදිරිපත් වී නැත" කියන ඌනතාව. එය තේරුම් අර ගෙන මමත්, විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාත් සාරගර්භව කරුණු ඉදිරිපත් කළා. අවසානයේදී උත්තරයක් නැති වූ තැන ගරු කථානායකතුමාට -එතුමාට- තෝරා ගැනීම් කිහිපයයි තිබුණේ. විධායක ජනාධිපති ක්‍රමය කොච්චර ශක්තිමත්ද කිව්වොත්, රටේ එක තැනක විධායක ජනාධිපතිවරයා සිටින විට එතුමාගේ එක කුස උපන් සහෝදරයා පාර්ලිමේන්තුවේ කථානායකවරයා වුණා. එහෙම වුණාම ඇසට පෙනෙන දෙය පවා නොපෙනෙන තත්ත්වයකට පත් වෙනවා. ඒක තමයි අපි මුහුණ දී තිබුණු අවාසනාව. වාසනාවකට අපි ඒකෙන් ගොඩ ආවා. 2013 ජනවාරි 11 වැනි දින කථානායකතුමාගේ තීන්දුව අවසානයේ එතුමා සඳහන් කළ කොටස එදින හැන්සාඩ් වාර්තාවේ මේ ආකාරයට සඳහන් වෙනවා:

> "එම නිසා අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 යෝජනාව දැන් ඡන්ද විමසීම සඳහා ඉදිරිපත් කරමි."

යෝජනාවට ඡන්ද විමසීමෙන් පසුව සඳහන් වෙනවා, "පක්ෂව 155යි; විරුද්ධව 49යි; නොපැමිණි 20යි" කියා. මොකක්ද, මේ "විෂය අංක 1" කියන්නේ? චෝදනා විමර්ශනය සඳහා තේරීම් කාරක සභාවක් පත් කිරීමේ යෝජනාව. ඊට වඩා වැඩි යමක් තිබුණේ නැහැ. එක වතාවක් කාරක සභාවක් පත් කරලා, ඒක රැස් වෙලා, හරියට හෝ වැරදියට තීන්දුවක් අර ගෙන තිබෙනවා නම්, ඉන් පස්සේ නැවත පත් කරන්නේ මොකටද? ඒ කාර්ය පටිපාටිය වැරදියි; මුල සිටම වැරදියි; හොඳටම වැරදියි. ඒක තමයි ඇත්ත. ඊට වඩා මොකක් කියන්නද? අවසානයේදී කථානායකතුමාත් ඒ ආකාරයටයි මේ ඡන්ද විමසීම පවත්වලා තිබෙන්නේ.

මේ ක්‍රමය වැරදි නම් විරුද්ධව ඡන්දය දුන්නේ ඇයි කියලා ඇහුවා. ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමා ඡන්දය විමසීම ආරම්භයේදී විරුද්ධව ඡන්දය දුන් සියලු දෙනා වෙනුවෙන් නිශ්චිතව කියා තිබෙනවා, කාර්ය පටිපාටිය වැරදියි; යෝජනාවක් නැහැ; කෙසේ නමුත් අපි මේකට විරුද්ධත්වය ප්‍රකාශ කිරීම සංකේතාත්මක කිරීම සඳහායි විරුද්ධව ඡන්දය පාවිච්චි කරන්නේ කියා. ඒක හැන්සාඩ් වාර්තාවේ ලිඛිතව සඳහන් වෙනවා. කරුණාකරලා, සම්පූර්ණ හැන්සාඩ් වාර්තාව කියවන්න.

ඒ වාගේම මේ අග්‍ර විනිශ්චයකාර ධුරයේ රැඳිලා හිටපු මොහාන් පීරිස් මහත්මයා ගැනත් යමක් කියන්න අවශ්‍යයි. ශුද්ධෝත්තම පාප් වහන්සේ ලංකාවට පැමිණි අවස්ථාවේදී අග්‍ර විනිශ්චයකාරවරයා වශයෙන් එතුමාට පෙනී සිටීමට ඉඩ දුන්නේ ඇයි කියා ඇහුවා. මම කියනවා, මොහාන් පීරිස් නමැති තැනැත්තා තමන්ගේ භාර්යාව සමඟ එදා කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටු පොළට පැමිණියේ ආරාධනාවක් නැතුවයි කියා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
බලෙන් පැමිණියේ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
බලෙන් පැමිණියා කියා මම කියන්නේ නැහැ. ඒ ධුරයේ තිබෙන නීත්‍යානුකූලභාවය ආරක්ෂක නිලධාරීන් දන්නේ නැහැ. ඔවුන් පැමිණියාට පස්සේ හරවලා යවන්නද?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Lalith Dissanayake, what is your point of Order?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
කතෝලික කෙනෙකුට - එතුමා කතෝලිකයෙක්.- මෙතුමන්ලාගේ යහ පාලන ආණ්ඩුවෙන්-

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
That is not a point of Order.

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து)
(The Hon. Arundika Fernando)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Arundika Fernando, what is your point of Order?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කතෝලික ගරු මන්ත්‍රීතුමන්ලාට පාප් වහන්සේ පිළි ගැනීම සඳහා ගුවන් තොටු පළට පැමිණෙන්න කියා අපි ආරාධනා කර තිබුණා. නමුත් මොහාන් පීරිස්ට ආරාධනා කර තිබුණේ නැහැ. ආරාධනා නැතිව තමයි- [බාධා කිරීම්]

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து)
(The Hon. Arundika Fernando)
පොඩ්ඩක් ඉන්න, පොඩ්ඩක් ඉන්න. [බාධා කිරීම්] ගරු අජිත් පෙරේරා මන්ත්‍රීතුමනි, අපි ඔබතුමන්ගෙන් අහන්නේ, "අතිගරු ජනාධිපතිතුමා පාප් වහන්සේට ඒ වෙලාවේ මොහාන් පීරිස් මහතාව හඳුන්වා දුන්නේ කොහොමද?" කියලායි. [බාධා කිරීම්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
That is not a point of Order.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
කරුණාකරලා වාඩි වෙන්න. ඒක point of Order එකක් නොවෙයිනේ. කරුණාකරලා වාඩි වෙන්න. දැන් දින සියයට support එක දෙනවා නේ. [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමාත් දින සියයට support එක දෙනවා කිව්වා. [බාධා කිරීම්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Lalith Dissanayake, please sit down.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
දැන් දින සියයට සහය දෙනවා නම් - [බාධා කිරීම්] දින සියයේ වැඩසටහනේ තිබෙනවා, ශිරානි බණ්ඩාරනායක නැවත අග විනිසුරු ධුරයට පත් කරනවා කියා. [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔය මොහාන් පීරිස් ගැන ආදරයෙන් කතා කරන උදවියට කියන්න ඕනෑ එක කාරණයක් තිබෙනවා. [බාධා කිරීම්]

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ආදරයක් නොවෙයි.[බාධා කිරීම්]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
SC/HECA/LA/88/13 ශ්‍රේෂ්ඨාධිකරණ අභියාචන 156/14 පෙත්සම්කරු, Asia Asset Finance PLC. මේකේ අධ්‍යක්ෂ ප්‍රියන්ති පීරිස් කවුද? මොහාන් පීරිස්ගේ ආදරණීය බිරිඳ. මේකේ අධ්‍යක්ෂක, කුප්‍රකට ව්‍යාපාරික මනෝ නානායක්කාර කවුද? මොහාන් පීරිස්ගේ මස්සිනා. තමන්ගේ නෝනා අධ්‍යක්ෂක වන, මස්සිනා අධ්‍යක්ෂක වන මේ නඩුව මොහාන් පීරිස් අහනවා. අහලා තීන්දුවත් දෙනවා, "Leave to Proceed" තීන්දුව දෙනවා. ඒ විතරක් නොවෙයි, ඒ නඩු පොතේ ගහලා තිබෙනවා "මෙම නඩුව මා ඉදිරියේම ගනු" කියා. ඒ කියන්නේ වෙන කාටවත් විභාග කරන්න දෙන්නේ නැහැ. තමන්ගේ නෝනා පාර්ශ්වයක්, තමන්ගේ මස්සිනා පාර්ශ්වයක්. මේ රටේ ගෞරවාන්විත විනිශ්චයකාරවරු මොනවා හෝ සම්බන්ධයක් තියෙනවා නම් එවැනි නඩු තමන් ඉදිරියේ විභාගයට ගන්නේ නැහැ. එහෙම සම්ප්‍රදායක් මේ රටේ තිබෙනවා. අපිත් මේ රටේ නීතිඥ වෘත්තීය කරලා තිබෙනවා. නඩුවක පාර්ශ්වයකට මොනවා හෝ සම්බන්ධයක් තිබෙනවා නම්, -නෑදෑකමක්, යාළුකමක්- ඒ විනිශ්චයකාරවරු කියනවා, "මේ නඩුව මම අසන්නේ නැහැ, වෙන විනිශ්චය මණ්ඩලයකට යොමු කරනවා, වෙන අධිකරණයකට යොමු කරනවා කියා. හැබැයි, මොහාන් පීරිස් මොකක්ද කියන්නේ? මොහාන් පීරිස් කියනවා, "මගේ නෝනාගේ නඩුව, මගේ මස්සිනාගේ නඩුව මා ඉදිරියේම ගනු" කියා. එහෙම නඩු පොතේ ලියනවා. [බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
දැන් -

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
දැන් නොවෙයි පොතේ ලියලා තියෙන්නේ. මේ වාගේ හොරුන්වයි ආරක්ෂා කරන්නේ. ඒකයි තිබෙන කැත. [බාධා කිරීම්] ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ සභාවට හෙළිදරවු වුණා, ආරාධනා නැතිව අග්‍ර විනිශ්චයකාර සම්මේලනයකට ගියා කියා. කැතයි. ආරාධනා නැතිව පාප් වහන්සේ පිළි ගැනීමට ගියා. කැතයි. නමුත් ඔය ධුරයේ සිටි අවුරුදු දෙක ඇතුළත පණස් වාරයකට වඩා මේ රටේ මිනිසුන්ගේ මුදල්වලින් විදේශ ගත වෙලා තිබෙනවා. [බාධා කිරීම්] පණස් වතාවකට වැඩියි. සෑම මාසයකට තුන් වතාවක් විදේශ ගත වෙනවා. [බාධා කිරීම්] එපමණක් නොවෙයි. අහ ගන්න. [බාධා කිරීම්] මේවා අහ ගන්න. මේ රටේ අහිංසක මිනිසුන්ගේ මුදල්වලින් මාසයකට තුන් වතාවක්, හතර වතාවක් සෑම විටම විදේශ ගත වෙලා තිබෙනවා. මේ රටේ අහිංසක මිනිස්සුන්ගේ මුදල්වලින් trip යන්න පුදුම ආශාවක් තියෙන්නේ. සෙලාන් බැංකුවේ සභාපති ධුරය දැරුවා. රටේ තිබුණු ප්‍රධාන ආයතන ගණනාවක අධ්‍යක්ෂක ධුර දැරුවා. මෙවැනි පසු බිමක් තිබෙන අය තමන්ගේ වෘත්තීය කර ගෙන, අධ්‍යක්ෂකකම් කර ගෙන ඉන්නවා. ඒ මදිවාට විනිශ්චයකාරකමත් ඕනෑ. දැන් මේ කතාවලින් හෙළිදරවු වුණේ, අග්‍ර විනිශ්චයකාරකම ඉල්ලලා කෙඳිරි ගෑවා කියා. එහෙම අග්‍ර විනිශ්චයකාරකම ඉල්ලලා කෙඳිරි ගෑවාම අග්‍ර විනිශ්චයකාරකම දෙනවාද? මොකක්ද ඒ සදාචාරය? මේ රටේ සාමාන්‍ය විනිශ්චයකාරවරුන්ට මොන තරම් බලපෑම්

කළාද? ඒ වාගේම කලාකරුවන්ට, ජයතිලක බණ්ඩාර මැතිතුමන්ට බිම දමා ගෙන පහර දුන්නා. තවත් කලාකරුවන් රාශියකට පහර දුන්නා.

එවැනි අවස්ථාවලදී ඒ අයට ඇප දෙන්න කියලා බලපෑම් කළා. ඒ වාගේම කුරුණෑගල, කුඹුක්ගැටේදී පළාත් සභා මන්ත්‍රීවරයෙක් තරුණ කලාකරුවන්ට පහර දුන්නා. ඒ වෙලාවේ තමන්ගේ යටතේ ඉන්න චාමර වීරසේකර කියන මහෙස්ත්‍රාත්වරයාට කථා කරලා, කරුණාකර වහාම පළමුවැනි දවසේම ඇප දෙන්න කියලා දැනුම් දුන්නේ ඔය අග්‍ර විනිශ්චයකාරවරයායි. එහෙම නම් එතුමා අග්‍ර විනිශ්චයකාරවරයෙක්ද? අග්‍ර විනිශ්චයකාරවරයෙක් එහෙම කරනවාද? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේ ඉතාමත් දුෂ්චරිතවත්, කැත, ගඳ ගහන, මේ රටේ අධිකරණය අගෞරවයට පත් කරපු මිනිස්සු වෙනුවෙන් අද මෙතුමන්ලා කථා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මේ අය පටි බැඳ ගෙන ඉන්නවා. දැන් ගරු මන්ත්‍රීතුමන්ලා කී දෙනකු අතේද ඒ පටිය තිබෙන්නේ? බොරුවට පටි බැඳ ගෙන ඉඳලා දැන් ගලවලා. දැන් මේ ඉදිරිපත් කරන්නේ විරෝධයක් නේද? අඩු ගානේ මේ පාර්ලිමේන්තුව ඉවර වෙන තුරු ඔය පටිය දාගෙන ඉන්න බැරිද? මොකක්ද තිබෙන කැප වීම?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

තමුන්නාන්සේලාගේ ජෝන් අමරතුංග ඇමතිවරයාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනෙනවා.[බාධා කිරීම්]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

තමුන්නාන්සේ අතේ තිබුණු පටිය කෝ? කෝ, පටිය? [බාධා කිරීම්] ප්‍රතිපත්තියක් තිබෙනවා නම්, විරෝධයක් ඉදිරිපත් කරනවා නම් එහෙම කරන්න ඕනෑ, ගරු මන්ත්‍රීතුමා. එහෙම නැහැ. කෝ, පටිය? [බාධා කිරීම්] අද මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ මන්ත්‍රීවරු පටි බැඳගෙන ආවා. කෝ, පටිය? පටි නැත. [බාධා කිරීම්] පටි ගැලවෙනවා. ගඳ ගහන චරිත ආරක්ෂා කරන්න එපා. ඔහොම ගඳ ගහන චරිත ආරක්ෂා කළාම පටි ගැලවෙනවා. [බාධා කිරීම්] ඇත්ත කථාව ඕක නොවෙයි නේ? මොනවා හෝ කරන්න කියලා හිතාගෙන මේ යෝජනාව ඉදිරිපත් කළාට හිතේ කැක්කුමක් නැහැ. කෝ, පටිය? කෝ, කළු පටි? ඒවා නැහැ. ඒවා ගලවා විසි කර දමලා. [බාධා කිරීම්]

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

මෙන්න තියෙනවා. මෙන්න කළු පටිය. ඔබතුමාගේ දිස්ත්‍රික්කයේම කළු පටිය.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

අන්න, එක් කෙනකු ඉන්නවා. අර එහා පැත්තේ -[බාධා කිරීම්] අන්න, සොයිසා මන්ත්‍රීතුමා දැන් පටිය ගැට ගහනවා.[බාධා කිරීම්] ගරු ජෝන් සෙනෙවිරත්න මන්ත්‍රීතුමා කෝ, පටිය? [බාධා කිරීම්] ඕක තමයි කථාව. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා මේවා බොරු විරෝධ. විපක්ෂ නායකවරයා එකඟ වෙනවා නම් මොන කථාද? දැන් පටි බඳිනවා. ඔවා විරෝධද? ලජ්ජයි. නිකම්, කරන්නන් වාලේ විරුද්ධ වෙන්න එපා. දැන් හොඳ අග්‍ර විනිශ්චයකාරවරයෙක් ඉන්නවා. එතුමාට සහය දෙන්න; සුබ පතන්න. මේ රට නතර කර තැන ඉඳලා අපි එකමුතුව ඉදිරියට යමු. එච්චරයි.

[අ.භා. 6.10]

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද වන විට ශ්‍රී ලංකා අධිකරණ ක්ෂේත්‍රයත් ඒ වාගේම පාර්ලිමේන්තුවේ ජනතා පරමාධිපත්‍යයත්, නීතියේ පරමාධිපත්‍යයත් ඉතා බරපතළ විධියට බාදනයට ලක් වී තිබෙන බව අපට දැනෙනවා. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා කොයි තරම් හඬ ගා කථා කළත්, ඒ අය බලයට පත් වන කොට කිව්ව දේවල් අද කණ පිට පෙරළෙන බව අපට පැහැදිලියි. අද උදේ අපේ විපක්ෂ නායකතුමා කිව්වා වාගේ මීට දින කිහිපයකට ඉස්සෙල්ලා වත්තල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාටත්, මන්ත්‍රීවරුන් කිහිප දෙනකුටත් ඒ අයගේ කාර්යාලවලට යන කොට පහර දී තිබෙනවා. ඒ පහර දීමට ඒ අයව යොමු කළේ මේ රටේ මහජන සාමය භාරව කටයුතු කරන ඇමතිවරයායි කියන කාරණය අද පැහැදිලි වෙලා තිබෙනවා. අන්න ඒ නිසා තමයි අද උදේ රැස් වුණු ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මන්ත්‍රී කණ්ඩායම තීන්දු කළේ ඉතා ඉක්මනට විශ්වාස භංග යෝජනාවක් ඒ ඇමතිවරයාට විරුද්ධව ගෙනෙන්න.

මා හිතන හැටියට මේ රටේ ඉතිහාසයේ රජයක් බලයට පත් වෙලා මාසයක් යන්නට පෙරාතුව ඇමතිවරයකුට විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන පළමුවැනි වතාව තමයි මේක. ඒ තරම් ඉක්මනට විශ්වාස භංග යෝජනාවක් ගෙන එන ආකාරයට තමුන්නාන්සේලා අද කටයුතු කර තිබෙන බව පෙනෙනවා. එතකොට මෙවැනි තත්ත්වයක් අද මේ පාර්ලිමේන්තුව සම්බන්ධවත් පැන නැඟිලා තිබෙනවා. ඒක තමයි අග විනිසුරු මොහාන් පීරිස් මහත්මයා ඉවත් කිරීම සඳහා මේ රජය ගත්ත පියවර. අග්‍ර විනිශ්චයකාරවරයකු වන්න පුළුවන්, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයකු වෙන්න පුළුවන්, අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයකු වෙන්න පුළුවන් ඔහුව ඉවත් කරන්න ඕනෑ නම් ඒ සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සටහන් වෙලා තිබෙනවා. ඒ අනුව පාර්ලිමේන්තුවට පමණයි අග්‍ර විනිශ්චයකාරවරයකු ඉවත් කරන්න පුළුවන්.

මොහාන් පීරිස් මහත්මයා හොරකම් කරනවාද, එහෙම නැත්නම් එතුමාගේ භාර්යාවගේ නඩු එතුමා විසින් අහනවාද, එහෙමත් නැත්නම් එතුමා ව්‍යාපාර ගෙනයනවාද කියන එක නොවෙයි මෙතැනදී අදාළ වෙන්නේ. ඒ මොනවා කළත් මොහාන් පීරිස් මහත්මයා මේ රටේ අග්‍ර විනිශ්චයකාරවරයායි. අවුරුදු දෙකක් අග්‍ර විනිශ්චයකාර ධුරයේ කටයුතු කරන කොට ඔය එක කාරණයක්වත් පැහැදිලිව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළේ නැහැ. එහෙම ප්‍රකාශ නොකර ඉඳලා දැන් හදිසියේම එතුමාව ඉවත් කරන්න තමුන්නාන්සේලාට ඕනෑ වෙලා තිබෙනවා. තමුන්නාන්සේලාට එතුමාව ඉවත් කරන්න වුවමනාකම තිබෙනවා නම් තමුන්නාන්සේලා විසින් කළ යුතු දේ තමයි මේ පාර්ලිමේන්තුවට යෝජනාවක් ගෙන ඒම. යෝජනාවක් ගෙනැල්ලා, තේරීම් කාරක සභාවක් පත් කරලා, ඊට පස්සේ ඒ අනුව ජනාධිපතිතුමා ලවා - විධායකය ලවා- ඔහුව ඉවත් කරන්න තමුන්නාන්සේලාට පුළුවන්කම තිබෙනවා. ඒක තමයි අපි ගිය වතාවේ අනුගමනය කළේ. ඒ වෙලාවේ මගේ මිත්‍ර ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා එදා විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරයෙක් වශයෙන් විරෝධතාවක් ගෙනාවා "මේ ඉදිරිපත් කරලා තිබෙන යෝජනාව වැරැදියි" කියලා. එතකොට අපි ඒ ගැන විවාද කළා. එහෙම විවාද කරලා අවසානයේදී ගරු කථානායකතුමා ඒ සම්බන්ධයෙන් තීන්දුවක් දුන්නා. ගරු කථානායකතුමා එදා ගත් තීරණය මීට පෙර දුන් - පාර්ලිමේන්තුවේදී හැමදාම ඔවැනි අවස්ථාවලදී දෙන- තීන්දු තීරණ හා සමානවම එම කාරණයේත් අවසානය බවට පත්

[ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා]

වෙනවා. මොකද, පාර්ලිමේන්තුවේ නොයෙක් ප්‍රශ්න පැන නැඟුනාම ගරු කථානායකවරයාගෙන් අපි මේ වාගේ තීරණ බලාපොරොත්තු වෙනවා. ඒ අනුව තමයි එදාත් මේ කාරණයේදී එතුමාගෙන් අපි තීරණයක් බලාපොරොත්තු වුණේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමනි, ගරු කථානායකතුමා එදා දුන් තීන්දුව මෙතැනදී කිහිප වරක් කියැවුණා. නමුත් අද මේ යෝජනාවට ඉතාමත් අදාළ නිසා ගරු කථානායකතුමා එදා ලබා දුන් තීරණය කියවන්න මමත් බලාපොරොත්තු වෙනවා. 2013 ජනවාරි 11වන දින හැන්සාඩ් වාර්තාවේ 650වන තීරුවේ මෙසේ සඳහන් වනවා:

"ගරු ඇමතිවරුනි, ගරු මන්ත්‍රීවරුනි, අදාළ ස්ථාවර නියෝග හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන මම අධ්‍යයනය කර බැලුවෙමි.ජනාධිපතිතුමාට යෝජනාවක් ඉදිරිපත් කිරීම සඳහා මා වෙත මන්ත්‍රීවරුන් අත්සන් කොට ලබා දෙන ලද යෝජනා සම්මතයට අමතරව අලුත් යෝජනාවක් ඉදිරිපත් කළ නොහැකි බව මම ප්‍රකාශ කරමි."

එයින් අදහස් කරන්නේ එම යෝජනාවට පරිබාහිරව - පිටස්තරව- වෙනත් යෝජනාවක් ඒ අවස්ථාවේ ඉදිරිපත් කරන්න බැහැ කියන එකයි. එහි තවදුරටත් මෙසේ සඳහන් වනවා:

"දැනට ඉදිරිපත් කර ඇති යෝජනාව හොඳින් අධ්‍යයනය කර බැලීමේදී මෙම යෝජනාව ඉදිරිපත් කොට ඇත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107(2) ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 107(3) ව්‍යවස්ථාව සහ 78(අ) ස්ථාවර නියෝගය යටතේ බව ඉතා පැහැදිලිව සඳහන් කොට ඇත.

තවද, මෙම යෝජනාවෙන් බලාපොරොත්තු වන්නේ ඉහත සඳහන් විෂමාචාර චෝදනා හේතුවෙන් එම විෂමාචාර චෝදනා පිළිබඳ පරීක්ෂණය කොට එම චෝදනා එකක් හෝ ඊට වැඩි ගණනක් ඔප්පු වී ඇතැයි විශේෂ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබුවහොත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍ර විනිශ්චයකාර පදවියෙන් ගරු ආචාර්ය උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මිය ඉවත් කිරීම සඳහා යෝජනාවක් අතිගරු ජනාධිපතිතුමාට ඉදිරිපත් කළ යුතු යැයි සඳහන් වන බැවින් මෙම යෝජනාවේ පරමාර්ථය ඉතා පැහැදිලි වන අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107(2) ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 107(3) ව්‍යවස්ථාව ප්‍රකාර යෝජනාවක් ඉදිරිපත් කිරීමට අද දින න්‍යාය පත්‍රයේ අඩංගු කර ඇති යෝජනාව ප්‍රමාණවත් වන බව මම ප්‍රකාශ කරමි."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේකෙන් පෙනෙනවා ඇත්ත වශයෙන්ම මෙහි පරමාර්ථය මොකක්ද කියන එක ගරු කථානායකතුමා තේරුම් ගත් බව. පරමාර්ථය වුණේ එවකට හිටපු අග්‍ර විනිශ්චයකාරතුමිය නිලයෙන් ඉවත් කිරීමයි. මේ පරමාර්ථය - intention එක - හඳුනාගෙන තමයි අපි හුඟක් අවස්ථාවලදී අර්බුද නිරාකරණය කරන්නේ. ඒක වැදගත්. අපි හුඟක් අර්බුදවලට යොමු වුණාම ඒ යම් යම් පාර්ශ්වවල තිබෙන පරමාර්ථය - intention එක - ගැන බලනවා. මේ යෝජනාව ඉදිරිපත් කිරීමේදීත් සමහර විට යම් යම් තාක්ෂණික අඩු පාඩුකම් වෙන්න පුළුවන්; යතුරු ලියන - typing - අඩු පාඩුකම් ඇති වෙන්න පුළුවන්. මේ මොනවා තිබුණත් ඒ කර්තෘගේ, එහෙම නැත්නම් ඉදිරිපත් කළ පුද්ගලයාගේ පරමාර්ථය පැහැදිලි නම් ඒ පරමාර්ථය මුල් කරගෙන ඒ කටයුත්ත අවසාන කරන්න පුළුවන්.

මෙහිදී කථානායකතුමා දෙන තීන්දුව ඉතාම වැදගත් වෙනවා. පාර්ලිමේන්තුවේ දෙන තීන්දුවලදී කථානායකතුමාගේ තීන්දුව අවසාන බලපෑමක් තිබෙන තීන්දුවක් වශයෙන් හැම දාම පිළිගැනෙනවා. ඒ අනුව තමයි පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු ගෙන යන්නේ. ඒ අනුව තමයි පාර්ලිමේන්තුව හරහා අනෙක් වැඩ කටයුතු ගෙන යන්නේ. නමුත්, මේ කාරණයේදී ඒ විධියේ අවසානයක් කරලා -අග්‍රවිනිශ්චයකාරතුමිය ඉවත් කරලා, ඊට පසුව නව අග්‍ර විනිශ්චයකාරවරයෙක් පත් කරලා- අවුරුදු දෙකක් ගියාට

පස්සේ, හරයක් නැති ඒ අඩු පාඩුව ඉස්මතු කරගෙන ඒ පත් කළ අග්‍ර විනිශ්චයකාරවරයා ඉවත් කිරීම තමයි අද මේ ප්‍රශ්නයට තුඩු දීලා තිබෙන්නේ.

මෙම තීරණය ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව එකී අදාළ යෝජනාව ඡන්ද විමසීමට ලක් වුණා. එහිදී මන්ත්‍රීවරු 155ක් යෝජනාවට පක්ෂවද, මන්ත්‍රීවරු 49ක් යෝජනාවට විපක්ෂවද ඡන්දය ප්‍රකාශ කරනු ලැබුවා. මෙහිදී ඉහත කී විරෝධතාව එම විවාදය ආරම්භයේදී කිසිවකු විසින් හෝ මතු කර තිබුණේ නැහැ.

ඇත්ත වශයෙන්ම මම කියන්න ඕනෑ, මේ විරෝධය මතු කළේ ඒ විවාදය අවසාන වෙලා එම යෝජනාව ඡන්දයකට යොමු කරන්න යන වෙලාවේ බව. විවාදය ආරම්භ කරන වෙලාවේ කවුරුවත් මේ විරෝධය නැඟුවේ නැහැ. ඒ වෙලාවේ තමුන්නාන්සේලාට කියන්න තිබුණා, "අප මේ විවාදයට සහභාගි වන්නේ නැහැ, මෙතැන අඩුවක් තිබෙනවා, අග්‍ර විනිශ්චයකාරවරිය ඉවත් කරන්න මෙතැන යෝජනාවක් නැහැ" කියලා. එහෙම දෙයක් තමුන්නාන්සේලා කළේ නැහැ. තමුන්නාන්සේලා විවාදයට සහභාගි වුණා. You raised it at the end of the Debate, when the matter was to put for vote. ඡන්දය ගන්න ලෑස්ති වෙන කොට තමයි කිව්වේ.

කථානායකවරයා එතුමාගේ තීන්දුව දුන්නාට පසුව, යෝජනාව පිළිබඳව ඡන්ද ගන්න වෙලාවේ තමුන්නාන්සේලා ඡන්දය පාවිච්චි කළා. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමනි, තමුන්නාන්සේත් ඒ අවස්ථාවේ ඡන්දය පාවිච්චි කළා. Even the Hon. Prime Minister, who was the then Leader of the Opposition, did vote. At that time, you could have walked out. You did not do that. You remained in the House and participated in the Proceedings. So, you cannot say that you boycotted or you did not participate in it.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Senewiratne, your time is over.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

අවශ්‍යතාවක් තිබුණා නම් සභා ගැබෙන් පිටවී යෑමටද පුළුවන්කම තිබුණා. එදා එවැනි කිසිම විරෝධතාවක් හෝ අප්‍රසාදයක් නොදක්වා, එතැන් සිට වර්ෂ දෙකක් පුරා නිහඬව සිට මෑතකදී අග විනිසුරු ගරු මොහාන් පීරිස් මහතාගේ පත්වීම නීත්‍යානුකූල නැති බව පවසා ඔහු එම තනතුරින් ඉවත් කිරීමට විධායකයට උපදෙස් දීම ඉතාම බරපතළ වරදක් බව මා කියනවා. මේ කරුණුවලදී අපට එක දෙයක් පෙනෙනවා. පුවත් පත්වල මේ ගැන පළ වෙලා තිබුණා. මේ කාරණය සඳහා ඉදිරියට ඇවිත් ක්‍රියාත්මක වුණු නීතිඥවරු එදා සිටම -මේ සිද්ධිය ආරම්භයේ සිටම- ශිරානි බණ්ඩාරනායක මහත්මිය මේ තනතුරේ තියාගන්න කටයුතු කරපු නීතිඥවරු. ඒ අය තමයි මේ කාරණය විධායකය ඉදිරියට යොමු කරලා, එතුමා නොමඟ යවලා මේ තීන්දුව ගත්තේ කියන එක අපි මේ අවස්ථාවේදී කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙවැනි දේවල් කිරීම නිසා මේ රටේ බලාපොරොත්තු වන යහ පාලනයක් ඇති වෙයි කියලා අපට කියන්න බැහැ. යහ පාලනයක් ගැන කථා කරමින්, යහ පාලනයකට තුඩු නොදෙන කටයුතු කිරීම තුළින් මේ රට පරිහානියට යනවාය කියන කාරණය අමුතුවෙන් කිව යුතු නැති බව සඳහන් කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Anura Priyadharshana Yapa. Before he starts, will an Hon. Member propose the Hon. R. Yogarajan to take the Chair.

ගරු නවින් දිසානායක මහතා (සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு நவீன் திஸாநாயக்க - சுற்றுலா மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Navin Dissanayake - Minister of Tourism and Sports)

I propose that the Hon. R. Yogarajan do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ආර්. යෝගරාජන් මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஆர். யோகராஜன் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. R. YOGARAJAN *took the Chair.*

[අ.භා. 6.21]

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විවාදයේදී අපට කරුණු රාශියක් අහන්න ලැබුණා. විශේෂයෙන්ම අග්‍ර විනිශ්චයකාරවරයා වශයෙන් වැඩ කළ මොහාන් පීරිස් මැතිතුමා ගැන චෝදනා ගණනාවකුත් අහන්න ලැබුණා. මම මේ අවස්ථාවේ කියන්න ඕනෑ, අප අද විවාද කරන්නේ පුද්ගලයන් ගැන හෝ ඒ පුද්ගලයන් අතින් සිදු වූ දේවල් ගැන නොවන බව. විශේෂයෙන්ම මෙම අග්‍ර විනිශ්චයකාරවරයා ඉවත් කිරීම සම්බන්ධයෙන් අනුගමනය කරන ලද ක්‍රියා මාර්ගය හේතු කොට ගෙන මේ පාර්ලිමේන්තුවේ උත්තරීතර බලයට අභියෝගයක් වුණාද, එහෙම නැත්නම් කථානායකතුමාගේ තීන්දුව අභියෝගයට ලක් වුණාද කියන ප්‍රධාන කාරණා දෙක පිළිබඳවයි අපි විවාද කළ යුත්තේ.

ආචාර්ය ශිරානි බණ්ඩාරනායක මහත්මියට එරෙහිව කරන ලද යෝජනාවක් අනුව ගරු කථානායකතුමා විසින් විශේෂ කාරක සභාවක් පත් කළා. ඒ විශේෂ කාරක සභාවේ සභාපතිවරයා වශයෙන් වැඩ කරන්න මට අවස්ථාව ලැබුණා. ඒ විශේෂ කාරක සභාව රැස්වන අතර තුර ඒ විශේෂ කාරක සභාව ගන්නා ලද තීන්දුවලට විරුද්ධව ශිරානි බණ්ඩාරනායක මැතිනියගේ නීතිඥ මණ්ඩලය එම අවස්ථාවට සහභාගි නොවී නැඟිටලා ගියා. ඒ නිසා තමයි අපට මේ වාර්තාව ඉදිරිපත් කරන්න සිද්ධ වුණේ. ඒ වාර්තාව මඟින් අංක 1, 4 හා 5 යන චෝදනා ඔප්පු වී ඇති බව අපි මේ සභාවට වාර්තා කළා. දෝෂාභියෝගයක් සම්බන්ධයෙන් යම් ක්‍රමවේදයක් ස්ථාවර නියෝග 78අ. සිට දිගටම සඳහන්ව තිබෙනවා. ඒ ක්‍රමවේදය පිළිබඳව අවසානයේ අපි සාකච්ඡා කරන කොට ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා යම්කිසි වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කළා. ඒ මතු කළ වරප්‍රසාද ප්‍රශ්නය සම්බන්ධයෙන් ගරු කථානායකතුමා තීන්දුවක් දුන්නා. ඒ තීන්දුව දුන්නාට පස්සේ ඒ පිළිබඳ සියලු කාරණා නිරාකරණය වුණා කියලායි මා හිතන්නේ. මොකක්ද එයට හේතුව? ජනතාවගේ ව්‍යවස්ථාපිත බලය ජනතාව විසින් තෝරා ගන්නා ලද පාර්ලිමේන්තුවක් විසින් ක්‍රියාත්මක කරන්න ඕනෑ නිසායි. Sir Thomas Erskine May ගේ "Parliamentary Practice" නමැති පොතේ එක වාක්‍යයක් උපුටා දක්වන්න මා කැමැතියි. ඔහු තමයි ලෝකය පුරාම පාර්ලිමේන්තු Procedure ගැන කියන්නේ.

I quote:

> "The constitution has assigned no limits to the authority of Parliament over all matters and persons within its jurisdiction. A law may be unjust and contrary to sound principles of government. But Parliament is not controlled in its discretion, and when it errs, its errors can only be corrected by itself."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ ප්‍රධානම තර්කය තමයි, මෙවැනි වරදක් සිදු වී ඇතැයි කියා යම් ආකාරයකට කල්පනා කරනවා නම්, ඒ වරද නිවැරැදි කරන්න පුළුවන් වන්නේත් මේ පාර්ලිමේන්තුවට මිස විධායකයට හෝ අධිකරණයට නොවෙයි කියන එක. එම නිසා අපි කල්පනා කරන්න ඕනෑ, මෙය පුද්ගලයින්ට එරෙහිව කරන දෙයක් නොවෙයි කියලා. මේ ගන්නා තීන්දුව වැරැදියි කියා අනාගත පාර්ලිමේන්තුවක් විසින් හෝ අනාගත විධායකයක් විසින් කිව්වොත්, එතැනදී නැවත වරක් ප්‍රශ්නයක් ඇති වනවා. එම නිසා මේ පිළිබඳව එකඟතාවකට පැමිණීමට මුළු පාර්ලිමේන්තුවටම හැකියාව තිබියදී, පාර්ලිමේන්තුවේ පස්සා දොරෙන් ගිහින් කරන ලද ක්‍රියාවක් හැටියට, ප්‍රශ්නකාරී තීන්දුවක් හැටියට හැම වෙලාවේම හැඳින්වීම, ඔබතුමන්ලා ක්‍රියාත්මක කරන යහ පාලනයට ඇති කරන ලද කැළලක් හැටියට හඳුන්වන්න මා කැමැතියි.

Mr. Presiding Member, I would like to say a few words in English. As the Chairman of the Parliamentary Select Committee that investigated the allegations against former Chief Justice Dr. Shirani Bandaranayake, I wish to make this statement on the recent events that have taken place in respect of the Office of the Chief Justice of Sri Lanka, which has given rise to grave concerns regarding the legal system of this country.

As a Member of Parliament and as a member of the legal fraternity, I wish to state that the process followed by the present Government to unceremoniously oust Mr. Mohan Pieris from the Office of the Chief Justice is entirely unacceptable, unconstitutional and an unsightly blemishes on the judicial system of Sri Lanka.

The Supreme Court is the apex court of this country and the citadel of the judicial power of the people as set out in Article 4 of the Constitution. The Office of the Chief Justice which represents the pinnacle of the judicial system is, therefore, a hallowed position that symbolizes the Rule of Law and embodies the people's faith in the Judiciary as an effective check on the other two organs of the Government, namely, the Legislature and the Executive.

It is in recognition of the above that a single specific procedure has been very clearly provided in Article 107 (2) of the Constitution for the removal of the Chief Justice or any Judge of the Supreme Court and the Court of Appeal on either of the two exclusive grounds: misbehaviour or incapacity.

It was also in recognition of the above hallowed nature of the Office of the Chief Justice and in

[ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා]

acknowledgement of the supremacy of the Constitution that the Government took measures to ensure that former Chief Justice, Dr. Shirani Bandaranayake was impeached on grounds of misbehaviour in 2013 in strict and full adherence to the provisions made in the Constitution and the Standing Orders of Parliament.

I wish to remind this House that the impeachment of Dr. Shirani Bandaranayake was carried out by the then Government only pursuant to the adoption of a two-thirds majority in Parliament by the findings of a Parliamentary Select Committee, which considered an inquiry into the allegations of misconduct made against her, based on which only a Declaration was made by the President on the impeachment of the Chief Justice. Accordingly, the claim that the appointment of Mr. Mohan Pieris as the Chief Justice was void from the beginning, and Dr. Bandaranayake was removed unconstitutionally is entirely misconceived in law, since contrary to such claims, Dr. Bandaranayake was in fact impeached in adherence to Article 172, and no such action carried out in compliance with the Constitution can be deemed voidable or reversible.

Therefore, I wish to state with all responsibility, that the action taken by the present Government to unconstitutionally replace a duly-appointed Chief Justice with an impeached Chief Justice is a blatant disregard of the procedure provided in Article 107(2) of the Constitution and is completely *ultra vires* the Constitution and it seized the scope of the process vested in the Executive by the Constitution. This action which violates the accepted norms and values enshrined in our Constitution is a severe blow to the certainty and the integrity of the judicial system of the country and has caused irreparable damage to the faith of the people in the Judiciary.

I wish to conclude by reiterating that unconstitutional and capricious acts of this nature will not enable the present Government to achieve the good governance that it aspires to establish in the country, but would only undermine the democratic values and the Rule of Law hitherto preserved by Sri Lankan people.

Thank you.

[6.30 p.m.]

ගරු ඩීව් ගුණසේකර මහතා
(மாண்புமிகு டீயூ குணசேகர)
(The Hon. DEW Gunasekara)

Sir, in view of the time factor, I wish to make my speech in English. The subject matter that we debate today is another crisis generated by the J.R. Jayewardene Constitution of 1978 and that is the issue of Chief Justice 43, Shirani Bandaranayake, and Chief Justice 44, Mohan Peiris.

Conflicts and confrontations between the three organs of the State, namely, the Legislature, the Executive and the Judiciary have been the order of the day ever since the enactment of the J.R. Jayewardene Constitution. I do not want to recount all such instances. However, touching upon the Judiciary, this House had to face three impeachments and those were against Chief Justice Neville Samarakoon, Chief Justice Sarath N. Silva and Chief Justice Dr. (Mrs.) Shirani Bandaranayake and thereafter, now there is the question of the so-called removal of Chief Justice Mohan Peiris by the President.

Despite all such experiences of crises, this House had failed to take corrective measures so as to obviate the need to face such crises. When the question of Shirani Bandaranayake came up in Parliament on 11th January, 2013, I, along with my Colleagues, the Hon. (Prof.) Tissa Vitarana and the Hon. Chandrasiri Gajadeera refused to support the impeachment on the ground that this Parliament was required in terms of Article 107(3) to provide a process for such an impeachment with such a procedure in respect of investigation and proof of the alleged misbehaviour or incapacity and also the right of such accused judge to defend herself.

I repeat that in terms of Article 107(3), Parliament is called upon to enact a law or Standing Order. We failed to satisfy this requirement till 1984, until the need arose in the case of the impeachment against Neville Samarakoon. And, yet again, despite the experiences in respect of Chief Justice Sarath N. Silva and Chief Justice Shirani Bandaranayake and now the Chief Justice Mohan Peiris, we have miserably failed to enact a law or Standing Order with regard to the process or procedure to meet with such situations.

Regrettably, neither the Judiciary, the Bar Council, the Attorney-General nor the legal fraternity - who for the slightest thing come to the streets - realized the need for a process or procedure in order to avoid such confrontations between the Judiciary and the Legislature or the Judiciary and the Executive.

This failure on our part had led to this impasse; crisis and confrontation.

I must remind this House that even the inadequate Standing Order 78A, which is the subject matter under Debate, was introduced to this House in a mighty hurry within a matter of 24 hours. Sir, this whole question on unconstitutionality arose from this glaring inadequacy. It is in this background that we should discuss the current issue of the reinstatement of CJ 43, Shirani Bandaranayake as well as the removal of CJ 44, Mohan Peiris.

I do not propose to repeat all the events that led to this Debate. I wish to raise the fundamentals of the constitutional requirements that we must satisfy and that

is the supremacy of Parliament. As representatives of the people, we can claim to be supreme. But, the fact remains that under the 1978 Constitution, our supremacy has eroded; our power has been substantially reduced. As legislators, we do not enjoy the powers that were enjoyed under the 1972 Constitution. That was why we were demanding right throughout that remedy and that is to get rid of this destructive and defective Constitution.

In the past, there have been attempts of invasion by the Judiciary on the Legislature by the Chief Justice Sarath N. Silva. A former Speaker, late Hon. Anura Bandaranaike had to react and resist that invasion. Similarly, there had been attempts of invasion by the Executive on the Legislature, as in the case of Chief Justice Neville Samarakoon and Chief Justice Dr. Shirani Bandarnayake. In the case of Chief Justice Neville Samarakoon, the Hon. Lalith Athulath Mudali saved the situation by arranging a quiet retirement for Neville Samarakoon. In the case of Dr. Shirani Bandaranayake, the Legislature had to sucumb to the invasion by the Executive on the Legislature. It is in this context that I look at the two issues relating to the reinstatement and the removal of CJ 43 and CJ 44. Even if I am prepared to accept what the Hon. Prime Minister stated on the Floor of this House, giving reasons for the Executive's behaviour on these two issues, he cannot get behind the need to honour the supremacy of Parliament.

Granting that Parliament may have erred by its failure to observe the provisions of the Constitution, that matter should have been referred to the Parliament for remedy. The Executive, or for that matter, the President, is not above the Constitution. I repeat that neither the Executive nor the Judiciary is above the Constitution. As much as former Speaker Anura Bandaranaike resisted the invasion by the Judiciary, the Hon. Speaker should, in this case, have resisted the invasion by the Executive.

To adjudicate on the issues relating to both reinstatement of CJ 43 and the removal of CJ 44 is a matter for the Legislature.

Parliament never attempts to use the powers of the Executive or the Judiciary. Equally, we, as the Legislature cannot allow the Executive or the Judiciary to cause invasion of our territory.

The reinstatement or the removal of Supreme Court Judges falls within the Constitutional rights of the Legislature. The Executive cannot bypass the Legislature under any circumstances. In these two issues, the Executive has blatantly bypassed the Legislature. Even if the Legislature has failed to observe the procedure or the process, as required by the Constitution, that could have been corrected by the Legislature itself. The Executive cannot act arbitrarily, simply because the Legislature has erred. The whole episode of Shirani Bandaranayake and Mohan Peiris was a perpetration by the Executive.

I request the Hon. Speaker to study these two issues and pronounce the Legislature's constitutional position as a ruling of the Legislature for future guidance, in order to avoid repetition of such invasions by the Executive or the Judiciary.

Mr. Presiding Member, I do not claim that Parliament is above the Constitution. But, we claim to be supreme as representatives of the people who are sovereign. Time and again, issues of this nature arise from the destructive and defective nature of the J.R. Jayewardene Constitution of 1978. Therefore, we cannot abdicate our right to defend Parliament; that is what I have to say, Mr. Presiding Member.

Thank you.

[6.38 p.m.]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நெடுஞ்சாலைகள், உயர்கல்வி மற்றும் முதலீட்டு ஊக்குவிப்பு பிரதி அமைச்சர்)
(The Hon. Eran Wickramaratne - Deputy Minister of Highways, Higher Education and Investment Promotion)

Hon. Presiding Member, I am glad to participate in this Adjournment Debate and I would like to start by making the point that many have made throughout the day: that the Motion placed on the Order Paper on the 6th of November, 2012 was basically to investigate, and I might read it for the record. I quote:

> "Therefore we, the aforementioned Members of Parliament resolve that a Select Committee of Parliament be appointed in terms of Article 107.(3) of the Constitution read with the provisions of Article 107(2) and Standing Order 78A of Parliament enabling the submission of a resolution to His Excellency the President for the removal of the Hon. (Dr.) (Mrs.) Upatissa Atapattu Bandaranayake Wasala Mudiyanse Ralahamilage Shirani Anshumala Bandaranayake from the office of the Chief Justice of the Democratic Socialist Republic of Sri Lanka in the event the Select Committee reports to Parliament that one or more of the charges that have been levelled have been proved after the aforesaid charges of misconduct have been investigated."

And, as per this Resolution in Parliament, a Parliamentary Select Committee was appointed to go into the charges of the Impeachment on the 23rd of November 2012. It met on the 4th of December and also on the 6th of December.

I think many Hon. Members have made the point that this same Motion was subsequently placed on the Order Paper on the 11th of January, 2013 and this Motion clearly provided for the investigative aspect in terms of the allegations made about Chief Justice 43. Then there should have been another Motion placed in Parliament on the day that we were recommending her removal. Provision regarding the type of Resolution for removal of a Judge of Supreme Court is in Section 107(2) of the Constitution, which states, I quote:

> "A judge of the Supreme Court and Court of Appeal can only be removed :

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

By an order of the President made after an address of Parliament supported by a majority of the total number of Members of Parliament (including those not present) has been presented to the President for such removal on the ground of proved misbehavior or incapacity".

And, that Resolution needs to be signed by not less than one third of the total number of Members of Parliament, so that it could be adopted by Parliament.

Now, on that particular day, we remember that there was no such resolution and the Leader of the House, the Hon. Nimal Siripala de Silva - if you examine the Hansard, you will find in his speech - tried to introduce a Resolution like that, but it had not been previously tabled. So, as a result, we have a situation where the Resolution passed on the 11th does not set out the alleged misbehaviour. It is not an address to the President to remove the Chief Justice, Shirani Bandaranayake. Instead, it was just the same Resolution enabling the submission of a Resolution to His Excellency the President. Therefore, the Resolution was never presented in Parliament; therefore deemed never to be voted for the removal and therefore the position of the Chief Justice was never vacated and, therefore, there was no position to be filled.

I have taken this position right at the outset. This happened on a Friday and on Sunday, I spoke to the media about this and in that media interview, I very specifically said that there is a risk in future, that this might be questioned for its legal validity. That is exactly what has happened at this point in time.

Now, we must remember that the process was flawed and this flawed process was not just about the Resolution to remove her. The Chairman of the Parliamentary Select Committee, the Hon. Anura Priyadarshana Yapa, spoke before me and I would like to point out to him that we did not accept the PSC Report from its very outset. The Superior Courts of our country have concurred with our view. Documents were tabled at the PSC on Thursday, the 6th of December 2012. The PSC Chairman, Hon. Anura Priyadharshana Yapa, announced that the Chief Justice and her lawyers will be given time until 1.30 p.m. on the 7th of December, 2012 to file answers. Never mind, the CJ and her lawyers, but, I would want to know whether the PSC Members themselves had enough time to read the documents and understand the logic behind the arguments in a few hours? It would then require calling for evidence, hearing of witnesses and so on. It was only natural then that the Chief Justice and her lawyers walked out of the PSC. Witnesses were called on the 7th of December; evidence heard; judgment determined and a Report prepared and the draft was approved by the PSC by 8.30 a.m. on the 8th of December. In a few hours, there was a historical travesty of justice. Where in the world would this happen? Which right-thinking person could accept that Report of the PSC? But, that is exactly what happened and I have to refer to those events because I think those events need to be on record again because a question of the removal of the Chief Justice has been raised.

Impeachment is a responsibility of Parliament. It is Parliament's address to the President that will determine the removal of a Judge of the Superior Court. In that sense, judges do not determine the fate of the Superior Courts Judges whose conduct has warranted an investigation. So, it is Parliament's responsibility. The Supreme Court is also clear on this principle. In that sense, Parliament is supreme. However, on the interpretation of the Constitution, you may also say that the Judiciary is supreme. Article 4(c) of the Constitution directs Parliament to exercise judicial power to judicial institutions except in matters pertaining to the Privileges of Parliament and its Members. So, that is the only exception.

Article 125(1) leaves no ambiguity that the Supreme Court shall have the sole and exclusive jurisdiction to hear and determine any questions relating to the interpretation of the Constitution. The Supreme Court has determined that proof being matters of law, will have to be provided by law to avoid uncertainty as to the proof of the alleged misbehaviour. The right of the judge, the right to be heard, cross-examination of witnesses, adduced evidence must also be provided. The judge is also entitled to equal protection of the law enshrined in the Constitution. This is what the then Leader of the Opposition, the Hon. Ranil Wickremasinghe, tried to provide for, from the very inception of this crisis. He argued that an independent panel of judges should go into the allegations and through such a process, arrive at the findings. He went as far as to say the panel of judges should be constituted from the Commonwealth countries. When he was Prime Minister, an Impeachment Motion was brought against the then Chief Justice. It was the Hon. Ranil Wickremasinghe who initiated a process to obtain eminent judges of the Commonwealth. Justice must be done and justice must be seen to be done.

Naturally, the Chief Justice and her lawyers walked out of the Parliamentary Select Committee. The Opposition Members of the PSC also walked out the next day when it was evident that the principles of natural justice were being violated. We spoke against her Impeachment in Parliament; we voted against it and we have struggled to this day to ensure that Sri Lanka's Judiciary is independent.

I would also like to remind this House that Justice Shirani Bandaranayake was appointed to the Bench, not by a United National Party Government or a President of that Party. Pradeep Kariyawasam was appointed as the Chairman of the National Savings Bank, not by a UNP

administration, but by the then Minister of Finance and Planning of the country, His Excellency Mahinda Rajapaksa. If Pradeep Kariyawasam did wrong, why was he not punished? You thought you could control the Chief Justice through that mechanism.

The Ruling of the Bench against the Divineguma Bill caused your pride to be shattered; the "King's" fury saw no limits. Shirani Bandaranayake had to go. The court fought back to defend its independence. The court ruled that Parliament was right to impeach the Chief Justice, but also asked Parliament to adopt a process to hear out the Impeachment. I went with my fellow MPs - the Hon. Ajith P. Perera, the Hon. Niroshan Perera and the Hon. Ruwan Wijayawardhana - to court in support of that principle, that the Judiciary was supreme in matters of interpretation of the law. Therefore, we have now created a constitutional controversy. If there is a parliamentary controversy, it could be resolved by going for an election. But, such a mechanism is not available when you have a conflict between Parliament and the Judiciary; it cannot be resolved in that particular way. Constitutional governance requires that the three arms or pillars of a modern democracy be both independent and separate from each other.

The 18th Century French philosopher Montesquieu introduced the concept of separation of powers after looking at the Westminster model. We are told that the American and the French Constitutions were the basis for our Constitution and Article 33 - "Powers and functions of the President" - clearly states, I quote:

> "In addition to the powers and functions expressly conferred on or assigned to him by the Constitution or by any written law whether enacted before or after the commencement of the Constitution, the President shall have the power -"

Article 33(f) states, I quote:

> "to do all such acts and things, not being inconsistent with the provisions of the Constitution or written law as by international law, custom or usage he is required or authorized to do."

Our new President Maithripala Sirisena, seeing the constitutional crisis between the court and Parliament, has had to become the arbiter of the crisis and it is under those circumstances that he has now acted.

The question of an impeachment, therefore, does not arise. The question of an impeachment arises when it is about the behaviour of a Judge. The mechanism used here is not a punishment for unlawful or unethical behaviour. It is, correcting a constitutional crisis. The process was to correct a wrongful removal of a Judge, in this case, the Chief Justice. The senior-most Judge of the Supreme Court has been appointed to the Office of the Chief Justice. Justice K. Sripavan's name has been unanimously approved by the Parliamentary Council, which included the Hon. Leader of the Opposition of Parliament. We now have a new beginning.

ඔබ මේ විවාදයේදී කොයි පැත්තේ සිටියත්, මේක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අර්බුදයක්. පාර්ලිමේන්තුවේ ප්‍රශ්නයක් නම්, පාර්ලිමේන්තුවට විසඳන්නට පුළුවන්. එහෙම නැත්නම් මැතිවරණයක් හරහා ඒක විසඳන්නට පුළුවන්. නමුත් ව්‍යවස්ථාදායකයයි, අධිකරණයයි අතර තිබෙන අර්බුදයක් පාර්ලිමේන්තුවට විසඳන්නට බැහැ. ඒ නිසා තමයි අපේ අලුත් ජනාධිපතිතුමා, එතුමා සතු බලතල පාවිච්චි කරලා, - විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33. (ඊ) ව්‍යවස්ථාවේ බලතල භාවිත කරලා - මේ අර්බුදය විසඳන්නට ඉදිරිපත් වෙලා තිබෙන්නේ. පාර්ලිමේන්තුව උත්තරීතරයි; පාර්ලිමේන්තු කටයුතුවල නීති සම්පාදනය උත්තරීතරයි. ඒ වාගේම නීතිය අර්ථ නිරූපණය කිරීමේ දී අධිකරණයත් උත්තරීතරයි. අපේ ඩිව් ගුණසේකර මැතිතුමාත් කිව්වා වාගේ මේ මූලධර්මය එදා මේ පාර්ලිමේන්තුව පිළිගත්තා නම්, අද අපි මේ අර්බුදයට මුහුණ දෙන්නේ නැහැ.

ඔබ මේ විවාදයේ දී කොයි පැත්තේ සිටියත්, අපිට දැන් අලුත් මාර්ගයක් තිබෙනවා. අපේ ශ්‍රේෂ්ඨාධිකරණයේ ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාරතුමා වන ශ්‍රීපවන් විනිශ්චයකාරතුමා අද වන විට අපේ අග්‍ර විනිශ්චයකාරවරයා වශයෙන් පත් කර තිබෙනවා. අපට අලුත් පටන් ගැන්මක් තිබෙනවා. අධිකරණයේ ස්වාධීනත්වයේ මූල අදයි කියලා මම සඳහන් කරන්නට ඕනෑ. බොහොම ස්තූතියි.

[6.54 p.m.]

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)

Mr. Presiding Member, I think all of us here look forward to having good governance and we were all hoping that this "Hundred-Day Programme" would be smoothly implemented with the cooperation of everybody in this House. I must say for myself that I am in support of all the progressive measures that have been included in that "Hundred-Day Programme". But, there are some, of course, which we do not accept. There are, in particular, the constitutional changes, which were expected to remove the Executive Presidency. But, now it looks as if there is only a reduction of its powers.

Basically, while we are prepared to cooperate in this exercise, I think it is very unfortunate that the Government has decided to bring up this issue of the removal of the Chief Justice. In the context of reducing the powers of the President and increasing the powers of Parliament, we see here a process of usurping a power with Parliament arbitrarily by the Executive, by the President, and this is completely unacceptable. This is a violation of our Constitution; it is a violation of Parliamentary procedures and it really is a violation of the sovereignty of Parliament and the people. I must say that the President - I can imagine under a lot of pressure particularly from the Hon. Prime Minister, who himself is a leading advocate of the Latimer House Principles - has really been prevailed upon to take this step.

[ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා]

As previous speakers had amply demonstrated, the dismissal of a Chief Justice must have the consent of Parliament; there has to be a Resolution moved in Parliament, which is the basis for the President to take that action and which has now been completely dropped. That whole Article, which really stresses the importance of that process, has been ignored and an arbitrary decision has been taken by the President as the Executive to dismiss the Chief Justice.

We totally oppose this and we regret that such a course of action has been taken. I would like to mention here that the excuse given for doing so is the fact that the dismissal of the earlier Chief Justice, the 43rd Chief Justice, Dr. Shirani Bandaranayake was done in an irregular manner. But, not only had the Hon. Speaker given a ruling on that, but also when the matter was taken up first by the Court of Appeal and thereafter by the Supreme Court clearly it was stated that it was a matter for Parliament and that Parliament has to decide on the course of action to be taken. That is what has been done. Even the retired Chief Justice Sarath N. Silva has clearly stated that what was done in the case of Dr. Shirani Bandaranayake is perfectly legal.

Here, I must add to what my Colleague, the Hon. DEW Gunasekara, said. We were unhappy with the procedure. We wanted the way in which the things were done to be fair and done in a more transparent manner. As a result of it, we ourselves abstained from voting.

ගරු නවින් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
But, your voice was never heard within the Government.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
I cannot help that. But -

ගරු ඩීව් ගුණසේකර මහතා
(மாண்புமிகு டீயூ குணசேகர)
(The Hon. DEW Gunasekara)
Hon. Dissanayake, he was in the same position as you were.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
Hon. Dissanayake, I think you were also in the same position.

ගරු ඩීව් ගුණසේකර මහතා
(மாண்புமிகு டீயூ குணசேகர)
(The Hon. DEW Gunasekara)
Hon. (Prof.) Tissa Vitarana, comparatively his was more than yours.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
So, the question is that is it legal or not? We maybe unhappy with the way things were done and we may have brought better methods of doing things. We ourselves made suggestions as to how the procedures could be improved, but it is acceptable, legal and that is what really matters. That procedure was legal. Therefore, now to declare arbitrarily that that procedure was invalid is not correct. Thereafter, the next appointment was made by the then Executive President Mahinda Rajapaksa. He had complete power to appoint a successor and he did so; whether the choice of the successor is to our liking or not is a different matter. But, the person chosen is a duly appointed Chief Justice and that Chief Justice has functioned for a period of over two years. He has been the head of the legal system for that entire period. He has officiated in various ways. His judgments are there. What is going to happen to all that? So, all that has been forgotten and here the arbitrary use of the executive powers has been exercised against the requirements imposed on us by the Constitution. So, this is a development which is dangerous, anti-democratic and it is against the very principle that you have been advocating of good governance and of the need for having a reduction in executive powers. So, here we have the President taking on powers that are not within his ambit.

This has set going a train of events. We know that in Court No. 5 in Hulftsdorp, how undue pressure was exerted on the Chief Justice by a group of lawyers. And, this same group of lawyers went to Court No. 5 where there was a disciplinary inquiry regarding a lawyer and the Magistrate had to leave the court. We are having here a situation of chaos. Your President got elected on the basis of having better law and order in the country. But, here, we have a breakdown of law and order. This is the trend that is continuing. We must not allow this to go on and we need to arrest this process.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, you have to wind up now.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
Hon. Presiding Member, please give me a half a minute.

I have a strong feeling that what ultimately is going to happen is what happened to Mrs. Sirimavo Bandaranaike during the J.R. Jayewardene regime, where she was deprived of her civic rights so that she could not contest. We are having a similar trend taking place, today, and I will not be surprised if the former President Mahinda Rajapaksa also faces a similar sad fate.

[අ.භා. 7.05]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණයේ හිටපු අග්‍ර විනිශ්චයකාරතුමිය යළි පත් කිරීම පිළිබඳව, පසු ගිය දා මේ රටේ මහත් ආන්දෝලනයට ලක් වූ ඒ කාරණය පිළිබඳව විවාද කරන මොහොතයි මේ. පසු ගිය දා අග්‍රාමාත්‍යතුමා මේ පිළිබඳව ප්‍රකාශයක් කළා. මුලින්ම, අග්‍ර විනිශ්චයකාරතුමාගේ කාරණයට එන්න කලින් කිව යුතුයි, අග්‍රාමාත්‍යතුමාගේ එදා හැසිරීම පිළිබඳව. තමුන්නාන්සේලාගේ රජයේ අග්‍රාමාත්‍යතුමා කෙරෙහි අපේ ලොකු ගෞරවයක් තිබුණා. හැබැයි, අගමැතිතුමාගේ හැසිරීම ඉතාම පහත් එකක්ය කියා මුලින්ම කියන්න ඕනෑ. මේ රටේ අගමැතිවරයා පාර්ලිමේන්තුවේදී කථා කරනවා, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ටොකු අනින්න. මේ රටේ අගමැතිවරයා පාර්ලිමේන්තුවේ කථා කරනවා, විපක්ෂයේ මන්ත්‍රීවරුන් ඔක්කෝම හිරේ දමන්න පුළුවන් කියලා. මේ රටේ ජනතාව අග්‍රාමාත්‍යවරයා ඇතුළු තමුන්නාන්සේලාට මේ රටේ යහ පාලනයක් ඇති කරන්න අවස්ථාව දුන්නේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් හිරේ දමන්නද? විපක්ෂයේ මන්ත්‍රීවරුන් හිරේ දමන්නද තමුන්නාන්සේලාට ඡන්දය දුන්නේ? විපක්ෂයේ අපි සියලු දෙනා අග්‍රාමාත්‍යතුමාගේ එදා හැසිරීම පිළිකුලෙන් යුතුව හෙළා දකිනවා කියන එක මුලින්ම මතක් කරන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතුමා මහා ලොකුවට අත දිගු කරනවා, වනනවා, කෑ ගහනවා ප්‍රචාරය කළා; රූපවාහිනියේ පෙන්නුවා. හැබැයි, අද දවසේ මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඉඳගෙන අහගෙන ඉන්න එතුමාට ආත්ම ශක්තියක් තිබුණේ නැහැ. අඩු ගණනේ එතුමා අද ඇවිල්ලා මේ විවාදයට ඇහුම් කන් දෙන්න තිබුණා. මන්ත්‍රීවරුන් හිරේ දමනවා කියා, මන්ත්‍රීවරුන්ට ටොකු අනිනවා කියා කියපු එතුමාට අද පාර්ලිමේන්තුවට එන්න කොන්දක් නැහැ. ඒ නිසා අපි අග්‍රාමාත්‍යතුමාට කියනවා, මේ රටේ ජනතාව ඡන්දය දුන්නේ මේකට නොවෙයි කියා. මීට වඩා ගෞරවාන්විතව මේ පාර්ලිමේන්තුවේ හැසිරෙන්න කියලා කියනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද අපි දකිනවා, විපක්ෂයේ මන්ත්‍රීවරුන් හිරේ දමන්න කටයුතු කරන බව. තිස්ස අත්තනායක මහත්මයා -එක්සත් ජාතික පක්ෂයේ හිටපු ලේකම්තුමා- අද බන්ධනාගාරගත කළා. අද එතුමා බන්ධනාගාරගත කරලා. අපේ ප්‍රේමලාල් ජයසේකර හිටපු නියෝජ්‍ය ඇමතිතුමා බන්ධනාගාරගත කරලා. හෙට අනිද්දා වෙනකොට අපේ තවතවත් මිනිසුන් බන්ධනාගාරගත කරාවි. හැබැයි, මිනිසුන් හිරේ දමලා, අපව බය කරලා තමුන්නාන්සේලාට මේ සටන නවත්වන්න බැහැ. චෝදනා දමලා අපව බය කරන්න තමුන්නාන්සේලාට බැහැ. තමුන්නාන්සේලා මොන තරම් මන්ත්‍රීවරුන් හිරේ දැම්මත්, තමුන්නාන්සේලා අපට තර්ජනය කරන්න මොන තරම් කටයුතු කළත් ඒවාට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අප බය නැහැ කියන එක අපි මේ පාර්ලිමේන්තුවේදී තමුන්නාන්සේලාට කියන්න කැමැතියි. අපි මේ ඉවසාගෙන ඉන්නේ වෙනත් මොකවත් නිසා නොවෙයි. මේ පාර්ලිමේන්තුවේ බහුතරය අපට තිබෙනවා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව සුළුතර ආණ්ඩුවක්. ඔය ඇමතිකම්, කෝට් ඔක්කෝම පැය 24න් ගලවන්න පුළුවන්. මතක තියාගන්න.

ගරු නවින් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
කොහොමද ගලවන්නේ?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගලවන හැටිද? ගලවන හැටි කියා දෙන්නම්. එළියට ආවාම කියා දෙන්නම්. ඕවා ගලවන්න පුළුවන්. ඇමතිතුමනි, අපටයි බහුතරය තිබෙන්නේ. ඒක මතක තියාගන්න. තමුන්නාන්සේ සුළුතර ආණ්ඩුවක ඇමතිවරයකු බව මතක තියාගන්න.

ගරු නවින් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
බහුතර කැමැත්ත. [බාධා කිරීම්]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

බහුතර ජනතාව ඡන්දය දුන්නු එක හරි. [බාධා කිරීම්] හැබැයි, මතක තියාගන්න- [බාධා කිරීම්] තමුන්නාන්සේලාට බහුතර ජනතාව ඡන්දය දුන්නු එක හරි. හැබැයි මතක තියාගන්න, දැන් ජනාධිපතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති බව. තමුන්නාන්සේ ඒක මතක තියාගන්න. අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති ජනාධිපතිතුමායි. තමුන්නාන්සේ ඒක මතක තියාගන්න. [බාධා කිරීම්] කවුද, තමුන්නාන්සේලා කියන බහුතර ජනතාව? [බාධා කිරීම්] ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේ කියනවා බහුතර ජනතාව ගැන. [බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
පින් ඇමති. [බාධා කිරීමක්]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

මොකක්ද? [බාධා කිරීම්] මගේ මිත්‍ර ඇමතිතුමනි, තමුන්නාන්සේ එදා ඔය පැත්තේ මගේ ළඟ නේ සිටියේ. [බාධා කිරීම්] ඒක තමයි මා කියන්නේ. [බාධා කිරීම්] ඒක නිසා තමයි මා මේ කියන්නේ. තමුන්නාන්සේලා කිව්වා, "බහුතර ජනතාවගේ ඡන්දය" කියා. මතක තියාගන්න, බහුතර ජනතාවගේ ඡන්දය, 450,000යි. අපි ඒක පිළිගන්නවා. ඒ පිළිබඳව අපට තර්කයක් නැහැ. අපි මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට ගරු කරනවා. අපි එතුමාට පොරොන්දු වුණා, තමුන්නාන්සේලාගේ දින 100 වැඩසටහනට සහයෝගය දෙනවා කියා. ඒ පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. හැබැයි මහත්තයෝ, සහයෝගය දෙන්නයි; ගුටි කන්නයි දෙකක් බැහැ. ඒක මතක තියාගන්න. සහයෝගය දෙන්නයි, ගුටි කන්නයි දෙකක් කරන්න බැහැ. තමුන්නාන්සේලා කියන දේ නොවෙයි අද ගමේ තිබෙන්නේ.

ගරු නවින් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
නාවලපිටියේ ඔබතුමා නේ ගුටි දුන්නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

කාටද? [බාධා කිරීම්] තමුන්නාන්සේ ඒ කාලයේ අපත් එක්ක නේ සිටියේ. කොහේද ගුටි දුන්නේ? තමුන්නාන්සේගේ මල්ලිගෙන් අහන්න කෝ. තමුන්නාන්සේගේ මල්ලි සංවිධායකකම නැති වුණාම මට රෑට රෑට කථා කරලා ඇඩුවා. තමුන්නාන්සේගේ මල්ලි සංවිධායකකම නැහැ කියා මට කථා කරලා ඇඩුවා; උදවු කරන්න කිව්වා. තමුන්නාන්සේගේ මල්ලි ගැන තවත් අහගන්න ඕනෑද? පසු ගිය ජනාධිපතිවරණය කාලයේදී අපේ සල්ලි අරගෙන තමුන්නාන්සේගේ මල්ලි එහා පැත්තට ගියා. අහගන්න ඕනෑද? [බාධා කිරීම්] සල්ලි ගත්තේ බැසිල් රාජපක්ෂගෙන්.

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

තමුන්නාන්සේගේ මල්ලි අපේ සල්ලි අරගෙන එහා පැත්තට ගියා. තමුන්නාන්සේ මට මොකුත් කියන්න එපා. තමුන්නාන්සේ නිකම් බුදු වෙලා වාගේ කථා කරන්න එපා. තමුන්නාන්සේට අපි ගරු කරනවා. තමුන්නාන්සේත් එක්ක අපේ ප්‍රශ්න නැහැ. නවින් දිසානායක ඇමතිතුමනි, ඔබතුමා ඇඟිල්ල දිගු කළාට අපි භය නැහැ. තමුන්නාන්සේත් එක්ක අපට ප්‍රශ්න නැහැ. හැබැයි, අපි කියන්නේ මයන්ත දිසානායක ගැනයි. තමුන්නාන්සේට ඕනෑ නම්, ඒ record කරපුවා තිබෙනවා. අපි ඒවා තමුන්නාන්සේට කියන්නම්. [බාධා කිරීමක්] මොනවාටද කට අවුස්සා ගන්නේ? මොනවාද අවුස්සා ගන්නේ? [බාධා කිරීමක්] කියන්න, මොනවාද? මොකක්ද? [බාධා කිරීමක්] තමුන්නාන්සේ ක්‍රීඩා - [බාධා කිරීමක්] මොනවාද? නවින් දිසානායක ඇමතිතුමනි, ඉතින් අපේ නෝනා ගෙනැල්ලා ඔබතුමා ගෙදර තියා ගන්න. හැබැයි, ඔබතුමාට මම එක දෙයක් කියන්නම්. මගේ නෝනාට කලින් ඔබතුමාගේ නෝනා බේරා ගන්න. ඔබතුමා මේ ගරු සභාවේදී මට ඒ විස්තර කිව්වා නේ. ඔබතුමා ඉස්සෙල්ලා ඔබතුමාගේ නෝනා බේරා ගන්න. ඇමතිතුමනි, පෞද්ගලික දේවල් මෙතැන අදින්න ඕනෑ නැහැ. තමුන්නාන්සේ වැදගත් ඇමතිවරයෙකුගේ පුතෙක් නේ. ඒ නිසා මගේ නෝනාට කලින් තමුන්නාන්සේ තමුන්නාන්සේගේ නෝනා ගෙනැත් තියා ගන්න. අපේ පැත්තේ ඉන්න කොට මට කියපු එක මම මෙතැන කියන්නේ නැහැ. ඔබතුමාගේ නෝනා ගැන ඔබතුමා මට කිව්වා. මම ඒක මෙතැන කියන්නේ නැහැ. මම ඒ වාගේ පහත් තත්ත්වයට පත් වන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බලන්න, අද අධිකරණය ගැන විශ්වාසයක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බලන්න, අද පොලීසිය ගැන විශ්වාසයක් නැහැ. අද පොලීසිය භාර ඇමතිවරයා තමුන්ගේ ආසනයේ මිනිසුන්ට ගහනවා.

මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කරන ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා අද මෙතැන ඉන්නවා. අද නාවලපිටිය ආසනයේ පවතින භීෂණය බලන්න. අදත් ඒ ප්‍රදේශයේ මිනිසුන්ට ගහනවා. ගෙවල් 25ක් කැඩුවා. මගේ පියාගේ සහෝදරියගේ වයස අවුරුදු 77යි. ඇවිල්ලා ඒ ප්‍රදේශයේ එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරයා දවල් 12ට ඇයගේ ගෙදරට ගිනි තැබුවා. එතුමිය නහරයක් පුපුරා මැරුණා. එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරයා ඒකට වග කියන්න ඕනෑ. මේ සියල්ල ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා දන්නවා. අපේ පක්ෂයේ මිනිසුන්ට ගහනවා. මේ දේවල් සම්බන්ධයෙන් මම කනගාටු වනවා.

ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමනි, අපි ගුරු ගම්මානයක් හැදුවා. නියම විධියට ඉඩම් කච්චේරි තියලා ප්‍රදේශයේ ගුරුවරුන්ට අපි සාධාරණව ඉඩම් බෙදුවා. එදා ඔබතුමාව නොමඟ යවා ඒ ඉඩම්වලින් ඒ අයව ඉවත් කරන්න කිව්වා. ඔබතුමාට ඒ ඉඩම් සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු දුන්නේ නැහැ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, you have to wind up now.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව අවසන් කරනවා.

අපි ඒ කටයුත්ත කළේ සාධාරණ ආකාරයටයි. ඒක ඔබතුමා හොයා බලන්න. ඊයේ නාවලපිටියේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු ඔබතුමා හම්බ වන්න ඇවිල්ලා ඔබතුමාට ඒ විස්තර කිව්වා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ දේශපාලනය මැතිවරණයෙන් පස්සේ අවසන්. හැබැයි, අපි කියන්නේ අපට අත උස්සා ඡන්දය දෙන්නයි, ගුටි කන්නයි දෙකක් කරන්න බැහැ කියලායි. ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෝ අපෙන් මේ සම්බන්ධයෙන් අහනවා. ජනාධිපතිතුමාට තිබෙන ගෞරවය නිසා තමයි අපි මේ දේවල් ඉවසා ගෙන ඉන්නේ. දින 100 වැඩ පිළිවෙළට සහයෝගය දෙනවා කියා ජනාධිපතිතුමාට අපි පොරොන්දුවක් දුන්නා. ඒ සහයෝගය අපි දෙනවා. හැබැයි, සහයෝගය දෙන්නයි, ගුටි කන්නයි දෙකක් කරන්න අපට බැහැ. නවින් දිසානායක ඇමතිතුමනි, තමුන්නාන්සේ ක්‍රීඩා අමාත්‍යාංශයට ආවා කියලා තමුන්නාන්සේ අපට ඇඟිල්ල දිගු කළා කියලා තමුන්නාන්සේට අපි භය නැහැ. තමුන්නාන්සේගේ නැටිලිවලට අපි භය නැහැ. ඇඟිල්ල දිගු කළාට තමුන්නාන්සේලාට අපි භය නැහැ. [බාධා කිරීමක්] තමුන්නාන්සේ එකක් මතක තබා ගන්න. තමුන්නාන්සේට ඕනෑ නම්, ඒ දේවල් මගෙන් අහගන්න. තමුන්නාන්සේ මේක මතක තබා ගන්න. මහවැලිය, කොත්මලේ හදන කොට මල්ලිට ඒජන්සි දුන්නේ නැහැ. ඒක මතක තියා ගන්න. ඒ නිසා ඒ දේවල් අපෙන් අහගන්න එපා. ඒ නිසා ඇමතිතුමනි, ඕවාට අපි භය නැහැ. නවින් දිසානායක ඇමතිතුමා ඇඟිල්ල දිගු කළාට අපි භය නැහැ. අපිව භය කරන්නත් එපා. භය කරන්න එන්නත් එපා. අපි තමුන්නාන්සේට භයත් නැහැ. ඒක මතක තබා ගන්න. භය කරලා අපෙන් උදවු ගන්න හැදුවොත් අපට තීන්දු ගන්න සිද්ධ වනවා. ඒ වාගේ පහත් විධියට හැසිරෙන්න එපාය කියන එකත් මතක් කරමින් මම නිහඬ වනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 7.14]

ගරු තිලංග සුමතිපාල මහතා
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
නමෝ බුද්ධාය!

අද මෙම විවාදයට එකතු වන්න මටත් අවස්ථාව ලැබීම ගැන මා ඉතාම සන්තෝෂ වනවා. මොකද, පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරු හැටියට අපේ අයිතිවාසිකම, ඒ වාගේම අපේ මන්ත්‍රී ධුරයේ ගෞරවය පිළිබඳ ප්‍රශ්නයක් තමයි අද දවස පුරාම අපි මේ කථා කරන්නේ. අවසානයට පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වුණු දවසේ ගරු අගමැතිතුමා ප්‍රකාශයක් කළා. ඒ ප්‍රකාශය කළේ මේ උත්තරීතර සභාවෙන් පිටත සිද්ධ වූ දේවල් සම්බන්ධයෙන් මිසක්, පාර්ලිමේන්තුව තුළ සිද්ධ වූ දේවල් සම්බන්ධයෙන් නොවෙයි. එතුමා ඉතාම සූක්ෂ්ම විධියට අපි ගෙනාපු තර්කය බැහැර කරලා සිද්ධීන් පිළිබඳව වාර්තා කරන්න උත්සාහ ගත්තා. ශිරානි බණ්ඩාරනායක මහත්මිය ගැනවත්, ශ්‍රීපවන් මැතිතුමා ගැනවත්, මොහාන් පීරිස් මැතිතුමා ගැනවත් නොවෙයි අපේ තර්කය. නීත්‍යානුකූලව අග්‍ර විනිශ්චයකාරවරයෙකු ඉවත් කරන්න ජනාධිපතිවරයෙකුට තිබෙන බලතල මොනවාද කියා පෙන්වන්න අද දවසේ කථා කළ කිසිම කෙනෙකුට පුළුවන්කමක් තිබුණේ නැහැ.

අග්‍ර විනිශ්චයකාරවරයකු ඉවත් කිරීම සඳහා මේ රටේ නීතියේ කිසිම ප්‍රතිපාදනයක් නැහැ. අනික් සියලු දේවල් ගැන කියනවා, පත් කිරීම ගැන කියනවා. අපි කිව්වේ නැහැ, ජනාධිපතිවරයකුට අග්‍ර විනිශ්චයකාරවරයකු පත් කිරීමට බලයක් නැහැයි කියලා. අග්‍ර විනිශ්චයකාරවරයකු පත් කිරීමේ බලය ජනාධිපතිවරයකුට තිබෙනවා. නමුත් පත් කළේ කවුද, පත් කිරීම වැරැදිද කියා අපව වෙනත් තැනකට ගෙන යනවා. අපේ පක්ෂයේ වර්තමාන සභාපතිතුමා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා වුණත්, නීත්‍යානුකූල රාමුවක් තුළ ක්‍රියාත්මක වුණේ නැති වැඩසටහනක් තිබෙනවා නම් එය නිවැරැදි මාර්ගයට යොමු කරන්න, ඒ වෙනුවෙන් පෙනී සිට කථා කරන්න තිබෙන අයිතිය තමයි අපි මේ ක්‍රියාත්මක කරන්නේ. එම නිසා දේශපාලන අවශ්‍යතාවක් සඳහා මොහාන්

පීරිස් මැතිතුමා ඉවත් කරන්න තීන්දුවක් ගත්තා නම්, මොනවා හෝ ක්‍රමයකට ඒ තීන්දුව ක්‍රියාත්මක කරන්න උත්සාහ ගත්තා නම් අපි ඒ ගැන කනගාටු වනවා. මොකද, යම් කිසි විධියකට එතුමා ලවා ඉල්ලා අස් කරවා ගන්නට උත්සාහ කරලා, ඒක බැරි වුණාම අසාද් සාලි මහත්මයාව ඊ එතුමාගේ ගෙදරට යවලා එතුමාට බලපෑමක් කළා කියලා පොලීසියේ පැමිණිල්ලක් තිබෙනවා. ඊට පසු දින උදේ මොහාන් පීරිස් මහත්මයාගේ පත්වීම වලංගු නැහැ කියලා, එතුමා අස් කර, ඒ වෙනුවට හිටපු අග්‍ර විනිශ්චයකාරවරිය පත් කළා. ඉන් පසුව එතුමියවත් පැය 24කින් ගෙදර යවලා, ඉන් පසුව ශ්‍රී පවන් මැතිතුමාව අග්‍ර විනිශ්චයකාර ධුරයට පත් කළා. මේක හරියට teledrama එකක් වාගෙයි. මේ රට බලාපොරොත්තු වෙන්නේ යහ පාලනය. යහ පාලනය කියන්නේ මොකක්ද? යහ පාලනය කියන එකේ මූලික සිද්ධාන්තය තමයි විධිමත්, ක්‍රමවත් වැඩසටහනකට ගිහින් විධායක තීන්දු ගැනීම. Executive decisions will have to be arrived at after going through a process. That process is what is lacking here. මේක අපි කථා කරන්නේ නැද්ද? අපි මේ පාර්ලිමේන්තුවල හැමදාම ඉන්නේ නැහැ. මේ අයට උපදෙස් දුන්නේ කවුද?

අගමැතිතුමා එදා මේ ගරු සභාවට ඇවිල්ලා කිව්වා, "Bar Association එකේ සංවිධානවලින් ඇවිත් බලපෑමක් කළා, ඒ අය එකඟ නැහැ" කියලා. ඒක වෙන්න පුළුවන්. ඒ නීති ක්ෂේත්‍රයේ සිටින අය අකැමැති වෙන්න පුළුවන්. ඒ වාගේම යම් යම් පිරිස් මොහාන් පීරිස් මැතිතුමාට අකැමැති වෙන්න පුළුවන්. එහෙම නම් එතුමාව නීති ප්‍රතිපාදන තුළින් ඉවත් කරන්නට ඕනෑ. අපි කිසි කෙනෙකුට මේ උත්තරීතර සභාවට ඇවිල්ලා කියන්න පුළුවන්ද, "මේ නීතියේ මේ වගන්තිය අනුව ජනාධිපතිතුමාට පැවරී ඇති බලතල අනුව මොහාන් පීරිස් මහත්මයා ඉවත් කළා" කියලා. මොකද, අන්තිමටම, -අපි දිගටම කථා කළා. එදා කථානායකතුමාමයි අදටත් කථානායක- එදා ගරු කථානායකතුමා නියෝගයක් දුන්නා. ඒ නියෝගයට අනුව මේ උත්තරීතර සභාව තීන්දුවක් ගත්තා; ඡන්දයකට ගියා. ඒ ඡන්දයෙන් තීන්දුවක් අරගෙන ශිරානි බණ්ඩාරනායක මැතිනියව ඒ ධුරයෙන් ඉවත් කරන්න තීන්දු කළා. ඒ සම්බන්ධයෙන් එදා හිටි ජනාධිපතිතුමාව දැනුවත් කළා. එවකට ජනාධිපතිතුමා එතුමාට තිබුණු නීත්‍යානුකූල බලතල පාවිච්චි කරමින්, පාර්ලිමේන්තුවට ගරු කරමින්, පාර්ලිමේන්තුවේ තීන්දුව ක්‍රියාත්මක කර ශිරානි බණ්ඩාරනායක මැතිනියව ඉවත් කරලා එම ධුරයට මොහාන් පීරිස් මැතිතුමාව පත් කළා. එතකොට මේ සම්පූර්ණ ක්‍රියාදාමය වැරදිද? නැහැ. ඒ ක්‍රියාදාමය සියයට 100ක් නිවැරදියි; නීත්‍යානුකූලයි. ඒකයි අපි කථා කරන්නේ. මේ සම්බන්ධයෙන් කොකැන හෝ වරදක් වුණා නම්, -දේශපාලන වශයෙන් මේ දින 100 වැඩසටහනේදී යම් යම් කරුණු කියනවා. ඒවාට දින වකවානු නැහැ- ඒ කණ්ඩායමට පුළුවන්කමක් තිබුණා මොහාන් පීරිස් මහත්මයාට ඉල්ලා අස් වෙන්න කියලා හෝ ඒ කටයුත්ත කරන්න. එහෙම කළා නම් අපට ප්‍රශ්නයක් නැහැ. නමුත්, ඇයි මේ උත්තරීතර සභාව - පාර්ලිමේන්තුව- හැල්ලුවට පත් කරන්නේ? ගරු කථානායකතුමා එදා නියෝගයක් දුන්නා.

මම ඔබතුමන්ලාට කියන්නට කැමැතියි, නවසීලන්තය ඔවුන්ගේ වාර්තාවකින්- ඒක විශාල වාර්තාවක් - කියා සිටිනවා, "The Speaker is a judge of law" කියා. මේක අපට නැහැ කියන්න බැහැ. එංගලන්ත පාර්ලිමේන්තුව ගැන බැලුවොත් යම් කාරණයක් සම්බන්ධයෙන් එහි කථානායකතුමා තීන්දුවක් ගත්තාම ඒ තීන්දුව අවසාන තීන්දුව වෙනවා. එහෙම නම් අපි මොකක්ද මේ හැල්ලුවට ලක් කරන්නේ? අපි එක එක තැන්වල තිබෙන දේවල් ගැන, මෙයින් පරිබාහිර දේවල් ගැන, ඒ අයගේ පෞද්ගලික දේවල් ගැන කතා කරනවා. ශිරානි බණ්ඩාරනායක මැතිනිය ගැනවත්, ශ්‍රීපවන් මැතිතුමා ගැනවත්, මොහාන් පීරිස් මැතිතුමා ගැනවත් කතා කරන එක නෙවෙයි අපට අවශ්‍ය වන්නේ. මේ උත්තරීතර සභාවට තිබෙන අයිතිය උදුරා ගන්නේ ඇයි? මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා බලයට එන්න කලින් කිව්ව දේ මොකක්ද? විධායක ජනාධිපති ධුරයේ තිබෙන බලතල ඉවත් කරනවා කිව්වා; පාර්ලිමේන්තුවට බලතල ගෙනෙනවා කිව්වා. පාර්ලිමේන්තුවේ බලතල ගැන වැඩියෙන්ම කතා කළ පුද්ගලයා තමයි වර්තමාන අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා. එතුමා එදා කිව්ව දේම නේ දැන් නොකර ඉන්නේ. පාර්ලිමේන්තුවට බලය ගෙන ඒම ගැන කියලා, පාර්ලිමේන්තුවේ අපට තිබෙන බලතල, කථානායකතුමාගේ අයිතිය සහ බලය මේ උත්තරීතර සභාවෙන් අරගෙන නීතිය වෙනත් තැනකින් ක්‍රියාත්මක කරනවා. අපි දින 100 වැඩ පිළිවෙළට සහයෝගය දෙන්නේ මේවාට නෙවෙයි. අපි විපක්ෂයේ ඉඳගෙන, බහුතර බලයක් තියාගෙන අවංක චේතනාවෙන් දින 100ට සහයෝගය දෙන්නේ මේ යහ පාලනය කියන මාතෘකාව යටතේ වන ක්‍රියාදාමයකට යන්නයි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, you have to wind up now.

ගරු තිලංග සුමතිපාල මහතා
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව සුළු කාලයක් ලබා දෙන්න.

සුළුතර බලයක් තිබෙන මේ ආණ්ඩුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට අපෙන් සහාය බලාපොරොත්තු වෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සිදු කරන්නට යන ඒ සංශෝධනයන් එක්ක සිදු වෙන වෙනස්කම් තුළින් රටට යම් කිසි ජයග්‍රහණයක් ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා. අපි උදවු කළේ අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් යුතු රජයකටයි. අපි අය වැයට සහයෝගය දෙනවාද නැද්ද කියන එක තීන්දු කරන්නේත් ඒ අනුව හිතලායි. එහෙම නැතුව ගරු රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාගේ අය වැයකට නෙවෙයි අපි සහයෝගය දෙන්නේ. ඒ කාරණය පැහැදිලිව තේරුම් ගන්න. බලය නැතුව මේ විධියට හැසිරෙන තමුන්නාන්සේලාට බලය ලැබුණොත් කොහොම හැසිරෙයිද කියලා අපිට දැන් සැකයක් මතුවෙලා තිබෙනවා. ඒක නිසා අපි දක්වන මේ සහජීවනයෙන්, අපි දක්වන මේ සහයෝගයෙන් අයුතු ප්‍රයෝජන ගන්න එපා. අප මේ දක්වන සහයෝගය නිවටකමක් කියලා හිතන්න එපා. අපි තමුන්නාන්සේලාට බලය දුන්නේ ජනතාව දිනවන්නයි. නැතිව එක එක්කෙනාට මැති ඇමතිකම් කරලා, තමන්ගේ තිබෙන අවශ්‍යතා ඉටු කර ගන්න නොවෙයි. ඒක අපේ අඩු පාඩුවක්, මදිකමක් කියලා හිතන්න එපා. අපි ක්‍රියාත්මක වෙන්න ඕනෑ වේලාවට ක්‍රියාත්මක වෙලා, ජනතාව ජයග්‍රහණය කිරීම සඳහා නැඟී සිටිනවා කියමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 7.21]

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රථමයෙන් මම කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රගතිශීලී ජනතාවට ස්තුතිවන්ත වෙනවා පසු ගිය 8වෙනි දා පැවති ජනාධිපතිවරණයෙන් වැඩි ඡන්ද 25,000කින් පමණ එක්සත් ජනතා නිදහස් සන්ධානයට විශාල ජයග්‍රහණයක් ලබාදීම පිළිබඳව. ඒ වාගේම මාගේ අරණායක ආසනයේ ජනතාවටත් ආසනය ජයග්‍රහණය කර දීම ගැන මම ස්තුති වන්ත වෙනවා. ඇත්තෙන්ම දැන් යහ පාලනයක් ගැන ජනතාව බලාපොරොත්තු තියාගෙන ඉන්න මොහොතක්. විශේෂයෙන්ම ඔබතුමන්ලාගේ පොරොන්දුව වුණේ විධායක ජනාධිපති ක්‍රමයේ

[ගරු ලලිත් දිසානායක මහතා]

බලතල අයින් කරලා පාර්ලිමේන්තුවට බලතල ගෙනෙනවා කියන එකයි. පාර්ලිමේන්තුව ශක්තිමක් කරන්න ඕනෑ කියන පදනම මත ඉඳගෙන තමයි ඒකාලයේ විපක්ෂය වැඩියෙන්ම සාකච්ඡා කළේ. එහෙම කියලා බලය ගත් ඔබතුමන්ලා දින ගණනාවක් යනකොට, මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ බලය ගිලිහී යන තත්ත්වයකට පත් කරලා තිබීම ගැන අපි අද බොහොම කනගාටු වෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107වන ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිතුමාට තමයි ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරු පත් කිරීමේ බලය තිබෙන්නේ. හැබැයි, ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරු ඉවත් කිරීමේ බලය තිබෙන්නේ මේ පාර්ලිමේන්තුවටයි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

අනතුරුව ගරු ආර්. යෝගරාජන් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு ஆர். யோகராஜன் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. R. YOGARAJAN *left the Chair and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *took the Chair.*

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි බොහොම කනගාටුවෙන් ප්‍රකාශ කරන්න ඕනෑ යහ පාලනයක් ගැන කථා කරන මේ රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ ආණ්ඩුව අද පාර්ලිමේන්තුවේ බලතල උදුරාගෙන, නීතිඥ සංගමයට ඕනෑ විධියට කටයුතු කරලා තිබෙනවාය කියා. ඒක වැරැදියි. මොකද මේ මහජන නියෝජිතයන්ට නැත්නම් ජන්දයට තිබෙන අයිතිය තිබෙන්න ඕනෑ. පාරවල්වල උද්ඝෝෂණය කළාට, එහෙම නැත්නම් වෙන ක්‍රියාකලාපයක් කළාට ඒවාට පාර්ලිමේන්තුව යටත් වුණොත් මේ යහ පාලනය ගෙනියන්න හම්බවෙන්නේ නැහැ. ඒ නිසා වැදගත් වෙන්නේ අන්න ඒකයි. ඒ යහ පාලනය අද මේ පාර්ලිමේන්තුව ඇතුළේ සිද්ධ වෙන්නේ නැහැ. නීතිඥ සංගමයට ඕනෑ විධියට අග්‍ර විනිශ්චයකාරවරු පත් කරන්න බැහැ. එදා මොහාන් පීරිස් මහතා අග්‍ර විනිශ්චයකාරවරයා හැටියට පත් වුණා. එතුමා පත් වෙන්න කලින් හිටපු ශිරානි බණ්ඩාරනායක අග්‍ර විනිශ්චයකාරතුමිය ඒ තනතුරෙන් ඉවත් කළේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලවයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පාර්ලිමේන්තුවෙන් සම්මත කරලා තිබෙන එකක්. ඒක වෙනස් කරන්න ඕනෑ නම් ඔබතුමන්ලාට ඒකට අයිතිය තිබෙනවා. හැබැයි, ඒත් අපි නැතුව ඒක කරන්න බැහැ. පාර්ලිමේන්තුවේ බහුතර බලය තිබෙන්නේ අපිටයි. ඒ නිසා අපේ සහයෝගය නැතුව ඔබතුමන්ලාට මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එක ව්‍යවස්ථාවක්වත් වෙනස් කරන්න බැහැ; ඔය දින 100 වැඩසටහන ක්‍රියාත්මක කරන්නත් බැහැ. ඒ නිසා ඔබතුමන්ලා ඒ ගැන හිතන්න. මොකද ඊළඟට පත්වෙන පාර්ලිමේන්තුවක තුනෙන් දෙකේ බලයක් නැත්නම් ඒ ගැන කථා කරන්න බැහැ.

ඔබතුමන්ලා ශිරානි බණ්ඩාරනායක මැතිනිය අග්‍ර විනිශ්චයකාර පුටුවේ වාඩිකරවලා ඒ පුටුව අපිරිසිදු කළා. එතුමියට විරුද්ධව තිබෙන චෝදනා වෙනත් අධිකරණවල විනිශ්චයට භාජනය වෙනවා. නීතිපතිතුමා ඒ චෝදනා ඉල්ලා අස් කර ගත්තාද? නැහැ. ඒවා ඉල්ලා අස් කර ගන්නේ නැතිව චෝදනා තිබෙද්දී තමයි ගිහිල්ලා අග විනිසුරු පුටුවේ වාඩි කළේ. සාමාන්‍ය දේවල් සම්බන්ධයෙන් චෝදනා තිබෙනවා. වත්කම් ප්‍රකාශය ලබා දුන්නේ නැහැ. තවත් යම් කිසි මුදල් තැන්පත් සම්බන්ධයෙන් චෝදනා තිබුණා. මේ රටේ ඉතිහාසයේ අග විනිසුරු තනතුරට පත් කළ කිසිම කෙනකුට හෝ, ඔවුන්ගේ ස්වාමිපුරුෂයාට හෝ බිරිඳට හෝ විරුද්ධව අධිකරණයේ කිසිම නඩුවක් තිබිලා නැහැ. අද මේ අය මොහාන් පීරිස් මහත්මයාට විරුද්ධව විවිධ නඩු පෙන්වනවා. මොහාන් පීරිස් ගැන කථා කරන්න ඉස්සෙල්ලා, යහපාලනයක් ගැන කතා කරන ආණ්ඩුවේ ශිරානි බණ්ඩාරනායක මැතිනිය අග විනිසුරු පුටුවේ ඉඳගන්නකොටම ඇය විත්තිකාරියක් බව කියන්නට ඕනෑ. එහෙම නම් අධිකරණ ඉතිහාසයේ විත්තිකාරියක් අග්‍ර විනිශ්චයකාර පුටුවේ වාඩි කළ ආණ්ඩුවක් තමයි රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ යහපාලන ආණ්ඩුව. වැරදි පූර්වාදර්ශයක් දීලා තිබෙනවා.

අපි කියන්නේ මොහාන් පීරිස්, එහෙම නැත්නම් ශිරානි බණ්ඩාරනායක නොවෙයි. මේ දෙන්නාම නැතිව වෙනත් කෙනෙක් පත් කරන්නට තිබුණා. එතුමියට විශ්‍රාම වැටුප දෙන්නට ඕනෑකම තිබුණා නම් ඒකට වෙනම ක්‍රමයක් තිබුණා. ඒකයි කියන්නේ වැරදි ක්‍රමවේදයක්ය කියා. මමත් නීතිඥයෙක්. මමත් නීතිඥ සංගමයේ යාවජීව සාමාජිකයෙක්. මෙතුමා මූලාසනයේ ඉන්න අවස්ථාවේ කොළඹ නීතිඥ සංගමයේදී මේ විරෝධතාව ගැන එදා කථා කරනකොට අපි ඒ ගැන කථා කළා. මේවා කථා කර විසඳා ගන්න පුළුවන් ප්‍රශ්න. මේ විධියට උත්තරීතර පාර්ලිමේන්තුව යටත් කර කටයුතු කිරීම අපි සියලු දෙනාගේම වරප්‍රසාද කඩ කිරීමක්. ඒක එතරම් හොඳ පූර්වාදර්ශයක් නොවෙයි. මේ බලතල පාර්ලිමේන්තුවට තියෙන්න ඕනෑ. මේ බලතල තිබෙන නිසා තමයි අපට අද මේ ගැන කථා කරන්නට පුළුවන්කම තිබෙන්නේ. මේ බලතල වෙන අධිකාරියකට දුන්නා නම්, වෙන කොමිසමකට දුන්නා නම්, වෙන අධිකාරියක් පත් කළා නම්, ඒ අධිකාරියයි මේ තීන්දුව ගන්නේ. එහෙම නම් ඒ ගැන ප්‍රශ්න කරන්නට අපට හැකියාවක් නැහැ. එම නිසා මම ඔබතුමාට එක දෙයක් කියනවා. පාර්ලිමේන්තුවේ තිබෙන වරප්‍රසාද බලතල වෙන තැනකට දෙන්න එපා. අද අපි විපක්ෂයට ඇවිත් තිබෙනවා. මේ බලතල කොමිසමකට නැත්නම් වෙන තැනකට දුන්නා නම් ඒවා වෙනස් කරන්න බැහැ; නිලධාරියෙකුට දුන්නා නම් වෙනස් කරන්න බැහැ. අපි වැරදි ක්‍රියා මාර්ගයක් ගත්තා නම් පාර්ලිමේන්තුව වෙනස් කරන්න මහජනතාවට අයිතිය තිබෙනවා. අපි වැරදි ක්‍රියා මාර්ගයක් ගත්තාය කියා අපව විපක්ෂයට යැව්වාට, ඔබතුමන්ලා යහ පාලනයක් ලබා දී නැහැ. වැරදි පූර්වාදර්ශයක් තමයි ලබා දී තිබෙන්නේ. මේ උත්තරීතර පාර්ලිමේන්තුව තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කඩ කරමින්, ව්‍යවස්ථානුකූලව කටයුතු නොකිරීම තුළ තමන්ට ඕනෑ විධියට නැත්නම් යම් බලපෑමක් උඩ මේ අග්‍ර විනිශ්චයකාර ධුරයට වෙනත් කෙනකු පත් කිරීම තුළින් වැරදි පූර්වාදර්ශයක් ලබා දී තිබෙන්නේ.

මොහාන් පීරිස් ද වෙන කෙනෙක් ද කියා අපි කියන්නේ නැහැ. විදේශ කටයුතු නියෝජ්‍ය ඇමතිතුමා කිව්ව ආකාරයට, එතුමාගේ පත් වීමේ මොනවා හෝ ප්‍රශ්නයක් තිබෙන්නට පුළුවන් කියා ඔබතුමන්ලාට කියන්න පුළුවන්. නමුත් කතෝලිකයෙකු හැටියට පාප් වහන්සේව බැහැ දකින්නට එතුමාට අයිතියක් තිබෙනවා. විදේශ කටයුතු නියෝජ්‍ය ඇමතිතුමා ඒකත් බැහැ කිව්වා. ඒක වැරදියි. මොකද, තමන්ගේ ආගමික නායකයෙකු එනකොට එතැනට එන්නට එතුමාට අයිතියක් තිබෙන්නට ඕනෑ. යහ පාලනයක් ගැන කියනකොට අපි බොහොම පරිස්සම් වෙන්නට ඕනෑ. ඔබතුමන්ලා නිවැරදි ආකාරයට කටයුතු කරන්නට ඕනෑ. දැන් මහ බැංකු අධිපතිතුමා පත් කර තිබෙනවා. විදේශගතව සිටින මාධ්‍යවේදීන්ට එන්නට කියා ආණ්ඩුව යහ පාලනයක් ගැන කථා කරනවා. දැන් පෙරටුගාමී පක්ෂයේ නායකතුමා ඇවිත් තිබෙනවා. නමුත් එතුමාට පුරවැසිකම ලබා දෙන්නට ගණන් ගන්නේ නැහැ; කථාවක් කරන්නේ නැහැ. හැබැයි, ජනතා විමුක්ති පෙරමුණ මොකක්ද කියන්නේ? ජනතා

විමුක්ති පෙරමුණ යෝජනාවක් ගෙනාවා. මොකක්ද? රටවල් දෙකක පුරවැසිකම තිබෙනවා නම්, මේ රටේ ඡන්දය ඉල්ලන්න බැහැ කියනවා. ඇයි, ඒ ගොල්ලන්ගේ දේශපාලන න්‍යාය පත්‍රය අනුව පෙරටුගාමී පක්ෂයේ නායකයාට නායකත්වය ගියොත් ඒ ගොල්ලන්ගේ පක්ෂයට විරුද්ධව නායකයෙක් බිහි වේය කියායි. මෙන්න මේ වාගේ කෙටි න්‍යාය පත්‍ර තමයි ඒ අයගේ තිබෙන්නේ. ජනතා විමුක්ති පෙරමුණ ලොකුවට අද බලාපොරොත්තු වෙනවා, අපේ අයට මඩ ගහන්න. ඒ අය නාට්‍යයක් තමයි රඟ පාන්නේ. චෝදනා තිබෙනවා නම් ඔප්පු කරන්නය කියා අපි කියනවා. එදා ඔබතුමන්ලා මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාට විරුද්ධව ෆොන්සේකා ගැන කථා කළා. එක්සත් ජාතික පක්ෂයේ හිටපු මහ ලේකම්තුමා පක්ෂය මාරු කළාය කියා අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද එතුමා හිර කූඩුවේ ඉන්නේ. එතුමා අවුරුදු 26ක් එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම්. [බාධා කිරීම්] හැබැයි යහ පාලනය ගැන කථා කරන්නේ.

ෆොන්සේකා ගැන ඉක්මනට නඩු ඇහුවා. තමන්ට හිංසා කළ එක්සත් ජාතික පක්ෂය අත හැරලා, එතුමාගේ ප්‍රතිපත්තිය අනුව එදා මහින්ද රාජපක්ෂ මැතිතුමාට -එක්සත් ජනතා නිදහස් සන්ධානයට- එකතු වුණු එක්සත් ජාතික පක්ෂයේ හිටපු මහ ලේකම්ව මේ ආණ්ඩුව ඇවිත් දින සියය යන්නත් ඉස්සෙල්ලා හිරේ විලංගුවේ දාලා ඉවරයි. මේකද යහ පාලනය? මේකද ඔබතුමන්ලා දෙන ආදර්ශය? එදා ෆොන්සේකා ගැන කථා කළා. විරුද්ධ පක්ෂයට ගිය නිසා, හිටපු ජනාධිපතිතුමාට විරුද්ධව ඡන්දය ඉල්ලූ නිසා ෆොන්සේකාට දඬුවම් දුන්නාය කියා කිව්වා. අවුරුදු 26ක් නැත්නම් ඊට වැඩි කාලයක් එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් කැප වුණු ඒ මහ ලේකම් පක්ෂය මාරු කළා කියා ඉතා ඉක්මනටම චෝදනා දාලා අද පාර්ලිමේන්තුවට එනකොට අත් අඩංගුවට අරගෙන හිරේ විලංගුවේ දාලා තිබෙනවා; රිමාන්ඩ් භාරයට පත් කර තිබෙනවා. මේක න්‍යාය පත්‍රයේ මුලද? දින සියයේ න්‍යාය පත්‍රයේ මුල තිස්ස අත්තනායකද? එහෙම නැත්නම් දින සියයේ මුල මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාද? එහෙම නැත්නම් වෙන ඇමතිවරු ද කියා අප අහනවා. ඔබතුමන්ලාට ඊට වැඩි දෙයක් කරන්නට තිබෙනවා. ඔබතුමන්ලා මේ න්‍යාය පත්‍රයේ මේ දින සියයට කලින් අපේ සහයෝගය අරගෙන විධායක ජනාධිපති ක්‍රමයේ බලතල ලිහිල් කිරීම නැත්නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සංශෝධනයන් ගැන කථා කරන්න. අප ඒකට සහයෝගය දෙන්න සුදානම්. හැබැයි අපේ පාක්ෂිකයන්ට තලන්න එපා. අපේ මන්ත්‍රීවරුන්ගෙන් බොරුවට පළිගන්න එපා.

අපි හදවතට එකඟවයි කටයුතු කරන්නේ. අපට විපක්ෂ නායකයෙක් ඉන්නවා. අපි එතුමා සමඟ කටයුතු කරනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කියන්නේ මේ රටේ ජනතාවගෙන් පනස්හත් ලක්ෂයක් ඡන්දය දුන්නු පක්ෂයක්. අපි ඔවුන් වෙනුවෙන් පෙනී සිටිනවා. ඒ නිසා ඔබතුමන්ලා කියන විධියට නොවෙයි අපි වැඩ කරන්නේ. මේ රටේ ප්‍රගතිශීලී ජනතාව යම්කිසි ප්‍රතිපත්තිමය තීන්දුවක් අරගෙන තිබෙනවා. අපි එතැනදී විරුද්ධ පක්ෂය හැටියට කටයුතු කරනවා. හැබැයි ඔබතුමන්ලා හිතන්න ඕනෑ, ඔබතුමන්ලාට ඉන්නේ බහුතරයක් නැති අගමැතිවරයෙක් කියන එක. ඒකත් අමතක කරන්න එපා. ඒ වාගේම, පාර්ලිමේන්තු මැතිවරණයකට ගිහින් මනාප ඡන්දයෙන් බලයට එන්න ඕනෑය කියන එකත් අපි ඔබතුමන්ලාට මතක් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 7.30]

ගරු සුජීව සේනසිංහ මහතා (අධිකරණ හා කම්කරු සබඳතා නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு சுஜீவ சேனசிங்க - நீதி மற்றும் தொழில் உறவுகள் பிரதி அமைச்சர்)

(The Hon. Sujeewa Senasinghe - Deputy Minister of Justice and Labour Relations)

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. රටේ අනාගතයට විශාල වශයෙන් බලපාන මාතෘකාවක් සම්බන්ධයෙන් තමයි අපි කථා කරන්නේ. මගේ පියා කිසියම් අසනීප තත්ත්වයකින් සිටින මේ අවස්ථාවේ හොඳ මානසික තත්ත්වයකින් නොවෙයි මම ඉන්නේ. හැබැයි, පක්ෂයේ වගකීමත්, රටේ වගකීමත් ඉටු කරන්න මා පොරොන්දු වුණු ආකාරයට මගේ කථාව කරන්නම් කියා මා හිතුවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ හිටපු සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමා තිස්ස අත්තනායක මන්ත්‍රීතුමා සම්බන්ධයෙන් කිව්වා. එතුමා පක්ෂ මාරු කිරීම සම්බන්ධයෙන් තවම තීන්දුවක් අරගෙන නැහැ. එතුමා කියනවා, එතුමා තවම ඉන්නේ අපේ පක්ෂයේ කියලා. හිටපු ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, එතුමා සම්බන්ධයෙන් කථා කරනකොට, කුඨ ලේඛන සම්බන්ධ නීතිය ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳව අපට මේ අවස්ථාවේදී කථා කරන්න අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. නීතිය ක්‍රියාත්මක වේවි. එතුමාට විරුද්ධව චෝදනාවක් තිබෙනවා නම් ඒ චෝදනාව ඉදිරිපත් කරයි. විජයදාස රාජපක්ෂ මැතිතුමාත්, මාත් අධිකරණය භාර අමාත්‍යවරුන් වශයෙන් ඔබතුමන්ලාට පොරොන්දු වෙනවා, තරාතිරම නොබලා, පක්ෂ, පාට බේදයෙන් තොරව නීතිය අකුරටම ක්‍රියාත්මක කරමින් අපි අපේ වගකීම ඉටු කරන බවට. එහිදී විශේෂයෙන්ම හිටපු මන්ත්‍රීවරයෙක් හෝ හිටපු ඇමතිවරයෙක් හෝ තනතුර හෝ පාට හෝ බලපාන්නේ නැහැ. ඔබතුමන්ලා -අපි දන්නා විධියට රටේ සියලුම පුරවැසියන්ට එකසේ නීතිය ක්‍රියාත්මක කරනවා.

විශේෂයෙන්ම පක්ෂ, පාට බේදයෙන් තොරව අපි අද මේ ප්‍රශ්නය දෙස බලමු. මේ ක්‍රියාවලියේදී සිද්ධ වුණේ මොකක්ද කියලා අධිකරණයේ ස්වාධීනත්වය, පාර්ලිමේන්තුවේ උත්තරීතර බලය ආදී මේ සියලු දේ සම්බන්ධයෙන් අපි විග්‍රහ කර බලන්න ඕනෑ.

රවුෆ් හකීම් ඇමතිතුමාගේ කථාවේදී එතුමා කිව්වා, "ශිරානි බණ්ඩාරනායක මැතිනිය සහ ජනාධිපතිතුමා අතර තිබුණු විරසකය සමාදාන කරන්න එතුමන්ලා විශාල වශයෙන් වෙහෙසුණා" කියලා. ශිරානි බණ්ඩාරනායක මැතිනිය සම්බන්ධයෙන් අපි ප්‍රශ්න කළා. එතුමියගේ පත්වීම සම්බන්ධයෙන් මේ රටේ ප්‍රශ්න තිබුණා. නීත්‍යානුකූලව එතුමියගේ පත්වීම සිදු කළත්, ඒ පත් කිරීම හරිද වැරදිද යන කාරණය සම්බන්ධයෙන් සදාචාරාත්මක වශයෙන් විග්‍රහ කර බලන්න අපි ඒ අවස්ථාවේදී අදහස් ඉදිරිපත් කළා.

මගේ සහෝදරයාගේ භාර්යාවගේ පියා තමයි, Justice Ranjith Dheeraratne. ඒ අවස්ථාවේදී එතුමා මොකක්ද ප්‍රකාශ කළේ? ශිරානි බණ්ඩාරනායක මැතිනිය පත් කරන අවස්ථාවේදී එතුමා විරුද්ධ වුණා, ඒ පත් කිරීම අපේ අධිකරණ පද්ධතියට අනුකූලව සදාචාරාත්මක නැහැ කියලා. හැබැයි, එතුමිය පත් කළාට පස්සේ එතුමා කිව්වා, එතුමිය දැන් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරියක්. ඒ නිසා එතුමියට අවශ්‍ය ගෞරවයත්, ඒ අවස්ථාවත් අපි ලබා දෙනවා කියලා. එතුමියගේ මුල් පත්වීම සම්බන්ධයෙන් අපට ප්‍රශ්න තිබුණත් ජ්‍යෙෂ්ඨත්වය අනුව එතුමියට ඒ තනතුර ලැබුණා. එතුමියට ඒ තනතුර ලැබුණාට පස්සේ ඔබතුමන්ලා එතුමිය ඒ ධුරයෙන් ඉවත් කරන්න කටයුතු කළා. එතුමිය ඒ ධුරයෙන් ඉවත් කරන්න කටයුතු කිරීම සම්බන්ධයෙන් වූ ස්ථාවර නියෝග කෙරෙහි අපි ඔබතුමන්ලාගේ අවධානය යොමු කරනවා. ස්ථාවර නියෝග සම්බන්ධයෙන් ඩිව් ගුණසේකර හිටපු ඇමතිතුමා අදහස් ප්‍රකාශ කළා. අපි ඒක පිළිගන්නවා. මේ ස්ථාවර නියෝග පටිපාටිය හරියට සකස් කරලා නැහැ; එච්චරම පැහැදිලි නැහැ. හැබැයි, අඩුම ගණනේ මේ තිබෙන ස්ථාවර නියෝග අපි පිළිපදින්න ඕනෑ නේ. ගරු ඇමතිතුමනි, ස්ථාවර නියෝග 78අ. (2)හි මේ විධියට සඳහන් කර තිබෙනවා:

"(2) මෙම නියෝගයේ (1) වන ඡේදයෙ හි සඳහන් කරනු ලැබූ යෝජනා සම්මතයක් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරනු ලැබූ කල් හි කථානායකවරයා එම යෝජනා සම්මතයේ දක්වා ඇති විෂම පැවැත්ම හෝ අබලතාව පිළිබඳ චෝදනා විභාගකොට පාර්ලිමේන්තුවට වාර්තා

[ගරු සුජීව සේනසිංහ මහතා]

කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් හත් දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවකින් සමන්විත පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුත්තේ ය."

ඒක තමයි පළමුවැනි පියවර, ගරු ඇමතිතුමනි. මේ පළමු පියවර ක්‍රියාත්මක වුණා. කථානායකතුමා හෝ පාර්ලිමේන්තුවේ ලේකම්වරයා නීති විශාරදයන් නොවෙයි. එතුමන්ලාට ඉදිරිපත් කරන කරුණු අනුව, එතුමන්ලාට දෙන උපදෙස් අනුව එතුමන්ලා තීන්දු දෙනවා. ඒ ආකාරයෙන් මේ කාර්ය පටිපාටිය සිදු වුණා. ඒ කාර්ය පටිපාටිය සිදු වුණේ නොවැම්බර් මාසයේ 06 වැනි දා. මම ඒ කෙරෙහි ඔබතුමන්ලාගේ අවධානය යොමු කරනවා. 2012.11.06 වැනි දින න්‍යාය පත්‍රයේ 20වැනි යෝජනාවේ අවසාන ඡේදය මම ඉදිරිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එහි මෙසේ සඳහන් වෙනවා:

"එබැවින් ඉහත සඳහන් විෂමාචාර චෝදනා හේතුවෙන් එම විෂමාචාර චෝදනා පිළිබඳ පරීක්ෂා කර එම චෝදනා එකක් හෝ වැඩි ගණනක් ඔප්පු වී ඇතැයි විශේෂ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබුවහොත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍ර විනිශ්චයකාර පදවියෙන්, ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මිය ඉවත් කිරීම සඳහා යෝජනාවක් අතිගරු ජනාධිපතිතුමාට ඉදිරිපත් කළ හැකි වන පරිදි පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි ඉහත නම් සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අපි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 (3) ව්‍යවස්ථාව සමඟ කියැවෙන 107(2) ව්‍යවස්ථාවේ විධිවිධාන සහ 78අ. දරන පාර්ලිමේන්තු ස්ථාවර නියෝග ද ප්‍රකාරව ප්‍රකාශ කර සිටිමු."

මේ යෝජනාව ඉදිරිපත් කළා. ඒ අනුව විශේෂ කාරක සභාවක් මේ පාර්ලිමේන්තුවේ කථානායකතුමාගේ උපදෙස් පරිදි පත් කළා.

දෙවැනි කාර්ය පටිපාටිය තමයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හිටපු අධිකරණ ඇමතිතුමනි, මේ 78අ. (7) ස්ථාවර නියෝගය. 78අ.(7) ස්ථාවර නියෝගයේ කියන්නේ මොකක්ද? 78 (7) කියනවා, " ඔප්පු වී ඇති විෂම පැවැත්මක්" කියලා. ඒ කාරක සභාව ඔප්පු කරන්න ඕනෑ විෂම පැවැත්මක් තිබුණාය කියලා. එතකොට තමයි ඊළඟ වගන්තිය අදාළ වන්නේ. ඒ වගන්තිය නැතිව දෝෂාභියෝගය හෝ අග විනිසුරු ඉවත් කිරීමේ ක්‍රියා පටිපාටිය සම්පූර්ණ වන්නේ නැහැ. ඒ ස්ථාවර නියෝගයේ සඳහන් වන්නේ මොනවා ගැනද? ඔප්පු වී ඇති විෂම පැවැත්මක් ගැන. විෂම පැවැත්මක් ඔප්පු වෙලා තියෙන්න ඕනෑ. ඒ පරීක්ෂණයෙන් පස්සේ ඔප්පු වෙන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් තීන්දුවක් දෙන්නත් ඕනෑ. 78අ.(7) ස්ථාවර නියෝගයේ මෙහෙම සඳහන් වෙනවා;

" ඔප්පු වී ඇති විෂම පැවැත්මක් හෝ අබලතාවක් හෝ හේතුකොටගෙන විනිශ්චයකාරවරයකු ධුරයෙන් ඉවත් කිරීම සඳහා ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලබන යෝජනාවක් සඳහා වූ යෝජනා සම්මතයක්...."

ඒ කියන්නේ, වැරදිකරු බවට පත් කරලා ඊට පස්සේ නැවත අලුතින් යෝජනා සම්මතයක් සකස් කරන්න ඕනෑ, වැරදිකරු බවට පත් කළාය කියලා. නමුත් ඔබතුමන්ලා කළේ මොකක්ද? ඒ ස්ථාවර නියෝගයේ තවදුරටත් මෙසේ සඳහන් වෙනවා:

"...යෝජනා සම්මතයක් පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ කල්හි, කථානායකවරයා පාර්ලිමේන්තුව වෙනුවෙන් එකී යෝජනාව ජනාධිපතිවරයාට ඉදිරිපත් කළ යුත්තේ ය."

දැන් මේ වගන්තිය ඇතුළත් යෝජනාව දෙවැනි වතාවටත් එනවා. ඒ වගන්තිය මොකක්ද? මම හිතන විධියට මේ සඳහා නීති උපදෙස් දෙන්න ඇත්තේ වර්තමාන විපක්ෂ නායකවරයා වෙන්න ඇති. එතුමා හිතා මතාම ඒක කළාද දන්නේත් නැහැ. මොකද, ඒ දවස්වල රාජපක්ෂවරුන්ට ගොඩක් විරුද්ධව තමයි එතුමා කටයුතු කළේ. මොකද, මේ රටට අත්වන ඉරණම ගැන එතුමාට විශාල ශෝකයක්, දුකක් තිබුණා. ඒ නිසා එතුමා හිතා මතාම මේ වැඩේ කළාද කියලා මට හිතෙනවා. එතුමා නීතිය සම්බන්ධයෙන් හොඳ අවබෝධයක් තිබෙන හිටපු ඇමතිවරයෙක්. එතුමා මොකක්ද කරන්නේ? මේ විධියට දෙවැනි යෝජනාව හදනවා. මොකක්ද දෙවැනි යෝජනාව? අර පළමු යෝජනාවම කොපි කරලා ආපසු ගහනවා. කලින් ගෙනාපු යෝජනාවම.

මෙන්න දෙවැනි යෝජනාව. 2013 ජනවාරි 11 වැනි දින න්‍යාය පත්‍රයේ ඇතුළත් එම යෝජනාවේ අවසාන ඡේදයේ මෙහෙම තිබෙනවා:

"ඉහත සඳහන් විෂමාචාර චෝදනා හේතුවෙන් එම විෂමාචාර චෝදනා පිළිබඳ පරීක්ෂා කර එම චෝදනා එකක් හෝ වැඩි ගණනක්"

පළමු යෝජනාවම දෙවැනි යෝජනාව හැටියටත් ගෙනෙනවා. අකුරක්වත් වෙනස් නැහැ. අකුරක්වත් වැරදි නැහැ. අර 78අ. (2) ස්ථාවර නියෝගයට අදාළ යෝජනාව ආපසු ගෙනෙනවා. 78අ. (7)වැනි ස්ථාවර නියෝගයට අනුව ගෙනෙන්න ඕනෑ යෝජනාව මෙතැන නැහැ. මොකක්ද ඒ යෝජනාවේත් සඳහන් කරන්නේ?

"ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මිය ඉවත් කිරීම සඳහා යෝජනාවක් අතිගරු ජනාධිපතිතුමාට ඉදිරිපත් කළ හැකි වන පරිදි පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි ඉහත නම් සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අපි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 (3) ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 107(2) ව්‍යවස්ථාවේ විධිවිධාන සහ 78අ. දරන පාර්ලිමේන්තු ස්ථාවර නියෝග ප්‍රකාරව යෝජනා කර සිටිමු."

මේ වැඩේ වැරදි නේ. මේ යෝජනා දෙකම එකයි නේ. මේ 78අ. (2) ස්ථාවර නියෝගයට අනුව ගෙනෙන යෝජනාවත් ඒකමයි. 78අ. (7) ස්ථාවර නියෝගයට අනුව එනම්, වැරදි කරුවකු බවට පත් කරලා ගෙනෙන්න ඕනෑ යෝජනාවත් ඒකමයි.

ඔබතුමන්ලා නීතිඥවරු. අපිත් නීතිඥවරු. ගරු කථානායකතුමා නීතිඥවරයෙක් නොවෙයි. මේ ලේකම්තුමා නීතිඥවරයෙක් නොවෙයි. මෙතුමන්ලාට ලැබෙන උපදෙස් පරිදි කථානායකතුමාට හදිසියේ උපදෙස් ලබා දුන්නා. කථානායකතුමා ඒ උපදෙස් අනුව කටයුතු කළා. මම හිතන විධියට කථානායකතුමා විශාල පීඩනයකට ලක් වෙලායි හිටියේ. මේක මේ රටේ ජනාධිපතිතුමා ගත්ත තීන්දුවක්. ඊට අදාළ මේ රටේ බලවත් ඇමතිවරු ගත්ත තීන්දුවක්. ඒ අනුව කථානායකතුමා ඒ තීන්දුව ලබා දුන්නා.

මේ කාර්ය පටිපාටිය සිදු වී තිබෙන ආකාරය අපි සලකා බැලුවොත්,- [බාධා කිරීමක්] ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා පක්ෂය මාරු කරලා මේ පැත්තට ආවාද දන්නේ නැහැ. කෙසේ වෙතත් එතුමා එහෙම තීන්දුවක් ගත්තා නම් අපි ආඩම්බර වෙනවා. ඒක හොඳ අවස්ථාවක්.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ලේකම් මණ්ඩලයේ ඉන්නේ නීතිඥවරු.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

නැහැ. මෙතුමා - නියෝජ්‍ය මහ ලේකම්තුමා- නීතිඥවරයෙක්. මෙතුමා විතරයි නීතිඥවරයා. අනෙක් කට්ටිය නීතිඥවරු නොවෙයි. [බාධා කිරීමක්] නැහැ. නැහැ. මෙතුමා නීතිඥවරයා. එහෙම නම් ඔබතුමා දන්නේ නැහැ. [බාධා කිරීමක්] හරි. ගරු මන්ත්‍රීතුමනි, නීතිඥවරු මේ සම්බන්ධයෙන් තීන්දුවක් ගත්තා නම් මීට වඩා සැලකිලිමත්ව මේ තීන්දුව ගන්න තිබුණා. ඒ වෙලාවේ ගරු කථානායකතුමාට උපදෙස් දුන්න ඒ නීතිඥවරු ඉන්නවා නම්, හිටපු සභානායකතුමා ඉන්නවා නම් ඒ ගැන පැහැදිලි කිරීමක් කරන්න කියලා මම කියනවා. මේ වැඩේ වැරදියි. මේ 78අ. (7) ස්ථාවර නියෝගයට අනුව, වැරදිකරු කරලා යෝජනා සම්මතයක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් වුණේ නැහැ. ඒ කාරණය තමයි අපි ඒ අවස්ථාවේ සඳහන් කළේ.

ඒ සාධකය ගණන් ගත්තේ නැහැ, ඒ සාධකයට ඇහුම්කන් දුන්නේ නැහැ. දැන් මොකක්ද ඔබතුමන්ලා කියන්නේ? අග විනිසුරුතුමා අයින් කරන්න පුළුවන් මේ පාර්ලිමේන්තුවට පමණයි කියන කථාව හරි. මේ කාර්ය පටිපාටියේ, ස්ථාවර නියෝග අනුව එතුමා හෝ එතුමිය අයින් කරන්න පුළුවන් පාර්ලිමේන්තුවට පමණයි. ස්ථාවර නියෝග නැතිව, අග විනිසුරුතුමියගේ මුහුණ කැතයි නම්, අග විනිසුරුතුමාගේ suit එක හරි නැත්නම්, තමන්ට ඕනෑ විධියට ඒ තනතුරින් ඉවත් කිරීමේ අයිතියක් මේ පාර්ලිමේන්තුවට නැහැ. පාර්ලිමේන්තුවේ ඒ බලතල ඔබතුමන්ලාට සහ අපට ලැබෙන්නේ මේ ස්ථාවර නියෝග සහ රටේ නීතිය අනුවයි. අපිට ඕනෑ විධියට ඉගෙනීමක් නැති, උගත්කමක් නැති අයිආර්සීකාරයෝ, කුඩුකාරයෝ, එතනෝල්කාරයෝ, මං කොල්ලකාරයෝ, මිනීමරුවෝ, මේ පාර්ලිමේන්තුවට පත් කරලා ඉන්නවා නම්, ඒ පුද්ගලයින්ට ඕනෑ විධියට මේ පාර්ලිමේන්තුවේ තීන්දු ගන්න ඉඩදෙන්න බැහැ. ගරු ඩිව් ගුණසේකර මන්ත්‍රීතුමනි, මේ රටේ නීතියට සහ ස්ථාවර නියෝගවලට අනුවයි ඒ තීන්දු ගන්න ඕනෑ. මොකක්ද සිද්ධ වුණේ? ඒ ස්ථාවර නියෝග අනුව ක්‍රියා කළේ නැහැ. එහෙම කටයුතු කළේ නැති නම් අපිට පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය රකින්න පුළුවන්ද? අපිට ඕනෑ විධියට අග විනිසුරුතුමා අයින් කරන්න පුළුවන්ද? කරන්න බැහැ. මෙන්න මේ කාර්ය භාරය ඔබතුමන්ලාගෙන් සිදු වුණේ නැහැ. ඒ නිසා තමයි ගරු ඩිව් ගුණසේකර මන්ත්‍රීතුමනි, ඒ කාරණාව අපිට ඉටු කරන්න සිද්ධ වුණේ. කවුද, මේ තීන්දුව ගත්තේ? මේ තීන්දුව ගත්තේ දේශපාලනය සම්බන්ධයෙන් හොඳ දැනීමක් තිබෙන පුද්ගලයෙක්; මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා. එතුමා ක්‍රෝධයෙන්, වෛරයෙන් ඒ තීන්දුව ගත්තේ නැහැ. එතුමා ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙනකොට හොඳට හිතලා බලලා අවුරුදු 46ක් සිටිය තමන්ගේ පක්ෂය යම්කිසි මොහොතකට අමතක කරලා මේ රටේ අනාගතය වෙනුවෙන් ඒ තීන්දුව ගත්තා. තමන්ගේ අනාගතය වෙනුවෙන්, යහ පාලනය වෙනුවෙන් එතුමා ඒ තීන්දුව ගත්තා.

එතුමා තීන්දුව ගත්තා පමණක් නොවෙයි, එතුමා ජනාධිපතිතුමා වශයෙන් ඔබතුමන්ලාගේ පක්ෂයේ සභාපතිතුමා. ඒ සභාපතිතුමා නීති විශාරදයින් දුන්නු උපදෙස් පරිදි එතුමාගේ ඥානය, එතුමාගේ උගත්කම, එතුමාගේ තියුණු බුද්ධිය, එතුමාගේ පරිණතභාවය පාවිච්චි කරලායි මේ තීන්දුව ගත්තේ. එතුමා ඔහේ ගන්නන් වාලේ තීන්දු ගන්න පුද්ගලයෙක් නොවෙයි. එතුමා ඔබතුමන්ලාගේ නායකයා. මම එතුමා සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුවේ සෑම වේලාවකම කථා කරලා තිබෙනවා. මම අද වන තුරු එතුමාට දොසක් කියලා නැහැ. මොකද, එතුමා නිහතමානීව දේශපාලනය කරපු නායකයෙක්. ඒ වාගේම රනිල් වික්‍රමසිංහ මැතිතුමා නීතිය සම්බන්ධයෙන් හොඳ අවබෝධයක් තිබෙන නායකයෙක්. එතුමන්ලා දෙදෙනාම මේ තීන්දුව ගන්න මැළි වුණා. මොකද? මේ ගත්ත තීන්දුව නීතියට අනුව නිවැරැදියි. හැබැයි රටේ ජනතාව එතුමන්ලාගෙන් බලාපොරොත්තු වුණා, මෘදු භාවයෙන් යුතුව කටයුතු කිරීමක්; නීතිය පමණක් ක්‍රියාත්මක කරන්න නොවෙයි, ඒ පුද්ගලයින්ගේ ගෞරවය ආරක්ෂා වන පරිදි නීතිය ක්‍රියාත්මක කිරීමක්. හොරෙක් වෙන්න පුළුවන්, යම්කිසි ආකාරයක විනය පිළිපදින්නේ නැති ක්‍රියා මාර්ග අනුගමනය කරලා තිබෙන්න පුළුවන්, මේ නීතිය ක්‍රියාත්මක කරන්න කියලා අපි මේ නායකයන් දෙන්නාට බල කරද්දී එතුමන්ලා දෙදෙනා කිව්වා, "නැහැ. එතුමාට ඉල්ලා අස්වෙන්න අවස්ථාවක් ලබා දෙන්න" කියලා. ඒ අවස්ථාව එතුමාට ලබා දුන්නා. මොකක්ද, මොහාන් පීරිස් මැතිතුමා ගැන අපට කියන්න තිබෙන්නේ? ගරු ඩිව් ගුණසේකර මන්ත්‍රීතුමනි, ඇත්තටම අපිට ලජ්ජයි. ඩිලාන් පෙරේරා මහත්මයාගේ තාත්තා මාර්ෂල් පෙරේරා මහත්මයා, මගේ තාත්තා නීතියේ සම්ප්‍රදායයන් අපට ඉගැන්වූවා. ඩිව් ගුණසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමා නීතිය සම්බන්ධයෙන් කොච්චර ගරු කරනවාද කියලා මම දන්නවා. විජයදාස රාජපක්ෂ මහත්මයා, අපි ඉගෙන ගත්තේ රොමේෂ් ද සිල්වා මහත්මයා, ඉක්‍රාම් මොහොමඩ් මහත්මයා, පරතලිංගම් මහත්මයා, කනගේෂ්වරම් මහත්මයා, මාර්ක් ෆර්නැන්ඩු මහත්මයා, විග්නේෂ්වරන් මහත්මයා, ඒ.ආර්.බී. අමරසිංහ මහත්මයා වැනි අයගෙන්. එතුමන්ලා අපට නීතියේ සදාචාරය ඉගැන්නුවා. මොකක්ද, ඉගැන්නුවේ? නඩුවක් සම්බන්ධයෙන් කෙනෙක් අපි ළඟට ආවාම, නීතිඥවරයෙක් වශයෙන් සල්ලි කීයක් ලැබෙනවාද කියලා බලන්නේ නැහැ, යාළුකමක් තිබෙනවා නම්, හිතවත්කමක් තිබෙනවා නම් අපි කියනවා, "මේ නඩුව භාරගන්න බැහැ" කියලා. ගරු නවින් දිසානායක මහත්මයාලා, ගාමිණී දිසානායක මහත්මයාලාගෙන් අපි ඒ අත් දැකීම් ලැබුවා. හැබැයි මොහාන් පීරිස් මහත්මයා කළේ මොකක්ද? මොහාන් පීරිස් මහත්මයා කියන්නේ, සරත් එන්. සිල්වා මහත්මයා කියන්නේ නීතිය සම්බන්ධයෙන් කටයුතු කළ පුද්ගලයින් නොවෙයි; දේශපාලනඥයෝ; මේ රටේ අධිකරණය වෙළෙඳාමක් බවට පත් කළ පුද්ගලයෝ. සරත් එන්. සිල්වා මහත්මයා සමඟ මගේ යම් හිතවත්කමක් තිබෙනවා. මම ඇත්ත දේ ඇත්ත සැටියෙන් සනාථ කරන්න ඕනෑ. මේ නීතිය කාබාසිනියා කරලා වල් වැද්දුවේ මේ පුද්ගලයෝ. ඔබතුමන්ලා අපි එකතු වෙලා නීතිය නැවත ක්‍රියාත්මක වන පරිදි මේ රටේ ජනතාවට අගය කරන්න පුළුවන්, ගරු කරන්න පුළුවන් නීති පද්ධතියක් සකස් කරන්න ඕනෑ ගරු ඩිව් ගුණසේකර මන්ත්‍රීතුමනි.

මොකක්ද මෙතුමා කළේ? විශේෂයෙන්ම Softlogic Capital PLC ආයතනය, P.W. Corporate Secretarial (Pvt.) Limited ආයතනවලට අදාළ ලේඛන සම්බන්ධයෙන් මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. P.W. Corporate Secretarial (Pvt.) Limited ආයතනය මොහාන් පීරිස් මහත්තයාගේ නෝනාට හිමිකම් තිබෙන සමාගමක්. විශේෂයෙන්ම Golden Key නඩුව එතුමාගේ අතට ගත්තා. ඒ විතරක් නොවෙයි, එම ආයතනයේ කොටස් මොහාන් පීරිස් මැතිතුමාගේ නෝනාට හිමියි. ඊට අදාළ ලේඛන මම **සභාගත*** කරනවා.

මේ Capital Reach Holdings Limited ආයතනය කියන්නේ Softlogic Capital PLC වෙන්න කලින් ආයතනය. මේ Softlogic Capital (Pvt.) Limited ආයතනයේ කොටස් හිමියන් අතර හිටපු මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මහත්මයාත් සිටින බවට සඳහන් වනවා. මේ සියලු දෙනා අපේ රටේ අධිකරණය ගනුදෙනුවක් බවට පත් කර ගත්තා ගරු ඩිව් ගුණසේකර මන්ත්‍රීතුමනි. මේ Capital Reach Holdings Limited ආයතනය සම්බන්ධ ලේඛනත් මම **සභාගත*** කරනවා.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු සුජීව සේනසිංහ මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම විශේෂයෙන්ම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා, සෙලාන් බැංකුවේ සභාපතිතුමා සම්බන්ධව. එතුමා සෙලාන් බැංකුවේ සභාපති බවට පත් කළේ, කබ්රාල් මහත්මයා. එතකොට නීතිපතිතුමා, ඒ නඩුවේ වගඋත්තරකරුවෙක්. Capital Reach Holdings Limited, Softlogic Capital PLC, P.W. Corporate Secretarial (Pvt.) Limited ආයතන සම්බන්ධයෙන් නඩු කීපයක් අද වෙන කොට තිබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු අංක එස්.සී.එෆ්.ආර්. 225/2014 යටතේ නඩුවක් එතුමාට විරුද්ධව ගොනු කර තිබෙනවා. එතුමා මේ නඩුව හංගා ගෙන ඉන්නවා. එතුමාගේ ක්‍රියා කලාපය සම්බන්ධයෙන් එතුමාට විරුද්ධව තිබෙන නඩු අංක එස්.සී.එෆ්.ආර්.225/2014 දරන නඩුව තවම විමසීමට අරගෙන නැහැ. මාසයක් යන කොට නඩුව ගන්න ඕනෑ. නමුත් ගන්නේ නැහැ. මේ පුද්ගලයා අධිකරණය හැල්ලුවට ලක් කළේ මෙහෙමයි. මම ඔබතුමාට උදාහරණයක් දෙන්නම්.

මම කොම්පඤ්ඤ වීදියේ නඩුව කළා. මම මගේ පෞද්ගලික අත් දැකීම ඔබතුමන්ලාට මේ අවස්ථාවේදී පවසන්නම්. කොම්පඤ්ඤ වීදියේ නඩුව කරද්දී සින්නක්කර ඔප්පු තිබෙන ඒ ජනතාව පැන්නීමට විශේෂයෙන්ම ඔබතුමන්ලාගේ හිටපු ආණ්ඩුව කටයුතු කළා. මම අධිකරණයට යද්දී මට පණිවුඩයක් එව්වා, "මේකට රාජපක්ෂලා සම්බන්ධයි, අත තබන්න එපා" කියලා. මම කිව්වා, "මේකට සේනසිංහලා සම්බන්ධයි කියලා පණිවුඩය ගිහින් කියන්න" කියලා. මම ගිහිල්ලා නඩුව භාර ගත්තා. නීතිඥවරු කවුරුවත් නඩුව භාර ගත්තේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ අවස්ථාවේදී මම උසාවියේ තහනම් නියෝගයක් ගත්තා. හැබැයි, මොහාන් පීරිස් මැතිතුමා පත් වුණාට පසුව ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාත් සමඟ එතුමාට කොම්පැනි ගණනකම සම්බන්ධයක් තිබුණා. එතුමා ඒ නඩුව ගත්තා. නඩුව ගත්තා පමණක් නොවෙයි, එතුමා ඉදිරියේ දිගින් දිගටම මේ නඩුව අහන්න ඕනෑය කියලා එතුමා නියෝගයක් දුන්නා. එතුමාට කිසිම සම්බන්ධයක් නැහැ. විශේෂයෙන්ම Greece Bonds සම්බන්ධයෙන් මම දැම්ම නඩුවේදී මම එතුමාට කිව්වා, "Greece Bonds සම්බන්ධ නඩුව අහන්න ඔබතුමාට අයිතියක් නැහැ, ඔබතුමා මහ බැංකුවේ හිටපු උපදේශකයෙක්" කියලා. මොකද, එතුමා මහ බැංකුව සම්බන්ධයෙන් හිටපු adviser කෙනෙක්. ඒ අවස්ථාවේදී එතුමා කිව්වේ මොකක්ද? නුරුස්නා ස්වභාවයෙන් මට යම් තර්ජනයක් කරලා, එතුමා ඒ අවස්ථාවේදී නඩුවෙන් ඉවත් වුණා. ඉවත් නොවී ඉන්න බැරි වුණා. මොකද, උපුල් ජයසූරිය මහත්මයා නඩුව කළේ. මම හිටියේ පැමිණිලිකරු - පෙත්සම්කරු - විධියට. උපුල් ජයසූරිය මහත්මයා කිව්වා, "මගේ සේවාදායකයා ඔබතුමාගේ සම්බන්ධය පිළිබඳව ප්‍රශ්න කරනවා" කියලා. එහිදී "මේකේ තිබෙන තේරුම මොකක්ද? මට එහෙම නම් නඩු අහන්න වෙන්නේ නැහැ" කියලා එතුමා එම නඩුවෙන් ඉවත් වුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි, කොම්පඤ්ඤ වීදියේ නඩුව හේතුවෙන් මට විරුද්ධව ටාටා ආයතනය කටයුතු කළා. ටාටා ආයතනය සම්බන්ධයෙන් අපි දැන් පරීක්ෂණයක් පවත්වනවා. ටාටා ආයතනය ලංකාවට ශත පහක් ගෙනැත් නැහැ. දුන්නු පොරොන්දු ඔක්කෝම බොරු. ගනුදෙනුකරුවන් අතරේ සිදු වුණු ඩොලර් මිලියන 40ක් විතර මුදලක් නිලධාරින් පිරිස අතරේ බෙදා ගන්නයි ටාටා ආයතනය කටයුතු කළේ. මොකක්ද කළේ? ඒවා ගැන කිසිම වගබැලීමකින් තොරව ටාටා ආයතනය තමන්ගේ අතට නඩුව අරගෙන එම පිරිස ඉවත් කරනවා කියලා බලෙන් මට විරුද්ධව තීන්දුව දෙන්න පටන් ගත්තා. මම මගේ විරෝධය ප්‍රකාශ කරලා උසාවියෙන් පිටත් වුණා. ඊට පසුව මට කිව්වා, "මගේ කෝට් එක ගලවන්න, මාව නීති වෘත්තියෙන් ඉවත් කරන්න ඕනෑ. එසේ කටයුතු කිරීමට එතුමාට අයිතිය තිබෙනවා" කියලා. මම කිව්වා, "පුළුවන් නම් කරන්න" කියලා. මොකද, අපි ඒ අවස්ථාවේදී විශේෂයෙන්ම රටේ

නීතිය සම්බන්ධයෙන්, රටේ අනාගතය සම්බන්ධයෙන් තීන්දුවක් ගත්තා. ඉවත් වුණත් කමක් නැහැ; මැරුවත් කමක් නැහැ අපි මේ රටේ යහ පාලනය, නීතිය, සදාචාරය, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ඇති කරනවා කියලා ගත් තීන්දුවෙන් තමයි, අද අපි ඔබතුමන්ලා සියලු දෙනාටම බලාපොරොත්තුවක් තබා ගන්න පුළුවන් රටක් ඇති කරන්න පුළුවන් පසු බිමක් ගොඩනඟා තිබෙන්නේ. පක්ෂ, පාට භේදයකින් තොරව මේ රටේ යහ පාලනය, නීතිය අපි සියලු දෙනාට අයිතියි. එම නිසායි ගරු ඩිව් ගුණසේකර මන්ත්‍රීතුමනි, අපි ඉල්ලා සිටින්නේ මේ රටේ යහ පාලනය, නීතිය, ප්‍රජාතන්ත්‍රවාදය අපි සියලු දෙනා අපේ දරුවන් වෙනුවෙන්, අපේ ඉදිරි අනාගතය වෙනුවෙන් පක්ෂ, පාට භේදයකින් තොරව නැවත ස්ථාපිත කළ යුතුයි කියලා.

මෙය අපට මහඟු අවස්ථාවක්. රටේ නායකයා ජනාධිපතිතුමා. ගරු ඩිව් ගුණසේකර මන්ත්‍රීතුමනි, එතුමා ඔබතුමන්ලාගේ නායකයා; රටේ මූල්‍යමය තීන්දු ගන්නා නායකයා; අපේ නායකයා. ඒ වාගේම ජාතික හෙළ උරුමය, ජනතා විමුක්ති පෙරමුණ, අපි පැරණි ඉතිහාසය අමතක කරමු. මේ රටට ආදරය කරන මන්ත්‍රීවරුන්, යහ පාලනයට ආදරය කරන මන්ත්‍රීවරුන් ඒ වාගේම නීතියට ගරු කරන මන්ත්‍රීවරුන් පත් කර ගනිමු. එතනෝල්කාරයෝ, කුඩුකාරයෝ, මං කොල්ලකාරයෝ, හොරු පාර්ලිමේන්තුවෙන් ඉවත් කරමු. තිබෙන තරහකට නොවෙයි. හැබැයි, රටේ ජනතාව බලාගෙන ඉන්නවා, මේ රටේ උගත් ඒ වාගේම රටට ආදරය කරන, රටේ නීතියට, යහ පාලනයට වාගේම ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරන පිරිසක් මේ පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය කවදා හෝ රකියි කියලා.

මම දැක්කා, දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ඉතාම ක්‍රෝධයෙන් විවේචනය කරනවා. මම හිතන්නේ ඒ අවස්ථාවේ එතුමාට තමයි රාජපක්ෂ මහත්වරුන්ගේ ක්‍රියා කලාපය සම්බන්ධයෙන් විශාල විවේචන තිබුණේ. එතුමන්ලා බලාපොරොත්තු වුණු කාර්ය භාරය අපේ ජීවිත පරදුවට තබා අපි ඉටු කළා. එතුමන්ලා බලා සිටියා. ඒ හින්දා අපි ඉල්ලා සිටිනවා, සියලු දෙනා එකතු වෙමු කියලා. විශේෂයෙන්ම මහජන පක්ෂය, ඔවුන් තමයි, මේ රටේ පීඩිත පන්තිය වෙනුවෙන්, මේ රටේ අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කරපු නායකයෝ. හැබැයි, ඒ නායකයන්ගෙන් කොඳු නාරටියේ පොඩ්ඩක් හරි ඇට ඉතුරු වෙලා තිබුණේ ඩිව් ගුණසේකර මහත්මයාගේ විතරයි. ඒ මහත්මයා රටට බලපාන ඒ වාගේ තීන්දු එන කොට, තදින් ක්‍රියාත්මක වෙලා කෙළින් නැඟී සිටියා. ඒ වාගේම චම්පික රණවක, පූජ්‍ය අතුරලියේ රතන හාමුදුරුවෝ වැනි නායකයන් තමන්ගේ ස්වාධීනත්වය පෙන්නුම් කළා. එම නිසා අපි විශේෂයෙන්ම මහජන පක්ෂවල නායකයන්ගෙන් ඉල්ලා සිටිනවා, ඔබතුමන්ලාගේ කාර්ය භාරය ඉටු කරන්න කියලා.

මේ රටේ පීඩිත පන්තියේ බත වෙනුවෙන් කථා කළේ මහජන පක්ෂයේ ඔබතුමන්ලා. ඒ දවස්වල මේ රටේ ජේ.ආර්. ජයවර්ධන, බණ්ඩාරනායක වැනි මහත්වරුන් එක්ක සටන් කරපු නායකයන් තමයි මහජන පක්ෂයේ නායකවරුන්. හැබැයි, රාජපක්ෂ මහත්වරු මේ අවුරුදු ගණන තුළ කරපු සියලු විෂමාචාරවලට එතුමන්ලාගේ සහයෝගය ලබා දුන්නා. එතුමන්ලා රටේ ජනතාවගේ අයිතිවාසිකම් රැක්කේ නැහැ; තමන්ගේ ඇමතිකම් රැක්කා. ඒ නිසා අපි ඉල්ලා සිටිනවා, මේ අවස්ථාවේදී පක්ෂ, පාට භේදයකින් තොරව කටයුතු කරමුයි කියලා. අපි පක්ෂයක් වශයෙන් මේ ගන්නා තීන්දු අපට දේශපාලන වශයෙන් අවාසියි. නීතිය ක්‍රියාත්මක කරමු. පොලීසියට අත ගහන්නේ නැතිව සිටිමු. විශේෂයෙන්ම අධිකරණ අමාත්‍ය ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමාත්, මමත් නීතිය අකුරටම ක්‍රියාත්මක කරනවා. එතුමායි, මමයි මේ රටේ සමස්ත ජනතාවගේ අනාගතය වෙනුවෙන් ඒ අපට දුන්නු වගකීම අකුරට ඉටු කරනවා. ඒ නිසා පක්ෂ, පාට, භේද අමතක කරන්න. රටේ යහ පාලනය වෙනුවෙන් දින 100 වැඩ පිළිවෙළට ඇතුළත් වෙන්නේ එක්සත් ජාතික පක්ෂය ශක්තිමත් කරන වැඩ පිළිවෙළක් නොවෙයි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Sujeewa Senasinghe, please wind up now.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Please give me half a minute, Sir.

මේ දින 100 වැඩ පිළිවෙළට ඇතුළත් වෙන්නේ, ඔබ සියලු දෙනාම එකතු වෙලා ජරාජීර්ණ කරපු රට නැවත ගොඩ ගැනීමේ කාර්ය භාරයයි. ඒ කටයුත්ත අපට කරන්න වෙලා තිබෙනවා. ඒ සඳහා ඔබතුමන්ලා අපට එකතු වෙන්න. අපට සහයෝගය ලබා දෙන්න. අපේ දේශපාලන ගමන ස්ථිර කර ගන්න හෝ තර කර ගන්න අපි මේක පාවිච්චි කරන්නේ නැහැ. අපි නීතිය ක්‍රියාත්මක කරමු. මේ රටේ ජරාජීර්ණ වූ අධිකරණය අපි ස්වාධීන කරමු. මේ රටේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම අපි ස්වාධීන කරමු. මේ රටේ පොලීසිය අපි ස්වාධීන කරමු. මැතිවරණ කොමිසම අපි ස්වාධීන කරමු. රාජ්‍ය සේවා කොමිසම අපි ස්වාධීන කරමු. මේ රටට අපි මේ අත්තිවාරම දැම්මාම, අපට පුළුවන් කර්මාන්ත 5,000ක් කර්මාන්ත 6,000ක් මේ රටට ගෙනැල්ලා රටේ ජනතාව දුප්පත්කමින් මුදා ගන්නා කාර්ය භාරය ඉදිරි අනාගතයේ ඉටු කර ගන්න. ඔබතුමන්ලා මේ ගැන සැලකිලිමත් වන්න. ගෙදර ගිහින් හිතන්න. ඔබතුමන්ලාගේ නායකයා, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත් එක්ක කථා කරන්න. මෙවැනි කඩාකප්පල් සිදුවීම්, ඒ වාගේම යෝජනා ඉදිරිපත් නොකරන්න. රටේ අනාගතය වෙනුවෙන් සුද්ද කරන්න ඕනෑ, අධිකරණය. සුද්ද කරන්න ඕනෑ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම. ඒවා සුද්ද කරද්දී අපි නීතිය අනුව කටයුතු කරන්න බලාපොරොත්තු වනවා. හැබැයි, සමහර වෙලාවට අපෙනුත් අතපසුවීම් සිදු වෙන්න පුළුවන්. ඒ නිසා සියලු දෙනාම එකතු වෙලා රටේ අනාගතය වෙනුවෙන් තමන්ගේ දායකත්වය දෙන්න කියන ඉල්ලීම මා මේ අවස්ථාවේ කරනවා. සියලු දෙනාටම බොහොම ස්තුතියි..

[අ.භා. 7.51]

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා මුලින්ම ගරු සුජීව සේනසිංහ නියෝජ්‍ය ඇමතිතුමාගේ පියාට ඉක්මනින්ම සුවය ලැබේවායි ප්‍රාර්ථනා කරනවා. මගේ පියාත්, එතුමාගේ පියාත් කාලයක් තිස්සේ දන්නා හඳුනන උදවිය. එතුමාට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සුජීව සේනසිංහ නියෝජ්‍ය ඇමතිතුමා මේ විවාදයේ අපි කථා කරන්න ඕනෑ issues පිළිබඳව මතු කළා. ඒ issues මතු කරමින් එතුමා කතාන්දරය වාගේ ඒවා කියා ගෙන ආපු නිසා මටත් පහසුයි. ඒ කතාන්දරය කියා ගෙන ඇවිල්ලා එතුමා අවසානයේ කිව්වේ, හිටපු ගරු අග්‍ර විනිශ්චයකාරතුමිය අයින් කරන්න ගත්ත ඒ ක්‍රියා මාර්ගයේ පළමුවැනි පියවර නිවැරදියි; දෙවැනි පියවර අපි විභාග කළා; ඒ විභාගයෙන් තීන්දුවක් ගත්තා; ඒකත් හරි; හැබැයි, ඒ තීන්දුව අරගෙන අවසානයේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන කොට යෝජනාව, ඒ යෝජනාව තමයි ප්‍රශ්නයක් තිබෙන්නේ කියලා. දැන් මේ ප්‍රශ්නය මේ විධියටම, මට මතක නැහැ ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමාද, ජෝශප් මයිකල් පෙරේරා ඇමතිතුමාද කියලා; ඒ දෙදෙනාගෙන් කෙනෙක් එදා ඒ යෝජනාව ඉදිරිපත් කරන වෙලාවේ විරුද්ධ පක්ෂයේ ඉඳලා නැඟිටලා මතු කළා. මතු කරලා ගරු කථානායකතුමාට කිව්වා, "ගරු කථානායකතුමනි, මේ යෝජනාව තිබෙන්නේ ශිරානි බණ්ඩාරනායක මැතිනිය පිළිබඳව පරීක්ෂණයක් පවත්වන්න කමිටුවක් පත් කරන්න විතරයි. ඒ නිසා මේ යෝජනාව වැරදියි" කියලා. ඒ වෙලාවේ ගරු කථානායකතුමා පාර්ලිමේන්තුව අත් හිටුවලා, මේ පිළිබඳව සලකා බලලා එතුමා පාර්ලිමේන්තුව නැවත රැස් කෙරෙව්වා. පසුව එතුමා තීන්දුවක් දුන්නා. ඒ තීන්දුව දීමේදී එතුමා පැහැදිලිවම එතුමාගේ අවධානය යොමු කළා පසු ගිය සුමානේ ගරු අග්‍රාමාත්‍යතුමා මේ පාර්ලිමේන්තුවේ නිවැරදිව කිව්ව විධියටම ඒ යෝජනාවේ තිබුණු උඩ කොටසට. ඒ යෝජනාවේ උඩ කොටසේ තිබෙන්නේ මෙහෙමයි:

> "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාර ධුරයෙන් ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මිය ඉවත් කිරීම සඳහා අතිගරු ජනාධිපතිවරයා වෙත පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් ඉදිරිපත් කිරීම පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107(2) ව්‍යවස්ථාව ප්‍රකාර යෝජනාව,-"

එසේ කියලා තමයි පටන් ගත්තේ. ඒකේ අවසාන කොටසේ තමයි, ඒ සඳහා විශේෂ කාරක සභාවක් පත් කරන්න ඕනෑ කියලා තිබෙන්නේ. එතකොට ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු කථානායකතුමාටත් මේ පරීක්ෂණය අවසාන වෙලා එතුමිය පරීක්ෂණයේ වැරදිකාරයා කියලා තීන්දු කරන්න යෝජනාව ආවායින් පස්සේ -අපේ කාරක සභාවේ හිටපු සභාපති ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා ඉදිරිපත් කළායින් පස්සේ- විරුද්ධ පක්ෂයෙන් ඒ යෝජනාව පිළිබඳව ප්‍රශ්නය මතු කළාම ගරු කථානායකතුමා ඒ ගැන තීන්දුවක් දුන්නා. මොකක්ද ඒ තීන්දුවේ කියන්නේ?

ගරු කථානායකතුමා ඡන්දය විමසලා අවසානයේ දී මෙහෙම කියනවා:

> "ගරු මන්ත්‍රීවරුනි, අද දින පාර්ලිමේන්තුවේ විෂය අංක 1, එනම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාර ධුරයෙන් ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මිය ඉවත් කිරීම සඳහා අතිගරු ජනාධිපතිවරයා වෙත පාර්ලිමේන්තුවේ යෝජනා සම්මත කර ඉදිරිපත් කිරීම පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 (2) ව්‍යවස්ථාව ප්‍රකාර යෝජනාව, පක්ෂව ඡන්ද 155ක් හා විරුද්ධව ඡන්ද 49ක් ලැබීමෙන් අද දින සභා සම්මත වූ බව දැනුම් දෙනු කැමැත්තෙමි. ඒ බව ස්ථාවර නියෝග 78අ.(7) අනුව අතිගරු ජනාධිපතිතුමා වෙත දන්වා යැවීමට කටයුතු කරන බව ද මෙයින් දැනුම් දෙමි."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ සියලු කටයුතු අවසානයේ; පක්ෂ-විපක්ෂ භේදයකින් තොරව ආපු වාද විවාද අහගෙන ඉඳලා, ඔය කියන අවසාන යෝජනාව පිළිබඳ ප්‍රශ්නයටත් සවන් දීලා අවසාන වශයෙන් ගරු කථානායකතුමා පාර්ලිමේන්තුවට කියා සිටින්නේ "හිටපු අග්‍ර විනිශ්චයකාරතුමිය ධුරයෙන් ඉවත් කිරීම සඳහා වූ යෝජනාව සම්මත වූ බව දැනුම් දෙමි" කියලායි. එතකොට ගරු කථානායකතුමාගේ නියෝගය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා නම්, එය වෙන කිසි කෙනෙකුට ඉවත් කිරීමට බැහැ, එය ඉවත් කළ හැක්කේ පාර්ලිමේන්තුවටම පමණයි. වෙනත් කෙනෙකුට ඉවත් කරන්න බැහැ. උදාහරණයක් හැටියට ගත්තොත්, ශිරානි බණ්ඩාරනායක මැතිතුමියට විරුද්ධව අපි දෝෂාභියෝගයක් ගේන්න හදන වෙලාවේ ඇපැල් අධිකරණයේ නඩුවක් තිබුණා. ඇපැල් අධිකරණයේ තීන්දුවක් දුන්නා ඒක අහන්න බැහැ කියලා. නීතිපතිතුමා ඒකට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. ශ්‍රේෂ්ඨාධිකරණයෙන් කිව්වා ඇපැල් අධිකරණයේ තීන්දුව වැරැදියි කියලා. ඊට පස්සේ විරුද්ධ පාර්ශ්වය පාර්ලිමේන්තුව ඇතුළෙත් මේ කාරණය මතු කළාම ගරු කථානායකතුමා, පාර්ලිමේන්තුවේ වැඩවලට අධිකරණයට ඇඟිලි ගහන්න දෙන්න බැහැ කියලා ගරු අනුර බණ්ඩාරනායක මැතිතුමා කථානායක වශයෙන් සිටියදී දෙන ලද තීන්දු පදනම් කර ගනිමින් තමයි අග්‍ර විනිශ්චයකාරතුමිය අයින් කිරීමේ

[ගරු ඩිලාන් පෙරේරා මහතා]

දෝෂාභියෝග ක්‍රියාවලිය ඉස්සරහට ගෙන යන්න ඉඩ දුන්නේ. ශිරානි බණ්ඩාරනායක මැතිනිය අයින් කළාට පස්සේ ඊළඟට පත් වෙන මොහාන් පීරිස් මැතිතුමා හොඳ නැත්නම්, මොහාන් පීරිස් මැතිතුමාත් අයින් කිරීම සඳහා දැනට තිබෙන ව්‍යවස්ථාව සහ පාර්ලිමේන්තුවේ තිබෙන ස්ථාවර නියෝග අනුව අනුගමනය කළ යුතු වන්නේ ශිරානි බණ්ඩාරනායක මැතිනිය අයින් කරන්න ගිය ක්‍රියා මාර්ගයමයි. උදාහරණයක් වශයෙන් මේ ආකාරයෙන් ගනිමු. ඒ වෙලාවේ ශිරානි බණ්ඩාරනායක මැතිනියට පසුව හිටපු ශ්‍රේෂ්ඨාධිකරණයේ ජ්‍යෙෂ්ඨ විනිශ්චයකාරවරිය වෙන්නේ අපි කාගේත් ගෞරවය දිනා ගත්ත ගරු ශිරානි තිලකවර්ධන මැතිනියයි. එතුමියට කිසිම චෝදනාවක් කොහේවත් තිබුණේ නැහැ. ඒක කවුරුත් පිළිගන්න ඕනෑ. ශිරානි තිලකවර්ධන මැතිනියත් පාර්ලිමේන්තුවේ දෝෂාභියෝග කමිටුව ඉදිරියේ සාක්ෂි දුන්නා, ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරියක් ලෙසින්ම ඇවිල්ලා. දැන් අපි මොහොතකට හිතමු, ඊළඟට පත් වුණේ මොහාන් පීරිස් මහත්මයා නොවෙයි ශිරානි තිලකවර්ධන මැතිනියයි කියලා. ඒ ආකාරයෙන් එතුමිය පත් වුණා නම් තමුන්නාන්සේලා මේ විධියටම, අදාළ ක්‍රියාදාමයෙන් පරිබාහිර වෙලා ශිරානි තිලකවර්ධන මැතිනියව අයින් කරනවාද? නැහැ. ඇයි තමුන්නාන්සේලා එහෙම අයින් කරන්නේ නැත්තේ? එකක් තමයි, ශිරානි තිලකවර්ධන මැතිනියට මොහාන් පීරිස් මැතිතුමාට වාගේ චෝදනා නොමැති නිසාත්, එවැනි ක්‍රියාදාමයකට ගිහිල්ලා ශිරානි තිලකවර්ධන මැතිනියව අයින් කරන එක වැරැදියි කියලා තීන්දු කරන නිසා. ඒ නිසා මේ මොහාන් පීරිස් කියන චරිතයේ තිබෙන කලු ලප, මොහාන් පීරිස් කියන චරිතයේ තිබෙන වැරැදි ක්‍රියා, විෂමාචාර ක්‍රියා නිසා, ඔහු රාජපක්ෂවාදියෙක් නිසා, ඔහු රාජපක්ෂ මැතිතුමාගේ ගෙදර නිතර ආව ගිය කෙනෙක් නිසා, සිංහල-හින්දු අලුත් අවුරුද්දට ගිහිල්ලා බුලත් දීලා වැඳපු නිසා කියන මේ සියලු කාරණා පදනම් කරගෙන තමයි මෙම තීන්දුව අරගෙන තිබෙන්නේ කියලා මම හිතන්නේ.

විජයදාස රාජපක්ෂ ජනාධිපති නීතිඥතුමා මෙතැන ඉන්නවා. එතුමාගේ ජනාධිපති නීතිඥ හිස් වැසුම අරගෙන තමයි මගේ තාත්තා දිවුරුම් දෙන්න ගියේ. මොකද මගේ තාත්තාට ඒවා සල්ලිවලට ගන්න ඕනෑකමක් තිබුණේ නැහැ. නාලන්ද එල්ලාවල නඩුවේ මා වෙනුවෙන් පෙනී ඉන්න ආණ්ඩු පක්ෂයෙන් කවුරුත් නැති වූ විට එතුමා තමයි මා එක්ක උසාවි ගියේ. එතුමා කෙරෙහි මගේ තිබෙන්නේ උපරිම ගරුත්වයක්. එතුමා ආණ්ඩුව දාලා ගිය වෙලාවෙත් මම ආණ්ඩුව ඇතුළේ කණ්ඩායමේත් එතුමා වෙනුවෙන් කථා කරලා තිබෙනවා. ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා මගේ කථාවට පසුව කථාව කරනවා. මගේ තර්කවලට එතුමා පිළිතුරු දේවි. එතුමා මට වඩා දක්ෂ නීතිඥයෙක්. හැබැයි, පැහැදිලිවම එතුමාගේ හෘදය සාක්ෂිය දන්නවා, මොහාන් පීරිස් මැතිතුමා නැතිව ශිරානි තිලකවර්ධන මැතිනිය නම් අග්‍ර විනිශ්චයකාර වුණේ තමුන්නාන්සේලා මේ ක්‍රම වේදය පාවිච්චි කරලා ශිරානි තිලකවර්ධන මැතිනියව අයින් කරන්නේ නැහැ කියලා. මේ ක්‍රම වේදය වැරැදියි කියලා දැන දැනත් මේ ක්‍රමවේදයම පාවිච්චි කරලා මොහාන් පීරිස් මැතිතුමා අයින් කරන්නේ වෙන කිසිම හේතුවක් නිසා නොවෙයි, මොහාන් පීරිස් මහත්මයා අග්‍ර විනිශ්චයකාර තනතුරේ තියා ගෙන දින 100 වැඩ පිළිවෙළ ගෙන යද්දී එහි සමහර වැඩ පිළිබඳව නඩු එහෙම ආවොත් විශ්වාසයක් නැති නිසායි. අපි කියන්නේ මොහාන් පීරිස් මැතිතුමා සම්බන්ධයෙනුත් ඔය තිබෙන විෂමාචාර චෝදනා දෝෂාභියෝගයක් හැටියට ගෙනාවා නම් ඒ ක්‍රමවේදය නිවැරදියි කියන එකයි. මම ශිරානි බණ්ඩාරනායක මැතිනියට විරුද්ධව තිබුණු දෝෂාභියෝග කමිටුවේ හිටපු කෙනෙක්. මා එතුමියව එම චෝදනාවලට වැරැදිකරුවකු කළේ හිතට එකඟවයි. මම අදත් ඒක කියනවා. මම අද එකක් කියලා, හෙට තව එකක් කියන කෙනෙක් නොවෙයි. මගේ පියා කවදාවත් මට ගෙදර එන්න දෙන්නේ නැහැ, මම හිතට විරුද්ධව ඒ වෙලාවේ ක්‍රියා කළා නම්.

මා ඒ වෙලාවේ එතුමිය එක්ක වාද වෙන ආකාරය සමහර websitesවල පළ වුණාම, එතුමියට අගෞරව කළා කියලා මගේ පියා සුමාන දෙකක් මාත් එක්ක කථා කළේ නැහැ. මා ශිරානි බණ්ඩාරනායක මැතිනියට අගෞරව වන විධියට එතුමියත් එක්ක වාද වුණා කියලා. මම වාද වුණේ එතුමියත් එක්ක නොවෙයි, එතුමියගේ නීතිඥ මහත්මයාත් එක්ක. එහෙමයි අපේ ගෙවල්වල අපව හැදුවේ. අධිකරණයට ගරු කරන්න කියලා දුන්නා. දේශපාලනයට අලුතෙන් ආපු සමහර උදවිය මේවා දන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කාරණය ගැනත් මා කියන්න කැමැතියි. මේ ප්‍රශ්න විසඳීම සඳහා තමුන්නාන්සේලා පළමුවෙන්ම උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා හරහා පසු ගිය දා ස්ථාවර නියෝග වෙනස් කිරීම සඳහා න්‍යාය පුස්තකයට යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා. ඒක ඉතාමත් හොඳයි. තමුන්නාන්සේලාට තිබුණේ ඒ පළමුවැනි ක්‍රියාව කළා වාගේම මොහොන් පීරිස් මහත්මයාව වහාම ධුරයෙන් ඉවත් කිරීම පිණිස පාර්ලිමේන්තුවට තිබෙන බලය ආරක්ෂා කරමින් අර ක්‍රමයම ක්‍රියාත්මක කිරීමයි. එහෙමයි කරන්න තිබුණේ. එහෙම නැතුව විජයදාස රාජපක්ෂ මහත්මයාගේ ළඟින්වත් තියන්න බැරි, සුජීව සේනසිංහ මහත්මයාගේ ළඟින්වත් තියන්න බැරි අර වන්නිනායක වාගේ නඩු නැතුව එහේ මෙහේ දඟලන නීතිඥයන් කරන දේශපාලන තර්ක විතර්ක ඉදිරිපත් කිරීම නොවෙයි. වන්නිනායක මහත්මයලා පසු ගිය සතියේ දී Court No. 05 එකේ හූ තියලා නඩුකාරයකුව බැස්සුවා නේ. ඇයි? දැන් කල්පනා කරනවා, "අග්‍ර විනිශ්චයකාරතුමාව එළෙව්වා හූ තියලා, දැන් මහෙස්ත්‍රාත්වරුත් හූ තියලා එළවන්න පුළුවන්" කියලා. මේ වැරැදි පූර්වාදර්ශයක් නේ දුන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ වෙලාවේ දේශපාලන පළිගැනීම් ගැන, අපේ ආසනවලට ගහන ඒවා ගැන, මගේ ආයතනයට කෙළින ඒවා ගැන කියන්න යන්නේ නැහැ. මොකද 10වැනි දාට අපි ඒවා ගැන කියනවා. විජයදාස රාජපක්ෂ මහත්මයාත් දන්නවා ඇති, ගිය පාර එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ආපු වෙලාවේ මට දැම්මේ මිනී මැරුම් චෝදනාවක් සම්බන්ධ නඩුවක්. ඒ වෙලාවේ රාජපක්ෂ මහත්මයාලාට පිං සිද්ධ වෙන්න අපි නිදහස් වුණා. ආණ්ඩු මාරු වෙන කොට, විශේෂයෙන්ම රනිල් වික්‍රමසිංහ මහත්මයා අගමැති වෙන කොට, දෙයියනේ! නඩු නොදා අපිව හිරේ නොදමා ඉඳිවිද? එහෙම නම්, ඒ රනිල් වික්‍රමසිංහ වෙන්න බැහැ නේ. අපි දන්නා රනිල් වික්‍රමසිංහ මහත්මයා අපව හිරේ දානවාමයි. ඒක ගාණක් නැහැ. අපේ තාත්තා හිරේ ගිහිල්ලා දේශපාලනය කරලා තිබෙන්නේ. ඉතින් අපිත් හිරේ යන්න ඕනෑ. අපි බොහොම කැමැත්තෙන් හිරේ යනවා. ඒක අපි දේශපාලනයත් එක්ක බලාපොරොත්තු වන දෙයක්. විශේෂයෙන්ම රනිල් වික්‍රමසිංහ මහත්මයා අගමැති වෙනවාය කියනකොට. එතුමාගෙන් ඉන් එහාට දෙයක් බලාපොරොත්තු වෙන්න බැහැ. අද මේ උත්තරීතර සභාවේ කොයි තරම් වැදගත් යෝජනාවක්ද විවාද වෙන්නේ? එතුමා එක විනාඩියකට පාර්ලිමේන්තුවට ඇවිල්ලා ගියේ නැහැ. ඔන්න, රනිල් වික්‍රමසිංහ මහත්මයා අධිකරණයට ගරු කරන හැටි.

එදා දැක්කා නේ අගමැතිතුමා පාර්ලිමේන්තුවේ හැසිරුණු ආකාරය. "ඉඳ ගන්නවා ඕයි. දානවා කුඩුවට. අනිනවා ටොක්කක්, ජනාධිපතිතුමාට කියලා. යනවා, යනවා, සමසමාජකාරයා; ශ්‍රී ලංකාකාරයා. හිරේ දානවා." එදා අගමැතිතුමාගේ සැබෑ තත්ත්වය එළියට ආවා. සාමාන්‍යයෙන් රටේ මිනිස්සු එතුමා ගැන කියන්නේ, "අයියෝ වැඩක් නැහැ. පණ නැහැ" කියලා නේ. ඔය තිබුණේ එදා පණ. හත් පණ වාගේ. ආණ්ඩු බලය අරගෙන විරුද්ධ පාක්ෂිකයන්ගෙන් පළි ගන්න යනකොට ඒ තත්ත්වය ටක් ගාලා ඇති වෙනවා. ඒ රනිල් වික්‍රමසිංහ. ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමාත් මේවා ගැන හොඳින්ම දන්නවා ඇති. එතුමා අපිත් එක්ක විරුද්ධ පක්ෂයේත් සිටියා නේ. [බාධා කිරීමක්] අපි ඒක දන්නවා.

මෛත්‍රීපාල සිරිසේන මහත්මයා ජනාධිපති වුණත්, එතුමා අපේ පක්ෂයේ නායකයා වුණත්, රනිල් වික්‍රමසිංහ මහත්මයා අගමැතිකමේ ඉන්නවා නම් ශ්‍රී ලංකාකාරයන් වන අපට කෙළිනවාම තමයි. විශේෂයෙන්ම කෙළින්නේ හොරුන්ට නොවෙයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එකතු කරන්න හදන අයටයි කෙළින්නේ. රනිල් වික්‍රමසිංහ මහත්මයා කවදාවත් හොරුන්ට කෙළින්නේ නැහැ. හොරුන්ට කෙළින්නේ නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එකතු කරන්න හදන අයට තමයි කෙළින්නේ. අපි ඒ ශ්‍රී ලංකා නිදයහස් පක්ෂය එකතු කරන අය නේ. ඒ නිසා අපි කෙළිල්ල භාර ගන්නවා. ඒකේ ගැටලුවක් නැහැ.

දැන් විධායක ජනාධිපතිතුමාගෙන් මේ බලතල අරගෙන කොහාටද මේ දෙන්න හදන්නේ, රාජපක්ෂ ඇමතිතුමනි? විජයදාස රාජපක්ෂ කියලා කියන්නම් කෝ. ඒ තරමට ඔබතුමා රාජපක්ෂ විරෝධී නේ. ඒ නිසා විජයදාස රාජපක්ෂ කියලා කියන්නම්. නැත්නම් ඊළඟට අතැනට නැකම් කියනවා කියලා කියයි. කාටද දෙන්න හදන්නේ ඇමතිතුමනි? දෙන්න හදන්නේ අගමැතිතුමාට නේ. වර්තමාන අගමැතිතුමාට තිබෙන්නේ පියන් කෙනෙකුට තිබෙනවා වාගේ බලතල නේ. එවැනි බලතල තියාගෙන රනිල් වික්‍රමසිංහ හැසිරෙන්නේ මෙහෙම නම්, අර බලතලත් එක්ක කොහොම කෙළීද? ඒ නිසා මේ වෙලාවේවත් අපි මේ පාර්ලිමේන්තුව වෙනුවෙන් පෙනී සිටියේ නැත්නම් අපට ඉස්සරහට මොනවත් කරන්න වෙන්නේ නැහැ. ගරු සුජීව සේනසිංහ නියෝජ්‍ය ඇමතිතුමා මෙහෙම කිව්වා. එතුමා කිව්වා, "කථානායකතුමා නීතිය දන්නේ නැහැ, ඒ නිසා ඒ වෙලාවේ පීඩනයට ලක් වෙන්න ඇති." කියලා. එහෙම නම් මටත් අනෙක් පැත්තට මේ විධියට තර්ක කරන්න පුළුවන්.

මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාත් නීතිය දන්නේ නැහැ, එතුමා නීතිඥයෙක් නොවෙයි. ඒ නිසා නීතිඥයකු හැටියට අගමැතිතුමාගේ පීඩනයට ලක් වන්න ඇති කියලා මට ඒ විධියට කියන්නත් පුළුවන්. අපි ඒ දෙදෙනා ගැනම කල්පනා කර බලනවා නම් එහෙමත් කියන්න පුළුවන්. මෙතැන යම් තීන්දුවක් ගත්තාම, ඒ තීන්දුව කවුරු ගත්තත් එහි බලපෑම ව්‍යවස්ථාදායකය හැටියට අපේ අයිතිවාසිකම්වලට බලපානවා නම් අඩු ගණනේ ඒ ගැන මේ වාගේ සභාව කල් තබන අවස්ථාවේ විවාදයක්වත් කරන්නට ඕනෑ කියලායි මම කියන්නේ. ඇයි? වෙන කරන්නට දෙයක් නැහැ. ලංකාවේ දැන් තිබෙන නීතිය හැටියට විධායක ජනාධිපතිතුමාව දික්කසාද නඩුවකටවත් උසාවියට අරගෙන යන්න බැහැ. උසාවියට ගියත්, ශිරානි බණ්ඩාරනායක මැතිනිය සම්බන්ධයෙන් නම් පාර්ලිමේන්තුවේත් ඒ ක්‍රියාදාමයට එහායින් වෙන කරන්න දෙයක් නැහැ කියලා ශ්‍රේෂ්ඨාධිකරණයෙන් කියලා තිබෙනවා. දැන් මේ වේලාවේ පක්ෂ - විපක්ෂ භේදයකින් තොරව කථා කරන්නේ සභාග ආණ්ඩු ගැන නේ; ජාතික ආණ්ඩු ගැන නේ; සර්ව පාක්ෂික ආණ්ඩු ගැන නේ. ඒ ආණ්ඩු ගැන කථා කර කර ගහන ඒවා, තළන ඒවා අනන්තයි. ඒවා කරනවා. ඒවා නැත්නම් රනිල් වික්‍රමසිංහ මහත්තයා වෙන්න බැහැ නේ.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Please wind up, Hon. Member.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මා අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

මේ සභාග ආණ්ඩු ගැන කථා කරනවා නම් අඩු තරමින් සුජීව සේනසිංහ අධිකරණ නියෝජ්‍ය ඇමතිතුමාට තිබුණු විනයවත් තියන්න. අඩු තරමින් ඒ විනයවත් තියන්න. අවම වශයෙන් ඒ විනයවත් තියන්න. හේතුව මොකද, මේ තනතුරු සදාකල් නැහැ. අප නම් ආණ්ඩු කරන කාලයේත් මේ තනතුරු සදාකල් නැහැ කියලා දැනගෙන සිටියා. අපි වැඩ කළේ ඒ විධියටයි. හැබැයි, අද සමහර එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ මැති ඇමතිතුමන්ලා, තුමියන්ලා හැසිරෙන්නේ මේවා සදාකල් පවතිනවා කියලා හිතාගෙනයි. දැන් බර වැඩිවෙලා, මුහුණු ඉලිප්පිලා, හිනාවල් එහෙම නැහැ.

සුජීව සේනසිංහ නියෝජ්‍ය ඇමතිතුමනි, අද අප ගෙනාපු මේ සභාව කල් තැබීමේ යෝජනාව කඩාකප්පල්කාරි යෝජනාවක් නොවෙයි. පැහැදිලිවම එහෙම නොවෙයි. ශිරානි බණ්ඩාරනායක මැතිනිය පිළිබඳව පාර්ලිමේන්තුවේ පැවැති දෝෂාභියෝග යෝජනාව සම්බන්ධයෙන් විවාදය අවසාන වෙලා ගරු කථානායකතුමා විසින් අතිගරු ජනාධිපතිතුමා වෙත යවපු ඒ ලිපියේ තිබෙන්නේ ශිරානි බණ්ඩාරනායක මැතිනිය ඉවත් කිරීම සඳහා වූ යෝජනාවක් සම්මත වුණාය කියලායි. එහෙම තමයි යෝජනාවේ තිබෙන්නේ. මම දැන් ඒ යෝජනාව කියෙව්වා. ඒ යෝජනාව වැරැදි නම්, ඒ යෝජනාව වැරැදියි කියලා තීන්දු කරන්න පුළුවන් මේ විධියේ ක්‍රියාදාමයකින් නොවෙයි. ඒක පාර්ලිමේන්තුවේ කටයුතුවලට ඇඟිලි ගැහීමක්; බරපතළ ලෙස ව්‍යවස්ථාදායකයේ කටයුතුවලට මැදිහත් වීමක්. ඒ නිසා සභාව කල් තබන අවස්ථාවේ විවාදයක්වත් අරගෙන අවම තරමින් අප මේ කාරණය ගැන කිව්වේ නැත්නම් අප ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරුන් වන්නේ නැහැ.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේ දී යෝජනා සම්මතයක් වෙලා ජනාධිපතිතුමාට තේරෙනවා නම් මේ යෝජනා සම්මතය වැරැදියි කියලා, එය බාර ගන්නේ නැතිව එතුමාට ඉන්න පුළුවන්ද?

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
පැහැදිලිවම. [බාධා කිරීමක්] මම ඒ කාරණය ගැනත් කියන්නම්. මට මතක විධියට මේ යෝජනා සම්මතය ආවාට පසුවත් එතුමා මේකෙන් පිට නීති විශේෂඥයන්ගෙන් සමන්විත කොමිටියක් පත් කළා. ඒ ගොල්ලන්ගෙනුත් අහලා තමයි මේ ගැන තීන්දුවක් ගන්නවා කියලා කිව්වේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ කාරණයත් කියලා මගේ කථාව අවසාන කරන්නම්. අද මේ පාර්ලිමේන්තුවේ අධිකරණය පිළිබඳව වැදගත් යෝජනාවක් අප විවාද කරන වෙලාවේ මේ රටේ අග්‍රාමාත්‍යවරයා මේ ගරු සභාවේ නැහැ. සුළුතරයකගේ ආණ්ඩුවක් තිබෙන්නේ. අපි challenge කළොත් එතුමාගේ අගමැතිකම එතුමාට ලැබෙන්නේ නැහැ. අඩු තරමින් මේ රටේ ජනතාවට එතුමා ගරු කරනවා නම්, අඩු තරමින් මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට - හංසයා ලකුණට - ඡන්දය දීපු මිනිසුන්ට ගරු කරනවා නම්, එතුමාට මේ පාර්ලිමේන්තු විවාදයට ඇවිල්ලා සවන් දීලා, මේ විවාදයට සම්බන්ධ වන්න තිබුණා. ඒ හරහා මේ අගමැතිතුමා පෙන්වා දී තිබෙන්නේ මේ අගමැතිතුමාට අධිකරණයේ ස්වාධීනත්වය ඕනෑත් නැහැ; ව්‍යවස්ථාදායකයේ අයිතිය ඕනෑත් නැහැ කියන කාරණයයි. එතුමාට ඕනෑ පරණ පුරුදු එක්සත් ජාතික පක්ෂයේ ජඩ, පහත් ඒ කාලකණ්ණි ක්‍රියාදාමය ක්‍රියාත්මක කරන්නයි. ඒ නිසා ගරු රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාගේ පාර්ලිමේන්තුව තුට්ටුවට දමන ඒ පහත් ක්‍රියාදාමය හෙළා දකින්නටත් මම මෙය අවස්ථාවක් කර ගන්නා බව සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 8.09]

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - நீதி மற்றும் தொழில் உறவுகள் அமைச்சர்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe - Minister of Justice and Labour Relations)
ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. විපක්ෂ නායකතුමාටත්, මේ යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා මුල් වුණු

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාටත් මා මුලින්ම ස්තුතිවන්ත වනවා. ජනතාවගේ පරමාධිපත්‍ය පිළිබඳව ඍජු ලෙස බලපාන කාරණයක් වශයෙන් එතුමන්ලා මෙවැනි විවාදයක් ඉල්ලා සිටීම පිළිබඳව ස්තුතිය ප්‍රකාශ කරන ගමන්ම, අද දිනයේ ආණ්ඩුව විසින් ගන්නා ලද - විශේෂයෙන්ම ජනාධිපතිතුමා විසින් ගන්නා ලද - තීරණය වැරැදියි කියලා විවේචනය කරපු අයටත්, හරියි කියලා ප්‍රකාශ කරපු අයටත් සියලු දෙනාටම මම ස්තුතිවන්ත වනවා. ප්‍රජාතන්ත්‍රවාදයක් තුළ දැකිය හැකි, ඉවසිය යුතු ගුණාංග ප්‍රකට කරමින් අප මේවායේ හොඳ නරක විවේචනය කරන්නට ඕනෑ. ඒක පාර්ලිමේන්තුවේ අයිතියක්. ඒ උත්තරීතර අයිතියට ආණ්ඩුවක් වශයෙනුත්, පෞද්ගලික වශයෙනුත් අපි ගරු කරනවා.

අපි බලාපොරොත්තු නොවුණු මොහොතක මේ විවාදය කඩිනමින් ඕනෑය කියලා විපක්ෂය ඉල්ලුවා. ඒක නිසා අපි එකඟතාවකට ආවා, අද දින මේ විවාදය පටන් ගන්න. අද දින ගරු අගමැතිතුමාට පාර්ලිමේන්තුවට එන්න නොහැකි තත්ත්වයක් තිබුණා, එතුමා රාජ තාන්ත්‍රිකයන් කිහිප දෙනෙක් සමඟ වැදගත් සාකච්ඡා කිහිපයක් නියම කර ගෙන තිබුණු නිසා. අද දිනය තුළ මට පාර්ලිමේන්තුව තුළ රැඳී සිටින්න පුළුවන් කියලා කිව්වාට පස්සේ, හදිසි කටයුත්තක් කියලා ඉල්ලපු නිසා එතුමා නොමැතිව වුණත් මේ විවාදය පැවැත්වීමට එකඟ වුණා. එහෙම නැතුව එතුමා මේ විවාදය මඟ හැර පලා යාමක් සිදු කළා කියලා චෝදනා කිරීම මම හිතන විධියට යම් කිසි අනවබෝධයක් නිසා සිදු වුණු දෙයක් වෙන්න ඇති.

උපරිමාධිකරණ විනිශ්චයකාරතුමන්ලා ඉවත් කිරීම පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේත්, ස්ථාවර නියෝගවලත් ප්‍රතිපාදන සකස් වෙලා තිබෙනවා. ඒ ප්‍රතිපාදනවල යම් යම් අඩු පාඩු තිබෙනවා කියලා දීර්ඝ කාලීන වශයෙන් මේ පාර්ලිමේන්තුවේ විවාද කළා. ශිරානි බණ්ඩාරනායක මැතිනියට එරෙහි දෝෂාභියෝගය අවස්ථාවේදීත් ඒවායේ අඩු පාඩු, වැරදි ගැන දෙපැත්තටම තර්ක කරමින් කරුණු ඉදිරිපත් කළා. ගරු ඩිව් ගුණසේකර මන්ත්‍රීතුමා වැනි අය ඒ කරුණු පෙන්වා දුන්නා. ඉන් ඔබ්බට ගියපු වැදගත් කාරණාවක් අපේ ගරු මන්ත්‍රීතුමන්ලාට, ගරු ඇමතිතුමන්ලාටමම සිහිපත් කරනවා. මේ දෝෂාභියෝගය ආන්දෝලනාත්මක ආකාරයෙන් ඉවර වෙලා දින කිහිපයකට පසුව ගරු චමල් රාජපක්ෂ කථානායකතුමා ගාල්ල ප්‍රදේශයේදී කථාවක් කළා. මාධ්‍යයෙන් ඒකට විශාල ප්‍රචාරයක් ලබා දුන්නා. ඒක අපේ පාර්ලිමේන්තුවට ඉතා වැදගත් කාරණයක්. ජනතාවට බලපාන කාරණයක්. එතුමා අපට දොස් පැවරුවා, "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ දෝෂාභියෝගයක් සම්බන්ධව ක්‍රමානුකූලව නීතියක් හදා ගන්න පාර්ලිමේන්තුවට බලය දීලා තිබිලාත්, තමුන්නාන්සේලා ඒ වගකීම ඉෂ්ට නොකරපු නිසා මම තමයි අපහසුතාවට පත් වුණේ" කියලා. මම හිතන විධියට එතුමා බොහොම සද්භාවයෙන්, හෘදය සාක්ෂියට එකඟව ඒ ප්‍රකාශය කළේ. ඒ නිසා ඒ දෝෂාරෝපණය අපි අවංකව භාර ගන්න ඕනෑ. පාර්ලිමේන්තුවේ එතැන අඩු පාඩුවක් තිබෙනවා.

මම හිතන විධියට මේ මැතිවරණ ප්‍රතිඵලය තුළින් මේ රටේ මෙතෙක් පැවැති අවලාද දේශපාලනය, විරසක දේශපාලනය, පළි ගැනීමේ දේශපාලනය නතර කරලා ජාතික ප්‍රතිපත්තියක් මත යහ පාලනයක් ඇති, ජාතික සංහිඳියාවක් හදන්න පුළුවන් දේශපාලන ක්‍රමවේදයක් ජනතාව බලාපොරොත්තු වුණා. ඒකෙදි ජනතාව අතිගරු ජනාධිපතිතුමා ජයග්‍රහණය කරවූයේ හුඟාක් බලාපොරොත්තු තියා ගෙනයි. ඒක නිසා අපි මේ පාර්ලිමේන්තුවට ආවේ බොහොම නැවුම් බලාපොරොත්තු ඇතිවයි. අද දිනයේදී අපේ නොයෙකුත් මන්ත්‍රීතුමන්ලාගේ හිත් රිදෙන විධියට, පැරෙන විධියට යම් යම් තර්ක විතර්ක ඉදිරිපත් වුණා. මම කාරුණිකව ඉල්ලා සිටිනවා, මේ ප්‍රජාතන්ත්‍රවාදය තුළ අපි ඒවා ඉවසමු කියලා. පක්ෂ භේදයකින් තොරව මේ කාර්යය කරන්න කියලා ජාතික

අවශ්‍යතාවක් තිබෙනවා. අපේ දේශපාලන පක්ෂ නායකවරුන් ඒ වෙනුවෙන් කැප කිරීම් කළා. අතිගරු ජනාධිපතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම්වරයා විධියට ඉඳලා කැප කිරීමක් කරලා එළියට ආවා. එක්සත් ජාතික පක්ෂයේ නායකයා විධියට ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා අපේක්ෂකත්වය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම්තුමාට ප්‍රදානය කළා. ඒ ඉහළින් ඇති සංහිඳියාව පිළිබඳව ජනතාව සුබවාදී බලාපොරොත්තු දල්වා ගෙන ඉන්නවා. තව දුරටත් තර්ක විතර්ක ඉදිරිපත් කිරීම තුළ අපි ඈත් වීම, බෙදීම, වෙන් වීම නොවෙයි සිදු විය යුත්තේ, ප්‍රජාතන්ත්‍රවාදය තුළ අපි සැම මේවා හරහා පාඩම් ඉගෙන ගෙන එකට එකතු වීම තමයි කළ යුතුව තිබෙන්නේ කියලා මම යෝජනා කරනවා. ප්‍රජාතන්ත්‍රවාදය කියලා කියන්නේ, "Unity in Diversity". බෙදී ගිය හුඟාක් වෙනස්කම් තිබියදීත් එක අරමුණකට එන්න පුළුවන් නම්, ඒක තමයි ප්‍රජාතන්ත්‍රවාදයේ මුදුන් මල්කඩ - pinnacle එක - කියලා කියන්නේ. ඒ ආදර්ශය දෙන්න පුළුවන් මට්ටමට ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව ළඟා වෙලා තිබෙනවා කියලා ජාත්‍යන්තර වශයෙන් පවා අද මාධ්‍ය මඟින් විශාල ප්‍රචාරයක් ලබා දීලා තිබෙනවා. ශ්‍රී ලාංකිකයන් විධියට අපි කවුරුත් ඒ තීරණය ගැන, ඒ තත්ත්වය ගැන සතුටු වෙන්නට ඕනෑ.

අතිගරු ජනාධිපතිතුමාට මේ තීරණය ගැනීම සඳහා අගමැතිතුමා හෝ ආණ්ඩුවේ ඇමතිවරුන්, නීති විශාරදයින් දුන් උපදෙස්වල දෝෂ සහගතභාවයක් තිබෙනවාය කියා මේ සභාවේදි දිගින් දිගටම කියවුණා. එතුමන් නීති විශාරදයින්ගෙන් උපදෙස් ගත්ත බව ඇත්ත. ඒ වාගේම, දේශපාලන නායකයන්ගේ අදහස් එතුමන්ට ප්‍රකාශ කළා. ඇත්ත වශයෙන්ම එතුමාට දේශපාලන හෝ නීති උපදෙස් නැතිව මේ තීරණය ගන්න බැරිද කියලා ප්‍රශ්නයක් තිබෙනවා. එතුමා මේ රටේ අවුරුදු හතළිස්හතක් ක්‍රියාකාරි දේශපාලනයේ යෙදිලා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම්වරයා විධියට අවුරුදු දහතුනක් කටයුතු කරලා පරිණත වුණු, බොහොම දූරදර්ශී නුවණක් තිබෙන, තැන්පත්කමින් යුතුව තීන්දු තීරණ ගන්න පුළුවන් නායකයෙක් බව අපි කවුරුත් දන්නවා. කවුරුත් ඒ ගැන හඬයට ලක් කරන්නේ නැහැ. ඒ නිසා මේ තීන්දුව යම් කෙනෙකුගේ උපදේශයක් ලැබුණු පමණින්, ඒ මතම ගත්ත තීන්දුවක් නොවෙයි. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන, ස්ථාවර නියෝගවල තිබෙන ප්‍රතිපාදන අනුව ඉදිරිපත් කරන ලද යෝජනා සම්මතය කුමක්ද කියලා පූර්ණ වශයෙන් අවබෝධ කර ගන්න එතුමන්ට කාගේවත් උපදේශයක් අවශ්‍ය නැහැ කියන කාරණය ඇත්තටම මට විශ්වාසයි. ඒක සරල කාරණයක්. සරල වුණත් ඒක පිළිබඳව බරපතළ ප්‍රශ්න මතු කරන්න පුළුවන් බව අප දන්නවා. අද මේ විවාදය ලැබිලා තිබෙන්නේත් ඒ නිසා තමයි. පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතය පිළිබඳව හුඟාක් කථික මන්ත්‍රීතුමන්ලා, ඇමතිතුමන්ලා දිගින් දිගටම කිව්ව නිසා මම ඒ වෙනුවෙන් කාලය වැය කරන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසානයට කතා කළ මගේ හිතවත් ගරු ඩිලාන් පෙරේරා මන්ත්‍රීතුමා කිව්වා පාර්ලිමේන්තුවෙන් ගත්ත තීරණය වෙනස් කරන්න ජනාධිපතිතුමාට බලයක් නැහැ, ඒක වෙනස් කරනවා නම් නැවතත් පාර්ලිමේන්තුවට ඇවිල්ලා පාර්ලිමේන්තුව තුළින්ම කරන්න ඕනෑ කියලා. මේ ප්‍රශ්නය ප්‍රබල තර්කයක් විධියට හුඟාක් කථික මහත්වරුන්ගෙන් මතු වුණා. ඇත්ත වශයෙන්ම ප්‍රශ්නය වෙලා තිබෙන්නේ, අපේ පාර්ලිමේන්තුවේ ගරු කථානායකතුමා එවකට හිටපු අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට යෝජනා සම්මතයක් ගැන ලියලා තිබෙන්නේ 2013 වර්ෂයේ ජනවාරි මාසයේ 11 වැනිදායි. මේ යෝජනා සම්මතයට ඇමුණුම් දෙකක් තිබෙනවා. එකක් තමයි 2012 වර්ෂයේ නොවැම්බර් මාසයේ 06වැනි දින පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරන ලද යෝජනාව වන කාරක සභාවක් ඕනෑ, එය පත් කරන්න කියලා ඉදිරිපත් කළ යෝජනාව. ඒක තමයි ඇමුණුම් අංක එක. දෙවනුව, එතුමාගේ දැන්වීමේ සඳහන් කරලා තිබෙනවා පාර්ලිමේන්තු කාරක සභාවේ වාර්තාවක්. ඒක ඇමුණුම් අංක

දෙක විධියට ඉදිරිපත් කරලා තිබෙනවා. එහෙම ඉදිරිපත් කරලා ගරු කථානායකතුමා කියනවා, "අනතුරුව කාරක සභාවේ වාර්තාව 2013 ජනවාරි මස 10 සහ 11 වන දිනයන්හිදී පාර්ලිමේන්තුවේ විවාද කර, එම යෝජනාව 2013 ජනවාරි මස 11 වැනිදා පක්ෂව ඡන්ද 155ක් හා විරුද්ධව 49ක් ලැබීමෙන් යථා පරිදි සම්මත වූ බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107.(2) ව්‍යවස්ථාව පරිදි ඔබතුමන්ට දැන්වීමට කැමැත්තෙමි" කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ පාර්ලිමේන්තුවේ ගරු කථානායකතුමා හිටපු ජනාධිපතිතුමාට දන්වලා යවපු ඒ දැන්වීමෙහි, නැත්නම් නියමයෙහි කිසිම තැනෙක සඳහන් කරලා නැහැ, ගරු ශිරානි බණ්ඩාරනායක මැතිනිය ඉවත් කරන්න යෝජනාවක් සම්මත කළා කියලා. එතුමා වැඩිදුර තේරුම් ගැනීම පිණිස මේ ඇමුණුම අමුණලා තිබෙනවා. පාර්ලිමේන්තුවේ කාරක සභාවක් පත් කිරීම සඳහා කරන ලද යෝජනාවකුයි ඒ ඇමුණුමේ තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය මෙතැනින් හබයට ලක් වන්නේ නැහැ. පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය හෝ පාර්ලිමේන්තුවේ තීන්දු අභියෝගයට ලක් කිරීමක් මෙතැනදී කිසි සේත් සිදු වෙලා නැහැ. ගරු කථානායකතුමා හිටපු ජනාධිපතිතුමාට යවා තිබෙන්නේ, පාර්ලිමේන්තුවේ කාරක සභාවක් පත් කරන්න ඡන්ද 155ක් අරගෙන යෝජනා සම්මතයක් වුණා කියලායි. ගරු ඩිලාන් පෙරේරා මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවේ ගරු කථානායකතුමා හිටපු අතිගරු ජනාධිපතිතුමාට යැවූ ලිපිය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා මා **සභාගත*** කරනවා.

ශිරානි බණ්ඩාරනායක මැතිනිය තනතුරෙන් ඉවත් කරන්න යෝජනාවක් සම්මත කරපු බවට අපේ ගරු කථානායකතුමා හිටපු අතිගරු ජනාධිපතිතුමාට දැන්වීමක් කර තිබෙනවායි කියා කවුරු හෝ මට, අපේ ආණ්ඩුවට පෙන්වා දුන්නොත්, ඔබතුමන්ලා ඉදිරිපත් කරන ඔය තර්ක මා හිස නමා, හිස මුදුනින් පිළි ගන්නවා. එහෙම දෙයක් වෙලා නැහැ.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ගරු ඇමතිතුමනි, හැන්සාඩ් වාර්තාවේ තිබෙනවා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මේක තමයි ලිපිය.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ ලිපිය හැන්සාඩ් වාර්තාවේ තිබෙනවා. ඒකේ තිබෙන්නේ ඉවත් කිරීම සඳහා යෝජනාවක්.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඒක මම පිළි ගන්නවා. නමුත් ගරු කථානායකතුමා අතිගරු ජනාධිපතිතුමාට යවපු ලිපිය, ඒ කියන්නේ නියෝගයෙන් කථානායකතුමා තමයි ජනාධිපතිතුමාට බලය දෙන්නේ. පාර්ලිමේන්තුව යෝජනාව වැඩි ඡන්දයෙන් සම්මත කරලා ගරු කථානායකතුමාට දෙනවා, ඉන්න අග විනිසුරු ඉවත් කරන්න මේක සම්මත කරන්නය කියා. එතකොට එහෙම යෝජනාවක් සම්මත වුණාම ඒක ගරු කථානායකතුමා ජනාධිපතිතුමාට දැනුම් දෙන්න ඕනෑ. නමුත් කථානායකතුමා ජනාධිපතිතුමාට කිසිම ආකාරයකින් දැනුම් දීමක් කරලා නැහැ, ඉවත් කිරීම සඳහා යෝජනා සම්මතයක් කළාය කියා. එතකොට තිබෙන්නේ දැන් ඉන්න ජනාධිපතිට උපදෙස් දීම පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි එදා ජනාධිපතිතුමාට මේ ලිපිය ලැබුණාම එතුමාට කවුරු හෝ උපදෙස් දිය යුතුව තිබුණා, අග විනිසුරු ඉවත් කිරීමට යෝජනාවක් පාර්ලිමේන්තුවේ සම්මත කරලා නැහැ කියා. එතැනයි අවංකවම ප්‍රශ්නය සිද්ධ වෙලා තිබෙන්නේ.

එතකොට ඉවත් කිරීම සඳහා යෝජනා සම්මතයක් තිබෙනවා කියා කථානායකතුමා ගරු ජනාධිපතිතුමාට දැනුම් දීලා නැත්නම් ජනාධිපතිතුමා අග විනිසුරුතුමිය ඉවත් කරන්නේ කොහොමද? එහෙම යෝජනා සම්මතයක් නැහැ. අපි දේශපාලනික වශයෙන් මොන තර්ක විතරක කළත් ඒක තමයි සත්‍ය කථාව. මා ඒකයි මේ ලියුම හැන්සාඩ් වාර්තා ගත කළේ. අපේම පාර්ලිමේන්තුවේ අපේම කථානායකතුමාගේ නියෝගයයි මා හැන්සාඩ් වාර්තා ගත කළේ. ඉතින්, මේ තත්ත්වය යටතේ -

ගරු තිලංග සුමතිපාල මහතා
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
ගරු ඇමතිතුමනි, ඔබතුමා කියන්නේ අද තිබෙන තත්ත්වය නේ. 2015 අපි ඉන්න තත්ත්වය. නමුත් ඒක එතුමිය canvass නොකළේ ඇයි? ඒක canvass කරන්න එතුමියට තිබුණු බාධාව මොකක්ද?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු මන්ත්‍රීතුමනි, මා ශිරානි බණ්ඩාරනායක මැතිනිය වෙනුවෙන් පෙනී සිටින්නේ නැහැ. ඔබතුමන්ලාට මතක ඇති, නීතිඥ සංගමයේ සභාපති කාලයේත් මා මේ ගරු පාර්ලිමේන්තුවට කිව්වා, "මා ශිරානි බණ්ඩාරනායක කියන තැනැත්තිය වෙනුවෙන් එක වචනයක්වත් වැය කරන්නේ නැහැ. හැබැයි, අග විනිසුරු තනතුර වෙනුවෙන් මා කථා කරනවා" කියා. ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට අපි කොළඹට නීතිඥ මහත්වරු 3,400ක් ගෙන්වලා ඒ තීන්දුව ගත්තේ සියලු දෙනාගේ කැමැත්තෙනුයි. අපේ ගරු ලලිත් දිසානායක මැතිතුමා අද කිව්වා, "ඒකට විරෝධතා තිබුණා" කියා. ඒකෙදී කවුරුත් විරුද්ධ වුණේ නැහැ. ශ්‍රී ලංකා නිදහස් නීතිඥ සංගමයේ ඩී.පී. මෙන්ඩිස් මහත්මයායි, ලේකම් නීතිඥ චම්පානි පද්මසේකර මහත්මයායි ඉස්සරහා පේළියේ වාඩි වුණේ. මගේ ඉස්සරහාම ඉඳගෙන තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සියලු දෙනා අත ඉස්සුවේ. පසුව මාධ්‍යවලින් එක එක කතන්දර ඉදිරිපත් වුණා. මොහාන් පීරිස් මහත්මයා එක්ක අපේ පෞද්ගලික තරහක් නැහැ. එතුමාට විරුද්ධව පෙනී සිටින්නෙත් නැහැ. ශිරානි බණ්ඩාරනායක මැතිනියට පක්ෂව පෙනී සිටින්නෙත් නැහැ. මේ රටේ අධිකරණ ක්‍රමයේ ගරුත්වය ආරක්ෂා කර ගන්න අපට වග කීමක් තිබෙනවා. රටක ප්‍රජාතන්ත්‍රවාදය තිබෙන්නේ, පාර්ලිමේන්තු තිබෙන්නේ ජනතාවගේ විශ්වාසය තිබෙන තුරු විතරයි. එතකොට අධිකරණය කෙරෙහි ජනතාවගේ විශ්වාසය රඳවා ගැනීම සඳහා අපි කටයුතු කළා. ඒක ඇත්ත. අපට හුඟක් අය දොස් කිව්වා, "ඇයි මේ තානාපතිකම් දෙන්න කටයුතු කළේ" කියා. මා ඒකේ වගකීම භාර ගන්නවා. එහෙම යෝජනාවක්, එහෙම ඉල්ලීමක් ආවාම මැදිහත් වෙලා එතුමා ඉල්ලන එක දෙන්න කියා අපි කිව්වේ වෙන මොනවත් නිසා නොවෙයි. අපි කැමැති නැහැ, කවුරු හෝ අග විනිසුරු පුටුවේ වාඩි වෙලා ඉන්න කෙනෙකු අගෞරව සම්පන්න විධියට එළියට යනවා දකින්න. බොහෝ දෙනකු කියනවා, අපි කළේ වරදක් කියා. වරදක් නම් ඒ වගකීම අපි භාර ගන්නවා. අපට ඕනෑ වුණේ මොකක්ද? ඇත්තටම මොහාන් පීරිස් මැතිතුමාගේ නම ගෞරවනීය විධියට රැකගෙන, කීර්තියක් තිබෙනවා නම් ඒක රැකගෙන ඊට උඩින් අග විනිසුරු තනතුරේ ගෞරවය රකින්න කටයුතු කරන්නයි. ඒ නිසයි අපි එහෙම කළේ. නැතිව බලපෑමක් විධියට ඒක කළා නොවෙයි.

**** කථාව අවසානයේ පළ කර ඇත.***
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

මෙතනදී මා එක කාරණයකට එකඟ වෙනවා. ගරු ඩිලාන් පෙරේරා මන්ත්‍රීතුමා කිව්වා, "සමහර වෙලාවට මොහාන් පීරිස් මැතිතුමා හැර වෙන කෙනකු හිටියා නම් මෙහෙම නොවෙන්න ඉඩ තිබුණා" කියා. මා ඒක නැහැ කියා කියන්නේ නැහැ. ඒ වෙන මොනවත් නිසා නොවෙයි. මොහාන් පීරිස් මැතිතුමා පසු ගිය අවුරුදු දෙක තුළ අධිකරණ පද්ධතිය තුළ ගෙන ගිය ක්‍රියාදාමය නිසා තව දුරටත් අපට අධිකරණ පද්ධතිය ගෙන යන්න බැරි වුණා. දැන් මහාධිකරණ විනිසුරු තනතුරු 10ක් හිස් වෙලා. මහාධිකරණ 10ක් වහලා තිබෙනවා.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ඒවා පිරෙව්වේ නැති වුණාම ඇයි දෝෂාභියෝගයක් නොගෙනාවේ?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මොකක්ද?

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ඔය කියන කාරණාම ඇතුළත් කරලා එතුමාට විරුද්ධව දෝෂාභියෝගයක් ගෙනාවා නම් මේ ක්‍රියාදාමය අනුගමනය කරන්න තිබුණා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඔව්, ඒක කරන්නත් තිබුණා. නමුත් අධිකරණ පද්ධතියේ බිඳ වැටීම තුළ -අපි ඒවාට මැදිහත් වෙන්නය කියනවා නොවෙයි.- පසු ගිය කාලයේ අධිකරණය ගෙන යා නොහැකි තත්ත්වයට පත් වෙලා තිබුණා.

ශ්‍රේෂ්ඨාධිකරණයේම බෙදීම් තිබුණා. පසු ගිය අවුරුදු දෙක තුළ මම නීතිඥවරයෙක් විධියට ශ්‍රේෂ්ඨාධිකරණයට දවස් 100ක් ගියා නම් අඩුම ගණනේ දවස් 60ක්, 70ක් ආපසු හැරිලා එනවා. මම විතරක් නොවෙයි, සියලුම නීතිඥවරු එහෙමයි. හේතුව, නඩුවලට සූදානම් වී සිය ගණනක් නීතිඥවරු අධිකරණයට ගියත් සමහර විනිශ්චයකාරවරු ඒවාට වාඩි වෙන්නේ නැහැ. විනිශ්චයකාරවරු තුන් දෙනෙක් ඉන්න ඕනෑ අධිකරණයක සියයට 50ක් විතර දවස්වල ඉන්නේ විනිශ්චයකාරවරු දෙදෙනයි. ඇතුළත පැවැති අභ්‍යන්තර සීතල යුද්ධය තුළ අපේ රටේ අධිකරණයේ මහා කඩා වැටීමක් තිබුණා. අධිකරණයට එන සේවා දායකයෝ හැමදාම කලකිරිලා යන්නේ. සේවා දායකයෝ ඒක අපට හදවතින්ම කියනවා. අපි අතිශයෝක්තියක් නොවෙයි මේ කියන්නේ. අපට තිබෙන අත් දැකීම් අනුවයි අපි මේ ඇත්ත කථා කරන්නේ. ශ්‍රේෂ්ඨාධිකරණයේ කටයුතු කරන නීතිඥ මහත්වරු ඕනෑම කෙනෙකුගෙන් ඔබතුමන්ලා අහන්න. මේ වගේ බරපතළ තත්ත්වයක් තිබෙනවා.

ඊට අමතරව මොහාන් පීරිස් මහත්මයාට මහා බරපතළ චෝදනා ආවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ඔක්කෝම කියන්නේ නැහැ. මේ වෙලාවේ ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා සිටියා නම් හොඳයි, එතුමා නීතිඥවරුන් ලවා නීතිපති දෙපාර්තමේන්තුවේදී මොහාන් පීරිස් මහත්මයා කරපු අක්‍රමිකතා, විෂමතා එකතු කරලා 129ක එකතුවක් හැදුවා. දෝෂාභියෝගය ක්‍රියාත්මක වන වෙලාවේ ඒ 129 අරගෙන ගිහිල්ලා අතිගරු ජනාධිපතිතුමාට භාර දීලා කිව්වා, "මේ වගේ දූෂිත කෙනෙක් නම් මේ තනතුරට පත් කරන්න එපා" කියා. ඒ සම්බන්ධව මම එකම එක කාරණයක් විතරක් කියන්නම්. මම වැඩිපුර කාලය ගන්නේ නැහැ.

එතුමා Assistant Director of Customs එදිරිව Royal Fernwood Porcelain Limited කියන ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක 360/2008 කියන නඩුවකට පෙනී සිටියා. Customs Duty නොගෙවීම සම්බන්ධව රුපියල් ලක්ෂ 700ක් ගෙවන්න තිබුණු සමාගමක් වෙනුවෙන් Director-General of Customsට නඩු දාලා එතුමා ඒ සමාගමේ නීතිඥවරයා විධියට පෙනී සිටි නඩුව ශ්‍රේෂ්ඨාධිකරණයේ තිබෙනවා. ඊට මාස කිහිපයකට පස්සේ එතුමා Attorney-General -නීතිපති- බවට පත් වෙනවා. නීතිපති වෙලා ගිහිල්ලා එතුමා 2009 මාර්තු 31 Director-General of Customsට -රේගු අධ්‍යක්ෂකට- ලියුමක් ලියනවා. එතුමා පෙනී සිටින නඩුවේ කාරණය විධියට කියනවා, "රුපියල් ලක්ෂ 700ක් රේගුවට ගෙවන්න තිබෙනවා, ඒක රුපියල් ලක්ෂ 26 දක්වා අඩු කරන්න කියලා මම නියෝග කරනවා" කියා. [බාධා කිරීමක්] ඒක හරි, ඒක මම පිළිගන්නවා. එතුමා ඒ නඩුවට පෙනී සිටි බව සඳහන් වාර්තාව සහ එතුමා ලියපු ලිපිය මම **සභාගත*** කරනවා.

පසු ගිය කාලයේ නීති විද්‍යාලයේ බරපතළ ප්‍රශ්න ඇති වුණා. මම මේ ඇමතිකම ගත්තට පස්සේ පසු ගිය දවස්වල අවම වශයෙන් ළමයි, දෙමව්පියෝ 500කට වැඩි පිරිසක් මාව හම්බ වෙන්න ආවා. පසු ගිය කාලයේ අපට වෙන දෙයක් කරන්න බැරි වුණා. නීති විද්‍යාලය සම්පූර්ණයෙන් අවුල් කරලා තිබුණා. එවකට හිටපු ඇමතිතුමා ලවා එතුමාට ඕනෑ උදවිය පත් කරගෙන නීති විද්‍යාලයේ විදුහල්පතිට යටින් උප විදුහල්පති කෙනෙක් දමා, ඊට උඩින් consultant කෙනෙක් දමා, ඊට උඩින් අධීක්ෂණය කරන්න කෙනෙක් දමා මුළු නීති විද්‍යාලයම අවුල් වෙලා තිබුණේ. ඒ සම්බන්ධව පසු ගිය කාලයේ අපි මේ පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න කොච්චර මතු කළාද කියා ඔබතුමන්ලාට මතක ඇති. ඇත්තටම අපි ගිහිල්ලා කථා කරලා ඒ ප්‍රශ්න විසඳුවා.

ගරු ඩිලාන් පෙරේරා මන්ත්‍රීතුමනි, පසු ගිය විභාගයේදී සමහර විෂයන්වලින් සියයට 80ක් ළමයි අසමත්. සිංහලෙන් හදාරන ළමයින්ටයි, ඉංග්‍රීසියෙන් හදාරන ළමයින්ටයි ප්‍රශ්න පත්‍රය ඉංග්‍රීසියෙන් දීලා කියනවා, "ඕනෑ භාෂාවකින් ලියන්න, හැබැයි ප්‍රශ්න පත්‍රය දෙන්නේ ඉංග්‍රීසියෙන්" කියා. ඉතින්, අපට ඉංග්‍රීසි තේරෙන්නේ නැහැ කියා ළමයි ඇවිල්ලා අඬනවා. ඒ ළමයින්ට ඉංග්‍රීසි තේරෙනවා නම් උත්තරත් ඉංග්‍රීසියෙන් ලියයි නේ. ඒක නිසා ළමයි සියයට 80ක් අසමත් වෙලා තිබෙනවා. නීති විද්‍යාලය කියන්නේ තරග විභාගයක් පවත්වලා හුඟක් බුද්ධිමත් ළමයි ගන්න තැනක්. ඒ නිසා මේවා බරපතළ ප්‍රශ්න. LL.B නීති උපාධිය කරලා එන අයට හැමදාම පන්ති ඇවිල්ලා තව අවුරුදු 3ක් නීති විද්‍යාලයේ ඉන්න කියනවා. එතකොට ඒ ළමයි නාකි වෙනවා. එහෙම ක්‍රමයක් ලෝකයේ කොහේවත් නැහැ. ගරු ජෝන් සෙනෙවිරත්න මන්ත්‍රීතුමා දන්නවා, අපි LL.B විභාගය ලියලා ගියාට පස්සේ සති තුනෙන් හතරෙන් Attorney-at-Law exam ලියලා එළියට එන බව. ඒක ඒ ළමයින්ගේ දක්ෂතාව. මම දන්නවා, පසු ගිය කාලයේ එක් ශිෂ්‍යයෙක් London LL.B කරලා ඇවිල්ලා නීති විද්‍යාලයේ I, II, III කියන විභාග තුනම සති 6ක් ඇතුළත ලියලා class ගත් බව. එතකොට මොහාන් පීරිස් මැතිතුමාගේ දරදඬු නීති නිසා මුළු ශිෂ්‍ය සංහතියම පෙළෙමින් සිටියා. ඊට පස්සේ නීති විද්‍යාලයේ වැසිකිළි හැරෙන්න හැම තැනම CCTV camera සවි කළා. ළමයින්ට තව කෙනෙක් එක්ක කථා කරන්න බැහැ. බොහොම බරපතළ විධියට ළමයි පීඩනයට පත් වෙලා සිටියා. මම උපදෙස් දුන්නා, ඒවා සියල්ල ගලවලා දමන්න කියා. [බාධා කිරීමක්] නැහැ, නැහැ. දේශන ශාලාවලයි,-

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ගරු ඇමතිතුමනි, අපේ කාලයේ එහෙම තිබුණා නම් ලොකු ප්‍රශ්නයක් වෙනවා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
හැබැයි, ඒ category එකට මම අනු වන්නේ නැහැ. මොකද, මම පිට ඉඳලා ආපු නිසා.

මම කියන්නේ, ඇත්තටම ඒ ශිෂ්‍යයන්ටත් ගරුත්වයක් තිබෙන්න ඕනෑ කියලායි.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු ඇමතිතුමනි, ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීමේ වයස් සීමාව සම්බන්ධව පොඩ්ඩක් කියන්න.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඇතුළත් වීම ගැන මට තව එක ප්‍රශ්නයයි විසඳන්න තිබෙන්නේ. අපේ ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමාට මම හුඟක් ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම ඔබතුමන්ලා මට අදහස් දෙන්න. මම ඒකට මැදිහත් වෙනවා. නීති විද්‍යාල පනතේ 7(ඒ) වගන්තිය යටතේ මට තීන්දු දෙන්න බලයක් තිබෙනවා. ඒක කළේ නැත්තේ එය immediate ප්‍රශ්නයක් නොවන නිසායි.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
සිංහලෙන් උත්තර ලියන්න අවස්ථාව දෙන්නත් ඕනෑ; එකවර විභාගය ලියන්න දෙන්නත් ඕනෑ.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඇත්තටම ඒ ඔක්කොම දුන්නා.

අනික් කාරණය මෙකයි. මෙවර නීති මණ්ඩලයට මා විසින් පත් කරපු ඒ සාමාජික මහත්වරුන්ගේ නම් ඔබතුමන්ලා මාධ්‍යයෙන් දකින්න ඇති. ඒ පත් කර තිබෙන්නේ ඒ පිළිබඳ ප්‍රවීණත්වය තිබෙන, කාටවත් හබයක් කරන්න බැරි, ලංකාවේ හොඳම අය කියලා අද අපට විනිශ්චයකාරතුමන්ලා පවා කියනවා. නීති ක්ෂේත්‍රයේ cream එක වාගේ ඉන්න, අපක්ෂපාතී හොඳ උදවිය පත් කර තිබෙනවාය කියලා එතුමන්ලා කියනවා. ඒ නිසා නීති විද්‍යාලයේ ප්‍රශ්න සියයට 90ක් අප දැනට විසඳලා තිබෙනවා. හැබැයි, මම ප්‍රතිපත්ති තීන්දු ගත්තා මිසක්, අභ්‍යන්තරයට ඇඟිලි ගසන්න ගියේ නැහැ. ඒ විභාගය පිළිබඳව, ලකුණු අඩුවීම් පිළිබඳ කාරණයේදී මම කිව්වා ඒ ගැන සුදුසු ක්‍රමයකට නීති කවුන්සලයෙන්ම ළමයින්ට සාධාරණයක් කරන්න කියලා. ප්‍රතිපත්ති තීන්දු ගත්තා ඇරෙන්න, අභ්‍යන්තර කටයුතුවලට මම අත ගැසුවේ නැහැ. අනාගතයේදී එහෙම කරන්නෙත් නැහැ.

ඊළඟට අධිකරණ සේවා කොමිසමෙන් - Judicial Service Commission එකෙන්- පත් කිරීම් කරන නිර්දේශ එන්නේ නැහැ. ලංකාවේ මහාධිකරණ 10කට විනිශ්චයකාරවරු නැහැ. අග විනිසුරුතුමා ඒවාට නිර්දේශ ජනාධිපතිතුමාට එවන්නේ නැහැ. පසු ගිය කාලයේම එවලා නැහැ. මහාධිකරණයට එන්න නියමිත විනිශ්චයකාරවරුන් මාස 8ක්, 10ක් තිස්සේ බලාගෙන ඉන්නවා, එතුමන්ලාට තවම උසස්වීම් නැහැ. මේ නිසා ඒ අය බොහොම අසහනයට පත් වෙනවා. කොළඹ දිසා අධිකරණයේ දිසා විනිසුරුතුමියට -අපේ ඩලස් අලහප්පෙරුම මැතිතුමාගේ සහෝදරියට- දැනට මාස 8කට, 10කට කලින් තමයි උසස්වීම ලැබෙන්න තිබුණේ. නමුත්, දඬුවමක් විධියට එතුමිය එහි තියලා තිබෙනවා. දැනට මාස 10කට කලින් තමයි එතුමියට මහාධිකරණයට යන්න තිබුණේ. මේ නිර්දේශ පහළින් එන්නේ නැතිව බරපතළ ගැටලුවක් තිබුණා. මෙන්න මේ ප්‍රශ්න හඳුනා ගෙන, ඒවා විසඳන්න ඕනෑ නිසා තමයි අපට මේ වාගේ තීන්දු තීරණයක් ගන්න සිද්ධ වුණේ.

ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමාත් මෙන්න මේ කාරණය මතු කළා. මොහාන් පීරිස් මහත්මයා දැන් අවුරුදු දෙකක් රාජකාරි කර තිබෙනවා. නඩු තීන්දු දීලා තිබෙනවා; විනිශ්චයකාරවරු පත් කර තිබෙනවා; මාරු කර තිබෙනවා; උසස්වීම් දීලා තිබෙනවා. මේවා ඔක්කොම අවලංගු වෙනවාය කියන පදනමින් සමහර ගරු මන්ත්‍රීතුමන්ලා කථා කළා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය පිළිබඳ මේ වාගේ ගැටලු ගැන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හදන උදවිය දන්නවා. මොකද, රටක තනතුරුවල ස්වභාව දෙකක් තිබෙනවා. ඒ *de facto* and *de jure*. එක ස්වභාවයක් වන්නේ තත්ත්වානුකූලව පත් වන අග විනිසුරු හෝ අධ්‍යක්ෂ හෝ වෙන කුමන හෝ තනතුරක්. ඒක පත් කිරීමේ ක්‍රමය වැරැදියි නම් ඒක තත්ත්වාකාරයි; ඒක *de facto*. *De jure* කියන්නේ, නීතියට අනුකූලව පත්වීම සිද්ධ කර තිබීමයි.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ගරු ඇමතිතුමනි, එම ලියුමේ තිබෙනවා "අවලංගු" සහ "බලශූන්‍ය" කියලා. එතකොට නීති විරෝධී විධියට බලශූන්‍ය වුණාම සැකයක් මතු වෙනවා, එය නඩු තීන්දුවලටත් බලපානවාද කියලා. ඒකයි ඒ ප්‍රශ්නය මතු වන්නේ.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
බොහොම හොඳයි, ගරු මන්ත්‍රීතුමනි. එය මුළු රටම දැන ගත යුතු කාරණයක්. අපේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනය කරන වෙලාවේ, ඒ සම්පාදකවරු මෙහෙම ප්‍රශ්නයක් බලාපොරොත්තු වෙලා තිබෙනවා. අපේ රටේ විතරක් නොවෙයි, ලෝකයේ හැම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකම ඒ සඳහා ප්‍රතිපාදන සලසා තිබෙනවා. අප දන්නවා අන්තිමටම ලෝකයේ හඳපු හොඳම ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යවස්ථා රාමුව වන්නේ නෙල්සන් මැන්ඩෙලා මැතිතුමාගේ නායකත්වයෙන් 1997 දී දකුණු අප්‍රිකාවේ හඳපු ව්‍යවස්ථාව බව. එම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළත් ඒ සඳහා ප්‍රතිපාදන තිබෙනවා. ඒ විධියට ලෝකයේ හුඟක් රටවල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවල ඒවාට ප්‍රතිපාදන තිබෙනවා. ඉන්දියාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙත් තිබෙනවා. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 119. (2) ව්‍යවස්ථාවේ ඒකට ප්‍රතිපාදන තිබෙනවා. යම්කිසි විනිශ්චයකාරවරයෙක්, ඔහුගේ එහි තනතුරක් හිස්ව තිබුණත්, ඔහු පත් කරපු ක්‍රමය වැරැදි වුණත්, ඔහුගේ පත්වීම දෝෂ සහගත වුණත්, අවලංගු වුණත්, විනිශ්චයකාරවරයෙක් විධියට යම් කිසි තීන්දුවක්, තීරණයක් ගත්තා නම් ඒ සියල්ලම නීත්‍යානුකූලව බලපවතී කියලා එම ව්‍යවස්ථාවේ තිබෙනවා. ඒ නිසා මොහාන් පීරිස් මැතිතුමා දුන්න කිසිම තීන්දුවක් අවලංගු වන්නේ නැහැ; එතුමා කරපු කිසිම උසස්වීමක්, පත්වීමක් අවලංගු වන්නේ නැහැ.

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

ඒක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ආරක්ෂා කර තිබෙනවා. අප ඒ පිළිබඳව අධ්‍යයනයක් කරලා තමයි කටයුතු කළේ.

අනික් කාරණය මේකයි. ඩිලාන් පෙරේරා මන්ත්‍රීතුමා මතු කළා වාගේ, ඒ පත්වීම අවලංගුයි කියා අප කියන්නේ, යෝජනා සම්මතයක් නැති නිසායි. ඒක අවලංගු කරනවා නම් අපට කරන්න වන්නේ දෝෂාභියෝගයක් හරහායි. ගරු ඩිලාන් පෙරේරා මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කළ ඒ නීති තර්කය අප පිළිගන්නවා. නමුත්, මෙතැන ආපසු දෝෂාභියෝගයට යන්න අවශ්‍යතාවක් නැත්තේ අපට ඕනෑකම තිබෙන්නේ අවලංගු කිරීමක් නොවෙයි, පත් කිරීම නීතියට අනුකූලව සිද්ධ වෙලා නැහැ කියලා පෙන්වා දීම පමණක් නිසායි. ඒක ජනාධිපතිවරයෙකුගේ වග කීමක්.

අප කියනවා පාර්ලිමේන්තුව උත්තරීතරයි කියලා. හැබැයි, මේ සංකල්පය වැරැදියි. අප හුඟක් ඉස්සර දේශපාලන විද්‍යාව ඉගෙන ගන්න කොට එහෙම තමයි ඉගෙන ගත්තේ.

අද එහෙම එකක් ලෝකය පිළිගන්නේ නැහැ. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් එහෙම පිළිගන්නේ නැහැ. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4වන ව්‍යවස්ථාව බොහොම පැහැදිලියි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 (අ) අනුව්‍යවස්ථාවට අනුව ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව උත්තරීතරයි; ස්වාධීනයි. දෙවනුව, 4 (ආ) අනුව්‍යවස්ථාවට අනුව රටේ ආරක්ෂාව ඇතුළුව ජනතාවගේ විධායක බලය සම්බන්ධයෙන් ජනාධිපතිවරයා ඇතුළු විධායකය උත්තරීතරයි. වෙන කාටවත් එයට මැදිහත් වන්න බැහැ.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

ගරු ඇමතිතුමනි, එදා රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ආණ්ඩුව කාලයේ ගෙනාපු දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ නඩුව දිනුවේ ඔය තර්කය ඉදිරිපත් කරලා තමයි.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

අපි නීතිඥවරු විධියට තර්ක කරනවා. නමුත් මා මෙතැන කථා කරන්නේ නීති තර්කයක් නොවෙයි. අර කියමනක් තිබෙනවා නේ, "Judges have to be consistent, but not the lawyers" කියලා. හැබැයි එහෙම නීති තර්කයක් නොවෙයි, මා මෙහිදී ගෙනෙන්නේ. පාර්ලිමේන්තුව උත්තරීතරයි කියා තිබෙනවා. හැබැයි මා දැන් මේ කියන කථාවත් ඒ නඩු තීන්දුවට සමාන වෙනවා; ගැළපෙනවා. එදා දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙන වෙලාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් විධායකයට දීලා තිබෙන උත්තරීතර බලය කප්පාදු කරන්න පාර්ලිමේන්තුවට බලයක් නැහැයි කියලා තර්ක කළ බව මට මතක් වුණේ ඩිලාන් පෙරේරා මන්ත්‍රීතුමා කිව්වාට පස්සේයි. අපි ඒ තර්කය ඉදිරිපත් කළාම ශ්‍රේෂ්ඨාධිකරණය එය පිළිගත්තා. ඒ එක්කම ජනතාවගේ පරමාධිපත්‍ය බලය තුළින් පත්වන විධායකයට බලය දීලා තිබෙනවා, ජනතාව වෙනුවෙන් අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම සඳහා අධිකරණ පත් කරන්න. එතකොට නීතියේ අර්ථ නිරූපණය කිරීම අතින් ගත්තාම අධිකරණය උත්තරීතරයි. ඇත්තටම මේ ආයතන තුනම උත්තරීතරයි, තම තමන්ගේ විෂය ක්ෂේත්‍රය තුළ. එම නිසා තමයි -

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

පාර්ලිමේන්තුව අවසන්-

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ඔව්. මොකද, විධායකය ක්‍රියාත්මක කරන්න ඕනෑ බලය මොකක්ද කියා තීන්දු කරන්නේ පාර්ලිමේන්තුවෙන්. අධිකරණය ක්‍රියාත්මක කරන්න ඕනෑ බලය අධිකරණයට දෙන්නේ පාර්ලිමේන්තුවෙන්. ඒ නීතිය හැදීමයි. පාර්ලිමේන්තුව නීති හදන නිසා පාර්ලිමේන්තුව උත්තරීතරයි. නීතිය හදලා අධිකරණයට දුන්නාට පස්සේ, මේ විධියටයි නීතිය ක්‍රියාත්මක වෙන්න ඕනෑය කියලා විධායකයට බලය දෙන කොට ඒ විෂයයන් සම්බන්ධයෙන් ඒ ගොල්ලනුත් උත්තරීතරයි. හැබැයි අපි පිළිගන්නවා, ඒක වෙනස් කරන්න ඕනෑ නම් ඒ සඳහාත් පාර්ලිමේන්තුවට බලය තිබෙනවාය කියලා. හැබැයි දීලා තිබෙන බලය ක්‍රියාත්මක කිරීමේදී ඒ ගොල්ලෝ උත්තරීතරයි. අවසානයේදී ජනතාවගේ පරමාධිපත්‍යය උත්තරීතරයි. ජනතාවගේ පරමාධිපත්‍යය එක ආයතනයකට දුන්නොත්, ඒ තුළින් ඒකාධිපතියකු නිර්මාණය වනවා. ඒක වළක්වන්න තමයි Baron de Montesquieu 1700 ගණන්වල වෙස්ට්මින්ස්ටර් ආකෘතිය අරගෙන separation of power concept එකක් ලෝකයට දුන්නේ. එය පිළිගෙන තමයි බලතල බෙදීමේ න්‍යාය අනුව අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හදලා තිබෙන්නේ.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. Minister, you have one more minute.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

Sir, give me five more minutes, please.

අපි මේ ඉදිරිපත් කරන කාරණය මේ රටේ ජනතාව පිළිගත්තාද, නැද්ද කියන ප්‍රශ්නයකුත් තිබෙනවා. පසු ගිය දිනයේදී ශිරානි බණ්ඩාරනායක මැතිනියගේ විශ්‍රාම ගැනීමේ උත්සවයට අපේ රටේ පහළ අධිකරණවල විනිශ්චයකාරවරුන් 130දෙනකුට වැඩි ප්‍රමාණයක් පැමිණ තිබෙනවා. මා හිතන හැටියට 180දෙනකු, 190දෙනකු විතර පැමිණෙන්න ඇති. එපමණ ප්‍රමාණයක් පැමිණ තිබෙනවා. මොකද, අවශ්‍යතාවක් විධියට අධිකරණය පැත්තෙනුත් ඒ කාරණය පිළිගැනීමට ලක් වෙලා තිබෙන නිසායි.

දැන් බලන්න. දැන් සති දෙකකට කලින් නීතිපති දෙපාර්තමේන්තුවට අවුරුදු 30ක් සම්පූර්ණ වීම නිමිත්තෙන් විශාල උත්සවයක් පැවැත්වූවා, ආසියාවේම නීතිපතිතුමන්ලා ගෙන්වා. එම උත්සවයට සහභාගි වීම සඳහා මොහාන් පීරිස් මැතිතුමාට ආරාධනා පත්‍රයක් යවා තිබුණා. නමුත් නීතිපති දෙපාර්තමේන්තුව තීන්දු කළා, එම ආරාධනාව cancel කරන්න. එය අපි කියලා කළ දෙයක් නොවෙයි. ඒ ගැන අපට කිසිම සම්බන්ධයක් නැහැ. අපිත් ගියේ ආරාධිතයන් විධියටයි. එවැනි තත්ත්වයක් අග විනිසුරු තනතුරකට උදා වන කොට, රටක අධිකරණ ක්‍රමය ගෙන යන්නේ කොහොමද?

අනික් කාරණය මෙයයි. අපි දින 100 වැඩ පිළිවෙළ ඉදිරිපත් කළා. එහි 94වන කාරණය හැටියට සඳහන් කර තිබෙනවා, වැරැදි විධියට ශිරානි බණ්ඩාරනායකට අහිමි කරපු ඒ තනතුර ආපසු දෙනවාය කියලා. ජනතාව එයට අනුමැතිය දීලා තිබෙනවා. අපේ ගරු විපක්ෂ නායකතුමා කිව්වා, දින 100 වැඩ පිළිවෙළට සම්පූර්ණ සහාය දෙනවා, එය ක්‍රියාත්මක කරන්නය කියලා. ඒ දින 100 වැඩ පිළිවෙළේ කොටසක් තමයි මේ කාරණය. එම නිසා ඔබතුමන්ලාත් මෙයට එකඟ වෙලා තිබෙනවා. අපි මෙය වැරැදි

විධියට අර්ථ කථනය කරනවා නොවෙයි. මේ කාරණයත් දින 100 වැඩ පිළිවෙළ තුළ තිබුණා.

ඒ විතරක් නොවෙයි. ඔබතුමන්ලා දන්නවා, මොහාන් පීරිස් මැතිතුමා -මා පෞද්ගලික දේවල් කියන්නේ නැහැ- රජයේ ජ්‍යෙෂ්ඨ නීතිඥවරයකු විධියට විශ්‍රාම ගිය බව. ඒ විශ්‍රාම ගියේ, අඩු සේවා කාලයකින් විශ්‍රාම යා හැකි බවට ඒ කාලයේ ජෝන් සෙනෙවිරත්න හිටපු ඇමතිතුමන්ලා නිකුත් කළ circular එක යටතේයි. එතකොට මොහාන් පීරිස් මැතිතුමා විශ්‍රාම ගියා. විශ්‍රාම ගිය මොහාන් පීරිස් මහත්මයා නීතිපති විධියට ආපසු සේවයට එනවා. එහෙම විශ්‍රාම ගිය අයට ආපසු සේවයට එන්න බැහැයි කියා ශ්‍රේෂ්ඨාධිකරණයෙන් නඩු තීන්දුවකුත් දීලා තිබෙනවා. ඒක තමයි රටේ, ලෝකයේ ඕනෑම තැනක තිබෙන නීතිය. ඒ ගොල්ලන්ට කොන්ත්‍රාත් පදනම මත සේවයට එන්න පුළුවන්. නමුත්, ස්ථිර තනතුරකට එන්න බැහැ. SSC විධියට විශ්‍රාම ගිය මොහාන් පීරිස් මහත්මයා නීතිපති විධියට ආපහු රස්සාවට එනවා. ඇවිල්ලා දෙවෙනි වතාවට විශ්‍රාම යනවා. ඊට පස්සේ අග විනිසුරු විධියට එනවා තුන්වෙනි වතාවට. ඊට පස්සේ එතුමා ආපහු තුන්වෙනි වතාවටත් විශ්‍රාම යනවා. ලෝකයේ කොහේද ඒ විධියේ ක්‍රමයක් තිබෙන්නේ? ඒ විධියේ ක්‍රමයක් මේ පාර්ලිමේන්තුවේ ඉන්න අපි කාටවත් අනුමත කරන්න පුළුවන්ද? මේක මහා බරපතළ ප්‍රශ්නයක්.

අපේ ගරු ඩිලාන් පෙරේරා මැතිතුමා මට යම් සිද්ධියක් කිව්වා, කොළඹ උසාවියේ අංක 05 අධිකරණයේ මහේස්ත්‍රාත්තුමන්ට අනවශ්‍ය බලපෑමක් කරලා, සිද්ධියක් වුණාය කියලා. තවත් කවුරුන් හෝ ඒ ගැන කිව්වා. ඇත්තටම අපි ඒ සිද්ධිය දන්නේ නැහැ. අපි එතැනදී කිසිම දේශපාලන මැදිහත්වීමක් කරලා නැහැ. මම ඒ සිද්ධිය දන්නේ නැහැ. ඔබතුමන්ලා ඒ කාරණය මතු කිරීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. ඒ පිළිබඳව සම්පූර්ණ පරීක්ෂණයක් කරලා, ගත යුතු හැම නීති පියවරක්ම අරගෙන අපි ඔබතුමන්ලාට දැනුම් දෙනවා. මින් ඉදිරියට යමක් කරන විට අපි ඔබතුමන්ලා සමඟ සාකච්ඡා කරන්නත් බලාපොරොත්තු වෙනවා.

මම හිතනවා, මම විශ්වාස කරනවා, ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීමට සහ යහ පාලනය ඇති කිරීමට එක්සත් ජාතික පක්ෂයේ අපට විතරක් අපේ රටේ ජනතාව දීපු mandate එකක් නොවෙයි මේක කියලා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම්තුමා විධියට, ජනාධිපති අපේක්ෂකයා විධියට ඉදිරිපත් වුණ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට කතිරයට ගහන විට ජනතාව ඒ mandate එක ඔබතුමන්ලාටත් දීලා තිබෙනවා. ඒ නිසා මේ කාරණාවලදී අපි කවුරුත් එකට එකතු වෙලා යා යුතු ගමනක් තිබෙනවා. නැත්නම් අපේ රටේ ජනතාවගේ සියලුම අපේක්ෂා භංගත්වයට පත් වෙනවා. සමහර වෙලාවට යම් යම් චෝදනාවලට, -දේශපාලනඥයන්ගෙන් වෙන්න පුළුවන්- පොලීසියෙන් ප්‍රශ්න කරන්න පුළුවන්, අත් අඩංගුවට ගන්න පුළුවන්. රටේ නීතිය ක්‍රියාත්මක වීමේදී දේශපාලන මැදිහත්වීමකින් තොරව ඒවා සිද්ධ වෙනවා නම් ඒ සම්බන්ධයෙන් දේශපාලනඥයන්ට දොස් කීම වැරදියි. ඒක අපේ පැත්තේ අය සම්බන්ධයෙන් වෙන්න පුළුවන්, ඔබතුමන්ලාගේ පැත්තේ අය සම්බන්ධයෙන් වෙන්න පුළුවන්. රටේ නීතිය ක්‍රියාත්මක කිරීමත් යහ පාලනය තමයි. රටේ නීතිය ක්‍රියාත්මක කිරීම ප්‍රජාතන්ත්‍රවාදය තමයි. නමුත් දේශපාලන මැදිහත්වීමකින් පොලඹවලා, පළිගැනීමේ චේතනාවකින් එහෙම කරනවා නම් වැරැදියි කියලා අපි පිළිගන්නවා. එහෙම දෙයක් තිබෙනවා නම් ඒ ගැන චෝදනා කරන්න ඔබතුමන්ලාට අයිතියක් තිබෙනවා.

වාද විවාදවලදී අපේ හිත් රිදුම්, අමනාපකම් ඇති වෙන්නට පුළුවන්. අපි ඒවා ඔක්කෝම පසෙක තියලා ජනතාවගේ අභිලාෂ ඉෂ්ට කර ගැනීම සඳහා දින 100 වැඩ පිළිවෙළට යමු කියලා මම ඉතා කරුණාවෙන් ඔබතුමන්ලාට ආරාධනා කරනවා. අපේ රටේ යහ පාලනය, ප්‍රජාතන්ත්‍රවාදය ඇති වුණාට පසුව, ආපසු ජනතාව තමයි තීන්දු කරන්නේ කවුද එතුමන්ලාගේ පාලකයෝ වෙන්න ඕනෑ කියලා. ඒ අයිතිය අපි ජනතාවට දෙමු. ජනතාවගේ තීන්දුවලට අපි ගරු කරමු; හිස නමමු. බොහොම ස්තුතියි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Yes, Hon. Leader of the Opposition.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
එතුමාගේ සංකල්පය ඉතාම හොඳයි, ඒ නිසා තමයි අපිත් උදවු කරන්නේ. නමුත් එක්සත් ජාතික පක්ෂයේ ප්‍රාදේශීය දේශපාලනඥයන් සහ සමහර මැති ඇමතිතුමන්ලා මේ තත්ත්වය තේරුම් ගන්න ඕනෑ. අපේ පාක්ෂිකයන්ට හිරිහැර කරන විට, -වත්තල ප්‍රාදේශීය සභාවට මැරයෝ ඇවිල්ලා පහර දෙන විට- අපට අමාරු වෙනවා ඔබතුමන්ලාට සහයෝගය දෙන්න. මොකද, අපි අපේ පාක්ෂිකයන්ගේ හඬට, ඔවුන්ගේ දුකට හා වේදනාවට සවන් දෙන්න ඕනෑ. ඒ නිසා ප්‍රායෝගිකව අපට දේශපාලනයේදී යම් යම් අමාරුකම් ඇති වෙයි, මේ තත්ත්වය දිගටම ගියොත් කියන කාරණය මම මතක් කරන්නට කැමැතියි.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මම ගරු විපක්ෂ නායකතුමාට ස්තුතිවන්ත වෙනවා. පසු ගිය දවස්වල බණ්ඩාරගම ප්‍රදේශයේ අපේ මන්ත්‍රීතුමෙක් සම්බන්ධවත් ඒ විධියේ ප්‍රශ්නයක් මතු වුණා. ආරක්ෂක ඇමති විධියට කිසිම පක්ෂ භේදයකින් තොරව තීන්දු තීරණ ගන්න බලය ජනාධිපතිතුමාට තිබුණා. එතුමා ඒ විධියට තීන්දු තීරණ ගත්තා; නීතිය ක්‍රියාත්මක කළා. දැන් ඔබතුමා සඳහන් කළ වත්තල ප්‍රදේශයේ සිද්ධිය සම්බන්ධයෙනුත් අතිගරු ජනාධිපතිතුමා නීතිය ක්‍රියාත්මක කරන්න මැළි වෙන්නේ නැහැ කියලා මට විශ්වාසයක් තිබෙනවා. නීතිය ක්‍රියාත්මක කිරීමේදී අපි එතුමාට බාධා කරන්නේත් නැහැ. රටේ ජනතාවගේ බලාපොරොත්තු ඉෂ්ට කරන්න, රටේ නීතිය ක්‍රියාත්මක විය යුතුයි කියලා අපි විශ්වාස කරනවා. ඒ වෙනුවෙන් අපි පෙනී සිටිනවා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ජනාධිපතිතුමා ගැන අපට අවිශ්වාසයක් නැහැ. මේ පිළිබඳව අපි දැන්වූ අවස්ථාවේදී එතුමා යම් යම් පියවර ගත්තා. නමුත් ප්‍රාදේශීය සභාවට දවල් ගිහින් අමු අමුවේ මේ විධියට පහර දුන් අයට දවසින් ඇප දුන්නා. ඒ අයට දවසින් ඇප දුන්නා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු විපක්ෂ නායකතුමනි, මම පිළිගන්නවා. ඒ විධියේ අවාසනාවන්ත සිද්ධි දෙක තුනක් වුණා. මගේ මහරගම ආසනයේත්, ගරු සුජීව සේනසිංහ නියෝජ්‍ය ඇමතිතුමාගේ කඩුවෙල ආසනයේත් විපක්ෂයේ අයගේ හිත රිදෙන දේවල් වචනයකින්වත් කියන්න අපි ඉඩ දුන්නේ නැහැ. අපි හැම පක්ෂවලටම ඡන්දය දුන්නු ජනතාව, අපේ දරුවෝ විධියට ආරක්ෂා කළා. ඔබතුමන්ලාට සොයලා බලන්නට පුළුවන් අපේ ආසනවල තත්ත්වය. අපි වචනයකින්වත් හිරිහැර කරන්න දුන්නේ නැහැ. [බාධා කිරීමක්] අපි දැන් ඒ ප්‍රතිපත්තියෙන් ඈත් වෙලා සිටින්නේ. අපිට ඕනෑ සියලු දෙනාම රැක ගන්නයි.

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

***සභාමේසය මත තබන ලද ලිපිය:**
சபாபீடத்தில் வைக்கப்பட்ட கடிதம் :
Letter tabled:

කථානායක, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
சபாநாயகர், இலங்கை பாராளுமன்றம்
Speaker, Parliament of Sri Lanka

2013 ජනවාරි මස 11 වැනි දින

අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිතුමා
ජනාධිපති කාර්යාලය
කොළඹ 1

අතිගරු ජනාධිපතිතුමනි,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍රවිනිශ්චයකාර ධුරයෙන් ගරු (ආචාර්ය) උපතිස්ස අනපත්තු බණ්ඩාරනායක වංශල මුදියන්සේ රාළහාමිලාගේ ගිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මිය ඉවත්කිරීම සඳහා අතිගරු ජනාධිපතිවරයා වෙත පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් ඉදිරිපත් කිරීම පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107(2) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 117 දෙනෙකුගේ අත්සන් සහිතව 2012 නොවැම්බර් මස 01 වන දින මා වෙත භාර දෙන ලද යෝජනාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට අනුකූලවූ ඟෙයින් ම විසින් භාරගන්නා ලදුව, 2012 නොවැම්බර් මස 6 වැනි දින පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරන ලදී. එම යෝජනාවේ පිටපතක් ඔබතුමාගේ පහසු යොමුව පිණිස ඇමුණුම් 1 වශයෙන් අමුණා එවමි.

එකී යෝජනා සම්මතයේ දන්වා ඇති චෝදනා පිළිබඳව විමර්ශනය කොට පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 78 අ (2) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර ප්‍රියදර්ශන යාපා මහතාගේ සභාපතිත්වයෙන් යුතු සහ ගරු නිමල් සිරිපාල ද සිල්වා, ගරු ඒ.ඩී.සුසිල් ප්‍රේමජයන්ත මහතා, ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා, ගරු ඩිලාන් පෙරේරා මහතා, ගරු විමල් වීරවංශ මහතා, ගරු නියෝමාල් පෙරේරා මහතා, ගරු ජෝන් අමරතුංග මහතා, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා, ගරු විජිත හේරත් මහතා සහ ගරු රාජවරෝදියම සම්පන්දන් මහතා යන මන්ත්‍රීවරුන්ගේ සාමාජිකත්වයෙන් ගරු මන්ත්‍රීතුමන්ලා 11 දෙනෙකුගෙන් සමන්විත විශේෂ කාරක සභාවක් වර්ෂ 2012 නොවැම්බර් මස 14 වන දින ම විසින් පත්කරන ලදී.

එකී යෝජනා සම්මතයේ දන්වා ඇති චෝදනා පිළිබඳව විමර්ශනය කොට පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 78 අ (2) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර ප්‍රියදර්ශන යාපා මහතාගේ සභාපතිත්වයෙන් යුතු සහ ගරු නිමල් සිරිපාල ද සිල්වා, ගරු ඒ.ඩී.සුසිල් ප්‍රේමජයන්ත මහතා, ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා, ගරු ඩිලාන් පෙරේරා මහතා, ගරු විමල් වීරවංශ මහතා, ගරු නියෝමාල් පෙරේරා මහතා, ගරු ජෝන් අමරතුංග මහතා, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා, ගරු විජිත හේරත් මහතා සහ ගරු රාජවරෝදියම සම්පන්දන් මහතා යන මන්ත්‍රීවරුන්ගේ සාමාජිකත්වයෙන් ගරු මන්ත්‍රීතුමන්ලා 11 දෙනෙකුගෙන් සමන්විත විශේෂ කාරක සභාවක් වර්ෂ 2012 නොවැම්බර් මස 14 වන දින ම විසින් පත්කරන ලදී.

එම කාරක සභාව, එකී යෝජනා සම්මතයේ දන්වා ඇති චෝදනා පිළිබඳව විමර්ශනය කොට තම නිර්දේශ ඇතුලත් වාර්තාව, 2012 දෙසැම්බර් මස 08 වැනි දින කාරක සභාවේ සභාපතිතුමන් විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. එම කාරක සභාවේ වාර්තාවේ පිටපතක් ඇමුණුම් 2 වශයෙන් අමුණා එවමි.

අනතුරුව කාරක සභාවේ වාර්තාව 2013 ජනවාරි මස 10 සහ 11 වැනි දිනයන්හිදී පාර්ලිමේන්තුවේදී විවාද කර, එම යෝජනාව 2013 ජනවාරි මස 11 වැනිදා පක්ෂව ඡන්ද 155 ක් හා විරුද්ධව ඡන්ද 49 ක් ලැබීමෙන් යථා පරිදි සම්මත වූ බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107(2) ව්‍යවස්ථාව පරිදි ඔබතුමන්ට දැන්වීමට කැමැත්තෙමි.

මෙයට, විශ්වාසී

චමල් රාජපක්ෂ

කථානායක

පාර්ලිමේන්තුව අ. භා. 8.45 ට, අද දින සහා සම්මතිය අනුව, 2015 පෙබරවාරි 05 වන බ්‍රහස්පතින්දා අ.භා. 1.00 වන තෙක් කල් ගියේය.

பி.ப. 8.45 மணிக்கு பாராளுமன்றம் அதனது இன்றைய தீர்மானத்துக்கிணங்க, 2015 பெப்ருவரி 05, வியாழக்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Adjourned at 8.45 p.m. until 1.00 p.m. on Thursday, 05th February, 2015, pursuant to the Resolution of Parliament of this Day.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

232 වන කාණ්ඩය - 05 වන කලාපය
தொகுதி 232 - இல. 05
Volume 232 - No. 05

2015 පෙබරවාරි 05වන බ්‍රහස්පතින්දා
2015 பெப்ருவரி 05, வியாழக்கிழமை
Thursday, 05th February, 2015

පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:
විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
හෝමාගම මහින්ද රාජපක්ෂ විද්‍යාලයේ නිර්මාණය වී ඇති අර්බුදය
උමා ඔය බහුකාර්ය ව්‍යාපෘතියේ හානිකර බලපෑම්

හෝමාගම මහින්ද රාජපක්ෂ විද්‍යාලයේ නිර්මාණය වී ඇති අර්බුදය:
අධ්‍යාපන අමාත්‍යතුමාගේ ප්‍රකාශය

වරප්‍රසාද:
2015 පෙබරවාරි 04 වන දින "සිරස" ප්‍රවෘත්ති විකාශය

විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත
පළමුවන වර කියවන ලදී

විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත
දෙවන වර කියවීම - විවාදය කල් තබන ලදී

பிரதான உள்ளடக்கம்

அறிவிப்புக்கள்:
ஒதுக்கீடு (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றத் தீர்ப்பு

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல் மூல வினா:
ஹோமாகம மஹிந்த ராஜபக்ஷ வித்தியாலயத்தில் உருவான நெருக்கடி
உமா ஓயா பலநோக்குக் கருத்திட்டத்தின் பாதக விளைவுகள்

ஹோமாகம மஹிந்த ராஜபக்ஷ வித்தியாலயத்தில் உருவான நெருக்கடி:
கல்வி அமைச்சரினது கூற்று

சிறப்புரிமை :
2015 பெப்ருவரி 04ஆம் திகதிய 'சிரச' செய்தி அறிக்கை

ஒதுக்கீடு (திருத்தம்) சட்டமூலம்
முதன்முறை மதிப்பிடப்பட்டது.

ஒதுக்கீடு (திருத்தம்) சட்டமூலம்
இரண்டாம் மதிப்பு - விவாதம் ஒத்திவைக்கப்பட்டது

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Appropriation (Amendment) Bill: Determination of the Supreme Court

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Crisis in Mahinda Rajapaksa College, Homagama
Adverse Impacts of Uma Oya Multipurpose Development Project

CRISIS IN MAHINDA RAJAPAKSA COLLEGE:
Statement by Minister of Education

PRIVILEGE:
News Telecast on "Sirasa TV" on 4th February, 2015

APPROPRIATION (AMENDMENT) BILL:
Read the First Time

APPROPRIATION (AMENDMENT) BILL:
Second Reading – Debate Adjourned

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2015 පෙබරවාරි 05වන බ්‍රහස්පතින්දා
2015 பெப்ருவரி 05, வியாழக்கிழமை
Thursday, 05th February, 2015

අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු චන්ද්‍රකුමාර් මුරුගේසු මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.

குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] தலைமை வகித்தார்கள்.

The Parliament met at 1.00 p.m.,

MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය
ஒதுக்கீடு (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றத் தீர்ப்பு
APPROPRIATION (AMENDMENT) BILL : DETERMINATION OF THE SUPREME COURT

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

I have an Announcement to make to the House regarding the Bill titled "Appropriation (Amendment)".

The Bill certified by the Cabinet of Ministers as urgent in the national interest was referred to the Supreme Court by His Excellency the President in terms of Article 122(1)(b) of the Constitution.

The Supreme Court has determined that in terms of Article 123(1) of the Constitution, neither the Bill, nor any of its provisions are inconsistent with the Constitution.

I order that the Determination of the Supreme Court be printed in the Official Report of today's proceedings.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය
உயர் நீதிமன்றத் தீர்ப்பு
Determination of the Supreme Court:

IN THE SUPREME COURT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA

In the matter of a reference in terms of Article 122 (1)(b) of the Constitution
An Act to Amend the Appropriation Act No. 41 of 2014

S.C. Special Determination No. 01/ 2015

Before :	Chandra Ekanayake,	Judge of the Supreme Court
	Sarath de Abrew,	Judge of the Supreme Court
	Priyantha Jayawardena PC,	Judge of the Supreme Court

Counsel : Indika Demuni de Silva, Deputy Solicitor-General with Dr.Avanthi Perera, Senior State Counsel and Suren Gnanaraj, State Counsel for the Attorney-General

The Court assembled for the hearing at 10.00 a.m. on 2nd February, 2015.

A Bill titled " AN ACT TO AMEND THE APPROPRIATION ACT NO. 41 of 2014 " has been referred to the Chief Justice by His Excellency the President in terms of Article 122(1)(b) of the Constitution for determination by this Court as to whether the Bill or any provision thereof is inconsistent with the Constitution. The Bill bears an endorsement under the hand of the Secretary to the Cabinet of Ministers to the effect that the Cabinet of Ministers has certified that in its view, the Bill is urgent in the national interest.

Indika Demuni de Silva, Deputy Solicitor-General with Dr.Avanthi Perera, Senior State Counsel and Suren Gnanaraj, State Counsel, appeared on behalf of the Attorney-General and assisted this Court in consideration of the provisions of the Bill.

The Bill seeks to amend Section 2 (1), 2(1)(b), 2(2), 2(4), First, Second and Third Schedules of the said Appropriation Act No. 41 of 2014 in order to vary the limits in the following manner;

(i) by the substitution for the words " rupees two thousand one hundred sixty eight billion two hundred ninety two million seven hundred eighteen thousand ", of the words " rupees one thousand nine hundred eighty one billion two hundred ninety two million seven hundred eighteen thousand " in section 2(1),

(ii) by the substitution for the words " does not exceed rupees one thousand seven hundred eighty billion " of the words " does not exceed rupees one thousand five hundred ninety three billion " in section 2(1)(b),

(iii) by the substitution for the words " rupees two thousand one hundred sixty eight billion two hundred ninety two million seven hundred eighteen thousand " of the words " rupees one thousand nine hundred eighty one billion two hundred ninety two million seven hundred eighteen thousand " in section 2(2), and

(iv) by the substitution for the words " rupees one thousand two hundred thirty six billion seven hundred seven million two hundred eighty two thousand " of the words " rupees one thousand two hundred thirty six billion seven hundred eight million four hundred fifty two thousand " in section 2(4).

Amendments to the said schedules are consequential to the proposed amendments to the principal enactment. Whilst the proposed amendments to section 2(1), 2(1)(b) and 2(2) reduce the limits, the proposed amendment to section 2(4) increases the limit, stipulated in the said section. Mrs. Demuni de Silva, submitted that the provisions of the Bill do not violate any of the Articles of the Constitution.

Having considered the provisions of the Articles set out in Chapter 17, and the provisions of Articles 75 and 76 of the Constitution in relation to the proposed Bill we are of the opinion that the amendments sought to be made are within the legislative powers of Parliament, and do not violate any of the provisions of the Constitution.

We accordingly determine that neither the Bill nor any of the provisions thereof are inconsistent with the Constitution.

Chandra Ekanayake
Judge of the Supreme Court

Sarath de Abrew
Judge of the Supreme Court

Priyantha Jayawardena, PC
Judge of the Supreme Court

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනතේ 2 වැනි වගන්තිය යටතේ විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 දෙසැම්බර් 11 දිනැති අංක 1892/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග.- [විදේශ කටයුතු අමාත්‍ය ගරු මංගල සමරවීර මහතා වෙනුවට ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

අය වැය ඇස්තමේන්තුව 2015 (සංශෝධිත කෙටුම්පත).- [මුදල් අමාත්‍ය ගරු රවි කරුණානායක මහතා වෙනුවට ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The Hon. Karuppaiah Velayudam - [*Pause.*] Not here.

ගරු පී. දයාරත්න මහතා
(மாண்புமிகு பீ. தயாரத்ன)
(The Hon. P. Dayaratna)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අම්පාර, මඩවලලන්ද, තිඹිරිගොල්ල විද්‍යාලයෙහි සේවය කරන පී. අරුණ ශාන්ත මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හෙම්මාතගම, මාවනැල්ල පාර, ඩී 83 දරන ස්ථානයෙහි පදිංචි එම්.එස්.එම්. අබුබක්කර් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The Hon. C.B. Rathnayake - [*Pause.*] Not here.

ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා
(மாண்புமிகு லக்ஷ்மன் வசந்த பெரேரா)
(The Hon. Lakshman Wasantha Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මාතලේ, ඕවිලිකන්ද, කිරිමැටියාව, අංක 44 දරන ස්ථානයෙහි පදිංචි අයි.පී. උපාරිස් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලුණුවිල පොල් පර්යේෂණ ආයතනය, විද්‍යාත්මක හා තාක්ෂණික සේවා නිලධාරින්ගේ සංගමයේ ලේකම් තනතුර දරන ඊ.එස්. ශාන්ත මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The Hon. Neranjan Wickramasinghe - [*Pause.*] Not here.

The Hon. Shehan Semasinghe - [*Pause.*] Not here.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Question No. 1.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා.

ඒ අතර මම ඔබතුමාගේ අවධානයට මේ කාරණය යොමු කරවනවා. අද තිබෙන්නේ ප්‍රශ්න හතරයි. ප්‍රශ්න සඳහා අපි පැයක් වෙන් කරලා තිබෙනවා. ඇත්තටම විපක්ෂයේත්, ආණ්ඩු පක්ෂයේත් මන්ත්‍රීවරු ඉදිරිපත් කරපු ප්‍රශ්න තිබෙනවා. ප්‍රශ්න විශාල ප්‍රමාණයක් ලැබී තිබුණු නිසා එක මන්ත්‍රීවරයෙක්ගෙන් එක ප්‍රශ්නයයි ගන්නේ කියලා පසු ගිය කාලයේ තීන්දුවක් ගන්නට යෙදුණා. ඒ නිසා නැවත වතාවක් ප්‍රශ්න ලැබෙනකම් හරි ප්‍රශ්න තිබෙන මන්ත්‍රීවරුන්ගේ ප්‍රශ්න සංඛ්‍යාව එකකට වඩා වැඩි කරලා කලින් විධියට ප්‍රශ්න තුනක් ඇතුළත් කරන්න කියලා මම ඔබතුමාගේ අවධානයට යොමු කරවනවා. ගරු කථානායකතුමාත් එක්ක කථා කරලා ඒකට වැඩ පිළිවෙළක් හදනවා නම් හොඳයි. නැත්නම් කාලය අපරාදේ. ඒකයි ප්‍රශ්නය. ප්‍රශ්න අහන්න වෙන් කර තිබෙන කාලය නැති වන එකත් ප්‍රශ්නයක්. ඒ නිසා මම ප්‍රශ්නය අහනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The Members of the Opposition have not yet referred Questions for Oral Answers. That is the problem. In future, we will do that.

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
What is the point of Order, Hon. Shantha Bandara?

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ වනකොට අපි විපක්ෂ මන්ත්‍රීවරු හැටියට ප්‍රශ්න කීපයක්ම බාරදීලා තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමා ඔතැන වාඩිවෙලා ඉන්නේ ඇයි?

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
මේ පැත්තේ වාඩිවෙලා ඉන්නේ එහා පැත්තේ ඉඩ නැති නිසා. එහා පැත්තේ ඉඩ නැති නිසා මේ පැත්තේ වාඩිවෙලා ඉන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි කියන්නේ ඒ ප්‍රශ්න අපි ඉදිරිපත් කරලා තිබෙන නිසා ඒ ප්‍රශ්න අහන්න අපට අවස්ථාව ලබා දෙන්න කියලායි. [බාධා කිරීමක්] ඒක පටලවා ගන්න එපා. මේ පැත්තේ හිටියාට අපි විපක්ෂයේ ඉන්නේ.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Hon. Shantha Bandara, the Government has been formed recently and now only we know who the Ministers are. So, in future, we will follow that procedure. Question No. 1- 4530/' 13 - (1), the Hon. Buddhika Pathirana.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Plantation Industries and Leader of the House of Parliament)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

රතුපස්වල වෙඩි තැබීමේ සිද්ධිය: පරීක්ෂණය
ரத்துபஸ்வல துப்பாக்கிச் சூட்டுச் சம்பவம்: விசாரணை
RATHUPASWALA SHOOTING INCIDENT : INVESTIGATION

4582/'13

2. ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මහජන සාමය, ආපදා කළමනාකරණය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පානීය ජලය අපවිත්‍ර වීමට එරෙහිව වැලිවේරිය, රතුපස්වල ජනතාව විසින් ගෙන යන ලද උද්ඝෝෂණයට වෙඩි තැබීමක් සිදු වූයේද;

(ii) එසේ නම්, එම වෙඩි තැබීම හේතුවෙන් තුවාල ලැබූවන්ගේ සංඛ්‍යාව කොපමණද;

(iii) තුවාල ලැබූවන්ගේ නම්, ලිපිනයන් සහ මියගිය අයගේ නම් සහ පදිංචිව සිටි ලිපිනයන් කවරේද;

(iv) එම වෙඩි තැබීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වනු ලැබුවේද;

(v) ඒ අනුව වෙඩි තැබීම සඳහා නියෝග ලබා දුන් නිලධාරීන් හා වෙඩි තැබූ පිරිස හඳුනාගෙන තිබේද;

(vi) එසේ නම්, එම පිරිස කවුරුන්ද;

(vii) එම පිරිසට දඬුවම් ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

மக்கள் ஒழுங்கு, அனர்த்த முகாமை மற்றும் கிறித்தவ மத அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) குடிநீர் மாசடைவதற்கு எதிராக வெலிவேரிய ரத்துபஸ்வல மக்கள் நடத்திய ஆர்ப்பாட்டத்தின் போது துப்பாக்கிப் பிரயோகம் மேற்கொள்ளப் பட்டதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி துப்பாக்கிப் பிரயோகத்தின் காரணமாக காயமடைந்தவர்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(iii) காயமடைந்தவர்களின் பெயர்கள், முகவரிகள் மற்றும் உயிரிழந்தவர்களின் பெயர்கள் மற்றும் இறுதியாக வசித்து வந்த முகவரிகள் யாவை என்பதையும்;

(iv) மேற்படி துப்பாக்கிப் பிரயோகம் தொடர்பாக விசாரணை நடத்தப்பட்டதா என்பதையும்;

(v) அதற்கமைய துப்பாக்கிப் பிரயோகம் மேற்கொள்வதற்கு கட்டளையிட்ட அதிகாரிகள் மற்றும் துப்பாக்கிப் பிரயோகம் மேற்கொண்டவர்கள் இனங்காணப்பட்டுள்ளார் களா என்பதையும்;

(vi) ஆமெனில், இவர்கள் யாவர் என்பதையும்;

(vii) இவர்களுக்கு தண்டனை வழங்கப்பட்டுள்ளதா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Order, Disaster Management and Christian Affairs:

(a) Will he inform this House -

(i) whether the protest against the contamination of drinking water carried out by the people of Rathupaswala, Weliweriya were shot at;

(ii) if so, of the number injured owing to the aforesaid shooting;

(iii) the names and addresses of the injured and the deceased;

(iv) whether an investigation has been carried out with relevance to that shooting;

(v) accordingly, whether the officers who gave orders to fire and those who performed it have been identified;

[ගරු අනුර දිසානායක මහතා]

(vi) if so, who the aforesaid group was; and

(vii) whether penalties were meted out to the aforesaid group?

(b) If not, why?

ගරු ජෝන් අමරතුංග මහතා (මහජන සාමය, ආපදා කළමනාකරණය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு ஜோன் அமரதுங்க - மக்கள் ஒழுங்கு, அனர்த்த முகாமை மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் அமைச்சர்)

(The Hon. John Amaratunga - Minister of Public Order, Disaster Management and Christian Affairs)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්

(ii) පුද්ගලයන් 15දෙනකු

(iii) තුවාල ලැබූවන්ගේ නම්, ලිපිනයන්

අනු අංකය	නම	ලිපිනය
01	බී.එස්. ලක්මාල්	අංක 290/3, ඇඹරුලුව උතුර, වැලිවේරිය.
02	එච්.ජේ. චින්තක පෙරේරා	අංක 78/04, නැදුන්ගමුව, ගම්පහ.
03	ආර්.ඩී.එස්. චන්ද්‍රසේන	අංක 75/15, ගල්ඔලුව, වැලිවේරිය.
04	ටී.පී.එන්.එස්. සේවියර්	අංක 588/ඒ, නැදුන්ගමුව, ගම්පහ.
05	වී.පී.එස්. ප්‍රියශාන් හිමංග	අංක 22/05, ඌරුවෙල, නැදුන්ගමුව, වැලිවේරිය.
06	එම්.කේ. පෙරේරා	අංක 560/4, නැදුන්ගමුව, ගම්පහ.
07	කේ.එස්.පී. චින්තක පෙරේරා	අංක 416/56, පින්තුවත්ත, වැලිවේරිය.
08	ජේ.ඒ.ඩී. සමීර ජයකොඩි	අංක 173, උඩුපිල, දෙල්ගොඩ.
09	වී.පී. සුජිත් විජේසිංහ	අංක 39/13/1, තෙන්නකෝන්වත්ත, වැලිවේරිය.
10	වී.ඒ. කැළුම් ප්‍රියනන්ද	අංක 39/2, පල්ලියවත්ත, වැලිවේරිය.
11	ඩී.ආර්. ප්‍රියන්ත	පොල්වත්ත පාර, වැලිවේරිය.
12	වී.ජී. නිෂාර තිලකරත්න	අංක 28/1, සියපත්විල, වැලිවේරිය.
13	එම්.ඩී. චාමික	අංක 51 ඒ, වැලිවත්ත, වැලිවේරිය.
14	එල්.එස්. කුමාර	අංක 416/192 ඒ, පින්තුවත්ත, වැලිවේරිය.
15	එස්. පෙරේරා	ජයන්ති මාවත, වැලිවේරිය.

මිය ගිය අයගේ නම් සහ පදිංචිව සිටි ලිපිනයන්

අනු අංකය	නම	ලිපිනය
01	කේ.ඒ.ඩී. අකිල දිනේෂ්	අංක 476/15, හෙලන්වත්ත, වැලිවේරිය.
02	එච්.එස්.ආර්. පෙරේරා	අංක 33, නැදුන්ගමුව, වැලිවේරිය.
03	පී.ආර්.ජී.එන්. පුෂ්පකුමාර	උඩහේන්තැන්න, ගම්පහ.

(iv) වෙඩි තැබීම සඳහා උසස් නිලධාරීන් විසින් නියෝග ලබා දී නොමැත. කලහකාරී පිරිස් විසින් යුද හමුදාව වෙතට එල්ල කළ ගල් ප්‍රහාර, පෙට්‍රල් බෝම්බ ප්‍රහාර සහ වෙඩි තැබීම්වලින් සිය ආත්ම ආරක්ෂාව සලසා ගැනීම සඳහාත් මහජන ජීවිත හා මහජන දේපළ ආරක්ෂා කරගැනීම සඳහාත් යුද හමුදා සෙබළුන් 10දෙනකු විසින් වෙඩි තැබීම සිදු කර ඇත. එම සෙබළුන් හඳුනාගෙන ඇත.

(v) ඔව්.

(vi)

අනු අංකය	නම	තනතුර	කඳවුර
01	එච්.කේ.ඩී.එස්. සෙනවිරත්න	ලා/කො 302211	06 වන ශ්‍රී ලංකා පාබල හමුදා ට්‍රිපෝලි කඳවුර, මරදාන.
02	ටී.ඒ.එස්. පද්මසිරි	සෙබළ Q 00450	26 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව, සපුගස්කන්ද.
03	කේ.පී.ඒ.අයි. දිසානායක	සෙබළ 162604	යුද හමුදා කඳවුර, වැලිසර.
04	ආර්.ඒ. වීරසූරිය	සෙබළ 402342	යුද හමුදා කඳවුර, දෙල්ගොඩ.
05	ඩී.යූ.කේ. චන්ද්‍රසේකර	සෙබළ 319296	යුද හමුදා කඳවුර, දෙල්ගොඩ.
06	කේ.එච්.ඩී. එරංග	කෝප්‍රල් එස් 319265	යුද හමුදා කඳවුර, අහුගම්මන, දෙල්ගොඩ.
07	ලලිත් ශ්‍රේ	කෝප්‍රල් 316586	එස්.එල්.එල්.අයි. අහුගම්මන, දෙල්ගොඩ.
08	ජේ.එම්. තිලකරත්න	සෙබළ 456428	ඩිමෝ කඳවුර, දෙමටගොඩ.
09	ඩිංගිරි සිරිසේන	සෙබළ 577319	ඩිමෝ කඳවුර, දෙමටගොඩ.
10	ඩී.එම්.එස්.බී. රත්නායක	සෙබළ 321086	08 වන ශ්‍රී ලංකා පාබල හමුදාව අහුගම්මන, දෙල්ගොඩ.

(vii) නැත. ගම්පහ මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක බී 1440/13 යටතේ නඩු පවරා ඇති අතර, ගොනුව නීතිපති උපදෙස් සඳහා යොමු කර ඇත.

(ආ) ඉහත පිළිතුරු සපයා ඇති බැවින් පැන නොනඟී.

ගරු අනුර දිසානායක මහතා

(மாண்புமிகு அநுர திஸாநாயக்க)

(The Hon. Anura Dissanayake)

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙසේයි.

එතැන උද්ඝෝෂණයක් පැවැත්වුණා. ගරු ඇමතිතුමනි, ඔබතුමා කියනවා පෙට්‍රල් බෝම්බ ගැහුවා කියලා. අපි නම් කොතැනකවත් දැක්කේ නැහැ වාගේම, මාධ්‍යවත් වාර්තා කර තිබුණේ නැහැ ජනතාව ඒ වෙලාවේ පෙට්‍රල් බෝම්බ ගහපු බවක්. මේක කලින් හදා දීපු උත්තරයක් වෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පොලීසියට එම තත්ත්වය පාලනය කරගන්න නොහැකියි කියලා පොලීසිය විසින් හමුදාව එතැනට කැඳවනු ලැබුවාද? එසේ කැඳවනු ලැබුවා නම් කවර පොලිස් නිලධාරියාද නියෝග දුන්නේ, තමාට මෙම තත්ත්වය පාලනය කරගන්න බැහැ, ඒ නිසා හමුදාව කැඳවිය යුතුයි කියලා?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் கொள்கை உருவாக்கம், பொருளாதார அலுவல்கள், சிறுவர், இளைஞர் மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரும்)

(The Hon. Ranil Wickremasinghe - Prime Minister, Minister of Policy Planning, Economic Affairs, Child, Youth and Cultural Affairs)

ගරු මන්ත්‍රීතුමනි, මහජන සාමය අමාත්‍යාංශයෙන් - පොලීසියෙන්- ලැබුණු පිළිතුරක් අපේ ගරු ඇමතිතුමා කියෙව්වා. එහෙත් ඔබතුමාත් දන්නවා අපි සියලුදෙනාට මේ ගැන ප්‍රශ්න ගණනාවක් තිබෙන බව. අපි තීරණය කරන්න ඕනෑ මේ ගැන

සොයා බලන්න අපි වෙනම කොමිෂන් සභාවක් පත් කරනවාද, එහෙම නැත්නම් මේ සභාවෙන් විශේෂ කාරක සභාවක් පත් කරනවාද කියලා. [බාධා කිරීමක්] මම එතැනට ගියා. මම දන්නවා මොකක්ද වුණේ කියලා. මම දන්නවා ඒ නිලධාරියාට තානාපති තනතුරක් හම්බ වුණේ කොහොමද කියලා. ඕනෑ නම් කොමිෂන් සභාවක් පත් කරන්න අපට පුළුවන්. මමයි ඉස්සර වෙලාම එතැනට ගියේ. පක්ෂ නායකයන් හෙට හමු වුණාම, කොහොමද මේ ගැන කටයුතු කරන්නේ කියන එක ගැන සාකච්ඡා කරලා ඊළඟ පියවර ගනිමු. මමත් සෑහීමකට පත් වන්නේ නැහැ ඒ සිද්ධිය පිළිබඳව මේ දීලා තිබෙන පිළිතුර සම්බන්ධයෙන්. ඒ සිද්ධිය අවසාන වුණාට පස්සේත් එදා රෑ වෙඩි තියාගෙන ගිහින් තිබෙනවා. එදා මට කථා කරලා ඒ ගැන කිව්වා. අපි මාතර රැස්වීමේ ඉන්නකොට මට කථා කරලා ඒ සිද්ධිය ගැන කිව්වා. ගරු මන්ත්‍රීතුමනි, ඒ සිද්ධිය ගැන ඔබතුමාත් දන්නවා; අපිත් දන්නවා. ඒ නිසා මේ ගරු සභාවට අයිතිය තිබෙනවා ඒ අයට වෙඩි තැබුවේ කොහොමද කියන එක ගැන දැනගන්න. එවකට ආණ්ඩු පක්ෂයෙනුත් කිව්වා වරදක් සිද්ධ වුණා කියලා. පරීක්ෂණය සම්බන්ධයෙන් විතරයි මෙතැන ප්‍රශ්නයක් තිබෙන්නේ. ඒ ගැන යහ පාලනය යටතේ පරීක්ෂා කරන්නේ කොහොමද කියන එක අපි ඔක්කෝම තීරණය කරමු.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු අගමැතිතුමනි, තිදෙනෙකු ඝාතනයට ලක් වෙලා තිබෙනවා. 15දෙනෙකුට තුවාල සිදු වී තිබෙනවා. එතැන කලබලකාරී තත්ත්වයක් ඇති වුණා නම් පොලීසිය යොදවා එම තත්ත්වය සාමකාමී කර ගැනීමට හැකියාව තිබුණා. එසේ තිබියදී එතැනට හමුදා කණ්ඩායමක් එනවා. ගරු ඇමතිතුමාගේ පිළිතුරේ තිබෙනවා, කිසිදු ඉහළ නියෝගයක් නැතිව තමයි මේ අය එන්නේ කියලා. විශේෂයෙන්ම ඒ මොහොතේ මා දැක්කා, මට මතක විධියට එතැන සිටි බ්‍රිගේඩියර්වරයෙකු, හැසිරුණේ තමන්ව ආක්‍රමණය කරන්න ආපු, තමන්ව යටපත් කර ගන්න ආපු ත්‍රස්තවාදී කණ්ඩායමකට ප්‍රහාර එල්ල කරන ආකාරයෙන්. එලෙසින් තමයි මේ වෙඩි තැබීම් සහ පහර දීම් සිදු වී තිබෙන්නේ. එතකොට ගරු අගමැතිතුමනි, එම හමුදා අනුඛණ්ඩයට එම ස්ථානය කරා යන්න ඇමතිතුමා කියන විධියට ඉහළ නියෝගයක් තිබුණේ නැහැ, ඉහළ අයගේ කිසිදු දැනුවත් කිරීමකින් තොරව තමයි මොවුන් ගිහිල්ලා තිබෙන්නේ කියලා පිළිතුරෙන් කියනවා නම් එය කිසිසේත්ම පිළිගන්න බැහැ. ඒ නිසා ඔබතුමා කිව්ව පරිදි මේ පිළිතුර පිළිබඳව කිසිසේත්ම සෑහීමකට පත් වන්න බැහැ. මෙය මුළුමනින්ම ඒ ක්‍රියාවලිය යටපත් කිරීම සඳහා සකස් කරන ලද්දක්. අපට ජනවරමක් ලැබී තිබෙන්නේ මොකටද කියලා අපි තේරුම් ගන්න ඕනෑ. පහළොස් දෙනෙකු තුවාල කරලා තිබෙනවා නම්, තුන් දෙනෙකු ඝාතනය කරලා තිබෙනවා නම්, ජනතාවගේ සාමකාමී උද්ඝෝෂණයකට වෙඩි තබා තිබෙනවා නම්, ඒ ප්‍රජාතන්ත්‍ර විරෝධී ඒකාධිපති වියරුවට එරෙහිව ක්‍රියා කරන්න තමයි අපට ජනවරමක් ලැබී තිබෙන්නේ. ඒ නිසා එම ඒකාධිපති වියරුව විසින් මේ රටේ ජනතාවට එල්ල කරන ලද ප්‍රහාර, කරන ලද වෙඩි තැබීම්, කරන ලද ඝාතන පිළිබඳව තමුන්නාන්සේලා සාධාරණ පරීක්ෂණයක් කොට මේ පාර්ලිමේන්තුවටත්, මේ රටේ ජනතාවටත් ඉදිරිපත් කළ යුතුව තිබෙනවා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

මන්ත්‍රීතුමනි, මේ ගැන විභාගයක් කරන්න අපි එකඟයි. මෙතැන ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. එම පාරේ උද්ඝෝෂණයක් තිබෙනවා නම්, බැලුම්මහර පාර වහලා සම්පූර්ණයෙන්ම නුවර පාරේ යන්න තිබුණා.

අනික මෙතැනදී තව ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. මේ සිද්ධියේ ප්‍රධාන ක්‍රියාකරුවෙකු තමයි ප්‍රවාහන අමාත්‍යාංශයේ එවකට හිටපු ලේකම්, ඒ වාගේම හේලීස් සමාගමේ සභාපති ධම්මික පෙරේරා මැතිතුමා. මෙතැනදී එතුමා සමඟ තිබෙන සම්බන්ධය මොකක්ද, මේ සිද්ධිය වහගන්න එතුමාගෙන් බලපෑමක් ඇති වුණාද කියන මේ ඔක්කෝම කරුණු පිළිබඳව අපට විභාග කරන්න වනවා. This is a good instance of crony capitalism.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Question No. 3 - 5020/'14 - (1), the Hon. Ajith Mannapperuma.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Highways, Higher Education and Investment Promotion, I ask for two weeks' time to answer that Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සේවකයන්: උසස්වීම්
தேசிய சேமிப்பு வங்கி ஊழியர்கள் : பதவி உயர்வு
EMPLOYEES OF NATIONAL SAVINGS BANK : PROMOTIONS

5204/'14

4. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සේවක පිරිසකට 2013.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි III - II ශ්‍රේණියට උසස් වීම් ලබා දී තිබේද;

(ii) එම උසස්වීම්ලාභීන්ගේ නාම ලේඛනයක් සහාගත කරන්නේද;

(iii) උක්ත උසස්වීම් ලබා දීමේදී උසස්වීම් ලැබිය යුතු පිරිසක් මඟ හැරී ඇති බව දන්නේද;

(iv) අදාළ දිනයට පෙර විශ්‍රාම ගිය සේවකයින් පිරිසක්ද එම උසස්වීම් ලබා දීම සඳහා අදාළ කර ගෙන තිබේද;

(v) ඉහත (iv)හි පරිදි උසස්වීම් ලබා දීමට හැකියාවක් නොමැති බව දන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தேசிய சேமிப்பு வங்கியின் ஊழியர்கள் சிலருக்கு 2013.07.01ஆம் திகதி முதல் அமுலுக்கு வரும் வகையில் 111-11 தரத்திற்கு பதவி உயர்வு வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

(ii) மேற்படி பதவி உயர்வு பெற்றவர்களின் பெயர்ப் பட்டியலொன்றை சபையில் சமர்ப்பிப்பாரா என்பதையும்;

(iii) மேற்படி பதவி உயர்வை வழங்கும்போது பதவி உயர்வு பெறவேண்டிய சிலர் கைவிடப்பட்டுள்ளனர் என்பதை அறிவாரா என்பதையும்;

(iv) குறித்த திகதிக்கு முன்னர் ஓய்வுபெற்ற ஊழியர்கள் சிலரும் மேற்படி பதவி உயர்வை வழங்குவதற்கு ஏற்புடையவர்களாக்கிக் கொள்ளப்பட்டுள்ளார்களா என்பதையும்;

(v) மேலே (iv) இற்கு அமைய பதவி உயர்வு வழங்குவதற்கான இயலுமை இல்லையென்பதை அறிவாரா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance:

(a) Will he state -

(i) whether promotions have been granted to a group of employees of the National Savings Bank to Grade III - II with effect from 1st July, 2013;

(ii) whether a list of names of the recipients of such promotions will be tabled;

(iii) whether he is aware that some employees who should have been granted promotions in granting the above promotions have been overlooked;

(iv) whether a group of employees who have retired before the relevant date too have been granted promotions; and

(v) whether he is aware that there is no possibility of granting promotions as indicated in (iv) above?

(b) If not, why?

ගරු රවි කරුණානායක මහතා (මුදල් අමාත්‍යතුමා)
(மாண்புமிகு ரவி கருணாநாயக்க - நிதி அமைச்சர்)
(The Hon. Ravi Karunanayake - Minister of Finance)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ) (i) ඔව්.

2013.07.01 දින සිට බලපැවැත්වෙන පරිදි බැංකු සේවකයින් එකසිය තිස්නව දෙනෙකු අධීක්ෂණ නිලධාරි (III-III ශ්‍රේණිය) තනතුරේ සිට විධායක නිලධාරි (III-II ශ්‍රේණිය) තනතුර දක්වා උසස් කර ඇත.

(ii) ඔව්.

ඇමුණුම 01හි දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

(iii) නැත.

(iv) ඔව්.

(v) මෙම සේවකයින් විශ්‍රාම යාමට පෙර III-II ශ්‍රේණියට උසස් කිරීම සඳහා වූ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින ලද අතර, එහිදී ඔවුන් කඩඉම් ලකුණ ඉක්මවා ලකුණු ලබාගෙන තිබූ බැවින්, III-II ශ්‍රේණිය වෙත උසස් කිරීම සඳහා සුදුසුකම් ලබා තිබුණි.

(ආ) පැන නොනඟී.

Annexe ०।

1	Abeysekera N D Mr	48	Fernando A A J Ms	95	Leelawathie D S M Mrs
2	Abeysekera R M Mr	49	Fernando U H M Mr	96	Liyanaarachchi KLS Mrs
3	Abeywardena M M T Mr	50	Fernando W A S R Mrs	97	Mallika A K Mrs
4	Alahakoon N P Mrs	51	Gnanawathie K D Mrs	74	Mallika N Mrs
5	Ambagahawatta D N Mrs	52	Godakanda Arachchi NC Mrs	75	Mubaarak U L Mr
6	Appuhamy A B W Mr	53	Gunaratne GADGD Mr	76	Nanayakkara KDTV Mrs
7	Aquinas U A D Mr	54	Gunaratne A Mrs	77	Nandana W A U Mr
8	Ariyaratne L A K Mr	55	Gunasekera R W D Mrs	78	Nanthakumar S Mr
9	Arulanantham T Mrs	56	Gunathilake MDAP Ms	79	Nihal P H Mr
10	Azeez M T A Mr	57	Gunawardena HADP Mr	80	Padmakanthi S M S Mrs
11	Bandara J S K Mrs	58	Gurusinghe M K R Mrs	81	Palihakkara C K Mrs
12	Bandara K M P C Mr	59	Hapuarachchi S W Mr	82	Peiris H R C Mrs
13	Batcha M J M R Mr	60	Hemantha W K L Mr	83	Pemasiri H P Mr
14	Chandra C P M Mrs	61	Herath A C P Mrs	84	Perera H A N J Mr
15	Chandralatha A S Mrs	62	Janet W A W Mrs	85	Perera J M A S M Mrs
16	Chandrasena A Mr	63	Jayasinghe J A P Mr	86	Perera K A K Mr
17	Chandrasiri W A S Mr	64	Jayasinghe L K Mr	87	Perera S Mrs
18	Chitralatha G W N Mrs	65	Jayasooriya D S P S Mr	88	Piyasena H H Mr
19	Cyril E M Mr	66	Jayasooriya H P T Mr	89	Prabath N A C Mr
20	Damayanthi H G C Mrs	67	Jayathilake R P Mr	90	Prathapasinghe G Mr
21	Daulagala WWGWMAB Mr	68	Jayatissa D G S Mr	91	Premakantha K S Mr
22	Dayaratne K G Mr	69	Jayawardena A Mr	92	Pemaratne B A Mr
23	Dayarupa L D Mr	70	Jayawardena DRAG Mrs	93	Premasiri M Mr
24	Dayasena B Mr	71	Jayawardena G G N Mr	94	Priyantha M H R Mr
25	Dayasiri S Mr	72	Jayawardena G R Mr	95	Pushpa M A D Mrs
26	De Silva K H N C Mrs	73	Jayaweera A J R Mrs	96	Pushparaj W A W Mr
27	De Soysa W H Mr	74	Kasthuriarachchi KAD Mrs	97	Rajapakse R P D S Ms
28	Dhammika B G Mrs	75	Katugaha K L P K Mrs	98	Ramawickrama R Mr
29	Dhammika T D L Mrs	76	Kodagoda K T M Mr	99	Ranasinghe K G Mrs
30	Dissanayake T W W Mr	77	Kotuwella R M S T K Mrs	100	Ranjani M P P Mrs
31	Dorabawila B M J B Mr	78	Kumara U M J Mr	101	Ranjanie M D Mrs
32	Douglas M M Mr	79	Kumara W R Mr	102	Ranjith P H A Mr
33	Ekanayake E D M Mr	80	Kumarasinghe K S Mrs	103	Ratnasiri W Mr
34	Ekanayake HEMIWTC Mr	81	Kusumawathie A D Mrs	104	Ratnatunga M Mrs
35	Eliyathamby V Mr	82	Lalitha J Mrs	105	Sandaratne W L Mr
36	Sarath G L D Mr	83	Somasiri G G Mr	130	Weerakoon U D Mr
37	Sarath H H Mr	84	Somawathie D M Mrs	131	Weerasekera G U Mr
38	Seelawansa P D C Mr	85	Somawathie H M Mrs	132	Weerasooriya K D T Mr
39	Sellahewa S Mrs	86	Sriyakanthi W H W M S Mrs	133	Welivita W D A P K Mr
40	Senadeera S N R Mr	87	Sriyawathie I D Mrs	134	Wickramasinghe W S Mr
41	Seneviratne I L Mr	88	Sumathipala N K Mr	135	Wickramasooriya M A S Mrs
42	Seneviratne K A D A Mr	89	Sunil K H A Mr	136	Wijeratne A M Mr
43	Silva S J Mr	90	Tiddy A P Mr	137	Wijesekera M T Mrs
44	Silva S R A Ms	91	Udawattage H D Mrs	138	Wijesinghe W M C Mrs
45	Sirisena R D Mr	92	Vipulasiri I H Mr	139	Yatawara P A Mr
46	Sisira Kumara P V R Mr	93	Wanninayake W M M Mrs		
47	Somaratne M M S Mr	94	Washington J M A Mr		

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ඇමතිතුමාගෙන් අහන පළමුවැනි අතුරු ප්‍රශ්නය.

ගරු ඇමතිතුමනි, මෙම උසස්වීම් ලැබීමට නියමිත පිරිසක් මහ හැරී තිබෙන එක සම්බන්ධව ඇති ලේඛනය මම ඔබතුමාට ලබා දෙන්නම්. එහෙම වුණොත් ඔබතුමා ඒ ගැන කටයුතු කරනවාද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මෙතැන ප්‍රශ්නයක් වෙලා තිබෙනවා කියන එකද මන්ත්‍රීතුමා ඔය කියන්නේ?

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔව්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා ඉදිරිපත් කර තිබෙන මේ කරුණ සම්බන්ධයෙන් අපි තොරතුරු ලබා ගෙන මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් කරලා යම් කෙනෙකුට අසාධාරණයක් වෙලා තිබෙනවා නම්, ඒ අයට සාධාරණයක් ඉටු කිරීමට අපි බැඳී සිටිනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මේ ප්‍රශ්නයට සෘජුව අදාළ නොවුණත්, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අය වැය කථාවේදීත් සඳහන් වුණා, බැංකුවල රත්තරන් බඩු උකස් තැබූ අයට ඒවා නිදහස් කරන්න සහනයක් ලබා දෙනවා කියලා. හැබැයි, බැංකුවලට ගිය හුහක් අය කියන්නේ උකස් තියපු රත්තරන් බඩු නිදහස් කර ගන්න ගියාම එම සහනය ලබා දෙන්නේ නැහැ කියායි. එහෙම චක්‍රලේඛයක් ඇවිල්ලාත් නැහැ, ඒ සම්බන්ධයෙන් මොකුත් දැනුම්දීමකුත් නැහැ කියන එක තමයි බැංකුවලින් කියන්නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එය මේ ප්‍රශ්නයට අදාළ නොවුණත් ඔබතුමාත්, මමත් හැම වෙලාවේම ප්‍රශ්න අහලා තිබෙන නිසා මම ඒ ප්‍රශ්නයට උත්තර දෙන්නම්. නමුත්, මේ අතුරු අය වැය තුළ තිබෙනවා, මේ යෝජනාව ක්‍රියාත්මක කරනවා කියලා. අනික් එක, එක පාරටම බැංකුවලට මේ කටයුත්ත කරන්න බැහැ. මෙම උකස් කරපු රත්තරන් බඩු බේරා ගන්න බැරිවීමට හේතු මොනවාද කියලා අපට හොයා ගන්න අවශ්‍යයි. ඊට පස්සේයි ඒ සම්බන්ධ පොලිය කපා හරින්නේ. මේ අය බැංකුවලට එක පාරටම යන්නේ ඒ ගොල්ලන්ගේ නොදැනුවත්කමට. රත්තරන් බඩු උකස් කරලා මෙතෙක් කල් හිටපු අය තව මාස එක හමාරක්, දෙකක් ඉඳලා ඒ සම්බන්ධයෙන් විධිමත්ව කටයුතු කළාට පස්සේ ඒ හා සම්බන්ධ පොලිය අඩු කරන්න තමයි අපි යෝජනා කරන්නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තුන්වන අතුරු ප්‍රශ්නය මම අහනවා.

බැංකුවලට අදාළ නිසායි මම මේ ප්‍රශ්නය අහන්නේ.

ගරු ඇමතිතුමනි, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට දිරි දීමට යැයි කියමින් ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව ආරම්භ කරනු ලැබූ බව ඔබතුමාත් දන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සමහර අවස්ථාවල ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව දෙන ලද ණය අය කර ගැනීමේ අනුපාතය සියයට 50ක මට්ටමට පවා පැවතුණා. ඒ නිසා මුළුමනින්ම දේශපාලන හිතවත්කම්වලට, තමන්ගේ වුවමනාකම්වලට, හඳුනා ගන්නා ලද පිරිස්වලට ණය ලබා දීම සඳහා තමයි මෙම බැංකුව උපයෝගී කර ගෙන තිබෙන්නේ. අවස්ථා ගණනාවකදීම මෙම පාර්ලිමේන්තුවෙන් ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව වෙනුවෙන් විවිධ අවස්ථාවල අය වැයෙන් මුදල් වෙන් කර දී තිබෙනවා. ඒ මහජනයාගේ මුදල්. ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව මුළුමනින්ම දේශපාලන අරමුණක් වෙනුවෙන් උපයෝගී කොට ගෙන තිබෙනවා. මහජනයාගේ මුදල් විශාල ප්‍රමාණයක් නාස්ති කර තිබෙනවා; අවභාවිතාවේ යොදවා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පන්සලට අයිති සමහර ඉඩම් උගසට තියලා ලංකා පුත්‍ර බැංකුවෙන් ණය අරගෙන තිබෙනවා. දායක සභාව කියනවා, මේ ඉඩම අයිති පන්සලටය කියා. පන්සලෙන් අවුරුදු දෙකකට විතර තාවකාලිකව පොඩි කඩයක් දා ගන්න පැවරුවාම, මුළු ඉඩම ම බැංකුවට තියලා ණය ගන්නවා. එම නිසා මේ ලංකා පුත්‍ර සංවර්ධන බැංකුවේ දේශපාලන මැදිහත් වීම නිසා සිදු කර තිබෙන මහා පරිමාණ වංචා, දූෂණ, නාස්තිය පිළිබඳව තමුන්නාන්සේලා පරීක්ෂණයක් කරනවා ද, ඒ පිළිබඳව දැනට අර ගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවා ද කියා දැන ගන්නට කැමතියි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ස්තූතියි, ගරු මන්ත්‍රීතුමනි, එවැනි සැබෑ තත්ත්වයක් තමයි තිබෙන්නේ. පන්සලට අයිති ඉඩමේ ප්‍රශ්නය හැර අනෙක් කාරණාවලට මට උත්තර දෙන්නට පුළුවන්. රුපියල් මිලියන 6800ක් දාලා තිබෙනවා. දැනට කොම්පැනි 228 කට එම බැංකුවෙන් ණය දීලා තිබෙනවා. ඒකෙන් සියයට 68.9ක් non-performing loans. ඒ සම්බන්ධයෙන් අපි පරීක්ෂණයක් සඳහා යොමු කර තිබෙනවා. මේකෙන් කාට ද ණය දීලා තිබෙන්නේ, කොයි ආකාරයෙන්ද දීලා තිබෙන්නේ යන්න සම්පූර්ණයෙන් සොයා බැලීමට සහ නැවත එම බැංකුව ප්‍රතිසංස්කරණය කරන්න කටයුතු කරන්න කියා අපේ ගරු අගමැතිතුමා නිර්දේශ කර තිබෙනවා. ඒ තුළින් ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ සියලු දේවල් සම්බන්ධයෙන් සලකා බලා මෙහි සැබෑ තත්ත්වය ඔබතුමාට තව මාසයකින් පමණ ඉදිරිපත් කරන්නම්. අර පන්සල් ඉඩමේ ප්‍රශ්නය ගැන අපව දැනුවත් කිරීමට අවශ්‍ය කරුණු ඉදිරිපත් කරන්නට පුළුවන් නම් අගය කරනවා. ඒ ප්‍රශ්නය ගැන පමණයි මා නොදැනුවත්ව තිබෙන්නේ. බොහොම ස්තූතියි.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

I

හෝමාගම මහින්ද රාජපක්ෂ විද්‍යාලයේ නිර්මාණය වී ඇති අර්බුදය
ஹோமாகம மஹிந்த ராஜபக்ஷ வித்தியாலயத்தில் உருவான நெருக்கடி
CRISIS IN MAHINDA RAJAPAKSA COLLEGE, HOMAGAMA

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Nimal Siripala de Silva - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවසර ලබා දීම ගැන ඔබතුමාට බෙහෙවින් ස්තූතිවන්ත වෙනවා.

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

හෝමාගම මහින්ද රාජපක්ෂ විද්‍යාලයේ නිර්මාණය වී ඇති අර්බුදයට විසඳුමක් ලබා දී දරුවන්ගේ ආරක්ෂාව සහතික කිරීමට මැදිහත් වන ලෙස ඉල්ලා සිටිනවා.

පුරා වසර 4ක් පමණ කිසිදු අර්බුදයකින් තොරව දිවයිනේ අතිදක්ෂතම ශිෂ්‍යත්වලාභී දරුවන් දහස් ගණනක් ඉගෙනුම ලබන හෝමාගම මැතිවරණ කොට්ඨාසයේ පවතින එකම ආදර්ශ ජාතික පාසල වන මහින්ද රාජපක්ෂ විද්‍යාලයේ ඉගෙනුම කරන වේලාව වෙනස් කිරීම සහ අනෙකුත් වෙනස්කම් හා දේශපාලන ක්‍රියා මාර්ග හේතුවෙන් විශාල අර්බුදයක් නිර්මාණය වී ගුරු දෙගුරුන් හා ශිෂ්‍යයන් මහත් පීඩාවට පත් වී සිටී.

විදුහල්පතිට වදින්න ගිය ශිෂ්‍යයන්ට පහර දීමෙන් ශිෂ්‍යයෝ රෝහල් ගත කළ අතර, එසේ පහර දුන් ගුරුවරු අධිකරණයට ඉදිරිපත් කොට ඇත. එදින කළු ඇඳුම් ඇඳගත් පිරිසක් පාසලට ඇතුළු වී ඇති බව දෙමාපියන් දන්වා සිටී.

දහස් ගණන් සිසුන්ගේ ජීවිත ආරක්ෂාව සැලසීම රජයේ පරම යුතුකමක් වන බැවින් අතිගරු ජනාධිපතිතුමා, අග්‍රාමාත්‍යතුමා ඇතුළු රජයෙන් මෙම අර්බුදයට ස්ථිරසාර පිළියමක් යොදා ජාතික පාසල්වල දරුවන්ගේ ජීවිත ආරක්ෂාව ලබා දීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මම ඉල්ලා සිටිමි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
හෙට උත්තරයක් දෙනවා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද කැබිනට් මණ්ඩලයේ සාකච්ඡාව ටිකක් දිග්ගැස්සී තිබුණා. එම නිසා හෙට එම පිළිතුර ලබා දෙනවා.

II

උමා ඔය බහුකාර්ය ව්‍යාපෘතියේ හානිකර බලපෑම්
உமா ஓயா பலநோக்குக் கருத்திட்டத்தின் பாதக விளைவுகள்
ADVERSE IMPACTS OF UMA OYA MULTIPURPOSE DEVELOPMENT PROJECT

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට බෙහෙවින්ම ස්තූතිවන්ත වෙනවා.

උමා ඔය බහුකාර්ය ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සමඟ උද්ගත වී ඇති සමාජයීය, පාරිසරික, ආර්ථික හානි පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කරනු කැමැත්තෙමි. උමා ඔය බහු කාර්ය ව්‍යාපෘතිය 2009.04.29 වන දින මුල්ගල් තැබීමත් සමඟ ආරම්භ වුණා. පසු ගිය මහින්ද රාජපක්ෂ පාලන සමයේ මෙම ව්‍යාපෘතිය ආරම්භ කරනු ලැබුවේම රටේ නීති උල්ලංඝනය කරමිනුයි. ජාතික පාරිසරික පනත යටතේ ප්‍රකාශිත 1993 ජූනි 24වන දින අංක 772/22 දරන ගැසට් නිවේදනයට අනුව මෙවැනි ව්‍යාපෘතියකට මුල්ගල් තැබීමට ප්‍රථම පරිසර බලපෑම් තක්සේරු වාර්තාවක් සකස් කර පූර්ව ලිඛිත අනුමැතිය ලබා ගත යුතුයි. පරිසර වාර්තාවක් සකස් කර එයට අනුමතිය ලබාගෙන තමයි මෙම ව්‍යාපෘති කටයුතු ආරම්භ කරන්නට ඕනෑකම තිබෙන්නේ, ඒ ගැසට් නිවේදනය අනුව.

නමුත් මෙම නීතිමය ප්‍රතිපාදනයන් උල්ලංඝනය කර රුපියල් ලක්ෂ දෙසිය හැටක් කාබාසිනියා කරමින් මුල්ගල් තැබීමේ උළෙල සිදු කරනු ලැබුවා. මුල්ගල් තැබීමේ උත්සවයටත් ලක්ෂ 260ක් ගියා.

මධ්‍ය කඳුකරයේ දැවැන්ත උමං පද්ධතියක් ඉදි කිරීමටත්, ජලාශ, විදුලි බලාගාර ඉදිකිරීමටත් මෙම ව්‍යාපෘතිය මඟින් යෝජනා කෙරුණා. මෙම ව්‍යාපෘතිය ඇරඹීමට ප්‍රථමව 2008 වසරේ සිට එවකට වාරිමාර්ග අමාත්‍යවරයාගෙන් මේ පිළිබඳව පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න කරනු ලැබුවා.

ගරු කථානායකතුමා තමයි ඒ වෙලාවේදී වාරිමාර්ග අමාත්‍යවරයා හැටියට සිටියේ. මේ පිළිබඳව අප ඉදිරිපත් කරන ලද ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීම සඳහා එතුමා විසින් කොමිටියක් පත් කළා. ඒ අනුව අමාත්‍යවරයා අප නඟන ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීම සඳහා විශේෂ සාකච්ඡාවක් 2009.03.18 වැනි දින පාර්ලිමේන්තුවේ කාමර අංක 08 දී පැවැත්වුවා. මේ සඳහා අදාළ ව්‍යාපෘතිය භාර නිලධාරින්ද, දේශපාලනඥයන්ද සහභාගි වුණා. එහිදී එකඟතාවට පැමිණියේ පරිසර බලපෑම් ඇගැයීම් වාර්තාව අනුමත කොටගෙන මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන බවටයි. නමුත් මෙම වාර්තාව අනුමතකොට ගනු ලැබුවේ 2011 අප්‍රේල් මාසයේ දීය. මුල්ගල් තබා පසුව වාර්තාව සකස් කළේ ව්‍යාපෘතිය හානිකර වුවත් ව්‍යාපෘතිය ඉටු කිරීමට අවශ්‍ය තත්ත්වය නිර්මාණය වන පරිදි බවට සාධාරණ සැකයක් මතු වුණා.

පරිසරවේදීන්, බුද්ධිමතුන් හඬනඟා එරෙහි වෙද්දී එම විරෝධතා නොසලකා ඇරඹී ව්‍යාපෘතියේ ඉදිකිරීම්වලින් මේ වන විට කොටසක් නිම කර ඇත. නිම කිරීමට ඇති කොටස් නිම කළ කොටසට වඩා වැඩිය. මේ වන විට සිදු කර ඇති ඉදිකිරීම් කටයුතු හේතුවෙන් ඉහළ ඌවේ මධ්‍යම කඳුකරයේ විශාල සමාජීය, පාරිසරික, ආර්ථික හානි මේ වන විට වාර්තා වෙමින් පවතිනවා.

කඳු නායයාම, කඳුබිම් පිපිරීමට ලක්වීම, ළිං හා උල්පත් සිඳීයාම, නිවාස, ආගමික ස්ථාන ඉරි තැලීම්, පිපිරීම් හා ගිලා බැසීමට ලක් වීම, ගොවිබිම් විනාශවීම, ජනතාව අවතැන් වීම, වන්දි ගෙවීමේ විවිධ අක්‍රමිකතා හා අවිධිමත් ක්‍රියාවලින් සිදු වීම, ජනතාවගේ ගොවිතැන් කටයුතු අඩාළ වීම, ජීවන වෘත්තිය අහිමි වීමත්, එසේ අහිමි වීමෙන් ආර්ථික ගැටලුවලට මුහුණ දීමට සිදුවීමත් මෙම ව්‍යාපෘතියෙන් මේ වන විට සිදු වී ඇති හානි ලෙස සඳහන් කරන්නට පුළුවන්.

පසු ගිය දවස්වල මාධ්‍ය හරහා මේ පිළිබඳව වාර්තා කරනු ලැබුවා. මෙම ව්‍යාපෘතිය හේතුකොටගෙන යයි සැක කළ හැකි පරිදි ළිංවල වතුර හිඳෙන්නට පටන් ගෙන තිබෙනවා; නිවාසවල බිත්ති පුපුරන්න පටන් ගෙන තිබෙනවා; පන්සල් ගොඩනැඟිලිවලට හානි සිදු වන්නට පටන් ගෙන තිබෙනවා; දිය සීරා හිඳෙන්න පටන් ගෙන තිබෙනවා. මේ විධියේ සමාජීය, පාරිසරික ගැටලු රාශියක් මේ ව්‍යාපෘතිය විසින් මේ වනකොටත් සිදු කරමින් තිබෙන බව පැහැදිලියි. එසේම මීට වැඩි හානියක් ඉදිරියේ දී සිදු වන බව අපගේ විශ්වාසයයි. එහි ආසන්නතම විනාශය වාර්තා වන්නේ බණ්ඩාරවෙල ප්‍රදේශයෙනුයි. මකුල්ඇල්ල, එගොඩගම, වෙහෙරගලතැන්න, කුරුඳුගොල්ල, හීල්ඔය, මැදපේරුව, පල්ලේපේරුව යන ග්‍රාම නිලධාරි වසම්වල පානීය ළිං 120ක් පමණ සම්පූර්ණයෙන් හිඳී ගොස් ඇති අතර

තවත් ළිං 150ක පමණ ජල මට්ටම ශීඝ්‍රයෙන් අඩු වෙමින් පවතිනවා. නිවාස 90ක් පමණ ඉරි තලා පුපුරා ගොස් ඇති අතර පොළොව විශාල ඉරිතැලීම් හා පිපිරීම්වලට ලක්ව තිබෙනවා. මෙම තත්ත්වය ක්‍රම ක්‍රමයෙන් ව්‍යාප්ත වෙමින් පවතිනවා. ඒ ජනතාව තුළ විශාල බියක් ඇති වෙලා තිබෙනවා. තමන්ගේ නිවාස කඩා වැටෙවිද, තමන්ගේ ළිංවලට මොකක්ද මේ සිදුවෙමින් තිබෙන්නේ, තමන්ගේ ඇස් ඉදිරිපිටම පොළොව පුපුරා යමින් තිබෙනවාය කියන මේ කරුණු පිළිබඳව විශාල බියක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා මෙම ව්‍යාපෘතිය මඟින් විශාල පරිසර හානියක් ඇතිකොට තිබෙනවා.

උමාඔය බහුකාර්ය ව්‍යාපෘතියේ ප්‍රධාන උමඟ කිලෝ මීටර් 15.2ක් දිගින් යුක්ත වන අතර එම උමඟ මේ විශාල වශයෙන් ජනාවාස වූ ගම්මාන යටින් ඉදි වෙමින් පවතිනවා. උමඟ යන්නේ ජනතාව පදිංචි වෙලා සිටින ගම්මාන යටිනුයි. එම උමඟෙන් කිලෝ මීටර් 4ක් පමණ ඉදිකරන විට මෙම තත්ත්වය පැන නැඟී තිබෙනවා. එම උමඟේ තවත් කිලෝ මීටර් 11ක දුරක් ඉදි කිරීමට නියමිතව තිබෙනවා. දැනට ඉදි කර තිබෙන්නේ කිලෝ මීටර් 4ක් පමණයි. කිලෝ මීටර් 4ක් ඉදි කරපු එකේ ප්‍රතිඵලය තමයි මේ. තවත් කිලෝ මීටර් 11ක් ඉදි කිරීමට නියමිතව තිබෙනවා. ඒ වනකොට කවර තත්ත්වයක් ඇති වේවිද?

පිදුරුතලාගල කඳු මුදුනෙනුත්, හෝර්ටන් තැන්නෙනුත් උපත ලබා පෝෂිත වන උමා ඔය ඌවේ මහාඔය නම් වේ. මෙම ඔය කිලෝ මීටර් 75ක් දුරට ගලා බසී. මෙම උමාඔය නිම්නයේ ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් ජීවත් වෙනවා. ඔවුන්ගේ ජීවිත රඳා පවතින්නේ මෙම දියදහර මතයි. එපමණක් නොව මහවැලි මහා ව්‍යාපාරයේ රන්ටැඹේ ජලාශයට මෙම ඔයේ ජලය එකතු වී මහවැලි 'සී' හා 'බී' කලාපවලටද දියවර සපයනවා. එලෙසම මිණිපේ අමුණටත්, උමාඔයේ දියවර දායකත්වය සපයනවා. ඒ අනුව බලන කල බදුල්ල, නුවරඑළිය, අම්පාර, මාතලේ, මහනුවර, පොළොන්නරුව හා මඩකළපුව දිස්ත්‍රික්කවලටද මෙම උමාඔය දියවර සපයනවා. මේ සා මහා මෙහෙයක් කරන උමාඔය, පැවති ආණ්ඩුවේ රාජපක්ෂලාගේ සංවර්ධන සිහින සැබෑ කිරීම උදෙසා, එනම් හම්බන්තොට ගුවන් තොටුපළ හා වරාය දක්වා මෙම ජලය ගෙන යාමට සැලසුම් කරනු ලැබුවා. කැනේඩියානු රජය ඩොලර් මිලියන 250කට ඇස්තමේන්තු කළ මේ ව්‍යාපෘතිය රාජපක්ෂලාගේ වුවමනාව මත ඉරාන ණයක් ලෙස ගෙන ඩොලර් මිලියන 532කින් නිම කිරීමට එකඟ වුණා. කැනේඩියානු රජයේ ආධාර මත ඩොලර් මිලියන 250කට තමයි මෙක ඇස්තමේන්තු කර තිබුණේ. ඒක ඩොලර් මිලියන 532ක් වුණා. එහි කොන්ත්‍රාත්තුව ඉරානයේ පරාබි කොම්පැනියට කිසිදු ටෙන්ඩර් කැඳවීමකින් තොරව ලබා දුන්නා. අර හැම ව්‍යාපෘතියක් වාගේම මෙම ව්‍යාපෘතිය ලබා දී තිබෙන්නේත් කිසිදු ටෙන්ඩර් කැඳවීමකින් තොරව සැබෑ මුදල වාගේ දෙගුණයකටයි. මහා පරිමාණ ව්‍යාපෘතිවලින් මහා පරිමාණ වංචා සිදු වූවා වාගේම මහා පරිමාණ විනාශයන්ද සිදු වෙමින් තිබෙනවා.

මේ තත්ත්වය තුළ උමාඔය ව්‍යාපෘතිය ආශ්‍රිතව පැන නැඟී ඇති පහත ගැටලු පිළිබඳව අදාළ අමාත්‍යවරයා පිළිතුරු ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරනවා.

1. උමාඔය ව්‍යාපෘතියේ පාරිසරික ඇගැයීම් වාර්තාව මුල් ගල තැබීමෙන් පසුව ඉදිරිපත් කිරීම සම්මත පටිපාටිය උල්ලංඝනය කිරීමක් නොවන්නේද?
2. ව්‍යාපෘතිය ආශ්‍රිතව මේ දක්වා උද්ගත වී ඇති පාරිසරික හා සමාජීය ගැටලු සමාලෝචනය සඳහා ගනු ලැබ ඇති පියවර කවරේද?
3. හඳුනා ගනු ලබන හානි පූරණය වෙනුවෙන් වන්දි මුදල් ප්‍රදානය කිරීමක් සිදු නොවන්නේද?
4. ව්‍යාපෘතියේ මූල්‍ය අක්‍රමිකතා සහ ඊට වග කිව යුත්තන් සොයා බැලීම සඳහා ගන්නා වූ ක්‍රියා මාර්ගය කුමක්ද?
5. අදාළ විද්වතුන්, බුද්ධිමතුන්, පරිසරවේදීන් සම්බන්ධ කර ගනිමින් සමස්ත ව්‍යාපෘතිය නැවත සමාලෝචනය කර ඒ පිළිබඳව විද්‍යානුකූල නිගමනයකට එළඹීමට පියවර ගනු ලබන්නේද?

ගරු වසන්ත අලුවිහාරේ මහතා (මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த அலுவிஹார - மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. Aluvihare Wasantha - Deputy Minister of Mahaweli Development and Environment)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ විෂය සම්බන්ධයෙන් නියෝජ්‍ය ඇමතිවරයා හැටියට කටයුතු කරන්නේ මමයි. ජනාධිපතිතුමා තමයි ඇමතිවරයා හැටියට ඉන්නේ. මේ සම්බන්ධයෙන් සම්පූර්ණ වාර්තාවක් මම හෙට මෙම ගරු සභාවට ඉදිරිපත් කරන්නම්.

හෝමාගම මහින්ද රාජපක්ෂ විද්‍යාලයේ නිර්මාණය වී ඇති අර්බුදය: අධ්‍යාපන අමාත්‍යතුමාගේ ප්‍රකාශය

ஹோமாகம மஹிந்த ராஜபக்ஷ வித்தியாலயத்தில் உருவான நெருக்கடி : கல்வி அமைச்சரது கூற்று

CRISIS IN MAHINDA RAJAPAKSA COLLEGE, HOMAGAMA: STATEMENT BY MINISTER OF EDUCATION

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு அகில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු විපක්ෂ නායකතුමා විසින් ස්ථාවර නියෝග 23(2) යටතේ ඇසූ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

වත්මන් රජය ජාතික පාසල් සම්බන්ධයෙන් සමාන ප්‍රතිපත්තියක් අනුගමනය කරන බැවින් හෝමාගම මහින්ද රාජපක්ෂ විද්‍යාලයේ ද පාසල නිමා කරන වේලාව ප.ව. 1.30 වශයෙන් වෙනස් කිරීමට තීරණය කරන ලදී. එතෙකුදු වුව ද අනෙකුත් පාසල්වල මෙන්ම විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා පාසල් වේලාවෙන් පරිබාහිරව කටයුතු කිරීමට කිසිදු බාධාවක් නොමැත. පාසලේ ගුරුවරුන් 124 දෙනකුගේ අත්සනින් ඔවුන් පත්ව ඇති පීඩාවන් මා වෙත ලිඛිතව ඉදිරිපත් කොට ඇති බවත් මෙම තීන්දුව ගැනීමේදී එම ඉල්ලීම ද සැලකිල්ලට භාජනය කළ බවත් දන්වා සිටිමි.

2015.01.29 දින පාසලේ යම් අසහනකාරී තත්ත්වයක් මතුව තිබූ අතර, ඒ පිළිබඳව පොලීසිය විසින් සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ බලධාරීන් විසින් අවශ්‍ය නිසි පරීක්ෂණ පවත්වා ඇත. එම පරීක්ෂණවල ප්‍රතිඵල අනුව ඉදිරි ක්‍රියා මාර්ග ගනු ලබන බව දන්වා සිටිමි. මේ වන විට පාසලේ කටයුතු සාමාන්‍ය අයුරින් ක්‍රියාත්මක වන අතර, සිසුන්ගේ හා ගුරුවරුන්ගේ ආරක්ෂාව පිළිබඳව ගැටලුවක් නොමැති බව ද දන්වා සිටිමි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Next, there is a Question of Privilege to be raised by the Hon. Mahindananda Aluthgamage.

වරප්‍රසාද : 2015 පෙබරවාරි 04 වන දින "සිරස" ප්‍රවෘත්ති විකාශය
சிறப்புரிமை: 2015 பெப்ருவரி 04ஆம் திகதிய 'சிரச' செய்தி அறிக்கை
PRIVILEGE: NEWS TELECAST ON "SIRASA TV" ON 4TH FEBRUARY, 2015

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊයේ "සිරස" රූපවාහිනී නාළිකාවේ සවස 7.00 ප්‍රවෘත්ති විකාශයේදී මඩකලපුව දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී පී. අරියනේත්‍රන් මහතා විසින් ප්‍රකාශයක් නිකුත් කරමින් මම ඒ මන්ත්‍රීවරයාට රුපියල් මිලියන 50ක මුදලක් ලබා දෙන බවටත්, කොළඹින් නිවසක් ලබා දෙන බවටත් පොරොන්දු මත රජයට එක් වන ලෙස මීට අවුරුද්දකට කලින් එතුමාට යෝජනා කළ බව සඳහන් විය. එතුමාගේ ප්‍රකාශයෙන් පස්සේ වැලිඅමුණ කියන පුද්ගලයෙක් දුරකථනය මඟින් ඒ නාළිකාවට සම්බන්ධ වෙලා වහාම රහස් පොලීසිය මඟින් මොහුව අත් අඩංගුවට ගත යුතුය කියලා ප්‍රකාශයක් කළා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා පාර්ලිමේන්තුවේදී අරියනේත්‍රන් මන්ත්‍රීතුමා සමඟ හිනා වෙලා තිබෙනවා, එකම දවසක්වත් කථා කරලා නැහැ. මගේ කිසිදු සම්බන්ධයකුත් නැහැ. මම නීතිඥයකු මාර්ගයෙන් එතුමාගෙන් රුපියල් මිලියන 500ක් වන්දි ඉල්ලලා එන්තරවාසියක් යැව්වා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ඒ කටයුත්ත වෙනම කරනවා.

මම විශ්වාස කරනවා මේ උත්සාහ කරන්නේ අසත්‍ය චෝදනා එල්ල කරමින් රහස් පොලීසිය හරහා මන්ත්‍රීවරු අත් අඩංගුවට ගන්නයි කියලා. දැන් තිස්ස අත්තනායක මන්ත්‍රීතුමා ගෙදර හිටියදී එක වරටම රහස් පොලීසිය ඇවිල්ලා අත් අඩංගුවට ගත්තා. අධිකරණයට ඉදිරිපත් කරලා රිමාන්ඩ් භාරයට පත් කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ විධියට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට අපේ වරප්‍රසාද උල්ලංඝනය වීමක් සිද්ධ වෙනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, please read out whatever is contained in the letter. Do not go out of it.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඒක තමයි කියන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියා ඉල්ලීමක් කරනවා. මේක සම්පූර්ණ අසත්‍යයක්. මෙහෙම සිද්ධියක් වෙලා නැහැ. එතුමා අවුරුද්දකට කලින් හීනෙන් දැකපු එකක් ගැනයි කියන්නේ. මේක පැහැදිලිවම මා අත් අඩංගුවට ගැනීම සඳහා කරන වැඩ පිළිවෙළක්. ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
I will refer this matter to the Hon. Speaker.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! What is your point of Order, Hon. Dinesh Gunawardena.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Mr. Deputy Chairman of Committees, I would like to bring to your notice - ගරු අග්‍රාමාත්‍යතුමාත් සිටින අවස්ථාවේදී ගරු කථානායකතුමා පක්ෂ නායකයන්ට දැනුම් දුන්නා, ජනවාරි 20 වන දින විවාදය සජීවී ලෙස විකාශනය වන බව. ඒ විකාශය සජීව ලෙස සිදු වන බව ගරු කථානායකතුමා ප්‍රකාශ කරනවා. එය 2015 ජනවාරි 20 වන දා හැන්සාඩ් වාර්තාවේ 40 වන තීරුවේ මෙන්න මෙහෙම සඳහන් වෙනවා.

> "පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු සජීවී ලෙස විකාශය වන නිසා මන්ත්‍රීවරයෙක් තම කථාව කරන අවස්ථාවේ කරුණාකර ගරු මන්ත්‍රීතුමන්ලා නිශ්ශබ්දව තම අසුන්වල ඉන්න."

But, Hon. Deputy Chairman of Committees, there was no live telecast. - [*Interruption.*] First, I would like to raise the issue. - [*Interruption*].

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Hon. Member, please raise your point of Order.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, there was no live telecast of the Debate. I would like you to bring that to the notice of the Hon. Speaker and ask as to why this happened and who the officers responsible for this are, because the Hon. Speaker had given an assurance to the House that there will be a live telecast of the whole Debate. - [*[Interruption.*]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Yes, Hon. Leader of the House.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

I have one more point to raise. In addition, I would like to request that the Budget Debate in full be telecast live. I request the Hon. Prime Minister to keep to his words.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මොන වගන්තිය යටතේ ද මෙම ඉල්ලීම කරන්නේ කියා මම දැනගන්න කැමැතියි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

Sir, I raised a point of Order. I have the right to ask why an Order given by the Hon. Speaker is being violated.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

What is the Section?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

Why is his Order being violated? ගරු කථානායකතුමා ලබා දුන්න නියෝගයක් violate කරන්නේ කොහොමද?

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

That matter will be looked into. - [*[Interruption.*] Yes, Hon. Prime Minister.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙතැන ප්‍රශ්න දෙකක් මතු වුණා. එක ප්‍රශ්නයක් අපේ සභානායකතුමා ඇහුවා, මොන ස්ථාවර නියෝග යටතේද කියා. මම ඒකට එකඟ වනවා. මම මේකට පිළිතුරක් දෙන්නම්. ඇත්ත වශයෙන්ම කථානායකතුමා මේ ගැන සඳහන් කරපු නිසා අපි කථානායකතුමා මුණ ගැහිලා මේ සජීව විකාශය ලබා දෙන්න කටයුතු කරනවා. මොකද සජීව විකාශය අපිට වුවමනා වෙලා තිබෙනවා. අපි ඒ බව විරුද්ධ පක්ෂයේ සිටියදීත් කිව්වා. එදා අපිට මේක ලැබුණේ නැහැ. ඒ ගැන සොයා බලා පුළුවන් තරම් ඉක්මනට මේ සජීව විකාශය අපි ලබා දෙන්න ඕනෑ. කථානායකතුමා මේ ගැන කිව්ව නිසා පක්ෂ නායකයින් කැඳෙව්වාම අපි ඒක සාකච්ඡා කරමු. සජීව විකාශය අපේ දින සියයේ වැඩසටහනේ කොටසක්. අපි දෙපාර්ශ්වයම ඒකට එකඟ වෙලා තිබෙනවා. මෙතෙක් කල් සජීව විකාශය කරන්න බැරි වුණා. නමුත් දැන් සජීව විකාශය කිරීමේ අතපසුවීමක් තිබෙනවා නම් ඒක සොයා බලා නිවැරැදි කරලා ඉදිරියට ගෙන යමු. නමුත් එක කාරණයක් මම මතක් කරන්නම්. සජීව විකාශය කරනවා නම් අපේ හැසිරීම ගැනත් විශේෂයෙන්ම බලන්න ඕනෑ. As soon as the Hon. Speaker comes, we will meet and sort it out. We must have the live telecast as soon as possible.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මට පුදුමයි, දිනේෂ් ගුණවර්ධන මැතිතුමා සජීව විකාශය මතක් කිරීම. මේක මම ගරු කථානායකතුමාට ඉදිරිපත් කළා. එවකට 2013 අය වැයෙන් ගරු කථානායකතුමා මේක හරි කියා පටන් ගත්තා. ඒක හිටපු ජනාධිපතිතුමා සහ හිටපු ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා නැවැත්තුවා. එම නිසා අපෙන් මේ ප්‍රශ්නය අහන්න එපා. ඇයි, එදා මේක නැවැත්වුවේ කියා ඔබතුමා අහන්න. අපි විනිවිදභාවය ඇති කර තිබෙනවා. මතක තියා ගන්න. මේවා මොකටද කියා ඔබතුමන්ලා තමයි ආණ්ඩු පක්ෂයේ සිටියදී ඇහුවේ. [බාධා කිරීම්] මේ වාගේ ලජ්ජා සහගත ප්‍රකාශ කරන්න එපා. ඔබතුමන්ලා ඒ වාගේ හැසිරෙන්න එපා.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත
ஒதுக்கீடு (திருத்தம்) சட்டமூலம்
APPROPRIATION (AMENDMENT) BILL

"2014 අංක 41 දරන විසර්ජන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ මුදල් අමාත්‍ය ගරු රවි කරුණානායක මහතා විසිනි.
நிதி அமைச்சர் மாண்புமிகு ரவி கருணாநாயக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.
Presented by the Hon. Ravi Karunanayake, Minister of Finance.

පාර්ලිමේන්තුවේ කටයුතු
பாராளுமன்ற அலுவல்
BUSINESS OF THE PARLIAMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

I move,

"That the following provisions shall have effect with respect to the Business of this day's Sitting of Parliament :-

(a) That the Second Reading of the "Appropriation (Amendment) Bill", presented this day be proceeded with this day; and

(b) That immediately after the Bill to which this order applies has been read a second time, it shall be considered in Committee of the whole Parliament."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත
ஒதுக்கீடு (திருத்தம்) சட்டமூலம்
APPROPRIATION (AMENDMENT) BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

[අ.භා. 1.36]

ගරු රවි කරුණානායක මහතා (මුදල් අමාත්‍යතුමා)
(மாண்புமிகு ரவி கருணாநாயக்க - நிதி அமைச்சர்)
(The Hon. Ravi Karunanayake - Minister of Finance)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

මෙම අවස්ථාව මට ලබාදීම සම්බන්ධව මම අගය කරනවා. අපි 2015 ජනවාරි මාසයේ 29වැනිදා ඉදිරිපත් කළ අතුරු අය වැය සම්බන්ධයෙන් ඔබතුමන්ලා අදහස් ඉදිරිපත් කර තිබෙනවා. මුලින්ම ඒ සම්බන්ධයෙන් මිනිත්තු 4ක් 5ක් කථා කර ඊට පස්සේ අය වැය විවාදය අවසානයේදී අදහස් පළ කරන්න තමයි මම අදහස් කළේ. එතකොට සැබෑ තත්ත්වය සම්බන්ධව සියලුම මන්ත්‍රීවරුන්ට උත්තර දෙන්න පුළුවන්. අතිගරු ජනාධිපතිතුමාගේත්, අගමැතිතුමාගේත් උපදෙස් පරිදි අතුරු අය වැය අපි ඉදිරිපත් කළා. ඉදිරිපත් කරන අවස්ථාවේදී අපට අවශ්‍ය වුණා, යම් විධියක විෂමතාවක් තිබෙන වියදම් ඉවත් කරලා ජනතාවට සෙතක් ලබාගන්න පුළුවන් මාර්ගයක් ඇති කරලා අහිංසක ජනතාවට කිසිම පීඩාවක් ඇති නොවන විධියට අතුරු අය වැය ඉදිරිපත් කරන්න. සියලුම මන්ත්‍රීවරුන්ගේ අදහස් අනුව සියයට 99ක සාර්ථකත්වයක් අපි ලබා ගෙන තිබෙන බව පෙනෙනවා. ප්‍රශ්න දෙක තුනක් තිබෙනවා. නමුත් මම නැවත මතක් කරන්නේ සියයට 99ක සාර්ථකත්වයක් ජනතාවකට- [බාධා කිරීම්] ඔබතුමන්ලා අවුරුදු 11ක් තිස්සේ දහලලා අපි මේක දවස් 21න් දීම පුදුමයක් ලෙස ඔබතුමන්ලා සලකනවා. නමුත් ඉදිරි දැක්මක් සහිතව ජනතාවට උදවු කරන්නයි අපට ඕනෑකම තිබෙන්නේ. එක්කෙනෙකුගේ දෙදෙනෙකුගේ සාක්කුවලට යන මුදල් නවත්වලා ඒවා අපි ජනතාවට ලබා දෙනවා කියන එක තමයි අප මෙතැනදී මතක් කර තිබෙන්නේ.

මේ අවස්ථාවේදී අපට කියන්න පුළුවන් එකම දෙය තමයි, රටේ ආර්ථිකය ඉතාම භයානකකාරී තත්ත්වයක තිබෙනවාය කියන එක. අපි විපක්ෂයේ ඉන්නා අවස්ථාවේදී අපට ලැබෙන්න තිබුණු සියලු තොරතුරු ලැබුණේ නැති නිසා අපට යම් විධියකට ව්‍යාංගයෙන් තමයි උත්තර දෙන්න සිදු වුණේ. නමුත් මේ දවස් 21, 22 තුළින් අපට පෙනී ගොස් තිබෙනවා, මේ රටේ ආර්ථිකයේ ඊට වඩා භයානකකාරී තත්ත්වයක් තිබෙනවාය කියලා. ආර්ථිකය හදන්න බැහැ කියන එක නොවෙයි. නමුත් කොතරම් දුරට මේ රටේ ආර්ථිකය කඩා වැටී තිබෙනවාද කියන එක තමයි අප මේ අවස්ථාවේදී මතක් කරන්නේ. මම මේ ගරු සභාවේ ආණ්ඩු පක්ෂයේ ඉන්නා කෙනෙකු විධියට වගකීමකින් මේ කාරණය කියන්න අවශ්‍යයි. මොකද, අපට ජාත්‍යන්තරය සමඟ ගනුදෙනු කරන්න තිබෙනවා. ආර්ථික ආයෝජන මේ රටට ගෙන්වා ගන්න තිබෙනවා. නමුත් ඒ සැබෑ තත්ත්වය ගැන කියන එක මම හිතන හැටියට මගේ යුතුකමක්. රටේ ආර්ථිකය කඩා වැටිලා තිබෙන්නේ. මොනවාද අනුගමනය කළේ? ඒ කියන විගසම අප මතක තබා ගන්න අවශ්‍යයි, ග්‍රීසිය ගැන. "ආශ්චර්යවත් රටක්" කියලා කථා කළ ග්‍රීසිය අද බංකොලොත් වෙලා කොටඋඩ ගිහින් තිබෙනවා. ඒ වාගේ තමයි මේ අවස්ථාවේදී අප ඇස්තමේන්තු කළා, අපේ රටේ තිබෙන සම්පූර්ණ ණයබරතාව. එය රුපියල් කෝටි හයලක්ෂ අසූඅටදහසකට තමයි අප ඇස්තමේන්තු කළේ. නමුත් දැන් මෙය ඇස්තමේන්තු කර තිබෙන ආකාරයට රුපියල් කෝටි නවලක්ෂ විසිතුන්දහසකට විතර වැඩි වෙලා තිබෙනවා. මම කියන්නේ about all contingent liabilities. ඒක සම්පූර්ණයෙන් සියයට සියයක් නොවෙයි. සම්පූර්ණ අවදානම් තත්ත්වය තමයි, මෙතැන හෙළිදරව් කරලා තිබෙන්නේ. ඒ ගැන කියන එක මගේ යුතුකමක්. නැත්නම් හිතයි, සම්පූර්ණයෙන් ඒ තත්ත්වය කියලා. අපි දැනට ඇස්තමේන්තු කර තිබෙන ආකාරය අනුව රුපියල් කෝටි නවලක්ෂ විසිතුන්දහසකට මෙය වැඩි වෙලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් කවුද උත්තර දෙන්නේ? අහලා තිබෙන ප්‍රශ්නය යටපත් කර තිබෙනවා. සමහර වෙලාවට ඉරානයේ ණය වාගේ දේවල් සම්පූර්ණයෙන් ගණනය කරලා නැහැ. දැන් අපි ඒවා ගැන සොයා බලන කොට තමයි, ඒවා ගැන හෙළිදරව් වෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි ඔබතුමන්ලා සියලු දෙනාම දන්නවා, අප ඉදිරිපත් කර තිබුණු අතුරු අය වැය තුළින් අප කපා හැරියේ, අනවශ්‍ය ප්‍රාග්ධන වියදම්; නාස්තිකාර ප්‍රාග්ධන වියදම් බව. ඒකෙන් අප යම් ප්‍රතිශතයක් ලබා ගත්තා. මේ සියලුම ලේඛන දැනටමත් පුස්තකාලයේ තිබෙනවා, ඔබ සියලු දෙනාගේ අධීක්ෂණය සඳහා. අපි එසේ අනවශ්‍ය වියදම් කපා හැරලා ඒ සම්බන්ධයෙන් යම් විධියක අලුත් ආදායම් උපයන ක්‍රමයක් ඉදිරිපත් කර තිබෙනවා. මේක කිසිසේත්ම සාමාන්‍ය ජනතාවට බලපාන්නේ නැහැ.

මේකෙන් ප්‍රශ්න දෙකක් ඇති වෙලා තිබෙනවා. ඒ තමයි මන්දිර බද්ද සහ වාහන බද්ද සම්බන්ධව. මගේ යුතුකමක් තමයි, ඒ සම්බන්ධව නිවැරදි කිරීමක්, පැහැදිලි කිරීමක් කර ඒ තුළින් අන්තිමට මේ සියලු මන්ත්‍රීවරුන් අහපු ප්‍රශ්නවලට උත්තර ලබා දීම. අපි මන්දිර බද්ද යන්නෙන් අදහස් කළේ මොකක්ද? මේ රටේ ගෙවල් ලක්ෂ ගණනක් තිබෙනවා. පසු ගිය අවුරුදු දහය, දොළහ තුළ යම් විධියකින් අනිසි මට්ටමට ආදායම උපයෝගි කර ගෙන, වල්මත්ව ගෙවල් හදා ගෙන තිබෙනවා. එසේ ඉදි කර තිබෙන ඒවායෙන්, මන්දිර වාගේ පෙනෙන නිවාසවලින් තමයි ඇත්ත වශයෙන්ම මෙම බද්ද අය කරන්න හදන්නේ. එහෙම නැතුව අවුරුදු ගණනාවක් තිස්සේ එවැනි නිවාස තිබුණු අයට කිසිසේත්ම මෙයින් ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ. ඒ ගැන වැරදි ලෙස අර්ථකථනය කිරීමට අවශ්‍යතාවකුත් නැහැ. ඒ විතරක් නොවෙයි, ක්ෂය කිරීමේ පද්ධතිය තුළින් අප ඒ බර පුළුවන් තරම් අඩු කරලා, අපිට අවශ්‍ය වෙන්නේ ගෙවල් 1000කින්, 1500කින් අය කරලා මේකෙන් රුපියල් බිලියන එකහමාරක් -රුපියල් මිලියන 1500ක්- විතර සොයා ගන්න විතරයි. ඒ විතරක් නොවෙයි, අප මේක පුළුවන් තරම් සරල කරලා විවෘත කරනවා. මේක කිසිසේත්ම කවුරුවත් පසුපස යන එකක් නොවෙයි. මේක යම් විධියකින් විවෘත කරලා, කැමැත්තෙන් ගෙවන්න පුළුවන් හැකියාව ඇති කිරීම තමයි අපගේ අරමුණ. ඒ කියන්නේ රටේ ගෙවල් 1000ක්, 1500ක් තමයි මේකට යටත් වන්නේ. එහෙම අයට රුපියල් ලක්ෂ දහයක් ගෙවන්න බැරි නම් මේ රටේ ප්‍රශ්නයක් ඇති. මොකද, ගෙයක් හදන්න රුපියල් ලක්ෂ 2000ක් විතර වියදම් කරනවා නම් රටේ අහිංසක ජනතාව වෙනුවෙන් ආයෝජනය කිරීමට ඒකෙන් රුපියල් ලක්ෂ දහයක් වියදම් කරන්න බැරිද? මෙන්න මේක තමයි අපේ තිබෙන එකම අරමුණ.

දෙවැනි එක තමයි, වාහන බද්ද. අපිට අවශ්‍ය වුණේ, අහිංසක ජනතාවට 1000ccවලට වඩා අඩු වාහනවලට බදු ලිහිල් කිරීමක් ලබා දෙන්නයි. [බාධා කිරීම්] පේනවානේ, රටේ තිබෙන ප්‍රජාතන්ත්‍රවාදය. කිසිම ඇඟිලි ගැසීමක් නැහැ. [බාධා කිරීම්] ඔබතුමන්ලාගේ කාලයේ මේ වාගේ එන්න පුළුවන්ද? [බාධා කිරීම්] ඒවාට ඇඟිලි ගැසීම් කළා. දැන් බලන්න. කිසි ඇඟිලි ගැසීමක් නැහැ. ඒ ප්‍රශ්නය අධිකරණයට භාර දීලා තිබෙනවා. අපේ මන්ත්‍රීවරයෙක් එන එක ගැන අපට සතුටුයි. කවුරුවත් ඒ ප්‍රශ්නය

පස්සේ යන්නේ නැහැ. මතක තබා ගන්න. අශික්ෂිත පාලනය නැති කරලා ඔන්න, යහ පාලනයක් ගෙනැල්ලා තිබෙන යුගය තමයි අපි ඇතිකර තිබෙන්නේ.

මේ අවස්ථාවේදී මම කියන්න කැමැතියි, 1000ccවලට වඩා අඩු වාහනවලට අපි සියයට පහළොවකින්, සියයට විස්සකින් තීරු බදු අඩු කරලා තිබෙනවා කියා. ඒ විතරක් නොවෙයි, electric වාහනවලට සියයට පහට අඩු කරලා තිබෙනවා. ඩීසල්, පෙට්‍රල් වාහනත්, හයිබ්‍රිඩ් වාහනත් අතර සියයට120ක විතර පරතරයක් තිබුණා. අපට අවශ්‍ය වුණා ඒ විෂමතාව ඉවත් කිරීමට. ඒ පරතරය අඩු කිරීමට අපි සියයට 40ක බද්දක් දැම්මා. ඒ තුළින් ආදායමක් උපයා ගැනීම තමයි අපට අවශ්‍ය වුණේ. නැත්නම් කිසි සේත්ම හයිබ්‍රිඩ්වල මිල ඉහළ දැමීම නොවෙයි. අනෙක් ඒවා කිසි සේත්ම වෙනස් කරලා නැහැ. අපට පෙනුණා හයිබ්‍රිඩ් අතර තිබෙන වෙනස සියයට 85ක් බව. මීට පෙර ආනයනය කළ පෙට්‍රල් හා ඩීසල් රථ වාහන දැන් හයිබ්‍රිඩ්වලට වෙනස් වෙලා තිබෙනවා. ඒ පරතරය අඩු කිරීමත්, ඉදිරියේදී exchange control ප්‍රශ්නයක් ඇති නොවන විධියට කටයුතු කිරීම සඳහාත් තමයි ඒ වාහන බද්ද අපි පනවලා තිබෙන්නේ.

තුන්වන එක තමයි, Super Gain Tax එක. අපි බොහොම ඕනෑකමින් මේකෙන් ඉලක්ක කළේ, මේ රටේ තිබෙන සම්පත් පාවිච්චි කරලා, තඹ ශතයක් මේ රටේ ආර්ථිකයට ගෙවන්නේ නැති කොම්පැනියි. නිදසුනක් වශයෙන් ගත්තොත් CSN එක. CSN එක අයිති කාටද? මට මෙතැන ඒ ගැන මතක් කරන්න ඕනෑ නැහැ. ඒක අවුරුදු හයකින් spectrum බද්ද ගෙවලා නැහැ. විදුලි බල ගාස්තු ගෙවලා නැහැ. PSD එකෙන් තමයි ඒකට රථ වාහන දීලා තිබෙන්නේ. මේ වාගේ අය රටේ මුදල් රුපියල් මිලියන 3,000ක්, 4,000ක් විතර පාවිච්චි කරලා තිබෙනවා. ඒ වාගේ ආයතනවලට රුපියල් මිලියන 1,000ක බද්දක් පනවන එක ප්‍රශ්නයක්ද? ඒ නීතිමය රාමුව හදලා තිබුණේ සම්පූර්ණයෙන්ම එක කොම්පැනියකට ආදායම ලබා ගන්නයි. ජාතික රූපවාහිනියෙන් ක්‍රීඩා ප්‍රචාරය කිරීම සම්පූර්ණයෙන් අත් පත් කර ගෙන CSN ආයතනයට ඒ අවස්ථාව ලබා දුන්නා. රජයට ලැබෙන්න තිබෙන මුදල් අනිසි ලෙස ඒ කොම්පැනිය පාවිච්චි කරනවා අපි දැකලා, බද්දක් දැමීම අසාධාරණද? මම නිදසුනක් වශයෙන් එකක් කිව්වේ. ඒ වාගේ තව කොම්පැනි ගණනාවක් තිබෙනවා. එතකොට ඔබතුමන්ලාට පෙනෙනවා ඇති මේක කිසි සේත්ම පෞද්ගලික ප්‍රශ්නයක් පස්සේ දුවන කටයුත්තක් නොවන බව. රටේ ආර්ථිකය කඩා වට්ටලායි තිබෙන්නේ.

අපි ජීවන වියදම අඩු කළා. ඒක අවුරුදු 10කට ඉස්සෙල්ලා කරන්න තිබුණු දෙයක්. අවුරුදු 5කට, 6කට ඉස්සෙල්ලා -අපි උසාවි ගිය අවස්ථාවේදී- තෙල් මිල අඩු කරන්න තිබුණා. ඒ වෙලාවේ කිව්වේ, "ආණ්ඩුව අපේ අතේ. මේවා අඩු කරන්න අපට අවශ්‍යතාවක් නැහැ" කියලා. ඡන්දය එන කොට ඒවා මතක් වෙනවා. අපි ඒ වාගේ නොවෙයි. අපි පොරොන්දුවක් දුන්නා. ඒක ක්‍රියාත්මක කළා. ඒ වාගේ කටයුතු කිරීම තමයි අපට අවශ්‍ය වන්නේ. වග කීමක් ඇති ජනාධිපතිවරයෙක් සහ රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාගේ ආණ්ඩුව තුළ අපි කියපු දේ කරනවා. අපි මේ අවස්ථාව වන විට ජාතික ආණ්ඩුවක් තුළින් අතුරු අය වැයක් ඉදිරිපත් කරලා තිබෙනවා. එවකට හිටපු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඉදිරිපත් කළ අය වැයේ, අය වැය හිඟය රුපියල් කෝටි 53,210ක්. එනම් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4.6ක්. අපට මූල්‍ය විනයක් තිබෙනවාය කියලා පෙන්වන්න අවශ්‍ය වුණා. ඒක තමයි මට අගමැතිතුමා නිර්දේශ කළේ. ඒ නිසා ආදායම ලබා ගෙන වියදම අඩු කර ගෙන අය වැය හිඟය අපට අඩු කරන්න පුළුවන් වුණා, කෝටි 49,900කට. ඒ කියන්නේ, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4.4කට. අපි මේක ඕනෑකමින් කරලා තිබෙන්නේ. මේක කිසි සේත්ම ක්‍රියාත්මක කරන්න බැරි, ගණනය කිරීමක් පමණක් නොවෙයි. ප්‍රායෝගිකව කරන්න පුළුවන් දෙයක් තමයි අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ. මොකද, අපි ආණ්ඩුව ඉදිරියට ගෙන යන්න අවශ්‍යයි. අපි මෙතැන එක වැරදි ප්‍රකාශයක් කළොත් ඊට පස්සේ එන අවුරුද්දේ මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න ගියාම අපට ප්‍රශ්නයක් ඇති වේවි. අපි වග කීමකින් කියනවා, අපි මේ ඉදිරිපත් කර තිබෙන වැඩ පිළිවෙළ තුළින් අය වැය හිඟය සියයට 4.4ට අපට අඩු කරන්න පුළුවන් කියා.

අපි දන්නේ නැති දේ තමයි, එදා ඉදිරිපත් කළ අය වැය තුළින් වෙලා තිබෙන ආර්ථික පිරිහීම. ඒක ඇස්තමේන්තු කරන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. මොකද, ඡන්ද කාලයේ සමහර ලේකම්වරු රජයේ සල්ලි රුපියල් මිලියන 8,000ක් විතර පාවිච්චි කරලා තිබෙනවා. රුපියල් මිලියන 8,000ක් පාවිච්චි කරලා තිබෙන්නේ මොකටද? ඡන්ද ව්‍යාපාර වෙනුවෙන්. ඒ දවස්වල ඡන්ද වැඩ කටයුතු සම්බන්ධයෙන්. ඒ ඡන්ද ව්‍යාපාර සඳහා යන වියදම් කිසි සේත්ම ප්‍රාග්ධන වියදම් නොවෙයි. මම එන සුමානේ නොවෙයි, ඊට පසු සුමානේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නම් කොයි ලේකම්වරයාද, කොයි ඇමති ද ඒවා පාවිච්චි කළේ කියලා; වියදම් කළේ කියලා. මෙන්න මේ වාගේ දේවල් ගැන තමයි ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙන්නේ. ප්‍රාග්ධන වියදම් ඒ අය පුනරාවර්තන වියදම්වලට වෙනස් කරලා තිබෙනවා. රුපියල් මිලියන 1,200කට විතර ඒ වාගේ දේවල් සිදු වෙලා තිබෙනවා. මගේ ලේකම්තුමා ඇතුළු අපේ නිලධාරින් සියලු දෙනාම මහන්සියෙන් වැඩ කරලා අපට පුළුවන් වුණා මේ දවස් 23, 24 තුළින් ඒවා ඉදිරිපත් කරන්න. මම බොහොම ඕනෑකමින් කියනවා, තොරතුරු ඉදිරිපත් කරන කොට යම් ප්‍රශ්න ඇති වෙන්න ඉඩ තිබෙනවා; දුර්වලතා තිබෙන්න පුළුවන් කියා. නමුත් 7වැනි දා විවාදය අවසන් වන කොට ඒ සියලු දේම නිවැරදි කරලා මන්ත්‍රීවරුන් ඉදිරිපත් කරන ප්‍රශ්නවලට අවංක උත්තරයක් දෙන්න මම බැඳී සිටිනවා කියන එක මා මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. ඒ නිසා අදහස් යොමු කරන්න. මේ කියන තොරතුරු අපට ලබා ගන්න පුළුවන් වුණේ, දවස් 23ක්, 24ක් වැනි කාලයක් තුළින්.

විපක්ෂයේ ඉන්න කොට අපි පොල් ගෑවේ නැහැ. අපි දැන ගත්තා මොනවාද වෙලා තිබෙන්නේ කියලා. ඒ නිසා තමයි අගමැතිතුමාගේත්, අපේ ඇමති මණ්ඩලයේත් අදහස් තුළින් අපට මෙවැනි අතුරු අය වැයක් ඉදිරිපත් කරන්න පුළුවන් වුණේ. ඒ නිසා ඔබ සියලු දෙනාටම මම කාරුණිකව කියන්නේ මේ කාරණයයි. අපේ අදහස්වලට වඩා වැඩිය හොඳ අදහස් තිබෙනවා නම් ඒවා ලබා ගෙන ඉදිරියේදී ක්‍රියාත්මක කරන්න අපි සූදානම්. නමුත් අපට අවශ්‍ය නැහැ, පම්පෝරි ගහන ආර්ථිකයක්. ඒක අවසන්. දූෂණයට ලක් වෙලා තිබෙන ආර්ථිකයක් අපට අවශ්‍ය නැහැ. ඒ යුගය අවසන්.

මේ රථ වාහන සම්බන්ධයෙන් ඉදිරිපත් වෙලා තිබෙන යෝජනාව මීට පෙර අවස්ථා තුන, හතරක තිබුණු ආණ්ඩු තුළින් ක්‍රියාත්මක වෙලා තිබෙනවා. නමුත් ඒ හැම අවස්ථාවකදීම රථ වාහන ආනයන සංගම් ඇවිල්ලා යම් විධියකින් ගනුදෙනු දීලා වෙනස් කරගෙන තිබෙනවා. නමුත් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාත්, රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාගේ ආණ්ඩුවත් තඹ සතේක දූෂණයක් ඇති වෙන්න ඉඩ ලබා නොදෙන නිසා මෙවැනි ප්‍රතිපත්ති වෙනස් කරන්නේ නැහැයි කියන එක වගකීමකින් මේ අවස්ථාවේදී කියන්න කැමැතියි. නමුත් යම් කෙනෙකුට, වයසක පුද්ගලයන්ට, රජයේ නිලධාරින්ට, ආගමික සිද්ධස්ථානවලට ඒ වාගේ ප්‍රශ්න තිබෙනවා නම් අපි ඇහුම්කම් දෙනවාය කියලා මේ අවස්ථාවේදී විවෘතව ප්‍රකාශ කරන්න කියලා මට අගමැතිතුමා කිව්වා. එම නිසා මීට වඩා හොඳ අය වැයක් අපේ ජනතාවට ලබා දෙන්න කටයුතු කරමු කියලා ඔබ සියලු දෙනාගෙන්ම කාරුණිකව ඉල්ලා සිටින අතර, ලබන 07 වෙනි දා සවස් වරුවේ මේ ගැන පැයක් විතර කථා කරන්න සූදානමින් සිටින බව කියන්න කැමැතියි. බොහොම ස්තූතියි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

[අ.භා. 1.48]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා(විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Nimal Siripala de Silva - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු රවි කරුණානායක මැතිතුමා කාලාන්තරයක් තිස්සේ විපක්ෂයේ ඉඳගෙන ආර්ථිකය ගැන කථා කළා; අය වැය ගැන කථා කළා; විවේචනය කළා. අපේ රජය කටයුතු කරන කාලයේ ආදායම් මාර්ග සොයා ගැනීමේ ක්‍රමවේද පාවිච්චි කළේ නැහැ කිව්වා. දැන් එතුමාට අවස්ථාව ලබා දීලා තිබෙනවා එතුමා විපක්ෂයේ ඉඳගෙන කරන ලද විවේචන සාධාරණීකරණය කරලා ක්‍රියාත්මක කරලා පෙන්වන්න. ඉතින් එතුමා ඒ වැඩ කරන්නේ කොහොමද කියලා අපි බලාගෙන ඉන්නවා.

විශේෂයෙන්ම මෙම අතුරු අය වැය ලේඛනය පිළිබඳව සාරාංශයක් ගත්තොත් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ තුළින් ජනතාවට, රජයේ සේවකයන්ට ප්‍රතිලාභ ලබා දීම පිළිබඳව අපේ විරුද්ධත්වයක් නැහැ. අපි ඒ ප්‍රතිලාභ ලබා දීම අනුමත කරනවා. අවශ්‍ය මුදල් සොයා ගෙන මේ ප්‍රතිලාභ ලබා දෙන්න ඔබතුමන්ලාට පුළුවන් නම්, සමෘද්ධිය වැඩි කරන්න පුළුවන් නම් හොඳයි. මේ ප්‍රතිලාභ ලබා දීමේ ප්‍රධාන කොටස්කාරයන් බවට පත් වෙන්නේ විපක්ෂය. මොකද, විපක්ෂයේ සහයෝගය නැතිව මෙම අය වැය අනුමත කරගන්න ඔබතුමන්ලාට පුළුවන්කමක් ලැබෙන්නේ නැති නිසා. විපක්ෂයෙන් ලැබෙන සහයෝගය නිසා තමයි මේ රටේ ජනතාවට ඔබතුමන්ලා යෝජනා කරනු ලබන මේ ප්‍රතිලාභ සියල්ල ලබා දෙන්න පුළුවන් වන්නේ. ඒ නිසා එහි ගෞරවය පූර්ණ වශයෙන්ම විපක්ෂයට ලැබෙනවා. ඒ නිසා තමයි අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සමඟ මේ පිළිබඳව අපේ පක්ෂය තුළ කළ සාකච්ඡාවේදී මේ අතුරු අය වැය සඳහා අපේ ඡන්දය ලබා දීමට තීරණය කළේ. ඒ වාගේම එතුමා අපට ඉතා පැහැදිලිව කියා සිටියා මේ ගැන විවේචනාත්මක සහයෝගයක් ලබා දෙන්න, අඩු පාඩු තිබෙනවා නම් පෙන්වලා දෙන්න කියලා. ඒ අනුව විපක්ෂයේ කාර්ය භාරය වශයෙන් ඒ වැඩ කටයුත්තත් ඉෂ්ට කිරීමට අපි බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම අප රජය විසින් ඉදිරිපත් කළ අය වැය ලේඛනයේ සුළු සුළු වෙනස්කම් අද කරලා තිබෙනවා. අමාත්‍යාංශවල තිබෙන මුදල් එහෙන් මෙහෙට දමලා, මෙහෙන් එහෙට දමලා. වට්ටියෙන් පෙට්ටියට දමලා, පෙට්ටියෙන් වට්ටියට දමලා තමයි මෙම අතුරු අය වැය ලේඛනය ඉදිරිපත් කරලා තිබෙන්නේ. උදාහරණයක් කිව්වොත්, අපි කලින් ඉදිරිපත් කරන ලද අය වැය ලේඛනයට අනුව මුළු ආදායම, ප්‍රදාන ඇතුළත්ව රුපියල් බිලියන 1,689ක් වුණා. සංශෝධිත අය වැයේ මුළු ආදායම හා ප්‍රදාන රුපියල් බිලියන 1622යි. 1689ක් වුණු අපේ ආදායම් ලබා ගැනීම රුපියල් බිලියන 1622ට අඩු කළා. ඒ වාගේම වියදමත් රුපියල් බිලියන 87කට අඩු කරලා තිබෙනවා. ඉතින් ඒ නිසා මේ අතුරු අය වැය තුළ සුවිශේෂ ආශ්චර්යයක් නැහැ. නමුත්, නව ආදායම් ලබා ගැනීමේ මාර්ග වශයෙන් මුදල් ඇමතිතුමා ඉදිරිපත් කරලා තිබෙන කාර්යයන් සියල්ල කොතෙක් දුරට realistic ද? මෙය කොතෙක් දුරට ප්‍රායෝගික ද කියන කාරණය පිළිබඳව ප්‍රශ්න ගණනාවක් මතු වෙනවා.

ඒ වාගේම සහන ලබා දීම සඳහා මේ බලාපොරොත්තු වන මුදල් ප්‍රමාණය ප්‍රමාණවත් ද කියන කාරණය පිළිබඳව ප්‍රශ්න රාශියක් මතු වෙනවා. ඔබතුමා දන්නවා, මේ රටේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තිබෙන දත්ත අනුව වසරකට උපදින දරුවන්ගේ ගණන තුන් ලක්ෂ හැටදාහක්, හාරලක්ෂයක් අතර ප්‍රමාණයක් වෙනවා කියලා. ඒ එක් ගැබිනි මවකට රුපියල් 20,000 ගණනේ දෙන්න ගියාම රුපියල් බිලියන 8ක් පමණ ඕනෑ වෙනවා. නමුත් අපේ මුදල් ඇමතිතුමා ඉදිරිපත් කළ අය වැය යෝජනාවේ ඒ සඳහා වෙන් කරලා තිබෙන්නේ රුපියල් මිලියන දාහක් පමණයි. ඒ කියන්නේ අටෙන් එකකට තමයි මේ මුදල ලැබෙන්නේ. ඒ නිසා මේ පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් මතු වෙනවා. [බාධා කිරීමක්] හැම එක්කෙනාටම දෙනවා කියලා නේ කිව්වේ. You cannot discriminate like that. Your pledge was that you would give everyone. So, do not change now. ඒ අතින් බලන කොට එතරම් ප්‍රායෝගිකභාවයක් පෙන්වලා නැහැ කියලා මම හිතනවා.

අනෙක් කාරණය මෙයයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. විශේෂයෙන්ම මැතිවරණ ව්‍යාපාරවලදීත්, ඊට පෙරත් කැසිනෝ සම්පූර්ණයෙන්ම නතර කරනවා කියලා තමයි කිව්වේ. කැසිනෝ පිළිබඳව මේ රටේ ජනතාවට දුන්නු පණිවුඩය වුණේ, "අපි කැසිනෝ ඔක්කෝම වහලා දානවා" කියන එක. නමුත් මේ අය වැය ලේඛනයෙන් මිලියන 5,000ක විශේෂ කැසිනෝ බද්දක් දමලා තිබෙනවා. ඒකෙන් මොකක්ද කරන්නේ? You have legalized casinos. You have accepted that some casinos should remain. So, I would like to ask what the policy of the Government is. Are you going to close down all the casinos or are you permitting some casinos to be operated in Sri Lanka?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙය ප්‍රතිපත්තිමය ප්‍රශ්නයක්. රජයේ ප්‍රතිපත්තිය කැසිනෝ දෙකක් විතරක් තියෙන්න ඕනෑ, බිලියන 5ක් බදු ගහලා අපි ඒ අය තියාගෙන යනවා කියන එක නම්-

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Are you against that tax?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
I have only 15 minutes, please.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මට පැහැදිලි කිරීමට අවස්ථාවක් දෙන්න.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
මුදල් ඇමතිතුමා පැහැදිලි කරයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙන්න මේකයි තත්ත්වය. මොකක්ද කැසිනෝ පිළිබඳව ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තිය? කැසිනෝ ඔක්කෝම වහනවාද, කීපයට බදු ගහලා ඒවා තියාගෙන ඉන්නවාද කියන ප්‍රතිපත්තිය පිළිබඳව පැහැදිලි ප්‍රකාශයක් මුදල් ඇමතිතුමාගෙන් අපි බලාපොරොත්තු වෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමන්ලා කැසිනෝ බද්දට විරුද්ධද? අපි මේ ආණ්ඩුව අරගෙන තවම දවස් 23යි.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
නැහැ, නැහැ. බද්දට විරුද්ධත්වයක් නැහැ. මම අහන්නේ ප්‍රතිපත්තිය මොකක්ද කියන එකයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමන්ලා නීතිගත කරපු අය වැය සම්බන්ධයෙන් තමයි අපි මේ කථා කරන්නේ. ඔබතුමා මේ කැසිනෝ බද්දට විරුද්ධද?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
බද්දට විරුද්ධත්වයක් නැහැ. ඕනෑ නම් තවත් බදු ගහන්න. බද්දට විරුද්ධත්වයක් නැහැ. නමුත් මම අහන්නේ ප්‍රතිපත්තිය මොකක්ද කියන එකයි. තෝරා ගත්ත කැසිනෝ ව්‍යාපාර පවත්වාගෙන යෑම ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තියද කියන එක පැහැදිලිව රටට කියන්න. ඒක කිව්වා නම් ප්‍රශ්නයක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සුළු පරිමාණයේ වාහන ආනයනකරුවන් ගැන බලන්න. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලාත්, අපිත් හැම වෙලාවේම කථා කළේ සුළු ව්‍යවසායකයන් ගැන. අද වාහන ආනයනය කිරීමේදී සුළු ව්‍යාපාරිකයන් ඇතුළු හැමෝම වාර්ෂිකව රුපියල් මිලියන 1.5ක මුදලක් ගෙවන්න ඕනෑ. වාහන විශාල වශයෙන් ආනයනය කරන එක්කෙනාත් ඒ ගණන ගෙවන්න ඕනෑ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
වාහන ආනයනය කරන association එකේ අදහසක් තමයි අපි මේ ගරු සභාවට යොමු කළේ. මේ රටේ තිබෙනවා, ඒ වාගේ ආනයනය කරන ආයතන 820ක්. මේ කටයුතු විධිමත් කරන්න ඒ ගොල්ලන්ගේ ප්‍රතිපත්තිය අනුව ඒ ගොල්ලන් කිව්වා, කරුණාකරලා මේ වාගේ බද්දක් දමන්න කියලා. අපි ඒක අංග සම්පූර්ණව භාර ගත්තා. අපි අලුතෙන් බද්දක් ගහන්නේ නැහැ. කිසිම බද්දක් නැහැ. මේ ආයතන මෙතෙක් දුරට තඹ සතයක්වත් මේ රටට ගෙවලා නැහැ. ඒ ගොල්ලන්ගේ අදහස අනුව, ඒක 400කට දාලා ඒකෙන් බද්දක් එකතු කරන එක විතරයි කළේ. ඉතින් මේකෙන් තඹ සතයකින්වත් කාර් එකක මිල වැඩි වෙන්නේ නැහැයි කියන එක වග කීමකින් කියනවා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඊළඟට මද්‍යසාර නිෂ්පාදනය කිරීම පිළිබඳව බලන්න. විශාල වශයෙන් මද්‍යසාර ව්‍යාපාරයේ යෙදෙන අයට වාසියක් වන පරිද්දෙන් සුළු පරිමාණයේ මද්‍යසාර නිෂ්පාදනය කරන සියලු දෙනාටම මිලියන 200ක බද්දක් දැම්මා. ඒ නිසා ඒ ආයතන වහන්න වෙනවා. ඒවායේ ඉන්න අයට රැකියා නැති වෙනවා. You have created a monopoly for one or two business tycoons in this country. Is that the policy of the Government? To help one or two business tycoons in the country, you have imposed this tax so that all the other manufacturers have to close down their businesses.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙන්න මේ විධියේ සිද්ධීන් වෙලා තිබෙනවා. මෙහි දීර්ඝ කාලීන ප්‍රතිඵලයක් වශයෙන් සුළු නිෂ්පාදන කරන සමාගම් ඔක්කොම වැහිලා යනවා; රැකියා අවස්ථා නැති වෙලා යනවා; එක් කෙනෙකුට, දෙදෙනෙකුට විශාල ඒකාධිකාරයක් - monopoly එකක් - ඇති කර ගන්න පුළුවන් වෙනවා. [බාධා කිරීමක්] ඔබතුමා මගේ කාලය ගන්න එපා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපි කියලා තිබෙනවා, ඕනෑම කෙනෙකු බදු ගෙවනවා නම් ඒ අවස්ථාවේම ක්‍රියාත්මක කරගෙන යන්න පුළුවන් කියලා. නමුත් එතනෝල් කන්ටේනර් දහස් ගණනින් එළියට ඇවිල්ලා තිබෙනවා. බදු ගෙවපු නැති අයගේ සාක්කුවට මේ මුදල් යන්නේ නැතිව අනිවාර්යයෙන්ම රටේ ජනතාවගේ සාක්කුවට මේ මුදල් යන විධියටයි අප සකස් කරලා තිබෙන්නේ. මොකක්ද ඒකේ තිබෙන වැරැද්ද? එහෙම නම් ඔබතුමා කියන්නේ එතනෝල්කාරයන්ට ආනයනය කරන්න ඉඩ දෙන්න කියලාද? ඒ අය නම් කරන්නම්, අවශ්‍ය නම්. මන්ත්‍රීවරු ගණනාවක් ඉන්නවා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, Rs. 2 billion profitsවලට tax දැම්මා. ඉතාම හොඳයි. එතකොට රුපියල් මිලියන 1,999ක් ගත් කෙනාට tax එක නැහැ. So, what is the rationale? රුපියල් මිලියන 1,500ක් ගත්ත කෙනාට tax එකක් නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා කියනවා නම් ඒ ගණන රුපියල් මිලියන 1,000කට අඩු කරන්නම්.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
මම කියන විධියට ඔබතුමාගේ රජය ක්‍රියා කරන්න කැමැති නම් හොඳයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපි නම්‍යශීලී ආණ්ඩුවක්.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
මම කියන්නේ මෙහි සාධාරණත්වයක් නැහැ කියලායි. කමක් නැහැ, target කරන අයට ගහන්න. ඒකට කමක් නැහැ. අප මේකට විරුද්ධ නැහැ. නමුත් මේකේ තිබෙන සාධාරණත්වය මොකක්ද? රුපියල් බිලියන 1.999කට Balance Sheet එක හැදුවොත් ඔහුට tax එකක් නැහැ. නමුත් රුපියල් බිලියන 2 වුණු හැටියේ ඒකට tax එකක් ගහන්න ඕනෑ. [බාධා කිරීමක්]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඉදිරියට කරන්න බලාපොරොත්තු වන දෙයක් සම්බන්ධයෙන් තමයි අප කියන්නේ.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

මන්දිර බද්ද පිළිබඳව පැහැදිලි criteria එකක් නැහැ. කවුද මේක තක්සේරු කරන්නේ, වරිපනම් ගෙවීම අනුවද, කොහොමද මේක තක්සේරු කරන්නේ කියලා මේ පිළිබඳව පැහැදිලි criteria එකක් නැහැ. පැරණි නිවාස මේකට අයිති වෙනවාද, නැද්ද? This is a confusing tax. Therefore, I think you will have a lot of problems.

The other matter I would like to bring to the notice of the Hon. Minister is that there is a recent judgment in India - I do not know whether you are going to follow that or not - on the retrospective legislation in respect of tax collection. ඒ කියන්නේ පසු කාලයට බලපාන, පසු කාලයේ කරන ලද ආදායම් පිළිබඳව බලපාන ඒවා ක්‍රියාත්මක කරන්න පුළුවන්ද, නැද්ද කියන කාරණය පිළිබඳව -

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Now that this question was raised by you, it is my bounden duty to answer it. Retrospective laws are not what we want to impose. But, in 2011, you brought in laws with retrospective effect and managed to expropriate 22 companies. We are basically taking on an economy that you have run down, which was run by two or three for the want of one or two. We are only rectifying that. We have an obligation for 21 million people of the country, not for two or three family members.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

Hon. Minister, it is not an excuse to say, "You did this and, therefore, we are doing this". ඔබතුමන්ලා යහ පාලනය කරන්න, නිසියාකාරයෙන් නීතිය අනුව කටයුතු කරන්න ආවා නම් අප මේ වැරැදි වැඩ කළා, මෙහෙම කළා කියලා ඒ පූර්වාදර්ශ දෙන්න එපා. සඳහන් කළ විධියට කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

අද පාර්ලිමේන්තුවට ආපු ලිපියක් මම මෙම අවස්ථාවේදී කියවන්නට කැමැතියි.

"විපක්ෂ නායක නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ. ගල්ගමුව ආසනය, අංක 23, පහළ ගිරිබාව, ගොවි සංවිධානයේ ගරු භාණ්ඩාගාරික එච්.එම්. ජයසුන්දර.

- මම ඔබතුමාට ටෙලිෆෝන් නොම්මරයත් කියන්නම්.- 071-0975011.

වී මිල දී ගැනීම් පිළිබඳව. රජය විසින් රුපියල් 50ට වී මිල දී ගැනීම නොකරන හෙයින් මෝල් හිමියන් විසින් වී කිලෝවක් රුපියල් 30 - 32 අතර මිලකට ලබා ගන්නා නිසා ගොවි මහතුන් විශාල අපහසුතාවකට පත් වී ඇත. මේ පිළිබඳව පාර්ලිමේන්තුවේ සාකච්ඡා කරන මෙන් ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි."

මේක තමයි ජනතා ප්‍රතිචාරය. ඔබ කියන ආකාරයට අද වීවලට රුපියල් 50ක් ලැබෙනවාද, රුපියල් 50කට වී විකුණා ගන්න පුළුවන්ද, ඒ සඳහා ක්‍රමවේදයක් රජය මගින් සකස් කරලා තිබෙනවාද කියන කාරණා පිළිබඳව අප ගැඹුරින්ම සිතා බලන්නට ඕනෑ.

මේ වැටුප් වැඩි කිරීමේදී සිදු වන වැටුප් විෂමතා පිළිබඳව විශේෂයෙන්ම රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය ජාතික වැටුප් ප්‍රතිපත්තිය පිළිබඳව ගැඹුරු අධ්‍යයනයක් කරලා ඔබතුමන්ලාට ඒ පිළිබඳව කරුණු ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාගේම මේ වැටුප් වැඩි කිරීමේදී ලබා දෙන්නේ දීමනාවක් විතරද, එය වැටුපට එකතු කරනවාද, විෂමතා වළක්වන්නේ කොහොමද කියන කාරණා පිළිබඳව ගැඹුරින් සලකා බලන්නට ඕනෑ. අද විශ්‍රාමිකයන් මේ පිළිබඳව බලා ගෙන ඉන්නවා. අපේ රජයෙන් ඒ අවස්ථාවේදී කිව්වේ, විශ්‍රාමිකයන්ගේ ගැටලු සියල්ල විසඳනවා කියලායි. හුදෙක් වැඩි කිරීමක් පමණක් නොවෙයි, ඒ සමඟ ඇති වන අනෙකුත් ගැටලු නිරාකරණය කරන ලෙසත් රාජ්‍ය සේවකයන් විශේෂයෙන්ම ඉල්ලා සිටින බව අපි ප්‍රකාශ කරන්නට ඕනෑ.

එසේම තිරිඟු පිටි මිල අඩුකිරීම තුළ, පිටි ආනයනය කිරීම තුළ, පිටි ආනයනයේදී එක් පක්ෂයකට ලැබෙන වාසිදායක තත්ත්වය තුළ එය දේශීය කෘෂිකර්මයට කොයි තරම් දුරට බලපායිද කියන කාරණය සලකා බලන්නට ඕනෑ. අපට පුළුවන් වුණා, මේ රටේ පිටි පරිභෝජනය අඩු කරලා, ඇමෙරිකාවට සල්ලි යන එක නතර කරලා, මේ රටේ ජනතාව ක්‍රම ක්‍රමයෙන් සහල් පරිභෝජනය සඳහා යොමු කිරීමට. ඒ තුළින් තමයි මේ රටේ දේශීය නිෂ්පාදනය වැඩි වෙන්නට පටන් ගත්තේ. ඒ නිසා පිටි ආර්ථිකය නැවත මේ රටට යම් ආකාරයකින් ගෙන ඒමට මේ අය වැය ලේඛනය රුකුල් වන බව මම ප්‍රකාශ කරන්නට කැමැතියි.

අපේ අය වැය ලේඛනය තුළින් කුඩා පරිමාණ උක් වගාකරුවන් දිරිමත් කිරීමේ අදිටනින් ගොවීන්ට උක් මිලදී ගැනීමට ගෙවනු ලබන මිල මෙට්‍රික් ටොන් එකකට රුපියල් 4,500 දක්වා වැඩි කරන්නට යෝජනා කළා.

කුඩා තේ වතු සඳහා තේ අක්කරයකට රුපියල් 5,000 බැගින් ගෙවනු ලබන දීමනාව තව දුරටත් පවත්වා ගෙන යාමට කටයුතු කළා. මේ විධියට අපේ රජය මඟින් ඉදිරිපත් කරන ලද අය වැය ලේඛනය මඟින් ලබා දෙන ලද සහන ඒ ආකාරයෙන්ම ලබා දීමට කටයුතු කරනවාද කියන කාරණය මම අහන්න කැමැතියි. ඒ පිළිබඳව අපට පැහැදිලි පිළිතුරක් අවශ්‍යයි. නැත්නම් වෙන්නේ, අප විසින් ලබා දෙන ලද සහනාධාර රාශියක් කප්පාදු කරලා, ඒ වෙනුවට යම් සහනාධාර ප්‍රමාණයක් එකතු කිරීම පමණයි.

ජනාධිපතිවරයාගේ වැය අඩු වීම ගැන අපි සතුටු වෙනවා. නමුත් වෙලා තිබෙන්නේ, අමාත්‍යාංශවල අය වැය එහාට මෙහාට දැමීම නිසා ඉලක්කම්වලින් අඩුවක් පෙන්වීම පමණයි. නමුත් ඔබලාගේ සමස්ත අය වැය වියදම, අප විසින් ඉදිරිපත් කරන ලද අය වැය වියදමට සමානවම ඒ ආකාරයෙන්ම තිබෙනවා.

පාරවල්, මං මාවත්, ජල සම්පාදන යෝජනා ක්‍රමවලට වෙන් වෙලා තිබෙන මුදල් පිළිබඳව මම සොයා බැලුවා. ඒ වාගේම අධ්‍යාපනය සහ සෞඛ්‍යය සඳහා වෙන් කරන ලද මුදලේ වැඩි වීමක් වෙලා නැහැ. ඒකත් කියන්න ඕනෑ. එදා අධ්‍යාපනයට සල්ලි මදි, සෞඛ්‍යයට සල්ලි මදි කියලා අපට කියපු -

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

වකුගඩු රෝගීන්ට ලබා දෙන විශේෂ දීමනාව සඳහා අපි රුපියල් මිලියන 2,000ක් වෙන් කරලා තිබෙනවා. අපේ දින සියයේ වැඩ පිළිවෙළ තුළ වකුගඩු රෝගීන් සඳහා රුපියල් මිලියන 2,000ක් වෙන් කරලා තිබෙනවා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

But, the overall health expenditure remains the same. There had not been an increase in the overall expenditure on health and the overall expenditure on education. අපේම ප්‍රතිපත්තිය තමයි, අපේම අය වැය ලේඛනය තමයි අමාත්‍යාංශ ගණන අඩු කරලා, මේ අමාත්‍යාංශයේ සල්ලි අනෙක් එකට දමලා, ඉලක්කම් ටිකක් වෙනස් කරලා මේ පෙන්වලා දීලා තිබෙන්නේ කියලා මා ප්‍රකාශ කරනවා. අපි ප්‍රාර්ථනා කරනවා, ජනතාවට ලැබෙන සහන හරි හැටි ලබා දීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන වෙන් කරලා දෙන්න හැකි වෙන්න කියලා. එසේ කියා සිටිමින් මාගේ කථාව අවසන් කරනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Sunil Handunnetti. You have eight minutes.

[අ.භා. 2.05]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මාගේ කාලය සංශෝධනය කරලා දෙනවා කියලා විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා එකඟ වුණා. ඊට අනුව තමයි මම කථා කරන්නේ. විපක්ෂ නායකතුමා සමඟ සාකච්ඡා කරලා කාලය සංශෝධනය කරලා දෙනවා කියලා පොරොන්දු වූ නිසායි මම කථා කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අතුරු අය වැයක් හැටියට මේ අය වැය යෝජනාවලියේ ජනතාවට සුබවාදී යෝජනා ගණනාවක් තිබෙනවා. විශේෂයෙන්ම ජීවන වියදම් සහන ලබා දෙන ඒ සුබවාදී යෝජනා පිළිබඳව මේ වන විට මේ රටේ සාකච්ඡාවට ලක් වෙලා, මාධ්‍යවල අවධානය යොමු වෙලා තිබෙන නිසා මම ඒ ගැන වැඩිය සාකච්ඡා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඒ දැක්වූ උත්සාහය අගය කරන අතර, මේ අය වැය යෝජනාවලිය නිසා මතු වෙලා තිබෙන ප්‍රායෝගික ගැටලු ප්‍රමාණයක් තිබෙනවා. ඒවා ගැන සාකච්ඡා කරන්න බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම මුදල් අමාත්‍යතුමා මුලින් කළ පැහැදිලි කිරීමේදීත් වාහන සම්බන්ධයෙන් කථා කළා.

ගරු මුදල් ඇමතිතුමනි, මෙතැන තියෙන ප්‍රායෝගික ගැටලුව, මේ වාහන ආනයනය කරන ව්‍යාපාරික ආයතන මුහුණ දෙන ගැටලුවක් නොවෙයි. අද මේ ගැටලුවට මුහුණ දීලා තිබෙන්නේ ජීවිතයේ පළමුවැනි වතාවට සහ අවසාන වතාවට -එක වතාවකට- පෞද්ගලිකව වාහනයක් මිලදී ගන්න උත්සාහ කරපු උදවියයි. මේ අය මේ දිනවල ජපානයේ යෙන් එකේ අගය අඩු වෙන නිසා ඒ අඩුවීම දිහා බලාගෙන ඉඳලා, නව රජය යම් බදු සහනයකුත් දෙයි, බදු බර පටවන එකක් නැහැ කියලා විශ්වාස කරපු නිසා, වාහනයක් ඇණවුම් කරපු අය. මේ අය ගත්තොත් වෛද්‍යවරු-

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අපි සියයට 20 කින් බදු අඩු කරලා තිබෙනවා. රථවාහනයක් තිබුණේ නැති ඒ අභිංසක අයට අපි ඒ සහනය ලබා දීලා තිබෙනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මගේ පැහැදිලි කිරීම අවසානයේ ඔබතුමා ඒ ගැන කිව්වොත් ලොකු දෙයක්. වෛද්‍යවරු ඉන්නවා. ඉංජිනේරුවරු ඉන්නවා. විශ්‍රාම පාරිතෝෂිකය ලබා ගත්ත අය ඉන්නවා. තමන්ගේ තිබුණු වාහනය විකුණලා වාහනයක් ඇණවුම් කරපු අය ඉන්නවා. මේ ආකාරයේ විවිධ අය ඉන්නවා. මේ අය ඉල්ලන්නේ 2015 ජනවාරි මාසයේ 29වැනි දා අය වැය ලේඛනය ඉදිරිපත් කරන්න කලින් ඒ ඇණවුම් සඳහා ණයවර ලිපි විවෘත කරපු -LC open කරපු- අයට තමන්ගේ වාහනය ගෙන්වා ගන්න සහනය දෙන්න කියන එක. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ අය දන්නේ නැහැ මේ බද්ද ගැන. ඒ අය වාහනය ඇණවුම් කළා කියන්නේ - L/C open කළා කියන්නේ- ඒ අය මිලදී ගැනීම සම්පූර්ණ කරලායි තිබෙන්නේ. වාහනය නැවේ එන අතරවාරයේ තමයි අය වැය ලේඛනයෙන් මේ බද්ද පනවන්නේ. එතකොට ඒක සාධාරණද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒකට උදාහරණයක් මම කියන්නම්. කඩේට ගිහින් කෑම එකක් කන කොට තිබුණේ එක මිලක්. කාලා කවුන්ටරයට ඇවිල්ලා බිල ගෙවන්න යන කොට දෙගුණයක් මිල කිව්වොත් මොකද කරන්නේ? කෑම එක කන වෙලාවේ තිබෙන ගණන නොවෙයි කවුන්ටරයට ඇවිල්ලා බිල ගෙවන්න හදන කොට කියන ගණන. අත සෝදා ගෙන වාඩි වුණාම කෑම එකේ මිල රුපියල් 150යි කියලා, එළියට එන කොට රුපියල් 300 ක් අය කළොත් මොකද කරන්නේ? ඒ වාගේ වැඩක් මේ වෙලා තිබෙන්නේ.

මෙතැන මට තිබෙන පුදුමය මෙයයි. 2012 අප්‍රේල් මාසයේ මේ පාර්ලිමේන්තුවේම එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුවෙන් මෙවැනිම ක්‍රියාවලියක් කරලා බදු වැඩි වුණාම, ඒක ගෙවා ගන්න බැහැ කියලා අසාධාරණයට ලක් වුණ මෙවැනි පිරිසක් ඉන්නවා කියලා අපි ඒ කාරණාව ඉදිරිපත් කරන කොට, එයට මට සහයෝගය දුන්නේ එවකට රවි කරුණානායක මන්ත්‍රීතුමා සහ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමායි. [බාධා කිරීමක්] ඔබතුමන්ලා කිව්වා.

ඔව්, ඔබතුමන්ලා කිව්වා. දැන් ඔබතුමන්ලාට මතක නැහැ. [බාධා කිරීමක්] අප්‍රේල් පළමු වැනිදා පත්තර බලන්නකෝ. ඔබතුමාත් කතා කරපු ඒවා තිබෙනවා. ඒවා මට මේ වෙලාවේ ගෙනෙන්න බැරි වුණා. ඒ වෙලාවේ මුදල් අමාත්‍යාංශයේ හිටපු ලේකම් පී.බී. ජයසුන්දර මහතා තමයි ඒකට සම්පූර්ණයෙන් විරුද්ධ වුණේ. සරත් අමුණුගම හිටපු ඇමතිතුමාගේ යම් නම්‍යශීලීත්වයක් තිබුණා. ගරු ඇමතිතුමනි, ඒත් මේ සිද්ධියමයි. මේක වාහන ගෙන්වන සේල් හිමිකරුවන්ගේ ප්‍රශ්නයක් නොවෙයි. මොකද, වාහන සේල් හරහා මේවා ගෙන්වන කිහිප දෙනෙක් ඇති. නමුත් මා සඳහන් කරන මේ අසාධාරණයට ලක් වූ අය පිළිබඳ වාර්තාවක් මා ළඟ තිබෙනවා. ඒ අයගේ ණයවර ලිපි - L/C - අංක, නම්, ජංගම දුරකථන අංක, ඔවුන් වාහනය ඇණවුම් කළ දින ආදිය සඳහන් හයසිය දෙනෙකුගේ පමණ විස්තර ඇතුළත් එම වාර්තාව මා දැන් **සභාගත*** කරනවා.

ඔබතුමාට ලංකාවේ බැංකුවලින් මේ පිළිබඳ තොරතුරු සොයා ගන්න පුළුවන්. ලංකාවේ බැංකුවලින් ඔබතුමාට සොයා ගන්න පුළුවන් පෞද්ගලිකව වාහනයක් ඇණවුම් කළ අය කවුද කියලා. වාහන සේල් කොම්පැනි නොවෙයි. L/C open කරලා තිබෙනවා. මෙහි L/C අංකය තිබෙනවා.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැවත ඔබතුමා ඒක දේශපාලනීකරණය කරන්න ඕනෑ නැහැ. අපි කිව්වා, ඔය වාගේ භාර පන්සියයක් විතර සිටිනවා නම් අපි ඒ ගැන මානුෂීය මට්ටමින් බලා ක්‍රියාත්මක කරනවා කියා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔබතුමා කියන ආකාරය පැහැදිලි නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම අද මගේ කථාව පටන් ගත්තේ ඔය ගැන කියලා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔබතුමා කියන්න කෝ මෙහෙම. මම ඔබතුමා අපහසුතාවට පත් කරනවා නොවෙයි. 2015 ජනවාරි මාසයේ 29 වැනිදා වෙන කොට L/C open කරලා තිබුණු හයිබ්‍රිඩ් වාහන සම්බන්ධයෙන් මේ බද්ද අය කරන්නේ නැහැ කියලා ඔබතුමා කියනවාද? ඒකද උත්තරය?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
වාණිජකරණ මට්ටමෙන් නැතිව පෞද්ගලික මට්ටමෙන් තමාගේ නමටම ලියා පදිංචි කරන්න කාර් එකක් ගෙන්වනවා නම්, -මතක තියා ගන්න, තමාගේම නමට ලියා පදිංචි කරන්න වාහනයක් ගෙන්වනවා නම්- නම් අපි ඒ සම්බන්ධයෙන් සාධාරණව බලනවා. ඒකට අපි දන්නා විධියට කාර් රථ 350ක් 400ක් විතර තියෙනවා. ඒකට කිසි ප්‍රශ්නයක් නැහැ. දැන් බලන්න රජයේ සේවකයෙකුගේ permit එක විකුණලා ඒකට වාහනයක් ගෙනැල්ලා විකුණන්න හදනවා නම් ප්‍රශ්නයක් තියෙනවා. නමුත් අපේ අහිංසක ජනතාවට අපි කිසිසේත්ම මේකෙන් කිසිම බදු බරක් පටවන්න ඉඩ දෙන්නේ නැහැ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා ඔයිට වැඩිය සාධාරණ විධියට හිතන්න කියලා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා කිව්ව කාරණයේදී උදවු කරනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒක හරි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
L/C ඇරලා තිබෙනවා නම් අපි කියන දවසට පෙර, කිසි සේත්ම වෙළෙඳාම පැත්තෙන් ඒක උපයෝගී කර ගන්නේ නැත්නම්, තමාගේ නමට ඒ වාහනය ලියා පදිංචි කරන්න යනවා නම් කිසි ප්‍රශ්නයක් නැහැ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු ඇමතිතුමනි, වාහන ගෙන්වන, වාහන අළෙවි කරන සමාගමක් කියලා හිතමුකෝ. ඒ අයට හැම තිස්සේම මුහුදේ නැව් භාරයක් තිබෙනවා. කොයි වෙලාවේ බද්ද පැනෙව්වත් ඒ අයගේ shipment එකක් තිබෙනවා. එතකොට ඔබතුමන්ලා බදු වැඩි කරන කොට පාඩු වේවි, බදු අඩු කරන වෙලාවට ඒ අයට ලාභ වේවි. ඒක වාහන ව්‍යාපාරිකයාගේ ප්‍රශ්නයක්. අපි මේ කථා කරන්නේ ඒක නොවෙයි. [බාධා කිරීමක්] නැහැ, නැහැ. ඔබතුමා ඉන්නකෝ. ඔබතුමා කියන විධියෙන්, ඒ කියන්නේ 400ක්, 300ක් කියන එකෙන් තමයි මේ ප්‍රශ්නය එන්නේ. මොකද, මෙතැනම 600ක් තිබෙනවා. ඔබතුමා හොයලා බලන්න. සමහර අය පෞද්ගලිකව L/C open කරනවා තමයි. ඒ අය ඒ වාහනය ගෙන්වන්නේ කුඩා පරිමාණයේ හෝ මොකක් හෝ මට්ටමක වාහන සේල් එකකින් වෙන්න පුළුවන්. එතකොට ඇති වෙන ප්‍රශ්නය මොකක්ද? එතකොට ඒක ගෙන්වන්නේ වාහන සේල් එකේ අයිතිකාරයා නොවෙයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපි අඩු කරලා තිබෙනවා, ලක්ෂ හතරක විතර බදු ප්‍රමාණයක්. සියයට 20ක් විතර අඩු කරලා තිබෙනවානේ. ඒ ගැන මොනවත් කථා කරන්නේ නැහැනේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මම වාහන ව්‍යාපාරිකයෙක් නොවෙයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
1000ccවලට වඩා අඩු වාහනවලට කිසි ප්‍රශ්නයක් නැහැ. හයිබ්‍රිඩ්- [බාධා කිරීමක්]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔබතුමා ව්‍යාපාරිකයින් කිහිප දෙනෙක් හමු වෙන්න ඇති. බලන්නකෝ මේ ගැන-

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, නැහැ. ව්‍යාපාරිකයින් පිළිබඳ ප්‍රශ්නයක් නැහැ මෙතැන. බොහොම සාධාරණව-

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
හයිබ්‍රිඩ් වාහන ලක්ෂ හත අට-

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මෙතැනදී එන්ජින් ධාරිතාව 1000ට අඩු ඒවාට කිසි ප්‍රශ්නයක් නැහැ. සියයට 20ක වරප්‍රසාදයක් තිබෙනවා. එන්ජින් ධාරිතාව 1000ත්-2500ත් අතර ඒවාට තමයි ප්‍රශ්නය තිබෙන්නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු ඇමතිතුමනි, දැන් මේ මිල වැඩි වන වාහන ක්‍රම දෙකකට ගෙන්වනවා. එකක් පෞද්ගලිකව තමන්ගේ පරිහරණය සඳහා ගෙනෙන වාහන. ඊළඟට, අළෙවිය සඳහා සමාගම් විසින් ගෙනෙන වාහන තිබෙනවා. ඒ වාගේම පෞද්ගලිකව තමන්ට ගෙන්වන්න සබඳතා හෝ හැකියාවක් නැති නිසා කුඩා සමාගමක් හරහා ගෙන්වන්න try කරන අයත් ඉන්නවා. එතකොට ඔබතුමාගේ -

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
උදාහරණයක් කියන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මට වාහනයක් ගෙන්වන්න ඕනෑය කියලා හිතමු. හැබැයි, මා දන්නේ නැහැ, පෞද්ගලිකව L/C එකක් open කරලා ඒක ගෙන්වන්නේ කොහොමද කියලා. මම වාහන ගෙන්වන කුඩා පරිමාණයේ ව්‍යාපාරයක් කරන කෙනෙකුට කියනවා "මම වාහනය ගන්නවා; මේකයි මගේ ගණන, මගේ නමින් ඔබ L/C එක open කරලා මට වාහනය ගෙනැවිත් දෙන්න" කියලා. සමහර අය ඉන්නවා, විකුණන්නම ගෙනෙන. ඔබතුමාට තේරෙනවා ඇති, මා මේ කියන දේ. ඔබතුමා කියනවා, තමන්ගේ පෞද්ගලික පරිහරණය සඳහා ගෙනෙන වාහන සඳහා ඒ දිනය වෙන කොට L/C එක open කරලා තිබුණා නම් ඒ ගොල්ලන්ට මේ බද්ද අදාළ වෙන්නේ නැහැ කියලා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අදාළ වෙන්නේ නැහැ නොවෙයි, අපි ඒක ඉවත් කරන්න කටයුතු කරමු.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ කියන්නේ, ඒ බද්ද ඉවත් කරන්න කටයුතු කරනවා කියන එකනේ. මොකද, ඒ ගොල්ලන් ඒ වෙන කොටත් මේ වාහනයේ මිල ගණන් දැනගෙන, ඒ ප්‍රමාණයට තමන් ළඟ මුදල් තබා ගෙනයි මේක ගෙනැල්ලා තිබෙන්නේ. එතකොට එහෙම නම් ඒ සහනය හම්බ වෙන්න ඕනෑ.

ඊළඟට, සමාගම් විසින් අළෙවිය සඳහා වාහන ගෙන්වනවා. එතකොට ඒ ගොල්ලන්ට පුළුවන් හෙට ඉඳන් ඒ ගණන වැඩි කරලා අළෙවි කරන්න. හැබැයි, සමහර අය - මා කිව්වේ ඒකයි, විශේෂ කිහිපයක් තිබෙනවා කියලා.- අර ව්‍යාපාර කරන අය හරහාම සල්ලි බැඳලා තමයි වාහනය ගෙන්වන්න උත්සාහ කරන්නේ. ඒ අයට ඒ සහනය ලැබෙන්නේ නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ විධියට වාහන ගෙන්වන අය කී දෙනකු ඉන්නවාද? ඔබතුමා ඔහොම කියනවා නම් දන්නවා ඇති නේ. කී දෙනකු ඉන්නවා ද එහෙම අය?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම ප්‍රමාණය දන්නේ නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක තමයි. නොදන්නා ප්‍රමාණය නිසා මේක දූෂණයට ලක් වෙන්න පුළුවන්. ඔබතුමා කිව්වොත් මෙපමණ ඉන්නවා කියලා ඒ අයට සාධාරණයක් කරන්න පුළුවන්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එවැනි කණ්ඩායමක් ඉන්නවා නම් සහන දෙන්න ලැස්තියි ද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපි ලැස්තියි. හැබැයි, ඒ ප්‍රමාණය දහස් ගණනක් වෙන්න බැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒක හරි. එතකොට සමාගමක් දහයක් විතර අල්ලාගෙන කිව්වොත් මේ ගොල්ලන් වෙනුවෙන් තමයි අපි මේවා ගෙනාවේ කියලා-

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Sunil Handunnetti, you have two more minutes.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තමාගේ නමට අවුරුදු තුනක් ලියා පදිංචි කරලා තිබෙන්න ඕනෑ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු මුදල් ඇමතිතුමනි, ඔබතුමාත් එකඟ වෙන කාරණාව මේකයි. දැන් ඔබතුමන්ලාගේ බද්ද පනවන්න කලින් ව්‍යාපාරිකයෝ ගෙනැල්ලා තිබෙනවා හයිබ්‍රිඩ් -දෙමුහුන්- වාහන

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

අඩු ගණනට. ඒවා මේ බද්ද නිසා දැන් වැඩි කරන අයත් ඉන්නවා. ඒක හරි. නමුත් දැන් මේ ව්‍යාපාරික ප්‍රශ්නය නොවෙයි, ඔබතුමා හරියට හඳුනා ගන්න මේ බද්ද පනවන්න කලින් පෞද්ගලිකව ගෙන්වන අය කවුද කියලා. ඔබතුමාට හඳුනා ගන්න පුළුවන් ඒ අයව. හඳුනා ගෙන ඒ අය ගෙනෙන්නේ වාහන සේල් එකක් හරහාද පෞද්ගලිකව, සෘජුව ඇණවුම් කරලාද කියන එක නොසලකා ඒ අයට මේ සහනය දෙන්න කියන ඉල්ලීම තමයි මා මේ කරන්නේ. [බාධා කිරීමක්] ඔබතුමාගේ පිළිතුරු කථාවේදී ඉතිරි ටික කියන්න. මේක බරපතළ ප්‍රශ්නයක්. මේ බරපතළ ප්‍රශ්නයට මේ පාර්ලිමේන්තුවේ පක්ෂ විපක්ෂ හැම දෙනාගේම අවධානය යොමු කරන්න කියලා මා ඉල්ලා සිටිනවා.

තව ප්‍රායෝගිකව මතු වුණු ප්‍රශ්නයක් තමයි විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් වැඩි කිරීම සම්බන්ධ ප්‍රශ්නය. මොකද, ඔබතුමන්ලා දින සියයේ වැඩසටහනේ හතරවැනි කාරණාව හැටියට සඳහන් කළේ විශ්‍රාමිකයින්ගේ වැටුප් විෂමතා ඉවත් කරනු ලබන තෙක් ඔවුන්ට රුපියල් 3,500ක මාසික අන්තර් දීමනාවක් ලබා දීමයි. විශ්‍රාමිකයින් ලක්ෂ හයක් විතර රටේ ඉන්නවා. ඒ අය විශ්වාස කරනවා දින සියයේ වැඩසටහන තුළ මේ වැටුප් විෂමතාව තුරන් කරාවි කියලා. හැබැයි මේ අතුරු අය වැය යෝජනාවේ ඒ සඳහා කිසිදු යෝජනාවක් නැහැ. ඊළඟ ප්‍රශ්නය තමයි ඔවුන්ට මාසිකව රුපියල් 3,500ක දීමනාවක් ලබා දෙන එක. නමුත් රුපියල් 1,000ක් තමයි වැඩි කරලා තිබෙන්නේ. අය වැයෙන් වැඩි කළ මුදල පෙබරවාරි මාසයේ සිට රජයේ සේවකයාට ලැබෙනකොට විශ්‍රාමිකයා සඳහා වැඩි කළ රුපියල් 1,000ක මුදල ඔවුන්ට ලැබෙන්නේ අප්‍රේල් මාසයේ සිටයි. එතකොට ප්‍රශ්නය වන්නේ මේකයි. ලබා දෙනවාය කියපු රුපියල් 3,500ක දීමනාව තමයි රුපියල් 1,000කට අඩු වෙලා තිබෙන්නේ. ආණ්ඩුවේ සමහර ඇමතිවරුන් කලින් ලබා දුන් රුපියල් 2,500ක දීමනාවට මේ රුපියල් 1,000ක දීමනාව ඇඳලා රුපියල් 3,500යි කියලා අර්ථ දක්වනවා මා දැක්කා. කලින් රුපියල් 2,500ක් ලබා දුන්නා, ඒ නිසා එයට මේ රුපියල් 1,000 ඇඳලා තිබෙනවා කියලා සඳහන් කළා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අපි රුපියල් 3,500ක් දෙන්න පොරොන්දු වෙලා තිබෙනවා. දැන් රුපියල් 2,500ක් ලැබිලා තිබෙනවා, අපි ඒකට තවත් රුපියල් 1,000ක් එකතු කරනවා. අපේ පොරොන්දුව තමයි අය වැය අවස්ථාවේ දී රුපියල් 3,500ක් ලබා දීම. ඒ රුපියල් 3,500 සඳහා ජනවාරි මාසයේ රුපියල් 2,500ක් ලබා දීලා තිබෙනවා, ඒකට තව රුපියල් 1,000ක් එකතු කරනවා. එතකොට රුපියල් 3,500යි. ඔබතුමා කියන විධියට දෙන්න ගියොත් මේ රටේ ආර්ථිකය ඉතුරු වන්නේ නැහැ නේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඒක සාධාරණ වන්නේ නැහැ. දින සියයේ සහන වැඩසටහන කියන්නේ ඒක නොවෙයි. එහෙම නම් ඔබතුමන්ලා දුන් පොරොන්දුව විශ්‍රාමිකයා තේරුම් ගත් හැටි වැරදියි. ඒකද ඔබතුමා කියන්නේ? මොකද, දින සියයේ වැඩසටහනේ හරි පැහැදිලිව කියනවා, "විශ්‍රාමිකයන්ගේ වැටුප් විෂමතාව ඉවත් කරනු ලබන තෙක්" කියලා. එතකොට වැටුප් විෂමතාව තිබෙනවා. ඒ වැටුප් විෂමතාව තිබියදී කලින් රුපියල් 2,500ක් ලැබිලා තිබෙන බව ඇත්ත. හැබැයි, මෙහි තිබෙන්නේ "වැටුප් විෂමතාව ඉවත් කරනු ලබන තෙක් ඔවුන්ට රුපියල් 3,500ක් ලබා දෙනවා" කියන එකයි. ඒකෙන් පැහැදිලිවම අදහස් කරන්නේ මේ රජයේ දින සියයේ වැඩසටහනට අනුව රුපියල් 3,500ක් ලැබෙනවා කියන එකයි. එහෙම නැත්නම් කෙළින්ම නැහැයි කියලා කියන්න. ඒක වෙනම කථාවක්. කොළේ වහලා ගහන්න ඕනෑ නැහැ නේ. එක්කෝ වැටුප් විෂමතාව වෙනස් කරන්නට ඕනෑ. වැටුප් විෂමතාව වෙනස් කරන්නට දින සියයේ වැඩසටහන තුළ වැඩ පිළිවෙළකුත් නැහැ. ඊළඟට රුපියල් 3,500ක් ලබා දෙන වැඩසටහන වෙනුවට ඒක රුපියල් 1,000ට බස්සලා තිබෙනවා. එදා විශ්‍රාමිකයෝ උද්ඝෝෂණ කළා. ඒ නිසා "අපි එක ආණ්ඩුවකින් බැට කෑවා - රාජපක්ෂ පාලනයෙන් බැට කෑවා- දැන් මේ ආණ්ඩුවෙනුත් අපට කන්න වෙලා තිබෙන්නේ ඒ වගේම පරිප්පුවක්ද?" කියලා තමයි අද විශ්‍රාමිකයා කල්පනා කරන්නේ. ඒ නිසා මම කියන්නේ එහෙම කරන්න එපා කියන එකයි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
දැන් කථාව අවසන් කරන්න.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මම කථාව අවසන් කරන්නම්. මට තව එක කාරණයක් කියන්න තිබෙනවා. ඒ නිසා මට තව මොහොතක් දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම තව ගැටලුවක් තිබෙනවා. ඔබතුමන්ලා තේ දළු සඳහා සහතික මිලක් නියම කරනවානේ. දැන් ප්‍රායෝගික ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. තේ දළුවලට රුපියල් 80ක සහතික මිලක් ලැබෙන එක හොඳයි. කිලෝ එකක් සඳහා රුපියල් 80ක් ලබා ගන්න තේ දළු සපයන අය බලාපොරොත්තු වෙනවා. එතකොට ඒ මුදල ලබා ගන්න වෙන්නේ තේ කර්මාන්තශාලා හිමියාගෙන්. හැබැයි, තේ කර්මාන්තශාලා හිමියාත් ප්‍රශ්නයක ඉන්නවා. මොකද, මේ පවතින තත්ත්වය යටතේ මේ කාලයේ ඔවුන්ට රුපියල් 80ක් ගෙවන්න බැහැ. දැන් දළු කිලෝවක් සඳහා ගෙවන්නේ රුපියල් 68යි, 70යි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Sunil Handunnetti, please wind up now.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මම කථාව අවසන් කරන්නම්.

එතකොට ඔබතුමන්ලා රුපියල් 80ක සහතික මිල නියම කරන්නේ කවදා ඉඳලාද, කොහොමද, ඒකට හඳන යාන්ත්‍රණය මොකක්ද? ඒ සඳහා යාන්ත්‍රණයක් තිබෙන්න එපායැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
වැවිලි කර්මාන්ත ඇමතිවරයා විධියට ඔබතුමා පැහැදිලි කිරීමක් කරනවා නම් හොඳයි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)+
(Mr. Deputy Chairman of Committees)
Yes, Hon. Leader of the House.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
එතුමාට අවසර දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒක වැදගත් දෙයක්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒ සඳහා අපි ක්‍රමවේදයක් හදාගෙන යනවා. අපි යථා කාලයේ දී ඒක මේ ගරු සභාවට ඉදිරිපත් කරනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
බොහොම ස්තුතියි. මොකද, ඒක බරපතළ ප්‍රශ්නයක් වන නිසා ඊළඟට ගැටුම ඇති වන්නේ තේ කර්මාන්තශාලා හිමියා සහ තේ දළු සපයන අය අතරයි.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
What is your point of Order, Hon. Chandrasiri Gajadeera?

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
මා දැන ගන්න කැමැතියි, ජාතික විධායක සභාවේදී මේ අතුරු අය වැය ගැන සාකච්ඡා කළේ නැද්ද කියලා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
එතැන කථා කරන්න වෙනත් දේවල් තිබෙනවා. හොරකම් ගැන, දූෂණ ගැන සොයන්න, ඒ වාගේ ගොඩක් ප්‍රශ්න තිබෙනවා එතැන කථා කරන්න. අපි ඒවා එතැනදී බේරා ගන්නම්. [බාධා කිරීමක්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
That is not a point of Order. Hon. Sunil Handunnetti, please wind up now. Your time is over.- [*Interruption.*]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔබතුමාත් එතැනට එන්න. ඔබතුමාගේ ජනාධිපතිතුමා නේ ඉන්නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
කියන්න, ගරු ඇමතිතුමා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා ඇහුවා විශ්‍රාම වැටුප් විෂමතාව ගැන. ඔව්, අපි රුපියල් 3,500ක් දෙනවා කියලා කිව්වා. දැන් රුපියල් 2,500ක් දීලා තිබෙනවා. පසුව තව රුපියල් 1,000ක් දීලා තිබෙනවා. ඒ අතර තුරේදී විශ්‍රාමිකයන්ගේ වැටුප් විෂමතා නිවැරදි කිරීමට පොරොන්දු වෙලා තිබෙනවා. අපි ඒක නිවැරදි කරනවා. ඒක මීට පිටස්තරව සිදු වන දෙයක්. මගේ අමාත්‍යාංශයේ ලේකම්තුමාටත්, නිලධාරි මණ්ඩලයටත් මේ ගැන කියලා තිබෙනවා. ඒ සඳහා රුපියල් කෝටි 3,000ක් විතර වැය වෙනවා. කාල වකවානු අනුව නොවෙයි, ඒකත් ලබන අවුරුද්දේ Budget එකෙන් කරනවා. [බාධා කිරීම්]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
බොහොම ස්තුතියි.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Chandrasiri Gajadeera, what is the point of Order?

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාගේ අදහසට අපේ සියයට 100ක එකඟතාව තිබෙනවා. ඇත්ත වශයෙන්ම අපි කනගාටු වෙනවා, ජාතික විධායක සභාව ඉදිරියේ දී මේවා පිළිබඳවත් යම් සොයා බැලීමක් නොකිරීම ගැන.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
I am sorry, that is not a point of Order. The next speaker is the Hon. P. Harrison.

[අ.භා. 2.22]

ගරු පී. හැරිසන් මහතා (සමාජ සේවා, සුබසාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு பீ. ஹரிசன் - சமூக சேவைகள், நலன்புரி மற்றும் கால்நடை வளர்ப்பு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. P. Harrison - Minister of Social Services, Welfare and Livestock Development)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනතාව බලාපොරොත්තු වුණු ආකාරයේ සහන ලබා දුන් අය වැයක් මෙවර ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටත්, ඒ වාගේම ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ආණ්ඩුවේ රවි කරුණානායක මුදල් අමාත්‍යවරයාටත් පළමුවෙන්ම අපේ ගෞරවය හා ස්තුතිය පිරිනමනවා. [බාධා කිරීමක්] ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් අහගෙන ඉන්නකෝ. මම දන්නේ නැහැ, ඔබතුමන්ලා ඇයි මේකටත් විරුද්ධ වන්නේ කියලා. මේ අය වැය යටතේ ජනතාවට සහන දෙන වැඩසටහන් කිහිපයක් අප ආරම්භ කර තිබෙනවා. ඒ වැඩසටහන් ආරම්භ කළේ වෙනත් කිසිදු ආකාරයකින් නොවෙයි, පසු ගිය රජයේ තිබුණු නාස්තිය, දූෂණය, හොරකම වළක්වලා ඒ සල්ලිවලින් තමයි ජනතාවට සහන දීලා තිබෙන්නේ.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
අද හාල් රුපියල් 100යි.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ඔබතුමා පොඩ්ඩක් ඉන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අප ලබා දුන් පළමුවෙනි සහනය තමයි රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කිරීම. ගරු මහින්ද යාපා අබේවර්ධන මන්ත්‍රීතුමනි, මම තමුන්නාන්සේට මතක් කරන්න කැමැතියි, මෙවර අය වැයෙන් අපි පළමුවෙන්ම රුපියල් 5,000ක දීමනාවක් ලබා දීලා රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කර තිබෙන බව.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
රුපියල් 3,000ක් ලබා දුන්නේ අපි.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

හිටපු කෘෂිකර්ම ඇමතිතුමනි, කලබල වෙන්නේ නැතිව පොඩ්ඩක් ඉන්න කෝ. ඔබතුමා වග කිව යුතු හිටපු ඇමතිවරයෙක් නේ. දැන් මේවා කියනකොට ඉවසන්න බැහැ.

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
Sir, I rise to a point of Order.- [*Interruption.*]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Hon. Shantha Bandara, what is your point of Order?

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
මට බාධා කරන්න එපා.

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
ඔබතුමාට බාධා කරනවා නොවෙයි, ගරු ඇමතිතුමනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රාජ්‍ය සේවකයන්ට වැඩි කරපු මේ මුදල ඔවුන්ගේ මූලික වැටුපට එකතු කරනවාද, නැත්නම් දීමනාවක් හැටියටද දෙන්නේ? කලින් අපේ ආණ්ඩුවෙන් ලබා දීපු රුපියල් 3,000ත් එක්ක එකතු කරලාද ඒ මුදල දෙන්නේ කියලා මම දැන ගන්න කැමැතියි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
That is not a point of Order. Hon. Minister, you carry on with your speech.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය කාලයේ රාජ්‍ය සේවකයන් මොන තරම් දරිද්‍රතාවෙන් සිටියාද කියන එක අපි දැක්කා. පසු ගිය ආණ්ඩුවට පළමුවෙන්ම විරෝධය පළ කළේ රාජ්‍ය සේවකයනුයි. එහෙම නම් ඒ අයට ප්‍රශ්නයක් තිබුණා. ඒ ජනතාවගේ හදවතේ කැකෑරි, කැකෑරි තිබුණු ප්‍රශ්නය මොකක්ද? මේ සොච්චම් වැටුපෙන් ඒ අයට ජීවත් වෙන්න බැහැයි කියන එක පළමුවෙන්ම හඬනඟා කිව්වේ මේ රටේ රාජ්‍ය සේවකයන්. ඒ රාජ්‍ය සේවකයන් අප පත් කළ අය නොවෙයි. [බාධා කිරීමක්] ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමනි, මම තමුන්නාන්සේට කියන්න කැමැතියි, ඒ රාජ්‍ය සේවකයන් වැඩිහරියක් පසු ගිය ආණ්ඩුවෙන් පත් කළ අය බව. සමහර තැන්වල සිටින්නේ දේශපාලන හිතවත්කම් අනුව පත් කරපු අයයි. හැබැයි, ඒ අය තීන්දුවක් ගත්තා තමන්ට මේ සොච්චම් මුදලින් ජීවත් වෙන්න බැහැයි කියලා. මේ රුපියල් 5,000ක වැටුප් වැඩි කිරීම ඒ අය අගය කරනවා. ඒ විතරක් නොවෙයි, අප තේරුම් ගත්තා; අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා තේරුම් ගත්තා රටක ජනතාව හැටියට, විශේෂයෙන්ම රාජ්‍ය සේවකයන්ගේ හදවතේ කැකෑරෙන මේ ප්‍රශ්නය පිළිබඳව. ඒ නිසා ඔබතුමන්ලා ඒ අයට වැටුප් වැඩි කිරීම ගැන විරුද්ධද කියලා මා අහන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශ්‍රාම වැටුප් වැඩි කිරීම සම්බන්ධයෙන් -

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ඒ ගැන පොඩි පැහැදිලි කිරීමක් කර ගන්න පුළුවන්ද?

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ඒක මුදල් ඇමතිතුමා පැහැදිලි කරයි.

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

කිව්වේ නැහැ නේ. ඔබතුමන්ලා ඒක කියන්නේ නැහැ නේ. ඔබතුමා කැබිනට් මණ්ඩලයේ ඉන්නවා නේ, ඒක කියන්න කෝ.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟට මෙන්න මේ කාරණය පිළිබඳවත් මා තමුන්නාන්සේගේ අවධානයට යොමු කරවන්න කැමැතියි. ඒක තමයි, ජොෂ්ඨ පුරවැසියන් සඳහා බැංකු තැන්පතුවලට ගෙවන ලද පොලිය සම්බන්ධව. පසු ගිය කාලය තුළ මේ පොලී අනුපාතය අඩු කිරීම නිසා ඔවුන් අසීරුතාවට පත් වුණු ආකාරය අප දැක්කා. කාලයක් තිස්සේ රාජ්‍ය සේවයේ නියැලිලා ඒ අය හරිහම්බ කර ගත්ත මුදල් රාජ්‍ය බැංකුවක තැන්පත් කළේ බොහොම බලාපොරොත්තු ඇතිවයි. ඒ තැන්පතුවලින් ලැබුණු සොච්චම් පොලියෙන් තමයි ඒ අයගේ එදිනෙදා කටයුතු ඉෂ්ට කර ගත්තේ. විශේෂයෙන්ම වයසට ගිහින් ලෙඩක්, දුකක් හැදුණාම ඒ සඳහා වියහියදම් කරන්න උපයෝගී කර ගත්තේ මේ පොලී මුදලයි. හැබැයි, ඒ බැංකු තැන්පතුවලට ගෙවන පොලී අනුපාතය අනිකුත් පොලී අනුපාත සමඟ ගැට ගහන්න ගිහින් ඒ සිදු කළ අඩු කිරීම නිසා ඒ අයට ලොකු අසාධාරණයක් සිදු වුණා. ඒ නිසා මෙම අය වැය තුළින් ඒ පොලී මුදල වැඩි කිරීම අප ඉතාම අගය කරනවා. ඒ විතරක් නොවෙයි, රාජ්‍ය සේවයේ ඉඳලා විශ්‍රාම ගිය සියලු දෙනාමත් එය අගය කරන බව අප දන්නවා. [බාධා කිරීමක්]

හිටපු කෘෂිකර්ම ඇමතිවරයාට මම මේ කාරණයත් මතක් කරන්න කැමැතියි. ඔබතුමා මේ කෑගැහුවාට පසු ගිය ආණ්ඩුව කෘෂිකර්මය වෙනුවෙන් මොනවාද කළේ?

ඒ වාගේම තමයි කෘෂි කාර්මික ණය. විශේෂයෙන්ම මහ පොළොවත් එක්ක හැප්පිලා, ගැටිලා මේ රටට බත සපයන ගොවියාට ස්වභාව ධර්මය තුළින් හැම දාම ඇති වන ආපදා හා උපද්‍රව නිසා තමන් ගත්ත ණය ගෙවා ගන්න බැරිව සිටියා. එවැනි ගොවි ජනතාව දහස් සංඛ්‍යාවක් මේ රටේ සිටියා. ඒ ගොවි ජනතාව බැංකුවලට, ඒ වාගේම අනිකුත් මූල්‍ය ආයතනවලට සදාකාලිකව ගෙවන්න තිබුණු ණය කන්දරාව ගෙවා ගන්න බැරිව අසරණ වෙලා සිටියා. තමන්ගේ කන කර, ඉඩම උකස් තැබූ අය සිටියා. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා මේ රටේ ගොවි ජනතාවගේ ගැහෙන හදවත ගැන හොඳ අවබෝධයක් තිබෙන කෙනෙක්. එම නිසා එතුමාට පුළුවන් වුණා, මේ අලුත් ආණ්ඩුව යටතේ ඒ වගා ණය සියයට 50කින් කපා හරින්න. ඒ ගැන අපි සතුටු වනවා විතරක් නොවෙයි, මේ රටේ සමස්ත ගොවි ජනතාවගේ ගෞරවය එතුමාට හිමි වනවාය කියන එකත් මා මේ අවස්ථාවේදී විශේෂයෙන් මතක් කරනවා. අපි දැක්කා, පසු ගිය කාලවල මේ රටේ ආයෝජනය කරන්න මහා පරිමාණ ව්‍යාපාරිකයන් බැංකුවලින් ලබා ගත් රුපියල් කෝටි ප්‍රකෝටි ගණන් ණය කපා හැරිය බව. හැබැයි ගොවියා වෙනුවෙන් හඬක් නැඟුවේ නැහැ. මේ ගොවි ජනතාව වෙනුවෙන් ගත් තීන්දුවට අපේ මුදල් ඇමතිතුමාටත්, ඒ වාගේම අපේ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත් විශේෂයෙන්ම ස්තුතිවන්ත වනවාය කියන එක මා මේ අවස්ථාවේදී තමුන්නාන්සේලාට මතක් කරනවා.

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මට පෙර කථා කළ අපේ සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කිව්වා, තේ දළුවල මිල සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවාය කියලා. තේ දළු සඳහා අද පාලන මිලක් ඇති කරලා තිබෙනවා. ගොවියාට සහන දීමට තේ දළු සඳහා රුපියල් 80ක පාලන මිලක් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම අපි දැක්කා, පසු ගිය කාලයේ රබර් වගා කරන ගොවියාත් ඒ වෙනුවෙන් හඬ නැඟුවාය කියලා. රබර් වගාව පහළට වැටුණා. සමහර අය රබර් කිරි කැපීම අත්හැර දමා තිබුණා, ඒ අයට සාධාරණ මිලක් ලැබුණේ නැති නිසා. රබර් ගොවීන් සඳහා පාලන මිලක් ලබා දීම රබර් කර්මාන්තය ආරක්ෂා කර ගැනීමට ගත් උත්සාහයක් හැටියටයි මා දකින්නේ.

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! Will an Hon. Member propose the Hon. Mohamed Aslam to take the Chair?

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

I propose that the Hon. Mohamed Aslam do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු මොහොමඩ් අස්ලම් මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு மொஹமட் அஸ்லம் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. MOHAMED ASLAM *took the Chair.*

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

කුඩා තේ වතු හිමියන්ට නැවත වගා කරන්න සහනාධාරය දෙනවාද? ඒ ගැන පොඩ්ඩක් පැහැදිලි කරන්න.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

මුදල් ඇමතිතුමා ආවාට පස්සේ ඔබතුමාට ඒ ගැන සම්පූර්ණ පැහැදිලි කිරීමක් කරයි.

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සත්ව නිෂ්පාදන කර්මාන්තය දියුණු කිරීම සඳහා කිරි ගොවීන් වෙනුවෙන් රුපියල් 10ක මිල වැඩි කිරීමක් දීලා තිබෙනවා. මා තමුන්නාන්සේලාට විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, අපේ රටේ කිරි නිෂ්පාදනය වෙනුවෙන් ආයෝජකයන් දිරිමත් කිරීම සඳහාත්, ඒ වාගේම සත්ව නිෂ්පාදනය කරන ගොවීන් දිරිමත් කිරීම සඳහාත් තමයි මේ දිරි දීමනාව දීලා තිබෙන්නේ කියලා. විදේශීය රටවල බහුජාතික සමාගම්වල පිටි කිරි නිෂ්පාදන මත යැපෙන්න තමයි අපේ අය හැම දාම පුරුදු වෙලා සිටියේ. එහෙම නම් විශේෂයෙන්ම ගොවීන්ට සහන දෙන්න අපි කටයුතු කර තිබෙනවාය කියන එකත් මතක් කරන්න කැමැතියි.

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. තමුන්නාන්සේලා දන්නවා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට අපට අවුරුදු ගණනාවක් තිස්සේ විමධ්‍යගත මුදල් වශයෙන් ලැබුණේ රුපියල් මිලියන 5ක් පමණයි කියලා. හැබැයි තමුන්නාන්සේලාගේ ආණ්ඩුව තිබෙන කාලයේ ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්ට විමධ්‍යගත මුදල් අසීමිතව වියදම් කරන්න අවස්ථාව තිබුණා. විරුද්ධ පක්ෂය සඳහා ලැබුණේ සොච්චම් මුදලක්. අපි දැක්කා, පසු ගිය වතාවේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හරහා ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්ට මේ සඳහා විශේෂ මුදල් ලබා දීලා තිබුණාය කියලා. විශේෂයෙන් මේ අය වැය යටතේ ආණ්ඩුවේ සහ විපක්ෂයේ සියලුම මන්ත්‍රීවරුන්ට විමධ්‍යගත මුදල රුපියල් මිලියන 10 දක්වා ලබා දීමට ගත් උත්සාහය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට අපි බොහොම අගය කරනවා විතරක් නොවෙයි, ඒ සම්බන්ධයෙන් අපි ස්තුති කරනවා.

[ගරු පී. හැරිසන් මහතා]

මොකද, හැන්ද තිබෙන විට මේ පැත්තේ අයට විතරක් නොවෙයි හැමෝටම බෙදලා තිබෙනවා කියන කාරණයත් මම මේ අවස්ථාවේදී තමුන්නාන්සේට මතක් කරන්නට කැමැතියි.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Gajadeera, what is your point of Order?

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
අග්‍රාමාත්‍යතුමා එතුමාගේ ප්‍රකාශයේදී කිව්වා විවාදයක් යන විට පිළිතුරු දෙන්න, ප්‍රශ්න අහන විට පිළිතුරු දෙන්න ඇමතිවරු මේ සභා ගැබේ ඉන්නවා කියලා. නමුත් අපේ මුදල් ඇමතිතුමා ඉදිරිපත් කළ අය වැය සම්බන්ධයෙන් අහන ඒවාට පිළිතුරු දෙන්නට එතුමා සභාවේ නැහැ.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
නැහැ, නැහැ. ඒක point of Order එකක් නොවෙයි, කාලය නාස්ති කිරීමක් පමණයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
අපට මතු වන ප්‍රශ්න පිළිබඳව අදහසක් දැන ගන්නවත් එතුමා මේ ගරු සභාවේ නැහැ නේ. [බාධා කිරීමක්]

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා (ස්වදේශ කටයුතු හා ධීවර අමාත්‍යතුමා)
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா - உள்நாட்டலுவல்கள் மற்றும் கடற்றொழில் அமைச்சர்)
(The Hon. M. Joseph Michael Perera - Minister of Home Affairs and Fisheries)
මුදල් අමාත්‍යතුමාට වැඩ තිබෙනවා. එතුමා කාර්යාලයේ ඉන්නවා. මේ සියලු දේම සටහන් කරගෙන, අහපු ප්‍රශ්නවලට එතුමා ඇවිල්ලා උත්තර දෙනවා. භය වෙන්න එපා, හැංගෙන්නේ නැහැ.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මම අධ්‍යාපනය සඳහා දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 6ක මුදලක් වෙන් කිරීම ගැන කථා කරනවා. විශේෂයෙන්ම තමුන්නාන්සේ දන්නවා පසු ගිය කාලයේ විශ්වවිද්‍යාල ළමයි පාරට බැස්සේ මේ අධ්‍යාපනයේ තිබෙන ප්‍රශ්න වෙනුවෙන් කියලා. ඒ වාගේම පළමුවෙනි වතාවට පසු ගිය ආණ්ඩු කාලයේ විශ්වවිද්‍යාල ආචාර්යවරුන් පෙළපාළි ගියේ ඒගොල්ලන්ගේ පෞද්ගලික අවශ්‍යතා සඳහා ඉල්ලීම් කරන්න නොවෙයි. දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 6ක්වත් අධ්‍යාපනය සඳහා වෙන් කරන්න කියලා ඒගොල්ලන් හඬක් නැඟුවා. [බාධා කිරීමක්] මම ඉඩ දෙන්නේ නැහැ, තමුන්නාන්සේට. මේ වතාවේ දළ දේශීය නිෂ්පාදනයෙන් අධ්‍යාපනය සඳහා වෙන් කරන මුදල සියයට 6ක් දක්වා වැඩි කරලා තිබෙනවා. ඒ නිසා මම තමුන්නාන්සේට කියන්නට කැමැතියි, ඒ වෙනුවෙන් මේ ආණ්ඩුව, අපේ ගරු මුදල් ඇමතිතුමා ගත්ත උත්සාහය -

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා
(மாண்புமிகு எரிக் பிரசன்ன வீரவர்தன)
(The Hon. Eric Prasanna Weerawardhana)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, what is your point of Order?

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා
(மாண்புமிகு எரிக் பிரசன்ன வீரவர்தன)
(The Hon. Eric Prasanna Weerawardhana)
ගරු ඇමතිතුමා, පොඩි ප්‍රශ්නයක් අහනවා. ඔබතුමන්ලා අධ්‍යාපනයට අපට වඩා කීයක් වැඩි කරලා තිබෙනවාද?

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
අපි පැනලා යන්නේ නැහැ. ඔබතුමාගේ ප්‍රශ්නය සටහන් කරගෙන, මුදල් ඇමතිතුමාට දීපුවාම එතුමා පසුව ඒවාට පිළිතුරු දෙනවා. [බාධා කිරීම්]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මුදල් ඇමතිතුමා ඒ සම්බන්ධව පිළිතුරු දෙයි.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා කියන විට මේ අයගේ බොක්ක රත් වෙනවා. මේවා කියන කොට පසු ගිය ආණ්ඩුවේ අයගේ බොක්ක රත් වෙනවා. පසු ගිය කාලයේ කර ගන්න බැරි වුණු දේවල් කරන විට, යහ පාලනයත් සමඟ මේවා දෙන විට දැන් මෙතුමන්ලාව නළියනවා. ඒකට කරන්න දෙයක් නැහැ.

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා
(மாண்புமிகு எரிக் பிரசன்ன வீரவர்தன)
(The Hon. Eric Prasanna Weerawardhana)
ඔබතුමා මුදල කියන්න.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
කලබල වෙන්න එපා. පොඩ්ඩක් ඉන්න, අපි මුදල කියන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ජනතාවට පළමුවෙන්ම මේ තරම් ඉන්ධන සහනයක් දුන්නේ වෙන කවුරුවත් නොවෙයි, මේ ආණ්ඩුවයි. පසු ගිය ආණ්ඩුවෙන් මේ විධියේ ඉන්ධන සහනයක් ජනතාවට දුන්නේ කවදාද? පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 33කින් අඩු කළා. අද ගමේ මෝටර්සයිකල්කරුවාට, ත්‍රීවිලර්කරුවාට වාගේම සැහැල්ලු වාහනයක් තිබෙන කෙනාට මේ සහනය දෙන්න පුළුවන් වුණේ දවස් 20න් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වෙනුවෙන් ජනතාවගේ ප්‍රසාදය දැන් ඇවිල්ලා

තිබෙනවා. ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල අඩු වෙලා දැන් අවුරුදු ගණනක් වුණා. නමුත් ඒ සහන රටේ ජනතාවට දුන්නේ නැහැ. ඒ අය ඒ සහන දුන්නේ ඒ අයගේ හිතවතුන්ට, ඒගොල්ලන්ගේ හෙංචයියලාට. මම තමුන්නාන්සේට කියනවා සමහර අය ෂෙඩ්වලට රුපියල් කෝටි 16ක්, 17ක් ණයයි. සමහර තැන්වලට රුපියල් කෝටි 20ක් ණයයි. කාටද ඒ සහන තිබුණේ? ඒගොල්ලන්ගේ අයට තමයි ඒ සහන තිබුණේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ රටේ ජනතාව ඉතාමත්ම සතුටු වන දේවල් තමයි අපේ මුදල් ඇමතිතුමා මේ අය වැයෙන් ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඩීසල් මිල, භූමිතෙල් මිල අඩු කිරීම වතුකරයේ ජීවත් වන ලක්ෂ ගණනක් ජනතාවට ලැබුණු විශාල සහනයක්.

කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ යෙදෙන සියලුම ගොවි මහතුන්ට තමන්ගේ වගාව හොඳින් කරගෙන යාමට, ඒ වගාවෙන් ආදායමක් ලබා ගැනීමට මේ ඉන්ධන මිල අඩු කිරීම ලොකු සහනයක් වනවා.

මේ නිසා බස් ගාස්තු අඩු කරන්නට පුළුවන් වෙලා තිබෙනවා. ප්‍රවාහන ක්ෂේත්‍රයේ සියලු ගාස්තු අඩු කරන්නට පුළුවන් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැයේ මොනවාද දකින්නට නැත්තේ? පසු ගිය ආණ්ඩුවේ සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යවරයා වශයෙන් සිටියේ මා මිත්‍ර ලක්ෂ්මන් සෙනෙවිරත්න මැතිතුමායි. හැබැයි, එතුමාට සීනි මිල අඩු කරන්න බැරි වුණා. අපේ ආණ්ඩුව ආවා විතරයි සීනි කිලෝවක මිල රුපියල් 10කින් අඩු කර තිබෙනවා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
උක් ගොවියා හාන්සි වුණා.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
උක් ගොවියා හාන්සි වුණේ නැහැ. දැන් තමුන්නාන්සේ හාන්සිවෙලා ඉන්න බව මම දන්නවා. අද මේ රටේ ජනතාවට සහන දීලා තිබෙනවා. මොනවාද මේ අය කියන්නේ කියා මම අහනවා? කිලෝග්‍රෑම් 400 කිරි පිටි පැකට් එකක් අද රුපියල් 61කින් අඩු කරන්න පුළුවන් වෙලා තිබෙනවා. [බාධා කිරීම්] කාටද මේ සහන දුන්නේ? මේ සහන ලබා දුන්නේ නවසීලන්තයේ ගොවියාටද? නැහැ. මේ රටේ පාරිභෝගිකයන්ට තමයි මේ සහන ලබා දීලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දැක්කා පසු ගිය කාලයේ කිරි පිටි පැකට් එකක් ගන්න බැරි පුද්ගලයෝ හිටි බව. හැබැයි, ඒ අයට රුපියල් 50ක 60ක සහනයක් දැන් ලබා දීලා තිබෙනවා. ඒ බව තමුන්නාන්සේට පෙනෙනවා ඇති. අද සමස්ත ජනතාවගෙන් විමසුවාම කියනවා, භාණ්ඩ මිල අඩු කිරීම නිසා පළමුවෙනි මාසය වනකොට හැම පවුලකටම අඩුම තරමේ රුපියල් 2000කට 3000කට වැඩි සහනයක් ලැබිලා තිබෙන බව. කිරි පිටි විතරක් නෙවෙයි. [බාධා කිරීම්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රෝගියෙකුට අවශ්‍ය වෙලා තිබුණ සස්ටජන් මිල පවා රුපියල් 100කින් අඩු කර තිබෙන බව අපි දැක්කා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තිරිඟු පිටි මිල අඩු කළාම කිව්වේ ඇමෙරිකාවේ ගොවියාට සහන දුන්නා කියායි. [බාධා කිරීම්] අද මේ රටේ ජනතාවගෙන් කී දෙනෙක් තිරිඟු පිටි අනුභව කරනවාද? තිරිඟු පිටි මිල අඩු කළාම ඒ සහනය ජනතාවට ලැබෙන්නේ නැද්ද?

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
තමුන්නාන්සේලා ජනතාවට පිටි කවනවා. [බාධා කිරීම්]

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
තමුන්නාන්සේට මොනවාද කෘෂි කර්මාන්තයට කරන්න පුළුවන් වුණේ? කයිවාරු ගැහුවාට අඩු ගණනේ තමුන්නාන්සේට අහිතකර වල් නාශක වර්ග 4 තහනම් කර ගන්න බැරි වුණා නේ. කෘෂි කර්මාන්තය කැවා; විනාශ කෙරුවා. අඩු ගණනේ ඇහේ හැටියට මොළය තිබුණා නම් කෘෂි කර්මාන්තය දියුණු කරන්න පුළුවන්කම තිබුණා. [බාධා කිරීම්] තමුන්නාන්සේ කෘෂි කර්මාන්තයට කරපු

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

නැහැ. රුපියල් කෝටි 1,700ක පොහොර වංචාවක් කළා. [බාධා කිරීම්] ඒකට මොනවාද කළේ? [බාධා කිරීම්] බාල පොහොර රටට ගෙනැල්ලා වකුගඩු රෝගය වැපිරුවා. ඒ වාගේම විෂ අධික කෘෂි රසායන ද්‍රව්‍ය ගෙනාවා. රටට මොනවාද කළේ? බොරු කයිවාරු නැතුව වාඩි වෙන්න. [බාධා කිරීම්] දැන් එනවා බයිලා කියන්න.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
පොහොර සහනාධාරය 2005 අපි දුන්නා.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
කෘෂි කර්මාන්තයට මෙ ලෝ දෙයක් කර නැහැ. ඒක නිසා බොරු කයිවාරු ඕනෑ නැහැ හිටපු ඇමතිතුමා. [බාධා කිරීම්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොත්තමල්ලි අය වැයක් කියා මෙතුමන්ලා කිව්වා. [බාධා කිරීම්] තමුන්නාන්සේලාට වෙන කියන්න දෙයක් නැහැ. [බාධා කිරීම්] කොත්තමල්ලි තමයි තමුන්නාන්සේලාට හම්බ වෙන්නේ. කොත්තමල්ලි තම්බලා බොන්නයි වෙන්නේ. [බාධා කිරීම්]

ඒ විතරක් නෙවෙයි, පසු ගිය දවස්වල ගෑස්වල ඒකාධිකාරය පාලනය කෙරුවේ කවුද? මේ තුන් හතර දෙනෙක් පාලනය කෙරුවා. අපි මේ ආණ්ඩුව ගත්තාට පස්සේ දවස් 20 යනකොට අපිට පුළුවන් වුණා ගෑස් මිල රුපියල් 300ක් අඩු කර මේ රටේ ජනතාවට ඒ සහනය දෙන්න. මම අහනවා, "මේකට විරුද්ධද?" කියා. මේකට විරුද්ධ නම් තමුන්නාන්සේලා කියන්න. ගෑස් මිල අඩු කරපු එක වැරැදි නම් කියන්න. ජනතාව එහෙම නම් අය වැයට විරුද්ධයි කියන්න ඕනෑ. දැන් මේකට විරුද්ධත්වය දක්වන්න හදනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පසු ගිය කාලයේ දිගින් දිගටම කිව්වා, "කැසිනෝ තහනම් කරන්න ඕනෑ" කියා. [බාධා කිරීම්] කැසිනෝ බද්ද වැඩි කෙරුවා. අපි කිව්වා, "ජේම්ස් පැකර්ව මේ රටට ගෙන්නපුවාම මේ රටේ අලුතෙන් ගණිකා නිවාස බෝ වෙනවා; කැසිනෝ නිසා රටේ මිනිසුන්ගේ ජන ජීවිතය අවුල් වෙනවා" කියා. අපිට පුළුවන් වුණා, දවස් 20ක් ඇතුළත ජේම්ස් පැකර්ගේ ගමන නවත්වන්න; අලුතෙන් මේ රටේ කැසිනෝහල් ඉදිවෙන එක නවත්වන්න. ඒ විතරක් නොවෙයි ඇරලා තිබෙන කැසිනෝකාරයන්ට වැඩි බදු ගහලා, ඉතුරු කැසිනෝහල් ටිකත්

[ගරු පී. හැරිසන් මහතා]

වහන තැනට අපි කටයුතු කරනවා කියන එකත් මම තමුන්නාන්සේට කියන්න කැමැතියි. ඒකයි අපේ වැඩ පිළිවෙළ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

"මතට තිත" කිව්වාට, පසු ගිය කාලයේ අපි දැක්කා මත් පැන් අළෙවිසැල් සම්බන්ධයෙන් කටයුතු කරපු හැටි. මේ රටේ කාගීල්ස් supermarket ඔක්කෝටම අරක්කු permit දීලායි තිබෙන්නේ. මත්පැන් බලපත්‍ර ගැන ඇහුවාම කිව්වා, "2005 ඉඳලා එකක්වත් දීලා නැහැ" කියා. මම අහනවා, "කාගීල්ස් supermarketවලට දීලා තිබෙන්නේ ඇල්වතුර permitද?" කියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "මතට තිත" කිව්වාට, එහෙම වෙලා නැහැ. අද මුළු රට පුරා එය ව්‍යාප්ත වෙලා තිබෙනවා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
Sir, I rise to a point of Order. ගරු ඇමතිතුමනි, පොඩි පැහැදිලි කිරීමකට එකඟද?

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොරුවට මට බාධා කරනවා. ගරු මන්ත්‍රීතුමා, මගේ කාලය නාස්ති කරන්න එපා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
උක් මිල දී ගන්න මසකට රුපියල් 4,500ක්- [බාධා කිරීමක්]

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු මන්ත්‍රීතුමා, තමුන්නාන්සේ ගැනත් අපි කියන්නම්. හිර ගෙදර මාංචු දාලා හිටපු සිරකාරයන්ට STF එක යොදවලා වෙඩි තැබුවේ කොහොමද කියන කාරණයට අපි එන්නම්. [බාධා කිරීම්]

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ඒ ගැනත් බලමු. මට එක පැහැදිලි කරගැනීමකට අවසර දෙන්න.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තමුන්නාන්සේට මතක් කරනවා- [බාධා කිරීමක්]

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
පැහැදිලි කරගැනීමක්.- [බාධා කිරීමක්] සීනි සම්බන්ධ ප්‍රශ්නයක්.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
අපේ ගරු ජෝන් සෙනෙවිරත්න මැතිතුමනි, ඔබතුමා රාජ්‍ය පරිපාලන ඇමතිතුමා හැටියට, අඩු ගණනේ මේ රටේ කසාදයක් බඳින්න අවස්ථාව දීලා තිබුණාද? අපි කිව්වා, "අඩුම ගණනේ විවාහ ගාස්තුවවත් අඩු කරලා දෙන්න" කියා. ඒ කාලයේ කසාදයක් බඳින්න ගිය වියදම රුපියල් 5,000යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය කාලයේ කසාද බැන්දේ නැහැ. වැඩි හරියක් හොරෙන් පැනලා ගියේ. ඇයි ඒ? ඒ රුපියල් 5,000 ගෙවන්න කොහේද සල්ලි තිබෙන්නේ? දැන් ඒ ගාස්තුව රුපියල් 1,000 වන කල් අඩු කර තිබෙනවා. අපි මේ සභාවේදී ඇහුවා, අහිංසක මිනිහෙකු කසාදයක් බඳින අවස්ථාවේ රජයේ ගාස්තුවක් හැටියට මුද්දර ගාස්තු කියා ඒ අයගෙන් මේ තරම් අසීමිතව මුදල් අය කරන්නේ ඇයි කියා. හැබැයි, දැන් එම ගාස්තුව රුපියල් 1,000 දක්වා අඩු කර තිබෙනවා. විශේෂයෙන් අපි ඒ ගැන- [බාධා කිරීමක්]

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ගරු ඇමතිතුමා, මට තත්පරයක් දෙන්න.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
තවත් තත්පරයක් ලබා දෙන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ගරු ඇමතිතුමනි, හෝටලයක උත්සවයක් පවත්වලා විවාහයක් ලියා පදිංචි කරන අවස්ථාවේ විතරයි රුපියල් 5,000 අය කළේ. නමුත් රෙජිස්ට්‍රාර්තුමාගේ කාර්යාලයට ගිහිල්ලා විවාහ වුණා නම් අය කළේ රුපියල් 1,000යි.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
අපේ මිත්‍ර හිටපු ගරු ඇමතිතුමනි, දැන් ඒක හෝටලයේ කළත් එකයි, ගෙදර කළත් එකයි. දෙකටම ගාස්තුව රුපියල් 1,000යි. හෝටලයේ කරන කොට තමුන්නාන්සේලා රුපියල් 5,000ක් අය කළේ මොකටද?

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
හෝටලයේ විවාහ උත්සවයක් පවත්වන්නේ රුපියල් ලක්ෂ ගණනක් ගෙවලා නේ. හෝටල්වල පවත්වන විවාහ උත්සවවලට රුපියල් ලක්ෂ ගණනක් යනවා.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තවත් තත්පරයක් දෙන්න. ඊට පසුව මම කථාව අවසන් කරනවා.

ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට මම විශේෂ ස්තුතියක් කරන්න ඕනෑ. ඒ වාගේම අපේ ගරු (පූජ්‍ය) රතන ස්වාමීන් වහන්සේ මෙතැන වැඩ සිටියා. අපි කාලයක් තිස්සේ මේ රටේ වකුගඩු ප්‍රශ්නය ගැන කථා කළා. හැබැයි, ඒ ජනතාව වෙනුවෙන් යමක් කරන්න අපට අවස්ථාවක් තිබුණේ නැහැ. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා අපට වහාම නියෝග කර මේ රටේ වකුගඩු රෝගයෙන් පෙළෙන සෑම වකුගඩු රෝගියකුටම මාස් පතා ඒ අයගේ බෙහෙත් හේත් ටික ගන්න රුපියල් 3,000ක දීමනාවක් ගෙවිවා. ඒ විතරක් නොවෙයි,-

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
පසු ගිය අය වැයේ ඒ යෝජනාව තිබුණා.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
මේ රටේ ජනතාව වෙනුවෙන් වකුගඩු රෝගය නිවාරණය කරන වැඩසටහන යටතේ රටට අහිතකර කෘෂි රසායන ද්‍රව්‍ය තහනම් කරන්නත්, ඒ වාගේම විෂ අධික පොහොර වර්ග ගෙන්වීම නවත්වන්නත් එතුමා කටයුතු කර තිබෙනවා කියන එකත් මම බොහොම සතුටින් කියනවා. ඇයි එසේ කළේ? අපි දන්නවා, පසු ගිය අවුරුදු 10, 12 ඇතුළත මේ රටේ අහිංසක මිනිස්සු 25,000ක්, 30,000ක් විතර වකුගඩු රෝගය නිසා මැරුණ බව. මේ රටට බත සපයපු, මහ පොළොවත් එක්ක හැපුණු මිනිසුන් මැරුණා විතරක් නොවෙයි. අද ලක්ෂයකට ආසන්න සංඛ්‍යාවක් මේ අසනීප තත්ත්වයෙන් පෙළෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ අයට දෙන සහනයක් හැටියට තමයි අපි ඒ දීමනාව ලබා දෙන්නේ. මම තමුන්නාන්සේලාට විශේෂයෙන්ම ඒ කාරණය මතක් කරනවා. ඒ සඳහා විශේෂයෙන් කටයුතු කිරීම ගැන රජ රට ප්‍රදේශයේ විතරක් නොව, ගොවි ජනතාව නියෝජනය කරන මන්ත්‍රීවරයකු හැටියට මගේත්, අප සියලු දෙනාගේත් ගෞරවනීය ස්තුතිය එතුමාට පිරිනමනවා. මේ විධියේ සහනාදායී අය වැයක් ගෙන ඒම ගැන විශේෂයෙන්ම මුදල් ඇමතිතුමාටත්, අපේ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා. මොන තරම් අභියෝග, බාධක මැද්දේ වුණත් මේ ආණ්ඩුව පිහිටුවන්න එතුමන්ලා කටයුතු කළා. රටේ ජනතාවට තිබුණේ මැරෙනවාද, ජීවත් වෙනවාද කියන ප්‍රශ්නයයි. ඒ ප්‍රශ්නයට උත්තර දීලා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපතිතුමා ලෙස පත් කිරීම ගැන, එතුමාට ඡන්දය දුන්නු සියලු ජනතාවට ස්තුති කරමින්, මෙතුමන්ලාට මොළය පෑදේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 2.46]

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට බොහෝ දෙනෙකු මතක් කරන්න කියපු විශේෂ කාරණයක් තිබෙනවා. පසු ගිය රජය කාලයේ ලංකාව පුරා පාරවල්, ගොඩනැඟිලි, රෝහල්, පාසල් ආදිය හදන්න මුදල් වියදම් කර ඒ වැඩවලින් භාගයක් කරගෙන ගිහින් තිබෙනවා. ඒවා සියල්ලම මේ රජයෙන් දැනට නතර කරන්න කියලා තිබෙනවා. මාර්ගවල විශාල වශයෙන් ගල් දමා තිබෙනවා. ගොඩනැඟිලි බාගෙට හදා තිබෙනවා. පාලම් බාගෙට හදා තිබෙනවා. පාලම් 1,000ක් සෑදීමේ කටයුතු ආරම්භ කරලා ඉන් සෑහෙන ප්‍රමාණයක් හදලා තිබෙනවා. නමුත්, බාගෙට හැදූ පාලම් ද තිබෙනවා. ඒවායේ වැඩ කිරීම නතර කරන්න කියලා තිබෙනවා. ඒවායේ වැඩ කරන්න තිබෙන කොටස් අවසන් කරන්න අවකාශය ලබා දෙන්න කියලා මේ රජයෙන් මා විශේෂයෙන් ඉල්ලනවා. මාස තුනක පමණ කාලයක් පැවැති තද වර්ෂාව මේ දේවල් ප්‍රමාද වීමට එක් හේතුවක් වුණා. වර්ෂාව පැවැති කාලයේදී ඒවායේ කටයුතු කරන්න බැරි වුණා. විශේෂයෙන් කඳුකර ප්‍රදේශයේ මේ තත්ත්වය ඇති වුණා. ඒ නිසා ඉක්මනින්ම ඒ කටයුතු ආපහු ක්‍රියාත්මක කරන්න දැනුම් දෙන්න කියලා මා මේ රජයෙන් ඉල්ලනවා. එහෙම නොකළොත් රජය වියදම් කළ විශාල මුදලක් අපතේ යනවා. ඒ තුළින් ජනතාවට විශාල හානියක් සිදු වනවා. ඒ වාගේම නොයෙක් විධියේ පාඩු ඇති වන්නත් ඉඩ තිබෙනවා. ඒ නිසා එම කටයුතු ඉක්මනින්ම ක්‍රියාත්මක කිරීමට නිලධාරින්ට දැනුම් දෙන්න කියලා මා විශේෂයෙන් මතක් කරනවා.

ඊළඟට, මට තවත් කාරණයක් කියන්න තිබෙනවා. මේ අය වැය මැතිවරණයට යොදපු අය වැයක් කියලා තමයි කවුරුත් කල්පනා කරන්නේ. මොකද, සමහර භාණ්ඩවල මිල අඩු කරලා තිබෙනවාය කියනවා. Election එකට ඉස්සෙල්ලා කිව්වා, භාණ්ඩ දහයක මිල අඩු කරනවාය කියලා. දැන් භාණ්ඩ 13ක මිල අඩු කරලා තිබෙනවාය කියනවා. මේ භාණ්ඩ 13න් සාමාන්‍ය ජනතාවට ප්‍රයෝජනයක් තිබෙන්නේ මොනවායින්ද කියන එකයි ප්‍රශ්නය තිබෙන්නේ. මේ රජයේ බොහෝ දෙනෙකුට සාමාන්‍ය ජනතාවගේ ජන ජීවිතය ගැන අවබෝධයක් නැහැයි කියලායි මම හිතන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම අතුරු අය වැයේ භාණ්ඩ වර්ග 13ක් සඳහන් කරලා තිබෙනවා. හාල්, පොල්, සීනි, තේ කොළ, පරිප්පු වාගේ දේවල් තමයි අපේ සාමාන්‍ය ජනතාව දිනපතා පාවිච්චි කරන්නේ. කොත්තමල්ලි, මුංඇට, සාඩින්, උම්බලකඩ කියන දේවල් සමහර ගම්වල පාවිච්චි කරන්නේත් නැහැ. ඒවා ගන්න ඒ මිනිස්සුන්ට මිල මුදලුත් නැහැ. ඒ මිනිස්සුන්ට මේ දේවල් ගන්න විධියකුත් නැහැ. අර වාගේ දේවල් තමයි සාමාන්‍ය ජනතාව වැඩිපුර පාවිච්චි කරන්නේ. මේ රජය ඒවා ගැන කල්පනා කරලා නැහැ.

හාල්වල මිල දැන් එන්න එන්න වැඩි වෙලා තිබෙනවා. ඒ අනුව දැනට රුපියල් 10කින් පමණ හාල් කිලෝවක මිල වැඩි වෙලා තිබෙනවා. තව ටික දවසක් යනකොට හාල්වල මිල මීට වඩා හුඟක් වැඩි වනවා. අපේ රටේ ප්‍රධාන ආහාරය බත්. වී මිල වැඩි කළ එක හොඳයි. ඒ වුණාට මොකද, ඒකෙන් සාමාන්‍ය දුප්පත් ජනතාවට ජීවත් වන්න පුළුවන් වන ආකාරයට -ප්‍රධාන ආහාරය ලබා ගන්න පුළුවන් වන විධියට- සැලසුම්සහගත ක්‍රියා මාර්ගයක් සකස් කරන්න ඕනෑ. ඒ ක්‍රියා මාර්ගය තුළිනුයි මිනිස්සුන්ට සන්තෝෂයෙන් ජීවත් වන්න පුළුවන් වන්නේ. ආදායම උපදවා ගෙන, තමන්ට අවශ්‍ය දේවල් නිෂ්පාදනය කරනවා වාගේම, ජනතාවට එදිනෙදා ජීවිතයට වුවමනා කරන ආකාරයට මේ සෑම දෙයක්ම සකස් කරන්න ඕනෑ.

1952 අවුරුද්දේදී ජනතාවට හාල් සේරු දෙකක් නොමිලයේ දුන්නා. ඊට පස්සේ හාල් සේරුවක් නොමිලයේ දුන්නා. ඊට පස්සේ ශත 25ට හාල් සේරුවක් දුන්නා. ඒ කාල සීමා තුළදී ඒ වාගේ තත්ත්වයක් ඇති කළේ දුප්පත්ම ජනතාවටත් තමුන්ගේ ආහාර අවශ්‍යතාව සපුරා ගැනීමට වුවමනා කරන නිසායි. වී මිල වැඩි කිරීම තුළින් හාල් මිල හුඟක් වැඩි වනවා. හාල් මිල වැඩි වනකොට විශාල පිරිසකට තමන්ගේ ජීවිතය ගෙන යන්න බැරි වනවා. ඔවුන්ගේ ප්‍රධාන ආහාරය ලබා ගත නොහැකි වනවා.

දැන් පිටි මිල අඩු කරලා තිබෙනවා. මේක සම්පූර්ණයෙන් වැරදි ක්‍රියා මාර්ගයක්. පිටි මිල අඩු කළාට පස්සේ මිනිස්සු පිටිවලින් නිෂ්පාදනය කරන ද්‍රව්‍ය කන්න පටන් ගත්තොත් - විශේෂයෙන් පාන් කන්න පටන් ගත්තොත්- අපේ වී නිෂ්පාදනය දියුණු කරන්න පුළුවන් වන්නේ කොහොමද? අද වුවමනා වෙලා තිබෙන්නේ පිටිවලින් නිෂ්පාදනය කරන ද්‍රව්‍ය පරිභෝජනයට ගැනීම අඩු කිරීමයි.

[ගරු දි.මු. ජයරත්න මහතා]

ආනයනය අඩු කරලා අපනයනය වැඩි කිරීම තුළින් තමයි අපේ රටේ සංවර්ධනය ඇති කරන්න පුළුවන් වන්නේ. එහෙම කරන්නේ නැතිව ඇමෙරිකාවට, වෙනත් රටවලට අපි ඔක්කෝම දණ නමස්කාර කර ගෙන ඉන්න ඕනෑ කරන නිසා, ඔවුන්ගෙන් හොඳ නම ගන්න ඕනෑ නිසා ඒ රටවලින් මේ භාණ්ඩ ගෙන්වන්න සූදානම් කරලා තිබෙනවා. ඒ තුළින් සාමාන්‍ය ජන ජීවිතය සාර්ථක කරගන්න බැරිවනවා පමණක් නොවෙයි, රටේ ආර්ථිකයටත් හානියක් ඇති වනවා. ඒ වාගේ තත්ත්වයක් අද ඇති වෙලා තිබෙනවා.

අද විශාල වශයෙන් පලතුරු වර්ග මේ රටට ගේනවා. සමහර ඒවා හය මාසයක් පරණ වුණු ඒවා. දැන් කියනවා, ඇමෙරිකාවෙන් ගෙනාපු ඇපල් කන්න එපාය කියලා; ඒවා රෝගසහිතයි කියලා කියනවා. නමුත්, ඒ පලතුරු වර්ග ගෙන ඒම නතර කරන්න මේ රජය කිසිම වැඩ පිළිවෙළක් සකස් කරලා නැහැ. නොයෙක් විධියේ පලතුරු වර්ග දැන් මේ රටේ තිබෙනවා. ඒ පලතුරු වර්ග නිෂ්පාදනය කිරීම සම්පූර්ණයෙන්ම වාගේ නතර වෙනවා, ඒ පලතුරු වර්ග පුළුවන් තරම් පිට රටින් ගේන්න පටන් ගත්තාට පස්සේ. පිට රටින් ගෙනෙන ඒවා ඉදවා තිබෙන්නේ බෙහෙත් වැනි නොයෙක් දේවල් දමායි. ඒවායේ කිසි රසයක් නැහැ; ගුණයක් නැහැ. ඇයි, ආණ්ඩුව ඒ ගැන කල්පනා කරන්නේ නැත්තේ? ඇයි, ඒවා මේ රටට ගෙන්වන්නේ? ඇයි, ඒවා අපේ රටේ දියුණු කරන්න උපක්‍රමයක්, වැඩ පිළිවෙළක් සොයා ගෙන නැත්තේ? කෝ, මේ අය වැය ලේඛනයේ එවැනි සැලසුම් සහගත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර තිබෙනවා? එහෙම එකක් කරලා නැහැ. මේ අය වැය ලේඛනය දිහා මිනිස්සු බැලුවාම පෙන්වා තිබෙනවා, බඩු වර්ග13ක මිල අඩු කර තිබෙනවාය කියා. බඩු වර්ග 13ක මිල අඩු කළාය කිව්වාම, ඕනෑ කෙනෙකුට පේනවා මේ ආණ්ඩුව හරි හොඳයිනේ; බඩු මිල අඩු කරලා කියා. ඒක කියන්න පුළුවන්. මේවා පත්තරයේ වැටුණාම, රේඩියෝ එකේ ගියාම, "බඩු මිල අඩු කළා, බඩු මිල අඩු කළා, බඩු මිල අඩු කළා" කියා කෑ ගහන එකයි ඇති වෙන්නේ. බඩට ඒකෙන් ප්‍රයෝජනයක් නැහැ. ජන ජීවිතයට ඒකෙන් ප්‍රයෝජනයක් ඇත්තේ නැහැ. මනුෂ්‍යයාගේ ජීවන බර වැඩි වෙලා අමාරුවට පත් වන තත්ත්වයක් අද ඇති වෙලා තිබෙනවා. මා හිතන විධියට තව ටික දවසක් යන විට හාල් සේරුවක් රුපියල් සියයට පමණ වැඩි වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍ය මනුෂ්‍යයා ජීවත් වෙන්නේ කොහොමද? ගමේ මනුෂ්‍යයා ජීවත් වෙන්නේ කොහොමද? ගමේ මිනිස්සු ගැන, ගම ගැන මේ ආණ්ඩුවේ මන්ත්‍රීවරු මොනවාද දන්නා දේවල් කියා මම අහනවා. ඒ වාගේ තත්ත්වයක් තුළයි අද ක්‍රියා කර තිබෙන්නේ. මේ පිටරටින් ගෙනෙන දේවල් -ආනයනය කරන දේවල්- පුළුවන් තරම් සීමා කිරීමේ වැඩ පිළිවෙළක් මේ අය වැය ලේඛනයෙන් සකස් කරන්නට තිබුණා. එහෙම එකක් ක්‍රියාත්මක කරලා නැහැ.

පසු ගිය අය වැය ලේඛනය -මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මුදල් අමාත්‍යතුමා හැටියට ඉදිරිපත් කළ අය වැය ලේඛනය- බොහොම ශ්‍රේෂ්ඨ අය වැය ලේඛනයක්. එම අය වැය ලේඛනයෙන් මේ රට සංවර්ධනය කිරීම සඳහා දීර්ඝ කාලීන වැඩ පිළිවෙළවල් රාශියක් යෝජනා කර තිබෙනවා. ඉතිහාසයේ කවදාවත් නොවුණු ආකාරයට ශ්‍රී ලංකාව දියුණු කිරීමට වැඩ පිළිවෙළක් ඇති කළ එකම නායකයා තමයි මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා. එතුමාගේ අය වැය ලේඛනයේදී එහෙම කර තිබෙනවා. මේ රටේ සියලුම ගම්වලට, සියලුම ප්‍රදේශවලට යම් කිසි මුදලක් වියදම් කොට ඒවා දියුණු කිරීමේ වැඩ පිළිවෙළ ඇති කළා. ගමේ සාමාන්‍ය පාරක් පවා කාපට් කර හරි ගස්සලා තිබෙනවා. මහා මාර්ග හරි ගැස්සුවා. ඒ වාගේම අධිවේගී මාර්ග හරිගස්සා තිබෙනවා. මේවා අවුරුදු 2500ක ලියැවුණු ලංකා ඉතිහාසයේ ක්‍රියාත්මක වුණු දේවල් නොවෙයි. ඒ නිසා ඒ ජනාධිපතිතුමා ගෙනා වැඩ පිළිවෙළ, ඒ ක්‍රියා මාර්ගය ගෙනයන්නට මේ රජය උනන්දු වෙන්නට ඕනෑ. ඒකටයි උදව් කරන්නට ඕනෑ. ඒ චින්තනයයි ක්‍රියාත්මක කරන්නට ඕනෑ. ඒවා මේ විධියට වුණා, අර විධියට වුණා කියා මඩ ගහලා, බොරු ප්‍රචාර කරලා, ඒ තුළින් ජනතාවගේ සිත් ගන්නට උත්සාහ කිරීම වැරදි වැඩක්.

මේ රජය ක්‍රෝධයෙන්, ඊර්ෂ්‍යාවෙන් ක්‍රියා කරන රජයක් බවට පත් වෙලා තිබෙනවා. හැම දාම කාට හෝ චෝදනාවක් ඉදිරිපත් කරනවා. කාට හෝ වැරැද්දක් කරපු බවට චෝදනාවක් ඉදිරිපත් කරනවා. ඒ අය කියනවා, "අපි වරදක් කර නැහැ" කියා. එසේ නම් තියෙන එක අල්ලාගෙන ඒකට ක්‍රියා කරනවා මිසක් ප්‍රචාරය දීම තුළින් ලංකාවේ ගෞරවය සම්පූර්ණයෙන්ම නැති වෙලා යනවා. ඓතිහාසික වශයෙන් තිබුණු ගෞරවය නැති වෙනවා. මේ රට ගෞරවාන්විත රටක්. හොඳ ආගමක් තිබෙන, සංස්කෘතියක්, සභ්‍යත්වයක් තිබෙන, ඉතිහාසයක් තිබෙන රටක්. ඒ රටේ ජනතාව වැරදි කරන ජනතාවක් හැටියට මුළු ලෝකයටම -

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට කථා කිරීමට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)

ඒ තිරිසන් සහගත තත්ත්වයට පත් කිරීමට මේ රජය අද ක්‍රියා කර ගෙන යන බව පේනවා. මේකෙන් අපට විතරක් නොවෙයි. තමුන්නාන්සේලාගේ දරුවන්ටත් වැරදි තත්ත්වයක් අනාගතයේදී ඇති වෙනවා. තමුන්නාන්සේලාගේ දරුවනුත් මේ වාගේ රටක මිනිස්සු කියා කියයි. ඒකයි ඇති වන තත්ත්වය. එම නිසා මේකේදි ටිකක් පරිස්සම් වන්නටය කියා මම ආණ්ඩුවෙන් ඉල්ලනවා. වැරැද්දක් තිබෙනවා නම්, චෝදනා කළාට කමක් නැහැ; දඬුවම් කළාට කමක් නැහැ. ඒ චෝදනා ඉදිරිපත් කර ක්‍රියා කරන්න. දැන් කරන්න යන්නේ මේවා ලෝකයටම ප්‍රකාශ කරන්නටයි. ලෝකයටයි මේවා ඔක්කොම දෙන්න යන්නේ. වෙන රටවලටයි මේ කියන්න යන්නේ. ඒක හරිද කියා මම අහනවා. තමන්ගේ දරුවන්ටත් මේවායින් යම් තත්ත්වයක් ඇති වෙනවා නේ. අනාගත පරපුරට මොකක්ද වෙන්නේ? ඉතිහාසයට මොකක්ද වෙන තත්ත්වය? එම නිසා මෙන්න මේ තත්ත්වයන්ගෙන් ආරක්ෂා වෙලා අපේ ගෞරවය, ජාතියේ ගෞරවය, රටේ ගෞරවය, ඓතිහාසික තත්ත්වය ආරක්ෂා කරන්නටය කියා ගරු අගමැතිතුමාගෙනුත් ඉල්ලනවා. එහෙම නොවුණොත් අපි සියලු දෙනාම මේ තත්ත්වයට වැටෙනවා. [බාධා කිරීමක්] ඔබතුමාට නම් ඇති වෙන්න දෙයක් නැහැ, දරුවෝ නැති නිසා. අපට තියෙනවා. ඊට පස්සේ දරුවෝ හම්බු වෙන අයට ඒ තත්ත්වය ඇති වෙනවා නේ. ඒ අයට මොකක්ද වෙන තත්ත්වය? පිට රටවලට ගියාම මොකද වෙන්නේ? ලංකාව කියන්නේ මිලේච්ඡයන්ගේ රටක්, හොරුන්ගේ රටක්, තක්කඩින්ගේ රටක් කියන තත්ත්වයට මේ රට පත් වෙනවා. [බාධා කිරීමක්] මම දන්නවා, ඔබතුමාත් ඒ වාගේ කෙනෙක්. ඔබතුමා නේද කවුදෝ හිටවලා තිබ්බේ? උසාවියේ නඩුවක් තිබෙන්නේ ඔබතුමාට නේද? [බාධා කිරීමක්] පොලීසියේ ඉඳලාත් ඔය විධියේ වැඩ කරලා තිබෙනවා.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා (විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பாலித ரங்கே பண்டார - மின்வலு மற்றும் எரிசக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Palitha Range Bandara - State Minister of Power and Energy)
මොකක්ද?

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
දැන් ඔහොම කථා කරන්නේ කොහොමද?

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
පොලීසියේ ඉඳලා ආපු නිසා,- [බාධා කිරීමක්]

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ඇයි ඔබතුමාට විරුද්ධව උසාවියේ නඩු තිබෙන්නේ? [බාධා කිරීමක්] එවැනි තත්ත්වයක් යටතේ තමයි ඔබතුමන්ලා කටයුතු කරන්නේ. ගරු අගමැතිතුමනි, ඔන්න ඔය වාගේ අයගෙන් පරිස්සම් වෙන්න ඕනෑ. මේ ගොල්ලන් තමයි ඔය විධියේ වැඩ කරන්නේ. එහෙම කටයුතු කළාම රටත් ඉවරයි; ආණ්ඩුවත් ඉවරයි; නායකයෝත් ඉවරයි; ජාතියත් ඉවරයි; ඉතිහාසයත් ඉවරයි. එහෙම කරන්න හොඳ නැහැ. ඒ තත්ත්වය අපි දැන ගන්න ඕනෑ. ඒ හන්දා මම බොහොම ඕනෑකමින් ඉල්ලනවා, මේ තත්ත්වයන් ආරක්ෂා වන ආකාරයට අප ක්‍රියා කරන්න ඕනෑ කියලා.

වැරදිකාරයන්ට දඬුවම් කරන්න ඕනෑ. වැරදි නැති කරන්න ඕනෑ. ඒක අවශ්‍ය දෙයක්. එහෙත් අනවශ්‍ය ප්‍රචාරයක් දීලා, ඒ තත්ත්වය තුළින් අපේ අනාගත පරපුරට නින්දාවක් ඇති කරන්න ක්‍රියා කරන්න හොඳ නැහැ කියන එකයි මම ප්‍රකාශ කරන්නේ.

මේ අය වැය ලේඛනයේ හොඳ දේවල් නැත්තේ නැහැ. හොඳ දේවලුත් තිබෙනවා. ඒ වුණත් සාමාන්‍ය ජනතාවට ජීවත් වෙන්න වුවමනා වන ආකාරයේ සැලසුම් සහගත ආර්ථිකයක් ගොඩනැගීමේ වැඩ පිළිවෙළක් මේ තුළ නැහැ කියන එකත් මම ප්‍රකාශ කරනවා. බොහොම ස්තූතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
The Hon. Wimal Weerawansa, please. You have 12 minutes.

[අ.භා. 2.58]

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේලාගේ පාලනය අතුරු අය වැයක් ඉදිරිපත් කරලා, ඒ පිළිබඳ විවාදය සිදු වන වෙලාවේ කරුණු කිහිපයක් ගැන දැනුවත් කරන්න අවස්ථාව ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. තමුන්නාන්සේලා මේ අතුරු අය වැය ගෙනාවේ පසු ගිය ජනාධිපතිවරණයේදී දීපු පොරොන්දුවලට අනුව. ඒ වාගේම තමුන්නාන්සේලා - අපි කවුරුත් දන්නා විධියට, තමුන්නාන්සේලාගේ දින සියයේ වැඩසටහනින් ප්‍රකාශයට පත් කරලා තිබෙන ආකාරයට අප්‍රේල් මාසයේ අග වනකොට මේ පාර්ලිමේන්තුව විසුරුවා හැරීමකට ලක් වෙනවා. ඒ අනුව අපට පෙනෙනවා, අප්‍රේල් මාසයේ අග ඉඳලා මාස දෙකක් වාගේ කාලයක් ඇතුළත මේ රටේ මහ මැතිවරණයක් පැවැත්වෙනවාය කියන එක. පසු ගිය ජනාධිපතිවරණයේදී රටේ බොහෝ ප්‍රදේශවලින් තමුන්නාන්සේලාට බහුතර බලයක් නැති බව පිළිගන්න වෙලා තිබෙන නිසා, දීපු පොරොන්දු මොනවා හරි ටිකක් ඉටු නොකර, මේ විධියේ දෙයක් නොකර, ඒ මහ මැතිවරණයට ගියොත් ඇත්තෙන්ම ඒ බහුතර බලය හදා ගන්න බැහැ කියන එක තමුන්නාන්සේලා දන්නවා. මහා භාණ්ඩාගාරයේ සල්ලි කොච්චර තිබෙනවාද නැද්ද කියන එක සොයන්නේ බලන්නේ නැතිව තමයි තමුන්නාන්සේලා ඒ පොරොන්දු මල්ල දුන්නේ. දැන් ඉතින් සල්ලි නැහැ කියලා ඒවා නොකර ඉන්නත් බැහැ. නොකර හිටියොත් මහ ජන්දෙන් අනික් පැත්තට හැරෙන්න වෙනවා. ඒ නිසා තමුන්නාන්සේලා යම්කිසි ප්‍රමාණයක සහන පැකේජයකුත් එක්ක මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙනවා.

මේ අය වැය සහන පැකේජයෙන් එක පැත්තකින් තමුන්නාන්සේලා කියනවා, අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල පහත හෙළනවා කියලා. මීට කලිනුත් කියැවුණා, මේ රටේ සහල් මිල වැඩි වෙනවා මිස අඩු වෙන්නේ නැහැ කියලා. පාරිභෝගික කටයුතු පිළිබඳ අපේ අලුත් ඇමතිතුමාත් දැන් මේ ගරු සභාවේ ඉන්නවා. හාල් මිල වැඩි වෙනවා; පොල් මිල වැඩි වෙනවා. ඒවාට මොන සහනයක්වත් නැහැ. පාන්වලට සහනය හම්බ වුණාට ඒකෙන් ඇති වන සෘණාත්මක බලපෑමෙන් රටට ප්‍රයෝජනයක් වෙන්නේ නැහැ. පාන් කන එක වැඩි වෙයි. හැබැයි, තිරිඟු පිටි ගොවියා සවිමත් වෙයි.

තමුන්නාන්සේලා හයිබ්‍රිඩ් වාහනයට ලොකු බද්දක් ගැහුවා. පරිසර හිතකාමී ඒ වාහනය තමයි මේ රටේ පහළ මැද පන්තිය ක්‍රමානුකූලව තමන්ගේ වාහනය බවට පත් කර ගෙන තිබෙන්නේ. නමුත් හයිබ්‍රිඩ් වාහනවලට විශාල බද්දක් ගහලා ඒවායේ මිල ඉහළ නංවනවා. ඉන්දියාවේ මරුටි කාර් එකට සම්පූර්ණ වෙළෙඳ පොළ විවෘත කරලා දෙනවා. ඉන්දියාව දීපු උදවු උපකාරවල හැටියට තමුන්නාන්සේලා ඒක කරන්නත් ඕනෑ. ඒ වාගේම ගොවියාට අත්ට්‍රැක්ටරයක් දෙනවාය කියනවා. මම හිතන හැටියට ඒකත් ඉන්දියාවෙන් ණයට හම්බ වෙන අත්ට්‍රැක්ටරයක් වෙන්න ඇති. තමුන්නාන්සේලා එක පැත්තකින් මරුටි එකට ඉඩ හදලා දෙන්න ඕනෑ. මරුටි එකට ඉඩ හදලා දෙන්න නම් හයිබ්‍රිඩ් එකට ගහන්න ඕනෑ. එහෙම නැත්නම් මරුටි එකට වෙළෙඳ පොළ විවෘත වෙන්නේ නැහැ. පරිසර හිතකාමී කෙනාට, වඩා හිතකර වාහනයට වෙළෙඳ පොළේ තිබෙන ඉල්ලුම නැති කරලා තමන්ට උදවු පදවු කරපු අයගේ වාහනයට - මරුටි වාහනයට- වෙළෙඳ පොළ විවෘත කරලා දෙනවා.

ඒ විතරක් නොවෙයි, තමුන්නාන්සේලා අත්‍යවශ්‍ය ආහාර යැයි කියන කොත්තමල්ලි අපේ රටේ ජනතාව මාසයකට කොච්චර කනවාද, බොනවාද දන්නේ නැහැ. මාසයකට කොච්චර කොත්තමල්ලි කනවාද කියලා මම දන්නේ නැහැ. මාසයකට කොච්චර කහ පාවිච්චි කරනවාද කියලා මම නම් දන්නේ නැහැ. ඒ වාගේ තමුන්නාන්සේලාගේ තව අපූරු අත්‍යවශ්‍ය භාණ්ඩ ප්‍රමාණයක් තිබුණා. මාසයකට උම්බලකඩ කොච්චර කනවාද කියලා මම ඇත්තටම දන්නේ නැහැ. උම්බලකඩ තම්බලා හොඳි හදලා කෑවත් මම හිතන්නේ නැහැ, මාසයකට උම්බලකඩ ලොකු ප්‍රමාණයක් කැවෙයි කියලා. ඉතින් මේ වාගේ වැඩිපුර පරිභෝජනයට ලක් නොවන, ඉතාම සීමා සහිතව පරිභෝජනයට ලක් වන භාණ්ඩ ප්‍රමාණයකුත් මේක ඇතුළට දමලා, "10ක් නොවෙයි, ඔන්න අපි 13ක්ම අඩු කළාය" කියලා පෙන්වන

[ගරු විමල් වීරවංශ මහතා]

කථාවක් තමුන්නාන්සේලා කරනවා. සමහර භාණ්ඩවල මිල පහළ යෑම ජනතාවට බලපානවා. හැබැයි, මේ ජන ජීවිතයට එතරම් තදින් බලපෑමක් ඇති නොවන බොහෝ ද්‍රව්‍ය ප්‍රමාණයක මිල ලොකුවට අඩු කළාය කියලා තමුන්නාන්සේලා කියනවා. ඇත්තටම වෙන්න ඕනෑ හාල්වල මිලත් අඩු කරන එකයි. ඇයි, හාල්වල මිල අඩු කරන්නේ නැත්තේ? මොකක්ද හේතුව? තමුන්නාන්සේලාට පුළුවන් වුණා තිරිඟු පිටි මිල අඩු කරන්න. ඒ කියන්නේ තිරිඟු පිටිවලට තමුන්නාන්සේලාගේ රජයෙන් සහනාධාරයක් දෙනවා ප්‍රීමා සමාගමට හා අනෙක් සමාගම්වලට. එහෙම නැතිව මිල අඩු කරන්න බැහැ. එතකොට ඒ මුදල අපේ ගොවියාට දෙන්න බැරි වුණේ ඇයි? ඒ මුදල ගොවියාට දීලා ගොවියා මේ රටේ නිපදවන හාල් ටිකේ මිල අඩු කරන්න බැරි වුණේ ඇයි? ඒ නිසා අද තමුන්නාන්සේලා කරලා තිබෙන්නේ සහන කියන වචනය ඉස්සරහට දමලා වෙන අතුරු න්‍යාය පත්‍රයකුත් මේ තුළින් ඉදිරියට ගෙන එන එකයි.

අනෙක් අතට බලන්න, මේ ලොකු කථාවලින් පිරුණු අය වැයේ තමුන්නාන්සේලා ඉතා පැහැදිලිව කරලා තිබෙන්නේ මොකක්ද කියලා. රුපියල් 5,000ක් දෙනවා කියලා පසු ගිය රජයෙන් දුන්න රුපියල් 3,000ට තව රුපියල් 2,000ක් එකතු කරලා රජයේ සේවකයන්ගේ වැටුප රුපියල් 5,000කින් වැඩි කරනවා. මූලික වැටුප රුපියල් 10,000කින් වැඩි කරනවා කිව්වා. හැබැයි, අද රුපියල් 5,000කින් මූලික වැටුප වැඩි වෙලා නැහැ. මූලික වැටුප තිබුණු ගණනමයි. තමුන්නාන්සේලා කරලා තිබෙන්නේ අතුරු දීමනාවක් හැටියට රුපියල් 5,000ක් මේ වැටුපට එල්ලලා තිබෙන එකයි. අපි යෝජනා කරලා තිබුණේ රුපියල් 3,500කින් මූලික වැටුප වැඩි කරන්න; ඒ වාගේම වැටුප් විෂමතාව පිළිබඳ ප්‍රශ්නය ඉතාම කෙටි කාලයක් ඇතුළත ඉවර කරන්න; ඒ අනුව වැටුප් තලය නැවත සකස් කරන්න. මූලික වැටුප රුපියල් 3,500කින් වැඩි වුණා නම් ඊට සමානුපාතිකව අනෙකුත් දීමනාවල වටිනාකමත් වැඩි වෙනවා. එතකොට අවම වශයෙන් රුපියල් 15,000ක පමණ අතිරේක මුදල් ප්‍රමාණයක් ඒ සේවකයාගේ අතට එනවා. අද සිදු වෙලා තිබෙන්නේ මොකක්ද? තමුන්නාන්සේලා රුපියල් 3,000, රුපියල් 5,000 කරලා මූලික වැටුප නොවෙයි වැඩි කළේ. ඒ මුදල දීමනාවක් හැටියට එල්ලුවා. එතකොට අනෙක් දීමනාවලින් තමන්ට ලැබෙන්න තිබුණ වාසිය වැඩ කරන ජනතාවට ලැබෙන්නේ නැහැ. එතැනත් තමුන්නාන්සේලා කළේ කියපු දේ නොවෙයි. මූලික වැටුප රුපියල් 10,000කින් වැඩි කරනවා කියලායි කිව්වේ.

දැන් තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ ජනතා විමුක්ති පෙරමුණ ඉන්නවා. එතුමන්ලා ඉන්නවා අර විධායක සභාවද මොකක්ද කියලා තිබෙන එකේ. සම්පන්දන් මහත්තයා ඒකේ ඉන්නවා. අනුර දිසානායක මහත්තයා ඒකේ ඉන්නවා. චම්පික රණවක මහත්තයා ඒකේ ඉන්නවා. හකීම් මහත්තයා ඒකේ ඉන්නවා. එතුමන්ලා ආණ්ඩු පක්ෂයේ. ඉතින් මේක ඒ කාගේත් ආණ්ඩුවක්. එතැන ඉඳන් එකට තීරණ අරගෙන මෙතැනට ඇවිල්ලා රටට පෙනෙන්න වෙන වෙන කථා බොරුවට කියලා හරියන්නේ නැහැ. ඒවා මිනිස්සු පිළිගන්නේත් නැහැ. මෙතැන තිබෙන්නේ ඒ ඔක්කොම එකතු වෙලා හදපු අය වැය නේ.

ඇත්තටම ආදායම් සොයන්න තමුන්නාන්සේලා මොනවාද මේ අය වැයෙන් කරලා තිබෙන්නේ. එක පැත්තකින් කියනවා, රජයේ වියදම් කපනවාය කියලා. හැබැයි, කොයි කොයි ප්‍රමාණයෙන්, කොයි කොයි තැන්වල වියදම් කැපුවාද කියලා තවම අපට පැහැදිලි නැහැ. තමුන්නාන්සේලා අපට හරියට පෙන්වනවා නම් හොඳයි, මෙන්න මෙතැනින් මෙච්චරයි, අන්න අතැනින් මෙච්චරයි කියලා.

දැන් හිටපු ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂය ගැන කියනවා. එක වෙලාවකට කියනවා රුපියල් කෝටි 90,000යි කියලා. තව වෙලාවක කියනවා රුපියල් කෝටි 9,000යි කියලා. එක එක වෙලාවට එක එක ගණන් කියනවා. එහෙම නැතිව තමුන්නාන්සේලා හරියට ඒවා පෙන්වන්න. කොහෙන්ද ඒ වියදම් අඩු කළේ? මේ අමාත්‍යාංශයෙන් මෙච්චරයි, මෙන්න මේවාට තිබුණ සල්ලි මෙච්චරයි, ඒවා අපි කැපුවා කියලා ඒ විධියට හරි විස්තරයක් තමුන්නාන්සේලා මේ ගරු සභාවට ඉදිරිපත් කරන්න. එතකොට අධ්‍යයනය කරලා අපට පිළිගන්න පුළුවන්, අපට තේරුම් ගන්න පුළුවන් ඒ වියදම් කපපු ආකාරය. නමුත් වියදම් කපනවාය කියලා ඊළඟට තමුන්නාන්සේලා මොකක්ද කරන්නේ?

තමුන්නාන්සේලා දන්නවා, මේ අතුරු අය වැය ඉදිරිපත් කළ දවසේ ඉඳලා කොටස් වෙළෙඳපොළ පහළට කඩා ගෙන වැටෙනවා. ඒ විතරක් නොවෙයි, මේ ආණ්ඩුව ආපු දවසේ ඉඳලා රුපියල අවප්‍රමාණ වෙනවා. 130 ගණනට තිබුණ රුපියල අද 140 ඉක්මවා යන මට්ටමකට ඇවිල්ලා තිබෙනවා. දවසින් දවස රුපියල අවප්‍රමාණ වෙනවා. කොටස් වෙළෙඳපොළ දවසින් දවස බිඳ වැටෙනවා. ආයෝජකයෝ කොටස් වෙළෙඳ පොළට යන්නේ නැහැ. මොකද, තමුන්නාන්සේලා හිතුන ගමන් නින්දෙන් ඇහැරිලා "ත්‍රස්ත ටැක්ස් " ගහනවා. ඒකට කියන්නේ "ත්‍රස්ත ටැක්ස්" කියලා. කවුරු හරි, ඉලක්ක කර ගත්ත ව්‍යාපාර වට්ටන්න, කවුරු හරි ඉලක්ක කර ගත් මිනිස්සු වට්ටන්න අද බදු ප්‍රතිපත්තිය යොදා ගෙන තිබෙනවා. මේ ලෝකයේ කොහේද අතීතයට බලපාන පරිදි බදු ගහන්නේ? බදු ප්‍රතිපත්තියේ මූලික මූලධර්මයක් අනුව අතීතයට බලපාන පරිදි බදු ගහන්න බැහැ. කලින් අවුරුද්දේ ආදායම හා ලාභය බලනවා. ඒ ලාභය ඇවිල්ලා තිබෙන්නේ ඒවාට අදාළ බදු ගෙවලා. දැන් තමුන්නාන්සේලා නැවත ඒක අරගෙන ඒකට වෙනමම ත්‍රස්ත tax එකක් ගහනවා. මේ ත්‍රස්ත tax එකට ලක්වෙන ව්‍යාපාරිකයා ඊළඟට මොකක්ද කරන්නේ? ඒ අතිරේක මුදල ඔහුට කොහෙන් හෝ සොයන්න වෙනවා. ඔහු මොකක්ද කරන්නේ? එක්කෝ මේ අප්‍රේල් මාසයේ සේවකයින්ට දෙන bonus එක කපනවා. එහෙම නැත්නම් සේවක සංඛ්‍යාව කප්පාදු කරනවා. එහෙමත් නැත්නම් පාරිභෝගිකයාට තමන්ගේ යම්කිසි නිෂ්පාදනයක් යනවා නම් එහි මිල වැඩි කරනවා. දැනටමත් අපිට ආරංචියි, මේ රටේ දුරකථන සමාගම් සියල්ලම පාහේ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් දුරකථන ගාස්තු ඉහළ නංවන්න ඉල්ලීම් කර තිබෙනවා කියලා. මොකක්ද හේතුව? තමුන්නාන්සේලා ගහපු ත්‍රස්ත tax එක ඔරොත්තු දෙන්නේ නැහැ. ඒක පාරිභෝගිකයාගෙන් ගන්න වෙනවා. ඒ නිසා තමුන්නාන්සේලා අර ෂයිලොක් වාගේ එකතැනකට බදු ගහලා එතැනින් බිලියන පනහයි, තවත් කෙනෙකුට බදු ගහලා එතැනින් බිලියන සියයයි විධියට එකතු කළාට අන්තිමට මේ ප්‍රහාරය සාමාන්‍ය මිනිසාගේ කර මතට වක්‍රාකාරයෙන් පතිත වෙනවා. ඒක තේරුම් ගන්න. කැසිනෝවලින් ගන්න බද්ද සාමාන්‍ය මිනිහාගේ ඔළුවට පතිත කරන්න ක්‍රමයක් නැහැ. හැබැයි, කැසිනෝවලින් ගන්න බද්ද ඇරෙන්න අනෙක් සෑම බද්දක්ම මේ රටේ පොදු ජනතාවට එනවා. තමුන්නාන්සේලා සොයා බලන්න.

අද මේ රටේ ව්‍යාපාර ක්ෂේත්‍රය කඩා ගෙන වැටිලා තිබෙනවා; කර්මාන්තශාලා වැසීගෙන යනවා; ඉදිකිරීම් ආයතනවල සේවකයෝ හය හත්දහස කප්පාදු කරනවා. ප්‍රමුඛ පෙළේ එක්තරා ඉදිකිරීම් ආයතනයක් තිබුණා. ඒ ආයතනයේ වැඩ කළ ඉංජිනේරුවන් විශාල සංඛ්‍යාවකට කියලා තිබෙනවා, "ගෙදරට වෙලා ඉන්න, මූලික වැටුප විතරක් ගෙවන්නම්. වෙනත් දීමනා ගෙවන්න බැහැ" කියලා. මේකයි ඇත්ත තත්ත්වය. තමුන්නාන්සේලා මේ ගෙනාවේ ඉලක්ක කර ගත්ත, තෝරා ගත්ත කණ්ඩායමකට ප්‍රහාර එල්ල කරලා එතැනින් සල්ලි ටික අරගෙන "අපි මේ අවුරුද්දේ මැතිවරණයට යන්න කලින් යන්නම්

මේ ටික කරගෙන යනවා" කියලා හිතාගෙනයි. මැතිවරණයෙන් පස්සේ මොනවාද වෙන්නේ කියන ප්‍රශ්නය තමුන්නාන්සේලාට අදාළ නැහැ. මේ රටේ තිබුණේ සියයට 7.5ක පමණ ආර්ථික වර්ධන වේගයක් එක්ක ඉදිරියට පැමිණි ස්ථාවර ආර්ථිකයක්. අද ඒ වර්ධන වේගය කොහොමද කඩා වැටෙන්නේ කියන එක තමුන්නාන්සේලාට අදාළ නැහැ. එකම දෙයයි තිබෙන්නේ. ජූනි මාසයේ මහ මැතිවරණයක් එනවා. මහ මැතිවරණයට යන්න කලින් බඩට සැප දෙන්න ඕනෑ. සදාකාලිකවම ඒ පහසුකම දෙනවා නම් අපි ඒකේ වරදක් කියන්නේ නැහැ. හැබැයි තමුන්නාන්සේලා මේ කරලා තිබෙන්නේ මහ මැතිවරණය පසු වෙනකම් සහන දෙන, මහ මැතිවරණයෙන් පස්සේ දැවැන්ත ආර්ථික අර්බුදයකට මේ රට ගොදුරු කරන ආකාරයේ අතුරු අය වැයක් ඉදිරිපත් කිරීමක්.

මේ බිලියන ගණනක අතිරේක මුදල මේ විධියට "one-shot tax" වලින්, ත්‍රස්ත tax වලින් මේ අවුරුද්දේ ගත්තට ඊළඟ අවුරුද්දේ කොහෙන්ද ගන්නේ? ඒ "one-shot *thrastha* tax" එක ඊළඟ අවුරුද්දෙත් තව කට්ටියකට ගහනවාද? ඊළඟ අවුරුද්දේ මේ ආදායම කොහොමද සොයා ගන්නේ? ණයවලින් ද? එතකොට අය වැය පරතරය තවත් වැඩි වෙන්නේ නැද්ද? ණය බර තවත් වැඩි වෙන්නේ නැද්ද? ණයවලින් නොවෙයි නම් මේ මුදල කොහෙන්ද සොයා ගන්නේ? සොයන්න වෙන්නේ මේ රටේ තවත් භාණ්ඩ හා සේවාවලට අතිරේක දැවැන්ත බදු පැනවීමෙන් නෙවෙයි ද? නැතුව වෙන මොනවා හරි ඉන්ද්‍රජාලික විශ්වකර්ම ක්‍රමයක් තිබෙනවාද? ඒ නිසා තමුන්නාන්සේලා කරලා තිබෙන්නේ අද අනාගතය පරදුවට තියලා ඉදිරි මහ මැතිවරණයේ තමුන්නාන්සේලාට අහිමි වෙලා තිබෙන ඡන්ද පදනම ගොඩ නඟා ගන්නයි. ඒක තමුන්නාන්සේලා ගිය ජනාධිපතිවරණයේදී කළේ JVP එක එකතු කර ගෙන; - 'නැහැ' කියලා කියන්න බැහැ.- ජාතික හෙළ උරුමය එකතු කරගෙන; සම්පන්දන් මහත්මයා එකතු කරගෙන; හකීම් මහත්මයා එකතු කරගෙන. ඒ සඳහා සම්පන්දන් මහත්මයායි, හකීම් මහත්මයායි තව ඉන්න එක එක ජාතියේ ගොඩාක් අය එකතු කර ගත්තා. ඒ ඔක්කෝම හංසයාට හිටියා. හැබැයි මහ මැතිවරණයේදී JVP එක වෙනම ඉල්ලයි; සම්පන්දන් මහත්මයා වෙනම ඉල්ලයි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, තව විනාඩියකින් ඔබතුමාගේ කථාව අවසාන කරන්න.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසාන කරනවා.

මම දන්නේ නැහැ, හකීම් මහත්මයා අලියාගෙන් ඉල්ලයිද, ගහෙන් ඉල්ලයිද කියලා. කොහොම කොහොම හරි තමුන්නාන්සේලා අර එකට එකතු වෙලා සිටිය ගොඩ දෙකට තුනට බෙදෙනවා. ඒ නිසා තමුන්නාන්සේලාට තිබෙනවා, දේශපාලන බියක්. ඒ බිය නිසා තමුන්නාන්සේලා හිටපු ජනාධිපතිතුමාට දින සියයෙන් මඩ දහසක් ගහනවා; එතුමා එක්ක ඉන්න දේශපාලනඥයින්ට දින සියයෙන් මඩ දෙදහසක් ගහනවා. තමුන්නාන්සේලා සිර කූඩු අලුත් කරලා මේ රටේ විපක්ෂය මර්දනය කරලා හරි ඊළඟ මහ මැතිවරණය කොහොමද ගොඩ දාගන්නේ කියලා කල්පනා කරලා, ඒ වෙනුවෙන්ම කල්පනා කරලා හදාපු අතුරු අය වැයක් මිසක් මේ රටේ ආර්ථිකයේ ස්ථාවර ගමනක්, ලබන අවුරුද්ද වන විට ඇති විය හැකි තත්ත්වයක් ගැන මැනීමක්, නිශ්චිත ආර්ථික දර්ශනයක් ඇතිව ගෙන ආ අතුරු අය වැයක් නොවෙයි, මේ. එම නිසා තමුන්නාන්සේලා තමන්ගේ කඩ ඉම පනින්න පමණක් අරමුණු කොට ගෙන ගෙන ආ අතුරු අය වැයකුයි මේ. මේ රටේ අද රාජ්‍ය සේවකයින් කැලඹිලා ඉන්නේ. ඔවුන්ට මූලික වැටුපයි වැඩි කරනවා කිව්වේ. අද ඒක වෙලා නැහැ.ඒ වාගේම විශ්‍රාමිකයින්ට දෙනවයි කියාපු දේ නොවෙයි අද ලැබිලා තිබෙන්නේ. විශ්‍රාමිකයින්ට ඕනෑ වුණේ වැටුප් විෂමතාව ඉවත් කර ගන්නයි; නැතිව කීයක් හෝ මුදලක් කොහෙන් හෝ එල්ලා ගන්න නොවෙයි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් අවසාන කරන්න, කාලය අවසානයි.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසාන කරනවා.

"මහ මැතිවරණයෙන් පස්සේ මේ රටේ ආර්ථිකයට ඕනෑ කුදයක් වෙච්චාවේ, අපිට ඒක වැඩක් නැහැ. මේ මහ මැතිවරණය වෙනකම් කොහොම හරි බඩ අත ගාලා අපේ වැඩේ කර ගන්න ඕනෑ" කියන ප්‍රතිපත්තිය මත පිහිටා හදපු අතුරු අය වැයක්, මේ. එම නිසා අනාගතයේ ඇති විය හැකි තත්ත්වය දකින මිනිසුන් හැටියට අපි මේ අය වැය සම්බන්ධයෙන් අපේ සුබ පැතුම් තමුන්නාන්සේලාට එකතු කරන්නේ කොහොමද කියන ප්‍රශ්නය කාට නැතත් මට නම් තිබෙනවා. බොහොම ස්තූතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට, ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා. ඔබතුමාගේ කාලය විනාඩි 25යි.

[අ.භා. 3.12]

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා (විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பாலித ரங்கே பண்டார - மின்வலு மற்றும் எரிசக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Palitha Range Bandara - State Minister of Power and Energy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ ජනතාවට දැනෙන අන්දමේ සහනදායි අය වැයක් වසර ගණනාවකට පසුව මේ රටේ ජනතාවට ඉදිරිපත් වුණා. විශේෂයෙන්ම මේ අය වැය ඉදිරිපත් කරන්න කටයුතු කළ මුදල් ඇමති ගරු රවි කරුණානායක මැතිතුමාටත්, ඒ වාගේම වර්තමාන ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටත්, ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත් අපේ ජනතාව වෙනුවෙන් මම ස්තූතිවන්ත වෙනවා, සහන රැසකුත් එක්ක මිනිසුන් ජීවත් කරවීමේ අය වැයක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම පිළිබඳව. මේ අය වැය පිළිබඳව දැන් විවේචන ගණනාවක් ඉදිරිපත් කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ අය වැය කොත්තමල්ලි අය වැයක් කියනවා: උක් ගොවියා නැති කරන අය වැයක් කියනවා: උම්බලකඩ හොදි හදන අය වැයක් කියනවා.

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා
(மாண்புமிகு எரிக் பிரசன்ன வீரவர்தன)
(The Hon. Eric Prasanna Weerawardhana)
අධ්‍යාපනය කප්පාදු කරපු අය වැයක්.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ඔබතුමන්ලා අවුරුදු ගණනාවක් මේ රට පාලනය කළා.

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා
(மாண்புமிகு எரிக் பிரசன்ன வீரவர்தன)
(The Hon. Eric Prasanna Weerawardhana)
සෞඛ්‍ය, අධ්‍යාපනය කප්පාදු කරන අය වැයක්.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මම හිතන්නේ ඔබතුමාටත් කාලය ඇති. කාලය නැත්නම් තමුන්නාන්සේගේ පක්ෂයෙන් කාලය ඉල්ලා ගන්න. එසේ කාලය ඉල්ලා ගෙන කථා කළා නම් බාධාවක් නැහැ. තමුන්නාන්සේලාට කාලයවත් දෙන්නේ නැහැ කියන්නේ, තමුන්නාන්සේලාගේ පක්ෂයෙන් තමුන්නාන්සේලාට වටිනාකමක් දෙන්නේ නැහැ කියන එකනේ. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ විවේචන කරන හිටපු ආණ්ඩුවේ උදව්ය අවුරුදු නවයක් තිස්සේ අය වැය ඉදිරිපත් කළා. දිගටම ගත්තොත්, අවුරුදු විස්සක් තිස්සේ අය වැය ඉදිරිපත් කළා. අවුරුදු විස්සක් තිස්සේ අය වැය ඉදිරිපත් කරලාත් මිනිසුන්ට සහනයක් දෙන්න බැරි වෙලා දැන් කියනවා, උම්බලකඩ හොඳි හදන අය වැයක් කියලා. උම්බලකඩ හොද්දක් හදලා රසට කෑම වේලක් කන්න පුළුවන් අය වැයක් ඉදිරිපත් කළා නම්, ඒ අය වැය ඉදිරිපත් කළ මිනිහාට ස්තුති කරන්න ඕනෑ.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
වෙන මොකක්වත් ඕනෑ නැහැ. ඒ සහනයම ඇති.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් ඉන්න. ඔබතුමා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් නේ. ඔබතුමා අපි ගරු කරන මන්ත්‍රීවරයෙක් නේ. ඒ නිසා මට බාධා නොකර කථා කරන්න දුන්නොත් හොඳයි. ඕනෑ නම් ඔබතුමාට කථා කරන්න මම මගේ වේලාවෙන් ටිකක් ලබා දෙන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතාවට සහන දෙන්නේ කොහොමද කියලා අහනවා. මහින්ද රාජපක්ෂ මුදල් ඇමතිතුමා ඉදිරිපත් කරපු පසු ගිය අය වැයෙන් මේ රටේ ජනතාවගෙන් එක පුද්ගලයෙකු නඩත්තු කරන්න රුපියල් කෝටි 895ක් වෙන් කරලා තිබුණා. එක පුද්ගලයෙක්, එක පවුලක් නඩත්තු කිරීමට වෙන් කළ මුදල රුපියල් කෝටි 895ක්. රටේ ජනතාව වෙනුවෙන් එතැනින් රුපියල් කෝටි 600ක් අරගෙන වියදම් කරන කොට, රටේ ජනතාවට සහනයක් දෙන්න බැරිද? මේක තේරෙන්නේ නැත්නම් කොහොමද කරන්නේ? මේක තේරෙන්නේ නැත්නම් මොකටද මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප විශේෂයෙන්ම මතක් කරන්නට ඕනෑ, අප මෙම මැතිවරණයට ඉදිරිපත් වෙන කොට අප කිව්වා, රටේ ජනතාව වෙනුවෙන් අප තෙල් සහනාධාරය රුපියල් බිලියන 40ක් දෙනවාය කියලා. නමුත් අප ආණ්ඩුව පිහිටුවා දින හතක් යන්නට ඉස්සෙල්ලා ජනතාවට රුපියල් බිලියන 65ක තෙල් සහනාධාරය ලබා දුන්නා. අපි දෙනවා කිව්වේ, රුපියල් බිලියන 40ක සහනාධාරයක්. රුපියල් බිලියන 40ක සහනාධාරයක් දෙනවා කියපු අප රුපියල් බිලියන 65ක සහනාධාරයක් ලබා දුන්නා. ඒ කියන්නේ තවත් රුපියල් බිලියන 25ක් වැඩිපුර ලබා දුන්නා. ඇයි මේ? මේක දෙන්න පුළුවන් වුණේ කොහොමද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය වකවානුව තුළ තෙල් ලීටරයකට දිගින් දිගටම බදු පිට බදු ගැහුවා. පසු ගිය වකවානුව තුළ පෙට්‍රල් ලීටරයකට රුපියල් 67.31ක බද්දක් ගැහුවා. ඩීසල් ලීටරයකට රුපියල් 17.32ක් බද්දක් ගැහුවා. ඒ වාගේම භූමි තෙල් ලීටරයකට බද්ද ගැහුවා. එසේ බදු පිට බදු ගහලා රටේ ජනතාවගේ බොක්කම සූරා ගෙන කෑවා, පසු ගිය කාල පරිච්ඡේදය තුළ පැවැති ආණ්ඩුව. ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කාල පරිච්ඡේදය තුළ අති අමානුෂික විධියට තෙල් සංස්ථාව විනාශ කළා; විදුලිබල මණ්ඩලය විනාශ කළා. කොල්ලුපිටිය "ස්ටාර් ඩස්ට්" කැසිනෝ ශාලාවේ ඉඳගෙන තෙල් සංස්ථාව පාලනය කළා. තීන්දු, තීරණ ගත්තේ විපක්ෂයේ අද ඉන්නා මේ ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් නොවෙයි. තමුන්නාන්සේලාට තීන්දුවක්, තීරණයක් ගන්න ලැබුණේ නැහැ. ජනක බණ්ඩාර තෙන්නකෝන් මහත්මයා මාත් එක්ක එකඟ වෙයි. කොල්ලුපිටිය "ස්ටාර් ඩස්ට්" කැසිනෝ ශාලාවේ ඉඳලා කැසිනෝකාරයන් තමයි තෙල් සංස්ථාව පිළිබඳව, විදුලිබල මණ්ඩලය පිළිබඳව තීන්දු ගත්තේ. තමුන්නාන්සේලා ගත්ත තීන්දුව මොකක්ද?

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
එහේ ගියාද?

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගියාද? ගජදීර මහත්තයා දන්නේ නැති වුණාට, අනෙක් මහත්වරු දන්නවා. ඒවා දන්න නිසා තමයි ඒ ගොල්ලෝ අහ ගෙන ඉන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කැසිනෝ මුදලාලිලා තීන්දු ගත්ත රටක් මේක. තෙල් ටික පිළිබඳව තීන්දු ගත්තේ කැසිනෝකාරයෝ. ලංකා විදුලිබල මණ්ඩලය පිළිබඳව තීන්දු ගත්තේ කැසිනෝකාරයෝ. ඒවා දන්නේ නැත්නම් රාජපක්ෂ පවුලට සම්බන්ධ වෙලා හිටපු අනෙක් අයගෙන් අහන්න. හොරකම් පිළිබඳව කථා කළාට මෙතැන ඉන්න සියලු දෙනා හොරකම් කළේ නැහැ. සියලු දෙනා හොරකම් කළේ නැති වුණාට අලි හොරකම් කළ අලි හොරු ටිකක් ඉන්නවා. ඒ හොරු සම්බන්ධව තමයි රාජකාරි කෙරෙන්නේ. එහෙම නම් සියලුම මන්ත්‍රීවරු අත් අඩංගුවට ගන්න ඕනෑ නේ. සියලුම මන්ත්‍රීවරු පිළිබඳව මාධ්‍යයේ පෙන්වන්න ඕනෑ නේ. කෝ, සියලුම මන්ත්‍රීවරු පෙන්වනවාද? අහවල් එක හොරකම් කළා කියලා කෝ, හිටපු ඇමති රෙජිනෝල්ඩ් කුරේ මැතිතුමාව TV එකේ පෙන්වනවාද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හොරකම් කරපු කෙනා හොරකම් කළා කියන එක පෙන්වන්නත් ඕනෑ; ඒ පිළිබඳව රාජකාරි කරන්නත් ඕනෑ. ඒවා නොකරපු නිසා තමයි මේ රටට හෙණ ගැහිලා තිබෙන්නේ. ජනතා දේපළ දිගින් දිගටම හොරා කෑවා, හොරා කෑවා, හොරා කෑවා. නිදහස ලබපු තැන ඉඳලා මාරුවෙන් මාරුවට දිගින් දිගටම හොරා කෑවා. හොරා කාලා, හොරා කාලා තමන් හැදුණා. ලංකාවේ නොවෙයි පිට රට අරන් ගිහින් මුදල් ටික තැන්පත් කර ගත්තා. තමන් නොමැරෙන මිනිසුන් විධියටයි මේ රටේ ධනස්කන්ධය හොරකම් කළේ. එහෙම හොරකම් කළ හොරු පෙන්වන්න ඕනෑ.

දැන් බලන්න පුංචි හොරකම් නොවෙයි නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අලියෙක් හොරකම් කරන එක වහන්න පුළුවන්ද? මේ රටේ මහා සංඝ රත්නයට අනුගමනය කරන්න තිබෙන්නේ, "බුද්ධං සරණං ගච්ඡාමි" කියලායි. හැබැයි, සමහර හාමුදුරුවරු අනුගමනය කළේ, "රාජපක්ෂ සරණං ගච්ඡාමි" කියලා. අලි පැටවු

තුන් දෙනෙකු අරන් ගිහින් ඇලන්මැතිනියාරාමයේ කාමරයක දා ගෙන හැදුවේ කොහොමද? ඒ හොරු නොවෙයිද? ඒවා හොරකම් නොවෙයිද? නීතියට අනුව බලපත්‍ර අරගෙන තිබුණාද? කැලේ හිටපු වන සත්තු ටික හොරකම් කළ නිසා නේ ඒවා පෙන්වන්නේ. එහෙම නොකළා නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාධ්‍යයට පුළුවන්ද, "ජාතික රූපවාහිනිය"ට හෝ "සිරස"ට හෝ "ස්වර්ණවාහිනිය"ට හෝ "දෙරණ"ට හෝ "හිරු" එකට හෝ ITN එකට හෝ පෙන්වන්න පුළුවන්ද? උඩුවේ ධම්මාලෝක හාමුදුරුවන්ගේ ඇස් දෙක වහලා ඇලන්මැතිනියාරාමයට අලියෙක් අරගෙන ගිහින් කාමරයකට දාලා තියන්න පුළුවන්ද? අලි හොරකම් කළ නිසා තමයි ඒවා පෙන්වන්නේ. හොරකම් කළා නම් විඳවන්න ඕනෑ. රටේ නීතිය අතට අරගෙන කාබාසිනියා කළා නම් විඳවන්න ඕනෑ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
දඬයක් ගැහුවාද?

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
රාජකාරි කර ගෙන යනවා නේ. ඔහොම ඉන්න. කලබල වෙන්න එපා. තමුන්නාන්සේට හරි හදිසියි. බොරු ලියුම් ගහපුවාම, බොරු අත්සන් ගහපුවාම, forged documents හදපුවාම, EQD නැහැ කියනවා නම් - බොරු අත්සනක් කියනවා නම් - අත් අඩංගුවට ගන්නේ නැත්නම්, උසාවියට ඉදිරිපත් කරන්නේ නැත්නම් ඒකද සුදුසු? ඒ රජපක්ෂ යුගයමද ගෙනි යන්න කියන්නේ? නීතිය වල් වැදුණු යුගයක්ද ගෙනි යන්න කියන්නේ? මම කනගාටු වෙනවා වාසුදේව නානායක්කාර ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමා පිළිබඳව. තමුන්නාන්සේ හොරකමට, දූෂණයට එරෙහිව විරෝධතාව දක්වපු මනුස්සයෙක්. දැන් ඔබතුමා හොරෙක් ආරක්ෂා කරන්න කථා කරනවා. [බාධා කිරීමක්] ඔබතුමා පිළිබඳව කනගාටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා කොල්ලුපිටියේ- [බාධා කිරීමක්] මොකක්ද?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම කියන්නේ, ඒක කිරීම මඟ හැරෙන්න දෙන්න එපා කියලායි.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මම දන්නවා ඔබතුමාට ප්‍රශ්නයක් තිබෙනවා කියලා පූජ්‍ය උඩුවේ ධම්මාලෝක හාමුදුරුවොත් එක්කලා. කිසිම ප්‍රශ්නයක් නැහැ. ඒ රාජකාරිය කෙරෙයි. ඒ විතරක් නොවෙයි. රටේ හිටපු ප්‍රසිද්ධ කුඩුකාරයා තමයි වෙලේ සුදා. ඔහු අවුරුදු ගණනක් තිස්සේ ප්‍රසිද්ධියේ කුඩු විකිණුවා. කුඩු ව්‍යාපාරයේ යෙදුණා. එතකොට අත් අඩංගුවට ගත්තාද? ඔහු පිළිබඳව රාජකාරි කළාද? මේ රජය පත්වෙලා දවස් තුනෙන් නේද අත් අඩංගුවට ගත්තේ? අත් අඩංගුවට ගත්තාට පස්සේ ඔහු මොකක්ද කියන්නේ? අද කාගේ නම්ද කියන්නේ? හිටපු පොලිස්පතිවරයාගේ. නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්වරයා විධියට එතුමාව පත් කළ දවසේම මම මාධ්‍ය සාකච්ඡාවක් තියලා කිව්වා, -ගරු ජානක බණ්ඩාර මැතිතුමනි, ඔබතුමාත් මමත් පොලීසියට සම්බන්ධයි. ඒ නිසා අපට කැක්කුමක් තිබෙනවා ඒ පිළිබඳව.- "අනිච්චාවත සංඛාරා. අවසාන දිනය අහවල් දවස" කියලා. පොලීසියේ අවසානය පටන් ගන්නේ එදා කියලා. මොකද, වුණේ? කවුද වෙලේ සුදාගෙන් සල්ලි අරගෙන ගෙවල් අරගෙන තිබෙන්නේ? තමුන්නාන්සේ ගත්තාද? ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මන්ත්‍රීතුමා ගත්තාද? නැහැ. ඔබතුමන්ලා ගත්තේ නැහැ. වෙලේ සුදාගෙන් සල්ලි අරගෙන ගේ ගත්තේ කවුද? ක්‍රෙස්කැට් එකට ඇවිල්ලා වෙලේ සුදාගේ සල්ලි අරගෙන ගිය පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා කවුද? ඒවා විභාග කෙරෙනවා. ඇයි, හදිසිද? පොඩ්ඩක් ඉන්න. කලබල වෙන්න එපා. පැමිණිල්ලෙන් සාක්ෂියට, සාක්ෂියෙන් විත්තියට යන ක්‍රමයක් තමයි ක්‍රියාත්මක වෙන්න ඕනෑ. පැමිණිල්ලෙන් විත්තියට ගිහින්, විත්තිකාරයා බෙල්ල කෙටියෙන් අල්ල ගෙන හදිසියේ කරන්න ගිහින් අධිකරණයේ ඔප්පු කිරීමට තිබෙන සිද්ධාන්තය අහිමි කර ගන්න -සාක්ෂි අහිමි කර ගැනීමට- අවශ්‍යතාවක් නැහැ. ඒ නිසා වාසුදේව නානායක්කාර මැතිතුමනි, ඒවා සම්බන්ධව රාජකාරි කෙරෙයි. ඒවාට කලබල වෙන්න එපා. රාජකාරි කෙරෙන්න ඕනෑ. ඔබතුමාත් දූෂණයට විරුද්ධ නම් අන්න එතැනට එකතු වෙලා අපි මේ රටේ යහ පාලනය ගෙන යමු.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, [බාධා කිරීමක්] මොනවාද?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
කලබල කරන්නත් කවුරු හෝ ඉන්න ඕනෑ.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
කරන්න, කරන්න. ඔබතුමා හැම දාම කලබල කළා නේ. ඔබතුමා කලබල කළාට වෙච්ච දෙයක් නැහැ නේ. අන්තිමට ඔබතුමා "මහින්ද සරණං ගච්ඡාමි" වුණා නේ. එච්චරනේ වුණේ. වෙන වෙච්ච දෙයක් නැහැ නේ. වයසට යනකම් ඔබතුමා කලබලා කළා. එච්චරයි කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් එක තමයි ඇවන්ට් ගාඩ් සමාගම. මේ රටේ ජනතාවට සහන දෙන්න කොහෙන්ද සල්ලි කියලා අහනවා. ඇවන්ට් ගාඩ් සමාගම කියන්නේ, නිකම්ම නිකම් පෞද්ගලික ආරක්ෂක සමාගමක්; security company එකක්. ලංකා ඉතිහාසය ගත්තාම මෙතෙක් කාලයක් මුහුදේ ගිය යාත්‍රාවලට මුහුදු කොල්ලකරුවන්ගෙන් වන හානිවලට ආරක්ෂාව දුන්නේ ලංකාවේ නාවික හමුදාව. මුහුදේ සටන් කරන්න ඉන්න ලංකාවේ නීත්‍යානුකූල හමුදාව තමයි නාවික හමුදාව. ඒ නාවික හමුදාව අපට ආරක්ෂාව ලබලා දුන්නා මුහුදු කොල්ලකරුවන්ගෙන්. ඒ සඳහා මාසෙකට ලැබුණා ඩොලර් මිලියන 120ක්; රුපියල් ලක්ෂයේ ඒවා 153,423ක මුදලක් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකක්ද කළේ? හිටපු අග්‍ර විනිශ්චයකාර මොහාන් පීරිස් මහත්තයයි, හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහත්මයයි හිටපු කමිටුව මොකක්ද ගත්ත තීන්දුව? කිසිදු නෛතික අයිතියක් නැති පෞද්ගලික ආරක්ෂක සේවයක් වන ඇවන්ට් ගාඩ් සමාගමට මෙම කොන්ත්‍රාත්තුව ලබා දුන්නා. නාවික හමුදාවෙන් එය උදුරා ගත්තා. අවි ආයුධ 8,000ක් එතැනට දුන්නා. රටේ ආයුධ 8,000ක් දුන්නා. මේ රට පිට රටට සල්ලි ගෙවලා ගෙනාපු ආයුධ. ඒ ආයුධ ටික දන් දුන්නා ඇවන්ට් ගාඩ් සමාගමට. ඒ ඇවන්ට් ගාඩ් සමාගමට දීලා floating armoury එකක් දුන්නා ඒගොල්ලන්ට. එහෙමයි කළේ. BMICH එකේ armoury එක හැදුවා. ඒකට දුන්නා මේ ආයුධ ටික. අපේ සල්ලිවලින්, ජනතා සල්ලිවලින් ගෙනාපු ආයුධ ටික තමයි - ස්වයංක්‍රීය අවි ආයුධ 8,000ක්- ඇවන්ට් ගාඩ් සමාගමට දුන්නේ. පොලිස් දෙපාර්තමේන්තුවට ස්වයංක්‍රීය අවියක් දුන්නේ අන්තිම මොහොතේ. ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමා දන්නවා ත්‍රස්තවාදය උච්ච තැනකට ආවාම පොලීසියට මුහුණ

[ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා]

දෙන්න අමාරු වෙනකොට තමයි දුන්නේ. එතකන් දුන්නේ 303 rifle එකයි, SLR එකයි. එතුමා සාක්ෂි දරනවා.[බාධා කිරීමක්] හරිම ප්‍රශ්නනේ අහන්නේ? ඇවන්ට් ගාඩ් සමාගමට මේක දුන්නා. දීලා ඩොලර් මිලියන 120ක් -රුපියල් ලක්ෂ 153,423ක්- මාසිකව ඇවන්ට් ගාඩ් සමාගම ගත්තා. ඇවන්ට් ගාඩ් සමාගම ගත්ත මුදලින් ශත පහක මුදලක් ලංකා ආණ්ඩුවට බදු ගෙවලා නැහැ. තනිකරම රටේ ජනතා අවි ආයුධ ටික අරගෙන මේ විධියට වැඩ කටයුතු කරලා තිබෙනවා. ඉතින් මෙහෙම ගිය මුදල් තමයි මේ නතර කරලා තිබෙන්නේ. දැන් කෝ, ඇවන්ට් ගාඩ් සමාගමට ඒ ආරක්ෂාව දෙන්න පුළුවන් ද? මොකක්ද ගිවිසුම? වලංගු නැති පෞද්ගලික ආරක්ෂක සමාගමකට; පෞද්ගලික ආරක්ෂක ආයතනයකට රටේ ආයුධ ටික දෙන්න පුළුවන් ද? ස්වයංක්‍රීය ආයුධයක් දරන්න සිවිල් පුරවැසියෙකුට අයිතියක් තිබෙනවාද? කොහේද මොන නීතියේ ද තිබෙන්නේ? එහෙම නැතිව තිබෙද්දී මෙහෙම අවි ආයුධ කන්දරාවක් දුන්නා. මේ දීලා අවසන් වෙලා රටේ ධනස්කන්දය, රටට එන ආදායම එක පුද්ගලික සමාගමකට දුන්නා. පුද්ගලික සමාගමකට දීලා තමන්ට ඕනෑ විධියකට හසුරවා ගත්තා. මේ එක මන්ත්‍රීවරයෙකුට, ඇමතිවරයෙකුට ඒකට බලපෑමක් කරන්න පුළුවන් වුණා ද? සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මහලේකම් වුණාට එතුමාට පුළුවන් වුණා ද ඒ ගැන කථා කරන්න? එතුමාට පුළුවන් වුණා ද බලපෑමක් කරන්න? බලපෑම් කළා නම් එතුමාත් ඉවරයි. අන්න ඒකයි තත්ත්වය. අන්න එහෙමයි ගියේ. ඒ කාලපරිච්ඡේදය තුළ පොඩි හොරකමේ ඉඳලා අලි හොරකම දක්වා කරන්න පුළුවන් හොරකම් සියල්ල කළා. යුද්ධය අවසන් වුණාම මිනිස්සු බලාපොරොත්තු වුණා සහන ලැබෙයි කියලා. යුද්ධය අවසන් වුණාම මොකක්ද ලැබුණේ? ලැබුණේ අසහනය. දිගින් දිගටම බඩු මිල වැඩි කළා. ලෝකයේ තෙල් මිල අඩු වුණා. ලෝකයේ තෙල් මිල අඩු වෙන කොට එක වතාවක්වත් රටේ ජනතාවට සහනයක් ලබා දුන්නේ නැහැ.

දැන් බලන්න, 2013 අවුරුද්දේ තමයි ලෝකයේ තෙල් මිල ඉහළටම ගිය අවස්ථාව. ගරු සුසිල් ප්‍රේමජයන්ත මහත්මයා ඛනිජ තෙල් සංස්ථාව භාරව සිටි ඇමතිවරයා වශයෙන් මේ ගැ දන්නවා ඇතැයි මම විශ්වාස කරනවා. 2013 අවුරුද්දේ තෙල් මිල උච්ච ස්ථානයකට ආවාට පසු 2014, 2015 වසරවල දිගින් දිගටම තෙල් මිල අඩු වෙමින් ආවා. දැන් ආපසු සුළු වැඩි වීමක් වෙලා තිබෙනවා. කලින් අඩු වීමේ ප්‍රතිලාභය ජනතාවට දුන්නාද? කිසිම අන්දමකින් ජනතාවට දුන්නේ නැහැ. එදා අපි පාර්ලිමේන්තුවේ දී කථා කරනකොට එදා ආණ්ඩු පාර්ශ්වය නියෝජනය කරන ගරු ඇමතිවරු මොනවාද කිව්වේ? එතකොට කිව්වේත් "මේ දෙන්නෙත් අලාභ පිට" කියලා. අලාභ තමයි. තෙල් සංස්ථාව අලාභයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කොච්චරක් අලාභ ද දන්නවා ද? අලාභ වුණේ ඇයි? හෙජින් ගනුදෙනුව සිදු වුණා. ඒ වෙනකොට ඒ.එච්.එම්. ෆවුසි මැතිතුමා ඉන්ධන සංස්ථාව භාරව සිටි ඇමතිවරයා. අසන්ත ද මැල් මහත්මයා තමයි හිටියේ තෙල් සංස්ථාවේ සභාපතිවරයා වශයෙන්. ඒ කාල පරිච්ඡේදයේදී තෙල් සංස්ථාවට දැවැන්ත ප්‍රශ්නවලට මුහුණ දෙන්නට සිදු වුණා. මොකක්ද? හෙජින් ගනුදෙනුව සම්බන්ධයෙන්. හෙජින් ගනුදෙනුවට ඒ ඇමතිවරුන්ට බලපෑම් කරලා තිබෙනවා. අසන්ත ද මැල් මහතා කෙළින්ම නොකියා කියනවා, "ජනාධිපති මන්දිරයෙන්, රටෙන් ඉහළම තැනින් ආපු නියෝගය නිසා මට කරගන්න දෙයක් නැති වුණා, ඒ නිසා මට මෙය කරන්න සිදු වුණා" කියලා. එතකොට පසු ගිය වකවානුවේ ජනතාව දිහා බලා සහන ද ලබා දීලා තිබෙන්නේ? හෙජින් ගනුදෙනුවෙන් රටේ මුදල් කන්දරාවක් නැති කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හෙජින් ගිවිසුමෙන් විතරක් රුපියල් ලක්ෂ 9,700ක් අලාභ වුණා. එපමණක් නොවෙයි, සියයට 8ක පොලියක් ගෙවන්න වෙලා තිබෙනවා ස්ටැන්ඩඩ් චාර්ටඩ් බැංකුවට. ඒකේ ගාණන හදලත් නැහැ තවත් කොච්චර මුදලක් ගෙවන්න තිබෙනවා ද කියලා. කොච්චර මුදලක් ගෙවන්න තිබෙනවා ද කියලා හිතලා බලන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හෙජින් ගිවිසුමේ නීති වියදම් වෙනුවෙන් රුපියල් ලක්ෂ 2,320ක් ගිහිල්ලා තිබෙනවා. අපි මේ සම්බන්ධව එදා පාර්ලිමේන්තුවේ දී කිව්වා, අපි විවාදයේදී කිව්වා. "මේක කථා කරලා සමථයකට පත් කර ගන්න. මේ නඩුවට යන එකෙන් වැඩක් නැහැ, නඩුවට ගියාම තවත් අපිට අලාභයක් වෙන්නේ" කියලා. මොකක්ද කළේ? චණ්ඩිකමට ගියා. ගමේ ඉන්න චොප්පෙලා වාගේ, චණ්ඩි සිරාලා වාගේ, මරු සිරාලා වාගේ එක පැත්තකින් සරම උස්සා ගෙන චණ්ඩි කමට ගියා අපි බලා ගන්නම් කියලා. ගිහින් බැලුවේ මොකක්ද? ලංකාවේ මිනිස්සුන්ටයි දඬුවම් දුන්නේ. මොකක්ද කළේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නීතිමය කටයුතුවලට විතරක් වියදම රුපියල් මිලියන 232යි. රුපියල් ලක්ෂ 2,320ක් වියදම් කළා; නාස්ති කළා. මේ රටේ ජනතාව ජීවත් කරවන්නට තිබුණු සල්ලි. ජනතාවට සහන දෙන්න තිබුණු සල්ලි. වකුගඩු රෝගියා ගොඩගන්න තිබුණු සල්ලි. රෝහල් පද්ධතිය දියුණු කරන්නට තිබුණු සල්ලි. අධ්‍යාපනයේ විකාර නොකර අධ්‍යාපනය යහපත් විධියට ගෙන යන්න තිබුණු සල්ලි. භාණ්ඩ මිල අඩු කරන්න තිබුණු සල්ලි. භාණ්ඩවල බද්ද අඩු කරන්න තිබුණු සල්ලි. කාටද දුන්නේ? නීති වියදම් කියලා දුන්නා.

අනෙක් කාරණය, මෙහි විදේශීය ගමන් ගාස්තු වශයෙන් රුපියල් ලක්ෂ 2,500ක් වියදම් කරලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ ගුවන් ගාස්තු වෙනුවෙන්. Business Class එකේ නැඟලා ගියේ. ගිහිල්ලා, superstar, seven-star, five-star, three-star hotelsවලයි නතර වුණේ. තෙල් සංස්ථාවේ නිලධාරීන්, ආණ්ඩුවේ උදවිය ගිහිල්ලා එහේ නැවතිලා ඒ සියලු වියදම් මේ රටේ ජනතාව පිට පැටෙව්වා. ඉතින් තෙල් සංස්ථාව ලාභ ලබයිද? තෙල් සංස්ථාව ඉවර කරලා නේ තිබෙන්නේ. මේ රටේ දුම්රිය දෙපාර්තමේන්තුව, SLTB එක, තෙල් සංස්ථාව, විදුලිබල මණ්ඩලය යන මේ ආයතන අලාභ ලබන, මුදල් කාබාසිනියා කරන, විනාශකාරී ආයතන කියලා හිටපු නියෝජ්‍ය මුදල් අමාත්‍ය සරත් අමුණුගම මහත්මයා එක වතාවක දී ප්‍රකාශ කළා මට මතකයි. කවුද මේ තැනට ඒ ආයතන පත් කරලා තිබෙන්නේ? මේ රටේ මිනිස්සුද? මේ රටේ මිනිස්සු මේවා අලාභ කරලා නැහැ. මේ රටේ මිනිස්සුන්ගෙන් රුපියල් 67 ගණනේ බදු අරගෙන තිබෙනවා. ජනතාවගෙන් සහ ගහන බදු ලබාගෙන තිබෙනවා. ජනතාවගෙන් සහ ගහන බදු ලබාගෙන ඒ ආයතන කාබාසිනියා කරලා තිබෙන්නේ පාලකයන්. ඒ පාලකයන්ට සහ ගහන්න ඕනෑ. ඒ සහ තමයි මේ ලැබිලා තිබෙන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2011 අවුරුද්දේ ප්‍රමාද ගාස්තු වශයෙන් රුපියල් ලක්ෂ 950ක් ගෙවලා තිබෙනවා. කොහෙන්ද මේ? රුපියල් ලක්ෂ 950ක් ගෙවලා තිබෙනවා, 2011 අවුරුද්දේ. ඒ වාගේම 2012 අවුරුද්දේ ලක්ෂ 1,030ක් ගෙවලා තිබෙනවා, ප්‍රමාද ගාස්තු වශයෙන්. මේ මුදල් කන්දරාව ගෙවන්න වුණේ ඇයි? සංස්ථාව මේ තරම් මුදල් කන්දරාවක් අලාභ ලබන තැනට පත් වුණේ ඇයි? එහෙම වුණේ, පසු ගිය ආණ්ඩුව ගත්ත අමනෝඥ ක්‍රියා මාර්ග නිසායි. ජනතාව දිහා බලන්නේ නැතුව, තමන්ගේ කුට්ටිය ගැන කල්පනා කරලා ගත්තු තීන්දු නිසා තමයි මෙහෙම වුණේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අන්න ඒ නිසා තමයි අපි ඒ සියල්ල නතර කරලා අද ජනතාවට සහන දෙන ක්‍රම සකස් කරලා තිබෙන්නේ.

තෙල් සංස්ථාවේ නළ පද්ධතිය ගැන අවුරුදු විස්සක් තිස්සේ කියනවා. ඇමතිවරුන් මාරු වෙනවා, එහෙත් නළ පද්ධතියේ කිසිදු අලුත්වැඩියාවක් සිදු වෙලා නැහැ. කරන්න විධියක් නැහැ;

කරන්න දෙන්නේත් නැහැ. ඔක්කෝම දුන්නේ පිට රට සමාගම්වලට. දීලා මුදල් ටික එහාට ගෙව්වා. කොමිස් එක ලැබෙන ප්‍රමාණය අනුව තමයි දුන්නේ. තෙල් සංස්ථාවට අවුරුදු 52යි. අවුරුදු 52ක ඉතිහාසය තුළ ලංකාවට බාල තෙල් ගෙනාවේ එකම එක අවස්ථාවයි. ඒ "මහින්ද චින්තන" ආණ්ඩුව යටතේයි. ඒ ඇමතිතුමාත් මේ ගරු සභාවේ ඉන්නවා. එතුමාගේ - සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාගේ - කාල පරිච්ඡේදය තුළ තමයි ඒ බාල තෙල් ගෙනාවේ. ලංකාවට බාල තෙල් ගෙනාපු එකම කාල පරිච්ඡේදය කියලා එය ඉතිහාස ගත වෙනවා. ඒ වාගේම ෆවුසි ඇමතිතුමාගේ, අසන්ත ද මැල් මැතිතුමාගේ කාල පරිච්ඡේදයනුත් ඉතිහාස ගත වෙනවා, හෙජින් ගිවිසුම වැනි දඩබ්බර ගිවිසුම් ගහලා රටේ ජනතාවගේ බඩට ගහපු කාල පරිච්ඡේද ලෙස. මෙන්න මේ විධියට වැඩ කරලා, රටේ ධනස්කන්ධය කාබාසිනියා කරලා, මිනිහෙකුට සහනයක් දෙන්නේ කොහොමද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? රටේ මිනිස්සුන්ට සහනයක් දෙන්න විධියක් නැහැ.

එවැනි ආර්ථිකයක්, එවැනි පසු බෑමක්, එවැනි කඩා වැටීමක් ඇති කර තිබෙන අවස්ථාවක තමයි අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත්, අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් මේ රට බාර ගෙන මෙවැනි අමාරු අඩියක ඉඳගෙනත් මේ රටේ ජනතාව දිහා කල්පනා කරලා මෙවැනි සහන දෙන්න කටයුතු කර තිබෙන්නේ. භාණ්ඩ වර්ග දහයකටයි සහන දෙනවා කිව්වේ. නමුත් භාණ්ඩ වර්ග දහතුනකට සහන දුන්නා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රාත්‍රී 8.00ට, 9.00ට පසුව රෝහලකට ගියොත් ලෙඩෙකුට එහි නතර වෙනවා හැරෙන්න බෙහෙත් ටිකක් අරගෙන ගෙදර එන්න විධියක් තිබුණේ නැහැ. ඒ නිසා පැය 24 පුරාම බාහිර රෝගී අංශය විවෘත කර තබලා රෝගියකුට ප්‍රතිකාර ගන්න පුළුවන් ක්‍රමයක් හරි ගැස්සුවේ මේ පාලන ක්‍රමය යටතේ නොවෙයිද? සෞඛ්‍ය ඇමතිවරුන් හැටියට හිටපු උදවිය මේ ගරු සභාවේ ඉන්නවා. ඒ කාලයේ -

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

වර්තමාන අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා, සෞඛ්‍ය අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරපු කාලයේ දී තමයි සවස් වරුවෙන් පසුවත් බාහිර රෝගී අංශය විවෘතව තබන්න පටන් ගත්තේ.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

මා සන්තෝෂ වෙනවා, අද තමුන්නාන්සේ නැඟිටලා අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා කියලා කියන එකට. [බාධා කිරීමක්] "අයියෝ සිරිසේන, අයියෝ සිරිසේන" කිය කියා මැරෙන්න කෑ ගහපු, "අයියෝ සිරිසේනට හෙණ ගහන්න ඕනෑ" කියලා කියපු, "සිරිසේනගේ පුතාට හෙණ ගහන්න ඕනෑ" කියලා කියපු තමුන්නාන්සේ අද කථා කරනවා, "අතිගරු ජනාධිපතිතුමා" කියලා. [බාධා කිරීමක්] තමුන්නාන්සේ කලිසමක් ඇඳගෙනද කථා කරන්නේ කියලා මට අහන්න හිතෙනවා. [බාධා කිරීමක්]

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

රාජ යෝගයක් තිබුණේ නැහැ. මෙතුමාට රජ වෙන්න බැහැ.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

කාටද රජ වෙන්න බැරි?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

තමුන්නාන්සේලාගේ පක්ෂයෙන් ඉදිරිපත් කරන්න අපේක්ෂකයෙක් හිටියේ නැහැ. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා තමයි අපේ පක්ෂයේ සභාපති.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

තමුන්නාන්සේලාගේ පක්ෂයේ සභාපති වුණේ ජනාධිපති වුණාට පසුවයි. තමුන්නාන්සේලාගේ පක්ෂයේ සභාපති නම් ඇයි තමුන්නාන්සේලා එතුමාව දිනවන්න කටයුතු නොකළේ? [බාධා කිරීමක්] තමුන්නාන්සේලා මහින්ද රාජපක්ෂ දිනවන්න නේද කටයුතු කළේ? [බාධා කිරීමක්]

තමුන්නාන්සේලා මෛත්‍රීපාල සිරිසේන මහත්මයා වෙනුවෙන් එතුමාගේ මැතිවරණ වේදිකාවට නැඟුණාද? එතුමා වෙනුවෙන් රැස්වීම් පැවැත්වුවාද? Canvassing ගියාද? එතුමා වෙනුවෙන් කතිරය ගහන්න කියලා මිනිහෙකුට කිව්වාද? හිටපු නියෝජ්‍ය ඇමතිතුමා, නිකම් බයිලා ගහන්නේ නැතිව වාඩි වෙන්න. තමුන්නාන්සේ හනුමන්තා වාගේ බොරුවට කෑ ගහන්න එපා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හිටපු අග්‍රාමාත්‍ය දි.මු. ජයරත්න මැතිතුමා අද කථා කළා. එතුමා මොකක්ද කිව්වේ? මේ රටේ දරුවන්ව පරිස්සම් කර ගන්න කියලා කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අම්බුළුවාව ජෛව විවිධත්ව මධ්‍යස්ථානය තිබෙන තැන හාමුදුරු නමක් පන්සලක් හදාගෙන සිටියා. ඒ හාමුදුරුවන්ව එළවලා ඒ භූමිය අත් පත් කර ගත්තා. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ කාල පරිච්ඡේදයේ කෘෂි රක්ෂණ මණ්ඩලයේ - අපේ මහින්දානන්ද අලුත්ගමගේ මහත්මයා සමහර වෙලාවට මේ සම්බන්ධයෙන් සාක්ෂි දරයි. සමහරවිට "නැහැ" කියලා විරුද්ධ වෙයි. දැන් නම් එතුමාටත් සාක්ෂි දරන්න අමාරුයි කියලා මම දන්නවා, මගේ මිත්‍රයා නිසා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෘෂි රක්ෂණ මණ්ඩලයේ මුදල් ටික අරගෙන, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සල්ලි ටික අරගෙන, ඒ වාගේම ජනාධිපති අරමුදලේ සල්ලි ටික අරගෙන තමයි ජෛව විවිධත්ව මධ්‍යස්ථානය සකස් කළේ. ඒ මධ්‍යස්ථානය හදලා ඒක තමන්ගේ පවුලේ බූදලයක් කළා. රටේ ජනතාවට ජෛව විවිධත්වය බලා ගන්න සර්ව ආගමික මධ්‍යස්ථානයක් කියලා හැදුවා. ඒ මධ්‍යස්ථානය හැදුවේ තමන්ගේ අතින් සත පහක් වියදම් කරලා නොවෙයි. රටේ මහ ජනතාවගේ සියලුම ධනස්කන්ධය යොදවලා තමයි මේ මධ්‍යස්ථානය හැදුවේ. ඒ මධ්‍යස්ථානය හදලා එය වාර්තාගත කරන්න පාර්ලිමේන්තුවට පනතක් ගෙනාවා. පනත ගෙනැල්ලා මොකක්ද කළේ? පළමුවැනියට දැන් ඉන්න රජතුමාට - දි.මු. ජයරත්න මැතිතුමාට - මේක අයිතියි, එතුමාගෙන් පසුව එතුමාගේ පරම්පරාවේ සිටින පිරිමි දරුවන්ගේ අයිතිය සඳහා මේක අත් පත් වනවා කියලා මේ පාර්ලිමේන්තුව තුළ පනතක් සම්මත කර ගත්තා. ඒක බොරුද? එයට විරුද්ධව මේ ගරු සභාව තුළ කථා කරපු එකම එක මිනිහා පාලිත රංගෙ බණ්ඩාර විතරයි.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

හිටපු අගමැතිතුමා ඒ පනත ගෙනෙන්න කලින් තොණ්ඩමන් ඇමතිතුමාත් මේ හා සමාන පනතක් ගෙනාවා. ඒ සඳහා තමුන්නාන්සේලාගේ මත ඉදිරිපත් වුණා. මේක හිටපු අගමැතිතුමා, -

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

මේක රීති ප්‍රශ්නයක් නොවෙයි නේ. ඇති. [බාධා කිරීමක්] දැන් ඉතින් හරි නේ. වාඩි වෙන්නකෝ ඉතින්. තොණ්ඩමන් ඇමතිතුමා කළත් වැරැදියි; දි.මු. ජයරත්න කළත් වැරැදියි; ලලිත් දිසානායක කළත් වැරැදියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රටේ ධනස්කන්ධය අරගෙන, රටේ ධනස්කන්ධයෙන් ආයතනයක් හදලා ඒක පවුලේ බූදලයක් ලෙස සකස් කර ගන්නවා නම් ඒවා සහ ගහන අපරාධ. මේවා දරුවන්ට කන්න දෙනවා නම්, ඒවා කන දරුවන්ව දෙමව්පියන් පරිස්සම් කර ගන්නට ඕනෑ. මෙවැනි අය වැයක් ඉදිරිපත් කරපු උදවියගේ දරුවන් ගැන නොවෙයි, ගරු අග්‍රාමාත්‍යතුමාට දරුවන් ඉන්නවාද, නැද්ද කියන එක ගැන නොවෙයි කථා කරන්න තිබෙන්නේ. ගරු අග්‍රාමාත්‍යතුමාට දරුවන් ඉන්නවාද, නැද්ද කියන එක එතුමා බලා ගනීවි. දි.මු. ජයරත්නට දරුවන් ඉන්නවා නම් ඒ දරුවන්ට පන්සල්වල දේපළ කන්න දෙන්නේ නැතිව, පිංගුත්තරයින් කරන්නේ නැතිව, වැදගත් විධියට තමන් උපයන මුදලින් කන්න දීලා හදා ගන්න එක ඒ ගොල්ලන්ගේ වැඩක්. [බාධා කිරීමක්] ලලිත් දිසානායක මන්ත්‍රීතුමනි, කරුණාකරලා වාඩි වෙන්න කෝ. තමුන්නාන්සේ නිකම් හනුමන්තා වාගේ කෑ ගහනවා. මාවනැල්ලේ මුස්ලිම් මිනිහාගේ petrol shed එකට ගිනි තියලා විනාශ කරපු අතීතයක් තිබෙන තමුන්නාන්සේ තවත් මෙතැන කෑ ගහනවා.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
තමුන්නාන්සේ වාගේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

නැහැ.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විමල් වීරවංශ හිටපු ඇමතිතුමා කිව්වා, ඉදිකිරීම් කර්මාන්තය කඩා වැටිලා කියලා. ඉදිකිරීම් කර්මාන්තය කඩා වැටිලා තමයි තිබුණේ. සිමෙන්ති කොට්ටයක් මිනිහෙකුට ගන්න බැහැ. සිමෙන්ති කොට්ටයක මිල කීයද? මේ අය වැය තුළින් රුපියල් සියයකින් සිමෙන්ති කොට්ටයක මිල අඩු වෙනවා. මිනිසුන් සන්තෝෂයෙන් ගෙයක් දොරක් හදන්න පටන් ගන්නවා, දවස් 14ක අය වැය තුළින්.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගෙවල් හදනවා නොවෙයි, ගෙවල් කඩනවා.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

ගෙවල් කඩනවා? පසු ගිය ආණ්ඩු කාලයේ ධීවරයින් ගිහිල්ලා කිව්වේ මොකක්ද? "අපට තෙල් ටිකට සහනාධාරයක් දෙන්න, සාධාරණ මිලක් දෙන්න, අපට සහන එපා, අපට සාධාරණ මිලට භූමිතෙල් ටික දෙන්න" කියලා තමයි ධීවරයින් ඉල්ලුවේ. ධීවරයෝ සාධාරණ මිලට භූමිතෙල් ටික ඉල්ලනකොට මේ ආණ්ඩුව මොකක්ද කළේ? හලාවත වැල්ලට ගිහිල්ලා, මිනිසුන් ටික පෝලිම් කරලා මහින්ද රාජපක්ෂ ආණ්ඩුව ඔවුන්ට වෙඩි තියලා දැම්මා. තුවක්කුවෙන් තමයි ඔවුන්ට උත්තර දුන්නේ. අද මේ ආණ්ඩුව බලයට පත් වෙලා දවස් 7ක් යනකොට සාධාරණ මිලකට භූමිතෙල් මිල අඩු කරලා දුන්නා.

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දවස් 14ක් සම්පූර්ණ වනකොට දෙවැනි වතාවටත් ඉන්ධන මිල - භූමිතෙල් මිල - අඩු කරලා දුන්නා. පසු ගිය ආණ්ඩුව පම්පෝරි ගැහුවා; කෑ ගැහුවා. මිනිසුන් තෙල් ටික ඉල්ලනකොට වෙඩි තියපු ආණ්ඩුව, රතුපස්වල මිනිසුන් බොන්න වතුර ටික ඉල්ලනකොට වතුර වීදුරුවක් දෙන්නේ නැතිව වෙඩි තියපු ආණ්ඩුව, කටුනායක නිදහස් වෙළෙඳ කලාපයේ සේවකයන් තමන්ගේ අර්ථසාධක මුදල් ඉල්ලනකොට අර්ථසාධක මුදල් දෙන්නේ නැතිව වෙඩි තියලා මරපු ආණ්ඩුව දැන් අපි ජනතාවට සහන දෙන අය වැයක් ඉදිරිපත් කළාම, ජීවත් වන්න පුළුවන් අය වැයක් ඉදිරිපත් කළාම මෙන්න කියන කතන්දර.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ළඟ තිබෙනවා අලි හොරුන්ගේ ලැයිස්තුවක්. කවුද මේ? මාණ්ඩලික ප්‍රධානී ගාමිණී සෙනරත් කියන මහත්මයෙක් සිටියා. ගාමිණී සෙනරත් මහත්මයා මොකක්ද කළේ? ලංකාවේ තිබෙනවා, "මහවැලි" කියලා නෞකාවක්. ඔය නෞකාව floating armoury එකකට ගත්තා. Floating armoury එකකට අරගෙන ගාල්ල වරායට ගෙන ගියා. ගාල්ල වරායෙන් මොකක්ද කළේ? ලලිත් දිසානායක මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ ඒ ගැන දන්නවාද? ටැන්සානියාවට යන තුරු නෞකාව ගෙන ගියා. ටැන්සානියාවට නෞකාව ගෙනිහිල්ලා රාජපක්ෂ කෙනෙකුට දුන්නා, මේක විකුණන්න. කැලිවලට කඩලා කිලෝ එක රුපියල් පහ ගණනේ වික්කේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ පිළිබඳව අප ළඟ ලිඛිත තොරතුරු සියල්ල තිබෙනවා. මෙන්න මේ විධියට පට්ට හොරකම් කරපු පට්ට රැළක් ඉඳ ගෙන දැන් කියනවා මිනිසුන්ට මේ සහනය දෙන්නේ නැහැ, හෙණ ගහන්න ඕනෑ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හොරකම් කරපු අයට දඬුවම් දෙන්නට ඕනෑ. ජනතාව වෙනුවෙන් ආදරයෙන්, ගෞරවයෙන් තමයි මෙවැනි අය වැයක් ඉදිරිපත් කරලා තිබෙන්නේ. අපි අය වැය යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ ජනතාවට සාධාරණය ඉෂ්ට කිරීම ඉලක්ක කර ගෙන මිස මැතිවරණ ඉලක්ක කර ගෙන නොවෙයි. මැතිවරණයක් කරන්න නම් මිනිස්සු ජීවත් වෙලා ඉන්න ඕනෑ. ඒ නිසා මිනිසුන් ජීවත් කරවීම අපේ පූර්ණ වගකීම කියන එක තේරුම් අර ගෙන තමයි මේ වාගේ සාධාරණ, යුක්ති සහගත අය වැයක් ඉදිරිපත් කරන්න කටයුතු කරලා තිබෙන්නේ කියන එක මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා, බොහොම ස්තුතියි.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

ගරු පාලිත රංගෙ බණ්ඩාර රාජ්‍ය ඇමතිතුමනි, අභ්‍යන්තර ප්‍රශ්නයක් තිබෙනවා. තමුන්නාන්සේලා හතර දෙනායි මේ ගරු සභාවේ ඉන්නේ, අය වැය විවාදය අවස්ථාවේදී. මුදල් ඇමතිතුමාත් නැහැ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

அடுத்ததாக கௌரவ அரியநேத்திரன் அவர்கள். உங்களுக்கு 10 நிமிடங்கள் ஒதுக்கப்பட்டிருக்கின்றன.

[பி.ப. 3.37]

ගරු පී. අරියනේත්‍රන් මහතා
(மாண்புமிகு பா. அரியநேத்திரன்)
(The Hon P. Ariyanethran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இங்கு இடைக்கால வரவு செலவுத்திட்டம் தொடர்பான விவாதம் இடம்பெற்றுக்கொண்டிருக்கின்றது. ஆட்சி மாற்றத்துக்குப் பிற்பாடு இந்த நாட்டிலே 67ஆவது சுதந்திர தின விழாவைக் கொண்டாடிய சூழ்நிலையில், இந்த இடைக்கால வரவு செலவுத்திட்டத்திலே உரையாற்றுவதையிட்டு நான் மகிழ்ச்சிடைகின்றேன். இந்த வரவு செலவுத்திட்டத்தைச் சமர்ப்பித்து உரையாற்றிய கௌரவ நிதி அமைச்சர் ரவி கருணாநாயக்க அவர்கள், "இலங்கையர்கள் மீண்டும் சந்தோச பரவசத்தில் காணப்படுகின்றனர். இச்சந்தோசமானது சுதந்திரம், விடுதலை மற்றும் தைரியத்தினைப் பெற்றுக் கொடுத்துள்ளது" என்று தெளிவாகக் கூறியிருக்கிறார். 67ஆவது சுதந்திர தின விழா கொண்டாடப்பட்டிருக்கின்றது; அதைவிட, ஆட்சி மாற்றமும் இடம்பெற்றிருக்கின்றது. ஆனால், தமிழ் மக்களுடைய வேதனைகளும் துன்ப துயரங்களும் இன்னமும் குறைவடையாமல் தொடர்ந்து கொண்டிருக்கின்றன என்பதை நான் இவ்விடத்தில் பதிவு செய்ய விரும்புகின்றேன்.

இந்த வரவு செலவுத்திட்டத்தில் நிதி அமைச்சர் அவர்கள், புலம்பெயர்ந்து வாழ்கின்ற மக்கள் - வெளிநாடுகளில் இருக்கின்றவர்கள், இங்கு வந்து முதலீடு செய்யமுடியுமென்று கூறியிருக்கிறார். வாருங்களென்று அவர்களுக்கு அழைப்புக் கூட விடுக்கப்பட்டிருக்கின்றது. ஆனால், கடந்த 2ஆம் திகதி மட்டக்களப்பு, மாங்காட்டைச் சேர்ந்த, ஒரு பிள்ளையின் தந்தையான 36 வயதுடைய கந்தசாமி கருணாநிதி என்பவர் கட்டாரிலிருந்து புறப்பட்டு கட்டுநாயக்க விமான நிலையத்தில் வந்திறங்கியபோது கைதுசெய்யப்பட்டிருக்கிறார். அதற்கு அடுத்த நாள் - 3ஆம் திகதி - மட்டக்களப்பு, கொக்கட்டிச் சோலை, 9ஆம் வட்டாரத்தைச் சேர்ந்த ஒரு பிள்ளையின் தந்தையான 29 வயதுடைய தாமோதரம் பாஸ்கரன் என்பவர் டுபாயிலிருந்து வந்தபோது அவ்வாறே அங்கு வைத்துக் கைதுசெய்யப்பட்டிருக்கிறார். இதைவிட, கடந்த 2ஆம் திகதி கிழக்குப் பல்கலைக்கழக விரிவுரையாளரான மகேந்திரன் என்பவரின் வீட்டின்மீது பெற்றோல் குண்டுத்தாக்குதல் இடம்பெற்றிருக்கிறது. நான் இதை ஏன் கூறுகின்றேனென்றால், ஓர் ஆட்சி மாற்றத்திற்குப் பிறகு 67ஆவது சுதந்திர தின விழாவை நடத்திய இவ்வேளையில், ஆட்சி மாற்றம் தேவையென்று வடக்கு, கிழக்கிலுள்ள சிறுபான்மை மக்கள் கூடுதலாக வாக்களித்திருந்த நிலைமையில், நிதி அமைச்சர் அவர்கள் புலம்பெயர்ந்து வாழ்கின்ற மக்களுக்கு இங்கு வந்து முதலீடு செய்யுங்களென்று கூறிய பின்னரும் தொடர்ச்சியாக கைதுகள் இடம்பெற்றுக் கொண்டிருக்கின்றன என்பதைச் சுட்டிக்காட்டத்தான். இப்படியான சூழ்நிலையில் புலம்பெயர்ந்து வாழ்கின்ற மக்கள் இங்கு வந்து எவ்வாறு சுதந்திரமாக முதலீடு செய்ய முடியும்? என்பதை நீங்கள் தெளிவுபடுத்த வேண்டும். இவ்வாறான அழுத்தங்களும் கைதுகளும் தொடர்ச்சியாக இடம்பெற்றுக் கொண்டுதான் இருக்கின்றன. இந்த நிலையில்தான் தமிழ் மக்களாகிய நாங்கள் சுதந்திரத்தை அனுபவித்துக் கொண்டிருக்கின்றோம். வடக்கு, கிழக்கில் வாழ்கின்ற தமிழ் மக்கள் நிம்மதியாக, சுதந்திரமாக வாழ முடியவில்லை என்பதை இந்தக் கைதுகளூடாக எங்களால் உணரக்கூடியதாக இருக்கின்றது.

இந்த வரவு செலவுத்திட்டத்திலே பல்வேறுபட்ட நிவாரணங்கள் வழங்கப்பட்டிருக்கின்றன. நாங்கள் அதை ஏற்றுக்கொள்கின்றோம். குறிப்பாக, 13 அத்தியாவசியப் பொருட்களின் விலைகள் குறைக்கப்பட்டிருக்கின்றன. அதையிட்டு, நாங்கள் மகிழ்ச்சியடைகின்றோம். பல்வேறுபட்ட துறையினருக்குச் சம்பள உயர்வுகள் வழங்கப்பட்டிருக்கின்றன. குறிப்பாக, அரச உத்தியோகத்தர்களுக்கு ஐயாயிரம் ரூபாய் சம்பள உயர்வு வழங்கப்பட்டிருக்கின்றது. அது பத்தாயிரம் ரூபாவாக அதிகரிக்கப்படவிருப்பதாகவும் கூறப்பட்டிருக் கின்றது. இவற்றை நாங்கள் வரவேற்கின்றோம். ஆனால், அதிலே இன்னும் பல்வேறுபட்ட திட்டங்கள் உள்ளடக்கப்பட வேண்டியிருக்கின்றன. குறிப்பாக வடக்கு, கிழக்கிலே இருக்கின்ற மக்கள் கடந்த 65 வருடங்களாக அடிமைகளைப் போல வாழ்ந்து வருகின்றார்கள். 30 வருடங்களாக அங்கு ஓர் ஆயுதப் போராட்டமும் இடம்பெற்றது. அந்த ஆயுதப் போராட்டம் 2009ஆம் ஆண்டு மே மாதம் 19ஆம் திகதி முடிவுக்கு கொண்டுவரப்பட்டதாகத் தெரிவிக்கப்பட்டது. அந்த நிலங்களில் இருக்கின்ற மக்களுக்கான அடிப்படை வசதிகளைச் செய்து கொடுக்க வேண்டும்; மீள்குடியேற்றம் செய்துகொடுக்கப்பட வேண்டும். அங்கு போரினால் பாதிக்கப்பட்ட விதவைகளும் மாணவர்களும் அதிகளவில் இருப்பதோடு, பெருமளவான சேதமடைந்த வீடுகளும் புனரமைக்கப்படவேண்டி இருக்கின்றன. அவர்களுக்கென்று பல்வேறுபட்ட தேவைகள் இருக்கின்றன. ஆனால், இந்த வரவு செலவுத்திட்டத்தில் விசேடமாக அவர்களுக்கென எதுவுமே குறிப்பிடப்படவில்லை என்பதை நான் மனவருத்தத்துடன் தெரிவித்துக் கொள்கின்றேன். கடந்த காலத்தில் ஆட்சி மாற்றம் வேண்டுமென்று தமிழ் மக்கள் வாக்களித்தார்கள். அவர்களுக்குச் சார்பாக தமிழ்த் தேசியக் கூட்டமைப்பும் இருந்தது. என்றாலும்கூட, எதிர்பார்த்த விடயங்கள் எதுவுமே இதுவரை நடைபெறவில்லை. அவர்களுக்குத் தேவையான நிவாரணங்களோ, விசேட திட்டங்களோ வழங்கப்படவில்லை.

தொழில்வாய்ப்புக்களைப் பொறுத்தவரையில் வடக்கு, கிழக்கிலே இருக்கின்ற வேலையற்ற பட்டதாரிகளின் எண்ணிக்கை தொடர்ந்தும் அதிகரித்து வருகின்றது. குறிப்பாக மட்டக்களப்பு மாவட்டத்தை எடுத்துக்கொண்டால், 2012ஆம் ஆண்டு காலப்பகுதிவரை பல்வேறுபட்ட பட்டதாரிகளுக்கு வேலைவாய்ப்புக்கள் வழங்கப்பட்டன. ஆனால், இந்த 2012-2013ஆம் ஆண்டுகளிலே பரீட்சைப் பெறுபேறுகள் கிடைக்காததன் காரணமாக ஏறக்குறைய 180 பட்டதாரிகள் விடுபட்டிருக்கிறார்கள். அவர்கள் கடந்த வாரம்கூட மட்டக்களப்பிலே ஒரு கவனயீர்ப்புப் போராட்டத்தை நடத்தியிருந்தார்கள். ஆனால், அவர்களுக்கான வேலை வாய்ப்பு இன்னும் வழங்கப்படவில்லை. இந்த இடைக்கால வரவு செலவுத்திட்டத்திலே வேலைவாய்ப்புக்கள் பற்றி எதுவுமே பரிந்துரைக்கப்படவில்லை. ஆகவே, மட்டக்களப்பு மாவட்டத்திலே விடுபட்ட அந்தப் பட்டதாரிகளுக்கான வேலைவாய்ப்பு பற்றிய விடயமும் இந்த 100 நாள் திட்டத்துக்குள் உள்ளீர்க்கப்பட வேண்டும் என்பதை நான் இவ்விடத்திலே தெளிவாகக் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

இன்று இந்த 100 நாட்களில் 27 நாட்கள் முடிவுற்றிருக்கின்றன. எஞ்சியிருப்பது 73 நாட்கள்தான். 73 நாட்களுக்குள் இந்த வரவு செலவுத்திட்டத்தில் குறிக்கப்பட்ட பல விடயங்கள் அமுலாகுமா? என்கின்ற கேள்வி எங்கள் மத்தியிலே எழுகின்றது. குறிப்பாக, பாராளுமன்ற உறுப்பினர்களுக்கு வழங்கப்படும் ஐந்து மில்லியன் ரூபாய் நிதி, பத்து மில்லியனாக அதிகரிக்கப்பட்டிருக்கின்றது. இந்த 100 நாட்களுக்குள் அந்தப் பன்மடங்கப்படுத்தப்பட்ட நிதியை வழங்க முடியுமா அல்லது வழங்குவதற்கான வாய்ப்பு இருக்கின்றதா என்ற சந்தேகம்கூட எழுந்திருக்கின்றது. இந்த 100 நாட்களுக்குள் அதை வழங்க முடியுமா அல்லது அதற்குப் பிற்பாடுதான் அதை வழங்குவார்களா? என்ற கேள்வியும்

[ගරු පී. අරියනේතන් මහතා]

எழாமலில்லை. ஆகவே, பல தெளிவற்ற விடயங்கள் இந்த வரவு செலவுத்திட்டத்திலே காணப்படுகின்றன. அதை நிவர்த்தி செய்ய வேண்டும் என்பதையும் நான் இவ்விடத்திலே கூற விரும்புகின்றேன்.

இதைவிட சமுர்த்தி நலன்புரித்திட்டம் சம்பந்தமாகப் பல்வேறு வசனங்கள் இதிலே குறிப்பிடப்பட்டிருக்கின்றன. மட்டக்களப்பு வறுமைநிலை கூடிய மாவட்டமாக இருக்கின்றது. அதாவது இது இலங்கையில் இருக்கின்ற எல்லா மாவட்டங்களையும்விட கூடிய வருமானமற்ற அல்லது வறுமை கூடிய மாவட்டமாக இருக்கின்றது. ஆனால், சமுர்த்தி நலன்புரித் திட்டங்களைப் பொறுத்தவரையில் அங்கே சமுர்த்தி குடும்பங்களைக் குறைப்பதற்கான நடவடிக்கை மேற்கொள்ளப்படுகின்றது. அதாவது எந்தவொரு சரியான பரிசீலனையும் இல்லாமல், சரியான ஒரு வழிநடத்தலும் இல்லாமல், தாங்கள் விரும்பியபடி மட்டக்களப்பு சமுர்த்தி காரியாலயம் ஊடாக சமுர்த்தி முத்திரைகளைக் குறைக்கின்றார்கள். அங்கு இந்த சமுர்த்தி முத்திரையை குறைப்பதற்கான நோக்கம் மட்டக்களப்பு வறுமை கூடிய மாவட்டம் என்ற நிலையை மாற்றியுள்ளதாகக் காட்டுவதற்காகும். அதாவது, அங்கு சமுர்த்தி முத்திரைகளை வெட்டிவிட்டால் அந்த மக்கள் வறுமை நீங்கி முன்னேறியிருக்கின்றார்கள் என்றும் அது வறுமையற்ற மாவட்டமாக இருக்கின்றது என்றும் காட்டுவதற்கான நடவடிக்கைகள்தான் மட்டக்களப்பில் மேற்கொள்ளப் படுகின்றதே தவிர, சமுர்த்தி வழங்குவதற்கான குடும்பங்களை உண்மையாகவே இனங்கண்டு கொள்வதற்கு அங்கு பரிசீலனை செய்யப்படவில்லை. நான் இதை சமுர்த்திக்குப் பொறுப்பான அமைச்சர் அவர்களிடம் கூற வேண்டும் என்று நினைத்தேன். ஆனால், இப்பொழுது அமைச்சர் அவர்கள் இங்கு இல்லை. ஆகவே, சமுர்த்தி வெட்டப்பட்ட அந்தக் குடும்பங்களுக்கு மீண்டும் சமுர்த்தி நிவாரணங்கள் வழங்கப்பட வேண்டும். ஏனைய மாவட்டங்களுடன் ஒப்பிடுகின்றபோது வடக்கு, கிழக்குப் பகுதிகள் போரினால் தொடர்ச்சியாகப் பாதிக்கப்பட்டுப் பல இன்னல்களைக் கண்டுள்ள பிரதேசங்களாகும். அங்குள்ள மக்கள் வறுமையினால், இயற்கை அனர்த்தங்களினால், போரினால் மிகவும் பின்தங்கிய நிலையில் காணப்படுகின்றார்கள். இவ்வாறான நிலையில் திடீரென்று அங்கு சமுர்த்தி முத்திரை வெட்டப்படுவதன் காரணமாக அந்த மக்கள் மீண்டும் அந்த வருமானத்தை எய்த முடியாதிருக்கின்றார்கள்.

இந்த வரவு செலவுத்திட்டத்தில் கால்நடை வளர்க்கின்றவர்களின் நலன் கருதி பால் விலை அதிகரிக்கப்பட்டிருப்பது வரவேற்கத்தக்க விடயமாக இருக்கின்றது. ஆனால், மட்டக்களப்பு மாவட்டத்தைப் பொறுத்தமட்டிலே அங்கு ஏறக்குறைய மூன்று இலட்சம் மாடுகள் இருக்கின்றன. இந்த மூன்று இலட்சம் மாடுகளும் அந்த மாவட்டத்திலுள்ள வெல்லாவெளி, பட்டிப்பளை, வவுணதீவு, ஏறாவூர், செங்கலடி, வாகரை போன்ற இடங்களில் இருக்கும் மேய்ச்சல் தரைகளில் மேயவிடப்படுகின்றன. ஆனால், அந்த மேய்ச்சல் தரைகளிலே பசுக்களை மேய்த்த மாட்டுப் பண்ணையாளர்கள் 18 பேர் கடந்த வாரம் வன இலாகாவினால் கைதுசெய்யப்பட்டு இப்பொழுது பிணையில் விடப்பட்டிருக்கின்றார்கள். அங்கு மாடுகளை வளர்ப்பதற்கான மேய்ச்சல் தரைகள் உரிய முறையில் ஒதுக்கப்பட வேண்டும் என்பதை நாங்கள் கடந்த அரசாங்க காலத்திலும் பலமுறை கூறியிருந்தோம். ஆனால், இன்னமும் அதனைக் கணக்கில் எடுக்காத ஒரு நிலையே காணப்படுகின்றது. ஆகவே, இந்த விடயத்தில் கவனம் செலுத்துதல் வேண்டும். மட்டக்களப்பு மாவட்டத்திலே இருக்கின்ற கால்நடைப் பண்ணையாளர் களுக்கு அந்த மேய்ச்சல் தரைகளைச் சரியான முறையில் ஒதுக்கிக் கொடுத்தால் மட்டும்தான் அவர்கள் அங்கு மாடுகளை வளர்த்துத் தொடர்ச்சியாகப் பாலுற்பத்தியை மேற்கொள்ளக் கூடியதாக இருக்கும் என்பதை நான் இவ்விடத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

அடுத்ததாக, ஊனமுற்ற படையினருக்காகப் பல விசேட திட்டங்கள் இதிலே சேர்க்கப்பட்டிருக்கின்றன. ஆனால், வடக்கு, கிழக்கிலே போரினால் பாதிக்கப்பட்டு வாழ்ந்து கொண்டிருக்கின்ற மாற்றுத்திறனாளிகள் சம்பந்தமாக எந்தவொரு விசேட திட்டங்களும் இந்த வரவு செலவுத்திட்டத்திலே சேர்க்கப்படவில்லை. இந்த நிலைமையானது மஹிந்த ராஜபக்ஷவினது அரசாங்கமாயினும் சரி, மைத்திரிபால சிறிசேனவினது அரசாங்கமாயினும் சரி வடக்கு, கிழக்கு தமிழ் மக்களைப் புறக்கணிக்கும் நிலை தொடர்ந்துகொண்டிருக்கின்றது என்பதைக் காட்டுவதாக உள்ளது. ஆகவே, இந்தப் புறக்கணிப்பு என்பது தொடராமல் நல்லிணக்கமுள்ள அரசாங்கமாகச் செயற்பட வேண்டுமென்று கேட்டுக்கொள்கிறேன்.

இறுதியாக, நான் இன்னுமொரு விடயத்தைக் கூற வேண்டும். எனக்கு முன்னர் பேசிய முன்னாள் விளையாட்டுத்துறை அமைச்சர் அவர்கள் என்னைப் பற்றிச் சில விடயங்களைக் கூறியிருந்தார். அதாவது, அவர் என்னை அரசாங்கத்தின் பக்கம் வருமாறும் அதற்காகப் பணம் தருவதாகவும் என்னிடம் முன்னர் கேட்டிருந்த விடயத்தை நான் அண்மையில் வெளிப்படுத்தியிருந்தேன். "அந்த விடயத்தைப்பற்றி ஏன் நீங்கள் முன்னர் கூறவில்லை? இப்பொழுது கூறுவதற்குக் காரணம் என்ன?" என்று அவர் கேட்டார். இதனை நான் முதலில் கூறியிருந்தால், அப்போதிருந்த அரசாங்கம் இராணுவப் புலனாய்வாளர்களை வைத்து எவ்வாறான நடவடிக்கைகளை எடுக்கும் என்று தெரிந்த காரணத்தால் நான் அப்போது அதைக் கூறவில்லை. ஆனால், அவர் உண்மையாகவே அவ்வாறு என்னைக் கேட்டிருந்தார். இப்பொழுது அவர் எந்த நடவடிக்கையெடுத்தாலும் அதற்கு முகங்கொடுக்க நான் தயாராக இருக்கிறேன். கடந்த அரசாங்கமானது இவ்வாறான நடவடிக்கைகளை மேற்கொண்டு அநாகரிகமான முறையில்தான் செயற்பட்டது. ஒரு தடவை வரவு செலவுத்திட்டத்திற்கு ஆதரவாக என்னை வாக்களிக்கச் செய்வதற்காக எனது அண்ணனைப் பணயக் கைதியாகத் தடுத்து வைத்து நடவடிக்கை மேற்கொண்டார்கள். இவ்வாறான அடாவடித்தனமான ஓர் அரசாங்கம்தான் முன்னர் செயற்பட்டது என்று கூறி, விடைபெறுகின்றேன். நன்றி.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ. භා. 3.49]

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
විනාඩි 20යි. ඒක ඔබතුමා බලන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව මේ රටේ සමස්ත මූල්‍යකරණය පිළිබඳ පූර්ණ බලය තිබෙන්නේ අපේ පාර්ලිමේන්තුවට. මේ පාර්ලිමේන්තුවේ ඉදිරිපත් කරන අය වැය ලේඛනය හෝ අය වැය සංශෝධන රටේ සමස්ත නිමැවුම, ආදායම, සේවා නියුක්තිය, මිල මට්ටම, ගෙවුම් ශේෂය, ඉතුරුම්, ආයෝජනය වැනි සාර්ව ආර්ථික විචල්‍යයන් කෙරෙහි ඉතා බරපතළ ලෙස බලපෑම් ඇති කරන අතර, මේ රටේ නිරායුධ, අවිහිංසක ලක්ෂ සංඛ්‍යාත මිනිසුන්ගේ ජීවිතවලට සෘජුව බලපෑම් කරනවා. ඒ නිසා හොඳ යෝජනා සියල්ලට සහාය දෙමින්, ආර්ථික විද්‍යාත්මක වශයෙන් මා දකින කරුණු කිහිපයක් පිළිබඳ මේ ගරු සභාවේ අවධානයට යොමු කරන්නට මම බලාපොරොත්තු වෙනවා.

රාජ්‍ය මූල්‍ය කළමනාකරණය හා ප්‍රතිපත්තිවල වරදින් අපේ රටේ ඉතිහාසයේ ප්‍රථම වතාවට එකම වතාවක් ආර්ථිකය කඩා වැටිලා තිබෙනවා. මේ කතා කරන සමහර අය නිකම් ආර්ථිකය කඩා වැටීම් කිව්වාට කවදාවත් ලංකාවේ ආර්ථිකය එහෙම කඩා වැටිලා නැහැ. 2001 වර්ෂයේදී පමණක් ලංකාවේ ආර්ථිකය ආපස්සට ගමන් කළා; සෘණ 1.3ක් බවට පත් වුණා. ඒ අවස්ථාවේදී මේ ආර්ථිකය ධන බවට පත් කිරීම සඳහා එක්සත් ජාතික පෙරමුණු රජය යටතේ රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නායකත්වයෙන් දින සියයේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා. ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන කොට මම ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ කැබිනට් ඇමතිවරයා වශයෙන් හා මුදල් නියෝජ්‍ය අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළා. ඒ අවස්ථාවේ මුදල් අමාත්‍යතුමා ලෙස කටයුතු කළේ ගරු කේ.එන්. චොක්සි මැතිතුමා. මෙතුමා අද දින අභාවප්‍රාප්ත වෙලා තිබෙනවා. අපේ ආගමේ හැටියට ප්‍රථමයෙන්ම මම එතුමාට නිවන් සුව පතනවා; වැදගත් මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත වැනි පනතක් ගෙනෙන්නට දායක වුණු මුදල් අමාත්‍යවරයා හැටියට.

ඒ කාලපරිච්ඡේදය තුළදී වාගේම ලංකා ඉතිහාසයේ ඊට වඩා විශාල අභියෝග රාශියකට මුහුණ දුන් මුදල් අමාත්‍යවරයා; රාජ්‍ය නායකයා වන්නේ මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා. ලංකාවේ කිසිම රාජ්‍ය නායකයෙක් මුහුණ නොදුන් ප්‍රධාන අභියෝග පහකට එතුමා මුහුණ දුන්නා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2005 වර්ෂයේදී සුනාමි බෙදාවාරකයෙන් විනාශ වුණු රටක් එතුමා භාර ගත්තේ. ඒ නිසා සුනාමියෙන් විනාශ වූ මනුෂ්‍ය ජීවිත හැර අනෙක් සියලු දේ යළි තිබුණු තත්ත්වයට පත් කිරීම සඳහා විශාල අභියෝගයකට එතුමන් මුහුණ දුන්නා. දෙවැන්න, මුහුදු වෙරළෙන් තුනෙන් දෙකක්, මහ පොළොවෙන් තුනෙන් එකක් වෙනම රටක් ලෙස කඩා ගැනීම සඳහා තීරණාත්මක ලෙසින් එල්ටීටීඊ මිනීමරු ත්‍රස්තවාදී යුද්ධය ඇවිල්ලා තිබුණා. තුන්වනුව, තෙල් බැරලයක් ඩොලර් 127ට ඉහළ ගිහිල්ලා ලෝක ඛනිජ තෙල් අර්බුදයක් ඇති වෙලා තිබුණා. හතරවනුව, අවුරුදු තිහකට පසුව ලෝකයේ ඇති වන දැවැන්තම ආහාර අර්බුදය ඇති වීමෙන් ලෝක ජනතාවට කෑම නැති වුණා. පස්වනුව, එක්සත් රාජධානියේ ලීමන් බ්‍රදර්ස් කඩා වැටිලා, ඊළඟට මියුවුවල් බැන්ක් වාගේ ඒවා කඩා වැටිලා, -කාඩ් කුට්ටමක් පෙරළෙනවා වාගේ- ලෝකයේ රටවල දැවැන්ත ආර්ථික අවපාතයක් ඇති වුණා. මෙවැනි දැවැන්ත අර්බුද පහකට මුහුණ දීලා අය වැය ලේඛනය ඉදිරිපත් කළ ලංකාවේ එකම මුදල් අමාත්‍යවරයා මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා කියන එක අපි මතක් කර ගනිමු.

මේ රජය පත් වෙන කොට යුද්ධය නිම වෙලා තිබෙනවා. ඛනිජ තෙල් අර්බුදය නැති වෙලා තිබෙනවා. ආහාර අර්බුදයක් තිබුණේ නැහැ. රටේ යුද්ධය නිම කරලා, රටේ යටිතල පහසුකම් ඇති කරලා, සියයට 7ක වාගේ වර්ධන වේගයක් තිබෙන පහසු පසු බිමක් යටතේ විශාල ලෙස ජනතාවට සහන දෙන අය වැය ලේඛනයක් තමයි 2015 වසරට ඉදිරිපත් කළේ. ඉදිරිපත් කළ අය වැය ලේඛනයමයි මේ ඉදිරියට ගෙන යන්නේ. එය මේ පාර්ලිමේන්තුවේ සාකච්ඡා කරලා, කාරක සභාව රැස් වෙලා, කථානායකතුමාගේ අත්සන් තැබීමෙන් පසු රටේ ලිඛිත නීතියේ කොටසක් බවට පත් වෙලා තිබෙනවා.

එදා මහින්ද රාජපක්ෂ මහතා 2015 වර්ෂයට ඉදිරිපත් කරලා තිබුණු වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යාම සඳහා යම් කිසි කුඩා සංශෝධනයක් පමණයි අද මේ රජය ඉදිරිපත් කරන්නේ. මහින්ද රාජපක්ෂ හිටපු මුදල් අමාත්‍යවරයා ඉදිරිපත් කළ 2015 වැඩසටහන සඳහා වන ගැළපුම් කිහිපයක් රවි කරුණානායක නව මුදල් අමාත්‍යවරයා කර තිබෙනවා. ඒ ගැළපුම් කිරීමේදී මොකක්ද වෙලා තිබෙන්නේ? එදා සැලසුම් කර තිබුණු සමස්ත ආදායම රුපියල් බිලියන 1,654යි. අද රුපියල් බිලියන 1,592 යි. ඒ කියන්නේ රටේ බදු හා බදු නොවන සමස්ත ආදායම බිලියන 62කින් අඩු වෙලා තිබෙනවා.

අනෙක තමයි වියදම. වියදම ගත්තොත් සැලසුම් කළ පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම බිලියන 2210යි. දැන් බිලියන 2121යි. වියදම බිලියන 89කින් අඩු වෙලා තිබෙනවා. ආදායම අඩු වෙලා තිබෙනවා. වියදම බිලියන 89කින් අඩු වෙලා තිබෙනවා. වියදම් අඩු කිරීමේදී රජයක් එදිනෙදා පවත්වාගෙන යාමේදී දැරිය යුතු වන, නැවත නැවතත් දැරිය යුතු වන, දරනු ලබන වියදමේ ප්‍රතිඵලය වියදම දරන කාලපරිච්ඡේදයට පමණක් සීමා වන පුනරාවර්තන වියදම් - Recurrent Expenditure - වැඩි වෙලා තිබෙනවා. කොච්චරකින්ද? පුනරාවර්තන වියදම සැලසුම් කළේ, බිලියන 1525යි. දැන් බිලියන 1612යි. බිලියන 87කින් පවත්වාගෙන යාමේ වියදම වැඩි වෙලා තිබෙනවා. එසේ නම් සමස්ත වියදම අඩු වුණේ කෙසේද? සමස්ත වියදම අඩු කරපු තැනදී, රටේ නිමැවුම පහත නොවැටී පවත්වා ගෙන යාම සඳහාත්, නිමැවුම තව දුරටත් වැඩි කිරීම සඳහාත්, යටිතල පහසුකම් හා අනෙකුත් ප්‍රාග්ධන භාණ්ඩ අත් පත් කර ගැනීම සඳහා දරන වියදමට කියනවා, රාජ්‍ය ආයෝජනය -ප්‍රාග්ධන වියදම- කියලා. ප්‍රාග්ධන වියදම තමුන්නාන්සේලා මේ විධියට කපලා තිබෙනවා. ප්‍රාග්ධන වියදම ලෙස මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ රජයේ අය වැය ලේඛනයෙන් බිලියන 696ක් වෙන් කළා. දැන් වෙන් කරලා තිබෙන්නේ බිලියන 520යි. එතැනින් බිලියන 76ක් අඩු කරලා තිබෙනවා. එතකොට පුනරාවර්තන වියදම වැඩි කරලා ප්‍රාග්ධන වියදම, රටේ අනාගත සංවර්ධනයට තිබෙන වියදම කපා හැරීමක් තුළින් තමයි මේ ගැළපුම කරලා තිබෙන්නේ. අනෙකුත් වියදම් බිලියන 11ක් කපලා තිබෙනවා. එතකොට ප්‍රාග්ධන වියදම් බිලියන 76ක් අඩු වෙලා තිබෙනවා.

ඊළඟට අනෙකුත් වියදම් බිලියන 11ක් අඩු වෙලා තිබෙනවා. එතකොට බිලියන 87යි. ඒ බිලියන 87න් තමයි වර්තන වියදමේ වැඩි වීම ඉවත් කරගෙන තියෙන්නේ. ඒ ආදායම අඩු වීමත්, වියදම අඩු වීමත් තුළ මේ අය වැය ලේඛනය සකස් කිරීමේදී ලෝක බැංකුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි අනෙකුත් ණය දෙන ආයතන හා වෙනත් ජාත්‍යන්තර සම්බන්ධතා සමඟ සාකච්ඡා කරන නිසා ඒ උපදේශකයෝ උපදෙස් දීලා තිබෙනවා, ප්‍රධාන සාධකය වන අය වැය පරතරය ඉහළ නංවන්න එපාය කියලා. ඒ අනුව අය වැය පරතරය තමුන්නාන්සේලා තව දශම දෙකකින් අඩු කළ යුතු වනවා. පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් වෙන්නේ නැතිව මේ අය වැය පරතරය මෙලෙසින් පවත්වා ගෙන යන්න හැකියාව ලැබුණොත් රටේ ජනතාවගේ ජීවන වියදමේ පීඩනය අඩු වෙනවා. එසේ කළ නොහැකි වුණොත් මේ අය වැය ලේඛනයෙන් මතු පිටට පෙනෙන්න දැනට මේ කියන බොහොම සුන්දර කථා සහනයක් ලෙස පෙනුණත් ඒක හරියට හොරි කාරයකුගේ තත්ත්වය වාගෙයි. හොරි කියන රෝගය හැදුණාම කසන කොට

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

සනීපයක් තිබෙනවා. පසුව තමයි දැවිල්ල හැදෙන්නේ. ඒ නිසා කසන කොට සනීපයක් තිබෙන, පසුව දැවිල්ල හැදෙන අතුරු අය වැයක් බවට මෙය පත් නොවේවා කියලා මා ප්‍රාර්ථනා කරනවා.

තමුන්නාන්සේලා දන්නවා රාජ්‍ය සේවකයින් ලක්ෂ 14ක් ඉන්නා බව. පෞද්ගලික අංශයේ සේවකයින් ලක්ෂ හැටක් ඉන්නවා. රාජ්‍ය සේවකයන්ගේ ප්‍රමාණය කුඩායි. අතිමහත් බහුතර පිරිස ජීවත් වීම සඳහා ජීවනෝපාය සලසා ගන්නේ පෞද්ගලික අංශයෙනුයි. හැටලක්ෂයක් ඉන්නේ පෞද්ගලික අංශයේයි. රාජ්‍ය සේවකයන්ගේ වැටුප රුපියල් 10,000කින් වැඩි කරනවා. ඒක හොඳයි. අපේ ආණ්ඩුවක් තිබෙනවා නම් රුපියල් 20,000කින් වැඩි කර දෙන්න පුළුවන් නම් අපි දෙනවා. නමුත් ආර්ථික විද්‍යාත්මකව ලෝකයේ සිද්ධාන්තයක් තිබෙනවා, වැටුප් වැඩි වෙන කොට ඉල්ලුම වැඩි වෙනවා කියා. සමහර වෙලාවට aggregate demand එක වැඩි වුණත් සමස්ත සැපයුම වැඩි වෙන්නේ නැහැ. එතකොට බඩු මිල වැඩි වෙනවා. බඩු මිල වැඩි වෙන කොට යළිත් වැටුප් වැඩි කරන ලෙස උද්ඝෝෂණ ඇති වෙනවා. උද්ඝෝෂණ ඇති වුණාම නැවත වැටුප් වැඩි කරනවා. බඩු මිල පසුපස වැටුපත්, වැටුප පසුපස බඩු මිලත් හඹා යාමෙන් වැටුප් දබර උද්ධමනයක් ඇති වෙනවා. Wage සර්පිලයක් ඇති වෙනවා. ඒ තුළින් සමස්ත මිල මට්ටම් අසාමාන්‍ය ලෙස ඉහළ යන නිසා තමයි "වැටුප් වැඩි කරපියව්!" කියලා උද්ඝෝෂණ ඇති වුණාට, ආණ්ඩු "හිටපියව්! එහෙම දෙන්නම්" කියලා දෙන සිරිතක් මූල්‍ය කළමනාකරණයේ නැත්තේ. ඒ නිසා තමයි මේකට වෙනම සාස්තරයක්, විද්‍යාවක් තිබෙන්නේ. ඒ විද්‍යාවක් නැතිව දේශපාලනීකරණය වීම සම්බන්ධයෙන් පළමුවැනි වතාවට අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා වෙත රජයේ වෛද්‍යවරුන්ගේ සංගමය - GMOA එක- ලිපියක් ලියලා තිබෙනවා. මා ඒ ලිපිය **සභාගත*** කරනවා.

එහි අන්තිම ඡේදය විතරක් මා කියවන්නම්. එහි මෙසේ සඳහන් වනවා:

> "කෙසේ නමුත් පසු ගිය මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයට සමගාමී "දින 100 වැඩ සටහනේ" අංක 01 අනුව සියලු රජයේ සේවකයින්ට රුපියල් 10,000කින් නියමිත ක්‍රමවේදයකින් තොරව පඩි වැඩිවෙන බව දන්වා ඇත. මෙමඟින් ජාතික වැටුප් ප්‍රතිපත්ති සංකල්පය උල්ලංඝනය වනු ඇත. ජනවාරි 29 වෙනිදාට යෙදෙන අතුරු අය වැයෙන් රජයේ මෙන්ම විපක්ෂයේද "ප්‍රතිපත්ති මත පදනම් වූ දේශපාලනයකට" මුල පුරන මේ අවස්ථාවේදී වැටුප පිළිබඳ දැනට තිබෙන ජාතික ප්‍රතිපත්තිය උල්ලංඝනය නොකර යුතු බව අපි පෙන්වා දෙමු. එබැවින් මේ පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ජනවාරි 29 වෙනි දිනට පෙර අවස්ථාවක් ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමු."

රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ ලේකම්, වෛද්‍ය ලසන්ත ජිනදාස මහතා තමයි අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා, මුදල් අමාත්‍ය රවි කරුණානායක මහතා, සෞඛ්‍ය අමාත්‍ය රාජිත සේනාරත්න මහතා හා විපක්ෂ නායක නිමල් සිරිපාල ද සිල්වා මහතා ඇතුළු අයට මේ ලිපිය එවලා තිබෙන්නේ. ජාතික වැටුප් ප්‍රතිපත්ති සංකල්පය දේශපාලනීකරණය මත වෙනස්වීමේ ප්‍රශ්නය පිළිබඳව ප්‍රබුද්ධ ලෙස මේ වාගේ ගරු සභාවක විද්වත් සංවාදයකට එළඹෙන්න කියන එක තමයි මේ රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයෙන් ඉල්ලා තිබෙන්නේ.

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

තමුන්නාන්සේලා දක්වා තිබෙන ආකාරයට මේ වැටුප් වැඩි කිරීමට රුපියල් බිලියන 89ක් අතිරේකව අවශ්‍යයි. එය සපයා ගන්නේ කෙසේද කියලා මම සඳහන් කරන්න කැමැතියි. සුපිරි ලාභ බද්දෙන් රුපියල් බිලියන 50යි. සුපිරි ලාභ බද්ද කියන්නේ, රුපියල් බිලියන 2කට වඩා වැඩියෙන් ශුද්ධ ලාභයක් තිබෙන සමාගම්වල ගිය අවුරුද්දේ ශුද්ධ ලාභයෙන් සියයට 25ක් බදු විධියට අය කර ගැනීම. රුපියල් බිලියන 2ක ශුද්ධ ලාභයක් තිබෙන සමාගමකින් රුපියල් මිලියන 500ක් එක වර ගන්නවා. ලංකා ඉතිහාසයේ කවදාවත් මෙහෙම බද්දක් අය කරලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහින්ද රාජපක්ෂ හිටපු මුදල් අමාත්‍යතුමා අය වැය ලේඛනය ඉදිරිපත් කරලා අවසන් වූ අවස්ථාවේදී අපි මේ පාර්ලිමේන්තුවෙන් යන කොට ලංකාවේ ඉන්න ඔක්කෝම qualified chartered accountantsලා, Ernst & Young, Coopers & Lybrand වාගේ accountancy firmsවල ඉන්න ඔක්කෝම ගණකාධිකාරිවරුන් රැ එළි වෙනකල් එය තමන්ගේ සමාගම්වල ඉදිරි අය වැය ලේඛනයට බලපාන ආකාරය පිළිබඳ විශ්ලේෂණයක් කරනවා. රැ එළි වෙනකල් ඒ විශ්ලේෂණය කරලා ඒ පිළිබඳ වාර්තාවක් හදලා, සියලුම ප්‍රධාන සමාගම්වලට එහි පිටපත් බෙදා හරිනවා. එතකොට තමයි ඔවුන් ඊළඟ අවුරුද්දේ තමන්ගේ ව්‍යාපාර අය වැය ලේඛනය - business budget එක, ව්‍යාපාර මුදල් ලේඛනය- සකස් කරන්නේ. ප්‍රධාන සමාගම් මොනවාද? MAS Holdings සමාගම එකක්. එහි කී දහසක් රක්ෂාව කරනවාද? එය 70,000ක් ජීවනෝපාය සලසා ගන්නා සමාගමක්. ඩයලොග් සමාගම, ලංකා බැංකුව, මහජන බැංකුව, හේලීස් සමාගම ආදී මේ වාගේ ප්‍රධාන සමාගම් අපනයන ආදායමට එකතුවක් කරනවා; රටේ නිෂ්පාදනයට එකතුවක් කරනවා; දස දහස් ගණන් පිරිස්වලට රක්ෂා දෙනවා. කිසිදු වග විභාගයකින් තොරව එක පාරට හදිසියේ මේ අයගේ පොකට්ටුවෙන් රුපියල් බිලියන 50ක බද්දක් අය කළාම, පෞද්ගලික අංශයේ සියලුම ප්‍රධාන ආයෝජකයෝ දෙවරක් හිතනවා. මේ ආණ්ඩුව ගැන ඒ සියලුම ආයෝජකයෝ හිතලා තිබෙන්නේ ඉඳලා බලමු - "wait and see" - කියන විධියටයි. එක්සත් ජාතික පක්ෂය පෞද්ගලික අංශයේ ආරක්ෂකයෝ ලෙසයි සිටියේ.

අපි කැමැති වුණත් නැතත්, මේ රට කරන කොට රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය, සමුපකාර අංශය කියලා අංශ තුනක් තිබෙනවා. මේ අංශ තුනම පිළිබඳව තුලනාත්මක විග්‍රහයක යෙදෙන්නේ නැතිව, මැතිවරණයක් දිනන්න දේශපාලන වාසි තකා පමණක් රාජ්‍ය මූල්‍ය මෙහෙයවනවා නම්, එහි ප්‍රතිඵලය භයානක වෙනවා කියලා විතරයි මට කියන්න පුළුවන්කම තිබෙන්නේ. 2015.02.05වන දින "DailyFT" පුවත් පතේ මුල් පිටුවෙහි පළ වූ ලිපියක් හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා මම **සභාගත*** කරනවා.

එහි සඳහන් වෙනවා, මේ අතුරු අය වැය ඉදිරිපත් කළාට පස්සේ ලංකාවේ කොටස් වෙළෙඳ පොළේ - stock market එකේ- value එක විතරක් රුපියල් බිලියන 168කින් පහළ ගිහිල්ලා තිබෙනවා කියලා. ලංකාවේ කොටස් වෙළෙඳ පොළ කඩා වැටිලා තිබෙනවා. එක සමාගමක විතරක්, රුපියල් බිලියන 20ක්. කල්පනා කරන්න. මොකද, තමුන්නාන්සේලාට රක්ෂා 70,000ක් දෙන්න බැහැ; රක්ෂා 100,000ක් දෙන්න බැහැ. මේ සමාගම්වලට ආයෝජනය කරන කොට ආයෝජකයා බිය වෙනවා. ඇයි? එක්වරම රුපියල් බිලියන 50ක් සල්ලි තිබෙන තැන් දැකලා අය කරනවා. අග්‍රාමාත්‍යතුමා කිව්වා මේක "සරදියල් බජට්" එකක් කියලා. අපි වැඩි එක්කෙනාගෙන් අරගෙන අඩු එක්කෙනාට

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

දෙනවා කියලා කිව්වා. ඒක හොඳයි. හැබැයි, එක්සත් ජාතික පක්ෂයේ අග්‍රාමාත්‍යවරයා පිළිබඳව -රනිල් වික්‍රමසිංහ මහතා පිළිබඳව- මෙච්චර කල් මේ රටේ පෞද්ගලික අංශය තබා තිබුණු විශ්වාසය රවි කරුණානායක මැතිතුමා හා රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ අය වැය ලේඛනය නිසා සම්පූර්ණයෙන්ම බිඳ ගත්තාය කියන එක තමයි මට පෞද්ගලිකව, අවංකව සිතෙන සිතුවිල්ල. මොකද, සමහර සමාගම්වලට මේ බර දරන්න බැහැ. අවශ්‍යයෙන්ම ඔවුන් තමන්ගේ රක්ෂා ප්‍රමාණය අඩු කරනවා. රාජ්‍ය අංශයේ වැටුප වැඩි කරන කොට පෞද්ගලික අංශයේ පඩිය රුපියල් 2,500කින් වැඩි කරන්න කියලා ඉල්ලීමක් කළා. එහෙම කරන්න ඕනෑ. මොකද, හැටලක්ෂයක් රක්ෂා කරන්නේ එතැනයි. පෞද්ගලික අංශයේ රක්ෂා ප්‍රමාණය වැඩි කරන කොට, සුළු පරිමාණයේ, මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවෝ විශාල ප්‍රමාණයක් ඉන්නවා. ඔවුන්ගේ භාණ්ඩයක නිෂ්පාදන පිරිවැය හැදෙන්නේ වැටුප්, බදු කුලී, ලාභ, පොලිය කියන මේ සාධක හතරේ එකතුවෙන්. එතකොට වැටුප් බිල වැඩි වෙනවා; නිෂ්පාදන වියදම් - cost of production - වැඩි වෙනවා. පිරිවැයේ තල්ලුවෙන් ඇති වන උද්ධමනයකට තමයි අනාගත කාලයේදී මුහුණ දෙන්න සිද්ධ වෙන්නේ. පෞද්ගලික අංශයේ විවිධ ආයතන වැඩ වර්ජනය කරන කොට, ඔවුන් ඒ වැඩි කළ මුදල ඉල්ලා සිටින කොට පෞද්ගලික අංශය හිතනවා වැඩි වන වැටුප ගෙවීම සඳහා සේවකයෝ 10දෙනා ඉන්න තැනින් සේවකයෝ දෙන්නෙක් ඉවත් කරනවා කියලා. එතකොට 8දෙනායි සේවා කරන්නේ. විරැකියාවේ ප්‍රතිශතය තනි ඉලක්කමේ සංඛ්‍යාවක් කරලා තිබුණු රටේ පෞද්ගලික අංශයෙන් සහ රාජ්‍ය අංශයෙන් නැවත වතාවක් විරැකියාවේ ගොඩට එකතු වන ප්‍රමාණය පිළිබඳව තමුන්නාන්සේලාට තේරුම් ගන්න පුළුවන් වෙන්නේ 2015 දී නොවෙයි; 2016 දීයි. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් ඉතාමත් අමාරුවෙන්, ඉතාම තරගකාරී වටපිටාවක් යටතේයි කටයුතු කරන්නේ. ඒ නිසා ඔවුන් ගැන මීට වඩා හිතන්න තිබුණා කියන එක තමයි මම කල්පනා කරන්නේ. නමුත් එහෙම හිතලා නැහැ.

දෙවැනි එක, මෝටර් වාහන ආනයන බද්ද රුපියල් බිලියන 7කින් වැඩි කරලා තිබෙනවා. මෙතෙක් පැහැදිලිවම හයිබ්‍රිඩ් වාහනවලින් ජනයාට සහනයක් තිබුණා. එකක් ඉන්ධන පිරිමැස්මක් තිබෙනවා. තව එකක් තමයි එම වාහන පරිසරයට හිතකරයි. ඒ බදු වැඩි කිරීම නිසා එම වාහන රුපියල් ලක්ෂ හයහමාරකින්, ලක්ෂ අටහමාරකින්, ලක්ෂ දහයකින් වැඩි වෙනවා. වැඩි වෙලා ජපන් වාහන වෙළෙඳ පොළ ඉන්දියන් මරුටි වෙළෙඳ පොළක් බවට පරිවර්තන කිරීම තමයි මෙම අය වැයේ යටි අරමුණ බවට පත් වෙලා තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි, මහා පරිමාණයේ ආනයනකරුවන්ට රුපියල් මිලියන 1.5ක ආනයන බලපත්‍ර ගාස්තුවක් පනවලා තිබෙනවා. මේ ආනයන බලපත්‍ර ගාස්තුව සාධාරණද කියලා කල්පනා කරලා බලන්න. සමහර අය තමන්ගේ පෞද්ගලික වියදමින් තනි වාහනයක් ගේනවා. මාසෙකට වාහන දෙකක් ගෙනැල්ලා අළෙවි කර ගන්න අය ඉන්නවා. සමහර අය මාසෙකට වාහන 5යි ගේන්නේ. සමහර අය මාසෙකට වාහන 10යි ගේන්නේ. සමහර අය විතරයි මාසෙකට වාහන 100, 200 ගේන්නේ. කල්පනා කරන්න, රුපියල් 125,000ක මාසික බද්ද නිසා එක වාහනයක් ගේන කෙනාගේ වාහනයේ මිල රුපියල් 125,000කින් වැඩි වෙනවා. වාහන දෙකක් ගේන කෙනාගේ බද්ද රුපියල් 62,500ක් වෙනවා. වාහන 100ක් ගේන කෙනාගේ බද්ද වෙන්නේ රුපියල් 1,250යි. එතකොට කොහොමද වාහන ලෝකයේ තරග කරන්නේ? කල්පනා කරන්න. ඒක නිසා මේ වාහන බද්ද ඉවත් කරන්න කියා මා කියනවා.

දැන් සමහර ව්‍යාපාරිකයෝ කථා කරනවා, ඒ කට්ටිය එකට එකතු වෙලා -පල්ලිය විසින් එකතු කරලා- ඒ අනුව අපි තනි බලපත්‍රයක් අරගෙන වාහන ගෙනෙමු කියලා. එහෙම එකතු වෙන්නෙත් නැහැ. විශේෂයෙන් online businesses කරන අය තමන් රහසිගතව වාගේ තමයි ඒ ව්‍යාපාරය කරගෙන යන්නේ. වාහනයක් දෙකක් ගෙනැල්ලා, පොඩි ලාභයක් තියාගෙන ඒක විකුණලා, ඊළඟට වාහන 3ක් ගෙනැල්ලා ව්‍යාපාර කරනවා. මේ වාගේ කටයුතු කරන දහස් ගණනක් ඉන්නවා. මහා පරිමාණයේ සමාගම් කිහිපයක වුවමනාවට, තමුන්නාන්සේලාට උදව් කළ කිහිප දෙනෙකුට සහන සලසන්න ආනයන බලපත්‍ර සඳහා බදු අය කිරීම පිළිබඳව නැවත හිතා බලන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඊළඟට බලන්න, කැසිනෝ නැතිවෙයි කියලා මිනිස්සු හිතුවා. මිනිස්සු හිතුවේ ඔබතුමන්ලා කථා කරපු විධියට මේ ආණ්ඩුව ඇවිල්ලා පහුවදා උදේට කැසිනෝ සියල්ල අවලංගුයි කියලා නීතියක් ගෙනෙයි කියලායි. එහෙම නීතියක් ගෙනාවේ නැහැ. "සුරාබදු ඔක්කෝම අවලංගුයි, තැබෑරුම් නැහැ, ලංකාවේ තැබෑරුම් වහනවා." මෙහෙම කියයි කියලා තමයි සාමාන්‍ය ජනතාව අපේක්ෂා කළේ. නමුත් මොකක්ද කරලා තිබෙන්නේ? කැසිනෝ බදු රුපියල් බිලියන 5යි, මත්පැන් හා බියර්වලට රුපියල් බිලියන 5යි, ඔට්ටු හා සුරාබදු බලපත්‍රවලට රුපියල් මිලියන 400යි, රට බීමහල් හා තැබෑරුම්වලට රුපියල් බිලියන 1යි, සුරාබදුවලින් රුපියල් මිලියන 600යි, විදුලි සංදේශ සමාගමේ ලාභ මත රුපියල් බිලියන 10යි, ගෑස් සමාගමේ ලාභ මත රුපියල් බිලියන 10යි. දැන් බලන්න, සුපිරි ලාභ බද්ද රුපියල් බිලියන 50යි, මෝටර් වාහන ආයනයෙන් රුපියල් බිලියන 7යි, කැසිනෝ බදුවලින් රුපියල් බිලියන 5යි, මත්පැන් හා බියර්වලින් රුපියල් බිලියන 5යි, ඔට්ටු හා සුරාබදු බලපත්‍රවලින් රුපියල් මිලියන 400යි, රට බීමහල් හා තැබෑරුම්වලින් රුපියල් බිලියන 1යි, සුරාබදුවලින් රුපියල් මිලියන 600යි, විදුලි සංදේශ නියාමන කොමිසමෙන් රුපියල් බිලියන 10යි, ගෑස් සමාගමේ ලාභ මත රුපියල් බිලියන 10යි, ඔක්කෝම රුපියල් බිලියන 89යි.

මෙන්න, වැටුප් වැඩි කිරීමට මුදල් හොයා ගත්ත හැටි. මේ බදුවලට "වෛර බදු" කියන්නේ ඇයි? තමුන්නාන්සේලා හිතනවා "මේ සමාගම් අපේ ඡන්දයට වැඩ කළේ නැහැ", එහෙම නැත්නම් "දුන්නා මදි" කියලා. එහෙම හිතලා එක්කෙනෙකුට දෙන්නෙකුට බදු ගහන්න ගිහින් සමස්තයක් ලෙස පෞද්ගලික අංශයටම බදු ගහලා තිබෙනවා.

දැන් බද්දක් පනවා තිබෙනවා, "මන්දිර බද්ද" කියලා. හරි සන්තෝෂයි. නමුත් මන්දිර තිබෙන අයගෙන් බදු නැහැ. මන්දිර බද්ද පනවලා බැලුවාම පෙනුණා, මේ වලව්වල මහා බලවතුන් ඉන්න බව. ඒ වලව්වල ඉන්න අය ඇහුවා, "අපි ආණ්ඩුව ගෙනැල්ලා වලව්වලට බදු පනවා ගත්තාද?" කියලා. ඒ නිසා වලව්වලට බදු නැහැ. මේක පුදුම වැඩක් නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බදු අය කිරීමේදී සාධාරණ බවේ මූල ධර්මය, සරල බවේ මූල ධර්මය, සානුබල මූල ධර්මය, නිශ්චිත බවේ මූල ධර්මය යනුවෙන් මූල ධර්ම කීපයක් ලෝකයේ තිබෙනවා. මම හොඳටම දන්නවා මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා මේ මූල ධර්ම,-

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට නියමිත වේලාව අවසානයි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
කරුණාකරලා මට තව විනාඩි පහක් දෙන්න.

මම හොඳට දන්නවා ඒ ලේකම්තුමා මේ මූල ධර්ම පිළිබඳව මධ්‍ය විද්‍යාල, මහා විද්‍යාල හරහා,-

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට නියමිත කාලය මිනිත්තු 20යි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙකුගේ කාලයෙන් මට විනාඩි 5ක් ඉල්ලා දෙන්න. මම මේ කාරණය විතරක් කියලා කථාව අවසන් කරන්නම්.

නිවසක් වර්ග අඩි 5,000ට වඩා වැඩි නම් මන්දිර බද්ද වශයෙන් වර්ෂයකට රුපියල් මිලියනයක් ගෙවන්න ඕනෑ. මේ කෝට්ටේ නගර සීමාව තුළ ගෙවල් කීයක් තිබෙනවාද බලන්න. තමන්ට දරුවන් තුන්දෙනෙක් ඉන්නවා නම් ඒ දෙමව්පියන් තමන්ගේ ගෙදර තට්ටු දෙකක්, තට්ටු තුනක් හදලා ඒ දරුවන් තුන්දෙනාට කියනවා. මේ මන්දිරවලට රුපියල් 83,333ක් මාසයක් ගණනේ ගෙවන්න වුණාම තත්ත්වය කොහොමද? සමහර අය හිතන්නේ මේක ගෙවන්නේ එකවරයි කියලායි. එකවරක් නොවෙයි, නගර සභාවට හැම අවුරුද්දකම ගෙවන්න වෙනවා. මාසයකට රුපියල් 83,333ක් ගෙවන කොට මේ රටේ ගෙවල් කුලියට මොකද වන්නේ? ගෙවල් කුලිය මහා පරිමාණයෙන් වැඩි වෙනවා. කෙනෙකුට හිතෙන්න පුළුවන් තමන්ගේ ගෙය දමලා ගිහින්, පාර්ලිමේන්තුව පැත්තෙන් කුලියට ගෙයක් හොයාගෙන රුපියල් 83,000ට වඩා අඩුවෙන් ඉන්න පුළුවන් නේද කියලා.

මේ බද්ද පැනවීම නිසා සිදු වන අනෙක් අසාධාරණය මේකයි. ගෙයක් හදපු එක්කෙනා බැංකු ණයක් අරගෙන තමයි ගෙය හදලා තිබෙන්නේ. ඒ පොලියටත් එයා බදු ගෙවනවා. ඒ වාගේම ගේ හදන්න ගන්න වැලිවලට බදු ගෙවනවා; ගඩොල්වලට බදු ගෙවනවා; දැවවලට බදු ගෙවනවා; ඇස්බැස්ටෝස්වලට බදු ගෙවනවා; electrical fittingsවලට බදු ගෙවනවා; bathroom fittingsවලට සියයට 300, 400ක බදු ගෙවනවා. මේ විධියට බදු පිට බදු පටවලා තිබෙන්නේ.

ලංකාවේ වර්ග අඩි 5,000ට වැඩි ගෙවල්වලට බදු අය කරනවාය කියලා දැනගෙන හිටියා නම් මිනිස්සු වර්ග අඩි තුන්දහසේ, දෙදහසේ, දහසේ ගෙවල් හදයි. නමුත් එහෙම කරලා නැහැ. දැන් මේ හදපු ගෙවල් කඩන්න බැහැ. වලව්වලට දෙන සහනය වලව්වල ඉපදුණේ නැති අහිංසක මිනිසුන්ටත් දෙන්න කියලා මම මේ වෙලාවේ ඉල්ලා සිටිනවා. වලවකාරයෝ ඉස්සරහ විතරක් දණ ගහන්නේ ඇයි? ඇයි, වලව්වල නොවන මිනිස්සු, මිනිස්සු නොවෙයිද? පාරම්පරික, රදල වලව්වකට විතරක් සහනය දීලා, අනික් මිනිසුන්ගේ ගෙවල් වර්ග අඩි 5,000ට වඩා වැඩි නම් බදු අය කරන්නේ ඇයි? මේක සාධාරණ බවේ මූල ධර්මයට අනුකූල නැහැ. මේ "වෛර බදු" කිසිවක් සරල බවේ මූල ධර්මයට, සාධාරණ බවේ මූල ධර්මයට, සානුබල මූල ධර්මයට අනුකූල නැහැ. මේ නිසා ආයෝජකයන් අනාගත ආයෝජනයට පෙළඹෙන්නේ නැහැ. මේවාට විදේශ ආයෝජකයන් එනවාද? මීට වඩා ලාභයි බංග්ලාදේශයට යන එක කියලා මහා පරිමාණයේ සමාගම් සියල්ල හිතනවා. තමුන්නාන්සේලා දන්නවා බංග්ලාදේශයේ වියදම අඩුයි, ආයෝජකයාට තිබෙන පහසුව වැඩියි කියලා. පෞද්ගලික අංශයේ මේ සියලු දෙනා ගියොත් රාජ්‍ය අංශයට මේ සියල්ල කරන්න පුළුවන්ද? [බාධා කිරීමක්] ඒ නිසා මේ බදු ප්‍රතිපත්තිය -වෛර බදු පැනවීම- නිසා මේ රට ඉතා විශාල අර්බුදයකට ගමන් කරනවා.

මේ අය වැයේ තාවකාලික සහනයක් වශයෙන් තිබෙන්නේ විදුලි සන්දේශ සමාගම්වල සියයට විසිපහේ බද්ද පාරිභෝගිකයන්ගෙන් නිදහස් කරන එකයි. "ඩයලොග්", "මොබිටෙල්", "හච්", "එටිසලාට්", "එයාර්ටෙල්" කියලා සමාගම් පහයි තිබෙන්නේ. මේවායින් සමාගම් තුනක් පාඩුයි. සමාගම් දෙකක් ලාභ ලබනවා. සමහර සමාගම්වලට රුපියල් බිලියන 15ක් වැනි මුදලක් බදු වශයෙන් ගෙවන්න වෙනවා. එතකොට මේ සමාගම් වහන්න වෙනවා.

මෙම අය වැය මඟින් සන්නිවේදන ස්ථාන පහකට වැඩි - කුලුනු පහක් තිබෙන- සමහර ක්‍රීඩා නාලිකාවලට බදු පනවා තිබෙනවා. හැබැයි, කුලුනු හතරයි නම් තිබෙන්නේ, ඒවාට බදු නැහැ. ලංකා ඉතිහාසයේ මෙහෙම බදු පනවලා තිබෙන්නේ මේ ආණ්ඩුව විතරයි. මීට කලින් -1977 දී- මේ වාගේ අය වැය ලේඛනයක් රොනී ද මැල් ඇමතිතුමා ඉදිරිපත් කළ ආකාරය මම දැක තිබෙනවා. රොනී ද මැල් ඇමතිතුමා මේ පාර්ලිමේන්තුවට ඇවිත් කවදාවත් නැති විධියට මේ විධියටම මේ ගරු සභාව පාවිච්චි කරලා කිව්වා, දාසලා, ගුණදාසලා, පියදාසලා කියන ඔක්කොම දේශීය ව්‍යාපාරිකයන්ට බදු ගහනවා කියලා. මම තමුන්නාන්සේලාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටින්නේ දේශපාලන, ජාති, ආගම්, කුල, වර්ණ, ලිංග භේදවලින් තොරව කටයුතු කරන්න කියලායි. මිනිසුන් පිළිබඳව වෛරයෙන් හිතන්න එපා; සමාගම් ගැන වෛරයෙන් හිතන්න එපා; සුළු පරිමාණ කර්මාන්තකරුවන් ගැන වෛරයෙන් හිතන්න එපා. මේ සියලුම අය අපේ රටේ ජාතික ව්‍යාපාරිකයෝ.

සමහර අය සිංහල බෞද්ධ ව්‍යාපාරිකයෝ. විවිධ අවස්ථාවලදී සිංහල බෞද්ධයන්ට ව්‍යාපාරික ක්ෂේත්‍රයේදී අසාමාන්‍ය ලෙස පහර වැදිලා තිබෙනවා. යම් අවස්ථාවක එක සමාගමක් වැරැදි කරලා තිබෙනවා නම්, එක සමාගමක් වංචා කරලා තිබෙනවා නම්, එක සමාගමක් බදු ගෙවලා නැත්නම් ඒ සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කරන්න. තරග විරෝධී චර්යාවලට විරුද්ධව කටයුතු කරන්න පුළුවන්.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

Fair Trading Commission Act එකක් තිබෙනවා. සාධාරණ වෙළඳ කොමිෂන් සභා පනත යටතේ අලුතින් විධිවිධාන ඇතුළත් කර හෝ ඒවාට විරුද්ධව කටයුතු කරන්න. ඒකාධිකාරය, ඒකාබද්ධ වීම, තරග විරෝධී චර්යා තිබෙනවා නම් ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න. එහෙම නැතුව තමන්ට දරන්න බැරි වැය බරක් දමලා -

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

තව එක ප්‍රශ්නයක් විතරක් අහලා මගේ කථාව අවසන් කරනවා. මීට පස්සේ ලංකාවේ වැටුප් බිල රුපියල් බිලියන 616

දක්වා වැඩි වනවා. මේ මුදල ලබන අවුරුද්දේ මීටත් වඩා වැඩි වනවා. ඊළඟ අවුරුද්දේ ඊටත් වැඩි වනවා. රජයේ ආදායමින් භාගයක් රජයේ සේවකයන්ගේ වැටුප් බිලට වැය වෙනවා. ලබන අවුරුද්ද සඳහා අවශ්‍ය රුපියල් බිලියන 50ක් සමාගම්වලින් එක වරයි නේ ගන්නේ. ඊළඟ අවුරුද්දට මේ රටේ සියලුම ස්ථාවර තැන්පත් ගිණුම්වලටත්, NRFC ගිණුම්වලටත් විශාල බද්දක් අය කිරීමෙන් තමයි මේ මුදල ගන්න හදන්නේ කියන එක තමයි මූල්‍ය රහස්‍ය ආරංචි මාර්ග තුළින් මට දැන ගන්න ලැබුණේ. සියලුම බැංකුවල තැන්පත් කර තිබෙන ස්ථාවර තැන්පත්කරුවන්ගේ ගිණුම්වල සහ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල තමයි මේ වාගේ සල්ලි ප්‍රමාණයක් තිබෙන්නේ, ඊළඟට ගන්න. දැන් මේ විධියට තමුන්නාන්සේලා එක එක දවසට එක එක අංශය මරනවාද?

රටේ බදු පිළිබඳ සම්පූර්ණ අයිතිය තිබෙන්නේ පාර්ලිමේන්තුවටයි. තමුන්නාන්සේලා ජනතාවට දෙන මේ සියලුම සහනවලට අපි කොන්දේසි විරහිතව සහාය දෙනවා; කොන්දේසි විරහිතව අනුග්‍රහය දක්වනවා. නමුත් මේ තුළින් රටේ මෙතෙක් කල් ගොඩ නඟා ගෙන ආපු ආර්ථිකය, නිමැවුම, ආදායම, සේවා නියුක්තිය, මිල මට්ටම, ගෙවුම් ශේෂය, ඉතුරුම්, ආයෝජනය යන සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ විකෘතියක් ඇති කරන්න එපා. දැනටම කොටස් වෙළෙඳ පොළ කඩා වැටිලායි තිබෙන්නේ. තව ටික දවසකින් විනිමය අනුපාතය රුපියල් 140කට එනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මේ අවදානම තිබෙන නිසා කරුණාකරලා, "රාජ්‍ය මූල්‍ය කටයුතු දේශපාලනයෙන් නිදහස් කරන්න. දේශපාලනය වෙනම කරමු"යි කියන ආරාධනය කරමින් මගේ වචන කීපය අවසන් කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
The next speaker is the Hon. (Prof.) Tissa Vitarana. You have 10 minutes.

[4.15 p.m.]

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
Mr. Deputy Chairman of Committees, firstly I would like to commend the Maithripala Sirisena Government for honouring its election pledge to bring down the cost of living, and I am particularly happy that a proposal which we have been submitting every year, over the last few years, has been implemented. That is, to identify essential food items and we requested that all taxes on those items be removed. But, the fact that even a proportion of those taxes have been removed is a good development and, that I think is welcome from the point of view of bringing the cost of living down to the poorer sections of our people. But, let me say, at the same time, that mechanisms must be set in place to ensure that these prices are kept down. There must be a proper price control mechanism. That is not there and it will need some mechanism to see that the traders actually pass on the benefits of what you are proposing to the consumer. The only point I would like to mention is that some of the items like dhal, which are commonly consumed and need to be reduced, have not been brought down. That is something that should have been looked into.

At the same time, the main objective of bringing down the cost of living - it is very evident by looking at this Budget - is a short-term objective of winning the next election. The measures that have been instituted to effect this, to find the money required, to make up for the loss of revenue clearly indicate that this is a short-term objective. It is not going to be sustained and if the UNP comes back into power in some way, there is absolutely no guarantee from the way this whole Budget has been prepared, that this will be sustained. If we are to really have a sustainable economic development, then there has to be an investment in infrastructure development as well as in industrial development. If you look at this Budget, it is very clear that that is not there. It is evident that the reduction in capital expenditure, which has been used to make-up for the shortfall of revenue has been by cutting down on infrastructure expenditure.

Now, if you look from the angle of industrialization, the Ministry of Technology and Research no longer exists, so that the place that science, technology and innovation was given by our government earlier has not been sustained.

This will clearly indicate that the type of sustained economic development that is essential for a country to emerge from the middle-income trap, which is one of the biggest dangers confronting our country, has not been addressed by this Budget. If it is really a sustained budgeting process, that would have been addressed. So, I am extremely unhappy to see that there is no effort being made to meet the danger of the middle-income trap in this whole Budget and it is clear that even in the future, there is no attempt to do that.

Now, trying to beat the loss of revenue through these budgetary measures, we welcome on behalf of the people, but, it is also very short-sighted. You have targeted specific industries which really have taxes of a punitive nature, and directed against enterprises believed to be associated with the last Government, and this very act has already been producing negative effects. This type of taxation, which is based on earnings acquired in the past, is a poor system of taxation and especially when it is targeted against certain sections of the capitalist class, who had ties with the last Government, immediately leads

[ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා]

to a fear among the capitalist class as a whole, that for political reasons they will also be targeted at some future date. This has had its impact already.

As the previous speakers have mentioned, there has been a reduction, a marked drop in the stock exchange. There has also been a drop in the value of the rupee, which means that the capitalist class itself has been shaken by what has happened. To meet this loss of revenue, for instance, at all the previous Budgets I have suggested to increase direct taxation. Sri Lanka has one of the lowest levels of direct taxation in the world; the upper limit of taxation has been brought down to 24 per cent. If in a country like Britain, it is 40 per cent and if in other countries in Europe, it is 50 per cent, why should we not have at least something like 45 per cent? We are down at 24 per cent. If there is a general measure like that, then people can put the surplus wealth into productive use. If people voluntarily invest in some productive enterprise, those particular investments can be given some tax concessions. But, what has been done now is, you have maintained the 24 per cent low direct taxation and, in that context, the income that could have been obtained without this type of punitive and targeted taxation, has been avoided. The consequences are that even from the point of view of capitalist development of our economy, it is going to have a bad effect.

Then, how is this Government going to sustain this in the future? It will mean that the Government will have to get into an increased debt. That is the type of policy that the World Bank and the IMF have always been trying to thrust upon the governments in Sri Lanka. I have a deep fear that that is going to happen. When, Mr. Shah of the Ceylon Chamber of Commerce raised this very issue, the Deputy Minister who is concerned with Economic Affairs defended by saying that the Government is going to go into the "Regaining Sri Lanka" Policy; the policy which was rejected by the people from 2002 to 2004, because our assets were sold to foreign investors, to multinational corporations and the economic burden fell on the people.

Therefore, I warn the people of Sri Lanka that this Budget is undoubtedly a short-term Budget, which is aimed purely at getting your vote at the elections. Thereafter, what is going to be followed is the "Regaining Sri Lanka" type of policies and budgets, which will place increasing burdens on the ordinary people and give concessions not even to our local capitalist class, but to the foreign capitalist class to the detriment of our economy. Thank you.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

මීළඟට, ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.26]

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනවාරි මාසයේ 08වෙනි දා මේ රටේ ජනතාව දේශපාලන වශයෙන් තීන්දුවක් ගත්තා. ඒ තීන්දුව අනුව තමයි ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මේ රටේ වර්තමාන ජනාධිපතිවරයා හැටියට පත් වුණේ. එතුමා ජනාධිපතිවරයා හැටියට පත් වෙලා, එක්සත් ජාතික පක්ෂයේ විපක්ෂ නායක හැටියට හිටපු, ගරු රනිල් වික්‍රමසිංහ මහත්මයා අගමැතිවරයා හැටියටත්, ඊට අවශ්‍ය කැබිනට් මණ්ඩලයකුත් තෝරා පත් කර ගත්තා. ගරු රනිල් වික්‍රමසිංහ මහත්මයා එක්සත් ජාතික පක්ෂයේ සභාපතිවරයා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැටියට අපි එකතු වෙලා ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිවරයා හැටියට පත් කර ගත්තා.

එක්සත් ජාතික පක්ෂය කිව්වේ පවුල් පාලනය අවසන් කරලා හවුල් පාලනයක් ඇති කළා කියලා. ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා, -ජනාධිපතිවරයා- ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති වූ නිසා අපටත් නිරායාසයෙන් මේ හවුල් පාලනයට එකතු වෙන්නට සිද්ධ වුණා. මේ ගැන මේ රටේ ජනතාවට ලොකු විවිකිච්චාවක් තිබෙනවා. "කොහොමද මෙහෙම වෙන්නේ?" කියලා. මේක අලුත් දේශපාලන අත් දැකීමක්; අලුත් දේශපාලන ක්‍රමවේදයක්. මේ හවුල් පාලනයට අපි එකතු වෙලා තිබෙන්නේ මේ රටේ ජනතාවට විවිධ ජයග්‍රහණ වාගේම දේශපාලන, ආර්ථික සහ සමාජ වෙනස්කම්වල යම් කිසි පරිවර්තනයක් ලබා දීම සඳහා යම් කිසි අත්වැලක්, අත්උදවුවක් හැටියටයි. එහෙම නැතිව අපිට තනතුරු, තානාන්තර, ඇමතිකම් සහ වරප්‍රසාද ලබා ගැනීම සඳහා නොවෙයි. ඒ නිසා අද අපි විපක්ෂයේ බහුතරය කියාගෙන, විපක්ෂයේ ඉඳගෙන රජයේ හොඳ වැඩවලට, ජනතාවට ලැබෙන ජයග්‍රහණවලට, ජනතාවට ලැබෙන ප්‍රතිලාභවලට උදවු උපකාර කරනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි එසේ කරන්නේ, හරියට වතුර ගලන විට තෘණ ගස් නැමෙනවා වාගේ අපි නැමිලා, ආචාර කරලා, හිස නමලා ජනතාවට ඒ සහන ගලාගෙන යන්නට ඉඩ හැරීම සඳහායි. නමුත් මතක තියා ගන්න ඕනෑ, නැමුණා කියලා තළාගෙන යන්න හදනවා නම් ඒක ඒ තරම් හොඳ දෙයක් නොවෙයි කියලා.

අදත් අපි මේ පාර්ලිමේන්තුවේ Lobby එකේදී ගරු අගමැතිතුමා සමඟ සාකච්ඡා කළා, අපේ පාක්ෂිකයින්ට සිදු වන හිරිහැර, කරදර පිළිබඳව. ඒ වාගේම විවිධ බොරු චෝදනා සහ විවිධ චෝදනා ඉදිරිපත් කරමින්, සුළු වැරදි, සුළු චෝදනා බරපතළ චෝදනා බවට පත් කරමින් ගෙන යන්නා වූ යම් යම් ක්‍රියා මාර්ග පිළිබඳවත් අපි එතුමා සමඟ කථා කළා.

මේ රටේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක වන එක්සත් ජාතික පක්ෂය සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආරක්ෂා වෙන්නට ඕනෑ. ඒ පක්ෂ දෙක තමයි මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයේ මුර දේවතාවුන් හැටියට කටයුතු කරලා තිබෙන්නේ, ඉතිහාසය පුරාම. අනාගතයේ මේ රටේ යම් පරිවර්තනයක් වෙනවා නම් එහි වගකීමද ඔවුන්ට පැවරෙනවා. ඒ නිසා ඉතා පැහැදිලිව මේ දේශපාලන, ආර්ථික සහ සමාජ ප්‍රතිසංස්කරණ කෙරෙහි අපේ විශේෂ අවධානය යොමු වෙලා තිබෙනවා.

කෙසේ නමුත් මේ අතුරු අය වැය, -ලියවිල්ලක්- යෝජනා තුළින් අපට දැන ගන්නට තිබෙනවා විශේෂයෙන්ම භාණ්ඩ 13ක මිල අඩු කිරීමක් ගැන. දැන් ලියවිලි 2ක් තිබෙනවා. එකක් අතුරු අය වැය. අනෙක, දින 100 වැඩ පිළිවෙළ. මේ ලියවිලි දෙකේ තිබෙන කරුණු කාරණා දිහා බැලුවාම අපට පේනවා යම් යම් තැන්වල පරස්පර විරෝධතාවන් තිබෙන බව. මේ කියපු දේවල්

හරියටම, ඒ විධියටම, කියපු ආකාරයටම සිදු වෙලා නැහැ කියන කාරණාවත් පේනවා. දැන් බලන්න, භාණ්ඩ 13ක මිල අඩු කරනවා. අපි ඒ ගැන සතුටු වෙනවා. ඒ නිසා ජනතාවට ලැබෙන ප්‍රතිලාභ පිළිබඳව අපි විශේෂයෙන් මතක් කරනවා.

විශේෂයෙන් අපි දැක්කා බඩු මිල අඩු වුණත්, සමහර ජන කොටස්වලට මූලික ආහාරවලට අවශ්‍ය දේවල්වල මිල අඩු වුණේ නැති බව. විශේෂයෙන්ම සිංහල ජනතාවට අවශ්‍ය සහල්, පරිප්පු සහ පොල්වල මිල අඩු වෙලා නැහැ. කිරි හොද්දක්, පරිප්පු හොද්දක්, බත් ටිකක්, පොල් සම්බෝලයක් තමයි අපේ සාමාන්‍ය ජනතාවගේ ආහාරය. මෙතැනට යම් බලපෑමක් සිදු වෙලා නැහැයි කියන එක මතක් කර දෙන්න වෙනවා. අපි හිතනවා, මුදල් ඇමතිතුමා මේ පිළිබඳව අවධානය යොමු කරයි කියලා.

අනික් කාරණය මෙයයි. මේ ලබා දෙන සහනාධාර දීර්ඝ කාලීන සහනාධාර බවට පත් කරන්න තිබෙන ආර්ථික වැඩ පිළිවෙළ මොකක්ද කියන එක පිළිබඳව මේ අතුරු අය වැයේ පැහැදිලිව දකින්න නැහැ. එසේ කරන්නේ නිෂ්පාදනය වැඩි කිරීමෙන්ද, එහෙම නැත්නම් ඵලදායිතාව ඇති කිරීමෙන්ද කියන විශේෂ ආර්ථික වැඩ පිළිවෙළක් පිළිබඳ පැහැදිලි චිත්‍රයක් අපට අවශ්‍ය වනවා.

ඒ විතරක් නොවෙයි. අපි කියන්නට ඕනෑ, මේ අය වැයෙන් දීපු සමහර සහන තුළින් අපේ දේශීය ගොවියාට ඇති වෙලා තිබෙන බලපෑම ඉතා විශාල බව. මා පසු ගිය දිනවල මොනරාගල දිස්ත්‍රික්කයේ ගොවි බිම්වල ඒ ජනතාවත් එක්ක සාකච්ඡා කරමිනුයි සිටියේ. දැන් උඳු කිලෝවක් සඳහා අය කළ බද්ද රුපියල් 60 දක්වා අඩු වුණා. අපේ ගොවි ජනතාව උඳු කිලෝවක් රුපියල් 180කට, රුපියල් 200කට විකුණුවා. අද ඒ මිලට විකුණා ගන්න බැහැ. මොනරාගල දිස්ත්‍රික්කයේ ජනතාව මුං ඇට කිලෝවක් රුපියල් 250ටත් විකුණුවා. මුං ඇට සඳහා රුපියල් 30ක් බදු අඩු කරලා තිබෙනවා. මුං ඇට විකුණා ගන්න බැරි තත්ත්වයක් අද ඇති වෙලා තිබෙනවා. බඩ ඉරිඟු සඳහා රුපියල් 40ක සහතික මිලක් තිබුණා. නමුත් අද වන කොට රුපියල් 26කට තමයි බඩ ඉරිඟු විකුණන්න සිද්ධ වෙලා තිබෙන්නේ. රුපියල් 200ට විකුණපු කවුපි කිලෝව අද රුපියල් 130කටයි විකුණන්න සිද්ධ වෙලා තිබෙන්නේ. සීනි කිලෝවක් සඳහා පනවා තිබුණු රුපියල් 28ක බද්ද රුපියල් 10කින් අඩු කරලා තිබෙනවා. ඒ අනුව අපට සැකයක් තිබෙනවා, උක් මිලත් අඩු වෙයි කියලා. දේශීය නිෂ්පාදකයා ආරක්ෂා කරන්නේ නැතුව, ඇමෙරිකාවේ ඉරිඟු ගොවියා ආරක්ෂා වන විධියට පාන් පිටි කිලෝවක මිල රුපියල් 12.50කින් අඩු කළා. අපි දන්නවා, අපේ රටේ වතුකරයේ ජනතාව වැඩට ගියේ කහට බෝතලයයි, රොටි දෙකකුයි ඔතා ගෙනයි කියලා. දවාලට රොටි කාලා කහට කෝප්පය බීලා තමයි ඒ අය වතුවල වැඩ කළේ. නමුත් පුරුද්දක් හැටියට දැන් බත් කන්න ටික ටික පුරුදු වෙලා තිබෙනවා. ඒක හොඳ දෙයක්.

වී වලට සහතික මිලක් දීලා තිබෙනවා. හැබැයි, හාල් සේරුව රුපියල් 100ට වඩා වැඩි මිලකට යන තත්ත්වයක් අපට පේන්න තිබෙනවා. වී වලට සහනාධාරයක් දෙනවා නම්, වී ගොවියාට යම් සහනාධාරයක් ලබා දෙමින් ඒ සහතික මිල වැඩි කිරීම තුළින්ම වී ගොවියාට ආරක්ෂණයක් දෙන්න පුළුවන් කියලා අපි විශ්වාස කරන්නේ නැහැ. මොකද පාරිභෝගිකයාගේ පැත්ත, පාරිභෝගිකයා ආරක්ෂා කරන වැඩ පිළිවෙළක් තුළින් තමයි වී ගොවියාට ආරක්ෂාව දෙන්න අපට පුළුවන්කම තිබෙන්නේ. ලාම්පුතෙල් මිලත් අඩු කරලා තිබෙනවා. උම්බලකඩ, හාල් මැස්සන්, වාගේ භාණ්ඩවලත් මිල අඩු කරලා තිබෙනවා.

අපේ මත්ස්‍ය කර්මාන්තය පිළිබඳවත් මීට වඩා සැලකිල්ලක් අපි ලබා දිය යුතුයි කියලා මම විශ්වාස කරනවා. ඊළඟට සමෘද්ධිලාභීයා ගැන බලමු. අද මේ සමෘද්ධිලාභියාගේ සමෘද්ධිය වැඩි කරන න්‍යායෙන් පක්ෂ ශාඛා සමිති හදන වැඩ පිළිවෙළකට ගිහිල්ලා තිබෙන බව පෙනෙනවා. අපි කියන්නේ නැහැ දේශපාලනය කරන්න එපා කියලා. ඒ අයිතිය තිබෙනවා. නමුත් දේශපාලන වශයෙන් බලන්නේ නැතුව සමෘද්ධිලාභියාගේ දුප්පත්කම සහ ඔහුගේ ජීවන තත්ත්වය පිළිබඳ සලකා සමෘද්ධිය වැඩි කිරීම සහ සමෘද්ධිලාභීන්ට සහනාධාර ලබා දිය යුතුයි කියලා විපක්ෂය හැටියට අපි මතක් කර දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පෙර පාසල් ගුරුවරුන්ට අපේ රජයේ අය වැයෙන් රුපියල් 2,500ක් දෙන්න යෝජනා කළා. නමුත් මේ අය වැයෙන් පෙර පාසල් ගුරුවරුන්ට රුපියල් 250ක් තමයි දෙන්න යෝජනා කරලා තිබෙන්නේ. ඒ වාගේම දහම් පාසල් ගුරුවරයාගේ තත්ත්වය ගත්තාම ධර්මාචාර විභාගය සමත් අයට අපි ගුරු පත්වීම් ලබා දුන්නා. අද දහම් පාසැල් ගුරුවරියකට සතියකට රුපියල් 50 ක දීමනාවක්-

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මන්ත්‍රීතුමා ඔබතුමාට විනාඩි දෙකක කාලයක් වැඩිපුර ලබා දීලා තිබෙනවා. දැන් කථාව අවසාන කරන්න.

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
මම අවසාන කරනවා.

දෙමුහුන් කාර් සඳහා පනවා ඇති බද්ද පිළිබඳව මම අවසාන වශයෙන් කියන්න කැමැතියි. වාහනයක් මිලදී ගැනීම සාමාන්‍ය මධ්‍යම පන්තියේ අයගේ සිහිනයක්. අද ඒ සිහිනය බොඳ වෙලා තිබෙනවා. ඒ නිසා අපි මේ ආණ්ඩුවට විශේෂයෙන් මතක් කරන්නේ වැඩි වන බඩු මිලට ඔරොත්තු දෙන ආර්ථිකයක්, නිෂ්පාදන ආර්ථිකයක්, ජනතාවගේ අතට මුදල් ලැබෙන ආර්ථික ක්‍රමයක් ලබා දිය යුතුයි කියන එකයි. බහුතර විපක්ෂය හැටියට අපි රජයට කියනවා රජය නිසි මගට යොමු කරන්න, රජයේ වැරැදි පෙන්වා දෙන්න සහ රජයේ අඩු පාඩුකම් පෙන්වා දෙන්න අපි විපක්ෂයේ බහුතර කණ්ඩායමක් හැටියට ඉඳගෙන ඒ බලපෑම ජනතාව වෙනුවෙන් මේ අය වැයේ කරන්න සූදානම් බව.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 25 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.35]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. ගරු විජිත් විජයමුණි ද සොයිසා හිටපු ඇමතිතුමා ප්‍රකාශ කළා පරිප්පු, පොල් සහ සහල් මිල තවමත් වැඩියි, මේවා අඩු කරන්න ක්‍රමයක් තිබෙනවා නම් හොඳයි කියලා. එතුමා වුණත් අපි ඇත්තටම අගය කරනවා. අවුරුදු 10ක් මහින්ද රාජපක්ෂ පාලන ක්‍රමය තුළ ඉඳගෙන, එතුමාගේ යෝජනා ක්‍රියාත්මක වෙන්නේ නැති නිසා, සමහර විට යෝජනා කරන්නේ නැතුව බලා ගෙන ඉන්න ඇති මේකට මොකක්ද කරන්නේ කියලා. නමුත් අද ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ප්‍රමුඛ විශේෂයෙන්ම අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ පවතින මේ වර්තමාන රජය ගැන විශ්වාසය

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

පළ කරලා පරිප්පු, පොල් සහ සහල් ගැන කතා කිරීම සම්බන්ධයෙන් විශේෂයෙන්ම එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ඒ ගැන අභිමානයටත් පත් වෙනවා.

හිටපු ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අවධානයට යොමු කරනවා පොල් කර්මාන්තය වෙනුවෙන් ඇමතිවරු දෙන්නෙක් සිටිය බව. අද ඒ ඇමතිධුර දෙකම නැති කරලා තිබෙනවා. ඉස්සර පොල් ගහට ඇමතිවරු දෙන්නෙක් හිටියා. මම හිතන්නේ දැන් අපේ වියදම ගොඩක් දුරට අඩු වෙයි කියලායි. පොල් මිල අඩු කරන්නත් පුළුවන් වෙයි. මොකද අපි දැක්කා, පසු ගිය කාලයේ ඇමතිවරු පත් කිරීමෙන් සිද්ධ වුණේ ඒ කර්මාන්තය විනාශ වීම මිසක් ශක්තිමත් වීම නොවෙයි කියන එක. අද මම හිතනවා පොල් ගහට නිදහසේ වැඩෙන්න ඉඩකඩ ලැබෙයි කියලා. එතකොට පොල් මිල අඩු වෙයි. ඒ වාගේම සහල් ගැනත් කියන්න ඕනෑ. පසු ගිය කාලයේ මම ඉන්න වේයන්ගොඩ ප්‍රදේශයේ සහල් ගබඩාවෙන් විතරක් කෑමට ගන්න බැරි සහල් කිලෝ 125,000ක් හම්බ වුණා. ඒවා ගැන පරීක්ෂණ පවත්වනවා. ඉතින් මේවාගේ නාස්තිය අඩු කරලා, ඔබතුමා කිව්වා වාගේ අපි ඔක්කෝම එකතුවෙලා අත්වැල් බැඳගෙන මේ සඳහා කටයුතු කරමු. අපි ඒ වෙනුවෙන් කටයුතු කරනවා කියන එකත් විශේෂයෙන් සඳහන් කරනවා. ඒ සඳහා ඔබේ සහාය අපි ප්‍රාර්ථනා කරනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ගොවියා ගැන කතා කළා. මේ මිල අඩු වීම නිසා ගොවියාට වුණ ප්‍රශ්න ගැන කතා කළා. මුං ඇටවල මිල අඩු වුණා. උඳුවල මිල අඩු වුණා. නමුත් මම අවධානය යොමු කරනවා, අපේ ප්‍රතිපත්තිය පාරිභෝගිකයා සූරා කාලා ගොවියා ශක්තිමත් කිරීම නොව, ගොවියා ශක්තිමත් කිරීමට අවශ්‍ය පියවර ගනිමින් පාරිභෝගිකයාට අවශ්‍ය සහන ලබා දීමයි කියන එක ගැන. දැන් අපි දැක්කා අත් ට්‍රැක්ටර් සඳහා සහන ඇති කර දී තිබෙනවා. ට්‍රැක්ටර් සඳහා බදු නැති කරනවා. විවිධ පහසුකම් ගොවීන්ට සලසලා දීලා, ගොවියාව ශක්තිමත් කරලා ඔහුගේ වියදම, ගොවිතැන සඳහා කරන ප්‍රාග්ධන වියදම අඩු කරලා ඔහුව ශක්තිමත් කරලා, අඩු මිලට අස්වැන්න සපයන්න පුළුවන් විධියට හරි ගස්සලා දෙනවා. ඒ ගැන කිසිම සැකයක් හිතන්න දෙයක් නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකක්ද ඒකට හේතුව? වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ගොවි මහත්මයකු තමයි, ගොවි පවුලක දරුවකු තමයි අද මේ රටේ උත්තරීතර ජනාධිපති ධුරය හොබවන්නේ. ඒ මානව හිතවාදී මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා හොබවන ජනාධිපති ධුරය යටතේ, එතුමාගේ නායකත්වය තුළ කිසිම දවසක ගොවියාට හානියක් වන්නේ නැහැ කියා මම හිතනවා. පාරිභෝගිකයා සූරා කාලා, මේ රටේ ජනතාව සූරා කාලා ගොවියා නහා සිටුවීමේ ක්‍රමය වෙනුවට ගොවියාව ශක්තිමත් කිරීමට අදාළ සහන ලබා දීමේ ක්‍රමය අපි අනුගමනය කරනවා කියන එකත් මේ අය වැය වාර්තාවේ කෘෂිකර්මය වෙනුවෙන් යෝජනා කර තිබෙන සහන දිහා බැලුවාම ඔබතුමන්ලාට බලාගන්න පුළුවන් කියලා මා හිතනවා. අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල අඩු කරද්දී කොත්තමල්ලිවල බදු අඩු කිරීම හිටපු බොහෝ ඇමතිවරුන්ට ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඇයි මේ කොත්තමල්ලිවල බදු අඩු කළේ කියලා ඇහුවා. එදා අපේ දෙමව්පියන් අපට අසනීපයක් වුණාම ඉස්පිරිතාලයට ගෙන යන්න ඉස්සර වෙලා කොත්තමල්ලි ටිකක් තමයි රත් කරලා දුන්නේ. නමුත් කොත්තමල්ලිවල මිල වැඩි වීම නිසා කොත්තමල්ලි පානය නොකිරීමේ හේතුවෙන් කොත්තමල්ලි භාවිතය අද අපෙන් දුරු වෙලා ගිහින් තිබෙනවා; ඈතට වීසි වෙලා ගිහින් තිබෙනවා. අපි ඉස්පිරිතාලවලට ගිහින් බෙහෙත් ගන්න යොමු වෙලා තිබෙනවා. ඒ නිසා ඖෂධ භීතිය ඇති වෙලා තිබෙනවා. නමුත් අද වනකොට කර ඇති මේ බදු අඩු කිරීම නිසා ඉදිරියේ දී නැවතත් කොත්තමල්ලි ජන ජීවිතයට සමීප වන දෙයක් වේවි කියන එක අපි විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු විමල් වීරවංශ මැතිතුමා හිටපු ඇමතිතුමා ප්‍රකාශ කළා "ත්‍රස්ත ටැක්ස්" එකක් ගැන. "ත්‍රස්ත ටැක්ස් "එකක් ගහලා තිබෙනවා කියා එතුමා කිව්වා. ඒ යටතේ විශේෂයෙන්ම සුපිරි වාසි බද්ද - Super Gain Tax - ගැන කථා කළා. නමුත් මේ අය වැය වාර්තාවේ පැහැදිලිවම සඳහන් කර තිබෙනවා පසු ගිය බදු වර්ෂය තුළ, එනම් 2013/14 බදු වර්ෂය තුළ රුපියල් මිලියන 2,000කට - රුපියල් ලක්ෂ 20,000කට - අධික ලාභයක් උපයාගත් සමාගමක් හෝ කෙනකු ඒ ලාභයෙන් සියයට 25ක් රජයට ගෙවිය යුතුය කියලා. එවැනි අය බොහොම ටික දෙනකුයි ඉන්නේ. කාල්ටන් සමාජය තුළ තමයි ඒ අය බිහි වුණේ. වර්ෂයකට රුපියල් ලක්ෂ 20,000ක් උපයන්න පුළුවන් අය රටේ ඉන්නේ ටික දෙනකුය කියලා මම හිතනවා. ඒ අය සුපිරි අයයි. නීත්‍යානුකූල ක්‍රමයකට එච්චර උපයන්න පුළුවන්ද? එහෙම නම් ඒ අය දේශපාලන හවිහරණ අරගෙන ජනතාවගේ මුදල් සූරා කෑම තමයි සිදු කරලා තිබෙන්නේ. ජනතා විමුක්ති පෙරමුණ වාගේ පෙරමුණකින්, සමාජවාදී පක්ෂයකින් දේශපාලනයට පිවිසුණු එතුමා අද අවුරුද්දට රුපියල් ලක්ෂ 20,000ක් උපයන පුද්ගලයා ගැන බොහොම දුක් වෙලා ඒ Tax එක - Super Gain Tax - ගැන කථා කළා.

හිටපු බොහෝ ඇමතිවරුන්, විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් මෙහිදී කරපු කථා මම අහගෙන සිටියා. එතුමන්ලා චෝදනා කළා, "මෙය මැතිවරණයක් බලාගෙන ඉදිරිපත් කරපු අය වැයක්. මෙහෙම සහන දෙන්න බැහැ. මැතිවරණය ගැන හිතලායි මේ සහන දෙන්නේ." කියලා. නමුත් අපි විශේෂයෙන් කියන්න කැමැතියි, 2015 දී මැතිවරණයක් පවත්වන්නට නියමිතව තිබුණේ නැති බව. බලෙන් මැතිවරණයක් පවත්වන්න අවස්ථාව ලබාගෙන, සාම්ප්‍රදායානුකූලව ඉදිරිපත් කරන අය වැය වෙනුවට එම මැතිවරණය ඉලක්ක කරගෙන අදාළ දිනයට කලින් බලෙන් අය වැයක් ඉදිරිපත් කළා. ඒ මැතිවරණය මූලික කරගෙනම තමයි පසු ගිය රජය අය වැය ඉදිරිපත් කළේ. මහා සුරංගනා කථා ඒ අය වැයෙන් මැව්වාට ඒක පවතින දෙයක් නොවෙයි; යථාර්ථයක් නොවෙයි කියන එක ජනතාව තේරුම් ගත්තා. ඒ නිසා තමයි ජනතාව ඒකට විරුද්ධව කතිරය ගැහුවේ. ජනතාව එච්චර මෝඩ නැති බව විශේෂයෙන් දැනගන්නට ඕනෑ. එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ රජය එවැනි රැවටීමක් කරන රජයක් නොවෙයි. මැතිවරණය බලාගෙන අය වැය ඉදිරිපත් කළේ අප නොවෙයි. පසු ගිය රජය තමයි මැතිවරණය බලාගෙන අය වැයක් ඉදිරිපත් කළේ කියන එකත් විශේෂයෙන්ම සඳහන් කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් කථා කරන විධිය බැලුවාම ඔවුන් ආණ්ඩු පක්ෂයක සිටියාද කියන එකවත් මට හිතාගන්න බැහැ. එදා සීනි ටිකට, පරිප්පු ටිකට, කිරි පිටි ටිකට, ඉන්ධනවලට රුපියලක්වත් මිල අඩු කර ගන්න බැරිව හිටපු පසු ගිය රජයේ ඇමතිවරුන් අද අහනවා, "මේක කොහොමද අඩු කළේ? ඇයි මේක අඩු කළේ? ඇයි වැටුප් වැඩි කළේ?" කියලා. "මේවා අඩු කළා මදි, වැටුප් වැඩි කරපු එක වැරැදියි" කියා කියනවා. පසු ගිය අය වැයෙන් වැටුප් වැඩි කරනවා කියලා ප්‍රකාශයට පත් කළාම ජනතාව දැනගත්තා ඒක පුස්සක්, ඒක බොරුවක් කියලා. අවසානයේදී ගෙදර ගිහිල්ලා බැලුවාම වැටුප් වැඩි කිරීමක් නැහැ. අය වැය අහගෙන ඉන්නකොට නම් වැටුප් වැඩි වුණා. නමුත් අද වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම යථාර්ථයක් විධියට වැටුප් වැඩි කළාම ඒ වෙනුවෙන් බන්දුල ගුණවර්ධන මැතිතුමා වැටුප් සූත්‍ර ඉදිරිපත් කරනවා. ජනතාවගේ වැටුප් වැඩි කළාම "වැටුප් වැඩි වෙනවා, මිල වැඩි වෙනවා, උද්ඝෝෂණය කරනවා." කියන සූත්‍රය එතුමා ඉදිරිපත් කරනවා. පසු ගිය රජය මැතිවරණය උදෙසා බොරු අය වැයක් කලින්ම ඉදිරිපත් කළ බව අපට පැහැදිලිවම පෙනෙනවා. වැටුප් වැඩි කරනවා කියලා ජනතාව රවටපු එකේ ප්‍රතිඵල තමයි අද ඔවුන්ට ලැබිලා තිබෙන්නේ කියන එකත් මා විශේෂයෙන්ම සඳහන් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සමහර මන්ත්‍රීවරුන් මන්දිර බද්දක් ගැන කථා කරනවා අපි අහගෙන හිටියා. මේ තුළින් ජනතාව නොමඟ යවන්නයි හදන්නේ. රුපියල් මිලියන සියයකට - රුපියල් ලක්ෂ 1,000කට - වැඩියෙන් තක්සේරු කරන ගෙවල් තමයි මන්දිර බද්දට අදාළ වන්නේ. නමුත්, මේ අය වැයේ කියලා තිබෙනවා, මන්දිරයකින් අය කරනු ලබන්නේ රුපියල් මිලියනයක් පමණයි කියලා. මේ අය වැය පොතේ පැහැදිලිවම සඳහන් කරලා තිබෙනවා, මේ තුළින් බලාපොරොත්තු වන මුදල රුපියල් මිලියන 1,000යි කියලා. මුළු රටේම එවැනි මන්දිර තිබෙන්නේ උපරිමය 1,000යි. ඊට වැඩිය නැහැ. ඒ අනුව මේ බද්ද තුළින් ලබා ගැනීමට බලාපොරොත්තු වන්නේ රුපියල් මිලියන 1,000යි. ගෙදරක වර්ග අඩි ප්‍රමාණය 5,000ට වැඩි නම් මන්දිර බද්ද අය කරනවාය කියලා සමහරුන් ජනතාව නොමඟ යවනවා. නමුත් එහෙම දෙයක් නැහැ. මේ අය වැය ලේඛනයේත් පැහැදිලිවම සඳහන් වෙලා තිබෙනවා, මුළු රටේම එවැනි ගෙවල් තිබෙන්නේ 1,000යි කියලා. එම ගෙවල් රුපියල් ලක්ෂ 1,000කට වැඩි තක්සේරුවකට ලක් වන ඒවා විය යුතුයි කියලාත් පැහැදිලිව එහි සඳහන් කරලා තිබෙනවා. අද විමල් වීරවංශලා වාගේ හිටපු ඇමතිවරුන් කථා කරන්නේ මේ මන්දිර බද්ද ගැනයි. ඒ අය අද සුපිරි ගෙවල් ගැන කථා කරනවා; ඒ සුපිරි ගෙවල්වල හිමිකරුවන් ගැන කිඹුල් කඳුළු හෙළනවා.

සුපිරි වාසි බද්ද ගැනත් ඒ අය කථා කරනවා. පසු ගිය අවුරුද්දේ රුපියල් ලක්ෂ 20,000ක් හොයපු ව්‍යාපාරිකයා ගැන ඒ අය අද කිඹුල් කඳුළු හෙළනවා. නමුත් අහිංසක ජනතාව පරිභෝජනය කරන මුං ඇටවල මිල අඩු කිරීම ගැන, සීනි මිල අඩු කිරීම ගැන, මිරිස් මිල අඩු කිරීම ගැන අද කථා කරන්න කෙනෙක් නැහැ. ඔවුන් ඒ ගැන එදා කථා කළේත් නැහැ. නමුත් අද තත්ත්වයත් ඒකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොහොම වුණත් පසු ගිය දශකය තුළ මේ රටේ පාලකයන් ජනතාව ගැන හිතුවේම නැහැ. "හැම දාම අපට බලය එනවා, අපි මොනවා කළත් අපට බලය එනවා, අපව වෙනස් කරන්න බැහැ, අපව පෙරළන්න බැහැ" කියන තේමාව තුළ සිට තමයි ඔවුන් කටයුතු කළේ. විශේෂයෙන්ම මේ රටේ තිබුණේ එක් පවුලක් වටා ගොනු වූ, එක් පවුලක් පෝෂණය කරන පාලන ක්‍රමයක්. ඉහළ සිටින නිලධාරීන් ඒ පවුල පෝෂණය කරන්න ඕනෑ, මැති ඇමතිවරුන් ඔවුන්ගේ ඊළඟ තානාන්තරයට යන්න නම් ඒ පවුල පෝෂණය කරන්න ඕනෑ. එහෙම පාලන ක්‍රමයක් තමයි මේ රටේ තිබුණේ. විශේෂයෙන්ම කියනවා නම්, මේ රටේ ජනතාව ගැන කැක්කුමක් තිබෙනවාය කියලා පපුවට ගසාගෙන මොකක්ද කළේ කියලා අපි දැක්කා. ජනතා සල්ලි මං කොල්ල කෑම තමයි අනෙක් පැත්තෙන් සිදු වුණේ. ද්විත්ව පුරවැසිභාවය තිබෙන මැති ඇමතිවරුන් මේ රටේ සිටියා අපි දැක්කා. ජන්දය පැරදුණාට පසුව ඒ ගොල්ලන් ලංකාවේත් නැහැ. කෙළින්ම තමන්ට පුරවැසිභාවය තිබෙන අනෙක් රටට යනවා. බලය තිබෙන කොට මේ රටේ ඉන්නවා, ජනතා මුදල් ගසා කනවා. එහෙම පාලන ක්‍රමයක් තමයි මේ රටේ තිබුණේ. රටේ සංවර්ධනයට කියලා සල්ලි හොයාගෙන, චීනයෙන් ණය අරගෙන, ඉන්දියාවෙන් ණය අරගෙන, වෙනත් රටවලින් ණය අරගෙන කළේ මොකක්ද? ඒ තුළින් මුදල් ගසා කාලා, ජනතාව අන්ත පීඩිත තත්ත්වයට පත් කරලා, ද්විත්ව පුරවැසිභාවය තිබෙන මේ අය එම සල්ලි ටික අරගෙන ගිහින් තමන්ට පුරවැසි භාවය තිබෙන අනෙක් රටේ ආයෝජනය කිරීම තමයි සිදු වෙලා තිබුණේ. ඒ නිසා මේ ද්විත්ව පුරවැසිභාවය තිබෙන අයට විශේෂ නීති-රීති පද්ධතියක් සකස් කරන්නට ඕනෑය කියලා මේ අවස්ථාවේ දී මා විශේෂයෙන්ම කියන්න කැමැතියි. ද්විත්ව පුරවැසිභාවය තිබෙන අය මේ රටේ ඇමතිකම් කරද්දි, මේ රටේ මන්ත්‍රීකම් කරද්දි, දේශපාලනය කරද්දී ඔවුන්ට විශේෂ නීති පද්ධතියක් සකස් කර තිබිය යුතුය කියලා මම විශේෂයෙන් මේ ගරු සභාවට දැනුම් දෙනවා; මතක් කරනවා; යෝජනා කරනවා. ඒ වාගේම පුරා දශකයක් තිස්සේ මේ රට පාලනය කළේ "නංගී පෙන්වා අක්කා දෙන සංස්කෘතියක්" තුළිනුයි. නොයෙක් දේවල් දෙනවා කියලා සුරංගනා කථා මැව්වා. සංවර්ධනය කියලා ලස්සන ලස්සන කථා මැව්වා. නමුත් සිදු වුණු දෙයක් නැහැ. ජනතාවට කිසිම දෙයක් දැනුණේ නැහැ. ජනතාවට මේ දේවල්වලින් යහපතක් උදා වුණේ නැහැ. එහෙම සංවර්ධනයක් තමයි මේ රටේ සිදු වුණේ.

දින 100ක පොරොන්දු පත්‍රයක් ඉදිරිපත් කරලා, මැතිවරණයෙන් පසුව ගත වුණු දින 20ක් වැනි මේ පොඩි කාලය තුළ මෙවැනි අය වැයක් ඉදිරිපත් කිරීමට හැකිවීම ගැන ඇත්තටම අපි සතුටු වන්නට ඕනෑ. පසු ගිය කාලයේ මේ රට පත්ව තිබුණු අගාධිත තත්ත්වය කොහොමද කියලා කියනවා නම්, මේ රටට ලබාගෙන තිබෙන ණයවල පොලිය ගෙවන්න පසු ගිය අවුරුද්දේ මේ රටේ සමස්ත ආදායම මදි වුණා. ණය ගෙවන්න ඒ ආදායම මදි වුණා. එහෙම තත්ත්වයකට පත් වෙලා තිබෙන රටක් තුළ අද ජනතාවට සහන දෙන අය වැයක් ඉදිරිපත් කිරීමට හැකි වෙලා තිබෙනවා. මෙවැනි ජනතා හිතවාදී අය වැයක් ඉදිරිපත් කිරීම ගැන විශේෂයෙන්ම අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ මානව හිතවාදී බැල්මත්, ඒ වාගේම ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ පරිණත බුද්ධියත්, එතුමාගේ තුන් කල් දැක්මත්, ඒ වාගේම අපේ ගරු රවි කරුණානායක මුදල් අමාත්‍යතුමාගේ හැකියාවත් මේ අවස්ථාවේ දී විශේෂයෙන් අගය කරනවා.

පසු ගිය කාලයේ හිටපු පාලකයින් බලය තාවකාලිකයි කියලා හිතුවේ නැහැ; නිලය තාවකාලිකයි කියලා හිතුවේ නැහැ. බලය සදාකාලිකයි කියලා හිතාගෙන තමයි පසු ගිය කාලයේ පාලකයින් කටයුතු කළේ. "සියලු දේ අනිත්‍යයි" කියන බුදු දහම සනාථ කරමින් කුඩු, එතනෝල්, කැසිනෝ කියන නීති විරෝධී ව්‍යාපාරවලින් මේ රට වෙළා ගෙන පාලනය කරපු යුගය අවසන් වෙලා තිබෙනවා. කුඩු, එතනෝල්, කැසිනෝ කියන නීති විරෝධී ව්‍යාපාරවලින් මේ රට වෙළාගෙන පාලනය කරපු ඒ යුගය අවසන් කරන්නට ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා කෙරෙහි විශ්වාසය තබා, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඇතුළු එක්සත් ජාතික පක්ෂය ගැන විශ්වාසය තබා හංසයා ඉදිරියේ කතිරය ගහපු සියලු ජනතාවට මෙම අය වැය විවාදය පැවැත්වෙන අවස්ථාවේ දී මගේ ප්‍රණාමය පුද කරනවා.

මොකද, මෙවැනි අය වැයක් ඉදිරිපත් කරන්නට ලැබුණේ එවැනි විශ්වාසයකින් කටයුතු කිරීම නිසාය කියන එකත්, ඒ විශ්වාසය කිසි දවසක කඩ නොකර අකුරටම ඉෂ්ට කරනවාය කියන එකත් මේ අවස්ථාවේදී විශේෂයෙන්ම පැහැදිලි කරනවා. අද ඔය කිඹුල් කඳුළු හෙලන හිටපු ඇමතිවරු එක්සත් ජාතික පක්ෂයේ කලින් ආණ්ඩුව කාලයේත් ඒ ගැන කථා කළා. ලෝකයේ තෙල් මිල අඩු වෙනකොට රටේ තෙල් මිල අඩු වෙන විධිය ගැන කථා කළා. ලෝකයේ තෙල් මිල අඩු වෙනකොට ඇයි මේ රටේ තෙල් මිල වැඩි වෙන්නේ, එහෙම නම් මේකට ඇමතිවරයෙක් ඕනෑ නැහැ නේ, ලෝක බැංකුවේ, ලෝක වෙළඳ පොළේ ප්ලග් එක ගලවා පැත්තකට දාන්න ඕනෑ, ඇමතිවරු වැඩ කරන්නට ඕනෑය කියා විපක්ෂයේ හිටපු මන්ත්‍රීවරු - ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා වාගේ අය - කෑ ගැහුවා. ඔවුන්ගේ පාලනය එනකොට මේ ගැන කථා නැහැ. ලෝක වෙළඳ පොළේ තෙල් මිල අඩු වෙනකොට මෙහේ තෙල් මිල වැඩි වෙනවා. මේ සල්ලි ටික කාට ද ගියේ? කාගේ ගිණුම්වලට ද මේ වාසිය බැර වුණේ? ජනතාවට මේ වාසිය ලැබුණේ නැහැ. නමුත් අද කථා කරනවා, ලෝකයේ තෙල් මිල අඩු වුණා, ඒකයි තෙල් මිල අඩු වුණේ, ඒකයි ජනතාවට ප්‍රතිලාභ ලැබුණේ කියා. අදත් එක්සත් ජාතික පක්ෂයේ රජයක් තිබෙන්නේ. ලෝක වෙළඳ පොළේ තෙල් මිල අඩු වෙලා යම් සහනයක් ලැබෙනවා නම් එය සෘජුව ජනතාවට දෙන්න මිසක් එක එක ඇමතිවරුන්ගේ පොකැට්වලට,

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

ගිණුම්වලට ඒ වාසිය බැර කරන යුගයක් නොවෙයි උදා කරන්නේ කියන එක විශේෂයෙන් සඳහන් කරනවා. පසු ගිය පාලන කාලය තුළ ඉන්ධන සහනාධාරය දෙන්න, සහනයක් දෙන්න කියා ඉල්ලපු ධීවරයාට මොකද වුණේ? ඉන්ධන සහනාධාරය දෙන්න, ඉන්ධන මිල අඩු කරන්න කියා හලාවත ධීවරයෝ උද්ඝෝෂණය කළා. එහෙම උද්ඝෝෂණයක් නැතිවත් ජනතාවට සහන දෙන්න ඕනෑ නිසා අද අපි ඉන්ධන මිල අඩු කර තිබෙනවා. නමුත් එදා කළේ උද්ඝෝෂණය කළ අයට වෙඩි තියලා මරා දාපු එකයි. හලාවත ඇන්ටනි ප්‍රමුඛ කණ්ඩායම ඉන්ධන සහනාධාරය දෙන්න, ඉන්ධන මිල අඩු කරන්න, ධීවරයාට සහනය දෙන්න, පොරොන්දුව ඉෂ්ට කරන්න කියා උද්ඝෝෂණය කරද්දී මොකද කළේ? වෙඩි තියලා මැරුවා. වතුර ඉල්ලපු රතුපස්වල ජනතාවට වෙඩි තියලා මැරුවා. ඒ වාගේ තීන්දු තමයි ගත්තේ. ඒකාධිපති පාලනයක්, රජ කෙනෙකුගේ පාලනයක් මේ රටේ පැවැති යුගය නිමා කිරීම සඳහා හංසයා ලකුණ ඉදිරියේ කතිරය ගැසූ සියලු දෙනාටම ස්තූති කිරීමට මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජය භාර අරගෙන දින 20ක කාලය තුළ මෙවැනි ජනතාවාදී අය වැයක් හා ජනතාවට වාසි සහිත අය වැයක් ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම ගැන විශේෂයෙන් අපි ස්තුතිවන්ත වෙනවා. පැවැති ආණ්ඩුවේ හිටපු ඇමතිවරුන්ට නැන්තම් විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට දැන් ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා. මොකක් ද ප්‍රශ්නය? මේවාට සල්ලි කොහෙන් ද, කොහොම ද මේ මිල අඩු කළේ, අවුරුදු විස්සක් මේ රට පාලනය කරලා ඒ අයට ඒක කරන්න බැරි වුණා නේ, අවුරුදු දහයක් රාජපක්ෂ පාලනයේ ඉඳලා, යුද්ධය නැති කරලා අවුරුදු පහක් ගිහිල්ලා, මේ විධියට බඩු මිල අඩු කරන්න, ජනතාවට සහන සලසන්න බැරි වුණානේ කියලා ඒ අයට ප්‍රශ්නයක් ඇති වෙලා. මේවාට සල්ලි කොහෙන්ද, භාණ්ඩාගරයේ සල්ලි නැහැනේ, මේවා කරන්නේ කොහොමද කියා තමයි ඔවුන් අහන්නේ. "හැදෙන ගහ දෙපෙත්තෙන් දැනෙයි" කිව්වාලු. ඒ වාගේ පසු ගිය දවස්වල ආණ්ඩුව ගිය විධිය කොහොම ද කියා අපට දැනුණා.

වර්තමාන අතිගරු ජනාධිපතිතුමා දිවුරුම් දුන් උත්සවය පැවැත්වූයේ කොහොමද? පසු ගිය අවුරුදු දහය තුළ හිටපු ජනාධිපතිවරයාගේ දිවුරුම් දීමේ උත්සවවලට මුදල් කෝටි ගණන් වියදම් කළා. CTB බස් ටික ඔක්කොම පාරට බැස්සුවා. රටේ තිබෙන CTB බස්වලට මේ දිවුරුම් දීමේ උත්සවවලට නොමිලයේ සෙනඟ අදින්න ක්‍රියාත්මක වෙන්නට සිද්ධ වුණා. නමුත් අද රුපියල් හැට දාහකට වඩා අඩු ප්‍රමාණයක් තමයි මේ දිවුරුම් දීමේ උත්සවයට වියදම් වුණේ. එතැනම ඉතිරි වෙච්ච සල්ලි ටික මදි ද? එහෙම නම් ඒ යන ගමන අපට දකින්නට පුළුවන්. ඒ විතරක් නොවෙයි. වර්තමාන ජනාධිපතිතුමාගේ ජාතිය අමතන ඓතිහාසික අවස්ථාව අපි දැක්කා. වෙනදා ඔය උත්සවයට CTB බස් කොච්චර එනවා ද? ආණ්ඩු බලය තිබෙන කොට CTB බස් කීයක් එවනවා ද? මුළු රටේම එදාට private බස් විතරයි දුවන්නේ. ඇයි CTB බස් ටික ඔක්කොම ජාතිය ඇමතීමේ උත්සවවලට ගම්වල සෙනඟ අදින්න යොදා ගෙන තිබුණා. නමුත් අද එහෙම එකක් තිබුණේ නැහැ. අපි දකිනවා, කොහොම ද වියදම් අඩු වුණේ කියා. ආසියාවේ වැඩිම පිරිසක් සිටින ඇමති මණ්ඩලයක් නඩත්තු කළේ අපේ රටෙයි. අර කිව්වා වාගේ පොල් ගහ වෙනුවෙන් විතරක් ඇමතිවරු පත් කරලා තිබුණා. අපේ ප්‍රධාන ආදායම් මාර්ගයක් වෙච්ච පොල් ගහට නිදහසේ වැඩෙන්න ඉඩ ලැබුණේ නැහැ. ඒකත් පාලනය කරන්න ඇමතිවරු දෙන්නෙක් හිටියා.

එදා හිටපු ඇමතිවරු 71 දෙනා වෙනුවට අද ඉන්නේ ඇමතිවරු 31යි. එදාට වඩා හරි අඩකටත් වඩා අඩු ප්‍රමාණයක් තමයි අද ඉන්නේ. එහෙම නම් අද කොච්චර සල්ලි ඉතුරු වෙලා තිබෙනවාද? මේ යන විධියට ජනතාවට මීටත් වඩා සහන දෙන්න අපට පුළුවන් වෙනවා. දින 20ක අත්දැකීම් තුළයි මේ සහන දුන්නේ. විශේෂයෙන්ම මම කලින් කිව්වා වාගේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ මානව හිතවාදී ගුණයත්, අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ පරිණත බුද්ධිය, හැකියාව, දක්ෂතාව හා මෙහෙයවීම තුළත්, රවි කරුණානායක වැනි දක්ෂ මුදල් ඇමතිවරයකුගේ පරිපාලනය තුළත් මේ අවුරුද්ද අග වනකොට මීට වඩා සහන දෙන්න පුළුවන්. පහු ගිය කාලයේදී ඉතිරි කරපු සල්ලිවලින්, නාස්තිය නැති කිරීම තුළින්, දූෂණය නැති කිරීම තුළින්, කෝටි ප්‍රකෝටි ගණන්වල විශාල ව්‍යාපෘති ගැන නැවත සලකා බලා ඒවායේ වියදම් අඩු කිරීම තුළින් ජනතාවට මෙවැනි සහන රැසක් දෙන්න පුළුවන් වුණා නම් ඉදිරියේදී අපේ සංවර්ධන කටයුතුවලදී මීට ඩවා සහන දෙන්න පුළුවන්ය කියන එක මම විශේෂයෙන් මතක් කරනවා.

ඒ විතරක් නොවෙයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එදා පැවති රජය රාජ්‍ය සේවය ශක්තිමත් කළාය කියා පුරසාරම් දෙඩුවා. හැම තැනම ගිහින් කථා කළේ "අපි තමයි රාජ්‍ය සේවය ශක්තිමත් කළේ" කියලායි. එදා රාජ්‍ය සේවය ශක්තිමත් කරන්නට දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවා. රාජ්‍ය සේවකයා දෙපයින් නැගී සිටින, වැඩ කරන පුද්ගලයෙක් බවට පත් කරන්නට දහහත්වන සංශෝධනය ගෙනාවා. නමුත් ඒක අවලංගු කරලා දැම්මා. එහෙම නම් කොහොමද රාජ්‍ය සේවය ශක්තිමත් කළේ? ඒ සංශෝධනය ක්‍රියාත්මක නොකර අවලංගු කිරීම තුළින් රාජ්‍ය සේවකයා දේශපාලනඥයාගේ, පාලකයන්ගේ අතකොළු විධියට, රූකඩ විධියට වැඩ කරන තත්ත්වයට පත් කළා. ඒ ආණ්ඩුව එතැනින් නැවතුණේ නැහැ. එදා රාජ්‍ය සේවකයාට ජීවත් වෙන්න පුළුවන් වැටුපක් ගෙව්වේ නැහැ. එහෙම නම් රාජ්‍ය සේවකයා ශක්තිමත් කළාය කියන්නේ කොහොමද? අඩු ගණනේ තමන්ගේ දරුවාට අධ්‍යාපනය ලබා දෙන්නට, තමන්ගේ දරුවාට බෙහෙත් ටික අරගෙන දෙන්න, තමන්ගේ දරුවාට හරියට කෑම වේලක් සකසා දෙන්න පුළුවන් අන්දමේ වැටුපක් ගෙව්වේ නැහැ. ඔවුන් මානසිකව වැටිටුවා. ඔවුන් දේශපාලනඥයන්ගේ අතකොළු බවට පත් කළා. තමන්ගේ දැනුම බුද්ධිය අනුව කටයුතු කරන පුද්ගලයන් නොවී දේශපාලනඥයන්ගේ රූකඩ බවට පත් වෙන්න සිද්ධ වීම නිසා මානසික පීඩාවලට ඔවුන් ලක් වුණා. අනික් අතට ඔවුන්ට ජීවත් වෙන්න සරිලන වැටුපක් ගෙව්වේ නැහැ. නමුත් මේ රජය මේ අය වැය තුළින් ඒ ගැන හිතා කටයුතු කර තිබෙනවා. රාජ්‍ය සේවකයා මානසිකව බිඳ වැටීම තුළ, ඔහුට ජීවත් වෙන්නට සරිලන වැටුපක් නොගෙවීම තුළ වෙන්නේ මොකක්ද? ඔහුගෙන් සහාය ලබා ගන්නට එන, ඔහුගෙන් සේවය ලබා ගන්නට එන මේ රටේ සාමාන්‍ය ජනතාව තමයි ඒකෙන් අපහසුතාවට පත් වෙන්නේ. ඒ ගැන සලකා බලා තමයි රාජ්‍ය සේවකයාගේ වැටුප වැඩි කළේ. අද බන්දුල ගුණවර්ධන හිටපු ඇමතිතුමා පඩි සූත්‍ර ඉදිරිපත් කළා. පඩිය වැඩි කළාම මෙහෙම වෙනවාය; මෙහෙම වෙනවාය; විප්ලව වෙනවාය කියා කරුණු ඉදිරිපත් කළා. එතුමා ආර්ථිකය පිළිබඳ බුද්ධිමතෙක්. නමුත් රාජ්‍ය සේවකයාගේ වැටුප් වැඩි කරන්න අපට පුළුවන්ය කියන එක අපි ප්‍රායෝගිකව පෙන්නුවා. රාජ්‍ය සේවකයාගේ වැටුප කෙළින්ම රුපියල් 10,000කින් වැඩි කළා විතරක් නොවෙයි, ඔහුට ජීවත් වෙන්නට අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය 13ක -

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු මන්ත්‍රීතුමනි, තවම වැඩි කරලා නැහැ.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

වැඩි කරනවා. භය වෙන්න එපා. අපේ රජය කවදාවත් ඉටු නොකරන පොරොන්දු දීලා නැහැ. රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමා කිසි දවසක අසත්‍යයක් ප්‍රකාශ කරන්නේ නැහැ. අපි ඒ වගකීම අරගෙන තමයි කටයුතු කළේ. පඩි වැඩි කරනවා විතරක් නොවෙයි, හාල්මැස්සන්, කිරි පිටි, සීනි, සැමන් ආදී මේ හැම දෙයකම මිල අඩු කරලා ඔහුට ජීවත් වෙන්න පුළුවන් හොඳ වාතාවරණයක්, හොඳ පරිසරයක් නිර්මාණය කිරීමටත් කටයුතු කර තිබෙනවා.

විශේෂයෙන්ම තවත් කරුණක් කෙරෙහි රජයේ අවධානය යොමු කරනවා. පහු ගිය කාලයේ ටෙලිකොම් ආයතනයට manpower විධියට ගත්ත සේවකයන් ඉන්නවා. විදුලිබල මණ්ඩලයේත් manpower විධියට ගත්ත සේවකයන් ඉන්නවා. අවුරුදු ගණනාවක් තිස්සේ ඒ අය අසරණ වෙලා ඉන්නවා. මේ රජය යටතේ ඒ අයට යම් සහනයක් දී තිබෙනවා. අවුරුදු 7කට වැඩි කාලයක් සේවය කරපු අය ස්ථිර කරන බව කියා තිබෙනවා. නමුත් ඒක තව පොඩ්ඩක් අඩු කරන්න පුළුවන් නම් හොඳයි. ඒ කාල සීමාව අවුරුදු දෙක දක්වා අඩු කිරීම ගැනත් සලකා බලන්නය කියා මම කියනවා. විශේෂයෙන්ම ඒ ගැන රජයේ අවධානය යොමු කරනවා. මොකද, ඒ අය අද අන්ත අසරණ තත්ත්වයට පත් වෙලා ඉන්නවා. ස්ථිර කිරීම්වලින් තොරව සේවකයන් බඳවා ගෙන ඒ අය තමන්ගේ දේශපාලන වැඩ කටයුතු කර ගන්නා අතකොළු බවට පත් කර ගෙන තිබුණා. මේ ස්ථිර නොකරපු සේවකයන් තමන්ගේ ඡන්ද ව්‍යාපාරයේ කොළ ටික බෙදා ගන්න යොදා ගත්තා. සමහර රාජ්‍ය පාලකයන්ගේ ගෙදර වැඩ කරන්න ඒ සේවකයන් යොදවා ගත්තා. එවැනි තත්ත්වයක් උදා කර මේ රාජ්‍ය සේවය බාල්දු කළා, හෑල්ලු කළා. නමුත් මේ අය වැයෙන් ඔවුන්ට යම් සහනයක් ලබා දෙමින් අවුරුදු 7ක් වැඩ කරපු සේවකයන් ස්ථිර කරන බව කියා තිබෙනවා. අඩුම ගණනේ ඒ කාල සීමාව අවුරුදු දෙක දක්වාවත් අඩු කරන්න පුළුවන් නම් හොඳයි කියන කරුණ ගැන මම රජයේ අවධානය යොමු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය කාලයේ පොල් වගාවට ඇමතිවරු දෙදෙනෙක් පත් කර සිටි බව අපි දැක්කා. පොල් වගාවට ඇමතිවරු පත් කළේ; පොල් ගහට ඇමතිවරු පත් කළේ පොල් වගාව සාර්ථක කරන්නද, නැත්නම් පාරිභෝගිකයාට සේවයක් සපයන්නද? නැහැ. රජය රැක ගන්න, පවුල රැක ගන්න තමයි මේ ඇමතිවරු පත් කළේ. පසු ගිය කාලයේ සීනි කර්මාන්ත සංවර්ධන ඇමතිවරයෙක් සිටියා. නමුත් කිසි දවසක සීනි මිල පහළට බැස්සේ නැහැ. දිනෙන් දින සීනි මිල ඉහළ ගියා. ඇමතිවරයා කළේ සීනි මිල ඉස්සීම මිසක් ජනතාවට සහන සැලසීම නොවෙයි. සීනි කර්මාන්තශාලාවල බාල් නැටීම තමයි ඇමතිවරයාගේ රාජකාරිය වුණේ. නමුත් ඇමතිවරයෙක් පත් නොකර සීනි කිලෝවක මිල රුපියල් 10කින් අඩු කිරීමට මේ රජයට හැකි වීම විශේෂයෙන්ම භාග්‍යයක් විධියට සලකනවා.

ඒ විතරක් නොවෙයි, අපි දැක්කා පසු ගිය කාලයේ රාජ්‍ය නායකයෝ ගිහිල්ලා බබාලාව වඩා ගන්නවා. අම්මා වඩා ගෙන ඉන්න බබාව බලෙන් වඩා ගෙන ඉඕනවා. නමුත් දරුවාගේ කිරි පිටි මිල වැඩි වුණා. දරුවාගේ කිරි පිටි ගැන හිතුවේ නැහැ. නමුත් බොරු දරු කැක්කුමක්, බොරු ආදරයක් සමාජයට පෙන්නුවා. මාධ්‍ය ඉස්සරහ සන්දර්ශන කළා. ඒවා තමයි කළේ, දරුවෝ ගැන හිතුවේ නැහැ. නමුත් අපි දකිනවා, අද වන විට කිරි පිටි මිල අඩු කරලා. කැමරාව ඉස්සරහට ගිහිල්ලා දරුවෝ වඩා ගත්තේ නැතත් දරු කැක්කුම මනාවට පෙන්වලා ග්‍රෑම් 400 කිරි පිටි පැකට් එකක් රුපියල් 61කින් අඩු කරන්න පුළුවන් වුණා. දරුවෝ වඩා ගත්ත නායකයන්ට බැරි වුණා, කිරි පිටි මිල අඩු කරන්න. මේ රජය එතැනින් නැවතුණේ නැහැ. දරුවා ලැබෙන්න ඉන්න, පෝෂණ තත්ත්වය අඩු අම්මලාට, දරුවා ලැබෙන්න ඉස්සරවෙලා මව් කුසේ ඉන්න දරුවා ශක්තිමත් කරන්නත් රුපියල් 20,000ක සහන මුදලක් ලබා දීමට කටයුතු කළා. ඒ අය දරුවා වඩා ගන්න එක විතරයි කළේ. එහෙම තමයි ආදරය පෙන්නුවේ. නමුත් දරුවා බොන කිරි පිටි පැකට් එකක මිල රුපියල් 61කින් අඩු කරන්නටත්, දරුවා ලැබෙන්න ඉස්සර මව් කුස තුළ සිටිද්දී අවශ්‍ය ආහාර ද්‍රව්‍ය ගන්නට රුපියල් 20,000කුත් ලබා දෙන්නටත් මේ රජය කටයුතු කළා. එහෙම නම් දරුවාට සැබෑ ආදරයක් තිබෙන්නේ කවුද කියන එක විශේෂයෙන්ම පෙනෙනවා.

එතැනින් විතරක් නැවතුණේ නැහැ. ශක්තිමත් පරපුරක් බිහි කරන්නට හාල් මැස්සන් වාගේ දේවල මිල අඩු කළා. හාල් මැස්සන් කන එක අපෙන් ඇත් වෙලායි තිබුණේ. ඉස්සර අපේ ගෙවල්වල හාල් මැස්සෝ උයනවා. හාල් මැස්සෝ මාළුව අපේ ගෑමි ගෙදරක තිබුණා. නමුත් ඒක නැති වුණා. හැල් මැස්සන්, හෑම් බේකන් කනවා වාගේ සුඛෝපභෝගී දෙයක් වුණා. දැන් හාල් මැස්සන් ගන්න පුළුවන්කම ඇති කරලා ජනතාව මන්ද පෝෂණයෙන් නොපෙළෙන ශක්තිමත් පුද්ගලයන් බවට පත් කරන්න කටයුතු කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි, පසු ගිය කාලයේ අපි දැක්කා වයසක කාන්තාවක් පෙනෙන්න බැහැ, ගිහිල්ලා ඉඹ ගන්නවා. බදා ගන්නවා, රටට පෙනෙන්න. ඒක පෝස්ටර් එකක ගහනවා. වයසක ආච්චි කෙනෙක්ව බදා ගෙන පෝස්ටර් ගැහුවා. ඒක තමයි ඡන්ද ලකුණ වෙලා තිබුණේ. නමුත් වයසක කාන්තාවන්ට මොනවාද කළේ? ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වන මේ වයසක පුරවැසියන්ට මොනවාද කළේ? [බාධා කිරීමක්] ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ බැංකු ගිණුමේ පොලිය අඩු කළා. පුළුවන් කාලයේ ඒ අය කීයක් හරි හම්බ කරලා ඒක බැංකුවේ දමා ගෙන කාටවත් බරක් නොවී සැඳෑ සමය ගත කරන්න හිටපු අය. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ඔබතුමාට වෙන් කළ කාලය අවසානයි. කථාව අවසන් කරන්න. The next speaker is the Hon. Arundika Fernando. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා. ඊට පෙර ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව ගරු මොහමඩ් අස්ලම් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு மொஹமட் அஸ்லம் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. MOHAMED ASLAM *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *took the Chair.*

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. Arundika Fernando, you may commence your speech.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

මට තව කොච්චර වෙලාව තිබෙනවාද?

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து)
(The Hon. Arundika Fernando)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,- [බාධා කිරීමක්] අපේ ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමාට වෙලාව - [බාධා කිරීමක්] ඔබතුමාට වෙලාව නැහැ. වෙලාව ඉවරයි කියලා, ඔබතුමාට කොයි වෙලාවේ ඉඳලා කියනවාද? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ගැන හරියට කියන්න.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. Ajith Mannapperuma, you had already taken three minutes more. Hon. Arundika Fernando, you carry on with your speech.

[අ.භා. 5.03]

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து)
(The Hon. Arundika Fernando)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය ජනාධිපතිවරණයේදී හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට ඡන්දය ප්‍රකාශ කරපු සුවහසක් ජනතාවට මුලින්ම මාගේ ස්තුතිය පුද කරන්න ඕනෑ. මා නියෝජනය කරන පුත්තලම දිස්ත්‍රික්කයේ වෙන්නප්පුව මැතිවරණ කොට්ඨාසය කතෝලික ජනතාව විශාල වශයෙන් ජීවත් වන ප්‍රදේශයක්. ඒ වාගේම එක්සත් ජාතික පක්ෂයට බර ආසනයක් හැටියට තමයි කවුරුත් හැඳින්වුවේ. කටාන ආසනය පරදින විට, එහා පැත්තෙන් මීගමුව ආසනය පරදින විට, ජා ඇල ආසනය පරදින විට, හලාවත වගේ ආසන අඩු මට්ටමකට එනකොට විශේෂයෙන්ම වෙන්නප්පුව මැතිවරණ කොට්ඨාසයේ ජනතාව හිටපු අතිගරු ජනාධිපතිතුමා ගෙන ගිය වැඩ පිළිවෙළට, යුද්ධය අවසන් කරලා එතුමා දුන්න සහනයට, විශේෂයෙන්ම ධීවර හා ගොවි ජනතාවට ලබා දුන් සහනයට,ඒ වාගේම අපේ ප්‍රදේශවල කරපු සංවර්ධනයට කළගුණ සැලකීමක් වශයෙන් එතුමාට විශාල වශයෙන් සහයෝගය දක්වලා ඒ ආසනය ජයග්‍රහණය කළා. ඒ ආසනයේ ජනතාවට මාගේ ස්තුතිය මුලින්ම පුද කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ පණස්හත් ලක්ෂයක ජනතාවක් හිටපු අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ වැඩ පිළිවෙළ අනුමත කරලා, අගය කරලා, යුද්ධය අවසන් කරපු ඒ නායකයාට, සංවර්ධනය ගෙන ආ ඒ නායකයාට, යටිතල පහසුකම් සංවර්ධනය කළ ඒ නායකයාට, රටේ සාධනීය වැඩ පිළිවෙළවල් රාශියක් ක්‍රියාත්මක කරපු ඒ නායකයාට සහයෝගය ලබා දීලා තිබෙනවා. අපේ අවාසනාවට මේ රටේ සිදු වුණ යම් යම් අඩු පාඩු නිසා අපිට මේ තත්ත්වය උදා වුණා. **ඒ** පිළිබඳව අපි ස්වයං විවේචනය කර ගන්න ඕනෑ. අපෙන් සිදු වුණු යම් යම් අඩු පාඩු නිසා අපට පරාජයට පත් වෙන්නට සිදු වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊට හේතු වුණු එක් කාරණාවක් මතු කරනවා නම්, අපි සමහර අවස්ථාවල අන්තවාදී කොටස් සමඟ එකතු වෙලා මේ රටේ මුස්ලිම් ජනතාවගේ ප්‍රසාදය අහිමි කර ගත්තා. ඒ වාගේම අපේ සන්ධානය තුළට එකතු කර ගන්න ඕනෑ අයත් එකතු කර ගත්තා; ඕනෑ නැති අයත් එකතු කර ගත්තා. එක්තරා වෙලාවක වැරදි කරපු අයත් එකතු කර ගත්තා. සමහර වෙලාවට රටේ ජනතාව අතර අප්‍රසාදයට පත් වුණ පුද්ගලයින්ව අපි සන්ධානය තුළට එකතු කර ගත්තා. අපේ සමහර ආසනවල තිබුණ ගැටලු විසඳා ගත්තේ නැහැ. ඒ ගැටලු, අර්බුද සමථයකට පත් කර ගන්නට අපට පුළුවන්කමක් තිබුණේ නැහැ. මේ වාගේ දේවල් නිසා තමයි අපි පරාජයට පත් වුණේ. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාට මේ රටේ මිනිස්සු තවමත් ආදරය කරනවා. තමුන්නාන්සේලා බලන්න. අදටත් බස් රථ අරගෙන මිනිස්සු යනවා හිටපු ජනාධිපතිතුමාව බලන්න. හිටපු ජනාධිපතිතුමා ගැන පුදුම කැක්කුමක්, ආදරයක් මේ රටේ ජනතාවට තිබෙනවා. මොකද, එතුමා යුද්ධය අවසන් කරලා මේ රටට නිදහස ලබා දුන්න නායකයා. ඒ වාගේම තමයි මේ රටට දැවැන්ත සංවර්ධනයක් ගෙන ආ නායකයා. අඩු පාඩු තිබෙනවා. ඒ වාගේම අපි පැහැදිලිවම මේ වේලාවේදී කියන්නට ඕනෑ කාරණයක් තිබෙනවා. මෙතැන ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා ඉන්නවා, මම ඉන්නවා. අපිට මතකයි, අපේ ආණ්ඩුව පැවැති කාලයේ සමහර වෙලාවට මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ මිනිස්සු කියා අපිව හංවඩු ගැහුවා. හැබැයි, අපි ප්‍රතිපත්තියක පිහිටලා මහින්ද රාජපක්ෂ මැතිතුමාව පසු ගිය මැතිවරණයන්හිදී ජයග්‍රහණය කරවලා අදටත් අපි ඒ ප්‍රතිපත්තිය තුළ ඉන්නවා. හැබැයි, එහෙම නොකරපු අය අපි දැක්කා. සමහර වේලාවට පුද්ගලයෝ හඳුනා ගන්න ගිහිල්ලා සමහර දේවල් වැරදුණා. ඒක නිසා අපි ඒ ගැන ස්වයං විවේචනයක් කරන්න ඕනෑ.

අපේ පක්ෂයේ ලේකම්තුමා හැටියට සිටි මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මේ රටේ ජනාධිපති ධුරයට පත්වීම සම්බන්ධයෙන් අපි අවංක සිතින් අපේ සුභ පැතුම් පුද කරනවා. එතුමාගේ දේශපාලන ව්‍යාපාරයට අපිට සහයෝගය දෙන්න බැරි වුණාට, එතුමා පොළොන්නරුව වාගේ ගොවි ජනතාව නියෝජනය කරන ප්‍රදේශයකින් බිහි වුණු නායකයෙක් හැටියට, දැවැන්ත දේශපාලන පරිණතභාවයක් අත් දැකීමක් තිබෙන නායකයෙක් හැටියට මේ රටේ ජනතාවගේ සිතුම් පැතුම් තේරුම් අරගෙන ලොකු ගමනක් යයි කියා අපි හිතනවා. අපි එතුමාට සුභ පතනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ වේලාවේදී එක දෙයක් ගැන කියන්න ඕනෑ. මෙතැන විහිළුවක් තිබෙනවා. මොකක්ද විහිළුව? මේ රටේ මිනිසුන් ඡන්දය දුන්නේ, ජනාධිපතිතුමා ඉවත් කරන්නයි. හැබැයි, ජනාධිපතිතුමා ඉවත් කරන කොට මේ රටේ 2/3ක ආණ්ඩුවක් සම්පූර්ණයෙන් විපක්ෂයට ගිහිල්ලා අනිත් පැත්තෙන් සම්පූර්ණයෙන්ම සුළුතර කණ්ඩායමක් මේ බලය අතට අරගෙන තිබෙනවා. ඒ සුළුතර කණ්ඩායම අද මැතිඇමැතිකම් කරනවා; අගමැතිකම් කරනවා. අපේ කිසිම ගැටලුවක් නැහැ. ජනාධිපතිතුමා අයින් කරන්න තමයි, මේ රටේ මිනිසුන් ඡන්දය දුන්නේ. හැබැයි, අද වෙන කොට ආණ්ඩුවක් අයින් වෙලා අගමැති කෙනෙකු පත් වෙලා, ඇමතිවරුන් පත් වෙලා, ආයතනවල වෙනස්කම් සිදු වෙලා රට සම්පූර්ණයෙන්ම විපර්යාසයකට පත් වෙලා තිබෙනවා. කමක් නැහැ. හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහත්මයා පරදවා නව ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ඒ වැඩ පිළිවෙළට ජනතාව දුන් තීන්දුවට අප මේ වේලාවේදී සම්පූර්ණ සහයෝගය ලබා දෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. දින සියයේ වැඩ පිළිවෙළ තුළ අප මේ රජයේ අය වැයට විතරක් නොවෙයි, ගෙනෙන ඕනෑම සාධනීය දෙයකට සහයෝගය ලබා දෙනවා. හැබැයි, මේ අය වැය තුළදී වුණත්, අය වැයෙන් පිටතදී වුණත් මේ රජය මොනවා හෝ වැරැද්දක් කරනවා නම් ඒ වැරැද්දට විපක්ෂයක් හැටියට අප සම්පූර්ණයෙන්ම අපගේ විරෝධය දක්වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රටේ සෝභිත හාමුදුරුවන් වාගේ නායක ස්වාමීන් වහන්සේලා යහ පාලනය ගැන කථා කළා. විධායක ජනාධිපති ක්‍රමය තුළ තිබෙන යම් යම් අඩු පාඩුකම් ගැන කථා කළා. ඊළඟට, පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමය ගැන, අනුපාත මැතිවරණ ක්‍රමයේ තිබෙන අඩු පාඩුකම් ගැන සමාජයේ කථා කළා. මේ වෙනස්කම් සිදු කිරීමට මේ ආණ්ඩුවට වුවමනා වෙලා තිබුණා. හැබැයි, අපි එක දෙයක් කියනවා. මේක මගේ පෞද්ගලික මතය. මැතිවරණ ක්‍රමය ගත්තොත්, මේ මැතිවරණ ක්‍රමයේත් -අනුපාත මැතිවරණ ක්‍රමයේත්- හොඳ ලක්ෂණ තිබෙනවා. කේවල මැතිවරණ ක්‍රමයේත් හොඳ ලක්ෂණ තිබෙනවා. මේ දෙකෙන් හොඳ දෙයක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න. විධායක ජනාධිපති ක්‍රමයේ යම් යම් අඩු පාඩුකම් තිබෙනවා නම් ඒවා සකස් කරලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න. තමුන්නාන්සේලාට කොමිෂන් සභා ගෙනෙන්න ඕනෑ නම් ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න. තවත් රුපියල් කෝටි ගණනක් වියදම් කරලා

මේ අනුපාත මැතිවරණ ක්‍රමය තුළම තවත් මැතිවරණයක් පවත්වා විනාශකාරී විධියට සල්ලි නාස්ති කරන්නේ නැතුව මේ පාර්ලිමේන්තුව පාවිච්චි කරන්න. අපි ඊට සහයෝගය ලබා දෙන්නම්. තව අවුරුද්දක කාලයක් තිබෙනවා. ඒ අවුරුද්දක කාලය තුළදී මේ පාර්ලිමේන්තුව පාවිච්චි කරලා තමුන්නාන්සේලා හොඳ දේවල් ගෙනෙන්න. හොඳ දේවල් ගෙනෙන එකට අප තමුන්නාන්සේලාට සහයෝගය ලබා දෙන්නම්.

දැන් තමුන්නාන්සේලා කියනවා, ඊළඟට මැතිවරණයක් තබා සභාග ආණ්ඩුවකට යන්න ඕනෑය කියලා. හැබැයි, ඒ මැතිවරණයේදී විරසකවීම් ඇති වෙන්න පුළුවන්. එහෙම මැතිවරණයක් තුළ තරග කරද්දී, තමුන්නාන්සේලා හා අප අතර සටටන ඇති වෙන්න පුළුවන්. ඊළඟට, සභාග ආණ්ඩුවකට එන්නේ කොහොමද? එහෙම නම් සභාගයක් හැටියට මේ පාර්ලිමේන්තුව පාවිච්චි කරන්න. මේ පාර්ලිමේන්තුව පාවිච්චි කර අප සාකච්ඡා කරලා මේ මැතිවරණ ක්‍රමවලට, විධායක ජනාධිපති ක්‍රමයට, මේ කොමිෂන් සභාවලට ගෙනෙන්න තිබෙන සාධනීය පියවරයන් ගෙනෙමු. අපි මේ ගැන හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාටත් කිව්වා. අපි කිව්වා, "ඉතිහාසයේ කවදාවත් අපට මේ වාගේ 2/3ක බලයක් හැදුණේ නැහැ, අනාගතයේ හැදෙන්නේත් නැහැ. ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමාටත් කරන්න බැරි වුණා, 2/3ක බලයක් තිබිලා. ඔබතුමාට 2/3 බලයක් තිබෙන පාර්ලිමේන්තුවක් තිබෙනවා. ඒ 2/3ක බලය තිබෙන පාර්ලිමේන්තුවේ ඔබතුමා ගෙනෙන්න ඕනෑ හොඳ පියවරවල් ගෙනෙන්න. අපි ඒකට උදව් කරන්නම්." කියලා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து)
(The Hon. Arundika Fernando)
හැබැයි, ඒකේ අඩු පාඩු සිදු වෙලා තිබෙනවා. එහෙම නම් මේ 2/3ක බලය පාවිච්චියට ගන්න. පාවිච්චියට අරගෙන කරන්න තිබෙන හොඳ දේවල් කරන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තව විනාඩියක, දෙකක කාලයක් ලබා දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අය වැය ගත්තාම, මේ අය වැය තුළ මේ ආණ්ඩුව ගෙනැල්ලා තිබෙන සාධනීය යෝජනා තිබෙනවා. ඒවා ඉෂ්ට කරයි කියලා අප බලා ගෙන ඉන්නවා. හැබැයි, මේ ආණ්ඩුව මේවාට මුදල් සොයා ගන්නා ආකාරය ගැන යම් යම් පරස්පරතා තිබෙනවා. තමුන්නාන්සේලා තමුන්නාන්සේලාගේ ආදායම සහ වියදම පියවා ගන්නා ආකාරය පිළිබඳව, ආදායම එකතු කර ගන්නා ආකාරය පිළිබඳව පරස්පරතා තිබෙනවා. ඒ වාගේම තමයි, ප්‍රාග්ධන වියදම් අඩු කරලා තිබෙනවා. මම එක උදාහරණයක් කියන්නම්. මගේ මැතිවරණ කොට්ඨාසයේ ජනතාව ධීවර වරායක් හදනකම් බලා ගෙන සිටියා. අද ඒක ගැන කථාවක්වත් නැහැ. අඩුම ගණනේ වැඩිම මුහුදු තීරයක් තිබෙන පුත්තලම් දිස්ත්‍රික්කයේ ඉඳලා මන්නාරමට යන තෙක් එකම ධීවර වරායක්වත් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අය වැයේ ප්‍රාග්ධන වියදම් කපා තිබෙනවා. පුනරාවර්තන වියදම් වැඩි කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ, මේ ආණ්ඩුව මේ කරන වැඩ පිළිවෙළ දිහා ජනතාව බලා ගෙන ඉන්නවා; අපි බලා ගෙන ඉන්නවා; අපි හොඳ දෙයට සහයෝගය දෙනවා; හැබැයි, රජයක් හැටියට ජනතාවට අහිතකර දේවල් කරනවා නම් අනිවාර්යයෙන්ම අප විපක්ෂයක් හැටියට ඒකට විරුද්ධ වෙනවා කියලායි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. DEW Gunasekara. You have 10 minutes.

[අ.භා. 5.12]

ගරු ඩිව් ගුණසේකර මහතා
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නව මුදල් ඇමතිවරයෙක් අලුත් අය වැයක් ඉදිරිපත් කළ අවස්ථාවේ එතුමාට සුබ පැතීම අපේ පාර්ලිමේන්තුවේ සම්ප්‍රදායයක්. මුදල් ඇමතිතුමා දැන් ගරු සභාවේ නොසිටියත් ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමාගේ මාර්ගයෙන් ප්‍රථමයෙන්ම සම්ප්‍රදායානුකූලව මගේ සුබ පැතුම් එතුමාට පිරිනමන්න මා බලාපොරොත්තු වනවා.

එතුමා ඉදිරිපත් කළ අය වැය, අතුරු අය වැයක් වශයෙන් හඳුන්වා දුන්නා. මා නම් කල්පනා කරන්නේ නැහැ ඒක උචිත හඳුන්වා දීමක් කියලා. අතුරු අය වැයකට වඩා මෙය සංශෝධිත අය වැයක්. මොකද, එතුමාගේම වාර්තාව කියවා බලන කොට ඒ වාර්තාවේ තිබෙනවා, පසු ගිය වසරේ ඔක්තෝබර් මාසයේ 24වැනි දා ඉදිරිපත් කළ අය වැයට සංශෝධන මේ අය වැයේ අන්තර්ගත කරලා තිබෙන බව. මූලික වශයෙන් එදා අමාත්‍යාංශ 60කට වෙන් කර තිබුණු මුදල් මෙදා අමාත්‍යාංශ 31කටත්, රාජ්‍ය අමාත්‍යාංශවලටත් යළි වෙන් කිරීමක් කර තිබෙනවා. ඒක පළමුවැනි ප්‍රධාන ලක්ෂණයයි.

දෙවැනුව තිබෙනවා, අලුත් ආදායම් යෝජනා. විශේෂයෙන්ම ඒ යෝජනා ඉදිරිපත් කරන්න ඇත්තේ, ජනාධිපතිවරණයේදී දුන්නු පොරොන්දු ඉෂ්ට කිරීමේ අරමුණින් වෙන්න ඕනෑ. එය දේශපාලන වශයෙන් ජනතාවට දුන්නු ප්‍රතිඥාවක්. ඒ අනුව භාණ්ඩ රාශියක බදු අඩු කිරීමට බලාපොරොත්තු වෙලා තිබෙනවා. ඒවායේ මිල වහාම අඩු වන එකක් නැහැ. ඒක මම පිළිගන්නවා. මොකද, ආනයන බදු අඩු කළාම පාරිභෝගිකයාට මිල අඩු වීමේ වාසිය එන්න ටික කලක් යනවා. අපිත් වමේ පක්ෂ හැටියට හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට හැම අය වැයකදීම භාණ්ඩ ලැයිස්තුවකුත් ඉදිරිපත් කළා. අපි පාර්ලිමේන්තුවේ ඉදිරිපත් කළ හැම අය වැයකදීම කියා සිටියා, ජනතාවට බලපාන්නා වූ අවශ්‍යම භාණ්ඩ 10ක බදු අඩු කරන්න කියලා. භාණ්ඩ 10ක් වෙනුවට 13ක මිල අඩු කරන්න මෙවර කටයුතු කරලා තිබුණා. මම හිතන හැටියට ඒක සාධනීයයි. හොඳ දෙයක් කරනවා නම් අපි ඒකට විරුද්ධ වන්නේ නැහැ. අපි ඒක අගය කරනවා.

තුන්වන කාරණාව, මේ අය වැයේ තිබෙනවා අලුත් ආදායම් මාර්ග. හැබැයි, බදු ප්‍රතිපත්තිය පැත්තෙන් වෙනසක් කරන්න කටයුතු කරලා නැහැ. ඒක අපි අපේක්ෂා කරන්නෙත් නැහැ. මොකද, දවස් 20ක් ඇතුළත සම්පාදනය කළ අය වැයක ඇත්ත වශයෙන්ම බදු ක්‍රමයට අත ගහන්න ටිකක් අමාරුයි; කල් වේලා යනවා. නමුත් විශේෂයෙන්ම ආදායම් බදු පැත්තෙන් යම් සහනයක් දීලා තිබෙනවා. උපයන විට ගෙවීමේ බද්දෙන් පළමු රුපියල් ලක්ෂ 6 නිදහස් කර ඒ ආදායම් සීමාව රුපියල් ලක්ෂ 7 ½ දක්වා වැඩි කර තිබෙනවා. මම දකින එකම සාධනීය දෙය එයයි. ඒ සහනයේ වාසිය මධ්‍යම පාන්තිකයන්ට, විශේෂයෙන්ම රජයේ සේවකයන්ට ක්ෂණිකව ලැබෙනවා. ඊළඟට අපි දකිනවා බදු ක්‍රමයට අලුත් බදු ගණනාවක් ඉදිරිපත් කරලා තිබෙන බව. විශේෂයෙන්ම මන්දිර බද්ද, කැසිනෝ බද්ද ආදී නොයෙක් බදු ඉදිරිපත් කර තිබෙනවා. මම දන්නේ නැහැ කුමන අරමුණක් ඇතිව මේ බදු යෝජනා ඉදිරිපත් කළාද කියලා. අපේ හිටපු මුදල් ඇමතිවරයෙකු වන රොනී ද මෙල් මහත්මයා හමු වෙලා ඔහුගේ

[ගරු ඩිව් ගුණසේකර මහතා]

ආශිර්වාදය ලබාගෙන තමයි රවි කරුණානායක මහත්මයා එදා අය වැය කථාව ඉදිරිපත් කරන්න ආවේ. ඔහුව අනුගමනය කරමින් එතුමා තමන්ගේ කථාව කළ බවක් පෙනුණා.

තමුන්නාන්සේලාට මතක ඇති, 1977 සමගි පෙරමුණු ආණ්ඩුව පරාජයට පත් වෙලා ඉස් ඉස්සෙල්ලාම ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ අය වැය රොනී ද මැල් මහත්මයා ඉදිරිපත් කළ අවස්ථාව. ඔහුගේ අය වැය දැන් යළිත් කියවා බලන්න ඕනෑ. එදා මුළු අය වැය කථාවෙන් සියයට 50ක් තිබුණේ බණ්ඩාරනායක මැතිනියට පහර ගහලා. එපමණක් නොවෙයි. කොහේවත් ඉන්න ජෝන් මුදලාලිට, දාස මුදලාලිට, මැකලම් මුදලාලිට පතුරු යන්න ගහලා තිබුණා. එදා ටිකක් වෛරී දේශපාලනයක් මතු වෙලා තිබුණා. මට හිතෙන හැටියට බදු පැනවූවෙත් පළි ගැනීමක් විධියටයි. අපේ රවි කරුණානායක මුදල් ඇමතිතුමාත් සමහර විට රොනී ද මෙල් මහත්මයාගේ ආශිර්වාදය ලබා ගෙන ද කොහේද මට පෙනෙන්නේ මේ "මන්දිර බදු" කියන යෝජනා ගෙනැල්ලා තිබෙන්නේ. බදු අය කිරීම පිළිබඳව ආර්ථික විද්‍යාවේ මූල ධර්මවත් නොසලකා නිකම්ම බද්දක් ගහන්නම් වාලේ බද්දක් ගහලා. වර්ග අඩි 5,000ට වැඩි නිවාසවලට බදු ගහන රටක් ලෝකයේ කොහේවත් ඇත්තේ නැහැ. බදු ගහන්න ඕනෑ නම් ක්‍රම තිබෙනවා.

අපට අපේම අත් දැකීම් තිබෙනවා. අපට ධන බද්දක් අය කරන්න පුළුවන්. එතකොට ඒක සියලු දෙනාටම බලපානවා. මිලියන 10කට වැඩිය තිබෙන අයට සියයට භාගයක් ගෙවන්න කියන්න පුළුවන්. ඒක ඔක්කෝටම බලපානවා. නමුත් මේ විධියට තොරාගත්ත ගෙවල් 1000කට විතරක් බද්දක් අය කරනවාය කියනකොට, දැන් ඒකට අතුරු ප්‍රශ්න ඇවිල්ලා තිබෙනවා. ඊළඟට වලව්වලට බදු අය කරන්න යනවා. අද වලව්වලට ආදායම් නැහැ. හැබැයි, වටිනාකම තිබෙනවා. ඒත් ඒ මිනිසුන්ට ආදායමක් නැහැ. ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා ඒක දන්නවා. පරණ වලව්වල ජීවත්වන අයට විශාල ආදායම් මාර්ගයක් ඇත්තේ නැහැ. හැබැයි, වලව්වේ වටිනාකමක් තිබෙනවා. මම හිතන හැටියට ඒ බද්දට නම් කිසිම සාධාරණ පදනමක් ඇත්තේ නැහැ. එය අවිචාරාත්මක බද්දක්. මේවා කරන්න පුළුවන් ක්‍රම තිබෙනවා. නවීන බදු ක්‍රම තිබෙනවා. ධන බද්දක් අය කරන්න පුළුවන් සියයට භාගයක පමණ වටිනාකමක් අරගෙන. ගරු අධිකරණ ඇමතිතුමනි, ඒ නිසා පැහැදිලිවම කියන්න පුළුවන් මෙය තෝරා බේරාගෙන, target කරලා අය කරන්න හදන "වෛරී බද්දක්" කියලා. ඒක ටිකක් හොඳ මදි කියලායි මම කල්පනා කරන්නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
සංශෝධනය කරන්නම් අපි. [බාධා කිරීම්]

ගරු ඩිව් ගුණසේකර මහතා
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)
ඔව්. ඒ නිසාමයි මම කියන්නේ ඒක අසාධාරණයි කියලා. බද්දක් පනවනකොට ඒක සමස්තයටම බලපාන්න ඕනෑ. විශේෂයෙන්ම, පසු ගිය අවුරුදු 10ක කාලය තුළ අය වැය වාර්තාවලින් ඉදිරිපත් කරපු කාරණාවක් තමයි, අවුරුදු 10 ඇතුළත ඇති වුණ ශීඝ්‍ර ආර්ථික වර්ධනයත් එක්ක විශාල ආදායම් පරතරයක් තිබෙනවාය කියන එක. ජනාධිපතිතුමාගේ නිදහස් දින කථාවේදී ප්‍රධාන වශයෙන් ඒ කාරණය - ආදායම් පරතරය - මතු කරලා පෙන්වූවා. ආදායම් පරතරයක් තිබෙන කොට අලුත් ප්‍රශ්න සමාජයේ ඇති වෙනවා. අධිකරණ ඇමතිතුමාට තමයි ඒවාට මුහුණ පාන්නට සිද්ධ වෙන්නේ. ඉතින් ඒකට තිබෙන සූත්‍රය මොකක්ද? ආර්ථික විද්‍යාවට අනුව ඒ බදු මාර්ග තුලනය කරන්න ඕනෑ. බදු පරතරය අඩු කරන්න ඕනෑ. ඒකට ක්‍රම සහ විධි තිබෙනවා. එහෙම කිව්වාට මම බලාපොරොත්තු වෙන්නේ නැහැ දවස් 20කින් මේ කියන කාරණා වහාම ඉටු කරන්න ඕනෑ කියලා. මම හිතන හැටියට එය යළි සලකා බලා, කථා බහ කරලා තීරණය කරන්න ඕනෑ.

ගරු රවි කරුණානායක මුදල් ඇමතිතුමා පැහැදිලි කාරණා දෙකක් නිශ්චිත වශයෙන් මතු කරලා තිබුණා. එකක්, ණය පිළිබඳ කාරණාව. එම වාර්තාවේ මූලික කාරණාව වශයෙන් මම ඒක පිළිගන්න කැමැති නැහැ. එතුමා කියා තිබෙනවා, මීට කලින් වාර්තාවල තිබෙන සම්පූර්ණ ණය ප්‍රමාණය අඩුවෙන් තමයි ගණන් බලලා තිබෙන්නේ කියලා. ඒකට හේතු කියලා තිබෙනවා. ඒ හේතු මොනවාද? බැංකු විසින් පිට රටින් ගන්නා ලද ණය මෙයට ඇතුළත් වෙලා නැහැ, වෙනත් ආයතන බැංකුවලින් ගත්ත ණය මෙයට ඇතුළත් වෙලා නැහැ, භාණ්ඩාගාරය Guaranteesවලින් ලබා ගත්ත ඒවා මෙයට ඇතුළත් වෙලා නැහැ කියන එක. මේක Budget එකක්. Budget එකක් තිබෙන්නේ Estimates අනුව. ආදායම හා වියදම estimate කරලා තිබෙනවා. Budget framework එකට ඒවා ඇතුළත් වෙන්නේ නැහැ. Consolidated Fund එකේ ඒවා විතරයි ඇතුළත් වෙන්නේ. එතුමා ඒක නොදැන එහෙම කිව්වාද කියන්න මම දන්නේ නැහැ. භාණ්ඩාගාර ලේකම්වරු හරියාකාරව එතුමාට මග පෙන්වීමක් කරලා නැහැ. Estimates වලට අනුව පමණයි මුදල් පෙන්වන්නේ. අනෙක් මුදල් වෙනම පෙන්වලා තිබෙනවා. ඒවා මෙයට සම්බන්ධ වෙන්නේ නැහැ. අය වැය පරතරය සියයට 4ක්, සියයට 6ක් එනකොට ඒ මුදල් ගණන් ගන්නේ නැහැ. ඒවා වෙනම ගණන් බලන්න පුළුවන්. ඒ මුදල් අය වැයට බද්ධ කරන්න පුළුවන් කමක් ඇත්තේ නැහැ. මම හිතන හැටියට ඒ සම්බන්ධ වැරැදි මඟපෙන්වීමක් කරලා තිබෙන බව පෙනෙනවා. එම නිසා ඒ කාරණාව නිවැරැදි වෙන්න ඕනෑ.

මෙම ණය ගන්නා ලද වකවානුව තිබෙන්න ඕනෑ. ණය ගන්න එක හොඳ නැහැ. නමුත් ණය නොගන්න රටක් ඇත්තේ නැහැ. ඇමරිකාව ණය ගන්නේ චීනයෙන්. කවුරුත් ණය ගන්නවා. අපටත් ණය ගන්න හේතු තිබුණා. විදේශීය ආයෝජන නැත්නම් අපට ණය ගන්න සිද්ධ වෙනවා. එදා ඒ ණය ගන්න අවස්ථාවේ අපට අභියෝග දෙකක් තිබුණා. එක පැත්තකින් යුද්ධයක් තිබුණා. අනෙක් පැත්තෙන් 2007 ඉඳලා 2014 වෙනතෙක් අවුරුදු 7ක් ආර්ථික අර්බුදයක් තිබුණා. ඒ තත්ත්වය යටතේ කාගෙන් හරි ණය ගන්න ඕනෑ. සමහර අවස්ථාවල සියයට 6 පොලියට ණය ගත්තා වැඩියි කියලා තර්ක කරන්න පුළුවන්. නමුත් බොහෝ ණය අරගෙන තිබෙන්නේ සියයට 1ක, සියයට 2ක, සියයට 3ක, සියයට 4ක පොලියට. කීපයක් තමයි සියයට 6 පොලී ප්‍රමාණයට අරගෙන තිබෙන්නේ. සම්පූර්ණයෙන්ම ඒ ණය manage කරන්න පුළුවන් විධියට තමයි අරගෙන තිබෙන්නේ. They are manageable and affordable. ඒ නිසා ජනතාව බය කරන්න දෙයක් නැහැ. අපේ ආර්ථිකය කඩා වැටෙන තත්ත්වයක් ඇත්තේ නැහැ. ඒ පැත්තෙන් බලනකොට ඒ කාරණාව අපි හරියට කරලා තිබෙනවා.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
තව කාලය ඕනෑ ද?

ගරු ඩිව් ගුණසේකර මහතා
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)
තව කාලය තිබෙනවා ද?

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු මන්ත්‍රීතුමනි, මගේ විනාඩි 10ත් අරගෙන ඔබතුමා කථා කරන්න.

ගරු ඩිව් ගුණසේකර මහතා
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)
මම මිනිත්තු කීපයකින් අවසන් කරනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The Hon. Mahinda Amaraweera is left with eight minutes. You can take that time.

ගරු ඩිව් ගුණසේකර මහතා
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ණය පිළිබඳ කාරණාව ගැන කථා කරනවා නම්, අපට එදා ණය ගන්න තැනක් නැති වෙන කොට චීනය විතරයි හිටියේ. අද අපට විවේචන කරන්න පුළුවන් චීනයෙන් ණය ගත්තා කියලා. ඇමෙරිකාවත් ණය ගත්තේ චීනයෙන්. අපි විතරක් නොවෙයි. මුළු ලතින් ඇමෙරිකානු රටවල් 33ම ණය ගන්නේ චීනයෙන්. ලෝක ආර්ථික රටාව වෙනස් වෙලා. ඒක අලුත් සාධකයක්. අපි වෙනත් තැන්වලින් ණය ගන්න අකැමැති හන්දා චීනයෙන් ණය ගත්තා නොවෙයි. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා විශේෂ ඇල්මක් චීනයට දක්වපු නිසා චීනයෙන් ණය ගත්තා නොවෙයි. ඒක පවතින ලෝක යථාර්ථය. ඇමෙරිකාවේ ඔබාමා චීනයට යනවා නම් ණය ගන්න, ඒ තමයි පවතින ආර්ථික යථාර්ථය. [*Interruption*.] You do not know. ණය ගන්නවා. You know a little about it. Learn your economics before you talk about it. අරගෙන බලන්න, "Newsweek" ආදී සඟරාවල ඒ තොරතුරු තිබෙනවා. American literature අරගෙන කියවලා බලන්න. ආර්ථිකය කඩා වැටුණු වෙලාවේ stimulus එකකට, ආර්ථිකය පණ ගැන්වීමට liquid cash ගන්න සිද්ධ වුණා. තමුන්නාන්සේ දැන ගන්න, ලෝකයේ තිබෙන ඩොලර් ප්‍රමාණයෙන් තුනෙන් එකක් අද තිබෙන්නේ චීන ආර්ථිකය තුළ කියන එක. ඒක තමයි ඇති වුණ වෙනස. චීනයෙන් අපි ණය ගත්තේ ඒ තත්ත්වයන් යටතේ මිසක් වෙනත් කාරණාවක් නිසා නොවෙයි. ණය ගැනීමේ කාරණාව අපට පාලනය කරන්න පුළුවන්.

රනිල් වික්‍රමසිංහ එදා අගමැතිතුමා හැටියට හිටපු කාලයේ පනතක් තිබෙනවා. ඒ තමයි, Fiscal Management (Responsibility) Act එක. ඒ සීමාව තුළ තමයි මේ ණය අරගෙන තිබෙන්නේ. 2001 වෙන කොට ඒ සීමාව සියයට එකසිය දෙක පැන්නා. දැන් සියයට හැත්තෑඅටයි. Treasury guarantee කියන්නේ සල්ලි දෙන එකක් නොවෙයි. ඒක guarantee එකක් පමණයි. ඒක කොහොමද අය වැයට ඇතුළු කරන්නේ? ඒක guarantee එකක්. ඒක ණය දීමක් නොවෙයි නේ. මම දන්නවා, මුදල් ඇමතිතුමා ගණකාධිකාරිතුමෙක් කියලා. The Hon. Minister is a chartered accountant. But, ඒක ප්‍රමාණවත් නැහැ. ආර්ථික විද්‍යාවත් ටිකක් දැන ගන්න ඕනෑ.

අපේ අධිකරණ ඇමතිතුමාත් ඒ වාගේම කිරිඇල්ල ඇමතිතුමාත් දෙන්නාම මේ ගරු සභාවේ ඉන්න නිසා කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. දිගින් දිගටම අපි ඉල්ලා සිටියා, විශාල වශයෙන් අපේ රටේ තිබෙන ආදායම් පරතරය අඩු කරන්න ප්‍රගතිශීලි බදු ක්‍රමයක් අපේ රටේ ඇති කරන්න කියලා. අපි මේ කාරණය කලින් ආණ්ඩුවටත් කිව්වා. අපි මේ කාරණය අමාත්‍ය මණ්ඩලයේදී, පාර්ලිමේන්තු කණ්ඩායමේදී, පාර්ලිමේන්තුව තුළදී දිගින් දිගටම කිව්වා. ඒත් ඒකට ඇහුම් කන් දුන්නේ නැහැ. දැන් ආණ්ඩුව වෙනස් වෙලා තිබෙන තත්ත්වයක් යටතේ ඒ කාරණය යළිත් මතු කරන්න බලාපොරොත්තු වෙනවා. ඒක අවශ්‍යයි.

අපේ රටේ ඉන්න ආර්ථික විද්‍යාඥයන්, සමාජ විද්‍යාඥයන් සියලු දෙනා එකට එකතු වෙලා හදාපු කොමිෂන් සභා වාර්තාවක් තිබෙනවා. Taxation Commission එකේ Report එකක් තිබෙනවා. ඒ Report එකේ හොඳ මඟ පෙන්වීමක් කරලා තිබෙනවා. මම විජයදාස රාජපක්ෂ ඇමතිතුමාගෙනුත්, කිරිඇල්ල ඇමතිතුමාගෙනුත් මේ කාරණය ඉල්ලා සිටිනවා. ඒ Report එක ප්‍රකාශයට පත් කරලා නැහැ. භාණ්ඩාගාරය අවුරුදු දෙකක් තිස්සේ ඒක යට ගහලා තිබෙනවා. කරුණාකරලා ඒක ගෙන්වා ගන්න බලන්න. ඒක මේ රටේ ඉන්න ඉහළම මට්ටමේ ආර්ථික විද්‍යාඥයන් විසින් අපේ රටේ ප්‍රගතිශීලි බදු ක්‍රමයක් හදන්න ඕනෑ කියලා හදපු වාර්තාවක්. ඒක කාටත් සාධාරණ වාර්තාවක්. අන්න ඒ වාර්තාව අරගෙන බලන්න. ඒක වහාම ක්‍රියාත්මක කරන්න කියන එක නොවෙයි මා කියන්නේ. ඉදිරිය සඳහා ඒ වාර්තාවෙන් හොඳ මඟ පෙන්වීමක් කරලා තිබෙනවා. ඒ වාර්තාව ලබා ගැනීම අපි සටන් කරලාත් කර ගන්න බැරි වුණු දෙයක්. ඒ නිසා,- [බාධා කිරීමක්] මම ජනාධිපතිතුමාට ඒ ගැන කිව්වා. එතුමා මගෙන් පිටපතක් ඉල්ලුවා. මගේ ළඟ පිටපතක් නැහැ. මම ඒ පිටපතක් ජනාධිපතිතුමාට ලැබෙන්න මාර්ගයක් සකස් කළා. ඒක ඉතාම වැදගත් කාරණාවක්. මොකද, බදු ප්‍රතිපත්තියක් සකස් කිරීම අත්‍යවශ්‍යමයි.

අද ලෝකයේ ආර්ථික ක්ෂේත්‍රයේ මතු වෙච්ච ප්‍රධාන ප්‍රශ්නයක් තමයි, inequality කියන කාරණය. දුප්පත්කම දැන් අඩු වේ ගෙන යනවා. දුප්පත්කම දැන් සියයට 6ට අඩු වෙලා. නමුත් ඒකට අලුත් ප්‍රශ්නයක් එනවා, social inequality කියලා. ඒක මහ විශාල බරපතළ ප්‍රශ්නයක්. මේ අපරාධ රැල්ල පිටි පස්සේ තිබෙන්නේ ඒ කාරණාව. තමුන්නාන්සේට හෙට අනිද්දා වෙන කොට සිද්ධ වෙනවා, අකමැත්තෙන් හෝ එල්ලුම් ගහ ක්‍රියාත්මක කරන්න. එල්ලුම් ගහ ක්‍රියාත්මක කිරීම ගැන මම නම් ප්‍රතිපත්තියක් හැටියට විරුද්ධයි.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එල්ලුම් ගහ දැම්මා කියලාත් හරි යන්නේ නැහැ.

ගරු ඩිව් ගුණසේකර මහතා
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)
එයින් ප්‍රශ්න විසඳෙන්නේ නැහැ. නමුත් විෂමතාවක් - inequality එකක් - තිබෙනවා. ඇති - නැති පරතරය විශාල වශයෙන් පුළුල් වෙලා, පසු ගිය අවුරුදු දහයේ. ඒ නිසා ඒකට Mansion Tax දාලා හරි යන්නේ නැහැ. රවි කරුණානායක මැතිතුමා කිව්වා, Mansion Tax ගහන්න හේතුව විශාල වශයෙන් හොර ජාවාරම් කරලා ලබා ගත්ත සල්ලිවලින් හදපු නිවාස තිබෙන නිසා කියලා. ආදායම් බදු දෙපාර්තමේන්තුවට ඒවා හොයන්න පුළුවන්. හොයලා බලලා back duty ගහන්න පුළුවන්. කළු ආර්ථිකය නිල ආර්ථිකයට ඇතුළත් වෙලා තිබෙනවා නම් ඒ සල්ලි ගැන ආදායම් බදු දෙපාර්තමේන්තුවට හොයලා බලන්න පුළුවන්. ඒවාට විධි ක්‍රම, විද්‍යාත්මකව හොයන මාර්ග තිබෙනවා. එහෙම නැතිව අර අහිංසක ලක්ෂ්මන් කිරිඇල්ල මහත්තයාගේ වලව්වටයි, තවත් වලව්වලටයි මේ බදු ගහලා හරි යන්නේ නැහැ.

[ගරු ඩී.ඩබ්. ගුණසේකර මහතා]

සමහර වලව්වල අය එදා වේල කන්න නැතිව බොහොම අමාරුවෙන් ඉන්නේ. හැබැයි, වලව්වේ වටිනාකම ලොකුවට තිබෙනවා. අද නවීන බදු ක්‍රම තිබෙන කාලයේ වැඩවසම් ක්‍රමයේ බදු ගහන්න යන්න එපා. ඒක රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාට ගැළපෙන්නේත් නැහැ; අපේ මානවවාදී ජනාධිපතිතුමාට ගැළපෙන්නේත් නැහැ. අන්න ඒ නිසා ඒ කාරණා දෙක කෙරෙහි තමුන්නාන්සේලාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. මම මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Vasudeva Nanayakkara. You have 12 minutes .

[අ.භා. 5.29]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ දින සියයේ හෝරාව. දින 100ක් ඇතුළත කරන්න ලැස්ති කර ගත්ත වැඩ ගොඩාක් තිබෙනවා. ඒ අතරේ ඉතා වැදගත් දෙයක් තමයි, මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම සහ ජනාධිපති ක්‍රමය වෙනස් කිරීම. මේ දෙක එකට සම්බන්ධයි. මේ දෙක එකට ගමන් කරන බල තන්ත්‍රයක ව්‍යුහය තුළයි ස්ථානගත වෙලා තිබෙන්නේ. ඒ නිසා දින 100ක් නොවෙයි, දින 200ක් හෝ අරගෙන මේ වැඩ ටික ඉවර කරලා දමන්න. වැඩ ටික ඉවර කරලා දාලා ඊට පස්සේ අපි ජන්දයකට යමු. තමුන්නාන්සේලා ඇත්තටම දින සියයට සීමා කරගෙන මේ හදිසි වෙන්නේ ඊළඟ Budget එක ගෙනෙන්නයි. මට පෙනෙන්නේ එහෙමයි. මේක මේ තුන් මාසයේ Budget එකක්. තමුන්නාන්සේලා මහ මැතිවරණයෙන් පස්සේ ගෙනෙන්න යන්නේ ඇත්ත Budget එක.

ගරු ඩී.ඩබ්. ගුණසේකර මහතා
(மாண்புமிகு டீயூ குணசேகர)
(The Hon. DEW Gunasekara)
ඒ Budget එකත් ටිකක් ප්‍රමාද කරන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම ඒ නිසාමයි තමුන්නාන්සේලාට කියන්නේ ඒ Budget එක පුළුවන් තරම් ප්‍රමාද කර ගන්න පුළුවන් නම් ඒක අපිට ලොකු දෙයක් කියලා. ඇයි, අපි එහෙම කියන්නේ? නරක අනාගත වාක්‍යයක් අපි කියන්නේ ඇයි? මොකද, අපි දැකලා තිබෙනවා, "Regaining Sri Lanka" වැඩසටහනේ තිබෙන අන්තර්ගතය.

ලෝකය පුරාම සංවර්ධිත රටවලත් දැන් තිබෙන්නේ කප්පාදුව. හැම තැනම කප්පාදුව ක්‍රියාත්මක වන්නේ. මිනිසුන්ගේ මූර්ත වැටුප්වල කප්පාදුව, පහළ තලයේ ඉන්නා වූ අතිවිශාල බහුතරයකගේ මූර්ත ආදායම්වල කප්පාදුව, ඒ අතර ඩී.ඩබ්. ගුණසේකර මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඉහළට සංකේන්ද්‍රණය වන වස්තු සම්භාරය. දැන් මේ තත්ත්වය යටතේ මෙහි තිබෙන්න වෙන්නේත් කප්පාදුව තමයි. අපි පොඩ්ඩක් මේ ගැන කල්පනා කරලා බලමු.

තමුන්නාන්සේලා සීනිවල මිල අඩු කළා. ඒක ඉතාම හොඳ දෙයක්. අපි ඉල්ලා හිටියා, අත්‍යවශ්‍ය ද්‍රව්‍ය 10ක මිල අඩු කරන්න කියලා. අපි අන්තිමට බැරි තැන අත්‍යවශ්‍ය ද්‍රව්‍ය පහකවත් මිල අඩු කරන්න කියලා ඉල්ලා හිටියා. කාගෙන්ද? අපේ මහින්ද රාජපක්ෂ මහතාගේ රජයෙන්. ඒක අපිට ලැබුණේ නැහැ. අපි දිගටම ඉල්ලුවා. නමුත් ලැබුණේම නැහැ. එහෙව් අපිට මේ අත්‍යවශ්‍ය ද්‍රව්‍ය 13ක මිල තමුන්නාන්සේලා අඩු කළාම ඒක ප්‍රීති ඝෝෂා පැවැත්වීමට හේතුවක්. මොකද, ඒක අපේ ඉල්ලීමක්. මේ ජනමත බලපෑමට අපේ ශක්තියත් එකතු වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා මේ කළේ අනේපිඩු සිටාණන් කළා වාගේ වැඩක් නොවෙයි.

ගරු ඩී.ඩබ්. ගුණසේකර මහතා
(மாண்புமிகு டீயூ குணசேகர)
(The Hon. DEW Gunasekara)
හැටඑක් ලක්ෂයයි, පනස්හත් ලක්ෂයයි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
හැටඑක් ලක්ෂයක හා පනස්හත් ලක්ෂයක ජනතාව ඒකාබද්ධව කරපු ඉල්ලීම තමයි මේ බඩු වල මිල අඩු කිරීම. නමුත් ඒ අතර බලන්න ඕනෑ කාරණයක් තිබෙනවා. සීනි හොඳ උදාහරණයක්. එක පැත්තකින් අපි තීරු බදු අඩු කළාම සීනිවල මිල අඩු වෙනවා. දේශීය වශයෙන් අපේ සීනි කිලෝ එකක නිෂ්පාදන වියදම රුපියල් 80යි. එතකොට උක් ගොවීන්ට අපිට දෙන්න වනවා, විකුණුම් මිලක්. ඒ, දැන් තිබෙන cost of production එක අනුව ගෙවන රුපියල් 80 නොවෙයි. එතකොට cost of production එකට අඩුවෙන් විකුණන්න වනවා. ඇයි? මුළු වෙළෙඳ පොළේම අඩු මිල සීනි තිබෙනවා. අඩු මිල සීනි මුළු වෙළෙඳ පොළේම තිබෙන කොට අපේ රජයේ සංස්ථාවේ නිෂ්පාදනය කරන සීනි වැඩි මිලට විකුණන්න බැහැ නේ; විකිණෙන්නේ නැහැ නේ.

ඒ නිසා ඒවා අඩු මිලට විකුණන්න නම්, subsidy එකක් දෙන්න වෙනවා. මම කියන්නේ මේවා ඔක්කෝම කරන්න වෙනවා කියලායි, සීනි නිෂ්පාදනයක් තියා ගන්න වුණොත්. දැන් බලන්න, එකකට එකක් සම්බන්ධ වෙන හැටි. සීනි මිල අඩු කළා. ඊළඟට, අපේ උක් කර්මාන්තය පවත්වා ගෙන යන්න ඕනෑ. ඒකට අපි subsidy එකක් දෙනවා. ඊළඟට සීනිවල cost of production එක රුපියල් අසූවයි. ඒ විකුණුම් මිලට දෙන්න බැහැ. ඒ නිසා ඒකට subsidy එකක් දෙන්න වෙනවා. දැන් බලන්න, භාණ්ඩාගාරයෙන් වියදම් කරන මුදල කොච්චරද කියලා. මේවා ඔක්කෝම ගණන් බලලා තිබෙනවාද, සීනි මිල අඩු කරන කොට? නැහැ නේ. ඒකයි මම කියන්නේ, ඉතාමත්ම කෙටි කාලීනව, මැතිවරණය ජයග්‍රහණයෙන් ආපු ජනතාවගේ බලපෑමේ සාදය තමයි තමුන්නාන්සේලා මේ ලබා දීලා තිබෙන්නේ කියලා. නමුත් මේවා කරන කොට බලන්න ඕනෑ, කොහොමද ඉදිරි කාලයට මේවා සම්බන්ධ වෙන්නේ, කොහොමද ඒවාට මුහුණ දෙන්නේ කියලා. එතකොට තමයි මම කලින් සඳහන් කළ අනෙක් Budget එක එන්නේ. ඒකයි තමුන්නාන්සේලාට කලබල, තුන් මාසයක් යන කොට මහ මැතිවරණය තියන්න. හැබැයි මතක තියා ගන්න, තුන් මාසයකින් පස්සේ එන්නේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ බහුතර රජයක් බව. ඒක මතක තියා ගන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපේ මැතිවරණ ප්‍රකාශනයේ තිබුණා, අප්‍රේල් 23 වැනිදායින් පසුව පාර්ලිමේන්තුව විසුරුවා හරිනවා කියලා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
නැහැ, එහෙම පොරොන්දුවක් වුණේ නැහැ. වැඩ කරනවා කියලායි පොරොන්දු වුණේ, දින සියයක් ඇතුළත.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අප්‍රේල් 23 වැනිදායින් පසුව පාර්ලිමේන්තුව විසුරුවා හරිනවා කියලා අපේ මැතිවරණ ප්‍රකාශනයේ තිබුණා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒක හරි. එහෙම කිව්වේ, වෙන එකකට නොවෙයි. දින සියය ඇතුළත මේ දේවල් කරනවා කියලායි කිව්වේ. මේවා මොකුත් නොකර අප්‍රේල් 23 වැනිදායින් පසුව පාර්ලිමේන්තුව විසුරුවා හරිනවා කියලා නොවෙයි නේ කිව්වේ. ඉතින් මේවා කර ගන්න බැරි වුණොත් අපි උසාවියේදී කල් ඉල්ලනවා වාගේ date එකක්, දෙකක් ඉල්ලන්න පුළුවන් නේ.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - நீதி மற்றும் தொழில் உறவுகள் அமைச்சர்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe - Minister of Justice and Labour Relations)
පුළුවන්, පුළුවන්.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම කියන්නේ ඒකයි.

ඊළඟට, මම කියන්න යන්නේ මේ කාරණයයි. "හංසයා" ලකුණට ඡන්දය දීපු මාගේ මිත්‍රයෙක් ඉන්නවා, තිස්ස ද සිල්වා කියලා සිවිල් ඉංජිනේරුවරයෙක්. මිනිහාගේ චර්යාව ගැන කියනවා නම්, අතේ සල්ලි තිබුණාට මිනිහා රජයේ රෝහලට ගිහිල්ලා තමයි බෙහෙත් ගන්නේ; මිනිහා තමයි කඩ පොළට ගිහිල්ලා බඩු මිලදී ගන්නේ. තිස්ස ද සිල්වා "හංසයා" ලකුණට ඡන්දය දෙන අතර මටත් කිව්වා, "හංසයා" ලකුණට ඡන්දය දෙන්න කියලා. තිස්ස ද සිල්වා මේ ළඟදී මට හමු වුණා. මිනිහා හෘදයාබාධයට බෙහෙත් ගන්න යන්නේ කළුබෝවිල රෝහලට. ඒ ගියාම එයාගේ clinic එක - සායනය - ඉවර වුණාට පස්සේ දොස්තර මහත්මයා කිව්වාලු, "ඒ බෙහෙත් වර්ග නම් මෙහේ නැහැ" කියලා. මම කියන්නේ නැහැ, ඔබතුමන්ලාගේ ආණ්ඩුව පත් වුණු හැටියේ සියලුම බෙහෙත් වර්ග සැපයිය යුතුව තිබුණාය කියලා. ඒක නොවෙයි මම මේ කියන්නේ. ඊළඟට, සතොසට ගියාම අඩු මිලට සහල් නැහැ; අඩු මිලට මාළුත් නැහැ. මෙහෙම කිව්වේ, හංසයාට ඡන්දය දීපු තිස්ස ද සිල්වා.

එතුමා ඉතා වැදගත් එක දෙයක් කිව්වා. මේ හොරකම් අල්ලන එක ඔබතුමන්ලා කොහොමත් කළ යුතුමයි. ඒක කොහොමත් කළ යුතු දෙයක්. හොරකම් අල්ලනවා කියන්නේ, නීතිය ක්‍රියාත්මක කිරීම නේ. ඒක ගැන ඒ තරම් විශාල කථාවක් ඕනෑ නැහැ. ඒක කරන්න. හැබැයි මහජන පහසුකම් විපරම් කමිටුවක් හදන්න. දූෂණ විපරම් කමිටුවක් හදනවාට වඩා මහජන පහසුකම් විපරම් කමිටුවක් හැදීම සුදුසුයි කියලා තිස්ස ද සිල්වා කියා සිටියා. මම තමුන්නාන්සේලාට යෝජනා කරනවා, අපි මහජන පහසුකම් විපරම් කමිටුවක් හදමු කියලා.

මේ අඩු කරපු බඩුවල මිල එහෙමම තිබෙනවාද? ඊයේ මම රත්නපුරයේ ඉඳලා ආවා. රත්නපුරයේ නම් තිබුණේ නැහැ. හැබැයි ඇහැලියගොඩ තිබුණා. මේක හරි අසමාන තත්ත්වයක්. මේ ගැන සොයා බලා නියාමනය කරන්න ඕනෑ. මේ අඩු කරපු මිල ගණන් හැම ප්‍රදේශයකම ජනතාවට ප්‍රයෝජනවත් වෙනවාද කියලා බලන්න තමුන්නාන්සේලාට යන්ත්‍රණයක් නැහැ නේ. ඒක නේ වෙලා තිබෙන්නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
පාරිභෝගික සේවා අධිකාරිය තිබෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
පාරිභෝගික සේවා අධිකාරියෙන් ඒවා බලන්නේ නැහැ නේ. එතැනට පැමිණිල්ලක් ලැබුණොත් ඒක විභාග කරන එක නේ කරන්නේ. යමක මිල වැඩියි කියලා, එක්කෝ එහි expiry date එක පහු වෙලා කියලා, එක්කෝ ඒකේ යම් කිසි දූර්වලතාවක් තිබුණා කියලා, සේවාවේ යම් කිසි අඩුවක් තිබුණා කියලා පැමිණිලි ලැබුණොත් ඒවා ගැන නේ එතැන විභාග කරන්නේ. ඒ නිසා මහජන පහසුකම් ගැන සොයා බැලීම සඳහා නිසි යන්ත්‍රණයක් අවශ්‍යයි.

ඊළඟට මම කියන්න හැදුවේ මේ බදු පිළිබඳවයි. තමුන්නාන්සේලා හොඳ බදු ටිකක් ගහලා තිබෙනවා. මේ බදු මොනවාද කියලා මම කියන්න යන්නේ නැහැ, විශාල බදු තිබෙනවා. මම හිතන්නේ මේ බදුවලට අහු වෙන ඔක්කෝම අය සියයක් විතර ඇති. සියදෙනෙක් විතර තමයි මේ බදුවලට අහු වෙන්නේ. ඒ ඔක්කෝම තමුන්නාන්සේලාගේ ප්‍රතිවාදී ධනපතියන්. තමුන්නාන්සේලාගේ ප්‍රතිවාදී ධනපතියන්ට හොඳ බදු ටිකක් ගහලා තියෙනවා. මම නම් හරිම කැමැතියි. මම ඒ ගැන මගේ සතුට පළ කරනවා.

ගරු ඩිව් ගුණසේකර මහතා
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)
අපටත් ලෙඩ දාපු මිනිස්සු.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒ ගොල්ලන් අපටත් ලෙඩ දාපු මිනිස්සු.

ඒ නිසා තමුන්නාන්සේලා මේ ප්‍රතිවාදී ධනපතියන්ට විශාල වශයෙන් බදු ගැහුවාට අපි බොහොම කැමැතියි.

හැබැයි මතක තියා ගන්න, ඕනෑ දේ ඒක නොවෙයි. තමුන්නාන්සේලා රටට පෙන්වන්න හදන්නේ "අපි බදු ගැහුවේ ධනපති පන්තියට විරුද්ධවයි" කියලා. ඒක බොරු. ධනපති පන්තියට විරුද්ධව බදු ගහනවා නම් ඔහොම නොවෙයි ගහන්නේ, ඔයිට වඩා ලොකු කුට්ටියක් එකතු කර ගන්න තිබුණා. එහෙම බදු ගහන්නේ මෙන්න මෙහෙමයි. ගරු ඩිව් ගුණසේකර මන්ත්‍රීතුමා දැන් ඒ ගැන ටිකක් කිව්වා.

සමාජවාදී ජනතා පෙරමුණ වශයෙන් අපේ ඉල්ලීමක් තිබුණා, අපේ රජයෙන්. රජයේ ආදායමෙන් සියයට 80ක් වක්‍ර බදු තිබෙනවා. ඍජු බදු තිබෙන්නේ සියයට 20යි. අපි කිව්වා මේක වෙනස් කරලා වක්‍ර බදු සියයට 60ක් කරන්න, ඍජු බදු සියයට 40ක් කරන්න කියලා. ඒක කරන්න තමුන්නාන්සේලා විපක්ෂයේ ඉන්න කාලයේවත් කවදාවත් යෝජනා කළේවත් නැහැ, ඒක

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

යෝජනා කළේත් අපි නේ. ඒ මොකද? තමුන්නාන්සේලා ධනපති පන්තිය වෙනුවෙන් ඉන්න නියෝජිතයින් නිසා. ඒ නිසා කවදාවත් තමුන්නාන්සේලා ඍජු බදු වැඩි කරන්නට යෝජනා කරන්නේ නැහැ. ඒ නිසාම තමයි තමුන්නාන්සේලාට වුවමනා වුණේ ධනපති විරෝධී සංදර්ශනයක් දමන්න. ඒක තමයි තමුන්නාන්සේලා මේ බදු ගැහිල්ලෙන් කළේ. ඒ බදු ගහලා තිබෙන්නේ ධනපති පන්තියට නොවෙයි, තමුන්නාන්සේලාට දේශපාලන වශයෙන් අරියාදු කළ ධනපති ප්‍රතිවාදී පිරිසකට. ඒ නිසා අපි තමුන්නාන්සේලාගෙන් ඉල්ලනවා බදු අභියාචනා කොමිෂන් සභා පනතත් එළියට අර ගෙන ඇවිල්ලා මේ විධියට සමාජ සාධාරණත්වය ගැන කතා කරන්න කියලා.

ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමා-මෛත්‍රිපාල සිරිසේන ගරු ජනාධිපතිතුමා- 67වන ජාතික නිදහස් දිනයේදී කිව්වා, මේ තිබෙන දරිද්‍රතාව අඩු කිරීම තමයි තිබෙන ලොකුම ප්‍රශ්නය කියලා. දරිද්‍රතාව, ඇති නැති පරතරය අඩු කිරීම ගැන එතුමා කථා කළා. මෙතුමාත් කතා කළා ඇති නැති පරතරය ගැන. නමුත් ජනාධිපතිතුමා කතා කළා ඇති නැති පරතරය හා දරිද්‍රතාව කියන දෙකම අඩු කිරීම පිළිබඳව. ඇති නැති පරතරය අඩු කරන්න තිබෙන ක්‍රමය මොකක්ද? දරිද්‍රතාව අඩු කරන්න තිබෙන ක්‍රමය මොකක්ද? ලෝකයේ කවුරුත් පිළිගත්ත දෙයක් තමයි අඩු ආදායම් ලාභීන්ට ඍජු සහන ලබා දෙන්නට ඕනෑය කියන කාරණය. ඊළඟට, ඉහළ ආදායම් ලාභීන්ට ඍජු බදු නියම කරන්නට ඕනෑ. ඔන්න ඔය දෙක කළොත් මේ ඇති නැති පරතරය අඩු වෙනවා.

මොනවාද මේ අඩු ආදායම් ලාභීන්ට දෙන සහන? හොඳ ප්‍රවාහන සේවයක් ලබලා දෙන්න ඕනෑ, ඒක ලාභය උදෙසා නොවෙයි සේවය උදෙසා. හොඳ වෛද්‍ය සේවයක් ලබලා දෙන්න ඕනෑ. අද තිබෙන පෞද්ගලික අංශයේ සෞඛ්‍ය සේවයට අපේ මිනිසුන් යන්නේ කැමැත්තෙන් නොවෙයි, නොගිහින් බැරි නිසා. අපේ මිනිසුන් පෞද්ගලික අංශයේ වෛද්‍ය සේවයට යන්නේ ගෙදර තිබෙන දේවල් උකස් තියලා. ඇත්තටම මිනිස්සු මොන තරම් අඩියකට වැටිලා ඉන්නවාද කියලා බලන්න පුළුවන්, ඒ තරම් වත්කමකුත් නැහැ; ඒ තරම් දුප්පත් වෙලාත් නැහැ. පෞද්ගලික වෛද්‍ය සේවයට ගිහිල්ලා තියෙන තුට්ටු දෙකත් නැති කර ගෙන, අන්තිමට තමන් විශාල අර්බුදයකට මුහුණ දෙනවා.

ගරු ඩිව් ගුණසේකර මහතා
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)
ඇඳ උඩ මැරෙන්නද, ඇඳ යට මැරෙන්නද?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඇඳ යට මැරෙනවා වෙනුවට ඇඳ උඩ මැරෙනවා.

වෛද්‍ය සේවයත් ලාභය උදෙසා නොවෙයි සේවය උදෙසා, අධ්‍යාපනයත් ලාභය උදෙසා නොවෙයි සේවය උදෙසා කියලයි මම කියන්නේ.

අපි හැම දාම අපේ ආණ්ඩුවට කිව්වා, අධ්‍යාපනයට ප්‍රතිපාදන වැඩි කරන්න කියා. සෞඛ්‍ය සේවයට ප්‍රතිපාදන වැඩි කරන්න, ප්‍රවාහන සේවයට ප්‍රතිපාදන වැඩි කරන්න කිව්වා. අපේ ආණ්ඩුව ඒකට උත්තරයක් දුන්නේ නැහැ. තමුන්නාන්සේලාගේ තිබෙන්නේත් පොරොන්දුවක් පමණයි. තුන් මාසයේ අය වැයෙන් පසුව එන්නා වූ අර ගිනිගෙඩි අය වැයේදී -ඒක එන්නේ ඡන්දයෙන් පස්සේ- මේ ප්‍රශ්නය ඉතිරි වෙන්නේ මේ විධියටම පමණයි. ඒ නිසා මේ රටේ ජනතාවගේ උද්ඝෝෂණ ඇති වෙනවා. ඊළඟට, තමුන්නාන්සේලාට අනෙක් සෑම තැනම වාගේ පාවිච්චි කරන්න වෙන්නේ එක් පැත්තකින් කප්පාදුව, අනෙක් පැත්තෙන් මර්දනය. ඔය දෙක තමයි අනාගතයේදී තමුන්නාන්සේලාගේ වැඩ පිළිවෙළ වෙන්නේ. -එසේ නොවේවා! මම ඒකට කැමැති හින්දා කියනවා නොවෙයි- නමුත් මම දකින අනාගතය මොකක්ද කියලා කියන්න ඕනෑ. මොකද, තමුන්නාන්සේලාට සිද්ධ වෙනවා එක පැත්තකින් නිෂ්පාදනය ආරක්ෂා කරන්න, මේ රටේ රැකියා ආරක්ෂා කරන්න, මේ රටේ ආර්ථිකයේ වර්ධනය ආරක්ෂා කරන්න, කෘෂිකර්මයේ වර්ධනය ආරක්ෂා කරන්න.

නිෂ්පාදනය, කෘෂිකර්මය හා විවිධ අංශ ආරක්ෂා කරන්න සිදු වනවා. දැන් ඒක කරන එකයි, අනෙක් පැත්තෙන් තීරු බදු අඩු කළාම ඒ නිසා අර්බුදයට යන මේ නිෂ්පාදන රකින එකයි කියන මේ දෙකම කරන්න බැහැ. තමුන්නාන්සේලා ඔය දෙකෙන් එකයි තෝරා ගන්නේ. අන්තිමට තමුන්නාන්සේලා තෝරා ගන්නේ-

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
I will conclude, Sir. මා අවසන් වශයෙන් කියන්නේ මෙකයි. ඇත්තටම මෙකට කරන්න තිබෙන්නේ එකම දෙයයි. ඒ තමයි ද්විත්ව මිල ක්‍රමය ක්‍රියාත්මක කිරීම. ඒක අපි කිව්වා. රුපියල් 50,000ට අඩු ආදායම් තිබෙන අයට පමණක් සීනි මිල අඩු කළා නම්, මේ බඩුවල මිල අඩු කළා නම් ඉවරයිනේ. ඒ අයට සීමිත ආකාරයට සලාකයක් දුන්නා නම් ඉවරයිනේ. දැන් අද Galle Face එකට එන සුදු සංචාරකයා පුඩිම් කන්නෙත් තමුන්නාන්සේලා ඔය අඩු කළ පිටි මිලෙන්; ඔය අඩු කළ සීනි මිලෙන්. ඉතින් තමුන්නාන්සේලා මේ රටේ කාවද subsidize කරන්නේ? සහන දෙන්නේ මේ රටේ ඉහළ පන්තියත් ඇතුළත්වයි. ඒක මෝඩ වැඩක්. තමුන්නාන්සේලා ද්විත්ව මිල ක්‍රමයට එන්නේ නැහැ. ඒ මොකද? තමුන්නාන්සේලා වෙළෙඳ පොළවාදියි. වෙළෙඳ පොළේ තිබෙන්නා වූ මිල මට්ටම්වලට -

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු මන්ත්‍රීතුමනි, ද්විත්ව මිල ක්‍රමය ක්‍රියාත්මක කරන වෙනත් රටවල් තිබෙනවා ද?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
තිබෙනවා. වෙනිසියුලාව වාගේ රටවල ද්විත්ව මිල ක්‍රමය ක්‍රියාත්මක කරනවා. ද්විත්ව මිල ක්‍රමයක් නැත්නම් අන්තිමට අපට කරන්න වෙන්නේ අඩු මිලට ඕනෑ නැති අයටත් අඩු මිලට දෙන්න වෙන එකයි. දැන් බලන්න, නිදහස් අධ්‍යාපනය දිහා. අද නිදහස් අධ්‍යාපනයේ වැඩිම ප්‍රයෝජනය ගන්නේ කවුද? ආදායම් නැති අයද, ආදායම් ඇති අයද? ඉතින් අපට ආදායම් ඇති අයට කියන්න බැරිද, " ඔයගොල්ලන්ගේ ළමයින් නිදහසේ අධ්‍යාපනය ලබනවා. ඒක වෙනුවෙන් බද්දක් ගෙවන්න" කියලා. එහෙම නොකරන්නේ තමුන්නාන්සේලා ඒ ආදායම් ලබන ඉහළ පන්තිය වෙනුවෙන් පෙනී සිටින නිසයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා කථාව අවසන් කරනවා. ඇත්තටම මේ අපට දුන්නේ ජයග්‍රහණයේ ප්‍රීතිය නිමිත්තෙන් පොඩි සාදයක්. සාදය අවසන් වනවා, වැඩි කල් පවතින්නේ නැහැ. ඒ වාගේම සාදයෙන් පසුව එනවා ගිම්හානය. ඒකට සූදානම් වෙන්නට අපේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ සියලු දෙනා ඉතා එක්සත්ව සූදානම් බව ඔබට මතක් කරමින් මා නිහඬ වනවා.

[5.45 p.m.]

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
Mr. Deputy Chairman of Committees, today I am speaking after three Leftist Veterans. I really do not envy speaking after the three veterans, whom I always respect. But, I see today the Leftist Members of Parliament talking about the Super Gain Tax and the Mansion Tax. You are the people who should be promoting it, not denouncing it. You may feel that these are cosmetic -

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
We are very happy about it.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
Okay. Yes, you said so. I am sorry.

You are saying that these are cosmetic proposals to show that we are against these so-called "super-rich" people. Actually, these taxes have been brought because during the last nine years, a certain group of people who were close to the then administration were allowed to make exorbitant profits. People, who were ordinary professionals and those with a small capital have become billionaires in a short period of time only because they were allowed to exploit the system to make exorbitant profits. So, these people have to be taxed. Many of these taxes are one-time taxes.

Also, we have taxed casinos, we have taxed betting and gaming and also liquor manufacturers. These are three areas in which the then Government supported those few capitalists to become multi-billionaires in this country and they have exploited the system without paying the dues to the Government.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
They were subsidized by the Government.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
They were subsidized by the then Government to become rich quickly. They have robbed from the EPF. There are people who manipulated the share market, who started with, maybe, Rs. 10 million and who are billionaires today. So, these people have to pay up for what they stole from the system. Therefore, these are the proposals that we have made so that those dues can be collected to the Government.

As the Hon. Vasuveda Nanayakkara said, the difference between the rich and the poor has to be narrowed. He also said that we always wanted the indirect taxes to be reduced and the direct taxes to be increased. I am one person who has always been saying in this House that the direct taxes should be increased and indirect taxes should be reduced. As he said, the poor people also buy sugar and use two spoons in their cup of tea. The rich man cannot take sugar because he has diabetes and he does not use sugar at all. So, who is paying the taxes? We, in our Manifesto said that we would reduce the duties and the taxes and pass on the benefits to the people, so that they would have a better life. To some extent, through the reduction of prices of 13 food items, we have done that. We have done that on sugar, flour and so many other items, especially on milk powder . These are essentials of the people. The Hon. Minister mentioned specifically that the reduction of the price of flour would benefit the plantation people in a big way. Similarly, we are people who use black gram or *ulundu* to make *thosai* or *ídli* for our day-to-day meal. The tax on black gram was Rs. 110 per kilo and it has been reduced by Rs. 60. It gives us, the people of Indian origin or the Tamil people in general, the opportunity to enjoy more of these food that we like. So, these are things that have been thought out and proposed.

I heard the Hon. (Prof.) Tissa Vitarana talking about the price of *parippu*. The tax levied on a kilo of *parippu* is only Rs. 2. Reducing that Rs. 2 is not going to have an impact. If it was Rs. 20, we could have reduced it to Rs. 10 and given a concession to the people. - [*Interruption.*] No, we do not want to subsidize red lentil, which is imported. Why should we subsidize a foreign farmer? It is better to subsidize a local farmer.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
You can subsidize the local consumer.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
We are prepared to give it to the consumer, but not at the expense of supporting a foreign farmer. The better method is to subsidize a local alternative rather than a foreign farmer. This is why we did not touch *parippu*. There has always been consideration for *parippu* and that is the reason why the duty on *parippu* had remained low. So, there is no way for us to give further concessions.

[ගරු ආර්. යෝගරාජන් මහතා]

As far as fuel is concerned, when a barrel of crude oil was only US Dollars 110 in the world market, prices were fixed. When it came down to US Dollars 45 also, the previous Government was exploiting it; they were making profit. But, now we have a price formula and we are going to apply that formula in the future. The people are not getting any subsidy and we are also not going to subsidize the Ceylon Petroleum Corporation. They have to meet the needs of the people of the country, producing fuel at a fair price based on the crude oil prices, so that the Government does not lose money. They might have to subsidize, maybe, kerosene and diesel to keep the transport cost low, but not necessarily petrol. So, we are trying to address this in a very prudent manner.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
Your price reduction is temporary.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
It is not temporary. We have reduced prices with the idea of introducing a formula so that - [*Interruption.*] No, we do not say that this is going to be fixed, but we are not going to exploit it.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
Tell the people that you have reduced the price of kerosene temporarily.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
No, Hon. Mahinda Yapa Abeywardena, I am a person who respects you a lot. In those days, you were a UNPer, I am told. I have not known you as a UNPer. Yet, I want to tell you that this is not to cheat the people. What we are saying is, in the past when the price of a barrel of crude oil was fixed at US Dollars 110 and it came down to US Dollars 45, the Mahinda Rajapaksa Government, which you supported and made representations to - as you said here - did not listen. At least, today, you are making representations in the hope that we would listen. That is a good thing because you gave up hope on them, but you supported him trying to bring him back to power and you failed. At least, now you think that your rational thinking would have an impact on our thinking to act in a rational way.

The Hon. (Prof.) Tissa Vitarana and I sat on the All-Party Representative Committee. We produced a Report. The Hon. (Prof.) Tissa Vitarana went and presented it to the former President. All of your leftist parties are willing for devolution of power to the regions so that we all can live together. But, what happened to that Committee Report? It was shelved; it was hidden as if it never came to him. - [*Interruption.*] Yes. So, that happened to the Hon. Tissa Vitarana. Just now, the Hon. DEW Gunasekara spoke about the Report of the Taxation Commission. You work on a committee, put all your effort and bring out a report that you think is prudent, rational and necessary for this country. Then, what happens? Some so-called "ආර්ථික ඝාතකයා" puts it into the waste paper basket; all your efforts are wasted.

Then, the Hon. Vasudeva Nanayakkara, just now mentioned about another document. I did not hear him properly.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Hate Speech Legislation draft.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
Yes, the Hate Speech Legislation. Then, you brought proposals about the National Anthem. All those were not regarded. Still, you regret that that regime, which did not listen to you has been washed out.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
It was regretted because there was a perspective.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
No, there was no perspective; he had no perspective. He had perspective only for his family, not for this country.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
No.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
We have, today, a situation where the people feel free and that they can reconcile among the communities. That message was given yesterday by His Excellency the President or the Honourable President, because he does not want to be addressed as “His Excellency”. The Honourable President made a speech yesterday, a beautiful speech, a speech that did not come from somebody writing it out where he brought and read it. Somebody else did into write it for him; he spoke from his heart. That, we appreciate. We feel equal in this country today, which I did not feel one month ago.

The Hon. (Prof.) Tissa Vitarana will bear witness that in the APRC, I never asked or demanded that we be given anything special. We only wanted to be treated equally. That sense of equal treatment we feel today, because of yesterday's speech. Today's newspapers carry a news item stating that after 42 years, the Northern political representatives attended the Independence Day Celebrations. Maybe there are a few extremists there also who are pulling up the Leader, Hon. R. Sampanthan, for participating in yesterday's programme. But, generally the people in the North and the East want to live as one.

We were talking about giving more powers under APRC. I am getting diverted but it does not matter because these are matters that we have to speak. It is very relevant in today's circumstances. But, the previous Government refused to give powers. They had an election to show the whole world, but they did not allow the Chief Minister to function. They had one man above him, the Governor, who would not allow the Chief Minister to function. And, then, even if the Chief Minister gave orders, there was nobody to carry it out because the Chief Secretary will not function according to the requests of the Chief Minister. So, the first thing we did was, we removed the Governor and we appointed a new Chief Secretary. But, we did not send that Chief Secretary out. We brought her to Colombo, made her a Secretary to another Ministry that is relevant to our up-country people. Now, she is the Secretary to the State Minister of Plantation Industries**.** And, today we have three Secretaries functioning in Colombo with Ministers for servicing our people. We feel very good.

A former President, Her Excellency Chandrika Bandaranaike Kumaratunga, created the Ministry of Livestock Development and Estate Infrastructure to service the plantation people. She appointed a committee under Mr. Gunapala to assess the needs of the plantation people. Following that committee report, she created the Ministry of Livestock Development and Estate Infrastructure and appointed my late Leader, the Hon. Savumyamoorthy Thondaman as the Minister. That Ministry was functioning for about one year. After one year, she said, if this Ministry is to function properly, the Secretary should be a person who empathizes with those people. She removed that Secretary, Mr. Gunapala, who was the architect of that committee and replaced him with Dr. Prathap Ramanujam, because she thought that if the Hon. Thondaman has Dr. Prathap Ramanujam, another person of Indian origin, whose father was a Member of Parliament in the First Parliament, that would give a team that can work for those people in a proper manner. So, that is sincerity of purpose. She was sincere and thought that that Ministry that was created should really serve those people. So, because of that she brought in a Secretary to work with him.

Today, we have restored the Ministry of Plantation Infrastructure Development, which Mahinda Rajapaksa thought is not necessary. He thought parallel development is enough and vertical development is not necessary. For people who are backward, vertical development is also necessary. Affirmative action has been accepted all over the world as not distorting fundamental rights; where a different group of people who maybe deprived of or given certain facilities or assistance for their development is affirmative action. So that, which she thought was necessary, Mahinda Rajapaksa thought was not necessary.

Finally, what happened at the last Presidential Election? Ninety per cent of the Muslims voted against Mahinda Rajapaksa; 80 per cent of the Tamils voted against Mahinda Rajapaksa - [*Interruption*.] Right. They only highlighted the thinking of that regime and today, they are out. But, you are pleading that we should do some of the things that you proposed to Mahinda Rajapaksa and which were not done. Anyway, we will take it in good spirits. We have already started implementing many of those proposals. - [*Interruption*.] So, we will see.

Sir, during the previous regime, the Members of Parliament were treated unequally. We, the Members of Parliament of the Opposition got Rs. 5 million for DCB but the Members of the Government Parliamentary Group got Rs. 30 million.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
No, no.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
It happened. Do not say, "No", They got that money.- [*Interruption*.] Yes, I do agree. It came through the Ministry of Economic Development but it went through certain Members of Parliament of the Government.

ගරු ඩීව් ගුණසේකර මහතා
(மாண்புமிகு டீயூ குணசேகர)
(The Hon. DEW Gunasekara)
I did not get.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
Maybe you were not considered worthwhile giving that money because you would only gain for yourself or your party, whereas the SLFPers were given because they

[ගරු ආර්. යෝගරාජන් මහතා]

were organizers of electorates, so that they could build their political base more effectively. This is unfair. But, today we have increased the DCB funds from Rs. 5 million to Rs. 10 million for all Members of Parliament. That is a very fair way of doing things. Giving these monies for "Gama Neguma", "Maga Neguma", and "Divi Neguma" programmes through their Members of Parliament alone is biased politics. - [*Interruption.*] No, that is biased politics of your former Government and we are trying to correct that by, at least, multiplying the DCB and giving it through all Members of Parliament, whether Government or Opposition.

This Government has introduced a 50 per cent waiver on agricultural loans because during the bad seasons, the agriculturalists have suffered. So, we have thought it necessary to revive the agriculturer by supporting the agriculturalists.

Similarly, the biggest industry in this country became pawning. Those days, I know, there were licensed pawnbrokers and only they were doing pawning. Then, banks started fighting each other and to compete with them, the finance companies came in between. When the price of gold was Rs. 52,000, they were offering advances of Rs. 55,000. This whole thing crashed when the gold prices crashed. Many banks almost got into financial difficulties. The People's Bank had an exposure of 40 per cent and they had to reduce. Today, we have the ETI Finance Limited, which is having a negative balance sheet. All this is because of that situation. Why was there a boom in pawning? As the Hon. Minister said, when people had to buy medicines, they pawned their jewellery. So, for people to live, they had to pawn their jewellery. Now, we have given some relief to those who still have some gold left in the bank by renewing their pawned tickets, an opportunity to redeem the gold left without paying any interest. This is a very positive move.

Similarly, the elderly people who live on interest from deposits have been given a concession, an interest of 15 per cent. That subsidy is going to be paid by the Government. So, these are all very positive moves.

We have understood many of the issues and problems that the people are facing and we have tried to address them. There are many more which I could mention but due to lack of time, I will conclude now. We have done something positive and do not worry about our going for an election in a hundred days. Generally, soon after a Presidential Election, any political party will try to reap the benefits through a Parliamentary Election. Give us also that privilege. Do not deny us that.

Thank you.

[අ.භා. 6.09]

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු යෝගරාජන් මන්ත්‍රීතුමාගේ කථාවෙන් පස්සේ කථා කරන්න ලැබීම ගැන මම ඉතාම සතුටු වෙනවා. මේ අතුරු අය වැය ලේඛනය දිහා බැලුවාම කියන්න පුළුවන් කිසිම දර්ශනයකින් හෝ කිසිම දුර දැක්මකින් යුතුව ඉදිරිපත් කළ අය වැය ලේඛනයක් නොවන බව. මේක *ad hoc,* එහෙම නැත්නම් හදිසියෙන් තීරණ අරගෙන හදිසියෙන් ඉදිරිපත් කරපු වැඩසටහනක්. මේකේ වැඩසටහන් දිහා බැලුවාම ඒක හොඳින්ම පෙනෙනවා. මොකද, දීර්ඝ කාලීනව ගෙන යන්න පුළුවන් සැලැස්මක් මේ අය වැය තුළ නැහැ. අටුව කඩලා පුටුව හදලා තිබෙනවා. සමහර තැන්වලින් කපලා -යටිතල පහසුකම්වලින් කපලා- වෙනත් පහසුකම් ලබා දීලා තිබෙනවා. ඒ වගේ කරන්න පුළුවන් වෙනස්කම් කරලා තමයි මේ කටයුත්ත කර තිබෙන්නේ.

අය වැය පරතරය සියයට 0.42 කින් අඩු කරලා කියන්නේ, රටේ ජනතාවට දීර්ඝ කාලීන වාසි ලැබෙන රාජ්‍ය ආයතන සඳහා වන වියදම් රුපියල් බිලියන 696 සිට රුපියල් බිලියන 520 දක්වා, එනම් රුපියල් බිලියන 176ක් අඩු කරලා -කපා හැරලා- තිබෙනවා. ඒවා තමයි එහාට මෙහාට කර තිබෙන්නේ. එයින් ලැබෙන ලාභයක් නැහැ. ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා කිව්වා වාගේ ලැබෙන එකම ලාභය තමයි ජනතාවගේ බඩට යමක් දීලා, බඩ සනසලා ඊළඟ වතාවේ ඉක්මනින් ඡන්දයකට ගිහිල්ලා ඒක දිනා ගන්න පුළුවන්ද කියා බලන එක. ඒකටත් අපි සූදානම් කියන එක අපි මේ අවස්ථාවේ කියනවා.

යටිතල පහසුකම් වෙනුවෙන් වන රාජ්‍ය ආයෝජන රුපියල් බිලියන 576 සිට 399 දක්වා සියයට 30.7කින් අඩු කර තිබෙනවා. අය වැය හිඟය අඩු කර තිබෙන්නේ එහෙමයි. ඒ කියන්නේ පසු ගිය රජය කාලයේ මාර්ග, ජලය, විදුලිය වගේ ජනතාවට ලබා දුන් මූලික සහන කපා දමලා තමයි මේ වැඩසටහන ක්‍රියාත්මක කර තිබෙන්නේ. ඒක තමයි මේ අතුරු අය වැය ලේඛනයේ හරය. මම දන්නේ නැහැ මේ හරය කොපමණ දුරට ගෙන යන්න බලාපොරොත්තු වෙනවාද කියලා. මාස තුනකට තමයි මේ අය වැය limit කරලා තිබෙන්නේ. ඒ කියන්නේ දින 100කට තමයි මේ අය වැය limit කර තිබෙන්නේ. එතැනින් එහාට යන්න මේ රජය සූදානම් නැහැ.

මේ සංශෝධන කරන්න පුළුවන් වුණත්, බැරි වුණත් එතුමන්ලා පොරොන්දු වුණු දේවල් කළත්, නැතත් එතුමන්ලාට මේ දින 100න් පස්සේ මැතිවරණයකට යන්න වෙනවා. අපි ඒකට විරුද්ධ වෙන්නේ නැහැ. එතුමන්ලා කල් ඉල්ලුවොත් අපි කල් දෙන්නම්. නැත්නම් අපි සූදානම් ඕනෑම වේලාවක මැතිවරණයකට යන්න. මොකද, මේ සංශෝධන එකක්වත් කරන්න පුළුවන් දේවල් නොවෙයි. ජනාධිපතිතුමාගේ බලතල අඩු කරන්න කියා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් ගැන කථා කරනවා. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කවදාවත් ඒ ආකාරයෙන් කරන්න පුළුවන් දෙයක් නොවෙයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කරනවා නම් මේ ව්‍යවස්ථාව සම්පූර්ණයෙන්ම replace කරන්න ඕනෑ. එහෙම නැත්නම් අපි 1972 ජනරජ ව්‍යවස්ථාව නැවත බලාත්මක කරමු කියා මම යෝජනා කරනවා. කැලි කැලි repair කරන්න ගියොත් මේ ව්‍යවස්ථාව එහෙම පිටින්ම කඩාගෙන වැටෙනවා. මේක ගලවන්න පුළුවන් දෙයක් නොවෙයි. ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා හදපු ව්‍යවස්ථාව එහෙන් මෙහෙන් ගලවලා කැලි පුරුද්දන්න පුළුවන් එකක් නොවෙයි; අඩු කරන්න

පුළුවන් එකක් නොවෙයි. මේ කටයුත්ත කරනවා නම් ව්‍යවස්ථාව සම්පූර්ණයෙන් වෙනස් කර අලුතෙන් හදන්න වෙනවා. ඒ නිසා මේක වෙනස් කරන්න ගියොත් අපේ රටේ අනාගතයත්, අපි මේ කරගෙන යන වැඩ පිළිවෙළත් සම්පූර්ණයෙන්ම අකර්මණ්‍ය තත්ත්වයට පත් වෙනවා.

පසු ගිය අය වැයෙන් පුනරාවර්තන වියදම් සඳහා වෙන් කර තිබුණේ සමස්ත වියදමින් සියයට 69යි. මේ අතුරු අය වැයෙන් පුනරාවර්තන වියදම් සියයට 76 දක්වා වැඩි කර තිබෙනවා. ඒ කියන්නේ ජනතාවට තාවකාලික සහන දීලා මේ ටික දවසේ කාලා පොඩ්ඩක් ජොලියේ තියන්න තමයි උත්සාහ කරන්නේ. මට තිබෙන ප්‍රශ්නය ඒක නොවෙයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. පසු ගිය අවුරුදු හතරහමාර ඇතුළත, පසු ගිය අවුරුදු නමය ඇතුළත අපේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා කිසියම් දර්ශනයක් මත වැඩසටහන් ගෙන ආවා. විශේෂයෙන් කෘෂි කර්මාන්තය සඳහා. කෘෂි කර්මාන්තය සඳහා දෙන්න තවත් සහනයක් නැහැ. පොහොර සහනාධාරය දුන්නා. මෙතුමන්ලා දැන් කියනවා, කෘෂි කර්මාන්තය සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර සම්බන්ධව. ඒ යන්ත්‍ර සූත්‍ර අඩු මිලට දෙන්න දෙයක් නැහැ. ඒවා සඳහා බද්දක් අය කරන්නේ නැහැ. කෘෂි කර්මාන්තය සඳහා අවශ්‍ය කිසිම ආම්පන්නයකට මේ රටේ බද්දක් අය කර නැහැ. පසු ගිය කාල සීමාව තුළම බදු අය කළේ නැහැ. ඒ මිලටම තමයි ගොවියාට ඒ උපකරණ ලැබෙන්නේ. ඒ විධියට දෙන්න පුළුවන් සහන උපරිමයෙන් දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මුං ඇට වගාව ගැන කථා කළොත් මුළු ලංකාවටම වර්ෂයකට අවශ්‍ය වෙන්නේ මුං ඇට මෙට්‍රික් ටොන් 25,000යි. අපි පසු ගිය කාලයේ බලයට එන කොට මෙහේ නිෂ්පාදනය කරලා තිබුණේ මුං ඇට මෙට්‍රික් ටොන් 7,000යි. 2013 වර්ෂය වෙන කොට අපි මුං ඇට නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 21,000ක් දක්වා වැඩි කර, 2014 වෙන කොට අපේ අවශ්‍යතාව සියයට 100ක්ම සම්පූර්ණ කර තිබුණා. මේ වෙන කොට හම්බන්තොට මුං ඇට අස්වැන්න නෙළනවා. මේ අය වැය ලේඛනයෙන් ඒ ගොවියන්ව විනාශ කළා.

පිට රටින් මුං ඇට ගෙනැවිත් අඩු මිලට දුන්නාම ඒ මිනිසුන්ට තමන්ගේ අස්වැන්න විකුණා ගන්න බැරි වීම තුළ තවත් කවදාවත් ඒ ගොල්ලන් මුං ඇට වවන්න ඉදිරිපත් වෙන්නේ නැහැ. ඒ විධියට වගාව විනාශ කරපු අය වැයක් මේක. උඳුවලටත් වුණේ ඒකයි. අවුරුද්දකට මුළු ලංකාවටම උඳු වුවමනා කරන්නේ මෙට්‍රික් ටොන් දසදහසයි. අපි උඳු වගාව කළා. වවුනියාවේ කළා; මන්නාරමේ කළා; පුත්තලමේ කළා; හම්බන්තොට කළා. මේ හැම තැනම වගා කර අපි උඳුවල අවශ්‍යතාව සියයට සියයක් සම්පූර්ණ කර තිබුණේ. ඒක සම්පූර්ණයෙන් විනාශ කළා. ඒ ගොවීන් අනාථ කළා. ඉතින්, මේ ගොල්ලන් කියනවා, බඩට කන්න දුන්නා කියා. හාල් සේරුව රුපියල් 100ක් වෙන කොට බඩට කන්න දෙන්නේ කොහොමද? මේ අය වැය ලේඛනයෙන් අපේ රටේ මිනිස්සුන්ට බතුයි, පොල් සම්බෝලයි කන්න පුළුවන්ද? පොල් ගෙඩියක් රුපියල් 60යි. හාල් සේරුවක් රුපියල් 100යි. එහෙම තිබියදී ද අපි ජනතාවට කන්න දෙනවා, ජනතාවට සහන සැලසුවා කියා මේ ආණ්ඩුව කියන්නේ. ඒ නිසා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේක ඇස් බැන්දුම් අය වැයක්.

මා බදු ගැන කථා කරන්න යන්නේ නැහැ. අපේ ආර්ථික විද්‍යාඥයෝ සියලු දෙනාම වාගේ බදු ගැන කථා කළා. අගමැතිතුමා කියනවා, මේක සරදියෙල්ගේ අය වැයක් කියා. මේක සරදියෙල්ගේ අය වැයක් නොවෙයි. මේක අංගුලිමාලගේ අය වැයක්. ඇඟිල්ලක් කපා ගෙන බෙල්ලත් කපාපු අය වැයක්. ඇඟිල්ල කපා ගන්න ගිහිල්ලා බෙල්ල කැපුවාද, බෙල්ල කපන්න ගිහිල්ලා ඇඟිල්ල කැපුවාද කියන එක මා දන්නේ නැහැ. කෙසේ හෝ ඇඟිල්ල කපා ගෙන බෙල්ලත් කැපුවා. ඒ නිසා මේක අංගුලිමාල අය වැයක්. අංගුලිමාල අය වැයක් තමයි අපට ඉදිරිපත් කළේ. ඒ නිසා මේ විධියට ගියොත් අංගුලිමාලට අසු වුණු මනුෂ්‍යයාට වුණු දේ අපේ රටේ ආර්ථිකයට වනවා. ඇඟිල්ලත් කපා ගෙන බෙල්ලත් කපා ගෙන ආර්ථිකයත් සම්පූර්ණයෙන් නැති වනවා. තමුන්නාන්සේලා මේ ගැන කල්පනා කරන්න. මෙහෙම කරන්න එපා, තමුන්නාන්සේලාට දේශපාලන බලය අවශ්‍ය වුණයි කියා. බලය ලබා ගන්න. ඒකේ ඇති ප්‍රශ්නයක් නැහැ. මහජනයා ඡන්දය දෙනවා නම් අපි සියලු දෙනාම ඒ ජන මතයට ගරු කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේකෙන් ඉතාමත් අවාසනාවත්ත තත්ත්වයකට පත් කර තිබෙන්නේ, මේ රටේ විශ්‍රාමිකයනුයි. අපේ හිටපු ජනාධිපති ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ඉදිරිපත් කළ අය වැය ලේඛනයේ පිටපත මා ගෙනාවා. ඒකේ 24, 25 පිටු බලන්න. 24වන පිටුවේ 58 ඡේදයෙන් විශ්‍රාමිකයන් ගැන කියන්න පටන් ගෙන තිබෙනවා. එහි ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා කියා තිබෙනවා සියලුම විශ්‍රාමිකයන්ට 2015 වන තුරු තිබෙන හිඟ වැටුප සම්පූර්ණයෙන්ම ගෙවන්න කියලා. 2015 ජූලි මාසයේ 15වැනි දා වන විට මේ සියල්ල ගෙවලා අවසාන කරන්න කියලා එතුමා තවදුරටත් කියා තිබෙනවා. ඒ අනුව නම් මේ ජනවාරි මාසයේ සිට විශ්‍රාමිකයන්ගේ වැටුප ගෙවන්නයි තිබුණේ. එම අය වැය ලේඛනයේ 24වන පිටුවේ එතුමා තවදුරටත් කියා තිබෙනවා, "වැටුප් හා විශ්‍රාම වැටුප් සැකසීම සඳහා කල්ගත වන බැවින් විශ්‍රාමිකයන්ට මසකට රුපියල් 2,500ක් හා රාජ්‍ය සේවකයන්ට රුපියල් 3,000ක අන්තර් දීමනාවක් දැනට ගෙවන්න" කියලා. එය නොවැම්බර් මාසයේ සිට ගෙවන්න කියලාත් එතුමා කිව්වා. ඒ ගෙවීමටම තමයි ඔබතුමන්ලා ඔය එකතු කිරීම කළේ. මේ රජය රාජ්‍ය සේවකයන්ට රුපියල් 5,000ක් දෙනවා කිව්වේ ඒ රුපියල් 3,000ත් එකතු කරලායි. නමුත්, ඔබතුමන්ලා කිව්වේ නම් ඒ රුපියල් 5,000 වෙනම දෙනවා කියලායි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හේමන්ත රංජන් කස්තුරි මහත්මයා ඊයේ පළ වූ පුවත් පතකට ඒ ගැන article එකක් ලියා තිබුණා. ඒකේ ඔහු කියා තිබෙනවා, මේ වැඩසටහනින් විශ්‍රාමිකයන්ට හා රජයේ සේවකයන්ට විශාල අසාධාරණයක් මේ රජය විසින් කළාය කියලා. මේ කාරණය පෙන්වා දීම ගැන මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. අප මේ කාරණය දැක්කා. මේක මහා අමානුෂික විධියට කරන්න යන මහා අමූලික බොරුවක් කියන කාරණය අප දැක්කා.

ඔබතුමන්ලා ජනතාවට සහන දෙනවාය කිව්වා. අප ඉදිරිපත් කළ අය වැය අනුව 2006ට කලින් විශ්‍රාම ගිය විශ්‍රාමිකයෙකුට මසකට රුපියල් 15,000කට නොඅඩු වැඩිවීමක් සිදු වනවා. අඹු සැමි දෙදෙනාම රජයේ විශ්‍රාමිකයන් නම් පවුලක වැඩි වීම මාසයකට රුපියල් 30,000යි. දැන් මුදල් අමාත්‍යාංශයේ ප්‍රකාශය අනුව එවැනි විශ්‍රාමිකයෙකුට මෙම අය වැය මඟින් අතිරේකව ලැබෙන රුපියල් 1,000 සහ අනික් රුපියල් 2,500ක අතිරේක මුදල සමඟ එකතුව රුපියල් 3,500ක් නිසා දෙදෙනාටම ලැබෙන්නේ රුපියල් 7,000යි. මේක දීලා තමයි මෙතුමන්ලා මේ තට්ටමේ බෙර ගහන්නේ. විශ්‍රාමිකයන්ට දෙන්න තිබුණු අයිතියෙන් රුපියල් 23,500ක් අරගෙන, 7,500ක් දීලා මේ නිකම් තට්ටමේ බෙර ගහනවා, අපි මේක කළාය කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම කියන්නේ අප මේ අංගුලිමාල අය වැය ප්‍රතික්ෂේප කරන බවයි. නමුත්, අප පොදු එකඟතාවකට පැමිණ තිබෙනවා මෙතුමන්ලාගේ දින සියයේ වැඩසටහනට සහයෝගය දෙනවා කියලා. ඒ නිසා අප ඒ ගැන නැවත වරක් කල්පනා කරන්න තීරණය කළ බව ප්‍රකාශ කරමින්, මගේ කථාව සමාප්ත කරනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Lakshman Yapa Abeywardena. You have 10 minutes.

[අ. භා. 6.19]

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය ජනාධිපතිවරණයේදී උතුරු, නැගෙනහිර පළාත්ද ඇතුළුව සමස්ත ජනතාවගේ එකඟතාව මත -මැතිවරණ ප්‍රතිඵල අනුව- ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මේ රටේ ජනාධිපති වුණා. එතුමා ජනාධිපති වෙලා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිකමට පත් වුණාම එතුමා අපේ මන්ත්‍රී කණ්ඩායමෙන් ඉල්ලීමක් කළා, "දින සියයේ මේ වැඩ පිළිවෙළට අපේ සහයෝගය ලබා දෙන්න, කණ්ඩායමක් හැටියට කටයුතු කරන්න" කියලා. ඒ වාගේම මේ අය වැය විවේචනය කිරීමටත්, කණ්ඩායම ඇතුළෙත්, පිටත් තමන්ගේ නිදහස් අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය ලබා දීමටත් එතුමා ඉඩ පහසුකම් සැලසුවා.

දකුණේ බහුතර ජනතාවක් -සියයට 62ක්- මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට ඡන්දය පාවිච්චි කළත්, ශ්‍රී ලංකාව පුරාම සිටින බහුතරයක් ජනතාවගේ ඡන්දයෙන් ඒ සියලුම ජන කොටස්වල රාජ්‍ය නායකයා විධියට ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පත් වීම නිසා අතුරු අය වැයක් ඉදිරිපත් කිරීමට වර්තමාන රජයට සිද්ධ වුණා.

ඕනෑම අවස්ථාවක බඩුවක මිල තාවකාලිකව හෝ අඩු වෙනවා නම්, එහෙම නැත්නම් ජනතාවට සහනයක් ලබා දෙනවා නම් ඒ සහනය විවේචනය කිරීම අපේ ප්‍රතිපත්තිය නොවෙයි. ඒක ජනතාවට ලැබෙන දෙයක්. ජනතාවට ඒක ලැබෙනවා නම්, ඒ ලැබීම කාගෙන් හෝ ඉදිරිපත් වෙනවා නම් ඒ පිළිබඳ අප සතුටු වෙනවා. ඒ වාගේම ඒ සඳහා අපේ සහයෝගය ලබා දිය යුතුයි.

මේ අවස්ථාවේදී මුදල් ඇමතිතුමා මේ ගරු සභාවේ නැති එක ගැන මා කනගාටු වනවා. මුදල් ඇමතිතුමා විපක්ෂයේ ඉන්න කාලයේ මේ පාර්ලිමේන්තුවේදී හැම තිස්සේම කියපු කථාවක් තමයි, "මේ අසාධාරණ ඉන්ධන බද්ද වහාම ඉවත් කරන්න"යි කියන එක. දැන් මේ ඉන්ධන බද්ද ඉවත් කළාද? මේ ඉන්ධන සහනය සුළු වශයෙන් ලබා දුන්නේ ඉන්ධන බද්ද ඉවත් කරලාද? ලාභයෙන් කොටසක් නේ මේ ඉවත් කළේ. ඉන්ධන බද්ද ඉවත් කළේ නැහැ නේ. නමුත් පසු ගිය කාලයේ ඔබතුමන්ලා ජනතාවට කිව්වේ, "ඉන්ධනවලට මහා බද්දක් ආණ්ඩුව ගහනවා. ආණ්ඩුව ගහන මහා බද්ද ඉවත් කළාම ඉන්ධන මිල පහළටම වැටෙනවා. මිල පහළටම වැටුණාම මේ සහනය දෙන්න පුළුවන්" කියලායි. මෙම අවස්ථාවේදී එහෙම දීලා තිබෙනවාද? ඉන්ධන මිල දැන් දෙවරක්, තුන් වරක් අඩු කළා. නමුත් ජනතාවට පෙන්නුවේ ආණ්ඩුව ගන්න බද්ද අඩු කළ බවයි. මේ බද්දෙන් තමයි ඔක්කොම කරන්නේ. එහෙම ඉන්ධන බද්ද අඩු වුණේ නැහැ. [බාධා කිරීමක්]

මගේ මිත්‍ර ජනමාධ්‍ය ඇමතිතුමාට මා පළමුවෙන්ම ශුභ පතනවා. ඔබතුමාට ඒ ධුරය හිමි විය යුතුයි. ගරු ඇමතිතුමනි, ඔබතුමාත් තේ කර්මාන්ත ක්ෂේත්‍රය තුළ ජීවත් වන පුද්ගලයෙක්. තේ දළු සඳහා කිලෝවකට රුපියල් 80ක අවම මිලක් නියම කළා. ඔබතුමා දන්නවා, උඩ රට තේ සහ පහත රට තේ අතර වෙනසක් තිබෙනවාය කියලා. ඒ තේවල මිල අතරත් වෙනසක් තිබෙනවා. Factory එකෙන් factory එකට මිල වෙනස්. වැවිලි කර්මාන්ත ඇමතිතුමා මේ සභාවේ ඉන්නවා. ගරු ඇමතිතුමනි, මගේ කොට්ඨාසයේ තිබෙන පෝතොටුව තේ කර්මාන්තශාලාව තේ දළු කිලෝවක් සඳහා රුපියල් 86ක් ගෙවනවා. ඊට මෙහා පැත්තේ තව කර්මාන්තශාලාවක් තිබෙනවා, රොටුඹ තේ කර්මාන්තශාලාව. ඒ කර්මාන්තශාලාව තේ දළු කිලෝවකට රුපියල් 65යි ගෙවන්නේ. මේ රුපියල් 15 දැන් ආණ්ඩුව දෙන්න එපා යැ. රුපියල් 15ක subsidy එකක් factory එකට දෙන්න එපා යැ. පළාතෙන් පළාතට, factory එකෙන් factory එකට මේ සහනය දෙන්න වෙනවා. මේ සහනය දෙනවා නේද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
හොඳ වර්ගයේ තේවලට තමයි ඒ මුදල ගෙවන්නේ.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
අතුරු අය වැයේ සඳහන් කරලා නැහැ, හොඳ වර්ගයේ තේ වලටයි ඒ මුදල ගෙවන්නේ කියලා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
හොඳ වර්ගයේ තේවලට තමයි ගෙවන්නේ. ඒක තමයි අපේ අරමුණ. අපේ අරමුණ, හොඳ වර්ගයේ තේවලට හොඳ මිලක් ලබා දෙන එකයි.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
හොඳ වර්ගයේ තේවල මිල කොහොමත් ඉහළ යනවා. පෝතොටුව කර්මාන්තශාලාවේ හදන්නේ, දෙනියාය ප්‍රදේශයේ බානගල තේ කර්මාන්ත ශාලාවේ හදන්නේ හොඳ වර්ගයේ තේ. CTC එකේ තිබෙනවා, හොඳ වර්ගයේ තේ. ඒවා කොහොමත් මිල වැඩියි. හොඳ වර්ගයේ තේවලට රුපියල් 80 මිලක් අවශ්‍ය වන්නේ නැහැ. හොඳ වර්ගයේ තේ දළු කිලෝවක මිල රුපියල් 80කට ඉහළින් තිබෙනවා. තේ කර්මාන්තයේ නියැලී ඉන්න තේ දළු නෙළන ජනතාව තේ දළු කිලෝග්‍රෑම් එකකට රුපියල් 80ක් ලබා දෙයි කියලා බලාපොරොත්තු වනවා. දැන් මේ සභාවේදී කිව්වා, රුපියල් 80ක් දෙන්නේ හොඳ වර්ගයේ තේවලට විතරයි කියලා. එතකොට ඒ මුදල ජනතාවට නිසි ආකාරයෙන් ලැබෙන්නේ නැහැ. ඒ කාරණය පැහැදිලි වුණු එක හොඳයි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
හොඳ තේවලට දෙන්නේ.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
Subsidy එකට දෙන්න කියන්නකෝ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
කසළ තේවලට දෙන්නේ නැහැ.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ගරු වැවිලි කර්මාන්ත ඇමතිතුමනි, අද දින පුවත් පතක සඳහන් වනවා, "Mini-budget proposals may send confusing signals to investors..." කියලා. මේක තමයි ප්‍රශ්නය. දැන් ආණ්ඩුව ධනපතින්ටයි ගහන්නේ කියලා මහ ජනතාවට, දුප්පත් ජනතාවට පෙනෙන්න තාවකාලිකව වෛරීය බදු ක්‍රමයක් ඇති කරලා කර්මාන්ත 20කට, 30කට විතර බදු පනවන කොට මහා පරිමාණයේ ආයෝජකයන්ට - investorsලාට - ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ආයෝජකයෝ විශ්වාසයක් නැති තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මොකද, එක ආණ්ඩුවක් තිබෙන කොට එක ප්‍රතිපත්තියක් තිබෙන්නේ. මේ රටේ දැනට ගිවිසුම් අත්සන් කරපු ආයෝජන තිබෙනවා. ආණ්ඩුව වෙනස් වන කොට අද ඒ ප්‍රතිපත්ති වෙනස් වෙලා ගිවිසුම් අත්සන් කරපු ඒ ආයෝජනවලට බදු ක්‍රමයක් එනවා. 2013 හා 2014 වර්ෂවලට මේ බද්ද පැනෙව්වාම මොකද වෙන්නේ? ආයෝජකයන්ට future plans තිබෙනවා. 2013 වර්ෂයේ ලාභය අනුව, 2014 වර්ෂයේ ලාභය අනුව ඒ ආයෝජකයන්ට අවුරුදු හතරක, පහක ඉදිරි සැලැස්මක් තිබෙනවා. ඒ ආයෝජකයෝ සැලැස්මක් හදා තිබෙන්නේ ඉදිරියටයි. එම නිසා මේ බද්ද පැනෙව්වාම ඒ සැලසුම් සම්පූර්ණයෙන් confuse වනවා. ඒ ගොල්ලන්ට මේ ගැන පුදුමයි. ඒ ගොල්ලන්ගේ මේ සැලැස්ම සම්පූර්ණයෙන් වෙනස් වනවා. එම නිසා මේ කාරණය රජයට කල්පනා කළ යුතු කාරණයක් කියලා මා හිතනවා.

අද බෙදෙන්න එපා චීනයට, අද බෙදෙන්න එපා ඉන්දියාවට, අද බෙදෙන්න එපා යුරෝපයට කියලා අතිගරු ජනාධිපතිතුමා නිදහස් දිනයේදී කිව්වා. රජයක් හැටියට තීන්දු ගන්නා විට මධ්‍යස්ථ ප්‍රතිපත්තියක්, මධ්‍යස්ථ විදේශ ප්‍රතිපත්තියක් ගෙන යනවාය කිව්වා. දැන් වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා ඉතා පැහැදිලිව කිව්වා, ඩිව් ගුණසේකර මන්ත්‍රීතුමා ඉතා පැහැදිලිව කිව්වා ඇමෙරිකාව ණය ගන්නේ චීනයෙන් බව. ඩිව් ගුණසේකර මන්ත්‍රීතුමා ඉතා පැහැදිලිව ඇහුවා, "ඇයි චීනය ණය දෙන්නේ?" කියලා. ඇමෙරිකාව චීනයෙන් ණය ගන්නවා. ඇයි ඒ? චීනයට සල්ලි තිබෙන නිසා; අඩු පොලිය නිසා. දැන් ඒවා, "චීන" කියලා වෙනස් කරන්න බැහැ. දැන් අපි චීනයට නොදී වෙනත් රටකට අක්කර 25,000ක් දෙනවා නම්, තවත් රටකට තවත් ප්‍රමාණයක් දෙනවා නම්, ඒ වාගේ කාරණා ඉස්සරහට ගෙන යන්න ගියොත් මම හිතන හැටියට රටක් හැටියට ඉදිරියට යන්න අමාරු තත්ත්වයක් අපට ඇති වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේ අය වැය පරතරය සියයට 4.6යි. දැන් මේ සඟන දීලාත්, ඔය කියන ඒවා ඔක්කෝම කරලාත් මේ ආණ්ඩුවේ අය වැය පරතරය දමලා තිබෙන්නේත් සියයට 4.4ට නේ. ඒකත් විශ්වාස කරන්න බැහැ. දැන් මම මේ කාරණය අහනවා, කිරිඇල්ල ඇමතිතුමනි. සාමාන්‍යයෙන් අය වැය හිඟයට සියයට 2ක් එකතු කරලා තමයි පොලී අනුපාතය හදන්නේ. ඒක ලෝක ආර්ථික නිර්ණයනේ. අය වැය හිඟයකට දළ වශයෙන් සියයට 2ක් එකතු කළාම තමයි බැංකු පොලී අනුපාතය එන්නේ. ඉදිරි කාලයේදී මේ බැංකු පොලී අනුපාතය කොපමණ දුරට වැඩි වෙනවාද? අද සියයට 13ට, 12ට තිබෙන බැංකු පොලී අනුපාතය මේ නිසා ඉදිරි කාලය තුළ කොපමණ ප්‍රමාණයකට වැඩි වෙනවාද? ඒ පොලී අනුපාතයට මුහුණ දෙන්න සිද්ධ වෙනවා බැංකුවලට. ඒකත් අපි මතක තියා ගන්න ඕනෑ. මුදල් ඇමතිතුමා දැන් මේ සභාවේ නැහැ. මම මේ කාරණය අහනවා. පසු ගිය IMF loan එකේ අවසාන වාරිකය ගෙව්වේ ඩොලර් සංචිතයෙන් අරගෙනද, ඩොලර්වලින්ද? කරුණාකර ඒ ගැන පාර්ලිමේන්තුවට පැහැදිලි කරන්න. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය මුදලේ අවසාන වාරිකය ගෙව්වේ ඩොලර් සංචිතයෙන් අරගෙනද? මේ සංචිතයේ ඩොලර්වලින්ද ගෙව්වේ? මේ ගැන පාර්ලිමේන්තුවට පැහැදිලි කරන්න. සංචිතයෙන් අරගෙනද මේ ණය මුදල ගෙව්වේ?

මේක මාස තුනක අය වැයක්. මේ මාස තුනට පොඩි විජ්ජාවක් කරලා තිබෙන්නේ. මේ විජ්ජාව තමයි මැතිවරණයකට යෑම. මේ අය වැයේ රස්නය සාමාන්‍ය ජනතාවට සහ ව්‍යාපාරිකයන්ට දැනෙන්නේ තව මාස තුනක් ගිහින්. ඒකයි මේ මැතිවරණයට කලබල. මැතිවරණයට කලබල වෙලා තිබෙන්නේ මාස තුනෙන් පසුව මුහුණ දෙන එක භයානක නිසායි. මාස තුනෙන් පසුව එන ප්‍රශ්න ටිකට මුහුණ දෙන්න කලින් මැතිවරණයකින් ආණ්ඩු බලය ගන්න ඕනෑ. මම හිතන විධියට මේක තමයි මහ ජනතාවට දරන්නට වෙන විශාලම බර. මේ ආණ්ඩුව වෙනස් නොකළොත් ඉදිරි කාලය ඇතුළත, ඊළඟ මාස තුනෙන් පසුව එන මැතිවරණයේදී මේ රට මහා භයානක තත්ත්වයකට යනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනාධිපතිතුමා පක්ෂයේ සභාපතිතුමා නිසා, ඒ එකඟතාව මත ප්‍රතිපත්තියක් හැටියට අපි මේ අය වැයට සහයෝගය දුන්නාට, මේ අය වැයේ තිබෙන භයානක තත්ත්වය අපි හොඳින් අවබෝධ කරගෙන තිබෙනවා. ස්තුතියි.

එකල්හි වේලාව අ.භා. 6.30 වූයෙන් කටයුතු අත් හිටුවා විවාදය කල් තබන ලදී.

එතැන් සිට විවාදය 2015 පෙබරවාරි මස 06 වන සිකුරාදා පවත්වනු ලැබේ.

அப்பொழுது, பி.ப. 6.30 மணியாகிவிடவே, அலுவல்கள் இடைநிறுத்தப்பட்டு விவாதம் ஒத்திவைக்கப்பட்டது.

விவாதம், 2015 பெப்ருவரி 06, வெள்ளிக்கிழமை மீளத் தொடங்கும்.

It being 6.30 p.m.. Business was interrupted, and the Debate stood adjourned.

Debate to be resumed on Friday, 06th February, 2015.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

අ. භා. 6.30 ට නියෝජ්‍ය කාරක සභාපතිතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2015 පෙබරවාරි 06 වන සිකුරාදා අ. භා. 1.30 වන තෙක් කල් ගියේ ය.

பி.ப. 6.30 மணிக்கு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

அதன்படி பாராளுமன்றம், 2015 பெப்ருவரி 06, வெள்ளிக்கிழமை பி.ப 1.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது

At 6.30 p.m., MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *adjourned Parliament without Question put.*

Adjourned accordingly until 1.30 p.m. on Friday, 06th February, 2015.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

232 වන කාණ්ඩය - 6 වන කලාපය
தொகுதி 232 - இல. 6
Volume 232 - No. 6

2015 පෙබරවාරි 06 වන සිකුරාදා
2015 பெப்ருவரி 06, வெள்ளிக்கிழமை
Friday, 06th February, 2015

පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
ජනාධිපති ලේකම් කාර්යාලයේ වාහන අවභාවිතය

උමා ඔය බහුකාර්ය ව්‍යාපෘතියේ හානිකර බලපෑම්:
ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමාගේ ප්‍රකාශය

විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත:
දෙවන වර කියවීම - විවාදය කල් තබන ලදී

කල් තැබීමේ යෝජනාව:
ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ඇතුළු අමාත්‍යාංශ ගණනාවකින් ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති

பிரதான உள்ளடக்கம்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல் மூல வினா:

ஜனாதிபதி செயலக வாகனங்களின் தவறான பயன்பாடு

உமா ஓயா பலநோக்குக் கருத்திட்டத்தின் பாதக விளைவுகள்:

அரசாங்கக் கட்சி முதற்கோலாசானினது கூற்று

ஒதுக்கீடு (திருத்தம்) சட்டமூலம்

இரண்டாம் மதிப்பு - விவாதம் ஒத்திவைக்கப்பட்டது

ஒத்திவைப்புப் பிரேரணை:

பொருளாதார அபிவிருத்தி அமைச்சு உட்பட பல்வேறு அமைச்சுகளும் அமுல்படுத்திய அபிவிருத்திக் கருத்திட்டங்கள்

PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Misuse of Vehicles of Presidential Secretariat

ADVERSE IMPACTS OF UMA OYA MULTIPURPOSE DEVELOPMENT PROJECT:
Statement by Chief Government Whip

APPROPRIATION (AMENDMENT) BILL:
Second Reading – Debate Adjourned

ADJOURNMENT MOTION:
Development Projects implemented by Ministry of Economic Development and several other Ministries

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2015 පෙබරවාරි 06 වන සිකුරාදා
2015 பெப்ருவரி 06, வெள்ளிக்கிழமை
Friday, 06th February, 2015

අ. භා. 1.30ට පාර්ලිමේන්තුව රැස් විය.
නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු චන්ද්‍රකුමාර් මුරුගේසු මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் பி.ப. 1.30 மணிக்குக் கூடியது.
குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.30 p.m.,

MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *in the Chair.*

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - வெகுசன ஊடக, பாராளுமன்ற அலுவல்கள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Mass Media and Parliamentary Affairs and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මහා මාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2012 වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තිස් හතරවැනි වාර්ෂික වාර්තාව;

(ii) 2012 වර්ෂය සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(iii) 2012 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(vv) 2012 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ වාර්ෂික වාර්තාව සහ වාර්ෂික ගිණුම්;

(v) 2012 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ වාර්ෂික වාර්තාව; සහ

(vi) 2012 වර්ෂය සඳහා ජෛව රසායන, අණුක ජෛව වේද හා ජෛව තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා අදාළ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ගරු අජිත් පී. පෙරේරා මහතා - පැමිණ නැත.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා - පැමිණ නැත.

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා
(மாண்புமிகு (கலாநிதி)சரத் வீரசேகர)
(The Hon. (Dr.) Sarath Weerasekara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මරදමුනෙයි - 02, අල් මනාර් පාර, අංක 88 ඒ දරන ස්ථානයෙහි පදිංචි ඉසට් ඒ. කලීලුර් රහ්මාන් මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා
(மாண்புமிகு உதித் லொக்குபண்டார)
(The Hon. Udith Lokubandara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම පහත සඳහන් පෙත්සම් එකොළහ පිළිගන්වමි.

(1) අම්පිටිය, ගාල්තැන්න පාර, නෙළුම්විලා, අංක 269/1 දරන ස්ථානයෙහි පදිංචි වෛද්‍ය ඩී.එම්.පී.බී. දිසානායක මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) ශාස්ත්‍රවෙල කඳවුර විශේෂ කාර්ය බලකායේ සේවය කරන බී.ජී.ඒ.එම්. රණවීර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) කැගල්ල පොලිස් ස්ථානයේ සේවය කරන ඊ.එස්.එස්. කාරියවසම් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) චුන්නාකම් පොලිස් ස්ථානයේ සේවය කරන එච්.ආර්.එල්.එස්.කේ. පීරිස් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(5) කොටවෙහෙර පොලිස් ස්ථානයේ සේවය කරන ජේ.එම්.කේ.බී. දිසානායක මහතාගෙන් ලැබුණු පෙත්සම;

(6) පන්නිපිටිය, කොට්ටාව නැගෙනහිර, හොරහේන පාර අංක 1571/11/ඒ දරන ස්ථානයෙහි පදිංචි කේ.වී.එස්.එන්. දිල්ෂාන් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(7) බණ්ඩාරවෙල පොලිස් ස්ථානයේ සේවය කරන එම්.පී. ද සිල්වා මහතාගෙන් ලැබුණු පෙත්සම;

(8) බණ්ඩාරවෙල, මහඋල්පත යන ලිපිනයෙහි පදිංචි එන්.ජේ. පතිරණ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(9) අරණායක පොලිස් ස්ථානයේ සේවය කරන එස්.පී.සී.එස්.කේ. සෙනරත් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(10) යාපනය කඳවුර, විශේෂ කාර්ය බලකායේ සේවය කරන යූ.ජී.ඩී. වීරසේකර මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(11) කළුතර, කටුකුරුන්ද, විශේෂ කාර්ය බලකා පුහුණු පාසලෙහි සේවය කරන ඊ.එල්.සී. උභයරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ගරු අජිත් මාන්නප්පෙරුම මහතා - පැමිණ නැත.

ගරු කරුපයියා වේලායුදම් මහතා (වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கருப்பையா வேலாயுதம் - பெருந்தோட்டக் கைத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Karuppaiah Velayudam - State Minister of Plantation Industries)

Sir, I present the following petitions:

1. A petition from Mr. B.S.S. Perera of No. 88/A 4, Henriya Waththa, Pahalagama, Gampaha;
2. A petition from Mr. H.M. Senevirathna of Sri Lanka Insurance Corporation Limited, Kurunegala Branch;
3. A petition from Mr. H.P.C. Fonseka of Sri Lanka Insurance Corporation Limited, Puttalam Branch;
4. A petition from Mr. I.A.D.S. De Silva of No. 30, Galle Road, Sarikkalimulla, Moratuwa;
5. A petition from Mr. Jayantha Hewagamage of No. 118/14, Higgahawaththa Mawatha, Kalapaluwawa, Rajagiriya;
6. A petition from Mr. P.N.K.K. Gunawardhane of No. 333/3 C, 3rd Lane, Ekamuthu Mawatha, Thalangama North, Battaramulla;
7. A petition from Mr. R.M. Wijerathne of No. 576/3, Subasadhaka Mawatha, Erawwala, Pannipitiya;
8. A petition from Mrs. G.P. Ranjani Perera of No. 282/20, Katuwana Road, Homagama;
9. A petition from Mrs. L.H.S. Wijerathna of No. 49/5, 1/1 Elhena Road, Maharagama;
10. A petition from Mrs. R.F.T. Pallage of No. 354 A 1, Jinasena Mawatha, Mahara, Kadawatha;
11. A petition from Mrs. S.D. Wickramasurendra of No. 22/30, 3rd Lane, Jubilee Road, Lakshapathiya, Moratuwa;
12. A petition from Mrs. S.H.K. Rukmal of No. 11/4, Hiripitiya, Pannipitiya;
13. A petition from Mrs. Susila Chandrasekara of Sinnikulama, Shrawasthipura, Anuradhapura;
14. A petition from Ms. Chitranjalika Udugoda of No. 136/8 A, Pushparama Mawatha, Pahala Biyanwala, Kadawatha; and
15. A petition from Ms. G.H.W. Sadhana Lakmali of No. 70, 6th Lane, Sarabhoomi Niwasa, Madapatha, Piliyandala.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

දුම්රිය දෙපාර්තමේන්තුවට බඳවා ගත් සේවකයන් : ස්ථිර කිරීම
புகையிரதத் திணைக்களத்துக்கு ஆட்சேர்க்கப்பட்ட ஊழியர்கள் : நிரந்தரமாக்கல்
EMPLOYEES RECRUITED TO SRI LANKA RAILWAYS DEPARTMENT: PERMANENCY

4474/'13

1. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ, ප්‍රවාහන උප දෙපාර්තමේන්තුව සඳහා දුම්රිය කාර්ය සහායක, සනීපාරක්ෂක කම්කරු සහ කාර්යාල කම්කරු තනතුරු සඳහා 2009.05.15 සහ 2009.11.17 දිනැති පත්වීම් ලිපි මගින් සේවකයන් පිරිසක් බඳවා ගෙන ඇති බවත්;

(ii) මෙතෙක් ඔවුන්ගේ සේවය ස්ථිර කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් පරිදි බඳවා ගන්නා ලද සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් ස්ථිර කරනු ලබන්නේ නම්, එම දිනය කවරේද;

(iii) ඒ සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

உள்ளகப் போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை புகையிரதத் திணைக்களத்தின் போக்குவரத்து உப திணைக்களத்துக்கு புகையிரதப் பணி உதவியாளர், துப்பரவு ஏற்பாட்டுத் தொழிலாளர் மற்றும் அலுவலகத் தொழிலாளர் ஆகிய பதவிகளுக்காக 2009.05.15 ஆம் திகதி மற்றும் 2009.11.17 ஆம் திகதிய நியமனக் கடிதங்கள் மூலம் சிலர் ஆட்சேர்க்கப்பட்டுள்ளனர் என்பதையும்;

(ii) இதுவரை இவர்களின் சேவை நிரந்தரமாக்கப் படவில்லை என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்குறிப்பிட்டவாறு ஆட்சேர்க்கப்பட்ட ஊழியர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) இவர்கள் நிரந்தரமாக்கப்படுவார்களாயின் அத்திகதி யாதென்பதையும்;

(iii) இதற்காகக் கடைப்பிடிக்கப்படும் முறைமை யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Internal Transport:

(a) Is he aware that -

(i) a group of personnel have been recruited to the Transport Sub-Division of the Sri Lanka Railways Department through appointment letters dated 15th May, 2009 and 17th November, 2009 for the positions of Railway Assistant, Sanitation Worker and Office Labourer; and

(ii) their service has not been made permanent up to now?

(b) Will he inform this House -

(i) the number of personnel recruited in the aforesaid manner;

(ii) if the aforesaid persons will be made permanent in the service, of the date on which it will be done; and

(iii) the methodology that will be adopted to do so?

(c) If not, why?

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා (අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்துும பண்டார - உள்ளக போக்குவரத்து அமைச்சர்)
(The Hon. R.M. Ranjith Madduma Bandara - Minister of Internal Transport)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) 2014.10.24 දින සිට ස්ථිර කර ඇත.

(ආ) (i) 132කි.

(ii) 2014.10.24 දින සිට ස්ථිර කර ඇත.

(iii) 2014.11.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 අනුව, 2014.10.24 දිනට අඛණ්ඩව දින 180ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අවම වශයෙන් 08 ශ්‍රේණිය/9 වසර සමත් සේවකයන්ට ස්ථිර පත්වීම් ප්‍රදානය කර ඇත.

(ඇ) අදාළ නොවේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු අමාත්‍යතුමනි, ආණ්ඩු පක්ෂයේ ජනතා නියෝජිතයකු විධියට මා පළමුවැනි අතුරු ප්‍රශ්නයයි ඔබතුමාට යොමු කරන්නේ.

මේ මොහොත වන කොට ඔබතුමා යම් විශ්ලේෂණයක් කර තිබෙනවාද දුම්රිය සේවය තුළ cadre එක සම්පූර්ණ වෙන්න තවත් කොපමණ සේවක පිරිසක් අවශ්‍යද, ඒ සේවක පිරිසෙන් දුම්රිය දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාව වැඩි කරන්න පුළුවන්ද, ඒ සඳහා බඳවාගැනීම් මේ දින 100 තුළ කරන්න පුළුවන්ද, එසේ කරනවා නම් ඒ කොහොමද යනාදි කරුණු සම්බන්ධයෙන්. මේවා සම්බන්ධයෙන් එවැනි විශ්ලේෂණයක්, ගවේෂණයක් ඔබතුමා මේ වන කොට කරලා තිබෙනවාද? මොකක්ද ඒ සම්බන්ධයෙන් ගෙන තිබෙන ක්‍රියා මාර්ගය?

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்துும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

දැනට ආසන්න වශයෙන් 1,500ත්-2,000ත් අතර පුරප්පාඩු සංඛ්‍යාවක් තිබෙනවා. විශේෂයෙන් තාක්ෂණික සහ කාර්මික අංශයේ පුරප්පාඩු තමයි වැඩිපුරම තිබෙන්නේ. ඒ අතරතුර, අනියම් සේවකයන් 1,200ක් පමණ බඳවාගෙන තිබෙනවා. මා හිතන හැටියට වැඩක් නැතිව ඒ අය දැන් නිකරුණේ කාලය ගත කරනවා. ඒ සම්බන්ධව අවශ්‍ය කටයුතු කරන්න හෙට අනිද්දා තීරණයක් ගන්නවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු අමාත්‍යතුමනි, මා නියෝජනය කරන මාතර දිස්ත්‍රික්කය දක්වා ගමන් කරන්නේ මුහුදුබඩ දුම්රිය මාර්ගයයි. මුහුදුබඩ දුම්රිය මාර්ගයේ තිබෙන ප්‍රධාන ගැටලුවක් තමයි දුම්රිය නතර කිරීමේ ස්ථාන පිළිබඳ ගැටලුව. ජනතාවගේ අවශ්‍යතාව පරිදි තීන්දුවක් අරගෙන නොවෙයි පසු ගිය කාලයේ දුම්රිය නැවැත්වූයේ. නවත්වන්න ඕනෑ සමහර තැන්වල දුම්රිය නවත්වන්නේ නැහැ; නොනවත්වන්න ඕනෑ තැන්වල නවත්වනවා.

මුහුදුබඩ දුම්රිය ස්ථානයන්හි පොදු පහසුකම් පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. "දැයට කිරුළ" මඟින් ඒ සඳහා මුදල් වෙන් වුණය කියනවා. ඒ වැඩ කටයුතු සිදු වෙනවාද? ඒ වාගේම දුම්රිය නතර කිරීමේ ස්ථාන පිළිබඳව සහ දුම්රිය කාල සටහන් යුගයට ගැළපෙන විධියට යළි ප්‍රතිසංවිධානය කිරීම ගැන ඔබතුමාගේ අවධානය සහ අමාත්‍යාංශයේ අවධානය යොමු වෙලා තිබෙනවාද?

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்துும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධව ඔබතුමාගේ අදහස් ඉදිරිපත් කරන්න. අපි ඒ පිළිබඳව සලකා බලන්නම්. මා හිතන විධියට, "දැයට කිරුළ" යටතේ සිදු වන සියලු කටයුතු දැනට නවත්වා තිබෙනවා.කොහොම නමුත් ඔබතුමාගේ අවශ්‍යතා සම්බන්ධයෙන් අපි කටයුතු කරන්නම්. ඒවා අපට ඉදිරිපත් කරන්න.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

තමන්ට smartphone එකක් තිබෙනවා නම් එම ජංගම දුරකථනයෙන්, ඒ වාගේම tab එකක් තිබෙනවා නම් එම tab එකෙන් දුම්රිය ගමන් කරන ස්ථාන බලන්න පුළුවන් විධියට GPRS එකක් ගැන පසු ගිය කාලයේ කථා වුණා. එය මුහුදුබඩ දුම්රිය මාර්ගයට අදාළව ක්‍රියාත්මක වන බවත් කිව්වා. මම දැන් මෙතැනට එන්න කලිනුත් බැලුවා, මට නම් ඒක මගේ tab එකෙන් බලාගන්න පුළුවන් තත්ත්වයක් නැහැ. දැන් මේ ව්‍යාපෘතියට සල්ලි යට කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ ව්‍යාපෘතිය ගැන පසු විපරමක් කරන්න ඔබතුමාගේ අවධානය යොමු වෙලා තිබෙනවාද? ඒ GPRS System එක හරි විධියට ක්‍රියාත්මක කරන්න මේ දින 100 තුළ ඔබතුමා යම් වැඩ පිළිවෙළකට මුල පුරනවාද?

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்துும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

ඔව්. GPRS ක්‍රමය තවම ක්‍රියාත්මක කරලා නැහැ. මේ දින 100 ඇතුළත මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නේ කොහොමද කියලා අපි දැන් සාකච්ඡා කර ගෙන යනවා. ඒකට අවශ්‍ය මුදලුත් තවම ලැබිලා නැහැ. අපි මුදල් හොයා ගන්නේ කොහොමද කියලා දැන් සාකච්ඡා කර ගෙන යනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Question No.3 - 5424/'14 (1), the Hon. Sunil Handunnetti.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Then, second round. Question No. 2 - 5021/'14 (1), the Hon. Ajith Mannapperuma. - [*Pause.*] Not here.

රාමසාමි ප්‍රභාකරන්: පැහැර ගෙන යෑම
ராமசாமி பிரபாகரன் : கடத்தப்பட்டமை
RAMASAMY PRABHAKARAN : ABDUCTION

5656/'14

4. ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ගරු සිවශක්ති ආනන්දන් මහතා වෙනුවට)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - மாண்புமிகு சிவசக்தி ஆனந்தன் சார்பாக)
(The Hon. Dinesh Gunawardena on behalf of the Hon. Sivasakthy Ananthan)
මහජන සාමය, ආපදා කළමනාකරණය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) බම්බලපිටිය, මැජෙස්ටික් සිටි හි, තුන්වැනි මහලේ, අංක 3-26 සහ 27 යන ස්ථානයන්හි පිහිටි "පැනමා ට්‍රේඩර්ස්" වෙළඳ ආයතනයේ හිමිකරු වූ රාමසාමි ප්‍රභාකරන් යන අය මාස 28ක කාලයක් අත් අඩංගුවේ තබා සිටියදී ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවකට අනුව නිදහස් කළ අයෙකු බවත්;

(ii) නිදහස ලැබීමෙන් පසු මොහු විසින් නියෝජ්‍ය පොලිස්පති අනුර සේනානායක සහ රාජ්‍ය විමර්ශන ඒකකයේ සේවය කළ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි වාස් ගුණවර්ධන යන අයට විරුද්ධව මානව හිමිකම් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් අධිකරණය හමුවේ නඩුවක් ගොනු කර තිබූ බවත්;

(iii) ඊට අදාළ නඩු විභාගය 2012 පෙබරවාරි 13 වැනිදා පැවැත්වීමට නියමිතව තිබූ බවත්;

(iv) 2012 පෙබරවාරි 11 වැනිදා ප. ව. 3.30ට පමණ සුදු වෑන් රථයක පැමිණි පිරිසක් විසින් වැල්ලවත්ත ප්‍රදේශයේ දී මොහු පැහැරගෙන ගොස් ඇති බවත්; එතුමා දන්නෙහිද?

(ආ) (i) 2012 පෙබරවාරි මස 11 වැනි දින අතුරුදන් වූ රාමසාමි ප්‍රභාකරන් මේ වනවිට සිටින ස්ථානය කවරේද;

(ii) ඔහුගේ තත්ත්වය කෙසේද;

(iii) ඉහත කී පැහැර ගැනීමට සම්බන්ධ වූ අය හෝ අදාළ සැකකරුවන් කවුරුන්ද;

(iv) ඔවුන්ගේ නම් හෙළි කිරීමට නොහැකි නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

மக்கள் ஒழுங்கு, அனர்த்த முகாமை மற்றும் கிறித்தவ மத அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பம்பலப்பிட்டி, மெஜஸ்ரிக் சிட்டி, மூன்றாம் மாடியில், இலக்கம் 3 - 26 மற்றும் 27 ஆம் இலக்கங்களில் அமைந்துள்ள `பனமா டிரேடர்ஸ்' வர்த்தக நிலையத்தின் உரிமையாளரான திரு. ராமசாமி பிரபாகரன் என்பவர் 28 மாதகால மாக கைது செய்யப்பட்டிருந்த நிலையில் உயர் நீதிமன்றத் தீர்ப்பின் பிரகாரம் விடுதலை செய்யப்பட்ட ஒருவராவாரா என்பதையும்;

(ii) விடுதலை பெற்ற பின்னர் இவர் பிரதிப் பொலிஸ் மாஅதிபர் அநுர சேனாநாயக்க மற்றும் அரச புலனாய்வுப் பிரிவில் சேவையாற்றிய சிரேஷ்ட பொலிஸ் அத்தியட்சகர் வாஸ் குணவர்த்தன ஆகியோருக்கு எதிராக மனித உரிமை மீறல் தொடர்பாக நீதிமன்றத்தில் வழக்குத் தாக்கல் செய்திருந்தார் என்பதையும்;

(iii) இது சம்பந்தமான வழக்கு விசாரணை 2012 பெப்ருவரி மாதம் 13ஆம் திகதி நடத்தப்பட விருந்தது என்பதையும்;

(iv) 2012 பெப்ருவரி 11ஆம் திகதி பி.ப. 3.30 மணியளவில் வெள்ளை வேன் ஒன்றில் வந்த சிலர் வெள்ளவத்தை பிரதேசத்தில் வைத்து இவரை கடத்திச் சென்றுள்ளார்கள் என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) 2012 பெப்ருவரி 11ஆம் திகதி காணாமல்போன திரு. ராமசாமி பிரபாகரன் தற்போது இருக்கும் இடம் யாது என்பதையும்;

(ii) இவரின் நிலைமை என்ன என்பதையும்;

(iii) மேற்படி கடத்தலுடன் தொடர்புடையவர்கள் அல்லது சம்பந்தப்பட்ட சந்தேகநபர்கள் யாவர் என்பதையும்;

(iv) இவர்களின் பெயர்களை வெளியிட முடியா திருப்பின், அதற்கான காரணங்கள் யாவை என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Order, Disaster Management and Christian Affairs:

(a) Is he aware that -

(i) the owner of "Panama Traders" located at No. 3-26 and 27 on the Third Floor of Majestic City, Colombo, Ramasamy Prabhakaran, is a person released on a Supreme Court Ruling after being detained for a period of 28 months;

(ii) after his release, he had filed a human rights violation case against Anura Senanayaka, Deputy Inspector-General of Police and Vass Gunawardhana, Senior Superintendent of Police, who served in the State Investigations Unit;

(iii) the hearing of the relevant case was scheduled for 13th February, 2012;

(iv) he was abducted by some individuals who had come by a white van around 3.30 p.m. on 11th February, 2012 at Wellawatta?

(b) Will he state -

(i) where Ramasamy Prabhakaran, who disappeared on 11th February, 2012, is today;

(ii) what his condition is;

(iii) who the persons involved in the said abduction or who the relevant suspects are; and

(iv) the reason for not divulging their names, if such divulgence is not possible?

(c) If not, why?

ප්‍රශ්නය ඇහුවාට විතරක් හරි යන්නේ නැහැ. Hon. Minister, ඒ ප්‍රශ්නයට පිළිතුර table කරනවාද, නැද්ද කියලා අපට කියන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මහජන සාමය, ආපදා කළමනාකරණය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

සභාමේසය මත තබන ලද පිළිතුර:
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
**Answer tabled:*

(අ) (i) ඔව්. රාමසාමි ප්‍රභාකරන් යන අය 2009 දැයට කිරුළ ප්‍රදර්ශන භූමියට මරාගෙන මැරෙන බෝම්බකරුවෙකු රැගෙන ඒමට අධාර අනුබල දීම සම්බන්ධයෙන් 2009.05.22 වන දින අත් අඩංගුවට ගෙන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා ගැනීමේ නියෝග මත රඳවා ගෙන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වැඩිදුර විමර්ශන සිදු කර ඇති අතර, නීතිපති උපදෙස් මත ගල්කිස්ස මහෙස්ත්‍රාත් අධිකරණය මඟින් 2011.09.16 දිනැතිව ඔහු නිදහස් කර ඇත.

(ii) නැත. ශ්‍රේෂ්ඨාධිකරණයේ අයදුම් පත් අංක 963/2009 යටතේ ඔහුගේ මූලික අයිතිවාසිකම් කඩවීම සම්බන්ධයෙන් නඩුවක් ගොනු කර තිබූ බවට රාමසාන් ප්‍රභාකරන් යන අයගේ බිරිඳ වන ශිරෝමනී නාරායනන් විසින් වැල්ලවත්ත පොලිස් ස්ථානයට කර ඇති පැමිණිල්ලේ සඳහන්ව ඇත.

(iii) එම නඩු විභාගය 2012.02.13 දිනට පැවැත්වීමට නියමිතව තිබී ඇති බවට ඉහත පැමිණිලිකාරිය විසින් වැල්ලවත්ත පොලිස් ස්ථානයට කර ඇති පැමිණිල්ලේ සඳහන්ව ඇත.

(iv) වැල්ලවත්ත, කැනල් බැන්ක් පාර, අංක 153/01/01 දරන තම නිවස ඉදිරිපිටදී 2012.02.11 දින සවස 03.30ට පමණ සුදු පැහැති වෑන් රථයකින් පැමිණි ආයුධ සන්නද්ධ පිරිසක් විසින් පැහැර ගෙන ගිය බවට ඔහුගේ බිරිඳ වන ශිරෝමනී නාරායනන් නැමැත්තිය විසින් වැල්ලවත්ත පොලිස් ස්ථානය වෙත බල අපරාධ ලේඛන අංක 36/2012 යටතේ 2012.02.11 වන දින කර ඇති පැමිණිල්ලේ සඳහන් කර ඇත.

(ආ) (i) මෙතෙක් සිදු කර ඇති විමර්ශනවලදී අනාවරණය වී නොමැත.

(ii) මෙතෙක් සිදු කර ඇති විමර්ශනවලදී අනාවරණය වී නොමැත.

(iii) විමර්ශනයේදී සැකකරුවන් පිළිබඳව මෙතෙක් අනාවරණය වී නොමැත.

(iv) විමර්ශනයේදී සැකකරුවන් පිළිබඳව මෙතෙක් අනාවරණය වී නොමැත.

(ඇ) පැන නොනඟී.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

ජනාධිපති ලේකම් කාර්යාලයේ වාහන අවභාවිතය
ஜனாதிபதி செயலக வாகனங்களின் தவறான பயன்பாடு
MISUSE OF VEHICLES OF PRESIDENTIAL SECRETARIAT

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වනවා.

ජනාධිපති කාර්ය මණ්ඩලයට අයත් වාහන අවභාවිතයේ යෙදවීම පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කරනු කැමැත්තෙමි.

හිටපු ජනාධිපතිවරයාගේ පාලනය තුළ ජනාධිපති ලේකම් කාර්යාලය සතු වාහන අවභාවිත කරනු ලැබ ඇති බවටත්, එම වාහන විශාල සංඛ්‍යාවකට සිදු වී ඇති දේ සොයා ගැනීමට නොමැති බවටත් ජනමාධ්‍ය මඟින් වාර්තා කළා. පසු ගිය දා ශ්‍රී ජයවර්ධනපුර සමුපකාර සමිතියට අයත් පිටකෝට්ටේ පිහිටි ඉඩමක තිබී වාහන 52ක් හමු වූ අතර, බොරැල්ලේ නාගරික සංවර්ධන අධිකාරියට අයත් භූමියක ජනාධිපති ආරක්ෂක අංශයට අයත් යැයි සැක කෙරෙන වාහන 22ක් හමු වී තිබෙනවා.

ඒ වාගේම ඩිෆෙන්ඩර් රථ සහ කාර් රථ වැනි විශාල රථ ප්‍රමාණයක් තැන් තැන්වලින් හමු වන්න පටන් ගෙන තිබෙනවා. මේ සියලු වාහන මිලදී ගෙන තිබෙන්නේ මේ රටේ ජනතාවට අසීමිත ලෙස බදු බර පටවා ඒ බදුවලින් එක් රැස් කර ගන්නා ලද ධනයෙන්. ඕනෑම පාලකයෙකුගේ වගකීම තමයි තමන් පාලනය

[ගරු අනුර දිසානායක මහතා]

අත් හැර යනවා නම්, තමන් සතුව තිබුණු වත්කම් නිවැරදි ලෙස යළි භාර දීම. හැබැයි, දැන් සිදු වී තිබෙන දේ තමයි ඩිෆෙන්ඩර් රථ හොයා ගන්න සිද්ධ වෙලා තිබෙන්නේ ගස් ගල් යටින්. සමහර වාහන හොයා ගන්න වෙලා තිබෙන්නේ වහපු ගරාජ් යට තිබිලා. මේ ඇති වෙලා තිබෙන තත්ත්වය මොකක්ද?

මෙසේ තැන් තැන්වලින් රජයට අයත් වාහන හමු වී ඇති අතර, ඒවා හිටපු ජනාධිපති කාර්ය මණ්ඩලය විසින් පාවිච්චි කරනු ලැබ ඇති බවට වාර්තා පළ වෙනවා. නැත්නම් කවුරුවත් ඇවිල්ලා වාහන තැන තැන දමා යනවාද? මේ සිදු වී තිබෙන්නේ මොකක්ද? ඒවා ඔවුන්ගේ පෞද්ගලික මුදලින් මිලදී ගන්නා ලද ඒවා නොවෙයි. මේ රටේ දුප්පත් මහ ජනතාව ඉතා දුකසේ ඉතිරි කර දුන් මුදලින් රජය විසින් මිලදී ගත් ඒවායි. ඒවා ඉතාමත් නොසැලකිල්ලෙන් පාවිච්චි කරනු ලැබ ඇති බවත්, සුළු අඩු පාඩු ඇති වටිනා වාහන දිරා යාමට සලස්වා ඇති බවත් ජනමාධ්‍ය වාර්තා කළා.

පසු ගිය දිනක මාධ්‍ය මඟින් වාහන තොගයක් පෙන්වූවා අපි දැක්කා. ඒවායේ කුඩා කුඩා අඩු පාඩුකම් තිබුණේ. නමුත් ඒ වාහන දිරන්න පටන් ගෙන තිබෙනවා. මේ රටේ මහ ජනයාගේ දේපළ රුපියල් කෝටි ප්‍රකෝටි ගණන් නාස්ති කරපු බව මේ තුළින් පෙන්නුම් කරමින් තිබෙනවා.

මෙසේ විනාශ වී ඇත්තේ රජයේ රුපියල් කෝටි ගණනක දේපළ බව පැහැදිලියි. රජයට අයත් මෙම වාහන පිළිබඳ සත්‍ය දැන ගැනීමේ අයිතිය මහ ජනතාවට තිබෙනවා.

මේ තැන තැන හම්බ වන වාහන මොනවාද, මේ වාහන අයිතිව තිබුණේ කාටද, මේ වාහන පාවිච්චි කළේ කවුද, මෙහෙම වාහන තැන තැන දමා යන්නේ ඇයි කියන කාරණා සම්බන්ධයෙන් මේ රටේ ජනතාවට දැන ගන්න අයිතියක් තිබෙනවා. මේවා මේ රටේ මහ ජනයාගේ දේපළ. කාගේ හරි පවුලක බූදලයක් නොවෙයි. මේ වාහන මේ රටේ ජනතාවගේ හිස මත මහා බදු බරක් පටවා එක් රැස් කර ගත් ධනයෙන් ගත් ඒවායි. ඒ විතරක්ද?

මේ තත්ත්වය තුළ මෙම ජනාධිපති ලේකම් කාර්යාලයට අයත් වාහන පිළිබඳව පැන නැඟී ඇති පහත ගැටලුවලට අදාළ අමාත්‍යවරයා පිළිතුරු ලබා දෙනු ඇතැයි බලාපොරොත්තු වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රටක මෙහෙම තැන තැන වාහන දමා තිබෙන්නේ මේවා ඉදිකටු, අල්පෙනෙති, ෆයිල් කවර නොවෙයි; මේවා වාහනයි.

නිශ්චිතව පාවිච්චි කළ අයෙක් ඉන්න ඕනෑ. කාටද දුන්නේ කියා දුන්න අයෙක් ඉන්න ඕනෑ. සභානායක කාර්යාලයේ වැඩ කළ නිලධාරියෙක් -රියැදුරු මහත්මයෙක්- තමයි වාහන අධ්‍යක්ෂ හැටියට පත් වෙලා තිබෙන්නේ. ඒ අය මේවාට වග කියන්නට ඕනෑ.

එම නිසා මේ පිළිබඳව, මේ තත්ත්වය තුළ මෙම ජනාධිපති ලේකම් කාර්යාලයට අයත් වාහන පිළිබඳව පැන නැඟී ඇති පහත ගැටලුවලට අදාළ අමාත්‍යවරයා පැහැදිලිව පිළිතුරු ලබා දෙනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

1. ජනාධිපති ලේකම් කාර්යාලයේ සමස්ත වාහන සංචිතයේ ප්‍රමාණය කීයද? වාහන සංචිතය සතුව වාහන කොච්චර තිබුණා ද? එම වාහන වර්ග අනුව වෙන් වෙන් වශයෙන් කොපමණ ද?
2. එම වාහනවලින් කොපමණ වාහන සංඛ්‍යාවක් සොයා ගැනීමට නොමැතිද? එම වාහන වර්ග අනුව වෙන් වෙන් වශයෙන් කොපමණ ද?
3. මෙම වාහන රට පුරා කුමන කාර්යයන් සඳහා කුමන පුද්ගලයින්ගේ වගකීම යටතට පවරනු ලැබ තිබිණි ද?
4. මේවා අතුරුදහන් වී ඇත්නම් හෝ විනාශයට පත් වී ඇත්නම් ඊට වග කිව යුතු පුද්ගලයින් හෝ බලධාරීන් කවරහු ද? ඔවුන්ගෙන් එම වටිනාකම් අය කර ගැනීමට කටයුතු කරන්නේ ද?
5. පසු ගිය වසර 05ක කාලය තුළ ජනාධිපතිවරයා, ජනාධිපති කාර්ය මණ්ඩලය හා ජනාධිපති ලේකම් කාර්යාලය වෙනුවෙන් එක් එක් වර්ෂය තුළ මිලදී ගන්නා ලද වාහන මොනවා ද? ඒවායේ වටිනාකම් එක්ව හා වෙන් වෙන් වශයෙන් කොපමණ ද?
6. මේ වාහන අවභාවිතය පිළිබඳ විධිමත් පරීක්ෂණයක් සිදු කිරීමට පියවර ගන්නේ ද කියා දැන ගන්නට කැමතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் கொள்கை உருவாக்கம், பொருளாதார அலுவல்கள், சிறுவர், இளைஞர் மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரும்)

(The Hon. Ranil Wickremasinghe - Prime Minister, Minister of Policy Planning, Economic Affairs, Child, Youth and Cultural Affairs)

ගරු මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග 23/2 යටතේ ඔබතුමාගේ ප්‍රශ්නය මා ජනාධිපති කාර්යාලයට යොමු කළා, ජනාධිපතිතුමා වෙනුවෙනුත්. නමුත් ඒ පිළිබඳව අද පිළිතුරු දෙන්නට පුළුවන් තත්ත්වයක් නැහැ. කොහොමත් එම පිළිතුරු ලැබුණු විගස ඔබතුමාට ලබා දෙන්නම්.

මම මේ කරුණ ගරු මන්ත්‍රීතුමාට කියන්න කැමැතියි. වාහන කීයක් තිබුණා ද කියා අපි කවුරුත් දන්නේ නැහැ. කොහේද තියෙන්නේ කියලාවත් දන්නේ නැහැ. කොටසක් ගාල් කර තිබුණා, ජනාධිපති මන්දිරය ඉස්සරහා පාරේ. දැන් එක එක අය ළඟ වාහන තිබෙනවා. දාලා තිබුණු කළමනාකරු ගැන ඔබතුමා කිව්ව නිසා මා ආපසු ඒ ගැන කියන්නට යන්නේ නැහැ. මේ වාහන කොහෙන් ද ගත්තේ, මොනවාද ගත්තේ, කොහේද ඒවා තියෙන්නේ කියා අපි දන්නේ නැහැ. මේ අතර ලැම්බෝගිනි වාහන තියෙනවාද, ටොයෝටා වාහන තියෙනවා ද, නැනෝ වාහන තියෙනවා ද මොනවා තියෙනවා ද කියා අපි දන්නේ නැහැ. ඒ තියෙන වාහන ටිකේ ලැයිස්තුව අපි කියන්නම්. නැත්නම් මුළු පාර්ලිමේන්තුවම එකතු වෙලා මේ වාහන ටික සොයා ගන්න වේවි. මේක විශාල ප්‍රශ්නයක්. වාහන සියයක් තිබුණා ද, දාහක් තිබුණා ද, දහ දාහක් තිබුණා ද, ලක්ෂයක් තිබුණා ද කියා මට කියන්නත් බැහැ; ජනාධිපතිතුමාට කියන්නත් බැහැ; ඔබතුමාට කියන්නත් බැහැ. එවැනි තත්ත්වයක් තමයි අද තිබෙන්නේ. කොහොම හෝ පුළුවන් විධියට අපි මේ සම්බන්ධව කරුණු එකතු කර ගෙන හෙට හෝ වාර්තාවක් අපි ඔබතුමාට ලබා දෙන්නම්. මේක වැදගත් ප්‍රශ්නයක්. වාහන එක එක තැන්වල. මට පෙනෙන විධියට වාහන ආනයනය කළ සමාගම්වලින් අහන්න වෙයි, කොහෙන් කොහෙන් ද ගත්තේ කියා. වෙන මාර්ගයක් නම් මට තේරෙන්නේ නැහැ. මා හිතන්නේ, සමහරවිට මේක පාර්ලිමේන්තුව මඟින්ම සොයා බලන්න වේවි.

ගරු අනුර දිසානායක මහතා

(மாண்புமிகு அநுர திஸாநாயக்க)

(The Hon. Anura Dissanayake)

වාහන තැන් තැන්වල තිබෙන්නට පුළුවන්. ලිපිගොනුත් තැන් තැන්වල තිබෙන්නට පුළුවන්ද? ජනාධිපති ලේකම් කාර්යාලයට වාහනයක් මිලදී ගත්තා නම් ලිපිගොනුව ජනාධිපති ලේකම්

කාර්යාලයේ තිබෙන්නට ඕනෑ. වාහනය තමන්ගේ ඥාතියාට හෝ මලයාට හෝ නැන්දාට හෝ හම්බන්තොට කාට හෝ බෙදුවාද ඒ වාහනය නේ බෙදන්නේ. හැබැයි මේ වාහනවල ලිපිගොනුවක් තිබෙන්නට ඕනෑ. එහෙමනම් ඒ ලිපිගොනුත් අතුරුදහන් වෙලාද කියා ඔබතුමාගෙන් දැන ගන්නට කැමැතියි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ඇත්තටම ලිපිගොනු නැහැ මන්ත්‍රීතුමා. මේක අමුතු පාලනයක්. මම දන්නේ නැහැ ඒවා කොහේද කියා. මේවා ඔක්කොම ගැන අපට දැන් ජේන අහන්න වෙච්. අපිට දැන් සුමනදාසගෙන්වත් අහන්න වේවි කොහේද මේවා තියෙන්නේ කියලා. ලිපිගොනුද මොනවා ද කියා මම දන්නේ නැහැ. ගරු සභාවට ඇත්ත තත්ත්වය මම මේ කියන්නේ. ජනාධිපති කාර්යාලයෙනුත් එන පිළිතුර ගැන අපට සියයට සියයක් වගකියන්නට බැහැ. එතුමාට කියන්නටත් බැහැ. මේවා කොහේ තියෙයිද කියා මම දන්නේ නැහැ.

උමා ඔය බහුකාර්ය ව්‍යාපෘතියේ හානිකර බලපෑම් : ආණ්ඩු පාර්ශවයේ ප්‍රධාන සංවිධායකතුමාගේ ප්‍රකාශය

உமா ஓயா பலநோக்குக் கருத்திட்டத்தின் பாதக விளைவுகள் : அரசாங்கக் கட்சி முதற்கோலாசானினது கூற்று

ADVERSE IMPACTS OF UMA OYA MULTIPURPOSE DEVELOPMENT PROJECT: STATEMENT BY CHIEF GOVERNMENT WHIP

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශවයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - வெகுசன ஊடக, பாராளுமன்ற அலுவல்கள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Mass Media and Parliamentary Affairs and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊයේ දින ස්ථාවර නියෝග 23/2 යටතේ ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා විසින් නැඟූ ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

පළමු ප්‍රශ්නය හැටියට අසා තිබෙනවා, උමා ඔය ව්‍යාපෘතියේ පාරිසරික ඇගයීම් වාර්තාව මුල්ගල තැබීමෙන් පසුව ඉදිරිපත් කිරීම සම්මත පටිපාටිය උල්ලංඝනය කිරීමක් නොවන්නේ ද කියා.

එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි :

මෙම ව්‍යාපෘතියේ සමරු ඵලකය පමණක් 2008 අප්‍රේල් මාසයේදී විවෘත කළ අතර පරිසර බලපෑම් ඇගයීම් වාර්තාවට 2011 අප්‍රේල් මස 12 වන දින අනුමතිය ලැබීමෙන් පසුව 2011 මැයි මාසයේදී ව්‍යාපෘතියේ ඉදිකිරීම් ආරම්භ කර තිබෙනවා. මේ නිසා සම්මත ක්‍රියා පටිපාටිය උල්ලංඝනය කර නැහැ.

ඊළඟට දෙවන ප්‍රශ්නය හැටියට අසා තිබෙනවා, ව්‍යාපෘතිය ආශ්‍රිත මේ දක්වා උද්ගත වී ඇති පාරිසරික හා සාමාජීය ගැටලු සමාලෝචනය සඳහා ගනු ලැබ ඇති පියවර කවරේද කියා.

පහත සඳහන් ආකාරයට පාරිසරික හා සාමාජීය ගැටලු නිසි පරිදි සමාලෝචනය කර විසඳුම් ලබා දී තිබෙනවා:

නිවාස අහිමි වූවන් සඳහා සුදුසු ස්ථානවලින් ඉඩම් හඳුනාගෙන පවුල් 138ක් නැවත පදිංචි කරවීමට කටයුතු කර තිබෙනවා.

එම පදිංචිකරුවන්ගේ යටිතල පහසුකම් (විදුලිය, ජලය, මාර්ග පහසුකම් යනාදිය) ලබා දෙමින් පවතිනවා. ව්‍යාපෘතිය නිසා ඇති වී තිබෙන ළිං සිඳී යාම, ගෙවල් පුපුරා යාම, වගා හානි යනාදී පාරිසරික, කෘෂිකාර්මික හා සමාජ ආර්ථික ගැටලු පිළිබඳ අධ්‍යයනයක් සිදු කරමින් පවතිනවා. සමහර කෙටි කාලීන විසඳුම් මේ වන විට ලබා දී තිබෙනවා.

තුන් වන ප්‍රශ්නය වශයෙන්, හඳුනා ගනු ලබන හානි පූරණය වෙනුවෙන් වන්දි මුදල් ප්‍රදානය කිරීමක් සිදු නොවන්නේද කියා අසා තිබෙනවා. හානි පූරණය සඳහා වන්දි මුදල් ප්‍රදානය කිරීමක් සිදු වී තිබෙනවා. අවශ්‍යතාව අනුව තවදුරටත් දැනට සිදු වන හානි පූරණය සඳහා විධිමත් විමර්ශනයකින් පසු ප්‍රදානයන් සිදු කිරීමට බලාපොරොත්තු වෙනවා.

හතර වන ප්‍රශ්නය වශයෙන් ව්‍යාපෘතියේ මූල්‍ය අක්‍රමිකතා සහ ඊට වගකිවයුත්තන් සොයා බැලීම සඳහා ගන්නා වූ ක්‍රියා මාර්ගය කුමක්ද කියා අසා තිබෙනවා. මූල්‍ය අක්‍රමිකතාවන් අනාවරණය වන්නේ නම් ඒ පිළිබඳව කටයුතු කරනු ලබනවා.

පස් වන ප්‍රශ්නය වශයෙන් අදාළ විද්වතුන්, බුද්ධිමතුන්, පරිසරවේදීන් සම්බන්ධ කර ගනිමින් සමස්ත ව්‍යාපෘතිය නැවත සමාලෝචනය කර ඒ පිළිබඳ විද්‍යානුකූල නිගමනයකට එළඹීමට පියවර ගනු ලබන්නේද කියා අසා තිබෙනවා. එම ප්‍රශ්නයට පිළිතුර මෙයයි :

මෙම ව්‍යාපෘතියේ මූලික ශක්‍යතා අධ්‍යයනය, ඉංජිනේරුමය කාර්යන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය විසින් 1990 දී සිදු කරන ලදි. ඊට පසුව සම්පූර්ණ ශක්‍යතා වාර්තාව කැනේඩියානු සමාගමක් විසින් කරන ලදි. විශේෂයෙන් ඇති වී තිබෙන පාරිසරික ප්‍රශ්න වන ළිංවල වතුර සිඳී යාම සහ සමහර ගෙවල්වල ඉරි තැලීම්, උමඟක් හැරීමේදී බලාපොරොත්තු විය හැකි තත්ත්වයකි. මෙම තත්ත්වය පරිසර අධ්‍යයන වාර්තාවේද සඳහන් වී ඇත. මෙම තත්ත්වය උමඟේ සිදුරු වැසීමෙන් පසු සම්පූර්ණයෙන් යථා තත්ත්වයට පැමිණේ. මෙය ලංකාවේ මෙතෙක් ඉදි කළ උමං මාර්ගවලදී පැහැදිලිව දක්නට ලැබුණු තත්ත්වයකි. එම ප්‍රශ්නයට මුහුණ දී ඇති අයට වතුර සැපයීම හා ඉරි තැලී ගිය ගෙවල්වලට වන්දි ගෙවීම හා අනෙකුත් වගා හානිවලට වන්දි ගෙවීම විසඳුම් වන අතර මෙම ක්‍රියා මාර්ග උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය මඟින් දැනටමත් ක්‍රියාත්මක කරනු ලබනවා. මේ පිළිබඳ යම් අඩු පාඩුවක් ඇති වී තිබේ නම් අපගේ නව රජය ඒ සම්බන්ධයෙන් කටයුතු කරනු ලබනවා. ඊට අමතරව මෙය නිසියාකාරව ඉටු වේද යන්න හා තවත් ගත යුතු ක්‍රියා මාර්ග නිර්දේශ කිරීමට මධ්‍යම පරිසර අධිකාරිය හා ඉංජිනේරුමය කාර්යන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ විශේෂඥවරුන් දැනටමත් එම ප්‍රදේශවලට පිටත් කර යවා තිබෙනවා. ඔවුන්ගේ නිර්දේශයද සැලකිල්ලට ගෙන ඉදිරි ක්‍රියා මාර්ග හැකි ඉක්මනින් ගැනීමට කටයුතු කරනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අවස්ථාවේ දී ගරු අමාත්‍යතුමා සිටියා නම් වඩාත් යෝග්‍යයි කියා මා හිතනවා. ඊයේ උදෑසන පළාත් සභාවේ දී මේ ව්‍යාපෘතිය පිළිබඳව පක්ෂ, විපක්ෂ සියලු පක්ෂවලින් ඒකමතික යෝජනාවක් සම්මත කර ගෙන

[ගරු අනුර දිසානායක මහතා]

තිබෙනවා. මේ ව්‍යාපෘතිය තුළින් ඇති වී තිබෙන පරිසර හානි සහ සමාජීය බලපෑම් විශාල ලෙස දැන් එල්ල වෙමින් තිබෙනවා. ළිං සිඳී යාම, ගෙවල් පුපුරා යාම ආදී විශාල හානි සිදු වෙමින් තිබෙනවා. ඒ නිසා පළමුව කළ යුතු යයි කියා අප යෝජනා කරන්නේ, මෙය තාවකාලිකව අත් හිටුවීමයි. පරිසර හානි පිළිබඳව විධිමත් අධ්‍යයනයකින් පසුව, මෙම ව්‍යාපෘතිය කරගෙන යනවා නම් එය කරන්නේ කොහොමද, ඒ සඳහා අලුතින් ගත හැකි විකල්ප ක්‍රියා මාර්ග කවරේද කියා සැලකිල්ලට ලක් කළ යුතුව තිබෙනවා. එසේ නැතිව මේ හානි මෙසේම සිදු වෙමින් තිබියදී මේ ව්‍යාපෘතිය ඉස්සරහට යනවා නම්, ඉදිරියේ දී තවත් පරිසර හානි විශාල ප්‍රමාණයක් ඇති විය හැකිව තිබෙනවා. මෙම ව්‍යාපෘතිය තාවකාලිකව අත් හිටුවා, විධිමත් පරිසර ඇගැයීමකින් පසුව නැවත මෙය සමාලෝචනයකට ලක් කර, විකල්ප ක්‍රියා මාර්ග හරහා ඒ ව්‍යාපෘතිය ආරම්භ කිරීමයි සුදුසු වන්නේ කියන යෝජනාව තමයි ඌව පළාත් සභාවේදී ඒකමතිකව සම්මත වෙලා තිබෙන්නේ. ඒ නිසා ඒ පිළිබඳව ඔබතුමන්ලාගේ අවධානය යොමු වනු ඇතැයි අප බලාපොරොත්තු වෙනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

දැනටමත් ඒ සම්බන්ධව ක්‍රියා කිරීමට විශේෂඥවරුන් පිටත් කර යවා තිබෙනවා. ඔබතුමා කියපු කරුණුත් සැලකිල්ලට ගෙන අදාළ අමාත්‍යාංශයෙන් ඒ පිළිබඳව හැකි ඉක්මනින් කටයුතු කරනවා ඇති. මධ්‍යම පරිසර අධිකාරියත් ඒ සම්බන්ධයෙන් නැවත සොයා බලා කටයුතු කරනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ගරු අනුර දිසානායක මහතා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට ප්‍රශ්නයක් පැන නැඟී තිබෙනවා. ඊයේ කැබිනට් තීරණ දැනුම් දීමේ රැස්වීමේ දී කැබිනට් ප්‍රකාශකතුමා විසින් ප්‍රකාශයට පත් කළා, Colombo Port City ව්‍යාපෘතිය කිසිදු විරෝධයකින් තොරව ඉදිරියට පවත්වාගෙන යන බව. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නමුත් අපේ රටේ හෙක්ටෙයාර් 575ක් මුහුද ගොඩ කරන්න යනවා. මුහුද ගොඩ කිරීම පිළිබඳව නීතියක්වත් අපේ රටේ නැහැ. මෙයින් ඇති වන පරිසර හානි පිළිබඳව නිසි ඇගැයීමක් සිදු කරලාත් නැහැ. ඒ වාගේම මෙහි ඇති වී තිබෙන මූල්‍ය ගනුදෙනු පිළිබඳවත් විශාල ආන්දෝලනයකට තුඩු දී තිබෙනවා. වර්තමාන ගරු අග්‍රාමාත්‍යතුමා විපක්ෂ නායකතුමා වශයෙන් මේ පැත්තේ සිටිනකොට මේ ව්‍යාපෘතිය පිළිබඳව විශාල ආන්දෝලනයකට තුඩු දෙන ලිපි ලේඛන සහ කරුණු ඉදිරිපත් කර තිබුණා.

පසු ගිය මැතිවරණ ව්‍යාපාරය තුළත් මේ ව්‍යාපෘතිය පිළිබඳව විශාල චෝදනාවක් සහ විශාල ජනමතයක් ගොඩ නැඟිලා තිබුණා. විශේෂයෙන්ම වර්තමාන ජනාධිපතිතුමාත්, අග්‍රාමාත්‍යතුමාත් ඒ වෙලාවේ මැතිවරණ වේදිකාවේදී මේ ව්‍යාපෘතිය පිළිබඳ විවිධ අදහස් ඉදිරිපත් කරනු ලැබුවා. ඒ විධියට ජනතාවට කරුණු කියලා ජනවරමක් අරගෙන, කැබිනට් ප්‍රකාශක ගරු රාජිත සේනාරත්න ඇමතිතුමා කිව්ව පරිදි ඊයේ කැබිනට් මණ්ඩල රැස්වීමේදී මේ ව්‍යාපෘතිය කිසිදු සොයා බැලීමකින් තොරව ඉදිරියට ගෙන යන්න තීරණය කර තිබෙනවා. කිසිසේත්ම ඒ ආකාරයේ තීරණයක් ගත යුතු අවස්ථාවක නොවෙයි තිබෙන්නේ. ඊයේ කැබිනට් මණ්ඩල රැස්වීමේදී එවැනි තීරණයක් ගැනීමට හේතු සාධක වුණේ මොකක්ද කියලා මේ ගරු පාර්ලිමේන්තුව දැන ගන්න කැමැතියි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ගරු මන්ත්‍රීතුමා හදිසියේ මේ ප්‍රශ්නය යොමු කළේ. ඇත්ත වශයෙන්ම Port City ව්‍යාපෘතිය ගැන ප්‍රශ්න ගණනාවක් මතු වෙලා තිබුණා. මේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ ඒකට අදාළ ලිපි ගොනු සියල්ලම මම ඉල්ලුවා. ඒ ලිපිගොනු පරීක්ෂා කර බැලුවාම වුවමනා කරන වාර්තා සියල්ලම නැහැ. පරිසර වාර්තාවත් අඩුවක් තිබුණා. ඒ නිසා මේ ගැන සොයා බලන්න අපි වෙනම කොමිටියක් පත් කර තිබෙනවා. ඊට අමතරව ඒ වාර්තා ලබා ගත්තාට පස්සේ තීරණ ගන්න, මගේ ප්‍රධානත්වයෙන් කැබිනට් අනු කාරක සභාවකුත් පත් කර තිබෙනවා. පරිසර සංවිධාන ගණනාවක් යෝජනා කර තිබුණා, මේ වරාය නගරය - Port City ව්‍යාපෘතිය - ඉදි කිරීම සම්පූර්ණයෙන්ම අහෝසි කරන්න කියලා. අපි එහෙම අහෝසි කළේ නැහැ. ඒ පිළිබඳ ගැසට් නිවේදනයක් තිබෙනවා. ඒ කොමිටියේ වාර්තාව ලැබිලා අපේ අනු කාරක සභාවේ තීරණයක් ගන්නා තෙක්, ඒ ගැසට් නිවේදනය අපි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ නැහැ. ඒ වාර්තාව දිහා බලලා තමයි ඒක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම ගැන අපි තීරණයක් ගන්නේ.

අපි මේ ගිවිසුම සම්පූර්ණයෙන්ම අහෝසි කරන්න කියන ස්ථාවරයේ නැහැ. නමුත් පාර්ලිමේන්තුවට ගැසට් පත්‍රය ඉදිරිපත් කිරීම ගැන සම්පූර්ණ වාර්තාව ලැබුණාම අපි තීරණය කරන්නම්. වුවමනා නම් ඉදිරියේදී අලුත් ගැසට් පත්‍රයක් හෝ ඉදිරිපත් කරන්න පුළුවන්. මෙතැන කාරණා දෙකක් තිබෙනවා. එක කාරණයක් තමයි මේක විශාල ව්‍යාපෘතියක් වීම. චීන රජයේ අනුග්‍රහය ලැබුණු එකක්. ඒ නිසා ඉල්ලීම පරිදි නිකම් ඒ ව්‍යාපෘති නවත්වන්න බැහැ. අනෙක් අතට ඒ වාගේම වැදගත් දෙයක් තමයි, මේ රටේ පරිසරය ආරක්ෂා වෙන්න ඕනෑ කියන එක. පරිසරයට හානියක් වෙන්න බැහැ. ඒ වාගේම නීති රෙගුලාසි අනුව ක්‍රියාත්මක කරන්නත් ඕනෑ. ඒ වාර්තාව ලැබුණාම අපි කැබිනට් අනු කාරක සභාවෙන් බලලා කැබිනට් මණ්ඩලය මඟින් අන්තිම තීරණයක් ගන්නවා. එහෙත් ඒක සම්පූර්ණයෙන්ම ඉරා දමන්න කියන ස්ථාවරයේ අපි හිටියේ නැහැ. අපි තවම මේ ගැන පරීක්ෂා කර ගෙන යනවා. එතුමා කිව්වා මේ ගිවිසුම සම්පූර්ණයෙන්ම ඉරා දැම්මේ නැහැයි කියලා. ඒක හරි. ඒ කොමිටියේ වාර්තාව ලැබුණාම අපි මේ ගැන විශේෂයෙන් සොයලා බලලා තීරණ ගන්නම්. අපි ඒ තීරණය ගැන මේ ගරු සභාවටත් දැනුම් දෙනවා.

අද මට චීන ජනරජයේ විශේෂ නියෝජිතතුමා හමු වුණා. මම එතුමාට කිව්වා, අපට තවම සම්පූර්ණ වාර්තාව ලැබිලා නැහැ, ඒ වාර්තාව ලැබෙන්න සුමාන දෙකක් යනවා, ඒකේ කොපියක් චීන තානාපතිතුමාටත් ලබා දීලා ඊට පස්සේ එහි තිබෙන කරුණු අපි සාකච්ඡා කරමු කියලා. ඒවා ලැබුණාට පස්සේ ඒ ගැන සම්පූර්ණයෙන්ම දැනුවත් කරන්නම්.

පාර්ලිමේන්තුවේ කටයුතු
பாராளுமன்ற அலுவல்
BUSINESS OF THE PARLIAMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Plantation Industries and Leader of the House of Parliament)

I move,

"That the Government Business do have precedence this day."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

I

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I move,

"That notwithstanding the provisions of Standing Order 7(1) the Parliament shall sit on Saturday, February 07th, 2015."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I move,

"That notwithstanding the provisions of Standing Order No. 7 the hours of sitting on Saturday 07th February, 2015 shall be 1.00 p.m. to 5.00 p.m.. At 5.00 p.m. Mr. Speaker shall adjourn the Parliament without question put."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

III

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

I move,

"That this Parliament at its rising this day do adjourn until 1.00 p.m. on Saturday, February 07th, 2015."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக்கூட்டம்
MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

I wish to inform this House that the Meeting of the Committee on Parliamentary Business will be held on Friday, 6th February, 2015, today, at 2.30 p.m. in the Chambers of the Hon. Speaker. The Members of the Committee are kindly requested to be present at this Meeting.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Anura Dissanayake, what is your point of Order?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය ජනාධිපතිවරණයේදී එක්සත් ජනතා නිදහස් සන්ධානය තරග වැදුණා. එක්සත් ජනතා නිදහස් සන්ධානය මේ පාර්ලිමේන්තුවේ විපක්ෂය නියෝජනය කරමින් දැන් විපක්ෂයේ වාඩි වෙලා සිටිනවා. ඒ වාගේම මැතිවරණයේදී අපි වෙනම ප්‍රජාතන්ත්‍රවාදී ජාතික සන්ධානය -DNA- විධියට තරග වැදුණා. අපි මේ පාර්ලිමේන්තුව නියෝජනය කරමින් සිටිනවා. අපේ පක්ෂයෙන් පාර්ලිමේන්තුව නියෝජනය කරන්නේ මන්ත්‍රීවරුන් සුළු සංඛ්‍යාවක් වෙන්න පුළුවන්. හැබැයි, හැමදාමත් මේ විවාදයේදී ප්‍රජාතන්ත්‍රවාදී ජාතික සන්ධානයට වෙලාවක් වෙන් වෙලා තිබුණා. එක්සත් ජාතික පක්ෂය විපක්ෂයේ හිටපු කාලයේ එක්සත් ජාතික පක්ෂයට වෙලාවක් තිබුණා. ඔවුන් ඔවුන්ගේ මන්ත්‍රීවරුන් හරහා එම කාලය බෙදා ගත්තා. ඒ වාගේම TNA එකට ඔවුන්ගේ මන්ත්‍රීවරුන් අනුපාතය හා තවත් පක්ෂයක් ලෙස සලකමින් ඒකට ලබා දෙන වෙලාවක් තිබුණා. අපටත් වෙලාවක් ලබා දුන්නා. ඒක තමයි මෙතෙක් විපක්ෂය විවාදයන්හිදී කාලය බෙදීමේදී තිබුණු සම්ප්‍රදාය සහ යුක්තිසහගත තීරණය. හැබැයි, අද විවාදය තිබෙනවා. අපිට කිසිදු දැනුම්දීමකින් තොරව සමස්ත විපක්ෂයට ලැබී තිබෙන කාලයම එක්සත් ජනතා නිදහස් සන්ධානය තුළ බෙදා ගෙන තිබෙනවා. එතකොට විපක්ෂයේ දේශපාලන පක්ෂයක් විධියට, අපි වෙනම පක්ෂයක් විධියට තරග වැදිලා මේ අවස්ථාව නියෝජනය කරනවා නම් අපට ඒ සාධාරණ කාලය ලබා දිය යුතුයි. මම විපක්ෂ සංවිධායකතුමාගෙන් දැන ගන්න කැමැතියි, කවර තීන්දුවක් අනුව ද මේ තීරණය ගත්තේ කියා. කොහොමද, මේ සාකච්ඡාව සිද්ධ වුණේ? විපක්ෂයේ සංවිධායකවරයා කියන්නේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ සංවිධායකවරයා නොවෙයි. කාලය පිළිබඳව යම් ගැටලුවක්, සාකච්ඡාවක් තිබෙනවා නම් අපිත් එක්ක සාකච්ඡා කරන්න ඕනෑ. එතුමා ආණ්ඩු පක්ෂයේ ඉන්නකොට ඇමතිතුමා තමයි. මේ

[ගරු අනුර දිසානායක මහතා]

පැත්තේ දැන් ඉන්න කොට විපක්ෂ සංවිධායකතුමා. ඒක තේරුම් ගන්න ඕනෑ. ඒක තේරුම් අරගෙන නියමිත කාලපරිච්ඡේදය අපිට වෙන් කරන්න ඕනෑ. අද කිසිදු කාලයක් අපිට වෙන් කර නැහැ. පාර්ලිමේන්තුව පවත්වා ගෙන යන්න හදන්නේ මේ විධියට ද? තමුන්නාන්සේලා ආණ්ඩුවේ ඉන්නකොටත් අපේ හඬ යටපත් කරන්න උත්සාහ කළා. දැන් විපක්ෂයට ඇවිල්ලත් තමුන්නාන්සේලාට ලැබී තිබෙන බලය අනුව අපේ හඬ යටපත් කරන්න උත්සාහ කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එම නිසා මම දැන ගන්න කැමැතියි අපි වෙනම පක්ෂයක් ලෙස අද මේ විවාදයේදී අපට කාලයක් ලබා නොදෙන්න හේතුව මොකක්ද කියා. කාලයක් ලබා දෙනවා නම් කවර කාලයක් ද ලබා දෙන්නේ කියන එකත් අපි දැන ගන්න කැමැතියි. මේක විපක්ෂ සංවිධායකතුමාට උකස් තියන ලද පක්ෂයක් නොවෙයි. මේක ස්වාධීන පක්ෂයක්. අපිට අපේ මතය ඉදිරිපත් කරන්න ඕනෑ. ආණ්ඩුවේ ඉන්නකොට තමුන්නාන්සේලාගේ බලයත්, ඒ වාගේම හඬත් යටපත් කර ගන්න පුළුවන් වෙන්න ඇති. හැබැයි තමුන්නාන්සේලා විපක්ෂයට ඇවිල්ලා අපේ හඬ යටපත් කරන්න හදනවා නම්, අපේ ඉඩ යටපත් කරන්න හදනවා නම්, ඒකට ඉඩ දෙන්න කිසිසේත්ම අපි සූදානම් නැහැ. ඒ නිසා කරුණාකර මේ ගරු සභාව හමුවේ කියන්න ඕනෑ, අද විවාදයේදී ඇයි අපිට ඒ කාලය නොදුන්නේ කියා. ඇයි කාලය නොදෙන්නේ? කොච්චර කාලයක්ද ලබා දෙන්නේ? ඊයේත් විනාඩි අටක පමණ කාලයක් තමයි ලබා දීලා තිබෙන්නේ. එය මේ ගරු සභාවට පැහැදිලි කරන්න ඕනෑ. මේ ගරු සභාවේ අපේ හඬ යටපත් කරන්න, අපේ කථාව යටපත් කරන්න කිසිසේත්ම ඉඩ ලබා දෙන්න සූදානම් නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එම නිසා මේ ප්‍රශ්නය විසඳාගෙන තමයි විවාදය ඉස්සරහට යන්න ඕනෑකම තිබෙන්නේ. මන්ත්‍රීවරුන් කණ්ඩායමකගේ හඬ යටපත් කරලා, කාලය කපලා පාර්ලිමේන්තුවේ විවාදයක් පවත්වන්නේ කොහොමද? එම නිසා මේ පිළිබඳව යම් ස්ථාවරයක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුව තිබෙනවා.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Yes, Hon. Chief Opposition Whip.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා තේරුම් ගන්නට ඕනෑ, එක්සත් ජනතා නිදහස් සන්ධානය ආණ්ඩු පක්ෂයේ සිටියදී ආණ්ඩු පක්ෂයේ අසුන් ගෙන සිටි මන්ත්‍රීවරුන් සංඛ්‍යාවත්, එදා විරුද්ධ පක්ෂයේ අසුන් ගෙන සිටි මන්ත්‍රීවරුන් සංඛ්‍යාවත්, අද විරුද්ධ පක්ෂයේ අසුන් ගෙන සිටින මන්ත්‍රීවරුන් සංඛ්‍යාවත්, ආණ්ඩු පක්ෂයේ අසුන් ගෙන සිටින මන්ත්‍රීවරුන් සංඛ්‍යාවත් අතර විශාල වෙනසක් තිබෙන බව. එදා ආණ්ඩු පක්ෂයේ සිටි මන්ත්‍රීවරුන් 157ක් අද විරුද්ධ පක්ෂයේ අසුන් ගන්නවා. එතකොට එම මන්ත්‍රීවරුන් 157 දෙනාම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මන්ත්‍රීවරුන්. එතකොට එදා ඒ සංඛ්‍යාව අසුන් ගත්තේ ආණ්ඩු පක්ෂයේ. විරුද්ධ පක්ෂයේ සිටියේ ඉතා අඩු මන්ත්‍රීවරුන් සංඛ්‍යාවක්. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් සංඛ්‍යාව සහ මෙතුමන්ලාත්, TNA එකත්. එතකොට විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන්ට එම කාලය බෙදා ගන්න පුළුවන්කම තිබුණා. නමුත් අද විපක්ෂයට ලැබිලා තිබෙන මුළු කාලයම විනාඩි 150යි. ඒ වාගේම ආණ්ඩු පක්ෂයටත් ලැබී තිබෙන කාලය විනාඩි 150යි. මේ විනාඩි 150 මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව අනුව පක්ෂවලට බෙදන්න යෑමේදී අපිට පුළුවන්කම ලැබුණේ ප්‍රජාතන්ත්‍රවාදී ජාතික පෙරමුණට විනාඩි 22ක් වෙන් කරන්න. ඊයේ විනාඩි 12 ක් පාවිච්චි කරලා මෙතුමන්ලා විවාදයට සහභාගි වුණා. ඒ වාගේම හෙට විනාඩි 10ක් නැවත එතුමන්ලාට දීලා තිබෙනවා. සම්පූර්ණයෙන් විනාඩි 22ක් ඒ අයට ලබා දීලා තිබෙනවා. ඒ වාගේම TNA එකටත් ඒ ආකාරයට ඔවුන්ට ඉන්න මන්ත්‍රීවරුන් සංඛ්‍යාව අනුව ඒ අයටත් යම් කාලයක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම මම මෙතැනදී පැහැදිලිව කියන්නට ඕනෑ-

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Why do you not discuss this matter at the Committee on Parliamentary Business?

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පමණක් මන්ත්‍රීවරුන් 157ක් සිටිනවා. ඒ අනුවයි මේ වෙලාව වෙන් කරන්න සිදු වී තිබෙන්නේ. ඇත්ත වශයෙන්ම සෑම හැකියාවක්ම අපි උරගා බැලුවා වැඩි වෙලාවක් ඔවුන්ට දෙන්න. නමුත් අපිට දෙන්න පුළුවන්කම තිබෙන්නේ ඊයේ විනාඩි 12යි, හෙට විනාඩි 10යි, ඒ අනුව ප්‍රජාතන්ත්‍රවාදී ජාතික පෙරමුණට සම්පූර්ණ විනාඩි 22ක් ලැබිලා තිබෙනවා. එයට වඩා කාලය දෙන්න අපහසුයි. [බාධා කිරීමක්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Yes, Hon. Anura Dissanayake.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මම කියන්නේ මන්ත්‍රීවරුන්ගේ අනුපාතය අනුව කාලය බෙදන්න ඕනෑය කියන එකයි. ඒක මම පිළිගන්නවා. හැබැයි, ඒ වාගේම ඒ පක්ෂය, පක්ෂයක් ලෙස සලකාත් අතිරේකව වෙනම කාලයක් ලැබිය යුතුයි. මන්ත්‍රීවරු සංඛ්‍යාව පොදුවේ එම අනුපාතය ලබා ගන්නා අතර, ඒක වෙනම පක්ෂයක්, වෙනම ධාරාවක් නිසා ඒකටත් සාධාරණ නියෝජනයක් ලැබෙන්න ඕනෑකම තිබෙනවා. කවුරුන් හෝ එක මන්ත්‍රීවරයෙකු කවදා හෝ මේ පාර්ලිමේන්තුව නියෝජනය කළොත් - අනාගතයේදී එය විය හැකිව තිබෙනවා - ඔහුට කවදාවත් මේ පාර්ලිමේන්තුවේ කථා කරන්න ලැබෙන්නේ නැහැ. ඔය විධියට බැලුවොත්, ඔහුට විනාඩියයි, තත්පර පහළොවයි, තත්පර තිහයි ලැබෙන්නේ. එහෙම වෙන්නේ නැහැ. වෙනම දේශපාලන ධාරාවක්. මන්ත්‍රීවරුන් සංඛ්‍යාවත් සැලකිල්ලට ලක් කරන්න. අපි එක්සත් ජනතා නිදහස් සන්ධානයට ලැබී තිබෙන කාලයේ ප්‍රමාණයම ඉල්ලන්නේ නැහැ. ඒකෙන් අඩක් ඉල්ලන්නේත් නැහැ. ඒකෙන් හතරෙන් එකක් ඉල්ලන්නේත් නැහැ. හැබැයි, අපේ මන්ත්‍රීවරුන් සංඛ්‍යාවත් සැලකිල්ලට ලක් කරන්න.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Anura Dissanayake, why do you not take this matter up at the Committee on Parliamentary Business?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම අවසන් කරනවා. අපේ මන්ත්‍රීවරු සංඛ්‍යාව සැලකිල්ලට ලක් කරන්න. ඒ වාගේම අප වෙනම පක්ෂයක් ලෙස සැලකිල්ලට ලක් කරන්න. එසේ සැලකිල්ලට ලක් කර කාලය ලබා දිය යුතුයි. ඒ වාගේම එසේ ලබා දෙන කාලය කවදාද ලබා ගන්නේ කියන එක තීරණය කරන්නේ අපයි. විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා, තමුන්නාන්සේ කොහොමද තීරණය කරන්නේ ඊයේ කාලය ලබා දුන්නා; අනිත් ටික හෙටයි ලබා දෙන්නේ කියලා? අපෙන් ඒ ගැන අහන්න එපායැ. අපි හෙට එනවාද, නැද්ද කියලා තමුන්නාන්සේ දන්නේ කොහොමද? අපි හෙට එනවාද, නැද්ද කියලා තමුන්නාන්සේ තීරණය කරන්නේ කොහොමද? එහෙම නම් අපෙන් අහන්න ඕනෑ, "විනාඩි 22යි තිබෙන්නේ. එක දවසට ඕනෑද, දවස් දෙකට ඕනෑද, තුනට කඩලා ඕනෑද?" කියලා. ඒ විධියට අපෙන් අහන්න ඕනෑ. තමුන්නාන්සේ මේ ගරු සභාවට ඇවිත් කියනවා, "ඊයේ මෙතරම් වෙලාවක් දුන්නා; හෙට අනිත් ප්‍රමාණය දෙනවා." කියලා. අපි හෙට එනවාද, නැද්ද කියලා අපෙන් අහන්න ඕනෑ නේ. එහෙම අහන්නේ නැතුව තමුන්නාන්සේ කාලය තීරණය කරන්නේ කොහොමද? තමුන්නාන්සේට මේ පක්ෂය ලියලා දීලා නැහැ.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කාරණය ගැන මීට වඩා වේලාවක් නම් මේ විවාදයේදී වෙන් කරන්න බැහැ. [බාධා කිරීමක්] කෙසේ නමුත් මම පොරොන්දුවක් දෙනවා, මීට පසුව විවාද සඳහා කාලය වෙන් කරන කොට විශේෂයෙන්ම එතුමාගේ පක්ෂය සමඟත්, අනිත් පක්ෂ සමඟත් සාකච්ඡා කරනවා කියලා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම කැමැතියි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කිව්ව කාරණයට අවධානය යොමු කිරීමට. එහි සාධාරණයක් තිබෙනවා.

පළමුවැනි කාරණය තමයි, අය වැය විවාදයේදී ආණ්ඩුව සහ විපක්ෂය අතර වේලාව එක හා සමානව නොබෙදීම. ඒකෙන් ලොකු අඩු පාඩුවක් සිද්ධ වෙලා තිබෙනවා. අපි සම්ප්‍රදායානුකූලව විරුද්ධ පක්ෂයට තමයි වැඩි කාලය ලබා දෙන්නේ. එය මෙතැනදී අඩු වෙලා තිබෙනවා නම් අපට එය අද සහ හෙට නිවැරදි කර ගන්න පුළුවන්. ඒ පළමුවැනි කරුණ.

දෙවැනි කරුණ වන්නේ, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා නියෝජනය කරන පක්ෂයට හැම දාම වෙලාව දීලා තිබෙන සම්ප්‍රදායයක් තිබෙනවා නම් අප ඒ සම්ප්‍රදායය ගැන සාකච්ඡා කර බලා මිසක් සාකච්ඡා නොකොට වෙනස් කිරීම අසාධාරණ බව. හැම පක්ෂයකම මතයක් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දෙන්න ඕනෑ. සංඛ්‍යාත්මකව කොපමණ සිටියත් ඒ පක්ෂයේ මන්ත්‍රීවරුන් එම පක්ෂයේ මතයට යටත්. එයයි පාර්ලිමේන්තුව පිළිගත් සම්මතය; පක්ෂ නායකයන් හා පක්ෂයේ පිළිගැනීම. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කිව්ව කාරණාවේ සඳහන් වුණේ අඩු පාඩුවක් සිදු වෙලා තිබෙන බවයි. එම නිසා සාධාරණය වහාම ඉටු විය යුතුයි. අප ඒ සඳහා පියවර ගත යුතුයි. [බාධා කිරීමක්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Prime Minister, please.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා මතු කළ කාරණය ගැන බලන විට ගරු ජෝන් අමරතුංග ඇමතිතුමාත් මට කිව්වේ, අය වැය විවාදයේ දෙවැනි වර කියවීමේදී ඇත්ත වශයෙන්ම ආණ්ඩු පක්ෂය සහ විරුද්ධ පක්ෂය අතර සම සමව වාගේ කාලය බෙදුණු බවයි. ඊට පසුව කාරක සභා අවස්ථාවේදී විරුද්ධ පක්ෂයට වැඩියෙන් කාලය ලැබුණා. ඒ වාගේම ඒ අවස්ථාවේදී අප එක යෝජනාවක් කර තිබුණා, ඕනෑ නම් සෙනසුරාදා දින මුළු දවසම රැස්වීම් පවත්වමු කියලා. කොහොම වුණත් වැඩි වේලාවක් දෙමළ ජාතික සන්ධානයට හා ජනතා විමුක්ති පෙරමුණට ලබා දෙන්න නම් හෙට සවස පහට ඡන්දය ගන්නේ නැතුව සවස හයට ඡන්දය අර ගන්න පුළුවන්. We can add one more hour, which could be given to those parties and they also could be accommodated. වේලාව ටිකක් තිබෙනවා නම් අපටත් දෙන්න. මම කියන්නේ ඉස්සෙල්ලා මේ පක්ෂ දෙකට දීලා -

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
That, we will have to discuss at the Party Leaders' Meeting. - [*Interruption.*]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
Yes, we will take one hour more and work that out. අනාගතයේදී ඔබතුමන්ලා අතර කාලය බෙදා ගැනීමේ සූත්‍රය තිබුණාම, අප බලන්නම් කොපමණ කාලයක් සම්පූර්ණ විවාදයට ලබා දෙනවාද කියලා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
We have already passed a Motion to take up the Division at 5 o' clock tomorrow.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
But, tomorrow, we can put in a Motion to go on till 6 o'clock.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Okay, we will do that.

Now, we can start today's Debate. Hon. Dinesh Gunawardena, you have 12 minutes.

විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත
ஒதுக்கீடு (திருத்தம்) சட்டமூலம்
APPROPRIATION (AMENDMENT) BILL

කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී

ඊට අදාළ ප්‍රශ්නය [පෙබරවාරි 05]

"පනත් කෙටුම්පත දැන් දෙ වන වර කියවිය යුතු ය" [ගරු රවි කරුණානායක මහතා]

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.

ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.

சம்பந்தப்பட்ட வினா - [பெப்ருவரி 5]

"சட்டமூலம் இப்பொழுது இரண்டாம்முறை மதிப்பிடப் படுமாக" [மாண்புமிகு ரவி கருணாநாயக்க]

வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.

Order read for resuming Adjourned Debate on Question - [05th February]

"That the Bill be now read a Second time".- [The Hon. Ravi Karunanayake]

Question again proposed.

[අ.භා. 2.10]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පළමුකොට මම ස්තුතිවන්ත වෙනවා, අපට විනාඩි දොළහක් ලබා දීම ගැන. ඒ විනාඩි දොළහක කාලය මේ සුන්දර අය වැය ගැන රසවත් කථා කියන්නවත් ප්‍රමාණවත් නැහැ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
හෙට පැයක් -

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා මට හෙටත් කථා කරන්න දෙනවා නම් හොඳයි. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ -[බාධා කිරීම්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
වැඩිපුර කාලය ගත්තොත් -[බාධා කිරීම්] ඔබතුමාගේ විවේචනය වැඩි කරන්න. මෙක නිදහස් සමාජයක්.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
දැනටමත් විනාඩි දෙකක් ගියා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට මම පළමු කොටම කියන්න කැමැතියි, මේ අය වැය ලේඛනයේ බොහොමයක් තිබෙන්නේ "පස්සේ දෙන්නම්" කථා බව. මේ අය වැය "දෙන්නම් කාසි" අය වැයක් බවට පත් වෙලා ඉවරයි. මොකද, ඉදිරියට තමයි හුඟක් දේවල් දෙන්නම් කියලා කියන්නේ. ජූනි මාසයේ, අවුරුද්ද තුළ දෙන්නම් කියනවා. ඊට ඉස්සෙල්ලා මැතිවරණයක් පවත්වන්න ඕනෑ. මෙය මැතිවරණයක් සඳහා සූදානම් වන අය වැයක් බව මා සඳහන් කරන්න ඕනෑ.

අපේ රටේ ආර්ථිකය යම් කිසි ස්ථාවර පදනමක් මත අපි අවුරුදු ගණනාවක් තිස්සේ ගොඩනඟා ගෙන ඇවිත් තිබෙනවා. සියයට 7ක ආර්ථික වර්ධන වේගයක් ඇති, ශක්තිමත්, ස්ථාවරභාවයෙන් යුතු ආර්ථිකයක් තිබෙනවා. එය කඩා වැටෙනවාට මහජන එක්සත් පෙරමුණේ අපි කිසි ලෙසකින්වත් සතුටු වෙන්නේ නැහැ. අපි ඉතාම ඕනෑකමින් කියන්න ඕනෑ ගරු අග්‍රාමාත්‍යතුමා සඳහන් කළ විධියටම මෙය ධනවාදී ආර්ථිකයක් බව. එතුමා සඳහන් කළා, ගජමිතුරු ධනවාදයෙන් ආර්ථිකය මුදවා ගෙන පූර්ණ ධනවාදය කරා ගමන් කළ යුතුය කියා. පූර්ණ ධනවාදයේදී ඉහළ ධනවාදී සූරාකන්නන් විසින් පහළ ජනතාව සූරා කෑමට ඉඩ දෙන නව ආර්ථික ප්‍රතිපත්තියකට අවතීර්ණ වනවාදෝ කියන සැකය මේ තුළින් මතු වනවා. එයට ප්‍රධාන හේතුව, අපේ රටේ කෘෂි කර්මාන්තයට මෙතෙක් කල් දැක්වූ සුහදතාව මේ ආර්ථික ක්‍රමයෙන් කඩා වැටීමයි. කෘෂිකර්මාන්තයේදී කරුණු දෙකක් වැදගත් වෙනවා. එක, රටේ ජනතාව ජීවනෝපාය මාර්ගයක යෙදෙනවා. දෙක, විදේශ භාණ්ඩ හා ද්‍රව්‍ය ගෙන ඒමට පත්වීමෙන් රටේ ආර්ථිකය ස්වාධීනභාවයකට පත් වෙනවා. මේ ආර්ථිකයේ සහතික මිල පිළිබඳ මොන තරම් කථා කළත් පිට රටින් භාණ්ඩ ගෙන්වීම සඳහා වූ අවස්ථාව තුළ එයට හාත්පසින්ම ප්‍රතිවිරෝධව සෑම ද්‍රව්‍යකම මිල ඉහළ යනවා. එයින් අපේ රටේ ගොවි ජනතාව විශාල අර්බුදයකට මුහුණ දෙනවා.

ඊයේ බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා සඳහන් කළ කාරණය මම යළිත් සඳහන් කරන්න කැමැතියි. හාල්වලින් ජීවත් වුණු අපි පාන් පිටි කරා ගමන් කරමින් අපේ ප්‍රධාන ආර්ථික ක්‍රියාවලිය වෙනසකට භාජනය කිරීම නිසා භයානක තත්ත්වයක් ඇති වෙන්න ඉඩ කඩ තිබෙනවා. එය විශේෂයෙන් පිට රටින් පිටි ගෙන්වන්නන්ට, එසේ නැත්නම් පිට රටින් ආහාර හෝ වෙනත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ගෙන්වන්නන්ට වාසිදායකයි. ඒක තමයි ගජමිතුරුකම. මේ ආර්ථිකයට ලැබෙන ගොවියාගේ නිෂ්පාදන නවතා පිට රටින් භාණ්ඩ ගෙනැල්ලා අපේ වෙළෙඳ පොළට ලබා දීලා අපේ රට යළිත් වරක් ගමන් කරන පරිභෝජන රටාව වෙනස් කරලා වෙනත් ගමන් මාර්ගයකට පත් කිරීම ඒ අයට වාසියි. ජනතාවට සහන දීම සඳහා ගෙනෙන ලද ක්‍රියාවලි අපි අගය කරනවා. ජනතාවට සහනයත් අවශ්‍යයි. ජනතාවගේ ජීවිතය සැහැල්ලු කළ යුතුයි. ඒ වාගේම ජාතික ආර්ථිකයේ කොඳු නාරටිය ගමන් කරන මාර්ගය පිළිබඳ පැහැදිලිතාවකින් කටයුතු කරන්න ඕනෑ.

දැන් බදු යෝජනා ගැන විවිධ ප්‍රකාශ කළා. ප්‍රධාන සමාගම්, පෝසත්ම සමාගම්වලට පනවන ලද බද්ද, ඒ වාගේම Mansion Tax ආදී තෝරා ගත් බදු ප්‍රකාශයට පත් කරන ලද අය වැයක් බවට මේ අය වැය පත් වනවා. මම දන්නා වූ ආර්ථික න්‍යාය අනුව මේ රටේ ප්‍රසිද්ධ හෝ අප්‍රසිද්ධ මුදල් ආයෝජනය කරමින් ආර්ථිකය තුළ යම් කිසි ඵලදායිකත්වයකට භාජනය කරනවා නම් එයට රුකුල් දෙන තත්ත්වය වළවක්වනවා කියන්නේ, ආර්ථිකයේ අයෝජන අඩු වීමයි. අද මේ තුළින් සිදු වෙන්නේ මහා පරිමාණයේ සමාගම් අලුතින් ආයෝජනය කරන්න මැළිකමක් දක්වන්න ඉඩ තිබීමයි. මේ පිළිබඳව සඳහන්ව තිබෙන "Daily Financial Times" වාර්තාව මම කියවන්න කැමැතියි. ඒකෙන් කියැවෙනවා, මේ සම්බන්ධයෙන් ඒ සමාගම්වල තිබෙන අප්‍රසන්නභාවය. අලුතින් ආයෝජන සිදු නොවෙන තත්ත්වයකට ඒ මහා පරිමාණ සමාගම් පැමිණෙනවා.

මේ මහා පරිමාණ සමාගම් මේ ක්‍රියාවලිය නොරිස්සීමට පටන් ගැනීම හරහා ඔවුන්ගේ නිෂ්පාදනය අඩු වෙන්න පටන් ගත්තොත්, සති ගණනින්, මාස ගණනින් ඒ රැකියාවලින් දොට්ට දමන

ප්‍රමාණය වැඩි වෙන තත්ත්වයක් උදා වෙන්න පුළුවන්. අපි ආර්ථිකය පණ ගැන්විය යුත්තේ ජනතාවට අලුත් ආදායම් මාර්ග, රැකියා උත්පාදනය වන විධියටයි. ඒ වාගේම ධනවාදී ආර්ථිකයක ව්‍යාපාර පැලැන්තිය එහි ආයෝජකයන් බවට පත් විය යුතුයි. ගරු අග්‍රාමාත්‍යතුමා දැනුත් කිව්වා "පෝට් සිටි" ව්‍යාපෘතිය ගැන. තමුන්නාන්සේලා අවලංගු කරන බවට ප්‍රකාශ කරනු ලැබූ ඒ ව්‍යාපෘතිය යළි සලකා බැලීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කළ බව කිව්වා. එය ලොකුම ආයෝජනයක්. මේ වාගේ ආයෝජන රාශියක් පෞද්ගලික අංශය හරහා අපේ ආර්ථිකය තුළ ශක්තිමත් කරලා තිබෙනවා. අපේ ආර්ථිකයේ ස්ථාවරභාවය ලැබෙන්නේ දේශීය ආයෝජන හා විදේශ ආයෝජන තුළින් බවත් තමුන්නාන්සේලා ප්‍රකාශයට පත් කර තිබෙනවා. තමුන්නාන්සේලාගේ වැඩ පිළිවෙළ තුළ ඉදිරි දවස්වල, ඉදිරි මාසවල ලංකා ආර්ථිකයට මුහුණ දෙන්න සිද්ධ වෙන්නේ මූල ධනය පිළිබඳ අර්බුදයකට පමණක් නොව, මූල ධනය විවිධ මාර්ගවලින් පිට රටට ගමන් කිරීමේ අර්බුදයටයි. ඒ මඟින් විදේශ විනිමය අර්බුදයකට පවා මේ වසර තුළ මුහුණ දෙන්න අපේ රටට සිද්ධ වෙන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම අපි දකින්නේ නව පරම්පරාවේ ශක්තිය වෙනුවෙන් මේ අය වැය ලේඛනයේ කිසිවක් නැති බවයි. තරුණ පරම්පරාවේ බලාපොරොත්තු මත බලයට පැමිණි ජනාධිපතිතුමා ඔවුන්ට විශ්වාසනීය ආර්ථික වර්ධනයක් හා ආර්ථික අවස්ථා බිහි කරන්න පුළුවන් අය වැය ලේඛනයක් ඉදිරිපත් කරලා නැහැ. මේ නිසා අපේ රටේ තරුණ පරම්පරාව අසහනකාරී තත්ත්වයකට පත්වෙනවාය කියන එක සඳහන් කරන්න කැමැතියි. එය හැදෙන වැඩෙන නව පරම්පරාවට අප දිය යුතු විශ්වාසය නොවේ.

ඒ වාගේම මම කැමැතියි රජයේ සේවකයන් සම්බන්ධව කථා කරන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මුදල් අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ ප්‍රකාශකයෙක් දෙවැනි දා කළ ප්‍රකාශයක මෙසේ පවසා තිබෙනවා :

> "රජයේ සේවකයන්ට රුපියල් 10,000 දීමනාව ලැබෙන නමුත් ඒවා ඒකාබද්ධ වැටුපට ඇතුළත් කොට 2015 සඳහා නව වැටුප් ව්‍යුහයක් සැකැසීම සිදු නොවන බව ප්‍රකාශ කරනවා."

මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ අය වැය ලේඛනයේ නව ඒකාබද්ධ වැටුප් තලයක් පිළිබඳවත් ස්ථාවර වැටුප් කොමිසමක් පිළිබඳවත් සඳහන් කළා. එය අහෝසි වන බවට මුදල් අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ ප්‍රකාශකයෙක් කළ මේ ප්‍රකාශය ගැන මුදල් ඇමතිතුමාත්, රජයත් ස්ථිර ප්‍රකාශයක් කරන්නේ නම් අගය කරනවා. මොකද, ඒ මත තමයි රජයේ සේවකයන්ටත්, විශ්‍රාමිකයන්ටත් ලැබෙන දීමනා පිළිබඳ අඩු වැඩිභාවය තීරණය වෙන්නේ. එසේ සිදු වුණොත් අනිවාර්යයෙන්ම අපේ රජය ලබා දුන්නු ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයක් තමයි තමුන්නාන්සේලා ප්‍රාතිහාර්යය මවනවා කියපු මේ අය වැය ලේඛනයෙන් රාජ්‍ය සේවකයාටත්, විශ්‍රාමිකයාටත් ලබා දෙන්නේ. මෙය බරපතළ ප්‍රශ්නයක්. විශේෂයෙන්ම විශ්‍රාමිකයෝ අවුරුදු ගණනාවක් උද්ඝෝෂණය කරලා, ඒ උද්ඝෝෂණයේ ප්‍රතිඵලයක් වශයෙන් තමයි පසු ගිය අය වැය ලේඛනයේදී මේ ජයග්‍රහණය ස්ථාවර තත්ත්වයකින් අපේ රජය විශ්‍රාමිකයන්ට ලබා දුන්නේ.

මේ අය වැය ලේඛනය තුළින් ආදායම් එකතු කිරීමට මෙන්ම, රටේ මූලික නිෂ්පාදන සඳහා ප්‍රකාශ කළ සහතික මිල ලබා දීම ක්‍රියාත්මක කිරීමට හැකි වැඩ පිළිවෙළක් හරියාකාරව ඉදිරිපත් වෙලා නැහැ. මම විශේෂයෙන් සඳහන් කරනවා, නිෂ්පාදනය කරන දේ වෙළෙඳ පොළට පැමිණෙන අතර කාලයේ ඒවා සුරක්ෂිත කිරීමට අවශ්‍ය වෙනම මූල්‍ය ප්‍රතිපාදනයක් වෙන් කිරීම ඉතාම හොඳ බව. අපේ රටේ කෘෂිකර්මාන්ත නිෂ්පාදනයෙන් සියයට 40ක් අතර මගදී විනාශ වන බව අවුරුදු 25ක් තිස්සේ කරන ලද හැම වාර්තාවකම කියවුණත් එයට ප්‍රතිකර්මයක් යෙදුණේ නැහැ. පළමු වරට එවැනි උත්සාහයක් දරනවා නම් එය හොඳයි. එය කොයි තරම් දුරට සාර්ථක වෙයිද කියන එක තමුන්නාන්සේලාගේ අය වැයෙන් පැහැදිලි කරලා නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම, පරිසර හිතකාමී ප්‍රතිපත්තියක් මත තමයි අපි hybrid carsවලට අඩු තීරු බදු ගාස්තුවක් පනවන්න තීරණය කළේ. ජාත්‍යන්තර එකඟතාවක්ද ඇතිව ඇති කළ මේ පරිසර හිතකාමී ප්‍රතිපත්තිය කඩා දැමීමෙන් තමුන්නාන්සේලා රටක් හැටියට අනුගමනය කරන්නේ වැරැදි ප්‍රතිපත්තියක් බව මේ අවස්ථාවේ මා සඳහන් කරන්නේ, ඒවා නිවැරැදි කර ගැනීමට අවශ්‍ය වන නිසායි.

රට බීම, කැසිනෝ සම්බන්ධව ආණ්ඩුවේ ප්‍රතිපත්තිය මොකක්ද? මම ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් අහන්න කැමැතියි, අතිපූජ්‍ය මාදුළුවාවේ සෝභිත හාමුදුරුවෝ මේ ප්‍රතිපත්තියට අවසරය දුන්නාද කියලා. මෙහෙම දඩයක් ගහලා කැසිනෝ register කරන්න අතිපූජ්‍ය මාදුළුවාවේ සෝභිත හාමුදුරුවෝ කැමැතිද? මේ විධියට රට බීම සාප්පු register කරලා අවසානයේ සමාගම් තුන, හතරකට මේ රටේ රට බීම සාප්පු දහස් ගණන් අරින්න අතිපූජනීය මාදුළුවාවේ සෝභිත නායක හාමුදුරුවෝ එකඟද? උන්වහන්සේ ඔබතුමන්ලා මෙහෙයවන විධායක සභාවේ සාමාජිකයෙක් කියලා ප්‍රකාශ කරනවා. අපේ රටට යම් කිසි හරයක් ඇති දෙයක්,-

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, your time is over.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Mr. Deputy Chairman of Committees, we have saved half an hour from the time allocated for Questions. So, I will take just two minutes and conclude my speech.

ගරු අගමැතිතුමනි, මේ දවස් 100 වැඩසටහනේ පෙබරවාරි දෙවැනි දා වෙන කොට කරනවා කියලා තිබෙන්නේ, "සියලු මහජන නියෝජිතයන් විසින් පිළිපැදිය යුතු චර්යා ධර්ම සංග්‍රහයක් නීතිගත කිරීම" කියලා. එදා තමයි වත්තල මන්ත්‍රීවරුන්ට පහර දුන්නේ. ඔබතුමන්ලා ප්‍රකාශ කරපු චර්යා ධර්ම පද්ධතිය මේකද?

ගරු අග්‍රාමාත්‍යතුමනි, දින සියයේ වැඩසටහන යටතේ ජනවාරි 28 වැනි දාට නියමිත කාරණය හැටියට තිබෙනවා, "මනාප ඡන්ද ක්‍රමය සහමුලින්ම අහෝසි කොට සෑම මැතිවරණ කොට්ඨාසයකටම මන්ත්‍රීවරයකු ලැබෙන පරිදි මන්ත්‍රී ආසන ක්‍රමය හා සමානුපාතික ක්‍රමයේ සම්මිශ්‍රණයක් සහිත නව මැතිවරණ ක්‍රමය සඳහා යෝජනා ඉදිරිපත් කිරීම පිළිබඳ සර්ව පාක්ෂික කමිටුව පත් කිරීම" යනුවෙන්.

ඉතින්, දවස් සියයේ වැඩසටහනකට අපෙන් සහයෝගය ඉල්ලනවා. අපි යම් යම් හොඳ දේට සහයෝගය දෙන්න එකඟ බව ප්‍රකාශ කළා. නමුත් මේ එක වැඩ පිළිවෙළක්වත් රටට පොරොන්දු වෙච්ච දින පොත අනුව කෙරෙන්නේ නැති බවත්, මේ අය වැය ලේඛනයෙන්ද ඉතාම අසරණ තත්ත්වයකට මේ රටේ ජන ජීවිතය පත් කරන බවත් සඳහන් කරන්න කැමැතියි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Now, please wind up.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මගේ කථාව අවසන් කරන්න පෙර මට කථාවක් මතක් වුණා. මම මේ කියන කාරණය රනිල් වික්‍රමසිංහ මැතිතුමා දන්නවා. ඩඩ්ලි සේනානායක අග්‍රාමාත්‍යතුමා 1960 අප්‍රේල් මාසයේ 6වැනි දා මේ වාගේම උත්සාහයක් දැරුවා. එතුමා හුඟක් දේවල් පොරොන්දු වෙලා, මෙන්න මේ වාගේ දේකුත් මහජනතාවට පොරොන්දු වුණා.

"හාල් සේරුවක මිල ශත 25කට අඩු කරනු ලැබේ."

එතුමා මේ විධියට සියලු පොරොන්දු දීලා රාජාසන කථාව පැරදුණා; මැතිවරණයකට ගියා; ගෙදර යන්න සිද්ධ වුණා. ඔබතුමන්ලාත් බලාපොරොත්තු වෙන්නේ අය වැය ලේඛනයෙන් පසු මැතිවරණයක්. ඒ මැතිවරණය වෙනුවෙන් මෙසේ පොරොන්දු දුන්නාට, ඒවා ක්‍රියාත්මක කර ගන්න බැරි, ආර්ථික අවුලකට රට පරිවර්තනය කරන හේතු සාධක අද ඒ තුළින් මතු වී තිබෙනවා. එය තමයි ඇති වෙන ප්‍රතිඵලය කියන එක මම සඳහන් කරන්න කැමැතියි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා එක කාරණයක් පැහැදිලි කරන්න කැමැතියි. එතුමා කියපු කාරණා දෙක ගැනම පක්ෂ නායකයන් එක්ක සාකච්ඡා කරන්න අද අපි 3.00ට කාලය යොදාගෙන තිබෙනවා. නියම කරපු දිනයට අනුව ඒ කටයුතු කරන්න බැරි වුණා. ඒ ගැන කථා කරන්න අපට පක්ෂ නායකයන් මුණ ගැහෙන්න පුළුවන් වුණේ අද විතරයි. අපි ගිය සුමානේ රැස් වෙන්න හිටියා. නමුත් ඒක කල් ගියා. මම හිතන හැටියට අපි සියලු දෙනාගේම එකඟත්වය අනුව මේ කටයුතු දවස් 100 යන්න ඉස්සෙල්ලා කරන්න පුළුවන් වෙයි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Patali Champika Ranawaka. Before he starts, will an Hon. Member propose the Hon. Perumal Rajathurai to take the Chair?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

I propose that the Hon. Perumal Rajathurai do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු පෙරුමාල් රාජදුරයි මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பெருமாள் ராஜதுரை அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. PERUMAL RAJATHURAI *took the Chair.*

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු පාඨලී චම්පික රණවක මහතා.

[අ.භා. 2.26]

ගරු පාඨලී චම්පික රණවක මහතා (විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க - மின்வலு மற்றும் எரிசக்தி அமைச்சர்)
(The Hon. Patali Champika Ranawaka - Minister of Power and Energy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව බලයට පත් වුණේ විධිමත් පළල් සමාජ දේශපාලන ආර්ථික ප්‍රතිසංස්කරණයක් ඉදිරිපත් කිරීමේ බලාපොරොත්තුවෙන් නොවෙයි. මේ ජාතික ප්‍රතිසන්ධාන ආණ්ඩුවේ ප්‍රධාන බලාපොරොත්තුව දේශපාලන ප්‍රතිසංස්කරණයක් ඉදිරිපත් කිරීමයි. ඒ අතරේදී කිසියම් ආකාරයක ආර්ථික සහන ක්‍රියාවලියක්, සමාජයීය සහන ක්‍රියාවලියක් ඇති කර ගැනීම තමයි මේ ආණ්ඩුවේ පරමාර්ථය. දිගු කාලීන ආර්ථික සමාජ දේශපාලන ප්‍රතිසංස්කරණයක් සහිත ක්‍රියාවලියක් ඇරඹෙන්නේ ඊළඟ මහ මැතිවරණයෙන් පසුව ඇති වන ආණ්ඩුවත් එක්කයි. ඒ නිසා මේ ආණ්ඩුවේ මේ කෙටි කාලීන අරමුණු ජය ගැනීම සඳහා පසු ගිය මැතිවරණයේ දී අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඉදිරිපත් කරපු, මෛත්‍රී පාලනයක් යටතේ වුණ ඒ ආර්ථික සහන ක්‍රියාවලිය ඉදිරිපත් කිරීම තමයි මේ අය වැයෙනුත්, අය වැයට කලින් සිදු කරපු ඒ ඛනිජ තෙල් ඇතුළු ඉන්ධන මිල අඩු කිරීමෙනුත් ආණ්ඩුව බලාපොරොත්තු වුණේ.

මේ අතුරු අය වැය අපේ ගරු මුදල් ඇමතිතුමා හඳුන්වලා තිබෙන්නේ දින සියයක විප්ලවයක් හැටියටයි. මොකද, මේ අතුරු අය වැය අවශ්‍ය වුණා, සමාජ, ආර්ථික කෙටි කාලීන අඩිතාලමක් දමන්න වාගේම ඉදිරි කාලයේදී ගොඩ නඟන දේශපාලන ප්‍රතිසංස්කරණය ශක්තිමත්ව, පක්ෂ භේදයකින් තොරව ඉදිරියට ගෙනියන්න.

විශේෂයෙන්ම මේ අය වැය ගැන අපි කථා කරනවා නම් මේ අතුරු අය වැයේ ඉතාම වැදගත් අංග ලක්ෂණය තමයි, පසු ගිය රාජපක්ෂ පාලනයේ පැවතිච්ච ඉතාම බලගතු අපරාධකාරි බදු, සහගහන බදු ඉවත් කරලා ඒ සහනය මේ රටේ සාමාන්‍ය ජනතාවට ලබා දීම. රාජපක්ෂ පාලනයේ තිබුණු ඉතාම නරක අංග ලක්ෂණය තමයි, මහ ජනතාවගේ එදිනෙදා ඉන්ධන, ආහාර ආදියෙන් බදු අරගෙන, මහ ජනතාවට ඔරොත්තු නොදෙන, ඉහළ ගණයේ ධනපති කණ්ඩායමකට අවශ්‍ය කරන අධිසුඛෝපභෝගී සංවර්ධන ක්‍රියාදාමයකට අරමුදල් සැපයීම. ඒක තමයි සිද්ධ වුණේ. ඒක බොහොම පැහැදිලිව අපරාධකාරි සංවර්ධන උපාය මාර්ගයක්. ඒ අපරාධකාරි සංවර්ධන උපාය මාර්ගය දිගු කාලීනව අපි විසින් නතර කළ යුතු වනවා පමණක් නොවෙයි, ඒ සඳහා මුල් අඩි තාලමක් මේ අතුරු අය වැයෙන් ලැබිලා තිබෙනවා. එක්තරා ආකාරයකට මේ රටේ ජාවාරම්කාර පන්තියෙන් බදු අය කර ගන්නා අතරේ සාමාන්‍ය ජනතාවගේ ආහාරවලින්, ඉන්ධනවලින් අය කරපු බදු ඉවත් කිරීම තුළින් ඒ සමාජ සාධාරණත්ව මූල ධර්මය මේ අතුරු අය වැයෙන් ඉෂ්ට කරලා තිබෙනවා. මේක පසු ගිය අවුරුදු හතරක කාලය තුළ මුදල් අමාත්‍යාංශය කරවපු, ඒකට දේශපාලන නායකත්වය දීපු, ආර්ථික අපරාධකරුවන් විසින් මේ රට තුළ ඇති කරපු ඒ මහා සමාජ අසාධාරණය ආපසු හරවන්න ගත්ත වැදගත් පියවරක්. ඉදිරි කාලයේදී ඒක අපේ රටේ පක්ෂ - විපක්ෂ භේදයෙන් තොරව අපි සියලු දෙනා විසින්ම දිගු කාලීන සැලැස්මකින් ඇති කර ගත යුතු අලුත් වාතාවරණයක් හැටියට අපි දකිනවා.

මේ අය වැය ගැන නොයෙක් විවේචන තිබෙනවා, පරිප්පුවලට බදු අය කරලා නැහැ; දෙමුහුන් - hybrid - රථවල බදු වැඩි කරලා තිබෙනවා ආදී වශයෙන්. පරිප්පුවලින් අඩු කරන්න ලොකු බද්දක් නැහැ. රුපියල් දෙකක බද්දක් තිබෙන්නේ. දෙමුහුන් රථ පිළිබඳව යම්කිසි ප්‍රශ්නයක් තිබෙන එක ඇත්ත. නමුත් විදුලි මෝටර්

රථවලටත්, ඒ වාගේම හයිඩ්‍රජන් භාවිත කරන මෝටර් රථවලටත් සම්පූර්ණ බදු සහන ලබා දීලා තිබෙනවා. ඉදිරි කාලයේ දී ප්‍රවාහන ක්ෂේත්‍රයේ ඇති කරන ජාතික සැලැස්මකට අනුකූලව තමයි මේ බදු ප්‍රතිපත්තිය සකස් විය යුත්තේ. රටට සල්ලි නැති වුණාම මේ දෙමුහුන් රථවලට විශාල පරිමාණයෙන් බදු පනවන්න අතීතයේදී - 2008, 2009 වැනි කාලවල - ක්‍රියා කළ බව මම මේ අවස්ථාවේ දී මතක් කරනවා. එදිනෙදා දෛනික වියදම් පියවා ගැනීමටත් මෝටර් රථවලින් බදු අය කළ බව අපි මතක් කරන්න ඕනෑ. ඒ කෙසේ වෙතත් ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තියකට අනුකූලව තමයි මේ රථ වාහනවලට බදු නියම විය යුත්තේ කියන කාරණය අපි විශ්වාස කරනවා.

මේ අය වැයට ඇති වෙලා තිබෙන එක විවේචනයක් තමයි, කෙටි කාලීන ආදායම් මාර්ග මඟින් දිගු කාලීන වියදම් පියවා ගන්න උත්සාහ දරන බව. එනම් එක් වරක් පමණක් අය කරන බදුවලින් කාලාන්තරයක් මුළුල්ලේ යන වියදම් ලබා ගන්නට උත්සාහ දරනවාය කියන කාරණය.

මම පළමුවෙන්ම කියන්න ඕනෑ, මෙය අතුරු අය වැයක් බව. මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් ඉදිරිපත් කරපු ඒ අය වැය රාමුව ඇතුළේ තමයි මේ ආණ්ඩුවටත් වැඩ කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. මොකද, මේක පරිපූර්ණ අය වැයක් නොවෙයි. ඒ ආදායම්, වියදම් රාමුව ඇතුළේ ඉඳගෙන ජනතාවට සහන ලබා දීලා, දේශපාලන ප්‍රතිසංස්කරණය සියලු දෙනාගේ ශක්තියෙන් කර ගන්න තිබෙන අය වැයකුයි, මේ.

එම නිසා මේ අය වැය තුළින් ප්‍රාතිහාර්යය පාන්න බැහැ. එදිනෙදා ජනතාවට අවශ්‍ය කරන අත්‍යවශ්‍ය සහන ලබා දීමේ ක්‍රියාවලියක් තමයි අපි මේ අය වැය තුළින් බලාපොරොත්තු වුණේ. ඒ අනුව කෙටි කාලීන ආදායම් උපක්‍රමවල සාර්ථක අසාර්ථකභාවය විමසලා බලලා, ඒවා දිගු කාලීන ආදායම් බවට පරිවර්තනය කර ගැනීමට ඉදිරි කාලයේදී පත් වන ආණ්ඩුවකට හැකියාව ලැබෙයි කියලා අපි විශ්වාස කරනවා. මේ අය වැය සූර සරදියෙල්ගේ හෝ රොබින් හූඩ්ගේ අය වැයක් නොවෙයි; සමාජ සාධාරණත්වය වෙනුවෙන් ජාවාරම්කරුවන්ට එරෙහිව දැඩි පියවරක් ගන්න තබපු ක්‍රියාවලියක්. මේ පියවර ගන්න, රතු ඇඳ ගෙන, සමාජවාදය ගැන කථා කර ගෙන, ධනපතියන් ගැන හඬ නඟපු රාජපක්ෂ පාලනයට කොන්දක් තිබුණේ නැති විත්තිය අපි මේ අවස්ථාවේදී අවධාරණයෙන් ප්‍රකාශ කරන්නට ඕනෑ.

මම මේ අවස්ථාව උපයෝගි කර ගන්නවා, විශේෂයෙන්ම පසු ගිය අවුරුදු හතරක කාලය තුළ අපේ රටේ ආර්ථික ක්‍රියාදාමයේ ප්‍රතිපත්තිමය ක්‍රියාදාම පිළිබඳව විවේචනයක් ඉදිරිපත් කරන්නටත්. ඒ රාජපක්ෂ පාලනයේ අවසන් අවුරුදු හතරේ තිබුණු වැදගත්ම දේ තමයි "මහින්ද චින්තන ඉදිරි දැක්ම" නමින් විධිමත් ප්‍රතිපත්ති ප්‍රකාශනයක් ඉදිරිපත් කිරීම. රට පංච බල කේන්ද්‍රයක් බවට පත් කිරීම සඳහා වූ ප්‍රතිපත්ති ප්‍රකාශනයක් ඉදිරිපත් කළා. හැබැයි ඒ ප්‍රතිපත්තිය ජය ගත හැකි උපාය මාර්ගයක් හෝ උපක්‍රමයක් සකස් වුණේ නැහැ. ඒක තමයි ඇති වූ ලොකුම අඩු පාඩුව. ඊළඟට, අති බරපතළ ඉදිකිරීම් විප්ලවයකට ගමන් කළා. නමුත් ඒ ඉදිකිරීම්වලට අරමුදල් සම්පාදනය කර ගන්නේ කොහොමද, ඒ ඉදිකිරීම්වලින් ආදායම් ලබා ගන්නේ කොහොමද කියන එක ගැන පැහැදිලි උපාය මාර්ගයක් එතැන තිබුණේ නැහැ. ඒ නිසා ඒ ඉදිකිරීම් කිසිවකින් බලාපොරොත්තු වුණු ආදායම් හෝ වෙනත් ආකාරයක ආර්ථික ප්‍රයෝජනයක් අත් පත් වුණේ නැහැ. මූල්‍යමය වශයෙනුත්, ආර්ථිකමය වශයෙනුත් ඒවා අසාර්ථක ව්‍යාපෘති බවට පත් වුණා.

උදාහරණයක් හැටියට කියනවා නම්, මත්තල මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටු පොළට රුපියල් බිලියන 27ක් වියදම් කළා. නමුත් එහි ආදායම වුණේ, වර්ෂයකට රුපියල් 1,92,000ක් පමණයි. මා විසින් පෙන්වා දුන්නා, මත්තල මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ හදන්න ගත්තු ණය, ඒ ආදායමෙන් ගෙවන්න ගියා නම් අවුරුදු 1,40,000ක් යන බව. මේක ඉතාම පැහැදිලි උදාහරණයක්, රාජපක්ෂ පාලනයේ උපාය මාර්ගයක් නැති ආර්ථික සංවර්ධනයට. ඒ වාගේම නියමිත ප්‍රමිතිය හෝ පිල් සලකුණු මිලකට - benchmark cost - අනුව නොවෙයි මේ සියලුම ඉදිකිරීම් සිදු වුණේ. ඉතාම බරපතළ ආකාරයට මේ පිල් සලකුණු මිල ගණන් වෙනස් කරමින්, ප්‍රමිතියෙන් තොරව, ඇතැම් අවස්ථාවල 1:20, 1:30 අනුපාතයට පිල් සලකුණු මිල ගණන් වෙනස් කරමින් මහා මාර්ග ක්ෂේත්‍රයේ, ඒ වාගේම බලශක්ති ක්ෂේත්‍රයේ, ඒ වාගේම වරාය හා ගුවන් තොටු පොළ ක්ෂේත්‍රයේ කටයුතු කරපු ආකාරය අපි දැක්කා. මේ තත්ත්වය අනිවාර්යයෙන්ම නිවැරදි කර ගත යුතුයි. මේ මහා තාක්ෂණික දූෂණය, මේ මහා තාක්ෂණික වංචාව වළක්වන ශක්තිමත් තාක්ෂණික විගණන ක්‍රමයක් රටට අවශ්‍යයි කියන එක තමයි මේ තුළින් අපට පැහැදිලි වුණේ. තව පරම්පරා සිය ගණනකට මේ ණය ගෙවන්නට තිබෙනවා. ප්‍රමිතියෙන් තොරව පිල් සලකුණු මිල ගණන් වෙනස් කරමින් කරපු මේ මහා දූෂණයට තවත් පරම්පරා ගණනකට වන්දි ගෙවන්න තිබෙනවා. යළිත් කිසි කෙනෙකුට මෙය සිදු කිරීමට නොහැකි වන ආකාරයේ තාක්ෂණික විගණනයකට අනිවාර්යයෙන්ම මේ ඉදිරි දේශපාලන ප්‍රතිසංස්කරණයේදී අපි පියවර තැබිය යුතුයි කියන එක මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

මේ පාලනයේ තිබුණු තවත් වැදගත් අංග ලක්ෂණයක් තමයි, ණය සැඟවීම. ණය සැඟෙව්වා. මුදල් ඇමතිතුමා අපට ඒ බව පෙන්වා දුන්නා. ගිය අවුරුද්දේ අපේ තිබුණු ණය බර දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 78යි කිව්වා. නමුත් සඟවා තිබෙන ණය බර එකතු කළාම, ඒක සියයට 89ක්. රුපියල් බිලියන 1,442ක් විවිධ ස්ථානවල සඟවලා තමයි මේ ණය බර අපට අඩුවෙන් පෙන්නුවේ. ණය බරේ ප්‍රශ්නය පමණක් නොවෙයි, අපේ තක්සේරුවල හැටියට මේ ණය බර මීට වඩා තවත් වැඩියි. ණය බරේ අඩුව පමණක් නොවෙයි, සහනදායී නොවන පොලී අනුපාත යටතේ ණය ලබා ගැනීම නිසා මොකක්ද වුණේ? දිගු කාලීන වශයෙන් ආණ්ඩුවේ ආදායමට වඩා වැඩි මුදලක් ණය හා පොලී වාරික වශයෙන් ගෙවන්න ආණ්ඩුවකට සිදු වීමේ අර්බුදයට අපි ලක් වුණා. 2011, 2012, 2013, 2014 හා 2015 කියන මේ අවුරුදු පහේම ආණ්ඩුවේ ආදායමට වඩා ණය හා පොලී අනුපාත අනිවාර්යයෙන්ම ගෙවන්න අපට සිදු වෙලා තිබෙනවා. ඒ අනුව අප ඉතාම භයානක ණය උගුලකට හරවලා තිබෙනවා. ඉදිරි වසරේ හෝ වසර දෙකේ මේ රට පාලනය කරන්නේ කවුරු වුණත්, ඒ හැම කෙනාටම තිබෙන අභියෝගය තමයි ඉදිරි කාලයේදී ආර්ථික උපාය මාර්ගයක් මඟින් මේ ණය උගුලෙන් මේ රට ගලවා ගන්නේ කොහොමද කියන කාරණය.

ඒ වාගේම ආදායම් අහිමි කර ගත්තා; දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව එක දිගටම ආදායම් අහිමි කර ගත්තා. මම ඉදිරියේදී ඒ කරුණු පෙන්වන්නම්. ඒ අහිමි කර ගත් ආදායම් පියවීම සඳහා සාමාන්‍ය ජනයාගේ අත්‍යවශ්‍ය ද්‍රව්‍යවලින් බදු අය කර ගත්තා. ඉතාම බරපතළ විධියට පවුලේ ආදායම ඇද වැටුණා. පවුලේ ආදායම ඇද වැටුණා විතරක් නොවෙයි, පවුලේ ආදායම දළ දේශීය නිෂ්පාදනය ඇතුළේ ජාතික මං කොල්ලයක් බවට පරිවර්තනය වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ඒ ආර්ථිකය තුළ අපි දැකපු අනෙක් වැදගත් අංග ලක්ෂණය තමයි ආර්ථික පාදඩකරණය. අපේ ආයෝජන මණ්ඩලය හරහා නවෝත්පාදන ආර්ථිකයට ගොඩ වෙන විධියට, රටේ රැකියා ජනනය වන විධියට නොවෙයි ඒ ආයෝජන සැකසුණේ. ඒ ආයෝජන සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වුණේ ආර්ථික පාදඩකරණයක් වෙනුවෙන්. BOI ආයතනයට ලැබුණු ඒ ආයෝජනවලින් සියයට 19යි ප්‍රායෝගිකව මේ රට ඇතුළේ යම් කිසි ආකාරයකට කර්මාන්තයක් හෝ සේවාවක් බවට පත් වුණේ. ඒ සේවාවන්

[ගරු පාඨලී චම්පික රණවක මහතා]

බොහොමයක් රැකියා ජනනය කරනසුළු, ආදායම් ජනනය කරනසුළු ඒ වාගේම විදේශ අරමුදල් සම්පාදනය කරනසුළු දේවල් නොවෙයි. ඒවා බොහොමයක් විනෝදාස්වාදය මුල් කර ගත්ත, ඒ වාගේම සේවා ආර්ථිකයේ මූල්‍යමය පැත්ත හෝ අනෙක් පැත්ත නොවෙයි, බොහෝ දුරට සංචාරක ව්‍යාපාරය හා වෙනත් සේවා මුල් කර ගත්ත ක්‍රියාවලියක්.

ඊළඟට, පාරිසරික විනාශය. ඇත්ත වශයෙන්ම ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයත් ඒ වාගේම මුදල් අමාත්‍යාංශයත් සිදු කරපු දේ තමයි මධ්‍යම පරිසර අධිකාරියේ හා මේ රටේ තිබුණු සෑම පාරිසරික නීතියක්ම උල්ලංඝනය කරලා ඉතාම බරපතළ විධියට ඉඩම්, වෙරළ සහ රටේ අනෙකුත් සංවේදී පාරිසරික ස්ථාන විනාශ කරමින් ක්‍රියා කිරීම. මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරින්ට නීතිය ක්‍රියාත්මක කරන්න දුන්නේ නැහැ; වන සංරක්ෂණ නිලධාරින්ට නීතිය ක්‍රියාත්මක කරන්න දුන්නේ නැහැ. වනජීවී නිලධාරින්ට නීතිය ක්‍රියාත්මක කරන්න දුන්නේ නැහැ. ඔවුන් උත්සාහ කළේ කුමක් සඳහා ද? ඔවුන්ගේ ඔළුවේ වැඩ කරන ඒ මුග්ධ සංවර්ධනය කෙසේ හෝ බුල්ඩෝසරයක් හැටියට මේ අපේ වටිනා පරිසර පද්ධතිය හරහා ගෙන යාමටයි. පසු ගිය අවුරුදු 05 තුළ කරපු ඒ පරිසර විනාශය ආපසු හරවන්න බැරි ව්‍යසනයක්ය කියන එක අපි මේ අවස්ථාවේ අවධාරණය කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අපේ ගරු දිනේෂ් ගුණවර්ධන හිටපු ඇමතිතුමාත් කිව්වා, ආර්ථිකයේ සියයට 7ක වර්ධනය ගැන. සංඛ්‍යා ලේඛනවලින් පෙන්වා දුන්නා, සියයට 7කට, 8කට වැඩියෙන් ආර්ථිකය වර්ධනය වනවා, සියයට 6.7ට දුප්පත්කම බස්සලා තිබෙනවා, සියයට 4.3ට විරැකියාව බස්සලා තිබෙනවා, ඒ වාගේම ණය බරතාව දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 78ට බස්සලා තිබෙනවා කියා. මේ ආකාරයට විශාල ලෙස ආර්ථිකය කර ගෙන යන්න පුළුවන් විධියේ සුබවාදී පැවැත්මක් තිබෙන බව පෙන්වා දුන්නා. ඒ වාගේම ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවට අභියෝග එල්ල වුණා සංඛ්‍යා ලේඛන විකෘති කරන බවට. ඒ පිළිබඳව පැහැදිලි සාක්ෂි ඉදිරිපත් වුණා. ඒ ඉදිරිපත් වුණාම ඒවාත් යුද අපරාධවලට ගාවා ගත්තා. මේක යුද අපරාධවල සංඛ්‍යා ලේඛන, ආණ්ඩුව ඉදිරිපත් කරපු සංඛ්‍යා ලේඛන විකෘති කිරීම සඳහා දරන දේශද්‍රෝහී වෑයමක් කියලා පෙන්වා දුන්නා. ඒ ආකාරයට ඒක වහන්න උත්සාහ කළා. නමුත් අද මා බොහොම පැහැදිලිව කියනවා මේ වර්ධනය ගැන. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝකය පිළිගත්ත සම්මත ක්‍රම 6ක් පාවිච්චි කරලා අපගේ වර්ධන වේගය, අපගේ නිෂ්පාදන ශ්‍රිතය සම්පූර්ණයෙන්ම විශ්ලේෂණයට ලක් කළා. එහිදී පෙන්වා දුන්නා අපට අත්පත් කර ගත හැකි උපරිම වර්ධන වේගය 6.7යි කියලා. එහෙම නම් ඊට ඉහළින් වර්ධනයක් අත්පත් කර ගත්තායි කියන්නේ ඒක අතාත්වික වර්ධනයක්. ඒක යථාර්ථවාදී වර්ධනයක් නොවෙයි. අපගේ නිෂ්පාදන ශ්‍රිතයට අත්පත් කර ගත හැකි උපරිම වර්ධනය 6.7 නම් ඊට ඔබ්බෙන් ගිය 8.4ක, ඒ වාගේම 8.2ක වර්ධනයන් කියන්නේ මොනවාද? ඒවා අතාත්වික වර්ධනයන්. ඒ තුළ සැඟවී තිබෙනවා, මේ සංඛ්‍යා ලේඛන විජ්ජාවේ රහස.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපි පිළිගන්න ඕනෑ, අපේ විරැකියාව කිසියම් ප්‍රමාණයකට පාලනය වීම විශිෂ්ට ලක්ෂණයක් බව. හැබැයි, අපි කනගාටුවෙන් වුණත් කියන්න ඕනෑ අවුරුදු 20ත් - 24ත් අතර තරුණ පරපුර අතරේ තවමත් විරැකියාව සියයට 20ක් බව. ඒ වාගේම අපොස සාමාන්‍ය පෙළ අසමත් අය අතරේ විරැකියාව සියයට 5.3ක් වෙන කොට අපොස උසස් පෙළ සමතුන් අතරේ විරැකියාව සියයට 12.6යි. ඒ කියන්නේ, ඉගෙන ගැනීම සාපයක් වෙච්ච බිමක් බවට මේ ආර්ථිකය පත් වුණා විතරක් නොවෙයි රටේ ශ්‍රම බල කායෙන් සියයට 23ක් අද විදේශ ගතවයි සේවය කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටට 1992 දී ලැබුණා ජනගහන පාරිතෝෂිකය. එනම් demographic dividend එක අපට ලැබුණා. ඒ කියන්නේ රටේ ජනගහනය වර්ධනය වන වේගයට වඩා වැඩියෙන් ශ්‍රම බල කායේ වර්ධන වේගය වැඩි වුණා. එම පාරිතෝෂිකය තවත් වසර 17ක් පවතිනවා, මේ රටේ. මේ කාලය, එනම් 1992 ඉඳන් එන මේ කාලය තුළ තමයි රටට අවස්ථාව ලැබෙන්නේ අඩු ආදායම් රටක සිට වැඩි ආදායම් රටක් බවට පත් වීමට. ශ්‍රම සම්පත පැත්තෙන් බැලුවාම ඒ සඳහා ලැබුණු ස්වර්ණමය යුගය මේ යුගයයි. අපි ඒකෙන් සෑහෙන කාලයක්, අවුරුදු 25කට ආසන්න කාලයක් දැන් නාස්ති කර තිබෙනවා. ඒ නිසා ඉදිරි කාලයේදී මේ ශ්‍රම සම්පතින් අපි ප්‍රයෝජන නොගත්තොත් ඊළඟ අවුරුදු 15න් පස්සේ අපට එළැඹෙන්නේ වැඩිවියට පත් වුණු, වියපත් වුණු ජනගහනයක් නඩත්තු කරන රටක්. ඒකට මේ රට අපි අනිවාර්යෙන්ම සූදානම් කළ යුතුයි. ඒකට ගැළපෙන ආර්ථික ප්‍රතිපත්තියක් අපි විසින් සකස් කරගත යුතුයි. ඒ නිසා විරැකියාව පැත්තෙන් ගත්තත්, දුගී දුප්පත්කම පැත්තෙන් ගත්තත් අපි සංඛ්‍යා ලේඛන වශයෙන් විතරක් නොවෙයි, භෞතිකවත් යම් සුබවාදී තත්ත්වයක් අත්පත් කර ගෙන තිබෙනවා. ඒක ගැන අපට සතුටුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම 6.7ක් වැනි ආර්ථික වර්ධන වේගයක් අපේ නිෂ්පාදන ශ්‍රිතයේ පවතින එකත් සුබ ලකුණක්. ඒක අපි පිළිගත යුතුයි. නමුත් විකෘති සංඛ්‍යා ලේඛනවලින් අහස් මාළිගා තැනීමෙන් අපේ යථාර්ථය සඟවන්න බැහැ. අපි යථාර්ථවාදී, තාත්වික ආර්ථික වර්ධනයකට රට සූදානම් කර ගත යුතුයි. ආර්ථිකය දෙගුණ වුණා, පස්ගුණය වුණා කිව්වාට යුද්ධයෙන් පස්සේ 2009-2013 අතර කාලයේ සම්පූර්ණයෙන්ම ලබාගෙන තිබෙන මූර්ත ආර්ථික වැඩිවීම සියයට 33යි කියන එක මම කියන්න ඕනෑ. මූර්ත ආර්ථික වැඩිවීම ලබාගත් යුග දෙකක් තිබෙනවා. 2009 සිට 2011 දක්වා එක යුගයක් සහ 2011 සිට 2014 දක්වා තව යුගයක්. පළමුවැනි යුගයේදී වර්ධනය ලබා ගත්තේ සම්පූර්ණයෙන්ම ණයවර බුබුළකින්. එහෙම නැත්නම් credit bubble එකකින්. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මැදිහත් වීම නිසා ඒක නතර වුණා. අපි ඒ දවස්වල ඒක පෙන්වලා දුන්නා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ණය ගැනීමේදී යම් යම් කොන්දේසි පැනෙව්වා. රාජ්‍ය ආයතනවලට යම් යම් කොන්දේසි පැනෙව්වා. ලංකා විදුලිබල මණ්ඩලයට වාගේම තෙල් සංස්ථාව යනාදියට යම් යම් කොන්දේසි පැනෙව්වා. ඒ නිසා මොකද කළේ? වෙනත් ක්‍රමවේදවලට මාරු වෙන්න, වෙනත් ප්‍රභවයන්වලින් ණය ගන්න, වාණිජ ණය ගන්න, ආයතන ණය කරන්න, නව උපාය මාර්ගයක් හදාගන්න මුදල් අමාත්‍යාංශයට සිද්ධ වුණා. ඒ නිසා මේ රට ලබා ගත් රුපියල් බිලියන 1,442ක ණය සඟවන්න මුදල් අමාත්‍යාංශයට හැකියාව ලැබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම 2011 ඉඳලා 2014 දක්වා කාලය ගත්තොත් තව බුබුළක් නිර්මාණය කළා; තවත් අතාත්වික වර්ධනයක් නිර්මාණය කළා. එය නිර්මාණය කළේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2011-2014 කාලය තුළ වර්ධනයෙන් සියයට 14.7ක්, ඒ කියන්නේ ආසන්න වශයෙන් සියයට 15ක් ලබාගෙන තිබෙන්නේ සම්පූර්ණ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ඇති කර ගත් පෙණ බුබුළකින්; ආර්ථික වර්ධන පෙණ බුබුළකින්. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ලබා ගත් පෙණ බුබුළ හරහා තමයි මේ කෘත්‍රිම වර්ධනය ලබා ගත්තේ. එය තාත්වික වර්ධනයක්, ජනතාවට ආදායම් ගලා ගිය වර්ධනයක් නොවෙයි. ඒ නිසා අනාගතයේ මේ රට බරපතළ අනතුරකට පත් වෙනවා. මොකද, මේ පෙණ බුබුළු මඟින්; අතාත්වික වර්ධන ක්‍රියාවලියන් මඟින් ගෙන ගිය ආර්ථික පිම් සදාකාලිකව පවත්වාගෙන යන්න බැහැ; තිරසාරව පවත්වාගෙන යන්න බැහැ. තිරසර ආර්ථික

වර්ධනයක් සඳහා වන උපාය මර්ගයක් අද රටට අවශ්‍යයි. පෙණ බුබුළුවලින් ආර්ථිකය වර්ධනය කළ යුගය අපි අවසන් කළ යුතුයි. සමහර විට ඒක දුක්ඛිත ක්‍රියාවලියක් වෙන්න පුළුවන්. නමුත් රට මේ යථාර්ථය තේරුම්ගත යුතුයි කියන එක අපි පෙන්වලා දෙන්න ඕනෑ.

විශේෂයෙන්ම එම කාලය ඇතුළත අපේ ප්‍රධාන අපනයනය වන තේ අරගෙන බැලුවොත්, මේ අවුරුදු හතරේදීම තේ වගාවෙන් ලැබුණු ආර්ථික වර්ධනය සියයට දශම 5යි. වී වගාවෙන් සියයට 1.3යි. ඒ වාගේම අනෙකුත් වගාවලින් සියයට 2.5යි. ධීවරයින්ගෙන් සියයට 1.8යි. ඒ වාගේම රෙදිපිලි හා සම්භාණ්ඩවලින් -ඒක අපට තිබුණු ප්‍රධාන එකක්- සියයට 4යි. වරාය හා ගුවන් තොටුපළවලින් සියයට දශම 7යි. නමුත් ඉදිකිරීම් සහ ඒ හරහා ගොඩනැඟුණු අනෙකුත් ජාවාරම්කාර පන්තියේ ආර්ථිකයෙන් තමයි මේ ආර්ථික බුබුළ සකස් කරලා තිබෙන්නේ. තිරසර ආර්ථික ක්‍රියාවලියේ මොනම වර්ධනයක්වත් ඒ වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේවත්, කෘෂි කර්මයේවත්, ධීවර ක්‍රියාවලියේවත්, වෙනත් ක්‍රියාවලියකවත් සිදු වී නැති බව ඉතාම පැහැදිලියි. මෙම කාලය තුළ ඇති කර ගත් credit bubble එකේත්, ඒ වාගේම construction bubble එකේත් ප්‍රවණතාව පිළිබඳ මේ සභාව පමණක් නොවෙයි මේ රටම දැනුවත් වීම සඳහා සහ අපේ ජනතාවගේ අනාගත ප්‍රයෝජනය සඳහා මේ ඇමුණුම 1 සහ ඇමුණුම 2 වශයෙන් ලියවිලි දෙකක් මම මේ අවස්ථාවේ **සභාගත*** කරනවා.

මොකද, මේවා ඉතිහාසගත වෙන්න ඕනෑ, මේවා ලියැවෙන්න ඕනෑ. අපේ මහ බැංකු වාර්තාවේත්, ඒ වාගේම අපේ ආර්ථික සංවර්ධනය පිළිබඳව මුදල් අමාත්‍යාංශයෙන් නිකුත් කළ වාර්තාවලත් යථාර්ථය අපි දැන් හෙළි කර ගත යුතුයි. අපි ඒ යථාර්ය තේරුම් ගත්තොත් පමණයි මෙතැනින් ඔබ්බට ආර්ථික වර්ධනයක් ගැන අපට කථා කරන්න පුළුවන් වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපි ඉතාම කනගාටුවෙන් කියන්න ඕනෑ අපේ රාජ්‍ය ආයතන ඉතාම බරපතළ ණය උගුලකට හිර කරලා තිබෙනවා කියන එක. අද අරගෙන බැලුවොත් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ණය රුපියල් බිලියන 431ක් වෙනවා. ඒක මුදල් අමාත්‍යාංශයේ ණය පොතේ නැහැ. ලංකා විදුලිබල මණ්ඩලයේ ණය රුපියල් බිලියන 55යි. අද වෙන කොට ලංකා විදුලිබල මණ්ඩලයට, ඒ වාගේම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට, ඒ වාගේම රුපියල් බිලියන 370ක් ණය ඇති ජාතික ජල සම්පාදන මණ්ඩලයට ප්‍රාග්ධන වියදම් වශයෙන් ශත 5ක්වත් දීලා නැහැ. ඒ අනුව මේ ආයතන තුනටම, ඒ වාගේම හම්බන්තොට වරායට පොලිය ගෙවන්න තිබෙනවා, ගත්ත ණය ගෙවන්න තිබෙනවා. ඒකත් එක්ක පාඩුවට ලක්වන වරාය හා ගුවන් තොටුපළ සේවය, සෑම අවුරුද්දකම රුපියල් බිලියන 27ක් පාඩු ලබන අපේ ගුවන් සේවාව, මේ කියන කාරණා ඔක්කෝම එකතු කළාට පස්සේ එම ණය වෙනත් ආයතනවලට විතැන් කළාට ආර්ථික ඝාතකයින් පසු ගිය කාලයේ යෝධ ණය උගුලක රට හිර කරලා තිබෙන විත්තිය අපට පෙනෙනවා. ඒ නිසා මේ ආයතන මූල්‍ය ක්ෂේත්‍රයේ බැංකු සමඟ පටලවා තිබෙනවා. ඒ වාගේම වාණිජ ක්ෂේත්‍රය පටලවා තිබෙනවා, බලශක්ති ක්ෂේත්‍රය පටලවා තිබෙනවා. මේ මහා පැටලුම් ජාලයෙන් මේ ආර්ථිකයේ මේ ක්ෂේත්‍ර මුදා ගැනීම යෝධ අභියෝගයක් හැටියට අප ඉදිරියේ තිබෙනවා. අපේ ප්‍රධාන රාජ්‍ය බැංකු වාණිජ ණය ගැනීමට යොමු කිරීම විසින්, විදේශ ණය ගැනීමට යොමු කිරීම විසින්, ඒවා කිසිම ආදායමක් නොලැබෙන ස්ථානවල පාරවල් හදන්න, වතුර දෙන්න ආයෝජනය කිරීම විසින් සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? රට ඉතාම භයානක ආර්ථික උගුලකට හසු වීමයි.

උදාහරණයක් හැටියට කියනවා නම් ලංකා බැංකුව පාරවල් හදන්න සියයට හතේ පොලියට ණය දෙනවා; මහජන බැංකුවත් පාරවල් හදන්න සියයට හතේ පොලියට ණය දෙනවා. හැබැයි, ලංකා විදුලිබල මණ්ඩලයට, ඒ වාගේම ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සියයට දහයේ, එකොළහේ පොලියටයි ඒ අය ණය දෙන්නේ. ඒ අනුව අවසානයේ පාරවල් හදන ආයෝජකයන්ගේ ඒ ණය බර ගෙවන්නේ කවුද? විදුලි පාරිභෝගිකයා, ඒ වාගේම මේ ඉන්ධන පාරිභෝගිකයායි. මෙවැනි අපරාධකාරී උපාය මාර්ගයකින් තමයි රාජපක්ෂ පාලනය පසු ගිය කාලයේ මේ ආශ්චර්යයේ ආර්ථිකය ගෙන ගියේ. මේක දිගට ගෙන යන්න පුළුවන් ගමනක් නොවෙයි. මෙය අනිවාර්යයෙන්ම මේ රටේ සියලු දෙනාම දැනගෙන, ඉදිරි කාලයේදී අප විසින් සකස් කරගත යුතු ක්‍රියාවලියක් බව ප්‍රකාශ කරන්න ඕනෑ.

රාජපක්ෂ පාලනය විසින් විදේශ වෙළෙඳාම -අපේ අපනයන- ඉතාම බරපතළ විධියට බිඳ වැටටුවා. මම කීප වතාවක්ම එතුමාට එය පෙන්වා දුන්නා. දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව 2006 දී සියයට 23.4ක් වුණු අපේ අපනයන 2013 දී සියයට 15.5ක් දක්වා අඩු වුණා. ඒ වාගේම සියලුම ක්ෂේත්‍රවල අපනයන බිඳ වැටුණා. යම්කිසි සහනයක් හෝ ලැබුණේ මේ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ එම ක්‍රියාවලියෙන් විතරයි. අපේ ප්‍රතිපත්තියේ හැටියට නවෝත්පාදනය ගැන කථා කළාට මොකද මේ අවුරුදු හතරේම නවෝත්පාදනය සම්බන්ධයෙන් වුණු අධිතාක්ෂණ ක්ෂේත්‍රය දළ දේශීය නිෂ්පාදනයට දක්වපු දායකත්වය සියයට දශම 9ක් පමණයි. මෙන්න මෙවැනි ආර්ථිකයක් තමයි අපට ඒවායින් උරුම වුණේ.

ඇත්තටම 2014 වසරේ සිට තෙල් මිල අඩුවීම ආර්ථිකයට විශාල සහනයක් වන දෙයක් වුණා. ඒ තෙල් මිල අඩු වීමේ සහනය පවා ජනතාව වෙත මාරු කර යවන්නට ඒ ආණ්ඩුවට හැකියාවක් ලැබුණේ නැහැ. ඒ නිසා තමයි එතුමාගේ පාලනය පෙරළා දැමීමෙන් පසුව පත්වුණු අපේ ආණ්ඩුවේ පළමුවැනි කාර්ය හැටියට ඒ තෙල් සහනය අපේ ජනතාවට ලබා දුන්නේ. පසු ගිය ආණ්ඩුව කළේ මොකක්ද? සහ ගහන බදු මඟින්, පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් මිල අඩු නොකිරීම තුළින් රටේ දූෂිත සංවර්ධනයට; අකාර්යක්ෂම සංවර්ධනයට; වංචාකාරී සංවර්ධනයට අවශ්‍ය කරන අරමුදල් සම්පාදනයයි කළේ. අපි මේ රටේ ජනතාව මත පටවා තිබුණු ඒ මහා බර ඉවත් කරලා, පසු ගිය 29වන දා පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් මිල අඩු කිරීම මඟින් ඒ සහනය ජනතාවට ලබා දුන්නා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ බදු ආදායම -ආණ්ඩුවේ බදු ආදායම- ගැන මම කලිනුත් ප්‍රකාශ කළා. ජනතාව විශේෂයෙන්ම ජාවාරම්කාරයින්ගෙන්, දැවැන්ත සමාගම්වලින් බේරා ගත යුතුයි. අද මෙහි කථා කළා, සමාගම් ගැන. මෙහෙම කරගෙන ගියොත් සමාගම් වැටෙයි ලු; සේවකයන් ඇද වැටෙයි ලු. මේ සොයා ගත් යෝධ ධනය තමයි, ඒ බදුවල ප්‍රතිපත්තිය. මුලින්ම මේ බදු ක්‍රමය හඳුන්වා දෙමින් ඩේවිඩ් රිකාඩෝ පෙන්වා දුන්නේ මොකක්ද? "බදු අය කරන්න ඕනෑ. හැබැයි, ඒ බදු අය කර ගන්න ඕනෑ ඒ අදාළ ධනය උත්පාදනය කරන තැන්වලිනුයි. සාමාන්‍ය ජනයාගෙන් නොවෙයි" කියන එකයි. ඒ ආකාරයෙන් තමයි බදු ක්‍රමයේ ආරම්භය සිදු වුණේ.

2006 දී දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව සියයට 14.6ක් වුණු අපේ බදු ආදායම 2013 දී සියයට 11.6ක් වුණා. මෙහි විශේෂත්වය වුණේ ලංකාවේ බදු ආදායමින් සියයට සියයක්ම මහින්ද රාජපක්ෂ, ගෝඨාභය රාජපක්ෂ, බැසිල් රාජපක්ෂ විසින් පාලනය කිරීමයි. මේ ලෝකයේ කිසිම ඒකාධිපති පාලකයෙක් රටක බදු ආදායම සියයට සියයක් පාලනය කරලා නැහැ.

**** පුස්තකාලයේ තබා ඇත.***

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

[ගරු පාඨලී චම්පික රණවක මහතා]

වර්තමාන ඉතිහාසයේ එහෙම කිසිම උදාහරණයක් නැහැ. අන්න ඒකම ඇති, මෙවර පැවැති ජනාධිපතිවරණයෙන් එතුමාගේ ඉරණම තීරණය කරන්න.

මෙතුමන්ලා ආයෝජන ගැන කථා කළා. වර්ෂයකට බිලියන ගණනින් ආයෝජනයන් සිදු වනවාය කියලා කිව්වා. නමුත්, සියයට 19යි මේ රට ඇතුළේ ආයෝජන සිදු වෙලා තිබෙන්නේ. ආයෝජන බිඳ වැටිලා තිබෙන්නේ. මේ අවස්ථාවේ දී මෙම කාරණය ගැනත් මා සඳහන් කරන්න ඕනෑ. මහින්ද රාජපක්ෂ මහත්මයා බලයට ආවේ 2005 වර්ෂයේ දීයි. ඒ වනකොට රටේ ආර්ථික වර්ධනය සියයට 6.2කින් වර්ධනය වනකොට කුටුම්බයේ -පවුලේ- ආදායම සියයට 7.4කින් වර්ධනය වුණා. අද - එතුමාගේ පාලන කාලය අවුරුදු නවයක් ගත වුණාට පසුව- තත්ත්වය මොකක්ද? 2010 දී රටේ ආර්ථික වර්ධනය සියයට 5.8යි. පවුලේ ආදායම සියයට දශම 6යි. 2013 දී රටේ ආර්ථික වර්ධන වේගය සියයට 7.2යි. පවුලේ ආදායම සියයට දශම 3යි. අන්න ඒක තමයි එතුමාගේ පාලනයේ භයානකම තත්ත්වය. සමාජවාදයේ රතු ඇඳගෙන, නිර්ධනයෝ ගැන කථා කර කර පෙළපාළි ගියාට මොකද, රාජපක්ෂ පාලනය වාගේ පවුලේ ආදායම කොල්ල කාපු වෙනත් කිසිම පාලනයක් නැහැ. එතුමාගේ පාලන කාලයට අයත් 2013 වසරේ දී විතරක් සෑම පවුලකින්ම මාසයකට රුපියල් 12,000ක් මේ ආකාරයට ඉවත් වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, එතුමා පාලනයට එන්න කලින් ආසන්න වශයෙන් රටේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 44ක්, 45ක් පවුලේ ආදායම හැටියට තිබුණා. එතුමාගේ පාලනය යටතේ ඒක සියයට 35ට වැටුණා. කොටින්ම කිව්වොත්, 2013 වසරේ දී පවුල් පනස්පන්ලක්ෂයකට ලැබිය යුතු රුපියල් බිලියන 700ක් ඒ පවුල් පනස්පන්ලක්ෂයට නොලැබී තනි පවුලක් වෙතට ගියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප පසු ගිය දවස්වල දූෂණ විරෝධී පෙරමුණක් ඇති කළා. පෙත්සම් 2,000ක් පමණ අපට ලැබී තිබෙනවා. ඒ පෙත්සම් 2,000ම ඇගැයීමට ලක් කළාම අපට පෙනෙනවා, ආසන්න අවුරුදු පහ තුළ රුපියල් බිලියන 2,000ක්, එනම් ආණ්ඩුවක් විසින් වර්ෂයකට වියදම් කරන මුදලට සමාන මුදලක් දූෂණය, වංචාව තුළ ගමන් කර තිබෙන බව. අතීතයේ දීත් මේ රටේ දූෂණය, වංචාව තිබෙන්න ඇති. නමුත් මෙය නම් මහා ජාතික මං කොල්ලයක් බව අපි ප්‍රකාශ කරන්න ඕනෑ. මෙය වැළැක්වීම සඳහා අවශ්‍ය කරන ශක්තිමත් නීතිරීති, ශක්තිමත් සමාජ වටපිටාවක් හදන එක අපේ ජාතික වග කීමක් වනවා.

මේ අවස්ථාවේ දී අදාළ ප්‍රස්ථාර ඇතුළත් ලේඛන ඇමුණුම III හා ඇමුණුම IV වශයෙන් මා **සභාගත*** කරනවා. මොකද, මේ ආර්ථිකය ගැන පම්පෝරි ගහන්න කලින් ආර්ථිකයේ යථාර්ථය මොකක්ද කියන එක ගැන මේ රටේ ජනතාව දැන ගත යුතුයි.

ඒ විතරක් නොවෙයි. සඳහන් කළ යුතු අනෙක් වැදගත්ම දේ තමයි, මේ කාලය තුළ සමාජ ශුභ සාධනයට -අධ්‍යාපනයට, සෞඛ්‍යයට, සමෘද්ධියට, පොහොරවලට, විශ්‍රාම වැටුප්වලට- ලබා දීපු මුදල් ප්‍රමාණයන් ශීඝ්‍රයෙන් අඩු වීම. විශේෂයෙන්ම සෞඛ්‍ය හා අධ්‍යාපනය ගත්තොත් 2006 දී සෞඛ්‍ය හා අධ්‍යාපනය වෙනුවෙන් දළ දේශීය නිෂ්පාදිතයෙන් ලබා දුන් සියයට 4.6ක ප්‍රමාණය සියයට 3.1ක් දක්වා පහළ බැස්සුවා. ඒ වාගේම සමෘද්ධි ඇතුළු අනෙක් දේවල් සඳහා ලබා දුන් මුදලත් ඒ කාලය තුළ ශීඝ්‍ර අඩු වීමකට ලක් වුණා. 2005 දී සමෘද්ධිය, පොහොර සහනාධාරය හා විශ්‍රාම වැටුප් සඳහා දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4.1ක් වැය වුණා. නමුත් 2013 දී වැය කළේ සියයට 2.3යි. සාමාන්‍ය ජනයාගේ අධ්‍යාපනය, සෞඛ්‍යය, පොහොර, විශ්‍රාම වැටුප්, සමෘද්ධිය ආදී දේවල්වලට මේ තරම් වියදම් කප්පාදු කරපු පාලනයක් තිබුණේ නැති බව බොහොම පැහැදිලිව ප්‍රකාශ කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම විදේශ සංචිත ගැන අමූලික අසත්‍යක් කිව්වා. විශේෂයෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුවේ හිටපු අධිපතිතුමා අමූලික අසත්‍යක් කිව්වා, ලංකාවේ විදේශ සංචිත බිලියන 8ක් තිබෙනවාය කියලා. විදේශ සංචිත රුපියල් බිලියන 8ක් තිබෙනවා තමයි. හැබැයි ඒවා සම්පූර්ණයෙන් ණයට ගත් මුදල්. සෘජු විදේශ සංචිත ප්‍රමාණයේ අවසාන අගය ඩොලර් බිලියන සෘණ දශම 2යි. අනෙක් සියල්ලම ණය මඟින් ලබා ගත් සංචිත මිසක් රටේ දේශීය සංචිතයක් නැහැ. මතක තබා ගන්න ඕනෑ, ධන අගයක් තිබුණු ලංකාවේ විදේශ සංචිත ප්‍රමාණය මේ කාලය ඇතුළත සෘණ අගයකට ගෙන ආ බව. එම තොරතුරු ඇතුළත් ලේඛනයත් මා මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

ඒ එක්කම මා කියන්නට ඕනෑ, පසු ගිය කාලය තුළ විශේෂයෙන්ම ණය ගැනීමේ දී ක්‍රම -ක්‍රමයෙන් සහනශීලි ණය වෙනුවට වාණිජ ණයවලට ගමන් කළ බව. උදාහරණයක් හැටියට 2005 දී අපේ රටේ සහනශීලි ණය - concessional loans - සියයට 96යි තිබුණේ. නමුත් 2013 වසර වනකොට ඒ සහනශීලි ණය ප්‍රමාණය සියයට 50ක් වෙලා, සහනශීලි නොවන හා වාණිජ ණය ප්‍රමාණය සියයට 50ක් දක්වා වැඩි වුණා. ඒ සියලුම වාණිජ ණය ආයෝජනය කළේ ආදායම් උත්පාදනය වන තැන්වල නොවෙයි, ආදායම් නැති වන තැන්වලයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉදිරි වසර දෙක මේ රටට ඉතාම තීරණාත්මකයි. ඉදිරි වසර දෙක ඇතුළත මේ රට කවර රජයක් පාලනය කළත් මේ භයංකර ආර්ථික සංඛ්‍යා ලේඛන අපට පෙන්වා දෙන තත්ත්වයෙන් ඔබ්බට තිරසර ආර්ථික වර්ධනයක්, තිරසර සමාජ සමානාත්මතාවක්, තිරසර පරිසර සංරක්ෂණයක් ඇති කරනසුලු සංවර්ධනයකට රට ඉදිරියට ගෙන යන්න අපට හැකි වන්නට ඕනෑ. විශේෂයෙන්ම අප පත්ව තිබෙන මේ ණය උගුලෙන් අප ගලවා ගෙන ඉදිරියට ගෙන යන්න, විශේෂයෙන්ම මූල්‍ය ක්ෂේත්‍රයේත්, බලශක්ති ක්ෂේත්‍රයේත් ශක්තිමත් පියවර අපට අවශ්‍ය වෙලා තිබෙනවා. අපේ ක්ෂේත්‍රය ගැන කියනවා නම් අපි බලශක්ති ක්ෂේත්‍රයේ අරමුණු කිහිපයක් පෙරට ගෙන තිබෙනවා. පළමුවන අරමුණ තමයි බලශක්තියෙන් ජාතික ස්වයංපෝෂණයක් ඇති කර ගැනීම. ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනාධිපති බරක් ඔබාමා එතුමාගේ ඉලක්කය බවට බලශක්ති ස්වයං පෝෂණය ළඟා කර ගත්තා. එක්සත් ජනපද ආර්ථිකයට ලැබී තිබෙන ජවය එක්ක එහි ප්‍රතිඵල අද පෙනෙන්නට තිබෙනවා. මේ රටත් බලශක්ති නිපදවීමෙන්, පිරිපහදුවෙන්, ගබඩාවෙන් බලශක්ති ස්වයං පෝෂණය ළඟා කර ගත යුතුයි. ඒ වාගේම බලශක්ති වෙළෙඳ පොළක් බවට මේ රට පත් කිරීමෙන් අපි එය සිදු කර ගත යුතුයි.

විශේෂයෙන්ම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට ඕනෑ, 2008 දී මන්නාරම් ද්‍රෝණියේ තෙල් කැණීම සඳහා, ගෑස් කැණීම සඳහා භාර දුන් බව. නමුත් එයින් නිසි ප්‍රතිඵල අපට ලබා ගන්නට බැරි වුණා. 2011 දී එය ලබා දුන් සමාගම අවසානයේ දී කළේ තමන්ගේ කොටස් වෙළෙඳ පොළේ මිල ගණන් ඉහළ යවා, ඩොලර් බිලියන 7ක ගනුදෙනුවක් කරලා මාරු වෙලා යන එක විතරයි. දැන් අපට සිද්ධ වෙලා තිබෙනවා, ඒ තෙල් හා ගෑස්

---

* පුස්තකාලයේ තබා ඇත.
* நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
* Placed in the Library.

* පුස්තකාලයේ තබා ඇත.
* நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
* Placed in the Library.

සම්පත - විශේෂයෙන්ම ගෑස් සම්පත - අපේ රටේ සේවයට ගැනීම සඳහා වැඩ පිළිවෙළක් යොදන්න. ඒ අනුව අපි ඒ වැඩ පිළිවෙළ යොදනවා. අපි ඉතාමත් සතුටින් ප්‍රකාශ කරනවා, ඉදිරි කාලයේ දී අපට ගෑස් සම්පත ලැබෙයි කියලා. මන්නාරම් ද්‍රෝණියේ ඩොරඩෝ කියන ගෑස් ළිඳ බිමේ සිට කිලෝමීටර් 30ක් පමණ ඈතින් තමයි තිබෙන්නේ. ඒ ගෑස් ළිඳේ සාමාන්‍යයෙන් මීටර් 3,288කට යටින් අපට ගෑස් සම්පත හමු වී තිබෙනවා. ඊළඟට බරකියුඩා කියන දෙවෙනි ළිඳ අපට කිලෝමීටර් 68ක් ඈතින් තිබෙන්නේ. ඒකේ මීටර් 4,208ක් යටින් අපට ගෑස් සම්පත හමු වෙලා තිබෙනවා. දැන් මේ ගෑස් සම්පත මුහුදෙන් ගොඩට අරගෙන මිලියන 20ක් වුණු අපේ ජනතාවගේ සේවය සඳහා යොදවා ගැනීමේ කාලය එළැඹිලා තිබෙනවා. මේවා යොදා ගෙන එංගලන්තයේ කොම්පැනිවල, ස්කොට් කොම්පැනිවල, ඉන්දියානු කොම්පැනිවල ජාවාරම් කළ යුගය අවසන් කරලා මේක අපේ ජාතික මහා ධනය බවට පත් කර ගත යුතු යුගය එළැඹිලා තිබෙනවා. අපි අනිවාර්යයෙන්ම මේ සඳහා ජාතික තෙල් නිෂ්පාදන සමාගමක් බිහි කර ගත යුතුයි. ඒ ජාතික තෙල් නිෂ්පාදන සමාගම තමයි මේ රටේ ඊළඟ දශක තුනේ මේ රටේ අනාගතය තීරණය කරන්නේ; අපේ ජාතියේ අනාගතය තීරණය කරන්නේ; අපේ ජාතියේ ධනය තීරණය කරන්නේ; අපේ ගමන් මඟ තීරණය කරන්නේ. අන්න ඒ සඳහා වුණු මුල් පියවර අපි තබනවා, ජාතික ස්වයං පෝෂණයක් ඉන්ධනවලින් ලබා ගන්න.

අපේ දෙවෙනි ප්‍රතිපත්තිය තමයි ජාතික මිල ප්‍රතිපත්තියක් ඇති කිරීම. තෙල්වලට වාගේම විදුලි බලයට අපි කාටත් පෙනෙන, අපි කාටත් වග කියන, හැම කෙනාටම විනිවිද පෙනෙන සුලු මිල සූත්‍රයක් ඇති කර ගැනීම. අපි දැන් ඒ පිළිබඳව මූලික එකඟතාවන් ඇති කරගෙන තිබෙනවා. සියලුම ක්ෂේත්‍රයේ පිරිස් සමඟ අපි සාකච්ඡා ඇති කර ගන්නවා. අපි බලාපොරොත්තු වෙනවා ලබන මස වන විට මේ රටට පිළිගත හැකි ජාතික ඉන්ධන මිල ප්‍රතිපත්තියක් ඉදිරිපත් කරන්න පුළුවන් වෙයි කියලා. එතකොට බදු අය කිරීම් මඟින්, යටින් ගැහිලි මඟින්, ණය ගනුදෙනු මඟින් මේ බලශක්ති ක්ෂේත්‍රයට බලපෑම් එල්ල කරන්නේ නැතිව, ස්වාධීනව, ඒ වාගේම ස්වයංපෝෂිතව බලශක්ති ක්ෂේත්‍රය ඉදිරියට ගෙන යන්න හැකියාව ලැබෙයි කියලා අපි විශ්වාස කරනවා.

අපේ තුන්වෙනි කාරණය ආයතනික සුරක්ෂිතතාවයි. විශේෂයෙන්ම ලංකා විදුලිබල මණ්ඩලය ප්‍රමුඛ විදුලිය සපයන ආයතන, ඒ වාගේම ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඇතුළු ඛනිජ තෙල් සපයන ආයතන, ඉදිරි කාලයේදී ගෑස් සපයන ආයතන මූල්‍යමය වශයෙන් සුරක්ෂිත වෙන්නට ඕනෑ. මේ ආයතන මිලියන ගණන්, ට්‍රිලියන ගණන් ණයවලින් ගැති කරලා, ණයවලින් ඇද වට්ටන්නට දෙන්න බැහැ. මේ ආයතන මූල්‍යමය වශයෙන් ශක්තිමත් වෙන්නට ඕනෑ. ඒ වාගේම දූෂණ, වංචා, වැඩි වැටුප් වාගේ කාරණා සම්බන්ධයෙන් මේ ආයතනවලට එල්ල වෙලා තිබෙන චෝදනාවලින් නික්මිලා මේ ආයතන ජාත්‍යන්තර මට්ටමේ කාර්යක්ෂම ක්‍රියාවලියකට ගෙන එන්න ඕනෑ. අපි දැනට ලෝකයේ කාර්යක්ෂම කඩඉම් සකස් කරන Balanced Scorecard එක හඳුන්වලා දීලා තිබෙනවා, මේ ප්‍රධාන ආයතන සියල්ලටම. ඒ වාගේම අපි අනාගතයේදී ඒ ආයතන පාලනය කරන කළමනාකාරිත්වයටත් කුසලතා පදනම හඳුන්වා දෙන්නට කෙළින්ම ක්‍රියා කරනවා. ඒ මඟින් අපට පුළුවන් වෙයි කියලා බලාපොරොත්තු වෙනවා මේ ආයතන අන්තර්ජාතික මට්ටමට ඔසවා තබන්නට. අන්තර්ජාතික මට්ටමේ ජාතික ආර්ථිකයට, ඒ වාගේම රටේ මූල්‍ය පද්ධතියට ශක්තිමත් දායකත්වයක් ලබා දෙන්නට, රට ඉදිරියට ගෙන යන්නට පුළුවන් ජව සම්පන්න ආයතන බවට මේ ආයතන පත් කරන්නට අපි ක්‍රියා කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
මේ සේවාවන් මඟින් අපේ ජනතාවට ඉදිරි කාලයේදී ආර්ථික ප්‍රතිලාභ ලැබිය යුතුයි. අපි ඉතාම සතුටින් ප්‍රකාශ කරන්නට ඕනෑ, අද අපිට මේ රටේ සියයට 98ක් පමණ ගම්මාන විදුලියෙන් ආවරණය කරන්නට පුළුවන් වෙලා තිබෙන බව. මේ කලාපයේ අපි පමණයි ඒක කරලා තිබෙන්නේ. අද 24 පැයම අඛණ්ඩ විදුලි සැපයුමක්, අඛණ්ඩ ඛනිජ තෙල් සැපයුමක් ලබා දෙන්නේ අපි පමණයි. ඒක අපට ආඩම්බරයට කාරණයක්.

අපි ඊළඟට නවීන තාක්ෂණයත් සමඟ, විශේෂයෙන් තොරතුරු තාක්ෂණයත් සමඟ අපේ අනාගත විදුලි ජාලය, අපේ අනාගත ඛනිජ තෙල් ජාලය, අනාගතයේ ඉදි වෙන්නට යන ගෑස් ජාලය කියන මේ සියල්ලම පාරිභෝගිකයාට උචිත වන පරිදි විධිමත්කරණයට පත් කරන්නට ඕනෑ. විශේෂයෙන්ම අපි බලාපොරොත්තු වෙනවා අපේ විදුලි පද්ධතිය සුහුරු පද්ධතියක් බවට - smart grid එකක් බවට - පරිවර්තනය කිරීමට. අපි ඒ සඳහා පළමු, දෙවෙනි හා තුන්වෙනි පියවර ඉදිරියේදී තබනවා. පාරිභෝගිකයාට තමන්ගේ සේවය පිළිබඳව ප්‍රශ්න කරන්නට, තමන්ට ලැබෙන සේවයේ ගුණාත්මක භාවය ප්‍රශ්න කරන්නට අපි යනවා. අපිට විදුලි හිඟයක් තිබුණා. අපිට ඛනිජ තෙල් බෙදා හැරීමේ ගැටලු තිබුණා. ඒ අභියෝග ජය ගෙන අපි ඒ සේවාවන් ලබා දීලා තිබෙනවා. දැන් අපිට අවශ්‍ය වන්නේ ගුණාත්මක විදුලිය, ගුණාත්මක ඛනිජ තෙල් ලැබෙන යුගයකට රට ගමන් කරවීම තුළින් පාරිභෝගිකයාගේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමයි.

අපි අනාගත ලෝකය ගැන කල්පනා කරලා, අනාගත ලෝකයේ අභියෝග ජය ගන්නට, විශේෂයෙන්ම පාරිසරික ක්ෂේත්‍රයේ අභියෝග ජය ගන්නට පුළුවන් විධියේ කාර්යක්ෂම ඉන්ධන ක්ෂේත්‍රයක්, බලශක්ති ක්ෂේත්‍රයක් ගොඩ නගන්නට ඕනෑ. අපි ඉදිරියේදී බලාපොරොත්තු වෙනවා ප්‍රවාහන අමාත්‍යාංශය සමඟ ප්‍රමුඛතාවන් හඳුනා ගෙන විදුලි මෝටර් රථ, විදුලි දුම්රිය, විදුලි බස් රථ සහ හයිඩ්‍රජන්වලින් දුවන ප්‍රවාහන උපක්‍රම ක්‍රියාත්මක කරන්නට. ඒ තුළින් පමණයි ඉදිරි කාලයේ එළැඹෙන පාරිසරික අභියෝගවලට මුහුණ දෙන්නට අපට හැකියාව ලැබෙන්නේ. ඒ නිසා පරිසරයත් සමඟ තුලනාත්මකව ඉදිරියට යන හරිත සංවර්ධනයක ඉලක්ක සහිත බලශක්ති ප්‍රතිපත්තියක් අපි ඉදිරි දිගු කාලයේදී ඇති කර ගත යුතුයි. මේ කිසිම ප්‍රතිපත්තියකට පක්ෂ දේශපාලනයක් තිබිය යුතු නැහැ. මේ කිසිම ප්‍රතිපත්තියක් ඉදිරියට ක්‍රියාත්මක කිරීමේදී පාට දේශපාලනයක් තිබිය යුතු නැහැ. මොකද, බලශක්තිය කියන්නේ ආර්ථිකයේ ප්‍රධානතම ක්‍රියාදාමය. ඒ ක්‍රියාදාමය ඉදිරියට ගෙන යන්න නිශ්චිත ප්‍රතිපත්තියක්, නිශ්චිත උපාය මාර්ගයක් අපට තිබිය යුතුයි. එක එක ආණ්ඩුවලට වෙනස් උපක්‍රම තිබෙන්න පුළුවන්. නමුත් ප්‍රතිපත්තියත් උපාය මාර්ගයත් එකක් විය යුතුයි.

ඒ ක්‍රියාවලිය යම්කිසි ආකාරයකට පසු ගිය කාලය තුළ ගොඩනැගුණු බව මේ අතුරු අය වැය අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි. ඉදිරි කාලයේදී ඉතාම ශක්තිමත් විධියට ඒ බලශක්ති ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති මාලාව ක්‍රියාත්මක කිරීමට මේ පාර්ලිමේන්තුවේ දෙකට බෙදී තිබෙන පක්ෂ එකට එකමුතු වෙලා කටයුතු කරයි කියලා අපි බලාපොරොත්තු වනවා. අපේ දරුවන්ගේ සුබවාදී අනාගතයක් වෙනුවෙන් ඒ ශක්තිමත් ආර්ථික ජයග්‍රහණ ලබා ගන්න කටයුතු කරයි කියලා අපි බලාපොරොත්තු වනවා. විශේෂයෙන්ම නවෝත්පාදන ආර්ථිකයක අරුණලු නැඟෙමින් තිබෙන මේ මොහොතේ, ආසියාව ලෝකයේ බලගතුම ආර්ථික ජාලය බවට පත් වෙමින් තිබෙන මේ මොහොතේ එයට මුසු විය හැකි ශක්තිමත් ආර්ථිකයක අඩිතාලම ගොඩනැඟෙන බලශක්ති ක්ෂේත්‍රයක්, ශක්තිමත් මූල්‍ය ක්ෂේත්‍රයක් අපි ඇති කළ යුතුයි. ඒ වාගේම ජාවාරම්කරුවන්ට පමණක් නොවෙයි, පවුලේ හිතවතුන්ට පමණක් නොවෙයි සෑම ව්‍යවසායදායකයාටම සම

[ගරු පාඨලී චම්පික රණවක මහතා]

අවස්ථා ලැබෙන ඒ සම බිම ආර්ථිකය තුළ ගොඩනැගිය යුතු වනවා. ඒ අතර මේ ආර්ථික ක්‍රියාවලිය තුළ මේ රටේ දුප්පත් ජනතාවගේ දරුවන්ට, මේ ආර්ථික තරගයට එකතු වෙන්න බැරි ඒ අසරණ ජනතාවගේ දරුවන්ට ශක්තිමත් සමාජ ආරක්ෂණ දැලක් සමඟ අනාගතයේ අධ්‍යාපනයේ ශක්තියෙන්, තාක්ෂණයේ ශක්තියෙන් තරග කළ හැකි බිමක් ගොඩනැඟීමට අපි සියලු දෙනාම කැප විය යුතු බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
The next speaker is the Hon. Athauda Seneviratne. You have eight minutes.

[අ.භා. 3.02]

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතිරේක සංශෝධිත අය වැය ඉදිරිපත් කරමින් එක්තරා සහන මල්ලක් දෙන්න කටයුතු ආරම්භ කර තිබෙනවා. මේ සහන දීම ගැන කතා කරනකොට ජනතාවට යමක් ලැබෙනවා නම්, ජනතාවට සේවයක් වෙනවා නම් ඒකට මන්ත්‍රීවරු හැටියට අපි විරුද්ධ වන්නේ නැහැ. අපි පක්ෂයක් හැටියටත් තීන්දුවක් අරගෙන තිබෙනවා ඒවාට සහයෝගය දෙන්න. නමුත් මේ සහන මල්ල දිහා බැලුවාම ඒ සහන මල්ලේ හුහක් දේවල් ක්‍රියාත්මක කිරීමේදී බරපතළ තත්ත්වයකට මැදිහත් වෙන්න සිද්ධ වෙනවා. අද වන විට වී කිලෝවක මිල රුපියල් 50 දක්වා වැඩි කරලා තිබෙනවා. මේ තත්ත්වයන් තුළ ආර්ථිකයේ උද්ධමනය පාලනය කර ගන්න පිළිවෙළක් නැහැ. විදේශ විනිමයේ පිරිහීමක් සිදු වෙලා තිබෙනවා. ඒ අනුව මේ රටේ බත් කන මිනිසුන්ට තව මාස කීපයකින් රුපියල් 100කට සහල් මිලයට ගන්න සිද්ධ වෙනවා. සහල් මිල රුපියල් 100ට ඉහළ යයි. ඒක නිසා ජීවත් වීමේ සහනය වෙනුවට මහා අසහනකාරි තත්ත්වයකට පත් වෙන්න පුළුවන්. විශේෂයෙන්ම අද ගොවියාට වී ටික විකුණා ගන්නත් බැහැ. ගොවියාගේ වී ටික මිලයට ගැනීමට කොබ්බෑකඩුව මැතිතුමා කෘෂිකර්ම ඇමති කාලයේ ආරම්භ කරපු වී අළෙවි මණ්ඩලය එක්සත් ජාතික පක්ෂය විනාශ කෙරුවා. දැන් වී මිලට ගැනීම සඳහා පාවිච්චි කරන යාන්ත්‍රණය මොකක්ද? වී මිලට ගැනීම සඳහා තිබෙන ආයතනය මොකක්ද? දැන් වී මිලදී ගන්න කෙනෙක් නැහැ. ඒක නිසා වී මිලත් අඩු වෙලා තිබෙනවා. ඊළඟට සහල් මිලත් වැඩි වෙලා තිබෙනවා. මේ විධියට ඇති වී තිබෙන ගොවි බිමේ අසහනකාරි තත්ත්වයට මේ වැඩ පිළිවෙළෙන් සහනයක් ලැබෙන්නේ නැහැ.

ඊළඟට, "රුපියල් 10,000කින් පඩි වැඩි කරනවා" කියලා කිව්වා. දැන් රුපියල් 5,000ක් දෙනවා කියනවා. මේ රුපියල් 5,000 දෙන්නේ කොහොමද? මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පසු ගිය අය වැය ලේඛනයෙන් වැඩි කරපු මුදලට කොටසක් එකතු කරලාද මේ මුදල දෙන්නේ? න් තිබෙන ආරංචි, තොරතුරු අනුව පසු ගිය අය වැයෙන් වැඩි කරපු මුදලට තවත් මුදලක් එකතු කර තමයි රුපියල් 5,000ක් දෙන්නේ. කලින් අය වැය ලේඛනයෙන් වැඩි කරපු මුදලට තවත් මුදලක් එකතු කරලා තමයි රුපියල් 5,000 දෙන්න යන්නේ. රුපියල් 10,000ම දෙනවාට අපි කැමැතියි. ඒ නිසා රුපියල් 10,000ක් දෙන්න. අපි බලාපොරොත්තු වන්නේ එයයි. දැන් කියන හැටියට ජූනි මාසයේයි ඉතිරි මුදල දෙන්නේ. මේ රුපියල් 5,000ත් දෙන්න සූදානම් වන්නේ පසු ගිය අය වැය ලේඛනයෙන් වැඩි කරපු මුදලට මුදලක් එකතු කරලායි. මේක හරිද; නැත්නම් වැරදිද? මේ ගැන පැහැදිලි කර දෙන්න. ඊළඟට, ඒ වැඩි කරන මුදල මූලික පඩියට - basic salary එකට- එකතු කරනවාද, නැද්ද? ඒක දීමනාවක් - allowance එකක්- හැටියටද දෙන්නේ? ඒකත් පැහැදිලි කර දෙන්න. මහජනයාට කියපු ආකාරයේ සහනයක් නොවෙයි, ඒ පොරොන්දු වූ පිළිවෙළට නොවෙයි මේ පඩි වැඩි කිරීම කරන්න යන්නේ. ඒ නිසා මේ කාරණය ගැන පැහැදිලි කරගන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය අය වැය ලේඛනයෙන් මහින්ද රාජපක්ෂ මැතිතුමා ප්‍රකාශ කළා, විශ්‍රාමිකයන්ගේ වැටුප් විසමතාව ඉවත් කරනවාය කියා. එය ඉවත් කරනවාද? ඒ කාරණාව ක්‍රියාත්මක කරනවාද? මෙවර මොකක්ද කරන්නේ? පසු ගිය අය වැයෙන් විශ්‍රාමිකයන්ට මසකට රුපියල් 2,500ක් වැඩි කළා. ඒ වෙනුවට මෙවර රුපියල් 3,500ක් දෙන්න පොරොන්දු වුණා. ඒ රුපියල් 3,500 දෙන්නේ අර කියපු රුපියල් 2,500ට තව රුපියල් 1,000ක් එකතු කරලාය කියා තමයි ආරංචිය තිබෙන්නේ. ඉතින්, ඒක හරිද? එහෙමද දෙන්නේ? සහන කියා ඉදිරිපත් කරන්නේ මේවාද කියන එක තමුන්නාන්සේලා ජනතාවට පැහැදිලි කරලා දෙන්න; කරුණු ඉදිරිපත් කරන්න. මේ අනුව ජනතාව බලාපොරොත්තු වූ ආකාරයේ ගමනක් නොවෙයි මේ යන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප බලාපොරොත්තු වුණේ සීනි කිලෝවක මිල රුපියල් 10කින් අඩු කරනවා කියායි. ඊයේ හෝ පෙරේදා පත්තරයක තිබුණා, සීනි ගෙන්වන ව්‍යාපාරිකයකු කරපු පැහැදිලි කිරීමක්. ඔහු පැහැදිලි කර තිබුණා, දැන් රුපියලේ වටිනාකම බාල්දු වෙමින් යනවාය, ඩොලර් එකට රුපියල් වැඩි ගණනක් ගෙවන්න වෙනවාය, මෙන්න මේ තත්ත්වයයි තිබෙන්නේ, ඒ නිසා සීනි කිලෝවකින් රුපියල් 10ක් අඩු කර දෙන්න බැහැ, දැන් රුපියල් 6ක් තමයි අඩු කරන්න වෙන්නේ කියා. තවත් ටික කලක් යන කොට ඩොලර් එකට තවත් වැඩියෙන් ගෙවන්න වේවි. මේ තත්ත්වය තුළ ඒ රුපියල් 10න් කීයක සහනයක් ලැබේවිද දන්නේ නැහැ. එහෙම වුණාම සීනි ග්‍රෑම් 100ක් ගත්තොත්, ශත 50කවත් වාසියක් ලැබෙන්නේ නැහැ. ශත 50ක්වත් අඩු වන එකක් නැහැ. අර කියපු සහනය ලැබෙන්නේ නැහැ. ඒ අනුව බැලුවාම අද මේවා ක්‍රියාත්මක වන සහනයන් නොවන තත්ත්වයට පත් වෙන්න පටන්ගෙන තිබෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මෙතෙක් මතක් කළේ සහන ඉදිරිපත් කරපු ආකාරය පිළිබඳවයි. ඒ ගැන විතරක් නොව, අපි තවත් විශේෂ කාරණයක් ගැන මතක් කරනවා. ඒ තමයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය. අපි එයට ඡන්දය දෙනවා. විශාල උද්ඝෝෂණයකින් මහා පෙරළියක් කරනවා කියා තමුන්නාන්සේලා ඉදිරිපත් කරපු දේ තමයි ජනාධිපතිට තිබෙන අසීමිත බලතල නැති කරනවාය කියන එක. අන්න ඒක ඉක්මනින් කරන්න. අප ඉල්ලා සිටින්නේ එයයි. අප බලාපොරොත්තු වන්නේ එයයි. ඒ සංශෝධනය ඉක්මනට මේ ගරු සභාවට ඉදිරිපත් කරන්න. ඒ වාගේම, මේ මැතිවරණ ක්‍රමය වෙනුවට ආසන ක්‍රමය ගෙන එන්න. අපි ඒකට සහයෝගය දෙනවා. ඒක ඉක්මන් කරන්න. මේ රටේ ජනාධිපති ක්‍රමය සම්බන්ධයෙන් තිබෙන අර්බුදයටත් වඩා බිම් මට්ටමේ තිබෙන ලොකුම

දේශපාලන අර්බුදය තමයි දැනට පවතින අනුපාත ඡන්ද ක්‍රමය, දිස්ත්‍රික් මැතිවරණ ක්‍රමය. මේ දිස්ත්‍රික් මැතිවරණ ක්‍රමය නිසා අද බිස්නස්කාරයන්ට විතරයි මේ රටේ දේශපාලනය කරන්න පුළුවන්කම තිබෙන්නේ.

ඒ වාගේම ජාති භේද, ආගම් භේද, කුල භේද ශක්තිමත් කරන පදනමක් තමයි මේ ක්‍රමයෙන් ඇති වෙලා තිබෙන්නේ. ඒ කියන්නේ ඡන්ද දායකයින්ට ආසනයකට මන්ත්‍රීවරයෙකු නැහැ. ඒක නිසා මේ ක්‍රමය වෙනස් කිරීමට තමුන්නාන්සේලා පොරොන්දු වුණා. අපිත් ඒකට එකහයි. ඒ සඳහා අපි අත් දෙකම උස්සා ඡන්දය දෙන්නම්. දවස් සියයෙන් බැරි නම්, දවස් දෙසීයක්වත් අරගෙන මේ වැඩය අවසන් කරන්න. කොට්ඨාස මැතිවරණ ක්‍රමයට යන්න. මෙන්න මේ කාර්යය ඉෂ්ට කර දෙන්න කියා තමුන්නාන්සේලාට මම මතක් කරනවා. මාදුළුවාවේ සෝභිත හාමුදුරුවෝ, ඒ වාගේම රතන හාමුදුරුවෝ මේකට දායක වෙලා මේ කාලය තුළ බණ වෙනුවට මේ හා සම්බන්ධ දේවල් තමයි කිව්වේ. රැස්වීම් හා සාකච්ඡා පවත්වමින්, පත්තරවලින් කැඳවමින් මේක තමයි ඔබතුමන්ලා කිව්වේ. ඔබතුමන්ලා කියපු මෙන්න මේ ටික ඉෂ්ට කරන්න. ඒ සම්බන්ධයෙන් හඬක් ඇති කරන්න, රටට යන්න; "ඔන්න අපි ව්‍යවස්ථාවත් හැදුවා, වෙනස් කෙරුවා" කියා ඒ කාර්යය කරන්න. දවස් සියයේ වැඩ පිළිවෙළට අපි සහයෝගය දෙනවා. තමුන්නාන්සේලා මේ කාරණා ටික ඉෂ්ට කරන්න.

තමුන්නාන්සේලා එක පැත්තකින් කිව්වා, අපි ඡන්දයක් ඉලක්ක කර ගෙන තමයි මේවා ඔක්කෝම කෙරුවේ කියා. දැන් ඔබතුමන්ලා කරන්නේ මොකක්ද? දැන් ඔබතුමන්ලා තවත් එකක් කරනවා. ඒක තමයි, මේ පැත්තේ සිටින අයට දූෂණ තිබෙනවා කියා ඔබතුමන්ලා මඩ මල්ලක් දමනවා. අනික් පැත්තෙන් බඩු මල්ලක් දමනවා. බඩු මල්ලේ නම් එච්චර ප්‍රතිඵලයක් නැහැ. ඔබතුමන්ලා මේවා කරලා බලන්න කෝ. බඩු මල්ලයි, මඩ මල්ලයි; මේ දෙකෙන්ම මේ පැත්තට පහර ගහනවා. තරගයට සිටින අයට පහර ගහන්න යනවා. අනික් පැත්තෙන් මේ වාගේ සහන දෙනවා කියා ජනතාව අල්ලා ගන්න යනවා. මේ සහන ක්‍රියාත්මක වන්නේ නැහැ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
අවසාන කරන්න ගරු මන්ත්‍රීතුමා.

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
මම අවසාන කරනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බොහොම ස්තූතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට, ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.12]

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම රජය විසින් ඉදිරිපත් කරපු අය වැය සංශෝධන ගැන වචන කීපයක් කථා කරන්න ලැබීම ගැන මා සන්තෝෂ වනවා.

ඇත්ත වශයෙන්ම මේ දින 100 වැඩසටහන මේ ආණ්ඩුව විසින් ඉදිරිපත් කරපු ප්‍රධානම පොරොන්දුවක්. මේ පොරොන්දුව ඉෂ්ට කරන්න තමයි මේ අය වැය ඉදිරිපත් කළේ. එය ඉදිරිපත් කරනකොට රටට දීපු විශාලම විශ්වාසය තමයි, ඇති කරපු බලාපොරොත්තුව තමයි, ජනතාවට අත්‍යවශ්‍ය ද්‍රව්‍ය 10ක මිල අඩු කරනවාය කියන එක. ඊට පස්සේ අය වැය ඉදිරිපත් කර කිව්වා, "ඔන්න අත්‍යවශ්‍ය ද්‍රව්‍ය 13ක මිල අඩු කළා" කියා. ඒ ද්‍රව්‍ය 13 අරගෙන බැලුවාම අපට පැහැදිලි වන දෙයක් තමයි, ජනතාවගේ බලාපොරොත්තු ඉෂ්ට වන ආකාරයට මේ දේ සිද්ධ වෙලා නැහැයි කියන එක. මිල අඩු කර තිබෙන ද්‍රව්‍ය මොනවාද කියා බැලුවාම කහ, කොත්තමල්ලි ඒ වාගේම පාන් පිටි වැනි ජනතාව දිගින් දිගටම පාවිච්චි කරන ද්‍රව්‍යයන් නොවෙයි කියන එක අද පැහැදිලි වෙලා තිබෙනවා.

ඒ වාගේම අපි මෙහි තවත් කනගාටුදායක තත්ත්වයක් දකිනවා. පසු ගිය කාලයේ මේ රටේ මිනිස්සු විශාල වශයෙන් පාන් පිටිවලින් සැකසූ ආහාර ගන්න පුරුදු වෙලා හිටියා. පහසුවට; ලේසියට පාන් පිටිවලින් සැකසූ දේ තමයි හුඟ දෙනෙක් ආහාරයට ගත්තේ. නමුත්, අපි මේ තත්ත්වය වෙනස් කළා. වෙනස් කර හාල් සහ හාල් පිටිවලට ජනතාව නැඹුරු කරන්න අපට පුළුවන්කම ලැබුණා. පසු ගිය කාලයේ ඇති කරපු ඒ ප්‍රවණතාව මේ වනකොට බොහෝ දුරට ප්‍රචලිත වෙලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම පාන් පිටි බොහෝ රෝගවලට හේතු වන ආහාරයක්. ඒ නිසා පාන් පිටි කනවාට වඩා බත් හෝ හාල් පිටිවලින් සැකසූ ආහාර ගන්න මිනිස්සු පුරුදු වුණා. නමුත්, දැන් ඒක නැවත වරක් ආපස්සට හරවන්න මේ ආණ්ඩුව පාන් පිටිවල මිල යම් කිසි ප්‍රමාණයකින් අඩු කර තිබෙනවා.

වී කිලෝවකට රුපියල් 50ක සහතික මිලක් නියම කර ඒ මුදලට වී මිලට ගන්න දැන් මේ ආණ්ඩුව කටයුතු කර ගෙන යනවා. රුපියල් 50කට වී මිලට ගැනීම හොඳ දෙයක්. මොකද, එය ගොවියන්ගේ සාක්කුවට මුදල් එන ක්‍රමයක්. හිටපු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඉදිරිපත් කරපු අය වැයෙනුත් වී සඳහා රුපියල් 40ක සහතික මිලක් නියම කළා. රුපියල් 32ට තිබුණු සහතික මිල එතුමා රුපියල් 40 දක්වා වැඩි කළා. එහෙම වැඩි කිරීමේ පරමාර්ථය ගොවියා දිරිමත් කිරීමයි. ගොවියා පුළුවන් තරම් වී ගොවිතැනට නැඹුරු කර ඔහුව දිරිමත් කරන්නයි ඒ දේ කළේ. මම හිතන්නේ වී කිලෝවක සහතික මිල රුපියල් 50 කළ මේ ආණ්ඩුවේ පරමාර්ථයත් ඒකයි. නමුත්, ප්‍රශ්නය ඒක නොවෙයි. ඒ පිටුපස බැඳුණු තව ප්‍රශ්නයක් තිබෙනවා. වී කිලෝවක් රුපියල් 50ට අරගෙන හාල් කිලෝ එකක් හදන්න අඩුම වශයෙන් වී කිලෝ එක හමාරක්වත් යනවා. එතකොට වීවලට රුපියල් 75ක් වැය වනවා. ඊළඟට ප්‍රවාහන ගාස්තු, වී මෝල් ගාස්තු -කොටන්න වාගේම පොලිෂ් කරන්න වාගේ දේ සඳහා- අඩු වශයෙන් තව රුපියල් 25ක් වැය වනවා.

ඊළඟට, වෙළෙන්දාට දුන්නාම වෙළෙන්දා හාල් කිලෝවකින් රුපියල් 10කවත් ලාබයක් කියා ගන්නවා. ඒ අනුව අඩුම වශයෙන් හාල් කිලෝවක මිල රුපියල් 110ක් වෙනවා. හාල් කිලෝවක් රුපියල් 110ක් වෙනකොට, තමුන්නාන්සේලා පාන් පිටිවල මිල යම් කිසි ප්‍රමාණයකින් අඩු කරලා, ජනතාවට කියන්නේ මොකක්ද? හාල් පරිභෝජනයට වඩා පිටි පරිභෝජනය ලාබයි කියන එකයි. එතකොට පාන් පිටි පරිභෝජනය කිරීමේ ප්‍රතිපත්තිය වෙනස් වෙලා බත් කන්න, හාල් පිටිවලින් තැනූ ආහාර ගන්න පුරුදු වුණු ප්‍රතිපත්තිය නැති වෙලා යනවා. ඒක සෞඛ්‍යමය වශයෙන් අහිතකර කාරණයක් පමණක් නොවෙයි, රටේ විදේශ විනිමය හිඟයකටද විශාල වශයෙන් මුල් වෙනවා. මොකද, පිටරටින් තමයි පාන් පිටි ගෙන්වන්න ඕනෑ. හාල් මිල වැඩි වුණාම, හාල් මිලට ගැනීමත් අඩු වෙනවා. හාල් මිලට ගැනීම අඩු වුණාම වී ගොවියා ධෛර්යවත් කරලා, ඔහු ලවා වී නිෂ්පාදනය කිරීමට තමුන්නාන්සේලා ක්‍රියාත්මක කරන්න හදන ප්‍රතිපත්තියත් එතැනම ලොප් වෙනවා. මේ ප්‍රතිපත්තිය නිසා සම්පූර්ණයෙන්ම ඒ වැඩ පිළිවෙළ අසාර්ථක වෙනවාය කියන එක කියන්න ඕනෑ.

[ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා]

හිටපු රාජ්‍ය පරිපාලන අමාත්‍යවරයා වශයෙන් මම මතක් කරන්න ඕනෑ, 2005 දී මේ රටේ හිටියේ රාජ්‍ය සේවකයන් ලක්ෂ 4ක්ය කියන එක. නමුත් මේ වනකොට ඒ ප්‍රමාණය මිලියන 1.3ක් වෙලා තිබෙනවා. රජයේ සේවයට වැඩියෙන් බඳවා ගැනීම තුළින් ගම්බද සිටින උගත් තරුණ තරුණියන්ට පරිපාලන ක්ෂේත්‍රයට ඇතුල් වෙන්න, රජයේ පරිපාලනයට දායක වෙන්න අවස්ථාව ලැබුණා. ඒ අයට රැකියාවකට ඇතුල් වෙන්න අවස්ථාව ලැබීම තුළින් පෞද්ගලිකව ඒ අයගේ ජීවිත ආලෝකවත් කර ගන්න හැකි වනවා. මේ ආකාරයේ හුඟක් ප්‍රයෝජන ලැබෙනවා. ඒ පරමාර්ථ ඉෂ්ට කර ගන්න තමයි පහුගිය කාලය තුළ අපි විශාල වශයෙන් රාජ්‍ය සේවය ව්‍යාප්ත කළේ. රාජ්‍ය සේවයට පඩි වැඩි කිරීම අප දිගින් දිගටම කථා කළ දෙයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්තරා කාලයක අපේ දේශපාලන වේදිකාවේ ප්‍රධාන මාතෘකාව වුණේ හාල්. හාල් නිකම් දෙනවාද ඇහුවා. හඳෙන් හරි හාල් ගෙනත් දෙනවාය කියා අප කිව්වාය කියා සමහර අය කිව්වා. හාල් මිල අඩු වැඩි වෙනවාද යනාදී කාරණා තමයි 1970 ගණන්වල, 1980 ගණන්වල දේශපාලන වේදිකාවේ කථා වුණේ. නමුත් දැන් හාල් ගැන නොවෙයි කථා වෙන්නේ. අද අපේ රටේ රාජ්‍ය සේවකයන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. අද රාජ්‍ය සේවකයන් සමාජයේ විශාල කොටසක් වෙලා තිබෙනවා. ඒ නිසා රාජ්‍ය සේවකයන්ගේ පඩි වැඩි වීම තමයි අද හුඟක් වෙලාවට දේශපාලන වේදිකාවේදී ඉලක්ක වෙන්නේ. එක පක්ෂයක් කියනවා, ඒ අය රුපියල් 2,500ක් දෙනවාය කියා. අනික් පක්ෂය කියනවා, ඒ අය රුපියල් 10,000ක් දෙනවාය කියා. මෙවර රාජ්‍ය සේවකයන්ට රුපියල් 10,000ක් දෙනවාය කියා ආණ්ඩු පක්ෂය පොරොන්දු වුණා. ඒ වාගේම පහුගිය අය වැයෙන් අපි රජයේ සේවකයන්ගේ පඩි වැඩි කරලා පෙන්නුවා. රජයේ සේවකයන්ට දිගින් දිගටම දීමනාවක් - allowance එකක්- දුන්නා. ඒකට කිව්වා "එල්ලලා දෙනවා"ය කියා. පඩියට එකතු කරලා දුන්නේ නැහැ, ඒ මුදල විශ්‍රාම වැටුපට එකතු වෙන්නේ නැහැ, අනිකුත් දීමනාවලට එකතු වෙන්නේ නැහැ, ඒ නිසා එල්ලලා දෙන මේ දීමනාවෙන් -allowance එකෙන්- වැඩක් නැහැ කියා ඒ අය කිව්වා. ඒ නිසා පහු ගිය අය වැයෙන්, ඒ දීපු allowance එක රුපියල් 10,000 දක්වා වැඩි කළා. ඊ ළඟට තවත් රුපියල් තුන්දාස් ගණනක් පඩියට එකතු කළා. කොයි විධියකින් හරි මේ ආකාරයට රුපියල් 15,000කට කිට්ටු මූලික පඩියක් අතට ලැබෙන විධියට හැදුවා. අද මේ සියල්ලම කණපිට පෙරළී තිබෙනවා කියා මම හිතනවා.

ඊයේ පෙරේදා භාණ්ඩාගාරයේ නිලධාරියෙක් පුවත් පත්වලට ප්‍රකාශ කර තිබුණා, පහුගිය කාලයේ අය වැයෙන් රජයේ සේවකයන්ට අන්තර් දීමනාවක් වශයෙන් රුපියල් 3,000 ගණනේ ගෙව්වාය කියා. ඒ රුපියල් 3,000ට අමතරව මේ රජයෙන් පෙබරවාරි මාසයේ සිට තවත් රුපියල් 5,000ක් දෙන්න බලාපොරොත්තු වෙනවා. ඒක බොහොම හොඳයි. රුපියල් 10,000ක් දෙනවාය කියා තමයි පොරොන්දු වුණේ. තවත් රුපියල් 2,000ක් ජූනි මාසයේදී දෙනවාය කියා තිබෙනවා. එතකොට සම්පූර්ණ මුදල රුපියල් 10,000යි. එතකොට අර රුපියල් 3,000ත්, පෙබරවාරි මාසයේදී දෙනවාය කියන රුපියල් 5,000ත්, ජූනි මාසයේදී දෙනවාය කියන රුපියල් 2,000ත් යන මේ සියල්ලම එකතු වුණාම ලැබෙන රුපියල් 10,000 මූලික වැටුපට එකතු වන මුදලක් නොවෙයි. භාණ්ඩාගාර නිලධාරියා කියන විධියට ඒක එල්ලා දෙන දීමනාවක් විතරයි. ඒක නොවෙයි, රජයේ සේවකයන් බලාපොරොත්තු වුණේ. ඒ අයට වුවමනා වුණේ මූලික පඩියේ වැඩි වීමක්. පඩිය වැඩි වුණොත් තමයි ඒ ගොල්ලන්ගේ විශ්‍රාම වැටුප වැඩි වෙන්නේ. ඒ නිසා තමුන්නාන්සේලා මේවා ගැනත් කල්පනා කරන්න ඕනෑ. මොකද, මේ දින සියයේ වැඩ පිළිවෙළට අපි සහයෝගය දෙන්න තීරණය කළේ, අපට වඩා හොඳින් ජනතාව වෙනුවෙන් මේ සේවය කරයි කියන බලාපොරොත්තුව අප තුළ තිබුණු නිසායි. නමුත් අද ඒවා එකින් එක ලොප් වෙලා යනවා.

තව ලොකුවට කථා කළ දෙයක් තමයි, විවාහයක් ලියා පදිංචි කිරීමේදී රුපියල් 5000ක් ගෙවන්න ඕනෑය කියන කාරණය. විවාහ වෙන හැම කෙනෙක්ම මේ රුපියල් 5000 ගෙවිය යුතු නැහැ. ලොකු හෝටල්වල මංගල උත්සව පවත්වන විට විවාහ රෙජිස්ට්‍රාර්වරයා එතැනට යන්නට ඕනෑ. එම නිසා රුපියල් 5000ක් දක්වා එය වැඩි කළා. ඒ රුපියල් 5000න් රුපියල් 3500ක් රජයට යනවා. අනෙක් රුපියල් 1500 යන්නේ විවාහ රෙජිස්ට්‍රාර්වරයාටයි. ගෙදරක විවාහය ලියා පදිංචි කරනවා නම්, නැත්නම් විවාහ රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යාලයට ගිහින් විවාහය ලියා පදිංචි කරනවා නම් රුපියල් 5000ක් ගෙවිය යුතු නැහැ. එවිට ගෙවිය යුත්තේ රුපියල් 1000යි. එහෙමයි ඒක තිබුණේ. නමුත් මේ අය වැය සංශෝධනයෙන් යෝජනා කර තිබෙනවා, ඒ රුපියල් 5000ක මුදල රුපියල් 1000 දක්වා අඩු කිරීමට. ඒක හොඳයි. මේ රුපියල් 1000 අද කෙළින්ම යන්නේ ආණ්ඩුවටයි. අද විවාහ රෙජිස්ට්‍රාර්වරයාට කිසිම දෙයක් නැහැ. රෙජිස්ට්‍රාර්වරුන්ගේ සංගමය අද ඒ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීමට සූදානම් වනවා. ඒ අය, හිටපු ඇමතිවරයෙකු වශයෙන් මාවත් හමු වුණා. "අපිට මොකුත් නැති තත්ත්වයක් දැන් ඇති වෙලා තිබෙනවා" කියා ඒ අය කියනවා. විවාහ රෙජිස්ට්‍රාර්වරයාගේ නීත්‍යානුකූල ගාස්තු ගැනීම මේ අය වැයෙන් ප්‍රකශ වෙලා නැහැ. එතකොට ඔහු විවාහ වෙන අයගෙන් අත යටින් ගණනක් ගන්න ඕනෑ. විවාහ වෙන අයට ගෙවන්නය කියා නීතියෙන් බල කරන්නට පුළුවන් රුපියල් 1000යි. මේ කාරණයේදී මෙවැනි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා.

ඊළඟට මා විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ, මන්දිර බද්ද - Mansion Tax එක- ගැන.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
I was given 10 minutes, but I could not have exhausted that. I think I am entitled to, at least, another three minutes. - [*Interruption.*]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වර්ග අඩි 5000ට වැඩි නිවාසවලින් රුපියල් මිලියනයක් බදු වශයෙන් අය කරන්න යනවා. මේක ඇත්තවශයෙන්ම ඉතා අසාධාරණ බව පේනවා. මොකද, නොයෙක් දෙනා ඇවිත් මේ සම්බන්ධව අද දුක් ගැනවිලි කියනවා. මොකද අප දන්නවා, සමහර අය පර්චස් පහළොවක, විස්සක ඉඩම් කැබැල්ලක් අරගෙන, තමන්ට ඉන්න ළමයින් තුන් හතර දෙනාට තට්ටු නිවාසයක් -තට්ටු තුන හතරක නිවාසයක්- හදනවා. හදලා එක ළමයාට එක තට්ටුව බැගින් දෙනවා. එහෙම කරන සමහර අය ඉන්නවා. [බාධා කිරීමක්] Condominiums නොවෙයි. මා කියන්නේ නිවාස ගැන. මොකද, ඉඩම් මිල වැඩියි. කොළඹ හා අවට තදාසන්න ප්‍රදේශවල ඉඩම් මිල විශාල වශයෙන් වැඩියි. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. මට තව විනාඩි දෙකයි තිබෙන්නේ. ළමයින් තුන් දෙනෙක් ඉන්නවා නම් ඒ ළමයින් තුන් දෙනාට ගෙවල් තුනක් හදනවා නම් ඉඩම් කැබලි තුනක් ගන්න ඕනෑ. ඒක අමාරුයි. එම නිසා පර්චස් විස්සක විතර ඉඩමක් අරගෙන තට්ටු තුනක විතර ගෙයක් හදලා, අර දරුවන් තුන් දෙනාට එක තට්ටුව බැගින් දෙනවා. ඒක තමයි හුඟක් වෙලාවට

කෙරෙන්නේ. රජයේ සේවකයන් වන දෙමව්පියෝ එහෙම කරනවා. ඒ වාගේම විදේශවල ඉන්න අයත් කොහොම හෝ සල්ලි හම්බ කරලා මෙහාට එවලා තට්ටු දෙකක තුනක ගෙයක් හදලා, තමන්ගේ සහෝදර සහෝදරියන්ට දෙනවා. තමන්ගේ සහෝදරියෝ විවාහ කර දෙන්නෙත් ඒ වාගේ ගෙවල් හදලා තට්ටුව බැගින් දීලායි. ඒ අයට මේ නිවාස සඳහා මිලියනය බැගින් බදු ගෙවන්න කිව්වාම ඒක ඉතා අමාරු කාර්යයක්; අපහසුවක්. අද ඒ අය විශාල අපහසුවකට පත් වෙලා තිබෙනවා. අද හුඟ දෙනෙක් මේ කාරණය සම්බන්ධව මැසිවිලි නඟන බව මම දන්නවා.

කම්කරු ඇමතිවරයා වශයෙන් කටයුතු කළ නිසා මා මේ කාරණයත් කියන්නට ඕනෑ. මේ රටේ විශාල කොම්පැනිවල අඩුම වශයෙන් දෙදාහක්වත් සේවය කරනවා. මිලියන 2000ට වඩා ලාභ ලබන ඒ ආයතනවල වැඩ කරන විශාල සේවක සංඛ්‍යාවකගේ අද රැකියා ආරක්ෂා වෙලා තිබෙන්නේ ඒ සමාගම් ගෙන යන කාර්යක්ෂම තත්ත්වය නිසායි. නමුත් අද ඒ ගොල්ලන්ගෙන් සියයට 25ක් බදු වශයෙන් අය කරන්නට හදනවා. අනෙක් කාරණය මේ බද්ද අය කරන්නේ පසු ගිය වර්ෂයට ලැබුණු ලාභයටයි. පසු ගිය වර්ෂයේ ආදායම් බදු ගෙවලා, ඒ අයගේ ඉතිරි වුණු ලාභයෙන් තව සියයට 25ක් ගන්න හදනවා. ඒ අනුව, මේ ආයතනවල රැකියාව කරන හුඟක් සේවකයන්ට රැකියා අහිමි වන තත්ත්වයක් තිබෙනවා. ඒ අයගේ සුබසාධන දීමනා, සුබසාධන කටයුතු ඒ වාගේම bonus ගෙවීම් වාගේ දේවල් හුඟක් නතර වෙනවා. ඒ විතරක් නොවෙයි. සේවකයෝ හුඟ දෙනෙක් සේවයෙන් නෙරපන්න මේ තත්ත්වය හුඟක් හේතු වෙනවා. එම නිසා මේ සම්බන්ධයෙන් නැවත සලකා බලන්නය කියා මා ඉල්ලා සිටිනවා.

මම තව එක කරුණක් කියන්නට ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පසු ගිය කාලයේ රජයේ සේවකයන්ට motorcycles බෙදුවා. නමුත් සමහර දිස්ත්‍රික්කවලට බෙදුවේ නැහැ. පසු ගිය රජයෙනුත් රත්නපුර, කෑගල්ල, ගම්පහ යන දිස්ත්‍රික්කවලට බෙදුවේ නැහැ.

මම දැන ගන්න කැමැතියි, මුදල් ඇමතිතුමාගෙන් ඒ අයටත් බයිසිකල් බෙදනවාද කියලා. මොකද, බයිසිකල් බෙදීම මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය වුණා. තමුන්නාන්සේලා බයිසිකල් නොමිලේ දෙනවා කිව්වා. ඒ වාගේම රජයේ සේවකයන්ගෙන් ගත්ත රුපියල් 50,000 ආපසු දෙනවා කිව්වා. ඒවා ගැන වචනයක්වත් අද සඳහන් වන්නේ නැහැ. ඒ නිසා මේ කාරණය ගැනත් අවධානය යොමු කරවමින් මගේ වචන කීපය අවසන් කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
The next speaker is the Hon. Lakshman Kiriella. You have 15 minutes.

[අ.භා. 3.26]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Plantation Industries and Leader of the House of Parliament)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අය වැය ඉදිරිපත් කරන්න කලින් ඉන්ධන මිල අඩු කරලා සහනයක් දුන්නා. අය වැයෙන් අත්‍යවශ්‍ය භාණ්ඩ 13ක මිල අඩු වුණා. මේ මිල අඩු කිරීම් සියල්ලම අපි ගණනය කර තිබෙනවා. මේ මිල අඩු කිරීම් සියල්ලම ගණනය කළාම, එක පවුලකට මාසයකට රුපියල් 7,500ක ඉතිරියක් තිබෙනවා. තමුන්නාන්සේලා ඒක අධ්‍යයනය කරලා නැහැ. නමුත් ඉන්ධන මිල අඩු කිරීම, ඒ වාගේම අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල අඩු කිරීම සමස්තයක් වශයෙන් ගත්තාම එක පවුලකට මාසයකට අවම වශයෙන් රුපියල් 7,500ක ඉතිරියක් තිබෙනවා. ලංකාවේ ජීවත් වන හැම පවුලකටම මේ වාසිය ලැබෙනවා. තමුන්නාන්සේලාට කියන්න පුළුවන් මේක මැතිවරණ අය වැයක් කියලා. ඒක වෙන්න පුළුවන්. නමුත් මේ සහනය ඇත්ත. The benefit is real.

මහ බැංකුවේ සංඛ්‍යාලේඛන අනුව අපේ රටේ ජනතාවගෙන් සියයට 45කගේ දෛනික ආදායම ඩොලර් දෙකයි. රුපියල් 260ක දෛනික ආදායමක් ලබන ජනතාවක් තමයි සියයට 45ක් ඉන්නේ. පසු ගිය රජය විවිධ ගොඩනැඟිලි හැදුවාට, විවිධ ඇස්බැන්දුම් වැඩ කළාට ඇත්ත වශයෙන්ම ජනතාවගේ බඩගින්න ගැන හිතලා නැහැ. ඒක පසු ගිය ජනාධිපතිවරණයේදී අපි දැක්ක දෙයක්. විශේෂයෙන්ම අපේ මහනුවර දිස්ත්‍රික්කය වැඩි ඡන්ද 88,000කින් දිනුවා. අපි යන හැම තැනකම බඩගින්න ගැන කථා කළා. ඒ වාගේම අපේ දිස්ත්‍රික්කයේ ඉන්න ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෝ විශාල පිරිසක් අපට ඡන්දය දුන්නා, බඩගින්න නිසා. ඉතින් මට පුදුමයි, සමාජවාදී ආණ්ඩුවක් කියා ගත්ත ඒ ආණ්ඩුව ජනතාවගේ බඩගින්න ගැන හිතුවේ නැති එක ගැන. සමහර පවුල්වල දවසට එක වේලයි කන්නේ. සමහර පවුල්වල මස් මාළු කන්නේ දරුවෝ විතරයි; දෙමව්පියෝ කන්නේ නැහැ. ඒ වාගේ තත්ත්වයක් තමයි උදා වෙලා තිබුණේ. ඇත්ත වශයෙන්ම බඩගින්න, දුප්පත්කම පසු ගිය කාලය තුළ ශීඝ්‍රයෙන් වැඩි වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම ගැන ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු කථා කළා. පසු ගිය රජය දෙවතාවක් ජනාධිපතිවරණවලදී පොරොන්දු දුන්නා, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවාය කියලා. පසු ගිය රජයට ඒ සඳහා තුනෙන් දෙකේ බලය තිබුණා. නමුත් ඒක කළේ නැහැ. ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මැතිවරණ ක්‍රමය සංශෝධනය කිරීමට කොමිටියක් තිබුණා. දැන් අවුරුදු 12ක් තිස්සේ එතුමා ඒ කොමිටියේ මූලාසනය දරනවා. මැතිවරණ ප්‍රතිසංස්කරණ පිළිබඳ කමිටුව පත් කරලා දැන් අවුරුදු 12ක්. ආණ්ඩුවට තුනෙන් දෙකේ බලය තිබුණා. නමුත් ආණ්ඩුව ඒ ප්‍රතිසංස්කරණය කළේ නැහැ. ආණ්ඩුව විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කළේත් නැහැ; මැතිවරණ ක්‍රමය වෙනස් කළේත් නැහැ. ඒ සඳහා ආණ්ඩුවට දේශපාලන වුවමනාවක් තිබුණේ නැහැ. අන්න ඒකයි වෙනස. අපට තුනෙන් දෙකේ බලයක් නැති වුණාට ඒවා කරන්න දේශපාලන වුවමනාවක් තිබෙනවා. ඒ නිසා තමයි අද තමුන්නාන්සේලා කියන්නේ ඒවා කරන්න කියලා. තමුන්නාන්සේලාගේ පක්ෂයේ හිටපු තමුන්නාන්සේලාගේ නායකයාට මේ කටයුත්ත කරන්න දේශපාලන වුවමනාවක් තිබුණේ නැහැ. අපි ජනාධිපතිවරණයේදී ප්‍රකාශ කළ ආකාරයට, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ පනත, ස්වාධීන කොමිෂන් සභා ඇති කිරීමේ පනත, තොරතුරු දැන ගැනීමේ අයිතිය සම්බන්ධ පනත ඇතුළු සියලු පනත් ඉතාම ඉක්මනින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන බවට තමුන්නාන්සේලාට පොරොන්දු වෙනවා.

පසු ගිය කාලයේ ආණ්ඩුව කොච්චර උත්සාහ දැරුවත් මේ රටට ආයෝජන ආවේ නැහැ. මහ බැංකු වාර්තාව අනුව අවුරුද්දෙන් අවුරුද්දට අපේ රටේ ආයෝජන අඩු වුණා. ඇත්ත වශයෙන්ම මට පෙනෙන හැටියට පසු ගිය ආණ්ඩුව ණයයි, ආයෝජනයි පටලවා ගෙන තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය රජය ගත්ත ඒවා ආයෝජන නොවෙයි, ණය. හම්බන්තොට වරාය ගත්තත්, අනෙකුත් ව්‍යාපෘති ගත්තත් ඒ ඔක්කෝම ණය. ඒ හැම ශතයක්ම අපි ආපසු ගෙවන්න ඕනෑ.

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

නමුත් ආයෝජන කියන්නේ ඒවා නොවෙයි. ආයෝජන කියන්නේ පිට රට සිටින ධන කුවේරයෝ ඒ ගොල්ලන්ගේ මුදල් අරගෙන ඇවිල්ලා, ලංකාවේ ඉඩම් අරගෙන, ලංකාවේ කර්මාන්තශාලා විවෘත කරලා, රැකියා ලබා දීලා, නිෂ්පාදන කටයුතු කරන එක. ඒක තමයි ආයෝජනය කියන්නේ.

මීට මාස තුන හතරකට කලින් මම රනිල් වික්‍රමසිංහ අපේ නායකතුමා එක්ක චීනයේ තානාපතිතුමා හමු වුණා. මම චීන තානාපතිතුමාට පැහැදිලිවම කිව්වා, අපට ණය නොවෙයි ඕනෑ, ආයෝජන කියලා. ඔබතුමන්ලාගේ රටේ සිටින කෝටිපති ව්‍යාපාරිකයන් අපේ රටට එවලා කර්මාන්තශාලා විවෘත කරන්න, ගොවි ගම්මාන ආරම්භ කරන්න කිව්වා. අන්න ඒවා තමයි අපට අවශ්‍ය. ඔබතුමන්ලාගේ මුදල් අරගෙන ඇවිත් මේ රටේ හෝටල් හදලා, කර්මාන්තශාලා හදලා රැකියා භාර පන්සියයක් දෙන්න කිව්වා. අන්න ඒවා තමයි අපේ රටට අවශ්‍ය, ණය නොවෙයි. නමුත් පසු ගිය ආණ්ඩුව කාලයේ අපේ රටට ඒ වාගේ ආයෝජන හම්බ වුණේ නැහැ. පසු ගිය ආණ්ඩුවට ආයෝජන හම්බ වුණේ නැති නිසා ණය ගන්න සිද්ධ වුණා. පසු ගිය ආණ්ඩුවට ඇයි ආයෝජන ආවේ නැත්තේ? මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පසු ගිය ආණ්ඩුව කාලයේ අපට ආයෝජන ආවේ නැත්තේ අපේ රට මුළු ලෝකයෙන්ම කොන් වෙලා සිටිය නිසායි. අපට විරුද්ධව ජාත්‍යන්තර සංවිධානවල යෝජනා සම්මත වුණා. පසු ගිය රජය අග්‍රවිනිශ්චයකාරතුමිය එළවා දැම්මා. ඒ වාගේම මේ රටේ තිබුණ අවනීතිය, නීතිවිරෝධී ක්‍රියා, මර්දන ක්‍රියා යන මේ සියල්ලම නිසා අපේ රට ජාත්‍යන්තර වශයෙන් කොන් වෙලා හිටියේ. ඒ විධියට ජාත්‍යන්තරව කොන් වුණාම කිසිම රටකට ආයෝජන එන්නේ නැහැ. ඒකයි අපේ රටට වුණේ. මහින්ද රාජපක්ෂ මැතිතුමා හිතුවා, යුද්ධය අවසන්, දැන් සාමය තිබෙනවා කියලා. සාමය තිබුණොත් ඇති කියලා හිතුවා. නමුත් සාමයත් සමඟ ප්‍රජාතන්ත්‍රවාදය තිබෙන්න ඕනෑ; යහ පාලනය තිබෙන්න ඕනෑ; අවනීතිය නැති කරන්න ඕනෑ; සුළු ජාතීන්ට හොඳට සලකන්න ඕනෑ. මේ සියලු කරුණු සම්පූර්ණ කළාම තමයි රටක් ගැන විශ්වාසයක් ඇති වෙන්නේ. පසු ගිය ආණ්ඩුවට ඒ විශ්වාසය ඇති කරන්න බැරි වුණා. එතුමා ලොකුවට කිව්වා, "මම ජනාධිපති වුණාට පස්සේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම කර්මාන්ත ශාලාවක් විවෘත කරලා රැකියා 500ක් දෙනවා" කියලා. නමුත් එක කර්මාන්ත ශාලාවක් විවෘත කළේ නැහැ. තිබෙන කර්මාන්තශාලා වහපු එක තමයි කළේ. Tandon Lanka (Pvt.) Limited කියලා computer memory chips හදන කර්මාන්ත ශාලාවක් මහනුවර පල්ලේකැලේ තිබුණා. එක්තරා වකවානුවක ඒ කර්මාන්ත ශාලාවේ සේවකයන් 3,500ක් වැඩ කළා. ඒක සම්පූර්ණයෙන්ම වසා දැම්මා. ඇඟලුම් කර්මාන්තශාලා සම්පූර්ණයෙන්ම වසා දැම්මා. ඒවා ආරක්ෂා කළේ නැහැ.

පසු ගිය කාලයේ ඇමෙරිකානු ජනාධිපති බැරැක් ඔබාමා බුරුමයට ගියා. එතුමා සමඟ ආයෝජකයන් සියයක් බුරුමයට ගියා. ගිහිල්ලා, ඒ අයගේ සල්ලිවලින් ඉඩම් අරගෙන, ඒ අයගේ සල්ලිවලින් කර්මාන්තශාලා විවෘත කරලා, භාණ්ඩ අපනයනය කරලා, පසු ගිය අවුරුදු එකහමාර දෙක ඇතුළත තුන් භාරසියයකට රැකියා දෙන කර්මාන්තශාලා 124ක් විවෘත කළා. ඒ වාගේ ආයෝජකයන් පසු ගිය කාලයේ අපේ රටට ආවාද? එක්කෙනෙක්වත් ආවේ නැහැ. ගිනි පොලියට ණය අරගෙන ඒ ණය ගෙවන්න බැරි වුණාම මොකක්ද වෙන්නේ? අපේ දේපළ සින්න වෙන එක තමයි වෙන්නේ. ඒ නිසා අද හොඳ අවස්ථාවක් අපට ලැබිලා තිබෙනවා. අපේ රට පියවරෙන් පියවර යන මේ ගමනේදී අපි ආරාධනා කරනවා, විදේශ රටවල්වල සිටින අයට අපේ රටට එන්න කියා. සිංහල ඩයස්පෝරාව වාගේම ද්‍රවිඩ ඩයස්පෝරාවකුත් ඉන්නවා. අපි ඒ අයට කියනවා, ලංකාවට ඇවිල්ලා උතුරු නැගෙනහිර ප්‍රදේශ දියුණු කරන්න කියලා. ඒ අය එන්න සූදානම්.

මට මතකයි, 2001 - 2004 එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ පිට රට ඉන්න විශාල ව්‍යාපාරිකයන් ලංකාවට එන්න පොරොන්දු වුණා. නමුත් අපේ ආණ්ඩුව ඇද වැටීමත් සමඟම ඒ අය ආපස්සට ගියා. ඉතින් අද හොඳ අවස්ථාවක් ලැබිලා තිබෙනවා. රාජ්‍ය නායකයෝ අද පොරකනවා ලංකාවට එන්න. ඉදිරි කාලයේදී තමුන්නාන්සේලාට ඒක බලා ගන්න පුළුවන්. පසු ගිය කාලයේ ඒ වාගේ තත්ත්වයක් තිබුණාද? පිළිගත් රාජ්‍යයන්වලින් අපට ආරාධනා තිබුණේ නැහැ. අපට ආරාධනා ආවේ අප්‍රිකාවෙන්, එහෙමත් නැත්නම් ජාත්‍යන්තරව කොන්වෙලා තිබුණු රටවලින් තමයි අපට ආරාධනා ආවේ. නමුත් අද එහෙම නොවෙයි. අද අපට ආරාධනා එනවා. අපේ නායකයන්ටත් පිට රට යන්න අවස්ථාවක් ලැබෙනවා. එම නිසා අද ක්‍රම ක්‍රමයෙන් ලංකාව ජාතීන් අතර පිළිගන්නා තත්ත්වයකට පත් වෙනවා.

රටක ආර්ථික දියුණුවට එක සාධකයක් පමණක් ප්‍රමාණවත් වෙන්නේ නැහැ. ඒකට සාධක ගණනාවක් තිබෙනවා. රටේ සාමය තිබෙන්න ඕනෑ; නීතියක් තිබෙන්න ඕනෑ. පසු ගිය රජය අග්‍රවිනිශ්චයකාරතුමිය අස් කරපු වේලාවේ ලෝකයේ සෑම රටකම තිබෙන නීතිඥ සංගම් ඒක හෙළා දැක්කා. එක්සත් ජාතීන්ගේ නීතිඥ සංගමය එය හෙළා දැක්කා; පොදු රාජ්‍ය මණ්ඩලීය නීතිඥ සංගමය එය හෙළා දැක්කා. අද අග්‍ර විනිශ්චයකාරතුමියගේ පත් කිරීම ලෝකයේ හැම කෙනකුම පිළි අරගෙන තිබෙනවා. There is an acceptance. ඒක තමයි අවශ්‍ය. ඉදිරියේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරන්න අපට වුවමනාවක් තිබෙනවා. මේ සියල්ල ඉදිරියට අරගෙන යෑමට අපට වුවමනාවක් තිබෙනවා. රජය පොරොන්දු වෙලා තිබෙනවා, අපට සහයෝගය ලබා දීමට. අපි අද Parliamentary Business Committee එක රැස් වුණු වේලාවේ තීරණය කළා, අවශ්‍ය පනත් කෙටුම්පත් - තොරතුරු දැන ගැනීමේ අයිතිය සම්බන්ධයෙන්, ස්වාධීන කොමිෂන් පත් කිරීම සම්බන්ධයෙන් වූ පනත් කෙටුම්පත් - පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ පසුව, පාර්ලිමේන්තුව දිනපතා වුණත් රැස් වෙලා මේ පනත් කෙටුම්පත් සම්මත කර ගන්න. මොකද, මම කලින් කිව්වා වාගේ අපට දේශපාලන වුවමනාවක් තිබෙනවා, මේවා කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය දිහා බලන කොට අප හැම ජන කොටසකටම ඒ අවශ්‍ය සහන ලබා දීලා තිබෙන බව පෙනෙනවා. එක ජන කොටසකට නොවෙයි, හැම ජන කොටසකටම වාගේ අප සහන ලබා දීලා තිබෙනවා. තමුන්නාන්සේලා එළියට ගිහින් කථා කළොත්, සියයට 100ක සහයෝගය හා ආශීර්වාදය මෙම අය වැයට ලැබී තිබෙනවා කියන එක දැන ගැනීමට පුළුවන් වෙයි. අපි ගරු රවි කරුණානායක මැතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම අප එතුමාට සුබ පතනවා. එක්සත් ජාතික පක්ෂය කියන්නේ ධනපතියන්ගේ ආණ්ඩුවක්ය; එක්සත් ජාතික පක්ෂය පොඩි මිනිහා ආරක්ෂා කරන්නේ නැහැ කියන සංකල්පය මේ අය වැයෙන් සම්පූර්ණයෙන්ම බිඳ වැටුණා. මේ අය වැයෙන් පොඩි මිනිහාට සහන ලබා දීමට අප මුදල් සොයා ගත්තේ මහා පරිමාණ ව්‍යාපාරිකයන්ගෙන් බදු අය කරලායි. අවුරුද්දකට ආදායම රුපියල් මිලියන 2,000ක් ලබන 35 දෙනෙකු මේ රටේ සිටිනවා. ඔවුන්ගෙන් සියයට 20ක, 25ක බද්දක් අය කළාම මේ රටේ සාමාන්‍ය ජනතාවට ඒ අවශ්‍ය සහන ලබා දෙන්න පුළුවන්. නමුත් පසු ගිය ආණ්ඩුවට මහා පරිමාණ ව්‍යාපාරිකයන්ගෙන් බදු අය කිරීමට වුවමනාවක් තිබුණේ නැහැ; දේශපාලන වුවමනාවක් තිබුණේ නැහැ.

ඊයේ එක මන්ත්‍රීතුමෙක් කිව්වා වාගේ සමහර නායකයෝ ළමයින් බදා ගත්තා; අම්මලාත් බදා ගත්තා. නමුත් කිරිපිටි මිල අඩු කළේ නැහැ. කිරිපිටි මිල දවසින් දවස වැඩි කළා. අපි එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව විධියට මේ රටේ සාමාන්‍ය ජනතාව ගැන හිතලා තිබෙනවා. මොකද, අපි අවුරුදු ගණනාවක් මෙම පක්ෂයේ සිටියා. එම නිසා අප සාමාන්‍ය ජනතාවගේ දුක, අසහනය ගැන

දන්නවා. මම සතුටු වෙනවා, මාසයක් ඇතුළත අප පොරොන්දු වුණු ඒ සහන ජනතාවට ලබා දීමට හැකි වීම ගැන. ස්තූතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
The Hon. Jayarathna Herath may speak next. You have 10 minutes.

[අ.භා 3.39]

ගරු ජයරත්න හේරත් මහතා
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)
මුලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය ජනාධිපතිවරණ ප්‍රතිඵලත් එක්ක බහුතරයක් නැතුව පාර්ලිමේන්තුව තුළ කටයුතු කරන අපේ අග්‍රාමාත්‍යතුමා ප්‍රමුඛ ගරු මන්ත්‍රීතුමන්ලා ඉදිරිපත් කර තිබෙන මේ ඡන්ද අය වැය සම්බන්ධව වචන කිහිපයක් මේ උත්තරීතර සභාවේ කථා කරන්න අවස්ථාව ලැබීම ගැන ස්තූතිවන්ත වෙනවා. අපේ ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා බොහොම අලංකාර විධියට, බොහොම උද්දාමයෙන් මේ අය වැය සම්බන්ධව කථා කළා.

මුලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන්ම මතක් කරන්නට ඕනෑ, මේ රටේ පසු ගිය දේශපාලන ඉතිහාසය තුළ විවිධ අවස්ථාවල විවිධ ඛේදවාචක මේ රට තුළ උද්ගත වෙලා, රටේ සාමාන්‍ය ජනතාව බරපතළ විධියට පීඩාවට පත් වෙලා අනේකවිධ දුක් වේදනා, කම්කටුලු එක්ක ජීවත් වුණු කාල පරිච්ඡේදයක් පසු කර තමයි ඇවිල්ලා තිබෙන්නේ කියන එක. එක්සත් ජාතික පක්ෂය අවුරුදු 17ක් රට පාලනය කළා. අද මැතිවරණ පොරොන්දුවක් දීලා තිබෙනවා, විධායක ජනාධිපති ධුරයේ බලතල ආහෝසි කරන බවට. මම හිතන්නේ මේ ප්‍රශ්නය නිර්මාණය කරන ලද්දේත් එක්සත් ජාතික පක්ෂයයි. එක්සත් ජාතික පක්ෂය තමයි, හා හා පුරා කියලා විධායක ජනාධිපති ධුරයක් හදලා විශාල බලතල කන්දරාවක් එම ධුරයට පවරලා, මේ තුළ යම් බරපතළ අර්බුදකාරි තත්ත්වයක් උද්ගත කරන්නට අවශ්‍ය බීජය රෝපණය කළේ.

මෙහෙම ආපු එක්සත් ජාතික පක්ෂය තමයි 1977 වසරේ සිට අවුරුදු 17ක්ම මේ රටේ මිනිසුන්ට ජීවත් වීමේ අයිතිය අහිමි කරලා බරපතළ විධියට පීඩාවට පත් කළේ. මහ පාරේ තැන් තැන්වල මිනී; වළලන්න මිනිහෙක් නැතිව බල්ලෝ කපුටෝ කනවා; එවැනි ඉතාම අවිචාරවත් සමයක් මේ රටේ ගොඩ නැඟුණු යුගයක් තිබුණා. මිනී මරන එක, ඒ තිබෙන අවිචාරවත් සමය මෙරටින් තුරන් කරලා මිනිසුන්ට සාමකාමීව ජීවත් වෙන්න අයිතිය ලබා දෙන්න කියලායි ඒ කාලේ මිනිසුන් ඉල්ලුවේ. 1994 වසරේ මිනිසුන්ගේ මැතිවරණ සටන් පාඨය වුණේ ඒකයි. එදා මේ රට සාමාකාමී කරන්න, මිනිසුන්ට නිදහසේ ගෙදර ඉන්න, ඒ මිනී මැරුම් නවත්වන්න, ඒ තත්ත්වය පාලනය කරන්න චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියට මිනිසුන් 1994 දී ඡන්දය ලබා දුන්නා. ඒ මේ රටේ තිබුණු අසංවර තත්ත්වය සමනය කරන්නයි. ඊට පස්සේ 2005 වසරේ දී මහින්ද රාජපක්ෂ මැතිතුමාට මිනිසුන් ඡන්දය ලබා දෙන්නේ මේ රටේ තිබුණු කාලකණ්ණි, කෘරතර යුද්ධය අවසන් කරන්න. ජනාධිපතිවරු ගණනාවකගේ අතින් ගිලිහුණු යුද්ධය අවසන් කර ගන්න බැරිව, කිසිම දෙයක් කර කියා ගන්න බැරිව සිටි සමයක, එල්ටීටීඊ සංවිධානය එක්සත් ජාතික පක්ෂයේ රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ ඉඳලාම මුළු කැබිනට් මණ්ඩලයේ 3/4ක් පමණ සමූල ඝාතනය කරලා එක්සත් ජාතික පක්ෂයට යන එන මං නැති සමයක තමයි මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා යුද්ධය අවසන් කරන්නේ.

ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා 2005 වසරේ බලයට පත්වෙලා, යුද්ධය අවසන් කරලා, රට ගොඩ නඟලා මේ ගත වෙච්ච කාල සීමාව තුළ යම් සංවර්ධනයක් මේ රටේ ඇති කළා. දැන් මිනිසුන්ට නිදහසේ ඉන්න පුළුවන්; නිදහසේ කථා කරන්න පුළුවන්; නිදහසේ ඡන්ද පොළට යන්න පුළුවන්.

ඊට පසුව මිනිසුන්ට අවශ්‍ය වෙනවා, යහ පාලනය. ඒ යහ පාලනය කියන මාතෘකාව පදනම් කරගෙන තමයි මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට මිනිසුන් ඡන්දය ලබා දුන්නේ. දැන් රට සාමකාමීයි; රට නිදහස්; යුද්ධයක් නැහැ. දැන් මිනිසුන් ගෙවල්වලින් ඇදගෙන ගිහිල්ලා පාරවල්වල පුච්චන්නේ නැහැ. මේ සියල්ල අවසන් වෙලා සමාජය ඉතා උසස් මට්ටමකට පත් වන විට, මිනිසුන් යහ පාලනයට යම් කිසි ප්‍රතිචාරයක් දැක්වූවා. එහි ප්‍රතිඵලය තමයි මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මේ රටේ ජනාධිපතිවරයා විධියට සමස්ත ජනතාවම තෝරා පත් කර ගන්නේ. මෙය තමයි පසු ගිය කාල වකවානුව තුළ මේ රටේ දේශපාලන විකාශනයත් එක්ක අපේ රටේ ඇති වෙච්ච තත්ත්වය. හැබැයි, එක්සත් ජාතික පක්ෂයේ අගමැතිතුමා ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලයට අපි කියනවා, යහ පාලනය පිළිබඳව තමුන්නාන්සේලාගේ මේ දින සියයේ වැඩ පිළිවෙළ හඳුන්වලා දෙන්නට ඉඩ ප්‍රස්ථාව දෙන්න ඕනෑ නිසා තමයි අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බහුතරයක් සිටින සන්ධානය, මේ සුළුතරයක් ඉන්න එක්සත් ජාතික පක්ෂයට මේ තනතුරු තානාන්තර එක්ක මේ පාර්ලිමේන්තුව තුළ සහ මේ රට තුළ කටයුතු කරන්නට ඉඩ ප්‍රස්ථාව සලසා දී තිබෙන්නේ කියන එක. ඒ ගැන වැරැදි අවබෝධයක් ගන්නට එපා.

විධායක ජනාධිපති විධියට මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට මේ රට පාලනය කරන්නට බලය පැවරුවා මිසක්, රනිල් වික්‍රමසිංහ මහත්මයාට, මේ සුළුතරයකට, අගමැතිකම දරන්නට මිනිසුන් බලය පවරලා නැහැ. රනිල් වික්‍රමසිංහ මහත්මයාට ඒ බලය ලබා දීලා තිබෙන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ අපියි. ඒ නිසා තමුන්නාන්සේලා අපි ලබා දීලා තිබෙන සහයෝගය වැරැදි විධියට අර්ථකථනය කර ගෙන ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන්ට හිරිහැර කරන්න, විවිධ අඩන්තේට්ටම් කරන්න, ඉතිහාසයේ කරපු මිලේච්ඡ වැඩ කරන්න සූදානම් වෙන්න එපා. ඊයේ පෙරේදා සිදු වුණු වත්තල සිද්ධියේ දී මතක් වෙන්නේ මොන ඇමති තනතුරු තානාන්තර ගත්තත් "නරියාට කැලේ දකින කොට හූ කියන්නේ නැතිව ඉන්න බැහැ" කියන කියමනයි ගරු මන්ත්‍රීවරුනි. ඒක තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇති වෙලා තිබුණු තත්ත්වය. ඒ නිසා ඊයේ පෙරේදා සිදු වුණු සිද්ධිය මොකක් වුණත්, ඉදිරියේදී මේ රටේ සාමකාමීව මේ දෙපාර්ශ්වයටම මේ දින සියයේ වැඩ පිළිවෙළ තුළ ආත්මගරුත්වයක් ඇතිව කටයුතු කරන්න පුළුවන් පරිසරයක් ඇති කරන්න මේ උගත් බුද්ධිමත් අග්‍රාමාත්‍යවරයා ප්‍රමුඛ ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මැති ඇමතිතුමන්ලා බොහොම වගකීමෙන් යුතුව හිතට ගත්තොත් හොඳයි කියලා අප මේ අවස්ථාවේදී සිහිපත් කරනවා.

මූලාසනය හොබවන ගරු මන්ත්‍රීතුමනි, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා කථා කළා, හිටපු අග්‍ර විනිශ්චයකාරතුමා ඉවත් කිරීම පිළිබඳව. එතුමා, ඒක නැවත නැවත උද්දීපනය කරමින් හෝද හෝදා මඩේ දානවා. ඒක පැහැදිලිවම සරල ප්‍රශ්නයක්. ඕනෑම මිනිහෙකුට තේරුම් ගන්න පුළුවන්. රටේ අග්‍ර විනිශ්චයකාරවරයා ඉවත් කිරීම පිළිබඳව පැහැදිලි නෛතික බලයක් තිබෙන්නේ මේ උත්තරීතර සභාවටයි. ඉන් පරිබාහිරව ගත්ත තීන්දුවක් තුළ තමයි මේ වැරැදි ආදර්ශයක් ලැබිලා තිබෙන්නේ. කොයි හැටි වෙතත් අපි විශේෂයෙන් මේ කාරණය මතක් කරන්න ඕනෑ. මේ අය වැය ලේඛනයට ඉදිරිපත් වෙලා තිබෙන සමහර කාරණා අවබෝධයෙන් තොරව ඉදිරිපත් කරලා

[ගරු ජයරත්න හේරත් මහතා]

තිබෙනවාද කියලා අපට පොඩි ගැටලු සහගත තත්ත්වයක් තිබෙනවා.

මන්දිර බද්ද ගැන බලන්න. මේ මන්දිර බද්ද කියලා කියන කොට හුඟ දෙනෙක් උපකල්පනය කරන්න ඇති, මහා මන්දිර පිළිබඳව. මහා මන්දිරත් අතළොස්සක් නැතුවා නොවෙයි. එහෙම ඒවා තිබෙනවා. නමුත් මේ පනත ගෙනාවට පස්සේ මොකක්ද සිදු වෙන්නේ? කොළඹ නගරයේ පර්චස් 8, 10, 15 වැනි බොහොම සුළු -සොච්චම්- ඉඩම් ප්‍රමාණයක් තමයි ඉතුරු වෙලා තිබෙන්නේ. ව්‍යාපාරික ස්ථාන සඳහා මිනිස්සුන්ට ලබා ගන්න තිබෙන ඉඩකඩ හුඟක් අඩුයි. ඒ නිසා හුඟක් වෙලාවට කුලී පදනම මත, බදු පදනම මත තමයි යම් යම් ව්‍යාපාරිකයන් මේ නගරයට ඇවිල්ලා තමන්ගේ වෙළඳහෙළඳාම් කරන්න සුදුසු පරිසරයක් සඳහා ගොඩනැඟිලි තෝරා ගන්නේ.

ඉඩම් අයිතිකාරයා මේක මහල් අටකින්, දහයකින් ගැහුවොත් ව්‍යාපාරිකයන් දහ දොළොස් දෙනෙකුට මේක කුලියටවත් ගන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි මෝඩ තීන්දු අරගෙන ඒ මිනිස්සු අධෛර්යට පත් වුණොත්නේ වෙන්නේ මේ නගරයේ මිනිස්සු ආයේ අලුතෙන් ගොඩනැඟිලි හදන්නේ නැති වෙන එකයි. ඒ ගොල්ලෝ මහලකින්, දෙකකින් වැඩේ නවත්වනවා. එහෙම වෙන කොට වෙන්නේ ඒ නගරයට ඒකාරාශී වෙන, සේන්දු වෙන වැඩි ව්‍යාපාරික සංඛ්‍යාවකට ඒ නගරයේ වෙළඳහෙළඳාම් කරන්න තිබෙන ඉඩ ප්‍රස්ථාව අහිමි වෙලා යන එකයි. ඒ නිසා මම ඉතාම ගෞරවයෙන් කියනවා, මේ යෝජනාව සංශෝධනය කරන්න කියලා. ඉතාමත් අතළොස්සකට අයිති මේ සොච්චම් ඉඩම් ප්‍රමාණයෙන් වැඩි ඵලදායී ප්‍රතිඵලයක් ලබා ගන්න පුළුවන් වෙන විධියට, වැඩි පාරිභෝගික සංඛ්‍යාවකට අවශ්‍ය සහයෝගය දෙන්න පුළුවන් වන විධියට, ඔවුන්ට සත්කාර කරන්න පුළුවන් වන විධියට ඒ නගරවල මේ ව්‍යාපාරික ස්ථාන අලුතෙන් ගොඩ නඟන්න ඔවුන් ධෛර්යවත් කරන්න මේක සංශෝධනය කිරීම වඩාත් උචිතයි, කාලෝචිතයි කියන එක මම විශේෂයෙන් මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද තිබෙන්නේ සම්පූර්ණ මාධ්‍ය සංදර්ශනයක්. මැතිවරණ ඉලක්ක කරලා අය වැය ඉදිරිපත් කරනවා. මැතිවරණ ඉලක්ක කරලා අද ලංකාවේ තිබෙන සියලුම නාලිකා එකට එකතු වෙලා දේශපාලන මතයක් තහවුරු කරන්න ගන්නා උත්සාහයක් හැටියට තමයි අපි දකින්නේ. අපි කියන්නේ මේ ආණ්ඩුව හරි, කොයි ආණ්ඩුව හරි, මොන පුරවැසියා හරි යම් කිසි අපරාධයකට සම්බන්ධ නම් ඒකට අවශ්‍ය නිසි පරීක්ෂණ තියලා, ඒකට අවශ්‍ය මූලික විමර්ශන කරලා, ඒකට නඩුවක් ගොනු කරලා, "බී" වාර්තාවක් උසාවියට ඉදිරිපත් කරලා, ඒක විභාග කරලා තීන්දුවක් දෙනවා මිසක් මෙවැනි සංදර්ශන පැවැත්වීම වඩාත් කාලෝචිත නැහැ කියන එකයි.

අපේ ගමක මිනී මැරුමක් වුණොත් මේ විධියට පත්තරවල, රූපවාහිනියේ යන්නේ නැහැ. පොලීසියේ CID එක එනවා. මිනී මරුවා හඳුනා ගන්නවා. ඒ මිනිහා උසාවියට දානවා. දීර්ඝ නඩු විභාගයකින් පස්සේ, නඩුව ඔප්පු වුණොත්නේ එල්ලුම් ගස් යාවි. නැත්නම් අවුරුදු 20කට, 30කට හිරේට යාවි. මේක තමයි නීතියේ තිබෙන සාමාන්‍ය සම්ප්‍රදායික තත්ත්වය. මෙයින් පරිබාහිරව මාධ්‍ය උපයෝගී කරගෙන ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ අපේ ගරු මන්ත්‍රීවරුන්ටත්, අපේ පාක්ෂිකයන්ටත් මේ කරන බරපතළ හිරිහැරය වහාම නවත්වන්නට අද කාලය උද්ගත වෙලා තිබෙනවාය කියන එක මම විශේෂයෙන්ම ගරු අග්‍රාමාත්‍යතුමා ප්‍රමුඛ එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන ගරු අමාත්‍යතුමන්ලාට බොහොම කාරුණිකව මතක් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු ජයරත්න හේරත් මහතා
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)
අපි ප්‍රතිපත්තියක් විධියට මේ දින 100 වැඩ පිළිවෙළ පිළිබඳව සහයෝගය දෙන්නට යම් කිසි නිගමනයකට ඇවිල්ලා තිබෙනවා. අපේ විපක්ෂ කණ්ඩායම සාකච්ඡා කරලා ඒ පිළිබඳව තීන්දුවක් ලබා ගන්න උත්සාහ කරන වෙලාවක්. කොයි හැටි වෙතත්, අද මේ වැඩ පිළිවෙළ පිළිබඳව තමුන්නාන්සේලා රටට යම් සාර්ථක වැඩ පිළිවෙළක් ගෙන ගිහින්, මිනිස්සුන්ට යම් ප්‍රතිලාභයක් දෙන්න උත්සාහ කරනවා නම් ඒකට අපි තමුන්නාන්සේලා එක්ක එකඟ වෙනවාය කියන කාරණයත් මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තූතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
The next speaker is the Hon. Douglas Devananda. You have 12 minutes.

[பி.ப. 3.50]

ගරු ඩග්ලස් දේවානන්ද මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, புதிய அரசாங்கத்தின் இந்த வரவு செலவுத்திட்ட முன்மொழிவுகள் மக்களின் வாழ்க்கைச் சுமையைப் பல வழிகளிலும் குறைப்பதற்கு ஏதுவாக அமைந்திருக்கின்றபடியால் நாங்கள் பிரதம அமைச்சர் அவர்களிடமும் ஜனாதிபதி அவர்களிடமும் அவற்றுக்கு ஆதரவளிப்பதாகக் குறிப்பிட்டிருக்கின்றோம். இருந்தபோதிலும், சமையல் எரிவாயுவைப் பொறுத்தவரையில் அது கொழும்பில் ஒரு விலைக்கும் வடக்கு, கிழக்கில் ஒரு விலைக்கும் விற்கப்படுகின்றது. அதாவது, போக்குவரத்துச் செலவைக் காரணங்காட்டி அந்த விலைக் குறைப்பிலிருந்து மீறிய வகையில் அது விற்பனை செய்யப்படுகின்றது. அந்த வகையில், நிதி அமைச்சர் கௌரவ ரவி கருணாநாயக்க அவர்கள் அதைக் கவனத்திலெடுத்து நாடு தழுவிய ரீதியில் அந்த விலைகளைச் சமப்படுத்த வேண்டும். அதாவது விலைகள் குறைக்கப்பட்டிருந்தாலும் எல்லா இடங்களிலும் அந்த நடைமுறை கடைப்பிடிக்கப்படுவதாகத் தெரியவில்லை. ஆனபடியால் அதில் கூடிய கவனம் செலுத்த வேண்டும் என்று நான் கேட்டுக்கொள்கின்றேன்.

நீண்டகால ஆட்சியில்தான் பிரச்சினைகளுக்குத் தீர்வு காண முடியும் என்ற ஒரு கொள்கையை வைத்துத்தான் நாங்கள் கடந்த ஜனாதிபதித் தேர்தலில் எங்களுடைய பிரசாரத்தை முன்னெடுத்திருந்தோம். அந்த வகையில் எங்களுடைய அந்தக் கொள்கைகளுக்கு வாக்களித்த மக்களுக்கு மீண்டும் இந்தச் சபையில் நான் நன்றி கூறக் கடமைப்பட்டிருக்கின்றேன். அதேநேரத்தில் ஓர் ஆட்சி மாற்றம் தேவை என்ற வகையில் நாடு தழுவிய ரீதியில் வாக்களித்த மக்களுடைய உணர்வுகளுக்கு மதிப்பளித்து, முன்வைக்கப் பட்டிருக்கின்ற இந்த 100 நாள் வேலைத்திட்டத்துக்கு நாங்கள் எங்களுடைய ஆதரவை விமர்சனத்தோடு முழுமையாக முன்வைப்பதாகக் குறிப்பிட்டிருக்கின்றோம்.

வடக்கு, கிழக்கில் போருக்குப் பின் பல உட்கட்டமைப்பு வேலைகளைக் கடந்த அரசு செயற்படுத்தி வந்தது. அவை தற்சமயம் இடைநிறுத்தப்பட்டிருப்பதாகத் தெரிகின்றது. ஆனால், கடந்தகால அரசாங்கத்தின் அந்த உட்கட்டமைப்பு வேலைகளைத் தொடர வேண்டும் என்று இந்தப் புதிய அரசின் ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்களிடமும் பிரதம அமைச்சர் ரணில் விக்கிரமசிங்க அவர்களிடமும் நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன். ஏனென்றால் வடக்கு, கிழக்கு மக்கள் கடந்த காலங்களில் மாற்றாந்தாய் மனப்பான்மையோடு நடத்தப்பட்டதால் அந்தப் பிரதேசங்களின் அபிவிருத்தியில் பின்னடைவு காணப்பட்டது. அதேபோல யுத்த அழிவுகளினாலும் அந்தப் பிரதேசத்தில் பின்னடைவுகள் காணப்பட்டபடியால் தென்னிலங்கையோடு சமப்படுத்துகின்ற வகையில் அங்கு அந்த உட்கட்டமைப்பு வேலைகள் உட்பட, அபிவிருத்தி வேலைகளுக்கு கூடிய முன்னுரிமை கொடுத்துச் செயற்பட வேண்டும் என்று நான் கேட்டுக்கொள்கின்றேன்.

நிதியமைச்சர் அவர்கள் தன்னுடைய உரையில், விசேடமாக வட மாகாணத்திலிருந்து வெளிநாடுகளுக்குப் புலம்பெயர்ந்தவர்கள் இந்த நாட்டின் அபிவிருத்திச் செயற்பாட்டுக்குப் பங்களிக்கின்ற வகையில் 5 வருட முதிர்வைக் கொண்ட 4.5 சதவீத நிலையான வட்டிக்கு 25,000 அமெரிக்க டொலர் பெறுமதியான குறைந்த முதலீட்டு எல்லைக்குக்கீழ் 'தேசிய அபிவிருத்திப் பிணைகள்' வழங்குவதாக முன்மொழிந்திருக்கின்றார். அதை நாங்கள் வரவேற்கின்றோம். அதேநேரத்தில் இந்த அரசு இரட்டைக் குடியுரிமை நடைமுறைகளைத் தளர்த்தியிருப்பதனையும் வரவேற்கின்றோம்.

வடக்கு, கிழக்கைப் பிறப்பிடமாகக் கொண்ட எமது மக்களில் அனேகமானோர் யுத்தம் காரணமாக வெளிநாடுகளில் புலம்பெயர்ந்திருப்பதனால் எங்களுடைய பகுதிகளில் சனத்தொகை விகிதாசாரம் குறைந்திருக்கின்றது. அதனால், யாழ்ப்பாண தேர்தல் மாவட்டத்துக்குரிய சட்டமன்ற ஆசனங்களின் எண்ணிக்கை தற்பொழுது 11இலிருந்து 07ஆகக் குறைந்திருக்கின்றது. அதனை ஈடுசெய்கின்ற வகையில், இங்கு பிறந்து வளர்ந்து வெளிநாடுகளில் புலம்பெயர்ந்து இருக்கின்ற எமது மக்களுக்கும் வாக்குரிமை கொடுக்கக்கூடிய வகையில், சட்ட ஏற்பாடுகளைச் செய்யுமாறு கேட்டுக்கொள்கின்றேன். தேசிய அபிவிருத்திப் பிணைகளை வழங்க முன்வருகின்ற அரசாங்கம், இரட்டைக் குடியுரிமை வழங்குவதில் இருந்த நடைமுறைகள் தளர்த்தப்படுவதனால், அதனுடன் சேர்த்து அந்த மக்களுக்கும் இங்கு வாக்களிக்கக் கூடிய நிலைமையைச் சட்டரீதியாக ஏற்படுத்துமாறு கேட்டுக்கொள்கின்றேன்.

அடுத்து, பாதுகாப்புப் படையினரிடம் இருக்கின்ற நிலங்கள் சம்பந்தமாகக் குறிப்பிட வேண்டும். எங்களுடைய கடந்த ஆட்சிக் காலத்தில், நாங்கள் கிட்டத்தட்ட மூன்றில் இரண்டு பகுதிக்கும் அதிகமான நிலங்களை விடுவித்து மக்களிடம் கொடுத்துள்ளோம். மேலும் எஞ்சியுள்ள நிலங்களையும் இந்தப் புதிய அரசாங்கம் விடுவிக்கவேண்டும் என்று கேட்கின்ற அதேநேரத்தில், அவற்றை விடுவிக்கும் என்று நான் நம்புகின்றேன். ஏனென்றால், அந்த நிலம் மக்களுக்குச் சொந்தமானது என்பதனாலும் அவை விவசாயம் செய்யக்கூடிய வளமான நிலங்களாக இருக்கின்றபடியினாலும் நிச்சயமாக அந்தக் காணிகளை மக்களுக்கு வழங்கவேண்டும். அத்துடன், அங்கு பாதுகாப்புக்காக வைத்திருக்கின்ற படைத் தரப்பினருடைய எண்ணிக்கையையும் குறைக்க வேண்டும். அங்கு எத்தனையோ தரிசு நிலங்கள் இருக்கின்றன. அவர்களுக்குத் தேவையென்றால், அந்த மாவட்டத்துக்குரிய முகாம்களின் எண்ணிக்கைக்கு ஏற்றவகையில், அரச காணிகளில் முகாம்களை அமைக்கலாம் என்று நான் இந்தச் சந்தர்ப்பத்தில் குறிப்பிட விரும்புகின்றேன்.

அதேபோல, சிறைகளில் வாடுகின்றவர்கள் பற்றியும் சொல்ல வேண்டும். இவர்களில் தண்டனை விதிக்கப்பட்டவர்களும் விசாரணைக்கு உட்படுத்தப்படாதவர்களும் இருக்கிறார்கள். அவர்களில் அரசியல் காரணங்களுக்காக கைதுசெய்யப்பட்டவர்களுக்கு விரைவாக பொதுமன்னிப்புக் கொடுக்கவேண்டும் என்று நான் கேட்டுக்கொள்கின்றேன்.

அதைவிட, எங்களுடைய கடல் வளங்களை அழிக்கக்கூடிய வகையில், எங்களுடைய கடற்றொழிலாளர்களுடைய வாழ்வாதாரத்தைச் சூறையாடக்கூடிய வகையில், மீண்டும் தென்பகுதியிலிருந்து நூற்றுக்கணக்கானவர்கள் எல்லை தாண்டி வந்து கடற்றொழில் புரிவதாகச் செய்திகள் தெரிவிக்கின்றன. ஆனபடியினால், இந்த அரசாங்கம் இது தொடர்பில் கூடிய கவனம் செலுத்தி, இரு தரப்புக் கடற்றொழிலாளர்களையும் பேச்சுவார்த்தைக்கு உட்படுத்தி, விரைவாக அந்தப் பிரச்சினைக்குத் தீர்வுகாண வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

எங்களுடைய கடந்த ஆட்சிக் காலத்தில் ஓமந்தைச் சோதனைச்சாவடி உட்பட நூற்றுக்கணக்கான சோதனைச் சாவடிகளை நாங்கள் அகற்றியிருக்கின்றோம். ஆனால், இன்று அதில் ஒரு குழப்பமான கருத்தொன்று நிலவுகின்றது. நான் பிரதமரைச் சந்தித்தபோது மீண்டுமொரு முறை இதுதொடர்பில் வேண்டுகோள் விடுத்திருக்கின்றேன். இந்த நாட்டிலுள்ள எல்லா இடங்களுக்கும் எவ்வாறு இலகுவாகவும் சுதந்திரமாகவும் மக்கள் சென்றுவரக்கூடிய நிலைமை இருக்கின்றதோ, அதேமாதிரி சுதந்திரமாக வடக்கிற்கும் சென்றுவரக்கூடிய நிலைமை உருவாக்கப்பட வேண்டுமென்று கேட்டிருக்கின்றேன்.

அதைவிட, இன்னுமொரு குழப்பமான செய்தி என்னவென்றால், முப்படைகளுக்கும் பொலிஸ் அதிகாரம் வழங்கப்பட்டிருப்பதாக வர்த்தமானி அறிவித்தலொன்று வெளியிடப்பட்டிருப்பதாகும். இந்த அறிவித்தலானது மக்களிடையே ஓர் அச்சத்தையும் பீதியையும் ஏற்படுத்தியிருக்கின்றது. ஆனபடியினால், இதுதொடர்பில் இந்தப் புதிய அரசாங்கம் மக்களுக்குத் தெளிவுபடுத்த வேண்டும். கடந்த காலங்களில் அவ்வாறான ஒரு தேவை இருந்திருக்கலாம். ஆனால், இப்பொழுது யுத்தம் முடிவடைந்து ஐந்து வருடங்களுக்கு மேலாகியும் தொடர்ந்தும் அவ்வாறான அதிகாரங்கள் முப்படைகளுக்கு அவசியமில்லை என்று நான் கருதுகின்றேன். அந்த வகையில் நான் ஜனாதிபதி அவர்களிடமும் பிரதமர் அவர்களிடமும் இக்கோரிக்கையை இச்சபையினூடாக முன்வைக்கின்றேன்.

அடுத்து, தேசிய சுதந்திர தின விழாவில் ஜனாதிபதி அவர்கள் தன்னுடைய உரையிலே, "போர் முடிவுக்குக் கொண்டுவரப்பட்டபோதிலும் வடக்கு - தெற்கு மக்களுக் கிடையிலே நல்லிணக்கத்தை ஏற்படுத்தக்கூடிய போதுமான சூழ்நிலை உருவாக்கப்படவில்லை" என்று மனம்திறந்து குறிப்பிட்டார். அவருடைய உரையை ஏற்றுக்கொண்டு, அதற்கான ஏற்பாடுகளைச் செய்ய அனைவரும் முன்வர வேண்டும். அதாவது, ஒரு கையை மாத்திரம் தட்டினால் ஓசை வராது; இரு கைகளும் தட்டினால்தான் ஓசை வரும். அந்த வகையில் தமிழ் மக்களைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற பிரதிநிதிகளும் ஒன்றுசேர்ந்து செயற்பட வேண்டும்.

[ගරු ඩග්ලස් දේවානන්ද මහතා]

குறிப்பாகத் தமிழ்த் தேசியக் கூட்டமைப்பினரைப் பொறுத்தவரையில் தாங்கள் அரசாங்கத்தின் அமைச்சரவையில் அங்கம் வகிக்கவில்லையென்றும் அரசில் பங்கெடுக்க வில்லையென்றும் சொல்கிறார்கள். ஆனால், அப்படிச் சொன்னாலும் அவர்கள் இந்த அரசாங்கத்தின் நிறைவேற்றுச் சபையில் அங்கம் வகிக்கின்றார்கள். அதாவது அமைச் சரவையைவிட ஒரு மேலான சபையில் அவர்கள் அங்கம் வகிக்கின்றபடியினால் அந்தச் சந்தர்ப்பத்தைப் பயன்படுத்தி அவர்கள் எங்கள் மக்கள் எதிர்கொள்கின்ற பிரச்சினைகளைத் தீர்க்கவேண்டும். கடந்த காலங்களில் ஆளுங்கட்சி ஒரு கொள்கையை முன்வைத்தால் எதிர்க்கட்சி அதை எதிர்க்கின்ற நிலைமைதான் இருந்தது. ஆனால், இன்றைய நிலைமை அப்படியில்லை. ஆளுங்கட்சிக்கும் எதிர்க்கட்சிக்குமிடையில் ஒரு புரிந்துணர்வு இருக்கின்றபடியினால் இந்தச் சந்தர்ப் பத்தைப் பயன்படுத்தி எங்களுடைய மக்கள் எதிர்கொள்கின்ற பிரச்சினைகளுக்கு - அவை நாளாந்தப் பிரச்சினைகளாக இருக்கலாம் அல்லது அரசியல் உரிமைப் பிரச்சினைகளாக இருக்கலாம் - தீர்வு காணவேண்டும் என்று கேட்டுக் கொள்கின்றேன்.

கடந்த காலங்களில் நாங்கள் அரசியல் உரிமைப் பிரச்சினைக்குத் தீர்வாக நீண்டகாலமாக முன்வைத்து வந்தது இலங்கை - இந்திய ஒப்பந்தத்தில் உருவாக்கப்பட்ட 13ஆவது திருத்தச் சட்டத்தையாகும். அதனை முழுமையாக நடைமுறைப் படுத்துவதில் ஆரம்பித்து ஒரு பாராளுமன்றத் தெரிவுக் குழுவிற்கூடாகவோ அல்லது ஒரு சர்வகட்சிக் குழுவினூடாகவோ விசேட அதிகாரங்களை வடக்கு, கிழக்கு மக்களுக்குக் கொடுக்க வேண்டுமென்று நாங்கள் ஆரம்பம் முதற்கொண்டு கூறிவந்திருக்கிறோம். இந்தச் சந்தர்ப்பத்தில் தமிழ் மக்களுடைய பிரதிநிதிகள் அதை மீண்டும் வலியுறுத்திச் செய்ய வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன்.

அவ்வாறே, எரிபொருட்களினுடைய விலைகள் குறைக்கப் பட்டிருக்கின்றபடியினால் அவற்றோடு சம்பந்தப்பட்ட சகல வற்றையும் ஒரு கட்டுப்பாட்டு விலைக்குக் கொண்டுவரக் கூடிய ஏற்பாடுகளை இந்த அரசாங்கம் கவனிக்க வேண்டு மென்று கேட்டுக்கொள்கின்றேன்.

அத்துடன் விவசாயக் கடன்களில் 50 வீதம் இரத்துச் செய்யப்பட்டிருக்கின்றது. அதற்காக இந்த அரசுக்கு என்னுடைய நன்றியைக் கூறிக்கொள்வதுடன், கடந்த காலங்களில் எங்களுடைய பகுதிகளில் இயற்கை அனர்த் தங்களால் ஏற்பட்ட அழிவுகளை ஈடுசெய்யக்கூடிய வகையில் எமது மக்களுக்குத் தேவையான விவசாய உள்ளீடுகளை இலவசமாகவோ அல்லது மானிய அடிப்படையிலோ வழங்குமாறும் கேட்டுக்கொள்கின்றேன். மேலும், இந்த அரசாங்கத்தின் 100 நாள் வேலைத்திட்டத்துக்கும் எமது மக்கள் நலன் சார்பாக இந்த அரசு எடுக்கின்ற சகல நடவடிக்கை களுக்கும் நாங்கள் ஆதரவளிப்போம் என்று தெரிவித்து, இந்தச் சந்தர்ப்பத்தைக் கொடுத்ததற்கு நன்றி கூறி, விடைபெறு கின்றேன். வணக்கம்.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
The next speaker is the Hon. Sujeewa Senasinghe. You have 15 minutes.

[අ.භා 4.02]

ගරු සුජීව සේනසිංහ මහතා (අධිකරණ හා කම්කරු සබඳතා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சுஜீவ சேனசிங்க - நீதி மற்றும் தொழில் உறவுகள் பிரதி அமைச்சர்)
(The Hon. Sujeewa Senasinghe - Deputy Minister of Justice and Labour Relations)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අතුරු අය වැයක් - පුංචි අය වැයක් - සම්බන්ධයෙන් කථා කිරීමට මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මම අපේ පක්ෂයේ නායකයින්ට, ආණ්ඩු පක්ෂයට ස්තුතිවන්ත වනවා. මේ ස්ථානයේ ඉන්නවා, ගරු සරත් අමුණුගම හිටපු ඇමතිතුමා. ඒ වාගේම ගරු ෆිලික්ස් පෙරේරා හිටපු ඇමතිතුමාත් ඉන්නවා. එතුමන්ලා දේශපාලනයේ පතාක යෝධයෝ. බලාපොරොත්තු නොවූ ආකාරයෙන් තිබුණු ආණ්ඩුව බිඳ වැටුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මා තරුණ මන්ත්‍රීවරයකු වශයෙන් මගේ කුලුඳුල් කථාව 2010 මැයි මස 04 වැනිදා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. අනාවැකි කීමේ හැකියාවක් මටත් පොඩ්ඩක් තිබුණාය කියලා මා විශ්වාස කරනවා. [බාධා කිරීමක්] සමාවෙන්න. [බාධා කිරීමක්] ඊට වැඩිය හොඳ අනාවැකියක්; සත්‍යය බවට පත් වන අනාවැකියක්.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
වෙඩි තියා ගන්නේ නැද්ද?

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
නැහැ, වෙඩි තියා ගන්න වුවමනාවක් නැහැ. මොකද, අනාවැකිය සත්‍ය වුණා. මම එහෙම පොරොන්දුවක් දුන්නේත් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මගේ කුලුඳුල් - මංගල - කථාව මම පටන් ගත්තේ දේශපාලනයේ දී කෙළින් කථා කරන්න, සොරකම් නොකර පිරිසිදු දේශපාලනයක් කරන්න කියමින් මෙම උත්තරීතර සභාවට මා එවූ මගේ දෙමවුපියන්ට පින් දෙමිනුයි.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ඔබතුමාගේ දක්ෂකමට තැනක් නැහැ නේ.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
තැනක් තිබෙනවා. දේශපාලනය කරනකොට ඉවසීමෙන් කටයුතු කරන්න ඕනෑ. දේශපාලනය හදිසි වෙලා කරන කටයුත්තක් නොවෙයි.

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)
ඔබතුමාට ඉදිරියේ දී තැනක් ලැබේවි.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
බොහොම ස්තූතියි, ගරු මන්ත්‍රීතුමියනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා කියපු ආකාරයට මේ දක්වා අවුරුදු පහක් තිස්සේ මගේ කාර්ය භාරය මා ඉටු කළා. විශේෂයෙන්ම හොරකම ගැන, දූෂණය ගැන බය නැතිව කථා කළා. රටට දුන් පොරොන්දු අනුව කටයුතු කළා වාගේම පසුගිය ආණ්ඩුව බලයෙන් පහ කිරීම සඳහා මට පුළුවන් විධියට ඒ කාර්ය භාරයත් ඉටු කළාය කියලා මා හිතනවා. ඒ වාගේම මා ඔබතුමන්ලාගේ අවධානයට යොමු කරවන්න කැමැතියි, මීට අවුරුදු පහකට කලින් මේ පාර්ලිමේන්තුවේ කළ මගේ කුලුඳුල් කථාවේ දී රාජපක්ෂවරුන්ගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් මා අදහස් ප්‍රකාශ කළ ආකාරය පිළිබඳව. මේ අවස්ථාවේ දී එම කථාවෙන් කොටසක් මා කියවන්නම්. 2010 මැයි 04 වැනි දින හැන්සාඩ් වාර්තාවේ 124වැනි තීරුවේ මෙසේ සඳහන් වී තිබෙනවා:

> "අන්තිම වශයෙන්, පස්වන සියවසේ, පර්සියානු අධිරාජ්‍යයේ, හෙරොඩෝටස් නමැති ඉතිහාසඥයා විසින් සඳහන් කරපු වැකියක් මම ප්‍රකාශ කරන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා දන්නා ආකාරයට පර්සියානු අධිරාජ්‍යය පස් වන සියවසේ ලෝකයේ විශාල ලෙස පැතිරෙමින් පැවතුණා. එහිදී ජය, ජය පිට ජය, ඒ පිට තවත් ජය අත් කර ගන්නා අවස්ථාවේදී හෙරොඩෝටස් කියන ඉතිහාසඥයා කිව්වා, 'මෙවැනි අවස්ථාවක සිදු වන්නේ අධිරාජ්‍යවාදියකුට හෝ පාලකයකුට මෙවැනි ජය ලබන කොට බලයෙන් උම්මාද වෙලා බලයෙන් උම්මාදයට පත් වෙලා දූෂණය පටන් ගන්නවා. ඒ දූෂණය සමඟ දූෂණය වළක්වන්න මර්දනය පටන් ගන්නවා. ඒත් එක්කම ඒ මර්දනය තවත් තීව්‍ර කරලා භීෂණය පටන් ගන්නවා' කියලා. මේ සියලු දේ පටන් ගන්න කොට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අධිරාජ්‍යයේ, ඒ වාගේම ඒ පාලකයාගේ විනාශයත් ඉතා ඉක්මනින් පැමිණෙන බවට එතුමා ප්‍රකාශ කළා. පස්වන සියවසේ එතුමා ඒ ප්‍රකාශ කළ දේ අදටත් වලංගුයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද, මේ ආකාරයෙන් අපි දන්නවා, ආණ්ඩු පක්ෂය පළාත් පාලන ඡන්දය ජයග්‍රහණය කළා; පළාත් සභා ඡන්දය ජයග්‍රහණය කළා. පළාත් සභා පිට පළාත් සභා ජයග්‍රහණය කළා. ජනාධිපතිවරණය ජයග්‍රහණය කළා. පාර්ලිමේන්තු මහ මැතිවරණය ජයග්‍රහණය කළා. මේ ජයග්‍රහණයන් සම්බන්ධයෙන් මත වාද ගොඩක් තිබුණත් මේ ජයග්‍රහණයේ බලයෙන් මත් වෙලා උම්මාදයට පත් වෙලා ක්‍රියා කළොත්, මේ වාගේ රටට නොගැළපෙන නීති, ඒ වාගේම රට මර්දනය කරන, සාමාන්‍ය ජනතාවගේ පංචේන්ද්‍රියන් අකර්මණ්‍ය කරන නීති සාදන්න මේ ආණ්ඩු පක්ෂය පෙළඹුණොත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩු පක්ෂයටත් සිදු වන්නේ අර හෙරොඩෝටස්ගේ ඉතිහාසයමයි; ලංකාවේ ඉතිහාසය ආණ්ඩු පක්ෂයේ ඉතිහාසය බවට ඉදිරියේදී ලියවෙන්න සලස්වන්න පුළුවන් ශක්තියක් අපට විපක්ෂයක් වශයෙන් තිබෙනවා කියන එක කියන්න කැමැතියි."

මගේ කුලුඳුල් කථාවේ දී මේ කාරණය මා ප්‍රකාශ කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විශේෂයෙන්ම තව කාරණයක් කෙරෙහිත් මා ඔබතුමන්ලාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. සරත් අමුණුගම මැතිතුමා අපේ එක්සත් ජාතික පක්ෂයේත් හිටපු ඇමතිවරයෙක්. මේ රටේ සංවර්ධනය, ගම් උදාව, ඇඟලුම් කර්මාන්තය, ජන සවිය, මහපොළ කියන මේ ක්‍රියාදාමයන් අප සත්‍යයක් බවට පත් කළේ ආසියාව බඩගාන කාලයේ. මේක ආසියාවේ ශත වර්ෂය.

මා ඔබතුමන්ලාගේ අවධානයට යොමු කරවනවා, මේ අතුරු අය වැයෙන් අපි ජනතාවට ලබා දී තිබෙන විශාල සහන පිළිබඳව. ඔබතුමන්ලා දන්නවා, ඔබතුමන්ලාගේ නායකයා - මහින්ද රාජපක්ෂ මැතිතුමා - මීට මාස කිහිපයකට පෙර ඡන්ද අය වැයක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ බව. ඒ අය වැය ඉදිරිපත් කළාට පසුව ඒ අය වැය මත තමයි අපි මේ අතුරු අය වැය ඉදිරිපත් කර තිබෙන්නේ. විශේෂයෙන් මුදල් ඇමතිතුමාටත්, අගමැතිතුමාටත්, ජනාධිපතිතුමාටත් ඒ පිළිබඳව මගේ ස්තූතිය පුද කරනවා. මොකද, අපි නොහිතපු ආකාරයෙන් මේ අය වැය ජනතාවට සහන ලබා දෙන අය වැයක් බවට පත් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම පෙට්‍රල්, ඩීසල්, ගෑස්, ලාම්පුතෙල් මිල අඩු වෙලා තිබෙනවා. අපි අපේ මිතුරන්ට, රටේ ජනතාවට කථා කරද්දී ඔවුන් කියන්නේ මේ ඉන්ධන මිල අඩු කිරීමේ ක්‍රියාවලිය හේතු කොටගෙන තමන්ගේ ජීවන බර සියයට තිහකින්, සියයට හතළිහකින් වාගේ ප්‍රමාණයකින් අඩු වෙලා තිබෙනවාය කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් වාහනයකට full tank පෙට්‍රල් හෝ ඩීසල් ගහන්න නම් රුපියල් 6,000ක්, රුපියල් 6,500ක්, රුපියල් 7,000ක් වාගේ මුදලක් වැය වෙනවා. මේ වනකොට ඒ මුදල රුපියල් 4,000ට, රුපියල් 3,500ට වාගේ ප්‍රමාණයකට පහත වැටිලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ඉන්ධන මිල අඩු කිරීම මේ රටේ ජනතාවට විශාල වශයෙන් බලපානවා. ඒ තුළින් සියලු භාණ්ඩවල මිල අඩු වීමක් සිදු වෙනවා. මම හිතන විධියට කම්කරුවාට, ධීවරයාට, මේ රටේ දුප්පත් ජනතාවට, රුපියල් 200ක් දෛනිකව ආදායම් ලබන සියයට 40ක් වූ පවුල් ප්‍රමාණයකට මේ මඟින් අපි විශාල සහනයක් ලබා දී තිබෙනවා. අපට විශ්මකර්ම වැඩ කරන්න බැහැ. හැබැයි ගරු ඇමතිතුමනි, ගරු මන්ත්‍රීතුමනි, ඉතා කෙටි කාලයක් තුළ මේ සුළු අය වැයෙන් අපි මේ රටේ ජනතාව බලාපොරොත්තු වුණු ඒ සහන ලබා දීලා තිබෙනවා. අපට පුළුවන් ආකාරයෙන් අත්‍යවශ්‍ය භාණ්ඩ 13ක මිල අපි විශාල වශයෙන් අඩු කරලා තිබෙනවා. මොකද, මේ රටේ තිබුණු තත්ත්වය අනුව තමයි අපි මේ අය වැය ඉදිරිපත් කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉදිරි අනාගතයේදී මේ රටේ නව කර්මාන්ත ඇති කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මේ රටේ ආයෝජකයන් දිරිමත් කරන්න, රැකියා ප්‍රවර්ධනය කරන ආයෝජන මේ රටට ගෙන එන්න, විදේශ ආයෝජන ගෙන එන්න, දියුණු තාක්ෂණය ගෙන එන්න, මේ ක්‍රියාදාමය තුළින් විශාල වර්ධනයක් ඇති කරන්න බලාපොරොත්තු වෙනවා.

කලින් මම ඔබතුමන්ලාට රාජපක්ෂ පවුලේ ඇද වැටීම පිළිබඳ අනාවැකිය ඉදිරිපත් කළා වාගේම එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් හරහා මේ රටේ ජනතාව බලාපොරොත්තු වන ආකාරයට, ආසියාවේ දියුණු රටවල් වන මැලේසියාව, සිංගප්පූරුව වාගේ රටවල තිබෙන ආකාරයේ ආර්ථිකයක් අපි ඉදිරි අනාගතයේදී ගොඩ නඟනවා කියලා මම කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ දින සියයේ වැඩසටහන තුළ අපි මොනවාද කරන්නේ කියලා බලන්න. විශේෂයෙන්ම හිටපු ජනාධිපතිතුමාගේ වියදම් ඔබතුමන්ලාගේ අවධානයට යොමු කරනවා. ජනාධිපතිතුමාගේ වියදම් රුපියල් බිලියන 9ක්ව තිබුණා. ඔබතුමන්ලා දන්නවා, හිල්ටන් හෝටලය, ඒ වාගේම අනෙකුත් හෝටල් ජනාධිපති මන්දිරයට විවෘත කරලා තිබුණු බව. ඒ හෝටල් හරහා දවසකට විශාල ප්‍රමාණයක් කෑම ගෙන්වා ගත්තා. කෑම විශාල ප්‍රමාණයක් විසි කළා. දුප්පත් ජනතාවගේ පංචේන්ද්‍රියයන් හඳුනා ගන්නේ නැතුව ඒ ආකාරයට වියදම් කිරීම තුළින් විශාල විනාශයක් කිරීමට හිටපු ආණ්ඩුව තමන්ගේ බලය පාවිච්චි කළා.

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා අපේ පක්ෂයේ නායකයා නොවෙයි. ඔබතුමන්ලාගේ පක්ෂයේ නායකයා. එතුමා අගමැතිතුමා සමඟ එකතු වෙලා උදාහරණයක් දීලා තිබෙනවා. එදා ඇමතිවරු තමන්ගේ ආරක්ෂක භටයෝ යොදා ගෙන ඒ සඳහා විශාල වියදමක් දැරුවා. අද ඒක අඩු කරලා තිබෙනවා. ඇමතිවරුන් වශයෙන් අපි ලබාගෙන තිබෙන්නේ ආරක්ෂක භටයෙක්, නැත්නම් වැඩිම වුණොත් දෙදෙනෙක් පමණයි. මන්ත්‍රීවරුන් වශයෙන් අපි අපේ ජීවිත සැලසුම්ගත කරලා තිබුණු ආකාරය ඇමති ධුර දැරුවත් කිසිම ආකාරයකින් වෙනස් කරලා නැහැ. ඒ අදහස අපට ලබා දුන්නේ අගමැතිතුමා. රටට උදාහරණයක් දෙන්න, රටේ ජනතාව වෙනුවෙන් කැප කිරීමක්

[ගරු සුජීව සේනසිංහ මහතා]

කරන්න, පුළුවන් තරම් අඩු ආරක්ෂක භටයින් ප්‍රමාණයක් පාවිච්චි කරලා රටේ අනාගතය සඳහා උදව් කරන්න කියලා එතුමා කිව්වා. අපි ඒක ඒ අයුරින්ම පිළිපැද්දා.

ගරු මන්ත්‍රීවරුනි, ඔබතුමන්ලාගේ අවධානයට යොමු කරනවා, අපි යහ පාලනය, නීතිය සහ සදාචාරය මේ රටේ කෙළින් ක්‍රියාත්මක කරලා තිබෙන බව. මම හිතන විධියට මේ රටේ ජනතාව මේ අවස්ථාවේදී ඉතාමත් සන්තෝෂයෙන් ජීවත් වෙනවා. අපට අධිකරණ ක්ෂේත්‍රයේ අග්‍ර විනිශ්චයකාරතුමා ඉවත් කිරීම සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබුණා. ඒ සම්බන්ධයෙන් කතිකාවක් ඇති වෙලා තිබෙනවා. හැබැයි නීතිමය වශයෙන් අපි ඔබතුමන්ලාට පෙන්වා දුන්නා, ඒ කාර්යදාමය අපට කරන්න සිදු වුණේ මොනයම් හේතුවක් නිසාද, මොන ප්‍රතිඵලයක් නිසාද කියලා.

ඒ වාගේම අපි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ප්‍රතිසංස්කරණය කරනවා. ඒ වාගේම ස්වාධීනව කටයුතු කිරීම සඳහා පොලීසියටත්, අනෙකුත් රාජ්‍ය ආයතනවලටත් අවශ්‍ය සැලැස්ම, අඩිතාලම -අත්තිවාරම- මේ රටේ ඉදිරි අනාගතය වෙනුවෙන් සකස් කරගෙන යනවා. ඒ සඳහා අපි ඔබතුමන්ලාගේ සහයෝගය බලාපොරොත්තු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශපාලනමය වශයෙන් ගත්තොත්, පක්ෂයක් වශයෙන් ගත්තොත් එක්සත් ජාතික පක්ෂයට මෙය අවාසි සහගත තත්ත්වයක්. විශේෂයෙන්ම අගමැතිතුමා ප්‍රමුඛ මේ ආණ්ඩුව මේ රටේ නීතිය, යහපාලනය, මේ රටේ ආයතන ස්වාධීන කිරීම සඳහා මේ කරන කාර්ය භාරය දේශපාලන වශයෙන් අපට විශාල අවාසියක්. හැබැයි රට වෙනුවෙන්, ඉදිරි අනාගතය වෙනුවෙන් අපි මේ දුන් පොරොන්දු ඒ ආකාරයෙන්ම ඉටු කරනවා.

මේ රටේ ඡන්ද ක්‍රමය වෙනස් කිරීම සම්බන්ධයෙන් ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා කථා කළා. මෙය විශාල වශයෙන් සාකච්ඡා කළ යුතු දෙයක්. ඡන්ද ක්‍රමය වෙනස් කරන්න ජනාධිපතිතුමා කැමැතියි. ඡන්ද ක්‍රමය වෙනස් කරන්න අගමැතිතුමා කැමැතියි. හැබැයි ඒ සම්බන්ධයෙන් මේ අවස්ථාවේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ අකමැත්තක් ඉදිරිපත් වුණා. විශේෂයෙන්ම මේ ඡන්ද ක්‍රමය වෙනස් කළොත් සුළු පක්ෂවලට, සුළු පක්ෂවල නායකයින්ට, වාසුදේව නානායක්කාර මැතිතුමන්ලාට, ඒ වාගේම දිනේෂ් ගුණවර්ධන මැතිතුමන්ලාට, දක්ෂයන්ට සමහර වෙලාවට ජයග්‍රහණය කරලා පාර්ලිමේන්තුවට තේරී පත් වීමේ අවස්ථාවක් නොලැබීමේ තත්ත්වයක් උදා වෙන්න පුළුවන්. සමහර වෙලාවට ඒ සම්බන්ධයෙන් සියලු සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් රැක ගන්න බැරි වෙයි. මේ කාරණය අපි පුළුල් සාකච්ඡාවකට බඳුන් කරලා ඉදිරි අනාගතයේදී අපට තීන්දුවක් ගන්න සිදු වෙනවා.

ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමාත් ඇහුම් කන් දෙනවා නම් හොඳයි. ඔබතුමා ගැනයි, මා ගැනයි දූෂමාන ආරංචියක් වෙබ් අඩවියක පළ කරලා තිබුණා, මම දැක්කා. ඔබතුමාගෙන් මම දුරකථන පණිවුඩයක් දීලාත් ඒ සම්බන්ධයෙන් අහන්නයි සිටියේ. විශේෂයෙන්ම මේ වෙබ් අඩවි සම්බන්ධයෙනුත්, දූෂමාන ආරංචි සම්බන්ධයෙනුත් ඔබතුමන්ලාගේ අවධානය යොමු කරවනවා. මේ සම්බන්ධයෙනුත් යම් කිසි ආකාරයකින් නීතිය ක්‍රියාත්මක කරන්න අපට පුළුවන් නම් හොඳයි. මම හිතන විධියට වාරණයක් නොකොට මේ ආයතනවලටත් යම් කිසි සදාචාරයක්, මාධ්‍යවේදීන් වශයෙන් ක්‍රියා කළ යුතු පිළිවෙතත් උගන්වන්න පුළුවන් නම් ඉතා හොඳයි. මොකද, නීතිමය වශයෙන් අපට මේ ආයතන සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්න බැහැ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

වුවමනා කරන්නේ මේවා ගැන පැමිණිලි කරන්න ආයතනයක්. දැන් තිබෙන පුවත් පත් මණ්ඩලයට බැහැ මේවා -

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

ඒක තමයි. ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ නීතිය, යහපාලනය, ප්‍රජාතන්ත්‍රවාදය, මාධ්‍යය කියන ඒවා ජරාජීර්ණ වෙලායි තිබුණේ. ඒවා ශත පහකට ගණන් ගන්නේ නැතුව ඒකාධිපති වියරුවෙන් ක්‍රියා කරපු පාලකයෝ තමයි මේ රටේ සිටියේ.

මට මතකයි, ඒ දවස්වල ඔබතුමන්ලා රතු බලකොටුවේ මන්ත්‍රීවරු වශයෙන් කතා කරද්දි, ඔබතුමන්ලාගේ කට හඬ ඇහෙද්දි අපේ ඇඟේ මයිල් කෙළින් වෙනවා. විශේෂයෙන්ම ඔබතුමන්ලා නිර්ධන පන්තිය වෙනුවෙන්, ඒ වාගේම පීඩිත පන්තිය වෙනුවෙන්, රටේ නීතිය වෙනුවෙන්, යහපාලනය වෙනුවෙන් සටන් කරපු නායකයෝ. විශේෂයෙන්ම පැවැති ආණ්ඩුවේ තිබුණු දූෂණය, ඒ වාගේම නීතිය කඩා වැටීම, යහපාලනය කඩා වැටීම, ප්‍රජාතන්ත්‍රවාදය කඩා වැටීම ගැන මම හිතන්නේ ඔබතුමන්ලා ඇතුළේ ඉඳගෙන සටනක් කළා. ඇතුළේ ඉඳලා විවේචනය කරන්න තිබෙන හැකියාව අඩුයි. ඒක දේශපාලන වශයෙන් කරන්න බැහැ. හැබැයි, මේ සිදු වුණු ක්‍රියාදාමය නිසා මේ රට ජරාජීර්ණ බවට පත් වුණා ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන්ම අපි තරුණ මන්ත්‍රීවරුන් වශයෙන් මේ රටේ ඉදිරි අනාගතය වෙනුවෙන් දිගින් දිගට මේ සම්බන්ධයෙන් හඬ නැඟුවා.

ගරු සරත් අමුණුගම මන්ත්‍රීතුමාට මතක ඇති, 2001 වර්ෂයේදී සෘණ 1.5ක ආර්ථිකයක් තිබෙන රටක් ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාට භාර දුන්නේ. රැකියා සම්බන්ධව ඔබතුමන්ලා අපෙන් ප්‍රශ්න කළා. එතුමා මේ රටේ ආර්ථික වර්ධන වේගය අවුරුදු දෙකක් යන කොට සියයට 6.8කට වර්ධනය කළා. දැන් අපට පෙන්වන ආර්ථික වර්ධන වේගය නිවැරදි ආර්ථික වර්ධන වේගයක් නොවෙයි ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමන්ලා දන්නවා අපි චීනයෙන් රුපියල් බිලියන 6,500ක වාගේ ප්‍රමාණයක් ණය අරන් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, මේ මුදලින් විශාල කොමිස් ප්‍රමාණයක් බලාපොරොත්තුවෙන් මත්තල ගුවන් තොටු පළ, හම්බන්තොට ක්‍රිකට් ක්‍රීඩාංගනය, හම්බන්තොට වරාය, ඒ වාගේම නොරොච්චෝල තාප බලාගාරය, සාම්පූර් විදුලි බලාගාරය, ත්‍රිකුණාමල ජැටිය, නෙළුම් කුළුන, නෙළුම් පොකුණ ආදී වශයෙන් ව්‍යාපෘති ඇති කරද්දි, කොන්ක්‍රීට් කඳු ගහද්දි ජනතාවගේ ආදායම වැඩි වන්නේ නැහැ; ආයෝජන වැඩි වන්නේ නැහැ. ඒ වාගේම රැකියා වැඩි වන්නේ නැහැ. කොමිස් මුදලට තමයි ඒ ව්‍යාපෘති මේ රටේ නිර්මාණය වුණේ. ඒවාට ටෙන්ඩර් දැම්මේ නැහැ මන්ත්‍රීතුමනි. ඒ මුදල් වැය කරන කොට ඒකට පොලිය සම්බන්ධ වෙන්නේ නැහැ. විශේෂයෙන්ම ගෙවන මුදල් ප්‍රමාණය සම්බන්ධ වෙන්නේ නැහැ. මේ රටේ ආර්ථික වර්ධන වේගය ඉතා උසස් මට්ටමින් පෙන්නුම් කරනවා. හැබැයි, රටේ ජනතාවගේ ආදායම වැඩි වෙලා නැහැ. 2009 අවුරුද්දේ රුපියල් 19,000කට තිබුණු පඩිය 2015 අවුරුද්ද වෙන කොට මන්ත්‍රීතුමනි

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ඒ ව්‍යාපෘතිවලින් ලැබුණු වටිනාකම සඳහා බලා ඒ පිළිබඳව නිරීක්ෂණ මේ රටට ඉදිරිපත් කරන්න.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

හොඳයි. අපි ඒක තමයි කරන්නේ ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන්ම අපි දූෂණය සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. වකුගඩු රෝගීන් බේරා ගැනීම සඳහා ඊශ්‍රායලයෙන් රුපියල් බිලියන 15ට ලැබුණු ජල ව්‍යාපෘතිය, රුපියල් බිලියන 35 දක්වා inflate කරලා; වැඩි කරලා; අදාළ නිලධාරින් ඒක අනුමත කරලා ඒවාට ගිවිසුම් අත්සන් කළා. ඒ සම්බන්ධයෙන් අපි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිලි කරනවා. ගරු මන්ත්‍රීතුමනි, මේක සාධාරණීකරණය කරන්න පුළුවන්ද? රුපියල් බිලියන 20ක් රටේ දුප්පත් ජනතාවගේ මුදල්. මම මේ එක උදාහරණයක් පමණයි කිව්වේ. මේ ආකාරයෙන් තමයි මත්තල ගුවන් තොටු පළ, හම්බන්තොට වරාය සම්බන්ධයෙනුත් කටයුතු කළේ. ඔබතුමා දන්නවා ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් ආයතනයට අවසානයට ගෙන්වූ plane දහයේ, නැත්නම් දහහතරේ මැද ටැංකිය නැහැ ගරු මන්ත්‍රීතුමනි. ඒ plane එකේ මැද ටැංකියට වෙනම ගණනක් ගෙවනවා. ඒ ගණනම අහස් යානාවට මේ ආණ්ඩුව ගෙවලා තිබෙනවා; ඒ විධියට ගිවිසුම්ගත වෙලා තිබෙනවා. මෙය විශාල මුදල් කාබාසිනියා කිරීමක්. ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් ආයතනයේ එක අවුරුද්දක පාඩුව රුපියල් බිලියන 35ක් මන්ත්‍රීතුමනි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ඒ ගැන විමර්ශනයක් කරලා, ඒවා ගැන යම් කිසි නිගමනයන් නීතිමය වශයෙන් මේ රට ඉදිරියේ තබන්නේ කවදා විතරද?

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

මට තව සුළු වෙලාවයි තිබෙන්නේ මන්ත්‍රීතුමනි. ඔබතුමන්ලා අපට අග විනිසුරුතුමා ඉවත් කරන්න සහයෝගය දුන්නා නම් - [බාධා කිරීමක්] මේ රටේ සියලු දෙනාම එතුමාගේ තත්ත්වය දන්නවා. අල්ලස් කොමසාරිස්තුමා ඉවත් කරන්න දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ආපසු ගේන්න ඕනෑ. අපට මේ වාගේ නීතිමය බාධා තිබෙනවා. ඔබතුමන්ලා අපට මේවා නිරාකරණය කරලා දුන්නොත් මාසයක් යන කොට, මාස එකහමාරක් යන කොට මේ ක්‍රියාදාමය පටන් ගන්න පුළුවන්. දවස් 25යි තවම ගත වෙලා තිබෙන්නේ. දවස් 25ක් තුළදී ජනාධිපතිතුමාගේ ඒ තිබුණු බලතල අපි කප්පාදු කරලා, ඒ බලතල පාර්ලිමේන්තුවට ලබලා දුන්නා. [බාධා කිරීමක්] අපි ඉතා ඉක්මනින් ගෙනෙනවා මන්ත්‍රීතුමනි. ඔබතුමන්ලා කියන්නේ අවුරුදු දහයක් ඔබතුමන්ලා රත් කළ පුටු අපට වෙනස් කරන්න කියලා. විශේෂයෙන්ම පීඩිත ජනතාව වෙනුවෙන් අවුරුදු දහයක් ඉදිරිපත් වුණු නායකයෝ ඔබතුමන්ලා. හැබැයි, මහින්ද රාජපක්ෂ මහත්මයා ඇතුළු රාජපක්ෂ පවුල අවුරුදු දහයක් ඒකාධිපති වියරුවෙන් ක්‍රියා කරද්දි ඔබතුමන්ලා මොනවාද කළේ? අපි ආණ්ඩුව වෙනස් කළාට පස්සේ ඔබතුමන්ලා කියනවා දවස් 25න්, දවස් 30න් මේ සියලු වෙනස්කම් ඇති කරන්න කියලා. එහෙම ඇති කරන්න අමාරුයි මන්ත්‍රීතුමනි. ඔබතුමන්ලාගේ බලාපොරොත්තු අනුව කටයුතු කරන්න මාසයක් දෙකක් දෙන්න, මාස තුනක් හතරක් දෙන්න. අපි කියූ ආකාරයට පොරොන්දු ඉටු කරනවා.

විශේෂයෙන්ම රනිල් වික්‍රමසිංහ මැතිතුමන් සහ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් මේ රටේ නීතිය අදහන අය. රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ සහෝදරයින් හතර පස් දෙනෙක් ඉන්නවා. හැබැයි ඒ එක සහෝදරයෙක්වත් අමාත්‍ය මණ්ඩලයට අරගෙන නැහැ. විශේෂයෙන්ම අය වැය ලේඛනය ඉදිරිපත් කරද්දි තමන්ගේ සහෝදරයින්ට අය වැයෙන් මුදල් වෙන් කරලා නැහැ. එතුමාටත් ඉන්නවා දක්ෂ සහෝදරයෝ; එතුමාටත් ඉන්නවා ඉගෙන ගත්ත සහෝදරයෝ. හැබැයි එතුමා එහෙම කරලා නැහැ.

අපේ නායකයෝ එහෙම කර නැහැ. ඩී.එස්. සේනානායක, ඩඩ්ලි සේනානායක, සර් ජෝන් කොතලාවල, ජේ.ආර්. ජයවර්ධන, රණසිංහ ප්‍රේමදාස වැනි නායකයින් කවදාවත් එහෙම කර නැහැ. එතුමන්ලා තමන්ගේ දේපොළ දුන්නා මිසක් මේ රටේ දේපොළ පැහැර ගත්තේ නැහැ. රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් අන්න ඒ වාගේ නායකයෙක්. ඒ වාගේම අපි ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා අගය කරනවා. එතුමා ඔබතුමන්ලාගේ නායකයකු වුණත් අපට එතුමාත් සමඟ වැඩ කරන්න අවස්ථාව ලැබිලා තිබෙනවා.

විශේෂයෙන්ම මේ රටේ සංවර්ධනයට අපි කර්මාන්ත ගෙනෙනවා. අපි මේ රටේ electric car හදනවා, මේ රටේ electric trishaw හදනවා. මේ වන විට ආසියානු සංවර්ධන බැංකුවෙන් ව්‍යාපෘතියක් ඉදිරිපත් කර තිබෙනවා, ලංකාවේ සියලුම three-wheelerවල engine අයින් කර electric battery සවි කරන්න. ඒ අදාළ ආයතනය විසින් ඒ සියලු දේවල් නොමිලේ කරනවා. ඒ සඳහා රුපියල් 500යි දවසට charge කරන්නේ. ඒක රියැදුරු විසින් ගෙවන්න ඕනෑ. එතකොට අපි ඉදිරියේදී නිර්මාණය කරන සියලු three-wheeler රථ ඉතා අඩු වියදමකින් බැටරියෙන් ක්‍රියා කරන three-wheeler රථ බවට පත් කරන්න පුළුවන්. මේක රුපියල් ලක්ෂ දෙකහමාරකට අපට මේ රටේ හදන්න පුළුවන්. අපි මේ රටේ electric bus එක හදනවා; අපි මේ රටේ electric train එක හදනවා.

රාජපක්ෂ පවුල තවතවත් බලයේ හිටියා නම් මේ රටේ ජාතිවාදය අවුස්සමින් කටයුතු කරනවා. ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, ඔබතුමා ජාතික සමඟිය සම්බන්ධයෙන් කථා කරන මන්ත්‍රීවරයෙක්. ඔබතුමාගේ දුව තමයි උතුරේ මහ ඇමති, විග්නේස්වරන් මැතිතුමාගේ පුත්‍රයා කසාද බැඳලා ඉන්නේ. ඔබතුමන්ලා ප්‍රායෝගිකව ජාතික සමඟිය සම්බන්ධයෙන් ක්‍රියා කරන නායකයෝ. ඔබතුමන්ලා මේ රටට හොඳ උදාහරණ. හැබැයි, මොකක්ද මහින්ද රාජපක්ෂ මහත්මයා, ගෝඨාභය රාජපක්ෂ මහත්මයා, බැසිල් රාජපක්ෂ මහත්මයා කළේ? මේ රටේ ජාතිවාදය ඇවිස්සුවා. මේ රටේ පල්ලිවලට ගැහුවා. ඒ වාගේම පල්ලිවලට කියා පන්සල්වලට ගැස්සෙව්වා. තමන්ගේ බලය පාවිච්චි කර ඒකාධිපති වියරුවෙන් ක්‍රියා කරපු සියලු නායකයින් කළේ, ජාතිවාදය අවුස්සලා තමන්ට ජාතිකත්වය, දේශප්‍රේමීත්වය තිබෙනවා කියන එක රටට ඒත්තු ගැන්වූ එකයි.

ඒ වාගේම උතුරේ යුද්ධයක් පටන් ගන්නවා කිව්වා. අද බලන්න, යුද්ධයක් පටන් අරගෙන තිබෙනවාද කියා. ගරු සම්පන්දන් මන්ත්‍රීතුමා ඔබතුමාගේ ආසනයට එහා පැත්තේ ආසනයේ සිටිනවා. ඒ සියලු නායකයින් එක්ක එකතු වෙලා අපි ඒකීය ලංකාවක්, ඒකීය ජාතියක් ඉදිරි අනාගතයේ ඇති කරනවා. එක්සත් ජාතික පක්ෂය කියන්නේ දක්ෂ පක්ෂයක්. ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඇතුළු අපේ මේ දක්ෂ කණ්ඩායම මේ රටේ ඉදිරි අනාගතය වෙනුවෙන් දුප්පත් ජනතාවගේ ප්‍රශ්න විසඳනවා. කර්මාන්ත 5,000ක් මේ රටට ගෙනැල්ලා ඔබතුමන්ලා බලාපොරොත්තු වන, මේ රටේ ජනතාව බලාපොරොත්තු වන සංවර්ධනය ඇති කර, මේ රටේ දුප්පත්කම නැති කර මැලේසියාව, සිංගප්පූරුව වාගේ රටක් බවට අවුරුදු 5ක් යන කොට මේ රට පත් කරනවා. නැවතත් ඔබතුමන්ලාට මධ්‍යම පන්තියේ නායකයින් වෙනුවෙන් සටන් කරන්න, පීඩිත පන්තිය වෙනුවෙන් සටන් කරන්න අවස්ථාව අපි ඉතිරි කරන්නේ නැහැ.

විශේෂයෙන්ම මේ රටේ මධ්‍යම පන්තියේ සහ ඊට පහළ පන්තියේ අය රුපියල් හැත්තෑපන්දහස, අසූදහස පඩි ගන්නා පිරිසක් බවට අපි ඉදිරි අනාගතයේදී පත් කරනවා. අපි

[ගරු සුජීව සේනසිංහ මහතා]

ඔබතුමන්ලාට සුභ පතනවා. ඔබතුමන්ලා විශේෂයෙන්ම අධිරාජ්‍යවාදය ගැන, විදේශ බලපෑම් ගැන කථා කළා. දැන් මේ රටේ passport ජාවාරමක් ගැනත් කථා බහ වෙනවා. විශේෂයෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ භාර්යාව සම්බන්ධයෙන් එවැනි passport එකක් සකස් කර තිබෙනවා, ඒ සම්බන්ධයෙන් සෝල්හයිම් මැතිතුමා සම්බන්ධයි කියාත් -විදේශ බලවේගයක් මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වනවා කියාත්- අපට ආරංචි ලැබී තිබෙනවා. අපි බලාපොරොත්තු වනවා ඒ සම්බන්ධව නීතිය ක්‍රියාත්මක කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව තත්පර 20ක් දෙන්න. විශේෂයෙන්ම නීතිය සම්බන්ධයෙන් කථා කරද්දී ගරු මන්ත්‍රීවරයකු කිව්වා, "ඇප දෙන්න පුළුවන් වැරදිවලට ඇප දීලා නැහැ" කියා. එතුමා නීතිය දන්නේ නැහැ. ගරු නිමල් සිරිපාල ද සිල්වා මන්ත්‍රීතුමායි එහෙම කිව්වේ. ඇප ලබා දීමේදී විනිසුරුතුමාට අභිමතය පරිදි කටයුතු කරන්න පුළුවන්. ඒ සඳහා ඇප දෙන්න බැහැ කිව්වොත් දෙන්නම බැහැ. තමන්ගේ අභිමතය තිබුණත් දෙන්න බැහැ. ඇප දීමේ හැකියාවක් තිබෙනවා කියන්නේ ඇප දීම සඳහා විනිසුරුතුමාට තීන්දුවක් ගන්න පුළුවන් කියන එකයි. කූට ලේඛන සකස් කරලා වෙන්න පුළුවන්; නැත්නම් passports දෙකක් හදලා වෙන්න පුළුවන්; නැත්නම් දූෂණය සම්බන්ධයෙන් වෙන්න පුළුවන්. රනිල් වික්‍රමසිංහ මැතිතුමා, ඒ වාගේම ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා, ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා සහ මම ඔබතුමන්ලාට පොරොන්දුවක් දෙනවා, ඔබතුමන්ලා බලාපොරොත්තු වන පරිදි මේ රටේ නීතිය සාධාරණව ක්‍රියාත්මක කරන බවට. අපි රටේ නීතිය සියලු දෙනාටම එක ලෙස ක්‍රියාත්මක කරනවා. එහිදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු සම්බන්ධයෙන් වෙන්න පුළුවන්; අපේ ඇමතිවරයකු සම්බන්ධයෙන් වෙන්න පුළුවන්; අගමැතිවරයා සම්බන්ධයෙන් වෙන්න පුළුවන්. මේ රටේ නීතිය අපි හරියට ක්‍රියාත්මක කරලා, මේ රට ලෝකයේ පිරිසිදු රටක් බවට නිර්මාණය කරනවා කියන පොරොන්දුව මේ අවස්ථාවේදී මා ඔබතුමන්ලාට ලබා දෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු සුමේධා ජී. ජයසේන මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා.4.22]

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015 ජනවාරි 8 වැනිදා පැවැත්වූ ජනාධිපතිවරණයෙන් ජයග්‍රහණය කළ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේත්, අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේත් නායකත්වයෙන් යුත් රජයේ දින සියයේ වැඩ සටහන පිළිබඳව අය වැය විවාදය පැවැත්වෙන මේ අවස්ථාවේදී වචන කිහිපයක් කථා කරන්නට ලැබීම පිළිබඳව මා පළමුවෙන්ම සන්තෝෂ වනවා.

එක්සත් ජාතික පක්ෂයේ රනිල් වික්‍රමසිංහ මැතිතුමාට රජයක් පිහිටුවන්න ශක්තිය ලබා දුන්නේ අපේ පක්ෂයේ හිටපු ලේකම්තුමා වන ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමායි. අද අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විශේෂයෙන්ම රටට යහ පාලනය හඳුන්වලා දීලා යහ පාලනයක් ඇති කිරීමට ගෙන යන එම ආණ්ඩුව තුළින් එතුමන්ලා දුන් පොරොන්දු අනුව මේ වෙන කොට කටයුතු කරගෙන යනවා. ඇත්තටම යහ පාලනය ඉතාම හොඳ දෙයක්. පක්ෂ විපක්ෂ අපි සියලුම දෙනා කැමති දෙයක්. රටේම ජනතාව බලාපොරොත්තු වන දෙයක් තමයි යහ පාලනය කියන්නේ.

ඒ වුණත් මම කියන්න කැමැතියි ජනවාරි මාසයේ 9වැනිදා ජනාධිපතිවරණ ප්‍රතිඵල නිකුත් වූ වෙලාවේ සිට මේ දක්වාම මාධ්‍ය මඟින් අපි දැක්කේ වසර ගණනාවක් තිස්සේ එල්ටීටීඊ ත්‍රස්තවාදය නිසා දුක් විඳි අපේ ජනතාව සහ අපේ රට මුදාගෙන රටේ මහා සංවර්ධනයක් ඇති කළ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට විරුද්ධව නොයෙක් චෝදනා ගෙන එමින් මහා මඩ ව්‍යාපාරයක් ක්‍රියාත්මක වන බවයි. එවැනි දේවල් තමයි පසු ගිය කාල වකවානුව තුළ අපි නිරතුරුවම දැක්කේ. නොයෙක් දූෂණ ක්‍රියා කළාය කියා මුළු රටේම ජනතාව නොමඟ යවන වැඩ පිළිවෙළක් තමයි පසු ගිය දින කිහිපය තුළම සියලු මාධ්‍ය මඟින් අපි දැක්කේ.

ඇත්තටම ජනමාධ්‍ය භාරව සිටින ගරු ගයන්ත කරුණාතිලක අමාත්‍යතුමා එම අමාත්‍යාංශය භාර ගත්තාට පසුව විශේෂයෙන්ම සඳහන් කළා, රජයේ වැඩ පිළිවෙළ හෝ එතුමන්ලාගේ වැඩ පිළිවෙළ මාධ්‍ය හොරණෑවක් බවට පත් කරගන්නේ නැහැ කියා. ඇත්තටම ඒක ඉතාම හොඳ ප්‍රතිපත්තියක් හැටියට මා විශේෂයෙන්ම සඳහන් කරන්න කැමැතියි. ඒක හොරණෑවක් නොවුණත් පසු ගිය කාල වකවානුව තුළම අපි මාධ්‍ය මඟින් දැක්කේ -එතුමාගේ උපදෙස් මේ සඳහා නොලැබෙන්න ඇති, උපදෙස් නොලැබුණා වුණත්- නොයෙක් විධියේ දූෂණ ක්‍රියා කළාය කියා ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයින්ටත්, ඒ වාගේම හිටපු ජනාධිපතිතුමාටත් නොයෙක් ව්‍යාපාර මඟින් විශාල මඩ ගැහීමක් සහ මුළු රටේම ජනතාව නොමඟ යවන විධියේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන බවයි.

ගරු එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන මහතා (ඉඩම් අමාත්‍යතුමා)
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன - காணி அமைச்சர்)
(The Hon. M.K.A.D.S. Gunawardana - Minister of Lands)
ගරු මන්ත්‍රීතුමිය, ජනතාව සත්‍යය පිළිඅරගෙන තමයි ඡන්දය පාවිච්චි කළේ. අපි ඒක ගැන කථා කරන්න ගියොත් තවත් දේවල් කියැවෙන්න පුළුවන්. ඒක නිසා ඒ ගැන කථා නොකරන එක හොඳයි. ඒක ජනතාව තීන්දු කෙරුවා.

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)
හොඳයි අමාත්‍යතුමා, ප්‍රශ්නයක් නැහැ. ඔබතුමාගෙයි මගෙයි අතර ප්‍රශ්නයක් නැහැ. පොඩ්ඩක් ඉන්නකෝ. මම කියන එක පිළිබඳවත් අහගෙන ඉන්නකෝ.

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)
ප්‍රශ්නයක් නැහැ. ඒක ගැන ජනතාව තීන්දුවක් දුන්නා.

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)
පොඩ්ඩක් අහන්නකෝ. [බාධා කිරීමක්] නැහැ, මම කියන්නේ ඒක නොවෙයි. ඔබතුමායි මමයි විරුද්ධව කථා කරන්න අවශ්‍ය නැහැ. පොඩ්ඩක් ඉන්නකෝ. ඔබතුමාගෙයි මගෙයි අතර ප්‍රශ්නයක් නැහැ නේ. මම මෙතැනදී කියන්නේ, ඇත්තටම වරදක් කළා නම් ඒ වැරදිවලට නීතිය හමුවට ගෙනැල්ලා ඒ අයට දඬුවම් දෙන්න කියන එකයි.

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)
වැරදි කාරයෝ එළියේ ඉන්නවා නම් ඒ අයට නඩු දමන්න.

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)
ඒක තමයි මම කියන්නේ. නීතිය හමුවට ගෙනැල්ලා ඒ අයට නඩු දමන්න. නඩු දමා නීතිය මාර්ගයෙන් ක්‍රියා කරන්න.

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)
වැරදි කාරයෝ ඉන්නවා නම් නඩු දමනවා.

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)
ඒක තමයි මම කියන්නේ. වැරදිකාරයෝ හෝ නිවැරදිකාරයෝ හෝ නඩු මඟින් නීති මාර්ගයට ගෙනැල්ලා කටයුතු කරන්න කියන එකයි ගරු අමාත්‍යතුමනි මම සඳහන් කරන්නේ.

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)
සුදු හුනු ගාන්න එපා. ඔබතුමියට කියන්න තිබෙන දේවල් කියන්න.

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)
ඔබතුමාටයි මටයි කථා කරන්න පුළුවන්. කෑ ගහන්නේ නැතුව පොඩ්ඩක් ඉන්නකෝ. අපේ සහෝදරයා ඉන්නකෝ. ඔබතුමාට කවදාවත් මගේ විරුද්ධත්වයක් නැහැනේ. [බාධා කිරීමක්] ඒක තමයි. ඔබතුමාගෙයි මගෙයි අතර ප්‍රශ්නයක් නැහැ. ඔබතුමා පොඩ්ඩක් කෑ ගහන්නේ නැතුව ඉන්නකෝ. මට කථා කරන්න පොඩ්ඩක් ඉඩ දෙන්නකෝ. [බාධා කිරීමක්] ඇත්තටම ඔබතුමන්ලාගේ නව ආණ්ඩුවේ දින සියයේ වැඩ පිළිවෙළට අපි සම්පූර්ණ සහයෝගය දෙනවා. ඒ පිළිබඳව ගරු විපක්ෂ නායකතුමාත්, අපිත් එකඟ වෙලා අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට,-

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)
කකුලෙන් ඇද ඇද සහයෝගය දෙන්න එපා.

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)
මම කකුලෙන් ඇද්දේ නැහැ. ඔබතුමා කෑ ගහන්නේ නැතුව ඉන්න. [බාධා කිරීමක්] කකුලෙන් ඇද්දේ නැහැ. ඇත්තම කියනවා නම්,-

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)
ඔබතුමිය පළාත් සභා ඡන්දයෙන් පස්සේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට කොච්චර බැන්නාද කියලා කියන්න.

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)
මම බැන්නේ නැහැ. ඔබතුමා කොහොමද කියන්නේ මම බැන්නා කියා.

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)
ඔබතුමිය මගෙත් එක්ක බැණලා තිබෙනවා.

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)
කවදාවත් මම බැණලා නැහැ. ඔබතුමා ඇත්ත කථා කරන්න. ඔබතුමායි මමයි කවදාවත් එහෙම කථා කර නැහැ. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, ගරු මන්ත්‍රීතුමියට කථා කරන්න ඉඩ දෙන්න.

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)
ගරු ඇමතිතුමා, මේ ගරු සභාවේ අසත්‍ය ප්‍රකාශ කරන්න එපා. මම මෙතෙක් ඔබතුමා සමඟ සහෝදරයෙක් වාගෙයි කථා කළේ. ඔය විධියට අසත්‍ය ප්‍රකාශ කරන්න එපා, ගරු ඇමතිතුමනි. ඔබතුමා ප්‍රකාශ කළේ සම්පූර්ණ අසත්‍යයක්. ඒ කියපු දේවල් ඉල්ලා අස් කරගන්න. මම කවදාවත් එහෙම කථා කරලා නැහැ.

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)
අප විශ්වාසයෙන් සහ වග කීමෙන් කථා කරන්නේ.

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)
ගරු ඇමතිතුමනි, ඊට වඩා වග කීමෙන් මම කථා කරන්නේ. හැම දාම අපේ හිතවත්කම් තිබුණා. මම කවදාවත් ඔබතුමාට විරුද්ධව කථා කරලාත් නැහැ. ඔබතුමා එක්ක ජනාධිපතිතුමාට විරුද්ධව කථා කරලාත් නැහැ. කිසිම දවසක එහෙම කථා කරලා නැහැ. එහෙම කියන්න එපා. [බාධා කිරීමක්] මගේ කථාව අවසන් වෙනතුරු බාධා නොකර ඉන්න. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියට තව විනාඩි කීපයයි තිබෙන්නේ, කථා කරන්න. [බාධා කිරීමක්]

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)
ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒ කියපු කථාව නම් මම සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනවා. මම ඔබතුමාත් එක්ක එහෙම කථා කරලා නැහැ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියට තව විනාඩි දෙකයි තිබෙන්නේ. [බාධා කිරීමක්]

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ එම කථාව මම සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනවා. කවදාවත් මම එහෙම කථා කරලා නැහැ. මෙතෙක් කල් සිටි කිසිම නායකයෙකුට මම එහෙම කථා කරලා නැහැ. අඩු පාඩු, වැරැදි තිබෙන්න පුළුවන්. ඒවා නැහැ කියලා මම කියන්නේ නැහැ. සමහර විට එහෙම තිබුණත් මම කිසිම නායකයෙකුට විරුද්ධව කථා කරන කෙනෙක් නොවෙයි. මම ප්‍රතිපත්තියකට විරුද්ධව කථා කරනවා මිසක්, නායකයින්ට විරුද්ධව කථා කරන කෙනෙක් නොවෙයි.

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)
පිහිය රත්තරන් වුණත් ඒකෙන් ඇන ගන්න අප කැමැති නැහැ.

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)
අපි අගමැති රනිල් වික්‍රමසිංහ මහත්මයාට වුණත් ප්‍රතිපත්තියට විරුද්ධව කථා කරනවා මිසක්, කවදාවත් එතුමාට විරුද්ධව කථා කරන්නේ නැහැ. වේදිකාවල හරි වෙන කොහේ හරි ඉඳන් එහෙම කාටවත් මඩ ගහන්නේ නැහැ. [බාධා කිරීමක්]

ගරු ඇමතිතුමනි, ඔබතුමායි මමයි මේ ගැන කථා කරන එකේ තේරුමක් නැහැ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට තව විනාඩියක කාලයක් තිබෙන්නේ.

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)
ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන ඇමතිතුමා මොනවා කිව්වත්, මේ දින සියයේ වැඩසටහන ගැනත් මම කථා කරන්න ඕනෑ. එතුමා මේ ගරු සභාව නොමඟ යවන විධියේ අසත්‍ය දේවල් කිව්වා. මම ඒවා සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනවා.

අප කවුරුත් හැම දාමත් යහ පාලනයට කැමැතියි. නමුත් ඊට එරෙහිව සිදුවුණු සමහර සිද්ධීන් පසු ගිය දවස්වල අපි දැක්කා. එක්සත් ජාතික පක්ෂයට බලය ලැබුණාම වත්තල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට යම්කිසි පිරිසක් විසින් පහර දීලා එතුමා සභාවෙන් එළියට ඇද දමා තිබෙනවා. මේ රටේ නීතියක් කියලා දෙයක් තිබෙනවා. හැම දෙයකදීම නීත්‍යානුකූලව, සුබවාදීව කටයුතු කිරීම තමයි ඉතාම හොඳ වන්නේ කියන කාරණය මම මේ අවස්ථාවේ මතක් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමියනි.

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව පොඩ්ඩක් කාලය දෙන්න. එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන ඇමතිතුමා මට බාධා කළා නේ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
සීමිත වෙලාවක් තිබෙන්නේ.

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)
ස්වාධීන කොමිෂන් සභා ගෙන ඒමට කටයුතු කරන බවට මේ රජය ප්‍රකාශ කර තිබෙනවා. ඇත්තටම අපත් ඒවා අනුමත කරනවා. ස්වාධීන කොමිෂන් සභා පිහිටුවීම ඉතාම හොඳයි. ස්වාධීන කොමිෂන් සභා පත් කරලා, ඒවා මඟින් රටේ මහ ජනතාවට සිදුවන අසාධාරණකම් පිළිබඳව කටයුතු කරනවා නම් ඇත්තටම අප සතුටු වෙනවා.

ඔබතුමන්ලාගේ හොඳ වැඩ අප හැම වෙලාවේම අනුමත කරනවා. දින සියයේ වැඩ පිළිවෙළ යටතේ ඔබතුමන්ලා අත්‍යවශ්‍ය භාණ්ඩ කීපයක මිල අඩු කරලා තිබෙනවා. ඒ වුණත්, සහල්, පරිප්පු වැනි දේවල් පාරිභෝගිකයාට අත්‍යවශ්‍ය ආහාර වර්ගයි. ඒවායේ මිල අඩු කරලා නැහැ. පුළුවන් නම්, හැකියාවක් තිබෙනවා නම් ඒවායේ මිලක් ටිකක් අඩු කරනවා නම් හොඳයි කියන කාරණයත් මම මතක් කරන්න කැමැතියි.

තෙල්වලට සහන මිලක් ලබා දීම තුළින් අද ප්‍රවාහන ගාස්තු අඩු වෙලා තිබෙනවා. අපේ අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමා - මොනරාගල දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා- මැදිහත් වෙලා බස් ගාස්තු අඩු කර තිබෙනවා. එය ඉතාම හොඳයි. රුපියල් නවයට තිබුණු බස් ගාස්තුව දැන් රුපියල් අට දක්වා බස්සලා තිබෙනවා. නමුත්, ජනතාව බොහෝ දෙනෙක් අද කියනවා, "වෙනදාට රුපියල් දහයක් අනිවාර්යයෙන් දෙන්න වෙනවා, රුපියල් දහය දුන්නාම හුඟක් වෙලාවට ඉතිරි රුපියල අපට හම්බ වන්නේ නැහැ, දැන් රුපියල් අටක් කරපු නිසා රුපියල් දෙකක්ම හම්බ වන්නේ නැහැ" කියලා. හොඳ වාගේම සමහර වෙලාවට ඒ වාගේ පුංචි පුංචි අඩුපාඩුකම් තිබෙනවා.

විදේශවලින් ආනයනය කරන කිරි පිටිවල මිලත් මෙම අය වැය තුළින් අඩු කර තිබෙනවා. අපේ රජය නම් පසු ගිය කාලයේ නිරතුරුවම කටයුතු කළේ අපේ දියර කිරිවලට තැනක් ලබා දීම සඳහායි. දේශීය කිරි ගොවියා නඟා සිටුවීම සඳහාත්, විදේශ රටවලින් කිරි පිටි ආනයනය කිරීම ටිකක් අඩු කිරීම සඳහාත් අප රජය කටයුතු කළා. දැන් එම කිරි පිටි ලාභ කිරීම තුළින් බොහෝ දෙනෙක් ඒ පිටි කිරිවලට ඇබ්බැහි වීම අඩු කරන්න අමාරු වෙනවා. එයින් රටක් කිරිවලින් ස්වයංපෝෂිත කිරීමත් අපහසු වෙනවා.

ඊළඟට මෙන්න මේ කාරණය කෙරෙහි අවධානය යොමු කරන්න කියලා මම විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා. අපේ ජෝන් සෙනෙවිරත්න මන්ත්‍රීතුමාත් මේ කාරණය සඳහන් කළා. රජයේ නිලධාරින්ට යතුරුපැදි ලබා දීමේ වැඩ පිළිවෙළක් පසු ගිය දිනවල ක්‍රියාත්මක වුණා. එම නිලධාරින් බැංකුවලින් ණය ලබා ගෙන රුපියල් 50,000ක මුදලක් ඒ සඳහා යොදවලා තිබුණා.

මා හිතන හැටියට දැන් වාරික වශයෙන් ඒ ණය මුදල් ගෙවීමේ කටයුතු කර ගෙන යනවා. නමුත් බොහෝ දෙනකුට තවමත් යතුරු පැදි ලබා දී නැහැ. ඒ පිළිබඳවත් ඔබතුමන්ලාගේ අවධානය

යොමු කර ඒ අයට යතුරු පැදි ලබා දෙන්නට කටයුතු කරනවා නම් ඉතාමත් හොඳයි කියා මා විශේෂයෙන්ම මතක් කරන්න කැමැතියි. ඒ වාගේම ඒ ගෙවූ රුපියල් 50,000ක මුදල ඔබතුමන්ලාගේ රජය මඟින් ඉවත් කරන බවට අපේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් ප්‍රකාශ කර තිබුණා. ඒ පිළිබඳවත් අවධානය යොමු කරනවා නම් වඩාත් හොඳයි කියා මේ අවස්ථාවේදී සඳහන් කරමින්, කථා කිරීමට තවත් කාරණා තිබුණත් කාල වේලාව නොමැති නිසා මගේ කථාවේ ඉතිරි කොටස **සභාගත*** කරමින් මා නවතිනවා. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි. ඊළඟට ගරු ටී.බී. ඒකනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.33]

ගරු ටී. බී. ඒකනායක මහතා
(மாண்புமிகு ரீ. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දින 100කට ඒකාබද්ධ වුණු අතුරු අය වැය සම්බන්ධයෙන් වූ කෙටි කාලීන යෝජනා මාලාව මැතිවරණයක් ඉලක්ක කර ගෙන ජනතාවගේ ඔළුවට නොවෙයි, බඩට කථා කරන යෝජනාවලියක් විධියටයි අපට පෙනෙන්නේ. විශේෂයෙන් අපේ කලාපයේ -වයඹ පළාතේ- සහල්වලට තිබුණු ස්ථානය බැලුවාම වීවල සහතික මිල රුපියල් 50 දක්වා වැඩි කිරීම එක පැත්තකින් ශුභවාදී විධියට පෙනුණත්, නගරයේ ජීවත් වන පාරිභෝගිකයකුට එයින් සහනයක් ලැබෙන බවක් පෙනෙන්නේ නැහැ. මොකද, සහල් කිලෝග්‍රෑමයක් හදන්න වී කිලෝග්‍රෑම් එකහමාරක් පමණ අවශ්‍ය වන අතර එහිදී තැම්බුම් ගාස්තු, කෙටීමේ ගාස්තු, කම්කරු කුලී යන ඒවාත් එක්ක හාල් කිලෝග්‍රෑමයක මිල රුපියල් 100කට වඩා අධික වනවා. එවැනි තත්ත්වයක් තුළින් පාන් පිටි පරිභෝජනය සඳහා උත්තේජනයක් ලබා දීලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාවලියත් එක්ක මාධ්‍ය සංදර්ශන තමයි ක්‍රියාත්මක කරන්නේ. ජනතා විමුක්ති පෙරමුණේ හිටපු මන්ත්‍රීවරු කණ්ඩායමක් හැම දාම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට යන ආකාරය රූපවාහිනියෙන් පෙන්වනවා. හැබැයි ඒ එක සිද්ධියක්වත් අද වන කල් සනාථ කරන්න බැරි වුණා. අද පත්‍රයේ පළ වෙලා තිබෙනවා, බොල්ගොඩ ඔය අසල මෝටර් බෝට්ටු ගණනාවක් තිබුණාය කියලා. නාවික හමුදාවේ මාධ්‍ය ප්‍රකාශක එසැණින්ම කියා තිබුණා, "මෙය නාවික හමුදාව සතු බෝට්ටු අංගණයක්. එය වෙනත් කාගේවත් නොවෙයි" කියලා. ඒ වාගේම කුරුණෑගල ආර්ථික මධ්‍යස්ථානයේ තිබී වාහන වගයක් හම්බ වුණාය කියලා මාධ්‍යයෙන් ප්‍රචාරය වුණා. ඒ සැණෙකින්ම ආර්ථික කටයුතු විෂය භාර අධ්‍යක්ෂවරයා හා ලේකම්වරයා පොලීසියට දැනුම් දුන්නා, "ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ තිබිලා තිබෙන්නේ රජයේ නිලධාරින්ගේ වාහන. ඒ සම්බන්ධයෙන් ලිඛිතව තිබෙනවා. අපි මේවා පාවිච්චි කරනවා"යි කියලා. ඒ වාගේම ජනාධිපති ලේකම් කාර්යාලයේ වාහන ප්‍රමාණයක් කෝට්ටේ ප්‍රදේශයක තිබෙනවාය කියලා පෙන්නුවා. ඒ සම්බන්ධයෙන් සොයා බලන කොට එම ස්ථානය ජනාධිපති ලේකම් කාර්යාලයේ පරණ අබලි වාහන දමන ස්ථානයක් බව හෙළිදරවු වුණා. හිටපු ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මැතිතුමා කිව්වා, "මෙම ස්ථානය අපේ අබලි වාහන දමන තැනක්" කියලා. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය පාවිච්චි කරපු වාහන දෙකකුත් එතැන තිබුණා. මේවා සඟවා තිබෙන වාහන කියලා ලොකු ප්‍රචාරයක් දුන්නා. නමුත් එම ස්ථානය පාවිච්චි කරන්න නුසුදුසු වාහන ගාල් කරපු තැනක්.

වර්තමාන වැඩ පිළිවෙළ තුළින්, පැවති ආණ්ඩුවේ හිටපු මැති ඇමතිවරුන්ට, විශේෂයෙන් මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාට පහර ගැසීම සඳහා විවිධ උපක්‍රම යොදනවා. අරලියගහ මන්දිරයට ගිහින් එහි තිබුණු කඩුවක් පෙන්නුවා. සාමාන්‍යයෙන් හමුදාපතිවරයකු විශ්‍රාම යන කොට චාරිත්‍රානුකූලව ජනාධිපතිවරයාට දෙන්නේ කඩුවක්. ඒ කඩුව අරලියගහ මන්දිරයේ අලංකාරය සඳහා තබා තිබුණා. රූපවාහිනියෙන් ඒ කඩු පෙන්වා රත්‍රන් කඩු, තඹ කඩු, පිත්තල කඩු තිබෙනවාය කියලා ප්‍රචාරය කළා. මේ වාගේ බොළඳ මාධ්‍ය සංදර්ශන මඟින් තමයි මේ කාර්යයන් ක්‍රියාත්මක කර ගෙන යන්නේ. දින 100 යෝජනාවලියත් එක්ක වෙනත් යෝජනාවලියක් තමයි ක්‍රියාත්මක කරන්නේ. මේ වන කල් එක චෝදනාවක්වත් ඔප්පු කර ගන්න පුළුවන්කම ලැබුණේ නැහැ.

මේ වැඩසටහන්වලට වඩා අපි ක්‍රියාත්මක කරන්න අවශ්‍ය වන්නේ මේ රටේ ක්‍රියාත්මක කරන යහ පාලනයේ කාර්ය භාරයේ වගකීමයි. විපක්ෂයේ බහුතරයක් වන අපි සුළුතර ආණ්ඩුවකට සහයෝගය දෙන්න එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවත් එක්ක එකඟ වෙලා තිබෙන්නේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ඉල්ලීම මතයි.

එක පැත්තකින් අපේ සහාය අරගෙන, අනෙක් පැත්තෙන් අපේ අයට අඩන්තේට්ටම් කරන්න, හිරේ විලංගුවේ දාන්න, බොරු චෝදනා නඟන්න, බොරු අල්ලස් චෝදනා නඟන්න, හොරකම් කිරීමේ චෝදනා නඟන්න ක්‍රියා කරනවා. එක පැත්තකින් අපේ සහාය අරගෙන, අනෙක් පැත්තෙන් අපට පෙරළා පහර දීමේ න්‍යායක් තමයි ක්‍රියාත්මක කරගෙන යන්නේ.

මේ වන විට අපි ගෙන ගිය සංවර්ධන කාර්ය භාරයන් සියල්ලම නැවතිලා තිබෙනවා. විශාල ප්‍රමාණයේ සංවර්ධන, මධ්‍යම ප්‍රමාණයේ සංවර්ධන, ග්‍රාමීය මට්ටමේ සංවර්ධන කාර්යයන් නැවතිලා තිබෙනවා. අපි දිස්ත්‍රික් ලේකම්වරුන්ට කථා කළාම ඒ අය අපට දැනුම් දුන්නා, ඒ පටන් ගත්ත සංවර්ධන කාර්යයන් යළි ආරම්භ කරනවාද නැද්ද කියන කාරණය පිළිබඳව තවම උපදෙස් දීලා නැහැ කියලා. ප්‍රාදේශීය මට්ටමින්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින්, පළාත් සභා මට්ටමින් සහ ප්‍රාදේශීය සභා මට්ටමින් ක්‍රියාත්මක කරන සංවර්ධන කටයුතුත් මේ වන විට එහෙමම නැවතිලා තිබෙනවා.

විශේෂයෙන් අපි කියන්නට ඕනෑ, පසු ගිය දා පැවැත්වූ ජනාධිපතිවරණයේ ප්‍රතිඵල අනුව, උතුරු - නැඟෙනහිර දිස්ත්‍රික්ක පහ, නුවරඑළිය සහ නුවර දිස්ත්‍රික්කය හැර අනෙක් සියලුම දිස්ත්‍රික්ක හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහත්මයා ජයග්‍රහණය කරලා තිබෙන බව. අපි ලබා ගත් ඡන්ද ප්‍රතිශතයේ හැටියට ලංකාවේ මැතිවරණ කොට්ඨාස 60න් අපට මන්ත්‍රී ධුර 89කුත්, එක්සත් ජාතික පක්ෂයට මන්ත්‍රී ධුර 52කුත්, උතුරු, නැඟෙනහිර ප්‍රදේශවලින් දෙමළ ජාතික සන්ධානයට මන්ත්‍රී ධුර 19කුත් ලැබෙනවා. මේ ජනාධිපතිවරණයේ ඡන්ද ප්‍රතිඵල අනුව ඒ විධියටයි මන්ත්‍රී ධුර හිමි වන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අදත් අපි මේ සභාවේ ඉඳගෙන ඉන්නේ වැඩි බහුතරයක් සමඟ. නමුත් තමන්ගේ මැතිවරණ කොට්ඨාසය පැරදුණු මන්ත්‍රීවරුන් - අවුරුදු 20ක් තිස්සේ තමන්ගේ මැතිවරණ කොට්ඨාසය පැරදුණු මන්ත්‍රීවරුන්- අද කැබිනට් ඇමතිවරුන්, නියෝජ්‍ය ඇමතිවරුන් වෙලා සිටිනවා. අද නියෝජ්‍ය ඇමතිවරුන් සමඟ ඇමතිවරුන් 45 දෙනෙකු සිටිනවා. මේ අයගෙන් සියයට 75ක් දෙනා තමන්ගේ මැතිවරණ කොට්ඨාසය පරාදයි. අද පමණක් නොවෙයි, එදාත් තමන්ගේ මැතිවරණ කොට්ඨාස පරාද වුණු අය ජන මතයකින්

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ටී. බී. ඒකනායක මහතා]

තොරව, මහජන වැඩ පිළිවෙළක් නැතිව අද ඇමති තනතුරක වගකීම දරනවා.

අපි දකින දෙයක් තමයි, රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව අද හුහක් කාර්යයන් ක්‍රියාත්මක නොවෙන තත්ත්වයක් තිබෙනවාය කියන කාරණය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යහපාලනය කියන වචනය අර්ථය හැටියට ඉතාම හොඳයි. නමුත් අපි ප්‍රායෝගිකව කල්පනා කළ යුතු දෙය මේකයි. අපි -මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් 225 දෙනාම- එකට එක්ව යහ පාලනය ක්‍රියාත්මක කරලා රටේ ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම්, ජනතාවගේ අවශ්‍යතාවන් ඉෂ්ට සිද්ධ කරන්නට බැඳිලා ඉන්නවා. යහ පාලනය කියන ඒ වචනයේ යථාර්ථය, සැබෑම අර්ථය ක්‍රියාත්මක කරන්න අපි ලෑස්ති වෙන්න ඕනෑ. සාමය පිළිබඳ කටයුත්ත එක පැත්තකින් ක්‍රියාත්මක වෙද්දී අනෙක් පැත්තෙන් පොලු, මුගුරු, කැති අරගෙන ක්‍රියාත්මක වෙන වැඩ පිළිවෙළ අපි මේ කාර්ය භාරයේදී වෙනස් කළ යුතුයි. රජය විධියට, අමාත්‍යාංශ විධියට මේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ප්‍රශ්නයක් තිබෙනවා. අපේ වගකීම් ක්‍රියාත්මක කිරීම සඳහා අපි ආරම්භ කළ විවිධ අමාත්‍යාංශවල කාර්යභාරය එහෙමම ලොප් කරනවාද, එහෙම නැත්නම් ඒවා දිගට අරගෙන යනවාද කියන ප්‍රශ්නය අපට තිබෙනවා. ගිය වසරේ අපි ගෙනාපු අය වැය යෝජනාවේ ඒ සියල්ලටම මුදල් වෙන් කරලා තිබෙනවා. මේ ආණ්ඩුවෙන් ගෙනාපු අය වැයේත් යෝජනා ගැන සඳහන් කරලා තිබෙනවා. නමුත් ඒ යෝජනාවලට මුදල් ගන්නේ කොයි ආකාරයෙන්ද කියන කාරණය මේ අය වැය යෝජනාවේ නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සාමාන්‍යයෙන් අය වැයකින් මුදල් වැය කරන ක්‍රමවේදය එක පැත්තකින් ඉදිරිපත් කරන අතර, අනෙක් පැත්තෙන් කියනවා අපි මෙන්න මේ ආකාරයට තමයි මේ ආදායම සොයා ගන්නේ කියලා. ඒ විධියට ආදායම් බදුවලින් මෙපමණයි, අනෙක් දේවල්වලින් මෙපමණයි කියන කාරණය මේ අය වැයෙන් සනාථ වෙලා නැහැ. එහෙම නැති වැඩ පිළිවෙළක් තුළ අපි මුදල් ඇමතිවරයාගෙන් දැන ගන්න කැමැතියි, මේ මුදල් ලබා ගන්නා ක්‍රමවේදය මොකක්ද කියලා. මේ සම්බන්ධයෙන් කාරණා රාශියක් කථා කරන්න තිබෙනවා.

මෛත්‍රීපාල සිරිසේන අපේ පක්ෂයේ නායකතුමාගේ ඉල්ලීම මත, මේ යහ පාලන වැඩ පිළිවෙළේදී සුන්දරවූත්, රම්‍යවූත් වචන හරඹය පැත්තකට තියලා සැබෑ යහ පාලනය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නය කියන ඉල්ලීම කරනවා. ගම්වල සාමාන්‍ය ජනතාව තළා පෙළන්නේ නැතුව, රජයේ නිලධාරින් තළා පෙළන්නේ නැතුව මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න කියලා අපි ඉල්ලා සිටින්න කැමැතියි. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
The Hon. Navin Dissanayake, please. You have 15 minutes.

[අ.භා 4.42]

ගරු නවින් දිසානායක මහතා (සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு நவீன் திஸாநாயக்க - சுற்றுலா மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Navin Dissanayake - Minister of Tourism and Sports)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කුරුණෑගල දිස්ත්‍රික්කයේ මන්ත්‍රීතුමාගේ කතාවට සවන් දෙනකොට මට තේරුම් ගිය කාරණයක් තිබෙනවා.

සමාවෙන්න, ඊට කලින් ඉතාම සතුටින් මෙම ගරු සභාවට කියන්න කාරණයක් තිබෙනවා. ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතිතුමාගේ සහ ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඊයේ පැවැති කැබිනට් රැස්වීමේදී තීරණයක් ගැනීමට අවස්ථාව ලැබුණා, ලෝක කුසලානය දිනා ගත්තොත් අපේ ජාතික ක්‍රිකට් ක්‍රීඩකයන්ට ත්‍යාගයක් වශයෙන් රුපියල් මිලියන එකසිය තිහක් - ඇමෙරිකානු ඩොලර් මිලියන එකක්- ලබා දෙන්න. ඉතින් ක්‍රීඩා ඇමති හැටියට මම හිතනවා ඒක එතුමන්ලාට විශාල මානසික ශක්තියක් වෙයි කියලා.

කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාගේ කතාවෙන් තේරුණා, පසු ගිය මැතිවරණ ව්‍යාපාරයේදී එතුමන්ලාගේ විශාල අඩුපාඩුවක් තිබුණු බව. එතුමාගේ කතාවෙන් ඒ අඩුපාඩුව මට පෙනුණා. එතුමා ප්‍රකාශ කළා, මැතිවරණයේදී ආසන ප්‍රමාණයෙන් වැඩි ප්‍රමාණයක් එතුමන්ලා දිනුවා කියලා. නමුත් ඇත්ත වශයෙන්ම ජනාධිපතිවරණයක ගණන් ගත යුත්තේ ඡන්ද ප්‍රතිශතයයි. බහුතරයක් සිංහල ජනතාව සිටින ප්‍රදේශවලින් හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ජයග්‍රහණය කළා. ඒ ප්‍රදේශවලින් එතුමා සියයට 55ක් ඡන්ද ලබා ගත්තා. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ලබා ගත්තේ ඡන්ද සියයට 45යි. නමුත් අනෙක් ප්‍රදේශවලින්, විශේෂයෙන්ම සුළු ජාතික දමිළ හා මුස්ලිම් ජනතාව සිටින ප්‍රදේශවලින් හිටපු ජනාධිපතිතුමාට අන්ත පරාජයක් ලැබුණා. කෙසේ වෙතත්, ලබා ගත් ඡන්ද ප්‍රතිශතය තමයි අන්තිම ප්‍රතිඵලය.

මේ රටේ හැම පුරවැසියෙකුටම එක ඡන්දයක් තිබෙනවා. ඉතින්, ඒක වර්ගීකරණය කරනවාද සිංහලද, දමිළද, මුස්ලිම්ද කියලා? නැහැ. ඒක තමයි ඔබතුමන්ලාට වැරදුණේ. ඔබතුමන්ලාගේ campaign එක සියලුම ජාතීන්ට එකලෙස ක්‍රියාත්මක කළා නම්, මම හිතන විධියට මීටත් වඩා සාර්ථක ප්‍රතිඵලයක් ඔබතුමන්ලාට ලබා ගන්න තිබුණා. නමුත් එහෙම වුණේ නැහැ. ඔබතුමන්ලා දමිළ සහෝදරයන් අමතක කරලා දැම්මා. ඔබතුමන්ලා මුස්ලිම් සහෝදරයන් අමතක කරලා දැම්මා. ඔබතුමන්ලා හිතුවේ සිංහල ඡන්දවලින් පමණක්ම ජයග්‍රහණය කරන්න පුළුවන් වෙයි කියලා. කවදාවත් ඒක කරන්න බැහැ.1982 පැවති ජනාධිපතිවරණයෙන් ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ඡන්ද සියයට 51ක් ගත්තේ කොහොමද? එතුමා සියයට 51ක් ගත්තේ සිංහල, දමිළ හා මුස්ලිම් ඡන්ද එකමුතු කරලා. ඔබතුමන්ලා හිතනවා නම්, අනාගත මැතිවරණයකදී ඔය සංඛ්‍යාලේඛනත් එක්ක ගිහිල්ලා ජයග්‍රහණයක් ලබා ගන්න, එහෙම නම් ඒක අපට හොඳයි. මම උදාහරණයක් දෙන්නම්, තමුන්නාන්සේලා බලන්න. මේ තත්ත්වය මේ රටේ ජනාධිපතිවරණවලදී පමණක් නොවෙයි, ඇමෙරිකා එක්සත් ජනපදයේ 2012 දී පැවැති ජනාධිපතිවරණයේදීත් බලපෑවා. Even in the United States, President Obama's election reflected this reality. බැරක් ඔබාමා ජනාධිපතිවරයාට කවුද සහයෝගය ලබා දුන්නේ? සහාය දුන්නේ ලතීනුවන්. ඔබාමා ජනාධිපතිතුමාට ලතීනුවන්, කළු ජාතිකයන්, කාන්තාවන් වාගේම, විශේෂයෙන්ම ඒ රට තුළ සිටින විවිධාකාර ජාතීන් සහයෝගය ලබා දුන්නා. නමුත් රට තුළ සිටින සුදු ජාතිකයන්ගෙන් සියයට 35ක් පමණයි එතුමාට සහයෝගය ලබා දුන්නේ. එතකොට එතුමාට විරුද්ධව තරග කළ ජෝන් කෙරී අපේක්ෂකතුමාට කොපමණ ඡන්ද ලැබුණාද? මම වගකීමෙන් කියනවා. ඒ අවස්ථාවේ ජෝන් කෙරීට සියයට 65ක් පමණ සුදු ජාතික ඡන්ද ලැබුණා. මේක තමයි යථාර්ථය.

ඔබතුමන්ලා ජනාධිපතිවරණ ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම පදනම් කර ගත්තේ එක කොටසකට පමණයි. ඉතින් ඒ කොටස එක්ක තමුන්නාන්සේලා රබන් ගහ ගහ, හිනා වෙවී හිටියා. නමුත් අපේ ජනාධිපති මැතිවරණය අපි සියලු ජාතිකයන්ටම market කරලා ඒ විධියට ඉදිරියට අරගෙන ගියා. අනෙක් අතින් තමුන්නාන්සේලාට කොච්චර සම්පත්

ප්‍රමාණයක් තිබුණාද? මම ඒ ගැන වගකීමෙන් කියන්නේ. තමුන්නාන්සේලාට ජාතික රූපවාහිනිය තිබුණා; අයිටීඑන් එක තිබුණා. අද ඒවා තමුන්නාන්සේලාට නැහැ. ඉතින් මේ යථාර්ථය කරුණාකරලා පිළිගන්න.

විශේෂයෙන් දමිළ සහෝදරයන්, මුස්ලිම් සහෝදරයන් -දමිළ ජනතාව හා මුස්ලිම් ජනතාව - කොන් කරන්න එපා, ඒ අය එකතු කර ගන්න, ඒ අය එක්ක කථා කරන්න, ඒ අයගේ විශ්වාසය ගොඩ නඟාගන්න කියලා අපි කිව්වා. රජය ඇතුළේ ඉන්න කොට අපි නිරන්තරයෙන් ජනාධිපතිතුමාට එය කිව්වා. නමුත් එවැනි කිසිම දෙයක් කළේ නැහැ. අලුත්ගම සිද්ධිය නිසා අන්තිමේදි මොකක්ද වුණේ? මුස්ලිම් ජාතිකයන් සම්පූර්ණයෙන් විරුද්ධ පාර්ශ්වයට තල්ලු කළේ තමුන්නාන්සේලායි. මේ යථාර්ථය පිළිගෙන දේශපාලනය කරන්න. යථාර්ථය නොපිළිගෙන දේශපාලනය කරන්න එපා. අප ගත්තේ විශේෂයෙන්ම ප්‍රතිපත්තිමය තීරණයි. අපි දැන ගත්තා, සිද්ධ වන දේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි අය වැය ගැන කථා කරනවා. ඇත්ත වශයෙන් කවුද, පසු ගිය කාලයේ මේ රටේ ආර්ථිකය මෙහෙය වූයේ? මම වගකීමෙනුයි අහන්නේ. පුද්ගලයන් දෙදෙනායි, තුන්දෙනායි. එක පැත්තකින්, පී.බී. ජයසුන්දර. අනෙක් පැත්තෙන්, කබ්රාල්. ඒ අයත් එක්ක අපි කථා කළා. අපි ඒ අයට කරුණු කිව්වා. අපි කියපු දේවල් ශත පහකටවත් ගණන් ගත්තේ නැහැ. මගේ මිත්‍ර ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මන්ත්‍රීතුමා දැන් මේ ගරු සභාවේ ඉඳගෙන ඉන්නවා. ගරු මන්ත්‍රීතුමනි, මොකක්ද ඔබතුමාට වුණේ? ඔබතුමාගේ සීනි ව්‍යාපෘතිවලට මොනවාද වුණේ? ඔබතුමා හොඳ යෝජනා ගෙනාවා. අන්තිමට කොතැනින්ද ඒවා කැඩුණේ? කොතැනින්ද ඒවා නතර කළේ? මම වග කීමෙන් කියනවා, ඒවා නතර කළේ මුදල් අමාත්‍යාංශයේ පී.බී. ජයසුන්දර කියලා. මහින්ද රාජපක්ෂව කෑවා නම් කෑවේ ඒ දෙදෙනායි. තමුන්නාන්සේලා දැන් කරුණාකර අවදි වෙන්න. අපි විශාල සහන ප්‍රමාණයක් ජනතාවට දීලා තිබෙනවා. අපි කොහොමද මේවා දුන්නේ? ගරු කුමාර වෙල්ගම හිටපු ඇමතිතුමනි, අපි මේවා දුන්නේ, පැහැදිලිවම නාස්තිය, වියදම් අඩු කරලායි. ජනාධිපතිතුමාට ලබා දුන්නු මුදල අපි සියයට 50කින් කපා හැර තිබෙනවා. එය ඊටත් වඩා වැඩියි. We have reduced the expenditure of the President. The expenditure under the Head of the office of the President has been reduced by billions of rupees, and we have increased the revenue. අපි ආදායම් තත්ත්වය වැඩි කර තිබෙනවා.

අය වැයක් කියන්නේ විශේෂයෙන්ම ඇස්තමේන්තුයි. මේ රට මොන වාගේ දිශාවකට ද ගෙන යන්නේ කියන එක ගැන අපට පැහැදිලි තීරණයක් දෙන, යම්කිසි පණිවුඩයක් දෙන කථාවකුයි එහි අන්තර්ගත වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ අවස්ථාවේ විශේෂ කාරණයක් කියන්න කැමැතියි. තමුන්නාන්සේලා අර්ථකථනයක් කරනවා, අපේ මේ ආණ්ඩුවට බහුතරයක් නැහැ කියලා. පැහැදිලිවම බහුතරයක් නැහැ. අපි මෙතැන ඉන්නේ දින 100කට පමණයි. අපගේ අරමුණු ටික ඉෂ්ට කරගන්නට, මේ රටේ ජනතාව විශේෂයෙන් ඉල්ලන මේ ජනාධිපති ක්‍රමය අහෝසි කරන එකට තමුන්නාන්සේලාත් උදවු කරන්න.

අපි සමාජවාදය ගැන කථා කරනවා; කොමියුනිස්ට්වාදය ගැන කථා කරනවා; රැඩිකල්වාදය ගැන කථා කරනවා. නමුත් ඇත්ත වශයෙන් පසු ගිය කාලයේ තිබුණේ මොකක්ද? වැඩවසම් ක්‍රමයක් නේ තිබුණේ. පවුල්වාදයක් නේ තිබුණේ. තමුන්නාන්සේලාගේ ආර්ථික විශේෂඥයා දැන් කෝ? ඔහු මගේ තාත්තාගේ එවකට මිත්‍රයා. ඒ තමයි, Mr. Basil Rajapaksa. කෝ, අද ඔහු? ඇයි මෙතැනට ඇවිල්ලා මේ ප්‍රශ්නවලට පිළිතුරු දෙන්නේ නැත්තේ? ඇයි පැනලා ගියේ? ඇයි, ජනාධිපතිවරණයෙන් සතියකට පස්සේ ඇමෙරිකාවට ගියේ? ඇයි, තමුන්නාන්සේලා වාගේ මෙතැන ඉන්න බැරි වුණේ? අද සාමාන්‍ය ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන්ගේ දුක, වේදනාව තමුන්නාන්සේලාට තේරෙනවා. ඒ මානසික පීඩනය තමුන්නාන්සේලාට දැනෙනවා. නමුත් ඇමෙරිකාවේ සිටින බැසිල් රාජපක්ෂට ඒ පීඩනය නැහැ. ඔහු එහේ ගිහිල්ලා සැප විඳිනවා. ඔහු එහේ ගිහිල්ලා ඔහුගේ ඇඟ බේරාගත්තා. සාමාන්‍ය ඇමතිවරුන් හැටියට හිටපු අප දිහා ඒ කාලයේ බැසිල් රාජපක්ෂ බැලුවේවත් නැහැ. මම එය වගකීමෙන් කියනවා. ඒ අය තමයි මේ ආණ්ඩුව නැති කරලා දැම්මේ. අවුරුදු 40ක් දේශපාලනය කරපු හිටපු ජනාධිපතිතුමා ප්‍රබුද්ධ දේශපාලනඥයෙකු නම්, එවැනි අය පත් කරනවාද ඒ තනතුරුවලට? මා එය අහන්න කැමැතියි.

එක පැත්තකින්, කබ්රාල්. "රටේ කිසිම ප්‍රශ්නයක් නැහැ, දරිද්‍රතාව අඩු වෙනවා" කියලා මේ ලස්සන සිහිනය මැව්වේ කබ්රාල්. මගේ අත් දැකීමෙන් දැනගත් එකක් මම කියන්නම්. එක සංඛ්‍යා ලේඛනයක් සම්පූර්ණයෙන් වැරැදියි. ඒ තමයි, විරැකියා සංඛ්‍යා ලේඛනය. අපට කිව්වේ මේ රටේ විරැකියාව සියයට 4යි කියලායි. පිළිගන්නවාද, එම අගය සියයට 4යි කියලා? බම්බුව! ඒක බොරු. අපි ගම්වලට ගියාම රැකියා සඳහා application දෙන්න අප ළඟට එන කොල්ලන්ගේ සංඛ්‍යාව බලන්න. මම දන්නේ නැහැ, අපේ ලක්ෂ්මන් සෙනෙවිරත්න මන්ත්‍රීතුමාට රස්සා කීයක් දෙන්න පුළුවන් වුණාද කියලා. මට නම් බැරි වුණා. ඒක තමයි යථාර්ථය.

පාරවල් හදන්න විශාල වශයෙන් සල්ලි දැම්මා. ඒකෙන් සොච්චමක් දමන්න තිබුණා, රස්සා ටිකක් ඇති කරන්න. අපගේ මුදල් ඇමතිතුමා සහ අගමැතිතුමා පැහැදිලිව ප්‍රකාශ කර තිබෙනවා, අවුරුදු දෙක තුනක් ඇතුළත රැකී රක්ෂා ලක්ෂ 10ක් මේ ආර්ථිකය තුළ නිර්මාණය කරනවා කියලා. මම හිතන්නේ අපට ඒක කරන්න පුළුවන් කියලායි. අපට හැම දාම රජයේ රැකියා දෙන්න බැහැ.

අපි දේශපාලනඥයන් වශයෙන් ඊට වඩා වග කීමෙන් වැඩ කළ යුතුයි. එහෙම නම්, පෞද්ගලික අංශය නිදහස් කරලා; පෞද්ගලික අංශයට ඒ අවශ්‍ය සම්පත් ලබා දීලා ප්‍රතිපත්තිමය රාමුවක් - policy framework එකක් - තුළ තමයි මේ රැකී රක්ෂා ලබා දෙන්න පුළුවන් වන්නේ. කැබිනට් මණ්ඩලය පණස්පහෙන්, විසිහතට අපි අඩු කරලා තිබෙනවා. මේ තුළින් පැහැදිලිවම රජයේ මුදල් විශාල ප්‍රමාණයක් ඉතිරි වනවා. මේක විශාල ජයග්‍රහණයක්. අපි කිව්ව සෑම දෙයක්ම ඉෂ්ට කරලා තිබෙනවා. ඒක අමතක කරන්න එපා. අපි කිව්වා, තෙල් මිල අඩු කරනවා කියලා; ඒ අනුව අපි තෙල් මිල අඩු කළා. අපි මේ සහන මල්ල ලබා දෙනවා කිව්වා; ඒ සහන මල්ල අපි ලබා දීලා තිබෙනවා. අපි රජයේ සේවකයන්ට පඩි වැඩි කරනවා කිව්වා; ඒ අනුව අපි ඔවුන්ගේ පඩි වැඩි කළා. අපි මේවා කළේ කොහොමද? මේවාට සමච්චල් කරන්න එපා. මේවා කරන්න තිබුණු දේවල්. මහින්ද රාජපක්ෂ මැතිතුමාට හොඳ මුදල් උපදේශකයන් හිටියා නම් මේක කරන්න තිබුණා.

මහින්ද රාජපක්ෂ අසාර්ථක පුද්ගලයෙක් කියලා අපි කියන්නේ නැහැ. එතුමාට යම් කිසි ශක්තීන් තිබුණා. එතුමා හොඳ නායකයෙක්. මේ රටේ ජනාධිපති වන්න යම් කිසි නායකත්ව ලක්ෂණ තිබෙන්න ඕනෑ. එතුමා ඒවා පෙන්නුවා. අපි ඒවා නැහැයි කියන්නේ නැහැ. නමුත්, එතුමාව නැති කළේ එතුමාගේ වටේ ඉන්න කට්ටිය; විශේෂයෙන්ම එතුමාගේ සහෝදරයා බැසිල් රාජපක්ෂ. එය සියයට 100ක්ම සැබෑවක්ය කියලා තමුන්නාන්සේලාගේ හදවතේ තිබෙනවා කියලා මම දන්නවා. මොකද, අපි ඇමතිවරු හැටියට අනුවේදනීය, කනගාටුදායක සිද්ධීන්වලට මුහුණ දීලා තිබෙනවා.

[ගරු නවින් දිසානායක මහතා]

මේ අතුරු අය වැය අහනකොට ඇත්ත වශයෙන්ම 1978-79 ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ කාලයේ ඉදිරිපත් කළ අය වැය මට මතක් වනවා. සමාජවාදී අය වැයක්. තමුන්නාන්සේලා, අපි 2001 දී යූඑන්පී ආණ්ඩුවේ හිටියා. ලක්ෂ්මන් සෙනෙවිරත්න මැතිතුමනි, ඔබතුමාට එය මතක ඇති. අපේ අකිල විරාජ් කාරියවසම් ඇමතිතුමාත් මෙම අවස්ථාවේදී ගරු සභාවේ ඉන්නවා. ඒ මන්ත්‍රී කණ්ඩායමේ එදා සිටි අපි කිව්වා, රස්සා ටිකක් දෙන්න කියලා. දුන්නේ නැහැ. එදා මොනවාද වුණේ? පටි තද කර ගන්න කිව්වා.

අද සම්පූර්ණයෙන්ම වෙනස් රැඩිකල් දර්ශනයකටයි මේ ආණ්ඩුව යන්නේ. ඒ ජනතාවට සහන ලබා දෙන්නයි. මොකද, මේ රටේ සුපිරි පන්තියක් ඉන්නවා කියලා අපි විශ්වාස කරනවා. විශේෂයෙන් ඔය පෙරේරාලා. නම් කියන්න යන්නේ නැහැ, මම. කවුද කියලා තමුන්නාන්සේලා දන්නවා. ඉස්සරහා නම් ටික දමා ගන්න. තමුන්නාන්සේලා ඒ නම් ටික දන්නවා. 'පෙරේරා' කිව්වාම තමුන්නාන්සේලා දන්නවා. පෙරේරාලා දෙන්නෙක් හිටියා. They have been manipulating the stock market by pumping and dumping money. ඒ ගොල්ලන්ගේ යාළුවෝ ටික දමා ගෙන stock market එක උඩට පහළට කරනවා. රුපියල් 50ට share එකක් අරගෙන හැන්දෑ වෙන කොට එය රුපියල් 55 කරනවා. ඒ කෘත්‍රිම වශයෙන්. එතකොට රුපියල් 5ක ලාභයක් තිබෙනවා. ඒ මඟින් රුපියල් කෝටි ගණන් හම්බ කළා. ඒ දේවල් අපි දන්නවා. මේ ගොල්ලන් තමයි මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ campaign එකට මුදල් දුන්නේ. මේ ගොල්ලන් අපට සමච්චල් කළා. අපි හම්බ වුණාම මේ ගොල්ලන් අපට කිව්වා, "මොන පිස්සුද? මහින්ද රාජපක්ෂ මැතිතුමා උඩින්ම දිනනවා" කියලා. ඇයි එහෙම කිව්වේ? සල්ලි බලය නිසා. නමුත්, සල්ලි බලයට වඩා මනුෂ්‍ය බලය වැදගත් කියලා මේ රටේ ජනතාව ඔප්පු කළා. එම නිසා සල්ලිවලින්, බලයෙන්, පවුල් වාදයෙන් දීර්ඝ කාලීන ගමනක් යන්න බැහැයි කියන එක තමුන්නාන්සේලා අමතක කරන්න එපා.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අනාගත නායකයෝ කවුද කියලා අපි දන්නේ නැහැ. බණ්ඩාරනායක පවුලත් අවුරුදු ගණනාවක් - අවුරුදු 40ක්, 50ක්- රටේ නායකත්වයේ හිටියා. මේ රාජපක්ෂ පවුලත් හිතන්න ඇති, අවුරුදු 50ක්, 60ක්, 70ක් පාලනය ගෙන යන්න. කවුද නියම නායකයා කියලා තමුන්නාන්සේලා ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන් වශයෙන් තීරණයක් ගන්න.

ඇත්ත වශයෙන්ම එක්සත් ජාතික පක්ෂයේ මේ නව දර්ශනය යටතේ අපි ක්‍රියා කරනවා. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ අනුදැනුමෙන් රනිල් වික්‍රමසිංහ මැතිතුමා හා රවි කරුණානායක මැතිතුමා ඉතාමත් ශුභවාදී සහන අය වැයක් ලබා දීලා තිබෙනවා.

මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි, ජූනි මාසයේ සිට සමෘද්ධි දීමනාව සියයට 200කින් වැඩි කරන බව. ඒක අය වැයේ පැහැදිලිවම සඳහන් කර තිබෙනවා. බුද්ධිමත් ජනතාවක් වන අපේ ජනතාව අධ්‍යාපනයට වෙන් කරන මුදල සියයට 6කින් වැඩි කරන්න කිව්වා. මේක අධ්‍යාපන ක්ෂේත්‍රයේ සියලු දෙනාම නිරන්තරයෙන්ම කළ ඉල්ලීමක්. දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6ක් අධ්‍යාපනයට වෙන් කරන්න කියලා මේ රටේ බුද්ධිමතුන්, මේ රටේ බුද්ධිය අගය කරන ජනතාව ඉල්ලීමක් කළා. මේ වතාවේ අපි ඒක කරලා තිබෙනවා. අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියුතුවූවන් ඒකට කළ අරගළය පිළිබඳව තමුන්නාන්සේලා දන්නවා. මේවා අවශ්‍ය දේවල්. රටකට දීර්ඝ කාලීන සැලැස්මක් තිබෙන්න ඕනෑ. එදා අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශාල පිම්මක් පැන්න අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා අද අධ්‍යාපනයට වෙන් කරන මුදල සියයට 6 දක්වා වැඩි කරලා තිබෙනවා. මේ ප්‍රමාණය තිබුණේ සියයට 2ක් වශයෙන්. සියයට 2 කිව්වාට, සියයට 1.7යි තිබුණේ. නමුත් සියයට 6කට මේක වැඩි කර තිබෙනවා.

These are huge policy changes. Expenditure for Education has been increased to 6 per cent of the GDP. It is a huge monumental change. So, we welcome things like that and you, Hon. Members of the Opposition, should too.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Please wind up, Hon. Minister.

ගරු නවින් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක කාලයක් දෙන්න. මේ වැඩ පිළිවෙළ දින සියයකට පමණයි. ඒ හරහා අලුත් ව්‍යවස්ථාවක් හඳුන්වා දීමට අප බලාපොරොත්තු වෙනවා. ඊට පසු අපි මහ මැතිවරණයකට යමු. අපි මිත්‍රයන් වශයෙන් දේශපාලනය කරමු. රට වෙනුවෙන් දේශපාලනය කරමු. තමුන්නාන්සේලාගේ අදහස් අපට වැදගත්. ඒ අදහස් ලබා දී අපි ඉදිරියට යමු කියන පණිවුඩය දෙමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
The next speaker is the Hon. E. Saravanapavan. You have 20 minutes.

[பி.ப. 4.58]

ගරු ඊ. සරවනපවන් මහතා
(மாண்புமிகு ஈ. சரவணபவன்)
(The Hon. E. Saravanapavan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! கௌரவ பிரதமர் ரணில் விக்கிரமசிங்க அவர்களின் தலைமையிலான அமைச்சரவையைக் கொண்ட இந்த அரசாங்கம் பொறுப்பேற்ற பின்னர் இச்சபையில் எனக்கு உரையாற்றக் கிடைத்த முதலாவது சந்தர்ப்பத்தையிட்டு எனது மகிழ்ச்சியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

பெருமைக்குரிய இந்த நாடாளுமன்றம் பல வரவு செலவுத் திட்டங்களைச் சந்தித்துள்ளது. ஆனால், தற்சமயம் சமர்ப்பிக்கப்பட்ட வரவு செலவுத்திட்டம் மக்களுக்கு மிக அதிகமான அனுகூலங்களை வழங்கியதன்மூலம் ஒரு தனித்துவமான சாதனையை வெளிப்படுத்தியுள்ளமையை யிட்டு நான் எனது பாராட்டுக்களைத் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன். அத்தியாவசியப் பொருட்களின் விலை குறைப்பு, அரச ஊழியர்களின் சம்பள அதிகரிப்பு போன்ற எதிர்பாராத வகையிலான வரப்பிரசாதங்களை இந்த வரவு செலவுத்திட்டம் வழங்கியதன்மூலம் இந்நாட்டு மக்களின் மனதைக் குளிரவைத்துள்ளது. கடந்த அரசாங்க காலத்தில் இடம்பெற்ற வீண்விரயங்கள், ஆடம்பரச் செலவினங்கள், இலஞ்ச, ஊழல், மோசடி நடவடிக்கைகள் போன்றவற்றின் மூலம் ஏற்பட்ட விரயங்களைத் தவிர்த்து அதன் பலாபலன்களை மக்களுக்கு வழங்கும் வகையிலான இந்த அரசாங்கத்தின் நன்முயற்சியின் ஒரு பகுதியாகவே இதை நான் பார்க்கின்றேன்.

மேலும், மக்களுடன் நெருக்கமாக உறவாடி, அவர்களின் குறைநிறைகளையும் உணர்வுகளையும் புரிந்துகொள்ளக்கூடிய பெருமைமிகு ஊடகத்துறையுடன் தொடர்புடையவன் என்ற வகையிலும் மக்களின் தேவைகளை இச்சபையில் சமர்ப்பித்து நிவாரணங்களைக் கோரும் கடப்பாடுடைய ஒரு நாடாளுமன்ற உறுப்பினர் என்ற வகையிலும் நான் இங்கு சில விடயங்களைச் சுட்டிக்காட்ட விரும்புகிறேன்.

பெரும்பான்மையான மக்கள் மகிழ்ச்சிகொள்ளத்தக்க வகையில் இந்த வரவு செலவுத்திட்டம் அமைந்துள்ள போதிலும், ஒரு சில தரப்பினர் எதிர்பார்த்த அளவுக்கு அது நிறைவேற்றப்படவில்லை எனக் குறைபடுவதை என்னால் அறிய முடிந்துள்ளது. கடந்த காலங்களில் பல பெருந்தோட்டங்களில் முறையற்ற நிர்வாகம் காரணமாகவும் பராமரிப்பு, மீள்நடுகை என்பனவற்றில் போதியளவு கவனம் செலுத்தப்படாமையாலும் தேயிலை உற்பத்தியில் பாரிய பின்னடைவை எதிர்கொள்ள வேண்டியிருந்தது. இலங்கைத் தேயிலையின் உலகத்தரப்பங்கு இருந்த மதிப்பிலும் சரிவு ஏற்படும் நிலை தோன்றியது. அதனால், தோட்டத் தொழிலாளர்கள் சம்பள உயர்வு கோரும் போதெல்லாம் அதனைக் கொடுக்காமைக்கு இலாபமின்மை ஒரு காரணமாகக் காட்டப்பட்டது. எனவே, இத்தகைய குறைபாடுகள் களையப்படும் போது தொழிலாளர்களின் சம்பளம் உயர்த்தப்படுவதில் சிக்கல் இருக்க முடியாது. எனவே, கௌரவ பெருந் தோட்டத்துறை அமைச்சர் இந்த விடயங்களில் கூடுதல் கவனம் செலுத்தும் அதேவேளையில், தோட்டத் தொழிலாளர்களின் சம்பளத்தையும் மாதம் ஐயாயிரம் ரூபாயால் அதிகரிப்பதற்கு உடனடி நடவடிக்கை எடுக்கவேண்டுமெனவும் கேட்டுக் கொள்கிறேன்.

மேலும், கூட்டுறவுத் துறையைச் சேர்ந்த பணியாளர்களின் சம்பள அதிகரிப்புப் பற்றி இந்த வரவு செலவுத்திட்டத்தில் எதுவும் குறிப்பிடப்படாமையானது வருத்தமளிக்கும் ஒரு விடயமாகும். கடந்த காலத்தில் இடம்பெற்ற சிறுசிறு சம்பள உயர்வுகளும் அவர்களுக்கு வழங்கப்படவில்லை என்பதை நாம் புரிந்துகொள்ள வேண்டும். இப்படியாக அந்தப் பணியாளர்கள் குறைந்த ஊதியத்தில் வேலை வாங்கப்படுவதற்கு அந்தந்தக் கூட்டுறவுச் சங்கங்கள் நட்டத்தில் இயங்குவதாகக் காரணம் காட்டப்படுகின்றது.

ஒரு காலத்தில் வட பகுதியில் கூட்டுறவுச் சங்கங்கள் மிகவும் சிறப்பாக இயங்குவதில் பல அரிய உதாரணங்களை வெளிப்படுத்தின. ஆனால், கடந்த அரசாங்கத்தின் ஆட்சிக் காலத்தில் கூட்டுறவுச் சங்கங்களின் நிர்வாகத்தில் அதீதமான அரசியல் தலையீடுகள் மேற்கொள்ளப்பட்டன. அரசியல் வாதிகளின் எடுபிடிகள் நிர்வாக பீடங்களில் நியமிக்கப் பட்டனர். ஊழல் மோசடிகளில் ஈடுபட்டுவிட்டு, அரசியல் செல்வாக்கினால் சட்டத்தின் பிடியிலிருந்து தப்பிக் கொண்டனர். அதன் காரணமாகவே கூட்டுறவுச் சங்கங்கள் நட்டத்தில் இயங்கும் நிலை ஏற்பட்டது. சர்வாதிகாரத்தின் சீரழிவுகளால் ஏற்பட்ட நட்டத்தின் சுமை சாதாரண பணியாளர்களின் தலையிலே சுமத்தப்பட்டது. எனவே, ஏற்கெனவே ஆதிக்கம் வகித்துவரும் ஊழல் மோசடி நிர்வாகங்கள் கலைக்கப்பட்டு, கூட்டுறவுத்துறையில் அறிவும் அனுபவமும் வாய்ந்த நேர்மையான மனிதர்கள் நியமிக்கப்பட வேண்டும். அதற்காக கூட்டுறவுத்துறை அமைச்சரும், கூட்டுறவுத் துறையைச் சேர்ந்த பணியாளர்களின் ஊதியத்தை உயர்த்துவதற்கு நிதியமைச்சரும் ஆக்கபூர்வமான நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டுமென்ற எனது வேண்டுகோளை இச்சபையிலே முன்வைக்கின்றேன்.

எந்த அரசாங்கம் ஆட்சியிலிருந்தாலும் அரச நிர்வாகத்தைக் கொண்டுநடத்துவதில் அர்ப்பணிப்புடன் பணியாற்றுபவர்கள் அரச சேவைப் பணியாளர்களே. அவர்களது சேவைக்காலம் நிறைவடையும்போது அவர்களுக்கு அரசாங்கத்தால் ஓய்வூதியம் வழங்கப்படுகிறது. தமது வாழ்நாளில் முக்கிய பெரும் பகுதியை நாட்டுக்காகச் சேவை செய்வதற்காக அர்ப்பணித்த அவர்களைக் கௌரவிப்பதும் அவர்கள் கடைசிக் காலத்தில் நிம்மதியாக வாழ வழிசெய்வதும் அரசாங்கத்தின் கடமையாகும். அவ்வகையிலேயே சிரேஷ்ட பிரஜைகளான அவர்களுக்கு ஓய்வூதியம் வழங்கப்படுகின்றது. எனினும், இங்கு சமர்ப்பிக்கப்பட்ட இடைக்கால வரவு செலவுத் திட்டத்தில் ஓய்வூதியர்களுக்கு 1,000 ரூபாய் மட்டுமே அதிகரிக்கப்பட்டுள்ளது. அரச ஊழியர்களுக்கு 10,000 ரூபாய் ஊதிய உயர்வு வழங்கப்படும்போது, இவர்களுக்கு 1,000 ரூபாய் மட்டுமே வழங்கப்படுவது கவலையளிக்கும் ஒரு விடயமாகும். இன்றும் ஓய்வூதியர்கள் சிலர் தமது ஓய்வூதியத்தின் மூலமே குடும்பத்தைப் பராமரிக்க வேண்டிய நிலையில் உள்ளனர் என்பதையும் நாம் இங்கு கவனத்தில் எடுக்க வேண்டும். குறிப்பாக, வட பகுதியில் ஓய்வூதியர்கள் பலர் போர் காரணமாக உழைக்கும் தகைமையுள்ள தங்கள் பிள்ளைகளை இழந்துள்ளனர்; பலர் ஊனமுற்ற பிள்ளைகளைப் பராமரிக்க வேண்டிய நிலையில் உள்ளனர். அத்துடன், கணவன்மாரை இழந்த தங்கள் பெண் பிள்ளைகளையும் தகப்பன், தாயை இழந்த பேரப்பிள்ளைகளையும் கவனிக்க வேண்டிய நிலையிலும் உள்ளனர். இப்படியாகச் சில பிரத்தியேகப் பிரச்சினைகளையும் சந்திக்கும் ஓய்வூதியர் களுக்கு இந்த 1,000 ரூபாய் உயர்வு ஏமாற்றமளிப்பதாகவே உள்ளது. எனவே, ஆரம்பத்தில் கூறப்பட்டதைப் போன்று குறைந்தபட்சம் அவர்களுக்கு 3,000 ரூபாய் ஓய்வூதிய உயர்வு வழங்கப்பட வேண்டுமென நான் இந்தச் சபையிலே கௌரவ நிதியமைச்சர் அவர்களிடம் கோரிக்கை விடுக்க விரும்புகின்றேன்.

2004ஆம் ஆண்டுக்கு முன்பு ஓய்வூதியம் பெற்றவர்களுக்கும் பின்பு ஓய்வு பெற்றவர்களுக்குமிடையே கொடுப்பனவில் பாரிய வேறுபாடு உள்ளது. இந்த வேறுபாடு விரைவில் சரி செய்யப்படும் எனப் பலமுறை வாக்குறுதியளிக்கப்பட்டும் இன்றுவரை அது தொடர்பாக ஆக்கபூர்வமான நடவடிக்கைகள் எதுவும் எடுக்கப்படுவதாகத் தெரியவில்லை. எனவே, அதுதொடர்பாகவும் நிதியமைச்சரும் ஓய்வூதியத் திணைக் களமும் உரிய நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

அந்தவகையில், இங்கு சமர்ப்பிக்கப்பட்ட இடைக்கால வரவு செலவுத் திட்டத்தில் தனியார் துறையினர், கூட்டுறவு ஊழியர்கள், ஓய்வூதியர்கள் ஆகியோர் தொடர்பாகப் போதிய கவனம் செலுத்தப்படவில்லை என்பதை நான் இங்கு சுட்டிக்காட்டுவதுடன், அவற்றை நிவர்த்தி செய்ய உடன் நடவடிக்கை எடுக்க வேண்டுமெனவும் கேட்டுக்கொள்கிறேன். அப்படிச் செய்வதன்மூலமே இது அனைவரையும் திருப்திப் படுத்தும் ஓர் உன்னதமான வரவு செலவுத் திட்டமாக அமையும் என்பது எனது நம்பிக்கையாகும்.

Mr. Presiding Member, it is appropriate that I remind this House that the new President was elected on a mandate for good governance. My party and I, - and I am sure the majority in this country - welcome this and we are watching to see if this Government is serious about making robust changes to usher in good governance. It was on this very subject of Good Governance in our

[ගරු ඊ. සරවනපවන් මහතා]

universities that I spoke in this House in November last year, especially on the grave shortcomings in the governance of the University of Jaffna.

In this regard, statements made by the State Minister of Higher Education raised doubts on how serious the Government is in reforming our university system. The State Minister was reported in the "Sunday Observer" of 1st February, 2015, that he will not sack the Chairperson of the UGC, Prof. Kshanika Hirimburegama, but will address many mistakes done by her. As we know, the Federation of University Teachers' Association has been critical of the Chairperson of the UGC, who is a political appointee and in its recent press release, it requests the Government not to take ad hoc policy measures without following a serious consultative process with all stakeholders. What consultative process has the Minister followed in deciding that the Chairperson, a public official, whom he says has made mistakes, must not be removed? Such a decision requires a consultative process. If we go by what a Minister feels about a person, we will end up with unsuitable persons and a breakdown of the university system.

What was of particular concern to me was the University of Jaffna, which I referred to in my speech made in this House. The problems of abuse there are quite grave, as have been documented by the Jaffna University Science Teachers' Association - JUSTA. If we simply extend the Minister's logic based on personal feelings and say that the Vice-Chancellor of the Jaffna University and the other persons in authority have made mistakes but must stay on, what is the guarantee of change for the better? Clearly, these persons have not been transparent and their competence is questionable.

Now, I will say something about the mistakes on the part of the Vice-Chancellor of the University of Jaffna and especially, the academic members of the Council. A letter signed by more than 80 academics expressing dissatisfaction about the recruitment practices in the University was sent to the Vice-Chancellor in December, 2013. There was neither an acknowledgement nor a response. Other detailed reports on abuse compiled by JUSTA were sent to her during the course of the year 2014. These detail several cases of how candidates with excellent academic credentials are shut out and persons with much lower ability are recruited. It is only when one of the rejected top candidates went to the Supreme Court that the Vice-Chancellor condescended to respond. There too, as the JUSTA has shown, the Vice-Chancellor and the Dean of Management have, under Oath, told untruths to the Supreme Court. In July 2014, the Chairperson of the UGC promised to conduct an impartial inquiry, but has done nothing so far, and has continued to protect the Vice-Chancellor. In this regard, I have tabled the relevant report in Parliament. How could the public believe the assurances given that these people would be kept on and the Minister would see that their mistakes are corrected? This is not a healthy approach to good governance.

Good governance means that when there is a public complaint about grave abuse, there should be a proper inquiry and those accused should not be kept in a position to influence the inquiry. These are persons who mainly acquire positions through political favour and we should be much more vigilant in keeping such persons in position. Is this country so lacking in talented persons that we hang on to those whose main talent is sycophancy? In the University of Jaffna, only one candidate went through the trouble and expense of going to the Supreme Court when hers was not the worst case of abuse. If all those whose cases have been documented could go to the Supreme Court, there will be a major stink. Good governance is about managing our institutions with fairness and competence, so that the need for legal recourse is minimized.

I would like to remind this House that the University of Jaffna is the only University in the North with the task of having to produce the intellectual capital and professional skills for the entire region. The present trend of abuses in recruitment would ensure that the University degenerates steadily and will, very poorly, serve the region. For example, the University is supposed to have top-rate skills in discipline ranging from Law to Environmental Management. The question of waste oil dumped by the Northern Power Plant contaminating the ground water in Chunnakam has been raised before 2012. There was not even a sound from the University. The authorities in the University had no particular commitment to the broader society or environment. They were quite happy to go after a Government Minister and fall at his feet to ensure that they keep their positions. The Minister would even rig the Vice-Chancellors's election to ensure that this same group remains in power. It is only after the recent election when they felt threatened that their power would be taken away that they are trying to drum up publicity for themselves parading as experts using the disaster in Chunnakam several years, too late.

What we need is a first-rate University, not a University that shuts out talent that is willing to join the university profession. JUSTA has also documented cases of the University shutting out well-qualified persons who want to come home and serve.

The University needs a major transformation, so that we will have real experts with social concern and what happened at Chunnakam will not happen again. The only way this can be done is to appoint a competent authority, a dedicated person of proven integrity who knows the University system well and is capable of bringing in the necessary reforms.

I repeat, we are badly in need of a competent authority, immediately. I want the State Minister of Higher Education to give a hearing. This is my second speech as regards the Jaffna University. Do you want talented people in the University to run the University, or do you want to give us some logical answers? I should say in this House that after my speech on the last Budget, the then Minister of Higher Education, the Hon. S.B. Dissanayake attacked me saying that I spoke after consuming liquor. He attacked me as if I was a drunkard. It was a very sad situation. I was planning to reply him, but unfortunately, today he is on my side. So, I cannot reply him.

Thank you very much.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

The next speaker is the Hon. Akila Viraj Kariyawasam. You have 15 minutes.

[අ.භා.5.16]

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு அகில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අලුත් ආණ්ඩුවක් යටතේ මේ සභාව අමතන පළමු අවස්ථාවේ විශේෂයෙන්ම මේ අතුරු අය වැය යෝජනාව පිළිබඳව සලකා බැලීමේදී, මේ අතුරු අය වැය යෝජනාව මඟින් රටේ හැම කොටසකටම සහනයක් ලැබුණාය කිව්වොත් නිවැරදිය කියා මා විශ්වාස කරනවා. විශේෂයෙන්ම, පසුගිය කාලයේ ආණ්ඩුව "රාජ්‍ය සේවකයන් තමයි අපේ ශක්තිය" කියලා උදම් ඇනුවා. සමහර අවස්ථාවලදී අවිධිමත් ආකාරයෙන් රාජ්‍ය සේවකයන් බඳවා ගත්තා; විවිධ ලැයිස්තුවලින් බඳවා ගත්තා. බොහෝ අවස්ථාවලදී අපි ඡන්ද කොට්ඨාසය දිනුවත් රාජ්‍ය සේවකයන්ගේ ඡන්ද අපට නොලැබී ගියා. තැපැල් ඡන්දවලින් අපි පරාජයට පත් වුණා. නමුත් පසුගිය ජනාධිපතිවරණයේදී එහි පැහැදිලි වෙනසක් අපි දැක්කා. මේකෙන් මොකක්ද පෙන්වන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? රාජ්‍ය පාලනයේදී ඒ ක්‍රමවේද අනුගමනය කළේ නැති නිසා, පෞද්ගලික න්‍යාය පත්‍රවලට ගිය නිසා ඒවායේ විපාක තමයි, පැවැති ආණ්ඩුවට පසුගිය ජනාධිපතිවරණ ප්‍රතිඵලවලින් ලැබී තිබෙන්නේ.

රාජ්‍ය සේවකයන්ට මේ වාගේ දැනෙන ආකාරයට රුපියල් 10,000ක වැටුප් වැඩි වීමක් කිසිම අය වැයකින් ලැබුණේ නැහැ. රාජ්‍ය සේවක වැටුප රුපියල් 10,000කින් වැඩි වෙද්දී පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් මිල අඩු වුණා. පෙට්‍රල් පාවිච්චි කරන කෙනාට, මෝටර් සයිකල් පාවිච්චි කරන කෙනාට, ඒ වාගේම භූමිතෙල් පරිභෝජනය කරන අයට, ඩීසල් වාහන පාවිච්චි කරන අයට මේ වාගේ දැනෙන ආකාරයෙන් පසුගිය දසක ගණනාවක් තුළදීවත් පෙට්‍රල්, ඩීසල් සහ භූමිතෙල්වල මිල අඩු වුණාද කියා මම තමුන්නාන්සේලාගෙන් අහන්න කැමැතියි. මේ අතුරු අය වැය යෝජනා ගැන විවිධ අය විවිධ දේවල් කිව්වා. විවිධ ආකාරයේ චෝදනා කළා. සමහරු මේකට කොත්තමල්ලි අය වැයක්ය කිව්වා. හැබැයි පාරට බැහැලා ඒ ගැන ජනතාවගෙන් ඇහුවොත් ජනතාවට ලැබුණු සහන, ඒ සහන ඔස්සේ ජනතාවගේ හිතට දැනෙන සහනය අවතක්සේරු කරන්න කාටවත් පුළුවන්කමක් නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම මේ අය වැයෙන් ගත්තු ක්‍රියා මාර්ග ගැනත් බලන්න ඕනෑ. අපි දශකයකට වැඩි කාලයක් විපක්ෂයේ ඉඳලා සමහර දේවල් ගැන කථා කළා; එතනෝල් ව්‍යාපාරය ගැන කථා කළා; මත්පැන් අළෙවි හල් පිළිබඳව කථා කළා. කැසිනෝ ව්‍යාපාරය ගැන අපි මේ සභාව දෙවනත් වෙන්න කථා කරලා ඇති. එක්සත් ජාතික පක්ෂය බලයට පත් වුණොත් අපි ඒවාට තව තවත් දිරි දේවිය; අපේ රටේ සංස්කෘතිය විනාශ කරාවිය කිව්වා. අද මොකද වෙලා තිබෙන්නේ? මේ රටේ කැසිනෝ ව්‍යාපාරය අධෛර්යවත් කරන්න අපි ඒවාට බදු ගහලා තිබෙනවා. එතනෝල් ව්‍යාපාරය, මත්පැන් අළෙවි හල් අධෛර්යවත් කරන්න කටයුතු කර තිබෙනවා. ඒ වාගේම මන්දිර බද්දක් ගහලා තිබෙනවා. ගම්වල ඉන්න සාමාන්‍ය දුප්පත් ජනතාව ගැන අපි මේ අතුරු අය වැයේදී සලකා බලා තිබෙනවා. දැන් තමයි අපි රාජ්‍ය ප්‍රතිපත්ති හදාගෙන යන්නේ; ආධාර ගන්න ඒවා, විවිධ ක්ෂේත්‍රවලට මුදල් වෙන් කරන ඒවා කර ගෙන යන්නේ. අප්‍රේල් මාසයේ මැතිවරණයෙන් පසුව තමයි අපට මේවා නිසියාකාරව කරන්න පුළුවන්කම ලැබෙන්නේ. නමුත් මේ වනකොටත් අපි වියදම් කපා හැර තිබෙනවා. වැඩිය ඕනෑ නැහැ, හිටපු ජනාධිපතිවරයාට රුපියල් කෝටි 10,000කට ආසන්න ප්‍රමාණයක් වෙන් කර තිබුණා. ඒවා ජනතාවගේ බදු මුදල්වලින් අය කරපු සල්ලි. වර්තමාන ජනාධිපතිවරයා ඒ මුදල රුපියල් කෝටි 272 දක්වා අඩු කරලා තිබෙනවා. ඒකම මදිද? බැලු බැල්මට කරපු ඒ වියදම් කපා හැරීම මදිද, ඒ අහිංසක මිනිසුන් වෙනුවෙන් දුන්නු ඒ සහනයම මදිද කියා මම තමුන්නාන්සේගෙන් අහන්න කැමැතියි. ඒ වාගේම තමුන්නාන්සේලා දකින්න ඇති පහුගිය කාලයේදී දැයට කිරුළ වාගේ ව්‍යාපෘති දමාගෙන පහුගිය රජයේ ඇමතිවරු ඒ පවුලේම ඇමතිවරු දමාගෙන ඒ මුදල් විනාශ කරපු හැටි. "Unsolicited Proposals" කියා තමයි පහුගිය කාලයේදී ව්‍යාපෘති ආවේ. ඒවාට ටෙන්ඩර් කැඳවීම් නැහැ; ඒවාට අයිතිකාරයෝ නැහැ. හිතුණු හිතුණු ගජ මිතුරන්ට තමයි ඒවා දුන්නේ. පහුගිය කාලයේදී රුපියල් කෝටි හාරදාස් ගණනක වියදමින් දැයට කිරුළ ව්‍යාපෘතිය මගේ ආසනය ඉලක්ක කරගෙන ක්‍රියාත්මක වුණා. කොළඹ ඉඳලා යාපනයට යනකම් දිනපු එකම පළාත් පාලන ආයතනය මා නියෝජනය කරන කුලියාපිටිය ආසනයේ නගර සභාවයි. ඒක තමයි ඒ හිටපු ඇමතිවරයා කියා තිබෙන්නේ ආපුවහම ඒකට ෂොට් එක දෙන්න ඕනෑය කියා. අන්තිමට මොකද වුණේ? ඒවා දැම්මා කියලා මොකක්ද ලබා ගත් වාසිය?

පසු ගිය මැතිවරණයට වඩා මේ මැතිවරණයේදී මගේ ආසනයේ සියයට 300කින් ඡන්ද ප්‍රතිඵල වැඩි වුණා. කුරුණෑගල දිස්ත්‍රික්කයේ රාජ්‍ය සේවකයන්ගේ ඡන්දවලින් අපි දිනුවා. කුරුණෑගල දිස්ත්‍රිස්ත්‍රික්කයේ තැපැල් ඡන්දයෙන් අපි දිනුවා. ප්‍රතිපත්තිමය තීරණ අරගෙන මේ රට යහපාලනය ඇති රටක් බවට ගොඩ නගන්නට අවශ්‍ය පරිසරය සෑදිය යුතු කාලය ඇවිත් තිබෙන්නේ කියන එක අපි කියනවා. ඔය කරපු සිල්ලර වැඩ එකකින්වත් ආණ්ඩුවට වාසියක් ගන්නට පුළුවන් වුණේ නැහැ.

බලන්න, අධ්‍යාපනය විනාශ කර තිබෙන හැටි. අධ්‍යාපනය භාර ඇමතිවරයා වශයෙන් මම මේ චක්‍රලේඛන කියවද්දී පෙනී යනවා, මේ චක්‍රලේඛන එකකට එකක් පරස්පරයි කියන එක. ඒ වාගේම පසු ගිය කාලයේ පාසල්වලට ළමයින් ඇතුළත් කර ගැනීමේදී කර තිබෙන විනාශය බලන්න. විශේෂයෙන් කාල්ටන් පෙර පාසල්වලින් දහස් ගණන් ප්‍රධාන පාසල්වලට ළමයින් දාලා; නුවර ප්‍රධාන පාසල්වලට දාලා. අපි ශිෂ්‍යත්ව දෙන ළමයින් ප්‍රමාණය දහදාහකින් වැඩි කළා. අපි ඒ ගිය වර කියපු එකක්වත් අඩු කරන්නට හැදුවේ නැහැ. අපි ඒ සල්ලි වෙන් කර ගත්තා.

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

හැබැයි ඒ සල්ලි වැඩි කර ගත්තාට අද ශිෂ්‍යත්ව පාස් වෙච්ච ළමයින්ට යන්නට පාසල් නැහැ. මොකද, එක පැත්තකින් කාල්ටන් පෙර පාසල්වලින් ළමයින් දාලා. අනෙක් පැත්තෙන් පැවැති ජනාධිපති මන්දිරයෙන් ලැයිස්තු තුනක් ඇවිත් තිබෙනවා. ලොකු ලැයිස්තු එන්නේ ප්‍රධාන පාසල්වලට. අනෙක් පැත්තෙන් මහ ඇමතිවරු පාසල්වලට ළමයින් දාලා. තව පැත්තකින් කැබිනට් ඇමතිවරු පාසල්වලට ළමයින් දාලා. සාමාන්‍ය ගොවියාගේ, කම්කරුවාගේ දරුවන්ට පාසල්වලට යන්න ඉඩ නැහැ. ගිහිල්ලා තිබෙන්නේ ඔක්කොම ලැයිස්තුවලින්. අපි ඒවා ගැන තීරණයක් ගත්තා. කවුරුන් තරහ වුණත් අපි තීරණය කළා, මෙතැනින් එහාට අපි දේශපාලන වශයෙන් දේශපාලන ලැයිස්තුවලින් පාසල්වලට ළමයින් දාන්නේ නැහැ කියා. ඒ වාගේම "මහින්දෝදය" නමින් පාසල් හැදුවා. අපි ප්‍රතිපත්තිමය වශයෙන් තීරණය කළා, මින් ඉදිරියට පාසල්වලට දේශපාලනඥයින්ගේ නම් දාන්නේ නැහැ කියලා. ඒක අපිටයි පාඩු. අතීතයේ නම් දාපු ඒවාට අපි මොකවත් කරන්නේ නැහැ. මින් ඉදිරියට ජනාධිපතිවරයාගේ, අගමැතිවරයාගේ, අපේ හෝ කාගේවත් නම් පාසල්වලට දමන්නේ නැහැ කියා අපි තීරණය කළා. අපි මේ තත්ත්වය හදන්නයි යන්නේ. අපට දැන්වත් සහයෝගය දෙන්න. අපි මේ මොකක්ද කරන්න හදන්නේ කියා තමුන්නාන්සේලා බලන්න. මහින්දෝදය විද්‍යාගාර හදලා තිබෙනවා. එක පුද්ගලයෙකු ලක්ෂ 60ට හදපු එක තවත් කෙනකුට කෝටි එකහමාරට, කෝටි එකයි හැටට දීලා තිබෙනවා. ඒ දීලා තිබෙන්නේත් ටෙන්ඩර් පටිපාටියකින් තොරවයි. මේ ඔක්කොම ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් දීලා තිබෙන්නේ, තමන්ගේ මිත්‍රයින්ට. මේ විනාශය බිලියන ගණනක්. මේ විනාශය සිදු වුණේ නැත්නම්, අධ්‍යාපන අමාත්‍යාංශය ඇතුළු අපේ අමාත්‍යාංශවල වියදම් ටික ගසා කෑම්වලට ලක් කරන්නට ඉඩ තිබ්බේ නැත්නම් තවත් දහදාහකින් විතර වැටුප් වැඩි කරන්නට පුළුවන්. මේකයි යථාර්ථය. මේ විනාශය නිසා ස්වභාව ධර්මයෙන්ම තමයි පසු ගිය දවස්වල මේ වෙනස කළේ. එහෙම වෙයි කියලා කවුරුත් හිතුවේ නැහැ. කවුරුත් යන්න නොවෙයි හිටියේ. කවදාවත් ආණ්ඩු බලය නැති වෙයි කියා හිතලා නොවෙයි කටයුතු කළේ. එම නිසා තමයි අපි අරලියගහ මන්දිරයට ගියාම දැක්කේ ඒ අති සුඛෝපභෝගි දේවල්. අති සුඛෝපභෝගි කාමර තිබුණා. ලක්ෂ ගණන් වටිනා සුරතල් සතුන් ගෙනැල්ලා තිබුණා. කෝටි ගණන් වියදම් කර ගෙන AC කරගෙන තිබුණා. පත සේප්පු තිබුණා. හිතා ගන්නට බැහැ, අරලියගහ මන්දිරයේ ඇතුළු කාමරවල ඒ වාගේ සේප්පු තියෙන්නේ මොකටද කියලා. එවැනි දේවල්වලින් රාජ්‍ය පාලනයක් ද කළේ වෙනත් පාලනයක් ද කළේ කියන එක ගැන ජනතාව දැන ගත යුතුයි. මේවා ගැන ජනතාව දැනුවත් කිරීම අපේ යුතුකමක්ය කියා අපි හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන්වත් රට ගැන හිතලා මේ දූෂණයට, මේ කොමිස් ගැහිල්ලට, ජනතාවගේ දේවල් කඩා වඩා ගැනීමට එරෙහිව අපි ඔක්කොම එකතු වන්නට ඕනෑ. දැන් අපි ආණ්ඩු පක්ෂයේ ඉන්නේ. අපි ආණ්ඩු පක්ෂයේ ඉඳලා කියනවා, මේ පාර්ලිමේන්තුවේ විවාද සජීවීව දෙනවා නම් අපි කැමතියි කියලා. ඒක හෙට අනිද්දා ක්‍රියාත්මක වෙනවා. අපි කැමතියි තොරතුරු ලබා ගැනීමේ අයිතිය තහවුරු කරන්න. විපක්ෂයේ ඉඳලා නොවෙයි, ආණ්ඩු පක්ෂයේ ඉඳලාත් ඒ ටිකම කියනවා. ස්වාධීන කොමිෂන් සභා ටික ගේන්න අපි කැමතියි. ස්වාධීන පොලිස් කොමිසම ගේන්න අපි කැමතියි. ස්වාධීන මැතිවරණ කොමිසම ගේන්න අපි කැමතියි. අධිකරණය ස්වාධීන නොවෙනවාට අපි කැමති නැහැ. අපි කැමතියි, අධිකරණය ස්වාධීන වෙනවාට. බලන්න, අපි විපක්ෂයේ ඉඳගෙන කියපු ටික අද මෙතැනට ඇවිල්ලා ඉක්මනින් කරන්න තමයි අවශ්‍ය කටයුතු කර ගෙන යන්නේ. ඒක තමයි යහපාලනය. අද ජනතාවට මේවා ඇති වෙලායි තිබෙන්නේ. පසු ගිය කාලයේ එක එක්කෙනාට පෞද්ගලික මට්ටමින් උදව් කළා. කෝ ඡන්ද හම්බු වුණාද? මන්ත්‍රීවරයෙක් කියනවා මා දැක්කා, "ඡන්ද පණස් ලක්ෂ ගණනක් ගත්තා, පොඩි ගණනෙන් ගියේ, ඊළඟ සැරේ ඕවා වෙනස් වෙනවා" කියා. ඒවා සිහින. 2005 වර්ෂයේදී අපිත් ඔහොම හිතුවා. 2005 මැතිවරණයේදී උතුරේ දෙමළ ඡන්ද අපේ පක්ෂයට දාන්නට දුන්නේ නැහැ. එල්ටීටීඊ සංවිධානයත් එක්ක එකතු වෙලා ගිවිසුම් ගහලා ඔක්කොම බ්ලොක් කළා. දෙමළ ඡන්ද නැතිව අපි ලක්ෂ 47ක් ගත්තා. අපි තව ඡන්ද හැත්තෑ දාහක්, අසූ දාහක්, අනූ දාහක් ගත්තා නම් අපිට 2005 ජනාධිපතිවරණය ජයග්‍රහණය කරන්න තිබුණා. අපිත් එදා හිතාගෙන හිටියා, වැඩි කල් යන්නට ඉස්සෙල්ලා ආණ්ඩුවක් හදන්න පුළුවන් වේවි, පොඩි ගණනෙන්නේ ගියේ කියලා. එහෙම නැහැ දේශපාලනය. දේශපාලනය ගැන දන්නේ නැහැ. පසු ගිය කාලයේ ඡන්ද හම්බු වුණා තමයි. ඒ හම්බු වුණේ ජාතික රූපවාහිනිය, ITN එක, පොලිසි තියාගෙන, බඩු බෙදලා, මේ ඔක්කොම සංදර්ශන දාලා.

දැන් අපේ අගමැතිවරයා, අපි පත් කරපු ජනාධිපතිවරයා, අපේ ඇමතිවරු, අපේ මාධ්‍ය ඇමති, අපේ පොලීසිය භාර ඇමති, අපේ අධ්‍යාපන ඇමති, අපේ මුදල් ඇමති කියන මේ වැදගත්ම සන්ධිස්ථාන ටික අපටයි තිබෙන්නේ. අපි මේවා දෙනවාද? අපි ජනතාවට මෙච්චර සහන දෙද්දී, මේක ජනතාවාදී ආණ්ඩුවක් වෙද්දී ඊළඟ මැතිවරණයට ගියාම මොකක්ද වෙන්නේ කියා බලන්නකෝ. ඒක නොවෙයි. දැන් ජනතාව කියනවා, "අපි මේවා දැන ගෙන හිටියේ නැහැ නේ" කියා. ඇයි මෙහෙම කරන්නේ කියා අපෙන් අහනවා. ඇත්තටම අපි හොඳ වැඩියි. අපි ළඟ තිබෙන files ගත්තොත්; අපි ළඟ තිබෙන චෝදනා ගත්තොත් සමහරවිට තමුන්නාන්සේලා හිතන්නේ නැති අය ඇතුළේ ඉන්නවා. හැබැයි, අපේ තිබෙන වැදගත්කමට, අපි යහපාලනය අනුව කටයුතු කරන නිසා අපේ පළිගැනීම නැහැ. අපට තිබෙන ප්‍රශ්නය ජනතාවගේ දේපොළ, ජනතාවගේ මුදල් කාබාසිනියා කළ එක විතරයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ පිළිගන්නවා ඇති, පසු ගිය ආණ්ඩුවම බලයට පත් වුණා නම් මේ වන විට මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා හෝ එහෙම නැත්නම් මේකට විරුද්ධ වුණු අය කී දෙනකුට අද මෙහෙම ඉන්න ලැබෙනවාද කියා. පසු ගිය කාලයේ ආණ්ඩුව ක්‍රියා කළ ආකාරය ගැන අර හිටපු මර්වින් සිල්වා ඇමතිවරයා සාක්ෂි සහිතව ඔප්පු කරන්න files ටික ගෙනැල්ලා තිබෙනවා. එතුමා ලසන්ත වික්‍රමතුංග මැතිතුමාගේ ඝාතනය ගැන බය නැතිව කියනවා. සමහර මාධ්‍යවේදීන්ගේ ඝාතන ගැන කියනවා. මහේස්වරන් මැතිතුමාගේ ඝාතනය ගැන කියනවා. ඉතින්, අපි මේවා එළියට දැම්මොත් - ඔප්පු කළොත්- මොකද වෙන්නේ?

ඒ නිසා අපි කියනවා, පසු ගිය කාලයේ කළ දේවල් පටිසන් දීලා ඒවායේ ප්‍රතිවිපාක තමයි මේ භුක්ති විඳින්නේ කියා. ඒ නිසා විපක්ෂයේ හිටියත්, ආණ්ඩු පක්ෂයේ හිටියත් අපට දරන්න පුළුවන් විධියට ජීවත් වෙන්න; ඒ වාගේම කාටවත් කරදරයක් නොවන විධියට ජීවත් වෙන්න; හැමදාම බලයේ ඉන්නේ නැහැයි කියා හිතලා ජීවත් වෙන්න අපි දැන ගන්න ඕනෑ. අපි නම් එහෙම තමයි ජීවත් වන්නේ.

රාජ්‍ය ආයතනවල හොරකම් සොයන්න පාර්ලිමේන්තුවේ, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව තිබෙනවා; COPE එක තිබෙනවා. අපි පැහැදිලිව කියනවා COPE එකේ, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති විධියට දමන්න ඕනෑ නම් යූඑන්පී එකෙත් නොවන, අපේ කිසිම සම්බන්ධයක් නැති කෙනෙක්, එක්කෝ ජේවීපී වෙන්න පුළුවන් ඕනෑ කෙනකුට ඒවායේ සභාපතිකම් ගන්න කියා. එතකොට මේක හොඳට balance වෙනවා. අපේ ආණ්ඩුවෙත් මොනවා හෝ වරදක් තිබෙනවා නම්

එතැනින් එකපාරටම අහු වෙනවා. පසු ගිය ආණ්ඩුව වාගේ පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය කල් දමලා, එහෙම නැත්නම් සැසි වාරය කල් දමලා හොරු, හොර රාජ්‍ය ආයතන ආරක්ෂා කරන්න අපි කටයුතු කරන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙන්න මේකයි වෙනස. ඒක තමයි, අපේ වෙනස, මේ ආණ්ඩුවේ වෙනස. ඒ නිසා අපි කියනවා, පසු ගිය කාලයේ ඔය ලක්ෂ ගණන් ගත්තා කියලා කියන ඒවා බාගෙට කාලක් බහිනවා කියා. අඩිය අඟලට තද වෙනවා. ඊළඟ මැතිවරණවලදී බලන්න. ඒවායින් ජනතාවට වැඩක් නැහැ. දැන් ජනතාවට පෙනෙනවා නිදහස කියන්නේ මොකක්ද; මාධ්‍ය කියන්නේ මොකක්ද කියා. පාරවල කොච්චර cut-outs ගැහුවාද? කෝ දිනුවාද? අපි cut-outs ගැහුවාද? අපි posters ගැහුවාද? ජනතාවගේ හදවතට කථා කළ එක විතරයි අපි කළේ. අපි ඔක්කොම එකතු වුණා. දැන් කියනවා, සිංහල බෞද්ධ කියා. අපිත් හොඳ සිංහල බෞද්ධයෝ නේ. මේකේ සෑහෙන සිංහල බෞද්ධයෝ හිටියා. 2005 මැතිවරණයේදී දෙමළ ජන්ද ඔක්කොම නවත්වලා රාජපක්ෂ මහත්තයා ජයග්‍රහණය කළා. එතකොට මොනවා හෝ කිව්වාද? එතකොට කිව්වාද මේ රටේම ජන්ද වැටෙන්න දුන්නේ නැහැයි කියා. ඒ නිසා මේවා හිතේ අමාරුවට කියන කථා. මේවා කර ගන්න බැරිව කියන කථා. සමහර ඇමතිවරු ඉන්නවා, ඒගොල්ලෝ අපට සහයෝගය දෙන අය නොවෙයි. දැන් ඔක්කොම එකතු වෙලා සහාග රජයක් විධියට යන්න අපි ලැහැස්තියි. ඒ සහයෝගය දෙන්නේ නැති අයත් තවම වාහන භාර දීලාත් නැහැ. මගේ දිස්ත්‍රික්කයේ හිටපු නියෝජ්‍ය ඇමතිවරයෙක්ට වාහන හයක් තියෙනවා. මේ දින 100 වැඩ පිළිවෙළ ගෙන යන්න ඒගොල්ලෝ අපට සහයෝගය දෙන්නේත් නැහැ. හැබැයි, වාහන හය භාර දීලත් නැහැ. ලජ්ජයි. ඒ බලය අතහරින්න බැරිකම.

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඔබතුමන්ලාට ගන්න පුළුවන් නේ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා)
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඔව්, ඉදිරියේදී අපි ගන්නවා. හිටපු ගරු ඇමතිතුමනි, අපි දැන් ඒවා ගන්න තීරණය කර තිබෙනවා. මොකද, අපි බැලුවා එතුමා අපට දින 100 වැඩ පිළිවෙළ යන්න සහයෝගය දෙන කෙනෙක්ද කියා. බැලුවාම ලැයිස්තුවෙත් එහෙම නැහැලු. ඒක මම අද තමයි දැන ගත්තේ. [බාධා කිරීමක්] නැහැ, දැන් තමුන්නාන්සේලාම දන්නවා නේ දින 100ට සහයෝගය දෙන මන්ත්‍රීවරු ප්‍රමාණයක් ඉන්නවා කියා. [බාධා කිරීමක්] එහෙම සහයෝගය දෙන්න කොටසක් ඇවිල්ලා සිටිනවා ගරු මන්ත්‍රීතුමනි. ඒක අපි පිළිගෙන තිබෙනවා. මොකද, අපේ සුළුතරයයි ඉන්නේ. මේ ආණ්ඩුව හදන කොට කොච්චර දේවල් කිව්වාද? හදන කොට නොවෙයි, මැතිවරණ ව්‍යාපාරයේදී කොච්චර දේවල් කිව්වාද? කථානායකතුමාගේ නිල නිවසේ පැවැති භෝජන සංග්‍රහය දවසේදී හිටපු ජනාධිපතිතුමා ඇතුළු අපි කණ්ඩායම එකතු වෙලා ඉන්න වෙලාවේ අපේ හිටපු අලුත්ගමගේ ඇමතිතුමා කිව්වා, "මගේ ගෙදර කෙනෙක්වත් ගත්ත ඒවා දුන්නේ නැති කොට මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජයග්‍රහණය කළොත් මේවා දෙයිද" කියා. එතුමා අපූරුවට කියපු දේ බලන්න.

අවුරුදු හය, අවුරුදු පහ දක්වා නොවෙයි, අවුරුදු හතර දක්වා අඩු කරන්න එතුමා තීරණය කළා. එතුමා නැවත වරක් ජනාධිපතිවරණයකට තරග කරන්නේ නැහැ කියා තීරණය කළා. මෙන්න බලන්න නායකයින්. මේකයි වෙනස. ඒ නිසා මේවාට චෝදනා කරමින් ඉන්නේ නැතිව මේ වෙනස තේරුම් ගන්න. අපි මොකක්ද කරන්න හදන්නේ කියා තේරුම් ගන්න. මේක හැමෝටම පැහැදිලියි නේ. අපේ රටේ කුමන හෝ ජාතියකට, කුමන හෝ ආගමකට ආදරයක් තිබෙන හැමෝටම පැහැදිලියි අපි යන ගමන් මාර්ගය. ඒ නිසා අඩුම තරමින් අපිත් එක්ක අත්වැල් බැඳ ගන්න.

විවිධ චෝදනා කරමින්, අපේ නිහතමානීකම නිවටකම කියා හිතමින්, අපිත් සමඟ එකට හිටපු සමහර අයගෙන් පළි ගැනීමේ චේතනාවෙන් අපි ඒ ගොල්ලන්ට කරදර නොකරන නිසා, අපි ඒ අයට අවශ්‍ය දේවල් ටික නීත්‍යානුකූලවම ඔප්පු කර ගන්න ඉඩ දීලා තිබෙන නිසා, පසුගිය කාලයේ ආණ්ඩුව කළා වාගේ තරහ වුණාම ඒ තරහ, වෛරය පිරිමසා ගන්න අපේ බලය පාවිච්චි කර කටයුතු කරන්නේ නැති නිසා, ඒක නිහතමානීකම නිවටකම කියා හිතන්නේ නැතිව, අඩුම ගණනේ මේ පැවති තත්ත්වය පිළිබඳව තේරුම් අරගෙන ඉදිරියේදීවත් එකට එකතු වෙලා යන්න පුළුවන් විධියට කටයුතු කරන්න කියා මම කියනවා.

ඔබතුමන්ලාට මේ පඩිසන් දීලා තිබෙන්නේ දිට්ඨධම්ම වේදනීය කර්මය. ඔබතුමන්ලා එක්සත් ජාතික පක්ෂයටත් පසුගිය කාලයේ මේ දේවල්ම කළා. නමුත් අපි එහෙම කළේ නැහැ. දැන් ඒක පඩිසන් දීලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට මෙහෙම වෙලා. අද ඒ පක්ෂයේ නායකයෙක් නැහැ. සමහර අය අපි පත් කරපු ජනාධිපතිවරයා වැඳ පුදා ගන්නවා. ඒ ජනාධිපතිවරයා අපේ පක්ෂයේ සභාපතිවරයා කියා දැන් විපක්ෂයෙන් කියනවා. එහෙම කිව්වාට අපිට කමක් නැහැ. ඒකේ වරදක් නැහැ. නමුත් පහුගිය කාලයේ එතුමාට කරපු අපහාස දිහා බලන්න. "හිටන්, හිටන්" කියා අපහාස කළා. තව කියන්න පුළුවන් ඔක්කෝම කිව්වා. අනේ, අපිට නම් බැහැ, එහෙම අපහාස කරලා ඔය විධියට කථා කරන්න. මන්ත්‍රීකම නැතිවෙලා ගෙදර හිටියත් අපිට නම් එහෙම කරන්න බැහැ. ජනාධිපතිතුමාව වැඩියෙන්ම විවේචනය කළ මිනිස්සු අද ජනාධිපතිතුමාව වැඩියෙන්ම වර්ණනා කරනවා.

මේ කුණු වෙච්ච, පිළුණු වෙච්ච, වල් වැදිච්ච දේශපාලන සංස්කෘතිය වෙනස් කරලා, අපි ඔක්කෝම අත්වැල් බැඳ ගනිමු හොඳ දේශපාලන සංස්කෘතියක් ඇති කරන්න. මේ රටේ ජාතික ප්‍රතිපත්තියක් ඇති කර දියුණු රටවල දේශපාලනය කරනවා වාගේ අඩුම ගණනේ පියවරෙන් පියවර ගෙනෙන්න අපි ඔක්කෝම එකතු වෙලා කටයුතු කරමු කියා තමුන්නාන්සේලාට ආරාධනා කරමින් මම නවතිනවා. බොහොම ස්තූතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
The next speaker is the Hon. Thilanga Sumathipala. You have eight minutes. Before he starts, will an Hon. Member propose the Hon. (Mrs.) Sriyani Wijewickrama to take the Chair?

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා (ස්වදේශ කටයුතු හා ධීවර අමාත්‍යතුමා)
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா - உள்நாட்டலுவல்கள் மற்றும் கடற்றொழில் அமைச்சர்)
(The Hon. M. Joseph Michael Perera - Minister of Home Affairs and Fisheries)
I propose that the Hon. (Mrs.) Sriyani Wijewickrama do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු පෙරුමාල් රාජදුරයි මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு பெருமாள் ராஜதுரை அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு)திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. PERUMAL RAJATHURAI *left the Chair, and* THE HON. (MRS.) SRIYANI WIJEWICKRAMA *took the Chair.*

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා.5.34]

ගරු තිලංග සුමතිපාල මහතා
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
නමෝ බුද්ධාය!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අතුරු අය වැය ඉදිරිපත් කර තිබෙන අවස්ථාවක වචන ස්වල්පයක් එකතු කරන්නට ලැබීම පිළිබඳව මම සන්තෝෂ වෙනවා. අධ්‍යාපන අමාත්‍ය ගරු අකිල විරාජ් මැතිතුමා මට කලින් කථා කළා. මම බලා ගෙන හිටියා, අපේ අධ්‍යාපන අමාත්‍ය අකිල විරාජ් මැතිතුමා අධ්‍යාපනය සම්බන්ධයෙන් මොනවා හෝ ප්‍රකාශයක් කරයි කියා. එතුමා මුළු වෙලාවම ගත්තේ දේශපාලන කථාවක් කරන්න. හිටපු රජය සහ හිටපු මැති ඇමතිවරුන්ගේ ක්‍රියාදාමයන් සම්බන්ධයෙන් කථා කළා මිසක්, අධ්‍යාපනය සම්බන්ධයෙන් ඊළඟ පරම්පරාවට මොනවා හෝ දෙයක් එකතු කරලා මෙවර අය වැයේදී අධ්‍යාපනය සම්බන්ධයෙන් මෙහෙම දේවල් කළා, ඉදිරියේදී මෙහෙම දේවල් කරන්න බලාපොරොත්තු වෙනවා කියා යමක් කියයි කියලා මම බලාගෙන හිටියා. මම කනගාටු වෙනවා, මා මිත්‍ර අකිල විරාජ් අධ්‍යාපන ඇමතිතුමා මේ වෙලාව අරගෙන මඩ ගැසීම සඳහා පමණක් යොමු කරපු එක ගැන. මොකද, අධ්‍යාපන ඇමතිතුමා කියන තනතුර දෙස අපේ මුළු රටම බලාගෙන සිටිනවා. එම නිසා ඔබතුමා කරපු ඒ කාර්යය කරන්න පසුපෙළ මන්ත්‍රීවරයෙක් යොදා ගන්න කියා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඒ කෙසේ වෙතත්, මෙම අතුරු අය වැය ඉදිරිපත් කිරීමේදී ඔබතුමන්ලා මේකේ පසුබිම තේරුම් ගන්න ඕනෑ. පසු ගිය කාලයේ ජනාධිපතිවරණයක් තිබුණා. ජනාධිපතිවරණයේදී ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා වැඩසටහනක් ඉදිරිපත් කළා. ඒකට ගරු කර බහුතර බලයක් තිබෙන හිටපු රජය ඒකට ඉඩ දුන්නාම ඒකෙන් ඇති වෙච්ච තත්ත්වය මත තමයි රජයක් අලුතෙන් බිහි වෙන්නේ. අතුරු අය වැයක් තුළින් තාවකාලිකව මේ රටේ ජනතාව දිනවන වැඩසටහනක් තමයි බලාපොරොත්තු වන්නේ. ඔබතුමන්ලා ඉදිරිපත් කරන ලද ප්‍රතිපත්ති මාලාවේ ව්‍යවස්ථා සංශෝධනයන්, නොයෙකුත් පොරොන්දු මත ඒ ඒ කොමිෂන් සභා පත් කිරීම් යනාදී වශයෙන් සඳහන්ව තිබෙනවා. ඒ නිසා මේ කාලය පාවිච්චි කරගෙන එක්සත් ජාතික පක්ෂය දේශපාලන කර්තව්‍යයක් සඳහා සම්පූර්ණයෙන්ම උත්සාහ ගන්නවා නම්, අතුරු අය වැය සහ තමන්ගේ ඒ කර්තව්‍යයන් කරන්න උත්සාහ ගන්නවා නම් අනික් අය ඇස් වසාගෙන නොසිටින බව ඔබතුමන්ලා තේරුම් ගන්න ඕනෑ. ඒ අයටත් අවබෝධයක් තිබෙනවා.

ඒ වාගේම වර්තමාන ජනාධිපතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වයට අපි බලෙන් ගෙනත් වාඩි කළේ නැහැ. එතුමා කිව්වා, එතුමාට පක්ෂයේ නායකත්වය ඕනෑය කියලා. එතුමා CC එකට ඇවිල්ලා කථා කරලා, එකඟ වෙලා බොහොම ගෞරවයෙන්, ආදරයෙන් පක්ෂය ගොඩ නැඟීමට අවශ්‍ය වගකීමත් එක්කයි සභාපතිත්වය ගත්තේ. ඒ සභාපතිත්වය එක්ක තමයි අප වැඩ කරන්නේ. අපේ පක්ෂය ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයක්. එම නිසා තමයි සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට පසුව චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය එන්නේ; චන්ද්‍රිකා මැතිනියට පසුව මහින්ද රාජපක්ෂ මැතිතුමා එන්නේ; මහින්ද රාජපක්ෂ මැතිතුමාට පසුව දැන් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා එන්නේ. එසේ එන දේශපාලන නායකත්වයත් සමඟ වෙනසක් කරන්න පුළුවන් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයක්, අපේ පක්ෂය. 27 වතාවක්, 28 වතාවක්, 29 වතාවක් නොවෙයි 30 වතාවක් පැරදිලාත් නායකයා වෙනස් කර ගන්න බැරි පක්ෂයක් වාගේ නොවෙයි, අපේ පක්ෂය. අපේ නායකත්වය තුළ ප්‍රජාතන්ත්‍රවාදය තිබෙන පක්ෂයක්, අපේ පක්ෂය. මම ඒ ගැන තවදුරටත් කථා කරන්න කැමැති නැහැ. අපි සංහිඳියාවකින් යුතුව අවංක චේතනාවෙන් ඔබ තමුන්නාන්සේලාට උදව් කරන්නේ ජනතාව දිනවන වැඩසටහනකටයි. අපි ජනතාව දිනවන වැඩසටහන ගැනයි කථා කරන්නේ. ඒ වෙනස්කම් ටික ගැන, බලාපොරොත්තු වන අපේක්ෂාවන් ගැනයි කථා කරන්නේ. තමුන්නාන්සේලා සොයා ගත් සොරකම් තිබෙනවා නම්, වැරදි වැඩ කළ අය සිටිනවා නම් ඒ අයට දඬුවම් කරන්න. ඒ අය සම්බන්ධව හරියාකාරව ක්‍රියාත්මක වෙන්න. නමුත් දේශපාලන හස්තයක් අතට ලැබුණාය කියලා පළි ගැනීමේ චේතනාවෙන් ක්‍රියාත්මක වෙන්න එපා. අපි මේ ගැන තමුන්නාන්සේලාගේ පක්ෂයේ නායකයා වන අගමැතිතුමා එක්ක, ඒ වාගේම වර්තමාන ජනාධිපතිතුමා එක්ක බොහොම හොඳ සංවාදයක, සාකච්ඡාවක ඉන්නා වේලාවක් මේ. මම ඒ ගැන මතක් කරන්නේ, ඒක අතිශය වැදගත් නිසායි. ඔබතුමන්ලා ඉදිරිපත් කර තිබෙන අය වැයේ වැදගත් කරුණු දෙකකට වඩා සාකච්ඡා කිරීමට මට වේලාවක් නැහැ.

හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ඉදිරිපත් කළ අය වැයෙන් රාජ්‍ය ආයෝජන - public investment - යටතේ යටිතල පහසුකම් - infrastructure - සඳහා ප්‍රාග්ධන වියදම් හැටියට වෙන් කර තිබුණු රුපියල් බිලියන 576ක මුදල මෙම අය වැයෙන් රුපියල් බිලියන 399 දක්වා අඩු කරලා තිබෙනවා; රුපියල් බිලියන 177ක් අඩු කර තිබෙනවා. ප්‍රාග්ධන වියදම් කියන්නේ සම්පූර්ණයෙන්ම මේ රටේ ක්‍රියාත්මක වෙන යටිතල පහසුකම් සංවර්ධනය කරන යන්ත්‍රණය. එම නිසා යටිතල පහසුකම් සඳහා ලබා දී තිබෙන ප්‍රාග්ධන මුදල අඩු කිරීමෙන් වෙන්නේ මේ රටේ ඉංජිනේරු අංශය, කර්මාන්ත අංශය යනාදී සියලු අංශ කඩා ගෙන වැටීමයි. රටේ මේ අංශ තුළ අවුරුද්දකට අඩුම ගණනේ ලක්ෂ පහමාරක, හයක පමණ සේවක සංඛ්‍යාවක් වැඩ කරනවා. රුපියල් බිලියන 177ක් -සියයට 27ක්, සියයට 28ක්- අඩු කළාය කියන්නේ අඩුම ගණනේ අසූදහසක්, ලක්ෂයක් අතර ප්‍රමාණයේ පිරිසක් මේ අවුරුද්දේ රක්ෂාවලින් එළියට යනවා කියන එකයි. දූෂණය, වංචාව ගැන කථා කරනවා. හැබැයි, යටිතල පහසුකම්වලට, සංවර්ධනයට වෙන් කර තිබුණු ප්‍රාග්ධන මුදල අඩු කිරීම නිසා ඒ තුළින් වෙන හානිය බලන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එක්සත් ජාතික පක්ෂයෙන් පසු ගිය කාලයේ ගොඩක් දේවල් ගැන කථා කළා. මුහුද ගොඩ කර ඉදි කරන Port City එක වහනවා; ඒක වංචාවක්; චීනය එළවනවා; ලංකාව චීනකරණය වෙලා කියලා කිව්වා. නමුත් ඊයේ මොකද වුණේ? ඊයේ කැබිනට් තීන්දුවක් ගත්තා, චීනයත් එක්ක Port City එකේ වැඩ කටයුතු ඉදිරියට කර ගෙන යන්න. හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජයට කළ ලොකුම චෝදනාව තමයි, Port City එක සම්බන්ධ චෝදනාව. දැන් Port City එක ඉවත් කළාද? චීනය එළෙව්වාද? මිනිසුන්ට ඒ වාගේ ගල් පැළෙන බොරු කිව්වා. එක්සත් ජාතික පක්ෂය අද වෙනකල් බලයට ඇවිල්ලා නැහැ. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජයග්‍රහණය කළා. මිනිසුන්ට අසත්‍ය ප්‍රකාශ කරන්න එපා. අඩුම

ගණනේ මේ දින සියය තුළවත් බොරු සියයක් කියන්න එපා. මොකද, මිනිසුන් දන්නවා, අප ලබා දීපු බලය අරගෙන තාවකාලිකවයි එක්සත් ජාතික පක්ෂය පාලනය ගෙන යන්නේ කියන එක. ඒ කියපු බොරු දැනුත් ඔප්පු වෙනවා. දිනපතා බොරුවෙන් බොරුව, බොරුවෙන් බොරුව කියලා ප්‍රතිපත්තිමය වශයෙන් බොරු හසුවී ගෙන යනවා.

මීට අමතරව අද පෞද්ගලික අංශය දිහා බැලුවාම, ටෙලිකොම් කියන industry එක, එහෙම නැත්නම් ජංගම දුරකථන අංශය සම්පූර්ණයෙන්ම කඩා වැටෙන අය වැයක් මේක. බලපත්‍රලාභී ජංගම දුරකථන ක්‍රියාකරුවන්ට රුපියල් මිලියන 250ක බද්දක් ගෙවන්න කියනවා; ලාභයෙන් සියයට 25ක් ගෙවන්නත් කියනවා. මේ අය කොටස් වෙළඳ පොළට යන්නේ පසු ගිය අවුරුදු හතර, පහක වාර්තා අරගෙනයි. ඉදිරි අවුරුදු තුනේ කරන්න තිබෙන වැඩ - projections - මෙහෙමයි කරන්නේ කියලා තමයි ඒ අයගේ සම්පූර්ණ ශක්‍යතා වාර්තා දෙන්නේ. එතකොට ඒ ගොල්ලන් වැඩිපුර රුපියල් බිලියන 50, 100 ළඟ තබා ගෙන ඉන්නේ නැහැ, මේ ආණ්ඩුවට ගෙවන්න. දැන් කොටස් වෙළඳ පොළේ ටෙලිකොම් අංශයේ ඒවා දිනපතා රුපියල් දෙක, තුනකින් පහත වැටෙනවා. එතකොට මේ කොටස් වෙළඳ පොළෙන් සියලු අය ගැලවෙනවා. එතකොට ප්‍රාග්ධනය විධියට යට කළ මුදල් ටික සම්පූර්ණයෙන් වැටෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තව විනාඩි දෙකක කාලයක් ලබා දෙන්න.

පෞද්ගලික අංශයේ ආර්ථිකය සම්පූර්ණයෙන්ම කඩා ගෙන වැටෙනවා. පෞද්ගලික අංශයෙන් මිනිසුන් විශාල ප්‍රමාණයකට - ලක්ෂ ගණනකට- රක්ෂා ලබා දෙනවා. අප ක්‍රියාත්මක කළ දීර්ඝ කාලීන වැඩසටහන එහෙන් මෙහෙන් කපා අලවා මෙය ඉදිරිපත් කළත්, මේක අය වැයක් වෙන්නේ නැහැ. මේ අය වැය දර්ශනයක් නැති අය වැයක්. හැබැයි, අපි ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා නිසා තමුන්නාන්සේලාට දින සියය තුළදී මෙය කඩාකප්පල් වෙන්න ඉඩ දෙන්නේ නැහැ. මේකට විරුද්ධව ඡන්දයක් දෙන්න අපේ අරමුණක් හෝ අදහසක් නැහැ. හැබැයි, ප්‍රතිපත්තිමය වශයෙන් තමුන්නාන්සේලා සමඟ එකඟ නොවෙන්න අපට අයිතියක් තිබෙනවා. ක්‍රීඩාව පිළිබඳව මම එක දෙයක් කියන්න ඕනෑ. මම අවුරුදු ගණනාවක් ලංකාවේ-

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න. ඔබතුමා කාලය වැඩියෙන් අරගෙන තිබෙනවා.

ගරු තිලංග සුමතිපාල මහතා
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ කාරණය කියලා මා කථාව අවසන් කරනවා.

ක්‍රීඩා පරිපාලන ක්ෂේත්‍රයේ අවුරුදු ගණනාවක් හිටපු කෙනෙක් නිසා මා දන්නවා, ක්‍රීඩාව ජාතික වශයෙන් රට පුරා ප්‍රචලිත කරන්න අපට නාළිකාවක් අවශ්‍ය බව. ඒ නාළිකාව ITN ද, ජාතික රූපවාහිනියද කියලා අපට ප්‍රශ්නයක් නැහැ. ජාතික නාළිකාවකින් හෝ ක්‍රීඩාව පෙන්නුවොත් තමයි ගමේ ඉන්න අභිංසක දරුවන් අතරත් ක්‍රීඩාව ප්‍රචලිත වෙන්නේ; දැනුම ලැබෙන්නේ. CSN ආයතනය සම්බන්ධයෙන් යම් කිසි ප්‍රශ්නයක් තිබෙනවා නම්, ඒක විසඳා ගෙන ඒ අයත් එක්ක ගනු දෙනු කරන්න. නමුත් අපට ක්‍රීඩාව නරඹන්න තිබෙන අයිතිය, අවස්ථාව නැති කරන්න එපා. මොකද, තොරතුරු දැන ගැනීමේ අයිතිය අපට නැති වෙලා යනවා. මුහුණ ඇදයි කියලා නහය කපා ගන්නවා වාගේ Rs. 1 billion බදු මුදලක් CSN එකට දාන එක නොවෙයි ප්‍රශ්නය. ලංකාවේ මොන නාළිකාවද ක්‍රීඩාව පෙන්වන්න සම්පූර්ණයෙන් වෙන් කරලා තිබෙන්නේ, ඒ කටයුත්ත කරුණාකරලා කරන්න. වෙනම නාළිකාවක් ක්‍රීඩාව වෙනුවෙන් සම්පූර්ණයෙන් වෙන් කරන්න. ඒක රජයේ නාළිකා වන ජාතික රූපවාහිනිය හෝ ITN වෙන්න පුළුවන්.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න.

ගරු තිලංග සුමතිපාල මහතා
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
CSN එක හිටපු ජනාධිපතිතුමාගේ පුතාගේ නාළිකාව කියලා ඒකෙන් පළිගන්න ගිහින් අපේ ප්‍රේක්ෂකයන්ට අසාධාරණයක් කරන්න එපා. [බාධා කිරීම්] එතුමාගේ කියලා ඔබතුමන්ලා කියනවා නේ. මම කියන්නේ, ප්‍රේක්ෂකයන් ගැන හිතන්න; ඒ කාරණය ගැන අවධානය යොමු කරන්න කියලායි. ඒකට අපේ ජාතික නාළිකා වන රූපවාහිනිය, ITN එක වෙන්න පුළුවන්. ක්‍රීඩාව නරඹන්න, ක්‍රීඩාව ප්‍රචලිත කරන්න ක්‍රීඩාව වෙනුවෙන් වෙනම නාළිකාවක් වෙන් කරන්න. නැත්නම් අපේ රට පුරා ඉන්න ක්‍රීඩාවට දක්ෂ දරුවන්ගේ තාක්ෂණ දැනුම වර්ධනය කිරීමේ හැකියාව නැති වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අවස්ථාව මට ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වනවා.

[අ.භා 5.43]

ගරු සරණ ගුණවර්ධන මහතා
(மாண்புமிகு சரண குணவர்தன)
(The Hon. Sarana Gunawardena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වර්තමාන රජය ඉදිරිපත් කළ අතුරු අය වැය සම්බන්ධව විවාද කරන මේ අවස්ථාවේ ඒ ගැන වචන කීපයක් හෝ කථා කරන්න අවස්ථාවක් ලැබීම ගැන මම සතුටු වනවා. ඒ ගැන ඔබතුමියට ස්තුතිවන්ත වනවා.

රටේ සමස්ත ජනතාවගේ අවධානය විශාල වශයෙන් යොමු වුණු අය වැයක් හැටියට අපි මේ අය වැය හඳුන්වන්න ඕනෑ. මේ අය වැය තුළින් කියැවෙන කරුණු දිහා බැලුවාම රටේ ජනතාවට විශාල සහන ලබා දෙන අය වැයක් බවට වර්තමාන රජය මේ අය වැය පෙන්වා තිබෙනවා. ඒ අතරින් බඩු මිල අඩු කිරීම ගත්තාම, මේ රටේ ජනතාව දිනපතා පාවිච්චි නොකරන -පරිභෝජනය නොකරන- දේවල්වලට පමණක් විශාල අඩු කිරීමක් සිදු කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ මේ අය වැය එක්සත් ජාතික පක්ෂ රජයෙන් ඉදිරිපත් කළත් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ නායකත්වයෙන්, එකඟතාව මත ඉදිරිපත් කළ අය වැයක් බව. මේ අය වැයෙන් රටේ ජනතාවට වරප්‍රසාද ලබා දෙන්න යන නිසා අපි බහුතරයක් විපක්ෂයේ හිටියත් දින 100 වැඩසටහනට අතිගරු ජනාධිපතිතුමාගේ ඉල්ලීම මත අපේ කැමැත්ත, එකඟතාව දෙන්න අපි තීන්දු කරලා තිබෙනවා. හැබැයි, මේකේ පොඩි ගැටලුවක් තිබෙනවා. ඒ තමයි, මාස තුනකට ඉදිරිපත් කර තිබෙන අය වැයේ මේ දෙන සහන මාස තුනකට නොවෙයි, අවුරුද්දකට දික් කරන්න ඕනෑ. ඒ මම පෞද්ගලිකව හිතන දෙයක්. දැන් තමුන්නාන්සේලාට ගැටලුවක් මතු වෙයි. මොකද, අප්‍රේල් මාසයේ 23වැනි දා පාර්ලිමේන්තුව විසුරුවන්න ඕනෑ. හැබැයි, ඒක තීන්දු කරන්නේ රටේ ජනාධිපතිවරයා මිසක් වෙන කවුරුවත් නොවෙයි. ඒ නිසා මේක මේ අවුරුද්ද අවසාන වනකම් අදින්න. ඇදලා තමුන්නාන්සේලා මේ රටේ ජනතාවට දෙන්න පුළුවන් උපරිම සහන දෙන්න.

[ගරු සරණ ගුණවර්ධන මහතා]

මසකට රුපියල් 10,000කින් රාජ්‍ය සේවකයන්ගේ පඩිය වැඩි කරන්න දැන් යෝජනා කර තිබෙනවා. හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ අය වැයෙන් රුපියල් 3,000ක මුදලක් වැඩි කර තිබෙනවා. තමුන්නාන්සේලා ඒකට යම් මුදලක් එකතු කරලා මේ මාසයේ ඉඳලා රුපියල් 5,000ක් දෙන්න ලැහැස්ති කරලා තිබෙනවා. ඊට පස්සේ ජූනි මාසයේ ඉඳලා ඉතුරු රුපියල් 5,000ත් එක්ක රුපියල් 10,000ක් දෙන්න ලැහැස්ති කරලා තිබෙනවා. රාජ්‍ය සේවයේ නියුතු ලක්ෂ 13ත්, 15ත් අතර සංඛ්‍යාවකට මාසිකව විතරක් රුපියල් 10,000ක් වැඩි කළාම රුපියල් බිලියන 15ක් - රුපියල් මිලියන 15,000ක්- වෙන් කරන්න වෙනවා. අපි විශ්‍රාම වැටුප රුපියල් 2,500කින් වැඩි කළා. තමුන්නාන්සේලා තව රුපියල් 1,000ක් ඒකට එකතු කළා.

මම ඒ වැඩි වෙන මුදල කියන්නම්. රුපියල් 1,000ක් වැඩි කළොත්, විශ්‍රාම වැටුප ලබන 550,000ක් පමණ වන උදවියට මාසයකට රුපියල් මිලියන 550ක් වෙන් කරන්න වෙනවා. අපි ඒකට සතුටුයි. හැබැයි, මම මීට කලින් කිව්වා වාගේ ඒක මේ අවුරුද්ද අවසන් වෙනකල්ම ගෙවන්න. අපට මැතිවරණයක් හදිසි නැහැ. අපි අවුරුදු ගණනක් මේ රට පාලනය කළා. මේ රටේ ජනතාව මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට වරමක් දුන්නා, මේ රටේ යහ පාලනය ඇති කරන්න. ඒකට හවුල් වෙච්ච පක්ෂ හැටියට ඔබතුමන්ලා මේ වර්ෂය තුළ ඒ යුතුකම ඉෂ්ට කරලා, ජනතාවට ඒ වරප්‍රසාද ලබා දීලා, ජනතාව අතරට ගිහිල්ලා ඊළඟ අවුරුද්දේ ජනවාරි වෙනකොට මැතිවරණයකට එන්න. ඒ නිසා තාවකාලිකව දෙන මේ විසඳුම් ගැන අපට විශේෂ පැහැදිලිකමක් නැති බව මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම මම කියන්න ඕනෑ මේ සමෘද්ධි ව්‍යාපාරය ගැන. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමරතුංග මැතිනියගේ කාලයේ සමෘද්ධි ව්‍යාපාරය ආරම්භ කළා. එදා මේ රටේ දිළිඳු උදවිය දහඅට ලක්ෂයක්, දහනව ලක්ෂයක් හිටියා. ඊට පස්සේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා සමෘද්ධි ව්‍යාපාරයට රජයේ මුදල් වෙන් කරලා සමෘද්ධිලාභීන් දහහතර ලක්ෂයකට, පහලොස් ලක්ෂයකට අඩු කළා. මුළු රටේම ගත්තොත් සමෘද්ධි ව්‍යාපාරය තුළ සමෘද්ධිලාභීන් ලක්ෂ 16ක් පමණ හිටියා. ගම්පහ දිස්ත්‍රික්කයේ රුපියල් 210 බැගින් සමෘද්ධි ආධාර ලැබූ උදවිය 7,730 දෙනෙක් ඉන්නවා. ඒ වාගේම, රුපියල් 750 ගණනේ, රුපියල් 1,200 ගණනේ, රුපියල් 1,500 ගණනේ ආධාර ලබන අය 118,795 දෙනෙක් ගම්පහ දිස්ත්‍රික්කයේ ඉන්නවා. වර්තමාන රජය මිලියන 261ක් ගම්පහ දිස්ත්‍රික්කයට වෙන් කරනවා. ඒක හොඳයි. අපි අගය කරනවා. අපි සතුටු වෙනවා. සමෘද්ධි ආධාරය හැටියට රුපියල් 1,500ක් ලබපු කෙනාට අපි රුපියල් 3,000ක් දක්වා වැඩි කළා. ඒකට තවත් රුපියල් 1,500ක් වැඩි කරලා රුපියල් 4,500ක් දෙනකොට, ඒ ආධාරය දිය යුතු උදවිය කී දෙනෙක් ඉන්නවාද? අපි ආධාර දීපු උදවිය එතැනදී කපා හරිනවාද? එහෙම නැතිනම් තවත් ඒ මුදල වැඩි කරනවාද? සමෘද්ධි ආධාර ලබන 118,795 දෙනාගෙන් කී දෙනෙක් ඉවත් වෙනවාද? මේක දේශපාලන පළිගැනීමක්ද කියන ප්‍රශ්නය අපි අහනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම මේ වෙලාවේ මතක් කරනවා බස් ගාස්තුව ගැන. අපේ රජය කාලයේ මුලින්ම ඩීසල් මිල රුපියල් තුනකින් අඩු කළා. රුපියල් 121 සිට 118 දක්වා පහත දැම්මා. රුපියල් 118, නැවත 111ට ගෙනාවා. අපේ ආණ්ඩුව වෙනස් වුණා. අපේ ආණ්ඩුව වෙනස් වුණාම, මේ රජය රුපියල් 111ට තිබුණු ඩීසල් රුපියල් 95ට ගෙනාවා. ප්‍රතිශතයක් හැටියට ගත්තාම දැන් සියයට 21කින් තෙල් මිල බැහැලා තිබෙනවා. තව පැත්තකින් ගත්තාම ලෝක වෙළෙඳ පොළේ බොර තෙල් බැරල් එකක මිල ක්‍රමානුකූලව ඩොලර් 46 දක්වා අඩු වේ ගෙන ආවා. එතකොට මේ සියයට 21 ප්‍රතිශතය අනුව තමුන්නාන්සේලා බස් ගාස්තු සංශෝධනය හදා ගන්න. මේ කරලා තිබෙන්නේ වැරැදි සංශෝධනයක්. රුපියල් නවයට තිබුණ ටිකට් එක රුපියල් අටට අඩු වුණා. බස් මගියෙක් රුපියල් 10ක් දීලා ටිකට් එක ඉල්ලුවාම ටිකට් එක දෙනවා. නමුත් ඉතිරි රුපියල ලැබෙන්නේ නැහැ. බස් ගාස්තුව රුපියල් අට වුණාම, ඉතිරි රුපියල් දෙක ලැබෙන්නේත් නැහැ. රුපියල් 15ක් දීලා රුපියල් 13 ටිකට් එකක් ගත්තාම ඉතිරි රුපියල් දෙක ලැබෙන්නේ නැහැ. එතැනදී මේ වාසිය ලැබුණේ මේ රටේ ජනතාවට නොවෙයි, වෙන කෙනෙකුට. ඒ නිසා තමුන්නාන්සේලාගේ බස් ගාස්තු සංශෝධනය කිරීම සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරන්න.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු සරණ ගුණවර්ධන මහතා
(மாண்புமிகு சரண குணவர்தன)
(The Hon. Sarana Gunawardena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න. මට තව දෙයක් කියන්න ඕනෑ. මා ළඟ ඊට අදාළ සම්පූර්ණ විස්තරය තිබෙනවා. මා එම ලේඛනය හැන්සාඩ් ගත කිරීම සඳහා **සභාගත*** කරනවා.

ජනාධිපතිවරණයේ දී අපට ඡන්ද පනස්හත් ලක්ෂයක් ලැබුණා. තමුන්නාන්සේලාට ඡන්ද හැටඑක් ලක්ෂයක් ලැබුණා. අපි ඒක පිළිගත්තා; අපි තමුන්නාන්සේලාට බලය දුන්නා. හැබැයි, ඔබතුමන්ලා මතක තබා ගන්න. යාපනයේ දිස්ත්‍රික්කයෙන් 174,000ක වැඩි ඡන්ද අරගෙන තමයි හංසයා දිනුවේ. වන්නි දිස්ත්‍රික්කයෙන් 102,000ක් වැඩි ඡන්ද අරගෙන තමයි තමුන්නාන්සේලා දිනුවේ. සමස්ත ඡන්ද ප්‍රතිඵලය අනුව හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇතුළු අපි පැරදුණේ ඡන්ද 449,000කින්. ඒකෙන් අපට පෙනෙනවා නොකියා කියන දෙයක්. ඒ හරහා මේ රටේ බෙදුම්වාදය ඇති කරනවා කියන එක. තමුන්නාන්සේලාට පුළුවන්ද යහ පාලනය ඇති කරනකොට මේ රටේ බෙදුම්වාදය නවත්වලා, මේ ඔක්කොම එකම වේදිකාවකට ගෙනැල්ලා කථා කරන්න? නිදහස් උත්සවයට ටීඑන්ඒ මන්ත්‍රීවරුන් දෙන්නෙක් ගියා කියලා ටීඑන්ඒ මන්ත්‍රී කණ්ඩායමේ කොටසක් විරෝධය පෑවා. අවුරුදු හතලිස් ගණනක් මේ රටේ නිදහස වෙනුවෙන් කථා කළේ නැති උදවිය, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජය මේ රටේ යුද්ධය අවසන් කරලා මේ රටේ යහ පාලනය ඇති කරලා, ඊළඟ වැඩ පිළිවෙළ යනකොට තමයි මෙම ව්‍යාපෘතිය ආරම්භ කළේ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න.

ගරු සරණ ගුණවර්ධන මහතා
(மாண்புமிகு சரண குணவர்தன)
(The Hon. Sarana Gunawardena)
මන්නාරමේ රදගුරු රායප්පු ජෝශප් පියතුමා සිරකරුවන් නිදහස් කරන්නය කියලා කිව්වා. ඒකට අවුරුද්දක් කල් ඉල්ලුවා. මෙන්න එකඟතා. අපි ඒවා දිහා බලාගෙන ඉන්නවා. අපි

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

තමුන්නාන්සේලාට උදවු කරනවා. අපි තමුන්නාන්සේලාගේ කකුලෙන් අදින්නේ නැහැ. අපි තමුන්නාන්සේලාට සහයෝගය දෙනවා. හැබැයි, අපට ගහනවා; අපි ගුටි කනවා. අපට ඒවා හොඳට පුරුදුයි. හෙට අනිද්දා ගෙනෙන විශ්වාස භංග යෝජනාවේදී ඒ අදාළ ඇමතිවරයාගේ ඉතිහාසයේ ඉඳලාම කථා කරන්නම්. එදාට තමුන්නාන්සේලාම තේරුම් ගනියි එතුමාත් එක්කද අපි ඉන්නේ, යහ පාලනය කරන්නේ, නැත්නම් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට උදව් කරනවා ද කියලා.

අපි වග කීමෙන් මේ කාරණය කියනවා. තමුන්නාන්සේලා එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවක් බිහි කරගෙන මොකක්ද මේ නොකියා කියන්නේ? තමුන්නාන්සේලා කියන්නේ අපේ පක්ෂයේ සභාපති මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ඉවත් කරන්න කියලා. අපට තමුන්නාන්සේලාගේ හැසිරීම තේරෙනවා. මේවා හැන්සාඩ්ගත වෙනවා. අපි කථා කරලා එදාට කියන්නම් මොකක්ද වුණේ කියලා. මොන ගැටලු වාද භේද තිබුණත්, ඊළඟ මැතිවරණයේදී අපි එක ධජයක් යටතේ ඇවිල්ලා අපේ ආණ්ඩුවක් පිහිටුවනවාය කියන එක මේ අවස්ථාවේ මතක් කරමින් මා නිහඬ වෙනවා.

ඔබතුමියට ස්තූතියි.

[අ.භා.5.53]

ගරු ඒ.එම්. චාමික බුද්ධදාස මහතා
(மாண்புமிகு ஏ.எம். சாமிக புத்ததாஸ)
(The Hon. A.M. Chamika Buddhadasa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා පළමුවෙන්ම ස්තූතිවන්ත වෙනවා, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව. මම දැක්කා, කලින් විපක්ෂයේ හිටපු ගරු මන්ත්‍රීතුමන්ලාගේ හැසිරීම. කියමනක් තිබෙනවා, "මගේම කලිසම අගේට ඇඳගෙන උජාරුවට යනවා" කියලා. ඒ වාගේ තමයි ආණ්ඩු පක්ෂය අද මේ සභාවේ කටයුතු කරන්නේ.

2015 වර්ෂයට අපගේ රජය අය වැයක් ඉදිරිපත් කළා. දැන් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව 2015 වර්ෂයට අතුරු අය වැයක් ඉදිරිපත් කරලා පොරොන්දු විශාල ප්‍රමාණයක් ජනතාවට දීලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ වෙන කොටත් ඒ දුන් පොරොන්දු ඉටු කර ගන්න බැරිව තමයි ආණ්ඩු පක්ෂය ළතැවෙන්නේ. මම එකක් කියන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අහගන්න. 2014 වර්ෂයේ අය වැයේදීත්, 2015 වර්ෂයේ අය වැයේදීත් අපි ඉදිරිපත් කළා, අර්තාපල් ගොවියාට සහතික මිලක් දීමේ වැඩ පිළිවෙළක්. රුපියල් 80ක සහතික මිලක් දෙන වැඩ පිළිවෙළක් ඉදිරිපත් කළා. මේ අතුරු අය වැය පොතේ 17වන පිටුවේ මේ කාරණාව මේ විධියට සඳහන් වෙනවා:

> "අර්තාපල් මිලදී ගැනීම සඳහා වූ සහතික මිල කිලෝවකට රුපියල් 80 දක්වා වැඩි කරනු ඇත. මීළඟ අස්වනු කාලයේ සිට මෙය ක්‍රියාත්මක වේ."

මම ගරු මන්ත්‍රීතුමන්ලාට කියන්න කැමැතියි, අද වෙන කොට බදුල්ල දිස්ත්‍රික්කයේ ඌව පරණගම, වැලිමඩ කියන මැතිවරණ කොට්ඨාසවල ගොවි ජනතාව අර්තාපල් අස්වැන්න ලබා ගනිමින් සිටින බව. අද උදේ මම ඒ ගොවිජන සේවා මධ්‍යස්ථානවලට කථා කරලා ඇහුවා, අද මිල කීයද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රුපියල් 60ත්, 65ත් අතර මිලකට තමයි අර්තාපල් අස්වැන්න මිලදී ගන්න කටයුතු කරලා තිබෙන්නේ. ඉතින් මම මේ ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් අහනවා, මේ දුන් පොරොන්දු ඉටු කරනවාද, කවදාද ඒ අර්තාපල් ගොවීන් වෙනුවෙන් රුපියල් 80ක සහතික මිල දෙන්නේ කියලා. මේ වෙන කොට ඌව පරණගම, වැලිමඩ කියන මැතිවරණ කොට්ඨාසවල විතරයි අර්තාපල් අස්වැන්න නෙළන්න ආරම්භ කරලා තිබෙන්නේ. මම රාධක්‍රිෂ්නන් නියෝජ්‍ය ඇමතිතුමාගෙනුත් ඒ ගැන ඇහුවා. අප්‍රේල් වෙන කොට තමයි නුවරඑළිය දිස්ත්‍රික්කයේ අර්තාපල් අස්වැන්න එන්නේ.

අද ගොවියා අසරණ වෙලා ඉන්නවා. මේ කාලයේ වැඩිපුර අස්වැන්නක් වෙළෙඳ පොළට එන්නේ නැහැ. බීජවලට තමයි අස්වැන්න වැඩිපුර තියා ගන්නේ. පසු ගිය කන්නයේ අපි රුපියල් 80ට අර්තාපල් මිලදී ගන්න වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන කොට එවකට විපක්ෂයේ හිටපු එක්සත් ජාතික පක්ෂයේ පළාත් සභා, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු පාරට බැහැලා උද්ඝෝෂණය කරලා කිව්වා, "කෝ අපට රුපියල් අසූවේ සහතික මිල දෙනවාද" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වෙන කොටත් සතොස හරහා අපි රුපියල් 80ට මිලදී ගැනීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරලායි තිබුණේ. නමුත් එය කඩාකප්පල් කරන්න සැරසුණු ඒ උදවියට මම කියනවා, "දැන් පාරට එන්න, පාරට බහින්න. ඇවිල්ලා අල ගොවියා ගැන කථා කරන්න" කියලා. ඒ සහතික මිල හැකි ඉක්මනින් ලබා දෙන්න කියලා මුදල් අමාත්‍යවරයාට මම කියනවා.

ඒ වාගේම, මිලදී ගැනීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වුණත්, ඒ කන්නයේ අස්වනු නෙළන කාලයේ යම් අඩු පාඩුකම් විශාල ප්‍රමාණයක් තිබුණා. අපි සතොස හරහා අර්තාපල් මිලදී ගත්තත් අපට නිසි වෙළෙඳ පොළක් තිබුණේ නැහැ, ඒ අර්තාපල් ටික විකුණා ගන්නට. එදා අපි රජයක් හැටියට පාඩු වින්දා. ඒ නිසා මම ඒ ගොවි ජනතාව වෙනුවෙන් මේ ගරු සභාවට යෝජනා කරනවා, දේශීය අර්තාපල් වෙළෙඳ පොළට එන කොට මාසයකට පෙරදීවත් ආනයනික අර්තාපල් සියල්ලම ගෙන්වීම තහනම් කරන්න, ගෙන්වන්න එපා කියලා.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ සන්ධානය අවුරුදු ගණනාවක් තිස්සේ පොහොර සහනාධාරය දුන්නා, ගොවියා වෙනුවෙන්. වී ගොවියාට රුපියල් 350ටත්, අල ගොවියාට සහ එළවලු ගොවියාට රුපියල් 1,250ටත් පොහොර දුන්නා. අලුත් රජයත් දිගටම මේ පොහොර සහනාධාරය දෙනවාද, මේ කටයුත්ත දිගටම ක්‍රියාත්මක කරනවාද කියන එක මම අහන්න කැමැතියි. මොකද, කිසි කෙනෙකු මේ වන තුරු ඒ ගැන කථා කළේ නැහැ. ඒ වාගේම තව යෝජනාවක් මම ඉදිරිපත් කරනවා. මේ වන කොටත් බීජ අර්තාපල්වලට විශාල මුදලක් ගොවියා යට කරනවා. අපේ කරුපයියා වෙලායුදම් රාජ්‍ය ඇමතිතුමාත් මේ අවස්ථාවේදී ගරු සභාවේ ඉන්නවා. එතුමාත් මේ කාරණය ගැන දන්නවා, ඒ ප්‍රදේශය නියෝජනය කරන ඇමතිවරයෙකු හැටියට. අපි බීජ නිෂ්පාදනයට ප්‍රමුඛත්වයක් දිය යුතුයි. අපි රජයක් හැටියට පසු ගිය කාලයේ වැලිමඩ මැතිවරණ කොට්ඨාසයේ බීජ නිෂ්පාදනාගාර ස්ථාපිත කළා. මම යෝජනා කරනවා, අනිකුත් ආසනවල වාගේම ඌව - පරණගම මැතිවරණ කොට්ඨාසයේත් බීජ නිෂ්පාදනාගාර ස්ථාපිත කරලා ගොවියා වෙනුවෙන් යම් සහනයක් ලබා දෙන්න කියලා.

කිරි ගොවියා ගැනත් කිව යුතුයි. දේශීයව නිෂ්පාදනය වුණු කිරි පිටි පැකට් එකේ මිල අද තමුන්නාන්සේලා අඩු කරපු මිලටම ලබා දීමට රජයක් හැටියට අපි පසු ගිය අය වැයේදී කටයුතු කරලා තිබුණා. ආනයනය කරන කිරි පිටි පැකට් එකේ මිල අපි අඩු කළේ නැත්තේ දේශීය කිරි ගොවියා ආරක්ෂා කිරීමේ වැඩ පිළිවෙළක් හැටියටයි. අපි කිරි ගොවියාට කිරි ලීටරයකට දෙන්න පුළුවන් මුදල වැඩි කරලා දුන්නා. ඒ වාගේම දේශීය කිරි ගොවියාට අවශ්‍ය කරන පහසුකම් වාගේම සම්පත් ලබා දෙන්න කටයුතු කළා. මේ ගරු සභාව නියෝජනය කරන මන්ත්‍රීවරියක් එදා ඒ ආනයනික කිරි පිටි සම්බන්ධයෙන් වෙළෙඳ දැන්වීමකට පෙනී හිටියා. අද සමාජ සේවිකාවක් හැටියට, ඇමතිතුමියක් හැටියට ඉන්න එතුමියගෙන් මම අහනවා, දේශීය වශයෙන් අපේ කිරි ගොවියා ආරක්ෂා කරන්න නම් එදා ඔබතුමිය කිව්ව කාරණයමද අදත්

[ගරු ඒ.එම්. චාමික බුද්ධදාස මහතා]

කියන්නේ, එහෙම නැත්නම් අපේ රටේ නිෂ්පාදනය වන කිරි පිටි පැකට් එක ගැන කථා කරනවාද කියලා. ඒ සම්බන්ධයෙන් මේ ගරු සභාවට කියන්න කියලා මම එතුමියගෙන් ඉල්ලීමක් කරනවා.

පාසල් ගැනත් අද අපි කථා කරන්නම ඕනෑ. මහින්දෝදය විද්‍යාගාරත් එක්ක පාසල් දාහක් මේ රටේ ස්ථාපිත කරන කොට සමහරු ඊර්ෂ්‍යාවෙන්, වෛරයෙන්, ක්‍රෝධයෙන් ඒ දිහා බැලුවා. බදුලු දිස්ත්‍රික්කයේ ඌව - පරණගම ආසනය ගොවි ජනතාව නියෝජනය වන ආසනයක්. මම උදාහරණයක් හැටියටයි ඒ ආසනය ගැන කියන්නේ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙන්නේ ගරු මන්ත්‍රීතුමනි.

ගරු ඒ.එම්. චාමික බුද්ධදාස මහතා
(மாண்புமிகு ஏ.எம். சாமிக புத்ததாஸ)
(The Hon. A.M. Chamika Buddhadasa)
ආසනයකට පාසල් පහක් වශයෙන් මහින්දෝදය විද්‍යාගාර සහිත පාසල් දාහක් මේ රටේ හැදෙන කොට ඒ ගොවි අම්මා තාත්තාගේ දරුවාට ඒ පාසල්වලට යන්න පුළුවන් වන විධියට අපි ඒ පාසල් සංවර්ධනය කළා. මම නව අධ්‍යාපන ඇමතිතුමාට මේ අවස්ථාවේ දී මේ කාරණය පිළිබඳව ප්‍රකාශ කරනවා. අපි පාසල් පහක් සංවර්ධනය කරන්න සැලසුම් කළා. නමුත් එදා විපක්ෂයේ සමහරු එකතු වෙලා උද්ඝෝෂණය කරලා, මගේ ආසනයේ ජාතික පාසලක් හැටියට තිබුණු ඒ පාසලේ මහින්දෝදය විද්‍යාගාරය ඉදි කරන්න අවස්ථාව ලබා දුන්නේ නැහැ. අනෙක් පාසල්වල මහින්දෝදය විද්‍යාගාර ටික හැදෙන කොට ඒ අම්මා තාත්තාට, දරුවාට දැනුණා, "අනේ! අපේ පාසලට ලබා ගන්න තිබුණු සම්පතක් අපි නැති කර ගත්තා"ය කියලා. එවකට හිටපු බන්දුල ගුණවර්ධන අධ්‍යාපන ඇමතිතුමා, අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සංකල්පයක් අනුව මේ කටයුත්ත ක්‍රියාත්මක කරන කොට ඒ අහිංසක ගොවි ජනතාවගේ දරුවාට හොඳ පාසලක් අපේ ආසනය තුළ සංවර්ධනය කර ගන්න, නිර්මාණය කර ගන්න අපිට හැකියාව ලැබුණා.

මම නව අධ්‍යාපන ඇමතිතුමාට කියන්නේ මේකයි. අපිට මහින්දෝදය විද්‍යාගාරයක් ඉදි කර ගන්න බැරි වෙච්ච එක පාසලක් තිබෙනවා. ඒ තමයි, අපේ ආසනයේ එකම ජාතික පාසල හැටියට තිබෙන ලූණුවත්ත ජාතික පාසල. පුළුවන් නම් ඔබතුමා ඒ කටයුත්ත අපිට ඉටු කරලා දෙන්න. ඒ පාසල් පහේ මේ වන කොට මහින්දෝදය විද්‍යාගාර ඉදිකිරීමේ වැඩ කටයුතු ආරම්භ කරලා තිබෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා. කාලය අවසානයි.

ගරු ඒ.එම්. චාමික බුද්ධදාස මහතා
(மாண்புமிகு ஏ.எம். சாமிக புத்ததாஸ)
(The Hon. A.M. Chamika Buddhadasa)
එක පාසලක මහින්දෝදය විද්‍යාගාරයක වැඩ නිම කරන්න මේ වෙන කොට වැඩ කටයුතු කරගෙන යනවා. ඔබතුමාට මම කියන්නේ ඉතුරු පාසල් හතරටත් මහින්දෝදය විද්‍යාගාර ලබා දීලා, ඒ අහිංසක ගොවි අම්මා, තාත්තාගේ දරුවාට නිසි අධ්‍යාපනයක් ලබන්න පුළුවන් වාතාවරණය හදලා දෙන්න කියලායි. මම මේ අවස්ථාවේ ඒ ඉල්ලීමත් කරමින් මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියටත් ස්තුතිවන්ත වෙමින් මම මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. ඊළඟට ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා.

[අ.භා. 6.01]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජනාධිපතිවරණයට පෙර තිබුණු අවසාන සැසි වාරයේදී මම ප්‍රකාශ කළා, ජනාධිපතිවරණයෙන් පස්සේ නියත වශයෙන්ම අපි ආණ්ඩු පක්ෂයේ වාඩි වෙනවාය කියලා. ඒ විධියටම අද ආණ්ඩු පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විධියට ප්‍රථම වතාවට මට සභාව අමතන්න ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා.

අපේ ගරු චාමික බුද්ධදාස මන්ත්‍රීතුමා සභා ගර්භයේ ඉන්න වෙලාවේ එතුමා කියපු කථාවකින්ම මාගේ කථාව පටන් ගත්තොත් හොඳයි කියා මා හිතනවා. එතුමා ගොවීන් ගැන කිව්වා. මම හිතන්නේ ගොවීන්ට ලැබුණු කිසිම සහනාධාරයක් කප්පාදු වෙලා නැහැ. පොහොර සහනාධාරය එසේම ලබා දෙන ගමන් තවත් සහන ගණනාවක් ගොවීන්ට ලබා දීලා තිබෙනවා.

ගරු ඒ.එම්. චාමික බුද්ධදාස මහතා
(மாண்புமிகு ஏ.எம். சாமிக புத்ததாஸ)
(The Hon. A.M. Chamika Buddhadasa)
මන්ත්‍රීතුමා, මම කිව්වේ ස්ථාවර මිල තවම ලැබුණේ නැහැ කියලායි.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගොවීන්ගේ රුපියල් ලක්ෂය දක්වා වූ ණය සියයට 50ක් කපා හරින්න යෝජනා කරලා තිබෙනවා. ඒ වාගේම ගොවීන්ට අත් ට්‍රැක්ටර් සඳහා සහන ලබා දීලා තිබෙනවා. පසු ගිය කාලයේ ගොවීන්ට පමණක් නොවෙයි, සැම දෙනාටම ස්වර්ණාභරණ උකස් කරන්න සිද්ධ වුණා. තමන්ගේ සියලුම කනකර උකස් කියලා තමයි මිනිසුන් තම ජීවිකාව කර ගෙන ගියේ. මොකද, තමන් මාසිකව උපයන ආදායම ප්‍රමාණවත් නැහැ. මාසය අන්තිම වන විට තමන්ගේ ගෙදර නඩත්තුවට, හදිසි කටයුත්තකට ප්‍රයෝජනයට ගන්න තරම් මුදලක් අත ඉතිරි වන්නේ නැහැ. වියදම් අධිකයි. එතකොට තමන්ගේ කනකර උකස් කියලා තමයි මේ රටේ ජනතාව තමන්ගේ ප්‍රශ්න විසඳා ගත්තේ. ඒ උකස් කියපු භාණ්ඩ ආපසු බේරා ගන්න පුළුවන් තත්ත්වයකට ඒ අවුරුද්ද පුරාම ඒ අයගේ ආර්ථිකය ශක්තිමත් වුණේ නැහැ. ඒ නිසා අපේ මුදල් ඇමතිතුමා ඒ අයට හොඳ සහනයක් ලබා දීලා තිබෙනවා. රුපියල් ලක්ෂ දෙකක් දක්වා උකස් කියපු භාණ්ඩ සඳහා පොලිය ගෙවන්නේ නොමැතිව ඒවා බේරා ගැනීමට අවස්ථාව ලබා දීලා තිබෙනවා. මේ විධියට මේ සියලුම සහන ගොවීන්ට ලැබිලා තිබෙනවා.

ඊට අමතරව, ඉන්ධන මිල අඩුවීම හරහා ගොවීන්ට විශාල සහනයක් ලැබිලා තිබෙන බව අපි දන්නවා. අත් ට්‍රැක්ටර්, කොළ මඩින යන්ත්‍ර ඇතුළු නොයෙකුත් යන්ත්‍ර සූත්‍රවලට ඩීසල් යෙදීම

හරහා ඔවුන්ගේ නිෂ්පාදන පිරිවැය විශාල වශයෙන් ඉහළ ගියා. හැබැයි විශාල ප්‍රමාණයකින් ඉන්ධන මිල අඩු වීම හරහා ඒ සහනයත් ගොවීන්ට දැන් ලැබිලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, තමන්ට එදා වේලට අවශ්‍ය දේවල් ටික කඩෙනුයි ගොවීන් ගන්නේ. සැමන් ටින් එක, එහෙම නැත්නම් අනෙක් වුවමනා කරන දේවල් ටික කඩෙනුයි ගන්නේ. අද ඒවායේත් මිල අඩු වෙලා තිබෙනවා. ඍණ ගෘහස්ථ ආර්ථිකයක් ලෙසට තිබුණු ඔවුන්ගේ ගෘහස්ථ ආර්ථිකය මේ සියලු දේවල් හරහා අද ධන ගෘහස්ථ ආර්ථිකයක් බවට පත් වෙලා තිබෙනවා. තමන්ගේ අතේ සල්ලි ඉතුරු වන බව අද මිනිසුන්ට දැනිලා තිබෙනවා.

පාන් ගෙඩියේ මිල අඩු වෙලා තිබෙනවා. පාන් ගැන කියද්දී මේ කාරණයත් කියන්න ඕනෑ. ජාතික නිදහස් පෙරමුණේ විමල් වීරවංශ හිටපු ඇමතිතුමා කියලා තිබුණා, මේ තිරිඟු පිටි මිල අඩු කිරීම අධිරාජ්‍යවාදී කුමන්ත්‍රණයක් කියලා. ඒ ගැන අපි පුදුම වෙන්නේ නැහැ. එතුමා හැම දෙයටම අධිරාජ්‍යවාදී ලේබලය ගහන එක ගැන අපි පුදුම වෙන්නේ නැහැ. හැබැයි අපි ලජ්ජා වෙනවා, මිනිසුන්ට සහනයක් දෙන කොට ඒකත් "අධිරාජ්‍යවාදී" කියන ගොඩට දමලා කටයුතු කිරීම සම්බන්ධයෙන්.

දැන් විරුද්ධ පැත්තේ ඉන්න අය ගොඩාක් කෑ ගැහුවාට, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාව පොදු අපේක්ෂකයා විධියට ඉදිරිපත් කරලා මැතිවරණ ව්‍යාපාරයට යොදවපු වෙලාවේ එතුමා අධිරාජ්‍යවාදීන්ගේ බළල් අතක් කිව්වා; අතකොළුවක් කිව්වා; රූකඩයක් කිව්වා; කොටියෙක් කිව්වා; ඩයස් පෝරාවේ ඒජන්තයෙක් කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එහෙම කියපු අය අද එතුමාට ආවඩනවා. ඒ ගැන අපි දුක් වෙනවා. මේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හැටි. ඒක ඉතිහාසය පුරාම තිබෙන දෙයක්. ගුණමකු අය තමයි වැඩි පිරිසක් ඉන්නේ. අපි දන්නවා, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග හිටපු ජනාධිපතිතුමියගේ ධුර කාලය අවසන් වුණාම කුණු මාළු කෑල්ලක් කුණු කූඩයට දැම්මා වාගේ කටයුතු කළ බව. එක් කෙනෙක්වත් එතුමිය ළඟ හිටියේ නැහැ. සියලුම දෙනා අයින් වෙලා ගියා. ගරුත්වයක් තිබුණේ නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මූලස්ථාන කාර්යාලයේ තිබුණු එතුමියගේ ඡායා රූපයත් ඉවත් කළා. අද මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාටත් කරලා තිබෙන්නේ ඒ ටිකමයි. එදා ගුණ ගී ගායනා කරමින් එතුමා ළඟ හිටපු අය ඒ දෙයමයි එතුමාටත් කරලා තිබෙන්නේ. ඒ දෙයමයි කරලා තිබෙන්නේ!

අපේ එක්සත් ජාතික පක්ෂයේ ඉතිහාසය බලන්න. අපි කවදාවත් අපේ නායකයෙක් ඒ තත්ත්වයට පත් කරලා තිබෙනවාද? එක්සත් ජාතික පක්ෂයේ ඉතිහාසය තුළ කිසිම නායකයකුට එහෙම කරලා නැහැ. හැබැයි මේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉතිහාසය තුළ දිගින් දිගටම සිදු වුණේ ඒකයි. තමන්ගේ නායකයා ඉන්නකල් ආවඩලා, නායකත්වයේ ඉන්නකල් නායකයා වටා රොක් වෙලා ඉඳලා, නායකයාගේ හොඳයි, නරකයි සියල්ලම කියලා, අන්තිමට බලය නැති වෙලා යන කොට ඒ අය අත් හැරලා, ඒ අයට අපහාස කරලා, කිසිම ගරුත්වයකින් තොරව ඒ අය ඉවත් කරලා, අලුතෙන් ආපු නායකයා වටා රොක් වීම තමයි සිදු වුණේ. මේ දිහා බලන කොට අපට කනගාටුයි. මහින්ද රාජපක්ෂ මහත්මයාට විවේචන විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ කොච්චර විවේචන තිබුණත් එතුමාත් යම් දෙයක් කළා. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා යුද්ධයට දායකත්වයක් දුන්නා. එහෙම කරපු නායකයාට අද කවුරුවත් නැහැ. අද එතුමාව ඉවත් කරලා; පක්ෂයෙනුත් ඉවත් කරලා. අද එතුමාව මැදමුලනට තල්ලු කරලා. එක්සත් ජාතික පක්ෂයේ අයට වඩා අද එතුමාට මඩ ගහන්නේ මැතිවරණ ව්‍යාපාරයේදී එතුමා සමඟර හිටපු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අයයි. එතුමා හොරකම් කළා කියන්නේ, එතුමාගේ දූෂණ තිබුණා කියන්නේ, එතුමා සුදු වෑන් යැව්වා කියන්නේ එතුමා එක්ක හිටපු අය. ඉතින් මේ වාගේ ගුණමකු පිරිසක් ඉන්න පක්ෂයක් තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කියන්නේ. මම කියන්නේ නැහැ, සියයට 100ක්ම එහෙම අය කියලා. නමුත් බහුතරයක් එහෙම අය. අපි ඒ ගැන කනගාටු වෙනවා.

දැන් බලන්න, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාව ජනාධිපති කරන්න සියයට 85ක්ම දායකත්වය දුන්නේ එක්සත් ජාතික පක්ෂය. නමුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිකම අපට අයිති නැහැ. ඒක අපට අයිතිත් නැහැ; අපට ඕනෑත් නැහැ. හැබැයි මෛත්‍රීපාල සිරිසේන කියන ජනාධිපතිතුමාගේ අයිතිය තිබෙන්නේ අපට. අපිත් එක්ක එකතු වුණු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අය ඉන්නවා. එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහත්මයා ඉන්නවා, දුමින්ද දිසානායක මහත්මයා ඉන්නවා. ඒ අයට ඒ අයිතිය තිබෙනවා. හැබැයි ඒ වෙලාවේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට "අයියෝ සිරිසේන" කියපු අය දැන් "දෙයියෝ සිරිසේන" කියා ගෙන ආවාට එතුමන්ලාට මෛත්‍රීපාල සිරිසේන කියන ජනාධිපතිතුමාගේ අයිතියක් නැහැ. සභාපතිතුමාගේ අයිතිය තිබෙනවා. ජනාධිපතිතුමාගේ අයිතිය තිබෙන්නේ ඒ වෙනුවෙන් වැඩ කරපු, ඒ වෙනුවෙන් මහන්සි වුණු, ඒ වෙනුවෙන් දුක් විඳපු අයට. මම දන්නවා එතුමා පාර්ලිමේන්තුවට ආවාම සේරම අය එතුමා පිටිපස්සෙන් යන්නේ, මීමැස්සෝ වාගේ. භෝජනාගාරයේදීත් මීමැස්සෝ වාගේ වට කරගෙන ඉන්නේ. හැබැයි, ඒ හැමෝම ජනාධිපතිවරණයේදී මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට උදව් නොකරපු අය. එතුමා පරාජය වුණා නම් එතුමාට ඉන්න වෙන්නේ හිර ගෙදර. ඒ වෙනුවෙන් සැලසුම් හදපු අය, ඒ වෙනුවෙන් කටයුතු කරපු අය තමයි අද එතුමා පිටිපස්සෙන් ඉන්නේ. ඒ නිසා කවුරු පිටිපස්සෙන් ගියත් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා දන්නවා කවුද එතුමාට උදව් කළේ, කවුද එතුමාගේ ජයග්‍රහණය වෙනුවෙන් කැප වුණේ කියන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම එතුමා දන්නවා ඔය පිටිපස්සෙන් එන අය එන්නේ ආදරයට නොවෙයි කියන එකත්. මේක තමයි අවස්ථාවාදය කියන්නේ. මේක තමයි බලයට තිබෙන කෑදරකම කියන්නේ. දැන් ඒ අය හිතා ගෙන ඉන්නවා මාස තුනකින් රජය ගන්න. ජීවිතයට ගන්න හම්බ වෙන්නේ නැහැ. ඊළඟ අවුරුදු හයේ ජනාධිපතිවරයා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා. ඒ වාගේම, අගමැතිවරයා වෙන කවුරුවත් නොවෙයි එක්සත් ජාතික පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමා, ඒක ස්ථිරයි. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටවත් අවශ්‍ය නැහැ ඒක වෙනස් කරන්න. මොකද, එතුමා කළ ගුණ දන්නා නායකයෙක්. අනිත් එක, එතුමා දන්නවා රනිල් වික්‍රමසිංහ මැතිතුමා කියන්නේ කොච්චර දක්ෂ නායකයෙක්ද කියන එක. මම හිතන්නේ අවසාන කාලයේදී ඒක එතුමාට වඩාත් තේරුම් ගිහිල්ලා තියෙනවා.

ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා කොච්චර බුද්ධිමත් නායකයෙක්ද, කොච්චර දක්ෂ නායකයෙක්ද, කොච්චර දක්ෂ පාලකයෙක්ද කියන මේ සෑම දෙයක්ම මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා දැන ගෙන තිබෙනවා. මේ දෙන්නා බොහොම සහයෝගයෙන් මේ වැඩය කරන්නේ. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා තීන්දුවක් ගන්නා විට අගමැතිතුමාගෙන් අහනවා. අගමැතිතුමා තීන්දුවක් ගන්නා විට ජනාධිපතිතුමාගෙන් අහනවා. ඇත්ත තත්ත්වය මේකයි. මේක නොදන්නා අපේ ගම්වල සමහර ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෝ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පක්ෂයේ සභාපතිකම ගනිද්දි රතිඤ්ඤා පත්තු කරනවා. හැබැයි, ඒ අයගෙන් බහුතරයක් original ශ්‍රී ලංකා කාරයෝ නොවෙයි, ජාවාරම් කරපු අය. එහෙම නැත්නම් ඒ ආණ්ඩුවෙන් මොනවා හෝ "සම්තින්"එකක් ගන්න මොනවා හෝ සම්බන්ධයක් තිබුණු අය; එක්කෝ වැලි ජාවාරම් කරපු අය, එහෙම නැත්නම් කසිප්පු ජාවාරම් කරපු අය; එහෙමත් නැත්නම් සමෘද්ධි නියාමකවරු, කුඩු

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

ජාවාරම්කාරයෝ තමයි මෙහෙම සතුටු වුණේ. හැබැයි, ගමේ සිටින original ශ්‍රී ලංකා කාරයෝ බහුතරයක් ඉන්නේ මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා එක්ක. ගම්වල ඉන්න මිනිස්සු විධියට අපි ඒක දන්නවා. මම ඒක හදවතින් කියන්නේ. ඒ නිසා පක්ෂයේ සභාපතිකම ගත්තා කියලාවත්, පක්ෂය ඇල්ලුවා කියලාවත් මේ මන්ත්‍රීවරු සේරම මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට සහයෝගය දෙනවා කිව්වත් ගමේ මිනිස්සු වෙනස් වෙලා නැහැ. ගමේ මිනිස්සු බහුතරයක් -මම කියන්නේ original ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෝ ගැන- ඉන්නේ මහින්ද රාජපක්ෂ මහත්මයාත් එක්ක. අපි කියනවා පුළුවන් නම් දෙගොල්ලෝ එකතු වෙලා ඡන්දයක් තියලා බලන්න, අනිවාර්යයෙන්ම මෛත්‍රීපාල සිරිසේන මහත්මයාත් එක්ක ඉන්න පක්ෂයේ කණ්ඩායම පරාජය කරලා එන්නේ මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කණ්ඩායම.

අනෙක් එක, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට පුළුවන්ද, ජනාධිපතිවරණයේදී එතුමාට විරුද්ධකම් කළ, පසු ගිය ආණ්ඩුවේ හොරකම් කළ අයත් එක්ක ඊළඟ මැතිවරණයේදී එක වේදිකාවේ ඉන්න? මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ඒ මැතිවරණයේදී එක වේදිකාවට යනවා නම්, අද මේ ඉන්න පාර්ලිමේන්තුවෙන් බාගයක් පක්ෂයෙන් අයින් කරලා, බාගයක් අලුත් අය දාලා තමයි යන්න වෙන්නේ; අලුත් අයත් එක්කයි යන්න වෙන්නේ. ඒ නිසා මේ අය හිතා ගෙන ඉන්න දින සියයෙන් පසුව හදන සිහින ආණ්ඩුව හදන්න කීයටවත් බැහැ, ඒක සිහිනයක් පමණයි. මේ අය වැය ලේඛනය දින සියයක ඉලක්කයක් සඳහා දුන්නු අය වැය ලේඛනයක් නොවෙයි.

අපි දන්නවා පසු ගිය රජය කොපමණ මුදල් නාස්ති කළාද, කොපමණ මුදල් අපතේ ඇරියාද, අනවශ්‍ය ව්‍යාපෘතිවලට කොපමණ මුදල් වියදම් කළාද, කොපමණ ටෙන්ඩර් මගඩි කළාද, ටෙන්ඩර් නැතිව කට වචනයට කොපමණ පාරවල් හදන්න කොන්ත්‍රාත් පිරිනැමුවාද කියලා. මේ විධියට කට වචනයට කළ ව්‍යාපෘති නිසා අද කොන්ත්‍රාත් ගන්නා සමාගම් කීයක් තමන්ගේ කොම්පැනි වසා දමන තත්ත්වයට පත් වෙලා තිබෙනවාද? අපි දන්නවා, පසු ගිය මැතිවරණයට ඔන්න මෙන්න කියලා අපේ ප්‍රදේශවල, ඒ ආසන්නයේ සිටිය කොන්ත්‍රාත්කරුවාට පාරවල් හත අටක වැඩ පටන් ගන්න කියලා කට වචනයට කොන්ත්‍රාත්තුව දුන්නා, ඡන්ද බලා ගෙන; ඡන්දය ගන්න. ඒ මිනිස්සු ගිහිල්ලා වැඩ පටන් ගත්තා. අද ඒ මිනිස්සුන්ට ඒ සඳහා වියදම් වුණු මුදල්වත් ගන්න බැරි වෙලා තිබෙනවා.

උතුරු අධිවේගී මාර්ගය රටට අවශ්‍ය ව්‍යාපෘතියක් බව අපි දන්නවා. හැබැයි, ඒකේ මොකක්ද වෙලා තිබුණේ? ඒකේ මූලික කොටස තමයි එඩේරමුල්ලේ ඉඳලා මීරිගම, වේයන්ගොඩ දක්වා කොටස. ඒක ප්‍රදානය කරන්නේ නැතිව -පළමුවැනි කොටස ප්‍රදානය කරන්නේ නැතිව- එතැනින් එහා කොටස් වන මීරිගම සිට පොතුහැරට, පොතුහැර සිට දඹුල්ලට වාගේ කොටස්වලට කොන්ත්‍රාත් ප්‍රදානය කරලා තිබෙනවා. එතකොට අපි අහනවා, highway එකේ ඇවිල්ලා එතැනින් ඉතිරි කොටසේ එනම්, වේයන්ගොඩ ඉඳන් කොළඹට එන්නේ කොහොමද කියලා. එන්න වෙන්නේ කලින් ආපු පාරෙන්මයි. එහෙම නොවෙයි වෙන්න ඕනෑ. ඉස්සෙල්ලාම traffic එකක් නැතිව කොළඹින් එළියට යන්න හදන්න ඕනෑ. එහෙම කරන්නේ නැතිව අර කෙළවරේ ව්‍යාපෘති ටික කරන්න කොන්ත්‍රාත් ප්‍රදානය කළා, කිසිදු විනිවිදභාවයකින් තොරව. මා හිතන විධියට එක කිලෝමීටරයකට වියදම රුපියල් බිලියන 45කට ආසන්න ප්‍රමාණයක්.

අපේ ගරු රවි කරුණානායක මැතිතුමා, ගරු කබීර් හාෂීම් මැතිතුමා එහෙම දැන් අධ්‍යයනය කරගෙන යනවා, මේකෙන් සියයට 25කට වැඩි ප්‍රමාණයක් අඩුවෙන් මේ කොන්ත්‍රාත් ප්‍රදානය කරන්න පුළුවන් කියන එක ගැන. මේ වෙලාවේ ක්ෂේත්‍රයේ යම් කිසි කඩා වැටීමක් තිබෙනවා. ක්ෂේත්‍රයේ අය කලබල වෙලා තිබෙනවා. හැබැයි, ඒකට අපට කරන්න දෙයක් නැහැ. අපට මේක විනිවිදභාවයකින් යුතුව කරන්න මාසයක්, දෙකක් කල් ඕනෑ. අර දුන්නු විධියට කොන්ත්‍රාත් ප්‍රදානය කරගෙන යන්න බැහැ. අර දුන්නු විධියට ටෙන්ඩර් නැතිව කට වචනයට මේවා කරන්න දෙන්න බැහැ. අපි දන්නවා දේශීය බැංකු යෝජනා ක්‍රම යටතේ පාරවල් ගණනාවක වැඩ කෙරුණා, කිසිදු ටෙන්ඩර් කැඳවීමක් නැතිව. කොන්ත්‍රාත්කරුවා කියනවා; යෝජනාව ඉදිරිපත් කරනවා; ගිහිල්ලා කර ගනින් කියලා කොන්ත්‍රාත්තුව දෙනවා. ඒ ව්‍යාපෘති අද අඩපණ වෙලා තිබෙනවා. කොන්ත්‍රාත් ක්ෂේත්‍රයට කරපු මේ හානි හරහා මේ ක්ෂේත්‍රයේ ලක්ෂ සංඛ්‍යාත රැකියා කරන අයට අද විශාල තර්ජනයක් එල්ල වෙලා තිබෙනවා. හැබැයි, අපි ඒ අයට කියනවා මාසයක්, දෙකක් ඇතුළත අපි මේවා විනිවිදභාවයකින් යුතුව නිවැරදි කරන බව. නිවැරදි කරලා මේ ක්ෂේත්‍රය හොරුන්ගෙන් බේරා ගෙන, මංකොල්ලකාරයින්ගෙන් බේරා ගෙන, කොන්ත්‍රාත් මාෆියාව කරන ප්‍රධාන කොන්ත්‍රාත්කරුවන් තුන් හතර දෙනාගෙන් බේරා ගෙන, දේශීය දක්ෂ ව්‍යාපාරිකයින් සම්බන්ධ කරගෙන හොරකම් නොකර, නියම ප්‍රමිතීන්ට අනුව, ටෙන්ඩර් පටිපාටි අනුව කටයුතු කරන්න පුළුවන් වටපිටාව අපි හදනවා. පසු ගිය කාලයේ වුණේ කොන්ත්‍රාත්කරුවන්ට කට වචනයට කොන්ත්‍රාත් දුන්නු එකයි. එහෙම කොන්ත්‍රාත් දීලා advance payment එක ගත්තු ගමන් දේශපාලනඥයා කොමිස් මුදල සාක්කුවට දා ගන්නවා. ඊට පස්සේ කොන්ත්‍රාත්කරුවන් වැඩේ කරන්න ඕනෑ. ඒ නිසා මේ ක්ෂේත්‍රය අද විශාල වශයෙන් බිඳ වැටිලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අය වැයේදී අපේ රජය ගොවීන් දිහා විතරක් නොවෙයි, සෑම අංශයක් දිහාම බලලා තිබෙනවා. අපේ රටේ සම්පත, මතු පරපුර බිහි කරන ගැබිනි මාතාවට රුපියල් 20,000ක මුදලක් කිසිදු භේදයකින් තොරව උපදින සෑම දරුවකු වෙනුවෙන්ම දෙන්න යෝජනා කර තිබෙනවා. ඒක කොටස් වශයෙන් යම් කිසි කාලපරිච්ඡේදයක් ඇතුළත ලබා දෙනවා. දරුවා ඉපදෙන්න කලින් සහ දරුවා ඉපදිලා මාස තුන හතරක් ආවරණය වන පරිදි, ඒ මුදල කොටස් වශයෙන් දෙන්න අපේ ගරු මුදල් ඇමතිතුමා, ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහ ගරු ඇමතිතුමියන්ලා සාකච්ඡා කරලා යෝජනා කර තිබෙනවා. මේක ඉතාම හොඳ යෝජනාවක්. මිනිස්සු කිව්වේ එක්සත් ජාතික පක්ෂය කියන්නේ ධනවාදී පක්ෂයක් කියලයි. හැබැයි, මේ අය වැය දැක්කාට පස්සේ ගම්වල මිනිස්සු, අපේ රටේ උගත් මිනිස්සු කියන්නේ එක්සත් ජාතික පක්ෂ ඉතිහාසයේ ඉදිරිපත් කරපු සමාජවාදීම අය වැය මේකයි කියලයි. එදා ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා අපට කිව්වා ජේවීපී අය වැයක් ඉදිරිපත් කළා කියලා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
දැන් අවසන් කරන්න ගරු මන්ත්‍රීතුමනි.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මට විනාඩියක් දෙන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
දැන් කාලය අවසානයි.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

හොඳයි. පොඩි මිනිස්සුන්ට කරදරයක් නොකර, පොඩි මිනිස්සු ශක්තිමත් කරමින් කුඩු ව්‍යාපාරිකයින්ට එම ව්‍යාපාර කරන්න දෙන්නේ නැතිව, සල්ලි තිබෙන තැන්වලින්, ධන කුවේරයින්ගෙන්, ධනපති උදවියගෙන් සල්ලි ඇදලා ගන්න පුළුවන් හොඳ අය වැයක් ඉදිරිපත් කිරීම ගැන මා අපේ ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත්, අපේ ගරු මුදල් ඇමතිතුමාටත් ගරු කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමීයනි, මට කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමීයට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමීය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි. මීළඟට ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා.

[අ.භා. 6.16]

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමීයනි, විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා කෙටි වේලාවක් හෝ ලබා දී මේ විවාදයට එකතු වෙන්න අවස්ථාව ලබා දීම පිළිබඳව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමීයනි, අපේ ගරු නලින් බණ්ඩාර මන්ත්‍රීතුමා අදහස් ඉදිරිපත් කරද්දී ප්‍රකාශ කළා, හිටපු අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාව තනි කරලා එතුමාව පැත්තකට විසි කරලා අපි මේ දේශපාලන ගමන යන්න බලාපොරොත්තු වනවා කියලා. විශේෂයෙන්ම කියන්න කැමැතියි, මහින්ද රාජපක්ෂ කියලා කියන්නේ ලංකාවේ පමණක් නායකයකු නොවන බව. එතුමා ලංකාවට, දකුණු ආසියාවට, ආසියාවට විතරක් නායකත්වය දුන්නු කෙනකු හැටියට නොවෙයි අපි දකින්නේ. එතුමා මුළු ලෝකයේම නායකයකු හැටියටයි අපි ගණන් ගන්නේ. ලෝකයේම නායකයකු හැටියටයි එතුමාට අපි ගරු කරන්නේ. ඒ නිසා එතුමාට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට තව දුරටත් නායකත්වය දෙන්න වාගේම ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමන්ලා මේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තව දුරටත් ඉදිරියට ගෙන යන්න ඒ අවශ්‍ය ආශීර්වාදය සහයෝගය ලබා දෙන්න හැකියාව ලැබේවා යි ප්‍රාර්ථනා කරන ගමන් එතුමාට චිරාත් කාලයක් අපිත් එක්ක ජීවත් වෙන්න වාසනාව ලැබේවා යි කියලා අපි ප්‍රාර්ථනා කරනවා. කවදා හෝ එතුමා අභාවප්‍රාප්ත වූ දවසක වියට්නාමයේ හෝ චි මිං ගේ දේහය වීදුරු පෙට්ටියක දාලා ආරක්ෂා කරනවා වාගේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ දේහයත් ශ්‍රී ලාංකීය ජනතාව විසින් ආරක්ෂා කරන්නට ඕනෑ කියලා මා කියන්න කැමැතියි. මේ රටේ මොන ආණ්ඩුව තිබුණත්, මොන රාජ්‍ය නායකයා සිටියත්, බෙදුම්වාදී ත්‍රස්තවාදය පරාජයට පත් කළ, ජීවිත හා දේපළ විශාල ප්‍රමාණයක් ආරක්ෂා කර දුන් ඒ ශ්‍රේෂ්ඨ නායකයාව අපි ආරක්ෂා කරන්නට ඕනෑය කියන එක මේ වැදගත් සභාවේ දී විශේෂයෙන්ම මතක් කරන්න කැමැතියි. ඒ නිසා අපි ඔහුව තනි කරන්නේ නැහැ. නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා සඳහන් කළ ආකාරයට මහින්ද රාජපක්ෂ මැතිතුමා වෙනම පිලකත්, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා වෙනම පිලකත් ඉඳියි, ඒ නිසා ඉදිරි මැතිවරණයකදී මේ පක්ෂය දෙකට කැඩෙයි, මේ පක්ෂය දෙකට කැඩුණාට පසුව ඔවුන්ට බලය ලබා ගන්න පුළුවන් වෙයි කියන මතය තමයි එතුමා ඉදිරිපත් කළේ. [බාධා කිරීමක්] කෑ ගහන්න එපා. මට කථා කරන්න විනාඩි කිහිපයයි තිබෙන්නේ. අපි සද්ද නැතුව ඔබතුමන්ලා කියපු දේවල් සියල්ලම අහගෙන සිටියා.

අපි හිටපු ජනාධිපතිතුමාට ගෞරව කරන ගමන්ම විශේෂයෙන්ම මේ ගැනත් සඳහන් කරන්නට ඕනෑ. අපේ පක්ෂ ව්‍යවස්ථාව අනුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වර්තමාන නායකත්වයට පත් වෙලා සිටින්නේ ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමායි. මේ රටේ දැවැන්තම දේශපාලන ව්‍යාපාරය හැටියට ශ්‍රීමත් එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා ආරම්භ කළ සහ, වෙද, ගරු, ගොවි, කම්කරු කියන පංච මහා බලවේගයෙන් පෝෂණය වුණු මේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට අද නායකත්වය දෙන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට දැවැන්ත විධියට ආදරය කරන, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නඟා සිටුවීම සඳහා පසු ගිය කාලය තුළ දී අතිවිශාල කැප කිරීමක් කළ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වැඩ පිළිවෙළ ප්‍රායෝගිකව ඉදිරියට ගෙන යන්න පුළුවන් නායකයකු වන මෛත්‍රීපාල සිරිසේන මැතිතුමායි. ඒ නිසා තමුන්නාන්සේලා කලබල වෙන්න එපා. ඉදිරියේ දී එන මැතිවරණයකදී මේ රටට විශාල සේවාවක් කරපු, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරපු, මේ රටේ දුප්පත් ජනතාවගේ දුප්පත්කම නැති කිරීම සඳහා සමෘද්ධි ව්‍යාපාරය හඳුන්වා දුන් චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය එක පැත්තකිනුත්, මේ රටේ ත්‍රස්තවාදය නිමාවට පත් කරපු ඒ ශ්‍රේෂ්ඨ නායකයා වන අතිගරු මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා එක පැත්තකිනුත් සිටිමින්, ගමේ ජනතාවගේ දුක, වේදනාව, කඳුළු හඳුනන, රජ රට පුලතිසි පුරවරයෙන් ආපු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ නායකත්වයෙන් පැහැදිලිවම කෙටි කාලයක් තුළ මේ රටේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුවක් පිහිටුවනවාය කියන එකත් තමුන්නාන්සේලා මතක තබා ගන්න.

තමුන්නාන්සේලා මේ පාර්ලිමේන්තුවට අතුරු අය වැයක් ඉදිරිපත් කරලා තිබුණාට මේ අතුරු අය වැය සම්මත වන්නේ අපි අපේ සහයෝගය ලබා දුන්නොත් පමණයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමීයනි, අපි දන්නවා සාමාන්‍යයෙන් ජන වහරයේ තිබෙනවා "බල්ලා විසින් තමයි නකුට වනන්නේ" කියලා. ඒ කියන්නේ බල්ලාට ඕනෑ වෙලාවට තමයි නකුට වනන්නේ. හැබැයි, දැන් නකුට විසින් බල්ලා වනන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. හැබැයි, නකුට නැති බල්ලෝ ඕනෑ තරම් ඉන්න බවත් අමතක කරන්න එපා. නමුත් බල්ලෙකුගේ ඇඟක්, කඳක් නැතුව නකුටක් විතරක් පැවතෙන්නේ නැහැ කියන එකත් විශේෂයෙන්ම තමුන්නාන්සේලා මතක තියාගෙන කථා කරන්න කියලා අපි මේ වෙලාවේ දී කියන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමීයනි, විශේෂයෙන්ම අපි ගමෙන් ආපු මහජන නියෝජිතයන් හැටියට සද්භාවයෙන් යුතුව මේ අතුරු අය වැයට සහයෝගය ලබා දෙනවා. මේ අතුරු අය වැයෙන් ඉදිරිපත් කර තිබෙන වැඩ පිළිවෙළවල් පිළිබඳව, ඒ වෙනස්වීම් පිළිබඳව, ජනතාවට ලබාදෙන සහන පිළිබඳව අපේ ගෞරවයක් තිබෙනවා. විශේෂයෙන්ම ජනතාවගේ හද ගැස්ම තේරුම් ගත් නායකයකු හැටියට ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ උපදෙස් හා මඟ පෙන්වීම යටතේ ගරු අග්‍රාමාත්‍යතුමා, ඒ වාගේම මුදල් අමාත්‍යතුමා, එම අමාත්‍යාංශයේ නිලධාරීන් යුහුසුලුව ඉදිරිපත් කර තිබෙන අතුරු අය වැය තුළින් ජනතාවට ලැබෙන විශාල සහන පිළිබඳව අපි ස්තුතිවන්ත වෙනවා.

අපි මේ කටයුත්තට සහයෝගය දෙන ගමන්ම තව කාරණයක් ගැනත් කියන්නට ඕනෑ. ජනතාවට ඉන්ධන ලබා දීමේ දී ඒ සඳහා පනවා තිබූ සියලු බදු ඉවත් කරනවා කියලා පසු ගිය කාලය තුළදී කිව්වා. "දින සියයේ වැඩසටහන යටතේ මේ රටේ පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් සඳහා කිසිම බද්දක් අය කරන්නේ නැහැ, ඒ බදු සියල්ල ඉවත් කරනවා" කියලා කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමීයනි, ඒ නිසා ජනතාව වෙනුවෙන් ලබා දුන් ඒ පොරොන්දු ඒ ආකාරයෙන්ම ඉෂ්ට කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා. ඒ සඳහා

[ගරු ශාන්ත බණ්ඩාර මහතා]

අපි එක අතක් නොවෙයි, අත් දෙකම උස්සලා අවශ්‍ය සහයෝගය ලබා දෙනවා කියන එකත් විශේෂයෙන්ම මතක් කරන්න කැමැතියි.

මෙම අය වැයෙන් අත්‍යවශ්‍ය ආහාර වර්ග කීපයක මිල අඩු කර තිබෙනවා. අපේ ගරු කුමාර වෙල්ගම මන්ත්‍රීතුමා දැන් මේ ගරු සභාවේ ඉන්නවා. අපේ සහෝදර මන්ත්‍රීතුමන්ලාත් ගරු සභාවේ ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පසු ගිය දා අපේ මන්ත්‍රීවරුන්ගේ සහභාගිත්වයෙන් බේරුවලදී දවස් දෙකක වැඩ මුළුවක් පැවැත්වුණා. ඒ වැඩ මුළුවේදී අප හැම දෙනාම එකට නැඟිටලා මේ ජනතාවගේ ප්‍රශ්න ඉදිරිපත් කළා. මේ අත්‍යවශ්‍ය ආහාර වර්ගවල මිල අඩු කිරීම ඉතාම හොඳයි. විශේෂයෙන්ම හාල්, පරිප්පු, සීනි, හාල් මැස්සන් සහ කිරි පිටි යන ආහාර වර්ගත් අනිවාර්යයෙන්ම මේ මිල අඩු කරන ආහාර ද්‍රව්‍ය අතරට ඇතුළත් වුණොත් එය තවත් වැදගත් වෙනවාය කියන එකයි අප කියන්නේ. විශේෂයෙන්ම හාල් සහ පරිප්පු මිල අඩු කළ යුතු අත්‍යවශ්‍ය ආහාර ගොන්නට ඇතුළත් කරන්න කියලා අප මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මෙම අය වැයෙන් රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කිරීමට ගෙන තිබෙන ක්‍රියා මාර්ගය ඉතාම හොඳයි. පසු ගිය අපේ ආණ්ඩුවෙන් ඉදිරිපත් කළ අය වැයෙන් ජූලි මාසයේ දී වැටුප් විෂමතා ඉවත් කරන තුරු රාජ්‍ය සේවකයන්ට රුපියල් 3,000ක දීමනාවක් ලබා දුන්නා. එම දීමනාව ලබා දුන්නේ පසු ගිය අවුරුද්දේ නොවැම්බර් මාසයේ සිටයි. ඔබතුමන්ලා රාජ්‍ය සේවකයන්ට ලබා දෙනවා කියපු රුපියල් 10,000ක වැටුප් වැඩිවීම පසු ගිය නොවැම්බර් මාසයේ සිට ලබා දෙන ඒ රුපියල් 3,000ක දීමනාවට අමතරව මේ 2015 වර්ෂය තුළ ලබා දෙන්න කියන ගෞරවනීය ඉල්ලීම කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙන්නේ.

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
බොහොම ස්තූතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

විශේෂයෙන්ම මතක් කළ යුතු තවත් කාරණයක් තිබෙනවා. ඒ තමයි තරුණ තරුණියන්ගේ රැකියා ප්‍රශ්නය. පසු ගිය අපේ ආණ්ඩුව කාලයේ උපාධිධාරීන් 52,000කට රැකියා ලබා දෙන්න කටයුතු කළ බව අපි දන්නවා. පසු ගිය කාලය තුළ අප උපාධිධාරීන් 52,000කට රැකියා ලබා දුන්නා වාගේ, දැනට ඉතිරි වී සිටින උපාධිධාරීන්ටත් රැකියා අවස්ථා ලබා දෙන්න කියලාත් මා ඉල්ලා සිටිනවා. ඒ වාගේම අද වන විට කුරුණෑගල දිස්ත්‍රික්කය ඇතුළු දිස්ත්‍රික්ක ගණනාවක ගුරු හිඟය විශාල වශයෙන් තිබෙනවා. මා නියෝජනය කරන කුරුණෑගල දිස්ත්‍රික්කයේත් ප්‍රාථමික ගුරුවරුන්ගේ විශාල හිඟයක් තිබෙනවා. මේවාට පිළියම් ලබා දීම සඳහා පසු ගිය අය වැය තුළින් අප යෝජනා කළ ආකාරයට තරුණ තරුණියන්ට රැකියා ලක්ෂ තුනක් ලබා දීමේ වැඩ පිළිවෙළ කඩිනමින් ක්‍රියාත්මක කරන්න කියලා විශේෂයෙන් ඉල්ලන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අවසාන වශයෙන් මා මෙම කාරණය ගැනත් කියන්නට ඕනෑ. පසු ගිය කාලයේ අපේ රජයට ප්‍රධාන වශයෙන්ම මත් කුඩු, එතනෝල්, කැසිනෝ සම්බන්ධයෙන් චෝදනා එල්ල වුණා. ගමෙන් පැමිණි මන්ත්‍රීවරුන් හැටියට අපි නැවත නැවතත් කියන්නේ, මේවා අනිවාර්යයෙන්ම අපේ රටෙන් තුරන් කරන්නට ඕනෑ කියන එකයි. කිසිදු භේදයක් නැතිව, අපේ හෘදය සාක්ෂියට එකඟව ඒ කටයුත්තට අපේ සම්පූර්ණ සහයෝගය ලබා දෙනවා. හැබැයි, මේ අය වැයෙන් කැසිනෝ ව්‍යාපාරය තවදුරටත් ස්ථාවර කර තිබෙන බව අපට පෙනෙනවා. අප කියන්නේ මේවාට බදු වැඩි කරන්න කියලා නොවෙයි, කැසිනෝ සම්පූර්ණයෙන්ම මේ රටෙන් ඉවත් කරන්න කියලායි. ඒකයි අපේ ඉල්ලීම. මේවාට බදු වැඩි කරලා තවදුරටත් මේවා තහවුරු කරන්න එපා. එන එන ආණ්ඩු කරන්නේ තව තවත් මේ ව්‍යාපාරය තහවුරු කරන එකයි. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ තමයි මේ කැසිනෝ ව්‍යාපාරය පටන් ගත්තේ. එතුමන්ලා කැසිනෝ ව්‍යාපාරය පටන් ගන්න තමන්ගේ හිතවතුන්ට අවස්ථාව ලබා දීලා තිබුණා. බදු ප්‍රමාණ වැඩි කරලා, බලපත්‍ර ගාස්තු වැඩි කරලා පසු ගිය ආණ්ඩුවලින් ඒක තවදුරටත් තහවුරු කළා. ඒ නිසා තවත් මේ ආණ්ඩුවෙන් ඒ දේවල් කරන්න එපා. සෝභිත හාමුදුරුවෝ, රතන හාමුදුරුවෝ ඇතුළු සියලු දෙනා වේදිකාවට ඇවිල්ලා කිව්වේ කැසිනෝ ව්‍යාපාරය අපේ රටෙන් තුරන් කරන්න ඕනෑ කියන එකයි. ඒ නිසා මේ කැසිනෝ ව්‍යාපාරය අපේ රටෙන් තුරන් කරන්න කියලා මා කරුණාවෙන් ඉල්ලා සිටිනවා. අපි දැන් ඔසවලා ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
මා අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

අපේ ආණ්ඩුව හැම වෙලාවේම කළේ බඩගින්නේ කෑ ගහන කෙනාට මාළුවෙක් අල්ලා ගන්න කියලා බිලී පිත්තක් ලබා දුන් එකයි. දීර්ඝ කාලීන ආර්ථික දැක්මක් අප ඒකෙන් පෙන්නුම් කළා. දැන් මේ ආණ්ඩුවෙන් බිලී පිත්ත පැත්තකට දමලා, "කාපන්" කියලා මාළුවා අතට දීලා තිබෙනවා. හැබැයි, අප කියන්නේ මේ දෙකම නොවෙයි, බඩගින්නට දැන් කන්න මාළුවා දෙන ගමන්, හෙට අනිද්දා වන විට බිලී පිත්තකුත් ඔවුන් අතට දෙන්න කියලායි. එහෙම නැත්නම් මේ ගමන දීර්ඝ කාලීනව යන්න බැරි වෙයි. ඒ නිසා ආර්ථිකය කඩා වැටෙයි. තව අවුරුදු කිහිපයකින්, එහෙම නැත්නම් මේ අවුරුද්දේ අවසාන වනකොට තව මාස කිහිපයකින් එන ආණ්ඩුවකට මේ රටේ ආර්ථිකය හසුරුවන්නට බැරි වෙයි. ඒ පිළිබඳ අවදානමක් තිබෙනවා. ඒ ආර්ථික අවදානම ගැනත් කල්පනා කර බලා, ඉදිරියේදී තීන්දු තීරණ ගන්න කියලා මා ඔබතුමන්ලාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තූතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තූතියි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "අද දින මෙම විවාදය රාත්‍රී 7.00 දක්වා පවත්වා ගෙන යා යුතුය" යි මා යෝජනා කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඒ සඳහා සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. (MRS.) SRIYANI WIJEWICKRAMA *left the Chair and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *took the Chair.*

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Karuppaiah Velayudam. You have 10 minutes.

[பி.ப. 6.28]

ගරු කරුපයියා වේලායුදම් මහතා (වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கருப்பையா வேலாயுதம் - பெருந்தோட்டக் கைத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Karuppaiah Velayudam - State Minister of Plantation Industries)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, எனக்கு இந்தச் சந்தர்ப்பத்தைக் கொடுத்தமைக்காக உங்களுக்கு நன்றி கூறுகின்றேன். இந்தப் புதிய அரசு பொறுப்பேற்றதன் பின்னர் சமர்ப்பிக்கப்பட்டிருக்கின்ற இடைக்கால வரவு செலவுத்திட்டம் சம்பந்தமாக உரையாற்றச் சந்தர்ப்பம் கிடைத்ததையிட்டு மகிழ்ச்சியடைகின்றேன். இந்த இடைக்கால வரவு செலவுத் திட்டம் இந்த நாட்டின் சகல தரப்பு மக்களுக்கும் நன்மை பயக்கக்கூடிய ரீதியிலே அமைந்திருக்கின்றது. கடந்த ஜனவரி 08ஆந் திகதிக்குப் பிறகு இந்த நாட்டில் அனைத்து மக்களுடைய முகத்திலும் பாரிய மறுமலர்ச்சி காணப்படு கின்றது; புதியதொரு நம்பிக்கை தோன்றியிருக்கின்றது. நாட்டு மக்கள் மீண்டும் நல்லாட்சி உதயமாவதற்கான ஒரு சந்தர்ப்பமாக இதைக் கருதுகின்றார்கள். முழு உலகமும் இதை வரவேற்று நிற்கின்றது. இந்த வேளையில் மக்கள்மீது சுமையைச் சுமத்தாது அதனைக் குறைத்திருக்கின்ற இந்த வரவு செலவுத்திட்டத்தைச் சமர்ப்பித்த மாண்புமிகு நிதி அமைச்சர் ரவி கருணாநாயக்க அவர்களுக்கும் மாண்புமிகு பிரதம அமைச்சர் உட்பட சம்பந்தப்பட்டவர்கள் அனைவருக்கும் நான் நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

விசேடமாக, இந்த நாட்டிலே தோட்டத் தொழிலாளர்கள் எல்லா வகையிலும் பின்தள்ளப்பட்டவர்களாகவும் நாளுக்கு நாள் வறுமை அதிகரித்தவர்களாகவும் வாழ்ந்து வருகின்ற ஒரு சமூகம். இன்று அத்தியாவசியப் பொருட்களின் விலைகள் குறைக்கப்படவில்லை என்று சிலர் கூறிக்கொண்டிருக்கின்ற இந்த வேளையில், கோதுமை மாவும் அத்தியாவசியப் பொருட்களில் ஒன்று என்பதை மறந்துவிட முடியாது. இன்று பேசிய பலர் கோதுமை மா ஓர் அத்தியாவசிய உணவு அல்ல என்று கூறினார்கள். ஆனால், பெருந்தோட்டத்துறையினர் உட்பட, நடுத்தர வகுப்பினர் அதிகமாகப் பயன்படுத்துவது இந்த மாவைத்தான். இதனுடைய விலை குறைக்கப் பட்டதனால் இன்று ஒரு குடும்பத்துக்கு மூவாயிரம் ரூபாய்க்கு மேலாகச் செலவு குறைக்கப்பட்டிருக்கின்றது.

அதேவேளையில் இன்று அரசு ஊழியர்களுக்கு முதற்கட்டமாக ஐயாயிரம் ரூபாய் சம்பள உயர்வு வழங்கப் பட்டிருப்பதை நாங்கள் வரவேற்கின்றோம். அதேநேரம் தனியார் ஊழியர்களுக்குச் சம்பள உயர்வாக 2,500 ரூபாய் வழங்கப்பட வேண்டும் என்று சிபாரிசு செய்யப் பட்டிருக்கின்றது. ஆனால், இந்தச் சிபாரிசு சம்பந்தமாக நான் ஒன்றைக் குறிப்பிட்டாக வேண்டும். அதாவது, இன்று இந்தச் சிபாரிசைக் கட்டாயப்படுத்தக்கூடிய நிலைமை இல்லை. எனவே, நாங்கள் ஒன்றை உணர்ந்துகொள்ள வேண்டும். இன்று இந்த நாட்டிலே 44 சம்பள நிர்ணய சபைகள் இருக்கின்றன.

There are 44 Wages Boards which are set up on a tripartite basis. If the Wages Boards are to determine wages, it may take several months or years. This process is dilatory since it involves calling for objections, publishing in gazettes and newspapers, analyzing the objections and publishing the decisions thereafter. Therefore, the Wages Boards decisions are to be made prospective and not retrospective, as such delays are inevitable. It is, therefore, proposed to bring about a special legislation to give effect to this salary increase so that workers would benefit immediately.

எனவே, இந்தச் சம்பள உயர்வைத் தனியார்துறையினரும் பெற்றுக்கொள்ளும்வகையில் அதற்கென ஒரு புதிய சட்ட வாக்கத்தை உருவாக்கி, அதனூடாகச் சகல தனியார்துறை தொழிலாளர்களும் இந்த 2,500 ரூபாயைப் பெறக்கூடிய ஒரு நிலைமையை உருவாக்க வேண்டும். இல்லாவிட்டால், அரசாங்கம் எதிர்பார்க்கின்ற அந்தச் சம்பள உயர்வைத் தோட்டத் தொழிலாளர்கள் உட்பட ஏனைய தனியார் துறையினர் பெற்றுக்கொள்ள முடியாத நிலை ஏற்படும்.

அத்துடன், இந்த 100 நாள் வேலைத்திட்டம் சம்பந்தமாகவும் நான் குறிப்பிட்டாக வேண்டும். இன்று இந்த நாட்டிலே இடமற்றவர்களாக, வீட்டுரிமையற்றவர்களாக இருக்கின்றவர்கள் இந்தத் தோட்டத் தொழிலாளர்கள்தாம். இந்த அரசின் புதிய செயற்பாட்டுத் திட்டத்திலே "கிராமங்களை மையமாகக்கொண்ட வீடமைப்புத் திட்டங்கள் தோட்டங்களிலே அறிமுகப்படுத்தப்படும்" என்று கூறப் பட்டிருக்கின்றது. இன்று தோட்டங்களிலே வேலைசெய்கின்ற 174,390 குடும்பங்களும் வேலைசெய்யாத 89,834 குடும்பங்களும் இருக்கின்றன. எனவே, மொத்தமாக அங்கு கிட்டத்தட்ட 249,061 வீடுகள் வரை தேவைப்படுகின்றது.

[ගරු කරුපයියා වේලායුදම් මහතා]

இதற்கான காணிகளை வழங்க இன்று தோட்ட நிர்வாகங்கள் முன்வந்திருக்கின்றன. எங்களுடைய பெருந்தோட்டக் கைத் தொழில் அமைச்சர் மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல அவர்களுடைய வழிகாட்டலினூடாக அதற்கான பொறுப்பை என்னுடைய இராஜாங்க அமைச்சு மேற்கொள்ளும். இதன்மூலம் 100 நாள் வேலைத்திட்டத்தின்மூலம் இலங்கை யிலே புதியதொரு சரித்திரத்தைப் படைக்கவிருக்கின்றோம்.

பெருந்தோட்டத்துறைத் தொழிலாளர்கள் காணி உரிமை பெற்று சொந்த வீடுகளை ஏற்படுத்திக் கொள்வதற்கான செயற்றிட்டம் கௌரவ பிரதம அமைச்சரின் வழிகாட்ட லினூடாக மேற்கொள்ளப்படவிருக்கின்றது. அந்த வகையில் அவர்கள் சொத்துரிமை பெற்றவர்களாக மாற இருக்கிறார்கள். இது ஒரு சரித்திர மாற்றம்! அதாவது, அடிமைப்பட்டிருந்த மக்கள் முழுமையான விடுதலை பெற்று இந்த நாட்டில் பூரணமான சுதந்திரத்தை அனுபவிக்கின்ற சூழலை உருவாக்க வுள்ளோம். இதற்கு அனைத்து தரப்பினரும் ஒத்துழைப்புத் தருவதாகச் சொல்லியிருக்கிறார்கள்.

நான் இன்னும் சில விடயங்களைக் குறிப்பிட்டாக வேண்டும். இன்று பெருந்தோட்டத்துறையை நினைக்கின்ற போது கவலையளிக்கின்றது. பெருந்தோட்டத்துறைக் கம்பனிகளுடன் செய்துகொள்ளப்பட்ட ஒப்பந்தத்தின்படி அவர்களுக்கு ஒருசில வேலைகள் பொறுப்புக் கொடுக்கப் பட்டிருக்கின்றன. அதாவது, ஒவ்வொரு வருடமும் 3 சதவீதமான replant - மீள்பயிர்ச்செய்கை செய்யப்பட வேண்டுமென்று அந்த agreement இல் சொல்லப் பட்டிருக்கின்றது. சில கம்பனிகள் 0.7 சதவீதான மீள்பயிர்ச் செய்கையைச் செய்திருக்கின்றன. பெரும்பாலான கம்பனிகள் இதுவரை மீள்பயிர்ச்செய்கையை ஆரம்பிக்கவில்லை. இவ்வாறான கம்பனிகள் எங்களுடைய அமைச்சினூடாக ஊக்குவிக்கப்படும் அல்லது அது சம்பந்தமாக மேலதிக நடவடிக்கை எடுக்கப்படும். அவ்வாறு செய்கின்றபொழுது தோட்டங்கள் நவீனமயப்படுத்தப்படுவதோடு, அந்த தொழிற்றுறை மேலும் வளம் மிக்கதாகவும் உருவாக்கப்படும்.

இங்கு எனக்கு முன்னர் பேசிய சிலர் மீண்டும் இனவாத வெறியோடு பேசியதையிட்டு வேதனைப்படுகின்றேன். அவர்கள் கடந்த தேர்தலின்பொழுதும் அப்படித்தான் பேசினார்கள். வடக்கு, கிழக்கிலும் மலையகத்திலும் தமிழர்கள் வாழ்கின்ற பகுதிகளில்தான் ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்களுக்கு அதிகப்படியான வாக்குகள் கிடைத்தன என்றும் சிங்களப் பகுதிகளிலே ஐம்பத்தேழு இலட்சத்துக்கும் அதிகமான வாக்குகள் மஹிந்த ராஜபக்ஷ அவர்களுக்கே கிடைத்தனவென்றும் தமிழர்களுடைய வாக்குகளால்தான் தற்போதைய ஜனாதிபதி அவர்கள் வெற்றிபெற்றார் என்றும் அந்தவகையில் மஹிந்த ராஜபக்ஷ அவர்கள்கள்தான் உண்மையான வெற்றியை அடைந்தார் என்றும் கூறுகின்றார்கள். தேர்தலில் வாக்களிப்பதற்கு இந்த நாட்டிலுள்ள அனைத்து மக்களுக்கும் உரிமையுண்டு. தேர்தலில் யார், யார் எவ்வாறு வாக்களித்தார்கள் என்பது முக்கியமல்ல. நான்கு இலட்சத்துக்கும் அதிகமான மேலதிக வாக்குகளைப் பெற்று மைத்திரிபால சிறிசேன அவர்கள் பெரு வெற்றியடைந்திருக்கிறார். இந்த வெற்றிக்கு எங்களுடைய பிரதமர் ரணில் விக்கிரமசிங்க அவர்களுடைய தலைமையிலான ஐக்கிய தேசியக் கட்சி பாரிய பங்களிப்புச் செய்திருக்கிறது. இந்த நாட்டிலே நல்லாட்சியை ஏற்படுத்த வேண்டுமென்பதற்காகச் செய்த பங்களிப்பைக்கூட இனவாதக் கண்ணோடு பார்க்கின்ற இனவாதக் கும்பல் இன்னமும் இருக்கின்றது. எனவே, இந்த நாட்டில் இனவாதம் ஒழிக்கப்பட வேண்டும்; நல்லாட்சி மீளெழுப்பப்பட வேண்டும். எதிர்காலத்திலே எந்தத் தடைகள் வந்தாலும்கூட அதைச் செய்வதற்கு எங்களுடைய அரசு உறுதி பூண்டிருக்கின்றது. ஜனாதிபதிக்கு இருக்கின்ற அதிகாரங்களைப் பாராளு மன்றத்துக்கு கொண்டுவருதல் மற்றும் தேர்தல் கமிஷன், பொலிஸ் கமிஷன், பொதுச்சேவை ஆணைக்குழு போன்றன சுதந்திரமாக இயங்கும் வகையில் ஸ்தாபித்தல், தகவல் அறிகின்ற உரிமை போன்ற நல்ல செயற்றிட்டங்கள் இந்த 100 நாட்களில் மேற்கொள்ளப்பட இருக்கின்றன. இதைக் கண்டு பொறாமைப்படுகின்றவர்கள், அச்சமடைகின்றவர்கள் பொலிஸ் பலத்தையும் -

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Velayudam, your time is over.

කරුපයියා වේලායුදම් මහතා
(மாண்புமிகு கருப்பையா வேலாயுதம்)
(The Hon. Karuppaiah Velayudam)
Please give me one more minute, Sir.

இந்த விதமாக பல நல்ல செயற்றிட்டங்களை நாங்கள் முன்னெடுக்க இருக்கிறோம். 100 நாட்களுக்குப் பிறகு, ஏன் நாளைக்கு வேண்டுமானாலும், பாராளுமன்றத்தைக் கலைத்து விட்டு மக்கள் முன்சென்று மீள் ஆணையைப் பெறுவதற்கு ஐக்கிய தேசியக் கட்சி சக்தி பெற்றிருக்கின்றது என்பதை மறுக்க முடியாது. இன்று உலகம் எங்களை ஏற்றுக் கொண்டிருக்கின்றது. இதுவரை காலமும் விமர்சித்துவந்த தமிழ்நாடுகூட இன்றைய புதிய அரசின் செயற்றிட்டங்களை வரவேற்றிருக்கின்றது. கிராமப்புறங்களிலும் தோட்டப் புறங்களிலும் பின்தங்கிய பகுதிகளிலும் புதிய தொழில் முயற்சிகளை ஆரம்பிப்பதற்கு வெளிநாட்டவர்கள் பலர் விருப்பம் தெரிவித்திருக்கிறார்கள். அந்த வகையில், தொழில் வாய்ப்புக்கள் அதிகரிக்கப்பட இருக்கின்றன. இந்த நாட்டிலே சிங்களவர், தமிழர், இஸ்லாமியர் என்ற பேதமற்ற முறையிலே எல்லோருக்கும் சமத்துவமாக ஆட்சியைக் கொண்டு செல்வதற்கு ஏற்றவகையில் நாட்டு வளங்களை விரிவு செய்வதற்கும் எங்களுடைய அரசாங்கம் நடவடிக்கை எடுத்து வருகின்றது. எதிர்காலத்திலே நாங்கள் அனைவரும் உண்மை யான இலங்கையர்கள் என்று பெருமையோடு கூறுகின்ற அளவுக்கு இந்த அரசாங்கம் செயற்பட்டு வருகின்றது. வடக்கு, கிழக்கு, தெற்கு, மலையகம் என்ற பேதமற்ற முறையிலே திறமையின் அடிப்படையில், தேவையின் அடிப்படையில் அனைத்து மக்களுக்கும் சமனாகச் சேவை செய்யக்கூடிய நிலை உருவாகியிருக்கின்றது.

இறுதியாக, நான் இங்கு பல விடயங்களைக் கூறவிருந்தேன். ஆயினும், எனக்குக் கிடைக்கப்பெற்ற குறுகிய நேரத்தில் அவை எல்லாவற்றையும் குறிப்பிட முடியாத நிலையில், இந்த இடைக்கால வரவு செலவுத்திட்டத்தைக் கொண்டுவந்து அதன்மூலமாக எல்லாவிதத்திலும் மக்களுக்குப் பாரிய நன்மைகளை வழங்கியிருக்கின்ற நிதி அமைச்சர் அவர்களுக்கு நன்றி தெரிவித்து, எனக்கு அளிக்கப்பட்ட சந்தர்ப்பத்துக்காக மீண்டும் நன்றி கூறி, விடைபெறுகின்றேன்.

[අ.භා. 6.38]

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා බොහොම සන්තෝෂ වනවා, වචන කිහිපයක් කථා කරන්න ලැබීම ගැන. මා හිතන හැටියට ඔබතුමන්ලා අද අපේ විපක්ෂය පිළිබඳව බොහෝ විවේචන ඉදිරිපත් කළා. මා මේ කාරණය තමුන්නාන්සේලාට කියන්න ඕනෑ. ජනාධිපතිවරණයෙන් අපි පරාජය වුණා. මා ඇතුළුව අපේ පක්ෂයේ බොහෝ දෙනෙක් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට උදවු කළේ නැහැ. ඒක ඇත්තයි. අපි වචනයකින්වත් එතුමාට උදව්වක් කළේ නැහැ. අපි අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ආදරය කරන කණ්ඩායමක්. මා හිතන හැටියට ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා ඒ බව සහතික කරයි. මොකද, මැතිනියගේ ප්‍රජා අයිතිය අහෝසි වුණු දවසේ සිට ඔබතුමාත්, අපිත් එකටයි සිටියේ. ඔබතුමා අපේ පක්ෂයේ මටත් වඩා ඉතා ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙක්. මා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායක ධුරයට පත් වෙලා අවුරුදු 33ක් වනවා. මට ඉස්සෙල්ලා තමයි ඔබතුමා සිටියේ. ඒ ගැන මා විශේෂයෙන්ම කියන්න ඕනෑ. ජනමාධ්‍ය ඇමතිතුමාගේ බාප්පා වන රූපා කරුණාතිලක මැතිතුමා තමයි ඒ කාලයේ එක්සත් ජාතික පක්ෂයේ සිටියේ. අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ගොඩක් ආදරය කරනවා. අපේ පක්ෂයේ සභාපතිවරයා හැටියට සිටියේ මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමායි. ඉතින් අපේ යුතුකමක් තිබෙනවා, අපේ සභාපතිතුමා වෙනුවෙන් වැඩ කරන්න.

ඔබතුමන්ලාත් රනිල් වික්‍රමසිංහ මහත්මයාව එළවන්න කොපමණ උත්සාහ කළත් ඒක කරන්න බැරි වුණා. නමුත් තමුන්නාන්සේලා රනිල් වික්‍රමසිංහ මහත්මයාත් සමඟ සිටියා. අවසාන මොහොත දක්වාම තමුන්නාන්සේලාත් එතුමා සමඟ සිටියා. ඒ වාගේ අපිත් අපේ සභාපතිතුමා සමඟ සිටියා. නමුත් අපේ පක්ෂයේ හිටපු මහ ලේකම් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා අපේ පක්ෂයේ සභාපති ධුරයට පත් වුණා. එතුමා ජනාධිපතිවරයා හැටියට සිටියත්, එතුමා සභාපති ධුරයට පත් වුණාට පස්සේ අපි එතුමාට සලකන්නේ අපේ පක්ෂයේ සභාපතිවරයා හැටියටයි.

අපි අයුතු ප්‍රයෝජන ගන්න බලාපොරොත්තු වන්නේ නැහැ. ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන් හැටියට අපි අයුතු ප්‍රයෝජන, ඇමතිකම් බලාපොරොත්තුවෙන් ඉන්නවාය කියා හිතන්න එපා. අපේ එහෙම බලාපොරොත්තුවක් නැහැ. අපි හෙටත් සටන් කරන්නේ අපේ පක්ෂය ඉදිරියට ගෙන යන්නයි. අපේ පක්ෂයේ අයට වැරැදි තීන්දුවක් ගන්න අපි ඉඩ දෙන්නේ නැහැ. හැබැයි, අපට බලෙන් දෙයක් කරන්න කියන්නත් බැහැ. අපට බලපෑමක් කරන්නත් බැහැ. විශේෂයෙන්ම අපේ පක්ෂයේ ජයග්‍රහණය පිණිස, අපේ පක්ෂය ඉදිරියට ගෙන යන්න නිවැරැදියි කියා අපි හිතන දේ තමයි කරන්නේ. එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහත්මයාගේ චින්තනය, ඒ වාගේම අපේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ චින්තනය ඉදිරියට ගෙන යන බවට අපි බණ්ඩාරනායක මැතිනියට පොරොන්දු වෙලා තිබෙනවා.

තමුන්නාන්සේලාගේ දින සියයේ වැඩසටහනට අපි සහයෝගය දෙනවා. සහයෝගය දෙන්නේ, එක්සත් ජාතික පක්ෂයට තිබෙන ළැදිකමට නොවෙයි; තමුන්නාන්සේලාට තිබෙන ආදරයකටත් නොවෙයි; තමුන්නාන්සේලාගෙන් කිසියම් දෙයක් බලාපොරොත්තුවෙනුත් නොවෙයි. අපේ සභාපතිතුමා අපෙන් කරපු ඉල්ලීමක් නිසා අපි ඒ දින සියයේ වැඩසටහනට තමුන්නාන්සේලාට සහයෝගය දෙනවා. නමුත් කිසිවක් වැරැදියි කියා අපට යම්තම් හෝ හැඟුණොත් එයට විරුද්ධව අපි ඡන්දය දෙනවා. කවුරු කිව්වත් අපි විරුද්ධව ඡන්දය දෙනවා. අපි තීරණයක් ගත්තා නේ, එක්තරා ඇමතිවරයකුට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්න. අපි ඒ යෝජනාව ගෙනෙනවා. අපි එයට අත්සන් කළා. එයට බලපෑම් කරන්න කාටවත් බැහැ. අපේ ප්‍රතිපත්තිය මෙයයි. අපි හොඳ ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෝ. එහෙම නැතුව අපි කකුල් දෙක දෙපැත්තේ තබා ගෙන ඉන්න අය නොවෙයි. අපි හොඳ ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෝ. අපි මැරෙන්නෙත් ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන් හැටියටයි. එම නිසා අපි කවදාවත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට විරුද්ධව යන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අතුරු අය වැය සම්බන්ධව කාරණා දෙකක් පමණයි මා මතක් කරන්නේ. අපේ මුදල් ඇමතිතුමා ඒ කාලයේ එහා පැත්තේ පිටුපස පේළියේ මා ළඟයි ඉඳ ගෙන සිටියේ.

එතුමා මේ අතුරු අය වැයෙන් මේ රටට පරණ බස්, ඒ කියන්නේ අවුරුදු 10ක් පරණ බස් ගෙන්වන්න පුළුවන් කියා යෝජනාවක් ගෙනැවිත් තිබෙනවා. සීට 25ත් - 50ත් අතර අවුරුදු 10ක් පරණ බස් ගෙන්වන්න පුළුවන් කියා මුදල් ඇමතිතුමා එතුමාගේ අය වැය කථාවේදී කිව්වා. මම නම් ඒකට විරුද්ධයි. මොකද, අපි දැන් ඉදිරියට යන්නේ අලුත් තාක්ෂණයත් සමඟයි. අවුරුදු 10ක් පරණ බස් ගෙනෙනවා කියන්නේ, ඒ ගෙනාපු පුද්ගලයා කවුරු වුණත් හැමදාම ඔහුට garage එකේ තමයි ඉන්න වෙන්නේ. මොකද, බස් එකක ආයු කාලය අවුරුදු 10යි. අවුරුද්දකට කිලෝමීටර 100,000ක් දිව්වත්, -ජපානයේ දිව්වා කියා අපි කියමු- අවුරුදු 10 තුළ කිලෝමීටර ලක්ෂ 10ක් දුවලා. ඉතින්, මේ වාගේ පරණ බස් ලංකාවට ගෙන්වනවාට මම කැමැති නැහැ. ඉස්සර 1980 වකවානුවේදී අපි ගෙනාවා. තමුන්නාන්සේලාට මතක ඇති අපි එංගලන්තයෙන් Morris Oxford diesel car එක ගෙනා බව. අපි පරණ වාහන ගෙනාවා. නමුත් අපි ඒ පරණ වාහන ගෙනෙන යුගය නැති කළා. අපි ඒ යුගය නැති කර ඉන් පසුව අලුත් වාහනවලට ගියා. අපිට දැන් අවුරුදු 2ක් පරණ කාර් එකක් ගෙන්වන්න බැහැ නේ. අවුරුදු 10ක් පරණ බස් එකක් ගෙන්වනවා කියන්නේ, අමතර කොටස්වලට විශාල වියදමක් දරන්නට සිදු වෙනවා කියන එකයි. අනෙක් එක, garageවල රස්තියාදු වෙන්නට සිදු වෙනවා. ඒ විතරක් නොවෙයි.

අපි දැන් හොඳ පාරවල් හදලා තිබෙනවා. අපේ රජයේදී, පසු ගිය රජයේදී අපි highways හැදුවා. තමුන්නාන්සේලා කියනවා, කොමිස් ගැහුවා කියා. කොමිස් ගැහුවා නම් තමුන්නාන්සේලාට පුළුවන් අල්ලන්න. එහෙම නම් තමුන්නාන්සේලා ඉස්සෙල්ලාම පටන් ගන්න ඕනෑ Port City එකෙන්. තමුන්නාන්සේලාගේ නායකතුමා කිව්වා, "අපි බලයට ආවාට පසුව මේ Port City එක ඉදි කිරීම සම්පූර්ණයෙන්ම නවත්වනවා. අපි මේකෙන් බිම් අහලක් චීන ජාතිකයන්ට දෙන්නේ නැහැ" කියා. ඊයේ කැබිනට් ප්‍රකාශයේදී කියනවා, මේකට සම්පූර්ණයෙන්ම කැබිනට් එකෙන් අනුමැතිය ලැබුණා කියා. තමුන්නාන්සේලාගේ බංකොලොත් භාවය ඒකෙන්ම පෙනෙනවා, නැවත තවත් කථා කරන්නට දෙයක් නැහැ. ඒ වාගේම අපි හොඳ පාරවල් හදලා තිබෙනවා. මේ පාරවල්වල අලුත් වාහන යන්න ඕනෑ. එහෙම නැතිව highway එකක පරණ වාහනයක් ගිහින් නැවතුණොත් මුළු පාරම ඉවරයි. එම නිසා මම ගරු මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේක සංශෝධනය කරන්න කියා. අපට පරණ වාහන ගෙනෙන්න ඕනෑ නැහැ.

තමුන්නාන්සේලාට මතක ඇති, ඉස්සර ගඩොල් භාග වාගේ mobile phone තිබුණේ, ලොකු ඒවා. ඉස්සර mobile phone එක ගඩොල් භාගයක් වාගේ තිබෙන කාලයේ, signal නැති වුණාම අපි ඒක අරගෙන කඳුවලට දුවන්න ඕනෑ. අපි කඳුවලට දුවලා ගිහින් තමයි, "හලෝ, හලෝ" කියා කථා කරන්නේ. දැන් එහෙම නොවෙයි නේ. දැන් ලංකාවේ ඕනෑම තැනකට ගිහින් කථා කරන්න පුළුවන්. ඒ වාගේම, සාක්කුවේ දමාගෙන යන්න පුළුවන් තරමේ පොඩි mobile phone එකක් තිබෙන්නේ. ඒක තමයි අලුත් තාක්ෂණය කියන්නේ. දැන් අපට නැවතත් ගඩොල් භාග තරම්

[ගරු කුමාර වෙල්ගම මහතා]

mobile phoneවලට යන්න ඕනෑ නැහැ නේ. ඒක දැන් කෞතුක වස්තුවක්. ඒ නිසා මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා, අවුරුදු 10ක් පරණ බස් ගෙනෙන එක සම්පූර්ණයෙන් නවත්වන්න කියා. කාර්මික දැනුමක් තිබෙන, ලොරි ගැන, බස් ගැන දැනුමක් තිබෙන පරම්පරාවකින් එන පුද්ගලයෙක් හැටියටයි මම මේ ඉල්ලීම කරන්නේ.

තමුන්නාන්සේලාගේ අය වැයේ හොඳ දේවල් තිබෙනවා. මම නැහැ කියා කියන්නේ නැහැ. ඉන්ධන මිල අඩු කළා. ඕක අපටත් කරන්න තිබුණා නේ. කෙසේ හෝ අපේ අහේතුවකට අපි කළේ නැහැ. අපි ඒකත් කියන්නට ඕනෑ. අපේ අහේතුවකට අපි ඉන්ධන මිල අඩු කළේ නැහැ. ඒ වාගේම තමුන්නාන්සේලා ගෑස් මිල අඩු කළා. ඒ වාගේ, තමුන්නාන්සේලාගේ අය වැයේ මහ ජනතාවට හොඳ දේවලුත් තිබෙනවා; අනවශ්‍ය දේවලුත් තිබෙනවා. - ඔය කොත්තමල්ලිවල බදු අඩු කිරීම වාගේ ඒවා.- දැන් කාලයේ මිනිස්සු කොත්තමල්ලි බොන්නේ නැහැ, "පැනඩෝල්" දෙකක් බොනවා මිසක. කොත්තමල්ලි හැම දාම පරිභෝජනයට ගන්නේ නැහැනේ. කහ වාගේ දේවල් වැඩක් නැහැ. ඒ ගැන මම කථා කරන්න යන්නේ නැහැ.

ඊළඟ කාරණය තමයි, hybrid car එක. බස් ගැන කථා කළා වාගේම මේ ගැනත් හුඟක් දෙනෙක් කථා කළා. ඒ නිසා වැඩිය කථා කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. මේ hybrid carවල හොඳට ඉන්ධන වැඩ කරනවා. මේක ඉන්ධනවලින් විතරක් නොවෙයි, electric බලයත් සමඟයි යන්නේ. මේකෙන් රටට විශාල ලාභයක් එනවා. නමුත් දැන් තමුන්නාන්සේලා මේ ලාභය නැති කරන්නයි හදන්නේ.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, you have only one more minute.

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තව විනාඩියක් ලබා දෙන්න. Petrol හෝ dieselවලින් වැඩ කරන hybrid car එකක මිල සියයට 60කින් විතර වැඩි කර තිබෙනවා.

මෙන්න මේ hybrid වාහනවලත් මිල අඩු කරන්න. මොකද මේ hybrid වාහන මිලදී ගන්නේ ලොකු මහත්වරු නොවෙයි. දැන් අපේ ලොකු අය hybrid වාහන ගන්නේ නැහැ. ඒ ගොල්ලෝ යන්නේ V8 වාහනවල. තමුන්නාන්සේලා, අපි යන්නෙත් ආණ්ඩුවෙන් දීපු V8 වාහනවල. මගේ එක නම් මම බාර දුන්නා. තමුන්නාන්සේලා, අපි දැන් six-cylinder වාහනවල යන්නේ නැහැ නේ. අපි යන්නෙත් දැන් V8 වාහනවල. මොකද අපි ඇමතිකම් දරනකොට වාහනයට පෙට්‍රල්, ඩීසල් ගහන්නේ ආණ්ඩුවෙන් නේ. [බාධා කිරීමක්] මම කවදාත් යන්නේ V8 එකේ. [බාධා කිරීමක්] මම කොහොමත් යන්නේ V8 එකේ. මම යන්නෙත් V8 එකේ; ගන්නෙත් V8 වාගේ ඒවා.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (ආහාර සුරක්ෂිතතාව අමාත්‍යතුමා)
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - உணவுப் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. Gamini Jayawickrama Perera - Minister of Food Security)
ඔව්. ඔබතුමා ගන්න try කරනවා.

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඒ නිසා මම ඉල්ලනවා, මේ hybrid වාහන මිල අඩු කරන්න කියලා. මේවා සාමාන්‍ය මිනිස්සු නේ පාවිච්චි කරන්නේ. මම දැකලා තිබෙනවා, ලස්සන නෝනලා මේ වාහන එළවාගෙන යනවා. එහෙම නේද අපේ ගාමිණී ජයවික්‍රම ඇමතිතුමා?

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ඔව්. ඔව්.

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ආ ! ඒක නේ කියන්නේ. ඔබතුමාත් ඒකට එකඟ වෙනවා. කාන්තාවන් එළවාගෙන යන මේ වාහනය -[බාධා කිරීමක්] මට හොඳ එකක් තිබෙනවා. තමුන්නාන්සේට ඕනෑ නම් ගෙනැල්ලා පෙන්වන්නම්. අවශ්‍ය නම් ගෙනැල්ලා පෙන්වන්නම්. මම ගැන කියන්න ඕනෑ නැහැ. තමුන්නාන්සේ දන්නවා නේ.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ඔව්. ඔව්.

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඒ නිසා තමුන්නාන්සේට කියන්න ඕනෑ නැහැ. මම ඉල්ලන්නේ මේ hybrid වාහනවල මිල අඩු කරන්න කියලායි. සියයට 60කින් වැඩි කරපු එක අඩු කරන්න. පාර්ලිමේන්තුවේ වැඩ කරන අයත් කැමැතියි නේ වාහනයක යන්න. Hybrid කියන්නේ වැඩි ධාරිතාවක් තිබෙන වාහනයක්.දැන් තමුන්නාන්සේ සිලින්ඩර් ධාරිතාව 1000ට - 1000ccවලට- වඩා අඩු ඒවා සියයට 25කින් අඩු කළා. ඒකත් හොඳයි. මරුටි කාර් එක hybrid එකක් නොවෙයි. නමුත් මරුටි කාර් එකෙන් සියයට 25ක් මිල අඩු කළා. ඒක හොඳයි. හැබැයි, දැන් අපේ රටට ගෙන්වන්න ඕනෑ hybrid වාහනයි. මොකද එතකොට ඉන්ධන පාවිච්චිය අඩු වෙනවා. නමුත් hybrid වාහනවල මිල සියයට 60කින් වැඩි කළා. ඒ නිසා මම ඉල්ලා සිටිනවා, පරණ බස් ගේන එකෙත් සීමාව අඩු කරලා hybrid වාහන වැඩි වැඩියෙන් ලංකාවට ගේන්න කියලා. මේවාට තිබෙන ඒ duty එක මීට වැඩිය අඩු කරන්න. මොකද සල්ලි ඕනෑ නම් මීට වැඩිය හොයන්න පුළුවන් නේ. දැන් මන්දිර බද්ද කියලා බද්දක් ගහලා තිබෙනවා. තව එක එක බදු ගහලා තිබෙනවා නේ. ඒවායින් ගන්න පුළුවන්. මේ ඉල්ලීම තමුන්නාන්සේලාට කරමින්, ඒ වාගේම මේ අවස්ථාව මට ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "විවාදය දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ඊට අනුකූලව විවාදය කල් තබන ලදී.
එතැන් සිට විවාදය 2015 පෙබරවාරි මස 07වන සෙනසුරාදා පවත්වනු ලැබේ.

அதன்படி விவாதம் ஒத்திவைக்கப்பட்டது.
விவாதம், 2015 பெப்ருவரி 07, சனிக்கிழமை மீளத் தொடங்கும்.

The Debate stood adjourned accordingly.
Debate to be resumed on Saturday, 07th February, 2015.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ඇතුළු අමාත්‍යාංශ ගණනාවකින් ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති
பொருளாதார அபிவிருத்தி அமைச்சு உட்பட பல்வேறு அமைச்சுகளும் அமுல்படுத்திய அபிவிருத்திக் கருத்திட்டங்கள்
DEVELOPMENT PROJECTS IMPLEMENTED BY MINISTRY OF ECONOMIC DEVELOPMENT AND SEVERAL OTHER MINISTRIES

[අ.භා. 6.50]

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"2014 වර්ෂයේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මගපෙන්වීම යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ඇතුළු අමාත්‍යාංශ ගණනාවකින් මහා පරිමාණ, මධ්‍ය පරිමාණ හා කුඩා පරිමාණයේ සංවර්ධන ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කරන ලදී. එසේම ස්වයං රැකියා ප්‍රවර්ධනය සඳහාද ප්‍රතිපාදන විශාල ප්‍රමාණයක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙන් කර තිබුණි. ඇතැම් සංවර්ධන ව්‍යාපෘති අවසන් වී ඇති අතර, ඇතැම් සංවර්ධන ව්‍යාපෘති අයහපත් කාලගුණ තත්ත්වය නිසා අඩක් නිම වී ඇත. එබැවින් අවසන් කළ සංවර්ධන ව්‍යාපෘති සඳහා මුදල් ප්‍රතිපාදන කඩිනමින් ලබා දීමටත්, අඩක් නිමකර ඇති ව්‍යාපෘති අවසන් කිරීමට අවශ්‍ය උපදෙස් හා මුදල් ප්‍රතිපාදන ලබා දීමටත්, මිලදී ගෙන ඇති ස්වයං රැකියා උපකරණ ඉල්ලුම්කරුවන් වෙත කඩිනමින් ලබා දීමටත් කටයුතු කළ යුතු බවට යෝජනා කරමි."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම අපි දන්නවා පසු ගිය ආණ්ඩුව කාලය තුළ දී සංවර්ධනයට මූලිකත්වය ලබා දී තිබුණු බව. මේ රටේ යටිතල පහසුකම් නැංවීම සඳහා මාර්ග සංවර්ධනය, කෘෂිකාර්මික යටිතල පහසුකම්, වාරිමාර්ග යටිතල පහසුකම්, අධ්‍යාපනයට අවශ්‍ය යටිතල පහසුකම්, ක්‍රීඩාවට අවශ්‍ය යටිතල පහසුකම් ලබා දීම ඇතුළු විදුලිය ලබා දීම වාගේ දේවල්වලට විශාල මුදල් ප්‍රතිපාදන මේ පාර්ලිමේන්තුවෙන් අනුමත කරලා -සම්මත කරලා- ග්‍රාමීය ජනතාව වෙත, රටේ ජනතාව වෙත ඒ පහසුකම් ලබා දෙන්න කටයුතු කළා. 2014 අවුරුද්දේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ප්‍රාදේශීය සංවර්ධන කමිටු සඳහා මේ රටේ නිදහසෙන් පස්සේ වැඩිම මුදල් ප්‍රතිපාදන ප්‍රමාණයක් ලබා දුන්නා. ඒවා ලබා දුන්නේ ඉතාම නීත්‍යානුකූල විධියටයි.

ගමේ ජනතාවගේ යෝජනා, ග්‍රාමීය වශයෙන් තිබෙන සිවිල් සංවිධානවල, ස්වේච්ඡා සංවිධානවල යෝජනා සහ අදහස්, ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමාගෙන්, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගෙන්, පළාත් සභා මන්ත්‍රීවරයාගෙන් ආපු යෝජනා එකතු කරලා ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ අනුමැතිය ලබා ගෙන, දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ අනුමැතිය ලබා ගෙන ඒවාට අදාළ සංවර්ධන ව්‍යාපෘති නීත්‍යානුකූලව හඳුනා ගත්තා. ඒ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධව කටයුතු කරද්දී, රුපියල් ලක්ෂ 20ට අඩු හැම සංවර්ධන ව්‍යාපෘතියක්ම ඒ ඒ ග්‍රාමීය සංවිධාන විසින් ගිවිසුම් අත්සන් කරලා තමයි ආරම්භ කළේ කියන එක අපි දන්නවා. ඒ වාගේම රුපියල් ලක්ෂ 20ට වැඩි හැම සංවර්ධන ව්‍යාපෘතියක්ම රජයේ ටෙන්ඩර් පටිපාටිය යටතේ ටෙන්ඩර් කරලා, ඒවා ටෙන්ඩර්කරුවන් වෙත ලබා දීලා -අයදුම්කරුවන් වෙත ලබා දීලා- ඉතාම නීත්‍යානුකූලව කරපු ව්‍යාපෘති.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හැබැයි අපි දන්නවා පසු ගිය අවුරුද්ද ගත්තාම එක දිගට මාස 4ක් වර්ෂාපතනය පැවැති බව. ඒ වාගේම ප්‍රදේශ ගණනාවකටම ගං වතුර ආවා. තවත් ප්‍රදේශ ගණනාවකම අප කනගාටුවට පත් වුණු දැවැන්ත නාය යෑම් ඇතුළු විපර්යාස රැසක් සිදු වුණා. සමහර ව්‍යාපෘති ආරම්භ කළ නමුත් ස්වාභාවික විපත් රාශියක් පසු ගිය කාලය තුළදී සිදු වූ නිසා ඒවා අවසන් කරන්න බැරි වුණා. ඒ නිසා අපි දැන් මේ යෝජනාව හරහා විශේෂ ඉල්ලීමක් කර සිටිනවා. අවසන් කරලා තිබෙන සංවර්ධන ව්‍යාපෘතිවලින් ඇතැම් ඒවාට දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා මුදල් ප්‍රතිපාදන ගෙවා තිබෙනවා. හැබැයි, 2014.12.31වන දා වන කොට නියමිත ආකාරයට, ක්‍රමානුකූලව සංවර්ධන ව්‍යාපෘති අවසන් කරලා, කාර්මික නිලධාරින්ගේ උපදෙස්, මහ පෙන්වීම යටතේ බිල් පත් ඉදිරිපත් කරපු ඇතැම් සංවර්ධන ව්‍යාපෘතිවලට තවමත් මුදල් ප්‍රතිපාදන ලබා දීලා නැහැ. මේ හේතුව නිසා මොකක්ද වෙලා තිබෙන්නේ? ග්‍රාමීය සංවිධාන -ගමේ ගොවි සංවිධානය, ග්‍රාම සංවර්ධන සමිතිය, සමෘද්ධි සමිතිය- තමයි වගකීම් අරගෙන, ඒ සමිතිවලට ප්‍රමාණවත් මුදලක් නැත්නම් කාගේ හෝ සහයෝගයත් අරගෙන ඒවා කරලා තිබෙන්නේ.

අපි පෞද්ගලිකව දන්නවා සමහර අය කන කර බඩු උකස් කරලා පවා ඒ ව්‍යාපෘතිවලට වියදම් කර තිබෙන බව. ඒ, මුදල් ප්‍රතිපූරණය වුණාට පස්සේ ඒවා පියවාගන්නම් කියන පදනම යටතේ. අඩක් නිම කරපු සංවර්ධන ව්‍යාපෘති ඉතා ඉක්මනින් අවසන් කළේ නැත්නම් රජය ඒවාට මුදල් වැය කරපු අරමුණ අපත් වෙන්න පටන්ගන්නවා. මොකද, අපි දන්නවා සමහර ව්‍යාපෘති යටතේ මාර්ගය හදන්න දෙපැත්තෙන් කොන්ක්‍රීට් කානු දෙක බැඳලා තිබුණත් මැද සකස් කරලා නැති බව. ඒ නිසා දැන් ඒවා කැඩී කැඩී යනවා. අවසානයේදී රජයේ මුදල්ම තමයි ඒවාට වැය වන්නේ. අඩක් නිම කර තිබෙන ඒ සංවර්ධන ව්‍යාපෘතිවලට තවමත් අනුමැතිය ලබා දීලා නැහැ, ඒවා අවසන් කරනවාද, ඒවාට මොනවාද කරන්නේ කියන එක පිළිබඳව. ඒ නිසා අඩක් නිම කර තිබෙන සංවර්ධන ව්‍යාපෘති ඉතා කඩිනමින් නිම කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දෙන්න කියලා මේ අවස්ථාවේදී අපි ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන් ස්වයං රැකියා සඳහා, ස්වයං රැකියා ප්‍රවර්ධනය සඳහා කාන්තාවන්ගේ විශාල උනන්දුවක්, කැප කිරීමක් තිබුණා. මොකද, අපි දැක්කා මේ ආර්ථිකයේ ගැටලුත් එක්ක, ජීවන තත්ත්වයේ ප්‍රශ්නත් එක්ක හැම පවුලකටම අමතර ආදායම් අවශ්‍ය වූ බව. ඒ නිසා ඒ අමතර ආදායම සොයා ගන්න අවශ්‍ය උපකරණ සඳහා -සමහර විට මහන මැසීමක් වෙන්න පුළුවන්, වතුර මෝටරයක් වෙන්න පුළුවන්. එහෙමත් නැත්නම් පිරිමි අය ඉල්ලා සිටි විවිධ උපකරණ වෙන්න පුළුවන්.- අවශ්‍ය මුදල් ප්‍රතිපාදන වෙන් කරලා, නීත්‍යානුකූලව ටෙන්ඩර් කරලා ඒ මුදල් ප්‍රතිපාදනවලට අදාළ උපකරණ මේ වන කොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට ගෙනැවිත් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේත්, නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේත් ජනතාවගේ ඉල්ලීම් අනුව ගෙනැවිත් තිබෙන උපකරණ මේ වන කොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ගොඩ ගහලා තිබෙනවා. ඒවායෙන් සමහර ඒවා දැන් වැස්සට තෙමෙනවා; අව්වට වේළෙනවා. හැබැයි ඒ අයට උපදෙස් දීලා තිබෙනවා ඒවායේ ඉල්ලුම්කරුවන්ට ඒවා ලබා දෙන්න එපා කියලා. ඒ නිසා අපි විශේෂයෙන් අතිගරු ජනාධිපතිතුමාගේ, ගරු අග්‍රාමාත්‍යතුමාගේ, රජයේ, මුදල් අමාත්‍යතුමා ඇතුළු වග කිව යුතු අමාත්‍යාංශවල සියලු මැති ඇමතිවරුන්ගේ විශේෂ අවධානය මේ කාරණය කෙරෙහි යොමු කරවනවා. මේ නිසා ඇත්තෙන්ම රාජ්‍ය මුදල් නාස්ති වෙන්න පුළුවන්. ඒ නිසා ඒවා ඒ සුදුසුකම් ලත් අයට ලබා දෙන්න. මොකද, මහන මැසීමක් දෙන්න ඕනෑ මහන්න පුළුවන් කෙනකුටයි. ඔවුන්ට ඒ හා සම්බන්ධ වැඩ පිළිවෙළක්, ව්‍යාපෘතියක් තිබෙනවා. ඒ මහන මැසීම අරගෙන මොකක්ද කරන්නේ කියන එක පිළිබඳ ව්‍යාපෘතියක් ඒ අය මේ වන කොට හදලා තිබෙනවා. ඒ උපකරණ එසේ සුදුසුකම් තිබෙන අයට දෙන්න තිබෙන ඒවායි. මුදල් ප්‍රතිපාදන වෙන් කරලා, නීත්‍යානුකූලව මිලදී ගෙන තිබෙන ඒ උපකරණ දුන්නේ නැත්නම් විශාල අසාධාරණයක් වෙනවා. ඒ විතරක් නොවෙයි. රජයේ මුදල් නාස්තියක් ද වෙනවා.

ඒ නිසා ඒ පිළිබඳව කඩිනම් අවධානය යොමු කරන්න කියලා අපි විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා. මොකද, මේක ඉතා ඉක්මනින් කරන්න ඕනෑ වැඩ පිළිවෙළක්. දින සියයේ වැඩසටහන ක්‍රියාත්මක කරන ගමන් ඉහතින් සඳහන් කළ වැඩසටහන්වලට පූර්ණ අවධානය යොමු කරලා කටයුතු කරන්න කියන ගෞරවනීය ඉල්ලීම අපි කරනවා. ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත්, ඒ වාගේම කැබිනට් මණ්ඩලයත් මේ සම්බන්ධව සාකච්ඡා කරලා කඩිනමින් විසඳුමක් ලබා දෙයි කියලා අපට ලොකු විශ්වාසයක් තිබෙනවා. මෙය ජනතාවාදී ගැටලුවක් නිසාත්, රටේ ප්‍රශ්නයක් නිසාත්, මුදල් පිළිබඳව ඇති වන ප්‍රශ්නයක් නිසාත් ඒවාට සම්බන්ධ අනෙකුත් සියලු කරුණු සැලකිල්ලට ගෙන මේ සඳහා කඩිනමින් විසඳුමක් ලබා දෙන්න කියලා ඉතාම ඕනෑකමින් මා ඉල්ලා සිටිනවා.

බොහොම ස්තූතියි.

[අ.භා. 6.58]

ගරු ආර්. දුමින්ද සිල්වා මහතා
(மாண்புமிகு ஆர். துமிந்த சில்வா)
(The Hon. R. Dumindha Silva)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ සභාව කල් තැබීමේ යෝජනාව මා ස්ථිර කරනවා.

[අ.භා. 6.59]

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - வெகுசன ஊடக, பாராளுமன்ற அலுவல்கள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Mass Media and Parliamentary Affairs and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා විසින් ගෙනාපු සභාව කල් තැබීමේ යෝජනාවට රජය වෙනුවෙන් පිළිතුරු ලබා දීමට මා අදහස් කරනවා.

අතිගරු ජනාධිපතිතුමාත්, ගරු අග්‍රාමාත්‍යතුමාත් ඉතා පළපුරුදු, බොහොම පරිණත, දීර්ඝ කාලීන දේශපාලන නායකයන් හැටියටත්, ඉතාම සුපිරිසිදු දේශපාලන චරිත හැටියටත් රටේ හොඳ නමක් දිනා ගෙන තිබෙන පුද්ගලයන්ය කියන කාරණය විශේෂයෙන්ම ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමාට මම කියන්න කැමැතියි. එවැනි නායකයන් සිටින රජයක් වන අපේ අලුත් ආණ්ඩුව මොන විධියකටවත් මහ ජනතාවට ප්‍රයෝජනවත් වැඩසටහනක් හෝ ව්‍යාපෘතියක් නතර කිරීමට කටයුතු කරන්නේ නැති බව මම එතුමාට පළමුවෙන්ම මතක් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය පාලන කාලය තුළ, මේ රටේ පුංචිම තැන ඉඳලා ලොකුම තැන දක්වා වූ දේශපාලනඥයන් -ප්‍රාදේශීය මට්ටමින් විතරක් නොවෙයි, ජාතික මට්ටමිනුත්- මේ වාගේ ව්‍යාපෘතිවලට යෙදූ ජනතා මුදල් අවභාවිතයට ගත් බව රහසක් නොවෙයි කියන එක අපි කවුරුත් දන්නවා. ඒවා පිළිබඳව ජනතාව තුළ දැඩි කලකිරීමක් ඇති වෙලා තිබෙනවා. ඒවා පිළිබඳව සොයා බලා අවශ්‍ය කටයුතු කරන්න කියන ජනතාවගේ ඉල්ලීම නිරන්තරයෙන්ම අලුත් ආණ්ඩුවට ලැබෙනවා. ඒ නිසා අපගේ අලුත් ආණ්ඩුව මේ ව්‍යාපෘති පිළිබඳව, මේ යෝජනා ක්‍රම පිළිබඳව සවිස්තරාත්මක සොයා බැලීමක් සිදු කරනවා. ඒ සොයා බැලීමත් ඉතාම කඩිනමින් සිදු කරලා අවසන් කරන්නට මේ වන කොට අප තීරණය කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම මේ වැඩසටහන්වල, ව්‍යාපෘතිවල ප්‍රමිතිය සොයා බැලීම පිළිබඳව අපි විශේෂයෙන්ම අවධානය යොමු කරනවා. ප්‍රමිතියට අනුව අවසන් කරපු සියලුම වැඩ කටයුතු සඳහා ගෙවීම් කටයුතු කරන්නත් අපේ රජය කොයිම විධියකින්වත් පසුබට වන්නේ නැහැ. විශේෂයෙන්ම මේ වැඩ කටයුතු සිද්ධ කරපු ආකාරය පිළිබඳව සොයා බැලීම කළ යුතුය කියන එක නම් ආණ්ඩුවක් හැටියට කරන්න අප තීරණය කරලා තිබෙනවා. ඒවා නිවැරදි ලෙස ඇස්තමේන්තු සකස් කරලාද කරලා තිබෙන්නේ කියන එක අපි නිරන්තරයෙන්ම හොයනවා. ඒවා නිසි ලෙස ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කරලාද කරලා තිබෙන්නේ කියන එක පිළිබඳවත් සොයා බැලීමට වග කිව යුතු රජයක් හැටියට අප බලාපොරොත්තු වනවා. ඒ වාගේම නිසි අනුමැතිය ලබා ගෙනද ජනතා මුදල්වලින් මේ ව්‍යාපෘති කරලා තිබෙන්නේ කියන එක පිළිබඳවත් අප දැඩි ලෙස අවධානය යොමු කරන්න බලාපොරොත්තු වනවා.

මෙහිදී විශේෂයෙන්ම මම ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා ඇතුළු විපක්ෂයට තවත් කරුණක් මතක් කරන්න කැමැතියි. මෙවැනි ව්‍යාපෘති තව දුරටත් වර්ධනය කරලා ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් මන්ත්‍රීවරු සඳහා දෙන විමධ්‍යගත අරමුදල - DCB funds - පවා අවුරුදු ගණනකට පස්සේ වැඩි කරපු ආණ්ඩුව හැටියට, ඒ ගැනත් මේ අවස්ථාවේදී අපි ආඩම්බරයෙන් මතක්

කරනවා. අපි මේ කෙටි කාලය ඇතුළතදී ඉදිරිපත් කරපු අතුරු අය වැයෙන් විමධ්‍යගත අරමුදල රුපියල් මිලියන 5 සිට 10 දක්වා සියයට සියයක වැඩි කිරීමක් කළේත් ග්‍රාමීය මට්ටමින් ඒ වැඩ කටයුතු කළ යුතුයි කියලා තීරණය කරපු නිසායි.

ඒ වාගේම, මහ ජනතාවගේ ධනය අපතේ නොයවා, නිසි ක්‍රමවේදයක් ඔස්සේ ජනතාවට සෘජුව ප්‍රතිඵල ලැබෙන ලෙස මේ වැඩ කටයුතු කරන්නත් අනාගතයේදී අපි වග බලා ගන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රජයේ අමාත්‍යවරයකු හැටියට මා ඉතාම පැහැදිලිව වගකීමෙන් යුතුව කියනවා, මුදල් වෙන් කළ කිසිම වැඩ කටයුත්තක් අපි නොකර ඉන්නේ නැහැ, ඒවා නතර කරන්නේ නැහැ කියලා. ඒ සියලුම වැඩ කටයුතු අපි ක්‍රියාත්මක කරනවා. ඒ සමහර ව්‍යාපෘතිවලට මුදල් වෙන් කරලාත් නැහැ. ඒවා නමට සීමා කළ ව්‍යාපෘති විතරයි, මුදල් වෙන් කරලා නැහැ. ඒවා පිළිබඳවත් සමාලෝචනයක් කරන්න අපි කටයුතු කරනවා. ඒවා සමාලෝචනය කළාට පස්සේ, ඒවායේ තත්ත්වය කුමක්ද කියලා රට දැනුවත් කිරීමටත් අපි කටයුතු කරනවා.

අනෙක් කාරණය මේකයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ විෂයයට තමයි පසු ගිය කාලයේ මේ ඔක්කොම ව්‍යාපෘති යටත් කරලා තිබුණේ. එක පුද්ගලයකු වටේ තමයි ඒ සියලුම බලය තිබුණේ. මේ ජනාධිපතිවරණයේ ප්‍රතිඵලවලටත් ඒවා හුඟක් දුරට බලපෑවාය කියන එක එදා ආණ්ඩුවේ හිටපු, අද විපක්ෂයට වෙලා ඉන්න මන්ත්‍රීවරුත් එක්ක කථා කරනකොට ඒ අය කියනවා. ඒ අය පෞද්ගලිකව අපිත් එක්ක කියන කථාවක් තමයි එක තැනකට, එක කෙනෙකුට, එක පවුලකට මේ සියල්ලම ගොනු වෙලා තිබුණු එක. ඒ නිසා දැන් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ තිබුණු විෂයයන් රාශියක් අමාත්‍යාංශ කීපයකට වෙන් කරන්නත් අලුත් ආණ්ඩුව කටයුතු කරලා තිබෙනවා. මේ සියල්ලම සම්බන්ධීකරණය කරලා කටයුතු කිරීම සඳහා විශේෂ කැබිනට් අනුකමිටුවකුත් ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් මේ වෙනකොට පත් කර තිබෙනවා. අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් තිබෙන ඒ අනුකමිටුවේ ලේකම්වරයා හැටියට සැලසුම් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම්වරයා කටයුතු කරනවා. ඒ වාගේම රාජ්‍ය පරිපාලන අමාත්‍ය ගරු කරු ජයසූරිය මැතිතුමා, මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය ගරු කබීර් හෂීම් මැතිතුමා, ස්වදේශ කටයුතු හා ධීවර අමාත්‍ය ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමා, වාරිමාර්ග හා කෘෂිකර්ම අමාත්‍ය ගරු දුමින්ද දිසානායක මැතිතුමා, අග්‍රාමාත්‍ය කාර්ය මණ්ඩල ප්‍රධානී සාගල රත්නායක මැතිතුමා සහ ජනාධිපතිතුමාගේ නියෝජිතයකු හැටියට තිලක් රණවිරාජා මැතිතුමා මේ විශේෂ කමිටුවේ කටයුතු කරන්න දැනටම පත් කර තිබෙනවා.

අපි රජයක් හැටියට සියලුම අමාත්‍යාංශවල සංවර්ධන ව්‍යාපෘතිවල විස්තර මේ වෙනකොට ඉල්ලා තිබෙනවා. ඒ සියල්ලම අපි ඉක්මනින් ලබා ගන්නවා. ඊට පස්සේ දිස්ත්‍රික් සංවර්ධන කමිටු හරහා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලට එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පවරලා, ඒ වැඩ කටයුතු කඩිනමින් නිසි ලෙස, නිසි අධීක්ෂණයකින් යුතුව මහජන මුදල් අපතේ නොයන විධියට ක්‍රියාත්මක කරන්න කටයුතු කරනවා.

මා මේ පිළිබඳව දීර්ඝ වශයෙන් පැහැදිලි කරන්න අවශ්‍ය නැහැ. අපේ ගරු මන්ත්‍රීතුමාගේ කල්තැබීමේ යෝජනාවේ අවසානයට තිබෙනවා, මිල දී ගෙන ඇති ස්වයං රැකියා උපකරණ ඒ ඉල්ලුම්කරුවන්ට කඩිනමින් ලබා දීමටත් කටයුතු කළ යුතුයි කියලා. ඇත්ත වශයෙන්ම අපි ඒවාත් කඩිනමින් ලබා දෙනවා. හැබැයි, පසු ගිය කාලයේ ඒ සියලුම දේවල් ලබා දුන්නේ ලැබිය යුතු පුද්ගලයන්ටද කියන එක කවුරුන් තුළත් තිබෙන ප්‍රශ්නයක්. දේශපාලන වුවමනාවන් සඳහා ජනතා මුදල් පාවිච්චි කරලා තිබෙන බව පෙනෙනවා. ලැබිය යුතු අයට කෙසේ වෙතත්, ඉන්දය ලබා ගැනීම සඳහා ම ඒවා පාවිච්චි කළ විධිය අප දැකලා තිබෙනවා. ඒ නිසා ලැයිස්තු සකස් කරලා ඒවා ක්‍රමවත් විධියට ලබා දෙන්න, නිවැරදි පුද්ගලයන් අතට ලබා දෙන්න අපි රජයක් හැටියට කටයුතු කරනවා.

ඒ නිසා මම අවසන් වශයෙන් කියන්නේ, අපේ ජනාධිපතිතුමා, අගමැතිතුමා ඉතාම සුපිරිසිදු නායකයන් හැටියට මහජන මුදල් අවභාවිතයට සම්පූර්ණයෙන්ම විරුද්ධ බවයි. බොහොම පිරිසිදුකමක් ඇති එවැනි පුද්ගලයන් සිටින, ජනතාව බලාපොරොත්තුව සිටින නායකයන් සිටින ආණ්ඩුවකයි අපි කටයුතු කරන්නේ.

පහු ගිය කාලයේදී උඩ ඉඳලා පහළට යනතෙක් සිද්ධ වූ දේවල් අපි දන්නවා. ගමක කොන්ක්‍රීට් පාරක් හැදුවත්, ගමක පුංචි ව්‍යාපෘතියක් කළත් දේශපාලනඥයන් තමයි ඒවායේ කොන්ත්‍රාත්කරුවන් වුණේ. ඒවා ප්‍රමිතියට සිද්ධ වුණාද, ඒවායින් ගසා කෑවේ කවුද කියන කරුණු රටේ කවුරුත් දන්නවා. ඒවා පිළිබඳව නිසි අධ්‍යයනයක් කරලා නියමාකාර විධියට අපි කටයුතු කරනවාය කියන එකත් ප්‍රකාශ කරනවා. ජනතාවට ප්‍රයෝජනවත් කිසිම වැඩ සටහනක්, ව්‍යාපෘතියක් අපි නතර කරන්නේ නැහැ. තව තවත් ඒවා අලුතින් ක්‍රියාත්මක කරන්න කටයුතු කරනවා. විමධ්‍යගත අරමුදල් සියයට සියයකින් වැඩි කරපු ආණ්ඩුවක් ඒ ආකාරයෙන්ම කටයුතු කරනවාය කියන විශ්වාසය ඇති කර ගන්න කියලා රජය වෙනුවෙන් ප්‍රකාශ කරමින්, මේ යෝජනාව ඉදිරිපත් කිරීම ගැන ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමාට රජය වෙනුවෙන් ස්තුති කරමින් මගේ අදහස් ප්‍රකාශ කිරීම මෙතෙකින් අවසන් කරනවා. ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 7.06ට, අද දින සභා සම්මතිය අනුව 2015 පෙබරවාරි 07 වන සෙනසුරාදා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.

அதன்படி பி.ப. 7.06 மணிக்கு பாராளுமன்றம், அதனது இன்றைய தீர்மானத்துக்கிணங்க, 2015 பெப்ருவரி 07, சனிக்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Adjourned accordingly at 7.06 p.m. until 1.00 p.m. on Saturday, 07th February, 2015, pursuant to the Resolution of Parliament of this Day.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

232 වන කාණ්ඩය - 7 වන කලාපය
தொகுதி 232 - இல. 7
Volume 232 - No. 7

2015 පෙබරවාරි 07 වන සෙනසුරාදා
2015 பெப்ருவரி 07, சனிக்கிழமை
Saturday, 07th February, 2015

පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:
පාර්ලිමේන්තු විවාද සජීවීව විකාශනය කිරීම

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
පළාත් පාලන මැතිවරණ ක්‍රමය

වරප්‍රසාද:
2015 පෙබරවාරි 06 දින "ටීඑන්එල්" ප්‍රවෘත්තිය

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:
කහවිල්ගොඩ ජාතික උරුම උයන සංකල්ප කෞතුකාගාර සංවර්ධන අරමුදල (සංස්ථාගත කිරීමේ) -[ගරු නාමල් රාජපක්ෂ මහතා]- පළමුවන වර කියවන ලදී

විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත:
දෙවන වර හා තුන් වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

பிரதான உள்ளடக்கம்

அறிவிப்புக்கள்:
பாராளுமன்ற விவாதங்களின் நேரடி ஒளிபரப்பு

தனி அறிவித்தல் மூல வினா:
உள்ளூராட்சித் தேர்தல் முறைமை

சிறப்புரிமை :
2015 பெப்ருவரி 06ஆந் திகதிய 'ரிஎன்எல்' செய்தி அறிக்கை

தனி உறுப்பினர் சட்டமூலங்கள்:
கஹவில்கொட ஜாதிக உறும உயன எண்ணக்கரு நூதனசாலை அபிவிருத்தி நிதியம் (கூட்டிணைத்தல்) – [மாண்புமிகு நாமல் ராஜபக்ஷ] - முதன்முறை மதிப்பிடப்பட்டது

ஒதுக்கீடு (திருத்தம்) சட்டமூலம்:
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு, திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Live Telecast of Parliamentary Proceedings

QUESTION BY PRIVATE NOTICE:
Local Government Electoral System

PRIVILEGE:
"TNL" News Telecast on 6th February, 2015

PRIVATE MEMBERS' BILLS:
Kahawilgoda Jathika Uruma Uyana Concept Museum Development Fund (Incorporation) - [The Hon. Namal Rajapaksa] - Read the First time

APPROPRIATION (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed as amended.

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2015 පෙබරවාරි 07 වන සෙනසුරාදා
2015 பெப்ருவரி 07, சனிக்கிழமை
Saturday, 07th February, 2015

අ. භා.1.00ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA]
in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

පාර්ලිමේන්තු විවාද සජීවීව විකාශනය කිරීම
பாராளுமன்ற விவாதங்களின் நேரடி ஒளிபரப்பு
LIVE TELECAST OF PARLIAMENTARY PROCEEDINGS

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
2015 පෙබරවාරි මස 05වැනි දින පාර්ලිමේන්තු විවාද සජීවීව විකාශනය කිරීම සම්බන්ධයෙන් ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා විසින් සභාවේදී නඟන ලද රීති ප්‍රශ්නය පිළිබඳ ප්‍රකාශයක් කිරීමට කැමැත්තෙමි.

පාර්ලිමේන්තු විවාද 2015 ජනවාරි මස 20වැනි දින සිට සියලුම රැස්වීම් දිනවල ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට අයත් PEO TV Channel 91 ඔස්සේ සජීවීව විකාශනය කොට ඇති බව දන්වනු කැමැත්තෙමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

2013 වර්ෂය සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.- [අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු කරුපයියා වේලායුදම් මහතා - පැමිණ නැත.

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
ගරු කථානායකතුමනි, මම පන්නල, ශ්‍රී සීලානන්ද මාවත යන ලිපිනයේ පදිංචි අයි.පී. ජයන්ත මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා - පැමිණ නැත.
ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා - පැමිණ නැත.
ගරු මනුෂ නානායක්කාර මහතා - පැමිණ නැත.
ගරු නෙරන්ජන් වික්‍රමසිංහ මහතා - පැමිණ නැත.
ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා - පැමිණ නැත.
ගරු ෂෙහාන් සේමසිංහ මහතා - පැමිණ නැත.

ඉදිරිපත් කරන ලද පෙත්සම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுவைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petition ordered to be referred to the Committee on Public Petitions.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

පළාත් පාලන මැතිවරණ ක්‍රමය
உள்ளூராட்சித் தேர்தல் முறைமை
LOCAL GOVERNMENT ELECTORAL SYSTEM

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ මා මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍ය සහ බුද්ධ ශාසන අමාත්‍යතුමා වන ගරු කරු ජයසූරිය අමාත්‍යතුමා වෙතයි.

එතුමා වෙත ඉදිරිපත් කරන ජාතික වැදගත්කමකින් යුත් ප්‍රශ්න:

1. පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද නව පළාත් පාලන මැතිවරණ ක්‍රමය යටතේ පළාත් පාලන මැතිවරණයක් පැවැත්වීමට (මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා) නියමිතයි. 2015 මාර්තු මස අවසානයේදී සහ අප්‍රේල් මාසයේදී එකී සභාවන්හි කාලසීමාව අවසන් වන බැවින්, ඉහත කී නීතිය යටතේ එම ආයතන පිහිටුවීමට කටයුතු කිරීමට බලාපොරොත්තු වන්නේද?

2. ඒ අනුව එම පළාත් පාලන මැතිවරණයන් පැවැත්වීමට කටයුතු කරන දින වකවානු (මාසය, දිනය) දළ වශයෙන් ප්‍රකාශ කරන්නේද?
3. එම මැතිවරණයන් පැවැත්වෙන්නේ දැනට නීතිගතව පවතින ඉහත සඳහන් නව මැතිවරණ ක්‍රමය යටතේද?

ගරු අමාත්‍යතුමා මේ පිළිබඳව පාර්ලිමේන්තුවට ප්‍රකාශයක් කරන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

ගරු කරු ජයසූරිය මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍ය සහ බුද්ධ ශාසන අමාත්‍යතුමා)
(மாண்புமிகு கரு ஜயசூரிய - அரசாங்க நிருவாக, மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் சனநாயக ஆட்சி பற்றிய அமைச்சரும், புத்தசாசன அமைச்சரும்)
(The Hon. Karu Jayasuriya - Minister of Public Administration, Provincial Councils, Local Government and Democratic Governance and Minister of Buddha Sanasa)

ගරු කථානායකතුමනි, ජාතික වශයෙන් ඉතාමත්ම වැදගත්කමකින් යුතු ප්‍රශ්නයක් ගැන කරුණු පැහැදිලි කරන ලෙස ඉල්ලා සිටීම ගැන ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා. මේ ගැන අපි දෙගොල්ලන්ම බොහෝ කාලයක සිට සාකච්ඡා කළා. අවුරුදු බොහෝ ගණනක් ගියත් අපට අවශ්‍ය වන්නේ මේ කරුණ ඉතා ඉක්මනින් නිම කරන්නයි.

ගරු කථානායකතුමනි, ඒ වාගේම අපි මේ අමාත්‍යාංශය භාර ගෙන මාසයකට ආසන්න සුළු කාලයක් තුළ විශාල වැඩ කොටසක් කළා. එතුමාගේ පළමුවැනි ප්‍රශ්නයට පිළිතුර වශයෙන් මා සඳහන් කරන්න ඕනෑ කාල සීමාවන් අවසන් වන කොටස් වශයෙන් 2011 අප්‍රේල් 01 වැනි දා සිට 2015 මාර්තු 31 දක්වා ආයතන 234ක් තිබෙන බව. ඒ කියන්නේ නගර සභා 3යි, Urban Councils 30යි, ප්‍රාදේශීය සභා 201යි. ඒ වාගේම 2011 අගෝස්තු 01වැනි දින සිට 2015 ජූලි 31 දිනෙන් අවසන් වන ආයතන 65ක් තිබෙනවා. නගර සභා 1යි, සුළු නගර සභා 7යි, ප්‍රාදේශීය සභා 57යි.

ඒ වාගේම, 2011 ඔක්තෝම්බර් 17 දින ආරම්භ වී 2015 ඔක්තෝම්බර් 16 දිනට කාලය අවසාන වන ආයතන 21ක් තිබෙනවා, නගර සභා 15ක්, සුළු නගර සභා 1ක් සහ ප්‍රාදේශීය සභා 5ක් වශයෙන්. ඊට අමතරව, 2011 නොවැම්බර් පළමුවැනි දා ආරම්භ වී 2015 ඔක්තෝම්බර් 31 වන විට කාලය අවසාන වන නගර සභා දෙකක් තිබෙනවා. ගරු කථානායකතුමනි, 2008 මාර්තු මස 18 වන දින ආරම්භ වී 2012 මාර්තු 17 වන විට කාලය අවසන් වී ඇති ආයතන 9ක් තිබෙනවා. ඒ අතර, නගර සභා 1ක් සහ ප්‍රාදේශීය සභා 8 ක් තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයේ දෙවැනි කාරණයට අදාළව කථා කරනවා නම්, අපි මේ මැතිවරණය පැවැත්වීම සම්බන්ධයෙන් අවධානය යොමු කර තිබෙනවා. ඒ වාගේම, ඔබතුමාත් දන්නවා අප පොරොන්දු වූ පරිදි 2015 අප්‍රේල් 24 වැනි දාට මැතිවරණයක් සඳහා පාර්ලිමේන්තුව විසුරුවා හරින්නට වර්තමාන රජයේ අදහසක් තිබෙන බව. අපි ඒ බව ප්‍රකාශ කරලාත් තිබෙනවා. මේ මැතිවරණ දෙක කොහොමද පවත්වන්නේ කියන එක සම්බන්ධයෙන් මම දිනේෂ් ගුණවර්ධන මැතිතුමා සමඟ අදත් කථා කළා. ඒ ගැන අපි විපක්ෂය සමඟ සාකච්ඡා කරලා, අතිගරු ජනාධිපතිතුමාත්, ගරු අගමැතිතුමාත්, කැබිනට් මණ්ඩලයත් එක්ක සාකච්ඡා කරලා, ඒ සෑම දෙනාගේම අදහස් විමසලා ඒ මැතිවරණය කොහොමද පවත්වන්නේ කියන එක පිළිබඳව ඉතා ඉක්මනින් සභාව දැනුවත් කරන්න බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම, සීමා නිර්ණය කිරීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට පිළිතුරක් දෙන්න ඕනෑ. මට මතකයි, අපි විපක්ෂයේ ඉන්න කොට ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාත්, අපිත් කිහිප විටක්ම ඒ සීමා නිර්ණය පිළිබඳ විස්තර පාර්ලිමේන්තුවේ සභාගත කරන ලෙස ඉල්ලා සිටියා. නමුත් ඒ විස්තර ලබා ගන්න බැරි වුණා. මැතිවරණ කොමසාරිස්තුමාත් අපට කියලා තිබෙනවා, ඒ ගැන එතුමාටත් හුඟක් වාර්තා ඇවිල්ලා තිබෙනවා, ඒ හදලා තිබෙන ක්‍රමවේදය හොඳ නැහැ, අඩු පාඩුකම් තිබෙනවා කියලා. ඒ නිසා ගරු කථානායකතුමනි, මම අදහස් කරන්නේ දැන් තිබෙන වාර්තාව ඒ විධියටම අතිගරු ජනාධිපතිතුමාට ඉදිරිපත් කරන්න. ඊට පස්සේ අපි අවස්ථාව දෙන්න බලාපොරොත්තු වෙනවා ඒ ප්‍රදේශවල, ඒ ආසනවල යම්කිසි ප්‍රශ්නයක් තිබෙනවා නම් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින්, දිසාපති කාර්යාල මට්ටමින් සොයා බලා ඒ අනුව කටයුතු කරන්න. මොකද, මැතිවරණ කොමසාරිස්තුමාගේ වාර්තාවේ තිබෙන විධියට ඒ කාර්යයේ අඩු පාඩුකම් බොහෝ තිබෙනවා. ලිපියක් මඟින් එතුමා ඒ කරුණ මාගේ අවධානයට යොමු කර තිබෙනවා. නමුත් ඉතා ඉක්මනින් මේ කටයුතු අවසන් කිරීම තමයි අපේ අදහස.

ඒ වාගේම, මැතිවරණ කොමසාරිස්තුමාත්, අදාළ නිලධාරිනුත් ලබන සතියේදී කැඳවන්න මම තීරණය කරලා තිබෙනවා. එහිදී මේ සම්බන්ධයෙන් ඉදිරි අදහස් ලබා ගන්න පුළුවන්. මම බලාපොරොත්තු වෙනවා ඒ සම්බන්ධයෙන් දිනේෂ් ගුණවර්ධන මැතිතුමා දැනුවත් කරන්න. මොකද, විපක්ෂයේ අදහස් අපට ඉතා අවශ්‍යයි. අපට ඒ ගැන කථා කරන්න පුළුවන්. ඒ නිසා ඉතා ඉක්මනින් මේ කරුණු සම්බන්ධයෙන් විපක්ෂය දැනුවත් කිරීමටත්, ජනතාව දැනුවත් කිරීමටත් අපි බලාපොරොත්තු වෙනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඔබතුමා සඳහන් කළා වාගේ මේ මැතිවරණය පැවැත්වෙන්නේ නව මැතිවරණ නීති යටතේ. දැනට පාර්ලිමේන්තුව සම්මත කරලා තිබෙන නව නීති යටතේ.

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

දැන් කරලා තිබෙන සීමා නිර්ණය තුළ -[බාධා කිරීමක්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

I agree; it has to be discussed. But, it will be under the Ward System.

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

මේ ප්‍රශ්නය විසඳා ගත්තාට පස්සේ අපට කථා කරන්න පුළුවන්. මම හිතන හැටියට සුදුසුම ක්‍රමය ඒක තමයි. මමත් ඒක විශ්වාස කරනවා. සීමා නිර්ණය කිරීමේ ගැටලු විසඳා ගත්තාට පස්සේ අපි ගැන කථා කරමු.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නය, ගරු දිනේෂ් ගුණවර්ධන මහතා.

වරප්‍රසාද : 2015 පෙබරවාරි 06 දින "ටී.එන්.එල්." ප්‍රවෘත්තිය

சிறப்புரிமை : 2015 பெப்ருவரி 06ஆந் திகதிய "ரிஎன்எல்" செய்தியறிக்கை

PRIVILEGE: "'TNL" NEWS TELECAST ON 6TH FEBRUARY, 2015

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මේ වරප්‍රසාද ප්‍රශ්නය මතු කරන්න අවස්ථාව ලබා දීම ගැන මා පළමුකොට ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, ටී.එන්.එල්. රූපවාහිනී නාලිකාව මඟින් 2015.02.06 වැනි දින, එනම් ඊයේ රාත්‍රී සිංහල සහ ඉංග්‍රීසි ප්‍රවෘත්ති තුළින් මා පිළිබඳ අසත්‍ය සහ ද්වේෂ සහගත ලෙස විකාශනය වූ ප්‍රවෘත්තිය සම්බන්ධයෙන් මේ ප්‍රකාශය කරමි.

වර්ෂ 2015 පෙබරවාරි මස 6වැනි සිකුරාදා ටී.එන්.එල්. රූපවාහිනී නාලිකාව ඔස්සේ සවස 6.55 සහ රාත්‍රී ප්‍රවෘත්ති (සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යවලින්) විකාශනය කරන්නට යෙදුණු ටී.එන්.එල්. ප්‍රවෘත්තියකින් මා සම්බන්ධයෙන් ඉතාම ද්වේෂ සහගත ලෙස සම්පූර්ණ අසත්‍ය ප්‍රවෘත්තියක් විකාශය කරන ලදී.

එනම්, එහි අඩංගු වූ පරිදි,

1. මා ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යවරයා ලෙස කටයුතු කරන කාලය තුළදී යාපනයේ කිලිනොච්චි උතුරු පළාතේ ජල ව්‍යාපෘතිය (ආසියානු සංවර්ධන බැංකු ණය යටතේ ලැබුණු) මාගේ පුත්‍ර දියත් ගුණවර්ධන මහතාගේ ශ්‍රීන්ටෙක් ආයතනයට ලබා දුන් බවට සඳහන් කෙරිණි.

   මෙය සම්පූර්ණ අසත්‍යයක් වනුයේ, මා හට ඇත්තේ එක් පුත්‍රයෙක් සහ එක් දියණියක් පමණි. මාගේ එකම පුත්‍රයාගේ නම යදාමිණී ගුණවර්ධන වන අතර, ඔහුට අයත් හෝ ඔහුගේ නමින් සෘජුව හෝ වක්‍රව අධ්‍යක්ෂ ධුර හෝ එවැනි කිසිදු ආකාරයක සම්බන්ධයක් දක්වන ශ්‍රීන්ටෙක් නමින් හෝ ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ හෝ එම මණ්ඩලයේ හෝ ආසියානු සංවර්ධන බැංකුවේ හෝ රජයේ වෙනත් ආයතන සමඟ හෝ සෘජුව හෝ වක්‍රව කිසිදු ව්‍යාපාර හෝ ව්‍යාපෘතියක් සම්බන්ධව කිසිදු ගිවිසුමකට හෝ ගනුදෙනුවකට කිසිදු ආකාරයකින් සම්බන්ධ වී නොමැත.

2. තවද, එහි තවදුරටත් ප්‍රකාශය වූ බොරලුගොඩ සිංහයාගේ පුත් දිනේෂ් ගුණවර්ධනයන් දැන් පාර්ලිමේන්තුවේ උත්තරීතර බවත්, අගවිනිසුරු ඉවත් කිරීමේ දෝෂ ගැනත් කෑ මොරදෙන බවත්, බොරලුගොඩ සිංහයා ලෙස විරුදාවලිය ලත් තම පියාණන්ට අවනම්බුවක් බවත් සඳහන් කෙරුණි.

ඉහත සඳහන් පරිදි එවැනි දෙයක් මා විසින් කිසි ලෙසකින් සිදු කර නොමැති බැවින් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ද පසු ගිය දා ජාතික නිදහස් උළෙලදී ජාතික වීරවරයෙක් ලෙස ගෞරවය පුද කළ මාගේ පියාණන් වූ පිලිප් ගුණවර්ධන මැතිතුමාණන්ටද මෙමඟින් අපහාසයක් ද, මා වෙත අපහාසයක් ද, ද්වේෂ සහගත ලෙස ටී.එන්.එල්. ප්‍රවෘත්ති විකාශය මඟින් සිදු කර ඇත.

මේ හා සමාගාමීව මෙම අසත්‍ය ද්වේෂ සහගත ප්‍රවෘත්තිය අන්තර්ජාල, වෙබ් අඩවි, ගුවන්විදුලි නාලිකා සහ එවැනි මාධ්‍ය හරහාත් ප්‍රචාරය කර ඇත. මෙය වහාම නිවැරදි කරන ලෙස ටී.එන්.එල්. නාලිකාවට උපදෙස් දෙන ලෙස ඉල්ලා සිටින අතර, ඒ වාගේම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු සම්බන්ධව ප්‍රවෘත්ති විකාශය කිරීම සම්බන්ධයෙන් ඉතාමත් වග කීමන් යුතුව කටයුතු කරන ලෙස ගරු කථානායකතුමා අදාළ ආයතන වෙත අවවාද කරන ලෙස ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සියලු මන්ත්‍රීවරුන් වෙනුවෙන් ඉල්ලා සිටිමි.

මා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකු ලෙස පාර්ලිමේන්තුවේ උත්තරීතර බව හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීමට දී ඇති ප්‍රතිඥාව අනුව නොනැවතී ඉදිරියටත් කටයුතු කරන බව ගරු කථානායකතුමාට ගෞරවයෙන් දන්වා සිටිමි. ස්තුතියි, කථානායකතුමනි.

පාර්ලිමේන්තුවේ රැස්වීම්

பாராளுமன்ற அமர்வு

SITTINGS OF THE PARLIAMENT

I

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Plantation Industries and Leader of the House of Parliament)

Sir, I move,

"That notwithstanding the provisions of Standing Order 7(1) and the motion agreed to by Parliament on 09.07.2010, the Parliament shall sit on Tuesday, February 10th, 2015."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That notwithstanding the provisions of Standing Order No. 7 and the motion agreed to by Parliament on 09.07.2010, the hours of sitting on Tuesday, February 10th, 2015 shall be 9.30 a.m. to 6.30 p.m. At 9.45 a.m. Standing Order No. 7(5) shall operate."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

III

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That this Parliament at its rising this day do adjourn until 9.30 a.m. on Tuesday, February 10th, 2015."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

කහවිල්ගොඩ ජාතික උරුම උයන සංකල්ප කෞතුකාගාර සංවර්ධන අරමුදල (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
கஹவில்கொட ஜாதிக உறும உயன எண்ணக்கரு நூதனசாலை அபிவிருத்தி நிதியம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
KAHAWILGODA JATHIKA URUMA UYANA CONCEPT MUSEUM DEVELOPMENT FUND (INCORPORATION) BILL

ගරු නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා.

"කහවිල්ගොඩ ජාතික උරුම උයන සංකල්ප කෞතුකාගාර සංවර්ධන අරමුදල සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)

විසින් ස්ථිර කරන ලදී
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙත පවරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.

சட்டமூலம் நிலைக்கட்டளை இல. 47(5) இன்படி பிரதம அமைச்சரும் கொள்கை உருவாக்கம், பொருளாதார அலுவல்கள், சிறுவர், இளைஞர் மற்றும் கலாசார அலுவல்கள் அமைச்சருமானவருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப் பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.

The Bill stood referred, under Standing Order No. 47(5), to the Prime Minister, Minister of Policy Planning, Economic Affairs,Child, Youth and Cultural Affairs for report.

විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත
ஒதுக்கீடு (திருத்தம்) சட்டமூலம்
APPROPRIATION (AMENDMENT) BILL

කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී

ඊට අදාළ ප්‍රශ්නය [පෙබරවාරි 05]
'පනත් කෙටුම්පත දැන් දෙ වන වර කියවිය යුතු ය" [ගරු රවි කරුණානායක මහතා]
ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.

ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.

சம்பந்தப்பட்ட வினா - [பெப்ருவரி 05]
"சட்டமூலம் இப்பொழுது இரண்டாம்முறை மதிப்பிடப் படுமாக" [மாண்புமிகு ரவி கருணாநாயக்க]
வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.

Order read for resuming Adjourned Debate on Question - [05th February]
"That the Bill be now read a Second time".- [The Hon. Ravi Karunanayake]
Question again proposed.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු සජිත් ප්‍රේමදාස මහතා.

[අ.භා. 1.18]

ගරු සජිත් ප්‍රේමදාස මහතා (නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - வீடமைப்பு மற்றும் சமுர்த்தி அமைச்சர்)
(The Hon. Sajith Premadasa - Minister of Housing and Samurdhi)
ගරු කථානායකතුමනි, වෝල්ට් විට්මන් කියන දාර්ශනිකයා එක් අවස්ථාවක මෙසේ ප්‍රකාශ කර තිබෙනවා,

I quote:

"The greatest country, the richest country, is not that which has the most capitalists, monopolists, immense grabbings, vast fortunes, with its sad, sad soil of extreme, degrading, damning poverty, but the land in which there are the most homesteads, freeholds - where wealth does not show such contrasts high and low, where all men have enough - a modest living - and no man is made possessor beyond the sane and beautiful necessities."

එයින් කියැවෙන්නේ, "වඩාත්ම උසස්, පොහොසත් රට වනුයේ, එක් පසෙකින් සීමාවකින් තොරව, මනුෂ්‍ය තත්ත්වයට නොගැළපෙන්නා වූ කාලකණ්ණි දුගීභාවය රජ කරන අතර, අනෙක් පසින් වඩාත් ධනවාදීන්ගෙන්, ඒකාධිකාරීන්ගෙන් බරපතළ ලෙස සම්පත් කඩා වඩා ගැනීම්වලින් යුත් රටක් නොව, ධනය මඟින් උස්-පහත් භේදයක් ඇති නොකරන, සියලු මිනිසුන් හට ප්‍රමාණවත් හා සාධාරණ, තෘප්තිමත් ජීවිතයක් ගත කළ හැකි හා කිසිවෙකුට හෝ තම සැබෑ අවශ්‍යතාවන් ඉක්මවා යන සම්පත් හිමිකමක් නොලැබෙන, බොහෝ අය හට ගෙවතු හා දේපළ පිළිබඳ නිදහස් අයිතියක් හිමි වන්නා වූ භූමියකි." යන්නයි.

ගරු කථානායකතුමනි, එම වැදගත් සහ උතුම් අදහස් සමඟ මම ප්‍රකාශ කරන්නට කැමැතියි, ගරා වැටෙමින් පැවතුණු මාතෘ භූමිය තුළ අභිමානවත් නව ආරම්භයක් බිහි කිරීමට මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ සැදැහැවත් චින්තනය තුළින් අද මෛත්‍රී යුගයක් කරා යන මොහොතක, රනිල් වික්‍රමසිංහ ගරු අග්‍රාමාත්‍යතුමාගේ මෙහෙයවීම තුළ අද කුහකකම, උද්ධච්චකම, අහංකාරකම, වෛරය, ද්වේෂය, කුරිරුභාවය, මිලේච්ඡත්වය, රාජ්‍ය ත්‍රස්තවාදය තුරන් වුණු නව යුගයක නව ආරම්භයක් සිදු වනවාය කියන එක. එය මම මේ අවස්ථාවේ බොහොම සතුටින් ප්‍රකාශ කරන්නට කැමැතියි. විශේෂයෙන්ම මේක නව යුගය සනිටුහන් කරන නව අය වැයක්. පොඩි මනුස්සයාට සහන ලබා දෙන, සාමාන්‍ය ජනතාවට සෙත සලසන, අසාමාන්‍ය ලෙස සහන රැසක් පොදු ජනතාව වෙත ළඟා කරන, සමාජ සාධාරණත්වය මුදුන්පත් කර ගත් ධනාත්මක, ගුණාත්මක, හරාත්මක සංවර්ධන යෝජනා ක්‍රම රැසක් තුළින් රටේ ජීවත් වන සාමාන්‍ය ජනතාවට අතිශය විශාල අගයක් එකතු කරන අය වැයක්. එවැනි අය වැයක් පිළිබඳව මට කථා කරන්න ලැබීම ගැන මම බොහෝ සේ සතුටු වනවා.

ගරු කථානායකතුමනි, අද අපේ රටේ රාජ්‍ය ක්ෂේත්‍රය තුළ ආත්මගරුත්වය රැක ගනිමින්, ආත්මාභිමානය ශක්තිමත් කර ගනිමින්, අභිමානවත් ජනතා සේවාවක් ඉෂ්ට කිරීම සඳහා 14 ලක්ෂයක් වූ රාජ්‍ය සේවකයින් වෙනුවෙන් රුපියල් 10,000ක සහනයක් ලබා දෙන්නට, -රුපියල් 5,000ක් පෙබරවාරි මාසයේත්, ඉතිරි 5,000 ජූනි මාසයේත් ලබා දීමේ යෝජනාව ක්‍රියාත්මක කරන්නට- අද අපේ රජය කටයුතු කරමින් සිටිනවා. මේ දින 100 ඓතිහාසික විප්ලවය තුළ ගොවි ජනතාව විසින් වාණිජ බැංකුවලින් ලබා ගත් ණය -උපරිම වශයෙන් රුපියල් 100,000ක ණය ප්‍රාග්ධනය සඳහා- සියයට 50කින් කපා හැරීමට අපේ රජය කටයුතු කරමින් සිටිනවා. ඒ වාගේම වී වගාවේ නියැලෙන අපේ ලක්ෂ සංඛ්‍යාත ගොවි ජනතාවට රුපියල් 50ක සහතික මිලක්, අර්තාපල් ගොවියා වෙනුවෙන් රුපියල් 80ක සහතික මිලක්, තේ දළු කිලෝවක් වෙනුවෙන් රුපියල් 80ක සහතික මිලක්, රබර් කිලෝවක් සඳහා රුපියල් 350ක සහතික මිලක් යනාදී වශයෙන් අපේ රටේ කෘෂි කාර්මික ප්‍රජාවට අතිශය සහන රැසක් ලබා දෙන්නට කෙටි කාලයක් තුළ අපේ රජය සමත් වෙලා තිබීම සතුටට කරුණක්. ඒ වාගේම අපි හැමෝටම ආඩම්බරයට කරුණක්.

ගරු කථානායකතුමනි, අපි කිරි ලීටරයක මිල රුපියල් 10කින් වැඩි කර, රුපියල් 70ක සහතික මිලක් නියම කර තිබෙනවා. ගර්භිණී මවුවරුන් වෙනුවෙන් රුපියල් 20,000ක දීමනාවක් ලබා දීමට යෝජනා කර තිබෙනවා. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වියදම දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 3 දක්වා වැඩි කර තිබෙනවා.

සියලු රෝහල්වල බාහිර රෝගී අංශය 24 පැයම විවෘත කර තබන්නට යෝජනා කර තිබෙනවා. වකුගඩු රෝගීන් වෙනුවෙන් විශේෂ දීමනාවක් ලබා දීම සඳහා රුපියල් මිලියන 2,000ක් වෙන් කර තිබෙනවා. ධීවර ප්‍රජාවගේ රක්ෂණ යෝජනා ක්‍රමය තුළින් එක් ධීවරයකුට රුපියල් මිලියනයක ජීවිත රක්ෂණාවරණයක් ලබා දීමටත් යෝජනා කර තිබෙනවා. ඒ වාගේම රජයේ බැංකුවලට උකස් කරන ලද රුපියල් ලක්ෂ දෙක නොඉක්මවන වටිනාකමකින් යුත් ස්වර්ණාභරණ මත අය කරන පොලිය කපා හරින්නටත්, ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සතු ස්ථාවර තැන්පතු සඳහා සියයට 15ක ඉහළ පොලියක් ලබා දෙන්නටත් යෝජනා කර තිබෙනවා. මෙවැනි සහන රැසක් ඇතුළත් සහන මල්ලක් ජනතාවට ලබා දීම අතිශය ශක්තියක්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Order, please! ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
"පාර්ලිමේන්තුව අද දින පස් වරු 5.30 දක්වා පවත්වාගෙන යා යුතුය"යි මම යෝජනා කරමි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු සජිත් ප්‍රේමදාස මහතා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, සහන වට්ටෝරුව ගැන කියා ගෙන යන විටම තමයි පුංචි බාධාවක් ඇති වුණේ. කිසි ගැටලුවක් නැහැ. මෙවන් සහන රැසක් තුළින් අපේ රටේ ජීවත් වන ලක්ෂ 200ක් වූ ජනතාවට අපේ රජයෙන් සුවිශාල වූ සහන රැසක් ලබා දීලා තිබෙනවාය කියන එක බොහොම ආඩම්බරයෙන්, සාඩම්බරයෙන් යුතුව මම මේ අවස්ථාවේ දී ප්‍රකාශ කර සිටිනවා. ගරු කථානායකතුමනි, ඉතාමත්ම කෙටි කාලයක් තුළ, ඉතාමත්ම සීමිත කාල වකවානුවක් තුළ, සති දෙක තුනක් ඇතුළත මේ වාගේ සහන ලබා දෙන්නට අපේ රජයට පුළුවන්කම ලැබුණා නම්, ඉදිරි කාල වකවානුව තුළ දී ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාත්, ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් නායකත්වය දරන අපේ පක්ෂ දෙක තුළ තිබෙන මේ මහා ඓතිහාසික දේශපාලනික සංහිඳියාව තුළ මේ සාර්ථක රාජ්‍ය පාලන ගමන ඉදිරියට යන කොට කොයි තරම් විශාල සහන මල්ලක් අපේ රටේ ජනතාවට ඉදිරියේ දී ලැබෙයි ද කියන එක ගැන රටේ ජනතාවට පැහැදිලි පිරිසිදු විශ්වාසයක් හිතේ තබා ගන්නට පුළුවන් කියන කාරණයත් මම කියන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, අපේ රජය බලයට ඇවිල්ලා පළමු වැනි දින කිහිපය තුළ පෙට්‍රල් මිල රුපියල් 33කින් අඩු කළා; ඩීසල් මිල රුපියල් 16කින් අඩු කළා; භූමිතෙල් මිල රුපියල් 16කින් අඩු කළා. ගරු කථානායකතුමනි, අපේ රජය බලයට පත් වෙලා දින කිහිපයක් තුළ පෙට්‍රල් මිල රුපියල් 33කින් අඩු කරන්නට, ඩීසල් මිල රුපියල් 16කින් අඩු කරන්නට, භූමිතෙල් මිල රුපියල් 16කින් අඩු කරන්නට පුළුවන්කම ලැබුණා නම්, මේ මිල අඩු කිරීම හිටපු ආණ්ඩුවට කරන්න බැරි වුණේ ඇයි කියලා මට ලොකු ප්‍රහේළිකාවක් තිබෙනවා. හිටපු ජනාධිපතිතුමාට මේ වාගේ මිල අඩු කිරීමක් කරන්නට බැරි වුණේ ඇයි ?

ගරු කථානාකතුමනි, පසු ගිය කාලයේ සිදු වුණේ මොකක්ද? අනවශ්‍ය ලෙස ජනතාවගේ හිස මත බර පටවලා, පීඩනය දමලා, අසහනය පටවලා සිදු වුණු එකම දේ තමයි පාලකයෝ සුර සැප විඳපු එක. ජනතා අරමුදල් ගසා කෑවා. මහා භාණ්ඩාගාරයේ සීමිත සම්පත් හොරා කෑවා. අපි පැහැදිලිවම දන්නවා අරලිය ගහ මන්දිරය හැඳින්වූයේ "අරලිය ගහ මන්දිරය" හැටියටයි. නමුත් අද අරලිය ගහ මන්දිරයට යන කොට අරලිය ගහ මන්දිරයේ දිව්‍ය ලෝකයක් බිහි වෙලා තිබෙනවා. ජනාධිපති මන්දිරයක් නොවෙයි තිබෙන්නේ, ජනාධිපති දිව්‍ය ලෝකයක් බිහි වෙලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, පෙර පාසල් දරුවාගේ කිරි වීදුරුව කපලා;

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

පාසල් දරුවාගේ දිවා ආහාරය කපලා; ගර්භණී මවගේ පෝෂණ මල්ල කපලා; ගොවියාට ලබා දෙන සහන ටික කපලා; ධීවරයාගේ ඉන්ධන සහනාධාරය කපලා; ධීවරයාගේ නිවාස සහනාධාරය කපලා; කම්කරුවාගේ අයිතිය කපලා; වැටුප් කපලා; සහන කපලා; සුභසාධනය කපලා තමයි මේ මහා සම්පත් නාස්තිය, සම්පත් සූරා කෑම, මේ මහා දිව්‍ය ලෝක බිහි වීම සිදු වුණේ. 24 පැයේම, 365 දවසේම ලක්ෂ 200ක් වූ අපේ රටේ ජනතාවගේ සහන මල්ල කපලා තමයි අරලියගහ දිව්‍ය ලෝකය බිහි වුණේ; ජනාධිපති දිව්‍ය ලෝකය බිහි වුණේ.

ගරු කථානායකතුමනි, අපේ රජයට පුළුවන්කම ලැබුණා, පෙට්‍රල් මිල රුපියල් 33කින් අඩු කරන්න; ඩීසල් මිල රුපියල් 16කින් අඩු කරන්න; භූමි තෙල් මිල රුපියල් 16කින් අඩු කරන්න. මේ ලබා දෙන සහන රැල්ල, මේ ලබා දෙන සහන සුනාමිය මෙතැනින් අපි නතර කරන්නේ නැහැ. ඉදිරියේදී අපි බලාපොරොත්තු වෙනවා තවත් සහන සුනාමියක් තුළින් මේ රටේ ජනතාව ජීවත් කරවලා, පෝෂණය කරවලා ඔවුන්ට රැකවරණය, ශක්තිය ලබා දෙන්න. ඒ අයට උපරිම සහන ටික ලබා දීලා, මේ රටේ සුබසාධන රාජ්‍ය ව්‍යවස්ථාපිත කරලා, නීත්‍යානුකූල කරලා මේ රටේ බිහි වන ඓතිහාසිකම සුබසාධන යුගය, සහන ලබා දීමේ යුගය අපි නුදුරු අනාගතයේදී රට තුළ නිර්මාණය කරන්නට සැදී පැහැදී සිටිනවාය කියන එක ඉතාමත් ආඩම්බරයෙන් මා මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මම මේ අවස්ථාවේ ප්‍රවේශ වෙන්න කැමැතියි, විෂය භාර ඇමතිවරයා හැටියට සමෘද්ධි ක්ෂේත්‍රයට. එහෙම නැත්නම් අලුත් නාමයෙන් හඳුන්වන දිවි නැඟුම ක්ෂේත්‍රයට. මේ විවාදය තුළ සමෘද්ධි ක්ෂේත්‍රය පිළිබඳව අපේ හිතවත් ගරු සරණ ගුණවර්ධන මැතිතුමා අදහස් ඉදිරිපත් කරමින් ප්‍රශ්න වගයක් යොමු කරලා තිබෙනවා. චන්ද්‍රිකා ජනාධිපතිතුමියගේ සමයේ සමෘද්ධිලාභී පවුල් ලක්ෂ 18ක් හිටියාලු, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ සමයේ සමෘද්ධිලාභී පවුල් ලක්ෂ 14ක් හිටියාලු, මෛත්‍රීපාල යුගය තුළ සමෘද්ධි සහනාධාරය සියයට 200කින් වැඩි වෙනකොට අර සමෘද්ධිලාභී පවුල් ලක්ෂ 14 කැපෙනවාද කියලා එතුමා අහනවා. මම මේ අවස්ථාවේ පැහැදිලිවම කියන්න කැමැතියි, සමෘද්ධි සහනාධාරය සියයට 200කින් වැඩි වෙනකොට කිසිම සමෘද්ධිලාභියෙකුගේ ප්‍රතිලාභයක් අපි කප්පාදු කරන්නේ නැහැ කියලා. සියයට 200ක වැඩි කිරීම අපි සමෘද්ධිලාභී පවුල් ලක්ෂ 14ටම ලබා දෙනවාය කියන එක මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

එපමණක් නොවෙයි, වසර 21ක් තුළ තමන්ගේ දේශපාලන මතිමතාන්තර නිසා විවිධ පක්ෂවලට සම්බන්ධ වෙලා හිටපු සාමාජිකයන්ට දේශපාලන පළිගැනීම් තුළ සමෘද්ධි සහනාධාරය අහිමි වුණා. අපට බොරුවට කියන්න බැහැ, දින 100ක් ඇතුළත ඒ කැපුණු සහනාධාරය ලබා දෙනවාය කියලා. දේශපාලන පළිගැනීම් නිසා සමෘද්ධි සහනාධාරය අහිමි වුණු සියලුම පක්ෂවල සාමාජිකයන්ට; සමෘද්ධි සහනාධාරය ලබන්නට සුදුසුකම් තිබෙන සියලුම දෙනාට ඉදිරි මාස හත අට තුළ අලුත් සමෘද්ධි සහනාධාරය ලබා දෙන්නට අපේ රජය ඇප කැප වෙනවාය කියන එක මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

ගරු කථානායකතුමනි, සමෘද්ධි සහනාධාරය ගැන කථා කරන කොට, අද වන විට ගමේ ඉන්න මිනිස්සුන්ට සමෘද්ධි සහනාධාරය දිය යුතුද නැද්ද කියන එක තීන්දු කරන්නේ කවුද කියා මම අහනවා. ඒක තීන්දු කරන්නේ සමෘද්ධි සංවර්ධන නිලධාරිතුමා. එහෙම නැත්නම් දිවි නැඟුම නිලධාරිතුමා. මේ අය තමයි තීන්දු කරන්නේ, කාටද අර මුද්දරය ලැබෙන්නේ, කාටද මේ මුද්දරය ලැබෙන්නේ, කාටද මුද්දරය කැපෙන්න ඕනෑ, කාටද මුද්දරය ලැබෙන්න ඕනෑ කියලා. තනි පුද්ගලයායි තීන්දු කරන්නේ. ගරු කථානායකතුමනි, අද නිල් පාට වෙලා තිබෙන සමෘද්ධි ක්ෂේත්‍රය අපි කොළ පාටවත්, රතු පාටවත් කරන්න යන්නේ නැහැ. අපි ඒක සුදු පාට කරන්නට යනවා. නිර්පාක්ෂික කරන්නට යනවා. කොහොමද අපි ඒක කරන්නේ?

මින් ඉදිරියට සමෘද්ධි සහනාධාරය ලැබීමට සුදුසුකම් තිබෙන පුද්ගලයින් තෝරන්නේ ගමේ ඉන්න ප්‍රජාව, සමෘද්ධි නිලධාරිවරයා, ග්‍රාම නිලධාරිවරයා, කෘෂිකර්ම -කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරයා- ඒ වාගේම ආර්ථික සංවර්ධන නිලධාරිවරයා සහ ප්‍රාදේශීය ලේකම්. රාජ්‍ය නිලධාරින් සියලු දෙනාම වග කියන්නට ඕනෑ, සමෘද්ධි සහනාධාර ලැයිස්තුවට. ඒ ලැයිස්තුව ඉස්සෙල්ලාම ප්‍රසිද්ධ කරනවා. ප්‍රසිද්ධ කර විරෝධතා එල්ල කරන්න ගමේ පුද්ගලයින්ට අවස්ථාව ලබා දෙනවා. ගමේ සිටින සෝමදාස මුදලාලි මහත්තයාට මුද්දරේ දීලා, පොල් අතු පැලේ සිටින කුසුමාවතී නැන්දාට මුද්දරේ අහිමි කර තිබෙනවා නම්, කොයි පුද්ගලයාටද මුද්දරය ලැබෙන්නට ඕනෑ කියා ප්‍රජාවට පුළුවන් තීන්දු කරන්න. කවුද දුප්පත්, කවුද පොහොසත් කියන එක මින් ඉදිරියට තීන්දු කරන්නේ දිවි නැඟුම නිලධාරී නොවෙයි, සමෘද්ධි නිලධාරී නොවෙයි, ගමේ ඉන්න ප්‍රජාව. කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරයා, ග්‍රාම නිලධාරී, සමෘද්ධි නිලධාරී, ආර්ථික සංවර්ධන නිලධාරී සහ ප්‍රාදේශීය ලේකම් කියන රාජ්‍ය නිලධාරින් සියලුම දෙනාම අත්සන් තබන්නට ඕනෑ, ඒ සුදුසුකම් ලබන ලැයිස්තුවට. බැරි වෙලාවත් වැරැදි විධියට ලැයිස්තු හදලා තිබෙනවා නම් රාජ්‍ය නිලධාරින් පස් දෙනාම අමාරුවේ වැටෙනවා. මේ වාගේ තද නීති-රීති දමලා මෙතෙක් කල් නිල් පාට වෙලා තිබුණු, මෙතෙක් කල් බුලත් කොළේට ගැතිකම් කරපු සමෘද්ධි ව්‍යාපාරය අප නිර්දේශපාලනීකරණය කරනවාය කියන කාරණය බොහොම සතුටින් ප්‍රකාශ කරනවා.

පසු ගිය ජනාධිපතිවරණය පැවැති කාලයේදී හරක් පටවනවා වාගේ සමෘද්ධිලාභීන් CTB බස්වල පටවලා රැස්වීම්වලට ගෙන ගියා. රැස්වීම්වලට ආවේ නැත්නම් රුපියල් 2,500 කපනවා, අරකට ආවේ නැත්නම් මුද්දරය කපනවා, මේකට ආවේ නැත්නම් මේ වරදානය දෙන්නේ නැහැ, මේ වරප්‍රසාදය දෙන්නේ නැහැ, මේ ප්‍රතිලාභය දෙන්නේ නැහැ කියපු ක්‍රමය සඳහටම අප අවසන් කරනවා. මින් ඉදිරියට පක්ෂය කුමක් වුණත්, කොයි පක්ෂය රාජ්‍ය බලයේ හිටියත් කිසිම මැති ඇමතිවරයෙකුට, කිසිම ජනාධිපතිවරයෙකුට, කිසිම අගමැතිවරයෙකුට, නිලතල බලතල හොබවන කිසිම කෙනෙකුට ඒ ආකාරයට කටයුතු කරන්න දෙන්නේ නැහැ.

මේ රටේ දිවි නැඟුම සහන ලබන, සමෘද්ධි සහන ලබන සුවහසක් දුප්පත් ජනතාව දේශපාලන ඉත්තන් කරපු ඒ යුගය අවසන් කරලා සැබැවින්ම ඒ අයට නිදහස්, නිවහල් ජීවිතයක් ගත කිරීමේ යුගය අප බිහි කරනවාය කියන කාරණය ඉතාමත්ම සතුටින් සහ අභිමානයෙන් මා මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා. වර්තමානයේ සිටින සමෘද්ධිලාභී පවුල් ලක්ෂ 14ටම සියයට දෙසීයකින් සමෘද්ධි ප්‍රතිලාභය වැඩි කරනවා පමණක් නොවෙයි, ඉදිරි මාස හත අට තුළ දේශපාලන භේදයෙන් තොරව, එනමුත් දේශපාලනය නිසා මුද්දරය කැපුණු, මුද්දරය ලබන්නට සුදුසුකම් තිබුණු, දේශපාලන ගැතිකම් නොතිබුණු, දේශපාලන වරදාන, වරප්‍රසාද නිසා සහන කප්පාදු වුණු සියලුම දෙනාට පැහැදිලිවම නව මුද්දර ලබා දෙන්නටත් අප සැදී පැහැදී සිටිනවාය කියන කාරණය සරණ ගුණවර්ධන හිටපු නියෝජ්‍ය ඇමතිතුමාට - වර්තමාන මන්ත්‍රීතුමාට- ඉතාමත්ම සතුටින් මා මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

ගරු කථානායකතුමනි, සමෘද්ධි ක්ෂේත්‍රය තුළ බරපතළ අක්‍රමිකතාවන්, බරපතළ හොරකම්, බරපතළ ලෙස ජාතික ධනස්කන්ධය කොල්ලකෑමේ ක්‍රියාවලියන් රැසක් ක්‍රියාත්මක වෙලා තිබෙන බව කනගාටුවෙන් හෝ කියන්නට ඕනෑ. නමුත්

ඒවා පිළිබඳව අප පෞද්ගලික මඩ ගැසීම් කරන්නට ලෑස්ති වන්නේ නැහැ. විශේෂයෙන්ම ජාත්‍යන්තර කීර්තියට පත් Ernst & Young සහ PricewaterhouseCoopers ජාත්‍යන්තර විගණන සමාගම් දෙක උපයෝගී කර ගෙන රජයට, රටට - මාතෘ භූමියට- රුපියලක, සත පහක බරක් නැතිව, ඒ අයගේ සමාජ සත්කාරක වැඩසටහනක් හැටියට නොමිලයේ මේ අමාත්‍යාංශ දෙක පිළිබඳව අපක්ෂපාතී විගණනයක් කරන්න අප වැඩ කටයුතු ආරම්භ කර තිබෙනවා. ඒ විගණනය යන අතරතුර පසු ගිය කාලයේ සිදු වුණු අක්‍රමිකතාවන් රැසක් පිළිබඳව තොරතුරු මටත් එළි දක්වන්න සිද්ධ වනවා. හරියටම ජනාධිපතිවරණය ක්‍රියාත්මක වන යුගයේ දිවි නැඟුම මහා සම්මේලනයක් පැවැත්වූවා. දිවි නැඟුම මහා සම්මේලනය පවත්වන්නට නම් දිවි නැඟුම ග්‍රාමීය සංවිධාන බිහි කර සම්පූර්ණ වෙන්නට ඕනෑ. නමුත් ග්‍රාමීය සංවිධාන සම්පූර්ණ කර තිබුණේ නැහැ.

හදිසියේම දිවි නැඟුම සම්මේලනය ක්‍රියාත්මක වුණේ වෙන මොකක් නිසාවත් නොවෙයි, ජනාධිපතිවරණය නිසායි. මේ දිවි නැඟුම සම්මේලනය තිබුණේ කොහේද? නොවැම්බර් මස 21වැනි දා කැම්බල් පිටියේයි. ගරු කථානායකතුමනි, පොඩ්ඩක් හිතලා බලන්න. මේ දිවි නැඟුම සම්මේලනයට විය හියදම් කරලා තිබෙන්නේ සමෘද්ධිලාභීන්ට දෙන්න තිබුණු සල්ලි; සමෘද්ධිලාභියා වෙනුවෙන් කරන්න තිබුණු සංවර්ධන වැඩ සඳහා යොදවන්න තිබුණු සල්ලි; සමෘද්ධිලාභියාගේ ශුභ සිද්ධිය සඳහා වෙන් කළ සල්ලි. ඒ දවසට විතරක් රුපියල් මිලියන 63ක් -රුපියල් ලක්ෂ 637ක්- විය හියදම් කරලා තිබෙනවා. බලන්න ගරු කථානායකතුමනි, 37,590ක් ගෙන්වන්න රුපියල් මිලියන 24ක් -රුපියල් ලක්ෂ 240ක්- වියදම් කරලා තිබෙනවා. රැස්වීමට පැමිණි ප්‍රජා මූල නියෝජිතයින්ගේ සංග්‍රහ වියදම් සඳහා රුපියල් මිලියන 20ක් -රුපියල් ලක්ෂ 203ක්- වියදම් කරලා තිබෙනවා. පුවත් පත් දැන්වීම් වෙනුවෙන් රුපියල් ලක්ෂ 24ක් වියදම් කරලා තිබෙනවා. පුළුල් ඩිජිටල් තිර හයක් සපයා ගන්න විතරක් රුපියල් ලක්ෂ 10ක් වියදම් කරලා තිබෙනවා. මේ කාගේ සල්ලිද? සමෘද්ධිලාභීන් වෙනුවෙන් වැය කරන්න තිබුණු සල්ලි. ඒ වාගේම රැස්වීමට ගෙන්වූ ප්ලාස්ටික් පුටු වෙනුවෙන් රුපියල් ලක්ෂ 74ක් වැය කරලා තිබෙනවා. එක දවසෙන් සමෘද්ධිලාභීන්ගේ සල්ලිවලින් රුපියල් ලක්ෂ 630කට විදලා තිබෙනවා. මොකක් නිසාද? ජනාධිපතිවරණය නිසායි; ජනාධිපතිවරණය ජයග්‍රහණය කිරීම සඳහායි.

ගරු කථානායකතුමනි, අපි ක්‍රියාත්මක කරන මේ නිර්දේශපාලන ක්‍රමය තුළ කිසිම දවසක මොනම රජයකටවත් -මොනම ආණ්ඩුවකටවත්- රජයේ මුදල් වැය කරලා, සමෘද්ධිලාභීන්ගේ සල්ලි වැය කරලා මේ වාගේ දේවල් කරන්න බැහැ. මේ රටේ සල්ලි, දුප්පතාගේ සල්ලි, මහා භාණ්ඩාගාරයේ සල්ලි, පොදු ජනයාගේ සල්ලි විනාශ කරන යුගය අපි අවසන් කරනවා කියන එක බොහොම සතුටින් මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම නිවාස ක්ෂේත්‍රය ගත්තොත් ඒකත් බොහොම වේදනීය තත්ත්වයකට පත් වෙලායි තිබෙන්නේ. නිවාස ක්ෂේත්‍රයට යොදවන්න -ගෙවල් හදන්න- තිබුණු සල්ලි, කුලියට වාහන hire කරලා දේශපාලන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න උපයෝගී කර ගෙන තිබෙනවා. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් පමණක් වාහන 33ක් කුලියට අරගෙන තිබෙනවා. නිවාස හදන්න තිබුණු සල්ලි වියදම් කරලා මාසික කුලියට වාහන 33ක් අරගෙන තිබෙනවා, දේශපාලනය කරන්නට; දේශපාලන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්නට; ප්‍රතිරූප පුම්බන්නට. මම සන්තෝෂයෙන් කියන්න කැමැතියි ගරු කථානායකතුමනි, නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය තුළ මින් ඉදිරියට වෙළෙඳ දැන්වීම් නැති බව; ප්‍රතිරූප පුම්බන වෙළෙඳ දැන්වීම් නැති බව; අනවශ්‍ය වියදම් නැති බව; යාන වාහන කුලියට ගන්නේ නැති බව. රජයේ වාහන උපයෝගී කර ගෙන මම මාගේ දේශපාලන ව්‍යාපෘති කරන්නේ නැහැ. ගරු කථානායකතුමනි, මාගේ වාහන තුනත් මම රජයට දන් දීලායි තිබෙන්නේ. මාගේ පඩියත් මම දන් දීලායි තිබෙන්නේ. නිල නිවාසයත් දන් දීලායි තිබෙන්නේ. මොනවාටද? රට තුළ ගෙවල් ටික හදන්න. ගරු කථානායකතුමනි, ඔබතුමාටත් අවබෝධ වීම සඳහා මම මේ කරුණු කාරණා ඉදිරිපත් කරන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, ජනාධිපතිවරණය තුළ තවත් මහා මුදල් විනාශයක් සිදු වෙලා තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමාට තවත් විනාඩි 5ක කාලයක් තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට සම්පූර්ණයෙන්ම විනාඩි 30ක් තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ විනාඩි 30 ගැන තමයි මම කිව්වේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හොඳයි. ගරු කථානායකතුමනි, ජනාධිපතිවරණය තුළ තවත් මුදල් නාස්තියක් සිදු වෙලා තිබෙන බව කනගාටුවෙන් හෝ කියන්නට ඕනෑ. මාර්තු, අප්‍රේල් මාසවල මුද්‍රණය කරන්නට තිබුණු ලිත මෙදා පාර මුද්‍රණය කරලා තිබෙන්නේ නොවැම්බර්, දෙසැම්බර් මාසවල. ලිත් ලක්ෂ 50ක් මුද්‍රණය කර තිබෙනවා. ලිත් ලක්ෂ 50ක් වෙනුවෙන් රුපියල් මිලියන 26ක් වැය කරලා තිබෙනවා. මේ රුපියල් මිලියන 26 කාගේ සල්ලිද? දුප්පතාගේ සල්ලි. පොදු ජනතාවගේ සල්ලි. මහා භාණ්ඩාගාරයේ සල්ලි.

ඒ විතරක් නොවෙයි ගරු කථානායකතුමනි, ඡන්දය කාලයේදී "ඉසුරුමත් නිවහනක්" කියලා රුපියල් 2,500 ගණනේ බෙදා බෙදා ගිය බව ඔබතුමාත් දන්නවා. රුපියල් 2,500ක් බෙදුවාට අපට කිසි ප්‍රශ්නයක් නැහැ. රුපියල් 2,500ක් නොවෙයි, 25,000ක් නොවෙයි, 250,000ක් බෙදුවත් ප්‍රශ්නයක් නැහැ. නමුත් සල්ලි අර ගෙන තිබෙන්නේ කොහෙන්ද? සමෘද්ධිලාභීන්ගේ අනිවාර්ය ඉතිරි කිරීම්වලින්. මහා භාණ්ඩාගාරයේ සල්ලි නොවෙයි. අනිවාර්ය ඉතිරි කිරීම් කියලා සමෘද්ධි ලාභියාගේ මුද්දරයෙන් හැම මාසයකම කැපෙන සල්ලි ටික, පොඩි මිනිහාගේ සල්ලි ටික තමයි අර රුපියල් 2,500 දෙන්න අර ගෙන තිබෙන්නේ. මෙන්න සිදු වෙලා තිබෙන දේවල්.

ඒ විතරක් නොවෙයි. ගරු කථානායකතුමනි, 2014 අවුරුද්ද -පසු ගිය අවුරුද්ද- වෙනුවෙන් නිවාස සංවර්ධන අධිකාරිය රුපියල් ලක්ෂ 67ක් වියදම් කරලා කුලියට වාහන අරගෙන තිබෙනවා. නිකමට හිතලා බලන්න, වාහන කුලියට ගන්න රුපියල් ලක්ෂ 67 වියදම් කරන්නේ නැතිව, පුද්ගලයින්ට ගෙවල් ටික හදලා දෙන්න රුපියල් ලක්ෂය, ලක්ෂය ගණනේ අපට දෙන්න තිබුණා නේද? මෙන්න ගරු කථානායකතුමනි, සිදු වෙලා තිබෙන මහා මුදල් විනාශය. ඉදිරි කාලයේ මේවා පිළිබඳව යථාර්ථවාදී තොරතුරු එළි දැක්වෙන කොට, සත්‍යවාදීව මේ උත්තරීතර සභාවට ඉදිරිපත් කරන්නට මම බලාපොරොත්තු වෙනවාය කියන එක මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

එහෙම නම් විශේෂයෙන්ම මම මගේ කතාව අවසන් කරන්නේ ධම්මපදයේ වැදගත් දේශනයක් අවධාරණය කරමිනුයි කියන කාරණය මම ඔබතුමාට කියන්න කැමැතියි..

අසාරෙ සාරමතිනො - සාරෙ චාසාරදස්සිනො

තෙ සාරං නාධිගච්ඡන්ති - මිච්ඡාසඞ්කප්පගොචරා

ගරු කථානායකතුමනි, "නිසරු දේ සරු කොටත්, සරු දේ නිසරු කොටත් දකින්නා වූ වැරදි කල්පනාවල එල්බුණු පුද්ගලයෝ සරු දෙයක් -දහමක්- නොලබත්". එහෙම නම්, මොනම හේතුවකටවත් නිසරු දේ සරු කළේත් නැහැ, සරු දේ නිසරු කළේත් නැහැ. පැහැදිලිවම රට මුහුණ දෙන යථාර්ථය පිළිබඳවයි මම අද ප්‍රකාශ කළේ.

විශේෂයෙන්ම අද වාගේ දවසක අපේ ශ්‍රීමත් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ නායකත්වයෙන්, ඒ වාගේම ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ මහ පෙන්වීම තුළ අපි සැබෑ සංහිඳියාවක් ඇති කර ගෙන, පැහැදිලිවම වචනයට සීමා වුණු නව දේශපාලන සංස්කෘතියක් නොවෙයි, පොළොව මට්ටමේ, බිම් මට්ටමේ, වීදි මට්ටමේ, පාරවල් මට්ටමේ, නිවෙස් මට්ටමේ, පුද්ගලයා මට්ටමේ මේ රට තුළ යහ පාලනයක්, සැමටම සමෘද්ධිමත් දේශයක්, සැමටම සර්ව සාධාරණ සෞභාග්‍යයක් උදා කරන යුගයක් කරා යන්නට මූලික අඩිතාලම අපි දමලා තිබෙනවා. විශේෂයෙන්ම විසිහතර පැයම, තුන්සියහැටපස් දවසම ඒ උතුම් ඉලක්ක කරා යන්නට අපි ජීවිත පරිත්‍යාගයෙන් ඇප වෙනවා, කැප වෙනවා කියන එක ප්‍රකාශ කරමින්, මට වේලාව ලබා දුන් ගරු කථානායකතුමාට ස්තුතිය පුද කරමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 1.45]

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මේ අය වැය විවාදය අවස්ථාවේදී කරුණු කිහිපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. ගරු සජිත් ප්‍රේමදාස ඇමතිතුමා විශේෂයෙන් සමෘද්ධි ව්‍යාපාරය ගැන ප්‍රධාන කරුණක් කිව්වා. මගේ කරුණු ඉදිරිපත් කිරීමට පෙර ඒ කරුණ ගැන පමණක් කතා කරන්නට මම කැමැතියි. මුල් අවස්ථාවේදී සමෘද්ධි ව්‍යාපාරයේ අපේ නිලධාරින් විසින් තෝරා ගත්ත ලැයිස්තුවලින් සෑහෙන ප්‍රමාණයක් ඉවත් වුණේ 2001 වර්ෂයේ ඔබතුමන්ලාගේ එක්සත් ජාතික පක්ෂ රජය බලයට ආවාට පසුවයි. ඊට පස්සේ 2004 වර්ෂයේ ඉඳලා මේ දක්වා අපි ආණ්ඩු කළත්, අපි කවුරුවත් කපලාවත්, කවුරුවත් ඇතුළු කරලාවත් නැහැ. යම් යම් අය ඒ ලැයිස්තුවලට ඇතුළු කරන්න කියලා අපට ඉල්ලීම් විශාල ප්‍රමාණයක් ලැබුණා. නමුත් ඒ අවස්ථාවලත් අපට ඒක කර ගන්න පුළුවන් වුණේ නැහැ. මොකද, ඇත්තටම තමුන්නාන්සේලා අවසානයට සකස් කරපු ලැයිස්තුවට අතිරේකව, යම් කිසි කෙනෙක් සමෘද්ධියක් ඉවත් කර ගත්තා නම් ඒ වෙනුවට කවුරු හෝ ඇතුළු කළා මිසක්, මුළු වශයෙන් ඇතුළු කරන්න බැරි වුණා. ඒ නිසා ඒ සමෘද්ධි ලැයිස්තුවල ඉන්නේ ඔක්කෝම අපේ පාක්ෂිකයෝ කියන තර්කය සම්පූර්ණයෙන් වැරැදියි. ඒ තර්කය අනුව මම කියනව, ඒ ලැයිස්තු ඇතුළේ විවිධ පක්ෂවල අය ඉන්නවා කියලා. ඒ අය තමුන්නාන්සේලා විසින්ම, නිසි ලෙස ඔය විධියේම ගණනයක් කරලා තෝරා ගත්ත පිරිසක්. එදා නම් තමුන්නාන්සේලාගේ ශාඛා සමිතියේ සභාපතිවරයා හෝ ලේකම්වරයා, ගමේ පන්සලේ හාමුදුරුවෝ ඇතුළු පිරිසක් හිටියේ. නමුත් යම් සංශෝධනයක් කරනවා නම් ඒ සංශෝධනය වෙනුවෙන් ඊට වඩා ක්‍රමවත් වැඩ පිළිවෙළක් යොදා ගන්නට ඉදිරිපත් වීම ගැන මම සන්තෝෂ වනවා. ඒ වාගේම තව පිරිසක් ඒකට එකතු වෙන්න අවශ්‍යයි කියන කාරණය අපි කියන්න කැමැතියි. සමෘද්ධි දීමනාව අපිත් විවිධ අවස්ථාවල වැඩි කළා. ඊටත් වඩා වැඩි දීමනාවක් තමුන්නාන්සේලා ලබා දෙනවා නම් ඒ ගැන අපේ කිසිම විරෝධතාවක්, අසන්තෝෂයක්, ඊර්ෂ්‍යාවක්, වෛරයක්, කනගාටුවක්, දුකක් නැති බව මම මේ අවස්ථාවේදී ඔබතුමන්ලාට ඉතාම ආදරයෙන් කියන්න කැමැතියි.

ඒ වාගේම මා මතක් කරන්න කැමැතියි, මේ අය වැය ලේඛනය කියන්නේ තමුන්නාන්සේලා ඉදිරිපත් කරන අය වැය ලේඛනයක් පමණක් නොවෙයි කියන එක. විශේෂයෙන් හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා 2015 වසර සඳහා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු අය වැයට ගෙනෙන සංශෝධනයක් හැටියට තමයි තමුන්නාන්සේලා මේ අය වැය ඉදිරිපත් කරන්නේ. අපි රාජ්‍ය සේවකයන්ට යම් ප්‍රමාණයක පඩි වැඩි කිරීමක් කළා නම්, තමුන්නාන්සේලා ඒකට තව ටිකක් වැඩි කරලා තිබෙනවා. විශ්‍රාම වැටුපටත් තමුන්නාන්සේලා තව මුදලක් වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම වැඩිහිටියන්ගේ ගිණුම්වලට දෙන පොලී මුදල සඳහා අපි යෝජනා කරපු ප්‍රමාණයට වඩා ටිකක් වැඩි කරලා තිබෙනවා. ඒ විධියට ගණන් හදලා බලනවා නම් අපි කරපු දේම තමයි, අපි ලබා දීපු සහනම තමයි තමුන්නාන්සේලාත් දීලා තිබෙන්නේ. ඒ නිසා මේ අය වැය පිළිබඳව අපේ විරෝධතාවක් නැහැ. නමුත් මේ අය වැය පිළිබඳව කරුණු ගණනාවක් දැනුම් දීමට මා මෙය අවස්ථාව කර ගන්නවා.

විශේෂයෙන්ම මා කථා කරන්න කැමැතියි, දෙමුහුන් වාහනවලට ගහලා තිබෙන tax එක පිළිබඳව. අපි බලන්න ඕනෑ, මේ දෙමුහුන් වාහන කියන්නේ මොනවාද කියලා. ඇයි මේ දෙමුහුන් වාහනවලට එක තීරු ගාස්තුවකුත්, අනෙකුත් වාහනවලට තවත් තීරු ගාස්තුවකුත් දුන්නේ? ඒ කියන්නේ සාමාන්‍ය ඩීසල්, පෙට්‍රල්වලින් ධාවනය වන වාහනවලට එක තීරු ගාස්තුවකුත්, දෙමුහුන් වාහනවලට තව තීරු ගාස්තුවක් පනවා තිබෙනවා. ඔබතුමන්ලා දන්නවා, පසු ගිය අවුරුදු 5, 6 ඇතුළත ලෝකයේ තාක්ෂණයේ විශේෂ දියුණුවක් වූ බව. ඒ අනුව, ඉන්ධනවලින්ම දුවන එන්ජින් වෙනුවට එහෙම නැත්නම් දෙමුහුන් -hybrid- එන්ජිමක් සකස් කරලා ලෝකයට ඉදිරිපත් කළා. එහි එක අරමුණක් වුණේ ඉන්ධන දහනය අඩු කිරීමයි.

ඊළඟ කාරණාව වුණේ, ඉන්ධන දහනයෙන් පිට වන වායු ප්‍රමාණය අඩු කරන එකයි. පසු ගිය කාලයේ කාබන්ඩයොක්සයිඩ් වැඩිවීමෙන් උෂ්ණත්වය ඉහළ යෑම පිළිබඳ තර්කයක් ලෝකය පුරාම තිබුණා. ඒකට ආපු උත්තරයක් හැටියට තමයි මේ වාහන ආවේ. ඒ පරිසරාත්මක කරුණු නිසා, මා එවකට පරිසර ඇමතිවරයා හැටියට භාණ්ඩාගාරයට ඉදිරිපත් කරපු යෝජනාවක් පිළිබඳ දිගු සාකච්ඡාවකින් පසුව තමයි එවකට හිටපු මුදල් ඇමතිතුමා -හිටපු ගරු ජනාධිපතිතුමා- වාහන සඳහා ද්විත්ව බදු ක්‍රමයක් ක්‍රියාත්මක කළේ. ඒ අනුව පෙට්‍රල් සහ ඩීසල් වාහන සඳහා එක බදු ක්‍රමයකුත්, දෙමුහුන් වාහන සඳහා තව බදු ක්‍රමයකුත් ක්‍රියාත්මක කළා. ඒ නිසා ඒ ක්‍රමය ඇති කිරීමේ යම් කිසි පරමාර්ථයක් තිබුණා. නමුත් අද තාක්ෂණය මොකක්ද? අද තාක්ෂණය අනුව මේ වාහන එන්ජින් කොටස් තුනකින් එනවා. ඒ කියන්නේ, දෙමුහුන් වාහනවලට එකතු වනවා, තව electric එන්ජිමකුත්. දැන් අලුතින්ම එන වාහනයේ battery එක ගෙදර තිබෙන plug එකට ගැහුවාම පැය හතරෙන් charge වෙනවා. කිලෝමීටර් 50ක් ඒ බැටරියෙන් යන්න පුළුවන්. ඊට පස්සේ වාහනය ධාවනය වෙන්න පටන් ගන්නවා ඉන්ධන සහ දෙමුහුන් වශයෙන්. ඒ වාහනත් දැන් එළියට ඇවිල්ලායි තිබෙන්නේ. ඒ විධියට විදුලි බලයෙන් ගමන් කරන වාහනත් එමින් තිබෙනවා. ඒ නිසා තාක්ෂණය වැඩි වන කොට ඒ වාහනවලට පනවන බද්ද එක සමානව පනවන එක ඉතාම අසාධාරණයි කියන එකයි මගේ අදහස. ඒ නිසා වාහන සඳහා ද්විත්ව බදු ක්‍රමයක් පවත්වා ගැනීම සඳහා ඔබතුමන්ලා ක්‍රියාත්මක විය යුතුයි කියන එකත්, මේ බදු පැනවීම අසාධාරණ බදු පැනවීමක් හැටියටත් මා සඳහන් කරන්න

කැමැතියි. මොකද, තමුන්නාන්සේලා විරුද්ධ පක්ෂයේ ඉන්න කොටත් අසාධාරණ බදු පැනවීම් ගැන කථා කළා. විශේෂයෙන්ම අද මේ වාහන ගන්නේ හුහක්ම මධ්‍යම පන්තියේ අය. රාජ්‍ය සේවකයන්, එහෙම නැත්නම් පෞද්ගලික අංශයේ සේවකයන්. ඒ වාගේම යම් කිසි ස්වයං රැකියාවක යෙදෙන අය. ඒ වාගේ උදවියටත් වාහනයක් ලබා ගන්න ඉඩ කඩ දෙන්න ඕනෑ. තමුන්නාන්සේලා ඉන්ධන මිල අඩු කළාම ඒ අයටත් ඒ සහනය දෙන්න ඕනෑ. ඒ සහනය දෙන්නේ නැතිව මෙසේ මිල වෙනස් කිරීමෙන් ඒ පුද්ගලයන්ට විශාල අසාධාරණයක් වෙනවා. බොහොම අමාරුවෙන් වාහන ගෙන්වන විශාල පිරිසක් ඉන්න බව මා දන්නවා. කවුරු වාහන ගෙනාවාත්, වාහන 200, 300 ලොට් එකක් ගෙනාවාත් අවසානයේ ඒවා ගන්නේ පාරිභෝගිකයන්. එහෙම නැතිව එක් කෙනක් පමණක් ඒවා ගන්නේ නැහැනේ. ඒ නිසා ඒ අයට වන අසාධාරණය පිළිබඳව තමුන්නාන්සේලා කටයුතු කරන්න ඕනෑයි කියලා මා ඉතාම ඕනෑකමින් ඉල්ලා සිටින්න කැමැතියි. බොහොම සහයෝගිතා විවේචනයක් තමයි අපි මේ කරන්නේ.

දෙවැනි කාරණාව තමයි, දුරකතන පිළිබඳ කාරණාව. ගරු කථානායකතුමනි, 1997 දී, මංගල සමරවීර ඇමතිතුමා විදුලි සංදේශ අංශයේ ඇමතිවරයා. මා නියෝජ්‍ය ඇමතිවරයා. ඒ කාලයේ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවක් තමයි තිබුණේ. ඒ දෙපාර්තමේන්තුව හරහා ටෙලිෆෝන් එකක් ගන්න එක ඉතාම අසීරුයි.

මට මතකයි, මම පළාත් සභාවේ ඇමතිවරයකු හැටියට පත් වුණාම, මගේ ගෙදරට දුරකථන සම්බන්ධතාව ගන්න loop එක තිබුණේ මගේ ගෙදර ඉඳලා කිලෝමීටර් හතරහමාරක් එහායින්. ඒ නිසා "Oneplus One" කියලා ක්‍රමයක් දමලා තමයි -තිබෙන එකකට තව කෑල්ලක් එකතු කරලා තමයි- මට ඒ වෙලාවේ දුරකථන සම්බන්ධතාව දුන්නේ. අද අපි පිළිගන්න ඕනෑ ආසියාවේ ඉතා හොඳම දුරකථන ජාලය තිබෙන්නේ අප සතුවයි කියන එක. ඊට ප්‍රධානම හේතුව තමයි පෞද්ගලික අංශයටත් දුරකථන ජාලයට සම්බන්ධ වීමට ඉඩ දීම. ඒ නිසා මේ රට තුළ විශාල ආයෝජනයක් සිද්ධ වුණා. ඒ වාගේම දුරකථන තාක්ෂණය වෙනස් වුණා. අද ලංකාවේ ඕනෑම තැනකට ගිහිල්ලා අපට ජාත්‍යන්තර දුරකථන ඇමතුමක් ගන්න පුළුවන්. ගරු කථානායකතුමනි, ආසියාවේ එවැනි හැකියාවක් තිබෙන එකම රට ශ්‍රී ලංකාව පමණයි.

තමුන්නාන්සේලා ආයෝජනය පිළිබඳව විශ්වාස කරනවා නම්, ආයෝජකයන් ආ යුතුයි කියලා විශ්වාස කරනවා නම්, ආයෝජකයන් හරහා ආයෝජන ගෙනෙන්න ඕනෑ කියලා විශ්වාස කරනවා නම් ඒකට තිබෙන්නේ ක්‍රම දෙකයි. එකක් තමයි අපේ මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම. අනෙක් එක තමයි අපේ දුරකථන ජාලය සංවර්ධනය කිරීම. ඒ නිසා මේවාට බදු පැනවීමේදී ඔබතුමන්ලා කල්පනාකාරී වෙන්න ඕනෑ. ඒ බදු පැනවීමෙන් ඔබතුමන්ලා බලාපොරොත්තු වන දේ වෙනුවට වෙනත් දෙයක් වෙන්න පුළුවන්. අපේ රටේ ආයෝජනය කරන උදවිය අපට නැති වෙන්න පුළුවන්.

මට මතකයි, මීට අවුරුදු කිහිපයකට කලින් ඉන්දියාව 2G තාක්ෂණය ගෙනෙන කොට අපේ රටේ 3G තාක්ෂණය තිබුණා. අද අපි ඒක 4G තාක්ෂණය බවට පරිවර්තනය කරලා තිබෙනවා. අපේ රටේ දුරකථන සමාගම් ගණනාවක් තිබෙනවා. ඒ සමාගම් ගණනාවම තරගකාරී මට්ටමින් පවත්වා ගැනීම සඳහා බදු ක්‍රමය තුළ සාධාරණතාවක් නිර්මාණය කරන්න ඕනෑ. ඒ නිසා, අතීතයට බලපාන විධියට බදු පැනවීමේදී හෝ ඕනෑම බද්දක් පැනවීමේදී අපි ටිකක් කල්පනාකාරී විය යුතුයි කියලා මම කියන්න කැමැතියි.

අපට තේරෙන්නේ නැති සමහර බදු තිබෙනවා. මේ අය වැය ඇතුළේ අපට තේරෙන්නේ නැති බදු තිබෙනවා. මුදල් සොයා ගැනීම සඳහා නොතේරෙන බදු ගැසීමක් සිදු කර තිබෙනවා. ගරු කථානායකතුමනි, ලංකා ඉතිහාසය අරගෙන බලන කොට බදු ගැසීම ආරම්භ කරලා තිබෙන්නේ ලන්දේසි යුගයේ. ලන්දේසීන් තමයි ඉස්සෙල්ලාම බදු ගහලා තිබෙන්නේ. විවිධ ආකාරයේ බදු අය කරලා තිබෙනවා. ලංකාවේ ආලින්ද බද්දක් පනවලා තිබෙනවා.

එංගලන්ත පාලන කාලයේ Joy Tax එකක් තිබිලා තිබෙනවා. 1700 ගණන්වල ලන්දේසි කාලයේ ඉඳලා සෑම අවුරුදු 10කට, 15කට සැරයක්ම ලංකාවේ විප්ලවීය තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ කියන්නේ, කුරුඳු තලන්නන්ගේ ඉඳලා බදුවලින් අතෘප්තියට පත් වූ ලංකාවේ විශාල පිරිසක් ඒ බදු නොගෙවා සිටීමට තැත් කරලා තිබෙනවා. ඒවා තමයි 1818 කැරැල්ල දක්වාම එන ඉතිහාසය. ඒ ඉතිහාසය හොඳට හැදෑරුවොත් තමුන්නාන්සේලාට ඒක දැන ගන්න හැකි වෙයි. ඒ නිසා බදු පැනවීමේදී මහ ජනයාට සාධාරණ වෙන්න ඕනෑ; සාධාරණතාවක් ඇති කරන්න ඕනෑ.

සමාජය තුළ විවිධ පුද්ගලයෝ ඉන්නවා. මුදල් හදල් ඇති පුද්ගලයෝ ඉන්නවා, මුදල් හදල් නැති පුද්ගලයෝ ඉන්නවා. ඒ හැම දෙනාටම බදු ක්‍රමය සාධාරණ විය යුතුයි. එහෙම නැත්නම් ඒක පෙනෙන්නේ වෛරක්කාරී - oppressive - බදු ක්‍රමයක් හැටියටයි. ඒ බදු ක්‍රමයක ලක්ෂණ මේ අය වැය ඇතුළේ තිබෙනවා. මේ අය වැය තුළ වෛරය පාදක කරගත් බදු ක්‍රමයක් තිබෙනවාදෝ කියලා අපට සැකයක් තිබෙනවා. ඒ නිසා තමුන්නාන්සේලා එවැනි තත්ත්වයකින් ඉවත් වෙන්න ඕනෑ. කාටවත් වෛරී බදු ගහන එකේ තේරුමක් නැහැ.

1994 දී තමුන්නාන්සේලා අපට භාර දෙනවාට වඩා, 2015 දී අපි තමුන්නාන්සේලාට ආපහු භාර දෙන කොට සම්පූර්ණයෙන්ම වෙනස් රටක් තිබෙන්නේ. සෑම දෙයක්ම වෙනස් වෙලා. කොළඹ නගරය ගත්තත් වෙනස් වෙලා. මේවා ගැන තමුන්නාන්සේලාට විවිධාකාර මත ප්‍රකාශ කරන්න පුළුවන්. අර වියදම වැරැදියි, මේක කරපු ක්‍රමය වැරැදියි, මොකටද මේක කළේ, කින්ද මන්ද කියලා කියන්න පුළුවන්. විශේෂයෙන් මේ රටේ සාමය ඇති වුණාට පස්සේ මේ රටේ ජනතාවට ඕනෑ කරන යටිතල පහසුකම් නිර්මාණය කරන්න අපට ඕනෑ වෙලා තිබුණා. ඒ වෙනස්කම තමයි අපි ඇති කරලා තිබෙන්නේ.

තමුන්නාන්සේලා දන්නවා, ක්‍රීඩා සඳහා පැය 24ම විවෘත කිසිම channel එකක් දැන් අපේ රටේ නැහැ කියලා. Channel එක හරිද වැරදිද කියලා මම කියන්නේ නැහැ. ලංකාව තුළ ඒ විධියේ කිසිම channel එකක් නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් කළ වෙලාවෙන් තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
හොඳයි.

නමුත් තමුන්නාන්සේලා ඒ සඳහාත් අතිදැවැන්ත බද්දක් පනවලා තිබෙනවා. ඒක අසාධාරණයි. ඒක වෛරී බද්දක් හැටියටයි අපි සලකන්නේ. මන්දිර බද්ද වාගේම, sports channel tax එක සම්පූර්ණයෙන්ම වෛරී බදු හැටියටයි අපි සලකන්නේ. එහෙම කරන්න එපා. එහෙම කිරීමෙන් තමුන්නාන්සේලා කවුරුවත් සන්තෝෂ කරන්නේ නැහැ. ඒකෙන් අසන්තෝෂ වෙන්නේ රටේ ජනතාවයි. ඒ නිසා තමුන්නාන්සේලා ඒ කාරණය මතක තියා ගන්න.

[ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා]

මගේ කථාව අවසන් කරන්න පෙර මම මේ කාරණයත් කියන්න කැමැතියි. මේ අය වැයට අප සහාය දෙනවා. ඒකට එක හේතුවක් තමයි, මේ අය වැයේ සඳහන් සමහර අංශ අප ඉදිරිපත් කළ අය වැයේ ඉදිරියට යාමක් හැටියට අපි සැලකීම. නමුත්, සමහර අංශවලින් පසුපසට යාමක් හැටියට සලකන කොට මේ පාර්ලිමේන්තුවේ ඉඳගෙන අපි ඒ ගැන කියනවා. ඒ නිසා තමුන්නාන්සේලා අලුත් දේශපාලන සදාචාරයක් හා සංස්කෘතියක් ගැන කල්පනා කරනවා නම් ඒ සංස්කෘතිය සඳහා අවශ්‍ය කරන පෙළඹවීමත් තමුන්නාන්සේලාගේ පැත්තෙන් වෙන්න ඕනෑ. අසාධාරණ විවේචන කරන්නේ නැතිව, කවුරු හරි accountant කෙනෙක් නිකම් කොළයක් ලියා දුන්නාම, ඒ ගැන විමසන්නේ නැතිව ගෙනැත් ඉදිරිපත් කරනවාට වඩා, තමුන්නාන්සේලා ඒ ගැන සෘජුව කටයුතු කිරීමෙන් මේ දේශපාලන සදාචාරය අලුත් තැනකට ගෙනෙන්න පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා. මොකද, මේ තත්ත්වය තමුන්නාන්සේලාට හුරුත් නැහැ; අපට හුරුත් නැහැ. මේ මොකක්ද කියලා අප දන්නෙත් නැහැ; තමුන්නාන්සේලා දන්නෙත් නැහැ. ඒ නිසා පරණ සංදර්භයේ නැතිව අලුත් සංදර්භයක ඉඳගෙන අප අලුතින් නිර්මාණය කරන සමාජය ඒ ලෙසම ගොඩනැඟෙන්න ඉඩ සලස්වන්න කියලා ගෞරවයෙන් ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 1.59]

ගරු කරු ජයසූරිය මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍ය සහ බුද්ධ ශාසන අමාත්‍යතුමා)

(மாண்புமிகு கரு ஜயசூரிய - அரசாங்க நிருவாக, மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் சனநாயக ஆட்சி பற்றிய அமைச்சரும், புத்தசாசன அமைச்சரும்)

(The Hon. Karu Jayasuriya - Minister of Public Administration, Provincial Councils, Local Government and Democratic Governance and Minister of Buddha Sanasa)

ගරු කථානායකතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබාදීම සම්බන්ධව පළමුවෙන්ම මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම අපේ මුදල් ඇමති රවි කරුණානායක මැතිතුමාටත් විශේෂ ස්තුතියක් ප්‍රකාශ කරන්න මම මෙය අවස්ථාවක් කර ගන්නවා. මොකද, මේක විශේෂ අය වැයක්; ජනතාවට සෙත සැලසූ අය වැයක්. කාටවත් හානියක් නොකර, - මලකින් රොන් ගන්නවා වාගේ- සෑම දෙනාටම -විශේෂයෙන්ම වැඩ කරන ජනතාවට, රාජ්‍ය සේවකයාට, පාරිභෝගිකයාට- සෙත සැලසෙන අය වැයක් එතුමා ඉදිරිපත් කළා.

මෙම අය වැය ලේඛනය සකස් කිරීමේ දී අතිගරු ජනාධිපතිතුමා ඉතාම හොඳ උපදෙස් ටිකක් දුන්නා. එතුමා මුල ඉඳලාම කිව්වේ ජනතාවට සෙත සලසන අය වැයක් ඉදිරිපත් කරන්න කියලායි. ඒ සඳහා ගරු අගමැතිතුමාගේත් පූර්ණ සහාය ලැබුණා. අද ආපසු හැරී බලන විට අපට ඒ ගැන හුඟක්ම සන්තෝෂ වෙන්න පුළුවන්. මොකද, අද රටේ මේ ගැන කථා කරන කොට සෑම තැනින්ම අපට හොඳ ප්‍රතිචාරයක් ලැබෙනවා. මීට කලින් අය වැය ලේඛන ඉදිරිපත් වෙන කොට ඒවා ගැන රටේ ජනතාව තුළ විශාල උනන්දුවක් තිබුණු ආකාරය අප දැක්කා. තමන්ට ලැබෙන සහන මොනවාද කියලා ජනතාව මාස ගණනාවක් තිස්සේ බලාගෙන හිටියා. නමුත්, පසු ගිය අවුරුදු දහය, පහළොව තුළ ඒ උනන්දුව අප ජනතාව තුළ දැක්කේ නැහැ. ජනතාවගෙන් ඒ ප්‍රතිචාරය ලැබුණේ නැහැ. මොකද, අය වැය ලේඛනයට පෙර, තිබෙන බදු ඔක්කොම එකතු කරනවා. ඊට පසුව එන අය වැය ලේඛනයෙන් ඒ කිසිම සහනයක් ජනතාවට ලැබුණේ නැහැ. ඒ නිසා ඒ විධියට අය වැය ලේඛනය බාල්දු කිරීමක් පසු ගිය කාලවල තිබුණා. නමුත්, අපේ මේ නව රජය ඉදිරිපත් කළ අතුරු අය වැය යෝජනා කෙරෙහි ජනතාවගේ තිබෙන උනන්දුව අප දුටුවා. පසු ගිය ජනාධිපතිවරණ සමයේදී ගමින් ගමට ගිහින් අප ජනතාවට පොරොන්දු වුණා, අප අහවල් දවසේ අය වැය ඉදිරිපත් කරනවා, එදාට මෙන්න මේ සහනය ලබා දෙනවාය කියලා. ඒ දීපු පොරොන්දු බොහෝ දුරට අප අතුරු අය වැය තුළින් ඉෂ්ට කළාය කියලා බොහොම නිහතමානී සතුටකින් අප කියනවා. ඒ නිසා පොරොන්දු ඉෂ්ට කරන ආණ්ඩුවක් වශයෙනුයි අපි මේ කථා කරන්නේ.

ගරු කථානායකතුමනි, අපේ රජය ජනතාවට මේ තරම් සහන දුන්නේ තවත් කෙනෙකුට රිද්දලා නොවෙයි. බදු පනවනවා වෙනුවට අප කළේ මොකක්ද? නාස්තිය, දූෂණය නතර කළ හැකි නම් ජනතා අවශ්‍යතා සපුරාලීමට, ජනතාව බලවන්ත කිරීමට, මේ රට දියුණු කිරීමට අවශ්‍ය මුදල් හොයා ගන්න පුළුවන් කියන කාරණය මේ අය වැයෙන් අප පෙන්වා තිබෙනවා.

පසු ගිය කාලයේ පඳුරකට ගැසුවත් විසි වන තරමට මේ රටේ ඇමතිවරු හිටියා. නමුත්, පොරොන්දු ප්‍රකාරව ඒ ඇමතිවරු සංඛ්‍යාව අඩු කිරීමෙන් විතරක් අපි රුපියල් බිලියන 2.5ක් ඉතිරි කර ගෙන තිබෙනවා. ඒ වාගේම ජනාධිපතිවරයාගේ වියදම් අවම කර ගැනීමෙන් රුපියල් මිලියන 93,370ක මුදලක් ඉතිරි කර ගෙන තිබෙනවා. හිටපු ජනාධිපතිවරයා රුපියල් මිලියන 95,930ක වියදමක් මේ අවුරුද්දේ කරන්න හිටියා. නමුත්, වත්මන් ජනාධිපතිතුමා ඒක රුපියල් මිලියන 2,560 දක්වා අඩු කර ගෙන තිබෙනවා. මෙන්න මේක තමයි, මේ අය වැයේ දකින විශේෂ ලක්ෂණය. මෙතැනින් අප පෙන්වා තිබෙනවා, යහ පාලනයක වැදගත්කම. පසු ගිය දිනවල අප දිගින් දිගටම මේ කාරණය පෙන්වා දුන්නා. ඒක ප්‍රායෝගිකව ඔප්පු කරන්න පුළුවන්ද කියලා සමහර අය ඇහුවා. නමුත්, මේ මහ පොළොවේ එය කරන්න පුළුවන් කියන සිද්ධාන්තය දැන් අප ඔප්පු කර පෙන්වා තිබෙනවා.

බෞද්ධ දර්ශනය අදහන සාතිශය බහුතරයක් ඉන්න මේ රටේ අප සියලු දෙනාම 'අත් හැරීම' පුරුදු වෙන්න ඕනෑ. සියලු දෙයම තමන් වටා ගොඩ ගසා ගැනීම වෙනුවට, ඒවා එකින් එක අත් හැරීමට පුරුදු වුවහොත් එය තමන්ටත් හොඳයි; රටටත් හොඳයි. ගිය අය වැයේ රජයේ සමස්ත වියදම්වලින් සියයට 50කට වඩා වෙන් කර තිබුණේ රාජපක්ෂ පවුලට සීමා වෙලායි. නමුත් එක පවුලකට වෙන් කර තිබුණු ධනය, මේ අය වැය තුළින් රටේ සියලු දෙනා අතර බෙදා හරිමින් ජනතාවට ප්‍රතිලාභ රැසක් අපි ලබා දීලා තිබෙනවා.

යහ පාලනයක් රට තුළ ස්ථාපිත කරමින් මේ රට සදාචාර සම්පන්න රටක් බවට පත් කිරීම, මේ රටේ ශිෂ්ටත්වය තහවුරු කිරීම ගැන අපි මුල ඉඳලාම කථා කළා. ඔබතුමා දන්නා පරිදි අපි ඒ සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග රැසක් ගෙන තිබෙනවා. කැසිනෝ ව්‍යාපාරිකයකුගෙන් රුපියල් මිලියන 1,000ක බද්දක් අය කරනවා වාගේම කැසිනෝ සම්බන්ධයෙන් තිබූ විශේෂ පනත අපි අවලංගු කළා. ඒ වාගේම මත්පැන් අළෙවි සැල්වලින් රුපියල් 2,50,000ක බද්දක් අය කරන්න මේ අය වැයෙන් අපි යෝජනා කර තිබෙනවා. තමන් දේශ ප්‍රේමී කියා අඬ බෙර ගහපු ආණ්ඩුව ඉස්සර වැඩ කළේ මේ ආකාරයට නොවෙයි. අසීමාන්තික බදු සහන ලබා දෙමින් කැසිනෝ රජවරුන් මේ රටට ගෙන ඒමට පැවති පාලනය කටයුතු කළ බව අපි කවුරුත් දන්නා දෙයක්. ඒ කාලයේ කුඩු අහු වුණේ කිලෝ ගණනින් නොවෙයි, ටොන් ගණනින්. එවැනි තත්ත්වයක් තමයි මේ රටේ තිබුණේ.

මේ අය වැය තුළින් රුපියල් මිලියන 100කට වඩා වටිනා හෝ වර්ග අඩි 5,000කට වඩා වැඩි මන්දිර හිමියන්ගෙන් වාර්ෂිකව රුපියල් මිලියනයක බද්දක් අය කිරීමට යෝජනා කර තිබෙනවා. ඒ වාගේම සුඛෝපභෝගී, ශෝභනකාරී, අනවශ්‍ය ජීවන විලාසිතා වෙනුවට සරල ජීවන රටාවක් මේ රට තුළ පුහුණු කිරීමට අපි මේ අය වැයෙන් මූලාරම්භ කර තිබෙනවා. පුහු ප්‍රදර්ශන වෙනුවට සරල

බවට, අල්පේච්ඡතාවට අපි පුරුදු වුවහොත් අනවශ්‍ය කරදරවලින් තොරව සැහැල්ලුවෙන් ජීවිත පවත්වා ගෙන යෑමට අපි සියලු දෙනාටම පුළුවන් වනවා.

ගරු කථානායකතුමනි, වැරැදි රාජ්‍ය ප්‍රතිපත්ති නිසාවෙන් අපට අහිමි වූ GSP Plus වැනි බදු සහන යළි මේ රටට ලබා ගැනීමට රජයක් ලෙස අපි කටයුතු කරනවා. මේ සම්බන්ධයෙන් අපේ විදේශ කටයුතු අමාත්‍යතුමා දැනටමත් ක්‍රියාත්මක වෙලා තිබෙනවා. අපට පෙනෙන විධියට මේ සම්බන්ධයෙන් ශුභවාදී ආකල්පයක් ඉතා ඉක්මනින්ම ලැබෙයි කියා මා විශ්වාස කරනවා. මොකද, මේ රජය ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරනවා, යහ පාලනයට මුල් පියවර අරගෙන තිබෙනවා. මෙවැනි ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියා නිසා ලෝක ප්‍රජාව ශ්‍රී ලංකාව දිහා බලන්නේ අලුත් ඇසකින්.

GSP Plus සහනය නැති වීම නිසා පසු ගිය අවුරුදු 7 තුළදී විතරක් රුපියල් බිලියන 650ක පාඩුවක් අපට සිදු වුණා. මේ ගැන අපි හිතලා බැලුවොත්, මේ තරම් විශාල මුදල් සම්භාරයක් අපට අහිමි වුණේ හිතුවක්කාර ලෙස ක්‍රියා කළ නිසා බව පෙනෙනවා. ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කළා නම්, යහ පාලනය ස්ථාපිත කළා නම්, මේ අය කථා කරපු දේවල් ප්‍රායෝගිකව ඔප්පු කළා නම් අපට මේවා ලබා ගන්න තිබුණා. "GSP Plus සහනය අපට ඕනෑ නැහැ. අපි සුද්දන්ට ඔළුව නවන්න ඕනෑ නැහැ"යි කියා සමහර අවස්ථාවලදී රජයේ හිටපු මැති ඇමතිවරුන් කථා කළ ආකාරය මා දැක්කා. මෙවැනි විශාල මුදල් ප්‍රමාණයක් අපට අහිමි වීම ගැන අපි කනගාටු වනවා. මෙහිදී වැරැදි ප්‍රතිපත්ති, දුර්වල විදේශ ප්‍රතිපත්ති අනුගමනය කිරීම නිසා තමයි අපට මෙවැනි දෙයක් සිද්ධ වුණේ. මේ සහනය අපට ලැබුණොත් ජනතාවට මීටත් වඩා සහන ලබා දෙන්න අපට පුළුවන්. ඒ විතරක් නොවෙයි. දැනට අස්ථාවරව පවතින අපේ ඇඟලුම් කර්මාන්තයට මේ තුළින් විශාල තල්ලුවක් ලැබෙනවා. ඇඟලුම් කර්මාන්තය විශාල ප්‍රවර්ධනයක් ලබා ගන්නවා.

යහ පාලනය වෙනුවට තනි පාලනයක් රට තුළ ක්‍රියාත්මක වීම තුළ ඩොලර් බිලියන 5කට වැඩි මුදලක් අස්ථානගත වී ඇති බවටත් පසු ගිය දා මාධ්‍ය මඟින් වාර්තා කළා. මේක ඇත්ත නම් රුපියල් කෝටි 65,000ක් ජනතාවට අහිමි වී තිබෙනවා. මුළුමනින්ම නැති වුණත් මේ මුදලින් කොටසක් හෝ ආපසු ගන්න පුළුවන් නම්, රටක් ලෙස අපි ලබා ගෙන ඇති ණය ආපසු ගෙවීමට එම මුදල යොදා ගැනීමට හැකියාවක් ලැබෙනවා.

මේ වන විට රජයේ සමස්ත ණය ප්‍රමාණය රුපියල් ට්‍රිලියන 8.81ක් වනවා. ඒ කියන්නේ, හෙට උපදින බිළිඳකු පවා මෙලොව එළිය දකින්නේ රුපියල් 4,27,220ක ණය බරක් උරුම කර ගෙනයි. මෙන්න මේකයි අද රටේ තත්ත්වය.

මේ අස්ථානගත කර තිබෙන මුදල් ප්‍රමාණය ගත්තොත්, ගැබිනි මව්වරුන් සඳහා ලබා දීමට මේ අය වැයෙන් යෝජනා කර තිබෙන රුපියල් 20,000ක දීමනාව අවුරුදු 650ක් ගෙවීමට තරම් එය ප්‍රමාණවත් වනවා. එම නිසා මේ පිළිබඳව සොයා බැලීමට ඉතාමත් ඵලදායි ක්‍රියා මාර්ග කිහිපයක් ගෙන තිබෙනවා. ඒ වෙනුවෙන් ලංකා රජයට අවශ්‍ය විශේෂඥ සහාය ලබා දීම සඳහා ඉන්දියාව සූදානම්ව සිටින බවටත් පසු ගිය දා වාර්තා ලැබී තිබුණු බව අපි දැක්කා. ඒ සහාය ලබා ගෙන ඒ වෙනුවෙන් කටයුතු කිරීම අතිශයින්ම වැදගත්.

ගරු කථානායකතුමනි, අද අපි අලුත් රජයක ඉන්නේ; අලුත් විධියට හිතන්නේ. අපි පුංචි රටක්; අපි දුප්පත් රටක්. ඒක අපි අමතක කරන්නට හොඳ නැහැ. නමුත් අපි පසු ගිය කාලයේ ජීවත් වුණේ මහා ධන කුවේරයින් සිටින රටක ජීවත් වනවා වාගේ. විදේශ සංචාරවලදී, රාජ්‍ය උත්සවවලදී වාගේ සෑම අවස්ථාවකදීම අපි ආදායමට වඩා වියදම් කරලා ලෝකයට ශෝභනය පෙන්වන්නට කටයුතු කළා. මේ ගැන අපි නිතරම කථා කළා. රජයක් වශයෙන් අද මම සන්තෝෂ වෙනවා, වර්තමාන රජයේ අතිගරු ජනාධිපතිතුමාගේ සිට මේ චාම් බව ආරම්භ කරලා තිබීම ගැන. උත්සව පවත්වන්නේත් බොහොම චාම් විධියට. දැන් අපි ශෝභන ඇති කරලා නැහැ. මේ නාස්තිය, විනාශය ඉවත් කරන්නට පුළුවන් නම්, බොරු ශෝභන අයින් කරන්නට පුළුවන් නම් එයින් ලැබෙන සහනය ලැබෙන්නේ මේ රටේ ජනතාවට. මට මතකයි, අතීතයේදී උපන් දින උත්සව සඳහා පත්තර අතිරේකවලට පමණක් කොපමණ වියදම් කළාද කියලා. ඒ සන්දර්ශනවලට කොපමණ වියදම් කළාද? මහජන මුදල් කෝටි ගණනක් වියදම් කළා.

එක පැත්තකින් වකුගඩු රෝගීන්ට අවශ්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට නොහැකිව දුක් විඳිද්දී මේ විධියට අනවශ්‍ය මුදල් වියදම් කිරීම් කළා. මම සන්තෝෂ වෙනවා, වර්තමාන ජනාධිපතිතුමා දැනටමත් උපදෙස් දීලා තිබීම ගැන එතුමාගේ cut-outs ගහන්න එපා, එතුමා ගැන ප්‍රසිද්ධ කරන්න එපා, මේ තිබෙන මුදල් සෞඛ්‍ය කටයුතු සඳහා, විශේෂයෙන්ම වකුගඩු රෝගීන් වෙනුවෙන් වියදම් කරන්න කියලා. මම ඒක බොහොම අගය කරනවා. මේ කාරණය මම කිව යුතුයි ගරු කථානායකතුමනි. මේ රට තරුණ අසහන කැරලි දෙකකට භාජනය වූ රටක්. ඒ නිසා ආදායම් පරතරය අවම කළ යුතුයි. අපි දන්නවා සල්ලි තිබෙන අය වියදම් කරන ආකාරය. සමහර විට එක කෑම වේලකට රුපියල් 15,000ක් 20,000ක් වියදම් කරන ධන කුවේරයින් මේ රටේ ඉන්නවා. අපි ඊර්ෂ්‍යාවෙන් නොවෙයි කථා කරන්නේ. නමුත්, තුන් වේල කන්න බැරිව එක කෑම වේලකින් එහෙම නැත්නම් කෑම වේල් දෙකකින් ජීවත් වෙන තවත් කොටඨාසයක් මේ රටේ සිටිනවා. මේ ආදායම් පරතරය වැඩි වන විට තමයි රටවල අවුල් වියවුල් ඇති වන්නේ. විශේෂයෙන්ම ආදර්ශවත් ජීවිතයක් ගත කිරීමට මේ රටේ නායකයෝ විධියට, මහජන නියෝජිතයින් විධියට අපට විශාල යුතුකමක් තිබෙනවා. ඒ චාම් බව මේ රටේ ජනතාවට පුරුදු කරන්නට ඕනෑ. ඒක මම විශ්වාස කරනවා.

අපි මේ අය වැය ඉදිරිපත් කිරීම තුළින් මේ රටේ යම් කිසි විධියක අලුත් පරිච්ඡේදයක් ආරම්භ කළා. ඒ වාගේම ලෝකයේ කොහේවත් නැති අලුත් දේශපාලන සම්ප්‍රදායයක් මේ රටේ ඇති වෙලා තිබෙනවා. මම ලෝකයේ කොහේවත් මෙහෙම දෙයක් දකින්නේ නැහැ. අපි බලාපොරොත්තු වන්නේ මේ රටේ තිබුණු අතීතය අමතක කරලා, -අපි අප්‍රේල් 24වෙනි දා මැතිවරණයට ගියාට පසුව- මහ ජනතාවට නිදහස් සහ සාධාරණ මැතිවරණයක් පවත්වන්නට අවකාශ ලබා දීමටයි. ඒ වෙනුවෙන් අපි විශේෂයෙන් ක්‍රියා කරනවා. අද උදේ පාර්ලිමේන්තුවේදී මම ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාටත් ඒ බව කිව්වා. අපි ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා සමඟ සාකච්ඡා කරලා ඊළඟ මැතිවරණය නිදහස්, සාධාරණ හා සාමකාමී මැතිවරණයක් කරන්නට, ඒ වාගේම මේ රටේ ජනතාවට තමන්ගේ හෘදය සාක්ෂිය අනුව තමන්ට කැමැති දේශපාලන නායකත්වයක්, දේශපාලන දර්ශනයක් තෝරා ගන්නට අවස්ථාව ලබා දෙනවා. ඉන් පසුව, ඒ මැතිවරණයෙන් පසුව දේශපාලන මත දරන සියලු දෙනා සීමිත කාල සීමාවක් සඳහා එකතු වෙලා -අවුරුදු 2කට පමණ- මේ රට නැවතත් දියුණු කරන්නට පුළුවන් වුණොත්, "පෙරදිග මුතු ඇටය" යනුවෙන් පෙර කී ඒ සිද්ධාන්තය නැවතත් අපට ලබා ගන්නට පුළුවන් බව ප්‍රකාශ කරමින්, මට මේ අවස්ථාව ලබාදීම පිළිබඳව ගරු කථානායකතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 2.11]

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා කියනවා, " අපේ ආණ්ඩුව ඉදිරිපත් කළේ සරදියෙල් අය වැයක්" කියලා. එතුමා මේ ප්‍රකාශය කරලා තිබෙන්නේ මාවනැල්ලේ ගිය වෙලාවකදී. මාවනැල්ලේ උතුවන් කන්දේ

[ගරු ලලිත් දිසානායක මහතා]

තමයි සරදියෙල් හිටියේ. සරදියෙල් කළේ තිබෙන මිනිසුන්ගෙන් අරගෙන දුප්පත් මිනිසුන්ට බෙදලා දීමයි. මේ අය වැයේ අපි එහෙම දෙයක් දකින්නේ නැහැ.

මේ අය වැයත් සමඟම සුළු ව්‍යාපාරිකයෝ, වාහන ආනයනකරුවෝ මේ රජයට කියා සිටින්නේ මොකක්ද? ඒ අයට පනවා තිබෙන බද්ද මොකක්ද? ආනයනකරුවන්ට රුපියල් මිලියන 15ක බද්දක් ගහලා තිබෙනවා. ඒ බදු මුදල ගෙවා ගැනීමට නම් සාමාන්‍යයෙන් එක ආනයනකරුවෙක් වාහන 20ක්වත් විකුණා ගන්න ඕනෑ. එතකොට පුංචි මිනිහෙකුට වාහන ගෙන්වන්නට බැහැ. අපේ එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුව යටතේ පුංචි මිනිහෙකුට වාහනයක් ගෙන්වන්නට ඕනෑකම තිබුණා නම් ඔහුට ඒක ගෙන්වන්න නිදහස තිබුණා. අපි අගමැතිතුමාට කියනවා, උතුවන්කන්දේ සරදියෙල් නම් එහෙම කළේ නැහැ කියලා.

මේක "පික් පොකට්" ආණ්ඩුවක්. කොත්තමල්ලි බීලා, භූමිතෙල්වලින් නාන්න තමයි තිබෙන්නේ. තමුන්නාන්සේලා භූමි තෙල් මිල අඩු කළත්, අපි මේ රටේ ජනතාවගෙන් සියයට 98කට විදුලිය ලබා දීලා තිබෙනවා. එක්සත් ජනතා නිදහස් සන්ධාන රජය යටතේ අපි, කුප්පි ලාම්පුවකින් අනතුරක් සිදු වෙන තත්ත්වයක් ඇති කරලා නැහැ. කුප්පි ලාම්පුවක් පෙරළිලා ළමයෙක් මැරෙන තත්ත්වයක් ඇති කරලා තිබුණේ නැහැ. අපි සියයට 98කට ගෘහස්ථ විදුලිය ලබා දීලා තිබුණා. එහෙම නම් සරදියෙල් අය වැය මොකක්ද? ලක්ෂ 45ක් වන විදුලි පාරිභෝගිකයින්ගේ විදුලි බිල අපි පසු ගිය අය වැය මඟින් සියයට 25කින් අඩු කළා. මේ අය පම්පෝරි ගහනවා ගරු කථානායකතුමනි, ඉන්ධන මිල අඩු කළාය කියා. ලෝක වෙළෙඳ පොළේ තෙල් බැරලයක මිල සියයට 40ත් 43ත් අතර ප්‍රමාණයකින් අඩු වෙලා තිබෙනවා. එතකොට තෙල් මිල අඩු කරන්න ඕනෑ. අනිවාර්යයෙන්ම ඒක අඩු කළ යුතුයි. අපිත් ඒ කාලයේ අඩු කළා.

ඊළඟට, වකුගඩු රෝගීන් සඳහා රුපියල් 3,000ක දීමනාවක් දෙනවාය කියා තිබෙනවා. එදා අපේ අය වැයෙන් අපි ඒක යෝජනා කර තිබුණා. සෞඛ්‍ය සේවය කියන මාතෘකාව යටතේ 21.1හි මේ විධියට සඳහන්ව තිබුණා.

"මෙම රෝගයට දැඩි ලෙස ගොදුරු වී ඇති රෝගීන්ට මසකට රුපියල් 3,000ක ජීවන ආධාරයක් ලබා දීමට යෝජනා කරනවා."

මේක අපේ අය වැයේ copycat අය වැයක්. ගරු කථානායකතුමනි, මේක එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් කොපි කරපු අය වැයක්, duplicate එකක්. අපි කියපු දේ වැඩි කරලා දීලා තිබෙනවා. අපි රජයේ සේවකයන්ට බයිසිකල් දෙනවාය කිව්වාම මෙතුමන්ලා කියා තිබෙනවා, බයිසිකලයට ගෙවන ගණන කපා දමනවාය කියා. හැබැයි තවම කපා නැහැ. බයිසිකල් ටික එහෙමම තිබෙනවා. අපි ගෙන්වපු බයිසිකල් ටිකවත් තවම දෙන්න බැරි වෙලා තිබෙනවා, මේ දින 100 තුළ. අපි ගෙන්වපු බයිසිකල් ටිකවත් මේ දින 100 තුළ රජයේ සේවකයන්ට දෙන්නය කියා අපි කියනවා. මේ දින 100 ඇතුළත ඒකවත් කරන්නය කියා අපි කියනවා.

ගරු කථානායකතුමනි, ගහන එකට තමයි මේ දින 100 තුළ මෙතුමන්ලා මුල් තැන දී තිබෙන්නේ. ගරු ජෝන් අමරතුංග ඇමතිතුමාත් ඒ ආදර්ශය දීලා තිබෙනවා. එකට එකතු වෙන්න එන්නය; මේක සරදියෙල්ගෙ අය වැයක්ය කියන අගමැතිතුමා අනෙක් පැත්තෙන් අපේ පාක්ෂිකයන්ට හොඳටම ගහනවා, එළවනවා. ඊයේත් අපේ ආබාධිත රණ විරුවෙකුට අරනායක පොලිස් වසම තුළදී පහර දී තිබෙනවා. පොලීසියේ කෙනෙකුටත් පහර දී තිබෙනවා. හැබැයි ඒ අය අත් අඩංගුවට ගන්න කටයුතු කරන්නේ නැහැ. හැබැයි ඉතින් පැය 24න් සාමය ගෙනෙනවාය; නීතිය ඉටු කරනවාය කියනවා. නමුත් එහෙම දෙයක් වෙන්නේ නැහැ. තමුන්නාන්සේලා මොනවාද කළේ? නීතිඥ සංගමයේ සභාපති උපුල් ජයසූරිය මහතා picket කරනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිව, ව්‍යවස්ථාදායකයෙන් ඔබතුමා දුන්නු තීන්දුවට එරෙහිව අග විනිසුරු හැටියට වෙනත් කෙනෙක් පත් කරනවා. උපුල් ජයසූරිය මහතා ආයෝජන මණ්ඩලයේ සභාපති හැටියට පත් කරනවා. මොකක්ද එහෙම නම් යහ පාලනය කියන්නේ? තමන්ගේ මිනිස්සුන්ට සැලකීමද? හැබැයි ඉතින් කියනවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපි ඔක්කොම එකතු වෙලා මේ ගමන යමුය කියා. හැබැයි ඉතින් දේශපාලන වශයෙන් තමන්ට උදව් කරපු අය තමයි ඔක්කොම පත් කරලා තිබෙන්නේ. ඒක එහෙම නොවෙයි කියා කියන්න බැහැ නේ. උපුල් ජයසූරිය මහතා තමුන්නාන්සේලාට කඩේ ගියා. අන්න දැන් එතුමා ආයෝජන මණ්ඩලයේ සභාපති වශයෙන් පත් කර තිබෙනවා. අග විනිසුරුතුමා අයින් කරන්නය කියා එතුමා picketing කළා. ශිරානි බණ්ඩාරනායක මහත්මිය බලෙන්ම අග විනිසුරු පුටුවේ වාඩි කරවනවා. එතුමිය විත්තිකාරියක්. මේ රටේ ඉතිහාසයේ විත්තිකාර අයෙක් අග විනිසුරු පුටුවේ වාඩි කරවපු පළමු අවස්ථාව තමයි මේ. එතුමියට විරුද්ධව අධිකරණයේ චෝදනා තිබෙනවා. එතුමියගේ ස්වාමි පුරුෂයාට විරුද්ධව චෝදනා තිබෙනවා. ඒවා එකක්වත් අයින් කරලා නොවෙයි ගිහින් අග විනිසුරු පුටුවේ වාඩි කෙරෙව්වේ. ඒවා අමතක වුණා. එතුමියට විරුද්ධවත් චෝදනා තිබෙනවා. මේක යහ පාලන ආණ්ඩුවක් නම්, මේක සාධාරණ ආණ්ඩුවක් නම්, නීතිය හරියට කරනවා නම් විත්තිකාරියක් ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාරවරයා හැටියට පත් කරපු පළමු ආණ්ඩුව තමයි මේක. ඒක එහෙම නොවෙයි කියා කාටවත් කියන්න බැහැ. ඒ විත්තිකාරියට සමාව දීලා නැහැ. ඒ පිළිබඳව ක්‍රමවේදයක් තිබෙනවා. හැබැයි මේ ව්‍යවස්ථාදායක සභාවෙන් එහෙම නැත්නම් මේ උත්තරීතර පාර්ලිමේන්තුවෙන් වැරදිකාරයා කරපු කෙනෙකුට සමාව දෙන්න පුළුවන් අයිතියක් ජනාධිපතිතුමාට කොහෙන්වත් දීලා නැහැ. එහෙම මුක්තියක් නැහැ. ජනාධිපතිතුමාගේ මුක්තිය කියන එකේ කිසි තැනක ඒක සඳහන් වෙලා නැහැ. අද තමුන්නාන්සේලා මේවා තමයි කරන්නේ.

ඊළඟට, සුරා බදු ගැන කථා කළා. සාමාන්‍ය මිනිස්සු තමයි අද රට බීම හල් ආරම්භ කර තිබෙන්නේ. නමුත් ඒකත් ඉස්සර වාගේ ධනපතියාට -රේන්දකාරයාට- දෙන්න යනවා. කොහොමද ඒක කරන්න යන්නේ? මේ ඔක්කොම ටෙන්ඩර් කරන්න යනවා. එහෙම කළොත් මොකද වෙන්නේ? එහෙම කළොත් ගරු කථානායකතුමනි, මේ රටේ සාමාන්‍ය සුළු ව්‍යාපාරිකයාට තැනක් නැතිව යනවා. අද මෙතුමන්ලා සුළු ව්‍යාපාරිකයා ගැන හිතන්නේ නැහැ. මත්පැන් වෙළඳාම කරන්න පුළුවන්. නමුත් ඒක ඒ ප්‍රදේශයේ මනුෂ්‍යයෙක් කරන්නේ. ඉස්සර තිබුණු ක්‍රමයට අනුව ධනපතියෙක් තමයි -රේන්දකාරයා කියලයි කිව්වේ- මේ ඔක්කොම ගන්නේ. එහෙම නම් සරදියෙල්ගේ ක්‍රමය අනුව ඔක්කොම අනික් පැත්තට තමයි යන්නේ. රනිල් වික්‍රමසිංහ මහත්මයාට තමයි අද සූර සරදියෙල් කියා කියන්න වෙලා තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි. අද එතුමන්ලා සාමාන්‍ය මිනිස්සුන්ට සලකනවාය කියා කියනවා. නමුත් ගරු කථානායාකතුමනි, අපි පැහැදිලිව කියන්න ඕනෑ, එවැනි සැලකීමක් මේ අය වැය තුළින් සිදු වෙලා නැහැ කියන එක.

වාහන බද්ද ගැන කථා කරනකොට, එන්ජින් ධාරිතාව 1000ට අඩු වාහනවලට බදු සහන දී තිබෙනවා. හැබැයි කාර්වලට විතරයි. අපි දන්නවා, සුළු ව්‍යාපාරිකයන් පාවිච්චි කරන "ඩිමෝ බට්ටා" වාහනය. එවැනි වාහනයක් අරගෙන වෙළෙඳ පොළට ගිහින් ස්වයං රැකියාවක් කරලා, ඒකෙන් ආදායමක් උත්පාදනය කරලා මනුෂ්‍යයෙකුට හැදෙන්න පුළුවන්. එහෙම නම් එන්ජින් ධාරිතාව

1000ට අඩු මරුටි කාර් එකට විතරක් නොවෙයි ඒ ලොරියටත් ඒ බදු සහනය දෙන්න ඕනෑ. ලොරිවලින් තමයි ව්‍යාපාරික කටයුතු කිරීමේදී ප්‍රවාහනය සිද්ධ වෙන්නේ. නමුත් මේ සූර සරදියෙල් අගමැතිතුමා "පික්පොකට්" ගහන්නේ පුංචි මිනිහාට නොවෙයි, ලොකු මිනිහට තැන දීලයි. ඒ නිසා අපි කියනවා මේක "පික්පොකට්" අය වැයක්ය; copycat අය වැයක්ය කියා. මොකද, අපේ අය වැයෙන් අපි දුන්න සහනයම තමයි මේකෙත් තිබෙන්නේ.

අපේ අය වැයෙන් විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට සහන දුන්නා. විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට විතරක් නොවෙයි, අපේ අය වැයෙන් අපි වසරකට රුපියල් 50,000ක ශිෂ්‍යත්වයක් දුන්නා, විශ්වවිද්‍යාලවලට යොමු වීමට අපොහොසත් වන අඩු ආදායම්ලාභී පවුල්වල ශිෂ්‍යයන්ට. ඒ රුපියල් 50,000ක ශිෂ්‍යත්වය සඳහා රුපියල් 3,000ක මාසික ශිෂ්‍යාධාරයක් දෙන්න අපි යෝජනා කර කටයුතු කළා.

ඒ වාගේම අපි මහපොළ ශිෂ්‍යාධාරය රුපියල් 4,000ක් දක්වා වැඩි කළා. මේ ගොල්ලෝ ඒකට ගාණක් එකතු කළා. ඉතින් ඒක copycat නේ. අපි රුපියල් 4,000ක් දක්වා වැඩි කරපු එකට තව ගාණක් එකතු කරලා දෙන එකයි මේ කරලා තිබෙන්නේ. අපේ එක්සත් ජනතා නිදහස් සන්ධානය ඉදිරිපත් කරපු අය වැයේ තිබෙන යෝජනාවලටම එකතු කිරීමක් නැත්නම් plus තමයි මේ කරලා තිබෙන්නේ. අපි මහපොළ ශිෂ්‍යාධාරය රුපියල් 4,000ක් දක්වා වැඩි කරන්න යෝජනා කරනකොට මේගොල්ලන් තව රුපියල් 1,000ක් එකතු කරලා රුපියල් 5,000ක් කරනවා. වකුගඩු රෝගියකුට රුපියල් 3,000ක් දෙන්න අපි - [බාධා කිරීමක්]

ගරු කථානායකතුමනි, මේ ආණ්ඩුව ඉදිරිපත් කළ අය වැය සරදියෙල්ගේ අයවැයක් කියලා කිව්වාට, අගමැතිතුමාට අමතක වුණු කාරණයක් තිබෙනවා. සරදියෙල් නම් සූර සරදියෙල් හැටියට උතුවන්කන්දේ සිටියා. හැබැයි අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ සිටින මන්ත්‍රීවරුන් 120 මේ අය වැයට විරුද්ධ වුණොත් සරදියෙල්ගේ හුළං බහිනවා කියන එකත් අපි කියන්න කැමැතියි. [බාධා කිරීම්] මොකද වැඩි බලය තිබෙන්නේ අපිටයි. ඒ නිසා අන්න ඒ කාරණයත් අපි මතක් කරන්න ඕනෑ. සරදියෙල්ගේ හුළං බස්සන්න පුළුවන් නායකත්වය තිබෙන්නේ විපක්ෂයට කියලා අපි කියනවා. ඒ නිසා අගමැති රනිල් වික්‍රමසිංහ මහත්මයාට සූර සරදියෙල් කෙනෙක් වෙන්න බැහැ. මොකද අපි ළඟ තමයි remote control එක තිබෙන්නේ. අපි විරුද්ධ වුණොත් එතුමාට ගෙදර යන්න සිද්ධ වෙනවා කියන කාරණයත් මතක් කරමින් මා නවතිනවා. ස්තූතියි.

[පි.ප. 2.19]

ගරු පොන්. සෙල්වරාසා මහතා
(மாண்புமிகு பொன். செல்வராசா)
(The Hon. Pon. Selvarasa)

கௌரவ சபாநாயகர் அவர்களே, இன்று நடைபெறுகின்ற இடைக்கால வரவு செலவுத்திட்டத்தின் இறுதிநாள் விவாதத்திலே தமிழ்த் தேசியக் கூட்டமைப்பின் சார்பில் கலந்துகொள்வதையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன். இந்த நாட்டில் ஒரு நல்லாட்சி ஏற்படவேண்டும் என்பதற்காக கடந்த ஜனாதிபதித் தேர்தலில் நாங்கள் மைத்திரிபால சிறிசேன அவர்களை மேதகு ஜனாதிபதியாகத் தெரிவுசெய்தோம். இந்த நாட்டிலே ஒரு நல்லாட்சி நடைபெறவேண்டும் என்பதை நாங்கள் எதிர்பார்த்திருக்கின்றோம். ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்கள் இந்த நல்லாட்சியை ஒரு நலமில்லாத ஆட்சியாக மாற்றமாட்டார் என்ற நம்பிக்கை எங்களுக்கு இருக்கின்றது. அவர் பதவியேற்று ஏறக்குறைய ஒரு மாதம் கடந்த நிலையில், செய்தவையெல்லாம் நல்லவையாக இருப்பதையிட்டு நாங்கள் மகிழ்ச்சியடைகின்றோம்.

தமிழ்த் தேசியக் கூட்டமைப்பு உறுப்பினர்களான நாங்கள், இந்த வரவு செலவுத்திட்ட விடயங்கள் சம்பந்தமாக, ஒருநாளும் நல்லதை நல்லது என்று சொல்வதற்கும் தப்பானதைத் தப்பு என்று சொல்வதற்கும் தயங்கமாட்டோம்; அது கடந்தகால அரசாங்கத்துக்கும் பொருந்தும்; இன்றைய அரசாங்கத்துக்கும் பொருந்தும் என்று நினைக்கின்றேன். மாண்புமிகு ஜனாதிபதி அவர்கள் வெளியிட்ட தனது தேர்தல் விஞ்ஞாபனத்திலே, மக்களுக்கு மிகவும் தேவைப்படுகின்ற அத்தியாவசியப் பொருட்கள் 10இன் விலைகள் குறைக்கப்படும் என்று குறிப்பிட்டிருந்தார். ஆனால், அவர் பதவியேற்றதன் பின்னர் பத்துக்கும் மேலாக, 13 பொருட்களின் விலைகளைக் குறைத்திருப்பதையிட்டு இந்த நாட்டிலே வாழுகின்ற மக்களெல்லோரும் மகிழ்ச்சியடைந்திருக்கின்றார்கள். எனினும், தப்பான இரண்டு விடயங்களை நான் இங்கு சொல்லலாம் என்று நினைக்கின்றேன். தேர்தல் விஞ்ஞாபனத்திலே ஓய்வூதியர்களுக்கு 3,500 ரூபாய் அதிகரிக்கப்படும் என்று கூறப்பட்டிருந்தது. ஆனால், அதிகரிக்கப்பட்ட பணம் 1,000 ரூபாய் மட்டுமே! அரசாங்க ஊழியர்களுக்கு 5,000 ரூபாய் சம்பள அதிகரிப்பு வழங்கப்படும் என்று கூறப்பட்டிருந்தது. ஆனால், 2,000 ரூபாய் மட்டுமே கூட்டப்பட்டு, முன்னைய அரசாங்கம் அதன் வரவு செலவுத் திட்டத்திலே ஒதுக்கீடு செய்த அந்த 3,000 ரூபாயுடன் சேர்த்தே 5,000 ரூபாயாக வழங்குவதற்கு இப்போதைய புதிய அரசாங்கம் முடிவெடுத்திருப்பதாக நாங்கள் அறிகிறோம். அந்தவகையிலே இவர்களுடைய தேர்தல் விஞ்ஞாபனம் மீறப்படுகின்றது என்பதை நாங்கள் கவலையுடனும் மனவருத்தத்துடனும் இந்த அரசாங்கத்துக்குச் சொல்லிவைக்க விரும்புகின்றோம். ஆகவே, முன்னர் சொல்லியவாறு ஓய்வூதியக்காரர்களுக்குரிய கொடுப்பனவு 3,500 ரூபாய் இல்லாவிட்டாலும், ஆயிரத்தைவிட சற்றுக்கூடுதலாக இன்னொரு மடங்கைக் கூட்டி 2,000 ரூபாய் அல்லது 2,500 ரூபாயை வழங்கினால் அந்த ஓய்வூதியக்காரர்களுடைய விடயத்திலே நல்லதொரு கொடுப்பனவாக அது அமையுமென்று நான் நினைக்கின்றேன்.

எனது மட்டக்களப்பு மாவட்டத்தை எடுத்துக்கொண்டால், அரச ஊழியர்கள் நூற்றுக்கு 99 சதவீதமானோர் தபால்மூல வாக்களிப்பில் புதிய ஜனாதிபதிக்கு ஆதரவாக வாக்களித்திருந்தார்கள். அதாவது, அரச ஊழியர்களில் 1 சதவீதத்தைத் தவிர 99 சதவீதம் மட்டக்களப்பு மாவட்டத்தில் மட்டும் புதிய ஜனாதிபதிக்கு வாக்களித்திருக்கிறார்கள் என்றால், அவர்கள் இந்தத் தேர்தல் விஞ்ஞாபனத்தின் அடிப்படையில் இந்த நாட்டிலே ஒரு நல்லாட்சி அமைய வேண்டும் என்பதற்காகவும் அவர்களுடைய கொடுப்பனவுகள் அதிகரிக்கப்படவிருக்கின்றன என்பதற்காகவுமே வாக்களித் திருக்கிறார்கள். ஆகவே, நீங்கள் சொல்லிய அந்த 5,000 ரூபாவை பெப்ருவரி மாதச் சம்பளத்தோடு வழங்குவதற்கு நடவடிக்கை எடுக்கவேண்டுமென்று நான் அரசாங்கத்தை விநயமாகக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

இந்த நாட்டு மக்களின் விகிதாசாரத்தின்படி கடந்த தேர்தலில் அளிக்கப்பட்ட வாக்குகளை நாங்கள் கணிப்போமாகவிருந்தால், இலங்கையிலே மட்டக்களப்புத் தொகுதிதான் புதிய ஜனாதிபதி அவர்களுக்கு அதிகூடிய விகிதாசாரத்தை வழங்கியிருந்தது. அதாவது, அங்கே ஏறக்குறைய 87 சதவீத வாக்குகள் அவருக்குக் கிடைத்திருக்கின்றது. இதை எல்லோரும் ஏற்றுக்கொள்வார்கள் என்று நினைக்கின்றோம். நூற்றுக்குநூறு வீதம் தமிழ் பேசுகின்ற மக்கள் வாழுகின்ற அந்த மட்டக்களப்பு மாவட்டத்திலே 87 சதவீத வாக்கைப் பெற்றார் என்றால், அந்தச் சிறுபான்மையினம் புதிய ஜனாதிபதி தெரிவிலே மிகவும் அக்கறைகொண்டு அவரைத் தேர்ந்தெடுத் திருக்கிறார்கள் என்பதுதான் உண்மை.

[ගරු පොන්. සෙල්වරාසා මහතා]

அண்மையிலே வடக்குக்கு விஜயம்செய்த பாதுகாப்புப் பிரதி அமைச்சர் அவர்கள் அங்கு சில நல்ல வேலைகளைச் செய்தாலும்கூட, அவர் தெரிவித்த சில கருத்துக்கள் எமது மனதைச் சஞ்சலப்படுத்துவனவாக இருக்கின்றன. மாண்புமிகு சுகாதார மற்றும் சுதேச மருத்துவ அமைச்சர் ராஜித சேனாரத்ன அவர்கள், "இனிமேல் வடக்கு, கிழக்கிலே பாதுகாப்புப் படையினரின் முகாம்கள் புதிதாக முளைத்துவிட முடியாது" என்று கூறியிருந்தார்; அதை நாங்கள் வரவேற்கின்றோம். அதேநேரத்தில், பாதுகாப்புப் பிரதி அமைச்சர் அவர்கள், "இங்கிருந்து எந்த இராணுவ முகாமையோ அல்லது ஓர் இராணுவ வீரரையோ நாங்கள் அப்புறப்படுத்தமாட்டோம்" என்று கூறியிருக்கிறார். சிறுபான்மை இனத்துக்கும் பெரும்பான்மை இனத்துக்குமிடையே இணக்கப்பாடுகள் ஏற்பட்டுக்கொண்டிருக்கின்ற இந்தச் சந்தர்ப்பத்தில், அந்தப் பேச்சின் கருத்து தமிழர்களுடைய மனம் சற்றுக் கவலையடையக்கூடிய ஒரு போக்கை ஏற்படுத்தியிருக்கின்றது என்ற ஒரு கசப்பான உண்மையையும் அரசாங்கத்துக்கு நான் மனவருத்தத்தோடு சொல்லிவைக்க விரும்புகின்றேன். இந்த அளவுக்கு அமைச்சர்கள் அல்லது பிரதி அமைச்சர்கள் தங்கள் கருத்துக்களைக் கூறுகின்றபொழுது, கொஞ்சம் அவதானமாகக் கூறினால் சமூகங்களிடையே இருக்கின்ற பிரச்சினைகளைக் குறைத்துக்கொள்வதற்கு அது ஏதுவாக இருக்குமென்று நாங்கள் நம்புகின்றோம்.

அண்மையில் இன்னுமொரு கருத்தும் வெளியிடப் பட்டிருக்கின்றது. அதாவது, பொலிஸ் அதிகாரத்தை இராணுவத்துக்கு வழங்கியிருப்பதாகக் கூறப்பட்டிருக்கின்றது. இந்த விடயம் இன்றல்ல, முன்னைய அரசாங்கக் காலத்தில் ஏற்படுத்தப்பட்ட ஒன்றாகும். ஆனால், இன்று அது புதுப்பிக்கப்பட்டிருக்கின்றது; அதுதான் உண்மை. அப்படிச் செய்யாதிருந்தால் சிறுபான்மை இனத்தை நீங்கள் மேலும் வெல்வதற்கு ஏதுவாக இருந்திருக்குமென்று நான் நினைக்கின்றேன். இப்படிப்பட்ட விடயங்களை நாங்கள் கருத்துக்களாக பொதுமக்கள் மத்தியிலே வெளியிடுகின் றபொழுது மீண்டும் இன முரண்பாடுகள் ஏற்படக்கூடிய துக்ககரமான நிலைவரம் இந்த நாட்டில் ஏற்படலாம். அவற்றைத் தவிர்ப்பதற்காக, இப்படியான கருத்துக்களை வெளியிடாமல் மிகவும் நல்ல கருத்துக்களை வெளியிட்டால் இந்ந நாட்டில் புரையோடிப்போயிருக்கின்ற இன முரண்பாட்டுத் தன்மைகளைச் சற்றுக் குறைக்கலாமென்று நாம் அரசாங்கத்துக்கு ஆலோசனை கூற விரும்புகின்றோம்.

'ஹெல உருமய'வைச் சேர்ந்த அமைச்சர் சம்பிக ரணவக்க அவர்கள் கூறிய ஒரு வார்த்தை தமிழ் மக்களின் மனதைக் குளிரவைத்திருக்கின்றது என்று நாங்கள் கருதுகின்றோம். முன்னைய அரசாங்க காலத்திலே தமிழர்களுக்கு எதிராகக் குரல் கொடுத்த ஒரு கட்சிதான் 'ஹெல உருமய' கட்சி. அந்தக் கட்சியினர் இந்த நாட்டில் நல்லாட்சி ஏற்படவேண்டும் என்பதற்காகத் தங்கள் மனதை மாற்றிக்கொண்டிருக் கின்றார்கள். இன்றைய இந்தப் புதிய அரசாங்கத்திலே அக்கட்சியைச் சேர்ந்த சம்பிக ரணவக்க அவர்கள் அமைச்சுப் பதவியையும் ஏற்றிருக்கிறார். வட மாகாணத்திலே கோத்தாபய ராஜபக்ஷ அவர்களால் கபளீகரம் செய்யப்பட்ட காணிகள் அனைத்தையும் அரசாங்கம் மீண்டும் தமிழ் மக்களுக்குக் கொடுப்பதற்குத் தயாராக இருக்கின்றது என்ற வார்த்தைப் பிரயோகத்தை - கருத்தை அவர் வெளியிட்டிருக்கிறார். உண்மையிலே தமிழ் மக்கள் மட்டுமல்ல, தமிழ் நெஞ்சங்களை வென்றெடுத்த சிங்கள மக்கள்கூட அந்த வார்த்தையை வரவேற்பார்களென்று நினைக்கின்றோம். பொதுமக்கள் மட்டுமல்ல, தமிழ்த் தேசியக் கூட்டமைப்பின் அரசியல்வாதிகளாகிய நாங்களும் இந்தக் கூற்றை மிகவும் மனத்தூய்மையோடு வரவேற்கின்றோம். இதுபோன்ற நல்ல காரியங்கள் இந்த நாட்டில் நடைபெற வேண்டும்.

அதுபோல், எமது இளைஞர்கள் பலர் பல்லாண்டு காலமாகச் சிறைகளிலே வாடிக்கொண்டிருக்கின்றார்கள். 20 வருடங்களுக்கு மேலாகியும் இதுவரையில் அவர்களில் பெரும்பாலானோருக்கு எதிராக வழக்குகள் தாக்கல் செய்யப்படவில்லை; ஒரு சிலருக்கு எதிராக வழக்குகள் தாக்கல் செய்யப்பட்டிருக்கின்றன. அண்மையில் ஜனாதிபதி அவர்களையும் பிரதம அமைச்சர் அவர்களையும் எமது தமிழ்த் தேசியக் கூட்டமைப்பின் சார்பில் நாங்கள் சந்தித்தபொழுது இதற்காக குழுவொன்றை அமைப்பதற்கு அவர்கள் பச்சைக்கொடி காட்டினார்கள். ஆகவே, தமிழ் மக்களுக்கும் சிங்கள மக்களுக்கும் இடையிலே உறவை வளர்ப்பதற்கான ஒரு நல்ல சகுனம் இதுவென்று நான் நினைக்கின்றேன்.

இதேவேளையில் வெளிநாடுகளிலே வாழ்ந்தவர்கள் தங்கள் உறவுகளைச் சந்திப்பதற்காக இந்த நாட்டுக்கு வருகை தருகின்றபொழுது, அவர்கள் முன்னர் எல்ரீரீஈ இயக்கத்துக்குச் சார்பாக இருந்தார்கள் என்ற ஒரே காரணத்துக்காக விமான நிலையத்தில் வைத்து கைது செய்யப்படுகின்றார்கள். சென்ற வாரம்கூட, இரண்டு இளைஞர்கள் கட்டுநாயக்க விமான நிலையத்தில் வைத்து CIDயினரால் கைதுசெய்யப்பட்டு, தற்பொழுது சிறையிலே வைக்கப்பட்டிருக்கின்றார்கள்.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Hon. Member, you have to wind up now.

ගරු පොන්. සෙල්වරාසා මහතා
(மாண்புமிகு பொன். செல்வராசா)
(The Hon. Pon. Selvarasa)
அந்த இரண்டு பேர் மாத்திரமல்ல. இந்த விடயம் தொடர்பில் 15 பேருக்கும் மேற்பட்டவர்கள் பூஸா முகாமிலே இன்னமும் விசாரணைக்காக இருந்துகொண் டிருப்பதை நாங்கள் காண்கிறோம். ஆகவே, - [*Interruption.*]
Yes. Earlier they belonged to the LTTE cadre. That is why they have arrested these people. They are married people. They were working abroad and had come here to see their wives and children. Unfortunately, they were arrested at the airport.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதார மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health and Indigenous Medicine)
You take it up with - [*Interruption.*]

ගරු පොන්. සෙල්වරාසා මහතා
(மாண்புமிகு பொன். செல்வராசா)
(The Hon. Pon. Selvarasa)
I will give you all the reports. Thank you, Hon. Minister.

ஆகவே, இப்படியான நல்ல காரியங்களைச் செய் கின்றபொழுதுதான் இந்த நாட்டில் உண்மையான நல்லாட்சி நிலவும்; நல்லாட்சி நிலவுகின்றபொழுதுதான் இந்த நாட்டில் ஒரு நல்ல நிருவாகம் ஏற்படும் என்று கூறி, சந்தர்ப்பத்துக்கு நன்றி தெரிவித்து, விடைபெறுகின்றேன். நன்றி, வணக்கம்!

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මීළඟට ගරු ගයන්ත කරුණාතිලක අමාත්‍යතුමා.

එතුමාගේ කථාවට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මියගේ නම යෝජනා කරන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, "ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනාරූඪ විය.
அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon MR. SPEAKER *left the Chair, and* THE HON. (MRS.) SRIYANI WIJEWICKRAMA *took the Chair.*

[අ.භා. 2.35]

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - வெகுசன ஊடக, பாராளுமன்ற அலுவல்கள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Mass Media and Parliamentary Affairs and Chief Government Whip)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සහන රැසක් දීපු අතුරු අය වැයක් ගැන කථා කරද්දී මීට මොහොතකට ඉස්සර වෙලා ගරු ලලිත් දිසානායක මන්ත්‍රීතුමා කරපු කථාවෙන් මම පටන් ගන්න කැමැතියි. එතුමා දිගින් දිගටම කිව්වා, "මේක අපේ කොපියක්" කියලා. එතුමාගේ කොපිය ගැන කියන කොට මට මතක් වෙනවා එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ලේකම්තුමා වන සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා පත්තරයට කරපු ප්‍රකාශය. "මේ අයවැයට අපි පූර්ණ සහාය දෙනවා - පාර්ලිමේන්තු මන්ත්‍රී සුසිල් ප්‍රේමජයන්ත" යනුවෙන් එහි සඳහන් වෙනවා.

මෙන්න, කොපිය ගැන එක්සත් ජාතික නිදහස් සන්ධානයේ මහ ලේකම්වරයා කියපු හැටි:

"... අපි විවිධ අදහස් කිව්වා. සියල්ල කළමනාකරණය කළේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මඟින්. ඒ අමාත්‍යාංශයේ සිටි ආර්ථික විශේෂඥයෝ තමයි ඒ අයට අවශ්‍ය ආම්පන්න සැපයුවේ. අපට ඇහුම් කන් දීමක් ඒ වෙලාවේ සිදු වූයේ නැහැ. ... තෙල් මිල අඩු වීමේ සහනය ජනතාවට දෙන්න පුළුවන් බව අපි දැනගෙන හිටියා. ලෝක වෙළඳ පොළේ කිරිපිටි මිල අඩුවෙනකොට ඒකෙ සහනය ජනතාවට දෙන්න පුළුවන්. අපි අනවශ්‍ය වියදම් ටික නැවැත්තුවා නම්, සමෘද්ධි සහනාධාරය වගේ දේවල් දීමට ඒවා ගණනය කර ගන්න තිබුණා. තරුණයන්ට රැකියා ලබාදීම පිළිබඳව අපි ආර්ථික සංවර්ධන ඇමතිවරයාට, වගකිව යුත්තන්ට යෝජනා ඉදිරිපත් කළා. ඒත් ඒවට ඒ ආකාරයෙන් ඇහුම්කන්දීමක් වූයේ නැහැ. ජනතාවට මේ අයවැයෙන් සහන ලැබෙන නිසා අපි සහාය දෙනවා." මෙන්න, තමන්ගේ කොපිය ගැන කියපු ලලිත් දිසානායක මන්ත්‍රීවරයාට උත්තරය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවට මේ වාගේ අලුත් ආණ්ඩුවක් මේ රටේ ඇති වෙලා තිබෙනවා. ඒක අප කාටත් අලුත් අත්දැකීමක්. රටේ නාස්තිය දූෂණය නැති කරලා, පවුල් පාලනය නැති කරලා, යහ පාලනය ඇති කරලා, වෙනසක් ඇති කිරීමටයි මේ රටේ ජනතාව මේ සුවිශේෂී ජන වරම අපේ ජනාධිපතිතුමාට දුන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, නෙල්සන් මැන්ඩෙලා ජනාධිපතිතුමාගේ පත්වීමත් සමඟම දකුණු අප්‍රිකාවේත් මේ ආකාරයේම පෙරළියක් සිදු වුණා. එදා නෙල්සන් මැන්ඩෙලා හිරේ දැමූ ඒ රටේ ජනාධිපතිවරයා පසු කාලයක විප්ලවීය ව්‍යවස්ථා සංශෝධනයකට එකඟ වෙලා පසුව පැවැති ජනාධිපතිවරණයේදී මැන්ඩෙලාගේ ආණ්ඩුවේ උපජනාධිපති ධුරය භාරගත්තා. මැන්ඩෙලා ජනාධිපතිවරයා තමා හිරේ දාපු ජනාධිපතිට කිව්වේ, "මේ රටේ ප්‍රශ්න විසඳන්න ඔබ හොඳ මිත්‍රයකු හැටියට මට එකතු විය යුතුයි" කියලායි. අන්න එහෙමයි රටක් ගොඩ නඟන්න, අලුත් දෙයක් කරන්න අවංකවම සූදානම් නායකයන් කටයුතු කරලා තිබෙන්නේ. වර්තමාන අගමැතිතුමා වන අපේ පක්ෂයේ නායකතුමාත් මේ දේශපාලන පෙරළියට මඟ පාදමින් පරිත්‍යාගයක් කළේත් ඒ විධියටයි. ඒ නිසා අප හැමෝටම එකතු වෙලා පුළුවන් වුණා, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා වැනි විශිෂ්ට නායකයකු, කෘත හස්ත දේශපාලනඥයකු අපේ රටේ මුල් පුටුවේ වාඩි කරවන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සාම්ප්‍රදායික අච්චුවකින් බලන කොට නම්, පාර්ලිමේන්තුවේ ඔළු ගෙඩි ගණන් කරලා බලන කොට නම් බැලු බැල්මට අපේ ආණ්ඩුව නිකම් සුළුතර ආණ්ඩුවක් වාගේ තමයි පෙනෙන්නේ. නමුත් මේක ජන වරමක් පැහැදිලිව ලබා ගත්තු ජනාධිපතිතුමකුගේ ආණ්ඩුවක්ය කියන එක අමතක කරන්න එපා. ගිය වර වැඩි ඡන්ද ලක්ෂ 18කින් දිනපු ජනාධිපතිවරයා පරාජය කළේ ලක්ෂ හතරහමාරකින්. මෙය ගිය වරට වඩා ලක්ෂ 20ක්, 22ක් විතර වැඩිපුර ඡන්ද ගත්තු නායකයෙකුගේ ආණ්ඩුවක්ය කියන එක මම මතක් කරනවා. 2001දී එක්සත් ජාතික පෙරමුණට ජන වරමක් ලැබුණා. හැබැයි 2004 වන කොට ජනාධිපති බලය පාවිච්චි කරලා ඒ ආණ්ඩුව බලහත්කාරයෙන් විසුරුවලා ඡන්දයකින් අපව පැරැද්දුවා. එතැනදී එක්සත් ජනතා නිදහස් සන්ධානයට ජන වරම ලැබුණා. එතකොට කවුරුවත් 2001 ජන වරම ගැන කථා කරන්න ගියේ නැහැ. එහෙම නම් ඒ අනුව 2010 ජනතාව දුන් වරම පසු ගිය ජනවාරි 8වන දා ජනාධිපතිවරණයේදී පැහැදිලි ජන වරමක් ගත්තු ජනාධිපතිතුමාගේ මේ ආණ්ඩුවත් එක්ක සම්පූර්ණයෙන් න්‍යායාත්මකව අහෝසියි කියන එක මම මතක් කරන්න කැමැතියි.

එම නිසා මේ අලුත් දේශපාලන ගමනට අපි සියලු දෙනාම දැන් හැඩ ගැසෙමු. අපේ පක්ෂයේ නායකතුමා අගමැති වෙනකොට, ඔබේ පක්ෂයේ නායකතුමා ජනාධිපති වී තිබෙනවා. රටටම සුබදායී, වැඩදායී නව දේශපාලන සංයෝගයක් ඇති වෙලා තිබෙන වෙලාවකයි අතුරු අය වැය අපි ඉදිරිපත් කර තිබෙන්නේ. මේ අතුරු අය වැය ජනතාවට සහන රැසක් සමඟින් ඉදිරිපත් වෙන්නේ ජනාධිපතිතුමාගේ මැතිවරණ පොරොන්දු ඉටු කිරීමක් හැටියට බව අපි කවුරුත් දන්නවා. කියපු දේ කරන, කරන දේ කියන ජනාධිපතිවරයෙක් සහ අගමැතිවරයෙක්ගේ ආණ්ඩුවක් මේක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සහන සමඟින් මේ අය වැය ජනතාවාදීව ඉදිරිපත් කර තිබෙනවා කියන එක මම විශේෂයෙන්ම ඔබතුමියට මතක් කරනවා. ඒ කාලයේ එක්සත් ජාතික පක්ෂයේ -යූඑන්පී එකේ- අපිට කිව්වේ ධනපතියන්ගේ පක්ෂයක් කියා. ජනතාවට සහන දෙනවාට වඩා ව්‍යාපාරිකයන්ට සහන දෙන පක්ෂයක් හැටියටයි එදා අපේ පක්ෂය හැඳින් වූයේ. නමුත් මේ අතුරු අය වැයෙන් තරම් සාමාන්‍ය ජනතාව ඉලක්ක කර ගෙන ඉතිහාසයේ කිසිම අය වැයකින් සහන දීලා තිබෙනවාද

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

කියන ප්‍රශ්නය හෘදය සාක්ෂියට එකඟව අපි ඇසිය යුතුව තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බලන්න අපිට මෙහෙම සහන දෙන්න වුණේ ඇයි කියන එක. පසු ගිය පාලන කාලයේදී තමයි දුප්පතුන් සහ පොහොසතුන් අතර, මෑත යුගයේ වැඩිම පරතරය වාර්තා වුණේ කියා අපි දන්නවා. හතර දෙනෙකුගෙන් යුතු පවුලකට මාසයක් ජීවත් වෙන්න රුපියල් 50,000ක් අවශ්‍යයි කියා රජයේ සංඛ්‍යා ලේඛනවලින්ම ඔප්පු කළා. 10 දෙනෙක් ඉන්න තැනක එක් අයෙක් පාන් ගෙඩියෙන් භාගයක් කෑවොත් ඉතුරු 9 දෙනාටම ඉතුරු වෙන්නේ පාන් ගෙඩියෙන් භාගයයි කියන එක අපි දන්නවා. එදා ඇති නැති පරතරය කොහොමද? එක පෙළැන්තියක උදවිය ලැම්බෝගිනි මීලට ගෙන දළ දා මාළිගාව ඉස්සරහ කාර් රේස් යන කොට සාමාන්‍ය පා පැදියක්වත් නැති අහිංසක මිනිස්සු කොච්චර මේ රටේ හිටියාද කියන එක අපිට අමතක කරන්න බැහැ. පසු ගිය කාලයේ මාතර මහානාම පාලම දරිද්‍රතාවය නිසා සිය දිවි හානි කර ගන්නා අයගේ නිල්වලා ගඟට පනින වේදිකාවක් වෙලා තිබුණු හැටි අපි දැක්කා. එදා තිබුණු ආණ්ඩුව ඊට බාධකයක් විධියට net එකක් දමන්න පුළුවන්ද කියලා හොයලා බලන එක විතරයි කළේ. සමහර ලොකු ලොකු අයගේ දරුවෝ එක්ලක්ෂ පණස්දාහක විතර පාවහන් දමන කොට පැල්මඩුල්ලේ දැරියක් සපත්තු කුට්ටමක් ගන්න රුපියල් 300ක් නැතුව සිය දිවි හානිකර ගත්ත රටක් මේ කියන එක අපට අමතක කරන්න පුළුවන්කමක් නැහැ,

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. දරිද්‍රතා ප්‍රශ්නයට ක්ෂණික විසඳුමක් හැටියට තමයි ලංකා ඉතිහාසයේ වැඩිම සහනාධාර මුදල වෙන් කිරීම අපේ මුදල් ඇමතිතුමා විසින් සිදු කළේ කියා මම ඔබතුමියගේ අවධානයට යොමු කරනවා. පසු ගිය සමයේ දැඩි ආර්ථික පීඩනයට හසුවී සිටි දුගී දුප්පත් ජනතාව සහ මධ්‍යම පන්තියේ ජනතාව ගැනත්, ගොවි ජනතාව ගැනත්, කුඩා තේ වතු හිමියන් වැනි උදවිය ගැනත්, කුඩා පරිමාණයේ නිෂ්පාදන ඔසවා තැබීම ගැනත් මේ අතුරු අය වැයෙන් කටයුතු කර තිබෙනවා කියන එක ඉතාම පැහැදිලිව පෙනෙනවා. වී මිලදී ගැනීමේ සහතික මිල රුපියල් 50 දක්වා වැඩි කරපු අය වැයක්; ගොවි ණය සීයයට 50ක් කපා හැරපු අය වැයක්; ප්‍රමිතියෙන් යුතු පොහොර ලබා දෙමින් පොහොර සහනාධාරය ඒ අයුරින්ම පවත්වා ගෙන යන්න කටයුතු කරපු අය වැයක්; තේ සහ රබර් කිලෝවක් සඳහා ආකර්ෂණීය සහතික මිලක් නියම කරපු අය වැයක් වාගේම රජයේ සේවකයන්ගේ වැටුප රුපියල් 10,000කින් වැඩි කර එයින් රුපියල් 5,000ක් ලබා දෙන්න ක්ෂණිකව කටයුතු කරපු අය වැයක්. සමෘද්ධි දීමනාව සීයයට 200කින් වැඩි කළා. මේ අය වැයෙන් අධ්‍යාපනයට සීයයට 6ක් වෙන් කළා. අධ්‍යාපනයට කලින් වෙන් කර තිබූ රුපියල් බිලියන 90ක මුදල් ප්‍රමාණය රුපියල් බිලියන 110 දක්වා ඍජු වෙන් කිරීම් කිරීමට සමත් වුණ අය වැයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ තරම් සහන දෙන්න මුදල් කොහෙන්ද කියා දැන් සමහරු අහනවා. ඒ වාගේම අනික් පැත්තෙන් කියනවා, "කාබන් කොපියක්" කියා. පසු ගිය කාලයේ තිබුණු ශෝභන වියදම්, ප්‍රතිරූප පුම්බන්න හදපු වියදම්, එක් පවුලක් යැපෙන්න කරපු වියදම් ආදී අනවශ්‍ය වියදම් සියල්ලම කපා හැරීම නිසා ජනතාවට සහන දෙන්න පුළුවන් අය වැයක් අපි සකස් කර තිබෙනවා.

"දැයට කිරුළ" සැණකෙළියට 2011 වර්ෂයේදී පමණක් අමාත්‍යාංශ 38ක වියදමට රුපියල් බිලියන 37.6ක් -රුපියල් දස ලක්ෂ 37,600ක්- විවිධ අමාත්‍යාංශ මට්ටමින් වැය කර තිබුණු හැටි බලන්න. පාඩු ලබන රාජ්‍ය ආයතනවලට නිකුත් කර තිබෙන බැංකු ඇපකරවල වටිනාකම 2014 වර්ෂයේ දෙසැම්බර් මාසය වන කොට රුපියල් මිලියන 524,741යි. ජනාධිපතිතුමාට වෙන් කර තිබුණු මුදල රුපියල් කෝටි 9,573යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඉතාම සරල, පොළොවේ පය ගහපු, බලය ඕනෑම වෙලාවක අත් හරින්න පුළුවන්ය කියන එක අපට හැම තිස්සේම කියන ජනාධිපතිවරයෙක් මුළු රටටම ආදර්ශයක් දීලා එම මුදල රුපියල් කෝටි 256ට අඩු කළේ කොහොමද කියා මම ඔබතුමියට පෙන්වා දෙන්න කැමැතියි. රජයේ අනවශ්‍ය වියදම් සඳහා වැය වූ රුපියල් කෝටි 18,700ක්ම අඩු කරන්න පුළුවන්ය කියන එක මුදල් ඇමතිතුමා මේ අය වැයෙන් පෙන්වා දී තිබෙනවා.

අපි තෙල් මිල අඩු කළා. ඒ අනුව අත්‍යවශ්‍ය භාණ්ඩ රැසක මිල අඩු වුණා. බස් ගාස්තු අඩු වුණා. ත්‍රීරෝද රථ ගාස්තු අඩු වුණා. තෙල් මිල අඩු වන විට ඒ හරහා සකලවිධ භාණ්ඩ හා සේවාවල මිල ගණන් අනිවාර්යයෙන්ම අඩු වනවා. අද රටේ තොටේ ඇවිදින කොට; මිනිස්සු හම්බ වනකොට; තැනකට ගියාම; මිනිසුන්ගේ මුහුණ කට දිහා බලන කොට ඒ වෙනස පෙන්වන්න ජනතාව අද කටයුතු කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා වැනි ජනාධිපතිවරයෙක්, රනිල් වික්‍රමසිංහ මැතිතුමා වැනි අගමැතිවරයෙක් ප්‍රධාන අපේ රජයට අවශ්‍ය කර තිබෙන්නේ පසු ගිය කාලයේ ආණ්ඩුව කල්පනා කළා වාගේ සියයට එකක සුබ විහරණය ගැන කල්පනා කරන්න නොවෙයි. ඇත්ත වශයෙන්ම සියයට එකකට අමතරව අනිකුත් සියයට අනූනවයේ සුබ විහරණය ඇති කිරීම ගැන තමයි ජනාධිපතිතුමා වැනි නායකයෙක්, අගමැතිතුමා වැනි පළපුරුදු නායකයෙක් හැම තිස්සේම කල්පනා කරන්නේ.

මම දීර්ඝ වෙලාවක් කථා කරන්නේ නැහැ. අද කථික ලැයිස්තුවට ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඒ අනුව කථිකයෝ කීප දෙනෙකුගේ නම් කපන්නත් සිද්ධ වුණා. ඒක නිසා පුළුවන් තරම් ඉක්මනට මම මගේ කථාව අවසන් කරනවා.

ඇත්ත වශයෙන්ම පසු ගිය ජනාධිපතිවරණය මේ රටේ සියලුම දේශපාලන පක්ෂවල දේශපාලනඥයින්ට හොඳ පාඩමක් උගන්වපු මැතිවරණයක් හැටියට මම පැහැදිලිව දකිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කීප දෙනෙක් පොහොසත් කරලා, මැතිවරණය ආසන්න වෙද්දි මුදල් ටිකක් බෙදලා, බඩු ටිකක් බෙදලා, මොනවා හෝ බොරුවක් කර ඡන්ද ගන්න පුළුවන් කියා හිතාගෙන හිටපු දේශපාලනඥයින්ට; ඒ පැරණි වැඩවසම් මතයට ජනතාව හොඳ කනේ පහරක් දීපු මැතිවරණයක් හැටියටයි පසු ගිය ජනවාරි 8 වැනි දා පැවැති ඓතිහාසික ජනාධිපතිවරණය මම දකින්නේ. ඕනෑම කෙනෙකු සල්ලිවලට ගන්න පුළුවන්ය කියා සමහරු හිතාගෙන හිටියා. පසු ගිය කාලයේ එහෙම තමයි ආණ්ඩුවත් හැසිරුණේ. හැබැයි, මුදලට හෝ බඩු මල්ලකට හෝ ජනතාව දිනා ගන්න තවදුරටත් බැරිය, මේ රටේ ජනතාව ඊට වඩා ඉස්සරහින් කල්පනා කරනවාය, හිතනවාය කියන එක මේ ජනාධිපතිවරණයේදී ජනතාව කතිරයෙන් පෙන්වා තිබෙනවා.

මට ලැබී තිබෙන කාලය තව ටිකක් ඉතිරි කර ගන්න ඕනෑ. යහ පාලනයෙන් ඒ වාගේම මෛත්‍රී පාලනයෙන් යුක්ත නව පාලනයක් මේ රටේ ඇති වෙලා තිබෙද්දි අපේ නායකතුමා අගමැති වෙලා, ඔබතුමන්ලාගේ නායකයා ජනාධිපති වෙලා අලුත් ආණ්ඩුවක් හැදිලා රටේ ජනවරම පැහැදිලිවම ප්‍රකාශයට පත් වෙලා තිබෙන මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලය බැලුවාම එක්සත් ජාතික පාක්ෂික, ශ්‍රී ලංකා නිදහස් පාක්ෂික මැතිඇමතිවරු ඇතුළු සියලු දෙනාම සංකලනය වෙලා රට ගැන හිතා තීරණ ගන්න ආදර්ශයක් දීපු, නිල නිවාස නැති, අලුතෙන් වාහන නැති, සෝබන නැති, ප්‍රතිරූප පුම්බන අතිරේක නැති, cut-outs ප්‍රදර්ශන නැති ආදර්ශවත් ආණ්ඩුවක් හැටියට ක්‍රියා කරද්දි මේ අය වැයට වාගේම මේ ගමනට කාගේත් සහාය ලබා දෙන්න කියන ඉල්ලීම කරමින් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමියට ස්තූති කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 2.48]

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ අලුත් මුදල් ඇමතිතුමා වන රවි කරුණානායක මැතිතුමාට මම ප්‍රථමයෙන්ම සුබ පතනවා. නමුත්, එතුමාටත් නමක් හැදී තිබෙනවා. එතුමාට කියන්නේ "Robin Hood in the House" කියා. එතුමා පාර්ලිමේන්තුවේ "රොබින් හුඩ්" වෙලා තිබෙනවා. අගමැතිතුමා එතුමාට කියනවා, "සූර සරදියෙල්" කියා. ඉස්සර දහනායක මහත්මයාට කිව්වා, "බනිස් මාමා" කියා. ආතර් වී. දියෙස් මහත්මයාට කිව්වා, "කොස් මාමා" කියා. ඩඩ්ලි සේනානායක මහත්මයාට කිව්වා, "බත් දුන් පියා" කියා.

අද පාර්ලිමේන්තුවේ "රොබින් හුඩ්" එහෙම නැත්නම් -

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
සහන දුන් පියා.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

"සහන දුන් පියා" කියන්නට බැහැ. "රොබින් හුඩ්" කෙනෙක් වෙලා තියෙන්නේ රවි කරුණානායක මහත්මයායි. එතුමාට විශාල අභියෝගයක් තිබෙනවා. අගමැතිතුමාත් කියනවා, මේක "සරදියෙල් අය වැයක්" කියා. අත් හදා බැලීමක් හැටියට සාර්ථකයි. නමුත් ප්‍රතිඵල අනාගතයට භාරයි. සහන ලබා දීම හොඳයි. සහන ලබා දීම ගැන කවුරුත් එකඟයි. සහන ලබා දීමේදී අඛණ්ඩව බදු ආදායම් ප්‍රවාහයක් තමුන්නාන්සේලා නිර්මාණය කර තිබෙනවාද? තවම නැහැ. [බාධා කිරීමක්]මෙම වැඩ පිළිවෙළ සාර්ථක ද, අසාර්ථක ද කියා බැලීමේදී practical නැහැ කියන එකයි මම කියන්නේ. ඊළඟට මම කියන්නට ඕනෑ, යොදා ගන්නා ක්‍රමවේද ඇත්ත වශයෙන්ම විශ්වාසනීය විය යුතුයි කියා. එහෙම නැත්නම් මැතිවරණයක් සඳහා පමණක් වුණොත් ඒකේ ප්‍රතිඵල භයානකයි. ඒක හොඳටයි මම කියන්නේ.

එක්සත් ජාතික පක්ෂය ඔවුන්ගේ ආර්ථික ප්‍රතිපත්තියේ යම් කිසි වෙනසක් කර තිබෙනවා. ඇමතිතුමා කිව්ව විධියට යම් කිසි වෙනසක් -ඇති අයගෙන් අරගෙන නැති අයට දෙන එක- කර තිබෙනවා. නමුත් අවුරුදු ගණනාවක් තිස්සේ රජයේ සේවකයන්ට, විශ්‍රාමිකයන්ට ආබාධිතයන්ට, වැඩිහිටියන්ට, ගොවීන්ට, කම්කරුවන්ට, ධීවරයන්ට, ව්‍යාපාරිකයන්ට යන සෑම කණ්ඩායමකටම අපේ හිටපු ජනාධිපතිතුමා මුදල් ඇමති වශයෙන් බොහෝ දේවල් කළා. ඒ ගැන අපි ආඩම්බර වෙන්නට ඕනෑ. ඒකට පොඩි උත්තේජනයක් තමුන්නාන්සේලා දීලා තිබෙනවා. අපට ඒක නැහැයි කියන්නට බැහැ.

ඊළඟට පාරිභෝගිකයා ගැනත් පොඩ්ඩක් හිතන්නට ඕනෑ. අද පාරිභෝගික භාණ්ඩ 13ක මිල අඩු කර තිබෙනවා. මොනවාද ඒ? අපේ මුදල් ඇමතිතුමා අලුත් පාරිභෝගික භාණ්ඩ කණ්ඩායමක් හඳුන්වා දී තිබෙනවා. එකක් උම්බලකඩ. අනෙක් එක සීනි. මම සීනි ගැන කථා කරන්නම්. සීනි පාරිභෝගිකයෝ වැඩි වුණාම මොකක්ද ඒකෙන් වන අගතිය කියා කල්පනා කරන්නට ඕනෑ. ඇත්ත වශයෙන්ම අපේ හිටපු සීනි ඇමතිතුමා, සීනි ඇමතිතුමෙක් කියා අපට දැනුණා. සීනි නිෂ්පාදනය සියයට 10කින් වර්ධනය කර ගත්තා. අද සීනි import කළොත් මොකද වෙන්නේ? ගොවීන් කී දෙනෙක් අනාථ වෙනවාද? මේවා ප්‍රායෝගික ද නැද්ද කියා බලන්න. මොකද, අපි එකට ඉන්නවා නම්, අපේ අදහස්වලටත් තමුන්නාන්සේලා ටිකක් ගරු කරන්නට ඕනෑ. ඒකයි මම කියන්නේ. ඊළඟට පාරිභෝගිකයන්ට පමණක් ලබා දෙන සහනවලින් දීර්ඝකාලීන සුභ ගමනක් යන්නට බැහැ.

සමහරවිට කෙනෙකු තම ජීවිතයේ ගෙන්වූ පළමුවෙනි සහ අවසාන වාහනය hybrid වාහනය වෙන්නට පුළුවන්. "සූර සරදියෙල්" අය වැය හේතුවෙන් අද මොකද වෙලා තිබෙන්නේ? මේ ගෙනාපු වාහනවලට මොකද වෙන්නේ? ඔවුන්ට සහනයක් දෙනවාද? මේවායින් කාබන්ඩයොක්සයිඩ් වායුව පිටවෙන එක නතර කිරීමේ ක්‍රමවේදය අද අත් හිටුවා තිබෙනවා. ඊළඟට දැන් වාහන ආනයනය කරන්නට ඕනෑ නම්, ආනයනය කරන්නට වන්නේ ලක්ෂ 15ක් දෙන කට්ටියට පමණයි. කී දෙනා ද එහෙම importersලා ඉන්නේ? එදා කෙනෙක් internet එකෙන් බලලා වාහනයක් ගෙනාවා. Sales කරන අය විකුණන්නේ රුපියල් ලක්ෂ 10ක් 15ක් තියාගෙනයි. තමන්ටම ගෙන්වා ගන්නට පුළුවන් වුණා නම් ඇත්ත වශයෙන්ම ලක්ෂයක් ඔවුන්ගෙන් බදු ගත්තත් කමක් නැහැ. එම නිසා මම කියන්නේ තමුන්නාන්සේලාගේ බදු ක්‍රමය ප්‍රායෝගික නැහැ කියලායි. ඒක හොඳට මතක තියා ගන්න.

පොඩි මිනිහාගේ වාහන ගැන බලන විට Euro Standard 4 වාගේ ජපන් වාහනයි තිබෙන්නේ. ඉන්දියන් වාහන ගෙනාවොත් -අපේ අල්ලපු රට බව ඇත්ත- standard එකක් තියෙනවාද, කොච්චර කල් පාවිච්චි කරන්නට පුළුවන්ද, පාවිච්චි කළායින් පස්සේ වටිනාකමක් තිබෙනවාද කියන මේ කාරණා සියල්ල සැලකිල්ලට ගන්නට ඕනෑ. අපි ඕවා ගැන ඉස්සරහට කථා කරමු. මට කථා කරන්නට බොහොම සුළු වෙලාවක් තිබෙන්නේ.

ඊළඟට අපි විශේෂයෙන් කියන්නට ඕනෑ, සීනි පාරිභෝගිකයන්ට සහනයක් දීලා තිබෙන බව. දැන් බලන්න, අද සීනි වැඩියෙන්ම පාවිච්චි කරන්නේ මොනවාටද? කසිප්පු පෙරන්නටත් පාවිච්චි කරනවා. එදිනෙදා නිවෙස්වල පාවිච්චි කරන ප්‍රමාණය කොච්චරද? කසිප්පු පෙරන්න ඕනෑ ප්‍රමාණය කොච්චරද? එහෙම නම් ඇයි මේවා ධෛර්යවත් කරන්නේ? එතනෝල් ගෙන්වූවාය කියා කෑ ගහන කට්ටිය දැන් කසිප්පු සංස්කෘතියක් ඇති කරන්නට යනවාද මම දන්නේ නැහැ. මම මේ කාරණය ගැන පසුව උත්තර දෙන්නම්. තාර්කිකව මම තමුන්නාසේලාට කරුණු කියන්නම්. සීනි අමු ද්‍රව්‍යයක් වශයෙන් යොදා ගන්නා කර්මාන්තකරුවන්ගෙන් සමහර අයගේ ආදායම වැඩි වෙනවා. නමුත් අපට මේ සඳහා යන විදේශ විනිමය කොච්චරද?

කලින් සීනි නිෂ්පාදනය තිබුණේ මෙට්‍රික් ටොන් 31336යි. 2014 වෙද්දී සීනි මෙට්‍රික් ටොන් 50832ක් නිෂ්පාදනය කර තිබෙනවා. අවුරුද්දකට සීනි මෙට්‍රික් ටොන් ලක්ෂ හයක් අවශ්‍යයි. එයින් සියයට 10ක් අපි නිෂ්පාදනය කර ගෙන තිබෙනවා. දැන් මේ බද්ද නැති වුණාම අර සීනි ගොවියා එහෙමම ඉවර වෙනවාය කියන එකත් මතක තියා ගන්න ඕනෑ.

ඊළඟට සංචාරක ව්‍යාපාරය ගැන වෙනම අපි කථා කරන්නට ඕනෑ. සංචාරකයෝ විවිධ දේවල්වලට එනවා. සමහර ඒවා අත්හැර දමා තිබෙනවා. ඒවා අත්හැර දැමීමේ ප්‍රතිඵල ගැන මම සභාව කල්තැබීමේ යෝජනාවක් ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා. මේ අවස්ථාවේ කාලය නැහැ. ඒ නිසා ඒ ගැනත් අපි කියන්න ඕනෑ.

ඊළඟට උම්බලකඩ ගැනත් කියන්න ඕනෑ. උම්බලකඩ ගෙන්වන්නේ කොහොමද? අපට මේ රටේ උම්බලකඩ නිෂ්පාදනය කර ගන්න පුළුවන්. උම්බලකඩ හදා ගන්න පුළුවන් ක්‍රමවේද ඕනෑ තරම් තිබෙනවා. මාළුවා ශුද්ධ කරලා, උණු වතුරේ දමලා තම්බලා, මඳ පවනේ තමයි වියලා ගන්න ඕනෑ. මේ සඳහා හදපු මැෂින් තිබෙනවා. මම හිතන විධියට ධීවර සංස්ථාවත් ඒ සඳහා මැෂින් හදා ගත්තා. දැන් කර්මාන්තයක් වශයෙන් උම්බලකඩ නිෂ්පාදනය දියුණු වෙලා තිබෙනවා. කිලෝවක් රුපියල් 1200 ඉඳලා, 1400 දක්වා ගණන්වලට තමයි තිබෙන්නේ.

[ගරු ෆිලික්ස් පෙරේරා මහතා]

අපේ රටේ රුපියල් 600කට 700කට උම්බලකඩ කිලෝ එකක් හදා ගන්න පුළුවන්. අද මේවා ගෙන්වුවාම මොකද වෙන්නේ? ගෙන්වුවත් මේ ගණනම වෙනවා. ඒ සඳහා කොච්චර විදේශ විනිමය යනවාද? මේවා ප්‍රායෝගිකද කියලා පොඩ්ඩක් හිතන්නකෝ.

ඊළඟට කොත්තමල්ලි. මේ කොත්තමල්ලි ආදර්ශය කොහෙන් ගත්තාද මම දන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තව විනාඩියක් දෙන්න බැරිද?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
විනාඩියක් තිබෙනවා. කමක් නැහැ. ජිප්සීස් නායක සුනිල් දන්නවා නේ. ජිප්සීස් කණ්ඩායමේ අලුත්ම සින්දුව කොත්තමල්ලි ගැනයි. මේ සින්දුවේ මෙහෙම කියනවා.

"අනම් මනම් බෙහෙත්වලට ඇයි ගෙවන්නේ සල්ලි.....
ඕන ලෙඩක් හොඳ වෙනවා බොන්න කොත්තමල්ලි.....
රුමේනියාවේලු තියෙන්නේ හොඳම කොත්තමල්ලි.....
ලංකාවට ගෙන්නන්නේ අපේ අමල් මල්ලි....."

අමල් මල්ලි කවුද කියලා මම දන්නේ නැහැ. ඒ සින්දුවේ තවදුරටත් මෙහෙම කියනවා.

"බොමු අපි කොත්තමල්ලි - මොකටද විස්කි බ්‍රැන්ඩි
බොන්න නංගි මල්ලි - සැවොම කොත්තමල්ලි
ඔය ලෙඩට දුකට ඔබට පිහිට වෙන්නේ කොත්තමල්ලි"

ඒ විධියට තමයි ජිප්සීස් නායක සුනිල් කියලා තිබෙන්නේ. එතුමාගේ ආදර්ශය රවි කරුණානායක ඇමතිතුමා ගත්තාද දන්නේත් නැහැ. මේක තමයි අලුත්ම සින්දුව. මේ සින්දුව බොහොම ජනප්‍රිය වෙලා තිබෙනවා. පාර්ලිමේන්තුවේ මේවා තාලයට කියන්න බැහැ. තහනම්. මේ සින්දුව මම **සභාගත*** කරනවා.

ඒ සින්දුවේ තවදුරටත් මෙහෙම කියනවා.

"තරුණ වෙන්න සමහර අය විටමින් පෙති බොති.....
Exercise කරලා, කරලා, සමහරුන්ට හති.....
ඔය අරවා මේවා මුකුත් නොකර කොල්ලා වගේ ඉන්නේ .....
මම තාමත් උදේ හවා කොත්තමල්ලි බොන්නේ.....
පණහ පැනලා උණත් එයා ෆිට් එකේනේ ඉන්නේ....."

කවුද මේ කියන්නේ? ජිප්සීස් සුනිල්.[බාධා කිරීමක්] ඒ වුණාට අපේ වැඩිහිටි ඇමතිවරුන්ට මේවා ප්‍රයෝජනයක් වෙනවා නම් කමක් නැහැ, පොඩ්ඩක් වැඩි කරලා දෙන්න. කොත්තමල්ලි බොන්න. විස්කි බ්‍රැන්ඩි එහෙම බොන්න එපා. ඒකයි කියන්නේ. මේ රටට සංචාරකයෝ ආවත් අපට කොත්තමල්ලි එකක් දෙන්න පුළුවන් නේ. ඒක තමයි තිබෙන හොඳම දේ.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මගේ වෙලාව ඉවරද? මම තව එක කාරණාවක් කියන්නම්. ඇපල් import කරන්න අපි රුපියල් බිලියන 1.5ක් වියදම් කරනවා. ඒක නතර කරන්න. දේශීය ගොවියාට තැනක් දෙන්න. ඇයි, ඇපල්? මොකටද ඇපල්? ඇට නැති මිදි ගැන මම පාර්ලිමේන්තුවේත් කථා කළා. හෝමෝන් ගහපු ඇට නැති මිදි තිබෙනවා. ඒකට කියන්නේ "සන්පොන් මිදි" කියලා. "සන්පොන්" කියන වචනය අනෙක් පැත්තට හරවා ගන්නකෝ. මේ මිදි කාලා තමයි අපරාදේ අපේ මිනිස්සු නැති වෙලා යන්නේ. අද ඇමෙරිකාවේ ඇපල් පාච්චි කරලා රෝගයක් හැදිලා. ඇපල් තහනම් කරලා. මේවා ගෙන්වන එකෙන් මුදල් ඉතිරි කර ගන්නකෝ. Hybridවලින් ඉතිරි කර ගන්නේ මොකටද?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
කාලය ඉවරද? මට විනාඩි කීයක් තිබුණාද?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමා වැඩිපුර විනාඩි දෙකක කාලයක් අර ගෙන තිබෙනවා.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
එහෙමද? එහෙම නම් කමක් නැහැ. අනෙක් අයටත් අවස්ථාවක් දෙන්න ඕනෑනේ. මේවා ප්‍රායෝගික නැති ඒවා. හරියට බදු ගන්න බැරි නම් මේවා දුන්නාට පස්සේ කරන්න වෙන්නේ මොකක්ද? ලක්ෂ 13ක් වුණු රාජ්‍ය සේවකයෝ ලක්ෂ15 දක්වා අපි වැඩි කර තිබෙනවා. තමුන්නාන්සේලා අනිවාර්යයෙන්ම යෝජනාවක් ගෙනෙයි, කීයක් හරි අර ගෙන කැමැති නම් මේගොල්ලන්ට ගෙදර යන්න පුළුවන් කියලා. ඒ යෝජනාව ළඟදීම ගෙනෙයි කියලා මම හිතනවා. මොකද, මේ දෙන දේවල් දෙන්න මුදල් සොයා ගන්න තමුන්නාන්සේලාට ක්‍රමවේදයක් නැහැ. බොහොම ස්තුතියි.

[අ.භා. 2.58]

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා
(மாண்புமிகு (கலாநிதி)சரத் வீரசேகர)
(The Hon. (Dr.) Sarath Weerasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි ආණ්ඩු පක්ෂයේ සිටිද්දීත් කථා කරන්න ලැබුණේ ඉතාම කෙටි කාලයක්. දැන් විපක්ෂයට ඇවිල්ලාත් මන්ත්‍රීවරු විශාල සංඛ්‍යාවක් සිටින නිසා ලැබී තිබෙන්නේත් කෙටි කාලයක් නිසා ඉතාම කෙටියෙන් මගේ අදහස් ප්‍රකාශ කරන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජනතාවගේ ඇහැට වැලි ගසමින් ඊළඟ මැතිවරණය ඉලක්ක කර ගනිමින් හදපු ප්‍රායෝගික නොවන කූට අයවැයක් හැටියට තමයි අපි මෙය දකින්නේ. මා කැමැතියි, මුලින්ම මුදල් ඇමතිතුමාගේ ප්‍රකාශයකින් මගේ කථාව

පටන් ගන්න. එතුමා කිව්වා, කුඩු සිටුවරු කැසිනෝකාරයෝ, එතනෝල් රජවරු අපේ දරුවන්ගේ අනාගතය අඳුරු කර දැම්මා කියලා.

බොහෝ අහිංසක ළමයින් කැසිනෝකාරයන්ගේ කපටි උපක්‍රමවලට යට වුණා, ගොදුරු වුණා කියලා තමයි එතුමා කිව්වේ. එහෙම නම් ඇයි එතුමන්ලා බලයට ආවාට පස්සේ කැසිනෝ තහනම් කරන්නේ නැත්තේ? එතුමන්ලාට ඉතා ලෙහෙසියෙන් ඒක තහනම් කරන්න පුළුවන්. නමුත් එතුමන්ලා අද කැසිනෝ සමාගම්වලින් රුපියල් බිලියන එකක බද්දක් අයකර ගන්නවා. අපේ ආණ්ඩුව තිබෙන කාලයේ විරාත් කාලයක් තිස්සේ පැවැතගෙන ආපු කැසිනෝ සමාගම් තමයි තිබුණේ. ඒ ගොල්ලන් ව්‍යාපාරයක් හැටියට ආදායම් බදු ගෙව්වා. නමුත් අපි කවදාවත් බලපත්‍ර නිකුත් කළේ නැහැ. නමුත් මේ වාගේ විශාල මුදලක් අය කරන විට ඒ කැසිනෝ සමාගම්වලට ඉතා දැඩිව කියන්න පුළුවන් අපට බලපත්‍රයක් ලබා දෙන්න කියලා. ඒ නිසා මම ආණ්ඩුවෙන් අහන්න කැමැතියි, ඒ ගොල්ලන්ට බලපත්‍ර නිකුත් කරලා මේ කැසිනෝ regularize කරනවාද, ක්‍රමානුකූල කරනවා ද කියලා. බදු අය කර ගෙන ක්‍රියාත්මක කරන මේ කැසිනෝවලින් දරුවන්ගේ අනාගතය අඳුරු වෙන්නේ නැද්ද? දරුවන් ඔවුන්ගේ කපටි උපක්‍රමවලට ගොදුරු වෙන්නේ නැද්ද කියලා මම ඉතා පැහැදිලිව අහනවා. ඇත්ත වශයෙන්ම ඒ ප්‍රශ්නයට උත්තරයක් අපට අවශ්‍ය වෙනවා. අපේ රජය කාලයේ කැසිනෝ තිබුණාය කියලා මෙච්චර කල් අවලාද නැඟුව මේ ආණ්ඩුව අද ඔවුන්ගෙන් බදු අය කර ගෙන තවදුරටත් කැසිනෝ ක්‍රියාත්මක කරන්නට ඉඩ දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි චීනයෙන් ආධාර ගත්තා. නමුත් කවදාවත් අපි චීනයට යටත් වුණේ නැහැ. චීනය අපේ අභ්‍යන්තර කටයුතුවලට කවදාවත් ඇඟිලි ගැහුවේ නැහැ. ඇමෙරිකාවේ අතිරේක රාජ්‍ය ලේකම් නිෂා බිස්වාල් මේ ළඟදී අපේ රටට ආවා. ඇවිල්ලා මොනවාද කිව්වේ? "There is much to be done in Sri Lanka" කියලා, එතුමිය කියනවා as if she does not know what we have done already in Sri Lanka. We have crushed the most ruthless terrorist organization in the world, whereas they could not even punish the Talibans with all the sophistication. බිස්වාල්ගේ රට නියෝජනය කරමින් මෙහාට ඇවිල්ලා අපට කියනවා, "There is much to be done in Sri Lanka" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ රට ආසියාවේ රටක්. ඇත්ත වශයෙන්ම මේ රට ආසියාවේ රටක් නිසා තමයි අපට චීනය සහ රුසියාව සහයෝගය දෙන්නේ. අපේ විදේශ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රතිපත්ති සකස් විය යුත්තේ අපේ ආසියානු සංස්කෘතිය අනුව මිස ඇමෙරිකානු සහ යුරෝපීය සංස්කෘතිය අනුව නොවෙයි. අද අපට මේ විධියට උපදෙස් දෙන්න එන ඇමෙරිකාව ඩොලර් ට්‍රිලියන 60ක් ලෝකයට ණයයි.

ඒ වාගේම මානව හිමිකම් ගැන කථා කරන විට, drones - spy airplanes - ඒ කියන්නේ ඔත්තු බලන ගුවන් යානා 30,000ක් යම් යම් කටයුතු සොයා බලමින් අද ඇමෙරිකානු උඩු ගුවනේ සැරිසරනවා. ඒ වාගේම ඇමෙරිකාවේ සම්පූර්ණ ආර්ථිකය දුවන්නේ සමාගම් හරහා. ඒ වාගේ රටකින් ආපු බිස්වාල් මහත්මිය මේ රටට ඇවිත් කියනවා, "There is much to be done in Sri Lanka" කියලා. නමුත් අපි ඒවා පොඩ්ඩක්වත් ගණන් ගන්නේ නැහැ.

2015 අප්‍රේල් 23 වැනි දා පාර්ලිමේන්තුව විසුරුවන නිසා මැතිවරණය ඉලක්ක කර ගෙන තමයි මේ වාගේ අය වැයක් ඉදිරිපත් කරන්නේ. ජනතාවගේ පඩි වැඩි කරන එක හොඳයි. රාජ්‍ය සේවකයන්ගේ වැටුප රුපියල් 10,000කින් වැඩි කරන එක හොඳයි. රුපියල් 20,000කින් වැඩි කරනවා නම් අපි ඊටත් වඩා සන්තෝෂයි. නමුත් රාජ්‍ය සේවයේ වැටුප් රුපියල් 10,000කින් වැඩි කරන්න පමණක් රුපියල් බිලියන 140ක් මාසයකට ඕනෑ. නමුත් ඒ තරම් මුදලක් සොයා ගන්නේ කොහොමද කියලා මෙතුමන්ලා හරි හැටි විස්තර කරලා නැහැ. ඒ බදු අය කර ගන්නේ එක පාරකට පමණයි - one-off tax. ඒ කියන්නේ මේ අවුරුද්දට පමණයි ඒ වැටුප දෙන්න පුළුවන්. ඊළඟ අවුරුද්දේ දෙන්නේ කොහොමද කියලා විශ්වාසයක් නැහැ.

ගරු අගමැතිතුමා මේ පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයක් කළා, මේ අතුරු අය වැය සූර සරදියෙල්ගේ අය වැයක් කියලා. ඒ කියන්නේ ඇති අයගෙන් අරගෙන නැති අයට දෙන අය වැයක් කියන එකයි. එදා ඇති අය කිව්වේ සුද්දන්ට. ඒ දවස්වල සුද්දෝ අපේ සම්පත් සූරා කෑවා. ඒ වාගේ සුද්දන්ගෙන් අරගෙන තමයි සූර සරදියෙල් දුප්පත් මිනිසුන්ට දුන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, නමුත් අපි දන්නවා සූර සරදියෙල් සුද්දන් විසින්ම එල්ලා මැරුව බව. ඒ වාගේ ඉරණමක් අපේ අගමැතිතුමාට අත්නොවේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

මහඔය, අපේ ගමේ ගැමියෙක් ඉතා ලස්සන කථාවක් කිව්වා. වැවක සොරොව්ව වහලා අනෙක් පැත්තෙන් ඇල මාර්ග හදලා පොඩි පොඩි කුඹුරුවලට වතුර දුන්නොත් සම්පූර්ණයෙන්ම වතුර නාස්ති වෙලා යනවාලු. සොරොව්ව ඇරලා සොරොව්වෙන් තමයි වතුර දෙන්න ඕනෑ. අපි ඒ විධියට නොකර, ඇති අයගේ ධන ප්‍රවාහය, සම්පත් ප්‍රවාහය වහලා ඒවා දුප්පත් ජනතාවට දුන්නොත් ඇති අයත් නැති වෙලා ලංකාවේ ඉතිරි වෙන්නේ නැති අය පමණයි. එතකොට රට අරාජික වෙනවා. ඒ නිසා තමයි අද කොටස් වෙළෙඳ පොළ සම්පූර්ණයෙන්ම බැහැලා තිබෙන්නේ. ඒ නිසා තමයි අද ඩොලර් එක ඉහළ ගිහිල්ලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි දහම් පාසල්වල සහ පෙර පාසල්වල ගුරුවරුන්ට රුපියල් 2,500ක දීමනාවක් දුන්නා. නමුත් අද මේ ආණ්ඩුව රුපියල් 200ක දීමනාවක් මාසිකව ඒ අයට දෙනවා කියනවා. ඒ කියන්නේ සුමානයකට රුපියල් 50ක් වාගේ මුදලක් තමයි ලැබෙන්නේ. ඉරිදා ඉස්කෝලේ උගන්වලා ගෙදර යන කොට ඒකෙන් මාළු පාන් ගෙඩියක් කාලා ගෙදර යන්න පුළුවන්. එච්චර තමයි දීලා තිබෙන්නේ. නමුත් අපේ ආණ්ඩුව කාලයේ අපි මොනවාද කළේ? අපි ධර්මාචාර්ය විභාගය සමත් වුණු සහ අවුරුදු දහයක් සේවය කර තිබෙන දහම් පාසල් ගුරුවර ගුරුවරියන්ට රජයේ ගුරු පදවිය ලබා දීමට සූදානම් වෙලා සිටියා. අන්න එහෙම තමයි, අපි පෙර පාසල් සහ දහම් පාසල් ගුරුවරුන්ට සැලකුවේ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත වෙලාවෙන් තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා
(மாண்புமிகு (கலாநிதி)சரத் வீரசேகர)
(The Hon. (Dr.) Sarath Weerasekara)
හොඳමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒකයි මම මුලින් කිව්වේ, විපක්ෂයට ගිහිල්ලාවත් අපට කථා කරන්න වෙලාවක් නැහැ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, හිටපු ජනාධිපතිතුමාට රුපියල් මිලියන 9,500ක වැයක් තිබුණු බවත්, එය මෙවර අඩු කළ බවත් පවසමින් ජනතාව නොමඟ යවා තිබෙනවා. නමුත් සිදු වුණේ මේකයි. හිටපු ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය යටතේ විවිධ ආයතන තිබුණා. අද ඒ ආයතන අඩු කරලා තිබෙනවා. අද ඒ ආයතන වෙනත් අමාත්‍යාංශවලට පවරා තිබෙනවා. ඒ නිසා ඒ සල්ලි ඉතුරුවක් වෙලා නැහැ. අන්න ඒක තමයි වෙලා තිබෙන්නේ. ඒ වාගේම තමයි, හිටපු ජනාධිපතිතුමාට ඩොලර්

[ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා]

මිලියන 16ක ගුවන් යානයක් මිලදී ගත්තාය කියලා සාවද්‍ය ප්‍රකාශයක් කළා. Airbus industry එකෙන් කවදාවත් පගා දෙන්නේ නැහැ. Even the British Prime Minister has praised the transparency of this transaction. බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් පවා මේ ගනුදෙනුව ඉතාම හොඳින් සිදු වුණු ගනුදෙනුවක් හැටියට ප්‍රකාශ කර තිබෙනවා. ඒ වාගේම තමයි ඔවුන් මේ යානය දීලා තිබෙන්නේ complimentary kit එකක් හැටියටයි. ඒක order කරලා තිබෙන එකක් නොවෙයි. අද ඒ වාගේ ව්‍යාජ සහ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කරමින් ජනතාව නොමඟ යවමින් හිටපු ජනාධිපතිතුමා අපහසුතාවට පත් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මාත් අම්පාර දිස්ත්‍රික්කය නියෝජනය කරන කෙනෙකු නිසා ඔබතුමිය මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න.

ඊයේ ගරු රන්ජන් රාමනායක නියෝජ්‍ය අමාත්‍යතුමා ගම්පහට ගිහින් VIP කුටියක් ගැන කියලා ඉතාම වැරදි ප්‍රකාශයක් කළා. එතුමා කළ ප්‍රකාශය ස්වර්ණවාහිනී නාලිකාවේ ප්‍රවෘත්ති තුළින් විකාශය කළා. එතුමා කිව්වා, "හිටපු ජනාධිපතිතුමා තමයි, රුපියල් කෝටි 200ක් පමණ වියදම් කරලා ජනතාවගේ මුදල් මේ විධියට අයුතු ලෙස පාවිච්චි කර තිබෙන්නේ" කියලා. නමුත් ඒ මුදල පූජ්‍ය බෝදාගම චන්දිම හාමුදුරුවෝ තායිවානයේ සිට එවපු මුදලක්. මේ විධියට ඇයි හිටපු ජනාධිපතිතුමාට මඩ ගහන්නේ?

අද වෙන කොට යාපනයේ දෙමළ ජනතාව ප්‍රභාකරන් වීරයෙක් කරලා තිබෙනවා. අද ඔහු වෙනුවෙන් පහන් පත්තු කරනවා. ඔහුට හඳුන්කුරු පත්තු කරලා වීරයෙක් බවට පත් කරන කොට, ඒ ප්‍රභාකරන් විනාශ කළ, ඒ ත්‍රස්තවාදය විනාශ කළ මහින්ද රාජපක්ෂ මැතිතුමා කුමන්ත්‍රණකාරයෙක්, හොරෙක්, වංචාකාරයෙක් කියලා අද අපේ රටේ සිංහලයන්ම කියනවා. ඒ වාගේ කුහක, ගුණමකු සිංහලයන් ගැන ඇත්ත වශයෙන්ම අපි කනගාටු වෙනවා. ඒ වාගේම, එවැනි ප්‍රකාශවල තිබෙන නිරවද්‍යභාවය ගැන සොයන්නේ නැතුව ඒවා ගෙඩි පිටින් විකාශය කරන ගුණමකු, කුහක නාලිකා ගැනත් අප කනගාටු වෙනවාය කියන එක මේ අවස්ථාවේදී කියා සිටිමින් මගේ වචන ස්වල්පය සමාප්ත කරනවා.

[අ.භා. 3.06]

ගරු නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ප්‍රථමයෙන්ම අතිගරු ජනාධිපතිතුමාටත්, අග්‍රාමාත්‍යතුමා ඇතුළු නව රජයටත් සුබ පතනවා; ආශිර්වාද කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද ආණ්ඩුව මෙම අය වැය හඳුන්වන්නේ, "සහන දෙන අය වැයක්" විධියටයි. අපි එය පිළිගන්නවා. සහන නරකයි කියලා අපි කියන්නේ නැහැ. හැබැයි, මේ අය වැයෙන් සහන දෙන ගමන් අනිත් පැත්තෙන් ගහන අය වැයක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. එක් පැත්තකින් ජනතාවට සහන දෙනවා කියන චේතනාව උඩ කටයුතු කරනවා. ඒ වාගේම අනිත් පැත්තෙන් ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයාට, සන්ධාන ආණ්ඩුවට වැඩ කරපු ගමේ අයට පහර දෙන අය වැයක් බවට මේ අය වැය පත් කර ගෙන තිබෙනවාය කියන එකත් මම මේ අවස්ථාවේ මේ ගරු සභාව තුළදී මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ආර්ථික සංවර්ධනය, ග්‍රාමීය වර්ධනය සහ ග්‍රාමීය යටිතල පහසුකම් පිළිබඳව මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව පැවැති පසු ගිය වසර කීපය තුළ අපේ අවධානය යොමු කර තිබුණා. ඒ තුළින් ගම තුළ යටිතල පහසුකම් වර්ධනයේ විශාල ප්‍රබෝධයක් අපි දැක්කා. මහින්දෝදය විද්‍යාගාර ගොඩ නැඟීම තුළ ගමේ දරුවන්ගේ පාසල් අධ්‍යාපනය වර්ධනය කිරීමට, තොරතුරු තාක්ෂණය වර්ධනය කිරීමට අවශ්‍ය දැවැන්ත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වූ හැටි අපි දැක්කා. අපි බලාපොරොත්තු වෙනවා, පසු ගිය රජය තුළින් අප කර ගෙන පැමිණි හොඳ වැඩ පිළිවෙළවල් මේ ආණ්ඩුව විසින් ඉදිරියට අරගෙන යයි කියලා. එම විශ්වාසය අප සතුව තිබෙනවා.

අද වී ගොවියා ගැන තමුන්නාන්සේලා කථා කර තිබෙනවා. වීවල සහතික මිල රුපියල් පනහ දක්වා වැඩි කරන බවට ප්‍රකාශ කර තිබෙනවා. ඒක හොඳයි; අපි සතුටු වෙනවා. ජනතාවට සහන ලබා දෙන එක පිළිබඳව අපි ආඩම්බර වෙනවා; සතුටු වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. හැබැයි, අද - මේ වේලාවේත් - අපේ ගම්වල ගොවීන්ගේ වී ටික රුපියල් විසිපහට, රුපියල් විසිහයට තමයි අළෙවි වෙන්නේ.

රාජ්‍ය සේවකයාගේ වැටුප ගැන කථා කළොත්, රජයේ සේවකයා තමුන්නාන්සේලාට ඡන්දය දුන්නේ මූලික වැටුපට රුපියල් 10,000ක් වැඩි වෙයි කියන බලාපොරොත්තුවෙන්. හැබැයි, යම්කිසි හේතුවක් නිසා ඒ වැඩි වන මුදල මූලික වැටුපට එකතු වෙන්නේ නැහැ කියලා තමයි අපට දැන ගන්න ලැබෙන්නේ.

අද බදු අය කිරීම් පිළිබඳව, බදු ප්‍රතිපත්ති පිළිබඳව රට තුළ නොයෙක් කතිකාවත්, නොයෙක් මතිමතාන්තර ගොඩ නැඟිලා තිබෙනවා. අපි කියන්නේ නැහැ, කැසිනෝවලට බදු ගහන්න එපා කියලා. ඒ ගැන අපි කැමැතියි; අපි සතුටු වනවා. තව වැඩියෙන් ගත්තත් කමක් නැහැ. හැබැයි, අපට හිතා ගන්න බැරි දේ තමයි කැසිනෝවලින් අය කරන බදු ප්‍රමාණයම ක්‍රීඩා නාලිකාවකිනුත් අය කිරීම. එතකොට කැසිනෝ සහ ක්‍රීඩා නාලිකාව අතර තිබෙන සම්බන්ධතාව මොකක්ද? කොහොමද මේ දෙක ගැන නිර්ණය කළේ? ක්‍රීඩාව සහ කැසිනෝ කියන දෙකට එක සමාන බදු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වෙන්නේ කොහොමද කියන එක පිළිබඳව අපට සැකයක් තිබෙනවා. ඒ නිසා අපි තමුන්නාන්සේලාගෙන් ඉල්ලීමක් කරනවා, වෛරයෙන් බදු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නේ නැතුව රටේ ජනතාවට සහන දෙන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න කියලා.

අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපි විපක්ෂය විධියට තමුන්නාන්සේලාට සහයෝගය දෙන්න තීරණය කර තිබෙනවා. එහෙම නම් මේ කාල සීමාව තුළ ගොවියා, ධීවරයා සහ කම්කරුවා ශක්තිමත් කරන වැඩ පිළිවෙළක් තමුන්නාන්සේලා ක්‍රියාත්මක කරන්න ඕනෑ. පසු ගිය කාල සීමාවේ අපි එය ක්‍රියාත්මක කළා.

මේ අය වැයත් එක්ක අද දේශීය ගොවියා අධෛර්යට පත් වන්න පටන් අරගෙන තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මුං ඇට ගොවියා, උඳු ගොවියා අධෛර්යට පත් වන ප්‍රතිපත්ති මාලාවක් මේ අය වැය තුළින් ක්‍රියාත්මක වන බවක් තමයි අපට පෙනෙන්න තිබෙන්නේ. මේ අය වැය, සහන දෙන මුවාවෙන්, මැතිවරණය ඉලක්ක කර ගත් අය වැයක් කියලා තමයි කනගාටුවෙන් වුණත් අද මේ ගරු සභා ගර්භය තුළදී හඳුන්වා දෙන්න වෙන්නේ.

සහන ලබා දෙනවාට අපි කැමැතියි. පඩි වැඩි කරනවාට අපේ විරුද්ධත්වයක් නැහැ. ඒ ගැන අපි සතුටු වනවා. හැබැයි, අනෙක් පැත්තෙන් රටේ ග්‍රාමීය ආර්ථිකය නඟා සිටුවන්න වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියන එක තමයි අපට මේ ගරු සභාව තුළදී අපේ ආණ්ඩු පක්ෂයෙන් ඉල්ලා සිටින්න වෙන්නේ.

මා අවසාන වශයෙන් කියා සිටිනවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපි පක්ෂයේ සභාපතිතුමාට ගරු කරලා, පක්ෂයේ තීරණයට අනුව

මේ අය වැයට පක්ෂව ඡන්දය දෙන බව. හැබැයි, මේ අය වැය තුළින් රටේ ඉදිරි අනාගතයට මොන වාගේ බලපෑමක් වෙයිද කියන එක පිළිබඳව අපේ හෘදය සාක්ෂියට අනුකූලව යම් කිසි චකිතයක් තිබෙනවා. හෘදය සාක්ෂියට අනුකූලව අපට මේ අය වැයට පක්ෂව ඡන්දය දෙන්න බැරි වුණත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විධියට මේ අය වැයට ඡන්දය දීලා දින සියයේ වැඩ පිළිවෙළට සහයෝගය දෙනවා කියන එකත් මතක් කරමින් මා නිහඬ වනවා.

[අ.භා. 3.11]

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதார மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)

(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health and Indigenous Medicine)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද මේ අය වැය ගැන කථා කරන කොට අය වැයේ තිබෙන සියලුම යෝජනා ගැන මම කථා කරන්න යන්නේ නැහැ. මම කථා කරන්නේ, අය වැයේ තිබෙන "තේමාව" ගැනයි. ඒ තේමාව තමයි වැදගත්. මේ අය වැයෙන් සම්පූර්ණයෙන්ම ජනතාවට ලබා දුන්නේ සහන. මේක අමුතු දෙයක් නොවෙයි; අපේ දවස් සියයේ මෛත්‍රී පාලන වැඩසටහනේ පොරොන්දු පත්‍රයයි. මේ පොරොන්දු පත්‍රයෙන් අපි පොරොන්දුවක් ලබා දීලා තිබෙනවා, "ජනවාරි මාසයේ 29වැනි දාට අතුරු අය වැයක් මඟින් මේ රටේ ජනතාවට සහන ලබා දෙනවා" කියලා. ඒ සහන ලැයිස්තුව මොකක්ද කියලා එහි සඳහන්ව තිබෙනවා. මේ සහන ලැයිස්තුව තමයි අද ඉදිරිපත් කරන්නේ.

විපක්ෂය කියනවා, දින සියයේ වැඩසටහනට වචනයක් පාසා සහයෝගය දෙනවා කියලා. වචනයක් පාසා සහයෝගය දෙනවා කියලා, ඊට පස්සේ ඒකේ තිබෙන හැම වචනයකටම විරුද්ධ වනවා; අනෙක් පැත්තට කථා කරනවා. මට හිතෙන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සමහර මන්ත්‍රීවරුන්ට, "මේ මොකක්ද වුණේ?" කියලා කරකැවිච්ච ඔළුව තවම හදා ගන්න බැරි වෙලා තිබෙනවා කියලායි. ඒ ගොල්ලන්ට තේරුණේ නැති වුණාට මේ රටේ මුළු මහත් ජනතාවම අද ඒක තේරුම් අරගෙන ඉවරයි. ඒ ගොල්ලන්ටත්, ඒ ගොල්ලන්ගේ වටේ ඉන්න ප්‍රාදේශීය සභා, පළාත් සභා මන්ත්‍රීවරුන්ටත් පසු ගිය කාලයේ කොන්ත්‍රාත් කළ සියලු දෙනාටමත් තවම ඔළුව හදා ගන්න බැහැ. ඒ ගොල්ලෝ විතරක් නොවෙයි, මහ ජනතාව. මගේ ආසනය මම උදාහරණයකට ගන්නම්. මමත් එක්ක ආවේ එක ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයායි, එක නගර සභා මන්ත්‍රීවරයායි. මම ඒ ආසනය මහින්ද රාජපක්ෂ මහත්මයාට ජයග්‍රහණය කරලා දුන්නේ වැඩි ඡන්ද 15,000කින්. මන්ත්‍රීවරු දෙදෙනායි මාත් සමඟ ආවේ. මේ පාර මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා දිනුවා, වැඩි ඡන්ද 15,000කින්. ඡන්ද 30,000ක් එළියට ආවා. හැබැයි, මන්ත්‍රීවරු ආවේ නැහැ. ඒ නිසා දේශපාලනය ඉගෙන ගන්නවා නම් තමුන්නාන්සේලා මතක තබා ගන්න, ඔය ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුයි, පළාත් සභා මන්ත්‍රීවරුයි එක්ක කථා කරලා ආවොත් තමුන්නාන්සේලාගේ දේශපාලන ගමන විනාශ වෙලා යනවා කියන එක. ගමට ගිහින් කෙළින්ම ජනතාවට කථා කරන්න. ඒ මිනිස්සු අද මොකක්ද කියන්නේ? පාර්ලිමේන්තුවේ ඉන්න සේවකයෝ වුණත් අද මට කියන්නේ, අද බස් එකේ යන විට පවා "ඇයි, මේ හොරු ඇතුළට ගන්නේ නැත්තේ? ඇයි, මේ වැරැදි කළ අයට දඬුවම් ලබා දෙන්නේ නැත්තේ? " කියලා මිනිසුන් ඔවුන්ගෙන් අහනවා කියලායි. අන්න එතැනයි මහ ජනතාව ඉන්නේ. අන්න ඒ මහ ජනතාව තමයි තිබුණු රජය පෙරළා දුන්නේ. ඒක තමයි පෙරළිය. ඒකට තමයි අපි අපේ ඇමතිකම් දාලා එළියට බැස්සේ. තමුන්නාන්සේලාට පිට කොන්දක් තිබුණේ නැහැ, ඇමතිකම් වරප්‍රසාද දාලා එළියට එන්න. සමහර ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට පිට කොන්දක් තිබුණේ නැහැ, මන්ත්‍රීකම අතහරින්න. අන්න ඒ පිට කොන්ද තිබුණා නම් හොඳට ඔළුව වැඩ කරනවා, මොකක්ද මේ වෙන්නේ කියලා තේරෙනවා. හෙට මැතිවරණයක් පවත්වලා බලන්න, ඔය ඡන්ද ප්‍රතිශතය ලැබෙනවා ද කියලා. හෙට මැතිවරණයක් පැවැත්තුවොත් තමුන්නාන්සේලාට තව ඡන්ද ලක්ෂ 20ක් අඩු වෙනවා. ඒක තමයි යථාර්ථය. මොකද තමුන්නාන්සේලා නොවෙයි, එක සීමිත කොට්ඨාසයක් තමයි මේ සමඟ ඉන්නේ. අපි විතරක් එළියට බැස්සාට, කැබිනට් මණ්ඩලයෙන් තුන්කාලක් අපේ මතයේ හිටියා. බොරු කථා කරන්න ඕනෑ නැහැ, අපිත් එක්ක ඒ අය කථා කළා, ඒ ගොල්ලෝ එළියට බැස්සේ නැහැ. නමුත්, මේ වෙන දේවල් ගැන අපට වඩා ඉදිරියෙන් කථා කළා. එක පවුලක්, ඒ පවුල වටා ඉන්න එක කණ්ඩායමක් ආණ්ඩුව කරන හැටි ගැන කථා කළා. අද මොකක් ගැනද, ඔවුන් කථා කරන්නේ? කැසිනෝ එකට ගැහුව බද්ද ගැන කථා කරනවා. මේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයද? එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහත්තයා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැදුවේ කැසිනෝකාරයන් වෙනුවෙන් කථා කරන්නද? ලජ්ජා නැද්ද, කැසිනෝ කියන වචනය වෙනුවෙන් ඉදිරිපත් වෙන්න? කැසිනෝකාරයන්ගෙන් රුපියල් බිලියන එකක බද්දක් නොවෙයි, රුපියල් බිලියන දාහක බද්දක් අය කළත් ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන්ට තිබෙන අමාරුව මොකක්ද? ඒ කාලේ නම් එක්සත් ජාතික පක්ෂයටයි ඒ සම්බන්ධයෙන් අමාරුව තිබුණේ.

අද සමහර අය කිව්වා, මේක නව ලිබරල් ආර්ථිකයක් කියලා. එක්සත් ජාතික පක්ෂය ආවොත් නව ලිබරල් වෙනවා. මොකක්ද, අද වෙලා තිබෙන්නේ? පසු ගිය කාලයේ එක්සත් ජාතික පක්ෂයේ මොන තරම් පරිවර්තනයක් සිදු වෙලා තිබෙනවාද? එක්සත් ජාතික පක්ෂය විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න එකඟ වුණා; ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ගෙනාපු මැතිවරණ ක්‍රමය අහෝසි කරන්න පොරොන්දු වුණා; රටේ ඒකීයභාවයට එකඟ වුණා; නව ලිබරල් ආර්ථිකයේ ඉඳලා සමාජ වෙළඳ ආර්ථිකයට ගමන් කළා. අද සමාජ වෙළඳ ආර්ථිකය කියන්නේ මොකක්ද? ඒ, ලතින් ඇමෙරිකාවේ, නැඟෙනහිර යුරෝපයේ වාමාංශික ආණ්ඩු ජයග්‍රහණය කරලා ගෙන යන වෙළඳ ආර්ථික ප්‍රතිපත්තියයි. ඒක තමයි මේ තිබෙන්නේ. මේකට කියන්නේ "Social Market Economy" කියලා. මේ සමාජ ක්‍රමය සමාජයට උචිත වෙළඳ ක්‍රමයක්. ඒක තමයි අද චීනයේ තිබෙන්නේ, ඒක තමයි අද වියට්නාමයේ තිබෙන්නේ, ඒක තමයි අද කාම්බෝජයේ, ලාඕසයේ තිබෙන්නේ. මොනවාද මේ වෙන්නේ කියන එක ගැන තමුන්නාන්සේලා ගිහින් කියවන්න. මේ වෙනස ලංකාවේ විතරක් සිදු වෙන දෙයක් නොවේ. ලෝකයේම සිදු වුණු වෙනසක්. මේ තමයි මාකෝස්ව පරාජය කරලා පිලිපීනයේ සිදු වුණු වෙනස. මේ තමයි සුහර්තෝව පරාජය කරලා ඉන්දුනීසියාවේ සිදු වුණු වෙනස. මේ තමයි හොස්නි මුබාරක්ව පරාජය කරලා ඊජිප්තුවේ සිදු වුණු වෙනස. මේක තමයි බෙන් අලිව වෙනස් කරලා ටියුනීසියාවේ සිදු වුණු වෙනස. ඒ වෙනස තමයි ශ්‍රී ලංකාවෙත් සිදු වෙන්නේ. එය අලුත් දෙයක් නොවෙයි.

ඔබතුමන්ලා හොඳට මතක තබා ගන්න, මේ අය වැයෙන් සම්පූර්ණයෙන්ම ජනතාවට ලබා දුන්නේ සහන. මේ, ජනතාවට සහන ලබා දුන්න සරදියෙල් අය වැයක්. ෆිලික්ස් පෙරේරා මහත්මයා කියනවා, රොබින් හූඩ් අය වැයක් කියලා. කාට ද බදු ගැහුවේ? කැසිනෝකාරයන්ට බදු ගැහුවා. හැම කැසිනෝ එකකටම රුපියල් මිලියන 1,000ක බද්දක් පැනෙව්වා. ඒකෙන් කියනවා ද, අපි කැසිනෝ පිළිගන්නවා කියලා? තමුන්නාන්සේලාගේ, අපේ ඒ කාලයේ ආණ්ඩුවත් කැසිනෝවලට බදු ගැහුවා නේ. එයින් කියවෙනවාද, කැසිනෝ එකට බලපත්‍ර දුන්නා කියලා? නැහැ.

එපමණක් නොවෙයි, රුපියල් බිලියන දෙකක් 2013/14 වර්ෂය තුළ ලාභ ලැබූ සුපිරි ධනපතියන්ගෙන් සියයට 25ක් නව බද්දක් අයකර ගන්නවා. මොකට ද? රටේ මිනිසුන්ට කන්න දෙන්න. සමහරු අහනවා, "ඇයි, පරිප්පු මිල අඩු කළේ නැත්තේ?" කියලා.

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

පරිප්පුවල බද්ද රුපියල් දෙකයි. අඩු කරන්න දෙයක් නැහැ. පරිප්පුවලට ඒ කාලේ බද්දක් තිබුණේ නැහැ. ඒ නිසායි අඩු කළේ නැත්තේ. මේ මිල අඩු කළ භාණ්ඩ දහතුනේ තිබුණේ මොන වාගේ බදුද? මේ වැඩිම බදු තිබුණු භාණ්ඩයි. රුපියල් එකසිය ගණන්, රුපියල් 50, රුපියල් 40, රුපියල් 30, රුපියල් 20 වාගේ බදුයි තිබුණේ. ඇඟට දැනෙන වෙනසක් ඇති කරන්න තමයි මේ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය දහතුනක බදු අඩු කර තිබෙන්නේ. බදු අඩු කරන්න දෙයක් නැති දේවල් වෙනුවෙන් අපි බදු අඩු කරලා නැහැ. ඒ ආණ්ඩුවෙන් භාණ්ඩ එකක, දෙකක විතර බදු අඩු කරලා තිබුණා. ඉතින් ඒ භාණ්ඩවල බද්දේ අඩු කරන්න දෙයක් නැහැ.

වර්ග අඩි 5,000කට වැඩි බිම් ප්‍රමාණයක් ඇති නිවාස තිබෙන අයට වෙනම බද්දක් පැනෙව්වා. නරකද, ඒක? වාසුදේව නානායක්කාර මන්ත්‍රීවරයා, තේ පැන් සංග්‍රහයේදී මට කියනවා, "රාජිත, ඔයගොල්ලෝ ඉදිරිපත් කරලා තිබෙන්නේ අපේ අය වැය" කියලා. මම කිව්වා, "ඒක තමයි තමුන්නාන්සේලාට වැරැදුණු තැන" කියලා. තමුන්නාන්සේලාට වැරැදුණේ, තමුන්නාන්සේලා හිතුවා, යූඑන්පී එකත් එක්ක අය වැයක් ගෙනෙන කොට ඒ අය වැය ලේඛනයෙන් නව ලිබරල්වාදී ආර්ථිකයක් එනවා කියලා. නැහැ. වෙනස් වෙලා, එක්සත් ජාතික පක්ෂය. ඒකත් ලෝකයත් එක්ක වෙනස් වෙලා. සමාජ වෙළඳ ආර්ථිකයට ගමන් කරලා, එක්සත් ජාතික පක්ෂය. ඒක තමයි දැක්කේ නැති දෙය; අපේ 'වම්මුන්ට' පෙනෙන්නේ නැති දෙය. මොකද? 'වම්මු' හැමදාම රතු කණ්ණාඩියක් දමා ගෙන මේ දෙස බලා ගෙන ඉන්නේ. Dogmatismවලින් තමයි අපේ 'වම' බලන්නේ. ඒක තමයි 'වම' විනාශ වෙලා ගියේ. ඒක හොඳට මතක තබා ගන්න. අපි එළියට බහින කොට ඒ ගොල්ලෝ අපිට කිව්වා, අපි ඇමෙරිකන් අධිරාජ්‍යවාදයත් එක්ක එක්කහු වෙනවා කියලා. කවුද, ඇමෙරිකන් අධිරාජ්‍යවාදීන් එක්ක එකතු වෙලා තිබෙන්නේ? කවුද එකතු වෙලා තිබෙන්නේ, රාවුල් කැස්ත්‍රෝ. කවුද, රාවුල් කැස්ත්‍රෝ කියන්නේ? මම ගරු කරන නායකයා, මම ආදරය කරන නායකයා තමයි ෆිදෙල් කැස්ත්‍රෝ. මම යූඑන්පී එකේ ඉන්න විටත් මගෙන් ඇහුවා, මම ලෝකයේ ආදරය කරන නායකයා කවුද කියලා. මම කිව්වා, "ෆිදෙල් කැස්ත්‍රෝ" කියලා. ෆිදෙල් කැස්ත්‍රෝ තවමත් ජීවමානයි.

ෆිදෙල් කැස්ත්‍රෝගේ සහෝදර රාහුල් කැස්ත්‍රෝ, විප්ලවයට ඇවිල්ලා මොන්කාඩාවලට ගහපු රාහුල් කැස්ත්‍රෝ, එදා ඒ ඒකාධිපතින්ට විරුද්ධව සටන් කරපු රාහුල් කැස්ත්‍රෝ අද ඔබාමා එක්ක එකතු වෙනවා. අවුරුදු 15ක් හිටපු දේශපාලන සිරකරුවන් නැවත ඔවුන්ට ලබා දෙනවා. ඒ විතරක් නොවෙයි. ඔවුන් දෙගොල්ලෝ එකතු වෙනවා. රාහුල් කැස්ත්‍රෝගේ දියණිය මරීනා කැස්ත්‍රෝ ඇමෙරිකාවට ගිහිල්ලා ප්‍රකාශ කරනවා, "ඇමෙරිකාව එක්ක සම්බන්ධතාවක් නොමැතිව කියුබාවට අනාගතයක් නැහැ" කියලා. මේවා දිහා හොඳට බලන්න, මොකක්ද වෙන්නේ කියලා. "ඇමෙරිකන් අධිරාජ්‍යවාදය" කියලා බොරුවට කෑ ගහන අයටයි මම මේ කියන්නේ. තමන්ගේ ඇමතිකම අත නොහරින්නට ආත්ම ශක්තිය නැතිකමට, ඇමතිකමට තිබෙන ගිජුකමට නොයෙකුත් න්‍යාය පත්‍ර, න්‍යාය සූත්‍ර හදන කට්ටියටයි මම මේ කියන්නේ.

මම එක කාරණයක් සම්බන්ධයෙන් මන්ත්‍රීවරුන් දෙදෙනෙකුට ස්තුතිවන්ත වෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන්ට වඩා යම් දේශපාලනයක් දන්නවා, වාසුදේව නානායක්කාර මන්ත්‍රීවරයා සහ ඩිව් ගුණසේකර මන්ත්‍රීවරයා. ඔවුන් ආර්ථිකය ගැන කියවලා තිබෙනවා; දේශපාලනය ගැන කියවලා තිබෙනවා; ඉතිහාසය ගැන කියවලා තිබෙනවා. මම දැක්කා, ඔවුන් දෙන්නාම පුවත් පත්වලට කියලා තිබෙන දේවල්. ඔවුන් කියනවා, "මේක ප්‍රශංසාත්මක අය වැය ලේඛනයක්. මේ ජනතා සහන පිළිබඳව අපි ප්‍රශංසා කරනවා. මේකේ අපි බලාපොරොත්තු වුණාට වඩා -ඩිව් ගුණසේකර මැතිතුමාගේ කටින් කිව්වා- අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය දහයක බදු අඩු කරන්න පොරොන්දු වෙලා දහතුනක බදු අයින් කළා. මේක ඉතාමත් ප්‍රශංසාත්මකයි" කියලා. එතැනින් පටන් අරගන්න. එතැනින් පටන් අරගෙන, තිබෙන අඩු පාඩුකම් පෙන්වලා දෙන්න.

තමුන්නාන්සේලා එක පැත්තකින් කියනවා, අපේ පක්ෂයේ නායකයා මෛත්‍රීපාල සිරිසේන මහත්මයා කියලා. අනෙක් පැත්තෙන් මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේ යෝජනා ටික අය වැය ලේඛනයට දැම්මාම ඒක කවුරු හරි යූඑන්පී එක් කෙනෙක් ගෙනාවාය කියලා ඒකට විරුද්ධ වෙනවා. මොකක්ද මේ දෙබිඩි ප්‍රතිපත්තිය? ඔය කථා කරන කට්ටියට පිට කොන්දක් තිබුණාද, කැසිනෝ පනතට විරුද්ධව කථා කරන්න? එදා ගෙනාව දුම්කොළ හා මධ්‍යසාර සම්බන්ධ පනත් කෙටුම්පත පරාජය කරද්දී එයට විරුද්ධව කථා කරන්න කැබිනට් එකේ අපි දෙන්නෙක්, තුන් දෙනෙක් ඇරෙන්න තමුන්නාන්සේලාගෙන් කවුද නැඟිට්ටේ? ඖෂධ ප්‍රතිපත්තිය ගෙනැල්ලා ඒක නවත්වන කොට අපි දෙන්නෙක්, තුන් දෙනෙක් ඇරෙන්න තමුන්නාන්සේ කාටද පිට කොන්දක් තිබුණේ එදා ඒ ගැන කථා කරන්න? කැසිනෝවලට කථා නොකරපු, දුම්කොළ හා මධ්‍යසාර සම්බන්ධව ගෙනා පනත් කෙටුම්පතට විරුද්ධව කථා නොකරපු, ඖෂධ ප්‍රතිපත්තිය කඩාකප්පල් කරපු තමුන්නාන්සේලාට ආත්ම ගෞරවයක් තිබෙනවාද මේවාට විරුද්ධව කථා කරන්න?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට නියමිත වෙලාවෙන් තව විනාඩියක කාලයකුයි තිබෙන්නේ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මගේ කථාව මම අවසන් කරනවා.

අද මේ තිබෙන පොඩි පොඩි ඒවා ගැන කථා කරන්න තමුන්නාන්සේලාට පුළුවන්ද? ඒ නිසා මම තමුන්නාන්සේලාට මේ කාරණය කියනවා. තමුන්නාන්සේලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විනාශ කරන්න එපා. අපටත් ඕනෑ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගොඩ නඟන්න. ඒක අපි කරනවා. හොරුයි, කුපාඩියෝයි, වලත්තයෝයි ඔක්කෝමත් එක්ක ඒක ගොඩ නඟන්න බැහැ.

බණ්ඩාරනායක මහත්මයාගේ ප්‍රතිපත්තියට අනුව යනවා නම්, ඒ බණ්ඩාරනායක මහත්මයා පිළිගත්ත සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු කියන ප්‍රතිපත්තියට අනුව යනවා නම්, ගමේ තරුණයන්ට තැන දීලා යන පක්ෂයක් හදන්න ඕනෑ. එහෙම නැතුව අල්ලස්, කොමිස් ගන්න දූෂිතයෝ, එතනෝල් ගෙනාපු අය, කුඩු ගෙනාපු අය කෘත්‍රිම රා පෙරාපු අය වාගේ පුද්ගලයන් එක්ක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ගමනක් නැහැ. මැරයන් එක්ක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ගමනක් නැහැ. බණ්ඩාරනායක ප්‍රතිපත්තිවල මැරවරකම් නැහැ. බණ්ඩාරනායක මහත්මයා කියන්නේ බොහොම අවිහිංසාවාදී නායකයෙක්. මම පිළිගන්න බණ්ඩාරනායක මහත්මයා බලාපොරොත්තු වුණේ පක්ෂය සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු කියන පංච මහා බලවේගයට දෙන්න. නමුත් පස්සේ ගියේ පවුලකට. පස්සේ ගියේ වලව්වකට. ඒවාටයි ගියේ. අද ඒ පංච මහා බලවේගයෙන් නිර්මාණය වුණු ගොවි පවුලක පුතෙක් ජනාධිපති ධුරයේ ඉන්නවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
දැන් අවසන් කරන්න, ඇමතිතුමා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

බණ්ඩාරනායක මහත්මයා ප්‍රාර්ථනා කරපු, අනාගත නායකත්වය දැන් බිහි වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා ඒකට කුහකකමක් නැතුව, අපිත් එක්ක එතුමා සමඟ යමු. තමුන්නාන්සේලා තවම වලව් මානසිකත්වයේ ඉන්නේ. බණ්ඩාරනායකලා, රාජපක්ෂලා ඇරෙන්නට මේ පක්ෂයට නායකත්වයක් නැහැ කියන මානසිකත්වයෙන් තමුන්නාන්සේලා මිදෙන්න. ඒ මිදීම තුළ තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ප්‍රගතිශීලි ගමනක් තිබෙන්නේ. නැත්නම් ඒ පක්ෂය ප්‍රතිගාමී තත්ත්වයට යනවා. ඒ නිසා රාජපක්ෂලා නැතුව බැහැ, රාජපක්ෂලා කියන කට්ටියත් එක්ක තමයි යන්න ඕනෑය කිව්වාම කැසිනෝකාරයෝ, කුඩුකාරයෝ, එතනෝල්කාරයෝයි, මං කොල්ලකාරයෝයි ඔක්කෝම එකතු වෙනවා. ඒක ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නොවෙයි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
දැන් අවසන් කරන්න, ගරු ඇමතිතුමා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ඒ නිසා අපි ඔක්කෝම එකතු වෙමු. එක්සත් ජාතික පක්ෂය කියන්නේ එක ප්‍රජාතන්ත්‍රවාදී බලවේගයක්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කියන්නේ තව ප්‍රජාතන්වාදී බලවේගයක්. බණ්ඩාරනායක මහත්මයා මේ පක්ෂය නිර්මාණය කරන කොට කිව්වේ, "ප්‍රජාතන්ත්‍රවාදී බලවේග දෙකක් තිබෙනවා. ඒ දෙක තියෙන තාක් කල් මේ රට අන්තවාදීන්ට යන්නේ නැහැ. ඒ නිසා මේ දෙක පෝෂණය කරන්න" කියලා. අන්න ඒක අපි මතක තියා ගන්න ඕනෑ. මරා ගන්නේ, කපා ගන්නේ, කොටා ගන්නේ නැතුව මේ පක්ෂ දෙකම ගොඩ නැඟෙන්න ඕනෑය කියන මතයේ ඉඳලා තමුන්නාන්සේලාගේ ඉදිරි දැක්මෙන් යන්න. එතකොට තමුන්නාන්සේලාට මේ අය වැයේ හොඳ පැත්ත තේරේවි. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි.

ඊළඟට, ගරු ඩබ්ලිව්.බී. ඒකනායක මන්ත්‍රීතුමා.

[අ.භා. 3.22]

ගරු ඩබ්ලිව්.බී. ඒකනායක මහතා
(மாண்புமிகு டபிள்யு.பி. ஏக்கநாயக்க)
(The Hon. W.B. Ekanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිඳුන්ගේ සහ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිඳුන්ගේ මේ නව අය වැයට අපි සුබ පතනවා. ඒකට හේතුව, ජනතාවට අවශ්‍ය කරන යම් යම් ද්‍රව්‍යවල බදු අඩු කිරීම තුළ, මිල අඩු වීමක් වෙලා ජනතාවට සහනයක් ලැබෙයි කියන බලාපොරොත්තුව නිසා.

විශේෂයෙන්ම අප මතක් කරන්න කැමැතියි, මේ රටේ නිෂ්පාදනය කරන ද්‍රව්‍යවල මිල වැඩිපුර අඩු කරන්න ගියොත් එහි පහර වදින්නේ අහිංසක ගොවි ජනතාවට බව. ඒක දැනටම ක්‍රියාත්මක වෙලා ඉවරයි. අපේ දිස්ත්‍රික්කය ගත්තාම දැනටම උඳු නිෂ්පාදනයේ මිල විශාල වශයෙන් පහළ වැටිලා තිබෙනවා. වී මිල දී ගැනීම ගත් විට රුපියල් 22ක වාගේ මිලකට වී මිල විශාල වශයෙන් පහත වැටිලා තිබෙනවා. ඒත් එක්කම රුපියල් 40ට වාගේ තිබුණු බඩ ඉරිඟුවල මිල අද රුපියල් 20කට වාගේ අඩු වෙලා තිබෙනවා. ඒ නිසා රුපියල් 20කටවත් බඩ ඉරිඟු මිල දී ගන්න කෙනෙකු නැති තත්ත්වයට පත් වෙලා තිබෙනවා. වෙන දෙයක් තියා වී මෝල්වල තිබෙන හුන්සල් ටිකේ ඉඳලා දහයියා කුඩු ටික දක්වා මිල අඩු වෙලා තිබෙනවා. ගොවි ජනතාව කවදාවත් රජයකින් බලාපොරොත්තු වන්නේ නැහැ, ඔවුන් නිෂ්පාදනය කරන භාණ්ඩවල මිල අඩු කරයි කියලා. අපේ රජය අය වැය ඉදිරිපත් කරද්දී ප්‍රකාශ කළා, වී කිලෝ එකක් රුපියල් 40කට මිල දී ගන්නවාය කියලා. අතිගරු ජනාධිපතිතුමා බලයට පත් වෙන්න පෙර එතුමා පොරොන්දු වුණා, රුපියල් 50 ගණනේ වී මිල දී ගන්නවාය කියලා. නමුත් ඒ එක මිලකටවත් කොහේවත් මේ වන කොට වී මිල දී ගැනීමක් සිදු වන්නේ නැහැ. මේ අය වැය විවේචනය කරනවාට වඩා අප බලාපොරොත්තු වන්නේ ගොවි ජනතාවගේ තිබෙන අඩු පාඩුකම්, ඔවුන්ට වන අසාධාරණකම්, ඔවුන්ගේ පාඩු පිරිමැහීම සඳහා ගොවි ජනතාව වෙනුවෙන් පාර්ලිමේන්තුව තුළ කථා කරලා, පාර්ලිමේන්තුව තුළින් ඔවුන්ගේ අවශ්‍යතාවන් ඉෂ්ට කරලා දෙන්නයි. විශේෂයෙන්ම කෘෂිකාර්මික ප්‍රදේශවල ජීවත් වන අපට ගොවි ජනතාවට හැම වෙලාවේම මුහුණ දෙන්න වෙනවා. ඒ වාගේම ඔවුන් අහන ප්‍රශ්නවලට අප පිළිතුරු දෙන්න ඕනෑ. මොන රජයක් බලයට පත් වුණත් හැම වෙලාවේම අප ගොවි ජනතාව ආරක්ෂා කරන්න ඕනෑ. ඒකට හේතුව තමයි, තමුන්ගේ දහඩිය මේ මහ පොළොවට එකතු කරලා, මේ රටේ නිෂ්පාදනය වැඩි කරලා, මේ රටේ ආර්ථිකය ගොඩ නැඟීමේ වැඩ පිළිවෙළට ගොවි ජනතාව සහාය වීම. කවුරු කොහොම කථා කළත්, බොහොම අඩුවට කන්න දෙනවා කිව්වත් ගොවි ජනතාව අමතක කරන්න බැහැ. ඒ නිසා අපේ රටේ ගොවි ජනතාවට බිමට සමතලා වෙන්න දෙන්න බැහැ. කාලයක් ඒ යුගය තිබුණා. ඒ යුගය නැවත වතාවක් ඇති වෙයි කියලා බියක් අපට ඇති වෙලා තිබෙනවා. ඊයේ පෙරේදා ඉඳලා අපේ රටේ ගොවි නිෂ්පාදන දිනෙන් දින අඩු වෙමින් පවතිනවා. ඒ තත්ත්වයට පත් වෙන්න අප ලෑස්ති නැහැ. එදා ඉඳලා මේ දක්වාම අප හැම අවස්ථාවකදීම බලාපොරොත්තු වන්නේ අපේ රටේ ගොවි ජනතාව ආරක්ෂා කරන්නයි.

එක් පැත්තක් විතරක් නොවෙයි, කිරි නිෂ්පාදනය, වී නිෂ්පාදනය, අනිකුත් අතිරේක බෝග නිෂ්පාදනය, එළවලු නිෂ්පාදනය සඳහා නියම මිලක් ලැබුණොත් තමයි ගොවියා ගොඩ නඟන්න පුළුවන් වන්නේ. එහෙම නැතිව රජයේ සේවකයෙක් කියලා, රාජ්‍ය සේවයට බඳවා ගත්තා කියලා රටට නිෂ්පාදනයක් ඇති වෙන්නේ නැහැ. අප මොනවා හෝ නිෂ්පාදනය කරලා, එයින් ආදායමක් ලබාගෙන ඔවුන්ගේ පඩි වැඩි කරන්න ඕනෑ, පඩි ගෙවන්න ඕනෑ. මේක තමයි රාජ්‍ය සේවයේ කරන්න තිබෙන්නේ. ලක්ෂ 13ක් පමණ සිටින රාජ්‍ය සේවකයින් ගැන කථා කරනවා වාගේම මේ රටේ සියයට 60ක් පමණ සිටින ගොවි ජනතාව වෙනුවෙනුත් අප හැම වෙලාවේම කථා කරන්න ඕනෑ. ඒ වාගේම ඔවුන් වෙනුවෙන් කටයුතු කරන්න ඕනෑ. බැරි වෙලාවත් රටේ හාල් මිල ඉහළ ගිහිල්ලා, හාල් පිට රටින් ගෙන්වන්න වුණොත් අපට විශාල මුදලක් ඒ සඳහා වැය කරන්න සිදු වනවා. නමුත් අපේ රටේ වී නිෂ්පාදනය වැඩි වෙන්න වැඩි වෙන්න සහල් මිල පහළ බහිනවා. අපේ රටේ ජනතාවගේ ප්‍රධාන ආහාරය බත්. ඒ නිසා අපි වී නිෂ්පාදනය ආරක්ෂා කර දෙන්න ඕනෑ. ඒ අංශය බිඳ වැටුණොත් අප ඔක්කොම වැටෙනවා. කොහෙන් ගෙනෙනවා කිව්වත්, ගෙනාවා කිව්වත්, ලාභයට දෙනවා කිව්වත්, අඩුවට දෙනවා කිව්වත් වැඩක් වෙන්නේ නැහැ. මේ රටේ අහිංසක ගොවි ජනතාව වැටුණොත් අප ඔක්කොම වැටෙනවා. කාට පඩි වැඩි කරන්නත්, කාට සහන දෙන්නත් කලින් හැම වෙලාවේම ගොවි ජනතාවට තැන දීලා වැඩ කරන්න ඕනෑ. ඒක අත්‍යවශ්‍යයි. ගොවි ජනතාව කියන්නේ මේ රටේ කාටවත් බරක් නැති කොටසක්. ඔවුන් කිසි කෙනෙකුට බරක් වෙන්නේ නැහැ. තමුන් නිෂ්පාදනය කරන දේට හරි මිලක් ලැබෙනවා නම් ඔවුන් කවදාවත්, කොතැනකදීවත් කාටවත් යටත් වෙන්නේ නැහැ. ඔවුන් තමුන්ගේ ශ්‍රම ශක්තියෙන්

[ගරු ඩබ්ලිව්.බී. ඒකනායක මහතා]

රටේ ආර්ථිකය ගොඩ නඟන ජනතාවක්. තමුන්ගේ පවුල ගත්තොත් දෙමව්පියන් දෙදෙනා සමඟ දරුවන් හතර පස් දෙනෙකු ඉන්නවා නම් ඔවුන් හැම කෙනාම රජයේ රස්සා පස්සේ යන්නේ නැහැ. ඔවුන් තමන්ගේ දෙමව්පියන් කරන ගොවිතැනත් එක්ක එකතු වෙලා තමයි වැඩ කටයුතු කරන්නේ. ඒ තුළිනුත් අපට විශාල ශක්තියක් ලැබෙනවා. ඒ ශක්තිය ගොඩ නඟා ගන්න ගොවියා ආරක්ෂා කරන්න.

මේ රටේ කෘෂිකර්මාන්තය කෙරෙන විශේෂ දිස්ත්‍රික්කයක් තමයි පොලොන්නරුව දිස්ත්‍රික්කය. ඒ දිස්ත්‍රික්කයෙන් මේ රටට වැඩිපුර සහල් ලැබෙනවා. ඒ සහල්වලට හරි මිලක් ගොවීන්ට ලැබෙන්න ඕනෑ. රජ රට උපන් පුත්‍රයෙකු හැටියට මේ රටේ ජනාධිපතිවරයා අපේ ගොවි ජනතාව ගැන විශේෂ ඇල්මක් දක්වලා, ඔවුන් වෙනුවෙන් විශේෂ ව්‍යාපෘති ඇති කරලා, මේ ගොවි ජනතාව නඟා සිටුවන්න කටයුතු කරයි කියන විශේෂ බලාපොරොත්තුව අපට තිබෙනවා. ඒක එසේම වේවායි අපි ප්‍රාර්ථනා කරනවා.

ඒත් එක්කම තමුන්නාන්සේලාට මතක් කරන්නට ඕනෑ, උඳු විතරක් කන මිනිසුන් කොටසක් නොවෙයි මේ රටේ ජීවත් වන්නේ කියන එක. කහ විතරක් කන මිනිසුන් කොටසක් නොවෙයි මේ රටේ ජීවත් වන්නේ. කොත්තමල්ලි විතරක් බොන මිනිසුන් නොවෙයි මේ රටේ ජීවත් වන්නේ. මේවා අත්‍යවශ්‍යයි. නමුත් මේවායින් ඉතාම සුළු ප්‍රමාණයක් තමයි මිනිසුන් පරිභෝජනයට ගන්නේ. හැම මිනිහාම උඳු කන්නේ නැහැ. හැම මිනිහාම කොත්තමල්ලි බොන්නේ නැහැ. නමුත් මේ රටේ මිනිසුන්ට වැඩි සහනයක් ලබා දෙන ද්‍රව්‍යයක් බවට කොත්තමල්ලි පත් වෙලා තිබෙනවා. අද සමහරු ඒක සිනහවට ලක් කරලා තිබෙනවා. "කොත්තමල්ලි ආණ්ඩුවක්" කියලා කියනවා. "තුනපහ ආණ්ඩුවක්" කියලා කියනවා. මිනිසුන් කථා වෙනවා, අපට ඇහෙනවා. මේ ආණ්ඩුව ඒ තත්ත්වයට පත් කර ගන්න එපා. ඒවා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය තමයි. නමුත් ඊට වඩා මේ රටට අවශ්‍ය කරන දේවල් තිබෙනවා. ඒවායේ මිල අඩු කළා නම් ඒට වඩා හොඳයි කියන එක තමයි අපි යෝජනා කරන්නේ. අත්‍යවශ්‍ය භාණ්ඩ වර්ග 10ක මිල අඩු කරනවා කියලා කිව්වත්, භාණ්ඩ වර්ග 13කම මිල අඩු කළා කියලා කියනවා. ඉතින් ඒවායේ මිල අඩු වෙනකොට ජනතාවටත් ඒ සහන ලැබෙන්නට ඕනෑ. සමහර තැන්වලට ගියාම ඒ ව්‍යාපාරිකයෝ කියනවා, "මෙහේ එහෙම අඩුවට බඩු දෙන්නේ නැහැ" කියලා. එහෙමත් කියන අවස්ථා තිබෙනවා. ඒ නිසා ඒවා හරියට ක්‍රියාත්මක කරවන්න. ඒවා හරියට ක්‍රියාත්මක කරවලා, ජනතාව වෙනුවෙන් වැඩි වැඩියෙන් සහන සලසන්න කටයුතු කරන්න කියලා මා ඉල්ලා සිටිනවා. මේ රටේ ආර්ථිකය ගොඩනඟන, ආර්ථිකය ආරක්ෂා කරන ජනතාවක් තමයි කෘෂිකර්මාන්තයෙන් ජීවත් වන ජනතාව. ඔවුන්ව අමතක කරන්න එපා. ඔවුන්ගේ නිෂ්පාදනවල මිල අඩු කරන්න එපා. ඔවුන්ගේ නිෂ්පාදනවල මිල අඩු වන විධියට නොයෙකුත් දේවල් පිට රටවලින් ගෙන්වලා මේ රටේ නිෂ්පාදනය පහළ හෙළන්න, ගොවි ජනතාවගේ බඩට පහර ගහන්න කටයුතු කරන්න එපා. කවුරු නැති වුණත් ගොවි ජනතාව තමයි මේ රට ආරක්ෂා කරන්නේ කියන එක විතරක් හැම වෙලාවේම ඔළුවේ තියා ගන්න. ඒ බවත් සඳහන් කරමින්, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

මීළඟට, ගරු රෙජිනෝල්ඩ් කුරේ මන්ත්‍රීතුමා.

[අ.භා. 3.30]

ගරු රෙජිනෝල්ඩ් කුරේ මහතා
(மாண்புமிகு ரெஜினோல்ட் குரே)
(The Hon. Reginold Cooray)

මූලාසනය හොබවන ගරු මන්ත්‍රීතුමියනි, ලංකා ඉතිහාසයේ මින් පෙර කවර අවධියකවත් නොවූ විරූ අපූරු දේශපාලන හා ආර්ථික පසු බිමක ඉඳගෙනයි අපි අද මේ අය වැය විවාදයට මුහුණ දෙන්නේ. සම්ප්‍රදායික ගතානුගතික පිළිවෙතට, සිරිතට අනුව කල්පනා කළොත්, අද සිදු වන දේ හඳුනා ගැනීමට, තේරුම් ගැනීමට අපට පුළුවන්කමක් නැහැ. මොකද, ඒක මින් පෙර නොවූ විරූ දෙයක් නිසා. ඒ නිසා මේ අය වැය ලේඛනය පිළිබඳව අපි සලකා බැලිය යුත්තේ එවන් පසු බිමක ඉඳලායි කියන එක මම මේ අවස්ථාවේ දී කියන්නට කැමැතියි. සාමාන්‍යයෙන් අය වැය ලේඛනයක්, රටක තිබෙන්නා වූ ආර්ථිකමය, සංස්කෘතිකමය හා දේශපාලනමය පිළිබිඹුවක් බවට පත් වන්නට ඕනෑ. සමහර වේලාවල දී අය වැය ලේඛනය වඩාත් දේශපාලන නැඹුරුවක් ගන්නා අතර, තවත් අවස්ථාවල දී එය ආර්ථික නැඹුරුවක් දක්වන, නැත්නම් රටේ සංවර්ධනය ඉලක්ක කර ගත් අය වැය ලේඛනයක් බවට පත් වෙනවා. අද පවතින්නා වූ දේශපාලන වාතාවරණය තුළ අපි විශ්වාස කරන, අදහන, පිළිගන්නා වූ විද්‍යාත්මක ආර්ථික සිද්ධාන්ත හා රටේ සංවර්ධනය කියන කාරණාවට වඩා උත්තරාරෝපණය වී තිබෙන්නේ පවතින දේශපාලන සන්දර්භයයි. එම නිසා දේශපාලන සන්දර්භයට අනුව සැකසූ අය වැය ලේඛනයක් ලෙස අපි මෙය පිළිගන්නට ඕනෑ.

පසු ගිය ජනාධිපතිවරණයේ දී ලැබුණු ප්‍රතිඵල අනුව මහජන මතයට හිස නැමීම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේ ප්‍රතිපත්තිය හැටියට අපි සලකනවා. අප විශ්වාස කරන, අප ප්‍රාර්ථනා කරන, අප අදහන ධර්මතාවන් අනුව මෙහි අඩු ලුහුඬුකම් තිබුණත්, මහජන මතයට - මහජනතාවගේ තීන්දුවට - හිස නමා ගරු කිරීම සඳහා මේ අය වැය ලේඛනයට අපේ සහයෝගය ලබා දෙන්නට අපි තීන්දු කරලා තිබෙනවාය කියන එක මේ අවස්ථාවේ දී මා තමුන්නාන්සේලාට කියන්නට ඕනෑ. ඒ වාගේම මේ අය වැය ලේඛනයට අප සහයෝගය දුන් පමණින් අන්ධ භූත ජාතකය වාගේ, අන්ධයාගේ බූදලය වාගේ ඇස් කන් පියා ගෙන, කිසි දෙයක් නොදන්නා සිග්නල් කණු ලෙස විවේචනයෙන් තොරව සහයෝගය දෙන්නට අපට පුළුවන් කමක් ඇත්තේ නැහැ. අපි සහයෝගය දිය යුත්තේ, ඇස් කන් නාසා ඇති, සිහි බුද්ධිය ඇති අය හැටියටයි.

අපෙන් ජනතාව බලාපොරොත්තු වන පරිදි මෙහි ඇති ප්‍රති විපාක පිළිබඳව යම් කිසි දැනුවත්කමක් ඇති කරමින්; විය හැකි දේ පිළිබඳව දැනුවත් කරමින්, ඒ සඳහා විවේචනාත්මක සහයෝගයක් ලබා දීම අපේ යුතුකමක් හැටියට අපි කල්පනා කරනවා. ඒ නිසා මේ දින සියයේ වැඩ සටහනටත්, ඊට ආනුෂංගික අය වැය ලේඛන අණපනත්වලටත් අපි සහයෝගය දෙන්නේ යහ පාලනය හා මෙතෙක් මේ රටේ කර ගන්නට බැරි වුණා යයි කියන, එසේ කර ගන්නට බැරි වුණු යම් යම් වෙනස්කම් ඇති කර ගැනීමේ අරමුණ ඇතිවයි. ඒ නිසා ආර්ථික කාරණාවලටත් වැඩිය මෙතැන දී ඉස්මතු වන වඩා වැදගත් දේශපාලන භූමිකාව; දේශපාලන ප්‍රතිපත්තිමය වෙනස්කම් ඇති කර ගැනීමට අවශ්‍ය අඩිතාලමක් හැටියටයි අපි මේ අය වැය ලේඛනයට සහයෝගය දෙන්නේ. ආර්ථික සිද්ධාන්තවලටත් වඩා, ඒ මත ගෙන යන දින සියයේ වැඩ පිළිවෙළ, එහෙම නැත්නම් රටේ ජනතාව දීර්ඝ කාලයක් තිස්සේ අපේක්ෂා කරන ලද වෙනස්කම් මේ තාවකාලික රජය මඟින් සිදු කර ගැනීමට අවශ්‍ය පසු බිම සකසා ගැනීමේ චේතනාවෙනුයි මේ අය වැය ලේඛනයට අපි සහයෝගය දෙන්නේ කියන එකත් මේ අවස්ථාවේ දී කියන්නට ඕනෑ.

මේ සියලු දෙනාගේ එක්වීම මත අපි බලාපොරොත්තු වන වෙනස කුමක්ද? අය වැය ලේඛනයටත් වඩා අප බලාපොරොත්තු

වන්නේ මේ රටේ දේශපාලනයේ මුල් බැස ගත් යම් යම් විශ්වාසයන් හා වැරදි දේවල් ඉවත් කර ගැනීමයි. මේ රටේ දශක ගණනාවක් තිස්සේ සිටි රාජ්‍ය නායකයන් අතරින් ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා මැතිතුමා, එස්.ඒ. වික්‍රමසිංහ මැතිතුමා, පිලිප් ගුණවර්ධන මැතිතුමා, විජය කුමාරණතුංග මැතිතුමා, ඒ වාගේම සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා වැනි නායකයන් පිළිබඳව සඳහන් කරන්නට පුළුවන්. එතුමන්ලා තම තමන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී මේ විධායක ජනාධිපති ක්‍රමයේ තිබෙන්නා වූ භයානකකම පිළිබඳවත්, එහි සිදු විය යුතු සංශෝධනයන් පිළිබඳවත් සඳහන් කර තිබෙනවා. මේ වකවානුවේ සිදු විය යුතු වඩාත්ම වැදගත් වෙනස එයයි කියා අපි හිතනවා. ඒ වෙනස වෙනුවෙන් කිසි යම් පරිත්‍යාගයක් කරන්නට අපි සූදානම්. ඒ මොකක්ද? මේ අය වැය ලේඛනයට සහයෝගය ලබා දීමේ දී එහි මූලික අරමුණ ලෙස අර්ථකථනය කර ගත යුතු වන්නේ, යහ පාලනය උදෙසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සිදු කර ගත යුතු වෙනස්කම් සහ ප්‍රජාතන්ත්‍රවාදයට අවශ්‍ය ඒ වෙනස්කම් සිදු කර ගැනීම සඳහාත් දෙන සහයෝගයක් හැටියටයි.

උදාහරණයක් හැටියට ජනාධිපතිවරයාගේ මුක්තිය පිළිබඳ බලය ගැන සඳහන් කරනවා නම්, ඕනෑම වරදක් කර උසාවියට ඉදිරිපත් නොවී ඒ වැරදිවලින් ආරක්ෂා වීමට ඔහුට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබලා දී තිබෙන රැකවරණය ප්‍රජාතන්ත්‍රවාදයට විරුද්ධයි; ජන සම්මතවාදයට විරුද්ධයි; ශිෂ්ටාචාරයට විරුද්ධයි; යුක්ති ධර්මයට විරුද්ධයි කියලා අපි බරපතළ ලෙස විශ්වාස කරනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම යම් කිසි කෙනෙක් අධිකරණය ඉදිරියේ දී සියලු වැරැදිවලට නිර්දෝෂී කෙනෙක් කරනවා නම්, අපි මේ පොලිස් ස්ථාන තියා ගෙන, උසාවි තියා ගෙන, හෙල්මට් එකක් නැතිව බයිසිකලය පැද ගෙන යන මිනිහෙකුටත් දඬුවම් කරන එකේ තේරුම කුමක්ද? බරපතළ අපරාධයකට, බරපතළ වැරැද්දකට වැරැදිකරුවකු වන කෙනෙක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම ආරක්ෂා කරනවා නම්, මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික පද්ධතිය තුළම හොරුන් ආරක්ෂා කිරීමේ ගතිය තිබෙනවා කියලායි මම හිතන්නේ. එම ශිෂ්ටාචාරයේ වෙනස්කම් සිදු කර ගන්නට අවශ්‍ය නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඉවසීම හා පරිත්‍යාගය තුළින් මෙයට සහයෝගය දෙන්නට තීන්දු කර තිබෙනවාය කියන එක අපි මේ අවස්ථාවේ දී කියන්නට ඕනෑ.

මේ රටේ මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම පිළිබඳවත් බොහෝ අදහස් පළ වුණා. ඒ වාගේම පාර්ලිමේන්තු කාරක සභාවලින් අනුමත වුණු සංශෝධනත් තිබෙනවා. ජේ.ආර්. ජයවර්ධන මහත්මයා ඉදිරිපත් කළ මේ නව ක්‍රමයට ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව තර්කයක් ගෝචර වුණා. ඒ තමයි තනි පක්ෂයක් හැටියට අති විශාල ඡන්ද සංඛ්‍යාවක් ලැබූ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් යටතේ පාර්ලිමේන්තුව තුළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මන්ත්‍රීවරුන් අට දෙනෙක් දක්වා අඩු වුණා. ඒක ප්‍රජාතන්ත්‍රවාදය නොවෙයි කියලා එදා එතුමා තර්ක කළා. ඒකේ යම් කිසි ගත යුතු සත්‍යයක් තිබෙනවා කියලා අප පිළි ගන්නවා.

ඒ වාගේම, මේ ක්‍රමය තුළිනුත් යම් යම් වැරදි සිදු වෙලා තිබෙනවා. "එකක් වැරදි වහ ගන්නට ගිහින් දහසක් වැරදි හදා දුන්නා ආචාරියා" යයි කියනවා වාගේ, අපි එක වැරැද්දක් වහන්නට ගිහින්, ප්‍රජාතන්ත්‍රවාදය රකින්නට ගිහින්, ප්‍රජාතන්ත්‍රවාදයට බරපතළ වැරදි සිදු වුණු වෙලාවල් තිබෙනවා. ඒ නිසා මේ මැතිවරණ ක්‍රමය වෙනස් කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කරවීමේ වැඩ පිළිවෙළක් අපි බලාපොරොත්තු වෙනවා. මේ අය වැය සම්මත වුණාට පසුව දින සියයේ වැඩසටහන තුළින් අප ඊළඟට බලාපොරොත්තු වන ඉතාම වැදගත් වන කාරණය එය බව කියා සිටිනවා.

දූෂණවලට විරුද්ධව මාධ්‍ය සංදර්ශන පවත්වනවා වෙනුවට දූෂණයේ උල්පත ඇති වන්නා වූ කාරකයන් සොයා බලා ඒවා නතර කිරීම තමයි වඩාත් මූලික වන්නේ. මෙතෙක් මේ රටේ ඉතිහාසයේ එක්සත් ජාතික පක්ෂය විසින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හොරුන්ට දඬුවම් කරලා නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විසින් එක්සත් ජාතික පක්ෂයේ හොරුන්ට දඬුවම් කරලා නැහැ. තොරණක රතු පාට, නිල් පාට, කොළ පාට බල්බ් පත්තු වෙනවා වෙන වෙනම. නමුත් පිටුපසට ගිහිල්ලා බලපුවාම වයර් ඔක්කෝම එකකට එකක් සම්බන්ධයි; එකට බැඳිලයි තිබෙන්නේ. ඒ නිසා මේ පක්ෂ දෙකම පසු ගිය කාලවල් තුළ මේ සොරුන් ආරක්ෂා කිරීමේ සහයෝගිතාව ගෙන ගිහින් තිබෙනවා. ඒ නිසා අපි ඉල්ලා සිටින්නේ දූෂණයට විරුද්ධව මාධ්‍ය සංදර්ශන පවත්වනවා වෙනුවට ඒකට එරෙහිව සටන් කරන්නය කියන එකයි. ඒකට අපේ පූර්ණ සහයෝගය දෙනවා. ඒ එක්කම අපි කියන්නේ නැහැ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මේ රටේ හොරකමේ දූෂණයේ වංචාවේ මූල කඳවුර කියලා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත වෙලාවෙන් තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු රෙජිනෝල්ඩ් කුරේ මහතා
(மாண்புமிகு ரெஜினோல்ட் குரே)
(The Hon. Reginold Cooray)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තව මිනිත්තුවක් ලබා දෙන්න.

සියලු පක්ෂවල, සියලු සංවිධානවල තිබෙන සියලුම හොරකම්වලට විරුද්ධව කටයුතු කරන්න මෙය මධ්‍යස්ථානය විය යුතුයි. ජනතා විමුක්ති පෙරමුණ දැන් බොහොම ශක්තිමත් විධියට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා ඒ පක්ෂයේ නායකයින්ව එක එක තැන්වලට ගෙන යන්න ඉදිරිපත් වනවා. මට පුදුමයි, ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන්ට එක්සත් ජාතික පක්ෂය හා අනෙකුත් පක්ෂවල වැරදි කරපු අය ගැන කරුණු ඉදිරිපත් කරන්න අමතක වන්නේ මොන කාරණයක් නිසාද කියලා. හොරකමට විරුද්ධව යනවා කියන එකයි, යූඑන්පීයට කඩේ යනවා කියන එකයි දෙකක්ය කියන එක මා පැහැදිලිව කියන්න ඕනෑ. වැරදි කරනවා නම් ඒ වැරදි කරන සියලු දෙනාටම විරුද්ධව කටයුතු කරන්නය කියලායි මා ඉල්ලා සිටින්නේ.

අපේ පක්ෂ සියල්ලම නිවැරදි කර ගෙන, නිවැරදි දේශපාලන සංස්කෘතියක් කරා ගෙන යන්න කටයුතු කිරීම වෙනුවෙන් අපි මේ අය වැයට සහයෝගය දෙනවා. ඒ වාගේම මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ සංක්‍රාන්තික අවධියකයි. රටේ බොහෝ දේශපාලන නායකයෝ, පක්ෂ නායකයෝ, මේ පාර්ලිමේන්තුවේ නායකයෝ දින සියයකින් පසු පැවැත්වෙන මැතිවරණයක් පසු පස්සේ තබා ගෙනයි මේ අය වැය ලේඛනය ඉදිරිපත් කරන්නේ. ඒ නිසා ඔවුන්ගේ සියලු යෝජනාවල පිටුපස තිබෙන්නේ ඉන් පස්සේ එළැඹෙන්නා වූ මැතිවරණයේ ජයග්‍රහණය පිළිබඳ බලාපොරොත්තුයි. ඒවාත් එක්ක තමයි මේ සියල්ල ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ නිසා මේක දුර දිග යන, දුර දිග දකින, ඒ වාගේම හොඳ කල් අල්ලන එකක් කියලා අපට කියන්න බැහැ. උදාහරණයක් හැටියට රටක ආර්ථික සංවර්ධනයේ එක්තරා ලියවිල්ලක් පමණයි අය වැය ලේඛනය කියන්නේ. ඒක අවුරුද්දක කාලයකට අදාළ වුණත් එය ඉදිරි වසර 10ක, 15ක අනාගත දැක්මක් එක්ක, දර්ශනයක් එක්ක බද්ධ වුණු ලියවිල්ලක් වෙන්නට ඕනෑ. මේ අය වැය ලේඛනයට රටේ අනාගත සංවර්ධනයත් එක්ක කිසිම බැඳීමක් නැහැ. කිසිම සන්ධි වීමක් නැතිව හුදෙකලාව, යම් කෙටි කාලයක් සඳහා වලංගු වන මේ

[ගරු රෙජිනෝල්ඩ් කුරේ මහතා]

යෝජනා මේ මාස තුන හතරින් පස්සේ නැත්නම් තව අවුරුද්දකින් පස්සේ ක්‍රියාත්මක කරන්නේ කෙසේද කියන එක ගැන බරපතළ ගැටලු තිබෙනවා. මේ දෙන සහන කොයි තරම් කාලයක් දුරට පවත්වා ගෙන යා හැකිද, කොයි තරම් කාලයක් ගෙන යන්න පුළුවන්ද කියන ප්‍රශ්නය අනිවාර්යයෙන්ම මතු වනවා. ඒ නිසා අපි ඒ පිළිබඳ අවදානමත් මේ අවස්ථාවේදී තමුන්නාන්සේලාට ප්‍රකාශ කළ යුතුයි කියලා මා කල්පනා කරනවා.

කල් පවතින්නේ නැති, දුර දිග නොයන, ක්ෂණික පපඩම්, බොම්බයි මීටයි, චුවිං ගම් වැනි කටට රසැති, එහෙත් ගුණ නැති, සවිබල නැති, සෞඛ්‍යයට අහිතකර, රටේ දීර්ඝ කාලීන ගමනකට වැදගත්කමක් නැති අය වැයක් හැටියටයි මා මෙය දකින්නේ. ජනතාවට සහන දීම පිළිබඳව අපේ කිසි විරුද්ධත්වයක් නැහැ. හැබැයි, මේ දෙන්න යන සහන තුළම ජනතාව මත ව්‍යාංගයෙන් මතු වන අසහනය කොච්චරද කියන එක ගැන කිරා බලා නැහැ. ඒ නිසා මේ රටේ නිෂ්පාදනයට, මේ රටේ ගොවියාට, මේ රටේ දේශීය නිෂ්පාදකයාට ඒ මතින් සිදු වන බලපෑම නැවත වතාවක් ඔහුටම බරක් හැටියට පතිත වන දිනය ඈත නොවෙයි. ඒ නිසා මේක තාවකාලික ගමනක් බව අපි කියන්න ඕනෑ. මේක හරියට උණ ලෙඩාට වතුර දෙනවා වාගෙයි. ඒ දවස්වල ලෙඩක් තිබුණා ප්‍රීති කසානා කියලා. කසන කොට හරි ප්‍රීතියි, ඊට පස්සේ හරි වේදනායි. මේකත් එවැනි දදයක් වාගෙයි. මේ අවස්ථාවේදී මේ කරන දේවල් ගැන අපි විශාල වශයෙන් අවධානය යොමු කරන්න ඕනෑ. එක්සත් ජාතික පක්ෂය හැම දා ම මේ රටේ ආර්ථිකය වෙනුවෙන් පෙනී සිටියේ පෞද්ගලික අංශය කෙරෙහි විශ්වාසය තබමිනුයි. ඒ අය කියන විධියට පෞද්ගලික අංශය තමයි ආර්ථිකයේ එන්ජිම. දේපොළ, ව්‍යාපාර, ව්‍යාවසාය සහ නිදහස් වෙළෙඳ ආර්ථිකයේ මුර දේවතාවන් ලෙසින් පෙනී සිටියේ එක්සත් ජාතික පක්ෂයයි.

අද එතුමන්ලා සූර සරදියෙල්ගේ සහ රොබින් හුඩ්ගේ චරිතයට ආරූඪ වෙලා තිබෙනවා. හැබැයි, ඒ සූර සරදියෙල්ගේ හා රොබින් හුඩ්ගේ චරිතය තාවකාලික රංගනයක් පමණයි. වැඩි කලක් යන්නට මත්තෙන් සූර සරදියෙල්ලාත් වෙලේ සුදාලා, චොප්පෙලා, මරු සිරාලා, කර්තේලිස්ලා, වම්බොට්ටලා වනවා ඇති. ඒ නිසා ඒක නිවැරදි කරගන්න නම් අපි මීට වැඩිය හොඳින් කල්පනා කරලා මේ කටයුත්ත කරන්න ඕනෑ කියන එකයි අපේ විශ්වාසය.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න. ඔබතුමා කාලය වැඩියෙන් අරගෙන තිබෙනවා.

ගරු රෙජිනෝල්ඩ් කුරේ මහතා
(மாண்புமிகு ரெஜினோல்ட் குரே)
(The Hon. Reginold Cooray)
අවසන් කරන්නම්.

යහ පාලනය වෙනුවෙන්, මේ රටේ සිදු විය යුතු යහපත් වෙනස්කම් වෙනුවෙන් අය වැය ලේඛනයේ තිබෙන්නා වූ ගුණ අගුණ මහ ඉහළින් තර්ක විතර්කවලට බඳුන් නොකර අපි මේ අය වැයට සහයෝගය දෙනවා. මේ ආණ්ඩුවට මේ වැඩ කොටස කර ගෙන යන්න; විපක්ෂයේ බහුතරය මත රැඳෙන රජයකට රටේ සුගතියට, රටේ යහපතට ශක්තියක් හැටියට ඒ වැඩ පිළිවෙළ ඉදිරියට කර ගෙන යන්න අපේ බහුතරයේ සහයෝගය අපි ලබා දෙනවා. බොහොම ස්තූතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තූතියි, ගරු මන්ත්‍රීතුමනි.

මීළඟට ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා.

[අ.භා. 3.44]

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විරුද්ධ පාර්ශ්වයේ වේලාව ඉතිරි වෙලා තිබෙන නිසා විනාඩි කිහිපයක් වැඩිපුර ලබා දෙන්න කියලා ඉල්ලනවා. විශේෂයෙන්ම මේ අතුරු අය වැය එක්සත් ජාතික පක්ෂය, මෛත්‍රීපාල සිරිසේන, ජේවීපී හවුල් ආණ්ඩුවක් විසින් ගෙන ආ අය වැයක් විධියටයි අපි දකින්නේ. හවුල් ආණ්ඩුවක් එකතු වෙලා ගෙන ආපු අය වැයේ මූලික කරුණු දෙකක් මම මේ අවස්ථාවේ මතු කරනවා.

එකක් තමයි මූලිකව මේ අය වැය ඉදිරි අප්‍රේල් මාසයේ පවත්වන්නට යෝජනා කර තිබෙන මැතිවරණයක් ඉලක්ක කර ගත් අය වැයක් කියන එක. ඒක එක කරුණක් විධියට අපට සාකච්ඡා කරන්න වෙනවා. ඒ වාගේම ජේ.ආර්. ජයවර්ධන මහත්මයා මේ රටේ ආරම්භ කරපු ධනවාදයේ ඊළඟ පියවර වුණු නව ලිබරල් ධනවාදය ඉදිරියට ගෙන යාමක් මිසක් ඊට විකල්ප එකක් විධියට නොවෙයි අපි මේ අය වැය දකින්නේ. ඒ නිසා මේ දෙක ගැන මම කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම මේ අය වැය පිළිබඳවත්, වත්මන් ආණ්ඩුවේ ප්‍රචාරක ව්‍යාපෘතිය වුණු දින සියයේ වැඩ පිළිවෙළ පිළිබඳවත් ඉදිරියේදී අපට දීර්ඝ සාකච්ඡාවක් කරන්න තිබෙනවා. ඒ සඳහා ඉදිරියේදී අපි අවකාශයක් ලබා ගනිමු.

විශේෂයෙන්ම මේ රටේ ජනතාව වීදි බැහැලා, සංවිධානය වෙලා, ජනතාවගේ අභිලාෂයන් ක්‍රියාත්මක කර ගන්න අරගළ කරපු හැම වෙලාවේම පාලකයෝ භය වුණා. භය වෙලා ඒකට යම් සහන දුන්නා. ඒ භය වීම විශේෂයෙන් මැතිවරණ කිට්ටුවේදී වැඩිපුර සිද්ධ වුණා. ඡන්දයක් කිට්ටු වුණාට පස්සේ, විශේෂයෙන්ම බලය අහිමි වෙනවා කියලා දැක්කාට පස්සේ ජනතාව ඉල්ලා සිටි, අරගළ කරපු අයිතිවාසිකම්, යම් සහනයන් අකමැත්තෙන් හෝ දෙන්න සිද්ධ වුණා.

මහින්ද රාජපක්ෂ මහත්මයා පසු ගිය ඔක්තෝබර් මාසයේ වේලාසනින් ඉදිරිපත් කළ අය වැයත් අපි දැක්කා. ඒ වෙලාවේ ඔවුන් ප්‍රකාශ කළා, ඒ ආණ්ඩුවේ පාර්ශ්වකාරයෝ ප්‍රකාශ කළා මෑත ඉතිහාසයේ වැඩියෙන්ම සහන දුන් අය වැය ඒක කියලා. මේක තමයි වැඩිම සහන දුන් අය වැය කියලා ඒ ආණ්ඩුවේ හිටපු අය පම්පෝරි ගැහුවා. අපට මතකයි එදා එක්සත් ජාතික පක්ෂයේ නායක -විපක්ෂ නායක- රනිල් වික්‍රමසිංහ මහත්මයාට පාර්ලිමේන්තුව ඇතුළෙන් විවේචනයක් ආවා, ඒ අය වැය ගැන එතුමා වචනයක්වත් කථා කළේ නැහැ කියලා. කථා කරන්න බැරි වුණා. මොකද, ඒ ගොල්ලොත් පිළිගත්තා -විපක්ෂයත් පිළිගත්තා- ඒ අය වැයෙන් සහන දුන්නා කියලා. ඒ වාගේම ජනතා විමුක්ති පෙරමුණ ඒ සහන ගැන සාකච්ඡා කරමින්, ඒ සහන දුන්නාය කියමින්, ඒ සහන දුන්නේ මෙන්න මේ නිසාය කියලා කථා කරන්න ගත්තා; සහන දුන්නා කියලා පිළිගත්තා. එදා මහින්ද රාජපක්ෂ මහත්මයාට ඒ අය වැයේදී ඒ විධියට සහන දෙන්න වුණේ ඇයි? බලය අහිමි වෙනවා කියලා දැන ගත්තා, තේරුම් ගත්තා. බලය අහිමි වෙනවා කියලා තේරුම් ගත්තාම සහන විධියට මොනවා හෝ විජ්ජාවන් ටිකක් පෙන්වන්න ගත්තා. නැත්නම් ඒ ආණ්ඩුවට ඊට කලින් ඒ සහන දෙන්න තිබුණා. පැවැති ආණ්ඩුවේ මැති ඇමතිවරුනුත් දැන් කියනවා, ඒ අණ්ඩුව

කලින් දෙන්න තිබුණු සහන තමයි මේ දුන්නේ කියලා. ඒ නිසා ඒ කාරණය පැහැදිලියි.

දැන් මෛත්‍රීපාල සිරිසේන, රනිල් වික්‍රමසිංහ, ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු හවුල් ආණ්ඩුව ගෙනා මේ අය වැය ගැන ආණ්ඩුව කියනවා මේක සරදියෙල් අය වැයක් කියලා; මේක ඉතා හොඳ අය වැයක් කියලා. මේකෙදී අපි ඉතා පැහැදිලිව කියනවා, මේ අය වැය ගේන්නෙත් ඊළඟ මැතිවරණය ඉලක්ක කර ගෙන ජනතාවට හයේ කියලා. ඒ නිසා මේ අය වැයේ තිබෙන ඇත්ත කථාව තේරුම් ගන්න වෙන්නේ ආණ්ඩුවක් දුර්වල වුණු වෙලාවේ නොවෙයි. මේ වෙලාවේ මේ පාලනය දුර්වලයි. ඒ නිසා හැමෝටම අත වනනවා, හවුල් ආණ්ඩුවක් කරන්න එන්න කියලා. "අපි කවුරුත් එකතු වෙලා වැඩේ කරමු" කියනවා. මෙච්චර කල් අපි එකතු වෙලා මේ රටේ හොරු ආරක්ෂා කළා. කවුද හොරු? මේ රටේ අතිශය බහුතර ජනතාවගේ දේපළ මං කොල්ල කාපු ප්‍රාග්ධන හිමියෝ, සමාගම්කාරයෝ ඒ හොරු ආරක්ෂා කළා. ආදායම් බෙදී යාමේ විෂමතාව අතිශය බරපතළ කළා. ආණ්ඩුව දුර්වල නිසා, පාලනය දුර්වල නිසා ඒ හොරු ටික අපි ඉස්සරහට ආරක්ෂා කරමු කියා කාටත් අත වනනවා. ඒ නිසා දුර්වල පාලකයෝ හැම දාම ජනතාවට බයේ ඊළඟ මැතිවරණය ඉලක්ක කරලා, යම් සහන ප්‍රමාණයක් දෙන්න උත්සාහ කරනවා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඇත්තටම මේ අය වැය ජනතාවාදීද, නැද්ද කියා බලන්න වන්නේ ඊළඟට තිබෙන මැතිවරණයෙන් පසුවයි. ඒකට ඉඩකඩ විවෘතව තිබෙනවා.

මම විශේෂයෙන් මතක් කරනවා, මේ රටේ පාලකයන් ශක්තිමත්ව සිටි කිසිම අවස්ථාවක මේ රටේ ජනතාවට යමක් දුන්නේ නැති බව. ඒ නිසා දරිද්‍රතාව වැඩි වුණා; මන්ද පෝෂණය වැඩි වුණා; නීරක්තිය වැඩි වුණා; අඩු බර උපත් වැඩි වුණා; ආදායම් බෙදී යාමේ විෂමතාව වැඩි වුණා; විරැකියාව වැඩි වුණා. ඒ නිසා තව ඉස්සරහට ප්‍රතිඵල බලන්න තිබෙන අය වැයක් මේක. තව ගොඩක් දේවල් ගැන ඉස්සරහට බලන්න ඕනෑ.

විශේෂයෙන්ම අප මේ කාරණය කියන්න ඕනෑ. මේ අය වැය ඇතුළත රාජ්‍ය සේවකයාට දෙනවා කියපු වැටුප් වැඩි වීම දීමනාවක්ද, වැටුපට වැඩිවීමක්ද යන්න තවම නිශ්චිතව කියා නැහැ. දින සියයේ වැඩසටහනේදි විශ්‍රාමිකයන්ට දෙනවා කියපු රුපියල් 3,500 රුපියල් 1,000ක් කරලා, ඒක දෙන්නෙත් අප්‍රේල් මාසයෙන් පස්සේ කියා තිබෙනවා. ඒක හරියට කියලාත් නැහැ.

වතු කම්කරුවා පිළිබඳ පසු ගිය කාලයේ බරපතළ සාකච්ඡාවක් තිබුණා. ඔවුන් ගැනත් කිසිවක් සාකච්ඡා කර නැහැ. විධායක සභාවේ ඉන්න ජනතා විමුක්ති පෙරමුණට ඒක මහ හැරුණා. පෞද්ගලික අංශයේ සේවකයන් පිළිබඳ ප්‍රශ්නය මහ හැරුණා. හරියට කථා කළේ නැහැ. ඒ නිසා මේවා ගැන අප තව ඉස්සරහට කථා කරන්නම්.

දෙවැනි කාරණය, මේ අය වැය ඉදිරිපත් කළේ කුමන ආර්ථික පදනමක් මුල් කර ගෙනද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මහින්ද රාජපක්ෂ මැතිතුමා එදා ඒ අය වැය ඉදිරිපත් කළේ -ඒ සම්බන්ධවයි එදා මගේ විවේචනය තිබුණේ.- නව ලිබරල් ආර්ථිකය පදනම් කර ගෙන, ජේ.ආර්. ජයවර්ධන මහත්මයාගේ අය වැය පදනම් කර ගෙන; ඒ ප්‍රතිපත්තිය පදනම් කර ගෙනයි. මේ අය වැය ඊට වඩා වෙනස්ද? මේකේ ඊට වඩා වෙනසක් නැහැ. මට ඒවා ගැන කථා කරන්න වෙලාව මදි. ඒ සම්බන්ධව මම උදාහරණයක් කියන්නම්. ඉතාම අතළොස්සක් වුණු ලාභ ලබන ප්‍රාග්ධන හිමියන් ඉලක්ක කර ගත්ත අය වැයක් මහින්ද රාජපක්ෂ මහත්මයා ඉදිරිපත් කළා. එහි කිසිම ප්‍රතිපත්තියක් මේ අය වැයේ වෙනස් කර නැහැ.

මෙතුමන්ලා Colombo Port City ව්‍යාපෘතිය ගැන කිව්වා නේ. පරිසරවේදීන්, විද්වතුන් කිව්වා, "Colombo Port City ව්‍යාපෘතිය නවත්වන්න" කියා. අද ආණ්ඩුවේ වාඩිවෙලා ඉන්න ඇමතිවරු එදා ඒකට විරුද්ධව කථා කළා; කැසිනෝ ව්‍යාපාරයට විරුද්ධව කථා කළා. දැන් කැසිනෝ සම්බන්ධ ඒ පනත අහෝසි කරනවාද? නැහැ. මේ කාරණා උද්ධෘත කරන්න පුළුවන්. ගිය අවුරුද්දේ අප්‍රේල් මාසයේ 24, 25 දිනවල පළවූ හැන්සාඩ් වාර්තා ආපසු එහෙම පිටින්ම කියවන්න කියා මම ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරුන්ට, ඒ වාගේම ජනතා විමුක්ති පෙරමුණට ආරාධනා කරනවා. තමුන්නාන්සේලා කියපුවා වෙනස් කළාද? නැහැ, වෙනස් වන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මොකක්ද මේ අය වැය? මහින්ද රාජපක්ෂ මහත්මයා නව ලිබරල් ආර්ථිකය, ලාභය පදනම් කර ගෙන, වෙළෙඳ පොළ පදනම් කර ගෙන ඉදිරිපත් කරපු අය වැයම ඉස්සරහට යනවා; ඒක සහතික කරනවා. ඒ නිසා සමාජවාදය විශ්වාස කරන අය, කොමියුනිස්ට්වාදීන් විශ්වාස කරන අය ඉල්ලා සිටින්නේ මොකක්ද? මිනිසාගේ ශ්‍රමයට වටිනාකමක් දෙන, පරිසරය ආරක්ෂා කරන, ජනතාව ආරක්ෂා කරන ප්‍රතිපත්තියක් හදන්න කියායි. මේ අය වැය ඇතුළත ඒ සාකච්ඡාව නැහැ. ඒක කවුද කියන්නේ? විශේෂයෙන්ම ඒ පදනම වෙනස් වෙලා නැහැ කියා කවුද කියන්නේ? මම කියන්නම්. සුසිල් ප්‍රේමජයන්ත මන්ත්‍රීතුමා කියපු කථාව ගයන්ත කරුණාතිලක අපේ දිස්ත්‍රික්කයේ ඇමතිතුමා- [බාධා කිරීමක්] ගරු අජිත් පී. පෙරේරා නියෝජ්‍ය ඇමතිතුමනි, මට ටික වෙලාවයි තිබෙන්නේ. ඒ නිසා බාධා කරන්න එපා. අපි තව ඉස්සරහට කථා කරමු.

සුසිල් ප්‍රේමජයන්ත මන්ත්‍රීතුමා කියා තිබුණා මේ අය වැය හොඳයි කියා. අද මේ ගරු සභාවේදී අනුර ප්‍රියදර්ශන යාපා හිටපු ඇමතිතුමා කිව්වා, "මේ අපේ අය වැය ඉදිරියට යාමක්" කියා. ඒ නිසා මේක එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ මේ සියලු දෙනා එකඟ වෙන අය වැයක් කියා එතුමන්ලා කිව්වා. දැන් රෙජිනෝල්ඩ් කුරේ හිටපු ඇමතිතුමාත් කිව්වා, "තවදුරටත් මේ අය වැයට අප සහයෝගය දෙන්නේ ඒ පදනමෙන්" කියා. ඒ නිසා අපට හරි පැහැදිලියි, අද මේ සභා ගර්භයේ ඡන්දය විමසීමේදී ඡන්දය දෙන විධිය අනුවත් පැහැදිලියි, මේක මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ අය වැයේම දිගුවක් බව. එහි ප්‍රතිපත්තිමය වෙනසක් නැහැ. පොඩි පොඩි වෙනස්කම් විතරයි තිබෙන්නේ.

පසු ගිය ජනාධිපතිවරණයේදී අප කිව්වා, "මේ දෙකම එකයි" කියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ දෙකම එකයි කියා අප කිව්වේ මේ පදනමින්. ඒ නිසා ඒක තවදුරටත් තහවුරු වෙනවා.

මුදල් ඇමතිතුමා මොන විධියට ඉලක්කම් පෙන්නුවත්, මුදල් ඇමතිතුමාගේ වාක්‍ය රටාවේ මොනවා තිබුණත්, එතුමාට සුබ පතලා මොන විධියේ පෝස්ටර් ගැහුවත්, අපි අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමා කියපු කාරණයට අවධානය යොමු කරමු. එතුමා කියනවා, ආර්ථිකය සංවර්ධනය කරන්නේ නම් ජනතාව කැප කරන්න ඕනෑය කියා. ඒක තමයි, රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ දැක්ම. මොකක්ද මේ කියන්නේ? මේ රටේ කඹුරලා, කඹුරලා මහන්සි වෙලා උපරිමයෙන් වැඩ කරපු මිනිස්සු, වැඩ කරලා නිදා ගන්න වෙලාවක් නැති, විවේකයක් නැති, තමන්ගේ දරුවාත් එක්ක, බිරිඳත් එක්ක, තමන්ගේ මිත්‍රයන් එක්ක ගත කරන්න වෙලාවක් නැති, ඉතුරු වෙලාවේත් overtime කරලා ජීවත් වෙන්න බැරි මිනිහාට කියනවා, "ලැහැස්ති වෙන්න තවත් කඹුරන්න" කියා. කාටද? "මේ රටේ ලාභ උපයන මිනිසුන් වෙනුවෙන් වැඩ කරන්න ලැහැස්ති වෙයල්ලා, වැඩියෙන් මහන්සි වෙන කොට වැටෙන ඉඳුල් ටික කන්න ලැහැස්ති වෙයල්ලා" කියා ඒ මිනිසුන්ට කියනවා. මොකක්ද වන්නේ? වැඩියෙන් මහන්සි වෙන කොට, වැඩ කරන කොට ලාභ ලබන පිරිසක් ඉන්නවා. වැඩියෙන් වැඩ කරන කොට ඔවුන්ට වැඩියෙන් ලාභ ලැබෙනවා. මහන්සි වෙන මිනිසුන්ට ඉඳුල් ටිකක් හම්බ වෙනවා. වැඩියෙන්

[ගරු අජිත් කුමාර මහතා]

ඉඳුල් කන්න ලැහැස්ති වෙන්න කියා තමයි රනිල් වික්‍රමසිංහ මැතිතුමා වෙන විජ්ජාවකින් මේ කියන්නේ. ඒ නිසා මේ කරන්නේ මොකක්ද? ඒ සූරා කෑම තවදුරටත් පවත්වා ගෙන යාමයි.

ජේ.ආර්. ජයවර්ධන මහත්මයා පටන් ගත්ත නව ලිබරල් ආර්ථිකය, මහින්ද රාජපක්ෂ මහත්මයා ගෙනාපු නව ලිබරල් ආර්ථිකය ඉදිරියට ගෙන යන්න තමයි, රනිල් වික්‍රමසිංහ මැතිතුමා, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඇතුළු ඒකට සුබ පතන අය මේ කටයුතු කරන්නේ. "ඒක සුබවාදී අය වැයක්" කියා 2015 ජනවාරි 30වැනි දා මාධ්‍ය සාකච්ඡාවක් තියලා ජනතා විමුක්ති පෙරමුණ කියපු ඒ කාරණය තහවුරු කරන අය වැයක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ඉරාන් වික්‍රමරත්න මැතිතුමා කියපු කාරණයක් මා මතක් කරන්නම්. ආර්ථික නිදහස පිළිබඳ දර්ශකයේ ඉහළටම ලංකාව ගෙන යන එක තමයි අපේ අරමුණ කියා එතුමා කිව්වා. මොකක්ද මේ කියන්නේ? ආර්ථිකය ඉහළම දර්ශකයට ගෙනෙන්න මොකක්ද කියන්නේ? විදේශීය ප්‍රාග්ධනයට තිබෙන බාධාවන් ඉවත් කිරීමේදී අද ලංකාව ඉන්නේ 90වන ස්ථානයේය කියා එතුමා කිව්වා. කෙටි කාලීනව එය 70වන ස්ථානයට ගෙනෙන බවත්, දිගු කාලීනව 30වන ස්ථානයට ගෙනෙන බවත් එතුමා කිව්වා. මොකක්ද මේ කියන්නේ? ජේ.ආර්. ජයවර්ධන මහත්මයා පටන් ගත් ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය තමයි මේ ඉදිරියට ගෙන යන්නේ කියා ඉතා පැහැදිලිවම කියා තිබෙනවා. මුදල් ඇමතිතුමා මොනවා කිව්වත්, කථාවලින් කියන ඒවා නොවෙයි කරන්නේ කියන එක තමයි එළියේ කරන වැඩවලින් පෙනෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එළියේ කරන වැඩ කෙරෙහි මා ඔබතුමියගේ අවධානය යොමු කරන්නම්. හිටපු අධ්‍යාපන ඇමතිතුමා දැන් මේ ගරු සභාවේ සිටිනවා. එතුමාගේ රජය අධ්‍යාපනය පෞද්ගලීකරණය කරන්න විවිධ උත්සාහයන් ගෙනාපු වෙලාවේ විරුද්ධ වුණු බව අපි දන්නවා. මේ රටේ ගුරුවරුන් -

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙනවා.

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
හොඳයි. විරුද්ධ පාර්ශ්වයේ කාලය නම් ඉතුරු වෙලා තිබුණා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට නියමිත විනාඩි 10 අවසානයි. ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් ලබා දෙනවා.

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
හොඳයි.

විශේෂයෙන්ම පාසල්වලින් ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් විරෝධතාවක් තිබුණා. දැන් මේ රජය කළේ මොකක්ද? පාසල්වලින් ගාස්තු අය කිරීම වැරැදියි කියා උද්ඝෝෂණයක්, විරෝධතාවක් තිබෙන කොට රනිල් වික්‍රමසිංහ, මෛත්‍රීපාල සිරිසේන, ජනතා විමුක්ති පෙරමුණ හවුල් ආණ්ඩුව මොකක්ද කළේ? ඒක නීතිගත කළා. ඒ පිළිබඳව කවුද කථා කරන්නේ? අවශ්‍ය ඒවාට විතරක් සල්ලි අය කරන්න කියා කිව්වා. අවශ්‍ය ඒවා මොනවාද? දුරකථන බිල්, විදුලි බිල් වැනි ඒවා. මේ තුළින් කළේ පාසල්වලින් මුදල් අය කරන එක නීතිගත කරන එකයි. මේ අය වැයෙන් මොනවා කිව්වත්, මේ රටේ ජනතාව අපේක්ෂා කළ බලාපොරොත්තුවලට පටහැනි දෙයක් තමයි දැන් මේ ආණ්ඩුව කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපිත් කියන්නේ අවශ්‍ය ඒවාට මිනිසුන්ගෙන් අය කරන්න එපාය කියායි. පාසල්වල අවශ්‍ය වියදම් නොවෙයි, අනවශ්‍ය වියදම් නොවෙයි, කිසිවක් අය කරන්න එපා කියා තමයි මේ රටේ ජනතාව උද්ඝෝෂණය කළේ. [බාධා කිරීමක්] මට විනාඩි දෙකයි තිබෙන්නේ. ඔබතුමාගේ කථාවේදී උත්තර දෙන්න. [බාධා කිරීමක්] ඒකට ඔබතුමාගේ කථාවේදී උත්තර දෙන්න. ඔබතුමාට පැයක කාලයක් තිබෙනවා නේ. ඒ කාලය තුළ උත්තර දෙන්නකෝ. [බාධා කිරීමක්] ඔබතුමාගේ කථාවේදී ඒ වක්‍රලේඛය ගෙනැවිත් මේ සභාවට ඉදිරිපත් කරන්න. [බාධා කිරීමක්] අපි නොවෙයි. ජෝශප් ස්ටාලින් මහත්මයා ගුරු සංගමයේ නායකයෙක්. ඔබතුමන්ලාට සහයෝගය දුන්නු ඒ අය අද මාධ්‍ය සාකච්ඡාවක් පවත්වා කියනවා, පාසල්වලින් ගාස්තු අය කිරීම නීත්‍යානුකූල කරන්න වක්‍රලේඛ ගෙනාවේ තමුන්නාන්සේලායි කියා. [බාධා කිරීමක්] ඔබතුමා උත්තර දෙන්න. [බාධා කිරීමක්] ඒ ගැන වෙන විවාදයක් ගන්න.

ඊළඟට අනික් කාරණය මෙයයි. [බාධා කිරීමක්] ඒ විතරක් නොවෙයි. මර්දනය කැඳවීමට අවශ්‍ය වැඩ පිළිවෙළ හදනවා. විශේෂයෙන්ම මහින්ද රාජපක්ෂ මහත්මයා හමුදාවට සිවිල් බලය දුන්නා. හදිසි නීතිය ඉවත් කළාට පස්සේ සිවිල් බලය පාවිච්චි කරලා රතුපස්වලදී වෙඩි තැබුවා. 2015 ජනවාරි 03වන දා තමයි මහින්ද රාජපක්ෂ මහත්මයා අවසන් වතාවට ගැසට් නිවේදනයට අත්සන් කළේ. මෛත්‍රීපාල සිරිසේන මහත්මයා මොකද කළේ? එතුමාත් ඒ ගැසට් නිවේදනයට අත්සන් කළා. මුළු රටේම පොලිස් බලතල නැවත වරක් හමුදාවට දුන්නා. එහෙම නම් ඉතා පැහැදිලියි නේ, ගමන මොකක්ද කියා. මා මේ අවස්ථාවේදී විශේෂයෙන් ප්‍රකාශ කරනවා, මේ අය වැයේ තිබෙන්නේත් නව ලිබරල් ධනවාදී ආර්ථිකය ඉදිරියට ගෙන යෑම සඳහා අවශ්‍ය වටපිටාව හදන වැඩ පිළිවෙළයි කියා. කථා මොනවා වුණත් කෙරුම් තිබෙන්නේ වෙන පැත්තකටයි. ඒකට මේ රටේ ජනතාව විරුද්ධ විය යුතුයි කියන අදහස මා මේ අවස්ථාවේදී ඉදිරිපත් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තූතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තූතියි, ගරු මන්ත්‍රීතුමා.

ඊළඟට, ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මන්ත්‍රීතුමා. ඊට ප්‍රථම කවුරුන් හෝ මන්ත්‍රීවරයෙක් ගරු ජානක බණ්ඩාර මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
"ගරු ජානක බණ්ඩාර මහතා මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ජානක බණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஜானக பண்டார அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. (MRS.) SRIYANI WIJEWICKRAMA *left the Chair, and* THE HON. JANAKA BANDARA *took the Chair.*

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 3.56]

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව මිනිත්තු 5කට පමණක් මා සීමා කරනවා. විශේෂයෙන්ම මා නැඟිට්ටේ එකම දෙයකට උත්තර දෙන්න පමණයි. මගේ මිත්‍ර අපේ මුදල් ඇමතිතුමා සීනි පිළිබඳව කරපු කථාවට පමණයි මා උත්තර දෙන්නේ. ඊට පෙර මා මෙය අවස්ථාවක් කර ගන්නවා, විශේෂයෙන්ම පසු ගිය මැතිවරණයේදී සහයෝගය දීම පිළිබඳව බදුලු දිස්ත්‍රික්කයේ ජනතාවට, වියලුව, මහියංගනය වැනි ප්‍රදේශවල අපේ ජනතාවට ස්තුතිය පුද කරන්න.

මුදල් ඇමතිතුමාගේ කථාවේදී සීනි මිල අඩු කිරීම පිළිබඳව ප්‍රකාශයක් කරමින් අපට සීනි මිල අඩු කරන්න බැරි වුණේ ඇයි කියා ඇහුවා. ගරු මුදල් ඇමතිතුමනි, මා ඔබතුමාගෙන් එකම එක ප්‍රශ්නයක් අහනවා. තමුන්නාන්සේලාට හාල් මිල අඩු කරන්න බැරි වුණේ ඇයි? දේශීය ගොවියා ආරක්ෂා කරන්න ඕනෑ බව මා පිළිගන්නවා. හැබැයි, හාල් වර්ගවලින් එක වර්ගයක හෝ මිල අඩු කළා නම් ඒක බොහොම වටිනවා. ඒක වුණේත් නැහැ. අද මේ රටේ දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 4.4ක් මොනරාගල දිස්ත්‍රික්කයේ උක් ගොවීන්ගේ අතේ පමණක් තිබෙනවා. තමුන්නාන්සේලා සීනි මිල රුපියල් 10කින් අඩු කිරීමෙන් වෙන්නේ, ඒ ප්‍රදේශයේ ජීවත් වන උක් ගොවීන් 20,000කට, ඔවුන් නිෂ්පාදනය කරන හැම සීනි කිලෝවකින්ම රුපියල් 10ක් පාඩු වීමයි. සීනි මිල අඩු කරනවා නම් කළ යුත්තේ -මොකද, සීනි ගෙන්වන්නේ ඒ අමාත්‍යාංශයෙන් නොවෙයි, භාණ්ඩාගාරය තමයි ඒකට මැදිහත් වන්නේ, පෞද්ගලික අංශය- සුදු සීනිවල මිල අඩු කිරීමයි. මේ රටේ අපි නිෂ්පාදනය කරන්නේ වස විස නැති දුඹුරු සීනි. දුඹුරු සීනි ගන්න මේ රටේ ජනතාව කීයක් හරි වැඩිපුර ගෙව්වාට කමක් නැහැ. මොකද, ඒවා ගුණාත්මක සීනි. සුදු සීනිවලට සල්ෆ එකතු කරනවා. තමුන්නාන්සේලා පිටින් ගේන සුදු සීනිවල බද්ද අඩු කළාට ඒකෙන් මොනරාගල ප්‍රදේශයේ උක් ගොවීන්ට කිසිම හානියක් වෙන්නේ නැහැ. "සීනි රුපියල් 10කින් අඩු කළා" කියලා බොහොම ලස්සනට මාධ්‍යයට දාන්න පුළුවන්. සීනි මිල අඩු කිරීමෙන් උක් ගොවීන් 20,000කට වෙන හානිය ගැන කල්පනා කරන්න කියලා මම විශේෂයෙන්ම ගරු මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

වැවිලි කර්මාන්ත අමාත්‍ය, මගේ මිත්‍ර ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා, මේ ගැන හොඳට සොයලා බලන්න කියලා. මේ තීන්දුව ක්‍රියාත්මක කරන්නට යාමෙන් උක් ගොවියා අසීරු තත්ත්වයට පත් වෙනවා. අද උක් ගොවියා උක් ටොන් එකකට රුපියල් 4,500ක් ගන්නවා. ඒ ප්‍රදේශයේ ආර්ථිකය රඳා පවතින්නේ මේ කර්මාන්තශාලාත් සමඟයි.

ගරු මුදල් ඇමතිතුමනි, ඔබතුමා ඊයේ ප්‍රකාශයක් කරලා තිබුණා අවුරුදු දෙකක් රාජ්‍ය ආයතන පාඩු පිට පවත්වා ගෙන ගියොත්, ඒවා වහනවා කියලා. ඒ නිසා මේ වැඩේ කරන්න යන්නේ ඒකටද කියන ප්‍රශ්නයක් මගේ හිතට ඇති වෙනවා. මේ කරන්න යන්නේ මේ කර්මාන්තශාලා වහලා නැවත පෞද්ගලික අංශයට පැවරීමද කියන ප්‍රශ්නයක් මම ඔබතුමාගෙන් අහන්නට ඕනෑ. ගරු මුදල් ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් බලාපොරොත්තු වෙනවා, "මේ ආයතන නැවතත් පෞද්ගලික අංශයට පවරන්නට අදහසක් තිබෙනවාද?" කියන ප්‍රශ්නයට පිළිතුරක් දෙයි කියා. තමුන්නාන්සේ සීනි මිල අඩු කිරීම පිළිබඳව කළ ප්‍රකාශය අදට ගැළපෙන ප්‍රකාශයක් නොවෙයි. දේශපාලනයට හොඳයි. නමුත් ප්‍රායෝගිකව මේ රටේ ඉන්න උක් ගොවියා විනාශ කරන වැඩ පිළිවෙළක්. [බාධා කිරීමක්] ගරු මුදල් ඇමතිතුමනි, මට තිබෙන්නේ මිනිත්තු 4යි.

ගරු රවි කරුණානායක මහතා (මුදල් අමාත්‍යතුමා)
(மாண்புமிகு ரவி கருணாநாயக்க - நிதி அமைச்சர்)
(The Hon. Ravi Karunanayake - Minister of Finance)
මම දෙන්නම්, කාලය. ඔබතුමා කිව්වා වාගේ උක් ගොවීන් ලියා පදිංචි වෙලා ඉන්නේ 17,200යි. ඒ අයගේ උක් නිෂ්පාදනවලින් ලැබෙන්නේ මේ රටට අවශ්‍ය සීනිවලින් සියයට 12.8යි. මේ රටේ වී ගොවීන් මේ රටේ සහල් අවශ්‍යතාවෙන් සියයට 99ක් නිෂ්පාදනය කරනවා. දැනට පවතින සියයට 12.8 දේශීය සීනි නිෂ්පාදනය සියයට 50 පමණ වුණොත් ඒ ගැන හිතලා බලනවා. අපේ අහිංසක පාරිභෝගිකයා නිකම් පාඩු පිට-

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ඔබතුමාට පොඩි වැරදීමක් වෙලා. අපි මේ කර්මාන්තය භාර ගන්නා විට මේ රටේ සීනි නිෂ්පාදනය කළේ රටේ අවශ්‍යතාවෙන් සියයට 4යි. ඒ සියයට 4 අවුරුදු 3ක් ඇතුළත සියයට 10කට 12කට ඉහළ දමන්නට අපට පුළුවන් වුණා. මොකක්ද තිබුණු සැලැස්ම? අපි සීනි ආනයනය සඳහා අවුරුද්දකට මිලියන 6,500ක් විදේශ විනිමය පිට රට අරිනවා. ඒ ප්‍රමාණය යම් තාක් දුරකට නතර කරන්නට තමයි මේ සැලැස්ම ඇති කරලා තිබුණේ, අඩු වශයෙන් අවුරුදු 4කින්. මේ රටට ගැළපෙනම භෝගයක් තමයි උක් ගහ. වර්ෂාව අවශ්‍ය නැහැ. වැඩි වශයෙන් වතුර අවශ්‍ය නැහැ. ඒ වාගේම, ආදායම හොඳයි; ඕනෑම ප්‍රදේශයක වගා කරන්නට පුළුවන්. වී ගොවිතැන කරන්නට බැරි තැන්වල ඉතාමත්ම පහසුවෙන් උක් වගාව කරන්නට පුළුවන්. ඒ වාගේම වී ගොවිතැනට වඩා තුන් හතර ගුණයකින් ලාභය එනවා. වී ගොවිතැන සඳහා අවශ්‍ය වතුර ප්‍රමාණයෙන් හතෙන් එකයි උක් වගාව සඳහා අවශ්‍ය වන්නේ. මේක තණ කොළ ගහක්; රටට ගැළපෙන භෝගයක්. මේක තමයි එදා තිබුණු සැලැස්ම.

ගරු මුදල් ඇමතිතුමනි, ඔබතුමා දැන් ප්‍රකාශ කළේ මොකක්ද? රටේ සීනි අවශ්‍යතාවෙන් සියයට 12.8ක් නිෂ්පාදනය කරන උක් ගොවියාට ප්‍රශ්නයක් ඇති වුණාට කමක් නැහැ, සීනි මිල අඩු කිරීමෙන් කියලා. ඔබතුමා මේ විෂය පිළිබඳව තව පොඩ්ඩක් ඉගෙන ගන්න. දන්නේ නැත්නම් මුදල් අමාත්‍යාංශයේ නිලධාරි මහත්වරුන්ගෙන් අහගන්න.

මම ඒකයි ඔබතුමාට කිව්වේ, දුඹුරු සීනිවල මිල අඩු කරන්න එපා, සුදු සීනිවල මිල අඩු කරන්න කියලා. ඒකෙන් උක් ගොවියාට - ගොවි පවුල් 20,000කට- කිසිම හානියක් වෙන්නේ නැහැ. මේ ගොවියා ආරක්ෂා නොකළොත් ඒ ප්‍රදේශයේ තිබෙන ආර්ථිකය සම්පූර්ණයෙන් කඩා ගෙන වැටෙනවා. මේ ගැන විශේෂයෙන් සැලකිලිමත් වෙන්න කියන කාරණය තමයි මම ඉල්ලා සිටින්නේ. මට ඇත්තටම කථා කරන්නට වුවමනා වුණේ ඒ කාරණාව සම්බන්ධයෙන් පමණයි. මොකද, තමුන්නාන්සේ ඒ ගැන පුන පුනා කියපු නිසා ගරු මුදල් ඇමතිතුමනි. තමුන්නාන්සේගේ ඒ අදහස වැරදියි කියන කාරණය ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු ඩිලාන් පෙරේරා මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.03]

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුලින්ම කියන්න ඕනෑ ගරු රවි කරුණානායක මුදල් ඇමතිතුමා මගේ පාසලේ මිත්‍රයෙක් බව. එතුමාගේ පළමු අය වැය අතුරු අය වැයක්. ඒ අතුරු අය වැය හරියට අපේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ගෙනාපු අය වැය කියන බටර් කේක් එකට සීනි වැඩියෙන් දමලා, අයිසින් දමපු අය වැයක් වාගෙයි. මොකද, ඒක ඇතුළේ තිබෙන්නේ බටර් කේක් එකක්. හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රටේ ජනතාවට පහු ගිය අය වැයෙන් දුන්නු බොහෝ සහන සමහර තැන්වලදී ඒ විධියටම තියා ගෙන, සමහර තැන්වලදී ඒ තිබුණු සහනත් කප්පාදු කරලා ඒ කේක් එක උඩින් වැඩියෙන් සීනිත් තවරා අයිසින් ටිකක් දමා තිබෙනවා. බටර් කේක් එක විතරක් කෑවා නම් දියවැඩියාව හැදෙන්නෙත් නැහැ. දැන් අයිසින් දමපු නිසා සමහර විට දියවැඩියාව හැදෙන්නත් පුළුවන්.

දෙවන කාරණය තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව අද මේ අතුරු අය වැය සම්මත කර ගන්නවාය කිව්වත්, විරුද්ධ පක්ෂයේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මන්ත්‍රීවරුන්ගේ සහයෝගය නැතිව ඒ අයට මේ අය වැය සම්මත කර ගන්න බැහැ. ජනතා විමුක්ති පෙරමුණ, TNA යන පක්ෂවල සහයෝගය ගත්තත් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායමේ සහයෝගය නැතිව මේ අය වැය සම්මත කර ගන්න බැහැ. ඒ නිසා අද මේ අතුරු අය වැය සම්මත කර ගත්තායින් පසුව මේකෙන් ජනතාවට ලැබෙන සහන ලබා දීමේ කර්තව්‍යයේදී එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මන්ත්‍රීවරුන් තමයි මෙහිදී අවශ්‍ය කරන වැඩිම උපකාරය කරන්නේ. ඒක තමයි ඇත්ත කතන්දරය. අපි එහෙම කරන්න හේතු දෙකක් තිබෙනවා.

එකක් තමයි, පසු ගිය ජනාධිපතිවරණයේදී මේ රටේ ජනතාව හංසයා ලකුණින් තරග කළ අපේක්ෂකයාට -ඔහු එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයෙක් නොවෙයි- මේ රටේ ජනාධිපති වෙන්න ඡන්දය දුන්නා. ඒ දුන්නු ජනවරම තුළ දින 100 වැඩසටහනත් එක කොටසක්. ඒ නිසා ජන මතයට ගරු කරන පක්ෂයක් හැටියට සන්ධානය මේ අය වැයට අපේ සහයෝගය දෙනවා.

දෙවැනි කරුණ මෙයයි. ජනාධිපති හැටියට පත් වුණේ හංසයා ලකුණින් තරග කළ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාය, ඒ නිසා පාර්ලිමේන්තුව ඇතුළේ සුළුතරයක් තිබෙන එක්සත් ජාතික පක්ෂයට අගමැතිකම දරන්න සහ ආණ්ඩුවක් හදන්න බැහැ කියන තර්කය මතු කරලා -තාක්ෂණික ප්‍රශ්නයක් එළියට ඇද දමමින්- ජනතාවගේ ඡන්දයෙන් පාර්ලිමේන්තුවට පත් වුණු විශාලතම කණ්ඩායම සන්ධානය නිසා අගමැතිකම සහ ආණ්ඩුව සන්ධානයට ඕනෑය කියන කාරණය මතු කරන්න ඕනෑ නම් සන්ධානයට තිබුණා. එහෙම වුණා නම් ජනතාවගේ ඡන්දයෙන් හංසයා ලකුණෙන් පත් වුණු ජනාධිපතිතුමා ඇතුළු කණ්ඩායම විශාල අපහසුතාවකට පත් වෙනවා. නමුත් අත් දැකීමක් හැටියට සහයෝගී දේශපාලනය අපේ රටට අත් හදා බලන්නට තිබෙන අවස්ථාවට ඉඩ දෙමින් අපි කල්පනා කළා, රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා ඇතුළු සුළුතරයක් වුණු එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ ආණ්ඩුවට අපේ විරෝධය පළ නොකොට වැඩි මන්ත්‍රී සංඛ්‍යාවක් ඉන්නා විපක්ෂයක් වුණත්, විපක්ෂ නායකතුමා යටතේ කාරණා කටයුතු කරන්න. ඒ නිසා මේ පාර්ලිමේන්තුව තුළ අද අපි අත් විඳින්නේ, අත් හදා බලන්නේ අමුතුම තාලයේ දේශපාලන ආණ්ඩු ක්‍රමයක්. සමහර වෙලාවට මේක තේරුම් ගන්න බැරි උදව්ය ගොඩාක් ගම්වල ඉන්නවා. ගම්වල ඉන්න එක්සත් ජාතික පක්ෂයේ අය හුරු වෙලා තිබෙන්නේ ආණ්ඩුව මාරු වුණාම අනික් පක්ෂයේ අයට තළා පෙළන්නයි. හැම තැනම නොවෙයි සමහර ආයතනවල ජාතික සේවක සංගමයේ නිලධාරින් හුරු පුරුදු වෙලා තිබෙන්නේ ආණ්ඩුව මාරු වුණාම විරුද්ධ පක්ෂයේ union එකේ කට්ටිය මාරු කරන්නයි. ගිය සුමානයේ විදේශ සේවා නියුක්ති කාර්යංශයේ 54ක් මාරු කළා; පෙරේදා තවත් විසි ගණනක් මාරු කළා. ඒ අර පරණ පුරුද්දට. හැබැයි අත් දැකීම් තිබෙන, ඇමතිකම් කරලා පුරුද්ද තිබෙන ඇමතිවරු ඉන්න ස්ථානවල එවැනි දේවල් වෙන එක වළක්වා ගන්න, අලුත් සහයෝගිතා දේශපාලනය තුළ අලුත් ආණ්ඩුවේ ඇමතිවරු සමත් වෙලා තිබෙනවා. වෙන දා දකින්න ලැබෙන එවැනි දේවල් නැහැ. හැබැයි අත් දැකීම් නැති ඇමතිවරු ඉන්න තැන්වල ජාතික සේවක සංගමය ඇමති ධුරයේ කටයුතු කරන කොට ඒ අදාළ අමාත්‍යාංශය භාර උදව්ය වෘත්තීය සමිති නායක නායිකාවන්ගේ චරිතය නිරූපණය කර තිබෙනවා. අර්ජුන රණතුංග ඇමතිතුමා වරාය භාර ඇමතිතුමා හැටියට වැඩ බාර ගන්න පෙර විශාල කලබැගෑනියක් තිබුණා. නමුත්, එතුමා වැඩ බාර අරගෙන පැය විසිහතරෙන් ඒ දේවල් නවත්වන්න එතුමාට හැකියාව ලැබුණා.

අපි අද අත්හදා බලන්නේ අලුත් තාලයේ ආණ්ඩු ක්‍රමයක්. අපි දන්නේ නැහැ, මේ ආණ්ඩු ක්‍රමය කොයිතරම් දුරට සාර්ථක වෙයිද, කොයිතරම් දුරට අසාර්ථක වෙයිද කියලා. හැබැයි, ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයා සහ පත් වුණ අලුත් ආණ්ඩුවේ නායකයා බවට පත්වෙලා තිබෙනවා. ඒ නිසා පාර්ලිමේන්තුව ඇතුළේ වැඩි මන්ත්‍රී සංඛ්‍යාවක් සිටින ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ ප්‍රධාන විපක්ෂය වන එක්සත් ජනතා නිදහස් සන්ධානය අතේ තමයි මේ දුරස්ථ පාලකය - remote control - එක තිබෙන්නේ. ඒ නිසා අද ඕනෑ නම් රූපවාහිනිය දානවා. ඕනෑ නම් ITN එක දානවා. ඕනෑ නම් ස්වර්ණවාහිනිය දානවා. ඕනෑ නම් සිරස දානවා. නැත්නම් off කරනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයා ජනාධිපතිතුමායි. ජනතාවගේ ඡන්දයෙන් හංසයා ලකුණෙන් පත්වෙලා සුළුතර ආණ්ඩු බලයක් ලබා ගෙන තිබෙන ආණ්ඩුවේ නායකයාත් ජනාධිපතිතුමායි. ලෝකයේ කොහේවත් මෙවැනි ආණ්ඩු ක්‍රමයක් අත්හදා බලා නැහැ. 1916 දී එංගලන්තයේ මේ වාගේ දෙයක් අත්හදා බැලුවේත් interim period එකක. ඒ නිසා මේ අලුත් දේශපාලන විධික්‍රමය, ආණ්ඩු ක්‍රමය ලෝකයටම ආදර්ශයක් වෙන්න නම්, අපි ඒ ආණ්ඩු ක්‍රමය අත්හදා බැලීම සඳහා දෙන්න පුළුවන් සහයෝගය දෙන්න ඕනෑ. නමුත් සමහර වෙලාවට අපේ ගම්වල සහ ආයතනවල සිටින පාක්ෂිකයන්ට යම් යම් ආකාරයේ කුඩම්මාගේ සැලකිලි, යම් යම් ආකාරයේ ප්‍රශ්න පුරුදු පරිදි සිද්ධ වෙනවා. අපි ඒ සියලු දේවල් දරා ගෙන මේ අලුත් ආණ්ඩු ක්‍රමය, විධික්‍රමය අත්හදා බැලීම හරහා රටට සිදු වෙන සෙත ගැන හොයනවා. ඒ සෙත පිළිබඳ කල්පනා කරලා තමයි, මේ අතුරු අය වැයට අපේ සහයෝගය දෙන්න ඕනෑය කියලා කල්පනා කළේ. අපි ඒ කල්පනා කළ විධියටම සුළුතරයක් ඉන්නා වූ එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවත් කල්පනා කරලා, දිගින් දිගටම විරුද්ධ පක්ෂයෙන් ඒ සහයෝගය ලබා ගැනීම සඳහා අවශ්‍ය කරන වාතාවරණය සකස් කරයි, ඒ වාතාවරණය හරි ආකාරයෙන් සකස් වී නැති ස්ථානවලත් ඒවා නියමාකාරයෙන් ක්‍රියාත්මක කරන්න අවශ්‍ය නායකත්වය දෙයි කියලා අපි කල්පනා කරනවා. මොකද, මෙතැනදී give-and-take policy එකක් තිබෙන්න ඕනෑ. සමහර වෙලාවට අද අපි මේ අතුරු අය වැයට සහයෝගය දීලා එළියට බැහැලා අපේ ගම්වලට ගියාම, අපේ ආයතනවලට ගියාම, "අපට ගහනවා, මාරු කරනවා. තමුන්නාන්සේලා ලැජ්ජා නැතුව අතුරු අය වැයට සහයෝගය දුන්නා නේද" කියලා අපෙන් ප්‍රශ්න කරන්න පුළුවන්. අපි ඒකට දෙන උත්තරය තමයි, "මේ අලුත් තාලේ දේශපාලන සංස්කෘතිය අත්හදා බලන්න අපි මේ කටයුත්ත කළා" කියන එක. ඉතින් එවැනි ප්‍රශ්නවලටත් උත්තර හොයමින් විවිධ වාද භේද සහ තර්ක විතර්ක මැද්දේ තමයි අපි මේ තීන්දුවට ආවේ.

අද මේ රටේ ජනතාව පැහැදිලිව ඉල්ලන්නේ, මැතිවරණයක් අවසාන වුණාට පස්සේ රටේ ජාතික ප්‍රතිපත්තිය වෙනස් නොවන, මැතිවරණයක් අවසාන වුණාට පස්සේ රටේ පාලන තන්ත්‍රයේ

විවිධ පුටුවල ඉන්න උදවිය වෙනස් නොවන, මැතිවරණයක් අවසාන වුණාට පස්සේ දේශපාලන වශයෙන් මාධ්‍ය සංදර්ශන තියමින් ටොන් ගණන් මඩ ගහන ඒ දේශපාලන ක්‍රමයට විරුද්ධ වුණු, හැබැයි මේ රටේ සියලු දෙනාම සහයෝගයෙන් වැඩ කරන දේශපාලන විධික්‍රමයක්. ඒ සඳහා අද මේ අතුරු අය වැය සම්මත කරන වෙලාවේ මේ රටේ ප්‍රධාන විපක්ෂය මේ ආණ්ඩුවට දෙන සහයෝගය ආදර්ශයක් කොට ගනිමින්, ගුරුකොට ගනිමින් ඉදිරි කටයුතු කරන්නට අපි සූදානම් වෙන්නට ඕනෑ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දින 100 වැඩ පිළිවෙළේ අත්‍යවශ්‍යම කාරණය අතුරු අය වැය නොවෙයි. අතුරු අය වැය ඊළඟ මැතිවරණයක් සඳහා එක්සත් ජාතික පක්ෂයේ ඡන්ද ටික වැඩි කර ගැනීම සඳහා ඉදිරිපත් කළ එකක්. ඊට වඩා වැඩි දෙයක් තිබෙනවා දින 100 තුළ ඉෂ්ට කරන්න. විධායක ජනාධිපති ක්‍රමයේ බලතල අඩු කරන එක ඒ තුළ තිබෙන එක කාරණයක්. විධායක ජනාධිපති ක්‍රමයේ බලතල අඩු කිරීම සිද්ධ කරන්න බැහැ ඡන්ද ක්‍රමය අමතක කරලා. විධායක ජනාධිපති ක්‍රමයේ බලතල අඩු කරනවාය කියන කාරණය ඡන්ද ක්‍රමයත් එක්ක එකට සමානුපාතිකව, සමාන්තරව කරන්න ඕනෑ දෙයක්. මොකක්ද ඒකට හේතුව? මේ තිබෙන සමානුපාතික ඡන්ද ක්‍රමය යටතේ ලේසියෙන් කිසිම පක්ෂයකට පාර්ලිමේන්තුව තුළ තුනෙන් දෙකේ බලයක් ගන්න බැහැ. එහෙම නම් පාර්ලිමේන්තුව තුළ හැදෙන ආණ්ඩුව තුනෙන් දෙකේ බලයක් ගන්න බැරි, ටිකක් අස්ථාවර මට්ටමේ ආණ්ඩුවක්. එවැනි අස්ථාවර මට්ටමේ ආණ්ඩුවක් පාර්ලිමේන්තුව තුළ තිබෙන කොට, විශේෂ ස්ථාවර තීන්දු ගන්න විධායක ජනාධිපති ක්‍රමය වැදගත්. හැබැයි අපි එහි බලතල අඩු කරනවා නම්, පාර්ලිමේන්තුව තුළ ස්ථාවර ආණ්ඩුවක් හදාගැනීම සඳහා වූ ඡන්ද ක්‍රමයකුත් නිර්මාණය කරමින්මයි එය කළ යුතු වන්නේ. එහෙම නැතිව විධායක ජනාධිපති ක්‍රමයේ බලතල අඩු කරලා, ඡන්ද ක්‍රමය වෙනස් නොකර තිබුණොත් රට විශාල අර්බුදයකට යනවා. ඒ නිසා මේ රටේ විධායක ජනාධිපති ක්‍රමයේ බලතල අඩු කරන කොටම, ඊට සමගාමීව, ඊට සමාන්තරව අනිවාර්යයෙන්ම දින 100 වැඩ පිළිවෙළ මඟින් ජනතාවට පොරොන්දු වූ පරිදිම මැතිවරණ ක්‍රමය වෙනස් කිරීමත් කළ යුතුම වෙනවා. දැන් කෙනෙක් තර්ක කරයි, එහෙම කරන්න කල් ඕනෑ නේද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ රටේ විරුද්ධ පක්ෂය - සන්ධානය- හැටියට අපට, අපේ ජනතාවට සිදු වන්නා වූ යම් යම් කෙනෙහිලිකම්, කුඩම්මාගේ සැලකිලි සියල්ල පැත්තකට දමලා මේ රටේ සහයෝගිතා දේශපාලනය වෙනුවෙන් මේ අය වැයට සහයෝගය දෙන්න අපට පුළුවන් නම්, දින 100 තුළ අනිවාර්යයෙන්ම විධායක බලතල අඩු කිරීමත් සමඟ කළ යුතු වන්නා වූ මැතිවරණ ක්‍රමය වෙනස් කිරීමට කාලය ප්‍රමාණවත් නැත්නම් ඒ සඳහා තවත් කාලයක් ගැනීම වෙනුවෙන් එකඟ වීම අපට මහත් වූ කාරණයක් නොවෙයි; ප්‍රශ්නයක් නොවෙයි, එය රටේ අනාගතයේ ශුභ සිද්ධිය සඳහා කළ යුතු කාරණයක් වන නිසා. අපි දින 100ට උදවු කරනවා කියලා කියන්නේ, එහෙම පිටින්ම දින 100 පැකේජයට උදවු කරනවා විනා දින 100 වැඩසටහනේ තමුන්නාන්සේලාට වාසි කැලිවලට උදවු කරලා අවාසි කැලි පැත්තකට දමනවා කියන කාරණය නොවෙයි. දින 100 වැඩසටහන ජනතාවට වූ පොරොන්දුවක්. ඒ දින 100 තුළ ඒ වැඩසටහන එහෙම පිටින්ම ක්‍රියාත්මක කරන්නයි අපි උදවු කරන්න තීන්දු කළේ. ඒ සඳහා කටයුතු කිරීමේදී ජනාධිපති ක්‍රමයේ විධායක බලතල අඩු කරන කොට, ඊට සමගාමීව, සමාන්තරව, එක විටම මේ රටේ මැතිවරණ ක්‍රමයත් වෙනස් කිරීම අනිවාර්යයෙන්ම කළ යුතුමයි කියන කාරණයත් ප්‍රකාශ කරනවා.

මේ අලුත් අතුරු අය වැය ගෙනාපු අලුත් මුදල් ඇමති, මගේ පාසල් මිත්‍ර, ගරු රවි කරුණානායක මැතිතුමනි, ඔබතුමා බලාපොරොත්තු වූ දේවල් මේ අය වැයෙන් ඉටු කරන්න පුළුවන් වේද කියලා මම දන්නේ නැහැ. කෙසේ නමුත් ඒවා ඉටු කර ගැනීමට ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 4.16]

ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ ආණ්ඩුවේ -එතුමාගේ- පළමුවැනි අය වැය. එම ආණ්ඩුවේ මුදල් අමාත්‍යවරයා හැටියට එක්සත් ජාතික පක්ෂයේ රවි කරුණානායක අමාත්‍යවරයා ඉදිරිපත් කරපු අතුරු අය වැය පිළිබඳව විවාද කරන වෙලාවේ විශේෂයෙන් මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මැතිවරණ කාලයේ තමුන්නාන්සේලා යහ පාලනය ගැන කථා කළා. අපේ රටේ පුරුද්දක් තිබෙනවා, හැම දාම පිට රටින් මොකක් හරි දෙයක් ගෙනැල්ලා මෙහි ඔබන්න බලන එක. ඒ එකක් තමයි good governance. මේවා අපට අවශ්‍ය ද කියලා කල්පනා කරන්න ඕනෑ.

ගරු නවින් දිසානායක මහතා (සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு நவீன் திஸாநாயக்க - சுற்றுலா மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Navin Dissanayake - Minister of Tourism and Sports)
එය අවශ්‍ය නැහැ කියලාද කියන්නේ?

ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
මේ රට හොඳ බෞද්ධ පරිසරයක් තිබෙන රටක්. බලන්න ලංකාවේ සංස්කෘතිය දිහා. බෞද්ධයකු හැටියට කල්පනා කරන්න. "අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි" කියලා බුදු හාමුදුරුවෝ දේශනා කරලා අවුරුදු 2,500කට වැඩියි. හොරකම් කරන්නේ නැති මිනිහෙකු හදන්න අවුරුදු 2,500කට පෙර වැඩ සිටි බුදු හාමුදුරුවන්ටවත් බැරි වුණා. දැන් මේ ඒක කොරන්නද යන්නේ?

ගරු නවින් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
ඔබතුමා ඔහොම කථා කරන්න. ඒක අපට හොඳයි.

ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
නඩු තිබෙන මිනිස්සු නේ ඔය ඇමතිකම් කරන්නේ. නඩු තිබෙන මිනිසුන් නොවෙයිද ඔය ඇමතිකම් කරන්නේ? යහ පාලනය කියන එක මේ රටට ගෙනැල්ලා ඔබ්බන්න බැහැ. ඒක කරන්න නම් හොඳ මිනිහෙක් හදන්න. පන්සල්වල හාමුදුරුවරුන්ට පුළුවන් හොරකම් කරන්නේ නැති මිනිහෙක් හදන්න. මේක තමයි අපේ සංස්කෘතිය. එහෙම කරන්නේ නැතිව - හොඳ මිනිහෙක් හදන්නේ නැතිව- රටක යහ පාලනයක් කරන්න බැහැ.

[ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා]

[මෙම අවස්ථාවේදී අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සභා ගර්භයට පැමිණියේය.]

[இச்சந்தர்ப்பத்தில் மேதகு சனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்கள் சபாமண்டபத்துள் பிரவேசித்தார்.]

[At this stage, His Excellency President Maithripala Sirisena entered the Chamber.]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අධිකරණ ඇමතිතුමා එදා කිව්වා එල්ලුම් ගහ ගෙනෙන්න ඕනෑය කියලා. බලන්න බෞද්ධ දර්ශනය. අංගුලිමාල ඇඟිලි 999ක් කැපුවා. බුදු හාමුදුරුවන්ගේ ඇඟිල්ල කපන්න යන කොට වෙඩි තිබ්බාද, හිරේ දැම්මාද, පොලීසි ගියාද? ඔහු දමනය කරලා රහතන් වහන්සේ නමක් බවට පත් කළා. ඔහු පුනරුත්ථාපනය කරලා අංගුලිමාල මහ රහතන් වහන්සේ හැදුවා. ඒ නිසා එල්ලුම් ගහ අපට වුවමනා නැහැ. අපි බෞද්ධයෝ. බෞද්ධයන් හැටියට අපට වුවමනා කරන්නේ මොකක්ද?

මිනී මරුවෙකු වුණත් පුනරුත්ථාපනය කරලා සමාජයට ගන්න පුළුවන් සමාජ ක්‍රමයක් තමයි බෞද්ධයෝ හැටියට අපට අවශ්‍ය වෙන්නේ. මේ සඳහා ක්‍රමවේද අපට පිට රටින් ගේන්න වුවමනාවක් නැහැ. අපේ බෞද්ධ දර්ශනයේ තිබෙනවා, "අදින්නා දානා වේරමණී සික්ඛා පදං සමාදියාමි" කියලා. හොරකම් කරන්නේ නැති දරුවකු හදන්න අපේ පන්සල්වල භික්ෂූන් වහන්සේලාට වග කීමක් තිබෙනවා. එහෙම නම්, මේ ප්‍රශ්න ඇති වන්නේ නැහැ. අපට පිට රටින් මොකුත් ගෙනැල්ලා මෙහේ ක්‍රියාත්මක කරන්න වුවමනාවක් නැහැ. බෞද්ධයෝ හැටියට අපට ඒ සඳහා කටයුතු කරන්න පුළුවන්කම තිබෙනවා.

දැන් දූෂණය සහ වංචාව ගැන කථා කරන්නේ කවුද බලන්න. ඒ සමාජවාදී පිල වන ජනතා විමුක්ති පෙරමුණයි. මේ ගොල්ලන්ට තමයි රුදාව. මේ ගොල්ලන් හරි පිරිසිදු මිනිස්සු නේ. අනුර කුමාර දිසානායක මැතිතුමා කෘෂිකර්ම ඇමති විධියට සිටි කාලයේ ට්‍රැක්ටර් ගන්න චීනයට ගියේ සෝමවංශ අමරසිංහ මැතිතුමා. දැන් මේ අය අනෙක් අයගේ පිරිසිදුකම ගැන කථා කරනවා. මේ අය වැව් හදපු හැටි අලුතෙන් කියන්න අපට වුවමනාවක් නැහැ. නිකම් අනුන්ගේ මඩ හෝද හෝදා ඉන්නේ නැතිව තමුන් පිරිසිදු බව පෙන්වන්න. බංකොලොත් වූ දේශපාලනයකුයි ඔවුන් තම දේශපාලන දර්ශනය කර ගෙන ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ සමාජවාදය කොහේද තිබෙන්නේ? අද චීනයට ගිහිල්ලා බලන්න. කොමියුනිස්ට් පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා මා එක්ක තරහා වන්න එපා. මම කියන්නේ මේ දර්ශනය අද පිළිගන්නේ නැහැ කියලායි. සමාජවාදය අද කොහේද පිළිගන්නේ? අද socialist market economy එකක් නැහැ. අද එහෙම එකක් නැහැ. අද චීනයට ගිහිල්ලා බලන්න. ඉඩම් අක්කර දහස් ගණනක් බදු දීලා. බැංකු ටික පෞද්ගලීකරණය - privatize - කරලා. අද චීනයේ තිබෙන්නේ වෙළඳ පොළ ආර්ථිකයක්. මෙහේ ඇවිල්ලා අපට සමාජවාදී ක්‍රමය ගැන උගන්වනවා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
රීති ප්‍රශ්නයක්.

ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
මේ මගේ වෙලාව. මගේ වෙලාව ගන්න බැහැ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
මේ වාගේම 1919 දී සෝවියට් දේශයේ නව ආර්ථික වැඩ පිළිවෙළ තුළ අලුත් වෙනස්කම් පටන් ගත්තා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
එය රීති ප්‍රශ්නයක් නොවෙයි.

ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
මම කියන්නේ මේ සමාජවාදී ක්‍රමය ඉස්සෙල්ලාම ඇති කෙරුවේ රුසියාවේ කියලායි. අද රුසියාවේ සමාජවාදය තිබෙනවාද? අද ජනතා විමුක්ති පෙරමුණ මෙතැනට ඇවිල්ලා මහා ලොක්කෝ වෙන්න කථා කරනවා; සුදනුන් වාගේ කථා කරනවා. මේ අයට දර්ශනයක් තිබෙනවාද? මේ රටට ගැළපෙන දර්ශනයක් තිබෙනවාද? මේ රටේ ආර්ථිකය ගෙන යන්න ජනතා විමුක්ති පෙරමුණට වැඩ පිළිවෙළක් තිබෙනවාද? අද මේ අය දූෂණය ගැන කථා කරනවා. මේ ලෝකයෙන් දූෂණය නැති කරන්න බුදු හාමුදුරුවන්ටත් බැරි වුණා. "අදින්නා දානා වේරමණී සික්ඛා පදං සමාදියාමි" ඇතුළු පන්සිල් අපේ රටට හඳුන්වා දීලා වසර 2,500ක් ගත වෙලා තිබෙනවා. ලංකාවේ හොරකම් කරන්නේ නැති මිනිහෙක් හදන්න බෞද්ධ දර්ශනයටවත් බැරි වුණු එක ගැන අප සියලු දෙනාම කනගාටු වෙන්න ඕනෑ. හොරකම් කරන්නේ නැති දරුවෙකු හදන්න අපේ පන්සල්වල භික්ෂූන් වහන්සේලාට යුතුකමක් තිබෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
ඒ නිසා අපට වුවමනා කරන්නේ මොකක්ද? යහපත් සමාජයක් හදන්න අපට ඉන්දියාවෙන් ආපු දර්ශනයක් තිබෙනවා. ඒ බෞද්ධ දර්ශනය. මෙන්න මේ බෞද්ධ දර්ශනය මේ රටේ ස්ථාපිත කරලා හරියට ක්‍රියාත්මක කරන්න අප සියලු දෙනාටම වග කීමක් තිබෙනවා. ඒ සඳහා අපට එංගලන්තයෙන් ගෙනෙන දර්ශන අවශ්‍ය නැහැ; සංකල්ප අවශ්‍ය නැහැ. එහෙම එකක් අවශ්‍ය නැහැ. අපට දශ රාජ ධර්මය තිබෙනවා.

අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටපු මහ ලේකම්තුමා අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිතුමා. එතුමාට වග කීමක් තිබෙනවා. මොකද, එක්සත් ජාතික පක්ෂයේ උදවිය එතුමාට ඡන්දය දීලා තිබෙන නිසා එක්සත් ජාතික පක්ෂය ආරක්ෂා

කරන්නත් එතුමාට වග කීමක් තිබෙනවා. එතුමාට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආරක්ෂා කරන්නත් වග කීමක් තිබෙනවා, එතුමා වර්තමාන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිතුමා නිසා. එතුමාට තිබෙන මේ වග කීම ඉෂ්ට කරන එක ලේසි පහසු කර්තව්‍යයක් නොවෙයි. සන්තෝෂ කරන්න අන්ත දෙකක් එකතු කරන එක දුෂ්කර කර්තව්‍යයක්. එතුමාට මේ කර්තව්‍යය ඉෂ්ට කරන්න පුළුවන් වෙයි කියලා අප විශ්වාස කරනවා. ඒ සඳහා එතුමාට අප සුබ පතනවා.

ඒ විතරක් නොවෙයි. කිරි කර්මාන්තය දියුණු කරන්න ඕස්ට්‍රේලියාවෙන් කිරි එළදෙනුන් 20,000ක් ගෙනෙන්න අපි යෝජනා කරලා තිබුණා. ඉදිරි කාලය තුළ මේ කටයුත්ත ඉෂ්ට වනවාද කියලා මම දැන ගන්න කැමැතියි. කිරි පිටි මිල අඩු කිරීම නිසා මේ රටේ කිරි ගොවියාට කුමන කල දසාවක් යයිද? මුං ඇට හදන්න හේන් ගොවිතැන් කරපු ගොවියාට කුමන කල දසාවක් යයිද කියලාත් දැනගන්න අප බලාපොරොත්තු වනවා. ඒ වාගේම හාල් මිල, පරිප්පු මිල අඩු කරයි කියලාත් අප බලාපොරොත්තු වනවා. ඒ තත්ත්වය තවමත් ජනතාවට දැනෙන්න අරගෙන නැහැයි කියන එකත් මතක් කරමින්, ඒ ද්‍රව්‍යවල මිල අඩු කිරීම සඳහාත් කටයුතු කරන්න කියලා ආරාධනා කරමින් මගේ කථාව සමාප්ත කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි, බොහොම ස්තූතියි.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
රීති ප්‍රශ්නයක්, ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු ජනාධිපතිතුමා අද මේ සභා ගැබේ ඉන්නවා. ඒ පිළිබඳව අප සන්තෝෂ වනවා. මේ කියන කරුණුවලට සවන් දෙන්න මුදල් ඇමතිතුමා මේ අවස්ථාවේදී සභා ගැබේ නැහැ. නමුත්, අග්‍රාමාත්‍යතුමා ඉන්නවා.

ගරු සුජීව සේනසිංහ මහතා (අධිකරණ හා කම්කරු සබඳතා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சுஜீவ சேனசிங்க - நீதி மற்றும் தொழில் உறவுகள் பிரதி அமைச்சர்)
(The Hon. Sujeewa Senasinghe - Deputy Minister of Justice and Labour Relations)
මුදල් ඇමතිතුමා තේ එකක් බොන්න ගියා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මුදල් ඇමතිතුමා දැන් ගරු සභාවට එනවා.

The next speaker is the Hon. Muthu Sivalingam. You have seven minutes.

[பி.ப. 4.22]

ගරු මුතු සිවලිංගම් මහතා
(மாண்புமிகு முத்து சிவலிங்கம்)
(The Hon. Muthu Sivalingam)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அரசாங்க மாற்றத்தின் பின்னர், இச்சபையில் முதல் தடவையாகப் பேசுவதையிட்டு நான் பெருமகிழ்ச்சி யடைவதோடு, எனக்குப் பேசுவதற்கு நேரம் ஒதுக்கித் தந்தமைக்கு நன்றியையும் தெரிவிக்கின்றேன். முதலாவதாக புதிய ஜனாதிபதி அவர்களுக்கு எனது வாழ்த்துக்களைத் தெரிவிக்கின்றேன். அவ்வாறே, பதவியேற்றிருக்கின்ற அமைச்சர்கள், பிரதி அமைச்சர்கள் அனைவருக்கும் எனது வாழ்த்துக்களைத் தெரிவிக்கின்றேன். நீங்கள் எதிர்காலத்தில் இந்த நாட்டிலுள்ள பிரச்சினைகள் எல்லாவற்றையும் தீர்த்து, மக்கள் மகிழ்ச்சியோடு வாழக்கூடிய ஒரு சூழ்நிலையை ஏற்படுத்துவீர்கள் என்ற நம்பிக்கை எனக்கு உண்டு.

நான் இந்தப் பாராளுமன்றத்தில் கிட்டத்தட்ட 24 ஆண்டுகளாக மக்கள் பிரதிநிதியாக இருக்கின்றேன். இந்த நாட்டில் ஆட்சிசெய்த பல அரசாங்கங்களைப் பார்த்திருக் கின்றேன். அவை மக்களுக்குக் கொடுத்த வாக்குறுதிகளை எல்லாம் காற்றில் பறக்கவிடுவதுதான் வழக்கமாக இருந்தது. அந்த நிலை இந்த நூறுநாள் வேலைத்திட்டத்தில் ஏற்படக்கூடாது. விசேடமாக, தோட்டத் தொழிலாளர்களைக் கொண்ட எமது கட்சியான இலங்கைத் தொழிலாளர் காங்கிரஸ் இந்திய வம்சாவளி மக்களைப் பிரதிநிதித்துவப்படுத்தவும் அவர்களுக்கு வாக்குரிமையைப் பெற்றுக்கொடுக்கவும் குடியுரிமையைப் பெற்றுக்கொடுக்கவும் கல்வியற்ற நிலையிலே கைநாட்டு வைத்துக்கொண்டிருந்த மக்களை கல்வி கற்ற ஒரு சமூகமாக மாற்றுவதையும் நோக்கமாகக்கொண்டே ஆரம்பிக்கப்பட்டது. எங்களுடைய காலஞ்சென்ற ஐயா தொண்டமான் அவர்கள் அரும்பாடுபட்டு அந்த உரிமைகளையெல்லாம் எமக்குப் பெற்றுக்கொடுத்தார்.

இன்றைய நிலையில் நாங்கள் அடிக்கடி கூறுவதுபோல, தோட்டப்புறங்களிலே வாழும் மக்கள் 200 ஆண்டுகளுக்கு முன்னர் இந்தியாவிலிருந்து இலங்கைக்கு வந்த காரணத்தி னாலும் பெருந்தோட்டக் கம்பனிகள் வெள்ளைக்காரர்களுக்குச் சொந்தமாக இருந்த காரணத்தினாலும் அவர்கள் 'லயன்' களிலேயே குடியிருந்தார்கள். இந்த நாட்டை மாறிமாறி ஆட்சி செய்த அரசாங்கங்கள் அவர்களுக்கு ஓரளவுக்கு வீடுகளைக் கட்டிக்கொடுத்து குடியமர்த்தின. இருந்தாலும், சென்ற அரசாங்கம் 3,100 தோட்டத் தொழிலாளர்களுக்கு வீட்டு உரிமப்பத்திரம் வழங்குவதற்கு எல்லா ஏற்பாடுகளையும் செய்தது. இதனை அமைச்சர் அவர்கள் கவனத்திற் கொள்வதோடு, அவர்களுக்கு வீடுகளைக் கட்டிக்கொடுக்கும் பொழுது அவற்றை அவர்களுக்குச் சொந்தமாகக் கொடுக்க ஏற்பாடு செய்யவேண்டும்.

அதுமாத்திரமல்லாது, ஓரளவு அபிவிருத்தித் திட்டங்கள் மலையகத்திற்கும் சென்றடைந்திருக்கின்றன. வீதிகள் போடப் பட்டிருக்கின்றன; வீடுகள் கட்டப்பட்டிருக்கின்றன; கல்விக் கூடங்கள் கட்டப்பட்டிருக்கின்றன; கல்விநிலை வளர்ச்சி கண்டுள்ளது. நாங்கள் கேட்டுக்கொண்டதற்கிணங்க 3,000 பயிலுனர் ஆசிரியர்களை நியமிக்க எல்லா ஏற்பாடுகளும் செய்யப்பட்டுள்ளன. ஆகவே, அதில் எந்தவித பாகுபாடும் இல்லாது அந்த உத்தியோகங்களை அவர்கள் பெறக்கூடிய வாய்ப்பை ஏற்படுத்திக் கொடுக்கவேண்டும். தோட்டங்கள் வேறு, கிராமங்கள் வேறு என்று பாராமல் கிராமத்தில் நடக்கும் அபிவிருத்திகள் அனைத்தும் தோட்டங்களிலும் நடைபெற

[ගරු මුතු සිවලිංගම් මහතා]

வேண்டும். அந்த விடயத்தில் அரசாங்கம் அக்கறை எடுக்க வேண்டும். எனக்கு தற்போதுள்ள ஜனாதிபதி அவர்களை வெகுகாலமாகத் தனிப்பட்ட முறையிலே தெரியும். அவரை நான் நன்கு அறிந்திருக்கின்றேன். அவரும் சாதாரண குடும்பத்திலிருந்து வந்தவர். அதனால் அந்த மக்களுடைய பிரச்சினைகளுக்குச் செவிசாய்த்து, அவற்றைத் தீர்ப்பதற்கு ஆவன செய்வார் என்ற நம்பிக்கை எனக்குண்டு.

இப்பொழுது நிதி அமைச்சரிடம் ஒரு வேண்டுகோள் விடுக்க விரும்புகின்றேன். அதாவது தோட்டப்புறங்களிலே தொண்டமான் ஐயா அவர்களின் பெயரிலுள்ள 'பிரஜா சக்தி' என்ற அமைப்பில் வேலை செய்வோருக்கு இன்னும் மாதச் சம்பளம் கிடைக்கவில்லை. இந்தச் சம்பளம் அவர்களுக்குக் கிடைக்க நடவடிக்கை எடுத்தீர்களாம். அதனையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன். காரணம் அதிலே வேலை செய்வோர் எல்லோருமே இளைஞர் யுவதிகள்தாம். சிறுசிறு குடும்பங்கள்தான் அதிலே இருக்கின்றன. அவர்களுக்கு வருவாய் இல்லையென்றால் அவர்களால் குடும்பத்தை நடத்தமுடியாது. நிதி அமைச்சர் அவர்கள் தயவுசெய்து இந்த விடயத்தைக் கவனத்திலெடுத்து அவர்களுக்கு அந்த நிவாரணத்தை விரைவாகக் கொடுக்க ஆவன செய்யவேண்டும் எனக் கேட்டுக்கொள்கின்றேன். அதற்கு நீங்கள் சம்மதித்ததற்கு மிக்க நன்றி.

அடுத்ததாக, கண்டவர்களெல்லாம் பேசி மலையக மக்களைத் திசை திருப்பலாம் என்று சிலபேர் மனப்பால் குடிக்கின்றார்கள். அதற்கு அந்த மக்கள் ஒன்றும் கிள்ளுக் கீரையல்ல. எல்லாருமே தோட்டத்திலிருந்து வந்தவர்கள்தாம். கொழும்பிலுள்ள முதலாளிமாரும் தோட்டத்திலுள்ள லயத்தில் பிறந்தவர்கள்தாம். கண்டி நகரத்தில் உள்ளவர்களும் தோட்டத்தில் பிறந்தவர்கள்தாம். மலையகத்திலிருந்து வந்து இங்கே அமர்ந்திருப்பவர்களும் தோட்டத்தில் பிறந் தவர்கள்தாம். என் தாயார் கொழுந்து பறிக்கும் தொழிலைச் செய்தவர். என் அப்பா ஒரு சாதாரண கவ்வாத்துக் கண்காணி. எனவே, சொந்தங்கொண்டாடும்போது ஒரு முறை இருக்கவேண்டும். நாங்கள் 75 ஆண்டுகளாகச் செய்த அந்தச் சேவையை நீங்கள் எவ்வளவுதான் மறைத்து மக்களுக்குப் பொய்யான செய்தியைக் கொடுக்க நினைத்தாலும்கூட, வதந்திகளால் மக்கள் ஒருகாலமும் மயங்கிவிடமாட்டார்கள். இந்தத் தேர்தலிலும் எமது மக்கள் ஏனைய மக்களைப்போல் ஒரு மாற்றம் வேண்டுமென்று நினைத்தார்கள். அந்த மாற்றத்திற்காகத்தான் மைத்திரிபால சிறிசேன அவர்களுக்கு வாக்களித்தார்களே தவிர, யாரும் கட்டுக்கதை சொல்லி அவர்களைக் கூட்டிப்போகவில்லை. இன்று எல்லோரும் கல்வி அறிவுள்ளவர்கள் என்பதை நீங்கள் மனதிற்கொள்ள வேண்டும். எனவே, அந்த மக்கள் ஆட்டு மந்தைகள் அல்ல, வந்தவர்கள் பின்னால் போவதற்கு. இருந்தாலும் அந்த மக்களுடைய எதிர்காலத்தில் நீங்கள் அக்கறை எடுக்க வேண்டும். கல்வியிலே பாருங்கள், இன்னும்கூட ஆசிரியர் பற்றாக்குறை இருக்கின்றது. இதெல்லாம் காலத்தின் தேவைகள்.

உதாரணமாக 1948இலே இந்த நாடு சுதந்திர மடைந்தபோதும் மலையக மக்களுக்கு முழுமையாகச் சுதந்திரம், வாக்குரிமை, குடியுரிமை என்பன 1980இலேதான் கிடைத்தன. ஆகவே, இன்றைக்கு நாடு சுதந்திரமடைந்து 67ஆண்டுகள் முடிவடைந்திருந்தாலும்கூட 1980இலேதான் அவர்களுக்கு உண்மையான சுதந்திரம் கிடைத்திருக்கின்றது. அதற்காக நான் யாரையும் குறை சொல்லவில்லை. ஒரு சிறு தொகை சிங்கள மக்களைத் தவிர ஏனைய சிங்கள மக்கள் அனைவரும் அந்த மக்களுக்கு அனுதாபமாக இருந்து நாங்கள் இந்த வாக்குரிமையையும் குடியுரிமையையும் பெற எல்லா வகையிலும் ஒத்துழைப்புச் செய்தார்கள். அதற்காக நான் நன்றி சொல்கின்றேன். எதிர்காலத்திலும் அவர்களை இந்த நாட்டின் குடிமக்களாகச் சமமாகக் கருதவேண்டும்.

அவர்களுக்கு இன்றைக்குக் கிராமம் தேவைப்படுகின்றது. ஏனென்றால் தோட்டத்தைச் சேர்ந்த பிள்ளைகள் இன்றைக்குக் கல்வியறிவு பெற்றவர்களாக இருக்கிறார்கள். அவர்களுக்கு மீண்டும் மீண்டும் தோட்டத்திலே வேலை செய்யக்கூடிய வாய்ப்பில்லை. அவர்கள் வெளியே சென்று வேலை செய்யக்கூடிய சூழ்நிலை ஏற்பட்டிருக்கின்றது. அந்தமாதிரி சமூகமாற்றம் வரும்போது அவர்களின் குடியிருப்பை மனதிற் கொள்ள வேண்டும். வேலை செய்கிறார்களோ இல்லையோ அந்த மக்கள் தோட்டப்புறங்களிலே 200 வருடங்களாக வாழ்ந்து பழகியவர்கள். அந்தவகையில், அவர்கள் காடுகளைக் களனிகளாக்கி இன்றைக்குத் தோட்டங்களாக வைத்திருக் கிறார்கள். எனவே, அவர்களுக்கு அங்கே வீடு கட்டிக் கொடுத்துச் சொந்தமாகக் காணியும் கொடுக்கவேண்டும். அவ்வாறு ஒரு குறிப்பிட்டளவு காணி கொடுக்கும்போது அது பெரிய குடும்பங்களுக்குப் போதாமல் போய்விடுகின்ற நிலையும் ஏற்படலாம். எனவே, ஏற்கெனவே ஒவ்வொரு தோட்டத்திலும் ஒவ்வொரு 'கொலனி' இருக்கின்றது. அந்தக் 'கொலனி'களை மையப்படுத்தி இந்தக் கிராமங்களை உருவாக்கி எல்லா வசதிகளையும் செய்துகொடுக்கவேண்டும்.

I am making a request from the Minister of Finance. Hon. Minister, can I bring this matter to your attention, please? There are about 300 - 400 people working in the Thondaman Foundation. They are young people and some of them are married. They have not been paid their salaries yet. I hope you will take this matter into consideration and ensure that they be paid very early.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Member, our intention is to pay everybody who has been duly recognized and been working throughout. But, individual foundations do not come within the purview of the Government. If it has been individually or politically done, there is no way that -

ගරු මුතු සිවලිංගම් මහතා
(மாண்புமிகு முத்து சிவலிங்கம்)
(The Hon. Muthu Sivalingam)

Hon. Minister, you have misunderstood me. It is a Foundation formed by Parliament, and there were allocations throughout. There is a cadre, and according to that cadre only, they have been appointed and they are drawing salaries based on Government salary scales.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Since you have mentioned that, I will check that with the President, the Prime Minister and the Ministers who have been attending to those areas. Let me get a clarification and come back, without giving a vague answer now.

ගරු මුතු සිවලිංගම් මහතා
(மாண்புமிகு முத்து சிவலிங்கம்)
(The Hon. Muthu Sivalingam)

I know you are very clever, so I thought of drawing your attention to this matter. Thank you, Sir.

[අ.භා. 4.31]

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015 අලුත් අවුරුද්දේ අලුත් ආණ්ඩුවක් යටතේ පළමුවන වතාවට මෙම ගරු සභාවේ කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව විපක්ෂ නායකතුමාටත්, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාටත් මගේ ස්තුතිය පුද කරන අතර, අලුත් රජයේ අතිගරු ජනාධිපතිතුමාටත්, අගමැතිතුමා ප්‍රමුඛ මැති ඇමතිවරුන්ටත් මේ අවස්ථාවේදී අපේ සුභාශිංසන පිරිනමනවා.

මේ රටේ බහුතරයක් ජනතාව බලාපොරොත්තු වෙච්ච වෙනස, බලාපොරොත්තු වෙච්ච ඒ යහ පාලනය ස්ථාපිත කරන්න මේ ආණ්ඩුව කැප වෙයි කියා අපි විශ්වාස කරනවා. මොකද, ජනතාව ඉල්ලපු ඒ යහ පාලනය ස්ථාපිත කරන්න අවංක කැප වීමක් අවශ්‍ය බව අපි විශ්වාස කරනවා. එහෙම නැති වුණොත් මේ දේශපාලනය තුළ ප්‍රධාන පක්ෂ කෙරෙහි ජනතාව තබා තිබුණු විශ්වාසය සම්පූර්ණයෙන්ම කඩා බිඳ වැටීමේ අවදානමක් තිබෙන බව මතක් කරන්නට ඕනෑ. පසු ගිය කාලයත් එක්ක වුණු සිදුවීම් ගැන බලන කොට ඒ කාරණය වචනයට පමණක් සීමා වෙයි ද කියන ගැටලුව තවමත් අපිට තිබෙනවා, විශේෂයෙන්ම මේ පාර්ලිමේන්තුවේ උත්තරීතර බවට ප්‍රශ්නාර්ථයක් ඇති කරමින් කරන ලද අග විනිසුරු පත්වීම පිළිබඳවත්, බල ශූන්‍ය කිරීම පිළිබඳවත්. ව්‍යවස්ථාවට අනුකූල ඒ ක්‍රමවේදය පාවිච්චි නොකිරීම තුළත්. ඒ වාගේම විරුද්ධ පාක්ෂිකයන්ට සිදු වෙච්ච අසාධාරණකම් පිළිබඳව ඒවාට සාධාරණයක් ඉෂ්ට කරන්න අවශ්‍යයි කියන එකත් අප මතක් කරනවා. හොරකම, දූෂණය, වංචාව ඒ සියල්ලම නවත්වන්නට ඕනෑ. ඒ සියල්ලටම තිත තියන්න ඕනෑ. එම නිසා මේවා ගැන කටයුතු කිරීමේදී අපට පිළිගන්නට පුළුවන් ක්‍රමවේදයක් අනුව මේ දින සියය තුළ මේවා සොයා බලන්නට තිබෙනවා. විශේෂ විනිශ්චය සඟා පත් කර ඒ වැරදිකාරයන් සොයා දඬුවම් කරනවාට අපත් සම්පූර්ණ සහයෝගය දෙන බවත් මතක් කරනවා.

මේ ආණ්ඩුව ඩීසල්, පෙට්‍රල්, භූමිතෙල් මිල අඩු කිරීම තුළ ජනතාවට විශාල සහනයක් ලබා දී තිබෙනවා. මේ තුළින් ලාභයක්, සහනයක් ජනතාවට ලැබී තිබෙනවා. ඒ තුළින් බස් ගාස්තුව අඩු වෙලා. ඒ සමස්ත ප්‍රතිලාභයම ජනතාව වෙත ගලා එන විධියේ ක්‍රමවේදයක් අපි හදන්නට ඕනෑ. බස් ගාස්තුව අඩු වුණාට ත්‍රීවිල් ගාස්තුව අඩු වීමක් අපට දකින්නට නැහැ. ඔවුන් ඒ ගැන දැනුවත් නැහැ කියනවා. ඒ වාගේම ඩීසල්, පෙට්‍රල්, භූමිතෙල් මිල අඩු වීම තුළ බඩු මිල අඩු වීමක් සිදු වෙන්නට ඕනෑ. මොකද, ඩීසල් මිල වැඩි වෙච්ච ගමන් ප්‍රවාහන වියදමත් වැඩි වෙනවා. අතීතයේත් ආණ්ඩුවලින් මේ බනිජ තෙල්වලට සහනාධාරය දුන්නාට, මිල අඩු වුණාට ඒකේ ප්‍රතිලාභය ජනතාව අතරට ගලා ගියේ නැහැ. ජනතාවට ඒ නියම සහනය ලබා දෙන්න අවශ්‍ය ඒ ක්‍රමවේදය හදන්න කියා අපි ඉල්ලනවා.

එදා අපේ ආණ්ඩුවෙන් 2013 අවුරුද්දේත්, ඒ වාගේම 2014 අවුරුද්දේත් අය වැය විවාද අවස්ථාවල අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල අඩු කිරීම පිළිබඳව මා කථා කළා. විශේෂයෙන් හාල්, පරිප්පු, හාල්මැස්සන් වාගේ දේවල් ලාභයට දීම තුළින් ජනතාවට ඒවා පරිභෝජනය කළ හැකි වීම නිසා ජනතාවගේ නීරෝගීකම වැඩි දියුණු කිරීම තුළින් මිනිස් ශ්‍රම බලකායේ ඵලදායිතාවය වැඩි කිරීමේ අවශ්‍යතාව මා එදා පෙන්වා දුන්නා. අපට කර ගන්නට බැරි වෙච්ච දෙය -අත්‍යවශ්‍ය ආහාරවල මිල අඩු කිරීම- දින සියයේ වැඩ පිළිවෙළ තුළින් මේ ආණ්ඩුව ඉෂ්ට කිරීම පිළිබඳව මම සන්තෝෂ වෙනවා. සීනි මිල රුපියල් දහයකින් අඩු වෙලා තිබෙනවා. පස් දෙනෙකු ඉන්න පවුලක් දවසකට සීනි ග්‍රෑම් 250ක් පාවිච්චියට ගත්තොත් ඒකේ වාසිය රුපියල් 2.50ක් වනවා. කිරිපිටි මිල අඩු කර තිබෙනවා. මේ සමහර අත්‍යවශ්‍ය ආහාර පිළිබඳව මට ගැටලුවක් තිබෙනවා. සස්ටජන් කියන එක අත්‍යවශ්‍ය ආහාරයක් ද කියා හිතෙනවා. මේ රටේ මිලියන 21ක ජනතාවගෙන් සියයට එකක්වත් සස්ටජන් පාවිච්චි කරන්නේ නැහැ. ඉතාමත්ම තදබල රෝගීන් තමයි සස්ටජන් පාවිච්චි කරන්නේ. එම නිසා වෛද්‍යවරුන් නිර්දේශ කළාම රාජ්‍ය ඔසුසල හරහා යම් සහන මිලකට සස්ටජන් ලබා දීමේ ක්‍රමවේදයක් ඇති කරනවා නම් එය ප්‍රමාණවත්ය කියා මා හිතනවා.

ඒ වාගේම තිරිඟු පිටි මිල අඩු කර තිබෙනවා. වතුකරයේ ජනතාවට මෙයින් වාසියක් ලැබෙනවා. වතුකරයේ ජනතාව තිරිඟු පිටි බෙහෙවින් පාවිච්චි කරන බව අපි දන්නවා. නමුත් තිරිඟු පිටි ලාභ කිරීම තුළ තිරිඟු පිටි භාවිතය වැඩි වෙයි ද කියා අපට ගැටලුවක් තිබෙනවා.

විශේෂයෙන්ම සහල්වලට රුපියල් 60ක් 65ක් වගේ ස්ථාවර මිලක් පැවැති පසු ගිය කාලයේ ජනතාව වැඩි වශයෙන් බත් කන්න පෙළඹුණු බව අපි දැක්කා. වේල් තුනක් බත් කෑවා. ඒ තුළින් රටේ ගොවියාට ඒ ප්‍රතිලාභ ලැබුණා. ඒ වාගේම බෝ නොවන රෝග පාලනය කිරීමටත් තුන් වේලම බත් ආහාරයට ගැනීම වැදගත් වුණා. නමුත් අද පිටි මිල අඩු වෙලා, සහල් මිල පාලනයකින් තොරව තිබෙන බව අපි දකිනවා. විශේෂයෙන්ම වී කිලෝවකට රුපියල් 50ක සහතික මිලක් දුන්නාම සහල් මිල රුපියල් 90කට වඩා ඉහළ නඟිනවා. එතකොට තුන් වේලම බත් කන පස් දෙනකුගෙන් යුතු පවුලක් ගත්තොත් දවසකට හාල් සඳහා වියදම් වන මුදල රුපියල් 30කින් 35කින් වැඩි වෙනවා. අපේ රටේ ජනතාවගේ ප්‍රධානම ආහාරය වන්නේ බත්. ඒ නිසා සහල් සඳහාත් යම් සහනයක් ලබා දෙනවා නම් ඒක ඉතාමත්ම වටිනවාය කියලා මා විශ්වාස කරනවා. ඒ වාගේම හාල්මැස්සන් මිල අඩු කළ එකත් හොඳයි. අපි එය අගය කරන්නට ඕනෑ. නමුත් අපේ රට වටේටම මුහුද තිබෙනවා. ඒ නිසා ජනතාවට අලුත් මාළු කෑල්ලක් සහන මිලකට ලබා ගැනීමට හැකි වන ක්‍රමවේදයක් සකස් කරනවා නම්, එය ටින් මාළුවලට බදු සහනයක් දෙනවාට වඩා ඉතාම වැදගත් වෙනවා කියලා මා හිතනවා. ටින් මාළු හුඟාක් ගෙන එන්නේ පිට රටින්. ඒ නිසා අපට ඒකෙන් වාසියක් ලැබෙන්නේ නැහැ. භූමිතෙල් අඩු මිලට ලබා දීලා ධීවරයා ශක්තිමත් කර, ඒ තුළින් අලුත් මාළු සඳහා සහතික මිලක් ඇති කර දුන්නොත් ඒ වාසිය ජනතාවට ලැබෙනවා. ඒ වාගේම ජනතාවගේ පෝෂණ තත්ත්වය වැඩිදියුණු වෙනවා.

මිල අඩු කර තිබෙන සමහරක් භාණ්ඩ අත්‍යවශ්‍ය භාණ්ඩ වුණේ කොහොමද කියන ප්‍රශ්නය තිබෙනවා. කොත්තමල්ලි ගැන සඳහන් කරනවා නම්, මම දන්නා විධියට බටහිර වෛද්‍ය ක්‍රමයට අනුව නම් දරුවන්ට කොත්තමල්ලි දෙන්න එපා කියනවා. විශේෂයෙන් පළමුවැනි මාස හය තුළ දරුවන්ට දෙන්නේ මව් කිරි විතරයි. ඒ වාගේම උම්බලකඩ අත්‍යවශ්‍ය නැහැ. කහ, මිරිස්, කොත්තමල්ලි වාගේ දේවල් මිල දී ගන්නේ ග්‍රෑම් 250 වගේ ප්‍රමාණවලිනුයි. මාසයකට කොත්තමල්ලි අවශ්‍ය වන්නේ වැඩිම වුණොත් ග්‍රෑම් 250යි. කහ කුඩු අවශ්‍ය වන්නේ ග්‍රෑම් 100යි. ඒ නිසා මේවා එතරම් අත්‍යවශ්‍ය වන්නේ නැහැ. හාල්මැස්සන් වාගේ ආහාර ද්‍රව්‍යවල මිල අඩු කිරීම ගැන අපි සන්තෝෂ වෙනවා. ඒ වාගේම පරිප්පු ගැන කථා කළොත්, පරිප්පු හැම කෙනෙක්ම කන දෙයක්. ගෘහනියක් විධියට, අම්මා කෙනෙක් විධියට දරුවෝ ආශා කරන කෑම, ගුණ වැඩි කෑම ගැන අපි දන්නවා. ඒ නිසා පරිප්පු සඳහා අය කරන බදු අඩු කරලා ඒ සහනය ජනතාවට දෙනවා නම් හුඟක් හොඳයි කියලා මම හිතනවා.

[ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය]

රජයේ සේවකයන්ට රුපියල් 10,000ක වැටුප් වැඩි වීමක් ලබා දීලා තිබෙනවා. රජයේ සේවය කළ කෙනෙක් හැටියට මම ඒක ඉතාමත්ම අගය කරනවා. ඒ රුපියල් 10,000න් රුපියල් 5,000 ගණනේ පෙබරවාරි මාසයේ ඉඳලා මාස හතරකුත්, ඊට පසුව ජූනි මාසයේ ඉඳලා රුපියල් 10,000ම ලබා දෙන බවත් තමයි කියා තිබෙන්නේ. මෙතැන දී මෙහි සඳහන් කර තිබෙන ගණන් එක්ක මට එකඟ වන්න බැරිකමක් තිබෙනවා. ලක්ෂ 13ක් වන රාජ්‍ය සේවකයන්ට රුපියල් 5,000 ගණනේ මාස 4ක් දෙන්න රුපියල් මිලියන 26,000ක් ඕනෑ වෙනවා. ඊළඟට ඉතිරි මාස හතට රුපියල් 10,000 ගණනේ දුන්නොත් ඒ සඳහා රුපියල් මිලියන 91,000ක් ඕනෑ වෙනවා. ඒ දෙක එකතු කළාම රුපියල් මිලියන 1,17,000ක් ඕනෑ කරනවා, මේ වැඩි කළ වැටුප දෙන්න. නමුත් ඒ සඳහා වෙන් කළ මුදල වශයෙන් අය වැය පොතේ සඳහන් වෙලා තිබෙන්නේ රුපියල් මිලියන 89,700ක් විතරයි. ඉතිරි මුදල කොහේද තිබෙන්නේ කියන ප්‍රශ්නය අපට මතු වෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, තව විනාඩියක කාලයක් විතරයි තිබෙන්නේ.

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)
ඒ වාගේම මේ කාරණය ගැනත් මා විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ. ගර්භනී මව්වරුන්ට දරු උපතක දී රුපියල් 20,000ක් දෙනවා කියලා තිබෙනවා. ඒ සඳහා වෙන් වෙලා තිබෙන්නේ රුපියල් මිලියන 1,000යි. නමුත් රුපියල් මිලියන 7,500ක් ඕනෑ වෙනවා. මේ රුපියල් මිලියන 1,000ක මුදල ලබා දෙන්න පුළුවන් වන්නේ ගර්භනී මව්වරුන් 50,000කට පමණයි. ඒකත් මාස එකහමාරක කාලයකට විතරයි. ඒ නිසා අපට පොඩි සැකයක් ඇති වෙනවා, මේ දින 100 වැඩ පිළිවෙළ යටතේ ඉදිරිපත් කර තිබෙන අය වැය මැතිවරණයක් ඉලක්ක කර ගත් අය වැයක්ද කියලා. මේ ගර්භනී අම්මලා වෙනුවෙන් වෙන් කර තිබෙන මුදල් දිහා බැලුවාම ඒක ඔප්පු වෙනවා. ඒ නිසා එය නිවැරදි කරන්න රජය කටයුතු කරයි කියලා අපි විශ්වාස කරනවා. ඒ වාගේම අපි තව එක නිවැරදි කිරීමක් -

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු මන්ත්‍රීතුමියනි, අපි සංඛ්‍යා ලේඛන ලබා ගෙන ඒ අනුව තමයි මේ මුදල් වෙන් කළේ. එම සංඛ්‍යා ලේඛන අනුව තමයි අප්‍රේල් මාසයේ සිට අවුරුද්ද අග වන තෙක් මුදල් වෙන් කර තිබෙන්නේ. අඩු පාඩුවක් තිබුණොත් අනිවාර්යයෙන්ම ඒ මුදල සපුරාලනවා. ගරු රෝසි සේනානායක ඇමතිතුමිය සමඟ සාකච්ඡා කරලා එතුමියගේ අමාත්‍යාංශයෙන් -

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)
හොඳයි මුදල් ඇමතිතුමනි. මොකද අවුරුද්දකට 3,75,000ක පමණ දරු ප්‍රසූති සංඛ්‍යාවක් සිදු වෙනවා. ඒ නිසා රුපියල් මිලියන 1,000ක මුදල මදි වෙනවා. ඒ වාගේම තවත් නිවැරදි කිරීමක් කරන්නට ඕනෑ. විවාහ ලියා පදිංචි කිරීමේ ගාස්තුව වශයෙන් රුපියල් 5,000ක් අය කරනවා කියලා කලින් වැරදි මතවාදයක් ගිහිල්ලා තිබුණා. රුපියල් 5,000ක ගාස්තුවක් ගෙවිය යුතු වන්නේ, රෙජිස්ට්‍රාර්වරයා හෝටලයකට ගිහිල්ලා විවාහයක් ලියා පදිංචි කළොත් විතරයි. රෙජිස්ට්‍රාර්වරයා ළඟට ගිහිල්ලා යම් විවාහයක් ලියා පදිංචි කර ගන්නවා නම් ගාස්තුව රුපියල් 1,150යි. එතකොට හෝටලයක පැවැත්වෙන විවාහ උත්සවයකදී එම විවාහය ලියා පදිංචි කිරීම සඳහා රුපියල් 5,000ක මුදලක් ගෙවන්න ඒ අයට බැරිකමක් නැහැ. අද හෝටලයක මඟුල් කන අය කෑම පිඟානකට රුපියල් 1,000ක් ගෙවනවා. මල්වලට, කේක් කෑල්ලට, වාහනයට විශාල වියදමක් දරනවා. ඒ නිසා ඔවුන්ට රුපියල් 5,000ක් කියන එක එච්චර දෙයක් නොවෙයි. ඒ නිසා අපි ඒ මතය නිවැරදි කරන්නට ඕනෑ. ඒ බවත් සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි, බොහොම ස්තූතියි. මීළඟට ගරු රවි කරුණානායක මුදල් අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 40ක කාලයක් තිබෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ස්තූතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ අවස්ථාවේ දී සියලුම මන්ත්‍රීවරුන්ට මගේ ස්තූතිය ප්‍රකාශ කරනවා, අපේ රජය පත් වෙලා දවස් කිහිපයක් ඇතුළත ඉදිරිපත් කළ අතුරු අය වැය සම්බන්ධයෙන් දවස් 3ක් තිස්සේ ඉතාමත් උනන්දුවෙන්-

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! මේ අවස්ථාවේ දී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව ගරු ජානක බණ්ඩාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு ஜானக பண்டார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. JANAKA BANDARA *left the Chair and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Ravi Karunanayake, you may continue.

[අ.භා. 4.41]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දවස් තුනක් තිස්සේ විවාද කරපු අතුරු අය වැය සම්බන්ධයෙන් බොහොම වැදගත් අදහස් ඉදිරිපත් කිරීම ගැන මේ අවස්ථාවේ දී සියලුම මන්ත්‍රීවරුන්ට මාගේ ස්තූතිය ප්‍රකාශ කරනවා. නමුත් සුපුරුදු පරිදිම සමහර අය මෙය දේශපාලනීකරණය කරන්න හැදුවා. ඒ වාගේම වැඩි දෙනකු මේක මීට වැඩිය හොඳින් කරන්න පුළුවන් කියමින් තම අදහස් යොමු කළා. ඒ අදහස් අපි අගය කරනවා. මට ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් උපදෙස් දුන්නා, වහාම ක්‍රියාත්මක කරන්නට පුළුවන් යම් දේවල් මෙහි තිබෙනවා නම් ඒවා වහාම ක්‍රියාත්මක කරන්න කියලා. මතක තියා ගන්න, මේක

දවස් සියයේ අය වැයක් නම් නොවෙයි. මේක ඉදිරිපත් කරලා තිබෙන්නේ 2015 සම්පූර්ණ වර්ෂය වෙනුවෙනුයි. ඒ විතරක් නොවෙයි, මෙහි ඉදිරිපත් කර තිබෙන සමහර දේවල් 2016 වර්ෂයටත් ඇතුළත් වෙනවා. වැටුප් වැඩි කරනවා කියලා කියන්නේ දවස් සියයේ සීමාවක් නොවෙයි. 2016 වර්ෂය සඳහාත් මේ වෙනුවෙන් රුපියල් කෝටි 9,500ක්, 10,000ක් අනිවාර්යෙන්ම වෙන් වෙනවා. මේක දවස් සියයේ වැඩ පිළිවෙළක් කියලා කියනවා නම් ඒක අමූලික බොරුවක්. ඒ වාගේ වැරදි දේවල් ඉදිරිපත් කරලා අහිංසක ජනතාවගේ මනස විකෘති කරන අවස්ථා ඇති කරලා තිබෙනවා නම්, එය නිවැරදි කිරීම මගේ යුතුකමක් ලෙස මා සලකනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා මේ ගරු සභාවේ දී ප්‍රශ්නයක් ඇහුවා, මේ විවාදය සජීවී ලෙස විකාශය කරනවාද නැද්ද කියලා. අපි එදා විපක්ෂයේ සිටින විට සජීව විකාශය ලබා දෙන්න කියලා ඉල්ලුවා. එදා එය සිදු වුණේ නැත්තේ ඇයි කියන ප්‍රශ්නය අපි ඔබතුමන්ලාගෙන් අහනවා. මතක තියා ගන්න, එදා අපි විපක්ෂයේ ඉන්නකොට ඔබතුමන්ලාගෙන් අහපු දේ අද අපි මේ පැත්තට ඇවිල්ලා ක්‍රියාත්මක කරනවා. ඔබතුමන්ලා අවුරුදු 11ක් තිස්සේ යටපත් කරපු දෙයක් ගැන ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා දැන් බොහොම ලොකුවට සද්ද කරලා ප්‍රශ්න කරනවා. මේ සජීව විකාශය සිදු කරනවා කියලා අපි එදා පොරොන්දු වුණා. ඒ නිසා එය සිදු වෙනවා කියලා අපි බලාපොරොත්තුවෙන් සිටිනවා.

මේ අතුරු අය වැයෙන් යෝජනා කර තිබෙන මන්දිර බද්ද සම්බන්ධයෙන් යම් ප්‍රශ්නයක් ඇති වුණා. අපට මේ බද්ද පනවන්න අවශ්‍ය වුණේ යම් ආදායමක් උපයා ගැනීම සඳහායි. සියයට අනූ නවයක ජනතාවකට වරප්‍රසාද ලබා දෙන කොට, සියයට එකක ජනතාවක් මෙවැනි බද්දක් ගෙවීම අසාධාරණද? මේ අතුරු අය වැයෙන් අපි අහිංසක ජනතාවගෙන් කිසිසේත්ම බදු අය කරලා නැහැ. එක කොටසකගෙන් මන්දිර බද්දකුත්, තවත් කොටසකගෙන් Super Gain Tax එකකුත් අය කිරීම තුළින් සාමාන්‍ය ජනතාවටට කිසිසේත්ම බලපෑමක් ඇති නොවන විධියේ නිර්මාණශීලී අය වැයක් තමයි අපි ඉදිරිපත් කළේ. නමුත් ඒ මන්දිර බද්ද ගැන සමහර අය විසින් කරුණු විකෘති කරමින් සඳහන් කළා. කොළඹ විතරක් නොවෙයි, පිටස්තර ප්‍රදේශවලත් තවටු තුන හතරක් තිබෙන වර්ග අඩි 5000ක, 6000ක ගෙයක් වුණොත් ඒකත් මන්දිරයක් ලෙස සලකා බදු අය කරන බව සඳහන් කර තිබුණා. අපි කිසිම විධියකින් එවැනි දෙයක් අදහස් කළේ නැහැ. වැරැදි මතයක් ඇති වුණා නම් මා එය නිවැරැදි කරන්නම්.

මන්දිර බද්ද අය කිරීම සිදු කළ යුතු වන්නේ මෙන්න මේ විධියටයි. මන්දිර බද්ද අය කරන්නේ නිවාසවලට පමණයි. ඒ අනුව භූමිය සඳහා මෙම බද්ද අදාළ වන්නේ නැහැ. බදු අය කරන නිවාස වර්ග අඩි 10,000ක් හෝ වටිනාකම රුපියල් මිලියන 150කට වැඩි විය යුතුයි. එමෙන්ම 2000 වර්ෂයට පෙර සෑදූ නිවාසවලට මෙය අදාළ වන්නේ නැත. එසේ වුවත් 2000 වර්ෂයට පෙර මෙයට අදාළ වන අයුරින් නිර්මාණයන් කර තිබෙන නිවාස හිමියන් සිටී නම්, ඔවුන් ස්වේච්ඡාවෙන් මේ බද්ද ගෙවන්න ඉදිරිපත් වන්නේ නම් අපි ඉතාමත් සතුටින් එය භාර ගන්නවා. ඒක priority tax ඒකක්. යම් විධියකින් තමන් කැමැත්තෙන්ම එය ගෙවනවා නම් අපි එය අගය කරනවා කියන එකත් මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ.

කාර් රථ සම්බන්ධයෙනුත් යම් විරුද්ධ මතයක් ඉදිරිපත් කරන්න උත්සාහ කළා. මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා වාහන ආනයනකරුවන් සියලු දෙනාවම ඊයේ උදේ අටහමාරට අපි ගෙන්වා ගත්තා. අලුත් කාර් ආනයනකරුවනුත් මේ සාකච්ඡාවට ගෙන්වා ගත්තා. එම දෙපාර්ශ්වයම ඉදිරියේ අපි ඒ අයට කිව්වා, තමුන්නාන්සේලාට මේ පිළිබඳව මීට වඩා හොඳ අදහස් ඉදිරිපත් කරන්න තිබෙනවා නම් අපි ඒ සම්බන්ධයෙන් සලකා බලන්නම් කියලා. ඒ අයගේ ඒකමතික තීන්දුව අනුව තමයි මෙවැනි ප්‍රකාශයක් මම කරන්නේ. වාහන සම්බන්ධයෙන් අප විසින් යෝජනා කිහිපයක් ඉදිරිපත් කළා. ඒ යෝජනා බොහොමයක් වාහන ආනයනකරුවන් සමඟ සාකච්ඡා කර ඉදිරිපත් කරන ලද ඒවායි. ඊයේ උදෑසන 8.30 සිට පැය දෙකක් විතර අපි ඒ අය සමඟ සාකච්ඡා කළා. ඒ අනුව වාහන ආයනයනකරුවන්ට වාර්ෂිකව රුපියල් මිලියන 1.5ක බලපත්‍ර ගාස්තුවක් පැනවීම ඔවුන්ගේ ඉල්ලීමක් වුණා. මෙවැනි වාහන ආනයනකරුවන් 800ක් පමණ රට පුරා සිටිනවා. අප ඇස්තමේන්තු කළේ ආනයනකරුවන් 400ක් ලෙසයි. නමුත් ආනයනකරුවන් 800ක් සිටින නිසා රුපියල් මිලියන 1,200ක විතර ආදායමක් මෙයින් ලැබෙනවා. මේ තුළින් රථ වාහන මිල කිසිසේත්ම වැඩි වන්නේ නැහැ. නමුත් රටට නොලැබී තිබූ ආදායමක් නිසි ලෙස මේ තුළින් අනිවාර්යෙන්ම ලැබෙන එක තමයි අපට තිබෙන සතුට. මෙම බලපත්‍ර ගාස්තුව අලුත් වාහන මෙන්ම පාවිච්චි කළ වාහන වෙළඳාම සඳහා ආනයනය කරන අයට පමණක් අදාළ වෙනවා. නමුත් තමන්ගේ භාවිතය සඳහා තනි පුද්ගලයකු විසින් වාහනයක් ආනයනය කරන කොට මෙම බලපත්‍ර ගාස්තුව අදාළ වන්නේ නැහැ.

සංචාරක ව්‍යාපාරය සඳහා බස් රථ ආනයනය කිරීම ලිහිල් කරමින් අවුරුදු දහය දක්වා පැරණි බස් රථ ආනයනය කිරීමට අප විසින් අවසර ලබා දෙනු ලැබුවා. එම ආනයනකරුවන් විසින්ම මේ යෝජනාව තුළින් රජයට වැඩි ආදායමක් ලබා ගැනීමට හැකි වන ලෙස වසර 5 - 10 අතර පැරණි බස් රථයකට රුපියල් මිලියන 1.5ක සෙස් බද්දක් පනවන ලෙස ඉල්ලීමක් කළා. අප මෙය අවුරුදු පහේ සිට දහයට අඩු කළ විට මේ වාසිය යන්නේ ජපානයේ අපනයනකරුවන්ට මිසක් මේ රටේ ආනයනකරුවන්ට නොවෙයි කියා ඒ අයගේ ප්‍රායෝගික දැනුම තුළින් අපව දැනුවත් කළා. මේ රටේ තිබෙන සල්ලි පිට රට යවනවාට වඩා එය අඩු මිලට ලබා ගෙන මෙරටට ආනයනය කරන අවස්ථාවේදී, එක බස් රථයකට රුපියල් ලක්ෂ 15ක බද්දක් සෙස් බද්දක් වශයෙන් එකතු කිරීම ඒ අයගේ යෝජනාවක්. එසේ ආණ්ඩුවට ආදායම උපයා ගන්න පුළුවන් මාර්ගයක් ඇති කර දීම නිසා මම එය අගය කරනවා. ඔවුන්ගේ අදහස වුණේ, වසර දහයක් දක්වා පැරණි බස් රථ ආනයනය කිරීමේදී ජපානයට එම වාසිය ලබා දෙන්නේ නැතුව අප රටට එම වාසිය ලබා ගැනීමයි.

එමෙන්ම, අඩු ආදායම්ලාභීන්ට වාහන හිමිකරුවෙකු වීමට හැකි වන ලෙස එන්ජින් ධාරිතාව 1,000ට වඩා අඩු වාහනවලට සියයට 15 - 20 අතර ප්‍රමාණයකින් අප බදු අඩු කළා. එම සහනය එන්ජින් ධාරිතාව 1,000ට අඩු දෙමුහුන් වාහන සඳහා ලබා දීමට එම වර්ගයේ වාහන සඳහා වන බද්ද අය වැයට පෙර තිබුණු මට්ටමටම ගෙන ඒමට අප තීරණය කළා. අනෙකුත් දෙමුහුන් වාහන සඳහා මා විසින් 2015 ජනවාරි මාසයේ 29 වැනි දා යෝජනා කරන ලද නව බදු අනුපාත අදාළ වනවා. මෙහි අරමුණ වූයේ පෙට්‍රල්, ඩීසල් වාහන සහ දෙමුහුන් වාහන සඳහා වන බදු ව්‍යුහය තුළ පැවැති අසමතුලිතතාව යම් තාක් දුරකට අවම කිරීමයි. තමන්ගේ පෞද්ගලික පරිහරණයට වාහනයක් ආනයනය කර ඇති පුද්ගලයෙකුට බදු අනුපාතවලින් වන වෙනස් වීම නිසා අසාධාරණයක් වීමට අප ඉඩ දෙන්නේ නැහැ. 2015 ජනවාරි මාසයේ 29 වැනි දාට පෙර ණයවර ලිපි නිකුත් කර තමන්ගේ නමට ලියා පදිංචි කරන වාහන සඳහා මෙම බදු වැඩි වීම අදාළ වන්නේ නැහැ. ඒ සමඟ පරණ වාහන ආනයනය කිරීමේදී දැනට බලපත්‍රවලට තිබෙන අවුරුදු දෙකක කාල සීමාව අවුරුදු තුනක් දක්වා වැඩි කිරීමට කටයුතු කරනවා. මෙය ක්‍රියාත්මක වන්නේ, මාර්තු මාසයේ පළමුවැනි දා සිටයි. ඒ තුළින්ද මහජනතාවට දැරිය හැකි මිලකට වාහනයක් හිමි කර ගැනීමේ හැකියාව වැඩි වනවා. තවද, මින් ඉදිරියට රජයේ සේවකයන් සඳහා සහනාධාර කොන්දේසි යටතේ ආනයනය කරනු ලබන වාහන අවුරුදු හතරක්

[ගරු රවි කරුණානායක මහතා]

යන තුරු වෙනත් පාර්ශ්වයකට පැවරීමට නොහැකි වන පරිදි අදාළ චක්‍රලේඛන වෙනස් කිරීමට තීරණය කර තිබෙනවා. මේ වරප්‍රසාද දෙන්නේ අහිංසක රජයේ සේවකයන්ටයි. මේක වෙන විධියකින් දීලා මේ රටට එන්න තිබෙන ආදායම් ප්‍රමාණයේ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. එම නිසා යම් විධියක සහනයක් ලබා දෙනවා නම්, ඒ බදු ගෙවන්නේ නැත්නම් අවුරුදු හතරක් යනතුරු වෙනත් පාර්ශ්වයක් නමින් වාහනය ලියා පදිංචි කරන්න බැරි තත්ත්වය ගැනත්, තමන්ගේ නමින් තබා ගන්න ඕනෑය කියන එකත් මේ අවස්ථාවේදී මතක් කරනවා. වාහනවලට වටිනාකම තීරණය කිරීම සම්බන්ධයෙන් ගැටලු ඇති බව අපට වාර්තා වී තිබෙනවා. මොකද, මාසයකට රථ වාහන 2,500ක් 3,000ක් විතර ආනයනය කරනවා. එම නිසා එයින් ලැබෙන ආදායම යම් විධියකින් under-invoice කර තිබෙන ප්‍රශ්නය නිසා මෙවැනි අලුත් පියවරක් අප ඉදිරිපත් කරනවා. මෙයට විසඳුම ලෙස වටිනාකම තීරණය කිරීම සඳහා වාහන ආනයනය කරන ආනයනකරුවන්, රේගු නිලධාරීන්, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු සහ මුදල් අමාත්‍යාංශයේ නිලධාරියෙකු ඇතුළත් කමිටුවක් පත් කරනවා. මෙයට සාපේක්ෂව වරායේ සිටින custom officersලා සමඟ මෙවැනි review panel එකක් ඇති කර ගෙන සැබෑ වටිනාකම ලබා ගන්න පුළුවන් මාර්ගයක් අප මේ සම්බන්ධව ඇති කර තිබෙනවා. මෙම වැඩ පිළිවෙළ සාර්ථකව ඉදිරියට ගෙන යන්න පුළුවන් වුණොත්, 2016 අය වැයේදී මෙය සංශෝධනයට ලක් කර මේ රටේ ගෙවන්න තිබෙන බදු ප්‍රමාණය සැබෑ මට්ටමට ලබා ගැනීමට කටයුතු කරනවා කියන එක මේ අවස්ථාවේදී මතක් කරනවා.

මම මේ පාර්ලිමේන්තුවට සතුටින් ප්‍රකාශ කරන්න කැමැතියි, මේ දවස් 21 තුළ ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ ආදායම සියයට 6කින් වැඩි වෙලා තිබෙනවා කියන එක. ඒවා අනිවාර්යයෙන්ම පිරිසිදු පාලනයක් තුළින් වෙන ක්‍රියාවක් ලෙස තමයි අපට කියන්න පුළුවන් වෙන්නේ. මොකද, ජනාධිපති, අගමැති සහ කැබිනට් මණ්ඩලය කියන අප සියලු දෙනාම එක හා සමාන පිරිසිදු පාලනයක් ගෙන යනවා නම් වෙනත් පැතිවල අයට එයින් ආදර්ශවත් මට්ටමක් ඇති වෙන නිසා තමයි මෙවැනි වෙනසක් ඇති වෙලා තිබෙන්නේ. මේ තුළින් අපේ ආදායම අඩු ගණනේ රුපියල් මිලියන 7,000කින් වැඩි කර ගැනීමට අප ඇස්තමේන්තු කර තිබෙනවා.

ඊට පසුව අපට තිබෙන තවත් ප්‍රශ්නයක් තමයි, මත්පැන් සහ බීර නිෂ්පාදකයන්ගෙන් අය කරන වාර්ෂික බද්ද. මාසයකට අවම වශයෙන් රුපියල් මිලියන 200ක් බදු ලෙස මත්පැන් සහ බීර නිෂ්පාදන සමාගම් විසින් ගෙවිය යුතු බව යෝජනා කර තිබෙනවා. මෙයින් අප බලාපොරොත්තු වන්නේ නියමිත පරිදි බදු නොගෙවමින් රජයේ ආදායම අහිමි කළ මත්පැන් සහ බීර නිෂ්පාදකයන් බදු දැල තුළට ඇතුළත් කර ගැනීමයි. එම නිසා මත්පැන් සහ බීර නිෂ්පාදකයන් කිහිප දෙනෙකුට ඒකාධිකාරයක් බිහි වනු ඇතැයි කීම පිළිගත හැකි තත්ත්වයක් නොවේ. නීත්‍යානුකූල නොවන ලෙස එතනෝල් ආනයනය කරමින්, නීත්‍යානුකූල නොවන ලෙස මත්පැන් නිපදවා අයථා ලෙස වාසිය ලබා ගන්නවා. නීත්‍යානුකූල ලෙස මත්පැන් නිෂ්පාදනය කරන සාමාන්‍ය මට්ටමේ නිෂ්පාදකයන් ආරක්ෂා කර ගැනීමටත් යම් විධියකින් අපි කටයුතු කරන්න අවශ්‍යයි. නැත්නම් වෙන්නේ, නීත්‍යානුකූල නොවන මට්ටමේ නිෂ්පාදනයකට යෑමයි. අපි ඒ ගැනත් සලකා බලා, ඒ අයත් එක්ක සාකච්ඡා කරලා විධිමත් ක්‍රියා මාර්ගයක් ගන්නවාය කියන එක මේ අවස්ථාවේදී කියන්න කැමැතියි. ඒ තුළින් තව රුපියල් මිලියන 2,000ක් දේශීය ආර්ථිකයට එකතු වනවා. ඒක චක්‍රශීලීව වෙනත් පැත්තකට යන එක නවත්වන්න තමයි අපි කටයුතු කරන්නේ.

නීත්‍යානුකූල නොවන ලෙස එතනෝල් ගෙනැල්ලා දූෂිත මට්ටමට මේ රටේ ආදායම අවුරුද්දකට රුපියල් මිලියන 7,000ක් පමණ නැති කරපු අය සම්බන්ධයෙන් දැනට විධිමත් පරීක්ෂණයක් කර ගෙන යනවා. ඒවාට සම්බන්ධ වූ සියලු දෙනාටම තරාතිරමක් නොබලා කටයුතු කරන ලෙසට අපේ ජනාධිපතිත්, අගමැතිත් මට නිර්දේශ කර තිබෙනවා. ඒ නිසා තව සුමාන දෙක තුනකින් සියලු දේම හෙළිදරවු කරනවා කියන එක මේ අවස්ථාවේදී මා මතක් කරන්න කැමැතියි. ඒ වාගේ දේවල් කරපු හොරු ඇමතිවරුන්ට සල්ලි දීලා යම් විධියකින් ඒවා යටපත් කරනවා කියන බොරු ප්‍රචාර සම්පූර්ණයෙන්ම නිවැරදි කිරීමක් මේ ආණ්ඩුවේදී මම කරනවා කියන එකත් මතක් කර දෙන්න කැමැතියි. දූෂිතයන් විසින් රටේ ආර්ථිකයට ආදායමක් ලබා ගන්න තිබෙන හැකියාව නැති කරන එක ලොකු අපරාධයක් බව මා සඳහන් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ මන්ත්‍රීවරු ගණනාවක් විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් ප්‍රශ්න කළා. ඒ නිසා මා නැවත ඒ සම්බන්ධයෙන් කථා කළ යුතුයි. [බාධා කිරීමක්] Do you want to ask a question? රාජ්‍ය සේවයේ විශ්‍රාමිකයන් සඳහා ජනවාරි මාසයේ ලබා දුන්න රුපියල් 2,500ක දීමනාව රුපියල් 3,500 දක්වා, රුපියල් 1,000කින් 2015 අප්‍රේල් මාසයේ සිට වැඩි කරනු ලබනවා. ඒ අනුව අපි ලබා දුන් විශ්‍රාම වැටුප රුපියල් 3,500කින් වැඩි කිරීමේ යෝජනාව ඉටු වෙනවා. ඒ සමඟ විශ්‍රාම වැටුප්වල පවතින විෂමතා නිරාකරණය කිරීමටත් අපි බලාපොරොත්තු වනවා. එසේ කරන තුරු මෙම රුපියල් 3,500 දීමනාව අඛණ්ඩව ලබා දීමට කටයුතු කරනවා. අපේ වයෝවෘද්ධ අය ඇහුවා, අපි ඒ පොරොන්දුව කඩ කළාද කියලා. කිසි සේත්ම ඒ පොරොන්දුව කඩ කරන්න අපට අවශ්‍ය නැහැ.

ගරු ඩීව් ගුණසේකර මහතා
(மாண்புமிகு டீயூ குணசேகர)
(The Hon. DEW Gunasekara)

විෂමතා ඉවත් කරන්න කොච්චර කාලයක් යනවාද කියන්න පුළුවන්ද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ජූනි, ජූලි මාස වන කොට අවසන් කරන්න තමයි බලාපොරොත්තුව. පැවැති ආණ්ඩුවත් ජූලි, අගෝස්තු මාස තුළදී එය අවසන් කරන බව තමයි කියලා තිබෙන්නේ. අවුරුදු 7ක් තිස්සේ තිබුණු විෂමතා අපි අනිවාර්යයෙන්ම නිවැරදි කරනවා. අහිංසක විශ්‍රාමිකයන්ට අපි කියන්නේ, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා දුන්නු ඒ පොරොන්දුව ඒ ආකාරයෙන්ම ඉටු කරලා තිබෙන බවයි. ශත පහක්වත් අඩු කරලා නැහැ. පොරොන්දුව ඉටු කිරීම පමණක් නොව, වැටුප් විෂමතාව නිවැරදි කිරීමටත් කටයුතු කර ගෙන යනවා.

මේ අවස්ථාවේ මම කියන්න කැමැතියි ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ටත් සහන ලැබී තිබෙන බව. ස්ථිර ආදායමක් ලබන අවුරුදු 60ට වැඩි අයගේ රුපියල් ලක්ෂ 10ක් දක්වා තැන්පතු වෙනුවෙන් සියයට 15ක පොලියක් ලබා දෙන්න කටයුතු කළා. මීට පෙර සියයට 8, 9ක් තිබුණු පොලී අනුපාතය අපි සියයට 15ක් කළා. අපට පෙනුණා ස්ථිර ආදායමක් ලබන මෙවැනි අධික පිරිසක් සිටින බව. ඒ ගැනත් අපි අනුකම්පාවෙන් බලන්න අවශ්‍යයි. ඒ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයත්, මහ බැංකුවත් සමඟ සාකච්ඡා කළා. අපේ ජනාධිපතිත්, අගමැතිත් ඒකට උත්තරයක් දුන්නා. Finance companies මේ රටේ ආර්ථික කටයුතු ඉදිරියට කර ගෙන යන්න ආධාර කරනවා. දැනට මූල්‍ය සමාගම් 28ක් මහ බැංකුවේ ලියා පදිංචි කරලා තිබෙනවා. මෙහි ප්‍රවණතාව වැඩි කර, වැඩි ප්‍රමාණයක් license කරන්න අපි කටයුතු කර ගෙන යනවා. මහ බැංකුවෙන් අවසරය දුන් finance

companies එහි තැන්පත්කරුවන්ට දැනට සියයට 13ක, 14ක පොලියක් ගෙවනවා. එවැනි finance companiesවල තැන්පත් කරන මුදල්වලට අපි මහ බැංකුවෙන් රැකවරණයක් දෙනවා; ඒක අපි ආරක්ෂා කරනවා කියන එක මේ අවස්ථාවේ මතක් කරන්න කැමැතියි. ඒ සඳහා රජයේ මුදල් ශත පහක් යන්නේ නැහැ. මහ බැංකුවේ විධිමත් පාලනය තුළින් ඒවා කඩා නොවැටෙන මට්ටමට කටයුතු කිරීම මහ බැංකුවේත්, අපේ ආණ්ඩුවෙත් වග කීමක් ලෙස අපි භාර ගන්නවා. එවැනි finance companies තුළ මුදල් තැන්පත් කිරීම මින් පසුව භය නැතුව කරන්න පුළුවන් වේවා කියා මා ප්‍රාර්ථනා කරනවා. රජයට මේකෙන් ශත පහක් අය වෙන්නේ නැහැ. විධිමත් පාලනයක් තුළින් finance companies ක්‍රියාත්මක කිරීමෙන් ඒ සෙත සියලු දෙනාටම ලැබේවායි කියා මා ප්‍රාර්ථනා කරනවා. ඒ යෝජනාව අප්‍රේල් මාසයේ 1වැනි දා සිට ක්‍රියාත්මක කරන්න අපි නිර්දේශ කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපට ප්‍රශ්න 3, 4ක් තිබුණා. අපේ සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මන්ත්‍රීතුමිය කිව්වා, බෙහෙත් සඳහා අධික මිලක් අය කරනවා කියලා. එවැනි ප්‍රශ්නයක් තිබෙන බව සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මන්ත්‍රීතුමියනි, අපි දන්නවා. නමුත් සියලු දෙයක්ම දින 100 වැඩසටහන තුළින් ක්‍රියාත්මක කරන්න බැහැ. අපේ සෞඛ්‍ය අමාත්‍ය ගරු රාජිත සේනාරත්න මැතිතුමා විධිමත් පාලනයක් කරමින් ඕනෑ කමින් යුතුව කටයුතු කරනවා. ඒ සඳහා ඔබතුමියගේ දැනුවත් කිරීමත් අපට ලබා දුන්නා නම් හොඳයි. බෙහෙත් මිල අඩු කිරීම සඳහා අප පුළුවන් තරම් කටයුතු කර ගෙන යනවා. එපමණක් නොවෙයි. ආනයන ප්‍රතිපත්තියක් වශයෙන් දැනට US Dollar බිලියනයක් බෙහෙත් සඳහා වියදම් කරනවා. ඒ කියන්නේ රුපියල් බිලියන 131ක්. අපි ආරාධනා කරනවා, දේශීය කර්මාන්තකරුවන් හෝ වේවා, පිට රටන් මෙහි ඇවිත් හෝ වේවා පුළුවන් නම් මෙවැනි ආනයන සඳහා ආදේශක නිෂ්පාදනය කරන්නය කියා. ඒ, අර Critical mass එකක් වශයෙන්. මෙහි ගන්න තිබෙන බෙහෙත් ඒ කොම්පැනිවල විකුණන්න අපි අදහස් කර තිබෙනවා. ඒ නිසා ආනයනය කරනවා වෙනුවට නිෂ්පාදනය කරලා අපේ අවශ්‍යතාව සපුරාලීමට තමයි අපි මේ අවස්ථාවේදී කටයුතු කරන්නේ.

ප්‍රවාහන ගාස්තු සහ ආනයන ගාස්තු අඩු කර තිබෙන නිසා සිමෙන්ති මිල රුපියල් 100කින් අඩු වෙයි කියා අප අදහස් කළා. මම ඒ නිෂ්පාදනකරුවන්ට ඉතා කාරුණිකව කියනවා, අපේ ආණ්ඩුව අදහස් කළේ මෙය සැබෑ ලෙස පාරිභෝගිකයාට ලබා ගැනීමට හැකිවන අයුරින් කටයුතු කරන්න. සිමෙන්ති තොග තිබෙන නිසා අඩු වීමක් සිදු වෙන්නේ නැහැ කියා ඔවුන් අපව දැනුවත් කර තිබෙනවා. මේ අය තමන්ගේ මිල මට්ටම තව සුමානයකින් පාරිභෝගික ආරක්ෂක අධිකාරියට ලබා දුන්නේ නැතිනම්, එම අධිකාරිය විසින් එවැනි අයව raid කරලා දැනට තිබෙන බද්දට වැඩිය සියයට, දෙසීයක බද්දක් අය කරන්න කටයුතු කරනවා කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්නට කැමැතියි. අපි උත්සාහ කරන්නේ කාගේවත් සාක්කුවකට සල්ලි එකතු කිරීමට නොවෙයි. අහිංසක ජනතාවගේ සාක්කුවලට ඒ සල්ලි ලබා දී ඉතිරි කිරීමක් තමයි කරන්න හදන්නේ. අපි මේ ගරු සභාවට ඉදිරිපත් කරලා ක්‍රියාත්මක කරලා වෙනස් කරන ප්‍රතිපත්ති අනුගමනය කරන්නේ නැහැ. මීට පෙර ආණ්ඩුව අවුරුදු 10ක් තිස්සේ කළ සෙල්ලම් ජනවාරි 09 වැනිදා අවසන් වුණා. එම නිසා පිරිසිදු පාලනයකට අප රටේ සුළු සහ මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරිකයන් එකතු වෙන්න කියන කාරුණික ආරාධනාව මම මේ අවස්ථාවේදී ඉදිරිපත් කරනවා.

සහල් සම්බන්ධයෙන් නොයෙක් නොයෙක් දේවල් කළා. ලක්ෂ්මන් සෙනෙවිරත්න මැතිතුමා සංසන්දනය කරන්න හැදුවා, සියයට සියයක දේශීය නිෂ්පාදනයක් සහ සියයට 10ක 11ක නිෂ්පාදනය කිරීමක් සම්බන්ධයෙන්. අපේ මහ ඇමති හරින් ප්‍රනාන්දු මැතිතුමාත් සමඟ එදා පැවැති විවාදයේ තොරතුරු අනුව තමයි මම කියන්නේ. සියයට 11ක් නිෂ්පාදනය කරලා, සියයට 89ක් සියයට 90ක් මේ රටට ආනයනය කරනකොට ඒ තුළින් පාරිභෝගිකයා වෙත අනිසි බරක් පැටවීමට අපට කිසිසේත්ම අවශ්‍යතාවක් තිබුණේ නැහැ. එක පැත්තකින් අපව දිරි ගැන්වීමක් කර තිබෙනවා, සීනි කර්මාන්තය දියුණු කරන්න. උක් වගාව වැඩි කරලා මීට වඩා කොම්පැනි විවෘත කරන්න පසු ගිය සුමානයේ කථා කර තිබෙනවා. චෙකොස්ලොවැකියාවෙන් කොම්පැනියක් ඇවිත් තිබෙනවා. ඔබතුමන්ලා ඒ ගැන කථා කරලා තිබෙනවා. ඒ සම්බන්ධව අගය කරනවා. ඒ තිබෙන වියදමත් අඩු කර මේ රටේ ආයෝජන කරන්න අප ආරාධනා කර තිබෙනවා.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ගරු ඇමතිතුමනි, ඇමෙරිකන් ඩොලර් මිලියන 36ක් වැඩියි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ලක්ෂ්මන් සෙනෙවිරත්න හිටපු ඇමතිතුමනි, ඒ ඔබතුමන්ලාගේ කාලයේ වෙන්න පුළුවන්. නමුත් අප එය සම්පූර්ණයෙන්ම තරගකාරී තත්ත්වයකට දමලා තඹ ශතයක් දෙන්නේ නැතිව ඒගොල්ලන්ගේ ආයෝජන තුළින් මේ රටේ උක් වගා කිරීම වැඩි කරනවා මිසක්, එවැනි ආකාරයේ කොම්පැනි මේ රටේ යළිත් ඇති වෙන්නේ නැහැයි කියා අප විශ්වාස කරනවා. අපි අගය කරනවා, ඔබතුමන්ලා ඒ මාර්ගයේ ගෙන ගොස් තිබුණු එක ගැන. ඒ යන වියදම අපි නිවැරැදි කරලා ආයෝජනය කරන්න කටයුතු කර ගෙන යනවා. ඒ වාගේම නොයෙක් ආකාරයේ ලාංකික කොම්පැනිත් ඉදිරිපත් වෙලා තිබෙනවා. අපි ඒ අයට උදව් කරනවා. උක් වගාව වෙනුවෙන් ගෙවන මිල කිසිසේත්ම අඩු වෙන්නේ නැහැ. අපි එය guarantee කරනවා. ඒ වාගේම මේ රටේ සීනි නිෂ්පාදනය කළාම සියයට 40කට වැඩි වුණොත් වී වලට බදු අය කළා වාගේම නැවත එය ආරක්ෂා කරන බද්ද පනවන්න අපි කටයුතු කරනවා. අපට අවශ්‍ය වෙන්නේ කෘෂි කර්මාන්තය දියුණු කරන්න. දියුණු කරන්නේ සියයට සියයක් තුළ ගමන් මිසක් ඒවාට බාධාවන්ට ඉඩ ලබා දෙන්නේ නැහැ කියා අපි වග කීමකින් කියනවා. අපේ අතිගරු ජනාධිපතිතුමා කෘෂි කර්මාන්තයෙන් යැපිලා ඒ ප්‍රදේශයෙන් ආ නිසා අපට මීට වඩා හොඳ උදාහරණයක් ලබා ගැනීමට අවශ්‍ය වෙනවාද? අපට වග කීමකින් යුතුව කටයුතු කිරීමටයි අවශ්‍ය වන්නේ.

ඊළඟට ලක් සතොස ගනිමු. මෙතෙක් චෝදනා කරන ලද සියලු දෙනාටම හෙළිදරවු කරනවා, මීට මාස 3, 4කට කලින් හදිසි හාල් ආනයනය කරන්න කියා ලංකා බැංකුවත්, මහජන බැංකුවත් රුපියල් මිලියන 7,500ක් ලක් සතොසට දීලා තිබුණු බව. මේ හාල් ටික ආනයනය කළා. මේවා අධික මිලකට බංග්ලාදේශයෙන් තමයි ගෙනැවිත් තිබෙන්නේ. තවමත් අධික මිලකට ඒ සහල් ප්‍රමාණය මේ රටට එනවා. අවසානයේදී, රුපියල් මිලියන 7,500ක් දීලා කිලෝව රුපියල් 70ට 80ට ගෙනැවිත් තිබෙන හාල් රුපියල් 40ට විකුණන්නට ගිහිල්ලා රුපියල් මිලියන 3,800ක අලාභයක් ලබලා තිබෙනවා. ඉතිරි සල්ලිවලිනුත් ඒ අය වෙනත් දේවල් ආනයනය කර තිබෙනවා.

අපි මේ ආණ්ඩුව භාර ගන්න කොට, ලක් සතොස මිලියන 4,900ක අලාභයක් සහිතව -negative balance sheet එකක් සහිතව- තමයි භාර ගන්න වෙලා තිබුණේ. මෙතෙක් දුරට සද්ද කරලා, "මෙන්න, සතොස නැති කරපු අය" කියලා කියපු අය නැවත අපට මේ ආයතනය ලබා දීලා තිබෙන්නේ, මේ රටේ මුදල් කුණු කොල්ලයට පාවිච්චි කරලා මේ ආයතනය නැති කරලායි. අපි සියලුම මන්ත්‍රීවරුන්ට විගණකාධිපතිගේ වාර්තාව ඉදිරිපත් කරන්නම්. එතකොට දැන ගන්න පුළුවන්, මොන වාගේ දූෂණයක්ද ගෙන ගිහිල්ලා තිබුණේ කියන එක. මම කාරුණිකව ඔබතුමන්ලාගෙන් ඉල්ලනවා, අපිත් එක්ක එකතු වෙන්න කියා.

[ගරු රවි කරුණානායක මහතා]

ඕනෑම වෙලාවක මුදල් අමාත්‍යාංශය විවෘතයි. අපි කියන දේ සාක්ෂාත් කරන්න, ඔබත් ඒ කොමිටියට ඇතුළත් වෙලා කටයුතු කරන්න කියලා මම කාරුණිකව විවෘත ආරාධනාවක් කරනවා. අපට අවශ්‍ය වන්නේ විවෘත පාලනයක්.

රටේ ඕනෑම කෙනෙකුට තොරතුරු ලබා ගැනීමේ හැකියාව ඇති කරන්න ඕනෑය කියා එදා අපි කිව්වාම ඔබතුමන්ලා තමයි ඒක නැති කළේ. අපි ඒ නීති එන තාක් කල් අපේ අමාත්‍යාංශය විවෘත කරනවා. අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුනුත් ඉතා උනන්දුවෙන් මේ සම්බන්ධව කරන දිරිමත් කිරීම අපි අගය කරනවා. මනුෂ්‍යයන්ට වැරදෙන්න ඉඩ තිබෙනවා. නමුත් සියලු දෙනාම එක්සත් වුණොත් ඒ ප්‍රශ්නත් නැති වෙනවා කියන විශ්වාසය තමයි මම අනුගමනය කරන්නේ.

කොටස් වෙළෙඳ පොළ සම්බන්ධයෙන් යමක් කියන්න ඕනෑ. අපට තවම පෙනෙනවා, මේ රටේ සියයට තුනකට විතර තමයි රටේ කොටස් වෙළෙඳ පොළේ ආයෝජනවලින් සියයට 95ක් විතර භාරව තිබෙන්නේ කියලා. සියයට 95ක, 96ක පිරිසකට සියයට 3ක් තමයි කොටස් වෙළෙඳ පොළේ අයිතිය තිබෙන්නේ. අතිවිශිෂ්ට ජයග්‍රහණයක් කරපු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ජනාධිපති ධුරය සම්බන්ධයෙන් සහ රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ආණ්ඩුව සම්බන්ධයෙන් මේ අය ප්‍රශ්නයක් ඇති කරන්න හදනවා, "මේ යන ගමන වැරැදියි, ඒ නිසා ප්‍රශ්නයක් ඇති කරන්න ඕනෑය" කියා. අපි කියනවා, "වැරැදි විධියට කටයුතු කරන හතර, පස්, හය දෙනෙකුට මේ රටේ ආර්ථිකයත් එක්ක සෙල්ලම් කරන්න අපි ඉඩ දෙන්නේ නැහැ. තමන්ගේ පසු ක්‍රියාව අනුව එතැන තිබුණු cases ගෙනැල්ලා ඒවා compound කරලා නැති කරපු අය බැරි වෙලාවත් ඕනෑකමින් රටේ ආර්ථිකය කඩා වට්ටන්න හදනවා නම් අපි හෙළිදරවු කරලා ජනතාවට පෙන්වන්නම්, මේ අය pump හා dump ක්‍රියාව ඇති කරනවාය" කියා.

අපි අගය කරනවා, වර්තමාන සභාපති තිලක් කරුණාරත්න හිටපු මන්ත්‍රීතුමා මේ ආයතනය ඉදිරියට ගෙන ගොස්, පිරිසිදු පාලනයක් ඇති කරන්න කටයුතු කරන එක ගැන. අපි විශ්වාස කරනවා, සුළු පිරිසක් කොටස් වෙළෙඳ පොළ වට්ටන්න හදනවා කියා. කොටස් වෙළෙඳ පොළ ඕනෑකමින් වට්ටන්න හදනවා නම්, අපි ආණ්ඩුවක් වශයෙන් එවැනි ක්‍රියාවක් කරන අයට සමාවක් නැතුව ක්‍රියාත්මක වෙන්නත් බැඳී සිටිනවා කියන එක අපි මේ අවස්ථාවේ මතක් කරන්න කැමැතියි. මම මේ කියන්නේ, කොටස් වෙළෙඳ පොළේ ආයෝජනය කරන්න හදන අහිංසක පුද්ගලයන් ගැන හිතලායි. ඒ නිසා කරුණාකරලා මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න අපට උදව් කරන්න. [බාධා කිරීමක්] There will be no interference at all. We would appreciate if any of you can help us. අපි 1000ccවලට වඩා වැඩි-

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්, කියන්න ගරු මන්ත්‍රීතුමා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
පෞද්ගලික අංශයේ වැටුප් සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරනවා නම් හොඳයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම ඒකට එන්නම්.

ආනයනය කරන වාහන සම්බන්ධයෙන් අපේ කැබිනට් මණ්ඩලය තීරණයක් ගත්තා. කවදාවත් කාර් එකක් ගන්න අවස්ථාවක් නොතිබුණු අපේ අහිංසක මිනිසුන්ට ඒ අවස්ථාව ඇති කරන්න තමයි, 1000ccට වඩා අඩු වාහන වැඩියෙන් ආනයනය කරන්න අපි තීරණය කළේ. මම මෙතැනදී නිදසුනක් හැටියට කියනවා, සියයට 25කට, 30කට මේකෙන් ඒ වාසිය භුක්ති විඳින්න අවස්ථාවක් ලැබෙනවා කියා. වාහන ආනයනය කරන තුන්-හතර දෙනෙක් ඊයේ මා දැනුවත් කළා. මම ඒ කොම්පැනියේ නම කියන්නේ නැහැ. ඔවුන් කරන ක්‍රියාව නම් අසාධාරණයි. රුපියල් ලක්ෂ 14ක් ගෙවන්න තිබුණු කාර් එකකට මේ අය වැයට පස්සේ රුපියල් 238,000ක් ඉතුරු වෙනවා. ඒ රුපියල් 238,000 ඒ කොම්පැනියෙන් වාහන ඇණවුම් කරන්න දීපු ඒ අහිංසක පාරිභෝගිකයාට ලබා දෙන්නේ නැහැ. ඒකෙන් රුපියල් 20,000යි අඩු කර තිබෙන්නේ. මම ඒ අයත් සමඟ සාකච්ඡා කරන්නම්.

මම ඒ කොම්පැනියට කියනවා, "මේ වරප්‍රසාදය ඒ අහිංසක පාරිභෝගිකයාට ලබා දුන්නේ නැත්නම් පාරිභෝගික ආරක්ෂක අධිකාරිය තුළින් ක්‍රියාත්මක වෙන්න සිදු වෙනවා" කියා. අපි ඇවිල්ලා සිටින්නේ, ව්‍යාපාරික ලෝකයට යම් විධියක අත් උදව්වක් දීලා ඉදිරියට තල්ලු කරන්නයි. මේ අවුරුදු 10, 11 තුළ ආර්ථිකය කඩා වැටිටුවා. ව්‍යාපාරිකයන්ට සියයට 25ක්, 30ක් කොමිස් වශයෙන් ගෙවන්න තිබුණා. මින් පසුව ශත පහක් ගෙවන්නේ නැති නිසා ඒ වරප්‍රසාදය -ඒ මුදල- පාවිච්චි කරන්න තමන්ගේ සුළු, මධ්‍යම හා මහා පරිමාණ කර්මාන්තය දියුණු කරන්න. මෙවැනි දේවල් වුණොත් ඒ අයට විරුද්ධව තදින් කටයුතු කරන්න තමයි වෙන්නේ. මම අගය කරනවා, පාරිභෝගිකයන් අපට කථා කර මේ විධියට කටයුතු කිරීම සම්බන්ධයෙන්.

අපේ හිටපු ඇමතිතුමා පෞද්ගලික අංශය ගැන ප්‍රශ්නයක් ඇහුවා. ශ්‍රම බල කායෙන් සියයට 88ක් ඉන්නේ පෞද්ගලික අංශයේ. අපි නිර්දේශ කරලා, ඒ අදාළ ආයතනවලට යොමු කර තිබෙනවා, කරුණාකර රුපියල් 2,500කින් පඩි වැඩි කරන්න කියා. මේ රටේ වැදගත්ම සාධකය පෞද්ගලික අංශය සතුවයි තිබෙන්නේ. ඒ, මනුෂ්‍ය ශ්‍රම සම්පත. කොම්පැනි සහ වාණිජ මණ්ඩල සියයට 75කට වැඩිය මේ ගැන ඕනෑකමින් හිතලා, ඒ මුදල ගෙවන්න එකතු වෙලා තිබෙනවාය කියන කාරණය මට සතුටින් කියන්න පුළුවන්.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
අර්ථසාධක අරමුදලේ සියයට දෙකේ දායකත්වය, -

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order please! The Hon. Speaker will now take the Chair.

අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, කථානායකතුමා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* MR. SPEAKER *took the Chair.*

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

රුපියල් 2,500කින් පඩි වැඩි කරලා දෙන්න කියලා ඉල්ලීම කරලා තිබුණාම ඒකට කොම්පැනි සහ වාණිජ මණ්ඩල සියයට 75ක් උදවු කරලා තිබෙනවා. ඒක මා අගය කරනවා. මේ සම්බන්ධයෙන් දේශපාලනය කරන්න අවශ්‍ය නැහැ. අප ආණ්ඩුවක් වශයෙන් කටයුතු කරලා තිබෙනවා. චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමා ඇහුවා, ගිය ආණ්ඩුව තුළ සියයට දෙකකින් අර්ථ සාධක අරමුදල වැඩි කරලා තිබෙනවාය කියන කාරණය සම්බන්ධයෙන්. ඒක කිසිසේත්ම අඩු කරලා නැහැ. කරුණාකර ඒ ආකාරයෙන්ම එය ක්‍රියාත්මක කරන්න කියලා අප ඒ අයට මේ අවස්ථාවේදී මතක් කරලා දෙන්න කැමැතියි. අප මෙතැනට ඇවිල්ලා තිබෙන්නේ සූරා කන්න නොවෙයි. අහිංසක ජනතාවට තඹ සතයක් ලැබිලා තිබෙනවා නම් ඒක තවත් සුරක්ෂිත කරන්න තමයි අප බලයට පත් වෙලා ඉන්නේ කියන කාරණය මා මේ අවස්ථාවේදී සතුටින් ප්‍රකාශ කරන්න කැමැතියි. මේකයි වෙනස. ගිය වර අය වැයෙන් මේ වෙනුවෙන් සත පහක් වෙන් කරලා තිබුණේ නැහැ. වෙන් කරලා තිබෙන හොඳ දේවල් දීලා, අනවශ්‍ය, පම්පෝරි ගහන දේවල් තමයි අප අඩු කරලා තිබෙන්නේ. සමහරු කියනවා, මේ කොත්තමල්ලි ආර්ථිකයක්ලු, අර ආර්ථිකයක්ලු, මේ ආර්ථිකයක්ලු කියලා. මම ඒ සම්බන්ධයෙන් කනගාටු වනවා. එහෙම හිතපු මන්ත්‍රීවරු මේ පැත්තේ ඇමතිවරු වශයෙන් හිටියා. මම එතුමන්ලාගෙන් අහනවා, ඇයි ඒ කාලයේ කොත්තමල්ලි මිල අඩු කළේ නැත්තේ; සීනි මිල අඩු කළේ නැත්තේ; සැමන් මිල අඩු කළේ නැත්තේ; තෙල් මිල රුපියල් 60කින් අඩු කළේ නැත්තේ; භූමිතෙල් මිල රුපියල් 59ට අඩු කළේ නැත්තේ කියලා. ඔවුන් වෙනත් සුන්දර ලෝකයක හිටියේ. රාජපක්ෂ ආණ්ඩුව කවදාවත් පරාජය කරන්න බැහැයි කියලා එතුමන්ලා හිතුවා. මෙන්න මේක තමයි තිබෙන වෙනස. තමුන්නාන්සේලාගේ අදක්ෂතාව, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා, රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා ප්‍රමුඛ අපේ ආණ්ඩුවේ දක්ෂතාවයෙන් මනින්න එපාය කියන කාරණය මා නැවත මේ අවස්ථාවේ දී මතක් කරනවා. දවස් සියයෙන් මේ වැඩ කොටස කරන එක නොවෙයි අවශ්‍ය වන්නේ. අවුරුද්දක්, ඊට පස්සේ ජනතා වරම තුළින් ප්‍රජාතන්ත්‍රවාදීව ඉදිරියට කටයුතු කිරීම තමයි අප මේ අවස්ථාවේදී බලාපොරොත්තු වන්නේ කියන කාරණය මතක තියා ගන්න අවශ්‍යයි.

මා දූෂණය ගැන නැවත මතක් කරන්න ඕනෑ නැහැ. නමුත් සමහර අය කරපු ක්‍රියා ගැන මතක් කිරීමක් කරන්න අපට අවශ්‍යයි. නිහාල් අමරසේකර මැතිතුමා අවුරුදු දෙක තුනකට ඉස්සෙල්ලා හෙජින් සූදුව සම්බන්ධයෙන් එවකට හිටපු නීතිපතිට ලියුමක් යොමු කරලා තිබුණා, "කරුණාකරලා අපට මේ හෙජින් සූදුව සම්බන්ධයෙන් කියන්න. අඩු ගණනේ මෙයින් රුපියල් කෝටි 16,800ක් විතර නැති වෙනවා. මේගොල්ලන් ඉදිරියේදී arbitrationවලට යනවා. මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ ස්ථාවරය මොකක්ද?" කියලා පැහැදිලි කරන්න කියලා. එවකට හිටපු නීතිපති මොහාන් පීරිස් උසාවිය දැනුවත් කරලා තිබුණා, "ඔව්. අප එය අගය කරනවා. අප ඉදිරිපත් කරපු මේ නීතිමය කටයුත්ත සම්බන්ධයෙන් සත පහක් නැති වෙන්න ඉඩ දෙන්නේ නැහැ"යි කියලා. නමුත් අන්තිමට මොකද වුණේ? අද Deutsche Bank එකේ රුපියල් මිලියන 2,500ක් නැති වෙලා තිබෙනවා. Standard Chartered Bank එකේ රුපියල් කෝටි 800ක් නැති වෙලා තිබෙනවා. මේ කියපු මොහාන් පීරිස් ගැන -මේ වාගේ පෞද්ගලික චරිත ගැන- ගිය සුමානයේ ලොකුවට සද්ද කරලා කථා කළ අය, මෙතැන විත්තිකරුට එක් වතාවක් පෙනී සිටිනවා; ඊට පස්සේ ආණ්ඩුව වෙනුවෙන් තව වතාවක් කථා කරනවා. එදා ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් කිව්ව ඒ පෞද්ගලික හැසිරීම තමයි අපි එතැනදී පෙන්නුවේ. මම මේ කාරණය කිව්වේ, මේ මොහාන් පීරිස් කියන්නේ බොහොම සුදන චරිතයක් කියලා එදා ආණ්ඩුව පෙන්වන්න හැදුව නිසායි.

අද තෙල් මිල රුපියල් 35කින්, රුපියල් 40කින් වැඩි වෙලා තිබෙන්නේ දෙදෙනෙකු නිසායි. එක් කෙනෙකු තමයි, අජිත් නිවාඩ් කබ්රාල්. අනික් කෙනා තමයි, මේ මොහාන් පීරිස්. අපි මේ තොරතුරු හෙළිදරවු කරන්නම්. මෙන්න මේ වාගේ අය නිසා තමයි රටක ආණ්ඩුව කඩා වැටෙන්න ඉඩ තිබෙන්නේ. අපේ ආණ්ඩුවට තිබෙන ප්‍රශ්නය තමයි, මේ කරපු පව් අපටත් ඇදගෙන යන්න සිදු වීම. නමුත් අප මේ අපරාධ සම්බන්ධයෙන් හෙළිදරවු කරනවා. මෙන්න කරපු අපරාධය, මෙන්න මේ පුද්ගලයින් තමයි මේවා ක්‍රියාත්මක කරලා තිබෙන්නේ කියන එක පිළිබඳව අඩු ගණනේ මේ රටේ ජනතාව වෙනුවෙන් කරුණු ඉදිරිපත් කිරීම සහ ප්‍රසිද්ධ කිරීම අපේ යුතුකමක් ලෙස සලකා අප කටයුතු කර ගෙන යනවා. අප මේවා සම්බන්ධයෙන් පරීක්ෂණ ආරම්භ කරලා තිබෙනවා. තව සුමාන තුන හතරකින් එය හෙළිදරවු කරනවා. මෙතැන ඉන්න මන්ත්‍රීවරු අපෙන් අහනවා, "මේ අපරාධ කරපු පව්කාරයින් හෙළිදරවු කරන්නේ නැත්තේ මොකද?" කියලා. මතක තියා ගන්න, අප තවම දවස් 28ක ආණ්ඩුවක් බව.

අවුරුදු 11ක් තිස්සේ කරපු අපරාධ සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් වෙන්න ඉස්සෙල්ලා තිබුණු files ඔක්කොම ගෙනගිහින් තිබෙනවා. තවමත් කාර් 2,800ක් එළියේ තිබෙනවා. රේගුවෙන් ගන්න වාහන ලියා පදිංචි කරන්නේ නැතිව වෙනත් තැන්වල තිබෙනවා. මේවා කියන්න කියන්න අප ලජ්ජාසහගත වනවා විතරයි. මා මේ අවස්ථාවේ නම් හෙළිදරවු කරන්නේ නැත්තේ අප ඔබතුමන්ලා වාගේ වල්මත් පාලනයක් කරන්නේ නැති නිසායි. අධිකරණයක් තිබෙනවා. පොලීසියක් තිබෙනවා. නිසි පරීක්ෂණයක් කරනවා. මෙන්න මේ අය තමයි මේ අපරාධ කරලා තිබෙන්නේ කියන කාරණය නිසි වෙලාවට පෙන්වන්න ක්‍රියා කරනවා. ඒ නිසා කරුණාකර අපට උදවු කරන්න. මේ වාගේ බොරුවට ප්‍රශ්න කරලා ඔබතුමන්ලා ඒවාට අභියෝග කළොත් අපට වෙන්නේ "ඔව්. මෙන්න මේගොල්ලන් තමයි මේ අපරාධ කරලා තිබෙන්නේ" කියන එක පෙන්වන්නයි. අපි ඒවා නිසියාකාරව, හරි වෙලාවට හෙළිදරවු කරනවා කියන එක මතක් කරන්න අවශ්‍යයි.

මේ අය වැය යෝජනාවලිය ඉදිරිපත් කරද්දී අපි කිව්වා, ශ්‍රීලන්කන් ගුවන් සමාගමත්, මිහින් ලංකා ගුවන් සමාගමත් ඒකාබද්ධ කරනවා කියලා. මෙතැන ඉන්න අයගෙන් එක් කෙනෙක්, දෙදෙනෙක් ඒ ගැන වෙනත් ප්‍රකාශ කරලා තිබුණා. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ ඒ යෝජනාව අනුව ඒ ආයතන දෙක ඒකාබද්ධ කරලා, අපි නාස්තිය නැති කරනවා. ඒකට වෙනත් අර්ථකථනයක් දෙන්න අවශ්‍යතාවක් නැහැ. ඒ ආයතන දෙක ඒකාබද්ධ කළාට පසුව ඒ මහින් ලාභ ලැබීම ඒ අදාළ ඇමතිවරයාට අදාළයි. බැරි වෙලාවත් ඒ ආයතනය පවත්වා ගෙන යන්න බැරි වුණොත්, ඒ නිලධාරි මණ්ඩලයේ වෙනසක් ඇති කරන්න අවශ්‍යයි. මොකද, යම් යම් අය තවම එම තැන්වලම ඉන්නවා. එම වයින්ම අලුත් බෝතල්වලට දමලා කටයුතු කරමින් යන ගමනක් පෙනෙන්න තිබෙනවා. අපි ඉතාමත් ඕනෑකමින් ඒ අදාළ ඇමතිවරයාට කියනවා, දූෂණය ඇති කරන්න ඉඩ දෙන්න බැරි බව. ඒ වැරදි කරන නිලධාරින් සම්පූර්ණයෙන්ම වෙනස් කරන්න අවශ්‍යයි. ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් ආයතනයේ ඉහළ නිලධාරියාගේ ඉඳලා පහළ නිලධාරියා දක්වා ඕනෑම තැනක වැරදි සිදු වෙනවා නම්, ඒවා නිවැරදි කරන ලෙස මම මේ අවස්ථාවේදී ඒ අදාළ ඇමතිවරයාට නිර්දේශ කරනවා. ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් මීට ටික වෙලාවටකට ඉස්සර මට මේ බව කිව්වා. මොකද, රුපියල් කෝටි 3,200ක අලාභයක් ඉදිරියට ගෙන යනවා කියන්නේ, හෙණ ගහන අපරාධයක්. එහි බලපෑම ඇති වන්නේ බදු ගෙවන අහිංසක ජනතාවටයි. ඒ නිසා වෙනත් අර්ථකථන දෙන්න අවශ්‍ය නැහැ. ඒක තමයි රජයේ ප්‍රතිපත්තිය. ඒක අපි ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කරනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමනි, තව විනාඩි දෙක තුනකින් කථාව අවසන් කරන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මට තව මිනිත්තු පහක් ලබා ගන්න පුළුවන්ද?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Oneworld එක සම්බන්ධයෙන් වියදම් ඉදිරිපත් කරලා තිබෙනවා. මේ කටයුතු කරලා තිබෙන ආකාරය ගැන අපට දුකයි. ඒ අය අපට කථා කරලා කිව්වේ, අපට ගෙව්වේ රුපියල් මිලියන 9යි කියලා. නමුත් ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් ආයතනය රුපියල් මිලියන 29ක වියදමක් ඉදිරිපත් කරලා තිබෙනවා. මේ එක පොඩි දෙයක් වෙනුවෙන් රුපියල් මිලියන 20ක් -රුපියල් ලක්ෂ 200ක්- නැති කරලා තිබෙන බවක් තමයි අපට පෙන්වලා තිබෙන්නේ. මම මේ වාර්තාව හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

අපි මේවා දැන ගන්න අවශ්‍යයි. ඔරේන්ජ් ආයතනය තමයි ඒ කටයුත්ත කළේ. ඒ අහිංසකයින්ට ඒ සම්පූර්ණ කටයුත්තටම රුපියල් මිලියන 9යි ගෙව්වේ. නමුත් ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් ආයතනයෙන් මේකට රුපියල් මිලියන 29ක් ගෙව්වාය කියා ඉදිරිපත් කරලා තිබෙනවා කියන කාරණය අපි මේ අවස්ථාවේදී හෙළිදරවු කරනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම තමයි පාරවල් සම්බන්ධයෙනුත් තිබෙන තත්ත්වය. දවස් තුනකට ඉස්සර වෙලා චීන කොම්පැනියට සල්ලි -ඒ ණය මුදල- ලැබෙනවා. පාරවල් හදන්න ණය - රුපියල් මිලියන 500ක් - හම්බ වෙනවා. ඒ පාරවල්වලට යන වියදම අනුව කිලෝමීටර් 63කට යම් විධියකින් එක කිලෝ මීටරයකට රුපියල් මිලියන 100ක් අය කරනවා. ඒකම sub contract කරනවා, ලාංකික කොම්පැනියකට. මම මේ අවස්ථාවේදී නම් හෙළිදරවු කරන්නේ නැහැ, ඒ අය සම්බන්ධයෙන් නීතිමය කටයුතු කරන්න අවශ්‍ය නම් ඒ සඳහා ඒක බාධාවක් වෙන නිසා. රුපියල් මිලියන 66ක් ගෙවනවා. කලින් කොම්පැනිය එක කිලෝ මීටරයකට රුපියල් මිලියන 34ක් වැඩිපුර අය කරනවා. කාගේ සාක්කුවටද මේ සල්ලි යන්නේ?

"ඇයි, මේ ප්‍රාග්ධන වියදම අඩු කළේ?" කියලා අපෙන් ප්‍රශ්න කරනවා. අපි රුපියල් කෝටි 18,700ක් අඩු කළේ, මෙන්න මේ වාගේ වියදම් නැති කරන්නයි. ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් ආයතනයේ රුපියල් කෝටි 13,200ක්, දැයට කිරුළ ව්‍යාපෘතියේ රුපියල් කෝටි 3,000ක් ඉතුරු කරලා තමයි රුපියල් කෝටි 18,700ක් අඩු කරලා තිබෙන්නේ. අපි විනයක් ඇතුව, ජනතාවට සෙතක් සලසන්න පුළුවන් විධියට ප්‍රාග්ධන වියදම් අඩු කරලා තිබෙනවා. ඊයේ ශාන්ත බණ්ඩාර මැතිතුමා සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව වශයෙන් ඉදිරිපත් කළේ, අපි ප්‍රාග්ධන වියදම් කපා හැරලා පුනරාවර්තන වියදමට එකතු කර තිබෙනවා කියලා. ඒවා මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ ආණ්ඩුව කාලයේ කරපු දේවල්. අපි මේ ආණ්ඩුව තුළින් විනයක් ඇතුව කටයුතු කරනවා. අපි ප්‍රාග්ධන වියදම වශයෙන් අඩු කරලා තිබෙන්නේ, පම්පෝරියට තිබුණු නාස්තිකාර වියදම් මිසක් වෙනත් ඒවා නොවෙයි. අපට අවශ්‍ය වන්නේ රට හදන්නයි. ජනතාව විශ්වාස කරලා තිබෙනවා, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේත්, රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාගේත් ආණ්ඩුව තුළින් අලුත් ආශ්වාදයක් ඇතුව ඉදිරියට ගමන් කරන්න පුළුවන් කියලා. අපට අවශ්‍ය වන්නේ ඔබ සියලු දෙනාගේම සහයෝගයයි. මේක මේ දින සියයේ වැඩ පිළිවෙළ පමණක් නොවෙයි. ඩිලාන් පෙරේරා මන්ත්‍රීතුමා කිව්වා වාගේ මීට ඉදිරියට කටයුතු කර ගෙන යන්න අවශ්‍යයි. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවා. පිරිසිදු පාලනයක් ගෙනෙනවා. යහ පාලනයක් ගෙනෙනවා. මේ ඔක්කෝම දවස් සියයෙන් කරනවා වාගේම ඊටත් එහාට ඒවා ක්‍රියාත්මක කරන්නට අපි සියලු දෙනාම බැඳී සිටිනවා.

මෙන්න, වියදම සම්බන්ධයෙන් තිබෙන තත්ත්වය. අපි දන්නා ආකාරයට උතුරු අධිවේගී මාර්ගය සඳහා කොටස් පහකට රුපියල් කෝටි 25,480ක් ඇස්තමේන්තු කරලා තිබෙනවා. ඒ චීන කොම්පැණියම ඇවිල්ලා අපට කථා කරලා තිබෙනවා. මට විතරක් නොවෙයි, අපේ කබීර් හාෂීම් ඇමතිතුමාටත් කථා කරලා තිබෙනවා. තවත් රුපියල් කෝටි 6,000ක් අඩුවෙන් මෙය කරන්න පුළුවන් වෙයි කියලා තිබෙනවා. කාගේ සාක්කුවලටද මේ සල්ලි ටික යන්නේ? මෙන්න මේවා නිසා තමයි යම් විධියකින් බාධාවක් ඇති වන්නේ. අපි යාපනය දක්වා උතුරු අධිවේගී මාර්ගයේ කටයුතු කර ගෙන යනවා. ඒ ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ. නමුත් ඒ කරන කොට බදු ගෙවන අහිංසක ජනතාවගේ සල්ලි අපි පාවිච්චි කරන්න අවශ්‍ය වන්නේ, හැම තඹ ශතයකින්ම ජනතාවට වරප්‍රසාදයක් ලබා දෙන්න පුළුවන් ආකාරයටයි. එහෙම නැතුව එක් කෙනෙකුගේ, දෙදෙනෙකුගේ සාක්කුවට සල්ලි යන ආකාරයට නොවෙයි අපි කටයුතු කළ යුත්තේ කියන කාරණයත් මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

මගේ කථාවට වෙලාවත් හරස් වෙලා තිබෙනවා. මට පෙනෙන විධියට මහ බැංකුවේ රුපියල් කෝටි 8,000ක් විතර මේ මාස හය, හත තුළ වියදම් කරලා තිබෙනවා. Greece Bondsවල රුපියල් මිලියන 3,500ක් නැති වෙලා තිබෙනවා. මේ රටේ විදේශ අමාත්‍යාංශයක් තිබෙනවා. නමුත් ඒ අය විශ්වාස කරන්නේ නැතිව එක මන්ත්‍රීවරයකුගේ දෙන්නෙකුගේ ඕනෑකමට රුපියල් මිලියන 1,300ක් public relations company එකකට, කිසිම අනුමැතියක් නැතිව වියදම් කරලා තිබෙනවා. ඩොමිනික් ස්ට්‍රවුස් බාන් කියන පුද්ගලයාගේ චරිතය පිළිබඳව, IMF එකේ වොෂිංටන්වල සිදු වුණ දේවල් පිළිබඳව මේ වෙලාවේ හෙළිදරවු කරන්න අවශ්‍ය නැහැ. මේ අයට රුපියල් මිලියන 750ක් ගෙවන්න නියෝග කරලා තිබුණත් අපි ඒක නවත්වලා තිබෙනවා. ඒත් එයින් රුපියල් මිලියන 250ක් ගෙවලා තිබෙනවා.

ඒ නාස්තිය වාගේම, එතනෝල් ආනයනය කිරීමේදී මේ අවුරුද්ද තුළ රුපියල් මිලියන 7,200ක් නැති වෙලා තිබෙනවා. හම්බන්තොට වරායට රුපියල් කෝටි 8,200ක් වියදම් කරලා තිබෙනවා. නමුත් value addition එක අනුව තිබෙන නිල අගය රුපියල් මිලියන 300යි. ආදායම රුපියල් මිලියන 5,400ක් කිව්වාට, value addition එක රුපියල් මිලියන 300යි. දැන් එහි දෙවැනි අදියරටත් අත්සන් කරලා තිබෙනවා. එහි වියදම රුපියල් කෝටි 8,900යි. දැනට එයින් සියයට 35ක් වියදම් කරලා අවසන්. පළමුවැනි අදියරෙන් තඹ සතයක් ලැබෙන්නේ නැති තත්ත්තවක් තිබියදී දෙවැනි අදියරටත් වියදම් කිරීම අපරාධ වියදමක් කියලා

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මම හිතන හැටියට අපේ කථානායකතුමා වුණත් මේ අවස්ථාවේ එකඟ වේවි. මේ හරහා ඉදිරියේදී අපේ වරාය ක්ෂේත්‍රය දියුණු කරන්න පුළුවන් නම් කමක් නැහැ. අපි ඒ පළමුවැනි අදියර දියුණු කරලා ඒ තුළින් ඉදිරියට යන්නට හැකි නම් දෙවැනි අදියරේ අවශ්‍යතාවක් තිබෙනවා කියලායි මම හිතන්නේ.

ගරු අර්ජුන රණතුංග ඇමතිතුමාත් මමත් ඊයේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක පිරිස හමු වුණා. අවුරුදු තුනෙන් තුනට සාමූහික වග කීමකින් - Collective Agreement - පඩි වැඩි කිරීම සම්බන්ධයෙන් අපට ලොකු ප්‍රශ්නයක් තිබුණා. ඊයේ සාකච්ඡාව අනුව, රුපියල් මිලියන 2,500ක් ලාභයක් එකතු කරන්න අපි අනිවාර්යයෙන්ම බැඳී සිටිනවා. එය අඩු කරන්නට කිසි සේත්ම අපට අවශ්‍යතාවක් තිබුණේ නැහැ. නමුත් අපි පෙන්වලා දුන්නේ රුපියල් මිලියන 400ක අලාභයක් තිබෙනවා කියන එකයි. දැන් JCT එකෙන් නැව් ටික චීන වරායට යනවා. ඒ නිසා ආදායම තවත් අඩු වෙනවා. මේ රුපියල් මිලියන 2,500 එකතු වුණොත් සහ එන අවුරුද්දේ සහ ඊළඟ අවුරුද්දේ හම්බන්තොට වරායට රුපියල් මිලියන 5,900කුත් ගෙවන්න පටන් ගත්තාට පස්සේ, කොයි ආකාරයෙන්ද අපේ කොළඹ වරාය ලාභදායීව ගෙන යන්න පුළුවන් වන්නේ?

ඵලදායිතාව වැඩි කරලා, දූෂණය නැති කරලා වරාය අධිකාරිය ලාභදායී ලෙස ගෙන යන්න පුළුවන් වැඩ පිළිවෙළක් ඇති කරන්න අවශ්‍යයි කියලා අපි අභියෝගයක් ඉදිරිපත් කළා. වරාය අධිකාරියේ සේවක පිරිස ඒ අභියෝගය භාර ගත්තා. ඒක අමාරු කාර්ය භාරයක්. ඒ වැඩ කරන 10,800ක සේවක පිරිසට තෘප්තිමත්ව වැඩ කරන්න පුළුවන් හැඟීම ලබා දෙන්නට අපේ ගරු අර්ජුන රණතුංග ඇමතිතුමාත් මාත් එකඟ වුණා.

මේ වාගේ සිදු කළ යුතු දේවල් ගණනාවක් තිබෙනවා. අපි මේ ආර්ථිකය හරියාකාරව ගෙන ගියේ නැතිනම් කඩා වැටෙනවා. යම් අය මේ ආර්ථිකය එක්ක සෙල්ලම් කළාට, ඒ ගැන අපි සියලු දෙනාටම හැඟීමක් තිබෙනවා. අපේ ආණ්ඩුවට විතරක් නොවෙයි විපක්ෂයටත් ඒ හැඟීම තිබෙනවා. ඒ නිසා අපි දෙගොල්ලෝම එකතු වෙන්න ඕනෑ. මේ ආර්ථිකය කොළ පාට, නිල් පාට, රතු පාට, කහ පාට ආර්ථිකයක් නොවෙයි. මෙය ජාතික ආර්ථිකයක්. මේ ජාතික ආර්ථිකය හදන්න අපි සියලු දෙනාම ඒක රාශි වෙන්න ඕනෑ. එය 2015 වර්ෂයට විතරක් නොවෙයි, ඉදිරි අවුරුදු 10, 15වත් මේ ආර්ථිකය හදන්න අපත් සමඟ එකතු වෙන්න කියන එක මතක් කරන අතර, අපට ඉතාම වැදගත් අදහස් ඉදිරිපත් කිරීම ගැන අපේ ගරු ජනාධිපතිතුමාටත්, ගරු අගමැතිතුමාටත්, ඇමති මණ්ඩලයටත් ස්තුති වන්ත වෙනවා.

මේ අවස්ථාවේදී මුදල් අමාත්‍යාංශයේ ලේකම් සහ රජයේ නිලධාරින්ට ස්තුති වන්ත වෙනවා. මේ අදහස් අපේම අදහස් පමණක් නොවෙයි. අපේ කැබිනට් මණ්ඩලයේ සියලු දෙනාම මේ ගැන අදහස් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාගේම, ඉතාම දක්ෂ ලෙස විපක්ෂයේ මන්ත්‍රීවරුන් හය, හත්, අට දෙනෙක් අදහස් ඉදිරිපත් කළා. මෙහෙම තමයි අපේ ජනතාව වෙනුවෙන් ඉදිරිපත් කරලා තිබෙන අය වැය සම්බන්ධව ඉදිරියට කටයුතු කර ගෙන යා යුත්තේ. මෙය දේශපාලනීකරණය කරන්න එපා. ඔබතුමන්ලා දේශපාලන අරමුණකින් කටයුතු කළාට කිසි ප්‍රශ්නයක් නැහැ. නමුත් මේ කරන දේ විකෘති කර ජනතාවට පෙන්වන්න එපා කියන එක මේ අවස්ථාවේදී මතක් කරනවා.

මම එදා අය වැය කතාව අවසන් කරන වෙලාවේ කිව්වේ, දුප්පතුන් ඉක්මනින් පොහොසතුන් කළ නොහැකි වුවත්, නැති බැරිකමින් තොර වූ සමාජයක් අපට ඉක්මනින් ගොඩ නැඟිය හැකි බවයි. ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා වෙනුවෙන්, රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා වෙනුවෙන්, අපේ ඇමති මණ්ඩලය සහ මන්ත්‍රීවරුන් වෙනුවෙන් එය මේ අවස්ථාවේදීත් කියා සිටිනවා.

මේ විවාදයට එකතු වී ඔබ සියලු දෙනාම ඉතාම ඕනෑකමින් ඉදිරිපත් කළ අදහස් අපි අගය කරනවා. මේ අය වැයට අපි සංශෝධන ඉදිරිපත් කළා. මේ සංශෝධනවලට විරුද්ධත්වයක් නැති නිසා අපි එකට ගමන් කරමු. රටේ ජනතාව වෙනුවෙන් ජාතික ආර්ථිකයක් හදමු. අපි මේ තනතුරු දරන්නේ තාවකාලිකවයි. ජනතාවගේ අවශ්‍යතා ඉටු කරන්නට අප සියලු දෙනාම ඒක රාශි වෙමු කියන කාරණය මතක් කරමින්, ගරු කථානායකතුමාටත්, ඔබ සියලු දෙනාටත් ස්තුති වන්ත වෙමින් මම නිහඬ වෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පනත් කෙටුම්පතේ ඉතිරි වැඩ කටයුතු අවසාන වන තෙක් කර ගෙන යෑමට සභාවෙන් කාලය ඉල්ලා සිටිනවා. ඒ සඳහා සභාව එකඟ ද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පනත් කෙටුම්පත දෙවන වර කියවීම සම්මත කිරීමට සභාවේ එකඟත්වය?

ප්‍රශ්නය විමසන ලදී.
කටහඬවල් අනුව "පක්ෂ" මන්ත්‍රීන්ට ජය බව කථානායකතුමා විසින් ප්‍රකාශ කරන ලදී.
வினா விடுக்கப்பட்டது.
குரல்களின்படி 'ஆம்' மேலோங்கிற்று என சபாநாயகர் அவர்கள் அறிவித்தார்கள்.
Question put.
MR. SPEAKER, *having collected the Voices, declared that the "Ayes" had it.*

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ගරු කථානායකතුමනි, බෙදීමක් අවශ්‍යයි.

පාර්ලිමේන්තුව 43 වන ස්ථාවර නියෝගය යටතේ - පක්ෂව 164 : විරුද්ධව 01 යනුවෙන් බෙදුණේය.
பாராளுமன்றம் 43ஆம் நிலைக்கட்டளைப்படி பிரிந்தது: சார்பாக 164; எதிராக 01.
The Parliament divided under Standing Order No. 43: Ayes 164; Noes 01.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, "abstained" record කරන්න කියලා අපි ඉල්ලීමක් කරනවා. ඒ එකඟතාව නිසා තමයි "by name" ඉල්ලුවේ නැත්තේ. ඒ නිසා, give us the chance to show that we abstained from voting.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, ඒක සටහන් කර ගන්නවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මධ්‍යස්ථ හැටියට,- [බාධා කිරීම්] "පක්ෂයි" කිව්වේත් නැත්නම්, "විරුද්ධයි" කිව්වෙත් නැත්නම් ඒක "abstained" කියලා ගණන් ගන්න.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මෙතෙක් කල් පාර්ලිමේන්තුවේ සම්ප්‍රදායක් හැටියට පේළියෙන් පේළියට ඡන්දය ගන්න කොට එහෙම සටහන් කර ගත්තේ නැහැ. නමුත් අපට පුළුවන් වේවි, ඒක සටහන් කර ගන්න.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු කථානායකතුමනි, විරුද්ධව සිටින්නේ එක මන්ත්‍රීවරයකු පමණයි. එතුමාගේ අදහස ප්‍රකාශ කළා. මෙතැනදී බෙදෙන්න වුවමනාවක් නැහැ. සහයෝගය දුන්නු සියලු දෙනාටම අපි ස්තුතිවන්ත වෙනවා. විරුද්ධ නොවුණු අයටත් ස්තුතිවන්ත වෙනවා. මේක තමයි අලුත් දේශපාලන සංස්කෘතියක් ඇති කිරීමට ගත්ත පළමුවැනි පියවර. මේ දෙපැත්තේම අය දැන ගන්න ඕනෑ, තිබෙන ප්‍රශ්න ටිකෙන් ටික තුනී කර ගෙන කොහොමද එකට වැඩ කරන්නේ කියලා. ඒ වාගේම විරුද්ධ වුණු ගරු මන්ත්‍රීතුමාටත් ස්තුතිවන්ත වෙනවා. මොකද, මුළු සභාවේම ඒකමතික තීරණයක් නැහැ කියලාත්, පාර්ලිමේන්තුව ක්‍රියාත්මක වනවාය කියලාත් එතුමා පෙන්නුවා. ඒ නිසා මීට වඩා විවාද කරන්න දෙයක් නැහැ.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.
அதன்படி சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." -[ගරු රවි කරුණානායක මහතා]

தீர்மானிக்கப்பட்டது.
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக"
[மாண்புமிகு ரவி கருணாநாயக்க]

Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Ravi Karunanayake.]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[කථානායකතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் ஆராயப்பட்டது.
[சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered in Committee.
*[*MR. SPEAKER *in the Chair.]*

1 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 1 ordered to stand part of the Bill.

2 වන වගන්තිය.- (2014 අංක 41 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.)
வாசகம் 2.- (2014ஆம் ஆண்டின் 41ஆம் இலக்கச் சட்டத்தின் 2ஆம் பிரிவைத் திருத்துதல்)
CLAUSE 2.- *(Amendment of section 2 of Act, No.41 of 2014.)*

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"1 වන පිටුවේ, (1) 11 වන පේළිය සහ 12 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'වෙනුවට "රුපියල් දෙදහස් එකසිය එක් බිලියන දෙසිය අනූඑක් මිලියන පන්සිය හතළිස් අට දහසක්' යන්';

(2) "16 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'බිලියන එක් දහස් හත්සිය අසූවක් යන වචන' ";

(3) "20 වන පේළියේ සිට 22 වන පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'දහඅට දහසක්" යන වචන වෙනුවට "රුපියල් දෙදහස් එකසිය එක් බිලියන දෙසිය අනූඑක් මිලියන පන්සිය හතළිස් අට දහසක්" යන වචන ආදේශ කිරීමෙන්; සහ' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
2ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 2, as amended, ordered to stand part of the Bill.

3 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.)
வாசகம் 3.- (முதன்மைச் சட்டவாக்கத்துக்கான முதலாம் அட்டவணையை மாற்றீடு செய்தல்)
CLAUSE 3.- *(Replacement of the First Schedule to the principal enactment)*

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "6 වන පිටුවේ, 5 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'වැඩසටහන 02 සංවර්ධන වැඩසටහන 237,627,037,000 220,012,417,000' "

(2) "10 වන පිටුවේ, 6 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'වැඩසටහන 02 සංවර්ධන වැඩසටහන 52,194,000 164,800,000' "

(3) "11 වන පිටුවේ,

(1) 10 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

‘ වැඩසටහන 01 මෙහෙයුම් වැඩසටහන 45,109,150,000 5,539,790,000”

(2) 12 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න :

‘වැඩසටහන 01 මෙහෙයුම් වැඩසටහන 907,650,000 817,000,00

(3) 21 වන පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

‘වැඩසටහන 02 සංවර්ධන වැඩසටහන 77,965,000 72,150,000' "

(4) "12 වන පිටුවේ, 09 වන පේළිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'වැඩසහටන 01 මෙහෙයුම් වැඩසටහන 41,225,000 2,130,000' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendments put, and agreed to.

3 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

3ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 3, as amended, ordered to stand part of the Bill.

4වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

4ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 4 ordered to stand part of the Bill.

ගරු ලසන්ත අලගියවන්න මහතා

(மாண்புமிகு லசந்த அலகியவன்ன)

(The Hon. Lasantha Alagiyawanna)

ගරු සභාපතිතුමනි, මේ කියන සංශෝධන අපට ලබා දීලා නැහැ. ඔබතුමන්ලා සංශෝධන සම්මත කරගත්තාට ගැටලුවක් නැහැ. නමුත් ඒ සංශෝධන කල් ඇතුව අපට ලබා දෙන්න ඕනෑ. දෙවැනි වගන්තියේ සහ තුන්වැනි වගන්තියේ සංශෝධන පමණයි අපට ලබා දීලා තිබෙන කොළයේ තිබෙන්නේ.

ගරු රවි කරුණානායක මහතා

(மாண்புமிகு ரவி கருணாநாயக்க)

(The Hon. Ravi Karunanayake)

මේවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා.

සභාපතිතුමා

(தவிசாளர் அவர்கள்)

(The Chairman)

ඒක භාෂා තුනෙන්ම ඉදිරිපත් කරන කොට සිදු වුණු අතපසුවීමක්.

ගරු රවි කරුණානායක මහතා

(மாண்புமிகு ரவி கருணாநாயக்க)

(The Hon. Ravi Karunanayake)

සංශෝධන ඉදිරිපත් කර අවසන් වුණු ගමන්ම copy එකක් එවන්නම්.

5 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ තෙවන උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.)

வாசகம் 5.- (முதன்மைச் சட்டவாக்கத்திற்கான மூன்றாம் அட்டவணையை மாற்றீடு செய்தல்)

CLAUSE 5.- (*Replacement of the Third Schedule to the principal enactment.*)

ගරු රවි කරුණානායක මහතා

(மாண்புமிகு ரவி கருணாநாயக்க)

(The Hon. Ravi Karunanayake)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) “42 වන පිටුවේ, 2 වන සහ 3 වන පේළි ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'79 පුද්ගලයන් ලියා පදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව 22701 රජයේ නිලධාරින්ට අත්තිකාරම් 18,000,000 12,000,000 65,000,000' ;

(2) 42 වන පිටුවේ, 7 වන පේළියේ සිට 9 වන පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙකද ඇතුළත්ව) ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'82 බන්ධනාගාර දෙපාර්තමේන්තුව 23201 රජයේ නිලධාරින්ට අත්තිකාරම් 120,000,000 100,000,000 400,000,000'

'83 බන්ධනාගාර දෙපාර්තමේන්තුව 23202 බන්ධනාගාර කාර්මික හා කෘෂි කාර්මික කටයුතු 80,000,000 90,000,000 12,000,000 50,000,000' ;

(3) 47 වන පිටුවේ, 9 වන පේළිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'139 කෘෂිකර්ම දෙපාර්තමේන්තුව 28501 රජයේ නිලධාරින්ට අත්තිකාරම් 194,430,000 110,000,000 500,000,000' ;

(4) 49 වන පිටුවේ, 1 වන පේළිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'155 ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව 30001 රජයේ නිලධාරින්ට අත්තිකාරම් 7,000,000 3,000,000 40,000,000' ;

(5) 49 වන පිටුවේ, 8 වන පේළිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'161 ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව 30602 දුම්රිය ගබඩා අත්තිකාරම් ගිණුම 2,000,000,000 1,800,000,000 6,935,000,000 1,000,000,000' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendments put, and agreed to.

5 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

5 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 5 , as amended, ordered to stand part of the Bill.

6 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

6ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 6 ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.

Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported with Amendments.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I move,

"That the Bill, as amended, be now read the Third time."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන් තුන් වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

அதன்படி, சட்டமூலம் மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

Question put, and agreed to.
Bill, as amended, accordingly read the Third time, and passed.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

එකල්හි වේලාව අ.භා. 5.00 පසු කර තිබුණෙන් කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.40ට අද දින සභා සම්මතිය අනුව, 2015 පෙබරවාරි මස 10 වන අඟහරුවාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.

அப்பொழுது நேரம் பி.ப. 5.00 மணிக்குப் பிந்திவிட்டமையால் சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

அதன்படி, பி.ப. 5.40க்கு பாராளுமன்றம், அதனது இன்றைய தீர்மானத்துக்கிணங்க 2015 பெப்ருவரி 10, செவ்வாய்க்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.

It being past 5.00 p.m., MR. SPEAKER *adjourned Parliament without Question put.*

Adjourned accordingly at 5.40 p.m. until 9.30 a.m. on Tuesday,10th February, 2015, pursuant to the Resolution of Parliament of this Day.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

232 වන කාණ්ඩය - 8 වන කලාපය
தொகுதி 232 - இல. 8
Volume 232 - No. 8

2015 පෙබරවාරි 10වන අඟහරුවාදා
2015 பெப்ருவரி 10, செவ்வாய்க்கிழமை
Tuesday, 10th February, 2015

පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:

දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය

කථානායකතුමාගේ සහතිකය

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:

වරාය නගර ව්‍යාපෘතියේ වත්මන් තත්ත්වය

දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත:

පළමුවන වර කියවන ලදී

කල් තැබීමේ යෝජනාව:

පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා

பிரதான உள்ளடக்கம்

அறிவிப்புக்கள்:

புகையிலை மற்றும் மதுசாரம் மீதான தேசிய அதிகாரசபை (திருத்தம்) சட்டமூலம் : உயர் நீதிமன்றத் தீர்ப்பு

சபாநாயகரது சான்றுரை

அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவின் அறிக்கை

தனி அறிவித்தல் மூல வினா:

துறைமுக நகரக் கருத்திட்டத்தின் தற்போதைய நிலைமை

புகையிலை மற்றும் மதுசாரம் மீதான தேசிய அதிகாரசபை (திருத்தம்) சட்டமூலம் :

முதன்முறை மதிப்பிடப்பட்டது

ஒத்திவைப்புப் பிரேரணை:

தேர்தலுக்குப் பிந்திய வன்செயல்கள்

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

National Authority on Tobacco and Alcohol (Amendment) Bill: Determination of the Supreme Court

Speaker's Certificate

REPORT OF COMMITTEE ON PUBLIC ACCOUNTS

QUESTION BY PRIVATE NOTICE:

Present Situation of Port City Project

NATIONAL AUTHORITY ON TOBACCO AND ALCOHOL (AMENDMENT) BILL:

Read the First Time

ADJOURNMENT MOTION:

Post-Election Violence

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2015 පෙබරවාරි 10වන අඟහරුවාදා
2015 பெப்ருவரி 10, செவ்வாய்க்கிழமை
Tuesday, 10th February, 2015

පූ. භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

I

දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත : ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය
புகையிலை மற்றும் மதுசாரம் மீதான தேசிய அதிகாரசபை (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றத் தீர்ப்பு
NATIONAL AUTHORITY ON TOBACCO AND ALCOHOL (AMENDMENT) BILL : DETERMINATION OF THE SUPREME COURT

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

"දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත පිළිබඳව නිවේදනයක් කරනු කැමැත්තෙමි.

ජාතියේ හිත සුව පිණිස වහා අවශ්‍ය යැයි අමාත්‍ය මණ්ඩලය විසින් සහතික කරනු ලැබූ මෙම පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122 (1) (ආ) ව්‍යවස්ථාව ප්‍රකාර අතිගරු ජනාධිපතිතුමා විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කරනු ලැබීය.

එකී පනත් කෙටුම්පත හෝ එහි විධිවිධාන කිසිවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල නොවන බවට 123 ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර ඇති බව දන්වනු කැමැත්තෙමි.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතු යැයි මම නියෝග කරමි.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය :
உயர் நீதிமன்றத் தீர்ப்பு:
Determination of the Supreme Court:

IN THE SUPREME COURT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA

S.C. (SD) No. 2 / 2015.

In the matter of a reference in terms of Article 122 (1) (b) of the Constitution

"An Act to Amend the National Authority on Tobacco and Alcohol Act, No. 27 of 2006"

BEFORE :

K. Sripavan	-	Chief Justice
Sisira J. de Abrew,	-	Judge of the Supreme Court, and
Priyantha Jayawardena, PC	-	Judge of the Supreme Court

Counsel : Janak de Silva, Deputy Solicitor-General, with Anusha Fernando SSC and Suranga Wimalasena SSC for the Attorney-General

Faisz Musthapha PC with Faisza Markar, Manoj Bandara, Lakshana Perera and Mehran Casseem for Ceylon Tobacco Company PLC. Mr. Musthapha was permitted to make submissions in respect of the Bill.

The Court assembled for the hearing at 10.45 a.m. on 6th February, 2015.

A Bill titled " AN ACT TO AMEND THE NATIONAL AUTHORITY ON TOBACCO AND ALCOHOL ACT, NO. 27 of 2006 " has been referred to the Chief Justice by His Excellency the President in terms of Article 122(1) (b) of the Constitution for special determination of this court as to whether the Bill or any provision thereof is inconsistent with the Constitution. The Bill bears an endorsement under the hand of the Secretary to the Cabinet of Ministers to the effect that the Cabinet of Ministers has certified that in its view, the Bill is urgent in the national interest.

Janak de Silva, Deputy Solicitor-General with Anusha Fernando SSC and Suranga Wimalasena SSC appeared on behalf of the Attorney-General and assisted this Court in the consideration of the provisions of the Bill.

Mr. Faisz Musthapha, P.C. sought to intervene on behalf of Ceylon Tobacco PLC on the basis that Ceylon Tobacco PLC is directly affected by the amendments sought by the Bill. The Court gave a hearing to Mr. Musthapha in terms of Article 134(3) of the Constitution.

The Bill seeks to amend Section 34 of the National Authority on Tobacco and Alcohol Act, No. 27 of 2006 in order to comply with Article 11 of Frame work Convention on Tobacco Control (FCTC) on the basis of national interest to comply more effectively with the international obligation of Sri Lanka with a view to protect public health.

The proposed amendment seeks to make the following changes to Act No. 27 of 2006.

(a) It repeals Section 34 of the said Act and substitutes a new Section,

(b) A new Section 34A is inserted immediately after Section 34 of the principal enactment.

The amendments made by (a) and (b) above must be read together to understand the changes sought to be made to the said Act. Section 34(1) of the said Act as it stands now does not specify the size of the pictorial health warning contemplated therein. The size of the pictorial health warning was specified by the Minister of Health by regulations made under Sections 30 read with 34 of the said Act. The two amendments explained above are intended to impose 80% as the size of the pictorial health warning by the main Act itself. The amendment also increases the maximum fine to Rs. 50,000/= from Rs. 2,000/=.

(c) Section 45 of the principal enactment is amended by adding the definition of "health warnings",

(d) Manufacturers and importers of existing tobacco products are granted a grace period to comply with the provisions of the amendment.

(e) Regulations already made in terms of Section 34 of the principal enactment prior to February 1, 2015 are kept alive in so far as they are not inconsistent with the provisions of the amendment.

At the hearing before Court, Mr. Janak de Silva suggested the following amendments to the Clause 2 of the Bill;

The amended Clause was made available to both the Court and Mr. Musthapha and it was agreed that submissions be restricted to the amended formulation. The re-formulation of Clause 34 as drafted by the Legal Draftsman and submitted to Court is as follows:

Existing Clause 2 of the Bill shall be replaced with the following:-

" 34 (1) A manufacturer or an importer of a tobacco product shall cause to be displayed conspicuously and in legible print-

(a) on the top surface area of both front and back sides of every packet, package or carton containing the tobacco product manufactured or imported by such

[ගරු නියෝජ්‍ය කථානායකතුමා]

manufacturer or importer, such health warnings, as may be prescribed, subject to the provisions of section 34A; and

(b) on every packet, package or carton containing the tobacco product manufactured or imported by such manufacturer or importer, a label or a statement specifying the tar and nicotine content in each tobacco product in such packet, package or carton.

(2) A person shall not sell, offer for sale, supply, distribute or store a packet, package or carton containing tobacco products unless a health warning as provided for in subsection (1) (a) and a label or a statement specifying the tar and nicotine content in each such product as provided for in subsection (1) (b), are displayed conspicuously in legible print on every packet, package or carton containing the tobacco products.

(3) Any person who contravenes the provisions of subsection (1) or subsection (2) commits an offence and upon conviction after summary trial by a Magistrate be liable to an imprisonment of either description for a term not exceeding one year or to a fine not exceeding rupees fifty thousand or to both such fine and imprisonment."

He further submitted that the words " and shall come into operation with effect from February 1, 2015 " in Clause 1 will be deleted as the said date has now passed and the Bill is not intended to be passed with retrospective effect.

Mr. de Silva further submitted that the aforesaid suggested amendments to the Bill can be moved at a Committee stage in Parliament to replace Clauses 1 and 2 of the Bill. He thus argued that effect must be given to Framework Convention on Tobacco Control as Sri Lanka has already signed and ratified the said Treaty.

Mr. de Silva drew the attention of Court to the WHO Framework Convention on Tobacco Control. He drew the attention of Court to Article 2.1 and Article 5.2 of the WHO Framework Convention on Tobacco Control.

"Article 2.1

In order to better protect human health, Parties are encouraged to implement measures beyond those required by this Convention and its protocols, and nothing in these instruments shall prevent a Party from imposing stricter requirements that are consistent with their provisions and are in accordance with international law."

"Article 5.2

Towards this end, each Party shall, in accordance with its capabilities:

(a) establish or reinforce and finance a national coordinating mechanism or focal points for tobacco control; and

(b) adopt and implement effective legislative, executive, administrative and/or other measures and cooperate, as appropriate, with other Parties, in developing appropriate policies for preventing and reducing tobacco consumption, nicotine addiction and exposure to tobacco smoke."

In the determination of S.C. (S.D.) No. 13 – 22/05 (National Authority on Tobacco and Alcohol Bill) it was held that " the Petitioners who are from the alcohol and tobacco industries and trade do not dispute the findings disclosed in these publications that manage from specialized Agencies of the United Nations; their contention is that the health risk of the illicit trade is far worse and the restrictions sought be placed on the lawful trade would aggravate the health risk resulting from the illicit trade. This argument fails to account for the basic premise that the harmful impact of alcohol, tobacco and for that matter drug, whether the source of supply of such substance is lawful or illicit, is a common pattern of use, addiction and dependence. Undoubtedly, the health risk of illicit use is worse. But, the behavioural tendency of use, addiction and dependence being the same, the lawful trade and the illicit trade would have the effect aggravating such behavioural tendency. The user would have recourse to the licensed sources as well as illicit sources when the behavioural trend is set in motion. Hence, from the point of public health, there is a harmful interlink. The likely pattern is that addiction will start from the licensed source and get aggravated in the fold of the illicit trade. The illicit trade is per se contrary to law, punishable under various statutes and there is no question of regulating an illicit trade. On the contrary the trade that is carried out on the basis of a license or authority of the law, which is found to be harmful to public health should necessarily be subject to restraint in order to minimize the harmful consequences to public health. "

Mr. de Silva drew the attention of the Court to an International Status Report – September 2014 (Fourth Edition) published by the Canadian Cancer Society. Page 2 of the said report contains the following details;

" The top countries in terms of warning size as an average of the front and back:

1. 85% Thailand (85% of front, 90% of back)
2. 82.5% Australia (75%, 90%)
3. 80% Uruguay (80%, 80%)
4. 75% Brunei (75%, 75%)
4. 75% Canada (75%, 75%)
4. 75% Nepal (75%, 75%)
7. 65% Togo (65%, 65%)
7. 65% Turkey (65%, 65%)
7. 65% Turkmenistan (65%, 65%)
10. 65% Mauritius (60%, 70%)
11. 65% Mexico (30%, 100%)
11. 65% Venezuela (30%, 100%) "

Page 7 of the said report states " Effective package warnings increase awareness of the health effects and reduce tobacco use. As a result of health warnings, consumers receive more information, not less. Consumers are entitled to be fully informed of the many health effects of tobacco products, and the package is the best way to do that. Studies show that consumers, including children, underestimate the health effects, in low, middle and high income countries. "

Mr. Musthapha relied on the judgment of the Court of Appeal in C.A. Writ Application No. 336/12 (C.A. Minutes of 12.05.14) and sought to argue that the pictorial health warning covering 80% of the front and back side of a packet was unreasonable and is violation of the vested right to use the trade and enshrined in Section 121(1) of the Code of Intellectual Property Act.

This Court is now exercising its constitutional jurisdiction by virtue of a reference made by His Excellency the President in terms of Article 122(1)(b). The submission of the learned President's Counsel that the amendments sought to be made would affect the decision of the Court of Appeal in Writ Application No. 336/12 is misconceived as this Court is exercising sole and exclusive jurisdiction to determine any question as to whether the Bill or any provision thereof is inconsistent with the Constitution. One of the objects of Act No. 27 of 2006 as stated in the preamble to the said Act is to "identify the policy on protecting public health in order to eliminate harms relating to tobacco and alcohol". A policy once formulated is not good for ever. The Government has the power to change the policy. The executive power is not limited to frame a particular policy. It has untrammelled power to change, re-change, adjust and readjust the policy taking into account the relevant and germane considerations. It is entirely in the discretion of the Government how a policy should be shaped. It should not however be arbitrary and capricious. As rightly submitted by Mr. Faisz Musthapha "to declare what the law is, or has been, is a judicial power; to declare what the law shall be, is legislative." Thus, the covering the area of 80% of both front and back sides of every packet, package or carton contacting cigarettes

5

and other tobacco products cannot be considered arbitrary and capricious. In this context it may be appropriate to reproduce the observation made by this Court in S.C. (S.D.) No. 13-22/05 (National Authority on Tobacco and Alcohol Bill) which reads thus:-

" In this connection we cite the observations made by Supreme Court of India in the case of Vincent vs Union of India 1987 All India Reporter – S.C. 1 – page 990 at page 995 which reads as follows:

"……maintenance and improvement of public health have to rank high as these are indispensable to the very physical existence of the community and on the betterment of these depends the building of the society of which the Constitution makers envisaged. Attending to public health, in our opinion, therefore, is of high priority – perhaps the one at the top."

Ceylon Tobacco Company PLC in the Writ Application urged that the regulations formulated under Act No. 27 of 2006 with regard to pictorial warnings were ultra vires, since the said Act does not empower the Minister to make such regulations. The said argument was rejected by the Court of Appeal. The Court of Appeal in its judgment held that Section 30 read with Section 34 of the said Act enables the Minister to prescribe pictorial health warnings by way of subordinate legislation. Hence, this Court does not see any violation based on the judgment of the Court of Appeal.

Mr. Musthapha sought to argue that the change of policy is likely to frustrate the legitimate expectation of Ceylon Tobacco Company PLC and has an important bearing on the protection afforded by Article 12 of the Constitution. Once the Government lays down a policy it has to follow it uniformly. Government cannot resort to such policy in certain cases where it likes and depart from the said policy as it chooses. Having laid down a definite policy if the Government pick and choose by an irrational method certain traders only, than that would amount to an arbitrary action violative of Article 12. The legitimate entitlement of Ceylon Tobacco Company PLC to continue to engage in lawful trade and to use its trade mark as provided in the Intellectual Property Act has not been hindered by the proposed amendments. Thus, the Court does not see any violation of Article 12 and/or 14(1)(g) of the Constitution. The grace period given in Clause 5 in order to comply with the provisions of Section 34A is reasonable in its operation and the Court would hesitate to intervene and strike down what the Government has proposed. This Court cannot strike down a decision to grant a grace period only up to 1st June, 2015. The Court can interfere only if the policy decision is patently arbitrary, discriminatory or mala fide.

Mr. Janak de Silva submitted that the provisions of the Bill do not violate any Article of the Constitution. We are inclined to agree with the submission made by Mr. Janak de Silva.

We have considered the amendments sought to be made and are of the opinion that the proposed amendments are within the legislative powers of the Parliament and do not violate any of the provisions of the Constitution.

We accordingly determine that neither the Bill nor any provision thereof is inconsistent with the Constitution.

In conclusion we wish to place on record our appreciation for the valuable assistance rendered by the Deputy Solicitor General and the learned President's Counsel.

K. SRIPAVAN
CHIEF JUSTICE

SISIRA J. DE ABREW
JUDGE OF THE SUPREME COURT

PRIYANTHA JAYAWARDENE, PC
JUDGE OF THE SUPREME COURT

II

කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79වැනි ව්‍යවස්ථාව අනුව, 2015 පෙබරවාරි මස 07වන දින ගරු කථානායකතුමා විසින් විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

III

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
COMMITTEE ON PARLIAMENTARY BUSINESS

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2015 පෙබරවාරි මස 10වන අඟහරුවාදා, එනම් අද දින පෙර වරු 10.30ට ගරු කථානායකතුමාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින් ඊට පැමිණ සහභාගි වන ලෙස සියලු ගරු සභික මන්ත්‍රීවරුන් වෙත දැනුම් දීමට කැමැත්තෙමි.

මීළඟට කාරක සභා වාර්තා පිළිගැන්වීම - හත්වන පාර්ලිමේන්තුවේ පළමුවැනි සැසි වාරය සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ දෙවැනි වාර්තාව එම කාරක සභාවේ සභාපති ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා විසින් පිළිගැන්වීම.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவின் அறிக்கை
REPORT OF COMMITTEE ON PUBLIC ACCOUNTS

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හත්වන පාර්ලිමේන්තුවේ පළමුවැනි සැසිවාරය සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ දෙවැනි වාර්තාව මම ඉදිරිපත් කරනවා.

මේ අවස්ථාවේදී සිරිත් පරිදි වචන ස්වල්පයක් කථා කිරීමටත් මම බලාපොරොත්තු වෙනවා.

හත්වන පාර්ලිමේන්තුවේ පළමුවැනි සැසිවාරය වෙනුවෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ දෙවැනි වාර්තාව 2015 පෙබරවාරි මස 10වන දින -අද දින- එකී කාරක සභාවේ සභාපති වශයෙන් මා විසින් ස්ථාවර නියෝග අංක 125 යටතේ පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනවා.

2010 මැයි මස 20වන දින හත්වන පාර්ලිමේන්තුවේ පළමු සැසිවාරය සඳහා තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව 2010 ජූනි මස 08වන දින ප්‍රථම වරට රැස්වීමෙන් අනතුරුව හැකි සෑම රැස්වීම් දිනයකදීම රැස්වී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 125 ප්‍රකාරව රජයේ ආයතනවල ගිණුම් විභාග කරන ලදී. එම වාර්තාවෙන් 2012 ජනවාරි මස 17වන දින සිට 2012 ඔක්තෝබර් මස 25වන දින දක්වා වූ කාල සීමාව තුළ 2005 සිට 2010 දක්වා පළ වූ විගණකාධිපතිගේ වාර්තාවන්හි දැක්වුණු විගණන ඡේද මත පදනමට විමර්ශනය කරන ලද අමාත්‍යාංශ 17ක්, දෙපාර්තමේන්තු 15ක්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල 10ක් ඇතුළු රාජ්‍ය ආයතන 48ක් ආවරණය කර ඇත.

වාර්තාවේ පරිශිෂ්ට අංක 01 යටතේ කාරක සභාව විසින් විමර්ශනය කරන ලද රාජ්‍ය ආයතනයන්හි පොදුවේ දක්නට ලැබුණු කරුණු සාමාන්‍ය නිරීක්ෂණ ලෙස ඉදිරිපත් කර ඇත. පරිශිෂ්ට අංක 02 යටතේ එක් එක් රජයේ ආයතන සම්බන්ධයෙන් කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද ඌනතා, අඩු පාඩු සහ නිවැරදි කළ යුතු මූල්‍ය හා පරිපාලන කටයුතු ගෙන හැර දක්වා ඇත.

මූල්‍ය කළමනාකරණය සහ පරිපාලන කටයුතු සමබර ආකාරයෙන් පවත්වා ගෙන යමින් රාජ්‍ය ප්‍රතිපත්ති කාර්යක්ෂමව ඉටු කිරීම සෑම ආයතන ප්‍රධානියෙකුගේම වගකීම වෙයි. විගණකාධිපතිවරයාගේ වාර්තාවේ වැඩි අවධානයක් රාජ්‍ය ආයතනයන්හි මූල්‍ය කළමනාකරණය වෙත යොමු කළද, කාරක සභාවේ විමර්ශන කටයුතුවලදී වත්මන් කාර්ය සාධනය පිළිබඳවද ඒ හා සමාන අවධානයක් යොමු කිරීම සිදු වේ. පාර්ලිමේන්තුවට මහජන මුදල් පාලනය කිරීමට ඇති බලය සුරක්ෂිත වන අන්දමින් සහ ශ්‍රී ලාංකික පුරවැසියන්හට විශිෂ්ඨ ප්‍රතිලාභ ගලා යෑමේ හැකියාව ඇති වන පරිදි රාජ්‍ය ආයතනයන්හි කළමනාකරණය, කාර්ය සාධනය හා වගකීම මැන බැලීමේ ක්‍රමවේදයන් වෙනස් විය යුතුය.

නිරීක්ෂණ මඟින් හඳුනා ගත් අඩු පාඩු රජයේ ආයතනයන්හි සඵලදායි ක්‍රියාකාරිත්වය මත අහිතකර බලපෑමක් ඇති කරන බැවින් විමර්ශන අවස්ථාවේදී කාරක සභාව යෝජනා කරන නව

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

මූල්‍ය හා පරිපාලන කළමනාකරණ ප්‍රතිපත්ති යහපත් ආකාරයෙන් පිළිගනු ඇතැයි අපේක්ෂා කෙරේ. එසේම කාරක සභාව විසින් විවිධ අවස්ථාවලදී ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ පසු විපරම් ක්‍රියාත්මක කිරීම අනුගමනය කිරීමේ වැදගත්කම හා අනිවාර්ය බව මෙහි ලා අවධාරණය කරමි. කාරක සභාව විසින් ලබා දෙන නිර්දේශ, නියෝග මෙන්ම විශේෂිත පුද්ගල හා ආයතනික ඇගැයුම් පිළිබඳව ධනාත්මකව විග්‍රහ කොට තම ආයතනයන්හි දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගනු ඇතැයි යන අරමුණ පෙරදැරිව රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව මා ඉදිරිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රධාන ප්‍රශ්න කිහිපයක් පිළිබඳව තව වචනයක් දෙකක් මම කථා කරන්න ඕනෑ. මොකද, මේ දින 100 තුළ නව විගණක පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන එක පිළිබඳව අපි සියලු දෙනාටම සතුටුයි. අපිත් ඒක නිර්දේශ කර තිබෙනවා. ඒකට අපිත් කැමැතියි. සියයට 100ක්ම නොවෙයි, බොහෝ දුරට ප්‍රධාන ප්‍රශ්න වන්නේ අපේ විගණන ක්‍රමය, *post facto* analysis එකක් වීමයි. ඒ කියන්නේ, යම්කිසි සිද්ධියක් වෙලා, ඊට පස්සේ ඒ සම්බන්ධයෙන් විගණනය කරලා, විගණකාධිපතිතුමාගේ වාර්තාවට ඒ සිද්ධිය ඇතුළත් වුණාට පස්සේ තමයි ඒ පිළිබඳව සාකච්ඡා කරන්න අපේ Committee එකට ඉදිරිපත් වන්නේ. ඒ වන විට බොහෝ දේවල් වෙලා අවසන්. මුදල් වැය වෙලා තිබෙනවා, නිලධාරීන් මාරු වෙලා තිබෙනවා, වගකීම පිළිබඳ ප්‍රශ්න ඇති වනවා. ඇත්ත වශයෙන්ම මෙය postmortem එකක් වාගෙයි; ලෙඩා මැරුණාට පස්සේ හේතු මොනවාද කියලා බලනවා වාගේ වැඩක්. ඒකෙන් එතරම් ප්‍රයෝජනයක් නැහැ. විශේෂයෙන් නිලධාරීන් එහෙන් මෙහෙන් මාරු කිරීම - turn-over - නිසා බොහෝ දුරට අපේ Committees වලට - COPE එකට වෙන්න පුළුවන්, Public Accounts Committee එකට වෙන්න පුළුවන් - එන නිලධාරියා අලුත් කෙනෙක් වෙන්න පුළුවන්. බොහෝ විට ඒ නිලධාරියා කරුණු කියන්න පටන් ගන්නේ, "මේ ගැන මට නම් එතරම් දැනුමක් නැහැ"යි කියලායි. ඒ තුළ පාලනය පිළිබඳ විවේචනයක් තිබෙනවා. අපේ ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා මේ සම්බන්ධයෙන් හොඳට දන්නවා. එතුමා දීර්ඝ කාලයක් මේ Committeesවල වැඩ කරලා තිබෙනවා. බොහෝ විට මේ තත්ත්වය frustrating. එතකොට අපට ඒ සම්බන්ධයෙන් මැදිහත් වීම අමාරු වනවා. මොකද, ඒ වන විට බොහෝ විට ඒ වැරදි කාර්යයන් සිද්ධ වෙලා ඉවරයි.

ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, ESCAP යන හැම ආයතනයකම තිබෙනවා, යහ පාලනය පිළිබඳ ආයතන. ඒ තුළින් පර්යේෂණ කරනවා, සම්මන්ත්‍රණ පවත්වනවා. අපි ඒවාට සහභාගි වෙලා නිර්දේශ ඉදිරිපත් කරලා තිබෙනවා. මේ දින 100 තුළ ඒ විගණක පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කරන අවස්ථාවේදී අපට ඒ නිරීක්ෂණත් අදාළ කර ගන්න පුළුවන් වෙයි කියලා මා බලාපොරොත්තු වෙනවා.

මට පෙනෙන දෙවන කාරණාව මෙයයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. බොහෝ දුරට අමාත්‍යාංශයේ ලේකම්තුමා සහ පරිපාලනය මේ ගිණුම්වල වටිනාකම අවබෝධ කර ගන්නේ නැහැ. ඒ ගොල්ලෝ ක්ෂණික පරිපාලන ප්‍රශ්නවලට මැදිහත් වන නිසා, ඒ ගොල්ලන්ට ව්‍යවස්ථාවෙන් සුවිශේෂ වශයෙන් දී තිබෙන කාර්යය, ඒ කියන්නේ මුදල් පිළිබඳ වගකීම බොහෝ විට අපට පිළිගන්න පුළුවන් ආකාරයට සිද්ධ වන්නේ නැහැ.

තමුන්නාන්සේලා දන්නවා, විගණන ක්‍රියා මාර්ගය පිළිබඳව. ඉස්සෙල්ලාම ඒ ආයතනය තුළ audit එකක් කරනවා. ඊට පස්සේ ඒ ගොල්ලෝ ඒ ආයතනයේ ලේකම්තුමාත් එක්ක සාකච්ඡා කරනවා. ඊට පස්සේ ඒ වාර්තාව Auditor-General වෙත ඉදිරිපත් කරනවා. Auditor-General එතුමාගේ වාර්තාවට ඇතුළත් කරන්න හුඟක් ඉස්සෙල්ලා ඒ ලේකම්තුමාට කියනවා, "අපි මෙහි තිබෙන අඩු පාඩු සම්බන්ධයෙන් ඔබතුමාත් එක්ක සාකච්ඡා කරන්න ඕනෑ"යි කියලා. "මොකක්ද වෙලා තිබෙන්නේ? මේක හරිද, වැරැදිද?" කියලා විගණන විමසුම් ඡේදවලට එතුමාගෙන් පිළිතුරු සොයනවා. යම් කරුණක් විගණනය තුළින් ප්‍රශ්නයක් ලෙස පෙනුණාට, බොහෝ අවස්ථාවල ඒ විමසුම්වලින් සියයට 50ක්, සියයට 60ක් සාධාරණීකරණය කරන්න පුළුවන්. එහෙම නැත්නම් පසුව නිකුත් කරන චක්‍රලේඛ යනාදියෙන් ඒවා ආවරණය කරන්න පුළුවන්. නමුත් ඒ සංවාදය බොහෝ දුරට සිද්ධ වන්නේ නැහැ. බොහෝ විට අතිරේක ලේකම් කෙනකුට හෝ සහකාර ලේකම් කෙනකුට හෝ තමන්ගේ කාර්යාලයේ ඉන්න ගණකාධිකාරිවරයාට මේ කටයුතු භාර දීලා නිකම් ඉන්නවා. ඒ ලේකම්තුමාගේ පිළිතුර ගැන විගණකාධිපතිතුමා සෑහීමකට පත් වුණේ නැත්නම් විතරයි එතුමාගේ වාර්තාවේ විගණන විමසුමක් හැටියට ඒ කරුණ ඉදිරිපත් වන්නේ.

විගණකාධිපතිතුමාට ඒ ලේකම්තුමාගේ හේතු දැක්වීම - explanation එක - පිළිගන්න පුළුවන් නම් ඒ කරුණ බැහැර කරනවා; he strikes it off his list. දෙන්නා කරුණු හඳුනා ගෙන, ලේකම්වරයා දෙන සාක්ෂි, කරුණු පිළිගන්නට පුළුවන් කියලා හිතනවා නම්, it does not proceed to be entered into the Audit Report.

ගරු ඇමතිතුමා, මෙතැනදී අද මට පෙනෙන දෙයක් තමයි, සංවාදය තිබෙන නිසා සියලුම ලට්ට පට්ට මේ කාරක සභාවටලට ඇතුළත් වනවායි කියන කාරණය. ඒ අනුව COPE එකට සහ PAC එකට ලොකු ප්‍රශ්නවලට වාගේම ඉතාම සුළු ප්‍රශ්නවලටත් මැදිහත් වෙන්නට සිදු වෙනවා. ඊට වඩා හොඳයි, මේ සංවාදය හරියට පවත්වලා, විගණකාධිපතිවරයා සහ එතුමාගේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් අදාළ ලේකම්වරයා සමඟ ඉහළම මට්ටමින් සම්පූර්ණ විමර්ශනයක් කරලා, අවශ්‍ය දේවල් පමණක් විගණන වාර්තාවට ඇතුළත් කිරීමට යවලා, අනවශ්‍ය දේවල් ඊට පහළ මට්ටමේදී විසඳා ගන්නට පුළුවන් නම්. අද ඒ ක්‍රියා මාර්ගය සිදු වෙන්නේ නැහැ. මමයි ගරු ඩිව් ගුණසේකර මැතිතුමායි එකතු වෙලා අමාත්‍යාංශවල සියලුම ලේකම්වරුන් කැඳවූවා. මම කියන්නට ඕනෑ, ඒ අවස්ථාවේදී පී.බී. ජයසුන්දර මහත්මයාත් විශාල සේවයක් කළ බව. අපි ඒ අයත් සමඟ සාකච්ඡා කරලා ව්‍යවස්ථානුකූල තත්ත්වය මේකයි, නීතිය මේකයි, ඔබතුමාගේ වගකීම මේකයි කියලා සියල්ලම කිව්වා. නමුත්, අපිත් ලොකු වැරැද්දක් කරනවා. ලේකම්වරුන්ව එහාට මෙහාට මාරු කරනවා. අද ඉන්න ලේකම් නොවෙයි හෙට. අද ඉන්න දිසාපතිවරයා නොවෙයි හෙට. එතකොට, වගකීම දරන්නට ස්ථාවරභාවයක් නැහැ. ලේකම්වරයා හිටියත් ඔහුගේ නිලධාරීන්ව මාරු කරනවා. ඒ නිසා මේ කාරණයත් අපි විගණන පනත් කෙටුම්පත සාකච්ඡා කරන වෙලාවේ සැලකිල්ලට ගන්නට ඕනෑ. ඒක අත්‍යවශ්‍ය කාරණයක්.

අවසාන වශයෙන් මම කියන්නට ඕනෑ කාරණය මෙයයි. COPE එකයි, Public Accounts Committee එකයි දෙකම තිබෙන්නේ කරුණු සොයා බැලීමට, fact-finding bodies වශයෙන්. කරුණු සොයලා අපි ආපහු ලේකම්ට භාර දෙන්න ඕනෑ, ලේකම්වරයාට ඒ ගැන කටයුතු කරන්නට. පාර්ලිමේන්තුවට වාර්තා කරලා, අපේ වාර්තාව ලේකම්තුමාට කල් තියා දන්වලා කටයුතු කරන්නට කිව්වාට, ඒ සඳහා අවශ්‍ය හයිය සහ උනන්දුව නැත්නම් ඒ චක්‍රය සම්පූර්ණ වෙන්නේ නැහැ. දැන් අපේ ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා කිව්වා වාගේ, COPE එකෙන් කියනවා, PAC එකෙන් කියනවා. නමුත් අවසානයේ මොකද වෙන්නේ කියලා ජනතාව තුළ විමතියක් ඇති වෙනවා.

ඇත්ත වශයෙන්ම මම ඔබතුමන්ලාට ප්‍රසංශා කරන්නට ඕනෑ, නව විගණන පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීම ගැන. දෙපැත්තේම අය ඒ ගැන සාකච්ඡා කරලා හොඳ විසඳුමක් ලබා දෙන්න අපට පුළුවන් වෙයි කියලා බලාපොරොත්තු වෙනවා. බොහොම ස්තූතියි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Plantation Industries and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු කරුපයියා වේලායුදම් මහතා (වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கருப்பையா வேலாயுதம் - பெருந்தோட்டக் கைத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Karuppaiah Velayudam - State Minister of Plantation Industries)

Hon. Deputy Speaker, I present the following petitions:

1. A petition from Mr. A.R. Samithadasa of No. 248 C, Athurugiriya Road, Malapalla, Kottawa;
2. A petition from Mr. B.T. Thilakasiri of Supply Stores, Sri Lanka Insurance Corporation Limited, Union Place, Colombo 02;
3. A petition from Mr. G.R.S. Perera of No. 78/A/4, Sooriyapaluwa, Kadawatha;
4. A petition from Mr. K.A.K. Nanayakkara of Sri Lanka Insurance Corporation Limited, Regional Office, Galle;
5. A petition from Mr. L.G. Dayarathne of No. 158/01 A, Jayagath Mawatha, Hokandara North, Hokandara;
6. A petition from Mr. M.K. Saliya Silva of No. 317, Horana Road, Wekada, Panadura;
7. A petition from Mr. Sampath Narangoda of No. 24, Circular Road, Mount Lavinia;
8. A petition from Mr. T.W. Perera of No. 573 A, Halgahadeniya, Kalapaluwawa, Rajagiriya;
9. A petition from Mr. W.A.A.J. Perera of Sri Lanka Insurance Corporation Limited, Horana Branch;
10. A petition from Mr. W.K.S. Fernando of No. 29/16, Sri Ananda Vihara Bodhi Mawatha, Angulana, Moratuwa;
11. A petition from Mrs. A.U. Monika Dilani of No. 21/A, Old Veyangoda, Nittambuwa;
12. A petition from Mrs. D.M. Munasinghe of No. 307, Veyangoda Road, Minuwangoda.
13. A petition from Mrs. S. Gunathilake of Sri Lanka Insurance Corporation Limited, Ambalangoda Branch.
14. A petition from Mrs. V.K. Beddage of No. 34/1, Gamage Waththa, Bope, Padukka.
15. A petition from Mrs. W.D.D.M. Dissanayake of Sri Lanka Insurance Corporation Limited, Kalutara Branch.

ගරු සී.බී. රත්නායක මහතා
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම වලපනේ, නුවර පාර, අංක 39 දරන ස්ථානයෙහි පදිංචි එම්. නිහාල් කුරේ මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඉමදූව, ගල්කඩුව, මානිගෙවත්ත, "සම්පත්" යන ලිපිනයෙහි පදිංචි චමරි ප්‍රියංගිකා මලවිපතිරණ මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා - පැමිණ නැත.

ගරු මනුෂ නානායක්කාර මහතා
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගාල්ල, උනන්විටිය, වාඩුවැලිවිටිය, පූවේගොඩවත්ත යන ලිපිනයෙහි පදිංචි රාජා නානායක්කාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා - පැමිණ නැත.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

වරාය නගර ව්‍යාපෘතියේ වත්මන් තත්ත්වය
துறைமுக நகரக் கருத்திட்டத்தின் தற்போதைய நிலைமை
PRESENT SITUATION OF PORT CITY PROJECT

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா- எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Nimal Siripala de Silva - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 23(2) ස්ථාවර නියෝගය යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මා ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

වරාය නගර ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යාමට වත්මන් රජය තීරණය කර ඇතැයි කැබිනට් ප්‍රකාශක ගරු රාජිත සේනාරත්න අමාත්‍යතුමා ප්‍රකාශ කළ බවට මාධ්‍ය වාර්තා පළ වී ඇති හෙයින්, ඒ පිළිබඳව චීන ජනාධිපතිතුමාගේ විශේෂ නියෝජිතයා ලෙස පැමිණි එරට සහකාර විදේශ අමාත්‍ය ලියු ජියාන් චෝවු මහතා විදේශ අමාත්‍ය ගරු මංගල සමරවීර මහතා හමු වූ අවස්ථාවේදී විමසා ඇති බව වාර්තා වී ඇති හෙයින්ද,

මෙම ව්‍යාපෘතිය පිළිබඳ විවිධ පරස්පරවිරෝධී ප්‍රකාශයන් දැනට පළ වී ඇති බව පෙනෙන හෙයින්ද;

(1) වරාය නගර ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යාමට තීරණය කර ඇත්ද යන්නත්;

(2) එසේ නොමැති නම් එම ව්‍යාපෘතිය පිළිබඳව රජයේ ස්ථාවරය කුමක්ද යන්නත් ගරු අග්‍රාමාත්‍යතුමා මෙම ගරු සභාවට

පැහැදිලි කර දෙන්නේද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට ලබන සතියේ 18 වැනි දා පිළිතුරු දෙනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා කළ නිවේදනයක් අනුව අවසර දෙනවා නම් සභානායකතුමා පිළිතුරු දෙනු ඇතැයි අපි හිතනවා. අමාත්‍ය මණ්ඩලය ශ්‍රේෂ්ඨාධිකරණයට හදිසි පනත් කෙටුම්පතක් යොමු කිරීමේදී එහි පිටපතක් විරුද්ධ පක්ෂයේ නායකතුමාට ලබා දීමටත්, එමඟින් විරුද්ධ පක්ෂයේ අනික් පක්ෂවල නායකයන්ටත් එහි පිටපතක් ලබා දීමට කටයුතු කරනවාය කියා, පක්ෂ නායක කමිටුවේදී එකඟතාවකට පැමිණියා. එය අපි මේ පාර්ලිමේන්තුවේ දිගටම අනුගමනය කළ සම්ප්‍රදායක්. නමුත් එය ඒ අන්දමින් සිදු වෙලා නැති බව කනගාටුවෙන් වුණත් ප්‍රකාශ කරන්න ඕනෑ, ගරු සභානායකතුමනි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මොකක්ද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
දැන් announce කරපු පනත් කෙටුම්පතට. ඒ නිසා මේ සම්ප්‍රදාය අනුගමනය කරන මෙන් ඉතා ඕනෑකමින් ඉල්ලනවා. [බාධා කිරීමක්] Yes, it was just announced.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඒ පිළිබඳව පක්ෂ නායක රැස්වීමේදී අද දින නැවත සාකච්ඡා කරන්නට අප කටයුතු කරනවා.

ප්‍රධාන කටයුතු ආරම්භයේදී පනත් කෙටුම්පත් සහ යෝජනා. සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත
புகையிலை மற்றும் மதுசாரம் மீதான தேசிய அதிகாரசபை (திருத்தம்) சட்டமூலம்
NATIONAL AUTHORITY ON TOBACCO AND ALCOHOL (AMENDMENT) BILL

"2006 අංක 27 දරන දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍ය ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා විසිනි.
2015 පෙබරවාරි මස 18 වන බදාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.

சுகாதார மற்றும் சுதேச மருத்துவ அமைச்சர் மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.
2015 பெப்ருவரி 18, புதன்கிழமை இரண்டாம்முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப் பட்டது.

Presented by the Hon. (Dr.) Rajitha Senaratne, Minister of Health and Indigenous Medicine; to be read a Second time upon Wednesday, 18th February, 2015 and to be printed.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
යෝජනා පිළිබඳ දැනුම් දීම. ගරු සභානායකතුමා, අංක 2 යෝජනාව.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2015 පෙබරවාරි මස 18 වැනි බදාදා අ.භා. 1.00 වන තෙක් කල් තැබිය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා විසින් කරන ලද විමසීමට පිළිතුරක් තිබෙනවා. මම එය සභාගත කරනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
එය සභාගත කරන්න බැහැ, ගරු සභානායකතුමනි. ඊළඟ දිනයේ ඔබතුමා එය සභාවට කියවන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒක උත්තරයක්. This is only the answer.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
You have to read it out. Now, that stage has passed.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
All right.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු සභානායකතුමනි, කාලය දීර්ඝ කිරීම සඳහා ඔබතුමාගේ යෝජනාවක් තිබෙනවාද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින සභාවේ කටයුතු පැය භාගයකින් දීර්ඝ කරන මෙන් ඉල්ලනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා.

පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා
தேர்தலுக்குப் பிந்திய வன்செயல்கள்
POST-ELECTION VIOLENCE

[පූ.භා. 9.53]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Nimal Siripala de Silva-Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යෝජනාව ඉදිරිපත් කරන්නට අවසර ලබා දීම පිළිබඳව පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා.

සභාව කල් තබන අවස්ථාවේදී මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

" 2015 ජනවාරි මස 08 වෙනි දින පවත්වන ලද ජනාධිපතිවරණයෙන් පසුව දිවයිනේ ප්‍රදේශ රාශියක පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවන් සිදු වී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන් ඇතුළු විපක්ෂ ක්‍රියාකාරින්ගේ ජීවිත, දේපළ හා රැකියා අහිමි වී ඇති අතර, වැඩබිම්වල සේවකයින්ට සේවයට වාර්තා කිරීම බලහත්කාරයෙන් නවතා දමා මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවත්, නිවාස හා ව්‍යාපාරික දේපළ, චංචල හා නිශ්චල දේපළ විනාශ කර ඇති බවත්, නිවෙස්වලට පහර දීම්, ගිනි තැබීම තුළින් විශාල දේපළ හානි සිදු වී ඇති බවත්, පුද්ගලික බස් රථ ධාවනය කිරීම පවා අවහිර කොට ඇති බවත් වාර්තා වී ඇත.

හිටපු රජයේ ඇමතිවරුන්, පළාත් සභා මන්ත්‍රීවරුන් හා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ දේශපාලන කාර්යාල ගිනි තැබීම, ඒවාට පහර දීම සිදු වී ඇති අතර, හිටපු අමාත්‍ය සී.බී. රත්නායක අමාත්‍යතුමාගේ දේශපාලන කාර්යාලයට, තඹුත්තේගම ශ්‍රී ලංකා නිදහස් පක්ෂ කාර්යාලය එසේ කඩා බිඳ දමා විනාශ කරන ලද කාර්යාලවලින් කිහිපයකි.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රාදේශීය සභා සභාපතිවරුන් හා මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකුට කරන ලද පහරදීම්වලින් ඔවුන් රෝහල්ගත කර ඇති අතර, ක්‍රියාකාරි දේශපාලනයේ යෙදෙන එක්සත් ජනතා නිදහස් සන්ධානයේ පක්ෂ ක්‍රියාකාරීන්ගේ ඡන්ද පොළ නියෝජිතයන් විශාල පිරිසකගේ නිවෙස්වලට අලාභ හානි කිරීම හා ඔවුන්ට මරණීය තර්ජන කිරීම් කර ඇති බවට වාර්තා වී තිබේ.

රාජ්‍ය හා සංස්ථා ආයතන ගණනාවක නිලධාරින් හා සේවකයන් කිසිදු සාධාරණ හේතුවක් නොමැතිව දේශපාලන පළිගැනීම් මත මාරුකොට ඇති අතර, සමහර නිලධාරින් හා සේවකයන් සේවයට වාර්තා කිරීම බලහත්කාරයෙන් නවතා ඇත. මෙම මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා අතරින් ඉතා බෙදජනක ක්‍රියාවක් ලෙස ගල්ගමුව මිගලෑව පදිංචි ගල්ගමුව ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුගේ නිවසට පහරදීම සහ දියණියට පහරදීම සඳහන් කළ හැක. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නියෝජ්‍ය නගරාධිපතිවරයාගේ දේශපාලන සම්බන්ධීකරණ කාර්යාලයට පහර දී ඇති අතර, ඉහත කී සිද්ධීන් දිවයින පුරා සිදු වී ඇති මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවන්ගෙන් අතලොස්සක් පමණකි.

වත්තල ප්‍රාදේශීය සභාවේ හයවෙනි සැසි වාරයේ 40 වෙනි මහා සභා රැස්වීම 2015.01.20 වැනි දින පවත්වන ලද අවස්ථාවේ දී මැරවර පිරිසක් පැමිණ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ඇතුළු එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මන්ත්‍රීවරුන්ට පහර දීම නිසා එකී මන්ත්‍රීවරුන් රෝහල් ගත කරන ලදී. මෙහිදී පොලීසිය මෙම අපරාධය සියැසින්ම දැක එය වැළැක්වීමට උත්සාහ නො කළ අතර, මෙයට සම්බන්ධ සැකකරුවන් අත් අඩංගුවට ගැනීම සිදු නොකොට එම පහරදීමට සම්බන්ධයක් නොමැති මත්කුඩුවලට ඇබ්බැහිව සිටි තරුණයන් තිදෙනෙකු පොලීසිය විසින් ගරු අධිකරණයට ඉදිරිපත්කොට ගරු අධිකරණය නොමඟ යවා මෙම තිදෙනාට ඇප ලබා දී ඇත. එහෙයින් මෙම සමස්ත පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධ සියලු පුද්ගලයන්ට පක්ෂ, පාට භේදයකින් තොරව නීතිය ක්‍රියාත්මක කොට දඬුවම් පමුණුවන ලෙසත්, මෙම මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට සම්බන්ධ වූ මෙතෙක් අත් අඩංගුවට නොගෙන සිටින පුද්ගලයන් වහාම අත් අඩංගුවට ගෙන නීතිය හමුවට පත් කරන ලෙසත්, මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවන්හි ප්‍රතිඵලයක් වශයෙන්

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

විනාශ වූ ජීවිත හා දේපළ වෙනුවෙන් රජය මගින් වන්දි ගෙවන ලෙසත් , රැකියාවලින් ඉවත් කරන ලද සේවයට වාර්තා කිරීමට ඉඩ නොදුන් හා අසාධාරණ ලෙස මාරු කරන ලද සියලු දෙනා නැවත රැකියාවන්හි එකී ස්ථානයන්හි ප්‍රතිෂ්ඨාපනය කරන ලෙසත්, ඉදිරියේදී මෙවැනි පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවන් සිදුවීම වැළැක්වීම සඳහා කටයුතු කරන ලෙසත්, ව්‍යාජ චෝදනාවන් මත සිර භාරයට ගෙන සිටින හා නඩු පවරා ඇති විපක්ෂ දේශපාලන ක්‍රියාකාරීන්ට එරෙහිව පවරා ඇති නඩු ඉවත් කර ගැනීම සඳහා කටයුතු කරන ලෙසත් රජයෙන් ඉල්ලා සිටිමි. "

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මේ සිදු වුණු මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවන් පිළිබඳව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අපේ සියලුම ආසන සංවිධායකතුමන්ලාගෙන් හා ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමන්ලාගෙන් පක්ෂයක් හැටියට තොරතුරු ඉල්ලා සිටියා. මේ වනකොට එවැනි තොරතුරු ඇතුළත් විශාල ලිපිගොනු රාශියක් අපිට ලැබිලා තිබෙනවා. ඒ වාගේම අපේ මන්ත්‍රීතුමන්ලා විශේෂයෙන්ම ඒ තොරතුරු ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවෙන් සිටිනවා. ඇත්තෙන්ම දවසක විවාදයක් ප්‍රමාණවත් නැති තරමට ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් මේ පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීම සඳහා ඉල්ලීම් ලැබුණා. අපි එක් මන්ත්‍රීවරයකුට විනාඩි 5ක්, 6ක් බැගින් ගරු මන්ත්‍රීවරුන් 31 දෙනෙකුට මේ පිළිබඳව කථා කරන්න අවස්ථාව ලබා දීලා තිබෙන්නේ මේ රටේ ඇති වුණු ඒ ප්‍රචණ්ඩත්වය පිළිබඳව රටේ ජනතාව සහ රජය දැනුවත් කරන්නයි.

අතිගරු ජනාධිපතිතුමා හෝ ගරු අග්‍රාමාත්‍යතුමා මේවාට සම්බන්ධයි කියලා මා කිසිසේත්ම කියන්නේ නැහැ. මෙහි සිටින මැති ඇමැතිවරුන්ගෙන් හුඟක් දෙනෙක් මේවාට සම්බන්ධයි කියලා මා කියන්නේ නැහැ. නමුත් වැඩ බිම්වලත්, ඒ වාගේම ගමේත් සිටින එක්සත් ජාතික පක්ෂයේ පුද්ගලයන් මේ සඳහා විශේෂයෙන් සම්බන්ධ වෙලා තිබෙනවා. ඔවුන් මේ ප්‍රචණ්ඩ ක්‍රියාවන්වලට සම්බන්ධ වූ බවට අපට ඉතාමත්ම පැහැදිලිව පෙන්වා දෙන්නට පුළුවන්. විශේෂයෙන්ම එවැනි ක්‍රියාවන් සිදු වූ අවස්ථාවන්වලදී හා ඉන්පසුව පොලීසිය විසින් ගන්නා ලද ක්‍රියා මාර්ග ඉතාමත්ම කනගාටුදායකයි. සමහරවිට එවැනි බරපතළ සිද්ධීන්වලට අදාළ සැකකරුවන් වහාම ඇප පිට නිදහස් කර තිබෙනවා. එහෙම නැත්නම් තවමත් ඒ පිළිබඳව පරීක්ෂණ පවත්වා නැහැ. ඒ නිසා මා හිතනවා යහ පාලනය පිළිබඳ සංකල්පය ගැන තදින්ම කථා කරන රජයක් මීට වඩා මේ පිළිබඳව තමන්ගේ අවධානය යොමු කළ යුතුයි කියලා. මෙවැනි ක්‍රියා අද ඉඳන්වත්, දැන් සිටවත් නතර කරන ලෙස තමන්ගේ පාක්ෂිකයන්ට දැනුම් දීමට විශේෂයෙන් යම් පියවරක් ගත යුතුයි. මම ස්තුතිවන්ත වෙනවා ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාට, අප එතුමාත්, ජනාධිපතිතුමාත් මුණ ගැසිලා මේ පිළිබඳව කථා කළ අවස්ථාවේදී මේ සඳහා යම් යන්ත්‍රණයක් සකස් කර දීම පිළිබඳව. ඇත්තටම අපි ඒ බව කියන්න ඕනෑ. ඒ යන්ත්‍රණය දැන් එක්තරා ආකාරයකට ක්‍රියාත්මක වෙනවා. නමුත් එක්සත් ජාතික පක්ෂයේ බිම් මට්ටමේ මැරවර ක්‍රියාවන් කරන අයට මේ පණිවුඩය තවමත් ගිහිල්ලා නැහැ. අගමැතිතුමාත්, ජනාධිපතිතුමාත් මේ පිළිබඳව යම් යම් කරුණු කාරණා කියලා මෙය නැවැත්වීමට කොතරම් උත්සාහ කළත් ගම් මට්ටමේ අය අපට ගහනවා; අපේ පාක්ෂිකයන්ට හිරිහැර කරනවා. ඇත්ත වශයෙන් ඒ නිසා තමයි මේ පිළිබඳව මේ රටේ ජනතාවගේ අවධානය යම් ආකාරයකින් යොමු කරන්න අපි මේ විවාදය ඉල්ලුවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් වැඩ බිම්වල පවතින තත්ත්වය ගත්තොත්, හුඟක් ස්ථානවල, වැඩ බිම් විශාල ප්‍රමාණයක එවැනි දේ සිදු වී තිබෙනවා. මම ඒ අතරින් එක උදාහරණයක් කියන්නම්. අපේ ගයන්ත කරුණාතිලක අමාත්‍යතුමා මෙතැන සිටිනවා. මම හිතනවා මේ කාරණය එතුමාගේ විශේෂ අවධානයට යොමු වන්න ඕනෑ කියා.

ශ්‍රී ලංකා නිදහස් රජයේ මුද්‍රණ සේවා සංගමයේ නිලධාරීන් හිංසනයට ලක් වී තිබෙනවා. විශේෂයෙන් ඒ සංගමයේ ප්‍රධාන ලේකම් මහේෂ් ප්‍රදීප් සම්පත් මහතා රාජකාරියේ යෙදී සිටියදීම 2015 ජනවාරි මස 19වන දින විසිදෙනකුගෙන් යුත් කණ්ඩායමක් පැමිණ ඒ මහතාට පහර දීලා තුවාල කර තිබෙනවා. ඒ වාගේම, මහේෂ් මහතා පදිංචිව සිටි මරදාන විපුලසේන මාවතේ පිහිටි නිල නිවාසයෙන් ඉවත් කිරීම නිසා ඔහු අද පාරට වැටිලා තිබෙනවා. ඉතින් මම අහනවා, ඒවා අනුමත කරන්න පුළුවන්ද කියලා. මැතිවරණයකින් පස්සේ අපේ සංගමයේ නිලධාරීන්ට මේ විධියට අඩන්තේට්ටම් කර තිබෙනවා. ඒ වාගේම නීති විරෝධි ලෙස මුද්‍රණාලයාධිපතිතුමා එම තනතුරෙන් ඉවත් කර තිබෙනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - வெகுசன ஊடக, பாராளுமன்ற அலுவல்கள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Mass Media and Parliamentary Affairs and Chief Government Whip)
එතුමා අමාත්‍යාංශයට-

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඒක හරි. නමුත් ඇයි මුද්‍රණාලයාධිපති ධුරයෙන් මේ විධියට ඉවත් කර තිබෙන්නේ?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
වැරැදි පත්වීමක්.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
වැරැදි පත්වීමය කියලා ඕනෑ හැටියට මේ විධියට තීන්දු තීරණ ගැනීමට පුළුවන්කමක් නැහැ. එයින් පෙනෙනවා එවැනි දෙයක් සිදු වෙලා තිබෙනවා කියා ඔබතුමා පිළිගන්නා බව.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
එතුමා අමාත්‍යාංශයේ හොඳින් ඉන්නවා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
හොඳට සිටින ප්‍රශ්නය නොවෙයි තිබෙන්නේ. එතුමා කරපු රාජකාරියෙන් එතුමා ඉවත් කර තිබෙනවා. ඒ වාගේම ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමයත් අපට දැනුම් දීම් කර තිබෙනවා. ස්වාධීන රූපවාහිනී ආයතනයේ සේවය කරන ලද සංජීව එදිරිමාන්න, හර්ෂ වැනි අය අනිවාර්ය නිවාඩු යවා තිබෙනවා; ඔවුන්ට සේවයට පැමිණීම තහනම් කර තිබෙනවා. Lanka Mineral Sands Limited එක, ඒ වාගේම Sri Lanka Tourism Development Authority එක, සංචාරක මණ්ඩලය, සෙවණගල සීනි කර්මාන්තශාලාව, දුම්රිය දෙපාර්තමේන්තුව තවත් උදාහරණ කීපයක්. මේ ආකාරයෙන් කියන්න ගියොත් විශාල කාලයක් යනවා. මට තිබෙන කාලයත් ඉතාම සීමා සහිතයි. අපි මේ පිළිබඳව රජයේ අවධානය යොමු කරවන්න කැමැතියි. මා හිතන විධියට

විශේෂයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේ වෘත්තීය සමිති ව්‍යාපාරය අඩ පණ කිරීමේ උත්සාහයක් මේ දරන්නේ. ඔවුන් අධෛර්යය කිරීමේ උත්සාහයක් මේ දරන්නේ. එපමණක් නොවෙයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ දේශපාලනය වෙනුවෙන් කටයුතු කරපු මිහින්තලය ආසනයේ කටුකැලියාව, මිහින්තලය ලිපිනයෙහි පදිංචි ආර්. සෙනෙවිරත්න මහතාට පහර දීලා මරණයට පත් කළා. අපේ පාක්ෂිකයෙක් මැරුණා. මැරුණා නොවෙයි, මැරුවා. මෙවැනි තත්ත්වයකට අපේ පාක්ෂිකයන්ට මුහුණ දීමට සිදු වුණා පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිසා. ඒවා නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අධෛර්යයට පත් වන්නේ නැහැ. අපි වඩවඩාත් ශක්තිමත් වෙනවා. ඒ වාගේම, මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාගේ පියාගේ සොහොයුරියගේ නිවසට පහර දුන්නා. එයින් බිය වෙලා එම සොයුරිය හෘදයාබාදයකින් එතැනම මිය ගියා. එපමණක් නොවෙයි. මේ විධියේ තවත් සිද්ධි තිබෙනවා. ඒ අතරින් කීපයක් මම කියන්නම්. නිවිතිගල ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රී නිශාන්ත ධර්මසිරි මහතාට අජන්ත රණසිංහ නමැති කෙනෙක් කඩුවකින් පහර දී තිබෙනවා. ඔහු දැනට රත්නපුරය රෝහලේ අංක 1 වාට්ටුවේ ප්‍රතිකාර ලබනවා. අජන්ත රණසිංහ කියන්නේ එක්සත් ජාතික පක්ෂයේ අධාරකරුවෙක්. කුරුඳුවත්ත කඩවීදියේ පදිංචි එච්.ඒ. අමරසේන බණ්ඩාර මහතාගේ නිවසට වෙඩි තබා වීදුරු කුඩු කර තිබෙනවා. මම එය දැක්කා. විශේෂයෙන් නාවලපිටිය ආසනයේ සිදු වූ ප්‍රචණ්ඩ ක්‍රියා සියල්ල පරීක්ෂා කිරීමට මම ගියා. කාර් කුඩු කරලා තිබුණා. ගෙවල්වලට ගහලා තිබුණා. වීදුරු කඩලා තිබුණා. එසේ ප්‍රචණ්ඩත්වයක් ඇති වුණේ නැහැ කියලා කියන්න පුළුවන්කමක් නැහැ. ඒ වාගේම හම්බන්තොට තිස්සමහාරාමයේ දුමින්ද කොඩිකාර නමැති අයගේ වාහනයට ගිනි තබා විනාශ කරලා තිබෙනවා. තිස්සමහාරාමයේ ප්‍රේමසිරි මහතා පදිංචි නිවස සියලු දේපළ සමඟ ගිනි තබා තිබෙනවා. ඒ වාගේම තිස්සමහාරාමයේ ඩබ්ලිව්.පී. සුරංග සහ එච්.කේ. ආශා යන අයගේ නිවෙස්වලට- [බාධා කිරීම්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා (නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - வீடமைப்பு மற்றும் சமுர்த்தி அமைச்சர்)
(The Hon. Sajith Premadasa - Minister of Housing and Samurdhi)
අසත්‍ය.

ගරු දිලිප් වෙදආරච්චි මහතා (ධීවර රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு திலிப் வெதஆரச்சி - கடற்றொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Dilip Wedaarachchi - State Minister of Fisheries)
තනිකරම අසත්‍ය.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
[බාධා කිරීම්] ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාවේ විපක්ෂ නායක සමන් මහතා ඇතුළු පිරිසක් පැමිණ සුරංග මහතා සහ ඔහුගේ භාර්යාවට පහර දී දින හයක් රෝහල්ගත කර තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අසත්‍ය.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
මේ අය නිකම් බොරුවට ගිහිල්ලා රෝහල්ගත වුණාද? දින හයක් රෝහල්ගත වෙලා ඉඳලා තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
සම්පූර්ණ අසත්‍ය.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
පැපිලියාන සුනේත්‍රාදේවි පිරිවෙනේ විහාරාධිපති මැදගොඩ අභයතිස්ස නායක ස්වාමීන් වහන්සේට එක්සත් ජාතික පක්ෂයේ පළාත් සභා මන්ත්‍රී නිරෝෂන් පාදුක්ක මහතා විසින් තර්ජනය කොට විහාරයට අලාභහානි සිදු කරලා තිබෙනවා. ඒ වාගේම කිත්සිරි මංචනායක සහ පළාත් සභා මන්ත්‍රී රෝස් ප්‍රනාන්දු යන අය සංවිධානය කරන ලද රථ පෙළපාළියකින් පැමිණි පිරිස ඕතරවාඩිය නාමල් යන අය නිරුවත් කර පහර දීලා තිබෙනවා. මීරිගම, වේවැල්දෙනිය, මිල්ලවැල්ල, නොම්මර 12 යන ස්ථානයේ පදිංචි චන්ද්‍රා මහීපාල මහත්මියගේ නිවස ගිනි තැබීම හා රථයට ගිනි තැබීම සිදු කරලා තිබෙනවා. මේ, කරන ලද මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවන්ගෙන් කොටසක් පමණයි. මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා රාශියක විස්තර මා සතුව තිබෙනවා. අපේ මන්ත්‍රීතුමන්ලා තමතමන්ගේ ප්‍රදේශවල සිදු වූ ඒ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳව පසුව විස්තර කරනවා ඇති.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මේ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීම පිළිබඳව රජය ඵලදායී පියවරක් ගනිව් කියලා මා හිතනවා. අඩු ගණනේ අද ඉඳලාවත් ගම් මට්ටමින් සිදු වන ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳව කටයුතු කරයි කියලා අපට ලොකු විශ්වාසයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වත්තල ප්‍රාදේශීය සභාවේ සිදු වූ සිද්ධිය පිළිබඳව මම කිව්වා. ඔබතුමාත් ඒ පිළිබඳව දන්නවා. ඒවා ඉතාම අමිහිරි වූ සිද්ධීන්. ඒක එක්සත් ජාතික පක්ෂයේ දේශපාලනයටත්, ඒ වාගේම මේ රජයේ දේශපාලනයටත් විශාල වශයෙන් කැලලක් ඇති වුණු සිද්ධියක් බව අපි ප්‍රකාශ කරන්න ඕනෑ. මෙවැනි ක්‍රියා තුළින් එක්සත් ජාතික පක්ෂයේ බිම් මට්ටමේ සංවිධායකයන් බලාපොරොත්තු වන්නේ ඊළඟ මැතිවරණයේදී අපේ පාක්ෂිකයන් නිහඬ කරවීම; අපේ පාක්ෂිකයන් ඉදිරියට ඒම වැළැක්වීම; අපේ වෘත්තීය සමිති ව්‍යාපාර කඩාකප්පල් කිරීමයි. ඒ නිසා මේ පිළිබඳව ගැඹුරින් හිතා බලා වඩ වඩාත් ශක්තිමත් වන ලෙස අපි අපේ පාක්ෂිකයන්ට ආයාචනා කර සිටිනවා. ඒ වාගේම මේ ක්‍රියා නැවැත්වීමට අවශ්‍ය ප්‍රතිකර්ම වහාම ක්‍රියාත්මක කරන්න කියලාත් අපි රජයෙන් ඉල්ලා සිටිනවා. දැනට සාදා ඇති යන්ත්‍රණයට අමතරව මේ කාරණා පිළිබඳව පාර්ලිමේන්තුව තුළ විවාදයක් ලබා දීම ගැන අපි ස්තුතිවන්ත වනවා. මෙවැනි විවාදයක් තුළින් තමයි මේ රටේ යම් ජන මතයක් ඇති කරන්න පුළුවන් වන්නේ. යහ පාලනය පිළිබඳව වූ සංකල්පය මොන තරම් දුරට පළමුවැනි දින 20 තුළදී ක්‍රියාත්මක වුණාද කියන කාරණය පිළිබඳව ඉතා හොඳ චිත්‍රයක් අපට මේ විවාදය තුළින් දකින්න පුළුවන් වෙයි. ඒ නිසා අපි මේ කරන්නේ තමුන්නාන්සේලාගේ යහ පාලනයට උදව් වීමක්. මේ යහ පාලනය කැලැල් කරන පුද්ගලයින්ට විරුද්ධව තමුන්නාන්සේලා පියවර ගන්න. ඒවා නවත්වන්න. මොකද, අපි තමුන්නාන්සේලාගේ දින සියයේ වැඩ පිළිවෙළට සහයෝගය දුන්නා. ඒ සඳහා අපි ඡන්දය දුන්නා. අපි ඡන්දය දීලා ගුටි කන්නේ ඇයි කියලායි අපේ පාක්ෂිකයෝ අහන්නේ. ගුටි කකා ඡන්දය දෙන්න අපි සූදානම් නැහැ. ව්‍යවස්ථා සංශෝධන, අනිකුත් වැදගත් පනත් පිළිබඳව සංශෝධන තමුන්නාන්සේලා ඉදිරියේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිතයි. ඒ නිසා මේ ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳව දැඩි පියවර ගැනීමට රජයට විශාල යුතුකමක් හා වග කීමක් තිබෙනවා.

මට ලැබී තිබෙන කාලය සීමාසහිතයි. මගේ සහෝදර මන්ත්‍රීතුමන්ලාට කාලය දෙන්න ඕනෑ නිසා මම මීට වඩා දීර්ඝ

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

වශයෙන් කථා කරන්නේ නැහැ. මේ පිළිබඳව රජයේ අවධානය පූර්ණ වශයෙන්ම යොමු කරන්න කියන ඉල්ලීම මා කරනවා. ගරු සී.බී. රත්නායක මන්ත්‍රීතුමා මේ යෝජනාව ස්ථිර කරනවා ඇති.

[පූ.භා. 10.09]

ගරු සී.බී. රත්නායක මහතා
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂ නායක ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා ඉදිරිපත් කළ සභාව කල් තැබීමේ යෝජනාව මා ස්ථිර කරනවා.

නුවරඑළිය දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පුරා වසර 20කට අධික කාලයක් මහජන නියෝජිතයෙකු හැටියට කටයුතු කිරීමේදී, මා මහත්මා දේශපාලනය හා නිහතමානී දේශපාලනය තුළ රැඳී සිට කටයුතු කරපු කෙනෙකු බව මුළු රටම, ඒ මුළු ප්‍රදේශයම දන්නවා. විපක්ෂය බලයට පත් වුණාට පස්සේ, ඒ නිහතමානීකමයි, මහත්මා දේශපාලනයයි පිළිබඳව වැරදි අර්ථ කථනයන් කරමින් ක්‍රියාත්මක වූ ආකාරය පිළිබඳව මා පැහැදිලි කරන්න ඕනෑ.

මහජන සාමය හා නීතිය රකින මගේ හිතවත් ගරු ජෝන් අමරතුංග ඇමතිතුමනි, ඔබතුමා අන්‍යාගමික කෙනෙක් වුණත් මා ඔබතුමාට කියන්නට ඕනෑ," නහි වේරෙන වේරානි සම්මන්තීධ කුදාචනං අවේරෙන ච සම්මන්ති එස ධම්මො සනන්තනො" කියලා අපේ බුදු බණේ තිබෙන බව. [බාධා කිරීම්] සාමාන්‍යයෙන් හඳට බල්ලෝ බුරනවා. නමුත් හඳ වැටෙන්නේ නැහැ. ඒ නිසා බුරපුදෙන්. බල්ලෝ බිරුවත් මා මේ කාරණා කියන්නට සූදානම් වෙනවා.

ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේට මතක ඇති, 2004 වර්ෂයේදී තමුන්නාන්සේලාගේ කෙටි කාලීන ආණ්ඩුවක් ආපු වෙලාවේ, මා විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට තේරී පත් වුණාම මගේ නිවසට ඇවිත් ගහලා, කුඩු කරලා ගිය වෙලාවේ ඔබතුමාට මා දුරකථනයෙන් කථා කළ බව. ඒ වෙලාවේ, ඔබතුමා " ඒ ගැන බලන්නම්" කියා කිව්වාට ඒ අනුව කටයුතු සිද්ධ වුණේ නැහැ. අවසානයේදී අපේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට මම කථා කරලා කිව්වා, "මගේ නිවෙස විනාශ කර තිබෙනවා. ඒ නිසා මට එළියට යන්නට විධියක් නැහැ. මගේ දරුවෝ ඇඳ යට ඉන්නේ" කියලා. ඊට පස්සේ ඒ කර්තව්‍යය කළ උදවිය පිළිබඳව වහාම දැනුම් දීලා, මට යම් කිසි සහනයක් ලබා ගන්නට පුළුවන්කම ලැබුණා. ඒ සහනය ලබා ගැනීමත් එක්ක නැවත ඔවුන්ට වෛර කරන්නේ නැතිව, ඔවුන් එක්ක අත් වැල් බැඳගෙනම මේ දේශපාලන ක්ෂේත්‍රයේ, දේශපාලන කරලියේ මහජන නියෝජිතයෙකු හැටියට මා කටයුතු කර ගෙන ගියා. එහෙම කටයුතු කරගෙන යන අතරතුරේදී මේ දේශපාලන පරිවර්තනය සිදු වෙලා යහ පාලනයට ගොනු වුණු රජයක් ක්‍රියාත්මක කිරීමේදීත් නැවතත් ඒ අවස්ථාව උදා වුණා.

මේ අවස්ථාවේදී මම විශේෂයෙන් මේ කාරණය සඳහන් කරන්නට ඕනෑ. ඒ අවස්ථාව වෙනකොට, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, හඟුරන්කෙත ආසනයේ, රිකිල්ලගස්කඩ නගරයේ මගේ කාර්යාලය තිබුණා. පාන්දර දෙකට විතර ඇවිත් ඒ කාර්යාලය කඩලා, කුඩු කරලා, එහි තිබුණු උපකරණ සියල්ලම ගිනි තියලා විනාශ කර දැම්මා. එහෙම විනාශ කරන්නට තුඩු දුන් කාරණා පිළිබඳව සඳහන් කරමින් මම හඟුරන්කෙත පොලීසියට පැමිණිල්ලක් කර ඒ ගැන සොයා බලන්නට අවස්ථාව සලසා දුන්නා. අද වෙන තුරු ඒ පිළිබඳව විභාගයක්වත් කිසි දෙයක් සිද්ධ වෙලා නැහැ කියන එක මම මේ අවස්ථාවේදී වගකීමෙන් කියන්නට ඕනෑ. මෙවැනි ක්‍රියා ගැන පැමිණිලි කරන්න ගියාම, පැමිණිලි කරන අයට තර්ජනය කරමින් ක්‍රියාත්මක වන තත්ත්වයක් තිබෙනවා. මීට පෙරත් පුරා වසර ගණනාවක්ම මේ තත්ත්වය තිබුණා. එහිදී අපේ පැත්තටත් මම ඇඟිල්ල දිගු කර ගන්නවා. අපේ පැත්තට ඇඟිල්ල දිගු කර ගන්නේ වෙන කිසි දෙයක් නිසා නොවෙයි. පක්ෂ දෙකෙන්ම නියෝජනය වන්නේ සහෝදර පරපුරක්. ඒ පරපුරේ කෙනෙක් තමයි ඒ කටයුත්ත කරන්නේ. එම නිසා මේ භීෂණය දුරු කරන්න, භය සැක නැතිව ජීවත් වෙන්න අවස්ථාව හඟුරන්කෙත ආදරණීය ජනතාවට උදා කර දෙන්න කටයුතු කරන්නටය කියා මම විශේෂයෙන් සඳහන් කරනවා.

මෙතැන වෛරී දේශපාලනයක් නැහැ. අපි සත්‍යය ප්‍රකාශ කරන්නට ඕනෑ. ඒ සත්‍යය ප්‍රකාශ කිරීමේදී අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරන්න කියා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඒ වාගේම මා විශේෂයෙන් සඳහන් කරන්නට ඕනෑ-

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා (විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பாலித ரங்கே பண்டார - மின்வலு மற்றும் எரிசக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Palitha Range Bandara - State Minister of Power and Energy)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is the point of Order? - [*Interruption.*] ඒක point of Order එකක් නොවෙයි. ගරු මන්ත්‍රීතුමා කථා කරන්න. [බාධා කිරීමක්] That is not a point of Order. ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මට කරුණු පැහැදිලි කිරීමක් කරන්න අවස්ථාව දෙන්න.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
එහෙම පැහැදිලි කිරීමක් කරන්න අවස්ථාවක් නැහැ.

ගරු සී.බී. රත්නායක මහතා
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම -[බාධා කිරීමක්] එළියට එන්න, මම කථා කරලා කියන්නම්. මම උත්තර දෙන්නට බැඳිලා නැහැ. ඔබතුමාට මම කථා කර කියන්නම්. මට පෞද්ගලිකව එතුමාට කථා කර කියන්න පුළුවන්. මොකද, රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමා පොලිස්කාරයෙක්ව සිටි නිසා ඒ අවස්ථාව සලසා ගන්නට පුළුවන් වේවි. පැමිණිල්ලක් සඳහන් කරන්නේ නැහැ. [බාධා කිරීමක්] නමුත් මම විශේෂයෙන් සඳහන් කරන්නට ඕනෑ, වලපනේ ආසනයේ රේණුකා හේරත් මැතිනියට මම ස්තුතිවන්ත වෙන බව. ආපදාවන්ට ලක් කරන්නට අවස්ථාව සලසා දුන්නේ නැති වුණත් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයෙක් හැටියට කටයුතු කරන ජගත්කුමාර සමරහේවා නැමැත්තා විසින් මා වසර ගණනාවක් පාවිච්චි කළ කාර්යාලයට පොලීසියේ පැමිණිල්ලක් දාලා, ඒ පැමිණිල්ල අනුව කටයුතු කරන්නට පසු බිම සකස් කර තිබුණා. ඒ අනුව උසාවියේ search warrant එකක් අරගෙන ඇවිත් ඒ පිළිබඳව කටයුතු කළා. උසාවියේ තිබෙන කරුණක් නිසා මා ඒ ගැන මීට වඩා කථා කරන්නේ නැහැ. නමුත් කරුණු පැහැදිලි කිරීමක් කරන්න සූදානම් වෙනවා.

ප්‍රාදේශීය ලේකම්තුමා අතින් විමධ්‍යගත මුදල්වලින් මරණාධාර සමිතිවලට ගෙනැවිත් දී තිබුණු පුටු 800න් පසු ගිය කාලයේ පුටු 214 ක් තාවකාලිකව දෙන්න කියා මම ඉල්ලීමක් කර තිබුණා. ඒ ටිකත් ගෙනැල්ලා තිබුණා. ඒ වාගේම ප්‍රාදේශීය සභාවෙන් බට 19ක් ගෙනැල්ලා තිබුණා, පොඩි කොන්ක්‍රිට් එකක් දා ගන්න.

ඒවා තිබුණු නිසා ජනවාරි මාසයේ 12වැනි දා ඉඳලා ඊයේ වන තෙක්ම සීල් කරලා ඒ කාර්යාලය වහලා තිබුණා. ඒ කාර්යාලය වසා තැබීම සම්බන්ධයෙන් උසාවියට පැමිණිලි කරලා තිබෙනවා. උසාවියෙන් තීන්දුවක් දෙන තෙක් ඒ කටයුත්ත කරන්න කියලා ඉල්ලීමක් කරලා තිබුණා. කෙසේ වුවත්, ඊයේ උසාවියෙන් තීන්දුවක් ලබා දීලා කාර්යාලය විවෘත කරන්න අවස්ථාව සලසා දුන්නා. එසේ අවස්ථාව සලසා දුන්නත් එතෙක් මම යම්කිසි ගැටලුවකට, අපහසුතාවකට පත් වුණා, මා මුණගැහෙන්න එන මගේ පාක්ෂිකයන්ට, මගේ ආධාරකරුවන්ට ඒ අවස්ථාව සලසා ගන්න බැරි වුණු නිසා.

ඒ විතරක් නොවෙයි, ගරු ජෝන් අමරතුංග ඇමතිතුමනි. මම පරම්පරාවෙන් එන ව්‍යාපාරික පවුලක කෙනෙකු හැටියට, ප්‍රදේශයේ අභිමානවත් පවුලක කෙනෙකු හැටියට ජීවත් වුණු බව සඳහන් කරන්න ඕනෑ. මගේ අම්මටයි අප්පච්චිටයි දරුවෝ අට දෙනයි. එක්කෙනෙක් මම. හත් දෙනෙක්ම ව්‍යාපාර ක්ෂේත්‍රයේ රැඳී සිටිනවා. 119 දුරකථන අංකය ඔස්සේ පැමිණිලි කරලා එසේ ව්‍යාපාර කර ගෙන යන අයගේ තොග රැස් කරන මධ්‍යස්ථාන සීල් කරලා, ඒ ස්ථාන පරීක්ෂා කරන්න කියලා තිබෙනවා. මම කිව්වා, උසාවි තීන්දු ගන්න අවශ්‍ය නැහැ, ඕනෑම වෙලාවක ඒ ස්ථාන පරීක්ෂා කරන්න, අපි ඒ වගකීම භාර ගන්නම් කියලා. මොකද, අපි අවුරුදු ගණනාවක් තිස්සේ ඒ ප්‍රදේශයේ ඉන්නවා. අපි හොරු නොවෙයි; අපි වංචාකාරයෝ නොවෙයි. මම පුරාජේරු කථා කරනවා නොවෙයි.

මගේ පියාගේ පියා ඒ ප්‍රදේශයේ කෝරළේ මහත්තයා. මගේ පියා 1958 ඉඳලා 1977 වන තෙක් ගම් සභාපතිවරයා හැටියට කටයුතු කරලා තිබෙනවා. මම 1994 පාර්ලිමේන්තුවට එන කොට නුවරළිය දිස්ත්‍රික්කයේ මිනිස්සු "සීබී" කවුද කියලා දන්නේ නැහැ. ඒ කාලයේ මගේ පියාට ගමේ පටබැඳි නාමයක් තිබුණා, "නවරත්න රාළහාමි" කියලා. එදා නුවරඑළිය දිස්ත්‍රික්කයේ මිනිස්සු ඡන්දය දුන්නේ නවරත්න රළහාමිගේ පුතාට. නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පළමුවැනියා හැටියට මම පත් වුණා. ඒ අපි නමක් හදා ගෙන තිබුණ නිසා. ඒ නම කෙළෙසන්න මේ වාගේ කාලකණ්ණි විධියට කටයුතු කිරීම මට හරි හිත් වේදනා දෙන කරුණක්. අපි මේ දේශපාලනයෙන් සමු ගන්න පුළුවන්. දේශපාලනයෙන් ඈත් වෙන්න පුළුවන්. දේශපාලනය එපා කියලා යන්න පුළුවන්. හැබැයි, හදා ගත්ත නමක් තිබුණා නම් ඒ නම රැකෙන ආකාරයෙන් කටයුතු කරන්න ඕනෑ. ඒ නිසා තමුන්නාන්සේ මේ වෛරී දේශපාලනයට අත හිත දෙන්න එපා. බුද්ධිමත්ව කටයුතු කරන්න. පොලීසියට ඕනෑ විධියට නටන්න ඉඩ දෙන්න එපා. පොලීසියට අවශ්‍ය විධියට කටයුතු කරන්න ඉඩ දෙන්න එපා. ඒ කාර්යය කරන්න ඔබතුමා සූදානම් වෙන්න කියලායි මම කියන්නේ.

ගරු ජෝන් අමරතුංග මහතා (මහජන සාමය, ආපදා කළමනාකරණය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மக்கள் ஒழுங்கு, அனர்த்த முகாமை மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் அமைச்சர்)
(The Hon. John Amaratunga - Minister of Public Order, Disaster Management and Christian Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

ගරු සී.බී. රත්නායක මහතා
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
මගේ කථාවට ඉඩ දෙන්නකෝ. ඔබතුමා ඊට පස්සේ කියන්න.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
නැහැ, මම මේ ටිකත් කියන්න එපායැ. පොලීසියට ඕනෑ හැටියට නැටුවේ තමුන්නාන්සේලාගේ කාලයේ.

ගරු සී.බී. රත්නායක මහතා
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
ඒක නිසා තමයි ආණ්ඩුව වෙනස් කර ගත්තේ.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
අනෙක් කාරණය මේකයි. හඟුරන්කෙත දෙන්නෙක් අත් අඩංගුවට අරගෙන තිබෙනවා.

ගරු සී.බී. රත්නායක මහතා
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
තමුන්නාන්සේ පැහැදිලිව සොයලා බලන්න, සී.බී. රත්නායක කවදාවත් පොලීසියට උපදෙස් දීලා තිබෙනවාද, සී.බී. රත්නායක අනිසි ලෙස බලය පාවිච්චි කර තිබෙනවාද, සී.බී. රත්නායක කවදාවත් පොලීසියේ ක්‍රියාදාමයට ඇඟිලි ගහලා තිබෙනවාද කියලා. එදා ඒ ආකාරයට කටයුතු කරන කොට, මගේ ගෙදර කුඩු කරන කොට හිතවත් ඇමතිවරයකු හැටියට තමුන්නාන්සේ නිසියාකාරව ඒ තීන්දුව දුන්නේ නැහැ. ඒ ගැන මට පොඩි වේදනාවක් තිබෙනවා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා එදා ඒ තීන්දුව දුන්න නිසා මගේත්, මගේ දරුවන්ගේත් ජීවිත බේරා ගන්න පුළුවන් වුණා. දරුවෝ තුන් දෙනා ඇඳ යට තියා ගෙන හිටපු මට ඒ විධියට ජීවිත බේරා ගන්න අවස්ථාව ලැබුණා. අපි පොලීසියට ඇඟිලි ගහන්නේ නැතිව, ඒ වාගේ උදාහරණ දෙන්නේ නැතිව කටයුතු කර තිබෙනවා.

ඒ නිසා මම කියන්න කැමැතියි, කවුරුවත් කරපු වැරදි අනුන්ගේ පිටින් යවන්න සූදානම් වෙන්න එපා කියලා. ගරු ඇමතිතුමනි, ඒ වගකීම ඇතිව කටයුතු කරන්න. අපි වැරදි කරපු නිසා තමයි ජනතාව අපට තීන්දුව දුන්නේ. ඒ නිසා අද අපි විපක්ෂයේ ඉන්නවා. ඒක ඇත්ත. සදාකාලිකවම තමුන්නාන්සේලා ඔය පැත්තේ ඉන්නවා කියලා අපට පිළිගන්න පුළුවන්කමක් නැහැ. අපට පුළුවන්කමක් නැහැ-

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
අපි එහෙම හිතන්නේ නැහැ. ඔබතුමන්ලා තමයි හැම දාම ඉන්න හිතා ගෙන ඉන්නේ.

ගරු සී.බී. රත්නායක මහතා
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
ඒක වෙන්න පුළුවන්. මේ පනුවෙලා ඇවිල්ලා නිකම්

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

යන්න එපා. අවුරුදු 20ක අත්දැකීම් එක්ක තමයි මේ කථා කරන්නේ. [බාධා කිරීමක්] බැකෝ යන්ත්‍රවලින් ගත්ත දේවල්

[ගරු සී.බී. රත්නායක මහතා]

පිළිබඳව මම පස්සේ කියලා දෙන්නම්. ඒ නිසා නිකම්

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

යන්න එපා. අපි අත් දැකීම් එක්කයි මේ කථා කරන්නේ. මේ කාරණා පිළිබඳව කථා කරද්දී ඇති වන වේදනාව නිසා ඉතාම සංවේදී ලෙසයි මම කථා කරන්නේ. මොකද, කාගේ හරි ගෙයක් ගිනි කියලා තිබෙනවා කියලා, කාට හරි ගහලා තිබෙනවා කියලා මට ඇඟිල්ල දික් කරලා කියන්න පුළුවන් නම්, මට දඬුවම් දෙන්න. එහෙම දඬුවම් දෙන කොට අත් දෙකම උස්සා ගෙන යන්න ලැහැස්තියි. හිර ගෙවල් තිබෙන්නේ, එල්ලුම්ගස් තිබෙන්නේ බල්ලන්ට, බලු කුක්කන්ට නොවෙයි, මිනිස්සුන්ටයි. වැරැද්දක් කරලා තිබෙනවා නම් ඒ වැරැද්දට නියමිත දඬුවම් දෙන්න. ඒ දඬුවම් ලබන්න අපි සූදානම් වෙලා ඉන්නවා. අනෙක් මිනිස්සු හොරු, වංචාකාරයෝ කියලා නිකම් කියන්න සූදානම් වෙනවා නම් ඒක හරිම වැරදියි. මේ කාරණා නිසාම හිත් පලුදුවීම්, හිත් දූෂාවීම් මොන තරම් සිද්ධ වෙනවාද කියලා තමුන්නාන්සේට අමුතුවෙන් කියන්න ඕනෑ නැහැයි කියන එක මම මතක් කරන්න ඕනෑ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බොහොම ස්තූතියි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු සී.බී. රත්නායක මහතා
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
ඒක පාරාවළල්ලක් වාගේ වෙන්න පුළුවන්. ඒක පාරාවළල්ලක් වෙන්න පුළුවන්. නමුත් ඒ වේලාවේදී මෛත්‍රී කරනවා මිසක් පළි ගැනීමට යන්න අපි සූදානම් වෙන්නේ නැහැ. ඒ සූදානම් නොවීම වරදක් හැටියට අරගෙන අපට ගහන්න සූදානම් වෙනවා නම්, ඒ පිළිබඳව මම ඉතාම කනගාටු වෙනවා. ඒ නිසා මේ පිළිබඳව සොයා බලන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නුවරඑළිය දිස්ත්‍රික්කයේ පමණක් නොවෙයි, සමස්ත රටේ ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන් හැටියට කටයුතු කරන උදවියට, ඒ වාගේම වාමාංශික දේශපාලනය කරන උදවියට, රැකියවලට යන්න දෙන්නේ නැතිව කටයුතු කරපු ආකාරය පිළිබඳවත් කථා කරන්න ඕනෑ. මේ පිළිබඳවත් සාධාරණය ඉෂ්ට කරන්න. යහ පාලනය ගෙනෙන්න නම්, ඒකාබද්ධ වී අලුත් ආණ්ඩුවක් හැටියට යන්න සූදානම් වෙනවා නම් ග්‍රාමීය මට්ටමේ තිබෙන මේ ගැටුම් අවම කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතු වෙනවා; අවශ්‍ය ප්‍රතිපාදන ලබා දිය යුතු වෙනවා. එසේ නොවන්නේ නම්, එසේ නොකරන්නේ නම් කථාවට පමණක් සීමා වන යහ පාලනයක් සිද්ධ වෙයි කියන අනතුරු ඇඟවීමත් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තූතියි.

[පූ.භා. 10.21]

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා (විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பாலித ரங்கே பண்டார - மின்வலு மற்றும் எரிசக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Palitha Range Bandara - State Minister of Power and Energy)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සීතල බදුල්ලෙන් පටන් අරගෙන, ඊටත් වඩා සීතල නුවරඑළියට ගිහිල්ලා බොහොම රස්නය වැඩි අපේ පුත්තලමට විවාදය ගෙන එන්න අවස්ථාව ලැබුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සී.බී. රත්නායක මන්ත්‍රීතුමාගේත්, විපක්ෂ නායක ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාගේත් කථාවලට ඇහුම්කන් දුන්නාම ඉතා පැහැදිලිව පෙනෙන කාරණාවක් තමයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කඩා වැටීම, දියවීම ආරක්ෂා කර ගැනීම සඳහා මේ විවාදයේදී ප්‍රයත්නයක් දරන බව. එසේ නැතිව, රටේ ප්‍රචණ්ඩත්වයක් ඇති වෙලා, ප්‍රචණ්ඩ ක්‍රියා සිදු වෙලා, ඒ ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධව පොලීසිය නිර්වින්දනය වෙලා බලාගෙන ඉඳලා, ඔඩු දුවලා ඇති වුණ විනාශකාරී තත්ත්වයක් වළක්වා ගැනීම සඳහා ගෙන ආපු යෝජනාවක් නොවෙයි, මේ යෝජනාව. ඉතාම වටිනා කාරණා ඕනෑ තරම් මේ පාර්ලිමේන්තුවේදී සාකච්ඡාවට භාජන කරන්න තිබියදීත්, කිසිදු පදනමක් නැති අන්දමේ විවාදයකට තමයි අද මේ කාලය නාස්ති කරන්නට යොදා ගෙන තිබෙන්නේ. ඒ පිළිබඳව මම කනගාටු වෙනවා.

සී.බී. රත්නායක මැතිතුමා එස්.බී. දිසානායක හිටපු ඇමතිතුමාගේ සහෝදරයා සමඟ ඇති වෙලා තිබුණු ගැටුම අපි දන්නවා. ඒ පහරදීම් පිළිබඳවත් අපි දන්නවා. ඒ ඉතිහාසය අපිත් දන්නවා. අපට ඒ පිළිබඳව කථා කරන්නත් පුළුවන්. නමුත් අපි ඒ ගැන කථා කරන්න යන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොලිස් දෙපාර්තමේන්තුවේ සිටින වර්තමාන පොලිස්පතිතුමා තමයි ඉලංගකෝන් මැතිතුමා. අපි අලුත් රජයක් පිහිටුවලා තවම දින 30යි. ඉලංගකෝන් මැතිතුමා මේ දින 30 ඇතුළත අපි පත් කරපු පොලිස්පතිවරයෙක් නොවෙයි.

අපි එහා පැත්තේ වාඩි වෙලා, විරුද්ධ පක්ෂය නියෝජනය කරමින් විවාද කරද්දීත් මම බොහොම පැහැදිලිව සෑම විවාදයකදීම කියපු කාරණාවක් තමයි, කාලයකට පස්සේ රටේ නීතිය ක්‍රියාත්මක කරවන්න පුළුවන්, රටේ නිසි පරිපාලනයක් ගෙනියන්න පුළුවන්, අනවශ්‍ය විධියට නම්‍යශීලි නොවන යහපත් පොලිස්පතිවරයෙක් රටට බිහි වෙලා තිබෙනවාය කියන එක. එදා අපි විරුද්ධ පක්ෂයේ සිටියදී තමයි ඒ කථාව කිව්වේ. අපි එදා විරුද්ධ පක්ෂයේ සිටියදී ඒ විධියට කථා කරපු පොලිස්පති ඉලංගකෝන් මැතිතුමාම තමයි අදත් ශ්‍රී ලංකා පොලීසියේ පොලිස්පතිවරයා වශයෙන් වැඩ කටයුතු කරන්නේ. එහෙම නම්, එදා අපි විරුද්ධ පක්ෂයේ සිටින විට හොඳයි කියූ පොලිස්පතිවරයා අපි ආණ්ඩු පක්ෂයට එන කොට නරක් වෙන්නේ කොහොමද? එදා ආණ්ඩු පක්ෂයේ සිටින විට සී.බී. රත්නායක මැතිතුමන්ලාට, නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමන්ලාට ඉතා වැදගත් වුණු, අවංක වුණු, දක්ෂ වුණු පොලිස්පතිවරයා සහ එම පොලිස් දෙපාර්තමේන්තුවේ පොලිස් නිලධාරීන් කණ්ඩායම අද දුෂ්ට පොලිස් නිලධාරීන් බවට හංවඩු ගසන්නට පටන් අරගෙන තිබෙනවා.

ගරු සී.බී. රත්නායක මහතා
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පොලිස්පතිතුමාට චෝදනාවක් කළේ නැහැ.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ඔබතුමන්ලා පත් කරපු නියෝජ්‍ය පොලිස්පතිතුමන්ලා, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිතුමන්ලා, සහකාර පොලිස් අධිකාරිතුමන්ලා, කොට්ඨාස බාර නිලධාරීන්, ස්ථාන බාර නිලධාරීන් තමයි අදටත් ඉන්නේ. අපේ කොට්ඨාසයේ එකම පොලිස් නිලධාරියෙක්වත් අද වන තුරු වෙනස් කිරීමක් කරලා නැහැ. එහෙම නම් ඔබතුමන්ලා පත් කරපු පොලිස් නිලධාරීන්ම නේද තවමත් ඉන්නේ? එදා ඔබතුමන්ලා හොඳයි කියපු පොලිස්

නිලධාරින් නේද අද නරකයි කියලා ඔබතුමන්ලා කියන්නේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විවේචනයේ තිබෙන සාධාරණ අසාධාරණභාවය මොකක්ද කියලා නීතිඥවරයෙකු වශයෙන් ඔබතුමාට තේරෙනවා ඇතැයි කියලා මම විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රචණ්ඩත්වය ගැන කථා කරන්නේ එක්නැලිගොඩ කියන මාධ්‍යවේදියා අද වන තුරුත් සොයා ගන්න බැරි වන විධියට අතුරුදන් කළ පසු ගිය ආණ්ඩුවේ හිටපු සාමාජිකයන්. ඒ වාගේම, ලසන්ත වික්‍රමතුංග මහත්මයා අමු අමුවේ ඝාතනය කළ පසු ගිය ආණ්ඩුවේ හිටපු සාමාජිකයන් තමයි අද මේ ප්‍රචණ්ඩත්වය ගැන කථා කරන්නේ. ඒ වාගේම, රවිරාජ් මන්ත්‍රීවරයා හමුදා භටයන් හතර දෙනෙක් යොදවලා ඝාතනය කරවපු පසු ගිය ආණ්ඩුවේ හිටපු සාමාජිකයන් තමයි අද මේ ප්‍රචණ්ඩත්වය ගැන කථා කරන්නේ. ඒ වාගේම, මහේස්වරන් මන්ත්‍රීවරයා ඝාතනය කරවපු උදවියම තමයි අද මේ ප්‍රචණ්ඩත්වය ගැන කථා කරන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

සුදු වැන් කලාව ක්‍රියාත්මක කරලා මිනිහෙකුට නිදහසේ පත්තරයකට අකුරක් ලියන්න බැරි වෙන්න, මාධ්‍ය ආයතනවලට තමන්ගේ මාධ්‍ය පවත්වා ගෙන යන්න බැරි වෙන්න, දේශපාලන ක්‍රියාවලියේ යෙදෙන පුද්ගලයකුට තමන්ගේ දේශපාලනය නිදහසේ කථා කරන්න බැරි වෙන්න, වෘත්තියවේදියකුට තමන්ගේ වෘත්තිය අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින්නට බැරි වෙන්න, ව්‍යාපාරිකයකුට තමන්ගේ ව්‍යාපාරය නිදහසේ කර ගෙන යන්න බැරි වෙන අන්දමට පැහැර ගෙන යන්න කියන මෙන්න මේ සියලු කලාවන් ක්‍රියාත්මක කළ උදවියම අද මේ ප්‍රචණ්ඩත්වය පිළිබඳව කථා කරන එක මහ විහිළු සහගත ක්‍රියාවක් කියන එක මේ අවස්ථාවේදී මම ඔබතුමාට මතක් කරන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ වාගේම මම මතක් කරන්න ඕනෑ, මේ "හක්කේ බුදු රැස් - බොක්කේ දඩ මස්" ක්‍රියාවලියක් පමණයි කියන එක.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ ළඟ තිබෙනවා, පසු ගිය ජනාධිපතිවරණ තුළදී ඇති වුණු ප්‍රචණ්ඩකාරී ක්‍රියා පිළිබඳව වාර්තාවක්. මැතිවරණ ගණනාවක් පැවැත් වුණා. ඒ මැතිවරණ සියල්ලම ක්‍රියාත්මක කළේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රධාන එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුව යටතේයි. එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුව යටතේ, විශේෂයෙන්ම හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වය, නායකත්වය යටතේ මේ රටේ මැතිවරණ ගණනාවක් පැවැත් වූවා. එලෙස පවත්වන ලද ජනාධිපතිවරණ කිහිපයකදී සිදු වුණු මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා කිහිපයක ප්‍රතිඵල මම ඔබතුමා වෙත යොමු කරනවා. ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එම වාර්තාව මේ ගරු සභාව හමුවේ තබන අතර හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා එය **සභාගත*** කරනවා.

2005 වර්ෂයේ 11 වැනි මාසයේ 17 වැනි දා පවත්වපු ජනාධිපතිවරණයේදී මේ රටේ දේශපාලන ප්‍රචණ්ඩ ක්‍රියා 1,198ක් සිදු වෙලා තිබෙනවා. මේවාට ඇතුළු වෙනවා, වෙඩි තබා මිනී මැරීමට තැත් කිරීම්, බෝම්බ ගසා මිනී මැරීමට තැත් කිරීම්, බෝම්බ ගසා බිය ගැන්වීම්, අවි පෙන්වා බිය ගැන්වීම්, බරපතළ තුවාල සිදු කිරීම්, පැහැර ගෙන යෑම්, ගිනි තැබීම්, කොල්ලකෑම්, ගෙවල් බිඳීම් සහ සොරකම්, අනර්ථය සිදු කිරීම්, සුළු පහර දීම්, බැණ තර්ජනය කිරීම්, නිල ඡන්ද පත්‍රිකා/ ඡන්ද පත්‍රිකා කොල්ලකෑම්, හොර ඡන්ද දැමීම් සහ මැතිවරණ නීති උල්ලංඝනය කිරීම් යනාදිය. මේ සියලු සිදුවීම් සමඟ 2005 අවුරුද්දේ 11 වැනි මාසයේ 17 වැනි දා පැවැති එම ජනාධිපතිවරණයේදී සිදු වූ ප්‍රචණ්ඩ ක්‍රියා 1,198ක් වාර්තා වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2010 ජනවාරි මාසයේ 26 වැනි දා පැවැති ජනාධිපතිවරණයේදී මිනී මැරුම් හයක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම වෙඩි තබා මිනී මැරීමට තැත් කිරීම් හතක් සිද්ධ වෙලා තිබෙනවා. බෝම්බ ගසා මිනී මැරීමට තැත් කළ සිදුවීම් එකක් වාර්තා වෙලා තිබෙනවා. බෝම්බ ගසා බිය ගැන්වීම් 15ක් සිදු වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ සියල්ල සිදු වුණේ සී.බී. රත්නායක මැතිතුමන්ලා ඇමතිකම් දරපු ආණ්ඩුව ක්‍රියාත්මක වුණු කාලයේ. විපක්ෂ නායක නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා මේ යෝජනාව -

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
ඔබතුමන්ලා - [බාධා කිරීම්]

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ඔබතුමා වාඩිවෙන්න. ඔබතුමා බන්ධනාගාරයේ වැඩ කටයුතු කළ ආකාරය ගැන මම කියන්නම්. බන්ධනාගාරය කරපු හැටි දැක්කා නේ. -[බාධා කිරීම්]. මිනිහෙක් බන්ධනාගාරයේ රඳවන්නේ ඔහුගේ ආරක්ෂාව සඳහායි. එසේ රැඳවූ රැඳවියන් ආරක්ෂා කර ගන්න බැරි වුණු, ඒ රැඳවියන් අරගෙන ගිහින් ඝාතනය කරන තෙක් කොටටේ බදා ගෙන නිදා ගත්ත ඇමතිවරයකු විළිලජ්ජා නැතුව මේ සභාවේ මේ පිළිබඳව කථා කරන්න නැඟිටිනවා. කරුණාකර වාඩි වෙලා ඉන්න. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අවි පෙන්වා බිය ගැන්වීම් 42ක්, බරපතළ තුවාල සිදු කිරීම් තුනක්, පැහැර ගෙන යෑමේ සිදුවීම් දෙකක්, ගිනි තැබීම් 12ක්, කොල්ලකෑම් 20ක්, ගෙවල් බිඳීම් සහ සොරකම් සම්බන්ධ සිදුවීම් 47ක් සහ අනර්ථය සිදු කිරීම් 522ක් සිදු වෙලා තිබෙනවා. අලාභ කිරීම් 522ක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. 522ක් කියන සංඛ්‍යාවට ගිනි තැබීම්, කඩා බිඳ දැමීම් සහ වෙනත් අලාභ කිරීම් සියල්ල ඇතුළත් වෙනවා. ඒ වාගේම සුළු පහර දීම් 217ක් වාර්තා වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ වාගේම, බැණ තර්ජනය කිරීම් 127ක්, හොර ඡන්ද දැමීම් තුනක් සහ මැතිවරණ නීති උල්ලංඝනය කිරීම් 65ක් වාර්තා වෙනවා. මේ අනුව 2010 ජනවාරි මාසයේ 26 වැනි දින පැවැත් වූ ජනාධිපතිවරණයේදී සිදු වුණු මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා 1,089ක් වාර්තා වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

2015 වර්ෂයේ ජනවාරි මස 08 වැනි දා ජනාධිපතිවරණය පැවැත් වුණා. වාර්තාව අරගෙන බලන්න, ඔය කියන පම්පෝරි තිබෙනවාද, ඔය කියන සිදුවීම් වෙලා තිබෙනවාද කියලා. සී.බී. රත්නායක මැතිතුමනි, සංසන්දනය කරලා බලන්න. සිදු වෙලා තිබෙන්නේ, මිනී මැරුම් දෙකයි. එම මිනී මැරුම් දෙක සිදු වුණේ කාටද? ඒ ඝාතන දෙකේදීම මිය ගියේ එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයන්. එක්කෙනෙක්, රත්නපුරයේ හිටපු ශාන්ත දොඩංගොඩ මහත්මයා. රත්නපුර, තලගහවත්ත මුහන්දිරම්ලාගේ උපාලි පොතුවිල පනාපිටිය නමින් පැමිණිලි කර තිබෙන්නේ. ස්වයංක්‍රීය ගිනි අවිවලින් වෙඩි තබා තිදෙනෙකුට බරපතළ තුවාල සිදු කිරීම සහ ශාන්ත දොඩංගොඩගේ මරණය සිදු කිරීම. මෙය සිදු කර තිබෙන්නේ 2015 ජනවාරි මාසයේ 07 වැනි දා යි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒකේ විත්තිකාරයෝ කවුද? නිවිතිගල, වටාපොත, ප්‍රේමලාල් ජයසේකර හා ජේ.ඒ. නිලන්ත ජයකොඩි, වජිර දර්ශන ද සිල්වා. ප්‍රේමලාල් ජයසේකර, කවුද ඒ? ඔබතුමන්ලා එක්ක ඇමතිකම් හොබවපු, ඔබතුමන්ලා එක්ක මැති සබයේ හිටපු, ඔබතුමන්ලාගේ

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා]

කණ්ඩායම් රැස්වීමේ ඉන්න, නිවිතිගල ආසනයේ ඔබතුමන්ලාගේ පක්ෂයේ සංවිධායකවරයා. [බාධා කිරීමක්] සම්බන්ධ නැත්නම් මොකටද උසාවියට ඉදිරිපත් කරලා තිබෙන්නේ? මිත්‍රපාල මන්ත්‍රීතුමනි, මිත්‍රයෙක් ලෙස වාඩි වෙලා ඉන්න.

ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
දේශපාලන වශයෙන් පළි ගැනීමට.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- [බාධා කිරීමක්] මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති අපේක්ෂකයා වශයෙන් නිවිතිගල මැතිවරණ කොට්ඨාසයේ රැස්වීමකට යන්න සිටි අවස්ථාවේදී, ඒ රැස්වීම සංවිධානය කරමින් ඒ භූමිය සකස් කරමින් සිටි අහිංසක පුද්ගලයකු තමයි ශාන්ත දොඩංගොඩ කියන්නේ. ඔහු ඝාතනයට ලක් වුණා. ජනතාව ශාප කරනවා, චොකා මල්ලීට. මම ශාන්ත දොඩංගොඩගේ මළ ගෙදරටත් සහභාගි වුණා. මිත්‍රපාල මන්ත්‍රීතුමනි, ඔබතුමා මිත්‍රයෙක් නම් ඒ වාගේ මැරයින්, පාදඩයින් ආරක්ෂා කරන්න යන්න එපා. [බාධා කිරීමක්] තමුන්නාන්සේලාගේ පක්ෂයට කෙළ වුණේ ඒකයි; විනාශ වුණේ ඒකයි. මැරයෝ, ජඩයෝ, කුඩුකාරයෝ, එතනෝල්කාරයෝ හා කැසිනෝකාරයන්ට රජ කරන්න තමුන්නාන්සේලා ඉඩ දුන්නා. තමුන්නාන්සේලාට කර ගන්න දෙයක් තිබුණේ නැහැ. තමුන්නාන්සේලාගේ තත්ත්වය අපි දන්නවා. කොල්ලුපිටියේ "Star Dust" කියන කැසිනෝ එකේ ඉඳන් තමයි ඒවා සියල්ල පාලනය කළේ. තමුන්නාන්සේලා නිකම් නමට විතරයි හිටියේ. තමුන්නාන්සේලාට කරන්න දෙයක් තිබුණේ නැහැ. තමුන්නාන්සේලාට නමට ඇමතිකමක් හෝ නියෝජ්‍ය ඇමතිකමක් රාජපක්ෂ මහත්තයලා දීලා තිබුණා. එතැනින් එහාට තමුන්නාන්සේලාට කරන්න ඉටි ගෙඩියක් තිබුණේ නැහැ. සී.බී. රත්නායක මහත්තයාට පෞද්ගලික බස් දීලා තිබුණා, කරන්න කෙංගෙඩියක් නැහැ. ඒ නිසා බොරුවට හැප්පෙන්නට එපා. අපි දන්න කරුණුත් තිබෙනවා, කියන්නම්.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ඒ ඝාතනය සිදු කළ නිසා තමයි එහෙම වෙලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- [බාධා කිරීමක්]

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
Sir, I rise to a point Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is your point of Order, Hon. Member?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැනට ඒ සම්බන්ධයෙන් නඩුවක් අධිකරණයේ විභාග වෙමින් පවතිනවා. මෙතුමා ඒ සිද්ධියේ විත්තිකාරයා ගැනම සඳහන් කරලා කථා කරනවා. එහෙම කරන්න බැහැ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා අධිකරණයේ විභාගවන දේවල් හැර, අනෙකුත් කාරණා පිළිබඳව කථා කරන්න. ගරු ඇමතිතුමා, කථාව කරන්න.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- [බාධා කිරීමක්] ගරු ලලිත් දිසානායක මන්ත්‍රීතුමා, දැන් හරි නේ. තමුන්නාන්සේ වාඩි වෙන්න කෝ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- [බාධා කිරීමක්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Matters which are *sub judice* cannot be discussed in this House.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- [බාධා කිරීමක්] ගරු ලලිත් දිසානායක මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් වාඩි වෙන්න කෝ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණයයේ විමසුමට භාජනය වෙච්ච කරුණු පිළිබඳව කථා නොකරනවා නම් මේ විවාදය පවත්වන්න බැහැ. මේ කථා කරන්නේ ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධව. ඒ ප්‍රචණ්ඩ ක්‍රියා සහ මැතිවරණ නීති උල්ලංඝනය කිරීම් සියල්ල සම්බන්ධව පොලීසිය ක්‍රියාත්මක වෙලායි තිබෙන්නේ. පොලීසිය ක්‍රියාත්මක වනවා කියන්නේ, පොලීසිය මේ දේවල් කබඩ්වලට දා ගෙන තියා ගෙන ඉන්නවා කියන එක නොවෙයි. එතැනින් ඔබ්බට යනවා; ඒ සියල්ල අධිකරණය දක්වා ගෙන යනවා. ඒවා ගැන කථා නොකර මේ විවාදය කොහොමද ගෙන යන්නේ?

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] தலைமை வகித்தார்கள்.

Whereupon MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් ඒ සියලු කාරණා අධිකරණයේ විභාග වනවා. අධිකරණයේ විභාග කෙරෙන කාරණා පිළිබඳව කථා කරන්න බැරි නම්, ප්‍රචණ්ඩත්වය ගැන කථා කරන්න බැහැ.

ගරු සී.බී. රත්නායක මහතා
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Hon. Rathnayake, what is your point of Order?

ගරු සී.බී. රත්නායක මහතා
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
ගරු ඇමතිතුමා කථා කළා දැන් අධිකරණයේ තිබෙන කාරණයක් සම්බන්ධව. මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ, සැකකරුවෙක් සහ වරදකරුවෙක් කියන වචන දෙකේ අර්ථය දැන ගෙන විවාදය ඉදිරියට කර ගෙන යන්න කියලා. සැකකරුවෙක් ගැන කථා කරන එක අසාධාරණ-

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
That is not a point of Order, Hon. Member.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම සැකකරුවා සම්බන්ධවත් දන්නවා; වරදකරුවා සම්බන්ධවත් දන්නවා. ඒක විග්‍රහ කරලා දෙන්න ඕනෑ නම් ගරු සී.බී. රත්නායක මන්ත්‍රීතුමාට කියනවා, මම කථා කරලා ඉවර වුණාට පස්සේ සභා ගර්භයෙන් එළියට එන්න, මම lecture එකක් දෙන්නම් කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,- [බාධා කිරීමක්] දැන් ඇති. වාඩි වෙන්න කෝ. මන්ත්‍රීතුමා ලෙඩෙක් වෙන්න එපා. කරුණාකර වාඩි වෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ප්‍රචණ්ඩත්වය ගෙනාවේ කවුද? ඒ එක සිද්ධියක්. ඊළඟට මම කිව්වා, පසු ගිය ජනාධිපතිවරණයේදී මිනී මැරුම් දෙකක් සිදු වුණා කියලා. අනෙක් මිනී මැරුම කොහේද සිදු වුණේ? ඒ මම නියෝජනය කරන පුත්තලම් දිස්ත්‍රික්කයේ, හලාවත මැතිවරණ කොට්ඨාසයේ, බංගදෙනියේයි. කවුද මැරුණේ? එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයෙක්. ඔහු ඒ ගමේ සිටිය එක්සත් ජාතික පක්ෂයේ නායකයා වන මංජුල. කවුද ඔහුව ඝාතනය කළේ? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉන්න 'ගොටුකොළ සුදා' කියන පුද්ගලයා. 'ගොටුකොළ සුදා' තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගමේ නායකයා. මෙන්න තියා ගෙන ඉන්න මිනිස්සු. ගොටුකොළ සුදාලා, වෙලේ සුදාලා, මේ ගොල්ලන්ට ඉන්නේ ඒ වාගේ සුදාලා තමයි. ඒ සුදාලා දා ගෙන තමයි game ගැහුවේ.

දැන් මේ අය කියනවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ යන්ත්‍රණය දුර්වල කරන්න හදනවා කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කොහේද යන්ත්‍රණයක් තිබුණේ? [බාධා කිරීම්] තමුන්නාන්සේලාගේ ආණ්ඩුවෙන් අත් අඩංගුවට ගත්තේ නැහැ. මේ ආණ්ඩුව ඇවිල්ලා අත් අඩංගුවට ගත්තේ. ඒකවත් දන්නේ නැහැ. [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වෙලේ සුදා අත් අඩංගුවට ගත්තෙත් පසු ගිය ජනවාරි මාසේ 10වෙනි දායින් පසුවයි. [බාධා කිරීම්] ඒක දන්නෙත් නැහැ. නිකම් නමට ඇමතිකම් කරලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, -[බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මංජුලව ඝාතනය කළේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උදවියයි. මේ රටේ බරපතළම අපරාධ විධියට ගණන් ගන්නේ මිනීමැරුම්. [බාධා කිරීම්] මිනී මැරුම් දෙකක් සිද්ධ වුණා. ඒ මිනී මැරුම් සිද්ධි දෙකටම චෝදනා ලබලා තිබෙන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්. ඒ වාගේම අර ගොටුකොළ සුදාලා වාගේ ගමේ ඉන්න නායකයෝ. එහෙම නම් ප්‍රචණ්ඩත්වය ඇති කරලා තිබෙන්නේ කවුද? මේ ප්‍රචණ්ඩත්වය ව්‍යාප්ත කරලා තිබෙන්නේ කවුරුන්ද? [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟට ගිනි අවි පෙන්වා බිය වැද්දීම් එකක් තිබෙනවා. ඊළඟට බරපතළ තුවාල සිදු කිරීම් එකක් තිබෙනවා. ගිනි තැබීම් හතරක් තිබෙනවා. අනර්ථය සිදු කිරීම් 19ක් තිබෙනවා. සුළු පහරදීම්, සුළු තුවාල කිරීම් 13ක් තිබෙනවා. බැණ තර්ජනය, පරිභවය හෝ බලහත්කාරය සිදු කිරීම් 8ක් තිබෙනවා. මැතිවරණයෙන් පසු සමස්ත සිද්ධීන් 47යි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සමස්ත මැතිවරණ කාල පරිච්ඡේදයම ගත්තාම, සිද්ධීන් 472ක් සිදු වෙලා තිබෙනවා. එතකොට මේ සිද්ධීන් 472න් -[බාධා කිරීමක්]

ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
කෝ යහ පාලනය?

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
පොඩ්ඩක් අහගෙන ඉන්න කෝ මහත්තයෝ, නිකම් කැත වෙන්නේ නැතිව.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කිරි පාලනය. [බාධා කිරීම්]

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මැතිවරණය පවත්වන්නට කලින් සිද්ධීන් 387ක් සිදු වෙලා තිබෙනවා. මැතිවරණය අවසන් වුණාට පසුව සිදු වෙලා තිබෙන්නේ සිදුවීම් 47යි. එතකොට මීට පෙර හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පාලනය යටතේ, එක්සත් ජනතා නිදහස් සන්ධානය යටතේ පැවැති මැතිවරණ සියල්ලටම සිදු වූ සිද්ධීන් ගණනත් සමඟ සංසන්දනය කරනකොට 2005 වසරේ දී 1198යි; 2010 වසරේ 1089යි; 2015 වසරේ මෙම මැතිවරණයේ දී 472යි. මෙම සිද්ධීන් 472න් 387ක්ම සිදු වෙලා තිබෙන්නේ, මහින්ද රාජපක්ෂ මහත්මයාගේ පාලනය යටතේ තිබුණු කාලයේදීයි. එනම්, ජනවාරි මාසේ 08වෙනි දාට කලින් සිදු වෙලා තිබෙනවා. ඒ වාගේම ජනවාරි මාසේ 08වෙනි දා සිදුවීම් 36ක් සිදු වෙලා තිබෙනවා. මේ සිදුවීම් 36ටම වග කිව යුත්තේ මහින්ද රාජපක්ෂ මහත්මයාගේ රජයයි. ඒ රජයේ ඇමතිවරුන් තමයි දැන් මේ බාධා කර කර ඉන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එහෙම නම් මේවාට වග කිව යුත්තන් කවුද? ජනවාරි මාසේ 08වෙනි දායින් පසුව ඇති වෙලා තිබෙන සමස්ත සිදුවීම් ගත්තාම බරපතළ සිදුවීම් නැහැ. ඇතිවෙලා තිබෙන බරපතළ සිදුවීම් ඇති වෙලා තිබෙන්නෙත් යූඑන්පී කාරයන්ට එරෙහිවයි. එහිදී ඝාතනයට ලක් වෙලා තිබෙන්නේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාව ජයග්‍රහණය කරවන්න දුක් විඳින ලද උදවියයි. ගරු නියෝජ්‍ය කාරක

[ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා]

සභාපතිතුමනි, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට "අයියෝ! සිරිසේන, අයියෝ! සිරිසේන" කිය කියා බැණ වැදුණු උදවිය, දැන් "අතිගරු ජනාධිපති, අපේ නායකයා මෛත්‍රීපාල සිරිසේන මහත්මයා"යි කියන උදවිය විළිලජ්ජා නැතිව කොහොමද මේවා ගැන කථා කරන්නේ? ඒ උදවියනේද මේ අපරාධවලට නායකත්වය දීලා තිබෙන්නේ, ඒ උදවියනේද මේ අපරාධකාරයෝ කියන එක මම මේ ගරු සභාවෙන් අහන්නට කැමැතියි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. [බාධා කිරීමක්]

ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
බහුතරය-

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපට බහුතරය, සුළුතරය ප්‍රශ්නයක් නැහැ. ඔබතුමාගේ පැත්තේ නවක මන්ත්‍රීවරුන් 62දෙනෙකු ඉන්නවා කියන එක මතක තබා ගන්න. අපට කිසිම ගැටලුවක් නැහැ. අපි ඕනෑම වෙලාවක මැතිවරණයකට යාමට සූදානම්. අපි අපේ නායකතුමා වන ගරු අග්‍රාමාත්‍යතුමාට කිව්වේ, අපි ඕනෑම වේලාවක මැතිවරණයකට යාමට සූදානම් කියලායි.

ගරු සී.බී. රත්නායක මහතා
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
අපි ලැහැස්තියි, අපට ගැටලුවක් නැහැ.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මැතිවරණයකට යන්න ඔබතුමන්ලා ලැහැස්තියි නම්, යෝජනා කරන්න. අපි මැතිවරණයකට යමු. ඔබතුමන්ලාගේ පාලන කාලයේ කරන ලද ප්‍රචණ්ඩ ක්‍රියා ද වැඩි එහෙම නැත්නම් මේ කාලයේ කරන ලද ප්‍රචණ්ඩ ක්‍රියා ද වැඩි කියලා මැතිවරණ ප්‍රතිඵලයේදී බලා ගන්නට පුළුවන් වනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ සියලු සිදුවීම් සම්බන්ධව පොලීසිය ක්‍රියාත්මක වෙලා තිබෙනවා. එදා ඔබ වර්ණනා කරපු, අද ඔබ දෝෂාරෝපණය කරන පොලිස්පති ඉලංගකෝන් මැතිතුමාගේ යටතේම ක්‍රියාත්මක වෙන පොලීසියේ නිලධාරි මහත්වරුන් මේ සෑම සිද්ධියක් සම්බන්ධයෙන්ම ක්‍රියාත්මක වෙලා තිබෙනවා. ඒ සෑම සිද්ධියකම වාර්තා මා සතුව තිබෙනවා. මේ සෑම සිද්ධියකම පුද්ගලයන් අත් අඩංගුවට අරගෙන තිබෙනවා; ආයුධ සොයා ගෙන තිබෙනවා. ඒ ආයුධත් එක්ක අධිකරණයට ඉදිරිපත් කරලා තිබෙනවා. චොකා මල්ලි -ප්‍රේමලාල් ජයසේකර මන්ත්‍රීතුමා- කිව්වා මෙයට සම්බන්ධ නැහැ කියලා. සම්බන්ධ නැත්නම් ඒ ටී.56 ගිනිඅවිය පොලීසිය සොයා ගත්තේ කොහොමද? ඒ ටී.56 ගිනි අවිය රස පරීක්ෂකට යොමු කරලා තිබෙන්නේ කොහොමද? එහෙම නම් ඒ පුද්ගලයා අත් අඩංගුවට අරගත්තේ කොහොමද? ඒ අපරාධකරුවන් බලන්නට ඔබේ නායකතුමා ඊයේ දිනයේ බන්ධනාගාරයට ගියා.

යහ පාලනයක් -සාධාරණ පාලනයක්- ගෙන යන්න ඕනෑය කියලා මොරදෙන, ප්‍රචණ්ඩත්වයට එරෙහිව මොරදෙන ඔබේ ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා ඊයේ ඒ අපරාධකරුවන් බේරා ගන්නට නීතිඥයෙක් වශයෙන් පෙනී සිටින්න අධිකරණයට යනවා. නාමල් රාජපක්ෂට අද එල්ලෙන්න වැලේ වැල් නැහැ. දැන් නීතිඥයෙක් වශයෙන්, ප්‍රචණ්ඩත්වය ඇති කරපු මිනිස්සු, භීෂණය ඇති කරපු මිනිස්සු වෙනුවෙන් පෙනී සිටින්න එක එක්කෙනාගේ නඩු පස්සේ එල්ලී ගෙන යනවා. පවිත්‍රා දේවි වන්නිආරච්චි නෝනාට අද කර ගන්න දෙයක් නැහැ. [බාධා කිරීම්] එතුමිය ගිහිල්ලා අධිකරණය ඉදිරියේ නීතිඥවරියක ලෙස පෙනී සිටිනවා. ප්‍රචණ්ඩත්වය පිළිබඳව කථා කරන උදවිය, ප්‍රචණ්ඩ ක්‍රියා කරන අය ආරක්ෂා කිරීම සඳහා, මැරයන් ආරක්ෂා කිරීම සඳහා, ඔවුන් බේරා ගැනීම සඳහා අධිකරණ ගානේ යන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බොහොම කනගාටුදායක තත්ත්වයක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ඔබතුමාගේ අවධානයට යොමු කරවනවා, පසු ගිය කාල පරිච්ඡේදය තුළ සිදු වී තිබෙන සිදුවීම් ගැන. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආයුධ සන්නද්ධව කරපු ක්‍රියාවලිය ගැන බලන්න. අනුරාධපුර ගල්නෑවේදී 2014.12.16වැනි දා සිද්ධියක් වුණා. ඒ කාලයේ කාගේ පාලනයද තිබුණේ? මහින්ද රාජපක්ෂ මහත්මයාගේ එහෙම නැත්නම් මේ කෑ ගහන ඇමතිතුමන්ලාගේ පාලනයයි එදා තිබුණේ. එදා මොකක්ද සිදු වුණේ? එක්සත් ජාතික පක්ෂයේ කණ්ඩායමක් සංවිධාන කටයුතු කරගෙන ඉන්න තැනට ගිහිල්ලා ස්වයංක්‍රීය අවි ගෙනැල්ලා වෙඩි තිබ්බා. වෙඩි තිබ්බ පුද්ගලයන් සම්පූර්ණයෙන් මෙහෙයවලා තිබෙන්නේ එක්සත් ජනතා නිදහස් සන්ධානයයි. පොලීසිය ක්‍රියාත්මක වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

2014.12.20වැනි දා අනුරාධපුරයේ, එප්පාවල එක ස්ථානයකට බෝම්බ ගැහුවා. පක්ෂ නියෝජිත කාර්යාලයට පෙට්‍රල් බෝම්බය ගැහුවේ කාගේ පාලන කාලය තුළදීද? මහින්ද රාජපක්ෂ මහත්මයාගේ යහපත් කාලයේ, දේශ ප්‍රේමී කාල පරිච්ඡේදය තුළ තමයි ඒ පහර දුන්නේ. අද සුද්ධෝදනලා වෙන්න කථා කරනවා. ඒ වාගේම ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අනුරාධපුරයේ මිහින්තලේ 2015 ජනවාරි මාසයේ 09වැනි දා - මැතිවරණ දිනයට පස්සේ දවසේ- නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ කාර්යාලයකට එහෙම නැත්නම් මෛත්‍රීපාල සිරිසේන මහත්මයාව ජයග්‍රහණය කරවන්න උර දුන්නු තැනට ගිහිල්ලා වෙඩි තියලා දැම්මා. කවුද වෙඩි තිබ්බේ, කවුද ඒ භීෂණය පැතිරෙව්වේ? තමුන්නාන්සේලා නේද? ඒ වාගේම පොළොන්නරුවේ මැදිරිගිරියේදී පිස්තෝලයක් අරගෙන ගිහිල්ලා වෙඩි තිබ්බා. අද පොලීසිය ක්‍රියාත්මක වෙලා තිබෙනවා, ඒ පුද්ගලයන්ව හොයා ගන්න. ඒ අය නාඳුනන පුද්ගලයන්. කවුද මේ නාඳුනන පුද්ගලයන් කලාව මේ රටට බිහි කළේ? අපරාධ රැල්ල ඇති කළේ කවුද? තමුන්නාන්සේලාගේ කාල පරිච්ඡේදය තුළ නේද, නොදන්නා විත්තිකරුවන් සහිත අපරාධ වාර්තා වෙන්නට පටන් ගත්තේ? ඇයි ඒ? එදා පොලීසියට ක්‍රියාත්මක වෙන්න දුන්නාද, තමුන්නාන්සේලා? තමුන්නාන්සේලා පොලීසිය අකර්මණ්‍ය කළා; පොලිස් කොමිසම අහෝසි කළා; පොලිස් කොමිසම අකර්මණ්‍ය කරලා පොලීසියට බලපෑම් කරන්න පටන් ගත්තා; නිර්පාක්ෂිකව වැඩ කටයුතු කළ අයට බලපෑම් කළා.

2001 - 2004 කාල පරිච්ඡේදය තුළ රනිල් වික්‍රමසිංහ මැතිතුමා අග්‍රාමාත්‍යවරයා වශයෙන් ඉන්න කාලයේ එදා පොලිස් කොමිසම නිර්මාණය කළා. ඒ පොලිස් කොමිසම නිර්මාණය කළාට පස්සේ ඒ නිලධාරින් කොන්දක් ඇතුව විමර්ශනයක්, විමර්ශනයක් විධියට ක්‍රියාත්මක කළා. මොකක්ද අවසානයේදී සිදු වුණේ? පොලිස් කොමිසම අකර්මන්‍ය කළාට පස්සේ, පොලීසිය නිර්විත්දනය කරලා අකර්මන්‍ය කළා. ඒ නිසා තමුන්නාන්සේලාට පුළුවන් වුණා, බලපෑම් කරන්න. ඒක පොලීසියට පමණක් නොවෙයි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමටත් කළා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට බලපෑම් කරපු නිසා තමයි inquiry එකට එන්න කියපු දවසේ හිටපු ඇමතිවරයාව පලා පොළගෙකු

කැවේ. අන්තිමට මොකක්ද කළේ? පොලීසියේ හිටපු පොලිස් පරීක්ෂවරු දෙන්නත් යාපනයට transfer කළා. කාන්තා පොලිස් පරීක්ෂකවරිය වව්නියාවට transfer කළා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසන්. දැන් කථාව අවසන් කරන්න.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
එතුමාට විනාඩි 5ක කාලයක් ලබා දෙනවා.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
එදා තමුන්නාන්සේලා පොලීසිය අකර්මන්‍ය කළා පමණක් නොවෙයි, අනෙක් ආයතනත් අකර්මන්‍ය කළා. පාර්ලිමේන්තුවත් අකර්මන්‍ය කළා. පාර්ලිමේන්තුව අකර්මන්‍ය කරලා ඒකාධිපතිත්වයට යන්න කටයුතු කළා. ඒකාධිපතියෙක් විසින් මේ රට පාලනය කරන තැනට කටයුතු කළා. එවැනි තත්ත්වයකට රට විනාශ කරලා අද ප්‍රචණ්ඩත්වයක් පිළිබඳව කථා කරනවා, කිසිම තේරුමක් නැතුව. මෙතැන සිද්ධීන් ගණනාවක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ සිද්ධීන් සම්බන්ධ විමර්ශන ප්‍රගති වාර්තාව මම හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

ඒවා හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කර තියන්න, මේ ගොල්ලන්ගේ කාල පරිච්ඡේදය තුළ පොලීසිය ක්‍රියාත්මක කරලා තිබෙන්නේ කොහොමද, ප්‍රචණ්ඩත්වය ක්‍රියාත්මක කරලා තිබෙන්නේ කොහොමද කියලා දැන ගන්න. ඒ ප්‍රචණ්ඩත්වය මුදා හැරලා බලය අත් පත් කර ගැනීමට, බලයේ රැඳී සිටීමට ඔබතුමන්ලා කොහොමද කටයුතු කළේ?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පාර්ලිමේන්තුවේ කථා කරන රංගෙ බණ්ඩාරගේ ගොඩනැඟිලි තුනක් ගිනිබත් කෙරුවා. හලාවත කාර්යාලය ගිනි බත් කළා. විත්තිකරුවෝ ඒ ගින්නට හසු වෙලා -ආරච්චිකට්ටුවේ සමන්ත- කළුබෝවිල රෝහලේ රෝහල්ගත වෙලා හිටියා. මම ගිහිල්ලා කැමරාගත කළා. මම ගිහිල්ලා රටේ නායකයන්ට ඒවා පෙන්වූවා. පොලීසිය මේ පිළිබඳව දැනුවත් කළා. එක පුද්ගලයෙක් අත් අඩංගුවට ගත්තාද? අද වෙන කල් කිසිම විමර්ශනයක් නැහැ. ජෝන් අමරතුංග මහත්මයාට විරුද්ධව අපියි දෝෂාභියෝගයක් ගෙනෙන්න ඕනෑ. එතුමා ඇමතිවරයා වෙලා ඉන්නවා. තව වෙන කල් මේ විමර්ශන පටන් ගත්තේ නැහැ. විත්තිකරුවන් දහසය දෙනා පිළිබඳවම මා විසින් මාදම්පේ පොලීසියට ප්‍රකාශ ලබා දීලා තිබෙනවා. අද වන තුරු එක විත්තිකාරයකුවත් අත් අඩංගුවට ගෙන නැහැ. ඒ පිළිබඳව එකම ප්‍රකාශයක්වත් ලියාගෙන නැහැ. ඔන්න, තමුන්නාන්සේලාගේ කාල පරිච්ඡේදයේ දී නීතිය ක්‍රියාත්මක වුණු හැටි. කරුවලගස්වැව නීල් වීරසිංහ කියලා කෙනෙක් ඉන්නවා. ඔහු තමුන්නාන්සේලාගේ ප්‍රාදේශීය සභා සභාපතිවරයෙක්. ඔහු මගේ වාහනයට ගිනි තැබුවා. ඒ වෙලාවේ එම වාහනයේ වටිනාකම රුපියල් ලක්ෂ 13යි. දැන් නම් රුපියල් ලක්ෂ හතළිස් ගණනක් වෙනවා. අද වන තුරු ඒ පිළිබඳව විමර්ශනයක් නැහැ. ඒ සම්බන්ධයෙන් කිසිම කෙනෙකුව අත් අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කරලා නැහැ. ඔබතුමන්ලාගේ නායකයාගේ බලපෑම මත ඒවා ක්‍රියාත්මක කළා. ඒ වාගේම මේ මෑතකදී මගේ කරුවලගස්වැව හෝටලයට රාත්‍රී කාලයේ දී ගිහිල්ලා වෙඩි තබා තිබුණා. පළාත් සභාවේ මන්ත්‍රීවරයකුගේ නායකත්වයෙන් එය කළේ. ඒ සියලු තොරතුරු අපි දන්නවා. නමුත් තව වන තුරු එක පුද්ගලයකුවත් ඒ සම්බන්ධයෙන් අත් අඩංගුවට ගෙන නැහැ.

දෝෂාභියෝගයක් ගෙනෙන්න ඕනෑ, වෛරී දේශපාලනයක් ගෙන යන්න ඕනෑ අපියි. එදා ජානක පෙරේරා මහත්මයාත් ඡන්දය ඉල්ලපු පළාත් සභා මැතිවරණය අවස්ථාවේ දී මගේ ආණමඩුව කාර්යාලය ගිනි තැබුවා. ඒ සම්බන්ධයෙන් එක පුද්ගලයකුවත් අත් අඩංගුවට ගත්තේ නැහැ. තමුන්නාන්සේලාගේ සුන්දරම පුද්ගලයා - ආරච්චිකට්ටුවේ සිටින පළාත් සභා ඇමතිවරයා - ප්‍රචණ්ඩත්වය අතට අරගෙන, T56 අතට අරගෙන තමයි වැඩ කටයුතු කළේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේවා සම්බන්ධව හඬ නඟන්න ඕනෑ; කෑ ගහන්න ඕනෑ අපියි. මැතිවරණය අවසන් වුණාට පසුව ප්‍රචණ්ඩත්වය පතුරුවන්න අපටත් හැකියාව තිබුණා. නමුත් කිසිදු සිද්ධියක් අපේ පාර්ශ්වයෙන් සිදු වුණේ නැහැ. මැතිවරණයෙන් පසුවත් ප්‍රචණ්ඩත්වය ඇති කළේ තමුන්නාන්සේලායි. ඒ නිසා තමුන්නාන්සේලාට ප්‍රචණ්ඩත්වය ගැන කථා කිරීම සඳහා කිසිදු සදාචාරාත්මක අයිතියක් නැහැ, මන්ත්‍රීවරුනි. තමුන්නාන්සේලාගේ ගරා වැටීම, කඩා වැටීම සහ ඉදිරියේ දී එන මැතිවරණයේ දී ඇති වන සෝදා පාළුව වළක්වා ගැනීම සඳහා කාලය නාස්ති කිරීමට මෙවැනි නිෂ්ඵල ක්‍රියාවල යෙදෙන්නට එපා. තමුන්නාන්සේලා කරන මේ විගඩම් නිසා අද මේ Officials' Box එක ඇතුළේ නියෝජ්‍ය පොලිස්පතිතුමන්ලා, පොලිස්පතිතුමන්ලා, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිතුමන්ලා කී දෙනෙකු ඉන්නවාද? මේ රටේ කොතරම් අපරාධ ප්‍රමාණයක් ගැන කටයුතු කරන්න තිබෙන, කොතරම් වැඩ කොටසක් කරන්න තිබෙන නිලධාරි කණ්ඩායමක්ද මෙතැනට ඇවිල්ලා මේ කාලය ගත කරන්නේ? ඒ නිසා මේ වාගේ කාලකණ්ණි යෝජනා ගෙනැල්ලා කාලය විනාශ කරන්න එපා කියන කාරණයත් මතක් කරමින්, මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමාටත් ස්තුති කරමින් මා නිහඬ වනවා. බොහොම ස්තූතියි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The Hon. Chandrasiri Gajadeera, please. You have six minutes.

[පූ.භා. 10.47]

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු පාලිත රංගෙ බණ්ඩාර අමාත්‍යතුමා කථා කළාට පසුව මේ පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් වචන කිහිපයක් කථා කරන්නට මට අවස්ථාව ලබා දීම ගැන මා සතුටු වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මේ රටේ ජනාධිපතිවරයා කරවීම සඳහා ගෙන ගිය ක්‍රියා දාමය තුළ යහපත් සටන් පාඨ තිබුණා. දින සියයේ වැඩ පිළිවෙළ වාගේම මේ රටේ කාටත් සමානව සැලකීමේ ප්‍රතිපත්තිය, "නහි වේරෙන වේරානි" - කාගෙන්වත් පළි නොගන්නා සංකල්පය, මෛත්‍රිය - කියන මේ සියල්ල මේ ක්‍රියා දාමය තුළ කැටි වෙලා තිබුණා. නමුත් මා කියන්න කැමැතියි, මේ ක්‍රියාදාමයත් එක්ක තව සටන් පාඨ තිබුණු බව. ඒ තමයි, යහ

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා]

පාලනය සහ වෙනසක් ඇති කිරීම. මේ හේතු මත අද තමුන්නාන්සේලාට ජනතාව බලය දීලා තිබෙනවා. මා කියන්නට කැමැතියි, මේ වෙනසක් ඇති කරනවා කියලා කියන්නේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ වෙනසක් බව. එය දූෂණයෙන් තොර, සර්ව සාධාරණ සමාජ ක්‍රමයක් ගොඩනැඟීම සඳහා තමුන්නාන්සේලාට දීපු වරමක්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වරම හේතුකොට ගෙන බලය අතට අරගෙන රට තුළ ප්‍රචණ්ඩත්වය මුදා හරින්න කිසිවෙකුටත් අයිතියක් නැහැ. ඒ වාගේම අපි බලයට ආවාම ගහලා, තළලා, පෙළලා, පොඩි කරනවාය කියන වරමක් ගැනත් දින සියයේ වැඩ පිළිවෙළ තුළ තිබුණේත් නැහැ. නමුත් බලය ලබා ගත්තාට පසුව ගරු ජනාධිපතිතුමාගේ සංකල්පයත් බිඳ දමලා අද ත්‍රස්තවාදය ඒ තුළට ආදේශ කරලා තිබෙනවා. මේක මැතිවරණ ප්‍රචණ්ඩත්වය විතරක් නොවෙයි, සමස්ත ත්‍රස්තවාදයේම කොටසක්. ත්‍රස්තවාදය කියලා මා කිව්වේ බිය ගැන්වීමයි. බිය ගන්වන්න හේතු වෙලා තිබෙන කාරණා තමයි, මේ දින සියයේ වැඩ පිළිවෙළෙන් පසුව තිබෙන්නේ. ඒක පළමුවැනි පරිච්ඡේදය. තව පරිච්ඡේදයක් තිබෙනවා. තමුන්නාන්සේලා අප්‍රේල් මාසයේ 23 වැනිදා මේ ආණ්ඩුව විසුරුවනවාය කියලා කියනවා. ඒක තමයි ඒ දින සියයේ වැඩසටහනේ තිබුණේ. ඒකට පසුව එන පශ්චාත් යුගය - දෙවැනි පරිච්ඡේදය - තුළ රට ඇතුළේ බලය දිනා ගැනීමට අවශ්‍ය වන්නා වූ පරිසරය හදන්න ත්‍රස්තවාදය මුදා හැරිය යුතුව තිබෙනවා. මා කියන්න කැමැතියි, එවැනි ත්‍රස්තවාදයක් මුදා හරිනවා නම් කවදාවත් සර්ව පාක්ෂික ආණ්ඩු හදන්න බැරි බව. සර්ව පාක්ෂික ආණ්ඩුවක් හදනවා නම්, ඒ සඳහා වූ මූලික කොන්දේසි නිර්මාණය කරන්නට ඕනෑ. බලය ලබා ගත්තු ගමන් ප්‍රතිවිරුද්ධ කොටස්වලට පහර දීලා, තළලා, පොඩි කරලා, බිය වැද්දීමේ දේශපාලනය පටන් අර ගෙන, හිර ගෙවල් පෙන්වලා, බය කරලා, සමාජ පද්ධති දුරස් කර ගන්නවා නම්, කාගේත් එකතුවෙන් යුක්ත වූ රටට වැඩ කරන්න පුළුවන් සර්ව පාක්ෂික ආණ්ඩුවක් හදනවා කියන එක ඒකෙන් බලාපොරොත්තු වෙන්න පුළුවන්කමක් නැහැ.

මේ සර්ව පාක්ෂික ආණ්ඩුව පිළිබඳ අපේ මතය ගැනත් මම කියන්න කැමැතියි. අපේ පක්ෂවල මතය මොකක්ද කියලා තමුන්නාන්සේලා දන්නවා. මේ ලිහලා බලපු මල්ල ආපසු ඔබා බලන්න ඕනෑ නැහැ. 1977 එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව බලයට පත් වුණු වෙලාවේ මේ රටේ මොන තරම් ප්‍රචණ්ඩත්වය මුදා හැරියාද කියන එක අපි දන්නවා. මම ඒකේ ගොදුරක්. ඒ වෙලාවේ ලංකාවේ රැකියාවලින් එළියට දමපු 43,000ක් රාජ්‍ය සේවකයන්ගෙන් කෙනෙක් මමත්. ඊට පසුව තමයි මම නීති විද්‍යාලයට ඇතුළත් වෙලා නීතිඥවරයකු විධියට කටයුතු කළේ. ඒ වෙලාවේ මගේ කන්තෝරු කාමරය කඩලා එහි තිබුණු මගේ ලියවිලි ඔක්කෝම ගඟේ දමපු බව මම කියන්න කැමැතියි. මගේ කාර්යාලයේ බෝඩ් එක මතු වුණේ තල්පෙන්. ඒ ත්‍රස්තවාදයේ අත් දැකීම්; ඒ ප්‍රචණ්ඩත්වයේ අත් දැකීම් මටත් තිබෙනවා. ඒ නිසා තමයි මේ මැතිවරණයේ දී අපි කිව්වේ, එක්සත් ජාතික පක්ෂය අතට පූර්ණ බලයක් ලැබුණොත් රටට විය හැකි දේ හිතා ගන්න පුළුවන් කියලා. වාසනාවකට අද තමුන්නාන්සේලාගේ පැත්තේ ඉන්නේ සුළුතරයක්. බහුතරය ඉන්නේ මේ පැත්තේ. බහුතරය ඔය පැත්තේ සිටියා නම් රටේ ඇති විය හැකි තත්ත්වය ගැන අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ.

මා මේ කාරණය ගැනත් සඳහන් කරන්න කැමැතියි. යුද්ධය ජයග්‍රහණය කරපු නායකයා මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා බව තමුන්නාන්සේලා දන්නවා. රට සංවර්ධනය කරපු නායකයා තමයි මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා. ඒක මම විතරක් නොවෙයි කියන්නේ. තමුන්නාන්සේලාගේ මුදල් ඇමතිතුමා පසු ගිය දා ඉදිරිපත් කළ අතුරු අය වැය ප්‍රකාශයේ කියනවා, ආර්ථික වර්ධන වේගය සියයට 7ට ගෙනල්ලා තිබෙනවා කියලා. ඒක පුද්ගල ආදායම පිළිබඳව සඳහන් කරලා තිබෙනවා. ඒ ඇති වූ ආර්ථික වර්ධනය ගැන විග්‍රහයක් කරමින් තමයි එතුමා අතුරු අය වැය ප්‍රකාශය ඉදිරිපත් කළේ. නමුත් යහ පාලනය හා වෙනසක් අපේක්ෂාවෙන් මිනිසුන් එවැනි නායකයකු බලෙන් ඉවත් කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එහෙම නම් ඔය කියන යහ පාලන ප්‍රතිපත්තිය අද කවුරුත් අපේක්ෂා කරන බව මා මතක් කරන්න කැමැතියි. ඔය කියන වෙනස, සදාචාරාත්මක පැත්තට පරිවර්තනය වන්නට ඕනෑ. අවගමනය නොවෙයි, ප්‍රගමනය සිදු වන්නට ඕනෑ. අපේ පරමාර්ථය මොකක්ද කියලා මා කියන්න කැමැතියි. සමහර වැදගත් තීන්දුවලදී සහයෝගය දෙන්න අපි සූදානම්. අය වැය ඡන්ද විමසීමේ දී අපි ඡන්දය දුන්නේ නැහැ. අපි ඡන්දය දීමෙන් වැළකී සිටියා. නමුත් මේ රජය ගෙන යන යහපත් හා සාධාරණ ක්‍රියාදාමවලදී අපේ සහයෝගය දෙන්න අපි ලැහැස්තියි. හැබැයි ඒ සහයෝගය ලබා ගන්න නම්, වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම තමුන්නාන්සේලා ඒ වෙනස හා යහ පාලනය ඇති කළ යුතුයි. සියලු ජාතීන්ට විතරක් නොවෙයි, විරුද්ධවාදී දේශපාලනඥයන්ටත් මේ සමාජය තුළ සාධාරණ පුරවැසියන් විධියට ජීවත් වීමේ අයිතිය තහවුරු කිරීම තුළ තමයි අපේ සහයෝගය ලැබෙන්නේ.

මම කියනවා, මේ දින සියයේ වැඩ පිළිවෙළ තුළ සමහර කාරණා කැලැන්ඩරයෙන් පොලා පැනලා ඇවිල්ලා තිබෙනවා කියලා. පසුවට තිබුණු ඒවා ඉස්සරහට ඇවිත් තිබෙනවා. ඉස්සරහින් තිබුණු ඒවා පස්සට ගිහිල්ලා තිබෙනවා. නමුත් අපි කියන්න කැමැතියි, මේ රට තුළ කාගෙන් හෝ හෝ සර්ව සාධාරණ සමාජ ප්‍රතිපත්තියක්, යුක්තිගරුක සමාජයක් බිහි වෙනවා නම් අපි ඒකට විරුද්ධ වන්නේ නැහැ කියන එක. නමුත් ඇඟිල්ල දිගු කරලා, බය කරලා, හිර ගෙවල් පෙන්වලා, බියවද්දලා සහයෝගය ගන්න ලැහැස්ති වන්න එපා. හැරිසන් ඇමතිතුමා මීට කලින් කථා කරපු අවස්ථාවක වැලිකඩ සිර ගෙදර සිද්ධියක් ගැන පෙන්නුවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Chandrasiri Gajadeera, please wind up now.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
එතුමා හිතන්න ඇති අපි බය කරන්න පුළුවන් කියලා. මම කියනවා, ඕනෑම කරුණක් සම්බන්ධයෙන් ඕනෑම පරීක්ෂණයක් පවත්වන්න කියලා. අපි වරදකරුවෝ වුණොත්, එල්ලුම් ගහට වුණත් යන්න බය නැහැ කියලා මා ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම සාධාරණ සමාජයක් වෙනුවෙන් ජාතික ප්‍රතිපත්ති සම්මත වන තෙක් මහජන සාමය භාර ගරු ජෝන් අමරතුංග ඇමතිතුමාට හුඟක් වැඩ කරන්න පුළුවන්. ඒ ගෞරවය රටට ලබා දෙන්නය කියන එක ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

[පූ.භා. 10.55]

ගරු තිස්ස කරල්ලියද්ද මහතා
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த)
(The Hon. Tissa Karalliyadde)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමාගේ අදහස් ප්‍රකාශ කිරීමෙන් පසුව මටත් කෙටි වේලාවක් හෝ ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වන්නට ඕනෑ. මැතිවරණයට පෙර පළමුවෙන්ම සිද්ධියකට මුහුණ පෑවේ මමයි. මැතිවරණයට දින හතරකට පමණ පෙර මැදවච්චිය බලා ගමන්

කරන විට ඉකිරිගොල්ලෑව කියන මුස්ලිම් ගම්මානය මැදදි - මුස්ලිම් ජනතාව නොවෙයි- සිංහල ජනතාව පෙළපාළියකින් යමින් ඉන්න අවස්ථාවේ මගේ වාහනය වට කරලා, මට විවිධ තර්ජන කිරීමේ ක්‍රියාවලියක යෙදුණා. මම බොහොම ඉවසීමෙන් ඒ ස්ථානයෙන් ඉවත්ව ගියා. අවුරුදු විස්සක් මම පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් හැටියට කටයුතු කරනවා. අපි මැතිවරණ රාශියකට මුහුණ දුන්නා. පොලිස් පොත් ටික අරගෙන ඒ සටහන් පරීක්ෂා කළොත් පෙනේවි, ඒ මැතිවරණවලදී අපේ මැදවච්චිය ආසනය තුළ සාමකාමී තත්ත්වයක් තමයි බොහෝ අවස්ථාවලදී අපට දකින්නට ලැබුණේ. මේ වතාවෙත් ඉතාමත්ම සාමකාමී විධියට මැදවච්චිය ආසනයේ, එම බල ප්‍රදේශයේ මැතිවරණ කටයුතු සිද්ධ වුණා. ගරු ඇමතිතුමනි, සහෝදරත්වයෙන් හිටපු එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් මැතිවරණයෙන් පසුව ක්‍රියා කළ ආකාරය තුළ විවිධ සිද්ධීන් ඇති වුණා.

ඒ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීතුමිය ආරක්ෂක හිස් වැසුමක් නොමැතිව යතුරු පැදියේ ගමන් කිරීම නිසා කැබිතිගොල්ලෑව පොලීසියේ පොලිස් පරීක්ෂක මහත්මයෙක් ඇයට නීතිය ක්‍රියාත්මක කළා කියලා, මැතිවරණයෙන් පසුව ඇයගේ ස්වාමිපුරුෂයාත් ඇයත් මේ පොලිස් පරීක්ෂක මහත්මයාට ප්‍රසිද්ධියේ පහර දීමක් සිද්ධ වුණා. ඒ වාගේම මැදවච්චිය පොලීසිය ගැන මම කනගාටු වෙනවා, එහි මමම තෝරා පත් කර ගත්ත පොලිස් ස්ථානාධිපතිතුමෙක් සිටින්නේ. පොලීසියට විශාල වගකීමක් මේ කාල සීමාවේ ඉෂ්ට සිද්ධ කරන්න පුළුවන්. අනිත් පොලිස් ස්ථාන දෙකක හැකිතාක් දුරට සාමය ආරක්ෂා කළා. අනෙකුත් ජනතාවට හිරිහැර නොකර, ජයග්‍රහණය කළ පක්ෂවලට විනෝද වෙන්න වරම ලබලා දීලා ඒ පොලිස් ස්ථානවල සාමය ආරක්ෂා කළා. නමුත් මැදවච්චිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිතුමා මේ සෑම දේකටම පක්ෂග්‍රාහීවයි කටයුතු කළේ. කඩු, මුගුරු අරගෙන කාන්තාවන්ට පහර දෙන්න ආපු වෙලාවෙත් අවසානයේ වැරදිකාරයෝ නිදහස් වුණා, කාන්තාවන් වැරදිකාරයින් බවට පත් වුණා. මෙවැනි වාතාවරණයන් සහ සිද්ධීන් රාශියක් මේ කලාපය තුළ විශාල වශයෙන් සිද්ධ වුණා. මේ ගැන අධීක්ෂණයක් කරන්න කියලා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම තමයි, රජයේ නිලධාරින්ට කරන ලද බලපෑම්. අපි රජයේ නිලධාරින්ටවත්, පොලීසියටවත් රාජකාරි කටයුතු කිරීමේදී මොන යම් ආකාරයකින්වත් බලපෑමක් කළේ නැහැ. ඒ උගත් නිලධාරින්ට අපේ සම්පූර්ණ සහයෝගය ලබා දෙමින් තමයි අපි කටයුතු කළේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙය සාමකාමී කලාපයක් හැටියට අපි හඳුන්වන්නට ඕනෑ. අපට ත්‍රස්තවාදීන්ගේ ප්‍රශ්නය පමණයි තිබුණේ. ඒ ප්‍රශ්නයෙන් නිදහස් වුණාට පස්සේ අපි ඉතාමත්ම සහෝදරත්වයෙන් තමයි මේ කටයුතු සිද්ධ කළේ කියන එක මම මේ අවස්ථාවේදී කියන්නට ඕනෑ.

ගරු සජිත් ප්‍රේමදාස අමාත්‍යතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. එතුමා සමඟ මම සාකච්ඡා කළා. මේ "දිවි නැහුම" වැඩසටහන පරීක්ෂණයකට ලක් කරන්න. අපේ ආසන තුළ පක්ෂ භේදයෙන් තොරව තමයි ගරු ඇමතිතුමනි මේ ජීවන උපාය වැඩසටහන් ක්‍රියාත්මක කරලා තිබෙන්නේ. ඒ සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කරන්නය කියන ඉල්ලීමත් මම කරන්නට ඕනෑ.

ගුරුවරුන් සඳහා ගුරු ගම්මානයක් හදන්න අපි ඉඩම් ටිකක් වෙන් කරලා තිබුණා. ඔබතුමාගේ නිවාස ව්‍යාපෘතිය සඳහා ඒ ගුරු ගම්මානය යොදා ගන්න සැලසුම් කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මම හිතනවා ගම් මට්ටමින් නිවාස හදලා දුන්නොත් ඔබතුමාගේ මේ ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක වෙනවා කියලා. මගේ අදහසක් හැටියට මා එය ඔබතුමාට ඉදිරිපත් කරනවා. ඒ සඳහා ඉක්මන් වෙන්න අවශ්‍ය නැහැ. දින සියය තුළ මේක කරන්නත් අවශ්‍ය නැහැ. ගම් මට්ටමින් ඒ වැඩ පිළිවෙළ සාර්ථක කර ගන්න. ඉඩ කඩම් තිබෙන විධියට ඒවා හොයලා දෙන්න. මේ ගුරු ගම්මානය ගුරුවරුන් වෙනුවෙන්ම වෙන් කර දෙන්නය කියන කාරුණික ඉල්ලීමත් ඔබතුමාට මේ අවස්ථාවේ ඉදිරිපත් කරනවා. ඒ වාගේම මේ ජීවන උපාය වැඩසටහන සාධාරණ ලෙස, පරක්කු කරන්නේ නැතිව ඔවුන්ට ලබා දෙන්න කටයුතු කරන්නය කියන ඉල්ලීමත් මේ අවස්ථාවේදී මා කරනවා.

අපි පොලිස්පතිතුමා ගැන කථා කළා. එතුමා පොලිස්පතිතුමා වෙන්න මත්තෙන් අනුරාධපුර ප්‍රදේශයේ සේවය කළා. දීර්ඝ කාලීන යුද්ධය වාතාවරණය තුළ එතුමා ඒ ප්‍රදේශයේ සේවය කරපු අවංක නිලධාරියකු හැටියට අපි දන්නවා. ඒ නිසා අපට අපේ තිබෙන ප්‍රශ්න එතුමාට ඉදිරිපත් කරන්න පුළුවන්. පැන නඟින හැම කරුණකටම ක්ෂණිකව අපට පොලිස්පතිතුමාට ඇඟිල්ල දිගු කරන්න බැහැ. අපේ කලාපයේ ඉන්න වගකිව යුතු නිලධාරින්ට හතර පස් වතාවකට වඩා අපේ ප්‍රදේශයේ සිද්ධ වන සිද්ධීන් ගැන දැනුවත් කළත් ඒක "බිහිරි අලින්ට වීනා වාදනය කරනවා වාගෙයි" කියලා මා හිතුවා. එක් පොලිස් නිලධාරියකු හැරුණු කොට, අනෙක් අය ගැනයි මා මේ කියන්නේ. ඒ පොලිස් නිලධාරියාගේ නම සඳහන් කරන්න මා කැමැති නැහැ. ඒ නිලධාරියා අවංකව මැදිහත් වුණු සෑම තැනකදීම ගරු ඇමතිතුමනි, සාමය ආරක්ෂා කර දුන්නා. මෙන්න මේක තමයි අපි පොලීසියකින් බලාපොරොත්තු වන්නේ.

අපි ඉල්ලා සිටිනවා රාජකාරි කටයුතුවලට කරන බලපෑම් නවත්වන්නය කියලා. එහෙම ඉල්ලන්න අපට අවසරයක් තිබෙනවා අපි රාජකාරිවලට බලපෑම් නොකරපු නිසා. ග්‍රාම නිලධාරින්ට, සමෘද්ධි සංවර්ධන නිලධාරින්ට, දිවි නැහුම සංවර්ධන නිලධාරින්ට කරන අයුතු බලපෑම් නවත්වන්න කියලා ඉල්ලීමක් කරනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

ගරු තිස්ස කරල්ලියද්ද මහතා
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த)
(The Hon. Tissa Karalliyadde)
හොඳයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ජීවන උපාය මාර්ගය සඳහා තෝරා ගත්ත අයට මූල්‍යාධාර ලබා දෙන්නටත්, සමෘද්ධි තේරීම් සමෘද්ධි සංවර්ධන නිලධාරින් හරහා කිරීමටත් කටයුතු කරන්නය කියා ඉල්ලා සිටිමින් මට ලබා දුන්නු කෙටි කාලය පිළිබඳව ස්තුතිය පුද කරමින් මගේ කථාව අවසන් කරනවා.

[පූ.භා. 11.02]

ගරු සජිත් ප්‍රේමදාස මහතා (නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - வீடமைப்பு மற்றும் சமுர்த்தி அமைச்சர்)
(The Hon. Sajith Premadasa - Minister of Housing and Samurdhi)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද විපක්ෂය විසින් ඉදිරිපත් කර තිබෙනවා, පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩත්වය පිළිබඳ යෝජනාවක්. මා දකිනවා මේක ඓතිහාසික විහිළුවක් හැටියට. මැතිවරණ සමයේ සිදු වුණු සිදුවීම් සියල්ලක්ම අමතක කරලා, මේ පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩත්වය ගැන පමණක්ම කථා කිරීම දෛවයේ සරදමක් හැටියටයි මා දකින්නේ. මේ යෝජනාව ගෙන එන්නට කටයුතු කළේ ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

කොලොන්නාවේ රැස්වීමට වෙඩි තියාපු අයයි. ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ වඳුරඹ වේදිකාව පුච්චලා, විනාශ කරලා, ඉන් පස්සේ වඳුරඹ පොලීසිය ඇතුළට ගිහිල්ලා සැකකරුවන් බලහත්කාරයෙන් එළියට ගත්ත පාර්ශ්වය තමයි පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩත්වයක් ගැන කථා කරන්නේ. ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ පැල්මඩුල්ලේ වේදිකාවට පහර ගහපු කොටඨාසය, පොළොන්නරුවේ මැතිවරණ වේදිකාවට වෙඩි තියාපු කොටඨාසය, තිස්සමහාරාමයේ මැතිවරණ රැස්වීම්වලට සෙනග ගෙනා බස්රථවලට ඇණ තියාපු කොටඨාසය තමයි දැන් මේ පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩත්වය ගැන කථා කරන්නේ. බොහොම අගෙයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ධම්මපදයේ මෙහෙම ගාථාවක් තිබෙනවා:

"අත්තානමෙව පඨමං - පතිරූපෙ නිවෙසයෙ
අථඤ්ඤමනුසාසෙය්‍ය - න කිලිස්සෙය්‍ය පණ්ඩිතො"

අනුන්ට බණ දේශනා කරන්නට පෙර තමන් දැන ගන්නට ඕනෑ, තමන්ගේ හැදියාව සකස් කර ගන්න. අනුන්ට උපදෙස් දෙන්නට පෙර තමන් දැන ගන්නට ඕනෑ නියමිත සම්මතයේ ඉඳගෙන කටයුතු කරන්න. ඒකයි මෙම ගාථාවෙන් කියැවෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මොකක්ද ජනාධිපතිවරණ සමයේ සිද්ධ වුණේ? ඇත්ත වශයෙන්ම විපක්ෂයේ ඔබතුමන්ලාට මා දොස් කියන්නේ නැහැ. ඔබතුමන්ලා අසරණයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජනාධිපතිවරණ මැතිවරණ වැඩසටහන මෙහෙයවූවේ තමුන්නාන්සේලා නොවෙයි, අර නිවට බලුකාය. අර තිබ්බානේ, බලුකායක්. එක තරුණ මන්ත්‍රීවරයකු පුම්බන්න ගොඩ නහාපු බලුකාය. ඒ බලුකාය තමයි ජනාධිපතිවරණ සමයේ කරන්න පුළුවන් පහත්ම, නින්දිත වැඩ කටයුතු ක්‍රියාත්මක කළේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විපක්ෂයේ මන්ත්‍රීවරු මේ කොච්චර කෑ ගැහුවත් ඒ අය යම් සතුටකින් ඉන්නා බව අපි දන්නවා. ඒ මොකද? එදා කොච්චර ඇමතිකම් තිබුණත්, නියෝජ්‍ය ඇමතිකම් තිබුණත් අර බලුකාය ඒ ඇමතිවරුන්, නියෝජ්‍ය ඇමතිවරුන් අභිභවා ගිහිල්ලායි කටයුතු කළේ. ඒවාට කෙළින්ම නියෝග ආවේ ජනාධිපති ලේකම් කාර්යාලයෙනුයි. මැති ඇමතිවරුන්ට කිසිම බලයක් තිබුණේ නැහැ.

නිකම් නමට නිලයක් තිබුණා. ඉතින්, මේ බලුකාය තමයි ජනාධිපතිවරණය කාලයේදී මුළු රට පුරාම ප්‍රචණ්ඩත්වය ක්‍රියාත්මක කළේ. මම මේ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට ඇඟිල්ල දිගු කරන්නේ නැහැ. එක්කෙනෙක් දෙන්නෙක් හැරුණු කොට එතුමන්ලා කවුරුවත් ප්‍රචණ්ඩත්වය ක්‍රියාත්මක කළේ නැහැ. ඔක්කෝම කළේ අර බලුකාය. ජනාධිපතිවරණ සමයේ දේශපාලන අවිය වුණේ ජනමතයවත්, සර්වජන ඡන්ද බලයවත් - ඡන්දය දීමේ අයිතියවත්- නොවෙයි. ටී56 තමයි ජනාධිපතිවරණ සමයේදී රජ වුණේ. කඩුව, කිනිස්ස, බෝම්බය උපයෝගී කරගෙනයි රාජ්‍ය පාර්ශ්වය නියෝජනය කළ නින්දිත බලුකාය ක්‍රියා කළේ. කළු කරපු වීදුරු සහිත ඩිෆෙන්ඩර් වාහන එකක් දෙකක් නොවෙයි, එක ආසනයකට සීයයක් දෙසීයක් ඇවිල්ලා ඒ මහා භීෂණය, ඒ මහා භීතිකාව ක්‍රියාත්මක කළේ අර නිවට බලුකාය. දැන් මහ ලොකුවට පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩත්වය ගැන කථා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හම්බන්තොට දිස්ත්‍රික්කය ගැනයි මම කථා කරන්නේ. රැස්වීමක්, රැස්වීමක් පාසා ප්‍රචණ්ඩත්වය ක්‍රියාත්මක කළා. අපට පොකට් රැස්වීමක් පවත්වන්න බැහැ, රෑට ගෙදර ළඟට ඇවිල්ලා අහසට වෙඩි තියනවා. හැම රැස්වීමකම ක්‍රියාත්මක කළා, "අහසට වෙඩි තැබීමේ මහා ආශ්චර්යවත් ව්‍යාපෘතිය." කියන එක. ඒක තමයි පංච මහා ආශ්චර්වයත් ටී56 සංස්කෘතිය; ඒක තමයි පංචා මහා බලකේන්ද්‍රය. පොකට් රැස්වීමක් පවත්වන්න බැහැ, රෑට ඇවිල්ලා අහසට වෙඩි තියනවා. මෙන්න මේක තමයි එදා ක්‍රියාත්මක වුණේ. දැන් බලන්න විපක්ෂයේ මැති ඇමතිවරුනි. මම මන්ත්‍රීවරුන් කියා කියන්නේ නැහැ. මොකද, ඔබතුමන්ලාත් හිටපු මැති ඇමතිවරු. එක්සත් ජාතික පක්ෂයට, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට තංගල්ල නගරයේ රැස්වීමක් පවත්වන්න වරම් තිබුණේ නැහැ. ඒ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මේ රටේ පුරවැසියෙක් නොවන නිසාද? තංගල්ල නගරයේ රැස්වීම කරන්න දුන්නේ නැහැ, වලස්මුල්ල නගරයේ රැස්වීම කරන්න දුන්නේ නැහැ, තිස්සමහාරාමයේ පවත්වපු රැස්වීමට ජනතාව ආපු පෞද්ගලික බස්රථවලට ඇණ තැබුවා. ඔන්න බලුකායේ කෙරුවාව; නිල් බලකාය කියලා කියාගත් සුනඛ බලුකායේ කෙරුවාව. මේ අය තමයි විසිහතර පැයම, තුන්සියහැටපස් දවසේම හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ ප්‍රචණ්ඩත්වය ක්‍රියාත්මක කළේ. මම ඒක වග කීමෙන් ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හිටපු ගරු ජනාධිපතිතුමා බෞද්ධාගමික සිද්ධස්ථානවලට ගියා, මහා සංඝරත්නයට ලොකු ගරුත්වයක් තිබුණා, බෞද්ධ සිද්ධස්ථාන කේන්ද්‍ර කරගෙන යම් වැඩ කොටසක් කළා. නමුත් ජනාධිපතිවරණ සමයේ බෙලිඅත්ත දම්මුල්ල විහාරස්ථානයේ නායක හාමුදුරුවන්ට මොකක්ද කළේ? උන්වහන්සේ එක්සත් භික්ෂු බලමණ්ඩලයේ සාමාජික නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ නමක්. මොකක්ද කළේ? දකුණු පළාත් සභා මන්ත්‍රී කසුන් මන්ත්‍රීවරයා ටී56 අරගෙන three-wheelers දෙකකින් ඇවිල්ලා නායක හාමුදුරුවන්ගේ සිවුරෙන් ඇදලා අල්ලලා උඩට වෙඩි තියලා තර්ජනය කළා, "එක්සත් ජාතික පක්ෂයේ දේශපාලනඥයෝ පන්සලට ගෙන ආවොත් අපේ තීන්දුව මරණය" කියා. මම මේ වග කීමෙන් යුතුවයි කියන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කනගාටුවෙන් හෝ කියන්නට ඕනෑ, අදත් හම්බන්තොට දිස්ත්‍රික්කයේ බෙලිඅත්තේත්, වීරකැටියේත් නිල නොවන අවි ගබඩා තිබෙන බව. ටී56 අවි ගබඩා තිබෙනවා. ඒවායේ grenades තිබෙනවා, weapons තිබෙනවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් ඒවා අල්ලන්නකෝ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමාගෙන් අපි ඉල්ලීමක් කළා, කරුණාකරලා මේ අවි ගබඩා පිළිබඳව සොයා බැලීමක් කරන්න කියා. කවුද මේ අවි ගබඩා ක්‍රියාත්මක කරන්නේ? කියන්න ලජ්ජයි. හම්බන්තොට දිස්ත්‍රික්කය නියෝජනය කරන මේ පාර්ලිමේන්තුවේම මන්ත්‍රීවරයෙක්ම තමයි අවි ගබඩා ක්‍රියාත්මක කරගෙන යන්නේ.

තමුන්නාන්සේලාට මතක ඇති, ඒ කාලයේ කැකිරිපොඩ්ඩා, වම්බොට්ටා, වැටකොළුවා, ආමි ජීනේ, නේවි ජීනේ, පස්සර ගුණයා වාගේ මැරවරයෝ හරහා ක්‍රියාත්මක කරපු දේශපාලන සංස්කෘතිය. එය අදත් හම්බන්තොට දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වනවා. කවුද ඒකේ කප්පිත්තා? සුනඛ බලුකායේ ලොක්කා; පසු ගිය කාලයේ ප්‍රචණ්ඩත්වයේ කප්පිත්තා. ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි අප රැස්වීම් පවත්වපු නිවෙස්වලට ගිහින් එදා ඔවුන් ක්‍රියාත්මක කළේ ටී56න් වෙඩි තැබීමේ සංස්කෘතිය.

ඡන්ද කාලයේ තවත් අමුතුම සෙල්ලමක් ක්‍රියාත්මක වුණා. එක්සත් ජාතික පක්ෂයේ ඡන්ද පොළ නියෝජිතයන්ගේ නාම ලේඛන එකතු කරන්න කියා පොලීසියේ බුද්ධි අංශයට නියෝග කළා. මම මේ වග කීමෙන් කියන්නේ. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඒක සිද්ධ වුණා. ඒ පොලීසිවල සිටින බුද්ධි අංශයේ නිලධාරින්ට නියෝග කළා, යූඑන්පී එකේ ඡන්ද පොළ නියෝජිතයන්ගේ නාම ලේඛන රැස් කරන්න කියා. නාම ලේඛන රැස් කළාට පස්සේ මොකක්ද සිද්ධ වුණේ? හැම දාම රෑට රෑට ගිහිල්ලා ඒ අයට තර්ජනය කළා, polling booth එකට යන්න එපාය කියා. මෙන්න ක්‍රියාත්මක වුණු ආශ්චර්යවත්, සදාචාරවත් දේශපාලන සංස්කෘතිය!

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මැතිවරණ ජයග්‍රහණයත් සමඟම අප ගත්ත තීන්දුව මොකක්ද? හම්බන්තොට කච්චේරි භූමියේ ඉඳලාම දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි සිසිර කුමාර මැතිතුමා අමතා මම එතුමාට උපදෙස් දුන්නා, ඉස්සර වෙලාම ගන්න ඕනෑ පියවර මොකක්ද කියා. ජනාධිපතිතුමාගේ කාල්ටන් නිවසට ආරක්ෂාව ලබා දෙන්න; නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ කාර්යාලයට ආරක්ෂාව දෙන්න; මැදමුලන වලව්වට ආරක්ෂාව ලබා දෙන්න; මැදමුලන තිබෙන සොහොන් කොතට ආරක්ෂාව ලබා දෙන්න; මහින්ද අමරවීර හිටපු ඇමතිතුමාගේ නිවසට ආරක්ෂාව ලබා දෙන්න; නිරුපමා මැතිනියගේ නිවසට ආරක්ෂාව ලබා දෙන්න; ඉන්දික මන්ත්‍රීතුමාගේ නිවසට ආරක්ෂාව ලබා දෙන්න; ගරු කථානායකතුමාගේ තිස්සමහාරාමයේ නිවසට ආරක්ෂාව ලබා දෙන්න කියන එක තමයි අප ගත්ත පළමු පියවර. හැබැයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පැය 48කට පෙර මම මගේ ගෙදරට ආරක්ෂාව ඉල්ලුවා. නමුත්, කිසිම ආරක්ෂාවක් ලැබුණේ නැහැ. ඔන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි වෙනස.

තිස්සමහාරාමයේ ප්‍රචණ්ඩත්වයක් ක්‍රියාත්මක වුණාය කියා විපක්ෂ නායකතුමා ප්‍රකාශ කරනවා අපට ඇහුණා. දකුණු පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වික්‍රමරත්න මැතිතුමා අද නිලධාරින්ගේ කුටියට පැමිණ සිටිනවා. කනගාටුවෙන් හෝ මම කියන්න ඕනෑ, විපක්ෂ නායකතුමා ප්‍රකාශ කළේ අමු පට්ටපල් බොරුවක් බව. මේ නිලධාරිතුමා අප පත් කරපු කෙනෙක් නොවෙයි. ඒ පසු ගිය රජය සමයේ සිට දකුණු පළාත භාරව හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමායි. මම ගිහින් එතුමාගෙන් ඇහුවා, "මේක ඇත්තක්ද" කියා. එතුමා කියපු වචනවලින්ම කිව්වොත්, "අමු පට්ටපල් බොරුවක්" කියා තමයි එතුමා කිව්වේ. ඉතින්, මේ උත්තරීතර සභාවට ඇවිත් නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා මේ වාගේ අමු පට්ටපල් බොරු බෙගල් ඇද දැමීම ඉතාම නින්දිත ක්‍රියාවක්. ඒ මොකද? නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා අද විපක්ෂ නායකතුමා වෙලා ඉන්නේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට පින් සිද්ධ වෙන්නයි. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පක්ෂයේ නායකත්වය ගත්තේ නැත්නම් මොකද වන්නේ? ජාතික ලැයිස්තුවේ මන්ත්‍රීවරු දෙපළක් අයින් කරලා හිටපු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට එන්න හැදුවා නේද? විපක්ෂ නායක වෙන්න හැදුවා නේද? කනගාටුයි, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට පින් සිද්ධ වෙන්න විපක්ෂ නායකකමට පැමිණි පුද්ගලයා මේ උත්තරීතර සභාව තුළදී අද අමු පට්ටපල් බොරු බෙගල් ඇද දැමීම ඉතාම නින්දා සහගත ක්‍රියාවක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පශ්චාත් පළිගැනීම්, පශ්චාත් විමර්ශන ගැන කථා කරන මේ වෙලාවේ මෙන්න මේ කාරණය ගැන නම් මට කියන්න පුළුවන්. අප එක දෙයක් නම් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

මැතිවරණ කාලයේ සමෘද්ධිලාභින්ගේ අනිවාර්ය ඉතිරි කිරීම් හොරා කාලා සමෘද්ධිලාභින් 14,00,000කට රුපියල් 2,500 ගණනේ බෙදා දීම ගැන අපි විමර්ශනය කරනවා. සමෘද්ධිලාභින්ගේ අනිවාර්ය ඉතිරි කිරීම් මහ දවල් අමු-අමුවේ හොරා කෑම ගැන අපි විමර්ශනය කරනවා. ඒක පළිගැනීමක් කියලා කියන්න එපා. මහා භාණ්ඩාගාරයේ සල්ලිවලින් දෙන්න තිබුණ රුපියල් 2,500 දීලා තිබෙන්නේ සමෘද්ධිලාභියාගේ අනිවාර්ය ඉතිරි කිරීම්වලින්. මෙන්න මහා ලොකු ආශ්චර්යවත් කෙරුවාව.

ඒ විතරක් නොවෙයි. නිවාස අමාත්‍යාංශයේ ගෙවල් හදන්න තිබුණු සල්ලි හොරා කාලා තිබෙනවා. ඒ සල්ලි හොරා කාලා දේශපාලන ව්‍යාපෘති ක්‍රියාත්මක කරලා තිබෙනවා. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ වාහන 33ක් කුලියට අරගෙන තිබෙනවා. ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ වාහන 15ක් කුලියට අරගෙන තිබෙනවා. [බාධා කිරීමක්] අල්ලන්න දෙයක් නැහැ. ඒවා ඔක්කොම අහෝසි කරලායි තිබෙන්නේ. විවිධ දේශපාලන ව්‍යාපෘතිවලට අපි යාන වාහන පාවිච්චි කරන්නේ නැහැ. කිසිම ව්‍යාපෘතියකට අත තබන්නේ නැහැ. පෞද්ගලික ප්‍රතිරූප පිම්බීමේ වැඩසටහන්වලට ගෙවල් හදන සල්ලි අපි ගන්නේ නැහැ. හැබැයි ඒවා පිළිබඳව විමර්ශනය කරනවා. ඒවාට පළිගැනීම් කියලා කියන්න එපා. හොරා කාපු දේවල්, කොල්ල කාපු දේවල් ඔක්කොම සොයා බලනවා. ඒවා පළිගැනීම් නොවෙයි. ඒවා විමර්ශන. ඒ විමර්ශන කිරීම් සියල්ලක්ම අපක්ෂපාතීවයි ක්‍රියාත්මක කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වෙනදාට සමෘද්ධි අමාත්‍යාංශයෙන් වාර්ෂිකව ලිත් ලක්ෂ 4ක් මුද්‍රණය කරනවා. සාමාන්‍යයෙන් ඒවා මුද්‍රණය කරන්නේ මාර්තු මාසයේ හා අප්‍රේල් මාසයේ. මෙදා නොවැම්බර් මාසයේ හා දෙසැම්බර් මාසයේ ලිත් ලක්ෂ 50ක් මුද්‍රණය කරලා තිබෙනවා. ඒවා මුද්‍රණය කර තිබෙන්නේ කාගේ සල්ලිවලින්ද? සමෘද්ධිලාභියාගේ අනිවාර්ය ඉතිරි කිරීම්වලින්. සමෘද්ධිලාභියාගේ සල්ලි ටික හොරා කාලා ලිත් ලක්ෂ 50ක් මුද්‍රණය කරලා තිබෙනවා. ඒවා ගැන අපි විමර්ශනය කරනවා. ඒවා ගැන පරීක්ෂණ පවත්වනවා. ඒවාට පළිගැනීම් කියන්න එපා. ඒවා පළිගැනීම් නොවෙයි. තමුන්නාන්සේලාගේ රජය තමයි, 14,00,000ක් වූ සමෘද්ධිලාභින්ගේ මුදල් හොරා කාලා, මහ දවල් අමු-අමුවේ සල්ලි කොල්ල කාලා, සමෘද්ධිලාභියාගෙන් පළිය ගත්තේ. අපි නොවෙයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනාධිපතිවරණයක් උදෙසා මේ රටේ දුප්පත් මිනිසුන්ගේ අනිවාර්ය ඉතිරි කිරීම්, අරමුදල් හොරා කාලා, ලිත් ලක්ෂ 50ක් මුද්‍රණය කරනවාය කියන එක හරිද, වැරැදිද? උත්තරයක් දෙන්න කොන්දක් තිබෙනවාද?

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ලජ්ජයි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මෙන්න මේක තමයි ඇත්ත කථාව. මේ රටේ මහජන සම්පත් අමු-අමුවේ හොරා කාලා තිබෙනවා. අපේ තිස්ස කරල්ලියද්ද මැතිතුමා දිවිනැඟුම වැඩසටහන ගැන කථා කළා. ඔබතුමා භය වෙන්න එපා. දිවිනැඟුම වැඩසටහන සහමුලින්ම නිර්දේශපාලනීකරණය කරනවා. මින් ඉදිරියට එක එක නිලධාරින් හරක් දක්කනවා වාගේ සමෘද්ධිලාභින් සීවීබී බස්වලට නග්ගවා රැස්වීම්වලට දක්කපු කාලය ඉවරයි. තමුන්නාන්සේලාගේ කාලයේ කරපු ඒ නින්දිත ක්‍රියාව අපි නතර කරනවා. ඒවාට ඉඩ තබන්නේ නැහැ. ග්‍රාම සේවා වසමේ එක නිලධාරියකුට මහ ලොකු එහෙයියකුවෙලා, මහ ලොකු එහෙයියන්ගේ කප්පිත්තන් වෙලා, මහ ලොකු බලධාරියකු වෙලා අහිංසක සමෘද්ධිලාභි

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ජනතාව තළා, පෙළා, පොඩි කරලා පැත්තකට විසි කරපු කාලය ඉවරයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අපි ඒ කාලය නතර කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය කාලයේ සිදු වුණු විනාශය ගැන සොයා බලන්න අපට සිද්ධ වනවා.

මා ඉදිරියේ ඉන්නවා, ජෝන් සෙනෙවිරත්න හිටපු ඇමතිතුමා. මා ඉදිරියේ ඉන්නවා, තිස්ස කරල්ලියද්ද හිටපු ඇමතිතුමා. මා ඉදිරියේ ඉන්නවා, අතාවුද සෙනෙවිරත්න හිටපු ඇමතිතුමා. දැන් මා අහන්නේ පසු ගිය රජය සංවර්ධන කටයුතුවලට ඔබතුමන්ලාගේ අමාත්‍යාංශවලට සාධාරණ මුදලක් වෙන් කළාද කියලායි. අමාත්‍යාංශ දෙක, තුන බදා ගෙනයි සිටියේ. ඇත්ත වශයෙන්ම තමුන්නාන්සේලා කුලී හේවායන් වාගෙයි කටයුතු කළේ. තමුන්නාන්සේලා පඹයන් වාගෙයි සිටියේ. තමුන්නාන්සේලා දේශපාලන ක්ෂේත්‍රය තුළ තඹ දොයිතුවකටවත් ගණන් ගන්නේ නැති අවලංගු කාසි බවට පත් වෙලා සිටියා. කොහේද සල්ලි ටික තිබුණේ? ඔක්කොම තිබුණේ, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ. සියලු දෙනාම බැසිල් රාජපක්ෂ මැතිතුමා ළඟට ගිහින්, නාමල් රාජපක්ෂ මැතිතුමා ළඟට ගිහින්, "අනේ! අනේ! අපට සල්ලි දෙන්න. අනේ! අපට සල්ලි දෙන්න" කියලා වැඳ වැටෙන්න ඕනෑ. පින්සෙණ්ඩු වෙන්න ඕනෑ. සුවච, කීකරු ගෝලබාලයින් වෙන්න ඕනෑ. තමුන්නාන්සේලාට ඒ අයගේ කුලී හේවායින් වෙන්න සිද්ධ වුණා. ප්‍රතිපාදන ගන්න නම් සමහරුන්ට ඒ අය වෙනුවෙන් කුලියට කඹින්නත් සිද්ධ වුණා. ඒකයි ඇත්ත කථාව. අපි දන්නවා, විපක්ෂයේ ඉන්නට වීම නිසා අද විපක්ෂයේ බොහෝ දෙනාට යම් කනගාටුවක් ඇති කියා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Minister, your time is over.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I have five more minutes given by the Hon. Dilip Wedaarachchi. විපක්ෂයේ ඉන්න නිසා පොඩි දුකක් ඇති. නමුත් විපක්ෂයේ ඉන්න තමුන්නාන්සේලාගේ මුහුණු දිහා බැලුවාම පොඩි සතුටකුත් තිබෙන බව පෙනෙනවා. ඇයි? අද අඩුම තරමින් යම් යහ පාලනයක්, යම් ප්‍රජාතන්ත්‍රවාදයක් ක්‍රියාත්මක වෙන නිසායි. අඩුපාඩුකම් තිබෙනවා. එහෙම නැහැයි කියා අපි කියන්නේ නැහැ. අනිවාර්යයෙන්ම අඩුපාඩුකම් තිබෙනවා. අඩුපාඩුකම් හදා ගත්තේ නැත්නම් බලයේ සිටින ඕනෑම පාර්ශ්වයකට විපක්ෂයට යන්න සිද්ධ වේවි. අඩුපාඩුකම් නැහැයි කියා අපි කියන්නේ නැහැ. නමුත් යහ පාලනය තුළින් අපි හොඳ ආරම්භයක් ලබා තිබෙනවා. මගේ අම්මේ! අපේ චන්ද්‍රසිරි ගජදීර මැතිතුමා කථා කළා, "ඒක පුද්ගල ආදායම වැඩි කළ අපේ හිටපු ජනාධිපතිතුමා, ආර්ථික වර්ධන වේගය මහා උසස් මට්ටමකට ගෙනාපු හිටපු අතිගරු ජනාධිපතිතුමා" කියා. නමුත් යහ පාලනය උදෙසා ජනතාව එතුමා පැරැද්දුවා. චන්ද්‍රසිරි ගජදීර මැතිතුමනි, සමාජවාදය අනුගමනය කරන පුද්ගලයෙක් හැටියට තමුන්නාන්සේ දැනගන්න ඕනෑ, ආර්ථික වර්ධන වේගය කොතරම් වැඩි වුණත් පසු ගිය රජය සමයේ නැති බැරි - ඇති හැකි පරතරය පළල් වුණාය කියන එක.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
What is the point of Order, Hon. Chandrasiri Gajadeera?

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
අය වැය ලේඛනයේ 10වන පිටුව බලන්න. ඔබතුමන්ලාගේ මුදල් ඇමතිතුමා කිව්වේ-

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
That is not a point of Order.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒක point of Order එකක් නොවෙයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය රජය සමයේ ආර්ථික වර්ධන වේගය ගැන චන්ද්‍රසිරි ගජදීර මැතිතුමා පම්පෝරි ගැහුවාට, පොහොසත්ම සියයට 20 ජාතික ආදායමෙන් සියයට 54ක් බුක්ති වින්දා. දුප්පත්ම සියයට 20 බුක්ති වින්දේ ජාතික ආදායමෙන් සියයට 4ක් වැනි සොච්චමක්. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒක පුද්ගල ආදායම ගැන කථා කරනවා. ගරු මන්ත්‍රීතුමනි, ඒක පුද්ගල ණයබරතාවය රුපියල් ලක්ෂ 4යි. ඇයි, ඒක ගැන කථා කරන්නේ නැත්තේ? ඔබතුමා මහ ලොකුවට ප්‍රචණ්ඩත්වය ගැන කථා කරනවා. හිරගෙදර රැඳවියන්වත් රැක ගන්න බැරි වුණු ඇමතිතුමෙක් තමයි ඔබතුමා. ඔබතුමාට හිරගෙදර රැඳවියන් ටික රැක ගන්න බැරි වුණා. දැන් කථා කරනවා, සදාචාරය ගැන; ප්‍රජාතන්ත්‍රවාදය ගැන. මම අර කිව්වා වාගේ, කණ්ණාඩියක් ඉස්සරහට ගිහිල්ලා තමන්ගේ නිරුවත සෝදිසි කරලා බලා මේ උත්තරීතර සභාවට කථා කරන්න එන්නය කියා මම කියනවා. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අපි සතුටු වෙන්න ඕනෑ, යහ පාලනය තුළ සුනඛ බලකායට තැනක් නැති වීම ගැන. අද සුනඛ බලකායේ කප්පිත්තෝ කියනවා, ප්‍රචණ්ඩත්වය ක්‍රියාත්මක වීම පිළිබඳව නොමිලේ නීති ආධාර ලබා දෙනවාය කියා. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ප්‍රචණ්ඩත්වයක් තිබෙන්නේ කොහේද? අමු පට්ටපල් බොරු. බෙලිඅත්ත වධකාගාරයක් කළා. වීරකැටිය වධකාගාරයක් කළා. නීති ආධාර දෙනවාය කියා දැන් පම්පෝරි ගහන්න එනවා. හම්බන්තොට දිස්ත්‍රික්කයේ පොඩි මිනිහාගේ ඉඩම් කොල්ල කෑවා. ඒ පොඩි මිනිහාට නීති ආධාර දෙන්න ඕනෑ. පොඩි මිනිහාගේ ඉඩම් කොම්පැනිකාරයින්ට, බහුජාතික සමාගම්වලට තුට්ටු දෙකට දීලා තිබෙනවා. ඒවා පිළිබඳවයි නීති ආධාර ලබා දෙන්න ඕනෑ. පොඩි මිනිහාට මහා විනාශයක් කර තිබෙනවා. පොඩි මිනිහාගේ ඉඩම් කුට්ටි පිටින් අරගෙන අද ලොකු ලොකු හෝටල් හදනවා. අද Seven-Star හෝටල් හදනවා. කවුද මේ හෝටල්වල අයිතිකාරයෝ? අර බලුකායේ කප්පිත්තෝ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අන්න ඒ නිසා ඒ අය සෝබන දේශපාලනයක් කරනවා වෙනුවට කරුණාකරලා හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජනතාව ළඟට ගිහිල්ලා, තමන් කරපු ඒ මහා ඉඩම් කොල්ලය ගැන ජනතාව ඉදිරියේ දණ ගහලා සමාව ඉල්ලන්න ඕනෑය කියා මම කියනවා. නිකම් බොරුවට කෑ ගහන්නේ නැතිව ගිහින් බලන්න. තංගල්ලේ ඉඳලා කිරින්ද දක්වා ඉඩම් අයිතිව තිබෙන්නේ කාටද? ඉඩම් හොරා කාලා තිබෙන්නේ කවුද? පොඩි මිනිහාගේ ඉඩම්, ගොවියාගේ ඉඩම්, ධීවරයාගේ ඉඩම්, පුංචි මිනිස්සුන්ගේ ඉඩම් කොල්ල කාලා තිබෙනවා. ඒ නිසා නිකම් බොරුවට පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩත්ව ගැන බණ දේශනා කරන්න එන්නේ

නැතිව ගිහින් ඒවා බලන්නය කියා මම තමුන්නාන්සේලාට කියනවා. කරුණාකරලා මතක තියා ගන්න, ඔබලා ගහපු ගැහිලිවලින් බිහි වුණු ජනාධිපතිතුමා තමයි මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා කියන එක.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Minister, please wind up now.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට තව පොඩි කාලයක් ලබා දෙන්න. මට දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමාගේ වේලාවෙන් තව විනාඩි දෙකක කාලයක් ලබා දෙයි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
He gave you five minutes.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
He will give me two more minutes. He is willing to do that. එතුමා දෙනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
If he is willing, I do not mind.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හරි හරි බය වෙන්න එපා. මට ඕනෑ තරම් වේලාව තිබෙනවා.

මම පැහැදිලිවම මේ අවස්ථාවේ කියනවා, කරුණාකරලා හම්බන්තොට දිස්ත්‍රික්කයේ පොදු ජනතාව ළඟට ගිහිල්ලා, ඒ කරපු මහා ඉඩම් කොල්ලය වෙනුවෙන්, ඒ කරපු මහා නින්දිත මුදල් සූරාකෑම වෙනුවෙන් දණ නමස්කාර පූර්වකව සමාව ඉල්ලන්න ඕනෑය කියලා.

මහා භාණ්ඩාගාරයේ සල්ලි හොරා කාලා තමයි අද අරලිය ගහ මන්දිරය අරලිය ගහ දිව්‍ය ලෝකයක් වෙලා තිබෙන්නේ. අද ජනාධිපති මන්දිරයක් නොවෙයි තිබෙන්නේ, ජනාධිපති දිව්‍ය ලෝකයක්. අද එතැන exercise parlours තිබෙනවා; massage parlours තිබෙනවා; exercise machines තිබෙනවා; jacuzzis තිබෙනවා; අලුත්ම ග්‍රැනයිට් අල්ලලා තිබෙනවා. රටේ ජනතාවගේ සල්ලි කොල්ලකාපු ආකාරය ගිහිල්ලා බලන්න. රටේ ජනතාවගේ මුදල් පරිහරණය කරපු ආකාරය ගිහිල්ලා බලන්න. ඒවා තිබියදී නිකම් බොරුවට පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩත්වය ගැන මහා අමුතු භීතිකාවක් නිර්මාණය කරන්නද තමුන්නාන්සේලා හදන්නේ?

තමුන්නාන්සේලාගෙන් මම ඉල්ලීමක් කරනවා, යහ පාලනය කරගෙන යන්නට අපේ රජයට ඔබතුමන්ලාගේ සහයෝගය ලබා දෙන්න කියලා. එහෙම නැත්නම් අපි ලෑස්තියි ඕනෑම වේලාවක - හෙට වුණත්- ජනතා අධිකරණය ඉදිරියට ගිහිල්ලා තමුන්නාන්සේලාගේ කෙරුවාව, තමුන්නාන්සේලාගේ පම්පෝරිය, තමුන්නාන්සේලාගේ හොරකම රටට ඉදිරිපත් කරලා අලුත් ජනවරමක් ලබා ගන්න. නියෝජ්‍ය කාරක සභාපතිතුමනි බොහොම ස්තූතියි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Kanaka Herath. You have five minutes.

[අ.භා.11.27]

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
ප්‍රචණ්ඩත්වය පිළිබඳ සාකච්ඡා කරන මේ අවස්ථාවේ, මටත් විනාඩි පහක් ලබා දීම ගැන සන්තෝෂ වෙනවා. මේ මැතිවරණයෙන් පසුව පමණක් නොවෙයි, මැතිවරණය ප්‍රකාශ කරපු දිනයේ ඉඳලා මැතිවරණ දිනයේත්, ඉන්පසුව අද දක්වාත් විශේෂයෙන්ම කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන ආසනයේ අපේ සාමාන්‍ය ජනතාව, පාක්ෂිකයන් නොයෙකුත් හිරිහැරවලට, තාඩන පීඩනවලට ලක්වෙලා තිබෙනවා. මේ මැර ක්‍රියා සිදු කරන්නේ අපි බලයේ සිටිය අවස්ථාවේ අපේ රැකවරණය, ආරක්ෂාව ලබා නොදුන්න, රඹුක්කන ප්‍රදේශයේ සිටින කසිප්පු වෙළෙඳාම් කරන, ගංජා සහ මත්කුඩු ජාවාරම් කරන, ඒ වාගේම අනෙකුත් නීති විරෝධී වැඩ කරන, නීති විරෝධීව වැලි ගොඩදැමීම් වාගේ දේවල් කරපු අයයි. මේ අය තමයි අද අපේ රඹුක්කන ආසනයේ අහිංසක ජනතාවට මේ මැර ප්‍රහාර එල්ල කරන්න කටයුතු කරන්නේ. මොවුන් සියලුම දෙනා මිනී මැරුම් චෝදනාවලට වාගේම නොයෙකුත් නීති විරෝධී ක්‍රියා සඳහා අධිකරණයෙන් නඩු පවරා ඇති පුද්ගලයන්. ඔවුන් තමයි මේ ක්‍රියාවල යෙදී සිටිනේනේ. මේ ක්‍රියාවලට අනුබල දෙන්නේ, මේ මැරයන් ආරක්ෂා කරන්න කටයුතු කරන්නේ වෙන කවුරුවත් නොවෙයි, එක්සත් ජාතික පක්ෂයේ රඹුක්කන ආසනයේ සංවිධායක, පළාත් සභා මන්ත්‍රීවරයායි.

මැතිවරණය පැවැති කාලයේදී නීත්‍යානුකූලව තිබුණු අපේ කාර්යාල සියල්ල ගිනි තියලා, ඒවා කඩා බිඳ දමලා රඹුක්කන ආසනයේ අපේ පාක්ෂිකයන්ට තර්ජනය කළා. එපමණක් නොවෙයි, අපේ තරුණ තරුණියන්ට මේ මැරයන් පොලුවලින් ගහලා, කඩුවලින් කොටලා භීෂණය ආරම්භ කළා. ඒ වාගේම, එදා අපේ මැතිවරණ ප්‍රචාරක රැස්වීම්වලට ගිනි අවියක් පවා රැගෙන ඇවිල්ලා රැස්වීම නවත්වන්න කියලා තිබෙනවා; ඒ ආකාරයට රැස්වීම නවත්වන්න කටයුතු කරලා තිබෙනවා. අපේ ප්‍රචාරක රැස්වීමකට ඇවිල්ලා ඒ වාගේ කටයුතු කරන්න යොදා ගත්ත වැන් රථයක් සහ ගිනි අවියක් පොලීසිය මඟින් අත් අඩංගුවට අරගෙන අද කෑගල්ල පොලීසියේ තිබෙනවා. ඒ පිළිබඳවත් සොයා බලන්න කියලා අපි පොලීසියෙන් ඉල්ලීම් කරනවා.

ඒ වාගේම තමයි, මැතිවරණයෙන් පසුව, රඹුක්කන ප්‍රාදේශීය සභාවට අයත් නීත්‍යානුකූලව බදු දීලා තිබුණු කඩ කාමර, සති පොළවල්, මාළු අළෙවි සැල් ඇතුළු අනෙකුත් කඩ කාමර සියල්ල මේ මැරයන් විසින් අත්පත් කරගෙන තිබෙනවා. අපේ පාක්ෂිකයන් පමණක් නොවෙයි, එක්සත් ජාතික පක්ෂයේ වෙළෙඳුන් පවා ඒ සති පොළෙන් එළියට දැම්මා. එළියට දමපු නිසා මොකක්ද වුණේ? රඹුක්කන ජනතාවට සති දෙකක් පමණ තමන්ගේ ආහාර අවශ්‍යතා, එදිනෙදා අවශ්‍යතා වෙනුවෙන් පොළට ගිහිල්ලා බඩු ගන්න හැකියාවක් තිබුණේ නැහැ. මොකද, ඒ මැර කල්ලිය දැනගෙන සිටියේ නැහැ සති පොළේ වෙළෙඳාම කරන්න. අද වන තෙක් සෑම දිනයකම හැන්දෑ වරුවේ ඒ මැර කල්ලි ගිහිල්ලා -එක එක ගම් නියෝජනය කරන මැර කල්ලි- සති පොළේ ඒ වෙළෙඳුන්ගෙන් කප්පම් ගැනීම ආරම්භ කර තිබෙනවා. සති පොළේ පමණක් නොවෙයි, රඹුක්කන නගරයේ සිටින සෑම ව්‍යාපාරිකයකු -සියලු පක්ෂවල ව්‍යාපාරිකයන්- ළඟට ගිහිල්ලා ඒ අයගෙන් හැන්දෑවට මුදලක් ගන්නවා; කප්පමක් ගන්නවා. අපට එය ඔප්පු කරන්න හැකියාව තිබුණේ, කඩ කීපයක

[ගරු කනක හේරත් මහතා]

CCTV කැමරා තිබුණු නිසායි. ඒ නිසා අපට එය ඔප්පු කරන්න හැකියාවක් ලැබුණා. පොලීසියට ඒ දර්ශන ලබා දීලා ඒ අය අත්අඩංගුවට ගන්න හැකියාවක් ලැබුණා. නමුත් CCTV කැමරා නැති ව්‍යාපාරිකයන්ට අද වනතෙක් ඒ ව්‍යාපාර කරගෙන යන්න හැකියාවක් නැහැ. ඒ මැරයන් ඇවිල්ලා හැම දාම හැන්දෑවට ඒ කප්පම් ගැනීම සිදු කරනවා.

ඊට අමතරව, ඒ මැරයන් අපේ සංචාරක ව්‍යාපාරයට වැදගත් වන පින්නවල අලි අනාථාගාරය අසල තිබෙන ප්‍රාදේශීය සභාව මඟින් පවත්වාගෙන යන රථගාලටත් ගිහිල්ලා එහි ප්‍රවේශ පත්‍ර අළෙවි කරන මුදල් බලහත්කාරයෙන් ලබාගන්නවා; කප්පම් ගන්නවා. ඒ වාගේම ඒ ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාවට අයත්ව තිබෙන කඩ කාමර සියල්ල අත් පත් කරගෙන තිබෙනවා; ඒවායෙහි ව්‍යාපාර කරගෙන යන අයගෙන් කප්පම් ගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනවා. මේ ආකාරයට අපේ රඹුක්කන ආසනයේ අද භීෂණයක් ඇති වෙලා තිබෙනවා. අද සාමාන්‍ය ජනතාවට, අපේ පාක්ෂිකයන්ට පමණක් නොව එක්සත් ජාතික පක්ෂයට ඡන්දය දුන්නු අයට පවා හිරිහැර කරන්න ඒ අය කටයුතු කරනවා. අද රඹුක්කන ආසනය පාලනය කරන්නේ ඒ කසිප්පු වෙළෙන්දෝ; ඒ වාගේම, අනෙකුත් නීති විරෝධී ජාවාරම්කරුවන්. ඒ අය තමයි අද රඹුක්කන ආසනය පාලනය කරන්නේ; එහි රජ කරමින් කටයුතු කරන්නේ.

ඒ ජනතාවට වාගේම රජයේ නිලධාරින්ට පවා අද ඒ ආකාරයේ මැර තර්ජන තිබෙනවා. පසු ගිය කාලයේ මැර පිරිසක් ගිහිල්ලා රඹුක්කන රෝහලේ හිටපු වෛද්‍යවරිය, සේවකයන් ඇතුළු සියලුදෙනාට බරපතළ ලෙස තුවාල වන ආකාරයෙන් ගහලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා මේ අවස්ථාවේදී ඒ සිද්ධීන් සියල්ල පිළිබඳ විස්තර හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන්න කියා ඉල්ලමින් **සභාගත*** කරනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ඔබතුමාට නියමිත වෙලාව ඉවරයි.

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන වාගේම යටියන්තොට ආසනයේත් මේ ආකාරයෙන්ම නොයෙකුත් සිද්ධීන් වෙනවා. ඒ වාගේම විශේෂයෙන් කියන්න ඕනෑ, අපේ යටියන්තොට ආසනයේ ප්‍රධාන සංවිධායකතුමා වන සබරගමුව පළාත් සභාවේ ගරු අමාත්‍ය ශ්‍රීලාල් වික්‍රමසිංහ මැතිතුමාගේ ගෙදරට පැනලා පහර දී තිබෙන බව. එතුමා රෝගාතුරවයි ඉන්නේ. එතුමා paralyse වෙලා ඉන්න මනුස්සයෙක්. ඒ අමාත්‍යවරයාටත් ඒ මැරයන් පහර දී තිබෙනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
අද රජය යහ පාලනය ගැන, ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා. ඒ වාගේම, මේ රටේ දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්න පොරොන්දු වෙලා ක්‍රියා කරන අවස්ථාවක දේශපාලන වශයෙන් මෙවැනි මැර ප්‍රහාරවලට නායකත්වය ලබා දෙන දේශපාලනඥයන් වෙනුවෙන් නිසි තීරණ ගන්න කියන ඉල්ලීම අපි මේ අවස්ථාවේදී කරනවා.

ඒ වාගේම කෑගල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන අමාත්‍ය කබීර් හාෂිම් මැතිතුමාත්, ඒ වාගේම නියෝජ්‍ය අමාත්‍ය-

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
I am sorry, your time is over. The next speaker is the Hon. Dinesh Gunawardena. Before he starts, will an Hon. Member propose the Hon. Nalin Bandara Jayamaha to take the Chair?

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
I propose that the Hon. Nalin Bandara Jayamaha do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு நலின் பண்டார ஜயமஹ அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. NALIN BANDARA JAYAMAHA *took the Chair.*

[පූ.භා. 11.35]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ මැතිවරණයකට සහභාගි වීම ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක් වාගේම, ඡන්ද දායකයන් හා ක්‍රියාකාරින්ගේ ඒ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය ඡන්ද ප්‍රතිඵලය නිකුත් වීමෙන් පසු අහෝසි වීම බරපතළ තත්ත්වයක් බව පශ්චාත් මැතිවරණ හානි පිළිබඳව සහාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ යෝජනාවේදී මා විශේෂයෙන්ම සඳහන් කරන්න කැමැතියි. මෙම පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා මැතිවරණ ක්‍රමයට සහ මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතියට තර්ජනයක් වාගේම, මානව අයිතියටද තර්ජනයක්ය කියන ටික මම පළමුව ප්‍රකාශ කරන්න කැමැතියි.

ජනවාරි අටවැනි දා පැවැති ජනාධිපතිවරණය හමාර වීමෙන් පසු සිදු වූ එක් දෙයක් සම්බන්ධයෙන් මම කියන්නම්. රට පුරා තිබෙන ආයතන රාශියක සේවකයන්ට තමන්ගේ රාජකාරියට වාර්තා කිරීමට බැරි තත්ත්වයක් ඇති වුණා. විශේෂයෙන් රට පුරාම සිටින ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වෘත්තීය සමිති නායකයන්ට, සාමාජික සාමාජිකාවන්ට මෙවැනි තර්ජන රාශියකට මුහුණ දෙන්න සිද්ධ වුණා. මම එක උදාහරණයක් කියන්නම්.

රජයේ මුද්‍රණාලයේ 40ක පමණ පිරිසක් ඇතුළෙන්ම ඇවිල්ලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂ වෘත්තීය සමිතියේ ලේකම්ට තර්ජනය කරලා සිදු වුණු දේ හා සම්බන්ධ පොලිස් පැමිණිල්ල බොරැල්ල පොලීසියේ තිබෙනවා. රටේ කේන්ද්‍රීය ආයතනයක සිදු වුණු මේ

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ක්‍රියාව සම්බන්ධයෙන් අද වන තුරු කිසිම ක්‍රියාමාර්ගයක් ගෙන නැහැ. ජනාධිපතිතුමා දිවුරුම් දෙන අවස්ථාවේදීද ප්‍රකාශ කළා, "මැතිවරණය හමාරයි, සාධාරණව අපි හැම දෙනා එකට ගමන් කරමු" කියලා. අග්‍රාමාත්‍යතුමා දිවුරුම් දුන් අවස්ථාවේ තමන්ගේ පාක්ෂිකයන් ඇතුළු රට වැසියාගෙන් විශේෂ ඉල්ලීමක් කළා, "මෙවැනි ක්‍රියාවල යෙදෙන්න එපා"ය කියලා. නමුත්, එය අනුගමනය නොකරන තත්ත්වයක් පෙන්නුම් කිරීම නිසා රට පුරා නිවාස හානි, ඒ වාගේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හා එක්සත් ජනතා නිදහස් සන්ධානයේ සාමාජිකයන්ගේ ජීවිත හානි පවා කීප පොළකදී සිදු වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් වූ ලිපියක් කියවන්න මම කැමැතියි.

"2015.01.09 වන දින මගේ සහෝදරයාගේ පුත්‍රයා වන රසික රණතුංග දරුවාට අපගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ කාර්යාලයේදී හිසට පහර දීමෙන් මැහුම් හයක් දමා රෝහල්ගතවී ප්‍රතිකාර ගන්න සිද්ධ වුණා. මේ පහර දීම හේතුවෙන් කන් අඩිය පුපුරා දැනට කන නැසෙන නිසා විශේෂඥ වෛද්‍යවරුන්ගෙන් ප්‍රතිකාර ගැනීම සිදු කරනු ලබයි. මැතිවරණයට පසුව දා මාලේගොඩ පවත්වාගෙන ගිය මැතිවරණ කාර්යාලයට අලාභහානි කරන බවට දැන්වීමකින් අනතුරුව එහි ගිය විට මේ පහර දීම සිදු කර ඇත."

මෙයට අත්සන් තබන්නේ කමලා රණතුංග පාර්ලිමේන්තු මන්ත්‍රීතුමිය.

මෙය ඉතාම බරපතළ තත්ත්වයක්. ගරු කමලා රණතුංග මන්ත්‍රීතුමියගේ සහෝදරයාගේ දරුවා ඇතුළු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ක්‍රියාකාරීන්ටත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කාර්යාලයටත් සිදු වෙලා තිබෙන දේ බලන්න. මෙවැනි උදාහරණ රාශියක් අප ළඟ තිබෙනවා.

ඒ වාගේම, මම තවත් එක් උදාහරණයක් ඉදිරිපත් කරන්න කැමැතියි. කර්මාන්තශාලාවලටත් තර්ජනය කරලා ඒවා වසා දමන තත්ත්වයක් ඇති කරලා තිබෙනවා. වාලව්වේන එස්එම්එස් හෝල්ඩින්ස් කියන කර්මාන්තශාලාවේ සේවය කරන 70කට, 80කට වැඩි සේවක පිරිසකට තර්ජනය කරලා තිබෙනවා. මෙහිදී පොලීසිය කුමක්ද කරන්නේ? පැමිණිල්ලක් භාර ගත්තාට පස්සේ පොලීසිය කුමක්ද කරන්නේ? පශ්චාත් මැතිවරණ සමයේ කටයුතු කිරීමේ වගකීම තිබෙන සියලු නිලධාරි ඉටු කළ යුතු රාජකාරි තිබෙන බව අප සලකනවා.

ජනාධිපති ලේකම් කාර්යාලය පිළිබඳව බලන්න. රටේ කේන්ද්‍රීය ආයතනය තමයි ජනාධිපති ලේකම් කාර්යාලය. ජනාධිපති ලේකම් කාර්යාලයේ වාහන පිළිබඳව නොයෙක් චෝදනා කරනවා. මේවා භාරව හිටපු නිලධාරි මහත්මයාට සේවයට වාර්තා කරන්නට දෙන්නේ නැහැ. ඒ නිලධාරි මහතා මොකක්ද, කර තිබෙන වරද? ඔහු තමයි එතැන තිබෙන සියලු ලිපිගොනු ගැන දන්නේ. ඒ නිලධාරි මහතාට සේවයට වාර්තා කරන්නට ඉඩ දෙන්න. සේවයට වාර්තා කරන්නට ඉඩ දුන්නොත්- [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
He is a SLFPer.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
He is one of the permanent officers, not of the SLFP. He is a permanent staff member of the office of the Presidential Secretariat. මා කිව්වේ, ජනාධිපති ලේකම් කාර්යාලයේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාගේ අවසර ඇතුවයි මම මේ කියන්නේ. මට ලැබී තිබෙන තොරතුරු අනුව, මේ පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලයේ රියැදුරු මහත්මයෙක් - driver කෙනෙක්- තමයි ජනාධිපති ලේකම් කාර්යාලයේ Director/Transport.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒක නෙවෙයි ප්‍රශ්නය.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
That is why he has disappeared.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පොඩි මිනිස්සු ලොකු තැන්වලට ගියාය කියා අපහාස කරන්නට එපා. කවුරු හෝ මේ රාජකාරිය කරන තැනැත්තාට රාජකාරියට වාර්තා කරන්න ඉඩ දෙන්න. වාර්තා කරලා- [බාධා කිරීමක්] නැහැ මම කියන්නේ, ලිපිගොනු වගයක් නැහැ කියනවා; වාහන නැහැ කියනවා. එම නිලධාරියා එතැන ඉන්දවලා, ඒ නිලධාරියාගෙන් ඒ ලිපිගොනු ඔක්කොම ගන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු මන්ත්‍රීතුමා, සභානායක කාර්යාලයේ driver කෙනෙක් තමයි, ජනාධිපති ලේකම් කාර්යාලයේ Director/Transport. That is why he has disappeared.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මම එක එක්කෙනාගේ ඉතිහාසය කියවන්නට යන්නේ නැහැ. පොඩි මිනිහෙක් ලොකු මිනිහෙක් වුණාම ඒකේ වැරැද්ද තමයි හිතන්නේ. නමුත් පොඩි මිනිසුන්ට ලොකු වැඩ කරන්නට පුළුවන් බවට ඔය පැත්තෙත්, මේ පැත්තෙත් දෙපැත්තේම ඕනෑ තරම් උදාහරණ තිබෙනවා. ඔහුට කාර් බලාගන්න පුළුවන් නම්, ලිපිගොනු තියා ගන්න පුළුවන් නම් මොකද? මම දන්නේ නැහැ, නිලධාරින් ගැන. මම එකම දෙයයි කියන්නේ. ඔබතුමන්ලා ඒ නිලධාරියාට රාජකාරියට වාර්තා කරන්නට දුන්නොත් සභානායකතුමනි,-[බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම කියන්නේ ඇත්ත. ඔබතුමාට ඕනෑ නම් -[බාධා කිරීමක්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
You are on a different wavelength and I am also on a different wavelength. What I am requesting is that you allow this officer to report for duty. Then, you will know whether the files are there or not. You cannot get a peon from another place to come and handle those files. Then,

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

you will know from the time of the former President J.R.Jayewardene, what has happened to the vehicles and where they are. You should do that without making unnecessary allegations.

පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩකාරී සිද්ධීන් ඇතිවුණු ස්ථාන රාශියක් තිබෙනවා. මට ලැබී තිබෙන කාලය විනාඩි 10යි. මා මීට වඩා කාලය ගන්නේ නැහැ. මා ඉල්ලා සිටින්නේ මේවා වළක්වන්න පුළුවන් ක්‍රමවේදයක් හදන්න කියායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහජන එක්සත් පෙරමුණ හැටියට මම මේ කරුණු ටික අද කියන්නට ඕනෑ. මැතිවරණ කොමසාරිස්තුමාට විශේෂ බලතල නීතියෙන් පනවන්නට ඕනෑ. රටේ ජනතාවට මෙවැනි හානි වීම වැළැක්වීමට මැතිවරණයක් ඉවර වුණාට පස්සේ සතියක් හෝ දෙකක් ඒ පිළිබඳ පූර්ණ බලතල මැතිවරණ කොමසාරිස්වරයාට පවරනවා නම් මොන පක්ෂයක ආණ්ඩුවක් බලයට ආවත් කිසිම ප්‍රශ්නයකට අපි මුහුණ දෙන්නේ නැහැ. Election එක තියන්නේ, Election Commissioner . මිනිස්සු ගිහිල්ලා ඡන්දය දුන්නාට Election Commissioner තමයි වග කියන්නට ඕනෑ. රැස්වීම් පවත්වලා මැතිවරණයක් තිබ්බාට Election Commissioner තමයි වගකියන්නට ඕනෑ. පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමට හැකි පූර්ණ බලතල නීතියෙන් මැතිවරණ කොමසාරිස්තුමාට ලබා දෙනවා නම් වඩාත් හොඳයි කියලායි මම කියන්නේ. මොකද, එක පක්ෂයකටවත් මේ තත්ත්වය පාලනය කර ගන්නට බැරි වෙලා තිබෙනවා. මේකේ අවසානයේ ඇති කනගාටුදායක තත්ත්වය ඒකයි. ඊට වඩා හොඳයි, නීතියෙන් ඒ බලතල මැතිවරණ කොමසාරිස්තුමාට පවරා ඒ අනුව එතුමාට කටයුතු කරන්නට ඉඩ දෙනවා නම්. මිනිහෙකුට රක්ෂාවට යන්න ඉඩ දෙන්න, කඩ සාප්පුවක් අරින්න ඉඩ දෙන්න, කරන ඕනෑම රාජකාරියක් කරන්න අවස්ථාව සලසා දිය යුතුයි. පශ්චාත් මැතිවරණ සමයේ වාහනයක යන්න බැහැ, වාහනය කුඩු පට්ටම් කර දානවා.

දැන් මම කිව්වා, කමලා රණතුංග මන්ත්‍රීතුමියගේ සහෝදරයාට වෙච්ච දෙය. මේවා වළක්වන්න නම් ස්වාධීනව මැදිහත් වී කටයුතු කරන්න පුළුවන්කම තිබෙන්න ඕනෑ. මොකද, ජනාධිපතිතුමා ප්‍රකාශයක් කළා, ඒ අනුව කටයුතු කෙරෙන්නේ නැත්නම්, අග්‍රාමාත්‍යතුමාත් ප්‍රකාශයක් කළා, ඒ අනුවත් කටයුතු කෙරෙන්නේ නැත්නම් රටේ තත්ත්වය එයින් පෙනෙනවා කියන එකයි මට කියන්නට තිබෙන්නේ.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මට විනාඩියක් දෙන්න පුළුවන්ද, ගරු මන්ත්‍රීතුමා?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මට ටිකක් භයයි, විනාඩියක් වුණත් දෙන්න.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු මන්ත්‍රීතුමා, අපි ඔබතුමන්ලාට එදා කිව්වා, ස්වාධීන කොමිෂන් සභා පත් කරන්න කියා. ස්වාධීන මැතිවරණ කොමිසම පත් කරන්න කිව්වා, ස්වාධීන පොලිස් කොමිසම පත් කරන්න කිව්වා. ඒවා මොකුත් නොකර ඉඳලා මේ වෙලාවේ හෝ ඔබතුමන්ලාට බුද්ධිය පහළ වීම ගැන අපි සන්තෝෂ වෙනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අපට බුද්ධිය පහළ වීම ගැන සන්තෝෂ වුණාට ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඔබතුමා සන්තෝෂ වෙන්න ඕනෑ. මොකද, අපේ බුද්ධිය අනුව කටයුතු කළා නම් තමුන්නාන්සේට කොච්චර දේවල් කරන්න තිබුණාද? එහෙම නේද, ගරු ජෝන් අමරතුංග ඇමතිතුමනි? ඒවා ගැන මම කථා කරන්නේ නැහැ. හොඳ වෙලාවට ඔබතුමා අපේ පැත්තට එන්නේ නැතිව ඔය පැත්තේ ඉතුරු වෙලා හිටියා. ඒවා ගැන අපි කථා නොකර ඉඳිමු. ඔබතුමාට මම සුබ පතනවා. මගේ කථාව මෙතැනින් අවසන් කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. මීළඟට ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා.

[පූ.භා. 11.45]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ මිත්‍ර ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ජනාධිපති ලේකම් කාර්යාලයේ Director/ Transport -අධ්‍යක්ෂ- ගැන කථා කළා. ඇත්ත වශයෙන්ම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා කිව්වා, Director/ Transport හැංගිලා කියලා. ඒක ඇත්ත. මොකද, ඔහුට මේ අලුත් තත්ත්වයට මුහුණ දෙන්න බැහැ. ඔහු මගේ කාර්යාලයේ -සහායකයක කාර්යාලයේ- හිටපු driver කෙනෙක්. ඔහුව තමයි ජනාධිපති ලේකම් කාර්යාලයේ Director/Transport කරලා තිබුණේ. ඉතින් ඇත්ත වශයෙන්ම හැංගෙන එක පුදුමයක් නොවෙයි. මොකද, එතුමාට මේ අහන ප්‍රශ්නවලට උත්තර දෙන්න බැහැ. කෝට්ටේ yard එකක තිබිලා වාහන 400ක් හම්බ වුණා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔහුට වැඩට එන්න දෙන්නේ නැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
නැහැ, නැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඇයි, එතුමා වැඩට එන්න ඉඩ දීලා ඒ තමන්ගේ ආසනයේ ඉන්දවලා එතුමාගෙන් ප්‍රශ්න අහන්න දෙන්නේ නැත්තේ? එහෙම නොවෙයි, නේ කරන්නේ. එතුමාට වැඩට එන්න දෙන්නේ නැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එතුමා මගේ කාර්යාලයේ හිටපු driver කෙනෙක්.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒක නොවෙයි, ප්‍රශ්නය.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි කියනවා, එන්න කියලා. එන්නේ නැති එකයි වැඩේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
He is an officer who has to report for duty. Why are you not allowing him to come?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒ කියන්නේ මේ රාජකාරිය කරන්න බැරි නිලධාරියකුට කරන්න දුන්නාම එහෙමයි. ආණ්ඩු වෙනස් වීමක් සමඟ ඔහු හැංගිලා. ඔහු භීතියට පත් වෙලා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔහු හැංගිලා නැහැ. ඔහු කිහිප වතාවක් පොලිස් මූලස්ථානයට ගිහිල්ලා තිබෙනවා. කිසිම ලෙසකින් හැංගිලා නැහැ. ඔහුට රාජකාරියට වාර්තා කරන්න ඉඩ දෙන්න. හෙට වුණත් රාජකාරියට වාර්තා කරයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
All right. මගේ දිස්ත්‍රික්කය; මහනුවර දිස්ත්‍රික්කය ගැන කියන කොට ඇත්ත වශයෙන්ම ජනාධිපතිවරණයෙන් පස්සේ ඉතාමත් සාමකාමීයි. ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා වාගේම පසු ගිය සතියේ ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාත් කිව්වා, මහින්දානන්ද අලුත්ගමගේ මහත්තයාගේ නැන්දා කෙනෙක් ඝාතනය වුණා කියලා. මම නාවලපිටිය පොලීසියෙන් සහ කුරුඳුවත්ත පොලීසියෙන් වාර්තා ගෙනැවිත් තිබෙනවා. එක වාර්තාවක් නාවලපිටිය පොලීසියෙන්. ඒ කියන්නේ ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා කිව්ව සිද්ධිය සම්බන්ධයෙන්. ඒ වාගේම කුරුඳුවත්ත පොලීසියෙන් වාර්තාවක් ගෙනැවිත් තිබෙනවා. ඒ පොලීසි දෙකෙන්ම මට ලිඛිත වාර්තාවක් දීලා තිබෙනවා, අද ගරු නිමල් සිරිපාල ද සිල්වා මන්ත්‍රීතුමා කිව්ව විධියටත්, පසු ගිය සතියේ ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා කිව්ව විධියටත් කිසිම මිනීමැරුමක් සිද්ධ වෙලා නැහැයි කියලා. මේ වාගේ දේවලට මේ පාර්ලිමේන්තුව පාවිච්චි කරන්නේ ඇයි?

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
මිනී මැරුමක් කිව්වේ නැහැ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කිව්වා, කිව්වා.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
Heart attack එකක්. He has died of a heart attack.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
No, a heart attack is different. පපුවේ අමාරුවකින් මැරුණාම පාර්ලිමේන්තුවට පැමිණිලි කරන්නේ නැහැ නේ. [බාධා කිරීම්] මේ සම්බන්ධයෙන් කටයුතු කළ පොලීසි දෙකයි තිබෙන්නේ. කුරුඳුවත්ත පොලීසියයි, නාවලපිටිය පොලීසියයි. ඒ පොලීසිවල OIC මහත්වරුන්ට කථා කරලා වාර්තා දෙකක් ගෙන්වා ගත්තා. ඒ අනුව ඔය කියන ආකාරයේ සිද්ධියක් වෙලා නැහැ.[බාධා කිරීමක්] ඇත්ත වශයෙන්ම මේකේ හාස්‍ය ජනක දෙයක්. there is a funny side to the story. මේකේ හාස්‍ය ජනක පැත්තක් තිබෙනවා. අපේ මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා කිව්වා, " මගේ නැන්දා මැරුණා" කියලා. ඔහු ඇඟිල්ල දික් කළේ අපේ සංවිධායකට. එතුමාගේ ඥාතිවරයෙක් වන ආනන්ද අලුත්ගමගේ මැතිතුමාට තමයි ඇඟිල්ල දික් කරලා කථා කළේ. ආනන්ද අලුත්ගමගේගෙන් මම ඇහුවා, මෙහෙම සිද්ධියක් වුණාද කියලා. එතුමා කිව්වා, "මගේයි, මහින්දානන්දගෙයි නැන්දා කෙනෙක් මැරුණා" කියලා. ඒ උත්සවයේ ප්‍රධාන ගුණකථනය කළේ අපේ යූඑන්පී සංවිධායකවරයා. යූඑන්පී සංවිධායක ආනන්ද අලුත්ගමගේ මැතිතුමා තමයි ගුණකථනය කළේ. ඒ භූමිදාන කටයුතු ඔක්කොම කළේ එතුමායි. ඒ නිසා මේ කියන විධියට මිනී මැරුමක් සිද්ධ වුණා නම් එක්සත් ජාතික පක්ෂයේ අපේ සංවිධායකතුමාට එතැනට ගිහිල්ලා කථාවක් කරන්න පුළුවන්ද? මේක සම්පූර්ණයෙන්ම මේ පාර්ලිමේන්තුවට වැරදි තොරතුරු දීමක්. ඇත්ත වශයෙන්ම ඒ ගැන කනගාටුයි. මම කියන්න ඕනෑ මැතිවරණයෙන් පස්සේ මුළු දිස්ත්‍රික්කයේම සුළු සිද්ධීන් කිහිපයක් ඇති වුණ බව. නමුත් මේ කියන විධියට මහා පරිමාණයෙන් සිද්ධීන් වුණේ නැහැ.

අනෙක, මම මැතිවරණයට කලින් නාවලපිටියේ රැස්වීමකට ගියා. සරත් ෆොන්සේකා මහත්මයාගේ පක්ෂයේ චන්න ගලප්පත්ති පළාත් සභා මන්ත්‍රීතුමා ඒ රැස්වීමේදී මට කලින් කථා කරලා පිටත් වුණා. නාවලපිටියේදී එතුමාගේ වාහනය හරස් කරලා එතුමාගේ කකුල් දෙක කැඩුවා. එතුමා තවමත් මහනුවර රෝහලේ. ඔබතුමා දන්නවාද, එතුමාගේ දණ හිස -kneecap- කැලි අටකට කැඩිලා. මැතිවරණයට කලින් නාවලපිටියේදී මේ සිද්ධිය වුණේ. ඒ නිසා මැතිවරණයට කලින් තමයි ප්‍රචණ්ඩත්වය තිබුණේ. මැතිවරණයට පස්සේ ප්‍රචණ්ඩත්වයක් තිබුණේ නැහැ.

ඒ වාගේම තවත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රබලයෙක්, ධනුෂ්ක ලියනගේ කියන ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයාගේ වත්තේගම ගෙදරට ගිහිල්ලා ඔහුට පහර දුන්නා. ඔහුගේ වාහනයේ වීදුරු සියල්ලම කඩා දැමුවා. නිවසේ වීදුරු සියල්ලම කැඩුවා. ඒ වාගේම මහින්ද ඒකනායක මැතිතුමාගේ නිවසට පහර දුන්නා. දේදුණුපිටිය මහතාගේ නිවසට පහර දුන්නා. මේ ඔක්කෝම මැතිවරණයට කලින් සිදු වූ ප්‍රචණ්ඩ ක්‍රියා.

වැඩිය කියන්න ඕනෑ නැහැ. චන්ද්‍රිකා මැතිනිය පාතදුම්බර රැස්වීමකට ආවා, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට සහයෝගය දෙන ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන් කිහිප දෙනෙක් අමතන්න. එතැන පාක්ෂිකයන් හාර පන්සියයක් හිටියා. එදා හැන්දෑවේ එතුමිය පැමිණි හෝටලයට ගිහිල්ලා ඒ හෝටලයේ වීදුරු සියල්ලම කැඩුවා. එතැන ලක්ෂ 10ක පමණ damage එකක්, අලාභයක්. ඔබතුමා චන්ද්‍රිකා මැතිනියගෙන් අහන්නකෝ කවුද මේක කළේ කියලා. මේ සියල්ල සිදු වුණේ මැතිවරණයට කලින්. ඇත්ත වශයෙන්ම මැතිවරණයට පසුව ඔය කියන සුළු සුළු සිද්ධීන් අතළොස්සක් නම් ගම්වල ඇති වුණා.

එක්සත් ජාතික පක්ෂයේ අයට පසු ගිය කාලය තුළ සිද්ධ වෙලා තිබෙන දේශපාලන පළිගැනීම්, අපරාධ සහ ප්‍රචණ්ඩ ක්‍රියා ගැන වාර්තාවක් මම අද අරගෙන ආවා. 1994 වර්ෂයේ ඉඳලා මේ දක්වා සිදු වුණ එවැනි ප්‍රචණ්ඩ ක්‍රියා 6,500ක් පමණ තිබෙනවා.

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

මට ඒ විස්තර කියවන්න පුළුවන්. නමුත් වේලාවක් නැහැ. 1994 ඉඳලා කරපු මිනී මැරුම්, නිවාසවලට පහරදීම්, 6,500ක් පමණ එහි සඳහන් වෙනවා. එක්සත් ජාතික පක්ෂයේ දේශපාලන පළිගැනීම් විමර්ශන කමිටුව නමින් දැන් අපි වාර්තාවක් සකස් කරලා තිබෙනවා. මිනීමැරීම්, ගෙවල් ගිනි තැබීම්, ප්‍රචණ්ඩ ක්‍රියා, රැකියා අහිමිවීම් 6,500ක්. ඉතින්, ඇත්ත වශයෙන්ම කාටද මේ අසාධාරණකම් සිද්ධ වෙලා තිබෙන්නේ? මැතිවරණය අවසන් වෙලා මාසයක් යනකොට ඉතා සුළු සිද්ධීන් ඇති වුණා. මම ඒක නැහැ කියන්නේ නැහැ. නමුත් ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ විවාදයක් ගන්න තරම් හේතු තිබුණේ නැහැ.

අනෙක් එක, මේ පොලීසිවල ඉන්නේ තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කාලයේ පත් කළ නිලධාරින්. ඒ අය අපි තෝරා ගත්ත අය නොවෙයි. තවමත් ඉන්නේ ඔබතුමන්ලා පත් කළ නිලධාරින්. මට නාවලපිටිය සිද්ධිය ගැන වාර්තාව එව්වේ නාවලපිටිය පොලීසියේ ස්ථානාධිපතිතුමා. ඒ වාගේම, නව කුරුඳුවත්ත පොලීසියේ ස්ථානාධිපතිතුමා. ඒ නිලධාරින් මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා විසින් තෝරා බේරා ගත්ත අය. කෙසේ වෙතත් මම කියනවා, 1994 වර්ෂයේ සිට මේ දක්වා දේශපාලන පළිගැනීම්, ප්‍රචණ්ඩ ක්‍රියා, මිනීමැරීම්, මංකොල්ලකෑම් 6,500ක් පමණ එක්සත් ජාතික පාක්ෂිකයන්ට සිද්ධ වෙලා තිබෙන බව.

අපි කවුරුත් ප්‍රචණ්ඩත්වය ප්‍රතික්ෂේප කරන්න ඕනෑ. මගේ ආසනයේ නම් කිසිම ප්‍රචණ්ඩ ක්‍රියාවක් සිද්ධ වුණේ නැහැ. මම ඒවාට අනුබල දෙන්නේත් නැහැ. මගේ ආසනයේ මොනවා හරි සිද්ධියක් වෙනවා නම් මම ඒවා නවත්වනවා. අපි හැම දාම දේශපාලනය කරලා තිබෙන්නේ ඒ විධියට. මම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉන්න කාලයේත් ඒ විධියටයි දේශපාලනය කළේ. මම එහෙම දේශපාලනය කළ නිසා තමයි පක්ෂ මාරු කරලා වුණත් ජයග්‍රහණය කරන්න පුළුවන් වුණේ. අපේ දිස්ත්‍රික්කය ඡන්ද 88,000කින් එක්සත් ජාතික පක්ෂය දිනුවේ. එම නිසා අපට ප්‍රචණ්ඩත්වයක් ඇති කරන්න හේතුවක් නැහැ. මහනුවර දිස්ත්‍රික්කය අපි දිනුවා. බොහොම සාමකාමී විධියට අදත් ඒ පොලීසිවල නිලධාරින් ඒ ස්ථානවලම ඉන්නවා. මට නම් මගේ දිස්ත්‍රික්කයේ කිසිම කෙනෙක් මාරු කරන්න වුවමනාවක් නැහැ. පොලිස් නිලධාරින් හොඳට රාජකාරිය කළා.

මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, මැතිවරණය දවසේ මහනුවර දිස්ත්‍රික්කයේ ආසන හයක STF එක ක්‍රියාත්මක වුණ බව. මම ඒ අයට ස්තුතිවන්ත වනවා. සමහර අය Defender වලින් එහාටයි මෙහාටයි ගියා. නමුත් ඒවායෙන් බිමට බහින්න බැරි වුණා; සුපුරුදු විධියට බහින්න බැරි වුණා. මොකද STF එකේ නිලධාරින් හොඳට රාජකාරිය කරපු නිසා. ඒ නිසා STF නිලධාරින්ට මගේ ස්තුතිය පුද කරන්න ඕනෑ.

දැන් ආණ්ඩුවයි විපක්ෂයයි අතර සාමකාමී සහජීවනයක් තිබෙනවානේ. තමුන්නාන්සේලා අපේ දින සියයේ වැඩ පිළිවෙළට සහයෝගය දෙනවානේ. දැනට ඒ සහයෝගය දීලාත් තිබෙනවා. අපි එයට ස්තුතිවන්ත වෙනවා. එම නිසා අපි මේ තිබෙන ප්‍රශ්න තුනී කර ගෙන ඉදිරියට කටයුතු කරමු. මොකද, මේ දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය, ස්වාධීන කොමිෂන් ටික, තොරතුරු දැන ගැනීමේ අයිතිය යනාදිය රටට අවශ්‍ය දේවල්. ඒවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටවත්, එක්සත් ජාතික පක්ෂයටවත් ඕනෑ දේවල් නොවෙයි. ඒවා රටට අවශ්‍ය දේවල්.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
හොඳමයි.

ඒවා රටට අවශ්‍ය දේවල්. එම නිසා ඒ පනත් කෙටුම්පත් ටික සම්මත කිරීමට තමුන්නාන්සේලා අපට සහයෝගය ලබා දෙනවා නම්, හදවතින්ම එම සහයෝගය දෙන්න ඕනෑ. [බාධා කිරීමක්] අපි ඒක පිළිගන්නවා. එම නිසා අපට දින සියය අවසන් වෙන්න කලින් ඉක්මනින්ම මෙම පනත් ටික සම්මත කර ගන්න පුළුවන් වෙයි. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
කරුණාකර මූලාසනය සඳහා ගරු අතාවුද සෙනෙවිරත්න මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු අතාවුද සෙනෙවිරත්න මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අතාවුද සෙනෙවිරත්න මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, மாண்புமிகு நலின் பண்டார ஜயமஹ அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அதாவுத செனெவிரத்ன அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. NALIN BANDARA JAYAMAHA *left the Chair, and* THE HON. ATHAUDA SENEVIRATNE *took the Chair.*

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට ගරු ජෝන් සෙනෙවිරත්න මන්ත්‍රීතුමා.

[පූ.භා. 11.56]

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම අද දින පවත්වන පශ්චාත් මැතිවරණ සිදුවීම් සම්බන්ධ විවාදය මේ ජාතියටම කැළැලක් කියලා කියන්න පුළුවන්. අපේ රටේ සර්වජන ඡන්දය ක්‍රියාත්මක වුණේ, 1931 දියි. 1931දී - එදා - රාජ්‍ය මන්ත්‍රණ සභා මැතිවරණය පැවැතුණා. ඊළඟට පාර්ලිමේන්තු, පළාත් සභා, ජනාධිපතිවරණ, පළාත් පාලන මැතිවරණ වශයෙන් සෑම ආයතනයක් වෙනුවෙන්ම නිසි කාලයේදී මැතිවරණ පැවැත්වූ රටක් අපේ රට, 1982 පැවැත් විය යුතු මහ මැතිවරණය හැරුණු කොට. ඒ මහ මැතිවරණය පැවැත්වීමට එදා හිටපු රජය බය වුණා. එසේ බය වෙලා ජනමත විචාරණයක් පවත්වා ඒ මැතිවරණය කල් දැම්මා. ඒ හැරුණු කොට, අනෙක් හැම අවස්ථාවකදීම එම මැතිවරණ නිසි කලට පැවැත්වූවා. ඒක මොන ආණ්ඩුව බලයේ සිටියත් කරපු දෙයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඡන්දයක් පාවිච්චි කිරීම ගැන, මැතිවරණ කටයුතු ගැන සහ ඡන්ද දායකයා දැනුවත් කිරීම ගැන විශාල අත්දැකීම් සම්භාරයක් අද අපේ රටේ දේශපාලන

පක්ෂවලටත්, ඒ වාගේම ජනතාවටත් තිබෙනවා. ඒ නිසා අපේ ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා කිව්වා වාගේ, සාමකාමීව මැතිවරණ පවත්වන්නටත්, ඒ වාගේම සාමකාමීව ජය පරාජය භුක්ති විඳින්නටත් අපට මේ වෙන කොට පුළුවන්කම තිබෙන්න ඕනෑ.

1994දී එක්සත් ජාතික පක්ෂය පරාජය කරලා පොදු පෙරමුණ බලයට පැමිණියා. එදා බලයට පැමිණි ජනාධිපතිතුමිය අපට උපදෙස් දුන්නා, කිසිම කෙනෙකුට හිරිහැර කරන්නට එපා කියලා. පරාජිත පක්ෂයේ කිසි කෙනෙකුට හිරිහැර කරන්නට එපා කිව්වා. ඒ වාගේම සියලුම දෙනාට උපදෙස් දෙන්න කිව්වා, මොනම ආකාරයකින්වත් ප්‍රචණ්ඩ ක්‍රියාවල යෙදෙන්න එපා කියලා. එදා අපි ප්‍රතිපත්තියක් වශයෙන් සෑම මැතිවරණ කොට්ඨාසයකම ශබ්දවාහිනී යන්ත්‍ර යොදා ගෙන ජනතාවට උපදෙස් දුන්නා, පරාජිත අයට මොනම විධියකින්වත් හිරිහැර කරන්න එපා කියලා. එදා අවුරුදු 17කට පසුවයි අපි දිනුවේ. එම නිසා දීර්ඝ කාලයක් පරාජය භුක්ති විඳපු ජනතාවක් වශයෙන්, යම් යම් අහිතකර බලපෑම්වලට ලක් වුණු ජනතාවක් වශයෙන්, හිරිහැරවලට ලක් වුණු ජනතාවක් වශයෙන් නොයෙක් විධියේ මානසික තත්ත්ව අපේ පක්ෂයේ අයට තිබුණා. ඒ නිසා තමයි, ඒ අයට නිශ්චිත උපදෙස් දුන්නේ, මොනම විධියකින්වත් කිසිම කෙනෙකුට හිරිහැර කරන්න එපා කියලා. ඒ ප්‍රවණතාව පසුව පැවැති මැතිවරණවලදී හුඟක් දුරට පැවතුණා. නමුත් අවාසනාවක මහත! පසු ගිය ඡන්දයේදී ඒ තත්ත්වය වෙනස් වෙලා තිබෙනවා. පසු ගිය ඡන්දයේදී එම තත්ත්වය වෙනස් වෙලා රත්නපුර දිස්ත්‍රික්කයෙන් මුල්ම මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාව වාර්තා වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය ජනාධිපතිවරණයේදී රත්නපුර මැතිවරණ කොට්ඨාසයේ ඉතාමත් කනගාටුදායක සිදුවීම් ගණනාවක් සිදු වුණා. වේලාව නොමැති නිසා ඒවායින් කීපයක් පමණක් කියන්නට මා බලාපොරොත්තු වනවා.

රත්නපුර මැතිවරණ කොට්ඨාසයේ කුරුවිට, තැඹිලියන ලිපිනයේ පදිංචි ටී.එම්. උපුල් සමන්ප්‍රිය යන අයට 2015.01.08 ජනාධිපතිවරණයේ දී කුරුවිට අබෙතිලකාරත්නරාමය අංක 02 ඡන්ද මධ්‍යස්ථානය අසලදී කුරුවිට ප්‍රාදේශීය සභා එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රී කුලරත්න මහතා විසින් බැන තර්ජනය කොට පහර දීමට තැත් කර පලවා හැර තිබෙනවා. මැතිවරණය දවසේ ඔහුට ඡන්දය පාවිච්චි කරන්න දුන්නේ නැහැ. ඔහුට ගහන්න හදලා, පලවා හැරියා. මේ පිළිබඳව කුරුවිට පොලීසියට පැමිණිලි කර තිබෙනවා.

ඊළඟට කුරුවිට, විජේකුමාරතුංග පාසල ඉදිරිපිට, අංක 55, පැරඩයිස් ලිපිනයේ පදිංචි ඒ.ඩබ්ලිව්. නිමල් උපාලි මහතා එම ලිපිනයේ පවත්වා ගෙන යනු ලබන තේ කඩයට 2015.01.13 වන දින රාත්‍රියේ එක්සත් ජාතික පක්ෂ මැර පිරිසක් විසින් පහර දී කඩයේ ඉදිරිපස වැරන්ඩාවේ තිබූ කොත්තු බාර් එකට පහර දී වීදුරු කඩා බිඳ දමා පහර දී ඔහුටද මරණ තර්ජනය කර බිය වද්දා තිබෙනවා. මේ පිළිබඳව 2015.01.15 වන දින කුරුවිට පොලිස් ස්ථානය වෙත පැමිණිලි කර තිබෙනවා.

කුරුවිට, කදන්ගොඩ, කදන්ගොඩ ජනපදයේ පදිංචි කේ.ඒ. ප්‍රියදර්ශන මහතා විසින් කුරුවිට ආනන්ද බෝධිරාජ ඡන්ද මධ්‍යස්ථානයට අයත් එක්සත් ජනතා නිදහස් සන්ධාන මැතිවරණ ප්‍රචාරක කර්යාලය කුරුවිට, කදන්ගොඩ විජිත ස්ටෝස් අසල ජයරත්න මහතාට අයත් මල්දෙණිය ඉඩමෙහි ආරම්භ කර පවත්වාගෙන ගියා. එක්සත් ජාතික පක්ෂයෙන් කුරුවිට ප්‍රාදේශීය සභාවට තරග කර පරාජය වූ තිලකසිරි මහතා සහ ඔහුගේ මැර පිරිසක් විසින් එම කාර්යාලයට 2015.01.11 වන දින අලාභ හානි කර cut-out, banners ගිනි තබා එම පිරිසට තර්ජනය කර බිය ගන්වා පලා ගොස් තිබෙනවා.

කුරුවිට, ඌරුපැව්ව ලිපිනයේ පදිංචි එම්.සී. ගුණසේකර මහතාගේ නිවසට 2015.01.09 වන දින පෙර වරු 12.30ට පමණ ඌරුපැලැව්වේම පදිංචි එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධ ජොනී නැමැති අන්වර්ත නාමයෙන් හඳුන්වනු ලබන දාමරිකයකු පැමිණ ගුණසේකර මහතාට සහ ඔහුගේ පවුලේ සියලු දෙනාට නිවසෙන් එළියට පැමිණියහොත් මරා දමන බවට බිය ගන්වා තර්ජනය කර තිබෙනවා. මෙම පිරිසට 13වන දින තෙක් එළියට ඒමට ඉඩ නොදී මේ අය මාර්ගයේ වරින් වර රැඳෙමින් සිට තිබෙනවා. මේ පිරිස 9වැනි දා සිට 13වැනි දා දක්වා දවස් 4ක්ම දොරවල් වහගෙන ගේ ඇතුළේ බියෙන් තමයි ජීවත් වුණේ. මේ පිළිබඳව 2015.01.13 වන දින කුරුවිට පොලීසියේ ඔහුට විරුද්ධව පැමිණිලි සටහන් කර තිබෙනවා.

2015.01.10 වන දින රාත්‍රී 8ට පමණ රත්නපුර, මුද්දුව අංක 209 ලිපිනයේ පදිංචි රත්නපුර ප්‍රාදේශීය සභාවේ එක්සත් ජනතා නිදහස් සන්ධාන ගරු මන්ත්‍රී සී. ප්‍රේමතිලක මැතිතුමාගේ නිවසට එම මුද්දුව ගමේ පදිංචි එක්සත් ජාතික පක්ෂ ක්‍රියාකරුවකු වන සජිත් නොහොත් "බට්ටා" යන අය විසින් ගල් මුගුරුවලින් පහර දී දොර ජනෙල්වල වීදුරු බිඳ දමා මරණ තර්ජනය කර තිබෙනවා. මෙම නිවසට සිදුව ඇති පාඩුව රුපියල් 25,000ක් පමණ වන බව සඳහන් වෙනවා. මේ පිළිබඳව රත්නපුර මූලස්ථාන පොලීසියේ අංක ජී.සී.අයි.බී.(3) 286/121 යටතේ ප්‍රේමතිලක මන්ත්‍රීතුමා විසින් පැමිණිලි කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක ඉතාමත්ම බැරෑරුම් තත්ත්වයක්. රත්නපුර, ගිලිමලේ සමනල මහා විද්‍යාලයේ විදුහල්පති පුෂ්පකුමාර මහතා හට 2015.01.19 දින සිට රත්නපුර ප්‍රාදේශීය සභාවේ එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රී බෝතුංග ආරච්චි මහතා විසින් නොයෙකුත් ලෙස බැණ වදිමින් තර්ජනය කර පාසලේ 1 වසරට දරුවන් ඇතුළත් කර ගැනීමේ අවස්ථාවට ඔහුට ඇරයුම් නොකළැයි පවසමින් විදුහල්පතිවරයාට විද්‍යාලයෙන් පිටව යන ලෙසත්, විද්‍යාලයේ ඉගෙන ගන්නා දරුවන්ගේ දෙමව්පියන් සියලු දෙනා 2015.02.05 දින දේශපාලන රැස්වීමක් කිරීමට විද්‍යාලයට කැඳවා දෙන ලෙසත් තර්ජනය කර ඇත. මෙම කටයුත්තට සහය දෙන ලෙස බල කරමින් රත්නපුර ආසනයේ එක්සත් ජාතික පක්ෂ සංවිධායක සබරගමු පළාත් සභා මන්ත්‍රී ඒ.ඒ. විජේතුංග මැතිතුමාද බෝතුංග ආරච්චි මහතා සමඟින් තර්ජනය කර ඇත.

විදුහල්පතිතුමා විසින් මෙතෙක් කල් පාසලේ කිසිදු දේශපාලන රැස්වීමක් කර නොමැති බැවින් ඉදිරියටත් එය කළ නොහැකි බව පැවසීම නිසා මෙම දෙදෙනා විදුහල්පතිතුමාට තර්ජනය කරමින් සිටිනවා.

කුරුවිට, පැරඩයිස්, හුනුගල් දෙණිය, අංක 165/ඒ ලිපිනයේ පදිංචි ව්‍යාපාරික ඊ.ආර්. නිශාන්ත ගුණසෝම මහතා විසින් කුරුවිට පැරඩයිස් හංදියේ "ඉසුරු" වෙළෙඳ සැල පවත්වා ගෙන යමින් සිටින අතර, ඔහු මෙවර ජනාධිපතිවරණයේ දී, ඔහුගේ කඩේ ඉහළ මහලේ එක්සත් ජනතා නිදහස් සන්ධාන මැතිවරණ ප්‍රචාරක කාර්යාලයක් පවත්වා ගෙන යමින් සිටියා. 2015.01.08 දින වන ජනාධිපතිවරණ දිනයේ දී කුරුවිට ප්‍රාදේශීය සභාවේ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රාදේශීය සභා මන්ත්‍රී කුලරත්න මහතා තවත් මැර පිරිසක් සමඟින් "ඉසුරු" වෙළෙඳ සැලට පැමිණ වෙළෙඳ සැලේ හිමිකරු වන නිශාන්ත ගුණසෝම මහතාට බැණ වදිමින් තර්ජනය කරමින්, එක්සත් ජනතා නිදහස් සන්ධානය වෙනුවෙන් සංවිධාන කටයුතු නොකරන ලෙසට බැණ බිය වද්දා පිටව ගොස් තිබෙනවා. ඉන් අනතුරුව නැවතත් 2015.01.09 වන දින මෙම කඩයට පැමිණ කඩයේ දොරවල්වලට ගසා කඩා දමා ඉහළ මහලයේ සන්ධාන කාර්යාලයේ තිබූ බැනර්, කටවුට් හා පෝස්ටර් කඩා ගලවා දමා තර්ජනය කර මරා දමන බවටද බිය ගන්වා ගොස් තිබෙනවා. මේ පිළිබඳව කුරුවිට පොලීසියට පැමිණිලි කර තිබෙනවා.

[ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා]

ඊළඟට, රත්නපුරය ආසනයේ ගිලිමලේ කලාපයේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ක්‍රියාකාරී පාක්ෂිකයකු ලෙස කටයුතු කළ රත්නපුර, ගිලිමලේ, ලියදවෙළ ලිපිනයේ පදිංචි ජී.ඒ.එම්. සමන් පාලිත විජේරත්න නොහොත් රාලේ මල්ලී යන අය එක්සත් ජනතා නිදහස් සන්ධානයේ කරන සංවිධාන කටයුතු නතර නොකළ හොත් ඔහුගේ පෞද්ගලික පරිහරණය සඳහා කළු ගඟේ එම ප්‍රදේශයේ තිබෙන බෝට්ටුවට ගිනි තබා විනාශ කරන බවට රත්නපුර ප්‍රාදේශීය සභාවේ එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රී බෝතුංග ආරච්චි විසින් තර්ජනය කර තිබෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය දැන් අවසන්.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
තවත් එක් කාරණාවක් කියන්නට තිබෙනවා. 2015.01.16 දින රාත්‍රී 12.00ට පමණ බලංගොඩ නගර සභාවේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ගරු නගරාධිපතිතුමා වන ඩබ්ලිව්.එම්. නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමාගේ නිල රථය වන කැබ් රථයට පහර දී කැබ් රථයේ දකුණු පස බඳ හා දොරේ වීදුරුව පොඩිකර අලාභ හානි සිදු කර තිබුණා.

2015.02.06 වන දින පස්වරුවේ දී කලවානේ වේවැල්කඳුරේ පදිංචි එක්සත් ජනතා නිදහස් සන්ධානයේ සාමාජිකයන් වන එල්.ඒ. බෝධිපාල මහතාට සහ ඔහුගේ සොහොයුරු වන එල්.ඒ. උපාලි මහතාට පහර දී බරපතළ තුවාල සිදු කිරීම නිසා ඔවුන් දෙදෙනාට ආරෝග්‍යශාලාවේ දින ගණනක් නැවතී ප්‍රතිකාර ලබා ගැනීමට සිදු වී තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පැල්මඩුල්ලේ විධායක ඉංජිනේරු කාර්යාලය යටතේ අවුරුදු 10ක,15ක පමණ කාලයක් තිස්සේ මාර්ග සංවර්ධන අධිකාරියේ සේවය කළ අහිංසක දුප්පත් කම්කරුවන් 40දෙනෙකුට වැඩි පිරිසකට මැතිවරණ දිනයෙන් පසු දින සිට රාජකාරියට වාර්තා කිරීමට ඉඩ නොදී රාජකාරී ස්ථානයෙන් පන්නා දමා තිබෙනවා. ඔවුන්ට දැන් වැඩ ලබා දෙන්නේ නැහැ. ඔවුන්ට දැන් ජීවත් වෙන්න විධියක් නැහැ. මේවා පශ්චාත් මැතිවරණ සිද්ධීන් වශයෙන් අපි අනිවාර්යෙන්ම සලකා බැලිය යුතුයි.

ඇඹිලිපිටිය පල්ලේගම ජය ශ්‍රී මහා බෝධිමළු විහාරයේ විහාරාධිපති පූජ්‍ය කිරම ගුණවංස හිමියන්ව 2015.01.13 දින රාත්‍රී 8.30ත් 8.45ත් අතර කාලයේ දී විහාරස්ථානය ඉදිරිපිට මාර්ගයට පිරිසක් විසින් කැඳවාගෙන ගොස් - ජේවීපී කාලයේ වාගේ- ඇඳ සිටි චීවරය ගලවා විදුලි පන්දමකින් හිසට සහ ශරීරයේ කිහිප තැනකට පහර දී පලාගොස් තිබෙනවා. මෙම හේතුවෙන් විහාරාධිපති හිමියන්ගේ හිසට තුවාල සිදු වී ඇති අතර, විහාරස්ථානයට කිට්ටුව පිහිටි වෛද්‍ය මධ්‍යස්ථානයකින් ප්‍රතිකාර ලබා ගෙන තිබෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය දැන් අවසන්.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
අදාළ පහර දීමට සම්බන්ධ වී ඇත්තේ සබරගමු පළාත් සභාවේ ගරු මන්ත්‍රී ජයතිස්ස රණවීර මැතිතුමාගේ මැර පිරිසකි. විහාරාධිපති හිමියන් පසු ගිය කාලය පුරාවටම එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ක්‍රියාකාරී හිමිනමකි.

මේ ආකාරයට සිද්ධීන් ගණනාවක් පිළිබඳව තොරතුරු ලැබී තිබෙනවා. ඒ විස්තර ඇතුළත් මෙම ලේඛනය මා මේ අවස්ථාවේ දී **සභාගත*** කරනවා.

මෙවැනි පශ්චාත් මැතිවරණ සිද්ධීන් ඇතිවීම සම්බන්ධයෙන් ඇත්ත වශයෙන්ම අපි ලජ්ජා විය යුතුයි කියන කාරණයත් මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඕළඟට ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා.

[අ.භා. 12.08]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා සංවිධායක කටයුතු කරන රත්නපුර ඇහැළියගොඩ ප්‍රදේශය බොහොම සාමකාමී ප්‍රදේශයක්. 1977 වසරේ ඇති වුණු මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවලින් පසුව මෙවර මැතිවරණ අවස්ථාව වන තුරු මැතිවරණ කාලවල දී සුළු සුළු සිද්ධීන් ඇති වුණත්, එවැනි මැතිවරණ ප්‍රචණ්ඩ කියා සිදු වෙලා තිබුණේ නැහැ. මෙවර මැතිවරණයෙන් පසුව ඇහැළියගොඩ ආසනයට ඇතුළු වන අවිස්සාවේල්ල, රත්නපුර මාර්ගයේ ප්‍රධාන දොරටුව ලෙස සැලකෙන දිවුරුම්පිටිය නැමැති සන්ධිස්ථානයේ එක්සත් ජනතා නිදහස් සන්ධානයට හිතවත් නිශාන්ත නැමැති අයෙකුට ඔහුගේ මාමා වූ ධනසේන විසින් පවත්වා ගෙන යන කඩ කාමරයක් ලබා දී තිබුණා. ඒ කඩ කාමරය අපගේ සන්ධානයේ, ඒ වාගේම මහින්ද මහතාගේ ප්‍රචාරක කටයුතුවලට අනියම් මැතිවරණ කාර්යාලයක් හැටියටත් අපි පාවිච්චි කරපු ස්ථානයක්. එතැන එතුමාගේ රූපය තබා තිබුණා. ජනාධිපතිවරණයෙන් පසු මෙම කඩයේ භුක්තිය අපගේ විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධානියෙක් -ගම් ප්‍රධානියෙක්- ඇවිත් ඉල්ලුවා. නිශාන්තගෙන් ඉල්ලුවා, "මේ කඩයේ භුක්තිය අපට දෙන්න, මේ කඩයේ යතුර අපට දෙන්න" කියලා. නිශාන්ත කිව්වා, "ඒක කරන්න බැහැ" කියලා. ඊට හේතු වුණේ මේ කඩ කාමරය අපගේ අනියම් කාර්යාලයක් හැටියට තිබීමයි. ඒ ගැන උරණ වී සිටි ප්‍රධානියාට කියලා යවන්න කියලා මම කිව්වා, -මම ඔහුගේ නම කියන්නේ නැහැ- ඔහුට හිමිකමක් තිබෙනවා නම් නීත්‍යානුකූල මාර්ගයකින් දැනුම් දීමක් කරන්න. එහෙම නැතුව මේ යතුර භාර දෙන්න සූදානම් නැහැ කියලා. මෙහෙම කියලා දවස් දෙකක් ගත වෙන කොට පෙබරවාරි 03වැනි දා පෝය දිනයට එළිවෙන්න කට්ටියක් ඇවිල්ලා ඒකේ උළුවහු ගැලෙව්වා. රාත්‍රියට කවුරුවත් එතැන නැහැ. ඉන් පසුව ඒක හදා ගත්තා. පොලීසියට පැමිණිලි නොකර, දුර දිග නොගෙන යන්න ඕනෑ නිසා ඒ අය එතැනින් මෙය නවත්වන්න බැලුවා. ඊට පස්සේ 06වැනි දා එළිවෙන කොට මුළු කඩේම ගිනි තිබ්බා. මේකට රුපියල් ලක්ෂයක විතර අලාභයක් සිදු වෙලා තිබෙනවා. අවිස්සාවේල්ල පොලීසිය මේ ගැන විභාග කරගෙන යනවා. මේ කඩය මෙසේ ගිනි තැබීම ගැන සැකකරුවන් අත් අඩංගුවට අරගෙන තිබෙනවා. මම පොලීසියට කිව්වා, ප්‍රකාශයක් දෙන්න මම ලැහැස්තියි කියලා. නිශාන්තගෙන් මේ කඩය ඉල්ලපු ප්‍රධානියා කවුද, මම නිශාන්තට දීපු උපදේශය මොකක්ද, ඒ අනුව නිශාන්ත මේකේ යතුර දීම ප්‍රතික්ෂේප කළාය,

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

මේ හේතු නිසා මෙසේ වුණාය කියලා ප්‍රකාශයක් දෙන්න මම ලැහැස්තියි. ප්‍රධානියා කියලා තිබෙන්නේ, ඒ ගොල්ලන්ට කාර්යාලයක් දාගන්න මේක ඉල්ලුවා කියලායි.

ඊළඟට, මම තවත් කාරණයක් ගැන කියන්න කැමැතියි. ස්වයං රැකියා සම්මේලනයේ සාමාජිකයන් වුණු, ඉස්සර pavement එකේ ස්වයං රැකියා කරපු අයට ස්වයං රැකියා සම්මේලනය බැංකුවට ඇප වෙලා ඩිමෝ බට්ටා රථ ලබා දීලා තිබෙනවා වෙළෙඳාම් කරන්න. එම රථ 52ක් කොළඹ නගරයේ තැන් තැන්වල නවතා වෙළෙඳාම් කරනවා. එසේ කරන්නේ පොලිස්පතිතුමාගේ අවසරය ඇතුවයි. මේ අයට අද උදේ ඇවිල්ලා කියලා තිබෙනවා, මේවා ඒ තැන්වලින් ඉවත් කර ගන්න කියලා. ඒ තැන්වලින් ඉවත් කර ගන්න කිව්වාම ඒ අයට වෙන කරන්න පුළුවන් දෙයක් වෙලා නැහැ. ඒ ඔක්කෝම වාහන ඉවත් කරගෙන තිබෙනවා. මේ නිසා පවුල් 52කට අද ජීවනෝපාය අහිමි වී තිබෙනවා. ඒ පවුල් 52 ඒ තැනට පත් වී තිබෙන්නේ ඇයි? මේ ස්වයං රැකියා සම්මේලනය සැබවින්ම අපි කවුරුත් දන්නා පරිදි ගිය රජයට පක්ෂපාතීව තිබුණු වෘත්තීය සංවිධානයක්. වෘත්තීය සංවිධානයක් වාගේම මේ සංවිධානයට අයත්ව සිටි මහින්ද කහඳගමගේ මහතා ගිය රජයට පක්ෂපාතීව කටයුතු කරපු කවුරුත් දන්නා ප්‍රසිද්ධ චරිතයක්. ඒ සංවිධානය එක්ක තිබෙන කෝපයත් එක්ක තමයි මේ දේවල් කරන්නේ. ඒ සංවිධානයේ විරුද්ධාකරයන් හිටියා. ඌවතැන්නේ සුමන හාමුදුරුවෝ හිටියා. උන්වහන්සේ තවත් පදික සංගමයක් හදා ගත්තු කෙනෙක්.

පසු ගිය දවස්වල ගරු රවි කරුණානායක ඇමතිතුමා නගර සභාවට ගිය වෙලාවේ උන්වහන්සේ ෆයිල් එකක් දීලා මේ ගැන යම් පැමිණිල්ලක් කරලා තිබෙනවා, විරුද්ධවාදීකම උඩ. ගරු රවි කරුණානායක මහතා ඒ වෙලාවේ කියලා තිබෙනවා, මේ පුද්ගලයා අත් අඩංගුව ගැනීමට කටයුතු කිරීම සුදුසුද කියලා බලන්න කියලා. එතුමා අත් අඩංගුවට ගන්න කියලා නැහැ. මේක ආරංචි වෙලා මට කිව්වාම, මම පොලිස්පතිතුමාට ලියුමක් ඇරියා, "මෙතුමා අත් අඩංගුවට ගන්න යනවාද, මෙතුමා අපේ වෘත්තීය සමිති සංවිධානයක සභාපති. එහෙම නම් හේතුව මොකක්ද කියලා මට කියන්න" කියලා. මේ වන විට වංචා විමර්ශන අංශය ප්‍රකාශ ගනිමින් තිබුණා, සභාපති මහින්ද කහඳගමගේ මහතාගෙන් හා එම සංගමයේ වෙනත් නිලධාරින්ගෙන්. ඒක සංගමයේ මුදල් පිළිබඳ ප්‍රශ්නයක්. සංගමයේ මුදල් හා සංගමයේ නිලධාරි මණ්ඩලය පිළිබඳ ප්‍රශ්නයක්. ඒක සංගමය ඇතුළත ප්‍රශ්නයක්. ඉන් පසුව, මහින්ද කහඳගමගේ මහතා ඊයේ වංචා විමර්ශන අංශයෙන් අත් අඩංගුවට අරගෙන උසාවියට ඉදිරිපත් කරලා රිමාන්ඩ් භාරයට පත් කළා. මම දන්නේ නැහැ, උසාවියට ඉදිරිපත් කරපු වාර්තාවේ මොනවාද තිබෙන්නේ කියලා.

දේශපාලන වශයෙන් මොවුන් පැවැති රජයට පක්ෂපාතීව මහින්ද රාජපක්ෂ මහතාගේ හිතවතුන් හැටියට ක්‍රියා කරපු සංවිධානයක්. දුප්පත් පදික වෙළෙඳුන් හැටියට හිටපු ඒ අයට අද බැංකුවට ණය ගෙවා ගන්නත් බැහැ; ගෙවල්වලට ජීවනෝපයකුත් නැහැ. ගරු ඇමතිතුමනි, මේ තැනට පත් කරනු ලැබ තිබෙන්නේ ඔබතුමාගේ පොලීසියේ පොලිස්පතිතුමාගේ අණක් අනුවයි කියා මා විශ්වාස කරනවා. නමුත් එතුමාගේම අවසරය ඇතුව තමයි ඔවුන් ඒ තැන්වල හිටියේ. මහින්ද කහඳගමගේ මහතා රිමාන්ඩ් භාරයට පත් කරලා තිබෙනවා. ඒක අධිකරණයේ ප්‍රශ්නයක්. එතුමා රෝගී තත්ත්වයක ඉන්න කෙනෙක් නිසා රෝගී තත්ත්වය ගැන බන්ධනාගාරයේ වෛද්‍යවරුන්ගේ දැනුවත් වීම සඳහා ඒ ගෙදර අය ඔහුගේ වෛද්‍ය වාර්තා අද උදේ 7 වෙන කොට එවලා තිබෙනවා, මේ වාර්තා බන්ධනාගාරයට දෙන්න කියලා. වෛද්‍යවරු ඒ අනුව ඔහුව බන්ධනාගාර රෝහලට ඇතුළත් කිරීමට තීරණයක් ගැනීමට ඉඩ තිබෙනවා. මේ ගැන ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමාව දැනුවත් කළා, අද උදේ. ඉන් පසුව මම බන්ධනාගාරයේ ප්‍රධාන ජේලර් තැනට කථා කළා. කථා කරන කොටත් අර වෛද්‍ය වාර්තා අරගෙන ගිය අය දෙතුන් වාරයක් මේ ගැන මතක් කරලත් ඒ අයව ඇතුළට කැඳවලා නැහැ, මේ වෛද්‍ය වාර්තා භාර ගන්න. පැය තුනහමාරකට වඩා ඒ අය එතැන හිටියා. මම මෙතැනට එන වෙලාව වෙන කොටත් ඒ අය එතැන ඉන්නවා. මම ප්‍රධාන ජේලර් මහතාට කිව්වාම එතුමා කිව්වා, ඒ ගැන හොයලා බලලා, නීත්‍යානුකූලව ඒ නිසි නිලධාරින් හරහා ඒ වාර්තා ලබා ගෙන, වෛද්‍යවරුන්ට ඉදිරිපත් කරලා, නියමානුකූලව ක්‍රියා කරනවා කියලා. නමුත් මේ කටයුත්ත එසේ වනවාද, එහෙම නැත්නම් දැනට බලයේ ඉන්න රජයෙන් මහින්ද කහඳගමගේ මහතාට තිබෙන විරෝධය නිසාත් -ඔහු පැවැති රජයට පක්ෂපාතව ක්‍රියා කරපු කෙනෙකු නිසා - ඔවුන්ගේ තිබෙන්නා වූ දේශපාලන වෛරය නිසාත් බන්ධනාගාරය තුළත් ඔහුට විරුද්ධව, ඔහු එක්තරා පීඩනයකට ලක් කිරීමට විශේෂ වැඩ පිළිවෙළක් යොදාගෙන තිබෙනවාද? ඔහු diabetic රෝගියෙක්. ඒ වාගේම හෘදයාබාධ රෝගියෙක්. මෙතුමාගේ රෝගී තත්ත්වය සම්බන්ධ වාර්තා පදනම් කරගෙන, වෛද්‍යවරුන්ගේ උපදෙස් අනුව ඔහුට ඒ ප්‍රතිකාර ලබා ගැනීමට හා නිසි පරීක්ෂණ කිරීම සම්බන්ධයෙන් දිනපතා සොයා බලන්නට අවශ්‍ය කටයුතු සලස්වනවාද, එහෙම නැත්නම් තමුන්නාන්සේලා දේශපාලන විරුද්ධවාදීන්ට රිමාන්ඩ් බන්ධනාගාරය වධකාගාරයක් කරන්නට බලාපොරොත්තු වනවාද කියා මා අහනවා. මා හිතන්නේ නැහැ, තමුන්නාන්සේලා එහෙම කටයුතු කරයි කියා. එහෙම කටයුතු කරන්න යනවාද කියායි මා සැක පහළ කරන්නේ. ඒ අය බැලීමට ගිය උදවිය පැය තුනක් ප්‍රමාද කර තිබෙනවා. ඒ වාගේම වාර්තා ලබා ගැනීම ප්‍රමාද වෙමින් තිබෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය අවසානයි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මා මගේ කථාව අවසන් කරනවා. ඒ වාගේම බන්ධනාගාර රෝහලේ ප්‍රතිකාර ලබා ගැනීමට අවශ්‍ය හේතු තත්ත්වයන් මේ වාර්තාවලින් ඉදිරිපත් වනවා. ඔබතුමා මැදිහත් වී මේවා ගැන සොයා බලා කටයුතු කරයි කියා මා හිතනවා.

ජෝන් අමරතුංග ඇමතිතුමනි, ඔබතුමාට බන්ධනාගාරයේ වැඩ කටයුතු සොයා බැලීමට අයිතියක් නැති බව අප දන්නවා. විජයදාස රාජපක්ෂ ඇමතිතුමාට මා කිව්වා, "මම මේ ගැන උනන්දු වෙනවා. අපේ හිතවත් කෙනෙක්. අපට දේශපාලන වශයෙන් උදව් වුණු කෙනෙක්. ඔහු මේ විධියට රිමාන්ඩ් භාරයට පත් වෙලා ඉන්නවා. ඔහු ගැන හොයා බලන්න මා යනවා"ය කියා. ඇත්තටම ඔහු බලන්න මා අදත් යනවා. ඇත්තටම සාපේක්ෂ වශයෙන් ගත්තාම දැන් ප්‍රචණ්ඩත්වය ඉතා නරක තත්ත්වයක නැහැ. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ කාලයේ පැවැති වයඹ ඡන්දය මතක් වන කොට මේ ප්‍රචණ්ඩත්වය ඉතා සුළුයි කියා අපට හිතා ගන්න කිසිම අමාරුවක් නැහැ.

අවසාන කාරණය මේකයි. දේශපාලන වශයෙන් විරුද්ධවාදී මතයක් දැරූ නිසා තමන් කරන රස්සාවට යා ගන්නට, ඒ රස්සාව කරන්නට ඉඩක් නැති වෙන ආකාරයේ භීතියක වාතාවරණයක් ඇති වුණත් ඔබතුමන්ලා උත්සාහ කරන්නේ රස්සාවට එන්න. නමුත් රස්සාවට එන්න බැරි තරමේ වාතාවරණයක් ඒ තැන්වල ඇති වෙලා තිබෙනවා.

ජෝන් අමරතුංග ඇමතිතුමනි, අන්න ඒ තත්ත්වය වැළැක්වීමට ඔබතුමන් ක්‍රියා කරනු ඇතැයි අපේක්ෂා කරන අතර, මට කාලය ලබා දීම සම්බන්ධයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

[අ.භා. 12.17]

ගරු ජයසිංහ බණ්ඩාර මහතා
(மாண்புமிகு ஜயசிங்க பண்டார)
(The Hon. Jayasinghe Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා නවක මන්ත්‍රීවරයෙකු විධියට 2015 ජනවාරි 29 වැනිදා තමයි පාර්ලිමේන්තුවේ දිවුරුම් දුන්නේ. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති ධුරයට පත් වීම නිසා ඇති වූ ඒ පුරප්පාඩුව සඳහා තමයි මා පාර්ලිමේන්තුවට පිවිසුණේ. මට අද කථා කරන්න කාල වේලාව වෙන් කර දීම පිළිබඳව විශේෂයෙන්ම මා අපේ විපක්ෂ නායකතුමාට ස්තුතිවන්ත වනවා. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ නායකතුමා විධියටත්, මගේ ආසනයේ ප්‍රධාන සංවිධායකතුමා විධියටත්, මේ වන විට අප රටේ නායකත්වය දරන අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ නායකත්වය යටතේ තමයි මා 1989 ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කෙනෙකු විධියට පක්ෂයත් එක්ක එකට එක්කාසු වෙලා කටයුතු කරන්න පටන් ගත්තේ. මා 2002 පළාත් පාලන මැතිවරණයෙන් දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙකු විධියටත්, 2006 අවුරුද්දේ මා එම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විධියටත්, 2008 වර්ෂයේ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු විධියටත් තේරී පත් වුණා. 2010 මහ මැතිවරණයේ දී මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත්, මමත් ඒ ආසනයෙන් මැතිවරණයට ඉදිරිපත් වුණේ එතුමාගේ නායකත්වය යටතේයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයෙකු විධියට පසු ගිය මැතිවරණ කාලයේ මහින්ද රාජපක්ෂ හිටපු අතිගරු ජනාධිපතිතුමාට තමයි උදවු කළේ. ඒක මගේ යුතුකම සහ වගකීම වුණා. 1989 මගේ පාසල් දිවිය අවසන් වුණා. එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ මා මහනුවර හේවාහැට මධ්‍ය මහා විද්‍යාලයේ ඉගෙන ගත්තා. එදා මා ශිෂ්‍ය සංවිධානයේ සභාපතිවරයා හැටියට කටයුතු කළා.

ඒ වෙලාවේ මම පොඩි කොල්ලෙක් විධියට තමයි අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් සංවිධාන වැඩ කටයුතු කළේ. එදා මා සමඟ යහළුවන් හත් දෙනෙක් සිටියා. එක්සත් ජාතික පක්ෂ රජය 1989 භීෂණ කාලයේදී ඔළුවට ඇණ ගහලා, වෙඩි තියලා තමයි ඒ යහළුවන් -සහෝදරයන්- හත් දෙනා ජීවිතක්ෂයට පත් වුණේ. ඒ නිසා 1989 වර්ෂයේදී මම පොළොන්නරුව ප්‍රදේශයට ගිහිල්ලා පදිංචි වුණා. ඊට පසුව පොළොන්නරුව දිස්ත්‍රික්කයේ අපේ පක්ෂයේ නායකතුමා වූ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සමඟ මම එකතු වුණා.

මේ අවස්ථාවේදී මම දිඹුලාගල සහ වැලිකන්ද ඇතුළු පොළොන්නරු දිස්ත්‍රික්කයේ ආදරණීය ජනතාව ආමන්ත්‍රණය කරන්නට ඕනෑ. විශේෂයෙන්ම ඒ ගොවි ජනතාව නිසා තමයි මට පාර්ලිමේන්තුවට පිවිසෙන්නට හැකි වුණේ. අඩු මනාප සංඛ්‍යාවක් ලබා ගෙන පස් වැනි ස්ථානයට පත් වුණත්, මා ඒ මට්ටමට ඔසවා තැබීම සම්බන්ධව දිඹුලාගල සහ වැලිකන්ද ප්‍රමුඛ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ආදරණීය ජනතාවට මම මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා.

පසු ගිය 2014.11.21 වන දා අපට පොඩි ප්‍රශ්නයක් පැන නැගුණා, අපේ පක්ෂයේ දිස්ත්‍රික් නායකතුමා; ඒ වාගේම අපේ ආසනයේ ප්‍රධාන සංවිධායකතුමා වශයෙන් අප සමඟ එකට සිටි මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පොදු අපේක්ෂකයා වීම පිළිබඳව. ඒ සම්බන්ධයෙන් අපි දන්නේ නැති කරුණු රාශියක් තිබෙන්නත් ඇති. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පොදු අපේක්ෂකයා විධියට ඉදිරිපත් වෙන බව ඒ වෙලාවේ ජනමාධ්‍ය මඟින් අපට දැන ගන්න ලැබුණා.

දිඹුලාගල සහ වැලිකන්ද ප්‍රදේශ ඇතුළු පොළොන්නරුව දිස්ත්‍රික්කය කියන්නේ 1989 ඉඳලාම දැඩි ලෙස එල්ටීටීඊ ත්‍රස්තවාදය වෙළා ගත් ප්‍රදේශයක්. වසර 30කට වැඩි කාලයක් කිස්සේ ඒ ප්‍රදේශයේ අපි යුද්ධයට මුහුණ දුන් අවස්ථා අනන්තයි, අප්‍රමාණයි. අපේ ජන ජීවිතය අඩාල වෙලා ආපස්සට ගිය අවස්ථා අනන්තයි, අප්‍රමාණයි. අපේ ගොවි ජනතාවගේ කටයුතු විනාශ වූ අවස්ථා අනන්ත අප්‍රමාණව තිබුණා. ඒ යුගය අවසන් කළේ, හිටපු ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා. ඒ නිසා තමයි මම ඒ වෙලාවේ මහින්ද රාජපක්ෂ මැතිතුමාට උදවු කරන්න තීරණය කළේ.

පසු ගිය 2014.11.21 වන දා අපේ දිස්ත්‍රික් නායක මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පොදු අපේක්ෂකයා විධියට ඉදිරිපත් වෙන වෙලාවේ මා නියෝජනය කරන දිඹුලාගල සහ වැලිකන්ද ප්‍රදේශයේ මගේ ආසනයේ නායකතුමා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා. ඒ වෙලාවේ අපි බොහොම කනගාටුවට පත් වුණා; වේදනාවට පත් වුණා; අපි අසරණ වුණා; අපි ගන්නා තීන්දුව කුමක්ද කියන එක පිළිබඳව අපට ගැටලුවක් තිබුණා. ඒ වෙලාවේ අපි පක්ෂයක් විධියට වත්මන් ජනාධිපතිතුමාට උදවු නොකර ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආරක්ෂා කර ගෙන සිටියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1989 ඉඳලා මේ දක්වාම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපට බොහෝ තර්ජන ගර්ජන තිබුණා. ඒ කාලය මතක් වෙන කොට අපේ හදවතට වේදනාවක් දැනෙනවා. ඒ නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිකමට අතිගරු ජනාධිපතිතුමා පත් වීම සම්බන්ධව අපි ඉතාම සතුටට පත් වෙනවා. අපි පක්ෂයක් විධියට අතිගරු ජනාධිපතිතුමා සමඟ එකට එකතු වෙලා කටයුතු කරන්න තීරණය කර තිබෙනවා. එතුමාගේ වැඩ පිළිවෙළට සම්බන්ධ වෙලා, ඒ සඳහා සහයෝගය දෙමින් එතුමා සමඟ කටයුතු කරන්නට අපි ඉතාමත් ඕනෑකමින් සූදානම් වෙලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොළොන්නරුව දිස්ත්‍රික්කය කියන්නේ සියයට 80කට වැඩි අති බහුතර ගොවි ජනතාවක් ජීවත් වන ප්‍රදේශයක්. වැඩි වශයෙන් ගොවිතැන් කරන පිරිසක් තමයි ඒ පළාතේ ජීවත් වෙන්නේ. ඒ නිසා මේ කාල පරිච්ඡේදය තුළ අපි අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා දේශපාලන ක්ෂේත්‍රයේ ඉදිරියට ගෙනැල්ලා තිබෙනවා. ඒ නිසා තමයි අපි එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අත් නොහැර මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාටත් උදවු කරලා, අද වන විට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිකමට පත් වෙලා ඉන්න අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ නායකත්වය යටතේ මේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන්නත් තීරණය කර තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මැතිවරණ කාලය තුළ, විශේෂයෙන්ම පසු ගිය 9 වන දා අපි පරාජයට පත් වුණා. එක්සත් ජාතික පක්ෂයේ විශාල පිරිසක් මම සිටින පොළොන්නරුව ආසනය ප්‍රමුඛ දිඹුලාගල, වැලිකන්ද ප්‍රදේශය තුළ-

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

ගරු ජයසිංහ බණ්ඩාර මහතා
(மாண்புமிகு ஜயசிங்க பண்டார)
(The Hon. Jayasinghe Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක් ලබා දෙන්න.

විශේෂයෙන්ම ප්‍රචණ්ඩ ක්‍රියා නිසා අපේ ජීවිත හානි නොවී දේපළ විනාශ වුණ තැන් අනන්ත අප්‍රමාණ තිබෙනවා. පෞද්ගලික ව්‍යාපාර ඒ ව්‍යාපාරික ක්ෂේත්‍ර විනාශ කර තිබුණා. සමහර ප්‍රදේශවල නිවාසවලට ගල් ගහලා, මිනිසුන්ට හිරිහැර කරලා, තර්ජනය කරලා මේ වන විට ඒ සියල්ල සිදු වෙලා

තිබෙනවා. එක්සත් ජාතික පක්ෂ පාලන කාල වකවානුවක් තුළ, විශේෂයෙන්ම මෙවැනි ප්‍රචණ්ඩ ක්‍රියා කරන්න එපා කියා, මම පක්ෂයක් විධියට සහ නවක මන්ත්‍රීවරයෙක් විධියට ඉල්ලීමක් කරනවා. එහෙම කරන එක හොඳ නැහැ. ඒ ප්‍රදේශයේ අහිංසක මිනිස්සු බොහොම අමාරුවෙන් තමයි ජීවත් වන්නේ. ස්වයං රැකියාවක් විධියට පෙට්ටි කඩයක් දමා ගත්තාම පසුවදාම ඇවිල්ලා ඒක පෙරළලා ගිනි තබනවා. ඒ අය බොහොම අමාරුවෙන් තමයි නිවාස හදා ගෙන ඉන්නේ. ඒ ගෙවල්වලටත් ගිනි තබනවා. එහෙම විනාශයන් සිදු වුණු පවුල් රාශියක් සිටිනවා. අපි හෙට අනිද්දා ඒ අය සම්බන්ධ ලේඛනයක් ගරු විපක්ෂ නායකතුමාට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා. නවක මන්ත්‍රීවරයෙක් විධියට අදහස් ප්‍රකාශ කරන්න මට මේ අවස්ථාව ලබා දුන් ගරු විපක්ෂ නායකතුමාට මගේ ගෞරවනීය ප්‍රණාමය පුද කරනවා. බොහොම ස්තූතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට බොහොම ස්තූතියි. ඔබතුමා අද පාර්ලිමේන්තුවේදී පළමුවැනි කථාව පවත්වා වාර්තාවක් තැබුවා. ඔබතුමන්ට තව තවත් ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනා කරනවා.

මේ අවස්ථාවේදී දිවා භෝජනය සඳහා පස් වරු 1.00 දක්වා සභාවේ කටයුතු අත් හිටුවනවා.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්,අ.භා. 1.00ට නියෝජ්‍ය කථානායකතුමාගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

அதன்படி, அமர்வு பி.ப. 1.00 மணி வரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, MR. DEPUTY SPEAKER *in the Chair.*

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු දිලිප් වෙදආරච්චි මහතා.

[අ.භා. 1.02]

ගරු දිලිප් වෙදආරච්-චි මහතා (ධීවර රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு திலிப் வெதஆரச்சி - கடற்றொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Dilip Wedaarachchi - State Minister of Fisheries)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂය ඉදිරිපත් කර ඇති මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳ විවාදය පැවැත්වෙන මේ අවස්ථාවේ, හම්බන්තොට දිස්ත්‍රික්කය ගැන කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මම ප්‍රථමයෙන්ම ස්තූතිවන්ත වනවා.

1994 වර්ෂයේ සන්ධාන රජය පිහිටෙව්වාට පස්සේ එදා ඉඳලා හම්බන්තොට දිස්ත්‍රික්කයේ මැතිවරණ ජයග්‍රහණය කරන්න, ඒ රජය රැක ගන්න, නායකයින් රැක ගන්න හම්බන්තොට දිස්ත්‍රික්කයේ මැර දේශපාලනයේ නියමුවා වන එම්.කේ.රංජිත් -චණ්ඩි මල්ලි- නමැත්තා කටයුතු කර තිබෙනවා. ඔහු සෑම මැතිවරණයකදීම එක්සත් ජාතික පාක්ෂිකයන්ට වධහිංසා දෙමින්, හිරිහැර කරමින්, ඝාතන කරමින්, මං කොල්ලකෑම් කරමින්, දූෂණ කරමින් දිස්ත්‍රික්කය පුරාම පාතාල කල්ලි හදලා පාතාල නායකයින් විශාල වශයෙන් බිහි කළා. ඔහු ප්‍රථමයෙන්ම කළේ බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ හිටපු උප සභාපති ඒ.එම්.කේ. ගුණරත්න මැතිතුමා අමු අමුවේ ඝාතනය කරලා පසුව පාතාල නායකයා හැටියට පත් වෙලා, මුළු දිස්ත්‍රික්කයේම එය ව්‍යාප්ත කිරීමයි. දිස්ත්‍රික්කයේ ඒ ඒ කොට්ඨාසවලට නායකත්වය දෙන්න නායකයින් පත් කළා. "ආමි ජීනේ" කියලා කෙනෙක් හිටියා. ආමි ජීනේ කියන්නේ මුල්කිරිගල කලාපයේම මැතිවරණය ජයග්‍රහණය කරන්න නායකත්වය ලබා දුන්න පාතාල නායකයෙක්. ඔහු ප්‍රථමයෙන්ම පොලීසියේ IP කෙනෙක් රාජකාරි කරන අවස්ථාවේදී -uniform එකෙන් ඉන්න අවස්ථාවේදී- ඝාතනය කළා. ඒ ඝාතන රැල්ලත් එක්ක, මුල්කිරිගල බල ප්‍රදේශයම භීෂණයට පත් කර ගෙන මැතිවරණ ව්‍යාපාරය කර ගෙන ආවා. බිය වැද්දීම්, මං කොල්ලකෑම්, දූෂණ කිරීම්, කාන්තාවන් පැහැර ගැනීම් සම්බන්ධව මුල්කිරිගල කොට්ඨාසයටම නායකත්වය දුන්නේ ආමි ජීනේ කියන පුද්ගලයායි. ඒ වාගේම "කැකිරි පොඩ්ඩා" කියන්නේ බෙලිඅත්ත කොට්ඨාසයේ කුලියට මිනී මරන චණ්ඩි මල්ලිගේ පාතාල නායකයා.

ඒ පුද්ගලයා ඒ බලප්‍රදේශයම යටත් කරගෙන, භය කරගෙන, අපේ පාක්ෂිකයන්ට වධ හිංසා දෙමින් තළා පෙළා දමන කටයුතු කරගෙන ගියා. ඒ වාගේම ඔබතුමන්ලා දන්නවා ඇති, ජූලම්පිටියේ අමරේ කියන පුද්ගලයා ගැන. මුල්කිරිගල වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි වසම් 122කට නායකත්වය ලබා දීපු පුද්ගලයකු තමයි ජූලම්පිටියේ අමරේ කියන්නේ. ඒ පුද්ගලයා ගිනි දවල් හමුදා camouflage kit එක ඇඳගෙන, T-56 කරේ දාගෙන, motorcycle එකෙනුයි ඒ ප්‍රදේශවල සැරිසරන්නේ. අත් අඩංගුවට ගන්නාතුරුම එහෙමයි. ජනතා විමුක්ති පෙරමුණේ රැස්වීමකට ප්‍රහාර එල්ල කරලා දෙදෙනකු ඝාතනය කළා; තවත් අයට තුවාල කළා. ඒ වාගේම දූෂණය කිරීම් කළ, ඒ ප්‍රදේශයේ පන්සල් ඇතුළු සෑම දෙයක්ම කොල්ල කෑව පුද්ගලයකු තමයි ජූලම්පිටියේ අමරේ කියන්නේ.

චන්ද්‍රපුෂ්ප කියන්නේ තංගල්ල ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයා. එතුමා තමයි මැතිවරණවලදී පොදුජන එක්සත් පෙරමුණ ජයග්‍රහණය කරවන්න විතාරන්දෙණිය කලාපයේම මිනිස්සුන්ට වෙඩි තියන්නේ; ගෙවල් කුඩු කරන්නේ; විනාශ කරන්නේ. මිනීමැරුම් ගණනාවකට සම්බන්ධ පුද්ගලයකු තමයි චන්ද්‍රපුෂ්ප කියන්නේ. ඔහු තංගල්ල ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයා. එතුමාගේ පුතා තමයි සම්පත් චන්ද්‍රපුෂ්ප කියන්නේ. එතුමාත් පසු ගිය කාලයේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හැටියට ඒ කලාපය තුළ පියා කළ දේවල්ම කරමින් දැනට ඉන්න බල කායේ නායකයින්ට ශක්තියක්, ධෛර්යක් ලබා දෙමින් කටයුතු කළා. හෝටල්වලට පැනලා කාන්තාවන් දූෂණය කරලා, ඒ වටාපිටාවේ ඉන්න කාන්තාවන් දූෂණය කරලා, මං කොල්ල කාලා, හොරකම් කරලා, මිනී මරලා කටයුතු කළා පමණක් නොවෙයි, 2010 ජනාධිපතිවරණය වෙලාවේ තිස්සමහාරාමයේ පැවැති අපේ රැස්වීමකට සහභාගි වූ බස් එකකට වෙඩි තියලා ආත්තා කෙනකු මරලා, කිසිම නඩු හබයක් නැතිව නිදැල්ලේ හිටියා. ඒ සියල්ල කරලා පස්සේ යුරෝපීය කාන්තාවක් දූෂණය කර මරාපු එකට තමයි අද වන විට අත් අඩංගුවට පත් වෙලා ඉන්නේ. විතාරන්දෙණිය කලාපයේම, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේම මැතිවරණ මෙහෙයුම් කටයුතු කරන පුද්ගලයා තමයි චන්ද්‍රපුෂ්ප කියන්නේ.

"වම්බොට්ටා" කියන පුද්ගලයා ගැනත් ඔබතුමන්ලා දන්නවා ඇති. සූරියවැව කලාපයේ එම්.කේ. රංජිත් -චණ්ඩි මල්ලි- කියන පළාත් සභා ඇමතිතුමාගේ නායකත්වය යටතේ සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයම භීෂණයට පත් කරමින්, දූෂණ කරමින්, මං කොල්ලකෑම් කරමින්, මිනී මරමින්, කොන්ත්‍රාත්වලට මිනී මරමින්, පගා ගනිමින් මුළු සූරියවැව කොට්ඨාසයටම පමණක් නොව, මුළු හම්බන්තොට දිස්ත්‍රික්කයටම නායකත්වය දුන්නු ආණ්ඩු බලයේ නායකයකු තමයි "වම්බොට්ටා" කියන්නේ.

"පස්සර ගුණේ" කියලා පුද්ගලයකු ගැනත් ඔබතුමන්ලා අහලා ඇති. තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා කරපු, මැතිවරණ දවස්වල ගෙවල්වලට

[ගරු දිලිප් වෙදආරච්-චි මහතා මහතා]

පැනලා පහර දීපු, පොඩි දරුවා තොටිල්ලේ ඉන්න කොට, තොටිල්ල කඩා ගෙන බිමට වැටෙන්න පහර දීපු පුද්ගලයකු තමයි "පස්සර ගුණේ" කියන්නේ. ඒ පුද්ගලයා තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මිනී මැරුම්වලට සම්බන්ධයි; මං කොල්ලකෑම්වලට සම්බන්ධයි; හොරකම්වලට සම්බන්ධයි. අපේ එක්සත් ජාතික පාක්ෂිකයින්ගේ ගෙවල් දොරවල් විනාශ කිරීමට සම්බන්ධ වුණු පාතාල නායකයකු තමයි "පස්සර ගුණේ" කියන්නේ. ඒ වාගේම "පස්සර ගුණේ" කියන පුද්ගලයාට විශාල කේප්ප හරකෙක් හිටියා. උස අඩි 10ක් විතර ඇති. ඒ හරකා town එකේ market එකට යන කොට market එකේ කඩවල මුදලාලිලා අයින් වෙනවා. ඒ හරකාට ඕනෑ තරම් කාලා යන්න පුළුවන්. අන්න ඒ තරම් බලයක් "පස්සර ගුණේ" කියන පුද්ගලයාගේ හරකාටත් පසු ගිය ආණ්ඩුව කාලයේ තිබුණා. අන්න ඒ වාගේ බලයක් රකින්න, ඒ ආණ්ඩුවේ නායකයෝ රකින්න කටයුතු කරපු පුද්ගලයකු තමයි "පස්සර ගුණේ" කියන්නේ.

ඊළඟට, පන්නෙගමුවේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ "බෝම්බ සුමාර". හම්බන්තොට දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 12ක් තිබෙනවා. ඒ 12ට නායකත්වය ලබා දෙන පුද්ගලයින්, මැතිවරණ ජයග්‍රහණය කරන්න නායකත්වය ලබා දෙන පුද්ගලයින් ගැන තමයි මා මේ කියාගෙන එන්නේ. පන්නගමුවේ බෝම්බ සුමාර කියන්නේ, බෝම්බ අතේ අරගෙන, මැතිවරණ දවස්වලට මහ පාරේ වාහනවල බොනට් උඩ නැඟ ගෙන, ලොරි උඩ නැඟගෙන, භීෂණය පතුරවමින්, අපේ පාක්ෂිකයින්ට හිරිහැර කරමින්, පාක්ෂිකයන්ව තළා පෙළා දමමින්, තමන්ට අවශ්‍ය කාන්තාව සැමියා බලාගෙන ඉන්දැද්දීම ගත්ත පුද්ගලයෙක්. ගිනි දවල් ගෙදරට ගිහිල්ලා, මිනිහා ගෙදරින් එළියට බස්සවලා, කාන්තාව දූෂණය කරපු පුද්ගලයකු තමයි පන්නෙගමුවෙ "බෝම්බ සුමාර" කියන්නේ. ඒ අයට ආණ්ඩුවෙනුයි රැකවරණය ලබා දුන්නේ; ආණ්ඩුවෙනුයි හයිය හත්තිය ලබා දුන්නේ. 1994 ඉඳලා ගෙවුණු අවුරුදු 20 තුළ හම්බන්තොට දිස්ත්‍රික්කයේ වධකාගාරයක් හැටියට එක්සත් ජාතික පාක්ෂිකයන්ට හිරිහැර කරපු පුද්ගලයින් ගැන තමයි මා මේ කථා කරන්නේ.

ඊළඟට, වලස්මුල්ලේ සුමිත් කියන්නේ ප්‍රාදේශීය සභාවේ උප සභාපති. වලස්මුල්ල කලාපයේම මැතිවරණ කාලයට කාර්යාලයක් දමන්න බැහැ, කුඩු කරනවා. ඔහු ගෙවල් කුඩු කළා; මිනී මැරුවා; මං කොල්ල කෑවා; දූෂණය කළා.

වලස්මුල්ල කලාපයේ අපේ පාක්ෂිකයන්ට විශාල ලෙස වධ හිංසා දීපු පුද්ගලයෙක් තමයි වලස්මුල්ලේ සුමිත් කියන්නේ. ඔහු ප්‍රාදේශීය සභාවේ උපසභාපතිවරයා, පොදු පෙරමුණේ. ඔහු ජීවිතක්ෂයට පත් වුණා. දිට්ඨධම්ම වේදනීය කර්මය පල දුන්නා. බැදිගම උක්කුවා කියලා කෙනෙක් අක්කර ගණනක ආණ්ඩුවේ ඉඩමක් බලෙන් අල්ලාගෙන, ඒවා පරිභෝජනය කරමින්, මිනී මරමින්, මං කොල්ල කමින් ඒ බැදිගම කලාපයම විනාශයට පත් කළා. අපේ පාක්ෂිකයන්ට වධ හිංසා දුන් පුද්ගලයෙක් තමයි බැදිගම උක්කුවා කියන්නේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමා, දැන් කාලය අවසන්.

ගරු දිලිප් වෙදආරච්-චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මට විනාඩි 15ක් තිබෙනවා. තව විනාඩි 5ක කාලයක් දෙන්න.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමාට විනාඩි 10යි තිබුණේ.

ගරු දිලිප් වෙදආරච්-චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
තංගල්ලේ පල්ලිකුඩා උක්කුවා තමයි අනෙක් පුද්ගලයා. නිල් බල කායේ දැන් ඉන්න නායකයාගේ ප්‍රධාන ගෝලයා. මිනී මැරුම් හතරක් කරලා තිබෙනවා. මහින්ද රාජපක්ෂ මහත්මයා ජනාධිපති වුණාම තංගල්ල නගරයේ අධිආරක්ෂක කලාපයක් තිබුණේ. ගිය අවුරුද්දේ දවසක ගිනි දවල් ටවුන් එකේදී මිනිස්සු දෙන්නෙක් මැරුවා. මහා අධිකරණය ඉස්සරහා එක මිනිහෙක් මැරුවා, bus stand එකේදී එක මිනිහෙක් මැරුවා, රෑ 7ට ගෙදරකට පැනලා මිනිහෙක් මැරුවා. ඒ විධියට මිනිස්සු හතර දෙනෙක් මරපු පුද්ගලයෙක් තමයි ඔහු. ගිය සැරේ මුස්ලිම් මිනිසුන්ට ගහලා නගර සභාවේ බලය අරගෙන දුන්නා කියලා තෑග්ගක් හැටියට ඔහුට ඉඩකඩම් දීලා තිබෙනවා. ඔහු ඒකේ හෝටලයක් හදාගෙන වැජඹුණා. අද ඔහු හිරේ ඉන්නවා. අන්න එවැනි කණ්ඩායමක් තමයි හම්බන්තොට දිස්ත්‍රික්කය පරිපාලනය කළේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා විනාඩි දෙකක කාලයක් වැඩිපුර අරගෙන තිබෙනවා. දැන් කථාව අවසන් කරන්න.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ඒ අයගේ නායකයෝ ජයග්‍රහණය කරවන්න, නායකයන්ගේ සුබ විහරණය සඳහා අපේ එක්සත් ජාතික පාක්ෂිකයන් භීෂණයට පත් කළා. අපේ පාක්ෂිකයින්ට වධ හිංසා කළ, අවුරුදු 20ක් තිස්සේ ඒ දිස්ත්‍රික්කයේ ජනතාවට වධ හිංසා දුන් ආණ්ඩුවක නායකයෝ තමයි අද මේ තත්ත්වයට පත් වෙලා ඉන්නේ.

ජෙනරාල් සරත් ෆොන්සේකා මැතිතුමා කිව්වා, මුළු රටම බේරා ගත්තා කියලා. නමුත් හම්බන්තොට දිස්ත්‍රික්කය මේ යම රජ්ජුරුවන්ගෙන් බේරා ගන්න බැරි වුණා. අද නිදහස් විධියට මිනිසුන්ට ජීවත් වෙන්න පුළුවන් විධියට හම්බන්තොට දිස්ත්‍රික්කය රැකගෙන අපි කටයුතු කරනවාය කියන එක ප්‍රකාශ කරමින්, සජිත් ප්‍රේමදාසත්, දිලිප් වෙදආරච්චිත් හම්බන්තොට දිස්ත්‍රික්කයේ එක්සත් ජාතික පාක්ෂිකයන් ආරක්ෂා කරන්න කටයුතු කරනවාය කියන එකත් ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 1.12]

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක්සත් ජාතික පක්ෂයේ දිලිප් වෙදආරච්චි රාජ්‍ය ඇමතිතුමාගේ කථාවෙන් පසුව කථා කරන්නට ලැබීම ගැන මම ඉතාම සතුටු වෙනවා. එතුමාගේ කථාවට මම එක ඌණ පූරණයක් කරන්න කැමැතියි. එතුමා එච්චර දේවල් කිව්වා, හැබැයි "සොත්ති උපාලි" ගැන කිව්වේ නැහැ. සොත්ති උපාලි ගැන, එක්සත් ජාතික පක්ෂ කාලයේ හිටපු කට්ටිය ගැන තමුන්නාන්සේ කථා කළේ නැහැ. සොත්ති උපාලි ගැන කථා කළේ නැහැ. මිනී මැරුම් ගැන කථා කළේ නැහැ, දූෂණ ගැන කථා කළේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි මේ වෙලාවේ කථා කරන්නේ පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා ගැන. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඉතාම සන්තෝෂයෙන් කියනවා, මම අවුරුදු 30ක් මේ ගරු සභාවේ වැඩ කරලා තිබෙනවා කියලා. මේ අවුරුදු 30 ඇතුළත අපි කවදාවත් පොලීසියකට බලපෑමක් කරලා නැහැ. පොලිස් නිලධාරියෙකුගේ අඩු පාඩුවක් වෙනුවෙන් මම කවදාවත් පොලීසියකට කථා කරලා නැහැ. අපි හැම වෙලාවේම යුක්ති ගරුකව කටයුතු කරලා තිබෙනවා. අපි පොලීසියකට කථා කළා නම් කථා කළේ ඇපයක් ඉල්ලා ගන්න. විත්තිය වෙනුවෙන් කථා කළා නම් අපි කියන්නේ, "මේ මිනිහා වැරැද්ද කරලා තිබෙනවා, දෙකක් තුනක් ගහන්නේ නැතුව පුළුවන් නම් සමාව දෙන්න" කියායි. නරක මිනිස්සු ගැන කථා කරන්න වුණොත් ඔවුන්ට ගහන්න කියන වෙලාවලුත් තිබෙනවා. එහෙමයි අපි කථා කළේ. අපි කවදාවත් පොලීසියකට බලපෑම් කරලා නැහැ. නමුත් අද ඒ තත්ත්වය නොවෙයි තිබෙන්නේ. අද ඉතාම අවාසනාවන්ත තත්ත්වයක් තිබෙන්නේ.

ජෝන් අමරතුංග මැතිතුමා එතුමාගේ බල ප්‍රදේශයේ ප්‍රාදේශීය සභා සභාපතිතුමාට පහර දුන් හැටි අපි රූපවාහිනියෙන් දැක්කා. ඔබතුමා ගැන මම ලජ්ජා වෙනවා. මම ඔබතුමා ආශ්‍රය කරන්න පටන් අරගෙන අවුරුදු 30ක් වෙනවා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මම ගැහුවා කියලාද කිව්වේ? තමුන්නාන්සේ කියන්නේ මම ගැහුවා කියලාද? මේ සභාවට ඇවිල්ලා තමුන්නාන්සේ බොරු දොඩවන්න එපා. අසත්‍ය ප්‍රකාශ කරන්න එපා. දන්නේ නැතුව ඒ කරුණු ගැන කථා කරන්න එපා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
තමුන්නාන්සේත් එක්ක මම එක්සත් ජාතික පක්ෂයේ හිටියා. තමුන්නාන්සේගේ කෙරුවාව මම හොඳින් දන්නවා. මම අවුරුදු 30ක් තිස්සේයි තමුන්නාන්සේ ආශ්‍රය කරන්නේ. [බාධා කිරීමක්] තමුන්නාන්සේ ගැන මම දන්නේ අවුරුදු 30ක් තිස්සේ. පාර්ලිමේන්තුවට එන්න කලින් ඉඳලා මම තමුන්නාන්සේ ගැන හොඳට දන්නවා. තමුන්නාන්සේ කරන වැඩ ගැන මම දන්නවා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මොනවාද දන්නේ?

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
අපි එක මල්ලේ ලුණු කාපු කට්ටියනේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඒවා කියන්න එපා මෙතැන.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක ඉතාම අවාසනාවන්ත තත්ත්වයක්. අද එක්සත් ජාතික පක්ෂය මේ ගෙන යන දුර්දාන්ත පාලනය නිසා මේ රටේ ජනතාව අසරණ තත්ත්වයට පත් වෙලා ඉන්නේ.

පසු ගිය අය වැය ලේඛනය ඉදිරිපත් කරන කොට කිව්වා, රබර් වගාකරුවන්ට රබර් කිලෝ එකක් සඳහා රුපියල් 350ක මුදලක් ගෙවනවා කියලා. ඒ පිළිබඳව අද මේ මොහොතේත් උද්ඝෝෂණයක් පැවැත්වෙනවා. අද රබර් කිලෝ එකක් සඳහා රුපියල් 235යි ගෙවන්නේ. ඒ බොරුවෙන් අද ඒ පළාත එහෙම පිටින්ම කැළඹිලා තිබෙන්නේ. ඒ මුදල ගෙවන්න සල්ලි නැතිලු. විශ්‍රාමිකයන්ගේ හිඟ වැටුප දෙනවා කියලා කිව්වා. ඒක විශ්‍රාමිකයන්ගෙන් උදුරා ගත්තා. ඒ මුදල දුන්නේ නැහැ. දැන් විශ්‍රාමිකයෝ අසරණ වෙලා ඉන්නේ. ඒ වාගේම රජයේ සේවකයන්ගේ වැටුපත් තවම පිළිවෙළකට හදලා නැහැ.

අපේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා දීපු ඒ මුදලත් එකතු කරලා තමයි මෙතුමන්ලා රජයේ සේවකයන්ට දෙනවා කියපු රුපියල් 5,000 හදලා තිබෙන්නේ. මෙතුමන්ලා අද ඒ විධියේ අසරණභාවයකට වැටිලායි ඉන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එක කාරණයක් කියනවා. වැලිගම මැතිවරණ බල ප්‍රදේශයේ පසු ගිය මැතිවරණයට කලින්වත් කිසිම ප්‍රචණ්ඩ ක්‍රියාවක් සිද්ධ වුණේ නැහැ; කිසිම දෙයක් සිද්ධ වුණේ නැහැ. මම ඒ කොට්ඨාසය හොඳින් බලා ගත්තා. එක අවස්ථාවක ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ රැස්වීමක් හෙට දිනයේ තිබෙනවාය කියලා තිබුණා. ඊට කලින් දවසේ රැ කඩාකප්පල්කාරී යම්කිසි පිරිසක් යමක් කරනවාය කියලා ආරංචි වෙලා මම ඒ පැත්ත භාර පොලිස් නිලධාරි මහත්මයාට කථා කරලා කිව්වා, වහාම එළි වෙන තුරු මේ වේදිකාවට ආරක්ෂාව දෙන්න, කවුරු හරි කෙනෙක් මොනවා හරි කරනවා නම් ඔළුවට වෙඩි තියලා හරි ඒක නවත්වන්න කියලා. එහෙමයි අපි වැඩ කළේ. ඒ ප්‍රදේශයේ කිසිම සිද්ධියක් වුණේ නැහැ. නමුත්, ඡන්දයෙන් පස්සේ පළාත් සභා මන්ත්‍රී චතුර ගලප්පත්ති සහ හිටපු පළාත් සභා මන්ත්‍රී ජීනදාස ගුණවර්ධන කියන දෙදෙනා කණ්ඩායමකුත් එක්ක මගේ මාධ්‍ය ලේකම් වශයෙන් සිටි වැලිගම ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයාගේ ගෙදරට ගිහින් -එතුමා ඒ වෙලාවේ ගෙදර ඉඳලා නැහැ.- එතුමාගේ අහිංසක බිරිඳට සහ දරුවන්ට තිත්ත කථාවෙන් බැණලා, ඉතාම අශෝභන විධියට හැසිරිලා ඇවිත් තිබෙනවා. එතුමා ඒ සම්බන්ධව පොලීසියට කළ පැමිණිල්ල මම මේ අවස්ථාවේ **සභාගත*** කරනවා. නමුත්, මේකට කෙරුණු රාජකාරියක් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒකයි අපට තිබෙන වේදනාව.

අපේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයකු වන මොහමඩ් මුනාස් මැතිතුමාගේ ගෙදරට ගිහින් ඒ නිවසට ඇතුළු වීමට ඇති ගේට්ටුව කඩලා, තර්ජනය කරලා ඇවිත් තිබෙනවා. ඒකටත් කිසිම රාජකාරියක් කරලා නැහැ. මෙන්න මේ සිද්ධියට නම් පොඩි රාජකාරියක් කළා. කනංකේ සිරි පැරකුම්බා මධ්‍ය මහා විද්‍යාලයේ මුරකරු හැටියට වැඩ කළ ඊ.වී. ගාමිනී කියන අයට තර්ජනය කළා. හැබැයි, ඒ මහත්මයා පොලීසියට ගිහින් ඒ ගැන පැමිණිලි කළාට පස්සේ, ඒ පොලිස් නිලධාරි මහත්මයා නම් ඇවිත් සොයා බලලා ගිහින් තිබුණා. ඊට පසුව ඒ ප්‍රශ්නය ඇති වුණේ නැහැ. කොහොම හරි එතුමා ඒ රාජකාරිය හරියට කරලා තිබුණා. නමුත්, අනික් කාරණාවලදී සාධාරණයක් ඉෂ්ට වුණේ නැහැ. පොලීසිය ඇතුළේදී මේ ජීනදාස ගුණවර්ධන හිටපු පළාත් සභා මන්ත්‍රීතුමා හැසිරුණු හැටි ඉතාම නින්දා සහගතයි කියන එකයි මට මේ අවස්ථාවේදී කියන්න තිබෙන්නේ. මේවා තමයි අපට ඇති වුණු ප්‍රශ්න. අපි කවදාවත් මේ විධියේ දේවල් කළේ නැහැ. මේ වාගේ රාජකාරි කරන්න කවදාවත් මම පොලීසියකට අඩිය තියලා නැහැ. අපි කවදාවත් එහෙම කරලා නැහැ. අවුරුදු ගණනාවක් තිස්සේ පොලිස් නිලධාරින් අපිත් එක්ක වැඩ කළා. ඕනෑම පොලිස් නිලධාරියෙක් ගෙන්වලා අහන්න, පොලීසියේ රාජකාරියට අපි

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා]

අයුතු බලපෑම් කර තිබෙනවාද, එහෙම නැත්නම් පොලීසිය අයුතු විධියට පාවිච්චි කළාද කියලා. අපි කවදාවත් එහෙම කථා කරලා නැහැ. ඒකයි අපි කියන්නේ, අපට එහෙම කරපු එක වැරැදියි කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කිසිම චෝදනාවක් නැතිව, බණ්ඩාරවෙල අපේ ප්‍රාදේශීය සභා මන්ත්‍රී කරගහවෙල නන්ද ස්වාමීන් වහන්සේගේ පන්සලට පොලීසියෙන් ගියා, හොර බඩු තිබෙනවාය කියලා. පන්සලේ තිබෙන හොර බඩු මොනවාද කියලා මම නම් දන්නේ නැහැ. පොලීසියේ අයට නම් කිසිම දෙයක් සොයා ගන්න බැරි වුණා. පැමිණිල්ලක්, චෝදනාවක් නැතිව ඒ පන්සලට ගිහින් අපේ හාමුදුරුවන්ට මානසිකව පීඩා කරලා උන්වහන්සේට ඒ විධියට මහා අවමානයක් කළේ. එම විස්තරය සඳහන් වන පුවත් පත් වාර්තාවත් මම සභාගත කරනවා. මේ තොරතුරු සියල්ලම සඳහන් ලේඛන මම **සභාගත*** කරනවා. මේ කාරණා ගැන සොයා බලන්න මේ තොරතුරු කවදා හරි දවසක අවශ්‍ය වෙනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමාට නියමිත කාලයෙන් තව විනාඩියයි තිබෙන්නේ.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
අද එක්සත් ජාතික පක්ෂය මේ ගෙන යන දුර්දාන්ත වැඩ පිළිවෙළ තුළ අපේ රටේ ජනතාව අතරමං කළා විතරක් නොවෙයි, ජනතාවට අසත්‍ය පොරොන්දු දුන්නා විතරක් නොවෙයි, ජනතාව සදාකාලිකව මුළාවට පත් කෙරුවා. [බාධා කිරීමක්]

ගරු තලතා අතුකෝරල ඇමතිතුමියනි, ඔබතුමිය මොනවාද කියන්නේ? තේවලට රුපියල් අසූව දෙන්නේ කවදාද?

ගරු තලතා අතුකෝරල මහත්මිය (විදේශ රැකියා අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல - வெளிநாட்டு தொழில்வாய்ப்பு அமைச்சர்)
(The Hon. (Mrs.) Thalatha Atukorale - Minister of Foreign Employment)
අපි දෙනවා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
හා, දෙන්න බලන්න. දෙන කෙහෙල් මලක් නැහැ. අන්න, රබර් වතු හිමියන් අද උද්ඝෝෂණය කරනවා. අද රබර් මිල රුපියල් 235යි. [බාධා කිරීමක්] දැන් ගෙවන්න. ගෙවන්න සල්ලි නැහැලු. තමුන්නාන්සේලා ජාතියම මුළා කළා; මුළු රටම මුළා කළා; රටටම අසත්‍ය කිව්වා. අසත්‍ය කියලා පත් වුණු ආණ්ඩුවක් මේක. මේ ආණ්ඩුව ණයට ඉන්නේ. මෙතැන ඉන්නේ ණයට. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමියලා මේ ඉන්නේ ණයට. මෙතුමන්ලා බලයට ආවේ නැහැ. මිනිස්සු ඡන්දය දුන්නේ නැහැ. මෙතැන ඉන්නේ ණයට. හෙට අනිද්දා මැතිවරණයකින් බලය අරගෙන එනවාය කියන පොරොන්දුව පිටයි මේ ඉන්නේ. ඒ නිසා ඔබතුමියලා ඉක්මනින් මේ ණය ගෙවලා මෙතැනින් තොලොංවි වෙලා යන්න. මම කියන්නේ ඒකයි. මම තවත් කාලය ගන්නේ නැහැ. ගරු තලතා අතුකෝරල ඇමතිතුමියනි, ඔබතුමිය මගේ සහෝදරියක් වාගෙයි. ඔබතුමිය මට බාධා කළත්, ඒ ගැන අනුකම්පා කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 1.19]

ගරු සරණ ගුණවර්ධන මහතා
(மாண்புமிகு சரண குணவர்தன)
(The Hon. Sarana Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා ගැන කථා කරන මේ අවස්ථාවේ මටත් කරුණු කාරණා කීපයක් කියන්න තිබෙනවා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා වෙනුවෙන් ක්‍රියාකාරීව වැඩ කරපු අත්තනගල්ල මැතිවරණ කොට්ඨාසයේ අපේ පාක්ෂිකයන්ට, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට, ශාඛා සමිති නිලධාරීන්ට ඉතාම නින්දිත විධියට, කැත විධියට, භයානක විධියට පහර දුන්නා.

'ත්‍රීවීල් සම්පත්' කියන පුද්ගලයෙක් ත්‍රී-වීලර් එකේ මහින්ද මහත්මයාගේ ෆොටෝ එක ගහගෙන ටවුන් එකේ ඉන්නවා. ඔහුව ටවුන් එකට ගෙනැවිත්, දණ ගස්වා, ඔහුට පිස්තෝලයෙන් ගහලා, දවස් 3ක් ඉස්පිරිතාලේ සිටියා. අද වන කල් ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා නැහැ. දුම්රිය දෙපාර්තමේන්තුවේ වැඩ කරන බණ්ඩාර මහත්මයාගේ ගෙදරට පැනලා, ජනෙල් වීදුරුවලට ගහලා, වීදුරු කුඩු කරලා හානි කළා. පොලීසියට කියා තිබෙන්නේ, "මෙය ඉහළින් ආපු ඕඩරයක්. පැමිණිලි භාර ගන්න එපා"යි කියලායි. කමලා රණතුංග මන්ත්‍රීතුමිය මේ ගරු සභාවේ ඉන්නවා. මා එතුමියට ආරාධනා කළා, අද එන්න කියලා. 09වන දා උදේ එතුමියගේ මගෙලගොඩ ගමේ ගෙදරට පැනලා, එතුමියගේ සහෝදරයාගේ පුතාට ගහලා, ඔළුව පැළුවා. ඊට පස්සේ ඔහුව රෝහල්ගත කළා. නමුත් අද වන කල් කිසිම විභාගයක් නැහැ. පොලිස්පතිතුමාත්, නියෝජ්‍ය පොලිස්පතිවරුනුත් මේ නිලධාරීන්ගේ මැදිරියේ ඉන්නවා. මේ කාරණය ඒ අයගේ අවධානය සඳහා යොමු කරනවා.

එපමණක් නොවෙයි. එක්සත් ජාතික පක්ෂයේ ක්‍රියාවලිය අපි දන්නවා. 1977 එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව බලයට පත් වුණු වෙලාවේ ගහන්න පටන් ගත්තා; ගහන්න ඉගැන්වූවා. අපේ ගෙවල් දොරවල්වලට ගැහුවා, යාන වාහනවලට ගැහුවා. ඒ වාගේම රාජකාරි කරන සමහර උදවිය තිස් පොළකට, හතළිස් පොළකට මාරු කළා. ඒ විධියට විවිධ ආකාරයෙන් පළි ගත්තා. අපි අවුරුදු 17ක් දුක් වින්දා. අවුරුදු 17කට පස්සේ ඒ ආණ්ඩුව වෙනස් කරලා අපි බලයට පත් වුණා. අපි දන්නා විධියට, අපට මතක විධියට, අපි විශ්වාස කරන විධියට ඊට පස්සේ පැවැති සෑම මැතිවරණයකදීම අපේ ගමේ පාක්ෂිකයන් සතුටු වුණා නම් සතුටු වුණේ රතිඤ්ඤා කරලක් පත්තු කරලා ගමේ පාරට දමලායි. හැබැයි අල්ලපු වත්තට පැනලා, ඔවුන්ට ගහලා, එක්සත් ජාතික පක්ෂය වාගේ බිහිසුණු වැඩ කරන්න තරම් මට්ටමකට අපි පත් වුණේ නැහැ. අපි මැතිවරණ විසි ගණනක් දිනුවා. ඔබතුමන්ලා කියන විධියට අපි ගැහුවා නම් ගණන් හදලා බලන්නකෝ, මැතිවරණ විසි ගණනට පැමිණිලි කීයක් තිබෙන්න ඕනෑද කියලා. අපේ දිස්ත්‍රික්කවල පොලීසියේ පැමිණිල්ලක් තිබෙනවාද, අධිකරණයට ගිහින් තිබෙනවාද?

අපි කනගාටු වන්නේ, හිටපු ජනාධිපතිනිය සහ එක්සත් ජාතික පක්ෂයේ උදවිය එකතු වෙලා අත්තනගල්ල මැතිවරණ කොට්ඨාසයේ ඉතාම භයානක තත්ත්වයක් ඇති කර තිබෙන එක ගැනයි. ඉන්දික රාජපක්ෂ නමැති ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් ගෙවල්වලට පැනලා ගහනවා; වාහනයක යන්න බැහැ, ගහනවා. අහිංසක මිනිහෙක් කඩයක් දමා ගෙන ඉන්නවා නම් ඒවායේ ඉබි යතුරු කඩලා, කඩවලට ඇතුළු වෙලා, ඒවාට වෙන ඉබි යතුරු

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

දමන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට තර්ජනය කරනවා. සමහර අවස්ථාවල මාධ්‍යවේදීන් නොමඟ යවා වැරැදි තොරතුරු දීලා ගම් තුළ භීෂණය ඇති කරන්න හදනවා. මේවා එක්සත් ජාතික පක්ෂයේ සැලසුම්. එක්සත් ජාතික පක්ෂය කවදාවත් මේ වැඩේ අත්හරින්නේ නැහැ.

හැබැයි තමුන්නාන්සේලා මතක තබා ගන්න, තමුන්නාන්සේලා ආණ්ඩුවක් පිහිටුවා තිබෙන්නේ පොලියට ණයට අරගෙනයි කියලා. මාස තුනක පොලියට කරන්න ආපු ආණ්ඩුවක්. [බාධා කිරීමක්] තමුන්නාන්සේලාගේ යහ පාලනය කොහේද තිබෙන්නේ? මේකට කියන්නේ ගව පාලනය කියලායි. අපෙන් අහගන්න. මනුෂ්‍යයින්ට ශීලාචාර විධියට හැසිරෙන්න ඉඩක් දෙන්න. තමුන්නාන්සේලා අපේ රටේ ජනතාව නොමඟ යවනවා. එපමණක් නොවෙයි, වැරැදි විධියට හසුරුවනවා. ඒ ගැන මා කියන්න ඕනෑ නැහැ.

ජෝන් අමරතුංග ඇමතිතුමාගේ දිස්ත්‍රික්කය තමයි ගම්පහ දිස්ත්‍රික්කය. ඔස්මන් ගුණසේකර කියලා මිනී මරුවෙක් ඉන්නවා. අද මාව මරන්න, මගේ බිරිඳ හා දරුවන් මරන්න, අපේ පාක්ෂිකයන් මරන්න ඔහුව මෙහෙයවනවා. ඔහුට විරුද්ධව මිනී මැරුම් නඩු 30ක්, 40ක් තිබෙනවා. ඒ ගැන ඔබතුමාට අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. කොළ පාට ෂර්ට් එකක් ඇඳ ගෙන, තොප්පියක් දමා ගෙන, අවි ආයුධ තබා ගෙන පාරේ සැරිසරනවා. මේකද, යහ පාලනය කියන්නේ? ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් ආරම්භ කරන්න කියලා මා පොලිස්පතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. සීඅයිඩී එකට යොමු කිරීම සඳහා මෙම ලිපිය මා **සභාගත*** කරනවා. එය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

මේකද යහ පාලනය කියන්නේ? ඊළඟ මැතිවරණයේදී අපේ පක්ෂයේ උදවියට එළියට බහින්න දෙන්නේ නැහැ. තර්ජනය කරනවා, දුරකථනවලින් කථා කරලා කියනවා, එහෙම නැත්නම් රෑට පිස්තෝලයක් අරගෙන ගෙවල්වලට ගිහින්, "මම අසවලාගේ මිනිහා"යි කියලා භය කරනවා. මේකද යහ පාලනය?

අපි අදත් කියනවා, අපේ පක්ෂය ගත්ත තීන්දුවට අනුව මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට විරුද්ධව අපි වැඩ කළාය කියලා. නමුත් මෛත්‍රීපාල සිරිසේන මහත්මයා අපේ පක්ෂයේ සභාපති බව අමතක කරන්න එපා. එතුමා අපට අවවාද, අනුශාසනා දීලා, සමඟියෙන් ආණ්ඩුව ගෙන යන්න හදන කොට මේකද යහ පාලනය කියන්නේ? එහෙම ගහලා හරි යනවාද? තමුන්නාන්සේලා හිතනවාද, තව අවුරුදු ගණනක් ආණ්ඩු කරන්න පුළුවන් කියලා. ඊළඟ පාර්ලිමේන්තු මැතිවරණයේදී එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුවක් පිහිටුවා, තමුන්නාන්සේලාත් ආරක්ෂා කරන්න ශීලාචාර සමාජයක් ඇති කළ හැකි පද්ධතියක් හදනවාය කියන එක අපි වග කීමෙන් කියනවා.

ජෝන් අමරතුංග ඇමතිතුමා වත්තල ප්‍රාදේශීය සභාවට ගිහින් සාකච්ඡාවක් පැවැත්වූවා තමයි. අපි නැහැයි කියන්නේ නැහැ. මුළු රටටම, ලෝකයටම ඒක පෙන්නුවා. හැබැයි ඇමතිතුමා යන කොට ගියේ මන්ත්‍රීවරුන්ට බලා ගන්න කියලායි. කොයි ආකාරයෙන් බලා ගත්තාද දන්නේ නැහැ. ගරු ජෝන් අමරතුංග ඇමතිතුමනි, ඔය වාගේම ප්‍රේමදාස ජනාධිපතිතුමා මේ රටේ රාජ්‍ය නායකයා හැටියට ඉන්න විටත්, සොත්ති උපාලි, මාළු නිහාල්, එහෙම නැත්නම් සිරිසේන කුරේ එක්ක ගිහින් ජනතා විමුක්ති පෙරමුණේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උදවිය අත් අඩංගුවට අරගත්තා. රෑට ගිහින් බැලුවා. බලලා මොකක්ද කියන්නේ? වෙන මොකක්වත් නොවෙයි කිව්වේ, "අරන් දාන්න" කියලා කිව්වා. ඒ එක මනුෂ්‍යයකුවත් අද ජීවත්ව සිටිනවාද? අද වන විට ඒ සියලු දෙනාම ඝාතනය කරලා තිබෙනවා.

තමුන්නාන්සේලාගේත් ක්‍රමයක් තිබෙනවා. රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා ගැන මම කථා කරන්නේ නැහැ. නමුත් අපි දන්නවා, පසු ගිය දිනවල වුණු සිද්ධි ගැන. අපිට නිදහසේ ජීවත් වෙන්න ඉඩ දෙන්න ඕනෑ. අපි මාධ්‍යවලින් දැක්කා, දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් පුටුව උඩට පැනලා ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන්ට ගහන්න, බණින්න පටන් ගත් අන්දම. මේවා මේ රට තුළට පමණක් නොවෙයි ජාත්‍යන්තර තලයටත් යනවා. මේ රට ලේ, මස්, නහරවලින් හැදුණු ජනතාවක් ජීවත්වන රටක්. ඒ වාගේම තමුන්නාන්සේලාට ඡන්දය දුන්නු උදවිය කොපමණ සිටිනවාද කියලා තමුන්නාන්සේලා හිතන්න. තමුන්නාන්සේලා මේ ආණ්ඩුව කරන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් කැඩිලා ගිය කොටසක් අරගෙන.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, දැන් අවසන් කරන්න.

ගරු සරණ ගුණවර්ධන මහතා
(மாண்புமிகு சரண குணவர்தன)
(The Hon. Sarana Gunawardena)
අපේ ගම්වල ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සමහර උදවිය ගිහින් යහ පාලනයට, හංසයාට -අලියා නොවන නිසා- කතිරය ගැහුවා. අපි ඒක පිළිගන්නවා. ඒ කතිරය ගහපු මිනිස්සු අද කියනවා, "අපි කර ගත්ත මෝඩ වැඩේ" කියලා. ඒක නිවැරදි කරන්නට ඒ උදවිය ලැහැස්ති වෙලා ඉන්නවා. තමුන්නාන්සේලා හිතනවාද, -මන්ත්‍රීවරුන් 49 දෙනෙකු තියාගෙන- මන්ත්‍රීවරුන් 113කට වැඩි බහුතරයක් ගන්න පුළුවන් වෙයි කියලා? අපි අද විපක්ෂයේ හිටියත්, මන්ත්‍රීවරුන් විශාල සංඛ්‍යාවක් සමඟ තමයි ඊළඟ පාර පාර්ලිමේන්තු මැතිවරණයට එන්නේ. පළාත් සභාවල, පළාත් පාලන ආයතනවල ජනතා ජයග්‍රහණ ලබා තිබෙන සියලුම උදවිය සමඟ තමයි අපි පාර්ලිමේන්තු මැතිවරණයට එන්නේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, දැන් අවසන් කරන්න.

ගරු සරණ ගුණවර්ධන මහතා
(மாண்புமிகு சரண குணவர்தன)
(The Hon. Sarana Gunawardena)
තමුන්නාන්සේලාගේ නායකයා සමඟ, එහෙම නැත්නම් පක්ෂය සමඟ, යූඑන්පී එකේ කෘත්‍යාධිකාරී මණ්ඩලය සමඟ කථා කරලා හෝ මේ ප්‍රශ්නය විසඳලා දෙන්න. අද අපිට අල්ලස්, දූෂණ චෝදනා ගෙනෙනවා. අවුරුදු ගණනක් තිබුණු නඩු අද ඇදලා අරන් එළියට දමනවා. අද මන්ත්‍රීවරුන් සීඅයිඩී එකට ගෙනිහිල්ලා අවුරුදු ගණනකට හිරේ දමන්නට හදනවා. මේකද, යහ පාලනය? [බාධා කිරීමක්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, බොහොම ස්තූතියි.

මීළඟට ගරු අතුරලියේ රතන හිමි. ඔබ වහන්සේගේ කථාව කරන්න.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[අ.භා. 1.28]

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මැතිවරණ ප්‍රචණ්ඩත්වය පිළිබඳව විවාදයක් පාර්ලිමේන්තුවේ පැවැත්වෙන අවස්ථාවේදී මමත් අදහස් කිහිපයක් දැක්වීම වැදගත් කියලා මම හිතුවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මැතිවරණයට පෙර සහ මැතිවරණයට පසු ප්‍රචණ්ඩත්වය පිළිබඳව සාකච්ඡා කරන්නට යන්නේ නැහැ. මේ රටේ මැතිවරණ ඉතිහාසය අරගෙන බැලුවාට පසුව පෙනෙනවා, හැම දාම අපේ රටේ ජයග්‍රාහී පක්ෂය විසින් පරාජිත පක්ෂයට පහර දෙන සම්ප්‍රදායක් ගොඩ නැඟිලා තිබුණු බව.

අපි සර්වජන ඡන්ද බලය ලබා ගත්තාට පසුව 1936 දී පවත්වපු මැතිවරණය තමයි අපේ ආරම්භක මැතිවරණය. ඉන් පසුව කාලයක් යන තෙක් අපි මැතිවරණයක් පැවැත්තුවේ නැහැ. දෙවන ලෝක යුද්ධය නිසා අපට මැතිවරණයක් පවත්වන්නට බැරි වුණා. 1947 මැතිවරණයේදීත්, ඊට පසුව පැවැති සෑම මැතිවරණයකදීත් ප්‍රචණ්ඩත්වය ඇති වුණා. නමුත් ඒ සියලු කාලවලට වඩා, ඩඩ්ලි සේනානායක යුගය, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ යුගවලට පසුව විශේෂයෙන්ම 1977න් පසුව පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩත්වය කියන එක ඉතාම දරුණු තත්ත්වයකට පත් වුණු බව අපි දැක්කා. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග රජයෙන් පසුව එක දිගටම පැවතුණේ සන්ධාන රජයන්. ජනාධිපතිවරිය එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් හිටියත් රනිල් වික්‍රමසිංහ මහත්මයා අගමැති හැටියට අවුරුදු දෙකක පාලන කාලයක් අරගෙන ගියා.

මේ මුළු කාලයේම දේශපාලන ක්‍රියාකාරිත්වය සහ මැතිවරණ සමය විමසලා බැලුවොත් මේ නුදුරු දින පැවැත්වූ ජනාධිපතිවරණය තමයි මම හිතන හැටියට ලංකා දේශපාලන ඉතිහාසයේම වැඩිම ප්‍රජාතන්ත්‍ර විරෝධී මැතිවරණය වන්නේ. ලංකා දේශපාලන ඉතිහාසයේ රාජ්‍ය බලය අනිසි ලෙස යෙදීම වැනි කාරණා අරගෙන බැලුවාම, එය නිදහස් හා සාධාරණ මැතිවරණයක් නොවෙයි. නමුත් ඒ මැතිවරණය ස්වාධීන ජනතා බලවේග, -ඒ කියන්නේ ප්‍රබුද්ධ සමාජය විසින් ධන බලය සහ රාජ්‍ය බලය සියල්ල පරදවලා- දේශපාලන ජයග්‍රහණයක් ලබා ගත්තා.

ඒ දේශපාලන ජයග්‍රහණයට පෙර සහ ඊට පසුව ඇති වෙච්ච සිද්ධීන් ගැන මේ සභාවේ කථා කර තිබෙනවා. වත්තල ඇති වූ සිද්ධියේදී තුවාල ලැබූ පුද්ගලයන් රෝහල්ගත කර තිබුණා. මා ඔවුන් බලන්න ගියා. ඒ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා සහ සාමාජිකයෝ ඉතා දරුණු විධියේ පහර දීමකට ලක් වෙලා සිටියා. අපි කවුරුවත් කිසි ලෙසකින්වත් එවැනි තත්ත්වයක් අපේක්ෂා කළේ නැහැ. පොලිස්පතිතුමාගේ මැදිහත් වීමෙන් මෙවැනි සිද්ධීන් පිළිබඳ නිශ්චිතව පරීක්ෂණයක් කරලා ඒ වාර්තාව සමාජගත කිරීම අද අවශ්‍ය වෙලා තිබෙනවා. මුළු රටේම ශීලාචාර දේශපාලන සම්ප්‍රදායක් ඇති කිරීම සම්බන්ධයෙන් අලුත් කතිකාවතක් අපි ගොඩ නඟන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දේශපාලනමය වශයෙන් බලන විට අද ලංකාවේ සමාජයේ මිනිස්සු හුඟක් ඉස්සරහිනුයි ඉන්නේ. පසු ගිය මැතිවරණයේදී අපි දැක්කා, එක්සත් ජාතික පක්ෂයට වඩා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට වඩා, ලක්ෂ 20කට වඩා මධ්‍යස්ථ ජනතාවක් මේ මැතිවරණ ක්‍රියාවලිය තමන්ගේ ක්‍රියාවලියක් බවට පරිවර්තනය කරගෙන ඉස්සරහට අරගෙන ගියාය කියන කාරණය. විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සංගමය, වෘත්තිය සමිති, ස්වාධීන කලාකරුවන්ගේ සංගම්, වෘත්තියවේදීන්ගේ සංගම් පුදුමාකාර විධියට මේ මැතිවරණය ඉස්සරහට අරගෙන ගියා. ඔවුන් කිසිම තැනකදී ප්‍රචණ්ඩත්වයක් බලාපොරොත්තු වුණේ නැහැ. ඔවුන් ස්වාධීනව තමන්ගේ මතය ගෙනිච්චා. නමුත් පසු ගිය කාලයේදී ඔවුන්ටත් යම් යම් සිදුවීම්වලට මුහුණ දෙන්නට සිදු වුණා. මා ඒ ගැන කථා කරන්න යන්නේ නැහැ.

දැන් අප එළඹ සිටින අවධිය කුමක්ද යන්න ගැන දේශපාලන විනිශ්චයක් නැති වීම ඉතා බරපතළ කාරණයක්. අද අපි ඉන්නේ ජාතික ආණ්ඩුවක. පසු ගිය දිනක අතුරු අය වැයක් ඉදිරිපත් වුණා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ සන්ධානයේ අය ඒ අතුරු අය වැය දැක්කේ යුඑන්පී ආණ්ඩුවේ අය වැයක් හැටියටයි. නමුත් ඇත්ත වශයෙන්ම ජාතික ආණ්ඩුවක අය වැයක් හැටියටයි ඔවුන් එය දැකිය යුතුව තිබුණේ. අපි කනගාටු වෙනවා, ඒ අය වැය දෙපැත්තේම සාකච්ඡාවකින් පසුව ඇති වුණු ජාතික අය වැයක් හැටියට ඉදිරිපත් කරන්නට නොහැකි වීම ගැන. ඒ වාගේම ඒ අය වැයේදී ඇති වෙච්ච වාද විවාද, ගෙනාපු යෝජනාවලට සාධනීය විවේචන - ඒ කියන්නේ ජාතික ආණ්ඩුවක අය වැයේදී තමන්ගේ පාර්ශ්වයෙන් කළ හැකි දේ පිළිබඳව සාධනීය යෝජනාවලියක්- ගෙනැල්ලා, ඊට වඩා මිත්‍රශීලී අදහස් හුවමාරුවක් අපි කර ගත යුතුව තිබුණා. අපි කැමැති වුණත්, ඇකැමැති වුණත් අද මේ රටේ ජනාධිපති බවට පත්ව සිටින්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිවරයායි. ඒ අනුව මේ පක්ෂ දෙක අතර ඓතිහාසික අන්තර් සම්බන්ධතාවක් ඇති කර ගන්න සුවිශේෂ අවස්ථාවක් අපට පැදිලා තිබෙනවා. මේ පක්ෂ දෙකේ එකඟතාවක් නැතිව, මේ පක්ෂ දෙකේ සම්මුතියක් නැතිව මේ රටේ ව්‍යවස්ථා සංශෝධනයක් කරන්න බැහැ.

මෙහිදී විශේෂයෙන්ම කරුණු කිහිපයක් වැදගත් වෙනවා. එකක් තමයි ඡන්ද ක්‍රමය. අනෙක, අධිකරණයේ ස්වාධීනත්වය. ඒ වාගේම තනි පුද්ගලයෙක් මත බලය පැවරෙන විධායක ජනාධිපති ධුරයේ බලතල සංශෝධනය කිරීමට අදාළ වැදගත් සාකච්ඡාවක් ඉදිරි කාලයේදී අපට කරන්න සිද්ධ වෙලා තිබෙනවා. විශේෂයෙන්ම, මේ සාකච්ඡාවේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ සන්ධානයේ සමගාමී පක්ෂවලටත්, එක්සත් ජාතික පක්ෂයටත් සුවිශේෂ වගකීමක් පැවරී තිබෙනවා. මෙහිදී ඉතාම ස්වාධීනව, මධ්‍යස්ථව ඉදිමින් අපේ රටේ දරුවන්ට, අපේ රටේ අභිමානය රැකෙන පරිදි ස්ථාවර නීති ක්‍රමයක්, ස්ථාවර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් රට සතු කිරීම අපේ පරම වගකීමක් වෙනවා. ඒ වගකීම ප්‍රමුඛස්ථානයේ තබා ගෙන අප කටයුතු කළ යුතු වෙනවා. නමුත් මේ සිදු වෙලා තිබෙන වෙනස්කම, සමාජීය පරිවර්තනය පිළිබඳ කිසිම අදහසක් නැතිවයි සමහරු කටයුතු කරන්නේ. ඒක ඉතාම කනගාටුදායක තත්ත්වයක්.

විශේෂයෙන්ම ඉදිරි මැතිවරණයේදී ජයග්‍රහණය කරන්නේ කවුද කියන එක ගැන කවුරුත් කථා කරනවා. මම කියන්න කැමැතියි, දැන් මේ තිබෙන මැතිවරණ ප්‍රතිඵල අනුව අපි කොහොම කටයුතු කළත්, පසු ගිය පළාත් සභා මැතිවරණ ප්‍රතිඵල විශ්ලේෂණය කළායින් පසුව, ප්‍රධාන පක්ෂ දෙකටම සරල බහුතරයක් ලබා ගන්නා එක ලෙහෙසි පහසු කාර්යයක් වෙන්නේ නැහැ කියන එක අපට පෙනී යන බව. බොහෝ වෙලාවට ස්ථාවර පාර්ලිමේන්තුවක් බිහි වීමට තිබෙන ඉඩ කඩ අඩුයි. ඒ වාගේම මනාප ක්‍රමය අහෝසි කරලා කේවල ක්‍රමය හා අනුපාත ක්‍රමය ආවත්, ඒ කියන්නේ අනුපාත ක්‍රමයට වුණත් පාර්ලිමේන්තුව තේරී පත් වන ක්‍රමය වෙනස් කරපු ගමන්ම මේ ආසනවල සිටින බොහෝ ජනතාව මේ මන්ත්‍රීවරුන්ට විරුද්ධව ඡන්දය දෙන්න පෙළඹෙවිය කියා අපි කල්පනා කරනවා. ඒ අනුව ලංකාවේ මැතිවරණ ඉතිහාසයේ මහින්ද රාජපක්ෂ මැතිතුමා ලබපු ජයග්‍රහණයට ඔබ්බෙන් යන ජයග්‍රහණයක් ලබන්න ඕනෑ නම් විශාල සමාජීය ප්‍රතිසංස්කරණයකට අදාළ කතිකාවතකට ඇවිල්ලා අලුත් දේශපාලන සම්ප්‍රදාය පිළිබඳව සාධනීය වැඩ කොටසකට දායක විය යුතු වෙනවා. එසේ දායක වීමෙනුයි, අපි හැමෝටම රටේ මහජනතාව තුළ පදනමක් හදා ගන්න පුළුවන් වෙන්නේ.

එහෙම නැතුව අපි වහසි බස් දෙඩවීමෙන් හෝ අරහේට,මෙහේට බැණ වැදීමෙන් හෝ මේ ප්‍රශ්නයට ප්‍රවේශ වෙන්න පුළුවන්කමක් නැහැ. මේ ඉතාම වැදගත් ඓතිහාසික මොහොතක්. අපි කවුරු කැමැති වුණත්, අකැමැති වුණත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ බලවත් අවුලක් ඇති වුණේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිසායි. ඒ ව්‍යවස්ථාවේ ඉතාම දුර්වල අංග ලක්ෂණ රාශියක් පවතිනවා. එයින් ප්‍රධාන වශයෙන් මැතිවරණ ක්‍රමයත්, ඒ වාගේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ තිබෙන විධායක ජනාධිපති ධුරයේ බලතල පිළිබඳවත්, ප්‍රධාන පක්ෂ දෙකේම සම්මුතියක් ඇති කර ගන්න එක ස්ථානයකට, එක මංසන්ධියකට අප දැන් පැමිණ සිටිනවා. මෙහිදී ඉතාම වැදගත් වනවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිවරයාට, ජනාධිපතිවරයා හැටියට අතිමහත් වගකීමක් පැවරිලා තිබීම. ඒ වගකීමේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තමන් වෙත පැවරී ඇති ඒ ඓතිහාසික කාර්ය භාරය මනාව තේරුම් අරගෙන කටයුතු කළ යුතු වනවා. 1956 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මේ රටේ බලවත් පක්ෂයක් බවට පත්වෙලා, මහජන එක්සත් පෙරමුණ හැටියට බලයට පත් වුණා. එදා ඔවුන් සිදු කළාක් මෙන් ඒ ප්‍රගතිශීලි, ජාතික හා ජනතා වුවමනාවන් හරියට තක්සේරු කරලා, අද මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ජයග්‍රහණය කිරීමට "අපි මොනවාද අපේ පැත්තෙන් ඉදිරිපත් කරන්න ඕනෑ" කියන කාරණය පිළිබඳව දේශපාලන පක්ෂ අතර සංවාදයක් ඇති විය යුතුව තිබෙනවා. ඒ වාගේම එක්සත් ජාතික පක්ෂයේ නායකයා වූ ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා අද මේ රටේ අගමැතිවරයා බවට පත් වෙලා තිබෙනවා. එතුමා පිළිබඳ විවිධ විවේචන, විවිධ විග්‍රහ තිබෙනවා. නමුත්, එතුමා යම්කිසි බලගතු දේශපාලන තීන්දුවක් ගත්තා. ඒ තමයි පොදු අපෙක්ෂකයකුට ඉඩ දීලා මේ ජනාධිපතිවරණය කරා ප්‍රවේශ වීම. ඒ ගැන අපි වගකීමෙන් කටයුතු කළ යුතු වෙනවා. එතුමා ඒ කරපු කැප කිරීමත්, ඒ වාගේම මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ආණ්ඩුවෙන් එළියට ඇවිල්ලා, මැතිවරණයට ඉදිරිපත් වීමෙන් කරපු ඒ කැපකිරීමත් කියන කාරණා දෙකම ඒකාබද්ධ කරලා ඒ ගැන හිතන්නට මේ රටේ ප්‍රබුද්ධ සමාජ කණ්ඩායම්වලට වගකීමක් දැන් පැවරී තිබෙනවා. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිසි පරිදි සංශෝධනය කරලා, මේ ව්‍යවස්ථා අවුලෙන් මේ රට නිදහස් කර ගැනීමේ වගකීම අද අප සතුව තිබෙනවා.

අපි දන්නවා, මේ ප්‍රධාන පක්ෂ දෙකේම ඉහළ පෙළේ ප්‍රභූ දේශපාලන නායකයෝ කොළඹ ඉන්නා බව. නමුත් බිම් මට්ටමේ තිබෙන දුගී සමාජයේ පාතාල නායකයෝ හැම දිස්ත්‍රික්කයකම ඉන්නවා. අද වෙලේ සුදාගේ කට උත්තරය අරගෙන බැලුවොත්, බලයට පත්වී සිටි හිටපු ආණ්ඩුවේ දේශපාලන නායකයෝ කුඩුකාරයොත් එක්ක ගනුදෙනු කරලා තිබෙනවා කියලා අපට පැහැදිලිව පෙනෙන බව කියන්නට ඕනෑ. ඔවුන්ට දේශපාලන රැකවරණ තිබෙනවා. නමුත් අපි කියන්න කැමැතියි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සියලුම මන්ත්‍රීවරු මේකට වගකිව යුතු නැහැ; ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සියලු ඇමතිවරු මේකට වගකිව යුතු නැහැ කියලා. මේ සම්බන්ධයෙන් වගකිව යුතු ඇමතිවරු දෙතුන් දෙනෙක් ඉන්නවා. ඔවුන්ට දෙන දඬුවම මොකක්ද කියලා මේ රටම බලාගෙන ඉන්නවා. වර්තමාන ජනාධිපතිතුමා යටතේත්, අගමැතිතුමා යටතේත් ඒ දඬුවම් ඔවුන්ට ලබා දෙයි කියලා අපි බලාපොරොත්තු වනවා. මොකද, මේ රටේ, 1980 වෙනකොට එක්ලක්ෂ විසිදහසක් පමණ වුණ කුඩුකාරයෝ සංඛ්‍යාව අද වෙනකොට තුන්ලක්ෂ අසූදාහකට කිට්ටු සංඛ්‍යාවකට ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා මේ උවදුරින් රට ගලවා ගැනීමේ ජාතික වැඩ පිළිවෙළක්, ජාතික මෙහෙයුමක් අද ජාතියට අවශ්‍ය වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම අද කොළඹ නගරයේ දුගී පැල්පත් ආශ්‍රිත සමාජයේ මෙය බරපතළ සමාජ ගැටලුවක් බවට පත් වෙලා තිබෙනවා. මීගමුව, ජා ඇල, වත්තල ප්‍රදේශ මේ අතරින් විශේෂයි. ළඟදී ප්‍රශ්නයක් ඇති වුණෙත් වත්තල ප්‍රදේශයේ. ඒ වාගේම මේ තත්ත්වය මාළිගාවත්ත ප්‍රදේශයේත් තිබෙනවා. ඒ වාගේම ඔබේසේකරපුර පැත්ත, වනාත පැත්ත, බණ්ඩාරනායකපුර වාගේ දුගී ජනතාව ජීවත්වන සෑම ප්‍රදේශයකම අද මේ කුඩු ප්‍රශ්නය ඉතා බලගතු සමාජ ප්‍රශ්නයක් කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, අද ජාත්‍යන්තර පාසල්වලත් මේ ප්‍රශ්නය ඔඩුදුවලා තිබෙනවා. ඒ වාගේම අනුරාධපුරය වාගේ ඈත ගම්බිම්වලට, පොළොන්නරුව වාගේ ඈත ගම්බිම්වලට මේ කුඩු ප්‍රශ්නය අද ව්‍යාප්ත වෙලා තිබෙනවා. ඒ නිසා මේ වාගේ කාරණා සම්බන්ධයෙන් පාර්ශ්ව දෙක අතර ජාතික සම්මුතියක් අවශ්‍යයි. කුඩුවලට සම්බන්ධ ඇමතිවරු අත් අඩංගුවට ගැනීමට, ඔවුන්ව හිරේ දැමීමට කිසිම පක්ෂ භේදයකින් තොරව ප්‍රධාන පක්ෂ දෙකේම නායකයෝ වගකීමෙන් කටයුතු කරයි කියලා අපි විශේෂයෙන්ම බලාපොරොත්තු වනවා. ඔවුන්ට කිසිම දේශපාලන සමාවක් අපි ලබා දිය යුතු නැහැ.

මේ ව්‍යවස්ථා සංශෝධනයේදී පොලීසියේ ස්වාධීනත්වය අපි බලාපොරොත්තු වනවා. අද සෑම දෙයක්ම දේශපාලනීකරණය වෙලා තිබෙනවා. 1978 පටන් ගත්ත මේ සම්ප්‍රදාය එන්න එන්න වැඩි වුණා. විශේෂයෙන් පසු ගිය රජය කාලයේ මුළු සමාජයම දේශපාලනීකරණය වුණා. මහින්ද රාජපක්ෂ මහත්තයාගේ පාලන කාලය තුළ දරුවකු පාසලට දාන්න ගියත්, පොලීසියකට ගියත්, සෑම තැනකදීම මේ සමාජය ඉතා භයානක විධියට, ඉතා බරපතළ දේශපාලනීකරණයට ලක් කරලා තිබෙනවා. පොලීසියට ස්වාධීනව කටයුතු කරන්න බැරි තත්ත්වයක් ඇති කරලා තිබෙනවා. මෙන්න මේකෙන් නිදහස්වීම සඳහා ස්වාධීන කොමිෂන් සභා අලුත් ආකාරයකින් තහවුරු කර ගැනීම අවශ්‍ය වෙනවා. එහිදී පොලීසියට දේශපාලන අතගැසීම්වලින් තොරව තමන්ගේ කටයුතු ස්වාධීනව පවත්වාගෙන යන්න ඉඩ කඩ තිබෙන්න ඕනෑ. විශේෂයෙන්ම අපි ඊළඟ මැතිවරණය බලාපොරොත්තු වෙන්නේ ස්වාධීන පොලිස් කොමිෂන් සභාවක් යටතේයි.

අපි ඊළඟ මැතිවරණය බලාපොරොත්තු වන්නේ රජයේ මාධ්‍ය මැතිවරණ කොමසාරිස්වරයා යටතට ගත්තු ක්‍රමවේදයක් යටතේයි. රස්තියාදුකාරයන්ට, මැරයන්ට, පාතාලකාරයන්ට ආයෙත් පාර්ලිමේන්තුවට එන්න දෙන ඒ යුගය අවසාන කිරීමේ වැඩ පිළිවෙළට අද ප්‍රධාන පක්ෂ දෙකම එකඟ කරගැනීම අවශ්‍යයි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Order, please! කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතාගේ නම යෝජනා කරන්න.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எறிக் பிரசன்ன வீரவர்த்தன அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. ERIC PRASANNA WEERAWARDHANA *took the Chair.*

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමාජයක් විධියට ගත්තොත් අපේ රටේ විවිධ ආගම් අදහන පිරිසක් ජීවත් වෙනවා. ඉන්දියාව, බංග්ලාදේශය, පාකිස්තානය වාගේ රටවල්වලට සාපේක්ෂව බැලුවොත් අපේ රටේ මිනිසුන් සංස්කෘතික වශයෙන් හුඟක් ඉහළින් සිටිනවා. අපේ සාක්ෂරතාව ඉතා ඉහළ මට්ටමක තිබෙනවා. අපේ සෞඛ්‍ය ඉතා ඉහළ මට්ටමක තිබෙනවා. නමුත් අපි ඉතාම කනගාටුවෙන් කියන්නට ඕනෑ, අපේ රටේ දේශපාලනය සහ දේශපාලනඥයන් සිටින්නේ ඉතාම පහළින් බව. ඒ කියන්නේ අපේ සමාජයේ සංස්කෘතික දියුණුව අපේ දේශපාලනය තුළ නිරූපණය වන්නේ නැහැ. ඒ නිසා මේ දේශපාලනයට අලුත් පරම්පරාවක්, සබුද්ධික සමාජ කණ්ඩායමක් ඉදිරිපත් කිරීම සෑම පක්ෂයකම වගකීමක් වෙනවා. පැවැතුණු දේශපාලන භූමිකාව අවසාන කරලා ජනතා අභිලාෂයන් ඉෂ්ට නොකරපු පක්ෂ දෙකේම දේශපාලන නායකයන්ට ඉදිරි මැතිවරණයේ දී මහ ජනතාව පණිවුඩයක් ලබා දෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

අපි අලුත් පාර්ලිමේන්තුවක් බලාපොරොත්තු වෙනවා. ඒ අලුත් පාර්ලිමේන්තුව තුළ ජාතික ප්‍රතිපත්තියක් යටතේ රට හදන වැඩ පිළිවෙළක් හඳුන්වා දෙන්නට අපි බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම භික්ෂූන් වහන්සේ කෙනෙකු හැටියට මා එක්සත් ජාතික පක්ෂයටත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටත් ආරාධනයක් කරන්න කැමැතියි. තමන්ගේ දේශපාලන මති මතාන්තර පසෙකින් තබා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් මේ කරන්න යන බරපතළ සංශෝධනය පිළිබඳව ඉතා වගකීමෙන් යුතුව මිත්‍රශීලීව සාකච්ඡා කරන්න. බුද්ධිමතුන් එකතු කරගෙන, ඔවුන් සමඟ අවධියෙන් සිටිමින් කටයුතු කරන්න කියලා මා ඉල්ලා සිටිනවා. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය රටට උචිත විධියට කිරීම සඳහා වූ කාර්ය භාරයක් අප වෙත පැවරී තිබෙනවා. විශේෂයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට මේ පිළිබඳව සුවිශාල කාර්ය භාරයක් තිබෙන බව අපි කියන්නට ඕනෑ. මොකද, මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කළ හැක්කේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සහයෝගයෙන් පමණයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මෙය මහඟැරියොත් සිදු වන්නේ, ඉතා ඉක්මනින් මැතිවරණයක් එන එකයි. සෑම දෙනාම බුද්ධිමත්ව කල්පනා කර බලන්නට ඕනෑ, එවැනි මැතිවරණයකදී කාටද වාසි සිදු වන්නේ කියලා. අපි ඒ ගැන පැහැදිලිව කල්පනා කර බලන්නට ඕනෑ. අප දේශපාලනය තෝරන්නට ඕනෑ රටේ ඉදිරි මඟ ගැන හිතලායි. එසේ ඉදිරි මඟ ගැන හිතලා ගන්නා දේශපාලන තීන්දුවකින් පමණයි රටට යහපතක් සිදු වන්නේ කියන එක අපි මතක් කරන්නට ඕනෑ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බොහොම ස්තූතියි.

[අ.භා. 1.43]

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ දේශපාලනඥයන් අතර වේවා, පූජකවරුන් අතර වේවා, ගුරුවරුන් අතර වේවා, නඩුකාරයන් අතර වේවා හොඳ අයත් ඉන්නවා; නරක අයත් ඉන්නවා. ඔක්කෝම එක වාගේ දියුණු වෙලා නැහැ. ඒ වාගේම පොලීසියේ පවා එවැනි අඩු පාඩුකම් තිබෙන අය ඉන්නවා. ඉතින් අපි උත්සාහ කරන්නේ ඒවා අවම කරගෙන රට හදාගෙන ඉදිරියට යන්නයි.

අපේ ගරු ස්වාමීන් වහන්සේ මැතිවරණය ගැන කිව්වා. ගරු ස්වාමීන් වහන්ස, ඔබවහන්සේලාගේ පොරොන්දුව අනුව, ඒ ප්‍රකාශනය අනුව මේ මැතිවරණ ක්‍රමය ආසන ක්‍රමයකට යොමු කරන්න කියන එකයි මා මතක් කරන්නේ. ආසන ක්‍රමය නැතිකමෙන් තමයි පක්ෂය තුළත්, පක්ෂ පක්ෂ අතරත් රණ්ඩු සිදු වන්නේ. ඒ වාගේම මැතිවරණයකදී බිස්නස්කාරයන්, ව්‍යාපාරිකයන් එයට ඉදිරිපත් කරන්නට සිදු වෙනවා. ඒ අය දේශපාලනයට ආවාම තම පුරුද්දට අනුව ව්‍යාපාරය තමයි කරගෙන යන්නේ.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

ඔබතුමන්ලාගේ සහාය ලබා දුන්නොත් ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමේ කටයුත්ත සිදු වෙනවා.

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)

අපි සහාය දෙනවා. අපි එයට සහාය දෙන්න ලෑස්තියි. ඒක ඉක්මන් කරන්න. අතුරු අය වැයක් ගෙනෙන එක විතරක් නොවෙයි ඕනෑ කරන්නේ. ඊටත් වඩා රටට බලපාන, මිනිසුන්ට බලපාන,මේ තත්ත්වය හැදිය යුතුව තිබෙනවා. ජනාධිපතිතුමාගේ බලතල අඩු කරලා දුර්වල කරන එක, ඒ එක පැත්තක්.

අනෙක් පැත්තෙන්, ඊටත් වඩා රටට බලපාන දේ තමයි මන්ත්‍රීවරුන් පිළිබඳව තිබෙන ප්‍රශ්නය. මැතිවරණ ක්‍රමය ආසන ක්‍රමයට පරිවර්තනය කිරීම සුමාන දෙක තුනකින් කරන්න පුළුවන් දෙයක්. අපේ දිනේෂ් ගුණවර්ධන හිටපු ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කරලා ඒ සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒවාත් සැලකිල්ලට ගෙන බොහොම ඉක්මනින් මේ වැඩේ කරන්න පුළුවන්. අන්න ඒක කරන්න කියා මතක් කරනවා. ගරු (පූජ්‍ය) අතුරලියේ රතන ස්වාමීන් වහන්ස, ඒ සඳහා ඔබවහන්සේ ඉදිරිපත් වෙන්න කෝ. මාදුළුවාවේ හාමුදුරුවෝත් එදා මේ පිළිබඳව බොහොම හඬනැඟුවා. ඒ නිසා දැන් නිදියන්නේ නැතිව නිදි වරාගෙන ඒ වැඩේ කරන්න කියලා මතක් කරනවා.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

අතාවුද සෙනෙවිරත්න මන්ත්‍රීතුමනි, ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කරනකොට විධායක ජනාධිපති ධුරයේ බලතල අහෝසි කිරීම විතරක් නොවෙයි, මනාප ක්‍රමය අහෝසි කරන මැතිවරණ සංශෝධනයත් අනිවාර්යයෙන් අවශ්‍යයි කියලා ඔබතුමන්ලා ඉල්ලන්න.

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)

මේ දෙකම එකට යන්න ඕනෑ. මේ දෙක එකට යන්න අපි මේ පැත්තෙන් සහයෝගය දෙන්නම්.

ඊළඟට, මම තව කාරණයක් ගැන මතක් කරන්න කැමැතියි. ජනාධිපතිතුමා, ඒ වාගේම අග්‍රාමාත්‍යතුමා පත්වෙලා තමන්ගේ ධුරවල දිවුරුම් දෙන අවස්ථාවේ ඉල්ලීමක් කර සිටියා, ප්‍රචණ්ඩ ක්‍රියා සිදු කරන්න එපා කියලා. නමුත් පසු ගිය දා මාවනැල්ල නගරයට කණ්ඩායමක් ඇවිල්ලා යම් කලබලයක් ඇති කළා. එහි නායකත්වය දැරුවේ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක්. ඒ අය සමඟ මගේ වැඩි සම්බන්ධකමක් තිබුණේ නැහැ. මා එතුමාව එච්චර හඳුනන්නෙත් නැහැ. අනුර වන්දන කියන ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා මාවනැල්ල නගරයට

කණ්ඩායමක් අරගෙන ඇවිල්ලා ඒ නගරයේ කඩවල සිටි සමහර අය දොට්ට දමා ඒ කඩවල යතුරුත් අරගෙන ගියා. ඒ වාගේම එතැන තිබෙන මාළු ලෑල්ලේ මුදලාලි 'සුජිත්' කියලා කෙනෙක්. ඔහුගේ මාළු ලෑල්ලත් කඩා දමා, ඒ වාගේම එතැන තිබුණු බඩු මුට්ටුත් එළියට දැමුවා. ඔහුට පහර දීම නිසා ඔහුව මාවනැල්ල ඉස්පිරිතාලයට ඇතුළු කිරීමට සිදු වුණා. ඊට පසුව එතැනින් කෑගල්ල ඉස්පිරිතාලයටත් මාරු කර යවා සුමානයකට වැඩි කාලයක් ඒ ඉස්පිරිතාලයේ නැවතී ඉඳලා තමයි ඔහු ගෙදර ගියේ. මා මේ සිද්ධිය පිළිබඳව ජනාධිපතිතුමාට දැනුම් දුන්නා. ඊට පසුව ජනාධිපතිතුමා මේ සම්බන්ධයෙන් පොලිස්පතිතුමාට දන්වලා, පොලිස්පතිතුමා මා සමඟ ඒ පිළිබඳව කථා කළා. එවැනි දේවල් තමයි සිදු වුණේ.

ඊට පසුව නැවතත් bus stand එකේ කුලියට ලබා ගත් කඩ කාමරවල ව්‍යාපාර කරගෙන යමින් සිටි 26 දෙනෙකු පමණ පිරිසක් ඒවායින් දොට්ට දමා ඔවුන්ගේ බඩු මුට්ටු පවා ඉවතට වීසි කර දමා තිබෙනවා. පසුව වෙනත් පිරිසකට ඒ කඩ කාමර භාර දීලා, ඒ අය බඩු මුට්ටුත් අරගෙන ඇවිල්ලා ඒවායේ පදිංචි වුණා. අනුර චන්දන කියන ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා ඇතුළු විශාල පිරිසක් පැමිණිලා තමයි මේ තක්කඩිකම කෙරුවේ. මේ පිළිබඳවත් මා පොලිස්පතිතුමාට දැනුම් දුන්නා. පොලිස්පතිතුමා මේ පිළිබඳව අපේ දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිතුමාට දැනුම් දීමෙන් පසුව එතුමා ඒ පිළිබඳව පියවර ගත්තා. ඊට පසුව උසාවියෙන් නියෝගයක් දීලා තිබෙනවා, මේ අය කර තිබෙන්නේ වරදක් බැවින් මේ සියලු දෙනාවම එම ස්ථානවලින් ඉවත් කරලා කලින් සිටි අයට එම කඩ කාමර භාර දෙන්න කියලා. ඒ පිළිබඳව උසාවියට වාර්තා කරන්නත් පොලීසියට දිනයක් දීලා තිබෙනවා. ඒ දිනය තිබෙන්නේ හෙටටයි. නමුත්, තවමත් ඒ පිරිස එම ස්ථානවලින් ඉවත් කරලා කලින් සිටි මිනිස්සුන්ට එම කඩ කාමර භාර දීලා නැහැ. මෙන්න මේ විධියේ තත්ත්වයක් තිබෙනවා. ඒ නම් ටිකත් මට කියන්න පුළුවන්. නමුත් වේලාව ගත වන නිසා මම ඒ නම් ටික කියන්නේ නැහැ. මා ඒ නාම ලේඛනය **සභාගත*** කරනවා.

තවත් පිරිසකට පහර දීලා තිබෙනවා. රුකුලගම, අයගම උපාලි කියන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ශාඛාවේ සභාපතිවරයා. ගල්බොක්කේ අතුල කියන පුද්ගලයා ඔහුට පහර දීලා තිබෙනවා. ඒ පුද්ගලයාගේ කනටත් පහර වැදීම නිසා හක්ක කැඩිලා, මාවනැල්ල රෝහලට ඇතුළු වෙලා සුමානයක් විතර ඉඳලා තිබෙනවා. ඊට පසුව කෑගල්ල රෝහලට මාරු කර යවා, කෑගල්ල රෝහලෙන් කන පරීක්ෂා කරලා, මැහුම් දමා කට හදලා ඒ පුද්ගලයා දැන් ගෙදර ගිහිල්ලා ඉන්නවා. පොලීසියට ගියාම ඒ පුද්ගලයාට කියලා තිබෙනවා, මේක සමථ මණ්ඩලයට ඉදිරිපත් කරන්නම් කියලා. ඒ පුද්ගලයාගේ කන සුව කර ගන්න මාස හයක්, අවුරුද්දක් විතර බෙහෙත් ගන්න සිදු වෙයි කියලා කියනවා. ඒ අනුව දැන් සතියෙන් සතිය බෙහෙත් දෙනවා. සතියකට රුපියල් 1,000ක් පමණ බෙහෙත්වලට වියදම් වනවා. මෙන්න මේ වාගේ තත්ත්වයක් තමයි දැන් ඇති වෙලා තිබෙන්නේ.

ඊළඟට, මහන්තේගම පුෂ්ප නන්දන කියන පුද්ගලයාට චමින්ද යන අයකු පහර දීලා තිබෙනවා. මඟ රැකගෙන ඉඳලා ඒ පුද්ගලයාට තුවාල සිදු කර තිබෙනවා. ඊළඟට, මාවනැල්ල පොලිස් ප්‍රදේශයේදී බෝගල කියන පුද්ගලයකුට පහර දීලා තිබෙනවා. තවත් මෙවැනි සිද්ධීන් කිහිපයක් සිදු වෙලා තිබෙනවා. තුසිත, වසන්ත කුමාර, හෂාන් ධනසේකර, අසංක කියන පිරිස ත්‍රීරෝද රථයකින් ගමන් කරන අවස්ථාවේ දී ලක්මාල් කියන පුද්ගලයකු මේ ත්‍රීරෝද රථයට පහර දීලා එය පොඩි කර දමා තිබෙනවා. එයට රුපියල් 50,000ක විතර අලාභ හානියක් සිදු වෙලා තිබෙනවා. මේ සිදුවීමත් හෙම්මාතගම පොලිස් බල ප්‍රදේශයටයි අයත් වන්නේ. ඒ සම්බන්ධයෙන් පොලීසියට පැමිණිල්ලක් කරලා තිබෙනවා. මේ වාගේ සිදුවීම් රාශියක් තිබෙනවා.

වරකාපොල පොලිස් ප්‍රදේශයේ කේ.ජී.ආර්. සාලික මදුශාන් බණ්ඩාර නැමැත්තාට සී. සුරේන්ද්‍ර කුමාර, සී.ඇම්. ලතිරු, සී.ඇම්. ඉසුරු කියන පිරිස පහර දීලා තිබෙනවා. පහර කෑ පුද්ගලයා වරකාපොල රෝහලෙන් කෑගල්ල රෝහලට මාරු කර යවා තිබෙනවා. ඒ පුද්ගලයාගේ හක්ක තුවාල වෙලා, ඒ වාගේම ඔළුව තුවාල වෙලා මැහුම් දමා සුමානයක් පමණ රෝහල් ගත වෙලා ඉඳලා තිබෙනවා. ඒ පිළිබඳවත් පියවර ගන්නට තිබෙනවා. පුතාට පහර දෙනකොට එළියට ගිය අම්මාටත් පහර දීලා, අම්මාත් වරකාපොල ඉස්පිරිතාලයේ දවස් දෙකක් විතර හිටියා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා ඉක්මනින් කථාව අවසාන කරන්න.

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
රුවන්වැල්ල ප්‍රදේශයේ පත්මතිලක බණ්ඩාර කියා අපේ ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෙනෙක් ඉන්නවා. එතුමා ගැන ඡන්දයට ඉස්සෙල්ලා පොලීසියට පැමිණිල්ලක් දාලා තිබෙනවා, ඇවිල්ලා ගැහුවාය කියා. මෙහෙම තුවක්කු අරගෙන ආවාය කියා. ඒ විධියට පැමිණිලි කරලා නඩුවක් හදලා ඡන්දය වෙලාවේ රිමාන්ඩ් කර ගන්නට කටයුතු කර තිබෙනවා. ඒ පැමිණිල්ල පොලීසියේ තවමත් තිබෙනවා. ඒ ගැන පැමිණිලි විභාග කරලා ඒ අය නිදහස් කරන්න කටයුතු කරන්නය කියා මා විශේෂයෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට මා සඳහන් කරන්න කැමැතියි, පොලීසියේ නිලධාරි මහත්වරුන් නරකට කටයුතු කරලා නැහැ කියලා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි ගරු මන්ත්‍රීතුමා.

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
පොලිස්පතිතුමා ඕනෑකමින් උනන්දුවෙන් කටයුතු කිරීම ගැන අපි ස්තුතිවන්ත වෙනවා. කලින් වැරදි කළාය කියා පෙන්වලා අලුතෙනුත් වැරදි කරන එක නරකයි කියන එක මම කියනවා. මෙවැනි සිදුවීම් නරකයි කියනකොට පරණ ඒවා පෙන්වලා කථා කරනවා. එක වැරැද්දක් කළාය කියා තව වැරැද්දක් කරන එක හොඳයි කියන්න බැහැ. එම නිසා අද මේ තත්ත්වය හරිගස්සන්නට කටයුතු කරන්නට ඕනෑ.

විශේෂයෙන් එක්සත් ජාතික පක්ෂය බලයට පැමිණි හැම අවස්ථාවකම මේ ආරාවුල්, අරගළ ඇති කරනවා. රක්ෂාවලින් අස් කරනවා. මේ තත්ත්වයන් කර ගෙන යනවා. කුරුණෑගල ප්‍රදේශයේ එහෙම සිදුවීම් වෙලා තිබෙනවා. එම නිසා ඒ පිළිබඳව තමුන්නාන්සේලාගේ විශේෂ අවධානය යොමු කරන්නය කියා ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඊළඟට, ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[අ.භා. 1.53]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මූලාසනයේ ඉන්න වෙලාවේ මට කථා කරන්නට අවස්ථාව ලැබීම පිළිබඳව මා සන්තෝෂ වෙනවා.

අද පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳවයි සාකච්ඡා කරන්නේ. වත්තල සිද්ධියට පස්සේ, මේ රටේ වැඩියෙන්ම එවැනි සිදුවීම් වාර්තා වෙලා තිබෙන්නේ නාවලපිටිය ආසනයේයි. මේ වෙනකොට නාවලපිටිය ආසනයේ සිද්ධීන් 36ක් වෙලා තිබෙනවා. පහරදීම්, ගෙවල් ගිනි තැබීම් සහ මරණ සිද්ධ වෙලා තිබෙනවා. අද උදේ අපි අග්‍රාමාත්‍යතුමා හමුවෙලා මේ පිළිබඳව එතුමාට දැනුම් දුන්නා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ පහරදීම් පිළිබඳ ලැයිස්තුව මා සභාගත කරන්න බලාපොරොත්තු වනවා. මේ සියලුම සිදුවීම් පිළිබඳව පොලීසියේ පැමිණිලි කර තිබෙනවා. කුරුඳුවත්ත සහ නාවලපිටිය පොලීසිවලට සිද්ධීන් 36ක් පිළිබඳව පැමිණිලි කර තිබෙනවා. ගෙවල්වලට ගහපු සිද්ධීන්වල, ගෙවල්වලට ගිනි තැබූ සිද්ධීන්වල ඡායාරූප තිබෙනවා. වාහන කැඩූ ඒවා ඇතුළු සියලු සිදුවීම් පිළිබඳ තොරතුරු අපි අද ගරු අග්‍රාමාත්‍යතුමාට භාර දුන්නා.

වැවිලි කර්මාන්ත අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල මහතා මා එන්න කලින් මේ ගරු සභාවට ඇවිත් කිව්වාලු, නාවලපිටියේ කිසිම සිද්ධියක් වුණේ නැහැ කියා. මම කනගාටු වෙනවා. ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිවරයා කටින් ද කථා කරන්නේ, නැත්නම් වෙන පැත්තකින් ද කථා කරන්නේ කියා මා දන්නේ නැහැ. නාවලපිටිය පොලීසියට කථා කර බැලුවොත්, කුරුඳුවත්ත පොලීසියට කථා කර බැලුවොත් ඒ සිද්ධීන් ගැන දැන ගන්නට පුළුවන් වෙයි. අද නාවලපිටියේ එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරයා මදාවියෙක් විධියටයි හැසිරෙන්නේ. එක්සත් ජාතික පක්ෂය මේ විධියේ අයට සංවිධායකකම් දෙනවා ද කියා මා දන්නේ නැහැ. ඔහු වෘත්තියෙන් ගස් කපන්නෙක්. රෑට ඌරෝ වෙඩි තියලා ගෙනැල්ලා මස් කරලා කනවා. අරක්කු බීලා මිනිසුන්ට පහර දෙනවා. මේ තමයි එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකයා හැසිරෙන හැටි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීවරයා අද කතා කර කිව්වා, නාවලපිටියේ කිසිම සිද්ධියක් නැහැ කියා. සිද්ධීන් 36ක් පිළිබඳ පැමිණිලි කර තිබෙනවා. ගෙවල් කඩලා; ගෙවල් ගිනි තියලා. වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා කිව්වාලු මරණයක් සිද්ධ වෙලා නැහැ කියා. එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරයාගේ ගමේ මගේ නැන්දාගේ -මගේ පියාගේ සහෝදරියගේ- ගෙදරට ගිනි තිබ්බා. එතුමියගේ වයස අවුරුදු 78යි. ඒ කම්පාවට ඊට පසුව දා එතුමිය මිය ගියා. [බාධා කිරීම්] වැවිලි කර්මාන්ත ඇමතිතුමා මේ ගරු සභාවට ඇවිත් කියනවාලු එතුමිය මිය ගියේ නිකම් කියා. වැවිලි කර්මාන්ත ඇමතිවරයාට ලජ්ජා නැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා මේ වෙලාවේ ගරු සභාවට එනවා. මම ඔබතුමා ගැන තමයි දැන් කථා කරමින් සිටියේ; මහනුවර සිද්ධි පිළිබඳව කථා කරමින් සිටියේ. ඔබතුමා පාර්ලිමේන්තුවේ සභානායකවරයා. ඔබතුමා පාර්ලිමෙන්තුවේ සභානායකවරයා හැටියට පාර්ලිමේන්තුවේ ප්‍රකාශයක් කරන විට ඒක වගකීමෙන් කරනවා නම් හොඳයි. මම ඔබතුමාට මේ තොරතුරු ටික එවන්නම්. සිද්ධීන් 36ක් තිබෙනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඔව්. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා නැති වෙලාවේ අද උදේ වරුවේ මම ඒ ගැන කථා කළා. නාවලපිටියේ පොලීසි දෙකක් තිබෙනවා. එකක් තමයි නාවලපිටිය පොලීසිය. අනෙක් එක කුරුඳුවත්ත පොලීසිය. ඒ පොලීසි දෙකෙන්ම මට ලිඛිතව තොරතුරු දන්වා තිබෙනවා. ඔය මීනී මැරුමක් ගැන සඳහන් වෙලා නැහැ. සිද්ධීන් හතරයි වාර්තා කර තිබෙන්නේ. කුරුඳුවත්ත පොලීසියේ ඉන්නේ ඔබතුමා දාපු එක්කෙනා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

මේ මගේ වෙලාව ගරු ඇමතිතුමා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,- [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. ඔබතුමා පාර්ලිමේන්තුවේ සභානායකතුමා. මම කනගාටු වෙනවා. [බාධා කිරීමක්] මම කියන්නම්. මේක අහගන්න. පොඩ්ඩක් අහගන්නකෝ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අමරසේන බණ්ඩාර මහත්මයාගේ ගෙදරට පහර දීම සම්බන්ධයෙන් එම්.ඕ.අයි.බී.375/බී.6687/15 අංකය යටතේ පැමිණිල්ලක් කර තිබෙනවා. ගාමිණී දර්මාන දිසානායක මහත්තයා එම්.ඕ.අයි.බී.379/65-බී.6688/15 අංකය දරන පැමිණිල්ල කර තිබෙනවා. මාලනී නවරත්න මහත්මියගේ නිවසට පහර දීම සම්බන්ධයෙන් එම්.ඕ.අයි.බී.379/65 දරන පැමිණිල්ල කර තිබෙනවා. මේ ඔක්කොම උසාවියට දමලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, පැමිණිලි 24ක් තිබෙනවා. මම පාර්ලිමේන්තුවේ සභාගත කරනවා. ඒ වාගේම ඔබතුමා කියනවා පහරදීම් කරලා නැහැ කියලා. එතකොට මේ ෆොටෝ මොනවාද? පාර්ලිමේන්තුවේ සභානායකතුමනි, බලන්න මේ ෆොටෝ මොනවාද කියලා. ගෙවල් කඩපු ඒවා. තමුන්නාන්සේ බලන්න, මේ ගෙවල් ගිනි තියපු ඒවා. [බාධා කිරීමක්] තමුන්නාන්සේගේ OIC ගැන කථා කරන්න මට වැඩක් නැහැ.

මූලාසනාරූඪගරු මන්ත්‍රීතුමනි, අද මම මේවා පාර්ලිමේන්තුවේ සභාගත කරන ගමන්, ඇමතිතුමාට මේවායේ පිටපත් ටිකක් ගෙනැත් දෙනවා. ඇමතිතුමා ඒ ටික කියවන්න. මේවා බොරු නම්, මේ ගැන පොලීසියේ පැමිණිලි දමලා නැත්නම් -

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා විනාඩියෙන් විනාඩියට මගේ නම කියනවා. ඔබතුමා අහක බලා ගෙන ඉන්නවා, මගේ දිහා බලන්නේ නැතිව.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

මෙතුමාට කථා කරන්න වෙලාව දෙන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මම අද උදේ ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා නැති වෙලාවේ නාවලපිටිය පොලීසියේ සහ කුරුඳුවත්ත පොලීසියේ OIC මහත්වරුන් අත්සන් කළ ලිපි දෙකක් දුන්නා. ඒවායේ තිබෙන්නේ ගල් ගහපු සිද්ධීන් හතරක් ගැන විතරයි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු ඇමතිතුමනි, එතුමා පැමිණිලි අංකත් එක්ක ඉදිරිපත් කරනවා. ඔබතුමාට ඒවා බලන්න පුළුවන්.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

හරි නේ. පාර්ලිමේන්තුවේ සභානායකතුමා කරන ප්‍රකාශය ගෞරවාන්විත ප්‍රකාශයක් වෙන්න ඕනෑ. පොලීසියේ පැමිණිලි අංක තිබෙනවා නම් ඔබතුමා නැහැයි කියන්නේ කොහොමද? පොලීසියේ පැමිණිලි කර තිබෙනවා. පැමිණිලි අංක තිබෙනවා. තමුන්නාන්සේ කොහොමද කියන්නේ මරණයක් ගැන සඳහන් වෙලා නැහැ කියලා. මම කිව්වේ නැහැ, එතුමියට ගහලා මැරුවාය කියලා. දවල් 12.00ට විතර ගිහිල්ලා එතුමියගේ ගේ ගිනි තිබ්බා. ගේ ගිනි තියන කොට එතුමිය බලා ගෙන හිටියා. එදා එතුමිය හෘදයාබාධයක් හැදිලා ගම්පොළ රෝහලට ඇතුළත් කළා. ඊට පසුවදා මිය ගියා. ඒකයි මම කිව්වේ. එතුමියට ගහලා මැරුවේ නැහැ. ගහලා මැරුවා කියලා මම කිව්වේ නැහැ. එතුමියගේ දියණියගේ සාක්ෂිය බලන්න. එතුමියගේ දියණිය පොලීසියට කටඋත්තර දෙනවා. ඔබතුමා ඒක බලන්න. "මගේ අම්මා බලා ගෙන ඉද්දී ගේ ගිනි තිබ්බා, එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරයා. ඒ දුකට මගේ අම්මා පපුවේ අමාරුව හැදිලා ඉස්පිරිතාලයේ නැවැත්වුවා. ඒ නිසා මගේ අම්මා මැරුණා" කියලා. ඒ විධියට එතුමියගේ දියණිය පොලීසියට කටඋත්තර දෙනවා. තමුන්නාන්සේ මේ විධියට අසත්‍ය කියන්නේ ඇයි? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අසත්‍ය කියන්න ඕනෑ නැහැ. මේ ඇමතිතුමා නාවලපිටිය ගුරු ගම්මානේ නීත්‍යානුකූල ඉඩම් ටික බෙදුවා. ඉඩම් කච්චේරි තියලා සියලු ඉඩම් බෙදුවා. ඔබතුමා එදා ගිහිල්ලා ඉන්නවා, අපි රූපවාහිනියෙන් දැක්කා. ඔබතුමා පොලීසියේ ස්ථානාධිපතිට තර්ජනය කරනවා, මේ අය එළවන්න කියලා. ඔබතුමා පොලීසිය භාර ඇමති නොවෙයි. ඔබතුමාට මොකක්ද තිබෙන අයිතිය? රජයේ ඇමතිවරයෙක් හැටියට තමුන්නාන්සේ ලජ්ජා වෙන්න ඕනෑ. තමුන්නාන්සේ ඇමතිවරයෙක් හැටියට ඇවිල්ලා පොලීසියේ ස්ථානාධිපතිට කිව්වා, මේ මිනිස්සු එළවන්න කියලා. ඒක රූපවාහිනියෙන් අපි දැක්කා. ඒක ද යහ පාලනය? කිරිඇල්ල ඇමතිතුමනි, ඔබතුමාට එහෙම බලයක් දීලා නැහැ. තමුන්නාන්සේ ඔඅයිසීට කිව්වා මේ මිනිස්සු ඒ ඉඩම්වලින් එළියට දමන්න කියලා. එහෙම කරන්න තමුන්නාන්සේට බලයක් නැහැ. තමුන්නාන්සේ පාර්ලිමේන්තුවේ සභානායකවරයා. අද තමුන්නාන්සේ මේ පාර්ලිමේන්තුවට අසත්‍ය කිව්වා. අද මේ පාර්ලිමේන්තුව නොමඟ යැව්වා. සිද්ධීන් 27ක් සම්බන්ධයෙන් පොලීසියේ පැමිණිලි කර තිබෙනවා. අද අර නිලධාරි කුටිවල පොලීසියේ මහත්වරු ඉන්නවා. අද උදේ 11.00ට අපි තමුන්නාන්සේලාගේ අගමැතිතුමා හමු වුණා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

හොඳයි, එහෙම නම් පොලීසියේ කට්ටිය කැඳවමු.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

තමුන්නාන්සේ පොලිස්පතිතුමා මාර්ගයෙන් මේ පැමිණිලි අංක බලන්න. මේ ගෙවල්වලට ගහලා තිබෙන ඒවා. තමුන්නාන්සේ පාර්ලිමේන්තුවේ සභානායකවරයා හැටියට මේ සභාව නොමඟ යවන්න එපා. මම පැමිණිලි අංක කියනවා නම්, සිදුවීම් වෙලා තිබෙනවා නම්, ෆොටෝ තිබෙනවා නම්, තුවාලකාරයෝ ඉන්නවා නම් -

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මම ඒ අභියෝගය භාර ගන්නවා. මහනුවර ඩීඅයිජී මහත්තයා මෙතැන ඉන්නවා. ඔබතුමා කථා කරලා ඉවර වුණාට පස්සේ අපි දෙදෙනායි, එතුමායි හමු වෙමු. ඔබතුමා කවුරු හරි කෙනෙක් එවන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந්த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

හැබැයි, ඒකෙන් පස්සේ -

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඒ අභියෝගය භාර ගන්නවාද?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

භාර ගන්නවා. හැබැයි, ඒ සාකච්ඡාවෙන් පස්සේ ඒ තත්ත්වය ඔබතුමා මේ පාර්ලිමේන්තුවට වාර්තා කරන්නත් ඕනෑ කියලා මම කියනවා. මම ඒ සාකච්ඡාවට එනවා. පොලීසියේ පැමිණිලි තුනකට වඩා දමලා තිබෙනවා කියලා ඔප්පු කළොත් තමුන්නාන්සේ කියපු දෙය මේ සභාවට ඇවිල්ලා නිවැරදි කරන්නත් කටයුතු කරන්න ඕනෑ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

අද උදේ නාවලපිටිය පොලීසියට ලිපි දෙකක් ඉදිරිපත් කළා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ඔබතුමා කියන එක මම පිළි ගන්නේ නැහැ. ඔබතුමා නාවලපිටියට ගියාද? පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමා මළ ගෙදරට ගියා. විපක්ෂ නායකතුමා මළ ගෙදරට ගිහිල්ලා බැලුවා. තමුන්නාන්සේ කොහොමද නැහැ කියන්නේ. විපක්ෂ නායකතුමා මළ ගෙදරට ගියා. තමුන්නාන්සේලාගේ එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකතුමාගේ මල්ලි. මම වගකීමෙන් කියන්නේ. එතුමාගේ ගෙදරට අල්ලපු ගෙදර මහ දවල් ගිනි තිබ්බේ. [බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නාවලපිටියේ ඩිපෝ අධිකාරිවරයාට ඊයේ එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරයාගේ නිවසට එන්න කියලා කනට ගහලා තිබෙනවා. ඩිපෝ අධිකාරි විසින් ලිඛිතව කරන ලද පැමිණිල්ල මම **සභාගත*** කරනවා.

එක්සත් ජාතික පක්ෂයේ නාවලපිටිය මන්ත්‍රීවරුන් හය දෙනාගෙන් පස් දෙනෙක් ඇවිල්ලා මේක ඔබතුමාට කිව්වේ නැද්ද? නාවලපිටියේ සංවිධායකතුමා මිනිසුන්ට ගහනවා. මේ මිනිහා එළවා දමන්න කියා තමුන්නාන්සේට කිව්වේ නැද්ද? තමුන්නාන්සේ කියන්නේ එහෙම කිව්වේ නැහැ කියාද? තමුන්නාන්සේට එක්සත් ජාතික පක්ෂයේ සියලු මන්ත්‍රීවරුන්, ක්‍රියාකාරීන් ඇවිල්ලා කිව්වා, "නාවලපිටියේ භීෂණයක් වෙනවා. මිනිසුන්ට ගහනවා. මිනිස්සු මරණවා. මං කොල්ල කනවා. මේ මිනිහා එළවන්න." කියා. තමුන්නාන්සේ කප්පම් ගන්නවා. ඇයි තමුන්නාන්සේ නැඟිටින්නේ නැත්තේ? තමුන්නාන්සේගේ හෘදය සාක්ෂිය දන්නවා, තමුන්නාන්සේට ඒ පැමිණිල්ල කළ බව. ගරු ඇමතිතුමනි මට මේ පාර්ලිමේන්තුවේ අසත්‍ය කියන්න ඕනෑ නැහැ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව විනාඩියක් දෙන්න. ඒ විතරක් නොවෙයි, අද සියලුම සමෘද්ධි නියාමකවරු මාරු කරලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගඟඉඟළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා කුරුඳුවත්ත පොලිසිය ඉස්සරහා ඉන්නේ. කුරුඳුවත්ත පොලිසිය ඉස්සරහ තිබෙන එතුමාගේ නිවසට දින තුනක් ගිහිල්ලා මරණ තර්ජනය කළා. කුරුඳුවත්ත පොලීසියේ OIC ඉස්සරහා ප්‍රාදේශීය සභාවේ උප සභාපති මරණවා කිව්වා. OIC ඉස්සරහා කිව්වේ. එකම සිද්ධියක්වත් පැමිණිලි කළේ නැහැ; විභාග කළේ නැහැ. මම මහනුවර DIGට කථා කළා. මම මේ පිළිබඳව සියලුම දෙනාට කිව්වා. අද වන තුරු සාධාරණයක් ඉෂ්ට වෙලා නැහැ. හැබැයි, තමුන්නාන්සේලා අපෙන් සහයෝගය ඉල්ලනවා. තමුන්නාන්සේලාට තමයි අපේ ඡන්දය දෙන්නේ. අපි එදත් කියන්නේ අදත් කියන්නේ ගුටි කන්නයි, ඡන්දය දෙන්නයි දෙකක් කරන්න බැහැ කියා. ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමනි, තමුන්නාන්සේලා ගෞරවාන්විත විධියට අපිට කියනවා නම් අපි ගෞරවාන්විත විධියට ඉන්නම්. හැබැයි, තමුන්නාන්සේලා මේ වාගේ මිලේච්ඡ විධියට හැසිරෙන්න ගත්තොත්; පරණ යූඇන්පී කාරයෝ විධියට තමුන්නාන්සේලා අදත් හැසිරෙන්න ගත්තොත් - [බාධා කිරීමක්] අපේ රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමා ගැන බොහොම සතුටු වෙනවා. [බාධා කිරීමක්] දැන් එතුමා තලස්තැනි වෙලා. දැන් එතුමා බොහොම හොඳයි. අන්න ඒ විධියට තමුන්නාන්සේලා කටයුතු කරනවා නම් හොඳයි. බොහොම ස්තුතියි.

[අ.භා. 2.03]

ගරු රන්ජන් රාමනායක මහතා (සමාජසේවා, සුඛසාධන හා පශු සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரஞ்சன் ராமநாயக்க - சமூக சேவைகள், நலன்புரி மற்றும் கால்நடை வளர்ப்பு அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Ranjan Ramanayake -Deputy Minister of Social Services, Welfare and Livestock Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාට පසුව කථා කරන්න ලැබීම ගැන මම සතුටු වෙනවා. කථාවකට යම්කිසි වටිනාකමක් එන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ පුද්ගලයාගේ පැටිකිරිය අනුවයි. සද්දයට කළ පමණින්, කථාවට ලොකු තර්ක ඉදිරිපත් කළ පමණින් කථාවකට වටිනාකමක් එන්නේ නැත. පෙර වැරැදි, හැසිරීම, passport තහනම් කිරීම, සොරකම්, ඒ වාගේ වැරැදි සියලු දේවල් එකතු වුණාම තමයි කථාවකට වටිනාකමක් එන්නේ. ප්‍රභාකරන් වාගේ පුද්ගලයෙක් මානව හිමිකම් ගැන කථා කළොත්, හිටලර් වැනි පුද්ගලයෙක් මිනීමැරුම්, ප්‍රචණ්ඩ ක්‍රියා ගැන කථා කළොත්, ජනතාව සිනහා වෙනවා. හැමතැනින්ම සිනහා වෙනවා. මොකද, මානව හිමිකම් ගැන කථා කරන්න ප්‍රභාකරන්ට අයිතියක් නැහැ. මානව හිමිකම් ගැන කථා කරන්න හිටලර්ට අයිතියක් නැහැ . මහනුවර ප්‍රදේශයේ පසු ගිය දිනවල සිදු වුණු ප්‍රචණ්ඩ ක්‍රියා ගැන, මිනී මැරුම් ගැන, double murder ගැන, history එකක් තිබෙනවා. දැන් මේක විලාසිතාවක් වෙලා. ගෙදර ඉන්න වයස අවුරුදු 78ක ආච්චි කෙනෙක් මැරුණත් ඒක මේ account එකට බැර කරන තත්ත්වයට අද පත් වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හරියට බැලුවොත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා අඩුම ප්‍රමාණයක් වාර්තාගත වෙලා තිබෙන්නේ පසු ගිය මැතිවරණ කාලය තුළයි. මේ මැතිවරණයේදී ඒක හැමෝම දැක්කා. හැබැයි, මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සහ මැතිවරණ කුමන්ත්‍රණ ඉතා වැඩි වෙන්නට සැලසුම් කර තිබුණා. අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත්, පොලිස්පති ඉලංගකෝන් මැතිතුමාත් ඒවා නැවැත්වූවා. මේක වෙන්න තිබුණේ හිටපු නියෝජ්‍ය ඇමති ප්‍රේමලාල් ජයසේකර මැතිතුමා කිව්වා වාගේ නිවිතිගල සිදු වුණා වාගේ එක මිනී මැරුමකින් නොවෙයි.

300කට එහා මැරෙන්න තිබුණා. ඒක නැවැත්වූ ගරු පොලිස්පතිතුමාටත්, මැතිවරණ කොමසාරිස් මහින්ද දේශප්‍රිය මැතිතුමාටත්, ඒ වාගේම හමුදාපති දයා රත්නායක මැතිතුමාටත්, නිලධාරින්ටත් -කුට නිලධාරින් නොවෙයි - මේ අවස්ථාවේදී මගේ ප්‍රණාමය පුද කරන්නට කැමැතියි. මේක නොවෙයි වෙන්න තිබුණේ. මීට වඩා මහා භයානක මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා වෙන්න තිබුණා. නමුත් ඒ සියලු දේවල් නවත්වපු එකට ස්වභාව ධර්මයටත්, බුද්ධ ධර්මයටත්, ක්‍රිස්තු ධර්මයටත්, ඉස්ලාම් ධර්මයටත් ඒ වාගේම සියලු නිලධාරින්ටත් මම මේ අවස්ථාවේදී ස්තුති කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප ඇහැට දැක්ක දේ තමයි, මේ පාර්ලිමේන්තුවේ හිටපු නියෝජ්‍ය ඇමතිවරයෙක් ගිහින් සැරසිලි කරපු හාදයෙකුට වෙඩි තබා මරපු එක. [බාධා කිරීමක්] ප්‍රේමලාල් ජයසේකර මහතා. [බාධා කිරීමක්] ඒක අප දැක්කා. ඒ වාගේම යහ පාලනය ගැන සහතිකයක් දෙනවා නම් ඊට හොඳම උදාහරණයක් තමයි, එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී, පාලිත තෙවරප්පෙරුම මැතිතුමා අද සිරගත වෙලා සිටීම; බන්ධනාගාරගත වෙලා සිටීම. ඒ දේවල් හරියට කෙරුණා. එතකොට මේ අය චෝදනා කරන්නේ කාටද? කවුරුන් ගැනද මේ කියන්නේ?

එක්තරා පුවත් පතක සඳහන් වෙනවා මම දැක්කා, හිටපු අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ප්‍රකාශයක්. එහි සඳහන් වුණේ, තාඩන පීඩන නවත්වා හරියට තමන්ගේ කාර්ය භාරය කරන්න කියා එතුමා සියලු පාර්ශ්වවලින් කරන ඉල්ලීමක්. මැතිවරණයට පසු තාඩන පීඩන නවත්වන්න කියායි එහි සඳහන් කර තිබුණේ. එතුමා එහෙම කිව්වාට, එතුමා පූර්වාදර්ශ චරිතයක් විධියට මේ දේවල් පසු ගිය මැතිවරණවලදී කළාද? එතුමා කළේ මොකක්ද? එතුමා එක්ක ඡන්දය ඉල්ලපු, එතුමාට එරෙහිව ඡන්දය ඉල්ලපු ජනාධිපති අපේක්ෂකයාට මොකක්ද කළේ? ඒ අපේක්ෂකයාව බල්ලෙක් වාගේ ඇදගෙන ගිහින් සිරගත කළා. ඒක තමයි, ඉතිහාසගත වන දූෂිතම මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාව වෙන්නේ. අද ඒ අයට දිට්ඨධම්ම වේදනීය කර්මය පඩිසන් දීලා තිබෙනවා. ඒ අයට සිදු වෙලා තිබෙනවා, මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා ගැන අපෙන් අහන්න. බංකොලොත් වෙලා. සිද්ධි නැහැ. දත්ත - data - නැහැ. මොකුත් නැහැ. ඔහේ කියනවා, මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සිදු වුණාය කියා. 2015 ජනවාරි 8 වැනි දා රාත්‍රී 12 වෙන තෙක් සියලුම ජරා කථා කිය කියා අපේ ජනාධිපතිවරයාට -ඒ කාලයේ "කුරුම්බැට්ටි මූණා" කිව්වා; "අනේ සිරිසේනයෝ" කිව්වා. - බැණපු මේ අය අද කියනවා, "ඒ ජනාධිපතිතුමා අපේ ජනාධිපති; එතුමා අපේ හිටපු මහ ලේකම්තුමා; එම නිසා අප ළඟදීම ආණ්ඩුවක් පිහිටුවනවා" කියා. ඔව්, තමුන්නාන්සේලාට ආණ්ඩුවක් පිහිටුවන්න පුළුවන්. අනිවාර්යයෙන්ම පිහිටුවන්න පුළුවන් බව මම කියනවා. නමුත් එසේ පිහිටුවන්න වෙන්නේ, වැලිකඩ සහ බෝගම්බර තමයි. මොකද, මෙතැන හැටහුටහමාරක් සිටින passports තහනම් කරපු හිටපු ඇමතිවරු වාගේම අනිත් අයටත් හිරේ විලංගුවේ තමයි නවතින්නට වෙන්නේ. ඒ සියලුම දෙනා පසු ගිය කාලයේ සිදු වුණු මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවලට සම්බන්ධයි.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

දැන් මේ අය කවුරුන් හෝ දියේ ගිලී මැරුණත්, ඒකත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවක් කියනවා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்சன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

ගරු පාලිත රංගෙ බණ්ඩාර මැතිතුමා කියන කථාව ඇත්ත. මේ අවධියේ දියේ ගිලිලාවත් මැරෙන්න බැහැ; ඩෙංගු හැදිලාවත් මැරෙන්න බැහැ; උණ සන්නිපාතය, සරම්ප වාගේ රෝග හැදිලාවත් මැරෙන්න බැහැ. ඒ සේරම මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවලට ලඝු කරන්න හදනවා. නමුත් තමුන්නාන්සේලා ගහන

මේ මඩ, මේ කියන බොරු සහ ක්‍රියා සියල්ල තමුන්නාන්සේලාගේ හිටපු මහ ලේකම්තුමා රජ කරන, තමුන්නාන්සේලාගේ සහ අප කාගේත් ජනාධිපති වන මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට කරන දෝෂාරෝපණයක් කියාත් සලකන්න. මොකද, ඔයිට වඩා වැඩියෙන් කෑ ගහන්න ගත්තොත්, නාම යෝජනා නැති වෙන්නට පුළුවන්. එම නිසා ප්‍රවේශමෙන් කථා කරන එක සියලු දෙනාගේම ශරීර සෞඛ්‍යයට සහ - [බාධා කිරීම්] මොකක්ද? [බාධා කිරීම්]

දැන් මේ තමුන්නාන්සේලා විරුද්ධ වෙන්නේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට. [බාධා කිරීම්] තමුන්නාන්සේලා දුන්නත් පරදිනවා. [බාධා කිරීම්] තමුන්නාන්සේලාට දෙන්නේත් නැහැ. දුන්නත් පරදිනවා. තමුන්නාන්සේලා බොහොම ප්‍රවේශමෙන් කථා කරන්න. මොකද, හැම දේම වීඩියෝ වෙනවා. ඒ වීඩියෝ වෙන ඒවා ජනාධිපතිතුමාත් බලනවා. [බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔබතුමාට පුළුවන් නම් රත්නපුරයෙන් ඡන්දය ඉල්ලන්න. [බාධා කිරීම්]

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்சன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
අර්ජුන රණතුංග මැතිතුමා සිටියාය කියා බේරෙන්න බැහැ. [බාධා කිරීම්]

කවුරු හිටියා කිව්වත් බේරෙන්නට බැහැ. තමුන්ගේ පැටිකිරිය අනුව ඉතිහාසයේ කළ වැරදිවලට, නීතිය ක්‍රියාත්මක වන එක සිද්ධ වෙයි. [බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය දවස්වල අපි දැක්කා සිද්ධියක්- [බාධා කිරීමක්]

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
බන්ධනාගාරය ඇතුළේ මරා දමා තිබුණේ.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
බන්ධනාගාරයේ case එක. ඒකට තමයි වැඩියෙන්ම කේන්ති යන්නේ. [බාධා කිරීම්] ඒ ගැන හොයන්න වෙනවා. එතකොට ළඟදීම ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේත් passport එක තහනම් වෙයි. ඊට පස්සේ ඇතුළට යයි. ඒ නිසා මෛත්‍රී පාලනය එක්ක සෙල්ලම් කරන්න හිතන්න එපා. තමුන්නාන්සේලා සියලු දෙනා ජනාධිපතිතුමාට බැන්න හැටි සියල්ලම වීඩියෝවල තිබෙනවා.

ගරු සනී රෝහන කොඩිතුවක්කු මහතා
(மாண்புமிகு சனீ ரோஹன கொடிதுவக்கு)
(The Hon. Sanee Rohana Kodithuvakku)
ඔබතුමා මාත් එක්ක රත්නපුරෙන් තරග කරනවාද?

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මම all-rounder කෙනෙක්. ඕනෑම තැනකින් ඉල්ලුවොත් නොම්මර එක. හය වෙන්න එපා. [බාධා කිරීමක්] මම ඔබතුමාගේ පළාතෙන් ඔබතුමාට වඩා ඡන්ද ගත්ත කෙනෙක්. මතක තබා ගන්න. [බාධා කිරීම්] නැවත ඉල්ලුවත් එහෙමයි. මොකද, අපි හොරෙන් දඩ මස් විකුණලා නැහැ. අපි මුව මස්, හරක් මස් විකුණලා නැහැ. ඒවා මතක තබා ගන්න. වැරදි නොකරපු මිනිහෙක්ට ලංකාවේ ඕනෑම තැනකින්, ඕනෑම වෙලාවක ඡන්දෙ ඉල්ලන්න පුළුවන්. ඒක මතක තබා ගන්න.

ගරු සනී රෝහන කොඩිතුවක්කු මහතා
(மாண்புமிகு சனீ ரோஹன கொடிதுவக்கு)
(The Hon. Sanee Rohana Kodithuvakku)
ඒ වුණාට රත්නපුරෙන් ඉල්ලන්නේ නැහැ.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ඉල්ලුවොත් නැවත දිනලා පෙන්වනවා. [බාධා කිරීම්]

දැන් වත්තල ප්‍රශ්නය ගැන හැමෝම කථා කළා. ඇත්තෙන්ම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සිද්ධියට සම්බන්ධ පුද්ගලයා කවුද? තමුන්නාන්සේලාගේම පක්ෂයේ -විපක්ෂයේ- සුනිල් මෙන්ඩිස් කියන පුද්ගලයාව සාතනය කරපු නඩුවේ පළමුවැනි විත්තිකරුවා - first accused - තමයි, ත්‍යාගරාජා. ඒ පුද්ගලයාට තමයි කට්ටිය මේ කඩේ යන්නේ. Murder case එකක පළමු විත්තිකරුවා. මේ අය කියනවා, "මේ පුද්ගලයා බොහොම සුදනෙක් ලු." [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමා, මා ඔබතුමාට ගෞරව කරන කෙනෙක්. කරදර කරන්න එපා. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි පහක කාලයක් තිබෙනවා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු එස්.සී. මුතුකුමාරණ මන්ත්‍රීතුමා passport එක තහනම් කර ගන්න full try එකක් දෙනවා. [බාධා කිරීම්] ඔබතුමා කෑ ගහන්න, කෑ ගහන්න passport එක තහනම් වෙනවා. ඊට පස්සේ සිරගත වෙනවා. ඒ නිසා වැඩිය කෑ ගහන්න එපා. මොකද, හැම තැනම cameras තිබෙනවා. ජනාධිපතිතුමා හවසට මේවා බලනවා. [බාධා කිරීම්] මොකක්ද? [බාධා කිරීම්] කියන්න ඕනෑ නැහැ. එතුමා මේවා බලනවා. හැබැයි, තමුන්නාන්සේට නාම යෝජනා හම්බ වුණත්, පරදිනවා. ඒකයි වැඩේ. [බාධා කිරීම්] නාම යෝජනා හම්බ වුණත් පරදිනවා. සත්‍ය කියන කොට මෙච්චර කේන්ති යන්නේ මොකද කියලා මම දන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද යහ පාලනය නැහැ කිව්වාට යහ පාලනය තිබෙනවා. අද වැරදි කරන අයගේ passports තහනම් කරන අතරම රිමාන්ඩ් බන්ධනාගාරගත කරනවා. අපේ අගමැතිතුමාට කිසිම චෝදනාවක් කරන්න බැහැ. පාලිත තෙවරප්පෙරුම කියන්නේ අපේ පක්ෂය වෙනුවෙන් එදා සිට දර දිය ඇද්ද, කොටන් ඇද්ද, ක්‍රියාශීලීව වැඩ කළ මන්ත්‍රීවරයෙක්. අද එතුමාව පවා බන්ධනාගාරගත කර තිබෙනවා. අපි නීතිය හරියට ක්‍රියාත්මක කරනවා කියන එකට හොඳම උදාහරණය තමයි ඒක.

පසු ගිය මැතිවරණය වෙලාවේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට පැල්මඩුල්ලේදී ගල් ගැහුවා. එතකොට මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා පටන් ගත්තේ කවුද? ඒ ගල් ගහපු වෙලාවේ එතුමා හිස ආවරණය කර ගෙන stage එකෙන් බැහැලා ගිය හැටි වීඩියෝවලින් මුළු ලංකාවේම ජනතාව දැක්කා; සියලුම නාළිකාවල පෙන්නුවා. ඒවා ප්‍රචණ්ඩ ක්‍රියා නොවේද? අන්තිමට මොකක්ද වුණේ? කහවත්ත ප්‍රදේශයේ පුද්ගලයෙකුට ජීවිතයෙන් සමු ගන්න සිද්ධ වුණා. ශාන්ත දොඩංගොඩ කියන අපේ පක්ෂයේ සාමාජිකයාට ජීවිතයෙන් සමු ගන්න සිද්ධ වුණා. ඒ පුද්ගලයාට වෙඩි තබපු පුද්ගලයා කවුද? මේ පත්තරවල පළ වෙලා තිබෙනවා. "ප්‍රේමලාල් ඇමතිතුමා මට වෙඩි තිබ්බා කියමින් ශාන්ත බිම ඉඳ ගත්තා." මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය තමයි යහ

[ගරු රන්ජන් රාමනායක මහතා]

පාලනය ගැන, ප්‍රචණ්ඩ ක්‍රියා ගැන කථා කරන්නේ. මම දන්නේ නැහැ තමුන්නාන්සේලාට විළිලජ්ජාවක් තිබෙනවාද කියලා මේවා ගැන කථා කරන්න. පසු ගිය ටිකේම තමුන්නාන්සේලාගේ හිටපු නායකතුමා හැසිරුණු විධිය, ආශ්‍රය කළ පුද්ගලයන් කවුද කියලා අපි කවුරුත් දැක්කා. රටේ නීතියක් තිබුණේ නැහැ. මුළු ලංකාවම දැක්කා ඒ ආණ්ඩුවේ හිටපු කැබිනට් ඇමතිවරු මිනිසුන්ව ගස් බඳිනවා.

ඒ ගස් බැඳපු ඇමතිවරුම කිව්වා, "මම තමයි අර නාළිකාවට ගිහිල්ලා ගිනි තිබ්බේ; මම තමයි බෝම්බ ගැහුවේ; මම තමයි පිච්චුවේ" කියලා. නමුත්, ඒවාට කවදාවත් නීතියක් ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ නීතියක් ක්‍රියාත්මක වුණේ-

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
දැන් නීතිය ක්‍රියාත්මක කරන්න. අපට කියන්නේ මොකක්ද? දැන් නීතිය ක්‍රියාත්මක කරන්න පුළුවන්නේ.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
අර passport එක දැන් නම් අනිවාර්යෙන්ම තහනම් වෙනවා. දැන් නම් තහනම් වෙනවා. [බාධා කිරීමක්] ඒ නීති අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක වෙනවා. අනිවාර්යයෙන්ම තමුන්නාන්සේගේ passport එක තහනම් වෙනවා. [බාධා කිරීමක්] ඒ දවස්වල ඒ දේ වුණේ නැත්නම් වග කිව යුත්තේ එම ආණ්ඩුවමයි. [බාධා කිරීමක්] තමුන්නාන්සේ passport එක නැති කර ගන්නමයි යන්නේ. [බාධා කිරීමක්] මොකක්ද? [බාධා කිරීමක්] නැහැ. නැහැ. මම කථා කරන්න යන්නේ නැහැ, මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාගේ ප්‍රශ්න ගැන. [බාධා කිරීමක්]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමා තමයි නායකයා. ඔබතුමා තමයි තීරණය කරන්නේ.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
නැහැ. නැහැ. මම නොවෙයි තීරණය කරන්නේ. ඒක අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව තමයි තීරණය කරන්නේ. ඔබතුමාගේ ප්‍රශ්නය ගැන මම කථා කරන්නේ නැහැ. මොකද ඔබතුමා මට කරදර කළේ නැහැනේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යහ පාලනය ගැන කථා කරන විට, පසු ගිය කාලයේ කරන ලද හැසිරීම් දෙස බලන විට මේ අයට යහ පාලනය ගැන මේ ආකාරයෙන් නිර්වචනය කරන්න, කථා කරන්න, සාකච්ඡා කරන්න, විවාද කරන්න පුළුවන්ද? ඒක තමයි මම කිව්වේ හිටපු ජනාධිපතිතුමාගේ මිතුරන් ගැන. ජුලම්පිටියේ අමරේ, වම්බොට්ටා, හාල් ඇටයා, ඇට වමින්ද, පල්ලත්තර ජගත් යනාදී වශයෙන් සියලු දෙනාගේම නම් ටික ගරු දිලිප් වෙදආරච්චි ඇමතිතුමා කිව්වා. ආම් ජිනේ, කැකිරි පොඩ්ඩා, ජුලම්පිටියේ අමරේ, චන්ද්‍ර පුෂ්ප, සම්පත් චන්ද්‍රපුෂ්ප -චන්ද්‍ර පුෂ්පගේ පුතා-, වම්බොට්ටා, පස්සර ගුණේ, වලස්මුල්ලේ සුමිත්, බැදිගම උක්කුවා යන අය. ගරු රෙජිනෝල්ඩ් මැතිතුමනි, මේ අපි හදපු කථා නොවෙයි. මේ සියලුම දේවල් මේ පාර්ලිමේන්තුවේ ඉන්න ගරු ඇමතිවරු මන්ත්‍රීවරුන් දන්නා දේවල්. [බාධා කිරීම්] තමුන්නාන්සේලා හොඳටම දන්නවා හිටපු ජනාධිපතිතුමා අතින් මේ දේවල් අනිවාර්යෙන්ම වුණා කියලා. ගරු රෙජිනෝල්ඩ් මන්ත්‍රීතුමනි, මේ දේවල් අපි කළත් අපටත් දිට්ඨධම්ම වේදනීය කර්මය පඩිසන් දෙනවා. තමුන්නාන්සේලා පසු ගිය කාලයේ හිතාගෙන හිටියා "සඳ හිරු තරු පවතින තුරු - අපි මැරෙන්නේ නැහැ" යි කියලා. කවදාවත් පරදින්නේ නැහැයි කියන අධි මානසිකත්වයෙන් හිටියා. නමුත් මොකක්ද වුණේ? අද නන්නත්තාර වෙලා ගියා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, කථාව අවසන් කරන්න.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මෙච්චර කලක් කුරුම්බැට්ටි මූණ, පෙඳයා, කැඳයා කියපු කෙනාට අද තමුන්නාන්සේලා අතිගරු ජනාධිපතිතුමනි කියලා වැඳ වැටෙනවා. එතුමා අපි එක්ක ඇවිල්ලා අනේ! මේ රට බේරා ගත්තා; තමුන්නාන්සේලාවත් රාජපක්ෂ රෙජීමයෙන් බේරා ගත්තා. ඒ නිසා දැන්වත් කෑ නොගහා මේ යහ පාලනයට එක් වෙන්න. එතකොට අපේ රටට හොඳ අනාගතයක් උදාවෙයි. අප්පොච්චි මළා කියලා එතුමාටත් අපහාස කරන්න එපා. අපේ අප්පොච්චි මෙතැන ඉන්නවා. අපි මේ අප්පොච්චි එක්කම හොඳ ගමනක් යමු කියමින් මම නිහඬ වෙනවා.

[පි.ප. 2.19]

ගරු විනායගමූර්ති මුරලිදරන් මහතා
(மாண்புமிகு விநாயகமூர்த்தி முரளிதரன்)
(The Hon. Vinayagamoorthi Muralidaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கடந்த ஜனாதிபதித் தேர்தலுக்குப் பின்னர் நடைபெற்ற வன்முறைகள் சம்பந்தமான ஒத்திவைப்புப் பிரேரணை பற்றிய விவாதத்தில் உரையாற்றுவதையிட்டு பெருமையடைகின்றேன். என்னைப் பொறுத்தவரையிலே, பொதுவாக யாராக இருந்தாலும், - ஆளும் கட்சியாக இருந்தாலும் சரி, எதிர்க்கட்சியாக இருந்தாலும் சரி - வன்முறையில் ஈடுபடுவதை ஏற்றுக்கொள்ள முடியாது. ஏனென்றால், இன்று அரசியல் தலைவர்களுக் கிடையே நடைபெறுகின்ற வாதப்பிரதிவாதங்களின் விளைவாக இடையில் இருக்கின்ற அப்பாவிப் பொதுமக்கள் துன்புறுத்தப்படும் நிலை காணப்படுகின்றது. உண்மையிலே இது ஏற்றுக்கொள்ளப்பட முடியாததாகும். தேர்தல் காலங்களிலே - கடந்த காலங்களிலும் சரி, தற்பொழுதும்சரி - நாங்கள் கிழக்கு மாகாணத்திலே பிரசாரங்களை மேற்கொள்கின்றபோது மிகவும் நாகரிகமானமுறையில், எதுவித வன்முறையுமில்லாது அதனை மேற்கொண்டோம். இது அனைவருக்கும் தெரிந்த விடயம். ஆகவே, வன்முறை என்பதை நாங்கள் தவிர்த்துக்கொள்ள வேண்டுமென்று நான் அனைவரிடமும் அன்பாகக் கேட்டுக்கொள்கின்றேன்.

உங்களுக்கு நன்றாகத் தெரியும், இன்று அமெரிக்கா போன்ற வளர்ச்சியடைந்த நாடுகளிலே தோல்வியடைகின்ற ஜனாதிபதி வேட்பாளர்கள் அந்த நாட்டின் வெளிநாட்டு இராஜாங்கச் செயலாளராக நியமிக்கப்படுவர். எனவே, அந்தத் தேர்தலின் பிற்பாடு அவர்கள் இரண்டு பேரும் ஒன்றாகச் சேர்ந்து வேலைசெய்வார்கள். ஆனால், எங்களுடைய நாட்டை எடுத்துக்கொண்டால், - அது எந்தக் காலமாக இருக்கட்டும், எந்தத் தேர்தலாக இருக்கட்டும் - யார் ஆட்சிக்கு வந்தாலும் எதிர்த்தரப்பினரைப் பழிவாங்குகின்ற படலங்கள் தொடர்ந்து கொண்டுதான் இருக்கின்றன. ஆகவே, நாங்கள் இதனைத் தவிர்த்து, சிறந்தமுறையில் நாகரிகமான அரசியல் முறைமை யொன்றை உருவாக்கவேண்டுமென்று இந்த இடத்திலே நான் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

தமிழ்த் தேசியக் கூட்டமைப்பினர் இன்று இங்கே சமுகமளிக்கவில்லை. மட்டக்களப்பு மாவட்டத்தைப் பொறுத்த வரையிலே, அவர்களுடைய குண்டர்கள் சிலர் அங்குள்ள மக்களின் வீடுகளுக்கு கற்களால் வீசியிருந்தார்கள். அதுமாத்திரமல்ல, அவர்கள் கூறிய வார்த்தைப் பிரயோகங்கள் மிகவும் வேதனைக்குரியனவாக இருந்தன. தமிழ்த் தேசியக் கூட்டமைப்புப் பாராளுமன்ற உறுப்பினர் ஒருவர் கூறினார், "கருணா அம்மானைப் புனர்வாழ்வுக்கு அனுப்பவேண்டும்" என்று. ஆனால், இந்த நாட்டிலே அமைதியை ஏற்படுத்துவதற்கு 2004ஆம் ஆண்டு கிட்டத்தட்ட 6,000 விடுதலைப்புலிப் போராளிகளை வீட்டுக்கு அனுப்பி, அவர்களின் உயிர்களைக் காப்பாற்றி, அன்றிருந்த அரசுடன் சேர்ந்து நிரந்தர சமாதானத்துக்காக நான் ஒத்துழைத்திருக்கிறேன் என்பதை இந்தப் பாராளுமன்றத்திலே ஆணித்தரமாகக் கூறிக்கொள்ள விரும்புகின்றேன். இது எல்லோருக்கும் நன்கு தெரிந்த விடயம்! அன்று ஜனாதிபதியாக இருந்த சந்திரிகா அம்மையார் அவர்களுக்கும் பிரதம மந்திரியாக இருந்த எங்களுடைய தற்போதைய பிரதம அமைச்சர் ரணில் விக்கிரமசிங்க அவர்களுக்கும் இது நன்கு தெரியும். அதேபோல் அதற்குப் பிறகு தெரிவான ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்களுக்கும் தற்பொழுது ஜனாதிபதியாக இருக்கின்ற மைத்திரிபால சிறிசேன அவர்களுக்கும் இந்த விடயம் நன்கு தெரியும், அத்துடன், பாராளுமன்ற உறுப்பினர்கள் அனைவருக்குமே இது தெரிந்திருக்கும்.

இன்று அனைவரும் சேர்ந்து சிறந்ததொரு சமாதானத்தை ஏற்படுத்தியிருக்கிறோம். உண்மையிலே அந்தக் காலங்களில் வடக்கு, கிழக்கு பிரதேசங்களில் ஓர் அரசியல்வாதி சுதந்திரமாக நடமாடக்கூடமுடியாது. ஏன், தமிழ்த் தேசியக் கூட்டமைப்பினர் கூட நடமாட முடியாது. அன்று நான் எடுத்த முடிவின் பலனாகத்தான் இன்று தமிழ்த் தேசியக் கூட்டமைப்பினர் சுதந்திரமாக அரசியலில் ஈடுபடுகின்றார்கள். ஆனால், ஒன்றை நான் கூற விரும்புகின்றேன். அதாவது, அவர்கள் தமிழ் மக்களை ஏமாற்றுகின்றார்கள். அவர்களின் ஏமாற்று வித்தைகள் தற்பொழுது வெளிப்பட ஆரம்பித்திருக்கின்றன. இன்று இந்த அரசாங்கத்துடன் சேர்ந்துகொண்டு தமிழ் மக்களுக்கு வளங்களைப் பெற்றுத்தருவதாகவும் வாய்ப்புக்களை ஏற்படுத்தித் தருவதாகவும் கூறி, அனைத்து வளங்களையும் இழந்திருக்கிறார்கள்.

நான் தற்போது இந்த ஆளும் ஐக்கிய தேசியக் கட்சியினரிடம் தெரிவித்துக்கொள்வது என்னவென்றால், கிழக்கு மாகாணத்திலே ஒரு தமிழ் அமைச்சர்கூட இல்லை. கிழக்கு மாகாண சபையின் ஆட்சிப் பொறுப்பு முஸ்லிம்களிடம் வழங்கப்பட்டிருக்கின்றது. இன்று கிழக்கு மாகாணத்தில் இருக்கின்ற தமிழ் மக்கள் எதுவித அரசியல் உரிமையும் அற்றவர்களாக இருக்கின்றார்கள் என்பதைத்தான். இதை ஆளுகின்ற தரப்பு நன்கு உணர்ந்துகொள்ள வேண்டும். தமிழ்த் தேசியக் கூட்டமைப்பினர் தமிழ் மக்களுக்கு நன்மை செய்திருக்கலாம். ஆனால் அவர்கள் இன்று மக்களை ஏமாற்றிக் கொண்டிருக்கின்றார்கள். அமைச்சுப் பொறுப்புக்களை ஏற்கமாட்டோமென்று கூறிக்கொண்டு, அரசின் நிறைவேற்றுக் குழுவில் அங்கத்தவர்களாக இருக்கின்றார்கள். ஏன், அவர்களுக்கு அமைச்சுப் பதவியை எடுக்க முடியாது? மாகாண சபையின் ஆட்சிப் பொறுப்பைக் கேட்டு கெஞ்சினார்கள்; கிடைக்கவில்லை. முஸ்லிம் தலைவர்களை நாங்கள் பாராட்ட வேண்டும். தங்கள் சமூகத்துக்கென அமைச்சுப் பொறுப்புக்களை எடுத்துக்கொண்ட அவர்கள், தற்பொழுது மாகாண சபையின் ஆட்சிப் பொறுப்பையும் பெற்று விட்டார்கள். இன்று பாராளுமன்றத்தில் முஸ்லிம் அமைச்சர்கள் பலர் இருக்கின்றார்கள். ஆனால், அங்கேயும் வடக்கைச் சேர்ந்த இரண்டு தமிழ் அமைச்சர்கள் மாத்திரந்தான் இருக்கின்றார்கள். எனவே, கூடுதலான சலுகைகளையும் வளங்களையும் எங்களுடைய கிழக்கு மாகாண மக்களுக்கும் வழங்க வேண்டுமென்பதை இந்த அரசாங்கத்திடம் கேட்டுக்கொள்கின்றேன்.

இன்றைய இந்த ஆட்சி ஒரு சிறந்த ஆட்சி! உலகத்திலேயே முன்னுதாரணமாக இருக்கின்ற ஆட்சி! அந்த வகையில் சட்டம், ஒழுங்குகளை நன்றாகப் பேணவேண்டும். புதிதாகப் பொறுப்பேற்றிருக்கின்ற எங்களுடைய பாதுகாப்புப் பிரதி அமைச்சர் அவர்கள் இங்கிருக்கிறார். அவர் துரிதமாகச் செயற்பட்டுக்கொண்டிருக்கின்றார். உண்மையிலே நான் அவரை வரவேற்கின்றேன். அவர் வடக்கின் பெரும்பாலான பிரதேசங்களுக்குச் சென்று வந்திருக்கிறார். அங்கெல்லாம் எவ்வாறு சட்டமும் ஒழுங்கும் பேணப்படுகின்றதோ அதனை இன்னும் வலுப்படுத்தி சிறந்த இடங்களாக அந்தப் பிரதேசங்களை மாற்றியமைக்க வேண்டும்.

ஸ்ரீலங்கா சுதந்திரக் கட்சியைப் பொறுத்தவரையில், அதிலுள்ள அனைவரையும் குற்றஞ்சாட்ட முடியாது. தற்பொழுது ஊடகங்களிலே, வருபவர்கள் போகிறவர்கள் என எல்லோரும் குற்றச்சாட்டுக்களைச் சுமத்த முற்பட்டிருப்பதைப் பார்க்கின்றோம். தகுதியற்றவர்கூட எதிர்க்கட்சியினரைக் குற்றஞ்சாட்டுகின்ற நிலைமையை நாங்கள் இன்று பார்க்கக்கூடியதாக இருக்கின்றது. யாராக இருந்தாலும் பிழை விடுபவர்கள் தண்டிக்கப்படலாம். ஸ்ரீலங்கா சுதந்திரக் கட்சியில் மிகவும் ஒழுக்கம்மிக்க உயர்ந்த தலைவர்களும் இருக்கின்றார்கள். அவர்களுக்கு களங்கம் ஏற்படுத்தவேண்டா மென்பதையும் நான் அன்பாகக் கேட்டுக் கொள்கின்றேன். ஸ்ரீலங்கா சுதந்திரக் கட்சியைச் சேர்ந்த ஒருவர்தான் தற்போது இந்த நாட்டின் ஜனாதிபதியாக இருக்கின்றார். இந்த நாட்டிலே நிரந்தர அமைதி, சமாதானம் மற்றும் துரித வளர்ச்சி ஏற்பட வேண்டும் என்பதற்காகத்தான் உங்களுடைய இடைக்கால வரவு செலவுத்திட்டத்துக்கு எங்களுடைய முற்றுமுழுதான ஆதரவை நாங்கள் வழங்கினோம். தொடர்ந்தும் பழிவாங்குகின்ற படலங்களை நிறுத்திக்கொள்ளுங்கள்! குற்றஞ் செய்தவர்கள் தண்டிக்கப்படட்டும்! அது அனைவராலும் ஏற்றுக்கொள்ளப்பட வேண்டியதே! ஆனால், தவறான பிரசாரங்களை நிறுத்த வேண்டும்.

கிட்டத்தட்ட 10 வருடங்களாக நான் அரசுடன் சேர்ந்திருந்து வடக்கு, கிழக்கு உட்பட, நாட்டிலே நிரந்தர அமைதியை ஏற்படுத்துவதற்கு ஒத்துழைத்திருக்கிறேன். இந்த நாட்டில் சமாதானத்துக்காக முக்கிய பங்கெடுத்தவன் என்ற வகையில் எதிர்காலத்திலும் இந்த அரசுடன் சேர்ந்து நான் சமாதானத்துக்காக பாடுபடுவேன்; ஒத்துழைப்பு வழங்குவேன் என்பதை ஆணித்தரமாகக் கூறிக்கொள்கின்றேன். புலம்பெயர்ந்து வாழ்கின்ற தமிழ் மக்களும் தற்பொழுது இந்த நாட்டுக்கு வந்து சுதந்திரமாகக் கதைக்கலாம். அங்கு வீணான தீவிரவாதப் போக்குகளைக் கைவிட்டு, வன்முறைகளைத் தவிர்த்து இங்கு வந்து சமாதானப் பேச்சுவார்த்தைகளிலே கலந்துகொள்ள வேண்டுமென்று நான் அவர்களிடம் அன்பாகக் கேட்டுக்கொள்கின்றேன்.

எங்களுடைய மதிப்புக்குரிய தமிழ்த் தேசியக் கூட்டமைப்பின் தலைவர் சுதந்திரதின வைபத்திலே கலந்துகொண்டிருக்கிறாரென்றால், அதற்கு யார் காரணம் என்பதை அவர்கள் சிந்தித்துப் பார்க்கவேண்டும். வடக்கு, கிழக்கிலே யுத்தத்தை முடிவுக்குக் கொண்டுவந்து அங்கு நாங்கள் சமாதானத்தை ஏற்படுத்திய காரணத்தினால்தான் இன்று தமிழ்த் தேசியக் கூட்டமைப்பின் தலைவர் சம்பந்தன் அவர்கள் சுதந்திர தின விழாவிலே கலந்துகொண்டிருக்கிறார். இது வரவேற்கக்கூடிய விடயம். இந்தச் சுதந்திரமானது

[ගරු විනායගමූර්ති මුරලිදරන් මහතා]

அனைத்து மக்களுக்கும் வழங்கப்பட்டிருந்தது. இடையில் ஏற்பட்ட குரோதங்கள், மனக்கசப்புகள் காரணமாக இனங்கள் பிரிவடைந்தன. ஆனால், இன்று மீண்டும் இன ஒற்றுமை ஏற்பட்டிருக்கின்றது. ஐக்கிய தேசியக் கட்சியினரிடம் நான் கேட்டுக்கொள்வது என்னவென்றால், வன்முறைகளைத் தவிர்த்துக்கொள்ள வேண்டும் என்பதைத்தான். உங்களுக்கு வேண்டிய ஒத்துழைப்பை நாங்கள் வழங்குவோம். அந்த வகையில், தொடர்ந்தும் இந்த நல்லாட்சியை முன்னெடுக்க வேண்டுமென்று கேட்டு, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்.

[අ.භා. 2.27]

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා ගැන අද සභාව කල් තැබීමේ විවාදයක් විපක්ෂය විසින් ඉල්ලා සිටියේ පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා මේ රටේ සිදු වුණු නිසා. ඒ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සෑම මැතිවරණයකම ජය පරාජයෙන් පසුව අඩු වැඩි වෙමින් පැවතිලා තිබෙනවා. අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ලේකම්තුමා අපෙන් වෙන් වෙලා ගිහිල්ලා ජනතාවට කිව්වේ, එක්සත් ජාතික පක්ෂය සමඟ මෛත්‍රී පාලනයක්, යහ පාලනයක්, අලුත් වෙනසක්, නව දේශපාලන සංස්කෘතියක් ඇති කරනවා කියලා. තමුන්නාන්සේලා ඒ පිළිබඳව යම් වෙහෙසක් දැරීම අපට පෙනෙනවා. අපි ඒ ගැන ස්තුතිවන්ත වෙනවා. හැබැයි එය යථාර්ථවාදී වෙනසක් විය යුතුයි.

මගේ ආසනයේ ප්‍රචණ්ඩ ක්‍රියා කරන්න පටන් ගත්තේ පාන්දර දෙකට. මගේ ගෙදර ඉස්සරහා රතිඤ්ඤා පත්තු කරලා දමලා පහර දෙන්න පටන් ගත්තා. අපි උදේ අට වෙන කොට කොළඹ ආවා, ජනාධිපති ලේකම් කාර්යාලයට. ජනාධිපති ලේකම් කාර්යාලයට අපි ඇවිල්ලා අපේ පක්ෂයේ කණ්ඩායම් රැස්වීමට සහ අපේ මධ්‍යම කාරක සභා රැස්වීමට සහභාගි වුණා. මම ස්තුතිවන්ත වෙනවා, වර්තමාන ජනාධිපතිතුමාට. එතුමාට මම මේ ප්‍රචණ්ඩ ක්‍රියා ගැන කිව්වා. මගේ ආසනයේ විතරක් නොවෙයි, අම්පාර දිස්ත්‍රික්කයේ, බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රචණ්ඩ ක්‍රියා සිදු වුණා. මහියංගණයේත් ප්‍රචණ්ඩ ක්‍රියා සිද්ධ වුණා. වැල්ගොල්ලේ හාමුදුරුවන්ටත් ගැහුවා. ප්‍රචණ්ඩ ක්‍රියාවලට ගොදුරු වූ අයගේ ලැයිස්තු එකින් එක මගේ ළඟ තිබෙනවා. මට ලැබිලා තිබෙනවා, දඹුල්ල ආසනයේ ලැයිස්තුව. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න කෝ. ඔබතුමාගේ පෞද්ගලික ප්‍රශ්නයක්ද? එහෙම නම් ඒක ඔබතුමා විසඳන්න.

අපට අවශ්‍ය වෙන්නේ, මේ රටේ සිදු වූ මෙවැනි සිදුවීම් සියල්ල දිහා බලලා, මින් ඉදිරියට ඒවා සිදු නොවන්න කටයුතු කිරීමයි. ඒ සඳහා මොකක්ද ගත යුතු ක්‍රියා මාර්ගය? මම ඉදිරිපත් කරනවා, බිබිල ආසනයේ සිදු වූ ප්‍රචණ්ඩ ක්‍රියා ලැයිස්තුව; දඹුල්ල ආසනයේ ලැයිස්තුව; ආනමඩුව ආසනයේ ලැයිස්තුව. යම් යම් ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධ විස්තර සඳහන් ලැයිස්තු මා ළඟ තිබෙනවා. මම ඒවා ඉදිරිපත් කරනවා.

කොයි සැලූන් එකේත් කෙස් කොට තිබෙනවා. කිසිම සැලූන් එකක කෙස් කොට නැහැ කියලා කියන්න බැහැ. මේ වෙන වැරැදි ඉදිරියට නොවෙන්න මොකක්ද ඔබතුමන්ලා ගන්න ක්‍රියා මාර්ගය? සභානායකතුමාට අපි කියන්නේ, මැතිවරණ කොමිසම, පොලිස් කොමිසම ස්ථාපිත කරන්න කියලායි. [බාධා කිරීමක්] පොඩ්ඩක් වාඩි වෙන්න. මගේ වෙලාව ගන්න එපා. මට කථා කරන්න තිබෙන්නේ විනාඩි හතයි. වාඩි වෙන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඔබතුමා මා ගැන සඳහන් කළා; මගෙන් ඇහුවා.

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

නැහැ. මම ඔබතුමාගෙන් ඇහුවේ නැහැ. අහගෙන ඉන්න කියලා කිව්වේ. අහගෙන ඉන්න. අද බහුතර විපක්ෂය හැටියටයි අපි ඉන්නේ. ඒකට තමුන්නාන්සේලා ජාතික ආණ්ඩුවක් කියනවා. එහෙම නම් ජාතික වැඩ පිළිවෙළක්, මේ රටේ සමස්ත ජනතාව පිළිගන්න පොදු වැඩ පිළිවෙළක් ආරම්භ කරන්න. ඒකට අපි සහාය දෙනවා.

හැබැයි, තමුන්නාන්සේලාට අපි මේ කාරණය කියන්න ඕනෑ. අද වැඩ බිම්වලින් මිනිස්සු පළවා හැරලා තිබෙනවා. මගේ ආසනයේ, බිබිල ඩිපෝවේ කළමනාකාරතුමා 2011 මාර්තු 21 වැනි දා තමයි ඩිපෝව භාර ගත්තේ. එදා රුපියල් 275,000ක ආදායමක් තමයි තිබුණේ. ඒක හයලක්ෂය දක්වා වැඩි කළා. බස් 45ක් පාරට දැම්මා. ඔහු ඉවත් කරලා තිබෙනවා. ඒකට හේතුවක් නැහැ. ඒ ලිපියත් මා හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

අපි දැක්කා, පැල්වත්ත සීනි සමාගමේ, සෙවනගල සීනි සමාගමේ ප්‍රශ්න. අපි මේ කාරණයත් මතක් කරන්න ඕනෑ.

අපි දැක්කා නීතිය අතට ගත්තු ස්වභාවයක්. අපි ඒ ගැන කනගාටු වෙනවා. අපි ඒ තත්ත්වය විශේෂයෙන්ම දැක්කේ රුසියානු තානාපති කාර්යාලයේදී.

පන්සල් වෙහෙර විහාර ගැන බෞද්ධ කටයුතු අමාත්‍යාංශයක් තිබෙනවා. පන්සල්, වෙහෙර විහාර ගැන සොයා බලන්න බුද්ධ ශාසන ඇමතිවරයෙක් ඉන්නවා. පන්සල් වෙහෙර-විහාර ආරාමවලට ඇතුළු වෙනවා නම්, ඒකට අවසර ගන්න ඕනෑ ස්වාමීන් වහන්සේලාගෙන්. පොළොන්නරුව, අනුරාධපුර යුගයේ අපේ රටේ වෙහෙර විහාරවල තාක්ෂණික වශයෙන් ක්‍රමානුකූලව කැළි කසළ අපහරණ ක්‍රම වේදයක් තිබුණා. ඒවා හොඳට හදලා තිබෙනවා. බෞද්ධයන්ටවත් ඒවා ඇතුළට යන්න බැහැ. ඉතින් කොහොමද අන්‍යාගමිකයෝ මේවා ඇතුළට යන්නේ. මේක ලොකු ප්‍රශ්නයක්. මේ පූර්වාදර්ශය හොඳ නැහැ. ඒකයි අපි කියන්නේ. අපි දැක්කා පසු ගිය කාලයේ එවැනි යම් යම් සිදුවීම් සිදු වෙනවා. අපි එවැනි සිදුවීම් ඉදිරියට බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඉතින් මේ දෙයින් අපට පෙනෙනවා නීතිය අතට ගැනීමක්. ස්වාමීන් වහන්සේලා මේ විනය කර්ම කරන්න ඕනෑ. බුදුරජාණන් වහන්සේට අනේපිඬු සිටාණෝ අසූ කෙළක් ධනය වියදම් කරලා තමයි ජේතවනාරාම හදලා දුන්නේ. විනය පිටකයේ කොහේවත් නැහැ පන්සල්, වෙහෙර-විහාර සරල, වාම් විධියට හදන්න ඕනෑ කියලා. එහෙම එකක් නැහැ. විශාකාවගේ මේල පළඳනාවත් පන්සලට පරිත්‍යාග කළේ ඒකට. ඒ නිසා මේවා හොඳ නැහැ. රුසියානු තානාපති කාර්යාලයේ හදන වැඩබිමට බලෙන් ඇතුළු වෙන්න ගිහිල්ලා ජාත්‍යන්තර සබඳතාවලට හානි වන විධියට කටයුතු කරන්න හොඳ නැහැ. තානාපති කාර්යාලයක භූමියක් කියන්නේ ඒ රටේ භූමිය හා සමානවම සෑම රාජ්‍යයක්ම සලකනවා.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
අවසන් කරන්න, මන්ත්‍රීතුමා.

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

අවසාන වශයෙන් මා ඔබතුමාට කියන්න ඕනෑ, 2001 අවුරුද්දේ පෞද්ගලිකව මට වුණ සිද්ධියක් සම්බන්ධයෙන්. 2001 අවුරුද්දේ එක්තරා සිද්ධියක් සම්බන්ධයෙන් මම පැමිණිල්ලක් කරලා තිබියදී ඒ සම්බන්ධයෙන් මාව විත්තිය කරලා, වෙනම සහකාර පොලිස් අධිකාරිවරයකුට එය යොමු කරලා, ඒ සහකාර පොලිස් අධිකාරිවරයා පැමිණිල්ල විභාග කරලා, උසාවියේ නඩුවක් දැම්මා. ඒ නඩුවේ පැමිණිලිකරුවන් දිවුරුම් ප්‍රකාශයක් දීලා පිළිගත්තා, මම එතැන හිටියේ නැහැ කියලා. පොලීසියට කරපු මුල් පැමිණිල්ල - මුල් සටහන් - සැලැකිල්ලට ගන්නේ නැතිව, විවිධ චෝදනා යටතේ උසාවියට නඩු වාර්තා කරලා, "B" වාර්තා දෙක, තුන ඉදිරිපත් කරලා අද නීතිය මගින් අපිව මර්දනය කරනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපට ඒ කාරණය හොඳට පැහැදිලි වුණා.

රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිතුමාගේ කථාවේදී එතුමා කිව්වා, "වැඩිය කෑ ගැහුවොත් passport එක තහනම් කරනවා" කියලා. ඒ කියන්නේ කෑ ගහන අයගේ තමයි passport තහනම් කරන්නේ. ඒකද, යහ පාලනය කියන්නේ? මේ පාර්ලිමේන්තුව විසුරුවලා, ඊළඟ මැතිවරණයේදී භාරකාර ආණ්ඩුවක් යටතේ සාධාරණ මැතිවරණයක් තියන්න. ඒ අභියෝගය තමුන්නාන්සේලාට දෙනවා. එහෙම වුණොත් රටේ ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණයක් තිබුණා කියලා පෙන්වන්න පුළුවන්. මෙතෙක් කල් තිබුණු මැතිවරණවල අඩු පාඩු තිබුණා නම් මෛත්‍රී පාලනය තුළින් ඒ අඩු පාඩු සකස් කර ගෙන නිවැරදි දේ කරන්න තමුන්නාන්සේලාට අවස්ථාව ලැබිලා තිබෙනවා.

අපේ ජෝන් පොලිස් ඇමතිතුමාටත් අප මතක් කරනවා, වත්තල වැඩේ හොඳ නැති බව. ගිය දේ ගියා. එවැනි සිද්ධීන් යළිත් ඇති නොවෙන්න අපි වග බලා ගනිමු. බොහොම ස්තූතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමා.

[අ.භා. 2.34]

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය ජනවාරි මාසයේ 10 වැනිදා ඉඳලා සිදු වුණු සිද්ධීන් ගණනාවක් තිබෙනවා. එක සිද්ධියක් තමයි, ජනවාරි 10 වැනිදාම විපක්ෂ නායකවරයාත් එක්ක ප්‍රාදේශීය සභාවේ දහ දෙනෙකු විතර කලවාන සමුපකාර සමිතියට ගිහිල්ලා, එතැන හිටපු කට්ටියට තර්ජනය කරලා, නිලධාරින් භය ගන්වලා, ඒකේ තිබුණු බඩු මුට්ටු පොළොවේ ගහලා තිබෙනවා කියන එක. ඒ සම්බන්ධයෙන් පැමිණිල්ලක් කළා. ඒකට පොලීසියට 16 වැනිදාත් ගියා; 21 වැනිදාත් ගියා; ඊයේත් - 09 වැනිදාත් - ගියා. මේ වැඩේ තවම අවසන් වෙලා නැහැ. ඒ මිනිසුන්ට නිදහසේ සමුපකාර සමිතියේ වැඩ කරන්න දෙන්නේ නැහැ. අපි බලාගෙන හිටියා, අඩුම ගණනේ මාසයක් ගිහිල්ලාවත් මේ කටයුත්ත ඉවර වෙයි කියලා. මාසයක් ගිහිල්ලාවත් ඉවර වෙලා නැහැ. GM ඊයේත් පොලීසියට ගියා, "මට මෙතැන වැඩ කරන්න දෙන්නේ නැහැ" කියලා. අපි කියන්නේ යහ පාලනය නම් මාසයකින් - දින 30කින් - පස්සේවත් මේ වැඩේ පටන් ගන්න කියලායි. දින සියයම යන්න හදන්නේ මෙහෙමද කියලා තමයි අපිට අහන්න වෙන්නේ.

රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිතුමා මේ අවස්ථාවේ මේ ගරු සභාවේ නැහැ. එතුමා කිව්වා, "වැඩිය කථා කළොත් හිරේ දානවා; passport තහනම් කරනවා"ය කියලා. මේකද ප්‍රජාතන්ත්‍රවාදය? උත්තරීතර පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකුට කථා කරන්න බැරි නම් ඒකද, ප්‍රජාතන්ත්‍රවාදය? ඒකද, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාව පරාජයට පත් කරලා මේ හැදුවේ? අපි කියන්නේ හැමෝටම ප්‍රජාතන්ත්‍රවාදය නම්, එහෙම පාර්ලිමේන්තුවේ කාටවත් තර්ජනය කරන්න බැහැ කියලායි. එතුමා අපේ හිටපු නියෝජ්‍ය ඇමතිවරයකුට තර්ජනය කළා. "හිරේ දානවා, passport තහනම් කරනවා" කියලා මේ ජනවාරි 08 වැනිදාට ඉස්සෙල්ලා මේ පාර්ලිමේන්තුවේදී කාටවත් කවුරුවත් කියලා නැහැ. අපි කියනවා, මේවාට යම්කිසි ක්‍රියා මාර්ගයක් ගන්න කියලා. එතුමාම කිව්වා, අපේ හිටපු ඇමති කෙනෙක් සමෘද්ධි නියාමක කෙනකුව ගස් බැන්දා කියලා. දැන් මා මේ කියන්න හදන්නේ එම සිද්ධියට වෙනස් සිද්ධියක්. 06 වැනිදා වේවැල්කඳුර වසමේ සමෘද්ධි නියාමකට සමෘද්ධි රැස්වීමේදී ගැහුවා. සමෘද්ධි රැස්වීමේදී ගහලා, ඒ සම්බන්ධව 06 වැනිදා පැමිණිල්ලක් කළා. අද උදේත් මා මේ කාරණය සම්බන්ධයෙන් පොලීසියෙන් ඇහුවා, "තවම කට්ටිය හැංගිලා ඉන්නවා. අල්ලා ගන්න වුණේ නැහැ" කියලා කිව්වා. රාජකාරි වෙලාවේදී තමයි මේ සමෘද්ධි නියාමකට ගැහුවේ, "මෙන්න මේ ලැයිස්තුවට සමෘද්ධිය දෙන්න ඕනෑ" කියලා. "අපිට එහෙම සමෘද්ධිය දෙන්න විධියක් නැහැ. අලුතින් කමිටුවක් පත් කරලා තිබෙනවා. ඒ කමිටුවේ තීරණය අනුවයි සමෘද්ධිය ලබා දෙන්නේ" කියලා ඔහු කියා තිබෙනවා. ඒ අයගේ නම් කලවාන පොලීසියේ සඳහන් කර තිබෙනවා. "සමෘද්ධි මහත්තයාට ගහන්න එපා" කියලා එතැන හිටපු දෙදෙනෙකු ඔහුව බේරන්න ගියා. ඒ දෙදෙනාට පාරේදී ගැහුවා. අපේ ජෝන් සෙනෙවිරත්න හිටපු ඇමතිතුමාත් එතුමන්ලාගේ නම් කිව්වා. එල්.ඒ. ජගත් උපාලි කියන කෙනාගේ බයිසිකලය කුඩු කළා. බයිසිකලය කුඩු කරනවා දැකලා ඔහුගේ අයියා - එල්. ඒ. බෝධිපාල - එතැනට ආවා. ඔහු තමයි ගමේ හැම කටයුත්තකදීම මූලිකත්වය අරගෙන පිරිත් කියන මනුස්සයා.

බිම දා ගෙන ඔහුට ගැහුවා. මම ඊයේ ඒ ගෙදර ළඟට ගිහිල්ලා ඇහුවාම කාන්තාවක් කිව්වා, "සර්, කාන්තාවක් වෙලා මටත් රණ්ඩුව බේරන්න යන්න භය හිතුණා. ඒ තරමට ගැහුවා" කියලා. ඉල ඇට දෙකක් කැඩෙනකල් ගහලා. ඉල ඇට දෙකක් කැඩිලා, දවස් තුනක් රත්නපුර මහ රෝහලේ හිටියා. එහෙන් ටිකට් කපා ගෙන ගිහිල්ලා, අද කළුබෝවිල රෝහලට පෙන්වන්න එක්ක ආවා කියලා මට කිව්වා. ඒ, සමෘද්ධි රැස්වීමට ගිහිල්ලා කරපු වැඩේ. එදා සමෘද්ධි නියාමක ගස් බැන්දා, ඒක වැරදියි. අපි එදාත් ඒක වැරදියි කිව්වා. අද සමෘද්ධි නියාමකට රැස්වීමක් තියන්න දෙන්නේ නැහැ. -මේ ලියවිල්ල ඔහුගේ අත්සනින් දීලා තිබෙන්නේ.- එතකොට ඒක හරිද? ඒකත් වැරදියි. අපි කියන්නේ මෙවැනි දේ සිදු නොවෙන විධියට කටයුතු කරන්න කියලායි. ඒවා එහෙම කෙරීගෙන යනවා.

අපේ වර්තමාන ජනාධිපතිතුමාටත් මම මේ ගැන කිව්වා. දැන් මේ රජයේ නිලධාරින්ට වැඩ කරන්න දෙන්නේ නැහැ. ඒ වාගේම CTB එකට ගිහිල්ලා depot එකේ කැෂියර් එකේ වෙනත් කට්ටියක් ඉඳ ගෙන ඉන්නවා, නීත්‍යානුකූලව ඉන්න ඕනෑ කට්ටිය එළියේ. ඒ අය එතැන ඉඳ ගෙන ඒ කටයුත්ත කරනවා. යහ පාලනය ඇති කරන්න ඔබතුමන්ලාට ඡන්දය දීලා, තිබුණු ආණ්ඩුව පරද්දලා මේ ආණ්ඩුව පත් කළේ ඒවා කරන්න නොවෙයි. ඒකයි අපි කියන්නේ. අපි වැරදි කළා නම්, වැඩේ හරියට කරන්න තමයි ඔබතුමන්ලාට බලය දීලා තිබෙන්නේ. හැබැයි DS මහත්වරු මාරු

[ගරු ජානක වක්කුඹුර මහතා]

කරන්න ඕනෑ නම් නීත්‍යානුකූලව කෙනෙක් පත් කරලා මාරුකරලා යවන්න. කෘෂියර් එකේ අඩු පාඩුවක් වුණොත් ඉන්න අයට වග කියන්න වෙනවා. නීත්‍යානුකූලව මාරු කරන්න. මාරු කරලා ගිහිල්ලා ඕනෑ කටයුත්තක් කරන්න. අර මිනිස්සු අපට කථා කරලා කියනවා, "ප්‍රශ්නයක් වුණොත් වග කියන්න වෙන්නේ අපට" කියලා. CTB එකේ ඔය වැඩේ වෙන බව අපි දන්නවා. ආණ්ඩුවක් වෙනස් වෙන කොට ඉන්න අයට ගහලා පන්නනවා. හැබැයි ඒ අය තියා ගෙන ඉඳ ගෙනයි දැන් මේ කටයුතු කරන්නේ. අපි ඒකයි වැරදියි කියන්නේ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක කාලයක් දෙන්න.

අපේ ප්‍රාදේශීය සභාවේ පිමල් කුමාරතිලක කියන මන්ත්‍රීතුමාට ගැහුවා. එතුමා බයිසිකලයෙන් වැටිලා කකුලත් කැඩිලායි හිටියේ. ඒ කකුලටම ගැහුවා. එතුමා දවස් තුනක් රත්නපුර මහ රෝහලේ හිටියා.

නිවිතිගල ප්‍රාදේශීය සභාවේ නිශාන්ත කියලා මන්ත්‍රීතුමකුගේ මුහුණ කඩුවෙන් කැපුවා. එතුමා රත්නපුර මහ රෝහලේ හිටියා. මේවා නතර වෙන්නේ නැහැ කියලා මම කිව්වේ ඒකයි. ඊයේත් සිද්ධීන් වුණා. මේවා නතර කරන්න කියලා පොලීසිය භාර අපේ ඇමතිතුමාගෙනුත් ඉල්ලා සිටිනවා. මේවා නතර කරලා යහ පාලනය ඇති කරන්න. අපි අතුරු අය වැයටත් ඡන්දය දුන්නා, දින සියයේ වැඩසටහන අනුව ඒ කටයුතු කරන්න. හැබැයි මිනිසුන් අපට කියනවා, "ඔබතුමන්ලා ගිහිල්ලා අය වැයට ඡන්දය දුන්නා, මෙහේ තවම ගහනවා" කියලා. ඒකයි අපි කියන්නේ, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ගෙන යන ඒ වැඩ පිළිවෙළ යහ පාලනයක් ඇති කිරීම නම්, මේ වැඩේ නතර කරලා ඒක කරන්න කියලා. එක්සත් ජාතික පක්ෂයේ අය ඒ සඳහා එතුමාට සහයෝගය දෙන්න ඕනෑ. මොකද, එක්සත් ජාතික පාක්ෂිකයෝ තමයි මේ හිරිහැර සිදු කරන්නේ. ඒක නතර කරන්න කියලා ඉල්ලමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[பி.ப. 2.40]

ගරු කරුපයියා වේලායුදම් මහතා (වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கருப்பையா வேலாயுதம் - பெருந்தோட்டக் கைத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Karuppaiah Velayudam - State Minister of Plantation Industries)
කෞරව තලෛමතාංකුම් උරුප්පිනර් අවර්කලේ, ඉන්රු ඉච්චයිල් කාලෛයිලිරුන්තු නටෛපෙරුකින්ර විවාතත්තෛප් පාර්ක්කින්රපොළුතු මිකවුම් වේදික්කෛයාක ඉරුක්කින්රතු. ඒනෙනිල්, වේතාලම් වේතම් ඔතුවතෛප්පෝන්රු ඉරුක්කින්රතු. ඉන්ත නාට්ටිල් තේර්තල් කාලංකළිල් වන්මුරෛක් කලාචාරත්තෛත් තූණ්ටියවර්කළ් ඉන්රු නියායම් කේට්ටු, එංකළුටෛය ආට්චියිල් වන්මුරෛ නටප්පතාකක් කූරුවතෛප් පාර්ක්කින්රපොළුතු චිරිප්පුත්තාන් වරුකින්රතු. ඒනෙනිල්, අන්රු ඇවර්කළ් එන්න චෙය්තාර්කළ්? අන්රුටන් ඔප්පිට්ටුප් පාර්ක්කින්රපොළුතු, කටන්ත ජනවරි මාතම් 08ආම් තිකතික්කුප් පිරකු පිරන්ත ආට්චියිලේ අවවළවාන වන්මුරෛකළ් ඉටම්පෙරවිල්ලෛ. ඔරුචිල ඉටංකළිල් ඉටම්පෙට්රිරුක්කලාම්. ආනාල්, ඇවර්කළ් කාට්ටුකින්ර පූතාකාරනිලෛ උරුවාකවිල්ලෛ. ඊවා මාකාණත්තෛ එටුත්තුප්පාර්ත්තාල්, පතුළෛයිලේ 6 වන්මුරෛච් චම්පවංකළුම් පණ්ටාර වළෛයිලේ 15 වන්මුරෛච් චම්පවංකළුම් මොනරාකලෛයිල් 7 වන්මුරෛච් චම්පවංකළුමේ ඉතුවරෛ පොලිසිලේ මුරෛප්පාටු චෙය්යප්පට්ටිරුක්කින්රන. ඇවෛතාන් තේර්තල් වන්මුරෛකළාකක් කාට්ටප්පට්ටිරුක්කින්රන.

எனக்கு முன்னர் பேசிய உறுப்பினர் விஜிதமுனி சொய்சா அவர்கள் வெல்கொல்லை என்ற இடத்திலே பன்சலையில் இருந்த பௌத்த பிக்கு ஒருவர் தாக்கப்பட்டார் என்று குறிப்பிட்டார். அதற்கும் இந்தத் தேர்தலுக்கும் எந்தவிதமான சம்பந்தமும் இல்லை. நாங்கள் இதனைக் கேள்விப் பட்டவுடனே, உடனடியாக பொலிஸுக்கு அறிவித்து, சம்பவத்தைக் கண்டித்ததுடன் சம்பந்தப்பட்டவர்களுக் கெதிராகச் சட்ட ரீதியான நடவடிக்கை எடுக்கும்படியும் கேட்டுக்கொண்டோம். எனவே, இவ்விதமான வன்செயல்களைத் தூண்டுகின்ற அரசாங்கம் இதுவல்ல. இந்த நாட்டிலே நல்லாட்சியின்றி, நீதியின்றி, நேர்மையின்றி அரசியல் ரீதியாக மக்கள் தொடர்ச்சியாகப் பழிவாங்கப்பட்டார்கள். தமிழர்கள் என்று பழிவாங்கப்பட்டார்கள்; இஸ்லாமியர்கள் என்று பழிவாங்கப்பட்டார்கள்; ஐக்கிய தேசியக் கட்சியினர், ஜே.வி.பீ.யினர் என்று மக்கள் பல்வேறு கோணங்களிலும் பழிவாங்கப்பட்டார்கள். இந்த நிலைக்கு முற்றுப்புள்ளி வைக்கவேண்டும் என்பதுதான் இன்றைய எங்களுடைய ஆட்சியின் - "மைத்திரி" யுகத்தின் முக்கியமான நோக்கமாக இருக்கின்றது; பிரதமர் ரணில் விக்கிரமசிங்க அவர்களுடைய தலைமையிலே இருக்கின்ற இந்தப் பாராளுமன்றத்தின் - அமைச்சரவையின் - முக்கியமான நோக்கமாக இருக்கின்றது. எனவே, நாங்கள் இந்த நாட்டிலே உண்மையான ஜனநாயகத்தை உருவாக்கவேண்டும் என்று ஆசைப் படுகின்றோம். கடந்த மாதம் 09ஆம் திகதி விடியற்காலை ஒரு மணிக்கு நடந்த பேச்சுவார்த்தையின்மூலம் ஒரு மாற்றம் ஏற்பட்டிருந்தால், அன்று இந்த நாட்டிலே வன்முறைகள் ஏற்பட்டிருக்கும். இந்த நாட்டை இராணுவ மயமாக்குவதற்கான சதித்திட்டங்கள் நிறைவேற்றப் பட்டிருந்தால், நாட்டிலே ஜனநாயகம் இல்லாதுபோயிருக்கும். அன்றுதான் உண்மையான வன்செயல் ஆரம்பித்திருக்கும். ஆனால், நாங்கள் அதிலிருந்து தெய்வாதீனமாகத் தப்பித்தோம். இன்று இந்த நாட்டு மக்களுடைய முகத்திலே மகிழ்ச்சி காணப்படுகின்றது.

சுதந்திரக் கட்சியினர் தேர்தல் காலத்தில் என்ன செய்தார்கள்? இவர்கள் மக்களின் வாக்களிக்கும் உரிமையைத் தட்டிப்பறித்தார்கள்.

'குடு'க்காரர்களையும் கள்ள வழியிலே பணம் சம்பாதித்தவர்களையும் வைத்துக்கொண்டு என்னுடைய தொகுதியிலே 4,000 அடையாள அட்டைகளைப் பறித்தார்கள். அந்தத் தொகுதியில் மாத்திரம் இருபத்தேழாயிரம் 'அயன்' பெட்டிகளைக் கொடுத்தார்கள். மගේ ආසනයට විතරක් 27,000ක් iron boxes දුන්නා. මෙහෙම ඡන්ද ලබා ගත් පිරිස, ඡන්ද දායකයන්ගේ ඡන්ද උදුරා ගත් පිරිස අද ඇවිල්ලා "එහෙම වුණා, මෙහෙම වුණා" කියලා නිකම් කෑ ගහනවා. මේ විධියට කථා කරන්න මේ ගොල්ලන්ට මොන අයිතිවාසිකමක් තිබෙනවාද කියලා මා දන්නේ නැහැ.

ஆனால், இன்று மக்கள் மகிழ்ச்சியோடு இருக்கின்றார்கள். முன்னைய ஜனாதிபதித் தேர்தலின் பின்னர் ஐக்கிய தேசியக் கட்சியின் தொழிற்சங்கமான "ஜாதிக சேவக சங்கமய"வைச் சார்ந்த எவரும் பதுளை CTB டிப்போவுக்குச் செல்ல முடியவில்லை. அந்த நேரத்தில் மொனராகலையிலிருந்து விரட்டப்பட்டவர்கள் இன்றும் வேலையில்லாது இருக்கின்றார்கள். CTB එකේ වැඩ කරපු අයට පසු ගිය ජනාධිපතිවරණයෙන් පසුව එක ඩිපෝ එකකටවත් යන්න දුන්නේ නැහැ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා

(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Presiding Member)

Order, please! මේ අවස්ථාවේ දී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு எரிக் பிரசன்ன வீரவர்தன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. ERIC PRASANNA WEERAWARDHANA *left the Chair and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *took the Chair.*

ගරු කරුපයියා වේලායුදම් මහතා

(மாண்புமிகு கருப்பையா வேலாயுதம்)

(The Hon. Karuppaiah Velayudam)

அந்த நேரத்தில் குறிப்பிட்ட ஊழியர்கள் ஒரு வேலைத்தலத்துக்கும் செல்ல முடியவில்லை. பதுளை, மொனராகலை, பண்டாரவளை என்று அனைத்து இடங்களிலிருந்தும் அவர்கள் விரட்டப்பட்டார்கள். ஆனால், இன்று நாம் இவர்களின் ஆதரவாளர்களை அவ்வாறு நடத்தவில்லை. அங்கு அவர்கள் அனைவரும் செல்வதற்கு அனுமதியைக் கொடுத்திருக்கின்றோம். யாரும் அதைத் தட்டிப் பறிக்கவில்லை.

இன்று 'பாஸ்போட்' பற்றிக் கூறப்பட்டது. தவறு செய்தவர்கள் சட்டத்தின் முன்னால் கொண்டு வரப்படுவார்கள் என்பதைத்தான் ரஞ்ஜன் ராமநாயக்க அவர்கள் குறிப்பிட்டார். எனவே, இது அவர்களுடைய உரிமைகளைப் பறிப்பதற்காக அல்ல. அதுபோல், இன்று பள்ளிவாசல்களுக்குள், பௌத்த விகாரைகளுக்குள் செல்லக்கூடாதவர்கள் எல்லாம் பலாத்காரமாகச் சென்றார்கள் என்று கூறினார்கள். அன்று தம்புள்ளயிலே காளி கோயில் உடைக்கப்பட்டபொழுதும் பள்ளிவாசல் உடைக்கப்பட்டபொழுதும் இவர்கள் எங்கிருந்தார்கள்? அன்று சம்பந்தப்பட்டவர்கள் வணக்க ஸ்தலங்களுக்குள் பலாத்காரமாகப் புகுந்து மதவழிபாட்டைத் தடுத்தபொழுது இன்று தர்மம் பேசுகின்றவர்கள், நியாயம் பேசுகின்றவர்கள் எங்கே இருந்தார்கள்? அன்று இவர்கள் கண்ணை மூடிக்கொண்டு இருந்தார்களா? செவிடர்களாக இருந்தார்களா? அன்றைய வன்செயல்கள் முழுவதையும் அந்த அரசாங்கம் கண்டிக்காத நிலையே இருந்தது. ஆனால், இன்று அந்த நிலை இல்லை. அதனால்தான் சிங்களவர்கள், தமிழர்கள், இஸ்லாமியர்கள், பௌத்தர்கள், கிறிஸ்தவர்கள் என்ற பேதமற்ற முறையிலே அனைவரும் இந்த நாட்டுக்கு மைத்திரியின் ஆட்சியைக் கொண்டு வந்திருக்கின்றார்கள்.

"நான் தமிழ் மக்களது தலைவன், நான் தமிழ் மக்களது தோழன், நான் தமிழ் மக்களது பாதுகாவலன், நான் உங்களுடைய உறவினன்" என்றெல்லாம் அன்று வாய்கூசாமல் வடக்கிலும் கிழக்கிலும் மலையகத்திலும் தமிழிலே சத்தம்போட்டுக் கத்திய முன்னாள் ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்கள், தேர்தல் முடிந்தவுடன் தெற்குக்குச் சென்று தனது கிராமத்திலே என்ன கூறினார்? "தென்பகுதி மக்கள் எனக்கு வாக்களித்திருக்கின்றார்கள். நான்தான் தென்பகுதி மக்களுடைய தலைவன். ஆனால், வடக்கு, கிழக்குத் தமிழ் மக்களுடைய வாக்குகளால்தான் மைத்திரி ஜனாதிபதியாக வந்திருக்கின்றார்" என்று கூறினார். எனவே, தேர்தல் வரையும் நண்பனாக, உறவினனாக, தோழனாக, பாதுகாவலனாகத் தெரிந்த தமிழர்களும் இஸ்லாமியர்களும் தேர்தல் முடிந்தவுடன் இனவாத ரீதியில் பிரிக்கப்பட்டார்கள். இதனூடாக மீண்டும் இந்த நாட்டில் ஓர் இனப் பூசலையே இவர்கள் உருவாக்க முனைந்தார்கள்.

யுத்தம் முடிந்தது என்றார்கள். யுத்தம் முடிந்துவிட்டதுதான். ஆனால், என்ன காரணத்துக்காக யுத்தம் உருவாக்கப்பட்டதோ, என்ன காரணத்துக்காகத் தமிழ் மக்கள் ஆயுதங்களை ஏந்தினார்களோ, அதற்கான பரிகாரத்தைக் கடந்த பத்தாண்டுகளில் இவர்கள் செய்யவில்லை. அது வன்முறையில்லையா? அது ஓர் இனத்தை அழிக்கின்ற செயலாக உங்களுக்குத் தென்படவில்லையா? எனவே, தமிழ் மக்களுக்கு இன்று விடுதலை கிடைத்ததாகக் கூறினாலும் முழுமையான விடுதலை இன்னமும் கிடைக்கவில்லை என்பதுதான் உண்மை.

சிறையிலே வாடுகின்ற எங்களுடைய தமிழ் இளைஞர்கள் விடுதலை செய்யப்பட வேண்டும். இன்று கௌரவ உறுப்பினர் முரளிதரன் அவர்கள் கூறினார், தாங்கள் அரசுடன் இணைந்ததனால்தான் சமாதானம் பிறந்தது என்று. அதனால் சமாதானத்துக்கான அத்திவாரம் இடப்பட்டிருக்கலாம்! ஆனால், தொடர்ந்தும் சிறையிலே வாடுகின்ற இளைஞர்கள் விடுவிக்கப்பட வேண்டும். இன்னமும் சொந்த இடங்களுக்குச் செல்ல முடியாது அகதி முகாம்களிலே இருக்கின்றவர்களுடைய வாழ்விலே மாற்றம் கொண்டுவரப்பட வேண்டும். இன்று சுமார் ஓர் இலட்சம் தமிழ் மக்கள் தமிழ்நாட்டிலுள்ள 107 முகாம்களிலே அடைபட்டிருக்கின்றார்கள்.

இதுவரை அவர்களுக்குத் தேவையானவற்றை இந்திய அரசாங்கம் செய்துகொண்டிருக்கின்றது. அவர்கள் மீண்டும் இந்த நாட்டுக்கு அழைத்துவரப்பட வேண்டும். மீண்டும் அவர்களைக் கௌரவமான முறையில் வாழவைப்பதற்கான வழிமுறைகள் செய்யப்படவேண்டும். இவையெல்லாம் செய்யப்படுகின்றபோதுதான் இந்த இனத்துக்கு, இந்தச் சமூகத்துக்குக் கிடைக்கவிருக்கின்ற விடுதலை உருவாக முடியும்.

இந்த வன்முறைகள் தேர்தலுக்குப் பிறகு மாத்திரம் நடந்தவையல்ல. எமது மக்களுடைய வாக்குகளைப் பணம் கொடுத்துப் பறித்தார்கள். அடையாள அட்டைகளைப் பறித்தார்கள். தேர்தல் காலங்களிலே எதையெல்லாம் செய்யக் கூடாதோ, அதையெல்லாம் செய்தார்கள். இவையெல்லாம் வன்முறையில்லையா? இதற்கு வன்முறையென்று பெயரில்லையா? சற்றுச் சிந்தித்துப் பாருங்கள்! உயர்கல்வி அமைச்சர் என்னுடைய தொகுதிக்கு வந்து, එක්කෝ හොඳින් දිනනවා, නැතිනම් නරකින් දිනනවා කිව්වා. පසු ගිය කාලයේ නිටපු උසස් අධ්‍යාපන ඇමතිතුමා මගේ ආසනයට ඇවිල්ලා එහෙමයි කථා කළේ. கல்வி போதிக்கவேண்டியவர்கள் எங்களுடைய வாக்காளர்களுக்குக் கற்றுக்கொடுத்த பாடம் இது. அதேபோன்று பொருட்களையும் இன்னோரன்னவற்றையும் கொடுத்து எங்கள் மக்களுடைய வாக்குகளை இரவோடிரவாகக் களவாடினார்கள். அரச ஊழியர்களையும் சமுர்த்தி ஊழியர்களையும் அரசியலில் ஈடுபடவைத்தார்கள். வாக்களிக்காவிட்டால் சமுர்த்தி இல்லாது போய்விடும் என்று ஏழைகளைப் பயமுறுத்தினார்கள்.

[ගරු කරුපයියා වේලායුදම් මහතා]

கூட்டங்களுக்குச் செல்லாவிட்டால் சமுர்த்தி கொடுக்க மாட்டோம் என்று பயமுறுத்தினார்கள். இது வன்முறை இல்லையா? இதற்குப் பெயர் என்ன? இது ஜனநாயக விரோதச்செயல் இல்லையா? யார் எதைக் கொடுத்தாலும் இவ்வாறெல்லாம் செய்தவர்களுக்கு எதிராக மக்கள் தீர்மானித்தார்கள், ஆட்சிமாற்றத்தை ஏற்படுத்த வேண்டு மென்று. இந்த நாட்டிலே சிங்களவர்களும் தமிழர்களும் இஸ்லாமியர்களும் இணைந்த ஓர் ஆட்சியை ஏற்படுத்த விரும்பினார்கள். அனைத்து எதிர்க்கட்சிகளும் ஒன்றிணைந்து உண்மையான ஜனநாயகத்தை உருவாக்குவதற்கு அர்ப்பணிப்புடன் செயற்பட்டன. அது இன்று உருவாகியிருக்கின்றது. அந்த உருவாக்கத்தினூடாக இன்று நாங்கள் முன்னேற்பாடான பல நடவடிக்கைகளை எடுக்க இருக்கின்றோம்.

இதுவரை கிட்டத்தட்ட 200 ஆண்டுகளாக இந்த நாட்டு மண்ணுக்கு உழைத்த, அந்நியச்செலாவணியைப் பெற்றுக் கொடுத்த இந்திய வம்சாவளித் தோட்டத்தொழிலாளர்கள் சொந்த வீடற்றவர்களாக, சொந்தக் காணியற்றவர்களாக இருந்தார்கள். அவர்களுக்கு இந்த நல்லாட்சியின்கீழ் சொந்தக்காணிக்கான உரிமை கிடைக்க இருக்கின்றது. இதுவரை அவர்களுக்கு இந்த உரிமைகளை மறுத்தமையானது, ஒரு சமூகத்துக்கு எதிரான வன்செயல் இல்லையா? அவர்களுக்கெனச் சொந்த முகவரியைக் கொடுக்காதது ஒரு சமூகத்துக்கு எதிரான வன்செயல் இல்லையா? நீங்கள் என்ன செய்தீர்கள்? எனவே, வன்முறை என்பது தேர்தல் காலத்திலே தனிப்பட்ட ரீதியான குரோதங்களுக்காக மாத்திரம் ஏற்படுத்தப்படுவதல்ல. இவ்வாறு தொடர்ச்சியாக நீங்கள் எங்களுக்கு செய்திருக்கின்ற அநியாயங்கள் ஏராளம். இவற்றுக்கான விடுதலை காண, இவற்றுக்கான விடிவைப் பெற்றுத்தர இந்த அரசாங்கம் முனைந்திருக்கின்றது.

இந்த நாட்டில் சுதந்திரமாக வாக்களிக்கின்ற முறைமை இருக்கவேண்டும். தேர்தலில் வாக்களிப்பது ஒவ்வொருவரினதும் கட்டாய கடமையாகும். நேற்று நான் எனது தொகுதியிலுள்ள ஒரு பன்சலையில் இடம்பெற்ற கூட்டத்திற்குச் சென்றிருந்தேன். ஊவா மாகாணத்துக்குக் கொடுப்பதற்கான 'சிவிரு' உடைகள் அந்தப் பன்சலையில்தான் குவிக்கப்பட்டிருந்தன. எனவே, இந்தவிதமாக அனைத்தையும் கொடுத்தனர். இவ்வாறு பணத்தை வழங்கியவர்கள்கூட இன்று எங்களுடன் வந்துள்ளார்கள். கடந்த மாதம் 7ஆம் திகதி இரவு பசறைத் தொகுதியிலே தோட்டம் தோட்டமாகச் சென்று பணம் வழங்கப்பட்டது. மதுக் கலாசாரத்துக்கு மீண்டும் உயிரளிக்கப்பட்டது. இது வன்முறையில்லையா? எனவே, ஒரு குறிப்பிட்ட நோக்கத்தை மாத்திரம் வைத்து வன்முறை நடைபெறுவதாகக் கருதமுடியாது. இதுவரை காலமும் இவர்கள் செய்த அட்டகாசங்களோடு ஒப்பிட்டுப் பார்க்கின்றபோது இன்று நடந்தது அதில் ஒரு தூசிக்குச் சமனாகும். ஆனாலும் அவ்வாறானவை இடம்பெறுவதை நாங்கள் விரும்பவில்லை.

வாக்களிக்கின்ற உரிமை ஒவ்வொருவருக்கும் இருக்கின்றது. ඡන්දය දීමේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය සියලු දෙනාටම තිබෙනවා. ඒක වළක්වන්න කිසිම කෙනකුට අයිතියක් නැහැ. இந்த நாட்டிலே நல்லாட்சி இருக்கவேண்டும். அதற்குத் தேவையான அடித்தளத்தை எங்களுடைய அரசு ஏற்படுத்தியிருக்கின்றது. நீங்கள் பாகுபாடாக நாட்டை நடத்தினீர்கள். பசறைத் தொகுதியிலே எங்களுடைய பிரதேச சபையில் இருக்கின்ற எதிர்க்கட்சி உறுப்பினர்களுக்கு உங்களுடைய ஆட்சியிலே மோட்டார் சைக்கிள் வழங்கினீர்கள். அதேவேளை, எமது ஆளுங்கட்சி உறுப்பினர்கள் நான்கு பேருக்கு மட்டும் கொடுத்துவிட்டு ஆறு பேருக்குக் கொடுக்கவில்லை. அதுவும் ஒருவகையில் வன்செயல் இல்லையா? அது மோசமான நிலையில்லையா? இவ்வாறெல்லாம் செய்துவிட்டு இன்று சமத்துவத்தைப் பற்றிப் பேசுகின்றீர்கள்; சமாதானத்தைப் பற்றிப் பேசுகின்றீர்கள். இதைப் பார்க்க வேடிக்கையாகவும் சிரிப்பாகவும் இருக்கின்றது.

எனவே, ஜனாதிபதி மைத்திரி அவர்களினதும் பிரதம அமைச்சர் ரணில் விக்கிரமசிங்க அவர்களினதும் யுகத்திலே இந்த நாட்டில் நிச்சயமாக நல்லாட்சி மலரும்; நல்லாட்சிக்குத் தேவையான அனைத்து அடித்தள வசதிகளும் அடித்தளக் கட்டமைப்புகளும் உருவாக்கப்படும். எதிர்காலத்திலே சுதந்திரமான ஒரு தேர்தலை நடத்துவதற்கான செயற்பாடுகள் முன்னெடுக்கப் படும். ஊடகவியலாளர்கள், அரச ஊழியர்கள் அனைவரையுமே சமமாக மதிக்கின்ற நிலை உருவாக்கப்படும். அதற்கான செயற்றிட்டங்கள் உருவாக்கப்பட்டிருக்கின்றன. எனவே, நாங்கள் ஒரு புதிய அரசியல் கலாசாரத்தை நோக்கிப் போய்க்கொண்டிருக்கின்றோம். இந்தப் புதிய அரசியல் கலாசாரம் உலகம் முழுவதற்கும் ஓர் எடுத்துக்காட்டாக அமைய வேண்டும்.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
உங்களுக்கு இன்னும் ஒரு நிமிடம்தான் இருக்கிறது.

ගරු කරුපයියා වේලායුදම් මහතා
(மாண்புமிகு கருப்பையா வேலாயுதம்)
(The Hon. Karuppaiah Velayudam)
நன்றி.

இலங்கையிலிருந்து தமிழ்நாட்டுக்குச் சென்ற உறுப்பினர் எவரும் கறுப்புக் கொடிக்கு முகம்கொடுக்காமல் இதுவரை திரும்பியதில்லை. அவ்வாறில்லாமல் முதல்முறையாக அவர்கள் அனைவரதும் முழுமையான வரவேற்போடு அந்த நாட்டுக்குச் செல்லக்கூடிய வாய்ப்பு எனக்கு அண்மையிலே கிடைத்தது. அவர்களுடைய தலைவர்களையும் சந்திக்கக்கூடியதாக இருந்தது. அவர்கள் எங்களுடைய புதிய நிலைப்பாட்டை முழுமையாக ஏற்றுக்கொண்டிருக்கிறார்கள். இந்த நாட்டின் பொருளாதார வளத்திற்கு ஒத்துழைப்பு வழங்குவதற்காக, அங்குள்ள வசதி படைத்த பலர் இங்கு முதலீடு செய்ய விருப்பம் தெரிவித்திருக்கிறார்கள். அங்கு அகதிகளாக இருக்கின்ற பலர் மீண்டும் நாட்டுக்கு வருவதற்கு முனைந்துகொண்டிருக்கிறார்கள். எனவே, இவ்விதமான ஒரு நல்ல சூழல் உருவாகியிருக்கின்றது. இந்தச் சூழ்நிலையில் ஒரு சில பிரச்சினைகளுக்கு முகங்கொடுத்துத்தான் ஆகவேண்டும். ஏனெனில், நீங்கள் கற்றுக்கொடுத்ததை உடனடியாக அனைத்து மக்களும் மறந்துவிடமாட்டார்கள். அந்த வேதனையிலே துடித்தவர்கள் சில இடங்களிலே வன்முறைகளில் ஈடுபட்டிருக்கலாம். ஆனால், நீங்கள் கூறுகின்ற அளவுக்கு அவை பூதாகாரமான விடயங்களல்ல. எனவே, சொந்தப் பிரச்சினைகளால் நடந்தவற்றையெல்லாம் இந்தத் தேர்தல் வன்முறை என்ற பெட்டிக்குள்ளே போட்டு பூதாகாரமாகக் காட்டுவதைவிட, நடந்ததை மறந்து எதிர்காலத்திலே சக்திமிக்க ஓர் அரசை உருவாக்குவதற்காக, இந்த நாட்டு மக்களுக்கு உண்மையான சுதந்திரத்தையும் பேச்சுரிமையையும் பெற்றுக்கொடுக்க, எங்களோடு கரம்கோர்த்துச் செயற்படுமாறு உங்களுக்கு அழைப்பு விடுத்து, வாய்ப்புக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

[අ.භා. 2.56]

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රටේ ඉතිහාසයේ හැමදාමත් මැතිවරණයක් අවසන් වුණාට පසුව පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා ගැන පාර්ලිමේන්තුවේත්, පළාත් සභාවේත්, ඒ වාගේම ප්‍රාදේශීය සභාවලත්, රටේ ජනතාව තුළත් කථා බහට ලක් වෙනවා. මේක වැරදි සංස්කෘතියක්. මේ සංස්කෘතිය වහාම නතර කළ යුතුයි. ඒ ගැන විවාදයක් නැහැ. කොයි පැත්තෙන් සිදු වුණත්, මැතිවරණයක් අවසන් වනකොට ජයග්‍රහණය කරපු පාර්ශ්වය පරාද වුණු පාර්ශ්වයට තඩි බාන එක, එහෙම නැත්නම් ඔවුන්ගෙන් පළි ගන්න නිවාස ඇතුළු ඔවුන්ගේ දේපොළ විනාශ කරන එක, ඒ වාගේම රැකියා ස්ථානවල සේවය කරන්න දෙන්නේ නැතිව දිගින් දිගටම පළි ගන්න එක වැරැදියි. මේ නරක සංස්කෘතිය, වැරදි සංස්කෘතිය අපි වහාම නතර කළ යුතුයි. ඒ සංස්කෘතිය ඇති කරන්න නම් යහ පාලනය ඇති කිරීමේ ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමේ දිසාවට රටේ නායකත්වය විසින් මේ රටේ ජනතාව රැගෙන යා යුතුව තිබෙනවා.

ඇත්තටම ගත්තොත් මේ ජනාධිපතිවරණයෙන් පසුව ඇති වුණු සිදුවීම් ජනතා විමුක්ති පෙරමුණ විධියට අපි ඉතාම පැහැදිලිව තරයේ හෙළා දකිනවා. ඒ සිදුවීම්වලට අදාළ කොටස්වලට විරුද්ධව නීතිමය ක්‍රියා මාර්ග වහාම ගත යුතුයි කියන ස්ථාවරයේත් අපි ඉන්නවා. එවැනි නීතිමය පියවර ගැනීමෙන් තමයි ඒවා වළක්වා ගන්න පුළුවන් වන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය ජනවාරි 08 වැනිදායින් පසුව ඇති වුණු සිදුවීම් අහඹු සිදුවීම් නොවෙයි. ඒවා හිටපු ගමන් ඇති වුණු සිදුවීම් නොවෙයි. ඒවා ඇති වන්නට බලපාන ලද ඉතිහාසමය විෂය මූල තත්ත්වයක් තිබුණා. අවුරුදු ගණනාවක් තිස්සේ මේ රටේ ඇති කරපු ඒ වැරදි දේශපාලන සංස්කෘතියේ ප්‍රතිඵලයක් විධියට තමයි මේ පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නෂ්ටාවශේෂ විධියට තවමත් සිදු වෙමින් තිබෙන්නේ. ඉතිහාසයේ කවරදාකවත් නොවූ ආකාරයට රාජ්‍ය බලය, මැර බලය, මූල්‍ය බලය, මාධ්‍ය බලය වැඩියෙන්ම භාවිත වුණු මැතිවරණය තමයි පසු ගියදා පැවැති ජනාධිපතිවරණය. ජනාධිපතිවරයකු තමන්ගේ විධායක බලතල අතේ තියාගෙන පවත්වපු මැතිවරණයක්. ඒ විධායක බලය අතේ තියාගෙන රාජ්‍ය බලය, මැර බලය, මාධ්‍ය බලය, මූල්‍ය බලය සියල්ල යොදා ගත්තත් ජන බලයට පරාද වෙන්න සිදු වුණා. ඒ මැර බලය, රාජ්‍ය බලය පරදවන්න මේ රටේ ජනතාව සමත් වුණා. ඇත්තටම ගත්තොත්, මේ රටේ ඉතිහාසයේ වැඩියෙන්ම මූල්‍ය සහ රාජ්‍ය බලය යොදාගෙන පවත්වපු මැතිවරණය විධියට එම මැතිවරණය විශේෂ සිදු වීමක් වනවා; විශේෂ මැතිවරණයක් වනවා.

මෙම මැතිවරණයේ දී වාගේම තත්ත්වයක් මතු වුණු මීට කලින් පැවැති 2010 ජනාධිපතිවරණය ගැනත් අපට මතකයි. 2010 ජනාධිපතිවරණයේ දී මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රතිවාදී අපේක්ෂකයා වුණේ පොදු අපේක්ෂක සරත් ෆොන්සේකා මැතිතුමායි. එදාත් මැතිවරණයෙන් පසුව රාජපක්ෂ මහත්මයලා කළේ මොකක්ද? ඒ ඉතිහාසය මතක් කරන්න ඕනෑ. මොකද, ඒ ඉතිහාසය අමතක කරලා 2015 ජනවාරි 08 වැනිදා පැවැති මැතිවරණය ගැන කථා කරන්න බැහැ. එදා මහින්ද රාජපක්ෂ මහත්මයා ජයග්‍රහණය කරපු ගමන්ම කළේ, තමන්ගේ ප්‍රතිවාදී අපේක්ෂකයා වුණු, කිසිදු චෝදනාවක් නැතිව හිටපු සරත් ෆොන්සේකා මහතාට අභූත චෝදනා - බොරු චෝදනා - නඟලා, යුද අධිකරණයට ගෙන ගිහිල්ලා, දෙන්න පුළුවන් වධ හිංසා සියල්ල දීලා, අන්තිමට සිරගත කළ එකයි. ඒක තමයි අපේ රටේ ඉතිහාසයේ ජනාධිපතිවරයකු කරපු ඉතාම නරක, තුච්ඡ, නින්දිතම පළි ගැනීම. ඒ පළි ගැනීමෙන් තමයි ජනාධිපතිවරණයෙන් පසුව මහින්ද රාජපක්ෂ තමන්ගේ දෙවන ධුර කාලය පටන් ගත්තේ. එතැනින් එහාට තමන්ගේ ප්‍රතිවාදීන්ගෙන් දිගින් දිගටම පළි ගන්නට පටන් ගත්තා. එහි දිගුවක් තමයි අද මේ යන්නේ.

එම ජනාධිපතිවරණයේ දී පොදු අපේක්ෂකයා විධියට තරග කළ සරත් ෆොන්සේකා මහතාට, විධායක ක්‍රමය අහෝසි කිරීම සඳහා මැදිහත් වුණු සියලු දේශපාලන පක්ෂ, සියලු සිවිල් සංවිධානවලට පන්න පන්නා පහර දුන්නා. ඔහුට සහයෝගය දීපු මාධ්‍යවේදීන්ට, ඔහුට සහයෝගය දීපු හමුදාවේ හිටපු නිලධාරීන්ට, විශ්‍රාම ගිය නිලධාරීන්ට ගෙවල්වල ඉන්න පුළුවන් තත්ත්වයක් ඇති වුණේ නැහැ. ඔවුන්ට රට යන්න සිදු වුණා. ඒ රට පැනපු මාධ්‍යවේදීන් තවමත් ලංකාවට ඇවිල්ලා නැහැ. එදා ඒ පළි ගැනීම පටන් ගත්තේ රාජපක්ෂ පාලනයෙනුයි. එතැනින් එහාට මේ විධායක බලය තවත් ශක්තිමත් කරගෙන, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරගෙන, මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්වත් තමන්ට ඕනෑ විධියට හසුරවමින්, කැබිනට් මණ්ඩලයත් තමන්ට ඕනෑ විධියට තනි පුද්ගලයකුගේ අභිමතයට හසුරවා ගනිමින් තමයි පසු ගිය කාලයේ දේශපාලනය කළේ; ආණ්ඩු කළේ.

ඒ ආකාරයට මැර බලය, රාජ්‍ය බලය යන සියල්ල යොදවා ජනාධිපතිවරණයට මුහුණ දීලාත්, අවසානයේ දී ඔහුට පරාජය වන්න සිදු වුණා. නියමිත කාලයට අවුරුදු දෙකකට කලින් ගෙදර යන්න සිදු වුණා. ඔහුට ගෙදර යන්න සිදු වුණාට පසුව අලුත් තත්ත්වයක් ඇති වුණා. ඒ අලුත් තත්ත්වය තුළ ඇති වූ සිදුවීම් පිළිබඳව අද අපි මේ පාර්ලිමේන්තුවේ දී කථා කරනවා. මැතිවරණයකින් පසුව ප්‍රතිවාදීන්ට, විරුද්ධ පාර්ශ්වයේ අයට පහර දෙන එක, ඒ අයගෙන් පළි ගන්න එක වැරැදි දෙයක් බව ඉතා පැහැදිලියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මැතිවරණයෙන් පසුව අලුත් සම්ප්‍රදායක් ඇති වෙලා තිබෙනවා. දැන් විරුද්ධ පක්ෂයේ ඉන්න සමහර අයට, ඒ කියන්නේ කලින් පැවැති ආණ්ඩුවේ අමාත්‍ය ධුර දරපු අයට වරදාන, වරප්‍රසාද විධියට වාහන දෙක ගණනේ දෙනවා. එක පැත්තකින් ගහනවා කියලා කෑ ගහනවා. අනෙක් පැත්තෙන් වාහන දෙකක් දෙනවා, ඒ ගැන නම් සද්දයක්වත් නැහැ. ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා පාර්ලිමේන්තුවේ සිටින විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ සහයෝගය ලබා ගන්න නම් එතුමන්ලාට යම් යම් වරප්‍රසාද ටිකක් දෙන්න වෙනවා කියලා ජනාධිපතිතුමා කියනවා මා අහගෙන සිටියා. ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් වරප්‍රසාද ලබාගෙන සහයෝගය දෙන්න ඕනෑ නැහැ නේ. මේ වැරදි, ඒකාධිපති, ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රමය අහෝසි කරන්න නේ අපට ඕනෑ වෙලා තිබෙන්නේ. තමන්ට ලැබෙන වාහන දෙකයි, ඒකට ලැබෙන ඉන්ධන ටිකයි සඳහා ඡන්දය පාවිච්චි කරන සංස්කෘතියක් නම් ඕනෑ නැහැ. ඒ නිසා මැතිවරණයෙන් පසුව විරුද්ධ පාර්ශ්වයේ අයට පහර දෙන එකත් වැරැදියි; මැතිවරණයෙන් පසුව විරුද්ධ පාර්ශ්වයේ අයගේ සහාය ලබා ගන්න වාහන දෙක බැගින් දෙන එකත් වැරදියි. එහෙම තුටු පඩුරු දීලා, ඔවුන්ව සන්තෝෂ කරලා සහයෝගය ලබා ගන්න එකත් වැරදියි. මේ දෙකම වැරදියි.

පළිගන්න පහර දෙන එක, සේවකයන් මාරු කරන එක, සේවා ස්ථානවලට එන්න නොදෙන එක, නිවාසවලට අලාභහානි කරන එක වැරැදියි. ඒ වාගේම, මන්ත්‍රීවරුන්ට සහ හිටපු ඇමතිවරුන්ට වාහන දෙක බැගින් දෙන්න චක්‍රලේඛ නිකුත් කරන එකත් වැරැදියි. මොකද, මැතිවරණයෙන් පස්සේ දේශපාලනය තමන්ට ඕනෑ විධියට නම්මා ගැනීම සඳහා පාවිච්චි කරන උපක්‍රමයක් මේ දෙකේම තිබෙන්නේ. ඒ නිසා මේ දෙකම ගැන අපි කථා කළ යුතුව තිබෙනවා.

[ගරු විජිත හේරත් මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ මැතිවරණයේදී කවදාවත් නැති විධියට රාජ්‍ය සේවය අවභාවිතාවේ යෙදෙව්වා. සාමාන්‍යයෙන් අපි දන්නවා, ආයතන සංග්‍රහයේ ඉතා පැහැදිලිව තිබෙනවා, මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරින්ට දේශපාලන කටයුතුවලට සෘජුව මැදිහත් වෙන්න බැහැ, දේශපාලන රැස්වීම් ආමන්ත්‍රණය කරන්න බැහැ, දේශපාලනයට සෘජුව සම්බන්ධ වෙන කිසිදු වැඩ කටයුත්තකට සහභාගි වෙන්න බැහැ කියලා. ලංකා ඉතිහාසයේ පළමු වතාවට මේ නීතිය කැඩුවේ කවුද? මහින්ද රාජපක්ෂගේ මල්ලි. නීතිය පැත්තකට දමලා හමුදාවේ බලය තමන්ගේ පෞද්ගලික අභිමතය විධියට පාවිච්චි කළේ ගෝඨාභය රාජපක්ෂ, හිටපු ආරක්ෂක ලේකම්වරයා. අමු අමුවේ නීති උල්ලංඝනය කරමින් උදය ගම්මන්පිලගේ මැතිවරණ වේදිකාවට නැග්ගා. ඊට පස්සේ බේරුවල නගරාධිපතිගේ මැතිවරණ වේදිකාවට නැග්ගා. කොට්ටාවට ඇවිල්ලා මැතිවරණ වේදිකාවල නැඟලා කථා පැවැත්වුවා. ඊට පස්සේ සෑම තැනකම ගිහින් දේශපාලන රැස්වීම් ආමන්ත්‍රණය කළා. රාජ්‍ය සේවයට අනුයුක්ත අමාත්‍යාංශ ලේකම්වරයෙක් විධියට ආයතන සංග්‍රහයේ නීතිය අමු අමුවේ කැඩුවා. මැතිවරණ කොමසාරිස්වරයාට කරන්න පුළුවන් වුණේ මොකක්ද? වහාම ඒක නතර කරන්න කියලා මැතිවරණ කොමසාරිස්තුමා ජනාධිපති ලේකම්ට ලිපියක් දැම්මා. කාටද මේ ලිපි එවන්නේ? ලලිත් වීරතුංග මහත්මයාට. ලලිත් වීරතුංග මහත්මයාට ලිපියක් යවලා ගෝඨාභය නවත්වන්න පුළුවන්ද? නැවැත්වුවේ නැහැ. එදා රාජ්‍ය සේවයට ඒ වැරැදි පූර්වාදර්ශය දුන්නේ ගෝඨාභය රාජපක්ෂ. ඔහු ආයතන සංග්‍රහය ගැන දන්නේ නැහැ නේ. හමුදාවේ හිටිය නිලධාරියෙක් රාජ්‍ය පරිපාලනය ගැන දන්නවා ද? ආයතන සංග්‍රහය, රාජ්‍ය පරිපාලනය පිළිබඳව අබමල් රේණුවක් තරම් නොදන්නා ගෝඨාභය රාජපක්ෂ, සමස්ත රාජ්‍ය සේවයටම වැරැදි පූර්වාදර්ශයක් දුන්නා; රාජ්‍ය සේවකයන්ට, මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරින්ට දේශපාලනය කරන්න බැහැ කියන නීතිය කැඩුවා. එතැනින් නැවතුණේ නැහැ. එහෙම කරන ගමන් ඔහු අනෙක් රාජ්‍ය සේවකයන්ට දේශපාලන බලපෑම් මත තමන්ගේ මැතිවරණ කටයුතුවලට උදව් කරන්න, උපකාර කරන්න කියලා බල කළා. ඒ නිසා ලංකාවේ සෑම තැනම රාජ්‍ය සේවකයන් පිරිසක් කැමැත්තෙන් හෝ අකමැත්තෙන්, බයට හෝ වෙනත් මොන යම් හේතුවක් නිසා දේශපාලන කටයුතුවලට සම්බන්ධ වුණා.

මැතිවරණ ව්‍යාපාරය සඳහා -canvassing සඳහා- සමහර ආයතනවලින් බස් පිටින් සේවකයෝ අරගෙන ගියා. වාහනවලින් අරගෙන ගියා. ඒ අයට රාජකාරි නිවාඩු ලබා දීලා, රාජකාරි නිවාඩු විධියට පොත්වල සටහන් කරලා ඔවුන්ව විවිධ ප්‍රදේශවල මැතිවරණ කටයුතුවල යෙදෙව්වා. මහින්ද රාජපක්ෂ පාලනය තමයි මේ වැරදි සංස්කෘතිය පටන් ගත්තේ. පසු ගිය පාලන ඉතිහාසයේ කවදාවත් නැති ආකාරයට රාජ්‍ය සේවකයන් සෘජුවම දේශපාලන කටයුතුවලට මැදිහත් කළා. ඒ වැරදි සංස්කෘතිය අපි වෙනස් කරන්න ඕනෑ. අපි යහ පාලනය දිසාවට ගමන් කරනවා නම් මේ රටට පෙන්වපු ඒ වැරදි ආදර්ශයන් නතර කරන්න අලුත් ආරම්භයක් ලබා දිය යුතු වෙනවා.

ඒ විතරක් නොවෙයි. නීතිය හා සාමය රකින්න පොලීසිය යම් උත්සාහයක් දැරුවා. අපි ස්තුතිවන්ත වෙනවා, නීතිය හා සාමය රකින්න පොලිස්පතිතුමා තමන්ගේ පැත්තෙන් අපක්ෂපාතීව උපරිම වශයෙන් උත්සාහ කිරීම ගැන. අවම වශයෙන් මැතිවරණය සාධාරණව පවත්වන්න පොලීසිය පැත්තෙන් මැදිහත් වීමක් කරන්න උත්සාහ කළා. මොකක්ද රාජපක්ෂ මහත්මයා කළේ? අපට මතකයි කටුනායක සේවක අරගලය වෙලාවේ, සාධාරණ සටනක් ගෙනිච්ච වෙලාවේ, ඔවුන්ට වෙඩි තියන්න නියෝග කළේ හිටපු පොලිස්පති මහින්ද බාලසූරියයි. ඒ වෙලාවේ රොෂේන් චානක වෙඩි කාලා මැරුණා. අවසානයේ පොලිස්පතිවරයා විශ්‍රාම යන්න මාස දෙකක් තුනක් තිබියදී රාජපක්ෂ ජනාධිපතිවරයා මොකක්ද කළේ? ඒ චෝදනාවෙන් ආණ්ඩුවට ගැලවෙන්න ඕනෑකම තිබුණු නිසා මහින්ද බාලසූරියට කිව්වා, ඒකේ වගකීම භාර ගන්න කියලා. ඔහු ඒ වගකීම භාර ගත්තා. හැබැයි, පොලීසියට අණ දුන්නේ දේශපාලනඥයා. එහෙම නැතුව පොලිස්පතිවරයා නිකම්ම නියෝග දුන්නේ නැහැ. මොකක්ද ඔහුට දීපු දඬුවම? මහින්ද බාලසූරියට දීපු දඬුවම මොකක්ද? ඔහු බ්‍රසීලයේ තානාපති ධුරය සඳහා යැව්වා. ඔහුට උසස්වීමක් දුන්නා. අන්න ලබා දුන් වැරදි ආදර්ශය. ඉතින් පොලිස් නිලධාරින් බැලුවා නීතිය කැඩුවොත්, වෙඩි තිබ්බොත්, වෙඩි තියලා සේවකයෝ මැරුවොත් දඬුවම් නොවෙයි ලැබෙන්නේ, තානාපතිකම් වරප්‍රසාද වරදාන ලැබෙන්නේ කියලා. ඒ වැරදි ආදර්ශය නිසා නීතිය රකිනවා වෙනුවට නීතිය කඩන්න පටන් ගත්තා. සලාකා සූදුපොළ වටලපු පොලිස් නිලධාරින් 24දෙනා එක පැයෙන් මාරු කරලා දැම්මා. ඒ මාරු කිරීම කළේ ලක්ෂ්මන් හුළුගල්ල කියන දේශපාලන හෙන්චයියාගේ පෞද්ගලික වුවමනාවන් මතයි. හුළුගල්ල කියන ජාතික ආරක්ෂක ඒකකයේ හිටපු මාධ්‍ය ප්‍රකාශකගේ පෞද්ගලික වුවමනාවන්, පෞද්ගලික ආශාවන් ඉෂ්ට කරගන්න පොලිස් නිලධාරින්ව මාරු කරන්න සිද්ධ වුණා. පොලීසියට මෙවැනි තත්ත්වයක් ඇති කළේ රාජපක්ෂ පාලනයයි. පොලීසිය තමන්ගේ අතට ගන්න මහින්ද බාලසූරියව එතැනට ගෙනාවා. පොලිස්පතිතුමාට පොලීසියේ මාරුවීම් කරන්න දුන්නේ නැහැ. DIGලා මාරු කළේ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්, මහින්ද බාලසූරිය. පොලිස්පතිතුමා ඒකට අත්සන් කළේත් නැහැ. ඒකට අත්සන් කළේ SSP කෙනෙක්. DIG මාරු කරන ලිපියට SSP මහත්තුරු අත්සන් කරන තත්ත්වයට පත් වුණා. මහින්ද බාලසූරිය තමන්ගේ දේශපාලන වුවමනාවන් වෙනුවෙන් යොදා ගැනීම නිසා පොලීසිය මෙවැනි තත්ත්වයකට පත් වුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි. ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට හමුදාව දේශපාලන කටයුතු සඳහා යෙදෙව්වා. හමුදාවේ හැමෝම නොවෙයි, යම් යම් නිලධාරින් පසු ගිය ජනාධිපතිවරණය වෙලාවේ රාජපක්ෂ මහත්මයාගේ වුවමනාවන් වෙනුවෙන් පත්‍රිකා බෙදනවා අපි දැක්කා. සිවිල් ඇඳුමෙන් ඇවිල්ලා සමහර තැන්වල පත්‍රිකා බෙදුවා. අපි දන්නා හමුදා නිලධාරින් රාජකාරි තත්ත්වයන් යටතේ එහෙම කළා. ඉතිහාසයේ කවදාවත් හමුදාව මෙවැනි තත්ත්වයකට පත් කළේ නැහැ. මේ වැරදි ආදර්ශය දුන්නෙත් පසු ගිය ජනාධිපතිවරණය වෙලාවෙයි. ඒවා වැළැක්වීමට මැතිවරණ කොමසාරිස්තුමාට බලයක් තිබුණේ නැහැ. එතුමා යම් උත්සාහයක් දැරුවා තමයි. හැබැයි, මැතිවරණය පුරාවටම රාජ්‍ය බලය, රාජ්‍ය මාධ්‍ය තමන්ගේ වුවමනාවන් වෙනුවෙන් පාවිච්චි කරද්දී දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක වුණේ නැති නිසා ඒවා නවත්වන්න මැතිවරණ කොමසාරිස්වරයාට බලයක් තිබුණේ නැහැ. එතුමා ලියුම් ලියනවා, දැනුම් දෙනවා, නමුත් වැඩක් වුණේ නැහැ. එවැනි මැතිවරණයක් තමයි අපි පසු ගිය කාලයේ අත් දැක්කේ. නැඟෙනහිර ප්‍රදේශයේ, විශේෂයෙන්ම උතුරු ප්‍රදේශයේ හමුදා බුද්ධි අංශය දේශපාලන පක්ෂවලට දේශපාලන කටයුතු කරන්න ඉඩ දුන්නේ නැහැ. අපේ පෞද්ගලික අත් දැකීම් තිබෙනවා. ඕනෑ නම් සිද්ධි ගැන කියන්න පුළුවන්. රැස්වීමක් තියන්න යන හැම තැනකටම බුද්ධි අංශය පිටු පසින් ඇවිල්ලා රැස්වීම සූදානම් කරන ගෙවල්වල සාමාජිකයන් බිය වද්දමින් ඇති කරපු භීෂණය අපට හොඳට මතකයි.

දෙමළ ජනතාවට සිවිල් පරිපාලනය ලබා දෙන්න රාජපක්ෂ, ගෝඨාභය රාජපක්ෂ පාලනය සමත් වුණේ නැහැ. මැතිවරණය විතරක් නොවෙයි, සාමාන්‍ය තත්ත්වයක් යටතේවත් එවැනි තත්ත්වයක් තිබුණේ නැහැ. එවැනි වැරැදි සංස්කෘතියක් ඇති කර, මේ සියලු පව් වහ ගන්න; හෝදා ගන්න මාධ්‍ය පාවිච්චි කළා. ඒ කරපු වැරැදි ඔක්කොම වහලා, ජාතික රූපවාහිනිය, ස්වාධීන රූපවාහිනිය, අර කුණු හඩසන් සමරසිංහගේ ගුවන් විදුලිය එදා

මුළුමනින්ම පාවිච්චි කළේ වැරැදි, අසත්‍ය ප්‍රචාරය කරන්න විතරක් නොවෙයි, වැරැදි මතත් ඉදිරිපත් කළා. ඒ වැරැදි මත ඉදිරිපත් කරලා, රාජපක්ෂ පාලනයට විරුද්ධව අදහස් දක්වන හැමෝටම විරුද්ධව ඉතාම තුච්ඡ, නින්දිත විධියට මඩ ප්‍රචාර දියත් කළේ එදා ඒ රාජ්‍ය මාධ්‍ය තුළිනුයි. ඒ සංස්කෘතිය තමයි අප දැන් වෙනස් කරන්නේ. හැබැයි, ඒක ලෙහෙසි නැහැ. මේ පුරුද්දේ බලය විසින් ආපු ගොඩක් දේවල් දැන් ඉතුරු වෙලා තිබෙනවා. දින 100න් මේ සියල්ල වෙනස් කරන්න පුළුවන් කියා අප හිතන්නේ නැහැ. හැබැයි, ඒ අභියෝගය ආණ්ඩුව දැන් භාරගත යුතුයි. ඒ අභියෝගය භාර ගන්න පුළුවන් වන්නේ අර මතුගම සිද්ධිය වාගේ පහර දීලා හෝ, වත්තල සිදුවීම වාගේ පහර දීලා හෝ නොවෙයි.

වත්තල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට පහර දීපු එක වැරැදියි. හැබැයි, ඒ සභාපතිවරයාත් ඉස්සර ඔහොම තමයි. මම ඒකත් මතක් කරන්න ඕනෑ. එදා වත්තල ප්‍රාදේශීය සභාවේ අය වැය ඡන්දය වෙලාවේ සභාපතිවරයා පරදින්නයි ගියේ. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මන්ත්‍රීවරු තුන්දෙනෙක් ඔහුට විරුද්ධව ඡන්දය දෙන්න සූදානමින් හිටියා. විපක්ෂයේ මන්ත්‍රීවරු ඔහුට විරුද්ධව ඡන්දය දෙන්න හිටියා. ප්‍රාදේශීය සභාවට යන්න දුන්නේ නැහැ, මන්ත්‍රීවරුන්ට මැරයෝ දමලා ගැහුවා. ඒ සභාපති තමයි ඔය ගුටි කෑවේ. අර පාක්ෂිකයෝ -ගුටි කෑමට ලක් වුණු අය- ඒවා මතක තියාගෙන ඉඳලා තමයි ඔය දේ කළේ. ඒක හරිය කියා අප කියන්නේ නැහැ. ඒක වැරැදියි; ඒ පළිගැනීම වැරැදියි. හැබැයි, පළිගන්නා තැනට ඔවුන්ව පත් කළේ ඔය ත්‍යාගරත්න අල්විස් -ඒ ඉන්න සභාපතිම- තමයි. ඔහු වත්තල ඇති කළ භීෂණය, වත්තල ප්‍රදේශයේ විරුද්ධ පාක්ෂිකයන්ට පන්න, පන්නා ගහපු හැටි අවුරුදු 7ක්, 8ක් තිස්සේ අත් දැක්කා. ඒ වැරැදි තත්ත්වයන් යටතේ තමයි ඔහුටම ඒකේ ප්‍රතිඵලවලට ලක් වෙන්න සිද්ධ වුණේ. වත්තල සභාපතිට පහර දීම වැරැදියි. එය බරපතළ වැරැද්දක් විධියට අප දකිනවා. හැබැයි, ඔහු විසින් එදා ඇති කරපු ඒ භීෂණය සහ මන්ත්‍රීවරුන්ට ගහපු එක ගැනත් අප මතක් කරන්න ඕනෑ. මොකද, ඒකත් වැරැදියි. ඒ තත්ත්වයන් තුළ තමයි, මෙවැනි ප්‍රතිචාරවලට ඔහුටම මුහුණ දෙන්න සිද්ධ වුණේ. ඒ නිසා මේක නතර කරන්න ඕනෑ එක තැනකින් නොවෙයි. මේ දිගුවම; මේ ක්‍රියාදාමයම නතර කළ යුතුව තිබෙනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ජනාධිපතිවරණය පුරාවටම ආණ්ඩුව කරපු ප්‍රධාන දෙය තමයි, රැස්වීමක් පවත්වන්න ස්ථාන නොදී හිටපු එක. මහින්ද රාජපක්ෂ මහත්මයාට විරුද්ධව අදහස් දක්වන්න, රැස්වීම් පවත්වන්න නගර සභා, ප්‍රාදේශීය සභා කිසිවකින් විපක්ෂයට ඉඩක් දුන්නේ නැහැ. රැස්වීම් පවත්වන්න ස්ථානයක් දෙන්න කියා එදා ගම්පහ නගර සභාවෙන්, මහනුවර නගර සභාවෙන්, කැලණිය ප්‍රාදේශීය සභාවෙන් අප ඉල්ලීම් කළා. නමුත්, දුන්නේ නැහැ. ඒ ගැන මානව හිමිකම් කොමිසමට පැමිණිලි කළා. අද උදේ දහයහමාරට මානව හිමිකම් කොමිසමෙන් කැලණිය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා කැඳෙව්වා. ගම්පහ නාගරික කොමසාරිස්වරයා කැඳෙව්වා. ඔවුන් කැඳවලා ඇහුවා, "ඇයි, ඉඩ නොදුන්නේ?" කියා. අද ඔවුන්ට දෙන්න උත්තර නැහැ. අද ඔවුන්ව බේරා ගන්න බැසිල් රාජපක්ෂ නැහැ. අද ඔහු ඇමෙරිකාවේ ලොස් ඇන්ජලීස් නුවරට පැනලා ගිහිල්ලා. බැසිල් රාජපක්ෂගේ telephone callsවලට භය වුණු නාගරික කොමසාරිස්ලා, වත්තල ප්‍රාදේශීය සභාවේ සභාපතිලා එදා රැස්වීමක් පවත්වන්න ඉඩ දුන්නේ නැහැ. අද ඔවුන් මානව හිමිකම් කොමිසමට ඇවිත් උත්තර දීගන්න බැරිව හිටියා. කැලණිය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා අඩුම ගණනේ මානව හිමිකම් කොමිසමට වෙලාවට එන්නවත් සමත් වුණේ නැහැ. ඔහුව ඇතුළට ගත්තෙත් නැහැ, එළියට දමලායි තිබුණේ. වෙලාවට එන්න බැරි නම් ඒ වැරැද්දට ශ්‍රේෂ්ඨාධිකරණයට ගෙනියනවා කිව්වා. එදා රැස්වීමක් පවත්වන්න ඉඩ නොදී එවැනි තත්ත්වයක් ඇති කරපු එකට වග කියන්න ඕනෑ. මේ රාජපක්ෂ පාලනය ඇති කරපු වැරදි සංස්කෘතියයි. ඒ නිසා අප කියන්නේ ඒ ඇති කරපු භීෂණය නතර කරන්න ඕනෑය කියායි.

ජනාධිපති ලේකම් කාර්යාලයේ නැති වුණු වාහන දැන් තැන් තැන්වලින් හොයා ගන්නවා. ඒ වාහන එක එක තැන්වල තිබෙනවා. මාතලේ තිබෙනවා; ගාල්ලේ තිබෙනවා; පිටකෝට්ටේ තිබෙනවා. කවුද මේකට වග කියන්න ඕනෑ? මේකට වග කියන්න ඕනෑ, ජනාධිපති අතිරේක ලේකම් ගාමිණී සෙනරත්. කැබිනට් පත්‍රිකාවකින් ගාමිණී සෙනරත් අතිරේක ලේකම්වරයාට ලේකම්වරයකු හා සමාන බලතල අරගෙන තිබෙනවා. කොයි නීතියේද එහෙම තිබෙන්නේ? ලේකම්වරයාට හා සමාන බලයක් කැබිනට් මණ්ඩලයෙන් ගන්න පුළුවන් වන්නේ කොයි අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයාටද? ගාමිණී සෙනරත් පළමුවෙනි වතාවට එහෙම බලයක් අරගෙන තිබෙනවා. එහෙම තනි පුද්ගලයෙකුට බලය දීලා මේ ඇති කරපු වැරැදි සංස්කෘතිය අප නතර කරන්න ඕනෑ. ඒ සංස්කෘතිය නතර කළොත් විතරයි පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නතර කරන්න පුළුවන් වන්නේ. අන්න ඒ සඳහා අප ඒ ඉතිහාසයේ පාඩම් ඉගෙන ගෙන අද මේ පවතින මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නතර කර, ඊළඟ මැතිවරණයෙන් පසුවවත් මෙවැනි තත්ත්වයක් ඇති වීම වළක්වා ගන්න පියවර ගනිමු කියන කාරණය මතක් කරමින්, මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 3.16]

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා
(மாண்புமிகு எரிக் பிரசன்ன வீரவர்தன)
(The Hon. Eric Prasanna Weerawardhana)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනවාරි 08වන දා පැවති ජනාධිපතිවරණයෙන් පසුව ප්‍රථම වතාවටයි මා අද දින කථා කරන්නේ. එම නිසා ප්‍රථමයෙන්ම යම් පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි. පසු ගිය වසර 10ක කාලය තුළ මේ රටේ ජනතාවට ලොකු ප්‍රශ්නයක් වෙලා තිබුණු යුද්ධය අවසන් කරලා, සාමයේ නිදහස ලබා දීලා, විශේෂයෙන්ම ග්‍රාමීය වශයෙනුත්, නාගරික වශයෙනුත් දැවැන්ත සංවර්ධනයක් ඇති කර මේ රටට විශාල සේවයක් කළ හිටපු ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාට මාගේ ගෞරවය මේ අවස්ථාවේදී පිරිනමන්න කැමැතියි. පසු ගිය කාලයේ අපි එතුමා වෙනුවෙනුයි වැඩ කළේ. අපේ ඉල්ලීම පරිදි බුලත් කොළයට ඡන්දය දුන්නු ඒ සියලුම ජනතාවට අපේ උපහාරය මේ අවස්ථාවේදී පිරිනමන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කාලයක් තිස්සේ අපි හැමදෙනාම කථා කරමින් සිටි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන, මැතිවරණ ක්‍රමයේ සංශෝධන ඇතුළු ජනතාව බලාපොරොත්තු වුණු ඒ වෙනස ඇති කරන්න අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට බලය ලබා දීලා තිබෙනවා. ඒ කටයුතු කිරීම සඳහා එතුමාට ශක්තිය, ධෛර්යය ලැබේවා!යි කියා ප්‍රාර්ථනා කරමින්, නව ජනාධිපතිතුමාට ශුභ පතන්න මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ අතීතයේ සිටි ජනාධිපතිවරුන් ගැන, එතුමන්ලාගේ ක්‍රියා කලාප ගැන, එතුමන්ලා කරපු හොඳ වැඩ, නරක වැඩ යනාදී හැම දෙයක් ගැනම අපි සියලුදෙනාම දන්නවා. උදාහරණයක් විධියට ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමාගේ කාලයේ 40,000කට අධික රාජ්‍ය සේවකයන් එළියට ඇදලා දැම්මා; 1983 ජූලි කලබලය ඇති කළා; දෙමළ ජනතාව ඉතාමත් අපහසුතාවට පත් කරලා, ඔවුන් දහස් ගණන් ඝාතනය කරලා මේ රටේ යුද්ධයක් ඇති කළා.

[ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා]

ජනතාව ඉල්ලුවේ නැති, විසඳුමක් නොවන විසඳුමක් ලෙස පළාත් සභා ක්‍රමයක් ගෙනවා. ඒ වාගේම 1987, 1988, 1989 කාලයේ මේ රටේ දහස් ගණන් තරුණ තරුණියන් ඝාතනය කළා. ඒ ජේ.ආර්.ජයවර්ධන ජනාධිපතිතුමාගේ යුගය. ඒත් ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා ඉතාමත් ගෞරවාන්විතව අවසාන කාලයේ සිටියා. එතුමාගේ නිවස check කළේ නැහැ. එතුමා ගැන කවුරුවත් කථා කළේ නැහැ. එතුමාට ඒ ගෞරවය හිමි වුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වෛරී මැතිවරණයක් තමයි මෙවර තිබුණේ. ඉදිරියට මේ වෛරී දේශපාලනයෙන් මිදිලා, උඩ බලා ගෙන මුහුණට කෙළ ගහන්නේ නැතුව හිටපු ජනාධිපතිතුමාට අවශ්‍ය ගෞරවය ලබා දීලා, මේ රටේ ඉදිරියට වෙන්න ඕනෑ වෙනස කිරීමට අපි කටයුතු කරමුයි කියා සියලුදෙනාගෙන්ම මේ මොහොතේ ඉල්ලා සිටිනවා. ඒ විතරක් නොවෙයි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විධියට 2010දී අපට ඡන්දය ලබා දුන් ජනතාවගේ බලාපොරොත්තු වෙනුවෙන් අපි කටයුතු කරනවා. ඒ වාගේම පසු ගිය මැතිවරණයේදී අපි මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාටයි වැඩ කළේ. ඒ 58,00,000ක ජනතාවගේ අභිලාෂයන් වෙනුවෙන් අපි මේ පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ සිටිමින් කටයුතු කරනවාය කියන කාරණය මේ අවස්ථාවේදී පැහැදිලිවම ප්‍රකාශ කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වර්තමාන ජනාධිපතිතුමා අපේ පක්ෂයේ නායකයා -සභාපතිවරයා- විධියට පත් වෙලා තිබෙනවා. එතුමා ඉල්ලීමක් කර තිබෙනවා, මේ ප්‍රතිසංස්කරණ සඳහා, දින 100 ඉදිරි කටයුතු සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙන්නය කියා. ඒ අනුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරයකු විධියට ඉදිරියේදී ඒ කටයුතු සුදුසු පරිදි කරන්න අපේ සහයෝගය ලබා දෙනවාය කියන කාරණයත් මා මේ අවස්ථාවේදී කියන්න ඕනෑ. ඒ වාගේම අය වැය සම්බන්ධයෙන් අපට බොහෝ විවේචන තිබෙනවා. නමුත් අලුත් වෙනසක් කරන මේ මොහොතේ ඒ සඳහා සහයෝගය ලබා දෙනවා. අපි අය වැයට අකැමැති වුණත් විවේචන මධ්‍යයේ තමයි අපි ඒ සහයෝගය ලබා දුන්නේ කියන කාරණයත් මේ අවස්ථාවේදී පැහැදිලිවම කියන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. නිල් බලකායේ මාධ්‍ය ප්‍රකාශකවරයා විධියට මා මේ කාරණය සම්බන්ධයෙන් උත්තරයක් දෙන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් අද නොයෙකුත් අර්ථ දැක්වීම් කරන්න සමහරු සූදානම් වනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තරුණ සංවිධානය හදන්න කියා මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ සභාපතිත්වයෙන් හා එවකට පක්ෂයේ ලේකම්තුමා, වර්තමාන ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ සහභාගිත්වයෙන් මධ්‍යම කාරක සභාව තීරණයක් ගෙන තිබුණා. නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා ප්‍රමුඛව පාර්ලිමේන්තුවේ හා පළාත් සභාවල සිටින තරුණ මන්ත්‍රීවරුන්ගෙන් වැඩි සංඛ්‍යාවක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තරුණ මන්ත්‍රීවරුන් විසි අටදෙනෙක් ඉන්නවා. ඒ විසි අටදෙනාට භාර කළා, ගම්වලට ගිහින් තරුණ සංවිධාන ප්‍රතිසංවිධානය කරන්නය කියා. ඒ අනුව ඒ කමිටුවේ ඒ සාකච්ඡාවේදී, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තරුණ සංවිධානය ප්‍රතිසංවිධානය කරන වැඩ පිළිවෙළේදී ඒ ප්‍රතිසංවිධාන වැඩ පිළිවෙළට තාවකාලිකව දමාපු නම තමයි නිල් බලකාය කියන්නේ. අප සියලුදෙනාගේම ඒකමතික අනුමැතියෙන් තමයි ඒ නම යෝජනා කළේ. ඒ අනුව පසු ගිය කාලයේ ගමක් ගමක් ගානේ ගිහින්, ආසනයක් ආසනයක් ගානේ ගිහින්, තරුණයන්ට අලුත් දැක්මක් ලබා දෙමින්, දේශපාලනය කථා කරන්න තරුණයන්ට අවස්ථාවක් ලබා දෙමින්, ඒ වාගේම න්‍යායාත්මක දේශපාලන අවබෝධයක් තරුණයන්ට ලබා දෙමින් පැහැදිලි වැඩ පිළිවෙළක් අපි ගම් තුළ ක්‍රියාත්මක කළාය කියන කාරණය මේ අවස්ථාවේදී කියන්න ඕනෑ.

ඒ කාලය තුළ අපි දැනුවත්ව, සංවිධානාත්මකව පසු ගිය මැතිවරණය සම්බන්ධයෙන් කිසිදු කටයුත්තක් සිදු වෙලා නැහැ. හුදකලාව යම් යම් සිදුවීම් තිබෙන්න පුළුවන්. ඒවා නිල් බලකායේ ක්‍රියාවන් විධියට දාලා කරන චෝදනා අපි මේ වෙලාවේදී ප්‍රතික්ෂේප කරනවා; හෙළා දකිනවා කියන කාරණය කියන්නට ඕනෑ.

සජිත් ප්‍රේමදාස ඇමතිතුමා කියනවා මේක, "බලු බලකාය" ලු. මේ රටේ තරුණයන්ටයි ඔබතුමා මෙහෙම කියන්නේ. මේ රටේ විශාලතම තරුණ සංවිධානය තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂ තරුණ සංවිධානය. ඒ සංවිධානයට තමයි ඔබතුමා මෙහෙම කියන්නේ. එතුමාගේ තාත්තා -රණසිංහ ප්‍රේමදාස මහත්මයා- මේ රටේ ජනාධිපති වෙලා ඉන්න කාලයේ අපේ ගම්වල අහිංසක කොල්ලෝ කෙල්ලෝ දහස් ගණන් මරණ විට ඔබතුමා තරුණයෙක් විධියට මොකක්ද කළේ කියලා අපි අහනවා. ඔබතුමාගේ තාත්තා හම්බ වෙලා කිව්වාද, "තාත්තේ, මේ මගේ වයසේම කොල්ලෝ කෙල්ලෝ නේද මරන්නේ, මේවා නතර කරන්න" කියලා. ඔබතුමා එහෙම කිව්වාද කියලා මම අහනවා. අද එතුමා අපට "බලු බලකාය" කියලා කියනවා. ඒ නිසා පරිස්සමින් කථා කරන්න කියලා අපි එතුමාට කියනවා. ඔබතුමන්ලා shortcutවලින් බලයට ආවේ. රනිල් වික්‍රමසිංහ මහත්මයා අගමැතිවරයා විධියට එක පාරටම නිදහස් චතුරශ්‍රයේදී දිවුරුම් දෙන විට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් විධියට අපි පුදුම වුණා. මොකක්ද ඒ ප්‍රජාතන්ත්‍රවාදය?

මිත්‍රවරුනි, ගරු මන්ත්‍රීවරුනි, මේ නිල් බලකාය පිළිබඳව කථා කරන සජිත් ප්‍රේමදාස ඇමතිවරයාට කියන්න ඕනෑ shortcutවලින් බලයට ආවාට, ඔව්වර ඉදිමිලා කෑ ගහන්න එපා කියලා. අපි තරුණ සංවිධානයක් විධියට ඉදිරියටත් ශක්තිමත්ව කටයුතු කරනවා කියන කාරණය-

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
දැන් අවසන් කරන්න ගරු මන්ත්‍රීතුමා.

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා
(மாண்புமிகு எரிக் பிரசன்ன வீரவர்தன)
(The Hon. Eric Prasanna Weerawardhana)
මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ITN එකේ කාලීන සිදුවීම් අංශයේ සහකාර කළමනාකාර සංජීව එදිරිමාන්න මහත්මයා පළිගැනීමක් විධියට අනිවාර්ය නිවාඩු යවලා තිබෙනවා. කරුණාකරලා ඒක නිවැරදි කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම පේරාදෙනිය විශ්වවිද්‍යාලයට අයිති ඉඩමක්, -අපේ කිරිඇල්ල ඇමතිතුමාට, සභානායකතුමාට මම මේ කාරණය ඉදිරිපත් කරන්නේ. ඔබතුමාගේ නම තමයි මේකට ගෑවිලා තිබෙන්නේ.- බෙදන්න යනවා කියලා ජනාධිපතිතුමාට ලියුමක් ඉදිරිපත් කරලා තිබෙනවා. "විශ්වවිද්‍යාලයට අයත් ඉඩමක් ජනතාව අතර බෙදාදීම සම්බන්ධවයි" යන ශීර්ෂය සහිතව අතිගරු ජනාධිපතිතුමා, ජනාධිපති ලේකම් කාර්යාලය, කොළඹ යන ලිපිනයට මහාචාර්ය අතුල සේනාරත්න, උපකුලපති විසින් යොමු කරන ලද ලිපියක් මම **සභාගත*** කරනවා.

ඒ වාගේම සමෘද්ධි නිලධාරින් මාරු කරලා තිබෙනවා. ඒ වාගේම අපේ ප්‍රදේශවල තිබුණු ව්‍යාපෘති පළි ගැනීමක් විධියට

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

නතර කරන්නට කටයුතු කරලා තිබෙනවා. එක ඉස්කෝලයක තට්ටු දෙකේ building එකක් භාගයට හදාගෙන යමින් තිබියදී නතර කරලා තිබෙනවා. මේ වාගේ ව්‍යාපෘති නතර කරන්න එපා. මේවා ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක කරන්නේ. මේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න කියා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 3.24]

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය මැතිවරණයේ පශ්චාත් ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳව සාකච්ඡා කරන මේ මොහොතේ අදහස් කිහිපයක් දැක්වීමට මම කැමැතියි. අනුරාධපුර දිස්ත්‍රික්කයේ හොරොව්පතාන වාගේ ඇත පිටිසර ප්‍රදේශයක් නියෝජනය කරන මහජන නියෝජිතයෙකු වශයෙන් මම බලාපොරොත්තු වුණා රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා ප්‍රමුඛ මේ රජය අලුත් සංස්කෘතියක් ගෙන ඒම සඳහා මැතිවරණ ප්‍රචණ්ඩත්වය කියන එක නැති කරයි කියලා. අපි දැක්කා, එක්සත් ජාතික පාක්ෂිකයින් 2001 දී මැතිවරණය ජයග්‍රහණය කරලා හැසිරුණු ආකාරය.

අපි භය නැතිව ප්‍රකාශ කරනවා, හොරොව්පතාන ආසනයේ ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ මැතිවරණ ව්‍යාපාරය සිදු වන විට අපිට දෙන්න පුළුවන් සහයෝගය අපි එතුමාට ලබා දුන්නා කියා. රැස්වීම් තියන්න අවශ්‍ය තැන්වල රැස්වීම් පැවැත්වීම ගැන අපිත් සමඟ සාකච්ඡා කළ විට, රජය නියෝජනය කරන ආසන සංවිධායකවරුන් වශයෙන් අපි ඒ හැම තැනකම පහසුකම් සලසා දුන්නා, ප්‍රජාතන්ත්‍රවාදීව මැතිවරණ ව්‍යාපාරය කරගෙන යන්න ඉඩ දෙන්න කියලා. හැබැයි, ඒ මැතිවරණයට ඉස්සෙල්ලා එක්සත් ජාතික පක්ෂයෙන් තමයි අපේ කාර්යාල කැඩුවේ. එක පාරක් දෙපාරක් නොවෙයි සමහර කාර්යාල තුන් හතර පාර කැඩුවා. ඒ වාගේම මැතිවරණය අවසන් වෙලා, ජයග්‍රහණයෙන් පසුව අතිගරු ජනාධිපතිතුමා දිවුරුම් දීලා ඒ මොහොතේම අපේ හිටපු විපක්ෂ නායක ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැතිවරයා වශයෙන් දිවුරුම් දුන්නාට පසුව ඒ ප්‍රදේශය පුරා දැඩි ලෙස ප්‍රචණ්ඩකාරිත්වය පැතිරුණා.

ඕනෑම පුද්ගලයකුට ආරක්ෂාව තිබෙන තැන තමන්ගේ ගෙදරයි. ඒ ගෙදරට යම් කිසි කරදරයක් වුණොත් ඒ පුද්ගලයාගේ ආරක්ෂාව නැති වෙනවා. ඕනෑම පුද්ගලයෙක් ප්‍රචණ්ඩත්වය මුදා හැරීම සඳහා ගෙදරකට යන්න භයයි. මොකද, නීතියෙන් යම් කිසි ආරක්ෂාවක් තිබෙනවා. නමුත් මේ එක්සත් ජාතික පක්ෂයේ ක්‍රියාකාරින් අපේ polling booth නියෝජිතවරියකගේ ගෙදරට ගිහින් දරු තුන්දෙනා ඉදිරිපිට ඒ තැනැත්තියට පහර දුන්නා. ඒ තැනැත්තිය දවස් 5ක් 6ක් ඉස්පිරිතාලයේ නැවතිලා හිටියා.

අද ඒ තැනැත්තියගේ එක කනක් ඇහෙන්නේ නැති මට්ටමට ඇවිල්ලා තිබෙනවා. මේ සිද්ධිය සම්බන්ධයෙන් පොලීසිය නඩුව විසඳීමට අන්තිමට යැවිලේ සමථ මණ්ඩලයටයි. කාන්තාවකට තමන්ගේම ගෙදරට ඇවිල්ලා, දරු තුන්දෙනා ඉදිරිපිටදී පහර දීලා තිබෙනවා. ඒ කාන්තාව සතියක් විතර ඉස්පිරිතාලේ ඉඳලා තිබෙනවා. නමුත් ඒ වනතුරු පහර දුන්න පුද්ගලයෝ අත් අඩංගුවට ගන්නේ නැතුව, ඒ කාන්තාව ඉස්පිරිතාලේ ඉඳලා ගෙදර ආවාට පස්සේ ඒ කාන්තාව පොලීසියට ගෙනැල්ලා සාමදාන කරලා, පොලීසිය ඒ නඩුව විසඳන්න සමථ මණ්ඩලයට යොමු කළා. අපේ පොලීසිය බාර ගරු ඇමතිතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා මේ ගැන සොයා බලන්න කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම හොරොව්පතාන ආසනයේ සංවිධායකවරයා හැටියට පත්වෙලා මේ වනකොට අවුරුද්දකුත් මාස ගණනක් වෙනවා. හැබැයි, මම බය නැතුව කියනවා, කිසිම අවස්ථාවක පොලීසි තුනට නිකමටවත් මම ගිහිල්ලා නැහැ; පොලීසියට ගිහිල්ලා පොලීසියේ නිලධාරින්ට යම් ආකාරයකට බලපෑම් කරලා නැහැ; පොලීසිය අපේ අතේ තියාගන්න උත්සාහ කරලා නැහැ කියා. හැබැයි, මේ ජයග්‍රහණයත් එක්කම, කැබිනට් මණ්ඩලය පත් කළාත් එක්කම ඒ ප්‍රදේශයේ පළාත් සභා මන්ත්‍රීවරයාට ඒ පොලීසි තුනම යටත් වෙන තත්ත්වයක් උදාවෙලා තිබෙනවා. ඔවුන් ඒ ප්‍රදේශයේ නීතිය අතට අරගෙන ක්‍රියා කරන බව මම තමුන්නාන්සේට මේ අවස්ථාවේ මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් යහ පාලනය ගැන කියනවා. යහ පාලනයට අපි කැමැතියි. හැබැයි, යහ පාලනයක් ගැන කියන තමුන්නාන්සේලා අපිට වඩා නම්‍යශීලි වෙන්න ඕනෑ. තමුන්නාන්සේලා අපේ කලිසම අගේට ඇඳගෙන උජාරුවට යන ගමන් කරන්නේ මොකක්ද? තමුන්නාන්සේලා කරන්නේ අපිට පහර දෙන එකයි. තමුන්නාන්සේලා හැම වෙලාවේම කරන්නේ පහර දෙන එකයි. හැබැයි, දැන් අපිට ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ගමේ මට්ටමින් අපේ පාක්ෂිකයෝ කියනවා මෙහෙම ගහනවා නම්, ගම්වල මිනිස්සුන්ට මෙහෙම තර්ජනය කරනවා නම්, මේ එක්සත් ජාතික පක්ෂයත් එක්ක තමුන්නාන්සේලා ගහන හවුල් ආණ්ඩුව මොකක්ද කියලා. එක්සත් ජාතික පක්ෂයේ නායකයෝ කෙරෙහි විශ්වාසයක් තියන්න අපිට පුළුවන්ද? එක්සත් ජාතික පක්ෂයේ කැබිනට් මණ්ඩලය කෙරෙහි විශ්වාසයක් තියන්න අපිට පුළුවන්ද? අපි සමගියෙන් ගියාට, තමුන්නාන්සේලාගේ පීඩනකාරී යහ පාලන ආණ්ඩුවෙන් අපේ පාක්ෂිකයන්ට සෙතක් වෙයි කියලා අපට හිතන්න පුළුවන්ද? අපට එහෙම හිතන්න බැහැ. ඒක නිසා තමුන්නාන්සේලා මේ දින 100 දී යහපාලනය සම්බන්ධව ක්‍රියාවෙන් පෙන්වන්න; නිහතමානිකමෙන් පෙන්වන්න. අපි මේ ආණ්ඩුව සමඟ සමගියෙන් යනවා. නමුත් සමගියෙන් යන්න නම්, ඒක ක්‍රියාවෙන් කරලා ඔප්පු කළොත් තමයි තමුන්නාන්සේලාත් එක්ක අපිට යන්න පුළුවන් වෙන්නේ. තමුන්නාන්සේලාත් එක්ක එකට කතා කරලා, කාලා බීලා, අපි යනවා. හැබැයි, තමුන්නාන්සේලාගේ සංවිධායකයෝ අපේ ගම්වල ඉන්න මිනිස්සුන්ට ගහනවා. ගහලා ඉස්පිරිතාලේ ගියාම, පොලීසි ගියාම, පැමිණිලි විභාගයක් නැහැ. අපේ ගම්වල අය කියනවා ඊළඟ මැතිවරණයට ගමේ මට්ටමින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නැගිටීම නැති කිරීමට -බාල කිරීමට- තමයි දැන් තමුන්නාන්සේලා උත්සාහ ගන්නේ කියලා.

අද මේ ගරු සභාවේදී රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිතුමා කථා කරන විට කිව්වා වැඩිය කථා කළොත්-

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාගේ කථාව අවසාන කරන්න.

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට විනාඩියක කාලයක් ලබා දෙන්න. තමුන්නාන්සේලා ආණ්ඩුව පිහිටෙව්වේ අපේ පක්ෂයේ ලේකම්වරයා පලිහක් වශයෙන් ඉස්සරහට තියාගෙනයි. ඒ වාගේම අද තමුන්නාන්සේලා උත්සාහ කරන්නේ අපේ පක්ෂයේ සභාපතිවරයා -වර්තමාන ජනාධිපතිවරයා- ඉස්සරහට තියාගෙන අපේ පක්ෂය විනාශ කරන්නයි. ඒකට අපි එක්සත් ජාතික පක්ෂයට ඉඩ දෙන්නේ නැහැ කියමින් මම නිහඬ වෙනවා. ස්තූතියි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Felix Perera. You have seven minutes.

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
No, Sir, I have 10 minutes. Please check that.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Sorry, you have only seven minutes. Today, we are on a tight schedule.

[අ.භා. 3.30]

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මේ විවාදයේදී ප්‍රචණ්ඩත්වය ගැන කථා කරද්දී, මට එක දෙයක් මතක් වෙනවා. හිටපු ජනාධිපති ජේ.ආර්.ජයවර්ධන මැතිතුමා, හිටපු ජනාධිපති ආර්.ප්‍රේමදාස මැතිතුමා, හිටපු ජනාධිපති ඩී.බී. විජේතුංග මැතිතුමා යන අය දැන් මිය ගිහින්. නමුත් අපේ රටේ ජනාධිපතිවරු වශයෙන් පත්වුණ ගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය, ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා සහ වර්තමාන ජනාධිපතිතුමා කියන මේ තුන්දෙනාම අද ජීවතුන් අතර ඉන්නවා. මේ තුන්දෙනාගේම උපදෙස් අපිට ලැබෙනවා. එම නිසා තමුන්නාන්සේලාගේ මේ පාරිශුද්ධ දේශපාලනය කරගෙන යෑමට උපදෙසක් අවශ්‍ය නම්, කවුරු හරි හොඳ කෙනෙක් හොයාගන්න කියලා ඉස්සෙල්ලාම කියනවා. ඒකට හේතුවක් තිබෙනවා. මෙදා ගරු සජිත් ප්‍රේමදාස ඇමතිතුමා ඇමතිකම ලැබුණු ගමන් ගිහිල්ලා හම්බ වුණේ සිරිසේන කුරේ මැතිතුමාවයි.

ඒ වාගේම, මුදල් ඇමතිතුමාත් ගිහිල්ලා හමු වුණේ කවුද? රොනී ද මැල් මැතිතුමායි. යහ පාලනය කියන එක ඇති කරගන්න නම් ප්‍රබුද්ධත්වය අතින් හොඳ අයටත් සවන් දෙන්න ඕනෑ. ඔබතුමන්ලා දන්නවා, ඔබතුමන්ලාගේ කාලයේ කළු ජූලියේදී වූ අපරාධය. අවුරුදු විසි ගණනක යුද්ධයක් ඇදගෙන යන්න ඒක හේතු වුණා. අතීතය ගැන කථා කරමින් අපට චෝදනා කරන්නේ නැතිව කණ්ණාඩියක් ළඟට ගිහිල්ලා බැලුවොත් පෙනේවි තමුන්නාන්සේලාගේ ක්‍රියා කලාපය මොන ආකාරයෙන්ද සිද්ධ වුණේ කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජා-ඇලත් ප්‍රශ්න ටිකක් තිබුණා. නමුත් ඒවා එතරම් ලොකු ප්‍රශ්න නොවෙයි. වැසිකිළියකට ඉබි යතුරු දැම්මා. බලන්න, මොන තරම් අමානුෂික ක්‍රියාවක්ද කියලා. ඒ වාගේම, විශාකා වත්ත සංවර්ධන නිලධාරියාට පහර දුන්නා. රාගම රථගාල කරගෙන ගිය අය පලවා හැරලා එය දැන් ධීවර අමාත්‍යාංශයේ තනතුරක් දරන නිමල් ටෝජා කියන කෙනකු භාරයට ගෙන තිබෙනවා. රාගම සමන්ත නිරෝෂණ මන්ත්‍රීතුමාට ඡන්දය දා පහර දුන්නා. ජා-ඇල නගර සභාව සහ ප්‍රාදේශීය සභාව තුළ -බලහත්කාරයෙන් කළාය කියන්න බැහැ.- විපක්ෂ කාර්යාල පිහිටුවා තිබෙනවා. එහෙම කරන්න කියලා නීතියේ කොහේවත් නැහැ නේ. ඉතින් අර්බුදයකට පාර කපා ගන්නවා.

ගරු ජෝන් අමරතුංග ඇමතිතුමනි, ඔබතුමාත් වැදගත් පවුලක කෙනෙක්. කතෝලිකයකු වශයෙන් ඔබතුමා පාප් වහන්සේට ආරාධනා කරන්නත් ගියා මාත් එක්ක. හොඳ වෙලාවට පාප් වහන්සේ ලංකාවට ආවා. ආවේ නැත්නම් මීට වඩා විනාශයක් වෙන්න තිබුණා. ඒ ගැනත් හොඳින් කල්පනා කරන්න.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
The Hon. John Amaratunga)
කුමන්ත්‍රණය ක්‍රියාත්මක වුණා නම් උන්වහන්සේට එන්න හම්බ වෙන්නේ නැහැ.

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මොකක්ද කුමන්ත්‍රණය?

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
අරලියගහ මන්දිරයේ.

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ඔප්පු කරලා නැහැ නේ. කුමන්ත්‍රණයක් ගැන අපි කථා කරනවා-

ගරු සරත් කුමාර ගුණරත්න මහතා
(மாண்புமிகு சரத் குமார குணரத்ன)
(The Hon. Sarath Kumara Gunaratne)
ඔබතුමාගේ හොඳම යාළුවා නේ එතුමා.

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ඔව්, එතුමා ඔබතුමාගේ යාළුවා. ඔබතුමා එතුමාත් එක්ක කීප පාරක් රටත් ගිහින් තිබෙනවා; රවුමක් ගහලා තිබෙනවා.

ගරු සරත් කුමාර ගුණරත්න මහතා
(மாண்புமிகு சரத் குமார குணரத்ன)
(The Hon. Sarath Kumara Gunaratne)
"ජෝන් නැත්නම් මට යන්න බැහැ." කියනවා.

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ඒ යන කොට කනට කරලා අහන්න තිබුණා නේ, "ඡන්දයෙන් පස්සේ මොනවා හරි වෙනවාද?" කියලා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ෆීලික්ස් පෙරේරා මන්ත්‍රීතුමාගෙන් පරෙස්සම් වෙන්න කිව්වා.

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මොන පැත්තෙන්ද? අපි ඒක බලමු.

මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා -අපේ ජනාධිපතිතුමා- උතුරෙන් 253,000ක් ඡන්ද අරගෙන තිබෙනවා. 1994 මැතිවරණයේදී එහෙම වුණේ නැහැ. අපි උතුරේ යුද්ධය නැති කරපු හන්දා නේද තමුන්නාන්සේලාට මේ ජයග්‍රහණය ලබන්න පුළුවන් වුණේ? 1994 මහා මැතිවරණය අරගෙන බලන්න. ඩග්ලස් දේවානන්ද මහත්මයා ගත්තේ ඡන්ද 2,091යි. අන්තිම කෙනා වූ සඟරුල්ලා එම්.ඒ. ගඟූර් මන්ත්‍රීතුමා ගත්තේ ඡන්ද 351යි. මන්ත්‍රීවරුන් 10දෙනෙකු ඇවිල්ලා තිබෙන්නේ ඡන්ද 27,853කින්.

ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා වූ හින්දා නේද මේ ජයග්‍රහණය ලැබුවේ? අද උතුරේ ප්‍රචණ්ඩ ක්‍රියා මොකුත් නැහැ. අද උතුරේ ප්‍රචණ්ඩත්වය නැහැ. අද ඒක දකුණට එවලා. ගරු ඇමතිතුමනි, අපේ දකුණේ තමයි තමුන්නාන්සේ ඉන්නේ; මගේ ආසනයේ. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා පළමුවෙන්ම ජාතික ලැයිස්තුවෙන් ඔබතුමා පාර්ලිමේන්තුවට එව්වා. මගේ ආසනයේම ජයලත් ජයවර්ධන මැතිතුමාත් එව්වා. දැන් ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමාත් ජාතික ලැයිස්තුවේ. මේ ජාතික ලැයිස්තුවට ගන්නේ කොයි වාගේ අයද? ජාතික ලැයිස්තුවට ගන්නේ, පක්ෂයට ඕනෑය කියන අය. ඒ නිසා ඕනෑකමින් වැඩ කරන්න ඕනෑ නේ. ගරු ඇමතිතුමනි, බලන්න, ඔබතුමාගේ වත්තල ආසනයේ ඇති වූ සිද්ධිය. විෂයය භාර ඇමතිතුමා වන ඔබතුමාගෙන් මම අහනවා ප්‍රශ්න කීපයක්. ඒ පිළිගැනීමේ රැස්වීම එදාම පවත්වන්න ඕනෑ වුණාද? ටිකක් කල්පනා කරන්න තිබුණා නේද? ප්‍රාදේශීය සභා ගොඩනැඟිල්ලේ උත්සව ශාලා දෙකක් තිබෙනවා. කුමන ශාලාවේද එය පැවැත්වූයේ?

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
එය ශාලාවේ නොවෙයි පැවැත්වූයේ, පහළ.

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
පහළද? ඒකට එතැනටම එන්න ඕනෑද? පිළිගැනීමේ කථාව පැවැත්වූයේ කවුද?

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඒක මං සන්ධියක්.

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
තවත් කීදෙනෙක් කථා පැවැත්වූවාද? ඔබතුමා පිළිතුරු කථාවක් කළාද? ස්තුති කථාව කළේ කවුද? ඔබතුමාගේ පෞද්ගලික ආරක්ෂාවට පොලීසියේ ආරක්ෂකයන් මදි නිසාද තවත් 60කට ආසන්න කැරලි මර්දන පිරිසක් ගෙන්නුවේ? වෛරයක් පිරිමැසීමටද ඒක කළේ? ඒ උත්සව සභාවට ඔබතුමාට ආරාධනා කළේ කවුද? ඔහුගේ නිලය මොකක්ද? ඒ කිසිවක් සිදු නොවූ අතර, ඔබතුමා කළේ මොකක්ද? ඔබතුමා එතැනින් ගියා. ගියා වුණත් ඊට පස්සේ මොනවාද වුණේ? කවුද එය කළේ? මෙන්න මේවා තමයි මගේ ප්‍රශ්න. මා ඔබතුමාට කියන්න ඕනෑ එය කරපු උදවිය අප දන්නා බව. ඒ විස්තර ටිකත් අප ළඟ තිබෙනවා. [බාධා කිරීමක්] නමුත් ඔබතුමාගේ කාලයේ තමයි අර මරණය සිද්ධ වුණේ. එවිටත් ඔබතුමා නීතිය හා සාමය -පොලීසිය- පිළිබඳ අමාත්‍යවරයා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මැරුණේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පළාත් සභා මන්ත්‍රීවරයෙක්.

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ඒක තමයි. ඔබතුමාගේ මිත්‍රයා නේ වර්තමාන සභාපතිතුමා. Training එකක් දුන්නාද දන්නේ නැහැ. ඉතින් අපි මේවා ගැන කථා කරන්න ගියාම බොහෝ දේවල් කියන්න සිද්ධ වෙනවා.

මේ කට්ටියට මේ කරපු හිංසනය නම් අපට පිළිගන්න බැහැ. චන්ද්‍රිකා මැතිනියත් hospital එකට ආවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාටත් ඒ පිළිබඳව දැනුම් දීලා තිබුණා. අපි පෙර දැනුම් දීමකුත් කරලා තිබුණා. කවුද ඒ පුද්ගලයෝ? වත්තල ආසනයේ, ප්‍රාදේශීය සභා මන්ත්‍රී සනත් පියසිරි මහතාගේ නිවසට පහර දී ඔහුට අයත් කාර් එකට සහ යතුරු පැදියට පහර දී සිදු කරන ලද අලාභය රුපියල් ලක්ෂ පහක් වෙනවා. ගරු ඇමතිතුමනි, හොඳට බලන්න. ඔබතුමාට මේ ගැන පරීක්ෂණයක් කරන්න පුළුවන්. පොලීසියත් ඔබතුමා යටතේයි තිබෙන්නේ.

ප්‍රාදේශීය සභාපති නීල් ඉන්දික මහතාගේ නිවසට ගොස් ඔහු උස්සාගෙන ගිහින් ටී 56 ආයුධයක් හිසට තියා, දණ ගස්වා පහර දී ගේ ඇතුළට දමලා රතිඤ්ඤයක් පත්තු කර දමලා ගිහින් තිබෙනවා. හැඳල, බටගොඩ, දර්ශන මහතාගේ නිවස ඉදිරිපිට ඇති ඇන්ටනි මහතාගේ නිවසට ගල් ගසා පහර දී වීදුරු ජනෙල් කුඩු කිරීම. ප්‍රාදේශීය සභා මන්ත්‍රී යොහාන් වික්‍රමසිංහ මහතාගේ නිවසට පහර දී -

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
තත්පරයක් ඉන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මට මේ list එක කියවන්න තිබෙනවා.

ප්‍රාදේශීය සභා මන්ත්‍රී යොහාන් වික්‍රමසිංහ මහතාගේ නිවසට පහර දී පලා යෑම. ඒ සිද්ධියේදී රුපියල් ලක්ෂ පහකට ආසන්න අලාභයක් වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ සියල්ලම ඔබතුමා නියෝජනය කරන කොට්ඨාසයේ සිදු වූ දේවල්. හැබැයි, රන්දීර් රුද්‍රිගු මහත්මයා ගැන පොඩ්ඩක් ප්‍රවේසම් වෙන්න. එතුමා අපිත් එක්ක තමයි හිටියේ. එතුමාගේ විවාහයට අත්සන් කරන්න ගියේ අපේ හිටපු ජනාධිපතිතුමා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඒක තමයි නරක් වුණේ.

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
දැන් එතුමා, තමුන්නාන්සේලාගේ පැත්තට ඇවිල්ලා. එතුමාත් ඒ සිද්ධියට ගිහින් තිබුණා. අපි ළඟ සිටියදී නම් කාටවත් ඔහොම ගහන්න බැහැ. ඇත්ත කියන්න එපායැ. ඔබතුමන්ලාගේ පක්ෂයේ අය මාත් හිරේ දැම්මා. අපේ අයට ඇසිඩ් ගැස්සෙව්වා. තවමත් පොලීසියේ දෙදෙනෙකුගේ ඇස් පෙනෙන්නේ නැහැ.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මම සම්බන්ධ නැහැ, ඒවාට.

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
කවුරුවත් සම්බන්ධ නැහැ. ඒක හරි. නමුත් ඒ කාලයේ අපට ඒ පීඩනය දැනුණා. නමුත් අපි මොනවාද කළේ? 1994දී අපි ජයග්‍රහණය කරපු වෙලාවේ චන්ද්‍රිකා මැතිනිය කිව්වා කිසි

[ගරු ෆිලික්ස් පෙරේරා මහතා]

කෙනෙකුට කරදර කරන්න එපා කියලා. ඊට පසුව අපේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ජයග්‍රහණයෙන් පස්සේ මොකක්ද කළේ? එතුමා කිව්වා, කිරිබත් දෙන්න කියලා. එදා කොහේද ප්‍රචණ්ඩත්වයක් තිබුණේ? [බාධා කිරීමක්] නැහැ, නැහැ. එහෙම කළේ නැහැ. හැබැයි ඔබතුමන්ලාගේ කාලයේදී තමයි දෙමළ මිනිස්සු තොග ගණනේ පුච්චලා, බැරි තැන ඒ ඔක්කෝම අය ගෙනිහින් එහාට තල්ලු කරලා දැම්මේ. නැව්වලින් යාපනයට යවලා ත්‍රස්තවාදය පෝෂණය කළේ එහෙමයි. ඒ නිසා අපි ඒ සංස්කෘතිය නතර කරලා දමමු. ඒකෙන් වැඩක් නැහැ. මොකද, අපට පාර්ලිමේන්තුවේ බලතල තිබෙනවා. මෙදා නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාත් මේ බජට් එකට අත උස්සලා සහයෝගය දුන්නා. ඒකට ගරු කරන්න ඕනෑ. නිකම් බැණ බැණ ඉන්න එපා. මේක තමුන්නාන්සේලාගේ ජයග්‍රහණයක් විතරක් නොවෙයි. අපි ගිය වතාවේ ගම්පහ දිස්ත්‍රික්කය දෙලක්ෂ ගණනකින් දිනුවා. මෙදා පාර හාරදාස් ගණනකින් පැරදුණා. ඉතින් අපේම කට්ටිය තමයි තමුන්නාන්සේලාටත් ඡන්දය දීලා තිබෙන්නේ. හැබැයි දැන් ඒ අය කියනවා, "අපි වරද්දා ගත්තා" කියලා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Please wind up now.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
සමාවෙන්න, මට තව තත්පරයක් දෙන්න.

හමුදාවේ කට්ටිය දැන් කියනවා, "අනේ අපට වැරදුණා" කියලා. මේවායේ ආනිශංස අනික් පැත්තට එන නිසා අපි සමගියෙන්, සමාදානයෙන් කටයුතු කරමු. එසේ කටයුතු කිරීමේදී අපේ සහයෝගය තමුන්නාන්සේලාට දෙනවා. යහ පාලනය තිබෙන්න ඕනෑ. ඒ කාලයේ අපේ අතිනුත් පුංචි පුංචි වැරදි වෙන්න ඇති. නමුත් දැන්වත් මේ සංස්කෘතිය හදන්න උදව් වෙන්න කියා ඉල්ලනවා.

ඒ වාගේම මම මේ පොලිස්පතිතුමා ගැනත් යමක් කියන්න ඕනෑ. එතුමා ඉතාම අවංක කෙනෙක්. වචනයේ පරිමාජ්ත අර්ථයෙන්ම අවංක කෙනෙක්.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Please wind up now.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
තව විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරන වෙන කවුරුවත් නැහැ. මම විතරයි ඉන්නේ. අපේ නායකයාත් රට ගිහිල්ලා. දමලා ගිහිල්ලා.

අනුරාධපුරයේ ඉඳලා එද්දී වර්තමාන පොලිස්පතිතුමාට රත්රන් මාලයක් තෑගි දුන්නා. එතුමා ඒක ශ්‍රී මහා බෝධියට පූජා කළා. එතුමා නිසා පොලීසිය කෙරෙහි අපට විශ්වාසයක් තිබෙනවා. පොලීසිය භාර ඇමතිවරයා වශයෙන් ඒ විශ්වාසය ඔබතුමා සියයට දාහකින් තහවුරු කරන්න කියලා ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ඒ වාගේම මීගමුවේත් කරදර තිබෙනවා. මම ඒවා පස්සේ කියන්නම්.

[අ.භා. 3.40]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් මේ විවාදය පැවැත්වීමට අවස්ථාව ලබා දීම තුළින් රනිල් වික්‍රමසිංහ මැතිතුමා ප්‍රමුඛ රජය යහ පාලනය පිළිබඳ හොඳ පියවරක් අරගෙන තිබෙනවා. අද විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාට ඒ පිළිබඳව ඕනෑ විධියට කථා කරන්නට අවස්ථාව සලසා දීලා තිබෙනවා.

ඒ වාගේම, වෙනත් අවස්ථා දිහා බැලුවාම, මෙවර මැතිවරණයෙන් පසුව, "පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා" කියන ඒ වචන කිහිපය ශබ්ද කෝෂයෙන් ඉවත් වන තරමට මේ ප්‍රචණ්ඩ ක්‍රියා අඩු වෙමින් පවතින බව විශේෂයෙන් පෙනෙනවා. 2010 ජනාධිපතිවරණයෙන් පසුව ආධාරකරුවන්ට පහර දීම්, ගෙවල් ගිනි තැබීම් විතරක් නොවෙයි, ඡන්දය ඉල්ලපු අපේක්ෂකයාටත් දීපු දඬුවම් මොනවාද? ඒ ගැනත් අපි හිතා බලන්න ඕනෑ. එදා ජනාධිපති අපේක්ෂකයා වශයෙන් ඡන්දය ඉල්ලපු සරත් ෆොන්සේකා මැතිතුමාට මොනවාද කළේ? එතුමාගේ නිල නාම නැති කළා, එතුමාව හිරේ දැම්මා. දිය හැකි දුක් කන්දරා සියල්ල එතුමාට ලබා දුන්නා. එතුමාගේ විශ්‍රාම වැටුප නැති කළා, එතුමාගේ පට්ටම් නැති කළා, එතුමාගේ ආරක්ෂාව නැති කළා, එතුමා දිනා ගත් තරු සියල්ල නැති කළා. එහෙම කරලා හිරේත් දැම්ම එක තමයි එදා පැරදුණු ජනාධිපති අපේක්ෂකයාට අත් කළ ඉරණම. නමුත්, මේ ජනාධිපතිවරණයේදී පරාජයට පත් වූ අපේක්ෂකයාට අපි එහෙම කළාද කියලා විශේෂයෙන් අහනවා. මේ ජනාධිපති අපේක්ෂකයා -හිටපු ජනාධිපතිතුමා- පරාජයට පත් වුණාම එතුමාගේ ගමට, එතුමාගේ ගෙදරට යන්න අවශ්‍ය හෙලිකොප්ටරය පවා ලබා දෙන්න මේ රජය කටයුතු කළා. වාහන ඇතුළු ඒ අවශ්‍ය පහසුකම් අපි සලසා දුන්නා. මේ රජය එතැනින් නතර වුණේ නැහැ. මාධ්‍යයට පෙනී සිට ප්‍රකාශ නිකුත් කිරීමේ අයිතිය පවා එතුමාට ලබා දුන්නා. නමුත්, එදා පැරදුණු ජනාධිපති අපේක්ෂකයාට මොනවාද ලබා දුන්නේ? ජනතාව බලාපොරොත්තු වූ මේ වෙනස දැන් වනකොට මෛත්‍රීපාල-රනිල් සුසංයෝගයේ ප්‍රතිඵලයක් වශයෙන් අත් වෙලා තිබෙනවාය කියන එකත් මම විශේෂයෙන් කියනවා. විශේෂයෙන්ම දින සියයක් තුළ වෙනස් රටක්; අලුත් රටක් අපේක්ෂා කරමින් හංසයා වෙනුවෙන් කතිරය ගහපු ජනතාවට, ඒ දින සියය යන්නටත් මත්තෙන් - ජනාධිපතිවරණය අවසන් වනකොටම- හැමෝම එකතු වෙලා කිරිබත් කාලා සාමයෙන්, සතුටෙන් ඒ ජයග්‍රහණය බුක්ති විඳින්න ඔවුන්ගේ ඒ බලාපොරොත්තුව ඉෂ්ට වෙලා තිබෙනවාය කියන එකත් මම විශේෂයෙන්ම සඳහන් කරනවා.

ඒ විතරක් නොවෙයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එදා මොනවාද කළේ කියන එක මේ ගරු මන්ත්‍රීවරුන්ට අමතක වෙලා තිබෙනවාද කියන එක මම විශේෂයෙන් අහනවා. එදා කොළ පාට, රතු පාට තොප්පියක් දකින්න තිබුණාද; කොළ පාට, රතු පාට කොඩියක් දකින්න තිබුණාද? එදා ධන බලය, ඒ වාගේම මැර බලය කියන මේ සියල්ල පාවිච්චි කරමින් විපක්ෂය පවා සුනුවිසුනු කර දැම්මා. අපේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා, රනිල් වික්‍රමසිංහ මැතිතුමා ප්‍රමුඛ අප සියලු දෙනා මේ මැතිවරණ ව්‍යාපාරය පටන් ගත්තේ වර්ණ තොප්පි දමා ගෙන, සියලු කොඩි, පතාක, සියලු වර්ණ එකතු කර ගනිමින් සාමකාමී රටක්, යහ පාලනයක් ඇති කරනවාය කියන පණිවුඩය නිකුත් කරමිනුයි. එදා බැණ අඬගහපු, එදා විරුද්ධවාදිකම් කරපු, එදා stage ගිනි තියපු, එදා ආධාරකරුවන්ට ගහපු මේ හිටපු ඇමතිවරු, මන්ත්‍රීවරු අද වනකොට, 'සූර්යයා වටේ ග්‍රහ ලෝක කැරකෙනවා වාගේ' අතිගරු ජනාධිපතිතුමා වටේ කැරකෙන ආකාරය අපි දකිනවා. නමුත්, අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පරාජයට පත් වුණා නම්, එතුමාට අත් වන ඉරණම මොකක්ද? එහෙම වුණා නම්, සරත් ෆොන්සේකා මැතිතුමාට දීපු දඬුවම්වලටත් වඩා එහා

ගිය දඬුවම් එතුමාට ලැබෙනවා. එහෙම වුණා නම්, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ පවුලේ උදවියට අත් වන ඉරණම මොකක්ද? මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ආධාරකරුවන්ට අත් වන ඉරණම මොකක්ද? එහෙම නම්, එදා එතුමාට විරුද්ධව වැඩ කරලා; විරුද්ධව අදහස් ප්‍රකාශ කරලා; විරුද්ධවාදිකම් කරලා; stages කඩලා දැන් එතුමා ළඟට ඇවිල්ලා සතුටු සාමීචියේ යෙදෙන මේ අයට ඒ අවස්ථාව අද එයිද? මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මේ ජනාධිපතිවරණයෙන් පැරදුණා නම්, ඒ අයට ඔහොම කථා කරන්න අවස්ථාව එයිද කියන එක මම විශේෂයෙන් අහනවා.

ඒ විතරක් නොවෙයි, 2005 දී පැවැති ජනාධිපතිවරණයෙන් පස්සේ දේශපාලන පළිගැනීම්වලට ලක්වූවන්ට සහන සැලසීමේ කමිටුවට ලැබුණු පැමිණිලි සිරිකොත මන්දිරයේ තිබෙනවා. තමන් දේශපාලන පළිගැනීම්වලට ලක් වුණා, තමන්ගේ රස්සාව අහිමි කළා, තමන්ගේ රස්සාව කරන්න දුන්නේ නැහැ, තමන්ගේ ගෙට ගිනි තැබුවා, තමන්ගේ දේපළ මං කොල්ල කෑවා කියලා 35,000කට වැඩි පිරිසක් කරපු පැමිණිලි මේ දේශපාලන පළිගැනීම්වලට ලක්වූවන්ට සහන සැලසීමේ කමිටුවට ලැබී තිබෙනවා. ඒ මේ මැතිවරණය එන්නටත් පෙර කියන එකත් මම විශේෂයෙන් මතක් කරනවා. මේ මැතිවරණ සටනේ මූලිකව අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා හිටියා වාගේම මේ සටන මෙහෙයවපු ප්‍රධාන නායකයෙක් තමයි, රනිල් වික්‍රමසිංහ මැතිතුමා. එතුමා ප්‍රජාතන්ත්‍රවාදී නායකයකු වීමේ විශේෂත්වය පමණක් නොවෙයි එතැන තිබුණේ. නිල්-කොළ ඡන්දයක් නොවෙයි තිබුණේ. නිල් පාට-කොළ පාට අතර අරගළයක් නොවෙයි තිබුණේ. එහෙම නැත්නම් මහින්ද- මෛත්‍රී සටනක් නොවෙයි තිබුණේ. තිබුණේ දූෂණයට සහ භීෂණයට එරෙහි යහ පාලනයක් එක්ක තිබුණු සටනක්. ඒක අපි හොඳින් දන්නවා. ඒකයි මේ ජයග්‍රහණය උදා වීමත් සමඟම අපි ප්‍රචණ්ඩ ක්‍රියාවලට පෙලඹුණේ නැත්තේ. මොන පැත්තට ඡන්දය දුන්නත් කමක් නැහැ, අපි ඔක්කෝම එකතු වෙලා නගර ගණනේ කිරිබත් කාලා අලුත් ක්‍රමයකට, ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයකට මේ ජයග්‍රහණය සැමරුවේ ඒකයි. ජනතාවගේ අභිලාෂය වුණේ යහ පාලනයක් තිබෙන රටක්ය කියන එක අපි පැහැදිලිව විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආණ්ඩුවක් පෙරළුණේ නැතත්, ආණ්ඩුවක් වෙනස් වුණේ නැතත් 2005 දී පැවැති ජනාධිපතිවරණයේදී ප්‍රජාතන්ත්‍ර විරෝධී ප්‍රචණ්ඩ ක්‍රියා 1,200ක් වාර්තා වෙලා තිබෙනවා. නමුත් 2010 ජනාධිපතිවරණයේදී - ඒත් ආණ්ඩුව වෙනස් වුණේ නැහැ.- මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා 1,089ක් වාර්තා වෙලා තිබෙනවා. මේ ප්‍රචණ්ඩ ක්‍රියා 1,089 තුළ මිනිස් ඝාතන 6ක් තිබෙනවා. ඒ මැතිවරණ සමයේ වෙච්ච පශ්චාත් මැතිවරණ ක්‍රියා දෙස බැලුවාම මිනිස් ඝාතන 6ක් සිදු වෙලා තිබෙන බව පෙනෙනවා. එයින් කුරුණෑගල පොලිස් වසමේ මිනිස් ඝාතන දෙකක් සිදු වී තිබෙනවා. ගම්පොළ පොලිස් වසමේ මිනිස් ඝාතන දෙකක් සිදු වී තිබෙනවා. තංගල්ල හා පුත්තලම පොලිස් වසම්වල මනුෂ්‍ය ඝාතන එක බැගින් සිද්ධ වෙලා තිබෙනවා. මැතිවරණයෙන් පස්සේයි එය සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ වාගේම ඝාතනයට තැත් කිරීම් හතක් තිබෙනවා, බෝම්බ ගැසීම් 15ක් තිබෙනවා, ගිනි අවි පෙන්වා බිය වැද්දීම් 42ක් තිබෙනවා, තුවාල සිදු කිරීම් 217ක් තිබෙනවා, දේපළ විනාශ කිරීම් 522ක් තිබෙනවා. මෙන්න, 2010 ජනාධිපති මැතිවරණයෙන් පස්සේ ජයග්‍රහණය සමරපු විධිය. නමුත් 2015 ජනාධිපතිවරණයෙන් පස්සේ ගිනි තැබීම්, මංකොල්ල කෑම්, බිය වැද්දීම් නොවෙයි දකින්නට ලැබුණේ. හන්දියක් හන්දියක් ගානේ ජනතාව එකතු වෙලා කිරිබත් කාලා පක්ෂ විපක්ෂ භේදයක් නැතිව සතුට සමරන එකයි අපි දැක්කේ.

PAFFREL සංවිධානයේ වාර්තාවල තිබෙනවා, 2015 ජනවාරි 8වන දා සිට 21වන දා දක්වා වන දින 13 තුළ මේ රටේ වාර්තා වී ඇති පැමිණිලි සංඛ්‍යාව 50යි කියා. එයින් පශ්චාත් ප්‍රචණ්ඩ ක්‍රියා ලෙස එකතු වෙලා තිබුණේ 39යි. ඒ පැමිණිලි තුළ මනුෂ්‍ය ඝාතන සම්බන්ධයෙන් පැමිණිලි නැහැ. මැතිවරණයෙන් පස්සේ කිසිම මනුෂ්‍ය ඝාතනයක් සිද්ධ වුණේ නැහැ. බරපතළ පහර දීම් 4යි වාර්තා වෙන්නේ, පහර දීම් 07යි වාර්තා වෙන්නේ. වෙඩි තැබීම් නැහැ, ගිනි අවි පෙන්වා බිය වැද්දීම් නැහැ, බෝම්බ ප්‍රහාර නැහැ. කාර්යාලවලට, නිවාසවලට පහරදීම් ඇති වුණේ නැහැ. පොඩි, පොඩි දේවල් තිබුණත් අපි දැක්කේ සියලු දෙනා එක්කාසු වෙලා සාමයෙන් සතුටෙන් කිරිබත් කනවා විතරයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විපක්ෂයට මෙහෙම ඉතිහාසයක් තිබෙද්දී, මෙම විවාදයේදී රෙද්දක් ඇඳගෙන ඇවිත් කථා කරන්නට පුළුවන් ද කියා මා එතුමන්ලාගෙන් විශේෂයෙන් අහනවා. අපි දන්නවා, අද කෑ ගහන දේවල් ගැන බැලුවාම එතුමන්ලා බියටයි කෑ ගහන්නේ කියන එක. එදා කරපු දෙය එතුමන්ලා දන්නවා. ඒක එතුමන්ලාට මැවිලා පේනවා. "අපි කොහොමද, ජයග්‍රහණය සැමරුවේ, අපි කොහොමද, අපේ විරුද්ධවාදින්ට සැලකුවේ, අපි කොහොමද,පරාජිතයාට සැලකුවේ" කියන එක මෙතුමන්ලා හොඳින් දන්නවා. එම නිසා බිය ඇති වෙලා අද කෑ ගහනවා මිස, සාමකාමී යහ පාලනයක් වෙනුවෙන් මේ ආණ්ඩුව ක්‍රියා කර ගෙන යන හැටි පැත්තක සිට බලන ඕනෑම කෙනෙකුට පේනවා. මේ අතරතුරේත් සිදුවීම් සිදු වෙලා තිබෙනවා.

දැන් විපක්ෂය එල්ල කළ බොහෝ චෝදනා, දේශපාලනයට සම්බන්ධයක් නැති චෝදනායි. මෙම ගරු සභාවේ කුඩු විකුණපු හිටපු ඇමතිවරු ඉන්නවා; කැසිනෝ ව්‍යාපාරයේ යෙදුණු හිටපු ඇමතිවරු ඉන්නවා; ඒ වාගේම විවිධ කප්පම් ගත්ත හිටපු ඇමතිවරු ඉන්නවා. මේ කප්පම් සිද්ධීන් ඉස්මතු වෙච්ච අවස්ථා අපි දැක්කා.

කමලා රණතුංග මන්ත්‍රීතුමියගේ සහෝදරයෙකුගේ දරුවකුට පහර දීමක් කළාය කිව්වා. පොලීසියේම ලියවිලිවල සඳහන් වෙලා තිබෙනවා, ඒක පරණ කෝන්තරයක් මිසක් දේශපාලන ප්‍රශ්නයක් නිසා ඇති වෙච්ච දෙයක් නොවෙයි කියන එක. අද දේශපාලන පළිගැනීම් හුවා දක්වන්නට බැරි නිසා, පහර දීම් දේශපාලන වශයෙන් හුවා දක්වන්නට බැරි නිසා, ඒ ඒ අයගේ ආදී කල්පික වෛරය පිරිමසා ගැනීම් දේශපාලන ප්‍රචණ්ඩ ක්‍රියා ලෙස මේ සභාව තුළ හුවා දක්වන්නට උත්සාහ කරන අන්දම අපි දැක්කා. නමුත් ජනතාව සත්‍යය දන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මහින්ද රාජපක්ෂ පාලන කාලයේ, පසු ගිය ජනාධිපතිවරණයට පෙර කහවත්තේ වෙඩි තැබීමක් සිදු කළා කියා විශේෂයෙන් අපි දන්නවා. එයින් එක්සත් ජාතික පාක්ෂිකයෙක් මිය ගියා. මේකට චෝදනා කළා; සැක කළා, එවකට සිටි නියෝජ්‍ය ඇමතිවරයෙක් - වර්තමාන මන්ත්‍රීවරයෙක්- සහ කහවත්ත ප්‍රාදේශීය සභාවේ සන්ධාන මන්ත්‍රීවරයෙක්. ඒ කිසි කෙනකු එදා අත් අඩංගුවට ගත්තා ද? පසු ගිය ජනාධිපතිවරයෙන් පස්සේ, නව රජයෙන් නේද ඒ සඳහා කටයුතු සිදු කළේ කියන එක මා අහනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඌව පළාත් සභාවේ සෙන්දීල් තොණ්ඩමන් මන්ත්‍රීවරයා තැපැල් මහත්මයෙකුට පහර දුන්නාය කියා චෝදනා එල්ල වුණා. රජය මොනවා ද කළේ? ඔහුව අත් අඩංගුවට ගත්තා ද? ඔහුට විරුද්ධව අධිකරණයෙන් වරෙන්තුවක් නිකුත් වෙලා තිබුණා, දුටු තැන අත් අඩංගුවට ගන්න කියා. ඔහුව අත් අඩංගුවට ගත්තා ද? ඔහුට නිදහසේ හැසිරෙන්නට ඉඩ දුන්නා. ඒ විතරක් නොවෙයි, නිශාන්ත මුතුහෙට්ටිගම මන්ත්‍රීවරයා එදා නියෝජ්‍ය ඇමතිවරයකු වශයෙන් සිටියදී ගරු මෛත්‍රීපාල මැතිතුමා සහභාගි වෙන්නට තිබුණු මැතිවරණ වේදිකාවකට ගිනි තිබ්බා. මේ හේතුව නිසා ඔහු අත් අඩංගුවට ගන්න කියලා අධිකරණයෙන් විවෘත වරෙන්තුවක් නිකුත් කර තිබුණා. නමුත් අත් අඩංගුවට ගත්තාද? ඔහු පොලිස් නිලධාරීන් ඉදිරියේ ඔහුගේ බලය පෙන්නුවා. මේ විවෘත වරෙන්තුවක් තිබෙන පුද්ගලයා පොලිස් නිලධාරීන් ඉදිරියේ මැතිවරණ වේදිකාවලට

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

නැඟලා සින්දු කියන්න පටන් ගත්තා. ඒ විතරක් නොවෙයි, කිසිම ප්‍රශ්නයක් නැතිව විදේශගත වන්නටත් ගියා. ඒත් අත් අඩංගුවට ගත්තේ නැහැ. එහෙම ඉතිහාසයක් තියා ගෙන අද පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා ගැන කථා කරනවා. අද තමුන්නාන්සේලා, විශේෂයෙන්ම විපක්ෂයේ මන්ත්‍රීවරු හීලෑ වෙච්ච කොටි ටික වාගේ විපක්ෂයට වෙලා කටයුතු කරනවා. මේ සියල්ල සිදු කරලා අද සිල් අර ගෙන වාගේ කටයුතු කරනවා. පසු ගිය දශකය තුළ මෙවැනි කටයුතු කළ, මේ විධියට ප්‍රචණ්ඩත්වයෙන් හැසිරුණු ඔබතුමන්ලාට රෙද්දක් ඇඳ ගෙන ඇවිල්ලා මේ විවාදයට කථා කරන්න පුළුවන්ද කියා මම ප්‍රශ්න කරනවා.

විශේෂයෙන්ම හොරු ආරක්ෂා කළ පාලනය තිබුණේ කොයි කාලයේද කියලා මේ රටේ ජනතාවට අමතක නැහැ. හොරු ආරක්ෂා කරපු, හොරු නිර්මාණය කරපු, හොරුන් රැක ගත්ත පාලන කාලය එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩු කාලයයි කියන එක ජනතාවට අමතක වෙලා නැහැ. ඒක නිසායි ජනතාව සැබෑ වෙනසක් බලාපොරොත්තු වුණේ. එතනෝල්කාරයෝ - එතනෝල් ගෙන්වන අය- ආරක්ෂා කරපු ආණ්ඩුව මොකක්ද කියන එක මේ කෙටි කාලය තුළ ජනතාවට අමතක වෙන්න බැහැ. කුඩුකාරයන්ව ආරක්ෂා කරපු ආණ්ඩුව මොකක්ද කියන එක ජනතාවට අමතක වෙන්න බැහැ. ඒ විතරක් නොවෙයි, කැසිනෝකාරයෝ ආරක්ෂා කරපු ආණ්ඩුව මොකක්ද කියන එක ජනතාවට අමතක වෙන්න බැහැ. කේපී වාගේ කොටි නායකයන් තමන්ගේ ඔඩොක්කුවේ හුරතලේට තියා ගෙන කිරි පෙව්වේ මොන ආණ්ඩුව ද කියන එක ජනතාවට අමතක වෙන්න බැහැ. අද උපාසක බළලුන් වාගේ හැසිරුණාට මේ විවාදය තුළින් ජනතාවට ඒ බව ඒත්තු ගන්වන්න බැහැයි කියන එකත් මම පැහැදිලිව ප්‍රකාශ කරනවා.

අද වන විට ගරු ජෝන් අමරතුංග ඇමතිතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගේන්න විපක්ෂය උත්සාහ කරනවා. ඒකට හේතුව වත්තල ප්‍රාදේශීය සභාවේ ඇති වුණු ගැටුමයි. ඒක පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවලට ගැනෙනවා. නමුත් ජෝන් අමරතුංග මැතිතුමා ඒ අමාත්‍යාංශය භාර ගෙන දවස් කීයද ගියේ? එතුමා මේකට වගකිව යුතුද, වගකිව යුත්තේ කෙසේද කියන ප්‍රශ්නය විශේෂයෙන්ම අහන්න තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම නම් එදා තමන් උපයා ගත්ත අර්ථසාධක අරමුදල රජයට පවරා ගන්න ගියාය කියලා රොෂේන් වානක ඇතුළු පිරිස කටුනායක උද්ඝෝෂණය කරද්දී ඒ අයට වෙඩි තිබ්බා. ඒ උද්ඝෝෂණය කළ භූමිය තුළ රොෂේන් වානක මරා දැම්මා. එහෙම නම් ඒ සම්බන්ධයෙන් කොයි ඇමතිතුමාද ඉල්ලා අස් වුණේ? ආරක්ෂක ඇමතිවරයා ඉල්ලා අස් වුණාද? රතුපස්වල ජනතාව තමන්ට බොන්න වතුර ටිකක් දෙන්න කියලා පාරට ඇවිල්ලා උද්ඝෝෂණය කළා. ඒ අයට වෙඩි තිබ්බා. පාසල් දරුවෝ දෙන්නෙක් සහ තරුණයෙක් මරා දැම්මා. ඒ සම්බන්ධයෙන් කොයි ඇමතිවරයාද ඉල්ලා අස් වුණේ? ආරක්ෂක ඇමති ඉල්ලා අස් වුණාද? එහෙම නැත්නම් හිටපු නීතිය හා සාමය ආරක්ෂා කරන ඇමතිතුමා වූ ජනාධිපතිතුමා ඉල්ලා අස් වුණාද?

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
දැන් අවසාන කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මැතිවරණ ප්‍රකාශනයේ සඳහන් කර තිබෙන ඉන්ධන සහනාධාරය දෙන්න කියලා හලාවත ඇන්ටනී එදා කෑ ගැහුවා. ඔහුව වෙඩි පහරින් ඝාතනය කළා. ඒවා ගැන සෙව්වාද? දීපු දඬුවම් මොනවාද?

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Your time is over. Now, please wind up.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
එහෙම අය අද කථා කරනවා, යහ පාලනයේ වැරදි තිබෙනවා කියලා. [බාධා කිරීමක්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. S.M. Chandrasena. You have seven minutes.

[අ.භා. 3.54]

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය ජනාධිපතිවරණයෙන් පස්සේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පැවති ප්‍රචණ්ඩකාරී තත්ත්වය පිළිබඳව කථා කරන්නට මම බලාපොරොත්තු වෙනවා. 2015.01.23 වැනි දින තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තඹුත්තේගමදී, එක්සත් ජාතික පක්ෂයේ මැර කණ්ඩායම් උතුරු මැද පළාත් සභාවේ ගරු සභාපතිතුමාගේ නිවසට පැනලා තුන් වතාවක් පහර දුන්නා. ඒ පහර දීම නිසා එතුමාගේ බිරිඳ සති දෙකක් රෝහල්ගත වෙලා හිටියා. මේ පිළිබඳව සොයා බලන්න කියලා මම පොලිස්පතිතුමාටත් දැන්වුවා. කියන්න කනගාටුයි, පොලීසිය යම්කිසි උත්සාහයක් ගත් නමුත් සාධාරණය ඉටු වෙලා නැහැ. ඒ කියන්නේ පළාත් සභාවේ සභාපතිතුමාගේ ගෙදරට පැනලා, එතුමාගේ බිරිඳගේ අත කරකවලා ඉතාම අසාධ්‍ය තත්ත්වයෙන් ඇය සති දෙකක් රෝහල්ගත වෙලා හිටියා. යහ පාලනය කිව්වාම අපි බලාපාරොත්තු වුණා, මැස්සෙකුටවත් හිරිහැරයක් වෙන්නේ නැති යහ පාලනයක් ඇති වෙයි කියලා. මම කිව්වේ එක කාරණයක් විතරයි. මේ විධියේ සිද්ධි විශාල ප්‍රමාණයක් තිබෙනවා. මේවා අඩංගු ලේඛනය මම **සභාගත*** කරනවා.

2015.01.21 වන දින තලාව ප්‍රාදේශීය සභා මන්ත්‍රී අජන්ත කුමාර මහතාගේ නිවසට පහරදී ඔහුගේ මවට හා පියාට තුවාල සිදු කර, මරණීය තර්ජන එල්ල කර තිබෙනවා. මේ පිළිබඳව තඹුත්තේගම පොලීසියට පැමිණිලි කර තිබෙනවා. ඒ වාගේම තලාව ප්‍රාදේශීය සභාවට අයත් තලාව නගරයේ පිහිටි අපේ පක්ෂයේ අය මාළු විකුණන මාළු ලැල්ල පවා කඩා විසි කර, විනාශ කරලා තිබෙනවා. ඒ වාගේම අපේ ලේකම්වරයෙක් වශයෙන් කටයුතු කරපු ආනන්ද මහත්මයාගේ කටියාව ප්‍රදේශයේ පිහිටි නිවසට පැනලා පහර දීලා, රතිඤ්ඤා දමලා, ඒ දරුවෝ භය කරලා, ඒ ප්‍රදේශයේ විශාල විනාශයක් කළා. ඒ වාගේම කටියාව යාය 9 විද්‍යාලයේ විදුහල්පතිතුමාගේ නිවසට ගිහිල්ලා ඒ විදුහල්පතිතුමා බැංකු ණයක් අරගෙන මිලදී ගෙන තිබූ යතුරු පැදිය කඩා දමා තිබෙනවා. මමත් ගියා බලන්න. යතුරු පැදිය විනාශ කර දමා තිබුණා. ඒ වාගේම මගේ තලාව ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රධාන කාර්යාලය මැතිවරණ ප්‍රතිඵල කියලා ඉවර වෙන කොට පාන්දර කඩලා, කුඩු කරලා, විනාශ කරලා දැම්මා. පැවැති ආණ්ඩුවේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ නායකයා හැටියට මමයි කටයුතු කළේ. මැතිවරණයට කලින් සුළු

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

සුළු සිද්ධි දෙකක් ඇරෙන්න වෙනත් කිසිම සිද්ධියක් වාර්තා වෙලා නැහැ. පසුගිය මැතිවරණ වේලාවේදී මම දිස්ත්‍රික්කයේ කටයුතු කරපු ආකාරය පිළිබඳව ගරු හැරිසන් ඇමතිතුමාත් මට ස්තුති කළා. මම එතුමාටත් ස්තුති කළා. මම කිව්වා ඔබතුමාත් මේ ගැන බලන්න කියලා. මම එතුමාට ස්තුතිවන්ත වෙන්නේ ඒකයි. නමුත් අනෙක් අය කණ්ඩායම් වශයෙන් එකතු වෙලා, කල්ලි ගැහිලා විශාල විනාශයක් කළා. අනුරාධපුර දිස්ත්‍රික්කය කියන්නේ ත්‍රස්තවාදය තිබුණ කාලයේ නිරන්තරයෙන් වෙඩි ප්‍රහාරවලට ගොදුරු වෙලා, ජීවිත විශාල වශයෙන් විනාශ වෙච්ච ප්‍රදේශයක්. අපේ හිටපු ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා අපට සාමය ඇති කරලා දුන්නාට පස්සේ පැවැත් වූ සෑම මැතිවරණයකදීම අපි රතිඤ්ඤා කරලක් පත්තු කරන්න ඉඩ දුන්නේ නැහැ. අපි මැතිවරණ කිහිපයක් ජයග්‍රහණය කළා. නමුත් මේ ජනාධිපතිවරණයෙන් පස්සේ නැවත භීෂණයක් ඇති වුණා.

අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටපු මහ ලේකම් තමයි අතිගරු ජනාධිපතිවරයා වුණේ. එතුමා ජනාධිපති වෙලා පක්ෂයේ සභාපතිකමත් ගත්තා. වෙන කෙනෙක් ජනාධිපති වුණා නම් කොහොම හිටියි ද කියලා අපි කල්පනා කරන්න ඕනෑ. අපි දන්නවා එක්සත් ජාතික පක්ෂය තවම කටයුතු කරන්නේ 1977 කාලයේදී වාගේ කියලා. අපි දන්නවා 1977 කාලයේ අපේ රටට විශාල විනාශයක් කළ බව. එක්සත් ජාතික පක්ෂය මේ සිදුවීම්වලින් ඡන්ද අඩු කර ගත්තා. ඒක අපි දන්නවා. මිනිස්සුන්ට ගහලා බැනලා කවදාවත් ඡන්දයක් දිනන්න බැහැ. අපේ පක්ෂයෙන් ගැහුවත්, එක්සත් ජාතික පක්ෂයෙන් ගැහුවත්, කවුරු ගැහුවත් මිනිස්සුන්ට පහරදීලා ඡන්ද පදනම හදා ගන්න බැහැ. එක ගෙදරකට පහර දුන්නාම ගමේම ඉන්න මිනිස්සු ඒ පක්ෂයත් එක්ක තරහා වෙනවා. ඒක අපි දැන ගන්න ඕනෑ. ඒකයි අපි ඒවා නවත්වන්නේ. ගිය සැරේ මම දිස්ත්‍රික්කයේ පළමුවැනියා. මගේ මැතිවරණ ව්‍යාපාර කටයුතු කරද්දී මම කිසිම කෙනෙකුට හානියක් කරන්නේ නැහැ, පහර දෙන්නේ නැහැ, වචනයකින්වත් බනින්නේ නැහැ. පක්ෂයටත්, අපිටත් මිනිස්සු ඡන්දය දෙන්නේ, මනාප දෙන්නේ ඒ නිසයි. පහරදීලා, භය කරලා, මරලා කවදාවත් ඡන්ද ගන්න බැහැ. ඒක කල්පනා කරන්න ඕනෑ.

මේ මැතිවරණය එක්සත් ජාතික පක්ෂය පමණක් ජයග්‍රහණය කළ මැතිවරණයක් නොවෙයි. තමුන්නාන්සේලා ඒකට මුළා වෙන්න එපා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටපු මහ ලේකම්තුමා පොදු අපේක්ෂකයා වෙනකොට ඒ එක්කම අපේ ඡන්දත් එතුමාට ගියා. ඒ වාගේම ටීඑන්ඒ පක්ෂය, හකීම් ඇමතිතුමාගේ පක්ෂය සහ තවත් විශාල පක්ෂ සංඛ්‍යාවක් එකතු වෙලා මේ ජයග්‍රහණය ලබා ගත්තේ. වෙන් වෙන් වශයෙන් මහ මැතිවරණයට ඉදිරිපත් වෙනකොට මේ යන තත්ත්වය අනුව ප්‍රතිඵල බලන්න පුළුවන්. මැතිවරණයක් අවසන් වෙනකොට එක පැත්තකින් සාමකාමීව කිරිබත් කන ගමන් අනෙක් පැත්තෙන් විරුද්ධවාදීන්ට පහර දෙනවා. මම දැක්කා සමහර ප්‍රදේශවල කිරිබතුත් දෙනවා. හැබැයි තවත් ගමකට ගිහිල්ලා බලන කොට පහර දෙනවා. එක ප්‍රතිපත්තියක් තිබෙන්න ඕනෑ. විශේෂයෙන්ම අපි තමුන්නාන්සේලාට කියන්නේ මේ තත්ත්වය ඇති කරන්න එපා කියලායි. මොකද මේ වැඩවසම් යුගය නොවෙයි. 1977 නොවෙයි මේක. මේක දැන් 2015. අපි කාලයෙන් කාලයට වෙනස් වෙන්න ඕනෑ. යහ පාලනය ගැන කියනවා, ප්‍රජාතන්ත්‍රවාදය ගැන කියනවා. මේ සියල්ලම කරලා ඉවර වෙලා අන්තිමට ඡන්ද ප්‍රතිඵල කියන කොට රෑට ගෙවල් කඩනවා, ගෙවල් ගිනි තියනවා. දරුවෝ විශාල වශයෙන් භීතියට පත් වෙලා. කාඩයෝ, පාරේ යන කල්ලිකාරයෝ රෑ යාමෙට ගෙවල් අස්සට රතිඤ්ඤා දාපුවාම දරුවෝ භය වෙනවා. මුළු ගමම භය වෙනවා. නමුත් ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා, යහ පාලනය ගැන කථා කරනවා.

ජාතික ආණ්ඩු හදන්න එන්නය කියලා අපට කියනවා. අපිත් එක්ක ජාතික ආණ්ඩු හදන්න බලාපොරොත්තු වෙනවා. අපේ ගම්වලට ගහලා ඒ විධියට කටයුතු කරද්දී, ඔබතුමන්ලාත් එක්ක ජාතික ආණ්ඩු හදන්න ගියොත් ගම්වල මිනිසුන් අපට ගහන්න ඉඩ තිබෙනවා. ඒකයි, ඇත්ත තත්ත්වය. එම නිසා මොනවා හෝ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්න ඉස්සර වෙලා, අපේ සහයෝගය බලාපොරොත්තු වන්න ඉස්සර වෙලා තමුන්නාන්සේලා ආදර්ශවත් වෙන්න ඕනෑ. තමුන්නාන්සේලාගේ රජය පවතින්නේ සුළුතර ආණ්ඩුවක් හැටියටයි. අපේ විරුද්ධ පක්ෂයේ බහුතරයක් සිටිනවා. මේ පැත්තේ සම්පූර්ණයෙන්ම වාඩි වෙලා සිටින්නේ විරුද්ධ පක්ෂයේ අය. ඔබතුමන්ලාගේ ආණ්ඩු පක්ෂය පැත්තේ පිටුපස පේළි තුන හතරෙත් සිටින්නේ විරුද්ධ පක්ෂයේ අය. එම නිසා මේක සුළුතර ආණ්ඩුවක්. මම හිතන විධියට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා 62යි සිටින්නේ. අනෙක් සියලු දෙනාම විරුද්ධ පක්ෂයේ අය. තමුන්නාන්සේලාගේ අතුරු අය වැයට අපි සහයෝගය දුන්නා. තමුන්නාන්සේලා අපෙන් නොයෙකුත් දේවලට සහයෝගය ඉල්ලා සිටිනවා. ඒ අතරේ මේ විධියට අපේ පාක්ෂිකයන්ව මර්දනය කරන්න ගියොත් එහි අනෙක් පැත්තයි සිදු වන්නේ. එතකොට පක්ෂයක් විධියට අපටත් එක් එක් ක්‍රියා මාර්ග ගන්න සිදු වෙනවා. අපට ගහලා, අඩන්තේට්ටම් කරලා බය කර ගන්න ලැබෙන්නේ නැහැ. අපිත් ජනතාවගේ විශ්වාසය දිනාගෙන, ජනතාවගේ ඡන්දය අරගෙන, ජනතාව වෙනුවෙන් පෙනී සිටින මහජන නියෝජිතයන්. එම නිසා අපව පාගා ගැනීමට, යටකර ගැනීමට හැකියාවක් නැහැ. අපි එක එක අණ කිරීම්වලට යට වෙන මිනිසුන් නොවන බවත් තමුන්නාන්සේලාට පැහැදිලි කරන්නට ඕනෑ. මහජන සාමය පිළිබඳව සොයා බලන අමාත්‍යවරයා වශයෙන් ඔබතුමා විශේෂයෙන්ම මේවා ගැන සොයා බලන්න, ගරු ජෝන් අමරතුංග ඇමතිතුමනි. ඒ සිදුවීම් පිළිබඳව විස්තර ඇතුළත් ලේඛනය මා සභාගත කර තිබෙනවා. ඒවා ගැන පරීක්ෂා කර බලා සාධාරණය ඉටු කරන්නය කියලා මම තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 4.03]

ගරු වයි.ජී. පද්මසිරි මහතා
(மாண்புமிகு வை.ஜி. பத்மசிறி)
(The Hon. Y.G. Padmasiri)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මැතිවරණයෙන් පසුව සිදු වූ ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳව පැවැත්වෙන මේ සභාව කල් තැබීමේ අවස්ථාවේ විවාදයේ දී, කෑගල්ල දිස්ත්‍රික්කයේ තුන් කෝරළයේ යටියන්තොට ප්‍රදේශයේ සිදු වුණු ඇතැම් සිදුවීම් කිහිපයක් ගැන දැනුම් දීමට බලාපොරොත්තු වෙනවා. අපේ රටට සර්වජන ඡන්ද බලය ලැබිලා දැන් අවුරුදු අසූ ගණනක් පමණ ගත වෙලා තිබෙනවා. විශේෂයෙන්ම අපේ ප්‍රදේශය, එසේ සර්වජන ඡන්ද බලය ලැබුණු 1930 ගණන්වල සිටම මේ ප්‍රචණ්ඩ ක්‍රියාවල අත් දැකීම් ලැබූ ප්‍රදේශයක්. 1936 දී අපේ ප්‍රදේශයේ ඡන්දය දැමීමට යන මාර්ගයක තිබුණු ඒදණ්ඩ ඡන්දයට පෙර දිනයේ දී කඩා දමා තිබුණා කියලා අප අසා තිබෙනවා. උදේ බලනකොට මාර්ගයේ තිබුණු ඒදණ්ඩ නැහැ. ඉස්සර ඉඳලාම තමයි මේ ප්‍රචණ්ඩ ක්‍රියාවලට පුරුදු වෙලා තිබෙන්නේ. මේ ප්‍රචණ්ඩ ක්‍රියා උත්සන්න වුණු කාලවල් තිබුණා. විශේෂයෙන්ම ලංකා සම සමාජ පක්ෂයත්, එක්සත් ජාතික පක්ෂයත් අතර තමයි හුහාක් මේ ගැටුම් ඇති වෙලා තිබුණේ.

1965 වසරේ පැවැති මහ මැතිවරණය අවසානයේ මට වයස අවුරුදු 15 දී පමණ මා දැකපු පළමුවැනි ප්‍රචණ්ඩ ක්‍රියාව තමයි, ඒ ප්‍රදේශයේ හිටපු විදුහල්පතිවරයකු වන බොහොම අහිංසක මහත්මයකු බස් රථයෙන් බහින කොටම තදබල විධියට කම්මුල් පහරක් එල්ල කිරීම. එතුමා බෑග් එකත් සමඟම පාරේ වැටුණා. බෑග් එක පැත්තක; එතුමා තව පැත්තක. ඒ අවස්ථාවේ මා ළඟ මගේ අම්මාත් සිටියා. අම්මා කෑ ගසා කිව්වා, මේ මහත්තයාට ගහන්න එපා කියලා. එහෙම කියලා එතුමාව බේරා ගත්තා. දෙවැනි වතාවට ගහන්න ඉඩ දුන්නේ නැහැ. ඒ සිදුවීම මගේ ජීවිතයේ දී තදබල විධියට මගේ හිතට වැදුණු කාරණයක්. එම

[ගරු වයි.ජී. පද්මසිරි මහතා]

නිසා දේශපාලන ජීවිතය තුළ කවදාවත් රණ්ඩුවලට හෝ තව කෙනෙකුට හිරිහැර කරන්නට මගේ හිත ඉඩ දෙන්නේ නැහැ. මොකද, මුලින් සඳහන් කළ ඒ සිදුවීම දැකලා මා පාඩමක් ඉගෙන ගෙන තිබුණා. ඊට පසුව 1970 ගණන්වලදීත් එවැනි සිදුවීම් දැක්කා. 1965 දී අඟුරුවැල්ල කියන නගරය දඬුවම් දෙන නගරයක් බවට පත් වෙලා තිබුණා. ඒ කාලයේ මේ පාර්ලිමේන්තුව තුළත් ඒ ගැන කථා කරලා තිබෙනවා. සම සමාජ පක්ෂයට ඡන්දය දීපු අයට, රතු කමිසයක් ඇඳගෙන ගිය අයට, රතු ලේන්සුවක් දමා ගෙන ගිය අයට තදබල විධියට පහර දුන් අවස්ථා තිබුණා. ඒක මාස ගණනාවක්ම සිදු වුණා. එහි ප්‍රතිඵලයක් හැටියට 1970 මහ මැතිවරණය ජයග්‍රහණය කිරීමෙන් පසුව සිදුවීම් ගණනාවක්ම ඇති වුණා. 1977 දී ඊටත් වඩා දරුණු විධියේ සිදුවීම් ඇති වුණා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. එක හුළුඅත්තෙන් ගෙවල් 13ක් පුච්චපු මහකන්ද කියන ගම තිබෙන්නේ රුවන්වැල්ල ආසනයේ. මේවා දරුණු සිදුවීම් බවට පත් වුණා. ඒ වාගේම යටියන්තොට කොට්ඨාසයේ ගෙවල් 90ක් පමණ 1977 දී ගිනි තැබුවා. මේ සියල්ලක්ම අහිංසක පාක්ෂිකයන් ඡන්දය දමපු වරදට සිදු වුණු දේවල්. ඒ වාගේම 1977 දී අතලව කියන වත්තේ කිරි කපමින් සිටි විසිදෙදෙනෙකු පන්නා දමා, ඔවුන්ගේ පිහි සහ බාල්දි අරගෙන වෙනත් කට්ටියක් කිරි කපන්න පටන් ගත්තා.

ඒ කියන්නේ, 1977 දී රක්ෂා උදුරා ගන්නා ක්‍රමයකුත් ඇති වුණා. හැබැයි, පුංචි පුංචි රැකියාවන්. කම්කරුවන්ගේ, සමුපකාර සේවකයන්ගේ රැකියා උදුරා ගත්තා. නමුත් මේ මැතිවරණයෙන් පසුව ඊට වඩා ඉහළ තනතුරු උදුරා ගන්නවා අපි දැක්කා. මේ මැතිවරණයෙන් පසුව අග විනිසුරු පදවිය පවා උදුරා ගන්නවා දැක්කා. මානව හිමිකම් සංවිධාන අද නිදි. මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් සොයා බැලීමට තිබෙන මධ්‍යස්ථාන අද නිදි. ජනතාවට සිදු වුණු හිරිහැර ගැන කථා කරන්න අද ඒ සංවිධානවල අය නැහැ. මේ මැතිවරණයෙන් පසුව විශේෂයෙන්ම කිතුල්ගල, යටියන්තොට, බුලත්කොහුපිටිය කියන පොලිස් කොට්ඨාසවල යම් ප්‍රමාණයක සිදුවීම් ඇති වුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනවාරි 11වැනි දා උදේ 6.30ට විතර පුද්ගලයකු රුවන්වැල්ලේ තිබෙන මගේ නිවසට ඇවිල්ලා මට දුක් ගැනවිල්ලක් ඉදිරිපත් කළා. ඔහු කැලේක ඉඳලායි ආවේ කියලා කිව්වා. මම එතුමාගෙන් විස්තර ගත්තා විතරක් නොවෙයි, ඒ වෙලාවේම එම ගමේ මා දන්නා මහත්මයෙකුට දුරකථනයෙන් කථා කරලා ඒ සිද්ධිය පිළිබඳව ඇහුවා. ඔහු කිව්වා, "ඔව්, දැනට දවස් දෙකක් තිස්සේ මේ සිද්ධිය සිදුවෙලා තිබෙනවා. ඒ ගෙවල් 4ක කට්ටිය රෑට කැලෑවලට රිංගනවා" කියලා. සවසට ඒ අයට එහෙම තර්ජන, ගර්ජන ඇති වනවා කියන කාරණය මා පැහැදිලි කර ගත්තා. ඊට පසුව මා අවිස්සාවේල්ලේ සහකාර පොලිස් අධිකාරිතුමාට කථා කරලා ඒ සිද්ධිය වාර්තා කළා. පැලිකුරුහින්න කියන ගමේ බී.ජී. රණතුංග, එච්.කේ ධර්මසිරි කුමාර යන අයගේ ගෙවල්ද ඇතුළුව ගෙවල් හතරකට කඩු, තුවක්කු, පොලු රැගත් පුද්ගලයන් ඇවිල්ලා කෑකෝ ගහලා, ඒ අයව මරන බවට තර්ජනය කරනවා, ඒ පවුල්වල උදවිය බියපත්ව කැලේට පැනලා ඉන්නවා කියන කාරණය මා දැනුම් දුන්නා. එතුමා ඒ අවස්ථාවේම කිතුල්ගල පොලීසියට කථා කළා. කිතුල්ගල පොලීසියෙන් විනාඩි කිහිපයක් ඇතුළත මට කථා කරලා කිව්වා, ඒ සම්බන්ධව වාර්තා වෙලා නැහැ කියලා. වාර්තා වන්නේ කොහොමද? ඒ අය භය නිසා පොලීසියට යන්නේ නැහැ. මම නැවතත් කිතුල්ගල පොලීසියට කථා කරලා, මාව මුණ ගැහෙන්න ආපු පුද්ගලයාව පොලීසියට යවලා ඒ සම්බන්ධයෙන් පැමිණිලි කළා. නමුත් අද වන තුරු ඒ පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියා කරලා නැහැ; සාධාරණයක් ඉෂ්ට වෙලා නැහැ.

මැතිවරණය නිමා වනවාත් සමඟම දුනුකේදෙනිය වසමේ ජෝතිපාල මහත්මයාගේ නිවස අසල ඉදි කර තිබුණු සන්ධාන කාර්යාලයට ගිනි තබලා, එතැන කලබල කරලා තිබුණා. ඒ වාගේම බුලත්කොහුපිටිය වසමේ පැලැම්පිටිය ප්‍රදේශයේ කඩයකට පහර දී එහි සිටි පුද්ගලයන්ට හිරිහැර කර තිබෙනවා. ඒවා සියල්ලක්ම පොලීසියට වාර්තා කර තිබෙනවා. ඊළඟට රංගල්ල ගමේ කාන්තාවකට අඩන්තේට්ටම් කරලා තිබෙනවා; පහර දී හිරිහැර කර තිබෙනවා. මේ ක්‍රියා සියල්ලටම හේතුව ලෙස මතු කර තිබෙන්නේ, එක්සත් ජනතා නිදහස් සන්ධානයට - මහින්ද රාජපක්ෂ මැතිතුමාට- ඡන්දය දීපු වරදයි.

මේ සිද්ධීන් පිළිබඳව සඳහන් කරමින් අපි මේ විවාදය තුළින් බලාපොරොත්තු වන්නේ, මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබෙන පැමිණිලි විභාග කර වැරදි කර තිබෙන අයට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරන්න කියන එකයි. යහ පාලනය වචනයෙන්, පොත් පත්‍රිකාවලින් කරන්න පුළුවන් දෙයක් නොවන බව ඉතාම පැහැදිලියි. යහ පාලනයක් ඇති කරන්න පුළුවන් වන්නේ යහ ගුණවලින් පිරුණු මිනිසුන්ටයි. ඒක ඉහළින් විතරක් කරන්න පුළුවන් දෙයකුත් නොවෙයි. ඒක දේශපාලනයට පමණක් කරන්න පුළුවන් දෙයකුත් නොවෙයි. යහ පාලනය කියන අදහස හොඳයි. නමුත් එය ක්‍රියාත්මක කිරීමේ වගකීම භාර ගත් පිරිසගේ අතීත විස්තරය නම් ඒ තරම් හොඳ නැහැ. ඒ නිසා තමයි මම මැතිවරණ ඉතිහාසයේ සුළු සිද්ධීන් ටිකක් ගැන මතක් කළේ. පොලීසිය භාරව සිටින මහජන සාමය පිළිබඳව කටයුතු කරන ඇමතිතුමාගෙන් මා විශේෂයෙන්ම ඉල්ලනවා, මේ පැමිණිලි පිළිබඳව පරීක්ෂා කරලා වැරදිකරුවන්ට දඬුවම් දෙන්න කියලා. ඒ විධියට විනය, නීතිය ක්‍රියාත්මක කිරීමෙන් පමණයි මේ කියන යහ පාලනය ඇති කර ගන්න අපට පුළුවන් වන්නේ. ස්තූතියි.

[අ.භා. 4.10]

ගරු නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය මැතිවරණයෙන් පසුව ලංකාව පුරාම පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සහ දේශපාලන පළිගැනීම් පිළිබඳව අපට නොයෙක් අවස්ථාවල වාර්තා වුණා. විශේෂයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ සන්ධානයේ පාක්ෂිකයන් සහ වෘත්තීය සමිති නියෝජිතයන්, නායකයන් ඉලක්ක කර ගෙන සෘජුවම පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සහ දේශපාලන පළිගැනීම් දිගින් දිගටම සිදු වනවා අපි දැක්කා. ඒ පිළිබඳව නොයෙක් අවස්ථාවල අපි කථා කළත්, හඬක් නැඟුවත්, නීතිමය වශයෙන් බොහෝ අවස්ථාවල අපේ පාක්ෂිකයන්ට, අපේ වෘත්තීය සමිති නායකයන්ට සාධාරණයක් ඉටු වුණේ නැහැ කියන එක තමයි අපි පක්ෂයක් විධියට දරන මතය වන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

විශේෂයෙන් මා නියෝජනය කරන හම්බන්තොට දිස්ත්‍රික්කය හා ලංකාවේ අනෙකුත් දිස්ත්‍රික්ක දෙස බැලුවාම මෙවැනි සිදුවීම් රාශියක් අපට වාර්තා වෙලා තිබෙනවා. 1994 වසරේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුව පිහිටවපු වෙලාවේ ඉඳලා අපේ ආණ්ඩු තුළ ඉතිහාසයේ කිසි තැනෙක මෙවැනි සංවිධානාත්මක ලෙස පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සහ දේශපාලන පළිගැනීම් සිදු වෙලා නැහැයි කියන එක අප ඉතාමත් සතුටින් මතක් කරන්නට ඕනෑ. ඒ බව අප ආඩම්බරයෙන් යුතුව ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම, 2005 අවුරුද්දෙන් පසුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ සන්ධානය ප්‍රාදේශීය සභා මැතිවරණ, පළාත් සභා මැතිවරණ ආදී වශයෙන් මැතිවරණ රාශියක් ජයග්‍රහණය කළා. අපි මෙම මැතිවරණ ජයග්‍රහණය කළාට පසුව එක්සත් ජාතික පක්ෂයේ හෝ වෙනත් දේශපාලන පක්ෂවල ක්‍රියාකාරීන්ට හෝ දේශපාලන පළිගැනීම්

කළේ නැහැ. අපි දේශපාලනික වශයෙන් මාරුවීම් ලබා දුන්නේ නැහැ. අපි වෘත්තීය සමිති නායකයෝ ඉලක්ක කර ගෙන දේශපාලනික වශයෙන් පළිගැනීම් කළේ නැහැ. ගම්වල එක්සත් ජාතික පාක්ෂිකයන් මෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ සන්ධානයේ අනෙකුත් දේශපාලන පක්ෂවලට ඡන්දය ලබා දීපු අය මේ යහපාලනය තුළින් බලාපොරොත්තු වුණා, අපි අවම වශයෙන් හිතුවා, මේ මැතිවරණ කාල සීමාවෙන් පසුවත් දේශපාලන පළිගැනීම් සහ පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සිදු නොවෙයි කියලා. අවාසනාවකට අපි බලාපොරොත්තු වුණු දෙය නොවෙයි සිද්ධ වුණේ. තමුන්නාන්සේලා අපේක්ෂා කළෙත්, ඔබේ පාක්ෂිකයන්ට සහ ඔබේ ඡන්ද දායකයන්ට ලබා දුන්නෙත් එවැනි බලාපොරොත්තුවක් නොවෙයි. හැබැයි භූමිය තුළ සිදු වුණේ වෙනස් දෙයක්. අපේ ගම්වල ගෙවල්වලට ගල් ගහනවා, අපේ පාක්ෂිකයන්ගේ ගෙවල් ගිනි තියනවා, වාහනවලට ගිනි තියනවා, ත්‍රීරෝද රථ ගිනි තියනවා. මේවා ගැන පොලීසියට වාර්තා කළාම බොහෝ අවස්ථාවල නීතිමය වශයෙන් ඒවා ක්‍රියාත්මක වන වේගය ඉතාමත් අඩාලයි. සමහර තැන්වල පැමිණිලි ලියා ගත්තෙත් නැහැ.

මම අහගෙන සිටියා, මා නියෝජනය කරන හම්බන්තොට දිස්ත්‍රික්කයේම ආණ්ඩුවේ ඇමතිතුමන්ලා -සජිත් ප්‍රේමදාස ඇමතිතුමා, දිලිප් වෙදආරච්චි ඇමතිතුමා- හම්බන්තොට දිස්ත්‍රික්කයේ පාතාලයක් ගැන කථා කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දේශපාලන ඉතිහාසයේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ පාතාලයක් හිටියේ මොන කාලයේද කියලා ඒ ඉතිහාසය ගැන මතක තිබෙන අය දන්නවා. අද කීප දෙනෙකුගේ නම් කියා ගෙන ගියා. මේ උත්තරීතර සභාව තුළ ඒ නම් කියලා මම මාගේ කාලය නාස්ති කර ගන්නේ නැහැ. ඒ නම් කිව්ව අයගෙන් කී දෙනෙක් අද වන විට ජීවතුන් අතර ඉන්නවා ද කියලා මම අහනවා. එදා එක්සත් ජාතික පක්ෂය තමයි හම්බන්තොට දිස්ත්‍රික්කයේ පාතාලය මෙහෙයවූයේ. එදා එවැනි දේශපාලන පක්ෂ තමයි හම්බන්තොට දිස්ත්‍රික්කයේ වාගේම ලංකාවේ පාතාලය මෙහෙයවූයේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය කාල සීමාවේදීයි පාතාල මර්දනය සිදු වුණේ. පාතාල නායකයන්ට ඒ වෙනදා කර ගෙන ආ පාතාල වැඩ කටයුතු කරන්න ඉඩ නොදුන්නේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාල සීමාවේදීයි. ඒ යුගය නිර්මාණය කළේ එතුමායි. මම ආඩම්බරයෙන් යුතුව කියනවා, හම්බන්තොට දිස්ත්‍රික්කයේ පසු ගිය වසර 10ක කාලය තුළ මේ කියන ආකාරයේ පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා, මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සිදු වෙලා නැහැ කියලා. අද මට ඇහුණා එතුමා කියනවා මහා දැවැන්ත හීෂණයක් තිබුණා කියලා. මේ කියන විධියට හම්බන්තොට දිස්ත්‍රික්කයේ කිසිම එක්සත් ජාතික පක්ෂ රැස්වීමක් පවත්වන්න ඉඩ දීලා නැහැ. කිසිම දෙයක් කරන්න ඉඩ දීලා නැහැ. හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ සංවිධානාත්මකව කිසිම මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවකට අපි සම්බන්ධ වුණේ නැහැ. ඒ බව මම වගකීමකින් යුතුව ප්‍රකාශ කරනවා.

එතුමා හොඳ දේශපාලන පරම්පරාවකින් එන තරුණ දක්ෂ දේශපාලඥයෙක්. තරුණ සංවිධානයක් දිහා බලලා මේ කථා කරන විධිය පිළිබඳව අප අවංකවම කනගාටු වනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂ තරුණ සංවිධානයට තමයි "නිල් බලකාය" කියන්නේ. ඒකට වෙනත් සතුන්ගේ නම් ආරෝපණය කරලා, ඒ නම්වලින් එම තරුණයන්ව හඳුන්වලා ඒ නම් තුළින් තරුණ සංවිධාන සහ ඒ තරුණයින් අධෛර්යයට පත් කරලා, පාර්ලිමේන්තුවට ඇවිල්ලා බැණලා ගමට ගිහිල්ලා එම තරුණයන්ට ආරාධනා කරනවා "එන්න මාත් එක්ක එකතු වෙන්න" කියලා. ඉතින් මොකක්ද මේ දේශපාලනය? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තරුණ සංවිධානයක් තිබුණා. තවමත් තිබෙනවා. ඒ තරුණ සංවිධානය තුළ අපි තරුණයොත් එක්ක දේශපාලනය කළා. අප ඒවා පිළිගන්නවා. අප canvassing ගියා; අප ගෙයින් ගෙට ගියා; අපි රැස්වීම් පැවැත්වූවා; අප ශ්‍රමදාන කළා; අප ආගමික කටයුතුවලට සම්බන්ධ වුණා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රටේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ තරුණ සංවිධානය ඉතිහාසයේවත්, අනාගතයේදීවත් කිසි දවසක මැර දේශපාලනයකට ගියේ නැහැ, යන්නේ නැහැ කියලා මම වගකීමකින් යුතුව කියනවා. අපට අවශ්‍ය නව දේශපාලන සංස්කෘතියක් ගොඩ නගන්නයි. තරුණයන්ට අප පුහුණුව ලබා දෙනවා. අප ලබා දෙන්නේ දේශපාලනික පුහුණුව. අපි ඉතිහාසයේ දී දැක්කා තරුණයන්ට අවි පුහුණුව ලබා දෙනවා. අපි දැක්කා, LTTE සංවිධානය වාගේ සංවිධාන දේශපාලන පුහුණුව දුන්නු තරුණයාට ආයුධ අතට දීලා සයනයිඩ් කරල කරේ දාලා ඔහුව මරාගෙන මැරෙන බෝම්බකරුවෙක් බවට පත් කළ බව.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තරුණ සංවිධානය කිසි දවසක එවැනි මැර දේශපාලනයක් අනුමත කරන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. එවැනි දේශපාලන ක්‍රියාදාමයක් තුළ අපේ ගමේ අහිංසක දෙමව්පියන්ගේ දරුවන් නියැලෙන්නේත් නැහැ කියන එකත් මතක් කරන්න ඕනෑ. දේශපාලනික වශයෙන් එතුමාට ප්‍රශ්නයක් තිබෙනවා නම්, ඒ පිළිබඳව කථා කරන්න ඕනෑ. ගමේ තරුණයාව ගෙනැල්ලා, ඒ තරුණයා මැරයෙක් බවට පත් කරලා, ඒ ගම්වල ඉන්න අහිංසක තරුණ තරුණියන්ව අධෛර්යට පත් කරලා, ඒ තරුණයන්ට දේශපාලනය එපා කරවන්න කටයුතු නොකරන ලෙසයි අපි ඉල්ලා සිටින්නේ. මොකද අපට අවශ්‍යයි, ගමේ තරුණයන් දේශපාලනයට එන එක. ඒ අය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වෙන්න පුළුවන්, එක්සත් ජාතික පක්ෂයේ වෙන්න පුළුවන්, ජනතා විමුක්ති පෙරමුණේ වෙන්න පුළුවන්. අපට අවශ්‍යයි, ගමේ තරුණයන් දේශපාලනයට ගෙන එන්න. හැබැයි, මැර දේශපාලනයට නොවෙයි. ඒ නිසා මම අවංකව, ආදරයෙන් එතුමාගෙන් ඉල්ලා සිටිනවා, රටේ තරුණ දේශපාලන සංවිධානවලට සත්තුන්ගේ නම්වලින් කථා කරන්න එපා කියලා. ඒවා නියෝජනය කරන්නේ ගමේ අහිංසක දෙමව්පියන්ගේ දරුවන්. වර්තමාන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගරු සභාපතිතුමා, ඒ වාගේම ඔබේ අග්‍රාමාත්‍යතුමා එකතු වෙලා ජාතික ආණ්ඩුවක් බිහි කරලා තිබෙනවා. අපි විපක්ෂය විධියට ඒ දින 100 වැඩ පිළිවෙළට සහයෝගය දෙනවා. ඒ දින 100 වැඩ පිළිවෙළට සහයෝගය දෙනවා වාගේම, අපි අවංකව, ආදරයෙන්, ගෞරවයෙන් තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටින්නේ මේ පාර්ලිමේන්තුව තුළ ඔබ තමුන්නාන්සේලා ගොඩ නඟන්න උත්සාහ කරන ජාතික සමඟිය, මේ පාර්ලිමේන්තුව තුළ ඔබ තමුන්නාන්සේලා රටට ලෝකයට පෙන්නුම් කරන ජාතික ආණ්ඩු සංකල්පය ගමේ ඉන්න අහිංසක දෙමව්පියන්ටත් රැගෙන යන්න පුළුවන් අවකාශය, පරිසරය අපේ රටේ ගම් මට්ටමිනුත් ගොඩ නඟන්න කියන කාරණයයි. එම ඉල්ලීමත් කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

[අ.භා. 4.18]

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම පසු ගිය ජනාධිපතිවරණයේදී ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ එක්සත් ජනතා නිදහස් සන්ධානයට ඡන්දය දුන්නු ඒ අපේ සියලුම ජනතාවට මේ අවස්ථාවේදී මා ස්තුතිවන්ත වෙනවා. සේරුවිල මැතිවරණ කොට්ඨාසය අපි ජයග්‍රහණය කළා. ඒ වාගේම ත්‍රිකුණාමල මැතිවරණ කොට්ඨාසයෙනුත් අපි 2010 ජනාධිපතිවරණයට ගත්ත හා සමානව ඡන්ද ගත්තා. ඒක අපි ත්‍රිකුණාමල දිස්ත්‍රිකයෙන් ලබපු විශිෂ්ට ජයග්‍රහණයක්. එක්සත් ජනතා නිදහස් සන්ධානයට -මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාට- දුන්නු සහයෝගය වෙනුවෙන් ඒ සියලු දෙනාටම ගෞරවනීය ස්තුතියක් පිරිනැමීම මේ අවස්ථාවේ මගේ යුතුකමක් වෙනවා.

[ගරු සුසන්ත පුංචිනිලමේ මහතා]

ගරු ජෝන් අමරතුංග ඇමතිතුමනි, අනෙක් අයට වඩා වෙනස් ප්‍රශ්නයක් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ සන්ධානයට වැඩ කරපු අයට තිබෙන්නේ. එක්සත් ජාතික පාක්ෂිකයන්ගෙන් කාටවත් කරදරයක් නැහැ. සන්ධානයේම ඉඳලා, සන්ධානයම කාලා, සන්ධානයෙන්ම පෝෂණය වෙලා, අවස්ථාවාදීව කටයුතු කරන අයගෙන් තමයි අපේ දිස්ත්‍රික්කයේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ අයට කරදර තිබෙන්නේ. ඒකේ එක අංගයක් තමයි SLTB එකේ විජය ධර්මසේන කියන අපේ ඩිපෝ කළමනාකරු ඉවත් කිරීම. හොඳට කළමනාකරණය කරගෙන ලාභ ලබමින් තිබුණු ඩිපෝවෙන් එයාව අයින් කරලා වෙනත් කෙනෙක්ව පත් කරන්න කටයුතු කළා. ඒක නීත්‍යානුකූලව නොවෙයි, බලහත්කාරයෙනුයි කළේ. තවත් පිරිසක් එක්ක ඇවිල්ලා, එයාව බය කරලා අයින් කරන්න කටයුතු කරලා තිබෙනවා. දැන් ඒක තාවකාලිකව සමනය වෙලා තිබෙනවා.

ගෞරවනීය අපේ ස්වාමීන් වහන්සේලා වෙසෙන මොරවැව පන්සලට ගිහිල්ලා එහි තිබුණු හිටපු ජනාධිපතිතුමාගේ රූප රාමු පොලීසිය විසින් රැගෙන ගිහිල්ලා තිබෙනවා. ඒ වාගේම පන්සලට සම්බන්ධ වී සිටින දායකයින්ගේ ගෙවල්වලට ගිහිල්ලා පරීක්ෂා කරලා තිබෙනවා. ඒ විධියට නොයෙක් හිරිහැර සිදු වෙලා තිබෙනවා. මහජන සාමය ආරක්ෂා කරන ගරු ඇමතිතුමා -අපේ හිත මිත්‍රයා- මේ කාරණය ගැන කල්පනා කරලා බලන්න ඕනෑ. මතක තියෙන කාලයක මේ වකවානුවේ තමයි පන්සල්වලට ගිහිල්ලා ඒවායේ අලි ඉන්නවාද, එහෙම නැත්නම් තවත් අය ඉන්නවාද කියලා පන්සල් සෝදිසි කරලා, නොයෙක් නොයෙක් හිරිහැර බාධා ගොඩක් වෙලා තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, නීත්‍යානුකූල නොවන මොනවා හරි දෙයක් තිබෙනවා නම් ඒවා නීත්‍යානුකූල ක්‍රමයකට ගිහිල්ලා හොයන්න. පන්සලකට ගිහිල්ලා ඒ වාගේ කටයුතු කරන පිළිවෙළක් තිබෙනවා. ඒ පිළිවෙළ අනුව කටයුතු කළොත් හොඳයි. මොකද, මේක තවමත් බෞද්ධයින් වැඩි වශයෙන් ඉන්න රටක්. විශේෂයෙන්ම යහ පාලනයට යන එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ ඔබතුමන්ලාගේ රජයට ඒක හරි නැහැ. ඉතිහාසයේ කවදාවත් නොවුණු විධියට පන්සල්, විහාරවලට ගිහිල්ලා කරන බලපෑම තුළින් වෙනයම් අර්ථයක් මතු වෙයිද කියා සැකයක් ඇති වෙනවා. ඔබතුමන්ලාගේ එහෙම අදහසක් නොතිබෙන්න පුළුවන්. නමුත් මේවා කරන නිලධාරීන් නිසා මේ රජයේ තමුන්නාන්සේලා අපහසුතාවට, විවේචනයට ලක් වෙන තත්ත්වයක් අද උදා වෙලා තිබෙනවා.

ජෝන් අමරතුංග ඇමතිතුමනි, විශේෂයෙන්ම ඔබතුමාට මා මේ කාරණය කියන්න ඕනෑ. උසාවියේ සෝදිසි වරෙන්තුවක් අරගෙන ඇවිල්ලා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ මගේ එක්සත් ජනතා නිදහස් සන්ධාන කාර්යාලයේ තිබුණු පරිප්පු, සීනි, කාන්තාවන්ගේ සනීපාරක්ෂක තුවා පවා පොලීසිය අත් අඩංගුවට අර ගත්තා, ගරු ඇමතිතුමනි. දවස් ගණනක් ඒවා සීල් කර තිබුණා. ඊට පස්සේ ඒවා උසාවියට ඉදිරිපත් කළා. නමුත් උසාවියෙන් ප්‍රතික්ෂේප කර තිබෙනවා, "මේවා ගෙනෙන්න එපා. මේවා රජයේ ඒවා නොවන නිසා" කියා. මෙයින් මන්ත්‍රීවරයෙකු වශයෙන් මගේ වරප්‍රසාද කඩවීමක් සිදු වුණා. ඒ වාගේම එක්සත් ජනතා නිදහස් සන්ධානයේ අපට උදවු කරපු අනිකුත් හැමෝම බියට පත් වෙනවා, දිස්ත්‍රික්කයේ සිටින ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ -සන්ධානයේ- මන්ත්‍රීවරයාට මෙහෙම නම් අපට කොහොම වෙයිද කියා. මා මේ කාරණය සම්බන්ධයෙන් ඔබතුමාටවත්, එක්සත් ජාතික පක්ෂයටවත් ඇඟිල්ල දිගු කරන්නේ නැහැ. මා ඉස්සෙල්ලා කිව්ව මේ කටයුත්ත කරවන කෙනාට තමයි මා මේ කාරණය කියන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමාට මා මේ කාරණය සම්බන්ධයෙන් කියන්න ඕනෑ. මේ පිටුපස ඉන්නේ පොලිස් අධිකාරිවරයෙක්. ඔබතුමාත් එතුමා ගැන දන්නවා ඇති. ඔහු මාර්ක් නමැති කෙනෙක්. ඔහු එන අවුරුද්දේ විශ්‍රාම යන්න නියමිතයි. ඔහුට දැනට මිතුරන් වශයෙන් ඉන්නේ DIGලා සහ Senior DIGලා. මේ මාර්ක් නමැති කෙනා දක්ෂ නිසා තමයි ඔබතුමන්ලාගෙන් 1 දමා ගන්න කටයුතු කරන්නේ. අපට හිරිහරු කළාම ඔබතුමන්ලා සන්තෝෂ වෙයි කියා හිතලා තමයි ඔහු මේ දේවල් කරන්නේ. පසු ගිය මැතිවරණයට මාසයකට, දෙකකට ඉස්සෙල්ලා මේ පුද්ගලයා මාරු කළා. ඔහුගේ මාරුවත් ඔහු හදා ගත්තේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහත්තයා ළඟට ගිහිල්ලායි. අද කරපු මාරුව හෙට හදා ගන්න පුළුවන් තත්ත්වයක් තිබුණා, එදා අපේ ආණ්ඩුවේ හිටපු ජනාධිපතිතුමාත් සමඟ. අපත් එක්ක සම්බන්ධකම් තියාගෙන, ඔබතුමන්ලා ජයග්‍රහණය කළාට පස්සේ -අපේ ජනාධිපතිතුමා පරාජය වුණාට පස්සේ- එක පාරටම මේ ගොල්ලන් ඔබතුමන්ලාටත් වඩා ඉදිරියෙන් කටයුතු කරන්න යනවා.

ජෝන් අමරතුංග ඇමතිතුමනි, මෙන්න මේ කාරණය සම්බන්ධයෙන් විශේෂ පරීක්ෂණයක් පවත්වන්න කියා මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ කියන පොලිස් අධිකාරිවරයා දැනට ආශ්‍රය කරන අයගේ නාම ලේඛනය ඇතුළු විස්තර ඔබතුමාගේ දැන ගැනීම පිණිස මා හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ තරුණයන් අතුරුදන් කිරීමට සම්බන්ධ වෙච්ච, කප්පම් ගන්න, හෝටල්වලට ගිහිල්ලා කාලා පොල්ල තියපු උදවිය තමයි ඔහු අවුරුදු ගණනාවක් තිස්සේ ආශ්‍රය කරන්නේ. මේ පොලිස් අධිකාරිවරයා හැම weekend එකේම ඔහුගේ උදවියත් සමඟ කොහේ හෝ හෝටලයකට ගිහිල්ලා ප්‍රිය සම්භාෂණ පවත්වනවා. මෙන්න මේ ක්‍රියා නිසා ආණ්ඩුවට සහයෝගය දෙනවා කියා සිටින අපත් කලකිරීමට පත් වෙනවා. ආණ්ඩුවට සහයෝගය දෙන්න බැරි තත්ත්වයේ කටයුතු මේගොල්ලන් කරනවා. විශේෂයෙන්ම මහජන සාමය පිළිබඳව කටයුතු කරන අපේ හිත මිත්‍ර ජෝන් අමරතුංග ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ කාරණය පිළිබඳව සාධාරණ පරීක්ෂණයක් පවත්වන්න කියා.

ගරු ඇමතිතුමනි, මගේ කාර්යාලයෙන් රැගෙන ගිය බඩු ටික අරගෙන යන්න කියා දැන් පොලීසියෙන් දන්වා තිබෙනවා. මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, පොලීසියට ගෙන ගිය සීනි, පරිප්පු ආදී දේවල් නරක් වෙලා තිබෙනවා නම් ඒවාට අලුත් බඩු අපට ලබා දෙන්න කටයුතු කරන්න කියා. එහෙම නැත්නම් අපේ අයිතිවාසිකම් කඩ කිරීම් පිළිබඳව ඒ ගොල්ලන්ට විරුද්ධව නඩුවක් දමන්න මා කටයුතු කරනවා. ඒ වෙනුවෙන් ඔබතුමාගේ සහයෝගයත් මා ඉල්ලා සිටිනවා. මේ වාගේ ජරා වැඩ කරන පොලිස් අධිකාරිවරුන්ට වාගේම ඒවාට සම්බන්ධ පොලිස් නිලධාරීන්ට දඬුවම් ලබා නොදුන්නොත් ඔබතුමන්ලාට කවදා හෝ දවසක ආපසු විපක්ෂයකට යන්න සිදු වුණොත් ඔබතුමන්ලාට වෙන්නේත් ඊට වඩා අන්ත දේවල්වලට මුහුණ දෙන්නයි. මේවා වළක්වන්න නම් මේ වාගේ ජඩ වැඩ කරන, මේ වාගේ එකට ඉඳලා එක පාරටම අනික් පැත්ත හැරිලා වැඩ කටයුතු කරන නිලධාරීන්ට විරුද්ධව කටයුතු කරන්න කියා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඔබතුමාගේ පහසුව පිණිස මා මේ තොරතුරු සියල්ල හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා සභාගත කළා. බොහොම ස්තූතියි.

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[අ.භා. 4.26]

ගරු දුනේෂ් ගන්කන්ද මහතා (නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு துனேஷ் கங்கந்த - நகர அபிவிருத்தி, நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்பு பிரதி அமைச்சர்)
(The Hon. Dunesh Gankanda - Deputy Minister of Urban Development, Water Supply and Drainage)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳව අදහස් දක්වන මේ අවස්ථාවේදී එවකට ආණ්ඩු පක්ෂයේ හිටපු, අද විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන් නැවත ඉපදිලා වාගේ කතා කරනවා. එවන් අවස්ථාවක මම අවධාරණය කරන්න කැමැතියි, ලංකා ඉතිහාසයේ පැවැති දූෂිතම මැතිවරණය මේ 2015 ජනවාරි 08 වැනිදා පැවැත්වුණු ජනාධිපතිවරණය බව. විශේෂයෙන්ම රාජ්‍ය මාධ්‍ය මුළුමනින්ම මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ අභිමතය පරිදි ක්‍රියාත්මක වුණය කියන එක අපි කවුරුත් දන්නවා. ඒ ජනාධිපතිවරණය දූෂිතයි කියා කියන කොට එය පැවැත්වුණු ජනවාරි 08 වැනිදාට පමණක් සීමා වෙන්න අපට බැහැ. මැතිවරණයට දින නියම කරපු දිනයේ සිට මැතිවරණය පැවැත්වුණු දිනය දක්වා කාල සීමාවේදී සිදු වුණු සිදුවීම් ගැන විශ්ලේෂණයක් කරනවා නම්, රාජ්‍ය මාධ්‍ය හැසිරුණු ආකාරය අපි කවුරුත් දැක්කා. මම මේ ගරු සභාවට මෙයත් මතක් කරන්න කැමැතියි, උදේ 7.00 ඉඳලා ඡන්දය දමන්න අවස්ථාව තිබුණා. දිවා කාලය වන විට රාජ්‍ය මාධ්‍ය හරහා ප්‍රකාශයක් නිකුත් කළා, "සජිත් ප්‍රේමදාස මැතිතුමාත් අරලියගහ මන්දිරයට පැමිණ, එක්සත් ජාතික පක්ෂයෙන් මහින්ද රාජපක්ෂ පිලට එකතු වෙනවා" කියා. මෙවැනි විකෘති නිවේදන නිකුත් කරමින් රාජපක්ෂකරණය වෙලා ඉතාම අසාධාරණ මට්ටමෙන් රාජ්‍ය මාධ්‍ය හැසිරුණා.

සමෘද්ධිලාභීන්ගෙන් ඡන්ද මං කොල්ල කාපු හැටි අපි දන්නවා. සමෘද්ධිලාභීන්ට බලහත්කාරකම් කරලා, ඒ ගොල්ලන්ගේ සමෘද්ධිය ලබා නොදෙන ආකාරයට තර්ජනය කරලා ඡන්දය ලබා ගන්නට මේ රජය තැත් කරපු ආකාරය අපි දන්නවා. ඒ විතරක් නොවෙයි. සමෘද්ධි නියාමකවරුන් හරහා ගම්වල ජනතාව තුළට කා වැද්දුවා, ඡන්ද පෙට්ටිවල CCTV camera තිබෙනවා කියා. ඒකාධිපති රාජපක්ෂ පාලනයේ තිබුණු වියරු ස්වරූපය මඟින් මේ ආකාරයට ඡන්ද පෙට්ටිවල CCTV camera සවි කරලා තිබෙනවාය කියා, අහිංසක ගම්වාසීන් වෙනසකට පාවිච්චි කරන්න හදපු ඡන්දයත් තර්ජනාත්මක තත්ත්වයෙන් ලබා ගන්න මාධ්‍ය හැසිරෙව්වා විතරක් නොවෙයි, සමෘද්ධි නියාමකවරුන් හරහා මෙවැනි අභූත ප්‍රවෘත්ති නිකුත් කළා.

රාජ්‍ය ධනය, රාජ්‍ය සේවකයන්, රාජ්‍ය දේපළ විශාල වශයෙන් අනිසි ලෙස ඒ රජය පාවිච්චි කළ බව අපි දන්නවා. සිල් රෙදිවල ඉඳලා ඔරලෝසු දක්වා රාජ්‍ය ධනය යොදවලා මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මැතිවරණ කටයුතු සඳහා යොදා ගත් හැටි අපි දැක්කා. ජනතාවට දේශපාලන අල්ලස් ලබා දුන්නා.

ඒ විතරක් නොවෙයි. මහා පරිමාණයේ companiesවලින්, මහ බැංකුවෙන්, අධිවේගී මාර්ග සකස් කරන්නට තිබුණු මුදල්වලින් රුපියල් බිලියන ගණන් අරලියගහ මන්දිරයට ගෙනාපු අවස්ථා පිළිබඳ තොරතුරු internet එකෙන් ජනතාවට හෙළිදරව් වුණා. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ විධායක බලය, ධනය පාවිච්චි කරලා මැතිවරණ නීති උල්ලංඝනය කරලා මේ රජය ගෙන ගිය දූෂිත ක්‍රියාවලිය පරාජය කරන්නට නිර්පාක්ෂික අපේක්ෂකයෙක් හැටියට ඉදිරිපත් වුණේ, ඔබතුමන්ලාගේ පක්ෂයේ හිටපු මහ ලේකම් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා. ඒ වාගේම ඒ වෙනස ඇති කරන්නට ජනතාවත් බලාගෙන හිටියා. ජනතාව ඒ වෙනස ඇති කරන්නට එළියට ආවා. පාරට බැහැලා තමන්ගේ අදහස් ප්‍රකාශ කරන්නට ඉදිරිපත් වුණා. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජයග්‍රහණය කළේ, මේ රටේ ජනතාව මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ඡන්දය ලබා දුන්නේ -

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! Will an Hon. Member propose the Hon. R. Yogarajan to take the Chair?

ගරු දුනේෂ් ගන්කන්ද මහතා
(மாண்புமிகு துனேஷ் கங்கந்த)
(The Hon. Dunesh Gankanda)

I propose that the Hon. R. Yogarajan do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ආර්. යෝගරාජන් මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஆர். யோகராஜன் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. R. YOGARAJAN *took the Chair.*

ගරු දුනේෂ් ගන්කන්ද මහතා
(மாண்புமிகு துனேஷ் கங்கந்த)
(The Hon. Dunesh Gankanda)

මේ රටේ ඒකාධිපති පාලකයෙක් හැටියට ගෙන ගිය දූෂිත පාලනය හෙළා දැක, ඒ දූෂිත ක්‍රියාවලියට එරෙහිව ඒ පක්ෂයේම සිටි මහ ලේකම්වරයා -මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා- එළියට බැහැලා ගත්ත තීරණය ජනතාව අගය කළා. එතුමා ඒ වෙලාවේ කිව්වා, "මම කිසිම පක්ෂයකට නැතිව, ගෞරවනීය විධියට රාජ්‍ය නායකයාගේ වගකීම ඉෂ්ට කරනවා" කියා. ඒ අනුව ජනතාව එතුමා ගැන විශ්වාසයක් තබා ගත්තා. ඒ වෙනස් වීමට තුඩු දුන් මධ්‍යස්ථ ඡන්දය නිසායි එවකට මහින්ද රාජපක්ෂ රජය -රෙජීමය- අද විපක්ෂයට ගිහිල්ලා තිබෙන්නේ.

මැතිවරණ ප්‍රචණ්ඩත්වය ගැන කථා කළොත්, ඒ ගැන කථා කරන්නට මට විශාල පරම අයිතියක් තිබෙනවා. එවකට පැල්මඩුල්ලේ මම සංවිධානය කළ රැස්වීමට ජනාධිපති අපේක්ෂකතුමා හැටියට මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත්, ජෙනරල් සරත් ෆොන්සේකා මැතිතුමා, අර්ජුන රණතුංග මැතිතුමා, ජයතිස්ස රණවීර මැතිතුමා ඇතුළු ප්‍රධාන පෙළේ දේශපාලන කථික මන්ත්‍රීවරුන් කණ්ඩායමක් සහභාගි වුණා. මම සංවිධානය කළ ඒ රැස්වීම කඩාකප්පල් කරන්න කටයුතු සිදු වුණු ආකාරය ඔබ කවුරුත් දන්නවා. අද නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමන්ලා මාස තුනකින් මේ රජය වෙනස් කරනවාය කියලා උදම් අනනවා. "මාස තුනකින් පස්සේ ජනාධිපතිත් අපේ, ආණ්ඩුවත් අපේ" කියලා විපක්ෂ නායක හැටියට ඉතාමත්ම උජාරුවෙන් කියනවා. මේ ඔබගේම පක්ෂයේ නායකතුමා තමයි අද රටේ ජනාධිපති කියන එක, ඒ කියන අයට මම මතක් කරන්නට කැමැතියි. ඒ ජනාධිපතිතුමාට ජනාධිපතිවරණයේදී ඔබතුමන්ලා ආරක්ෂක නිලධාරීන් අතළොස්සයි ලබලා දුන්නේ. ආරක්ෂක නිලධාරීන් දෙතුන් දෙනෙක් දීලා, එතුමාගේ ආරක්ෂාව ගැන තිබුණු තත්ත්වය ගැන ඔබතුමන්ලා අවධාරණය කරන්න. එතුමාගේ ජීවිතය නැති කරලා හෝ පසු ගිය ජනාධිපතිවරණය ජයග්‍රහණය කරන්නට එවකට ආණ්ඩු පක්ෂය හැටියට ඔබතුමන්ලා කටයුතු කළ ආකාරය ඔබලාගේ යටි හිතට දැනෙනවා ඇති. පැල්මඩුල්ලේ එවැනි දැවැන්ත භීෂණයක් තිබුණා. ඒ වාගේම, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පැමිණීමට නියමිතව තිබුණු පැල්මඩුල්ල නගරයේ රැස්වීම තියන්නට මට අවසර ලබා දුන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි, අපේ ගරු නායක, වත්මන් අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැල්මඩුල්ල ආසනයේ වේවැල්වත්ත කලාපයේ

[ගරු දුනේෂ් ගන්කන්ද මහතා]

පැවැත්වීමට නියමිතව තිබුණු රැස්වීමටත් මට අවසර ලබා දෙන්න කටයුතු කළේ නැහැ. අපි මේ කටයුතු නීත්‍යානුකූලව ක්‍රියාත්මක කළ නිසා ඒ රැස්වීම කිහිපය පැවැත්වීමට විරුද්ධ වෙන්නට කිසිම හැකියාවක් තිබුණේ නැහැ. එදා පැල්මඩුල්ලේ bus stand එකේ තිබුණු රැස්වීමේදී මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා වේදිකාවේ ආමන්ත්‍රණය කරමින් සිටි මොහොතේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පැල්මඩුල්ල ආසනයේ සංවිධායක, ඒ වාගේම එම ආසනයේ ඉන්න එවැනිම අපවිත්‍ර දේශපාලන චරිතයන් ඇති අය එතුමාට සංවිධානාත්මකව ගල් ප්‍රහාරයක් එල්ල කළා. එදින එකතු වුණු දසදහසකට වඩා සෙනඟ උහුලා ගන්නට බැරිව, ජනාධිපති අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ගල් ගහලා, එතුමාගේ ජීවිතය අවදානම් තත්ත්වයකට පත් කරන්නට කටයුතු කළා. එදින ඇඟින් දුටු සාක්ෂි ඇතිව චෝදනා ලබන ඒ උදවිය නිදහස් කර ගන්නට අද ඉදිරිපත් වන්නේ කවුද? නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජෝන් සෙනෙවිරත්න මැතිතුමා, ඒ වාගේම නාමල් රාජපක්ෂ මැතිතුමා.

අද රටේ ජනාධිපතිතුමා ඒ අවස්ථාවේ ජනාධිපති අපේක්ෂකයා හැටියට පැල්මඩුල්ල නගරයේ රැස්වීමට සහභාගි වෙන කොට එල්ල කළ ගල් ප්‍රහාරයට සම්බන්ධ, ඇසින් දුටු සාක්ෂිවලට අදාළ වූදිතයන්ව ආරක්ෂා කරලා, ඇප ලබා දෙන්න දැන් එන්නේ කවුද? ජෝන් සෙනෙවිරත්න මන්ත්‍රීතුමායි, නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමායි. ඇත්තටම ඔබතුමන්ලා නියෝජනය කරන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ද එහෙම නැත්නම් මහින්ද රාජපක්ෂ ද කියන එක ගැන අද අපට විශාල ප්‍රහේලිකාවක් තිබෙනවා.

පසු ගිය මැතිවරණයේදී ශාන්ත දොඩන්ගොඩ කියන නිවිතිගල ආසනයේ අහිංසක පියෙකු මරුමුවට පත් කළේ,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ප්‍රේමලාල් ජයසේකරයි, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයකු වන ලසන්තයි කියන එක මා මේ අවස්ථාවේදී අවධාරණය කරන්න ඕනෑ. මෙවැනි ප්‍රචණ්ඩ ක්‍රියා අපි හෙළා දකිනවා. ඒ වාගේම පරාජයට පත් වෙලා මාසයකට අඩු කාල සීමාවකදී, ඒ දූෂිත රජයේ සිටි අය අද එළියට බැහැලා, "තව මාස තුනකින් අපි මහ මැතිවරණයට ඉල්ලනවා. අපට ඡන්දය දෙන්න" කියලා කියන්නේ විළි ලජ්ජාවක් ඇතිවද කියලා මා මේ අවස්ථාවේදී අහන්න කැමැතියි. අද රටේ ජනතාව බලාගෙන ඉන්නවා, ඒ දූෂිත පාලනයට එරෙහිව ඡන්දය පාවිච්චි කරලා මේ රට වෙනුවෙන් යුතුකම ඉෂ්ට කරන්නට. නුදුරු මහ මැතිවරණයේදී ජනතාව ඒ අයිතිය අතට අරගෙන කටයුතු කරාවි කියන විශ්වාසය ඇතිව මා නිහඬ වනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 4.38]

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து)
(The Hon. Arundika Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය ජනාධිපතිවරණයෙන් පසුව පැවැති මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් අද දින පැවැත්වෙන මේ විවාදයට සම්බන්ධ වීමට අවස්ථාව සලසා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට මතකයි, මේ රටේ පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් ගත්තාම 1977 සහ 2001 කියන කාලයේදී විශාල වශයෙන් රට තුළ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සිද්ධ වුණු බව. විශේෂයෙන්ම විරුද්ධ පාක්ෂිකයන්ට හිරිහැර කරලා, පොලීසියට නිවාඩු දීලා, දැවැන්ත විධියට රජය මැදිහත් වෙලා, රාජ්‍ය ත්‍රස්තවාදයත් එක්ක ඒ විරුද්ධ පාක්ෂිකයන්ට හිරිහැර කරදර සිද්ධ කළා. හැබැයි, ඒ හා සන්සන්දනය කරන කොට අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටත්, අග්‍රාමාත්‍යතුමාටත් විශේෂයෙන්ම ස්තූතිවන්ත වෙන්නට ඕනෑ, එදා තිබුණු ආකාරයට මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා අද සිදු වෙලා නැති නිසා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1994 දී පොදුජන එක්සත් පෙරමුණු රජය බලයට පත් වුණාට පස්සේ එවකට හිටපු අතිගරු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා කරන්න කොහෙත්ම ඉඩ දුන්නේ නැහැ. අවුරුදු 17ක එක්සත් ජාතික පක්ෂ පාලන කාලය අවසන් කරලා 1994 දී පොදුජන එක්සත් පෙරමුණ බලයට පත් වන කොට විශාල පීඩනයක් තිබුණා. ඒ පීඩනය එළියට ආවා. හැබැයි, ඒ ජනතාවට විශේෂයෙන්ම විරුද්ධ පාක්ෂිකයන්ට හිරිහැර කරන්න එතුමිය ඉඩ දුන්නේ නැහැ.

ඡන්දය පාවිච්චි කිරීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය කිරීම සම්බන්ධයෙන් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රටේ ඉතිහාසයට එක් වනවා. ඒ කාරණයේදී එතුමාගේ නම රන් අකුරින් ලියැ වෙන්න ඕනෑ. මොකද, ඒ නිසා විශාල වශයෙන් මැතිවරණ දූෂණ, ප්‍රචණ්ඩ ක්‍රියා සිද්ධ වුණේ නැහැ. ඒ වාගේම එතුමා 2005 ජනාධිපති ධුරයට පත් වුණාට පස්සේ සහ 2010 දී ජනාධිපති ධුරයට පත් වුණාමත් විශාල වශයෙන් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා රට තුළ සිද්ධ වෙන්න දුන්නේ නැහැ; විරුද්ධ පාක්ෂිකයන්ට ගහන්න දුන්නේ නැහැ; විරුද්ධ පාක්ෂිකයන්ට කරදර වෙන්න, හිරිහැර වෙන්න දුන්නේ නැහැ. හුදෙකලා සිද්ධීන් කිහිපයක් වෙන්න ඇති. හැබැයි, විශාල වශයෙන් ඒවා කරන්න දුන්නේ නැහැ. හැබැයි, 1977 සහ 2001 සම්බන්ධයෙන් ගත්තාම අපට තිබෙන්නේ ඉතාමත් ශෝචනීය අත් දැකීම්. 2001 දී මා නියෝජනය කරන පුත්තලම් දිස්ත්‍රික්කය තුළ වාගේම මේ රට පුරාමත් ඒ වාගේ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සිද්ධ වුණා. අද ඇත්තටම ගත්තාම හොඳ සාධනීය තත්ත්වයකට ඇවිල්ලා තිබෙනවා.

විශේෂයෙන්ම එහි ගෞරවය අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටත්, අග්‍රාමාත්‍යතුමාටත් පුද කරන්න ඕනෑ. මම නියෝජනය කරන්නේ වෙන්නප්පුව මැතිවරණ කොට්ඨාසය. වෙන්නප්පුව මැතිවරණ කොට්ඨාසයේ අපේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුට දංකොටුව පොළ ළඟදී දැඩි ලෙස පහර දුන්නා. හැබැයි, වෙන්නප්පුව මැතිවරණ කොට්ඨාසය භාර එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකතුමා -නිරෝෂන් පෙරේරා රාජ්‍ය අමාත්‍යතුමා- ඒකට වග කියන්න ඕනෑ නැහැ. මොකද, මම දන්නවා ඒ ක්‍රියා නවත්වන්න එතුමා විශාල උත්සාහයක් ගත්තා. අපි විරුද්ධ පක්ෂයේ සිටියත් ඇත්තටම එතුමාට ඒ ගෞරවය දෙන්න ඕනෑ. මැතිවරණයෙන් පස්සේ විරුද්ධ පාක්ෂිකයන්ගේ ගෙවල් ආරක්ෂා කරන්න, විරුද්ධ පක්ෂයේ අයට ගහන එක නවත්වන්න එතුමා සාධනීය පියවර රාශියක් ගත්තත්, හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊසාක් කැමිලස් කියන පුද්ගලයා සහ එතුමාගේ සහෝදරයෝ ඇවිල්ලා දංකොටුව පොළ ළඟදී ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයාට පහර දුන්නා. තැන් තැන්වල ඒ වාගේ හුදෙකලා සිද්ධීන් කිහිපයක් සිද්ධ වෙලා තිබෙනවා. අපි කියන්නේ, මේවා නවතින්න ඕනෑ කියන එකයි.

එක අතකින් අපි ස්තූතිවන්ත වෙනවා, මේ අවස්ථාවේ රජයක් හැටියට යම් යම් හොඳ පියවර රාශියක් අරගෙන තිබීම ගැන. හැබැයි, සමහර ආසන ගත්තාම -අපේ නාවලපිටිය ආසනය ගත්තාම- නාවලපිටිය ආසනයේ දැවැන්ත විධියට පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සිද්ධ වෙලා තිබෙනවා. නාවලපිටිය ආසනයේ විතරක් නොවෙයි, හුඟක් ආසනවල පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සිද්ධ වෙලා තිබෙනවා. ඒවා නවතින්න ඕනෑ. කොහෙන් හෝ ඒවාට තිතක් තියන්න ඕනෑ.

මේ රටේ ඉතිහාසයේ සිදු කළ වැරදි අනාගතයට ගෙනයන්නේ නැහැයි කියන තැන සියලුම දේශපාලනඥයෝ ඉන්නවා නම්, යහ පාලනය ගැන කථා කරනවා නම්, අපි ශුභවාදී දැක්මක් එක්ක මේ රට ඉදිරියට ගෙනයන්න ඕනෑ කියන තැන ඉන්න දේශපාලනඥයෝ නම් එම ක්‍රියාවලට අනුබල දෙන්න හොඳ නැහැ. නමුත් සමහර ආසනවල ඒ වාගේ අනුබල දුන් අවස්ථා අපි දැක්කා.

විශේෂයෙන්ම ප්‍රාදේශීය සභාවක අපේ ගරු සභාපතිවරයෙකුට වත්තලදී වූ සිද්ධිය ගැනත් අපි කනගාටු වෙනවා. ඇත්තටම රාජකාරි වෙලාවේදීයි එතුමාට ඒ දේ සිද්ධ වුණේ. ඒක නිසා අපි ඒ ගැන සම්පූර්ණයෙන්ම කනගාටුවට පත් වෙනවා. සමහර රජයේ නිලධාරින්ට, සමහර ප්‍රාදේශීය දේශපාලනඥයන්ට, ගම්වල දේශපාලනය කරන උදවියට රට පුරාම ඒ වාගේ යම් යම් තත්ත්වයන් ඇති වුණා. අපි ඒ ගැන කනගාටු වෙනවා.

විශේෂයෙන්ම ගරු අග්‍රාමාත්‍යතුමා අද යම් කිසි හොඳ තැනකට ඇවිල්ලා තිබෙනවා. පසු ගිය කාලයත් එක්ක ගත්තාම අග්‍රාමාත්‍යතුමා සාධනීය පියවර රාශියක් අරගෙන තිබෙනවා වාගේම, එතුමා හොඳ තැනකට ඇවිල්ලා තිබෙනවා. අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මැතිවරණයට ඉස්සෙල්ලා සහ මැතිවරණයෙන් පස්සේ එතුමාගේ හැම කථාවකදීම කිව්වා, මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා කරනවා නම් දැඩිව දඬුවම් කරනවා කියලා.

මේ සිද්ධි හුඟක් වෙලාවට පුද්ගලයානුබද්ධයි. අපේ නායකයෝ හොඳ ආදර්ශය දෙනවා නම්, අගමැතිතුමා ඒ ආදර්ශය දෙනවා නම්, ජනාධිපතිතුමා ඒ ආදර්ශය දෙනවා නම්, විපක්ෂ නායකතුමා ඒ ආදර්ශය දෙනවා නම්, පක්ෂ නායකයෝ ඒ ආදර්ශය දෙනවා නම්, ආසනවලට පත් කර තිබෙන ආසන සංවිධායකවරු, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, පළාත් සභාවල ප්‍රධාන නායකයෝ ඒ ආදර්ශය දෙනවා නම් පාක්ෂිකයෝත් ඒ තැනට එන්නේ නැහැ; ඒ දේවල් කිරීමට පෙළඹෙන්නේ නැහැ. ඒ දේවල් කරන්න යන්නේ නැහැ. හැබැයි, අපේ පාක්ෂිකයන් තුළ මෙහෙම මතයක් තිබෙනවා. මේ දින සියයේ කටයුතු තුළ ජනාධිපතිතුමා ඉන්නවා. ඒත් එක්කම මුළු ආණ්ඩු පක්ෂයයි, විරුද්ධ පක්ෂයයි සියලු දෙනාම එකතු වෙලා ඉන්නවා. ඒ සියලු දෙනා එකතු වෙලා රට පාලනය කරන නිසා අපේ පාක්ෂිකයන්ට ඒ විධියට ගහන්නේ නැහැයි කියලා අපේ අය මතයක් ඇති කරගෙන තිබෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து)
(The Hon. Arundika Fernando)
හොඳයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කවුරු දිනුවත් එකයි, කවුරු පැරදුණත් එකයි. ඊළඟ පාර්ලිමේන්තු මැතිවරණයෙන් පස්සේ මොන පක්ෂය ජයග්‍රහණය කළත්, මොන පක්ෂය පරාජයට පත් වුණත්, ඒ පැරදුණු අයට ජයග්‍රහණය කරපු අය හිරිහැර කරන්නේ නැතුව, ඒ ජයග්‍රහණය බුක්ති විඳිනවා නම්, ඒ වාගේම පැරදුණු අයටත් එකම ජන කොටසක් හැටියට සලකනවා නම් ඒක තමයි මේ රට තුළ සිද්ධ වෙන්න ඕනෑ දේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම සමහර සංස්ථාවල සිදු වන දේවල් ගැන මේ වෙලාවේ කියන්න ඕනෑ. ස්වාධීන රූපවාහිනීය ගත්තාම, ස්වාධීන රූපවාහිනීයේ "Chat 'n' Music" Programme එක කරපු අහිංසක ළමයා අද එළියට දමලා තිබෙනවා. ශ්‍රීලංකන් ගුවන් සේවයේ වෘත්තීය සමිති නායකයන් එළියට දමන්න කටයුතු කරගෙන යනවා. රූපවාහිනීයේ news කියපු කෙනා, පත්තරේක රස්සාව කරපු අය එළියට දාන්න අද කටයුතු කරනවා. ඒ වාගේ අයගෙන් පළිගන්න එපා.

ඒ වාගේ නිලධාරින්ගෙන් පළිගන්න එපා. වැරැදි කරපු නිලධාරින් ඇති. පක්ෂග්‍රාහීව වැඩ කරපු අය ඇති. හැබැයි, අහිංසක ලෙස වැඩ කළ අය ඉන්නවා. ඒ අයගෙන් පළිගන්න එපා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක තමයි මට කියන්න තිබෙන්නේ.

අපි සියලු දෙනාම එකතු වෙලා අපේ රට තුළ සිදු වන මේ පූර්ව සහ පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා අනිවාර්යයෙන්ම නැවැත්විය යුතුය කියන අදහසේ ඉඳගෙන තමයි මම මේ කථා කරන්නේ. අපේ ආසනවල ඒ තත්ත්වය මහ හරවන්න කටයුතු කළ නිරෝෂන් පෙරේරා ඇමතිතුමන්ලා වාගේ අයට නැවත වතාවක් මගේ ස්තුතිය පුද කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 4.47]

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය ජනවාරි 08වැනි දා පැවැත්වූ ජනාධිපතිවරණයෙන් පසුව සිදු වූ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සහ ඉන් පසුව ගනු ලැබූ විවිධ දේශපාලන තීරණ නිසා අසරණභාවයට පත් වුණු පුද්ගලයන් ඉන්නවා. අද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් කරලා මෙම විවාදය පැවැත්වෙන්නේ, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා වෙනුවෙන් බුලත් කොළය ලකුණට ඡන්දය පාවිච්චි කරපු ඒ ලක්ෂ 58කට ආසන්න ජනතාව අතරින් පීඩාවට පත් වූ පුද්ගලයන් පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කරවීම සඳහාත්, ඒ සම්බන්ධයෙන් යම් ආකාරයක කඩිනම් පියවර ගැනීම සඳහාත් බව මුලින්ම මා සඳහන් කරන්න අවශ්‍යයි.

අපේ රටේ පසු ගිය මැතිවරණ කාලවලදී -විශේෂයෙන් 1977න් පසුව- දේශපාලන සංස්කෘතියක් ඇති වුණා, මැතිවරණයකට පෙරත්, මැතිවරණයෙන් පසුවත් ජයග්‍රාහී දේශපාලන පක්ෂ හෝ කණ්ඩායම්වලට අයත් පිරිස් විසින් පරාජිත දේශපාලන පක්ෂ හෝ කණ්ඩායම්වලට අයත් ජනතාවට යම් ආකාරයේ හිංසාකාරී ක්‍රියා සිදු කිරීම සහ දේශපාලන පළිගැනීමට ලක් කරන. මේ හේතුව නිසා පසු ගිය ඉතිහාසයේ විවිධ අවස්ථාවලදී සමහර අය මිය ගියා; සමහර අය තුවාල වුණා; සමහර අය දේශපාලන පළිගැනීම්වලට ලක් වුණා. හැබැයි, ඒ සංස්කෘතිය 1994දී අපි අවසන් කළා. 1994දී පොදු පෙරමුණු රජය බලයට පැමිනුණාට පසුව ඒ තත්ත්වය අවසන් කළා. ඒ කාල සීමාව වන තුරුම, පළාත් සභා මැතිවරණයක් පැවැත්වූවාට පසුව සවස පහෙන් පසු දවසක් දෙකක් ඇඳිරි නීතිය දමපු යුගයක් තමයි තිබුණේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1993 දී පැවැති දකුණු පළාත් සභා මැතිවරණය හවස හතරට අවසන් වුණා. එදින පස්වරු පහේ සිට පහුවෙනි දා එළි වෙන තුරු ඇඳිරි නීතිය පනවලා තිබුණා. ඒ එක උදාහරණයක්. හැබැයි, මැතිවරණයෙන් පසුව ඇඳිරි නීතිය පනවන සම්ප්‍රදායය ඊට පසුව අපි අවසන් කළා. එක්සත් ජනතා නිදහස් සන්ධානය බිහිවූ දවසේ සිට -2004 වසරේ සිට- පසු ගිය ජනාධිපතිවරණය දක්වා අපි විවිධ මට්ටමින් මැතිවරණ ගණනාවක් -ජනාධිපතිවරණ, මහ මැතිවරණ, පළාත් සභා මැතිවරණ, ප්‍රාදේශීය සභා මැතිවරණ - පැවැත්වූවා. හැබැයි, මේ එකම මැතිවරණයක්වත් අවසන් වුණාට පස්සේ ඇඳිරි නීතිය පනවන්න අපේ පාලන කාලය තුළදී අපි කටයුතු කළේ නැහැ.

[ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා]

සමහරු ප්‍රචාරය කළා, අපේක්ෂා කළා මෙම ජනාධිපති මැතිවරණයේදීත් ඒ ආකාරයේ ක්‍රියාදාමයක් සිදු වෙයි කියලා. නමුත්, එසේ කළේ නැහැ. පසු ගිය ජනාධිපතිවරණයේ ප්‍රතිඵල නිකුත් වී අවසන් ප්‍රතිඵල නිකුත් වීමට මත්තෙන් හිටපු ජනාධිපතිතුමා අරලියගහ මන්දිරයෙන් පවා නික්ම ගියා. සමහර මැති ඇමතිවරු ඊළඟ පැය 24 තුළදී තමන්ගේ වාහන, කාර්යාල නව පාලනයට භාර දුන්නා. මා සතුව තිබූ වාහන, කාර්යාලය යන සියල්ලමත් පැය 24ක් තුළ මම භාර දුන්නා. අපි ඒ ආකාරයෙන් කටයුතු කළා. මට භාර දෙන්න නිල නිවාසයක් තිබුණේ නැහැ. මොකද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ ඇමතිවරයකු වශයෙන් මම නිල නිවාස කවදාවත් අරගෙන නැහැ. ඒ නිසා මට එවැනි ප්‍රශ්නයක් මතු වුණේ නැහැ. ඒ ආකාරයේ දේශපාලන සංස්කෘතියක් ක්‍රමානුකූලව අපි ගොඩ නඟාගෙන ආවා.

නායකයන් හැටියට අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත්, ගරු රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමාත් මේ තත්ත්වය සමනය කිරීම සඳහා එතුමන්ලාට දැනුම් දෙන ආකාරයට අවශ්‍ය සියලුම පියවර ගත්තාය කියන කාරණයත් එතුමන්ලාට ගෞරවයක් හැටියට මම සඳහන් කරන්න ඕනෑ. හැබැයි ඒ අයටත් පාලනය කර ගත නොහැකි තත්ත්වයන් තිබෙන්න පුළුවන්. එවැනි තත්ත්වයන් තුළ ජනතාව පීඩාවට පත් වන සිද්ධීන් යම් යම් ප්‍රදේශවල ඇති වුණා. මා දන්නා තරමින් කොළඹ දිස්ත්‍රික්කයේ නම් අපට කිසිම ප්‍රශ්නයක් තිබුණේ නැහැ. අපි හොඳ දේශපාලන සංස්කෘතියක් මේ ප්‍රදේශ තුළ පවත්වා ගෙන ගියා.

මෙහිදී මා විශේෂයෙන්ම මේ කාරණය අවධාරණය කරන්න ඕනෑ. අපේ ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා ජ්‍යෙෂ්ඨ නීතිඥ මහත්මයෙක්. ඒ වාගේම අපේ ජෝන් අමරතුංග මැතිතුමාත් ජ්‍යෙෂ්ඨ නීතිඥ මහත්මයෙක්. මා මේ කියන කරුණුත් මේ අතර තිබෙන බව මෙහිදී සඳහන් කරන්න ඕනෑ. 2010 ජනාධිපතිවරණය වකවානුවේදී සිදු වූ යම් යම් සිද්ධීන් සම්බන්ධයෙන් "බී" වාර්තා උසාවියට ගොනු කරලා, අවශ්‍ය සාක්ෂි ප්‍රමාණවත් නොවීම නිසා ඒ නඩු පසෙකින් තබා - lay by - තිබුණා. එසේ පසෙකින් තබා තිබුණු නඩු නැවත වතාවක් ගෙන, -පසු ගිය සතියේ අවස්ථා දෙකකදී- ඒ නඩුවල සැකකරුවන් යයි කියන පුද්ගලයින් රිමාන්ඩ් බන්ධනාගාරගත කළා. ඒ කාරණය ඔබතුමන්ලාගේ අවධානයට යොමු කරනවා. මා හිතන හැටියට ඒ ප්‍රශ්නය විසඳා ගන්න පුළුවන්. එතැන ලොකු ප්‍රශ්නයක් නැහැ. එක උදාහරණයක් මා කියන්නම්. ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ සභාපති -

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
In what year did it happen?

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
It happened in 2010, not during this Presidential Election; it happened immediately after the previous Presidential Election.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
කොහේද?

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ඇල්පිටිය ප්‍රදේශයේ. එහිදී අදාළ පළාත් සභා මන්ත්‍රීවරයාත් රිමාන්ඩ් කළා. ගරු සභානායකතුමනි, ගරු ජෝන් අමරතුංග ඇමතිතුමනි, එයට හේතුව Firearms Ordinance එක යටතේ charge එකක් ගොනු කර තිබෙන එකයි. ඒ කියන්නේ, "තුවක්කුවකින් වෙඩි තබන ශබ්දයක් මට ඇසුණා"යි කියලා සාක්ෂිකරුවකු කිව්වොත්, එය රතිඤ්ඤයක් වෙන්නත් පුළුවන්, නමුත් සාක්ෂි නැහැ. ඒ සඳහා production එකක් නැහැ, වෙඩි තැබූ බවට උණ්ඩ නැහැ, හිස් කොපු නැහැ. නඩු භාණ්ඩ හැටියට මේ කිසිවක් නැහැ. යම් කෙනකුගේ කට උත්තරයක සඳහන් වන්න පුළුවන්, "අසවලා එතැන සිටියා. එතැනින් වෙඩි තැබීමක් සිදු වුණා"යි කියලා. ගිනි අවි ආඥාපනත - Firearms Ordinance - යටතේ කියා සඳහන් කර තිබෙන නිසා මහෙස්ත්‍රාත්වරුන් ඇප ලබා දෙන්නේ නැහැ. ඒ සම්බන්ධයෙන් jurisdiction එක තිබෙන්නේ High Court එකට නිසා මහාධිකරණයට යන්න වෙනවා. මහාධිකරණයට මේ වාර්තා ගිහින්, නීතිපති දෙපාර්තමේන්තුවෙන් reports call කරලා, ඊට පස්සේ මේ ක්‍රියාදාමය -process එක- සිදු වෙන්න අඩුම තරමින් මාස එකහමාරක් හෝ මාස දෙකක් ගත වනවා. ඒ කාල සීමාව තුළ අර පිරිස් රිමාන්ඩ් බන්ධනාගාරගත වෙලා ඉන්නවා.

මේ සම්බන්ධයෙන් ක්‍රමයක් මට යෝජනා කරන්න පුළුවන්, ගරු ඇමතිතුමනි. -ඉස්සර විවිධ අවස්ථාවලදී අපි ඒ විධියට ක්‍රියා කළා.- නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයකු හෝ රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරයකු නම් කරලා, පොලිස් දෙපාර්තමේන්තුවෙන් SSP කෙනකු හෝ කවුරුන් හෝ එයට සම්බන්ධ කරලා මේ ක්‍රියාදාමය කඩිනම් කරන්න පුළුවන්. මෙවැනි ආකාරයෙන් රිමාන්ඩ් වුණු කෙනකුට නීතිඥ මහත්වරුන් හැටියට අපට පුළුවන්, නීතිපතිතුමාට ලියා, එය කෙළින්ම නීතිපති දෙපාර්තමේන්තුවට භාර දුන්නාම වහාම fax එකකින් report එක call කරන්න. ඒ report එක call කළාම නීතිපති දෙපාර්තමේන්තුවට උපදෙස් දෙන්න පුළුවන්, මෙය ඉදිරියට පවත්වා ගෙන යා හැකිද, එහෙම නැත්නම් ඇප දීමට විරුද්ධත්වයක් තිබෙනවාද, නැද්ද කියා. මහාධිකරණයට ගිහින් ඇප අයදුම් පත්‍රයක් ඉදිරිපත් කළත් සිද්ධ වන්නේ මේ ක්‍රියාදාමයමයි. හැබැයි ඒකට මාස එකහමාරක්, දෙකක් ගත වනවා. ඒ කාල සීමාව අඩු කර ගෙන, දින කිහිපයක් ඇතුළතදී, එනම් සතියක් වැනි කාලයක් ඇතුළතදී මේ පිළිබඳව තීන්දුව දෙන්න පුළුවන්. හැබැයි චෝදනා පත්‍රයක් ගොනු කිරීමට බැලූ බැල්මට ප්‍රමාණවත් සාක්ෂි තිබෙනවා නම්, ඒ පිළිබඳව ඇප දෙනවාට විරුද්ධ වනවාය කියා නීතිපති දෙපාර්තමේන්තුවට කියන්න පුළුවන්. එසේ නොමැති නම් මේ පිරිස් වහාම ඇප මත මුදා හරින්න කියා Attorney-General's Department can give their consent. එතකොට එය නීත්‍යානුකූලයි. එහිදී මූලික විමර්ශනයක් සිදු වෙලා තිබෙනවා. එම නිසා ඒ කටයුත්ත එසේ අවසන් කරන්න පුළුවන්. මා එවැනි යෝජනාවක් කරනවා. එවැනි සිද්ධීන් අපි ඔබතුමන්ලාගේ අවධානයට යොමු කරන්නම්. ඒ පිළිබඳව ගරු අග්‍රාමාත්‍යතුමාගේත් අවධානය යොමු කළා. ඒ ආකාරයෙන් කටයුතු කළොත් අනවශ්‍ය ලෙස රිමාන්ඩ් බන්ධනාගාරයේ තැබීම වෙනුවට ප්‍රමාදයකින් තොරව කඩිනමින් ඒ අය මුදා හැර පසුව පරීක්ෂණ කර නඩු පවරනවා නම් නඩු පවරන්න පුළුවන්කම තිබෙනවාය කියන යෝජනාව මා ඔබතුමන්ලාට ඉදිරිපත් කරනවා. ඔබතුමන්ලාගේ පාර්ශ්වයෙන් ඒ කටයුතු කරන්න පුළුවන්. මොකද, ඔබතුමන්ලා දෙදෙනාම මේ විෂය පිළිබඳව දන්නවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඇත්ත වශයෙන්ම ස්වාධීන කොමිෂන් සභා -ස්වාධීන අධිකරණයක්, ස්වාධීන පොලීසියක්- පිහිටු වීම මේ පාර්ලිමේන්තුව තුළින් ඉක්මනින් සම්මත කර ගත්තොත් - if we have the independent Commissions -

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

අපේ සම්පූර්ණ සහයෝගය ලබා දෙනවා, ස්වාධීන කොමිෂන් සභා පිහිටුවන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඇත්ත වශයෙන්ම ඔබතුමා කථා කරපු ප්‍රශ්නවලට උත්තර තිබෙන්නේ එතැනයි. අපි ස්වාධීන කොමිෂන් සභා පිහිටු වීම සම්මත කළොත්, මීට පස්සේ මෙවැනි ප්‍රශ්න පාර්ලිමේන්තුවේදී කථා කරන්න අවශ්‍ය වන්නේ නැහැ.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

ඒක හරි. ඔබතුමාත් එක්ක මා එකඟ වනවා. මොකද, ස්වාධීන කොමිෂන් සභා පිහිටු වීම සම්බන්ධයෙන් වූ දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සඳහා එදා මමත් ආණ්ඩු පක්ෂයේ ඉඳලා අත උස්සපු මන්ත්‍රීවරයෙක්. ඒකේ කිසි ගැටලුවක් නැහැ. නමුත් මා කියන්නේ අපට එතෙක් කල් ඉන්න අවශ්‍ය නැහැ කියලායි. මෙතැන ප්‍රශ්න කිහිපයයි තිබෙන්නේ. ඕනෑ නම් ඔය වාගේ අත් අඩංගුවට ගැනීම් කරලා තිබෙන ඒවා, අවුරුදු තුන හතරක් පරණ ඒවා පහක් හයක් ඇති. තමුන්නාන්සේලාට පුළුවන්, අදාළ අංශයට යොමු කරලා, සතියක් වැනි කාලයකදී ඒ කටයුතු නිම කරලා අවශ්‍ය ඉදිරි පියවර ගන්න.

අනෙක් කාරණය දේශපාලන වාතාවරණය. ඕනෑම රකට සංවර්ධනය සඳහා වැදගත් වන පළමුවන කාරණය තමයි රටේ සාමය; ජනවාර්ගික සාමය. අපි ඒක ඇති කරලා දීලා තිබෙනවා. හිටපු ජනාධිපතිතුමාත්, රජයත්, ඒ වෙලාවේදී කටයුතු කළ ඒ සියලු දෙනාත් ඒක රාශි වෙලා, බොහෝ දෙනාගේ සහයෝගයෙන් ඒ කාරණය ඇති කරලා තිබෙනවා. ඒක පදනම් කරගෙන දැන් දේශපාලන ස්ථාවරභාවයක් ඇති කර ගන්නට ඕනෑ. අපි කවුරුත් දන්නවා, ඒකට තමයි දැන් මේ කාගේත් සහයෝගය ලැබෙන්නේ කියලා. හිටපු ජනාධිපති ඒ තනතුරෙන් ඉවත් වුණාම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ව්‍යවස්ථානුකූලව නීතිය ක්‍රියාත්මක වීමෙන් අනිවාර්යයෙන්ම හිටපු ජනාධිපතිතුමා අනුශාසක ධුරයට පත් වෙනවා. ඊළඟට රටේ ජනාධිපති වෙන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කෙනකු නම් ඔහු නිරායාසයෙන්ම පක්ෂයේ සභාපති ධුරයට පත් වෙනවා. ඒ අනුව තමයි අපි පක්ෂයක් හැටියට තීන්දු ගත්තේ. තමුන්නාන්සේලාගේ ඡන්ද පදනම බොහෝ දුරට බලපෑවා, වර්තමාන ජනාධිපතිතුමා ජනාධිපති ධුරයට පත් වන්නට. අපේ ව්‍යවස්ථාව ක්‍රියාත්මකවීම නිසා එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති වුණා. මේක දෛවෝපගත සිද්ධියක්.

අනෙක් පැත්තෙන් අදටත් මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගෙන් 140 දෙනෙක් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ. එයින් 127 දෙනෙක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ. ඒ අනුව පාර්ලිමේන්තුවේ බහුතරය අපේ. නමුත් ආණ්ඩුව තමුන්නාන්සේලාගේ, 49 දෙනෙකු සිටියාට. මේකෙන් දෙපැත්තම තුලනයවීමක් වෙලා තිබෙන්නේ. එහෙම නේද? මේක තුලනයවීමක් වෙලා. ආණ්ඩුව තමුන්නාන්සේලාට ගිහින්. තමුන්නාන්සේලාගේ සහායෙන් පත් වුණු ජනාධිපතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති වෙලා. ඒක හොඳයි. හොඳ දේශපාලන සංස්කෘතියක්.

කෙසේ නමුත් මේ දේශපාලන ස්ථාවරභාවය වැදගත් වෙනවා. මොකක්ද හේතුව? කවුරුන් රට පාලනය කළත්, -ජනාධිපතිතුමාත්, ආණ්ඩුවත් මේ ආකාරයෙන් වුණාට- මේ දේශපාලන ස්ථාවරභාවයත් සමඟ තමයි විදේශ සංචාරකයින් තව වැඩියෙන් ලංකාවට එන්නේ; ආයෝජන ඒම වැඩි වෙන්නේ; ඒ වාගේම ජන වර්ග අතර සැකයන් තිබෙනවා නම් ඒවා දුරු වෙන්නේ. ඇත්ත වශයෙන්ම මේ තුළින් යහපත් සමාජයක් නිර්මාණය වෙනවා. ඒ සඳහා අවශ්‍ය වට පිටාව හැදෙන විට, දේශපාලන ප්‍රචණ්ඩත්වය කියන ඒවා අපි ප්‍රතික්ෂේප් කළ යුතුයි. දේශපාලනය කිරීම කියන හේතුව මත කරන මාරුවීම්, සේවයෙන් ඉවත්කිරීම් පවා නැවැත්වීමට අපි කටයුතු කරන්නට අවශ්‍යයි.

ඊළඟට, මම මෙහිදී සඳහන් කරන්නට ඕනෑ, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ, පාර්ලිමේන්තුව නියෝජනය කරන පක්ෂ 14ක් තිබෙනවා; පාර්ලිමේන්තුව නියෝජනය නොකරන පළාත් සභා නියෝජනය කරන මට්ටමේ තිබෙන පක්ෂ 2ක් තිබෙනවා; ඊට අමතරව මැතිවරණයකදී සහයෝගය දෙන ලියා පදිංචි දේශපාලන පක්ෂ 27ක් තිබෙන බව. මේ පක්ෂ සියල්ලේම තම තමන්ගේ ප්‍රතිපත්ති මාලා තිබෙනවා. නමුත් මේ අය සන්ධානය තුළ සන්ධානගත වෙලා සිටින්නේ එක අරමුණක් වෙනුවෙන්. එහෙම තමයි කටයුතු වුණේ. අපි දකිනවා, මේ මැතිවරණයෙන් පසුව සමහර වෙලාවට සන්ධානයේ දේශපාලන පක්ෂ තමන්ගේ මත ප්‍රකාශ කරනවා; පුවත් පත් සාකච්ඡා පවත්වනවා; රැළි සංවිධානය කරනවා. නමුත් ඒවා එක්සත් ජනතා නිදහස් සන්ධානය හැටියට සංවිධානය කළ ඒවා නොවෙයි. ඒවා ඒ ඒ දේශපාලන පක්ෂවලට සන්ධානය තුළ තිබෙන නිදහසත් සමඟ ඒ අය තමන්ගේ මතය ප්‍රකාශ කිරීම සඳහා යොදා ගත්ත ක්‍රියාදාමයක් කියන කාරණය මෙහිදී මම විශේෂයෙන්ම සඳහන් කළ යුතුව තිබෙනවා.

තව දින කිහිපයකින් පැවැත්වෙන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සමස්ත ලංකා කාරක සභාවේදී, අවශ්‍ය වෙනස්කම් කරගෙන, ඉදිරි වැඩ පිළිවෙළ සකස් කරගෙන, ඒ අනුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ දේශපාලන වැඩ පිළිවෙළ අපි ඉදිරියට ගෙන යනවා. ඊට සමගාමීව සන්ධානය හැටියට ඊට පසුව රැස් වෙලා දේශපාලන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා. ඒක ඕනෑම දේශපාලන පක්ෂයකට පොදුයි. හැම දේශපාලන පක්ෂයක්ම ඊළඟ මහ මැතිවරණය ඉලක්ක කරගෙන තමන්ගේ දේශපාලන වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යා යුතුයි. ඒ වාගේම ඉදිරියේදී පත් වන පාර්ලිමේන්තුවකදී පාර්ලිමේන්තු ව්‍යුහයත් මේ රටේ ජනතාව අපේක්ෂා කරන ආකාරයට සකස් විය යුතුව තිබෙනවා. ඒක මැතිවරණයකදී තීන්දු වෙනවා, කාටද පාර්ලිමේන්තුවේ බහුතර බලය ලැබෙන්නේ කියන කාරණයත් සමඟ.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැටියට අපට උතුරේ යාපනයේත්, දකුණේ හම්බන්තොටත්, බටහිර කොළඹත්, නැඟෙනහිර මඩකළපුව ප්‍රදේශයේත්, කඳුකර ප්‍රදේශයේත්, -මැතිවරණ බල ප්‍රදේශ 160ම- සංවිධාන වැඩ පිළිවෙළක් තිබෙනවා; සංවිධාන ශක්තියත් තිබෙනවා; අපේ සාමාජිකයෝ ඉන්නවා. ඒ නිසා සන්ධානයේ ප්‍රධාන දේශපාලන බලවේගය හැටියට අපට පුළුවන් වෙලා තිබෙනවා, සන්ධානය පදනම් වෙලා තිබෙන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මතය කියන කාරණය හැම විටම සිහියේ තබාගෙන කටයුතු කරන්න. ඒ වාගේම හිටපු ජනාධිපතිතුමාගේ, හිටපු ජනාධිපතිතුමියගේ, වර්තමාන ජනාධිපතිතුමාගේ ආශීර්වාදය තිබෙනවා, අපේ දේශපාලන වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන්න. ඕනෑම දේශපාලන පක්ෂයක් බැලුවත් එහෙමයි. ඒ ඒ දේශපාලන පක්ෂවල හිටපු ජනාධිපතිතුමන්ලාගේ සහාය, ආශීර්වාදය ඒ ඒ අවස්ථාවල ලැබුණා. ඒක අපිත් ලබා ගන්නවා. ඒ වාගේම ඊ ළඟ මහ මැතිවරණයක් එනවා නම් පාර්ලිමේන්තුවේ බහුතර බලය ලබා ගැනීම ඉලක්ක කරගෙන තමයි ඕනෑම දේශපාලන පක්ෂයක් තමන්ගේ දේශපාලන වැඩ පිළිවෙළ ගෙන යන්නේ. ඒ සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, එක්සත් ජනතා නිදහස් සන්ධානයත් කටයුතු කරනවාය කියන කාරණය මෙහිදී මම සඳහන් කරන්න ඕනෑ.

මම මීට වඩා දීර්ඝ ලෙස කථා කරන්න යන්නේ නැහැ. මෙහිදී විශේෂයෙන්ම අපට යුතුකමක් තිබෙනවා, එක්සත් ජනතා නිදහස් සන්ධානය වෙනුවෙන් පසු ගිය ජනාධිපතිවරණයේදී ඡන්දය ලබා දුන්නු, සහාය ලබා දුන්නු පණස්අට ලක්ෂයකට ආසන්න ජනතාව

[ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහත්මිය]

අතරින් කාට හෝ මානසිකව හෝ කායිකව යම් පීඩාවක් වෙනවා නම් ඒ වෙනුවෙන් අපි පාර්ලිමේන්තුවේදීත් ඉන් පිටතදීත් කරුණු දක්වමින් ඒ අයට අවශ්‍ය සහනය ලබා ගැනීම සඳහා, ඒ අය ආරක්ෂා කිරීම සඳහා අපි කටයුතු කරන්න. හැබැයි, ඒ අය රැක ගැනීමේදී, ඒ අයට සහාය ලබා දීමේදී වෙනත් දේශපාලන පක්ෂවල අයට පීඩාවක් කරනවාය කියන කාරණය මේකෙන් අදහස් වෙන්නේ නැහැ කියන බවත් මම මෙහිදී සඳහන් කරන්න ඕනෑ.

විශේෂයෙන්ම අද මේ අවස්ථාවේදී පළපුරුදු, පරිණත, දේශපාලනය කරපු ඇමතිවරු සහ ඇමතිතුමියන්ලා තමයි ආණ්ඩු පක්ෂය පැත්තේ ඉන්නේ. යම් ප්‍රශ්නයක් පැන නැඟුණොත් පාර්ලිමේන්තුවේදී නිල වශයෙන් ප්‍රශ්න කරනවා වාගේම තමුන්නාන්සේලාත් එක්ක සාකච්ඡා කරලා විසඳුම් දෙන්නත් අපට පුළුවන්. අපේ කාලයේදීත් එහෙමයි. මෙන්න මේ වාගේ ප්‍රශ්නයක් තිබෙනවාය කියා කවුරු හෝ අපට පාර්ලිමේන්තුවේදී යම් කාරණයක් ගැන කිව්වා නම් අප ඒ ගැන සොයා බැලුවා. ඒක තමයි අපේ දේශපාලන සංස්කෘතිය. ඒක තමයි අපි ඇති කළ යුතු වන්නේ. ඒ නිසා මුලදී කථාව පටන් ගනිද්දී කිව්වා වාගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ දැන් ඉන්න සභාපතිතුමා, රටේ ජනාධිපතිතුමා. ඒ වාගේම එක්සත් ජාතික පක්ෂය තමයි ආණ්ඩුව හැටියට පාලන බලය ඇතිව අමාත්‍ය මණ්ඩලයේ බහුතරයක් සමඟ රට පාලනය කරන්නේ. මෙවැනි දේශපාලන සංස්කෘතියක් අපේ රටේ ඇති වුණ ප්‍රථම අවස්ථාව තමයි මේ. ලෝකයේ කොහේවත් මෙවැනි තත්ත්වයක් ඇති වෙලා නැතිව ඇති.

කෙසේ වෙතත් පහුගිය මැතිවරණයේදී ජනතාව යම් අපේක්ෂාවකින් ඡන්දය දුන්නා. එයින් අදහස් වන්නේ හොඳ වැඩසටහන් වන ස්වාධීන කොමිෂන් සභා පිහිටුවීම, යම් ආකාරයක බලතල සීමාවන් ඇති කිරීම, පාර්ලිමේන්තුව ශක්තිමත් කිරීම, Oversight Committees පිහිටුවීම, Audit Commissions පිහිටුවීම සම්බන්ධයෙන් අධ්‍යයනය කරමින්, හැමතිස්සේම ප්‍රජාතන්ත්‍රවාදය සුරැකීම සඳහා ඒවාට අවශ්‍ය සහයෝගය ලබා දෙමින්, පාර්ලිමේන්තුව ශක්තිමත් කිරීම සඳහා ගෙන යන වැඩ පිළිවෙළට අපේ සහයෝගය ලබා දෙන්න පුළුවන්ය කියන කාරණය සඳහන් කරනවා. ඒ වාගේම එළඹෙන ඕනෑම මහ මැතිවරණයකදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ එක්සත් ජනතා නිදහස් සන්ධානය ඒ දේශපාලන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරමින් ප්‍රජාතන්ත්‍රවාදී ආකාරයෙන් පාර්ලිමේන්තුවේ බහුතර බලය ලබා ගැනීම සඳහා කටයුතු කරනවාය කියන කාරණය සඳහන් කරමින් පීඩාවට පත්ව සිටින අපේ පාක්ෂිකයන් වෙනුවෙන් අප පෙනී සිටිනවාය කියන කාරණයත් සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 5.05]

ගරු තලතා අතුකෝරල මහත්මිය (විදේශ රැකියා අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல - வெளிநாட்டு தொழில்வாய்ப்பு அமைச்சர்)
(The Hon. (Mrs.) Thalatha Atukorale - Minister of Foreign Employment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තූතියි. පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා ගැන කථා කරනකොට ඇත්තෙන්ම අද අපි ජීවතුන් අතර ඉන්නේ මේ මැතිවරණ ප්‍රතිඵලය නිසායි. විශේෂයෙන්ම මේ මැතිවරණ ප්‍රතිඵලය වෙනස් වුණා නම් මෛත්‍රිපාල සිරිසේන ජනාධිපතිතුමා ජීවතුන් අතර නැහැ කියන එක අකැමැත්තෙන් වුණත් කියන්න ඕනෑ. එහෙම නම් අපි ඔක්කොම ටික හිර ගෙවල්වල තමයි ඉන්නේ. [බාධා කිරීමක්] ඔබතුමාත් එක්ක මගේ ප්‍රශ්නයක් නැහැ. නමුත් විපක්ෂ නායකතුමා බලාගෙන ඉද්දි කියන්න ඕනෑ, මේක බොහොම කාලෝචිත යෝජනාවක්ය කියන එක. මොකද, මේ රටේ දේශපාලන ඉතිහාසයේ අඩුවෙන්ම ප්‍රචණ්ඩ ක්‍රියා වුණා නම් සිද්ධ වුණේ මේ මැතිවරණයෙන් පසුවය කියන එක කියන්න ඕනෑ. අපි ඒ පිළිබඳ ගෞරවය ගරු ජනාධිපතිතුමාටත්, අපේ ගරු අග්‍රාමාත්‍යතුමාටත් මේ අවස්ථාවේදී පුද කරනවා. කවුරු මොනවා කිව්වත් ඇත්ත කථාව තමයි 9 වැනි දා මැතිවරණ ප්‍රතිඵලය වෙනස් වුණා නම් අපි ජීවතුන් අතර නැහැ කියන එක.

හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා තවදුරටත් රත්නපුර දිස්ත්‍රික්කයේ හිටියා නම් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා වැඩි වෙන්න ඉඩ තිබුණා. ඒ ගැන කියන්න මම මෙය අවස්ථාවක් කර ගන්නවා. ගරු ජෝන් සෙනෙවිරත්න හිටපු ඇමතිතුමනි, එතුමා ඔබතුමාගේ හිතවත් මිත්‍රයා. එතුමා හිටියා නම් අනිවාර්යයෙන්ම අපේ පැමිණිල්ලක්වත් ලියාගන්නේ නැති තත්ත්වයකට පොලීසි ටික ඔක්කෝම පත් කරනවා. මොන හේතුවක් නිසාද දන්නේ නැහැ, වහාම ක්‍රියාත්මක වන පරිදි අපේ දැසටත් නොපෙන්වලා එතුමා යවලා තිබෙනවා. ගරු පොලිස්පතිතුමාට ඒ ගැන අපේ ස්තූතිය පුද කරන්න ඕනෑ.

රත්නපුර දිස්ත්‍රික්කයේ අපේ ජ්‍යෙෂ්ඨ නායකතුමා තමයි මාගේ ඉතාම හිතවත්, ජෝන් සෙනෙවිරත්න මැතිතුමා. එතුමාගේ කතාවේදී කියලා තිබෙනවා ගොඩක් ප්‍රචණ්ඩ ක්‍රියා රත්නපුර දිස්ත්‍රික්කයේ සිද්ධ වුණා කියලා. ගරු හිටපු ඇමතිතුමනි, ඔබතුමා දේශපාලනයට ගෙනාපු ඔබතුමාගේ ජ්‍යෙෂ්ඨතම ගෝලයා තමයි රත්නපුර දිස්ත්‍රික්කයේ මේ ප්‍රචණ්ඩකාරි සියලු දේ කරන්නේ. ඉතින් හිටපු ගරු ඇමතිතුමනි, ඕකට හැමදාම මුහුණ දෙන්නේ මම නේ. ඔබතුමා ඒ ගැන දන්නවා. සමහර විට ඔබතුමා හිතන්න ඇති අපේ අයියා ජීවතුන් අතර හිටියා නම් එයාටනේ ගහන්නේ, මේ ගැනිට නෙවෙයි නේ මේ ප්‍රශ්නය ඇති වෙන්නේ කියලා ඔබතුමා හිතන්න ඉඩ තිබුණා.

පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩත්වයට ඉස්සෙල්ලා, මැතිවරණයට පෙර මනුෂ්‍ය ඝාතනයක් සිදු වුණා. මම පෞද්ගලිකව හොඳටම දන්නා කාරණාවක් තමයි, අර මම කලින් කියපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ කරන පොලිස් නිලධාරින්ට පවා තර්ජනය කරලා තිබුණය කියන එක. ඒ තරමටම එදා තත්ත්වය පිරිහිලා තිබුණා. ඔහු තමයි ලලිත් ජයසිංහ කියන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා.

ඔබතුමා ඔබතුමාගේ ගෝලයා බලන්න ඊයේ උසාවි ගිහිල්ලා එතුමා වෙනුවෙන් පෙනී සිට තිබුණා. ඒවාට අපේ කිසිම අමනාපයක්, තරහක් නැහැ. නමුත්-

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඒවා අනුමත කරනවා නොවෙයි. මම ඇත්ත වශයෙන්ම කියන්න ඕනෑ විශේෂයෙන්ම මම ඒවා හෙළා දකිනවා කියලා. නමුත් පක්ෂයේ සිටින පුද්ගලයෙක් වශයෙන් පක්ෂයේ උපදෙස් අනුව මට යන්න සිද්ධ වුණා. දැන් මම ඇමතිවරයෙක් නොවෙයි.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

ඔබතුමා පක්ෂයේ උපදෙස් ගන්නේ අපේ ජනාධිපතිතුමාගෙන්ද? එහෙම නැත්නම් ඔබතුමා උපදෙස් ගන්නේ හිටපු ජනාධිපතිතුමාගෙන්ද?

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

මම දැන් ඇමතිවරයෙක් නෙවෙයි. ඒ නිසා නීතිඥවරයෙක් වශයෙන් උසාවි යන්න පුළුවන්. ඒ නිසා ඒ වරප්‍රසාදය මම භුක්ති විඳලා පක්ෂයේ සාමාජිකයෙක් වශයෙන් තමයි මම ගියේ. නැත්නම් ඒවා අනුමත කරනවා නොවෙයි.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

ඔබතුමාගෙන් මම අහන්නේ උපදෙස් ගත්තේ කොයි ජනාධිපතිතුමාගෙන්ද කියලායි. මම ඇහුවේ වැදගත් ප්‍රශ්නයක්. මම හොඳටම දන්නවා, ඔය ප්‍රහාරයට එන්න ඒ පුද්ගලයා ලෑස්ති වෙනකොට ඔබතුමා වාහනය නවත්වලා ගෙදර යන්න කියා උපදෙස් දීලා තිබුණු බව. අපි ඒවාට ගරු කරනවා. මම මේ තත්ත්වයට අද ඊයේ නෙවෙයි, මගේ අයියා නැති වුණු දවසේ ඉඳලා මුහුණ දුන්නා. ඔබතුමා දන්නවා, මේ තත්ත්වය මග හරින්න එතුමාත් එක්ක මම මොන තරම් හොඳ සම්බන්ධතාවක් ඇති කරගෙන තිබුණාද කියා. මේ මැර දේශපාලනයට මම කොහෙත්ම කැමැති කෙනෙක් නොවෙයි. මම කාන්තාවක්. මම මේ ඡන්දයට ඉස්සෙල්ලාත් කාන්තාවක්, පස්සෙත් කාන්තාවක්, හැමදාමත් මම කාන්තාවක් හැටියට පෙනී සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා කියපු ආකාරයේ ප්‍රචණ්ඩත්වයක් මේ වනකොට නැහැ. කිසිම කෙනෙකුට පොලීසියේ අනවශ්‍ය බලපෑම් ඒ ප්‍රදේශයේ නැහැ. පොලීසියේ පැමිණිලි ලියා ගන්න එපා කියලා නැහැ. මම හිතන්නේ හොඳම දේ තමයි රත්නපුර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයාගෙන් ඒ විස්තර ලබා ගන්න එක. එසේ ලබා ගත්තා නම් රත්නපුරයේ තිබුණු ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳව දැනුවත් වෙන්න පුළුවන්. සමහර අවස්ථාවන්වලදී මට මේවා දැන ගන්න ලැබුණාම මම ගමක් ගානේ ගිහින් කිව්වා, කිසි කෙනෙකුට කරදර කරන්න එපා, අපි මේ ගම්වල සමගියෙන් හොඳින් ජීවත් වෙන්න ඕනෑ, ඔයගොල්ලන්ගේ මළ ගෙදරට, මගුලට ඉන්නේ ගමේ මිනිස්සු මිසක් දේශපාලනඥයෝ නොවෙයි, අපි දේශපාලන වශයෙන් බෙදුණාම සමහර වෙලාවට අපි එන්නත් පුළුවන්, නොඑන්නත් පුළුවන් කියලා. අපි සමහර තැන්වල ඒ තත්ත්වයෙන් ආදර්ශවත් විධියට කටයුතු කළා.

රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ජානක වක්කුඹුර මහතා ප්‍රකාශයක් කළා, නිවිතිගල ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුට කඩුවෙන් ගැහුවා කියලා. කඩුවෙන් ගහන්න හේතුව තමයි අනවශ්‍ය විධියට යම් පුද්ගලයෙකුගේ ගෙදරකට මහ රෑ 12.30ට ඇතුළු වීමට යෑම. විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමනි, ඒ නිවස කොටාමුල්ලේ අජන්ත රණසිංහගේ ගෙදර. ඔහුගේ බිරිඳ බොහොම රූමත් කාන්තාවක්. කඩුවෙන් නොවෙයි, මොකෙන් ගැහුවත් මොකද? රෑ 12.30ට 1.00ට පමණ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් අනික් අයගේ ගෙවල්වලට රිංගනවාද? මෙන්න මේ වාගේ තත්ත්වයක් අද ඇති වෙලා තිබෙනවා. ඒ ඇරෙන්න, මම වගකීම බාර ගන්නවා රත්නපුර දිස්ත්‍රික්කයේ කොහේ හරි - [බාධා කිරීමක්] I do not know. That is up to you to decide. I am not - [බාධා කිරීමක්]

ඒවාත් ඔබතුමාගේ උපදෙස් කියලා තමයි අපට ආරංචි වෙලා තිබෙන්නේ. නමුත් motive එක, ඒක නොවෙයි කියලා ඔබතුමා දැනගත්තේ කොහොමද? අපි බොහොම සුහදව දේශපාලනය කරනවා. මේ බලය කියන එක අද තිබෙන්නට පුළුවන්; හෙට නැති වන්නට පුළුවන්. අපි කාලයක් බලයේ ඉඳලා තිබෙනවා; බලය නැතිව ඉඳලාත් තිබෙනවා. නමුත් මනුස්සයකු හැටියට, ඕනෑම කෙනකුට හිරිහැරයක් කරනවා නම් අපි ඒකට විරුද්ධයි. කලවාන ප්‍රදේශයේ යම් යම් සිදුවීම් පටන්ගෙන තිබුණා. ඒවා බරපතළ සිද්ධීන් නොවෙයි. ඒ බවට ජානක වක්කුඹුර මන්ත්‍රීතුමාත් සාක්ෂි දරනවා ඇති කියලා මා හිතනවා. ඒවා ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ කරපු ඒවා වාගේ, ප්‍රේමලාල් ජයසේකර හිටපු නියෝජ්‍ය ඇමතිවරයා පසු ගිය කාලයේ කරපු ඒවා වාගේ සිද්ධීන් නොවෙයි. ගරු විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමනි, ඒ වෙනුවෙන් නීතිය ක්‍රියාත්මක කරන්නේ නැත්තේ ඇයි කියලා මම එදා කථා කරලා ඇහුවා. අපේ ජනාධිපතිතුමා හෝ, අගමැතිතුමා එවැනි ක්‍රියා අනුමත කරන්න අපට උපදෙස් දීලා නැහැ. අප ලැබූ ජයග්‍රහණය තුළ පිහිටුවා තිබෙන මේ ආණ්ඩුවේ ජනාධිපතිතුමා එක් පක්ෂයකිනුත්, අගමැතිතුමා තවත් පක්ෂයකිනුත් පත් වෙලා සිටිනවා. මේක රටට ඉතාම හොඳ තත්ත්වයක්. මේ තත්ත්වය ඒ විධියටම ඉස්සරහට ගියොත් ඔය සිදුවීම් හැම එකක්ම නවතිනවා. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ලේකම්තුමාත් බොහොම පැහැදිලිව සඳහන් කළා, අපි මේ තත්ත්වය ඉස්සරහට ගෙන යන්නේ කොහොමද කියන එක. යුද්ධය අවසන් කළා කියලා හැම දාම ඒ පිළිබඳව කථා කරපු අයට ඒ තත්ත්වය මේ රටේ දකුණේ ඇති කරන්න බැරි වුණා. කුහකකම, ඊර්ෂ්‍යාව, වෛරය, තනතුරුවලට තිබෙන ලෝභකම, අනෙක් වරප්‍රසාදවලට තිබෙන කෑදරකම කියන ඒවා තමයි ඒ අයව මේ තැන්වලට තල්ලු කළේ.

මා වගකීමක් ඇතිව කියනවා, අපේ දිස්ත්‍රික්කය පිළිබඳව විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා මොන තරම් චෝදනා කළත් ඒවා එකක්වත් පිළිගන්න අපි සූදානම් නැහැ කියලා. එවැනි දෙයක් සිදු වුණේත් නැහැ. මගේ පාක්ෂිකයකු වූ ශාන්ත දොඩම්ගොඩ මහත්මයාව ජීවිතක්ෂයට පත් කරලා තිබියදීත් එක ගල් කැටයකින් හෝ, වැලි කැටයකින් හෝ අනෙක් අයට හානියක් සිදු නොවන විධියට අපි ඒ මරණයේ අවසන් කටයුතු සිදු කළා. ගරු ජෝන් සෙනෙවිරත්න මන්ත්‍රීතුමනි, එහෙම වුණේ නැහැ කියලා ඔබතුමා පුළුවන් නම් කියන්න. මට සමහර අය මේ සම්බන්ධයෙන් උපදෙස් දුන්නා. මම කිව්වා, "අපි මිනී විකුණාගෙන කන ජාතියේ අය නොවෙයි" කියලා. අවමංගල්‍ය සඳහා විශාල සෙනඟක් මේ නිවසට ආවා. ඒ නිවසේ සෙනඟ හසුරුවන්න බැරි තත්ත්වයක් තිබුණු නිසා පාංශුකූලය දීමේ කටයුතු, භූමිදාන කටයුතු කරගන්න විතරක් මෘත දේහය නගරයේ ස්ථානයකට ගෙන ගියා. මා එහි වගකීම භාර ගත්තා. නමුත් මිනීමැරුමට චෝදනා ලබා සිටින අයගේ ගෙවල්වලට අද විශේෂ කාර්ය බලකායේ ආරක්ෂාව ලබා දීලා තිබෙනවා. ඒ නිවසට පෙනෙන ස්ථානයක තමයි මේ මරණයට පත්වුණු මනුෂ්‍යයාගේ නිවස තිබෙන්නේ. නමුත් මිනීමැරුමට චෝදනා ලබා සිටින කහවත්ත ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ ගෙදරට විශේෂ කාර්ය බල කායේ ආරක්ෂාව ලබා දී තිබෙනවා.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ඒ, රණ්ඩු වේවි කියන බයටයි.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

නැහැ, නැහැ. එහෙනම් එහෙම කරලා ගොඩක් දවස්. ඔබතුමා එය දන්නවා. ඔබතුමා ඔය විධියට කියන්න එපා. ඔබතුමන්ලාගේ කාලයේ තමයි ඒවා සිදු වුණේ. අපේ කාලයේ ඒවා සිදුවෙලා නැහැ. අපි මිනී විකුණාගෙන කන්න තරම් බාල පන්තියේ දේශපාලනය කරන අය නොවෙයි. එතුමාගේ ජීවිතය බේරා ගන්න අපි උත්සාහ කළා. හැම කෙනෙකුම ඒ අවස්ථාවේ අපට උදව් කළා. නමුත් එය කර ගන්න බැරි වුණා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Minister, you have only one more minute.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

Okay, Sir. I have to only ask my Friend not to mislead the House. - [*Interruption*.] Yes, Hon. Senewiratne, you had done it. When I was not here, you had done it.

Anyway, thank you very much, Sir, for giving me time to speak.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Yes, Hon. John Senewiratne.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
The matters that I mentioned are those that actually took place. Otherwise, I would not have mentioned those. As regards this serious incident in Kahawatte, I am with you, Hon. Minister. I know you behaved very well.You controlled the people very well and there was nothing that happened contrary to the law and order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Thank you, Hon. Member. The next speaker is the Hon. Lasantha Alagiyawanna.

[අ.භා. 5.14]

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින විපක්ෂ නායකතුමා විසින් පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳව ගෙන එන ලද, සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව සම්බන්ධයෙන් වචන කිහිපයක් සඳහන් කිරීමට ලැබීම පිළිබඳව මා ඉතාම සතුටු වෙනවා. අද උදේ ඉඳන් පැවැති මෙම විවාදය පුරාවට ආණ්ඩු පක්ෂය නියෝජනය කරමින් කථා කළ සියලු කථිකයන් පසු ගිය කාල සීමාව තුළ - එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ආණ්ඩුව කාල සීමාව තුළ - ඒ අයට සිදු වූ හිරිහැර පිළිබඳව සඳහන් කළා. කුමන දේශපාලන පක්ෂයක් හෝ කුමන ආණ්ඩුවක් විසින් හෝ සිදු කරන මෙවැනි ක්‍රියා මා පෞද්ගලිකව හෙළා දකිනවා. මගේ මැතිවරණ බල ප්‍රදේශය වන මහර ආසනයේ සංවිධායකවරයා වශයෙන් මා මැතිවරණ 10කට ආසන්න සංඛ්‍යාවකට මුහුණ දීලා තිබෙනවා. එම මැතිවරණවලදී එකම පැමිණිල්ලක් සම්බන්ධයෙන්වත් පොලීසියකට යන්න සිදු නොවුණු තත්ත්වයක් තුළ එම මැතිවරණ ව්‍යාපාර දියත් කරන්නට අපට හැකිවීම ගැන මා සතුටු වනවා.

එක්සත් ජාතික පක්ෂය පසු ගිය කාල සීමාව තුළදී කිව්වේ මොකක්ද? ප්‍රචණ්ඩ ක්‍රියා ප්‍රතික්ෂේප කරනවා, ඒවා වැරදියි, ඒ අය ඒවා අනුමත කරන්නේ නැහැ කියන එකයි. ඒ අයට යම් බලයක් ලැබුණොත් එවැනි ප්‍රචණ්ඩ ක්‍රියා ක්‍රියාත්මක කරන්නේ නැහැ කියන පොරොන්දුව මේ රටේ ජනතාවට ලබා දීපු නිසා තමයි ජනතාව ඔවුන්ට ඡන්දය ලබා දුන්නේ. දැන් මේ අය බලයට පත් වුණාට පසුව මෙවැනි ප්‍රචණ්ඩත්වයක් මුදා හැරලා, නිදහසට කරුණු වශයෙන් අතීතයේ සිදු වූ දේවල් ගැන කියන එක ප්‍රමාණවත් වන්නේ නැහැ කියලා මා හිතනවා. ඒක අපි අවබෝධ කර ගන්නට ඕනෑ.

මම හිතන විධියට 1977 දී තමයි අපේ රටේ වැඩිම පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩත්වයක් ක්‍රියාත්මක වුණේ. දහස් සංඛ්‍යාත ගෙවල් ප්‍රමාණයක් පිච්චුවා. රජයේ සේවකයින්ව ස්ථාන මාරු කළා. ඔවුන් සේවයෙන් පහ කිරීමට කටයුතු කළා. 1977 දී එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව විසින් මේ ප්‍රචණ්ඩත්වය ආරම්භ කළා. මට මතකයි -

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Minister, what is your point of Order?

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
අපේ හිටපු නියෝජ්‍ය ඇමතිතුමා තවම කථා කරන්නේ 1977 අවුරුද්ද පිළිබඳවයි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
That is not a point of Order. Hon. Member, you may continue.

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
ඔබතුමියට වාගේ අතීතය අමතක කරන්න අපට බැහැ.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ඔව්, ඒක හොඳයි.

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
ඔබතුමියගේ seat එකට යන්න. ඔබතුමියගේ seat එකට ගිහිල්ලා කථා කරන්න.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
මේ මගේ seat එක.

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
1977 දී මමත් පෞද්ගලිකව මේ දේශපාලන ප්‍රචණ්ඩත්වයට මුහුණ දුන්නා. මට එතකොට වයස අවුරුදු 10යි. මගේ ගේ සම්පූර්ණයෙන්ම පිච්චුවා. මගේ මවත්, පියාත් ගුරුවරුන්. ඔවුන් සේවය කළේ අත්තනගල්ල ප්‍රදේශයේ පාසල්වල. නමුත් මැතිවරණයට පනුවදාම ඔවුන්ව අනුරාධපුරයට ස්ථාන මාරු කළා. ඊට පසුව පැවැති සෑම මැතිවරණයකදීම මේ දේශපාලන ප්‍රචණ්ඩත්වය මුදා හැරියා. නමුත් අපි අවුරුදු 17ක් විපක්ෂයේ ඉඳලා 1994 දී පොදුජන එක්සත් පෙරමුණු රජය බලයට පත් වුණත්, ඊට පසුව එවැනි ආකාරයෙන් පශ්චාත් මැතිවරණ

ප්‍රචණ්ඩත්වයක් මේ රට තුළ ක්‍රියාත්මක වුණේ නැහැ. නමුත්, 2001දී ප්‍රතිඵලය වුණේ මොකක්ද? 2001 දී චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය ජනාධිපතිනිය වශයෙන් කටයුතු කරද්දි එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව බලයට පත් වුණා. ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමාගේ කථාවේ දී කිව්වා, 1994 වර්ෂයේ සිට පසු ගිය කාල සීමාව තුළදී ප්‍රචණ්ඩ ක්‍රියා හයදහස් ගණනක් සිදු වුණාය කියලා. එතකොට පසු ගිය කාල සීමාව තුළ දීම ප්‍රචණ්ඩ ක්‍රියා හයදහස් ගණනක් සිදු වෙලා තිබෙනවා. හැබැයි, 2001 අවුරුද්දේ දී පමණක් දේශපාලන ප්‍රචණ්ඩ ක්‍රියා 3,000ක් සිදු වෙලා තිබෙනවා. එහි දී 60 දෙනෙකු මැරුණා. වාර්තා අරගෙන බලන්න, අපේ මැති ඇමතිවරුන්ගේ පුත්තු, පවුල්වල අය ඇතුළුව 60 දෙනෙකු 2001 අවුරුද්දේ දී දේශපාලන ප්‍රචණ්ඩත්වය නිසා ජීවිත පූජා කර තිබෙනවා. මේවා කාටවත් නැහැයි කියලා කියන්න පුළුවන්කමක් නැහැ. 1977 දී එහෙමයි; 2001 දී එහෙමයි කියලා, ඊට පසුව අපේ ආණ්ඩුවලිනුත් යම් ප්‍රචණ්ඩත්වයක් සිදු වුණා නම් ඒකත් වැරදියි. ඒක අපි පිළිගත යුතුයි.

එම නිසා අද පාර්ලිමේන්තුවට මේ කල් තැබීමේ යෝජනාව ගෙන එන්නත්, මේ විෂය භාර අමාත්‍යවරයා විධියට ජෝන් අමරතුංග අමාත්‍යතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙන එන්නත් මේ සෑම කරුණක් මුල් වුණා. ඒ වාගේම වත්තල ප්‍රාදේශීය සභාවේ සිද්ධ වුණු ඒ අනුමත කරන්න බැරි ඉතාමත් පහත් නින්දිත ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාවත් ඒ සඳහා මුල් වුණාය කියන එක අපි සඳහන් කරන්න ඕනෑ. [බාධා කිරීමක්] පශ්චාත් මැතිවරණ ක්‍රියා. [බාධා කිරීමක්] ඔබතුමා උත්තර දෙන විට කියන්න. පොඩ්ඩක් ඇහුම් කන් දෙන්න කෝ. කලබල වෙන්න එපා. [බාධා කිරීමක්] කලබල වෙන්න එපා. සාමාන්‍යයෙන් වත්තල ප්‍රාදේශීය සභා රැස්වීම් පැවැත්වෙන දින තීරණය කරන්නේ අවුරුද්ද මුලදීයි. ඒ අනුව ජනවාරි 22 වන දා වත්තල ප්‍රාදේශීය සභාවේ න්‍යාය පත්‍රය ප්‍රකාශයට පත් කළා. ජනවාරි 30 වන දා උදේ 9.00ට සභා රැස්වීම කැඳවා තිබුණේ. කැඳවීම් ලියුම් යවා, විධිමත් පරිදි මේ සියල්ලමක්ම කර මේ සභා රැස්වීම සිරිත් පරිදි පැවැත්වූවා. 29 වන දා සවස එක්සත් ජාතික පාක්ෂිකයන් ප්‍රාදේශීය සභාව ඉදිරියට ඇවිත් ගරු ජෝන් අමරතුංග අමාත්‍යතුමා පිළිගැනීමේ උත්සවයක් 9.30ට තිබෙනවාය කියා ලොකු cut-out එකක් ගැහැව්වා. හෙට උඹලාට ගහනවාය කියා තර්ජනය කළා. වත්තල ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා 29 වන දින ගිහිල්ලා පොලීසියේ entry එකක් දැම්මා, ජෝන් අමරතුංග ඇමතිතුමාගේ මග පෙන්වීම යටතේ තමන්ට සභාව ගෙන යන්නට පුළුවන් කමක් නැහැ, ආරක්ෂාව ලබා දෙන්නටය කියා. ඒ entry එකට අනුව පොලිස් ආරක්ෂාව ලබා දුන්නා. ගරු ඇමතිතුමාට අයිතියක් තිබෙනවා, තමාගේ ආසනයේ ප්‍රාදේශීය සභාවට ඇවිත් පිළිගැනීමේ උත්සවයක් කරන්න. ඒ පිළිබඳව අපේ කිසිදු ගැටලුවක් නැහැ. නමුත් සභා රැස්වීම තිබෙන දිනයේම මේ අවස්ථාව යොදා ගැනීම පිළිබඳව අපි සිතා බැලිය යුතුයි. අමාත්‍ය ධුරයේ වැඩ භාර අරගෙන පසුවදා නොවෙයි පිළිගැනීමේ උත්සවය තිබුණේ. අමාත්‍ය ධුරයේ වැඩ භාර අර ගෙන තව දින ගණනාවක් තිබුණා පිළිගැනීමේ උත්සව තියන්න. නමුත් සභාවක් කැඳෙව්වාට පස්සේ වෙනස් කරන්න බැහැ. ඒ කෙසේ හෝ අමාත්‍යතුමනි, ඔබතුමාගේ අභිමතය පරිදි ඔබතුමා හොඳයි කියා සිතලා, ඒක සුදුසුය කියා සිතලා එදා පිළිගැනීමේ උත්සවය පැවැත්වූවා. පිළිගැනීමේ උත්සවය ඉවර වුණා. උත්සවය ඉවර වෙලා, පොලිස් ස්ථානාධිපතිතුමාටත් එතැනින් යන්න කියලා ඔබතුමාත් එතැනින් නික්ම ගියා. ඊට පස්සේ පිරිසක් දොරවල් කඩලා ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා සභා රැස්වීම තිබෙන කාමරය ඇතුළට පැනලා, සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන්ට පහර දුන්නා. පොලීසිය ඇතුළට ආවා. පොලීසිය කිව්වා, දැන් මේ සභාවෙන් එළියට යන්න කියලා. "අපට එළියට යන්න බැහැ, එළියේ පිරිසක් ගහනවා" කියා සභාවේ අය කිව්වා. "අපි ආරක්ෂාව දෙන්නම්" කියා පොලීසියෙන් කිව්වා. ඒ අනුව මේ සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන් එළියට ගියා. එළියේදී මේ සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන්ට ප්‍රහාරයක් එල්ල කළා. සභාව තියන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. ප්‍රාදේශීය සභාව කියන්නේ ප්‍රජාතන්ත්‍රවාදී ආයතනයක්. ඒවායේ කටයුතු කර ගෙන යාමට ඉඩ දිය යුතුයි. පහර කෑ සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන් රෝහල් ගත කළා. ප්‍රහාරය එල්ල කළ සියලුම අය රූපවාහිනියේ පෙන්නුවා. පැමිණිල්ලේ නම් සඳහන් කළා.

ශ්‍රී ලංකා පොලීසිය පිළිබඳව මම පෞද්ගලිකව සතුටු වෙනවා. වර්තමාන පොලිස්පතිතුමා ස්වාධීන, අවංක පොලිස්පතිවරයෙක් කියන එක අපි දන්නවා. ඒ පිළිබඳව අපේ ගැටලුවක් නැහැ. අපි පොලීසියට දෝෂාරෝපණය කරන්නේ නැහැ. පසු ගිය කාලයේ - ඉතිහාසය තුළ- අපේ රටේ ප්‍රධාන අපරාධ සියල්ලක්ම ඇල්ලුවා. දක්ෂ පොලීසියක්. හැබැයි, පොලීසියේ නොවෙයි වැරැද්ද තිබෙන්නේ. පොලීසියට එල්ල වන දේශපාලන බලපෑම් මත පොලීසිය අසරණ වෙනවා. පොලීසියෙන් කටඋත්තර ගත්තා. නමුත් මේ සැකකරුවන් වන පළාත් සභා මන්ත්‍රීවරයා ඇතුළු අය අත් අඩංගුවට ගන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. ප්‍රාදේශීය සභා රැස්වීමක් තිබෙන අවස්ථාවක, සභාපතිවරයා සභාවේ කටයුතු පවත්වා ගෙන යන අවස්ථාවක දොරවල් කඩලා, ඇතුළට ඇවිල්ලා ප්‍රහාරයක් එල්ල කළා. ඒ එක මන්ත්‍රීවරයකුගේ අත කැඩිලා. එතුමා දියවැඩියා රෝගයෙන් පෙළෙන නිසා තවම එතුමාට operation එකක් කරන්න පුළුවන්කමක් නැහැ. එතුමා ශල්‍යකර්මයකට භාජන විය යුතුයි. සාමාන්‍යයෙන් අපේ රටේ නීතිය අනුව බලන විට මෙතැන පොලීසියෙන් හෝ අධිකරණයෙන් හෝ වැරැද්දක් සිද්ධ වෙලා තිබෙනවා. අපි මේ පිළිබඳව අධිකරණ අමාත්‍යතුමාගෙනුත්, අධිකරණ සේවා කොමිෂන් සභාවෙනුත් විමසනවා. මම මේ පිළිබඳව පාර්ලිමේන්තුවේ උපදේශක කාරක සභාව දැනුවත් කළා. මෙවැනි සිද්ධියකදී සැකකරුවන්ට ඇප ලබා දීම අපට අදහා ගන්න බැහැ. මම දන්නා සිද්ධියක් තිබෙනවා.

ගම්පහ දිස්ත්‍රික්කයේ සමුපකාර සමිතියේ සභාපතිතුමා අධ්‍යක්ෂ මණ්ඩල ලියකියවිලි ටික අරගෙන ගියා කියලා දින 21ක් රිමාන්ඩ් භාරයේ තබා තිබෙනවා. එතුමා අදත් රිමාන්ඩ් භාරයේ. සමුපකාර සමිතියේ සභාපතිතුමා අධ්‍යක්ෂ මණ්ඩල ලිපිලේඛන ටික අරගෙන ගියා කියලා දින 21ක් රිමාන්ඩ් භාරයේ තබනවා, සභාවක් පවත්වන කොට දොරවල් කඩලා ඇවිල්ලා සභාපතිට ගහලා, මන්ත්‍රීවරයකුගේ අත කඩලා තුවාලකරු රෝහල්ගත කර තිබෙද්දීත් ඒ සැකකරුවන්ට ඇප ලබා දෙනවා. ඉතින් මේක ප්‍රශ්නයක්. මේක විහිළුවක්. ඒ නිසා මම උපදේශක කාරක සභාවෙන් ඉල්ලුවා, කවුද අත් අඩංගුවට ගත්තේ, මොන වගන්තිය යටතේද දැම්මේ යනාදී විස්තර. පොලීසිය කියනවා, අපි ඇප දෙනවාට විරුද්ධ වුණා කියලා. මේවා සියල්ලම කියන්න පුළුවන්. පොලීසිය හොඳයි. ඒ වාගේම මම දන්නවා, බලපෑම මත පොලීසියට කරන්න පුළුවන් බොහෝ දේ තිබෙන බව. ඒ බලපෑම මත පොලීසිය ඒ දේ කළා. මේවා රට දැන ගත යුතුයි. මේවාට විරුද්ධව යහ පාලනය ඇති කරන්න තමයි අද මේ අය බලයට පත් වුණේ. ඒ වාගේම රූපවාහිනිය තුළින් මේ සැකකරුවන් මුළු රටටම පෙන්නුවා. මුලින්ම දැම්මේ සිද්ධියට සම්බන්ධ නැති වෙනත් තුන් දෙනෙක්. එම නිසා අද මේ සිද්ධිය පිළිබඳව විශාල සැකයක් සමස්ත රටේ ජනතාව තුළම ඇති වෙලා තිබෙනවා. ගරු ජෝන් අමරතුංග ඇමතිතුමා අපේ මිත්‍රයෙක්. ඒ මිත්‍රකම් වෙනයි. නමුත් විෂය භාර අමාත්‍යවරයා විධියට ඔබතුමා මේ සිද්ධියේදී අනවශ්‍ය ලෙස බලපෑම් කළාය කියන චෝදනාව අපි කෙළින්ම ඔබතුමාට එල්ල කරනවා. එසේ එල්ල කළ යුතුයි. ඒක නැහැයි කියන්න පුළුවන්කමක් නැහැ. මෙහෙම දේවලට සම්බන්ධ සැකකරුවන්ට ඇප දෙන්න තිබෙන නීතිමය තත්ත්වය මොකක්ද කියලා අපි අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් විමසනවා. කවුරු කළත් මේවා වැරදියි. වත්තල ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා ඇතුළු ඒ මන්ත්‍රීවරුන්ට සිදු වුණු අපහසුතාව පිළිබඳව අපගේ කනගාටුව පළ කරන අතර, ඒ දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරුන් විධියට අපි මේ පිළිබඳව සාධාරණය ඉටු කර ගැනීම වෙනුවෙන් අවශ්‍ය ඕනෑම ක්‍රියා මාර්ගයක් ගැනීමට කටයුතු

[ගරු ලසන්ත අලගියවන්න මහතා]

කරනවා. විෂය භාර අමාත්‍යවරයා විධියට මේ පිළිබඳව වගකීම ඔබතුමා භාර ගත යුතුයි. පොලීසියේ නිලධාරි මහත්වරුන්ටත් අපට ඒ තොරතුරු දෙන්න බැහැ කියලා අපි දන්නවා. සිදු වුණු දේ අපි දන්නවා කියන එක විතරක් අවබෝධ කර ගන්න. ඉතිහාසයේ කොහේවත් මෙවැනි සිද්ධියකට ඇප දීලා නැහැ. ඇප දෙන්න පුළුවන්කමක් නැහැ. එම නිසා අප මේ පිළිබඳව පාර්ලිමේන්තුව තුළදීත්, ඉන් පිටතදීත් ගත යුතු උපරිම ක්‍රියා මාර්ග සියල්ලක්ම ගැනීමට කටයුතු කරනවා. ඒ වාගේම අපේ ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා කොමිෂන් සභා පිළිබඳව කිව්වා. හරි, අප ඒවා කළේ නැහැ. එම නිසා අප වැරැද්ද පිළිගන්නවා. දැන් ඔබතුමන්ලා ඒක කරන්න. අපි සහයෝගය දෙනවා. හැබැයි, කොමිෂන් සභා පිහිටුවන කොට සියලුම ස්ථානාධිපතිවරුන් මාරු කරලා, සහකාර පොලිස් අධිකාරිවරුන් මාරු කරලා, දිස්ත්‍රික් ලේකම්වරුන් මාරු කරලා, ප්‍රාදේශීය ලේකම්වරුන් මාරු කරලා ඉවර වෙලා කොමිෂන් සභා පිහිටුවා වැඩක් වෙන්නේ නැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මම ඒ ගැන පැහැදිලි කිරීමක් කරන්නම්. ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම සියලුම පොලිස් ස්ථානාධිපතිවරුන් මාරු කරන්න කියා අප තීරණයක් අරගෙන නැහැ. මොකද, මහනුවර දිස්ත්‍රික්කය ගත්තොත්, අපට ප්‍රශ්න තිබෙන්නේ නාවලපිටියේ සහ පන්විල විතරයි. කිසිම පොලිස් නිලධාරියෙකු මාරු කරන්නය කියා මම නම් කියා නැහැ. මහනුවර වුණත්, සෙංකඩගල වුණත් මම ඒ වාගේ කිසිම ඉල්ලීමක් කර නැහැ. හැබැයි, සමහර පොලිස් ස්ථානවල ප්‍රශ්න තිබෙනවා. Some OICs were having problems in the area. එම නිසා එම පොලිස් ස්ථානවල අලුත් ආරම්භයක් - new beginning - සඳහා කරනවා මිස, අපේ නායකතුමා පැහැදිලිව කියා තිබෙනවා, සමස්තයක් වශයෙන් මාරු කරන්නේ නැතුව ප්‍රශ්න තිබෙන තැන් පිළිබඳව බලන්නය කියා. මොකද, තෝරන්න අමාරුයි. කුට්ටම කොහොම ඇනුවත් මතු වෙන්නේ ප්‍රශ්න තිබෙන කෙනෙක්. මොකද, අවුරුදු විස්සක් තිස්සේ පොලීසියට බඳවා ගත්තේ තමුන්නාන්සේලාගේ රජය යටතේනේ. එසේ බඳවා ගත් බොහෝ දෙනෙකු දේශපාලන හිතවත්කම් මත තමයි, බඳවා ගෙන තිබෙන්නේ. එම නිසා ඇත්ත වශයෙන්ම අපට පැහැදිලිව අපේ එක්කෙනා කියා තෝරා ගන්නත් බැහැ. නමුත් අප කරන්නේත් නැහැ. පසු ගිය කැබිනට් රැස්වීමේදී නායකතුමා පැහැදිලිව කිව්වා, "සමස්තයක් වශයෙන් මාරු කරන්න එපාය; නමුත් ප්‍රශ්න තිබෙන තැන් පිළිබඳව බලන්නය" කියා.

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

මම හිතන්නේ ඒ තමයි, ඔබතුමන්ලා බලාපොරොත්තු වෙන ආරම්භය. හැබැයි, ඒ ආරම්භය අලුතින් පිහිටුවන කොමිෂන් සභාවලටම බාර දුන්නා නම් තමයි, හොඳම ආරම්භය වෙන්නේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාවට, පොලිස් කොමිෂන් සභාවට බාර දෙන්න. දිස්ත්‍රික් ලේකම්වරුන් මාරු කිරීම සම්බන්ධව කටයුතු කිරීමේදී, එම නිලධාරින්ගේ බඳවා ගැනීමේ පටිපාටි, මාරු කිරීමේ පටිපාටි සම්බන්ධව කටයුතු කිරීමේදී එම කොමිෂන් සභාවලට බාර දෙන්න. පොලිස් නිලධාරින්ට විරුද්ධව කටයුතු කරනවා නම් පොලිස්පතිතුමාට පැමිණිලි කරන්න. ඒ අය සම්බන්ධව විනය පරීක්ෂණ පවත්වන්න. කඩවත සහකාර පොලිස් අධිකාරිවරයා ලෙස ගුණරත්න මහත්මයා කටයුතු කළා. එක්සත් ජාතික පක්ෂයේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුට 2010 වර්ෂයේදී පෞද්ගලිකව මොකක්ද සිදුවීමක් වුණාය කියා -ඔබතුමාට කියා- දැන් එතුමා වෙනත් කොහේටද මාරු කරලා. එතුමා ඉතා දක්ෂ නිලධාරියෙක්. එක්සත් ජාතික පක්ෂයේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා තමයි ඒ සහකාර පොලිස් අධිකාරිවරයා මාරු කරන්නේ. එතුමා සභාවේදී කිව්වා. සභා වාර්තාවල තිබෙනවා. ඔබතුමන්ලා පත් වුණේ, මේ වාගේ දේවල් කරන්නේ නැහැ කියායි. එම නිසා අප ඔබතුමන්ලාගෙන් ඉල්ලීමක් කරන්නේ. මේ සියලුම පොලිස් ස්ථානාධිපතිවරුන්, සහකාර පොලිස් අධිකාරිවරුන්, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරුන් සම්බන්ධව කටයුතු කිරීමේදී ඔබතුමන්ලාගේ පොලිස් කොමිසම පිහිටෙව්වාට පසුව එම කොමිසමට අලුත් ආරම්භය බාර දීම තමයි, මම හිතන්නේ සුදුසුම ක්‍රියා මාර්ගය වෙන්නේ. කොමිෂන් සභා පිහිටුවනවා කිව්වා; ස්වාධීනත්වය ඇති කරනවා කිව්වා. නමුත් අවශ්‍ය මාරුවීම් ටික කරලා තමයි, ඒ කොමිෂන් සභා පිහිටුවීමට කටයුතු කරන්නේ කියන එක රටේ ජනතාව දැන ගත යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙන කොට සියලුම දිස්ත්‍රික් සමෘද්ධි සම්බන්ධීකරණ නිලධාරින් මාරු කර අවසානයි. ඒ වාගේම සියලුම සමෘද්ධි නිලධාරින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් පිටතට මාරු කිරීම සඳහා අවශ්‍ය චක්‍රලේඛ නිකුත් කරලා අයදුම් පත්‍ර ලබන 15 වැනි දාට පෙර ඉල්ලන්න කියා උපදෙස් ලබා දීලා තිබෙනවා. අද අපේ ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා ඇතුළු මන්ත්‍රීවරුන් අගමැතිතුමා සමඟ තිබුණු සාකච්ඡාවේදී මේ කරුණු ඉදිරිපත් කළා. එතුමා ඒවා නවත්වන්න අවශ්‍ය උපදෙස් ලබා දුන්නා. එම නිසා අප හිතනවා, එම උපදේශය ක්‍රියාත්මක වෙයි කියා. හැබැයි, මේ වෙන විට සියලුම දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරිවරුන්ගේ ස්ථාන මාරුවීම් කර අවසානයි. සමෘද්ධි නිලධාරින් සමඟ ඔබතුමන්ලා තරහා ඇති; අමනාප ඇති. ඒ අය දේශපාලනමය අයිතිවාසිකම් තිබෙන නිලධාරින්. සමෘද්ධි සංවර්ධන නිලධාරින් කියන්නේ, දේශපාලන අයිතිවාසිකම් නැති නිලධාරින් නොවෙයි. ඒ අයට දේශපාලනය කරන්න අයිතියක් තිබෙනවා; දේශපාලනය කිරීමේ අයිතිවාසිකමක් තිබෙන නිලධාරින්ට දේශපාලනය කිරීමේ අයිතිය තිබෙනවා. එම නිසා අපි කියනවා, සමෘද්ධි ව්‍යාපාර තුළත් ස්ථාන මාරුවීම් සියල්ලක්ම කරන්න උත්සාහ කරන්නේ සැබෑ ලෙසම ඒ අයගෙන් දේශපාලන පළිගැනීමක් සඳහායි කියා. විශේෂයෙන්ම වත්තල ප්‍රාදේශීය සභාවේ ඒ ඇති වුණු සිද්ධියත්, පොලීසිය සම්බන්ධ කර ගෙන කරන නීති විරෝධි කටයුතුත් මා මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ. ඊට අමතරව, පොලිස් නිලධාරින්ට ලබා දෙන මාරුවීම්. ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමනි, ඔබතුමාගේ ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ තිබෙන රූපවාහිනී සංස්ථාවේ සභාපති ධුරය දැරූ අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ විමල් රූබසිංහ මහත්මා, ඒ වාගේම ස්වාධීන රූපවාහිනි සේවයේ නිරෝෂන් මහතා ඇතුළු ප්‍රධාන නිවේදකයෝ මේ වන විටත් ඒ ස්ථානවලින් පහ කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුව කියා කියන්නේ මේ සභා ගර්භය විතරක් නොවෙයි. මැතිවරණය අවසන් වෙලා දැන් මාසයකට ආසන්න කාලයක් ගත වෙලා තිබෙනවා. උපදේශක කාරක සභා ටික ඉක්මනට කැඳවන්න. ඒ වාගේම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව යන කාරක සභා ඉක්මනින් ක්‍රියාවට නැන්විය යුතුයි. අද ඒවා අක්‍රිය තත්ත්වයටයි පත් වෙලා තිබෙන්නේ. එම නිසා මම ගරු කථානායකතුමාගෙනුත්, අගමැතිතුමාගෙනුත් ඒ ඉල්ලීම කළා. අපි රාජ්‍ය නිලධාරින් මේ පාර්ලිමේන්තුවට කැඳවන්න ඕනෑ. ආයතනවල තිබෙන ප්‍රශ්න පිළිබඳව සාකච්ඡා කරන්න ඕනෑ. ඒ නිසා අපි මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා, පාර්ලිමේන්තු උපදේශක කාරක සභා සභාපති ඇතුළු සාමාජිකයන් ඉතාමත් කඩිනමින් නම් කරලා ඒවා කැඳවීමට කටයුතු කරන්න කියා.

පසු ගිය කාල සීමාව තුළදී දේශපාලන පළිගැනීම්වලට ලක් වුණු සියලුම දෙනාට මේ අවස්ථාවේදී අපේ කනගාටුව ප්‍රකාශ කරනවා. ඒ සිදුවීම් හරි ද, වැරදි ද කියා ආණ්ඩු පක්ෂයේ එක් කෙනෙකුගෙන්වත් මේ විවාදයේදී පිළිතුරක් ලැබුණේ නැහැ. පසු ගිය ආණ්ඩු කාල සීමාව තුළදී සිදු වූ දේවල් කියා, ඒ ආණ්ඩුව

එහෙම කළා එම නිසා මේවා හරියි කියන තර්කය තමයි ආණ්ඩුව විසින් ඉදිරිපත් කළේ. එම නිසා මම නැවතත් ඔබතුමාගේ අවධානය ඒ කෙරෙහි යොමු කරවනවා.

අද අපි එක අතකට සතුටු වෙන්න ඕනෑ. මොකද, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටපු ලේකම්වරයා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් බිහි වූ ජනාධිපතිවරයෙක් පත් වූ නිසා තමයි අද මෙවැනි ආකාරයකින් හෝ අඩු පළිගැනීමකට ලක් වුණේ. එහෙම නැතුව එක්සත් ජාතික පක්ෂයේම කෙනෙක් ජනාධිපතිවරයා ලෙස තේරී පත් වුණා නම් අද මෙවැනි තත්ත්වයක් නොවෙයි ඇති වෙන්නේ. එහෙම නම් ගෙවල් ලක්ෂ ගණනක් පිච්චිලා, ජීවිත දහස් ගණනක් නැති වෙලා, ලක්ෂ ගණනක් රස්සාවලින් එළියට දාලා. එවැනි තත්ත්වයක් අනිවාර්යයෙන්ම ඇති වනවා. එක්සත් ජාතික පක්ෂයේ ඒ සංස්කෘතිය වෙනස් වුණා කියා අපට මොනම ආකාරයකින්වත් හිතා ගන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා ඉදිරි කාල සීමාව තුළදීවත් ඒ සංස්කෘතිය වෙනස් කළ බව අපට ආදර්ශයෙන්, ක්‍රියාවෙන් ඔප්පු කරන්න කියන ඉල්ලීම ඔබ සියලු දෙනාගෙන් කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

[අ.භා. 5.40]

ගරු ජෝන් අමරතුංග මහතා (මහජන සාමය, ආපදා කළමනාකරණය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு ஜோன் அமரதுங்க - மக்கள் ஒழுங்கு, அனர்த்த முகாமை மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் அமைச்சர்)

(The Hon. John Amaratunga - Minister of Public Order, Disaster Management and Christian Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු ලසන්ත අලගියවන්න හිටපු නියෝජ්‍ය ඇමතිතුමා කියපු දේවල් සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරන බව මම මුලින්ම කියන්න ඕනෑ. මෙතුමා කරුණු නොදැනයි කථා කළේ. ඒ ගැන මම මගේ කථාවේදී පෙන්නුම් කරන්නම්. මෙතුමා හරියට කථා කළේ, ඒ ස්ථානයේ බලා ගෙන හිටියා වාගේයි. එවැනි කථාවක් කිරීම ගැන මම කනගාටු වෙනවා. ගරු සභාව නොමඟ යැවීමේ එවැනි කථා නොකරන ලෙස මා මෙතුමාට කියා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සභාව කල් තැබීමේ යෝජනාව ගෙන ඒම ගැන විරුද්ධ පාර්ශ්වයේ නායක ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාට මම ස්තුතිවන්ත වනවා. පසු ගිය කාල පරිච්ඡේදය තුළ -1994 සිට මේ වන තෙක්- සිදු වුණු සිදුවීම් පිළිබඳවත්, මේ රට පාලනය කරන ලද විවිධ දේශපාලන පක්ෂ සහ එම පක්ෂවල නායකයෝ මොනවාද කළේ කියන එක ගැනත් අපට කියන්නට හැකියාවක් ලැබුණා. ඒ ගැන මමත් දැන් කියන්නම්. මේ විවාදයේදී පාලිත රංගෙ බණ්ඩාර මැතිතුමා බොහොම හොඳ කථාවක් කළා. මේ ප්‍රචණ්ඩත්වය ගැන හොඳ විස්තරයක් කළා. සජිත් ප්‍රේමදාස මහතා, ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි, රන්ජන් රාමනායක මහතා, ඒ වාගේම විපක්ෂයෙන් නාමල් රාජපක්ෂ මහතා, දිනේෂ් ගුණවර්ධන මහතා, ඒ.බී. සුසිල් ප්‍රේමජයන්ත මහතා, විජිත හේරත් මහතා යන මැති ඇමතිවරුන් තමයි සාධාරණව අපක්ෂපාතීව ඇත්ත ඇති සැටියෙන් කථා කරලා මේ ගරු සභාවේ කරුණු ඔප්පු කළේ. සමහරු විවිධ චෝදනා කළාට එම චෝදනා ඔප්පු කර ගන්න බැරිව ගියා. නමුත්, අපි පිළිගන්නවා වැරදි කර තිබෙනවා නම් ඒ යම් කෙනෙක් නීතියේ රැහැණට අසු කරගෙන නැත්නම් ඒ ගැන සොයා බලා කටයුතු කළ යුතුයි කියා. මේ විවාදය අහගෙන ඉන්න එන්න කියලා පොලිස්පතිතුමාගේ ඉඳලා සියලුම නියෝජ්‍ය පොලිස්පතිවරුන්ට අද මම ආරාධනා කළා. ඒ මොකටද එන්න කිව්වේ? අහගෙන ඉන්නයි. විපක්ෂයේ මන්ත්‍රීවරුන්, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් කියන ඒවා අහගෙන ඒවා ලියා ගෙන ආපසු කාර්යාලවලට ගියාම මේවායේ ඇත්ත නැත්ත සොයලා බලලා ඒ අනුව කටයුතු කරන්න කියලා මම ඒ අයට කිව්වා. මට කරන්න පුළුවන් දෙය එපමණයි. මම ඒ කාර්යය කරලා තිබෙනවා. තවමත් නියෝජ්‍ය පොලිස්පතිතුමන්ලා ඒ ස්ථානයේ ඉන්නවා. එතුමන්ලා ඒ කාර්යය මැනවින් ඉටු කරයි. කිසිම කෙනෙක් කිසිම භයක් සැකක් තබා ගන්නට වුවමනා නැහැ. අපට කිසිම කාරණයක් වහන්න අවශ්‍යතාවක් නැහැ. දැන් මේ විවාදයේදී බොහොම වැදගත් යෝජනාවන් කිහිපයක් ආවා. ඒවා ගැන කථා කරන්න කලින් ජනාධිපතිතුමා කළ ප්‍රකාශයක් ගැන මම කියන්න ඕනෑ. මේ ජනාධිපතිවරණයට ඉදිරිපත් වීම තුළින් එතුමා මුහුණ දුන්නේ විශාල අභියෝගයකටලු. බැරි වෙලාවත් එතුමා පරාජය වුණා නම් අද ඉන්නේ පොළොව යට කියලා එතුමා කිව්වා. අන්න ඒකයි එතුමාට තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ගැන තිබුණු තක්සේරුව. එතුමා දෙවි දේවතාවන්ගේ ආශීර්වාදයෙන් යාන්තම් ජනාධිපති ලෙස පත් වුණා කියන එක තමයි එතුමා සඳහන් කරන්නේ. "බැරි වෙලාවත් මම පරාජය වුණා නම්, මමත්, මගේ පවුලත්, මගේ දූ දරුවොත් සියලු දෙනාම අද පොළොව යට තමයි නතර වෙන්නේ" කියලා තමයි අද එතුමා කියන්නේ. ජෝන් සෙනෙවිරත්න මහත්මයා ඒක දන්නවා නේ. අපි දන්නවා ජනරාල් සරත් ෆොන්සේකාට මොකද කළේ කියලා. එතුමාව පණ පිටින් අරගෙන ගිහිල්ලා එල්ලුවේ නැති එක විතරයි. තිබෙන අයිතිවාසිකම් සියල්ලම නැති කරලා හිර කළා. ඒකද තමුන්නාන්සේලා අපට දේශනා කරන්නේ? ඒ ඉතිහාසය කමක් නැහැ. ඒක ගියාවේ.

දැන් අපි අනාගතය ගැන බලමු. අනාගතය ගැන අද හොඳ යෝජනාවන් කිහිපයක් ආවා. මම ඔය නම් කියපු මැති ඇමතිතුමන්ලා කථා කළේ ඒ යෝජනා ගැනයි. අන්න නියම දේශපාලනඥයෝ. තමුන්නාන්සේලාත් හොඳ අදහස් කිහිපයක් දුන්නා. අපි ඒවා අගය කරනවා.

ප්‍රචණ්ඩ ක්‍රියා ඉතිහාසය ගැන මම පොඩ්ඩක් පෙන්වන්න ඕනෑ. මැතිවරණයට ප්‍රථම නාම යෝජනා දීලා ඒ කාල සීමාව තුළ ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් පැමිණිලි 387ක් වාර්තා වුණා. මැතිවරණයෙන් පසුව වාර්තා වෙලා තිබෙන්නේ පැමිණිලි 49යි. මැතිවරණයෙන් පසුව ප්‍රචණ්ඩ ක්‍රියාවල සියයට 60ක අඩුවීමක් වෙලා තිබෙනවා. මැතිවරණයට කලින් සිදු වුණු ප්‍රචණ්ඩ ක්‍රියා හේතු කර ගෙන තමයි ඔය පශ්චාත් ප්‍රශ්න ඇති වුණේ. මැතිවරණයෙන් පසුව ඔය මැර ක්‍රියාවන් සිදු වෙන්න එක හේතුවක් තමයි මැතිවරණයට කලින් ඇති වෙලා තිබුණු වාතාවරණය. ඒ තිබුණු පරිසරය නිසා තමයි මේ ප්‍රශ්න මේ විධියට පැන නැගුණේ. පසු ගිය ජනාධිපතිවරණ අවසන් වුණාම මොන විධියේ තත්ත්වයක් මේ රටේ තිබුණා ද කියලා ඉතිහාසය ගැන අපි බලමු. 2005 දී ජනාධිපතිවරණය අවසන් වුණාම ප්‍රචණ්ඩ ක්‍රියා 1198ක් වාර්තා වෙලා තිබෙනවා. මේ ඉතිහාසය මතක් කරලා දෙන්න මම වැඩි වෙලාවක් ගන්නේ නැහැ. 2010 ජනාධිපතිවරණය අවසාන වුණාම ප්‍රචණ්ඩ ක්‍රියා 2,089ක් වාර්තා වෙලා තිබෙනවා.

ගරු ලසන්ත අලගියවන්න මහතා

(மாண்புமிகு லசந்த அலகியவன்ன)

(The Hon. Lasantha Alagiyawanna)

නැඟී සිටියේය.

எழுந்தார்.

rose.

ගරු ජෝන් අමරතුංග මහතා

(மாண்புமிகு ஜோன் அமரதுங்க)

(The Hon. John Amaratunga)

තමුන්නාන්සේ වාඩි වෙන්න. තමුන්නාන්සේ කථා කරන අවස්ථාවේ මම බාධා කළේ නැහැ. තමුන්නාන්සේට කථා කරන්න මම දැන් අවස්ථාව දෙන්නේ නැහැ. 2015 ජනාධිපතිවරණයේදී

[ගරු ජෝන් අමරතුංග මහතා]

වාර්තා වූ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සංඛ්‍යාව 472යි. මීට කලින් ජනාධිපතිවරණවලදී වුණු සිද්ධීන් පිළිබඳ බැලුවාම, 472ක් කියලා කියන්නේ සියයට 65ක අඩු වීමක්. මේක පිළිගන්න ඕනෑ. මේක නැහැ කියන්න බැහැ. මේවා පොලිස් පොත්වල ලියැවිලා තිබෙන ඒවා. මේවා මම අතින්, සාක්කුවෙන් දාපුවා නොවෙයි. ඉතිහාසය බලපුවාම, මේ විධියට තමයි මේ සිද්ධීන් ඇති වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අපි ඇවිල්ලා ඉන්නේ අලුත් ප්‍රවණතාවකටයි. අපේ සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා කිව්වා, "ජනාධිපති ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති. අපේ ජනාධිපති" කියලා. මතක තියා ගන්න ඕනෑ, ජනාධිපතිතුමා ජයග්‍රහණය කළේ එක්සත් ජාතික පක්ෂයේ යන්ත්‍රණය නිසා කියන එකත්. එතුමා ඒක දන්නවා. එතුමා කවදාවත් එක්සත් ජාතික පක්ෂය අමතක කරන්නේ නැහැ. ඒ ගැන මට විශ්වාසයකුත් තිබෙනවා. කෙසේ වෙතත් අද ඒක නොවෙයි, තිබෙන තත්ත්වය. අද තිබෙන්නේ, මේ පාර්ශ්වයන් දෙකම එකට එකතු වෙලා මේ රටේ යහපතට වැඩ කරන එකයි. ඒක තමයි මෙතැන අවශ්‍යතාව. ඒ ගැන අපි සන්තෝෂ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කාරණයත් කියන්න ඕනෑ. දිනේෂ් ගුණවර්ධන මැතිතුමා කිව්වා, "මැතිවරණයක් ඉවර වුණාම මේ වාගේ ප්‍රශ්න ඇති වෙන්නේ නැහැ, මැතිවරණ කොමිසමක් තිබුණා නම්" කියලා. එතුමා ඒක පිළිගන්නවා. ඒ වාගේම තවත් මන්ත්‍රීවරු, ඇමතිවරු කිහිප දෙනෙක් කිව්වා, "ස්වාධීන පොලිස් කොමිසමක් තිබුණා නම් මේ තත්ත්වය ඇති වෙන්නේත් නැහැ. ස්වාධීන අධිකරණ කොමිසමක් තිබුණා නම් මේ තත්ත්වය ඇති වෙන්නේත් නැහැ. ස්වාධීන රාජ්‍ය සේවා කොමිසමක් තිබුණා නම් මේ තත්ත්වය ඇති වෙන්නේත් නැහැ. ස්වාධීන ජන මාධ්‍ය කොමිසමක් තිබුණා නම් මේ තත්ත්වය ඇති වෙන්නේත් නැහැ" කියලා. එවැනි වාතාවරණයක් මේ රටේ ඇති කරන්න තමයි, 2002 දී අපේ අග්‍රාමාත්‍යතුමා එවකට හිටිය ආණ්ඩුවත් එක්ක එකතු වෙලා මේ කොමිෂන් සභා පිහිටුවන්න - ස්ථාපිත කරන්න- කටයුතු කරලා පාර්ලිමේන්තුවට දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවේ. එහෙම ගෙනැල්ලා තමයි ඒ කොමිෂන් සභා ස්ථාපිත කළේ. මම එතකොටත් පොලීසිය භාර ඇමතිතුමා. හය මාසයක් ගියේ නැහැ, පොලිස් කොමිසම පිහිටෙව්වා. අපට කොහෙත්ම දේශපාලන බලපෑමක් කරන්න අවස්ථාවක් ලැබුණේ නැහැ. අපි කෙරුවේත් නැහැ. කරන්න ගියේත් නැහැ.

ඒ අවධියේදී පොලීසියේ ගෞරවයත්, අභිමානයත් ආරක්ෂා වුණා කියන එක මම මතක් කරන්න ඕනෑ. 2005 දී මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව මේ රට භාර ගත්තාට පස්සේ දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා අර ස්වාධීන කොමිෂන් සභා ඔක්කෝම නැති කරලා දැම්මා. ඒකෙන් වුණේ මොකක්ද? ඒකෙන් වුණේ, පොලීසිය දේශපාලනීකරණය වුණු එකයි.පොලීසිය දේශපාලනඥයන්ට යට වුණා; ඒ අයගේ බලපෑම්වලට යට වෙන්න පටන් ගත්තා. මට පෙර කථා කළ මන්ත්‍රීතුමා දැන් එහෙම කථා කළාට ඒ කාලයේ පොලීසිය පාලනය කෙරුවේ මැති ඇමතිවරු; ජනාධිපතිවරු. ඒක නැහැ කියන්න බැහැ. ඒවා දන්නා නිසා තමයි 2015 ජනවාරි මාසයේ 08වැනි දා අපේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ඡන්දය දීලා එතුමාව ජනාධිපති කළේ. එතුමා ජනාධිපති කළේ ඔබතුමන්ලා ඒ කාලයේ කළ වැරැදි නිසාය කියන එක තමුන්නාන්සේලා හොඳට මතක තියා ගන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එයින් බැහැරව ගිහිල්ලා අපි දැන් කල්පනා කරන්නේ අලුත් වැඩ පිළිවෙළක නිරත වෙන්නයි. මේ කරුණු දිහා බලපුවාම, අපේ කාලයේ පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා වර්ධනය වුණා කියලා, මේ ආණ්ඩුවට, මේ ඉන්න මැති ඇමතිවරුන්ට, මේ ඉන්න නියෝජ්‍ය ඇමතිවරුන්ට, අපේ ඉන්න මන්ත්‍රීවරුන්ට ඇඟිල්ලක් දික් කරන්න පුළුවන් වෙයි කියලා මම හිතන්නේ නැහැ. එහෙම වුණේ නැහැ. පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සියයට 65කින් අඩු වෙලා තිබෙනවා. අන්න ඒක ගැන කථා කරන්න ඕනෑ. මේ කොමිෂන් සභා සියල්ලම ක්‍රියාත්මක වුණා නම් තවත් අඩු කරන්න පුළුවන්කම තිබුණා. කනගාටුදායක තත්ත්වය තමුන්නාන්සේලාම මේවා නැති කරලා, අද අධිකරණයට ඇඟිල්ල දික් කරන එකයි.

වත්තල ප්‍රාදේශීය සභාවේ ඇති වුණු සිද්ධියේ සැකකරුවන්ට ඇප දීම සම්බන්ධයෙන් නඩුකාරයා හරියට වැඩ කළේ නැහැ කියලා ලසන්ත අලගියවන්න මන්ත්‍රීතුමා කියනවා. බොහොම වැරැදියි. අපි අධිකරණයේ ස්වාධීනත්වය ගැන කථා කරන කොට, ඒ අයගේ ක්‍රියා කලාපය ගැන ප්‍රශ්නය කිරීම හරිද? අසාධාරණයි. ඒ නඩුකාරයා ඇප දීලා තිබෙන්නේ කොහොමද? ඒ වෛද්‍ය වාර්තාව මම බැලුවා. සුළු තුවාල කියලා තමයි වෛද්‍යවරයා ඉස්පිරිතාලේ වාර්තා කරලා තිබෙන්නේ. ඒ වාර්තාව මා ළඟ තිබෙනවා. එහෙම තිබෙද්දී නඩුකාරතුමා කරන්න ඕනෑ මොකක්ද? එවැනි චූදිතයන් හය හත් දෙනෙකුට ඇප දෙනවා මිසක් ඔවුන් හිරේ දාන්න පුළුවන්ද? එහෙනම් ඒකත් කැකිල්ලේ රජ්ජුරුවන්ගේ තීන්දුවක් වෙනවා. මේ වාගේ නොදන්නා කරුණු තමයි ගරු ලසන්ත අලගියවන්න මන්ත්‍රීතුමා මේ සභාවට ගෙනැල්ලා කිව්වේ. මා ඒ සම්බන්ධයෙන් කනගාටු වනවා. තමුන්නාන්සේ අපේ පැත්තෙන් මනාපයක් ගන්න හදනවාද කියලා මට හිතෙනවා. මා ඒ ගැන තව විස්තර පසුව කියන්නම්.

මේ මොහොතේ මා සතුටු වනවා, මේ ස්වාධීන මැතිවරණ කොමිෂන් සභාව තිබුණා නම්, මේ ස්වාධීන කොමිෂන් සභා ටික ක්‍රියාත්මක වුණා නම් මේ ප්‍රශ්න ඇති වෙන්නේ නැහැ කියලා විපක්ෂය පිළිගැනීම ගැන. ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා ඒ කාරණය පිළිගත්තා වාගේම, ඒ සම්බන්ධයෙන් බොහොම පැහැදිලිව සඳහන් කළා. ඒ නිසා අපේ ගරු ලක්ෂ්මන් කිරිඇල්ල සභානායකතුමා කියපු විධියට තමුන්නාන්සේලාගේත් සහයෝගය ඇතිව මේ ව්‍යවස්ථා සශෝධන ටික ක්‍රියාත්මක කරන්න උදව් කරන්න.

අපි කොහෙත්ම මේ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා අනුමත කරන්නේ නැහැ. අපට එහෙම ඒවා අනුමත කරන්න වුවමනාවකුත් නැහැ. අපේ නායකතුමා ඒවා කරන්න අපට කවදාවත් අනුබල දෙන්නේත් නැහැ. එතුමා ඒවාට විරුද්ධවයි හැම දාම කටයුතු කළේ. නමුත් අපට තවම හදා ගන්න බැරි කීප දෙනෙක් ඉන්නවා. එවැනි අය ඔය පැත්තේත් ඉන්නවා; මේ පැත්තේත් ඉන්නවා. නමුත් මේ කොමිෂන් සභා ටික පිහිටුවලා ඒවාත් අපට අවම කරන්න පුළුවන්. ඒ වාගේම මේ කරුණු හරියට ක්‍රියාත්මක කරන්න පුළුවන්.

පසු ගිය දවස්වල අධිකරණය පිළිබඳවත් මේ රටේ විවිධාකාර ප්‍රශ්න තිබුණා. අධිකරණයට පත් කරන විනිශ්චයකාරවරුන් පිළිබඳව ප්‍රශ්නයක් තිබුණා.

රාජ්‍ය සේවය දිහා බලන්න. අද රාජ්‍ය සේවයට මොකක්ද වෙලා තිබෙන්නේ? අද රාජ්‍ය සේවය සම්පූර්ණයෙන්ම දේශපාලනයට යට වෙලා තිබෙනවා. ඒ නිසා තමයි ඔය ප්‍රශ්න ඇති වෙලා මාරු කිරීම් කරන්නත් සිද්ධ වෙලා තිබෙන්නේ. එවකට තිබුණු පාලන තන්ත්‍රයට බයේ තමයි රාජ්‍ය සේවකයන් නීති විරෝධී ක්‍රියාවල නිරත වුණේ. ඒක තමයි තිබුණු තත්ත්වය. මේවා දුටු මහ ජනතාව මොන බලපෑම් තිබුණත් ඡන්දය පාවිච්චි කරලා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා නව ජනාධිපතිතුමා හැටියට පත් කළා. තමුන්නාන්සේලාට මොන බලවේග තිබුණත්, මොන තරම් සල්ලි වියදම් කළත්, මොන දේවල් කළත්, ජනතාව ඒවාට රැවටෙන්නේ නැතිව මේ සැරේ හරි පිළිතුරක් දුන්නා, මේ ජනාධිපතිවරයා පත් කිරීම තුළින්. ඒක තමයි ඇත්ත තත්ත්වය.

මා මේ කාරණය කියන්නම ඕනෑ. මන්ත්‍රීවරු කීප දෙනෙක් එතුමන්ලාගේ ආසනවල වෙච්ච සිද්ධි පිළිබඳව කිව්වා. ඒ සිද්ධි සම්බන්ධ තොරතුරු ඇතුළත් වාර්තා මා ළඟ තිබෙනවා. ඒ වාර්තා අනුව එතුමන්ලා කියන කරුණු සියල්ලක්ම සත්‍ය නැහැ. සමහර සිද්ධවලට සම්බන්ධ චූදිතයන් උසාවියට ඉදිරිපත් කරලා තිබෙනවා. ඔවුන් දැනටමත් රිමාන්ඩ් භාරයේ ඉන්නවා. මැතිවරණයට ප්‍රථමයෙන් අපේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ගිය රැස්වීම් කීපයකට පහර දුන්නා; වෙඩි තැබුවා; ගල් මුල් ගැහුවා; රැස්වීම් පවත්වන්න ඉඩමක් දුන්නේ නැහැ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
වේදිකා පිච්චුවා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
වේදිකා පිච්චුවා. මෙවැනි සිද්ධි ගැන කෙළවරක් නැතිව කියන්න පුළුවන්. මේවා ඔක්කොම අපි තමුන්නාන්සේලාට මතක් කරලා දෙන්න ඕනෑ. මේවා මින් ඉදිරියටවත් නොවෙන්න වග බලා ගන්න වනවා, ඔය පැත්තේ අයත්, මේ පැත්තේ අයත්. මා හිතන හැටියට එතුමා බොහොම බයෙන් ඒ කාලයේ හිටියේ. මැතිවරණයේ අවසාන කාලය වන කොට එතුමාට පොලීසියෙන් උපදෙස් දුන්නා, "ප්‍රසිද්ධ රැස්වීම්වලට යන්න එපා, ඔබතුමා ඝාතනය කරන්න බලාගෙන ඉන්නවා" කියලා. අවසාන සුමානයේ ඇති වුණු තත්ත්වය ඒකයි. ඒ නිසා සමහර ප්‍රදේශවල තිබුණු රැස්වීම්වලට එතුමා ගියේ නැහැ. පොලීසියෙන් ආපු වාර්තා අනුව එතුමාගේ ජීවිතයට ආරක්ෂාව දෙන්න බැහැ කියන මතයක් ඇති වුණා. ඒ වාගේ තත්ත්වයක් ඇති වුණු නිසා තමයි මැතිවරණයෙන් පස්සේ මේ විධියේ ප්‍රචණ්ඩ ක්‍රියා සුළු ප්‍රමාණයක් හෝ ඇති වුණේ. එහෙම නැත්නම් මේ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා ඇති වන්නේත් නැහැ. සමහර ප්‍රදේශවල එතුමාට රැස්වීම් පවත්වන්න දුන්නේ නැහැ; ඒකට ඉඩමක් දුන්නේ නැහැ; රැස්වීම්වලට ගැහුවා; රැස්වීම් සංවිධානය කරපු අයට ගුටි බැට දුන්නා; කොඩි එල්ලපු අයට ගැහුවා. ඒවායේ ප්‍රතිඵලයක් වශයෙන් තමයි මැතිවරණය අවසන් වෙලා මේ වාගේ ප්‍රචණ්ඩ ක්‍රියා හෝ ඇති වුණේ. එහෙම නැත්නම් ඒ ප්‍රචණ්ඩ ක්‍රියා ටික ඇති වන්නේත් නැහැ. මෙවර මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සියයට 65කින් අඩු වෙලා තිබුණා. මැතිවරණයට ඉස්සෙල්ලා ප්‍රචණ්ඩත්වයක් නොතිබුණා නම් ඇත්ත වශයෙන්ම ඊට පස්සේ කිසිදු ප්‍රචණ්ඩ ක්‍රියාවක් නොවෙන්න ඉඩ තිබුණා. මේ කාරණය තමයි අපි තමුන්නාන්සේලාට මතක් කරන්න ඕනෑ. තව හුඟක් දේවල් කියන්න තිබෙනවා. නමුත් මා ඒවා කියන්න යන්නේ නැහැ.

ගරු ලසන්ත අලගියවන්න මැතිතුමා කියපු කාරණය සම්බන්ධයෙන් මා පොඩ්ඩක් කථා කරන්න ඕනෑ. එතුමා හරියට කථා කළේ එතැනට ඇවිල්ලා බලාගෙන හිටියා වාගේයි. එදා ඒ සභාවේ ප්‍රශ්නය ඇති වුණේ ඒ මන්ත්‍රීවරු අතර. ඇති වුණු ප්‍රශ්නය මොකක්ද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරන ප්‍රාදේශීය සභාවේ උපසභාපති ඇතුළු මන්ත්‍රීවරු දෙදෙනෙකුට මීට කලින් තිබුණු සභාවලට ඔය සභාපතිවරයා එන්න ඉඩ දුන්නේ නැහැ. ඔවුන් එක වෙලාවක ඒ සභාපතිවරයා ඉදිරිපත් කරපු අය වැය අපේ විපක්ෂයේ කණ්ඩායමත් එකතු කරගෙන පරාජය කළා. ඒකට එරෙහිව තමයි ඒ සභාපතිතුමා මේ කට්ටියට මීට කලින් තිබුණු සභා දෙකකට එන්න ඉඩ දුන්නේ නැත්තේ. එක් කෙනෙක් ගිහිල්ලා සභාපතිතුමාට එරෙහිව උසාවියෙන් රිට් ආඥාවක් ගත්තා, සභාවට එන්න නොදෙන එක වළක්වන්න. ඒ වෙලාවේ යකඩ වැටක් ගහලා සභාව වැහුවා. එදා පොලීසිය ක්‍රියාත්මක වුණේ නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන්ට ඒ සභාවට එන්න දුන්නේ නැහැ. ඒ වාගේ අවස්ථා කීපයක්ම තිබුණා. බැරි තැන තමයි එදා අපේ මන්ත්‍රීවරුත් එක්ක ඒ උපසභාපතිවරයායි, අනෙක් මන්ත්‍රීවරු දෙදෙනායි ඒ සභාවට ඇතුළු වෙලා වාඩි වුණේ. එසේ වාඩි වුණාට පස්සේ, ඝට්ටනය ඇති වුණේ ඒ දෙගොල්ලන් අතර. ඒ ඝට්ටනයේ ඡායාරූප ඔක්කෝම මා ළඟ තිබෙනවා. එතැනදී සභාපතිවරයා පැත්තකට දමලා අර උපසභාපතිවරයා ඒ සභාව පවත්වලා තිබෙනවා. ඒ වාර්තාවත් තිබෙනවා. ඒක නැහැ කියන්න බැහැ. ඊට පස්සේ සභාපතිවරයා එතැනින් යන වෙලාවේ ඒ දෙගොල්ලන් අතර වචන හුවමාරුවක් ඇති වීමෙන් තමයි ඝට්ටනයක් ඇති වුණේ. නමුත් ඒ ගැන මට ඇඟිල්ල දිගු කරන්නේ එතැන ඉඳලා මම ඒක කෙරෙව්වා වාගේයි. ලසන්ත අලගියවන්න මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ හරිම අසාධාරණ චෝදනාවක් කරන්නේ. කරුණු දැන ගෙන චෝදනා කළා නම් තව කමක් නැහැ. මීට පස්සේ මේ විධියේ චෝදනා කරන්න එපා. ඒක තමුන්නාන්සේ දේශපාලන වාසියක් ගන්න කරපු වැඩක් හැටියටයි මම දකින්නේ. අද වෙන කවුරුවත් ඔය වාගේ කථාවක් කළේ නැහැ. ඒ සිද්ධියේදී පොලීසිය හය දෙනෙක් අත්අඩංගුවට අරගෙන අධිකරණයට ඉදිරිපත් කළා. නඩුකාරතුමා වෛද්‍ය වාර්තාව බලලා, වෛද්‍ය වාර්තාවේ "සුළු තුවාල" යනුවෙන් සඳහන් කරලා තිබුණු නිසා තමයි ඇප දුන්නේ. ඒ විනිශ්චයකාරතුමාට චෝදනා කරන එක වැරදියි. එහෙම කළාම විනිශ්චයකාරවරුන්ට සාධාරණව, අපක්ෂපාතව වැඩ කරන්න බැරි වෙනවා. අපේ පොලිස් නිලධාරින්ට මම වචනයක්වත් කිව්වේ නැහැ. ඒ අත්අඩංගුවට ගත්ත අය උසාවියට ඉදිරිපත් කරලා තමයි ඇප ලබා ගත්තේ. ඒකයි එතැන තිබුණු තත්ත්වය.

ඒ සභාපතිවරයා තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටපු පළාත් සභා මන්ත්‍රී සුනිල් මෙන්ඩිස් මැරුවේ. ඔහු තමයි අද මහාධිකරණයේ තිබෙන ඒ නඩුවේ පළමුවැනි විත්තිකරු. ඒ නඩුව තවම විභාග වෙනවා. ඒ සභාපතිතුමාගේ ගෙදර තිබුණු සල්ලි වගයක් නැති වුණාට පස්සේ ඒ ගෙදර හිටපු මනුස්සයා ඝාතනය කළා. ඒ නඩුව තවම උසාවියට ඉදිරිපත් කරලා නැහැ. පොලීසිය ඒ ගැන වග විභාග කරනවා. ඒ වාගේ ප්‍රචණ්ඩ ක්‍රියා ගණනාවකට සම්බන්ධ වුණු කෙනෙක් ඔහු. මටත් අරියාදු කරලා තිබෙනවා. මැතිවරණ සමයේදී අපි කොළ බෙදන්න යන කොට පිරිසක් අරගෙන ඇවිල්ලා මට තරවටු කරන කොට මම පොලීසියට පැමිණිලි කළා. ඊට පසුව උසාවියට ඉදිරිපත් කළාම නඩුකාරතුමා ඔහුට අවවාද කරලා තිබුණා, මීට පසුව එවැනි දෙයකට සම්බන්ධ වුණොත් ඔබේ ඇපය අවලංගු කරනවා කියලා. ඔහු දැන් ඉන්නේ ඇප පිට. මිනී මරලා ඇප පිට ඉන්නේ. එහෙව් පුද්ගලයෙක්ද තමුන්නාන්සේලා ආරක්ෂා කරන්නේ? ඔන්න තමුන්නාන්සේලාගේ පක්ෂයේ තිබෙන තත්ත්වය. ඒ ගැන බලන්න. ඒ වාගේ මිනිසුන් ඒ සභාවලට දමන්න එපා. අහලා බලන්න. මම ඒ උප සභාපතිතුමා ජනාධිපතිතුමා ළඟට එක්ක ගෙන ගියා. අනෙක් මන්ත්‍රීවරුත් එක්ක ගෙන ගිහිල්ලා මොකක්ද සිද්ධ වුණේ කියලා ජනාධිපතිතුමාට ඇත්ත විස්තරය කිව්වා. මේ සභාපතිතුමාගේ ක්‍රියා කලාපය මොකක්ද කියලා කිව්වා. එතුමා කිසිම පිළිවෙළකට ඒ සභාවේ වැඩ කරන්නේ නැහැ. හොරකම් කරනවා, මංකොල්ල කනවා. නමුත් ඒවා අද මෙතැනට අදාළ නැහැ. නමුත් සිද්ධිය මේකයි. ඒ මන්ත්‍රීවරුන් දෙගොල්ලන් අතර ඝට්ටනයක් ඇති වුණා. ඊට පස්සේ පොලීසිය ඒ අය අත්අඩංගුවට ගත්තා; ඊට පස්සේ උසාවියට ඉදිරිපත් කළා; උසාවියෙන් ඇප දුන්නා. දැන් නඩුව දිගටම විභාග කර ගෙන යනවා. ඒකයි ඒ සිද්ධිය සම්බන්ධයෙන් තිබෙන තත්ත්වය. මම කනගාටු වෙනවා, මෙතුමා එතැන ඉඳලා බලා ගෙන සිටියා වාගේ කථා කිරීම ගැන. නියම තත්ත්වය දන්නේ නැතුව මේ සභාවට ඇවිල්ලා අනෙක් අයට මඩ ගහන්න ලැස්ති වෙන්න එපා. මම හිතුවා තමුන්නාන්සේ වැදගත් මන්ත්‍රීවරයෙක් කියලා. නමුත් දැන් නම් මට ඒ බවක් පෙනෙන්නේ නැහැ. මට පෙනෙන විධියට අබමල් රේණුවක තරම්වත් වැදගත්කමක් නැති මන්ත්‍රීවරයෙක්.

[ගරු ජෝන් අමරතුංග මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විවාදයේදී සුසිල් ප්‍රේමජයන්ත මන්ත්‍රීතුමා කළ ප්‍රකාශය පිළිබඳව මම සන්තෝෂ වෙනවා. දැන් ගිය දේ ගියාවේ. දැන් සියලු දෙනාම ඒකරාශී වෙලා යහ පාලනය කියන ඒ උතුම් ප්‍රතිපත්තිය මේ රටේ ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්න අපි සූදානම්. අපට කිසි ප්‍රශ්නයක් නැහැ. නැවත වරක් අර ස්වාධීන කොමිෂන් සභා පහ මේ රටේ ස්ථාපිත කළොත්, ඉදිරි අනාගතයේදී මේ රටේ හොඳ දේශපාලන ප්‍රවණතාවක් ඇති වෙනවාට කිසිම සැකයක් නැහැ.

විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ජෝන් සෙනෙවිරත්න මන්ත්‍රීතුමනි. ඔබතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉපැරණි දේශපාලනඥයෙක්. ඒ වාගේම නීතිඥ මහත්මයෙක්. ඔබතුමා දන්නවා මේ වැඩ පිළිවෙළ. කරුණාකරලා, මේ කිව්ව පිළිවෙළට ආණ්ඩු පක්ෂයෙන් ඉදිරිපත් කරන ව්‍යවස්ථා සංශෝධනයට වුවමනා කරන සහාය ලබා දීලා, ඉක්මනින්ම ඒක සම්මත කර ගෙන, මේ ස්වාධීන කොමිෂන් සභා ස්ථාපිත කරමු. එතකොට පොලීසියට ඇඟිල්ලක් දික් කරන්න වුවමනාවක් නැහැ; අධිකරණයට ඇඟිල්ලක් දික් කරන්න වුවමනාවකුත් නැහැ. මෙතැනදී කියවුණා, ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ දිසාපතිවරුන්ගේ මාරු කිරීම් ගැන. ඒවා කරන්න වුවමනාවකුත් නැහැ, හරියාකාරව ස්වාධීන කොමිෂන් සභා තිබෙනවා නම්. ඒ ස්වාධීන කොමිෂන් සභා නොමැතිවීම තමයි අපට තිබෙන අඩු පාඩුව.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

මේ කොමිෂන් සභා ඇති කිරීමේ විධිවිධානවලට දිගින් දිගටම අපේ සහාය ඉල්ලනවා. අපි පැහැදිලිව ප්‍රකාශ කරලා තිබෙනවා, අපි සහයෝගය දෙනවා කියලා. ඒක දින සියයේ වැඩ පිළිවෙළට අඩංගු කරුණක් බව මම හිතනවා. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයටත් පක්ෂව අපි ඡන්දය දුන්නා. අපි ඒක අනුමත කළා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ඇත්ත, ඇත්ත. අපි එක්කාසු වෙලා කළේ.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

මොන හේතු නිසා හෝ ඒක අවලංගු වුණා. දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් එය සංශෝධනය වුණා. නමුත් නැවත වරක් ඔබතුමන්ලා ඒ කොමිෂන් සභා පත් කිරීම සඳහා ගෙන එන ඒ සංශෝධනයට අපි සහාය දෙනවා. අනෙකුත් ව්‍යවස්ථා සංශෝධන ගැනත් අපි සාකච්ඡා කරමින් යනවා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

බොහොම හොඳයි.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

ලබන සතිය වෙන විට අපට යම් යම් තීන්දු ගන්න පුළුවන් වෙයි කියලා හිතනවා. ඒ අනුව එයට සම්පූර්ණ සහයෝගය අපි ලබලා දෙනවා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

බොහොම ස්තුතියි. ඒක හැකි ඉක්මනින්ම ක්‍රියාත්මක කරන්න.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

ක්‍රියාත්මකයි. තමුන්නාන්සේලා නේ එය ඉදිරිපත් කරන්නට ඕනෑ.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

අපි ලැහැස්තියි. ඒ ව්‍යවස්ථා සංශෝධන දැන් සූදානම් කර ගෙන යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාව ඉදිරිපත් කළ ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතාට මම ස්තුති වන්ත වනවා. මොකද, අපේ මැති ඇමතිවරුන්ට යථාර්ථය පෙන්වලා දෙන්න එයින් අපට අවස්ථාව ලැබුණා. මේක හරි වැදගත් දෙයක්. මොකද, රටට ගිහිල්ලා තිබුණේ වෙන අදහසක්. අපි නිදහස් මාධ්‍යයක් ඇති කළ නිසා, ජනමාධ්‍යවලින් බොරු ප්‍රචාර රට පුරාම ගෙන ගියා. අද අපේ මැති ඇමතිවරුන්ට යථා තත්ත්වය රටට පැහැදිලි කරලා දෙන්න අවස්ථාව ලැබුණු නිසා මම එතුමාට ස්තුති වන්ත වනවා. මේ පිළිබඳව වැදගත් අදහස් ගෙන ආ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් අපේ ප්‍රණාමය හා ස්තුතිය පුද කරනවා.

ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිතුමන්ලා, අතීතයේ වුණු දේවල් පිළිබඳවත් පැහැදිලි කරමින් ඉතාමත් වැදගත් අදහස් කිහිපයක් ඉදිරිපත් කළා. ඉදිරියට ඒවා සිදු නොවන්නට වග බලා ගන්නා බව සඳහන් කරන අතර, ඉදිරියේ පවත්වන මැතිවරණවලදී මෙවැනි කටයුතු නොවේවා කියලා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Thank you.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.05ට, අද දින සභා සම්මතිය අනුව, 2015 පෙබරවාරි මස 18වන බදාදා අ.භා.1.00වන තෙක් කල් ගියේය.

அதன்படி பி.ப. 6.05 மணிக்குப் பாராளுமன்றம், அதனது இன்றைய தீர்மானத்துக்கிணங்க, 2015 பெப்ருவரி 18, புதன்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கபபட்டது.

Adjourned accordingly at 6.05 p.m. until 1.00 p.m. on Wednesday, 18th February, 2015, pursuant to the Resolution of Parliament of this Day.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

232 වන කාණ්ඩය - 09 වන කලාපය
தொகுதி 232 - இல. 09
Volume 232 - No. 09

2015 පෙබරවාරි 18 වන බදාදා
2015 பெப்ருவரி 18, புதன்கிழமை
Wednesday, 18th February, 2015

පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:

ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය

වරප්‍රසාද:

වරාය අධිකාරියේ නිරීක්ෂණ චාරිකාවේදී සිදු වූ පහර දීම

ගරු ආර්. යෝගරාජන් මහතාගේ පැමිණිල්ල සම්බන්ධව පොලීසියේ පක්ෂග්‍රාහී ක්‍රියා කලාපය

වරාය අධිකාරියේ නිරීක්ෂණ චාරිකාවේදී සිදු වූ පහර දීම

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:

පසු ගිය රජය ආරම්භ කළ සංවර්ධන ව්‍යාපෘති ඇනහිටීම

ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශයට බඳවාගෙන ඇති පිරිසක් මුහුණපා ඇති ගැටලුකාරී තත්ත්වය

නොපැමිණීමේ අවසරය:

ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා

වරාය නගර ව්‍යාපෘතියේ වත්මන් තත්ත්වය:

ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රකාශය

ධීවර හා ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත:

දෙවන වර හා තුන් වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

කල් තැබීමේ යෝජනාව:

දිවිනැගුම කළමනාකාරවරුන්ගේ සහ සංවර්ධන නිලධාරීන්ගේ ස්ථාන මාරු

பிரதான உள்ளடக்கம்

அறிவிப்புக்கள்:

தேசிய மருந்துகள் ஒழுங்குபடுத்தும் அதிகாரசபைச் சட்டமூலம் : உயர் நீதிமன்றத் தீர்ப்பு

சிறப்புரிமை :

துறைமுக அதிகாரசபை பரிசீலனை விஜயத்தின் போது இடம்பெற்ற தாக்குதல்

மாண்புமிகு ஆர். யோகராஜனினது முறைப்பாட்டின் மீதான பொலிசாரது பாரபட்ச நடவடிக்கை

துறைமுக அதிகாரசபை பரிசீலனை விஜயத்தின் போது இடம்பெற்ற தாக்குதல்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல் மூல வினா:

முன்னைய அரசு ஆரம்பித்த அபிவிருத்தித் திட்டங்கள் இடைநிறுத்தம்

தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சுக்கு ஆட்சேர்க்கப்பட்டோர் எதிர் நோக்கும் பிரச்சினைகள்

வராதிருக்க அனுமதி :

மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ

துறைமுக நகரக் கருத்திட்டத்தின் தற்போதைய நிலைமை:

மாண்புமிகு பிரதம அமைச்சரினது கூற்று

கடற்றொழில், நீர்வாழ் உயிரின வளங்கள் (திருத்தம்) சட்டமூலம் :

இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு, திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

ஒத்திவைப்புப் பிரேரணை:

'திவிநெகும' முகாமையாளர்கள் மற்றும் அபிவிருத்தி உத்தியோகத்தர்களின் இடமாற்றம்

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

National Medicines Regulatory Authority Bill: Determination of the Supreme Court

Privilege:

Attack during Inspection Tour of Ports Authority

Biased action of Police on Complaint made by Hon. R. Yogarajan

Attack during Inspection Tour of Ports Authority

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:

Stalling of Development Projects initiated by former Government

Problematic Situation faced by a Group of Recruits to Ministry of National Languages and Social Integration

LEAVE OF ABSENCE:

Hon. Basil Rohana Rajapaksa

PRESENT SITUATION OF PORT CITY PROJECT:

Statement by Hon. Prime Minister

FISHERIES AND AQUATIC RESOURCES (AMENDMENT) BILL:

Read a Second, and the Third time, and passed as amended

ADJOURNMENT MOTION:

Transfers of Divineguma Managers and Development Officers

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2015 පෙබරවාරි 18 වන බදාදා
2015 பெப்ருவரி 18, புதன்கிழமை
Wednesday, 18th February, 2015

අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.

The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

I

ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත : ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය
தேசிய மருந்துகள் ஒழுங்குபடுத்தும் அதிகாரசபை சட்டமூலம் : உயர் நீதிமன்றத் தீர்ப்பு
NATIONAL MEDICINES REGULATORY AUTHORITY BILL : DETERMINATION OF THE SUPREME COURT

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

"ජාතික ඖෂධ නියාමන අධිකාරිය" යන නමින් යුත් පනත් කෙටුම්පත පිළිබඳව නිවේදනයක් කරනු කැමැත්තෙමි.

ජාතියේ හිත පිණිස වහා අවශ්‍ය යැයි අමාත්‍ය මණ්ඩලය විසින් සහතික කරනු ලැබූ මෙම පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122 (1) (ආ) ව්‍යවස්ථාව ප්‍රකාර අතිගරු ජනාධිපතිතුමා විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කරනු ලැබීය.

ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ සඳහන් සංශෝධන පනත් කෙටුම්පතට එකතු කිරීමට යටත්ව එම පනත් කෙටුම්පතේ විධිවිධාන කිසිවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල නොවන බවට 123 ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර ඇති බව දන්වනු කැමැත්තෙමි.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතු යැයි මම නියෝග කරමි.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය
உயர் நீதிமன்றத் தீர்ப்பு:
Determination of the Supreme Court:

IN THE SUPREME COURT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA

SC. SD. 03/2015

In the matter of a Reference in terms of Article 122(1) (b) of the Constitution

"AN ACT TO PROVIDE FOR THE ESTABLISHMENT OF A REGULATORY AUTHORITY TO BE KNOWN AS THE NATIONAL MEDICINES REGULATORY AUTHORITY WHICH SHALL BE RESPONSIBLE FOR THE REGULATION AND CONTROL OF REGISTRATION, LICENSING, MANUFACTURE, IMPORTATION AND ALL OTHER ASPECTS PERTAINING TO MEDICINES, MEDICAL DEVICES, BORDERLINE PRODUCTS AND FOR THE CONDUCTING OF CLINICAL TRIALS IN A MANNER COMPATIBLE WITH THE NATIONAL MEDICINES POLICY; TO PROVIDE FOR THE ESTABLISHMENT OF DIVISIONS OF THE NATIONAL MEDICINES REGULATORY AUTHORITY INCLUDING THE MEDICINES REGULATORY DIVISION, MEDICAL DEVICES REGULATORY DIVISION, BORDERLINE PRODUCTS REGULATORY DIVISION AND CLINICAL TRIALS REGULATORY DIVISION; TO ESTABLISH A NATIONAL ADVISORY BODY; TO REPEAL THE COSMETICS, DEVICES AND DRUGS ACT, NO. 27 OF 1980; AND FOR MATTERS CONNECTED THEREWITH OR INCIDENTAL THERETO."

BEFORE:

S. Eva Wanasundera, PC.	-	**Judge of the Supreme Court**
B.P. Aluwihare, PC.	-	**Judge of the Supreme Court and**
P. Jayawardena, PC.	-	**Judge of the Supreme Court**

COUNSEL:

Mr. Janak de Silva, Deputy Solicitor General, with Ms. Anusha Fernando, Senior State Counsel and Ms. Sureka Ahamed, State Counsel for Attorney General.

The Court assembled for the hearing at 10.45 a.m. on the 10th of February, 2015.

A Bill titled "AN ACT TO PROVIDE FOR THE ESTABLISHMENT OF A REGULATORY AUTHORITY TO BE KNOWN AS THE NATIONAL MEDICINES REGULATORY AUTHORITY WHICH SHALL BE RESPONSIBLE FOR THE REGULATION AND CONTROL OF REGISTRATION, LICENSING, MANUFACTURE, IMPORTATION AND ALL OTHER ASPECTS PERTAINING TO MEDICINES, MEDICAL DEVICES, BORDERLINE PRODUCTS AND FOR THE CONDUCTING OF CLINICAL TRIALS IN A MANNER COMPATIBLE WITH THE NATIONAL MEDICINES POLICY; TO PROVIDE FOR THE ESTABLISHMENT OF DIVISIONS OF THE NATIONAL MEDICINES REGULATORY AUTHORITY INCLUDING THE MEDICINES REGULATORY DIVISION, MEDICAL DEVICES REGULATORY DIVISION, BORDERLINE PRODUCTS REGULATORY DIVISION AND CLINICAL TRIALS REGULATORY DIVISION; TO ESTABLISH A NATIONAL ADVISORY BODY; TO REPEAL THE COSMETICS, DEVICES AND DRUGS ACT, NO. 27 OF 1980; AND FOR MATTERS CONNECTED THEREWITH OR INCIDENTAL THERETO", cited as the **National Medicine Regulatory Authority Act** No. ---- of 2015, has been referred to the Chief Justice by His Excellency The President of Sri Lanka in terms of Article 122(1)(b) of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka for the Special Determination of the Supreme Court as to whether the Bill or any Provisions thereof is inconsistent with the Constitution. The Bill bears an endorsement under the hand of the Secretary to the Cabinet of Ministers to the effect that the Cabinet of Ministers has certified that in its view, the said Bill is urgent in the national interest.

Mr. Janak de Silva, Deputy Solicitor General with Ms. Anusha Fernando, Senior State Counsel and Ms. Sureka Ahamed State Counsel appeared on behalf of the Attorney General and assisted this Court in the consideration of the provisions of the Bill.

[කථානායකතුමා]

The Bill seeks to repeal the Cosmetics, Devices and Drugs Act No. 27 of 1980. The Bill provides for the establishment of a Regulatory Authority to be known as the National Medicines Regulatory Authority. This Authority will hold responsibility for the regulation and control of registration, licensing, manufacture and importation of medical devices, borderline products and investigational medicinal products and all other aspects pertaining to medicines. Furthermore, it provides for the establishment of divisions of the National Medicine Regulatory Authority and the establishment of a National Advisory Body.

The National Medicines Regulatory Authority, consisting of 13 members is placed as an apex body independent of the Department of Health and is a body corporate which has perpetual succession and which can sue and be sued. The powers and functions of the Authority are stipulated in Section 14 of the Bill and includes provisions to guide and oversee all aspects regarding medicinal drugs which is an essential part of the health services in the country. By Article 27(2)(c) of the Constitution, the State has pledged to establish in Sri Lanka a democratic socialist society, the objectives of which includes the realization by all citizens of an adequate standard of living for themselves and their families under the Directive Principles of State Policy. This Bill is patient-centric, in that to make good quality affordable medicines, medical devices and borderline products continuously available to the patients in the society with adequate checks and balances. We observed that the Bill is designed with the best interest of the general public in mind, in line with the policy objectives of the Government.

At the hearing before Court, many clauses which would attract Article 12(1) of the Constitution were taken into consideration and amendments to overcome the situation were agreed upon in court.

This Court suggested that in Clause 12(b) of the Bill, the word "absolute" should be deleted and it should read as "The Authority shall have the discretion of accepting or rejecting the views of the experts" and the Deputy Solicitor General agreed to the said amendment.

Under 'Delegation of the Powers of the Authority', Clause 25(1) was agreed upon to read as follows:-

> "The Authority may in writing and subject to such condition as may be specified therein, delegate to the CEO and any Head of the relevant division of the Authority, any of its powers or functions and any such persons or Head of the relevant divisions shall exercise or perform such powers or functions in the name and on behalf of the Authority".

The Deputy Solicitor General suggested to delete certain parts of Clauses 29(2) , 36, 40, 101(3), 119(5) (b), last line of 130, 131(1) and 143(2) to read as follows:-

Clause 29(2)	-	Expenses incurred by any member, the CEO or any Officer or employee of the Authority in any suit or prosecution brought against him before any Court or Tribunal in respect of any Act which is done or purported to be done by him under the provisions of this Act or any other written law or if the Court holds that such act was done in good faith, be paid out of the Fund of the Authority, unless such expenses are recoverable by him in such suit or prosecution.
Clause 36	-	The Minister may make regulations to give effect to the provisions of this Part of this Act.
Clause 40	-	The Minister may make regulations to give effect to the provisions of this Part of this Act.
Clause 101(3)	-	Any person who contravene any provisions specified in sub Section 1 or 2 of this Section commits an offence.
Clause 119(5)	-	The Authority may upon consideration of all records and information pertaining to the application, (a) grant the Applicant the license; or (b) refuse the application and inform the reasons for such refusal to the Applicant in writing forthwith.

Clause 130 - Last Line - to read as "shall be guilty an offence under this Act."

Clause131(1)	-	Every person who contravenes any of the provisions of this Act or any regulation made thereunder shall be guilty of an offence and shall on conviction be liable:- (a) ……
Clause 143(2)	-	No civil or criminal proceedings shall be instituted against any person for any act which in good faith is done or purported to be done by him under this Act or any regulation make thereunder.

This Court was concerned of Clause 125(1)(e) which empowers an authorized officer to seize and detain any article or vehicle in relation to contravention of provisions of the Act or regulations made thereunder and of Clause 125(9) which requires such officer to inform the Authority. The Deputy Solicitor General addressed court on this matter and gave us the discretion to give a specific time for the officer to inform the Authority. This Court is of the view that Clause 125(9) should remain as it is, since the authorized officer is duty bound to inform the Authority as soon as possible, without much delay and that is the reason why it is mentioned in the said Clause that the officer should inform the Authority "as soon as practicable".

Clause 49(1)(c) as in the Bill drew the attention of Court since it refers to "any substance that may cause injury to the health of the user", where the word "injury' could even be interpreted to mean "side-effects" of a drug administered to cure a disease. The Deputy Solicitor General suggested that an amendment to read it differently, qualifying the word "injury", could overcome this problem. The amended Clause 49(1)(c) to be read as follows is in accordance with the wording used by the World Health Organization in their model law. Court is satisfied with this amendment to read as follows :-

Clause 49(1)(c) - "has in or upon it any deleterious substance that may cause injury to the health of the user; or"

This Court was called upon to exercise its constitutional jurisdiction by virtue of a reference made by His Excellency the President in terms of Article 122(1)(b) on the provisions of this Bill. Article 27(1) of the Constitution states that the Directive Principles of State Policy contained in Chapter VI of the Constitution shall guide the Parliament, the President and the Cabinet of Ministers in the enactment of laws. In the case of *Wijebanda Vs Conservator General of Forests and Others (2009, 1 SLR 337),* this Court held that although the Directive Principles of State Policy are no specifically enforceable against the State, they provide important guidance and direction to the various organs of the State in the enactment of laws and in carrying out the functions of good governance.

This Court observes that public health by itself is not specifically mentioned in the Directive Principles of State Policy in Article 27 of the Constitution. Yet, it is quite significant that adequate and affordable health facilities such as the core substance included in this Bill, providing and regulating safe drugs for affordable prices available at safe places as well as regulating the manufacturing of medicines, medical devises and borderline products are facilities necessary to ensure "an adequate standard of living" for all citizens alike, which is included in Article 27(2)(c).

In the Indian case of Vincent Panikurlangara Vs Union of India & *Others [1987 AIR 990, 1987SCR (2) 468, 1987SCC(2) 165, JT 1987 (1) 610, 1987 SCALE (1) 490]*, the Supreme Court of India made the following observation:-

"As pointed out by us, maintenance and improvement of public health have to rank high as these are indispensable to the very physical existence of the community and on the betterment of these depends the building of the society of which the Constitution makers envisaged. Attending to public health, in our opinion, therefore, is of high priority, perhaps the one at the top."

"The State's obligation to enforce production of qualitative drugs and elimination of the injurious ones from the market must take within its sweep an obligation to make useful drugs available at reasonable prices so as to be within the common man's reach. That would involve regulating the price. It may be that there may be an improved quality of a particular medicine which on account of its cost of production will have to sell at a higher price but for every illness which can be cured by treatment, the patient must be in a position to get its medicine. This, in our view, is an obligation which the Court has already found in the relevant Articles of Part IV of the Constitution."

This Court concludes therefore that the Bill is an attempt by Parliament to enact laws in accordance with the Directive Principles of State Policy.

We further note that the Bill is intended to apply across the board to the private as well as the public sector. Public Corporations such as State Pharmaceutical Corporation and State Pharmaceutical Manufacturing Corporation are also brought within the regulatory scheme set up by this Bill. Hence it covers "policy." We are of the opinion that the Bill is not inconsistent with Article 12(1) of the Constitution.

The subject matter of this Bill does not come within any of the headings in the Provincial Council List or the Concurrent List contained in the Constitution and therefore it can be enacted without following the procedure set out in Article 154 G(3) or 154 G(5) of the Constitution.

We have considered the provisions of this Bill and we are of the opinion that the Bill contains "national policy" which is within the legislative competence of Parliament. We do hereby determine that the Bill is not subject to any of the prohibitions or restrictions in the 13th Amendment, is not inconsistent with any of the provisions of the Constitution and may be passed by Parliament with a simple majority.

We wish to place on record our appreciation of the valuable assistance rendered by the Deputy Solicitor General.

S. EVA WANASUNDERA
JUDGE OF THE SUPREME COURT

B. P. ALUWIHARE
JUDGE OF THE SUPREME COURT

P. JAYAWARDENE
JUDGE OF THE SUPREME COURT

II

වරප්‍රසාද : වරාය අධිකාරියේ නිරීක්ෂණ චාරිකාවේදී සිදු වූ පහර දීම

சிறப்புரிமை : துறைமுக அதிகாரசபை பரிசீலனை விஜயத்தின்போது இடம்பெற்ற தாக்குதல்

PRIVILEGE : ATTACK DURING INSPECTION TOUR OF PORTS AUTHORITY

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රවි කරුණානායක මහතා තමන්ගේ වරප්‍රසාද කඩ වී ඇති බවට 2014 ඔක්තෝබර් මස 29වැනි දින පාර්ලිමේන්තුවේදී මතු කරන ලද කරුණු වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකිය.

III

වරප්‍රසාද : ගරු ආර්. යෝගරාජන් මහතාගේ පැමිණිල්ල සම්බන්ධව පොලීසියේ පක්ෂග්‍රාහී ක්‍රියා කලාපය

சிறப்புரிமை: மாண்புமிகு ஆர். யோகராஜனினது முறைப்பாட்டின் மீதான பொலிஸாரது பாரபட்ச நடவடிக்கை

PRIVILEGE : BIASED ACTION OF POLICE ON COMPLAINT MADE BY HON. R. YOGARAJAN

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ආර්. යෝගරාජන් මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩ වී ඇති බවට 2014 ඔක්තෝබර් මස 28වන දින පාර්ලිමේන්තුවේදි මතු කරන ලද කරුණු වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකිය.

IV

වරප්‍රසාද : වරාය අධිකාරියේ නිරීක්ෂණ චාරිකාවේදී සිදු වූ පහර දීම

சிறப்புரிமை : துறைமுக அதிகாரசபை பரிசீலனை விஜயத்தின்போது இடம்பெற்ற தாக்குதல்

PRIVILEGE: ATTACK DURING INSPECTION TOUR OF PORTS AUTHORITY

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා තමන්ගේ වරප්‍රසාද කඩ වී ඇති බවට 2014 ඔක්තෝබර් මස 31වන දින පාර්ලිමේන්තුවේදී මතු කරන ලද කරුණු වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකිය.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (ආහාර සුරක්ෂිතතාව අමාත්‍යතුමා)
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - உணவுப் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. Gamini Jayawickrama Perera - Minister of Food Security)

ගරු කථානායකතුමනි, මම 2011 වර්ෂය සඳහා වී අළෙවි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අදාළ උපදේශක කාරක සභාවට යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

2013 වර්ෂය සඳහා මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාව සහ වාර්ෂික ගිණුම්.- [ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

(i) 2013 වර්ෂය සඳහා බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යසාධන වාර්තාව හා ගිණුම්; සහ

(ii) 2013 වර්ෂය සඳහා ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යසාධන හා ගිණුම් වාර්තාව.- [ස්වදේශ කටයුතු හා ධීවර අමාත්‍ය ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා වෙනුවට ගරු කරු ජයසූරිය මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

2012 වර්ෂය සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාව.- [සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍ය ගරු රාජිත සේනාරත්න මහතා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - வெகுசன ஊடக, பாராளுமன்ற அலுவல்கள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Mass Media and Parliamentary Affairs and Chief Government Whip)

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මම 2011 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අදාළ උපදේශක කාරක සභාවට යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු සජිත් ප්‍රේමදාස මහතා (නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - வீடமைப்பு மற்றும் சமுர்த்தி அமைச்சர்)
(The Hon. Sajith Premadasa - Minister of Housing and Samurdhi)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

(1) 2011 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ වාර්ෂික වාර්තාව;

(2) 2011 වර්ෂය සඳහා රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව; සහ

(3) 2012 වර්ෂය සඳහා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා අදාළ උපදේශක කාරක සභාවට යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු තලතා අතුකෝරල මහත්මිය (විදේශ රැකියා අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல - வெளிநாட்டு தொழில்வாய்ப்பு அமைச்சர்)
(The Hon. (Mrs.) Thalatha Atukorale - Minister of Foreign Employment)

ගරු කථානායකතුමනි, 2012 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අදාළ උපදේශක කාරක සභාවට යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු කරුපයියා වේලායුදම් මහතා (වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கருப்பையா வேலாயுதம் - பெருந்தோட்டக் கைத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Karuppaiah Velayudam - State Minister of Plantation Industries)

Hon. Speaker, I present the following petitions:

1. A petition from Mr. C.S. Walpola of Sri Lanka Insurance Corporation Limited, Imaduwa Branch;
2. A petition from Mr. G.K.H. Perera of No. 52/2, Janatha Mawatha, Aththidiya, Dehiwala;
3. A petition from Mr. I.T. Gambeera of No. 405 A 2, Magammana, Homagama;
4. A petition from Mr. L.C. Dissanayaka of No. 111, Kurikotuwa, Veyangoda;
5. A petition from Mr. M.A.C.K. Jayaweera of No. 06, Gajabapura Housing Complex, Kolonnawa;

6. A petition from Mr. N.K. Ranushka Suranga Wimalasiri of No. 137/4, Kurikotuwa, Veyangoda;
7. A petition from Mr. S.M.M.A. Alagiyawanna of No. 171, Bogahawaththa, Kirindiwela;
8. A petition from Mrs. D.R. Jayadewa of Sri Lanka Insurance Corporation Limited, Kurunegala Branch;
9. A petition from Mrs. H. Wimalawathie of No. 675, Heiyanthuduwa;
10. A petition from Mrs. J.A. Kamani Jayasinghe of Alubohena, Poruwadanda, Horana;
11. A petition from Mrs. K.A.K. Ayoma of No. 92/1, Arakavila, Handapangoda;
12. A petition from Mrs. R.M. Chandrawathie of Sri Lanka Insurance Corporation Limited, Kurunegala Branch;
13. A petition from Mrs. S.G. Anusha Udayangani Fernando of No. 14/45, Visal Sevana, Pananwala, Delgoda;
14. A petition from Ms. D.M.E. Hansani Dasanayaka of No. 220/8, Asiri Uyana, Wataddara, Veyangoda; and
15. A petition from Ms. G.P.S. Perera of No. 111, Cheenagahakotuwa Road, Depanama, Pannipitiya.

ගරු ඒ.ඩී. චම්පික ප්‍රේමදාස මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ஏ.டி. சம்பிக பிரேமதாச - கைத்தொழில், வாணிப அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. A.D. Champika Premadasa -Deputy Minister of Industry and Commerce)

ගරු කථානායකතුමනි, මම රඹුක්කන, රෝහල පාර, අංක 40/1 දරන ස්ථානයෙහි පදිංචි ඒ.එස්.කේ. ධර්මසේන මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - கொள்கை உருவாக்கம், பொருளாதார அலுவல்கள், சிறுவர், இளைஞர் மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Harsha De Silva - Deputy Minister of Policy Planning, Economic Affairs, Child, Youth and Cultural Affairs)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) රාජගිරිය, ඔබේසේකරපුර, වජිරවංශ මාවත, අංක 46 දරන ස්ථානයෙහි පදිංචි එස්.ඒ.ඩී. සුනන්දා මෙනවිගෙන් ලැබුණු පෙත්සම; සහ
(2) නුගේගොඩ, පාගොඩ, දේවාල පාර, අංක 91 දරන ස්ථානයෙහි පදිංචි එල්.ඒ. චිත්‍රානි නානායක්කාර මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු අජිත් පී. පෙරේරා මහතා - පැමිණ නැත.
ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා - පැමිණ නැත.
ගරු රෝහිත අබේගුණවර්ධන මහතා - පැමිණ නැත.

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි :

(1) අම්බලන්ගොඩ, කෙරමිණිය, පතිරාජ පටුමඟ, අංක 28/2 දරන ස්ථානයෙහි පදිංචි ජී.ඩබ්ලිව්. අනුර මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ
(2) අම්බලන්ගොඩ, කන්දෙගොඩ, දෙවට පාර, අංක 34 දරන ස්ථානයෙහි පදිංචි ඩී.එල්.එස්.එන්. මෙන්ඩිස් මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු නෙරන්ජන් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு நெரன்ஜன் விக்கிரமசிங்க)
(The Hon. Neranjan Wickramasinghe)

ගරු කථානායකතුමනි, කුරුණෑගල, අස්වැද්දුම යන ලිපිනයෙහි පදිංචි මොහොමඩ් අත්තික් බාන් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ගරු කථානායකතුමනි, ආඩියාගල, පැල්බැඳියාව යන ලිපිනයෙහි පදිංචි පී.එම්. ජයන්ත පුෂ්පකුමාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු කථානායකතුමනි, කැලණිය, ඊරියවැටිය, අංක 642 ඒ. දරන ස්ථානයෙහි පදිංචි ඒ.ඒ.එස්. වෙරළුපිටිය මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

සපුගස්කන්ද තෙල් පිරිපහදුව ක්‍රියා විරහිත කිරීම: අලාභය
சப்புகஸ்கந்த எண்ணெய் சுத்திகரிப்பு நிலையம் செயலிழந்தமை : நட்டம்
NON-FUNCTIONING OF SAPUGASKANDA OIL REFINERY : LOSS INCURRED

4091/'13

1. ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2013 වර්ෂය තුළ සපුගස්කන්ද තෙල් පිරිපහදුව ක්‍රියා විරහිතව තිබූ දින තිබුණේද;
(ii) එසේ ක්‍රියා විරහිත කිරීමට හේතු වූ කරුණු කවරේද;

[ගරු අනුර දිසානායක මහතා]

(iii) බොර තෙල් නියමිත පරිදි සපයා ගැනීමට නොහැකි වීමෙන් පිරිපහදුව වසා දමා තිබුණේද;

(iv) එම දිනයන් කවරේද;

(v) බොර තෙල් නොමැතිකමින් පිරිපහදුව වසා දැමීම නිසා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සිදු වූ අලාභය දළ වශයෙන් කොපමණද;

(vi) බොර තෙල් හිඟවීම පිළිබඳව පරීක්ෂණයක් පවත්වා තිබේද;

(vii) එසේ නම්, එම පරීක්ෂණයෙන් වරදකරුවන් වූවන්ට එරෙහිව විනය ක්‍රියා මාර්ග ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

மின்வலு, எரிசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2013ஆம் ஆண்டில் சப்புகஸ்கந்த எண்ணெய் சுத்திகரிப்பு நிலையம் செயலற்றுப்போன நாட்கள் இருந்தனவா;

(ii) அவ்வாறு செயலற்றுப்போகச் செய்தமைக்கு ஏதுவான காரணங்கள் யாவை;

(iii) மசகெண்ணெயை உரியவகையில் பெற்றுக் கொள்ள இயலாமல் போனமையால் சுத்திகரிப்பு நிலையம் மூடப்பட்டுள்ளதா;

(iv) அந்நாட்கள் யாவை;

(v) மசகெண்ணெய் இன்மை காரணமாக சுத்திகரிப்பு நிலையம் மூடப்பட்டதால் இலங்கை பெற்றோலியக் கூட்டுத்தாபனத்திற்கு ஏற்பட்ட நட்டம் மொத்தமாக எவ்வளவு;

(vi) மசகெண்ணெய் பற்றாக்குறை தொடர்பாக விசாரணையொன்று மேற்கொள்ளப்பட் டுள்ளதா;

(vii) ஆமெனில் அவ்விசாரணையில் தவறாளிகளாகக் காணப்பட்டவர்களுக்கு எதிராக ஒழுக்காற்று நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டுள்ளனவா

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Energy:

(a) Will he inform this House -

(i) whether there were days in the year 2013 that the Sapugaskanda Oil Refinery was not functioning;

(ii) the reasons for non-functioning of the refinery;

(iii) whether the refinery was closed down due to the failure in obtaining crude oil;

(iv) what those days were;

(v) the gross loss incurred by the Ceylon Petroleum Corporation as a result of the closure of the refinery due to the lack of crude oil;

(vi) whether an inquiry has been conducted about the shortage of crude oil; and

(vii) whether disciplinary actions have been taken against the persons who were found guilty in that inquiry?

(b) If not, why?

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා (විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பாலித ரங்கே பண்டார - மின்வலு மற்றும் எரிசக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Palitha Range Bandara - State Minister of Power and Energy)

ගරු කථානායකතුමනි, විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) බොර තෙල් සපයා ගැනීමට නොහැකි වීම.

(iii) ඔව්, දෙවරක්.

(iv) 2013 මැයි 15 සිට 30 දක්වා.

2013 නොවැම්බර් 08 සිට 14 දක්වා.

(v) රුපියල් මිලියන 40ක් පමණ.

පිරිපහදුව දෙවරක් නතර කිරීම හා නැවත රත් කිරීමට සිදු වීම නිසා මෙම මුදල වියදම් විය.

(vi) නැත.

ඉරානයෙන් ගෙන්වන බොර තෙල් පමණක් මෙම පිරිපහදුවට යොදා ගැනේ. වෙනත් රටක නිෂ්පාදිත බොර තෙල් ඊට යොදා ගත නොහැක. ඇමෙරිකාව ඉරානයට සම්බාධක පනවා ඇති නිසා රජය ඉරානයෙන් බොර තෙල් ආනයනය නතර කරන ලදී.

(vii) පැන නොනඟී.

(ආ) පැන නොනඟී.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, මාගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමා කියූ පරිදිම මෙම පිරිපහදුව දෙවරක් නතර වී තිබෙනවා. එය නතරවීමට ප්‍රධාන හේතුව බවට පත් වී තිබෙන්නේ අවශ්‍ය වන බොර තෙල් ප්‍රමාණය නොමැතිවීමයි. පිරිපහදුවේ කටයුතු නතර කරලා නැවත පිරිපහදුවේ කටයුතු ආරම්භ කිරීම සඳහා තමයි මේ රුපියල් කෝටි හතරකට ආසන්න මුදල වැය වෙලා තිබෙන්නේ. අලාභය හැටියට ගණනය කරන්නේ ඒක. ගරු ඇමතිතුමනි, පිරිසිදු කරන ලද තෙල් ආනයනයට වඩා බොර තෙල් පිරිසිදු කිරීම හරහා ලබා ගන්නා තෙල්වලින් අපට තව ලාභයක් තිබෙනවා. ඒකත් එකතු කළොත් මේ පාඩුව මීට වඩා ඉහළ යනවා. ගරු ඇමතිතුමනි, ඇත්තටම මෙතැන ඇති වුණේ-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු මන්ත්‍රීතුමා, කථාව නතර කරලා, අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

හොඳමයි. දැන් අතුරු ප්‍රශ්නය අහන්න හදන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ප්‍රධානම ප්‍රශ්නය වුණේ ඇමෙරිකා එක්සත් ජනපදයෙන් ඇති කරන ලද සම්බාධක හේතුකොට ගෙන නොවෙයි, නිවැරදි ලෙස මිලදී ගැනීමේ පටිපාටියක් අනුගමනය නොකිරීම හේතුකොට ගෙන නේද?

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු මන්ත්‍රීතුමනි, එවැනි කරුණක් නම් වාර්තා වෙලා නැහැ. ඔබතුමා කියනවා නම් මම මේ පිළිබඳව සොයා බලා, පෞද්ගලිකව ඔබතුමාව ඒ සම්බන්ධයෙන් දැනුවත් කරන්න කටයුතු කරන්නම්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමාට වාර්තා හදලා දෙන්නේ මේ වැඩේට හවුල් වුණු අයම තමයි. ගරු කථානායකතුමනි, හවුල් වුණු අය වාර්තාව හදලා තිබෙන්නේ ඒ ගොල්ලන් ආරක්ෂා වීම සඳහායි. ආසන්න වශයෙන් ගත්තොත්, පිරිපහදුව වැසීම නිසා පිරිපහදුවේ පාඩුව රුපියල් කෝටි 4යි; බොර තෙල් පිරිපහදු නොකිරීම හේතුකොට ගෙන තෙල්වලින් ඇතිවන අතිරේක පාඩුව රුපියල් කෝටි 2 ඉක්මවනවා. එතකොට රුපියල් කෝටි 6කට වඩා අධික පාඩුවක් මෙහිදී ඇති වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, එය ස්වල්ප මුදලක් නොවෙයි. ඒ පිළිබඳ පරීක්ෂණයක් ආරම්භ කරන්න අමාත්‍යතුමා සූදානම් ද?

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු කථානායකතුමනි, මෙවැනි කාරණයක් අපට වාර්තා වෙලා නැහැ. නමුත් ගරු මන්ත්‍රීතුමාගේ කරුණු දැක්වීම පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා. ඒ පිළිබඳව සොයා බලා, ගරු මන්ත්‍රීතුමා දැනුවත් කිරීමට මම කටයුතු කරනවා. ඒ වාගේම එවැනි අකටයුත්තක් වෙලා තිබෙනවා නම්, ඒ පිළිබඳ අවශ්‍ය විමර්ශන සිදු කිරීමට පියවර ගන්නවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු ඇමතිතුමාගෙන් මේ කරුණුත් දැන ගන්න කැමැතියි. බොර තෙල් අවශ්‍යතාවන් පිළිබඳව නිශ්චිත කාල සටහනක් සකස් කරනවා, මේ කාලය වනකොට මෙච්චර අවශ්‍යයි, එය මිලදී ගැනීම සඳහා මේ ටෙන්ඩර් පටිපාටිය මේ දින වන විට ආරම්භ කළ යුතුයි කියලා. ඒ නිවැරදි දර්ශකය අනුව ටෙන්ඩර් කැඳවීමට සහ ප්‍රදානය කිරීමට කටයුතු කරන්න බාධාවක් වුණේ ඇයි කියලා ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි. එය නිසි ආකාරයට වුණා නම් මෙසේ වෙන්නේ නැහැ.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු කථානායකතුමනි, බොර තෙල් පමණක් නොවෙයි, ඉන්ධන ලබා ගැනීමේදී ද නියමිත පටිපාටිය අනුගමනය නොකර ලංකාවට ඉන්ධන එවන ලද සැපයුම්කරුවන් විසින් බාල තෙල් එවූ විට ඒවා භාරගැනීමට ඉඩ දීමත්, ඒ වාගේම එම සමාගම්වලටම නැවත නැවත තෙල් ගෙන ඒමටත් ඉඩ දී තිබෙනවා. නියමිත ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කිරීමකින් තොරව, පසු ගිය වසරවල තිබුණු ගිවිසුමේ කාලය නැවත දීර්ඝ කිරීම සිදු කර තිබෙනවා. ඒ අනුව පෙරේදා වන කොටත් බාල තෙල් නැවක් අප වෙත ලැබී තිබෙනවා. පෙට්‍රල් මෙට්‍රික් ටොන් 10,000 ප්‍රමිතියට තිබුණු නිසා අපි එය භාර ගත්තා, ගරු කථානායකතුමනි. ඩීසල් මෙට්‍රික් ටොන් 30,000 ඒ සමාගමටම ආපසු භාරගන්නා ලෙස අපි කියා තිබෙනවා. අතීතයේ ගිවිසුම නිසි පරිදි තිබුණු නිසා ඒ ගිවිසුමට අනුව අපට තෙල් සැපයුම්කරුවන්ගෙන් වන්දි මුදලක්, දඩ මුදලක් අය කර ගැනීමට අවස්ථාව තිබුණා. නමුත් මෙවර ඒ ගිවිසුමේ කාලය දීර්ඝ කිරීම තුළ ඒ ගිවිසුම්වලට මේ කොන්දේසි ඇතුළත් නොකිරීම හේතු කරගෙන එවැනි අය කරගැනීමක්ද අහිමි වී තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමා කියන කාරණාවල සත්‍යතාවක් තිබෙනවා. මේ ගිවිසුම් අවසන් කරන්න පුළුවන්කමක් නැහැ, 2015 අවසන් වන තෙක්. ඉන් පස්සේ පුළුවන් වෙනවා, නිවැරදි ක්‍රමයට යථාවත් කරන්න.

ගම්පහ, මිරිස්වත්ත සිට වතුරුගම මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය: විස්තර
கம்பஹா, மிரிஸ்வத்த - வத்துருகம வீதி விஸ்தரிப்புக் கருத்திட்டம் : விபரம்
PROJECT TO BROADEN ROAD FROM GAMPAHA, MIRISWATTE TO WATHURUGAMA : DETAILS

5022/'14

3. ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ගම්පහ, මිරිස්වත්ත සිට වතුරුගම දක්වා මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා වැය වන සම්පූර්ණ මුදල කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා සැකසූ ඇස්තමේන්තුවෙහි පිටපතක් සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ගය පුළුල් කිරීමේ කොන්ත්‍රාත්තුව ලබාගත් ආයතනයේ නම කවරේද;

(ii) එම ආයතනය තෝරා ගැනීම සඳහා පිළිගත් ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කළේද;

(iii) විධිමත් ටෙන්ඩර් පටිපාටිය අනුගමනය නොකළේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත මාර්ගය පුළුල් කිරීම සඳහා ඉඩම් අත්පත් කරගත් වර්ෂය කවරේද;

(ii) අත්පත් කරගනු ලැබූ ඉඩම් සඳහා වන්දි ගෙවා තිබේද;

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

(iii) එසේ නම්, එම වන්දි ගෙවීම් සිදු කළ වර්ෂය කවරේද;

(iv) මේ වන විට ඉහත පරිදි අත්පත් කරගත් සියලු ඉඩම් සඳහා වන්දි ගෙවා අවසන් කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

நெடுஞ்சாலைகள், உயர் கல்வி மற்றும் முதலீட்டு ஊக்குவிப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கம்பஹா, மிரிஸ்வத்த தொடக்கம் வத்துருகம வரையிலான வீதி விஸ்தரிப்பு கருத்திட்டத்திற்கு செலவாகும் மொத்தப் பணத் தொகை எவ்வளவு;

(ii) மேற்படி கருத்திட்டத்துக்காக தயாரிக்கப்பட்ட மதிப்பீட்டின் பிரதியொன்றை சபையில் சமர்ப்பிப்பாரா

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி வீதியை விஸ்தரிப்பதற்கான ஒப்பந்தத்தைப் பெற்றுக்கொண்ட நிறுவனத்தின் பெயர் யாது;

(ii) மேற்படி நிறுவனத்தை தெரிவுசெய்வதற்காக அங்கீகரிக்கப்பட்ட கேள்விப்பத்திர நடைமுறைகள் பின்பற்றப்பட்டனவா;

(iii) முறைசார்ந்த கேள்விப்பத்திர நடைமுறைகள் பின்பற்றப்படவில்லை எனில், அதற்கான காரணம் யாது

என்பதை அவர் குறிப்பிடுவாரா?

(இ) (i) மேற்படி வீதியை விஸ்தரிப்பதற்காக காணிகள் சுவீகரிக்கப்பட்ட வருடம் யாது;

(ii) சுவீகரிக்கப்பட்ட காணிகளுக்கு நட்டஈடு செலுத்தப்பட்டுள்ளதா;

(iii) ஆமெனில், அந்த நட்டஈடு செலுத்தப்பட்ட வருடம் யாது;

(iv) தற்போது மேலே குறிப்பிட்டவாறு சுவீகரிக்கப் பட்ட அனைத்து காணிகளுக்கும் நட்டஈடு செலுத்தி முடிக்கப்பட்டுள்ளதா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Highways, Higher Education and Investment Promotion:

(a) Will he inform this House -

(i) the total amount of money spent on the project to broaden the road from Gampaha, Miriswatte to Wathurugama; and

(ii) whether a copy of the estimate, which was prepared for the aforesaid project, will be tabled?

(b) Will he state -

(i) the name of the institution by which the contract to broaden the aforesaid road was undertaken;

(ii) whether the accepted tender procedure was followed for the selection of that institution; and

(iii) the reasons that led to it, if the formal tender procedure was not followed?

(c) Will he also inform this House -

(i) the year in which the lands were taken over for the purpose of broadening the aforesaid road;

(ii) whether compensation has been paid for the lands that were taken over;

(iii) if so, of the year in which the compensation was paid; and

(iv) whether compensation has been paid for all the lands that were taken over as mentioned above?

(d) If not, why?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நெடுஞ்சாலைகள், உயர்கல்வி மற்றும் முதலீட்டு ஊக்குவிப்பு பிரதி அமைச்சர்)

(The Hon. Eran Wickramaratne - Deputy Minister of Highways, Higher Education and Investment Promotion)

ගරු කථානායකතුමනි, මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මෙහි සංවර්ධන කටයුතු කොන්ත්‍රාත් දෙකක් යටතේ සිදු කරනු ලබයි.

කි. මී. 0.00 - 5.00 දක්වා කොටස

බෝක්කු පුළුල් කිරීම සහ අලුතින් ඉදි කිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන 48.98 (බදු සහිතව)

මේ සඳහා වැය වූ සම්පූර්ණ මුදල රුපියල් මිලියන 37.85 (බදු සහිතව)

මාර්ගය පුළුල් කර ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන 134.15 (බදු සහිතව)

මේ සඳහා වැය වූ සම්පූර්ණ මුදල රුපියල් මිලියන 132.39 (බදු සහිතව)

කිලෝමීටර් 5.00 - 10.71 දක්වා කොටස

බෝක්කු පුළුල් කර වැඩිදියුණු කිරීම, මාර්ගය පිළිසකර කිරීම සහ පුළුල් කිරීම සඳහා බිම් සකස් කිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන 110.15 (බදු සහිතව)

මෙම කොටසේ වැඩ ආරම්භ කර ඇති අතර, දැනට නිම කර ඇති කොටසේ වටිනාකම රුපියල් මිලියන 15.97 (බදු සහිතව)

පූර්ව මිශ්‍රණ යෙදීම සඳහා ටෙන්ඩර් කැඳවා ඇති අතර, එහි ඇස්තමේන්තු වටිනාකම රුපියල් මිලියන 151.00 (බදු සහිතව)

(ii) ඔව්.

(ආ) (i) කිලෝමීටර් 0.00 - 5.00 දක්වා කොටස

බෝක්කු පුළුල් කිරීම හා ඉදිකිරීම - ෆිනිටි ලංකා සමාගම (Finite Lanka)

මාර්ගය පුළුල් කර ප්‍රතිසංස්කරණය කිරීම - ස්ටාර් කන්ස්ට්‍රක්ෂන් ආයතනය (Star Construction)

කිලෝමීටර් 5.00 - 10.71 දක්වා කොටස

බෝක්කු පුළුල් කර වැඩිදියුණු කිරීම, මාර්ගය පිළිසකර කිරීම සහ පුළුල් කිරීම සඳහා බිම් සකස් කිරීම සිදු කරනු ලබනුයේ මාර්ග සංවර්ධන අධිකාරියේ සෘජු කම්කරු ශ්‍රමය යටතේය.

මෙම කොටසේ පූර්ව මිශ්‍රණ යෙදීම සඳහා ටෙන්ඩර් කැඳවා ඇති අතර, මෙතෙක් ටෙන්ඩර් ප්‍රදානය කිරීමක් කර නැත.

(ii) ඔව්.

(iii) අදාළ නොවේ.

(ඇ) (i) එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා 38 "අ" අතුරු විධානය යටතේ ඉඩම් රජයට අත්කරගෙන ඇත.

ප්‍රා.ලේ. කොට්ඨාසය	38 "අ" අතුරු විධානය පළ කරන ලද ගැසට් අංකය	දිනය
ගම්පහ	1660/42	2010.07.01
මහර	1625/12	2009.10.08
මහර	1658/34	2010.06.17
දොම්පේ	1659/11	2010.06.22

(ii) වන්දි ගෙවීමේ කටයුතු සිදු කරමින් පවතී.

(iii) 2013 වර්ෂයේ සිට වන්දි ගෙවමින් පවතී.

(iv) නැත.

ඉඩම් අත්කර ගැනීමේ පනත ප්‍රකාරව මූලික කටයුතු සිදු කර, වන්දි ගෙවීම සඳහා ප්‍රතිපාදන ඉල්ලා ඇති ගම්පහ සහ මහර ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් එම කොට්ඨාසවලට අයත් ඉඩම් කැබලි සඳහා බොහෝදුරට වන්දි ගෙවා අවසන් කර ඇත.

දොම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ඉඩම් කැබලි සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් ප්‍රතිපාදන ඉල්ලුම් කරනු ලැබූ විට වන්දි ගෙවීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඈ) පැන නොනඟී.

ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය : පුවරු සඳහා වැය කිරීම

நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு மற்றும் பொது வசதிகள் அமைச்சு: விளம்பரப் பலகைகளுக்கான செலவு

MINISTRY OF CONSTRUCTION, ENGINEERING SERVICES, HOUSING AND COMMON AMENITIES: MONEY SPENT ON HOARDINGS

5181/'14

4. ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (3) :

(අ) වර්ෂ 2009 සිට 2014 දක්වා කාල සීමාව තුළ දී,

(i) එවකට පැවති ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය යටතේ තිබූ ආයතන මඟින් අනුග්‍රාහක දැන්වීම්, සුබ පැතුම් පුවරු සහ ප්‍රචාරක පුවරු සවිකිරීම වෙනුවෙන් වැය කළ මුදල;

(ii) එකී ආයතනයන්හි අරමුණු ඉටු කර ගැනීම වෙනුවෙන් සවිකරන ලද පුවරු සඳහා වැය කළ මුදල;

(iii) එකී ආයතනයන්හි අරමුණුවලට පරිබාහිර අරමුණු වෙනුවෙන් සවි කරන ලද පුවරු සඳහා වැය කළ මුදල;

වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ආයතනයන්හි අරමුණුවලට පරිබාහිර අරමුණු වෙනුවෙන් සවි කරන ලද ප්‍රචාරක පුවරු මඟින් ප්‍රචාරය කරන ලද කරුණු කවරේද;

(ii) එම පුවරු සවි කිරීම සඳහා අනුමතිය ලබා දුන් අය කවුරුන්ද;

(iii) ඒ සඳහා වූ වියදම ප්‍රතිපූරණය කර ගත් ආකාරය කවරේද;

(iv) එකී පුවරු සඳහා කරන ලද ගෙවීම්වලට අදාළ ලේඛන ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

வீடமைப்பு மற்றும் சமூர்த்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2009ஆம் ஆண்டிலிருந்து 2014ஆம் ஆண்டு வரையான காலப்பகுதியில்,

(i) அன்றிருந்த நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு மற்றும் பொது வசதிகள் அமைச்சின் கீழுள்ள நிறுவனங்கள் மூலம் அனுசரணை அறிவித்தல்கள், வாழ்த்துரை பலகைகள் மற்றும் விளம்பரப் பலகைகளைப் பொருத்துவதற்குச் செலவிடப்பட்ட பணத்தொகை;

(ii) மேற்படி நிறுவனங்களின் நோக்கங்களை நிறைவேற்றிக்கொள்ளும்பொருட்டு பொருத்தப் பட்ட பலகைகளுக்குச் செலவிடப்பட்ட பணத் தொகை;

(iii) மேற்படி நிறுவனங்களின் நோக்கங்களுக்குப் புறம்பான நோக்கங்களுக்காகப் பொருத்தப்பட்ட பலகைகளுக்குச் செலவிடப்பட்ட பணத்தொகை

வருடாந்தம் வெவ்வேறாக எவ்வளவென்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்படி நிறுவனங்களின் நோக்கங்களுக்குப் புறம்பான நோக்கங்களுக்காகப் பொருத்தப்பட்ட விளம்பரப் பலகைகள் மூலம் விளம்பரம் செய்யப்பட்ட விடயங்கள் யாவை என்பதையும்;

(ii) மேற்படி பலகைகளைப் பொருத்துவதற்கு அங்கீகாரம் வழங்கியவர்கள் யாவர் என்பதையும்;

(iii) அதற்கான செலவு மீளளிப்புச் செய்யப்பட்ட விதம் யாதென்பதையும்;

(iv) மேற்படி பலகைகளுக்காக மேற்கொள்ளப்பட்ட கொடுப்பனவுகளுக்கு ஏற்புடையதான ஆவணங் களைச் சமர்ப்பிப்பாரா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

asked the Minister of Housing and Samurdhi:

(a) Will he state separately in relation to the period from the year 2009 to 2014 -

(i) the amount of money that was spent annually by the entities under the then Ministry of Construction, Engineering Services, Housing and Common Amenities on sponsorship advertisements, congratulatory cutouts and hoardings;

(ii) the amount of money that was spent annually on hoardings that were displayed with a view to achieving the objectives of the aforesaid entities; and

(iii) the amount of money that was spent annually on hoardings that were displayed with a view to achieving objectives that fall outside the ambit of the objectives of the aforesaid entities?

(b) Will he inform this House -

(i) the facts to which publicity was given through the hoardings that were displayed for achieving the objectives that fall outside the ambit of the objectives of the aforesaid entities;

(ii) the names of persons who gave approval for the display of such hoardings;

(iii) the manner in which the expenses incurred on them were reimbursed; and

(iv) whether documents pertaining to the expenses incurred on the same will be presented to this House?

(c) If not, why?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි. (අ) (i) අනුග්‍රාහක දැන්වීම් සහ ප්‍රචාරක පුවරු සඳහා මුදල් වැය කර නැත.

ආයතනයේ අරමුණු පිළිබඳව මහ ජනතාව දැනුවත් කිරීම සහ මහජන සහභාගිත්වය වර්ධනය කිරීම සඳහා අධ්‍යාපනික දැන්වීම් සහ පුවරු සඳහා පහත පරිදි මුදල් වැය කර ඇතැයි කියා මගේ අමාත්‍යාංශයේ නිලධාරීන් පිළිතුරු ලබා දී තිබෙනවා.

2009 වර්ෂය	-	රුපියල් 43,90,000
2010 වර්ෂය	-	රුපියල් 5,283,000
2011 වර්ෂය	-	රුපියල් 10,367,000
2012 වර්ෂය	-	රුපියල් 20,894,000
2013 වර්ෂය	-	රුපියල් 15,027,193
2014 වර්ෂය	-	රුපියල් 10,065,770

(ii) එකී ආයතනයන්හි අරමුණු ඉටු කර ගැනීම වෙනුවෙන් වැය කරන ලද මුදලින් පුවරු සඳහා පමණක් වැය කළ මුදල පහත සඳහන් වේ.

2009 වර්ෂය	- රුපියල් 470,000
2010 වර්ෂය	- රුපියල් 277,000
2011 වර්ෂය	- රුපියල් 6,931,970
2012 වර්ෂය	- රුපියල් 6,887, 492
2013 වර්ෂය	- රුපියල් 10,483,071
2014 වර්ෂය	- රුපියල් 6,894,208

ඒ වාගේම මේ පුවරු, අනුග්‍රාහක දැන්වීම්, සුබ පැතුම් පුවරු, ප්‍රචාරක පුවරු සවි කළ ස්ථාන සහ අනුග්‍රහයන් ලබා දුන් ආයතනවල විස්තර මම **සභාගත*** කරනවා.

(iii) ලබා දී තිබෙන පිළිතුරුවලට අනුකූලව, ආයතනවල අරමුණුවලට පරිබාහිරව ප්‍රචාරක පුවරු සවි කර නොමැත.

(ආ) (i) ආයතනවල අරමුණුවලට පරිබාහිරව වෙනත් අරමුණු සඳහා රාජ්‍ය අරමුදල් යොදවා ප්‍රචාරක පුවරු සවි කර නොමැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙසේයි. මෙම පුවරු වෙනුවෙන් විශාල මුදලක් වියදම් කර තිබෙන බව අපි මේ අවස්ථාවේ දැන ගත්තා. ගරු ඇමතිතුමනි, මේ පුවරු වෙනුවෙන් යොදා ගෙන තිබෙන්නේ කවර කටයුත්තක් සඳහා යොදා ගන්න තිබුණු මුදල්ද?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම මේ මහා විශාල මුදල් සම්භාරයම යොදවන්න තිබුණේ අපේ රටේ නිවාස නොමැති ජනතාවට නිවාස ටික හදා දෙන්නයි. එක්කෝ නිවාස ආධාර, එහෙම නැත්නම් නිවාස ණය, විසිරි ණය යනාදී වශයෙන් ලබා දෙන්නට පුළුවන්කම තිබුණා. ඇත්ත වශයෙන්ම ඒ බෙදා දෙන්න තිබුණු අරමුදල් තමයි මේ පුවරු සඳහා වැය කර තිබෙන්නේ. මම දකිනවා ඒක ඉතාම නාස්තිකාර වියදමක් හැටියට.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. හිටපු නිවාස ඇමතිතුමාගේ කාලයේ පුවරු සෙල්ලම කරගෙන ගියා. ගරු ඇමතිතුමනි, ඔබතුමාත් ඒ වාගේම මේ පුවරු සෙල්ලම දිගටම කරගෙන යන්න බලාපොරොත්තු වෙනවාද?

** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.*
ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.
Document not tendered.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මම මේ වගකීම බාර ගත් දවසේ සිට පුවරු වෙනුවෙන්, දැන්වීම් වෙනුවෙන් අනවශ්‍ය වියදම් සියල්ලක්ම නතර කරලා තිබෙන්නේ. කිසිම පුවරුවක් ගහන්න රජයේ අරමුදල් වැය කරන්නේ නැහැ. කිසිම ප්‍රචාරක දැන්වීමක් එහෙමත් නැත්නම් වෙළඳ දැන්වීමක්, දැනුවත් කිරීමක් සඳහා ගෙවල් හදන්න තිබෙන සල්ලිවලින් සත පහක්වත් යොමු කරන්නේ නැත කියන එක මම වගකීමෙන් කියනවා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. හිටපු නිවාස ඇමතිතුමාගේ කෝටි ගණනක් වටිනා නිවාස දෙකක් ගැන මාධ්‍ය ඔස්සේ පසු ගිය කාලයේදී කියැවුණා. ගරු ඇමතිතුමනි, ඉතින් මම අහනවා ඔබතුමාගේ ආයතනයේ පසු ගිය කාලයේ කොපමණ වංචා දූෂණ ප්‍රමාණයක් සිදු වෙලා තිබෙනවාද, මේ අවස්ථාව වන විට ඒ සම්බන්ධයෙන් ඔබතුමා කටයුතු කරලා තිබෙනවාද කියා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, හිටපු නිවාස ඇමති විමල් වීරවංශ මැතිතුමාගේ නිවාස සම්බන්ධ තොරතුරු මා සතුව නැහැ. නමුත් මේ උත්තරීතර සභාවට මම සඳහන් කරන්න කැමැතියි, නිවාස අමාත්‍යාංශය සහ ඊට අනුබද්ධව තිබුණු ආයතනවලින් විශාල මුදල් කන්දරාවක් නාස්ති කර තිබෙන බව. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව පමණක් වාහන 33ක් කුලියට අරගෙන තිබෙනවා. රටේ ජනතාවට ගෙවල් හදන්න තිබුණු සල්ලිවලින් තමයි වාහන 33ක් කුලියට අරගෙන එක එක අයගේ පුද්ගලික දේශපාලන ව්‍යාපෘති ක්‍රියාත්මක කළේ.

එක් එක් දේශපාලන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා නිවාස සංවර්ධන අධිකාරියේ වාහන පහළොවක් කුලියට අරගෙන තිබුණා. දැන් ඒ සියල්ලක්ම නතර කර තිබෙනවා. නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය තුළ තිබෙන එකම වාහනයක් හෝ එකම රාජ්‍ය සම්පතක් දේශපාලන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අප උපයෝගි කර ගන්නේ නැහැ. විශේෂයෙන්ම ඒ නාස්තිය, දූෂණය, හොරකම, වංචාව, මහ දවල් මං කොල්ල කෑමේ - දවල් සහ රාත්‍රී දෙකේම - සංස්කෘතිය අප සහමුලින්ම නතර කර තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

හොඳයි, සියලු දෙනා එය බලා ගෙන ඉන්නවා.

පලාලි ගුවන් තොටුපොළ : ඉදිකිරීම් කටයුතු
பலாலி விமான நிலையம் : நிர்மாண வேலைகள்
PALALI AIRPORT : CONSTRUCTION WORK

5359/'14

6. ගරු ඒ. විනායගමූර්ති මහතා
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3) :

(අ) (i) පලාලි ගුවන් තොටුපළේ ඉදිකිරීම් කටයුතු අවසන් කරනු ලබන දිනය කවරේද;

(ii) එය මහ ජනතාව සඳහා විවෘත කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள், கப்பற்றுறை மற்றும் விமானச் சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பலாலி விமான நிலையத்தின் நிர்மாண வேலைகள் எப்போது பூர்த்தியடையு மென்பதையும்;

(ii) பொதுமக்கள் பாவனைக்காக அது எப்போது திறக்கப்படுமென்பதையும்

அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Ports, Shipping and Aviation:

(a) Will he inform this House -

(i) as to when the construction work of Palali Airport will be completed; and

(ii) as to when it will be opened for public?

(b) If not, why?

ගරු අර්ජුන රණතුංග මහතා (වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා)
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க - துறைமுகங்கள், கப்பற்றுறை மற்றும் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Arjuna Ranatunga - Minister of Ports, Shipping and Aviation)

ගරු කථානායකතුමනි, පිළිතුර මෙසේයි.

(අ) (i) පලාලි ගුවන් තොටුපළ ඉදි කිරීම් කටයුතු සිදු කිරීම ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම මඟින් සිදු නොවේ.

(ii) ඉහත අ (i) අනුව අදාළ නොවේ.

(ආ) පැන නොනඟී.

ගරු ඒ. විනායගමූර්ති මහතා
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)

When will you open it for the public to travel from Palali?

ගරු අර්ජුන රණතුංග මහතා
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)

Hon. Member, we had a discussion regarding this last week. After speaking to the Air Force, we will be taking a decision within the next couple of weeks giving priority to national security.

ගරු ඒ. විනායගමූර්ති මහතා
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)

Security of the people or security of the army?

ගරු අර්ජුන රණතුංග මහතා
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
Security of the country.

ගරු ඒ. විනායගමූර්ති මහතා
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)
It will not affect the security of the country.

ගරු අර්ජුන රණතුංග මහතා
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
We need to concentrate on the security of the country and then take a decision on that.

ගරු ඒ. විනායගමූර්ති මහතා
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)
Who did the construction work and is it over?

ගරු අර්ජුන රණතුංග මහතා
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
It was done by the Air Force and not by the Airport and Aviation Services (Sri Lanka) Limited.

ගරු ඒ. විනායගමූර්ති මහතා
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)
The Indian Government intervened in this. Has the Indian Government not fully completed the construction work?

ගරු අර්ජුන රණතුංග මහතා
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
Hon. Member, you need to ask that from the State Minister of Defence.

සී/ස මිහින් ලංකා (පුද්ගලික) සමාගම : ශුද්ධ අලාභය

வ/ப மிஹின் லங்கா (தனியார்)கம்பனி : தேறிய நட்டம்

MIHIN LANKA (PVT.) LIMITED : NET LOSS

4465/'13

9. ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3) :

(අ) (i) සී/ස මිහින් ලංකා (පුද්ගලික) සමාගම 2010/2011 වර්ෂයේදී ලැබූ ශුද්ධ අලාභය කොපමණද;

(ii) එම වර්ෂයේ ගිණුම් පිළිබඳව විගණනය කළ වරළත් ගණකාධිකාරිවරුන් වන ප්‍රයිස් වෝටර් හවුස් කූපර්ස් ආයතනය විසින් මිහින් ලංකා සමාගමේ පැවැත්ම පිළිබඳව මතයක් ඉදිරිපත් කර තිබේද;

(iii) එසේ නම්, එකී ආයතනය පළ කර ඇති මතයේ "වර්ෂය තුළ මිහින් ලංකා සමාගම රුපියල් මිලියන 940.49ක අලාභයක් පෙන්වා ඇති අතර, ජංගම වගකීම් රුපියල් මිලියන 1,083.92කින් ජංගම වත්කම් ඉක්මවා ගොස් රුපියල් මිලියන 3,814.45ක සෘණ ශුද්ධ අගයක් පෙන්නුම් කරන බැවින් සමාගම ක්‍රියාත්මක තත්ත්වයේ ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යාමට ඇති හැකියාව පිළිබඳව සැක සහිත තත්ත්වයක් පෙන්නුම් කරයි" යනුවෙන් සඳහන් වී තිබේද;

(iv) එම තත්ත්වය තුළ සී/ස මිහින් ලංකා (පුද්ගලික) සමාගම තවදුරටත් පවත්වාගෙන යෑම සඳහා මහජන මුදල් යෙදවීම ඵලදායක නොවන බව රජය පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள், கப்பற்றுறை மற்றும் விமானச் சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வ/ப மிஹின் லங்கா (தனியார்) கம்பனி 2010/2011ஆம் ஆண்டில் பெற்ற தேறிய நட்டம் எவ்வளவு என்பதையும்;

(ii) அந்த ஆண்டின் கணக்குகள் தொடர்பாக கணக்காய்வை மேற்கொண்ட பட்டயக் கணக்காய்வாளர்களான `பிரய்ஸ் வோட்டர் ஹவுஸ் கூப்பர்ஸ்' நிறுவனம் மிஹின் லங்கா கம்பனியின் இருப்பு தொடர்பானதொரு கருத்தை முன்வைத்துள்ளதா என்பதையும்;

(iii) அவ்வாறாயின், அந்நிறுவனம் முன்வைத்துள்ள கருத்தில் `ஒரு வருடத்தில் மிஹின் லங்கா கம்பனி ரூபா 940.49 மில்லியன் நட்டத்தைக் காட்டியுள்ளதுடன், நடைமுறைப் பொறுப்புக்கள் ரூபா 1,083.92 மில்லியனால் நடைமுறைச் சொத்துக்களைத் தாண்டிச் சென்று ரூபா 3,814.45 மில்லியன் எதிர்மறையான தேறிய பெறுமானத்தைக் காட்டுவதன்மூலம் கம்பனியை இயங்கும் நிலையிலான தொழில்முயற்சி யொன்றாகத் தொடர்ந்தும் கொண்டுநடத்துவதற் கான ஆற்றல் தொடர்பில் சந்தேகமான நிலையைக் காட்டுகிறது' எனக் குறிப்பிடப் பட்டுள்ளதா என்பதையும்;

(iv) இந்நிலைமையில் வ/ப மிஹின் லங்கா (தனியார்) கம்பனியைத் தொடர்ந்தும் கொண்டு நடத்துவதற்கு பொதுமக்களின் பணத்தை ஈடுபடுத்துவது பயனற்றதென்பதை அரசு ஏற்றுக்கொள்கிறதா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Ports, Shipping and Aviation:

(a) Will he inform this House -

(i) the net loss of Mihin Lanka (Pvt.) Limited in the year 2010/2011;

(ii) whether an opinion has been expressed on the existence of Mihin Lanka (Pvt.) Limited by PricewaterhouseCoopers, Chartered Accountants' Firm which conducted the audit of the said year;

(iii) if so, whether it has been mentioned in the opinion that "The company had incurred a net loss of Rs. 940.49 million for the year and the company's current liabilities exceeded its current assets by Rs. 1,083.92 million reflecting a negative net value of Rs. 3,814.45 million which indicated the existence of a material uncertainty which may cast significant doubt about the ability of the company to continue as a going concern"; and

(iv) under these circumstances, whether the government admits that it is no longer productive to utilize public funds for the maintenance of Mihin Lanka (Pvt.) Limited?

(b) If not, why?

ගරු අර්ජුන රණතුංග මහතා
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි:

(අ) (i) රුපියල් මිලියන නවසිය හතළිහයි දශම හතරයි නවයක අලාභයකි. (රුපියල් මිලියන 940.49)

(ii) නැත.

(iii) තත්ත්වාගණනය කෙරෙන මතයක් ප්‍රකාශ නොකර, විගණකයින් කරුණු අවධාරණය කිරීම යටතේ 2011 වාර්ෂික වාර්තාවෙහි මූල්‍ය ප්‍රකාශවලට අයත් 3 වන සටහන කෙරෙහි අවධානය යොමු කර ඇත.

(iv) නැත.

(ආ) පැන නොනඟී.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

සී/ස මිහින් ලංකා (පුද්ගලික) සමාගම 2010/ 2011 වර්ෂයේ රුපියල් මිලියන 940ක් පාඩු ලබා තිබෙනවා. ඊට පසු වසරේ රුපියල් මිලියන 1,100ක් පාඩු ලබා තිබෙනවා. ඊටත් පසු වසරේ රුපියල් මිලියන 1,900ක් පාඩු ලබා තිබෙනවා. ගරු ඇමතිතුමාගෙන් මෙම ප්‍රශ්නයේ (අ) (iv) වැනි කොටසෙන් මා අසා තිබෙනවා, "එම තත්ත්වය තුළ සී/ස මිහින් ලංකා (පුද්ගලික) සමාගම තවදුරටත් පවත්වා ගෙන යෑම ඵලදායක වේද?" කියලා. එතුමා කියනවා, "ඵලදායකයි" කියලා.

ගරු ඇමතිතුමනි, වාර්ෂිකව මහජනයාගේ ධනය රුපියල් කෝටි 100ක්, රුපියල් කෝටි 190ක්, රුපියල් කෝටි 210ක් වැනි විශාල ප්‍රමාණවලින් නාස්ති කරන ආයතනයක් පවත්වාගෙන යා යුතු යයි ඔබතුමා තීරණය කර තිබෙන්නේ ඇයි?

ගරු අර්ජුන රණතුංග මහතා
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය අය වැය කථාවේදීත් අප ඒ ගැන දැනුවත් කළා. ශ්‍රීලංකන් ගුවන් ආයතනය සහ මිහින් ලංකා ආයතනය ඒකාබද්ධ කර ඉදිරියට ගෙන යාමට හැකිවන සැලසුමක් ගැන අපි දැනට සාකච්ඡා කරමින් පවතිනවා. එය කෙසේ කළ යුතුද කියන එක සම්බන්ධව අප ඉදිරි කාලයේ දී තීරණයක් ගනු ලබනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

2010 වර්ෂය සහ 2011 වර්ෂය පිළිබඳව මෙය විගණනය කරන ලද ප්‍රයිස් වෝටර් හවුස් කූපර්ස් ආයතනය විසින් කියනවා, "රුපියල් මිලියන 3814ක සෘණ ශුද්ධ අගයක් පෙන්නුම් කරන බැවින් සමාගම ක්‍රියාත්මක තත්ත්වයේ ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යාමට ඇති හැකියාව පිළිබඳව සැක සහිත තත්ත්වයක් පෙන්නුම් කරයි" කියලා. මෙම ආයතනය විගණනය කිරීම සඳහා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ආයතනයක් වෙත ලබා දුන්නාට පසුව, එම ආයතනයේ විගණන මතය බවට පත්ව තිබෙන්නේ මෙම මිහින් ලංකා ආයතනය ක්‍රියාත්මක තත්ත්වයේ ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පවත්වා ගෙන යෑම සැක සහිතයි කියන එකයි. එතකොට ඔවුන්ගේ විගණන ආයතනය විසින්ම මෙම මිහින් ලංකා ආයතනය පත්වාගෙන යාම සැක සහිත ආයතනයක් ලෙස අර්ථකථනය කර තිබෙනවා. විගණනය කරන්නේ ඒ පිළිබඳව යම් මතයක් ලබා ගන්න නේ. එවැනි මතයක් එම ආයතනය විසින් ලබා තිබිය දී, නැවත නැවතත් මෙම ආයතනය වෙත මහජනයාගේ මුදල් පොම්ප කරමින් මෙම විනාශය සිදු කරමින් තිබෙන්නේ ඇයි?

ගරු අර්ජුන රණතුංග මහතා
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
ගරු මන්ත්‍රීතුමනි, ඒ ගැන තමයි මම ඉස්සෙල්ලාත් දැනුවත් කළේ. මෙම ආයතන දෙක ඒකාබද්ධ කරලා මුදල් ලැබීමේ ක්‍රමවේදයක් සමඟ ඉදිරියට ගෙන යාමට පුළුවන්ද කියලා සොයා බලා තිබෙනවා.

මිහින් ලංකා ආයතනය පටන් ගත්තේ පසු ගිය කාලයේ. ඒ කාලයේ කරපු දේ හොඳද, නරකද කියන එක නොවෙයි, මේ ආයතනයෙන් කරපු දේ ඉදිරියට අරගෙන යන්නේ කොහොමද කියන එක තමයි අප දැනට සාකච්ඡා කරගෙන යන්නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒක හරි. නැවත මේ ආයතනය මහ ජනතාවට පාඩුවක් නොවෙන ආකාරයෙන් පවත්වාගෙන යාමට කල්පනා කරන එක හරි. හැබැයි, ගරු ඇමතිතුමනි, මේ රටේ සාමාන්‍ය ජනතාවට අසීමිත බදු බර පටවලා, එයින් එක් රැස් කර ගන්නා ලද මුදල් මෙම ආයතනයට පොම්ප කරලා තිබෙනවා. එම ආයතනය විසින් කෝටි ගණන් එම මුදල් පාඩු කරලා තිබෙනවා. අඩුම තරමේ එම ආයතන මෙහෙයවන ලද පුද්ගලයන්ට, මෙම තීන්දු තීරණ ගත්තු පුද්ගලයන්ට, මහජන මුදල් කෝටි ප්‍රකෝටි ගණන් නාස්ති කරන ලද පුද්ගලයන්ට එරෙහිව කිසිදු පියවරක් නොගෙන ප්‍රතිසංස්කරණයෙන් පමණක් ඒ සියල්ල වැහේවිද?

ගරු අර්ජුන රණතුංග මහතා
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය දවසක කමිටුවක් පත් කළා, external inquiry එකක් කරන්න. ඒ සඳහා දැනට ක්‍රියාත්මක වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මේ ආයතනය දිහා බලපුවාම, අඩු ආදායම් ලබන මැද පෙරදිග යන අයට සහන අංශයෙන් තමයි ගුවන් ගමන් සේවා ලබා දීලා තිබෙන්නේ. ඔබතුමා කියනවා

[ගරු අර්ජුන රණතුංග මහතා]

වාගේ අපට අවශ්‍ය වෙලා තිබෙන්නේ, මේ ආයතන දෙක එකතු කරලා ලාභ ලබන ආයතනයක් බවට පත් කරමින් ඉදිරියට ගෙන යන්නයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු ඇමතිතුමනි, අර නාස්ති කරපු අයට මොකද කරන්නේ?

ගරු අර්ජුන රණතුංග මහතා
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
ගරු මන්ත්‍රීතුමනි, ඒ වාර්තාව ආවාට පස්සේ අවශ්‍ය කටයුතු කරනවා. ගරු මන්ත්‍රීතුමනි, හරි විධියට නීතිමය කටයුතු කරනවා. අපට ඕනෑ විධියට හිරේ දාන්න අපි යන්නේ නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ආරක්ෂා කරන්නත් එපා කියලායි කියන්නේ.

ගරු අර්ජුන රණතුංග මහතා
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
නැහැ. ආරක්ෂා කිරීම නොවෙයි අපි කරන්නේ. පසු ගිය කාලයේ එක එක්කෙනාව හිරේ දැම්මා වාගේ දේවල් කරනවාට වඩා, අපි නීතිමය පියවර අරගෙන ඒ දේවල් ඉදිරියට ගෙන යන්න බලාපොරොත්තු වෙනවා.

විදුලිය බෙදා හැරීමේ කලාප : වියදම
மின்சார விநியோக வலயங்கள் : செலவினம்
ELECTRICITY TRANSMISSION DIVISIONS: EXPENDITURE

5111/'14

10. ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලයේ විදුලිය බෙදා හැරීමේ කලාප (Transmission Divisions) සංඛ්‍යාව කොපමණද;

(ii) එම කලාප කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2012 වර්ෂය තුළ ඉහත එක් එක් කලාපය මගින් විදුලි ඒකකයක් බෙදා හැරීම සඳහා දැරූ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2012 වර්ෂය තුළ විදුලි ඒකකයක් බෙදා හැරීම සඳහා දරන ලද වියදම ඉහත එක් එක් කලාපය අනුව වෙනස් වී තිබේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

மின்வலு, எரிசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை மின்சார சபையின் மின்சார விநியோக வலயங்களின் (Transmission Divisions) எண்ணிக்கை யாது என்பதையும் ;

(ii) அவ்வலயங்கள் யாவை என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) 2012ஆம் ஆண்டில் மேற்படி ஒவ்வொரு வலயத்தினாலும் ஒரு அலகு மின்சாரத்தை விநியோகிப்பதற்காக ஏற்கப்பட்ட செலவினம் வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) 2012ஆம் ஆண்டில் ஓர் அலகு மின்சாரத்தை விநியோகிப்பதற்காக ஏற்கப்பட்ட செலவினம் மேற்படி ஒவ்வொரு வலயத்தின் அடிப்படையில் வேறுபட்டிருப்பின் அதற்கான காரணங்கள் யாவை என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Energy:

(a) Will he state -
  (i) the number of Transmission Divisions of the Ceylon Electricity Board; and
  (ii) what those Divisions are?

(b) Will he inform this House -
  (a) the expenditure incurred on the distribution of one unit of electricity by each of the above divisions in the year 2012, separately; and
  (b) if the expenditure incurred on the distribution of one unit of electricity by each of the above divisions has varied in the year 2012, and the reasons for that?

(b) If not, why?

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු කථානායකතුමනි, විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) බෙදා හැරීම් කලාප හතරකි. (4)

(ii) බෙදා හැරීම් කලාප I, බෙදා හැරීම් කලාප II, බෙදා හැරීම් කලාප III සහ බෙදා හැරීම් කලාප IV වේ.

(ආ) (i) 2012 වර්ෂය තුළ ඉහත එක් එක් කලාපය මගින් විදුලි ඒකකයක් බෙදා හැරීම සඳහා දැරූ වියදම පහතින් දක්වා ඇත.

අනු අංක	බෙදා හැරීම් කලාපය	විදුලි ඒකකයක් (1 kWh) බෙදා හැරීම සඳහා දරන ලද වියදම (රු.)
1	බෙදා හැරීම් කලාප I	2.55
2	බෙදා හැරීම් කලාප II	2.95
3	බෙදා හැරීම් කලාප III	3.24
4	බෙදා හැරීම් කලාප IV	3.69

(ii) 2012 වර්ෂය තුළ ඉහත එක් එක් කලාපය මගින් විදුලි ඒකකයක් බෙදා හැරීම සඳහා දැරූ වියදම ඉහත එක් එක් කලාපය අනුව වෙනස් වී ඇත. ඒ සඳහා ප්‍රධාන වශයෙන් එක් එක් කලාපයට අදාළ විදුලි පාරිභෝගික සංඛ්‍යාව, විවිධ වර්ගයේ විදුලි පාරිභෝගිකයින්, විදුලි පාරිභෝගික ඝනත්වය, නඩත්තු කළ යුතු මධ්‍යම වෝල්ටීයතා සහ අඩු සැර වෝල්ටීයතා විදුලි මාර්ග ප්‍රමාණය සහ නඩත්තු කළ යුතු තරාපැවි සංඛ්‍යාව යනාදී සාධක බලපානු ඇත.

(ඇ) අදාළ නොවේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 12-4579/'13 - (2), ගරු අනුර දිසානායක මහතා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දෙවන වටය.

ප්‍රශ්න අංක 2-4767/'14- (2), ගරු අශෝක් අබේසිංහ මහතා. [බාධා කිරීමක්] නැත.

ප්‍රශ්න අංක 5-5271/'14-(3), ගරු මොහමඩ් අස්ලම් මහතා - [බාධා කිරීමක්] නැත. ප්‍රශ්න අංක 7-5421/'14-(1), ගරු අජිත් කුමාර මහතා. [බාධා කිරීමක්] නැත. ප්‍රශ්න අංක 8-5423/'14-(1), ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා - [බාධා කිරීමක්] නැත.

ප්‍රශ්න අංක 11-5443/'14-(1), ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්න. ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

I

පසු ගිය රජය ආරම්භ කළ සංවර්ධන ව්‍යාපෘති ඇනහිටීම
முன்னைய அரசு ஆரம்பித்த அபிவிருத்தித் திட்டங்கள் இடைநிறுத்தம்
STALLING OF DEVELOPMENT PROJECTS INITIATED BY FORMER GOVERNMENT

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Nimal Siripala de Silva - Leader of the Opposition)
ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නය ඇසීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මා ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා. පසු ගිය රජය මඟින් ආරම්භ කරන ලද ග්‍රාමීය මට්ටමේ සංවර්ධන ව්‍යාපෘති මෙන්ම යටිතල පහසුකම් පුළුල් කිරීමේ අරමුණින් ආරම්භ කිරීමට නියමිතව තිබූ මහාමාර්ග, ජල යෝජනා ක්‍රම, විදුලිය දිගු කිරීම් ඇතුළු පසු ගිය වර්ෂයේ නිම නොකරන ලද ව්‍යාපෘති රාශියක් හා මෙම වර්ෂයේ ආරම්භ කිරීමට බලාපොරොත්තු වූ සංවර්ධන ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කිරීම ඇනහිට ඇති බව දිවයිනේ සෑම ප්‍රදේශයකින්ම පාහේ වාර්තා වී ඇත.

ඉටු කරන ලද සංවර්ධන වැඩ කටයුතු වෙනුවෙන් ගෙවිය යුතු බිල්පත් සඳහා හෝ වැඩ කටයුතු ඉදිරියට කරගෙන යාම සඳහා අවශ්‍ය මූල්‍යමය ප්‍රතිපාදන භාණ්ඩාගාරය මඟින් අදාළ දිසාපතිතුමන්ලා, ප්‍රාදේශීය ලේකම්තුමන්ලා ඇතුළු දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ලබා දී නොමැති බවත්, මෙම වර්ෂයේ ඉටු කිරීමට නියමිතව තිබූ සංවර්ධන කටයුතු පිළිබඳව පැහැදිලි තීරණ ලබා දීම හා මුදල් වෙන් කිරීම, එකී මුදල් අදාළ ආයතන වෙත අත්තිකාරම් ගෙවීම සඳහා ලබා දීම සහ ටෙන්ඩර් කැඳවීම සඳහා කටයුතු කර නොමැති බවත් තවදුරටත් වාර්තා වී තිබේ.

"දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව සහ ප්‍රාදේශීය සංවර්ධන කමිටුව විසින් අනුමත කර ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති තාවකාලිකව අත්හිටුවීම" යන හිසින් යුතුව ස්වදේශ කටයුතු හා ධීවර අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක HAF/01/09/ DIS-Co-Meet දරන 2015.02.05 දිනැති ලිපිය මඟින් සංවර්ධන ව්‍යාපෘති අත්හිටුවන ලෙස සියලු දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත දැනුම් දී ඇත.

පසු ගිය වසරේ සෑම දිස්ත්‍රික්කයකම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මඟින් ග්‍රාමීය ජනතාවට බලපාන මහා මාර්ග, බෝක්කු, පාසල්, ප්‍රජාශාලා, පානීය ජල, පෙර පාසල්, සෞඛ්‍ය සායන මධ්‍යස්ථාන වැනි අතිවිශාල සංවර්ධන ව්‍යාපෘති රාශියක් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මඟින් ඉටු කරගෙන ගිය අතර, වසර අවසානයේදී පැවැති අයහපත් කාලගුණික තත්ත්වය සහ ජනාධිපතිවරණය හේතුවෙන් මෙම සංවර්ධන ව්‍යාපෘතිවලින් සමහර කොටසක් නිම කර වැඩ අවසන් කිරීමට නොහැකි විය.

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

එසේම වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති සඳහා ගිවිසුමට බැඳුණු නීත්‍යානුකූල ස්වේච්ඡා සංවිධාන වෙත අදාළ මුදල් ගෙවීම් ද සිදු වී නොමැත. තවද අවිච්ඡේද වැඩ විෂයයන් නැවත ආරම්භ කිරීමට අනුමැතිය ලබා දී නොමැති බැවින් එහි ප්‍රතිලාභීන් මහත් ගැටලුකාරී තත්ත්වයකට පත්ව ඇත.

සංවර්ධන ව්‍යාපෘතීන් ආරම්භ නොකිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඉදි කිරීම් ක්ෂේත්‍රයේ නියුතු ස්වයං රැකියාලාභීන්, කම්කරුවන්, මේසන්වරුන්, විදුලි කාර්මිකයන් විශාල ප්‍රමාණයකට දැනට රැකියා අහිමි වීමත්, ඔවුන්ගේ ආදායම් මාර්ග හීන වීමත් නිසා ඔවුන් දැඩි දුෂ්කරතාවන්ට මුහුණ දී ඇති බව වාර්තා වී ඇති හෙයින්, පහත සඳහන් ප්‍රශ්න පිළිබඳව රජයේ ස්ථාවරය මෙම ගරු සභාවට දන්වන ලෙස ඉල්ලා සිටිමි.

1. දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් වැඩ ආරම්භ කොට අවිච්ඡේද වී ඇති සංවර්ධන ව්‍යාපෘතීන් කඩිනමින් අඛණ්ඩව කරගෙන යාම සඳහා රජය කටයුතු කරන්නේද යන්නත්,

2. දැනටමත් ආරම්භ කොට අවිච්ඡේද වී ඇති සංවර්ධන කටයුතු වෙනුවෙන් ගෙවිය යුතු බිල්පත් පියවීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන අදාළ ආයතන වෙත නොපමාව ලබා දෙන්නේද යන්නත්,

3. පසු ගිය රජය මඟින් අය වැය ලේඛනයෙන් මුදල් වෙන් කරන ලද සංවර්ධන කටයුතු හා යටිතල පහසුකම්වලට අදාළ වන ව්‍යාපෘතීන් නොපමාව ආරම්භ කරන්නේද යන්නත්,

4. නො එසේ නම් මන්ද යන්නත් මෙම ගරු සභාවට දන්වන්නේද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Plantation Industries and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, ඒ සඳහා හෙට දිනයේ පිළිතුරක් ලබා දෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු අගමැතිතුමනි, මා මීට පෙරත් ඔබතුමාගෙන් ප්‍රශ්නයක් ඇහුවා. ඒ සඳහා පිළිතුරක් සූදානම් ඇති කියා මා හිතනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තව ප්‍රශ්න තිබෙනවා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ගරු කථානායකතුමනි, මම ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමාගේ ප්‍රකාශය ගැන පිළිතුර දෙන්නද?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්නය ඇසීමෙන් පසුව ඔබතුමා පිළිතුරු දෙන්න. ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්නය, ගරු අනුර දිසානායක මහතා.

II

ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශයට බඳවාගෙන ඇති පිරිසක් මුහුණ පා ඇති ගැටලුකාරී තත්ත්වය

தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சுக்கு ஆட்சேர்க்கப்பட்டோர் எதிர்நோக்கும் பிரச்சினைகள்

PROBLEMATIC SITUATION FACED BY A GROUP OF RECRUITS TO MINISTRY OF NATIONAL LANGUAGES AND SOCIAL INTEGRATION

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

කලින් පැවැති ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශයට බඳවා ගන්නා ලද 190කට වැඩි පිරිසකට බලපා ඇති ගැටලුකාරී තත්ත්වය පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කරන්න කැමැතියි.

2013 ජනවාරි මාසයේ 19වන දින පවත්වනු ලැබූ ජාතික ඒකාබද්ධතා සම්බන්ධීකාරක iii ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගයේ ප්‍රතිඵල මත හා 2013.11.18 දින සිට 2013.11.27 දින දක්වා පවත්වනු ලැබූ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත අදාළ තනතුරු සඳහා 190කට වැඩි පිරිසක් තෝරාගෙන තිබුණා. ඒ අනුව ඔවුන්ට පත්වීම් ප්‍රදානය කිරීමේ උත්සවය 2014.11.17වන දින ඊට සමගාමීව පවත්වන තෙදින නේවාසික පුහුණු වැඩ මුළුව 2014.11.17, 18 සහ 19 යන දිනවලදී කුරුණෑගල තුල්හිරිය පිහිටි මාස් කළමනාකරණ හා තාක්ෂණ ආයතනයේදී පැවැත්වෙන බව තෝරාගත් පත්වීම්ලාභීන්ට දන්වා තිබුණා. 2014.11.16 සිට නේවාසික පහසුකම් ලබාදෙන බවත්, එදින පස් වරු 2 සිට පස් වරු 7 දක්වා කාලය තුළ එම ස්ථානයට පැමිණෙන ලෙසත්, එදින සාමාන්‍ය ඇඳුමින් සැරසී පැමිණෙන ලෙසත්, දින 03ක් සඳහා රජයේ කාර්යාලයකට සුදුසු පරිදි ඇඳුම් රැගෙන එන ලෙසත් ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ඒ.ඩබ්ලිව්.ආර්. විමලවීර යන අය විසින් ඔවුන්ට දන්වා තිබුණා.

ගරු කථානායකතුමනි, එම ලිපියත් මගේ ළඟ තිබෙනවා. මේ අය තෝරාගෙන තිබුණා; ඔවුන්ට පත්වීම් දෙනවා කිව්වා; පත්වීම් ලබා ගැනීම සඳහා එන්න කිව්වා; ඒ සමඟම වැඩ මුළුවක් තිබෙනවා කියලාත් කිව්වා. සමහර අය ඒ අය කරමින් සිටි රැකියාවෙන් ඉල්ලා අස් වෙලා ආවා.

එසේ තිබියදී ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ලේකම් එම්.එස්. වික්‍රමසිංහ මහත්මියගේ 2014.11.07 දිනැති ලිපියකින් ඉහත කී පත්වීම් ලිපි ප්‍රදානය හා සේවාරම්භක පුහුණුව නොවැළැක්විය හැකි හේතුවක් මත කල්

දමා ඇති බව සහ ඉදිරි පියවර පසුව දැනුම් දෙන බව දන්වා තිබුණා. 2012.08.03 ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීමකට අනුව 2012.09.03 දින හෝ ඊට පෙර අයදුම් පත් කැඳවා විභාග ගාස්තු ලෙස රුපියල් 500ක් ද අය කර ගෙන තිබුණා.

ඉල්ලුම් පත් කැඳවා වසර දෙකකුත් මාස දෙකකට පසුව පත්වීම් ලිපියක් ප්‍රදානය කිරීමට අදාළ ඇමතිවරයාත්, පරිපාලන නිලධාරිනුත් සමත් වුණේ නැහැ. පත්වීම් ලබා ගැනීමට සූදානම් වී සිටි සුදුසුකම් ලැබූ මෙම පත්වීම්ලාභීහු අද දැඩි මානසික පීඩාවෙන් අතරමංව සිටිනවා. තමන් එතෙක් සිටි රැකියාවලින් ඉවත් වී තෝරාගත් රැකියාවට යෑමට ඔවුන් සූදානම්ව සිටියා.

අද ඔවුන් කරන ලද රැකියාව ද අහිමිව ආර්ථික වශයෙන් කර කියාගත නොහැකි තත්ත්වයකට පත්ව සිටිනවා. රැකියාවකට තෝරා ගත් බව රජයේ ආයතනයකින් ලිඛිතව දැනුම් දී, පැමිණිය යුතු දිනය ද සඳහන් කර, අදාළ ඇඳුම් ද සූදානම් කර ගන්නා ලෙස දන්වා එයින් පසුව කිසිදු වග කිව යුතු නිලධාරියකු හෝ ඒ ගැන නොසලකා කටයුතු කරන්නේ නම්, මේ පරිපාලනය කොයි තරම් වගකීමෙන් තොර තත්ත්වයකට පත්වී තිබෙනවාද කියා තේරුම් ගන්නට පුළුවන්, ගරු කථානායකතුමනි. මෙතරම් හැල්ලුවට ලක් කරන පරිපාලන සේවයක් මේ රටේ සිවිල් පුරවැසියන් මොන තරම් අසාධාරණ තත්ත්වයකට ඇද දමා තිබේද? ඡන්දයකින් පසුව හැදෙන ආණ්ඩු කුමන නාමකරණවලින් හැඳින්වුවද සිදු වන්නේ ඒක නොවෙයි. මෙම තත්ත්වය හමුවේ පැන නැඟෙන පහත ගැටලුවලට පිළිතුරු අදාළ අමාත්‍යවරයා විසින් සභාව හමුවේ තබනු ඇතැයි අපේක්ෂා කරනවා.

(1) පත්වීම් ප්‍රදානය අවලංගු කිරීමට කිසිදු සාධාරණ හේතුවක් නොමැති තත්ත්වයක් යටතේ කිසිදු නීතිමය බාධාවක් තිබී නැති තත්ත්වයක් යටතේ නියමිත ක්‍රියා පටිපාටියකට අනුව සිදු වූ දෙයක් වෙනස් කිරීමට පියවර ගත්තේ ඇයි?

ගරු කථානායකතුමනි, නිකම් වෙන වෙන ආයතනවල පුරප්පාඩු පුරවන විධියට නොවෙයි මේ අය තෝරා ගත්තේ. බඳවා ගැනීමේ පටිපාටිය අනුගමනය කළා; විභාග පැවැත්වුවා; සම්මුඛ පරීක්ෂණ තිබ්බා. එහෙම තෝරා ගත්ත දරුවෝ ඒ අය. ඒ අය කවර ආණ්ඩුවකින්ද ගත්තේ කියන එක වෙනම ප්‍රශ්නයක්. හැබැයි, ඒ අය මේ රටේ දරුවෝ. ඒ දරුවන්ට ඒ රැකියාව ලබා දිය යුතුයි.

(2) අදාළ පත්වීම්ලාභීන් අදාළ තනතුරු සඳහා පත් කර ගැනීමට තවමත් කටයුතු නොකරන්නේ ඇයි?

ගරු කථානායකතුමනි, ඒඅයට රස්සාවක් ලැබෙනවාය කියලා සාරි අර ගන්න කියලා, කමීස අර ගන්න කියලා පත්වීමට එන්න ලියුම් ආවාම ඒ අය අනෙක් රස්සාවල් අත් හැරලා දාලා ආවා. මාස ගණනාවක් ඒ අය රස්සාවක් නැතිව ඉන්නවා. දැන් ඒ අයට තිබුණු රස්සාවත් දැන් නැහැ. අලුතින් තෝරා ගත්ත රස්සාවට ඒ දරුවෝ ගන්නේත් නැහැ. මොකක්ද මේ ඇති කරලා තිබෙන තත්ත්වය?

(3) කරන ලද රැකියාව ද අහිමිව, ලැබිය යුතු රැකියාව ද නොමැතිව, අතරමංව සිටින එම තෝරා ගත් පිරිසට වහාම රැකියාව ලබා දීම සඳහා ගන්නා පියවර කවරේද කියලා ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි, ගරු කථානායකතුමනි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමා, පසුව පිළිතුරක් දෙනවාද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, හෙට පිළිතුරු ලබා දෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඊළඟට, නොපැමිණීමේ අවසරය පිළිබඳ යෝජනා. පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතාගේ නොපැමිණීමේ අවසරය ගරු විපක්ෂ නායක නිමල් සිරිපාල ද සිල්වා මහතා විසින් ඉදිරිපත් කිරීම.

නොපැමිණීමේ අවසරය : ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා

வராதிருக்க அனுமதி : மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ

LEAVE OF ABSENCE : HON. BASIL ROHANA RAJAPAKSA

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 66(ඊ) ව්‍යවස්ථාව යටතේ, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතාට 2015 පෙබරවාරි මස 18 වැනි දින සිට මාස තුනක් තුළ පාර්ලිමේන්තුවේ රැස්වීම්වලට නොපැමිණීමට අවසර දිය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔව්, ගරු අනුර දිසානායක මැතිතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමාගෙන් මම දැන ගන්නට කැමැතියි, ඔහු අධ්‍යයන කටයුත්තක් සඳහා ගොස් තිබෙනවාද, එහෙම නැතිනම් අසනීප කටයුතු හේතු කොට ගෙන ගොස් තිබෙනවාද කියා. එය මේ පාර්ලිමේන්තුව දැන ගන්නවා නම් හොඳයි. මන්ත්‍රීවරුන් මාස තුන,

[ගරු අනුර දිසානායක මහතා]

හතර එන්නේ නැතිව, "එන්නේ නැහැ" කියලා ලියුම් එවන්න බැහැ. එන්නේ නැති හේතුව ගරු කථානායකතුමාටත්, මේ පාර්ලිමේන්තුවටත් දැනුම් දිය යුතුයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔව්. ඒක හොඳ අදහසක්; හොඳ යෝජනාවක්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒක මේ ගරු සභාව දැන ගන්න ඕනෑ. ගරු බැසිල් රාජපක්ෂ මන්ත්‍රීතුමාට නිවාඩු දෙන්න කියලා ගරු විපක්ෂ නායකතුමා යෝජනාවක් ඉදිරිපත් කරනවා. හැබැයි, නිවාඩු දෙන්න කලින් මේ පාර්ලිමේන්තුව දැන ගන්න ඕනෑ එතුමා මේ පාර්ලිමේන්තුවට එන්නේ නැත්තේ ඇයි කියලා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔව්. කාරණාවත් කිව්වා නම් හොඳ තමයි.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, එතුමාට ඒමට අපහසුතාවක් තිබෙනවා, ඒ නිසා මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කරන්න කියලා එතුමා මගෙන් ඉල්ලීමක් කර තිබුණා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. එම යෝජනාවට සභාව එකඟයි.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
සම්ප්‍රදායක් වශයෙන් මේ පාර්ලිමේන්තුවේ එවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීමේදී කවදාවත් එවැනි කාරණා දීලා නැහැ. [බාධා කිරීම්] නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේක විශේෂ හේතුවක් වෙන්න ඇති. [බාධා කිරීම්]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
හේතු අහන්නේ නැහැ. එතුමාගේ නොපැමිණීමේ අවසරය පිළිබඳ යෝජනාව මේ ගරු සභාවට දැන් ඉදිරිපත් කර තිබෙනවා. එයට එකඟ වීම හෝ නොවීම මන්ත්‍රීවරුන් සතු අයිතියක්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මීළඟට අමාත්‍යාංශ නිවේදන. ගරු අගමැතිතුමා.

වරාය නගර ව්‍යාපෘතියේ වත්මන් තත්ත්වය : ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රකාශය
துறைமுக நகரக் கருத்திட்டத்தின் தற்போதைய நிலைமை : மாண்புமிகு பிரதம அமைச்சரினது கூற்று
PRESENT SITUATION OF PORT CITY PROJECT: STATEMENT BY HON. PRIME MINISTER

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் கொள்கை உருவாக்கம், பொருளாதார அலுவல்கள், சிறுவர், இளைஞர் மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremasinghe - Prime Minister, Minister of Policy Planning, Economic Affairs, Child, Youth and Cultural Affairs)
කොළඹ වරාය නගරය සම්බන්ධව අපේ රටේ ජනමාධ්‍ය ඔස්සේ පසු ගිය දින කීපයේම විවිධ තොරතුරු වාර්තා වුණා. ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක මන්ත්‍රීතුමාත් පෙබරවාරි 06වැනි දා පාර්ලිමේන්තුවේදී මේ ගැන කරුණු ගෙන හැර දැක්වූවා. පසු ගිය පෙබරවාරි 10වැනි දා ස්ථාවර නියෝග 23 (2) යටතේ ගරු විපක්ෂ නායකතුමාත් විමසීමක් සිදු කළා. එතුමා එහිදී විමසා සිටියේ මෙම ව්‍යාපෘතිය පිළිබඳ රජයේ ස්ථාවරය සභාව හමුවේ පැහැදිලි කර දෙන ලෙසයි.

කොළඹ වරාය නගරය ඉදි කිරීම සම්බන්ධව පසු ගිය ආණ්ඩුව අනුගමනය කළ ක්‍රියා කලාපය නෛතික හා සදාචාරාත්මක නොවන බව අප පාර්ලිමේන්තුවේදී පෙන්වා දුන්නා. අප ඒ පිළිබඳ අවස්ථා ගණනාවකදී මේ ගරු සභාවේ ප්‍රශ්න නැඟුවා. එක් අවස්ථාවක එවකට සභානායක ධුරය දැරූ ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා මේ ගරු සභාවට ඒ ගැන මෙසේ කියා සිටියා. ගරු කථානායකතුමනි, 2014 පෙබරවාරි 07වැනි දින පළ වූ හැන්සාඩ් වාර්තාවේ 670වන තීරුවේ මෙසේ සඳහන් වෙනවා:

> "මෙම සියල්ල, අදාළ අණපනත් යටතේ සිදු කරනු ලබන අනුමැතීන් වන අතර, එම පනත්වලට අවශ්‍ය වන වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබේ."

නමුත්, එසේ ප්‍රකාශ කර මාස 11ක් ගත වන තුරුම නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා ඇතුළු ආණ්ඩුව මේ සම්බන්ධ කිසිදු වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ නැහැ. 2014 මාර්තු 08වැනි දා එවකට සිටි අග්‍රාමාත්‍ය දි.මු. ජයරත්න මහතා මේ ගරු සභාව හමුවේ කියා සිටියේ වරාය නගර ව්‍යාපෘතිය පිළිබඳ අධ්‍යයන වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන බවයි. නමුත්, ජනාධිපතිවරණය පරාජය වන තුරුම එවැනි වාර්තාවක් මේ ගරු සභාවට ඉදිරිපත් කෙරුණේ නැහැ.

වරාය නගරයට අදාළ සියලු කටයුතු කළේ විනිවිදභාවයකින් තොරවයි; නෛතික කරුණු ගණනාවක් අනුගමනය කිරීමෙන් තොරවයි. ව්‍යාපෘති සඳහා ගිවිසුම් අත්සන් කළේ කැබිනට් අනුමැතියකින් තොරවයි. ඒ විතරක් නොවෙයි, නිසියාකාරයෙන් පාරිසරික වාර්තා ලබාගෙන තිබුණේ නැති බවට නැඟුණු චෝදනාවලට නිසි පිළිතුරු ලැබුණේත් නැහැ.

ආණ්ඩු බලය ලබා ගැනීමෙන් අනතුරුව අප මේ සියල්ල පිළිබඳ සොයා බැලුවා. ඒ අවස්ථාවේදී බැලූ බැල්මට පෙනී ගියේ මේ ගනුදෙනුව බරපතළ සැක සංකාවන්ට හේතු වන බවයි. පසු

ගිය ආණ්ඩුව වරාය නගරය සම්බන්ධයෙන් සියලු වාර්තා සහ කරුණු මෙම ගරු සභාවට වසන් කර ඇති බව අපට පැහැදිලි වුණා. මේ වාර්තා එදා ඉදිරිපත් කළා නම් අද මෙම තත්ත්වය මේ රටේ උද්ගත වන්නේ නැහැ. එපමණක් නොව අසත්‍ය ප්‍රකාශ ගණනාවක් මේ ගරු සභාව හමුවේ කර තිබුණා. ඒ නිසා වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳව සොයා බැලීම සඳහා මම විශේෂඥ කමිටුවක් පත් කළා. මෙම කමිටුවේ සභාපතිත්වය දරන්නේ අජිත් ද කොස්තා මහතායි. එතුමා මධ්‍යම පරිසර අධිකාරියේ හිටපු සභාපතිවරයෙක්. ඊළඟට මහාචාර්ය රුවිර කුමාරතුංග, ආචාර්ය එන්.පී. විජයානන්ද, ආචාර්ය අනිල් ප්‍රේමරත්න, මහාචාර්ය සමන්ත හෙට්ටිආරච්චි, චන්න ප්‍රනාන්දු සහ ඒ.එස්. ඔබේසේකර යන මහත්වරුත්, සුනිලා ජයවර්ධන හා තිලකරත්න යන මහත්මීනුත් මෙම කමිටුවේ සාමාජිකත්වය දරනවා.

මෙම විශේෂඥ කමිටුවේ වාර්තාව අධ්‍යයනය කර, තවදුරටත් අවශ්‍ය වන්නා වූ සොයා බැලීම් සිදු කර, අවශ්‍ය තීන්දු, තීරණ ගැනීම සඳහා මගේ සභාපතිත්වයෙන් යුතු කැබිනට් අනුකාරක සභාවක් ද පත් කර තිබෙනවා.

මෙම කමිටුව සහ අනුකාරක සභාව මඟින් වරාය නගර ව්‍යාපෘතිය පිළිබඳව ඉතා ගැඹුරින් හා සැලකිල්ලෙන් කරුණු ගවේෂණය කරනවා. සෑම අංශයක් ගැනම සූක්ෂ්මව සොයා බලනවා. ඒ වාගේම මෙම ව්‍යාපෘතිය පිළිබඳව ඉදිරිපත් වී ඇති ජනතා පැමිණිලි සම්බන්ධව ද සොයා බලනවා. පරිසර සංවිධාන ගණනාවක් මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අදහස් දක්වා තිබෙනවා. අප ඒ සියල්ල පරීක්ෂා කරනවා.

කැබිනට් ප්‍රකාශක දොස්තර රාජිත සේනාරත්න ඇමතිතුමා පැවසුවා සේ, අප මේ ව්‍යාපෘතිය නතර කරන්න තවම තීරණයක් ගෙන නැහැ. අප මේ ගිවිසුම සම්බන්ධයෙන් සියලු කරුණු සොයා බලනවා. මේ ගිවිසුම අත්සන් කරද්දී නීතියට පටහැනි දෑ සිදු වී ඇත්නම්, වංචා, දූෂණ සිදු වී ඇත්නම්, රටට හානිකර කොන්දේසි ඇතුළත් වී ඇත්නම් අප ඊට අවශ්‍ය නිසි පියවර ගන්නවා.

අප විශේෂඥ කමිටු වාර්තාව සහ ඒ පරීක්ෂණයේදී හෙළිදරවු කර ගන්නා කරුණු අනුව අවසන් තීරණය ගන්නවා. ගරු කථානායකතුමනි, ඒ වාර්තා වුවමනායි එහි අනාගතය කුමක්ද කියලා අවසන් තීරණයක් ගන්න. ඒ පිළිබඳව අපි මේ සභාව දැනුවත් කරනවා.

අපි මේ ගරු සභාවට වහලා ඒ කටයුතු කරන්නේ නැහැ. අපි ගන්නා පියවර කුමක්ද යන්න පිළිබඳව ඒ වාර්තා සියල්ල පිළිබඳව දැනුවත් කරනවා.

ඇත්ත වශයෙන්ම මේ ප්‍රශ්නය මේ තරම් බරපතළ වුණේ සත්‍ය කරුණු පාර්ලිමේන්තුවට වසන් කළ නිසායි. මෙවැනි ව්‍යාපෘති සඳහා විනිවිදභාවයකින් යුක්තව පාර්ලිමේන්තුව දැනුවත් කර තිබුණා නම් මා මුලින් කිව්ව හැටියට අද මේ ප්‍රශ්නය පැන නඟින්නේ නැහැ.

මමත්, ජනාධිපතිතුමාත් මේ පිළිබඳව චීන රජයේ නියෝජිතයන් සමඟ සාකච්ඡා කළා; චීන කොමියුනිස්ට් පක්ෂ නියෝජිතයන් සමඟ සාකච්ඡා කළා. අප පැවසුවේ දෙරටේ දේශපාලනඥයන් හෝ වේවා, නිලධාරීන් හෝ වේවා, රාජ්‍ය ආයතන හෝ වේවා, සමාගම් හෝ වේවා දූෂණයකට, වංචාවකට සම්බන්ධ වී ඇත්නම් ඔවුන්ට කිසිදු සමාවක් නොදෙන බවයි.

හොර මැරකම් හා දූෂණ වංචාවලින් ශ්‍රී ලංකා - චීන මිත්‍රත්වයට බාධා පැමිණවීමට අප ඉඩ දෙන්නේ නැහැ. අපට වුවමනා වන්නේ චීනය හා ලංකාව අතර තිබෙන කාලයක් තිස්සේ පැවත එන මිත්‍රත්වය මීටත් වඩා ළඟින් පවත්වා ගෙන යන්නයි. එය කාලයක් තිස්සේ පවත්වා ගෙන එන සම්බන්ධකමක්. චීනයේ හෝ වේවා, ශ්‍රී ලංකාවේ හෝ වේවා දූෂකයන් ආරක්ෂා කරන්න අප ඉදිරිපත් වන්නේ නැහැ. ශ්‍රී ලංකාව පමණක් නොව චීනයත් දූෂකයන් හා දූෂණ සම්බන්ධව ඉතා දැඩි ස්ථාවරයක සිටිනවා.

ඒ බව අවධාරණය කරමින්, චීන ජනාධිපති ෂී ජින් පින් මහතා දැක්වූ අදහසකින් මාගේ මේ කරුණු දැක්වීම අවසන් කරන්නම්.

"ජනතා විශ්වාසය සහ සහයෝගය දිනා ගත හැක්කේ සාධාරණ ලෙස බලය භාවිත කෙරෙන, පිරිසිදු සහ අවංක යහ පාලනයකින් පමණයි. බලය භාවිත කිරීම නිරන්තර පරීක්ෂාවට සහ නිරීක්ෂණයට ලක් කිරීම වැඩිදියුණු කොට, බලය සීමා කරලීමේ ක්‍රමවේදය සහතික කළ යුතුයි. දූෂණය නිවාරණය සඳහා දඬුවම් පැමිණ වීමේ යන්ත්‍රණයක්, දූෂණය වැළැක්වීම සඳහා අනතුරු හැඟවීමේ යන්ත්‍රණයක් සහ දූෂණය මැඩලීම සඳහා ඇප කැප වීමේ යන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතුයි."

ඒ අනුව බලන කොට චීනයත්, අපිත් එක ප්‍රතිපත්තියකයි සිටින්නේ කියලා මට ප්‍රකාශ කරන්න පුළුවන්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

අද දින න්‍යාය පත්‍රයේ විෂයය අංක 1, ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත දෙවනවර කියවීම.

ගරු ජෝශප් මයිකල් පෙරේරා අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත
கடற்றொழில், நீர்வாழ் உயிரின வளங்கள் (திருத்தம்) சட்டமூலம்
FISHERIES AND AQUATIC RESOURCES (AMENDMENT) BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

[අ.භා. 1.56]

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා (ස්වදේශ කටයුතු හා ධීවර අමාත්‍යතුමා)
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா - உள்நாட்ட லுவல்கள் மற்றும் கடற்றொழில் அமைச்சர்)
(The Hon. M. Joseph Michael Perera - Minister of Home Affairs and Fisheries)

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි, 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත සංශෝධනය කිරීම සඳහා ඉදිරිපත් කර තිබෙන මෙම පනත් කෙටුම්පතේ වගන්තිවල සඳහන් කරුණු මම සභාවට ඉදිරිපත් කිරීමට කැමැතියි. මේ පනත් කෙටුම්පතේ 2 වන වගන්තියේ මෙසේ සඳහන් වෙනවා:

[ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

"2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 49 වන වගන්තිය එම වගන්තියේ (2අ) උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(2අ) මේ පනතේ 14අ සහ 14ඊ වගන්තිවල සඳහන් විධිවිධාන උල්ලංඝනය කරන හෝ එම විධිවිධානවලට අනුකූලවීම පැහැර හරින යම් තැනැත්තකු වරදක් සිදුකරනු ලබන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිටදී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී එම තැනැත්තා වසර දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා වන බන්ධනාගාර ගත කිරීමකට හෝ පහත උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති ධීවර බෝට්ටුවේ දිග සැලකිල්ලට ගනිමින් නිශ්චය කරනු ලැබිය යුතු එහි II තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති දඩ මුදලට අඩු නොවන දඩ මුදලක් ගෙවීම සඳහා යටත් විය යුතු ය:-"

මේ වගන්තිය අපි නැවත වරක් Committee Stage එකේදී සංශෝධනය කරනු ලබනවා. 3 වන වගන්තියේ මෙසේ සඳහන් වෙනවා:

"3. ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 52අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය.

52අ. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 11 වන වගන්තියේ සහ 14 වන වගන්තියේ පටහැනිව කුමක් සඳහන් වුව ද එය නොසලකා මේ පනතේ නිශ්චිතව සඳහන් වැරදි විභාග කිරීම සඳහා සහ මේ පනතේ එම වැරදි සඳහා විධිවිධාන සලස්වා ඇති දඩ මුදල් පැනවීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණයට අධිකරණ බලය තිබිය යුතු ය". "

ගරු කථානායකතුමනි, මේ සංශෝධන තමයි අපි ඉදිරිපත් කරන්නේ. අපට මෙම පනත සංශෝධනය කිරීමට සිද්ධ වුණේ ඇයි කියන කාරණය මම පැහැදිලි කරන්නම්.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු ඇමතිතුමා, මෙම පනත් කෙටුම්පතේ සඳහන් වෙනවා, "1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 49 වන වගන්තිය එම වගන්තියේ (2අ) උපවගන්තිය" කියලා. (2අ) උපවගන්තියක් පනතේ කොයි අවස්ථාවේදීද ඇති වෙලා තිබෙන්නේ කියන කාරණය පැහැදිලි කරනවා නම් හොඳයි. එතැන අපැහැදිලිතාවක් තිබෙනවා. මොකද, පනතේ එහෙම එකක් නැහැ.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

හොඳයි. අපි ඒ ගැන බලලා, වරදක් තිබෙනවා නම් නිවැරදි කරන්නම්.

ගරු කථානායකතුමනි, මේ සංශෝධනය සිදු කරන්නට හේතු වුණ කරුණු මම පැහැදිලි කරන්නම්. මේ රටට ලැබුණු අතිවිශාල විදේශීය මුදල් අපේ ධීවර කර්මාන්තයේ යෙදුණු බොහෝ අයගේ අරපරිස්සම නැති නිසා අපට නැතිව ගියා. මේ නිසා යුරෝපා සංගමය කිහිප විටක්ම ලංකා රජයෙන් ඉල්ලුවා ඒ තත්ත්වය නිවැරදි කරන්න කියලා. අවුරුදු 4ක් තිස්සේ ඉල්ලා සිටියා. මේ කරුණ විශේෂයෙන්ම මේ රටේ ජනතාව දැන ගත යුතු කරුණක්. අවුරුදු හතරක් තිස්සේ මේ නිවැරදි කිරීම කරන්න පසු ගිය රජයට පුළුවන් වුණේ නැහැ. ඒ නිසා අපට සිද්ධ වුණේ මොකක්ද? අපේ ධීවරයන් අල්ලන මාළු මිල දී නො ගන්නට යුරෝපා සංගමයෙන් තීරණයක් ගත්තා. මෙයින් බරපතළ විනාශයක් ඇති වුණා. විශේෂයෙන්ම ධීවරයන් ඔවුන්ගේ මහන්සියෙන් හම්බ කරන ඒ මාළු ටික හොඳ මිලකට විකුණා ගන්න තිබුණු අවස්ථාව පසු ගිය රජයේ අක්‍රියකාරි තත්ත්වය නිසා මහ හැරී ගියා. යුරෝපා සංගමය සමඟ අප බැඳී තිබෙන ගිවිසුම් අනුව මේ ධීවර කර්මාන්තය ඉදිරියට ගෙන යන්නට අවශ්‍ය වන සංශෝධන සහ ක්‍රියා පටිපාටින් මේ රටේ ක්‍රියාත්මක කරන්න තමයි අපි මේ ක්‍රියාත්මක වෙන්නේ. එහෙම නොකරනවා නම්, යුරෝපා සංගමයේ රටවලට අපි අල්ලන මාළු හෝ ධීවර යාත්‍රා නැවතත් යවන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ගරු කථානායකතුමනි, මේ කාරණා තමයි ඉතාම කෙටියෙන් මට සඳහන් කරන්න තිබෙන්නේ. මේ කටයුතු ගැන කථා කරද්දී ඊට අදාළ වූ පසු බිමක් තිබෙනවා.

මහ මුහුදේ (ජාත්‍යන්තර මුහුදේ) ධීවර කර්මාන්තයේ යෙදීමේදී ශ්‍රී ලංකාව බැඳී සිටින්නාවූ ජාත්‍යන්තර සහ කලාපීය ගිවිසුම් යටතේ පිළිපැදිය යුතු කළමනාකරණ සහ සංරක්ෂණ පියවර අනුගමනය කළ යුතුය. ඒ අනුව මහ මුහුදේ (ජාත්‍යන්තර මුහුදේ) ධීවර කටයුතු ශ්‍රී ලාංකීය ධජ, යාත්‍රා ඉහත පිළිපැදිය යුතු කළමනාකරණ සහ සංරක්ෂණ පියවර අනුගමනය නොකිරීමේදී ප්‍රමාණවත් දඩ මුදල් පැනවීමට අවශ්‍ය පියවර ගත යුතු වෙනවා. එම නිසා මහ මුහුදේ (ජාත්‍යන්තර මුහුදේ) සහ වෙනත් රටක අධිකරණ බල සීමාවට අයත් මුහුදු තීරයේ නීති විරෝධී, වාර්තා නොවන, අවිධිමත්ව මසුන් ඇල්ලීමේ යෙදෙන ධීවර බෝට්ටුවල දිග සැලකිල්ලට ගෙන දඩ මුදල් වැඩි කිරීම යෝජිත සංශෝධන ඉදිරිපත් කිරීමේ මූලික අදහස වේ.

බෝට්ටුවල දිග ප්‍රමාණය අනුව ධාරිතාව වෙනස් වන බැවින්, දිග සැලකිල්ලට ගෙන දඩ මුදල් වැඩි කිරීම තුළින් මහ මුහුදේ (ජාත්‍යන්තර මුහුදේ) සහ වෙනත් රටක අධිකරණ බල සීමාවට අයත් මුහුදු තීරයේ නීති විරෝධී, වාර්තා නොවන අවිධිමත්ව මසුන් ඇල්ලීම වැළැක්වීම වඩා අර්ථවත් කිරීමට මේ යෝජිත සංශෝධන ඉදිරිපත් කරනු ලැබේ. මේ එක කාරණයක්. යුරෝපා සංගමය ශ්‍රී ලංකා රජයෙන් කරපු ඉල්ලීම්වලට අදාළ එක කාරණයක් තමයි අප අද සම්පූර්ණ කරන්නේ. ඒ වාගේම, මුහුදේ මාළු අල්ලන කොට, වැරැදි පිළිවෙළට මාළු අල්ලන, ඒවා වැරැදි පිළිවෙළට තබාගන්නා අය පිළිබඳව, ඒ අල්ලපු මාළු පිළිබඳව වාර්තා තබා ගැනීම වැනි තවත් රාජකාරි රාශියක් අපට කරන්න සිදු වෙලා තිබෙනවා. ඒ නිසා අපට සිද්ධ වුණා, විශාල මුදලක් වියදම් කරලා ඒ බෝට්ටුවලට VMS එකක් සවි කර දෙන්න. ලංකාවේ දැනට ධීවර බෝට්ටු 1,600ක් විතර තිබෙනවා. ඒ 1,600ටම මෙය බලපානවා. විශේෂයෙන් යන්ත්‍ර සවි කරන එක, එය monitor කරන එක, ඒ සඳහා අවශ්‍ය කරන නිලධාරින් ඒ නැව්වල යවන එක, බෝට්ටුවල යවන එක ආදි හැම දෙයක්ම වාර්තාගත කරන්න පුළුවන් නීතිමය තත්ත්වයක් ඇති කරන්න අපට සිද්ධ වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මෙය පොඩි වැඩක් එහෙම නොවෙයි. ඒ සඳහා අපට සෑහෙන කාල පරිච්ඡේදයක් ගත වෙනවා. VMS එකක් සෑදීම පිළිබඳව අත්සන් කර තිබෙන ගිවිසුම් නැවත සංශෝධනය කරන්න සිද්ධ වුණා. එසේ සංශෝධනය කරලා මාස පහක් ඇතුළත ඒ යන්ත්‍ර සවි කරන්න අවශ්‍ය කටයුතු කර තිබෙනවා. එවිට අපේ ධීවර ජනතාවට බයක් නැතිව මහ මුහුදේ රැකියාව කරන්න පුළුවන්කම ලැබෙනවා. ඒ වාගේම යුරෝපීය වෙළඳ පොළට අපේ මසුන් අළෙවි කරන්න අපට අවස්ථාව ලැබෙනවා.

මේ අවස්ථාවේදී අපට තවත් කරුණක් මතක් කරන්න සිද්ධ වෙනවා. අපි මේ වැඩ පිළිවෙළ යම්කිසි වැඩසටහනක් ක්‍රියාත්මක කරන ආකාරයට සංශෝධනය කරන්න ඕනෑ. ඒ පිළිබඳව විශේෂ කමිටුවක් පත් කරලා, road map එකක් හදලා අපි ඒක තමුන්නාන්සේලාට ඉදිරිපත් කරන්නම්. එය ඉක්මනින් ක්‍රියාත්මක

කරන්න පුළුවන් වැඩ පිළිවෙළකට යන්න අපට සිදු වෙනවා. එහෙම නොගියොත් අප බලාපොරොත්තු වන ප්‍රතිඵලය මෙයින් ලබා ගන්න හැකි වන්නේ නැහැ. අපි අපේ ධීවරයන්ට ආදරෙයි. ධීවර කර්මාන්තය මඟින් අපේ රටට මුදල් ලැබෙනවාට අපි කැමැතියි. ඒ නිසා මේ වැඩ පිළිවෙළ සාර්ථක කරගන්න තමයි අප කටයුතු කරන්නේ. අපේ රජය දැනටමත් විශාල මුදලක් මේ සඳහා වියදම් කර තිබෙනවා. මේ එක යන්ත්‍රයක් සවි කරන්න රුපියල් ලක්ෂ 4ක් විතර යනවා. අපි ඒ බෝට්ටු ඔක්කෝටම -1,600 ගණනටම- යන්ත්‍ර සපයා දෙනවා. අපි බලාපොරොත්තු වන්නේ ධීවරයන්ගෙන් මුදල් ගන්නේ නැතිව රජයේ මුදල් ගෙවා VMS එකක් සවි කරන්නයි. ඒ සඳහා ධීවරයන්ගෙන් මුදල් ඉල්ලන්නේ නැහැ.

ඒ විතරක් නොවෙයි, මේ එක්කම ධීවරයන්ට තවත් සහන දෙන්න අපි බලාපොරොත්තු වනවා. ධීවර කර්මාන්තය දියුණු කරන්න අපි පුළුවන් තරම් සහන දෙනවා. එලෙස ධීවර කර්මාන්තය දියුණු කරන්න අවශ්‍ය වන සහතිකය අපේ දින සියයේ වැඩ පිළිවෙළට බොහොම පැහැදිලිව අපි ඇතුළු කරලා තිබෙනවා. ඒවා තමයි ධීවර කර්මාන්තය දියුණු කරන්නටත්, ධීවර කාර්මිකයා දියුණු කරන්නටත් ගත යුතු පියවර.

ගරු කථානායකතුමනි, අපි පළමුවෙන්ම කරන්නේ එන්ජින්, දැල් සහ අනිකුත් ධීවර ආම්පන්නවලට පනවා තිබෙන අධික බදු ඔක්කෝම ඉවත් කිරීමයි. ඒක අපේ දින සියයේ වැඩ පිළිවෙළට ඇතුළු කරලා තිබෙනවා. අපි ඒ කාර්යයත් මේ දින සියයේ වැඩ පිළිවෙළ තුළ දී සිදු කරනවා.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මේ රටේ ධීවර ජනතාව අතිශ්‍රේෂ්ඨ ජනතාවක් බව ඔබතුමාත් දන්නවා. සාමාන්‍යයෙන් ඔවුන් රජයෙන් මොකුත් ඉල්ලන්නේ නැහැ; සහනාධාරයක් දුන්නොත් ගන්නවා. ගොවි ජනතාවට වාගේ ධීවරයන්ට විශාල වශයෙන් සහනාධාර දීලා නැහැ. ගරු කථානායකතුමනි, ඔබතුමා ඒක දන්නවා. නමුත්, එදා ඉන්ධන මිල වැඩි වුණු වෙලාවේ මේ කර්මාන්තය කරන්න බැහැ කියලා ධීවර ජනතාව උද්ඝෝෂණය කරන කොට පසු ගිය රජය ඒකට උත්තර දුන්නේ තුවක්කුවෙන්. එහිදී එක ධීවරයෙක් ජීවිතක්ෂයට පත් වුණා. ඒ වෙලාවේ තමයි පසු ගිය රජයෙන් කිව්වේ මේ සහනාධාරය දෙනවා කියලා. ඒ අනුව මේ සහනාධාරය ටික දිනක් දීලා බැලුවාම රජයට තේරුණා, මේ සහනාධාරය දෙන්න සල්ලි නැහැ කියලා. ඒ අනුව එම සහනාධාරය ලබා දීම නතර කළා. නතර කරන කොට නැවතත් ධීවර ජනතාව උද්ඝෝෂණය කරනවා කිව්වාම රජයෙන් කිව්වා, ඒ වෙනුවට වෙනත් විකල්පයක් දෙනවා කියලා. ඒ වෙනත් විකල්පය තමයි එන්ජින් සහ දැල් ලබා දෙනවා කියපු එක. ඒකෙනුත් කොටසක් ලබා දීලා තිබෙනවා. ඒකත් අපි කියන්න ඕනෑ. නමුත්, එන්ජින්වලටත් වඩා එදා ඒ ජනතාව ඉල්ලුවේ, ගේන මිලටම තෙල් ලබා දෙන්න කියලායි. "අපි සහන ඉල්ලන්නේ නැහැ. අපි හිහන්නෝ නොවෙයි. තෙල් ටික ගේන මිලටම අපට දෙන්න." කියලායි ඔවුන් ඉල්ලුවේ. දින සියයේ වැඩ පිළිවෙළ යටතේ අපි ඒක ක්‍රියාත්මක කරලා තිබෙනවා. දැන් ධීවර ජනතාවටත්, ඒ වාගේම භූමිතෙල්, පෙට්‍රල් උපයෝගි කර ගෙන තම ජීවිකාව කරන බොහෝ දෙනකුට මේ සහනය ලැබිලා ඒ අනුසාරයෙන්ම මේ රටේ ආර්ථිකයේ ලොකු වෙනසක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා අපට තව ඉදිරියට කරන්න තිබෙන්නේ ධීවර ජනතාවට අවශ්‍ය වන අනිකුත් සහනාධාර ටික ලබා දීම සහ ආරක්ෂාව ලබා දීමයි. මේ සඳහා අවශ්‍ය වන වරායවල්, නැංගුරම් පොළවල් රාශියක් හදන්න අපි දැන් කටයුතු කර ගෙන යනවා. පසු ගිය ආණ්ඩුවත් ඒවා සැලසුම් කරලා තිබුණාය කියලා කිව්වා. ඒක හොඳයි. ඒක හොඳ දෙයක්. නමුත්, පසු ගිය රජයට ඒක කරන්න බැරිව ගියා. දැන් අපි ඒ වැඩ ටික ඉතාම ඉක්මනින් කරන්න බලාපොරොත්තු වනවා.

ගරු කථානායකතුමනි, අපි මේ වැඩ පිළිවෙළ ඉදිරිපත් කරන කොට අපට තවත් පැහැදිලි කර ගැනීමක් කරන්න සිද්ධ වුණා. ඒ අනුව මේ සංශෝධනයේ තිබෙන එක කොටසක් අපට නැවත වරක් සංශෝධනය කරන්න වනවා. කාරක සභා අවස්ථාවේදී ඒ සංශෝධනය ඉදිරිපත් කරන්න අපි බලාපොරොත්තු වනවා.

මම දීර්ඝ වශයෙන් කථා කරන්නට යන්නේ නැහැ. මට සුළු වෙලාවකුයි ලැබී තිබෙන්නේ. ඒ සුළු වෙලාවෙන් උපරිම වශයෙන් ප්‍රයෝජන අර ගෙන මේ රටේ ධීවර කර්මාන්තය දියුණු කිරීම සඳහා ගත යුතු පියවර ගැන සඳහන් කිරීමට බලාපොරොත්තු වෙනවා.

ධීවර අංශ කිහිපයක් තිබෙනවා. මුහුදු ධීවර අංශය වාගේම වැව් වාගේ ජලාශවල කරන inland fisheries අංශයකුත් තිබෙනවා. මම ධීවර අමාත්‍යවරයා වශයෙන් සිටි කාලයේ ගරු කථානායකතුමනි, තමුන්නාන්සේගේ ආසනයට මම ගියා මට මතකයි. ඒ අවස්ථාවේ තමුන්නාන්සේත් මාත් එක්ක ඇවිත් ඒ වැඩ පිළිවෙළට සහයෝගය දුන්නා. අද අපි එය මතක් කිරීම ඉතාම වැදගත්ය කියා මා හිතනවා. ඒක තමයි රජයක සහ විරුද්ධ පක්ෂයක තිබෙන විශේෂ ලක්ෂණය. අපි ඒ විධියට වැඩ කරන්න කැමැතියි.

මා දීර්ඝ වශයෙන් කරුණු කියන්න යන්නේ නැහැ. මෙතැනදී අපට පෙනෙන්නේ, මේ වැඩ කොටස අපි හරියට කළොත් අනෙක් කර්මාන්තවලට ලැබෙන GSP Plus සහනත් අපට ලැබෙනවාය කියන එකයි. රැකියා ලක්ෂ දහයක් ඇති කරන්නට පුළුවන් කර්මාන්ත මේ රටට ගෙනෙන්නයි එයින් අපි බලාපොරොත්තු වන්නේ. එයින් වාසිය වෙන්නේ මේ රටේ දුප්පත් ජනතාවටයි. මේ දින සියයේ වැඩ පිළිවෙළට නිකම් බොරුවට කිසිවක් ඇතුළත් කර නැහැ. ඇතුළත් කර ඇති හැම යෝජනාවක්ම ක්‍රියාත්මක වෙනවා. දැන් මම කිව්වේ, විශේෂයෙන් ධීවරයන් සඳහා වාසි ලැබුණු කාරණා දෙකක්.

එකක් තමයි ඉන්ධන සහනාධාරය. ධීවර ජනතාව කිව්වේ, "අපට සහනාධාරයක් එපා, ඉන්ධන නියම මිලට දෙන්න" කියායි. ඉන්ධන නියම මිලට දීමේ කාරණාව මත අද ධීවර ජනතාව බොහොම සන්තෝෂයෙන් ඉන්නවා. ඒ එක්කම අනෙක් කාරණය ධීවර ආම්පන්නවල මිල අඩු කිරීම, ඒවාට ඇති බදු මුදල, දඩ මුදල අඩු කිරීම කියන කාරණයයි. ඒකත් අප තව ටික දවසකින් ඉෂ්ට කරනවා. එම නිසා මේ කාරණය මා ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. දින සියයේ වැඩ පිළිවෙළ ගැන අපේ අනෙකුත් මන්ත්‍රීතුමන්ලා කථා කරාවි. මේක තමයි ප්‍රධාන අරමුණ වෙලා තිබෙන්නේ. පසු ගිය ආණ්ඩුව මේ කටයුත්ත අවුරුදු හතරක් ප්‍රමාද කළා. අවුරුදු හතරක් ප්‍රමාද කළ නිසා තමයි අපට ලැබෙන්නට තිබුණු විදේශ විනිමය විශාල ප්‍රමාණයක් නැතිව ගියේ. දැන් අපි සියලු දෙනා එකතු වෙලා මේ කටයුත්ත සාර්ථක කර ගන්නට යනවා. ඒ සඳහා සියලු දෙනාගේ සහයෝගය ලැබේය කියා මම විශ්වාස කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ස්තුතියි. මීළඟට ගරු මිල්රෝයි ප්‍රනාන්දු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.11]

ගරු මිල්රෝයි ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு மில்ரோய் பர்னாந்து)
(The Hon. Milroy Fernando)

ස්තුතියි, ගරු කථානායකතුමනි. ධීවර ජනතාවගේ දුක දන්නා හඳුනන, හිටපු ධීවර අමාත්‍යවරයකු වන ගරු ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමා ධීවර අමාත්‍යවරයා හැටියටත්, ඒ වාගේම දකුණු පළාතේ ගරු දිලිප් වෙදආරච්චි මැතිතුමා ධීවර රාජ්‍ය අමාත්‍යවරයා හැටියටත් පත් කිරීම ගැන ධීවර ජනතාව වෙනුවෙන් ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ රජයටත්, ඒ වාගේම ගරු අගමැතිතුමාටත් මම මේ අවස්ථාවේදී විශේෂයෙන් ස්තුතිවන්ත වනවා.

ගරු ජෝශප් මයිකල් පෙරේරා ඇමතිතුමා අවුරුදු 6ක් විතර ඉතාම සාර්ථකව එම අමාත්‍යාංශය භාරව කටයුතු කළා. ඉන් පසුව 1994 දී හිටපු ජනාධිපති ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ධීවර ඇමතිවරයා හැටියටත්, මම නියෝජ්‍ය ඇමතිවරයා හැටියටත් වැඩ භාර ගත්තේ ගරු ජෝශප් මයිකල් පෙරේරා ඇමතිතුමා කර ගෙන ගිය වැඩ කොටස ඉදිරියට ගෙන යන්නයි. ඒ අවස්ථාවේ එතුමා ධීවර ජනතාව වෙනුවෙන් විශාල වැඩ කොටසක් කළා. විශේෂයෙන්ම ධීවර සමුපකාරය දියුණු කරන්න ජෝශප් මයිකල් පෙරේරා ඇමතිතුමා විශාල වැඩ කොටසක් කළා. නව රජයේ දින සියයේ වැඩසටහන තුළ එතුමා ධීවර ඇමතිවරයා හැටියට කටයුතු කිරීම සම්බන්ධව විශේෂයෙන්ම අපේ ප්‍රදේශයේ ධීවර ජනතාවගේ සුබ පැතුම් මේ අවස්ථාවේ පුද කරන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, හිටපු අමාත්‍ය ගරු රාජිත සේනාරත්න මැතිතුමාත් දැන් ඉන්නේ ඒ ප්‍රදේශයේ. අවුරුදු හතරක් යන තෙක් යුරෝපා හවුලේ සම්බාධක පිළිබඳ ප්‍රශ්නය නොවිසඳුණේ මොකද කියන එක ලොකු ගැටලුවක්. ට්‍රෝලර් යාත්‍රා හිමියෝ ඉන්නේ අපේ දිස්ත්‍රික්කයේ. විශේෂයෙන්ම වෙන්නප්පුව ආසනය - මගේ ආසනය- බහුදින යාත්‍රා විශාල සංඛ්‍යාවක් තිබෙන ප්‍රදේශයක්. මාළුවලට මිලක් නොලැබුණ නිසා තමයි ඒ අය ධීවර අමාත්‍යාංශයට ඇවිල්ලා විශාල ගැටුමකුත් ඇති වුණේ. ඒ නිසා මේවා අවුරුදු හතරක් තිස්සේ තිබුණු ප්‍රශ්න. යුරෝපා හවුල අපේ රජයෙන් ඉල්ලුපු දේ. මේවා පාර්ලිමේන්තුවෙන් අනුමත කර දෙන්න, VMS යන්ත්‍ර සවි කර දෙන්න, ඒ වාගේම ඒ කොඩිය දමා ගෙන යන නැව් නතර කරන්න කියන මේ සියලු ඉල්ලීම් ඉල්ලා තිබුණේ අපේ ධීවර ජනතාව වෙනුවෙන් පාර්ලිමේන්තුවෙන් අනුමත කරන්න ඕනෑ කියලායි. නමුත් අවුරුදු හතරක් තිස්සේ ඒ එකක්වත් නොකිරීමෙන් අපට ලොකු ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිද්ධ වුණා. ඒ වාගේම ට්‍රෝලර් හිමියෝ ධීවර අමාත්‍යාංශයට ඇවිල්ලා කළ උද්ඝෝෂණයේදී ධීවර ජනතාවට පහර කෑමටත් සිද්ධ වුණේ මේවා ප්‍රමාද වීම නිසායි. දැන් ගරු රාජිත සේනාරත්න ඇමතිතුමා මේ ගරු සභාවේ ඉන්නවා. ඔබතුමාගේ කථාවේදී ප්‍රකාශ කරන්න පුළුවන්, අවුරුදු හතරක් තිස්සේ මේක ප්‍රමාද වුණේ ඇයි කියන එක. ඒක අපේ රටට සිදු වුණු ලොකු පාඩුවක්. අපේ ධීවර ජනතාවට වුණු ලොකු පාඩුවක්. අපේ රටට ලැබෙන්න තිබුණු විදේශ විනිමය ප්‍රමාණයක් නොලැබුණු එක රටට ලොකු පාඩුවක්. ඒ නිසා මෙවැනි දේවල් සිදු නොවිය යුතුයි. අපේ රටේ ධීවර ජනතාව ඉතාම මහන්සියෙන්, බොහොම අමාරුවෙන් තමයි මේ කර්මාන්තයේ යෙදෙන්නේ. මුලින්ම බොහොම සුළුවෙන් තමයි ආරම්භ කරන්නේ.

පොඩි බෝට්ටුවකින් ගිහිල්ලා, තෙප්පමෙන් ගිහිල්ලා, ඊට පස්සේ ට්‍රෝලර්වලට මාරු වෙලා තමයි ඉදිරියට එන්නේ. ඒ වාගේම හිටපු ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා එදා ධීවර ඇමතිතුමා වෙලා සිටි කාලයේ සත පහක්වත් අය කරන්නේ නැතිව සහනාධාර හැටියට ට්‍රෝලර් යාත්‍රාවට රුපියල් ලක්ෂ 10ක මුදලක් එදා ලබා දුන්නා. මොකද, ධීවර කර්මාන්තය මේ රටේ දියුණු කරන්න අවශ්‍ය නිසා. දැල්වලින් මාළු අල්ලන්නේ නැතිව, යොත්වලින් මාළු අල්ලන ක්‍රමය හඳුන්වා දුන්නේ මහින්ද රාජපක්ෂ මැතිතුමා එදා ධීවර ඇමතිතුමාව සිටි කාලයේ. ඒ කාල සීමාවේදී එතුමා මේ කටයුතු කළේ අපේ රටේ ධීවර ජනතාවට ස්වශක්තියෙන් නැඟී සිටින්න පුළුවන් වාතාවරණයක් හදන්න. නමුත් අපි කනගාටු වෙන්නේ, ඇයි අපට අපේ කාලයේදී මේ දේවල් කර ගන්න බැරිව ගියේ කියන එක ගැනයි. ඒක විශාල ප්‍රශ්නයක්. එම නිසා මේ කටයුතු කිරීම පිළිබඳව මම විශේෂයෙන්ම මේ අවස්ථාවේදී රජයට ස්තුතිවන්ත වෙනවා.

භූමිතෙල් මිල සහ ඩීසල් මිල ගැන කථා කරනවා නම්, එදා ඉන්ධන සහනාධාරය ලබා ගැනීමට උද්ඝෝෂණයක් කළ අවස්ථාවේ අපේ පුත්තලම් දිස්ත්‍රික්කයේ හලාවත ධීවරයෙකුගේ ජීවිතය හානි වුණා. ඒ අවස්ථාවේත් අපේ කතෝලික පල්ලියේ කාදිනල්තුමා, බිෂොප්තුමන්ලා අපි සියලු දෙනාම එදා ඉල්ලා සිටියේ ධීවර ජනතාවට අවශ්‍ය තෙල් සහනාධාර ලබා දෙන්න කියලා. විශේෂයෙන්ම අද භූමිතෙල් මිල, ඩීසල් මිල අඩුවීම නිසා මාළු මිලෙහි යම්කිසි අඩුවීමක් අද දකින්න පුළුවන්. ඒ වාගේම ඒ අයගේ මුහුණේ පොඩි සතුටක් තිබෙනවා, අපට දැන් ලොකු වියදමක් යන්නේ නැතිව නෙළා ගත් මාළු අස්වැන්න ගොඩබිමට ගෙනෙන්න පුළුවන් කියන එක ගැන. එම නිසා මා දැල් කර්මාන්තය ආරක්ෂා කර ගන්නත්- මම හිතන හැටියට ගරු ජෝශප් මයිකල් පෙරේරා ඇමතිතුමාට ඒ සම්බන්ධයෙන් විශේෂ දැනුමක් තිබෙනවා. විශේෂයෙන්ම අද ට්‍රැක්ටර්වලින් මා දැල් අදිනවා. මොකද, අද සෙනඟ අඩුයි ඒ රස්සාව කරන්න. ලොකු මහන්සියක් වෙන්න ඕනෑ. ඒ වාගේම එක සේවකයෙකුට හය මාසයක් රස්සාව කරන්න ලක්ෂ එකහමාරක් විතර මුදලක් දෙන්න ඕනෑ. අඩුම තරමින් පනහක හැටක පමණ පිරිසක් ඕනෑ මා දැලක් නඩත්තු කරන්න. එම නිසා ලෙහෙසි ක්‍රමයකට අද ට්‍රැක්ටර්වලින් මා දැල් අදිනවා. නමුත් එයින් යම්කිසි හානියක් සිදු වන නිසා winch system එක ධීවරයින්ට හඳුන්වා දෙන්න කියලා මම විශේෂයෙන්ම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

වාරකන් සහ වලාල කියා කාල දෙකක් මුහුදේ තිබෙනවා. හලාවත ධීවරයන්ට අද නැඟෙනහිරට යන්න අවස්ථාව ලැබී තිබෙනවා. මම හිතන හැටියට ඔබතුමා අද එම ලිපිය අත්සන් කළා කියලා මට ආරංචියක් ලැබුණා. හලාවත අපේ ධීවරයෝ, විශාල වශයෙන් කරුකපනේ ධීවර ජනතාව නැඟෙනහිර ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මාළු ඇල්ලීම සඳහා යනවා. ඒ අයට පහසුකම් සපයන්න එම ප්‍රදේශවල පමණක් ජනතාව කැමැතියි; පමණක් අය අකැමැතියි. නමුත් මෙය පරම්පරා ගණනාවක් තිස්සේ දිගටම පැමිණි ක්‍රමයක්. එම නිසා එම ක්‍රමය ඉදිරියට ගෙන යෑමට කටයුතු කරන්න. ඒ ප්‍රදේශයේ සිටින ද්‍රවිඩ ජනතාවත්, මුස්ලිම් ජනතාවත්, අපේ සිංහල ජනතාවත් අතර ලොකු සම්බන්ධයක් තිබුණා. පසු ගිය කාලයේ යුද්ධය තිබුණත් ඒ කාලයේත් මේ ධීවර ජනතාව අතර බොහොම සුහදතාවක් තිබුණා. එම නිසා ඉදිරියටත් එම ධීවර ජනතාවට ඒ කාල සීමාව තුළ මාළු ටික ඇල්ලීමට හැකි වන පරිදි- මොකද, හය මාසයක් අපේ වෙරළේ මාළු අල්ලන්න බැහැ. හය මාසයකට පසුව අනෙක් වෙරළට තමයි යන්න වෙන්නේ.- ඒ කටයුත්ත ඉෂ්ට කරන්නය කියලා විශේෂයෙන්ම මා ඉල්ලා සිටිනවා. මේ යෝජනා ක්‍රමය යටතේ VMS යන්ත්‍ර ටික නොමිලයේ ලබා දීමට කටයුතු කිරීම සම්බන්ධවත්, ඒ වාගේම අනුන්ගේ මුහුදු සීමාවන්ට යන්නේ නැතුව තමන්ගේ මුහුදු සීමාවේ මාළු ඇල්ලීම සම්බන්ධව එම ධීවර ජනතාව හරියාකාරව දැනුවත් කිරීමේ කටයුතු කරන්නය කියන එකත් ඉල්ලා සිටිමින් මෙවැනි කටයුතුවලින් මේ රටටත්, විශේෂයෙන්ම ධීවර ජනතාවටත් ලොකු සේවයක් වෙනවාය කියන එකත් ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති. ඉන් පසුව ගරු සජිත් ප්‍රේමදාස මහතා.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ වීය.
அதன்பிறகு, சபாநாயகர் அவர்கள் *அக்கிராசனத்தினின்று அகலவே,* குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] *தலைமை வகித்தார்கள்.*
Whereupon MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The Hon. Sajith Premadasa, please. You have 20 minutes.

ගරු සජිත් ප්‍රේමදාස මහතා (නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - வீடமைப்பு மற்றும் சமுர்த்தி அமைச்சர்)
(The Hon. Sajith Premadasa - Minister of Housing and Samurdhi)
No, I have 30 minutes.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Have you been given the Hon. Hunais Farook's time also?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Yes.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Okay, then you may start.

[අ.භා. 2.20]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දවසේ අප රටටත්, රටේ ආර්ථිකයටත් වැදගත් වූ ක්ෂේත්‍රයක් වන ධීවර ක්ෂේත්‍රය සාකච්ඡාවට භාජන කරන මොහොතේ ඒ සම්බන්ධව වචන කිහිපයක් කථා කිරීමට ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. ඇත්ත වශයෙන්ම අපේ රටේ ධීවර ප්‍රජාවට යුරෝපා හවුල මත්ස්‍ය නිෂ්පාදන සම්බාධක පැනවීම නිසා අප රටේ ධීවර ප්‍රජාව අතිශය අසහනයකට ලක් වෙලා තිබෙන මොහොතක මම මතක් කරන්නට කැමැතියි, විශේෂයෙන්ම අපට පරස්පර මත දරන මේ ගරු සභාවේම මන්ත්‍රීතුමන්ලාගේ විරෝධය තුළ මේ රෙගුලාසි සහ අණපනත් ගෙන එන්නට තිබුණු පසු ගිය දවසේ ඒක ගෙන එන්නට බැරි වුණාය කියන එක.

ඒ නිසාම අපේ රටේ ධීවර ප්‍රජාවගේ අසහනය තවදුරටත් ප්‍රවර්ධනය වුණාය කියන කාරණය කනගාටුවෙන් වුවද සඳහන් කරන්නට ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2000 - 2013 අතර කාලය දිහා බලන කොට අපේ රටේ මත්ස්‍ය නිෂ්පාදනය අඩු වෙලා තිබෙනවා. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට ගත්තාම 2000 දී 2.7 සිට 2013 වන කොට 1.3 දක්වා අඩු වෙලා තිබෙනවා. 2000 දී 2.7ක ප්‍රතිශතයක තිබූ අපේ රටේ මත්ස්‍ය නිෂ්පාදනය, 2013 වන කොට 1.3 දක්වා අඩු වෙලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම ශ්‍රී ලංකාවේ ආර්ථික අනන්‍ය කලාපයට - Exclusive Economic Zone එක- වර්ග කිලෝමීටර් 517,000ක් තිබෙනවා. ඒක අයිස්ලන්තයටත්, ජපානයටත්, මැලේසියාවටත් වඩා විශාලයි. එහෙම තත්ත්වයක් තිබියදී ඇයි, 2000 - 2013 කාලය තුළ අපේ රටේ මත්ස්‍ය නිෂ්පාදනයේ ප්‍රතිශතය 2.7 සිට 1.3 දක්වා අඩු වෙලා තිබෙන්නේ? අපි ඒ ගැන සොයා බලන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මත්ස්‍ය සම්පත නෙළා ගැනීමේ නිසි ක්‍රමවේදයක් අපේ රටේ නැහැ. නවීන ආම්පන්න නැහැ. නවීන තාක්ෂණය නැහැ. වසරින් වසර අපේ රටේ ධීවරයාට ලබා දිය යුතුව තිබුණු සහන ටික කප්පාදු කළා. ඒ අයගේ අයිතීන් කප්පාදු කළා. ඒ අයට ලබා දිය යුතුව තිබුණු පහසුකම් සපයන්නට පසු ගිය රජය අපොහොසත් වුණා. එපමණක් නොවෙයි. ධීවරයාගේ සමාජ සුභසාධනය ක්‍රමක්‍රමයෙන් කප්පාදුවට ලක් වුණු ඒ කාල වකවානුවේ අපේ රටේ මුහුදු කලාපයට පිට රට බහුදින යාත්‍රා විශාල ප්‍රමාණයක් ඇතුළු වෙලා, අනවසරයෙන් මසුන් ඇල්ලීමේ ක්‍රියාවලියේ නිරත වන කොට රට පාලනය කරපු දේශ ප්‍රේමී, ජාත්‍යාලයෙන් පිරුණු ආණ්ඩුව නිහඬව බලා සිටියා. අන්න ඒකයි මත්ස්‍ය නිෂ්පාදනය අඩු වන්නට ප්‍රධානතම හේතුව වුණේ.

එපමණක් නොවෙයි. මුළු රාජ්‍ය වියදමේ ප්‍රතිශතයක් හැටියට ගත්තාම ධීවර අමාත්‍යාංශයේ වියදම පසු ගිය කාලයේ ක්‍රමක්‍රමයෙන් කැපුවා. 2010 දී දශම හයයි දෙකක් වූ වියදම 2015 වර්ෂය වන විට දශම තුනයි දෙකක් දක්වා පසු ගිය රජය කප්පාදු කළා. මේ කප්පාදුව කරනකොට 26 ලක්ෂයක් වූ අපේ රටේ ධීවර කර්මාන්තයෙන් යැපුණු ජනතාව සහමුලින්ම අනාථ වුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අපේ රට මුහුණ පා තිබෙන තත්ත්වය මොකක්ද? යුරෝපා හවුල 2015 ජනවාරි 15 වැනි දා සිට අපේ රටේ මත්ස්‍ය අපනයනය යුරෝපා හවුල සහමුලින් තහනම් කරලා තිබෙනවා. අපේ රටේ කිසිම මත්ස්‍ය නිෂ්පාදනයක් යුරෝපා රටවලට අපනයනය කරන්නට බැහැ. දේශප්‍රේමීත්වයෙන් වෙළුණු පසු ගිය රජය අපේ රටේ ධීවර ප්‍රජාවට පසු ගිය කාලයේ දී ලබා දුන් ලොකුම දායාදය මේකද කියලා මා අහන්න කැමැතියි. අපේ රටේ මත්ස්‍ය සම්පත යුරෝපා රටවලට අපනයනය කිරීම කප්පාදු කරවා ගත්තු එක ද පසු ගිය රජය ධීවර ප්‍රජාව වෙනුවෙන් ක්‍රියාත්මක කළ ලොකුම ක්‍රියාවලිය කියලා මා අහනවා. 2014 වසර ගත්තොත් ඇත්ත වශයෙන්ම ධීවර කර්මාන්තයේ සියයට 20ක වර්ධනයක් තිබුණා. යුරෝපා හවුලත් සමඟ කරන ලද ඒ ගනුදෙනු තුළ අප ලබා ගත් ඉපැයීම් දෙස බැලුවොත් පෙනෙනවා, ඇමරිකානු ඩොලර් මිලියන 125ක් අපි ලබා ගෙන තිබෙනවාය කියා. නමුත් මේ සම්බාධක පැනවීම තුළ මොකක්ද සිදු වුණේ? ඒ උපයා ගත් ඇමරිකානු ඩොලර් මිලියන 125ක මුදල අද අපේ රටේ ධීවර ප්‍රජාවට අහිමි වෙලා තිබෙනවා.

අදූරදර්ශී විදේශ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හේතුවෙන් එවකට හිටපු ධීවර ඇමතිතුමාට තමන්ගේ රාජකාරිය කිරීමේ දී ඇති වූ බාධා, කඩතොලු නිසා රටේ ධීවර ප්‍රජාව ඉමහත් අසහනයකට ලක් වුණා. ඇත්ත වශයෙන්ම ඇමෙරිකානු ඩොලර් මිලියන 125ක මුදලක් අපේ රටට අහිමි වනකොට, පාර්ලිමේන්තුවේ මැති ඇමතිවරුන්වත්, රටේ පාලකයන්වත්

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

නොවෙයි දුක් විඳින්නේ. මහ සයුරත් සමඟ පොරබදන, දළ රළ ජයගන්නවාය කියන ධීවරයා තමයි මෙම අදූර දර්ශී ජාතික ප්‍රතිපත්තිය නිසා මහා ව්‍යසනයකට, මහා හානියකට අද ලක් වෙලා තිබෙන්නේ.

ශ්‍රී ලංකාව ටූනා අපනයනය කරන, කෙළවල්ලන් අපනයනය කරන, කලාපවලින් ලොකුම කලාපය යුරෝපා හවුලයි. යුරෝපා හවුලට අපනයනය කරන ප්‍රමාණය සියයට 37යි. ජපානයට සියයට 19යි. ඇමෙරිකාවට සියයට 18යි. යුරෝපා හවුල අපට අනතුරු ඇඟෙව්වේ අද ඊයේ නොවෙයි. 2012 නොවැම්බර් මාසයේ දී යුරෝපා හවුලේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ශ්‍රී ලංකාවට අනතුරු ඇඟවීමක් කළා. ඔහු මොකක්ද කිව්වේ? ජාත්‍යන්තර මුහුදේ ධීවර කර්මාන්තය පිළිබඳව ප්‍රමාණවත් රාමුවක් නැහැ; ප්‍රමාණවත් හා කාර්යක්ෂම කළමනාකරණ වැඩසටහනක් නැහැ; පැහැදිලි නිරීක්ෂණ වැඩසටහනක් නැහැ; ජාත්‍යන්තර ධීවර නීති උල්ලංඝනය කරනකොට තහංචි පමුණු වන්නේ නැහැ; ගහන දඩ ප්‍රමාණවත් නැහැ; නෙළා ගත් මසුන් සඳහා සහතික කිරීමේ වැඩසටහනක් නිසි ලෙස ක්‍රියාත්මක වන්නේ නැහැ කියලා කිව්වා. අද ඊයේ නොවෙයි මෙය කිව්වේ. 2012 දී කිව්වේ.

2012 දී යුරෝපා හවුල මෙවන් අනතුරු ඇඟවීමක් කරනකොට පසු ගිය රජය මොකක්ද කළේ? පසු ගිය රජය කරපු එකම දේ තමයි හිටපු ධීවර ඇමතිතුමාට තමන්ගේ රාජකාරිය කරන්න ඉඩ දුන්නේ නැති එක. එතුමාට බාධා කළා. එතුමාට ප්‍රශ්න දැම්මා. එතුමාගේ අමාත්‍යාංශයේ සල්ලි කප්පාදු කළා. අපිත් විපක්ෂය පැත්තේ ඉඳගෙන ධීවර ඇමතිතුමාගෙන් බොහොම සතුටින් ප්‍රශ්න ඇහුවා. ධීවර ප්‍රජාවට ලබා දෙනවාය කියපු සහන කෝ කියලා ඇහුවා. එතුමාත් බොහොම අමාරුවෙන් ඇඟ බේරාගෙන උත්තර දුන්නා; ජාම බේරා ගෙන උත්තර දුන්නා. නමුත් පසු ගිය රජය කරපු එකම දේ මොකක්ද? තමන් පත් කරපු ධීවර ඇමතිතුමාට තමන්ගේ රාජකාරිය ඉෂ්ට කරන්නට ඉඩ දුන්නේ නැහැ. ඒක තමයි කළේ.

යුරෝපා හවුලේ අධ්‍යක්ෂ ජනරාල්වරයා කිව්වේ මොකක්ද? තමන්ගේ කාර්ය මණ්ඩලයත් සමඟ ධීවර අමාත්‍යාංශයේ නිලධාරිනුත් සම්බන්ධ කරගෙන අපි සහයෝගයෙන් මේ දුර්වලතා අවම කර ගනිමුය කියලා යෝජනා කරන කොට පසු ගිය රජය මොකක්ද කළේ? පසු ගිය රජයේ හිටපු ධීවර ඇමතිතුමා වන රාජිත සේනාරත්න මැතිතුමාට තමන්ගේ රාජකාරිය ඉෂ්ට කරන්නට ඉඩ ලබා නොදී එතුමාගේ කකුලෙන් ඇද්දා. මම පෙන්වන්නම්, කකුලෙන් ඇදපු අවස්ථාවන්. සාක්ෂි සහිතව ඒ තර්කය ඉදිරිපත් කරන්නට මා බලාපොරොත්තු වෙනවා.

මේ නීති-රීති, රෙගුලාසි ක්‍රියාත්මක වීම පිළිබඳව වෙනසක් ඇති නොවන කොට, විශාල යාත්‍රා ඇවිල්ලා ඉන්දියන් සාගරයේ මහා පරිමාණයේ මසුන් ඇල්ලීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන කොට, ඒ මත්ස්‍ය මං කොල්ලකෑම කිසිම පාලනයකට ලක් නොවන කොට, 2014 ඔක්තෝබර් මාසයේ දී යුරෝපා හවුල ඊළඟ අනතුරු ඇඟවීමත් කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ක්‍රියාවලිය තුළ අපේ රටේ ධීවර ප්‍රජාවට කෙළවල්ලන්, සප්පරා - swordfish - යුරෝපා හවුලට අපනයනය කරන්නට තිබුණු ඉඩ ප්‍රස්ථාව අද අහිමි වෙලා තිබෙනවා. 2013 වනකොට යූරෝ මිලියන 74ක පාඩුවක් ශ්‍රී ලංකාවේ අපනයනවලට සිදු වුණා. හැබැයි, ඒ යූරෝ මිලියන 74 ගැන කථා කරන කොට ධීවර ජනතාවගේ තිබුණු ගින්දර, ඔවුන්ගේ දුක මේ ගරු සභාවේ මැති ඇමතිතුමන්ලාට, මන්ත්‍රීතුමන්ලාට නොතේරෙනවා ඇති. නමුත් බොහොම අමාරුවෙන් ජීවිකාව කරගෙන යන රටේ ධීවර ප්‍රජාවට ඒ දුක දැනුණා. මේ වාගේ අවදානම් තත්ත්වයක් තිබියදී, අපේ රටේ ධීවර ප්‍රජාවට මේ වාගේ මහා භයංකාර ජාත්‍යන්තර අභියෝගයක් එල්ල වන කොට, දේශාභිමානයෙන් වෙළිච්ච, දේශානුරාගයෙන්, ජාති හිතෛෂීත්වයෙන් පිරී ඉතිරී ගිය රජය නිහඬව, තක් බීරි වෙලා හිටියේ ඇයි කියලා මා අහන්න කැමැතියි. ඔබතුමන්ලාගේ රජයේ මහා ලොකු දක්ෂයින් සිටියා නම්, අපේ රටේ ධීවර ප්‍රජාව ගොඩ ගන්නට ඔබතුමන්ලාගේ පාලකයින් කටයුතු නොකළේ ඇයි? ඒ වෙනුවෙන් කටයුතු කරන්න හදපු පුද්ගලයාගේත් - රාජිත සේනාරත්න ඇමතිතුමාගේ - කකුලෙන් ඇද්දා. ඒක තමයි සුපුරුදු ක්‍රියාවලිය. ඒ හේතුව නිසා තමයි එතුමා වෙනසක් ඇති කරන්නට බොහොම ප්‍රගතිශීලී තීන්දුවක් ගත්තේ. කරන්න පුළුවන් මිනිහාට කරන්න දුන්නේත් නැහැ; වෙන කවුරු හරි වැඩේ කළේත් නැහැ. අවසානයේ විපතට පත් වුණේ රටේ ධීවර ප්‍රජාවයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2014 ඔක්තෝබර් මාසයේත් යුරෝපා හවුල තව මාස තුනක් කල් දුන්නා. අපේ රටේ බහුදින ට්‍රෝලර් යාත්‍රා 4,300කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. ලක්ෂ ගණනින්, දස ලක්ෂ ගණනින් අපේ රටේ ධීවර ප්‍රජාව මේ කර්මාන්තයෙන් යැපෙනවා. ඩොලර් මිලියන ගණනක, රුපියල් බිලියන ගණනක අපනයන ආදායමක් එයින් අපේ රටට ලැබෙනවා. එහෙව් තත්ත්වයක් තිබියදී, පසු ගිය රජය මොකක්ද කළේ? ශ්‍රී ලංකාවේ ධජය යටතේ අපේ මුහුදු සීමාවට ඇවිල්ලා නීති විරෝධී අන්දමින් මත්ස්‍ය කර්මාන්තය කරන්නට චීන නැව් ගණනාවක් යෙදෙව්වා. චීන නැව් අටක් යෙදෙව්වා. ඇමතිවරයා ඒවා නතර කරන්න හැදුවා. නමුත් එතුමාට ඒවා නතර කරන්න ඉඩ දුන්නේ නැහැ. ඇයි? තමුන්නාන්සේලා සියලු දෙනාම දන්නවා, ඇමතිවරුන්ට වඩා මහා ඉහළ හස්තයක් පසු ගිය රජය කාලයේ ක්‍රියාත්මක වුණු බව. ඒ ඉහළ හස්තයේ ඕනෑ එපාකම් අනුව තමයි රටේ ප්‍රමුඛතා තීන්දු වුණේ. එදා තිබුණු ප්‍රමුඛතාව ධීවරයා සුරැකීම නොවෙයි. යුරෝපා හවුලට ලබා දෙන්න තිබුණු අපනයන ආරක්ෂා කිරීම නොවෙයි ඒ පාලකයින්ගේ වුවමනාව වුණේ. පාලකයින්ගේ අභිමතාර්ථය වුණේ එය නොවෙයි. පාලකයින්ට ඕනෑ වුණේ අරලියගහ දිව්‍ය ලෝකය හදා ගන්න; ජනාධිපති දිව්‍ය ලෝකය හදා ගන්න; සුර සැප විඳින්න. කියන්න ලජ්ජයි, ජනතාවට පෙරළා සහන ලබා දෙන්නට මැති ඇමතිවරුන්ට සහන ලබා දුන්නේ නැහැ. මැති ඇමතිවරුන්ට ප්‍රතිපාදන වෙන් කළේ නැහැ. මැති ඇමතිවරුන්ගේ මුදල් කප්පාදු කළා. ජනතා සේවාව වෙනුවෙන් මැති ඇමතිවරුන්ට තිබුණු වරදාන, වරප්‍රසාද සහමුලින් විනාශ කළා. අපේ ෆීලික්ස් පෙරේරා මන්ත්‍රීතුමාගේ මුහුණ දකින කොට ඒ බව පෙනෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් කොච්චර කලකිරීමෙන්ද එදා ඇමතිකම කළේ. ඇත්ත කථා කරන්න කෝ. ඒක තමයි ඇත්ත කථාව. [බාධා කිරීමක්] මම දන්නවා, ඔබතුමා මම කියන දෙයට එකඟ වෙන බව. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි, කවුරු මොන ඇමැතිකම් දැරුවත්, අදෘෂ්‍යමාන හස්තයක්, බලවේගයක් එතුමන්ලා පාලනය කළ බව.

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

මට කිසි කරදරයක් තිබුණේ නැහැ. අන්ධ අය, ගොළු අය, ආබාධිත අය හිටියේ. කිසි කරදරයක් තිබුණේ නැහැ. කොච්චර සැපද?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඇත්ත වශයෙන්ම පසු ගිය රජය පරාජය වෙන්න හේතුවත් අන්න ඒකයි. තමුන්නාන්සේලා හිතා ගෙන හිටියේ මේ රටේ

මුළුමහත් පුරවැසි පරපුරම අද ගොළු බිහිරි අය හැටියටයි. එහෙම හිතපු නිසා තමයි ඡන්දයත් පැරදුණේ. එහෙම තමයි පාලකයෝ හිතුවේ. ඒ අය හිතුවා, අරලියගහ දිව්‍ය ලෝකය හදන්න; ජනාධිපති දිව්‍ය ලෝකය හදන්න. මේ රටේ සුවහසක් ධීවර කම්කරුවා සුරකින්නට, ධීවර ප්‍රජාව රැක ගන්නට ඒ අය හිතුවේ නැහැ. ධීවර ප්‍රජාවගේ ශ්‍රමය සූරා කන්නට පසු ගිය රජය කටයුතු කළා. නමුත් ධීවරයාගේ අයිතිවාසිකම්, වරදාන, වරප්‍රසාද සුරක්ෂා කරන්න කටයුතු කළේ නැහැ. කරන්න හදාපු ඇමතිවරයාගේත් කකුලෙන් ඇද්දා. ඒක තමයි විසිහතර පැයේම පුන පුනා පසු ගිය රජය ක්‍රියාත්මක කළේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන් අපේ බහුදින යාත්‍රාවකට එක් වරක් මුහුදේ යන්නට අඩුම ගානේ රුපියල් ලක්ෂ තුන හතරක් වැය වනවා. රුපියල් ලක්ෂ තුන හතරක් වැය කරලා ඉතාම අවම තත්ත්වයේ පවතින තාක්ෂණය යොදා ගෙන තමයි ඒ අය මත්ස්‍ය කර්මාන්තය ක්‍රියාත්මක කරන්නේ. අද ඒ අයට සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? විදේශීය බහුදින යාත්‍රා සමඟ, විදේශීය ට්‍රෝලර් යාත්‍රා සමඟ, නවීන තාක්ෂණික උපාංග සමඟ, උපකරණ සමඟ පොර බදලා, තරග කරලා අපේ රටේ මුහුදු සීමාවේ මත්ස්‍ය සම්පත නෙළා ගැනීම අපේ රටේ ධීවරයින්ට අහිමි වන තත්ත්වයකයි අපි පසු ගිය කාලයේ හිටියේ. ඒක තමයි සත්‍යය. ඒක තමයි ඇත්ත කථාව. පසු ගිය රජය ධීවරයාගේ සුබසාධනය වෙනුවෙන් අබ මල් රේණුවක සේවාවක් ඉෂ්ට කළේ නැහැ. ඒක ෆිලික්ස් පෙරේරා මැතිතුමා හොඳාකාරවම දන්නවා. ඒ නිසා තමයි චීන යාත්‍රා අටකට, ඒ පිට රට යාත්‍රාවලට අපේ රටේ මුහුදු සීමාවට ඇවිල්ලා ඕනෑ තරම් මත්ස්‍ය කොල්ලකෑමේ නියැලෙන්නට, මුහුදු මං කොල්ලයක නියැලෙන්නට අවස්ථාව ලබා දුන්නේ. ඇත්ත වශයෙන්ම චීන රජයේ, චීන රටේ කොලනියක් හැටියටයි අපි කටයුතු කළේ. ඕනෑම චීන බෝට්ටුවකට, ට්‍රෝලර් යාත්‍රාවකට කිසිම අවසරයකින් තොරව ඇවිල්ලා, රිසි සේ, ඕනෑ තරම් මුහුදු කොල්ලකෑමේ නියැලිලා ආපසු යන්නට පුළුවන්. රජය නිහඬයි. මොකක්ද හේතුව? ධීවරයාගේ මත්ස්‍ය සම්පත මේ විධියට කොල්ලකන කොට නිහඬව සිටින්න චීනයෙන් රජයට කප්පමක් හම්බ වුණාද? පාලකයින්ට කප්පම් හම්බ වුණාද? පාලකයින්ට පගා හම්බ වුණාද? චීනයෙන් මොනවා හෝ සම්පතක් ලැබුණා ද? මා අහන්න කැමැතියි, විශේෂයෙන්ම රට පාලනය කරපු ඔබලාගෙන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ධීවරයාට සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? අනුන්ගේ පව් තමන්ගේ කර පිටින් යන තත්ත්වයක්. විශේෂයෙන්ම නීත්‍යානුකූල නොවන, වාර්තා නොවන සහ අවිධිමත් ධීවර ක්‍රමවේදය - illegal, unreported and unregulated fishing - නිසා අද යුරෝපා හවුල අපේ රටට සම්බාධක පමුණුවා තිබෙනවා. නමුත් එක දෙයක් මා කියන්න කැමැතියි. අපේ රටට ජාත්‍යන්තර වශයෙන් එල්ල වන හැම අභියෝගයකටම මුහුණ දෙන්නට ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේත්, ගරු රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමාගේත් රජය ලෑස්තියි. අපට පුළුවන් ජාත්‍යන්තර අභියෝගවලට මුහුණ දෙන්නට. ඒ නිසා තමයි අපේ ජාත්‍යන්තර සබඳතා උපයෝගි කරගෙන අපේ රටට විරුද්ධව ඉදිරිපත් කරන්නට ගිය මානව හිමිකම් වාර්තාව එක්සත් ජාතීන්ගේ සංවිධානය මාස හයකින් කල් දමා තිබෙන්නේ. අන්න අපි ලබාපු ජයග්‍රහණයක්. අන්න අපි ලබාපු ජාත්‍යන්තර ජයග්‍රහණයක්. අපි හුදෙකලා වෙලා සිටින්නේ නැතිව, ලෝකයත් සමඟ ගනුදෙනු කරලා රටේ භෞමික අඛණ්ඩතාව, දේශපාලන නිදහස සුරකිමින් අපේකම, ගමේකම, රටේකම, අපේ සංස්කෘතිය තුට්ටු දෙකට විකුණන්නේ නැතිව අපි අපේ රටේ ස්වෛරීත්වය ආරක්ෂා කර ගත්තු ආකාරය තමයි ඒ. එක්සත් ජාතීන්ගේ සංවිධානය මානව හිමිකම් සම්බන්ධයෙන් ගෙනෙන ලද රටට විරෝධී ඒ යෝජනාව, ඒ වාර්තාව ඉදිරිපත් කිරීම කල් දැමීම තුළින්ම පැහැදිලි වෙනවා අපේ රජයේ තිබෙන දක්ෂතාව, හැකියාව. අන්න ඒ නිසා ගරු ධීවර ඇමතිතුමාට විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමාගේත්, ගරු අගමැතිතුමාගේත් මඟ පෙන්වීම යටතේ යුරෝපා හවුලත් සමඟ ගනුදෙනු කරලා, කථා කරලා, සාකච්ඡා කරලා අපේ රටට මේ පනවා තිබෙන මේ සම්බාධක, මේ තහනම, ධීවරයා වනසන ධීවරයා විපතට පත් කරන මේ ආර්ථික සම්බාධක ඉවත් කර ගැනීමේ ඒ අනභිභවනීය මහා ක්‍රියාදාමය ජයග්‍රහණය කිරීමේ හැකියාව ගරු ධීවර ඇමතිතුමාට තිබෙනවාය කියන එක බොහොම සතුටින් ප්‍රකාශ කරන්නට ඕනෑ.

ගරු ෆිලික්ස් පෙරේරා මැතිතුමනි, මා මගේ කථාවේ සඳහන් කළා පසු ගිය රජය කාලයේ ධීවර ඇමතිතුමාගේ කකුලෙන් ඇදපු ආකාරය ගැන.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කාරණයත් ඔබතුමාට මතක් කරන්න කැමැතියි. එතුමා ඒ රජයේ ධීවර ඇමතිවරයා හැටියට කටයුතු කරන කොට 2006 දී ධීවරයාට ඉන්ධන සහනාධාරයක් ලබා දෙනවා කියා පොරොන්දු වුණා නේද? 2006 දී පොරොන්දු වුණු ඉන්ධන සහනාධාරය ක්‍රියාත්මක කළේ කවදාද? 2012 දී තමයි ඒක ක්‍රියාත්මක කළේ. මාස කීයද ක්‍රියාත්මක කළේ? මාස 8යි ක්‍රියාත්මක කළේ. මහ ලොකුවට පම්පෝරි ගැහුවා "දළ රළ ජය ගන්නා ධීවරයා සුරකිනවා" කියා. එහෙම කිය කියා වාර්තාවල විවිධ චින්තන මුද්‍රණය කරමින් මොනවාද කළේ? ඉන්ධන සහනාධාරය දෙනවා කියා දුන්නු ටිකත් කපා දැම්මා. මම දන්නේ නැහැ රාජිත සේනාරත්න ඇමතිතුමා තමන්ගේ ඇමතිකම කොහොම කළා ද කියා. එතුමා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා බොහොම අමාරුවෙන් තමයි පසු ගිය රජය වෙනුවෙන් කථා කළේ. ධීවරයාට ලබා දුන් ඉන්ධන සහනාධාරය සහමුලින් කප්පාදු කළා.

ඒ විතරක් නොවෙයි, ධීවර ක්ෂේත්‍රය පිළිබඳව උනන්දුවක් දක්වන හිටපු ෆිලික්ස් පෙරේරා ඇමතිතුමනි. ධීවර ජනතාව වෙනුවෙන් නිවාස 30,000ක් හදනවා කියා, ඒ සඳහා රුපියල් කෝටි 150ක් වෙන් කරනවා කියා මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් වුණා. දවසක් මම රාජිත සේනාරත්න ඇමතිතුමාගෙන් ඇහුවා, ඒ නිවාස 30,000 හදන්න කොපමණ මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවාද කියා. එවකට සිටි ඇමතිවරයා හැටියට එතුමාම කිව්වා, ශත 5ක්වත් වෙන් කරලා නැහැයි කියා. ඔන්න රාජිත සේනාරත්න ඇමතිතුමාගේ කකුලෙන් ඇද්ද අයුරු. එක පැත්තකින් ඉන්ධන සහනාධාරය ලබා දෙන්න එතුමාට ඉඩ දුන්නේ නැහැ. තවත් පැත්තකින් නිවාස වැඩසටහන ක්‍රියාත්මක කරන්න එතුමාට ඉඩ දුන්නේ නැහැ.

හිටපු ගරු ෆිලිකිස් පෙරේරා ඇමතිතුමනි, අපේ රටේ ධීවර ප්‍රජාව ඉමහත් විපතකට පත් වෙලා ඉන්දියාවේ අත් අඩංගුවට පත් වෙලා ඉන්න කොට ඒ ධීවරයෝ බේරා ගන්න කවුද ගියේ? ගරු රාජිත සේනාරත්න ඇමතිතුමා තමයි ගියේ. එතුමා ගිහිල්ලා ඉන්දියාවේ නිලධාරින් සමඟ සාකච්ඡා කර, රාජ්‍ය තාන්ත්‍රික සාකච්ඡා පවත්වලා, විදේශ ඇමතිවරයා සමඟ සහ රජයේ වෙනත් නිලධාරින් සමඟ සාකච්ඡා පවත්වලා ඒ ධීවරයින්,- [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රාජිත සේනාරත්න මැතිතුමා ඉන්දියාවට ගිහිල්ලා ඉන්දියාවේ විදේශ කටයුතු ඇමතිවරයාත් සමඟ සාකච්ඡා කර, රාජ්‍ය නිලධාරින් සමඟ සාකච්ඡා කර, ඉන්දියාවේ ධීවර ප්‍රජාවත් සමඟ සාකච්ඡා කර කොහොම හරි ධීවරයන් ටික බේරා ගත්තා; ධීවරයන්ගේ නිදහස දිනා ගත්තා. නිදහස දිනා ගෙන එතුමා ජයග්‍රාහී ලීලාවෙන් ගුවන් තොටුපළින් අපේ රටට එන කොට මොකක්ද අපේ රටේ විදේශ කටයුතු ඇමතිවරයා කළේ? එතුමා පුවත් පත් නිවේදනයක් දැම්මා, "මේක රාජිත සේනාරත්නගේ කෙරුවාව නොවෙයි, මේක විදේශ කටයුතු අමාත්‍යාංශයේ කෙරුවාව" කියා. විදේශ කටයුතු

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

අමාත්‍යාංශය තමයි ධීවරයෝ ටික බේරා ගත්තේ, විදේශ කටයුතු අමාත්‍යාංශය තමයි මැදිහත් වෙලා මේ මහා කටයුත්ත ක්‍රියාත්මක කළේ. එතැනදීත් රාජිත සේනාරත්න ඇමතිතුමාට වැඩ කරන්න දුන්නේ නැහැ. එතැනදීත් එතුමාට හිමි විය යුතු ගරුත්වය විදේශ කටයුතු ඇමතිතුමා උදුරා ගත්තා. මෙන්න රාජිත සේනාරත්න ඇමතිතුමාට ලබා දුන් කුඩම්මාගේ සැලකිල්ල. මෙන්න මේ කුඩම්මාගේ සැලකිල්ල රාජිත සේනාරත්න ඇමතිතුමා වෙත එල්ල කරන කොට ලොකුම මරු පහරට ලක් වුණේ එතුමා නොවෙයි, රටේ ධීවර ප්‍රජාවයි. ලක්ෂ ගණනින්, දසලක්ෂ ගණනින් අපේ රටට විදේශ විනිමය උපයන, අපේ රටට මත්ස්‍ය සම්පත සපයන අපේ රටේ අහිංසක අසරණ සුවහසක් ධීවර ප්‍රජාව තමයි පසු ගිය රජයේ කුහකකම, පසු ගිය රජයේ උද්දච්චකම, පසු ගිය රජයේ කුහක ප්‍රතිපත්ති නිසා විපතට පත් වුණේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම යුරෝපා හවුල පනවා තිබෙන සම්බාධක ඉවත් කර ගැනීමේ මහා මෙහෙයුමේ එක් පියවරක් තමයි අද අපේ රජය ක්‍රියාත්මක කරන්නේ. මේක කෙටි කාලීන ගමනක් නොවෙයි. පසු ගිය කාල වකවානුව පුරාවටම අපේ රට පාලනය කරපු පසු ගිය රජය තමන්ගේ යුතුකම, තමන්ගේ වගකීම ධීවර ප්‍රජාව වෙනුවෙන් ඉෂ්ට කර නැහැ. එසේ නොකිරීම තුළ සහ මේ ඇති වී තිබෙන විශ්වාසය භංග වීමේ වට පිටාව තුළ අමාරු ගමනක් යන්න අපට සිද්ධ වෙලා තිබෙනවා.

අපේ වර්තමාන ස්වදේශ කටයුතු හා ධීවර අමාත්‍ය ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමා, හිටපු ධීවර අමාත්‍ය ගරු රාජිත සේනාරත්න මැතිතුමා, විදේශ කටයුතු අමාත්‍ය මංගල සමරවීර ඇමතිතුමා, ඒ වාගේම ගරු අගමැතිතුමාගේත්, අතිගරු ජනාධිපතිතුමාගේත් නායකත්වය, මෙහෙයවීම, මහ පෙන්වීම තුළ අපි ඉතාම සතුටින් ප්‍රකාශ කරනවා, යුරෝපා හවුල පනවා තිබෙන මේ ආර්ථික සම්බාධක -මත්ස්‍ය සම්බාධක- ඉතාම කෙටි කාලයක් තුළ ඉවත් කර ගැනීමේ ඉඩ ප්‍රස්ථාව එළඹිලා තිබෙනවාය කියා. ඉක්මනින්ම, කෙටි කාලයක් තුළ මේ රටේ ධීවර ප්‍රජාව වෙනුවෙන් මේ සම්බාධක ඉවත් කරලීමේ ක්‍රියාවලිය ජයග්‍රහණය කරවමින්, මේ රටේ අසහනයට, විපතට පත් වෙලා සිටින අපේ ධීවර ජනතාව මුදවා ගන්නට වර්තමාන ධීවර අමාත්‍යතුමාට ධෛර්ය, ශක්තිය, වාසනාව, ප්‍රඥාව, දැනුම- මිනුම පහළ වේවා කියා ප්‍රාර්ථනා කරමින්, මගේ ඉදිරිපත් කිරීම අවසන් කරනවා.

[අ.භා. 2.47]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම ධීවර ක්ෂේත්‍රයට අදාළ වැදගත් නීතියක් -පනත් කෙටුම්පතක්- සම්මත කරන මේ අවස්ථාවේදී ඒ ක්ෂේත්‍රය පිළිබඳවත්, එහි ගැටලු පිළිබඳවත් මෙම ගරු සභාවේ අවධානය යොමු කරවන්නට කැමැතියි.

විශේෂයෙන්ම අපේ රටේ ලක්ෂ හයකට ආසන්න පවුල් ප්‍රමාණයක් සෘජුවම තමන්ගේ රැකියාව බවට ධීවර ක්ෂේත්‍රය පත් කර ගෙන තිබෙන බව අපි දන්නවා. පුද්ගලයින් හැටියට ගත්තොත් එය ලක්ෂ 26කට ආසන්න ප්‍රමාණයක් වෙනවා. අපේ රටේ ජනගහනයෙන් අටෙන් එකක් තමන්ගේ ප්‍රධාන ආදායම, තමන්ගේ ප්‍රධාන වෘත්තිය බවට ධීවර ක්ෂේත්‍රය පත් කර ගෙන තිබෙනවා. රටක් හැටියට, පාර්ලිමේන්තුවක් හැටියට, ආණ්ඩුවක් හැටියට ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමේදී; ඔවුන්ගේ ඇති වී තිබෙන ගැටලුවලට විසඳුම් ලබා දීමේදී ධීවර ක්ෂේත්‍රය කිසි සේත්ම අමතක කොට අත්හැර යන්න පුළුවන් ක්ෂේත්‍රයක් නොවෙයි. එයින් යැපෙන ජනගහනය පමණක් නොවෙයි, අපේ රටේ ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමේදී, ඕනෑම රටක් තමන්ට තිබෙන සම්පත් ප්‍රභවයන් පිළිබඳව දැක්මක් සහ අධ්‍යයනයක් කළ යුතුව තිබෙනවා. එහිදීත්, අපේ රටේ ජාතික ආර්ථිකය නැංවීමේදී, විශේෂයෙන්ම ධීවර ක්ෂේත්‍රය -ධීවර ප්‍රභවය- ඉතාම වැදගත් ක්ෂේත්‍රයක් බවට පත් වන එක වළක්වන්න බැහැ. ඒ නිසා පැති ගණනාවකින් මෙම ක්ෂේත්‍රයත්, මෙම ක්ෂේත්‍රයේ ජීවත්වන ජනතාවත්, ඔවුන්ගේ වෘත්තියත් අතිශය වැදගත්කමක් උසුලන බවත්, කිසි සේත්ම අපට අත් හළ නොහැකි තත්ත්වයක් බවත් අපි විශ්වාස කරනවා. නමුත් මෙම ක්ෂේත්‍රයත්, මෙම ක්ෂේත්‍රයේ ජීවත් වන ජනතාවත් ඔවුන්ගේ වෘත්තීන් පවත්වා ගෙන යාමේදී ගැටලු මතු වී තිබෙනවා. එය ප්‍රධාන ක්ෂේත්‍රයක් ලෙස සලකා පැවති ආණ්ඩු කටයුතු කළා දැයි සැක හිතෙන තරමට එම ගැටලු උත්සන්න වෙලා තිබෙනවා. විශේෂයෙන්ම අපි දන්නවා, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් නිසි ක්‍රියා මාර්ග පැහැර හැරීම හේතු කොට ගෙන, ශ්‍රී ලංකාවේ මත්ස්‍ය නිෂ්පාදන යුරෝපා සංගමය විසින් තහනම් කරනු ලැබූ බව. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය -එවකට පැවති රජය- ඉහත තහනම සම්බන්ධයෙන් සෘජුවම වග කියන්නට ඕනෑ. එවැනි සැලකිය යුතු කාලයක් මඟ හරින්නට, එවැනි සැලකිය යුතු කාලයක් අතපසුවීමක් ලෙස කිසිසේත්ම සලකන්න බැහැ. එය හිතා මතාම කරන ලද වැඩ පිළිවෙළක ප්‍රතිඵලයක් යැයි සැක හිතෙන තරමට සාධක තිබෙනවා. 2010 වසරේදී -මීට අවුරුදු පහකට පෙර- යුරෝපා සංගමය විසින් ප්‍රථම වරට, නීති විරෝධී ධීවර කටයුතු නැවැත්වීමට ශ්‍රී ලංකා රජය දැනුවත් කළා. 2010 වසරේ සිට 2012 වසරේ නොවැම්බර් දක්වා අවුරුදු දෙකක කාලය තුළ ඉහත ගැටලු විසඳා ගැනීමට අවශ්‍ය නිසි පියවර ශ්‍රී ලංකා රජය විසින් ගත්තේ නැහැ. ඒ නිසා 2012 වසරේ නොවැම්බර් මාසයේ 15වැනි දින නිල වශයෙන් අනතුරු අඟවා, කහ කාඩ්පත නිකුත් කළා.

අනතුරුව 2012 වසරේ නොවැම්බර් මස 15වන දින පැවැති සාකච්ඡාවේදී ශ්‍රී ලංකාව අනුගමනය කළ යුතු කරුණු අටක් යුරෝපා සංගමය පෙන්වා දුන්නා. මෙම කරුණු අට සම්පූර්ණ කිරීමට ඔවුන් 2012 නොවැම්බර් මාසයේ සිට වසරක කාලයක් ලබා දුන්නා. අවුරුද්දක්, යළි මාස තුනක්, නැවතත් කාලය ලබා දෙමින් 2014 සැප්තැම්බර් මාසය දක්වා -කීප වතාවක්- මෙම කාලය ශ්‍රී ලංකා රජය දීර්ඝ කර ගත්තා. "මෙම කාර්යය කරන්නම්, කාලය දීර්ඝ කර දෙන්න" කියලා අපමයි ඉල්ලුවේ. නමුත්, ඒ කිසිදු දීර්ඝ කිරීමක් ඇතුළේ මෙම කාරණා සම්පූර්ණ කරන්න අප අසමත් වුණා. 2014 සැප්තැම්බර් මාසයේ මෙම කාලය යළිත් දීර්ඝ කළ අතර, එතැන් සිට මාස තුනක් ඇතුළත මෙම කරුණු සම්පූර්ණ කරන ලෙස නැවත දැනුම් දුන්නා. එසේ කිරීමට නොහැකි වුවහොත් ශ්‍රී ලංකාවේ මත්ස්‍ය නිෂ්පාදනය මිලදී ගැනීම නතර කරන බව ඔවුන් දැනුම් දුන්නා. 2015 ජනවාරි මාසයේ 15වැනි දා සිට මිලදී ගැනීම නතර කිරීම ක්‍රියාත්මක වෙන්න පටන් ගත්තා.

බලන්න, 2010 වසරේ සිට අනතුරු අඟවලා, 2012 දී කහ කාඩ් පත නිකුත් කරලා, නැවත අවුරුද්දක් ඇතුළත යෝජනා අටක් ඉදිරිපත් කරලා, 2014 වසරේ සැප්තැම්බර් දක්වා කාලය දීලා, නැවතත් මාස තුනකින් කාලය දීර්ඝ කළත්, මේ කිසිදු කාලයක මේ රටේ ධීවර ක්ෂේත්‍රයත්, ධීවර ජනතාවත් පිළිබඳව සලකලා මේ ගැටලුව විසඳා දෙන්න අසමත් වී තිබෙනවා. එය හලාවත ජීවත් වන ඇන්ටන් මහත්මයා හෝ, දික්වැල්ලේ ජීවත් වන සුමනවීර හෝ, ත්‍රිකුණාමලයේ ජීවත් වන නඩරාජා හෝ,

මන්නාරමේ ජීවත් වන මුස්ලිම් සහෝදරයෙක් හෝ කළ යුතු කාර්යයක් නොවෙයි. ඒ අය මේ රටේ සාමාන්‍ය පුරවැසියන්. බලයට පත් වුණු රාජ්‍යයක්, බලය ගන්නා ලද ආණ්ඩුවක් ඒ පුරවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරනවා වෙනුවට, එය මුළුමනින්ම අත්හැරලා තිබෙනවා. ඒකට වන්දි ගෙවන්න වන්නේ කාටද? ඇමතිවරයාට හෝ පැවතුණු ආණ්ඩුවට හෝ ධීවර දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට හෝ නොවෙයි. අපේ රටේ ධීවර ජනතාවටත්, ධීවර ක්ෂේත්‍රයටත් තමයි ඒකට වන්දි ගෙවන්න සිද්ධ වුණේ. එය කිසිසේත්ම අපට පිළිගත නොහැකි, පිළිගත යුතු නැති තත්ත්වයක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේක සාමාන්‍ය ජනතාවට ගිහිල්ලා විසඳා ගන්න පුළුවන් ගැටලුවක් නොවෙයි; සාමාන්‍ය ජනතාව පාරට බැහැලා, උද්ඝෝෂණය කරලා, පෝස්ටරයක් ගහලා, දිවා රෑ දෙකේම මුහුදු ගිහින් -ඒ වාගේ මහන්සි වෙලා- විසඳා ගන්න පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි. මෙය රාජ්‍ය තාන්ත්‍රික වැඩකටයුත්තක්. එය කිරීම මුළුමනින්ම ආණ්ඩුවේ වගකීමක්. එය පැහැර හැරීමේ වගකීම මුළුමනින්ම ආණ්ඩුව භාරගත යුතුව තිබෙනවා. ඒ නිසා අපේ රටේ ධීවර ක්ෂේත්‍රයත්, ධීවර ජනතාවත් මෙම අසීරුතාවට, මෙම දුෂ්කරතාවට, මෙම පීඩනයට පත් කිරීම ගැන පැවැති රජය මුළුමනින්ම වග කියන්න ඕනෑ. දැන් කවර දේවල් කිව්වත්, එය කිසි සේත්ම අත් හරින්න බැරි කරුණක්.

එතුමන්ලා අපට කලින් කිව්වේ මොනවාද? "ජනාධිපතිතුමා ධීවර ඇමති වෙලා හිටියේ; තංගල්ල ධීවර ප්‍රදේශයේ ජනතාවත් එක්ක සුහදත්වයෙන් තමයි ජීවත් වෙමින් සිටියේ; එතුමා ධීවර ඇමති කාලයේ තමයි ගොඩක් දේවල් කළේ" කියලායි. එහෙව් ජනාධිපතිවරයෙක් හිටියා. නමුත්, මොකක්ද මේ ක්ෂේත්‍රයට කළේ? රාජ්‍ය තාන්ත්‍රික වශයෙන් මැදිහත් වෙලා මේ ක්ෂේත්‍රයේ කළ යුතු කාර්ය භාරය කිසි සේත්ම කරන්නේ නැතිව අත්හැරලා තිබුණා. ඒ තත්ත්වය එම ජනතාවත්, එම ක්ෂේත්‍රයත් විශාල වශයෙන් කඩා වැටීමට ලක් වෙන්න හේතු වුණා.

විදේශීය යාත්‍රාවලින් විවිධ රටවල මුහුදු සීමාවලින් අල්ලා ගනු ලබන කෙන්දා මසුන් එකතු කර තවත් විදේශීය විශාල මව් යාත්‍රා 11කින් පමණ අපේ රටට ගේනවා. වෙන යාත්‍රා මඟින් ඒ මසුන් අල්ලලා මව් යාත්‍රා 11කින් අපේ රටට ගේනවා. මෙවැනි මව් යාත්‍රාවලින් මාළු ගොඩ බෑමට අවසර නොමැතිද? ඒවාට අවසර තිබෙන්නේ කොහේද? ඒවා කියන්න ඕනෑ. කවර හෝ විදේශීය සමාගමක්, විදේශීය නෞකාවක් මාළු අල්ලාගෙන අපේ රටට ගේනවා නම් මේ රටේ ජනතාව -අඩුම තරමේ ධීවර ජනතාවවත්- දැන ගන්න ඕනෑ මේ මේ නැව්වලට අප බලපත්‍ර ලබා දී තිබෙනවාය කියලා. එහෙන් නැවක් එන කොට ධීවර ජනතාව මන්ත්‍රීවරයාට, නැත්නම් නිලධාරියෙකුට, ධීවර සමිතිවලට කථා කරනවා, මෙන්න නැවක් ඇවිල්ලා කියලා. ඒ නිසා මේ රටේ ජනතාව දැනුවත් කරන්න ඕනෑ, "මෙන්න මේ නෞකාවලට අප අවසර ලබා දීලා තිබෙනවා, අවසර ලබා දීමෙන් අපට ලැබෙන ප්‍රතිලාභ මේවායි, ඒවායින් අපට ලැබෙන මුදල මෙච්චරයි, අපට එන ලාභය මෙච්චරයි" කියලා. එහෙම නැත්නම් මේකෙන් අපට අවාසිද කියන කාරණා ගැන මේ රටේ ජනතාව දැන ගන්න ඕනෑ. මේක ධීවර අමාත්‍යාංශයේ හෝ නිලධාරින්ගේ කාර්ය භාරයක් නොවෙයි. ඒ ක්ෂේත්‍රය අයිති මේ රටේ ජනතාවටයි. එයින් පීඩාවට පත් වන්නේ මේ රටේ ධීවර ජනයායි. එය මේ රටේ ජාතික නිෂ්පාදන ක්ෂේත්‍රයක්. ඒ නිසා මේ යාත්‍රා එකොළහ මොන රටවල ඒවාද, ඒ කාර්යය සඳහා ඔවුන්ට අවසර දීලා තිබෙනවාද කියන කාරණා ගැන ඒ ජනතාව දැනගත යුතුව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙවැනි එක් යාත්‍රාවක් සතියකට වරක් අප වරායන්වලට පැමිණෙන බවට තොරතුරු ලැබී තිබෙනවා. එමඟින් මාළු කිලෝග්‍රෑම් 120,000ක් පමණ ගොඩ බානවා. අපේ ධීවර ක්ෂේත්‍රයට මේ සිද්ධ වන්නේ මොකක්ද?

මෙම නෞකා මෙරටට ගෙන්වනු ලබන්නේ Tropic Frozen Foods Limited, Global Sea Foods (Pvt.) Limited, Jay Sea Foods Processing (Pvt.) Limited යන සමාගම්. ඔවුන් මෙසේ මිල දී ගත් මසුන් දේශීය ධීවර යාත්‍රාවලින් අල්ලා ගත් මසුන් බව සටහන් කර යුරෝපා රටවලට අපනයනය කළා. ඒක ඇත්තයි. ඒක තමයි මෙතැන තිබුණු වැඩේ. ඒ සමාගම වෙන වෙන තැන්වල හොරෙන් මාළු අල්ලනවා. ඒවා මේ සමාගම්වලින් මිල දී ගෙන ඒවා මේ රටේ දේශීය ධීවර ප්‍රජාවගෙන් මිල දී ගත්තාය කියා වාර්තා හැදුවා. දේශීය ධීවර යාත්‍රාවල logbookවල, අවශ්‍ය අපනයන ලියකියවිලිවල සටහන් කර තිබෙනවා. එහෙමයි මේ වැඩේ කළේ. එය නීති විරෝධි ක්‍රියාවක්. එම නීති විරෝධි කටයුත්ත ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ නිලධාරින් දැනුවත්ව කර ගෙන ගියා. මේක දන්නේ නැති දෙයක් නොවෙයි. කොපමණ මාළු ප්‍රමාණයක්ද ලැබෙන්නේ කියා දැන ගන්න පුළුවන්. මුහුදු යන්නේ කොපමණ ප්‍රමාණයක්ද, අපට තිබෙන ධාරිතාව කොපමණද, අපට බහුදින යාත්‍රා කොපමණ තිබෙනවාද, අපට එක්දින යාත්‍රා කොපමණ තිබෙනවාද, වෙනත් ක්‍රමවලින් නිෂ්පාදනය කරන මාළු කොපමණද කියලා මේ රට දන්නවා. අඩුම තරමේ ආසන්න 10,000ටවත් තොරතුරු තිබෙන්න ඕනෑ, ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සතුව. නමුත් මෙතරම් තොග ගණන් මාළු එන කොට ඒ ගොල්ලෝ දැන ගන්න ඕනෑ, මේවා නීති විරෝධි මාළුයි කියලා. හංගලා කරපු දේවල් නොවෙයි. දැනුවත්වම විවිධ යටිකුට්ටු වැඩ හරහා කොමිස් අත්පත් කර ගැනීම, විශාල සමාගම්වල අයිතිය අත්පත් කර ගැනීම, විශාල ධනස්කන්ධයක් එක් රැස් කර ගැනීම ඒ පිටුපස තිබුණා.

යුරෝපා සංගමය නීති විරෝධි කටයුතු සම්බන්ධයෙන් අනතුරු හඟවා තිබියදී -ඒ ගොල්ලෝ 2010 දී අපට අනතුරු හඟවා තිබුණා- එය නොසලකා අන්තර්ජාතික සමුද්‍ර නීති හිතා මතා උල්ලංඝනය කරමින් ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව චීන නෞකා අටකට ශ්‍රී ලංකා ධජය යටතේ ධීවර කටයුතුවල නියැලීමට අවසර දී තිබෙනවා. යුරෝපා සංගමයේ තහනමට ප්‍රධානම හේතුව මෙම නෞකා අටයි. මෙම නෞකා අටට අවසර දීමට හේතුව මොකක්ද කියලා කියන්න ඕනෑ. ඒ තුළින් අපට ලැබුණු ප්‍රතිලාභ මොනවාද? ඕනෑ නම් මා කියන්නම් ඒ නෞකා අටෙන් අපට ලැබුණු මුදල කොපමණද කියලා. එය රටට කිසිදු ප්‍රතිලාභයක් නැති එකක්. විශේෂ නෞකා අටක් තෝරා ගත්තේ කොහොමද? ඒ සඳහා ටෙන්ඩර් කැඳවීම් කරනු ලැබුවාද? ඒ අය විසින් ඉල්ලා ගනු ලැබුවාද? වෙන වෙන අය ඉල්ලුවාද? මේ නැව් අටක් පමණක් තෝරා ගනු ලැබුවේ කොහොමද? ඒ වාගේම VMS නමැති උපකරණය අපේ යාත්‍රාවලට සවි කරන්න කියන කාරණය යුරෝපා සංගමයේ තවත් ප්‍රධාන ඉල්ලීමක් හැටියට තිබුණා. පසු ගිය වසර කිහිපය තුළ රටට ලැබිය යුතුව තිබූ විදේශ විනිමය විශාල ප්‍රමාණයක් අප ඉහත කරුණු ඉටු නොකිරීම නිසා මේ වන විට අපට අහිමි වෙලා තිබෙනවා. තවද, මෙම කර්මාන්තය තුළින් සෘජු රැකියාවල නිරත වී සිටින ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් විශාල පිරිසක් දුෂ්කරතාවට පත් වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. 2015 වර්ෂයට අදාළව Blue Ocean Fishery (Pvt.) Limited නමැති චීන සමාගමට අයත් මෙම නැව් අටට ධීවර කර්මාන්තයේ යෙදීමට බලපත්‍ර ලබා දී නොමැති අතර මොවුන් ශ්‍රී ලංකා රජයේ අණ නොතකා නීති විරෝධිව මසුන් මැරීම සඳහා මේ වෙලාවටත් පිටත් වෙලා තිබෙනවා. 2015 වර්ෂය සඳහා ඔවුන්ට බලපත්‍ර ලබා දීලා නැහැ. නමුත් මේ නැව් අට නැවත පිටත් වෙලා තිබෙනවා. ඒ සඳහා වහාම නීතිමය පියවර අනුගමනය කළ හැකි තත්ත්වයක් තිබිය අමාත්‍යාංශය නිහඬව ඉන්නේ ඇයි?

[ගරු අනුර දිසානායක මහතා]

2015 වර්ෂය සඳහා බලපත්‍ර නැහැ; බලපත්‍ර අලුත් කරලා නැහැ, දැන් නැව් අට පිටත් වෙලා තිබෙනවා. ඒ පිළිබඳව පරීක්ෂණයක් කරන්න. මා ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, ඒ පිළිබඳව පරීක්ෂණයක් කරනවාද කියලා. ඒවා යට ගහන්න නම් ඒ පිළිබඳව ප්‍රබල දේශපාලන හස්තයන්ගේ මැදිහත් වීම් තිබෙන්න ඕනෑ. එම නිසා ගරු ඇමතිතුමා ඒ පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ. මේ වන විට යුරෝපා සංගමය මසුන් මිල දී ගැනීම තහනම් කර ඇති අතර ඇමෙරිකාව, කැනඩාව, ජපානය වැනි රටවල් කිහිපයක් Tuna A+ වර්ගයේ මසුන් පමණක් අපෙන් මිල දී ගත් මෙම නීති විරෝධී නෞකා මඟින් මේ මොහොතේද අප රට තුළ තිබෙන කුඩා වෙළෙඳ පොළටද මසුන් ගෙන එනවා. එම නිසා අනිවාර්යයෙන් මේ කටයුත්ත වැළැක්වූවේ නැත්නම් එම මිල දී ගැනීමත් නතර වීමේ ඉඩ කඩ තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. කෙන්දා මසුන් කිලෝග්‍රෑම් ලක්ෂ දෙකහමාරකට අධික ප්‍රමාණයක් රැගෙන 2015 පෙබරවාරි මාසයේ 13වන දා ගම්පහ දිස්ත්‍රික්කයේ දික්ඕවිට වරායට නීති විරෝධී නෞකා දෙකක් පැමිණියා. මෙම මසුන් අල්ලා ගෙන ඇත්තේ නීති විරෝධී ක්‍රමයකටයි. ඒ බව ධීවරයින් ප්‍රකාශ කරනවා. ඒ ගැන ඔබතුමා දන්නවා. පෙබරවාරි 15වන දා මේ නැව් දෙක ඇවිල්ලා විශාල මාළු තොගයක් බෑවා. එහෙම සිද්ධ වන්නේ කොහොමද? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙය ඔරුවක් නොවෙයි; එක්දින යාත්‍රාවක් නොවෙයි. මෙය වරායකට එනවා. නැවක් වරායකට එනවා. ඒ නැවෙන් කිලෝග්‍රෑම් ලක්ෂ දෙකහමාරකට වඩා අධික මාළු ප්‍රමාණයක් ගොඩ බානවා. නමුත් ඒ පිළිබඳව තවමත් නිසි අධ්‍යයනයක් කරලා ඒවාට අවශ්‍ය වන මැදිහත්වීම නොකරන බව තමයි පෙන්නුම් කරමින් තිබෙන්නේ.

2015 පෙබරවාරි මස මුලදී ධීවර අමාත්‍යවරයා, ධීවර රාජ්‍ය අමාත්‍යවරයා සහ ධීවරයින් අතර සාකච්ඡාවක් පැවැත් වුණා. ඒ සාකච්ඡාවේදී මෙම යාත්‍රා තහනම් කරන බවට ලේකම්වරයා ප්‍රකාශයක් කළා. ඒක හොඳයි. හැබැයි ප්‍රකාශ කරලා විතරක් වැඩක් නැහැ. අපි ප්‍රකාශ රාශියක් අහලා තිබෙනවා, ගරු ඇමතිතුමනි. "අපි මේවා තහනම් කරනවා. අපි මේවාට කමිටු පත් කරනවා. අපි මේවා අධ්‍යයනය කරනවා. මේවා කිසි සේත්ම සිද්ධ වන්න දෙන්නේ නැහැ"යි කියන ප්‍රකාශ අපි අහලා තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේදීත්, පාර්ලිමේන්තුවෙන් පිටතදීත් ධීවර ජනතාවගෙනුත්, නිලධාරින්ගෙනුත්, ඇමතිවරුන්ගෙනුත් මෙවැනි ප්‍රකාශ ඕනෑ තරම් අපි අහලා තිබෙනවා. අවශ්‍ය වන්නේ ප්‍රකාශ නොවෙයි.

පෙබරවාරි මාසයේ 15වන දා සාකච්ඡාවේදී ඒ පිළිබඳව ක්‍රියා මාර්ග ගන්නා බවට ලේකම්වරයා දැනුම් දුන්නා. ඒ සාකච්ඡාවට ඔබතුමාත් හිටියා. නමුත් මොකක්ද වෙලා තිබෙන්නේ? කිසි ක්‍රියා මාර්ගයක් අරගෙන නැහැ. සාකච්ඡාව එතැනම නතර වෙනවා. පෙබරවාරි 15 දා සිට කාලය ප්‍රමාණවත් නොවෙන්න පුළුවන්. නමුත්, මේක අපේ රටේ ආර්ථිකයේ ප්‍රශ්නයක්. මේක මේ රටේ ධීවර ජනතාවගේ ප්‍රශ්නයක්. ඒ නිසා වහාම ඒ පිළිබඳව ක්‍රියා මාර්ග ගත යුතුව තිබෙනවා.

තවද, මෙම Blue Ocean Fishery (Pvt.) Limited සමාගමේ නැව් 8ට අමතරව වෙනත් විදේශීය නැව්වලින් මෙරටට නීති විරෝධී මසුන් ගෙන ඒම තහනම් කරන බවට අමාත්‍යවරයා පොරොන්දුවක් දුන්නා. එදා ඔබතුමා කිව්වා, මේ නැව් 8 විතරක් නොවෙයි, එන අනෙක් නැව්ද තහනම් කරනවා කියලා. ධීවර ජනතාව ඒ සාකච්ඡාවෙන් පසුව ටිකක් සතුටින් ගියා. නමුත් ඒ පොරොන්දු දුන්නාට වැඩක් නැහැ. ඒ දේ සිද්ධ වෙමින් තිබෙනවා. මේ මුහුද අවට හැම තැනම ධීවරයන් ගැවසෙනවා; ඔවුන්ගේ බෝට්ටු තිබෙනවා. මේක හොරෙන් කරන්න පුළුවන් වැඩක් නොවෙයි. කවුරු හරි කල්පනා කරනවා නම්, නැවකට අවසර දෙන්නේ නැහැ, හොරෙන් මාළු බා ගන්නට ඉඩ කඩ දෙනවා කියලා, එහෙම කරන්න බැහැ. මේ ධීවර ජනතාව නිරන්තරයෙන් මුහුදත් සමඟ හැප්පි හැප්පී, මුහුද සමඟයි ඉන්නේ. ඒ ජනතාව මේ තත්ත්වය දන්නවා. ඒ නිසා පොරොන්දුවලින් පමණක් මේ ප්‍රශ්නය බේරන්න බැහැ. ගරු ඇමතිතුමනි, මා ඒ පිළිබඳව තමුන්නාන්සේගේ අවධානය යොමු කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම VMS එකක් රුපියල් ලක්ෂ 4ක් වටිනවා. ගරු ඇමතිතුමනි, මාස 5ක් ඇතුළත යාත්‍රා 1,500කට මෙම උපකරණ සවි කර දෙන බවට ඔබතුමා පොරොන්දු වෙලා තිබෙනවා. ඒකේ ප්‍රතිඵලය මොකක්ද දන්නේ නැහැ? මම දැන ගන්න කැමැතියි ඒ කටයුතු කොහොමද ඉදිරියට යන්නේ කියලා. ගරු ජෝශප් මයිකල් පෙරේරා ඇමතිතුමාගේ කථාවේදී ඒ පිළිබඳව අදහස් දක්වන්න. ඔබතුමා කිව්වා බෝට්ටු 1,500කට මේ උපකරණ සවි කරන්න සූදානම් කියලා. මේ වන විට ඒ සඳහා ටෙන්ඩර් කැඳවලා තිබෙනවාද, ඒ යන්ත්‍ර මිල දී ගෙන තිබෙනවාද, එසේ නැත්නම් කලින් ගත්ත ඒවා තිබෙනවාද, ඒ උපකරණ තෝරා ගෙන තිබෙනවාද? එහෙම නැත්නම් මේ මාස 5 ඇතුළත මේ කටයුත්ත කරන්න බැහැ. අප්‍රේල් මාසයේ පාර්ලිමේන්තුව විසුරුවා හැරියාම ජූනි මාසය වන තුරු ඡන්ද. ඒ මාස තුන තුළ මොකුත් කරන්න ලැබෙන්නේ නැහැ. ඒ නිසා ඔබතුමාට මේ කටයුත්ත කරනවා නම් කරන්න තිබෙන්නේ අප්‍රේල් මාසයේ 23වන දාට පෙර තමයි. අප්‍රේල් මාසයේ 23වන දාට පෙර කරන්න නම් මේ වන විට මිල දී ගැනීමේ කටයුතු ආරම්භ කරලා තිබෙන්න ඕනෑ. ඒ සඳහා ධීවර යාත්‍රා හඳුනා ගැනීම කරලා තිබෙන්න ඕනෑ. ඒ සඳහා අවශ්‍ය වන අනෙකුත් මිලදී ගැනීමේ ක්‍රියා පටිපාටි අනුගමනය කරලා තිබෙන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, මට ලැබී තිබෙන තොරතුරු අනුව නම් මේ මාස 5 තුළ මෙය අවසන් කරන්න නොහැකි වෙනවා. ඒ වාගේම ඒ ඡන්දය කෙරෙන මාස 3 විසින් මේ කටයුත්ත ඇත අනාගතයට තල්ලු කරන එක වළක්වන්නටත් බැහැ. ඔබතුමා මේ VMS යන්ත්‍ර ධීවර යාත්‍රා 1,500කට සවි කරන බවට එකඟ වුණා. ඒ සඳහා ඉක්මන්, වේගවත් ක්‍රියා මාර්ගයක් අනුගමනය කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මෙම Blue Ocean Fishery (Pvt.) Limited සමාගම යටතේ ලැබී ඇති ආදායම බලන්න. ඔබතුමාත් දන්නවා රුපියල් ලක්ෂ 56යි, නැව් 8කින් ලැබිලා තිබෙන්නේ කියලා. ත්‍රී වීලර් එකක් හන්දියක ගාල් කරගෙන දිව්වත් ඊට වඩා හම්බ වෙනවා. ත්‍රී වීලර් එකක් හන්දියක ගාල් කරගෙන දිව්වා නම් ඊට වඩා මුදලක් හොයා ගන්න පුළුවන්. මේ සමාගමට අපේ ධීවර වරායේ පහසුකම් දෙනවා, නීති විරෝධීව මාළු බාන්න දෙනවා, ඒ හරහා අපේ ධීවර ක්ෂේත්‍රය අනතුරට පත් කරලා තිබෙනවා, අපේ ධීවර ජනතාව අනතුරට පත් කරලා තිබෙනවා. මේ ඔක්කොම කරලාත් රුපියල් ලක්ෂ 56යි හම්බ වෙලා තිබෙන්නේ. ඔබතුමා දන්නවා ඒ බව. මොකක්ද අපට මේකෙන් ලැබෙන ප්‍රතිඵලය? ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරනවා. ඒ නිසා මා ඉල්ලා සිටින්නේ වර්තමානයේදී මේ ක්ෂේත්‍රයේ මතු වී ඇති ගැටලු පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙසයි.

අවසාන වශයෙන් මම කියන්නේ මෙම කාරණයයි. ගරු ජෝශප් මයිකල් පෙරේරා ඇමතිතුමනි, අපේ ධීවර ජනතාව සංස්කෘති මය වශයෙන් තව ඉහළ තලයකට ගෙනෙන්න ඕනෑ. ඔවුන්ගේ අධ්‍යාපනය, නිවාස සහ අනෙකුත් පහසුකම් ගැන සෑහීමකට පත් වෙන්න පුළුවන් ප්‍රමාණයකින් සමහර ස්ථාන තිබුණත්, බොහෝ ප්‍රදේශවල හොඳ තත්ත්වයක් නොවෙයි තිබෙන්නේ.

ඔබතුමා දන්නවා, වාරකන් කාලයට හලාවත ප්‍රදේශයේ ධීවරයන් නැඟෙනහිර මුහුදට යන බව. දැන් ධීවරයන් අතර ගැටුමක් ඇති වෙලා තිබෙනවා. ඒක හොඳ ගැටුමක් නොවෙයි. මොකද, මේ පැත්තෙන් යන්නේ සිංහල ධීවරයන්. ඒ පැත්තේ සිටිනවා, මුස්ලිම් ධීවරයන්. ඒ නිසා මෙය සිංහල, මුස්ලිම් ජනයා අතර ගැටුමක් දක්වා වර්ධනය වීමේ අනතුර පවා තිබෙනවා. මොකද, දැන් ඒ අයගේ බෝට්ටු විනාශ කරනවා. ඒ බෝට්ටුවලට පහර දෙමින් තිබෙනවා. ධීවරයන්ට පහර දෙමින් තිබෙනවා. සිංහල අයට වෙනම මුහුදක්, මුස්ලිම් අයට වෙනම මුහුදක්, දෙමළ අයට වෙනම මුහුදක් කියලා කොතැනකවත් තිබෙන්න බැහැ. මේක සිංහල, දෙමළ, මුස්ලිම් කියන මේ රටේ ජීවත් වෙන සියලු පුරවැසියන්ගේ මුහුද. මේ පැත්තේ වාරකන් කාලයට මේ පැත්තේ ධීවරයන් මාළු අල්ලන්න ඒ පැත්තට යනවා. හැබැයි, ඒ පැත්තේ මුස්ලිම් ජනතාව මේ පැත්තෙන් යන සිංහල ජනතාවට පහර දෙනවා නම් එය කිසිසේත් සාධාරණ නැහැ. ඒ නිසා කරුණාකර එය දිගු ගැටුමක් බවට පත් වෙන්න ඉඩ දෙන්න එපා. එය රටේම විශාල ගිනි ගැනීමක් බවට පත් වෙන්න ඉඩ තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ නිසා ඒ කාරණාව කෙරෙහි මා ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. විශේෂයෙන් මේ පළාත්වලින් ඒ පළාත්වලට මුහුදු රක්ෂාව කරන්න යන ජනතාවගේ රැකියාව සුරක්ෂිත කරන ලෙසත්, ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු කරන ලෙසත් ගරු ජෝශප් මයිකල් පෙරේරා ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 3.05]

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதார மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)

(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health and Indigenous Medicine)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, යුරෝපා සංගමයේ තහනම ගැන මම කරුණු කිහිපයක් කියන්න ඕනෑ. මම ගරු ජෝශප් මයිකල් පෙරේරා අමාත්‍යතුමාට ස්තූතිවන්ත වෙනවා, VMS නොමිලයේ ලබා දීම ගැන. ගිය වර අපි සූදානම් වුණේ ඒවා ණයට ලබා දෙන්න. පසු ගිය රජයේ තිබුණු ආර්ථික තත්ත්වයේ හැටියට ඊට වඩා දෙයක් කරන්න බැරි වුණා. නමුත් ඒවා නොමිලේ ලබා දෙනවා නම් ඉතාම වැදගත්. මේ VMS සවි කිරීමේ කටයුත්ත අපි කරන්න පටන් ගත්තේ යුරෝපා සංගමයේ වුවමනාව නිසා නොවෙයි. මම 2009 දී මේ පිළිබඳව සොයා බලලා, 2010 වන විටම VMS සවි කිරීමේ වැඩසටහන ආරම්භ කළා.

ඊට පසු කාලයක තමයි යුරෝපා සංගමය VMS එක ගැන අපට කථා කළේ. නමුත් VMS එක ගැන අවබෝධයක් තිබෙන කිසිම කෙනෙක් ලංකාවේ හිටියේ නැහැ. VMS එක හඳුන්වා දෙන්න පෙර, ලංකාවට උචිත හොඳම satellite එක මොකක්ද කියලා හොයා ගන්න ඕනෑ. Satellites වර්ග කිහිපයක් තිබෙනවා. Inmarsat කියලා ඒකක් තිබෙනවා. [බාධා කිරීමක්] නැහැ එහෙම නොවෙයි, satellites වර්ග තිබෙනවා. Argos කියලා එකක් තිබෙනවා; Iridium කියලා එකක් තිබෙනවා. ඒවායින් කොයි එකද අපට හොඳ කියලා තෝරා ගන්න අපේ විශේෂඥයන්ට කාලයක් ගියා. ඒවා තෝරා ගන්න Technical Evaluation Committee දැම්මේ අපේ අමාත්‍යාංශයෙන් නොවෙයි. අපේ අමාත්‍යාංශයේ ඒ සම්බන්ධ දැනුම තිබෙන අය හිටියේ නැහැ. ඒ නිසා කැබිනට් මණ්ඩලය මඟින් මම Procurement Committee එකක් පත්කර ගත්තා. ඒකට නාවික හමුදාව, මොරටුව විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරු, TRC එක, භාණ්ඩාගාරයේ අය හිටියා. ඒ අයත් අධ්‍යයනය කරමින් බොහොම හෙමින් තමයි මේ කටයුතු කළේ. මොකද, ඒ ගොල්ලන්ටත් මේ ගැන හරි අවබෝධයක් තිබුණේ නැහැ. පිට රට ගිය වෙලාවක කොයි එකද හොඳම කියලා මමත් හොයා ගත්තා. මොකද, යම්කිසි අනතුරක් වුණාම ඒ අනතුර ගැන ඉක්මනට දැනුම් දුන්නේ නැත්නම් ධීවරයෝ අපට චෝදනා කරන්නට පටන් ගන්නවා. ඒ විධියට ඒ සියල්ල සොයා බලලා අඩුම මුදලට හොඳම එක තෝරා ගන්නට Procurement Committee එකට මාස 7ක් විතර ගියා. එහෙම තෝරා ගත්තාට පස්සේ කැබිනට් මණ්ඩලයෙන් appoint කළා, Cabinet Appointed Negotiating Committee එකක්. වර්තමාන භාණ්ඩාගාර ලේකම් තමයි එහි සභාපතිවරයා හැටියට හිටියේ. Cabinet Appointed Negotiating Committee එක අවුරුදු දෙකකට කිට්ටු කාලයක් පවත්වාගෙන ගියා. මම වරින්වර ඒ අය ගෙන්වලා පුළුවන් ඉක්මනට මේ කටයුත්ත ඉවර කරන්න කිව්වාට, ඒ අයත් තමන්ගේ ඇඟ බේරාගෙන තමයි කටයුතු කළේ. මොකද, හරි අවබෝධයක් තිබෙන කවුරුවත් හිටියේ නැති නිසා තීන්දු ගැනීමේ ප්‍රශ්නයක් තිබුණා. නමුත් ගියවර මේ ප්‍රශ්න ආපු වෙලාවේ ඒ අධ්‍යක්ෂ ජනරාල්වරිය හමු වීමට මම ම ගියා. 2013 අප්‍රේල් මාසයේ 24 වැනි දා Minute එකේ මෙසේ සඳහන් වුණා: "Ms. Lowri Evans, Director-General, appreciated the action taken by the Hon. Minister on IUU control measures and the plan of introducing VMS to over 3,000 vessels thereby undertaking an effective control". මට ස්තූති කරලා 2013 අප්‍රේල් මාසයේ 29 Ms. Lowri Evans ලියමනක් එව්වා. ඊට පස්සේ ජූනි 12 වෙනි දා යුරෝපා සංගමයේ ධීවර කටයුතු පිළිබඳ කොමසාරිස්වරිය වන Ms. Damanaki මෙන්න මේ ප්‍රකාශය කළා, යුරෝපා සංගමය ඉදිරියේ. "During these last months, we were able to convince some countries of moving to an effective fisheries control system. In particular, Fiji, Togo, Sri Lanka and Panama have made credible progress". ඉතා ප්‍රශංසාත්මක දියුණුවක් ලංකාව ඇතුළු මේ රටවල් ජූනි මාසය වෙන කොට ලබා ගෙන තිබෙනවා කියලා තමයි එතුමිය කිව්වේ. 2013 ඔක්තෝබර් මාසයේ 18 වැනි දා අපේ තානාපතිවරයාට, Cesar Deban විසින් ලියමනක් එවලා තිබෙනවා. ඔහු තමයි තාක්ෂණික අංශයේ ප්‍රධානියා. ඔහුගේ ලියුමෙන් ඔහු කිව්වා, "I recall that the Commission recognized the positive cooperation and progress made by Sri Lanka in the fight against IUU fishing…" කියලා. මේ පිළිබඳව ඉතා විශාල ප්‍රගතියක් ලංකාව අත් කර ගෙන තිබෙනවා කියලා එතුමාගේ ලියමනෙන් දැන්නුවා. ඊට පස්සේ 2013 ඔක්තෝබර් මාසයේ 28 වෙනි දා නැවත Lowri Evans මහත්මිය මට ලියමනක් එව්වා. ඒකෙන් කිව්වා, "From recent correspondence between our services, I am pleased to see that Sri Lanka is making an effort to remedy the situation highlighted in the list of necessary actions to be taken sent to you in June this year" කියලා.

ඔක්තෝබර් මාසයේ 13 වන තුරුත් ප්‍රශංසාත්මක වශයෙන් කිව්වේ, අපි යවන වාර්තා ඉතා හොඳයි කියලායි. ඇත්තටම ඊට පස්සේ තමයි මෙහි වෙනසක් ඇති වුණේ. මම නම් හිතනවා මේක තාක්ෂණික කරුණක් වාගේම දේශපාලනික කරුණක් කියලා. ඒක දේශපාලනික කරුණක් කියන්නේ මොකද? ඔවුන්ගේ අවසාන Report එකේ හැම තැනම, පරිච්ඡේදයෙන් පරිච්ඡේදයේ කියනවා, "This is not political" කියලා. ගිහිල්ලා බලන්න, ඇමතිතුමනි. අපි කවදාවත් කිව්වේ නැහැ "political" කියලා. මේ රජයත් එක්ක තිබුණ ප්‍රශ්නය එක්සත් ජාතීන්ගේ සංවිධානය යටතේ තිබෙන FAO එක ඇතුළු මේ ආයතන මඟින් ප්‍රකාශ වුණා. අපි වැරැද්දක් කරනවා නම්, අපේ වැරැදි හොයන්න තිබෙන ආයතනය තමයි ඉන්දියන් සාගර ටූනා කොමිසම. ඒ කොමිසම අද වන තුරු අපට කිසිම වැරැද්දක් කියලා නැහැ.

අපේ යාත්‍රා තිබෙනවා. IUU - Illegal, Unreported and Unregulated - vessels අතර චීනයෙන් හෝ වෙනත් රටකින්

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

හෝ එන එක යාත්‍රාවක්වත් නැහැ. අපි හැම මාසයකම ලැයිස්තුවක් යවන්න ඕනෑ, ඒ ඒ රටවල හසු වූ යාත්‍රා මෙන්න මේවායි කියලා. ඒ ලැයිස්තුවේ තිබෙන සියල්ල ලාංකික යාත්‍රායි. ඒකට හේතුවක් තිබෙනවා. ඒ හේතුව තමයි, ලාංකික යාත්‍රාවලට ගැඹුරු මුහුදේත්, ජාත්‍යන්තර මුහුදේත් මත්ස්‍ය සම්පත අල්ලාගන්න තිබෙන නොහැකියාව. ඒ නිසා ඔවුන් නියමිත මුහුදු සීමාව පසු කර තවත් වෙරළාසන්න මුහුදකට යනවා මාළු බාන්න. ලොකු නෞකා කවදාවත් එය කරන්නේ නැහැ. මොකද, ගැඹුරු මුහුදේ මත්ස්‍ය සම්පත හොඳින් නෙළාගන්න ඔවුන්ට පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2014 ඔක්තෝබර් මාසයේ 14වන දා -ඒ කියන්නේ, කලින් ආණ්ඩුවේ අවසාන කාලයේ- මේ තහංචිය එන කොට ඉන්දියානු සාගර ටූනා කොමිසමේ විධායක ලේකම්තුමා වන Randolph Payet මට මෙසේ ලියා එව්වා:

"I am very sad to hear about the decision of the EU. This is an extremely challenging moment for your developing and growing fishing industry"; "...developing and growing fishing industry..."

එහෙමයි එතුමා කිව්වේ. එතුමා තවදුරටත් මෙසේ කියනවා:

"Please let me know how you think the IOTC Secretariat may be able to assist within the next three months and beyond, so that this decision may be reversed". "දියුණු වෙන මේ industry එක ආරක්ෂා කරගැනීම සඳහා කොයි විධියටද, අපි ආධාර උපකාර කරන්නේ?" කියා එතුමා ඇහුවා. මෙන්න මේක තමයි තත්ත්වය. එහෙම නම් ඕනෑම කෙනකුට තේරුම් ගන්න පුළුවන් තත්ත්වය මොකක්ද කියන එක. මම ගරු මංගල සමරවීර ඇමතිතුමාටත් කිව්වා, "මේක දේශපාලනික කරුණක්. ඔබතුමා ගිහින් දේශපාලන වශයෙන් කොතරම් කථා කළත් ඒ අය එය පිළිගන්නේ නැහැ. එකඟ වෙනවා තමයි. නමුත් මෙහි තාක්ෂණික පැත්ත හරි ගස්සන්න ඕනෑ. ඒක ඉදිරිපත් කළාම තමයි අර දේශපාලන කරුණු ටික වෙනස් වෙන්නේ." කියලා. ඒක අද ඒ විධියටම සිදු වෙලා තිබෙනවා. ඇයි, චීන යාත්‍රා ලංකාවට ගෙනාවේ? මීට වඩා අනතුරක් තිබුණා, 2010 දී. යුරෝපා සංගමයේ බලපෑම අපනයන මාළු ටිකට විතරයි.

2010 දී යුරෝපා සංගමය ඉන්දියානු සාගර ටූනා කොමිසමට යෝජනාවක් ගෙනාවා, ඉන්දියානු සාගරයට quota ක්‍රමය ගෙනෙන්න. එය මේ වන කොට පැසිෆික් සාගරය, අත්ලන්තික් සාගරය, අන්තර් ඇමෙරිකානු සාගරය කියන සියල්ලට ගෙනැවිත් අවසානයි. ජාත්‍යන්තර මුහුදේ අල්ලන මාළු ප්‍රමාණය සම්බන්ධයෙන් ඒ අය quota එකක් දෙනවා. කලින් මාළු මෙට්‍රික් ටොන් 500ක් අල්ලපු එක මෙට්‍රික් ටොන් 5කට සීමා කළොත් ඒ අනුව හැම රාජ්‍යයටම අයිති quota එක අඩු කරනවා. Quota එක සියයෙන් 1ක් නම් ඒ සියයෙන් 1 තමයි අපට අදාළව තිබෙන්නේ. ඒ quota ක්‍රමය අනුව 2010 දී අපට අයිති වෙලා තිබුණේ මාළු මෙට්‍රික් ටොන් 362යි. මාළු මෙට්‍රික් ටොන් 362ක් ගෙනෙන්න නම් අපට යාත්‍රා 15ක් තිබුණාම ඇති. නමුත් ඒ වන විට අපට ජාත්‍යන්තර මුහුදේ ධීවර කටයුතු කරන බහු දින යාත්‍රා 3,000ක් තිබුණා. ඒ තුන්දාහෙන් 15ක් මාළු අල්ලන්න ගියාට පස්සේ ඉතිරි අය මොකද කරන්නේ? ඒ සියලු දෙනාගේ ධීවර කටයුතු විනාශ වෙලා යනවා. ඒ වෙලාවේ මම වෙරළාසන්න සියලු රටවල ධීවර ඇමතිවරුන් ගෙන්නලා දවස් දෙකක් මෙහේ ඉඳගෙන එයට විරුද්ධව ක්‍රියා කළා. හැමෝම ඒ වැඩේට ආසයි; නමුත් බයයි. ඒ මොකද? ඒ, යුරෝපා වෙළඳ පොළ නිසායි. අන්තිමට මම කිව්වා, "තමුන්නාන්සේලා සහයෝගය දෙනවා නම් මම යෝජනාව ගෙනෙනවා." කියලා. සියලු දෙනා සහයෝගය දුන්නා. ඉතිහාසයේ පළමුවැනි වරට ඉන්දියානු සාගර කලාපීය ටූනා කොමිසමේදී අපි යුරෝපා සංගමයේ යෝජනාවක් පරාජය කළා. ඒ නිසා ඔවුන් මා සමඟ ටිකක් හිත හොඳ නැති වුණා. මාස හයකට පස්සේ යුරෝපා සංගමයේ කොමසාරිස්වරයා ඇවිත් කිව්වා, මට බය හින්දයි මෙය කළේ කියා අනෙක් ඇමතිවරුන් කියනවා කියලා. මම කිව්වා, "මට මොකටද බය වෙන්නේ? ඒ අයගේ ඇමතිකම් නැති කරන්න මට බැහැ. මේක බොරු කථාවක්." කියලා. නමුත් මට මගේ උපදේශකවරයා කිව්වා, මේ යන විධියට ඉදිරියේදී එක් එක්කෙනාව බාගන්නවා, ඒ නිසා ඉන්දියාවත් එක්ක හොඳ ස්ථාවරයකට එන්න කියලා. ඒ නිසා මම ඉතාම දැඩි ස්ථාවරයක් වෙනුවෙන් ඉන්දියාවේ සහයෝගය මට ලබා ගත්තා. ඒ quota එක එදා පරාජය කළේ නැත්නම් අපේ අපනයන ධීවර කර්මාන්තය අවසානයි. අපනයන ධීවර කර්මාන්තය කඩා වැටුණාම එය වෙළඳ පොළට බලපානවා. අපි දැන ගත්තා, මේක හැම දාම නවත්වන්න බැහැ කියලා. අනෙක් හැම සාගරයකටම quota ක්‍රමය තිබෙනවා නම් අපේ රටටත් ඒ ක්‍රමය එනවා. ඉදිරියේදී තවත් අවුරුදු දෙක තුනකින් ඒ ක්‍රමය එන නිසා මම වහාම ලෑස්ති වෙන්න පටන්ගත්තා, එයට මුහුණ දෙන්න. ඒ නිසා මම ඉස්සර වෙලාම ආරාධනා කළේ සවුදි අරාබියේ අල් ෆයිඩා සමාගමටයි. ඊට පස්සේ අපේ සියලු embassies හරහා, සියලු මාර්ග හරහා ප්‍රකාශන මඟින් හැම තැනකින්ම ඉල්ලුවා, පුළුවන් තරම් මත්ස්‍ය නැව් එවන්න කියලා. මොකද, ලංකාවට ගොඩ බාන මත්ස්‍ය ප්‍රමාණය වැඩි කර ගත්තොත් අපේ quota එක වැඩි වෙනවා. තායිලන්තය කරන්නේ මොකක්ද? තායිලන්තයේ විදේශ නෞකා දහස් ගණනක් ක්‍රියාත්මක වෙනවා. අපේ රටේ වාගේ කොන්දේසි කිසිවක් ඒ අයට නැහැ. ඒ නිසා බොහෝ දෙනා එහේට යනවා. අප ආරාධනා කළාට මෙහේ එන්නේ නැහැ. මොකද මම කියනවා, සියයට 10ක් ධීවර සංස්ථාවට දෙන්න ඕනෑ, මේ මේ tax ගෙවන්න තිබෙනවා කියලා. කොන්දේසි නැති හින්දා තමයි තායිලන්තයේ මත්ස්‍ය අපනයන වෙළඳාම ඇමෙරිකානු ඩොලර් බිලියන 6ක් ලෙස තිබෙන්නේ. නමුත් අපේ රටේ තවම තිබෙන්නේ ඇමෙරිකානු ඩොලර් මිලියන 250යි.

මේ ඩොලර් මිලියන 250ට වඩා අපට අවශ්‍ය වන්නේ මේ කර්මාන්තය බේරා ගැනීම නම් අපි මේ quota ක්‍රමයට මුහුණ දෙන්න ඕනෑ. අපි ඉල්ලුවාම ලංකාවට ආවේ ජපන් යාත්‍රා දෙකයි, චීන යාත්‍රා අටයි. චීනයෙන් යාත්‍රා විස්සක් ගේනවා කිව්වාට විස්සක් ලැබුණේ නැහැ. නොයෙකුත් තහංචි, කරදර තිබෙන නිසා ඒ ගොල්ලන් එන්නේ නැහැ. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා, අපට ලැබිලා තිබෙන ආදායම රුපියල් ලක්ෂ 56යි කියලා. එහෙම නොවෙයි. මගේ ළඟ බිල්පත් තිබෙනවා. 2013 ජූලිවල ඉඳලා 2014 පෙබරවාරි මාසය වන තෙක් වූ මාස 8ට මේ සමාගම්වලින් අපේ රටට ලැබුණු ආදායම -income එක- විතරක් රුපියල් මිලියන 839.75ක් වනවා. නමුත්, අපේ රටේ පද්ධතියත් එක්ක මේ කටයුතු කරන්න ඒ ගොල්ලන්ට බොහොම අමාරුයි.

අනෙක් කරුණ, ඒ ගොල්ලන්ගේ කිසි යාත්‍රාවකට අපේ ආරක්ෂක සේවකයන් කිසි කෙනකු අපි දුන්නේ නැහැ. අපේ හැම යාත්‍රාවකම ආරක්ෂක අමාත්‍යාංශයෙන්, රක්නා ලංකා ආරක්ෂක සේවයේ සේවකයින් දෙදෙනෙකු යැව්වා. මොකද, ඒ යාත්‍රා මත්ස්‍ය කර්මාන්තයේ යෙදුණේ සෝමාලියාව කිට්ටුවයි. සෝමාලියානු මං කොල්ලකරුවන්ගෙන් බේරෙන්න තමයි හැම යාත්‍රාවකටම රක්නා ලංකා ආරක්ෂක සේවයෙන් සේවකයින් දෙදෙනෙකු දුන්නේ.

අනෙක් කරුණ, අපේ මුහුදු තීරයේ තිබෙන්නේ වර්ග කිලෝමීටර් 517,000ක් බව මතක තියාගන්න. නමුත්, ජාත්‍යන්තර මුහුද තිබෙනවා, කිලෝමීටර් 75ක්. ඒ කියන්නේ අපේ මුහුදු තීරය

වාගේ එකසියපණස් ගුණයක්. කාට හෝ ජාත්‍යන්තර මුහුදේ ධීවර කර්මාන්තයේ යෙදෙන්න යාත්‍රා දුන්නාට එය අපේ ධීවර කර්මාන්තයට කිසිම ආකාරයකින් බලපාන්නේ නැහැ. එය ඒ තරම් විශාල මුහුදක්. මොකද, ඒ ගොල්ලන් යන්නේ ඉන්දුනීසියාව පැත්තට, මැලේසියාව පැත්තට, සෝමාලියාව පැත්තට. සෝමාලියාව ආශ්‍රිත මුහුදේ විශාල මත්ස්‍ය සම්පතක් තිබෙන හින්දා තමයි ඒ ගොල්ලන් රක්නා ලංකා ආරක්ෂක සමාගමේ සේවකයන් සම්බන්ධ කර ගත්තේ.

මම දැනුත් ගරු ඇමතිතුමාට මේ කරුණ කියනවා. යුරෝපා සංගමය කියනවා නම්, මේ ලොකු යාත්‍රා යුරෝපා සංගමයට එපා කියලා මම ඉස්සෙල්ලාම කියනවා, තමන්ගේ යාත්‍රා ටික අයින් කර ගන්න කියලා. මේ VMS ක්‍රමය එනකොටම මට ඉන්දියාවෙන් මොකක්ද කිව්වේ? ඉන්දියාව මේකට විරුද්ධ වුණා. මා සමඟ සාකච්ඡා කිරීමේදී මම කිව්වා, "ඔය ගොල්ලන්ට මේකේ ප්‍රශ්නයක් නැහැ. මේ ප්‍රශ්නය තිබෙන්නේ ප්‍රංශ සහ ස්පාඤ්ඤ නෞකාවලට විතරයි." කියලා. ඉන්දියානු සාගරයේ මත්ස්‍ය සම්පතෙන් සියයට 48ක් යුරෝපා සංගමයට අයත් නෞකාවලින් අල්ලා ගන්නවා. එය මතක තබා ගන්න. මේක තමයි යථාර්ථය. අපට මේ යථාර්ථයට මුහුණ දෙන්න වනවා. ඒක තමයි ඒ ගොල්ලන් quota ගන්න හදන්නේ. Quota එක ගත්තාම ඒ ගොල්ලන්ට සියයට 48ක් හම්බ වනවා. ඉතිරි සියයට 52 අනික් සියලු රටවලට පොඩ්ඩ පොඩ්ඩ හම්බ වනවා. අපට කියනවා නම්, ලොකු යාත්‍රා ගේන්න එපා කියලා ඒක වැරදියි. ඒ ගොල්ලන්ගේ යාත්‍රාවල capacity එක මෙට්‍රික් ටොන් 1,000 සිට මෙට්‍රික් ටොන් 2,000 දක්වා වනවා. එදා විදේශ කටයුතු ඇමතිතුමා කිව්වා, ලොකු යාත්‍රා ඉවත් කරන්න කියලා. මම කිව්වා, "එහෙම නම්, ඊට ඉස්සෙල්ලා ඒ ගොල්ලන්ගේ ලොකු යාත්‍රා ටික අයින් කරන්න." කියලා. ඒ ගොල්ලන්ගේ එක යාත්‍රාවක ධාරිතාව මෙට්‍රික් ටොන් 1,000යි, 2,000යි. ඔවුන් අපේ මත්ස්‍ය සම්පතෙන් සියයට 48ක් අරගෙන යනවා. යුරෝපා සංගමයත් එක්ක අපි ගනුදෙනු කරන්න ඕනෑ මේ තත්ත්වය හොඳට බලාගෙනයි. නමුත්, ඒ ගොල්ලන්ගේ අභිප්‍රායයනුත් අපි දැනගන්න ඕනෑ. මේ ක්‍රමයට ගිහිල්ලා අපි ඔක්කෝම නැවැත්තුවොත්, quota එක ඉස්සරහට ගෙනියන්න අපට බැරි වුණොත් මොකද වෙන්නේ? ඉන්දියානු සාගර කොමිසමට එන අවුරුද්ද හෝ ලබන අවුරුද්ද වනකොට quota ක්‍රමය එනවා. ඒ quota ක්‍රමය එනකොට අන්තිමට අපට වැඩිම වුණොත් මෙට්‍රික් ටොන් 400ක්, 500ක් හම්බ වෙයි. එතැනදි අපේ මුළු කර්මාන්තයම ඉවරයි. අපේ බහුදින යාත්‍රා සේවය සියල්ලම ඉවරයි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Minister, you have one more minute.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මෙන්න මේ තත්ත්වය හොඳට අවබෝධ කර ගන්න. මොකද, ගරු ඇමතිතුමාට ඉදිරියේදී ඒ ප්‍රශ්නය එයි.

අනෙක් කරුණ, ශ්‍රී ලංකා ධජය යටතේ තමයි ඒ ගොල්ලන් යන්න ඕනෑ කියලා අපි තීන්දුවක් ගත්තා. මොකද, 1991 ඉඳලා තායිවානයේ, ඉන්දුනීසියාවේ ඔක්කෝම යාත්‍රා ආවේ ඒ ගොල්ලන්ගේ ධජය යටතේයි. එතකොට ඔවුන් වැරැද්දක් කළොත්, ඒ ගොල්ලන්ට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරන්න ඒ රටවලට කියන්න ඕනෑ. ශ්‍රී ලංකා ධජය ගැහුවාට පස්සේ ඒ ගොල්ලන් යම් වැරැද්දක් කළොත්, එය නවත්වන්න අපට පුළුවන්. ගරු ඇමතිතුමනි, ඒ අනුව ඕනෑම වෙලාවක ඒවා cancel කරන්න දැන් ඔබතුමාට පුළුවන්. මොකද, දැන් ඒ තීන්දුව ගන්න අපට පුළුවන්. හැබැයි, ඉන්දුනීසියානු, තායිවාන් යාත්‍රා cancel කරන්න අපට බැහැ. ඒ රජයට කියලා, ඒ රජය ලවා ඒ නියෝගය නිකුත් කරන්න ඕනෑ. ඒක අද ඉන්දියානු සාගර ටූනා කොමිසමේ කොන්දේසියක්. යම් රටකට අයත් යාත්‍රා වෙනත් රටකට අයත් මුහුදේ යාත්‍රා කරනවා නම්, ඒ රටේ flag එක යටතේ යන්න ඕනෑ. මොකද, ඒ යාත්‍රා ඒ රටේ නීති පද්ධතියට යටත් වන්න ඕනෑ.

අලුත් ධීවර ඇමතිතුමා වන අපේ ජෝශප් මයිකල් පෙරේරා ඇමතිතුමාට මේ කටයුත්ත අලුත් දෙයක් නොවෙයි. එතුමා කලිනුත් මේ විෂය භාරව සිටියා. එතුමාට ජාත්‍යන්තර පැත්තෙන් මේ සම්බන්ධයෙන් balance එකකින් මේ කටයුතු කර ගෙන යන්න පුළුවන්. ඒ වාගේම අපේ රටේ අනාගතය, ධීවර කර්මාන්තයේ අනාගතය බලා ඒ කටයුතු ඔබතුමා හරියට ඉෂ්ට කරන්න. ඉතිරි කටයුතු පිළිබඳව ප්‍රශ්නයක් නැහැ. අපේ රටේ මත්ස්‍ය නිෂ්පාදනය, අපනයනය, පරිභෝජනය කියන සියලු දේවල් දැන් වැඩි වෙලා තිබෙනවා. බොහොම ස්තුතියි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Felix Perera. Before he starts, will an Hon. Member propose the Hon. R. Yogarajan to take the Chair?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
I propose that the Hon. R.Yogarajan do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ආර්. යෝගරාජන් මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஆர். யோகராஜன் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. R. YOGARAJAN *took the Chair.*

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Yes, Hon. Felix Perera, you may start your speech.

[අ.භා. 3.21]

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ධීවර විෂය ගැන කථා කරද්දී අපි විශේෂයෙන්ම කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. අපේ ආර්ථික අනන්‍ය කලාපය රට වටේටම වර්ග කිලෝ මීටර් 1,750ක වෙරළ තීරයක් සමඟ ගොඩ බිම වාගේ අට ගුණයක මුහුදක් අපට තිබෙනවා. මේ සාගරය අපට ලොකු සම්පතක්. ඒකට අපි කියන්නේ "සාගර සම්පත" කියලායි. සංචාරක ව්‍යාපාරයට වාගේම රටේ නොයෙකුත් දේවලට විශාල රුකුලක් මේ මුහුදෙන් සහ මුහුදු වෙරළෙන් අපට ලැබෙනවා. ඒ නිසා අපි සාගර සම්පත ආරක්ෂා කර ගන්න ඕනෑ.

[ගරු ෆිලික්ස් පෙරේරා මහතා]

විශේෂයෙන්ම අපේ රටේ ධීවරයන් විසිහය ලක්ෂයක් ඉන්නවා. අද ඒ ධීවරයන් එක්ක කථා කරද්දී ඒ ගොල්ලන් කියන්නේ "අද අපි අඳුරට වැටිලා" කියලායි. ඒ තත්ත්වයට හේතුවක් තිබෙනවා. හේතුව තමයි විදේශ යාත්‍රාවලින් කරන ජාතික අපරාධය. මම ධීවර ඇමතිවරයාව ඉන්න කොට කිසිම දවසක අපේ ලංකාවේ කොඩිය ඒ අයට දුන්නේ නැහැ. ඒක අපට දෙන්න බැහැ. මොකද, ඒ අය අපේ ලංකාවේ කොඩිය දමා ගෙන අපේ මුහුදු සීමාව තුළ මාළු අල්ලා ගත්තොත් අපට මාළු නැතිව යනවා. සාමාන්‍යයෙන් ධීවර යාත්‍රාවක් ටොන් තුනේ ඉඳලා ටොන් පහ දක්වා තමයි මාළු අල්ලන්නේ. නමුත් මේ ධීවර නැවක් කොච්චර මාළු අල්ලනවා ද? ඒ වාගේ හතළිස් ගුණයක් අල්ලනවා; පණස් ගුණයක් මාළු අල්ලනවා.

ඒ අය විශාල යාත්‍රාවකින් ඇවිල්ලා අල්ලන ක්‍රමය බලන්න. අපේ විදේශ කටයුතු ඇමතිතුමාත් මේ අවස්ථාවේ මේ ගරු සභාවේ ඉන්න එක හොඳයි. ඔබතුමාටත් ඒ කාරණය කියන්න ඕනෑ. ඒ ක්‍රමයට කියන්නේ "Purse Seine System" කියලායි. මීටර් 20ක් යටින් tent එකක් දමලා ඒකට බෝයාවක් දමලා තාක්ෂණය සවි කරලා ඒක පාවෙන්න දෙනවා. ඊට පස්සේ වටේටම security දමලා ඒක ආරක්ෂා කරනවා. ඒ ගොල්ලන් ඒ system එක උපයෝගී කර ගෙන සිටින හැම මාළුවාම අල්ලනවා. මොකද, කොටයක් දැම්මත් එතැනට මාළු එකතු වෙනවා. මේ ඔක්කොම මාළු අල්ලා ගෙන මෙහාට ගේන්නේ නැහැ. මුහුද වටේම ඒගොල්ලන්ගේ බහුදින යාත්‍රා තිබෙනවා. එතැනින්ම පටවලා කොටසක් අරිනවා. අපි මේ මාළු සම්පත ඉතිරි කර ගන්න ඕනෑ. උදාහරණයක් වශයෙන් මාලදිවයින බලන්න. මාලදිවයිනේ බිලි පිත්තෙන් තමයි මාළු අල්ලන්නේ. පුංචි මාළු කන්න තමයි ලොකු මාළු ටික එන්නේ. මේ පුංචි මාළු ටිකත් එක්කම විනාශ කළාම අපට මුහුදක් ඉතිරි වන්නේ කොහොමද?

මේ විසිහය ලක්ෂයක් වන ධීවරයන් වෙනුවෙන් අපේ විදේශ ප්‍රතිපත්තියත් නිවැරදිව ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒක නො කළොත් සිද්ධ වන්නේ ධීවරයා විපතේ වැටෙන එකයි කියන එක ප්‍රකාශ කරන්න ඕනෑ. ඒ වාගේම කවුරු මොනවා කිව්වත් මම යන්න ඉස්සර වෙලා මේ VMS - Vessel Monitoring System - එක ගැන කැබිනට් පත්‍රිකාව දැම්මා. අනතුරු ඇඟවීමක් කළා. ඒ ගොල්ලන් කිව්වා, ඉක්මනට කරන්න කියලා. අපි කාලයක් ඉල්ලා ගත්තා. කැබිනට් පත්‍රිකාව දමලා අපි අත් හදා බැලීමක් කළා. Vessel Monitoring Systems දෙකක් දමලා සතියක් බැලුවා. කොළඹ, මෝදර ඉඳලා යන හැටි බලා ගෙන හිටියා. ඒක නිසා මේක කළේ නැහැයි කියලා කාටවත් කියන්න බැහැ. මේක නිර්මාණයක් කියන්න බැහැ. කාලාන්තරයක් තිස්සේ තිබුණු ප්‍රශ්නයක්. Indian Ocean Tuna Commission එක කියන්නේ මාළු අල්ලන්න එපා කියලා නොවෙයි, වැරදි විධියට මාළු අල්ලන්න එපා කියලායි. ඒ වාගේම අපි ඒ කාලයේ radar system එකක් දමන්න හැදුවා. Radar system එකක් දමලා ලංකාවේ මාළු අල්ලන එක නොවෙයි, විදේශ යාත්‍රා මෙරටට එන එක නතර කරන්නේ කොහොමද කියන එක බලන්න ඕනෑ. මොකද, සමහර මුහුදු තිබෙනවා, දැන් මාළු නැහැ. ඉන්දියන් සාගරයේ විතරයි මාළු ටිකක් තිබෙන්නේ. ඒ ටිකත් විදේශිකයන්ට අල්ලා ගෙන යන්න දුන්නොත් මොකක්ද වෙන්නේ? ඒ ටික අල්ලා ගැනීම සඳහා අපි උත්සාහ කරන්න ඕනෑ. අපි ඉන්න කොට ලංකාවේ බහුදින ධීවර යාත්‍රා සඳහා සියයට 8ක පොලී අනුපාතයක් යටතේ බැංකු අයිරාවක් දුන්නා. දැන් තමුන්නාන්සේලා ඒක සියයට 6ක් කරලා තිබෙනවා. ඒ ගැන අපි ස්තුතිවන්ත වෙනවා. නමුත් ඔබතුමා කියන තර්ක නම් මට පිළිගන්න බැහැ. මොකද, මේ ලෝකයේ VMS භාවිත කරන රටවල් තිබෙනවා. ඇල්මේනියාව තිබෙනවා; ආර්ජන්ටිනාව තිබෙනවා; ඕස්ට්‍රේලියාව තිබෙනවා; කැනඩාව තිබෙනවා; චිලී, තායිවානය, ක්‍රොඒෂියාව, ඩෙන්මාර්කය, දකුණු අප්‍රිකාව, ජර්මනිය, අයිස්ලන්තය, ඉන්දියාව, ජපානය, නෙදර්ලන්තය, නවසීලන්තය, පේරු, රුසියාව තිබෙනවා. මේ හැම රටක්ම VMS පාවිච්චි කරනවා. ඉතින් බලන්න, ඩෙන්මාර්කයේ තිබෙන්නේ 600යි. තායිවානයේ තිබෙන්නේ 1,200යි. ජර්මනියේ 300යි.

අයිස්ලන්තයේ 1,600යි. නෙදර්ලන්තයේ 500යි. නවසීලන්තයේ 1,000යි. අපි එකවරටම 3,000ක් ගන්න යනවා. ඒ ඇයි කියලා මම දන්නේ නැහැ. බොහෝ රටවල් දිගු කාලයක සිට මේ තාක්ෂණය ප්‍රයෝජනයට ගන්නවා. කැනඩාව 2001 වර්ෂයේ ඉඳලා ප්‍රයෝජනයට ගන්නවා. නවසීලන්තය 1994 ඉඳලා, ස්වීඩනය 1998 ඉඳලා ප්‍රයෝජනයට ගන්නවා. මේකේ systems තුනක් තිබෙනවා. එකක් තමයි Inmarsat-C ක්‍රමය. මේ ක්‍රමය ගොඩක් ලාභයි. ගරු ඇමතිතුමා හිටියා නම් මට මේක කියන්න තිබුණා. මේක කොච්චර ලාභද කියලා බලන්න. -දැන් ඇමතිතුමා මේ ගරු සභාවට එනවා.- මේකේ systems ගොඩක් තිබෙනවා.

Inmarsat-C system එක තිබෙනවා. අනෙක Argos ක්‍රමය. තවත් එකක් තිබෙනවා. ඉන්දුනීසියාවේ යාත්‍රා 1500ක පමණ මේ තාක්ෂණය පාවිච්චි කරනවා. දකුණු කොරියාවත් මේ තාක්ෂණය පාවිච්චි කරනවා. අපි ලොකු expensive තාක්ෂණයක් ගේන්න යනවා. රජය කළත් කවුරු කළත් කොහොම කළත් මේක අවශ්‍ය ද කියන එකයි මම අහන ප්‍රශ්නය. විදේශ විනිමය කොපමණ යනවා ද? තමුන්නාන්සේලාට පිරි ඉතිරෙන්නට සල්ලි තිබෙනවා ද? හිතන්න. අනෙක් අතට මේ ධීවරයන්ට ගහන දඩ ටික ගැන බලන්න. පොඩි ගණනක් ද, තමුන්නාන්සේලා දැන් ගහන්න යන්නේ. එක එක ගණන් දඩ ගහන්න යනවා. මේ සංශෝධනයට අනුව දිග මීටර් 10.3 - මීටර් 15 දක්වා වූ බෝට්ටු සඳහා රුපියල් මිලියන 1.5ක දඩ මුදලක් අය කරනවා. බලපත්‍රයක් ලබා නොගෙන යාත්‍රාවක් ගිහිල්ලා අහු වුණොත් මෙහි නඩුවකුත් දාලා කරන්නේ මොකක් ද, මිලියන 1.5ක දඩයක් ගහනවා. ගරු අධිකරණ ඇමතිතුමනි, ඔබතුමාටත් චෝදනාවක් එනවා. මේ සංශෝධනයෙන් කරන්නේ මොකක් ද? මිලියන 1.5ක දඩයක් ගහනවා.

දිග මීටර් 15 සිට මීටර් 24 දක්වා වූ බෝට්ටු සඳහා රුපියල් මිලියන 5ක දඩයක් අය කරනවා. මීටර් 24 සිට මීටර් 45 දක්වා වූ බෝට්ටු සඳහා රුපියල් මිලියන 75ක් අය කරනවා. මීටර් 45 සිට මීටර් 75 දක්වා වූ බෝට්ටු සඳහා රුපියල් මිලියන 120ක් අය කරනවා. මීටර් 75ට වැඩි බෝට්ටු සඳහා රුපියල් මිලියන 150ක් අය කරනවා.

බලන්න, මිනිස්සු යාත්‍රාවක් ගනීවි ද? හරියට මේක කැසිනෝවලට දඩ ගහනවා වාගෙයි නේ. කැසිනෝවලටත් මෙපමණ දඩයක් නැහැ නේ. මේක සංශෝධනය කර ගන්න.

ඔබතුමාගෙන් මා ඉල්ලන්නේ මෙය සංශෝධනය කර ගන්න කියායි. අපේ මිනිහෙක් ආයෝජනය කරාවි ද? මුහුදු යනවාය කියන්නේ අවදානමක්. එක පැත්තකින් අවදානම. අනෙක් පැත්තෙන් සුළඟ. අනෙක් එක මාළු රැන පිටුපස්සෙන් බෝට්ටුව යනවා. වුවමනාවෙන්ම මාළු ඇල්ලුවාය කියා අධිකරණයෙන් නිර්වචනයක් කළහොත් කොහොම ද ඒක කරන්නේ? අධිකරණයෙන් නිර්වචනය කරන්න ඒ නඩුව අහන කට්ටියට මුහුද පිළිබඳ අවබෝධයක් තිබෙනවා ද? මේක අනවබෝධයෙන් කළහොත් ධීවර කර්මාන්තය සම්පූර්ණයෙන් ලංකාවෙන් තුරන් වෙලා යනවා. එම නිසා මේකට ඉඩ දෙන්නට එපාය කියා ඉතාම කාරුණිකව මා ඉල්ලා සිටිනවා.

අප මේ අමාත්‍යාංශය භාරව සිටි කාලයේ බොහෝ දේවල් කළා. අපට සම්පූර්ණ මුහුද තිබුණේ නැහැ. මුහුදෙන් තුනෙන් එකයි තිබුණේ. මුහුදෙන් තුනෙන් එකක් තියාගෙන තමයි අපි

ධීවර කටයුතු කළේ. නමුත් කළමනාකරණය කළා. ඒ කාලයේ මා ලංකාවේ කොඩිය ගහගෙන යන්න දුන්නේ නැහැ. ලංකාවේ කොඩිය දෙන්න එපාය කියලාමයි මම කියන්නේ. මොකද, අපේ රට තාක්ෂණයෙන් දියුණු වෙනවා නම්, ආයෝජන තිබෙනවා නම්, අපටම මේ වැඩ කර ගන්නට පුළුවන් හැකියාවක් තිබෙන්නට ඕනෑ. චීන නැව්වලට ඉඩ දීම නිසායි අපට මේ යුරෝපා තහනම පැන වීමට මූලික කාරණාව වුණේ කියන එක සඳහන් කරන්නට ඕනෑ. මොකද, ඒ අය Purse Seine system එකයි අනුගමනය කරන්නේ. ලොකු hut එකක් වාගේ tent එකක් දාලා, ඒක පාවෙන්නට දාලා එහි තිබෙන හැම දෙයක්ම අල්ලා ගෙන යනවා. අනෙක් එක bottom trawling ක්‍රමය. Bottom trawling කියන්නේ මොකක් ද?[බාධා කිරීමක්] Purse Seine system එක තහනම්. ඔබතුමා කොහොම මොනවා කිව්වත්,- [බාධා කිරීමක්] මේ පුංචි රටේ Purse Seine system එක කරන්න බැහැ. මහා සාගරය තිබෙන්න ඕනෑ. Purse Seine system එක මාර්ගයෙන් කරන වංචාව කොච්චර ද කියා බලන්න. මා අහන ප්‍රශ්නය මේකයි. මීටර් 20ක් යටට tent එකක් පාවෙන්නට දාලා- බෝයාවක් දාලා බෝයාවේ සිග්නල් එක බලා මේ හැම මාළු පැටියෙක්ම අල්ලා ගන්නා එක ඔබතුමා අනුමත කරනවා ද? ටූනා මත්ස්‍යයෙක් අවුරුදු තුනක් ඇතුළත කිලෝ 100 - 150 අතර ප්‍රමාණයකට හැදෙනවා. පොඩි මාළුන් ටික අල්ලා ගත්තාම කොහෙන් ද මාළු? [බාධා කිරීම්] යුරෝපා සංගමය නොවෙයි, මේක ලංකාව? මේක ලංකාව. හරිද? මේක ඔබතුමා තේරුම් ගන්න. දැන් අපට තහනම වැටිලා ඉවරයි. VMS එක ඕනෑය කියා අප කටයුතු කළා. අවුරුදු හතරක් තමුන්නාන්සේ සිටියා, ඒක ක්‍රියාත්මක වුණේ නැහැ. මමත් තමුන්නාන්සේට සුබ පැතුවා, තමුන්නාන්සේ ඒ අමාත්‍යාංශය භාර ගත්ත වෙලාවේ. නමුත් මේ වැඩය කරන්නට එපා. මේ වැඩය කළොත් මේ රට විනාශ වෙනවා. අපට කන්නට දෙයක් නැති වෙනවා. මාළු නැතිව යනවා.

අපි තවත් කාරණයක් මතක් කරන්නට ඕනෑ. තමුන්නාන්සේලා භාරයක්ද මොකක්ද වෙලා ඒ කාලයේ මිරිදිය ජල ජීවී වගාව තහනම් කරලා තිබුණා. හිටපු ජනාධිපතිතුමා ඒක නැවත ඇති කර දුන්නා. එහි ප්‍රතිඵලයක් වශයෙන් දැන් රට අභ්‍යන්තර ජලාශවල ටොන් හතළිස්දහසක මාළු ප්‍රමාණයක් හදනවා.

Purse Seine system එකයි, bottom trawling system එකයි සම්පූර්ණ වැරදියි. මේ කටයුත්තට නම් අපි විරුද්ධයි. ධීවරයක්ගෙන් ඇහුවොත් ඔවුන් සම්පූර්ණයෙන් විරුද්ධයි. අපි කරන්නේ මොකක් ද? අපි කරන්නේ longline system එක. Longline system එක ඔබතුමා දන්නවා නේ. මුහුදේ අට පොළකට බිලිකටු දාලා මාළු අල්ලන මරුවැල් ක්‍රමය. මුහුදේ අට පොළකට විතර මේවා යැව්වායින් පස්සේ, ලොකු මාළු විතරයි මේකට අහු වෙන්නේ. පොඩි මාළුවා බෙරිලා යනවා. මාළු අල්ලන නෙට් එකේ සිදුරු ලොකු කරලා තිබෙන්නේ මොකටද? පොඩි මාළුන්ට අහු වෙන්නේ නැති වෙන්න රිංගලා යන්න. ලොකු මාළුන් අල්ලා ගන්නයි. ඉතින් මාළු සම්පත දැන් ඉවරයි නේද? ආපහු මේක හදන්නද කියන්නේ? මොකක්ද මේකේ තේරුම? අපිත් කවුරු එක්කවත් පෞද්ගලික වෛරයක් නැහැ. වෛර කරන්න මට වුවමනාවකුත් නැහැ. නමුත් මේ ධීවරයා වෙනුවෙන් කථා කරන්න මට අයිතියක් තිබෙනවා. හේතුව, අපි ධීවර ප්‍රදේශවල ජීවත් වන අය නිසා.

අනෙක් කාරණය, අපි කතෝලිකයන්. ගරු ඇමතිතුමාත් කතෝලිකයෙක්, මමත් කතෝලිකයෙක්. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තමන්ගේ ප්‍රධාන ගෝලයා හැටියට තෝරා ගත්තේ කාවද? ධීවරයකුව තෝරා ගත්තේ. ජේසුස් වහන්සේ ඔහුට කිව්වේ මොකක්ද? "ජේදුරු නුඹ පර්වතයක්ය. මේ පර්වතය පිට මාගේ සභාව ගොඩ නහන්නෙමි" කියලා කිව්වා. ඒ නිසා ධීවරයන් ගැන කථා කරන්න අපට අයිතියක් තිබෙනවා. ඒ අයිතිය නැති කරන්න කාටවත් බැහැ කියන එක ප්‍රකාශ කරන්නට ඕනෑ.

දැන් අපි විශාල විපතකට වැටිලා තිබෙන්නේ කියන එක මා කියන්නට ඕනෑ. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා, මේ කර්මාන්තය කරන කොම්පැනි පහක්, හයක් තිබෙනවා කියලා. ඒ ගොල්ලන් මාළු අල්ලනවාද? මාළු ගෙන්වනවාද? මුහුද මැදට ගිහිල්ලා විශාල නැව්වලින් එන මාළු ටික ලබා ගන්නවා. එතකොට ඒ ගොල්ලන්ට මෙහෙ මාළු අල්ලන්න බැහැ. එහෙම නම් අපේ අමාත්‍යාංශයෙන් catch permit එකක් දෙන්න ඕනෑ. මාළු අල්ලන්න permit එක දෙන්න ඕනෑ. ඔබතුමා ගිහිල්ලා බලන්න. ලංකාවෙන් අල්ලපු මාළු විධියට බොරු permit එකක් පෙන්වන්නේ. ලංකාවේ මාළු අල්ලන්නේ නැහැ. මේ ගොල්ලන් ගිහිල්ලා මුහුද මැද තිබෙන නැව්වලින් මාළු අරගෙන එනවා. චීන නැව්වලිනුත් මාළු අරගෙන එනවා. එහෙම අරගෙන ඇවිල්ලා, අපේ ලංකාවෙන් අල්ලපු මාළු කියලා මෙහෙන් permit එකක් ගස්වලා දෙනවා. එතකොට තමයි යුරෝපා කොමිසම ඒක පිළි ගන්නේ. එම නිසා මේවායින් මීදෙන්න කටයුතු කරන්න. ජනතාව අපව මෙතැනට එවලා තිබෙන්නේ, ඒ ජනතාව වෙනුවෙන් කථා කරන්නයි. ඒ නිසා අපි මේකට විරුද්ධයි. මේ දඩයට අපි විරුද්ධයි. මෙච්චර ලොකු දඩ ගැහුවාම කවුද බෝට්ටු ගන්නේ? අපි වාහනයක් ගත්තාම insurance එකකුත් ලබා ගන්නවා. ඇයි? ඒ වාහනය මොකක හරි හැප්පුණොත්, කැඩුණොත්, අනතුරක් වුණොත් ඒ අලාභ වන මුදල නැවත ලබා ගන්න. ධීවර යාත්‍රාවකට මෙච්චර ලොකු දඩයක් ගහපුවාම මිනිස්සු බෝට්ටු ගනීවිද? නැහැ නේ. තෙප්පම් ගනීවි. එතකොට අපි ඉන්න ඕනෑ, වෙරළ හරියේ. ලොකු නැව් ටික ඇවිල්ලා අපේ මුහුදේ මාළු ටික අල්ලා ගෙන යාවි. එතකොට අපි මොනවාද කන්නේ? මුකුත් කන්න දෙයක් නැතිව යනවා. ප්‍රෝටීන් ඌනතාව මඟ හරවන්න සියයට 80ක ප්‍රෝටීන් ප්‍රමාණයක් මාළුවලින් සපුරා ගන්නට පුළුවන් කියලා කියනවා. මෙහි යථාර්ථය ගැනයි මා කථා කරන්නේ. එක එක පැත්තට තාර්කිකව කථා කරලා මේක විනාශ කරන්න දෙන්න බැහැ කියන එකත් අපි මතක් කරන්න ඕනෑ.

අද විශාල ඉල්ලුමක් තිබෙනවා, - ටූනා - කෙළවල්ලා මසුන්ට. මේවාට කියනවා, "ශෂිමි" කියලා. ජපානයේ අය වසාබි සෝස් එකත් එක්ක අමුවෙනුයි කන්නේ. මාළු කිලෝ එකකට අඩු තරමින් ලංකාවේ මුදලින් රුපියල් 3,000ක් 4,000ක් ලැබෙනවා. අපේ රටේ හැටියට නම්, කිලෝ සියයක මාළු දෙදෙනෙක් දුන්නාම එහෙන් කාර් එකක් ගන්න පුළුවන්. මොකද, ඒ ගොල්ලන්ගේ ආර්ථිකය ශක්තිමත් නිසා ඒ ගොල්ලන්ට වැඩි පෝෂණය තිබෙන දේවල් මිල දී ගැනීමේ හැකියාව සහජයෙන්ම ලැබිලා තිබෙනවා. නමුත් අපේ වාගේ රටක සිදු වන්නේ, සාමාන්‍ය මාළු ටික ආහාරයට අරගෙන, ලොකු මත්ස්‍ය වර්ග export කරලා ඒ ලැබෙන සල්ලිවලින් දරු පවුල් රැකගෙන කටයුතු කිරීමයි.

මා තවත් කාරණයක් මතක් කරන්න ඕනෑ. මේ කොම්පැනිය කාගේද? මම එදත් මේ ගැන කිව්වා. මේ කොම්පැනිය ධීවර අමාත්‍යාංශයේ නිලධාරියකුගේ. ඒ නිලධාරියා මිලියන 600ක කොම්පැනියකින් සියයට 60ක් ගන්නේ කොහොමද? හිතන්න. එහෙම නිලධාරියෙක් ඉන්නවා පුළුවන්ද? ධීවර අමාත්‍යාංශයේ නිලධාරියකුට මිලියන 600ක කොම්පැනියකින් සියයට 60ක shares තිබෙනවා. එතකොට එයාගේ share එක මිලියන 310යි. කල්පනා කරලා බලන්න. මම කියන්නේ ඒකයි. ඔය යහ පාලනය කියන ඒවා හරි යන්නේ නැහැ. ඒ නිසා මේ ටික හරියට කරන්න. එසේ කළොත් අපේ රට බේරා ගන්න පුළුවන්. මේ පිළිබඳව අනතුරු ඇඟවීමක් කර තිබෙනවා. 2012 නොවැම්බර් මාසයේ දී අනතුරු ඇඟවීමක් නිකුත් කළා. අනෙකුත් රටවල් මේ කොමිසමේ නිර්දේශ පිළිබඳව සාධනීය මට්ටමෙන් කටයුතු කරපු නිසා ඒ ගොල්ලන්ට මේක අයිති වුණා. ඒ අනතුරු ඇඟවීම කළේ කවුද? ධීවර හා සාගර සම්පත් කොමිසමේ කොමසාරිස්වරිය වන මරියා දමනකී මහත්මිය තමයි නිවේදනයක් නිකුත් කළේ. ශ්‍රී ලංකාවට

[ගරු ෆිලික්ස් පෙරේරා මහතා]

සමගාමීව 2012 දී අනතුරු ඇඟවීම් නිකුත් කළ අනෙකුත් රටවල් වන බ්‍රසීලය, පීජී, පැනමා සහ වනාතු යන රටවල අනතුරු ඇඟවීම ඉවත් කළ බවත් එහිදී ප්‍රකාශයට පත් වුණා. අනතුරු ඇඟවීම කළාම ඒ ගොල්ලන් ඒවා හදා ගත්තා. අපිත් මේක හදා ගන්න ඕනෑ. මම පෞද්ගලිකව දොස් කීමක් නොවෙයි කරන්නේ. මට අයිතියක් තිබෙන නිසා ඒ අයිතිය පිළිබඳව කථා කිරීමක් මේ කරන්නේ.

තමුන්නාන්සේලා දැන් බලවත් තැන්වල ඉන්නවා නේ. බලවත් තැන්වල ඉන්නකොට ඒ බලය ජනතාවගේ ප්‍රයෝජනය සඳහා පාවිච්චි කරන්න. යම් යම් තොරතුරු සැඟවීමට ඒ බලය පාවිච්චි කරන්න එපා. තොරතුරු දැන ගැනීමේ පනත් කෙටුම්පතත් සම්මත කර ගැනීමට ඉක්මනින් පාර්ලිමේන්තුවට ගෙනෙන්න. එතකොට ඒ සියල්ල වෙන්නේ කොහොමද කියලා අපට දැන ගන්න පුළුවන් වෙයි. ඒ ටික තමයි මට කියන්නට තිබෙන්නේ.

ඊළඟට, VMS හදනවාට අමතරව අප විශේෂයෙන්ම කළ යුත්තේ පිට රටින් එන නැව් ටික අපේ මුහුදේ මසුන් අල්ලාගෙන යන එක නතර කිරීමයි. ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලීමක් කරන්න කැමැතියි. පොඩි radar system එකක් හදලා navy එකට දෙන්න. එතකොට මේ අනතුරු සියල්ල නැති කර ගන්න පුළුවන්. Mother vessels ගණනාවක් මුහුද මැද්දේ නතර කරලා ඒවාට තෙල් ගහගන්නවා. ඒකට කියන්නේ bunkering කියලා. එසේ bunkering කරලා එහෙම්ම අපේ මත්ස්‍ය සම්පතත් එහා පැත්තට අර ගෙන යනවා. ඒ අපේ විදේශ විනිමය. ඔය ටික නතර කරන්නය කියලා මා ඉතා කාරුණිකව ඉල්ලන අතර, තොරතුරු දැන ගැනීමේ පනත් කෙටුම්පතත් සම්මත කර ගැනීම සඳහා ඉක්මනටම පාර්ලිමේන්තුවට ගෙනෙන්නය කියලා ඉල්ලා සිටිනවා. එම පනත් කෙටුම්පත සම්මත වුණාම, ඒ සියලු තොරතුරු දැන ගෙන ඇත්ත තත්ත්වය ගැන රටට හෙළි කරන්න අපට පුළුවන්.

ඊළඟට, මේ රට බේරා ගත් අපේ හිටපු ජනාධිපතිතුමා ගැන කළ ප්‍රකාශයක් සම්බන්ධව මම රනිල් වික්‍රමසිංහ මැතිතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමා අවංක මනුෂ්‍යයෙක්. එතුමා කිව්වේ මොකක්ද? මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ යුද ජයග්‍රහණය කාටවත් අවතක්සේරු කරන්නට බැහැ කියලා එතුමා කියා තිබෙනවා. "Daily Mirror" පත්තරය බලන්න, එතුමා කර තිබෙන එම ප්‍රකාශය එහි පළ වෙලා තිබෙනවා. වැදගත්, අවංක මනුෂ්‍යයකු වශයෙන් එහි ගෞරවය එතුමාට හිමි වන බවත් මා කියන්නට ඕනෑ. අවංකකමේ ප්‍රතිමූර්තියක් තමයි ඔබතුමන්ලාගේ නායකයා. ඒ විතරක් නොවෙයි, ඉවසීමට සමාන වචනය රනිල් වික්‍රමසිංහ මහතා යන්නයි. එතුමා තරම් ඉවසපු කෙනෙක් නැහැ. එම නිසා කවුරු කවුරුත් විවේචන ඉවසන්නට ඕනෑ. විවේචනය කරන්නේ මොන පරමාර්ථයෙන් ද? මාළු ගන්න ද? ශෂිමි මාර්කට් එකෙන් කැල්ලක් ඉල්ලා ගන්න ද? නැහැ. මේ ගරු සභාව රට හදන තැන නේ. රට හදන තැන හරියට ක්‍රියා කරන්න ඕනෑ කියන එක අප මතක් කරන්නට ඕනෑ. කමක් නැහැ. දැන්වත් අප ඒ වැරදි හදා ගෙන කටයුතු කරමු.

ගරු රාජිත සේනාරත්න ඇමතිතුමාගෙනුත් ඉල්ලා සිටිනවා, ඔබතුමාගේ experience එක අනුව වැරදි තැන් නිවැරදි කර ගැනීමට කටයුතු කරන්නය කියලා. දෙමළ බසින් කියමනක් තිබෙනවා, එක රිටි පහරක් ගහලා වැරදුණොත් රිටි පහරවල් දහසක් ගැහුවත් හරි තැන සොයා ගන්න බැහැ කියලා. එම නිසා රිටි ගහන්නේ නැතුව දැන් හබලක්වත් පාවිච්චි කරලා මේ ගමන යන්න. එතකොට අපේ රටේ සංවර්ධනයට හරියාකාරව දායකත්වය ලබා දෙන්න ඔබතුමන්ලාට පුළුවන් වේවි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කළ වෙලාවෙන් තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියද තිබෙන්නේ?

දැන් බලන්න, අපේ බහු දින යාත්‍රාවක් සාමාන්‍යයෙන් රුපියල් ලක්ෂ හතරක, පහක ඉන්ධන ගහගෙන යනවා. සමහර වෙලාවට මාළු හම්බ වෙන්නේත් නැතිවම නැවත එන්න වෙනවා. අපිත් ඒ කාලයේ බහු දින යාත්‍රා දෙන්න ගියා. ධීවරයන් කිව්වේ මොකක්ද? "අනේ! අපට මාසයකට සැරයක්වත් ගෙදර එන්න ඕනෑ, අපට පවුල් ඉන්නවා; දරුවෝ ඉන්නවා; අපට මුහුදේ ජීවත් වෙන්න බැහැ" කියලා කිව්වා. දැන් මේ නැව් මාස හයක්, හතක් මුහුද මැද්දේ නතර කරලා තිබෙනවා. වටේම දැල් දමලා, මාළු ටික එකතු කර ගෙන ඒකට පටවා ගන්නවා. අපේ export කරන අය ඒකෙන් හොරෙන් අරගෙන ඇවිල්ලා, අපේ ලංකාවේ නිෂ්පාදනයක් විධියට ලෝකයට හඳුන්වා දෙනවා. මේ ලෝකයේ තාක්ෂණය නැද්ද? NGO නැද්ද? ඒවා හෙළිදරවු වීම නිසා තමයි අපට මේක නැති වුණේ කියන එක මා ප්‍රකාශ කරනවා. හිත් රිදීමක් වුණා නම් ඒකටත් සමාවෙන්න. මම තමුන්නාන්සේලාට කියන්නේ, මේ කටයුත්ත හරියාකාරව කරන්න කියන එකයි. මේකට විදේශ කටයුතු ඇමතිතුමාගේත් සෘජු මැදිහත්වීම අවශ්‍යයි. මොකද, ඉන්දියාවත් ඒක කරනවා. ඉන්දියාවෙනුත් ඇවිල්ලා ලොකු යකඩ දෙකක් දමලා, මේ පැත්තෙන් බෝට්ටු දෙකක් දමලා අපේ ඉස්සෝ සම්පතයි, මත්ස්‍ය සම්පතයි ඒ සියල්ලම ඇදගෙන යනවා. එතකොට ලක්ෂ 26ක ධීවර ජනතාවට මොකද වෙන්නේ? ඒ අය වෙනුවෙන් කථා කරන්නේ කවුද? මේ ධීවරයන්ට සහනාධාර අවශ්‍ය නැහැ. කවුරු හරි කියනවා නම් ධීවරයන්ට සහනාධාර අවශ්‍යයි කියලා, එහෙම අවශ්‍ය නැහැ කියලා. එම ධීවරයන් ජීවත් වන පරිසරයේ, මුහුදේ අයිතිය ඒ අයට ලබා දීලා; මුහුදේ මාළු ඇල්ලීමේ හැකියාව ඔවුන්ට ලබා දීලා; බහු දින යාත්‍රාවලට අවශ්‍ය තාක්ෂණය ලබා දීලා; බහු දින යාත්‍රා ලබා ගැනීමට අඩු පොලියට ණය ලබා දීලා; ඔවුන්ට අවශ්‍ය ආරක්ෂාව ලබා දුන්නොත්, ඒ ගොල්ලන් එම කටයුතු කර ගෙන යයි. හැබැයි, යම් විධියකින් වැරදිලාවත් ඒ පැත්තට ගිහිල්ලා ඒ රටෙනුත් දඩ ගහලා, මෙහෙනුත් දඩ ගහලා රුපියල් ලක්ෂ 100, 150 ගෙවන්නට සිදු වුණොත් එහෙම ධීවර කර්මාන්තය සම්පූර්ණයෙන් නැති වෙන බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

[3.40 p.m.]

ගරු ඒ. විනායගමූර්ති මහතා
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)

Hon. Presiding Member, I thank you for giving me an opportunity to speak on the Fisheries and Aquatic Resources (Amendment) Bill.

I think from what the Hon. Minister stated, it became necessary for this Bill to be brought in because of the ban imposed by the European Union. I want to find out from the Hon. Minister whether he is taking any steps to get

the ban removed or whether he is speaking to the European Union people who are involved in this because unless he does it, we will lose our own wealth.

Sri Lanka is known as the "Pearl of the Indian Ocean" and around Sri Lanka you find seawater. If we develop the fisheries industry, we can get all the foreign exchange we need. Why do we not do that? We are importing fish. When we have got enough fish here, why do you want to import fish? Another matter I have noticed is that our fish which is our wealth, is being plundered by foreign countries like China, Japan and Thailand. I also understand that the Government has given licences for these countries to come and do fishing here. Hon. Minister, please stop that. Then only we can develop our industry.

The Navy does not arrest any Chinese, Japanese or the Thai people. They arrest only the Tamils who come from South India who are living below the poverty line. How can the Navy close their eyes and be in the sea without arresting the Chinese, Japanese or the Thai people?

Please see that you stop issuing further licences to all these countries to come and do fishing here. Please take necessary steps to get that ban removed. If we can develop our fisheries industry to a certain extent, we can get all the foreign exchange we want without depending on any other products. So, I kindly request the Hon. Minister to stop issuing licences to other countries to come and do fishing here and direct the Navy to arrest even the Chinese, Japanese and Thai people, not only the Tamils, who come and do fishing here.

Thank you.

[3.44 p.m.]

ගරු මංගල සමරවීර මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு மங்கள சமரவீர - வெளிநாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. Mangala Samaraweera - Minister of Foreign Affairs)

Hon. Presiding Member, as you maybe aware, at the end of January, I was in Brussels, the home of the European Union. The objective of my visit was largely to revive positive relations and begin a new chapter in Sri Lanka-European Union relations, based on mutual respect and understanding. But, I was also in Brussels to specifically address two very urgent issues of great national importance: firstly, the EU-IUU fishing ban which was announced on the 14th of October last year and which came into force three months later, on the 14th of January this year, exactly one week after the new President was sworn into office. Secondly, I went there to discuss the question of the GSP Plus tariff concession, which was withdrawn from Sri Lanka nearly five years ago as a result of the previous Government's persistent reluctance to embrace good governance and ensure basic human rights.

When engaged in high seas fishing, countries have obligations to comply with the international regulations that help ensure the sustainability of common resources. These international regulations help ensure that fish stocks are sustainable and attempt to limit environmental damage. In Sri Lanka's case, the relevant regulations are those agreed upon at the Indian Ocean Tuna Commission or better known as the IOTC. According to the Environmental Justice Foundation, global losses associated with IUU which stands for Illegal, Unreported and Unregulated fishing are valued at between US Dollars 10 million to 23.5 billion annually.

The EU imposes bans on countries that fail to comply with these regulations. These bans are imposed after multiple warnings, and offers of assistance to help with compliance and investigations. It is the previous administration's failure to comply with these regulations despite repeated warnings, and their turning a blind eye to IUU fishing activities that led to the current ban. Thus, all nations and specially countries like Sri Lanka whose coastal fisheries account for nearly 53 per cent of total marine fish production, have an incentive and a duty to protect and manage common resources in a way that prevents the depletion of fish stocks, and ensure the preservation of this resource for posterity.

In fact, as you are well aware, 1.8 per cent of our GDP is generated through fish and fisheries products and fisheries is the ninth largest export sector. In 2013, the share of seafood in the overall export basket was around 2.5 per cent generating export income of nearly US Dollars 246 million, and the EU accounts for about 40 per cent of our total fish exports.

Mr. Presiding Member, the IUU fishing by Sri Lankan vessels was first flagged as an issue of concern, when an investigation mission from the European Commission in 2010 found Sri Lanka to be non-compliant with standards enforced by the IOTC. Thereafter, on the 15th of November 2012, a yellow card was issued to eight countries, of which Sri Lanka was one, formally notifying Sri Lanka on the possible identification of the country as a non-cooperating third country in the EU-IUU fishing regulations. Following that early warning, the Ministry of Fisheries and the Sri Lankan Government managed to hold several very fruitful discussions and dialogues with members of the EU and IOTC, showing much progress on the ground, and was even on the verge of reversing the yellow card and having the file closed. Indeed, recently, as early 2014, the EU commended Sri Lanka on its "significant progress" in terms of its compliance with IOTC regulations, including addressing the IUU fishing.

I have been told, Sir, that, in fact, Sri Lanka has 1,615 vessels in the high seas, where over 90 per cent of this fishing fleet is less than 15 metres in length, all of which are by international standards considered to be artisanal

[ගරු මංගල සමරවීර මහතා]

fishing vessels and minimally damaging to the environment. However, the problems started in March 2014, when a political decision was taken by the previous government to increase the quota of fish that Sri Lanka could export, by introducing eight high capacity Chinese-built and owned Purse Seiner vessels. These commercial ships are over 45 metres long, have a capacity of 651 metres and may catch as much as 300 metric tons of fish per trip. Their catch size is between 25 and 100 times more per trip than the small sized artisanal Sri Lankan boats, which, as I just mentioned, are the type of vessels traditionally found in Sri Lankan waters.

The fishing gear used by these vessels has pernicious effects on the environment, sustainability of fish stocks and marine bio-diversity. Purse Seine fishing produces significantly greater "by-catch", that is the catch of non-marketable sea animals than other more traditional fishing methods such as longline fishing.

Most importantly, however, the introduction of the vessels took the other stakeholders in the Indian Ocean by complete surprise because they were not forewarned because it seemed to be at odds with our overall policy for fishing in the Indian Ocean, because at the time, there were no regulatory and control measures in place signified to our partners in the Indian Ocean that we were about to embark on large-scale commercial fishing without the consultation of other stakeholders or the consideration of the environment and our international obligations.

In April 2014, Sir, the Director-General for Maritime Affairs and Fisheries in Brussels, better known as DG-MARE, declared that “the momentum set in motion, during which much of the progress has been reported, is likely to be on a derailed path”. Not soon after, on 14th October, 2014, the European Union decided to inform us of the decision to ban Sri Lanka's fisheries exports to the EU but had decided to implement the ban only three months later, thus giving Sri Lanka yet another three months to rectify the situation. However, due to sufficient lack of progress in these three months, the ban unfortunately came into effect on the 14th of January, this year.

But, let us not be misguided in thinking that the ban will be so easily removed as by revoking the licences of those eight large vessels. The EU has also drawn our attention to the fact that that not all vessels flying the Sri Lankan flag and which are authorized to fish in the high seas outside the jurisdiction of our own waters, have valid licences. In fact, out of the 1,615 vessels, I have been told that only 86.3 per cent have valid licences and many vessels are still, however, submitting catch certificates even without a logbook and VMS data is still only limited to a small number of vessels. In the most recent count, I have been told that only 35 vessels, out of 1,615 are having these Vessel Monitoring Systems in place. Further, deterrents to violations were at the time inadequate to prevent additional violations; physical inspections rarely revealed non-compliance of vessels to the IOTC regulations and when there were such reports, not enough was done unfortunately to follow up.

At the time of issuing of the ban, the vessel observer scheme was underdeveloped, VMS reports on progress required by Resolution 06/03 had not been provided, length frequency data for coastal fisheries required by Resolution 10/02 had not been submitted and neither had there been a report on import, landing, and transshipment of tuna and tuna-like fish products as required by Resolution 10/10.

Thus, there are many areas where Sri Lanka needed and still needs drastic improvement, especially in the application of legislative frameworks and in the ground policing of vessels. While all my meetings were extremely warm and cordial - in fact, there was a great need amongst all the officials I met to help Sri Lanka to come out of this impasse as soon as possible - it became evident that Sri Lanka needs to implement several serious reforms before the EU may begin to consider lifting the ban. The constant revisions of deadlines, such as the deadlines to order and introduce the appropriate transponders on board ships, have been the cause of a significant loss of credibility or, as the DG-MARE put it in my meeting with her, the cause of much "disappointment" from within the EU and despite the well-intentioned administrative work force within the Ministry of Fisheries, it was stressed that what was lacking in Sri Lanka was the "political will" to execute the necessary changes.

But, I am happy to note that under the new Minister of Home Affairs and Fisheries, this "political will" has been amply displayed and in fact, there was a meeting just a week ago chaired by the Prime Minister himself, where the question of Vessel Monitoring Systems being ordered as early as possible was discussed in great detail, and I am sure, the Hon. Minister will inform the House that the process has already begun. We believe that by the 1st of July, more than 1,500 of these Vessel Monitoring Systems would have been ordered and fixed in these vessels.

In advocating for the need for swift and urgent reforms, let me also note one important consequence of the EU-IUU fishing ban. The EU, as a trade bloc, has emerged as the number one market for Sri Lanka’s exports for decades and in 2013, accounted for about 32 per cent of Sri Lanka’s total exports. In the period between 2005 and 2010, Sri Lanka was a significant beneficiary under the GSP Plus scheme, which was extremely important for the success of Sri Lanka’s business community, and achieved a GSP Plus utility rate

as high as 72 per cent. These tariff concessions helped Sri Lanka promote and develop ethical trading practices primarily in the garment and textile sector, and over the years more than 100 garment factories across the country were awarded with the "garments without guilt" label by the International Certification Authorities for their progress in providing positive working environments.

Currently, Sri Lanka enjoys trade preferences granted by the European Union under the standard GSP scheme where the utility rate of preferential trade concessions has been in an average range of 61 per cent during the 2011-2013 period. Thus, in this context, it is crucial for the EU -IUU ban to be lifted immediately in order for Sri Lanka to have a positive response by the European Commission to its GSP Plus application.

In fact, we know that there was a reversal of such a fishing ban in Belize, where, I was told that it took eight months. The senior officials I met in Brussels assured me that they will give priority to Sri Lanka but Sri Lanka must, as I said earlier, have the political will to implement these reforms as early possible and I think this Bill which is presented in Parliament today, again amply demonstrates the political will of the new administration to get this ban reversed as early as possible.

Thank you.

[අ.භා. 3.59]

ගරු වික්ටර් ඇන්ටනි මහතා
(மாண்புமிகு விக்டர் அன்டனி)
(The Hon.Victor Antony)

මුලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, උපන් දා ඉඳලාම ධීවර ප්‍රදේශයක ජීවත් වන කෙනකු හැටියට ධීවර ජන ජීවිතයේ ප්‍රශ්න, ගැටලු හා වේදනා මා හොඳට දන්නවා; හඳුනනවා. ඒ නිසාම හැම ධීවරයෙකුගේම ප්‍රශ්න දිහා අපි බලන්න ඕනෑ විධිය ඇත්ත වශයෙන්ම මා දන්නවා.

මුලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, කොහොම නමුත් අද ප්‍රධානම ප්‍රශ්නය වෙලා තිබෙන්නේ, බහුදින ධීවර ජනතාවට සිද්ධ වෙලා තිබෙන හානියයි. බහුදින ධීවර ජනතාව විශාල ප්‍රපාතයකට වැටී ගෙන යන කාලයකුයි මේ තිබෙන්නේ. ඒකෙන් ඔවුන් මුදා ගන්න හිටපු හැම ධීවර අමාත්‍යතුමෙක්ම උත්සාහ කළා. මම කිසිම අමාත්‍යවරයෙකුට දොස් කියන්නේ නැහැ. මොකද, අපේ හිටපු හැම ධීවර ඇමතිවරයෙකුම ධීවර ජන ජීවිතයේ නැග්මක් උදෙසා යම් කිසි විධිමත් වැඩ පිළිවෙළක් දියත් කළ උදවියයි. ලංකා ඉතිහාසය ගත්තාම හිටපු අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා තරම් ධීවර ජනතාවට සේවය කළ වෙනත් කෙනෙක් නැහැ. ඒක අපි අවිවාදයෙන් පිළිගන්න ඕනෑ. අපේ හිටපු ධීවර ඇමතිවරයෙකු වන ගරු ෆිලික්ස් පෙරේරා මැතිතුමාටත් අපි ගරු කරන්න ඕනෑ. එතුමාත් යම් යම් දේවලට හුඟක් උත්සාහ කළා. ඒ වාගේම තමයි අපේ හිටපු ධීවර අමාත්‍ය ගරු රාජිත සේනාරත්න මැතිතුමා. අපට මෙම ප්‍රශ්නයේදී එතුමාව කොහොමටවත් අමතක කරන්න බැහැ. එතුමා බහුදින ධීවර යාත්‍රා හිමියන් සම තැනකට ගෙනෙන්න ලොකු උත්සාහයක් ගත්තා. නමුත් ඒ උත්සාහය හුඟක් අවස්ථාවල බැහැර වුණු හැටි අපි දැක්කා. සමහර වෙලාවට ලොකු ප්‍රශ්න, ගැටලුවලට එතුමා මුහුණ දුන්නා. එතුමා ඒ අවස්ථාවල හදවතින්ම ක්‍රියා කළ බව මට අවිවාදයෙන්ම කියන්න පුළුවන්. එතුමා ධීවර අමාත්‍යවරයා හැටියට කටයුතු කරපු කාලයේ අපි එතුමා ළඟ හිටියා. වයඹ පළාත විශාල ධීවර ජනතාවක් නියෝජනය කරන ප්‍රදේශයක්. එම ප්‍රදේශයේ ධීවර කටයුතුවලට අපි එතුමාත් එක්ක සහභාගි වුණා. ධීවර ජනතාවගේ ජන ජීවිතය නඟා සිටු වන්න එතුමා ගත් උත්සාහයන් මට මොහොතකටවත් අමතක කරන්න පුළුවන්කමක් නැහැ. යුරෝපා සංගමයෙන් ශ්‍රී ලංකාවට පනවපු මත්ස්‍ය අපනයන තහනම ඉවත් කර ගැනීම වෙනුවෙන් එතුමා බොහොම මහන්සි වුණා. ඒ සම්බන්ධයෙන් එතුමා හුඟක් කථා කළා.

ඉන්දියානු සාගර ටූනා කොමිසමත් සමඟ එතුමා සාකච්ඡා කළ ආකාරය අපි දැක්කා. යුරෝපා සංගමය සමඟ කළ සාකච්ඡා අපි දැක්කා. ඒ හා සම්බන්ධ ගැටලු මතු වුණු වෙලාවේ එතුමා ඒවාට මුහුණ දුන් ආකාරය අපි දැක්කා. විශේෂයෙන්ම ධීවර ජන ජීවිතයට හොඳ තත්ත්වයක් උදා කර දෙන්න, බහුදින ධීවර ජනතාවට යහපත්, උසස් 1.07 අනික් රටවලින් මාළු ගන්නවා; අපේ මාළුවලට තැනක් දෙන්නේ නැහැ කියලායි. එහි පොඩි ඇත්තකුත් තිබුණා. ඒ ධීවර ජනතාව ඉල්ලපු සුළු සුළු කාරණා ටිකක් තිබුණා. ඒගොල්ලෝ සමහර වෙලාවට කිව්වා, ලෝකයේ කොයි නැව ඇවිල්ලා මාළු වික්කත් අපට කමක් නැහැ; ලංකාවේ ධීවර ජනතාවගේ මාළු ඉස්සෙල්ලා ගන්න; අපේ අයට පෝළිමක් නැතිව ගන්න; අපේ අයට පහසුවෙන් ඒ මාළු ටික විකුණා ගන්න අවසර දෙන්න කියලා. සමහර වෙලාවට තමන්ගේ මාළු ටික විකුණා ගන්න බැරිව දවස් තුනක් පෝලිමේ සිටියා. මෙන්න මේ වාගේ සුළු ප්‍රශ්නවලට සමහර වෙලාවට ඒ අය මුහුණ දුන්නා. හැබැයි මම මතක් කරන්න ඕනෑ, රාජිත සේනාරත්න ඇමතිතුමා එදා යම් යම් කොම්පැනි ගෙනැල්ලා කථා කරලා, ලංකාවේ ධීවරයින්ගෙන් වේලපහින්ම මාළු ගන්න කියලා ඒ කොම්පැනිවලින් ඉල්ලීමක් කළා කියන කාරණය. ඒ විතරක් නොවෙයි, ධීවර ජනතාවට ගැළපෙන සාධාරණ මිලක් දෙන්න කියලා එතුමා ප්‍රකාශ කළා. එතුමාගේ ළඟ හිටි අය හැටියට අපි ඒ බව දන්නවා. එම නිසා එතුමන්ලා කාටවත් මම දොස් කියන්නේ නැහැ. එතුමා පුළුවන් තරම් උත්සාහ කළා, මේ ධීවර ජනතාවගේ විශේෂයෙන්ම බහු දින ධීවර යාත්‍රාවලට පැන නැඟී තිබෙන ප්‍රශ්නය විසඳන්න. මේ ප්‍රශ්නය අන්තිමට අපේ ආගමික නායකයන් කරාත් ගියා. ඒ වාගේම ධීවර ජනතාව සහන ඉල්ලපු අවස්ථාවලදී ආගමික නායකයෝ මැදිහත් වුණු බව අපි දැක්කා. අපේ හිටපු ජනාධිපතිතුමා ඉතාමත් පැහැදිලිවම පොරොන්දුවක් දුන්නා ධීවර ජනතාවට මේ සහනාධාරය ලබා දෙනවා කියලා. ඒ වාගේම එතුමා එම සහනාධාරය ලබා දුන්නා. "මාස 3ක් මට කල් දෙන්න" කියලා එතුමා කිව්වත්, මාස 3ක් එතුමා හිටියේ නැහැ. මාසයකට, මාස එකහමාරකට ආසන්න කාලයකදී රුපියල් 20කින් එම භූමිතෙල් සහනාධාරය ධීවර ජනතාවට එතුමා ලබා දුන්නා. අප එය අමතක කරන්න හොඳ නැහැ. එවැනි සහන ලබා දීලා තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස අමාත්‍යතුමා හොඳ කථාවක් කළා. අපි එය නැහැයි කියන්නේ නැහැ. නමුත් එතුමා කිව්ව යම් යම් කරුණුවලට අපට එකඟ වෙන්න බැහැ. ධීවර සහනාධාර කප්පාදු කළා කියන එකට එකඟ වෙන්න බැහැ. මට මතකයි මුළු ලංකාවේම ධීවර ගැටලුව වූ තෙල් සහනාධාරය පිළිබඳ ප්‍රශ්නය මතු වූ වෙලාවේ, රාජිත සේනාරත්න ඇමතිතුමා ජනතාව මැද්දට ගිහිල්ලා මේ පිළිබඳව විසඳුමක් හෙව්වා. අන්තිමට ජනතාව වැඩි ප්‍රමාණයක් කිව්වේ මොකක්ද? "අපට දැල් සහනාධාරයක් දෙන්න, තෙල් සහනාධාරය එපා" කියලා. තෙල් සහනාධාරය වෙනුවට දැල් සහනාධාරයක් ඉල්ලුවා. එහිදී එතුමා Cabinet Paper එකක් දාලා දැල් සහනාධාරය අනුමත කළා. ඒ දැල් තවම බෙදා ගන්න විධියක් නැතිව, ගබඩාවල stock කරලා තිබෙනවා. ඒ අතර කාලය තුළ තමයි හිටපු අතිගරු ජනාධිපතිතුමා මෙම තෙල් සහනාධාරය ලබා දුන්නේ. ඕනෑ නම්, රාජිත සේනාරත්න ඇමැතිතුමාට එදා පුළුවන්කම තිබුණා, තමුන්නාන්සේලාට අපි තෙල් සහනාධාරය දුන්නා, දැල් සහනාධාරය දෙන්නේ නැහැ කියලා දැන් සහනානධාරය නවත්වන්න.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කළ වෙලාවෙන් තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු වික්ටර් ඇන්ටනි මහතා
(மாண்புமிகு விக்டர் அன்டனி)
(The Hon.Victor Antony)
නමුත්, හිටපු ධීවර ඇමති රාජිත සේනාරත්න මැතිතුමා එහෙම කළේ නැහැ. එතුමා තෙල් සහනාධාරයත් ගන්න, දැල් සහනාධාරයත් ගන්න කියන පදනම මත ඉඳලා, එම සහනාධාර ධීවර ජනතාවට අද දක්වාම ලබා දෙනවා. අප ඒවා අමතක කරන්න හොඳ නැහැ. අප මේ කෙනෙකුට හුණු ගානවා නොවෙයි. හෘදය සාක්ෂියට එකඟව අපි කථා කරන්න ඕනෑ. මොකද, මමත් වයඹ පළාත් සභාවේ අවුරුදු 9ක් ධීවර ඇමතිවරයෙකුව හිටියා. අපට මෙම ප්‍රශ්න මතු වුණා. අප මෙම ගැටලුවලට මුහුණ දුන්නා. ඒ ගැටලුවලට මුහුණ දෙන විට අපට තේරෙනවා හරියට යන්නේ කවුද, වැරැදියට යන්නේ කවුද කියලා. එම නිසායි මම කිව්වේ හිටපු කිසිම ධීවර අමාත්‍යවරයෙකුට මම දොස් කියන්නේ නැහැ කියලා. මොකද? හැම අමාත්‍යවරයෙක්ම උත්සාහ කළා, ධීවර ජන ජීවිතයේ නව ගමනක් යන්න.

ගරු මන්ත්‍රීවරුනි, අද ඇති වෙලා තිබෙන ලොකුම ප්‍රශ්නය මේ ප්‍රශ්නය විතරක් නොවෙයි. මම අලුත් ධීවර ඇමතිතුමාට සුබ පතනවා. එතුමා දක්ෂ කෙනෙක්; හිටපු ධීවර ඇමති කෙනෙක්; පරිණත කෙනෙක්. අද වන විට මහ ධීවරයා පමණක් නොවෙයි, සුළු ධීවරයාත් එක පැත්තකින් වැටී ගෙන යනවා. Trawling ක්‍රමය, තහනම් දැල් ක්‍රමය කියන ඒවා නිසා අද මෙම ධීවර ජනතාව වැටී ගෙන යනවා. තමුන්නාන්සේට අද ඒවාටත් විසඳුම් සොයන්නට වෙයි. අද trawling ක්‍රමය නිසා -අයහපත් ධීවර ක්‍රමය නිසා- සුළු ධීවරයා විනාශ වී ගෙන යන තත්ත්වයක් තිබෙනවා. රාජ්‍ය පෙරළියත් එක්ක මෙම trawling ක්‍රමය වැඩි වෙලා.

මම නිර්භයව කියනවා, හිටපු ධීවර ඇමති රාජිත සේනාරත්න ඇමතිතුමා මුහුණු දුන්නු ප්‍රශ්නවලට කිසිම ඇමති කෙනෙක් මුහුණ දුන්නේ නැහැ කියලා. Trawling ක්‍රමය තහනම් කරපු එකම ඇමතිවරයා රාජිත සේනාරත්න ඇමතිතුමායි. කවුරුත් ඒකට අත ගැහුවේ නැහැ. නමුත් අද ඒක නැවත වරක් මතු වෙලා, ගරු ඇමතිතුමනි. මම ඔබතුමාගෙන් ඉල්ලන්නේ, සුළු ධීවරයාත් ආරක්ෂා කරන්න ඕනෑය කියලායි. වැඩි පුර ඉන්නේ සුළු ධීවරයන්. ඒ සුළු ධීවරයන් ආරක්ෂා කිරීමේ වැඩ පිළිවෙළට තිරසාරව, එඩිතරව මුහුණ දීලා කටයුතු කරන්න කියා මම තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා. හොඳයි, බොහොම ස්තුතියි. අපේ මුලසුන සංඥා කරනවා, "කථා කළා ඇති" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නවතිනවා.

[අ.භා. 4.09]

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාගෙන් අවසරයි. මේ පියවර ගැනීම ගැන, මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම ගැන මම මුලින්ම ජෝශප් මයිකල් පෙරේරා ඇමතිතුමාට මාගේ ස්තුතිය පළ කරන්න ඕනෑ. අපේ රට වටා තිබෙන මුහුදෙන් අයුතු ප්‍රයෝජන ගන්න පිට රට බෝට්ටුවලින් පැමිණෙන ධීවර පිරිස් හරහා ඇති වෙන සූරාකෑම නතර කරන්න ඒ තුළින් වැදගත් පියවරක් ගැනෙනවා. මේ කරුණ කියන ගමන් මතක් කරන්න ඕනෑ, මේ පනත් කෙටුම්පතේ සඳහන් කරලා තිබෙන ආකාරයේ යම් වැරැදීමක් සිදු වෙලා තිබෙනවා කියන එක. ඒ පනත් කෙටුම්පතේ සඳහන් කරලා තිබෙනවා, "පනතේ 49වන වගන්තිය එම වගන්තියේ (2අ) උපවගන්තිය ඉවත් කර" කියලා. නමුත් ඇත්ත වශයෙන් පනතේ ඒ වාගේ කොටසක් නැහැ. කරුණාකර ඒ ගැන බලා ඒක නිවැරැදි කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
අපි කථා කරන්නේ 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත ගැන. ඒක හරිද?

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
ඔව්.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඒක සංශෝධනය කරලා තිබෙනවා. සංශෝධනය වෙලා 2013 අංක 35 දරන ධීවර හා ජලජ සම්පත් (සංශෝධන) පනත කියලා එකක් තිබෙනවා. ඒ පනතේ තමයි ඔය කරුණ තිබෙන්නේ.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
හොඳයි. මේ සංශෝධනය ක්‍රියාත්මක කිරීම වැදගත් වෙනවා. අපි කවුරුත් දන්නවා, මෙය ප්‍රමාද වීම හේතුකොටගෙන මේ අවුරුද්ද මුල ඉඳලා යුරෝපා සංගමය අපට විරුද්ධව සම්බාධක පනවන්න කටයුතු කරලා තිබෙන බව. මේක අපේ ධීවර ආර්ථිකයට තදින් බලපායි. අපි දන්නවා, මේ ධීවර අංශයෙන් අපේ රටට ලැබෙන ආදායම දළ දේශීය ආදායමෙන් 1.3ක් වැනි ඉතාම අඩු ප්‍රතිශතයක් බව. කෘෂිකර්ම ක්ෂේත්‍රයේ වර්ධනයක් අපේ රටේ සිදු වෙලා තිබුණාට, ධීවර අංශයේ එවැනි වර්ධනයක් නොතිබීම ගැන අපේ කනගාටුව ප්‍රකාශ කරන්න ඕනෑ. ධීවර අංශය නියම මට්ටමකට නග්ගන්න මේ කාලය තුළදී ඔබතුමාට ලොකු වග කීමක් තිබෙනවා.

ඉදිරි කාලයේදී අප රටේ ධීවර අංශය දියුණු කිරීමට නවීන තාක්ෂණයත් උපරිම ලෙස යොදවා ගනියි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ඒ තුළින් අපේ රටට ලැබෙන ආදායම වැඩිවෙනවා පමණක් නොවෙයි, අපේ ධීවර සමාජයටත් ලොකු වාසියක් අත් වෙනවා. ධීවර අංශයෙන් යැපෙන ලක්ෂ 5කට වැඩි ජනතාවක් අප රටේ ඉන්නවා. තාක්ෂණය උපරිම ලෙස යොදා ගැනීම තුළින් ඒ අංශයේ ආදායම් අපට වැඩි කරගන්න පුළුවන් වේවි.

තාක්ෂණය පැත්තෙන් බැලුවාම අපට දියුණු කරන්න තිබෙන අංශයක් තමයි, බහුදින යාත්‍රා අංශය. මේ අංශය දියුණු කිරීමට මා විද්‍යාත්මක කටයුතු භාර ඇමති හැටියට COSTI කියලා සංවිධාන ව්‍යුහයක් ගොඩ නැඟුවා. ඒ ආයතනය හරහා අපි ධීවර අංශයේ විවිධ කොටස් එක්ක සාකච්ඡා පවත්වලා, මේ බහුදින යාත්‍රා දියුණු කිරීම සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරගෙන ගියා. මා ප්‍රාර්ථනා කරනවා, ඒ කටයුත්ත දියුණු කරගෙන නොකඩවාම ඉදිරියට යන්න පුළුවන් වෙන්න කියලා. අපේ රටේම මේ යාත්‍රා නිෂ්පාදනය කිරීමේ හැකියාව තිබෙනවා. ඒ නිසා මේ අංශයට අත දිය යුතුව තිබෙනවා. මේ අංශය අප රටේ දියුණු නොකරන නිසා තමයි පිට රටින් ඇවිල්ලා අපේ මුහුදෙන් උපරිම ප්‍රයෝජන ලබා ගන්නේ. මේ තත්ත්වය අපට වෙනස් කරන්න පුළුවන් වන්නේ අප රටේම මේ අංශය දියුණු කරන්න පුළුවන්

වුණොත් පමණයි. මේ කටයුත්ත සඳහා අවශ්‍ය සහාය ලබා දිය යුතුයි. මේ අංශය දියුණු කිරීමට පෞද්ගලික ව්‍යාපාරිකයන් ඉදිරිපත් වෙන්න ලෑස්ති වුණත් ඒ අයට අවශ්‍ය මූල්‍ය ධනය ලබා ගැනීමේ ප්‍රශ්න තිබෙනවා. මා බලාපොරොත්තු වනවා, ඉදිරි කාලයේදී ඒ ගැන සලකා බලා අවශ්‍ය සහාය ලබා දෙයි කියලා.

තාක්ෂණය පැත්තෙන් බලන කොට තවත් වැදගත් අංශයක් තමයි, චන්ද්‍රිකා තාක්ෂණය. චන්ද්‍රිකා තාක්ෂණය හරහා මුහුදේ මාළු ඉන්නේ කොහේද කියලා හොයා ගන්න පුළුවන්කම තිබෙන බව අප දන්නවා. ඒ sensor mechanism පාවිච්චි කරලා තොරතුරු දැනගෙන, ඒ තොරතුරු ධීවර ජනතාවට ලබා දෙන්න වැඩ පිළිවෙළක් දියත් කරන්න ඕනෑ. "විදාතා" වැඩ පිළිවෙළ දියුණු කරන ගමන් මා බලාපොරොත්තු වුණා, මේ සම්බන්ධකම ඇති කරගෙන මුහුද ආසන්න ප්‍රදේශවල ඉන්න ජනතාවට ඒ තොරතුරු ලබා දෙන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරන්න. මා කියන්න සන්තෝෂයි, ඉන්දියාවේ ආණ්ඩුව මේ කටයුත්තට සහාය දෙන්න ලෑස්ති වෙලා හිටිය බව. නමුත් අපට මෙතෙක් එයින් උපරිම ප්‍රයෝජන ලබා ගන්න පුළුවන් වෙලා නැහැ. ඉදිරි කාලයේදී අපි ඒ සඳහා කටයුතු කරන්න ඕනෑ. ඒ දැනුම දිනපතාම අපේ ධීවරයන්ට ලබා දෙන්න පුළුවන් වුණොත්, මාළු ඉන්නේ කොහේද කියලා කලින් දැනගෙන වැඩි මාළු තොගයක් අල්ලා ගැනීමට හැකි වේවි. ඒ නිසා මේ අංශයත්, මේ තාක්ෂණයත් දියුණු කිරීම වැදගත් වනවා.

කර්මාන්ත තාක්ෂණ පර්යේෂණ ආයතනය, නාරා ආයතනයත් සම්බන්ධ කරගෙන ධීවර කර්මාන්තයේදී අපතේ යන දේ ගැන සොයා බලන්න කටයුතු කරනවා. මාළු පිරිසිදු කරන කොට වාගේම අළෙවි කරන අවස්ථාවේදී නොයෙකුත් කොටස් අපතේ යනවා. මේ අපතේ යන කොටස් එකතු කරලා වෙළෙඳ පොළේ හොඳ මිලක් තිබෙන ද්‍රව්‍ය ලබා ගැනීමේ හැකියාව තිබෙනවා. ඒ සඳහා අපේ විද්‍යාඥයන් සම්බන්ධ කරගෙන, තාක්ෂණයත් උපයෝගි කරගෙන කර්මාන්ත දියුණු කරලා ධීවර අංශයට අතුරු ආදායමක් ලබා දීමට පුළුවන්. මම ඉල්ලීමක් කරනවා, කර්මාන්ත තාක්ෂණ පර්යේෂණ ආයතනයෙන් මෙතෙක් කරලා තිබෙන පර්යේෂණවලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා පියවර ගත යුතුයි කියලා.

ඒ එක්කම ධීවර ජනතාවගේ පැත්තෙන් බලන කොට කවුරුත් පිළිගන්නා දෙයක් තමයි, මැද සිටින වෙළෙන්දන්ගේ ගසාකෑම හේතු කොට ගෙන ධීවර අංශයේ වැඩ කරන ජනතාවට නිසි ආදායමක් ලබා ගැනීමේ අපහසුතාවක් තිබෙනවා කියන එක. මේවා පරාජය කිරීම සඳහා සමුපකාර ක්‍රම ශක්තිමත් කර දියුණු කිරීම, අළෙවි කිරීමේ පහසුකම් දියුණු කිරීම කළ යුතුයි. ඒ කටයුතු හරහා ධීවර ජනතාවට වැඩි ආදායමක් ලබා ගැනීමට හැකි වැඩ පිළිවෙළක් ඇති කිරීම වැදගත් වෙනවා. මම හිතන විධියට මේ ආකාරයට කටයුතු කරමින් ධීවර ජනතාවගේ ආදායම වැඩි කරන වැඩ පිළිවෙළකුත් ඉදිරි කාලයේදී අප රට තුළ ක්‍රියාත්මක කළ යුතුයි.

කෘෂිකාර්මික අංශයට සහනාධාර ලබා දෙනවා වාගේම, ධීවර අංශය දියුණු කිරීම සඳහාත් වැඩි සහනාධාර ප්‍රමාණයක් දෙන්න කියන ඉල්ලීමත් ඒ ජනතාව වෙනුවෙන් මා ඉදිරිපත් කරනවා. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

The next speaker is the Hon. (Mrs.) Vijayakala Maheswaran. Before she starts, will an Hon. Member propose the Hon. Shantha Bandara to take the Chair?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

I propose that the Hon. Shantha Bandara do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ආර්. යෝගරාජන් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ශාන්ත බණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு ஆர். யோகராஜன் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சாந்த பண்டார அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. R. YOGARAJAN *left the Chair, and* THE HON. SHANTHA BANDARA *took the Chair.*

[பி.ப. 4.21]

ගරු විජයකලා මහේස්වරන් මහත්මිය (කාන්තා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன் - மகளிர் அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran - Deputy Minister of Women's Affairs)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் சபையில் சமர்ப்பிக்கப்பட்டுள்ள கடற்றொழில், நீர்வாழ் உயிரின வளங்கள் (திருத்தம்) சட்டமூலம் சம்பந்தமான விவாதத்தில் உரையாற்றுவதற்குச் சந்தர்ப்பம் தந்தமைக்காக முதலில் நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். யாழ். மாவட்டத்திலே 25 வருட காலமாக மீனவக் குடும்பங்கள் இடம்பெயர்ந்து வசித்து வருகின்றன. சென்ற கிழமை வட பகுதிக்கு - யாழ். மாவட்டத்துக்கு விஜயம் செய்த கடற்றொழில் அமைச்சர் மாண்புமிகு ஜோசப் மைக்கல் பெரேரா அவர்கள் நேரடியாக அந்தக் குடும்பங்களுடன் உரையாடியிருக்கிறார். அவருக்கு மீனவர்களின் பிரச்சினை பற்றி நன்றாகத் தெரியும். இந்த வயதிலும் அவர் ஓர் இளைஞர்போல் செயற்பட்டு, அவர்களுடன் கூடி மகிழ்ந்து அவர்களுடைய குறைகளைக் கேட்டறிந்திருக்கிறார். "எங்களுடைய அரசின் 100 நாள் வேலைத்திட்டத்தில் அவர்களுக்கு எங்களால் இயன்ற உதவிகளைச் செய்ய வேண்டும்; எந்த அளவுக்கு அவர்களை மீள்குடியேற்றம் செய்ய முடியுமோ, அந்த அளவுக்குக் குடியேற்றி அவர்களுக்கு தொழில் வாய்ப்புக்களையும் பெற்றுக்கொடுக்க வேண்டும்" என்று அவர் கூறியிருந்தார். அவருக்கு இந்தச் சபையிலே வட மாகாண மக்களின் சார்பில் நான் நன்றியைக் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

யாழ்ப்பாணப் பிரதேசத்தில் மீனவக் குடும்பங்கள் வசித்த இடங்களில் முன்னைய அரசாங்கத்தினால் இராணுவ முகாம்கள் அமைக்கப்பட்டன. அத்தகைய இராணுவ முகாம்கள் சம்பந்தமாக வர்த்தமானியிலும் அறிவித்தல் பிரசுரிக்கப்பட்டது. அந்த வர்த்தமானி அறிவித்தலை இரத்துச்செய்து, அத்தகைய இராணுவ முகாம்களை அகற்றி, அந்த மீனவக் குடும்பங்களை அங்கு குடியேற்ற வேண்டுமெனவும் அந்த பிரதேசத்தில் அவர்களுக்கான தொழில் வாய்ப்புக்கு அனுமதி பெற்றுக்கொடுக்க வேண்டுமெனவும் நான் மேதகு ஜனாதிபதி அவர்களிடமும் பிரதம அமைச்சர் கௌரவ ரணில் விக்கிரமசிங்க அவர்களிடமும் இந்த உயர்ந்த சபையிலே

[ගරු විජයකලා මහේස්වරන් මහත්මිය]

வேண்டுகோள் விடுக்கின்றேன். மக்களால் தெரிவு செய்யப்பட்ட எங்களுக்கு இது ஒரு பாரிய பொறுப்பு! 100 நாள் திட்டத்தினூடாக கட்டாயம் இதைச் செய்துகொடுக்க வேண்டும். நாவாந்துறை, நவாலி, ஆனைக்கோட்டை போன்ற பிரதேசங்களில் இராணுவ முகாம்கள் அமைந்துள்ளன. உண்மையாக அந்தப் பிரதேசங்கள் கரையோரப் பிரதேசங்களாகும்; அந்தக் கரையோரங்கள் மீனவ குடும்பங்கள் வசிக்கின்ற இடங்களாகும். அந்த இடங்களை அவர்களுக்குப் பெற்றுக்கொடுக்க வேண்டும். அது உயர் பாதுகாப்பு வலயமல்ல. முன்னைய அரசாங்கத்தில் இருந்ததுபோல அல்லாது இந்த அரசாங்கம் தடைகளை நீக்க வேண்டும். அப்படி நீக்கினால்தான் எங்கள் மக்கள் மத்தியில் - தமிழ், சிங்கள, முஸ்லிம் மக்கள் மத்தியில் - நம்பிக்கை உண்டாகும். மேலும், அந்த மீனவக் குடும்பங்களின் வாழ்வாதாரத்துக்கும் நாங்கள் உதவி செய்ய வேண்டும்.

காங்கேசன்துறை, மயிலிட்டி, பலாலி போன்ற பிரதேசங்களும் மீனவக் குடும்பங்கள் வாழ்கின்ற பிரதேசங்களாகும். அங்குள்ள பாடசாலைகள், வீடுகள், பள்ளிவாசல்கள், தேவாலயங்கள் போன்றன முற்றுமுழுதாகத் தரைமட்டமான நிலையில் காணப்படுகின்றன. போர் முடிவடைந்து தற்போது ஐந்தரை வருடங்கள் பூர்த்தியாகிவிட்டன. போர் நடைபெறாத 2013 - 2014ஆம் ஆண்டு காலப்பகுதியில்தான் அவை முற்றாகச் சேதமாக்கப்பட்டன. இந்த அரசாங்கத்தில் இருந்துகொண்டு நான் அதனை வன்மையாகக் கண்டிக்கின்றேன். போர் நடக்காதபோதும் அந்த பிரதேசத்தை நீங்கள் ஏன் முற்றாக அழித்தீர்கள்? இன்று நாங்கள் ஒரு பள்ளிக்கூடத்தையோ, ஒரு வீட்டையோ, ஒரு குடும்பத்தையோ கட்டிக்காப்பதற்கு எவ்வளவோ கஷ்டப்படுகின்றோம். மக்கள் தமது மூன்றுவேளை உணவுக்காகக் கஷ்டப்படும் இவ்வேளையில், அந்த மீனவ குடும்பங்கள் இப்படியான இக்கட்டான சூழ்நிலைக்குத் தள்ளப்பட்டிருக்கின்றன.

மண்டைதீவுப் பிரதேசத்தில் 1,000 குடும்பங்கள் வசித்து வருகின்றன. அவற்றில் 750 இற்கும் மேற்பட்ட குடும்பங்கள் மீனவக் குடும்பங்களாகும். கிளிநொச்சி, வவுனியா, மன்னார் போன்ற பிரதேசங்களில் வாழ்ந்த மீனவக் குடும்பங்கள்தான் அங்கே மீளக் குடியமர்ந்திருக்கின்றன. அவர்களின் வாழ்வாதாரத்துக்கும் உதவ வேண்டும். முன்னைய அரசாங்கத்தினால் மற்றைய பகுதி மீனவர்களுக்கு வழங்கப்பட்டதுபோன்று அந்த மீனவக் குடும்பங்களுக்கு மீன்பிடி உபகரணங்கள் வழங்கப்படவில்லை. அது எல்லோருக்கும் நன்றாகத் தெரியும். ஆகையால், இந்தக் குடும்பங்களுக்கு மீன்பிடி உபகரணங்கள் வழங்கவேண்டும்.

மேலும், மண்டைதீவுப் பிரதேசத்தில் வாழும் மீனவர்களின் குடும்பத் தலைவர்கள் மூன்று பேர் இன்றுவரை சிறை வாழ்க்கை அனுபவித்து வருகின்றனர். அதாவது, போதைப்பொருள் கடத்தல் தொடர்பில் கைதுசெய்யப்பட்ட தமிழக மீனவர்கள் ஐந்து பேருக்கும் இலங்கை மீனவர்கள் மூன்று பேருக்கும் மரண தண்டனை விதிக்கப்பட்டிருந்தது. எனினும், கடந்த அரசாங்கத்தினால் தமிழகத்தைச் சேர்ந்த ஐந்து மீனவர்களும் பொதுமன்னிப்பின்கீழ் விடுதலை செய்யப்பட்டனர். ஆனால், குறிப்பிட்ட இலங்கை மீனவர்கள் மூன்று பேரும் விடுதலை செய்யப்படவில்லை. சென்றகிழமை நான் மண்டைதீவுப் பிரதேசத்துக்குச் சென்றபொழுது, அந்த மூன்று மீனவர்களினதும் மனைவிமார் அழுது குழறினார்கள். இதனைப் பார்க்கும்போது எங்களுக்கு மிகவும் கவலையாக இருந்தது. இந்த விடுவிப்பைப் பொறுத்தவரையில் இலங்கையிலே வெளிநாட்டவர்களுக்கு ஒரு சட்டமும் உள்நாட்டில் வசிக்கும் வட பகுதி மீனவர்களுக்கு இன்னொரு சட்டமும் கடைப்பிடிக்கப்பட்டிருக்கின்றது. சட்டம் என்றால் எல்லோருக்கும் சமமாக இருக்க வேண்டும். வெளிநாட்டவர்களுக்கு ஒரு சட்டமும் எமது மக்களுக்கு இன்னொரு சட்டமுமாக இருக்கக்கூடாது. கடந்த காலத்தில் இருந்த அரசாங்கம் நீதியாக நடக்கவில்லை. எனவே, தற்போதிருக்கின்ற அரசாங்கமாவது அந்த மீனவர்களை விடுதலை செய்வதற்கு முன்வர வேண்டும்.

அடுத்து, வட பகுதியின் கரையோரப் பிரதேசங்களில் தண்ணீருக்குத் தட்டுப்பாடு நிலவுகின்ற நிலையில், அங்குள்ள ஐந்து கிணறுகள் மூடப்பட்ட நிலையில் காணப்படுகின்றன. இவை ஏன் மூடப்பட்டுக் கிடக்கின்றன? எனவே, இந்த ஐந்து கிணறுகளையும் உடனடியாகப் புனரமைத்துத் தரவேண்டுமென நான் இச்சபையிலே மேதகு ஜனாதிபதி அவர்களுக்கும் மாண்புமிகு பிரதம அமைச்சருக்கும் பகிரங்க வேண்டுகோள் விடுக்கின்றேன். இந்தக் கிணறுகள் தனியார் காணிகளிலும் பொதுக்காணிகளிலும் இருக்கின்றன. இந்த ஐந்து கிணறுகளையும் புனரமைப்புச் செய்து, மக்களின் பாவனைக்கு விடவேண்டும். அந்தக் கிணறுகள் மூடப்பட்டிருப்பது எங்களுக்குச் சந்தேகத்தை உண்டாக்கியுள்ளது. முன்னைய அரசாங்கத்தின் காலத்தில் படையினர் மற்றும் தமிழ் ஆயுதக்குழுக்களின் நடவடிக்கையினால் எங்களுடைய பிரதேச மீனவக் குடும்பங்களைச் சேர்ந்த பலருடைய சகோதரர்கள், கணவன்மார் காணாமல் போயுள்ளனர். அவர்களுக்கு என்ன நேர்ந்தது என்பதைச் சிலவேளை நாங்கள் இதிலிருந்தும் அறிந்துகொள்ள முடியும். எனவே, இந்தக் கிணறுகளைப் புனரமைப்பதற்கு அரசாங்கம் அனுமதி வழங்கவேண்டும்.

மாண்புமிகு கடற்றொழில் அமைச்சர் அவர்கள் குருநகர் பிரதேசத்துக்கும் சென்றிருக்கின்றார்; "சீ-நோர்" நிறுவனத்துக்குச் சென்றிருக்கின்றார். அதேபோல், மீனவக் குடும்பங்கள் வேலைசெய்யும் தொழிற்சாலைகளுக்கும் சென்றிருக்கின்றார்; அங்கு 300 இளம் பெண்கள் வேலை செய்துகொண்டிருப்பதை அவர் கண்களாலேயே பார்த்திருக்கின்றார். அந்தப் பெண்களின் கைகளைத் தொட்டுப்பார்த்தால் அவை விறைத்துப் போயிருப்பதைக் காணலாம். மூன்றுநேர உணவுக்காக இந்தப் பெண்கள் இவ்வாறு கஷ்டப்படுகின்றார்கள். எனவே, இந்த மீனவக் குடும்பங்களுக்கு மாண்புமிகு அமைச்சர் அவர்கள் தனது அமைச்சினூடாக உதவி செய்யவேண்டும். இது சம்பந்தமாக நான் அவரிடம் வேண்டுகோள் விடுத்திருக்கின்றேன். அவரும் அக்குடும்பங்களுக்கு உதவிசெய்வதாக உறுதியளித்திருக் கின்றார். அதற்காக நான் அவருக்கு இந்தச் சபையிலே நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

அதுமட்டுமல்ல, மாண்புமிகு அமைச்சர் அவர்கள் தனது பதவிக்காலத்தில் மீனவக் குடும்பங்களை அவர்களுடைய சொந்த இடங்களில் மீள்குடியேற்றம் செய்து, அங்கு அவர்கள் தொழில் செய்வதற்குரிய ஏற்பாடுகளையும் செய்துகொடுக்க முன்வரவேண்டும். அந்தக் குடும்பங்கள் குழறி அழுததும், அமைச்சர் அவர்களுடைய கைகளைப் பிடித்து, "நாங்கள் இங்கு 25 வருடங்களாக இருக்கின்றோம்; எங்களை எங்களுடைய சொந்தக் காணிகளில் குடியமர்த்தினால் போதும்; உங்களுடைய உபகரணங்கள் எங்களுக்குத் தேவையில்லை; நாங்கள் சொந்தமாகத் தொழில் செய்து எங்களுடைய குடும்பங்களை முன்னேற்றிக்கொள்வோம்"

என்று கூறியதும் அவருக்கு நன்றாகத் தெரியும். இந்த மீனவக் குடும்பங்கள் வாழும் பிரதேசங்களில் இராணுவ முகாம்கள் இருக்கின்றன. இது தொடர்பில் வர்த்தமானியிலும் பிரசுரிக்கப்பட்டிருக்கின்றது. அந்த வர்த்தமானி அறிவித்தலை உடனடியாக இரத்துச்செய்து, அவர்கள் வாழும் பிரதேசங்களிலுள்ள இராணுவ முகாம்களை அகற்ற வேண்டுமென நான் மீண்டும் கேட்டுக்கொள்கிறேன். மீனவக் குடும்பங்கள் நெரிசலாக வாழுகின்ற பிரதேசங்களில் இராணுவம் நிலைகொண்டிருப்பதை நாங்கள் முற்றுமுழுதாகக் கண்டிக்கின்றோம். நாங்கள் உயர் பாதுகாப்பு வலயத்திலுள்ள இராணுவத்தை அகற்றுமாறு கேட்கவில்லை. மாறாக, நகரத்தில் நிலைகொண்டிருக்கின்ற இராணுவத்தை அகற்றுமாறுதான் கேட்கின்றோம்.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
நன்றி.

[අ.භා. 4.30]

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ධීවර ඇමතිතුමා මේ අවස්ථාවේ ගරු සභාවේ නැති වුණත් මම මේ කරුණ කියන්න ඕනෑ. එතුමාගේ කථාව ආරම්භයේදී පැහැදිලි කළා, මේ සංශෝධන පනත් කෙටුම්පත ගෙනෙන්නේ යුරෝපා හවුලෙන් අපට පනවා තිබෙන මත්ස්‍ය තහනම ඉවත් කර ගැනීම සඳහා ගන්නා ලද පියවරක් විධියට බව.

වර්තමාන ආණ්ඩුව ගිය ජනාධිපතිවරණයේදී මේ රටේ ජනතාවට දීපු ප්‍රතිඥා අතර, කෙටි කාලීන ඉක්මන් වැඩසටහන – 100 දිනක් ඇතුළත ක්‍රියාවට නංවන ක්ෂණික සහන වැඩසටහන - යටතේ ධීවර ජනතාවට බලපාන කරුණු කිහිපයක් ඉදිරිපත් කර තිබුණා. ඒක ධීවර ඇමතිතුමාගේ අවධානයට ලක් වුණා. ඒ කෙටි කාලීන සහන වැඩ පිළිවෙළ යටතේ, -ජනතාව අතර බෙදා හැරිය ඉදිරි මඟ කියන වැඩ පිළිවෙළ යටතේ- ඇති අංක 63, 64, 65 යන වගන්ති තුනම ධීවර ක්ෂේත්‍රයට බලපාන කරුණුයි. අංක 63හි සඳහන් වන්නේ, ධීවර යාත්‍රා, දැල් ආම්පන්න සහ බෝට්ටු එන්ජින් සඳහා දැනට පනවා ඇති අධික බදු ඉවත් කිරීමයි. අංක 64 යටතේ සඳහන් වන්නේ, විදේශ ධීවර යාත්‍රා ලංකා මුහුදු සීමාව ආක්‍රමණය කිරීම වැළැක්වීමයි. අංක 65 යටතේ සඳහන් වන්නේ මත්ස්‍ය අපනයනය සඳහා අහිමි වී තිබෙන යුරෝපා වෙළෙඳ පොළ නැවත ලබා ගැනීමයි. 2015 ජනවාරි මාසයේ 15 වැනිදා ඉඳලා මේ තහනම ක්‍රියාත්මකයි. මේ තහනම නිසා මේ රටට ලැබෙන්න තිබුණු විදේශ විනිමය ඇමෙරිකානු ඩොලර් මිලියන 200ක විතර අපට අහිමි වෙලා තිබෙනවා.

දැන් මේ තත්ත්වය වෙනස් කිරීම අපේ රටේ ධීවර ක්ෂේත්‍රයේ සෘජුව සහ චක්‍රව ධීවර කටයුතුවල යෙදෙන පන්ලක්ෂ හාරසියයක පමණ ධීවර ජනතාවගේ ජීවන තත්ත්වය දියුණු කිරීමට වැදගත් වෙනවා. මොකද, පසු ගිය කාලයේ අපේ ආණ්ඩුව තිබුණ වෙලාවේ සමහර ප්‍රශ්නවලදී ධීවරයින් එළියට බැස්සා. යුරෝපා හවුලේ මේ තහනම පිළිබඳව එදා ධීවරයින්ට හරි දැක්මක්, අවබෝධයක් තිබුණේ නැහැ. ඒ නිසා යුරෝපා හවුල ගෙන ගිය මත්ස්‍ය අපනයන තහනමත් එක්ක ධීවර ක්ෂේත්‍රයේ ඇති වුණු අර්බුදය එදා පැවතුණු ආණ්ඩුව පිට තමයි ගියේ. ඒ නිසා මා කියන්න කැමැතියි, මේ ප්‍රශ්නයට විසඳුම් දෙන්න එදා අවස්ථා ගණනාවකදීම එවකට රජයේ ධීවර අමාත්‍යවරයා හැටියට හිටපු රාජිත සේනාරත්න මැතිතුමා උත්සාහ ගත් බව. ඒ රජයේ හිටපු අමාත්‍යවරයකු හැටියට එතුමාගේ කථාවේදී එතුමා ඒක හොඳින් පැහැදිලි කළා. එතුමා ඉතා පැහැදිලිව වැදගත් කරුණු දෙකක් කිව්වා. එකක් තමයි මේ තහංචිය සඳහා තාක්ෂණික හේතු වාගේම දේශපාලනික හේතුත් තිබෙනවායි කියන එක.

යුරෝපා හවුලේ කටයුතුවලදී ලෝක තත්ත්වයන් පිළිබඳව අපට අත් දැකීම් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හුඟක් වෙලාවට බටහිර රටවල්, රටවල් ඇතුළත ප්‍රශ්න හදන්නත් සමහර පියවර ගන්නවා. කෙසේ වෙතත් මත්ස්‍ය පරිභෝජනය කරන යුරෝපයේ ජීවත් වන ජනතාවට සාධාරණ අයිතියක් තිබෙනවා, ඔවුන් පරිභෝජනය කරන්නේ කවර ස්වභාවයේ මත්ස්‍යයින්ද කියලා දැන ගන්න. ඒ වාගේම තිරසාර සංවර්ධනයක් වෙනුවෙන් ඒ ක්‍රමවේදය සකස් කිරීමේ වැදගත්කමත් තිබෙනවා. ඒක මා ප්‍රතික්ෂේප කරන්නේ නැහැ. ඒ වෙනුවෙන් පසු ගිය රජය කාලයේ තවත් සංශෝධන පනතක් ගෙනාවා. ඒ තමයි 2013 අංක 35 දරන ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත. මේ මූලික පනතට මෙම සංශෝධනය ගෙනාවේ යුරෝපා හවුල ඉදිරිපත් කළ කරුණු සම්පූර්ණ කරන්නයි. ඒක අධ්‍යයනය කළොත් පෙනෙනවා, ඔය කියන කොන්දේසිවලට විසඳුම් ඒ පනතේ අන්තර්ගතයි කියලා. රාජිත සේනාරත්න හිටපු ඇමතිතුමා තමයි මේ පනත ගෙනාවේ. නමුත් එයින් මූලික පියවරයන් රැසක් ගෙන තිබුණා. ඒ අවස්ථාවේ මතු වුණු අනෙක් ප්‍රශ්නය තමයි මේ දණ්ඩනය ප්‍රමාණවත් නැහැ කියන එක. මගේ පෞද්ගලික අදහස හැටියට මම කියන්න ඕනෑ, මේ තිබෙන දඬුවම් බර වැඩියි කියලා. ධීවර ක්ෂේත්‍රයේ හොඳට අත් දැකීම් තිබෙන ගරු ෆිලික්ස් පෙරේරා හිටපු ඇමතිතුමාත් ඒක පැහැදිලි කළා. මොකද, දේශීය ජල තීරයෙන් ඔබ්බට යන්න වන අවස්ථා ඇති වෙනවා. සමහර වෙලාවට මාළු රැනක් සමඟ යන කොට, "චේතනාත්මකව දේශීය ජල තීරයෙන් පිටට ගිහින් මත්ස්‍යයන් අල්ලනවා"ය කියන අදහසකින් තොරව දේශීය ජල තීරයෙන් පිටට ඇදී යන්න වන අවස්ථා තිබෙනවා. ඒ වාගේම මෙවැනි දණ්ඩනයක් නියම කරන විට ඇත්ත වශයෙන්ම ඒ පිළිබඳ විනිශ්චය ආසනයකට දෙන ලද සාක්ෂි සහ ඒ කරුණු තහවුරු කරන්න පුළුවන් තාක්ෂණික පසු බිමක් තවම අපේ රටේ නැහැ. ඒ නිසා මේ වාගේ පනත් කෙටුම්පතක් සම්මත කරලා අපි දඬුවම් නියම කරන කොට ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවරයන්ට ඒක දැඩිව බලපානවා. ඒ නිසා මේක ලාංකීය ධීවර ක්ෂේත්‍රය අධෛර්යවත් කරන්නටත් බලපාන්න ඉඩකඩ තිබෙනවා. ඒ නිසා මේ දණ්ඩනය නියමයන් පිළිබඳව වර්තමාන ධීවර ඇමතිතුමාට මම කියනවා, ඒ ගැන යළි සලකා බැලීමක් කරන එක හොඳයි කියලා. හැබැයි ඒ සලකා බැලීම කරන කොට මතභේද හදාගන්නේ නැතුව යුරෝපා හවුලත් එක්ක සාකච්ඡා කරලා, අපේ රටේ ධීවරයන්ගේ ස්වභාවය පිළිබඳවත් තේරුම් කර දීලා කිසියම් එකඟත්වයකට ඇවිත් ඉදිරි කාලයේ හෝ මේ තත්ත්වය වෙනස් කරගන්න උත්සාහයක් ගන්නවා නම් හොඳයි කියන කාරණය පැහැදිලි කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් කළ වෙලාවෙන් තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණය පිළිබඳවත් මම කියන්න කැමැතියි. මේ ක්ෂණික වැඩසටහන මඟින් කියපු සහනාධාර, ඒ කියන්නේ බදු සහන ලබා දීම සම්බන්ධයෙන් අය වැය තුළ කිසිවක් සඳහන් වෙන්නේ නැහැ. තෙල් මිල අඩු වීම ධීවර ජනතාවට යම් සහනයක් වුණා. ඒක මම ප්‍රතික්ෂේප කරන්නේ නැහැ. නමුත් ධීවර ක්ෂේත්‍රයට මෙවැනි තහංචි නිසා ධීවර ප්‍රජාවට ගැටලුවලට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ඒ නිසා

[ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා]

ධීවර ප්‍රජාව එම තත්ත්වයෙන් මුදාගන්න අවශ්‍ය වූ යම් සහනදායී පිළිවෙත් අනුගමනය කිරීම වැදගත්. ගරු ජෝශප් මයිකල් පෙරේරා ඇමතිතුමනි, ඔබතුමා කියපු ක්ෂණික වැඩසටහනේ 63, 64, 65 යටතේයි මම කථා කළේ. මම මේ ගැන කියන්න හදිසි වෙන්නේ නැහැ. ඔබතුමා ධීවර අමාත්‍යවරයා හැටියට කටයුතු කරපු කාලයේ මට අත් දැකීමක් තිබෙනවා. ඔබතුමා ඒ ගැන සැලකිල්ලක් දක්වයි කියලා මම විශ්වාස කරනවා.

මම අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න කැමැතියි. අපි මේ සියල්ල වෙනස් කරලා, අවශ්‍ය කොන්දේසි සම්පූර්ණ කරලා, ඒ වාගේම මේ දණ්ඩන නියමයන් මෙතැනදී සම්මත කරගෙන ගියත්, හෙට දවසේ අලුත් කොන්දේසි ඉදිරිපත් කරන්නත් පුළුවන්. ඒ නිසා මේක තුළ තිබෙන තාක්ෂණික පැත්ත මෙන්ම හිටපු ධීවර ඇමතිතුමා වන රාජිත සේනාරත්න ඇමතිතුමා කිව්වා වගේ දේශපාලන පැත්තකුත් තිබෙන බව මම විශ්වාස කරනවා.

"ජීඑස්පී" සහනය ගැනත් කථා කළා. ගරු ජෝශප් මයිකල් පෙරේරා ඇමතිතුමාත් ඒ ගැන කිව්වා; ගරු මංගල සමරවීර ඇමතිතුමාත් කිව්වා. ඒ නිසා මේ තත්ත්වය දැන් ටිකක් වෙනස් වෙයි කියා මම හිතනවා. රටේ බලාපොරොත්තුවල මීට වඩා වෙනසක් ඇති වෙලා වඩා සහනදායී තත්ත්වයක් ඇති වෙන්න පුළුවන්. කෙසේ වෙතත් එය නොසලකා නොහැර ඒ පිළිබඳව මැදිහත් වෙන්න. මංගල සමරවීර ඇමතිතුමා මේ සම්බන්ධයෙන් මැදිහත් වන බව කිව්වා, සාකච්ඡා ආරම්භ කරපු බව කිව්වා. ඔබතුමා ධීවර අමාත්‍යවරයා හැටියට මේ කරුණු ගැන වැඩි අවධානයක් යොමු කරලා ධීවර ප්‍රජාවගේ අනාගතය වෙනුවෙන් රටක් හැටියට ගන්න පුළුවන් සියලු ප්‍රයත්න ගනු ඇතැයි මා විශ්වාස කරනවා. ඒ වාගේම අපි මෙයට බාධා නොකරන බවත්, මේ වාගේ යහපත් අදහස්වලදී කිසිම පැකිළීමකින් තොරව අපි සහයෝගය ලබා දෙන බවත් මා ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ස්තුතියි. මීළඟට ගරු සුසන්ත පුංචිනිලමේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.40]

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
මුලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ධීවර ප්‍රජාව වැඩි වශයෙන් ජීවත් වන ප්‍රදේශයක් වන ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් වශයෙනුත්, ඒ වාගේම හිටපු ධීවර නියෝජ්‍ය ඇමතිවරයෙක් වශයෙනුත් මට අපේ නව ධීවර අමාත්‍යතුමාට මතක් කරන්නට කරුණු කිහිපයක් තිබෙනවා. ලංකාවේ මාළු, එහෙම නැත්නම් ටූනා මාළු අපනයනයෙන් විදේශ විනිමය ලබා ගන්නා ආකාරය ගැන බලලා තමයි විශේෂයෙන්ම මේ ඔක්කෝම කථා කළේ. ගරු ඇමතිතුමනි, අපේ රටේ ජනතාවට ලාභෙට මාළු කෑල්ලක් කන්න දෙන්න පුළුවන් ක්‍රමවේදයක් ඇති කරන්න පුළුවන් නම් ඒක ගොඩාක් වටිනවා කියලා තමයි මම විශ්වාස කරන්නේ. මොකද, හිටපු ධීවර හා ජලජ සම්පත් සංවර්ධන ඇමති රාජිත සේනාරත්න මැතිතුමා හැම අවස්ථාවේදීම කිව්වේ මන්දපෝෂණය නැති කිරීම සඳහා මාළු ඉතාම හොඳ ආහාරයක්, ජනතාවට මාළු දෙන්න ඕනෑ කියලා. නමුත් ඒක එහෙම වෙලා නැහැ. හැම අවස්ථාවේදීම අපේ රටේ මිනිසුන්ට මාළු මිලදී ගන්න වෙලා තිබෙන්නේ ගිනි ගණන්වලට. ඒ වාගේම ඒවා හොඳ මාළුත් නොවෙයි. එහෙම නේද ගරු ඇමතිතුමා? ඒ නිසා අන්න ඒකට වැඩ පිළිවෙළක් යොදන්න ඔබතුමාට පුළුවන් නම්, එය හුඟක් වටිනවා කියලා මම හිතනවා.

කෘෂි කර්මාන්තය -වී ගොවිතැන- තමයි අපේ රටේ බහුතර ජනතාවගේ පැවැත්ම වෙලා තිබෙන්නේ. අද වී ගොවිතැන සඳහා සහනාධාරයක් වශයෙන් රුපියල් 350ට ගොවියාට පොහොර ලබා දෙනවා. ගරු ඇමතිතුමනි, අපේ හිටපු ඇමතිතුමාත් කිව්වා වාගේ එවැනි ක්‍රමවේදයක් ධීවරයා වෙනුවෙනුත් හදන්නට පුළුවන් නම් හොඳයි. මොකද, ධීවරයාට අද එවැනි පහසුවක් නැහැ. අද භූමිතෙල් මිල ටිකක් අඩු වෙලා තිබෙනවා, ඒක හොඳයි. ඒක නරක නැහැ. නමුත් ධීවර බෝට්ටුවක් ගන්න ගියාම, ඒකට අවශ්‍ය කරන ආම්පන්න ගන්න ගියාම ධීවර රක්ෂාව කරන අපේ දිස්ත්‍රික්කයේ ධීවරයන් ඇතුළු මේ රටේ සිටින බහුතර ධීවර ජනතාවට විශාල මුදලක් ඒ සඳහා වියදම් කරන්න සිදු වෙලා තිබෙනවා. ඒ නිසා ධීවරයන් වෙනුවෙනුත් එවැනි යම් ක්‍රමවේදයක් ඔබතුමන්ලාගේ නව රජය යටතේ ඇති කරන්න පුළුවන් නම්, ඒකෙන් මේ රටේ මිනිස්සුන්ටත් යහපතක් වෙයි; ඒ වාගේම ධීවර රැකියාව කරන අයටත් ලොකු යහපතක් වෙයි කියලා මම හිතනවා.

මා ඔබතුමාට මතක් කර දෙන්න කැමැතියි, විශේෂයෙන්ම ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය තුළ සිංහල, ද්‍රවිඩ, මුස්ලිම් කියන අපේ සහෝදරයෝ - නෑදෑයෝ - බහුතරයක් කෘෂිකර්මාන්තයට අමතරව ඊළඟට වැඩි වශයෙන් යෙදෙන්නේ කරදිය සහ මිරිදිය ධීවර කර්මාන්තයේ බව. ගරු ඇමතිතුමනි, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ මුලතිව් ඉඳලා පොතුවිල් දක්වා පහළ මුහුදු තීරයේ ඩයිනමයිට් වැනි නීති විරෝධී පන්න ක්‍රම, එහෙම නැත්නම් වෙනත් නීති විරෝධී ක්‍රම මඟින් තමයි අද බහුල වශයෙන් ධීවර රැකියාව කරන්නේ. ඒ විධියට ඩයිනමයිට් යොදා අල්ලා ගන්නා ලද මාළු කොපමණ ප්‍රමාණයක් ගෙනත් තිබෙනවාද කියලා ත්‍රිකුණාමලයේ තොග වෙළඳ මධ්‍යස්ථානයට ගියාම බලා ගන්න පුළුවන්.

විශේෂයෙන්ම ඒ පළාතේ ධීවර ජනතාවගේ බෝට්ටු විශාල ප්‍රමාණයක් license කරලා නැහැ. බොහොම අඩු බෝට්ටු ප්‍රමාණයක් තමයි license කර තිබෙන්නේ. උතුරේත්, නැගෙනහිරත් ධීවර සම්පත ගත්තාම, අපේ අසල්වැසි රට වන ඉන්දියාවේ ධීවරයින් ඇවිල්ලා ඒ ගොල්ලන්ගේ බෝට්ටු අපේ මාදැල් උඩින් - ඒවාට අවහිර වන පරිදි - පවා ධාවනය කරලා, අපේ ධීවර සම්පත විශාල වශයෙන් බලහත්කාරයෙන් නෙළා ගෙන යනවා. ඔබතුමන්ලාගේ මේ නව රජයේ ප්‍රතිපත්ති අනුව, විශේෂයෙන්ම ඉන්දියාවත් එක්ක බොහොම සමීප සම්බන්ධතාවක් තිබෙන නිසා, ඉන්දියාවේ ධීවරයන් ඇවිල්ලා උතුරු පළාතේ අපේ ධීවර සම්පත මංකොල්ල කන එක නතර කර දෙන්න පුළුවන් නම් එය අපේ ධීවර ජනතාවට විශාල සහනයක් වේවි කියලා මා විශ්වාස කරනවා. මේවා කළොත් තමයි ඒ ජනතාවට දැනෙන්නේ. ඔබතුමාත් දන්නවා, ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන NARA ආයතනය තමයි මහ මුහුදේ ධීවර සම්පත පිළිබඳ තොරතුරු සපයන්නේ කියලා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමන්ට නියමිත වෙලාවෙන් තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
පරිසරයේ යම් වෙනසක් සිදු වී තිබෙනවා නම්, ඒ තොරතුරු ලබා දුන්නාම ඒ අනුව මත්ස්‍ය සම්පත බෝ වෙන එක, නැති වෙන එක පිළිබඳ යම් අදහසක් ගන්න පුළුවන් වෙනවා.

ගරු ඇමතිතුමනි, එදා ඔබතුමන්ලාගේ කාලයේ ඒ කටයුතු කරන NARA ආයතනයේ නිලධාරින්ට නවාතැන් ගන්නට ත්‍රිකුණාමලය කලපුවේ ධීවර වරායේ නිවාඩු නිකේතනයක් සමඟ පර්යේෂණ ආයතනයක් තිබුණා. අද වන විට එය අහිමි වෙලා තිබෙනවා. හිටපු ධීවර ඇමතිතුමාටත් එය නැවත ගන්නට බැරි වුණා. ඒ නිසා පරීක්ෂණ පවත්වන්න එන අයට එහි නතර වෙලා හරියාකාරව පරීක්ෂණ පවත්වා, ධීවර සම්පත පිළිබඳව ජනතාවට අවශ්‍ය කරන තොරතුරු ලබා දෙන්න බැරි අවස්ථාවක් අද උදා වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ආරක්ෂක ලේකම්වරයා සහ ආරක්ෂක ඇමතිවරයා සමඟ මේ පිළිබඳව සාකච්ඡා කරලා නැවත එය ලබා ගන්න කටයුතු කරන්න කියලා මා ඉල්ලීමක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මේ කාරණය ගැනත් මා මතක් කරන්න කැමැතියි. ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවට ධීවර ජනතාව අමාත්‍යාංශයට ඇවිල්ලා ගුටි බැට දුන්නේ අපේ හිටපු ධීවර ඇමතිතුමා වන රාජිත සේනාරත්න මැතිතුමාගේ කාලයේයි. ඒ කාරණයත් අප අමතක කරන්න හොඳ නැහැ. අන්න ඒ වාගේ දේවල් නැවත ඔබතුමන්ලාගේ කාලයේ සිදු වන්න දෙන්නේ නැතිව, ඔය කියන යහ පාලනය හොඳ විධියට ධීවර ජනතාවගේ පැත්තටත් ලබා දෙන්න කියන ඉල්ලීමත් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තූතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ස්තූතියි, ගරු මන්ත්‍රීතුමනි.

මීළඟට ගරු පාලිත රංගෙ බණ්ඩාර ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.47]

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා (විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பாலித ரங்கே பண்டார - மின்வலு மற்றும் எரிசக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Palitha Range Bandara - State Minister of Power and Energy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තූතියි.

අපේ දිස්ත්‍රික්කයට අදාළ විෂයක් පිළිබඳව සාකච්ඡාවට භාජන වන මේ අවස්ථාවේ දී ඒ ගැන අදහස් දක්වන්නට අවස්ථාව ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා.

පුත්තලම දිස්ත්‍රික්කයේ, වෙන්නප්පුව සහ ගම්පහ මායිමේ සිට මන්නාරම මායිම දක්වා සම්පූර්ණයෙන් තිබෙන්නේ මුහුදු තීරයක්. විශාල පිරිසක් මේ මුහුදු තීරයේ ධීවර කර්මාන්තයේ නියැළෙනවා. විශේෂයෙන්ම ලංකාවේ අනෙක් ප්‍රදේශවලට වඩා සුවිශේෂී වෙනසක් තිබෙන කොට්ඨාසයක් තමයි පුත්තලම කලාපය. මොකද, කළපු දෙකක්, ඒ වාගේම දූපත් 18කින් සමන්විත මුහුදු කලාපයක් තිබෙන ලංකාවේ එකම ප්‍රදේශය පුත්තලම මුහුදු කලාපයයි. ඒ අතරින් සුවිශේෂී තැනක් ගන්න ස්ථානයක් තමයි, බත්තලන්ගුණ්ඩුව. මීගමුවේ ධීවර ජනතාව බත්තලන්ගුණ්ඩුවට ගිහින් පදිංචි වෙලා තමන්ගේ ධීවර කර්මාන්තයේ යෙදෙමින් රටේ ජනතාවට අවශ්‍ය මත්ස්‍ය සම්පත ලබා දෙන්නට දායක වෙනවා.

පුත්තලම කලාපයේ කළපු දෙකේත්, මුහුදු තීරයේත් ධීවර කර්මාන්තයේ යෙදෙනවා වාගේම, මිරිදිය ධීවර කර්මාන්තයේ යෙදෙන අතිවිශාල ප්‍රමාණයකුත් ඉන්නවා. ප්‍රසිද්ධ මිරිදිය ජලාශ ගණනාවක් තිබෙන කලාපයක් තමයි පුත්තලම කලාපය. කරදිය සහ මිරිදිය කියන වර්ග දෙකෙන්ම මත්ස්‍ය නිෂ්පාදනය ලබා දෙන ප්‍රදේශයක් තමයි අපේ ප්‍රදේශය.

අපේ රටේ නිෂ්පාදන දිහා බැලුවාම වියදමකින් තොරව - කවුරුවත් කෑම දෙන්නේ නැතිව, බෙහෙත් දෙන්නේ නැතිව, නඩත්තු කරන්නේ නැතිව - කරන්න පුළුවන් එකම නිෂ්පාදනය අපේ මේ මත්ස්‍ය සම්පත බව අපට පෙනෙනවා. මුහුදේ, නැත්නම් මිරිදිය ජලාශවල හැදෙන මත්ස්‍යයන් අල්ලාගෙන ඇවිත් ජනතාවට අළෙවි කරලා විනිමය -ආදායම- හොයා ගන්න පුළුවන් මාර්ගයක් තමයි මේ ධීවර කර්මාන්තය කියන්නේ. හැබැයි, එම කර්මාන්තය කරගෙන යන ධීවර කාර්මිකයන්ට ගැටලු රාශියක් තිබෙනවා. මෑත යුගයේ දී යුරෝපා සංගමය විසින් ලංකාවේ මත්ස්‍ය සම්පත මිලදී ගැනීමට පනවන ලද තහංචිය; බාධකය ඒ අතර ප්‍රධානම ගැටලුව බවට පත් වෙලා තිබෙනවා. දිගින් දිගට නීති උල්ලංඝනය කරමින් ලංකාවේ ජනතාව මෙල්ල කරනවා වාගේම, අනෙක් පැත්තෙන් අප ලෝකයේ ජනතාවටත් සෙල්ලම් දමන්නට ගියා. ඒ සෙල්ලම් දමන කොට බලාගෙන ඉඳලා, ඉඳලා ඒ උදවිය අප කරන වැරැදි නවත්වන්න උපදෙස් දුන්නා. සහයෝගයෙන්, සංවාදයෙන් ඒවා බේරා ගන්න උත්සාහ කළා. නමුත් ඒවාට අවනත නොවනකොට ටිකෙන් ටික ඒ අය අපව කොනිත්තන්න පටන් ගත්තා. ඒකේ ප්‍රතිඵලය කොයි තරම් දුරට ආවාද කියනවා නම්, පසු ගිය රජය කාලයේ ලංකාවේ මත්ස්‍ය සම්පත යුරෝපා වෙළෙඳ පොළට මිලදී ගැනීමත් නතර වුණා. මේකෙන් පහර වැදුණේ කාටද? පාලකයන්ටද, ධීවරයන්ටද, එහෙම නැත්නම් පාලිතයන්ටද? පාලකයා දරදඬු වෙලා, අනෙක් උදවියට චණ්ඩිකම් පෙන්වනකොට රිදුණේ පාලිතයන්ටයි. මොකද, ලෝක ප්‍රජාව ගහනකොට ඒ ප්‍රහාරය වදින්නේ මේ රටේ ඉන්න කුඩා ජනතාවටයි. ධීවර ජනතාව තමන්ගේ මහන්සිය යොදලා මත්ස්‍ය සම්පත ගෙනාවත්, ඒ මත්ස්‍ය සම්පත විදේශ වෙළෙඳ පොළට විකුණා ගන්න බැරිව යනකොට මාළු මිලට ප්‍රශ්නයක් ඇති වෙනවා. ඉතින් ධීවරයාගේ ආදායමට තමයි මේ ප්‍රශ්නය බලපෑවේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය වකවානුවේ ධීවර ජනතාවගේ ආදායමට වඩා වියදම බෙහෙවින්ම වැඩි වෙලා තිබුණා. මොකද, ධීවර ආම්පන්නවලට යන වියදම අධික වෙලා තිබුණා. බෝට්ටු, දැල් ආදියට යන වියදම අධික වෙලා තිබුණා. ඒ වාගේම නව තාක්ෂණය පාවිච්චි කරන්න විධියක් නැහැ. ඒ නව තාක්ෂණයට යන මිල ඉහළ ගිහින් තිබුණා. මේ වාගේ කාරණා නිසා ධීවරයා අසීරුතාවට පත් වෙලා තිබුණා. මෙන්න මේ නිසා ධීවර ජනතාව රටේ පැවැති රජයෙන් ඉතාම සාධාරණ සහ යුක්ති සහගත ඉල්ලීමක් කළා.

රටේ සෑම කාර්යයකටම අවශ්‍ය වන ඉන්ධන ධීවර කර්මාන්තයටත් අත්‍යවශ්‍යයි. තමන්ගේ වියදම ආදායම අභිභවා යන නිසා ජීවනෝපාය ගොඩ නඟා ගන්න බැරි තත්ත්වයකට, පවුලේ ජීවිත ආරක්ෂා කර ගන්න බැරි තත්ත්වයකට ධීවර ජනතාව පත් වුණා. එම නිසා ධීවර ජනතාව ඉතාමත් සාධාරණ ලෙස රජයට කරුණු කියන්නට ආවා. ඒ ගොල්ලෝ විප්ලව කළේ නැහැ; දේපොළ විනාශ කළේ නැහැ; දේපොළ ගිනි බත් කළේ නැහැ; ජීවිත විනාශ කළේ නැහැ; නීතිය කරන උදවියට පහර දුන්නේ නැහැ; ඒ උදවිය ඝාතනය කළේ නැහැ; ඒ නීතිය කරන උදවියගේ අවි ආයුධ උදුරා ගන්න ගියේ නැහැ; ඒ ආයතන කුඩු පට්ටම් කළේ නැහැ. ඒ උදවිය ඇවිල්ලා ඉතාමත් සාධාරණ විධියට රජයෙන් ඉල්ලීමක් කළා, "කරුණාකරලා සාධාරණ මිලට ඉන්ධන දෙන්න, රටේ මිනිසුන්ට හොඳට කාලා, බීලා සාධාරණව ජීවත් වන්න පුළුවන් පරිසරයක් හදන්න අපි මුහුදට ගිහිල්ලා මේ රටේ ජනතාවගේ ආහාරයට අවශ්‍ය ඉතාමත් වටිනා පෝෂ්‍යජනක ආහාරය වන මත්ස්‍ය සම්පත ගෙනැවිත් දෙන්නම්"යි කියලා. ඒ මිනිස්සු එළියට බැහැලා ඒ ඉල්ලීම කරන කොට පාලකයන් ඒ

[ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා]

ඉල්ලීමට එරෙහිව මොකද කළේ? කඳුළු ගෑස්වලින් සහ බැටන් පොලුවලින් සංග්‍රහ කරන්න පටන් ගත්තා. විශේෂයෙන්ම ඒ මුහුදු තීරයේ තිබෙන කතෝලික දේවස්ථානවල පියතුමන්ලා, ඒ වාගේම රදගුරුතුමන්ලා මේ විපත දැකලා ජනතාවගේ ජීවිත ආරක්ෂා කිරීම සඳහා, දේපොළ ආරක්ෂා කිරීම සඳහා ජනතාවගේ ආරක්ෂකයින් විධියට එළියට ආවා. ඉස්සරහට ඇවිල්ලා ඔවුන්ව රැකීමට උත්සාහ කළා. පියතුමන්ලා සහ බිෂොප්තුමන්ලා එළියට ඇවිල්ලා පැවැති රජයේ නිලධාරින් එක්ක, පාලකයින් එක්ක සාකච්ඡා කළා. බිෂොප්තුමන්ලාට, පියතුමන්ලාට විවිධාකාර පොරොන්දු දුන්නා. ඉන්ධන සහනයක් ලබා දෙනවාය කිව්වා, සාධාරණ මිලකට ඉන්ධන දෙනවාය කිව්වා. ඒ වාගේම බෝට්ටුවලට, දැල්වලට සහ උපකරණවලට සාධාරණ සහනයක් දෙනවාය කියලා පොරොන්දුවක් දුන්නා. ඒ අනුව මුල් අවස්ථාවේදී ජනතා උද්ඝෝෂණය යටපත් කර ගන්න පුළුවන් වුණා. නමුත් ජනතාව දිගින් දිගටම රවටන්න බැහැ. ජනතාව බලා ගෙන සිටියා. නමුත් තමන්ගේ අවශ්‍යතාව, ඉල්ලීම ඉෂ්ට වන්නේ නැති වුණාම ජනතාව නැවතත් වීදි බහින්න පටන් ගත්තා. ඔවුන් සාධාරණව තමන්ගේ ඉල්ලීම් ඉදිරිපත් කළා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමාට වෙන් කර තිබෙන විනාඩි 10ක කාලයත් මට ලබා ගන්න අවසර දීලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ ධීවර ජනතාව එළියට බැහැලා තමන්ට සාධාරණය ඉෂ්ට කරන්න කියලා ඉල්ලීම් කළා. ඒ ධීවර ජනතාව වීදි බැහැලා, තමන්ගේ මුහුදු තීරයේ ඉඳගෙන මනුෂ්‍යත්වයේ නාමයෙන් සාධාරණව තමන්ගේ අවශ්‍යතාව ඉදිරිපත් කරන කොට පියතුමන්ලාට පොරොන්දු දුන්නු, බිෂොප්තුමන්ලාට පොරොන්දු දුන්නු රජය මොකක්ද කළේ? ධීවර ජනතාව ඉදිරියට ගිහින් ඔවුන්ට බැටන් පොල්ලෙන් පහර දුන්නා, කඳුළු ගෑස් ගහලා ඔවුන්ව එළෙව්වා. ඊට පස්සේ විශේෂ කාර්ය බලකාය, හමුදාව යොදවලා ඔවුන්ට වෙඩි තැබුවා. ඉල්ලුවේ ඉන්ධනවලට සාධාරණ මිලක්. පිළිතුරු දුන්නේ උණ්ඩයෙන්. වන්දිය ගත්තේ ජීවිතවලින්. මෙන්න මේ විධියට තමයි ධීවර ජනතාවට සංග්‍රහ කළේ, සැලකුවේ. අපි නියෝජනය කරන හලාවත දිස්ත්‍රික්කයේ එක්සත් ජනතා නිදහස් සන්ධාන රජය බිහි කිරීම සඳහා කැප වීමෙන් වැඩ කරපු, සංවිධාන කටයුතු කරපු ඇන්ටනි ප්‍රනාන්දු සාතනය කළා. ඔබතුමා නියෝජනය කළ පැවැති රජය පුත්තලම දිස්ත්‍රික්කයෙන් පළමුවන බිල්ල ගත්තා. ඒ බිල්ල අරගෙන නතර වුණේ නැහැ. රිගන් ඇතුළු තවත් තුන්දෙනකුට බරපතළ තුවාල සිදු කළා. වැල්ලේ බෝට්ටු තල්ලු කරමින්, මහ දියඹේ දැල් එළමින්, මත්ස්‍ය සම්පත මෙරටට ගෙනාපු ශක්තිමත් පුරුෂයින් තුන්දෙනකු සදා කල් ආබාධිතයින්, රෝගින් බවට පත් කළා. මාසයකට ශත පහක දීමනාවක්, ආදායමක් නැතුව අනුන්ගෙන් යැපෙන පුද්ගලයින් බවට ඔවුන්ව පත් කළා. මේක තමයි ධීවරයාට දුන්නු ඉන්ධන සහනාධාරය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඒ දවස්වල තර්ක කරමින් කිව්වා, "මේක සාධාරණ ඉල්ලීමක්. මේ සාධාරණ ඉල්ලීම ඉෂ්ට කරන්න. ධීවරයාට තමන්ගේ ජීවිතය රැක ගන්න ඉඩකඩ සලසා දෙන්න" කියලා. එවකට පැවති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජය මොකක්ද කිව්වේ? "ඉන්ධන මේ මිලට දෙන්නේත් ඉතාම අසීරුවෙන්, මීට වඩා අඩුවෙන් දෙන්න විධියක් නැහැ, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව කඩා වැටෙනවා, ඒ වාගේම රටේ ආර්ථිකය කඩා වැටෙනවා, මේ දෙන්නෙත් බොහොම අමාරුවෙන්, මේ ගාණට දෙන්නත් බැහැ, මීට වඩා අඩුවෙන් දුන්නොත් ඉවරයි" කිව්වා.

ජනවාරි මාසයේ 10වෙනි දා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත් සමඟ ඇති කළ යුග පෙරළියත් සමඟ අපි 19වෙනි දා ගිහින් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය භාර ගත්තා. අපි මේක අධ්‍යයනය කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි එදා කිව්වා වාගේම ගිහින් බලන විට පෙනුණා, එක පෙට්‍රල් ලීටරයකින් රුපියල් 67ක් මහින්ද රාජපක්ෂ මහත්මයාගේ රජය ජනතාවගෙන් බදු වශයෙන්, එහෙම නැත්නම් ලාභ වශයෙන් අරගෙන තිබෙන බව. මේ විධියට භූමිතෙල්වලිනුත් ගත්තා; ඩීසල්වලිනුත් ගත්තා. අපි වහාම ක්‍රියාත්මක වෙලා භූමිතෙල් මිලත්, පෙට්‍රල් මිලත්, ඩීසල් මිලත් අඩු කළා. ඒ සඳහා අමාත්‍යාංශය භාර ගෙන දවස් 4යි ගත වුණේ. දවස් 14ක් යන විට අපේ මුදල් අමාත්‍ය ගරු රවි කරුණානායක මැතිතුමා මේ රටට අතුරු අය වැය ලේඛනයක් ඉදිරිපත් කළා. ඒ අය වැය ලේඛනය ඉදිරිපත් කරන විට අපි නැවත වරක් භූමිතෙල් ලීටරයේ මිල තවත් රුපියල් 6කින් අඩු කළා. නව රජයක් බිහි වෙලා දින 14ක් ඇතුළත, මෛත්‍රී පාලනයක් ඇවිල්ලා දින 14ක් ඇතුළත භූමිතෙල් ලීටරයක මිල රුපියල් 22කින් අඩු කරලා ජනතාවට ලබා දුන්නා.

මුහුදු යන ධීවරයා අද සතුටින් කථා කරනවා. ඔවුන්ගේ දවසක වියදම රුපියල් 2,000කින් අඩු වුණා කියලා ඔවුන් බොහොම සන්තෝෂයෙන් කථා කරනවා. අද ඔවුන් වෙන දා ගිය ප්‍රමාණයට වඩා මුහුදේ ඈතට ගිහින්, දියඹට ගිහින් වැඩිපුර මත්ස්‍ය සම්පත ගේන්න පුරුදු වෙලා තිබෙනවා. ඒ අයගේ වියදම අඩු වුණා. ඒ නිසා ඒ අයට මත්ස්‍ය සම්පත වැඩිපුර අල්ලා ගන්න පුළුවන් වෙලා ඔවුන්ගේ ආදායම වැඩි වෙලා තිබෙනවා.

ජනවාරි මාසයේ 08වෙනි දා ජනතාව ගත්ත ඉතා වටිනා වූ මෛත්‍රී පාලනයක් බිහි කිරීමේ යුග තීන්දුවත් සමඟ මිනිසුන් මර්දනය කරමින්, මිනිසුන් සාතනය කරමින් පාලකයින් යැපෙන යුගය අවසන් කරන්නට පුළුවන් වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක තමයි කළ යුතු කාරණය වෙන්නේ. ජනතාව ජීවත් කරවීම සඳහා තමයි රටක පාලනයක් ඇති කළ යුත්තේ. එහෙම නැතිව ජනතාව මර්දනය කිරීමට නොවෙයි; විප්ලව කරන, උද්ඝෝෂණ කරන, සාධාරණ ඉල්ලීම් කරන මිනිසුන්ව පැහැර ගෙන යන්න සුදු වෑන් එවන්නට නොවෙයි; තමන්ගේ ඉල්ලීම් වෙනුවෙන් සටන් කරන, උද්ඝෝෂණය කරන මිනිසුන්ව සාතනය කිරීමට නොවෙයි; ඇත්ත යුක්තිය කථා කළාම, Beverly Palace වාගේ ඒවා හදන විට මේවාට විරුද්ධව කථා කළාම, ඒවා පෙන්වා දුන්නාම ඒවා පෙන්වා දුන් මිනිසුන්ගේ දේපොළ ගිනි තියලා මහ පාරට දාන්නට නොවෙයි. නමුත් පසු ගිය වකවානුවේ සිද්ධ වුණේ ඒකයි.

අපි දෙනියායේ ගිහින් මඟ නැහුමෙන් ඉදි කළ බංගලාව බලලා හලාවතට යන්න ඉස්සෙල්ලා මගේ කාර්යාලය ගිනිබත් කරලා දැම්මා. මට රුපියල් කෝටි එකහමාරක පමණ අලාභයක් සිදු කළා. ඒ, අතීතය. එහෙම නම් ඒ ජරස්ත අතීතය අමතක කරමින්, මකා දමමින් රටට යහ පාලනයක් ගේන්නට හැකියාව ලැබුණු නිසා තමයි අද ධීවරයින්ගේ ආර්ථික ප්‍රශ්නය, ජීවන ප්‍රශ්නය විසඳන්නට කටයුතු කරන්නට පුළුවන් වෙලා තිබෙන්නේ. ඒ වාගේම අනෙක් පැත්තෙන් ධීවරයාට දැඩි ලෙස බලපාන කාරණයක් බවට පත් වෙලා තිබුණු මත්ස්‍ය සම්පත ජාත්‍යන්තර වෙළෙඳ පොළට විකුණා ගැනීමට බැරිව තිබුණු ප්‍රශ්නයට පිළිතුරක් ලබා දෙන්න පුළුවන් තත්ත්වයක් ඇති කිරීමටත්,

ධීවරයාට සහනයක්, සාධාරණයක් ඉෂ්ට කරන්නට පුළුවන් තත්ත්වයක් ඇති කිරීමටත් මෙම සංශෝධන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනැල්ලා තිබෙනවා. වැරදි කරන පුද්ගලයන්ට නිසි දඬුවම් ලබා දීමටත්, නිවැරදි පුද්ගලයින් ආරක්ෂා කරගෙන ඔවුන් සහ ඒ සමාජය යහපත් තැනට ගෙන යන්නට පුළුවන් වෙන විධියට කටයුතු කරන්නටත් ධීවර අමාත්‍ය ගරු ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමා අද පියවර අරගෙන තිබෙනවා. මේ ක්‍රියාවලිය ඉතාම ප්‍රශංසනීය ක්‍රියාවලියක්. එතුමා කාලයක් ධීවර ඇමතිවරයා වශයෙන් වැඩ කළා. අපි ඒ කාලයේ ඉස්කෝලේ යනවා. එතකොට අපි දේශපාලනයට ඇවිත් නැහැ. අපට මතකයි, එතුමා ධීවර සමුපකාර සංගම් හැදුවා; ගම්වල ධීවර සංවිධාන හැදුවා; නිවාස වැඩසටහන් හදුන්වලා දුන්නා. පැල්කොටේ හිටපු ධීවරයාට නියමිත පරිදි ගෙයක ජීවත් වෙන්න පුළුවන් පරිසරය හැදුවා. විදුලි ලාම්පුවක්, විදුලි එළියක් දකින්නේ නැතුව කුප්පි ලාම්පුවෙන් පන්දම් එළියෙන් ජීවත් වුණු ධීවරයාගේ නිවසට විදුලිය ලබා දෙන්න කටයුතු කළා. ඒ ප්‍රදේශවල ජනතාවට සකසුරුවම් ණය ක්‍රම, අධ්‍යාපනය සඳහා පාසල් ආරම්භ කිරීම ආදී සියල්ල එදා එක්සත් ජාතික පක්ෂ රජයක් තුළ සිදු වුණා. ඒ වැඩ පිළිවෙළේ පුරෝගාමීන් විධියට වැඩ කටයුතු කරපු නායකයින් දෙදෙනෙකු අපි දකිනවා. එතුමන්ලා තමයි, වර්තමාන ස්වදේශ කටයුතු හා ධීවර අමාත්‍යතුමා වන ගරු ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමා හා අපේ දිවංගත ෆෙස්ටස් පෙරේරා අමාත්‍යතුමා. එතුමන්ලා දෙදෙනා කරපු ඒ සේවාව අපි ඉතාම ගෞරවයෙන් සිහිපත් කරනවා. හැබැයි, එතුමන්ලාගේ යුගවල කවදාවත් බෝට්ටු ඉල්ලුවාම, දැල් ඉල්ලුවාම, සහන ඉල්ලුවාම, තෙල් මිල අඩු කරන්න කිව්වාම ධීවරයන්ට වෙඩි තියලා මැරුවේ නැහැ; බලහත්කාරයෙන් අරගෙන ගිහිල්ලා වැළළුවේ නැහැ; තමන්ගේ පවුලේ සාමාජිකයන්ට එන්න බැරි වෙන්න හමුදාව දමා කටයුතු කළේ නැහැ; පියතුමන්ලාට බොරු පොරොන්දු දුන්නේ නැහැ; බිෂොප් වහන්සේලාට බොරු පොරොන්දු දීලා රැවටුවා නැහැ. පසු ගිය වකවානුව තුළ ආගමික නායකයාත් රැවැට්ටුවා. ගමේ මිනිහාත් රැවැට්ටුවා, ධීවරයාත් රැවැට්ටුවා. ඒ යුගය අවසන් කර යහපත් යුගයක වැඩ කටයුතු කරන්න ඉඩකඩ සැලසීම නිසා අද ධීවර ජනතාවට පමණක් නොව සියලු ජනතාවට සාධාරණව ජීවත් වෙන්න පුළුවන් යුගයක් නිර්මාණය වීම පිළිබඳව අපි සියලු දෙනා සන්තෝෂ වෙන්නට අවශ්‍යයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිවන්ත වන අතර මෙවැනි පනත් කෙටුම්පතක් ගෙනැල්ලා ධීවර ජනතාවගේ සුරක්ෂිතභාවය සහ ඔවුන්ගේ වෘත්තීය ආරක්ෂා කිරීමට පියවර ගැනීම පිළිබඳව අපේ ස්වදේශ කටයුතු හා ධීවර අමාත්‍ය ගරු ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමාටත්, ඒ වාගේම අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත්, අපේ ධීවර ජනතාව වෙනුවෙන්, විශේෂයෙන් පුත්තලම් දිස්ත්‍රික් ජනතාව වෙනුවෙන් ප්‍රසාදය පුද කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු රාජ්‍ය අමාත්‍යතුමාට ස්තුතියි. මීළඟට ගරු අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමා.

[අ.භා. 5.03]

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து)
(The Hon. Arundika Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තරුණ මන්ත්‍රීවරයෙකු හැටියට, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තරුණ සංවිධානයේ සභාපති ධුරයට පත් වීම සම්බන්ධව මුලින්ම මා ඔබතුමාට සුබ පතනවා. අපේ රටේ ධීවරයන්ට පැන නැඟුණු මේ ගැටලුවට අදාළව වචන කිහිපයක් ප්‍රකාශ කරන්න ඔබතුමා මූලාසනයේ සිටින විට දී අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රට දියුණු කරන්න නම් ප්‍රධාන අංශ තුනක් දියුණු කරන්නට වුවමනා බව හැමදාමත් අපි කිව්වා. එයින් එක් අංශයක්, මේ රටේ කෘෂි කර්මාන්තය. මේ රටේ කෘෂි කර්මාන්තය දියුණු කරන්න වුවමනායි. මේ රටේ කෘෂි කර්මාන්තය, සංචාරක ව්‍යාපාරය හා ධීවර කර්මාන්තය කියන අංශ තුන දියුණු කළොත් අනිවාර්යයෙන් මේ රට දියුණු කිරීමට හැකියාව ලැබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යුරෝපා සංගමය - European Union එක- විසින් අපේ ධීවරයන්ට පනවා තිබෙන මත්ස්‍ය අපනයන තහනම සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍ය ගරු මංගල සමරවීර මැතිතුමා සාධනීය පියවර කිහිපයක් අරගෙන තිබෙනවා. ධීවරයන්ගේ ධීවර නිෂ්පාදන මිලදී ගැනීම සම්බන්ධයෙන් පනවා තිබෙන මේ තහනම ගැන කථා කරද්දී මේ පවතින රජය -වර්තමාන රජය- එක කාරණයක් පැහැදිලි කර ගන්නට වුවමනායි. එක කාරණයකට අපට පිළිතුරු වුවමනායි. ඒ මොකක්ද? මේ රටේ විදේශ අමාත්‍යවරයා ඒ ගත්තා වූ සාධනීය පියවරත් එක්ක ඉදිරියට ගිහිල්ලා, මේ තහනමේ සැබෑ අරමුණ මොකක්ද කියන එක සොයා ගැනීම. යුරෝපා සංගමය පනවා තිබෙන තහනමේ සැබෑ අරමුණ මොකක්ද කියන එක පිළිබඳව සාකච්ඡා කර, ඒක හොයා ගන්න ඕනෑ. ඒකට තමයි මුලින්ම පිළිතුරු දෙන්න ඕනෑ.

මෙහි දේශපාලන අරමුණක් තිබෙනවා නම්, මම හිතන්නේ ධීවරයන්ගේ පැත්තෙන් මොනවා කළත් වැඩක් නැහැ කියායි. ඒ අයගේ දේශපාලන අරමුණට අවශ්‍ය කරන පිළියම යොදන්න ඕනෑ. අපට මතකයි, ඒ වෙලාවේ චීන නැව් දහයක් වාගේ ප්‍රමාණයක් ධීවර අමාත්‍යාංශය හරහා අපේ ධජය අරගෙන අපේ මුහුදේ මත්ස්‍යයින් ඇල්ලීම දිගටම සිද්ධ කළා. චීනයත් සමඟ තිබෙන ප්‍රශ්නයකටද අපට වන්දි ගෙවන්න සිද්ධ වෙලා තිබෙන්නේ කියන කාරණාව අපි ඉස්සෙල්ලාම විසඳාගන්න ඕනෑ.

චීනය තරහා කර ගෙනත් මේ වැඩේ කරන්න බැහැ. චීනය කියන්නේ මේ රටට බලපාන ප්‍රධාන බල කඳවුරු දෙකෙන් එකක්. අපි සමහර දේවල් සම්බන්ධයෙන් හැම තිස්සේම වාගේ චීනය ඇදාගෙන කථා කරනවා. තමුන්නාන්සේලාගේ නව රජය එක වෙලාවක කිව්වා, චීනයත් එක්ක කරගෙන යන කොළඹ වරාය නගරය ව්‍යාපෘතිය තහනම් කරනවා කියා. හැබැයි, තමුන්නාන්සේලාට ඒක තහනම් කර ගන්න බැරි වෙලා තිබෙනවා. චීනය තරහා කරගෙන යන්න බැහැ. ධීවර අමාත්‍යාංශය ධීවරයන් සම්බන්ධයෙන් -විශේෂයෙන් මත්ස්‍යයන් ඇල්ලීම සම්බන්ධයෙන්- චීනය සමඟ යම්කිසි ගනුදෙනුවක් සිද්ධ කළා. දේශපාලන අරමුණක් තිබෙනවා නම් ඒ බල කඳවුරු දෙකටම සම්බන්ධ වන්නේ නැතිව, මැද මාවතක් අනුගමනය කරමින් ඒකට පිළියමක් යොදන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා නියෝජනය කරන පුත්තලම දිස්ත්‍රික්කයේ, විශේෂයෙන් මගේ මැතිවරණ කොට්ඨාසය වන වෙන්නප්පුවේ තමයි බහුදින යාත්‍රා ධීවරයන් වැඩිම පිරිසක් ඉන්නේ. දැන් මේ ගරු සභාවේ අපේ ගරු සරත් කුමාර ගුණරත්න හිටපු ධීවර නියෝජ්‍ය අමාත්‍යතුමා සිටිනවා. එතුමා විශාල වැඩ කොටසක් කළා. ඒ වාගේම හිටපු ධීවර අමාත්‍යතුමා වන ගරු රාජිත සේනාරත්න අමාත්‍යතුමාත් විශාල වැඩ කොටසක් කළා. මේ රටේ හිටපු සියලු ධීවර අමාත්‍යවරුන් තමන්ගේ ශක්ති ප්‍රමාණයෙන් දැවැන්ත වැඩ කොටස් රාශියක් කර තිබෙනවා. විශේෂයෙන් පුත්තලම දිස්ත්‍රික්කයේ සිටින ජනතාවට - බහුදින යාත්‍රා මඟින් ධීවර රස්සාවේ යෙදෙන අයට- ප්‍රධාන

[ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා]

ගැටලුවක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අල්ලා ගත් මසුන්ගෙන් පළමුවැනි quality එකට -first quality එකට- Quality "A" කියා අපි කියනවා. Quality "A" යවන්නේ විශේෂයෙන් ජපානයට සහ ඇමෙරිකාවටයි. ජපානයේ "ශෂිමි" කියන කෑම වර්ගය සඳහා තමයි පළමුවැනි quality එක යවන්නේ. අපි අල්ලා ගන්නා ඒ මාළු quality දෙකකට වර්ග කරනවා. ඒ අතරින් දෙවැනි quality එක තමයි අපි European Union එකට යැව්වේ. දැන් ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා, මෙහි දේශපාලන අරමුණක් නැත්නම් ධීවරයන් භාවිත කරන උපක්‍රම, එහෙම නැත්නම් තාක්ෂණික ක්‍රම සම්බන්ධව ද තහනම පනවා තිබෙන්නේ කියා. VMS එක කියන්නේ මාළු සොයා ගන්නා යාත්‍රා සුපරීක්ෂණ පද්ධතියයි. මේ තහනමේ තිබෙනවා අපි දැක්කා, ධීවරයන්ගේ ලියා පදිංචි අංකය බෝට්ටුවේ ප්‍රදර්ශනය කරන්න කියා. ධීවරයන් මරු වැල් සඳහා උණ බටයක් වාගේ දෙයක් යොදා ගන්නවා. ලියා පදිංචි අංකයත් සමඟ කොඩි දමන්න කිව්වා. සමහර වෙලාවට European Union එක මේ වාගේ සරල කාරණාත් කිව්වා. මෙහිදී විශේෂයෙන් කියන්න ඕනෑ, European Union එකට යැව්වේ දෙවැනි quality එකයි කියන එක. එහෙම නම් මේ පිළිබඳව සාකච්ඡා කරන්න ඕනෑ.

අනෙක් කාරණාව මේකයි. විශාල වශයෙන්, සමාගම් තිබෙනවා. ධීවර නිෂ්පාදන පිට රට යවන සමාගම් රාශියක් තිබෙනවා. ඒ සමාගම් බල අධිකාරියක් පිහිටුවාගෙන තිබෙනවා. ඒ සමාගම් විදේශ නැව්වලින්, එහෙම නැත්නම් චීන නැව්වලින් එන ඒවාට ප්‍රමුඛතාව දෙනවා. එවිට අපේ ධීවරයෝ අසරණ වෙනවා. සමහර වෙලාවට අපෙේ ධීවරයන් තමන්ගේ නිෂ්පාදන ගෙනාපු ලොරි ගාල් කරගෙන දවස් ගණන් -දවස් දෙකතුන- බලාගෙන ඉන්නවා. එහෙම බලාගෙන ඉන්න කොට අර සමාගම් නැව්වලින් ගෙනෙන මාළු ටික ගන්නවා. නැව්වලින් ගෙනෙන මාළු ටික සමහර විට අඩු මිලට ගන්නවා. අඩු මිලට අරගෙන ඒ අයට වාසිය සලස්වා ඒ නැව් මාළු ටික විතරක් සම්පූර්ණයෙන් පිට රටවලට යවනවා. අපේ ධීවරයෝ -බහුදින යාත්‍රා ධීවරයෝ- බලාගෙන ඉන්නවා. සමහර වෙලාවට ඒ අය ගෙන ආ මාළුවල quality එක බාල වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අනිවාර්යයෙන් මේවාට විසඳුම් ලබා දෙන්න ඕනෑ. පළමුවැනි කාර්යය හැටියට, නැව්වලින් ගෙනෙන ධීවර නිෂ්පාදන මෙහෙන් පිට රට යවන නැව් සමාගම් සහ ධීවරයන් අතර සම්බන්ධීකරණයක් -සම්බන්ධතාවක්- ඇති කරන්න ඕනෑ. පසු ගිය කාලයේ එහෙම කරන්න විශාල වශයෙන් උනන්දු වුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ගරු සභාවේ සමහර අය හැම තිස්සේම වාගේ කථා කරනවා, පසු ගිය රජය ධීවරයන් සම්බන්ධයෙන් කිසි දෙයක් සිද්ධ නොකරපු ආකාරයට. මේ වෙලාවේ කියන්න ඕනෑ, හිටපු අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රටේ ධීවරයන්ට ලබා දීපු ලොකුම සහනය, යුද්ධය අවසන් කර දීපු එකයි කියා. අපේ රටේ සංක්‍රමණික ධීවරයන් ඉන්නවා. ඒ අය මාස හයක් රටේ එක පැත්තක ධීවර රස්සාව කරනවා. වාරකන් කාලය ආවාම ඔවුන් මාස හයක් ධීවර රස්සාව කරන්න යන්නේ රටේ අනෙක් පැත්තටයි. යුද්ධය තියෙද්දී ඒ අයට මාස හයක් බඩගින්නේ ඉන්න සිද්ධ වුණා. දරුවන් එක්ක බඩගින්නේ ඉන්න සිද්ධ වූ කාලයක් තමයි මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා අවසන් කළේ.

අද විජයකලා මහේස්වරන් මන්ත්‍රීතුමියලා උතුරේ ධීවරයන් ගැන කථා කරනවා. එදා යුද්ධය නිසා උතුරේ ධීවරයන්ට මුහුදට යන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. යුද්ධය අවසන් වුණු නිසා තමයි අද ඒ අයට ධීවර රස්සාව කර ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ. හැම තිස්සේම හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මොකුත්ම කළේ නැහැ කියන කාරණාව තුළ සිට කථා කරනවා නම්, අපි වැරදියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කළ වෙලාවෙන් තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து)
(The Hon. Arundika Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද නුගේගොඩට ගිහිල්ලා බැලුවොත් පෙනෙනවා, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට ආදරය කරන විශාල පිරිසක් ඒ ප්‍රදේශයට ඇවිල්ලා සිටින බව. අපි කියන්නේ මේ කාරණයයි. ඒ ජනාධිපතිතුමාගේ කාල සීමාවේදී යම් කිසි වැඩ කොටසක් මේ රටට; සමාජයට කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක් දෙන්න.

අපි පළමුවෙන්ම මෙතැනදී කාරණා දෙකක් මතු කරන්න ඕනෑ. පළමු වන කාරණාව, මෙහි දේශපාලන කාරණාව හඳුනා ගෙන ඒකට පිළියම් යෙදීම. දෙවැනි කාරණාව, මෙයයි. ධීවරයන්ගේ පැත්තෙන් මොනවා හෝ අඩු පාඩු සිද්ධ වෙලා තිබෙනවා නම්, තාක්ෂණික ක්‍රම හඳුන්වා දීලා ඒ සම්බන්ධීකරණය හරියට ඉටු කර දීලා ඒ අයට හරියට උපදෙස් මාලාවක් දුන්නාම ඒ අය ඒ අනුව කටයුතු කරනවා.

මෙහිදී මතුවන තුන්වන කාරණාවකුත් මම දකිනවා. ධීවර කර්මාන්තය ආශ්‍රිතව බල අධිකාරියක් පිහිටුවා ගෙන ඇති සමාගම් තිබෙනවා. අද හැම තැනම වාගේ මේ තත්ත්වය තිබෙනවා; හැම ව්‍යාපාරයක් තුළම තිබෙනවා. බල අධිකාරියක් පිහිටුවා ගෙන තිබෙන මේ අතරමැදි සමාගම් සමහර වෙලාවට සාමාන්‍ය යාත්‍රාවල ගමන් කරන ධීවරයන්ට වැඩිය නැව්වල ගමන් කරන අයට ප්‍රමුඛතාව දෙනවා. අපි මේ දේවල් හරියට හඳුනා ගන්න ඕනෑ. ධීවරයන්ට නිවැරදි තාක්ෂණය කියා දීලා ඒ සඳහා අවශ්‍ය උපදෙස් දීලා මේ ප්‍රශ්න විසඳා ගන්න පුළුවන් නම්, මේ කර්මාන්තය මීටත් වැඩිය ඉදිරියට ගෙන යන්න පුළුවන්ය කියා මම හිතනවා.

ගරු ධීවර ඇමතිතුමනි, ඔබතුමාගෙන් මම එක ඉල්ලීමක් කරනවා. මේ රටේ විශාලම ධීවර කලාපයක් තමයි පුත්තලම දිස්ත්‍රික්කය ආශ්‍රිත කලාපය. ගරු පාලිත රංගෙ බණ්ඩාර ඇමතිතුමා කිව්වා වාගේ ගම්පහ සිට මන්නාරම දක්වා එකම එක ධීවර වරායක්වත් අපට නැහැ. පසු ගිය කාලයේ මා කළ යෝජනාවක් අනුව වෙන්නප්පුව මැතිවරණ කොට්ඨාසයට ධීවර වරායක් ලබා දෙන්න පසු ගිය රජය විසින් අය වැයේදී මුදල් වෙන් කළා. ඒ, විශේෂයෙන්ම බහුදින ධීවර යාත්‍රා සඳහා.

ඉතාමත් හොඳ කෙනෙකු හැටියටත්, ධීවර අමාත්‍යාංශය මෙහෙයවපු කෙනෙකු හැටියටත්, ගරු ජෝශප් මයිකල් පෙරේරා ඇමතිතුමනි, ඔබතුමාගේ කාලයේදී මේ බහුදින යාත්‍රාවල ගමන් කරන අය වෙනුවෙනුත්, කුඩා ධීවර යාත්‍රාවල ගමන් කරන අය වෙනුවෙනුත් නැංගුරම් පොළක්වත් නැති පුත්තලම දිස්ත්‍රික්කයෙන් තෝරා ගත් වෙන්නප්පුව ප්‍රදේශයට ධීවර වරායක් ඇති කර දෙයි කියන බලාපොරොත්තුවත් එක්ක මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.
මීළඟට ගරු විනායගමූර්ති මුරලිදරන් මන්ත්‍රීතුමා.

[பி.ப. 5.13]

ගරු විනායගමූර්ති මුරලිදරන් මහතා
(மாண்புமிகு விநாயகமூர்த்தி முரளிதரன்)
(The Hon. Vinayagamoorthi Muralidaran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, first of all, I would like to thank the Minister, Hon. M. Joseph Michael Perera, for bringing in this Bill. You are an experienced Parliamentarian; everybody knows about you and your service.

மட்டக்களப்பு மாவட்டத்தைப் பொறுத்தவரையில், அது கூடுதலான கடல் வளங்களையும் மற்றும் கூடுதலான வாவி களையும் உள்ளடக்கிய ஒரு பிரதேசமாக இருக்கின்றது. அது அமைச்சர் அவர்களுக்கும் தெரியும். ஆகவே, அங்குள்ள பெருந் தொகையான மக்கள் அந்த வளங்களைப் பயன்படுத்துகின்ற வர்களாக இருக்கின்றார்கள். பொதுவாக மட்டக்களப்பு மாவட்டத்தின் மொத்த மீனவக் குடும்பங்களின் தொகை 25,726. அங்கு 82,567 பேர் கடற்றொழிலிலும் மற்றும் வாவித் தொழில், அதாவது நன்னீர் மீன்பிடித் தொழிலிலும், தங்கியிருக் கின்றார்கள். அங்கு மொத்தமாக 14,287 குடும்பங்களைச் சேர்ந்தவர்கள் கடலிலே மீன்பிடிக்கின்றார்கள். 11,439 குடும்பங்கள் வாவிகளிலே மீன்பிடிக்கின்றன. அங்கு ஆறு, கடல் மற்றும் வாவிகள் எல்லாம் சேர்த்து கிட்டத்தட்ட 122 இறங்குதுறைகள் இருக்கின்றன. அதாவது சிறு துறைகளில் இருந்து பாரிய துறைகள் வரைக்குமான இறங்குதுறைகளாக அவை உள்ளன. மேலும் மட்டக்களப்பு மாவட்டத்திலே 130 மீன்பிடிச் சங்கங்கள் இருக்கின்றன. அங்கு கிட்டத்தட்ட 252 கிராம சேவகர் பிரிவுகளில் இந்த மீனவர்கள் இருக்கின்றார்கள். அங்கே 353 multi-day trawlers இருக்கின்றன. ஒரு நாளிலே மீன்பிடித்துவிட்டு வருகின்ற one-day trawlers 77 இருக்கின்றன. அதேபோன்று fibre glass boats 1,078 இருக்கின்றன. அதேவேளை கடலிலே 1,108 தோணிகளையும் வாவியிலே 2,325 தோணிகளையும் மீன் பிடிப்பதற்குப் பயன்படுத்து கிறார்கள். இவ்வாறான வகையில்தான் உபகரணங்களைப் பயன்படுத்தி அங்கு மீனவக் குடும்பங்கள் வாழ்கின்றன.

கடந்த அரசாங்க காலத்திலே நாங்கள் பாரிய அபிவிருத்திகளை மேற்கொண்டிருக்கின்றோம். அதனை மறுப்பதற்கில்லை. முன்னாள் ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்களும் அதற்கு வேண்டிய உதவிகளை வழங்கி யிருக்கின்றார். அதேபோன்று நானும் அமைச்சர் ராஜித சேனாரத்ன அவர்களும் சேர்ந்து மட்டக்களப்பிலே இறால் வளர்க்கின்ற திட்டத்தை அதிகரித்திருந்தோம். இறால் வளர்க்கக்கூடிய சிறந்த பிரதேசமாக மட்டக்களப்புப் பிரதேசம் இருக்கின்றது. நாம் அங்கு இறால் குஞ்சு பொரிக்கின்ற நிலையம் ஒன்றையும் இறால் வளர்க்கின்ற ஒரு model farm ஐயும் திறந்திருக்கின்றோம். அதனூடாக இன்று மக்கள் பயன் பெற்றுவருகின்றார்கள். தற்பொழுது அங்கு 09 பாரிய குளங்கள் இருக்கின்றன. 300 க்கும் மேற்பட்ட நடுத்தர மற்றும் சிறு குளங்கள், அதாவது medium and minor tanks, இருக்கின்றன. இந்தக் குளத்திலே விடப்படுகின்ற நன்னீர் மீன் குஞ்சுகளின் எண்ணிக்கை போதாது. அங்கு ஒரு season க்கு கிட்டத்தட்ட 20 மில்லியன் குஞ்சுகளை விடலாம். ஆனால், அங்கு இரண்டு - மூன்று மில்லியன் குஞ்சுகளைத்தான் இப்பொழுது விட்டுக்கொண்டிருக்கின்றார்கள். ஆகவே, கௌரவ அமைச்சர் அவர்களே! அங்கு ஒரு நன்னீர் மீன் hatchery ஐ உருவாக்கித் தரவேண்டும் என்று நான் உங்களிடம் அன்பாகக் கேட்டுக்கொள்கின்றேன். அவ்வாறு அதனை உருவாக்கினால் நாங்கள் அங்கு கூடுதலான மீன்குஞ்சுகளை விட்டு, இந்தக் குளங்களை - வாவிகளை நம்பியிருக்கின்ற, அந்தக் கிராமத்திலே இருக்கின்ற பெருந்தொகையான சிறு மீனவர்களின் அந்த உற்பத்தியைக் கூட்டலாம் என்பதையும் உங்களிடம் நான் கூறிக்கொள்கின்றேன்.

பொதுவாக வடக்கு, கிழக்கு கரையோரப் பிரதேசங்களிலே இருக்கின்ற தமிழர்கள் கூடுதலாக மீனவர்களாக இருக் கின்றார்கள். ஆனால், இன்று வட பகுதியை எடுத்துக் கொண்டால் அங்கு எங்களுடைய மீனவர்கள் பாரிய பாதிப்புக் குள்ளாகி வருகின்றார்கள். காரணம், தென்னிந்திய மீனவர்கள் எங்கள் கடற் பிரதேசத்துக்கு வந்து மீன்பிடிப்பதுதான். அவர்களால் அங்குள்ள எமது மீனவர்களின் வலைகள் அறுக்கப்படுகின்றன; வள்ளங்கள் சேதமாக்கப்படுகின்றன. அத்துடன் அவர்கள் எங்களுடைய பிரதேசத்து மீன்களை அள்ளிக்கொண்டு போகின்றார்கள். ஆனால், இதுபற்றி அங்குள்ள மாகாண சபைகூட சம்பந்தப்பட்டவர்களிடம் கேட்பதில்லை. இந்தியாவுடன் பகைக்கக்கூடாது என்பதற்காக அவர்கள் அதை விட்டிருக்கின்றார்கள். ஆனால், அது எந்த நாடாக இருந்தாலும் அது பற்றிக் கேட்க வேண்டும். ஆகவே, அவர்கள் எங்களுடைய கடல் எல்லைக்குள் வருவது நிறுத்தப்பட வேண்டும்.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

කරුණාකර නිශ්ශබ්ද වන්න. මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව ගරු ශාන්ත බණ්ඩාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு சாந்த பண்டார அவர்கள் *அக்கிராசனத்தினின்று அகலவே,* பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] *தலைமை வகித்தார்கள்.*

Whereupon THE HON. SHANTHA BANDARA *left the Chair and* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *took the Chair.*

ගරු විනායගමූර්ති මුරලිදරන් මහතා
(மாண்புமிகு விநாயகமூர்த்தி முரளிதரன்)
(The Hon. Vinayagamoorthi Muralidaran)

ஆகவே, அதனைத் தடுக்கும்வகையிலான சட்ட திட்டங்களை நீங்கள் அமுலாக்கவேண்டும் என்பதை நான் உங்களிடம் அன்பாகக் கேட்டுக்கொள்கின்றேன். ஏனென் றால், கூடுதலாக முல்லைத்தீவு மாவட்டத்திலே இருக்கின்ற மக்கள் பாதிக்கப்பட்டிருக்கின்றார்கள்; காங்கேசன்துறை, வல்வெட்டித்துறை போன்ற பிரதேசங்களிலே இருக்கின்ற மக்கள் பாதிக்கப்படுகின்றார்கள்.

அதேபோன்று மன்னாரிலே முள்ளிக்குளம் என்ற பிரதேசத்தில் ஒரு கடற்படை முகாமொன்று அமைக்கப் பட்டிருக்கின்றது. இது உண்மையிலே ஒரு மீனவக் கிராமம். என்னைப் பொறுத்தவரையிலே அந்தக் கிராமத்தில் அந்த முகாமை அமைக்கவேண்டிய தேவையில்லை. ஏனென்றால், கடற்படை முகாம் அமைப்பதற்குப் பல பிரதேசங்கள் இருக்கின்றன. ஆனால், அந்த முள்ளிக்குளம் பிரதேசத்திலே கடற்படையினர் அந்த முகாமை அமைத்திருக்கின்ற காரணத்தினால் அங்கிருந்த மீனவர்கள் எல்லோரும் வெளியேற்றப்பட்டிருக்கின்றார்கள். அது உண்மையிலே ஏற்றுக்கொள்ளப்பட முடியாத ஒரு நிகழ்வாக இருக்கின்றது.

[ගරු විනායගමූර්ති මුරලීදරන් මහතා]

ஆகவே, அந்த முகாமை நீங்கள் தயவுசெய்து அங்கிருந்து அகற்றுவதற்கு வழிசெய்ய வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

அடுத்ததாக, எமது மீன் ஏற்றுமதிக்கு ஐரோப்பிய யூனியனால் கொண்டுவரப்பட்டிருக்கின்ற தடையை நீக்கு வதற்கு நீங்கள் எடுக்கின்ற முயற்சியை நான் உண்மையிலே வரவேற்கின்றேன். இது தொடர்பாக இன்று அமைச்சர் ராஜித சேனாரத்ன அவர்கள் சிறந்த முறையில் தெளிவான விளக்கத்தைக் கூறியிருந்தார். அந்தத் தடை தொடர்பில் பல அரசியல் பின்னணிகள், பல பிராந்திய ஆதிக்கவெறி என்றெல்லாம் பல காரணிகள் இருக்கின்றன. அதனை நாங்கள் இராஜதந்திர ரீதியாகப் பேசி வெல்லவேண்டும் என்பதை நான் உங்களிடம் அன்பாகக் கேட்டுக்கொள்கின்றேன். ஏனென்றால், இலங்கை ஒரு தீவாக இருப்பதனால், இன்று விதிக்கப் பட்டுள்ள அந்தத் தடை நீக்கப்படின், அதனூடாக எங்களுடைய மீனவர்கள் கூடுதலான இலாபத்தைப் பெறக்கூடிய வாய்ப்பிருக்கின்றது.

அத்துடன், மீன்பிடி தொடர்பாகப் பாரிய தொழில் நுட்பத்தையும் நீங்கள் அறிமுகப்படுத்த வேண்டுமென்றும் நான் கேட்டுக்கொள்கின்றேன். ஏனென்றால், எங்களுடைய பெரும்பாலான மீனவர்கள் பாரம்பரிய மீன்பிடி முறைகளையும் பாரம்பரிய தொழில்நுட்பங்களையும்தான் பயன்படுத்து கின்றார்கள். ஆகவே, நவீன தொழில்நுட்பங்களை அறிமுகப்படுத்துகின்றபோது அவர்கள் கூடுதலான மீன்களைப் பிடிப்பதற்கான வாய்ப்பைப் பெறுவார்கள். அத்துடன் எமது மீனவர்கள் நாளாந்தம் எதிர்நோக்கும் பிரச்சனைகள் தொடர்பில் கூடுதலாகக் கவனம் செலுத்தி அவர்களுக்கு மானியங்களை வழங்கவேண்டும் எனவும் நான் கேட்டுக்கொள்கின்றேன்.

விவசாயிகளைப் பொறுத்தவரையில் அவர்களுக்கு நாங்கள் உரமானியத்தை வழங்குகின்றோம்; பயிர்ச்சேதம் நிகழ்ந்தால் உடனடியாக நிவாரணங்களை வழங்குகின்றோம். ஆனால், மீனவர்களுக்கு எதுவுமே வழங்கப்படுவதில்லை. மீனவர் களுக்கு மீன்பிடி உபகரணங்கள்தான் முக்கியமாக இருக்கின்றன. மட்டக்களப்பு மாவட்டத்துக்கு மேலும் பாரிய மீன்பிடி வள்ளங்கள், மீன்பிடித் தோணிகள் தேவையாக இருக்கின்றன. ஆகவே, அவற்றை எமது மீனவர்களுக்கு நீங்கள் மானியமாகத் தந்துதவினால் அது அவர்களுக்குக் கிடைத்த பாக்கியமாகவும் பெரும் புண்ணியமான விடய மாகவும் அமையும் என்பதைக் கூறிக்கொண்டு உங்களிட மிருந்து விடைபெறுகின்றேன். நன்றி, வணக்கம்.

[5.20 p.m.]

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

Thank you, Hon. Deputy Speaker, for this opportunity to speak on the attempt by the Government to address the issues raised by the EU, which has banned the export of sea products from Sri Lanka to the EU. The Government has now taken action to address the issue of the ban on fisheries products exported to the EU on a political and also on a legal and technical front.

The Hon. Minister of Foreign Affairs, the Hon. Mangala Samaraweera, explained to this House how he has been dealing with the EU on a political front. Further, the Government has brought to this House the current Amendment to the Fisheries and Aquatic Resources Act to address the issues raised under IUU fishing, which has been highlighted by the EU to impose larger fines and to regulate the fishing industry in and around Sri Lanka.

In this Debate, I wish to highlight the issues that have arisen between India and Sri Lanka in the field of fishing. We all know that, every now and then, Indian fishermen intrude into our waters, they are arrested and their boats are confiscated. Similarly, when our fishermen intrude into the Indian waters, they are also arrested and their boats are seized. This has been going on for some time and each time there would be an exchange of pleasantries between the leaders of our countries, then boats or fisherman would be released, they would be exchanged and we go back to a neutral position again and again. But, this issue is continuing. Recently, the previous Government had taken a decision that whenever an Indian fisherman intruded into our waters, he would be arrested, but soon released. However, there was a decision to hold the boat as a deterrent to continuous intrusion by Indian fishermen into our waters. And, through that policy, 87 boats of Indian fishermen were held by Sri Lanka and as a countermeasure, the Tamil Nadu Government and the Andhra Government had seized as many as 28 Sri Lankan boats and held them.

There was a situation where the Indian fishermen were worried that they would lose their boats and so were the Sri Lankan fishermen. They, as individuals, had invested large amounts of money to buy these boats and by losing them, they were losing their means of livelihood. Hence, there was a human problem also. At that time, after the change of the Government, there was hope in the minds of the people in India that the new Government would address this issue in a more humane manner. I got an invitation through a friend of mine, Mr. K. Jayakumar, Secretary to the Sree Narayana Guru Society of Indian Malayalees in Sri Lanka, from a well-known Swamiji in India called Sunil Das Swamiji of Calangute. I accepted the invitation and went there. I had the privilege of meeting the Indian fishermen led by N. Devadas, President of Rameswaram Co-operative Fishermen's Association, who pleaded with me that I should speak to the Government of Sri Lanka and help release 87 boats held in Sri Lanka. When I returned, I spoke to the Minister of Foreign Affairs, to the Minister of Home Affairs and Fisheries, to the High Commissioner of India, and the honourable Attorney-General and came to know that His Excellency the President had ordered that these boats be released when the Minister of Foreign Affairs went to India, but the technicalities had been delaying and the coordination was not in place. I intervened with all the parties: the Minister of Home Affairs and Fisheries, the Minister of

Foreign Affairs, the Indian High Commission, the fishermen and the Deputy High Commissioner for Sri Lanka in Chennai, and by bringing these parties together, we were able to get the 87 boats held in Sri Lanka released to their owners in India, and also to get the 28 boats and six fishermen held in India, back to Sri Lanka.

This was done before the visit of His Excellency President Maithripala Sirisena to New Delhi in India to meet Prime Minister Narendra Modi, and President Pranab Mukherjee. Through this, we have now re-established goodwill among the fishermen of India and the fishermen of Sri Lanka. We have to put a stop to this arrest and harassment of fishermen by both sides. The ideal thing would be for these fishermen not to cross the border but, as we all know, there is no fence in the maritime border. Fishermen, as was said by some of the Hon. Members today, go behind the fish and then they intrude into international waters or beyond the borders of Sri Lanka, into the waters of India. So, this is a problem that we have to think of in a more prudent way. The fishermen of India are in larger numbers with more powerful boats. We have very few; comparatively less fishermen and less facilities. So, there has to be some understanding between the fishermen of India and the fishermen of Sri Lanka. Several rounds of talks have taken place between these two groups, but we have still not been able to reach an understanding. The fishermen of India are demanding or requesting that they be allowed to fish in our waters for 90 days in a year including the 52 Sundays each year, because on Sundays our fishermen do not go to sea. However, there has still not been an understanding. The next round of talks is expected to take place in Chennai on the 5th of March this year and during that time, with the current understanding between the people in the two countries, we can reach an amicable solution or an agreement. In fact, the people in Tamil Nadu had celebrated the victory of our Government and the replacement of the former Government because they believe that this Government would be more fair to the Tamil people in Sri Lanka and, in turn, also understand the issues that the Tamil people of Tamil Nadu have regarding the Tamil people living in Sri Lanka. Hence, I request that we all look at it as a human problem which exists between the fishermen of Sri Lanka and the fishermen of India and not as a problem between two governments, and try to solve this issue on a give-and-take policy.

Further, our Government, in its Manifesto, had promised great relief to the people, which has now been granted. Similarly, relief to the fishermen has also been promised and I am glad that the Minister today, in this House, reiterated that these promises to the fishermen will be granted as promised in the "Hundred-Day" Programme of President Maithripala Sirisena. Under this Programme, it is necessary to grant relief to the fishermen on the equipment, nets and boats that they use for fishing. The cost of fishing comes down as soon as you reduce duties as promised in the "Hundred-Day" Programme of President Maithripala Sirisena. Fish is an essential food item for our people and today, through the export of fish products, we earn a large component of the foreign exchange required by our country. Under these circumstances, the fishing industry is a very vital and important industry, which has to be sustained and developed. Towards this end, we should formulate policies, implement them and empower the fishing community to deliver what the country expects from them.

Thank you.

[பி.ப. 5.33]

ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා (නියෝජ්‍ය කාරක සභාපතිතුමා)

(மாண்புமிகு முருகேசு சந்திரகுமார் - குழுக்களின் பிரதித் தவிசாளர்)

(The Hon. Murugesu Chandrakumar - Deputy Chairman of Committees)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கடற்றொழில், நீர்வாழ் உயிரின வளங்கள் (திருத்தம்) சட்டமூலம் சம்பந்தமான இந்த விவாதத்திலே கலந்துகொள்வதற்குச் சந்தர்ப்பம் தந்தமைக்காக நான் உங்களுக்கு நன்றி தெரிவிக்கின்றேன். இந்தச் சந்தர்ப்பத்தில் நான் வட பகுதி மீனவர்கள் எதிர்கொள்ளும் விடயங்களை இந்த அவையிலே முன்வைக்க விரும்புகின்றேன். இன்று வட பகுதி மீனவர்கள் எதிர்கொள்ளும் முக்கியமான பிரச்சினையாக இருப்பது இந்திய இழுவைப் படகுகளின் அத்துமீறிய தொடர் நடவடிக்கைகளாகும். அந்தப் படகுகள் மன்னார் தொடக்கம் முல்லைத்தீவு வரையிலான கடற்பகுதிகளில் தொழில்புரியும் எங்களது ஆயிரக்கணக்கான கடற்றொழிலாளர்களின் வாழ்வாதாரத்தைத் தினமும் சுரண்டிக்கொண்டிருக்கும் ஒரு துர்ப்பாக்கிய நிலைமைக்கு மத்தியில்தான் நான் இப்பொழுது பேசிக்கொண்டிருக்கின்றேன். இந்த அவையிலே நான் உரையாற்றும்போதும்கூட, அங்கு அவர்கள் அந்த நடவடிக்கைகளில் ஈடுபடுகின்றார்கள். அதாவது சில நிமிடங்களுக்கு முன்பு நான் அந்தக் கடற்றொழிலாளர் சங்கங்களின் தலைவர்களுடன் பேசியபோது "நாங்கள் கடற்கரையிலே நிற்கின்றோம்; இப்போதும் இழுவைப் படகுகள் எங்களது கடற்கரையை நோக்கி வந்துகொண்டிருக்கின்றன" என்று சொன்னார்கள். ஆகவே, இது ஒரு சாதாரண விடயமல்ல. இந்திய மீனவர்களின் கப்பல் போன்ற பாரிய இழுவைப் படகுகள் எங்களது கடல் எல்லைக்குள் நுழைந்து, எங்களது கடற்கரைவரை வந்து, கடற்றொழிலாளர்களின் வாழ்வாதாரத்தைச் சுரண்டுகின்றன. அவர்கள் எங்களது மீனவர்களின் கடற்றொழில் உபகரணங்கள் மற்றும் வலைகளை அழித்துத் தங்களது தேவையைப் பூர்த்தி செய்கின்ற நிலைமையையே நாங்கள் அங்கு காண்கின்றோம்.

கடந்த யுத்த காலத்தில் எமது கடற்றொழிலாளர்கள் அனுபவித்த கொடுமைகள் பல. யுத்தத்துக்குப் பின்னரான சூழலில் அவர்களுக்கு இலகுவாகக் கடற்றொழில் புரியக்கூடிய ஒரு நிலைமை உருவாக்கப்பட்டாலும் இந்த இந்திய மீனவர்களின் அத்துமீறல்களினால் அவர்களது வாழ்வாதாரம்

[ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා]

தினமும் அழிக்கப்பட்டுக்கொண்டிருக்கின்றது. இதற்கு ஒரு நிரந்தரமான தீர்வு எட்டப்பட வேண்டும். இந்திய கடற்றொழிலாளர்கள் எங்களது கடற்பிரதேசத்துக்குள் புகுந்து கடல்வளங்களைச் சுரண்டும்போது கடற்படையினரால் எடுக்கப்படும் நடவடிக்கைகள் அரசுக்கு இராஜதந்திர அழுத்தங்களை ஏற்படுத்துகின்றன. இந்திய மீனவர்கள் அத்துமீறி நுழைந்தால், அதற்கு எதிரான சட்டரீதியான நடவடிக்கைகள் எடுக்கப்படும்போது, அங்கு ஆர்ப்பாட்டங்கள், இந்திய அரசுக்கு நெருக்குதல்கள் கொடுக்கப்படுகின்றன. பிடிபட்ட இந்திய மீனவர்களை நல்லெண்ண அடிப்படையிலே இலங்கை அரசாங்கமும் விடுவிக்கின்றது. ஆனால், இந்த நடவடிக்கைகள் நாடுகளுக்கிடையே நல்லெண்ணத்தையும் உறவுகளையும் வளர்க்கிறதே தவிர, கடற்றொழில் செய்கின்ற எமது மக்களின் வாழ்வாதாரத்தைப் பாதுகாக்கவில்லை. நாங்கள் எங்களது கடற்றொழிலாளர்களின் வாழ்வை இழந்துதான் இந்த நல்லெண்ணத்தை கடைப் பிடிக்கின்றோமா? என்பது தொடர்பாகத் தெளிவான வரையறையொன்று இருக்கவேண்டும்.

எனக்கு முன்பு பேசிய மாண்புமிகு ஆர். யோகராஜன் அவர்கள், "அண்மையில் மேதகு ஜனாதிபதி அவர்களுடைய உத்தரவின் பேரில் நீண்டகாலமாகத் தடுத்துவைக்கப் பட்டிருந்த, இந்திய கடற்றொழிலாளர்களின் பாரிய வள்ளங்களில் சில அவர்களிடம் ஒப்படைக்கப்பட்டும் சில ஒப்படைக்கப்பட வேண்டியும் இருக்கின்றது" என்று கூறினார். ஆனால், கடந்த காலங்களில் மாண்புமிகு ராஜித சேனாரத்ன அவர்கள் கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சராக இருந்தபோது, "பிடிபட்ட கடற்றொழிலாளர்களை மனிதாபிமான அடிப்படையில் விடுவிப்பதில் எந்த ஆட்சேபனையும் இல்லை; ஆனால் அவர்களது வள்ளங்களைத் திருப்பி ஒப்படைப்பது என்பது நடைமுறையில் சாத்தியமில்லை" என்று இந்த அவையிலே குறிப்பிட்டிருந்தார். ஏனென்றால், நாங்கள் விடுவிக்கும் வள்ளங்கள் நாளை மீண்டும் அத்துமீறி எங்களது வளங்களைச் சுரண்ட வரும். அவ்வாறு மீண்டும் வராதென்பதற்கான எந்த உத்தரவாதமும் இல்லை. நாங்கள் நல்லெண்ண அடிப்படையில் இந்திய அரசாங்கத்தின் வேண்டுகோளுக்கிணங்கவே விடுவிக் கின்றோம். ஆகவே, இதற்கு நிரந்தரமானதொரு தீர்வு என்னவென்றால், கடல் எல்லையைத் தாண்டும் நடவடிக்கைகள் கட்டுப்படுத்தப்பட வேண்டும்; தடுக்கப்பட வேண்டும். இதற்கு இந்தியக் கடற்படையும் இலங்கைக் கடற்படையும் இணைந்து ரோந்துசென்று இந்த நடவடிக்கையை இறுக்கமாகக் கடைப்பிடிக்க வேண்டும்.

வடபகுதியிலே கடற்றொழில் செய்கின்ற தமிழ் மீனவர்கள் தினமும் போராட்டம் நடத்துகின்றார்கள். சில தினங்களுக்கு முன்னர்கூட மன்னாரில் மிகப்பெரிய ஆர்ப்பாட்டம் நடைபெற்றது. இதேபோல் அங்கும் ஆர்ப்பாட்டங்கள் நடைபெறுகின்றன. எங்கள் எல்லைக்குள் வந்து மீன்பிடிப்பதற்கான சட்டரீதியான அங்கீகாரம் வேண்டும் என்று கேட்டுத்தான் அங்கு போராட்டம் நடக்கிறது. ஆனால், எங்களுடைய எல்லைக்குள் அவர்கள் வரக்கூடாது; எங்களுடைய வளங்களைச் சுரண்டக்கூடாது என்றுதான் நாங்கள் பேசுகின்றோம்; கோருகின்றோம்; போராட்டம் நடத்துகின்றோம். போராட்டம் என்பது நியாயத் தன்மையுடையதாக இருக்க வேண்டும். ஆகவே, இவர்களும் இலங்கை மக்கள்தான். இவர்களின் வாழ்வாதாரத்தை உறுதிப்படுத்திக்கொண்டுதான் நாங்கள் நல்லிணக்கத்தையும் நல்லெண்ணத்தையும் வெளிப்படுத்த முடியுமென்று இங்கு நான் வலியுறுத்துகின்றேன்.

அடுத்ததாக, இன்னுமொரு முக்கியமான விடயத்தையும் குறிப்பிட வேண்டும். எமது உள்நாட்டுக்குள்ளேயும் அத்துமீறல்கள் இருக்கத்தான் செய்கின்றன. முல்லைத்தீவுப் பிரதேசத்திலே தென்னிலங்கையிலிருந்து வருபவர்கள் அட்டை, சங்கு குளித்தல் என்ற போர்வையில் வெளிச்சம் பாய்ச்சி, சட்டவிரோத கடற்றொழில் நடவடிக்கைகளில் ஈடுபடுகின்றார்கள். சட்டரீதியாக அவர்களுக்கு அங்கே வருவதற்கு எந்த அனுமதியும் இல்லை; கொடுக்கவும் முடியாது. ஏனென்றால், அங்குள்ள மக்களின் - கடற்றொழிலாளர்களின் - வாழ்வாதாரம் இதனால் பாதிக்கப்படுகின்றது. பலதடவைகள் நான் இந்த அவையிலே இதுசம்பந்தமாகக் குறிப்பிட்டிருக்கின்றேன். ஆகவே, இந்த விடயத்தில் புதிய அரசு கடற்றொழிலாளர் அனைவருக்கும் பாரபட்சமற்ற முறையில் அவர்களது வாழ்வாதாரத்தைப் பாதுகாக்கும் உறுதிப்பாட்டை ஏற்படுத்திக் கொடுக்க வேண்டும்.

மேலும், வடபகுதியிலுள்ள வலி. வடக்கில், காங்கேசன்துறை தொடக்கம் வளலாய் வரையிலான கடற்கரைப் பிரதேசங்கள் உயர் பாதுகாப்பு வலயத்துக்குள் அடங்கியிருப்பதனால் பல்லாயிரக்கணக்கான கடற்றொழிலாளர்கள் தங்களது சொந்தக் கடற்பிரதேசத்திலே மீன்பிடிக்க முடியாத நிலையிலுள்ளனர். குறிப்பாக, மயிலிட்டி போன்ற பிரதேசங்களிலே மீளக் குடியேற முடியாமல், அவர்கள் பருத்தித்துறை போன்ற பிரதேசங்களிலே இடைத்தங்கல் முகாம்களில் தங்கியிருந்து தங்களுடைய தொழில்களைச் செய்துகொண்டிருக்கிறார்கள். ஆகவே, சொந்தப் பிரதேசத்திலிருந்து அவர்கள் கடற்றொழிலைச் செய்வதற்குரிய ஏற்பாடுகளைப் புதிய அரசு ஏற்படுத்திக் கொடுக்கவேண்டும் என்பதை நான் இங்கு வலியுறுத்துகின்றேன்.

மயிலிட்டி மீன்பிடித் துறைமுகம் கடற்றொழிலாளர்களின் மிகவும் பிரசித்தி பெற்ற துறைமுகமாகும். அது இன்று உயர்பாதுகாப்பு வலயத்திற்குள் இருக்கின்றது. ஆகவே, அந்த வலயத்திற்குள்ளிருந்து அந்தப் பிரதேசம் விடுவிக்கப்பட்டு அந்தப்பகுதி மக்கள் அங்கு வாழக்கூடிய ஒரு சூழலை ஏற்படுத்திக் கொடுக்கவேண்டும். அதேபோன்று மயிலிட்டி, ஊறணி, காங்கேசன்துறை போன்ற இடங்களில் ஆயிரக்கணக்கான கடற்றொழிலாளர்கள் மீளக்குடியேற வேண்டியிருக்கின்றது. இன்று அவர்களது வாழ்வாதாரம் மிகவும் மோசமான நிலைமையில் இருக்கின்றது என்பதையும் இங்கு நான் குறிப்பிட விரும்புகின்றேன்.

அதேபோன்று கிளிநொச்சி மாவட்டத்திலுள்ள இரணைதீவுப் பிரதேச மக்கள் கிட்டத்தட்ட 20 வருடங்களாக இடம்பெயர்ந்து இரணைமாதா நகர் என்ற இன்னொரு கிராமத்தில் வசிக்கின்றார்கள். அங்கு வசிக்கும் கிட்டத்தட்ட 500 கடற்றொழிலாளர்கள் தங்களது சொந்த ஊருக்குச் சென்று தொழிலை மேற்கொள்வதற்கு விரும்புகின்றார்கள். ஆனால், இரணைதீவிலுள்ள கடற்படை அந்தப் பிரதேசத்தைத் தம்வசம் வைத்துக்கொண்டு அந்த மக்கள் மீளக்குடியேறுவதைத் தடைசெய்கின்றது. ஆகவே, இந்த நிலைமையையும் அரசாங்கம் கருத்திலெடுக்க வேண்டும். இதேபோன்ற நிலைமைதான் சிலாபத்துறை, முள்ளிக்குளம் போன்ற பிரதேசங்களிலும் காணப்படுகிறது. கிட்டத்தட்ட 1400 ஏக்கர் நிலம், அதாவது முள்ளிக்குளத்தின் முழுக்கிராமமுமே, கடற்படைக்கென்று சுவீகரிக்கப்பட்டிருக்கின்றது.

அக்கிராமத்தில் 525 குடும்பங்கள் வாழ்ந்துகொண்டிருந்தன. அதேபோன்று சிலாபத்துறையிலே 800 குடும்பங்கள் நெருக்கமாக வாழ்ந்த, கிட்டத்தட்ட 100 ஏக்கர் பரப்பளவுடைய மிகப்பெரிய ஒரு நகர்ப்பிரதேசம் கடற்படையின் ஆளுகைக்குள் கொண்டுவரப்பட்டிருக்கின்றது. ஆகவே, அந்தப் பிரதேசங்களில் குறிப்பிட்ட கடற்றொழிலாளர்கள் மீளக்குடியேறி அவர்களது நிம்மதியான வாழ்க்கையைக் கொண்டுசெல்வதற்குரிய வழிவகைகளைப் புதிய அரசு மேற்கொள்ள வேண்டும் என்று நான் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

அதேநேரத்தில் முன்னைய அரசாங்கம் முன்னெடுத்துவந்த சில விடயங்களைத் தொடரவேண்டும் என்பதையும் நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். முன்னைய அரசினால் மண்ணெண்ணெய் மானியத்திற்குப் பதிலாகக் கடற்றொழிலாளர்களுக்கு 1,20,000 ரூபாய் பெறுமதியான வலைகள், கடற்றொழில் உபகரணங்கள் வழங்கப்பட்டு வந்தது. கிட்டத்தட்ட 50 வீதமான மக்கள்தாம் அந்தப் பலனைப் பெற்றிருக்கின்றார்கள். கிளிநொச்சி மாவட்டத்திலே 482 குடும்பங்களுக்கு அந்த வாய்ப்புக் கிடைத்தது. ஆனால் 215 பேர்தான் இதுவரை பெற்றிருக்கின்றார்கள். அவற்றைப் பெற்றுக்கொள்ளாத மக்கள் புதிய அரசு தங்களுக்கும் அவற்றைப் பெற்றுத்தருமா? என்ற ஏக்கத்துடன் இருக்கின்றார்கள். அதுபோலவே, முல்லைத்தீவு, யாழ்ப்பாண மாவட்டங்களிலுள்ள 50 சதவீதமான மக்களே மண்ணெண்ணெய் மானியத்துக்கு மாற்று ஏற்பாடான வலைகளும் கடற்றொழில் உபகரணங்களும் தமக்குக் கிடைக்கும் என்ற நம்பிக்கையுடன் காத்திருக்கின்றார்கள். அவர்களது எதிர்பார்ப்பைப் பூர்த்தி செய்யவேண்டுமென நான் இங்கு வலியுறுத்துகின்றேன்.

இதுபோலவே, நீண்டகால முக்கிய கோரிக்கையாக இருந்துவருகின்ற கிளிநொச்சி, யாழ்ப்பாணம், முல்லைத்தீவு ஆகிய மாவட்டங்களை மையப்படுத்திய சுண்டிக்குளம் தொடக்கம் மாத்தளன் வரையிலான கடற்கரைப் பிரதேசத்தில் கடற்றொழில் நடவடிக்கைகளில் ஈடுபடுவதற்கு கடற்படையினர் இன்னமும் தடை விதித்து வருகின்றனர். இதனால், ஆயிரக்கணக்கான கடற்றொழிலாளர்கள் மாற்று இடங்களில் கடற்றொழிலில் ஈடுபடவேண்டிய துர்ப்பாக்கிய நிலையில் இருந்துகொண்டிருக்கின்றார்கள். ஆகவே, அவர்களுக்குச் சொந்தமான கடற்கரைப் பிரதேசத்தை அவர்களுக்கே வழங்குவதற்கு உரிய நடவடிக்கைகள் எடுக்கவேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

இறுதியாக, நந்திக்கடல் பிரதேசத்தைப் பற்றியும் குறிப்பிட வேண்டும். இறுதிக்கட்ட யுத்தத்தின்போது நந்திக்கடல் பிரதேசம் பெருந்தொகையான மக்கள் பாதிப்புக்குள்ளான ஒரு பிரதேசம் என்பது உங்கள் எல்லோருக்கும் தெரியும். இது கிட்டத்தட்ட 2,000 கடற்றொழிலாளர்களின் வாழ்வாதாரத்துக்குரிய ஒரு கடற்பிரதேசமாகும். நந்திக்கடல் பிரதேசம் ஆழமாக்கப்பட வேண்டுமென முல்லைத்தீவு மாவட்ட கடற்றொழிலாளர்கள் தொடர்ந்தும் வலியுறுத்தி வருகின்றார்கள். உண்மையாகவே, இறால் பிடிக்கும் தொழிலில் மிகவும் பிரசித்தி பெற்ற இடமாக நந்திக்கடல் பிரதேசம் விளங்குகிறது. ஆகவே, இப்பிரதேசத்திலுள்ள கிட்டத்தட்ட 2,000 குடும்பங்களின் வாழ்க்கையை மேம்படுத்தும் வகையில், நீங்கள் அந்தக் கடற்பிரதேசத்தை ஆழமாக்கிப் புனரமைத்து அவர்களின் கடற்றொழிலை மேலும் விரிவுபடுத்த நடவடிக்கை எடுக்கவேண்டும் என்பதை வலியுறுத்தி, விடைபெறுகின்றேன். நன்றி, வணக்கம்.

[අ.භා. 5.45]

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත යටතේ යුරෝපා කොමිසම මත්ස්‍ය අපනයනය තහනම් කිරීම පිළිබඳව සාකච්ඡා කරන මේ මොහොතේ ධීවර කටයුතු භාර අමාත්‍යතුමාට ප්‍රථමයෙන්ම අපි සුබ පතනවා. එතුමා මේ ක්ෂේත්‍රය පිළිබඳව විශේෂ අත් දැකීම් තිබෙන ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරයෙක්. එතුමාට ඒ කටයුතු සාර්ථකව කර ගෙන යන්න හැකි වේවායි කියා සුබ පැතීම ප්‍රථමයෙන්ම සිදු කරන්න කැමැතියි.

අපේ රට වටේටම මුහුද තිබෙනවා. අපේ රට දූපතක්. හැබැයි, අපි තවමත් අපට අවශ්‍ය මාළු පිට රටින් ගෙන්වන තත්ත්වයක් තමයි තිබෙන්නේ. අපට පරිභෝජනයට අවශ්‍ය මාළු ටික පිට රටින් ගෙන්වනවා. ඒ වාගේම කරවල ටික පිට රටින් ගෙන්වනවා. උම්බලකඩ ටික, හාල්මැස්සන් ටික මේ සියල්ලම පිට රටින් ගෙන්වන බව අපි දන්නවා. මේ තත්ත්වයෙන් ඔබ්බට යාමට මෙතෙක් හිටපු සියලු රජයන්, ධීවර අමාත්‍යවරුන් විශාල කැප කිරීමක් කළා. නමුත් අපට තවමත් ඒ ඉලක්කය කරා ළඟා වෙන්න බැරි වෙලා තිබෙනවා. අපි කෘෂිකර්මාන්තයට දක්වන සැලකිල්ල වාගේම ධීවර ක්ෂේත්‍රයටත් විශාල සැලකිල්ලක් දැක්වීම තුළ අපට අවශ්‍ය මත්ස්‍ය සම්පත නිපදවා ගන්නට හැකියාව ලැබෙනවා.

අපි දන්නවා, යුරෝපා රටවලට මත්ස්‍ය අපනයනය තුළින් අපි විශාල ආදායමක් ලබන බව. ජපානය වාගේ රටවලින් අපට විශාල ආදායමක් ලබා ගන්න පුළුවන්. එසේ ආදායම ලබන අතර, අපට අවශ්‍ය මත්ස්‍ය සම්පත ලබා ගැනීම සඳහාත් අපි විශේෂ වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ.

හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාව අපි මේ අවස්ථාවේදී සිහිපත් කරන්න ඕනෑ. එතුමා ධීවර අමාත්‍යවරයා විධියට හිටපු කාලය තුළ මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ප්‍රචලිත කිරීම සඳහා විශාල වැඩ පිළිවෙළක් සකස් කළා. 1994 අපි ආණ්ඩුව භාර ගත් අවධිය වන විට මිරිදිය ධීවර කර්මාන්තය සම්පූර්ණයෙන් නතර කරලායි තිබුණේ. ඒ වෙලාවේ රජය ගත් තීන්දුවක් නිසා ඒ කර්මාන්තයෙන් සම්පූර්ණයෙන් ඉවත් වෙලායි තිබුණේ. ඒක තහනම් කළ කර්මාන්තයක් විධියට සලකා තමයි ඒ වෙලාවේ කටයුතු කළේ. නමුත් අද වන විට ඒක යම් මට්ටමකට ඉස්සරහට ඇවිල්ලා තිබෙනවා. අපේ ජලාශවල මිරිදිය කර්මාන්තය ප්‍රචලිත කිරීම තුළින් විශාල මත්ස්‍ය සම්පතක් ලබා ගත හැකි අතර ඒ තුළින් විශාල ආදායමක් ලබා ගන්නට හැකියාව තිබෙනවා. ඒ සඳහා ගරු අමාත්‍යතුමා වැඩි අවධානයක් යොමු කර විශේෂ වැඩ පිළිවෙළක් සකස් කළොත් අපට අවශ්‍ය ප්‍රෝටීන් අපේ රට තුළින්ම ලබා ගන්නට පුළුවන්කම ලැබෙනවාය කියා අපි විශ්වාස කරනවා.

අපේ රටේ අපට අයිති මුහුදු කලාපයේ තිබෙන මත්ස්‍ය සම්පත; ඒ මත්ස්‍ය අස්වැන්න නිරන්තරයෙන්ම විදේශ රටවලින් අර ගෙන යන බව අපි දන්නවා. අපේ අසල්වැසි රට වුණු ඉන්දියාව හැම වෙලාවේම අපේ සම්පත් අර ගෙන යනවා. ඒ වාගේම ඒ තුළින් ගැටුම් නිර්මාණය වෙනවා. මම දැක්කා, නව ජනාධිපතිතුමා ඉන්දියාවේ අග්‍රාමාත්‍යතුමා සමඟ සාකච්ඡා කරනවා. ඒ හොඳ හිත දියුණු කර ගැනීම තුළින් ඉදිරියේදී ඒ කාර්යය නිවැරදි මාවතකට ගෙන එන්න අපට පුළුවන්කම ලැබෙයි කියා මම හිතනවා. ඉන්දියාවට අපට වඩා ලොකු ට්‍රෝලර් යාත්‍රා තිබෙනවා. ඒ වාගේම අවශ්‍ය පහසුකම් සහ නවීන තාක්ෂණය තිබෙනවා. ඒ නිසා ඔවුන් අපේ රටට අයත් මුහුදෙන් වැඩි මත්ස්‍ය සම්පතක් ගන්නවා. ඒ

[ගරු මහින්ද අමරවීර මහතා]

වාගේම තමයි අපේ රටේ ධීවරයිනුත් ඒ ප්‍රදේශවලට ගියොත් ඔවුන් අත් අඩංගුවට ගැනීම් සිදු කරනවා. වෙනත් රටවල් ආසන්නයේ මුහුදු තීරයන්වලට ගිය වෙලාවටත් එසේ අත් අඩංගුවට ගැනීම් හා හිරිහැරවලට ලක්වීම් අනිවාර්යයෙන්ම සිද්ධ වෙනවා. ඒ වාගේම අපේ රටේ ධීවරයන් මුහුදේදී අනතුරට පත් වුණාම ඒ අය බේරා ගැනීමේ වැඩ පිළිවෙළ පිළිබඳව -අපට තිබෙන ක්‍රමවේදය පිළිබඳව- සෑහීමට පත් වෙන්න පුළුවන්කමක් නැහැ. ඒ තත්ත්වය තවත් වැඩිදියුණු කිරීම අනිවාර්යයෙන්ම කළ යුතු වෙනවා. ඒ වාගේම අපේ ධීවරයන්ට අවශ්‍ය පහසුකම් සහිත, තාක්ෂණය සහිත නවීන යාත්‍රා ලබා ගැනීමට අපි උදවු උපකාර කරන්න ඕනෑ. ඒ සඳහා ධීවරයන්ට දෙන සහනාධාර දැන් ක්‍රමානුකූලව නතර වෙලා තිබෙනවා. ඒ සහනාධාර ඔවුන්ට ලබා දෙන්න. ඒවා තමයි ආයෝජන. ගොවියාට දෙනවා වාගේම ධීවරයාට දෙන දේවලුත් ආයෝජන. ඒවා නැවත අප රටට ලැබෙන දේවල්. ඒ නිසා ඔවුන්ට සහනාධාර ක්‍රම වාගේම, සහන පොලියට ණය ලබා දීමේ වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කිරීමත් අනිවාර්යයෙන්ම කළ යුතු වනවා.

ධීවරයන්ට තවත් ප්‍රධාන ප්‍රශ්නයක් තිබෙනවා. ධීවර ජනතාව විශාල වශයෙන් මුදල් සොයා ගන්නවා. මාළු තිබෙන කාලයට ඒ අය සල්ලිකාරයෝ. ඒ වාගේම මාළු වැඩියෙන් අහු වෙනකොට ඒවා විකුණා ගත්තාම රත්තරන් බඩු ඇතුළු ගෙදරට අවශ්‍ය සියලු භාණ්ඩ ඔවුන් ගන්නවා. හැබැයි, වාරකන් කාලය වනකොට ඔවුන් සතු ඒ සියල්ලම බැංකුවලට විතරක් නොවෙයි, පොලී මුදලාලි ළඟටත් යනවා. වාරකන් කාලයට ගෙදර තිබෙන television එක, මෝටර් සයිකලය ඇතුළු සියලු දේවල් වැඩි පොලියට උගස් තබන තත්ත්වයට ධීවරයන් පත් වනවා. ධීවරයන් ඒ තත්ත්වයෙන් මුදා ගන්න නම්, ඒ අය දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. මම හිතන හැටියට ඒකට ධීවර අමාත්‍යාංශය මැදිහත් වන්න ඕනෑ. රාජිත සේනාරත්න ඇමතිතුමා ඒ වෙනුවෙන් වැඩ පිළිවෙළක් ආරම්භ කරලා තිබුණා. ඒ වැඩ පිළිවෙළ ඉස්සරහට ගෙන යන්න ඕනෑ. ධීවර ක්ෂේත්‍රයේ යෙදෙන අය සොයා ගන්නා මුදල් නාස්ති කරන ප්‍රමාණය වැඩියි. සමහර වෙලාවට මත්පැන්, සිගරට්වලට පවා ඔවුන් විශාල මුදලක් වියදම් කරන තත්ත්වයක් දකින්න තිබෙනවා. ඒ තත්ත්වය වළක්වා ගන්න නම්, ඒ සම්බන්ධයෙන් ඔවුන්ව දැනුවත් කරන්න ඕනෑ; ඒ සඳහා ඒ අයට අවශ්‍ය උපකාර කරන්න ඕනෑ. මෙහිදී ඒ අයත් එක්ක සහයෝගයෙන් කටයුතු කරන නිලධාරි මණ්ඩලයක් පත් කිරීම අත්‍යවශ්‍යයෙන්ම කළ යුතු වනවා. එහෙම වුණොත් ධීවර ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කරන්න අනිවාර්යයෙන්ම පුළුවන්කම ලැබෙනවා.

අපේ රටේ තිබෙන මත්ස්‍ය සම්පත වැඩි කර ගන්න පුළුවන් ක්‍රමවේද තවත් ඕනෑ තරම් තිබෙනවා. ධීවර ක්ෂේත්‍රයෙන් ඉදිරියට ගිය රටවල් ඒවා ක්‍රියාත්මක කරන ආකාරය අපි දැකලා තිබෙනවා. නෝර්වේ වාගේ රටවලදී කූඩු තුළ මසුන් ඇති කිරීම අපි දැක්කා. කූඩු තුළ මසුන් ඇති කිරීම තුළින් ඒ රටවල් විශාල ආදායමක් ලබා ගන්නවා. අපේ රටේ තවම එහෙම ක්‍රමයක් ක්‍රියාත්මක වෙන්න පටන් ගෙන නැහැ. ඒකෙන් ඉතාමත් සාර්ථක ප්‍රතිඵල ලබා ගන්නට පුළුවන්. අපේ ගම්මානවල කුකුළන් ඇති කරනවා; ඌරන් ඇති කරනවා; එළුවන් ඇති කරනවා; හරක් ඇති කරනවා. ඒ වාගේම මත්ස්‍යයන් ඇති කිරීමේ කර්මාන්තයත් ක්‍රියාත්මක කරන්න පුළුවන්. සමහර රටවල් ඒ තුළින් විශාල ආදායමක් ලබා ගන්නවා. ඒ පිළිබඳව සොයා බැලීම සඳහා නිලධාරින් ඒ ප්‍රදේශවලට යොමු කරලා, ධීවර ක්ෂේත්‍රයේ සිටින ඒ සඳහා ආයෝජනය කරන්න පුළුවන් ව්‍යාපාරිකයන් ඒවාට යොමු කරලා කටයුතු කළොත් අපට ඒ කර්මාන්තය තුළින් විශාල ආදායමක් ලබා ගන්නට පුළුවන්. විශේෂයෙන් සැමන් මාළුන් ඇති කිරීම ඒ රටවල සිදු වෙනවා. සැමන් මාළුන් ඇති කිරීම වෙන්න පුළුවන්; නැත්නම් අපට ආවේණික මත්ස්‍ය සම්පත වෙන්න පුළුවන්, ඒ විධියට එම කර්මාන්තය ක්‍රියාත්මක කරන්න අපට පුළුවන්කම තිබෙනවා.

අපේ රට තුළ ඉතාමත් හොඳ මත්ස්‍ය නිෂ්පාදනයක් තිබෙනවා. ශ්‍රී ලංකාවේ ටූනා මාළුන්ට විදේශ වෙළඳ පොළේ හොඳ ඉල්ලුමක් තිබෙනවා. ඒ වාගේම අනෙකුත් මාළුවලත් රසයේ වෙනසක් තිබෙනවා. අපි හිතුවොත් එකම මුහුද, ඒ නිසා මාළුන්ගේ රස එකමයි කියලා. ඒක වැරදියි. රැල්ලෙන් රැල්ලට මාළුන්ගේ රස වෙනස් වෙනවා. කිලෝ මීටර් දහයක්, පහළොවක් ඈත රැල්ලකින් එන මාළුන්ගේ රසයට වඩා, ඊළඟ රැල්ලෙන් එන මාළුන්ගේ රසයේ වෙනසක් තිබෙනවා. ඒ නිසා ඒ හොඳ තත්ත්වයක් තිබෙන ඒවා දියුණු කරන්න, ඒ සම්පත වඩා වැඩි ආදායමක් ලබන ආකාරයට දියුණු කර ගන්නට පුළුවන්කම ලැබෙනවා නම්, අපේ රට දියුණු කර ගන්නට එය මහඟු අවස්ථාවක් වෙනවාය කියා මම විශ්වාස කරනවා.

අපේ රටේ වැව් විශාල ප්‍රමාණයක් තිබෙනවා. කෘෂිකර්මයයි, ධීවර කර්මාන්තයයි එකට කර ගෙන යන්නට පුළුවන් කර්මාන්ත දෙකක්. අපේ රටේ වැව් පද්ධතිය සකස් කර ගන්නට පුළුවන්කම ලැබෙනවා නම්, -

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසාන වේගෙන යනවා.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
හොඳයි. අපේ රටේ වැව් පද්ධතිය සකස් කර ගන්නට පුළුවන්කම ලැබුණොත්, ඒ මඟින් එක පැත්තකින් වගාවට අවශ්‍ය ජලය වාගේම මසුන් ඇති කිරීම තුළින් විශාල ආදායමක් ලබා ගන්නටත් පුළුවන්කම ලැබෙනවා.

මා අවසාන වශයෙන්, යම්බන්තොට දිස්ත්‍රික්කයේ තිබෙන ප්‍රශ්නයක් පිළිබඳව ගරු අමාත්‍යතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. රැකව වැල්ලට නැංගුරම් පොළක අවශ්‍යතාව තිබෙනවා. ඒ පළාත්වල සුළු ධීවර කර්මාන්තයේ යෙදෙන අය නිතරම අනතුරට පත් වෙනවා. එම නිසා රැකව නැංගුරම්පොළ සකස් කිරීම සඳහා කරුණාකර ඔබතුමාගේ අවධානය යොමු කරන්නය කියන ඉල්ලීම කරන අතර, නැවතත් ඔබතුමාට සුබ පතමින් මා නිහඬ වෙනවා. ස්තූතියි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මීළඟට, ගරු සරත් කුමාර ගුණරත්න මහතා

[අ.භා. 5.54]

ගරු සරත් කුමාර ගුණරත්න මහතා
(மாண்புமிகு சரத் குமார குணரத்ன)
(The Hon. Sarath Kumara Gunaratne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගම්පහ දිස්ත්‍රික්කයේ මගේ හිතවතකු වන, ස්වදේශ කටයුතු හා ධීවර අමාත්‍ය ගරු ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමාට හිටපු ධීවර අමාත්‍යවරයකු වන මගේ ශ්‍රභාශිංසන පළමුවෙන්ම පිරිනමනවා. ධීවර ක්ෂේත්‍රය කියන්නේ මහ විශාල ක්ෂේත්‍රයක්. එතුමාට ස්වදේශ කටයුතු පිළිබඳ කාර්ය භාරයත් පවරා තිබෙනවා. ඒ නිසා ප්‍රශ්නවලින්

තොරව එතුමාගේ කාර්ය භාරය හොඳින් ඉටු කරන්නට වාසනාව ලැබේවායි කියා මා ප්‍රාර්ථනා කරනවා. ගරු ඇමතිතුමනි, අද මේ ගෙනැවිත් තිබෙන්නේ අලුත් පනත් කෙටුම්පතක් නොවෙයි. කලින් තිබුණු පනතක් සංශෝධනය කිරීමක් තමයි මේ කරන්නේ. යුරෝපා සංගමයෙන් අපේ මාළුවලට ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. දඩ මුදල් පිළිබඳව මිල ගණන්, එහෙම නැත්නම් දඩ මුදල් ප්‍රමාණවත් නැහැ කියා යුරෝපා සංගමයෙන් එය නැවත හරවා එවීම නිසා තමයි අපට අද මේ පනත සංශෝධනය කරන්නට සිදු වුණේ. මේ සංශෝධන තුළින් අපේ බහු දින යාත්‍රාවලට නොවෙයි ඇඟිල්ල දිගු කරන්නේ. බහු දින යාත්‍රාවකට රුපියල් මිලියන 1.5 යි කියන්නේ කුඩා ගණනක්. මෙතැන තිබිලා තිබෙනවා, යාත්‍රා වර්ග ගණනාවක්. ඒ වර්ග ගණනාව තුළම තිබෙන්නේ "නැව්" කියන වචනය. ඔබතුමා මේක සම්පූර්ණයෙන් අධ්‍යයනය කළොත් පෙනේවි 2010 වර්ෂයෙන් පටන් අර ගෙන 2012 වර්ෂයේ දී yellow card එකක් issue කරලා, ඊට පසුව red card එකක් issue කරලාත් අපේ අමාත්‍යාංශයෙන් මොකක්ද කළේ කියන එක. ගරු රාජිත සේනාරත්න ඇමතිතුමා අපව හැර ගියාට පසුව තමයි මට පුළුවන් වුණේ, මේ පිළිබඳව එකමුතුභාවයක් ඇති කරන්න. ගරු ඇමතිතුමනි, සුහදතාවේ සහ තමන් නොදන්නා දෙයක් තව කෙනෙකුගෙන් දැන ගැනීමේ අවශ්‍යතාව ඔබතුමා පැහැදිලිව තේරුම් ගන්නවා ඇති.

ගරු සජිත් ප්‍රේමදාස ඇමතිතුමා අද දින ගරු රාජිත සේනාරත්න ඇමතිතුමාට ලස්සනට සුදු හුණු ගාලා, මෙහෙමයි වුණේ කියලා කිව්වා. [බාධා කිරීමක්] නැහැ, නැහැ, එහෙම ප්‍රශ්නයක් නොවෙයි. සමහරවිට එතුමාත් කියාවි, රාජිත සේනාරත්න ඇමතිතුමාට දේශපාලන ප්‍රශ්නයක් නිසා මේක කරන්න සිදු වුණාය කියලා. මටත් එහෙම හිතෙනවා. ගරු සරත් අමුණුගම හිටපු ඇමතිතුමා මේ සඳහා නිලධාරින් යැව්වා. නිලධාරින් ගිහිල්ලා සාකච්ඡා කළා. නමුත් යුරෝපා සංගමයේ නිලධාරින් කථා කරලා තිබෙන ආකාරය පිළිබඳව අපට හිතා ගන්න බැහැ. දැන් මෙතුමන්ලා කිව්වා, ඉන්දියාවේ ට්‍රෝලර් යාත්‍රා අපේ මුහුදු සීමාව ආක්‍රමණය කරලා මහා විනාශයක් කරනවා කියලා. කොච්චර නිදහස් කළත් ඒ ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. දකුණු ඉන්දියාවේ පැහැදිලිවම දැනටත් එය සිද්ධ වෙනවා. මෙතුමා කිව්වා දැනුත් ඇවිල්ලා තිබෙනවා කියලා. ඉතින් ඒ ප්‍රශ්නයට වඩා මේ ප්‍රශ්නය තුළ අපේ බහුදින යාත්‍රා අද වනකොට ඉතාම කනගාටුදායක තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. මොකද, යුරෝපා සංගමයෙන් තමයි අපේ මාළු විශාල ප්‍රමාණයක් මිලදී ගත්තේ. විදේශ අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය, ඒ වාගේම අපේ අමාත්‍යාංශයේ නිලධාරින් එකට වාඩි කරවලා, ධීවර සංවිධානත් වාඩි කරවලා, ඊට අමතරව එයට අදාළ ප්‍රධාන සමාගම්වල අයව ගෙන්වලා සාකච්ඡා කරන්න මට පුළුවන් වුණා. එහිදී තමයි මෙහි තිබෙන භයානකත්වය දැක්කේ. එතකොට වැඩේ වෙලා ඉවරයි. ගරු සරත් අමුණුගම ඇමතිතුමාව හරවලා යැව්වා.

ගරු මංගල සමරවීර ඇමතිතුමා, ගරු රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා දින සියයේ වැඩසටහන තුළ පැහැදිලි ප්‍රකාශයක් කරලා තිබුණා, මේක වෙනස් කරනවා, කල් දමා ගන්නවා කියලා. අපිත් ඉල්ලුවේ කල් දමන්න කියලා තමයි. නමුත් මෙතැනදී ඇඟිල්ල දිගු කරලා මේ ගොල්ලන් තදින්ම කටයුතු කරලා තිබෙනවා. මේකේ ප්‍රධාන කාරණාව හංගන්න දෙයක් නැහැ. ගරු සජිත් ප්‍රේමදාස ඇමතිතුමා ඒවා වහන්න හැදුවාට, ගරු මංගල සමරවීර ඇමතිතුමා ඒක අද පැහැදිලිවම කිව්වා. එතුමා පැහැදිලිව කිව්වා, අපේ ලංකා කොඩිය ගහගෙන විදේශ නැව් මේ කරන ආක්‍රමණය තමයි මේකට ප්‍රධාන හේතුව වෙලා තිබෙන්නේ කියලා. Purse Seine ක්‍රමයට මාළු අල්ලනවා. මරු වැල් ක්‍රමයට නොවෙයි විරුද්ධ. 2012 වර්ෂයේ yellow card එක නිකුත් කරලා තිබෙද්දී, එක එක්කෙනාගේ කොම්පැනිවලින් - මම දන්නේ නැහැ කාගේද කියලා - මේ චීන නැව් ලංකාවට ගෙනාවේ ඇයි? VMS - Vessel Monitoring System - එකක් ඇති කළ යුතුයි කියලා පැහැදිලිව තිබෙනවා. දැනට මාස ගණනකට උඩදී අපේ ආයතන නොමිලයේ දීපු 50 තමයි අපි සවි කරන්න ලැහැස්ති කළේ. එතෙක් මේ VMS - Vessel Monitoring System - එක කිසිම නැවක තිබුණේ නැහැ. කිසිම පරීක්ෂකවරයෙක් මේ නැවක සිටියේ නැහැ. මා ළඟ තිබෙන මේ ලේඛනය ඔබතුමා කියවා බලන්න. මෙහි පැහැදිලිව තිබෙනවා, "large vessels" කියලා. ගරු ඇමතිතුමනි, එක් ජපන් නැවක් තිබෙනවා. තවම ඒ නැව ලංකාවට ඇවිල්ලා නැහැ. අපේ ගරු රාජිත ඇමතිතුමාත් මේවා කිව්වා. මම මේවා පැහැදිලි කළ යුතුයි. ගරු රාජිත ඇමතිතුමා කිව්වා, quota එක ආරක්ෂා කරන්නයි මේ නැව් ගෙනාවේ කියලා. ගරු ඇමතිතුමනි, මම පැහැදිලිව කියන්නම්, කිසිම quota එකක් නැහැ. මේ චීන නැව්වලින් පසු ගිය කාලයේ අපේ රටට ලැබුණු මුදල් පිළිබඳව අපේ නිලධාරින් එක්ක එකතු වෙලා මම ගණන් බැලුවා. මෙතුමා කිව්වා මිලියන 700ක ආදායමක් ලබා තිබෙනවා කියලා. නැහැ, මිලියන 32යි මේ නැව්වලින් ලංකාවට ආදායම ගෙනැල්ලා තිබෙන්නේ. මේ නැව් දෙසැරයයි ලංකාවට මාළු ගෙනාවේ. අනෙක් සෑම නැවක්ම ආවේ zero. ඒ කියන්නේ මාළු නැතිව. ලංකාවේ කොඩිය අරගෙන ගිහිල්ලා මහ මුහුදේ මාළු අල්ලලා, වෙනත් නැව්වලට මාළු විකුණලා මේ ගොල්ලන් තෙල් ගහ ගන්න අපේ ලංකාවට ආවා. මිලියන 700ක ආදායමක් අපේ රටට ආවා නම්, අද වෙනකොට ධීවර සංස්ථාව ලාභ ලබන ආයතනයක් නේ.

ධීවර සංස්ථාවට මාළු දීලා තිබෙන්නේ ලක්ෂ 60යි. අවුරුද්දක් යනකම් මුළු ධීවර සංස්ථාවට සියයට 10ක් හම්බවෙලත් ලැබිලා තිබෙන්නේ ලක්ෂ 60යි. ඒකෙන්ම මේ quota ක්‍රමයේ තිබෙන ප්‍රතිරූපය, මේකේ අභ්‍යන්තරය මොකක්ද කියලා ජනතාවට පැහැදිලි වෙනවා. ඒක නිසා මේක හරි භයානක දෙයක්. කවුරු උපදෙස් දුන්නා ද දන්නේ නැහැ, එතුමා අපට දොස් කිව්වා. ධීවර සංවිධානවලින් ඇවිල්ලා අමාත්‍යාංශයෙන් ආපු නිලධාරින්ට දොස් කිව්වා. එතුමාට කවුරු හරි වැරදි අවබෝධයක් දීලා තිබුණා. එතුමා red card එක ආවට පසුව පුවත් පත්වලට ප්‍රකාශ කළා "නැහැ, කිසි දෙයක් මේකේ වෙන්නේ නැහැ, මම ඒවා විසඳලා ඉවරයි, vesselsවල අයට මම කථා කළා" කියලා. නමුත් මුදල් අමාත්‍යාංශය, විදේශ අමාත්‍යාංශය පැහැදිලිව කිව්වා, මේකේ තිබෙන භයානකත්වය. අපේ කොම්පැනිවල අය ඇවිල්ලා පැහැදිලිව කිව්වා. නමුත් ඒ සියලු දෙනාටම බැණ වදින තත්ත්වයකට පත් වුණා. මේ ප්‍රශ්නය පිළිබඳව උද්ඝෝෂණයක් කරලා, එදා අපේ වෙන්නප්පුව, හලාවත, මීගමුව ධීවරයින් ගුටි කෑවා. ඒ අයත් එක්ක ගිහිල්ලා හිටපු ජනාධිපතිතුමා එක්ක කථා කරන්න මට පුළුවන් වුණා. ක්ෂණික පියවර අරගෙන මේකට වැඩ පිළිවෙළක් හදන්න මට පුළුවන් වුණා. මේක අර පැත්තේයි, මේ පැත්තේයි කාටවත් සුදු හුනු ගෑමක් නොවෙයි.

මේ දේ අභ්‍යන්තරව අවුරුදු ගණනාවක් තිස්සේ නොවෙච්ච දෙයක්. ගරු ඇමතිතුමනි, දැනට ජාත්‍යන්තර මුහුදේ යන අපේ බහු දින යාත්‍රා තිබෙන්නේ 750යි. ලියා පදිංචි වෙලා තිබෙනවා එක්දහස් දෙසීය ගණනක්. එතකොට 3,000ක් තිබුණා කියලා මේ වාර්තාව ගරු ඇමතිතුමාට දුන්නේ කවුද? VMS උපාංග 3,000ක් ගෙනෙන්න ගිවිසුමක් අත්සන් කළා. අපි ඒකට විරුද්ධ වුණා. ඒ මොකද, යම් ආයතනවලින් අපට නොමිලයේ උපාංග 50ක් ලබා දුන්නා. ඒක මිල අඩුයි. එතකොට අපට බහු දින යාත්‍රාවකට ලක්ෂ 4ක එකක් සවි කරන්න අවශ්‍යතාවක් නැහැ. බහු දින යාත්‍රා හත්සිය ගණනයි දැනට ජාත්‍යන්තර මුහුදට යන්නේ. අපි කියමු කෝ 1,200යි කියලා. එහෙමනම් 3,000කට උපාංග ගෙනෙන්න ගිවිසුම් අත්සන් කළේ ඇයි? මම මේ කොම්පැනියත් එක්ක සාකච්ඡා කළා. මම කිව්වා මේ තුන්දහස් ගණනක ප්‍රමාණය දහසකට වෙනස් කරලා දෙන්න කියලා. නමුත් ඒ අය බැහැයි කියලා කිව්වා.

[ගරු සරත් කුමාර ගුණරත්න මහතා]

"අපි මේ ගිවිසුම අත්සන් කරලා ඉවරයි. එම නිසා අපට මේ ගිවිසුම වෙනස් කරන්න බැහැ" කියලා ඒ අය තදින් සිටියා. මම කිව්වා, "වෙනස් කරන්න. මීට වඩා අඩුවෙන් ගන්න අපට පුළුවන්. එහෙම හෝ කමක් නැහැ, අපේ ධීවරයන්ව අමාරුවේ දමන්නේ නැතුව ප්‍රමාද නොකර මේ වැඩ පිළිවෙළ කරන්න ඕනෑය" කියලා. මම දැක්කා, ජෝශප් මයිකල් පෙරේරා ඇමතිතුමා 1,500ට එකඟ වෙලා තිබෙනවා. බහු දින යාත්‍රාවකට කුඩා යන්ත්‍රයක් සවි කළාම හොඳටම ඇති. චීන නැව මීට වඩා ගෙනෙන්න එපාය කියලා මේ වෙන කොට යුරෝපා සංගමයෙන් පැහැදිලිව නියෝගයක් දීලා තිබුණා. ඇයි ඒ? අපේ මේ මුහුදු විනාශය මේකෙන් නතර වෙනවා. මේ කෝටා ක්‍රම, අරවා මේවා බොරු. මේක ඇතුළේ මහා කුමන්ත්‍රණයක් තිබෙනවා. එම නිසා ඔබතුමා මේ සම්බන්ධව පැහැදිලි තීරණයක් ගන්න. කවුරුවත් ආරක්ෂා කරන්න එපා. මේ ගරු සභාවේ අප ප්‍රකාශ කළ දේවල්, අපේ අනිත් සහෝදර මන්ත්‍රීවරුන් ප්‍රකාශ කළ දේවල් සම්බන්ධව පැහැදිලිව ඔබතුමාගේ අවධානය යොමු කරන්න. නිලධාරින් කියන සියලු දේවල් ගණන් ගන්න එපා. ඔබතුමා වෙනම ස්වාධීන මණ්ඩලයක් පත් කරන්න. මොකද, මේක හරි භයානකයි. අද වෙන කොට ට්‍රොපික් ආයතනයටයි, තව ආයතනයකටයි විතරයි ඇමෙරිකාවෙන් සහ ජපානයෙන් orders තිබෙන්නේ. බහු දින යාත්‍රා හිමියෝ බලා ගෙන සිටිනවා, රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා එතුමාගේ ප්‍රකාශයෙන් කියපු දේවල් ගැන. ධීවරයින්ට සහනාධාර දෙනවාය කිව්වා. ධීවරයන්ගේ මේ ප්‍රශ්නය විසඳන්න හය මාසයක් කල් ඉල්ලුවා. ධීවරයෝත් මේ වතාවේ ඡන්දය දුන්නා. ඔවුන් රාජිත සේනාරත්න ඇමතිතුමා එක්ක පුදුම විරෝධයක් තිබුණේ. නමුත් අවසානයේ ඔබතුමන්ලාගේ දින සියයේ වැඩසටහනට ධීවර ජනතාවත් ඡන්දය දුන්නා. එම නිසා ඔබතුමා හිතුවාට මේක නොමිලයේ දෙනවාය කියලා එච්චර ලෙහෙසි වැඩක් නොවෙයි. දැන් ඔබතුමාටම තේරෙනවා ඇති, මුදල් අමාත්‍යාංශයෙන් කොහොමද මුදල් ලබා ගන්නේ කියලා. ස්වදේශ කටයුතු අමාත්‍යාංශයයි, ධීවර අමාත්‍යාංශයයි එකට එකතු කරලා එක තැනකට මුදල් අරගෙන ධීවර අමාත්‍යාංශයට වෙනම මුදල් දීලා මේ කටයුතු කරන කොට මේවා මහා පැටලිලි සහගත වැඩ. නමුත් මම ප්‍රාර්ථනා කරනවා, ඔබතුමාට මේ විකල්ප වැඩ පිළිවෙළ කරන්න ලැබේවා කියලා.

ගරු පාලිත රංගෙ බණ්ඩාර ඇමතිතුමා පැහැදිලිව කිව්වා, ධීවරයන්ට ගැහුවා කියලා. ඔබතුමා දන්නවා, ඒ හැම උද්ඝෝෂණ අවස්ථාවකම මම ගරු පියතුමන්ලා සමඟ ඒ උද්ඝෝෂණ සිදු කළ ධීවරයන් සමඟ සිටියාය කියලා. ඒ හැම වේලාවේම මම ඇසුවා, ඇයි තෙල් මිල අඩු කරන්න බැරි කියලා. ධීවරයෝ කියන්නේ කවුද? ධීවරයෝ කියන්නේ රටට මහා සම්පතක් ගෙනෙන අය. තේවලට සහනයක් දෙනවා නම්, පොල්වලට සහනයක් දෙනවා නම්, රබර්වලට සහනයක් දෙනවා නම් රටට මේ තරම් සම්පතක් ගෙනෙන ධීවරයන්ට සහනයක් දෙන්න බැරි ඇයි? තේ ගහකට, රබර් ගහකට පොහොර දමලා එහි සම්පත නෙළා ගැනීමට අවුරුදු ගණනක් ගත වෙනවා. නමුත් ධීවරයාට සහන දුන්නාම එසේ නොවෙයි. ධීවරයා මුහුදට ගිහින් නැත්නම් කලපුවට ගිහින් පසු දා වෙන කොට සම්පතක් නෙළා ගෙන එනවා. අපි මෙන්න මේවා ගැන හිතන්න ඕනෑ. ඔබතුමාගේ කාලයේ සහනාධාර දුන්නා. නමුත් හැම වෙලාවේම මම වැරදි දෙය වැරදියි කියලා කියපු පුද්ගලයෙක්. සමහරු මට ඒකට ඇඟිල්ල දිගු කරලා දොස් කියනවා. නමුත් අපි හරි මඟ යන්නේ නැතුව අපට කවදාවත් ඉදිරියට යන්න බැහැ. අපට මතකයි, එක කාලයක් සියයට 90ක සහනාධාර දුන්නා. දැන් ඔබතුමා දැල් ආම්පන්න ගැන කිව්වා. ධීවර සංස්ථාව විනාශ වෙලා ඉවරයි, ගරු ඇමතිතුමනි. ධීවර සංස්ථාව වෙළෙන්දන්ට විතරක් රුපියල් ලක්ෂ 3,000ක ණයක් තිබුණා. මට පුළුවන් වුණා, හිටපු ජනාධිපතිතුමාට කථා කරලා, මුදල් අමාත්‍යාංශයට ගිහින් මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා සමඟ මේ ගැන කථා කරන්න. අපේ හිටපු ඇමතිතුමා ඒ අවස්ථාවේදී මාත් එක්ක ලොකු වාදයකට පැටලුණා. ධීවර සංස්ථාව තිබෙන්නේ ධීවරයන්ගෙන් මාළු ගන්න මිසක් මාළු මුදලාලිලාගෙන් මාළු ගන්න නොවෙයි. එතැනදී මුදල් රැස් කළා. අපේ ශීතාගාර විනාශ වෙලා. අපට මේවා ගැන හිතන්න වෙලා තිබෙනවා. ශීතාගාරයක් නැතුව අපි කොහොමද මාළු ගබඩා කර තබා ගන්නේ? මටත් මා දැලක් තිබෙනවා. ඊයේ මගේ මා දැලටත් තෝර මාළු හසු වුණා. අපට ඊයේ තෝර මාළු, පරා මාළු විකුණා ගන්න බැරුව ගියා. මොකද, මේ දිනවල චීනයේ තිබෙන උත්සව නිසා චීන සමාගම් තෝර මාළු, පරා මාළු ගැනීම නතර කර තිබෙනවා. නමුත් ධීවර සංස්ථාවේ ශීතාගාර ගබඩා හරියාකාරව තිබුණා නම් ඒ තෝර මාළු, පරා මාළු හසු වෙන කාලයට ඒ මාළු ගබඩා කර තබා අපේ මිනිසුන්ට ලාභෙට මාළු ලබා දෙන්න පුළුවන්කම තිබුණා. මම මෙය යෝජනා කර තිබෙනවා. දැන් ධීවර සංස්ථාවේ වැඩ පිළිවෙළ අන්තිමටම වෙනස් වෙලා. මම හිටපු ජනාධිපතිතුමාට මේ ගැන කිව්වා. එතුමා කිව්වා, "සරත්, ඔබ හරි. මම ධීවර සංස්ථාව හැදුවේ මාළු වෙළෙන්දාගෙන් මාළු මිලදී ගන්න නොවෙයි. මාළු අල්ලන ඒ අපේ ධීවර සහෝදරයන් ළඟට ගිහින් මාළු මිලදී ගන්නයි" කියලා. මම එතුමාට කියලා ධීවරයන්ට සහතික මිලක් ලබා දුන්නා. ඔබතුමා දන්නවා, මීගමුවේ වැල්ලේ සාලයා විකුණා ගන්න බැරුව, හුරුල්ලා විකුණා ගන්න බැරුව අපේ ධීවරයන් ඒ මාළු වීසි කළා. ධීවරයන් හැඬුවා. නමුත් මට පුළුවන් වුණා, හිටපු ජනාධිපතිතුමාට කියලා හුරුල්ලා, සාලයා, පරා, කුම්බලා කියන මාළුවලට සහතික මිලක් ලබා දෙන්න. ඒ සහතික මිල තුළ ධීවරයාට ශක්තියක් තිබෙනවා.

අපි අද වීවලට සහතික මිලක් දෙනවා නම්, වෙනත් දේවලට සහතික මිලක් දෙනවා නම් මාළුවලට සහතික මිලක් දෙන්න බැරි ඇයි? මම ඒ සහතික මිල නියම කරලා ඒක ප්‍රසිද්ධියට පත් කළා, ගරු ඇමතිතුමනි. සමහර වේලාවට මීගමුවේ වේවා, වෙන කොහේ හරි වේවා අපේ මාදැල්වලට මාළු කිලෝ 2,000ක්, 3,000ක් හසු වුණාම, ඒ මාළු විකුණා ගන්න බැහැ. නමුත් ස්ථාවර මිලක් තිබෙන කොට අතරමැදියාට අපේ ධීවරයාව ගසා කන්න බැහැ. අපේ බහු දින යාත්‍රාවල අයටත් ටූනා මත්ස්‍යයින් වෙනුවෙන් රුපියල් 700ක ස්ථාවර මිලක් දුන්නා, එතැනදීත් අතරමැදියන් ඔවුන් ගසා කන නිසා. ඒ කොම්පැනි ගෙන්වලා ඒ අය එක්ක සාකච්ඡා කරන්න. එක මන්ත්‍රීතුමෙක් මේ කොම්පැනි ගැන කථා කළා. ඒ මන්ත්‍රීතුමා කවුද කියලා මට මතක නැහැ. කවුරු තරහා වුණත් මම කියනවා, ඔය එකම කොම්පැනියකවත් මාළු අල්ලන නැවක් නැහැ කියලා. හැම නැවක්ම ලියා පදිංචි කරන්න ඕනෑ. මම එම සමාගමක නියෝජිතයෙකුගෙන් ඇහුවා, ඔය ගොල්ලෝ මාළු අල්ලන්න බිලි කටුයි, මරු වැලුයි කීයක් ගෙන යනවාද කියලා. අපි උදාහරණයකට කියමු 1,000යි කියලා. අපේ යාත්‍රාවල ගෙනි යන්නේ 1,000යි. අපේ අය දවස් 20ක් රස්සාව කරනවා නම්, මරු වැල් 1,000ක් ගෙන යන ඒ සමාගම් සුමානෙන් ගෙනෙනවා අපේ වාගේ තුන් ගුණයක මාළු. කොහෙන්ද ඒවා ගෙනෙන්නේ? ගරු ඇමතිතුමනි, ඒ මාළු ගෙනෙන්නේ අල්ලා ගෙන නොවෙයි. ඒ ගොල්ලෝ විදේශ නැව්වලින් මාළු මිලදී අරගෙනයි ලංකාවට ගෙනෙන්නේ. සමහර වෙලාවට ගෙනෙන්නේ කුණු මාළු. අපේ බහුදින යාත්‍රාවල ධීවරයෝ මීට දවස් ගණනකට ඉස්සෙල්ලා දික්ඕවිට වරායට ගිහිල්ලා ඒ නැවක තිබුණු කුණු මාළු එළියට අරගෙන පෙන්නුවා. "අපේ මාළු ගන්නේ නැහැ, අපේ මාළුවලට මිලක් දෙන්නේ නැහැ, අපේ මාළු ප්‍රතික්ෂේප කරනවා, මේ කුණු මාළු අරගෙන මේ ගොල්ලෝ අපව රවට්ටනවා" කියලා. මේවා අපි තේරුම් ගන්න ඕනෑ. මේ ධීවර ක්ෂේත්‍රය වෙනස් කරන්න ඕනෑ.

ගරු සජිත් ප්‍රේමදාස ඇමතිතුමාට මම දවසක් කිව්වා, ඔබේ තාත්තා ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වැහුවත් ඔබතුමා අපේ ජලජීවී වැඩ පිළිවෙළ ගැන ප්‍රශංසා කළා කියලා. අද මේ දේවල් ගැන අපේ නිලධාරින්ට වඩා හොඳ දැනුමක් බහුදින ධීවර යාත්‍රා සමිති නියෝජනය කරන අපේ ධීවරයන්ට තිබෙනවා. පිට රටවලට පොකිරිස්සන් යවන අය වෙන්න පුළුවන්, ඉස්සන් යවන

අය වෙන්න පුළුවන්, ඒ අයගෙන් තමයි අපට සම්පත් ඔක්කෝම ලැබෙන්නේ. ඒ අයට වක්‍රලේඛ මඟින් දාලා තිබෙන නීති වෙනස් කරන්න, ගරු ඇමතිතුමනි. මම අපේ නිලධාරින්ට කිව්වා, ඒ අය අපේ රටට විදේශ විනිමය ගෙනෙන අය, ඔවුන්ට උදවු වෙන්න, කුඩා ව්‍යාපාරිකයෝ ගොඩ නගන්න කියලා. ඉස්සන් ව්‍යාපාරිකයෝ වේවා, පොකිරිස්සන් ව්‍යාපාරිකයෝ වේවා, මුහුදු කුඩැල්ලන් ව්‍යාපාරිකයෝ වේවා, ඔවුන්ට තහංචි දාලා, මාසෙන් මාසයට permit දෙන්නේ නැතුව, නියම පුද්ගලයින්ව තෝරලා ඒ අයට නියම බලපත්‍ර ලබා දෙන්න කියලා මම යෝජනා කළා. එහෙම නැත්නම් අපට මේ ගමන යන්න ලැබෙන්නේ නැහැ.

අතිගරු ජනාධිපතිතුමා ඉන්දීය සංචාරයට යන්න ඉස්සර වෙලා ඉන්දියාවේ සියලු ධීවර යාත්‍රා නිදහස් කරලායි ගියේ. යාත්‍රා විශාල ප්‍රමාණයක් තිබුණා. මට මතක හැටියට 70ක්, 80ක් විතර තිබුණා. ධීවරයන් එක්ක නිදහස් කළා. හැබැයි, හිටපු ජනාධිපතිතුමාත්, රාජිත ඇමතිතුමාත් තදින් හිටියා, මේවා නිදහස් කළොත් මේ යාත්‍රා නැවත අපේ ලංකාවට එනවා; මේක මහා ව්‍යාපාරයක් කියලා. පාකිස්තානය එලෙස නිදහස් කරලා තිබුණා. අපේ ලංකාවත් නිදහස් කළා. නමුත් කවදාවත් දකුණු ඉන්දියාවෙන් එන ධීවරයන්ව නතර කරන්න කාටවත් හැකියාවක් නැහැ. ඒවා ගැන TNA එක කථා කරන්නේ නැහැ; අපේ රදගුරුතුමා කථා කරන්නේ නැහැ; පළාත් සභාව කථා කරන්නේ නැහැ. මේ ආක්‍රමණ තුළ අපේ මුහුද සම්පූර්ණයෙන් විනාශ වෙලා. අද ඉන්දියානු මුහුදේ මාළු නැහැ. මම ඒ ගොල්ලන්ගේ ට්‍රෝලර් යාත්‍රාවලට ගිහින් බැලුවා. ජේසාලෙයි ඉඳලා බලන කොට කිලෝ මීටර් භාගයක් එහාට ඒ යාත්‍රා එනවා. නාවික හමුදාවට යාත්‍රා 1,000ක් එළවන්න හැකියාවක් නැහැ. නාවික හමුදාව අසරණ වෙලා. ඇයි, යුරෝපා සංගමයට බැරි ඒවාට විරුද්ධව කථා කරන්න? ඇයි, යුරෝපා සංගමය ලංකාව වාගේ පොඩි රටකට ඇඟිල්ල දික් කරන්නේ? අද මහා පරිමාණයේ බලවත් රටවල් ඇවිත් මුහුද ආක්‍රමණය කරලා මාළු අල්ලා ගෙන යනවා. ඒවාට කථා කරන්නේ නැහැ. අපේ පුංචි රටට ඇඟිල්ල දික් කරනවා. මේවායේ පසු පස කුමන්ත්‍රණයක් තිබෙනවාද කියලා මට ලොකු සැකයක් තිබෙනවා. ඉන්දියානු ආක්‍රමණ නතර නොකළහොත් අපේ මාළු සම්පත සම්පූර්ණයෙන් විනාශ වනවා. ඒ වාගේම මුහුදු පැළෑටි විනාශ වෙනවා. මම ගිහින් බැලුවා. ඒ යාත්‍රා මහා පරිමාණයේ යකඩ දාලා මුළු බිමත් එක්කයි ඇද ගෙන යන්නේ.

ගරු ඇමතිතුමනි, ජේසාලෙයි ප්‍රදේශයේ තමයි සීනක්කාලි කකුළුවෝ වැඩි වශයෙන් නිෂ්පාදනය කෙරෙන්නේ. මම වෙන්නප්පුවට ගිහින් කොම්පැනියක් විවෘත කළා. ඒ අය සීනක්කාලි කකුළුවෝ මිලදී ගන්නවා. ඒ පැත්තේ ධීවරයෝ දෙමළ වේවා, සිංහල වේවා, මුස්ලිම් වේවා බොහොම සතුටින් ඒ වැඩ පිළිවෙළට සම්බන්ධ වෙලා ඉන්නවා. නමුත් අර එන යාත්‍රාවලින් කරන විනාශය තුළින් ඒ ප්‍රදේශයම විනාශ වෙලා ඉවරයි. ඒවා ගැන කවුරුත් කථා කරන්නේ නැහැ. මේවායි අපි කථා කළ යුත්තේ. අර පැත්තට ඇඟිල්ල දික් කරලා, මේ පැත්තට ඇඟිල්ල දික් කරලා, අපේ සජිත් ඇමතිතුමා රාජිත ඇමතිතුමාව ගලවන්න හදනවා. එහෙම නොවෙයි, අපි විවෘතව කථා කරමු. මොකද, ධීවර ප්‍රශ්නය කියන්නේ රටට බලපාන ප්‍රශ්නයක්. බහුදින ධීවර යාත්‍රා හිමියන් ඒ අසරණ තත්ත්වයෙන් මුදා ගන්න නම් අපි විවෘත සංවාදයක යෙදෙන්න ඕනෑ. අපි නිලධාරින් කියන සේරම අහලා, බොරු දේවල් කරන්න ගියොත් ඒ වැඩේ අපට කවදාවත් කරන්න බැහැ.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් අවසාන වශයෙන් තව ඉල්ලීමක් කරනවා. ඔබතුමන්ලා Port City එක පිළිබඳව වේදිකාවේ කථා කළා. ඒක චීනයත් එක්ක තමුන්නාන්සේලා බේරා ගන්න, ඒකට මගේ විරුද්ධත්වයක් නැහැ. ගරු ඇමතිතුමනි, උස්වැටකෙයියාව වෙරළේ ඉඳලා මීගමුවේ දුංගල්පිටිය, සෙත්තප්පාඩුව මුහුදු තීරයෙන් තමයි ඒ ව්‍යාපෘතියට වැලි ගන්න තීරණය කරලා තිබෙන්නේ. මේ නිසා මාළු බිම් විනාශ වනවා. කිසිම මාළුවෙක් එන්නේ නැහැ. දැනටත් වැලි ඇදීම තුළ සෙත්තප්පාඩුව, කැපුන්ගොඩ ගල් මතු වෙලා අපට මාදැලක් වට කරන්න බැහැ; උස්වැටකෙයියාව ප්‍රදේශයේ ඉඳලා බෝට්ටුවක් යන්න බැහැ. ඒ නිසා ඒ ප්‍රදේශයෙන් වැලි ගන්නවාට මා විරුද්ධ වුණා. මගේ සම්බන්ධීකරණ කමිටුවේදී මා යෝජනාවක් අනුමත කළා, මේ ප්‍රදේශයේ මේ දේ කරන්න එපා, කැමැති වෙන තැනකින් වැලි ගන්න කියලා. මොකද, මේ පැත්තෙන් වැලි ගත්තොත් ඒ අය කියනවා, "අපට සහනාධාරයක් දෙන්නම්" කියා. නමුත් ධීවරයෝ මේ වන විටත් පාරට බහින්න සූදානම් වෙලා සිටිනවා. මම ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා, අපේ හිටපු ඇමතිවරයෙක් කැපුම්ගොඩ හැදූ නැංගුරම් තොටුපොළේ සිදු වන විනාශයත්, වැලි අරගෙන කරනු ලබන විනාශයත් කියන දේවලින් අපේ ප්‍රදේශය ගලවා දෙන්න කියා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. මීළඟට ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා ඇමතිතුමා.

[අ.භා. 6.12]

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා (ස්වදේශ කටයුතු හා ධීවර අමාත්‍යතුමා)
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா - உள்நாட்டலுவல்கள் மற்றும் கடற்றொழில் அமைச்சர்)
(The Hon. M. Joseph Michael Perera - Minister of Home Affairs and Fisheries)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කථා කරන ලද සියලු දේ පිළිබඳව තීරණයක් ගැනීමට දැන් වෙලාව නැහැ. හිටපු ධීවර නියෝජ්‍ය ඇමතිතුමාට මම ආරාධනා කරනවා, අපි පොඩ්ඩක් එකතු වෙලා මේ ගැන කථා කරමු කියා. මම හිතනවා, ඒක තමයි අද තිබෙන හොඳම වැඩ පිළිවෙළ කියා. පාර්ලිමේන්තුව තුළදීත්, ඉන් පිටතදීත් ඒ සම්බන්ධව කථා කරන්න අපට පුළුවන්. කථා කරන්න කාරණා කිහිපයක් තිබෙනවා. මම මේ අවස්ථාවේදී ගරු අගමැතිතුමාට ස්තුතිවන්ත වෙනවා, මෙම ප්‍රශ්නයේ දී කෙළින්ම එතුමා මැදිහත්වීම සම්බන්ධයෙන්. එතුමා කෙළින්ම මැදිහත් වෙලා, අපත් දැනුවත් කර, රාජ තන්ත්‍ර මට්ටමෙන් මේකට විසඳුම් සොයලා ඒ අනුව වැඩ කටයුතු කළා. ඊට පස්සේ ඔබතුමා කියපු ගිවිසුම අනුව අප විසින් VMS උපාංග 1500කට ගෙනැල්ලා එම amendment එකත් කරලා, මට පිළිතුරක් ලැබුණේ දින 330කින් මේ VMS එක සවි කරනවා කියා. මම කිව්වා, "බැහැ" කියා. අගමැතිතුමාත් තදින් කියා හිටියා, මේක මාස 5ක කාලයකින් අවසන් කරන්න ඕනෑ කියා. ඒ කියන්නේ මාස 5 අවසානයේ දී දෙන එක නොවෙයි, විටින් විට විටින් විට ගෙනැල්ලා අවසානය මාස 5ක කාලයයි. එය තමයි දැන් අප කරගෙන යන්නේ. අප ඒ පිළිබඳව තදින් කටයුතු කරගෙන යනවා. ඒ ගොල්ලන්ට ඕනෑ, මුදල් එවෙලේම ලබලා දුන්නා. මෙය දිගටම කරගෙන යනවා.

මට ඊට වඩා වැදගත් ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. තමුන්නාන්සේ සහනාධාර ගැන කිව්වා. සහනාධාරවලත් අප වෙනසක් කළ යුතුව තිබෙනවා. හරි අය වැරදි අය ඔක්කොම ගන්නවා. විකුණන්නත් ගන්නවා. ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ මීගමුවේ වුණ සිදුවීම් සියල්ල දන්නවා නේ? ඒවා ඉතින් මම අමුතුවෙන්ම කියන්න ඕනෑ නැහැ නේ. අපේ දින සියයේ වැඩ පිළිවෙළේ "වෙනසකට එක්වෙමු මෛත්‍රී පාලනයක් 100 දිනකින් අලුත් රටක්" යන පත්‍රිකාවේ '100 දිනක් ඇතුළත ක්‍රියාවට නංවන ක්ෂණික සහන වැඩසටහන' යටතේ බොහොම පැහැදිලිව සඳහන් වෙනවා. මම ඒවා තමුන්නාන්සේලාට මතක්

[ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

කරන්නම්. එහි අංක 63 යටතේ ධීවර ක්ෂේත්‍රය ගැන මෙසේ සඳහන් වෙනවා:

"63. ධීවර යාත්‍රා, දැල් ආම්පන්න සහ බෝට්ටු එංජින් සඳහා දැනට පනවා ඇති අධික බදු ඉවත් කිරීම"

අප එය කරනවා.

එහි අංක 64 යටතේ මෙසේ සඳහන් වෙනවා:

"විදේශ ධීවර යාත්‍රා ලංකා මුහුදු සීමාව ආක්‍රමණය කිරීම වැළැක්වීම"

අප එයට ආක්‍රමණය කියා කියමු. එතකොට, එය උතුරටත් බලපානවා.

එහි අංක 65 යටතේ මෙසේ සඳහන් වෙනවා:

"මත්ස්‍ය අපනයනය සඳහා අහිමි වී තිබෙන යුරෝපා වෙළඳපොළ නැවත ලබා ගැනීම"

එහි අංක 66 යටතේ මෙසේ සඳහන් වෙනවා:

"කුණාටු සහ මුහුදේ ඇති වන කැළඹීම් තත්ත්වයන් ගැන නිවැරදි තොරතුරු කඩිනමින් ධීවරයා වෙත ලබා දිය හැකි කාළගුණ විමර්ශන වැඩ පිළිවෙළක් සකස් කිරීම"

මෙම වැඩ පිළිවෙළ තමයි ධීවර ජනතාව වෙනුවෙන් මෙම දින සියය තුළ කිරීමට බලාපොරොත්තු වෙන්නේ.

ගරු සරත් කුමාර ගුණරත්න මහතා
(மாண்புமிகு சரத் குமார குணரத்ன)
(The Hon. Sarath Kumara Gunaratne)
රක්ෂණය පිළිබඳව ඉතා වැදගත් දෙයක් සඳහන් කර තිබුණා.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
අපට මේවා සම්බන්ධයෙන් සියලු දෙනාගේම සහයෝගය ලබා ගන්න පුළුවන්. අද වන විට තවත් ප්‍රශ්නයක් මතු වෙනවා. විශේෂයෙන්ම නැගෙනහිර පළාතේ සිංහල ධීවර ජනතාවත්, මුස්ලිම් ධීවර ජනතාවත්, ද්‍රවිඩ ධීවර ජනතාවත් හිටියා. මම මේ මන්ත්‍රීවරුන් සමඟ කථා කළා, පරණ licences තිබුණු අයට නැවත වරක් අවස්ථාවක් ලබා දෙන්න කියා.

ගරු සරත් කුමාර ගුණරත්න මහතා
(மாண்புமிகு சரத் குமார குணரத்ன)
(The Hon. Sarath Kumara Gunaratne)
පෙරේදා කල්ලාර් ප්‍රදේශයට යන්න දුන්නේ නැහැ.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
කල්ලාර්, කෝකිලායි ප්‍රදේශවලත් ඒ වාගේ හැම තැනම එම ප්‍රශ්න තිබෙනවා. හැම කෙනෙකුටම යන්නත් බැහැ. ඒකත් අප පිළිගන්න ඕනෑ. ඉස්සර අවසර පත්‍ර - licences - තිබුණු අයට ගිහිල්ලා එම ධීවර වැඩ කටයුතු කරන්න එතුමන්ලාගේ සහයෝගයත් අපට ලබා ගන්න තිබෙනවා. ඒකත් අප ලබා ගන්නවා. ඒ වාගේම එතුමන්ලාගේ පළාත්වල ප්‍රශ්න ගොඩාක් කිව්වා. ඒවා පිළිබඳවත් අප විශේෂ අවධානය යොමු කරවනවා. මට ඒ ඔක්කොම එකින් එක කියන්න බැහැ. නමුත් ඒ ජනතාවගේ අවශ්‍යතාව අප ඉෂ්ට කරන්න අවශ්‍යයි. එම නිසා ඒ සම්බන්ධයෙන් ගත යුතු සියලු පියවර ගන්නවා. විශේෂයෙන්ම, පැටලුණු තැනක් තිබෙනවා. මාතර ධීවර සංවිධාන, මීගමුව ධීවර සංවිධානයේ බහුදින ධීවර යාත්‍රා තිබෙන අය ගෙන්වලා අප කථා කළා; අපේ නිලධාරින් සමඟත් කථා කළා. ඒකට අපේ පළාත් සභා මන්ත්‍රී හෙක්ටර් අප්පුහාමි මැතිතුමාත් සහභාගි වුණා.

අපි එක තීරණයකට ආවා. ඒ තීරණය මොකක්ද? මම දන්නේ නැහැ, මෙහෙම කියන එක හරිද කියා. සිංහ කොඩිය දමා -අපේ ජාතික කොඩිය දමා- මාළු අල්ලන නැව් අටක් තිබෙනවා. එතුමන්ලා කිව්වා, ඒ නැව් අට නතර කරන්න කියා. මම එවේලේම නියෝගයක් දුන්නා, ඒවා නතර කරන්න කියා. ඊට පස්සේ තව එකක් තිබුණා. මට නිලධාරින් කිව්වා, ඒක මුහුදට ගිහිල්ලා එන කල් ඉන්න ඕනෑය කියා. මම කිව්වා, "කමක් නැහැ, ආවාට පස්සේ ඒකත් නතර කරන්න" කියා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේ දික්ඕවිට ඊයේ පෙරේදා ඇති වෙච්ච තත්ත්වය ගැනත් යමක් කියන්න ඕනෑ. මාළු අල්ලන නැව් වගයක් ගෙනැල්ලා ලොකු ප්‍රශ්නයක් ඇති වුණා. මම කිව්වා, "ඒ ගැනත් අපි කථා කරමු" කියා. ඒවාත් ලංකාවේ ඒවා. මම දන්නා හැටියට ඒවායින් මාළු අල්ලන්නේ නැහැ.

ගරු සරත් කුමාර ගුණරත්න මහතා
(மாண்புமிகு சரத் குமார குணரத்ன)
(The Hon. Sarath Kumara Gunaratne)
මාළු වැඩියෙන් අහුවෙන කාලයට ඒ අයට මාළු අල්ලන එක සීමා කරන්න.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඒ අයට කොහොමත්ම අල්ලන්න දෙන්නේ නැහැ. අපි පොඩි ධීවරයා නාස්ති වෙන විධියට කොහොමත්ම අල්ලන්න දෙන්නේ නැහැ. ඒ විධියට මාළු අල්ලන බහු දින යාත්‍රාත් තිබෙනවා. කොහොමත් ඒක කරන්න දෙන්නේ නැහැ. වෙලාවකට අපට මාළු අඩුයි. මාළුවලට හොඳ මිලක් එන කොට ධීවරයා ඒක වෙනමම විකුණා ගන්නවා. වැඩි පුර මාළු අස්වැන්න හම්බ වෙන කොට සංස්ථාවට හෝ, කොහේට හෝ ඒවා ගන්න වෙනවා. ඒකට වැඩ පිළිවෙළක් ලැහැස්ති කරනවා. ඒ වාගේම සුළු ධීවරයා ගැන අපි මේ වෙලාවේදී කථා කළ යුතුමයි. තෙප්පම්, පොඩි ඔරු, පොඩි බෝට්ටු පාවිච්චි කරන ධීවරයා ආරක්ෂා කර ගත යුතුයි. මොකද, ඔවුන්ගෙන් ලැබෙන මත්ස්‍ය සම්පත කොහේවත් අරින්නේ නැහැ. අපි අතරමයි -අපේ ජනතාව අතරමයි- බෙදා හදා ගන්නේ. මම ඒ ස්ථාවරයේ සිටිනවා.

Trawling ක්‍රමය සම්පූර්ණයෙන් තහනම් කර තිබෙනවා. කොහේවත් ඒකට අවසර දීලා නැහැ. ඔවුන් නීති විරෝධීවයි ඒවා කරන්නේ. හැබැයි, ඒක තහනම් කළාට අපේම මන්ත්‍රීවරු ඇවිල්ලා එක එක දේවල් කියා ඒක කරන්න දෙන්න කියන බව ඔබතුමාත් දන්නවා. එතකොට අපි හරි අසරණ තත්ත්වයකට පත් වෙනවා. ඒ නිසා පොදු එකඟතාවකට අපි එමු. තව එකක් තිබෙනවා. සුරුක්කු දැල්, ලයිලා දැල් පිළිබඳව ලොකු විරෝධයක් තිබෙනවා. නමුත් අපේ දෙපාර්තමේන්තුවෙන් අවුරුද්දකට අවසර දීලා තිබෙනවා, මාළු රැස් වෙන හැටි බලලා හැතැක්ම 10කට එහා ධීවර කටයුතු කරන්න කියා. ඒකටත් ජනතාව විරුද්ධයි. ඒ ගැනත් අපි බලමු. ඒ ගැන බලලා, ඒකට ගත යුතු වැඩ පිළිවෙළවල් අපි යොදනවා. මට ඒ පිළිබඳව පැමිණිලි ලැබුණේ මෙහෙන් විතරක් නොවෙයි.

අපි උතුරට ගිය වෙලාවේ උතුරෙනුත් ඒ වාගේම මඩකලපුවෙනුත්, හැම පැත්තකින්මත් මේ ප්‍රශ්නය ගැන පැමිණිලි ලැබුණා. ඒ වාගේම ඉන්දියාවේ ඉඳලා එන ධීවර යාත්‍රා ගැන පැමිණිලි ලැබුණා. මේක නම් ලොකුම ප්‍රශ්නයක්. ඒක නතර වෙන්නේ නැති ප්‍රශ්නයක්. ධීවර සමිති ගිහිල්ලා යම් යම් එකඟතාවන්ට පැමිණ තිබුණා. නමුත් දැන් ඒවා කඩලා. ඒවා එච්චරම සාර්ථක නැහැ. කොහොම හරි අපේ රජය ඉන්දියාවත් සමඟ ජාත්‍යන්තර වශයෙන් කථා කර මේකට ස්ථිර විසඳුමක් ලබා

ගත යුතුයි. ඒක ඉතාම වැදගත්. ඒ නිසා අපි ඒ පිළිබඳවත් අපේ අවධානය යොමු කරමින් ඉදිරි කටයුතු කරනවා.

ගරු සරත් කුමාර ගුණරත්න මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ කිව්ව වැලි කේස් එක පුදුම විධියට තිබෙනවා. මම දුන්ගාල්පිටියේ කැපුම්ගොඩ, වරාය හදපු එක ගැන කියපු වෙලාවේ එදා තමුන්නාන්සේ මාත් එක්ක හැප්පුණා. දැන් තමුන්නාන්සේ පිළිගන්නවා, මම එදා කියපු එක හරි කියා. එදා මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලීමක් තමයි කෙරුවේ. දැන් තමයි මට ඇත්ත කථාව තේරුණේ. කොහොමත් අපි ඒ වෙලාවේ, තියෙන දේ කිව්වා. දික්ඕවිට වරාය හදලා ගමේ ධීවරයන්ට ඇතුළට බෝට්ටු ගන්න විධියක් නැහැ. ඉතින්, නැංගුරම් පොළක් හදන්න ඔබතුමන්ලා පොරොන්දු වෙලා තිබෙනවා. මට දැන ගන්න ලැබුණු විධියට -මම ඊයේත් කථා කළා.- ඒක හදලා ඉවර නැහැ.

පොඩි මිනිහා ගැන කථා කරන කොට මෙවැනි තැන් ඒ අයටත් ලැබෙන විධියට කටයුතු කිරීම හුඟක් වැදගත්. නැත්නම් අර නැව්වලින් මාළු ගෙනෙන කොට ඒ මනුස්සයාටත් ඊර්ෂ්‍යාවක් ඇති වෙනවා. ඒක තමයි ඇති වෙලා තිබෙන්නේ. ඒ ව්‍යාපාරයේ වාසිය ඒ ගම්වල ජනතාවටත් එන්න ඕනෑ. ඒක තමයි අපට කරන්න තිබෙන දේ. ගමේ මිනිහාට කිසිම දෙයක් නැත්නම් අර නැව් දිහා බලා ගෙන ඉන්න ඕනෑ. අපි ඒ අයගේ ප්‍රශ්නය පිළිබඳව කථා කරනවා. මම අද හෙටම අපේ ධීවර බෝට්ටු අයිතිකාරයන් එක්ක කථා කර, ඒ companies එක්ක කථා කර යම් කිසි එකඟතාවකට එන්න කටයුතු කරනවා. එහෙම හොඳයි නේ. එහෙම තමයි වෙන්න ඕනෑ.

අපට තව දුරටත් මේක දියුණු කරන්න වෙනවා. දියුණු ක්‍රමවලින් අපේ මුහුදේ කොපමණ දුරට මාළු අල්ලන්න පුළුවන්ද කියා කොහොමත් එතැනදී අපට සාකච්ඡා කරන්න වෙනවා. මේක තමයි ලොකුම ප්‍රශ්නය. අපි කොපමණ සහනාධාර දුන්නත්, දියුණු ක්‍රමවලින් කොහොමද අපේ මුහුද පාලනය කර ගන්නේ කියන එක ගැන අපි කල්පනා කරන්න ඕනෑ. එතකොට අර ගොඩ බිමට එන සත්තු එන්නේත් නැහැ. ඒවාවල මාළු බෝවෙන තැන් තිබෙනවා. ඉතින්, ඒ ඔක්කෝම destroy වෙයි. එහෙම වුණොත් අපි මොකක්ද කරන්නේ? ඒ වාගේම මුහුදත්, කළපුවත් විනාශ වෙන ප්‍රශ්න රාශියක් තිබෙනවා.

සරත් කුමාර ගුණරත්න මන්ත්‍රීතුමනි, මීගමුව කළපුව සංවර්ධනය කිරීමේ වෙනම වැඩ පිළිවෙළක් තිබෙන බව තමුන්නාන්සේ දන්නවා. ධීවරයින් එක්ක කථා කරලා හරි ක්‍රමයකට මේ කටයුත්ත කරන්න, ඒ වාගේම මෙයින් උපරිම ප්‍රයෝජනය ගන්න, ඒ අනුව වැඩ කරන්නයි අපි බලාපොරොත්තු වන්නේ. ෆීලික්ස් පෙරේරා මැතිතුමා ලොකු වාදයක් ගෙන ගියා. එතුමා ගොඩක් දුරට චෝදනා එල්ල කළේ රාජිත සේනාරත්න ඇමතිතුමාටයි.

සරත් කුමාර ගුණරත්න මන්ත්‍රීතුමනි, ඔබතුමාත් ව්‍යංගයෙන් හෝ චෝදනා එල්ල කළේ රාජිත සේනාරත්න ඇමතිතුමාටයි. එතුමාත් මේ කටයුත්ත වෙනුවෙන් විශාල වැඩ කොටසක් කරලා තිබෙනවා. අපට ඒක නැහැ කියලා කියන්න බැහැ. විශාල වැඩ කොටසක් එතුමාත් කරලා තිබෙනවා. එක එක මට්ටමේ ඉඳගෙන, එක එක සිද්ධාන්ත තුළ ඉඳගෙන කවුරුත් වැඩ කරලා තිබෙනවා. වරදින්න පුළුවන්, හරි යන්න පුළුවන්. අපි ඔක්කොම එක්කහු වෙලා මේ වැඩ පිළිවෙළ සාර්ථකව ඉදිරියට ගෙනි යන්න කටයුතු කරමු.

ඉන්ධන සහනාධාරය පිළිබඳව කිව්ව කාරණයට මා නම් එකඟ වන්නේ නැහැ. ඉන්ධන සහනාධාරය ලබා දුන්නේ ඉන්ධනවල මිල වැඩි වුණාමයි; ධීවරයින් කරපු උද්ඝෝෂණයේ ප්‍රතිඵලයක් හැටියටයි. සහනාධාරය දීලා ටික දවසක් ගිහිල්ලා ඒක නතර කළා. ඒකයි ඇත්ත කතන්දරය. ඉන්ධන සහනාධාරය නතර කරන කොට පොරොන්දුවක් වුණා, ඒ අයට අවශ්‍ය වන දැල්, engines ආදි වශයෙන් රුපියල් ලක්ෂයක් පමණ වටිනා බඩු දෙනවාය කියලා. මේවා සමහර අයට දීලා තිබෙනවා. සමහරු ගෙනැල්ලාත් තිබෙනවා. දැන් මුළු ලංකාවේම මේ ප්‍රශ්නය තිබෙනවා. මට ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මැතිතුමාත් මේ කාරණය සම්බන්ධයෙන් කිව්වා. ධීවර බෝට්ටු තිබුණු අයට, engines තිබුණු අයට ඒ සහනාධාරය ලැබිලා නැත්නම් සම්පූර්ණ සමීක්ෂණයක් කරලා ඒවා ලබා දෙන්න අපි කටයුතු කරනවා. ලැයිස්තු බැලුවාම මට පෙනෙනවා, ධීවර බෝට්ටුවක්වත් නොතිබුණු, engine එකක්වත් නොතිබුණු මිනිසුන්ටත් මේ සහනාධාරය ලබා දෙන්න නිර්දේශ කරලා තිබෙන බව. ඒවාත් වෙනස් කරලා, හරි මාර්ගයේ යන්න අපි කටයුතු කරනවා.

අනික් කාරණය තමයි, ගොවිතැනට හුඟක් සහනාධාර ලබා දෙනවා කියන එක. ඒක හොඳයි. අපි ඒක නැහැ කියලා කියන්නේ නැහැ. මොකද, ගොවි ජනතාවත් මේ රටේ ජීවනාලිය වාගේ තමයි වැඩ කරන්නේ. ඒ වාගේම අයිතියක් තිබෙනවා, ධීවරයින්ටත් ඒ අවස්ථාව ලබා දෙන්න. මේ ගැන මම වැඩිය කථා කරන්න යන්නේ නැහැ. මොකද, ධීවරයින් ලොකු උද්ඝෝෂණ කරන්නේ නැති නිසා; වැඩිය කෑ ගහන්නේ නැති නිසා. නමුත් අපි ද්‍රවිඩ, මුස්ලිම් මන්ත්‍රීතුමන්ලාගේත් සහයෝගය මේ සඳහා බලාපොරොත්තු වනවා. ඒ වාගේම මේ කාරණා ටික ඉෂ්ට කර ගන්න විරුද්ධ පැත්තේ ඉන්න මන්ත්‍රීතුමන්ලාගේත් සහයෝගය අපි බලාපොරොත්තු වනවා. ඒ කාරණා ටික ඉෂ්ට කර ගත්තොත් අපට පුළුවන් වෙයි හොඳ ඉදිරි ගමනක් යන්න. ඇත්ත වශයෙන්ම අපේ පරිභෝජනය වැදගත්. එහිදී inland fisheries පැත්ත වැදගත් වනවා. පරිභෝජනය වැදගත් වන කොට ඒකෙන් ලොකු සම්පතක් අපේ රටට ලැබෙනවා; අඩු මුදලට මාළු ගන්නත් පුළුවන් වෙනවා. මම මේ ගැන මීට වැඩිය කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම බලාපොරොත්තු වුණු වෙලාව තමුන්නාන්සේ මට ලබා දුන්නේ නැහැ. ඒ වේලාව සරත් කුමාර ගුණරත්න මන්ත්‍රීතුමා ගත්තා. කමක් නැහැ. එතුමාත් ප්‍රකාශ කළේ හොඳ අදහස් නේ. ඒ නිසා මම මගේ කථාව අවසන් කරනවා. මේ පිළිබඳව සහයෝගයෙන් කථා කිරීම සම්බන්ධයෙන් සියලු ගරු මන්ත්‍රීතුමන්ලාට ස්තුතිවන්ත වනවා. එතුමන්ලාගේ ඉල්ලීම් තිබුණා. අපි ඒවාත් සලකා බලනවා. හැන්සාඩ් වාර්තාව බලලා, ඒ හැම දෙනා එක්කම කථා කරලා, අලුත් ගමන් මගකට පිවිසෙන්නට මම පොරොන්දු වනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.
Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." [ගරු ජෝශප් මයිකල් පෙරේරා මහතා]
தீர்மானிக்கப்பட்டது.
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா]
Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament."- [The Hon. M. Joseph Michael Perera.]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் ஆராயப்பட்டது.
[பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered in Committee.
[MR. DEPUTY SPEAKER in the Chair.]

[ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

1 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

1 ආම් වාසකම් සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clause 1 ordered to stand part of the Bill.

2 වන වගන්තිය. - (1996 අංක 2 දරන පනතේ 49 වගන්තිය සංශෝධනය කිරීම.)

வாசகம் 2 .- (1996ஆம் ஆண்டின் 2 ஆம் இலக்கச் சட்டத்தின் 49 ஆம் பிரிவினை திருத்துதல்.)

CLAUSE 2.- *(Amendment of section 49 of Act, No. 2 of 1996)*

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා

(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)

(The Hon. M. Joseph Michael Perera)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"1 වන පිටුවේ, 22 වන පේළිය ඇතුළු උපලේඛනය ඉවත්කොට පහත දැක්වෙන කොටස ඇතුල් කරන්න:-

'මුදලක් ගෙවීම සඳහා යටත් විය යුතු ය. :-

උපලේඛනය

I වන තීරය	II වන තීරය
බෝට්ටුවේ දිග	දඩ මුදල
මීටර් 10.3 සිට මීටර් 15ට අඩු	රුපියල් මිලියන 1.5
මීටර් 15 සිට මීටර් 24ට අඩු	රුපියල් මිලියන
මීටර් 24 සිට මීටර් 45ට අඩු	රුපියල් මිලියන 75
මීටර් 45 සිට මීටර් 75 දක්වා	රුපියල් මිලියන 120
මීටර් 75ට වැඩි	රුපියල් මිලියන 150' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

2ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 2, as amended, ordered to stand part of the Bill.

3 සහ 4 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

3 ஆம், 4ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 3 and 4 ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.

Enacting Clause and Title ordered to stand part of the Bill.

Bill reported with Amendments.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා

(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)

(The Hon. M. Joseph Michael Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් සංශෝධිතාකාරයෙන් තුන්වන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

Question put, and agreed to.

Bill, as amended, accordingly read the Third time, and passed.

කල්තැබීම

ஒத்திவைப்பு

ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)

(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

வினா எடுத்தியம்பப்பெற்றது.

Question proposed.

නියෝජ්‍ය කථානායකතුමා

(பிரதிச் சபாநாயகர் அவர்கள்)

(The Deputy Speaker)

කල් තැබීමේ යෝජනාව, ගරු ලසන්ත අලගියවන්න මහතා. Order, please! Before he starts, the Hon. Deputy Chairman of Committees will take the Chair.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *took the Chair.*

දිවි නැඟුම කළමනාකාරවරුන්ගේ සහ සංවර්ධන නිලධාරීන්ගේ ස්ථාන මාරු

'திவிநெகும' முகாமையாளர்கள் மற்றும் அபிவிருத்தி உத்தியோகத்தர்களின் இடமாற்றம்

TRANSFERS OF DIVINEGUMA MANAGERS AND DEVELOPMENT OFFICERS

[අ.භා. 6.28]

ගරු ලසන්ත අලගියවන්න මහතා

(மாண்புமிகு லசந்த அலகியவன்ன)

(The Hon. Lasantha Alagiyawanna)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අප රටේ දුගී දුප්පත්කම තුරන් කිරීම සඳහා 1995 වර්ෂයේ පොදුජන එක්සත් පෙරමුණු රජය මඟින් ආරම්භ කරන ලද සමෘද්ධි වැඩසටහන තුළින් ඉතා සාර්ථක ප්‍රතිඵල නෙළා ගැනීමට හැකි වී තිබුණු අතර, පසු ගිය කාල සීමාව තුළදී දිවිනැඟුම පනත මඟින් එම වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා දිවිනැඟුම දෙපාර්තමේන්තුව ස්ථාපිත කර සමෘද්ධි අධිකාරිය යටතේ සිටි සියලු කළමනාකරුවන්, සමෘද්ධි සංවර්ධන නිලධාරීන් එම දෙපාර්තමේන්තුව යටතට අනුයුක්ත කර විශ්‍රාම වැටුප් සහිත රජයේ නිලධාරීන් බවට පත් කරන ලදී. විශේෂයෙන්ම මෙම

නිලධාරින් බඳවා ගැනීමේදී ඔවුන්ගේ අධ්‍යාපන හා අනෙකුත් වෘත්තීමය සුදුසුකම් පිළිබඳව නිසි අවධානයක් යොමු කර බඳවා ගෙන තිබූ අතර, අප රටේ දුගී දුප්පත්කම තුරන් කිරීම අරමුණු කර ගෙන මිලියන 2.5කට ආසන්න පවුල්වලට එම අයගේ ජීවන තත්ත්වය උසස් කර ගැනීම සඳහා සැලකිය යුතු කාර්ය භාරයක් පසු ගිය කාලය තුළදී ඉටු කළ බව සඳහන් කළ යුතුය. විශේෂයෙන්ම මෙවැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී අදාළ ග්‍රාම සේවා වසම්වල සේවයේ නියුතු නිලධාරින්, අදාළ ග්‍රාම සේවා වසම් තුළ හෝ ඊට යාබද ග්‍රාම සේවා වසමක අදාළ නිලධාරියා ස්ථිර පදිංචිය වීම එම දිවිනැඟුම ප්‍රතිලාභීන් සඳහා අනිවාර්යයෙන්ම සිදු විය යුතු බව අතීත අත් දැකීම් අනුව අවබෝධ කර ගත යුතුය. වර්තමානයේදී කළමනාකරුවන් සහ ග්‍රාම සේවා මට්ටමේ සේවයේ නියුතු දිවිනැඟුම සංවර්ධන නිලධාරින් හට ස්ථාන මාරුවීම් ලබා දීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් පිටස්තර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වෙත ස්ථාන මාරු වීමට කැමැත්තක් දක්වන්නේ නම්, ඒ පිළිබඳව සටහන් කරන ලෙස දන්වා ඇත. මෙම තත්ත්වය නිසා සියලු නිලධාරින් සිය රාජකාරි කටයුතු කර ගෙන යාම පිළිබඳව යම් කිසි මානසික පීඩාවකට ලක් වී ඇති බැවින්, විශේෂයෙන් මෙම නිලධාරින් අතිමහත් බහුතර පිරිසක් වර්තමානයේ සේවය කරන ග්‍රාම සේවා වසම තුළ අවුරුදු 05කට අඩු සේවා කාලයක් සිදු කර ඇති බව දැන ගන්නට ලැබී ඇති බැවින් මෙම අයගේ ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීමට පෙර විශේෂයෙන්ම වෘත්තීය සමිති ඇතුළු අනෙකුත් අවශ්‍ය කරන අංශ සමඟ විධිමත් සාකච්ඡාවක් පවත්වා අදහස් යෝජනා ලබා ගෙන මාරුවීම් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන මෙන් යෝජනා කරමි."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නියෝජ්‍ය අමාත්‍යවරයා වශයෙන් මා කටයුතු කළ අමාත්‍යාංශයේත්, සමෘද්ධි අමාත්‍යාංශයේත් අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරන ගරු ඇමතිතුමාට ප්‍රථමයෙන්ම මා සුබ පතනවා. මම පෞද්ගලිකව හිතන ආකාරයට සමෘද්ධි වැඩසටහනක් සම්බන්ධයෙන් මොනම ආකාරයකටවත් දේශපාලන කෝණයකින් බලා තීන්දු තීරණ ගත යුතු වන්නේ නැහැ. අතීතයේදීත් අපේ රටේ තිබුණු සෑම ආණ්ඩුවක්ම මේ රටේ දුගී දුප්පත්කම තුරන් කිරීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කළා; හාල් පොත් ලබා දුන්නා; ජනසවිය ලබා දුන්නා; ඒ වාගේම සමෘද්ධි වැඩසටහන ආරම්භ කළා. නමුත් අපි කවුරුත් පිළිගත යුතුයි, මේ රටේ දුගී දුප්පත්කම තුරන් කිරීමේ කාර්ය භාරයේදී වැඩිම අරමුණු ප්‍රමාණයක් ඉටු කර ගන්නට පුළුවන්කමක් ලැබුණේ මේ සමෘද්ධි ව්‍යාපාරය මඟින් බව. ඒකට හේතුව, හාල් පොත් ලබා දීම, ජනසවිය ලබා දීම, ආහාර මුද්දර ලබා දීම ආදී පෙර පැවැති සහනාධාර ලබා දීමේ වැඩසටහන් හුදෙක්ම සහනාධාරයකට පමණක් සීමා වුණු නිසායි.

මාසික සහනාධාරය ලබා දීම මේ වැඩසටහනේ එකක් වන අතර, ප්‍රජාව තුළ ආකල්පමය වශයෙන් වෙනස්කම් ඇති කරමින්, ඒ අය විවිධ ක්‍රියාකාරකම්වලට යොමු කරමින්, ඒ අයගේ ජීවිත ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය කරන සියලු ක්‍රියාකාරකම් මේ වැඩ සටහන තුළ ක්‍රියාත්මක වුණු බව අමුතුවෙන් සඳහන් කරන්න අවශ්‍ය නැහැ කියලායි මා හිතන්නේ. සහනාධාර ලබා දීම එක වැඩසටහනක් විධියට තියා ගෙන, අනෙකුත් සියලු වැඩසටහන් ක්‍රියාත්මක වුණු නිසා තමයි අපේ රටේ දුගී දුප්පත්කම තුරන් කිරීමේ වැඩසටහන් අතුරින් සාර්ථකම වැඩසටහන බවට අද මෙම වැඩසටහන පත් වෙලා තිබෙන්නේ.

මේ අය ණය ගත්තා; ඉතිරි කිරීම් කළා; ස්වයං රැකියා කළා; වාණිජ බැංකුත් අභිභවා ඒ ගත්ත ණය ආපසු ගෙවිවා. සියයට 95යි ආපසු ණය ගෙවීමේ ප්‍රතිශතය. සාමාන්‍ය වාණිජ බැංකුවක තත්ත්වයත් මේකයි. මේවා නිකම්ම ඇති වුණු දේවල් නොවෙයි. කුඩා කණ්ඩායම් හදලා, සති දෙකකට වතාවක් රැස්වීම් තියලා, සාමූහිකව එකතු වෙලා වැඩ කරන්න පුළුවන් පුරුද්ද ඇති කරලා තමයි මේ තත්ත්වයට ඇවිත් තිබෙන්නේ. ඒ වාගේම ඒ අය මත් ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් වැනි වැඩසටහන් ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒ ප්‍රදේශයේ ඉන්න දානපතියන්ගෙන් මුදල් ආධාර අරගෙන, කැපකරු ශිෂ්‍යත්ව ක්‍රම මඟින් දුප්පත් පවුල්වල දරුවන්ට අධ්‍යාපනය ලබා දීම සඳහා ශිෂ්‍යත්ව වැඩසටහන් ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒ ආකාරයේ දැවැන්ත කාර්යභාරයක් ඉටු කිරීම නිසා තමයි නිවාස වැඩසටහන් වැනි ඉලක්ක කරා ළඟා වීමේ පුළුවන්කමක් අද මේ ව්‍යාපාරය ලබා ගෙන තිබෙන්නේ.

විශේෂයෙන්ම මෙම කාර්යයේදී ඒ සංවර්ධන නිලධාරින්ගේ, කළමනාකරුවන්ගේ කැපවීම අපි අගයන්න ඕනෑ. සමහර අය දකිනවා, ඒ අය ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවේ මැතිවරණ ව්‍යාපාර කරන අය හැටියට. සමහර විට එහෙම දකිනවා වෙන්න පුළුවන්. නමුත් ඒ අයත් දේශපාලන අයිතිවාසිකම් හිමි නිලධාරින්. දේශපාලන අයිතිවාසිකම් හිමි නිලධාරින් දේශපාලනය කිරීම වරදක් විධියට අප දැකිය යුතු වන්නේ නැහැ. රාජකාරි කටයුතු පැත්තකින් තබා, දුගී දුප්පත්කම තුරන් කිරීම සඳහා කටයුතු කරන්නේ නැතිව, ඒ අය දේශපාලනය කළා නම් ඒක වැරදියි. මේ නිලධාරින් අතර සියලු දේශපාලන පක්ෂවලට අයත් වන විධියට ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් පත් වෙලා තිබෙනවා. මේ අය එක දේශපාලන පක්ෂයකින් පමණක් පත් වුණ අය නොවෙයි. අද ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන් හැටියට ඉන්නවා සමෘද්ධි සංවර්ධන නිලධාරින්. ඒ අය දේශපාලනය කළ බව ඇත්ත. හැබැයි, අපි මතක තියා ගන්න ඕනෑ, මොනම ආකාරයකින්වත් තමුන්ගේ වගකීම් යුතුකම් ඉටු කරන්නේ නැතිව ඒ අය දේශපාලනය කළේ නැති බව. දේශපාලන අයිතිවාසිකම් නැති නිලධාරින් එහෙම කටයුතු කළා නම් වැරදියි.

අද අපේ රටේ තිබෙන විශාලතම අභියෝගය මොකක්ද? අපේ රටේ දෙමාපියන් වෙහෙස මහන්සි වෙලා උගන්වා දරුවන් විශ්වවිද්‍යාලයට යවනවා. නමුත් විශ්වවිද්‍යාලය අද දැඩි දේශපාලනීකරණයකට ලක් වෙලා තිබෙනවා. ඒ දරුවන්ට ගිහිල්ලා ඉගෙන ගන්න පුළුවන්කමක් නැහැ. විවිධ බලපෑම් කරලා දේශපාලන පක්ෂවලට බඳවාගෙන කටයුතු කරනවා. එවැනි තත්ත්වයක් තුළ මේ නිලධාරින් දේශපාලනමය වශයෙන් කටයුතු කිරීම වරදක් විධියට දකින්න මොනම ආකාරයකටවත් අපට පුළුවන්කමක් නැහැ.

මේ සෑම නිලධාරියෙකුටම නියමිත අධ්‍යාපන සුදුසුකම් තිබෙනවා. අධ්‍යාපන සුදුසුකම් නැති කිසිදු නිලධාරියෙක් නැහැ. නිලධාරින් 24,540 දෙනෙක් ඉන්නවා. කළමනාකරුවන් 2,529 දෙනෙක් ඉන්නවා. ඒ සියලු අයට නියමිත අධ්‍යාපන සුදුසුකම් තිබෙනවා. නමුත් ප්‍රශ්න තිබෙන අයත් ඉන්නවා. වැරදි අධ්‍යාපන සහතික ලබා දීලා මේ තනතුර ලබාගත් කිහිප දෙනෙක් ඉන්නවා. ඒක මේ ක්ෂේත්‍රය තුළ පමණක් ඇති දෙයක් නොවෙයි. වැරදි සහතික ඉදිරිපත් කරලා රස්සාවට ගිහිල්ලා සේවයෙන් පහ කරපු අය රාජ්‍ය සේවයේ සෑම ක්ෂේත්‍රයකම ඉන්නවා. මේ ක්ෂේත්‍රයේත් එවැනි අය ඉන්නවා. එවැනි අයට රටේ පවතින නීතිය අනුව කටයුතු කිරීම පිළිබඳව අපේ විරෝධතාවක් නැහැ. නමුත් අනෙක් නිලධාරින් මේ සේවයට බඳවා ගත්තේ නියමිත අධ්‍යාපන සුදුසුකම් අනුවයි කියන එක අපි බොහොම පැහැදිලිව සඳහන් කරන්න ඕනෑ.

ඕනෑම ආණ්ඩුවක් විවිධ ව්‍යාපෘති විවිධ නම්වලින් හඳුන්වා දෙනවා. කලින් සමෘද්ධි ව්‍යාපාරය තිබුණා. පැවැති ආණ්ඩුවේ අමාත්‍ය මණ්ඩලය තීන්දු කළා, පනතක් ඉදිරිපත් කරලා ඒ සමෘද්ධි ව්‍යාපාරය වඩා ශක්තිමත්ව 'දිවි නැඟුම' නමින් දෙපාර්තමේන්තුවක් බවට පත් කළ යුතුයි කියලා. ඒ අනුව ඒක කළා. වර්තමාන ආණ්ඩුවට සුළුතරයක් තිබුණත්, මේ ව්‍යාපාරය ඕනෑම නමකින් හඳුන්වා දෙන්න පුළුවන්කම තිබෙනවා. ඒ පිළිබඳව කිසිදු ආකාරයක බාධාවක්, ගැටලුවක් නැහැ. හැබැයි, මම එක ඉල්ලීමක් කරනවා. මේ පාර්ලිමේන්තුව මඟින් සම්මත කළ පනතක් මඟින් දිවි නැඟුම දෙපාර්තමේන්තුව බවට පත් කළ මේ ව්‍යාපාරය වෙනස් කිරීමේ අයිතිය විෂය භාර අමාත්‍යවරයාට තිබෙනවා. හැබැයි, ඒක නිසි පරිදි වෙනස් විය යුතුයි. එහෙම නොවුණොත් මේ පාර්ලිමේන්තුව තමයි හැල්ලු වෙන්නේ. මේ පාර්ලිමේන්තුව මඟින් සම්මත කරපු දිවි නැඟුම පනත යටතේ

[ගරු ලසන්ත අලගියවන්න මහතා]

තමයි අද මේ වැඩසටහන් ක්‍රියාත්මක වෙන්නේ. ඒ පනතට අනුව තමයි සෑම දෙයක්ම සිදු විය යුතු වෙන්නේ. ඒ පනත වැරදි නම්, ඒ පනතේ තිබෙන දේවල් දිවි නැඟුම ව්‍යාපාරයට අහිතකර නම්, ඒ සඳහා පනතට සංශෝධනයක් ඉදිරිපත් කළ යුතුයි. එහෙම නැතිව තිබෙන පනතට, නීතියට පරිබාහිරව නිලධාරින්ගේ චක්‍රලේඛන මඟින් යම් යම් දේවල් සිද්ධ කරනවා නම් අනිවාර්යයෙන්ම එයින් හෑල්ලුවට ලක් කරන්නේ මේ පාර්ලිමේන්තුවයි.

ගරු සජිත් ප්‍රේමදාස ඇමතිතුමා, අමාත්‍යවරයා සතු බලතල අනුව 2015.02.02වැනි දින ගැසට් නිවේදනයක් මඟින් කලාප ඉවත් කිරීමක් සිදු කරලා තිබෙනවා. ඒ කලාප 6 අහෝසි කරලා තිබෙනවා. ඒ පනතේ රෙගුලාසි අනුව ගැසට් නිවේදනයක් මඟින් ඔබතුමාට ඒක අවලංගු කරන්න පුළුවන්, ගරු ඇමතිතුමනි. ඒක ඔබතුමාගේ මතය, ඔබතුමාට තිබෙන අයිතිය. ඒ පිළිබඳව ගැටලුවක් නැහැ. හැබැයි, මේ පිළිබඳව අමාත්‍ය මණ්ඩලයේ අවධානය යොමු වුණාද නැද්ද කියලා මම පෞද්ගලිකව දන්නේ නැහැ. මීට පෙර, මේ කලාප ස්ථාපිත කරලා විෂය භාර අමාත්‍යවරයා ඒ කටයුතු සිද්ධ කරනු ලැබුවේ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිවයි. සමෘද්ධි ව්‍යාපාරය පනතක් මඟින් අද දිවි නැඟුම ව්‍යාපාරය බවට පත් වෙලා තිබෙනවා. අද මේ සඳහා විවිධ රෙගුලාසි සකස් විය යුතුයි. විශේෂයෙන්ම බඳවා ගැනීමේ පරිපාටිය, උසස් වීමේ පරිපාටිය, ස්ථාන මාරු ලබා දීමේ පරිපාටිය ඇතුළත් මට්ටමක තමයි අද මේ ව්‍යාපාරය තිබෙන්නේ. ගරු අමාත්‍යතුමනි, මේ ව්‍යාපාරය සැබෑ ලෙස දියුණු කර ගැනීම සඳහා සකස් කරන ලද ඒ පනතේ යම් යම් අඩු පාඩුකම් තිබෙනවා නම් ඒවා නිවැරදි කරගන්නවා වාගේම, මෙහි ඉතිරි කොටස ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් අවශ්‍ය කරන රෙගුලාසි යනාදිය පැනවීමට අවශ්‍ය නම් ඔබතුමාට ඒ සඳහා අවස්ථාව උදා වෙලා තිබෙනවා.

පසු ගිය කාල සීමාව තුළ මේ පාර්ලිමේන්තුවේ හැන්සාඩ් වාර්තා අර ගෙන බැලුවොත් අපට පෙනෙනවා, එක්සත් ජාතික පක්ෂය, විපක්ෂය වැඩි වශයෙන්ම පාවිච්චි කළ වචනය 'කොමිෂන් සභා' කියන එක බව. ඔබතුමන්ලා දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන කථා කළා; ස්වාධීන පොලිස් කොමිසම, ස්වාධීන රාජ්‍ය සේවා කොමිසම, ස්වාධීන මැතිවරණ කොමිසම ගැන කථා කළා. පසු ගිය කාල සීමාව තුළදී විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂය පාර්ලිමේන්තුව තුළ වැඩියෙන්ම පාවිච්චි කළ වචනය තමයි 'කොමිෂන් සභා' කියන එක. ඒ කටයුත්ත ඉටු කිරීම පිළිබඳව අද කිසිම ගැටලුවක් නැහැ. ඒ කටයුතු දැනට සිදු වෙමින් පවතිනවා. ඒ කොමිෂන් සභා පිහිටුවීම පිළිබඳව මොනම ආකාරයෙන්වත් අපේ විරෝධතාවක් නැහැ. අපි ඒ සඳහා අවශ්‍ය සහයෝගය පාර්ලිමේන්තුව තුළ ලබා දෙනවා.

විපක්ෂයේ සිටින විට එහෙම කථා කරලා, කොමිෂන් සභා පිහිටුවීම සිදු වෙමින් පවතින අතරතුර, අද බොහෝ ක්ෂේත්‍රවල නිලධාරින්ගේ ස්ථාන මාරුවීම් සිද්ධ වෙමින් පවතිනවා.

ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝ කළමනාකාරවරුන් සහ ප්‍රාදේශීය කළමනාකාරවරුන් සියල්ලන්ටම ස්ථාන මාරුවීම් ලිපි ලබා දී තිබෙනවා කියලා අද අපට දැන ගන්නට ලැබුණා.

25,000කට ආසන්න නිලධාරින් පිරිසක් සිටින මේ ක්ෂේත්‍රය තුළ, දිවි නැඟුම කළමනාකරුවන් සේවා ස්ථාන අතර ස්ථාන මාරු කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා 2015.02.10 වැනි දින චක්‍රලේඛයක් නිකුත් කරලා තිබෙනවා. මේ "දිවි නැගුම පනත" සෑදීමට පෙර ආයතන සංග්‍රහයේ ක්‍රියා පටිපාටිය අනුගමනය කරමිනුයි සමෘද්ධි කළමනාකරුවන්ගේ සහ නිලධාරින්ගේ ස්ථාන මාරුවීම් සිද්ධ කළේ. සමෘද්ධි කළමනාකරුවන් සහ සමෘද්ධි සංවර්ධන නිලධාරින්ගේ වාර්ෂික ස්ථාන මාරු 2011 වර්ෂය සඳහා සිදු කළේත් එහෙම. එවකට සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල්වරයා ආයතන සංග්‍රහයේ ක්‍රියා පටිපාටිය අනුගමනය කරමින් අගෝස්තු මාසය වන විට අයදුම් පත්‍ර ඉදිරිපත් කරන්න කල් ලබා දීලා, මාරු මණ්ඩල ඇති කරලා, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින්, දිස්ත්‍රික් ලේකම් කොට්ඨාස මට්ටමින් අභියාචනා මණ්ඩල ඇති කරලා, ඒ සඳහා වෘත්තීය සමිති නියෝජනයන් ලබා දීලා, අයදුම් පත්‍ර කැඳවලා ජනවාරි 1වැනි දා සිට තමයි මේ ස්ථාන මාරුවීම් පසු ගිය කාල සීමාව තුළදී සිදු කරනු ලැබුවේ. මේ නිකුත් කළ ස්ථාන මාරුවීම් වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නට බලාපොරොත්තු වන්නේ මේ චක්‍රලේඛය මඟින්වත්, ආයතන සංග්‍රහය අනුවවත් නොවෙයි. ඔබතුමන්ලාගේ චක්‍රලේඛයේම සඳහන් කරලා තිබෙනවා "ආයතන සංග්‍රහයේ රාජ්‍ය සේවා කොමිෂන් සභා ක්‍රියා පටිපාටිය රීති සංග්‍රහය 200 III වගන්තිය ප්‍රකාරව" කියලා. වෘත්තීය සමිති නියෝජිතයා පමණක් මාරු මණ්ඩලයට ඉදිරිපත් කර තිබෙනවා. හැබැයි, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටි, රීතිවලින් පරිබාහිරව තමයි අනිවාර්යයෙන්ම මේ ස්ථාන මාරුවීම් ක්‍රියාවලිය සිද්ධ කරන්නට යන්නේ. මම මුලින් සඳහන් කළා වාගේ, අපේ රටේ දුගී දුප්පත්කම තුරන් කිරීම සඳහා විශාල වෙහෙස, මහන්සියක් වෙලා කටයුතු කළ අතිමහත් බහුතර නිලධාරින් පිරිසක් දේශපාලනමය වශයෙන්, අපේ දේශපාලන පක්ෂයේ ප්‍රතිපත්ති දරා ගෙන කටයුතු කළ බව ඇත්ත. එයට පළිගැනීමක් විධියට තමයි අද මේ මාරු වීම් ක්‍රියාත්මක කරන්නට යන්නේ කියන එක බොහොම පැහැදිලිව සඳහන් කරන්නට ඕනෑ. එසේ කිරීමේ අයිතියත් ඔබතුමන්ලාට තිබෙනවා. ඒ පිළිබඳව ඒ අයගේ අදහස්, යෝජනා තමයි අපි පාර්ලිමේන්තුව තුළ මේ ඉදිරිපත් කරන්නේ. ඒ අයිතිය තිබුණත්, පසු ගිය කාල සීමාව තුළදී මේ ස්වාධීන කොමිෂන් සභා ඇති කිරීම වෙනුවෙන් කටයුතු කළ, කථා කළ අයගේ ක්‍රියා කලාපය පිළිබඳව අපි අද සැබෑ යථාර්ථය අවබෝධ කර ගත යුතුව තිබෙනවා. අපි කිව්වා, අදාළ ග්‍රාම නිලධාරි වසමට යාබද ප්‍රදේශයක මේ නිලධාරින් කටයුතු කිරීමත් මේ ව්‍යාපාරය දියුණු වීමට එක් ප්‍රධාන හේතුවක් වුණා කියලා.

හදිසියේ කෙනෙක් මැරුණොත් ඒ නිලධාරියා ගිහින් මිනී පෙට්ටිය අරගෙන දෙන්න ඕනෑ. වෙනත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක රාජකාරි කරන සමෘද්ධි නිලධාරින්ට එහෙම රැකවරණයක් දෙන්න පුළුවන්කමක් නැහැ. එම නිසා ඒ ග්‍රාම නිලධාරි වසම තුළ හෝ ඒ ග්‍රාම නිලධාරි වසම ළඟ තිබෙන වසමක ඒ අය පදිංචිව සිටීම මේ ව්‍යාපාරයේ දියුණුවට බලපාන ප්‍රධානතම සාධකයක් බවට පත් වෙනවා. එම නිසා තමයි මේ යෝජනාව හරහා විශේෂයෙන්ම අප මේ ඉල්ලීම කරන්නේ. ගරු ඇමතිතුමනි, මේ ව්‍යාපාරය වෙනුවෙන් ගෙන එන ඕනෑම දෙයකට පක්ෂ භේද සියල්ලක්ම අමතක කරලා අපේ සහයෝගය සහ දායකත්වය ලබා දෙනවා. ඒ පිළිබඳව අපේ කිසිදු ගැටලුවක් නැහැ.

ගරු ඇමතිතුමනි, "පසු ගිය දවස්වල ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය මඟින් සල්ලි වියදම් කරලා ලිත් ගැහුවා; සම්මේලනවලට සල්ලි වියදම් කළා; මෙච්චර, මෙච්චර මුදල් වංචා කළා; වියදම් කළා" කියලා. මේ යෝජනාවටත් ඔබතුමා පිළිතුරු දෙයි. මේ ආයතනයේ පමණක් නොවෙයි, ඕනෑම වංචාකාරයෙක් ඉන්නවා නම් ඒ අයට විරුද්ධව කටයුතු කරන්න. හැබැයි, ඔබතුමාගේ පිළිතුරේදී අප බලාපොරොත්තු වන්නේ මේ පිළිබඳව කටයුතු කරන ආකාරය ගැන පමණයි. ඒ ගැන අපට පැහැදිලිව කියන්න.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. Member, the Opposition has been allotted half an hour and you have already taken 22 minutes. If the Seconder is going to speak, then he can speak for eight minutes.

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
I will take only two more minutes, Sir.

දුගී දුප්පත්කම තුරන් කිරීම සඳහා ආරම්භ කළ තවත් මෙවැනි වැඩසටහන් කීපයක් ගැන මම දැන් කියන්නම්. ආහාර මුද්දර ලබා දුන්නා, ජන සවිය ලබා දුන්නා. කිව්වා, රුපියල් 25,000ක් බැංකුවේ තැන්පත් කරනවා කියලා. නමුත්, අපේ රටේ කිසිදු බැංකුවක එවැනි මුදලක් තැන්පත් කරලා නැහැ. ඒවා ගැන කථා කරලා වැඩක් වන්නේ නැහැ. ඒ නිසා මේ විෂයය භාර අමාත්‍යවරයා විධියට ඔබතුමා දැනුත් "මෙච්චරක් ලිත් ගැහුවා, මෙච්චර රැස්වීම් තිබ්බා, අරවා කළා, මේවා කළා" කියලා මේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දුන්නොත් මා හිතන හැටියට ඒවා මේ ප්‍රශ්නයට පිළිතුරක් නොවෙයි. ගරු ඇමතිතුමනි, අප බලාපොරොත්තු වන්නේ එය නොවෙයි. මේ මාරුවීම් ක්‍රියා පටිපාටිය වැරැදියි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වෘත්තීය සමිති නැහැ. නමුත්, ඒ වෘත්තිය සමිති ඔබතුමාගෙන් ඉල්ලීමක් කර තිබෙනවා. ඔබතුමා අනෙක් වෘත්තිය සමිති හම්බ වෙලා තිබෙනවා. සෑම මාසයකම ඔබතුමා ඒ වෙලාව ඔවුනට ලබා දෙන්න තීරණය කර තිබෙනවා. ඒක අප අගය කරනවා. එම නිසා මේ වෘත්තිය සමිතිවලත් අදහස්, යෝජනා අරගෙන ඒවා සලකා බලා කටයුතු කරනවා නම් අප අගය කරනවා.

කලින් එවපු චක්‍රලේඛය අනුව දිස්ත්‍රික් මාරු මණ්ඩල පමණයි ක්‍රියාත්මක වුණේ. දැනට ගම්පහ දිස්ත්‍රික්කයේ නිලධාරීන් 1,000කට ආසන්න පිරිසක් ඉන්නවා. ඒ නිසා එක මාරු මණ්ඩලයකින් මේ වැඩ කටයුතු ක්‍රියාත්මක කරන්න බැහැ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් මේ මාරු මණ්ඩල ඇති කරලා, මේ අයට අසාධාරණයක් නොවන පරිදි, ඒ අයගේ කැමැත්ත පරිදි, සැබෑ ලෙස සාධාරණය ඉටු කරන්න කියලා මා ඉල්ලා සිටිනවා. වැරැදි වැඩ කරපු අය ඉන්නවා නම් ඒ අයට විනයානුකූලව කටයුතු කරලා දඬුවම් ලබා දීම පිළිබඳව මොනම ආකාරයකින්වත් අපේ විරුද්ධතාවක් නැහැ. ගරු ඇමතිතුමනි, මේ කරුණු පිළිබඳව ඔබතුමාගේ දැඩි අවධානය යොමු කරලා කටයුතු කරන්න කියන ඉල්ලීම කරමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තූතියි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
මීළඟට, ගරු මහින්ද අමරවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.50]

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු ලසන්ත අලගියවන්න මන්ත්‍රීතුමා අද දින සභාව කල් තබන අවස්ථාවේදී ඉදිරිපත් කරන ලද යෝජනාව මම ස්ථිර කරනවා.

මේ ස්ථාන මාරුවීම් සම්බන්ධව කටයුතු කරද්දි අපට නැවත කියන්න පුළුවන්, පසු ගිය ආණ්ඩුව කාලයේත් මේ වාගේ දේවල් සිද්ධ වුණාය කියලා. ඒකට විරුද්ධව කථා කරලා තමයි යහ පාලනයක් උදෙසා මෙවර ජන්දය ගත්තේ. ඒ වාගේම කොමිෂන් සභා ස්ථාපිත කරමින්, නිර්දේශපාලන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සඳහා තමයි මේ වතාවේ බලය ගත්තේ. ඒක අප පැහැදිලිව සඳහන් කරන්න ඕනෑ. නැත්නම් පාර්ලිමේන්තුවේ මේ තිබෙන්නේ විකෘති බලයක් නේ. 49ක් ඉන්න කණ්ඩායම රජය බලයට පත් කරගෙන අගමැතිවරයෙක්, අමාත්‍ය මණ්ඩලයක් යටතේ රට පාලනය කරනවා. බහුතරයක් -තුනෙන් දෙකක ප්‍රමාණයක්- විරුද්ධ පක්ෂයට වෙලා අද මේ කටයුතුවලට සහයෝගය ලබා දෙනවා. හැබැයි, ඒක වැරදි විධියට හිතන්න එපා. අප ඉතාම පැහැදිලිව කියන්න ඕනෑ, රජයේ හොඳ වැඩ පිළිවෙළට අපේ සහයෝගය ලබා දෙන බව. දින සියයේ වැඩ පිළිවෙළට අප සහයෝගය ලබා දෙනවා. අපේ ජනාධිපතිතුමා අපේ පක්ෂයේ නායකත්වය ගත්ත නිසා තමයි ඔබතුමන්ලාට මේ අවස්ථාව ලැබුණේ. නැත්නම් මේ වන විට එක්කෝ මහ මැතිවරණයක් පවත්වනවා. එහෙම නැත්නම් අපේ අගමැතිවරයෙක් යටතේ තමයි පාලනය වන්නේ. ඒ කාරණය අප පැහැදිලිව කියන්න කැමැතියි.

මැතිවරණයකින් ඇති වන ප්‍රතිඵලය පිළිබඳව ඔබතුමන්ලාට දැන ගන්න පුළුවන්, දැන් නුගේගොඩ තිබෙන රැස්වීමට ගිහින් බැලුවොත්. එම රැස්වීමට ලක්ෂ ගණනාවක ජනතාව සහභාගි වීමෙන්ම පෙනෙනවා, ජනතාවගේ කැමැත්ත තිබෙන්නේ අද තිබෙන රජයට නොවෙයි, අපටයි කියලා. අද එවැනි තත්ත්වයක් දකින්න ලැබෙන්නේ සැලසුම් සහගත රැස්වීමක නොවෙයි. අසීමිත ජනතාවක් අද පාරට බහින තත්ත්වයට පත් වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා දුන් පොරොන්දු ඒ ආකාරයෙන් ඉෂ්ට කරන්න නොහැකි වීම නිසා තමයි ඒ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ.

ස්ථාන මාරු කිරීම් සහ දේශපාලන පළිගැනීම් නතර කරන්න ඕනෑ. ඒකට තමයි ඔබතුමන්ලා බලය ගත්තේ. ගරු සජිත් ප්‍රේමදාස ඇමතිතුමනි, ඔබතුමාත්, මමත් නියෝජනය කරන හම්බන්තොට දිස්ත්‍රික්කය ගත්තොත් තිස්සමහාරාමය මැතිවරණ කොට්ඨාසයේ, තිස්සමහාරාමය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වීරහෙල සමෘද්ධි සමිතියට ඔබතුමාගේ හිතවත් එක්සත් ජාතික පාක්ෂිකයන් 15දෙනෙක් පමණ ගිහින්, එතැන යම් කලබලකාරි තත්ත්වයක් ඇති කරලා, එහි හිටපු සමිති නිලධාරීන් අයින් කරලා සමිතියක් පත් කර ගෙන තිබෙනවා. මේ පිළිබඳ සම්පූර්ණ තොරතුරු ඔබතුමාට ඉදිරිපත් කිරීමේ හැකියාව අපට තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. හම්බන්තොට, තිස්සපුර ග්‍රාම නිලධාරි වසමේ දිවි නැඟුම සංවර්ධන නිලධාරිට තංගල්ලට මාරු වීමක් ලබා දීලා තිබෙනවා. ඒක ඉතාමත් දුර මාරු වීමක්. ඇය ධම්මිකා නමැති කාන්තා නිලධාරිනියක්. ඒ වාගේම හම්බන්තොට නගර සභාවේ විපක්ෂ නායක අයුබ් බාන් හම්බන්තොට දිවි නැඟුම සංවර්ධන නිලධාරි රිෂ්වාන් මහතාට හම්බන්තොට නගරයේදී මරණ තර්ජන එල්ල කිරීමක් සිදු කරලා තිබෙනවා. මේ සම්බන්ධව අවශ්‍ය කටයුතු කරන්න. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ සම්බන්ධයෙන් දන්නවා ඇති. නොදන්නවා නම් ඒ පිළිබඳව සොයා බලා ඒ සඳහා අවශ්‍ය පියවර ගන්න. මෙය එතරම් හොඳ තත්ත්වයක් නොවෙයි. ඔබතුමාගේ දිස්ත්‍රික්කයෙන් අපට ක්ෂණිකව ලැබුණු තොරතුරු ටිකක් විතරයි මේ ඉදිරිපත් කළේ. මා හිතනවා, ඔබතුමා මේ පිළිබඳව අවධානය යොමු කර ඒ සඳහා අවශ්‍ය කටයුතු කරයි කියලා.

සමෘද්ධි ව්‍යාපාරය, දිවි නැඟුම ව්‍යාපාරය සහනාධාර දෙන වැඩ සටහනක් කියලා අපි ඒ වැඩසටහන් හැල්ලුවට ලක් කරන්නේ නැහැ. පසු ගිය කාලය තුළ අපේ රටේ දුප්පත්කමේ යම් අඩු වීමක් වාර්තා වනවා. එයට ප්‍රධානම සාධකය වුණේ, සමෘද්ධි ව්‍යාපාරය හා දිවි නැඟුම වැඩ පිළිවෙළ යටතේ ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමයි. ඒ තුළින් සත්ව පාලනයෙන්, කෘෂි කර්මාන්තයෙන්, ඒ වාගේම ස්වයං රැකියාවලින් ජීවත් වන විශාල පිරිසක් අද බිහි වෙලා තිබෙනවා. පවුල් ගණනාවක් ආර්ථික වශයෙන් ශක්තිමත් වෙලා තිබෙනවා. ඒක අපි අමතක කරන්න හොඳ නැහැ. අසාර්ථක වුණු සමහර අවස්ථා නැත්තේ නැහැ. බීජ පැළ වුණේ නැහැයි කියන චෝදනා නිරන්තරයෙන් එල්ල වුණා. නමුත් සමස්තයක් විධියට ගත්තොත් මේ ව්‍යාපෘතිය තුළින් මේ රටේ පවුල් ගණනාවක් ආර්ථික වශයෙන් ශක්තිමත් කරන්න පුළුවන්කම ලැබුණා.

[ගරු මහින්ද අමරවීර මහතා]

ඒ විතරක් නොවෙයි. සමෘද්ධි ව්‍යාපාරය තුළ ඉතිරි කිරීම්වල විශාල ප්‍රගතියක් දකින්න ලැබෙනවා. ඒ සඳහා විශාල කැප කිරීමක් මේ නිලධාරින් සිදු කළා. විශේෂයෙන්ම අද කාන්තාවන්ගේ ඉතිරි කිරීම් විශාල වශයෙන් වැඩි වෙලා තිබෙනවා. කුඩා කණ්ඩායම් සකස් වෙලා ඔවුන්ගේ හැකියා ඉදිරිපත් කරන අවස්ථා දකින්න ලැබෙනවා. ගම්වල කාන්තාවන් පුරුදු වෙලා සිටියේ, හුරු වෙලා සිටියේ ළමයින් ටික බලා ගන්නයි, ගෙදර කෑම ටික උයන්නයි විතරයි. නමුත් අද කාන්තාව ඉදිරියට ඇවිල්ලා තිබෙනවා. ඒ අය මත් ද්‍රව්‍ය විරෝධි වැඩසටහන්වලට සම්බන්ධ වනවා; දුම් වැටි විරෝධි වැඩසටහන්වලට සම්බන්ධ වනවා; ප්‍රචණ්ඩත්වයට එරෙහිව පාරට බහිනවා. ඒ වාගේම ඔවුන්ගේ කථිකත්වය වැඩිදියුණු වෙලා තිබෙනවා; සාහිත්‍යමය හැකියාවන් වර්ධනය වෙලා තිබෙනවා. අද කාන්තාවන්ට ඉදිරියට ඒම සඳහා ප්‍රධාන වශයෙන්ම සමෘද්ධි ව්‍යාපාරයත්, දිවි නැඟුම ව්‍යාපාරයත් ඉවහල් වුණු බවට ඇමතිතුමාම සාක්ෂි දරනවාය කියලා මා විශ්වාස කරනවා.

මගේ දිස්ත්‍රික්කයේ අමාත්‍යවරයකු විධියට ඔබතුමා යටතට මේ ව්‍යාපෘතිය ලැබුණු එක පිළිබඳව මා සතුටු වනවා. මා ඔබතුමාට ශුභ පතනවා. හැබැයි මේ නිලධාරින්ට හිංසාවක් නොවන විධියට, මේ වැඩ පිළිවෙළේ මූලික අංග වෙනස් නොවන විධියට, ඉතාමත් සාධාරණව හරියාකාරව මේ කටයුතු ක්‍රියාත්මක කළොත් එහි ප්‍රතිඵලය රටටයි ලැබෙන්නේ. එහෙම නැතුව ඒ දෙස දේශපාලන කෝණයකින් බලා කටයුතු කිරීම නිසා ඒ වැඩ පිළිවෙළ කඩාකප්පල් වුණොත් එය මේ රටේ දියුණුවට බාධාවක් වනවා, ඒ වාගේම දුප්පත්කම තුරන් කිරීමේ වැඩ පිළිවෙළට බාධාවක් වනවා.

අපෙන් අඩු පාඩු සිද්ධ වෙන්න ඇති; වැරැදි සිද්ධ වෙන්න ඇති. ඒවා පිළිබඳව ප්‍රශ්නයක් නැහැ. වංචා සිදු වුණාය, දූෂණ සිදු වුණාය කියා බොහෝ කාරණා පිළිබඳව කථා කරනවා. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. ඒවා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට ගෙන යන්න. ඒ වෙනුවෙන් දඬුවම් ලබා දෙන්න. අපි පැහැදිලිව කියනවා, ඒ එකක්වත් අත් හරින්න එපා, ඒවා ක්‍රියාත්මක කරන්න කියලා. ඒවා හුදු මාධ්‍ය සංදර්ශනවලට පමණක් සීමා කරන්න එපා. "හොරා, හොරා" කියලා සියලු දෙනාටම චෝදනා කරලා, මේ මහජන නියෝජිතයන් හැල්ලුවට පත් කරන්න එපා.

එහෙම චෝදනා එල්ල කරනවා නම් විපක්ෂයටත් ඕනෑ තරම් චෝදනා එල්ල කරන්න පුළුවන්. නමුත් චෝදනා එල්ල කරලා විතරක් වැඩක් නැහැ, ඒවා ඔප්පු කරන්න ඕනෑ. ඒ නිසා ජනතා විමුක්ති පෙරමුණට, එක්සත් ජාතික පක්ෂයට වාගේම සියලු කණ්ඩායම්වලට අපි කියන්නේ මෙයයි. දේශපාලනඥයෙක් හොරකම් කරලා තිබෙනවා නම් ඒ සඳහා දඬුවම් ලබා දීමේ වැඩ පිළිවෙළ අනිවාර්යයෙන් දියත් කරන්න. ඒ සඳහා අපි අත් දෙකම උස්සනවා. ඒ වාගේම නිලධාරින් ඒ කටයුතුවලට මැදිහත් වෙලා තිබෙන බව අපි දන්නවා. ඒ අයවත් ඒ වැඩ පිළිවෙළට අනිවාර්යයෙන්ම ඇතුළත් කර ගන්න. නමුත් නිකරුණේ ලිපි ගොනු - files - පෙන්ව පෙන්වා, මාධ්‍ය සන්දර්ශන තියලා පමණක් මේ වැඩේ නතර කරන්න එපා කියන කාරණයත් අපි පැහැදිලිව කියනවා.

මම මීට වඩා කථා කරන්නට යන්නේ නැහැ. අද ගරු ලසන්ත අලගියවන්න මන්ත්‍රීතුමා සභාව කල් තබන අවස්ථාවේදී ඉතාම වැදගත් යෝජනාවක් ඉදිරිපත් කළා. මම ඒ යෝජනාව නැවතත් ස්ථිර කරනවා. ගරු සජිත් ප්‍රේමදාස ඇමතිතුමනි, මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමේදී දිස්ත්‍රික්කයේ මහජන නියෝජිතයෙකු වාගේම, කලින් ආණ්ඩුවේ සිටි කෙනෙකු විධියටත්, දැන් විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරයෙකු විධියටත් ඔබතුමාගේ හොඳ වැඩසටහන් සියල්ලටම පූර්ණ ආශිර්වාදය, සහයෝගය ලබා දෙන බව සිහිපත් කරමින්, සමෘද්ධි ක්ෂේත්‍රයේ සහ දිවි නැඟුම ක්ෂේත්‍රයේ ඇති වෙලා තිබෙන මේ තත්ත්වය නිවැරදි කිරීමට කටයුතු කරන ලෙසට ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 6.58]

ගරු සජිත් ප්‍රේමදාස මහතා (නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමා)

(மாண்புமிகு சஜித் பிரேமதாஸ - வீடமைப்பு மற்றும் சமுர்த்தி அமைச்சர்)

(The Hon. Sajith Premadasa - Minister of Housing and Samurdhi)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු ලසන්ත අලගියවන්න මැතිතුමාටත්, ගරු මහින්ද අමරවීර මැතිතුමාටත් පළමුවෙන්ම මාගේ ස්තූතියි පුද කරනවා, සමෘද්ධි ක්ෂේත්‍රය පිළිබඳවත්, දිවි නැඟුම ක්ෂේත්‍රය පිළිබඳවත් මේ යෝජනාව ගෙනැල්ලා මේ වැඩසටහන් පිළිබඳව යථාර්ථය පහදා දීමට අවස්ථාව ලබා දීම ගැන.

හිටපු නියෝජ්‍ය ඇමතිතුමනි, -විරුද්ධ පක්ෂයේ හිටියාට කමක් නැහැ, අදටත් අපි ඇමතිවරු විධියට ඔබතුමන්ලාට ගරු කරනවා- මේ යෝජනාව ඇති තතු නොදැන අනවබෝධයෙන් ඉදිරිපත් කළ යෝජනාවක් හැටියටයි මම දකින්නේ. ඒ ප්‍රකාශය තහවුරු කරන්නට කරුණු කාරණා ඉදිරිපත් කරන්නට මම බලාපොරොත්තු වෙනවා.

හිටපු නියෝජ්‍ය ඇමතිතුමනි, බලන්න ඉදිරිපත් කරලා තිබෙන මේ චක්‍රලේඛ දිහා. මේ චක්‍රලේඛවල තිබෙනවා මාරුවීම් කටයුතු කරන විට නිලධාරියාගේ කැමැත්ත බලන්න ඕනෑ කියලා. එතැන කොහේද පළිගැනීම? පදිංචි නිවසට ආසන්න ස්ථානයක් වීම. එතැන කොහේද පළිගැනීම? මම මෙම චක්‍රලේඛ තුනම හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

මේ චක්‍රලේඛ දිහා බලන විට පෙනෙනවා, මේවායේ කිසිම පළිගැනීමක් නැහැ කියා. මම ඔබතුමාට වගකීමෙන් කියනවා අදාළ නිලධාරින් ආසන්නතම ග්‍රාම නිලධාරි වසමට මාරුවීමයි අපි නිර්දේශ කරන්නේ කියලා. කලාපයෙන් කලාපයටවත් මාරු කරන්නේ නැහැ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් කොට්ඨාසයටවත් මාරු කරන්නේ නැහැ. දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයටවත් මාරු කරන්නේ නැහැ. [බාධා කිරීමක්] ගරු ලසන්න අලගියවන්න මන්ත්‍රීතුමා කරුණාකරලා පොඩ්ඩක් අහගෙන ඉන්න. [බාධා කිරීමක්] නැහැ, නැහැ. ඒක තමයි මම කිව්වේ මේක අනවබෝධයෙන් කළ යෝජනාවක් කියලා.

ගරු ලසන්න අලගියවන්න මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාගේ යෝජනාවේ කියනවා, වර්තමානයේ සේවය කරන ග්‍රාම සේවා වසම තුළ අවුරුදු 5කට අඩු සේවා කාලයක් ඇති අතිමහත් බහුතරයක් සිටිනවා කියලා. හිටපු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ යෝජනාවේ සඳහන් කරන ආකාරයට අවුරුදු 5කට අඩු නම් මේ මාරුවීම් අදාළ නැහැ. ඔබතුමා කොහේ ඉඳලාද මේ යෝජනාව ලියලා තිබෙන්නේ? අතිමහත් බහුතරයක් ඉන්නේ අවුරුදු 5ට අඩු සේවා කාලයක් සම්පූර්ණ කළ අය නම් ඒ අයව මාරු වෙන්නේ නැහැ. මම හිතන්නේ ඔබතුමා මේ විෂය පිළිබඳව හොඳ අධ්‍යයනයක් කරලා නොවෙයි මේ යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ නිසා මම විශේෂයෙන්ම ඔබතුමාට සඳහන් කරන්නට කැමැතියි, ඔබතුමා මේ යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ වෙනත් දේශපාලන අරමුණක් මුදුන් පත් කර ගැනීම සඳහායි කියලා. [බාධා කිරීමක්] ගරු මහින්ද අමරවීර මන්ත්‍රීතුමා,

---

** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.*
ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.
Document not tendered.

මම ඔබතුමාට බාධා කළේ නැහැ. මට උත්තර දෙන්න අවස්ථාව දෙන්නකෝ. දැන් මෙතැන කිසිම ප්‍රශ්නයක් නැහැ. මේ මාරුවීම්වල කිසිම පළිගැනීමක් නැහැ.

මම පැහැදිලිවම ඔබතුමාට කියනවා, අපි මේ මාරුවීම් පිළිබඳව පළමුවෙනි චක්‍රලේඛය නිකුත් කළේ ජනවාරි 28වෙනි දා බව. ජනවාරි 28වෙනි දා මේ චක්‍රලේඛය නිකුත් කළාට පස්සේ අපට යම් යම් යෝජනා ආවා. ඒ යෝජනා එන විට අපි මොකක්ද කළේ? අපි පෙබරවාරි 07වෙනි දා වහාම වෘත්තීය සමිති රැස්වීමක් කැඳවලා විධිමත් සාකච්ඡාවක් කළා.

ලසන්ත අලගියවන්න මැතිතුමනි, ඔබතුමා කිව්වා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වෘත්තීය සමිතියක් නැහැයි කියලා. මොන අසත්‍යක්ද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වෘත්තීය සමිතියට තමයි බලහත්කාරයෙන් 18,000ක් බඳවා ගෙන තිබෙන්නේ. ජගත් කුමාර කියලා පළාත් සභා මන්ත්‍රීවරයකුත් එහි ඉන්නවා. ඒ නිසා මේ ගරු සභාවේ අසත්‍ය ප්‍රකාශ කරන්න එපා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වෘත්තීය සමිතියක් තිබෙනවා. ඒ වෘත්තීය සමිතිය පසු ගිය කාල වකවානුව තුළ ක්‍රියාත්මක වුණු ආකාරය ගැන වුණත් අපට කථා කරන්න පුළුවන්. නමුත් ඒකට මම කාලය මිඩංගු කරන්න යන්නේ නැහැ. ඒ හැම වෘත්තීය සමිතියක්ම මේ සාකච්ඡාවට ආවා. ඒ අය පෙන්වා දුන්නා, ප්‍රාදේශීය කමිටු පත් කරන්නය කියලා. ඒ අඩු පාඩුව පිළිගෙන තමයි අපි නැවතත් වරක් සංශෝධිත චක්‍රලේඛයක් නිකුත් කළේ. ඒවාගේම - [බාධා කිරීමක්] ඔබතුමන්ලා දැක්කේ නැති පළියට මට කරන්න දෙයක් නැහැ නේ. ඒවා හොර රහසේ කරපු දේවල් නොවෙයි. මේක ඔබතුමා අනවබෝධයෙන් ගෙනාපු යෝජනාවක්. ඒ විතරක් නොවෙයි, දිවි නැඟුම නිලධාරින් ඇහුවා, අපිව විතරක් මාරු කරන්නේ ඇයි කියලා. දිවි නැඟුම බැංකු නිලධාරින්ව මාරු කරන්නේ නැත්තේ ඇයි කියලා ඇහුවා. අපි ඒක පිළිගත්තා. පිළිගෙන, පෙබරවාරි 10 වැනි දා චක්‍රලේඛය හරහා ඒ මාරුවීම් පටිපාටිය දිවි නැඟුම බැංකු නිලධාරින්ටත් යොමු කළා.

ඉතින් කරුණාකර කියන්න එපා, ඔබතුමාගේ යෝජනාව මේ වෘත්තීය සමිතිවලට සවන් දෙන්න කියන එකයි කියලා. ඔබතුමන්ලාගේ යුගය තමයි වෘත්තීය සමිතිවලට සවන් නොදුන්නු යුගය. මම හැම මාසයකම වෘත්තීය සමිති හමු වෙනවා. අපේ නිලධාරිතුමන්ලා එක්ක සාකච්ඡා කරලා ප්‍රශ්න විසඳා ගන්න වෘත්තීය සමිතිවලට වෙනම දිනයක් වෙන් කරලා තිබෙනවා. දිවි නැඟුම නිලධාරින්ට, දිවි නැඟුම බැංකු කළමනාකරුවන්ට ප්‍රශ්න ඉදිරිපත් කරලා, ඒවා විසඳා ගැනීම සඳහා අමාත්‍යාංශය තුළ අපි වෙනමම දුක්ගන්නාරාළ කෙනෙක් - ඔම්බුඩ්ස්මන්වරයෙක් - පත් කරලා තිබෙනවා.

ලසන්ත අලගියවන්න මන්ත්‍රීතුමනි, මෙන්න මේකයි ඇත්තම කථාව. ඒ විතරක් නොවෙයි වෘත්තීය සමිති නියෝජිතයනුත් මේකට ඇතුළත් කරලා තිබෙනවා. එතුමන්ලාගේ අනුකූලත්වයක් නොමැතිව කිසිම මාරුවීමක් කරන්නේ නැහැ. එක වසමක වසර 5ක් හිටියා නම්, ඊළඟට තිබෙන වසමට දාන්න කියලා මම යෝජනා කරලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔන්න මගේ යෝජනාව. ඒක අසාධාරණ ද? ඒක වැරැදිද? ඉතින් තමුන්නාන්සේ නිකම් තොරතුරු නොදැන පව යෝජනාවක් නේ අද ගෙනැල්ලා තිබෙන්නේ? නිකම් අසත්‍ය යෝජනාවක් නේ. හැබැයි, ඔබතුමා ගෙනාපු මේ යෝජනාව තුළ මටත් කරුණු රැසක් ඉදිරිපත් කරන්න තිබෙනවා. ඔබතුමාගේ දැන ගැනීම සඳහා මා මේ චක්‍රලේඛ තුනම **සභාගත*** කරනවා.

ඔබතුමා සඳහන් කරලා තිබෙනවා මේ කරන්නට යන වැඩ පිළිවෙළ තුළින් මහා මානසික පීඩාවකට දිවි නැඟුම නිලධාරින්, දිවි නැඟුම බැංකු කළමනාකරුවන් පත් වෙලා තිබෙනවා කියලා. කොහොමද මන්ත්‍රීතුමනි, එහෙම කථාවක් කියන්නේ? මම 2015 ජනවාරි 12වැනි දින දිවුරුම් දීලා ජනවාරි 22 වෙනි දා තමයි වැඩ බාර ගත්තේ. මට කියන්න කෝ, මෙහෙම වැඩ කරනකොට ඒ නිලධාරින්ට මානසික පීඩාවක් අත්පත් වන්නේ කොහොමද කියලා. ඔබතුමාම කියන්න කෝ. මෙතෙක් සමෘද්ධි ව්‍යාපාරයේ, දිවි නැඟුම ව්‍යාපාරයේ ක්ෂේත්‍ර නිලධාරින්ට ලබා දෙන්නට තිබුණු, මෙතෙක් ලබා නොදුන් රුපියල් 300ක් වූ ක්ෂේත්‍ර දීමනාව මම ජනවාරි ඉඳලා ලබා දුන්නා. ඒකෙන් මානසික පීඩාවක් ඇති වෙනවාද, ගරු මන්ත්‍රීතුමනි? ඔබතුමන්ලාගේ කාල වකවානුව තුළ මේ ක්ෂේත්‍ර දීමනාව ලබා දුන්නේ නැහැ. අපි ලබා දුන්නා. ඒකෙන් කොහොමද මානසික පීඩාවක් ඇති වෙන්නේ?

තමුන්නාන්සේ කිව්වා, දිවි නැඟුම නිලධාරින් 25,000ක් ඉන්නවා කියලා. තවත් 2,500ක් දිවි නැඟුම බැංකු කළමනාකරණ නිලධාරින් ඉන්නවා කියලා කිව්වා. ඔබතුමන්ලාගේ කාල වකවානුව තුළ සමෘද්ධි ව්‍යාපාරයේ යෙදී සිටින මේ මිනිසුන්ගේ සුබ සාධනය වෙනුවෙන් කරලා තිබෙන්නේ මොනවාද? ඔබතුමන්ලා කිව්වා සියයට 95ක ණය ආපසු අය කිරීමක් කර තිබෙනවා කියලා. ඒක ඇත්ත. ඔවුන් විශිෂ්ට සේවාවක් කරලා තිබෙනවා. අඩුම ගණනේ සමෘද්ධි ව්‍යාපාරය තුළින් මේ මිනිස්සුන්ට බැංකු ණයක් දීලා තිබෙනවාද? සමෘද්ධි ව්‍යාපාරයේ, දිවි නැඟුම ව්‍යාපාරයේ සිටින මේ නිලධාරින් 28,000ටම ඉතාමත් සහන පොලියට ණය ලබා දීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කරන්නට ප්‍රථම වතාවට අපි නිර්දේශ කළා. මෙන්න, එහෙම ණය ලබා දෙන කොට කියනවා, ඒ නිලධාරින්ට මානසික පීඩාවක් ඇති වෙනවා ලු. පුදුම මානසික පීඩාවක්. ලසන්ත අලගියවන්න මන්ත්‍රීතුමා, පොඩ්ඩක් මේක අහගෙන ඉන්න.

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
අහගෙනයි ඉන්නේ, ඇමතිතුමනි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අද වනකල් - මේ මොහොත වනකල් - ඔබතුමා සඳහන් කරපු ආකාරයටම උසස්වීමේ පටිපාටියක් නැහැ. මහා ප්‍රබල ඇමතිවරයකු වුණු බැසිල් රාජපක්ෂ මැතිතුමා සිටියේ ඔබතුමාගේම දිස්ත්‍රික්කයේ.

අපි දැක තිබෙනවා, ඔබතුමාත් ගිහිල්ලා යම් යම් වැඩ කර ගන්න එතුමා ළඟ හැම වෙලාවේම වැඳ වැටුණු හැටි. වැඩ කර ගැනීමේ නිදහස ඔබතුමන්ලාට තිබුණේ නැහැ. ඔක්කෝම සම්පත් තිබුණේ එතුමා ළඟයි. නිලධාරින්ට උසස් වීමේ පටිපාටියක් හදන්න එතුමාට බැරි වුණා. අපි අද ඒක හදාගෙන යනවා. දින 100 ඇතුළත උසස් වීමේ පටිපාටිය හදලා අවසන් කරනවා. ඒ කටයුත්ත අවසන් කරලා අපි එය දිවි නැඟුම -සමෘද්ධි- ක්ෂේත්‍රයේ නිලධාරින්ට දායාද කරනවා.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඒ ගැන අපිත් සතුටුයි.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

තවත් දේවල් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. පොඩ්ඩක් අහගෙන ඉන්න.

ගරු ලසන්ත අලගියවන්න මන්ත්‍රීතුමනි, ඔබතුමා මහා ලොකුවට කිව්වා, මම ගැසට් නිවේදනයක් මඟින් කලාප ඉවත් කළා කියලා. ඔව්, ඉවත් කළා. මොනවාද ඔබතුමා කලාප කියලා කියන්නේ? දේශපාලන කාර්යාල 6ක්. මම දේශපාලන කාර්යාල 6කුයි ඉවත් කළේ. හැම දිස්ත්‍රික්කයකම පත් කර තිබුණා නියෝජ්‍ය අධ්‍යක්ෂ කියලා දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරයෙක්. මම ඉවත් කළා. ඉවත් කළා කියන්නේ, ඒ තනතුර ඉවත් කළා කියන එකයි. ඒ මනුෂ්‍යාව ඉවත් කළේ නැහැ. ඔහු සමෘද්ධි ව්‍යාපාරය තුළ ඉන්නවා. ඔබතුමන්ලා දන්නවාද කියලා මා දන්නේ නැහැ, ඔබතුමන්ලාටත් හොරා හැම ආසනයකටම සම්බන්ධීකරණ නිලධාරිවරුන් 160 දෙනෙකු පත් කරන්නට බැසිල් රාජපක්ෂ මහත්මයා සැලසුම් කර තිබුණා. මම ඒකත් නතර කළා. මම දැන් ඔබතුමන්ලාට කියන්නම්, ඒක නතර කරලා අපි කරපු දේ මොකක්ද කියලා. ඒ සියල්ල නතර කිරීම තුළින් රුපියල් ලක්ෂ 300ක් හෙවත් රුපියල් මිලියන 30ක් ඉතිරි වෙනවා, ගරු මන්ත්‍රීතුමනි. මා යෝජනා කරනවා, ඒ රුපියල් ලක්ෂ 300ම සමෘද්ධි ක්ෂේත්‍රය තුළ නිලධාරින් වෙනුවෙන් සුබසාධන අරමුදලක් පිහිටුවීම සඳහා යොදවන්නට. එමඟින් නිලධාරින්ට මානසික ආතතියක් ඇති වනවාද? එමඟින් මානසික පීඩාවක් එතුමන්ලාට ඇති වනවාද කියලා මම අහන්න කැමැතියි.

මාරු මණ්ඩල ගැන කථා කරනවා නම්, විශේෂයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කේන්ද්‍ර කරගෙන, දිස්ත්‍රික් ලේකම් බල ප්‍රදේශ කේන්ද්‍ර කරගෙන, වෘත්තීය සමිති ඇතුළත් කරලා, ඒ වෘත්තීය සමිතිවල එකඟතාව ඇති කරගෙනයි අපි ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න යන්නේ කියලා ලසන්ත අලගියවන්න මන්ත්‍රීතුමාට මා කියන්න කැමැතියි. ඔබතුමාට කවුරුන් හෝ හොඳටම දිරව්ව ලනුවක් දීලා තිබෙනවා, ලසන්ත අලගියවන්න මන්ත්‍රීතුමනි. ඒ දිරව්ව ලනුව කාලා තමයි තමුන්නාන්සේ අර අපේ අභිංසක මහින්ද අමරවීර මන්ත්‍රීතුමාවත් පොළඹවාගෙන මේ යෝජනාව පාර්ලිමේන්තුවට ගෙනැල්ලා මහා විහිළුවක් බවට, මහා රංගනයක් බවට පත් කරගෙන තිබෙන්නේ. අපි ඒ දෙපාර්තමේන්තුව, ඒ ආයතන, ගම් මට්ටම, බිම් මට්ටම දක්වා ප්‍රතිව්‍යුහගත කරන බව ඔබතුමාට මා කියන්න කැමැතියි. සෑම සමෘද්ධි සමිතියකටම, සෑම දේශපාලන පක්ෂයකම පුද්ගලයන් සම්බන්ධ කරනවා. මින් ඉදිරියට සහනාධාර ලබා දීම තීන්දු කරන්න අපේ නිලධාරින් අවශ්‍ය නැහැ. අපි ප්‍රජාවට ඉඩ දෙනවා ඒ තීන්දුව ගන්න. කාටද සහනාධාර දෙන්නේ; කාටද ණය දෙන්නේ; කාටද ආධාර දෙන්නේ; කාටද ප්‍රතිලාභ ලබා දෙන්නේ කියලා තීන්දු කරන්න ප්‍රජාවට පුළුවන්. ඒක නරකද? සහනාධාර ලැයිස්තුව හැදුවාම එය ප්‍රසිද්ධ කරනවා. ප්‍රසිද්ධ කළාම විරෝධතා එල්ල කරන්න පුළුවන්. ඉන් පස්සේ සහනාධාර ලැයිස්තුවට සමෘද්ධි සංවර්ධන නිලධාරි, ග්‍රාම නිලධාරි, කෘ.ප.නි.ස. නිලධාරි, ආර්ථික සංවර්ධන නිලධාරි, ප්‍රාදේශීය ලේකම් අත්සන් තබන්නට ඕනෑ. වැරැදියට තෝරා තිබෙනවා නම් නිලධාරින් පස්දෙනාටම ගෙදර යන්න වෙනවා. නරකද ක්‍රමය? එය හොඳ නැද්ද? මේ යහ පාලනය නොවෙයිද, ප්‍රජාතන්ත්‍රවාදය නොවෙයිද? එතකොට සමෘද්ධි ඇමතිවරයා හැටියට අරයාව ඇතුළු කරන්න, අරයාව කපන්න, අරයාව කොන් කරන්න කියලා එක් එක්කෙනාට ලියුම් ලියන්න මට බැහැ. මැතිවරණයක් ආවාම SLTB බස් යවලා හරක් දක්කනවා වාගේ සමෘද්ධි ලාභීන් බස්වලට නංවලා රැස්වීම්වලට ගෙනාපු සංස්කෘතිය ඉවරයි මන්ත්‍රීතුමෝ! ඒ සංස්කෘතිය ඉවරයි, සතුටු වෙන්න. මෙන්න යහ පාලනය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම විශේෂයෙන් තවත් කාරණාවක් කියන්න කැමැතියි. සමෘද්ධි නිලධාරින් මහා පීඩාවකට ලක්වුණු කාරණයක් සම්බන්ධයෙන් පෙරේදා මම තීන්දුවක් ගත්තා. මොකක්ද තීන්දුව? විශ්‍රාම වැටුප් ක්‍රමයට අවතීර්ණ වූ දිවි නැගුම සේවක මහත්ම මහත්මීන් 8,373දෙනකුගේ අර්ථ සාධක මුදල් තමුන්නාන්සේලාගේ රජයෙන් ඒ අයට නොදී සිටියා. තමුන්නාන්සේලා ඒ අයට හිමි අර්ථ සාධකය නතර කරලා තිබුණා. ඒ සියලු දෙනා සඳහා මුදල් නිකුත් කරන්න අපි තීන්දුවක් ගත්තා. දැන් ඒකෙන් ඒ අයට මානසික පීඩාවක් ඇති වෙනවාද මන්ත්‍රීතුමනි? එහෙම නැත්නම්, මානසික සහනයක් ඇති වෙනවාද? ඒකෙන් මානසික ආතතියක් ඇති වෙනවාද; එහෙම නැත්නම් හිතට සැනසීමක් ඇති වෙනවාද? මේවා ඔබතුමන්ලාගේ රජය කළ යුතුව තිබුණු දේවල්. ඔබතුමන්ලාගේ හිටපු ආර්ථික සංවර්ධන ඇමතිතුමා, ඒ නිලධාරිතුමන්ලා 8,373දෙනාගේ මුදල් ටික තහනම් කරලා මහා භාණ්ඩාගාරයට අරගෙන එතුමාගේ මහා සුරංගනා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්නයි උත්සාහ කළේ කියලා මා වගකීමකින් යුතුව කියනවා. ඒ සල්ලි ටික ඔක්කෝම සමෘද්ධි ක්ෂේත්‍රයේ නිලධාරිතුමන්ලාට දුන්නා. එතැනින් නතර වන්නේ නැහැ. තවත් අයිතිවාසිකමක් ඉල්ලන සමෘද්ධි නිලධාරින් 14,000ක් ඉන්නවා. මම සාකච්ඡා කරන්නත් ඉස්සෙල්ලා කියනවා, මොන සාකච්ඡා තිබුණත් ඒ අයටත් ඒ සහන ටික ලබා දෙනවාය කියන එක. අපි වැඩ කරන ආකාරය ඔබතුමන්ලා හොඳට බලාගෙන ඉන්න.

ගරු ලසන්ත අලගියවන්න මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ කොමිෂන් සභා ගැන කථා කළා; යහ පාලනය ගැන කථා කළා; නිර්දේශපාලනීකරණය ගැන කථා කළා. මෙන්න අපි ඒ දේවල් කරනවා. කයිවාරුව විතරක් නොවෙයි. අපි ක්‍රියාවෙනුත් ඒ දේවල් කරනවා. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගේ කථාවට disturb කළේ නැහැ නේ. පොඩ්ඩක් අහගෙන ඉන්න.

අපි සමෘද්ධි සහනාධාරය සියයට 200කින් වැඩි කරනවා. සමෘද්ධි ව්‍යාපාරය දේශපාලනීකරණයට ලක් වුණු නිසා මුද්දරය ලැබිය යුතු වුවත් දේශපාලනය නිසා මුද්දරය අහිමි වුණු විවිධ පක්ෂවල පුද්ගලයෝ ඉන්නවා. කාටවත් එය නැහැයි කියන්න බැහැ. එහෙම පළිගැනීම් සිද්ධ වෙලා තිබෙනවා. ඒ පළිගැනීම් සිදු වුණු අයටත් මාස හත අටකින් අපි අලුත් මුද්දර නිකුත් කරනවා. අපි අප්‍රේල් මාසයේදී සියයට 200කින් සමෘද්ධි සහනාධාරය වැඩි කරනවා. ඒ විතරක් නොවෙයි. මේ රටේ කිසිදාක ක්‍රියාත්මක නොවුණු ඓතිහාසික, අතිවිශාල ස්වයං රැකියා ව්‍යාපෘති වැඩසටහනක් කොට්ඨාස මට්ටමෙන් අපි ක්‍රියාත්මක කරනවා. ඒ වාගේම ඓතිහාසික නිවාස වැඩසටහනකුත් අපි ක්‍රියාත්මක කරනවා. ගම ගොඩ නඟන්නට ගම්මාන 36,822ම සම්බන්ධ කරන වැඩසටහනක් අපි දියත් කරනවා. ඒ ගම හදා රට හදන්නටයි. තමුන්නාන්සේලා "ගම" කියලා කිව්වේ ග්‍රාම සේවා වසමටයි. ග්‍රාම සේවා වසම් 14,022ක් තිබෙනවා. තමුන්නාන්සේලා කළේ "එක ගමකට එක වැඩක්" කියලා රුපියල් ලක්ෂ 10ක් දීලා එක ගමක යම් කිසි වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමයි. සමහර තැන්වල රුපියල් ලක්ෂ 8ක වැඩ කරලා රුපියල් ලක්ෂ 2ක් සාක්කුවේ දමා ගත්තා. මෙදා පාර එහෙම නැහැ. මෙදා පාර පස් වැඩ නැහැ, බොරලු වැඩ නැහැ, තාවකාලික වැඩ නැහැ. අපි රුපියල් 100,000ක් දෙනවා 1,250,000ක වැඩක් කරන්න. එහිදී හොරකම නැහැ. වංචාව නැහැ. විනිවිදභාවයෙන් යුක්තව අපි ඒ වැඩ කටයුතු ක්‍රියාත්මක කරනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සඳහන් කළා, මානසික පීඩාවක් ගැන. ඇත්ත වශයෙන්ම ඒ වචනය පාවිච්චි කරපු එක හොඳයි ගරු මන්ත්‍රීතුමනි. මොකද මානසික පීඩාවට තුඩු දෙන වැඩ කටයුතු රැසක් සිද්ධ වුණා. යෝජනාව ඉදිරිපත් කරන වෙලාවේ ඔබතුමාම කිව්වා, "මෙන්න මේ මේ දේවල් ගැන විතරක් කථා කරන්න,

අරවා ගැන කථා කරන්න එපා"ය කියලා. ඔබතුමා කොහොමද එහෙම කියන්නේ? මටත් කථා කිරීමේ නිදහස තිබෙනවා නේද? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අපට භාෂණයේ නිදහස ලබා දීලා නැද්ද? ඔබතුමා කියනවා, "අරවා ගැන නම් කථා කරන්න එපා, මේක ගැන විතරක් කථා කරන්න" කියලා. දැන් මම තමුන්නාන්සේට මේකට හොඳට බඩ කට පිරෙන්න උත්තරය දීලා තිබෙන්නේ. මානසික පීඩනය, මානසික ආතතිය ගැන ඔබතුමා කථා කළා නේ? විශ්‍රාම වැඩසටහන් හතරක්; ක්‍රමවේද හතරක් ගිය වසරේ ක්‍රියාත්මක වුණා. ඒක හරි නේ? මට තමුන්නාන්සේ කියන්න, ඒ විශ්‍රාම වැඩසටහන වෙනුවෙන් එක රුපියලක් මහා භාණ්ඩාගාරයෙන් වෙන් කළාද කියලා. ඒ සඳහා එක රුපියලක් වෙන් කළේ නැහැ. මොකක්ද ඔබතුමන්ලා කළේ? ඔබතුමන්ලා රැකියාව අත් හැර ගිය දිවි නැඟුම නිලධාරින්ට වන්දි සහ පාරිතෝෂික ගෙවේවේ රුපියල් මිලියන 1,546යි. ඒ රුපියල් ලක්ෂ 15,460 ඔබතුමන්ලා ගෙවේවේ සමෘද්ධිලාභියාගේ සල්ලිවලින්. ඔවුන්ගේ අනිවාර්ය ඉතිරි කිරීම්වලින්, බැංකුවල සල්ලිවලින්. ඔන්න මානසික ආතතිය ගැන කථා කරන කොට කලන්තය දමන දේවල්. දැන් තමුන්නාන්සේලා අඬබෙර ගහලා සමෘද්ධි නිලධාරින්ව රවටා, දිවි නැඟුම නිලධාරින්ව රවටා හොඳ විශ්‍රාම වැටුප් ක්‍රම හතරක් ලබා දෙනවාය කිව්වත් එක ශත පහක්, තඹ දොයිතුවක් මහා භාණ්ඩාගාරයෙන් ඒ සඳහා වෙන් කළේ නැහැ. මම බොරුද කියන්නේ?

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
ගරු ඇමතිතුමනි, ඔබතුමා උපදේශක කාරක සභාවට එන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
සමෘද්ධිලාභීන්ගේ අනිවාර්ය ඉතිරි කිරීම්වලින් තමයි ඔබතුමන්ලා වන්දි හා පාරිතෝෂික ගෙවේවේ. ඒක මම වග කීමෙන් කියනවා.

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
සම්පූර්ණ අසත්‍ය. ඔබතුමා උපදේශක කාරක සභාවට එන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එය සහමුලින් ඇත්ත. උපදේශක කාරක සභාවක් ඕනෑ නැහැ. ඒවා සනාථ කරන සියලු ලිපි ලේඛන මා සතුව තිබෙනවා. මම ඒවා හැන්සාඩ්ගත කිරීම සඳහා **සභාගත*** කරනවා.

ඔබතුමා පොඩ්ඩක් අහගෙන ඉන්න. [බාධා කිරීමක්] තරහා නැතිව ඔබතුමා පොඩ්ඩක් අහගෙන ඉන්න කෝ. මම ඔබතුමාට disturb කළේ නැහැ. මම ඔබතුමාට කරදර කළේ නැහැ. මේ කාරණයට සවන් දෙන්න. [බාධා කිරීමක්] කිසි බොරුවක් නැහැ; කිසිම බොරුවක් නැහැ. මම කියන්නේ බොරුවක්ය කියා ඔප්පු කරනවා නම් මම මන්ත්‍රීකමෙන් අස් වෙනවා; මගේ ඇමතිකමින් මම අස් වෙනවා; දේශපාලනයෙනුත් අයින් වෙනවා. මහා භාණ්ඩාගාරයෙන් එක රුපියලක් වෙන් කර නැහැ, මේ විශ්‍රාම වැටුප් වැඩසටහනේ වන්දි හා පාරිතෝෂික ගෙවන්න. මේවා බොරුය කියා ඔප්පු කරනවා නම් මම දේශපාලනයෙනුත් අයින් වෙනවා. [බාධා කිරීමක්] පව දොඩවනවා නොවෙයි. [බාධා කිරීමක්] මම දන්නවා. ඔබතුමා "එපා, එපා" කියන්නේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඔබතුමාට මම හොඳ සම්පතක් නිසා නේ. මමනේ ඔබතුමාට ඉන්න එකම මිත්‍රයා.

ජනාධිපතිවරණ සමයේ රුපියල් 2,500 ගණනේ දුන්නා. ඒ සල්ලි භාණ්ඩාගාරයේ සල්ලිද? [බාධා කිරීමක්] උත්තර දෙන්න ඉඩ දෙන්න කෝ. මම ඔබතුමාට කරදර කළේ නැහැ. පොඩ්ඩක් අහගෙන ඉන්න. ඔබතුමාට මේවා අහගෙන ඉන්න අමාරුයි. රුපියල් 2,500ක් බෙදුවා නේ. රුපියල් 2,500 ගණනේ බෙදන්න සල්ලි කොහෙන් ද? [බාධා කිරීමක්] ඔව්. මිනිසුන්ගේ සල්ලි. සමෘද්ධිලාභියාගේ අනිවාර්ය ඉතිරි කිරීම්. සමෘද්ධි ලාභියාගේ බැංකුවල සල්ලි. සමෘද්ධිලාභියාට හිමි සල්ලි ටික තමයි රුපියල් 2,500ක් දෙනවා කියලා ආපසු දුන්නේ. ලජ්ජයි. ලජ්ජයි කියන්න.

ඒ විතරක් නොවෙයි. සාමාන්‍යයෙන් ගරු මන්ත්‍රීතුමනි, අලුත් අවුරුද්දට ලිත ගහන්නේ මාර්තු මාසයේ. මෙදා පාර ලිත ගැහුවේ නොවැම්බර් මාසයේ. ඔන්න අහගන්න. ලිත් ලක්ෂ 50ක් ගැහුවා. ඒකත් අසත්‍ය ද? දෙසැම්බර් 3 වන දා ලිත් ලක්ෂ 18යි. මා ළඟ ඔක්කොම ලිපි ලේඛන තිබෙනවා. මේවා පව නොවෙයි. දෙසැම්බර් 8 වන දා තවත් ලිත් ලක්ෂ 18ක් ගැහුවා. දෙසැම්බර් 10 වන දා තව ලිත් ලක්ෂ 9ක් ගැහුවා. දෙසැම්බර් 15 වන දා ලිත් ලක්ෂ 5ක් ගැහුවා. ඔක්කොම ලිත් ලක්ෂ 50යි. වියදම කොච්චර ද? රුපියල් ලක්ෂ 260යි. කාගේ සල්ලි ද? හිටපු ඇමතිවරුන්ගේ අම්මාගේ අප්පාගේ බූදලය ද? නැහැ. සමෘද්ධිලාභියාගේ සල්ලි. සමෘද්ධි බැංකුවල සල්ලි. වන්දි හා පාරිතෝෂික ගෙවන්නටත් සමෘද්ධිලාභියාගේ සල්ලිවලට විද්දා. රුපියල් 2,500 දෙන්නටත් සමෘද්ධිලාභියාගේ සල්ලිවලට විද්දා. ලිත් ලක්ෂ 50ක් මුද්‍රණය කරන්නටත් සමෘද්ධි ලාභියාගේ සල්ලිවලට විද්දා. ඒ විතරක් නොවෙයි. මේවා මුද්‍රණය කරන එකට රුපියල් ලක්ෂ 31ක වැට බද්දකුත් ගහලා තිබෙනවා. ඒකත් ගෙවා තිබෙන්නේ සමෘද්ධිලාභියාගේ සල්ලිවලින්. ඔවා බොරුද? මේ ඔක්කොම ලිපිලේඛන මා ළඟ තිබෙනවා. ඒ ලිපිලේඛන හැන්සාඩ්ගත කිරීම සඳහා **සභාගත*** කරනවා.

ඒ විතරක් නොවෙයි. ඡන්දය ළං කරලා දිවි නැඟුම සම්මේලනයක් පැවැත්වූවා. එතකොට මේ දිවි නැඟුම සම්මේලනයට සල්ලි කොහෙන්ද? ඒ දිවි නැගුමේ සල්ලි. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ සල්ලි. කියද ගණන? රුපියල් ලක්ෂ 637යි. ඔන්න අහගන්න අලගියවන්න මන්ත්‍රීතුමා. මොනවාට ද රුපියල් ලක්ෂ 637ක් ගිහින් තිබෙන්නේ? බස් රථ 1074කින් ජනතාව ප්‍රවාහනය කරන්න රුපියල් ලක්ෂ 240යි. අභිංසක සමෘද්ධිලාභියාගේ සල්ලි. ඒ විතරක් නොවෙයි. සංග්‍රහ සඳහා රුපියල් ලක්ෂ 203යි. කාගේ සල්ලි ද? සමෘද්ධිලාභියාගේ සල්ලි. පුවත් පත් දැන්වීම්වලට රුපියල් ලක්ෂ 24යි. කාගේ සල්ලි ද? සමෘද්ධිලාභියාගේ සල්ලි.

ගරු මන්ත්‍රීතුමනි, මේකත් අහගන්න කෝ. විශාල ප්‍රමාණයේ තාවකාලික ආවරණ සැකසීම සඳහා සමෘද්ධිලාභියාගෙන් කීයක් ගසා කෑවා ද? රුපියල් ලක්ෂ 74ක් ගසා කෑවා. පොඩ්ඩක් හිතලා බලන්න. ජනාධිපතිවරණය වෙනුවෙන් එක දවසකට, එක මොහොතකට "දිවි නැඟුම සම්මේලනය" කියා පව සම්මේලනයක් ක්‍රියාත්මක කරන්නට සමාද්ධිලාභියාගේ රුපියල් ලක්ෂ 637කට විදින එක සදාචාර සම්පන්න ද? ඒක නිවැරදි ද? එම නිසා මේ අවස්ථාවේ මානසික පීඩනය ගැන කථා කරනකොට ගරු මන්ත්‍රීතුමාගෙන් මා අහන්නට කැමතියි,

---

** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.*
ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.
Document not tendered.

** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.*
ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.
Document not tendered.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

මානසික පීඩනයට ලක් වෙලා තිබෙන්නේ සමෘද්ධි ලාභියා ද, සමෘද්ධි සංවර්ධන නිලධාරිතුමා ද, එහෙම නැත්නම් ඔබතුමන්ලා ද කියලා. මේවා ඇහෙනකොට මානසික ආතතියක් ඇති වෙනවා. ඇත්තටම පොදු ජනතාව සමඟ, ඒ අයගේ සිතුම් පැතුම් සමඟ බොහොම කිට්ටුවෙන් ඉන්න ගරු මහින්ද අමරවීර මන්ත්‍රීතුමා වාගේ පුද්ගලයෝ ඉන්නවා. මම දන්නවා, එතුමාට මානසික ආතතිය විතරක් නොවෙයි, දැන් තවත් ආතතියක් හැදිලා ඇති මේ ගණන් හිලවු ටික අහනකොට.

මොකද, එතුමා පොදු ජනතාවට ආදරය කරන මනුස්සයෙක්. පොදු ජනතාවගෙන් ගසා කන මනුස්සයෙක් නොවෙයි. ගරු ලසන්ත අලගියවන්න මැතිතුමනි, කිසිම පළි ගැනීමක් සිද්ධ වන්නේ නැහැයි කියන එක මම බොහොම වගකීමෙන් ඔබතුමාට ප්‍රකාශ කරනවා. පළි ගැනීමක් සිදු වුණොත් ඒ හැම පළි ගැනීමකටම මම වගකියනවා. එහෙම වරදක් සිදු වෙලා තිබුණොත් මම ඒක නිවැරදි කරනවාය කියන එක ඔබතුමාට පැහැදිලිවම කියනවා. හැබැයි, ගරු ලසන්ත අලගියවන්න මැතිතුමනි, ඔබතුමා නැඟිටලා "බොරු, බොරු" කියන්න එපා. මොකද, මම ඔබතුමා කියන දේට හොඳට සවන් දුන්නා. වන්දි හා පාරිතෝෂිකවලට රුපියල් මිලියන 1546ක් ගන්න සමෘද්ධි ලාභියාගේ පොකැට්ටුවට ගැහුවා කියන එක බොරුවක් නොවෙයි. ඒක ඇත්ත. ඒ මහා භාණ්ඩාගාරයේ සල්ලි නොවෙයි. ඔබතුමා පොඩ්ඩක් සවන් දෙන්න. රුපියල් 2,500 ගණනේ බෙදන්න සල්ලි රුපියල් මිලියන 2990ක් මහා භාණ්ඩාගාරයෙන් ගත්තේ නැහැ. ගත්තේ "දිවි නැඟුම" ඉතිරිකිරීම්වලින්. ලිත් ලක්ෂ 50ක් ගහන්න රුපියල් ලක්ෂ 260ක් වෙන් කළේ දුප්පතාගේ සල්ලිවලින්. ගරු හිටපු ඇමතිතුමනි, දිවි නැඟුම ජාතික සම්මේලනයට රුපියල් ලක්ෂ 637ක් ගත්තේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ මැතිවරණ ව්‍යාපාරයෙන් නොවෙයි. ඒ සල්ලි ඔක්කොම දුප්පතාගේ සල්ලි; පොඩි මනුස්සයාගේ සල්ලි; පොදු ජනතාවගේ සල්ලි. මේවා සත්‍යය. ඔබතුමන්ලා සත්‍යය ඉදිරියේ හැංගෙන්න යන්න එපා. සත්‍ය ඉදිරියේ යථාර්ථය අවබෝධ කර ගෙන ඔබතුමන්ලාත් මේ වැඩ සටහනත් එක්ක අත්වැල් බැඳ ගෙන අපි හොඳ ගමනක් යමු.

අපේ ගරු මහින්ද අමරවීර මැතිතුමාත් අදහස් කිහිපයක් ඉදිරිපත් කළා. දේශපාලන විකෘතියක් ක්‍රියාත්මක වෙනවාය කියා ගරු මහින්ද අමරවීර මැතිතුමා ප්‍රකාශ කළා. පැහැදිලිවම ඒ දේශපාලන විකෘතිය නිවැරදි කරන්න අපි ලැහැස්තියි. මහ ජනතාව ඉදිරියට යමු. දැන් ඔබතුමන්ලාගේ පාර්ශ්වයේ කොටසක් තමයි කියන්නේ "අනේ, ඡන්ද තියන්න එපා, ඡන්ද තියන්න එපා" කියා. අපි ලැහැස්තියි, ජනතාව ඉදිරියට යන්න. අපි ලැහැස්තියි, ජනතාව ඉදිරියට ගිහිල්ලා, ජනතාවගේ පැතුම පිළිබඳව ජනතා මතය ලබා ගන්න . ඒ ගැන කිසි ගැටලුවක් නැහැ. ඒ වාගේම ගරු මහින්ද අමරවීර මැතිතුමනි, ඔබතුමාත් පොඩ්ඩක් පොට වරද්දා ගත්තා. ඔබතුමන්ලාගේ ජාතික සංවිධායකතුමා කවුද? සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා. එතුමා පැහැදිලිවම කිව්වා, "නුගේගොඩ රැළියත් එක්ක අපේ කිසිම සම්බන්ධතාවක් නැහැ"යි කියා. දැන් ඔබතුමා මෙතැන නැඟිටලා කියනවා, "බලන්න නුගේගොඩ රැළියට ගිහිල්ලා, අපේ මහජන බලවේගයේ තරම" කියා. අන්න බලන්න කෝ, ඔබතුමා පොට වරද්දා ගත්තා නේ. සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාත් කියනවා මේක අපේ රැළියක් නොවෙයි කියා. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ඇතුළු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පක්ෂ නායකත්වය සියලු දෙනාම ප්‍රතික්ෂේප කර තිබෙනවා, මේ නුගේගොඩ රැළිය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා රැසක් අද මේ ස්ථානයේ නැහැ. මම දන්නේ නැහැ ඒ ඇයි කියා. එහෙම නම් ඔබතුමා කියන විධියට ඒ රැළියට ගිහිල්ලා ඇති. ඔබතුමා ගිය නැත්තේ ඇයි කියා මම දන්නේ නැහැ. [බාධා කිරීමක්] හැබැයි, සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා - මම දන්නේ නැහැ, මට ඇහුණු දේ මම කියන්නේ- ප්‍රකාශ කළා, "මේක අපේ රැළියක් නොවෙයි, අපි ඒකට සහභාගි වන්නේ නැහැ, අපට ඒකට ආරාධනා කර නැහැ" කියා. ඒ නිසා මම ගරු මහින්ද අමරවීර හිටපු ඇමතිතුමාට කියන්න කැමැතියි පනින්න පෙර පොඩ්ඩක් සිතා බලන්න කියා. කථා කරන්න පෙර පොඩ්ඩක් සොයලා බලන්න, ඔබතුමන්ලාගේ පක්ෂ නායකත්වය අර ගෙන තිබෙන තීන්දු තීරණ මොනවාද කියා. ඒක වැදගත් වෙනවා.

මේ අවස්ථාවේ ඔබතුමන්ලා ඉදිරිපත් කළ අදහස් මම පැහැර හරිනවා නොවෙයි. මම ඒ හැම දෙයක්ම හිතට අර ගෙන අඩු පාඩුකම් සිදු වෙනවාද කියා තවදුරටත් සොයා බලනවා. මේ සමෘද්ධි නිලධාරි ක්ෂේත්‍රයේ ඔබතුමන්ලාගේ රජයයන් කිසිදාක ඓතිහාසික සහන රැසක් ලබා දෙන්න අපි සැදී පැහැදී සිටිනවා. ඒ සඳහා මම ඔබතුමන්ලාටත් ආරාධනා කරනවා. ඔබතුමන්ලා හීනෙකින්වත් මේ සමෘද්ධි නිලධාරින්ට, කළමනාකරුවන්ට ලබා නොදුන් - එදා නම් තුන්වැනි පන්තියේ සැලකිල්ලක් ලබා දුන්නා. විශ්‍රාම වැටුප් ක්‍රමයක් ආරම්භ කරනවාය කියා ඒකට සල්ලි වෙන් කරන්නේ නැත්නම් ඒ කුඩම්මාගේ සැලකිල්ල නේ. - මේ අයට ලබා දෙන්න පුළුවන් ඉහළම සැලකිල්ල ලබා දීලා- [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා පොඩ්ඩක් අවබෝධ කර ගන්න, අද මේ වන විටත් පාරිතෝෂිකය ගෙවන්නේ නැතිව අධිභාරයක් තිබෙන බව. සාමාන්‍යයෙන් දින 30න් ගෙවන්න ඕනෑ. තමුන්නාන්සේලාගේ රජය පාරිතෝෂිකය ගෙවන්නේ නැතිව අද අධිභාරයක් තිබෙනවා. අද මානව හිමිකම් කොමිසමට ගිහිල්ලා; අද ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා; අද උසාවියක් ගානේ ගිහිල්ලා. ඇයි? ඔබතුමන්ලාගේ රජය සල්ලි වෙන් කළේ නැහැ නේ.

ඔබතුමන්ලාගේ රජය බොරුවට කයිය ගැහුවා විශ්‍රාම වැටුප් ලබා දෙනවයි කියා. ඒ සඳහා එක තඹ දොයිතුවක් වෙන් කළේ නැහැ. එක සත පහක් වෙන් කළේ නැහැ. එම නිසා මම ලසන්ත මන්ත්‍රීතුමාට එක දෙයක් යෝජනා කරනවා. පොඩ්ඩක් ඉගෙන ගන්න, ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරපු ධර්මය. ධම්ම පදයේ මේ ආකාරයට සඳහන් වෙනවා:

"අත්තානමේ'ව පඨමං පතිරූපේ නිවේසයේ අථ'ඤ්ඤම'නුසාසෙය්‍ය න කිලිස්සෙය්‍ය පණ්ඩිතෝ"

අනුන්ට බණ දේශනා කරන්නට පෙර තමන් සුදුසු ගුණයෙහි පිහිටා කථා කරන්න ඕනෑ. අනුන්ට උපදෙස් දෙන්නට පෙර කණ්ණාඩිය ඉදිරියට ගිහිල්ලා තමන්ගේ නිරුවත, තමන්ගේ අංගෝපාංගයන්, තමන්ගේ උස මහත, තමන්ගේ කොට දේවල්, දිග දේවල් ඒවා දිහා හොඳට විපරම් කරලා තමන් හැදිලා තමන් දෙන්න අනුන්ට අවවාද. අන්න ඒ යුතුකම ඔබතුමා ඉගෙන ගන්න. අඩුම ගණනේ ඒ යුතුකම, ඒ පාඩම ඔබතුමාට උගන්වන්නට මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. බොහොම ස්තුතියි.

එකල්හි වේලාව අ. භා. 7.30 වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2015 පෙබරවාරි 19 වන බ්‍රහස්පතින්දා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.

அப்பொழுது, பி.ப. 7.30 மணியாகிவிடவே குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

அதன்படி பாராளுமன்றம், 2015 பெப்ருவரி 19, வியாழக்கிழமை பி.ப 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

It being 7.30 p.m., MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *adjourned Parliament without Question put.*

Adjourned accordingly until 1.00 p.m. on Thursday, 19th February, 2015.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

232 වන කාණ්ඩය - 10 වන කලාපය
தொகுதி 232 - இல. 10
Volume 232 - No. 10

2015 පෙබරවාරි 19 වන බ්‍රහස්පතින්දා
2015 பெப்ருவரி 19, வியாழக்கிழமை
Thursday, 19th February, 2015

පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේ වාර්තාව කල් දැමීම

පසු ගිය රජය ආරම්භ කළ සංවර්ධන ව්‍යාපෘති ඇනහිටීම:
ස්වදේශ කටයුතු හා ධීවර අමාත්‍යතුමාගේ ප්‍රකාශය

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:
සුජීව සේනසිංහ පදනම (සංස්ථාගත කිරීමේ) -[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා] -
පළමුවන වර කියවන ලදී

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත:
දෙවන වර සහ තුන් වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

பிரதான உள்ளடக்கம்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல் மூல வினா:

ஐக்கிய நாடுகள் மனித உரிமைகள் பேரவையின் அறிக்கை ஒத்திவைப்பு

முன்னைய அரசு ஆரம்பித்த அபிவிருத்தித் திட்டங்கள் இடைநிறுத்தம்:
உள்நாட்டலுவல்கள் மற்றும் கடற்றொழில் அமைச்சரது கூற்று

தனி உறுப்பினர் சட்டமூலங்கள்:

சுஜீவ சேனசிங்க மன்றம் (கூட்டிணைத்தல்) – [மாண்புமிகு நலின் பண்டார ஜயமஹ] -
முதன்முறை மதிப்பிடப்பட்டது

குற்றச் செயல்களுக்குப் பலியாக்கப்பட்டோருக்கும் சாட்சிகளுக்குமான உதவி மற்றும் பாதுகாப்புச் சட்டமூலம் :

இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு, திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Postponement of Report of United Nations Human Rights Council

STALLING OF DEVELOPMENT PROJECTS INITIATED BY FORMER GOVERNMENT:
Statement by Minister of Home Affairs and Fisheries

PRIVATE MEMBERS' BILLS:

Sujeewa Senasinghe Foundation (Incorporation) - [The Hon. Nalin Bandara Jayamaha] –
Read the First time

ASSISTANCE TO AND PROTECTION OF VICTIMS OF CRIME AND WITNESSES BILL:

Read a Second, and the Third time, and passed as amended

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2015 පෙබරවාරි 19 වන බ්‍රහස්පතින්දා
2015 பெப்ருவரி 19, வியாழக்கிழமை
Thursday, 19th February, 2015

අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
COMMITTEE ON PARLIAMENTARY BUSINESS

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2015 පෙබරවාරි මස 19වන බ්‍රහස්පතින්දා, එනම් අද දින පස් වරු 03.00ට ගරු කථානායකතුමාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින් ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සභික මන්ත්‍රීවරුන් සියලු දෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

2012 වර්ෂය සඳහා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.- [ආහාර සුරක්ෂිතතාව අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු කරුපයියා වේලායුදම් මහතා (වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கருப்பையா வேலாயுதம் - பெருந்தோட்டக் கைத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Karuppaiah Velayudam - State Minister of Plantation Industries)

Hon. Speaker, I present the following petitions:

1. A petition from Mr. K.R. Dissanayaka of No. 72, Idipokunagoda Road, Tangalle;
2. A petition from Mr. M.G.M. Wickramasinghe of No.1335/13, Bogahawaththa Road, Pannipitiya;
3. A petition from Mr. N.D.B. Rajapaksha of No. 38, Godaparagahahena, Palathota, Kalutara;
4. A petition from Mr. W.P.R.D. Weerasinghe of No. 48 L, Weralugolla Waththa, Wataddara, Veyangoda;
5. A petition from Mrs. G.I.C. Perera of No. 63/16, Dambahena Road, Maharagama;
6. A petition from Mrs. J.M. Kumarasinghe of Sri Lanka Insurance Corporation Limited, Kaduwela Branch;
7. A petition from Mrs. K.K. Shiranthika Pavithrani of No. 18, 2nd Lane, Bangala Handiya, Pitakotte, Kotte;
8. A petition from Mrs. K. P. M. Champika of No. 340, Humbutiyawa, Nittambuwa;
9. A petition from Mrs. K.T. Matharage of Sri Lanka Insurance Corporation Limited, Galle Branch;
10. A petition from Mrs. M. Chandrika Priyani Perera of Hathathuduwa, Kalawila, Beruwala;
11. A petition from Mrs. M. Verani Yashodha of No. 72/2, Mulleriyawa, Himbutana New Town;
12. A petition from Mrs. M. D. Nirosha Pushpakumari of Sri Lanka Insurance Corporation Limited, Kalutara Branch;
13. A petition from Mrs. M.G.S. Nilmini Kumari of Fully Claim Unit, Life Department, Sri Lanka Insurance Corporation Limited, Colombo 02;
14. A petition from Mrs. S.A.V.R.K. Siriwardhana of No. 118/1, New Airport Road, Ratmalana; and
15. A petition from Mrs. W.M.S.M. Weerasekara of Sandaganagama, Weligepola, Balangoda.

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා
(மாண்புமிகு எரிக் பிரசன்ன வீரவர்தன)
(The Hon. Eric Prasanna Weerawardhana)

ගරු කථානායකතුමනි, මම වැරැල්ලගම, ඉඩමේගම, "පුෂ්පසිරි" යන ලිපිනයෙහි පදිංචි පුෂ්පා සංජීවනී ගොඩබැද්දගේ මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගොහාගොඩ සත්ත්ව ගොවිපොළ : විස්තර
கொஹாகொட விலங்குப் பண்ணை : விபரம்
GOHAGODA ANIMAL FARM : DETAILS

3922/'13

2. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමා සහ බුද්ධ ශාසන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (4):

(අ) (i) මහනුවර නගරය තුළ එක්රැස්වන කැළි කසළ මහනුවර, ගොහාගොඩ ප්‍රදේශයේ මහවැලි ගඟ ආසන්නයේ වූ ස්ථානයකට බැහැර කරන බවත්;

(ii) එම ස්ථානය අසල සත්ත්ව ගොවිපොළක් පවත්වාගෙන යනු ලබන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ස්ථානයේ සත්ත්ව ගොවිපොළක් පවත්වාගෙන යෑම සඳහා නීත්‍යානුකූල අවසරයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම අවසරය ලබා දී ඇති ආයතනයේ හෝ ආයතනවල නම් කවරේද;

(iii) එම සත්ත්ව ගොවිපොළෙහි හිමිකරුගේ නම සහ ලිපිනය කවරේද;

(iv) එකී සත්ත්ව ගොවිපොළේ හිමිකරු එම ව්‍යාපාරයට අමතරව වෙනත් ආයතනයක රැකියාවක් කරනු ලබන්නේ නම්, එම ආයතනයේ නම සහ ඔහු විසින් දරනු ලබන තනතුර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

அரசாங்க நிர்வாக, மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் சனநாயக ஆட்சி பற்றிய அமைச்சரும் புத்தசாசன அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) கண்டி நகரத்தில் சேருகின்ற குப்பை கூளங்கள் கண்டி கொஹாகொட பிரதேசத்தில் மகாவலி கங்கைக்கு அருகாமையிலுள்ள இடமொன்றில் அகற்றப்படுகின்றதென்பதையும்;

(ii) அவ்விடத்தில் விலங்குப் பண்ணையொன்று பேணிவரப்படுகின்றதென்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி இடத்தில் விலங்குப் பண்ணை யொன்றை பேணிவருவதற்கு சட்டரீதியான அங்கீகாரம் வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி அனுமதி வழங்கப்பட்டுள்ள நிறுவனம் அல்லது நிறுவனங்கள் யாவை யென்பதையும்;

(iii) மேற்படி விலங்குப் பண்ணை உரிமையாளரின் பெயர் மற்றும் முகவரி யாதென்பதையும்;

(iv) மேற்படி விலங்குப்பண்ணையின் உரிமையாளர் இந்த தொழில்முயற்சிக்கு மேலதிகமாக வேறு நிறுவன மொன்றில் தொழில் புரிவாராயின் அந்நிறுவனத்தின் பெயர் மற்றும் அவர் வகிக்கும் பதவி யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils, Local Government and Democratic Governance and Minister of Buddha Sasana:

(a) Is he aware that -

(i) the garbage collected in the City of Kandy is disposed of at a place in Gohagoda area in Kandy close to the Mahaweli River; and

(ii) an animal farm is run close to that place?

(b) Will he state -

(i) whether legal permission has been granted to run an animal farm in the aforesaid place;

(ii) if so, the names of the institutions that have granted the aforesaid permission or the name of the institution that has granted the aforesaid permission;

(iii) the name and address of the owner of the aforesaid animal farm; and

(iv) if the owner of the aforesaid farm is employed in another institution in addition to that industry, the name of that institution and the post held by him?

(c) If not, why?

ගරු කරු ජයසූරිය මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍ය සහ බුද්ධ ශාසන අමාත්‍යතුමා)
(மாண்புமிகு கரு ஜயசூரிய - அரசாங்க நிருவாக, மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் சனநாயக ஆட்சி பற்றிய அமைச்சரும், புத்தசாசன அமைச்சரும்)
(The Hon. Karu Jayasuriya - Minister of Public Administration, Provincial Councils, Local Government and Democratic Governance and Minister of Buddha Sanasa)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි:

(අ) (i) ඔව්.

(ii) ඔව්.

එම ස්ථානය අසල සත්ත්ව ගොවිපොළවල් කිහිපයක්ම පවත්වාගෙන යනු ලැබේ.

(ආ) (i) නැත.

(ii) අදාළ නොවේ.

(iii) පෞද්ගලිකව සත්ත්ව ගොවිපොළවල් පවත්වා ගෙන යන අයගේ තොරතුරු පහත සඳහන් වේ :

	සත්ත්ව ගොවිපළවල් හිමිකරුවන්ගේ නම	ලිපිනය
1	එම්.ජී. සිරිසේන මහතා	34/1, ගොහාගොඩ පාර, තේක්ක වත්ත, කටුගස්තොට
2	එස්.තංගවේලු මහතා	34/බී1, ගොහාගොඩ පාර, තේක්ක වත්ත, කටුගස්තොට
3	එම්.ජී. සරත් මහතා	39, ගොහාගොඩ පාර, තේක්ක වත්ත, කටුගස්තොට
4	කේ.ජී. ජයතිලක මහතා	34, ගොහාගොඩ පාර, තේක්ක වත්ත, කටුගස්තොට
5	කේ.ජී. හිරන්ති මහත්මිය	34, ගොහාගොඩ පාර, තේක්ක වත්ත, කටුගස්තොට
6	ආර්.ජී.කේ. රාජපක්ෂ මහතා	33/ඒ1, ගොහාගොඩ පාර, තේක්ක වත්ත, කටුගස්තොට
7	එම්.ජී. ප්‍රියන්ත මහතා	33/ඒ, ගොහාගොඩ පාර, තේක්ක වත්ත, කටුගස්තොට
8	එම්.ජී. අජිත් කුමාර මහතා	04, ගොහාගොඩ පාර, තේක්ක වත්ත, කටුගස්තොට
9	ආර්.ජී. ප්‍රියන්ත කුමාර මහතා	33/බී, ගොහාගොඩ පාර, තේක්ක වත්ත, කටුගස්තොට
10	බන්දුල වීරවර්ධන මහතා	34/1, ගොහාගොඩ පාර, තේක්ක වත්ත, කටුගස්තොට
11	වසන්ත කුමාර් මහතා	35, ගොහාගොඩ පාර, තේක්ක වත්ත, කටුගස්තොට

(iv) වෙනත් රැකියාවක් කරන සත්ත්ව ගොවිපොළ හිමිකරුවන්ගේ රැකියාව හා ආයතන පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු ඇමතිතුමනි, එතැන වෙනත් රැකියා කරන අය නැද්ද?

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
මම ඒ නම් කියවන්නම්.

	සත්ත්ව ගොවිපළවල් හිමිකරුවන්ගේ නම්	රැකියාව හා ආයතනයේ නම
1	එම්.ජී. සිරිසේන මහතා	මහනුවර මහා නගර සභාවේ කම්කරු (විශ්‍රාමික)
2	එස්. තංගවේලු මහතා	මහනුවර මහා නගර සභාවේ කම්කරු (විශ්‍රාමික)
3	එම්.ජී. සරත් මහතා	මහනුවර මහා නගර සභාවේ යන්ත්‍ර ක්‍රියාකරු
4	කේ.ජී. ජයතිලක මහතා	මහනුවර මහා නගර සභාවේ රියැදුරු
5	ආර්.ජී.කේ. රාජපක්ෂ මහතා	මහනුවර මහා නගර සභාවේ කම්කරු
6	එම්.ජී. ප්‍රියන්ත මහතා	භාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ කම්කරු
7	එම්.ජී. අජිත් කුමාර මහතා	කටුගස්තොට ස්කාගාරයේ රියැදුරු
8	ආර්.ජී. ප්‍රියන්ත කුමාර මහතා	මහනුවර මහා නගර සභාවේ කම්කරු
9	බන්දුල වීරවර්ධන මහතා	එකෝටෙක් ආයතනයේ කම්කරු
10	වසන්ත කුමාර් මහතා	මහනුවර මහා නගර සභාවේ කම්කරු (දැනට විදේශගත වී ඇත.)

(ඇ) අදාළ නොවේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, මහනුවර, ගොහාගොඩ කුණු ගොඩ නිසා බරපතළ පාරිසරික ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. මේ නිසා ගඟේ ජල පොම්පාගාරයට ඉහළ සිට ගඟට අපවිත්‍ර ජලය සහ ක්ෂීරණය එකතු කරනවා. මේ ජලය "බැර මූලද්‍රව්‍යවලින් ගහණයි" කියලා මධ්‍යම පරිසර අධිකාරිය දීපු වාර්තාවක් මම මේ ගරු සභාවට ඉදිරිපත් කළා. ඒ කුණු කාලා තමයි ඒ ඇති කරන ඌරෝ සහ හරක් හැදෙන්නේ. එතකොට, ඒ බැරලෝහ ඒ සත්තුන්ගේ ඇඟේ තැන්පත් වෙනවා. ඒ බැරලෝහ තැන්පත් වුණු හරක් සහ ඌරෝ ජා-ඇල ප්‍රදේශයට රුපියල් 30,000ට, 35,000ට විකුණනවා. ඒ මාංශ කන මිනිසුන්ගේ ශරීරයේ කැඩ්මියම් සහ මර්කරි කියන බැරලෝහ තැන්පත් වෙනවා. අවසානයේදී ඒ මිනිස්සු ලෙඩ්ඩු බවට පත් වෙනවා.

බලපත්‍රයක් අරගෙන ඒ ගොවිපොළවල් පවත්වා ගෙන ගියත්, ඒ සතුන්ට කඩෙන් ගන්න සත්ව ආහාර නොවෙයි කෑමට දෙන්නේ. ගොහාගොඩ කුණු ගොඩේ කෑම පමණයි ඒ සත්තු කන්නේ. මම ඒක ඇස් දෙකෙන් දැක්කා. මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ අමාත්‍යාංශයට මොකක්ද කරන්න පුළුවන් මැදිහත්වීම.

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
ගරු මන්ත්‍රීතුමනි, අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. දැනට ඒ ගැන මගේ අවධානය යොමු වෙලා තිබෙනවා. මේ සම්බන්ධව ක්‍රියා කරන ලෙස මම දැනටමත් උපදෙස් දීලා තිබෙනවා. මම ඉදිරියේදී තව පියවර ගන්නවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, මේ ගොහාගොඩ කුණුගොඩ ප්‍රතිචක්‍රීකරණයේ දී එය හුදෙක්ම ඔබතුමාගේ අමාත්‍යාංශයට පමණක් තනිවම කරන්න පුළුවන් වැඩක් නොවෙයි. ඒ සඳහා පරිසර අමාත්‍යාංශයේත්, තවත් අමාත්‍යාංශ ගණනාවකත්, රාජ්‍ය නොවන ආයතනවල සහයෝගයත් අවශ්‍යයි. මේ ගොහාගොඩ කුණුගොඩ සම්බන්ධයෙන් එවැනි සමෝධානික වැඩ පිළිවෙළක්, සියලු අමාත්‍යාංශ සහ අදාළ බලධාරීන් එකතු වුණ වැඩ පිළිවෙළක් පිළිබඳව අමාත්‍යාංශයේ අවධානය යොමු වෙලා තිබෙනවාද?

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
තිබෙනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මා මෙම ප්‍රශ්නය මීට කලිනුත් මතු කළා. එවකට හිටපු උසස් අධ්‍යාපන අමාත්‍යතුමාටත් මා මේ බව දැන්වූවා. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයෙක් මේ කුණුගොඩ ප්‍රතිචක්‍රීකරණය කරනවාය කියලා ව්‍යාපෘති වාර්තා ලියමින්

[ගරු බුද්ධික පතිරණ මහතා]

විශ්වවිද්‍යාල website එක එතුමාගේ පෞද්ගලික වුවමනාවට පාවිච්චි කර තිබෙනවා. ඒ මහාචාර්ය බෙන් බස්නායක කියන මහත්මයා. මම ඒක බොහොම වගකීමකින් මීට කලින් මේ ගරු සභාවේදී කියලා තිබෙනවා. මේ මැදිහත්වීම නතර කරන්නත් අමාත්‍යාංශයේ අවධානය යොමු කරනවාද?

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
ඔව්.

නොරොච්චෝල බලාගාරය: මෙහෙයුම් සහ නඩත්තු කටයුතු
நுரைச்சோலை அனல் மின் நிலையம் : தொழிற்பாடு மற்றும் பராமரிப்பு
NORACHCHOLAI POWER PLANT: OPERATION AND MAINTENANCE

5183/'14

5. ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) වැඩ අවසන්ව ඇති නොරොච්චෝල ගල් අඟුරු තාප බලාගාරයේ මෙගාවොට් 300ක ධාරිතාව සහිත පළමුවැනි අදියරේ වර්තමාන මෙහෙයුම් කටයුතු සහ නඩත්තු කටයුතු සිදු කරන සමාගම කවරේද;

(ii) එම වගකීම පවරනු ලැබූ දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත බලාගාරයේ මෙහෙයුම් කටයුතු සහ නඩත්තු කටයුතු ඉදිරියට පවත්වාගෙන යෑම සඳහා එහි ඉදිකිරීම් කටයුතු සිදු කළ චීන සමාගමට පැවරීමට කටයුතු යොදා තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) මෙම බලාගාරයේ 2 වැනි සහ 3 වැනි අදියරවල වැඩ කටයුතු නිම කිරීමට නියමිතව ඇති දින වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

மின்வலு, எரிசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பணிகள் நிறைவு செய்யப்பட்டுள்ள நுரைச் சோலை அனல் மின் நிலையத்தின் 300 மெ.வொ. கொள்ளளவுடன் கூடிய முதலாவது கட்டத்தின் தற்போதைய தொழிற்பாட்டு நடவடிக்கைகளையும் பராமரிப்புப் பணி களையும் மேற்கொள்கின்ற நிறுவனம் யாதென் பதையும்;

(ii) மேற்படி பொறுப்பு கையளிக்கப்பட்ட திகதி யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்படி மின் உற்பத்தி நிலையத்தின் தொழிற்பாட்டு நடவடிக்கைகளையும் பராமரிப் புப் பணிகளையும் முன்னெடுத்துச் செல்வதற் காக அதன் நிர்மாணப் பணிகளை மேற்கொண்ட சீனக் கம்பனிக்கு கையளிப்பதற்கு நடவடிக்கை எடுக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அத் திகதி யாதென்பதையும்;

(iii) மேற்படி மின் உற்பத்தி நிலையத்தின் இரண் டாவது மற்றும் மூன்றாவது கட்டங்களின் பணிகளை நிறைவு செய்வதற்கு உத்தேசிக்கப் பட்டுள்ள திகதிகள் யாவையென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Energy:

(a) Will he state -

(i) the name of the company which presently carries out the operational activities and maintenance work of Phase I of Norachcholai Coal Power Plant, which has a capacity of 300 MW, of which the construction work has been completed; and

(ii) the date on which that company was assigned with such responsibility?

(b) Will he inform this House -

(i) whether arrangements have been made to delegate the responsibility of carrying out operational activities and maintenance work of the aforesaid power plant to the Chinese company which constructed that power plant;

(ii) if so, the date from which such responsibility will be delegated to that company; and

(iii) the scheduled dates of completion of the construction work of Phase II and Phase III of that power plant?

(c) If not, why?

ගරු පාඨලී චම්පික රණවක මහතා (විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க - மின்வலு மற்றும் எரிசக்தி அமைச்சர்)
(The Hon. Patali Champika Ranawaka - Minister of Power and Energy)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) වැඩ අවසන්ව ඇති නොරොච්චෝල ගල් අඟුරු තාප බලාගාරයේ මෙගාවොට් 300ක ධාරිතාව සහිත පළමුවෙනි අදියර ද ඇතුළුව සියලුම අදියරයන්හි මෙහෙයුම් හා නඩත්තු කටයුතු කිසිදු සමාගමකට පවරා නැති අතර, එම කටයුතු සිදු කරනු ලබන්නේ ලංකා විදුලි බල මණ්ඩලය විසිනි.

(ii) අදාළ නොවේ.

(ආ) (i) නැත. ඉහත බලාගාරයේ මෙහෙයුම් හා නඩත්තු කටයුතු ඉදිරියටත් කරගෙන යනු ලබන්නේ ලංකා විදුලි බල මණ්ඩලය විසිනි.

(ii) අදාළ නොවේ.

(iii) මෙම බලාගාරයේ 2 වැනි සහ 3 වැනි අදියරයන්හි වැඩ කටයුතු ද මේ වන විට අවසන් කර ඇත.

(ඇ) අදාළ නොවේ.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, පසු ගිය කාලයේ නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයට ගල් අඟුරු සැපයීමේදී කෝටි 150ක වංචාවක් හෙළිදරවු වුණා. විශේෂයෙන් ඇමතිතුමාට පසු ගිය රජය කාලයේ ඒ අමාත්‍යාංශය දාලා යන්න වුණේත් මෙන්න මේ වංචාවට අදාළ ලිපි ගොනුව හෙළිදරවු කිරීම නිසායි.

වර්තමානයේ අපේ රජයේ විදුලිබල හා බලශක්ති ඇමතිතුමා විධියට නැවත පත් වුණු ඔබතුමාගෙන් මා මේ ප්‍රශ්නය අහනවා. පසු ගිය රජය කාලයේ ඔබතුමාගෙන් පස්සේ ඇමතිකම භාර දීලා තිබුණේ අපේ පවිත්‍රාදේවී වන්නිආරච්චි හිටපු ඇමතිතුමියටයි. අපි දන්නවා, ඊට වඩා ඔබතුමාට හැකියාව, පළපුරුද්ද සහ දැනුමක් තිබෙන බව. අපි අහනවා, ඔබතුමා මේ කෝටි 150ක වංචාව සම්බන්ධව දැන් මොකක්ද කරගෙන යන්නේ, මොකක්ද එහි තත්ත්වය කියලා.

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ගරු කථානායකතුමනි, අපේ හිටපු ඇමතිතුමිය පසුව ප්‍රකාශ කර තිබුණා, එවැනි වංචාවක් -කෝටි 150ක වංචාවක්- නොවුණු බව. අපේ හිටපු ලේකම්තුමාත් ඒ බව ප්‍රකාශ කර තිබුණා. කෙසේ නමුත්, ඒ අවස්ථාවේ ගල් අඟුරු ගෙන ඒම පිළිබඳව අපේ නැව් සංස්ථාව වෙනත් සමාගමක් සමඟ ඇති කර ගත්ත ගිවිසුම නිසි ආකාරයෙන් ඉටු නොවීම නිසා -තත්ත්වයෙන්, ප්‍රමිතියෙන් බාල ගල් අඟුරු ගෙන ඒම නිසා- ලංකා විදුලිබල මණ්ඩලයට ආසන්න වශයෙන් මිලියන 460ක පමණ පාඩුවක් සිදු වෙලා තිබෙනවා. ඒ මුදල් පියවන බවට අපේ රාජ්‍ය නැව් සංස්ථාව අපට පොරොන්දු වෙලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් ඇති තත්ත්වය සොයා බැලීම සඳහා අපේ අමාත්‍යාංශයෙන් විශේෂ විමර්ශන කොමිටියක් දැන් පත් කර තිබෙනවා. ඒ වාර්තාව අපට ලැබුණු වහාම ඊට වග කිව යුත්තන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන්න අපි කටයුතු කරනවා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි . අපි දන්නවා, මේ ගල් අඟුරු බලාගාරයට ගල් අඟුරු සැපයීම සම්බන්ධයෙන් ලංකා කෝල් සමාගම පිහිටුවලා තිබෙන බව. මේ සමාගම රජයට යම්කිසි සම්බන්ධතාවක් ඇති. නමුත් මේ ලංකා කෝල් සමාගමේ ටෙන්ඩර් කැඳවීම්, ගල් අඟුරුවල ප්‍රමිතිය සම්බන්ධව වාගේම මේවායේ මිල ගණන් කැඳවීම සහ ප්‍රදානයන් සම්බන්ධව බරපතළ සැකයක් සහ බරපතළ දූෂණ ඇති බවට වාර්තා වෙලා තිබෙනවා. ඒ වාගේම අපිට ඒ පිළිබඳව තොරතුරු දැන ගන්න ලැබිලා තිබෙනවා. මේ ලංකා කෝල් සමාගම සම්බන්ධව ඉදිරියේදී ගැනීමට බලාපොරොත්තු වන තීරණ මොනවාද කියලා ඔබතුමා අපිව දැනුවත් කරනවාද?

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ගරු කථානායකතුමනි, ලංකා කෝල් සමාගම සම්පූර්ණයෙන්ම රජයට අයිති සමාගමක්. එය ලංකා විදුලිබල මණ්ඩලයට අවශ්‍ය ගල් අඟුරු සැපයීම් කරන රජයට අයිති ආයතනයක්. නමුත් ශ්‍රී ලංකාවට ගල් අඟුරු ගෙන්වීම ආරම්භ කරපු මුල් වර්ෂයේ -2009 වර්ෂයේ- ඉඳලා නිසි ටෙන්ඩර්කරුට ඒක ලබා දීමට නොහැකි වන ආකාරයේ යම් යම් බලපෑම් සිදු වී තිබෙනවා. මෙවර අපි ඒ ගල් අඟුරු ටෙන්ඩරය විධිමත් කරලා, සියලු දෙනාටම පිළිගත හැකි ආකාරයට, විනිවිද පෙනෙනසුලු ආකාරයකට එම ගල් අඟුරු ටෙන්ඩරය විවෘත කරලා තිබෙනවා. ඒ මඟින් ශ්‍රී ලංකාවට අවම මිලකට ගල් අඟුරු මිල දී ගැනීමට හැකියාව ලැබෙනවා ඇති.

මේ පිළිබඳ පැහැදිලි විස්තරයක් මා විසින් ප්‍රකාශයට පත් කරන ලද "බලය හා බලය" නමැති කෘතියේත්, ඒ වාගේම "ආලාපාළු ආර්ථිකය" නමැති කෘතියේත් පැහැදිලිව සටහන් කර තිබෙනවා. මේ කටයුතු සම්බන්ධයෙන් තාක්ෂණික විගණනයක අවශ්‍යතාව මතු වෙනවා වාගේම, විශේෂයෙන්ම රජයේ මෙවැනි මහා පරිමාණ මිල දී ගැනීම්වල දී සිදු වන අඩු පාඩුව නිසා රටට අතිවිශාල හානියක්ද සිදු වනවා. ඉදිරි කාලයේදී වංචා, දූෂණ මැඩලීමට මේ පාර්ලිමේන්තුව යම්කිසි නීති ප්‍රතිපාදනයක් අනුමත කරනවා නම් අනිවාර්යයෙන් මේ තාක්ෂණික විගණනයේ පහසුකම ඒ අදාළ ආයතනවලට ලැබිය යුතුයි. ඒ වාගේම එම ගනුදෙනු පිළිබඳවත් දැන් අපි අපේ අමාත්‍යාංශයේ විමර්ශනයට ලක් කර තිබෙන බව ප්‍රකාශ කරන්නට ඕනෑ.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, මාගේ තුන් වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, පසු ගිය රජය සාම්පූර් විදුලි බලාගාරය සම්බන්ධයෙන් ඉන්දියාව සමඟ ගිවිසුමක් අත්සන් කළා. ලංකාවට සහ ඉන්දියාවට සියයට 50:50ක අයිතියක් හිමි වන ආකාරයට තමයි ඒ ගිවිසුම අත්සන් කර තිබෙන්නේ. බලාගාරය සඳහා යන වියදමෙන් තමයි සියයට 50 බැගින් දරන්නේ. හැබැයි බලාගාරයට යන වියදමෙන් අඩකට සමාන වියදමක් යනවා, සාම්පූර් සිට වේයන්ගොඩ දක්වා දිවෙන අධිසැර විදුලි මාර්ගය ඉදි කිරීම සඳහා. නමුත් සියයට 100ක්ම මේ වියදම දරන්නේ ලංකා රජයෙන්, එහෙම නැත්නම් ලංකා විදුලිබල මණ්ඩලයෙන්. ඉතින් මේක හරියට "මෝඩ මිනිහා කිරි ගවයාගේ ඉදිරි කොටස භාර අර ගෙන කන්න දෙන කොට, කපටි මිනිහා ගවයාගේ පිටු පස කොටස භාර අරන් වාසි ලබා ගන්නවා වාගේ" වැඩක් නේද?

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ගරු කථානායකතුමනි, ඉන්දියාවේ 'එන්.ටී.පී.සී.' ආයතනයේ සහ ලංකා විදුලිබල මණ්ඩලයේ ඒකාබද්ධ සමාගමක් මඟින් මෙගාවොට් 500ක විදුලි බලාගාරයක් සාම්පූර් ප්‍රදේශයේ ඉදිකිරීම සඳහා අවශ්‍ය කරන සියලුම ගිවිසුම් දැන් අත්සන් කරලා තිබෙනවා. එහි සම්ප්‍රේෂණ පද්ධතිය ලංකා විදුලිබල මණ්ඩලය විසින් ජපානයේ ආධාර ඇතුව ගොඩ නඟනවා. ඒ සම්ප්‍රේෂණ පද්ධතිය ගොඩ නඟන්නේ හුදෙක් සාම්පූර්වල තිබෙන ශ්‍රී ලංකා ඉන්දියානු සමාගම්වලට අයිති එම විදුලි බලාගාරයේ විදුලි බලය ගෙන ඒමට පමණක් නොවෙයි. එය ඊට වඩා එහා ගිය වැඩ පිළිවෙළක්. ත්‍රිකුණාමල ප්‍රදේශයේ තිබෙන විදුලි බලාගාර සියල්ලේම විදුලිබල ශක්තිය කොළඹ ඇතුළු රට පුරා ප්‍රදේශවලට ගෙන යාමට තමයි අපි බලාපොරොත්තු වෙන්නේ. අපට මුලින් තිබුණු ගැටලු යම් ප්‍රමාණයකට අපි දැන් විසඳා ගෙන තිබෙනවා. ඉදිරියේදී ඒවා තවදුරටත් විසඳනවා. ඉන්දු ලංකා සාම්පූර් බලාගාරයේ පරිසර ඇගයීම් වාර්තාව දැනට මහජනයාට විවෘත කරලා තිබෙනවා. මහජන විරෝධතා අවසන් වූ වහාම ඒ පිළිබඳ තාක්ෂණ ඇගයීමක් සිදු කිරීමෙන් පසු එහි වැඩ කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරනවා.

ගල් අඟුරු බලාගාර : විස්තර

நிலக்கரி மின் உற்பத்தி நிலையங்கள் : விபரம்

COAL POWER PLANTS : DETAILS

5196/'14

6. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (3):

(අ) (i) ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන ගල් අඟුරු බලාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම බලාගාරවල නම් කවරේද;

(iii) අලුතින් ඉදිකිරීමට යෝජිත ගල් අඟුරු බලාගාර සංඛ්‍යාව කොපමණද;

(iv) එම බලාගාර ස්ථාපිත කරන ප්‍රදේශ කවරේද;

(v) එම ඉදිකිරීම් සඳහා අවශ්‍ය ඉඩම් ලබා ගැනීමේ ක්‍රමවේදය කවරේද;

(vi) නොරොච්චෝලේ තාප විදුලි බලාගාරයෙන් දැනට ජනනය කර ඇති විදුලි ඒකක සංඛ්‍යාව කොපමණද;

(vii) එය ශ්‍රී ලංකාවේ විදුලිබල අවශ්‍යතාවයෙන් කොපමණ ප්‍රතිශතයක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

மின்வலு, எரிசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் தற்சமயம் இயங்கும் நிலக்கரி மின் உற்பத்தி நிலையங்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) அந்த மின் உற்பத்தி நிலையங்களின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) புதிதாக நிர்மாணிப்பதற்கு உத்தேசிக்கப் பட்டுள்ள நிலக்கரி மின் உற்பத்தி நிலையங் களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(iv) மேற்படி மின் உற்பத்தி நிலையங்கள் தாபிக் கப்படும் பிரதேசங்கள் யாவை என்பதையும்;

(v) மேற்படி நிர்மாணிப்புகளுக்குத் தேவையான காணிகளை பெற்றுக்கொள்ளும் முறைமை யாதென்பதையும்;

(vi) நுரைச்சோலை அனல் மின் நிலையத்திலிருந்து தற்போது உற்பத்தி செய்யப்பட்டுள்ள மின் அலகுகளின் எண்ணிக்கை எவ்வள வென்பதையும்;

(vii) இது இலங்கையின் மின்சாரத் தேவையில் எவ்வளவென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Energy:

(a) Will he state -

(i) the number of coal power plants that are in operation in Sri Lanka at present;

(ii) the names of those power plants;

(iii) the number of new coal power plants that have been proposed to be built;

(iv) the locations in which the aforesaid power plants will be established;

(v) the methodology that will be adopted to acquire land that is required for the aforesaid construction activities;

(vi) the number of units of electricity that is generated by the Norachcholai coal power plant at present; and

(vii) the aforesaid amount as a percentage of the total energy requirement of Sri Lanka?

(b) If not, why?

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන ගල් අඟුරු බලාගාර සංඛ්‍යාව එකකි.

(ii) එය පුත්තලම, නොරොච්චෝලේ පිහිටි ලක් විජය විදුලි බලාගාරයයි.

(iii) ලංකා විදුලිබල මණ්ඩලය විසින් පළ කරන ලද 2013-2032 දිගුකාලීන ජනක සැලසුමට අනුව නුදුරු අනාගතයේදී අලුතින් තවත් ගල් අඟුරු විදුලි බලාගාරයක් ඉදි කිරීමට සැලසුම් කර ඇත.

(iv) එම විදුලි බලාගාරය සාම්පූර් ප්‍රදේශයේ ඉදි කිරීමට තීරණය කර ඇත.

(v) මේ සඳහා මූලික වශයෙන් රජයට අයත් ඉඩම් යොදා ගැනීමට සැලසුම් කර ඇත. රජයේ ඉඩම් ප්‍රමාණවත් නොවන අවස්ථාවන්හිදී 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලි පනතේ 52 වැනි ඡේදයට ප්‍රකාරව කටයුතු කරමින් පෞද්ගලික ඉඩම් ද ඒ සඳහා පවරා ගැනීම කරනු ලැබේ.

(vi) නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය 2014.12.31 දින වන විට ජනක යන්ත්‍ර 1 මඟින් 5418.49 GWhක විදුලි ශක්තියක් ද, ජනක යන්ත්‍ර 2 මඟින් 1222.8402 GWhක විදුලි ශක්තියක් ද, ජනක යන්ත්‍ර 3 මඟින් 434.1885 GWhක විදුලි ශක්තියක් ද ජනනය කර ඇත.

(vii) එය ලංකාවේ සම්පූර්ණ විදුලිබල අවශ්‍යතාවයෙන් 15%ක ප්‍රතිශතයකි.

(ආ) අදාළ නොවේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. විශේෂයෙන්ම මේ ප්‍රශ්නය පැන නඟින්නේ කලින් ඔබතුමා ලබා දුන් පිළිතුරත් එක්කයි. මැතිවරණ සමයේදී ඔබතුමාත් විවාදවලට පැටලුණා. විශේෂයෙන්ම නොරොච්චෝලේ විදුලි බලාගාරයේ ගනුදෙනුව සම්බන්ධයෙන් රුපියල් කෝටි 150ක වංචාවක් ගැන කරුණු මතු වුණා.

ඒක ඔබතුමාටත් සෘජුව ඉලක්ක වෙමින් ඉදිරිපත් වන වෙලාවේදී ඔබතුමාගේ පැත්තෙන් කියැවුණේ "මේ ගනු දෙනුව විතරක් නොවෙයි, මීට වඩා දේවල් තිබෙනවා. මා ඒ දේවල් හෙළිදරවු කරන්න සූදානම්" කියලායි. ඒකට අවස්ථාවක් හැටියට ඔබතුමාට දැන් නැවතත් ඒ විෂය භාර අමාත්‍ය ධුරයම ලැබිලා තිබෙනවා. ඒක නිසා ඔබතුමාගේ පැත්තෙන් තිබෙන සූදානම මොකක්ද, මෙය පූර්වාදර්ශයක් වීම වළක්වන්න, මේ ගනුදෙනුවලදී මෙතෙක් ඇති වුණු දේවල් ඉදිරියටත් නොවෙන්න කටයුතු කිරීමට. ඔබතුමා කිව්වා, තාක්ෂණික විගණනයක් පිළිබඳව. එවැනි ගත හැකි පියවර මොනවා ද? විශේෂයෙන්ම නොරොච්චෝලේ බලාගාරය සම්බන්ධයෙන්.

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

ගරු කථානායකතුමනි, නොරොච්චෝලේ බලාගාරය සහ බලාගාරයට ගල් අඟුරු ගෙන ඒම පිළිබඳව ඇති වුණු තත්ත්වයන් පිළිබඳව, එහි ඇති වුණු අක්‍රමිකතාවන් සහ එහි ඇති වුණු ඇතැම් වංචනික ක්‍රියා පිළිබඳව සවිස්තර වාර්තාවක් මුලින්ම මේ රටේ ජනතාවට ඉදිරිපත් කළේ මමයි. ඒ මගේ "බලය හා බලය" කෘතියෙන්.

ඊළඟට, විශේෂයෙන්ම බලාගාරය හා බලාගාරයේ වියදම් පිළිබඳව විධිමත් ඉදිරිපත් කිරීමක් මවිසින් මගේ "ආලාපාළු ආර්ථිකය" නමැති කෘතියෙන් ඉදිරිපත් කර තිබෙනවා. එය මා දැන් භාර දී තිබෙනවා, විද්වත් ත්‍රිපුද්ගල කමිටුවකට. එම කමිටුව විසින් එම ප්‍රශ්නය හදාරනවා ඇති. ඒ වාගේම ඒ සම්බන්ධයෙන් යම් කිසි අක්‍රමිකතාවක් සිදු වී තිබෙනවා නම් අදාළ පුද්ගලයින්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරනවා ඇති. ඒ වාගේම අනාගතයේ එවැනි දෑ සිදු නොවන්නට සිදු කළ යුතු ව්‍යවස්ථාමය සහ ආයතනික ක්‍රියාදාමයන් පිළිබඳව අපි අනාගතයේ කටයුතු කළ යුතුයි. විශේෂයෙන්ම තාක්ෂණික විගණනය හා ඒ පිළිබඳ දැනුම අපගේ මිලදී ගැනීම්වලදී, මහා පරිමාණ ඉදි කිරීම්වලදී -විදුලිබල ක්ෂේත්‍රයේ පමණක් නොවෙයි, මහාමාර්ග, වරාය, ගුවන් තොටුපොළ ආදී මේ සෑම ක්ෂේත්‍රයකම උපාය මාර්ග ඉදි කිරීම්වලදී- සිදු කළ යුතුයි. ඒ සඳහා අවශ්‍ය විධිමත් තාක්ෂණික යන්ත්‍රණයක් අපි ඉදිරියේදී සම්මත කරන්න යන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේත්, විගණන පනතෙත් තිබිය යුතුයි.

ඒ වාගේම මෙවැනි තොරතුරු ජනතාව දැනගත යුතුයි. මෙවැනි කාරණා පිළිබඳව තොරතුරු දැනගැනීම සඳහා තොරතුරු දැන ගැනීමේ පනත ඉතාම අත්‍යවශ්‍යයි. ඒ වාගේම මේ පාර්ලිමේන්තුව රටේ මූල්‍ය ක්ෂේත්‍රයට වග කියන ආයතනය නිසා පාර්ලිමේන්තුවටත් මේ පිළිබඳව විධිමත්ව දැකබලා ගැනීමට එමඟින් හැකියාව ලැබෙනවා ඇති.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නයත් විදුලි බලාගාර සම්බන්ධයෙන්මයි අහන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමාත් දන්නවා මේ වෙන කොට කිතුල්ගල ප්‍රදේශයේ ඉදි කරන්න යන බලාගාරයක් නිසා ඒ ප්‍රදේශයේ මතු වෙලා තිබෙන ප්‍රධාන ගැටලුව පිළිබඳව. ඒ තමයි ලංකාවටම විශේෂ වුණු, ඒ ප්‍රදේශයටම විශේෂ වුණු රාත්‍රීන් ක්‍රීඩාව සම්පූර්ණයෙන්ම අනතුරට ලක් වෙලා තිබීම. ඒ වාගේම ඒක සංචාරක කර්මාන්තයත් එක්කත් ගැට ගැහිලා තිබෙනවා. ලංකාවේ සංචාරකයින්, විශේෂයෙන්ම ගුණාත්මක වශයෙන් දියුණු කරන්න පුළුවන් අය රාත්‍රීන් ක්‍රීඩාවටත් එක්කයි කිතුල්ගල ප්‍රදේශයට එන්නේ. ඒ ප්‍රදේශයේ ඉදි කිරීමට කටයුතු කරමින් තිබෙන බලාගාරයක් නිසා රාත්‍රීන් ක්‍රීඩාව අනතුරට ලක් වෙලා තිබෙන බව ජනමාධ්‍යවලත් පළ වුණා. මේ පිළිබඳව ඔබතුමා දක්වන ප්‍රතිචාරය මොකක්ද? විශේෂයෙන්ම එහිදී විකල්ප ක්‍රියා මාර්ගයක් හැටියට ඒ රාත්‍රීන් ක්‍රීඩාව ආරක්ෂා කර ගන්නත්, ඔබතුමන්ලාගේ අවශ්‍යතාව අනුව විදුලි බලාගාරය ක්‍රියාත්මක වෙනවා නම් එහි කටයුතු කෙරෙන ආකාරය පිළිබඳවත් පැහැදිලි කිරීමක් කරන්න.

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

ගරු කථානායකතුමනි, කැලණි ගඟේ අවසාන ජල විදුලි බලාගාරය හැටියට කිතුල්ගල ප්‍රදේශයේ ක්‍රෝඩ්ලන්ඩ්ස් බලාගාරය ඉදි කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඉතා විශාල සටනක් කරලා තමයි මේ විදුලි බලාගාරය ගේන්න සිද්ධ වුණේ. මේ සඳහා කැබිනට් පත්‍රිකා 17ක් ඉදිරිපත් කරන්න මට සිද්ධ වුණා. ඒ බලාගාරය ඉතාම ඈත කාලයේදී -1960 දශකයේදී- ලංකා විදුලිබල මණ්ඩලයේ දිගුකාලීන ජන සැලැස්මේ තිබුණු බලාගාරයක්. කැලණි ගඟේ ලක්ෂපාන විදුලි බලාගාර සංකීර්ණයේ අවසාන බලාගාරය. ඒ බලාගාරයේ ඉදිකිරීම් කටයුතු දැන් ආරම්භ කරලා තිබෙනවා.

එම ඉදි කිරීම් කටයුතු නිසා කිලෝමීටර් තුනහමාරත් පහත් අතර ප්‍රමාණයක කැලණි ගඟේ ජල මට්ටමේ අඩු වීමක් සිදුවන බවත්, එමඟින් දැනට ඒ ප්‍රදේශයේ ඉතාම ප්‍රචලිත රාත්‍රීන් ක්‍රීඩාවට බලපෑමක් එල්ල වන බවත් අපට දැනුම් දී තිබෙනවා. පරිසර ඇගයීමේ වාර්තාව මේ පිළිබඳව යම් කිසි ඇගයීමක් කරලා තිබෙනවා. එම පිරිස් සමඟ අපි සාකච්ඡා කළා. ඒ අනුව දිවා කාලයේදී අඩුවකින් තොරව එම ක්‍රීඩාව සඳහා අවශ්‍ය කරන ජලය කැලණි ගඟෙන් මුදා හැරීමට අපි විශේෂ සැලැස්මක් ඉදිරිපත් කරලා තිබෙනවා. එම සැලැස්ම අපි ඒ අදාළ ආයතන; පිරිස්වලට පෙන්වලා දීලා තිබෙනවා. ඒක තවත් ස්වාධීන පිරිසක් විසින් අනුමත කළ යුතුයි කියා ඒ අය විසින් අපට ප්‍රකාශ කළා. දැන් ඒක අපි ස්වාධීන විද්වත් මණ්ඩලයකට යොමු කරලා තිබෙනවා. එය සාකච්ඡාවෙන් විසඳා ගන්නට අපි කටයුතු කරනවා. ජල විදුලිය පරිසර හිතකාමී විදුලි බලයක් හැටියට, කැලණි ගඟේ අවසාන සම්පත හැටියට අපේ රටට තිබෙන එය අපි වැඩිදියුණු කර ගත යුතුයි. ඒ අතරේ අවට පරිසර පද්ධතියට යම් කිසි බලපෑමක් එල්ල වනවා නම් අය අවම කර ගැනීම සඳහා පියවර ගනිමින් තිබෙන බව ප්‍රකාශ කරනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 8 -4088/'13- (3), ගරු බුද්ධික පතිරණ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු අබ්දුල් හලීම් මොහොමඩ් හාෂිම් මහතා (මුස්ලිම් ආගමික කටයුතු හා තැපැල් අමාත්‍යතුමා)
(மாண்புமிகு அப்துல் ஹலீம் மொஹமட் ஹாஷிம் - முஸ்லிம் சமய அலுவல்கள் மற்றும் தபால் அமைச்சர்)
(The Hon. Abdul Haleem Mohamed Hasheem - Minister of Muslim Religious Affairs and Posts)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ශ්‍රී ලංකා මිරර් වෙබ් අඩවිය : විස්තර
ஸ்ரீ லங்கா மிரர் இணையத்தளம் : விபரம்
SRI LANKA MIRROR WEBSITE: DETAILS

5198/'14

12.ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ලංකා මිරර් (Sri Lanka Mirror) නමැති වෙබ් අඩවිය එවකට ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ ලියාපදිංචි කර තිබුණේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) එම ලියාපදිංචිය සඳහා අය කරන ලද ගාස්තු කවරේද;

(iv) නියමිත පරිදි ලියාපදිංචි කර තිබූ එම වෙබ් අඩවිය පවත්වාගෙන ගිය ස්ථානය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් පරීක්ෂාවට ලක් කර, එහි තිබූ පරිගණක ඔවුන්ගේ භාරයට ගෙන තිබේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ඉහත ක්‍රියා කලාපයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කළ මූලික අයිතිවාසිකම් නඩු දෙකට අදාළව ලබා දී ඇති තීන්දුවකට අනුව, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාරයට ගත් පරිගණක ශ්‍රී ලංකා මිරර් ආයතනයට ආපසු භාර දී තිබේද;

(ii) අමාත්‍යාංශයේ ලියාපදිංචි පුවත් වෙබ් අඩවියකට අන්තර්ජාල පහසුකම් සපයන ආයතනවල සේවා අඩාළ වීම නිරන්තරවම සිදු වන්නේ නම්, අමාත්‍යාංශයට ගත හැකි ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

வெகுசன ஊடக, பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஸ்ரீ லங்கா மிரர் (Sri Lanka Mirror) எனப்படும் இணையத்தளம் அப்போதைய வெகுசன ஊடக, தகவல் அமைச்சில் பதிவுசெய்யப்பட்டிருந்ததா என்பதையும்;

(ii) ஆமெனில், அத்திகதி யாதென்பதையும்;

(iii) மேற்படி பதிவுக்காக அறவிடப்பட்ட கட்டணம் யாதென்பதையும்;

(iv) உரியவாறு பதிவுசெய்யப்பட்ட மேற்படி இணையத்தளத்தைக் கொண்டுநடத்தும் இடத்தை குற்றப்புலனாய்வுத் திணைக்களத்தின் உத்தியோகத்தர்கள் பரிசோதனைக்குள்ளாக்கி அங்கிருந்த கணினிகளை அவர்களது பொறுப் பின்கீழ் கொண்டுவந்தார்களா என்பதையும்

(v) ஆமெனில், அத்தேதி யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) குற்றப்புலனாய்வுத் திணைக்களத்தின் உத்தியோகத்தர்களது மேற்படி நடவடிக்கைக்கு எதிராக உயர்நீதிமன்றத்தில் தாக்கல் செய்யப் பட்ட 2 அடிப்படை மனித உரிமைகள் வழக்கு களுக்கு ஏற்புடையதாக வழங்கப்பட்டுள்ள தீர்மானத்தின்படி, குற்றப் புலனாய்வுத் திணைக் களத்தின் பொறுப்பின்கீழ் கொண்டுவரப்பட்ட கணினிகள் மீண்டும் ஸ்ரீ லங்கா மிரர் நிறுவனத் திற்கு கையளிக்கப்பட்டதா என்பதையும்;

(ii) அமைச்சில் பதிவுசெய்யப்பட்டுள்ள ஒரு செய்தி இணையத்தளத்திற்கு ஏற்புடையதாக இணைய வசதிகளை வழங்கும் நிறுவனங்களின் சேவை தொடர்ச்சியாகவே தடைப்படுமெனில் அந்த அமைச்சினால் மேற்கொள்ளக்கூடிய நடவடிக் கைகள் யாவையென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Mass Media and Parliamentary Affairs:

(a) Will he state -

(i) whether the website named Sri Lanka Mirror had been registered at the Ministry of Mass Media and Information;

(ii) if so, the date on which it was done;

(iii) the fee charged for the aforesaid registration;

(iv) whether the premises used to maintain the aforesaid website which was duly registered, was inspected by the officers of the Department of Criminal Investigation and the computers in the aforesaid premises were taken into their custody; and

(v) if so, the date on which it was done?

(b) Will he inform this House -

(i) whether the computers that were taken into custody of the Department of Criminal Investigation have been returned to Sri Lanka Mirror following a determination given pertaining to the two Fundamental Rights cases that were filed at the Supreme Court against the aforesaid conduct of the officers of the Department of Criminal Investigation; and

(ii) the action that can be taken by the Ministry if there are constant break-downs in the provision of internet facilities by service providers to a news website that is registered at the Ministry?

(c) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - வெகுசன ஊடக, பாராளுமன்ற அலுவல்கள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Mass Media and Parliamentary Affairs and Chief Government Whip)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2012 වසරේදී මෙම වෙබ් අඩවිය ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ ලියා පදිංචි කර ඇත.

(ii) ප්‍රථම ලියා පදිංචිය 2012.01.12 සිදු කර ඇත.

(iii) ප්‍රවෘත්ති වෙබ් අඩවි සඳහා ප්‍රථම ලියා පදිංචි ගාස්තුව වශයෙන් රුපියල් 25,000ක මුදලක් හා වාර්ෂිකව අලුත් කිරීමේ ගාස්තුව රුපියල් 10,000ක් ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය මඟින් අය කරනු ලැබේ. ඒ අනුව ඉහත ශ්‍රී ලංකා මිරර් වෙබ් අඩවිය සඳහා ලියා පදිංචි ගාස්තු රුපියල් 25,000ක් අය කර ඇත.

(iv) නොදනී.

(v) පැන නොනඟී.

(ආ) (i) නොදනී.

(ii) ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය ප්‍රවෘත්ති වෙබ් අඩවිවල ලියා පදිංචිය පමණක් සිදු කරන අතර, තාක්ෂණික කටයුතුවලට මැදිහත්වීමක් සිදු නොකෙරේ.

(ඇ) අදාළ නොවේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමාම පිළිගන්නවා මේ වෙබ් අඩවිය ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ ලියා පදිංචි කර තිබෙනවාය කියලා. ඇත්තටම මේක ලියා පදිංචි කෙරෙන්නේ වෙබ් අඩවියක් හැටියට විතරක් නොවෙයි, ප්‍රවෘත්ති සපයන වෙබ් අඩවියක් හැටියටයි. ඒ නිසා නේ, ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවත්, ජනමාධ්‍ය අමාත්‍යාංශයත් ඒක පිළිගන්නේ.

ගරු ඇමතිතුමනි, මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කරමින් "නියමිත පරිදි ලියා පදිංචි කර තිබූ එම වෙබ් අඩවිය පවත්වා ගෙන ගිය ස්ථානයට CID එක ගිහින් පරීක්ෂා කිරීම් කර තිබෙන බවත්, එම ස්ථානයේ තිබුණු පරිගණක ඔවුන්ගේ භාරයට ගෙන තිබේද; සහ ඒ පරීක්ෂා කිරීම්වලට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කළ මූලික අයිතිවාසිකම් නඩු දෙකකට අදාළව ලබා දී ඇති තීන්දුව ගැනත් අසා තිබෙනවා. ඒවාට "නොදනී" කියලා ඔබතුමා උත්තර දෙන එක මට ගැටලුවක්. මොකද, ඔබතුමාගේ අමාත්‍යාංශයේ නිලධාරින්ගේ වගකීම තමයි, එවැනි කටයුත්තක් සිද්ධ වෙලා තිබෙනවාද කියන එක ගැන සොයා බැලීම. සොයා බලා ගන්න නේ මමත් මේ ප්‍රශ්නය අහන්නේ, ගරු ඇමතිතුමනි. පසු ගිය කාලයේ ජනමාධ්‍යවලට එල්ල වුණු මරු පහරවල් තමයි මේවා. මා හිතන හැටියට ඔබතුමාට ලැබී තිබෙන්නේ පරණ ආණ්ඩුව ආරක්ෂා කරන උත්තරයි. කරුණාකර මේ ගැන නැවත සොයන්න කියා මා ඉල්ලා සිටිනවා. ඔබතුමා මේ ගැන සොයනවාද? "නොදනී." කියන උත්තරය පිළිගන්න බැහැ නේ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඔබතුමාට ඒ පිළිබඳව තවත් සවිස්තර වාර්තා ඕනෑ නම්, සවිස්තර වාර්තාවක් පසුව සපයන්නම්.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
වැරැදි ආදර්ශයක්.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
සියලුම දේවල් සොයා බලා ඔබතුමාට ඒ පිළිබඳව තවත් සවිස්තර වාර්තා ඉදිරිපත් කරන්න අපි ලෑස්තියි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ ප්‍රශ්නය නැවත පාර්ලිමේන්තුවට යොමු කරන්න කියලා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඒ වාගේම ඔබතුමා ඇහුවා, බාධා කිරීම් සිදු වීම පිළිබඳව. පසු ගිය කාලයේ දී එවැනි කටයුතු සිද්ධ වුණා අපිත් දැක්කා. අපි වග කීමෙන් කියනවා, මින් ඉදිරියට එවැනි දේවල් සිදු වන්නේ නැති බව. එවැනි දේවල් සිද්ධ වන බව අපි දැක්කා.

මේ පිළිබඳව සවිස්තරාත්මක පිළිතුරක් මා සති දෙකකින් ලබා දීමට බලාපොරොත්තු වෙනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
බොහොම ස්තුතියි.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

දක්ෂිණ අධිවේගී මාර්ගය : පිවිසුම් ස්ථානය
தெற்கு அதிவேகப் பாதை : நுழைவிடம்
SOUTHERN EXPRESSWAY : ENTRY POINT

4265/'13

14. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) දක්ෂිණ අධිවේගී මාර්ගය මාතර, ගොඩගම සිට හම්බන්තොට, මත්තල දක්වා දීර්ඝ කිරීමට කටයුතු කරන බවත්;

(ii) තිහගොඩ, කිරින්ද සහ දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට ආසන්නම දක්ෂිණ අධිවේගී මාර්ගයට පිවිසුම් ස්ථානය ලෙස අපරැක්ක මාර්ගය යෝජනා කර මිනුම් කටයුතු පවා සිදු කර ඇති බවත්;

[ගරු බුද්ධික පතිරණ මහතා]

(iii) යෝජිත අපරැක්ක පිවිසුම් මාර්ගය වෙනස් කර එය කිරින්ද-පුහුල්වැල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ, වලකන්ද ප්‍රදේශයට ගෙන යාමට සැලසුම් කර ඇති බවත්;

(iv) පිවිසුම් මාර්ගය ඉහත (iii) හි සඳහන් පරිදි වෙනස් කිරීමකට ලක් වුවහොත් වැඩි ජන කොටසකට ප්‍රතිලාභ ලැබීමට ඇති අවස්ථාව අහිමි වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, දක්ෂිණ අධිවේගී මාර්ගයට පිවිසුම් ස්ථානය ඉහත අ(iii)හි සඳහන් පරිදි වෙනස් නොකිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

நெடுஞ்சாலைகள், உயர் கல்வி மற்றும் முதலீட்டு ஊக்குவிப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தெற்கு அதிவேகப் பாதையை மாத்தறை, கொடகம தொடக்கம் அம்பாந்தோட்டை, மத்தல வரை நீடிப்பதற்கு நடவடிக்கை மேற்கொள்ளப் படுகின்றதென்பதையும்;

(ii) திஹகொடை, கிரிந்த மற்றும் தெவிநுவர பிரதேச செயலாளர் பிரிவுகளுக்கு மிகவும் அண்மித்த தான தெற்கு அதிவேகப் பாதைக்கு நுழை விடமாக அப்பரெக்க வீதியை முன்மொழிந்து அளவை நடவடிக்கைகள்கூட மேற்கொள்ளப் பட்டுள்ளன என்பதையும்;

(iii) உத்தேசிக்கப்பட்ட அப்பரெக்க நுழைவுப் பாதையை மாற்றி அதனை கிரிந்த புஹுல் வெல்ல பிரதேச செயலாளர் பிரிவின் வலகந்த பிரதேசத்திற்கு கொண்டு செல்வதற்கு திட்ட மிடப்பட்டுள்ளது என்பதையும்;

(iv) நுழைவுப்பாதையானது மேற்படி (iii) இல் குறிப்பிடப்பட்டுள்ளவாறு மாற்றத்திற்கு உள் ளாக்கப்படுமெனில் அதிகளவிலான மக்களுக்கு அனுகூலங்கள் கிடைப்பதற்குள்ள வாய்ப்பு குறைவடையும் என்பதையும்

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) ஆமெனில், தெற்கு அதிவேகப் பாதைக்கான நுழை விடத்தை மேற்படி அ (iii) இல் குறிப்பிடப்பட்டுள்ள வாறு மாற்றியமைக்காதிருக்க நடவடிக்கை எடுப்பாரா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Highways, Higher Education and Investment Promotion:

(a) Will he admit that -

(i) arrangements are being made to extend the Southern Expressway to Mattala in Hambantota via Godagama, Matara;

(ii) the Aparekka road had been proposed as the closest entry point to the Southern Expressway from the Divisional Secretary's Divisions of Thihagoda, Kirinda and Dondra and surveying has also been conducted already;

(iii) a move has been made to change the proposed Aparekka entry point and shift the entry point to Walakanda in the Kirinda--Puhulwella Divisional Secretary's Division; and

(iv) if the entry point is subjected to a change as mentioned in (iii) above, the opportunity to give benefits to a wider population will be lost?

(b) lf so, will he inform this House whether he will ensure that the entry point to the Southern Expressway will not be changed as stated in (a) (iii) above?

(c) If not, why?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நெடுஞ்சாலைகள், உயர்கல்வி மற்றும் முதலீட்டு ஊக்குவிப்பு பிரதி அமைச்சர்)

(The Hon. Eran Wickramaratne - Deputy Minister of Highways, Higher Education and Investment Promotion)

ගරු කථානායකතුමනි, මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය, මාතර සිට හම්බන්තොට දක්වා දීර්ඝ කිරීම සඳහා කටයුතු කරමින් පවතී. ඒ සඳහා වන ඉඩම් අත්පත් කර ගැනීම්, සැලසුම් සැකසීම හා ඊට අදාළ අධ්‍යයන කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. මාතර - බෙලිඅත්ත කොටස කර ගෙන යනවා. ඉතිරි කොටස පිළිබඳව අපි නැවත සොයා බලනවා.

(ii) අධිවේගී මාර්ගය ඉදි කිරීමට ඉඩම් අත්කර ගැනීමේ කටයුතු සඳහා මැනුම් කටයුතු සිදු කර මායිම් සලකුණු කර ඇත.

(iii) ව්‍යාපෘතිය සඳහා මූලික ශක්‍යතා අධ්‍යයනය සිදු කරන අවස්ථාවේදී අපරැක්ක මෙන්ම දන්දෙනිය ප්‍රදේශයද අන්තර් හුවමාරුව ස්ථානගත කිරීම සඳහා විකල්පයක් ලෙස පරීක්ෂා කරන ලදී. තාක්ෂණික හා පිරිවැය සම්බන්ධ කරුණු හේතුවෙන් අවසානයේ එම අන්තර් හුවමාරුවේ පිහිටීම වලකන්ද වෙත ගෙන යාම සඳහා නිර්දේශ විය. එබැවින් ශක්‍යතා වාර්තාව අනුව අපරැක්ක ස්ථානය අන්තර් හුවමාරුවකට යෝජනා වී නොමැත.

(iv) අන්තර් හුවමාරුව වලකන්ද ප්‍රදේශයේ ස්ථානගත කිරීම සඳහා නිර්දේශ කර තිබුණද අපරැක්ක ප්‍රදේශයේ ජනතාවට අධිවේගී මාර්ගයට පිවිසීමේ පහසුකම් ලබා දීම සඳහා හිඟුරුපත්වල සිට දන්දෙනිය මාර්ගය හා රදම්පල සිට මුරුතගස්පිටිය හරහා කිරින්ද මාර්ගය සංවර්ධනය කර වලකන්ද හුවමාරුව වෙත සම්බන්ධ කිරීමට දැනටමත් යෝජනා කර ඇත.

(ආ) (අ) (iii) සඳහන් කර ඇති අධ්‍යයනයෙහි ප්‍රතිඵල අනුව වලකන්ද අන්තර් හුවමාරුව යෝජනා කර ඇති බැවින්, එය අපරැක්ක ප්‍රදේශයට ගෙන යාමේ අවශ්‍යතාවක් පැන නොනඟී.

(ඇ) පැන නොනඟී.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ විස්තරාත්මක පිළිතුරු දීම ගැන මම සතුටු වනවා. මුලින්ම සාකච්ඡා කරලා අපරැක්ක ප්‍රදේශයට යෝජනා වී තිබුණු අන්තර් හුවමාරු ස්ථානය තමයි වලකන්දට ගෙන ගියේ. මේවා ශක්‍යතා අධ්‍යයනයේ නාමයෙන් ගත්ත දේශපාලන තීන්දු. අමාත්‍යාංශයේ නිලධාරීන් හදලා දෙන උත්තරය ඔබතුමාට කියවන්නට සිදු වෙනවා. ඒකට ප්‍රශ්නයක් නැහැ. නමුත් මේ ගැන සොයා බලා කටයුතු කරන්න කියලා, මා ඔබතුමාට කියනවා. ඇත්තටම ඔය සමහර නිලධාරීන්ම නේ එදත් හිටියේ. ටයි පටිය විතරයි වෙනස් වෙලා තිබෙන්නේ. මේ ගත්ත තීන්දුවේ ඇත්තටම ගැඹුරු විද්‍යාත්මක යථාර්ථයක් තිබෙනවාද, නැද්ද කියලා ඔබතුමා සොයා බලනවාද?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ටයි පටියවත් වෙනස් වෙලා නැහැ. ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේම මාතර සිට බෙලිඅත්ත දක්වා ප්‍රධාන අධිවේගී මාර්ගයේ කොටසක වැඩ කටයුතු කරගෙන යනවා. ඒ වාගේම එතැන සිට ඉතිරි කොටස ගැනත් සොයා බලනවා. ඔබතුමා කියනවා නම් මේ ශ්‍යාක්‍යතා වාර්තාව දේශපාලන කරුණු උඩ තීරණය වුණා කියලා, අනිවාර්යයෙන්ම ඒ ගැනත් සොයලා බලනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. දක්ෂිණ අධිවේගී මාර්ගයේ හම්බන්තොට සිට මත්තල ගුවන් තොටුපළ දක්වා වන දිගුවේ පළමුවෙනි අදියර නිමා කරන්නට කලින් සැලසුම් කරලා තිබුණු දින වකවානු අනුව ඒ කටයුතු කරන එකද අමාත්‍යාංශයේ අපේක්ෂාව?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ඒකට මට පිළිතුරක් දෙන්නට බැහැ. මොකද, ඔබතුමා දන්නවා මේවා පිළිබඳව හුඟක් චෝදනා තිබෙන බව. මේවා ගැන හොයා බලන මේ අවස්ථාවේදී ඒ කටයුතු ඒ දිනවලටම සිදුවෙයි ද නැද්ද කියලා ස්ථිර ලෙසම කියන්න අපහසුයි.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ඔබතුමා ඒ ගත්ත තීන්දුව ගැන අපිට සතුටුයි. මොකද ඒක තමයි මට දැන ගන්නට වුවමනා වුණේ.

මගේ තුන්වෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ අධිවේගී මාර්ගයට පසු ගිය වකවානුවේ ඇස්තමේන්තුගත වුණු මුදල් පිළිබඳව අපට බරපතළ ප්‍රශ්න තිබුණා. ඇත්තටම ජාත්‍යන්තර පූර්වාදර්ශත් එක්ක බැලුවාම කිලෝමීටරයකට වියදම් කරන මුදල පිළිබඳව ප්‍රශ්න තිබුණා. මේ මුදලෙන් තුනෙන් එකකින් මේක කරන්න පුළුවන්ද කියලා අපිට ප්‍රශ්න තිබුණා. පාරිසරික පද්ධතියක් හරහා මේ මාර්ගය යන්නේ. ගරු ඩිව් ගුණසේකර ඇමතිතුමාත් දන්නවා, ගරු කථානායකතුමාත් දන්නවා, මේ අධිවේගී මාර්ගය යන්නේ කුඹුරු යායවල් මැද්දෙන් කියලා. නිල්වලා ගං මිටියාවතේ ඉන්නේ නිල්වලා යෝජනා ක්‍රමයෙන් බැට කාපු මිනිස්සු. ඒ නිසා මේ සම්බන්ධයෙන් සිදු කරන විමසුම මොකක්ද?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ඔබතුමා කියපු මේ කොටස ගැන විතරක් නොවෙයි, මේ අධිවේගී මාර්ගවල වියදම ගැනත් විශාල ප්‍රශ්න තිබෙනවා. මොකද, තරගකාරී පටිපාටියෙන් පිට තමයි මේවා කරලා තිබෙන්නේ. ඒ නිසා අපි දැනටම කරගෙන යන සමහර අධිවේගී මාර්ගත්, ඒ වාගේම මාර්ගත් අපි ඒ විධියටම කර ගෙන යනවා. මොකද දූෂණය පිළිබඳව තිබෙන ප්‍රශ්නයයි, සංවර්ධනය පිළිබඳව තිබෙන ප්‍රශ්නයයි අපි වෙන වෙනම හඳුනා ගෙන තිබෙනවා. [බාධා කිරීමක්]

මා කලිනුත් කිව්වා වාගේ කොටසින් කොටසයි අප සලකා බලන්න ඕනෑ. ඔබතුමා ඒ කාරණය මතු කරපු නිසා ඒ කොටස ගැන විශේෂයෙන් සොයා බලන්නම්.

ජනාධිපති අරමුදල : විස්තර
சனாதிபதி நிதியம்: விபரம்
PRESIDENT'S FUND: DETAILS

3713/'13

1. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (ගරු අනුර දිසානායක මහතා වෙනුවට)
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - மாண்புமிகு அநுர திஸாநாயக்க சார்பாக)
(The Hon. Sunil Handunnetti on behalf of the Hon. Anura Dissanayake)

අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (5):

(අ) (i) 2010, 2011 සහ 2012 වර්ෂවලදී ජනාධිපති අරමුදලට ලැබුණු මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එම මුදල් සම්පාදනය කරගත් ආකාරය කවරේද;

යන්න වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ජනාධිපති අරමුදලින් පසු ගිය වර්ෂ දෙක තුළ දී වැය කරනු ලැබූ සමස්ත මුදල;

(ii) එක් එක් ක්ෂේත්‍රය අනුව වැය කළ මුදල;

කොපමණද යන්නත් වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ජනාධිපති අරමුදලින් වෛද්‍ය ප්‍රතිකාර සඳහා ආධාර ලබා දීම සඳහා පුද්ගලයන් තෝරා ගැනීම සිදු කරන පදනම කවරේද;

(ii) පසු ගිය වර්ෂ 03ක කාලය තුළ ප්‍රාදේශීය සභා, පළාත් සභා සහ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරුන් වෙනුවෙන් වෛද්‍ය ප්‍රතිකාර සඳහා ජනාධිපති අරමුදලින් ආධාර ලබා දී තිබේද;

(iii) එසේ නම්, ඔවුන්ගේ නම් සහ එක් එක් තැනැත්තාට ලබා දුන් මුදල් ප්‍රමාණය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

பிரதம அமைச்சரும் கொள்கை உருவாக்கம், பொருளாதார அலுவல்கள், சிறுவர், இளைஞர் மற்றும் கலாசார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2010, 2011 மற்றும் 2012 ஆம் ஆண்டுகளில் சனாதிபதி நிதியத்திற்குக் கிடைத்துள்ள நிதி எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி நிதி பெற்றுக் கொள்ளப்பட்ட முறை யாது என்பதையும்

வருடாந்த அடிப்படையில் தனித்தனியாக அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) சனாதிபதி நிதியத்தினால் கடந்த இரண்டு வருட காலப்பகுதியில் செலவிடப்பட்டுள்ள மொத்தப் பணத் தொகை எவ்வளவு என்பதையும்;

(ii) ஒவ்வொரு துறை ரீதியாக செலவிடப்பட்ட பணத் தொகை எவ்வளவு என்பதையும்

வருடாந்த அடிப்படையில் தனித்தனியாக அவர் குறிப்பிடுவாரா?

(இ) (i) சனாதிபதி நிதியத்தினால் மருத்துவ சிகிச்சை களுக்கு உதவி வழங்குவதற்காக ஆட்களைத் தெரிவு செய்கின்ற அடிப்படை யாது என்பதையும்;

(ii) கடந்த 03 வருட காலப்பகுதிக்குள் பிரதேச சபைகள், மாகாண சபைகள் மற்றும் பாராளு மன்றத்தைப் பிரதிநிதித்துவம் செய்கின்ற உறுப்பினர்களுக்காக மருத்துவ சிகிச்சைகளுக்கு சனாதிபதி நிதியத்திலிருந்து உதவி வழங்கப் பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், அவர்களின் பெயர்கள் மற்றும் ஒவ்வொருவருக்கும் வழங்கப்பட்டுள்ள பணத் தொகைகள் எவ்வளவு என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Policy Planning, Economic Affairs, Child, Youth and Cultural Affairs:

(a) Will he state separately, in each year -

(i) the amount of money received by the President's Fund in the years 2010, 2011 and 2012; and

(ii) the funding sources of that amount?

(b) Will he also state separately, in each year -

(i) the total amount of money spent by the President's Fund during the last two years; and

(ii) the breakdown of that expenditure on each sector?

(c) Will he inform this House -

(i) the basis on which people are selected for providing aid for medical treatment from the President Fund;

(ii) whether aids have been provided from the President's Fund for medical treatment to members of Pradeshiya Sabhas, Provincial Councils and the Members of Parliament during the period of last 03 years; and

(iii) if so, of their names and the amount of money provided to each person?

(d) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

වර්ෂය	සමස්ත ආදායම (රු.)
2010	1,135,962,451.35
2011	1,646,496,088.79
2012	1,863,699,012.78

(ii)

වර්ෂය	2010	2011	2012
සංවර්ධන ලොතරැයි මණ්ඩලය මගින්	969,473,122.00	1,376,035,051.00	1,648,471,001.00
පොලී ආදායම	129,836,475.42	112,754,910.99	155,469,134.38
පරිත්‍යාග වශයෙන්	36,580,919.65	157,706,126.80	59,758,877.40
විවිධ ලැබීම්	71,934.28	-	-
එකතුව	**1,135,962,451.35**	**1,646,496,088.79**	**1,863,699,012.78**

(ආ) (i)

වර්ෂය	සමස්ත වියදම (රු.)
2011	1,522,326,318.86
2012	1,713,863,623.15

(ii) එක් එක් ක්ෂේත්‍රය අනුව වැය කළ මුදල

කාණ්ඩය	2011	2012	මුළු එකතුව (රු. මි.)
වෛද්‍ය ආධාර	815,814,245.79	857,641,804.65	1,673,456,050.44
මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල සඳහා ලබා දී ඇති මුදල	600,866,585.50	734,128,030.50	1,334,994,616.00
ශිෂ්‍යත්ව ආධාර	96,266,987.57	102,447,038.00	198,714,025.57
අධ්‍යාපන සංවර්ධන කටයුතු සඳහා ආධාර	2,000,000.00	10,200,000.00	12,200,000.00

සංස්කෘතික කටයුතු සඳහා ආධාර	1,260,000.00	7,385,000.00	8,645,000.00
ආගමික කටයුතු සඳහා ආධාර	3,150,000.00	650,000.00	3,800,000.00
විශේෂ ව්‍යාපෘති සඳහා ආධාර	2,000,000.00	800,000.00	2,800,000.00
සුබසාධන හා වෙනත් කටයුතු සඳහා ආධාර	968,500.00	611,750.00	1,580,250.00
එකතුව	**1,522,326,318.86**	**1,713,863,623.15**	**3,236,189,942.01**

(ඇ) (i) වෛද්‍ය ආධාර ලබාගැනීමට පහත සඳහන් ලියකියවිලි අවශ්‍ය වේ.

* විශේෂඥ වෛද්‍යවරයාගේ ලිපිය (මුල් පිටපත)
* වියදම් ඇස්තමේන්තුව (මුල් පිටපත)
* රෝගියාගේ හෝ ඉල්ලුම්කරුගේ ලිඛිත ඉල්ලීමක්

එමෙන්ම මෙම ලියකියවිලි ඉදිරිපත් කර ඇති රෝගීන් අතුරින්, පහත සුදුසුකම් සපුරාලන පුද්ගලයෝ ජනාධිපති අරමුදලින් වෛද්‍ය ප්‍රතිකාර සඳහා ආධාර ලැබීමට සුදුසුකම් ලබති.

* ප්‍රතිකාර සඳහා ප්‍රමාණවත් මුදලක් නොමැති
* ආදායම් බදු නොගෙවන
* පවුලේ මාසික ආදායම ර.70,000/= සීමාව නො ඉක්මවූ
* සැත්කම හෝ ප්‍රතිකාර සඳහා වූ ඇස්තමේන්තුවෙන් සියයට 50 හෝ ඊට වැඩි මුදලක් රක්ෂණ ක්‍රමයකින් හෝ වෙනත් ආකාරයකින් නොලැබෙන
* ජාතික රක්ෂණ භාරකාර අරමුදලින් ප්‍රතිලාභ නොලබන
* ජනාධිපති අරමුදලින් ඉල්ලීමක් කිරීමට පෙර සැත්කමක් / ප්‍රතිකාර කිරීමට සිදු වූයේ නම් රෝගියා රෝහලෙන් පිට වී ගොස් සතියේ වැඩ කරන දින 5ක් ඇතුළත ඉල්ලීම ඉදිරිපත් කළ.

(ii) ඔව්.

(iii) ඔව්.

වර්ෂය	නම	තනතුර	ලබා දුන් මුදල
2010	ගරු පී. පොඩිඅප්පුහාමි මැතිතුමා	ප්‍රාදේශීය සභා මන්ත්‍රී	250,000.00
	ගරු අශෝක ජයවර්ධන මැතිතුමා	පළාත් සභා මන්ත්‍රී	300,000.00
	ගරු සරණපාල විජේසිංහ මැතිතුමා	පාර්ලිමේන්තු මන්ත්‍රී	358,000.00
			908,000.00

වර්ෂය	නම	තනතුර	ලබා දුන් මුදල
2011	ගරු මනෝජ් සිරිසේන මැතිතුමා	පළාත් සභා මන්ත්‍රී	300,000.00
	ගරු පී. හැරිසන් මැතිතුමා	පාර්ලිමේන්තු මන්ත්‍රී	250,000.00
	ගරු ආර්.ඒ. ටියුඩර් දයාරත්න මැතිතුමා	පාර්ලිමේන්තු මන්ත්‍රී	300,000.00
			850,000.00

වර්ෂය	නම	තනතුර	ලබා දුන් මුදල
2012	ගරු ආර්. ධම්මික අංගම්මන මැතිතුමා	පළාත් සභා මන්ත්‍රී	500,000.00
	ගරු කේ.ආර්. මහින්ද මැතිතුමා	පළාත් සභා මන්ත්‍රී	541,443.85
	ගරු අයි.කේ. මහින්ද රත්නතිලක මැතිතුමා	පාර්ලිමේන්තු මන්ත්‍රී	1,000,000.00
	ගරු ඩී.ඒ. ආරියනන්ද මැතිතුමා	පාර්ලිමේන්තු මන්ත්‍රී	250,000.00
	ගරු ඒ.එම්.ජේ.එම්. අධිකාරී මැතිතුමා	පාර්ලිමේන්තු මන්ත්‍රී	150,000.00
	ගරු එච්.ඩබ්ලිව්. ගුණසේකර මැතිතුමා	පාර්ලිමේන්තු මන්ත්‍රී	500,000.00
	ගරු ජයලත් ජයවර්ධන මැතිතුමා	පාර්ලිමේන්තු මන්ත්‍රී	1,000,000.00
	ගරු කෙහෙළිය රඹුක්වැල්ල මැතිතුමා*	පාර්ලිමේන්තු මන්ත්‍රී හා ගරු ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍ය	10,908,798.40
	ගරු ඩී.එම්. ජයරත්න මැතිතුමා	ගරු අග්‍රාමාත්‍ය	29,298,926.09
එකතුව			44,149,168.34

* මෙම මුදල කොටස් වශයෙන් ආපසු ගෙවීමට එතුමා එකඟ වී ඇත.

(ඇ) පැන නොනඟී.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 3-4769/'14-(2), ගරු අශෝක් අබේසිංහ මහතා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, ගරු අශෝක් අබේසිංහ මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු අබ්දුල් හලීම් මහතා
(மாண்புமிகு அப்துல் ஹலீம்)
(The Hon. Abdul Haleem)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය : විස්තර
நுரைச்சோலை அனல் மின் நிலையம் : விபரம்
NORACHCHOLAI THERMAL POWER PLANT: DETAILS

4845/'14

4. ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා - (ගරු අජිත් මාන්නප්පෙරුම මහතා වෙනුවට)
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ - மாண்புமிகு அஜித் மான்னப்பெரும சார்பாக)
(The Hon. Nalin Bandara Jayamaha on behalf of the Hon. Ajith Mannapperuma)
විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය ප්‍රමිතියෙන් තොර බලාගාරයක් බව විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ප්‍රකාශ කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) එම බලාගාරයේ,

(i) පළමුවන අදියර වෙනුවෙන් ඇස්තමේන්තුගත මුදල හා වැය කළ මුදල කොපමණද;

(ii) ප්‍රමිතිය, උපකරණ හා ක්‍රියාකාරි තත්ත්වය සම්බන්ධයෙන් අදාළ ඉදි කිරීම් සමාගම සමග

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

වගකීම් කාලයක් සහිත ගිවිසුමකට එළැඹ සිටියේද;

(iii) ප්‍රමිතියෙන් තොර තත්ත්වය හා සිදු වන අක්‍රිය වීම් සම්බන්ධයෙන් බලාගාරය ඉදි කළ සමාගමට එරෙහිව ගත් ක්‍රියා මාර්ග කවරේද;

(iv) අලුත්වැඩියාවලට සහ එම කාලය තුළ අහිමි වූ විදුලි බලය ලබා ගැනීමට වැය වූ අතිවිශාල මුදල ඊට වගකිව යුත්තන්ගෙන් අය කර ගැනීමට කටයුතු කරන්නේද;

(v) පළමුවැනි අදියර නිසි පරිදි ඉදි නොකළ සමාගම විසින්ම එහි ඊළඟ අදියරයන් ද ඉදි කරනු ලබන්නේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉදිරියේදී මහ ජනතාවට ප්‍රතිලාභ ලබා දිය හැකි වන පරිදි විදුලිය නිපදවීමට සැලසුම් කර තිබේද;

(ii) විදුලි බිල අඩු වීමට හේතු වන එම සැලසුම දින වකවානු සහිතව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

மின்வலு, எரிசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) நுரைச்சோலை அனல்மின் நிலையம் தரமற்ற மின் நிலையமென மின்வலு, எரிசக்தி அமைச்சின் செயலாளர் கூறியுள்ளாரென்பதை அவர் ஏற்றுக் கொள்வாரா?

(ஆ) மேற்படி மின்நிலையத்தின்,

(i) முதலாம் கட்டத்திற்காக மதிப்பிடப்பட்ட பணத் தொகை மற்றும் செலவிடப்பட்ட பணத் தொகை எவ்வளவு;

(ii) தரம், உபகரணங்கள் மற்றும் செயற்பாட்டு நிலைமை சம்பந்தமாக ஏற்புடைய நிர்மாணிப்புக் கம்பனியுடன் உத்தரவாதக் காலப்பகுதியுடனான உடன்படிக்கையொன்று மேற்கொள்ளப்பட்டிருந்ததா;

(iii) தரமற்ற நிலைமை மற்றும் இடம்பெறுகின்ற செயலிழப்புக்கள் சம்பந்தமாக மின்நிலையத்தை நிர்மாணித்த கம்பனிக்கு எதிராக மேற்கொண்ட நடவடிக்கைகள் யாவை;

(iv) திருத்தவேலைகளுக்காகவும் அக்காலப்பகுதியில் இழந்த மின்சாரத்தை பெற்றுக் கொள்வதற் காகவும் செலவாகிய பெருந்தொகைப் பணத்தை அதற்குப் பொறுப்புக்கூற வேண்டியவர்களி டமிருந்து அறவிட நடவடிக்கை எடுப்பாரா;

(v) முதலாம் கட்டத்தை சரிவர நிர்மாணிக்காத கம்பனியே அதன் அடுத்த கட்டங்களையும் நிர்மாணிப்பதாயிருப்பின் அதற்கான காரணங்கள் யாவை

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) எதிர்காலத்தில் பொதுமக்களுக்கு நன்மைகளைப் பெற்றுக்கொடுக்கக்கூடிய வகையில் மின் சாரத்தை உற்பத்திசெய்ய திட்டமிடப்படுள்ளதா;

(ii) மின்சாரக் கட்டணப்பட்டியல் குறைவடைய ஏதுவாக அமையக்கூடிய அத்திட்டம் காலவரை யறைகள் சகிதம் யாது

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Energy:

(a) Is he aware that the Secretary to the Ministry of Power and Energy has stated that the Norachcholai Thermal Power Plant is not up to the expected standards?

(b) Will he inform this House in relation to that power plant -

(i) the estimated sum and the sum spent on the first phase;

(ii) whether an agreement with a warranty period of time had been entered into with the relevant construction company with regard to the standard, equipment and operational standard;

(iii) the action taken against the company that constructed the power plant regarding low standards and breakdowns that occur;

(iv) whether arrangements will be made to recover the massive amount of money spent on repairs and the lost power during that period from those who responsible for that; and

(v) if the company which did not complete the first phase properly engages in the construction of the other phases too, the reasons for it?

(c) Will he state -

(i) whether plans have been made to provide electricity to the people in a beneficial manner in future; and

(ii) the plan that seeks to bring down the electricity tariff with the stipulated period of time?

(d) If not, why?

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) වාර්තා වී නොමැත.

(ආ) (i) පළමුවන අදියර ඉදි කිරීම් වෙනුවෙන් සාකච්ඡාමය කොන්ත්‍රාත් මිල ඇමෙරිකානු ඩොලර් මිලියන භාරසිය පනස්පහකි. (ඇ.ඩො. මිලියන 455කි.) පළමුවන අදියර ඉදි කිරීම් වෙනුවෙන් වියදම් කළ සම්පූර්ණ මුදල ඇමෙරිකානු ඩොලර් මිලියන භාරසිය හතළිස් අටකි. (ඇ.ඩො. මිලියන 448කි.)

(ii) ඔව්.

(iii) ඉහත ප්‍රශ්න අංක (ආ)(ii) හි සඳහන් ගිවිසුමට අනුව කොන්ත්‍රාත් සමාගම විසින් වගකීම් දරන කාලය විදුලි බලාගාරය වාණිජ කටයුතු සඳහා පණ ගැන්වූ දින සිට අවුරුදු දෙකකි. එම කාලය තුළ විදුලි බලාගාරය අක්‍රිය වූ අවස්ථාවන්හිදී අදාළ කොන්ත්‍රාත් සමාගම අවශ්‍ය තැන්හිදී අමතර කොටස් ද යොදා සියලු අලුත්වැඩියා කටයුතු අය කිරීමකින් තොරව සිදු කර ඇත. එබැවින් අදාළ සමාගමට එරෙහිව කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නැත.

(iv) අලුත්වැඩියාවන්වලට අදාළ සියලු වියදම් ඉදි කිරීම් කරනු ලැබූ චීන සමාගම විසින් දරා ඇත. අදාළ ජනක යන්ත්‍ර අලුත්වැඩියා කර නැවත පණ ගන්වා විදුලිය ජනනය ආරම්භ කරන තුරු ජනන වියදම අවම වන සේ වෙනත් ජනක යන්ත්‍ර මඟින් විදුලිය ලබාගෙන ඇත.

(v) දෙවැනි අදියර සඳහා ගිවිසුම් අත්සන් කරනු ලැබ ඇත්තේ පළමුවෙනි අදියර අවසන් වීමට පෙර වන අතර, මෙම කාර්යය සඳහා ණය මුදල ලබා දුන් චීන රජය විසින් අදාළ කොන්ත්‍රාත් සමාගම නිර්දේශ කර ඇත.

(ඇ) (i) ඔව්.

(ii) මේ වන විටත් සැලකිය යුතු ප්‍රමාණයකින් විදුලිය බිල අඩු කර ඇත. (2014.09.16 සිට)

තවද ලංකා විදුලිබල මණ්ඩලය විසින් සෑම දෙවසරකටම වරක් ඉදිරි වර්ෂ 20ක් සඳහා වන දීර්ඝ කාලීන අඩු වියදම් ජනක සැලසුම් වාර්තාවක් පිළියෙල කරනු ලබයි. මේ වන විට 2013-2032 කාලය සඳහා සකස් කරන ලද වාර්තාව (Long Term Generation Expansion Plan, 2013-2032) මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කොට මහජන අදහස් විමසීමෙන් පසු සියලු සංශෝධන සමඟින් එළි දක්වා ඇත. අදාළ සැලසුම් නිසි පරිදි ක්‍රියාත්මක කිරීමෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා දිය හැක. ජනක සැලසුමේ සාරාංශය සඳහන් එම වාර්තාවේ පිටු අංක A11-1 හි පිටපතක් ඇමුණුම* ලෙස ඉදිරිපත් කරමි.

(ඈ) පැන නොනඟී.

Annex

Results of Generation Expansion Planning Studies

Revised Base Case 2012

Table Ad.1 Revised Base Case Plan

YEAR	RENEWABLE ADDITIONS	THERMAL ADDITIONS	THERMAL RETIREMENTS	LOLP %
2013	-	-	4x5 MW ACE Power Matara 4x5 MW ACE Power Horana 4x5.63 MW Lakdanavi	1.821
2014	-	*4x5 MW Northern Power*** *3x8 MW Chunnakum Extension*** *1x300 MW Puttalam Coal (Stage II)*		1.357
2015	-	*1x300 MW Puttalam Coal (Stage II)* 3x75 MW Gas Turbine	6x16.6 MW HeladanaviPuttalam 14x7.11 MW ACE Power Embilipitiya 4x15 MW Colombo Power	1.228
2016	*35 MW Broadlands* *120 MW Uma Oya*	-	-	1.017
2017	-	1x105 MW Gas Turbine	-	1.483
2018	27 MW Moragolla Plant	2x250 MW Trincomalee Coal Power plant	4x5 MW Northern Power 8x6.13 MW Asia Power	0.399
2019	-	2x300 MW Coal plant	5x17 MW Kelanitissa Gas Turbines 4x18 MW Sapugaskanda diesel	0.080
2020	-	-	-	0.247
2021	-	1x300 MW Coal plant	-	0.162
2022	49 MW Gin Ganga ***	1x300 MW Coal plant	-	0.085
2023	-	2x300 MW Coal plant	163 MW AES Kelanitissa Combined Cycle Plant 115 MW Gas Turbine 4x9 MW Sapugaskanda Diesel Ext.	0.045
2024	-	-	-	0.169
2025	-	1x300 MW Coal plant	4x9 MW Sapugaskanda Diesel Ext.	0.162
2026	-	-	-	0.518
2027	-	1x300 MW Coal plant	-	0.466
2028	-	1x300 MW Coal plant	-	0.370
2029	-	-	-	1.078
2030	-	1x300 MW Coal plant	-	1.094

[ගරු පාඨලී චම්පික රණවක මහතා]

2031	-	1x300 MW Coal plant	-	1.140
2032	-	1x300 MW Coal plant	-	1.233
Total PV Cost up to year 2032, US$ 14,049.05 million [LKR 1,600,181.18 million]				

Notes:

- Discount rate 10%, Exchange Rate as an average of January 2012 (US$ 1 = LKR. 113.9)
- All additions/retirements are carried out at the beginning of each year
- Committed plants are shown in Italics. All plant capacities are given in gross values.
- PV cost includes the cost of Projected Committed NCRE, US$ 689.98 million.

** Year of connection to national grid based on the estimated time schedule of Kilinochchi – Chunnakkam Tx line.

*** 49MW Ging ganga Hydro Power Plant is forced in year 2022 considering 4 years for securing approvals and finances, preliminary & detailed design, preparation of Tender Documents, Tendering and 4 years for construction & commission work from year 2014 as water resource distribution of this Project is still not decided by Irrigation Department.

Generation Expansion Plan – 2012 *Page A11 - 1*

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 7-5416/'14-(2), ගරු අජිත් කුමාර මහතා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමා සහ බුද්ධ ශාසන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

එක්සත් ජනපදයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ PATTON BOGGS සමාගම : ගනුදෙනු

அமெரிக்க இலங்கை தூதரகம் மற்றும் PATTON BOGGS கம்பனி : கொடுக்கல் வாங்கல்

SRI LANKAN EMBASSY IN US AND PATTON BOGGS COMPANY: TRANSACTIONS

4467/'13

9. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා - (ගරු අනුර දිසානායක මහතා වෙනුවට)
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - மாண்புமிகு அநுர திஸாநாயக்க சார்பாக)
(The Hon. Sunil Handunnetti on behalf of the Hon. Anura Dissanayake)
විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2010, 2011 හා 2012 යන වර්ෂවලදී එක්සත් ජනපදයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය Patton Boggs නමැති සමාගම සමග ගනුදෙනු කර තිබේද;

(ii) එසේ නම්, එම ගනුදෙනු සිදු වී ඇති දින වකවානු කවරේද;

(iii) එම ගනුදෙනු තුළින් ඉටු කර ගෙන ඇති කාර්යය හෝ කාර්යයන් කවරේද;

(iv) එමගින් ලැබී ඇති ප්‍රයෝජන කවරේද;

(v) එම කටයුතු වෙනුවෙන් කරන ලද ගෙවීම්වල වටිනාකම කොපමණද;

(vi) ඒ සඳහා මුදල් වෙන් කරනු ලැබූ වැය ශීර්ෂය කවරේද;

(vii) එම සමාගම සමග ගිවිසුම්වලට එළැඹ ඇත්නම්, එම ගිවිසුම් සහාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010, 2011 மற்றும் 2012 ஆம் ஆண்டுகளில் ஐக்கிய அமெரிக்காவின் இலங்கை தூதரகம் Patton Boggs எனும் கம்பனியுடன் கொடுக்கல் வாங்கல் மேற்கொண்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி கொடுக்கல் வாங்கல் இடம்பெற்றுள்ள காலப்பகுதி யாதென்பதையும்;

(iii) மேற்படி கொடுக்கல் வாங்கல் மூலமாக நிறைவேற்றப்பட்டுள்ள பணி அல்லது பணிகள் யாவையென்பதையும்;

(iv) அதன் மூலம் கிடைத்துள்ள நன்மைகள் யாவையென்பதையும்;

(v) மேற்படி பணிகளுக்காக மேற்கொள்ளப்பட்டுள்ள கொடுப்பனவுகளின் பெறுமதி யாதென்பதையும்;

(vi) அதற்காக நிதி ஒதுக்கப்பட்ட செலவுத் தலைப்பு யாதென்பதையும்;

(vii) மேற்படி கம்பனிகளுடன் உடன்படிக்கைகள் கைசாத்திடப்பட்டிருப்பின், அந்த உடன்படிக்கைகளை சபையில் சமர்ப்பிப்பாரா என்பதையும்

அவர் இச்சபையில்அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs:

(a) Will he inform this House -

(i) whether the Sri Lankan Embassy in the United States had dealings with the company named "Patton Boggs" in the years 2010, 2011 and 2012;

(ii) if so, the period during which such transactions have taken place;

(iii) the task or tasks accomplished through such transactions;

(iv) the benefits derived from them;

(v) the value of the payments made for the said transactions;

(vi) the expenditure head under which funds were allocated for this purpose; and

(vii) if agreements have been entered into with that company whether such agreements will be tabled?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

සභාමේසය මත තබන ලද පිළිතුර:
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii)

වර්ෂය	ගෙවීම් කළ දිනය
2010	2010.04.30
	2010.10.22
	2010.12.31
2011	2011.03.10
	2011.05.20
	2011.07.28
	2011.11.30
2012	2012.03.20

(iii) Patton Boggs LLP සමාගමට අනුව, ඔවුන් ගිවිසගෙන ඇත්තේ,

1. ශ්‍රී ලංකාව වෙනුවෙන් කොංග්‍රසයේ මිත්‍ර සබඳතා ඇති කර ගැනීමට,

2. කොංග්‍රසයට, ශ්‍රී ලංකාවට එරෙහිව යම් පනත් කෙටුම්පතක් හෝ යෝජනා සම්මුතියක් හෝ ගෙන ඒම වැළැක්වීමට උත්සාහ කිරීමට,

3. සංචාරකයන් සඳහා වන මාර්ගෝපදේශ මාලාවේ ශ්‍රී ලංකාවේ සංචාරය කිරීම සම්බන්ධයෙන් දක්වා ඇති කරුණු ඉවත් කරවා ගැනීමට උපකාර කිරීමට,

4. පුද්ගලයන් නීති විරෝධී ලෙස ප්‍රචාහනය කරන රටවල ලැයිස්තුවෙන් ශ්‍රී ලංකාව ඉවත් කිරීමට උපකාර කිරීමට,

5. ශ්‍රී ලංකාවට පැමිණීමට එක්සත් ජනපද ව්‍යාපාරික නියෝජිත කණ්ඩායමක් සංවිධානය කිරීමට.

(iv) Patton Boggs නිලධාරින් පහත සඳහන් දෑ ඉටු කර තිබෙන බව කියනු ලබයි.

1. ශ්‍රී ලංකාව වෙනුවෙන් එක්සත් ජනපද කොංග්‍රසය තුළ අව්‍යාජ සබඳතා ඇති කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ සංචාරය කිරීම සඳහා එක්සත් ජනපද කොංග්‍රස් නියෝජිතයන්ගෙන් සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩලවලින් සමන්විත නිල නියෝජිත කණ්ඩායම් සංවිධානය කිරීම.

2. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ජාත්‍යන්තර විමර්ශනයක් කැඳවීමේ පනත් කෙටුම්පත් එක්සත් ජනපදයේ කොංග්‍රස් සභාවේ සභාගත වීම වැළැක්වීම.

3. ශ්‍රී ලංකාවට එරෙහිව එක්සත් ජනපදය 2010 වසරේදී පනවා ඇති ශ්‍රී ලංකාවේ සංචාරය කිරීම පිළිබඳ අනතුරු ඇඟවීම රාජ්‍ය දෙපාර්තමේන්තුව ලවා ඉවත් කිරීමට දූත මණ්ඩලය වෙනුවෙන් සාකච්ඡා පැවැත්වීම.

4. එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව විසින් පළ කරන ලද "පුද්ගලයන් නීති විරෝධී ලෙස ප්‍රචාහනය කරන රටවල ලැයිස්තුවෙන්" ශ්‍රී ලංකාව ඉවත් කිරීමට උපකාර කිරීම.

5. 2011 වසරේදී එක්සත් ජනපද වෙළඳ සමාගම්වල ව්‍යාපාරික නියෝජිත කණ්ඩායමකගේ ශ්‍රී ලංකා සංචාරය සංවිධානය කිරීම.

මෙම සියලු කටයුතු වොෂිංටන්හි තානාපති කාර්යාලයේ රාජ්‍ය තාන්ත්‍රික නිලධාරින්ගේ වගකීම්වලට අයත් වන නිසාත්, ඒ මඟින් සැලකිය යුතු තරම් වියදම් ප්‍රමාණයක් ඉතිරි කර ගත හැකි වන නිසාත්, එම නිලධාරින් මෙම කටයුතු ඉටු කළ යුතුව තිබූ බව මගේ හැඟීම බව තවදුරටත් ප්‍රකාශ කිරීමට ද කැමැත්තෙමි.

(v) මෙම අමාත්‍යාංශය විසින් සිදු කරන ලද ගෙවීම් මෙසේය.

2010 - ශ්‍රී ලංකා රුපියල් 35,685,907.63

2011 - ශ්‍රී ලංකා රුපියල් 46,913,476.71

2012 - ශ්‍රී ලංකා රුපියල් 12,992,860.05

(vi) විදේශ කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය

112 - 2 -3 - 0 - 1405 (04)

(vii) ඔව්. ගිවිසුමේ පිටපතක් **අමුණා*** තිබේ.

(ආ) පැන නොනඟී.

ඩෙංගු රෝගය මර්දනය : BTI කීට නාශක යෙදවීම
டெங்கு நோயைக் கட்டுப்படுத்தல் : BTI குடம்பி நாசினிப் பிரயோகம்
ELIMINATION OF DENGUE: USE OF BTI LARVICIDE

4777/'14

10. ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා - (ගරු අශෝක් අබේසිංහ මහතා වෙනුවට)
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ - (மாண்புமிகு அசோக் அபேசிங்க சார்பாக)
(The Hon. Nalin Bandara Jayamaha on behalf of the Hon. Ashok Abeysinghe)

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාව තුළ මැලේරියා රෝගය සම්පූර්ණයෙන් තුරන් කර තිබේද;

(ii) ශ්‍රී ලංකාව තුළ මෑතකදී මැලේරියා රෝගීන් නැවත හඳුනා ගත් බව දන්නේද;

පුස්තකාලයේ තබා ඇත.
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

(iii) ඩෙංගු රෝගය මර්දනය කිරීම සඳහා දේශීයව නිපදවූ BTI කීට නාශක යෙදවීම ආරම්භ කර තිබේද;

(iv) ඩෙංගු මර්දනය කිරීම සඳහා ගෙන්වන ලද විදේශීය BTI කීට නාශක සම්පූර්ණයෙන් බෙදා හැර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதார மற்றும் சுதேச மருத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் மலேரியா நோய் முற்றாக ஒழிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) இலங்கையில் அண்மைக் காலத்தில் மலேரியா நோயாளர்கள் மீண்டும் இனங்காணப் பட்டுள்ளனர் என்பதை அறிவாரா என்பதையும்;

(iii) டெங்கு நோயைக் கட்டுப்படுத்துவதற்காக உள்நாட்டில் உற்பத்தி செய்யப்பட்ட BTI குடம்பி நாசினிப் பிரயோகம் ஆரம்பிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iv) டெங்கு நோயைக் கட்டுப்படுத்துவதற்காக இறக்குமதி செய்யப்பட்ட வெளிநாட்டு BTI குடம்பி நாசினி பூரணமாக விநியோகிக்கப் பட்டுள்ளதா என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Indigenous Medicine:

(a) Will he inform this House -

(i) whether Malaria has been completely eliminated from Sri Lanka;

(ii) whether he is aware that malarial patients have been identified again in Sri Lanka recently;

(iii) whether the use of the BTI larvicide which was locally produced to eliminate dengue, has been started;

(iv) whether the BTI larvicide imported to control dengue has been completely distributed?

(b) If not, why?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதார மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health and Indigenous Medicine)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) 2012 ඔක්තෝබර් මාසයෙන් පසු හඳුනා ගනු ලැබුවේ විදේශයන්හිදී මැලේරියාව වැළඳී මෙරටට පැමිණි පුද්ගලයන් පමණි. මැලේරියා රෝගය බහුලව පවතින රටවල සංචාරය කිරීමෙන් පසු ශ්‍රී ලංකාවට පැමිණෙන දේශීය හා විදේශීය සංචාරකයන්ගෙන් මැලේරියා රෝගය තවදුරටත් වාර්තා වේ. ඒ අනුව සංචාරකයන් හරහා රට තුළට ඇතුළු වන මැලේරියා පරපෝෂිතයන් මඟින් නැවතත් රට තුළ මැලේරියාව ව්‍යාප්ත වීමට ඉඩ ඇති බැවින් මෙම අමාත්‍යාංශය මැලේරියා මර්දන ව්‍යාපාරය හරහා අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ සහයෝගය ද ඇතිව තවදුරටත් රෝග නිවාරණ කටයුතු ක්‍රියාත්මක කරනු ලැබේ.

(iii) ඔව්.

(iv) ඔව්.

(ආ) පැන නොනඟී.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 11-5023/'14-(1), ගරු අජිත් මාන්නප්පෙරුම මහතා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු කථානායකතුමනි, ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කුරුණෑගල මහ රෝහල : සී.ටී. ස්කෑන් යන්ත්‍රය
குருநாகல் பொது வைத்தியசாலை : சீ.ரீ. ஸ்கேனர்
KURUNEGALA GENERAL HOSPITAL: CT SCANNER

5422/'14

13. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (ගරු අජිත් කුමාර මහතා වෙනුවට)
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - மாண்புமிகு அஜித் குமார சார்பாக)
(The Hon. Sunil Handunnetti on behalf of the Hon. Ajith Kumara)

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) කුරුණෑගල මහ රෝහලේ සී.ටී. ස්කෑන් යන්ත්‍රය සැලකිය යුතු කාලයක සිට අබලන් වී ඇති බවත්;

(ii) එම ස්කෑන් යන්ත්‍රය අබලන් වීම හේතුවෙන් රෝහලට පැමිණෙන රෝගීන්ට එම සේවාව ලබා

ගැනීම සඳහා පෞද්ගලික ආයතන කරා යෑමට සිදු වීමෙන් විශාල වියදමක් දැරීමට සිදු වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම සී.ටී. ස්කෑන් යන්ත්‍රය අලුත්වැඩියා කිරීමට හෝ නව සී.ටී. ස්කෑන් යන්ත්‍රයක් සවි කිරීමට මේ වන විට කිසියම් ක්‍රියා මාර්ගයක් ගෙන තිබේද;

(ii) ඒ සඳහා කොපමණ කාලයක් ගතවේද;

(iii) ඒ සඳහා අමාත්‍යාංශය දරන වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதார மற்றும் சுதேச மருத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) குருநாகல் பொது வைத்தியசாலையின் சீ.ரீ. ஸ்கேனர் இயந்திரம் குறிப்பிடத்தக்களவு காலமாக சீர்கெட்டுள்ளதென்பதையும்;

(ii) ஸ்கேனர் இயந்திரம் சீர்கெட்டுள்ளதனால் வைத்தியசாலைக்கு வருகை தருகின்ற நோயாளர்கள் அச்சேவையைப் பெற்றுக் கொள்வதற்காக தனியார் நிறுவனங்களுக்குச் செல்ல வேண்டி நேரிட்டுள்ளதால் பெருந்தொகைப் பணத்தை செலவிட வேண்டி நேரிடுகின்றதென்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி ஸ்கேனர் இயந்திரத்தை திருத்தியமைப்பதற்கு அல்லது புதியதொரு ஸ்கேனர் இயந்திரத்தைப் பொருத்துவதற்கு ஏற்கெனவே ஏதேனும் நடவடிக்கை மேற்கொள்ளப்பட்டுள்ளதா என்பதையும்;

(ii) இதற்கு எவ்வளவு காலம் எடுக்கும் என்பதையும்;

(iii) இதற்காக அமைச்சு ஏற்கும் செலவினம் எவ்வளவு என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Indigenous Medicine:

(a) Is he aware that -

(i) the CT Scanner of the Kurunegala General Hospital has been defunct for a considerable length of time; and

(ii) as a result of it being defunct, the patients who come to that hospital have to bear a huge expense as they have to go to private institutions to obtain the service of a CT Scanner?

(b) Will he inform this House -

(i) whether any measure has been taken to repair the defunct CT Scanner or to install a new one;

(ii) how long it will take; and

(iii) what amount of expenditure will be borne by the Ministry for the purpose?

(c) If not, why?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්. එම යන්ත්‍රය කලක සිට විටින් විට ක්‍රියා විරහිත වෙමින් තිබුණි.

(ii) නැත. එම යන්ත්‍රය ක්‍රියා විරහිත වූ විට අදාළ රෝගීන් සී.ටී. පරීක්ෂණය සඳහා කොළඹ මහ රෝහල වෙත යොමු කරන ලදී.

(ආ) (i) නව සී.ටී. ස්කෑන් යන්ත්‍රයක් සවි කිරීමට ක්‍රියා මාර්ග ගෙන තිබේ.

(ii) 2014.03.12 දින සිට නව සී.ටී. ස්කෑන් යන්ත්‍රයක් සවි කර තිබේ.

(iii) නව යන්ත්‍රය ජපන් රජයෙන් ශ්‍රී ලංකා රජයට පරිත්‍යාග වශයෙන් ලැබී තිබේ.

(ඇ) පැන නොනඟී.

එක්සත් ජනපදයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ QORVIS COMMUNICATIONS සමාගම : ගනුදෙනු

அமெரிக்க இலங்கை தூதரகம் மற்றும் QORVIS COMMUNICATIONS கம்பனி : கொடுக்கல் வாங்கல்

SRI LANKAN EMBASSY IN US AND QORVIS COMMUNICATIONS COMPANY: TRANSACTIONS

4469/'13

15. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (ගරු අනුර දිසානායක මහතා වෙනුවට)
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - மாண்புமிகு அநுர திஸாநாயக்க சார்பாக)
(The Hon. Sunil Handunnetti on behalf of the Hon. Anura Dissanayake)

විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) 2010, 2011 හා 2012 යන වර්ෂවලදී එක්සත් ජනපදයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය Qorvis Communications නමැති සමාගම සමඟ ගනුදෙනු කර තිබේද;

(ii) එසේ නම්, එම ගනුදෙනු සිදු වී ඇති දින වකවානු කවරේද;

(iii) එම ගනුදෙනු තුළින් ඉටු කර ගෙන ඇති කාර්යය හෝ කාර්යයන් කවරේද;

(iv) එමඟින් ලැබී ඇති ප්‍රයෝජන කවරේද;

(v) එම කටයුතු වෙනුවෙන් කරන ලද ගෙවීම්වල වටිනාකම කොපමණද;

(vi) ඒ සඳහා මුදල් වෙන් කරනු ලැබූ වැය ශීර්ෂය කවරේද;

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

(vii) එම සමාගම සමඟ ගිවිසුම්වලට එළැඹ ඇත්නම්, එම ගිවිසුම් සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010, 2011 மற்றும் 2012ஆம் ஆண்டுகளில் ஐக்கிய அமெரிக்காவின் இலங்கை தூதரகம் Qorvis Communications எனும் கம்பனியுடன் கொடுக்கல் வாங்கல் மேற்கொண்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி கொடுக்கல் வாங்கல் இடம்பெற்றுள்ள காலப்பகுதி யாதென்பதையும்;

(iii) மேற்படி கொடுக்கல் வாங்கல் மூலமாக நிறைவேற்றப்பட்டுள்ள பணி அல்லது பணிகள் யாவையென்பதையும்;

(iv) அதன் மூலம் கிடைத்துள்ள நன்மைகள் யாவையென்பதையும்;

(v) மேற்படி பணிகளுக்காக மேற்கொள்ளப்பட்டுள்ள கொடுப்பனவுகளின் பெறுமதி யாதென்பதையும்;

(vi) அதற்காக நிதி ஒதுக்கப்பட்ட செலவுத் தலைப்பு யாதென்பதையும்;

(vii) மேற்படி கம்பனிகளுடன் உடன்படிக்கைகள் கைசாத்திடப்பட்டிருப்பின், அந்த உடன்படிக்கைகளை சபையில் சமர்ப்பிப்பாரா என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs:

(a) Will he inform this House -

(i) whether the Sri Lankan Embassy in the United States had dealings with the company named Qorvis Communications in the years 2010, 2011 and 2012;

(ii) if so, the period during which such transactions have taken place;

(iii) the task or tasks accomplished through such transactions;

(iv) the benefits derived from them;

(v) the value of the payments made for the said transactions;

(vi) the expenditure head under which funds were allocated for this purpose; and

(vii) if agreements have been entered into with that company, whether such agreements will be tabled?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) නැත.

(ii) දාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(v) අදාළ නොවේ.

(vi) අදාළ නොවේ.

(vii) අදාළ නොවේ.

(ආ) පැන නොනඟී.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේ වාර්තාව කල් දැමීම
ஐக்கிய நாடுகள் மனித உரிமைகள் பேரவையின் அறிக்கை ஒத்திவைப்பு
POSTPONEMENT OF REPORT OF UNITED NATIONS HUMAN RIGHTS COUNCIL

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Nimal Siripala de Silva - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නය ඇසීමට අවසර ලබා දීම පිළිබඳව මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව ඉදිරියේ ශ්‍රී ලංකාවට එරෙහිව ඇති මානව හිමිකම් කඩ කිරීම් පිළිබඳව වූ පරීක්ෂණයේදී අදාළ වාර්තාව හා ඒ පිළිබඳව ගත යුතු ක්‍රියා මාර්ගයන් 2015 මාර්තු මාසයේදී පැවැත්වීමට නියමිත සැසිවාරයට ඉදිරිපත් නොකොට, එය මීළඟ සැප්තැම්බර් මාසයේ පැවැත්වෙන සැසිවාරය සඳහා කල් දැමිය යුතු යැයි එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ කොමසාරිස් සෙයිඩ් රාඩ් අල් හුසේන් මහතා ප්‍රකාශයට පත් කළ බවට විවිධ ජනමාධ්‍ය මඟින් ප්‍රසිද්ධියට පත් කොට ඇති හෙයින් ද,

මෙසේ මෙම පරීක්ෂණ වාර්තාව හා ඊට අදාළව ගත යුතු ක්‍රියා මාර්ගයන් පිළිබඳව වාර්තාවන් ඉදිරිපත් කිරීම කල් දමන ලද්දේ එසේ කරන ලෙස ශ්‍රී ලංකා රජය මඟින් කරන ලද ඉල්ලීමක් නිසා බවද,

විශේෂයෙන් විදේශ කටයුතු භාර අමාත්‍ය මංගල සමරවීර මහතා විසින් එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් කමිටුවේදී එහි ප්‍රධානියා වෙත යවන ලද ලිපියක් මඟින් ශ්‍රී ලංකා රජය දින සියයක් ඇතුළතදී මානව හිමිකම් ක්ෂේත්‍රයේ විවිධ ප්‍රතිසංස්කරණ රාශියක් ඉටු කිරීමට එකඟ වී ඇති බවත්, එසේ එකඟ වූ කරුණු

අතර යුද අපරාධ පිළිබඳව යුක්තිය ඉටු කිරීමක් සහතික කර ඇති බවක් ප්‍රකාශ කර ඇති බව වාර්තා වී ඇති හෙයින් ද,

විශේෂයෙන් උතුරු පළාත් සභාව මඟින් ශ්‍රී ලංකාවේ සිදු වූයේ යැයි ඔවුන් විසින් කියනු ලබන යුද අපරාධ පිළිබඳව ජාත්‍යන්තර පරීක්ෂණයක් පැවැත්වීම අත්‍යවශ්‍ය බවත්, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සංවිධානයට ඉදිරිපත් කළ යුතු වාර්තාව කල් දැමීම යෝග්‍ය නොවන බව දමිළ ඩයස් පෝරාව නියෝජනය කරන සංවිධාන රාශියකගේ අත්සනින් යුතුව කරුණු ඉදිරිපත් කිරීමක් සිදු කර ඇති බවත් දෙස් විදෙස් මාධ්‍යයන්හි වාර්තා වී ඇති හෙයින්ද, මේ පිළිබඳව රජයේ ස්ථාවරය පූර්ණ වශයෙන් මෙතෙක් පැහැදිලි කොට නැති හෙයින් පහත සඳහන් කරුණු සඳහා සවිස්තරාත්මක ප්‍රකාශයක් රජය මගින් ප්‍රකාශ කිරීම අත්‍යවශ්‍ය වන හෙයින්,

1. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේ මාර්තු මාසයේ සැසි වාරය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතව තිබූ වාර්තාව හා රෙකමදාරුවන් මෙම වර්ෂයේ සැප්තැම්බර් සැසි වාරය සඳහා කල් දැමීමට ශ්‍රී ලංකා රජය මඟින් ඉල්ලීමක් කළේ ද යන්නත්;

2. මේ පිළිබඳව ගරු විදේශ අමාත්‍යවරයා විසින් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුවේ සභාපතිවරයා වෙත යවන ලද ලිපියේ දී හෝ වෙනත් සාකච්ඡාවන්වලදී යුධ අපරාධ සම්බන්ධයෙන් සාධාරණත්වය ඉටු කිරීමට ක්‍රමවේදයක් ශ්‍රී ලංකා රජය සකස් කරන බවට පොරොන්දුවක් දී තිබේද යන්නත්;

3. මේ පිළිබඳව ශ්‍රී ලංකා රජය එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව වෙත යවන ලද හා විදේශ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද ලිපි මෙම සභාවට ඉදිරිපත් කරන්නේ ද යන්නත්;

4. උතුරු පළාත් සභාව මඟින් ශ්‍රී ලංකාවේ සිදුවූවා යයි ඔවුන් ප්‍රකාශ කරන යුධ අපරාධ පිළිබඳව ජාත්‍යන්තර පරීක්ෂණයක් කළ යුතු යැයි ඉදිරිපත් කර ඇති කරුණු පිළිබඳව හා එසේ ජාත්‍යන්තර පරීක්ෂණයක් පැවැත්වීමට කර ඇති ඉල්ලීම ව්‍යාර්ථ කිරීම සඳහා ජාතික හා ජාත්‍යන්තර වශයෙන් රජය ගැනීමට බලාපොරොත්තු වන පියවර මොනවා ද යන්නත්;

5 එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සංවිධානය ඉදිරියේ ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය රැක ගැනීම සඳහා ගැනීමට බලාපොරොත්තු වන නව පියවර මොනවාද යන්නත් මෙම සභාවට දන්වන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ගරු විදේශ කටයුතු ඇමතිතුමා විසින් හෙට දින මේ සඳහා පිළිතුරු සපයනවා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, සංවර්ධන වැඩ කටයුතු නවතා තැබීම පිළිබඳව ඊයේ මා ඉදිරිපත් කළ ප්‍රශ්නයටත් අද පිළිතුරු සපයනවා කිව්වා. ඒ පිළිතුර දුන්නොත් හොඳයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, ගරු ඇමතිතුමාට අවස්ථාව තිබෙනවා.

පසු ගිය රජය ආරම්භ කළ සංවර්ධන ව්‍යාපෘති ඇනහිටීම: ස්වදේශ කටයුතු හා ධීවර අමාත්‍යතුමාගේ ප්‍රකාශය

முன்னைய அரசு ஆரம்பித்த அபிவிருத்தித் திட்டங்கள் இடைநிறுத்தம்: உள்நாட்டலுவல்கள் மற்றும் கடற்றொழில் அமைச்சரது கூற்று

STALLING OF DEVELOPMENT PROJECTS INITIATED BY FORMER GOVERNMENT: STATEMENT BY MINISTER OF HOME AFFAIRS AND FISHERIES

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා (ස්වදේශ කටයුතු හා ධීවර අමාත්‍යතුමා)
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா - உள்நாட்டலுவல்கள் மற்றும் கடற்றொழில் அமைச்சர்)
(The Hon. M. Joseph Michael Perera - Minister of Home Affairs and Fisheries)
ගරු කථානායකතුමනි, විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා විසින් 2015.2.18 වන දින ස්ථාවර නියෝග 23(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. ඔව්.

2. ලබා දෙන්න මුදල් වෙන් කර නැත. මුදල් ගෙවලා නොවෙයි මේ වැඩ කර තිබෙන්නේ.

3. මුදල් වෙන් කර ලබා දී තිබෙන ඒවා කරනවා. නැත්නම් අලුත් වැඩ පිළිවෙළ යටතේ තමයි බලන්න වෙන්නේ.

4. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ විශාල වැඩ කොටසක් මැතිවරණය වෙලාවේ කර ගෙන ගියා. මුදල් දුන්නේ නැහැ. සමහර ඒවා කළා. ඒ කරපු ඒවාට ගිවිසුම් අත්සන් කර තිබෙනවා නම් ගෙවනවා. ගිවිසුම් අත්සන් කර නැතිව කළ ඒවාට ගෙවන්න බැහැ. සල්ලි වෙන් වෙලා නැහැ ; ගිවිසුම් අත්සන් කර, කොටසක් මඟ නතර කර තිබෙනවා නම් ඒ ටික කරනවා. එහෙම හොඳයි නේ.

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
Sir, I rise to a point of Order.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා.

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
ගරු කථානායකතුමනි, ඔබතුමාගේ අවසරය ඇතිව මම ඉල්ලා සිටිනවා, ස්වයං රැකියා සඳහා -

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි,-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, point of Order එකක් තිබෙනවා. පොඩ්ඩක් ඉන්න.

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
ගරු කථානායකතුමනි, ස්වයංරැකියා කරන කාන්තාවන් සහ ව්‍යවසායකයන් සඳහා භාණ්ඩ විශාල ප්‍රමාණයක් ගෙනැවිත් ඒවා මැතිවරණ කාලයේදී බෙදන්න එපාය කිව්ව නිසා මේ වනකොට ඒවායින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වතු පුරවා තිබෙනවා. බෙදන්න එපාය කියා දැනුවත් කර තිබෙන නිසා මේ වනකොට ඒ භාණ්ඩ වර්ෂාවට තෙමෙනවා; අව්වට වේළෙනවා. ඒ භාණ්ඩ ලැබෙන තෙක් ඒ කාන්තාවන් බලා ගෙන ඉන්නවා. පක්ෂ බේදයකින් තොරවයි ඒ අය තෝරාගෙන තිබෙන්නේ. ඒ නිසා කරුණාකරලා ඒවා බෙදන්න අවසර ලබා දෙන්නය කියා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඒ බඩු ගෙනැවිත් තිබෙන්නේ මැතිවරණ කාල පරිච්ඡේදය තුළදීයි. ඒවාට සල්ලි වෙන් කරලා නැහැ.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඒවාට වවුචර් අත්සන් කරලායි තිබෙන්නේ. [බාධා කිරීම්]

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ප්‍රශ්නයක් අහලා තිබෙනවා. කරුණාකර ඒකට උත්තර දෙන්න ඉඩ දෙන්න. මේ ගෙනැත් තිබෙන ඒවායින් කොටසක් මැතිවරණ සමයේ සමහර නිලධාරින් යොදාගෙන මිනිසුන්ට බෙදා දී තිබෙනවා. මුදල් දුන්නා, මැෂින් දුන්නා. එවැනි නොයෙක් කාරණා සිදු වුණා. නමුත් මේ සඳහා ගෙවිය යුතු මුදල් දිසාපතිවරුන්ට ලැබී තිබුණේ නැහැ. ඒ ගෙනාපු බඩු අපි තියා ගෙන ඉන්නේ නැහැ. කාට හරි දිය යුතු නම් ඒවා දිය යුතුයි. ඒ සඳහා මුදල් ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. ඔබතුමන්ලා වැරදි කළත් අපි වැරදි කරන්නේ නැහැ. සුදුස්සන් තෝරා ඒ බඩු -[බාධා කිරීම්] ගරු කථානායකතුමනි, point of Order එකක් ඉදිරිපත් කළාම දෙන උත්තරය අහගෙන ඉන්න ඕනෑ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කියන ඒවා ඔක්කොම අහගෙන ඉන්න බැහැ.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
අහගෙන ඉන්න බැරි නම් මම වාඩි වෙන්නම්. එච්චරයි තිබෙන්නේ. ප්‍රශ්න අහන්න එපා. [බාධා කිරීම්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමා, ඒකට විස්තර දෙන්න. [බාධා කිරීම්] ප්‍රශ්නයට පිළිතුරු දෙනකම් ඉන්න. [බාධා කිරීම්]

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
අපි ප්‍රශ්නවලින් මඟ හරින්නේ නැහැ. මම කිව්වා, ඒ ගෙනැවිත් තිබෙන බඩුවලට සල්ලි ගෙවා තිබෙනවා නම්, ඒවා ලැබිය යුතු අයට, සුදුසු අයට ලබා දෙන්න කටයුතු කරනවාය කියා. සල්ලි ගෙවා නැත්නම් අදාළ නිලධාරින්ගෙන් ඒවා අය කර ගෙන සුදුසු අයට දෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, ගරු විපක්ෂ නායකතුමා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
එතුමා විසින් කරන ලද ප්‍රකාශය පිළිබඳව අපි පක්ෂ නායක රැස්වීමේදී දිනයක විවාදයක් ඉල්ලීමට බලාපොරොත්තු වෙනවා.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
බොහොම හොඳයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. දැන් තිබෙන්නේ, ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා. ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීම.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

සුජීව සේනසිංහ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
சுஜீவ சேனசிங்க மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
SUJEEWA SENASINGHE FOUNDATION (INCORPORATION) BILL

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"සුජීව සේනසිංහ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත්කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.
වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සමාජ සේවා, සුඛසාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

විනා විදුක්කප්පට්ටු, ஏற்றுக்கொள்ளப்பட்டது.
இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் நிலைக்கட்டளை இல. 47(5) இன்படி சமூக சேவைகள், நலன்புரி மற்றும் கால்நடை வளர்ப்பு அபிவிருத்தி அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.
The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Social Services, Welfare and Livestock Development for report.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු කථානායකතුමනි, අර ඉල්ලන විවාදය ඉක්මන් කරලා අපට ලබා දෙන්න.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, අද Parliamentary Business Committee එකේ රැස්වීම තිබෙනවා නේ. ඒකෙදි තීරණය කරමු.

ප්‍රධාන කටයුතු. අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1, අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත දෙවැනි වර කියැවීම. ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත
குற்றச்செயல்களுக்குப் பலியாக்கப்பட்டோருக்கும் சாட்சிகளுக்குமான உதவி மற்றும் பாதுகாப்புச் சட்டமூலம்
ASSISTANCE TO AND PROTECTION OF VICTIMS OF CRIME AND WITNESSES BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

[අ.භා. 1.47]

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - நீதி மற்றும் தொழில் உறவுகள் அமைச்சர்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe - Minister of Justice and Labour Relations)
ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි, අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත මා ඉදිරිපත් කරමින් එහි අරමුණු පිළිබඳව කෙටි හැඳින්වීමක් කිරීමට බලාපොරොත්තු වෙනවා.

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
Sir, I rise to a point of Order.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
ගරු කථානායකතුමනි, සාමාන්‍යයෙන් පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරද්දී උපදේශක කාරක සභාවේ අනුමැතියට ගිහින් තිබෙන්න ඕනෑ. උපදේශක කාරක සභාවේ අනුමැතියක් ඇතුවද මෙම පනත් කෙටුම්පත සභාවට ගෙනෙන්නේ කියලා අපි දැන ගන්න කැමැතියි.

ගරු රවුෆ් හකීම් මහතා (නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා)
(மாண்புமிகு றவுப் ஹகீம் - நகர அபிவிருத்தி, நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்பு அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of Urban Development, Water Supply and Drainage)
Sir, this Bill had been on the drawing board since the year 2000. Several times - this is, in fact, the tenth incarnation of the same Bill - it was debated and adjourned after two days of full debate. Since it got entangled in the whole issue relating to the former commissions of inquiry on those ten incidents, again it got politicized, unnecessarily. In fact, all agreed that under the Criminal Justice system, this Bill is an important one. Unfortunately, this got muddled with all other international issues. Now, it is time that all of us, with bipartisan support, pass this Bill. I do not think we need to vet it through the Consultative Committee process. This is my humble opinion, Mr. Speaker.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අපි පරීක්ෂා කර බලනවා, මෙම පනත් කෙටුම්පත උපදේශක කාරක සභාවේ අනුමැතියට යොමු කර තිබෙනවාද කියලා. එහෙම නැතුව ඉස්සෙල්ලා අරගෙන තිබෙනවා නම් -

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Plantation Industries and Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, මට පොඩ්ඩක් අවසර දෙන්න.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඇත්තවශයෙන්ම 2008 වර්ෂයේදී එවකට පැවති ආණ්ඩුව විසින් මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
2012 දීයි ඉදිරිපත් කළේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
නැහැ. 2008 වර්ෂයේදී ඉදිරිපත් කළේ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
2008 වර්ෂයේදීත් ඉදිරිපත් කළා. 2012 වර්ෂයේදීත් ඉදිරිපත් කළා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මම මේ පිළිබඳව සොයා බලා ඉක්මනින් දැනුම් දෙන්නම්. මෙම පනත් කෙටුම්පත මීට කලින් අරගෙන තිබෙනවා නම් උපදේශක කාරක සභාවේ අනුමැතියට ගිහින් තිබෙන්න ඕනෑ. කෙසේ නමුත් අප ඒ ප්‍රශ්නය පිළිබඳව සොයා බලා පිළිතුරක් ලබා දෙන්නම්.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම මේ පනත් කෙටුම්පතට අපේ විරුද්ධත්වයක් නැහැ. නමුත් සම්ප්‍රදායානුකූලව අපේ ප්‍රතිපත්තියක් තිබෙනවා, හැම පනත් කෙටුම්පතක්ම විවාදයට ගන්න ඉස්සර වෙලා එය උපදේශක කාරක සභාවට ඉදිරිපත් කර අනුමත කර ගැනීමට. නමුත් ඒ කටයුත්ත මේ කෙටුම්පතේදී වෙලා නැහැ කියන එකයි අදහස.

මේ පනත් කෙටුම්පත 2008 දී ඉදිරිපත් වුණාය කියන එක මම පිළිගන්නේ නැහැ. 2012 දී ඉදිරිපත් වුණු බව ඇත්ත. අවුරුදු කීපයක් තිස්සේ සාකච්ඡා කළා. මේක උපදේශක කාරක සභාවට ඉදිරිපත් වෙලා නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
2012 දී ඉදිරිපත් වුණා නම් උපදේශක කාරක සභාවට ගිහිල්ලා නේ එන්නේ. එහෙම නම් අපි ඒක පොඩ්ඩක් බලමු.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මම මේ පිළිබඳව 2008 දී කථා කළා. මා ළඟ ඒ හැන්සාඩ් වාර්තාව තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම නම් උපදේශක කාරක සභාවට ගිහින් තිබෙනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේක 2008 දී -[බාධා කිරීමක්] නැහැ.

ඇත්ත වශයෙන්ම පසු ගිය රජයේදී ගරු මහින්ද සමරසිංහ මැතිතුමා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයට 2007 දී ගිහින් කිව්වා, "මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවාය" කියලා. ඒ අනුව තමයි 2008 දී ඉදිරිපත් කළේ. ඒ අතර කාලය තුළ යම් යම් ප්‍රශ්න ඇති වුණා. මම හිතන හැටියට ආණ්ඩුවට දේශපාලනමය වශයෙන් වුවමනාවක් තිබුණේ නැහැ මේක ඉදිරියට අරගෙන යන්න. කොහොම නමුත් පනත් කෙටුම්පත අත් හිටෙව්වා. 2007න් පස්සේ 9වැනි අවුරුද්ද - ninth year - මේ යන්නේ. අපි අවුරුදු 9ක් තිස්සේ බලා ගෙන හිටියා මේ පනත් කෙටුම්පත එනකම්. විශේෂයෙන්ම අපට -[බාධා කිරීමක්]

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
දේශපාලනමය වශයෙන් වුවමනාවක් තිබුණේ නැහැ කියන එකේ සත්‍යතාවක් නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ පිළිබඳව මා සොයා බැලුවා. මේ පනත් කෙටුම්පත 2014 සැප්තැම්බර් මස 9වැනි දා උපදේශක කාරක සභාවට ඉදිරිපත් වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමා, ඔබතුමාගේ කථාව කරන්න.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු කථානායකතුමනි, මම කථාව ආරම්භ කරන ගමන්ම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ගරු මන්ත්‍රීතුමන්ලා මේ ගරු සභාවේ රීති තර්ක ඉදිරිපත් කරන කොට වග කීමකින් යුතුව ඉදිරිපත් කළ යුතු බවට දැනුම් දෙන්න කියලා. මොකද, සමහර ගරු මන්ත්‍රීතුමන්ලා වග කීමකින් තොරව නගන රීති ප්‍රශ්න නිසා මේ ගරු සභාවේ වටිනා කාලය අනවශ්‍ය විධියට නාස්ති වෙනවා.

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
Sir, I rise to a point of Order.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා, මොකක්ද point of Order එක. හැබැයි, හරියට අහන්න.

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
ගරු කථානායකතුමනි, ඊයේ දවසේ ඉදිරිපත් කළ ධීවර ක්ෂේත්‍රයට සම්බන්ධ පනත් කෙටුම්පතත් අපි දන්නා තරමින් උපදේශක කාරක සභාවට ඉදිරිපත් වුණේ නැහැ. අලුත් ආණ්ඩුවක් නිසා තවම එක උපදේශක කාරක සභාවක්වත් පවත්වන්න කටයුතු කරලා නැහැ. ඒ නිසා දැනුවත් වීම සඳහායි ඒ ප්‍රශ්නය විමසුවේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේක ආණ්ඩුවක එක කොටසක් පමණයි. ඒ නිසා මම හිතන්නේ නැහැ අලුතෙන් අවශ්‍ය වෙයි කියලා. ගරු ඇමතිතුමා, කථා කරන්න.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු කථානායකතුමනි, අපි කවුරුත් දන්නා විධියට බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී පාලන සමයේ පටන් -1833 සිට- අපේ රටේ නීතිය හා සාමය ආරක්ෂා කිරීම සඳහා අපරාධ වගකීම් ඇති කරන නීති, අණපනත් රාශියක් සම්මත කර තිබෙනවා. විශේෂයෙන්ම දණ්ඩ නීති සංග්‍රහය. අපරාධ නඩු සම්බන්ධව, අපරාධ නඩු විධාන සංග්‍රහය. සිවිල් නඩු සම්බන්ධව, සිවිල් නඩු විධාන සංග්‍රහය.

විශේෂයෙන්ම, මෙම පනත් කෙටුම්පත අදාළ වන්නේ අපරාධ නඩු සම්බන්ධවයි. අපේ රටේ අපරාධ නිර්වචනය කරන්න, අපරාධ හඳුන්වා දෙන්න, අපරාධ සම්බන්ධ නඩු කටයුතු මෙහෙයවන්න, ඒ වැරැදිකරුවන්ට දඬුවම් කරන්න යනාදී මේ කියන සියලු කාරණා සම්බන්ධව අවුරුදු 180ක් තිස්සේ නීති සකස් වෙලා තිබෙනවා. අවුරුදු 200කට ආසන්න නීති ඉතිහාසයක් තිබෙන අපට ප්‍රශ්නයක් විධියට තිබුණේ, මේ අපරාධවලින් අසරණභාවයට පත් වන වින්දිතයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා පැහැදිලි නීතියක් සම්මත කර ගන්නට නොහැකි වීමයි.

අනෙක් අතට, පසු ගිය කාල වකවානුව පුරාම අපරාධ නඩුවක් ඔප්පු කර ගැනීම පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් තිබුණා. අපේ රටේ අධිකරණ ක්‍රමය වෙනුවෙන්, විනිශ්චයකාරවරුන් වෙනුවෙන් විශාල මුදල් ප්‍රමාණයක් මහජන මුදල්වලින් වෙන් කරනවා. එහි අවසාන ප්‍රතිඵලය විධියට රටේ ජනතාව බලාපොරොත්තු වෙන්නේ නිවැරැදි වූ නඩු තීන්දුවක් ප්‍රකාශයට පත් කර ගැනීම සහ වැරැදිකරුවන්ට නීතියට අනුකූල ලෙස දඬුවමක් නියම කරලා ක්‍රියාත්මක කර ගැනීමයි. එම කාර්යය සාර්ථකව කර ගැනීමට තිබෙන මූලිකම යාන්ත්‍රණය තමයි, අපක්ෂපාතී, ස්වාධීන සාක්ෂිකරුවන්ගේ සාක්ෂි ලබා ගැනීම. පසු ගිය වකවානුවේ අපට විශාල ගැටලුවක් වෙලා තිබුණා, යම් සාක්ෂිකරුවෙක් යම් සිද්ධියක් දැක්කත්, ඇහුණත් අධිකරණයට ඇවිල්ලා එම කාරණා ඔහුගේ හෘදය සාක්ෂියට එකඟව ඉදිරිපත් කිරීමට නොහැකි අපහසුතාවක් තිබුණ එක. ඒකට හේතු තමයි, නොයෙකුත් අපරාධකරුවන් නැත්නම් චෝදනා එල්ලවන පාර්ශ්ව විසින් සාක්ෂිකරුවන්ට තර්ජනය කිරීම, බිය ගැන්වීම, හිංසා කිරීම, නොයෙකුත් ආකාරයට සාක්ෂි විකෘති කරලා ඉදිරිපත් කරන්න පෙලඹවීම. මේ ආදී කාරණා ගණනාවක් හේතුවෙන් පසු ගිය වකවානුවේ යම් යම් ආයතන සංඛ්‍යාලේඛන මඟින් ඉදිරිපත් කරලා පෙන්නුවා, අපේ රටේ සමහර වසරකදී අධිකරණයට ඉදිරිපත් වෙන චෝදනාවලින් සියයට 4ක වාගේ සුළු ප්‍රමාණයක් පමණයි වැරැදිකරුවන් බවට පත් වෙන්නේ, සියයට 96ක වාගේ ප්‍රමාණයක් නිදහස් වෙලා යනවා කියලා. ඊට බලපෑ ප්‍රධාන කාරණයක් විධියට අපි දකිනවා, සාක්ෂිකරුවෙකුට නිවැරැදි ලෙස සාක්ෂියක් ඉදිරිපත් කිරීමට උචිත පරිසරයක්, රැකවරණයක් රාජ්‍යයක් විසින් සකසා දිය යුතුව තිබුණත්, ඒ කාර්ය දීර්ඝ කාලයක් තිස්සේ අතපසු වෙලා තිබීම.

මෙම කාරණා පිළිබඳව දීර්ඝ කාලීනව පවත්වන ලද සාකච්ඡා, වාද විවාද අතරේ මීට අවුරුදු දහයකට, දොළහකට, පහළොවකට විතර කලින් මෙවැනි පනතක අවශ්‍යතාව මේ පාර්ලිමේන්තුවේදී පවා පෙන්වා දීලා තිබෙනවා. එහි ප්‍රතිඵලයක් විධියට, දීර්ඝ කාලීන ව්‍යායාමයක ප්‍රතිඵලයක් විධියට අද මේ පනත් කෙටුම්පත දෙවැනි වර කියැවීමේ විවාදයට ඉදිරිපත් කරලා තිබෙනවා.

මම මුලින්ම ස්තුතිවන්ත වෙනවා, මේ පනත් කෙටුම්පත සකස් කිරීමෙහිලා අධිකරණ අමාත්‍යාංශයේ මාගේ පූර්වගාමී ගරු අමාත්‍ය රවුෆ් හකීම් මැතිතුමා විශේෂ උනන්දුවක් දක්වලා කටයුතු කර තිබීම ගැන. මොකද, අනෙකුත් සාම්ප්‍රදායික නීතියක් මෙන් නොව, ඊට වඩා සුවිශේෂ නීති තත්ත්වයක් ප්‍රකාශයට පත් කරන නීතියක් මේ පනත් කෙටුම්පත හරහා ඇති වන නිසා. තරමක් අසීරු තත්ත්වයක පැවතුණත්, එතුමා ඉතා උනන්දුවෙන් කටයුතු කරලා මේ කටයුත්ත සාර්ථකව ඉටු කර තිබෙනවා.

ඒ එක්කම, නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරිනුත්, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ නිලධාරිනුත් විශේෂ උනන්දුවකින් මේ නීතිය සකස් කිරීමෙහිලා කටයුතු කර තිබෙනවා. මම ඒ සියලු දෙනාටමත් මාගේ ස්තුතිය ප්‍රකාශ කරන්න මෙය අවස්ථාවක් කර ගන්නවා.

මෙය කිසිදු පක්ෂයකට හෝ දේශපාලනඥයෙකුට හෝ පෞද්ගලිකව බලපාන හෝ, නැත්නම් දේශපාලන අරමුණක් ඇතිව කිසිම පක්ෂයක් හෝ කිසිම නිලධාරියෙක් හෝ අමාත්‍යවරයෙක් හෝ සකස් කරපු පනත් කෙටුම්පතක් නොවෙයි. මෙය රටේ පොදු අවශ්‍යතාවක් ඉටු කරලීම සඳහා, දීර්ඝ කාලයක් තිස්සේ තිබුණු අඩු පාඩුවක් මඟ හරවා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති පනත් කෙටුම්පතක්. ඒ නිසා පක්ෂ භේදයකින් තොරව අපි බලාපොරොත්තු වෙනවා, මේ ගරු සභාවේ සියලුම ගරු ඇමතිතුමන්ලා, මන්ත්‍රීතුමන්ලා මේ පනත් කෙටුම්පත සම්මත කර ගැනීමට අපට සහයෝගය ලබා දෙයි කියලා.

Hon. Speaker, as you are aware, victims of crime face numerous problems as a consequence of being subjected to criminality. While some of these problems are of a general nature, some are directly associated with their participation in the Criminal Justice system, which is an adversarial system in our country. Having to face these problems add to their trauma, and is sometimes more traumatizing than the original crime itself. Furthermore, these problems prolong the suffering of the victims and, at times, cause permanent harm.

Lack of knowledge on how to deal with the incident: whether to complain to the police or remain silent; whether to institute civil legal proceedings et cetera; lack of support and advice; absence or lack of proper treatment and care by the State health service; absence of financial and other resources to obtain treatment from the private sector; absence of immediate financial relief to redress material harm or loss suffered by them; absence of psychological support; social stigma, isolation, marginalization; and occupational and financial losses are the problems that the victims of crime generally face as a consequence of being subjected to criminality.

Absence of an opportunity to submit to court the nature of the penal sanctions such person may wish court to impose on the convict; in a case of acquittal, the accused not receiving information regarding the reasons for the acquittal; in a case of conviction, the convict not receiving information regarding judicial review of the conviction about appeal or revision; absence of an opportunity to make legal representation at such hearing; not receiving information regarding the release of the convict from the prison; not having an opportunity to make representations before a decision is taken to grant a pardon, are the main concerns of the victims in criminality.

The other problems faced by the victims of crime are threats, harassments, intimidations, retaliations or reprisals, and other criminal offences. These are perpetrated to dissuade victims from coming forward,

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

complaining to the police and testifying in court, or as a punishment for complaining, and testifying.

Problems associated with the receiving of compensation have also been adequately addressed in this Bill. The civil legal proceedings to obtain compensation are time-consuming and expensive. Hardly any compensation is received at the end of criminal proceedings, and the State does not have a mechanism for awarding compensation. These issues have been seriously addressed when drafting this Bill.

Then, the plight of witnesses has also been taken into consideration. They face certain problems such as harassment, disbelief, absence of assistance to attend court; threats, harassment and pressure not to attend court; intimidation, retaliatory attacks et cetera.

Child victims of crime and witnesses have also been addressed in this Bill. Due to tender age, inherent weaknesses and vulnerabilities, the situation of child victims of crime and witnesses has become a serious issue in our country. Family members and guardians of child victims of crime and witnesses also face numerous problems during the criminal justice process.

It is also necessary to consider the present position of the existing law. Victims are reluctant to report crimes in certain circumstances and witnesses seldom volunteer to make statements to the police. Sometimes, victims and witnesses are reluctant to come to court to testify. The overall efficacy of the criminal justice system has been adversely affected as a result of those weaknesses and lacunas.

Then, the objects of the new law are also an important factor which has to be considered during this Debate. They are: set out and recognize the rights and entitlements of victims of crime and witnesses; establish mechanisms to promote, protect, enforce and exercise such rights and entitlements; provide for rendering of assistance and protection to victims and witnesses; provide for payment of compensation to victims; provide for obtaining of redress by victims including restitution, reparation and rehabilitation; set out duties and responsibilities of judicial officers, police officers and other public officers with regard to the victims and witnesses; stipulate offences that may be committed in respect of victims and witnesses and provide for implementation of internationally accepted norms and best practices relating to the protection of victims and witnesses.

According to the general scheme of the proposed law, there are two categories of beneficiaries: the first is the victims of crime and the second is the witnesses. Two forms of relief have also been provided in the Bill: the first is assistance and the second is the protection of the law and the legal authorities.

A "Victim of Crime" means a person who has suffered any injury, harm, impairment or disability, whether physical or mental, emotional; economic or other loss as a result of an act or omission, which constitutes an offence under any law, or an infringement of Fundamental Rights enshrined in Articles 11, 13(1) and 13(2) of the Constitution, and includes a person who suffers harm as a result of intervening to assist such a person or to prevent the commission of an offence, and any member of the family and next of kin of such person, dependents and any other person of significant importance to that person. That is the definition given in the Bill with regard to a “Victim of Crime”.

A “Witness” has also been defined. “Witness” means any person who has provided information, lodged a complaint, made a statement with a law enforcement agency; or, has been summoned by a court or a commission; or, has investigated into an offence or infringement of Fundamental Rights enshrined and guaranteed by Articles 11, 13 (1) and 13 (2) of the Constitution. Such category includes a victim of crime, a family member or dependent of such witness, or any other person of significant importance, and also includes an Expert Witness and a Defence Witness.

This Bill also provides to establish a Commission to protect the rights and entitlements of victims and witnesses. “Commission” means, a commission appointed under the Commissions of Inquiry Act and the Special Presidential Commissions of Inquiry Act; a Commission appointed under the Special Presidential Commissions of Inquiry Act; the Commission to Investigate Allegations of Bribery and Corruption; or the Human Rights Commission of Sri Lanka.

This Bill also makes specific provisions with regard to the Rights of Victims of Crime. A victim has to be treated with equality, fairness and with respect for his dignity and privacy. He is also entitled to receive adequate, prompt, appropriate and fair redress including reparation and restitution. He has to be protected from harm, intimidation, reprisals or retaliation; medically treated; and, be informed of legal remedies, the progress of the investigation, dates fixed for hearing of judicial proceedings, release on bail, discharge, institution of criminal proceedings, conviction, sentence, acquittal of the accused, assistance available et cetera. Such a person should have the complaint recorded by any police officer, and to have the complaint investigated into impartially and comprehensively. He is also entitled to make representations to the investigator and receive a feedback regarding the progress of the investigation. Such a person has to be represented by a legal counsel during investigations, and he is entitled to present written communications to the Attorney-General. Further, the victim is entitled to be present and represented during legal proceedings; to receive assistance required to attend legal proceedings; to obtain certain legal documentation

from court; to submit to court - during trial or after conviction, or prior to the sentence or in appeal or revision - the impact of crime. If a pardon or remission of sentence is being considered by the relevant authorities, such a party is entitled to submit the impact of the crime and make representations. The victim of crime is entitled to receive actual financial loss or expenses incurred due to participation in legal proceedings; and to receive medical treatment.

Then, this Bill categorically provides certain entitlements to the witnesses such as to receive from investigational, quasi-judicial and judicial authorities, fair and respectful treatment; not to be harassed for providing information regarding an offence or an infringement of Fundamental Rights or Human Rights, volunteering to make statements with a law-enforcement agency, and, providing testimony. Witnesses are also to receive protection against any real or possible harm, threat, intimidation, reprisal or retaliation.

This law also provides protection to whistle-blowers, which has not been provided in the previous statutes. Accordingly, no person who has provided information regarding the commission of an offence, infringement of Fundamental Rights or Human Rights in such person's employment environment, shall be harassed, subjected to suffering, loss or damage or any adverse change in conditions of employment.

The Offences against Victims of Crime and Witnesses have also been defined in this Bill. They include: threatening; causing hurt; causing grievous hurt; wrongful restraint; causing forceful or deceitful movement; damage or destruction to property; harassment or loss or damage to whistle-blowers; unlawful or unauthorized divulging of information regarding informants or witnesses; providing a gratification to another to desist from providing information or instituting legal proceedings; providing false information to obtain protection; unlawful or unauthorized release of information relating to the providing of protection, and thereby placing the life of the protected person in danger.

This Bill also makes provisions to establish a National Authority for the Protection of Victims of Crime and Witnesses. This would be a statutory body tasked with the primary responsibility of promoting and protecting the rights and entitlements of victims and witnesses. It would recommend to Government institutions, the measures to be adopted to protect the rights and entitlements of victims and witnesses. Further, it will maintain a Compensation Fund to provide interim relief to victims, pending a court of law formally awarding compensation. Together with the Victims of Crime and Witnesses Protection Division of the Sri Lanka Police, it will provide protection to witnesses and victims. Further, it will provide necessary assistance to victims and witnesses, such as facilitating treatment, reparation, restitution and rehabilitation. It will also recommend the adoption of new measures relating to victims; and investigate and inquire into infringements of rights and entitlements of victims of crime and witnesses.

This Bill also provides for a Board of Management tasked with the formulation of policy, supervision of administration and management, and control of the affairs of the Authority. There will be four persons chosen from the fields of criminal justice, appointed by the Constitutional Council. When the Constitutional Council does not appoint, within one month of the vacancy arising, the Minister of Justice, in consultation with the President, Chief Justice, Minister of Human Rights and the Attorney-General, shall make the appointment. That includes four persons chosen from the field of Human Rights, Secretary to the Ministry of Justice, Secretary to the Ministry in charge of the Police Department, Secretary to the Ministry of Human Rights, Secretary to the Ministry of Women's Affairs, Secretary to the Ministry in charge of the subject of Children, a member of the Human Rights Commission, a nominee of the Attorney-General and a Senior DIG nominated by the Inspector-General of Police.

There shall be a "Victims of Crime and Witnesses Assistance and Compensation Fund". The Authority will maintain a Fund to provide compensations to victims. The purpose of maintaining this Fund is to provide interim compensations to victims and assistance to victims and witnesses. The High Court and the Magistrate's Court can, when sentencing a convict, order him to pay an amount extending up to 10 per cent of the fine payable to the Compensation Fund. Additionally, the Parliament can vote funds to the Compensation Fund.

Protection to Victims and Witnesses, and the Victims of Crime and Witnesses Assistance and Protection Division will also be established under this law. This Division of the Police will be responsible for providing protection to victims and witnesses. They will undertake providing protection to them on a request by a victim or a witness; a recommendation by the Authority; a report from a law enforcement agency or a notification from a court of commission. This Division will conduct a threat assessment and thereafter enter into a MoU with the victim or the witness.

The nature of the protection given by this Bill could be summarized as follows: security to the person and his property; temporary housing or accommodation; permanent relocation; temporary or permanent employment; necessary finances; re-identification; and any other measure which may be necessary to protect the victim or the witness.

There will be a number of protective measures adopted by a Court or a Commission. The Courts and Commission would be empowered to adopt and enforce

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

necessary protective measures including the following: conducting proceedings in-camera; adoption of measures necessary to prevent the victim or witness from being subjected to unnecessary harassment; intimidation or influenced by seeing the accused present at the venue of the trial; preventing the identity and the background of the victim or the witness or relevant parts of their testimony from being disclosed to those other than the accused and his lawyers.

Protection could be withdrawn when it becomes not necessary any further and such occasions have been identified in the Bill and could be summarized as follows: when the need for protection no longer exists; when the victim or witness requests that protection be terminated; when the victim or witness refuses to receive protection; when protection is abused; when the victim or witness acts contrary to the terms of the MoU; and when the victim or witness is found to have given a false statement or testimony; or false information to obtain protection.

Sir, one of the most important features in this Bill is that the victim is entitled to receive compensation in the same proceedings unlike in the previous procedure where you had to file a separate civil action, which takes years and years, and by the time a decision is taken, the purpose of the claimant is virtually lost. But, this provides immediate relief. In the Bill it is provided that every High Court and Magistrate's Court convicting a person of any offence, can direct the convict to pay compensation to the victim of a crime, an amount extending up to Rs. 1 million. When compensation or damages are being considered by a civil court, this amount should be taken into consideration.

It further provides for testimony through the contemporaneous audio-visual links. The victim or the witness will be permitted to testify from a remote location via a cotemporaneous or near-contemporaneous audio-visual link. A court-appointed officer will remain at the remote location from where the victim or the witness is testifying, to provide authenticity to the process.

ගරු කථානායකතුමනි, මෙම පනතේ ඉතා උසස් අරමුණු ගණනාවක් අපි ඉහතින් සඳහන් කරන්න යෙදුණා. විශේෂයෙන්ම අපරාධ නඩුවක් ඔප්පු කර ගැනීමේදී සාක්ෂිකරුවෙකුට නිර්භයව තමන් දුටු දේ, ඇසූ දේ, තමන්ට දැනුණු දේ පිළිබඳව සාක්ෂියක් ඉදිරිපත් කිරීමට ඇති අයිතිය තහවුරු කරනවා වාගේම, අපේ රටේ නීතියේ දීර්ඝ කාලයක් තිස්සේ අවධානයට ලක් නොවුණ වින්දිතයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේදීත්, ඔවුන්ට ක්ෂණික සහන ලබා ගැනීමේ ක්‍රමවේදයක්, වැඩ පිළිවෙළක් මේ තුළ පවතිනවා. විශේෂයෙන්ම මේ නීතිය සකස් කිරීමේදී මීට අදාළ නීති තත්ත්වයන් ජාත්‍යන්තර මට්ටමෙන් පිළිගත්ත ප්‍රමිතීන් පවතිනවා. මේක ඒ ප්‍රමිතීන්වලට අනුකූලව සකස් කරලා ඉදිරිපත් කරපු පනත් කෙටුම්පතක්. එම නිසා අපේ රටේ නීතිය හා සාමය ආරක්ෂා කර ගැනීම, යුක්තිය හා සාධාරණත්වය ඉටු කර ගැනීම යනාදී කරුණු තුළින් අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කර ගැනීමට මේ පනත මඟින් විශාල දායකත්වයක් ලැබෙනවා කියන කරුණ සිහිපත් කරමින් මේ උත්තරීතර සභාවේ සියලු දෙනාගේම සහාය මෙම පනත් කෙටුම්පත සම්මත කර ගැනීමට බලාපොරොත්තු වෙමින් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මම නිහඬ වෙනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

බොහොම ස්තුතියි. ගරු ඇමතිතුමනි, සමහර අය පැමිණිලිවලට රිමාන්ඩ් කරනවා. ඊට මාස දෙක තුනකට පස්සේ නඩුවක් නැහැ කියලා නිදහස් කරනවා. ඒ වාගේ අයට පුද්ගලිකව සිදු වන හානිය පිළිබඳවත් මෙතැනදී අවධානය යොමු වෙනවාද? ඔබතුමාගේ අවධානය යොමු කරනවා, ඒ පිළිබඳවත් සොයා බලන්න කියලා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු කථානායකතුමනි, ඒ පිළිබඳව මූලික අයිතිවාසිකම් නඩු කටයුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12, 13, 14 ව්‍යවස්ථා යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කිරීමේ හැකියාව තිබෙනවා. ඔබතුමා මතු කළ කාරණය සම්බන්ධව පීඩාවට පත් වූ පාර්ශ්වයක් විධියට සලකලා එක පැත්තකින් දැනට රටේ පවතින නීතිය අනුව, ද්වේශසහගත ලෙස නඩු පැවරීමක් - malicious prosecution - තුළින් කෙනෙකුට වෙච්ච අපහසුතාව සම්බන්ධව සිවිල් නඩුවක් ඉදිරිපත් කිරීමේ හැකියාව තිබෙනවා. ඊට අමතරව මූලික අයිතිවාසිකම් නඩුවක් හරහා ඒ කාරණය අභියෝගයට ලක් කරන්න පුළුවන්, ගරු කථානායකතුමනි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා. ඊට පෙර ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.
அதன்பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.
Whereupon MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *took the Chair.*

[අ.භා. 2.23]

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින ගරු අධිකරණ ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන්නට යෙදුණු, අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත ඉතාමත්ම කාලෝචිත පනත් කෙටුම්පතක් වශයෙන් හඳුන්වන්නට පුළුවන්. ඇත්ත වශයෙන්ම මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගන්නට අදහස් කළේ මීට අවුරුදු කීපයකට ඉස්සෙල්ලායි. මා දන්නා පරිදි 2012 දී මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කර ඒ ගැන

සාකච්ඡා කළා. නමුත් අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා කිව්වා, මේ පනත් කෙටුම්පත 2007 දී ඉදිරිපත් වුණාය කියලා. සමහර විට ඒක සිදු වන්නට ඇති. 2012 දී අපේ අනුකමිටුවක් තිබුණා, නීතිමය කරුණු ගැන විමර්ශනය කරන. නීතිමය කරුණු ගැන විමර්ශනය කරන ඒ කමිටුව මඟින් දෙවතාවක් මේ පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කරලා, යම් යම් සංශෝධනයන් සමඟ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න තීන්දු තීරණ ගත්තා. ඒ වෙලාවේත් අධිකරණ ඇමති වෙලා හිටියේ අද මේ ආණ්ඩුවේ ඇමතිවරයකු වශයෙන් කටයුතු කරන රවුෆ් හකීම් මහත්මයායි. එතුමා බොහොම මහන්සි වෙලා මේ කටයුත්ත කළා කියන කාරණයත් මම මේ අවස්ථාවේ දී කියන්නට ඕනෑ.

මේ පනත් කෙටුම්පත අපිට ඕනෑ නැතිව තිබුණු දෙයක් හෝ අපි සැලකිල්ලක් නොදක්වපු දෙයක් නොවෙයි. මේ පනත් කෙටුම්පත හැකි තරම් ඉක්මනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගන්නට අපිට ඒ වෙලාවේ අවශ්‍ය වුණා. අද සිටින අධිකරණ ඇමතිතුමා මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙන ඒමට ඉදිරිපත් වීම ගැන අපි සන්තෝෂ වනවා. ඇත්ත වශයෙන්ම අපේ රටේ සමාජ සංවර්ධනය සඳහා, සමාජයේ පැවැත්ම සඳහා ක්‍රියාත්මක කළ යුතු අපරාධ නීති සමූදායක් තිබෙනවා. අපරාධ නීති තිබුණත්, බොහෝ විට ඒ අපරාධ නීති ක්‍රියාත්මක කිරීමේ දී අඩු පාඩුකම් සිදු වන බව අපි දකිනවා. සාමාන්‍ය ව්‍යවහාරයක් වාගේම සම්මතයක් තිබෙනවා, අපේ රටේ අපරාධ නඩු සියයක් ගොනු කළාම එයින් ඔප්පු වන්නේ හතරයි කියලා. එතකොට විශාල නඩු ප්‍රමාණයක චූදිතයන් නිදහස් වෙනවා. ඒ අය නිදහස් වෙන්නේ බොහෝ විට සාක්ෂි මදිකම නිසා, සාක්ෂි නොමැති වීම නිසා, එහෙම නැත්නම් සාක්ෂිකාරයන් පසුව තමුන්ගේ මුල් කට උත්තරයට පටහැනිව සාක්ෂි දීම නිසායි. චූදිතයන් නිදහස් වීමට මෙවැනි කරුණු හුඟක් දුරට බලපානවා. මෙහිදී විශාල නඩු ප්‍රමාණයක් නිෂ්ප්‍රභ වෙනවා. ඒ තත්ත්වය මේකෙන් මඟ හැරෙනවා කියලා මම හිතනවා. මම එහෙම කියන්නේ මොකද, ඇත්ත වශයෙන්ම චින්දිතයන්ට, විශේෂයෙන්ම සාක්ෂිකරුවන්ට ඔවුන්ගේ ආරක්ෂාව සලස්වන්නටත්, ඔවුන්ට සහාය දීමටත් මේ පනත් කෙටුම්පතින් විධිවිධාන සැලැස්වෙන නිසයි.

අප දන්නවා, සාක්ෂිකාරයින් බොහෝ විට අපරාධකරුවන්ගේම තර්ජනවලට, ගර්ජනවලට ලක් වන බව. ඒ අයගේ ගෙවල් දොරවල්වලට පවා හානි සිද්ධ වනවා. මේ නිසා සාක්ෂිකාරයෝ ඉදිරිපත් වෙන්න අකැමැතියි. හුඟක් තැන්වල අපරාධයක් සිද්ධ වුණාම පොලීසියට තිබෙන ලොකුම දුෂ්කරතාවක් තමයි, ඒ අපරාධය දැකපු අය සිටියත් සාක්ෂි දීම සඳහා කෙනෙකු ඉදිරිපත් නොවීම.

උසාවියට ගිහිල්ලා ඒ අපරාධකරුට විරුද්ධව චෝදනා නඟලා, ඒ චෝදනා සම්බන්ධව කරුණු ඉදිරිපත් කරලා, සාක්ෂිවලින් ඒ බව තහවුරු කරන්න බැරි වුණාම අපරාධකරු නිදහස් වෙනවා. ඒ අපරාධයට ලක් වුණු චින්දිතයාට සහනයක් නැති තත්ත්වයකට පත් වෙනවා. මම හිතන විධියට මෙවැනි තත්ත්වයට පත් වන අවස්ථා බොහොමයක් අද අපේ සමාජයේ තිබෙනවා. බොහොමයක් අපරාධකරුවන් නිදැල්ලේ, අයාලේ සිටිනවා. එහෙම සිටින්න පුළුවන් වෙලා තිබෙන්නේ, ඒ අය කරන අපරාධ සම්බන්ධව අධිකරණයට ගිහිල්ලා ප්‍රකාශ ඉදිරිපත් කරලා, ඒ බව තහවුරු කරන්න සාක්ෂිකරුවන් ඉදිරිපත් නොවෙන නිසායි. මේ පනත් කෙටුම්පතේ තිබෙන විධි විධානවලින් මේ තත්ත්වය හුඟක් දුරට මඟහැර ගන්න පුළුවන් වෙයි කියලා මා හිතනවා. යම් යම් සාක්ෂිකරුවන්ට තර්ජනය කරනවාය, හිරිහැර කරනවාය කියලා යම් යම් විධියේ චෝදනා ආවාම ඒ චෝදනා සම්බන්ධව පරීක්ෂා කරලා අවශ්‍ය පියවර ගන්නට මේ පනත් කෙටුම්පත යටතේ අධිකාරියක් පිහිටුවලා, ඒ අධිකාරියෙන් කටයුතු යොදලා තිබෙනවා.

චින්දිතයන් යම් යම් සිද්ධීන්වලට මුහුණ පාන අවස්ථා තිබෙනවා. යම් යම් සිද්ධීන්වලට භාජන වෙලා නොයෙක් විධියේ අපහසුතාවලට, පීඩනවලට ලක් වෙලා දුක් දොම්නසින් ජීවත් වන්නට සිදු වන තත්ත්වයට ඒ ගොල්ලන් පත් වෙනවා. සමහර විට නොයෙක් විධියේ දරුණු අපරාධවලට ලක් වුණු චින්දිතයන් ආරෝග්‍යශාලාවල ඉඳලා සුවයට පත් වුණත්, ඒ අයට ඊට පසුව රැකියාවක් කර ගන්න බැරි තත්ත්වයට පත් වන අවස්ථා තිබෙනවා. ඒ ගොල්ලන් අබලන් තත්ත්වයට, ආබාධිත තත්ත්වයට පත් වන අවස්ථා තිබෙනවා. ඒ නිසා ඒ අය පිළිසරණක් නැති තත්ත්වයට පත් වෙනවා. මහෙස්ත්‍රාත් උසාවියෙන්, නැත්නම් මහාධිකරණයෙන් චූදිතයාට දඬුවම් කළත්, ඒ චින්දිතයන්ට සිවිල් උසාවියට ගිහිල්ලා වන්දි ලබා ගැනීමට දෙවැනි වරටත් නඩුවකට යන්න ඔවුන්ට මූල්‍යමය ශක්තියක් නැහැ. මේ නිසා හුඟක් අය මහෙස්ත්‍රාත් උසාවියෙන් ලබා දෙන තීන්දුවෙන් විතරක් සෑහීමකට පත් වෙලා ගෙදරට වෙලා ඉන්නවා. නමුත් ඔවුන්ට පෞද්ගලිකව ලැබෙන සහනයක්, ප්‍රයෝජනයක්, එහෙම නැත්නම් මූල්‍යමය ආධාරයක් නැහැ. එහෙම ලබා ගන්න ක්‍රමයකුත් නැහැ.

ඇත්ත වශයෙන්ම මේ පනත් කෙටුම්පතේ විධි විධාන ගැන බොහොම සතුටුයි. මොකද, මේ පනත් කෙටුම්පතේ විධි විධාන අනුව මහාධිකරණයට හෝ මහෙස්ත්‍රාත් අධිකරණයට පුළුවන්කම තිබෙනවා, පළමු වැනි නඩුවෙන්ම ඒ චින්දිතයාට වන්දි ගෙවන්න. රුපියල් මිලියනයකට නොවැඩි මුදලක් වන්දි වශයෙන් ඔහුට ලබා දෙන්න ඒ අධිකරණයට අයිතිය තිබෙනවා. ඒක ඉතාම හොඳ දෙයක්.

ඒ වාගේම තව දුරටත් මෙහි සලසා තිබෙන විධි විධාන අතර අපරාධයක චින්දිතයන්ට හා සාක්ෂිකරුවන්ට සහය හා ආරක්ෂාව සැපයීමේ අරමුදලක් තිබෙනවා. අධිකරණය විසින් යම් කිසි දඩයක් නියම කළාම ඒ දඩයෙන් සියයට 20ක් ඒ අරමුදලට දායක වන්නට ඕනෑ. ඒ මුදල එහෙම නැත්නම් ඒ අරමුදල උපයෝගී කර ගැනීමෙන් ඒ අයට තවදුරටත් පහසුකම් ලබා දෙන්නට පුළුවන්කම ලැබෙනවා. ඒ වාගේම මෙහි සලසා ඇති විධි විධාන තුළින් සාක්ෂිකරුවන්ගේ අනන්‍යතාව ආරක්ෂා වන විධියට, ඒ අයගේ අනන්‍යතාව හෙළි නොවන විධියට විනිශ්චයකාරතුමාගේ නිල කාමරයේ දී සාක්ෂි දෙන්නට ඒ අයට පුළුවන්කම ලැබෙනවා. එය ඉතා හොඳ දෙයක්. මොකද, ප්‍රසිද්ධියේ සාක්ෂි දීලා තමන්ගේ අනන්‍යතාව හෙළි කර ගන්න සමහර අය කැමැති නැහැ. එහෙම හෙළි කළාම නඩුවල පාර්ශ්වකාරයන් වශයෙන් සිටින ඉතාමත් ප්‍රචණ්ඩකාරී උදවිය ඊට පසුව ඒ අයට හිරිහැර කරන අවස්ථා තිබෙනවා. සාක්ෂි දීලා අධිකරණයෙන් යන කොට යම් යම් අයට පහර දීපු අවස්ථා ගැන අපි අහලා තිබෙනවා. සමහර අයට වෙඩි තියලා මරා දමන, පිහියෙන් අනින අවස්ථා තිබෙනවා. මෙවැනි සිද්ධීන් ලංකාවේ ඕනෑ තරම් සිදු වෙලා තිබෙනවා. මෙවැනි සිදුවීම් නිසා මිනිසුන්ට ලොකු භයක් තිබෙනවා, අධිකරණයට ඇවිල්ලා සාක්ෂි දෙන්න. බොහෝ අවස්ථාවල සාක්ෂි දීලා, ආරක්ෂාවක් නැතිව තනියම යනකොට ඒ සාක්ෂිකරුවන්ට හානි සිදු කරන්න, තර්ජනය කරන්න යම් යම් ප්‍රචණ්ඩකාරී පුද්ගලයින්ට පුළුවන්කම ලැබෙනවා. විනිශ්චයකාරවරයාගේ නිල කාමරයේ දී ඒ පරීක්ෂණ සිදු කිරීම තුළින් මෙන්න මේ තත්ත්වය වළක්වා ගන්නට සමහර විට පුළුවන්කම ලැබේවි. මේ අනුව එම පරීක්ෂණයේ දී ඕනෑම කෙනකුට සාක්ෂි දෙන්න පුළුවන්කම ලැබෙනවා වාගේම, ඊට පසුව ඔවුන්ගේ අනන්‍යතාව ආරක්ෂා කරගෙන, එහෙම නැත්නම් හෙළි කර ගන්නේ නැතිව යන්නටත් පුළුවන්කම ලැබෙනවා.

මේ ආකාරයට ඉතාමත් වැදගත් විධි විධාන රාශියක් මේ පනත් කෙටුම්පත තුළ අඩංගු වෙලා තිබෙනවා. ඒ වාගේම මෙහි සඳහන් අධිකාරිය ගැන බැලුවාම එය ඉතාම විශාල බලයක් සහිත අධිකාරියක්. මේ විධියේ වැඩ පිළිවෙළක් සහිත පනත් කෙටුම්පතක් අද ඉදිරිපත් කරලා, මේ රටේ අධිකරණයේ මෙතෙක් පැවැති අඩුවක් සම්පූර්ණ කරන්නට කටයුතු කර තිබෙනවා. විශේෂයෙන්ම අපරාධ නීතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි අපහසු

[ගරු ඩබ්ලිව්.ඩී. ජේ. සෙනෙවිරත්න මහතා]

තත්ත්වයක් තිබුණු අවස්ථාවක ඒ ක්ෂේත්‍රයේ අපහසුකම් නැති කරන්නට කටයුතු කිරීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මගේ වචන කිහිපය අවසන් කරනවා.

[අ.භා. 2.33]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Plantation Industries and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2007 දී ගරු මහින්ද සමරසිංහ මැතිතුමා ශ්‍රී ලංකා රජය නියෝජනය කරමින් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයේ දී පැහැදිලිව පොරොන්දුවක් දුන්නා, අද මේ සාකච්ඡා කරන පනත් කෙටුම්පත නීතිගත කරනවා කියලා.

එපමණක් නොවෙයි, එතුමා 2007 දී පොරොන්දුවක් දුන්නා දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සක්‍රිය කරනවා කියලා. මොකද, සාමාජිකයන් පත් කරන්නේ නැතුව 2007 දී දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අක්‍රිය වෙලා තිබුණේ. ඒ වාගේම තොරතුරු දැන ගැනීමේ අයිතිය තහවුරු කිරීම සඳහාත් පනතක් ගේනවා කියලා 2007 දී පොරොන්දුවක් දුන්නා. නමුත් 2009 දී යුද්ධයේ අවසානයත් සමඟ ඒ පොරොන්දු සියල්ල පසු ගිය රජය විසින් අමතක කර දැම්මා. එසේ අමතක කිරීම නිසා තමයි අපට GSP සහනය නැති වුණේ. [බාධා කිරීමක්] මේ පනත් කෙටුම්පත 2008 දී ගෙනැල්ලා දැනට අවුරුදු 7ක් වෙනවා. මම එදාත් පාර්ලිමේන්තුවේදී මේ ගැන කථා කළා. ඒ හැන්සාඩ් වාර්තාව මට ඉදිරිපත් කරන්න පුළුවන්.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

2007 දී පොරොන්දු වුණා. නමුත් පනත් කෙටුම්පත ගෙනාවේ 2012 දීයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Hon. John Senewiratne, I have that Hansard here with me. What are you talking? මම මේක ගැන කථා කළා. ඒකයි මම දන්නේ. 2007 දී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයට පොරොන්දුවක් දුන්නා. එදා මම පාර්ලිමේන්තුවේදී පැයක් කථා කළා. ඒකයි මම දන්නේ. ඒ හැන්සාඩ් වාර්තාව මගේ ළඟ තිබෙනවා. මේ කටයුත්ත අතරමඟ නැවැත්තුවා. Your government stopped this. මොකද, මේක කරන්න ආණ්ඩුවට දේශපාලන වුවමනාවක් තිබුණේ නැහැ. ඇත්ත වශයෙන්ම ඒකයි වුණේ. 2008 දී කිව්වා "අපි තව පනතක් ගේනවා" කියලා. නමුත් ගෙනාවේ නැහැ.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ චෝදනාව වැරැදියි. 2007 දී එතුමා ඒක පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කරලා තිබෙනවා. ඒක අපි නැහැ කියන්නේ නැහැ. නමුත් මේක පනත් කෙටුම්පතක් වශයෙන් සකස් කරලා මේ ගරු සභාවට ඉදිරිපත් කළේ 2012 දීයි. [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Please do not waste my time. කොහොම හරි තුනෙන් දෙකේ බලයක් තියාගෙන පසු ගිය රජයට අවුරුදු 7ක් යන තෙක් මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගේන්න වුවමනාවක් තිබුණේ නැහැ. ඒ නිසා අද අපට මේ කටයුතු කරන්න සිද්ධ වෙලා තිබෙනවා. පසු ගිය රජය ලබා දුන් පොරොන්දු ක්‍රියාත්මක කිරීමට අපි බැඳී ඉන්නවා.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

Hon. Minister, we are supporting this Bill.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

I want to put the record straight.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

There was no delay as such. This was tabled in 2012 and the Hon. Minister spoke about it.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මම දන්නවා, තමුන්නාන්සේලා අද මේකට සහයෝගය දෙන බව. නමුත් මම කියන්නේ මේකයි. 2007 දී පොරොන්දුවක් දීලා, 2008 දී මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනැල්ලා, අද 2015 දී නව රජයක් යටතේ තමයි මේ පනත් කෙටුම්පත සම්මත වෙන්නේ. තමුන්නාන්සේලාට තුනෙන් දෙකක බලයක් තිබුණා.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

2007 දී ඒ ගැන ප්‍රකාශ කළ බව ඇත්ත. පනත් කෙටුම්පත ගෙනාවේ ඊට පස්සේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

I want to set the record straight as to what happened. I am happy that you are supporting it. අපි සතුටු වෙනවා. මේවා ඇත්ත සිද්ධි. 2009 වසරේ යුද්ධය අවසානයත් සමඟ මේ පනත, දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන එනවාය කියා පොරොන්දු වුණා. තොරතුරු දැන ගැනීමේ අයිතිය ලබා දෙනවාය කිව්වා. ඒ සියල්ලම ජාත්‍යන්තරයට දුන්නු පොරොන්දුයි. ඒක නැහැයි කියන්න බැහැ. නමුත් ඒවා ඔක්කොම අමතක කළා. ඒ අමතක කරපු නිසා තමයි පසු ගිය කාලයේ ජාත්‍යන්තරයත් එක්ක අපේ රටේ යම් යම් ප්‍රශ්න ඇති වුණේ. මේවා ක්‍රියාත්මක කරන්න නව රජය බැඳී සිටිනවා. තමුන්නාන්සේලා සහයෝගය දෙන එක ගැන අපි සතුටු වෙනවා. මොකද, පසු ගිය රජය කාලයේ අපේ ගරු ජෝන් සෙනෙවිරත්න මැතිතුමා වාගේ අයට මෙය කරන්න වුවමනාවක් තිබුණත් කරන්න බැරි තත්ත්වයක් තිබුණා. ඒක අපි පිළිගන්නවා. විධායක ජනාධිපති ධුරය අහෝසි කරන්න වුවමනාව තිබුණාට, ඒක අහෝසි කරන්න කියලා නැඟිටලා කියන්න තමුන්නාන්සේලාට ශක්තියක් තිබුණේ නැහැ. තොරතුරු දැන ගැනීමේ අයිතිය ගෙනෙන්න කියන්නට තමුන්නාන්සේලාට

ශක්තියක් තිබුණේ නැහැ. අපි දැන් ඒ ශක්තිය ලබලා දීලා තිබෙනවා. අපි දැන් මේවා කරනවා. අපි මේවා කරන කොට තමුන්නාන්සේලා සහයෝගය දෙනවා නම් ඒක රටට හොඳයි. It is good for the country. ඒකයි මම කියන්නේ. මේවා රටට අවශ්‍යයි. අද ගෙනෙන මේ පනත රටට අවශ්‍යයි. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අවශ්‍යයි. ස්වාධීන කොමිෂන් සභා අවශ්‍යයි. තොරතුරු දැන ගැනීමේ අයිතිය අවශ්‍යයි. මේවා තමුන්නාන්සේලා ලබා දුන්නු පොරොන්දු. තමුන්නාන්සේලා ඉෂ්ට කළේ නැති නිසා තමයි අපට මේවා කරන්න සිදු වෙලා තිබෙන්නේ.

අද ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා කථා කරන වෙලාවේ යුද අපරාධ ගැන කිව්වා. මම තමුන්නාන්සේලාට කියන්න කැමැතියි, 2009 වර්ෂයේ මැයි මාසයේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම් ලංකාවට ආවාම, යුද්ධය අවසාන කාලයේ සිදු වුණ දේවල් ගැන අභ්‍යන්තර පරීක්ෂණයක් කරනවා කියලා පොරොන්දු වුණේ හිටපු ජනාධිපතිතුමා බව. අපි නොවෙයි. අපි ආණ්ඩුවේ හිටියේ නැහැ. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම් එක්ක ලිඛිත ගිවිසුමක් අත්සන් කළා. මම හිතන හැටියට පාර්ලිමේන්තුවේදී මම ඒක සිය වතාවක් විතර ඉදිරිපත් කරලා තිබෙනවා. අපි නොවෙයි, හිටපු ජනාධිපතිතුමා තමයි අභ්‍යන්තර පරීක්ෂණයක් කරනවාය කියලා පොරොන්දු වුණේ. ඒ පොරොන්දුව ඉෂ්ට නොකළ නිසා තමයි ඒක වර්ධනය වෙලා, වර්ධනය වෙලා අවසාන වශයෙන් ජාත්‍යන්තර පරීක්ෂණයක් දක්වා ගියේ. වැඩිය කියන්න ඕනෑ නැහැ, උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ ජනාධිපති කොමිසමේ වාර්තාව - LLRC වාර්තාව - සිද්ධීන් හතක් සම්බන්ධයෙන් කියලා, ඒ සිද්ධීන් හත පරීක්ෂා කරන්න කිව්වා. ඒකවත් කළේ නැහැ. අපි නොවෙයි, තමුන්නාන්සේලා තමයි මේකට ජාත්‍යන්තරය සම්බන්ධ කර ගත්තේ. තමුන්නාන්සේලා තමයි ඒ පොරොන්දුව දුන්නේ, "අපි අභ්‍යන්තර පරීක්ෂණයක් කරනවා" කියලා. ඒක තමුන්නාන්සේලා කළේ නැහැ. තමුන්නාන්සේලා ඒක කළා නම් මෙය ජාත්‍යන්තරය දක්වා යන්නේ නැහැ. එක්සත් ජාතීන්ගේ සංවිධානය හැම දාම කිව්වේ "අපි මේවා කරන්න කැමැති නැහැ" කියලායි.

රටේ නීතියක් තිබෙනවා නම්, අධිකරණයක් තිබෙනවා නම්, පොලීසියක් තිබෙනවා නම් "තමුන්නාන්සේලා මේක කරන්න" කියලා තමයි ඔවුන් හැම දාම කිව්වේ. ජාත්‍යන්තරය මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන්න ඕනෑය කියලා කිසිම දවසක කියලා නැහැ. ඒ අය හැම දාම කිව්වේ ශ්‍රී ලංකාවට පරීක්ෂණයක් කරන්න කියලායි. අන්තිමට මොකක්ද වුණේ? තමුන්නාන්සේලා ඒක කළේ නැහැ. කළේ නැති නිසා මේ කාරණය ජාත්‍යන්තරයට ගිහින් අද මුළු රටටම ප්‍රශ්නයක් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පනත් අවශ්‍ය වන්නේ ඇයි? රටක ආර්ථිකයක් දියුණු කරන්න ජාත්‍යන්තර සම්මුතීන් අනුව වැඩ කිරීම අවශ්‍යයි. ජාත්‍යන්තරයට අප දීලා තිබෙන පොරොන්දු, සම්මුතීන් අනුව වැඩ කළේ නැත්නම් අපට ආර්ථික වශයෙන් සම්බාධක එනවා. GSP සහනයට අපට සම්බාධක ආවා. GSP සම්බාධකය ආවේ ලංකාවේ තිබුණු තත්ත්වය නිසායි. තමුන්නාන්සේලාට නැහැ කියන්න බැහැ. යුරෝපා හවුල කිව්වා, ස්වාධීන කොමිෂන් සභා ටික ඇති කරන්න, යහ පාලනයක් ඇති කරන්න, තොරතුරු දැන ගැනීමේ අයිතිය ක්‍රියාත්මක කරන්න කියලා. තමුන්නාන්සේලා ඒවා කළේ නැහැ. ඒ නිසා මුල ඉඳලාම මේ දේවල් ආරම්භ කරන්න දැන් අපට සිද්ධ වෙලා තිබෙනවා.

ඊයේ ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත සම්මත වුණු නිසා අපේ ධීවරයන්ට එන සම්බාධක නවතිනවා. අපේ රටේ ආර්ථිකය දියුණු කරන්න ඕනෑ. අපේ පක්ෂය පොරොන්දු වෙලා තිබෙනවා මැතිවරණයෙන් පසුව රැකීරක්ෂා ලක්ෂ 10ක් දෙනවා කියලා. එය ක්‍රියාත්මක කරන්න නම් අපට ජාත්‍යන්තර සහයෝගය අවශ්‍යයි. අපේ අපනයනවලින් සියයට 60ක් යන්නේ යුරෝපයට, ඇමෙරිකාවට හා බ්‍රිතාන්‍යයටයි. ඒ නිසා මේ නීතිරීති රටට අවශ්‍යයි. විපක්ෂය මේවාට සහයෝගය ලබා දීමට කැප වීම ගැන මම සතුටු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පත අනුව පොලීසියට විශාල රාජකාරියක් පැවරිලා තිබෙනවා. පොලීසිය ස්වාධීන නැත්නම් මේ රාජකාරිය කරන්න පුළුවන්ද? අද මේ ගෙනාපු පනත් කෙටුම්පතත් දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ Police Commission එකත් එක්ක වෙළී, ගැටී තිබෙන ක්‍රියාදාමයක්. අද ඉදිරිපත් කර තිබෙන මේ අපරාධයක විත්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත මඟිනුත් පොලීසියට තමයි කියන්නේ, මේ අය ආරක්ෂා කරන්න කියලා. එතකොට පොලීසිය ස්වාධීන නැත්නම් ආරක්ෂාව දෙන්න පුළුවන්ද? පොලීසිය ස්වාධීන වෙන්න ඕනෑ. ඊළඟ මාසයේ මේ පනත් කෙටුම්පත් සියල්ලම අප පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. ඒ අවස්ථාවලදී ඒවාට තමුන්නාන්සේලාගේ සහයෝගය ලබා දෙන්න කියා ඉල්ලා සිටිමින්, මගේ කථාව අවසන් කරනවා.

[පි.ප. 2.42]

ගරු කන්දයියා ප්‍රේමචන්ද්‍රන් මහතා
(மாண்புமிகு கந்தையா பிரேமச்சந்திரன்)
(The Hon. Kandiah Premachandran)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்று இந்தச் சபையிலே குற்றச் செயல்களுக்குப் பலியாக்கப்பட்டோருக்கும் சாட்சிகளுக்குமான உதவி மற்றும் பாதுகாப்புச் சட்டமூலம் விவாதத்துக்காகச் சமர்ப்பிக்கப்பட்டிருக்கின்றது. இந்தச் சட்டமூலம் பல ஆண்டுகளுக்கு முன்பே சமர்ப்பித்திருக்கப்பட வேண்டிய ஒன்று. ஏற்கெனவே கௌரவ ஜோன் செனெவிரத்ன அவர்கள் கூறியதுபோன்று, இச்சட்டமூலத்தை 2012ஆம் ஆண்டில் கொண்டுவருவதற்கு முயற்சிக்கப்பட்டாலும் பின்னர் அதுவும் கைவிடப்பட வேண்டிய ஒரு சூழ்நிலை இருந்தது. இந்த நாட்டில் பல்லாயிரக்கணக்கான மக்கள் பல்வேறுபட்ட சந்தர்ப்பங்களில் கொன்றுகுவிக்கப்பட்டிருக்கின்றார்கள். அது தொடர்பான விசாரணைகள் வருகின்றபோது சாட்சிகளைக் கொண்டுவர முடியாத நிலைமைகள் இருந்திருக்கின்றன. சாட்சிகளுக்கு எந்தவிதமான பாதுகாப்பும் இல்லாமல் இருந் திருக்கின்றது. இந்தச் சாட்சிகளுக்கான பாதுகாப்பு இருந்திருக்குமாக இருந்தால், பல்வேறுபட்ட சந்தர்ப்பங்களில் பல்வேறு குற்றச்சாட்டுக்களை நிரூபிக்கக்கூடியதாக இருந் திருக்கும். எனவே, சாட்சிகளுக்கான பாதுகாப்புச் சட்ட மென்பது மிகமிக அவசியம் என்பதுடன், நான் இன்னுமொரு விடயத்தையும் இந்தச் சபையினுடைய கவனத்துக்குக் கொண்டுவர விரும்புகின்றேன்.

யுத்தம் முடிவடைந்து ஐந்தரை வருடங்கள் கடந்துவிட்ட பின்பும் பயங்கரவாதத் தடுப்புச் சட்டம் என்பது இன்னமும் நடைமுறையில் இருக்கின்றது. இப்பொழுதுகூட பொதுமக்கள் பயங்கரவாதத் தடுப்புச் சட்டத்தின்கீழ் கைதுசெய்யப்படுவதும் 18 மாத காலம் விசாரணையின்றித் தடுத்து வைக்கப்படுவதும் தொடர்ச்சியாகவே நடந்துகொண்டிருக்கின்றது. மிக அண்மை யில், ஏறத்தாழ 7-8 மாதங்களுக்கு முன்பாக, கிளிநொச்சியில் ஒரு வயதான அம்மாவும் ஒரு சிறுபிள்ளையும்கூட இந்தப் பயங்கரவாதத் தடுப்புச் சட்டத்தின்கீழ் கைதுசெய்யப்பட்டு, இன்றுவரை அவர்கள் விசாரணையில்லாமல் விளக்கமறியலில் வைக்கப்பட்டிருப்பதை நாங்கள் பார்க்கின்றோம். ஆகவே,

[ගරු කන්දයියා ප්‍රේමචන්ද්‍රන් මහතා]

இந்தப் பயங்கரவாதத் தடுப்புச் சட்டம் அமுலில் இருக்கும் வரையில் நாங்கள் இந்தச் சாட்சிகளைப் பாதுகாப்பதற்கான சட்டத்தைக் கொண்டுவந்தாலும், பயங்கரவாதத் தடுப்புச் சட்டத்தின்மூலம் பாதுகாப்புப் படையினருக்கும் பொலிஸாருக்கும் free hand - அவர்கள் விரும்பியவர்களைக் கைது செய்ய அதிகாரமுள்ளது. அவ்வாறு கைதுசெய்வது மாத்திரமல்ல, கைதுசெய்யப்பட்டவர்களைத் தொடர்ந்து 18 மாதங்கள் எந்தவிதமான விசாரணைகளுக்கும் உட்படுத்தாமல் வைத்திருப்பதற்கும் இச்சட்டம் வழிவகுக்கின்றது. ஆகவே, முதலாவதாக நாங்கள் செய்ய வேண்டியது என்னவென்றால், அந்தப் பயங்கரவாதத் தடைச் சட்டத்தை நீக்குவதுதான். அதன்மூலம்தான் அனாவசியமான கைதுகளைத் தவிர்க்க முடியும். சந்தேகத்தின்பேரில் கைதுசெய்வதுகூட பயங்கர வாதத் தடுப்புச் சட்டத்துக்குள் வருவதால், அந்த வகையில் கைதுசெய்யப்படுபவர் 18 மாதங்களுக்கு மேலாக விசாரணை களில்லாமல் தொடர்ந்து தடுப்புக் காவலில் இருப்பதற்கான சூழ்நிலைகளை இது ஏற்படுத்திக்கொடுக்கின்றது.

எனக்கு முன்பு இங்கு பேசிய மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல அவர்கள், இங்கு இந்த விடயங்கள் எவ்வாறு கையாளப்படுகின்றன என்று கூறினார். இதற்கு முன் இந்த நாட்டில் இடம்பெற்ற சில சம்பவங்கள் தொடர்பாக ஒருசில விசாரணை ஆணைக்குழுக்கள் நியமிக்கப்பட்டன. திருகோண மலையில் 5 மாணவர்கள் கொல்லப்பட்ட விடயத்தை ஓர் ஆணைக்குழு விசாரித்தது. மூதூரில், பிரான்ஸ் தொண்டர் நிறுவனத்தைச் சேர்ந்த 18 பேர் கொல்லப்பட்டார்கள். அதுபற்றிய விசாரணையை ஓர் ஆணைக்குழு நடத்தியது. ஆனால், இந்த விசாரணைகள் யாவும் சரியான முறையில் கையாளப்படாமல் இடைநடுவில் விடப்பட்டது மாத்திரமல்ல, சில அமைச்சர்களால் அவற்றின் சாட்சிகளும் பயமுறுத்தப் பட்டனர். சாட்சிகளில் ஒருவரான இறந்த ஒருவரின் தகப்பனாருக்கு "உங்களுக்கு நாங்கள் கொழும்பில் வீடு வாங்கித் தருகின்றோம்; தேவையான அளவுக்கு பணம் தருகின்றோம்; நீங்கள் இந்த ஆணைக்குழுவின்முன் சாட்சியமளிக்கக்கூடாது" என்று மிரட்டல் விடுக்கப்பட்டது. அதனால் அவர் இந்த நாட்டிலிருந்து வெளியேறித் தன்னையும் தனது குடும்பத்தையும் பாதுகாக்கின்ற நிலைமைக்குத் தள்ளப்பட்ட ஒரு சூழ்நிலைதான் இங்கு இருந்தது. ஆகவே, இந்த நிலைமைகள் மாற்றப்படவேண்டுமாக இருந்தால், நிச்சயமாக சாட்சிகளுக்கான பாதுகாப்புச் சட்டமென்பது மிகமிக முக்கியமான விடயமென நான் கருதுகின்றேன்.

இதுமாத்திரமல்ல, இந்த நாட்டில் ஒரு பாரிய யுத்தம் நடைபெற்றது. அந்த யுத்தத்தில் பல்லாயிரக்கணக்கானோர் கொல்லப்பட்டனர். கிட்டத்தட்ட 70,000 பேர் கொல்லப் பட்டிருக்கிறார்கள் என்று ஐ.நா. சபை கூறியது. அதுமாத்திர மல்ல, ஐ.நா.வினுடைய மனித உரிமைகள் பேரவையில் 3 தீர்மானங்கள் நிறைவேற்றப்பட்டன. அதில் மூன்றாவது தீர்மானம், ஐ.நா. சபை ஒரு சர்வதேச விசாரணையை நடத்தவேண்டுமென்பது. அந்த விசாரணையை ஐ.நா. சபை நடத்தியது. ஆனால், அந்த விசாரணையை இலங்கைக்குள் நடத்த முடியாது; நாங்கள் அவர்களை இங்கு வரவிட மாட்டோம் என்று முன்னைய அரசாங்கம் கூறிக் கொண்டிருந்தது. இங்கிருக்கின்ற சாட்சிகள் சாட்சியமளிப் பதற்கான சந்தர்ப்பங்கள் மறுக்கப்பட்டன. இங்கிருந்து எழுத்துமூலமாகச் சாட்சியம் கொடுப்பதற்கு முயற்சி செய்தவர் கைதுசெய்யப்பட்டு சிறையில் தள்ளப்பட்டார். அதற்கு உதவி செய்தவர் இன்று நாடு கடந்துபோய் இன்னமும் மறைமுகமாக வாழ்கின்ற நிலைமையில் இருக்கின்றார்.

அதுமாத்திரமல்ல, முன்னர் இருந்த ஆளும்கட்சி Spokesperson ஆக இருந்தவர், அவ்வாறாகச் சாட்சியம் அளிப்பது பிழையானது; சட்டத்துக்கு முரணானது என்று பல விடயங்களைக் கூறினார். அதனால், சாட்சிகளைச் சாட்சிய மளிக்கவிடாது அமைச்சர்களே அவர்களை அச்சுறுத்திய நிலைமைகளை நாங்கள் இங்கு தொடர்ச்சியாகப் பார்க்கக்கூடியதாக இருந்தது. எனினும், அந்த விசாரணை யாளர்கள் இந்த நாட்டுக்குள் வரமுடியாமல் இருந்தாலும்கூட, பாதிக்கப்பட்ட ஒருவரால் வெளியிலிருந்து அந்தச் சாட்சியங்கள் கொடுக்கப்பட்டு, விசாரணை அறிக்கை யொன்றை ஐ.நா. சபை தயாரித்திருக்கின்றது. ஆனால், இப்போது இலங்கையில் ஆட்சியிலிருக்கின்ற புதிய அரசாங்கம் அந்த அறிக்கையை இப்போது வெளியிட வேண்டாமென ஐ.நா. சபையிடம் கேட்டிருக்கின்றது. United Nations High Commissioner for Human Rights அண்மையில் ஒரு statement ஐ விடுத்திருக்கின்றார். அதில் அவர், "2015 செப்ரெம்பர் வரையில் நாங்கள் இந்த அறிக்கையை வெளியிடுவதில்லையென்று தீர்மானித்திருக்கின்றோம்" என்று குறிப்பிட்டுள்ளார்.

The High Commissioner has stated, “I have received clear commitments from the new Government of Sri Lanka indicating it is prepared to cooperate with my office on a whole range of important human rights issues which the previous Government had absolutely refused to do, and I need to engage with them to ensure those commitments translate into reality”. He further stated, “I have therefore decided, on balance, to request more time to allow for a stronger and more comprehensive report”.

ஆகவே, நீதி அமைச்சர், வெளிவிவகார அமைச்சர், சபை முதல்வர் ஆகியோரிடம் நான் கேட்க விரும்புவது என்னவென்றால், will the new Government acknowledge the UN international investigation via the office of the High Commissioner for Human Rights and agree to cooperate with its mandate? Will the new Government give immediate access to the OISL team to Sri Lanka? Will the Government accept and arrange the visits of Special Rapporteurs to Sri Lanka which are pending?

Sir, the visits of the Special Rapporteur on extrajudicial, summary or arbitrary executions, Special Rapporteur on freedom of expression and Working Group on enforced or involuntary disappearances, Special Rapporteur on summary executions, Special Rapporteur on torture and others are still pending for a long time since the Government of Sri Lanka has not accepted their requests or cooperated with their office.

The present Government has made a commitment to the United Nations High Commissioner for Human Rights to cooperate with him. So, I would like to know whether the Government will allow them to come to Sri Lanka for the investigations, so that a clear and a proper report can be given in the coming month of April. The Government wants to postpone the United Nations Human Rights Investigation Report. If they actually want it in September, they must tell it very clearly to the

people because the UN High Commissioner for Human Rights has said that the Government has made a range of commitments to him. Therefore, I would like to clearly know from the Government Benchers whether you will be doing that.

இதேசமயம் இன்னுமொரு விடயத்தையும் நான் குறிப்பிட விரும்புகின்றேன். இதற்கு முன்னைய அரசாங்கம் காணாமற் போனோரைக் கண்டுபிடிப்பதற்கென ஓர் ஆணைக்குழுவை நியமித்தது. ஏறத்தாழ இரண்டு வருடங்களாக அந்தக் குழு பல இடங்களில் அதைப்பற்றி விசாரணை செய்தது. தற்போது இந்த அரசாங்கம் அந்தக் குழுவின் நடவடிக்கைகளைத் தொடர்வதற்கு அனுமதித்திருக்கிறது. அந்த ஆணைக்குழு தொடர்ந்தும் விசாரணை செய்யட்டும்! ஆனால், கடந்த இரண்டு வருட காலத்தில் அவர்கள் செய்த விசாரணைகள் சம்பந்தமாக குறைந்தபட்சம் ஓர் இடைக்கால அறிக்கை யையாவது - Interim Report - இந்தச் சபைக்குச் சமர்ப்பிக்க வேண்டும். ஏறத்தாழ 20,000 பேர் காணாமற்போனதாகச் சொல்லப்படுகின்றது. அவர்கள் காணாமற்போனமை பற்றிய மனுக்கள் கொடுக்கப்பட்டிருக்கின்றன. இவற்றின் அடிப் படையில் இந்த இரண்டு வருட காலத்துக்குள் என்னென்ன விடயங்களைச் செய்திருக்கிறார்கள்? எவ்வளவுதூரம் அவர்கள் investigations செய்திருக்கிறார்கள்? காணாமற்போன எத்தனை பேரை அவர்கள் கண்டுபிடித்திருக்கிறார்கள்? போன்ற இன்னோரன்ன விடயங்களை நான் அறிய வேண்டியுள்ளது.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்த நாட்டில் மர்மமான முறையில் யாருக்கும் தெரியாதவாறு கடத்தப் பட்டோர் பல இடங்களில் இன்னமும் மறைத்து வைக்கப் பட்டிருப்பதாகச் சொல்லப்படுகின்றது. அதை நாங்கள் பூரணமாக நம்புகின்றோம். திருகோணமலையில் இருக்கின்ற கடற்படை முகாமில் ஏறத்தாழ 35 குடும்பங்கள் தடுத்து வைக்கப்பட்டிருந்தன. வெளியுலகத்துடன் எந்தவிதத் தொடர்பு மில்லாமல் அவர்கள் தடுத்துவைக்கப்பட்டிருந்தார்கள். அவர் களில் சிலர் விடுவிக்கப்பட்டிருக்கின்றார்கள். ஆனால், எத்தனை பேர் விடுவிக்கப்படாமல் காணாமற்போனார்கள் என்ற விடயம் ஒருவருக்கும் தெரியாது. விடுவிக்கப்பட்ட வர்களை வைத்திருந்ததற்கான ஆவணங்களும் கிடையாது; அவர்கள் கைதுசெய்யப்பட்டதற்கான ஆவணங்களும் கிடையாது. ஆனால், விடுவிக்கப்பட்ட சிலருடன் உண்மை யாகவே நான் பேசியிருக்கிறேன். திருகோணமலை கடற்படை முகாமில் 'கோட்டாபய' என்ற பெயரிலும் ஒரு முகாம் இருப்பதாகவும் கைதுசெய்யப்பட்ட மற்றும் surrender ஆகிய 700 இற்கும் மேற்பட்டவர்கள் அந்த முகாமில் வைக்கப் பட்டிருந்ததாகவும் அவர்கள் சொல்கிறார்கள். அவர்களுக்கு என்ன நடந்ததென்பது இன்றுவரை தெரியாத நிலை காணப்படுகின்றது. ஆகவே, இவ்வாறான இடங்கள் எங்கெங்கு இருக்கின்றன? என்பது பற்றி சட்டம் மற்றும் ஒழுங்குக்குப் பொறுப்பான அமைச்சராக இருக்கின்ற மாண்புமிகு ஜோன் அமரதுங்க அவர்கள் இந்தச் சபைக்கு அறிவிக்க வேண்டும். அந்தக் கடற்படை முகாமுக்குச் சென்று, இவ்வாறான பெயரில் அங்கு முகாம் இயங்கியதா? முன்னாள் பாதுகாப்புச் செயலாளர் இவற்றை நடத்தினாரா? என்பவை பற்றி விசாரித்து எங்களுக்குத் தெரிவிக்க வேண்டும். அங்கிருந்தவர்களுக்கு என்ன நடந்தது? எவ்வாறு அவர்கள் காணாமற்போனார்கள்? வெளியுலகத்துடனான அவர் களுடைய தொடர்புகள் ஏன் துண்டிக்கப்பட்டன? ஒன்றி ரண்டல்ல, சட்டத்துக்கு அப்பாற்பட்ட முறையில் பல நூற்றுக்கணக்கானவர்களை அவ்வாறு வைத்திருந்தார்கள்; சித்திரவதை செய்திருக்கிறார்கள். அவர்களுக்கு என்ன நடந்ததென்பது தெரியாது.

நீங்கள் transparency பற்றிப் பேசுகின்றீர்கள்!

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, you have only one more minute.

ගරු කන්දයියා ප්‍රේමචන්ද්‍රන් මහතා
(மாண்புமிகு கந்தையா பிரேமச்சந்திரன்)
(The Hon. Kandiah Premachandran)
I will conclude, Sir.

நல்லாட்சியைப் பற்றி, சட்டமும் ஒழுங்கும் பற்றிப் பேசுகின்றீர்கள்! புதியதோர் அரசாங்கம்! புதிய பாதை! எல்லாமே புதியது என்று கூறுகின்றீர்கள். நிச்சயமாக உங்களுடைய இந்த அரசாங்கத்தைப் பதவிக்குக் கொண்டுவருவதற்குத் தமிழ் மக்களும் பாரிய பங்களிப்புச் செய்திருக்கிறார்கள் என்ற வகையில், அந்த முகாம்களில் இருந்தவர்கள் எங்கே? அவர்களுக்கு என்ன நடந்ததென்பதைத் தயவுசெய்து நீங்கள் தமிழ் மக்களுக்குத் தெளிவாகவும் பட்டவர்த்தனமாகவும் சொல்ல வேண்டும். இப்பொழுது தமிழ் மக்களுடன் நல்லிணக்கத்துடன் செயற்படுவதாகச் சர்வதேச சமூகத்துக்கு நீங்கள் சொல்கிறீர்கள். அவையெல்லாம் உண்மையாக இருந்தால், நான் இந்தச் சபையில் கேட்ட கேள்விகளுக்கு தயவுசெய்து நீங்கள் பதில் சொல்ல வேண்டுமென்று கேட்டு, விடைபெறுகின்றேன்; நன்றி.

[අ.භා. 2.55]

ගරු තිලංග සුමතිපාල මහතා
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
නමෝ බුද්ධාය! මෙම විවාදයට එක් වන්නට ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. මීට පෙර අධිකරණ අමාත්‍යතුමා විධියට ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ප්‍රකාශයක් කළා. අපරාධ විත්දිතයන් සහ සාක්ෂිකරුවන් සම්බන්ධයෙන් වූ මේ පනත් කෙටුම්පත අවුරුදු ගණනාවක් තිස්සේ හුඟක් මහන්සි වෙලා ඉදිරිපත් කිරීම ගැන අපි සන්තෝෂ වෙනවා. අපේ ගරු ලක්ෂ්මන් කිරිඇල්ල අමාත්‍යතුමා කිව්වා වාගේ මේ සම්මත කර ගැනීමට යන පනත් කෙටුම්පත දිහා අපි බැලිය යුත්තේ, දේශපාලනය පැත්තෙන් නොවෙයි, ජනතාවට මෙයින් ඇති වන ප්‍රයෝජනය ගැනයි.

මෙහිදී මම වැදගත් කාරණයක් විධියට දකින කාරණයක් තිබෙනවා. විශේෂයෙන්ම දරුවන් සහ කාන්තාවන් යම් කිසි ආකාරයක පීඩනයකට හෝ අසාධාරණයකට ලක් වෙලා සාක්ෂි ඉදිරිපත් කරන්න වෙන අවස්ථාවේදී, ඒ අයට ප්‍රසිද්ධියේ සාක්ෂි දෙන්න වුණාම සහ නැවතත් උසාවියේ සාක්ෂි කූඩුවට නැඟලා සාක්ෂි ඉදිරිපත් කරන්න වුණාම ඒ අය එයින් ඈත් වෙන්න බලනවා. එවැනි අවස්ථාවල ඒ අය සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා අපරාධකරුවන් නිදහස් වෙනවා. මෙම පනත් කෙටුම්පත සම්මත කර ගැනීමෙන් පසු එවැනි අවස්ථාවන් මහ හැරලා අසාධාරණයට සහ කරදරයට ලක් වුණු අයට සාක්ෂි දීමේ විශේෂ වරප්‍රසාද ලැබෙනවා.

ගරු අධිකරණ ඇමතිතුමා අවබෝධතා ගිවිසුමක් ගැන සඳහන් කළා. සාමාන්‍යයෙන් නීතියක් සම්පාදනය කරන විට එයට අවබෝධතා ගිවිසුමක් ඇතුළත් කළොත්, ඒ සම්බන්ධයෙන් සම්පූර්ණ බලතල තිබෙන්නේ කාටද කියලා ගැසට් නිවේදනයක් මඟින් හෝ කියන්න ඕනෑ. එහෙම නැත්නම් කාලයෙන් කාලයට අවබෝධතා ගිවිසුම මඟින් පොලීසියේ නිලධාරියෙකුට හෝ පොලීසියේ යම් කිසි ආයතනයකට බලය දුන්නොත් ගැටලුකාරී තත්ත්වයන් ඇති වන්නට පුළුවන්. මේ පනත් කෙටුම්පතේ ඒ

[ගරු තිලංග සුමතිපාල මහතා]

සම්බන්ධයෙන් පැහැදිලි කරලා නැහැ. ගරු ඇමතිතුමා ඒ සම්බන්ධයෙන් පැහැදිලි කරයි කියලා මම බලාපොරොත්තු වෙනවා. මේ පනත් කෙටුම්පතේ හැටියට සාක්ෂිකරුවෙකුට හෝ යම් කිසි කෙනෙකුට පොලීසියට ඇවිල්ලා, "මම මේ ගැන සාක්ෂි දෙනවා" කියලා ලිඛිත අවබෝධයක් ඇති කර ගන්නට පුළුවන්. අවබෝධතාව උඩයි ඒ සාක්ෂි ඉදිරිපත් කරන්නේ. ඒ සාක්ෂියේ තිබෙන සත්‍යතාව - authenticity එක- පිළිබඳව තහවුරු කිරීම ගැන පැහැදිලි නැහැ.

Channel 4 එකෙන් මොකක්ද කළේ කියලා අපි දන්නවා. අවුරුදු ගණනක් පරණ තොරතුරු අරගෙන ලෝකය ඉදිරියේ අපේ රට අපකීර්තියට පත් කළා. ඉන් පස්සේ අපේ රටට විරුද්ධව ජාත්‍යන්තර වශයෙන් මතවාදයක් හදලා ඉවරයි. ඒ නිසා අපි අද අවංක චේතනාවෙන් මේවා කළත් මේවායින් අයුතු ප්‍රයෝජන ගන්න පුළුවන් කණ්ඩායමක් ඉන්නවා. ඒක නිසා අපි මේ පනත් කෙටුම්පත ගෙන ඒමෙන් අනාගතයේදී යම් යම් පිරිස්, ඒ අයගේ අවශ්‍යතාව සඳහා පමණක් මේක පාවිච්චි කරන්නේ කොහොමද කියලා අපි බලන්න ඕනෑ. මෙහි අවබෝධතා ගිවිසුම ගැන අපැහැදිලියි. ඒ වාගේම සාක්ෂිකරුවන් ඉදිරිපත් කරන්න, සාක්ෂිකරුවන් ඉදිරිපත් කළාට පස්සේ ඒ අය වෙනුවෙන් ක්‍රියාත්මක වෙන්න මේ පනත් කෙටුම්පතෙන් යම්කිසි බලතලයක් දෙනවා නම් ඒකත් අපැහැදිලියි.

අපේ TNA එකේ මන්ත්‍රීතුමා කිව්වා, ජාත්‍යන්තර පරීක්ෂණ ගැන, ජාත්‍යන්තර පරීක්ෂණය පිළිබඳව ක්‍රියාත්මක වීම, UN එකෙන් ඇවිල්ලා තොරතුරු ලබා ගැනීම ආදී කරුණු ගැන. මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වර්තමාන රජයත්, හිටපු රජයත් කිව්ව දේ අවබෝධ කර ගන්න වුවමනායි. දැන් මේ පනත් කෙටුම්පත ගෙනැල්ලා තිබෙන්නේත් රට තුළ පරීක්ෂණයක් කළාම ඒ පරීක්ෂණයේ අවසාන තීන්දුවක් ගන්නයි. අපි UN එකේ Resolution එකට අත්සන් කළ කණ්ඩායමක් නොවෙයි. හැබැයි, ආපසු මේ තුළින් වක්‍රව යන්න හදන්නේ එදා හිටපු තැනටමයි. අපි මේ රටේ ඒකීයභාවය ගැන කථා කරනවා; අපේ රටේ භෞමික අඛණ්ඩතාව ගැන කථා කරනවා. නමුත් අපේම රටේ ඉන්න එක මහ ඇමැති කෙනෙක් ජාත්‍යන්තර පරීක්ෂණයක් තියන්න කියලා කථා කරනවා. එහෙම නම් අපි යන්නේ කොතැනටද? මේ සැකය දුරුකර ගන්න අපි අවංකව කථා කරනකොට අපේම රටේ ඉන්න යම්කිසි පිරිසක් අපිව සැකයටම තල්ලු කරනවා. මේ පිළිබඳ හිටපු රජයට යම්කිසි සැකයක් තිබුණා; අවදානමක් තිබුණා. ඒ නිසා තමයි බොහොම පරිස්සමෙන් මේ වාගේ පනත් කෙටුම්පතක් ගේන්න හිතුවේ. හැබැයි, වර්තමාන රජය එක්කත් TNA එකේ මන්ත්‍රීවරු සම්පූර්ණයෙන්ම ඒ සැකය අභියෝගයට ලක් කරනවා. ඒක නිසා මේ පනත් කෙටුම්පත ගෙන ඒමෙන් එහි සම්පූර්ණ බලතල, එහි සම්පූර්ණ සුරක්ෂිතභාවය, එහි රහස්‍යභාවය ගැන අවබෝධයක් ඇති කර ගන්න ඕනෑ කියලා අපි විශ්වාස කරනවා. ඒ වාගේම බොරු තොරතුරු ලබා දුන්නොත්, වැරැදි තොරතුරු ලබා දුන්නොත්, පරීක්ෂණ නොමඟ යැව්වොත් ඒ අයට කරන දඬුවම, ඒ අය පිළිබඳ ගන්නා වූ ක්‍රමවේදය පිළිබඳ පැහැදිලි අවබෝධයක් අපි ඇති කර ගන්න ඕනෑ. මොකද මේ පනත් කෙටුම්පතෙන් පැහැදිලිවම දරුවා, ඒ වාගේම කාන්තාව යම්කිසි පරීක්ෂණයකට ලක් කළාට පස්සේ, ඒ අයව උසාවියට ඉදිරිපත් කළාට පස්සේ, ඒ අයට උසාවියෙන් තීන්දුවක් ලබා ගැනීමේ හැකියාව තිබෙනවා. මේ පනත් කෙටුම්පතේ 44 (1) වගන්තියේ මෙසේ සඳහන් වී තිබෙනවා:

> "The Minister on the recommendation of the Authority, may make regulations under this Act in respect of all such matters as are necessary to be provided for in order to give effect to the provisions of this Act."

So, there is no limitation here; there is unlimited power. The Gazette can go beyond the expected scope, which would be very difficult to turn back. So, by the time it comes before the House, it might be too late.

මෙම පනත් කෙටුම්පත ඉදිරිපත් කරන අවස්ථාවේදී යුද අධිකරණය ගැන කථා කරනවා. රට ඇතුළේ හමුදා පරීක්ෂණ පවත්වා යම් යම් විධියේ තීන්දු ගැනීමේ හැකියාව හමුදාවට තිබෙනවා. අපේ රටේ යුද්ධය පැවති කාලයේ හෝ යුද්ධයෙන් පස්සේ හෝ වර්තමානයේ හෝ අතීතයේ හෝ යම්කිසි කටයුත්තක් පිළිබඳව පැමිණිල්ලක් කළා නම්, ඒ පැමිණිල්ලට අදාළව පරීක්ෂණයක් කළා නම් ඒ පරීක්ෂණයේ තීන්දුව අනුව දඬුවම් කිරීමේදී හෝ ඒ සාක්ෂි පිළිබඳව ක්‍රියාත්මක කිරීමේදී අද දින අප සම්මත කරන මෙම පනත් කෙටුම්පත ඒ කටයුතු සඳහා අදාළ වන්නේ නැහැ. අපේ මේ පනත් කෙටුම්පත බලපාන්නේ නැහැ, හමුදාවේ පරීක්ෂණයක් කිරීමේදී. එවැනි තත්ත්වයකදී එකම වරදක් පිළිබඳව හෝ එකම සැකයක් පිළිබඳව පරීක්ෂණ දෙකක් පවත්වන්න පුළුවන්ද? එම පරීක්ෂණයට උපුටා ගන්නා සාක්ෂි තවත් කරුණක් සඳහා ඉදිරිපත් කරන්නේ කොහොමද කියා ගැටලුවක් ඇති විය හැකියි. මේ ගැන යම්කිසි පැහැදිලි කිරීමක් කළ යුතුයි කියා මා කියා සිටිනවා.

අපේ රටේ තිබුණු යුද අධිකරණයේදී, එහෙම නැත්නම් අපේ හමුදාව තුළ තිබුණු පරීක්ෂණවලදී ඒ වෙනුවෙන් දඬුවම් කිරීමේ හැකියාව සහ ක්‍රියාත්මක කිරීමේ බලතල හමුදාවට තිබෙනවා. එම ක්‍රියාදාමයට අද දින සාකච්ඡාවට භාජන කරනු ලබන අපරාධයක චින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත කිසිසේත් අදාළ වන්නේ නැහැ. එය සම්පූර්ණයෙන්ම ස්වාධීනයි. මේ රජයට ඒ ගැනත් යම්කිසි පැහැදිලි කිරීමක් කරන්න පුළුවන් නම් අපි එය අගය කරනවා. සම්පූර්ණ පනත් කෙටුම්පත දිහා බැලුවොත් එය ඉතාම කාලෝචිතයි. ඒ සම්බන්ධයෙන් කිසි ගැටලුවක් නැහැ. මෙය සිදු විය යුතුයි. අපි බලාපොරොත්තු වන සාධාරණ සමාජයක යම්කිසි කෙනකුට සාක්ෂියක් දීමට භයක්, සැකක්, චකිතයක් තිබෙනවා නම් ඒ අයව සුරක්ෂිත කළ යුතුයි; ඒ අයව බලා ගන්න ඕනෑ. ඒ වාගේම වැරැදි වැඩක් කරපු කෙනකු ඉන්නවා නම් ඔහුට දිගටම වැරැදි කර ගෙන යන්න ඉඩ දීලා, සාක්ෂිකරුවන්ව මර්දනය කිරීමෙන් සමාජයට සිදු වන හානිය වළක්වන්න මේ පනත් කෙටුම්පත හොඳ රුකුලක් වනවා. මේ පිළිබඳව පොලීසියට, එහෙම නැත්නම් ඒ අධිකාරයට යම්කිසි බලයක් දෙනවා නම් ඒ අයටත් යම්කිසි පැහැදිලි ක්‍රියා පටිපාටියක් තිබෙන්න ඕනෑ. එක එක යුගවලදී නියෝජ්‍ය පොලිස්පතිතුමන්ලා -ඩීඅයිජී මහත්වරුන්- වැනි අය සම්පූර්ණ බලය අතට ගෙන, ඒ බලතල තුළින් යම් යම් ඒකක හදා ගෙන, ඒ ඒකක තුළින් යම්කිසි විධියක ජනතාව මර්දනය කිරීමක් අපි දැක්කා. එම නිසා ඒ ගැනත් බොහොම පැහැදිලිව ක්‍රියාත්මක වන්න ඕනෑය කියා කියමින්, මේ රටේ ඒකීයභාවයට, භෞමික අඛණ්ඩතාවට, ඉතිහාසයේ අපට අත් දැකීම් තිබෙන රට තුළ ඇවිළුණු ප්‍රශ්නවලට මෙම කාලෝචිත පනත අයුතු ලෙස පාවිච්චි කරන්න ඉඩ දෙන්න එපාය කියා මා ඉල්ලා සිටිනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

The next speaker is the Hon. (Prof.) G.L. Peiris. Before he starts, the Deputy Chairman of Committees will take the Chair.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] தலைமை வகித்தார்கள்.

Whereupon MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Peiris, you may start your speech.

[3.05 p.m.]

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

Hon. Deputy Chairman of Committees, I am very happy to participate in this Debate on an important piece of legislation, following my Friend the Hon. Thilanga Sumathipala. This is undoubtedly a piece of legislation which goes a long way to fill a gap that has existed in the legal system of Sri Lanka. It is, therefore, an exceedingly timely and welcome piece of legislation. However, I would like to point out that there are several deficiencies in the Bill which we can still correct at the Committee Stage before this legislation is enacted in a final form. I say this particularly because this is a very far-reaching piece of legislation. That is indicated in Clause 38 of this Bill which declares that the provisions of this Bill shall have legal force overriding the provisions of any other law to the extent of inconsistency. So, if there is a conflict between the provisions of the law, which we are debating in this House today, and the provisions of any other statute law except, of course, the Constitution, then this particular piece of legislation is entitled to prevail. So, it has a special status in that sense in the legal system of Sri Lanka.

A novel feature of this law, which is also particularly significant in the current context, is the provision contained in the Clause 31, which enables testimony to be given through audio-visual linkage without the person giving that evidence being physically present in court. That is an important change. So, using modern technology, a person can give evidence which is acted upon by a court of law, even though that person is not present in court at the time of giving his evidence.

It is important that this is confined to evidence given within Sri Lanka. The words “within Sri Lanka” are contained in Clause 31. I would like to refer briefly to the history of this legislation. In the year 2008, when the Assistance and Protection to Victims of Crime and Witnesses Bill was presented, it contained a provision enabling evidence to be given outside Sri Lanka through audio-visual linkage. Now, happily, that provision has been deleted from this legislation. When the 2008 law was challenged in the Supreme Court, Justice Shiranee Tilakawardane had some comments to make with regard to that matter. But, we do not need to pursue that further at this time because there is no provision in the existing law for evidence to be given in this manner outside Sri Lanka.

There is a further safeguard that is contained in Clause 32 (1)(a) which gives discretion to the Attorney-General and to the Secretary of the Ministry of Justice to make a recommendation that in particular circumstances, evidence should not be received in this manner. In this connection, there is a suggestion that I would like to make to the Hon. Minister of Justice and this has to do with the provision contained in Clause 3(h) of this Bill which uses the word “legal counsel”. That is, a victim is entitled to be represented by legal counsel. That is the phraseology that is used in Clause 3(h). Now, the Supreme Court in its Determination - a copy of which I have here - has suggested that the word “legal counsel” should be deleted and that it should be replaced by the phrase “attorney-at-law”. That is to make it very clear that the person representing the victim should be an attorney-at-law of the Supreme Court of Sri Lanka. “Legal counsel” is a term which is used to refer to practising lawyers in other countries. It is a word that is commonly used in that context, but here we want to make it very clear that the lawyer representing the victim should be an attorney-at-law of the Supreme Court of this country and not a foreign lawyer. So, I think that should be the subject of an appropriate Committee Stage amendment.

Then, there are other deficiencies in the Bill, which I would like to point out. The whole purpose of this legislation is to inspire confidence. The object of the Bill is to give protection to victims and witnesses, to encourage to come forward and give evidence without fear in their minds. That will, therefore, improve the quality of the administration of justice because the court of law will have at its disposal the full range of evidence that is necessary to arrive at the truth in regard to the matter which is the subject of the judicial inquiry. So, the whole idea is to give people confidence to come forward without fear, without anxiety, without apprehension.

There are some provisions in the Bill which militate against that objective. For example, there is a very powerful body that is established within the police force. I am happy that my Friend, the Hon. John Amaratunga is in the Chamber at this time. So, a very powerful mechanism for the implementation of this legislation is located within the police force and this is the "Victims of Crime and Witnesses Assistance and Protection Division" of the police force. It is established by Clause 19(1) and this is a body that is created by the Inspector-General of Police, in accordance with guidelines by the National Authority. Clause 19(2) provides that a Senior Superintendent of Police shall be in charge of this Division. One of the deficiencies in the Bill is that there is no reference, whatsoever, about who will actually comprise this Division. This is a very powerful Division and it performs crucial functions. For example, according to Clause 20 (3), this Division within the police force has the power to decide whom to admit and whom to reject as beneficiaries of this programme. So, they have a discretion to decide who should actually be admitted into this programme.

Unfortunately, there is no indication, whatsoever, as to who would constitute this Division and what are the

[ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා]

criteria that are applicable in that regard. I think that is a clear deficiency in the law. Everything is left vague. Who is going to constitute this body; in accordance with what criteria is the body going to be constituted, is all left vague, nebulous and open-ended. That is not going to inspire confidence in the victim or the witness and to that extent the purpose of the law is frustrated.

Then, there is a further deficiency that is contained in Clause 21(2) of the Bill, which says that a request for protection should be made to an officer-in-charge of a police station. So, if I want protection, I have to go to the officer-in-charge of the police station. He is one of the people to whom I can make this request. But, in a situation where the person concerned is wanting protection from the police force itself, then there is an anomaly here and an obvious conflict. So, that again is something that stands in the way of accomplishment of the objectives underpinning the very beneficial legislation which is before the House this afternoon.

I would also like to bring to the notice of the Hon. Minister of Justice that there is a deficiency with regard to Clause 22(1) of the Bill. Clause 22(1) sets out different kinds of protection which are available, what sort of protection can be given. There are six different kinds of protection that are made available. But, there is no indication of the criteria in accordance with which this decision is made. If a person comes forward asking for this protection, asking to be admitted to the programme, how does one decide whether that person qualifies or does not qualify for admission? The criteria are not stipulated and that again represents a lacuna in the Bill.

There is a very useful article which has been written on this subject by an author called Rosalind Sipos and in that article, there is a citation of the Model Witness Protection Bill published in the year 2000 by the United Nations Office on Drugs and Crime. In this draft legislation there is an exhaustive enumeration of the criteria which can be called in aid in this regard and, in fact, those criteria are applicable in the law of several jurisdictions, including Hong Kong.

I would respectfully submit that the Sri Lankan legislation be significantly improved by the inclusion of criteria, which would determine whether a request for assistance is accepted or not. There are also some problems connected with the allocation of responsibility. Who actually decides whether a request is to be accepted or not? Clause 13(d) of this Bill states that the National Authority for Protection can perform this function. They will appoint an officer to carry out any inquiry and if that officer finds *prima-facie* evidence, then three members of the Board will meet to consider the matter.

So, one of the bodies having the power to make this decision is the National Authority. But, the National Authority is not the only organ which has that power. It is also available in terms of Clause 19(3) to the Division that is set up by the Inspector-General of Police. So, there is a certain duplication of functions. This function can be performed by the National Authority; it can equally well be performed by the Division set up by the Inspector- General of Police.

That *per se* is not an objection, but there are other problems which are reflected in the text of the law. Clause 20(3) states that the Police Division may act on the recommendation of the Authority. So, the Authority recommends and the Police Division can give effect to that. But, Clause 20(4) states that the Division can provide this relief only after the conduct of a threat assessment by the Division. So, the Division is required to make a threat assessment. It is only after that, the relief requested can be provided.

Now, to my mind, there is a clear contradiction between Clause 20(4) and Clause 22(3). Clause 20(4) states that the Police Division can give this relief only after carrying out a threat assessment. On the other hand, Clause 22(3) states, I quote:

> "When providing protection or assistance to any victim of crime or a witness, the Division shall act in accordance with the advice and recommendations made by the Authority".

So, there seems to be a conflict between those two provisions.When the Authority makes a recommendation, is the Police Division bound to carry that out or would the Police Division act only after making an independent threat assessment and being satisfied that the relief sought is required?

There is also a gap in the Bill with regard to another matter. That is the removal or variation of protection, which is provided for in Clause 22(5). Naturally, the Bill has to provide for certain circumstances in which protection once given, can be withdrawn. For example, if the beneficiary of that protection abuses that protection or commits a breach of the peace or violates the memorandum of understanding in accordance with which the protection has been provided, of course, in those circumstances the protection has to be withdrawn. There are several persons who have the authority to withdraw that protection. There is a National Authority, a Senior Superintendent of Police in charge of the Division, or a Commission. All these people can order the removal of protection once given. That is frank. There is no problem about that. But, sometimes, protection withdrawn needs to be restored on certain conditions being satisfied. The giving of protection is not permanent. The withdrawal of protection is also not permanent. So, there are circumstances in which protection withdrawn may have to be made available once more, resumed. The South African law for example sets out very clearly circumstances in which there can be resumption of the protection which has been withdrawn. The Sri Lankan

law has a hiatus in that regard, because there is no comparable provision governing the resumption of protection once it has been withdrawn.

There is also a defect, in my view, and I would like the Hon. Minister of Justice to give his mind to that. There seems to be a defect with regard to Clause 36 (1). That is, it creates an offence if any person were to disclose that "X" is a beneficiary of this programme. Then, that is an offence. If I were to say that "so and so" is benefiting from this programme, that of course would endanger that person. It would put him in jeopardy and, quite rightly, it has been characterized as an offence by the provision contained in Clause 36(1). It is proper but it is incomplete. What should be criminalized is not simply the disclosure that a particular person is a beneficiary of the programme. If you look at the Canadian legislation, for example, any disclosure with regard to the location of that person - you know, in some circumstances you may have to provide a person with a temporary abode, some address, a means of livelihood. Those are effective means of providing protection for victims and witnesses. So, if there is any divulging of the location of that person or any temporary employment, which may have been provided for him as a means of livelihood, those can also not be disclosed, because if those are disclosed, that would also entail substantial jeopardy to a person who happens to be a beneficiary of this programme. Those situations are catered for by the law applicable in other jurisdictions, notably Canada, but that is entirely lacking in the provisions of the Sri Lankan Bill, which is the subject of Debate in this august Assembly today.

The Hon. Minister of Justice may also like to consider whether he is entirely satisfied with the definition of the word, “witness,” that is contained in Clause 46. Particularly, in our culture, it often happens that threats are directed not only to the person concerned, but to the spouse or to a child, for example. In some countries, the ambit of the protection is not rigidly confined to the particular person whose evidence is required in a court of law, but legitimately that protection is extended to members of his family. But, the definition of the word, “witness” in the draft Bill, contained in Clause 46, is perhaps incomplete and inadequate in that regard.

There is also, to my mind, a problem with regard to the financial provisions under Clause 39. Clause 39 is a crucial provision, because it governs finance. Clause 39 (1) states, I quote:

> “The provisions of Article 154 of the Constitution relating to the audit of the accounts of public corporations shall apply to and in relation to the audit of the accounts of the Fund of the Authority and the Protection Fund.”

Clause 39(2) states, I quote:

> “The provisions of Part II of the Finance Act, No. 38 of 1971 shall *mutatis mutandis* apply to the financial control and accounts of the Funds referred to in subsection (1).”

But surely, in this area of the law, you need to strike a perceptive balance between transparency, and accountability. Of course, these are public funds and the manner in which these funds are disbursed and expended needs to be known by the public. But, at the same time, there is a real need for secrecy, because you are protecting somebody who is very vulnerable and unless that person is satisfied in his or her own mind that they are safe, their family is safe, they will not come forward to give evidence. The entire object of this law is to remove inhibition in the minds of potential witnesses and to encourage them to come to a court of law and offer testimony without any vestige of fear or apprehension in their minds. Consequently, the provisions dealing with finance fail to accomplish that objective and do not, in my opinion, establish the equilibrium that is required in this area of the law.

So, these are some of the suggestions which I would like to make for consideration by the Hon. Minister of Justice and if he feels that some of these ideas should be incorporated into the law by way of Committee Stage Amendments, then, I would commend these matters for his attention.

The Supreme Court, in their Determination, has already pointed out some areas whether there is a lack of clarity. For example, three judges of the Supreme Court presided over by the present Chief Justice, have pointed out that the provisions of Clause 3(c), relating to procedures for redress, need to be improved. So, I am sure, that will be done by the Government at the Committee Stage. The Supreme Court has a -

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

We are going to incorporate all the amendments suggested by the Supreme Court.

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

The point I am making, Hon. Minister, is that apart from Clauses 3(c) and 3(f), those are deficiencies which have been specifically pointed out by the Supreme Court. I am happy that the Government is accepting those suggestions and moving the Committee Stage amendments accordingly.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. Member, you have one more minute.

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

Okay, Sir. But, those are not the only areas where there is a lack of clarity. I have pointed out at least six or

[ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා]

seven areas where there is that a lack of clarity and that impinges upon matters of substance and can well stultify, at least in part, the very opportune and beneficial objectives that you are striving to achieve, quite admirably, by the presentation of this legislation to Parliament.

So, I would suggest that in addition to the suggestions made by the Supreme Court in respect of particular provisions of the Bill, that you give your mind more broadly to some of the other gaps in the Bill, because there are many gaps and if you compare this legislation with what is operative in other parts of the world, then we can see that the protection that is offered is incomplete in several crucial respects, and it may therefore be worth focusing on those areas in order to make the law more effective and to accomplish with greater efficiency, the laudable policy objectives which underpin the provisions of this legislation.

I thank you, Sir.

[අ.භා. 3.26]

ගරු ජෝන් අමරතුංග මහතා (මහජන සාමය, ආපදා කළමනාකරණය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மக்கள் ஒழுங்கு, அனர்த்த முகாமை மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் அமைச்சர்)
(The Hon. John Amaratunga - Minister of Public Order, Disaster Management and Christian Affairs)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මැතිතුමා ඉදිරිපත් කළ ප්‍රශ්නය ගැන මම මුලින්ම කියන්න ඕනෑ. උතුරේ පවුල් කිහිපයක් ගෝධාභය කඳවුරේ සඟවා ගෙන සිටියාය කියා එතුමා කිව්වා. ඒ ගැන සොයා බලා ඒ පවුල්වලට වුණේ මොකක්ද, ඒ උදව්යට වුණේ මොකක්ද කියලා මේ ගරු සභාව දැනුවත් කරන්න කියලා එතුමා මගෙන් ඉල්ලීමක් කළා. මම එතුමාට කියන්න ඕනෑ, ඒ කාරණය සම්පූර්ණයෙන්ම තිබෙන්නේ ආරක්ෂක ඇමතිවරයා හැටියට ජනාධිපතිතුමා යටතේ බව.

He is the Minister of Defence and this matter will have to be taken up with him. I will certainly bring to the notice of the Hon. Minister of Defence, who is the President, about this issue that was raised by the Hon. Premachandran.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ගරු ජී.එල්. පීරිස් හිටපු ඇමතිතුමා මේ පිළිබඳව විශාරදයෙක්. එතුමා උගත් මන්ත්‍රීවරයෙක්; හිටපු ඇමතිවරයෙක්. පසු ගිය ආණ්ඩුවේත් ඊට කලිනුත් එතුමා ඇමතිවරයෙක් හැටියට කටයුතු කළා. මම හිතන හැටියට එතුමා අධිකරණ ඇමතිවරයා හැටියටත් කාලයක් හිටියා. ඉතින් ඒ කාලයේ මේවා ගේන්න තිබුණා නේ. ඔය කිව්ව දේවල් ඔක්කොම හදා ගෙන මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න තිබුණා නේ. මේවා නොකළ නිසා තමයි ප්‍රශ්න ගණනාවකට අද අපේ රටේ ජනතාවට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ. 2007 මේ පනත් කෙටුම්පත ගෙනැල්ලා සම්මත කර ගත්තා නම් පසු ගිය කාලයේ ඇති වුණු භයානක කාල පරිච්ඡේදය ඇති වන්නේ නැහැ. පසු ගිය කාලය බලනවිට මොන තරම් ප්‍රශ්න ගණනාවකට මේ රටේ ජනතාව මුහුණ දුන්නාද? එක පැත්තකින් පාතාලය. අනෙක් පැත්තෙන් කුඩු ජාවාරම්කාරයෝ. අනෙක් පැත්තෙන් රාජ්‍ය ත්‍රස්තවාදය. ඒ වාගේම සුදු වැන් සංකල්පය. මේ වාගේ ප්‍රශ්න ගණනාවකට මේ රටේ ජනතාවට මුහුණ දෙන්න සිද්ධ වුණා. සාක්ෂි දෙන්න කෙනෙක් ඉදිරිපත් වුණේ නැහැ. සාක්ෂි දෙන්න ඉදිරිපත් වුණා නම් ඒ මිනිහාට වෙඩි තියලා මරා දමනවා. ඒක තමයි මේ රටේ පසු ගිය කාලයේ තිබුණ තත්ත්වය. ඒ ගැන අපි කනගාටු වෙනවා. ඒක නිසාම තමයි ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා මෙවැනි පනත් කෙටුම්පතක් ගෙනැල්ලා මේ සමාජය සුරක්ෂිත කළ යුතුයි, ආරක්ෂා කළ යුතුයි කියලා, දින සියයේ වැඩසටහනට මෙය ඇතුළත් කරලා ජනතාවට ඉදිරිපත් කළේ. ඒ නිසා තමයි ජනතාව ඡන්දය දීලා එතුමා ජනාධිපති හැටියට පත් කළේ. ඒක තමයි කාරණය.

ඉතින් මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළ අපේ ගරු ඇමතිතුමාට අපේ ප්‍රසාදය, ප්‍රශංසාව මම පිරිනමනවා. අපි විතරක් නොවෙයි, මුළු රටම එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම අපේ ගරු අගමැතිතුමාට විශේෂ වුවමනාවක් තිබුණා මේ පනත් කෙටුම්පත හැකි ඉක්මනින් ගෙනැල්ලා මේ ගරු සභාවේ සම්මත කර ගන්න. මොකද, එතුමා දැක්කා පසු ගිය කාල පරිච්ඡේදයේ සිදු වූ දේවල් පිළිබඳව. මම හිතනවා, මේ පනත තුළින් මේ රටේ ජනතාව පසු ගිය කාල සීමාව තුළ විඳපු දුක්ගැහැට නිමා වෙලා තර්ජන ගර්ජනවලින්, බිය ගැන්වීම්වලින් බේරිලා සමාජයේ බොහොම යහතින් ජීවත් වෙන්න ඔවුන්ට අවස්ථාව ලැබේවි කියලා. මේ පනත් කෙටුම්පතේ පරමාර්ථය පමණක් මම බොහොම කෙටියෙන් සඳහන් කරන්නම්. Sir, do I have 20 minutes?

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
No, you have been allotted only 10 minutes.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
I am taking the 10 minutes allotted to the Hon. Mangala Samaraweera also. So, I should have 20 minutes.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
All right.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, යුක්තිය ඉටු කිරීම පිළිබඳ කාරණයේදී සාධාරණය හා යුක්තිය යන කරුණු දෙකම සෝදා පාළුවට ලක් වූ මෙවන් කාල පරිච්ඡේදයක හා පසු බිමක එහි ප්‍රතිඵල භුක්ති විඳින අප රටේ ජනතාවට අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් පිළිබඳ විශ්වාසය හා ආත්ම ශක්තිය නංවා ලීමට අද හඳුන්වා දෙනු ලබන මෙම පනත් කෙටුම්පත සම්මත කර ගැනීම තුළින් හේතු වනවා ඇති. සාරාංශ හැටියට කියනවා නම් එය තමයි මෙහි මූලික පරමාර්ථය. මෙම පනත් කෙටුම්පතේ පරමාර්ථ රාශියක් සඳහන් කර තිබෙනවා. ඒ වාගේම සාක්ෂිකරුවන්ගේ සහ අපරාධයක වින්දිතයන්ගේ අයිතිවාසිකම් පිළිබඳව කරුණු රාශියක් මෙහි සඳහන් කර තිබෙනවා. මම ඒවා ගැන අලුතින් කියන්න යන්නේ නැහැ. ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා ඒ පිළිබඳව සවිස්තරව සඳහන් කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය කාල සීමාව දෙස බැලුවාම, මේ රටේ ඇති වූ ප්‍රශ්න ගැන මෙතැනදී කථා කරන්න අපට සිදු වෙනවා. පසු ගිය කාල පරිච්ඡේදය තුළ අපරාධ ගණනාවක් සිද්ධ වුණා. එවකට පොලීසියට බැරිව ගියා ඒ අපරාධවලට සම්බන්ධ වූ, ඒ අපරාධවල නියුක්ත වූ, ඒවා කරපු උදවිය අත් අඩංගුවට අරගෙන ඔවුන් නීතියේ රැහැණට හසු කර ගන්න. ඒක තමයි පැවැති තත්ත්වය. ඒ තත්ත්වයට එක හේතුවක් තමයි මෙවැනි පනත් කෙටුම්පතක් ඒ කාලයේ සම්මත නොවීම. මෙවැනි පනත් කෙටුම්පතක් ඒ කාලයේ සම්මත වුණා නම් ඒ අපරාධ බොහෝ දුරට වළක්වාගන්න අපට පුළුවන් වෙනවා. ඒ කාලයේ සිදුවූ අපරාධවලින් කීපයක් මම තමුන්නාන්සේලාට මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. ඒ අතරින් එකක් තමයි "The Sunday Leader" පුවත් පතේ ප්‍රධාන කර්තෘ ලසන්ත වික්‍රමතුංග මහතා ඒ මහතාගේ නිවසේ සිට පුවත් පත් ආයතනයට එන අතර මඟදී වෙඩි තබා ඝාතනය කිරීම. වෙඩි තැබුවේ කවුද කියලා අල්ලා ගන්න පුළුවන් වුණාද? මේක රාජ්‍ය ත්‍රස්තවාදයේ කොටසක්ද කියලාත් අපට කියන්න බැහැ. මේ වාගේ පනත් කෙටුම්පතක් එදා සම්මත වෙලා තිබුණා නම්, ඒවා කෙරුවේ කවුද කියලා කියන්න මිනිස්සු ඉදිරිපත් වනවා. ඒ සිද්ධිය ඇඟින් දුටු අය පමණක් නොවෙයි, රාජ්‍ය නිලධාරීන් පවා ඒ ගැන සාක්ෂි දෙන්න සූදානමින් සිටියා. නමුත් ඔවුන් සාක්ෂි දෙන්න එන්න භය වුණා, ඔවුන්ගේ ජීවිත ආරක්ෂාවට තර්ජන, ගර්ජන ඇති වෙයි කියලා.

ඒ එක්කම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුව සිටි මහේස්වරන් මහත්මයාව වෙඩි තබා මරා දැමුවා. ඒකත් කවුද කළේ කියලා සොයා ගන්න බැරිවුණා. මොකක්ද සිදු වුණේ? කවුද ඒක කෙරුවේ?

ඊළඟට, රවිරාජ් මන්ත්‍රීතුමා. ඒ තවත් මන්ත්‍රීවරයෙක්.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

In the case of the Hon. T. Maheswaran, I think the Court has given a verdict.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

We are unable to resolve these murder cases that have taken place. Why? Because nobody is coming forward to give evidence through fear of life and death. That is the reason. If this law had been enacted and if this was in existence, this would not have happened. Even in the case of the assassination of the former Minister, Hon. Jeyaraj Fernandopulle, there is a lot of controversy. There are different arguments that come up as to who did it; how it was done; how people were kept hidden in a house; they ran away and half way through they were murdered. There are a lot of stories. But, we could not arrive at a final decision. I will come to that.

ඊළඟට, ප්‍රසිද්ධ රගර් ක්‍රීඩකයකු වන වසීන් තාජුදීන් නැමැති ක්‍රීඩකයා අභිරහස් ලෙස ඝාතනයට ලක් වීම. ඒ ඝාතනය සිදු කළේ කවුද කියලා සොයා ගන්න පුළුවන් වුණාද? මේ කොළඹ සිදුවුණු දේවල්. ප්‍රශ්නය වෙලා තිබුණේ, ඒ සිද්ධීන් සම්බන්ධයෙන් සාක්ෂි දෙන්නට කවුරුවත් ඉදිරිපත් වුණේ නැහැ. මොකද, සාක්ෂිකරුවන්ට ආරක්ෂාවක්, රැකවරණයක් තිබුණේ නැති නිසා. මේ එකක්. මෙවැනි සිද්ධීන් තව තිබෙනවා.

ඊළඟට, ධීවරයන්ට හිමි ඉන්ධන සහනය ලබා දෙන ලෙස ඉල්ලා හලාවත දී කරන ලද සාමකාමී උද්ඝෝෂණයේ දී ඇන්ටනි නැමැති අයට වෙඩි තබා ඝාතනය කළා. ඒ ඝාතනය කළේ කවුද; වෙඩි තැබුවේ කවුද කියලා කියන්න කෙනෙකු ඉදිරිපත් වුණේ නැහැ. ඒ ඇයි? එහෙම ඉදිරිපත් වුණා නම්, ඒ මිනිහාගේ ජීවිතය අනතුරේ. එහෙම නැත්නම් ඔහු ආ ගිය අතක් නැතිව යනවා. මෙවැනි සිද්ධීන් තවත් තිබෙනවා.

තම කම්කරු අයිතිවාසිකම් ඉල්ලා කටුනායක නිදහස් වෙළෙඳ කලාපයේ කරන ලද උද්ඝෝෂණයේ දී රොෂෙන් චානක නැමැති අයට වෙඩි තබා ඝාතනය කිරීම හා තවත් පිරිසකට තුවාල සිදු කිරීම පිළිබඳව පොලීසියට පැමිණිලි ලැබුණත්, පොලීසිය විමර්ශන කටයුතු කළත්, පොලීසියට එම විමර්ශන ඉදිරියට ගෙන යන්න හැකියාවක් තිබුණේ නැහැ. උසාවියට ගෙන යන්න සාක්ෂිකාරයෝ නැහැ. මේ පනත් කෙටුම්පත එදා සම්මත වෙලා තිබුණා නම්, සාක්ෂිකරුවන් භයක්, සැකයක් නැතිව ඒ සඳහා සාක්ෂි දෙන්නට ඉදිරිපත් වනවා. එහෙම නම් ඒ වැරදිකාරයෝ කවුද කියලා සොයා ගෙන ඔවුන්ට දඬුවම් කරන්න අවස්ථාවක් ලැබෙනවා. නමුත් ඒවා ඔක්කෝම යටපත් වෙලා ගියා.

ඊළඟට ගම්පහ, වැලිවේරිය රතුපස්වල ජනතාව බීමට ගන්නා ජලය ඉල්ලා සාමකාමීව කරන ලද උද්ඝෝෂණයේදී එම පිරිසට වෙඩි තබා තිදෙනෙකු ඝාතනය වුණා. තවත් විශාල පිරිසකට තුවාල සිදු වුණා. මම තමුන්නාන්සේගෙන් අහනවා, අද වන තුරු ඒ පිළිබඳව උසාවියට පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබෙනවා ද කියලා. ඒක එහාට යනවා, මෙහාට යනවා. අද ඒක ගිහින් නීතිපති කාර්යාලයේ හිර වෙලා තිබෙනවා. ඒකයි අපට තිබෙන කනගාටුදායක තත්ත්වය. වෙඩි තියනවා, මිනිස්සු මරනවා, නමුත් නීතියේ රැහැනට ඔවුන් හසුවන්නේ නැහැ. අද ඒවා ඔක්කොම යටපත් වෙලා තිබෙනවා.

ඊළඟට, භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර මැතිතුමාගේ ඝාතනයට අදාළ සිද්ධිය ගැනත් කථා කරන්නට ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මේ නඩුව සම්බන්ධයෙන් ඇති වෙලා තිබෙන තත්ත්වය මොකක්ද කියලා මම අහනවා. මේ ඝාතනය කළේ කවුද? ඒ ඝාතනයේ සාක්ෂිකාරයන් කෝ? ඒ ඝාතනය දැකපු සාක්ෂිකාරයෝ කෝ? ඒ වුදිතයන් කෝ? ඒ නඩුවටත් වෙච්ච දෙයක් නැහැ. පසු ගිය ආණ්ඩුවේ හිටපු තමුන්නාන්සේලා තමයි මේවාට වගකියන්නට ඕනෑ. අද කනගාටුවෙන් වුණත් මේවා කියන්නට සිදු වෙනවා. මේ පනත් කෙටුම්පත සම්මත වෙලා තිබුණා නම් මේ වාගේ අපරාධ රාශියක් වළක්වා ගන්නට අපට පුළුවන්කම තිබුණා.

කැලණිය ප්‍රාදේශීය සභා මන්ත්‍රී හසිත මඩවල මහතාගේ ඝාතනය සිදු වුණා. ඔහුව මහ පාරේ වෙඩි තබා මරා දැමුවා. එම ඝාතනය සම්බන්ධයෙන් අද වන තුරු කිසිම දෙයක් සිදු වෙලා නැහැ. ඒ නඩුවත් තවම එහෙම්ම නතර වෙලා තිබෙනවා. ඊළඟට මාධ්‍යවේදී එක්නැලිගොඩ අතුරුදහන් වීම. මම හිතන හැටියට මේක ජාත්‍යන්තරයටත් ගිය ප්‍රශ්නයක්. සමහරු කියනවා, ඔහු ඉන්නවාය කියලා. තවත් සමහරු කියනවා, ඔහුව කොහේද හංගාගෙන ඉන්නවාය කියලා. මෙන්න මේ වාගේ තත්ත්වයක් තමයි එදා රටේ තිබුණේ. ඒ තත්ත්වය තිබුණේ මේ ප්‍රශ්නවලට විරුද්ධව කවුරුවත් ඉදිරිපත් වුණේ නැති නිසායි. එදා මේ පනත් කෙටුම්පත සම්මත වෙලා තිබුණා නම් මේ ප්‍රශ්න ඇති වන්නේත් නැහැ. මොකද, සාක්ෂිකාරයෝ බය සැක නැතිව එළියට ඇවිල්ලා මේවාට සම්බන්ධ අය කවුද කියා හෙළිදරවු කරන නිසා.

ඊළඟට, රාගම ප්‍රසිද්ධ දේවාලයක ලොකු සීයා නමින් ප්‍රකට මොහොමඩ් නියාස් නැමැති අය පැහැර ගෙන යාම. මේ පුද්ගලයාව පැහැර ගෙන ගිහින් තිබෙනවා. ඊට පසුව ඔහු ආ ගිය අතක් නැහැ. මේවා තමයි ඒ කාලයේ සිද්ධ වුණ දේවල්. මේ වාගේ තවත් සිද්ධීන් රාශියක් සිදු වෙලා තිබෙනවා. පොලීසියට මේවා ගැන පැමිණිලි ලැබුණත්, ඒ සම්බන්ධයෙන් උසාවියක නඩු පවරා, සාක්ෂි සටහන් කර ගැනීම වැනි ඒ කිසිවක් කර ගන්නට

[ගරු ජෝන් අමරතුංග මහතා]

බැරි තත්ත්වයක් තුළ අද ඒවා නතර වෙලා තිබෙනවා. මා මේ කිව්වේ සමහරක් පමණයි.

මේ කාලයේ සිද්ධ වුණ එක දෙයක් තමයි රාජ්‍ය ත්‍රස්තවාදය. ඒක නැහැ කියන්නට බැහැ. ඒක කවුරුත් පිළිගන්නවා. මෙතැන සිටින තමුන්නාන්සේලා බහුතරයක් ඒවා අනුමත කරාවිය කියා මා හිතන්නේ නැහැ. රාජ්‍ය ත්‍රස්තවාදය කියන්නේ, රාජ්‍ය අනුග්‍රහය ඇතිව ගිහිල්ලා මිනිසුන් මරා දැමීම, එසේ නැත්නම් මිනිසුන් අතුරුදහන් කිරීමයි. සුදු වෑන් සංස්කෘතිය, ඒ කාලයේ බොහොම ජයට සිද්ධ වුණු දෙයක්. ඒක අපි කවුරුත් දන්නා දෙයක්. උන්න ගමන් ඇවිත් මිනිසුන්ව වෑන්වල දමා ගෙන යනවා. ඒ පුද්ගලයන්ට මොකද වුණේ? දැන් මේකත් විශාල ප්‍රශ්නයක්. අද වන තුරු ඒ විධියට අතුරුදහන් වුණු අයට සිදු වුණේ මොකක්ද කියලා අපට සොයා ගන්නට බැරි වෙලා තිබෙනවා.

ඊළඟට මුදල් වංචාවන්. රාජ්‍ය දෙපාර්තමේන්තුවල, සංස්ථාවල, ඒ වාගේම අනෙකුත් ආයතනවල මුදල් වංචාවන් රාශියක් සිදු වී තිබෙනවා. නමුත් ඒවා පිළිබඳව සාක්ෂි දෙන්න කවුරුවත් ඉදිරිපත් වන්නේ නැහැ. අද ඒ වංචනිකයෝ බොහොම නිදැල්ලේ හැසිරෙනවා. ඔවුන් කෝටි ගණන් සල්ලි රැස් කර ගෙන මේ රටේ ජීවත් වෙනවා.

පසු ගිය දවස්වල බන්ධනාගාරයේ රැඳවියන් කිහිප දෙනෙකු මිය ගියා. ඒ පිළිබඳව වාර්තාවක් ඉල්ලුවා. වාර්තාව දෙන්න අවුරුද්දක් විතර ගත වුණා. ඒ වාර්තාවේ සඳහන් වන ආකාරයට නඩුවක් දැම්මත් සිද්ධ වෙච්ච දෙයක් නැහැ. මේ වාගේ තත්ත්වයක් තමයි රටේ ඇති වෙලා තිබුණේ. ප්‍රමාද වෙලා වුණත්, දැන් හරි මෙවැනි පනත් කෙටුම්පතක් ගෙන ඒම පිළිබඳව විශේෂයෙන්ම ගරු ඇමතිතුමාට අපි ස්තුතිවන්ත වන්නට ඕනෑ.

මේවා ගැන කථා කරනවා නම් දවසක් පුරා වුණත් කියන්න දේවල් තිබෙනවා. තවමත්, උසාවියේ නඩු ගණනාවක් තිබෙනවා. පොලීසියේ පැමිණිලි තිබෙනවා. වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා. වාර්තාව ඉදිරිපත් කළායින් පසුව එතැනින් එහාට කටයුතු කරගෙන යන්න සාක්ෂිකරුවෝ නැති නිසා පැමිණිල්ල ගොනු කර ගන්න හැකියාවක් නැහැ. අද පැමිණිලි රාශියක් එකතු වෙලා තිබෙනවා. අහිංසක පවුල්වල භාර්යාවන්, දූ දරුවන් අද හඬා වැළපෙනවා, අපේ ස්වාමි පුරුෂයාට එහෙම නැත්නම් අපේ පියාට වෙච්ච දෙයක් නැහැ, කරුණාකරලා ඒ අයට මොකක්ද සිදු වුණේ කියා සොයා දැනුම් දෙන්න කියලා. මෙවැනි විසඳුමක් නැති අපරාධ රාශියක් තිබෙනවා. සමහරක් ඒවා නීතිපති කාර්යාලයේ හිර වෙලා තිබෙනවා. තව සමහරක් ඒවා පොලීසියේ පොත්වලට පමණක් සීමා වෙලා තිබෙනවා. මෙවැනි තත්ත්වයක් තමයි මේ රටේ පැවැතුණේ. දැන්වත් මෙවැනි පනතක් ගෙනල්ලා මේ රටේ ජීවත් වන ජනතාවට ජීවිත ආරක්ෂාව ලබා දීම පිළිබඳව අපි සෑහීමකට පත් වන්නට ඕනෑ. මේක තමයි අපට අවශ්‍ය වන්නේ. ශ්‍රී ලංකා රජය මානව හිමිකම් උල්ලංඝනය කිරීම පිළිබඳව ගෙන තිබෙන පියවර මොනවාද කියන එක ගැන අද ජාත්‍යන්තරය බලාගෙන ඉන්නවා.

මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ නායකත්වයෙන් යුතු මේ නව රජය අද ජාත්‍යන්තර සම්මේලනවලට ගිහිල්ලා, අපේ මානව හිමිකම් ආරක්ෂා කරගෙන, අද රටේ ජනතාවට සුරක්ෂිතභාවයක් ලබා දී තිබෙනවාය කියන එක බයක් සැකක් නැතිව අපට බෙහොම පැහැදිලිව කියන්න පුළුවන් තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. අද ඒ තත්ත්වය අපේ ගරුත්වය ආරක්ෂා වන තරමට ඇවිල්ලා තිබෙනවා. පසු ගිය කාලයේ විවිධාකාර චෝදනාවලට සම්බන්ධ වුණු, දූෂණවලට සම්බන්ධ වුණු, කුඩු ජාවාරම්වලට සම්බන්ධ වුණු, මිනීමැරුම්වලට සම්බන්ධ වුණු, මුදල් වංචාවලට සම්බන්ධ වුණු අය අල්ලා හිර කරන්නේ නැත්තේ ඇයි කියන එක ගැන දැන් අපට චෝදනා තිබෙනවා. එහෙම කරන්න බැහැ. පහුගිය කාලයේ තිබුණු පාලන තන්ත්‍රය යටතේ එහෙම කළාට අපේ රජය එහෙම කරන්න බලාපොරොත්තුවක් නැහැ. අපි හරියට සාක්ෂි හොයලා, සාක්ෂි ගොනු කරලා, එවැනි චෝදනාවක් ඔප්පු කරන්න පුළුවන් නම් තමයි ඒ අය නීතියේ රැහැනට ඇතුළත් කරගෙන බන්ධනාගාරගත කරලා උසාවියේ නඩුවලට ඉදිරිපත් කරන්නේ. එහෙම තමයි මේ රජය කටයුතු කරන්නේ. යහ පාලනය කියන්නේ ඒකයි. ආවාට ගියාට අල්ලලා, සුදු වෑන්වලින් උස්සාගෙන ගිහිල්ලා, ඔවුන්ව මරා දමන එක නොවෙයි අපේ රාජ්‍ය ප්‍රතිපත්තිය. රාජ්‍ය ත්‍රස්තවාදය නොවෙයි අපේ ප්‍රතිපත්තිය. අපේ ප්‍රතිපත්තිය නීත්‍යානුකූලව කටයුතු කිරීමයි. අපට දණ්ඩ නීති සංග්‍රහයක් තිබෙනවා. අපේ රජය ඒ අනුව කටයුතු කරන රජයක්ය කියන එක මේ අවස්ථාවේ දී මතක් කරන්න ඕනෑ.

පසුගිය කාලයේ සිදු වූ දූෂණ, වංචා විමර්ශනය කිරීම සඳහා අපේ නායකතුමා දැන් දූෂණ විරෝධී කමිටුවක් පත් කර තිබෙනවා. පසුගිය කාලයේ දී සිදු වුණු වැරදි, අපරාධ, දූෂණ, මුදල් වංචා හැම දෙයක්ම ඒ කමිටුවේ පරීක්ෂාවට ලක්කරනවා. ඒ සඳහා නිලධාරීන් පත්කර ගෙන දැන් ඒ කටයුතු කර ගෙන යනවා.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! There is a point of Order being raised by the Hon. Lalith Dissanayake. Yes, Hon. Member, what is your point of Order?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අර පත් කළ කමිටුවට පළමුවෙන්ම වත්තල සිද්ධිය ගෙනෙන්නය කියා අපි යෝජනා කරනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
That is not a point of Order. Hon. John Amaratunga, you carry on.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මේ වාගේ වැදගත් පනත් කෙටුම්පතක් ගැන කථා කරන වෙලාවේ බහු බූත කථා කරන්න එපා, මන්ත්‍රීතුමනි. වාඩිවෙන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2007දී මේ පනත සම්මත කර ගත්තා නම් මෙවැනි ප්‍රශ්න ඇති වෙන්නේ නැහැ. මේ පාර්ලිමේන්තුවේ ඉන්න බහුතරයක් පහුගිය කාලයේ දී සිදු වුණු අපරාධ අනුමත කරන්නේ නැහැ කියන එක මා දන්නවා. ඒ අය ඒවාට විරුද්ධයි. නමුත් කරන්න දෙයක් නැති නිසා ඒ අය කට වහගෙන හිටියා. අද ඒ අයට සතුටට පත් වෙන්න පුළුවන්, දැන්වත් මේ වැරදි කරපු මිනිස්සුන් අල්ලා ගන්න පුළුවන් කියලා. මොකද, මේ පනත් කෙටුම්පත තුළින් විත්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ විධි විධාන සලසා දී තිබෙනවා.

මම මීට වඩා කථා කරන්නේ නැහැ. මම පොලිස් නිලධාරින්ගෙන් ඉල්ලීමක් කර තිබෙනවා, මම මේ සඳහන් කරපු සාතන ගැන නැවත වරක් විභාග කර, මේවාට සම්බන්ධ කවුද කියා සොයා බලා, ඒ සඳහා අලුතෙන් සාක්ෂි ලබා ගන්න කියලා. මේ පනත් කෙටුම්පත සම්මත වුණායින් පසුව ඒ අපරාධ සම්බන්ධයෙන් වුවමනා කරන සාක්ෂිකරුවන් ඉදිරිපත් වේවිය කියා මට විශ්වාසයක් තිබෙනවා.

දැනටමත් අපට විවිධාකාර පෙත්සම් ලැබෙනවා; විස්තර ලැබෙනවා. විශේෂයෙන්ම කුඩු ජාවාරම්කරුවන් ගැන විස්තර ලැබෙනවා. දැන් ඔවුන් අල්ලා ගෙන, අල්ලා ගෙන යනවා. පසු ගිය කාලයේ සිදු වුණු මිනී මැරුම් පිළිබඳවත් සොයා බලමින් පවතිනවා. "The Sunday Leader" පුවත් පතේ කර්තෘ, ලසන්ත වික්‍රමතුංග මැතිතුමා ශ්‍රේෂ්ඨ පුද්ගලයෙක්. මේ රටේ ජනමාධ්‍යයේ නායකයෙක් හැටියට හිටපු ඒ පුද්ගලයා අමු අමුවේ මරා දැම්මා. අපි දැන්වත් සොයන්න උත්සාහ ගන්නවා, කවුද මේක කළේ සහ කවුද මේකට වගකිව යුත්තේ කියන එක. එක්නැලිගොඩ මැතිතුමා ගැනත් සොයනවා. එතුමාගේ බිරිඳ ඇවිත් හඬා වැළපෙනවා, එතුමා ඉන්නවා නම් සොයා දෙන්න කියලා. ඔහුට මොකක්ද වුණේ කියලා අහනවා. අද වෙනකම් ඔහු ආ ගිය අතක් සොයා ගන්න නැහැ. ඔය මම කිව්වේ කොටසක් පමණයි. උතුරු නැගෙනහිර හිටපු ජනමාධ්‍යවේදීන් ගණනාවකට සිදු වුණු දෙයක් නැතුව ගියා. මේවා තමයි මේ රටේ තිබුණු ප්‍රශ්න. ඒ නිසාම තමයි, ජනතාව මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට විශිෂ්ට ජයක් ලබා දුන්නේ. අද විපක්ෂයේ සිටින බහුතරයක් හිටපු මැති ඇමතිවරු මේවා අනුමත කළේ නැහැ. නමුත් කර ගන්න දෙයක් නැතුව එතුමන්ලා කට පියා ගෙන සිටියා. අද ගරු ජී.එල්. පීරිස් මැතිතුමා මෙම පනත් කෙටුම්පත සංශෝධනය විය යුතු ආකාරය පිළිබඳව හොඳ යෝජනා කිහිපයක් ඉදිරිපත් කළා. ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මැතිතුමා කිව්වා, "මෙම පනත් කෙටුම්පත ගෙනාපු එක හොඳයි. මෙය හොඳ දෙයක්. එය ගෙන ඒමට ප්‍රමාද වීම ගැන කනගාටු වෙනවා" කියලා. ඒ වාගේ අදහස්, උදහස් ඉදිරිපත් කරලා සම්මුතියකින් මෙම පනත් කෙටුම්පත සම්මත කර ගැනීමට එතුමන්ලා ලබා දෙන සහයෝගය අප අගය කරනවා කියමින් මම නිහඬ වෙනවා. ස්තූතියි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. Minister, you have taken the 10 minutes that was allotted to the Hon. Mangala Samaraweera. The next speaker is the Hon. Sunil Handunnetti.

[අ.භා. 3.44]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම අපරාධයක විත්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත ගෙන ඒම අපි ඉතා අගය කරනවා. මේ පිළිබඳව විවාදයක් නැහැ. මොකද, අප දන්නවා බොහෝ වේලාවට මේ කාරණය නිසාම වැරදිකරුවන් නිවැරදිකරුවන් වෙලා තිබෙනවා; නිවැරදිකරුවන් වැරදිකරුවන් වෙලා තිබෙනවා කියන එක. ඒ වාගේම හෘදය සාක්ෂියට එකඟව සාක්ෂි දෙන්න පුළුවන් වටපිටාවක්, පරිසරයක් අපේ රටේ තිබුණේ නැහැ. ඒක එක පක්ෂයක, එක කාලයක, එක පාලනයක ප්‍රශ්නයක් නොවෙයි. පොදුවේම තිබෙන ගැටලුවක්. හැබැයි, දැන් අද අපි මේ උත්සාහ කරන්නේ අපරාධයක සැබෑ තත්ත්වය රටට හෙළිදරවු කිරීම සඳහා සාක්ෂිකරුවන්ට ආරක්ෂාවක් ලබා දීමටයි. සාක්ෂිකරුවන්ට ආරක්ෂාව දීම ගැන අපට කොහෙත්ම විවාදයක් නැහැ. අපි ඒ පිළිබඳව සම්පූර්ණ එකඟතාව පළ කරනවා. නමුත්, අපි දන්නවා පසු ගිය කාලය පුරාවටම සාක්ෂිකරුවන්ට විතරක් නොවෙයි, විනිශ්චයකාරවරුන්ටත් තමන්ගේ නඩු තීන්දු නිසා ජීවිතය පූජා කරන්න සිදු වුණාය කියන එක. මට මේ වේලාවේදී මතක් වෙනවා, විනිසුරු අඹේපිටිය මැතිතුමාට සිදු වුණු දේ. විනිසුරු අඹේපිටිය මැතිතුමා ඝාතනය කිරීමට අවශ්‍ය ඒ මෙහෙයුම කළේ කවුද? එම මෙහෙයුම කළ අය සිටියේ කොහේද? ඔවුන් සිරගත වෙලා සිටියත් ඔවුන්ට බලයක් තිබෙනවා. එවැනි බලයන් තමයි ක්‍රියාවට නැඟුණේ. ඒ නිසා මේ ආයතන පද්ධතිය සහ ඒ ආයතන පද්ධතිය තුළ තිබෙන ධුරයන් අක්‍රිය වෙන මට්ටමට පත් වෙලා තිබෙනවා. අන්න ඒ තත්ත්වය වළක්වන්නයි කටයුතු කරන්න ඕනෑකම තිබෙන්නේ. මට මේ සම්බන්ධව මෙම ගරු සභාවේදී කරන්න තිබෙන්නේ දීර්ඝ කථාවක් නොවෙයි, කෙටි දෙයක්. ගරු අධිකරණ ඇමතිතුමනි, ඇත්තටම සාක්ෂිකරුවන් විතරක් නොවෙයි, අද විනිශ්චයකාරතුමන්ලාත් ආරක්ෂා වෙන්න ඕනෑ. මොකද, විනිශ්චයකාරවරුන්ටත් කෙළින් තීන්දු තීරණ ගන්න බැරි වටපිටාවන් තමයි නිර්මාණය වෙලා තිබුණේ. නීතිපතිතුමාටත් එහෙමයි. ඒ සම්බන්ධව අද උදාහරණයක් තිබෙනවා. කුමරන් පද්මනාදන් -කේපී- සම්බන්ධයෙන් අභියාචනාධිකරණයෙන් වාර තුනක් වාර්තාවක් ඉල්ලුවා. අදත් නීතිපතිතුමා ඇවිල්ලා බොහොම කම්මැළි විධියට කිව්වා, තවම වාර්තාවක් හදා ගන්න බැරි වුණා කියලා. මේ සිදුවීම වුණේ පහළ අධිකරණයක නොවෙයි. අභියාචනාධිකරණයට වාර්තාවක් දෙන්න නීතිපතිතුමාට තවම බැරි වෙලා තිබෙනවා, කේපී නොහොත් කුමරන් පද්මනාදන් ගැන. මම හිතන්නේ දින සියය නොවෙයි, දින පන්සියයත් පනිව්, සමහර විට වාර්තාව දෙන කොට. ඒක තමයි තත්ත්වය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් සාක්ෂිකරුවන් විතරක් නොවෙයි, ආරක්ෂා කළ යුත්තේ. මම හිතන හැටියට මෙහෙම ගියොත් නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිපතිතුමාත් ආරක්ෂා කරන්න වෙනවා. විනිශ්චයකාරවරුන්වත් ආරක්ෂා කරන්න වෙනවා. මොකද, ඔවුන්ටත් ස්වාධීනව තීන්දු තීරණ ගැනීමේ වටපිටාවක් අහිමි වුණු යුගයක් මේ. මම නැවතත් විවාදයකට පැටලෙන්නේ නැහැ. විත්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමට සහ ආරක්ෂා කිරීම සඳහා මේ ගත්ත පියවර යහ පාලනය පැත්තෙන් ගත්තත්, ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ පැත්තෙන් ගත්තත් හොඳ දෙයක්. ඒක හරි.

ඒ එක්කම මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා දැන් ඇප නැතුව සිරගත වෙලා ඉන්න සිරකරුවන් පිළිබඳව වර්ගීකරණයක් කරන්නය කියා. ඇත්තටම ඒ අය තවදුරටත් සිරගත කර තබන එකේ යුක්ති සහගතභාවය මොකක්ද කියලා බලන්න. මොකද, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, සමහර අයට තිබෙන්නේ තමන්ගේ වැරැද්දක් නොවෙයි, තමන්ගේ නිවැරදිභාවය ඔප්පු කර ගන්න බැරි වීමයි. වැරැද්ද වෙලා තිබෙන්නේ ඒකයි. ඔවුන් වැරදිකරුවන් විධියට සිරගත වෙලා තිබෙන්නේ ඔවුන්ගේ නිවැරදිභාවය ඔප්පු කර ගන්න බැරි වීම නිසායි. සමහර වෙලාවට තීන්දු දෙන මොහොතේ ඇති වන තත්ත්වයන් විසින් ඔවුන්ව සිරගත කර තිබෙනවා. ඇප දෙන්න විධියක් නැති නිසා සිරගත වුණු අය විශාල ප්‍රමාණයක් ඉන්නවා. වැරදි සාක්ෂි දීපු නිසා, සාක්ෂි වරද්දපු නිසා, වැරදි සාක්ෂිකරුවන් යොදවපු නිසා අද සාමාන්‍ය ලෝකයත් එක්ක ජීවත් වෙන්න වට පිටාව අහිමි වුණු මිනිස්සු ඉන්නවා. ඇත්තටම අපේ රටේ සිරගත වෙලා සිටින අයගේ ඇත්ත තත්ත්වය හෙව්වොත් සිර ගෙවල්වලින් භාගයක් හිස් කරන්න පුළුවන්; ඔවුන්ව සමාජගත කරන්න පුළුවන්. ඒ නිසා ඇත්තටම සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම වාගේම, අපි පොඩ්ඩක් ආපස්සට ගිහින් මෙන්න මේ සමාජගත කරන්න පුළුවන්, මුදා හරින්න පුළුවන් අය පිළිබඳව හොයන්න ඕනෑ. ඒ අයට දෙන්න පුළුවන් සහනය මොකක්ද කියලා හොයන්න ඕනෑ.

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

මම නීතිය පිළිබඳව ඔබතුමන්ලා තරම් කරුණු කාරණා ගොඩක් දන්නේ නැහැ. පසු ගිය කාලයේ Licence Board එක රැස් වුණා. සිරගතවූවන්ට නැවත සමාජගත වෙන්න අවස්ථා ගණනාවක් තිබෙනවා. ඒ අවස්ථාවන් වැඩි කරන්න ඕනෑ. මොකද, රජයේ මුදල් යොදවලා ඒ අයට කන්න බොන්න දීලා, නඩත්තු කර කර තියා ගන්න එකේ තේරුමක් ඒ අයටත් නැහැ. මරණ දණ්ඩනයට නියම වුණු අය ඉන්නවා. මම මැගසින් බන්ධනාගාරයට ගිය අවස්ථාවක මට මතකයි ඒ අය කිව්වා, "එක්කෝ අපිව මරන්න. නැත්නම් අපිව එළියට දාන්න" කියලා. "ඒ දෙකම නොකර තියා ගෙන ඉන්නේ ඇයි?" කියලා ඇහුවා. ඇත්තටම එහෙම අහන එක සාධාරණයි. මොකද, ඒ අය -

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කළ කාරණය අපි පිළිගන්නවා. පසු ගිය දවස්වල අපි ඒ පිළිබඳව තක්සේරුවක් කරලා ඇප ලබා දීමට මුදල් නොමැතිකමෙන් සිරගතව සිටි උදවියයි, වයස අවුරුදු 75ට වැඩි සුළු අපරාධවලට වරදකරුවන් වූ උදවියයි අවස්ථා දෙකකදී 612ක් සහ 557ක් නිදහස් කළා. චෝදනා තිබෙනවාද නැද්ද කියලා අවිනිශ්චිත තත්ත්වයේ 182ක් ඉන්නවා. ඒ සම්බන්ධව කමිටුවක් පත් කරලා තිබෙනවා. වාර්තාවක් ගත්ත ගමන් අපි ඒක ක්‍රියාත්මක කරන බව ඔබතුමාට දැනුම් දෙනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඒ ගැන ඔබතුමාට බොහොම ස්තූතියි.

ඊළඟ කාරණය මේකයි. මේ දවස්වල නැවත මාතෘකාවට ඇවිත් තිබෙනවා වැලිකඩ බන්ධනාගාරයේ ඇති වුණු සිද්ධිය. මම දැක්කා අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් ඒ පිළිබඳව මැදිහත් වීමක් කර තිබුණා. ඒවා පිළිබඳව ගත වන කාලය, ක්‍රමවේද-

ගරු සුජීව සේනසිංහ මහතා (අධිකරණ හා කම්කරු සබඳතා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சுஜீவ சேனசிங்க - நீதி மற்றும் தொழில் உறவுகள் பிரதி அமைச்சர்)
(The Hon. Sujeewa Senasinghe - Deputy Minister of Justice and Labour Relations)

ඒ පිළිබඳව පරීක්ෂණ පැවැත්වෙනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඒවා ඉක්මන් වීම තුළින් සමාජයට විශ්වාසයක් ඇති කරවනවා. මට කියන්න ඕනෑ වුණේ ඒකයි. දැන් අවශ්‍ය වෙලා තිබෙන්නේ ඒකයි. රටේ නීතියක් ක්‍රියාත්මක වනවා කියන එක මිනිසුන්ට දැනෙන්නයි ඕනෑ. අද තිබෙන තත්ත්වය ගත්තොත් හුඟ දෙනෙකුට තිබෙන ගැටලුව තමයි රටේ නීතිය මේ රජයටත් ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙයිද කියන ප්‍රශ්නය. ගරු ඇමතිතුමනි, ජනතාවගේ පැත්තෙන් ඒකේ සාධාරණත්වයක් තිබෙනවා. මොකද, හේතුව? නීතියක් නැතුව ක්‍රියාත්මක වුණු රටක මිනිසුන් එහෙම ප්‍රශ්න අහන එක වැරැද්දක් නැහැ. පසු ගිය ජනාධිපතිවරණය කාලයේ මිනිසුන් බඩු මිල ගැන නොවෙයි හිතුවේ. ආර්ථික ප්‍රශ්න ගොඩක් තිබුණාට, පඩි වැඩි කිරීම ගැන ප්‍රශ්න ගොඩක් තිබුණාට, ඒවාට වඩා මිනිසුන් සලකපු සාධක තමයි රටේ යහ පාලනය; රටේ නීතිය ක්‍රියාත්මක වීම. ඒක අද සමාජයක් හැටියට මිනිසුන් පිළිගෙන තිබෙනවා. ඒ නිසා මේ හදන යෝජනා, ඒවා ක්‍රියාත්මක වීම, ඒවායේ භාවිතය ගැන ජනතාව බොහොම සංවේදීව ඉන්නවා ඒවා යථාර්ථවාදීව ප්‍රායෝගිකව ක්‍රියාත්මක වනවාද, දැනෙනවාද කියලා. එහෙම දැනෙන උදාහරණ කීපයක්, අඩු තරමේ දැනෙන ආදර්ශ කීපයක් රටට ඕනෑ. එහෙම නැතුව රටක් හැටියට ඉස්සරහට යන්න බැහැ. අපට දේශපාලන වශයෙන් විවිධ මතිමතාන්තර, වෙනස් අදහස් තිබෙන්න පුළුවන්. ආණ්ඩු පක්ෂයට සහ විපක්ෂයට විවිධ මත තිබෙන්න පුළුවන්. සමහර විට විපක්ෂයේ ඉඳලා ආණ්ඩු පක්ෂයට ගියාම මත වෙනස් වෙන්න පුළුවන්. ආණ්ඩු පක්ෂයේ ඉඳලා විපක්ෂය පැත්තට ආවට පස්සේත් බොහෝ වෙලාවට මත වෙනස් වෙන්න පුළුවන්.

නමුත් ඒ මොනවා වුණත් රටක් ඉස්සරහට යන්න ඕනෑ. ඉස්සරහට යෑමේ වග කීම අපි කාටත් තිබෙනවා. විශේෂයෙන්ම මේ පනත් කෙටුම්පත ගැන ආණ්ඩු පක්ෂ විපක්ෂ භේදයකින් තොරව අදහස් දැක්වීම්වලින් පෙනෙන්නේ, හැමෝගේම එකඟතාවක් තිබෙනවා කියා. අපි කියන්නේ, එකඟ නොවීමට කාරණා තිබියදී පවා -එකඟ නොවිය හැකි කාරණා තිබියදී පවා- එවැනි එකඟතාවන්ගෙන් ඉදිරියට යා යුතුයි; ඉදිරියට යන්න ඕනෑ කියායි.

විශේෂයෙන්ම මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, අද අධිකරණ පද්ධතියේ ක්‍රියාත්මක වන ඇලිමැලි ස්වභාවයන් ප්‍රමාණය සම්බන්ධව. ඒ ඇලිමැලි ස්වභාවයන් ප්‍රමාණය වෙනස් කරන්න නම් චූදිතයන්, විත්දිතයන් ආරක්ෂා කරනවා වාගේම මම අර කලින් කිව්ව ආකාරයට අධිකරණ පද්ධතියේ ඉහළම ඉන්න අයගේත් ස්වාධීනත්වය, නිදහස සහ ඔවුන්ට තීන්දු තීරණ ගැනීමේ හැකියාව මීට වඩා බලාත්මක කරන්න ඕනෑ; ඒ සඳහා මීට වඩා ක්‍රියාත්මක වෙන්න ඕනෑ. ඒ සඳහාත් කටයුතු කරන්න කියා ඉල්ලා සිටිමින් මෙම පනත් කෙටුම්පතට අපේ සහයෝගය පළ කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

[අ.භා. 3.54]

ගරු සුජීව සේනසිංහ මහතා (අධිකරණ හා කම්කරු සබඳතා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சுஜீவ சேனசிங்க - நீதி மற்றும் தொழில் உறவுகள் பிரதி அமைச்சர்)
(The Hon. Sujeewa Senasinghe - Deputy Minister of Justice and Labour Relations)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපරාධයක විත්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත දෙවන වර කියැවීමේ විවාදයේදී අදහස් පළ කරන්නට අවස්ථාව ලබා දීම සම්බන්ධව ඔබතුමාට බොහොම ස්තූතියි. ජනාධිපති මැතිවරණය ඉවර වුණාට පස්සේ වැදගත් කාර්ය භාරයක් අධිකරණ ඇමතිතුමා -විජයදාස රාජපක්ෂ මැතිතුමා- සහ අප අමාත්‍යාංශය මේ වෙන කොට ඉටු කරමින් තිබෙනවා. ඒ දින සියයේ පොරොන්දුව තුළ වැඩි කොටසක් ඉටු කරන්න තිබුණේ අපේ අමාත්‍යාංශයටයි. ජී.එල්. පීරිස් මැතිතුමා අපි අගයන නීති විශාරදයෙක්. එතුමා මේ සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කළා. ඔබතුමාගේ අදහස් අපි ඉතාමත් ආදරයෙන් භාර ගන්නවා. හිටපු ඇමතිතුමනි, මෙච්චර නීතියට ආදරය කරන, නීතියට ගරු කරන ඇමති කෙනෙකු වශයෙන් ඒ දවස්වල වල් වැදිලා තිබුණු රටේ නීතිය සම්බන්ධයෙන් ඔබතුමා අදහස් මොනවත් ප්‍රකාශ කළේ නැති එක අපට ප්‍රශ්නයක්. විශේෂයෙන්ම ඒ කාරණය අපි ඔබතුමාගේ අවධානයට යොමු කරවනවා. ඒ කාලයේ මේ රටේ අධිකරණයක් පැවතුණේ නැහැ; මේ රටේ පොලීසියක් පැවතුණේ නැහැ. හිටපු ඇමතිතුමනි, මේ රටේ අධිකරණය හා පොලීසිය ක්‍රියාත්මක වුණේ, දුප්පත් ජනතාවට නැත්නම් කිසිම දෙයක් කර ගන්න බැරි, කිසිම බලයක් නැති ජනතාවට විතරයි.

විශේෂයෙන්ම ඔබතුමාගේ අවධානයට යොමු කරවනවා, තංගල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා කරපු ඝාතනය ගැන. ඒ සම්බන්ධයෙන් ඔබතුමන්ලා ගත්තු පියවර මොකක්ද? අවුරුදු එකහමාරක් යන කල් ඒ ඝාතකයාව අත් අඩංගුවට ගන්න බැරි වුණා; සාක්ෂිකාරයෙක් හොයා ගන්න බැරි වුණා හිටපු ජී.එල්. පීරිස් ඇමතිතුමනි. මේ අවස්ථාවේ කථා කරනවා වාගේ එදා ඔබතුමන්ලා කථා කර ඒ ඝාතන ගැන අවධානය යොමු කළා නම්, මේ රටේ නීතිය අපි බලාපොරොත්තු වුණු ආකාරයට යම් තැනකට ගෙනෙන්න ඔබතුමන්ලාගේ ඒ මැදිහත් වීම ගොඩක් උදවු වෙන්න තිබුණා. ජී.එල්. පීරිස් මැතිතුමනි, නීතිය හදාරන විට ඔබතුමාගේ නම නිතරම කියැවෙනවා. මොකද, නීතිය සම්බන්ධයෙන් ඔබතුමා විශාල පොත් සංඛ්‍යාවක් ලියලා තිබෙනවා. ඔබතුමන්ලා, වාසුදේව නානායක්කාර මැතිතුමන්ලා සාධාරණය ගැන ගොඩක් කථා කරන උදවිය. හැබැයි, ඒ අවස්ථාවේදී නිහඬව හිටියා. මම දන්නේ නැහැ, ඒක දේශපාලනයේ කොටසක්ද කියා. මේ රටේ නීතිය වල් වැදිලා තිබුණු අවස්ථාවක තමයි තංගල්ලේදී ඒ සුදු ජාතික කාන්තාව ඝාතනය වුණේ. මම ඒ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි.

සුදු ජාතික කාන්තාව සමඟ ආපු තරුණයාව මැරුවාට පස්සේ තමයි සුදු ජාතික කාන්තාව දූෂණය වෙන්නේ. ඒ තරුණයා මරලා, විනාඩි 15ක් යනකොට ඒ ලේ උඩ ඒ කාන්තාව දූෂණයට පත් වෙනවා. හැබැයි, එකම සාක්ෂිකාරයෙක්වත් හොයා ගන්න බැරි වුණා. අවුරුදු එකහමාරක් ගියා, අත් අඩංගුවට ගන්න. අවුරුදු එකහමාරක් ගිහිල්ලත් අත් අඩංගුවට ගත්තේ, අර ඩේවිඩ් කැමරන් ඇවිල්ලා නටපු නාඩගමෙන් පස්සේයි. ඩේවිඩ් කැමරන් රටේ හැම තැනම යන්න පටන් ගත්තා. ඒකට බය වෙලා තමයි ඒ අත් අඩංගුවට ගැනීමත් සිදු කළේ. මහින්ද රාජපක්ෂ මහත්තයාගේ ආණ්ඩුව කාලයේ මේ රටේ නීතියක් තිබුණේ නැහැ. නීතිය ක්‍රියාත්මක වුණේ එතුමාට ඕනෑ විධියටයි; එතුමාගේ පවුලේ උදවියට ඕනෑ විධියටයි. හැබැයි දින කිහිපයක් ඇතුළත අපි අධිකරණයේ ස්වාධීනත්වය රකින්න, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ ස්වාධීනත්වය රකින්න, පොලීසියේ ස්වාධීනත්වය රකින්න කටයුතු කළා.

අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් කරපු පොඩි ගෝරියකට ඇප ලැබුණේ සුමාන හතරකට පස්සේ. ඔහු ආණ්ඩු පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්. ඒකට ජනාධිපතිතුමා අත ගැහුවේ නැහැ. අගමැතිතුමා අත ගැහුවේ නැහැ. අධිකරණ ඇමතිතුමා අත ගැහුවේ නැහැ. මේක තමයි මේ රටේ ජනතාව බලාපොරොත්තු වෙන නීතිය. අපි දින කිහිපයක ඉතා සුළු කාලයක් තුළ ඔබතුමන්ලා ඇතුළු සියලු දෙනාටම ජීවත් වෙන්න පුළුවන් අත්තිවාරම වන නීතිය, යහ පාලනය, ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් කරන්න ඕනෑ විශාල කාර්ය භාරයක් අපි ඉටු කර තිබෙනවා. විශේෂයෙන් අධිකරණ ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා, එතුමා ඇමතිවරයා විධියට පත් වූ ගමන්ම පනත් කෙටුම්පත් කිහිපයක් ඉදිරිපත් කරන්න කටයුතු කිරීම ගැන.

ඉදිරියේදී දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය එනවා. මේ රටේ ස්වාධීන ආයතන ඇති කරන්න අපි කටයුතු කරනවා. දවස් කිහිපයයි ගියේ. මෙතුමා ඇතුළු අපි එකතු වෙලා ඒ කාර්ය භාරය ඉටු කරනවා. ඔබතුමන්ලා -ජී.එල් පීරිස් මහත්තයාලා - අවුරුදු 20ක් මේකේ ඉඳගෙන හිටියා. මේ පාර්ලිමේන්තුවට තොරතුරු දැන ගැනීමේ පනත් කෙටුම්පත ගෙනාවේ නැහැ.

ඔබතුමන්ලා දැන් අදහස් ඉදිරිපත් කරනවා වාගේම ආණ්ඩු පක්ෂයේ ඉන්න කොටත් ඔබතුමන්ලාට මේ වාගේ අදහස් ඉදිරිපත් කරන්න තිබුණා නේ. හැබැයි, ඔබතුමන්ලා අන්ධයෝ වාගේ, ගොළුවෝ වාගේ හිටියා. විශේෂයෙන් ඔබතුමන්ලා මේ රටට වග කියන, නීතිය සම්බන්ධයෙන් හොඳ අධ්‍යාපනයක්, දැනුමක් තිබුණු උදවිය. "ජනාධිපතිතුමනි, ඇයි මේවා ගෙනෙන්නේ නැත්තේ, මේවා වැරැදියි" කියා කෙළින් කථා කර කියන්න ඔබතුමන්ලාට කොන්දක් තිබුණේ නැහැ. හැබැයි, දින කීපයක් යන කොට මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා දුන්නු පොරොන්දු අනුව, ලෝබ වන්නේ නැතිව, ලජ්ජා වන්නේ නැතිව තමන්ගේ බලය අඩු කර ගත්තා. මේ රටේ කිසිම නායකයෙක් මේ විධියට කටයුතු කර නැහැ. ඒ දුන්නු පොරොන්දු අනුව එතුමා කටයුතු කරනවා. එතුමා අද ගෙනෙන්නේ එතුමාගේ නෝනා ඔතලා දෙන බත් එක. ඉතාම අල්පේච්ඡ ජීවිතයක් එතුමා ගත කරන්නේ. ඉතාම අඩු මුදලක් තමයි එතුමා වෙනුවෙන් වැය වෙන්නේ. එතුමා ඊයේ - පෙරේදා ශ්‍රීලන්කන් එයාර් ලයින්ස් සමාගමට අයත් plane එකකින් තුන් හතර දෙනෙකු සමඟ ලස්සනට රට ගියා. මෙන්න මේවා තමයි ආදර්ශ. හිටපු ජනාධිපතිතුමා කොහොමද පිට රට ගියේ? Plane එක ඇතුළේ ඩොලැක්ක ගහන්න හතර දෙනෙක් විතර හිටියා. වයලීන් ගහන්න තව පස් දෙනෙකු විතර හිටියා. ඒ අස්සේ ඔබතුමන්ලාත් හිටියා. 120 දෙනෙක්, 110 දෙනෙක් බිම තියලා තමයි එතුමන්ලා plane එකෙන් පිට රට ගියේ. ශ්‍රීලන්කන් එයාර් ලයින්ස් සමාගමේ පාඩුව රුපියල් බිලියන 35යි. ඔබතුමන්ලා රටේ නීතිය ගැන කථා කරන්නේ කොහොමද? මේ රටේ නීතිය විතරක් නොවෙයි, ඔබතුමන්ලා මේ රටත් විනාශ කළා. අපි රට වෙනුවෙනුයි කටයුතු කරන්නේ. නමුත් දේශපාලන වශයෙන් අපිට අවාසියි. ජෝන් අමරතුංග මහත්තයාට ඇඟිල්ල දිගු කරන්න පුළුවන්ද? එතුමා ගිහින් ගැහුවේ නැහැ. එතුමාගේ ආසනයේ යම්කිසි ප්‍රශ්නයක් ඇති වුණා. ඒ සම්බන්ධයෙන් පොලීසිය ක්‍රියාත්මක වුණා. ඊට සම්බන්ධ පුද්ගලයින් අත් අඩංගුවට අරගෙන තිබෙනවා; නීතිය ක්‍රියාත්මක වෙලා තිබෙනවා. මගේ ආසනයේ, විජයදාස රාජපක්ෂ මහත්තයාගේ ආසනයේ ඇති වෙන ප්‍රශ්නයක් අපිට නවත්වන්න පුළුවන්ද? නවත්වන්න පුළුවන් නම් අපි නවත්වනවා. හැබැයි, අපි නැති වෙලාවක යම්කිසි ප්‍රශ්නයක් ඇති වුණොත් ඒක නීතියේ ආධිපත්‍ය බිඳ වැටීමක්ද? නැහැ. අපි නීතිය හැම තැනම ක්‍රියාත්මක කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම සුනාමි කාලයේ මේ රටේ සිදු වුණු සිද්ධියක් සම්බන්ධයෙන් මම ඔබතුමන්ලාගේ අවධානය යොමු කරවනවා. හිටපු ජනාධිපතිතුමාගේ ගිණුමකට සුනාමි මුදලක් -රුපියල් ලක්ෂ 5,300ක්- බැර වුණා. මේ රටේ අහිංසක ජනතාවට මොකක්ද වුණේ? අපි සාක්ෂිකරුවන් ගැන කථා කරනවා. අගතියට පත් වුණ පාර්ශ්ව ගැන අපි කථා කරනවා. නඩු දමන්න ආපු මනුස්සයා තව ටිකෙන් හිරේ දමනවා. කබීර් හාෂීම් මහත්තයා ශ්‍රේෂ්ඨාධිකරණයට පැමිණිල්ලක් ඉදිරිපත් කළා, "මේ මුදල් ටික පෞද්ගලික ගිණුම්වලට වැටුණේ කොහොමද?" කියා. ශ්‍රේෂ්ඨාධිකරණයේ හිටපු මොහාන් පීරිස් මහත්තයාලා, ඊට කලින් හිටපු සරත් නන්ද සිල්වා මහත්තයාලා දුන්නු තීන්දු මොනවාද? පැමිණිල්ල කරපු මනුස්සයා හිරේ දමන්න ඕනෑ කිව්වා. මෙන්න මේකයි මේ රටේ තිබුණු නීතිය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම තමයි පුරාවස්තු කොල්ලකෑම. පුරාවස්තු කොල්ලකෑම සම්බන්ධයෙන් තොරතුරු අපිට දැන් තමයි දැන ගන්න ලැබෙන්නේ. කිල්ල නිසාලු පුරාවස්තු කොල්ලකෑවේ. කිල්ල ඇති වුණොත් කැරකෙන බෝලේ කිරිවලින් නාවන්න ඕනෑලු. ඒ වාගේම අශ්වයාගේ බෙල්ල දුවුගැමුණු රජ්ජුරුවන්ගේ කඩුවෙන් කපන්න ඕනෑලු. මෙච්චර CCTV camera තිබෙනවා. කෝ, සාක්ෂිකාරයෝ? සාක්ෂිකාරයින් ඇල්ලුවාද? කොළඹ මැද සිදු වුණු ඒ හොරකම් සම්බන්ධයෙන් හොයා බලන්න කවුරුවත් කටයුතු කළේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රට ලජ්ජාවට පත් වුණා. BBC ආයතනය මහින්ද රාජපක්ෂ මහත්තයාත් එක්ක සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වූවා. ලංකාවේ සුදු වැන් සංස්කෘතිය ගැන එතුමාගෙන් ඇහුවා. සුදු වැන්වලින් අතුරුදහන් වන උදවිය සම්බන්ධයෙන් ඔබතුමාගේ උත්තරය මොකක්ද කියා ඉංග්‍රීසි භාෂාවෙන් ඇහුවා. එතකොට මහින්ද රාජපක්ෂ මහත්තයා උත්තර දුන්නා, "මේ රටේ සුදු වැන් විතරක් නොවෙයි, රතු වැන්

[ගරු සුජීව සේනසිංහ මහතා]

තිබෙනවා. කළු වැන් තිබෙනවා. කහ වැන් තිබෙනවා. පාට පාට වැන් තිබෙනවා" කියා. අන්න ඒ ආකාරයටයි අපේ රටේ ජනාධිපතිතුමා ජාත්‍යන්තර ආයතනයකට උත්තර දුන්නේ.

විශේෂයෙන්ම කොළඹ නගරයේ නිවාස කැඩීම සම්බන්ධ කාරණයට මම මැදිහත් වුණා. ඒ සඳහා කටයුතු කරන්න ඉදිරිපත් වුණු පුද්ගලයාට මොකක්ද වුණේ? සුදු වැන් එකක් ඇවිල්ලා අරගෙන ගිහිල්ලා, දවස් තුනකට පස්සේ මිනිහා ගෙනැල්ලා බස්සලා තමන්ට ඕනෑ දේ කර ගත්තා. ඒ වාගේම කොම්පඤ්ඤ වීදියේ ජනතාව ඔප්පු සහිතව හිටපු නිවෙස්වලින් බලෙන් ඉවත් කළා. ශ්‍රේෂ්ඨාධිකරණය තමයි මේ නඩු අතට ගත්තේ. ඒ ගැන සාකච්ඡා කළේ ඇමතිවරුන් සමඟ වාගේම ආරක්ෂක ලේකම්ලා සමඟයි. අපිට විරුද්ධව මේ රටේ නීතිය ක්‍රියාත්මක වුණේ මෙහෙමයි. අපිට නඩු කථා කරන්නවත් මේ රටේ නිසි වාතාවරණයක් තිබුණේ නැහැ, විජයදාස රාජපක්ෂ ඇමතිතුමනි. අපි මරණ තර්ජන එල්ල කරනවා, පගා ඉල්ලනවා, මේ නඩුවෙන් සල්ලි ඉල්ලලා තිබෙනවා කියා අපිව නඩුවෙන් ඉවත් කරන්න තැත් කළා. අපි මේ සම්බන්ධයෙන් "වහාම හෙට පරීක්ෂණයක් පවත්වන්න" කියා ශ්‍රේෂ්ඨාධිකරණයට කරුණු ඉදිරිපත් කළා. අග විනිසුරුතුමා මොකක්ද කිව්වේ? "නැහැ, නැහැ. අපි සුජීව සේනසිංහලා ගැන දන්නවා. කිසිම පරීක්ෂණයක් අවශ්‍ය නැහැ, මේක අහක් කරලා දමන්න" කියා නීතිපති දෙපාර්තමේන්තුවට ඒ අවස්ථාවේදී අණක් දුන්නා. හැබැයි, file එක යවලා අවුරුදු දෙකක් වනවා. මම මාස හයකට කලින් කිව්වා, "මට විරුද්ධව චෝදනා තිබෙනවා නම් ඒ ගැන විභාග කර මේ කටයුත්ත අවසන් කරන්න" කියා. ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමාගේ අවධානයට මම මේ කාරණය යොමු කරනවා. Files විශාල සංඛ්‍යාවක් තිබෙනවා. මම හිතන්නේ ඒ සඳහා අපි මුදල් වෙන් කරන්න ඕනෑ; නීතිඥවරු බඳවා ගන්න ඕනෑ. දැන් හොඳ නීතිපතිතුමෙක් ඉන්නවා. පැහැදිලිව ක්‍රියා කරන්න පුළුවන්, ස්වාධීනව ක්‍රියා කරන්න පුළුවන්, දේශපාලන හස්තයට බය නොවන, ගරු කරන්න පුළුවන් නීතිපතිතුමෙක් අද අපේ රටට පත් වෙලා ඉන්නවා. ඒ වාගේම තමයි, අග විනිසුරුතුමා. එතුමා තමන්ගේ ජීවිත කාලය තුළ වාගේම අධිකරණ පද්ධතිය තුළත් හරියාකාරව ඉස්සරහට ආපු අග විනිසුරුතුමෙක්. ඒ නිසා අපට බය නැතුව අද අධිකරණයේ ස්වාධීනත්වය ගැන කථා කරන්න පුළුවන්. මේ රටේ කලින් හිටියේ අග විනිසුරුතුමන්ලා නොවෙයි, ව්‍යාපාරිකයෝ හිටියේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ගිහිල්ලා කෑම කෑවේ අග විනිසුරුතුමාගේ කාමරය ඇතුළේ. මෙහෙම අධිකරණයක් තමයි ක්‍රියාත්මක වුණේ. අපි ඇත්තටම ලජ්ජා වෙනවා. ජී.එල්. පීරිස් මැතිතුමා මේ රටේ නීතියට විශාල කාර්ය භාරයක් කළ ඇමතිවරයෙක්. හැබැයි එදා එතුමා නිහඬව හිටියා. හැබැයි එතුමා අද යම් අදහස් කිහිපයක් ප්‍රකාශ කළා. හැබැයි ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අද දක්වපු අදහස් ටික මුහුදට දමන පොඩි අල්පෙනෙත්තක් වාගෙයි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Please wind up now.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම අවසාන වශයෙන් තව විනාඩියක් ඉල්ලා සිටිනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සම්මේලනය පැවැත්වූවා, මම දැක්කා. දැන් මේ සභාවේ සිටින, හිටපු ඇමතිවරුන් ඒ දවස්වල විශාල වශයෙන් ප්‍රකාශ කළා, රාජපක්ෂ පවුලේ දක්ෂයන් විශාල ප්‍රමාණයක් ඉන්නවා කියලා. බැසිල් රාජපක්ෂ, ගෝඨාභය රාජපක්ෂ, නාමල් රාජපක්ෂ කියන්නේ අති දක්ෂයෝ; ඒ නිසා ඒ අමාත්‍යාංශවලට සියයට 70ක්, සියයට 80ක් මුදල් වෙන් කළාම මොකද වෙන්නේ කියලා ඇහුවා. හැබැයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තනතුරු දෙනකොට එක රාජපක්ෂ කෙනෙකුගේවත් නමක් මට ඇහුණේ නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉදිරි අනාගතය වෙනුවෙන් රාජපක්ෂවරුන් ගෑවිලාවත් නැහැ. ඔබතුමන්ලා කිව්ව ආකාරයට, ඒ කාලයේ ඇමතිවරුන් ප්‍රකාශ කළ ආකාරයට ඔබතුමන්ලා මෙතරම් දක්ෂ පිරිසක් ඉවත් කිරීම සම්බන්ධයෙන් මම කනගාටුව ප්‍රකාශ කරනවා. මම හිතන විධියට ඉදිරි අනාගතයේදී විශාල විපර්යාසයක් සිදු වෙනවා. ගරු මන්ත්‍රීතුමනි, අපේ ආණ්ඩුව පත් වෙලා දවස් තිස් ගණනයි තවම ගත වෙලා තිබෙන්නේ. දැනටමත් අපි නීතිය ක්‍රියාත්මක කරන්නට ඕනෑ කරන සියලු කටයුතු සිදු කරනවා. අධිකරණය කෙළින් කර ගන්න අපට අවශ්‍යතාව තිබුණා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම අපි කෙළින් කර ගෙන යනවා. පොලීසිය, ඒ වාගේම අනෙකුත් ආයතන අපි කෙළින් කර ගෙන යනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපට ආරංචි වුණා, ඩොලර් බිලියන දෙකහමාරක, තුනක වාගේ මුදල් ප්‍රමාණයක් විදේශ ගිණුම්වල තැන්පත් කරලා තිබෙනවා කියලා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Sujeewa Senasinghe, your time is over.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
අපි INTERPOL එක හරහා, අනෙකුත් විදේශ තානාපති කාර්යාල හරහා ඒ සම්බන්ධයෙන් කටයුතු කරනවා. ඒ හොර මැරයින් අධිකරණයට ඉදිරිපත් කරලා නීතිය ක්‍රියාත්මක කරන්නට අප කටයුතු කරනවා. දවස් 40ක් වාගේ පොඩි කාලයක් තමයි තවම අපට ගත වෙලා තිබෙන්නේ. දවස් සියය ඇතුළත මේ රටේ ඔබතුමන්ලා බලාපොරොත්තු වෙන අත්තිවාරම වන නීතිය, යහ පාලනය, ප්‍රජාතන්ත්‍රවාදය ඇති කරනවා. ජී.එල්. පීරිස් මැතිතුමාට කරන්නවත්, හිතන්නවත් වෙලාවක් තිබුණේ නැති දෙයක් අපි දින සියයක් ඇතුළත මේ රට වෙනුවෙන්, ඉදිරි අනාගතය වෙනුවෙන් කරනවා කියලා පොරොන්දු වෙන බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට ඕනෑ. ඒ වාගේම ජනාධිපතිතුමාටත්, අගමැතිතුමාටත්, අපේ අධිකරණ හා කම්කරු සබඳතා ඇමතිතුමාටත් මාගේ ස්තුතිය, ප්‍රණාමය මේ අවස්ථාවේදී පුද කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 4.06]

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ අධිකරණ නියෝජ්‍ය ඇමතිතුමා දැන් මේ සභාවේ ගොඩාක් දේවල් කිව්වා. මේ දින සියයක් ඇතුළත ක්‍රියාවට නඟන ක්ෂණික වැඩසටහන් අනුව නම් පෙබරවාරි 19වැනි බ්‍රහස්පතින්දා - අද - ජාතික විගණන පනත ඉදිරිපත් කිරීම තමයි සිදු වෙන්න ඕනෑ. ඒක මේ දින සියය ඇතුළත ඉදිරිපත් කරනවාද කියලා නම් මම දන්නේ නැහැ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මඟ එනවා.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඒක තමයි. ඔක්කෝම "මහ එනවා" තමයි. ඊළඟට ජාතික ඖෂධ ප්‍රතිපත්තිය කැබිනට් මණ්ඩලයෙන් අනුමත කොට පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට තිබුණේ පෙබරවාරි 06වැනි දා. මේවා බාලගිරි දෝෂය වාගේයි. අද නොවෙයි, හෙට. ඒ වැඩසටහනේ හෙටට නියමිතව තිබෙන්නේ තොරතුරු දැන ගැනීමේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Sujeewa Senasinghe, what is your point of Order?

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු මන්ත්‍රීතුමනි, අපි ඔය දින වකවානු දමලා තිබෙන්නේ අපේ පහසුවටයි. එහෙම නැතුව අපි ඒ දිනයටම හැම දෙයක්ම කරනවා කියලා නොවෙයි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
That is not a point of Order.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඉදිරි අනාගතයේදී අනිවාර්යයෙන්ම කරනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
You carry on, Hon. Member.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
හොඳයි, හොඳයි. ඒකද ඔබතුමා කියන්නේ? ජනතාවට කිව්වේ දින සියයෙන් කරනවා කියලා නේ. මේ දින සියයට බාලගිරි දෝෂය. අද නොවෙයි, හෙට. ජාතික ඖෂධ ප්‍රතිපත්තිය කැබිනට් මණ්ඩලයෙන් අනුමත කොට පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට තිබුණේ පෙබරවාරි 06වැනි දා. අද නොවෙයි හෙට කියලා කියනවා.

ඊළඟට, ජාතික විගණන පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට තිබුණේ පෙබරවාරි 19වැනි දා. ඒ කියන්නේ අද. අද නොවෙයි හෙට කියනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟට, තොරතුරු දැන ගැනීමේ පනත. අද නොවෙයි හෙට. ඒකයි අපි කියන්නේ, මේ දින සියයේ වැඩ පිළිවෙළ එන්න එන්න පස්සට යනවා කියලා.

අපේ ජෝන් අමරතුංග ඇමතිතුමා පොලීසිය ගැන කිව්වා. මොනවාද කිව්වේ? ගොඩාක් දේවල් කිව්වා. අත් අඩංගුවට ගැනීම් ගැන, "The Sunday Leader" කර්තෘතුමා ඝාතනය කිරීම ගැන, තජුඩීන් රගර් ක්‍රීඩකයා ඝාතනය කිරීම ගැන, හලාවත උද්ඝෝෂණයේදී ඇන්තනි කියලා කෙනෙක් මැරුණු එක ගැන, කටුනායක උද්ඝෝෂණයේදී රොෂේන් චානක මැරුණු එක ගැන, රතුපස්වල සිද්ධිය ගැන ආදී වශයෙන් ගොඩක් දේවල් කිව්වා. ඉතින් මේවා ගැන සොයන්න. ඒකට තමයි ජනතාව තමුන්නාන්සේලාට බලය දුන්නේ. එහෙම නැතුව පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියවන්න නොවෙයි; වත්තල ප්‍රාදේශීය සභාව ඇතුළට පැනලා අහිංසක සභාපතිවරයාට ගහන්න නොවෙයි. ඒ වාගේ වැඩ කරන්න නොවෙයි ජනතාව තමුන්නාන්සේලාට බලය දුන්නේ. ජනතාව තමුන්නාන්සේලාට බලය දුන්නේ ඒ කාරණා සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කරන්නයි. ඒවා කරන්නේ නැතුව මෙතැන ඇවිල්ලා අඬන්න නොවෙයි. වැරදි කරලා තිබෙනවා නම් ඒ අය අත් අඩංගුවට ගන්න. දැන් තමුන්නාන්සේලාට බලය දීලා තිබෙනවා නේ. වැරදිකරුවන් අල්ලලා දඬුවම් දෙන්න. දැන් දින 41ක් ගත වෙලා තිබෙනවා. මොනවාද කරලා තිබෙන්නේ? රතුපස්වල සිද්ධිය සම්බන්ධයෙන් මොනවාද කරලා තිබෙන්නේ? ඊළඟට "The Sunday Leader" කර්තෘතුමා ගැන මොනවාද කරලා තිබෙන්නේ? තමුන්නාන්සේලා මාධ්‍ය ගැන කථා කළා. දැන් මෙතැන ඇවිල්ලා අඬනවා. අඬලා වැඩක් නැහැ. දින 41න් කරපු දේවල් කියන්න. මෙන්න මේ මාධ්‍යවේදියාගේ ඝාතනය සම්බන්ධයෙන් පොලීසියෙන් පරීක්ෂණයක් කරලා තිබෙනවා; කොමිසමක් පත් කරලා තිබෙනවා කියලා කියන්න. එහෙම දෙයක් කිව්වේ නැහැ. අපට චෝදනා කරනවා. අපට චෝදනා කරන්න නොවෙයි තමුන්නාන්සේලාට බලය දීලා තිබෙන්නේ. ඒවා සම්බන්ධයෙන් කටයුතු කරන්නයි තමුන්නාන්සේලාට බලය දී තිබෙන්නේ. ඔබතුමන්ලා ඒවා කරන්නේ නැහැ. කරන්නේ මොකක්ද? අර ප්‍රාදේශීය සභාවේ අහිංසක සභාපතිතුමාට ගිහිල්ලා ගහනවා. ඒක තමයි ඒ ඇමතිතුමාට කරන්න පුළුවන් ලොකුම දෙය. ඊළඟට මොකක්ද? අපිත් කියනවා, රිචර්ඩ් ද සොයිසා ගැන ඒ කාලයේ ප්‍රශ්න තිබුණා කියලා. ප්‍රේමකීර්ති ද අල්විස් ඝාතනය වුණා. එහෙම අතීතයක් තිබුණා.

ඊළඟට ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුවක් තිබුණු නිසා තමයි අද රට පුරා එක නීතියක් ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ කියලා අපි කියනවා. 2005 වර්ෂය වන තුරු එහෙම නීතියක් ක්‍රියාත්මක වෙලා තිබුණේ නැහැ. රට පුරා එකම නීතියක් තිබුණේ නැහැ. වෙනම නීතියක් තමයි තිබුණේ. ඒ තමයි ත්‍රස්තවාදී කොටි නීතිය. පසු ගිය ආණ්ඩුව කාලයේ නීතියක් තිබුණේ නැහැ, අරවා තිබුණේ නැහැ, මොනවා තිබුණේ නැහැ කියා තමුන්නාන්සේලා කිව්වත් එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුව නිසා තමයි මේ රටේ සෑම පුරවැසියෙකුටම එක නීතියක් ක්‍රියාත්මක කරන්න පුළුවන් වුණේ. එදා උතුරට වෙනම විනිශ්චයකාරවරුන් හිටියා. උතුරට යන්න බැහැ. අධිකරණ පද්ධතියක් තිබුණාට වැඩක් නැහැ. ප්‍රභාකරන් තමයි -

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Will an Hon. Member propose the Hon. R. Yogarajan to take the Chair?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
I propose that the Hon. R. Yogarajan do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ආර්. යෝගරාජන් මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு ஆர். யோகராஜன் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. R. YOGARAJAN *took the Chair.*

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, you may continue with your speech.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද "යහ පාලනය" කියලා කියනවා. යහ පාලනයක් නොවෙයි අද තිබෙන්නේ වහ පාලනයක්. යහ පාලනයක් නම් ඒකේ හොඳ දේවල් තිබෙන්න ඕනෑ නේ. අපේ ජී.එල්. පීරිස් මැතිතුමා මේ රටේ නීතියට විශාල කාර්ය භාරයක් කළා. නමුත් අපි මොනවාවත් නොකළා වාගේ තමයි අද මේ අය කථා කරන්නේ. 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත, ඒ වාගේම 2007 සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය, ඊළඟට වාණිජ ආරාවුල් සමථයකට පත් කිරීමේ පනත, ඒ වාගේම කාලාවරෝධ සංශෝධන පනත, ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත එක්සත් ජනතා නිදහස් සන්ධාන රජයෙන් ගෙනාවේ. ගෘහස්ත ප්‍රචණ්ඩත්වය එනම් ස්වාමිපුරුෂයා හා භාර්යාව අතරේ යම්කිසි ප්‍රශ්නයක් ඇති වෙනවා නම්, ප්‍රචණ්ඩත්වයක් ඇති වෙනවා නම් ඒ සම්බන්ධයෙන් උසාවියට යන්න පුළුවන් තත්ත්වයක් අපි ඇති කළා. එවැනි නීති-රීති පද්ධතියක් පසු ගිය රජය කාලයේ අපි ගෙන ආවා. ඔබතුමන්ලාගේ ගරු අධිකරණ ඇමතිතුමා ගෙනෙන මේ පනත් කෙටුම්පත අපේ ආණ්ඩුව කාලයේදී අපි පටන් ගත්තේ. අපි මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කටයුතු කරලා, මේක committees කිහිපයකට ගිහිල්ලා, සංශෝධනයන් වෙලා, ඒ යෝජනා ඔක්කෝම එකතු වෙලා තමයි මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඇවිත් තිබෙන්නේ. එහෙම නැතිව මෙය ඔබතුමන්ලාගේ අධිකරණ ඇමතිතුමා එක පාරටම ගෙනාව පනත් කෙටුම්පතක් නොවෙයි. අපි කෙටුම්පත් සකස් කරලා, පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවට දාලා, විවාද කරලා, සංශෝධනය කරලා තමයි ගෙනාවේ. ඒ කෙසේ වෙතත් මෙවැනි පනත් කෙටුම්පතක් ගෙන ඒම ගැන අපි අද සතුටු වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද, මමත් නීතිඥවරයෙක්. බොහෝ විට නීතිය ඉදිරියට ගියාම වැඩි වශයෙන්ම ආරක්ෂා වුණේ විත්තිකරුයි. විත්තිකරුගේ පැත්තෙන් තමයි ගොඩාක් දේවල් කථා වුණේ. එම නිසා මේ පනත් කෙටුම්පත ඉතාමත් වැදගත්. මෙහි 4.(1) උප වගන්තියේ විත්දිතයෙකුගේ හිමිකම් යටතේ මෙසේ සඳහන් වෙනවා:

> "....යම් අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් ඉදිරිපිට දී පවත්වනු ලබන යම් අධිකරණ හෝ අර්ධ අධිකරණ කටයුත්තට සහභාගී වීම හා
>
> සිදු වූ වරදේ ප්‍රතිඵලයක් වශයෙන් අපරාධයක විත්දිතයකුට දරන්නට සිදු වූ වියදම් සලකා බැලීමේ දී, අධිකාරියෙන් මුදලක් ලබා ගැනීමට, අපරාධයක විත්දිතයාට හිමිකමක් තිබිය යුතුය."

ඒ කාරණය වැදගත්. මොකද, යම්කිසි අපරාධයකින් කෙනකු පීඩාවට පත් වෙනවා. මමත් නීතිඥයෙක් හැටියට දකිනවා විශේෂයෙන්ම කාන්තාවක් දූෂණයට ලක් වුණාම ඒ කාන්තාවන්ට යම්කිසි සහනයක් තිබෙන්න ඕනෑ කියා. ඒ නිසා මේ කාරණය ඉතා වැදගත් වෙනවා. ඒ වාගේම අපරාධ විත්දිතයෙකුට යම්කිසි වන්දියක් ලබා ගන්න 29.(1) උප වගන්තිය යටතේ ආරක්ෂණ අරමුදලක් ඇති කිරීමට කටයුතු කර තිබෙනවා. 29.(1) උප වගන්තියේ මෙසේ සඳහන් වෙනවා:

> "(මෙහි මින්මතු "ආරක්ෂණ අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන) විත්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂණ අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් තිබිය යුතුය."

මේක ඉතා වැදගත්. මොකද හේතුව, අධිකරණයට සාක්ෂි දෙන්න ඇවිල්ලා ඒ අපරාධකරුගෙන් යම්කිසි ජීවිත හානියක්, වෙනත් හානියක් වුණොත්, ඔහුගේ නිවසට ගිනි තියලා වාගේ දෙයක් වුණොත්, අධිකරණයෙන් තීන්දුවක් ලැබුණොත් මිස ඔහුට වන්දියක් ලබා ගන්නට ඉතිහාසයේ කවදාකවත් සහනයක් තිබුණේ නැහැ. දැන් මේ පනත් කෙටුම්පත සම්මත වුණාම මේ ආරක්ෂණ අරමුදල යටතේ අන්න ඒ සාක්ෂිකරුවාට, විත්දිතයාට ඒ අරමුදලෙන් යම්කිසි වන්දියක් ලබා ගන්න පුළුවන්කම ලැබෙනවා. ඒක ඉතා වැදගත්. මම ගරු ඇමතිතුමාගෙනුත්, නියෝජ්‍ය ඇමතිතුමාගෙනුත් ඉල්ලා සිටිනවා -ගරු නියෝජ්‍ය ඇමතිතුමා වතුර බොනවා. වතුර ටිකක් වැඩියෙන් බොන්න. මොකද, මේ කාලයේ වැඩ වැඩියි. - මේ අරමුදලට වැඩි ප්‍රතිපාදනයක් වෙන් කරන්න කියලා. මොකද, මේක ඉතා වැදගත්. ඔබතුමාත් නීතිඥවරයෙක්.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

ගරු මන්ත්‍රීතුමනි, ඉදිරි අනාගතයේදී වැඩි ප්‍රතිපාදනයක් වෙන් කරන්න පුළුවන්.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

අනෙක් කරුණ තමයි යම්කිසි වරදකරුවකුට අධිකරණයකින් පනවනු ලැබිය හැකි දණ්ඩනයට අමතරව වන්දියක් නියම කිරීමට පුළුවන් කියා මේ පනත් කෙටුම්පතේ සඳහන් වනවා කියන එක.

28. (1) (අ) (i) උප වගන්තිය යටතේ මෙසේ සඳහන් වෙනවා:

> "වන්දියක් ලෙස අපරාධයක විත්දිතයකු හෝ සාක්ෂිකරුවකු වෙත ගෙවිය යුතු රුපියල් මිලියනයකට නොවැඩි මුදලක්; හෝ"

ඒ කියන්නේ විශාල මුදලක් ප්‍රදානය කරනවා. අධිකරණය සලකා බලා ඒ සාක්ෂිකරුට, එහෙම නැත්නම් ඒ විත්දිතයාට රුපියල් ලක්ෂ 10 දක්වා වන්දි මුදලක් ගෙවන්න නියම කරන්න පුළුවන්. ඒක ඉතා වැදගත්. ඒ වාගේම වරදක් සඳහා ගෙවිය යුතු දඩ මුදලින් සියයට 20කට නොවැඩි මුදල් ප්‍රමාණයක් මේ අපරාධ විත්දිතයින් සඳහා ලබා දෙන්නට මේ පනත් කෙටුම්පත යටතේ කටයුතු කර තිබෙනවා. ඒක ඉතාම වැදගත් වෙනවා.

ඒ වාගේම මේ පනත් කෙටුම්පතේ තිබෙන තවත් වැදගත් කාරණයක් මා ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. ඒ තමයි 3.(1) (ඇ) උප වගන්තිය. එහි මෙසේ සඳහන් වනවා:

> "අපරාධයක විත්දිතයකු වීම හේතුවෙන් විඳින යම් හානියක්, අලාභයක් හෝ පාඩුවක් සඳහා සහ ඒ වෙනුවෙන් හානිපූරණය සහ ප්‍රතිෂ්ඨාපනය ඇතුළුව නියම කරන ලද ක්‍රියාපටිපාටියකට අනුකූලව අප්‍රමාදව සුදුසු සහ සාධාරණ සහනයක් ලබා ගැනීමට;"

මෙය ඉතාම වැදගත්. උදාහරණයක් විධියට ගත්තොත්, කෙනකු උසාවියට ගිහිල්ලා අපරාධයක් සම්බන්ධ නඩුවකදී සාක්ෂි දීමේ අවස්ථාවක් හෝ අපරාධයක විත්දිතයකු බවට, හානිකරුවකු බවට පත් වන අවස්ථාවක් ගත්තොත්, විත්තිකරුට කරන දඬුවම විතරයි ඔහුට සහනයක් හැටියට තිබෙන්නේ. නමුත්

මේ විත්දිතයාට හෝ මිනී මැරුමකදී නම් මරණයට පත් වුණු තැනැත්තාගේ භාර්යාවට එහෙම නැත්නම් යැපෙන දරුවන්ට සහනයක් නැහැ. මේ පනත් කෙටුම්පත යටතේ, ඒ විත්දිතයාට එහෙම නැත්නම් ඒ ඝාතනයට ලක් වුණු පුද්ගලයාගේ පවුලට, දරුවන්ට යම් කිසි වන්දියක් විත්තිකරුගෙන් ලබා ගැනීමේ හැකියාව තිබෙනවා.

කලින් සඳහන් කළ අරමුදල මඟින් අපරාධයක විත්දිතයකුට, සාක්ෂිකරුවකුට යම් සහනයක් ලබා ගන්න පුළුවන්කම තිබෙනවා. ඒකත් මේ පනත් කෙටුම්පතෙහි තුන්වැනි වගන්තිය යටතේ සඳහන් වනවා. ඒ විධියේ තව ගොඩක් කරුණු කාරණා මේ පනත් කෙටුම්පතේ තිබෙනවා.

සාක්ෂි දීම කෙනකුගේ අයිතිවාසිකමක් හැටියට මේ රටේ නීති පොතට ඇතුළත් වෙලා තිබුණේ නැහැ. එම නිසා යම් අවස්ථාවක සාක්ෂිකරුවකුට සාක්ෂි දීම නවත්වන්න කියලා තර්ජනය කරන්න පුළුවන්; බිය ගැන්වීම් කරන්න පුළුවන්. අපරාධ නඩුවිධාන සංග්‍රහයෙන් එහෙම නැත්නම් සාක්ෂි ආඥාපනත වාගේ දේවල්වලින් තමයි එවැනි සාක්ෂිකරුවකු ආරක්ෂා කළේ. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් කෙටුම්පත තුළ අපරාධයක විත්දිතයා සහ සාක්ෂිකරු ලිඛිතව ආරක්ෂා කිරීමට අවශ්‍ය නීතිමය පටිපාටි ඇතුළත් වීම ඉතාම වැදගත් කියන එක මා කියනවා. ඒ ගැන අපි බොහොම සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් කෙටුම්පතේ 4.(1) උප වගන්තිය යටතේ තවත් වැදගත් කාරණයක් සඳහන් වනවා. ඒ තමයි විත්දිතයකුගේ හිමිකම් සම්බන්ධයෙන් සඳහන් වන කාරණාව. එහි මෙසේ සඳහන් වනවා:

> "....අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් ඉදිරිපිට දී පවත්වනු ලබන යම් අධිකරණ හෝ අර්ධ අධිකරණ කටයුත්තකට සහභාගී වීම හා සිදු වූ වරදේ ප්‍රතිඵලයක් වශයෙන් අපරාධයක විත්දිතයකුට දරන්නට සිදු වූ වියදම් සලකා බැලීමේ දී, අධිකාරියෙන් මුදලක් ලබා ගැනීමට, අපරාධයක විත්දිතයාට හිමිකමක් තිබිය යුතු ය."

ඒ කියන්නේ, අපරාධයක විත්දිතයකුට එහෙම නැත්නම් සාක්ෂිකරුවකුට මේ පනත යටතේ පිහිටුවන අධිකාරියෙන් පනතේ 4.(1) උප වගන්තිය අනුව මුදලක් ගන්නට හිමිකමක් තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ඒ විත්දිතයාට ඒ අපරාධය නිසා හිංසාවක්, හානියක් ඌනතාවක් හෝ ආබාධයක් ඇති වුණොත් බෙහෙත්, වෛද්‍ය පහසුකම් ඇතුළු යම් අවශ්‍ය පුනරුත්ථාපන ලබා ගැනීමට හිමිකමක් තිබෙනවා. මේක ඉතාම වැදගත්. සමහර වෙලාවට යම් කෙනෙක් අපරාධයකට ලක් වෙනවා; අත පය කැඩෙනවා; උසාවි යනවා; සාක්ෂි දෙනවා. නමුත් මීට පෙර මේ රටේ නීතියක් තිබුණේ නැහැ, ඒ විත්දිතයාට, ඒ සාක්ෂිකරුට සහනයක් ලබා ගන්නා ක්‍රමවේදයක්. ඒ අවශ්‍ය පහසුකම් ටික මේ පනත් කෙටුම්පතින් ලබා දීලා තිබෙනවා. ඒක ඉතාම වැදගත්.

තවත් වැදගත්ම දෙයක් මේ පනත් කෙටුම්පතේ 8.(1) උප වගන්තිය යටතේ සඳහන් වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විත්දිතයකු එහෙම නැත්නම් සාක්ෂිකරුවකු තැති ගැන්වීමකට ලක් කළොත්, එහෙම නැත්නම් ඔහුට අපරාධයක්, යම් කිසි බලහත්කාරකමක් කළොත්, ඒ බලපෑම කරන කෙනාට මහාධිකරණය විසින් අවුරුදු 10කට නොවැඩි බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් හෝ රුපියල් 20,000ක දඩයක් නියම කිරීමේ හැකියාව තිබෙනවා. මේක ඉතාම වැදගත්.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, you have one more minute.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
හොඳයි.

ඒ අදාළ වරද කළ කෙනාට අභියාචනාධිකරණයෙන් තමයි ඇප දෙන්න පුළුවන්. මේක ඉතාම වැදගත්. යම් කිසි සාක්ෂිකරුවකුට හෝ විත්දිතයකුට යම් කිසි බලපෑමක් කළොත්, ඒ බලපෑම කළ පුද්ගලයා වරදකරුවකු බවට පත් වනකොට, අභියාචනාධිකරණයෙන් තමයි ඔහුට ඇප නියම කරන්න පුළුවන්. ඒක ඉතාම හොඳ දෙයක්. එතකොට සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වනවා.

නීතිඥයන් හැටියට අපි දන්නා කාරණයක් තමයි, බොහෝ අවස්ථාවල මේ කටයුතුවලදී වෛද්‍ය සහතික ගන්න පුළුවන්කම තිබුණේ ඒ අදාළ විත්තිකරුගේ නීතිඥයාට විතරයි. නමුත් මේ පනත් කෙටුම්පත යටතේ, අනෙක් අයටත් ඒ සඳහා අවශ්‍ය බලතල දී තිබෙනවා. ඒ සම්බන්ධයෙන් 14.(1) (ii) උප වගන්තිය යටතේ මෙසේ සඳහන් වනවා :

> "අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් නොවන යම් තැනැත්තකුට, පරීක්ෂා කිරීම සහ පිටපත් කිරීම සඳහා පොලිස් පරීක්ෂණ සටහන්, තොරතුරු සටහන් පොත්වල උද්ධෘත, නිලධාරීන්ගේ හමුවීමේ පොත්වල උද්ධෘත ඇතුළුව ඔහුගේ හෝ එහි සන්තකයේ හෝ භාරයේ තිබෙන යම් ලේඛනයක්, එහි සහතික කළ පිටපතක් හෝ වෙනත් දෙයක් අධිකාරිය වෙත ඉදිරිපත් කිරීමට නියම කිරීම;"

ඒ ආකාරයට ඒවා ලබා ගන්න පුළුවන්.

පොලීසියට කරන පැමිණිලි පරීක්ෂා කරන්න, වාර්තා කර ගන්න අයිතිවාසිකම් මේ පනත් කෙටුම්පත යටතේ ලබා දීලා තිබෙනවා. ඒ නිසා මෙය ඉතාම වැදගත් පනත් කෙටුම්පතක්.

අපි කියනවා, දැනට බලයේ ඉන්න ආණ්ඩු පක්ෂයට විතරක් මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළ වාසිය යන්නේ නැහැ කියලා. අපේ හිටපු අධිකරණ ඇමතිතුමා ඇතුළු අපේ රජයත් මේ පනත් කෙටුම්පත මේ තත්ත්වයට ගෙනෙන්න කටයුතු කර තිබෙනවාය කියන එකත් මතක් කරනවා.

අවසාන වශයෙන්, තව කරුණක් කියන්න කැමැතියි. අපි අධිකරණය ගැන කථා කරනවා. නමුත් ඒ නීතිය ක්‍රියාත්මක වීම තව තවත් ශක්තිමත් වෙන්න ඕනෑ. උද්ඝෝෂණවලින් විනිසුරුවරුන් ඉවත් කිරීම, ඒ අය බලපෑම්වලට යටත් කිරීම, ඒ අය ආයෝජන මණ්ඩලය වාගේ ස්ථානවල සභාපති තනතුරුවලට පත් කිරීම වැනි කටයුතු තුළින් ඒ කටයුතුවල විනිවිදභාවයට කැළලක් ඇති කර ගන්නවාය කියා මා හිතනවා. ඒවා කරන්න එපා. එහෙම කළොත් යූඑන්පීයත් එකයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එකයි කියලා කියයි. යහ පාලනයක් ඇතිව එකමුතු වෙලා ආණ්ඩු කරමු කියනවා. හැබැයි, හැම තැනම තනතුරුවලට පත් කරන්නේ කවුද? හැම තනතුරකටම තම තමන්ගේ හෙංචයියලා, නැත්නම් ගොට්ටෝ තමයි පත් කරන්නේ. බලන්න පසු ගිය කාලයේ දීපු පත්වීම් දිහා. යහ පාලනයක් ගැන කියලා, එකට යමු කියලා ඒ අනුව ස්වාධීනව කටයුතු කරලා තිබෙනවාද? නැහැ, ඒ තැන්වල හිටපු සියලු දෙනාම ඉවත් කරලා තිබෙනවා. මම ඒ ගැන එක දෙයක් කියලා මගේ කථාව නවත්වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වන විට මාවනැල්ල නගරයේ නීත්‍යානුකූල ඔප්පු සහිත ව්‍යාපාර ස්ථාන තිබෙන අයට බී වාර්තා 48ක් ඉදිරිපත් කරලා තිබෙනවා. මගේ ළඟ ඒ ඔප්පු තිබෙනවා. ඒ ඔප්පුවලට අනුව නීත්‍යානුකූලව ව්‍යාපාරික කටයුතු කළ මාවනැල්ල නගරයේ 48දෙනෙක් බලහත්කාරයෙන් එළවලා ඔවුන්ගේ ජීවන වෘත්තිය නැති කරලා තිබෙනවා. අධිකරණයෙන්

[ගරු ලලිත් දිසානායක මහතා]

තීන්දුවක් දීලා තිබුණත්, ඒ තීන්දුව පිළිගන්නේ නැතිව කටයුතු කරලා තිබෙනවා. මේ නිසා අද 48 දෙනෙකුට බඩ වියත රැක ගැනීමේ රස්සාව නැති වෙලා තිබෙනවා. යහ පාලනය මෙන්න මෙහෙමද කියලා මම අහනවා. තමන්ගේ දරුවන්ට කන්න හම්බ කර ගත්ත කඩෙන් එළවා තිබෙනවා. ඒ අය බලහත්කාරයෙන් ඒ ස්ථානවල හිටියා නම් ප්‍රශ්නයක් නැහැ. නමුත් මාවනැල්ල නගරයේ ඔප්පු සහිත කඩ කාමරවල ව්‍යාපාර කළ 48 දෙනෙක් යහ පාලනය යටතේ මිලේච්ඡ ආකාරයෙන් බලහත්කාරයෙන් අයින් කර දමලා තිබෙනවා. ඒ නිසා යහ පාලනය "වහ පාලන" තත්ත්වයට පත් කරන්න එපා කියමින් මම නිහඬ වෙනවා. ස්තූතියි.

[4.20 p.m.]

ගරු රවූෆ් හකීම් මහතා (නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා)
(மாண்புமிகு றவுப் ஹகீம் - நகர அபிவிருத்தி, நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்பு அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of Urban Development, Water Supply and Drainage)

Bismillahir Rahmanir Raheem.

Hon. Presiding Member, this Bill that is before the House today, is perhaps one of those pieces of legislation which has undergone a long gestation period though the Bill itself has been a long-felt need in the Criminal Justice system of Sri Lanka.

I must thank the Hon. Lalith Dissanayake for having made some critical comments on this Bill. I, perhaps, am one of those in the Chamber today, who can be much relieved that this Bill is being finally taken up for debate and adoption. Being somewhat exhausted attempting to get this through the Cabinet, - it has been going back and forth from the Attorney-General's Department, then to the Police Department - it is indeed a matter of relief that finally we see the Bill being presented by my successor, the Hon. (Dr.) Wijeyadasa Rajapakshe and debated. In a sense, it is a matter of conscience and a matter of credibility for all of us since this has been an assurance that we have even given to the international community at different forums including in Geneva. This Bill was originally formulated as a result of the National Centre for Victims of Crime promoting this, and then, way back in the year 2000, it was proposed that the Law Commission examines the need for this legislation. Unfortunately, though they started work in the year 2000, they shelved it for a while. Then, in 2004, it was revived once again and we were able to have deliberations with different forums, both governmental and the civil society. The Bill has had the benefit of input from diverse segments of society and has even been vetted through the Consultative Committee process several times.

Here, I must, particularly thank two officials of the Attorney-General's Department, Mr. Yasantha Kodagoda, who is present in the Officials' Box, and Mr. Sarath Jayamanne, both of whom are now Additional Solicitors-General. They had assisted me when I was given this responsibility. I believe one has already taken silk and the other is due to take silk in a few days' time. Let me congratulate them and recognize them for having contributed immensely in the deliberations in trying to see this Bill through multifarious forums through which it had been vetted.

I must say that mid-way, in 2006, unfortunately with the institution of the so-called International Independent Group of Eminent Persons, who were appointed to supervise the Commission of Inquiry that was set up to go into 10 incidents of grave crime or some tragic incidents that took place during that period, the Bill itself became a very controversial subject getting entangled in political debate and that was particularly because of the incidents relating to the massacre of five students in Trincomalee and thereafter the so-called massacre of 17 aid workers in Muttur which became a matter of discussion in many international forums. Particularly, in the Universal Periodic Review Sessions in Geneva, our delegation had to face many hardships in trying to assure the international community that we, indeed, are concerned with the safety of victims and witnesses and that we are quite ready to make this idea of Assistance to and Protection of Victims of Crime and Witnesses Bill, a reality. Ultimately, we have had some success in vetting it through different processes.

Let me tell you very briefly, Hon. Presiding Member, that some of us who have been in practice of the criminal law in the law courts of this country do know that victims of crime are quite often very reluctant to report the crime. Then, we also see witnesses seldom volunteer to make statements to the police. This is something that we see in everyday life. Victims of crime and witnesses are reluctant to come to court to testify. Then, we have victims of crime and witnesses who are not only reluctant to testify, they very often change their version of the story. Then, we also have the overall efficacy of the criminal justice system that gets adversely affected because of these issues connected with victims and witnesses. And, therefore a mechanism of this nature which gives protection to victims of crime and witnesses is a long-felt need in our criminal justice system.

I am sure my Friend, the Hon. (Mrs.) Rosy Senanayake who looks after children's affairs as far as her portfolio is concerned and others perhaps will deal with child victims and witnesses and women particularly, who very often are so reluctant to come before courts of law or to even report a crime to the police. Due to tender age, inherent weaknesses and vulnerabilities, the situation of child victims of crime and witnesses is much worse than adult victims. Family members and guardians of child victims of crime and witnesses also face numerous problems during the criminal justice process purely because of matters of stigma when it relates to social

issues and outrageous incidents that can happen to women in particular, and children. Therefore, this particular Bill, I am sure, is a long-felt need in our criminal justice system and we are all relieved that we have been able to finally bring this to some fruition.

I must say that there are two categories of beneficiaries here which all of us know. One is, victims of crime and the other is witnesses. Then there are two forms of relief that are sought to be given. One is, assistance and the other is the protection.

The objectives of this law are also very clear: set out and recognize rights and entitlements of victims of crime and witnesses; establishe mechanisms to promote, protect, enforce and exercise such rights and entitlements; provide for rendering of assistance and protection to victims of crime and witnesses; provide for payment of compensation to victims of crime; provide for obtaining redress by victims of crime including restitution, reparation and rehabilitation; set out duties and responsibilities of judicial officers, police officers and other public officers with regard to victims of crime and witnesses; stipulate offences that may be committed in respect of victims and crime and witnesses; provide for implementation of internationally accepted norms and best practices relating to the protection of victims of crime and witnesses. This, I believe, have all been embodied in an elaborate way in the several sections that deal with the different aspects of this Bill.

Then, we also have the issue relating to the protection of whistle-blowers. A whistle-blower is a person who is not connected with the victim or the witness; he could be a public-spirited person who could come forward to throw some light on a possible crime having taken place. No person who has provided information regarding the commission of an offence, infringement of fundamental rights or human rights in such person's employment environment, shall be harassed, subjected to suffering, loss or damage, or any adverse change in conditions of employment. This is something praiseworthy for having been included.

We also have the establishment of the National Authority for the Protection of Victims of Crime and Witnesses and the Board of Management. I am sure the Hon. Minister will select the right type of people with the correct credentials to man these institutions that will be created. That will be done without delay once the Hon. Speaker places his signature and the Bill becomes law. This is going to bring lot of relief to many people. Unfortunately, as I told you, this had got entangled in political controversy because of some of the unfortunate tragic incidents that happened in the past and had got the country also into some disrepute for having procrastinated in passing this Bill.

Having been the former Minister of Justice, I have been at the receiving end of criticism by many Members on both sides of the House perhaps and particularly from the Opposition. Now, I find myself among those very people who criticized me for having delayed bringing this Bill to fruition. But, as I told you, Sir, I am a much-relieved person today because we see the light of day at the end the tunnel.

Then, Sir, we have this important aspect leading to the protective measures to be adopted by a court or a commission of inquiry. Courts and Commissions would be empowered to adopt and enforce necessary protective measures, including the following: conducting proceedings in-camera which is quite often done in courts of law in this country; adoption of measures necessary to prevent victims of crime or witnesses from being subjected to unnecessary harassment, intimidation, or influenced by seeing the accused present at the venue of the trial. This particularly relates to child victims most of the time; preventing the identity and the background of the victim of crime or witnesses, or relevant parts of their testimony from being disclosed to those other than the accused and his lawyers. That, sometimes becomes absolutely necessary in a trial particularly when it comes to protecting victims of crime.

The Bill also goes to the extent when the protection will be withdrawn, which is also quite important, because otherwise, it brings in unnecessary expenses to the State to keep on providing protection to victims and to witnesses. Protection will be withdrawn when the need for protection no longer exists; when the victim of crime or witness requests that protection be terminated; when the victim of crime or witness refuses to receive protection - that also can happen. It has been observed in the past that sometimes giving protection can also attract unnecessary attention onto yourselves. Protection may also be withdrawn when protection is abused - that is another possibility. People can abuse the protection they get for a variety of other purposes. Protection may also be withdrawn when the victim of crime or witness acts contrary to the terms of the memorandum of understanding entered into; when the victim of crime or witness is found to have given a false statement or testimony or false information to obtain protection - this too can happen to people who have been associated with such situations in the past in a court of law.

Then, the most important other aspect which perhaps attracted some attention from some Members who participated in the Debate today, is this testimony through contemporaneous audio-visual link and this was particularly an issue which resulted in the International Independent Group of Eminent Persons, which oversaw the conduct of the inquiry by that Commission of Inquiry, that was appointed.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Minister, you have exceeded your time.

ගරු රවූෆ් හකීම් මහතා
(மாண்புமிகு றவூப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
Sir, I am winding up.

That particular Commission, which was led by a very eminent jurist from our region, Justice Bhagawati, got into a very awkward situation where our own Attorney-General virtually challenged the right of the International Independent Group of Eminent Persons to stipulate conditions for the testimony through contemporaneous audio-visual link, resulting from a particular testimony and while it was being recorded, it ran into a controversy.

So, all these dragged this whole issue into a muddle and finally brought us some disrepute, purely because some felt that we are deliberately procrastinating in bringing this Bill, based on some assumptions that we had something to hide. Certainly, we have nothing to hide and our judicial system is something that has been tested over a period of time. It may have gone through its own convolutions in the past and the efficacy of the system remains very much to the core. I am sure the introduction of a Bill of this nature will certainly enhance the value that our system enjoys and our criminal justice system will be very much richer in content with the introduction of this law.

Thank you very much, Sir.

[අ.භා. 4.35]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් කෙටුම්පත සම්මත වන අද දිනය අපි කාටත් සතුට උපදවන, ඒ වාගේම මේ රටේ නීති ඉතිහාසයේ ඉතාමත් වැදගත් පියවරක් සලකුණු කරන දිනයක් වෙනවා. මම මේ නීතිය ගැන කරුණු සාකච්ඡා කිරීමට පෙර, නීතිය වල් වැදී තිබුණු කාලයක් ගැන ගරු සුජීව සේනසිංහ ඇමතිතුමා කථා කළා. ඒ නීතිය නැවත එළිමහනට ගෙන එමින් තිබෙන බවත් එතුමා කිව්වා. වල් වැදුණු කාලයේ ඉඳලා මේ ආණ්ඩුව ආවාට පස්සේ ඒ වල් වැදුණු නීතිය එළිමහනට ගෙන එමින් තිබෙන බව එතුමා කිව්වා. ඒ එළිමහනට ගෙන ආ නීතියද පාර්ලිමේන්තුවේ බලය අහෝසි කරන්නට මේ රටේ ක්‍රියාත්මක වුණේ කියලා මම අහන්නට කැමැතියි. තමන්ගේ හිතවතෙක් රිමාන්ඩ් භාරයට පත් නොකිරීම, පොලීසියේ යම් හිතවතෙකුට විරුද්ධව පරීක්ෂණ නොකිරීම, තවත් තැනෙක පොදු සමාවක් දීම, මේ වාගේ යම් යම් අවස්ථා මේ රටේ ඉතිහාසයේ අපි ඕනෑ තරම් දැකලා තිබෙනවා. ඒවා යම් දේශපාලන බලපෑම් හා දේශපාලන උනන්දුව මත යම් යම් පුද්ගලයින්ට විය යුතු නීති ප්‍රකාරව ක්‍රියාකාරිත්වයන් නොවීමක්; නීති කර්තව්‍යයන් නොවීමක්. නමුත් ඒ සියල්ලටම වඩා බරපතළයි, මේ රටේ පාර්ලිමේන්තුවේ බලය අහෝසි කරන ක්‍රියාවක නියැලීම. ඒ වාගේම තමයි, මේ පාර්ලිමේන්තුවේ බහුතරයක් නැති නායකයෙක් පාර්ලිමේන්තුවේ අගමැතිවරයා වෙලා කැබිනට් මණ්ඩලයක් පත් කිරීම. මේවා නීතිය වල් වැදීමට වඩා බරපතළයි. මගේ කල්පනාවේ හැටියට මෙය නීතිය පිටුවහල් කිරීමක්; නීතිය වල් වැදීමට වඩා නීතිය පිටුවහල් කිරීමක් -මේ රටෙන් හා මේ රටේ ප්‍රධාන රාජ්‍ය පාලන ආයතනවලින්-හැටියටයි මම දකින්නේ.

නීතිය මෙපණ කාලයක් ප්‍රමාද වෙලා තිබෙනවා කියලා කිව්වා. ඒක මම පිළිගන්නා බව කියන්නට කැමැතියි. එය අනවශ්‍ය තරම් කාලයක් ප්‍රමාද වෙලා තිබෙනවා. මම පසු ගිය ආණ්ඩුවේ අවුරුදු පහක පමණ කාලයක් හිටපු ඇමතිවරයෙක් හැටියට ඒ ගැන මගේ කනගාටුව ප්‍රකාශ කරමින්, ඒ ගැන මම සමාව ඉල්ලා සිටිනවා.

අපේ රටේ සිටි ශ්‍රී මේස විජයරත්න මැතිතුමා - අද ජීවතුන් අතර නැති - නොයෙක් තනතුරු දැරූ, ඉතා වටිනා අධිනීතිඥවරයෙක්. එතුමා Centre for Victims of Crime කියන සංවිධානය වෙනුවෙන් "Victims of Crime" කියන පොත් පිංච සම්පාදනය කර එහි දෙවැනි මුද්‍රණය 2005 වර්ෂයේ පිට වුණා. මම හිතන විධියට මේ පොත් පිංච තමයි නීති කොමිසම මේ අදහස් ඉදිරිපත් කිරීමට බොහෝ දුරට පාදක කර ගනු ලැබුවේ. එතුමාට යම් කෘතවේදිත්වයක් පළ කිරීමේ අදහසින් තමයි මම මේ වෙලාවේ ඒ පොතේ නම මතක් කළේ.

සාක්ෂිකරුවන්ට සහ විත්දිතයන්ට කෙළින්ම බලපාන මේ අයුතු හිංසන, තර්ජන වැළැක්වීමට තිබෙන හොඳම මාර්ගය ඇත්තටම අධිකරණයයි. අධිකරණය ඉදිරියට එන විත්දිතයා හා සාක්ෂිකරුවා ආරක්ෂාව ඇතිව හෝ අධිකරණය වෙත කැඳවා ගෙන ඒමට හෝ අධිකරණයෙන් නැවත යන විට ඔහුට ආරක්ෂාව දීමට අධිකරණය හා පොලීසිය ක්‍රියාත්මක වෙනවා නම් එය තමයි බලවත්ම යාන්ත්‍රණය වන්නේ. ඒ බලවත්ම යාන්ත්‍රණය නිසි තත්ත්වයෙන් ක්‍රියාත්මක නොවෙනවා නම් කොයි තරම් නීති හැදුවත් ප්‍රයෝජනයක් වන්නේ නැහැ. ප්‍රායෝගිකව අන්තිමට විත්දිතයා හා සාක්ෂිකරුවා පිළිබඳ ප්‍රශ්නය යුක්ති සහගත ලෙස තීරණය වන්නේ අධිකරණය ඔවුන්ට දෙන ආවරණය හා ආරක්ෂාව අනුවයි. මා හිතන හැටියට ඒක එසේ නොවෙයි කියලා කවුරුවත් කියන එකක් නැහැ. මේ පනත මඟින් වුණත් නීතියේ කටයුතු මෙහෙය වන අධිකරණයේ නිලධාරින් මේ පිළිබඳව වඩා යොමු කිරීමක් තමයි සිද්ධ වන්නේ. අපේ සාක්ෂි ආඥාපනත හා නීති විධිවිධාන සංග්‍රහවලින් මීට පෙර පෙන්වා තිබුණු තත්ත්වය වූයේ සාක්ෂිකරුවෙකුට අයුතු බලපෑමක් කිරීම අධිකරණයට විරුද්ධව කරන ක්‍රියාවක් හැටියට සලකා අධිකරණය ක්‍රියා කර තිබෙන ආකාරයයි. මේ සඳහා වුවමනා කරන අවධානය, මේ පිළිබඳව සැලකීම හා මේ ගැන සමාජයේත්, රජයේත් වඩාත් ප්‍රබල යොමුවීමක් මේ පනත නිසා ලැබෙනවා. ඒ නිසා මා හිතන විධියට ඉදිරියේදී අධිකරණයත්, පොලීසියත් මේ පිළිබඳව වඩාත් ප්‍රවේශමෙන්, වඩාත් උනන්දුවෙන් හා වඩාත් ඕනෑකමින් ක්‍රියා කිරීමට පෙළඹෙනවාය, එය සිද්ධ වනවාය කියා පේනවා.

විත්දිතයන්ට අවශ්‍ය වන්දි ගෙවීම, සාක්ෂිකරුවන්ට අවශ්‍ය වියදම් ගෙවීම කියන කාරණා තමයි නොතිබුණේ. අපට අවශ්‍ය වන්නේ ඒ කාරණායි. අප කවුරුත් දන්නවා මෙය පන්ති ප්‍රශ්නයක් බව. අන්තිමට බැලුවාම හැම දෙයක්ම පන්ති ප්‍රශ්නයක්. දුප්පත් මිනිසුන්ට තමයි මේ සියලුම අමාරුකම් බලපාන්නේ. ඇත්තටම වත් පොහොසත්කම් තිබෙන අයට මේ ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නය එන්නෙත් නැහැ; එම සාක්ෂිකරුවන්ට බලහත්කාරකම් කිරීමට යම් කෙනෙකු ඉදිරිපත් වීමක් පිළිබඳ ගැටලුවක් එන්නේත් නැහැ. මේ ප්‍රශ්නය බලපාන්නේ මේ සමාජයේ අසරණ, දුප්පත්, බලයක් නැති මිනිසුන්ටයි. ඒ නිසා මේ ගැන ක්‍රියා කිරීමේදී අධිකරණයත්, පොලීසියත් කටයුතු කළ යුතුව තිබෙනවා.

මේ පනතේ පෙන්වා තිබෙන විධියේ කාර්ය ක්‍රමයක් දිහා බැලුවාම අපට පෙනෙනවා, ඒ කාර්ය ක්‍රමයේ යම්කිසි පියවර ගණනාවක් ගැනෙන්න තිබෙන බව. මේ threat assessment එකක් කරන්න කියනවා. මේ තර්ජනය කොයි තරම් දුරට යථාර්ථ වශයෙන් පවතීද? ඇත්තටම තර්ජනයක් තිබේද, නැද්ද? ඇත්තටම මේවා ලිවිය යුතු තරම් දේවල්වත් නොවෙයි. තර්ජනයක් තිබෙනවාද, නැද්ද; අවදානමක් තිබෙනවාද, නැද්ද; කෙනෙකුට හිංසාවකට ඉඩක් තිබෙනවාද, නැද්ද කියන එක ඒ පුද්ගලයා කරන පැමිණිල්ල අනුවයි තීරණය වන්නේ. "මට සාමාන්‍ය විධියට

අධිකරණයට එන්න ඉඩක් නැහැ, මට අධිකරණයට එන්න බැහැ, මට තර්ජන තිබෙනවා" කියලා කිව්වාම ඒකම ප්‍රමාණවත් වෙන්න ඕනෑ.

විත්දිතයන්ට තිබෙන්නා වූ අසීරුතාවත්, ඔවුන්ට විඳින්න වූ අලාභයත්, ඔවුන්ට ලබා දිය යුතු වන්දියත් පිළිබඳව තීරණය කිරීමට අධිකරණයෙන් නිර්දේශයක් ලැබීම ප්‍රමාණවත් ලෙස සලකන්න ඕනෑය කියලායි මම හිතන්නේ. මේ පනතේ කියා තිබෙන විධියට ඉල්ලීම් කරන්න ඕනෑ. ඉල්ලීම් කළාට පසුව ඒවා ගැන තක්සේරු කිරීම් කරනවා. මා හිතන විධියට මේ ක්‍රියාදාමය ටිකක් දිග වැඩියි. ඒ ක්‍රියාදාමය තිබුණාට කමක් නැහැ. අතිරේක වශයෙන් අධිකරණය නිර්දේශ කරනවා නම්, ඒ නිර්දේශය ප්‍රධාන ලෙස සැලකීමට ගන්නට මේ අධිකාරියට වග කීමක් හා බැඳීමක් තිබෙන බවත් අපි සඳහන් කරනවා නම් හොඳයි.

ඊළඟට, මා කල්පනා කළේ මේ කාරණය ගැන කියන්නයි. සාක්ෂිකරුවන්, විත්දිතයන් වාගේම නිරපරාදේ සැකකරුවන් වෙලා දීර්ඝ කාලයක් බන්ධනාගාරගතව සිටින මිනිසුන් ගැනත් අපට කල්පනා කරන්න සිදු වනවා. මෙයට කෙළින්ම අදාළ නොවුණත්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ආරක්ෂක ලේකම්ට බලයක් තිබෙනවා, මිනිසුන්ව දිගටම හිර භාරයේ තබන්න. මෙන්න මේ බලය නැති කිරීම අවශ්‍යයි. මේ බලය අධිකරණයේ විමර්ශනයකටත් යටත් කිරීමට පුළුවන් වන ආකාරයට මේ නීති වෙනස් විය යුතුයි. එසේ නීති වෙනස් වනවා නම් නිලධාරියකුට හිතුමතයේ මිනිසකුව හිර භාරයේ තබන්න වුවමනා කරන්නේ නැහැ. සාක්ෂිකරුවාගේත්, විත්දිතයාගේත් ප්‍රශ්නය තිබෙන්නේ මේ දික් ගැස්සෙන නඩු විභාග ක්‍රමය තුළයි. ඒ වාගේම රිමාන්ඩ් භාරයේ ඉන්නවාය කියන එක ඇත්තටම විත්තිකරුවකු, චූදිතයකු හැටියට බන්ධනාගාරයක දඬුවම් විඳිනවා හා සමානයි. මේ තත්ත්වයන් වෙනස් කිරීම අත්‍යවශ්‍යයි. රිමාන්ඩ් භාරයේ ඉන්නවාය කියන්නේ ඔහු රක්ෂිත බන්ධනාගාරගතව ඉන්නවාය කියන එකයි. ඔහු යම්කිසි දඬුවමක් විඳින්න වුවමනා නැහැ. නමුත් ඇත්ත කථාව තමයි, රිමාන්ඩ් කිරීම ඉතාමත් භයානකයි කියන කාරණය. මොකද, එක පැත්තකින් රිමාන්ඩ් භාරයේ සිටියදී ඔහුට මුහුණ දෙන්නට සිදු වන සැබෑ වටපිටාව දණ්ඩනයක් හා සමානයි. අනෙක් පැත්තෙන් බල අපරාධ සම්බන්ධ නඩු විභාග යම්කිසි කාල සීමාවකට නියම කරලා, ඒ සැකකරුවන් චූදිතයන් බවට පත් කරන කොට අධිකරණය ඒ පිළිබඳව වග කීමක් භාර ගන්න ඕනෑ. අධිකරණය නිකම් මධ්‍යස්ථවම ඉඳ ගෙන මේ කටයුතු කරන්නට බැහැ.

අපේ රටේ තිබෙන සම්ප්‍රදාය අනුව වරදක් කළාය කියා කියන කොටම එය රජයට විරුද්ධව කරපු, සමාජයට විරුද්ධව කරපු වරදක්, එම නිසා ඒ පිළිබඳව රජයත්, අනෙක් පැත්තෙන් චූදිතයාත් අතර මධ්‍යස්ථ තත්ත්වයක අධිකරණයේ නිලධාරියා ඉන්න ඕනෑය කියන අදහසයි තිබෙන්නේ. මා හිතනවා, ඊට වඩා වැඩි දෙයක් අවශ්‍යයි කියලා. සැකකරුවකු චූදිතයකු කරන වෙලාවට, ඔහුට විරුද්ධව චෝදනා පත්‍රයක් ඉදිරිපත් කරන වෙලාවට විනිශ්චයකාරතුමා මූලික ලෙස ඒ කාරණයට මැදිහත් විය යුතුයි. ඔහු රිමාන්ඩ් භාරයට පත් කරනු ලබන තත්ත්වය තුළ ඔහු සැකකරුවකු වීමත් සමඟම ඔහු රිමාන්ඩ් භාරයේ සිටින කාලය නියම වනවා නම් ඒ පිළිබඳව අධිකරණය ඉතා ප්‍රවේශමෙන් ක්‍රියා කළ යුතුයි. කෙසේ නමුත් මේ දික් ගැහෙන නඩු කෙටි කාලයකට හකුළුවා ගෙන, බල අපරාධයක් නම් බැලූ බැල්මටම සැකකරුවා සැබැවින්ම එක්තරා ප්‍රමාණයකට මේ අපරාධය කිරීමට සම්බන්ධ බව අධිකරණයට පෙනී යනවා නම්, ඔහු පිළිබඳව අවසන් තීරණයක් දීමට පෙර ඒ කාලය තුළ ඔහු රිමාන්ඩ් භාරයේ තැබීමට තීන්දුවක් ගත හැකි වන පරිදි නැවත නීති සකස් වීමක් අවශ්‍යයි කියා මා හිතනවා. එසේ කිරීම තුළින් සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව ඉබේම සැලසෙනවා. අපි කවුරුත් දන්නවා, සමහර සැකකරුවන් හිරගෙදර ඉඳගෙන සාක්ෂිකරුවන්ට විරුද්ධව මෙහෙයවීම් කරවන බව.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, you have to wind up now.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Okay, Sir. නමුත් සැකකරුවකු රිමාන්ඩ් භාරයේ සිටීම සාක්ෂිකරුවාට හෝ විත්දිතයාට අයුතු බලපෑම් කිරීම වැළැක්වීම සඳහා එක්තරා මාර්ගයක් වනවා. එම නිසා මා කල්පනා කරන්නේ අපේ අධිකරණ ක්‍රියාදාමයට ඉතාම අවශ්‍යව තිබුණු දෙයක් වැදගත් නීති ලේඛනයක් බවට අද පත් වෙලා තිබෙන බවයි. ඒ තුළින් මේ රටේ විත්දිතයන්ට වන්දි ලබා ගත හැකි වීම ඔවුන්ට ලැබෙන අලුත් අයිතිවාසිකමක් වනවා. මේවා ක්‍රියාවට නැංවීමේදී දික් ගැස්සෙන ක්‍රියාදාමයන් වළක්වන ක්‍රමයකුත් හිතා ගත යුතුයි. ඒ අනුව යම් යම් රීති පැනවිය යුතුයි කියා ප්‍රකාශ කරමින්, මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම ගැන අධිකරණ ඇමතිතුමාට ස්තුති කරමින් මගේ වචන ස්වල්පය හමාර කරනවා.

[අ.භා. 4.49]

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මෙම අවස්ථාව ලබාදීම ගැන විශේෂයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. නීතිය හා අධිකරණය ගැන කථා කිරීමේ දී පසු ගිය වකවානුව තුළ - දින 40කට ආසන්න කාල සීමාව තුළ - අධිකරණ පද්ධතියේ විශාල වෙනසක් ඇති කරන්නට එක්සත් ජාතික පක්ෂය විසින් ක්‍රියා කර තිබෙන බව කියන්නට ඕනෑ. එය හොඳ පැත්තට සිදු වුණා කියලා අපට කියන්නට බැහැ. අග්‍ර විනිශ්චයකාරවරයාව ශ්‍රේෂ්ඨාධිකරණයෙන් එළවා දැමීම, අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කරන්නට කටයුතු කරන කණ්ඩායමක් විධියට අප හෙළා දකින බව මහජන එක්සත් පෙරමුණ වෙනුවෙන් මා ප්‍රකාශ කර සිටිනවා.

මේ පනත් කෙටුම්පත ගැන කථා කිරීමේදී, ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දු කිහිපයක් තුළින් මෙම පනත් කෙටුම්පතට නිර්දේශයන් කිහිපයක් එකතු කරන්නට කටයුතු කරලා තිබෙනවා. නීතියේ සංවර්ධනය සඳහා උදවු වුණු එස්.ඩී. 1/2014 සිට එස්.ඩී. 6/2014 දක්වා වූ නඩු තීන්දුවලින් මේ පනත් කෙටුම්පතට ඉතාමත්ම වැදගත් වූ නිර්දේශයන් කිහිපයක් ලබා දීලා තිබෙනවා. එස්.ඩී. 1/2014 නඩුව ගෝමින් දයාසිරි ඇතුළු නීතිඥවරුන් විසින් ඉදිරිපත් කළ නඩුවක්. ඒ වාගේම 2/2014 නඩුවත් ඒ නීතිඥවරයා විසින්ම ඉදිරිපත් කළ නඩුවක්. එස්.ඩී. 3/2014 කියන නඩුව කණිෂ්ක විජේරත්න ඇතුළු නීතිඥ මහතුන් විසින් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාගේම එස්.ඩී. 4/2014, එස්.ඩී. 5/2014 සහ එස්.ඩී. 6/2014 කියන නඩු මනෝහර ද සිල්වා ඇතුළු නීතිඥ කණ්ඩායමක් විසින් පවරා තිබෙනවා. ඒ තුළින් මේ පනතට නව අර්ථ කථන රැසක් එකතු කරන්නට කටයුතු කරලා තිබෙනවා. අපි ඒ වෙනුවෙන් ස්තුතිවන්ත වන්නට ඕනෑ. ඒ වාගේම මේ නඩු තීන්දු තුළින් මෙම පනත් කෙටුම්පත යම් පුළුල් කිරීමක් කර තිබෙනවා. The Bill provides for the setting out of the rights and entitlements of victims of crime and witnesses and the protection and promotion of such rights and entitlements; gives effect to appropriate international norms, standards and best practices relating to the protection of victims of crimes and witnesses. මේ අනුව විශේෂයෙන්ම මේ ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දු තුළින් මේ පනත් කෙටුම්පතට කරුණු ගණනාවක් එකතු කරන්නට කටයුතු කරලා තිබෙනවා.

[ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය]

ඒ වාගේම අධිකරණයට සහාය දෙන අය විධියට නීතිඥවරුන්ට "legal counsel" කියන වචනය වෙනුවට attorney-at-law, "නීතිඥවරයා" යනුවෙන් එකතු කරන්නට කටයුතු කරන ලෙස අපි යෝජනා කරනවා. අපේ රටේ නීතිඥවරුන් නම් කරන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරුන් හැටියට වන බැවින් නීතිඥවරුන් සඳහා "ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥ" යනුවෙන් එකතු කරන්නට අවශ්‍යයි කියන කාරණයත් මෙහිදී විශේෂයෙන්ම සඳහන් කරනවා.

ඒ වාගේම අපරාධ චින්දිතයන්ට සහන සැලසීමේදී ඔවුන්ට වන්දි ලබා ගැනීමට තිබෙන ඉඩ ප්‍රස්තා පුළුල් කිරීම ඉතාමත් හොඳ තත්ත්වයක් විධියට, අධිකරණයේ කටයුතු කරන නීතිඥවරියක් හැටියට මම දකිනවා. ඒ වාගේම මේ පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා වන මේ අවස්ථාවේදී මා කියන්නට කැමැතියි, මේ සෑම නිදහසක්ම ජාතියට ලබා දිය යුතු නමුත් අපේ රටේ ජාතික ආරක්ෂාව කියන කාරණයේදී ඒ සීමාවන් ඉතාමත් හොඳින් අවබෝධ කරගෙන මේ නීතිය ක්‍රියාත්මක කිරීම අවශ්‍යයි කියන කාරණය.

මෙම පනත් කෙටුම්පතේ සඳහන් වනවා, ඇප සම්බන්ධයෙන් සාක්ෂිකරුවන්ට වන බලපෑම්වලදී අදාළ නීතිමය තත්ත්වය. ඇප සම්බන්ධ නීතිය රටේ විශාල සාකච්ඡාවකට ලක් වුණා. පසු ගිය කාල සීමාවේ ඇප පනතක් නීතියට එකතු කරලා ඇප සම්බන්ධ නීතිය සංශෝධනයන්ට ලක් කරනු ලැබුවා. නමුත් මේ පනත මඟින් අපේ රටේ ඇප සම්බන්ධව තිබුණු නීතිය පරණ නීතිය පැත්තට ආපසු යෑමක් අපට පේන්න තිබෙනවා. මේ පනත් කෙටුම්පතේ 10 වන වගන්තියේ තිබෙනවා, 9 වන වගන්තිය යටතේ සිදු කරන වරදකට අභියාචනාධිකරණය මඟින් දෙන ලද ව්‍යතිරේකීය අවස්ථානුගත කරුණු සලකා බලා ඇප දෙන්න ඕනෑය කියන කාරණය. විශේෂයෙන්ම අභියාචනාධිකරණය මඟින් ඇප දිය යුතු වැරදි රාශියක් පිළිබඳ බලය ඇප පනත මඟින් මහාධිකරණයට පවරනු ලැබුවා. ඒ විධියට ඒ කටයුත්ත කළේ මේ නීතිය සම්බන්ධයෙන් මහා විශ්ලේෂණයක් කරලා, මේක හොඳට කිරලා බලලා තමයි. මේ පනත් කෙටුම්පතේ 10 වන වගන්තිය සංශෝධනය කළ යුතුයි කියා මම යෝජනා කරනවා. 10(2) උප වගන්තිය යටතේ, "8 වන වගන්තිය හෝ 9 වන වගන්තිය යටතේ යම් වරදක් සිදු කර ඇතැයි චෝදනා ලැබූ තැනැත්තෙකුට එරෙහිව පවත්වන නඩු විභාගයක්, ඒ අධිකරණයේ වෙනත් නඩු කටයුත්තක් ඇසීමට පෙරාතුව විභාගයට ගත යුතු අතර, වාර්තා ගත කළ හැකි නොවැළැක්විය හැකි හේතු මත මිස, දිනපතා පැවැත්වෙන නඩු විභාගයක් ලෙස පවත්වාගෙන යා යුතු අතර, එම නඩු විභාගය අතරතුරදී කල් දැමීම ද නො කළ යුතු ය" කියා සඳහන් වනවා. නඩු කටයුත්තක් ඉක්මන් කළ යුතුය කියන නිර්දේශය ලබා දීම සුදුසු වුණත් මේ වාගේ විධානාත්මක වගන්තියක් අධිකරණය වෙත යොමු කිරීම සුදුසු වන්නේ නැහැ. මොකද අධිකරණයක නඩු විභාගයක් පවත්වද්දී මේ විධියට අතරමඟ දී එම නඩු කටයුත්ත නතර කරන්න බැහැ කියන නිර්දේශයක් ලබා දීම තුළින් බලාපොරොත්තු වන යුක්තිය ඉටු කරන්නට පුළුවන්ද කියන ප්‍රශ්නය ඇති වෙනවා. ඒ නිසා මේ වගන්තිය සංශෝධනය කරන්න කියා මම ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, you have only one more minute.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව කරුණු කීපයක් කියන්නට තිබෙනවා. ඒ නිසා මට තව විනාඩි දෙකක කාලයක් ලබා දෙන්න.

අපරාධයක චින්දිතයන්ට විරුද්ධව කරන ලද පැමිණිල්ලක් සම්බන්ධයෙන් අලාභ නඩුවක් පවරන්නට පුළුවන්. ඒ අලාභ ඉල්ලන අවස්ථාවකදී මහෙස්ත්‍රාත් අධිකරණයට, මහාධිකරණයට දුන්නු බලය තුළ අපට යම්කිසි සහනයක් ලබා ගන්නට පුළුවන්. අපේ රටේ අපිත් පෙනී හිටපු නඩු රාශියක් තිබෙනවා. අපරාධ චින්දිතයෙක් කරන ලද පැමිණිල්ලක් මත බොහෝ චූදිතයන් වැරදිකරු කරන්නට හම්බ වෙන්නේ නැහැ. ඒ වාගේ අවස්ථාවලදී ඒ චූදිතයා වන්දි ඉල්ලා, අලාභ ඉල්ලා චින්දිතයන්ට විරුද්ධවත් නඩු පවරන අවස්ථා තිබෙනවා; සාක්ෂිකරුවන්ට විරුද්ධව නඩු පවරන අවස්ථාත් තිබෙනවා. ඒ වාගේම පොලිස් නිලධාරීන් වැනි රජයේ නිලධාරීන් සිය රාජකාරිය ඉටු කරද්දී එකී රාජකාරිවලට අදාළව සාක්ෂිකරුවන් වූ විට ඒ අයට විරුද්ධව නඩු පවරන අවස්ථාත් තිබෙනවා. මේ නීතිය ඒ කියපු තැන්වලටත් සහන දෙන්න පුළුවන් විධියට පුළුල් වන්නට ඕනෑ.

මේ පනත් කෙටුම්පතේ පළාත් සභා විෂයයන් සම්බන්ධයෙනුත් කථා වෙලා තිබෙන බව විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. අපරාධයක චින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා ජාතික අධිකාරියක් පිහිටුවීම ආදි කරුණු තුනක් මෙහි විශේෂයෙන් මුල් වෙලා තිබෙනවා. ඒවා බොහොම හොඳ කාරණා විධියට දකිනවා. ඒ වාගේම, මම මේ ගරු සභාවට යෝජනාවක් කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, please wind up now.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් කරුණු දෙකක් පමණයි කියන්නේ. මේ පනත් කෙටුම්පත පිට රටවල තිබෙන කරුණු රාශියක් ඇතුළත් කර ගත් පනත් කෙටුම්පතක්. ඒ නිසා විශේෂයෙන් අපේ රටේ සංස්කෘතියට, අපේ රටේ මිනිසුන්ගේ හැදියාවන්ට, ජීවත් වන රටාවට මෙය කොතරම් දුරට ගැළපේද කියන කාරණය ගැන මට ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා මේ පනත වසර කීපයකින් පස්සේ නැවත මේ පාර්ලිමේන්තුවේම සලකා බැලිය යුතුමයි. බොරු පැමිණිල්ලක් කිරීම මත ඇප ගන්න බැරි වන තත්ත්වයන් මේ පනත යටතේ තිබෙනවා. අපේ රටේ මිනිසුන් මේ පනතත් එක්ක මොන විධියට අනුගත වේද යන කාරණය පිළිබඳව බරපතළ තත්ත්වයක් වුණත් ඇති වන්නට පුළුවන්. ඒ නිසා මේ පනත නැවත වරක් විවාදයකට භාජනය කරන්න, විභාග කරන්න, ඒ ගැන කථා කරන්න, එයට අවශ්‍ය සංශෝධන කරන්න වසර කීපයකින් නැවත මේ පාර්ලිමේන්තුවට ගෙන ඒමට කටයුතු කරන්න කියා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 5.01]

ගරු රෝසි සේනානායක මහත්මිය (ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க - சிறுவர் அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. (Mrs.) Rosy Senanayake - State Minister of Children's Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපරාධයක චින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත දෙවන වර කියවා සම්මත කිරීමට අවශ්‍ය කටයුතු කිරීම සම්බන්ධයෙන් වත්මන් අධිකරණ අමාත්‍ය ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමාට මගේ කෘතවේදිත්වය පළ කරනවා. මේ පනත් කෙටුම්පත ගැන කථා කරන්න ඉස්සර වෙලා මට කිව යුතු

දෙයක් තිබෙනවා. වත්මන් රජය සම්බන්ධයෙන්, රජයේ දින සියයේ වැඩසටහන ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් විවේචන කීපයක් කර තිබුණා. මම කනගාටු වෙනවා, ඒ පිළිබඳව. වත්මන් රජය පත් වෙලා තවම දින 38යි. ඒ දින 38නුත් අද වන කොට දින 9ක් අපි පාර්ලිමේන්තුවේ වාඩි වෙලා තිබෙනවා. ඒ දින 9 ඇතුළත ජනතාවට සහන ලබා දෙන්න විශාල වැඩ කොටසක් කර තිබෙනවා. ඒ වාගේම, මුළු රටම වසර ගණනාවක් පුරාවට බලාපොරොත්තුවෙන් සිටි, අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය ලබා දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත දෙවන වර කියවා සම්මත කිරීම සඳහා වන කටයුතු කරන්නත් අද හැකි වී තිබෙනවා. වත්මන් ජනාධිපති අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා දින සියයේ වැඩසටහන මඟින් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන සියල්ල මේ දින සියය ඇතුළත නුදුරු අනාගතයේදී -අප්‍රේල් 23වන දා වන විට- අනිවාර්යයෙන් ක්‍රියාත්මක කිරීමටත්, අදාළ පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුවට ගෙනැල්ලා විශේෂයෙන් විපක්ෂයේ සහාය ද සහිතව ඒවා සම්මත කරගැනීමටත් අපේ රජය බලාපොරොත්තු වන බව මම පැහැදිලිවම කියන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීළඟට අද දවසේ විවාදයට ගැනෙන මේ පනත් කෙටුම්පතේ වටිනාකම මම පහදා දෙන්නම්. The objectives of the Bill are to uphold and enforce the rights and entitlements of victims of crimes and witnesses and to establish mechanisms to promote, protect, enforce and exercise such rights and entitlements. එය, මෙහි ප්‍රධාන අරමුණක් බවට පත් වනවා. මගේ අමාත්‍යාංශය යටතේ එන විෂය පද්ධතීන් ගත්තාම ජාතික ළමා රක්ෂණ අධිකාරිය ප්‍රධාන වූවක්. අද රටේ දැවෙන ප්‍රශ්න ගණනාවකට මුහුණ දෙන, හෙට දවසේ රටේ අනාගතය බාර ගන්න සිටින මල් වැනි දරුවන් සිය ආරක්ෂාව සම්බන්ධයෙන් බරපතළ ප්‍රශ්න රාශියකට මුහුණ දෙනවා. විශේෂයෙන් ජාතික ළමා රක්ෂණ අධිකාරියේ ප්‍රධාන කාර්ය භාරය ගැන කථා කරන කොට, ළමා අපයෝජන වළක්වා ගැනීම, ළමා අපයෝජනයකදී ඊට අදාළව වඩා එලදායි ලෙස නීතිය ක්‍රියාත්මක කිරීම මෙන්ම අපයෝජනයේදී වින්දිතයන් බවට පත් වන දරුවන්ගේ රැකවරණය තහවුරු කිරීම සම්බන්ධයෙන් සුවිශේෂ වූ කාර්ය භාරයක් කරන්න ජාතික ළමා රක්ෂණ අධිකාරියට සිදු වෙලා තිබෙනවා.

ඒ වාගේම අපයෝජනයට ගොදුරු වූ ළමයි ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය මැදිහත්වීමක් ද ජාතික ළමා ආරක්ෂක අධිකාරියට කරන්න සිදු වෙලා තිබෙනවා. ළමා අපයෝජනයේදී වින්දිතයන් බවට පත් වූ ළමයින් සඳහා අවශ්‍ය මනෝ සමාජ සහාය ලබා දීමත්, ඔවුන් නැවත සමාජගත කිරීමත් මේ අධිකාරියේ ප්‍රධාන කාර්ය භාරයක් බවට පත් වෙලා තිබෙනවා. මේ කාර්ය භාරය ඉටු කිරීමේදී පසු ගිය වසර පුරාවටම බාධක ගණනාවක් මතු වුණු බව මම මේ අවස්ථාවේදී මතක් කර දෙන්න ඕනෑ. විශේෂයෙන්ම නීතිය වල් වැදිලා අවනීතිය රජ කරපු අවස්ථාවකදී රටට අවශ්‍ය මෙවැනි කාලෝචිත පනත් කෙටුම්පතක් ගෙන ඒමේදී ඒකත් විවේචනය කිරීම සම්බන්ධයෙන් මම කනගාටු වනවා.

ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියේ 19(2) වන ව්‍යවස්ථාවේ පැහැදිලිව කියනවා, "ළමා අපයෝජන සහ නොසලකා හැරීම් අවස්ථාවලදී ඒවා හඳුනා ගැනීම, වාර්තා කිරීම, යොමු කිරීම, විමර්ශනය කිරීම, ප්‍රතිකර්ම කිරීම සහ පසු විපරම් කිරීම සඳහා සාර්ථක ක්‍රියා පටිපාටියක් ස්ථාපිත කිරීම අපේ පරම යුතුකමයි." කියා.

නමුත් සාර්ථක ක්‍රියා පටිපාටියක් ස්ථාපිත වුණාද, මේවා ක්‍රියාත්මක වුණාද කියන එක අද ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. ඒකට හේතු කාරක දත්ත එක්ක මම සටහන් කරන්නම්. මොකද, අද අප සියලු දෙනාම දන්නා කරුණක් 2009-2014 දක්වා වූ කෙටි කාලය ඇතුළතදී ළමයින්ට එරෙහිව සිදු වූ වාර්තාගත බල හා සුළු අපරාධ සංඛ්‍යාව 32,259ක්; කාන්තාවන්ට එරෙහිව සිදු වූ බල හා සුළු අපරාධ සංඛ්‍යාව 39,604ක් බව. නමුත්, මේ අපරාධ වර්ග දෙකම අරගෙන බැලුවාම අද මේ සම්බන්ධයෙන් වූදිතයන් හෝ වරදකරුවන් බවට පත් වෙලා දඬුවම් විඳින පුද්ගලයින් සංඛ්‍යාව 713ක් වනවා. මේක විහිළුසහගත කරුණක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සංඛ්‍යාව 713ක් වන්න හේතු ගණනාවක් පාදක වනවා. එනම්, දරුවන්ට හෝ දෙමව්පියන්ට හෝ විශේෂයෙන්ම වින්දිතයන්ට තමන්ගේ කරුණු -සාක්ෂි- හරියාකාරව ඉදිරිපත් කිරීමට නොහැකි වීම හේතුවෙන්ද, සාක්ෂිකරුවන් ඉදිරිපත් නොවීම හේතුවෙන්ද, දේශපාලනීකරණය සහ දේශපාලන ඇඟිලි ගැහීම් හේතුවෙන්ද, එහෙමත් නැත්නම් සමහර අපයෝජන හෝ අපරාධ කරපු පුද්ගලයන් දේශපාලනයට සෘජුවම සම්බන්ධ පුද්ගලයන් වීම හේතුවෙන්ද කියන ඒවායි. කහවත්තේ සිද්ධිය, අකුරැස්සේ සිද්ධිය, තංගල්ලේ සිද්ධිය බලන්න. කලින් පැවැති ආණ්ඩුව නියෝජනය කරමින් දකුණු පළාතේ සිටි සමහර දේශපාලනඥයන් කාන්තාවෝ සියයක් දූෂණය කරලා ඒ සම්බන්ධයෙන් පුරාජේරු දෙඩේව්වා. ඒ සම්බන්ධයෙන් සාජ්ජත් දැම්මා. පසු ගිය අවුරුදු 10 පුරාවටම නීතිය වල් වැදිලා, අවනීතිය රජ කළාය කියා මම කිව්වේ මෙන්න මේ හේතු නිසායි.

මෙතෙක් පැවැති අවනීතිය පරාජය කරමින් රටේ ජනතාව අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා කෙරෙහි සුවිශේෂ වූ විශ්වාසයක් තබමින් තමයි එතුමාව බලයට පත් කළේ. එතුමා බලයට පත් වූ විගසම දුන් පොරොන්දු ඇතුළත් ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව දින සියයක් තුළදී ඊළඟ මැතිවරණයට යන්න පෙර ඉෂ්ට කරන්න යන කරුණු කාරණාවලින් එකක් විධියට තමයි අද දවසේදී ගරු අධිකරණ ඇමතිතුමා මේ පනත් කෙටුම්පත සම්මත කිරීම සඳහා පාර්ලිමේන්තුවට යොමු කරන්නේ.

මම මේ අවස්ථාවේදී තවත් කරුණක් කියන්න ඕනෑ. දෙමව්පියන් හෝ ළමයින් වින්දිතයන් බවට පත් වුණාම බොහෝ අවස්ථාවලදී ඔවුන් අපහසු තත්ත්වයට හා අසරණ තත්ත්වයට පත් වන හේතු ගණනාවක් තිබෙනවා. එහිදී වින්දිතයන් වෙනුවෙන් විශාල පිරිවැයක් දැරීමට එම පවුල්වලට සිදු වනවා. ඒ වාගේම අදාළ දරුවන්ගේ දෙමව්පියන්ගේ ආර්ථික තත්ත්වය මත එය දරා ගැනීමට අපහසු තත්ත්වයකටත් පත් වනවා. ඒ වාගේම මානසික ආතතිය තුළ මේ දේවල් දරා ගැනීමටත් අපහසු වනවා. මේ හේතු නිසා බොහෝ වෙලාවට මේ නඩු එළියට යන අවස්ථා අපි දකිනවා. අපරාධ නඩුවක් අවසාන වන තෙක්ම මූල්‍ය පිරිවැයක් දැරීමට මේ අයට සිදු වනවා. ඔවුන්ට මේක දරා ගන්න බැරි කරුණක්. නීතිඥවරු අනවශ්‍ය අවස්ථාවලදී පවා නඩුවලට මැදිහත් වනවා. නඩුව අවසන් වී වන්දිය ලැබීම හෝ නොලැබීම තීරණය වන තෙක් රාජ්‍ය පාර්ශ්වයෙන් මේ සඳහා යම් පිරිවැයක් දැරීම වැදගත් කාරණයක් බවට පත් වෙලා තිබෙනවා. ඒකත් මම කිව යුතුයි.

විශේෂයෙන්ම ළමයින්ට එරෙහිව සිදුවන අපරාධ පසු ගිය වසර ගණනාව පුරාවටම අපි දැක්කා. මේ නඩු අහලා අවසන් කරන්න විශාල කාල පරිච්ඡේදයක් ගතවනවා. අවුරුදු 6ක දරුවෙකු ලිංගික අතවරයකට හෝ අපචාරයකට ලක් වුණාම එම නඩුව අහලා අවසන් වන කොට සමහර විට ඒ දරුවාගේ වයස අවුරුදු 15යි, 16යි. මේක ඉතාමත්ම කනගාටුදායක තත්ත්වයක්. මම අධිකරණ ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. විශේෂයෙන්ම කාන්තාවක්, මවක් හැටියට මගේ එකම ඉල්ලීම තමයි දරුවන්ට සිදු වන අපරාධවලදී මාස හයක්, එක්කෝ අවුරුද්දක් ඇතුළතදී මෙම නඩු අහලා අවසන් කරන්න පුළුවන් නම්, එය ඉතාම වැදගත් කාරණයක් වනවා කියන එකයි.

විශේෂයෙන් දරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් audio-visual පටිගත කිරීම හරහා දරුවන්ට සාක්ෂි දීමට පුළුවන් පරිසරයක් ඇති කරන්නට ඕනෑ. ඒ පරිසරය ජාතික ළමා

[ගරු රෝසි සේනානායක මහත්මිය]

ආරක්ෂක අධිකාරියේ පමණයි තිබෙන්නේ. මේ කටයුත්ත පළාත් මට්ටමින් දීප ව්‍යාප්ත කරන්නට පුළුවන් නම් වැදගත් වෙනවා. දරුවන්ගේ ආරක්ෂාව, පෞද්ගලිකත්වය සම්බන්ධයෙන් පුළුවන් තරම් සලකා බැලීම අවශ්‍ය වෙනවා. මොකද, බොහෝ අවස්ථාවලදී දරුවා අධිකරණයක් ඉදිරියට ගිහින් තමන්ගේ වූදිතයා දැක්ක ගමන් භය වෙනවා; දරුවා මානසිකව වැටෙනවා; දරුවාට හරියට සාක්ෂි දී ගන්නට බැරි වෙනවා. මේ හේතු නිසාමයි බොහෝ අවස්ථාවලදී නඩු එච්චර ප්‍රමාණයක් වාර්තා ගත වෙලාත්, අද වරදකරුවන් බවට පත් වෙලා සිටින්නේ වූදිතයන් 713ක ප්‍රමාණයක්ය කියන එක ඇත්තටම ලජ්ජාසහගත තත්ත්වයක්. හරියට සාක්ෂි දීමට නොහැකි වීම හෝ සාක්ෂි දෙන පුද්ගලයාට හෝ විත්දිතයාට තමාගේ ප්‍රකාශය හරියට කර ගන්නට අවශ්‍ය කරන පහසුකම් නොමැති වීම නිසා හෝ බොහෝ අවස්ථාවලදී මේ දරුවන් අසරණ තත්ත්වයට පත් වෙනවා. අසරණ තත්ත්වයට පත් වෙච්ච හේතුව නිසාමයි මේ නඩු අධිකරණයෙන් එළියට යන්නේ.

ඊයේ දවසේ අධිකරණ ඇමතිතුමා, ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපතිනි නටාෂා බාලේන්ද්‍ර මහත්මිය සහ එම අධිකාරියේ උප සභාපති සජීව සමරනායක මහතා මුණ ගැසුණු අවස්ථාවේදී අපි තව ඉල්ලීමක් කළා. මා හිතනවා, ගරු ඇමතිතුමා ඒ ඉල්ලීමට ඇහුම් කන් දෙයි කියා. ඒ, පුළුවන් නම් හැම අධිකරණ පද්ධතියකම ළමා නඩු ඇසීමට ළමයින් වෙනුවෙන් එක දවසක් යොදා ගන්නය කියන එක. මොකද, ළමයින්ගේ නඩුත් අනෙක් නඩුත් එක්ක එකට අහන කොට ඒ පරිසරය දරුවාගේ මානසිකත්වයට හුහක් බලපානවා. එම නිසා සතියේ එක දිනක් හෝ ළමා නඩු අහන්න කටයුතු යෙදීම වැදගත් වෙනවා. බොහෝ දෙනෙක් දන්නා කාරණයක් තමයි අද අධිකරණයේ තිබෙන නඩුවලින් තුනෙන් එකක් දරුවන්ට එරෙහිව සිදුවුණු අපරාධ පිළිබඳව නඩු වීම. මේක කනගාටුදායක තත්ත්වයක්. අද ලංකාව ගැන කථා කරනකොට ලෝකයේ උතුම් ම රට කියා කථා කළත්, අද රටේ දරුවන්ට මුහුණ පාන්නට සිදු වන මේ අවාසනාවන්ත සිදු වීම් නිසා අපට සතුටු වන්නට බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා විශේෂයෙන් කිව යුතු කාරණයක් තිබෙනවා. පසු ගිය සති තුන ඇතුළතදී පුත්තලම් දිස්ත්‍රික්කයෙන් වාර්තා වුණා, අවුරුදු හයක දරුවෙක් පියා විසින් දූෂණය කර; පියාගේ යහළුවාටත් දූෂණය කරන්නට දීලා කියා. ඒ වගේම පසු ගිය මාසයේ 27 වෙනිදා අවුරුදු එකහමාරක දරුවෙක් දූෂණය වුණා. මේවා සිදු වන්නට හේතුව තමයි නීතිය හරියාකාරව ක්‍රියාත්මක නොවීම. 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාන්තාවන්ට හා ළමයින්ට එරෙහිව සිදුවන අපරාධ සියයට විස්සකින් වැඩි වෙලා තිබෙනවා. මෙයට හේතුව ලෙස ඒ කරන ලද සමීක්ෂණයෙන් පෙන්නුම් කරන්නේ, the State failed to criminalize the criminals. එම නිසා තමයි මම පුන පුනා කියන්නේ, නීතිය වල් වැදිච්ච නිසා අවනීතිය රජ කළාය කියන එකයි. මේ තත්ත්වයට තිත තියන්න මේ වෙනකොට අධිකරණ ඇමතිතුමා සහ අධිකරණ නියෝජ්‍ය ඇමතිතුමා ගන්නා ක්‍රියා මාර්ගයන් ගැන මගේ කෘතවේදීත්වය පළ කරනවා. සාමය සහ නීතිය හරියාකාරව ක්‍රියාත්මක කරන මීට වඩා යහපත් ශ්‍රී ලංකාවක් තුළ අපේ දරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කිරීමට අවශ්‍ය කරන පසු බිම සකස් වේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 5.12]

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් ඔබතුමා මූලාසනයේ සිටින වෙලාවක මෙම වැදගත් පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදය අවසානයේදී හෝ අදහස් දක්වන්නට ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. මොකද, ඔබතුමා මෙම පනත් කෙටුම්පත පිළිබඳව පෞද්ගලිකවත්, මේ පාර්ලිමේන්තුව තුළත්, පාර්ලිමේන්තුවෙන් පිටතදීත් විශේෂ උනන්දුවක් දැක්වූ කෙනෙක්. මා අධිකරණ නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් හිටපු කාලයේ මේ පනත් කෙටුම්පත පිළිබඳව ඔබතුමා පෞද්ගලිකව මගෙන් අසා තිබෙනවා. මා අධිකරණ නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් හිටපු කාලයේ සිටම මේ පනත් කෙටුම්පත පිළිබඳව අධිකරණ අමාත්‍යාංශයෙන් විවිධ වතාවල කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් වෙලා තිබෙනවා. මේ ගැන නිලධාරින්ගේ මැදිරියේ සිටින අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමිය දන්නවා. එවකට එතුමිය අතිරේක ලේකම්වරියක්. මේ පනත් කෙටුම්පත පිළිබඳව අධිකරණ අමාත්‍යාංශයෙන් විවිධ වතාවල කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් වෙලා අවසානයේ අපේ ගරු රවුෆ් හකීම් මැතිතුමා අධිකරණ අමාත්‍ය ධූරය දැරූ කාලයේත් ඒ කැබිනට් මණ්ඩලය විසින් කැබිනට් අනුකමිටුවට දමා -මා එම අනුකමිටුවේ සාමාජිකයෙක්. - අද අපට මේ පනත් කෙටුම්පත සම්මත කර ගන්නට අවස්ථාව ලැබෙනවා.

ගරු අධිකරණ ඇමතිතුමනි, මා මුලින්ම කියන්නට ඕනෑ, අපි මේ ගෙනැවිත් තිබෙන සංශෝධනයේ "counsel" යන වචනය වෙනුවට ඉංග්‍රීසි භාෂාවෙන් "attorney-at-law" යන වචනය තිබෙන බව. නමුත් එහි සිංහල පරිවර්තනයේ තිබෙන්නේ "නීතිඥයකු" කියායි. "Attorney-at-law" යන වචනයේ සිංහල පරිවර්තනය හැටියට "ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥ" යනුවෙන් සඳහන් වුණොත් හොඳ නැද්ද? මොකද, මෙහි පරමාර්ථය වුණේ පිට රට counsel කෙනෙක් පෙනී සිටීම වළක්වනවාය කියන කාරණයයි.

මට වඩා හොඳට ඔබතුමා නීතියත් දන්නවා. මට වඩා හොඳට ඔබතුමාට භාෂාව හසුරුවන්නත් පුළුවන්. ඒ නිසා ගරු අධිකරණ ඇමතිතුමනි, -අජිත් පී. පෙරේරා විදේශ කටයුතු නියෝජ්‍ය ඇමතිතුමාත් ඔබතුමා ළඟට කිට්ටු වෙනවා- ඒ කාරණය පිළිබඳව අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා. මොකද, පරමාර්ථය වුණේ "counsel" කියන වචනය වෙනුවට ලංකාවේ නීතිඥයෙක් පෙනී සිටිනවාය කියන වචනය ගෙන එන්නයි. එම නිසා මේ අවස්ථාවේ වඩාත්ම යෝග්‍ය වචනය "ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥ" කියන වචනයයි.

මේ පනත් කෙටුම්පත ඉතාම හොඳ පනත් කෙටුම්පතක්. තේරිලා, බේරිලා, සාකච්ඡා කරලා ආපු පනත් කෙටුම්පතක්. මීට කාලයකට පෙර ගෙනෙන්නට ඕනෑකම තිබුණු පනත් කෙටුම්පතක්. ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා කිව්වා වාගේම මමත් කැබිනට් ඇමතිවරයෙක් වෙලා සිටියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපේ ආණ්ඩුව කාලයේ මෙම පනත් කෙටුම්පත ගෙන ඒමට ප්‍රමාද වීම පිළිබඳව මම සමස්ත සමාජයෙන්ම සමාව ඉල්ලනවා. මොකද, සාමූහික වගකීමක් තිබෙන්නට ඕනෑ නිසා. මේක මීට කාලයකට පෙර ගෙන ආ යුතු පනත් කෙටුම්පතක් කියා මා කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම කියන්න ඕනෑ, සමහර මන්ත්‍රීතුමන්ලා මේ වැදගත් විවාදයත් දේශපාලනයට හරවා ගත්තාය කියන එක. ගරු ජෝන් අමරතුංග ඇමතිතුමා නම් ඒක දේශපාලනයට හරවා ගත්ත එක පිළිබඳව මට අරුමයක්, පුදුමයක් නැහැ. මොකද, එතුමා විරුද්ධ පක්ෂයේ ඉන්න කාලයේ වාගේ නොවෙයි ආණ්ඩු පක්ෂයේ ඇමතිවරයෙක් වුණාම. විරුද්ධ පක්ෂයේ ඉන්න කාලයේ එතුමාට මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා නැතිවම බැහැ. අපේ ජනාධිපතිතුමා ඇමෙරිකාවේ ගියොත් එතුමාත් ඇමෙරිකාවට යනවාමයි. එතුමා විරුද්ධ පක්ෂයේ ඉඳලා ආණ්ඩු පක්ෂයේ ඇමතිවරයෙක් වුණාම අද හැසිරෙන්නේ හරියට ඕපපාතික වෙලා වාගෙයි. සෑම කාරණයක්ම දේශපාලනයට ඔබ්බවා ගන්නවා. ඒ ගැන අපට

පුදුමයි. එතුමා විරුද්ධ පක්ෂයේ ඉන්න කාලයේ අපේ හොඳ මිත්‍රයෙක්. අද එතුමා ලැයිස්තු ගණනාවක් කියවමින් මේ වැදගත් විවාදයත් දේශපාලනීකරණය කළා. එහෙම නම් අපටත් කියන්න පුළුවන්. ප්‍රේමදාස මහත්තයාගේ කාලයේ සිදු වුණු ඝාතන ටික, නඩුකාරයන්ට ගල් ගහපු ඒවා සොයා ගන්න බැරි වුණේ මේ පනත නොතිබුණු නිසා, රිවර්ඩ් ද සොයිසා මරපු කෙනා සොයා ගන්න බැරි වුණේ මේ පනත නොතිබුණු නිසා කියලා හෙට එළි වෙන තෙක්ම කියා ගෙන කියා ගෙන යන්න පුළුවන්. හන්දියක් හන්දියක් ගානේ මරලා දමලා හිටපු කොල්ලන් මැරුවේ කවුද කියලා සොයා ගන්න බැරි වුණේ ඒ නිසාය කියලා කියන්න පුළුවන්. නමුත් අද විය යුත්තේ එහෙමද? මෙවැනි වැදගත් පනත් කෙටුම්පතක් විවාද කරන වෙලාවේ විය යුත්තේ මෙම පනත් කෙටුම්පතේ වැදගත්කම පිළිබඳව කථා කරලා, මේ රටේ සමහර අපරාධවල සාක්ෂිකරුවන්ට, චින්දිතයන්ට ඒ අපරාධයට සම්බන්ධ වූදිතයා සොයා ගන්න බැරිව තිබුණු ප්‍රශ්න නිරාකරණය කර ගන්න බැරි වුණේ මෙවැනි පනතක් නොමැති වීම නිසාය කියන කාරණය පිළිබඳව කථා කිරීම නේද? නමුත් එහෙම නොවෙයි කළේ. සමහර කට්ටිය කියන්න පටන් ගත්තා, "නීතිය වල් වැදිලා තිබුණා, දැන් නීතිය එළියට ආවා" කියලා. දැන් මේ නීතිය එළියට ඇවිල්ලාද? මේ කියන වල් වැදිලා නැති, එළියට ආපු නීතිය යටතේ අදත් මේ රටේ සෑම ලංගම ඩිපෝවකම බලහත්කාරයෙන් DS මහත්වරු පන්නලා කොන්දොස්තර මහත්වරු ඒ පුටුවේ ඉඳ ගන්නවා. ඌව පළාත මමත් විජිත් විජයමුණි සොයිසා මන්ත්‍රීතුමාත් නියෝජනය කරන පළාත. මෙන්න යහ පාලනය. මෙන්න නීතිය.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
බිබිල ඩිපෝ එකේ DS එළෙව්වා.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
බිබිල ඩිපෝ එකේ DS එළෙව්වා විතරක් නොවෙයි, ඌව පළාත් සභාවට ජනතාවගේ ඡන්දයෙන් පත් වුණු මහ ඇමතිතුමා දිවුරුම් ප්‍රකාශ අත්සන් කරලා මහ ඇමතිකමෙන් බලෙන් පන්නනවා. මේ යහ පාලනය; සහජීවනය. අපි පාර්ලිමේන්තුවේ එහෙම දෙයක් කළාද? විරුද්ධ පක්ෂයේ අපට එකසිය විසි ගණනක් ඉන්නවා. යූඑන්පී එකට ඉන්නේ 48යි. අපි දිවුරුම් ප්‍රකාශ අත්සන් කරලා ජනාධිපතිතුමාට ගිහින් දුන්නාද, "නැහැ, නැහැ, එයා නොවෙයි අගමැති, නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා හරි කවුරු හරි" කියලා. එහෙම කළේ නැහැ. ඇයි, අපි ජනතාවගේ තීන්දුව පිළිගෙන, අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමාය කියලා මැතිවරණ කාලයේ ජනතාවට කිව්ව නිසා ඒක පිළිගෙන මේ පැත්තේ; විරුද්ධ පක්ෂයේ බහුතරයක් තියා ගෙනත් අපි අගමැතිතුමාගේ අගමැතිකම අභියෝගයට ලක් කරන්න ගියේ නැහැ. හැබැයි, ආණ්ඩුව දිනපු ගමන් ඌව පළාත් සභාව හැසිරුණේ එහෙම නොවෙයි. අද හරින් ප්‍රනාන්දු මහත්මයා ඉන්නේ "පිනා මහ ඇමති" විධියටයි. එතුමා "පිනා මහ ඇමති." දිවුරුම් ප්‍රකාශ අර ගෙන, මහ ජනතාවගේ ඡන්දයට එරෙහිව, නීතියට එරෙහිව කටයුතු කළා. මේ වල් වැදුණා කියන නීතිය එළියට ගත්ත හැටිද? දිවුරුම් ප්‍රකාශය දුන්නේ කවුද? මහියංගනයේ ඉඩම් ඇල්ලුවා, නිධන් හෑරුවා, හොරකම් කළා, ගැහුවා කියලා හරින් ප්‍රනාන්දු මහත්තයලාම කිව්ව එක්කෙනාගෙන් දිවුරුම් ප්‍රකාශය ගත්තා. ඒක ගත්ත ගමන් එයා හොරා නොවෙයි; මිනීමරුවා නොවෙයි. ඒ මිනිහා දිවුරුම් ප්‍රකාශය දුන්න ගමන් අර වැරදි ඔක්කොම ශුද්ධයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා නීතිය වල් වැදුණු යුගය වෙනුවට දැන් නීතිය එළියට ඇවිල්ලා කියලා කියන්න ඕනෑ නැහැ. හැබැයි, මේ රටේ නීතිය වල් වැදුණා නම් ඉතිහාසය පුරාම යම් යම් අවස්ථාවල පාලනය කළ සියලුම පක්ෂ ඒකට වග කියන්න ඕනෑ. ස්වයං විවේචනාත්මකව ඒකට වග කියන්න ඕනෑ. මේ පනත ගෙනෙන්න ප්‍රමාද වුණු එක ගැන අද මම සමාව ඉල්ලුවා වාගේ පක්ෂ, විපක්ෂ බේදයකින් තොරව සියලු දෙනාටම ජනතාවගෙන් සමාව ඉල්ලන්න බැරි ඇයි? ඒකට කොන්දක් තිබෙන්න ඕනෑ. මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා ජනාධිපතිතුමා හැටියට ඉන්න කාලයේදීවත් අපට ඒ කොන්ද තිබෙන්න ඕනෑ. මොකද, මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා ජනාධිපති හැටියට පත් වෙලා, අපේ පක්ෂයේ සභාපති වෙලා, අභ්‍යන්තරව -පක්ෂය ඇතුළේ- ප්‍රජාතන්ත්‍රවාදීව විවේචනය කරන්න, හෘදය සාක්ෂියට එකඟව කථා කරන්න අද අපේ පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායමට අවස්ථාව දීලා තිබෙනවා. ඒකෙන් තිබෙන සුවය, සැනසීමත් එක්ක රෑට නින්ද යන නිසා ඒකෙන් ලැබෙන සැනසීම අපේ ඇඟට දැනෙනවා. හැබැයි, මෛත්‍රිපාල සිරිසේන ජනාධිපතිතුමාගේ ඒ යහ පාලනය එක්සත් ජාතික පක්ෂය ඇතුළේ ක්‍රියාත්මක වෙනවාය කියන එක අපට පෙනෙන්නේ නැහැ. එහෙම නම් කොහොමද විදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ ටෙලිකොම් එක ගැසට් වෙන්නේ? අද ටෙලිකොම් එක තිබෙන්නේ තැපැල් අමාත්‍යාංශය යටතේ නොවෙයි, විදේශ කටයුතු අමාත්‍යාංශය යටතේයි. කොහොමද එහෙම නම් යහ පාලනය යටතේ එහෙම ගැසට් වෙන්නේ? මුදල් අමාත්‍යාංශය යටතේ තිබෙන මහ බැංකුව, අගමැතිතුමාගේ අමාත්‍යාංශය යටතට ගෙනෙනවා. ලෝකයේ කොහේවත් මහ බැංකුව මුදල් අමාත්‍යාංශයෙන් පිට දමා නැහැ. ඒකද යහ පාලනය කියන්නේ? අගමැතිතුමාගේ අමාත්‍යාංශය යටතේ ආයතන තිස් ගණනක් ගොඩ ගැහිලා. ඒවා එහෙමද වෙන්නේ? ඒ නිසා නීතිය වල් වැදිච්ච එක මේ පනත් කෙටුම්පතත් එක්ක එක පාරටම එළියට ආවාය කියන්න එපා. මේ රටේ මිනිස්සු දන්නවා, තවමත් මේ රටේ සමහර ආයතනවල නීතිය වල් වැදිලාය කියන එක. ඒක කොච්චරද කියනවා නම් සමහර අමාත්‍යාංශවල ඇමතිතුමන්ලා, ඇමතිතුමියන්ලා නොවෙයි, ජාතික සේවක සංගමයේ සභාපති, ලේකම් යන අය තමයි ඇමතිතුමන්ලා, ඇමතිතුමියන්ලා විධියට කටයුතු කරන්නේ. හැම තැනම නොවෙයි, සමහර ආයතනවල ඇමතිත්, ඇමතිතුමියත් ඉන්නේ පියන් හැටියටයි.

ඒ එක්කම තවත් එකක් කියන්න ඕනෑ. හොඳත් කියන්න එපායැ. පෙර පැවති මැතිවරණ හා සංසන්දනාත්මකව බලනකොට මේ මැතිවරණයෙන් පසුව ප්‍රචණ්ඩ ක්‍රියා අඩුයි. ඒක මම පිළිගන්නවා. ඒක නැහැ කියන්නේ නැහැ. හැබැයි එහෙම කියලා මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේදී නීතිය එහෙම පිටින්ම වල් වැදී තිබුණාය, දැන් එළියට ඇවිල්ලාය, දැන් ෂෝක්, සුදුයි කියන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක ඉතා වැදගත් පනත් කෙටුම්පතක්. මේ පනත් කෙටුම්පතේ අධිකාරිය පිහිටෙව්වායින් පසුව විශේෂයෙන්ම කාන්තා කටයුතු විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ ලේකම්වරයා විසින් නම් කළ එකී අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකු, ළමයින් පිළිබඳ විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ අමත්‍යවරයා විසින් නම් කළ එකී අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකු මේ ගරු සභාවේ සාමාජිකයන් වෙනවා. ඒ නිසා විශේෂයෙන්ම කාන්තාවන් හා දරුවන් සම්බන්ධ වෙච්ච නඩුවලදී ඒ අය පැමිණිලිකාරයෝ, චින්දිතයෝ වෙනුවෙන් පෙනී සිටිනවා. ගරු විජයදාස රාජපක්ෂ අධිකරණ අමාත්‍යතුමා, නීතිඥ අජිත් පෙරේරා, විදේශ කටයුතු නියෝජ්‍ය ඇමතිතුමා සමහර නඩු ගැන මට වඩා හොඳින් දන්නවා. ඒ නඩුවල සාක්ෂි ලබා ගැනීමේදී ගොඩාක් ප්‍රශ්න මතු වුණා. අපි වාගේ ටිකක් කට සද්ද නීතිඥවරයෙක් විත්තිය වෙනුවෙන් හරස් ප්‍රශ්න අහන්න ගත්තොත් ඒ දරුවාගේ හරි, පැමිණිලිකාරියගේ හරි මානසිකත්වය සම්පූර්ණයෙන් කඩා වැටෙනවා. ඒ නිසා එවැනි අවස්ථාවලදී ඒ චින්දිතයා හරි, සාක්ෂිකරුවා හරි ආරක්ෂා කිරීම සඳහා මෙවැනි පනතක් ගෙන ඒම ඉතා වැදගත් වෙනවා. මේ පනත පාර්ලිමේන්තුවට ගෙනාපු එක ගැන මම ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමාට ස්තුතිවන්ත

[ගරු ඩිලාන් පෙරේරා මහතා]

වෙනවා. අවසානයේදී මේ පනත පාර්ලිමේන්තුවට ගෙනෙන්න එතුමාට කොන්දක් තිබුණා. මම අධිකරණ නියෝජ්‍ය ඇමති වෙලා හිටපු කාලයේදීත් නොයෙකුත් ප්‍රශ්න නිසා මේ පනත පාර්ලිමේන්තුවට ගෙනෙන්න බැරි වුණා. ඊට පසුව ආපු අයටත් බැරි වුණා. මොන පක්ෂයක් බලයේ හිටියත් වර්තමාන සමාජය තුළ මෙවැනි දෙයක් කරන එක ලෙහෙසි නැහැ. විවිධ අන්තගාමී කල්ලිවල, cultsවල විවිධ මත දරන දේශපාලන මතදාරීන් ඉන්නා සමාජයක, රටක මෙවැනි පනතක් ගෙනෙන එක ලෙහෙසි නැහැ. ඒ සඳහා කොන්දක් තිබෙන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, ඔබතුමාට ඒ සඳහා කොන්දක් තිබුණු එක ගැන මා සතුටු වෙනවා. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ යහ පාලන ප්‍රතිපත්තිය තුළ එතුමාගේ සරලකම, එතුමා මේ රටේ ගමක ඉපදුණු කෙනෙක් හැටියට, ගම්වල තිබෙන මෙවැනි නඩුවල වින්දිතයන්ට, සාක්ෂිකරුවන්ට තිබෙන ප්‍රශ්න පිළිබඳව ප්‍රායෝගිකව දන්නා කෙනෙක් හැටියට, එතුමාගේ නායකත්වයත් ඔබතුමාට ඒ ශක්තිය ලබා දෙන්න ඉවහල් වෙන්න ඇතිය කියා මා හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ඔබතුමා නියෝජනය කරන වතුකරයේ ජනතාවටත් මෙයින් විශාල සහනයක් ලැබෙනවා. නීතිය තිබෙන්න ඕනෑ, බැරි කෙනාටයි. ඒ මිසක් පුළුවන් කෙනාට නොවෙයි. නීතිය ඉදිරියේ මේ රටේ බැරි කෙනා ගැන හොයනකොට විශේෂයෙන්ම වතුකරයේ ජනතාව තමයි ඒ බැරිම ගොඩේ ඉන්නේ. ඒ අයට ප්‍රශ්නයක් වුණාම, ඒ අය යම්කිසි නඩුවක වින්දිතයෝ වුණාම, සාක්ෂිකරුවෝ වුණාම වතුකරයේ ජනතාවට තමයි විශේෂයෙන්ම ආරක්ෂාව ඕනෑ. මොකද, සමහර වෙලාවට ඒ අය පැමිණිලි දමන්න පොලීසියට ගියාම තවමත් ඒ පොලීසිවල පැමිණිල්ල ලියා ගන්න තරම් භාෂාව දන්නා කෙනෙක් නැහැ. එවැනි ප්‍රශ්න රාශියක් මැද තමයි වතුකරයේ ජනතාව ජීවත් වෙන්නේ. විශේෂයෙන්ම වතුකරයේ ජනතාව යම් නඩුවක වින්දිතයෙක් හෝ සාක්ෂිකරුවෙක් වූ අවස්ථාවකදී මේ පනත හරහා විශේෂයෙන්ම සහනයක් ලැබෙනවාය කියා මා හිතනවා. විශේෂයෙන්ම නීතිය තිබෙන්න ඕනෑ පුළුවන් එකාට නොවෙයි -තිබෙන කොනාට නොවෙයි- සමාජයේ බැරි කෙනාටය කියන මතය සනාථ කරමින් මෙවැනි පනතක් ගෙන ඒම සම්බන්ධයෙන් රජයට ස්තුතිය පළ කරනවා. හැබැයි, රජයේ සමහර මැති ඇමතිවරුන් පුරසාරම් දොඩපු විධියට වල් වැදිච්ච නීතිය තවම එළියට ඇවිල්ලා නම් නැහැ. තවමත් සමහර තැන්වල වල් වැදිච්ච නීතිය වළ ඇතුළේමයි කියන කාරණය මතක් කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පි.ප. 5.24]

ගරු පෙරුමාල් රාජදුරයි මහතා
(மாண்புமிகு பெருமாள் ராஜதுரை)
(The Hon. Perumal Rajathurai)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, குற்றச்செயல்களுக்குப் பலியாக்கப்பட்டோருக்கும் சாட்சிகளுக்குமான உதவி மற்றும் பாதுகாப்புச் சட்டமூலம் தொடர்பான விவாதத்திலே கலந்துகொண்டு என்னுடைய கருத்துக்களையும் முன்வைப்பதற்கு சந்தர்ப்பம் அளித்தமைக்கு நன்றி தெரிவிக்கின்றேன். இன்று நாடளாவிய ரீதியில் பல குற்றங்கள் நடைபெறுகின்றன. குறிப்பாக, திட்டமிடப்பட்டுக் குழுக்களினால் புரியப்படும் கடுமையான குற்றங்கள் அதிகரித்துள்ளன. இன்று இந்தக் குற்றங்கள் தொடர்பில் பாதிக்கப்பட்டவர்கள் மற்றும் சாட்சிகள் நீதிமன்றத்தில் சாட்சியமளிக்கவும் பொலிஸ் நிலையம் போன்ற முறைப்பாட்டைப் பெற்றுக்கொள்ளும் திணைக்களங்களில் அல்லது ஏனைய விசாரணை நிலையங்களில் முறைப்பாடு செய்யவும் விசாரணைகள் தொடர்பில் மேலதிக ஒத்துழைப்பை வழங்கவும் சுதந்திரமாகச் செயற்படவும் முடியாத நிலையே காணப்படுகின்றது. இன்று குற்றம் புரிந்தவர்கள், குற்றவாளிகள் சுதந்திரமாகப் பொலிஸ் நிலையத்துக்குச் செல்கின்ற, நீதிமன்றத்தில் துணிந்து ஆஜராகின்ற அதேவேளை, இந்தக் குற்றங்களினால் பாதிக்கப்பட்ட நபர்கள் மற்றும் சாட்சிகள் துணிந்து சுதந்திரமாகச் செயற்பட முடியாத நிலை காணப்படுகின்றது. எனவே, இது தொடர்பில் ஒரு சட்டத்தை இலங்கையில் உருவாக்குமாறு ஐக்கிய நாடுகள் சபை ஒன்றியங்களினால் காலத்துக்குக்காலம் பல தடவைகள் வலியுறுத்தப்பட்டது. இதனைத் தொடர்ந்து, இலங்கையின் நீதித்துறை மேலும் சுதந்திரமாகச் செயற்பட ஒத்துழைக்கக் கூடியவகையில், குற்றச்செயல்களினால் பாதிக்கப்பட்டவர்களையும் சாட்சிகளையும் பாதுகாக்கக்கூடிய, அவர்களுக்கு உதவி மற்றும் பாதுகாப்பு வழங்கக்கூடிய இப்படியான ஒரு முக்கியமான சிறந்த சட்டமூலத்தை இந்தச் சபையிலே சமர்ப்பித்த நீதித்துறை அமைச்சர் அவர்களுக்கு நான் நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

நான் ஏறத்தாழ 18 வருடங்களாக ஒரு சட்டத்தரணியாக, அதுவும் ஆரம்ப அல்லது முதல்நிலை நீதிமன்றங்களான நீதவான் நீதிமன்றம், மாவட்ட நீதிமன்றம் போன்றவற்றின் வழக்குகளில் ஆஜராகியிருக்கின்றமையால், நான் தொழில் ரீதியாகப் பெற்ற அனுபவங்களை இந்தச் சந்தர்ப்பத்திலே பகிர்ந்துகொள்வது சாலப்பொருந்தும் என்று நினைக்கின்றேன்.

இன்று குற்றச்செயல்களில் ஈடுபட்டவர்கள் வழக்கு விசாரணை முடிந்த பின்னர், குற்றவாளியாகக் காணப்பட்டால் நீதிமன்றம் தண்டனை வழங்குவதற்கு முன்னர், குற்றவாளிகளிடம் தண்டனையைக் குறைப்பதற்கான காரணங்களைக் - mitigation - கேட்கின்றது. ஆனால், பாதிக்கப்பட்டவரின் வழக்குரைப்பினைக் - Victim Impact Statement- கேட்பதில்லை. ஆனால், இன்று உலகில் பல வளர்ச்சியுற்ற நாடுகளிலே இந்த நிலைமை நடைமுறையிலே காணப்படுகின்றது. எனவே, தற்போதைய நடைமுறையில் குற்றவாளிகளுக்குத் தண்டனை வழங்குவதற்கு முன்னர் அல்லது தண்டனைத் தீர்ப்பளிப்பதற்கு முன்னர் பாதிக்கப்பட்டவரின் உரையினை - Victim Impact Statement - கட்டாயம் நீதிமன்றம் கேட்கவேண்டும். இதன்மூலம் குற்றவியல் நீதி முழுமையாக நடைமுறைப்படுத்த வாய்ப்பு ஏற்படும்.

அதேபோல் குற்றங்களினால் பாதிக்கப்பட்டவர்கள் விசேடமாகக் கற்பழிப்பு, சிறுபிள்ளைகள் சம்பந்தப்பட்ட குற்றச்செயல்கள் போன்றவற்றால் பாதிக்கப்பட்டவர்கள் பொலிசில் முறைப்பாடு செய்யும் நேரங்களில் சட்டத்தரணி ஒருவரின் மூலமான சட்ட உதவி வழங்கப்படவேண்டும் என்பது கட்டாயமாக்கப்படல் வேண்டும். கற்பழிப்புப் போன்ற குற்றச் செயல்களினால் பாதிக்கப்பட்டவர்கள் பொலிசில் முறைப்பாடு செய்யும்போது தெளிவான மனநிலை அவர்களுக்கு இருப்பதில்லை. எனவே, சரியான முறையில் முறைப்பாட்டினை மேற்கொள்ளச் சட்டத்தரணி ஒருவரின் உதவி கட்டாயமாக்கப்படல் வேண்டும் என்பதே என்னுடைய கருத்து. அதேபோல் குற்றங்கள் தொடர்பிலான "B" Report என்று சொல்லப்படுகின்ற முதல் அறிக்கை பொலிசாரினால் நீதிமன்றத்தில் தாக்கல் செய்யப்படுகின்றபோது, அந்த அறிக்கையில் குற்றத்தினால் பாதிக்கப்பட்டவர் தொடர்பில் சட்ட உதவி பெற்றுக்கொடுத்தமை பற்றி விரிவாக அறிவித்திருக்க வேண்டும் என்பதையும் கட்டாயப்படுத்தினால் இந்தச் சட்டம் மேலும் சிறப்பானதாக அமையும்.

குற்றங்களினால் பாதிக்கப்பட்டவர்களைப் பாதுகாப்பதற்கான தேசிய அதிகார சபையொன்றைத் தாபிப்பதற்கான ஏற்பாடு இச்சட்டமூலத்தில் காணப்படுகின்றது. அது மிகவும் சிறப்பான ஒரு அம்சமென்று நான் கருதுகின்றேன். இன்னும் தென்னாபிரிக்கா போன்ற நாடுகளில் குற்றங்களினால் பாதிக்கப்பட்டோரின் நலன்கள் தொடர்பில் விசேட கவனத்துடன் செயற்படும் தேசிய அதிகாரசபைகள் காணப்படுகின்றன. ஆனால், இந்த அதிகாரசபையின் முழுமையான பணி நிறைவேற்றம் தொடர்பிலே நீதிமன்றத்தின் மேற்பார்வை அல்லது அதிகாரம் இருத்தல் நன்று என்று கருதுகின்றேன்.

அதுமாத்திரமல்ல, இன்று குற்றச்செயல்களினால் பாதிக்கப்பட்டவர்கள் நடைமுறை வாழ்க்கையிலே பல பாதிப்புக்களை எதிர்கொள்ளும் துர்ப்பாக்கிய நிலை காணப்படுகின்றது. அதில் குறிப்பாக மனோநிலை பாதிப்பு, பொருளாதார நிலையில் பின்னடைவு, வாழ்வாதார நிலை பாதிப்பு, சமூக அங்கீகார இழப்பு போன்ற பல பாதிப்புக்களை அடையாளப்படுத்தலாம். எனவே, இப்படியான காரணிகள் தொடர்பிலே கவனமெடுத்துச் செயற்பட வேண்டும். மனநல சிகிச்சைமுறை என்று கூறப்படுகின்ற consultation போன்றவை குற்றங்களினால் பாதிக்கப்பட்டவர்களுக்கு வழங்கப்படல் மிகவும் அத்தியாவசியமாகும்.

சமூக எதிர்பார்ப்பினை ஏற்படுத்துகின்ற வழக்குகளில் - sensitive cases - விசாரணைகள் காலம் தாழ்த்தப்படாது துரிதமாக மேற்கொள்ளப்படல் வேண்டும். உதாரணமாக, பாதிக்கப்பட்டவர்கள் குற்றம் புரிந்தவர்களிடம் சரணடையும் வரை பொலிசாரும் சட்ட மாஅதிபர் திணைக்களமும் நீதிமன்றத்திலே குற்றப்பத்திரிகையைத் தாக்கல் செய்வதில்லை. பாதிக்கப்பட்டவர்கள் வேறு வழியின்றிக் குற்றம் புரிந்தவர்களிடம் சரணாகதி அடைந்து சமரசம் செய்து கொள்ளும் நிலை ஏற்படும்போது வழக்கு விசாரணைகள் ஆரம்பிக்கப்படுகின்றன. இந்த நிலைமையில் பாதிக்கப்பட்ட சாதாரண மக்களுக்கு நீதி, நியாயம் பூரணமாகக் கிடைக்கும் என்ற நம்பிக்கை இழக்கப்படுகின்றது. எனவே, சிறுவர் பாலியல் துஷ்பிரயோக வழக்குகள் ஆகக்குறைந்தது ஒருவருட காலத்திற்குள்ளாவது விசாரித்து முடிக்கப்பட வேண்டும் என்ற ஒரு கட்டாய நடைமுறை இங்கு காணப்பட்டால் சிறந்ததென்று கருதுகின்றேன்.

தற்போது இப்படியான சிறுவர் பாலியல் துஷ்பிரயோக வழக்குகளில் சட்ட மாஅதிபரின் ஆலோசனை - Attorney General's Advice - மிக முக்கியமாகக் கருதப்படுகின்றது. நாட்டிலுள்ள பல நீதிமன்றங்களிலே பல வழக்குகள் இந்த சட்ட மாஅதிபரின் ஆலோசனை கிடைக்காத காரணத்தினால் விசாரணைக்குக்கூட எடுக்கப்படாது இன்னமும் தேங்கியிருக்கின்றன. இவ்வாறு காலங்கடத்தப்படுகின்ற போது, குறிப்பாக இந்தப் பாலியல் துஷ்பிரயோகத்திற்கு உட்பட்ட பெண் பிள்ளைகள் தங்களது திருமண வயதுக்கு முன்னர் திருமணத்தை முடித்துவிடுகின்ற ஒரு சூழ்நிலையில், அவர்கள் நீதிமன்றம் வந்து தனக்கு நடந்த அநீதியைப்பற்றி வெட்கமின்றி அல்லது தயக்கமின்றி எடுத்துக்கூறக்கூடிய நிலை ஏற்படுவதில்லை. சிலர் வெட்கம் காரணமாகத் தமக்கு எதுவுமே நடக்கவில்லை என்றுகூட நீதிமன்றத்திலே கூறுகின்றார்கள். இதனால், குற்றம் புரிந்தவர்கள் இங்கே தண்டனைக்குள்ளாகாமல் பாதிக்கப்பட்டவர்களே மென்மேலும் பாதிப்புக்குள்ளாகும் நிலை காணப்படுகின்றது.

இன்று குற்றத் தீர்ப்பளிக்கப்பட்டுச் சிறைத்தண்டனை பெறுவோர் கடுழிய உடல் உழைப்புடன்கூடிய சிறைத் தண்டனை பெறுகின்றார்கள். சிறையில் அவர்கள் புரியும் வேலைக்கு வேதனம் வழங்கப்படுகின்றது. அவர்கள் சிறைத் தண்டனைக்காலம் பூர்த்தியான பின்னர் அந்தக் குறிப்பிட்ட வேதனத்தின் மொத்தத் தொகையையும் பெற்றுக்கொண்டு வெளியிலே வருகின்றார்கள். இதனால் குற்றச்செயல்களினால் பாதிக்கப்பட்டவர்களுக்கு எந்தவித நன்மையும் கிடைப்பதில்லை. எனவே, சிறைத்தண்டனை பெறும் குற்றவாளிகளின் உடல் உழைப்பு வேதனத்தின் ஒரு குறிப்பிட்ட பங்கு பாதிக்கப்பட்டவருக்கு வழங்கப்படுவதற்கான ஏற்பாடுகளைச் செய்யவேண்டும்.

இன்னுமொரு விடயத்தையும் குறிப்பிட வேண்டும். வாகன விபத்து போன்ற வழக்குகளில், பாதிக்கப்பட்டவர்கள் அல்லது இறந்தவர்கள் தொடர்பிலே தற்போது நீதவான் நீதிமன்றம் ஓர் இலட்சம் ரூபாய் வரை நட்ட ஈட்டினைப் பெற்றுக்கொடுக்க முடியும். இது குற்றவியல் நடவடிக்கைமுறைச் சட்டக் கோவையிலே 17ஆம் பிரிவில் காணப்படுகின்றது. இந்தத் தொகை அதிகரிக்கப்படவேண்டும். வாகன விபத்து வழக்குகளில் குறிப்பாக மரணம் அல்லது முழுமையான அங்கவீனம் போன்றவை ஏற்படுகின்றபோது இந்த விடயம் கடைப்பிடிக்கப்படலாம் என்று கருதுகின்றேன்.

பாலியல் துஷ்பிரயோக வழக்குகளில் பாதிக்கப்பட்டவர்களின் விசாரணைகள் விசேடமாக சிறுவர் சிறுமியர் தொடர்பிலான வழக்கு விசாரணைகள் பிரத்தியேகமான அறையிலே நடைபெறுவதற்கு ஆவன செய்யப்பட வேண்டும். அதேபோல் குற்றவாளிகள் சார்பிலே ஆஜராகும் சட்டத்தரணிகள் பாதிக்கப்பட்ட சிறுவர்களுடன் நேருக்கு நேர் நின்று மிகவும் மோசமான முறையில் குறுக்கு விசாரணைகளைச் செய்து - கேள்விகளைக் கேட்டு அவர்களைச் சங்கடத்துக்குள்ளாக்காமல், நவீன தொழில்நுட்ப உதவியுடன் சாட்சியை வேறோர் அறையில் வைத்து விசாரணை செய்தல் மிகவும் சிறந்தது என்று நான் கூறுகின்றேன்.

அதுபோல், வெளிநாட்டுப் பிரஜைகள்மீதான குற்றங்கள் பற்றிய இன்னுமொரு முக்கியமான விடயம் பற்றியும் நான் குறிப்பிட விரும்புகின்றேன். இலங்கை, உல்லாசப் பிரயாணத் துறைமூலம் பிரதான வருமானத்தைப் பெறுகின்ற ஒரு நாடு. இன்று இலங்கைக்கு வருகின்ற உல்லாசப் பிரயாணிகள்மீது பெரும்பாலும் வெளிநாட்டுப் பிரஜைகள்மீது பல குற்றங்கள் புரியப்படுவதுடன் அவர்கள் பாலியல் துன்புறுத்தல்களுக்கும் ஆளாகின்றனர். இந்த வகையில் திருட்டு, கொள்ளை, பாலியல் துஷ்பிரயோகம் போன்ற குற்றச்செயல்களினால் பாதிக்கப்பட்ட வெளிநாட்டுப் பிரஜைகள் தம்முடைய முறைப்பாட்டைப் பொலிஸாருக்கு அறிவிக்கின்றபோதிலும் தங்களுடைய விசா காலம் முடிவடைந்த பின்னர் இந்த நாட்டைவிட்டு வெளியேறி விடுகின்றார்கள். எனவே, தொடர்ந்துவரும் காலங்களிலே வழக்கு விசாரணைகளில் பங்கெடுப்பதற்கு அவர்களுக்கு எந்த விதமான சந்தர்ப்பமும் இல்லை. இதனால் போதிய சாட்சிகள் நீதிமன்றத்துக்கு வராததால் அந்தக் குற்றச்செயல்கள் புரிந்தவர்கள் விடுதலை செய்யப்படுகின்றார்கள். இதனால் இவ்வாறு பாதிக்கப்பட்டவர்கள் இலங்கையின் சட்டதிட்டங்களின் நடைமுறை தொடர்பிலே அதிருப்தியடைந்து, இலங்கை நாட்டுக்கெதிராகப் பிரசாரங்களை மேற்கொள்ள நிர்ப்பந்திக்கப்படுகின்றனர். இந்த நிலை இலங்கைக்குச் சர்வதேச நாடுகளிலே பாரிய அபகீர்த்தியை ஏற்படுத்துகின்றது. எனவே, இவ்வாறானவர்கள் வெளிநாட்டுத் தூதரகங்களின்மூலம் செய்மதி - satellite - ஊடாக விசாரிக்கப்படுவதனூடாக அவர்களுக்கு நிவாரணம் வழங்கும் ஒழுங்குமுறைகள் மேற்கொள்ளப்பட்டால் இந்த நாட்டின் நற்பெயர் காப்பாற்றப்படும்; அவ்வாறு பாதிக்கப்பட்டவர்களுக்கும் நீதி கிடைக்கும் என்று கூறி, என்னுடைய இந்த உரையை முடித்துக்கொள்கின்றேன். நன்றி.

[අ.භා. 5.35]

ගරු මහින්ද සමරසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த சமரசிங்க)
(The Hon. Mahinda Samarasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ප්‍රථමයෙන්ම අපේ හිතමිත්‍ර අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍ය, ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මැතිතුමාට අප සියලු දෙනාගේම ස්තුතිය පුද කරනවා, ප්‍රමාද වෙලා හෝ මේ අත්‍යවශ්‍ය පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිළිබඳව. මේ පනත් කෙටුම්පත පිළිබඳව කථා කරන කොට මේ පනත් කෙටුම්පතට දීර්ඝ ඉතිහාසයක් තිබෙන බවත් කියන්න ඕනෑ. මට මතකයි, 2008 වර්ෂයේදී මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අවස්ථාවේදී මානව හිමිකම් ඇමතිවරයා හැටියට මමයි, මුල් කථාව සිදු කළේ. අමරසිරි දොඩංගොඩ මැතිතුමා අධිකරණ ඇමතිවරයා හැටියට පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනාවාට එතුමාගේ අසනීප තත්ත්වය නිසා මේ පනත් කෙටුම්පත පිළිබඳ අවශ්‍ය විග්‍රහය කිරීම පැවරුණේ මටයි. ඒ අවස්ථාවේදී අපි සූදානම් වෙලා ආවේ මේ පනත් කෙටුම්පත සම්මත කරන්නයි. හැබැයි, ඒ අවස්ථාවේදී එයට පාර්ලිමේන්තුවේ එකඟතාවක් තිබුණේ නැහැ. විශේෂයෙන්ම විපක්ෂයෙන් නැඟිටලා කිව්වේ, තවදුරටත් මේ පනත් කෙටුම්පත පිළිබඳව අධ්‍යයනයක් කරන්න ඕනෑ; එම නිසා එදින සම්මත කිරීමට පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න එපා කියලායි. ඊට පසුව තමයි, කාරක සභාවකට පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා දීර්ඝ කාලයක් ගත්තේ නැවත වරක් මේ පනත් කෙටුම්පත සංශෝධන ඇතිව කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා අනුමැතිය ලබා ගන්න. ඊට පෙර, නීතිපති දෙපාර්තමේන්තුව සමඟ, Legal Draftsman සමඟ දීර්ඝ වශයෙන් කථා කරලා අවසානයේදී කාලයක් ගිහිල්ලා තමයි මේ පනත් කෙටුම්පත කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා අනුමැතිය ලැබුණේ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! Will an Hon. Member propose the Hon. Perumal Rajathurai to take the Chair?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

I propose that the Hon. Perumal Rajathurai do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ආර්. යෝගරාජන් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු පෙරුමාල් රාජදුරයි මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, மாண்புமிகு ஆர். யோகராஜன் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பெருமாள் ராஜதுரை அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. R. YOGARAJAN *left the Chair, and* THE HON. PERUMAL RAJATHURAI *took the Chair.*

ගරු මහින්ද සමරසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த சமரசிங்க)
(The Hon. Mahinda Samarasinghe)

මට මතකයි, ජාත්‍යන්තර සම්මේලනවලට අපි සහභාගි වෙන කොට නොයෙකුත් අවස්ථාවලදී මේ පනත් කෙටුම්පත සම්මත කළ යුතුයි කියන ප්‍රකාශය නොයෙකුත් අය, -බලවත් රටවල් පවා- අපට ඉදිරිපත් කළා. ඒ බවත් අප සඳහන් කරන්න ඕනෑ. අපි ජාත්‍යන්තර මානව හිමිකම් කවුන්සිලයට ගිහිල්ලා 2008 දීත්, 2012 දීත් විශ්ව කාලීන සමාලෝචන වාර්තාව ඉදිරිපත් කරන අවස්ථාවේදී මමයි ඒ UPR - Universal Periodic Review - වාර්තාව රජය වෙනුවෙන් ඉදිරිපත් කළේ. විශේෂයෙන්ම මෙවැනි පනතක් නැතිකමේ අඩු පාඩුව පිළිබඳව ඒ අවස්ථාවේදී කථා කළ නොයෙකුත් රටවල් සඳහන් කළා කියන එකත් වාර්තාගත වෙලා තිබෙනවා. එවැනි අවස්ථාවලදී අපි කිව්වේ, 2008 වෙනකොට මේ පනත් කෙටුම්පත ගෙනාවා; ඒ පනත් කෙටුම්පත අපට සම්මත කර ගන්න බැරි වුණා; හැබැයි, ඉදිරියේදී අප එය සම්මත කරනවා කියලායි. මොකද, අපි පරීක්ෂණ පවත්වනවා නම් ඒ පරීක්ෂණ සාර්ථක පරීක්ෂණ වෙන්න ඕනෑ. ඒ පරීක්ෂණ හරහා අපි අවසාන තීරණයකට එනවා නම්, ඇත්ත සොයන්න අපි බලාපොරොත්තු වෙනවා නම් සාක්ෂි අවශ්‍යයි. සාක්ෂිකරුවෝ ඉදිරිපත් වෙන්නේ නැත්නම් කවදාවත් අපට අවශ්‍ය ඒ තොරතුරු ලබා ගන්න බැරි වෙනවා.

2009 මැයි 19වැනි දා වන කොට යුද්ධය ඉවර වුණත් ඒ කාලය තුළදී, -2006 ඉඳලා 2009 දක්වා- ඇති වුණු සිද්ධීන්, නැත්නම් අපට චෝදනා එල්ල කළ සිද්ධීන් පිළිබඳව පරීක්ෂණ පවත්වලා සාර්ථක ප්‍රතිඵලයක් අපි ලබා දෙනවා නම් අපට සාක්ෂිකරුවන් අවශ්‍යයි. හැබැයි, ඒ සාක්ෂිකරුවන් ඉදිරිපත් වන්නේ නැත්තේ මෙවැනි පනතක් නැති නිසායි. නැත්නම් නීතියෙන් ඒ අයට ආරක්ෂාවක් ලැබෙන්නේ නැති නිසායි කියන මතය තමයි නොයෙකුත් අවස්ථාවල අපට ඉදිරිපත් කළේ. ඇත්ත වශයෙන්ම මානව හිමිකම් කවුන්සිලයට පමණක් නොවෙයි. රජයේ නියෝජිතයා හැටියට අන්තර් පාර්ලිමේන්තු සංගමයේ මානව හිමිකම් කමිටුවට ගියත් මගෙන් ඒ අය හැම වෙලාවේම ඉල්ලුවේ, "මේ පනත් කෙටුම්පත සම්මත කරලා සාක්ෂිකරුවන්ට ආරක්ෂාව දෙන්න" කියලායි.

අපි මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ, යුද්ධය පැවැති කාලයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, ඒ වාගේම හිටපු ඇමතිවරු ගණනාවක් ඝාතනය වුණ බව. ජෝශප් පරරාජසිංහම් මන්ත්‍රීතුමා ගැන කථා කළත්, රවිරාජ් මන්ත්‍රීතුමා ගැන කථා කළත්, මහේස්වරන් මන්ත්‍රීතුමා ගැන කථා කළත්, ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ ඇමතිතුමා ගැන කථා කළත්, ලක්ෂ්මන් කදිර්ගාමර් හිටපු විදේශ ඇමතිතුමා ගැන කථා කළත්, ද.මු. දසනායක හිටපු ඇමතිතුමා ගැන කථා කළත් ඒ මේ පාර්ලිමේන්තුවේ වාඩි වුණු අපේ සහෝදර මන්ත්‍රීවරු, ඇමතිවරු. ඒ මහජන නියෝජිතයෝ ගැන කථා කළත්, ඇත්ත හොයලා, පරීක්ෂණ අවසන් කරලා, "අපි මෙවැනි දේවල්වලට හිස නමන්නේ නැහැ" කියන එක ජාත්‍යන්තරයට ගෙනියලා පෙන්වන්න අපට තවම හැකියාව ලැබිලා නැහැ.

ජෝශප් පරරාජසිංහම් මන්ත්‍රීතුමාගේ පරීක්ෂණය තවම ඉවර නැහැ. මොකද, අවශ්‍ය සාක්ෂිකරුවන් ඉදිරියට ඇවිල්ලා නැති නිසා. රවිරාජ් මන්ත්‍රීතුමා ගැන කථා කළත් ඒකයි තත්ත්වය. හිටපු ඇමතිවරයෙකු වන මහේස්වරන් මහතාගේ පරීක්ෂණය නම් ඉවරයි. අවසානයේදී, ඒ වෙඩි තියපු එක් කෙනාව අල්ල ගත්තා. වරදකරු පාපෝච්චාරණයක් කළා. DNA පරීක්ෂණයක් හරහා ඔප්පු කළා, ඔහු වරදකරු බව. ද.මු. දසනායක හිටපු ඇමතිතුමාගේ පරීක්ෂණයත් හුඟක් දුරට ඉවරයි. එක් කෙනෙක් අත් අඩංගුවට අරගෙන තිබෙනවා. ඇත්ත වශයෙන්ම පරීක්ෂණ අවසන් නොමැති වීම නිසා අපි ජාත්‍යන්තරයට විශාල වශයෙන් අවස්ථා දුන්නා, අපට මඩ ගහන්න. ඒ පරීක්ෂණ අවසන් කරලා අපි බලාපොරොත්තු වන පුළුල් සංහිඳියාවට යන්න අපට බැරි වුණේ ඇයි කියන කාරණයට කියන්න දෙයක් අපිට තිබුණේ නැහැ.

ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා පරණගම කොමිසමේ කාලය අගෝස්තු දක්වා දීර්ඝ කර තිබෙනවා. ඒ ගත්ත තීරණය හොඳයි. දැන් මේ පනත් කෙටුම්පතට ගරු කථානායකතුමා අනුමැතිය දුන් පසුව පරණගම කොමිසමට පුළුවන් මේ පනත පදනම් කර ගෙන

සාක්ෂිකරුවන් හොයලා, ඒ සාක්ෂිකරුවන්ට ආරක්ෂාව සහිතව ඇවිල්ලා, ඒ පරීක්ෂණ ඉවර කරන්න අවශ්‍ය තොරතුරු සපයන්න අවස්ථාව දෙන්න. ඒ වාගේම මාර්තු මාසයේ ජිනීවා මානව හිමිකම් කවුන්සිලයට තමුන්නාන්සේලාගේ රජය පැත්තෙන් නියෝජිතයෝ යැව්වාම ඔහුට කියන්න පුළුවන්, "දැන් අපි ඒ පනත් කෙටුම්පත සම්මත කර ගෙන තිබෙනවාය" කියලා. හැබැයි ගරු ඇමතිතුමනි, මම කියන්න ඕනෑ, අද මේ ඉදිරිපත් කළ පනත් කෙටුම්පතයි, 2008 ඉදිරිපත් කළ පනත් කෙටුම්පතයි අතර ලොකු වෙනසක් තිබෙන බව. 2008 ඉදිරිපත් කළ පනත් කෙටුම්පත මීට වඩා ශක්තිමත්. අවාසනාවකට අපට එදා ඒක සම්මත කර ගන්න බැරි වුණා. මොකද, එකඟතාවක් තිබුණේ නැති නිසා. හැබැයි, එහි ශක්තිමත් බව දියාරු කරලා හෝ යම් කිසි මට්ටමේ ආරක්ෂාවක් ලබා දෙන්න පුළුවන් පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීම හරහා මම හිතනවා, මේ රටේ පුළුල් සංහිඳියාවක් ඇති කරන්න අපේ තිබෙන බලාපොරොත්තුව ඉෂ්ට කර ගන්න අපට අවශ්‍ය වාතාවරණය මේ හරහා සකස් කරන්න පුළුවන් කියලා. තොරතුරු තිබෙනවා නම් භය නැතුව ඉදිරිපත් වෙලා ඒ තොරතුරු ලබා දීලා ඒ අවාසනාවන්ත සිද්ධීන් පිළිබඳ ඇත්ත හොයන්න උදවු වෙන්න පුළුවන්. ඊට පසුව ඒ කරුණු ජනතාවට ඉදිරිපත් කරන්න. නැත්නම් අපට කවදාවත් ඒ පුළුල් සංහිඳියාවේ ගමන අවසන් කරන්න බැරි වනවා. අපේ රජයටත් ඒ සඳහා වුවමනාවක් තිබුණා.

හැබැයි, අවාසනාවකට මෙවැනි ආරක්ෂාවක් ලබා ගන්න අපි ප්‍රමාද වුණා. ඒ වාගේම මම කියන්න ඕනෑ විපක්ෂයත් මේ කාලය තුළදී නිහඬව හිටිය බව. මේ පනත ගේන්න එපා කියලා එදා කිව්වත්, ඇත්ත වශයෙන්ම අපේ පැත්තෙනුත් මේ සඳහා උනන්දුවක් දැක්වුයේ නැහැ; අවාසනාවකට විපක්ෂයෙනුත් මේ පිළිබඳව උනන්දුවක් දැක්වුයේ නැහැ. ගරු රවුෆ් හකීම් ඇමතිතුමා අධිකරණ ඇමතිතුමා වුණාට පසුව තමයි නැවත වරක් මෙම පනත් කෙටුම්පත ගත්තේ. මම දන්නවා, එතුමාට නොයෙකුත් අවස්ථාවලදී කැබිනට් මණ්ඩලයේ දෝෂාරෝපණවලටත් මුහුණ දෙන්නට සිදු වුණු බව. හැබැයි, එතුමාට ආත්ම ශක්තියක් තිබුණා, ඒවාට මුහුණ දෙන්නට.

ගරු ඇමතිතුමනි, හොඳ නීතිඥවරයෙක් හැටියට, පුළුල් වශයෙන් සිතන ඇමතිවරයෙක් හැටියට ඔබතුමාටම ඔබින ඇමතිකම ප්‍රමාද වී හෝ ලැබුණා. සංහිඳියාව පිළිබඳව හදවතින්ම වැඩ කරන කෙනෙක් හැටියට ඔබතුමා දැක්කා, අපි ඇත්ත හොයන්න ඕනෑ කියලා. මොකද, ඇත්ත හොයන්නේ නැතිනම් මේ රටේ ඉන්න සියලුම ජනතාව අතර, ඒ අවශ්‍ය කරන සුහදතාව, එකමුතුකම ස්ථාපිත කරන්න අපට නොහැකි වනවා. මොකද, අපේ රටේ විවිධ ආගම් අදහන අය ඉන්නවා; විවිධ භාෂා කථා කරන අය ඉන්නවා; විවිධ සංස්කෘතික පිළිවෙත් අනුගමනය කරන අය ඉන්නවා. විවිධාංග බොහොමයක් තිබෙනවා. මෙම විවිධාංග ආරක්ෂා වෙන්න ඕනෑ. මෙම විවිධාංග ආරක්ෂා වුණොත් පමණයි, අවසානයේ දී නියම ශ්‍රී ලාංකික අනන්‍යතාවක් ගොඩනඟලා, අවුරුදු 30ක් තිස්සේ පැවැති යුද්ධය, ත්‍රස්තවාදය නැවත වරක් මේ රටේ ස්ථාපිත නොවන අන්දමින් කටයුතු කරන්න අපට අවස්ථාව ලැබෙන්නේ. මම හිතන හැටියට එක පැත්තකින් ජාත්‍යන්තරයට මෙය හොඳ පණිවිඩයක් වෙනවා. ඔබතුමන්ලාගේ රජයෙන් මෙම පනත් කෙටුම්පත සම්මත කර ගන්න අද දින ඉදිරිපත් කළා. පාර්ලිමේන්තුවේ බහුතරයක් සිටින විපක්ෂයේ අපි තමුන්නාන්සේලාත් එක්ක එකතු වෙලා අත්වැල් බැඳගෙන මේ පනත් කෙටුම්පත සම්මත කරන්න ඉදිරිපත් වුණා. ඒ වාගේම තව පැත්තකින්, මෙම පනත ක්‍රියාත්මක කිරීම අමාත්‍යතුමාට භාරයි. මෙම පනත නිකම් තියාගෙන ඉඳලා හරියන්නේ නැහැ. මේ පනත ක්‍රියාත්මක වෙන්න ඕනෑ. පත්තර හරහා, ජනමාධ්‍ය හරහා පුළුල් ප්‍රචාරයක් මේ පනත පිළිබඳව ලබා දෙන්න ඕනෑ. අමාත්‍යතුමනි, තමුන්නාන්සේ ගිහිල්ලා එහි නායකත්වය අරගෙන මේ පනතේ වටිනාකම ගැන, මේ පනත හරහා දෙන ආරක්ෂාව පිළිබඳව කථා කරන්න. එතකොට ජනතාව තුළ විශ්වාසයක් ඇති වෙයි, "අපි ඉදිරිපත් වෙලා තොරතුරු සැපයුවා කියලා අපට ප්‍රශ්නයක් මතු වෙන්නේ නැහැ" කියලා. "ජාත්‍යන්තර පරීක්ෂණයක් අවශ්‍ය නැහැ. දේශීය කොමිසමක් අවශ්‍යයි" කියන ස්ථාවරයේයි අපි ඉන්නේ.

ඊයේ පෙරේදා විදේශ කටයුතු අමාත්‍ය මංගල සමරවීර මැතිතුමා ගිහිල්ලා, මහන්සි වෙලා, ලංකාව සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ වාර්තාව නිකුත් කිරීමට සැප්තැම්බර් මාසය වෙන තෙක් කල් ගත්තා. ඒක හොඳයි. එක්සත් ජාතික සංවිධානයේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් වන සයිඩ් අල් හුසේන් මැතිතුමා එයට එකඟතාව ප්‍රකාශ කරන කොට කිව්වේ, "අපි බලාපොරොත්තු වෙනවා, නව රජය අපට සහයෝගය ලබා දෙමින් අපිත් එක්ක එකතු වෙලා වැඩ කරයි. මෙම ජාත්‍යන්තර පරීක්ෂණය මීට වඩා පුළුල් පරීක්ෂණයක් හැටියට පරිවර්තනය කරන්න, එහෙම නැතිනම්, ඒ ඉදිරිපත් කරන වාර්තාව මීට වඩා පුළුල් වාර්තාවක් හැටියට සකස් කරන්න අපට සහයෝගය ලබා දෙයි කියලා" කියායි. මම හිතන හැටියට මෙම පනත පදනම් කරගෙන ඔබතුමාට පුළුවන්කම තිබෙනවා, ඒ ඇත්ත සොයන්න. ඒ ඇත්ත හෙව්වොත් තමයි අපට මේ ගහන මඩ පහරවල් නතර කරලා, ජාත්‍යන්තරයේ අපේ ප්‍රතිරූපයට වෙලා තිබෙන හානිය ආරක්ෂා කරන්න පුළුවන්කම තිබෙන්නේ.

අමාත්‍යතුමාට මම නැවත වරක් සුබ පතනවා. ඔබතුමාට සහයෝගය දෙන්න ඕනෑ වෙලාවක අපි ඉන්නවා. මොකද, අපටත් ඇත්ත වශයෙන්ම ඕනෑ, මේ රට ඉදිරියට ගෙනියන්නයි. මේ රටේ සිටින සියලුම ජන කොටස් සමඟ අත්වැල් බැඳ ගෙන මේ රට විශාල දියුණුවකට ගෙන යන්නයි අපේ බලාපොරොත්තුව. මෙවැනි දේවල් හරහා විශාල පියවරක් අරගෙන එම ගමන යන්නට හැකියාව ලැබෙනවා කියන කරුණත් මතක් කරමින් මාගේ වචන ස්වල්පය මෙතැනින් අවසන් කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට, ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලබා දෙනවා.

[අ.භා. 5.49]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ස්තුතියි. ගරු මහින්ද සමරසිංහ මන්ත්‍රීතුමනි, ඔබතුමාට විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා, බොහොම සුබවාදීව මේ පනත් කෙටුම්පත දෙස බලා නව රජය පැසැසුමට ලක් කිරීම සම්බන්ධව. ඒ වාගේම අපි දැක්කා, මෙම පනත ගෙන ඒමට ප්‍රමාද වීම සම්බන්ධයෙන් ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා සහ ගරු ඩිලාන් පෙරේරා මන්ත්‍රීතුමාත් ජාතියෙන් සමාව ඉල්ලා සිටිය බව. ඇත්තටම සමාව ගැනීම මනුස්ස ගතියක්. ඒ වාගේම සමාව දීම දේව ගතියක්. මේ දින සියයක කාලයෙන් දැන් දින 38ක් විතර ගත වෙලා. ඒ කාලය තුළ හිටපු විවිධ ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් සමාව ඉල්ලපු අවස්ථා අපි දැක්කා. දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට පක්ෂව අත ඉස්සීම ගැන සමහර අය සමාව ඉල්ලුවා. මට තිබෙන ප්‍රශ්නය වන්නේ, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාටත්,ගරු ඩිලාන් පෙරේරා මන්ත්‍රීතුමාටත් මේ දින සියය ඇතුළත කී වතාවක් අපෙන්, ජාතියෙන් සමාව ගන්න සිදු වෙයිද කියක එකයි. මොකද අපි යහ පාලනය උදෙසා විවිධ පනත් කෙටුම්පත් රැගෙන එන නිසා.

විශේෂයෙන්ම අපේ ගරු ලලිත් දිසානායක මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, "මේ යහ පාලනය, වහ පාලනයක් වෙන්න යනවා" කියලා. ඇත්තටම මේ යහ පාලනය, වහ පාලනයක් වනවා, වැරැදි කරපු

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

මන්ත්‍රීවරුන්ට; වැරැදි කරපු ඇමතිවරුන්ට. ඔවුන්ට නම් මේ යහ පාලනය, වහ පාලනයක් බවට පත් වෙයි. ඒක අපට නවත්වන්න විධියක් නැහැ. නමුත් අපි හිතනවා, ලලිත් දිසානායක මැතිතුමා එහෙම වැරැදි වැඩ කරලා නැතුවා ඇති කියලා. නමුත් වැරැදි කරපු සියලු දෙනාටම යහ පාලනය, වහ පාලනයක් වෙන එක අපට නවත්වන්න බැරි වෙනවා කියන එකත් ලලිත් දිසානායක මැතිතුමාට මතක් කර දෙන්න ඕනෑ. ඒ වාගේම එතුමා කිව්වා, මේ ගෙනාපු පනත් කෙටුම්පත ආණ්ඩුවෙන් ගෙනාවාට එතුමන්ලාගේ පසු ගිය රජය හදපු පනත් කෙටුම්පතක් කියලා. නමුත් අවුරුදු 10කට වැඩි කාලයක් මේ පනත් කෙටුම්පත පල් වෙවී තිබුණා. මෙවැනි පනත් කෙටුම්පත් ගෙනෙන්න බැරි වුණ නිසා තමයි, එදා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා තමන්ගේ ඇමතිකම, පක්ෂයේ මහ ලේකම්කම දාලා විපක්ෂයට එක් වුණේ. හකීම් ඇමතිතුමන්ලා කොන්දේසි විරහිතව ඇවිල්ලා මෛත්‍රී-රනිල් රජයට සහයෝගය දෙන්න අත්වැල් බැඳ ගත්තේ, මෙවැනි පනත් කෙටුම්පත් එදා ගෙනෙන්න වාතාවරණයක් තිබුණේ නැති හින්දා. එතුමන්ලාට "කොන්ද පණ තිබෙනවා" කියලා කිව්වා. කොන්ද පණ තිබෙනවා කියන සංකල්පයෙනුත් ඔබ්බට ගිහිල්ලා එතුමන්ලා තමන්ගේ තානාන්තර, තනතුරු දාලා මෛත්‍රී - රනිල් සුසංයෝගයට එකතු වෙන්නට තීරණය කරලා තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෛත්‍රී-රනිල් රජය බලයට පත් වුණේ, මේ රටට යහ පාලනය ගෙනෙනවා කියන එක පදනම් කරගෙනයි. මේ රටේ ජනතාවට යහ පාලනය අවශ්‍ය වෙලා තිබුණා. රටේ නීතියක් තිබුණේ නැහැ. කුඩු, එතනෝල් වාගේ මත් ද්‍රව්‍ය මේ රටේ රජ කරලා, ඒවා ගෙන්වන අය මේ රටේ රජ්ජුරුවෝ බවට පත් වෙලා, පාලකයෝ බවට පත් වෙලා, තීන්දු ගන්න අය බවට පත් වෙලා, පොලීසිය, හමුදාව පාලනය කරන අය බවට පත් වෙලා තිබුණු කාලයක් තිබුණා. මිනී මරුවෝ, දාමරිකයෝ, සුදු වැන් සංස්කෘති වාගේ දේවල්වලින් මේ රටේ ජනතාවගේ ජීවිතයට කිසිම හවිහරණක් නැතුව, විශ්වාසයක් නැතුව ජීවත් වෙන්න සිදු වුණු කාලයක් උදා වෙලා තිබුණා. එවැනි කාලයක තමයි ජනතාව ඉල්ලුවේ, "අපට ඕනෑ කොන්ක්‍රීට් කරපු පාරවල් නොවෙයි. අපට ඕනෑ වරායවල් නොවෙයි. අපට ඕනෑ ඔය කියන ගුවන් තොටු පොළවල් නොවෙයි. අපට ඕනෑ යහ පාලනයක්. සැනසිල්ලේ ජීවත් වෙන්න පුළුවන් වට පිටාවක් අපේ රටේ හදලා දෙන්න" කියලා. ඒ ඉල්ලීම ඉටු කරන්න අපි පොරොන්දු වුණා. දින සියයක් තුළ ඒකට අවශ්‍ය කරන ප්‍රතිකර්ම කරනවා. "මෙන්න, ඒ වෙනුවෙන් දින සියය තුළ අපි කරන ප්‍රතිකර්ම" කියලා අපි ජනතාවට පොරොන්දු පත්‍රයක් ඉදිරිපත් කළා. අපේ නව රජය යුහුසුළුව කටයුතු කරන්නේ මේ ප්‍රතිඵලය ජනතාවට ලබා දෙන්නයි. කඩිනමින් ඒ ප්‍රතිඵලය ලබා දීමට කටයුතු කරනවා.

ගරු ලලිත් දිසානායක මන්ත්‍රීතුමා කිව්වා, "තවම නැහැ නේ, මේක" කියලා. තව දින 38යි ගියේ. තව දින 62ක් දින තිබෙනවා, මේ පොරොන්දු ඉෂ්ට කරන්නට. අපි මේ සියල්ලම ක්‍රමානුකූලව, පිළිවෙළකට, හරියාකාරයෙන් ඉදිරිපත් කරමින් පවතිනවා. කිසිම සැකයක් හිතන්න ඕනෑ නැහැ. මේ දින සියය ඉවර වෙන කොට මේ රටේ යහ පාලනය කිරීම සඳහා අවශ්‍ය සම්පූර්ණ පසු බිම සකස් කිරීමට -අත්තිවාරම දමා දෙන්නට නැත්නම් පරිසරය නිර්මාණය කරලා දෙන්නට- අපි කටයුතු කරනවා කියන එක විශේෂයෙන්ම ප්‍රකාශ කරන්න ඕනෑ. ඒක අමාරු කටයුත්තක්. අර මම කලින් කිව්වා වාගේ කුඩු, එතනෝල් වාගේ නීති විරෝධී මත් ද්‍රව්‍ය සහ අවනීතිය මේ රටේ රජ කරලා තිබුණු කාලයක් පසු කරලා, ඒකාධිපති පාලනයක් මේ රටේ ක්‍රියාත්මක වුණු කාලයක් පහු කරලා එක සැරේට දින සියයක් ඇතුළත යහ පාලනය ස්ථාපිත කරන එක ලේසි වැඩක් නොවෙයි. හැබැයි ඒ අභියෝගය අපි ජය ගනිමින් පවතිනවා. ඒ අභියෝගය අපි ජය ගන්නවා.

මානව හිතවාදී නායකයෙක් ජනාධිපතිවරයා වශයෙන් මේ රටට පත් වුණා. පරිණත බුද්ධියක් තිබෙන නායකයෙක් අග්‍රාමාත්‍යවරයා වශයෙන් කටයුතු කරනවා. හොඳ ඇමති මණ්ඩලයක් ඉන්නවා. මේ සුසංයෝගය -මේ එකතු වීම- මේ අභියෝගය ජය ගන්න අපට බාධාවක් වන්නේ නැහැ. මේ එකතු වීමෙන් ඒ අභියෝගය ජය ගන්න පුළුවන් කියන එක විශේෂයෙන් අපි ප්‍රකාශ කරනවා. මොකද, ජනතාවගේ අභිලාෂය වුණේ ඒකාධිපති පාලනය පැත්තකට විසි කර දමලා යහ පාලනයක් ඇති කර ගැනීමයි.

විජයදාස රාජපක්ෂ ඇමතිතුමනි, ඔබතුමා අද මේ ගෙනෙන ලද අපරාධයක විත්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත යහ පාලනය ස්ථාපිත කරනවා කියන කාරණයට අඩි තාලමක් - පියවරක් - වශයෙන් අපිට හඳුන්වන්න පුළුවන්. ඒ යහ පාලනයේ අරුණලු දැන් ජනතාව දකිනවා. සිගරැට් පැකැට්ටුව මත සියයට 80ක් ආවරණය වන පරිදි රූපමය අවවාද ප්‍රදර්ශනය කළ යුතු යයි කියන තව පනත් කෙටුම්පතක් හෙට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. මේ රටේ වැඩිම මරණ සංඛ්‍යාවක් සිදු වන්නේ දුම් බීම සහ මත් ද්‍රව්‍ය පානය කිරීම නිසායි. ඒ නිසා එම පනත් කෙටුම්පතත් හෙට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. අපි දන්නවා, විපක්ෂයේ ආශීර්වාදය තුළ මේ පනත් කෙටුම්පත් සියල්ලම සම්මත වන බව. යහ පාලනය කියලා කියන්නේ තරග කරලා, කෑ ගහලා, රණ්ඩු වෙලා, අපේ බලය මෙච්චරයි කියලා පනත් කෙටුම්පත් සම්මත කර ගැනීම නොවෙයි. නමුත් එදා එහෙම දෙයක් තිබුණා. කැසිනෝ ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගෙන ඉදිරිපත් කරන ලද ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත් කෙටුම්පත සම්මත කරනවාට අපි විරුද්ධ වුණා. එම පනත් කෙටුම්පතට විරුද්ධව අපි කථා කළා. නමුත් අපි කියපු දේවල් කනකට අහන්නේ නැතිව, තුනෙන් දෙකේ බලය ඒකාධිපති බලයක් විධියට පාවිච්චි කරමින් තමන්ට ඕනෑ විධියට ඒ පනත් කෙටුම්පත සම්මත කර ගත්තා. සමහර ගරු මන්ත්‍රීවරුන්, ඇමතිවරුන් එදා මේ පනත් කෙටුම්පත සම්මත කරනවාට කැමැති වුණේ නැහැ. එහෙම තිබියදීත් ඉහළින් ආපු විධාන තුළ එම පනත් කෙටුම්පත බලහත්කාරයෙන් සම්මත කර ගත්තා. නමුත් ඊට වඩා සරල, ඊට වඩා පහසු, ජනතාවට සුව පහසු, මන්ත්‍රීවරුන්ට සුව පහසු ක්‍රමයක් අනුව බොහොම රිසි සේ කථා කරලා, හරි දේ කරන්න පුළුවන් යහ පාලනයක් විශේෂයෙන්ම අපි අද රටට හඳුන්වා දීලා තිබෙනවා; හඳුන්වා දෙමින් පවතිනවා.

අපරාධයක විත්දිතයින් වාගේම අපරාධයක සාක්ෂිකරුවන්වත් අපි මේ පනත් කෙටුම්පත තුළින් ආරක්ෂා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විත්දිතයාගේ හඬ අපිට අවශ්‍ය වනවා. ඔහු හඬ නහන්නේ ඔහුගේ පාඩුව වෙනුවෙන් නොවෙයි, මේ සමාජය නිවැරැදි කරන්නයි. මේ සමාජය තුළ යහ පාලනය ස්ථාපිත කරන්න නම් ඔහුගේ හඬ රටට අවශ්‍ය වෙනවා. සාක්ෂිකරුවා හඬ නහන්නේත්, සාක්ෂිකරුවා සාක්කි දෙන්නේත්, ඒ විත්දිතයාට සිදු වුණු හානිය නැති කරන්න විතරක් නොවෙයි, මේ සමාජයත් නිවැරැදි කරන්නයි. මේ සමාජය තුළ යහ පාලනය ස්ථාපිත කරන්න නම් සාක්ෂිකරුවාගේ හඬ උසාවිය තුළ දී අවශ්‍ය වෙනවා. මේ විත්දිතයාව රැක ගැනීම, විත්දිතයාගේ හඬ ශක්තිමත්ව තබා ගැනීම, විත්දිතයාට තිබෙන අපහසුකම් නැති කර ඔහුට අවශ්‍ය පහසුකම් ලබා දීම විතරක් නොවෙයි, සාක්ෂිකරුවාගේ හඬ රැක ගැනීම, සාක්ෂිකරුවාගේ හඬ ශක්තිමත් කිරීම, සාක්ෂිකරුවාට හඬ නැඟීමට අවශ්‍ය පරිසරය සකස් කර දීම රජයක වග කීමක් වනවා. සාක්ෂිකරුවා ශක්තිමත් කිරීම විත්දිතයාගේ වග කීමක් විතරක් නොවෙයි, රජයක වග කීමක්ද වනවා. රටක යහ පාලනයක් ඇති වෙන්න නම්, රටක සර්ව සාධාරණ පාලනයක් ඇති කරන්න නම්, සාධාරණ සමාජයක් බිහි කරන්න නම් මේ හඬවල් දෙකම රජය විසින් සුරැකිය යුතුව තිබෙනවා. නමුත් ඔවුන්ට ආරක්ෂාව සලසන්නට, ඔවුන්ට සහාය ලබා දීම සඳහා කටයුතු කරන්නට මෙතෙක් කල් තිබුණු රජයන්

ඉදිරිපත් වුණේ නැහැ. මොවුන්ව ආරක්ෂා කිරීම, මොවුන්ට සහාය ලබා දීම සඳහා වූ මේ පනත් කෙටුම්පත අවුරුදු දහයක් තිස්සේ හමස් පෙට්ටියේ හැංගිලා තිබුණා. ඒක එළියට ගන්න පුළුවන්කමක් තිබුණේ නැහැ.

ගරු මහින්ද සමරසිංහ මන්ත්‍රීතුමා ප්‍රකාශ කරපු විධියට මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නට ඔවුන් උත්සාහ කළා. මේ පනත් කෙටුම්පත රටට අවශ්‍යයි. විදේශ රටකට ගිහිල්ලා රට ගැන අභිමානයෙන් යුතුව කථා කරන්න මේ පනත් කෙටුම්පත අවශ්‍යයි. නමුත් ඒකට අවස්ථාව ලැබුණේ නැහැ.

ගරු මහින්ද සමරසිංහ මන්ත්‍රීතුමනි, මා ඔබතුමාට ස්තුති කළේ ඒකයි. මෙතැන විමල් වීරවංශ මන්ත්‍රීතුමා හිටියා නම් කියනවා, "ඕක බටහිර කුමන්ත්‍රණයක්" කියලා. අනිවාර්යයෙන්ම එතුමා කියනවා, "ඕක බටහිර කුමන්ත්‍රණයක්, ඕක අධිරාජ්‍යවාදීන්ට ඕනෑ එකක්, ඕක අර ජිනීවා කට්ටියට ඕනෑ එකක්, ඕක නම් අපි සම්මත කරන්නේ නැහැ" යි කියලා. එහෙම වාතාවරණයක් තමයි මේ පාර්ලිමේන්තුව තුළ තිබුණේ; එහෙම වාතාවරණයක් තමයි මේ රට තුළ තිබුණේ. නමුත් මහින්ද සමරසිංහ වාගේ හොඳ මන්ත්‍රීවරුන් කර කියා ගන්න දෙයක් නැතිව හිටියා. මේ කටයුත්ත රජයේ වගකීමක්.

ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමනි, ඔබතුමා මේ ගත්ත ක්‍රියා මාර්ගය ඇත්තටම මෛත්‍රී - රනිල් රජයේ ඒ යහ පාලනය ශක්තිමත් කිරීමට ගත්ත පියවරක් වශයෙන් අපි විශේෂයෙන්ම දකිනවා. මෙතෙක් කල් මේ රටේ තිබුණු තත්ත්වය මොකක්ද? වින්දිතයා විඳගෙන ඉන්නවා. වින්දිතයා දන්නවා, උසාවියට ගියාට වැඩක් නැහැ, අවුරුදු ගණනක් මේ ගැන නඩු අහනවාය කියලා. සමහර විට වින්දිතයා දරුවෙක්. නඩුව ඉවර වනකොට ඔහු විවාහ වෙලා. විවාහ වෙලා නෝනා සහ දරුවනුත් එක්කත් නඩුවට යන්න සිදුවෙලා තිබෙනවා. ඒ තත්ත්වයෙන් ඒ අයව ආරක්ෂා කර ගැනීමේ වුවමනාව තිබෙනවා. ඒ ප්‍රතිරූපය අධිකරණයෙන් ගලවා ගන්න ඕනෑකමක් තිබෙනවා. ජනතාව තුළ අධිකරණය කෙරෙහි විශ්වාසයක් ඇති කරන්න ඕනෑකම තිබෙනවා. මේවා විඳගෙන පැත්තකට වෙලා අහිංසකව ඉන්න ඔවුන්ට සිද්ධ වෙලා තිබුණා. ඇසින් දුටු සාක්ෂි තිබුණත් ඒවා ඉදිරිපත් කරන්න විධියක් තිබුණේ නැහැ; ඒ සඳහා හැකියාවක් තිබුණේ නැහැ; තර්ජන ගර්ජන මැද්දේ, බලපෑම් මැද්දේ ඒ සාක්ෂි යටපත් වෙලා තිබුණා. අන්න ඒ අය ආරක්ෂා කර ගත්තොත් තමයි මේ රටේ යහ පාලනය ස්ථාපිත කරන්න අපට පුළුවන් වන්නේ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත වෙලාව ඉවරයි. දැන් කථාව අවසන් කරන්න.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි දෙකක් දෙන්න. මේ නිසාම අපේ රටේ අපරාධ රැල්ල වැඩි වුණා. වරදකරුවන් නිදැල්ලේ හැසිරුණා. ඇයි? වින්දිතයා අසරණයි, සාක්ෂිකරු අසරණයි. ඒ නිසා වරදකරුවා නිදැල්ලේ හැසිරුණා. අන්න ඒ යුගය නැති කරන්න තමයි විශේෂයෙන්ම අපි මේ පනත් කෙටුම්පත ඉක්මන් කරලා - කඩි මුඩියේ - පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය කාලයේ සිදු වූ දේවල් ගැන අපි දන්නවා. ආයුධ සොයන්න කියලා සැකකරුවා අර ගෙන යනවා. මඟදී වෙඩි තියලා මරලා දමනවා. ඊට පසුව කියනවා, ඔහු පෙරළා වෙඩි තියන්න සැරසුණා කියලා. ඒ ගැන සාක්ෂි නැහැ. වින්දිතයන් අසරණයි. රජයට විවේචන එල්ල කරපු "The Sunday Leader" කතෘවරයා මහ දවල්, පාර මැද්දේ මරලා දැම්මා. කවුරුවත් ඒක දැක්කේ නැද්ද? දකින්න ඇති, හඳුනා ගන්නත් ඇති. නමුත් ජනතාව අසරණයි. මේ ගැන සාක්ෂි දෙන්න බය වුණා. වින්දිතයන් අසරණයි. ඒ සම්බන්ධයෙන් කටයුතු කර ගන්න හැකියාවක් නැහැ.

තමන්ගේ පාරිතෝෂික මුදල රජයට පවරා ගත්තා කියලා කෑ ගහපු රොෂේන් චානකට දෙනෝදහසක් මැද්දේ වෙඩි තැබුවා. ඒක කවුරුවත් දැක්කේ නැද්ද? සාක්ෂිකරුවන් නැහැ, ඔවුන් අසරණයි. ඒ වාගේම ධීවරයන්ට ඉන්ධන සහනාධාරය ලබා දෙන්න කියලා කෑ ගහපු හලාවත ඇන්තනිට වෙඩි තැබුවා. මේ නඩුවලට මොනවාද වුණේ? අන්න ඒ නිසා යහ පාලනය ස්ථාපිත කරන්න ඕනෑ. ආසන්නතම සිද්ධිය තමයි මගේ ගමේ සිදු වුණේ. රතුපස්වල ජනතාව බීමට වතුර ටිකක් ඉල්ලා කෑ ගැහුවා. ලැබුණු උත්තරය මොකක්ද? පොලීසිය, හමුදාව ඇතුළු දෙනෝදහසක් මැද්දේ වතුර ඉල්ලපු දරුවන්ට වෙඩි තියලා මරලා දැම්මා. මේ කණ්ඩායම ඉදිරිපිට පාසල් දරුවන් දෙදෙනෙක් මරලා දැම්මා. පල්ලිය ඇතුළට ගිහිල්ලා ඒ sistersලා, fathersලා කෑ ගහද්දී තුවක්කු butt එකෙන් ගහලා පුද්ගලයකුව මරලා දැම්මා. මේවාට සාක්ෂි නැත්තේ නැහැ. සාක්ෂි දෙන්න කවුරුවත් ඉදිරිපත් වන්නේ නැහැ. එහෙම සමාජයක් තමයි මේ රටේ තිබුණේ. එහෙම රටක තමයි මේ යහ පාලනය ඇති කරන්න ලැහැස්ති වන්නේ. වින්දිතයන් වෙනුවෙන් මේ නඩුව file කරන්න, දයාව දන්නා සමාජයෙන් - ගෙවල් ගාණේ ගිහිල්ලා; ගම් ගාණේ ගිහිල්ලා - අපි සාක්ෂි ඉල්ලුවා. සාක්ෂිකරුවන් ඉන්නවා නම් ඉදිරිපත් වෙන්න කියලා කිව්වා. කවුරුවත් ඉදිරිපත් වුණේ නැහැ. ඉදිරිපත් වන්න බිය වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රට තුළ අද යහ පාලනය ස්ථාපිත වුණත් ඒ නඩුව තවදුරටත් විභාග කරන්න අපට හැකියාවක් නැහැ. මේ අපරාධකරුවන්ට දඬුවම් දීම හරිම දුෂ්කර කාර්යයක් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මොකද, සියලුම සාක්ෂිකරුවන් නිහඬයි. සාක්ෂි සමඟම ඔවුන් මිය යනවා. සාක්ෂි පොළොව යටට යනවා. වින්දිතයන් නිහඬව ඒවා විඳ දරා ගෙන ඉන්නවා. ඒ යුගය, ඒ කාලය අවසන් කරන්න තමයි යහ පාලනය තුළ අපි අද මේ පනත් කෙටුම්පත සම්මත කරන්නේ කියන එක පැහැදිලි කරමින් මා නිහඬ වෙනවා, බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
The next speaker is the Hon. Chandrasiri Gajadeera. You have 10 minutes.

[අ.භා. 6.00]

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැදගත් පනත් කෙටුම්පතක් සභාගත කර තිබෙන මේ අවස්ථාවේ දී විශේෂයෙන්ම අධිකරණ ඇමතිතුමා හමුවේ ප්‍රායෝගික කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න

[ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා]

මේ සුළු කාලය යොදා ගන්නට උත්සාහ කරනවා. මේ පනත් කෙටුම්පත කාලීනව වැදගත් එකක්. මොකද, ඕනෑම සමාජයක යහ පැවැත්ම, සංස්කෘතික හරයන්, සමාජ සාධාරණත්වය ඉෂ්ට වෙන්න නම් නීතිය හා යුක්තිය බලගැන්විය යුතුයි කියලා අපි දන්නවා. නීතිය හා යුක්තිය බල ගැන්වෙන කොට, ඒ නීතිය ක්‍රියාත්මක වීමේ සම්ප්‍රදායය ශක්තිමත් වෙන්න ඕනෑ. ඒක සාධාරණ වෙන්න ඕනෑ. ඒ නිසා එවැනි අදහසකින් මේ පනත් කෙටුම්පත -

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

අනතුරුව ගරු පෙරුමාල් රාජදුරයි මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு பெருமாள் ராஜதுரை அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. PERUMAL RAJATHURAI *left the Chair, and* MR. DEPUTY SPEAKER *took the Chair.*

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

අපේ මහින්ද සමරසිංහ හිටපු ඇමතිතුමාත් කිව්වා වාගේ මේ පනත අපේ රජය කාලයේ කෙටුම්පත් කරලා අවස්ථා කිහිපයකදීම සභාගත කර සම්මත කර ගන්නට උත්සාහ කළා. නමුත් එදා විපක්ෂයේ ඉල්ලීම මත තමයි එක පැත්තකින් ඒ කටයුත්ත පමා වන්නට හේතු වුණේ. දැන් ඒකට කමක් නැහැ. අපි දෙගොල්ලන්ම එකතුව රටට වැදගත්, මේ රටේ යහ පැවැත්මට තුඩු දෙන, අපේ සමාජ සංස්කෘතික හරයන් ශක්තිමත් කරන ශීලාචාර නීති පද්ධතියක් හඳුන්වා දෙන්නට ඕනෑ.

යම් අපරාධයක් සම්බන්ධයෙන් එහි වින්දිතයා සහ සාක්ෂිකරු ආරක්ෂා කරන්නේ නැත්නම්, සාක්ෂිකරුවෙකුට සාධාරණ සාක්ෂියක් දෙන්න සමාජය ඉඩ තියන්නේ නැත්නම්, යුක්තිය විසඳන්නට බැහැ.

එම නිසා එහෙම අවස්ථාවකදී සාක්ෂිකරුට හිතට එකඟව යුක්තිගරුකව ඒ සිද්ධිය සම්බන්ධයෙන් තමන්ගේ සාක්ෂිය අධිකරණය හමුවේ හෝ කොමිසමක් හමුවේ ලබා දෙන්න ඉඩකඩ ලබා දීමට අපට පරම යුතුකමක් තිබෙනවා.

අනෙක් පැත්තෙන් බන්ධනාගාර තුළදීත් පුනරුත්ථාපන ක්‍රියාවලිය ශක්තිමත් කරන්න අපි අවධානය යොමු කළ බව ඇමතිතුමාට කියන්න කැමැතියි. යම් යම් සිද්ධීන් පිළිබඳ විවේචන තිබෙනවා. මම එවකට රජයේ පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ විෂය භාර අමාත්‍යවරයා හැටියට පුනරුත්ථාපන ක්‍රියාවලිය ශක්තිමත් කරන කොට ඒ වින්දිතයන් පිළිබඳවත් අපි අවධානය යොමු කළා. ඒ වින්දිතයන් සමාජ ක්‍රියාවලියට සම්බන්ධ කරන්න ආරම්භක වැයක් හැටියට පසු ගිය රජයත් රුපියල් මිලියන 20ක් ලබා දුන් බව මම ඔබතුමාට කියන්න කැමැතියි. මම එතැනදී වින්දිතයන් හැටියට කරුණු දෙකක් ගත්තා. එකක් තමයි ඒ අපරාධයට සෘජුව සම්බන්ධ වූ තැනැත්තා. තවත් කොටසක් තමයි මේ අපරාධයට සම්බන්ධ වූ රැඳවියාගේ පවුල. ඒ සියලු දෙනාටම සමාජයේ යහපත් ජීවන තත්ත්වයක් දිනා දෙන්න පුළුවන් වන විධියට ඒ අයගේ පුනරුත්ථාපන ක්‍රියාවලිය ශක්තිමත් කරන්න අපි කටයුතු කළා. උතුරුකරයේ අවි ගත්ත තරුණයන් සමාජගත කරන්න ගෙන ගිය නෛතික ක්‍රියාවලිය සහන ක්‍රියාවලියක් විධියට බන්ධනාගාර තුළට ගළපන්න අපි උත්සාහ කළා. ඒකට ක්‍රියාදාමයකුත් අපි ආරම්භ කළා. නමුත් අපිට ඒක ඉදිරියට ගෙන යන්න බැරි වුණා. මම ඔබතුමාට කියන්න කැමැතියි ඒ මුදලුත් ඔබතුමාගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සතුව ඇති කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මතක් කරන්න කැමැතියි, හුඟාක් වෙලාවට සෘජු සාක්ෂි දෙන්න බැරි හේතු තිබෙන බව. අපි මේක අත් දැකීමෙන් දන්නවා. ඔබතුමාත් නීතිඥවරයෙක් හැටියට ඒ ගැන දන්නවා. අද අපරාධවල ස්වභාවය වෙනස්. ඉස්සර වාගේ නොවෙයි. සමූල ඝාතන සිදු වන, අපේ වචනවලින් "පාතාල" කියලා කියන මහා අපරාධ සිදු වන, අපරාධ ගහනය වැඩි වුණ වකවානුවක් අද තිබෙන්නේ. මෙවැනි තත්ත්වයක් යටතේ අපරාධය කරපු තැනැත්තා හඳුනා ගන්න පෙරෙට්ටුවට එන එකත් නවත්වන්න අපරාධකරුවෙකුට පුළුවන්කම තිබුණා. මේ හුඟාක් ඒවා කරන්නේ බන්ධනාගාරය ඇතුළේ ඉඳගෙන දුරකථන ඇමතුම් මඟිනුයි. එහෙම අපරාධ ජාලයක් දැන් තිබෙනවා. ඉස්සර වාගේ නොවෙයි. ඇත්ත වශයෙන්ම ඒකට විවිධ සාධක තිබෙනවා. ඒ ගැන ලොකු විග්‍රහයකට අපි යන්න ඕනෑ නැහැ. යුක්තිය ඉෂ්ටවීමේදී හුඟාක් පැතිවලින් සාධාරණත්වය ඉටු නොවීම එක් කාරණයක්. පොලීසියට නඩු හදන්නත් පුළුවන්, නඩු නැති කරන්නත් පුළුවන්. සමහර වේලාවට දේශපාලනඥයින්ගේ බලපෑම්, සමහර වේලාවට බන්ධනාගාරය තුළ තිබෙන සමහර සිදුවීම් සහ බාහිර වශයෙන් අල්ලස හා ධනය යන මේ සියල්ල හමුවේ නඩු නැති මිනිහාට නඩුවක් හදන්නත් පුළුවන්, නඩුව තිබෙන මිනිහා ගෙදර යවන්නත් පුළුවන්. එහෙම තත්ත්වයක් යටතේ සෘජුව යම් අපරාධයක වින්දිතයකුට ඒ වෙනුවෙන් සාක්ෂියක් දෙන්න, ඒ වෙනුවෙන් පෙරෙට්ටුවකට ගිහින් කෙනෙක්ව හඳුනා දෙන්න තිබෙන ඉඩකඩ හුඟාක් වෙලාවට තාක්ෂණික විද්‍යුත් ක්‍රම මඟින් වෙනස් කරන්න පුළුවන්. අපරාධකරුවෙකුට කෙළින්ම ගිහිල්ලා මුහුණටම බලපෑම් කරන්න ඕනෑ නැහැ, උඹ මරණවා කියලා. අද දුරකථන ජාල මඟින් එහෙම අය බිය ගන්වන සමාජ ජාලයක් තිබෙනවා. සමහර අපරාධකරුවන් ඉන්නවා මිනීමැරුම් 10ක්, 12ක් කළත් එක නඩුවක්වත් ඔප්පු වෙන්නේ නැහැ. එහෙම සිදුවීම් තිබෙනවා. ඒක ඔබතුමාගේ අත් දැකීමෙනුත් දන්නවා. මම රජයේ පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ විෂයභාර අමාත්‍යවරයා හැටියට පැමිණි කාලයේ පැරණි සිදුවීම් විග්‍රහ කරලා බලපුවාම එහෙම අවස්ථා අපි දැක්කා. ඒ නිසා අපිට සිදු වෙලා තිබෙනවා මේ තාක්ෂණික ගලපා ගැනීම් හඳුනා ගන්න. බන්ධනාගාරය තුළදී විතරක් නොවෙයි, මේ සමාජය තුළත් සිදු වන මංකොල්ලකෑම්, එහෙම නැත්නම් වෙනත් අපරාධ මේ තාක්ෂණික උපකරණ මඟින් අපි හඳුනා ගෙන තිබෙනවා.

වින්දිතයන්ට රැකවරණය ලබා දීම, වින්දිතයන්ට සහනය සැලසීම, සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම ආදි වශයෙන් මේ පනත් කෙටුම්පතේ තිබෙන වැදගත් අංශවලට අමතරව, සාක්ෂි විකෘති කිරීම් වාගේ කරුණුවලටත් දණ්ඩන නියමයන් ලබා දෙන්න අවශ්‍ය වූ අංග මේ පනත් කෙටුම්පතෙහි ඇතුළත් වෙලා තිබෙනවා.

පසු ගිය කාලය ඇතුළත අපි හුඟක් උත්සාහ කළා, නව තාක්ෂණික මෙවලම් බන්ධනාගාර ජාලය තුළ සවි කරන්න. අපි ඒක කරන්න උත්සාහ කළේ ඇත්ත වශයෙන්ම ඒ තුළ සිදු වන බිය ගැන්වීම් වැනි දේවල් පාලනය කරන්නයි. සමහර වෙලාවට බන්ධනාගාරය තුළ වෙන්න පුළුවන්, වෙනත් තැනක වෙන්න පුළුවන්, වෙනත් ස්තරයක වෙන්න පුළුවන් මේ ගෙන යන මෙහෙයුම් තුළින් මිනිසුන්ව බිය ගන්වනවා. සමහර කෙනකුට පුළුවන්, දුරකතනයෙන් කෙනකු බිය ගන්වන්න. කඩයකට පැනලා මං කොල්ලකෑමක් හෝ වෙන අපරාධයක් කරනවා වාගේම අනෙක් පැත්තෙන් වෙනත් සමාජ සම්බන්ධතා මත

තමන්ට අවශ්‍ය මෙහෙයුම කරන්න පුළුවන්කම තිබෙනවා. සමහර වෙලාවට ඒවාට තිබෙන බිය නිසා සෘජුව සාක්ෂියක් දෙන්න එන්න අකැමැත්තක් දක්වනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
හොඳයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ අවසාන විනාඩියේදී මා ඔබතුමාට තවත් කාරණයක් මතක් කරන්න කැමැතියි. අපි වින්දිත පාර්ශ්වය ගැන අවධානය යොමු කිරීම ඉතාම වැදගත්. සමහර වෙලාවට ස්ත්‍රී දූෂණ වැනි දේවල්වලට ලක් වුණු අය අධිකරණයට ඇවිල්ලා විවෘතව සාක්ෂියක් දෙන්න දක්වන උනන්දුව බොහොම අඩුයි. තමන් ඒ මුහුණ දුන්නු අතවරය සඟවා ගෙන, "නඩු දැම්මේ නැති වුණත් කමක් නැහැ, මගේ ආත්ම ගරුත්වය ආරක්ෂා කර ගන්න ඕනෑ" යි කියන මානසික මට්ටම්වල ඒ අය ඉන්නවා. ඒ නිසා එවැනි දේවල් වෙනස් කරන්න මේ පනත් කෙටුම්පතට විධිවිධාන ඇතුළත් කර තිබෙනවා. එවැනි කරුණු සම්බන්ධයෙන් කරන විනිශ්චයන්වලදී කට උත්තර ලබා ගැනීමේ රහස්‍යභාවය ආරක්ෂා කිරීම වැනි කරුණු නඩුවක් ආරම්භ කළාට පස්සේ ඒ නඩුව අවසානය දක්වාම ගෙන යාමට හැකි විධිවිධාන අඩංගු කරලා තිබෙනවා. විශේෂයෙන්ම කාන්තාවක් අතවරයට ලක් වුණු අවස්ථාවකදී සාධාරණ විනිශ්චයක් ලබා දෙන්න විශේෂිත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සුදුසුයි කියලා යෝජනා කරනවා. මේ පනත් කෙටුම්පත මේ අවස්ථාවේ ඉදිරිපත් කරමින් අපේ රටේ යුක්තිය, සාධාරණත්වය, නීතිගරුකත්වය ගොඩ නඟන්න කැප වීම ගැන අපි ගරු ඇමතිතුමාට ගෞරව කරනවා. ඒ වාගේම කියන්න ඕනෑ නීතියේ ආධිපත්‍ය කියන්නේ නීතිඥවරුන්ගේ ආධිපත්‍ය නොවෙයි කියන එක. ඒ ගැනත් සැලකිල්ලක් දක්වන අතරේ සාධාරණ සමාජයක් හදන්න අවශ්‍ය මේ සියලු කරුණු කෙරෙහිත් සැලකිල්ලක් දක්වන්නය කියා ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තූතියි.

[பி.ப. 6.11]

ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා (නියෝජ්‍ය කාරක සභාපතිතුමා)
(மாண்புமிகு முருகேசு சந்திரகுமார் - குழுக்களின் பிரதித் தவிசாளர்)
(The Hon. Murugesu Chandrakumar - Deputy Chairman of Committees)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, மாண்புமிகு நீதி அமைச்சர் அவர்களினால் சமர்ப்பிக்கப்பட்ட குற்றச்செயல்களுக்குப் பலியாக்கப்பட்டோருக்கும் சாட்சிகளுக்குமான உதவி மற்றும் பாதுகாப்புச் சட்டமூலம் சம்பந்தமான விவாதத்திலே பேசுவதற்கு எனக்குச் சந்தர்ப்பம் கொடுத்தமைக்காக நான் உங்களுக்கு நன்றி தெரிவிக்கின்றேன். இங்கே நான் முக்கியமானதொரு விடயத்தைப்பற்றி, அதாவது நீண்ட காலமாக சிறைகளிலே தடுத்து வைக்கப்பட்டிருக்கும் தமிழ் அரசியல் கைதிகளின் விடுதலை தொடர்பாக, பேச விரும்புகின்றேன். சிறிய குற்றங்களுக்காக அல்லது சந்தேகத்தின்பேரில் கைதுசெய்யப்பட்ட தமிழ் இளைஞர்கள் நீண்டகாலமாகச் சிறைகளிலே வாடுகின்ற பரிதாப நிலைமையைப் பற்றியும் அவர்களது விடுதலை தொடர்பாகவும் நாங்கள் எல்லோரும் இந்தச் சபையிலே பல தடவைகள் வலியுறுத்தியிருக்கிறோம். ஆனால், இன்னமும் அது நிறைவேற்றப்படாமல் இழுத்தடிக்கப்பட்டு வரும் நிலைமையையே நாங்கள் பார்க்கின்றோம். கடந்த அரசின் ஆட்சிக்காலத்தில் தமிழ் அரசியல் கைதிகள் சிறைகளுக்குள் இருந்து பல்வேறு போராட்டங்களை நடத்தியிருக்கிறார்கள். அவர்களது அந்தப் போராட்டத்துக்கு நியாயம் வழங்குவதாக வாக்குறுதிகள் வழங்கப்பட்டிருந்தன. முன்னாள் நீதியமைச்சராக இருந்த, தற்போது இந்த அரசிலே அங்கம் வகிக்கின்ற அமைச்சர் அவர்கள்கூட இரண்டு வருடங்களுக்கு முன்பு, "விசேட நீதிமன்றங்களை உருவாக்கி, இவர்களது விசாரணைகள் துரிதப்படுத்தப்பட்டு விரைவாக விடுதலை செய்யப்படுவார்கள்" என்ற உத்தரவாதத்தை வழங்கியிருந்தார். ஆனால், அது இன்றுவரை நிறைவேற்றப்படவில்லை. இப்போதும் அவர்கள் அந்தச் சிறைகளிலே வாடுகின்றார்கள்.

சிறைகளிலே வாடும் தமிழ் இளைஞர்கள் - தமிழ் அரசியல் கைதிகள் மூன்று வகையாக இருக்கிறார்கள். ஒன்று, எதுவித விசாரணையுமின்றி நீண்டகாலம் தடுத்து வைக்கப்பட்டிருப்பவர்கள்; இரண்டாவது, நீண்டகாலமாக வழக்குகள் நடந்துகொண்டிருப்பவர்கள்; மூன்றாவது, சிறிய குற்றங்களுக்காகத் தண்டனை அனுபவித்துக்கொண்டிருப்பவர்கள். ஆனால், இந்தத் தண்டனையானது குற்ற ஒப்புதல் வாக்குமூலத்தின் அடிப்படையில் வழங்கப்பட்டது என்று இப்போது குறிப்பிடப்படுகின்றது. இது இப்பொழுது விமர்சனத்துக்குள்ளாக்கப்படும் நிலைமையை நாங்கள் காண்கின்றோம். குற்ற ஒப்புதல் வாக்குமூலம் எப்படிப் பெறப்பட்டது? என்ன மாதிரியாக அந்த அணுகுமுறை பின்பற்றப்பட்டது? என்பவை தொடர்பான பல விமர்சனங்களை இன்றும் பலருடைய பேச்சுக்களிலே அவதானித்தோம். ஆகவே, அந்த குற்ற ஒப்புதல் வாக்குமூலங்கள் சரியானதா? என்பதை மீளாய்வு செய்ய வேண்டுமென்று நான் வலியுறுத்துகின்றேன்.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
Hon. Deputy Speaker, can I just make a clarification with regard to what the Hon. Member said?

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Yes, Hon. (Dr.) Wijeyadasa Rajapakshe.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
Sir, there are about 182 suspects who have been taken into custody under the Prevention of Terrorism Act. They had been there for a long time. Now, we have appointed a committee to make an evaluation as to whether in fact there are evidences to prosecute them. After obtaining that report within two or three weeks, we may be able to make a decision very soon. With regard to the detainees against whom there are no material evidence, we will have to take steps to release them.

ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා
(மாண்புமிகு முருகேசு சந்திரகுமார்)
(The Hon. Murugesu Chandrakumar)
Thank you very much.

[ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා]

நீங்கள் இந்த விடயத்திலே துரிதமாக நடவடிக்கை எடுக்க முனைவதற்கு நான் உங்களுக்கு நன்றி தெரிவிக்கின்றேன். அண்மையில் ஜனாதிபதி அவர்களினால் பொது மன்னிப்பு என்ற அடிப்படையில் இந்த நாட்டின் முன்னாள் இராணுவத் தளபதி சரத் பொன்சேகா அவர்களுக்கு எதிராகச் சுமத்தப்பட்ட எல்லா குற்றச்சாட்டுக்களிலிருந்தும் அவர் விடுவிக்கப்பட்டார். அவரிடமிருந்து மீளப்பெறப்பட்ட பதவி நிலைகளெல்லாம் மீண்டும் வழங்கப்பட்டிருக்கின்றன. அதேபோல, பிரதம நீதியரசர் அவர்களுக்கும் அவருடைய பதவி நிலை மீண்டும் உறுதிப்படுத்தப்பட்டிருக்கின்றது. இந்த அணுகுமுறையை ஏன், எங்களது தமிழ் இளைஞர்கள்மீது காட்டக்கூடாது? என்பதை நான் இங்கே வலியுறுத்திக் கேட்கின்றேன். நாட்டின் ஜனாதிபதி அவர்கள் தனது அதிகாரத்தைப் பயன்படுத்தி இந்த விடயத்தில் ஒரு மனிதாபிமான அணுகுமுறையைப் பின்பற்ற முன்வர வேண்டும் என்பதையும் நான் இவ்வவையிலே வலியுறுத்துகின்றேன்.

அடுத்ததாக, கொலைகள் பற்றிய விடயம். கடந்த 30 ஆண்டுகளில் இந்த நாட்டிலே பல அரசியல் தலைவர்கள் கொலை செய்யப்பட்டிருக்கின்றார்கள். அந்த வகையில் மிகப் பிரபல்யமான தென்னிலங்கையின் தலைவர்கள் அதாவது ஜனாதிபதி மற்றும் அமைச்சர்கள் என்று பலர் கொல்லப் பட்டிருக்கின்றார்கள். அதுபோலவே தமிழ்த் தலைவர்களும் கொல்லப்பட்டிருக்கின்றார்கள். அதாவது தமிழர் விடுதலைக் கூட்டணியின் செயலாளர் நாயகமாகவிருந்த மூத்த தலைவர் அமிர்தலிங்கம், பாராளுமன்ற உறுப்பினர்களான ஜோசப் பரராஜசிங்கம், நடராஜா அற்புதராஜா, கிட்டிணன் சிவநேசன், என். ரவிராஜ், பீ. சந்திரநேரு, கே. தங்கத்துரை, சாம் தம்பிமுத்து ஆகியோர் உட்பட அகில இலங்கை தமிழ்க் காங்கிரஸ் கட்சிப் பொதுச் செயலாளர் குமார் பொன்னம்பலம் போன்ற பல முக்கிய அரசியல் பிரமுகர்களும் மகேஸ்வரி வேலாயுதம், பாலநடராஜ ஐயர், பத்திரிகையாளர்களான நிமலராஜன், சிவராம் போன்ற பலரும் கொல்லப் பட்டிருக்கின்றார்கள். ஆனால், இந்தக் கொலைகளுக்கு இதுவரை நியாயம் கிடைக்கவில்லை. அதாவது, குற்றவாளிகள் கண்டுபிடிக்கப்பட்டுத் தண்டிக்கப்படவில்லை. இவற்றுக்குரிய விசாரணைகளையும் மீள ஆரம்பிக்க வேண்டுமென்று நான் இந்த அவையிலே வலியுறுத்த விரும்புகின்றேன்.

இன்னொரு முக்கியமான விடயத்தை நான் சொல்ல வேண்டும். அதாவது, பாராளுமன்ற உறுப்பினராகவும் அமைச்சராகவும் இருந்த திரு. மகேஸ்வரன் அவர்களது கொலையில் நேரடியாகச் சம்பந்தப்பட்டவர், திரு. மகேஸ்வரன் அவர்களின் பாதுகாவலர்களால் சுடப்பட்டு வைத்திய சாலையில் சிகிச்சை பெறும்போது கைதுசெய்யப் பட்டார். இப்போது நீதிமன்றம் அவருக்குத் தண்டனை வழங்கியிருக்கின்றது. ஆனால், இந்தக் கொலைக்கான பழியை எமது கட்சியின்மீது சுமத்துகின்ற வகையில் அடிக்கடி பத்திரிகைகள், வானொலிகள், தொலைக்காட்சிகள் என்பவற்றின்மூலம் செய்திகள் வெளியிடப்படுவதோடு, பாராளுமன்றத்திலும் அவ்வாறு பேசப்படுகின்றது. ஒரு கொலைக் குற்றவாளிக்குத் தண்டனை வழங்கப்பட்ட பின்பு அது தொடர்பாக வேறொருவரை நோக்கி விரல் நீட்டிக் குற்றஞ்சாட்டுவது அந்த நீதிமன்றத்தை அவமதிப்பதாக இல்லையா? அல்லது அந்தக் கொலைக் குற்றவாளிமீது தண்டனை வழங்கப்பட்டது தவறு என்று சொல்லப் படுகின்றதா? அல்லது அது மீளாய்வு செய்யப்பட வேண்டுமா? இந்த விடயத்துக்குப் பதிலளிக்கப்பட வேண்டும். ஆகவே, இந்தக் கொலைக் குற்றம் தேவையில்லாமல் அரசியல் நோக்கத்துக்காக எம்மீது சுமத்தப்படுவதை நான் இந்த அவையிலே கண்டிக்கின்றேன். அதேநேரம் கொலைகள் நடந்திருக்கின்றன. அவ்வாறு எல்லா அரசியல் கொலைகளும் விசாரிக்கப்பட வேண்டும் என்று நாங்களும் சொல்கின்றோம் .

புலிகளுக்கும் அரசுக்கும் இடையிலே பேச்சுவார்த்தை நடைபெற்ற 2002 மற்றும் 2007ஆம் ஆண்டு காலப்பகுதியில் எமது கட்சியின் நூற்றுக்கணக்கான உறுப்பினர்கள் கொல்லப் பட்டிருக்கின்றார்கள். இந்தக் கொலைகளுக்கு இதுவரை நீதி கிடைக்கவில்லை. அந்த உறுப்பினர்களின் பிள்ளைகளும் அவர்களது மனைவிமாரும் இன்று மிகவும் துன்பத்தில் இருக்கின்றார்கள். இந்தக் கொலைகள் நியாயப்படுத்தப்படு கின்றனவா? அல்லது சம்பந்தப்பட்டவர்கள் அதனைக் கண்டும் காணாததுபோல் இருக்கின்றார்களா? என்பதை நான் இந்தச் சபையிலே கேட்க விரும்புகின்றேன்.

அடுத்ததாக, நீதி அமைச்சு தொடர்பாகவும் சில விடயங்களைச் சொல்ல வேண்டும். சந்தேகத்தின் பேரில் குற்றஞ்சாட்டப்பட்டு கைதுசெய்யப்படுபவர்கள் நீதிமன்றங் களில் நிறுத்தப்படும்போது அவர்களின் குற்றச்செயல்கள் எவ்வளவு பாரியதாக இருந்தாலும் அவர்கள் பிணையில் விடுவிக்கப்படும் நிகழ்வுகள் இன்று வடக்கிலே நடைபெறு கின்றன. இது மிகவும் -

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, please wind up.

ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා
(மாண்புமிகு முருகேசு சந்திரகுமார்)
(The Hon. Murugesu Chandrakumar)
Just give me two more minutes, Sir.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Please try to conclude within one minute.

ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා
(மாண்புமிகு முருகேசு சந்திரகுமார்)
(The Hon. Murugesu Chandrakumar)

அந்தச் சந்தேக நபர்களை உடனடியாகப் பிணையில் விடுவதற்கு என்ன காரணமென்று விசாரித்தபோது, அவர்களைச் சிறைகளிலே அடைப்பதற்கு அங்கு இடமில்லை யென்று கருத்துச் சொல்லப்படுகின்றது. இது பாதிக்கப்பட்ட வர்களுக்கு அச்சுறுத்தலாக இருக்கின்றது.

எனக்கு இங்கே பல விடயங்களைக் குறிப்பிடவேண்டி இருந்தாலும், நேரம் போதாததால் இன்னொரு முக்கியமான விடயத்தை மாத்திரம் கூறி, நான் முடித்துக்கொள்கின்றேன். கசிப்பு உற்பத்தி, மரக்கடத்தல், மணல் கடத்தல் மற்றும் பாலியல் துஷ்பிரயோகம் போன்ற குற்றச்செயல்களில் ஈடுபடுபவர்களைப் பாதுகாக்கின்ற அடிப்படையில் சட்டத் துறையில் தேறிய சட்டத்தரணிகள் செயற்படுகின்றனர். குற்றச்செயல்கள் புரிவோருக்கு இவர்கள் பக்கபலமாகவும் உறுதுணையாகவும் இருக்கின்ற துன்பகரமான நிலைமையை நாங்கள் காண்கின்றோம். சட்டத்தரணிகள் இந்தச் சமூகத்தில் முக்கியமானவர்கள். ஆகவே, குற்றச்செயல்களில் ஈடுபடுபவர் களைப் பாதுகாக்கும் நடைமுறையிலிருந்து இவர்கள் மாற வேண்டும். குற்றவாளிகளுக்குத் தண்டனை பெற்றுக் கொடுப்பதற்கே அவர்கள் தங்களது சட்ட அறிவைப்

பயன்படுத்த வேண்டும். அதைவிடுத்து, அவர்களுக்குப் பாதுகாப்பாக இருப்பது துரதிருஷ்டவசமானது. இது குற்றச் செயல்களில் ஈடுபடுபவர்களுக்கு உற்சாகத்தைக் கொடுப்பது போல அமையும். எப்படியாவது தமது சட்டத்தரணி களுக்கூடாக தங்களால் தப்பித்துக்கொள்ள முடியும் என்ற மனநிலையையும் இது உருவாக்கும். ஆகவே, இந்த விடயத்தில் சட்டத்தரணிகளுக்கென சட்ட அறிவுக்கொள்கையொன்று உருவாக்கப்பட வேண்டும். அவர்கள் தங்கள் வரையறைக் குள்ளிருந்து தங்களது சட்ட அறிவைப் பயன்படுத்திக் கொள்ளும் வகையில் பொறிமுறையொன்று உருவாக்கப்பட வேண்டும் என்பதை நான் இங்கு வலியுறுத்துகின்றேன்.

இறுதியாக ஒரு விடயம். அமாலி சதுரிகா என்ற சப்ரகமுவ பல்கலைக்கழக மாணவி பகிடிவதை காரணமாக மனமுடைந்து 16.02.2015ஆம் திகதி தற்கொலை செய்துகொண்டுள்ளார். இந்தப் பகிடிவதை என்பது தொடர்ச்சியாக நடைபெற்று வருகின்றது. ஆகவே, பகிடிவதை செய்பவர்களுக்குத் தண்டனை வழங்குவதை உறுதிப்படுத்தும் வகையில் சட்ட மூலமொன்றைக் கொண்டுவர வேண்டும் என்று கௌரவ நீதி மற்றும் தொழில் உறவுகள் அமைச்சர் அவர்களுக்கு தெரிவித்து, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Permission of this House is sought to extend time till the Business is concluded. Does the House agree?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
The next speaker is the Hon. Ajith P. Perera.

[අ.භා. 6.23]

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - வெளிநாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Ajith P. Perera - Deputy Minister of Foreign Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ යුක්තිය පසිඳලීමේ ඉතිහාසයේ ඓතිහාසික අවස්ථාවක් සනිටුහන් කරන මේ විවාදයේදී රජය වෙනුවෙන් අවසාන කථාව කිරීමට ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා.

මීට වසර 5කට පමණ කලින් මා මේ පාර්ලිමේන්තුවට පැමිණෙන්නටත් කලින් කටයුතු ආරම්භ කරලා එක් වරක් දෙ වන වර කියැවීමේ විවාදයට ගෙන අමතක කර දමා තිබුණු මෙම පනත් කෙටුම්පත නීතියක් ලෙස සම්මත කිරීම පිළිබඳව මගේ අවධානය යොමු වුණා. පාර්ලිමේන්තුවේ අධිකරණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේදී මම මේ ප්‍රශ්නය මතු කළා. ඒ වාගේම මේ පාර්ලිමේන්තුවේ මම කළ කථාවලදී මේ පනත ඉක්මනින්ම ගෙන ඒමේ අවශ්‍යතාව පිළිබඳව අවම වශයෙන් තුන් වතාවක්වත් මා සඳහන් කළා. මට මතකයි පසු ගිය අය වැය විවාදයේ දෙ වන වර කියැවීමේ විවාදය අවස්ථාවේදී මේ ගැන මා තරමක් ආවේගශීලීව කථා කරන විට ගරු යෝගරාජන් මන්ත්‍රීතුමා මට අවවාද කළා, මෙතරම් ආවේගශීලී වන්නට එපා, මේ තිබෙන පාලන ක්‍රමය තුළ මෙවැනි ප්‍රගතිශීලී පනතක් සම්මත කර ගැනීම කවදාවත් සිදු වන්නේ නැහැ, කවදා හෝ අපේ ආණ්ඩුවක් බලයට ආපු දවසකට තමයි මේක සම්මත කරගන්නට වන්නේ කියලා. හිතුවාටත් වඩා ඉක්මනින් -වසර දෙකකට කලින්- අපේ ආණ්ඩුවක් බලයට ආවා. ඒ ආණ්ඩුවේ ප්‍රමුඛම කාර්යයක් හැටියට මේ පනත් කෙටුම්පත සම්මත කර ගැනීමට ලැබීම එක්සත් ජාතික පක්ෂයේ පමණක් නොවෙයි, පක්ෂ පාට භේදයක් නැතුව මේ රටේ සියලු දෙනාගේම වාසනාවක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පනත පිළිබඳ මූලික අදහසේ සිට කෙටුම්පත් කිරීම සහ ඉතාම වේදනාකර සහ දුෂ්කර, කාලය ගත වන ක්‍රියාදාමයන් රාශියක් හරහා තමයි අද මේ තත්ත්වයට පත් වෙලා සම්මත වීම පිළිබඳ අවසාන අවස්ථාවට පත් වෙලා තිබෙන්නේ. මේක එක් අයෙකුගේ ක්‍රියාවක් නොවෙයි. මෙය විශාල පිරිසකගේ දායකත්වයෙන් සිදු වුණු ක්‍රියාවක්. එක අතකින් මේ සඳහා දායක වුණු නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවටත්, ඒ වාගේම නීතිපති දෙපාර්තමේන්තුවටත්, විශේෂයෙන්ම යසන්ත කෝදාගොඩ මහත්මයාට සහ සරත් ජයමාන්න මහත්මයාටත් අපගේ ස්තුතිය පිරිනමන්න අවශ්‍යයි. ඒ වාගේම මේ කාරණය සම්බන්ධව විශේෂයෙන්ම උනන්දු වෙලා කටයුතු කළ අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමිය ඇතුළු ඒ සියලුම නිලධාරින්ට අපගේ ස්තුතිය පිරිනමන්න අවශ්‍යයි. අමාත්‍යාංශයේ වර්තමාන නිලධාරින් පමණක් නොවෙයි, මේ කාර්යයේදී දිගටම මහන්සි වුණු තවත් විශාල පිරිසක් සිටියා. ඒ සියලු දෙනාටම ඒ ගෞරවය හිමි විය යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ පනත් කෙටුම්පතට සංශෝධන කිහිපයක් ඉදිරිපත් කරලා තිබෙනවා. විශේෂයෙන්ම ශ්‍රියානි විජේවික්‍රම මැතිනිය සහ තවත් ගරු මන්ත්‍රීතුමන්ලා කිහිප දෙනෙක් අවධානය යොමු කළා, "පෙනී සිටීමට ඇති අයිතිය" පිළිබඳව තිබෙන යෙදුම සම්බන්ධව. මේ පිළිබඳව මුල් පනත් කෙටුම්පතේ තිබෙන ව්‍යවහාරය, එනම් "නීති උපදේශකයකු මඟින් පෙනී සිටීමට" යන ව්‍යවහාරය දෝෂ සහගත නිසා අප සංශෝධනයක් ගෙනැවිත් තිබෙනවා, "නීතිඥවරයකු මඟින් පෙනී සිටීමට සහ එම විමර්ශන...." යනාදී වශයෙන්. ඉංග්‍රීසි භාෂාවෙන් මෙය සංශෝධනය වන්නේ "attorney-at-law" කියායි. මේ පිළිබඳව කිසිම සැකයක් ඇති කර ගත යුතු නැහැ. මෙයින් අදහස් වන්නේ, "ශ්‍රී ලංකාවේ වෘත්තියේ යෙදීමට බලය ඇති නීතිඥවරයකු" යන්නයි. ඉංග්‍රීසි භාෂාවෙන් "attorney-at-law" යන්න සිංහලයට පරිවර්තනය කළාම "නීතිඥ" යනුවෙන් අදහස් වෙනවා. "ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥ" යන යෙදුමෙහි ඇති "ශ්‍රේෂ්ඨාධිකරණයේ" යන කොටස භාවිතය තුළ යෙදෙන අලංකරණය පිළිබඳ කාරණයක් පමණයි. අපි මේ පිළිබඳව අවධානය යොමු කළා. ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මැතිතුමාගේ අවධානයත් ඒ පිළිබඳව යොමු වෙලා තිබෙන බව අපි දන්නවා.

1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 41වන වගන්තිය ප්‍රකාරව, "පෙනී සිටීමට ඇති අයිතිය" පිළිබඳව සඳහන් කරලා තිබෙනවා. එහි විස්තර කරන "attorney-at-law", නැත්නම් "නීතිඥ" යන අර්ථය තමයි මෙම පනතේ ඇති අර්ථය. ඒ නිසා මේ පනත මතු දිනක අර්ථ නිරූපණය කිරීමේදී, විදේශයක නීතිඥ වෘත්තිකයෙකු ලෙස සුදුසුකම් ලැබූ අයෙකුට, මෙම පනතේ පරිමාණය තුළ ශ්‍රී ලංකාව තුළදී පෙනී සිටීමට අයිතියක් නොමැති බව විශේෂයෙන්ම සඳහන් කර තැබීම වටිනවා. ඒ අනුව ඒ ප්‍රශ්නය මෙම සංශෝධනය මඟින් අවසන් වෙනවා. එයින් රටේ සාමාන්‍ය අධිකරණ පද්ධතියේ "නීතිඥ", නැත්නම් "Attorney-at-law" යන අර්ථයමයි ලැබෙන්නේ.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

මෙම විවාදය ඉතාම විශේෂ විවාදයක්. ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, මෙම විවාදය තුළදී වර්තමාන විපක්ෂයේ සිටින ගරු කටයුතු, දැනුම් තේරුම් ඇති මන්ත්‍රීතුමන්ලා කිහිප දෙනෙක්ම ජාතියෙන් සමාව ඉල්ලුවා. ජාතියෙන් සමාව ඉල්ලුවේ කුමකටද? මේ අගනා පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට මෙතරම් කාලයක් ප්‍රමාදවීම ගැනයි. සමාව ඉල්ලීම යහපත් ගුණයක්. එය වැදගත් දෙයක්. මොකද, සමහරුන්ට එපමණකවත් නිහතමානීභාවයක් නැහැ. නමුත්, එහි ඇති දේශපාලන අර්ථය තේරුම් ගත යුතුයි. මෙතරම් දීර්ඝ කාලයක්, මෙතරම් වැදගත් වූ මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිණිස අවශ්‍ය කරන ධෛර්යය - දේශපාලනික ධෛර්යය- සහ ප්‍රඥාව කලින් ආණ්ඩු කළ, දැන් විපක්ෂයේ සිටින එම ගරු මන්ත්‍රීතුමන්ලාට නොතිබුණා කියන එකයි මේකේ තිබෙන දේශපාලන පණිවුඩය. ඒ නිසා අනාගතයේ දවසකවත් එම ගරු මන්ත්‍රීතුමන්ලාට රාජ්‍ය පාලනය භාර දෙන්න සුදුසුද නැතිද කියන කාරණය ගැන මේ රටේ ජනතාව කල්පනා කර බලන්නට ඕනෑ.

ගරු මහින්ද සමරසිංහ හිටපු ඇමතිතුමා -මානව හිමිකම් භාරව හිටපු ඇමතිතුමා, විදේශ රාජ්‍ය තාන්ත්‍රික කාරණා පිළිබඳ දීර්ඝ කාලයක් යෙදුණු ඇමතිතුමා- මේ පනත් කෙටුම්පත සහ ජාත්‍යන්තර ප්‍රජාව ඉදිරියේ ශ්‍රී ලංකාවේ අභිමානය කෙළෙසුණු ආකාරය සහ දුෂ්කරතාවට පත් වූ ආකාරය විස්තර කළා. ඇත්ත වශයෙන්ම මේ පනත් කෙටුම්පත එක අතකින් මේ රටේ සියලු පුරවැසියන්ට -සිංහල, දෙමළ, මුස්ලිම් සියලු පුරවැසියන්ට- ජාතිය, ආගම, කුලය, ප්‍රදේශය වැනි භේදයක් නොමැතිව ඒ පුරවැසි හිමිකම තහවුරු කරන නීතියක්. මේක මානුෂික අවශ්‍යතාවක්; මනුෂ්‍ය අවශ්‍යතාවක්. සැම වේලාවේම අපරාධයකින් පීඩාවට පත් වෙන වින්දිතයා, ඒ වාගේම ඒ පිළිබඳව සාක්ෂි දීමට වගකීමකින් යුතුව ඉදිරිපත් වන සාක්ෂිකාරයා ඒ පුරවැසි වගකීම ඉෂ්ට කරන විට, එම සාක්ෂිකාරයා හෝ වින්දිතයා ආරක්ෂා කිරීමේ වගකීමක් සමාජයට පවතිනවා. ඒ වගකීම තමයි රජය ඉටු කරන්නට භාර ගන්නේ. ලෝකයේ පවතින දියුණු නීති ක්‍රමවලට ගැළපෙන පරිදි මේ නීතිය ගෙන එන්නේ ඒ කාරණය උදෙසායි. ඒ ගැන කිසි සැකයක් නැහැ. මේ ප්‍රශ්නය ජාත්‍යන්තරීකරණය වෙන්නේ, යුද්ධය හා සම්බන්ධ වින්දිතයන් පිළිබඳව මේ ප්‍රශ්න නිරාකරණය වෙද්දී, ශ්‍රී ලංකාව තුළ විශ්වාසවන්ත අධිකරණමය ක්‍රියාදාමයක් කිරීමට අවශ්‍ය කරන නීතිමය පරිසරය තිබෙනවාද කියන කාරණය ගැන ප්‍රශ්න කිරීමේදී, "මේ පනත් කෙටුම්පත ඇයි නැත්තේ, ඇයි ප්‍රමාද, ඇයි සම්මත කරන්නේ නැත්තේ?" කියන ප්‍රශ්නය මතු වීම නිසායි. එතැනදීයි ජාත්‍යන්තර අවධානය යොමු වුණේ. එහෙම නැතිව මේ පනත් කෙටුම්පත ද්‍රවිඩ ජනතාවගේ අයිතිවාසිකම් පිළිබඳව පමණක් සඳහන් එකක් නොවෙයි. ඇත්ත වශයෙන්ම එහෙම එකක් මේ පනත් කෙටුම්පතේ ඇත්තේම නැහැ. මෙය ශ්‍රී ලාංකික පුරවැසියන් සියලු දෙනාගේම අයිතිවාසිකම් ආරක්ෂා කරන පනතක්. ඒ නිසා, මේ දින සියයේ වැඩ පිළිවෙළ යටතේ වර්තමාන රජය යටතේ කරනු ලැබූ මේ ජයග්‍රහණය ගැන පක්ෂ, පාට භේදයක් නැතිව මේ රටේ පුරවැසියන් ආඩම්බර වෙන්නට ඕනෑ.

ගරු මහින්ද සමරසිංහ හිටපු ඇමතිතුමා වැදගත් කාරණයක් සඳහන් කළා. මේ පනත් කෙටුම්පත මෙම පාර්ලිමේන්තුවේම කලින් රජය පැවැති අවස්ථාවේ ඉදිරිපත් කරන්න සූදානම් වුණු වෙලාවේ, හිටපු අධිකරණ ඇමති ගරු රවුෆ් හකීම් ඇමතිතුමාට අමාත්‍ය මණ්ඩලය තුළ බැණුම් අසන්නට සහ හිරිහැරවලට ලක් වන්නට සිදු වුණා කියලා එතුමා කිව්වා. ඇත්ත වශයෙන්ම මේ කාරණය මම දැන ගෙන හිටියත්, ගරු රවුෆ් හකීම් මැතිතුමා පෞද්ගලිකව කියූ දෙයක් මම නොකිව යුතුයි කියලා මම හිතුවා. හැබැයි, දැන් ගරු මහින්ද සමරසිංහ මැතිතුමා මේ කාරණය කියූ නිසායි මම ඒ ගැන සඳහන් කළේ. ගරු රවුෆ් හකීම් මැතිතුමා ඉතාම ප්‍රඥාවන්තව, රට ගැන හිතලා, අනාගතය ගැන හිතලා, යුක්තිය ගැන හිතලා මේ පනත් කෙටුම්පත ඉක්මනින් ඉදිරිපත් කරන්න උත්සාහ කරන සෑම වේලාවකම, අමාත්‍ය මණ්ඩලය තුළ මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම වැළැක්වූවේ කවුද?

රවුෆ් හකීම් මැතිතුමාට ඒ අපහාස උපහාස අඩන්තේට්ටම් කළේ කවුද? එයාගේ නම මහින්ද රාජපක්ෂ. ඒ හිටපු ජනාධිපතිතුමා; සමහරු නැවත අගමැති කරන්න කථා කරන මහින්ද රාජපක්ෂ. එතුමා තමයි, මේ නීතියේ මූල ධර්ම, යහ පාලනය පිළිබඳ මූල ධර්ම, නීතියේ ආධිපත්‍ය පිළිබඳ මූල ධර්ම අරගෙන එන මේ වාගේ වැදගත් පනත් කෙටුම්පතක් මේ රටේ නීතිය බවට පත් වන එක වසර 10ක් තිස්සේ වැළැක්වූයේ. එතුමා නීතිඥවරයෙක්. පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හිටපු ඇමතිතුමා කිව්වා, නීතියේ පාලනය කරන්නේ නීතිඥවරු නොවෙයි කියලා. ඒක ඇත්ත. හැබැයි, නීතිඥවරයෙකු වූ හිටපු ජනාධිපතිවරයා මේ රටේ නීතියේ ආධිපත්‍ය පිළිබඳව, ඒ වැදගත් මූල ධර්ම පිළිබඳව අල්ප මාත්‍රයක්වත් සැලකුවේ නැහැ.

එක අතකින් මම මහින්ද රාජපක්ෂ මහත්මයාට විතරක් දොස් කියන්නේ නැහැ. අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන්ටත්, නීතිය දන්නා නීතිඥවරුන් හෝ නීතිඥවරුන් නොවන අයටත් ඒ ධෛර්යය තිබිය යුතුව තිබුණා. නමුත්, එහෙම තිබුණේ නැහැ. ඒ නිසා ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා, රනිල් වික්‍රමසිංහ මැතිතුමා, විජයදාස රාජපක්ෂ මැතිතුමා, සුජීව සේනසිංහ මැතිතුමා ඇතුළු මේ පනත් කෙටුම්පත් ගෙන ඒම සඳහා ඉදිරිපත් වුණු සියලු දෙනාට අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

විදේශ කටයුතු නියෝජ්‍ය ඇමතිවරයා විධියට මා දන්නවා මේ පනත් කෙටුම්පතේ ඇති වැදගත්කම කුමක්ද කියලා. මේ රට මුහුණ දී තිබෙන දැවැන්ත අභියෝග හමුවේ ශ්‍රී ලංකාව තුළ අපේ ප්‍රශ්න අපට විසඳා ගත හැකියි කියන පණිවුඩය, විශ්වාසවන්ත ශ්‍රී ලාංකික ක්‍රියාදාමයක් හමුවේ ඒවා විසඳා ගත හැකියි කියන පණිවුඩය ලෝකයට දෙද්දී, මෙම පනත් කෙටුම්පත සම්මත කර ගැනීම ඉතාම වැදගත් මූලික අවශ්‍යතාවක් වුණා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මේ පනත් කෙටුම්පත පමණක් නොවෙයි, දින සියයේ වැඩ පිළිවෙළ තුළ අප පොරොන්දු වුණු සියලුම පනත් කෙටුම්පත් එකක්වත් අඩු වන්නේ නැතිව ඒ දින සියයක කාලය තුළ ඉදිරිපත් කරලා, මේ රටේ පුරවැසියන්ට අහිමි වුණු, මේ රටේ පුරවැසියන්ට අහිමි කරන ලද අයිතිවාසිකම් සනාථ කරන්නට අපේ වර්තමාන රජය කටයුතු කරනවාය කියන කාරණය සඳහන් කරමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." -[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

தீர்மானிக்கப்பட்டது.
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ]

Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Wijeyadasa Rajapakshe]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் ஆராயப்பட்டது.
[பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered in Committee.
[MR. DEPUTY SPEAKER *in the Chair.*]

1 සහ 2 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

1ஆம், 2ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 1 and 2 ordered to stand part of the Bill.

3 වන වගන්තිය.- (අපරාධයක වින්දිතයන්ගේ අයිතිවාසිකම්.)

வாசகம் 3.- (குற்றச் செயல்களுக்குப் பலியாக்கப்பட்டோரின் உரிமைகள்.)

CLAUSE 3.- *(Rights of Victims of Crime)*

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "3 වන පිටුවේ, 5 වන සහ 6 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(අ) සමානව, සාධාරණව සහ එම වින්දිතයාගේ ගරුත්වයට සහ පෞද්ගලිකත්වයට ගෞරව වන සේ සලකවා ගනු ලැබීමට;'

(2) 23 වන පේළියේ සිට 36 වන පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න : -

' (ඊ) එම වින්දිතයා විසින් ඉල්ලීමක් කිරීමේ දී,

(i) අලාභ ලබා ගැනීම සඳහා ඇති සිවිල් ප්‍රතිකර්ම සහ ඊට අදාළ කාලාවරෝධ කාලසීමා ඇතුළුව, ඔහු විසින් විඳ ඇති යම් හිංසාවක් සඳහා සහන සලස්වා ගැනීමට පවතින නෛතික ප්‍රතිකර්ම පිළිබඳව අධිකාරිය මගින් හෝ කොට්ඨාසය මගින් දැනුවත් වීම සඳහා;

(ii) විමර්ශනය කරනු ලබන අදාළ පොලිස් ස්ථානාධිපති මගින් හෝ වෙනත් යම් අධිකාරියක් මගින් පැවැත්වෙන, කරගෙන යනු ලබන යම් විමර්ශනයකට අගතියක් නොමැතිව, එම අපරාධයක වින්දිතයා විසින් එකී පොලිස් ස්ථානය වෙත හෝ විමර්ශනය පවත්වනු ලබන වෙනත් යම් අධිකාරියක් වෙත ඉදිරිපත් කර ඇති පැමිණිල්ල සම්බන්ධයෙන් කර ගෙන යනු ලබන විමර්ශනයේ ප්‍රගතිය පිළිබඳ දැනුවත් වීම සඳහා;

(iii) අවස්ථාවෝචිත පරිදි, අදාළ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා හෝ විමර්ශනය පවත්වනු ලබන වෙනත් යම් අධිකාරියක්, නීතිපතිවරයා හෝ අධිකරණ රෙජිස්ට්‍රාර්වරයා මඟින් ලඝු නොවන පරීක්ෂණය, නඩු විභාගය, අභියාචනය සහ ප්‍රතිශෝධන ඉල්ලීම ඇතුළුව, අධිකාරිය මගින් වින්දිතයා විසින් පැමිණිලි කර සිටින වරදට අදාළ අධිකරණ කටයුතු විභාග කිරීම සඳහා නියම කර ඇති දින හා එම අධිකරණ කටයුතුවල ප්‍රගතිය සහ බැහැර කිරීම පිළිබඳව මෙන්ම එම නීති කෘත්‍යවලට අදාළව අපරාධයක වින්දිතයාගේ අයිතිවාසිකම් සහ හිමිකම් පිළිබඳව ද අධිකාරිය මගින් දැනුවත් වීම සඳහා;

(iv) අවස්ථාවෝචිත පරිදි, විමර්ශනය පවත්වනු ලබන අදාළ පොලිස් ස්ථානයේ ස්ථානාධිපති හෝ විමර්ශනය පවත්වනු ලබන වෙනත් යම් අධිකාරියක්, නීතිපතිවරයා, අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා හෝ බන්ධනාගාර අධිකාරි මඟින් පහත සඳහන් කරුණු සඳහා නියමකර ඇති දින පිළිබඳව එනම්:-

(අ) ඇප මත මුදා හැරීම සම්බන්ධයෙන්;

(ආ) සැකකරු නිදහස් කිරීම සම්බන්ධයෙන්;

(ඇ) වුදිතයාට එරෙහිව අපරාධ නඩු කටයුතු ගොනු කිරීම සම්බන්ධයෙන්;

(ඈ) සැකකරු හෝ වුදිතයා වරදකරු කිරීම, දණ්ඩන පැනවීම හෝ නිදොස් කොට නිදහස් කිරීම සම්බන්ධයෙන්; සහ

(ඉ) අපරාධයක වින්දිතයාට එරෙහිව වරදක් සිදු කර ඇති හෝ සිදු කර ඇති ලෙස සලකනු ලබන වැරදිකරු බන්ධනාගාරයෙන් මුදා හැරීම හා ඊට අදාළ හේතු සම්බන්ධයන්,

දැනුවත් වීම සඳහා; සහ

(v) අපරාධයක වින්දිතයාට සිදු වී ඇති යම් හානියක් සඳහා ප්‍රතිකාර හා උපස්ථාන ලබා ගැනීම සඳහා ඇති වෛද්‍ය, සමාජ සේවා සහ වෙනත් යම් සහායයක් පිළිබඳව අධිකාරිය මඟින් දැනුවත් වීම සඳහා;' "

(3) "4 වන පිටුවේ, 1 සිට 12 දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කරන්න";

(4) "25 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න :-

'නීතිඥවරයකු මඟින් පෙනී සිටීමට සහ එම විමර්ශන' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendments put, and agreed to.

3 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

3 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 3, as amended, ordered to stand part of the Bill.

4 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

4ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 4 ordered to stand part of the Bill.

5 වන වගන්තිය.- (සාක්ෂිකරුවන්ගේ හිමිකම්.)

வாசகம் 5.- (சாட்சிகளின் உரித்துடைமைகள்.)

CLAUSE 5.- (*Entitlements of witnesses.*)

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"8 වන පිටුවේ, 4 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න :-

'අධිකරණ බලධරයන්ගෙන්, එම සාක්ෂිකරුගේ ගෞරවයට සහ පුද්ගලිකත්වයට' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

5 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

5ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 5, as amended, ordered to stand part of the Bill.

6 සිට 19 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

6ஆம் வாசகத்திலிருந்து 19ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 6 to 19 ordered to stand part of the Bill.

20 වන වගන්තිය.- (වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක වැඩ සටහන්.)

வாசகம் 20.- (குற்றச் செயல்களுக்குப் பலியாக்கப்பட்டவர்களுக்கும் சாட்சிகளுக்கும் உதவியும் பாதுகாப்பும் அளிக்கும் நிகழ்ச்சித்திட்டம்.)

CLAUSE 20.- (*Victims of Crime and Witnesses Assistance and Protection programme.*)

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"29 වන පිටුවේ, 27 වන පේළියේ සිට 33 වන පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න :-

'වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක වැඩ සටහන්.	20. (1) ඇති විය හැකි හෝ පවතින තර්ජන, හානි, පළිගැනීම්, ප්‍රතිප්‍රහාරයන් සහ බියගැන්වීම්වලින් අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සහ ඔවුන්ට සහාය වීම සඳහා, කොට්ඨාසය විසින් අවශ්‍ය කාර්යක්ෂම පියවර ගැනීමට විධිවිධාන සලසන 'අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක වැඩසටහනක්' තත් කාර්යය සඳහා අධිකාරිය විසින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශවලට අනුකූලව සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු ය.' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

20 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

20 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 20, as amended, ordered to stand part of the Bill.

21 සිට 28 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

21 ஆம் வாசகத்திலிருந்து 28 ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 21 to 28 ordered to stand part of the Bill.

29 වන වගන්තිය.- (අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහයක සහ ආරක්ෂණ අරමුදල.)

வாசகம் 29.- (குற்றச் செயல்களுக்குப் பலியாக்கப்பட்டோரினதும் சாட்சிகளினதும் உதவி மற்றும் பாதுகாப்பு நிதியம்.)

CLAUSE 29.- (*Victims of Crime and Witnesses Assistance and Protection Fund.*)

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "41 වන පිටුවේ, 8 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න :-

'හැකි සියලු මුදල් ගෙවනු ලැබිය යුතු ය.;'"

(2) "12 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න : -

'ලැබිය හැකි සියලු මුදල් ගෙවනු ලැබිය යුතුය.;'"

(3) "15 වන පේළියේ සිට 16 වන පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න :-

'ප්‍රේෂණය කරනු ලබන සියලු මුදල් ගෙවනු ලැබිය යුතු ය.

එසේ වුවද, දඩ මුදලක ආකාරයෙන් අධිකරණයක් විසින් එකතු කරනු ලබන යම් මුදලක්, ආරක්ෂණ අරමුදලට ප්‍රේෂණය නොකළ යුතු ය.' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendments put, and agreed to.

29 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

29ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 29, as amended, ordered to stand part of the Bill.

30 සිට 43 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

30ஆம் வாசகத்திலிருந்து 43ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 30 to 43 ordered to stand part of the Bill.

44 වන වගන්තිය.- (නියෝග)

வாசகம் 44.- (ஒழுங்குவிதிகள்)

CLAUSE 44.- (*Regulations*)

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"50 වන පිටුවේ 18,19 20 සහ 21 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න :-

'නියෝග	44 (1) අමාත්‍යවරයා විසින්, අධිකාරියේ නිර්දේශය මත මේ පනතේ විධිවිධාන බලාත්මක කිරීම පිණිස, විධිවිධාන සැලසීම අවශ්‍ය විය හැකි යම් කාරණා සම්බන්ධයෙන් සහ නියම කර ඇති සියලු කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

44 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

44 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 44, as amended, ordered to stand part of the Bill.

45 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

45 ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டு மெனக் கட்டளையிடப்பட்டது.

Clause 45 ordered to stand part of the Bill.

46 වන වගන්තිය.- (අර්ථ නිරූපණය)
வாசகம் 46.- (பொருள் கோடல்)
CLAUSE 46.- (*Interpretation*)

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "52 වන පිටුවේ 3 සිට 10 දක්වා වූ ජේළි (ඒ ජේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න : -

' "අපරාධ චින්දිතයා" යන්නෙන්, ළමා චින්දිතයකු ඇතුළුව,

(අ) යම් නීතියක් යටතේ උද්දේශිත වරදක් සංයුක්ත වන්නා වූ; හෝ

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව හෝ 13(1) හෝ (2) වන ව්‍යවස්ථා යටතේ පුරක්ෂිත කොට ඇති මූලික අයිතිවාසිකමක්, උද්දේශිත උල්ලංඝනය කිරීමත් සංයුක්ත වන්නා වූ ද,

යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක ප්‍රතිඵලයක් ලෙස යම් කායික හෝ '

(2) 54 වන පිටුවේ 1, 2 සහ 3 වන ජේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න :-

'විශේෂඥ සාක්ෂිකරුවකු සහ උද්දේශිත වරදක් කරන ලද බවට හෝ උද්දේශිත මූලික අයිතිවාසිකමක් කඩ කිරීම හෝ මානව හිමිකමක් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් සැක කරන හෝ චෝදනා ලත් තැනැත්තකු වෙනුවෙන්' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

46 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

46ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 46, as amended, ordered to stand part of the Bill.

උප ලේඛනය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

அட்டவணை திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Schedule ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.

Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported with Amendments.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පනත් කෙටුම්පතේ සෝදුපත්වල මුද්‍රණ දෝෂ, අංක දෝෂ හෝ ඒ හා සමාන දෝෂ නිවැරදි කර ගැනීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත අවසර දෙන ලෙස ඉල්ලා සිටිමි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් සංශෝධිතාකාරයෙන් තුන්වන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

Question put, and agreed to.
Bill, as amended, accordingly read the Third time, and passed.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

එකල්හි වේලාව අ.භා. 06.30 පසු කර තිබුණෙන් නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.
පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 6.47ට 2015 පෙබරවාරි 20 වන සිකුරාදා අ.භා. 1.30 වන තෙක් කල් ගියේය.

அப்பொழுது நேரம் பி.ப. 6.30 மணிக்குப் பிந்திவிட்டமையால், பிரதிச் சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.
அதன்படி, பி. ப. 6.47 க்கு பாராளுமன்றம், 2015 பெப்ருவரி 20, வெள்ளிக்கிழமை பி.ப. 1.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

It being past 6.30 p.m., MR. DEPUTY SPEAKER *adjourned Parliament without Question put.*
Adjourned accordingly at 6.47 p.m. until 1.30 p.m. on Friday, 20th February, 2015.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

232 වන කාණ්ඩය - 11 වන කලාපය
தொகுதி 232 - இல. 11
Volume 232 - No. 11

2015 පෙබරවාරි 20 වන සිකුරාදා
2015 பெப்ருவரி 20, வெள்ளிக்கிழமை
Friday, 20th February, 2015

පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

විගණකාධිපතිවරයාගේ වාර්තාව

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
රාජ්‍ය සේවකයන්ට හා විශ්‍රාමිකයන්ට ලබා දෙන ප්‍රතිලාභ
සාගර ආරක්ෂක සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයන් මුහුණ පා ඇති ගැටලු

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේ වාර්තාව කල් දැමීම:
විදේශ කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය

වරප්‍රසාද:
දෙපානම කාර්යාලයට බලහත්කාරයෙන් ඇතුළුවීම

දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත:
දෙ වන වර හා තුන් වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

කල් තැබීමේ යෝජනාව:
ශ්‍රී ලංකාව තුළ සමාජ කටයුතුවල නිරත වීමේ අයිතිය

பிரதான உள்ளடக்கம்

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல் மூல வினா:
அரச ஊழியர்கள் மற்றும் ஓய்வூதியர்களுக்கான நன்மைகள்
கடல் பாதுகாப்புச் சேவையிலுள்ள இலங்கையர் எதிர்நோக்கும் பிரச்சினைகள்

ஐக்கிய நாடுகள் மனித உரிமைகள் பேரவையின் அறிக்கை ஒத்திவைப்பு :
வெளிநாட்டலுவல்கள் அமைச்சரினது கூற்று

சிறப்புரிமை :
தெபானம காரியாலயத்தினுள் அத்துமீறி நுழைந்தமை

புகையிலை மற்றும் மதுசாரம் மீதான தேசிய அதிகாரசபை (திருத்தம்) சட்டமூலம் :
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு, திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

ஒத்திவைப்புப் பிரேரணை:
இலங்கையில் சமூக நடவடிக்கைகளில் ஈடுபடுவதற்கான உரிமை

PRINCIPAL CONTENTS

AUDITOR-GENERAL'S REPORT

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Benefits for Government Servants and Pensioners
Problems faced by Sri Lankans in Maritime Security Service

POSTPONEMENT OF REPORT OF UNITED NATIONS HUMAN RIGHTS COUNCIL:
Statement by Minister of Foreign Affairs

PRIVILEGE:
Intrusion into office at Depanama

NATIONAL AUTHORITY ON TOBACCO AND ALCOHOL (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed as amended

ADJOURNMENT MOTION:
Right to engage in Social Activities in Sri Lanka

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2015 පෙබරවාරි 20 වන සිකුරාදා
2015 பெப்ருவரி 20, வெள்ளிக்கிழமை
Friday, 20th February, 2015

අ. භා. 1.30ට පාර්ලිමේන්තුව රැස් විය.
නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் பி.ப. 1.30 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகார் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.30 p.m.,
MR. DEPUTY SPEAKER
[THE HON. CHANDIMA WEERAKKODY] in the Chair.

විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාර 2011 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ XI වැනි කොටස; සහ 2012 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ VII වැනි කොටස, හතරවැනි කාණ්ඩයේ IX වැනි කොටස, පස්වැනි කාණ්ඩයේ IV සහ V වැනි කොටස් සහ හයවැනි කාණ්ඩයේ X, XI සහ XII වැනි කොටස් මම ඉදිරිපත් කරමි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Plantation Industries and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "එකී වාර්තාවේ එකී කොටස් මුද්‍රණය කළ යුතුය"යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

2012 වර්ෂය සඳහා ජනාධිපතිවරයාගේ අරමුදල පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව.- [මුදල් අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - வெகுசன ஊடக, பாராளுமன்ற அலுவல்கள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Mass Media and Parliamentary Affairs and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහා මාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2012 වර්ෂය සඳහා මාර්ග නඩත්තු භාර අරමුදලේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අදාළ උපදේශක කාරක සභාවට යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

2013 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7(2) වගන්තිය යටතේ අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2015 පෙබරවාරි 02 දිනැති අංක 1900/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය.- [අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු කරුපයියා වේලායුදම් මහතා (වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கருப்பையா வேலாயுதம் - பெருந்தோட்டக் கைத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Karuppaiah Velayudam - State Minister of Plantation Industries)

Hon. Deputy Speaker, I present the following petitions:

1. A petition from Mr. B.L.K.U. Priyankara of No. 987, 4th Lane, Hospital Road, New Town, Embilipitiya;
2. A petition from Mr. C.W.M.H.C. Chandrasekara of Marine Insurance Department, Sri Lanka Insurance Corporation Limited, No. 21, Vauxhall Street, Colombo 02;

[ගරු කරුපයියා වේලායුදම් මහතා]

3. A petition from Mr. H.A.P. Maddevithana of Kuda Mathugama, Pareigama;

4. A petition from Mr. K.L.J. Kumarasiri of Sri Lanka Insurance Corporation Limited, Avissawella Branch;

5. A petition from Mr. O.T.M.R.T.D. Bandara of No. 15 D, Mahinda Mawatha, Batugedara, Ratnapura;

6. A petition from Mr. R.P.K. Dissanayake of No. 03, Dematalanda, Wathuragama;

7. A petition from Mr. S.L. Perera of No. 06, Gajabapura Housing Complex, Kolonnawa;

8. A petition from Mr. W.E. Jayakody of No. 61/D, Kalalgoda, Pannipitiya;

9. A petition from Mrs. G.G.D. Dishanthi of No. 122/288, Samanalathenna, High Level Road, Watareka;

10. A petition from Mrs. K.V.I.P. Vithanage of No. 93, Pituwala Road, Elpitiya;

11. A petition from Mrs. Kanthi Chintha Gunarathne of No. 48, Nagahaella Road, Mawilmada;

12. A petition from Mrs. M.H.S. Pushpalatha of No. 170/2, Thalawathuhenpita North, Mahara, Kadawatha;

13. A petition from Mrs. N.L. Liyanage of No. 198A, Maimbula Nittambuwa;

14. A petition from Mrs. P.M.K. Hapuarachchi of No. 30/1, Maduwegedara, Nittambuwa; and

15. A petition from Mrs. R.M.C.P.K. Rajapaksha of No. 92/5, Green Ville Estate, Thekkalanda Road, Kundasale.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 1 - 4323/'13 - (2), ගරු බුද්ධික පතිරණ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

එක්සත් ජනපදයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ CRANFORD JOHNSON ROBINSON WOODS සමාගම: ගනුදෙනු
அமெரிக்க இலங்கை தூதரகம் மற்றும் CRANFORD JOHNSON ROBINSON WOODS கம்பனி : கொடுக்கல் வாங்கல்
SRI LANKAN EMBASSY IN US AND CRANFORD JOHNSON ROBINSON WOODS COMPANY : TRANSACTIONS

4468/'13

2. ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) 2010, 2011 හා 2012 යන වර්ෂවලදී එක්සත් ජනපදයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය Cranford Johnson Robinson Woods නමැති සමාගම සමඟ ගනු දෙනු කර තිබේද;

(ii) එසේ නම්, එම ගනු දෙනු සිදුවී ඇති දින වකවානු කවරේද;

(iii) එම ගනු දෙනු තුළින් ඉටු කර ගෙන ඇති කාර්යය හෝ කාර්යයන් කවරේද;

(iv) එමඟින් ලැබී ඇති ප්‍රයෝජන කවරේද;

(v) එම කටයුතු වෙනුවෙන් කරන ලද ගෙවීම්වල වටිනාකම කොපමණද;

(vi) ඒ සඳහා මුදල් වෙන් කරනු ලැබූ වැය ශීර්ෂය කවරේද;

(vii) එම සමාගම සමඟ ගිවිසුම්වලට එළැඹ ඇත්නම්, එම ගිවිසුම් සහාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010, 2011 மற்றும் 2012ஆம் ஆண்டுகளில் ஐக்கிய அமெரிக்காவின் இலங்கை தூதரகம் Cranford Johnson Robinson Woods எனும் கம்பனியுடன் கொடுக்கல்வாங்கல் மேற்கொண் டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி கொடுக்கல்வாங்கல் இடம்பெற்றுள்ள காலப்பகுதி யாதென்பதையும்;

(iii) மேற்படி கொடுக்கல்வாங்கல் மூலமாக நிறைவேற்றப்பட்டுள்ள பணி அல்லது பணிகள் யாவையென்பதையும்;

(iv) அதன்மூலம் கிடைத்துள்ள நன்மைகள் யாவையென்பதையும்;

(v) மேற்படி பணிகளுக்காக மேற்கொள்ளப்பட்டுள்ள கொடுப்பனவுகளின் பெறுமதி யாதென்பதையும்;

(vi) அதற்காக நிதி ஒதுக்கப்பட்ட செலவுத் தலைப்பு யாதென்பதையும்;

(vii) மேற்படி கம்பனிகளுடன் உடன்படிக்கைகள் கைச்சாத்திடப்பட்டிருப்பின், அவ்வுடன்படிக்கைகளைச் சபையில் சமர்ப்பிப்பாரா என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs:

(a) Will he inform this House -

(i) whether the Sri Lankan Embassy in the United States had transactions with the company named Cranford Johnson Robinson Woods in the years 2010, 2011 and 2012;

(ii) if so, the period during which such transactions have taken place;

(iii) the task or tasks accomplished through such transactions;

(iv) the benefits derived from them;

(v) the value of the payments made for the said transactions;

(vi) the expenditure head under which funds were allocated for this purpose; and

(vii) if agreements have been entered into with that company, whether such agreements will be tabled?

(b) If not, why?

ගරු මංගල සමරවීර මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு மங்கள சமரவீர - வெளிநாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. Mangala Samaraweera - Minister of Foreign Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ) (i) ඔව්, 2010 වසරේදී ගනු දෙනු කර තිබේ.

(ii) 2010 පමණි.

(iii) Cranford Johnson Robinson Woods සමාගමට අනුව, ඔවුහු ශ්‍රී ලංකාව වෙනුවෙන් මාධ්‍ය කටයුතු සිදු කර තිබේ.

(iv) Cranford Johnson Robinson Woods සමාගමට අනුව ඔවුහු එක්සත් ජනපදයේ පුවත් පත් සමඟ ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය වැඩි දියුණු කිරීමේ ව්‍යාපාරයක් දියත් කර තිබේ.

නමුත් ඇත්තවශයෙන්ම කිව්වොත්, මෙවැනි කාර්යභාරයක් කරන්න තානාපති කාර්යාලයේ සුදුසුකම්, පහසුකම් තිබියදී තමයි මේ සමාගමට මේ කටයුත්ත භාර දීලා තිබෙන්නේ.

(v) ශ්‍රී ලංකා රුපියල් 5,172,750.00 යි. (පණස්එක් ලක්ෂ හැත්තෑදෙදහස් හත්සියපණහක්)

(vi) 112-02-03-1405(04) යන වැය ශීර්ෂය යටතේ.

(vii) ඇමෙරිකා එක්සත් ජනපදයේ වොෂිංටන්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමඟ එවැනි කිසිම ගිවිසුමකට එළැඹ නැත.

ගිවිසුමක් අත්සන් නොකර මෙම ගෙවීම කර තිබෙන බව තමයි අපට පෙනෙන්නේ.

(ආ) Cranford Johnson Robinson Woods වෙළෙඳ සමාගම විසින් දූත මණ්ඩලය වෙත යෝජනාවක් යවන ලද අතර, එය පදනම් කර ගෙන අත්තිකාරම් ගෙවීමක් සිදු කර ඇත.

එම නිසා ඔබතුමා අහපු ප්‍රශ්නය නිසා මටත් ප්‍රශ්න කිහිපයක් ම පැන නැඟී තිබෙනවා.

විශේෂයෙන්ම කිසිම ගිවිසුමක් නැතිව මෙවැනි ආයතනයකට මේ මුදල ගෙවීවේ කොහොමද කියන එක ප්‍රශ්නයක්. ඒ නිසා ඒ ප්‍රශ්නය සම්බන්ධයෙන් පරීක්ෂා කරලා හැකි තාක් ඉක්මනින් තවත් වාර්තාවක් ලබා දෙන්න කියලා මම අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කරලා තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

බොහොම ස්තූතියි ගරු ඇමතිතුමනි. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මෙම ඇමෙරිකානු සමාගම විශේෂයෙන්ම එක්සත් ජනපදය තුළ ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය නැංවීමේ මාධ්‍ය කටයුතු වෙනුවෙන් මැදිහත් වුණා කියලා තමයි ඔබතුමා පවසන්නේ. ඒ වෙනුවෙන් තමයි ශ්‍රී ලංකා මුදලින් රුපියල් ලක්ෂ 51කට අධික මුදලක් වැය කරලා තිබෙන්නේ. ඔබතුමා ලබා දෙන්නේ, "අපි මාධ්‍ය කටයුතු කළා, අපි මේ ජාතියේ ඒවා කළා" කියලා එම සමාගම විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු. ඇත්තටම විදේශ කටයුතු අමාත්‍යාංශය සතුව ඒ සම්බන්ධව තිබෙන තොරතුරු මොනවාද? ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය නැංවීමේ මාධ්‍ය කටයුතු වෙනුවෙන් අපේ තානාපති කාර්යාලවලට අමතරව ඇමෙරිකාවේ සමාගම් මිල දී ගන්නේ මොකටද කියලා මා දන්නේ නැහැ. ඇමෙරිකාවට තඩිබාන්න කථා කරන ආණ්ඩුවක් හිටියේ. දේශප්‍රේමිත්වය පිළිබඳ සළු පිළි පොරවා ගත් ආණ්ඩුවක් හිටියේ. ඒ ආණ්ඩුව ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය නැංවීම වෙනුවෙන් ඇමෙරිකාවේ සමාගම් මිල දී ගෙන තිබෙනවා. එතකොට, එම ආයතනය කරන ලද කාර්ය භාරය මොනවාද කියලා විදේශ කටයුතු අමාත්‍යාංශයට කියන්න තිබෙන්නේ කවරක්ද?

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

ඇත්ත වශයෙන්ම ගරු මන්ත්‍රීතුමනි, විදේශ කටයුතු අමාත්‍යාංශයට තිබෙන තොරතුරු මෙපමණයි. නමුත් දැනට මට ලැබී තිබෙන තොරතුරු අනුව, මේ තීන්දුව අරගෙන තිබෙන්නේ ඇමෙරිකා එක්සත් ජනපදයේ තානාපති ජාලිය වික්‍රමසූරිය මහතා නිර්දේශ කරලා, 2008 දෙසැම්බර් 19 වැනි දා ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මහතාට ලියපු ලිපියක් අනුවයි. ඒ ලියුමට අමතරව වෙන කිසිම ගිවිසුමක් හෝ තොරතුරක් අපට තවමත් ලබා ගන්නට බැරි වෙලා තිබෙනවා. ඒ නිසා විදේශ කටයුතු අමාත්‍යාංශය පැත්තෙනුත් යම් වරදක් සිදු වෙලා තිබෙන බව පෙනෙනවා. ගිවිසුමක් නැතිව, එවැනි පරීක්ෂාවක් නොකර මෙවැනි සමාගමකට මේ මුදල කාගේ බලපෑම උඩ ගෙව්වාද කියන එක අපටත් ප්‍රශ්නයක්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. අපි හිතාගෙන හිටියේ ටෙන්ඩර් නැතිව තමන්ගේ හිතවතුන්ට විවිධ ව්‍යාපෘති ප්‍රදානය කිරීම, විවිධ රාජ්‍ය මුදල් ප්‍රදානය කිරීම, විවිධ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම ලංකාව තුළ විතරයි සිද්ධ වෙලා තිබෙන්නේ කියලා. දැන් බලන කොට ඇමෙරිකා එක්සත් ජනපදයේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේත් ඒ ආකාරයෙන්ම කටයුතු කරලා තිබෙනවා. කිසිදු ගිවිසුමක් නැතිව, කිසිදු එකඟතාවක් නැතිව, විශේෂයෙන් එම සමාගම විසින් කරන ලද ඉල්ලීමකට අනුව ඒ විධියේ කටයුතු කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක් එක් සමාගම්වලට පුළුවන්ද, "මට මේක කරලා දෙන්න. මට මේක දෙන්න. මම මේ වැඩ කොටස කරන්නම්" කියලා ඉල්ලන්න? ශ්‍රී ලංකා රජය තමයි තීරණය කරන්න ඕනෑ, "අපට මෙහෙම අවශ්‍යතාවක් තිබෙනවා, ඒ අවශ්‍යතාව වෙනුවෙන් ඒ සමාගම් කැඳවන්න ඕනෑ"ය කියලා. එතකොට විදේශ කටයුතු අමාත්‍යාංශය මෙවැනි අවශ්‍යතාවක් තිබුණු බව හඳුනා ගෙන තිබෙනවා ද? විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් මෙම සමාගම තෝරා ගැනීම සඳහා යම් ඉල්ලුම් පත්‍ර කැඳවීමක් කර තිබේ ද?

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

අපට ලැබිලා තිබෙන තොරතුරු අනුව කිසිම ඉල්ලුම් පත්‍ර කැඳවීමක් හෝ මැදිහත් වීමක් විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් වෙලා නැහැ. ඇත්ත වශයෙන්ම කියන්න කනගාටුයි. දැන් අපට ලැබී තිබෙන තොරතුරු අනුව වාගේම ඔබතුමා කියන ආකාරයට පසු ගිය කාලය තුළ බොහෝ විදේශ තානාපති කාර්යාල ඒ ඒ තානාපතිවරුන්ගේ ව්‍යාපාරික මධ්‍යස්ථාන බවට පරිවර්තනය වෙලා තිබෙනවා. ඒ අය ඒ අයගේ බිස්නස් කර ගෙන ගියා. ඒ විතරක් නොවෙයි. අපට පුළුවන් පරීක්ෂා කරලා තවත් මේ තොරතුරු ඉක්මනට ලබා දෙන්න.

ලෝකයේ තවත් ඉතා වැදගත් රටක තානාපති කාර්යාලයක තානාපතිවරයෙක් තමන්ගේ තානාපති කාර්යාලයේ ඉඳ ගෙන ඒ රටේ වෙනත් කණ්ඩායම්වලට අවි ආයුධ සැපයීම සම්බන්ධයෙන් තොරතුරු අද ලැබී තිබෙනවා. ඒ නිසා ඔබතුමා කිව්වා වාගේ මේ කැලෑ පාලනය ලංකාවේ භූමියට පමණක් සීමා වෙලා තිබුණේ නැහැ. පිට රටවල තිබුණු අපේ තානාපති කාර්යාලවලත් මේ කැලෑ නීතිය ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක වී තිබෙනවා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் கொள்கை உருவாக்கம், பொருளாதார அலுவல்கள், சிறுவர், இளைஞர் மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremasinghe - Prime Minister, Minister of Policy Planning, Economic Affairs, Child, Youth and Cultural Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදේශ කටයුතු අමාත්‍යාංශය, අතුරුදහන් වූ පුද්ගලයන් අතරේයි තිබුණේ. මේ අවුරුද්දේ ජනවාරි 12 වැනි දා විතර තමයි අපි මේක ආපහු සොයා ගත්තේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මේ පිළිබඳව තවත් ප්‍රශ්න ගණනාවක් මා ඉදිරියටත් යොමු කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි. ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය නැංවීමට යයි කියමින් ඇමෙරිකා එක්සත් ජනපදයෙන් hire කරන ලද -ඒ කියන්නේ සහාය ගන්නා ලද- එකම සමාගම මේකද, තවත් සමාගම් ගණනාවක් තිබේද කියා ගරු ඇමතිතුමාගෙන් දැනගන්න කැමැතියි.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

මා දන්නා හැටියට තවත් කිහිපයක් තිබෙනවා. අපේ නියෝජ්‍ය ඇමතිතුමා, ඊයේත් ඔබතුමාගේම ප්‍රශ්නයකට, මේ වාගේම තවත් සමාගමකට ලබා දුන් මුදල් පහසුකම් සම්බන්ධයෙන් ප්‍රශ්නයකට, පිළිතුරක් ලබා දුන්නා. අපට ලැබී තිබෙන තොරතුරු අනුව මෙවැනි සමාගම් කිහිපයක්ම -සමාගම් 5ක්, 6ක් පමණ තිබෙනවා. ඒ ගණන ස්ථිර වශයෙන්ම මට තවම කියන්න බැහැ. Patton Boggs ආදී සමාගම් තිබෙනවා. - මෙහිදීත්, මහා බ්‍රිතාන්‍යයේදීත් මේ සමාගම් පාවිච්චි කර තිබෙනවාය කියන එකයි අපට ආරංචි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ප්‍රශ්න අංක 6 - 5420/' 14 - (2), ගරු අජිත් කුමාර මහතා.

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වාරිමාර්ග හා කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය: විස්තර
தேங்காய்சார் உற்பத்திகளின் ஏற்றுமதி : விபரம்
EXPORT OF COCONUT-BASED PRODUCTS : DETAILS

4405/'13

8. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) 2013 වර්ෂයේ ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාල සීමාව තුළදී ශ්‍රී ලංකාවේ ගෘහස්ථ පොල් පරිභෝජනය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම කාල සීමාව තුළදී අපනයනය හා ආනයනය කරන ලද පොල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරනු ලබන අපනයනය ඉලක්ක කර ගත් පොල් ආශ්‍රිත නිෂ්පාදනයන් කවරේද;

(iii) එම එක් එක් නිෂ්පාදනයන්ගෙන් වාර්ෂිකව අපනයනය කරනු ලබන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) ඉහත (අ) හි සඳහන් කාල සීමාව තුළදී පොල් වතුර අපනයනය කර තිබේද;

(ii) එසේ නම්, එම පොල් වතුර අපනයනය කර ඇත්තේ පොල් වතුර ස්වරූපයෙන්ද; නැතහොත්, පොල් වතුර ආශ්‍රිත නිෂ්පාදනයන් වශයෙන්ද;

(iii) පොල් වතුර හෝ ඒ ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කළ රටවල් කවරේද;

(iv) එම අපනයනයන්ගේ ප්‍රමාණය කොපමණද;

(v) පොල් වතුර හෝ ඒ ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීම තුළින් ලැබූ මුළු ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ශ්‍රී ලංකාව තුළ පොල් නිෂ්පාදනය ආරම්භ කරන්නෙකු සඳහා රජය මඟින් ලබා දිය හැකි සහන කවරේද;

(ii) එම සහන ලබා ගැනීම සඳහා නිෂ්පාදකයෙකු විසින් අනුගමනය කළ යුතු ක්‍රමවේදය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නො එසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்டக் கைத்தொழில்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2013ஆம் ஆண்டில் சனவரி தொடக்கம் ஒக்ரோபர் வரையான காலப்பகுதியில் இலங்கையில் மனைசார்ந்த தேங்காய் நுகர்வு எவ்வளவு என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) குறித்த காலப்பகுதியில் ஏற்றுமதி மற்றும் இறக்குமதி செய்யப்பட்ட தேங்காய்களின் அளவு வெவ்வேறாக யாதென்பதையும்;

(ii) இலங்கையில் உற்பத்தி செய்யப்படும் ஏற்றுமதியை இலக்காகக் கொண்ட தேங்காய் சார்ந்த உற்பத்திகள் யாவை என்பதையும்;

(iii) அவ்வாறான ஒவ்வோர் உற்பத்தியிலிருந்தும் வருடாந்தம் ஏற்றுமதி செய்யப்படும் அளவு வெவ்வேறாக எவ்வளவென்பதையும்

அவர் இச்சபையில் சமர்ப்பிப்பாரா?

(இ) (i) மேற்படி (அ) இல் குறிப்பிடப்பட்டுள்ள காலப்பகுதியில் தேங்காய்த் தண்ணீர் ஏற்றுமதி செய்யப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி தேங்காய்த் தண்ணீர் ஏற்றுமதி செய்யப்பட்டுள்ளது தேங்காய்த் தண்ணீரின் வடிவத்திலா இன்றேல் தேங்காய் தண்ணீர் சார்ந்த உற்பத்தியாகவா என்பதையும்;

(iii) தேங்காய்த் தண்ணீர் அல்லது அதுசார்ந்த உற்பத்திகள் ஏற்றுமதி செய்யப்பட்ட நாடுகள் யாவை என்பதையும்;

(iv) அந்த ஏற்றுமதிகளின் அளவு யாதென்பதையும்;

(v) தேங்காய்த் தண்ணீர் அல்லது அதுசார்ந்த உற்பத்திகளை ஏற்றுமதி செய்ததன்மூலம் பெறப்பட்ட மொத்த வருமானம் யாதென்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஈ) (i) இலங்கையில் தேங்காய் உற்பத்தியை ஆரம்பிக்கும் ஒருவருக்கு அரசாங்கத்தால் வழங்க முடியுமான நிவாரணங்கள் யாவை என்பதையும்;

(ii) இந்த நிவாரணங்களைப் பெற்றுக்கொள் வதற்காக உற்பத்தியாளர் ஒருவர் கடைப்பிடிக்க வேண்டிய முறைமை யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(உ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation Industries:

(a) Will he state the domestic coconut consumption during the period from January to October in the year 2013?

(b) Will he table-

(i) the quantity of coconuts that was exported and imported during the aforesaid period of time, separately;

(ii) the export-oriented coconut-based products manufactured in Sri Lanka; and

(iii) the quantity of each of those products exported each year, separately?

(c) Will he inform this House-

(i) whether coconut water was exported during the period of time mentioned in (a);

(ii) if so, whether the aforesaid coconut water was exported in the form of coconut water or as coconut water-based products;

(iii) the countries to which coconut water or coconut water-based products were exported;

(iv) the quantity of the aforesaid exports; and

(v) the total income received from the export of coconut water or coconut water-based products?

(d) Will he also state -

(i) the concessions that the Government can grant to a person who commences coconut production in Sri Lanka; and

(ii) the methodology that should be adopted by a producer to obtain those concessions?

(e) If not, why?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) ගෙඩි මිලියන 1,522යි. (එක්දහස් පන්සිය විසිදෙකයි)

(ආ) (i) අපනයනය - පොල් ගෙඩි 17,951,000කි. (මිලියන දාහතයි දශම නවයයි පහයි එක)

පොල් ආනයනය කිරීමක් සිදුකර නොමැත.

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

(ii)

පොල් මද ආශ්‍රිත නිෂ්පාදන	පොල් තෙල්, නැවුම් පොල් තෙල්, දිසිඳි පොල්, කොප්පරා, ගෙඩි පොල්, බීජ පොල්, තැඹිලි, පුන්නක්කු, පොල් ක්‍රීම්, පොල් කිරි පිටි, මේදය ඉවත් කළ පොල්, පොල් අරක්කු, විනාකිරි හා ෆැට් ඇසිඩ්.
පොල් කටු ආශ්‍රිත නිෂ්පාදන	පොල් කටු අඟුරු, සක්‍රිය කාබන් සහ පොල් කටු පිටි
කොහු ආශ්‍රිත අමුද්‍රව්‍ය නිෂ්පාදන	ගුදිරි කොහු, බ්‍රිස්ටල් කොහු, දඟර කොහු
කොහු ආශ්‍රිත නිමි භාණ්ඩ	කොහු ලනු, කොහු කඹ, තවාෂි බුරුසු, රබර් මිශ්‍රිත කොහු හා බුරුසු, කොහු කළාල, කොහු පාපිසි, කොහුබත්, පොල් ලෙලි කැබලි, මිහිසළු, උද්‍යාන වගා ආශ්‍රිත නිෂ්පාදන
අනෙකුත් නිෂ්පාදන	පොල් ඉරටු, පොල් ලී ආශ්‍රිත නිෂ්පාදන

(iii)

අනු අංකය	භාණ්ඩ වර්ගය	ප්‍රමාණය (මෙ.ටො)
01	පොල් තෙල්	1720 (එක්දහස් හත්සියවිස්ස)
02	නැවුම් පොල් තෙල්	2101 (දෙදහස් එකසිය එක)
03	දිසිඳි පොල්	28202 (විසිඅටදහස් දෙසීය දෙක)
04	කොප්පරා	71 (හැත්තෑ එක)
05	ගෙඩි පොල්	21456 (විසිඑක්දහස් හාරසිය පනස්හය)
06	බීජ පොල්	2021 (දෙදහස් විසිඑක)
07	තැඹිලි	570215 (පන්ලක්ෂ හැත්තෑදහස් දෙසීය පහළොව)
08	පුන්නක්කු	187 (එකසිය අසූහත)
09	පොල් ක්‍රීම්	1591 (එක්දහස් පන්සිය අනූඑක)
10	පොල් කිරි	12570 (දොළොස්දහස් පන්සිය හැත්තෑව)
11	පොල් කිරි පිටි	4702 (හාරදහස් හත්සිය දෙක)
12	මේදය ඉවත් කළ පොල්	3619 (තුන්දහස් හයසිය දහනවය)
13	පොල් අරක්කු (ලීටර්)	17071 (දහහත්දහස් හැත්තෑඑක)
14	පොල් විනාකිරි (ලීටර්)	24007 (විසිහතරදහස් හත)
15	ෆැට් ඇසිඩ්	2447 (දෙදහස් හාරසිය හතළිස්හත)
16	මෙට්‍රස් කොහු	53142 (පනස්තුන්දහස් එකසිය හතළිස්දෙක)
17	බ්‍රිස්ටල් කොහු	10251 (දහදහස් දෙසීය පනස්එක)
18	ටිවිස්ටඩ් කොහු	41406 (හතළිස්එක්දහස් හාරසියහය)
19	පොල් කටු අඟුරු	6359 (හයදහස් තුන්සිය පනස්නවය)
20	පොල් කටු හා කටු කුඩු	438 (හාරසිය තිස්අට)
21	සක්‍රිය කාබන්	36629 (තිස්හයදහස් හයසිය විසිනවය)
22	කොහු ලණු	2002 (දෙදහස් දෙක)
23	කොහු ටුවයින්	5728 (පන්දහස් හත්සිය විසිඅට)
24	තවාෂි බුරුසු (ඒකක)	28204993 (දෙසීයඅසූදෙලක්ෂ හාරදහස් නවසිය අනූතුන)
25	කොහු හා බුරුසු (ඒකක)	21298535 (දෙසීයදොළොස්ලක්ෂ අනූඅටදහස් පන්සිය තිස්පහ)
26	රබර් මිශ්‍ර කොහු පෑඩ් හා ඇඳන් මෙට්ට (ඒකක)	7578408 (හැත්තෑපන්ලක්ෂ හැත්තෑඅටදහස් හාරසිය අට)
27	බුමුතුරුණු හා පාපිසි (ඒකක)	568759 (පන්ලක්ෂ හැටඅටදහස් හත්සිය පනස්නවය)
28	කොහු ලණු පැදුරු හා බුමුතුරුණු (වර්ග මීටර)	11017 (එකොළොස්දහස් දහහත)
29	කොහු බත්	143911 (එක්ලක්ෂ හතළිස්තුන්දහස් නවසිය එකොළහ)
30	පොල් ලෙලි කැබලි	11815 (එකොළොස්දහස් අටසිය පහළොව)
31	මිහිසළු	3362 (තුන්දහස් තුන්සිය හැටදෙක)
32	උද්‍යාන වගාවන් සඳහා යොදා ගන්නා කොහු ආශ්‍රිත නිෂ්පාදන	58136 (පනස්අටදහස් එකසිය තිස්හය)
33	පොල් ඉරටු	8375 (අටදහස් තුන්සිය හැත්තෑපහ)
34	පොල් ලී	0.086 (බින්දුවයි දශම බින්දුවයි අටයි හය)

(ඇ) (i) ඔව්.

(ii) පොල් වතුර ස්වරූපයෙනි.

(iii) හොංකොං, ලෙබනන්, පාකිස්තානය, සිංගප්පූරුව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ජර්මනිය, නෙදර්ලන්තය, ස්විට්සර්ලන්තය, එක්සත් රාජධානිය, ස්ලෝවේනියාව, කැනඩාව, ඇමෙරිකා එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව.

(iv) 2013 වසර වන විට පොල් වතුර සඳහා ස්ථිර කේත අංකයක් නොතිබුණු බැවින් පොල් වතුර පලතුරු යුෂ සම්බන්ධයෙන් වූ කේත අංකයටම අපනයනය කර තිබේ. පොල් වතුර කොපමණ ප්‍රමාණයක් අපනයනය කර තිබේදැයි නිශ්චිත වශයෙන් කිව නොහැකිය.

(v) 2014 ජූනි සිට සැප්තැම්බර් දක්වා - රුපියල් මිලියන 64.55යි.

(ඈ) (i) a). පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන ආරම්භ කිරීම සඳහා තාක්ෂණික උපදෙස් හා ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා මූල්‍ය පහසුකම් ලබා දීම.

b). මූල්‍ය පහසුකම් සඳහා සහන පොලී ණය යෝජනා ක්‍රමය යටතේ මහජන බැංකුවෙන් හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මඟින් උපරිමය රුපියල් මිලියන 05 දක්වා ණය පහසුකම් ලබා දීම.

c). සුළු හා කුඩා පරිමාණයේ කර්මාන්ත සඳහා යන්ත්‍ර, උපකරණ හා මෙවලම් සහන පදනම මත ලබා දීම.

d). දේශීය හා විදේශීය ප්‍රමිතිකරණය පිළිබඳ විශේෂ දැනුවත් කිරීම.

(ii) පොල් සංවර්ධන අධිකාරියෙහි නිෂ්පාදකයෙකු වශයෙන් ලියා පදිංචි වීම.

(ඉ) ඉහත පිළිතුර අනුව පැන නොනඟී.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්න.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමා මෙම ප්‍රශ්නයේ (ඇ) (v)ට පිළිතුර ලෙස සඳහන් කළා, පොල් වතුර අපනයනයෙන් ලද ආදායම. අපි රටක් විධියට ගත්තාම කෙටි කාලයක් තුළ ඒ තුළින් විශාල ආදායමක් ලබා තිබෙනවා. අපේ රටේ දළ වශයෙන් ගෙවල් ලක්ෂ 30ක් තිබෙනවාය කියා උපකල්පනය කළත්, එක ගෙදරක දවසකට පොල් ගෙඩියක් බින්දොත් පොල් ගෙඩි ලක්ෂ 30ක් බිඳෙනවා. හැබැයි, පොල් ගෙඩිය බින්දා, වතුර ටික විසි කළා. ඒ නිසා පොල් ගෙඩි ලක්ෂ 30ක වතුර අපතේ යනවා. එතකොට අපනයනය කරන්න පොල් වතුර එකතු කරපු ක්‍රමවේදය මොකක්ද?

සාමාන්‍යයෙන් අපි දන්න තරමට වෙන්නේ, ගෙවල්වල පොල් වතුර විසි කරන එකයි. අපි දන්නවා, දියර කිරි එකතු කිරීමේ ක්‍රමවේදයක් තිබෙන බව. මම කියන්නේ, පොල් වතුරත් ඒ විධියට එකතු කරන්න පුළුවන් නම් අපට වැඩි ආදායමක් ලබා ගන්න පුළුවන් කියලායි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා කියන්නේ හැම ගෙදරකටම ගිහින් පොල් වතුර එකතු කරන්න කියලාද?

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
නැහැ, නැහැ. එහෙම නොවෙයි. අපි නිකමට හිතුවොත් ගරු ඇමතිතුමනි, දවසකට මේ රටේ ලක්ෂ 30ක් පොල් ගෙඩි බිඳෙනවා නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒක ප්‍රායෝගික නැහැ. හැම ගෙදරකටම- [බාධා කිරීමක්]

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මම අහන්නේ, ඔබතුමන්ලා එහෙම දෙයක් ගැන හිතලාවත් තිබෙනවාද කියලායි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
පොල් වතුර එකතු කරන්න ඊට වඩා මුදල් යනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
නැහැ, නැහැ. එහෙම හිතන්න එපා. හැම දාම, හැම ගෙදරකටම යන්න ඕනෑ නැහැ. ඒ ගැන නිර්මාණශීලීව හිතන්න පුළුවන්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
හැම ගෙදරකටම ගිහින් පොල් වතුර එකතු කිරීම අමාරු කාර්යයක්. හැබැයි, මෙතුමාගේ යෝජනාව හොඳයි. නමුත් ඒක ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම තමයි ප්‍රශ්නය.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මන්ත්‍රීතුමා කැමැතියි, ගෙවල්වලට ගිහින් එකතු කරන්න.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු ඇමතිතුමනි,-

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
That is a very good idea but the only thing is, there is a problem of implementation.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මේක සැහැල්ලුවට ගන්න, විහිළුවක් ලෙස සලකන්න එපා. පොල් ගෙඩි ලක්ෂ 30ක පමණ වතුර අපි රටක් විධියට දිනපතා විසි කරනවා. ඒ, සල්ලි!

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දෙවන අතුරු ප්‍රශ්නය අහනවාද?

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මම දෙවැනි අතුරු ප්‍රශ්නය අහනවා. ගරු වැවිලි කර්මාන්ත ඇමතිතුමනි, පොල් වතුරේ රසායනික සංයුතිය බොහෝ දුරට සේලයින්වලට සමානයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔව්. ඒක මම පිළිගන්නවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
තවමත් අපි රටක් විධියට සේලයින් ආනයනය කරනවා. -දැන් මෙතැන හිටපු සෞඛ්‍ය ඇමතිතුමෙකුත් ඉන්නවා. දැනට ඉන්න සෞඛ්‍ය ඇමතිතුමාත් ඉන්නවා. අපේ රටේ සේලයින් නිෂ්පාදනය කිරීම සඳහා යම් කිසි ආකාරයකට පොල් වතුර භාවිතයට ගැනීම

[ගරු බුද්ධික පතිරණ මහතා]

පිළිබඳව අමාත්‍යාංශ දෙක අතර -සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය අතර- යම් කිසි සාකච්ඡාවක් සිදු වෙලා තිබෙනවා ද, එහෙම වැඩ පිළිවෙළක් අනාගතයේ දී සිදු කිරීමට සිතලා තිබෙනවාද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

සෞඛ්‍ය අමාත්‍යාංශය අපෙන් ඉල්ලීමක් කෙරුවොත්, අපට ඒ අවශ්‍ය කරන පොල් ටික ලබා දෙන්න පුළුවන්. We can supply any number of coconuts if the Ministry of Health and Indigenous Medicine requests. We are willing to do that.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සෞඛ්‍ය ඇමතිතුමා මේ වෙලාවේ මෙම ගරු සභාවේ සිටින නිසා මම මෙය එතුමාගෙන් දැන ගන්න කැමැතියි. සේලයින් වෙනුවෙන් අපි රුපියල් කෝටි ගණනක් පිට රටට යවනවා. වැවිලි කර්මාන්ත ඇමතිතුමා කියනවා පොල් වතුර ලබා දෙන්න පුළුවන් කියලා. ඒ නිසා මේ ගැන යම් කිසි මැදිහත්වීමක් වෙන්න පුළුවන් ද කියලා දැන ගන්න කැමැතියි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ප්‍රශ්නය අහලා තිබෙන්නේ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන්.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதார மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health and Indigenous Medicine)

දැනටමත් පැහැදිලිවම මැදිහත් වෙලා තිබෙනවා. ලංකාවේ සේලයින් නිෂ්පාදනය කිරීම සඳහා සමාගම් කිහිපයක් ලංකාවට ඇවිල්ලත් තිබෙනවා. එය සාකච්ඡා මට්ටමේ තිබෙන්නේ. එම නිසා සියලු ඖෂධ ලංකාවේ නිෂ්පාදනය කිරීමට ඉදිරි අවුරුදු 03 තුළදී අවශ්‍ය පියවර ගන්නවා. [බාධා කිරීමක්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

පොල් වතුර ගැන එතුමාට උත්තර දෙන්න බැහැ. බොහොම ස්තූතියි.

ප්‍රශ්න අංක 9 - 4573/'13-(2), ගරු අනුර දිසානායක මහතා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමාජසේවා, සුබසාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ප්‍රශ්න අංක 13-4473/'13-(2), ගරු බුද්ධික පතිරණ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමා සහ බුද්ධ ශාසන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

කල් ඉල්ලීමත් දැන් style එකක් වෙලා නේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ඔබතුමා කලබල වෙන්න එපා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මේක පුදුම බෝවිල්ලක් නේ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් අහපු ප්‍රශ්නයක්.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය : CHOGM සඳහා දරන ලද වියදම

வெகுசன ஊடக, தகவல் அமைச்சு: CHOGM தொடர்பான செலவு

MINISTRY OF MASS MEDIA AND INFORMATION: MONEY EXPENDED ON CHOGM

4580/'13

14.ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2013 වර්ෂයේ පැවති පොදු රාජ්‍ය මණ්ඩලීය නායක සමුළුව වෙනුවෙන් එවකට පැවති ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය හා ඊට අදාළ අනෙකුත් ආයතන විසින් දරන ලද මුළු වියදම් ප්‍රමාණය කොපමණද;

(ii) එම මුදල් සපයා ගනු ලැබූ ආකාරය කවරේද;

(iii) එම මුදල් වැය කරන ලද ආකාරය කවරේද;

(iv) එම සමුළුවේ මාධ්‍ය ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් දැරූ වියදම කොපමණද;

(v) ප්‍රචාරණ කටයුතු ලබා දුන් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය කවරේද;

(vi) එම එක් එක් මාධ්‍ය ආයතනය වෙනුවෙන් ගෙවන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

வெகுசன ஊடக, பாராளுமன்ற அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2013ஆம் ஆண்டில் நடைபெற்ற பொதுநலவாய அமைப்பின் தலைவர்களின் மாநாட்டுக்காக அப்போதைய வெகுசன ஊடக, தகவல் அமைச்சு மற்றும் அதனுடன் சம்பந்தப்பட்ட ஏனைய நிறுவனங்களால் ஏற்கப்பட்ட மொத்தச் செலவுத் தொகை எவ்வளவு என்பதையும்;

(ii) இப்பணத்தொகை பெற்றுக்கொள்ளப்பட்ட முறை யாது என்பதையும்;

(iii) இப்பணத்தொகை செலவிடப்பட்ட முறை யாது என்பதையும்;

(iv) மேற்படி நாட்டுத் தலைவர்களின் மாநாட்டுக்கான ஊடக பிரசாரப் பணிகளுக்காக ஏற்கப்பட்ட பணத்தொகை எவ்வளவு என்பதையும்;

(v) பிரசாரப் பணிகள் வழங்கப்பட்ட மின்னியல் மற்றும் அச்சு ஊடகங்கள் யாவை என்பதையும்;

(vi) மேற்படி ஒவ்வொரு ஊடக நிறுவனத்தின் சார்பிலும் செலுத்தப்பட்ட பணத்தொகை தனித்தனியே எவ்வளவு என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Mass Media and Parliamentary Affairs:

(a) Will he inform this House -

(i) the total amount of money that was spent on the recently held CHOGM in the year 2013 by the then Ministry of Mass Media and Information and the other institutes coming under the purview of that Ministry;

(ii) the manner by which the aforesaid money was raised;

(iii) the manner in which the aforesaid money was spent;

(iv) the total amount of money spent on media publicity for the aforesaid Heads of States Meeting;

(v) the names of electronic and print media through which publicity was given; and

(vi) separately the amount of money that was paid to each of the aforesaid media institutes?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය විසින් මෙම සමුළුව හා සම්බන්ධ මාධ්‍ය ආවරණ හා ප්‍රචාරක කටයුතු වෙනුවෙන් දරන ලද මුළු පිරිවැය රුපියල් 1,177,434,333.46කි. (ආසන්න වශයෙන් බිලියන 1 මිලියන 177යි.)

(ii) භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් මුදල් සොයා ගෙන ඇත.

(iii) මාධ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීම් හා පවත්වාගෙන යාම වෙනුවෙන් රුපියල් 828,327,661.88යි. (අටසිය විසිඅට මිලියන තුන්සිය විසිහත් දහස් හයසිය හැටඑකයි ශත අසූඅටයි. ආසන්න වශයෙන් මිලියන 828)

විද්‍යුත් මාධ්‍ය ආයතන මඟින් සිදු කරන ලද ප්‍රචාරක වැඩසටහන් සඳහා රුපියල් 180,547,649.66යි. (එකසිය අසූ මිලියන පන්සිය හතළිස් හත් දහස් හයසිය හතළිස් නවයයි ශත හැට හයයි. ආසන්න වශයෙන් මිලියන 181යි.)

මහජනතාව දැනුවත් කිරීමේ ප්‍රචාරක වැඩසටහන් සඳහා රුපියල් 144,477,425.08යි. (එකසිය හතළිස් හතර මිලියන හාරසිය හැත්තෑහත් දහස් හාරසිය විසි පහයි ශත අටයි. ආසන්න වශයෙන් මිලියන 144යි.)

කාර්යාල උපකරණ මිල දී ගැනීම සඳහා රුපියල් 4,551,707.20යි. (හතර මිලියන පන්සිය පනස් එක් දහස් හත්සිය හතයි ශත විස්සයි. ආසන්න වශයෙන් මිලියන 5යි.)

නිල ලාංඡනය නිර්මාණය සහ පුවත් පත් දැන්වීම් සඳහා රුපියල් 396,696.00යි. (තුන්සිය අනූහය දහස් හයසිය අනූ හයයි. ආසන්න වශයෙන් ලක්ෂ 4යි.)

දේශීය විදේශීය මාධ්‍යවේදීන් සඳහා රාත්‍රී භෝජන ඇතුළු සංග්‍රහ කටයුතුවලට රුපියල් 10,022,905.00යි. (දස මිලියන විසිදෙදහස් නවසිය පහයි. ආසන්න වශයෙන් මිලියන 10යි.)

චෝගම් ව්‍යාපෘති කාර්යාල නිලධාරින්ට දීමනා දීමට රුපියල් 162,485.00යි. (එකසිය හැට දෙදහස් හාරසිය අසූපහයි. ආසන්න වශයෙන් ලක්ෂ 2යි.)

නිලධාරින් සඳහා වූ දීමනාවලට රුපියල් 343,233.45යි. (තුන්සිය හතළිස් තුන්දහස් දෙසිය තිස්තුනයි ශත හතළිස් පහයි. ආසන්න වශයෙන් ලක්ෂ 3යි.)

වෙනත් වියදම් සඳහා රුපියල් 8,511,095.19යි. (අට මිලියන පන්සිය එකොළොස් දහස් අනූ පහයි ශත දහනවයයි. ආසන්න වශයෙන් මිලියන 9යි.)

සම්පූර්ණ වියදම රුපියල් 1,177,434,333.46යි. (එක් බිලියන එකසිය හැත්තෑ හත් මිලියන හාරසිය තිස් හතර දහස් තුන්සිය තිස්තුනයි ශත හතළිස් හයයි. ආසන්න වශයෙන් බිලියන 1 මිලියන 177යි.)

(iv) මහ ජනතාව දැනුවත් කිරීමේ ප්‍රචාරක වැඩසටහන්වලට රුපියල් 144,477,425.08යි. (එකසිය හතළිස් හතර මිලියන හාරසිය හැත්තෑහත් දහස් හාරසිය විසි පහයි ශත අටයි. ආසන්න වශයෙන් මිලියන 144යි.)

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

විද්‍යුත් මාධ්‍ය ආයතන වෙනුවෙන් ප්‍රචාරක කටයුතු සඳහා රුපියල් 180,547,649.66යි. (එකසිය අසූ මිලියන පන්සිය හතළිස් හත් දහස් හයසිය හතළිස් නවයයි ශත හැට හයයි. ආසන්න වශයෙන් මිලියන 181යි.)

එකතුව රුපියල් 325,025,074.74යි. (තුන්සිය විසිපස් මිලියන විසිපන්දහස් හැත්තෑ හතරයි ශත හැත්තෑ හතරයි. ආසන්න වශයෙන් මිලියන 325යි.)

(v) 1. එම්ටීවී/එම්බීසී නෙට්වර්ක් (MTV/MBC Network)

(Sirasa TV, MTV Sports, Shakthi TV, Sirasa FM, Yes FM, Y FM, Legends FM)

2. පවර් හවුස් ප්‍රයිවට් ලිමිටඩ් (Power House (Pvt.) Limited)

(Derana TV, Derana FM)

3. කාර්ල්ටන් ස්පෝර්ට්ස් නෙට්වර්ක්(Carlton Sports Network)

(CSN TV)

4. එම්ජීඑම්ආර් නෙට්වර්ක් ප්‍රයිවට් ලිමිටඩ් (MGMR Network (Pvt.) Limited)

(Max TV, Max Radio)

5. ආර්ට් ටෙලිවිෂන් බ්‍රෝඩ්කාස්ටින් ප්‍රයිවට් ලිමිටඩ් (ART Broadcasting (Pvt) Limited)

(ART TV)

6 විස් බ්‍රෝඩ්කාස්ටින් ප්‍රයිවට් ලිමිටඩ් (VIS Broadcasting (Pvt) Limited)

(Sinha FM, RED FM)

7. ඇසෙට් රේඩියෝ බ්‍රෝඩ්කාස්ටින් ප්‍රයිවට් ලිමිටඩ් (Asset Radio Broadcasting (Pvt) Limited)

(Neth FM)

8 ඒෂියා බ්‍රෝඩ්කාස්ටින් කෝර්පරේෂන් ප්‍රයිවට් ලිමිටඩ් (Asia Broadcasting Corporation (Pvt) Limited)

(Hiru TV, Hiru FM, Gold FM, Sooryan FM, Sha FM, Sun FM)

9 ඊඒපී නෙට්වර්ක් ප්‍රයිවට් ලිමිටඩ් (EAP Network (Pvt) Limited)

(Swarnavahini)

10. කලම්බෝ කමියුනිකේෂන් ප්‍රයිවට් ලිමිටඩ් (Colombo Communication (Pvt) Limited)

(Sri FM, Ran FM, E FM)

11. ටෙල්ෂාන් නෙට්වර්ක් ප්‍රයිවට් ලිමිටඩ් (Telshan Network (Pvt) Limited)

(TNL TV, TNL Radio)

12. සැලසිනේ ටෙලිවිෂන් ඉන්ස්ටිට්යුට් (Selacine Television Institute)

(vi) (Rs.)

1. MTV/MBC Network
68,519,733.32

(හැට අට මිලියන පන්සිය දහනව දහස් හත්සිය තිස් තුනයි ශත තිස් දෙකයි. ආසන්න වශයෙන් මිලියන 69යි.)

2 Power House Limited
16,916,659.20

(දහසය මිලියන නවසිය දහසය දහස් හයසිය පනස් නවයයි ශත විස්සයි. ආසන්න වශයෙන් මිලියන 17යි.)

3. Carlton Sports Limited
7,996,799.89

(හත් මිලියන නවසිය අනූහය දහස් හත්සිය අනූ නවයයි ශත අසූ නවයයි. ආසන්න වශයෙන් මිලියන 8යි.)

4 MGMR Networks (Pvt) Limited
1,142,400.00

(එක් මිලියන එකසිය හතළිස් දෙදහස් හාරසියයි. ආසන්න වශයෙන් මිලියන 1යි.)

5 ART Television Broadcasting (Pvt) Limited
1,142,400.00

(එක් මිලියන එකසිය හතළිස් දෙදහස් හාරසියයි. ආසන්න වශයෙන් මිලියන 1යි.)

6 VIS Broadcasting (Pvt) Limited
3,427,200.94

(තුන් මිලියන හාරසිය විසිහත් දහස් දෙසියයි ශත අනූ හතරයි. ආසන්න වශයෙන් මිලියන 3යි.)

7. Asset Radio Broadcasting (Pvt) Limited
11,154,020.06

(එකොළොස් මිලියන එකසිය පනස් හතර දහස් විස්සයි ශත හයයි. ආසන්න වශයෙන් මිලියන 11යි.)

8. Asia Broadcasting Corporation (Pvt) Limited
34,262,860.80

(තිස් හතර මිලියන දෙසිය හැට දෙදහස් අටසිය හැටයි ශත අසූවයි. ආසන්න වශයෙන් මිලියන 34යි.)

9. EAP Network (Pvt) Limited
20,563,177.11

(විසි මිලියන පන්සිය හැට තුන් දහස් එකසිය හැත්තෑ හතයි ශත එකොළහයි. ආසන්න වශයෙන් මිලියන 21යි.)

10. Colombo Communication (Pvt) Limited
13,708,800.00

(දහතුන් මිලියන හත්සිය අට දහස් අටසියයයි. ආසන්න වශයෙන් 14යි.)

11 Telshan Network (Pvt) Limited

1,713,598.28

(එක් මිලියන හත්සිය දහතුන් දහස් පන්සිය අනූ අටයි ශත විසි අටයි. ආසන්න වශයෙන් මිලියන 2යි.)

Total 180,547,649.66

(එකසිය අසූ මිලියන පන්සිය හතළිස් හත්දහස් හයසිය හතළිස් නවයයි ශත හැට හයයි. ආසන්න වශයෙන් මිලියන 181යි.

(ආ) අදාළ නොවේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාගේ පළමු වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුවේ මාධ්‍ය ඒකකය කියන්නේ, එහි ප්‍රධානම අංශයක් නොවෙයි. එහි ප්‍රධාන වැඩ කටයුතු විදේශ කටයුතු අමාත්‍යාංශයෙනුත්, ජනාධිපති ලේකම් කාර්යාලයෙනුත් මෙහෙයවනු ලැබුවා. මාධ්‍ය ඒකකය කියලා කියන්නේ එහි ඉතාම කුඩා කොටසක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ කුඩා කොටස වෙනුවෙන් රුපියල් දස ලක්ෂ 1,117ක වියදමක් දරලා තිබෙනවා. ඒ කියන්නේ රුපියල් බිලියනයකුත්, මිලියන 117ක්. රුපියල් දසලක්ෂ 1,117ක් රාජ්‍ය නායක සමුළුවක ප්‍රචාරක වැඩ කටයුතුවලට වියදම් කරලා තිබෙනවා. මේ ශ්‍රී ලංකාව නේ. මේ මහා යුරෝපයක් පුරා ප්‍රචාරක කටයුතු සිදු කරලා නොවෙයි. මහා අර්ධද්වීපයක් පුරා ප්‍රචාරක කටයුතු කරලා නොවෙයි. වර්ග කිලෝමීටර 65,610ක් වන ශ්‍රී ලංකා දූපතේ පැවැති එක් රාජ්‍ය නායක සමුළුවක ප්‍රචාරක කටයුතු වෙනුවෙන් රුපියල් දසලක්ෂ 1,117ක් - රුපියල් කෝටි 111කට අධික මුදලක් - වැය කරන්නේ කොහොමද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි. එම මුදල්වලින් රුපියල් මිලියන 5යි උපකරණ මිලදී ගැනීම සඳහා වියදම් කරලා තිබෙන්නේ. ඉතිරි වෙන්නේ රුපියල් මිලියන 5ක උපකරණ පමණයි. ඒවාත් කොහොම ගත්තාද කියලා දන්නේ නැහැ. උපකරණ මිලදී ගැනීම සඳහා වැය කර තිබෙන්නේ රුපියල් මිලියන 5යි. රුපියල් මිලියන 1,112ක්ම වැය කරලා තිබෙන්නේ සම්පූර්ණයෙන්ම නාස්ති වන වියදම් හැටියටයි. වර්ග කිලෝමීටර 65,610ක භූමියක් සහිත මේ දූපතේ පවත්වපු පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව වෙනුවෙන් රුපියල් මිලියන 1,117ක් වැය කර ප්‍රචාරක වැඩ කටයුතු සිදු කිරීම මේ රටට, මේ රටේ ආර්ථිකයට සාධාරණද කියලා මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ජනවාරි මාසයේ 8වැනිදා මේ රටේ ජනතාවත් ඕකට උත්තරයක් දීලා තිබෙනවා, ඔය වියදම් දරාගන්න බැරි වීම නිසා. මමත් ඔය ගැන ඉතාම කනගාටු වෙනවා. සමහර ඒවායේ බිල්පත් පවා පැහැදිලිව නැහැ. අපට දැන් ඒවා පිළිබඳවත් පරීක්ෂා කරන්න සිදුවෙලා තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ජනතාව පරාජයට පත් කළේ කවර ආකාරයේ විනාශකාරී පාලනයක්ද කියන එක දැන් දැන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ප්‍රශ්නවලින් සහ ඒවාට ලැබෙන පිළිතුරුවලින් පෙන්නුම් කෙරමින් තිබෙනවා. මේ ප්‍රශ්න මීට පෙර ඇහුවා නම් මේ විධියට නොවෙයි ඒවාට පිළිතුරු ලැබෙන්නේ. මේවා හංගන, මේවා යට ගහන, පාර්ලිමේන්තු බලයත් යටපත් කරන උත්තර හැටියට තමයි ලැබෙන්නේ. කෙසේ වුවත් ආණ්ඩුවක් මාරු වුණාට පසුව හෝ මේ උත්තරවලින් නිවැරදි විස්තර ලැබීමෙන්, මේ රටේ දියත් කරමින් තිබූ පාලනය කවරාකාර යක්ෂාගමන පාලනයක්ද, කවරාකාර දූෂණයෙන්, නාස්තියෙන් පිරුණු පාලනයක්ද කියන එක මේ රටේ ජනතාවට පෙන්නුම් කෙරෙමින් තිබෙනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්නය අහන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. එහි මාධ්‍ය ඒකකය වෙනුවෙන් රුපියල් මිලියන 857ක් වැය කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ග්‍රහලෝකයකද ඒක පැවැත්වුණේ? මේක මේ ශ්‍රී ලංකා භූමියේ කාර්යාලයක්. මාධ්‍ය ඒකකයක් පවත්වාගෙන යෑම වෙනුවෙන් රුපියල් මිලියන 857ක් වැනි අධික මුදලක් වැය කිරීම සාධාරණද කියලා ගරු ඇමතිතුමාගෙන් දැනගන්න කැමැතියි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

කිසිසේත්ම එය සාධාරණ නැති බව ඕනෑම කුඩා දරුවෙකුට වුණත් තේරෙනවා. ඉතින් මේ වාගේ ජනතා මුදල් කාබාසිනියා කරන දේවල් පිළිබඳව අමාත්‍යවරයකු විධියට මින් ඉදිරියට මේ ගරු සභාව තුළ පිළිතුරු දෙන්නට නොලැබේවා කියලාත් මම ප්‍රාර්ථනා කරනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

තුන්වැනි අතුරු ප්‍රශ්නය.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, මේ සඳහා ලංකාවේ හැම පුද්ගලයකුම රුපියල් 550ක් වියදම් කරලා තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මාධ්‍ය ඒකකය සඳහා පමණයි මේ වියදම. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. එම උත්සවයේ එක රාත්‍රී භෝජන සංග්‍රහයක වියදම රුපියල් ලක්ෂ 100යි. ඒ, එක් රාත්‍රී භෝජන සංග්‍රහයක් සඳහා වූ වියදම. එම මාධ්‍යවේදීන් වෙනුවෙන් රුපියල් ලක්ෂ 100ක් වැය කර රාත්‍රී භෝජන සංග්‍රහයක් පවත්වා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම මාධ්‍යවේදීන්ට කන්න දුන්නේ රුපියල් 5,000 කොළද කියලා මා දැන ගන්න කැමැතියි. රුපියල් 5,000 කොළ මැල්ලුමක්, රුපියල් 5,000 කොළ හොද්දක්, රුපියල් 5,000 කොළ තැම්බුමක්ද? මේ රටේ ඇත

[ගරු අනුර දිසානායක මහතා]

ගම්වල මිනිස්සුන්ට ජීවත් වෙන්න විධියක් නැහැ. දරුවන් අරගෙන ළිඳට පනිනවා; කෝච්චියට පනින්න උත්සාහ කරනවා. ඉන්න හිටින්න හරි හමන් ගෙයක් දොරක් නැහැ. මේ පාලකයෝ මොකක්ද කරලා තිබෙන්නේ? රුපියල් ලක්ෂ 100ක් එක රාත්‍රී භෝජන සංග්‍රහයක් වෙනුවෙන් වියදම් කරන්න එහි menu එක මොකක්ද කියලා ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාගේ ඊළඟ අතුරු ප්‍රශ්නයට පිළිතුර නම්, menu එක පිළිබඳව පැහැදිලි විස්තරයක් මේ වේලාවේ දෙන්න අමාරුයි. පසුව හොයලා කියන්න පුළුවන්. නමුත් මාධ්‍යවේදීන් විතරක් නොවෙයි, වට පිටාවේ බොහෝ දෙනෙක් හොඳට කාලා, බීලා තිබෙනවා කියන එක පෙනෙනවා. ජනතා මුදල්ම කාලා තිබෙනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවැනි වටය.

ප්‍රශ්න අංක 3 - 4755/'14- (2), ගරු අශෝක් අබේසිංහ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අශෝක් අබේසිංහ මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, I ask for two weeks' time to answer that Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ජාතික විදුලිබල පද්ධතියට එක් කළ විදුලි ඒකක ප්‍රමාණය : විස්තර

தேசிய மின் முறைமைக்கு சேர்த்த மின் அலகுகள் : விபரம்

UNITS OF ELECTRICITY ADDED TO NATIONAL GRID : DETAILS

5112/'14

4. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු අජිත් මාන්නප්පෙරුම මහතා වෙනුවට)
(மாண்புமிகு புத்திக பதிரண - மாண்புமிகு அஜித் மான்னப்பெரும சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Ajith Mannapperuma)

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) 2013 සැප්තැම්බර් මස 12 සහ 13 යන දිනයන්හි දී ජාතික විදුලිබල පද්ධතියට එක් කළ විදුලි ඒකක ප්‍රමාණය පැයට කිලෝවොට්වලින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල වෙන් වෙන් වශයෙන්, රුපියල් මිලියන කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2013 සැප්තැම්බර් 11, 12 සහ 13 යන දිනයන්හි දීජල විදුලි බලාගාර මඟින් උත්පාදනය කර ජාතික විදුලිබල පද්ධතියට එක් කර ඇති විදුලි ඒකක (පැයට කිලෝවොට්) සංඛ්‍යාව එක් එක් දිනය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත සඳහන් එක් එක් දිනයන්හිදී ජල විදුලි බලාගාර මඟින් උත්පාදනය කර ඇති විදුලි ඒකක සංඛ්‍යාව එකිනෙකට වෙනස් වූයේ නම්, එසේ වීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

மின்வலு, எரிசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2013ஆம் ஆண்டு செப்ரெம்பர் 12 மற்றும் 13ஆம் திகதிகளில் தேசிய மின்சார முறைமைக்கு சேர்க்கப்பட்ட மின்சார அலகுகளின் எண்ணிக்கை மணித்தியாலத்திற்கு கிலோ வாற்றின் அடிப்படையில் வெவ்வேறாக எவ்வளவு என்பதையும் ;

(ii) இதற்குச் செலவான தொகை வெவ்வேறாக எத்தனை மில்லியன் ரூபாய் என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 2013ஆம் ஆண்டு செப்ரெம்பர் 11, 12 மற்றும் 13ஆம் திகதிகளில் நீர் மின் நிலையங்களினால் உற்பத்தி செய்யப்பட்டு தேசிய மின்சார முறைமைக்கு சேர்க்கப்பட்ட மின்சார அலகுகளின் (மணித்தியாலத்திற்கு கிலோ வாற்று) எண்ணிக்கை ஒவ்வொரு நாளின் அடிப்படையில் வெவ்வேறாக எவ்வளவு என்பதையும் ;

(ii) மேலே குறிப்பிடப்பட்ட ஒவ்வொரு தினத்திலும் நீர்மின் நிலையங்களினால் உற்பத்தி செய்யப்பட்ட மின்சார அலகுகளின் எண்ணிக்கை ஒன்றுக்கொன்று வேறுபட் டிருப்பின் அவ்வாறு நடைபெறுவதற்கான காரணங்கள் யாவை என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Energy:

(a) Will he state-

(i) the number of units of electricity added to the national grid on 12th and 13th September, 2013 in per kilowatt hour separately; and

(ii) separately, the amount of money spent on that in millions?

(b) Will he inform this House-

(i) separately and on daily basis, the number of units of electricity generated by the hydropower plants and added to the national grid (in kilowatt hours) on 11th, 12th and 13th September, 2013 ; and

(ii) if the number of units of electricity generated by the hydropower plants on the above mentioned dates varied from each other, the reasons for that?

(c) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

සභාමේසය මත තබන ලද පිළිතුර:
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) වර්ෂ 2013 සැප්තැම්බර් මස 12 සහ 13 යන දිනයන්හිදී ජාතික විදුලිබල පද්ධතියට එක් කළ විදුලි ඒකක ප්‍රමාණය පහතින් දක්වා ඇත.

	දිනය	විදුලි ඒකක ප්‍රමාණය (GWh)
1	2013 සැප්තැම්බර් මස 12	28.538
2	2013 සැප්තැම්බර් මස 13	28.623

(ii) ඒ සඳහා වැය වූ මුදල වෙන් වෙන් වශයෙන් රුපියල් මිලියන කොපමණද?

	දිනය	විදුලි ඒකක ප්‍රමාණය (GWh)	වැය වූ මුදල (රු.මිලියන)
1	2013 සැප්තැම්බර් මස 12	28.538	250
2	2013 සැප්තැම්බර් මස 13	28.623	160

වැදගත් - ඉහත වැයවූ මුදල ලෙස දක්වා ඇත්තේ තාප බල ජනනය සඳහා වූ මෙහෙයුම් වියදමය.

(ආ)

(i) වර්ෂ 2013 සැප්තැම්බර් 11, 12 සහ 13 යන දිනයන්හිදී ජල විදුලි බලාගාර මඟින්උත්පාදනය කර ජාතික විදුලිබල පද්ධතියට එක් කර ඇති විදුලි ඒකක සංඛ්‍යාව එක් එක් දිනය අනුව වෙන් වෙන් වශයෙන් පහතින් දක්වා ඇත.

	දිනය	ජල විදුලි බලාගාර තුළින් උත්පාදනය කළ විදුලි ඒකක ප්‍රමාණය (GWh)
1	2013 සැප්තැම්බර් මස 11	21.408
2	2013 සැප්තැම්බර් මස 12	17.887
3	2013 සැප්තැම්බර් මස 13	21.556

(ii) 2013 සැප්තැම්බර් මස 12 දින කොළඹ පිටත වටරවුම් මාර්ගයේ ඉදිකිරීම් කටයුතු පහසු කරලීම සඳහා බියගම සිට පන්නිපිටිය දක්වා දිවෙන ද.වො.220 අධි බලැති සම්ප්‍රේෂණ මාර්ගයට අයත්ව තිබූ සමහර විදුලි කුළුණු වෙනත් තැනක සථාපනය කිරීමට සිදුවිය. අලුතින් ඉදි කළ කුළුණු මතට විදුලි රැහැන් එලීම සඳහා එම විදුලි මාර්ගය විසන්ධිකොට එමඟින් විදුලිය සම්ප්‍රේෂණය එදිනට පමණක් තාවකාලිකව අත්හිටවන ලදී.

මෙම හේතුව මත එදිනට සම්ප්‍රේෂණයේ තිබූ සීමාවන් නිසා ජල විදුලිබල නිෂ්පාදනයද සීමා කරන ලදී. එබැවින් 2013 සැප්තැම්බර් මස 12 ජල විදුලි බලාගාර මඟින් උත්පාදනය කර ඇති විදුලි ඒකක සංඛ්‍යාව 2013 සැප්තැම්බර් 11 සහ 13 යන දිනයන්හි කළ ජල විදුලිබල නිෂ්පාදනයට වඩා අඩු වී ඇත.

(ඇ) පැන නොනඟී.

"බිම් සවිය" වැඩසටහන: මූලික පරමාර්ථ
`பிம் சவிய' நிகழ்ச்சித்திட்டம் : அடிப்படைக் குறிக்கோள்
"BIM SAVIYA" PROGRAMME : OBJECTIVES

5199/'14

5. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා වෙනුවට)
(மாண்புமிகு புத்திக பதிரண - மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Sunil Handunnetti)

ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2) :

(අ) (i) බිම් සවිය වැඩසටහන මූලික පරමාර්ථ කවරේද;

(ii) අධිකරණය මඟින් ලබාදුන් තීන්දුවකට පටහැනි ලෙස බිම් සවිය වැඩසටහන යටතේ ඉඩම් මැනීමක් සිදු කිරීමට හැකියාවක් තිබේද;

(iii) එසේ නම්, එම ඉඩම් මැනීම කවර නීති ප්‍රතිපාදනයක් යටතේ සිදු කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) හෝමාගම දිසා අධිකරණයේ, නඩු අංක 2061 බෙදුම් නඩුවේ අවසන් තීන්දුව අනුව කොටස් 3කට කැබලි කළ ඉඩමක් එම තීන්දුවට පටහැනිව බිම් සවිය නිලධාරින් විසින් කොටස් 2කට කැබලි කර ඇති බව දන්නේද;

(ii) එම ඉඩම එසේ බෙදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

காணி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) `பிம் சவிய' நிகழ்ச்சித்திட்டத்தின் அடிப்படைக் குறிக்கோள்கள் யாவை என்பதையும்;

(ii) நீதிமன்றத்தால் வழங்கப்பட்ட தீர்ப்பொன்றுக்கு முரணான வகையில் `பிம் சவிய' நிகழ்ச்சித்திட்டத்தின்கீழ் காணிகளை அளவை செய்வதற்கு இயலுமாயுள்ளதா என்பதையும்;

(iii) ஆமெனின், மேற்படி காணி அளவையானது எந்தச் சட்ட ஏற்பாடுகளின் பிரகாரம் மேற்கொள்ளபட்டதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

[ගරු බුද්ධික පතිරණ මහතා]

(ஆ) (i) ஹோமாகம மாவட்ட நீதிமன்றத்தில், வழக்கு எண் 2061 என்ற பிரிவிடல் வழக்கின் தீர்ப்பிற்கு இணங்க 3 பகுதிகளாக பிரிக்கப்பட்ட காணியொன்றை மேற்படி தீர்ப்பிற்கு முரணாக `பிம் சவிய' உத்தியோகத்தர்கள் 2 பகுதிகளாக பிரித்துள்ளனரென்பதை அறிவாரா என்பதையும்;

(ii) மேற்படி காணியை இவ்வாறு பிரித்தமைக்கான காரணங்கள் யாவை என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Lands:

(a) Will he state -

(i) the objectives of the "Bim Saviya" programme;

(ii) whether there is a possibility to survey lands under the "Bim Saviya" programme violating a ruling given by the court; and

(iii) if so, the legal provisions under which the aforesaid survey of land has taken place?

(b) Will he inform this House-

(i) whether he is aware that a land divided into three blocks as per the final decision given by the Homagama District court for a partition case bearing case number 2061, has been divided into two blocks by "Bim Saviya" officers violating the aforesaid decision; and

(ii) of the reason for the aforesaid land to be divided in that manner?

(c) If not, why?

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා (ඉඩම් අමාත්‍යතුමා)
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன - காணி அமைச்சர்)
(The Hon. M.K.A.D.S. Gunawardana - Minister of Lands)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 1. මායිම් සහ හිමිකම් පිළිබඳ ගැටලු විසඳා සෑම ඉඩමකටම රජයෙන් පිඹුරක් සහිත හිමිකම් සහතික පත්‍රයක් නිකුත් කිරීම.

2. ඉඩම් පිළිබඳ ජාතික තොරතුරු පද්ධතියක් ගොඩ නැංවීම.

(ii) නැත.

(iii) මැනීම් කරන අවස්ථාවේදී අධිකරණයේ නඩුවක් පවතින බවට කරුණු ඉදිරිපත් නොවීම නිසා මැනුම් කටයුතු සිදු කර ඇත. නඩුවක් පවතින බව දැන ගැනීමෙන් පසුව නඩු තීන්දුව අනුව නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) (i) ඔව්.

(ii) මැනීම් කරන අවස්ථාවේදී, ඉඩමට සම්බන්ධ පාර්ශවයන් අධිකරණයේ නඩුවක් පවතින බවට කරුණු ඉදිරිපත් නොකිරීම නිසා මැනුම් කටයුතු සිදු කර ඇත. නඩුවක් පවතින බව වාර්තා වීමෙන් අනතුරුව නඩු තීන්දුව අනුව නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) අදාළ නොවේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 7-5657/'14-(2), ගරු විජිත හේරත් මහතා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමා සහ බුද්ධ ශාසන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය: අතිරික්ත රියැදුරන් හා කොන්දොස්තරවරුන්
இலங்கைப் போக்குவரத்துச் சபை : மேலதிக சாரதிகள் மற்றும் நடத்துனர்கள்
SRI LANKA TRANSPORT BOARD: EXCESS DRIVERS AND CONDUCTORS

4771/'14

10.ගරු බුද්ධික පතිරණ මහතා (ගරු අශෝක් අබේසිංහ මහතා වෙනුවට)
(மாண்புமிகு புத்திக பதிரண - மாண்புமிகு அசோக் அபேசிங்க சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Ashok Abeysinghe)
අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය යටතේ දැනට ධාවනය වන මුළු බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එහි සේවය කරන අතිරික්ත රියැදුරන් හා කොන්දොස්තරවරුන් සම්බන්ධයෙන් ගන්නා ක්‍රියා මාර්ග කවරේද;

(iii) අතිරික්ත රියැදුරන් හා කොන්දොස්තරවරුන්ගේ සංඛ්‍යාවට සරිලන පරිදි බස් රථ ගෙන්වීමට කටයුතු කරන්නේද;

(iv) අය වැයෙන් ඒ සඳහා මුදල් වෙන් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

உள்ளகப் போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கைப் போக்குவரத்துச் சபையின்கீழ் தற்போது ஓட்டத்தில் ஈடுபடுத்தப்படுகின்ற மொத்தப் பேருந்துகளின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) அங்கு பணியாற்றுகின்ற மேலதிக சாரதிகள் மற்றும் நடத்துனர்கள் சம்பந்தமாக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவையென்பதையும்;

(iii) மேலதிக சாரதிகள் மற்றும் நடத்துனர்கள் எண்ணிக்கைக்கு பொருந்துகின்ற வகையில் பேருந்துகளைத் தருவிப்பதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(iv) வரவு செலவுத்திட்டத்தின் மூலம் அதற்காக பணம் ஒதுக்கப்பட்டிருந்ததா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Internal Transport:

(a) Will he inform this House-

(i) the number of buses that are operating under the Sri Lanka Transport Board at present;

(ii) the course of action adopted regarding the excess drivers and conductors employed in it;

(iii) whether action will be taken to import buses to suffice the number of excess drivers and conductors; and

(iv) whether money has been allocated from the budget for the aforesaid purpose?

(b) If not, why?

ගරු මොහොම්මදු ෂරීෆ් තවුෆික් මහතා (අභ්‍යන්තර ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு மொஹம்மது ஷரீப் தௌபீக் - உள்ளக போக்குவரத்து பிரதி அமைச்சர்)

(The Hon. Mohammadu Shareef Thoufeek - Deputy Minister of Internal Transport)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) දිනකට බස් රථ 5,000ක් පමණ ධාවනය වේ.

(ii) රියදුරු හා කොන්දොස්තරවරුන්ගේ අතිරික්තයක් නොමැත. දිනකට ධාවනය කළ යුතු බස් රථ ප්‍රමාණය ධාවනය කරවීම සඳහා රියැදුරන් හා කොන්දොස්තරවරුන් 11,000 බැගින් අවශ්‍ය වන අතර දැනට සේවය කරනුයේ රියැදුරන් 9,393ක් හා කොන්දොස්තරවරුන් 9,927ක් පමණක් වන බැවින් දැනට රියැදුරු හා කොන්දොස්තර හිඟයක් පවතී.

(iii) පැන නොනඟී.

(iv) පැන නොනඟී.

(ආ) පැන නොනඟී.

කෘෂිකාර්මික ට්‍රැක්ටර්: බදු වැඩි කිරීම

விவசாய உழவு இயந்திரங்கள் : வரி அதிகரிப்பு

AGRICULTURAL TRACTORS : INCREASE OF TAX

5113/'14

11. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු අජිත් මාන්නප්පෙරුම මහතා වෙනුවට)

(மாண்புமிகு புத்திக பதிரண - மாண்புமிகு அஜித் மான்னப்பெரும சார்பாக)

(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Ajith Mannapperuma)

මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) කෘෂිකාර්මික ට්‍රැක්ටර් සඳහා, 2014.01.01 දින සිට ක්‍රියාත්මක වූ වැඩි වූ බදු ප්‍රතිශතය කොපමණද;

(ii) කෘෂිකාර්මික ට්‍රැක්ටර් සඳහා මෙම බදු වැඩි වීම ක්‍රියාත්මක කිරීමේදී ගොවි ජනතාවට හෝ රටට සිදුවේ යැයි බලාපොරොත්තු වන යහපත කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 2012, 2013 වර්ෂවලදී සහ 2014 වර්ෂයේ අප්‍රේල් මස අවසානය දක්වා ලියාපදිංචි කර ඇති රෝද හතරේ නව කෘෂිකාර්මික ට්‍රැක්ටර් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) කෘෂිකාර්මික ට්‍රැක්ටර් සඳහා වන බදු වැඩි කිරීම තුළින් ගොවි ජනතාවට සහ කෘෂිකර්මාන්තයට අයහපත් බලපෑමක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, එම අහිතකර බලපෑම වැළැක්වීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2014.01.01ஆம் திகதி முதல் அமுல்படுத்தப்பட்ட விவசாய உழவு இயந்திரங்களுக்காக அதிகரிக்கப்பட்ட வரி வீதம் எவ்வளவென்பதையும்;

(ii) விவசாய உழவு இயந்திரங்களுக்கான மேற்படி வரி அதிகரிப்பை அமுல்படுத்துகின்றபோது விவசாயிகளுக்கு அல்லது நாட்டுக்கு ஏற்படுமென எதிர்பார்க்கப்படுகின்ற நன்மைகள் யாவையென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) 2012, 2013ஆம் ஆண்டுகளிலும் மற்றும் 2014ஆம் ஆண்டின் ஏப்பிரல் மாதம் இறுதி வரையிலும் பதிவு செய்யப்பட்டுள்ள புதிய நான்கு சக்கர விவசாய உழவு இயந்திரங்களின் எண்ணிக்கை தனித்தனியாக எவ்வளவென்பதையும் அவர் குறிப்பிடுவாரா?

(இ) (i) விவசாய உழவு இயந்திரங்களுக்கான வரி அதிகரிப்பின் ஊடாக விவசாயிகளுக்கும் கமத்தொழிலுக்கும் பாதகமான தாக்கங்கள் ஏற்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அத்தகைய பாதகமான தாக்கங்களைத் தடுப்பதற்கு எடுக்கப்படும் நடவடிக்கைகள் யாவையென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

[ගරු බුද්ධික පතිරණ මහතා]

asked the Minister of Finance:

(a) Will he state -

(i) the percentage of the increase of tax on agricultural tractors with effect from 1st January, 2014; and

(ii) the advantage expected to be accrued to the farmer community or the country by effecting this increase of tax on agricultural tractors?

(b) Will he also state the number of new four wheel agricultural tractors registered in 2012, 2013 and up to the end of April 2014 separately?

(c) Will he state -

(i) whether the increase of tax on agricultural tractors has had a harmful effect on the farmer community or agriculture; and

(ii) if so, the measures to be taken to negate that harmful effect?

(d) If not, why?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

සභාමේසය මත තබන ලද පිළිතුර:
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2013.12.31 දින තෙක් ආනයනික මෙන්ම දේශීයව නිෂ්පාදිත කෘෂිකාර්මික ට්‍රැක්ටර් සඳහා ආනයන තීරු බදු (CID), ජාතිය ගොඩනැඟීමේ බදු (NBT) හා අගය එකතු කළ බදු (VAT) නිදහස් කර තිබූ අතර, 2014.01.01 දින සිට ආනයනික කෘෂිකාර්මික ට්‍රැක්ටර් සඳහා පමණක් ජාතිය ගොඩනැඟීමේ බද්ද (2%) හා අගය එකතු කළ බද්ද (12%) ක්‍රියාත්මක කරන ලදී.

(ii) දේශීය කෘෂිකාර්මික ට්‍රැක්ටර් නිෂ්පාදනය දිරි ගැන්වීම උදෙසා විදේශීයව නිෂ්පාදිත කෘෂිකාර්මික ට්‍රැක්ටර් ආනයනය අධෛර්යමත් කිරීම මෙමඟින් අපේක්ෂා කෙරේ.

(ආ)

	මාසය	එක් එක් වර්ෂයේදී ලියා පදිංචි කර ඇති නව කෘෂිකාර්මික ට්‍රැක්ටර් සංඛ්‍යාව		
		2012	2013	2014
1	ජනවාරි	564	316	187
2	පෙබරවාරි	628	236	99
3	මාර්තු	671	279	125
4	අප්‍රේල්	585	358	76
5	මැයි	710	414	
6	ජූනි	451	260	
7	ජූලි	335	213	
8	අගෝස්තු	413	234	
9	සැප්තැම්බර්	373	265	
10	ඔක්තෝබර්	624	346	
11	නොවැම්බර්	553	298	
12	දෙසැම්බර්	314	218	
එකතුව		6,221	3,437	487

(ඇ) (i) නැත.

(ii) අදාළ නොවේ.

(ඈ) පසු ගිය වකවානුව තුළ බල පැවැත්වූ නියං තත්ත්වය හේතුවෙන් ගොවි ජනතාවගේ ආදායම් තත්ත්වය පහත වැටීම හා උකස් වෙළෙඳ පොළ දැඩි ලෙස අස්ථාවර වීම හේතුවෙන් රන් භාණ්ඩ උකසට තබා අමතර අරමුදල් ආයෝජනය සඳහා යොදා ගැනීමේ හැකියාවද පහත වැටීම හේතුවෙන් කෘෂිකාර්මික ට්‍රැක්ටර් සඳහා වන ඉල්ලුම අඩු වී ඇත.

2011 වසරේ සිටම වාර්ෂිකව ලියා පදිංචි කරනු ලබන කෘෂිකාර්මික ට්‍රැක්ටර් සංඛ්‍යාව නොකඩවා පහත වැටී ඇත. එනම්, 2011 වසරට සාපේක්ෂව 6%කින් 2012 වසරේදීද, 2102 වසරට සාපේක්ෂව 45% කින් 2013 වසරේදීද, 2013 වසරට සාපේක්ෂව 42%කින් 2014 වසරේදීද වාර්ෂිකව ලියා පදිංචි කරනු ලබන කෘෂිකාර්මික ට්‍රැක්ටර් සංඛ්‍යාව අඩු වී ඇත.

රාජ්‍ය සේවක මුස්ලිම් බැතිමතුන්ගේ උම්රා සහ හජ් වන්දනාව: වීසා ලබා දීමේ ක්‍රමවේදය

உம்ரா மற்றும் ஹஜ் யாத்திரை செல்லும் முஸ்லிம் அரச ஊழியர்கள் : வீசா நடைமுறை

UMRA AND HAJ PILGRIMAGES FOR MUSLIMS IN PUBLIC SERVICE: VISA GRANTING MECHANISM

5202/'14

12. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා වෙනුවට)
(மாண்புமிகு புத்திக பதிரண - மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Sunil Handunnetti)

මුස්ලිම් ආගමික කටයුතු හා තැපැල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) රජයේ සේවයේ නියුතු මුස්ලිම් ආගමික බැතිමතුන් උම්රා සහ හජ් ආගමික වන්දනාව සඳහා විදේශගත වීම සඳහා අවසර ලබා ගැනීමට ඉදිරිපත් කරන අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතු ලේඛන කවරේද;

(ii) අදාළ පුද්ගලයා ගුරුවරයකු වන විට, ඔහුට එම වන්දනා ගමන සඳහා වැටුප් සහිත නිවාඩු හිමි වන්නේද;

(iii) උම්රා වන්දනාව සහ හජ් වන්දනාව සඳහා විදේශගත වන අය සඳහා සරල අයදුම්පත් හා වීසා ලබා දීමට ක්‍රමවේදයක් සකස් කළ යුතු බව පිළිගන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා මැදිහත් වීමක් සිදු කරන්නේද;

(v) ඉහත වන්දනා චාරිකාවේ යෙදෙන රජයේ සේවකයින් සඳහා අනුමත කරන නිවාඩු දින ගණන කොපමණද;

(vi) එම දින ගණන ප්‍රමාණවත් වන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

முஸ்லிம் சமய அலுவல்கள் மற்றும் தபால் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அரசாங்க சேவையில் ஈடுபட்டுள்ள முஸ்லிம் சமய பக்தர்கள் உம்ரா மற்றும் ஹஜ் யாத்திரைக்காக வெளிநாடு செல்வதற்கு அனுமதி பெற்றுக்கொள்வதற்காக சமர்ப்பிக்கின்ற விண்ணப்பப்படிவத்துடன் முன்வைக்க வேண்டிய ஆவணங்கள் யாவை என்பதையும்;

(ii) ஏற்புடைய நபர் ஓர் ஆசிரியராக இருக்கும் பட்சத்தில், இவருக்கு மேற்படி யாத்திரைக்கு சம்பளத்துடனான லீவு உரித்தாகுமா என்பதையும்;

(iii) உம்ரா யாத்திரை மற்றும் ஹஜ் யாத்திரைக்கு வெளிநாடு செல்பவர்களுக்கு எளிமையான விண்ணப்பப்படிவம் மற்றும், வீசா வழங்கும் முறைமையொன்று உருவாக்கப்பட வேண்டும் என்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(iv) ஆமெனில், அதற்கான தலையீடு மேற்கொள்ளப்படுமா என்பதையும்;

(v) மேற்படி யாத்திரையில் ஈடுபடுகின்ற அரசாங்க ஊழியர்களுக்கு அனுமதிக்கப்படுகின்ற லீவு நாட்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(vi) மேற்படி லீவு நாட்கள் போதுமானதா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Muslim Religious Affairs and Posts:

(a) Will he state -

(i) the documents that should be submitted together with the application forwarded to seek approval to travel overseas for the Umra and Haj pilgrimages by Muslim devotees employed in the Public Service;

(ii) when the relevant individual is a teacher, whether he is entitled to leave with pay for such pilgrimage;

(iii) whether he acknowledges that a simplified application and visa granting mechanism should be formulated for those who travel overseas for the Umra and Haj pilgrimages;

(iv) if so, whether an intervention will be made in this connection;

(v) the number of days of approved leave for Public servants undertaking the above pilgrimage; and

(vi) whether this number of dates is sufficient?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුස්ලිම් ආගමික කටයුතු හා තැපැල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) අදාළ ආගමික වන්දනාව සඳහා නිලධරයා සහභාගි වන බවට තහවුරු කිරීමට ඔහු විසින් ඉදිරිපත් කරන ලද ලිපියක් ලබා ගැනීම ප්‍රමාණවත් වේ.

(ii) ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 24.2 උප වගන්තිවල විධිවිධානවලට යටත්ව වැටුප් සහිත විදේශ නිවාඩු අනුමත කිරීමේ හැකියාවක් ඇත.

(iii) නැත. හජ් වන්දනා සඳහා දැනටමත් සරල අයදුම්පතක් හඳුන්වා දී ඇති අතර, වීසා ලබා දීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් හඳුන්වා දුන් ක්‍රමවේදයක් අනුගමනය කරනු ලැබේ.

(iv) නැත.

(v) නිලධරයා ගුරුවරයෙක් නම් ඉහත ii පිළිතුරේ ඉදිරිපත් කරන ලද නිවාඩුද අනෙකුත් නිලධරයන් වෙනුවෙන් ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 23 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව ඒ ඒ නිලධර ගණය හිමිකම් ලබන නිවාඩුද ලබා ගැනීමේ හැකියාව ඇත.

(vi) ඉහත පිළිතුර අනුව නිලධාරියෙකුට ලබා ගත හැකි නිවාඩු ප්‍රමාණය ඒ ඒ නිලධාරියා උපයා ගත් නිවාඩු ප්‍රමාණය මත තීරණය වන බැවින් ප්‍රමාණාත්මකභාවය පිළිබඳව දෙපාර්තමේන්තුවට පිළිතුරු ලබා දිය නොහැක. කෙසේ වෙතත්, උම්රා වන්දනාවක නිරත වීමට දින 12ක් සහ හජ් වන්දනාවක නිරත වීමට දින 30කුත් වශයෙන් වන්දනාකරුවෙකුට නිවාඩු අවශ්‍ය වේ.

(ආ) අදාළ නොවේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ප්‍රශ්න අංක 15-4772/'14-(2), ගරු අශෝක් අබේසිංහ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අශෝක් අබේසිංහ මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු මොහොම්මදු ෂරීෆ් තවුෆික් මහතා
(மாண்புமிகு மொஹம்மது ஷரீப் தௌபீக்)
(The Hon. Mohammadu Shareef Thoufeek)

Sir, on behalf of the Minister of Internal Transport, I ask for two weeks' time to answer that Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

මීළඟට ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්න. ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

I

රාජ්‍ය සේවකයන්ට හා විශ්‍රාමිකයන්ට ලබා දෙන ප්‍රතිලාභ
அரச ஊழியர்கள் மற்றும் ஓய்வூதியர்களுக்கான நன்மைகள்
BENEFITS FOR GOVERNMENT SERVANTS AND PENSIONERS

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Nimal Siripala de Silva - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 23(2) ස්ථාවර නියෝගය යටතේ මෙම ප්‍රශ්නය නැඟීමට අවසර ලබා දීම පිළිබඳව මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

පසු ගිය රජය විසින් ඉදිරිපත් කරන ලද 2015 අය වැය ලේඛනය පරිදි රාජ්‍ය සේවකයින් හට දෙන ලද විශේෂ දීමනා ඔවුන්ගේ වැටුපට එකතු කිරීමටත්, අවම වැටුප මසකට රුපියල් 15,000 දක්වා වැඩි කිරීමටත්, කනිෂ්ඨ සේවකයන් හා ලේකම්වරුන් අතර වැටුප් අනුපාතය 1:4.25 අනුපාතයට පවත්වා ගනිමින් වැටුප් වර්ධක වැඩි කිරීමටත් යෝජනා කරන ලද අතර, සෑම රජයේ සේවකයකුටම 2015 ජනවාරි මස සිට ගෙවනු ලබන ජීවන වියදම් දීමනාව රුපියල් 10,000 දක්වා රුපියල් 2,200කින් වැඩි කිරීමටත්, මේ අනුව රජයේ සේවකයින්ගේ අවම මාසික වැටුප රුපියල් 25,000 දක්වා වැඩි කිරීමටත්, විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන්, වෛද්‍යවරුන්, අධිකරණ නිලධාරීන් සඳහා ගෙවනු ලබන විශේෂ දීමනාද අදාළ පරිදි වැඩි කිරීමටත් යෝජනා කරන ලද අතර ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 1 පන්තියේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා අනෙකුත් දීප ව්‍යාප්ත සේවා නිලධාරීන්ටද, වසර 20 ඉක්මවූ වෘත්තීය සුදුසුකම් සහිත රාජ්‍ය නිලධාරීන්ටද රුපියල් 15,000ක වෘත්තීය දීමනාවක් ගෙවීමටත් යෝජනා කරන ලදී.

සෞඛ්‍ය සේවාවල නිල ඇඳුම් දීමනාව රුපියල් 500කින්ද, අනෙකුත් සේවාවල නිල ඇඳුම් දීමනාව රුපියල් 300කින්ද වැඩි කිරීමටත්, දින 180 ඉක්මවා ඇති අනියම් හා තාවකාලික සේවකයින් සඳහා තනතුරු ඇත්නම් ඔවුන් ස්ථිර කිරීමටත් යෝජනා කොට ඇත.

රාජ්‍ය සේවකයින්ට ණය ගැනීමට හැකි සීමාව වන මූලික වැටුපෙන් සියයට 40, දළ මාසික වැටුපෙන් සියයට 40 ලෙස සංශෝධනය කිරීමටත්, 5වන ශ්‍රේණියේ සහ මහපොළ ශිෂ්‍යත්ව රාජ්‍ය සේවකයින්ගේ දරුවන්ටත් ලබා දීමටද, සියලුම රජයේ සේවකයින්ට වාරික 10කින් පොලී රහිතව ගෙවිය හැකි වන පරිදි රුපියල් 10,000ක ණය සීමාවන් තුළ ජාතික රක්ෂණ අරමුදල ඇප සහිතව හදිසි අත්තිකාරම් ලබා ගැනීමට බැංකු කාඩ් පතක් නිකුත් කිරීමටද, ශල්‍යකර්ම හා බරපතළ රෝග සඳහා රෝහල්ගත වන රජයේ සේවකයින්ට දෙනු ලබන අග්‍රහාර රක්ෂණය රුපියල් තුන්ලක්ෂ පනස්දහස සිට රුපියල් පන්ලක්ෂය දක්වා වැඩි කිරීමටද, ප්‍රමාණවත් නේවාසික පහසුකම් නොමැති පොලිස් ස්ථානවල සේවය සඳහා අනුයුක්ත කරන ලද නිලධාරීන්ට නිර්නේවාසික දීමනාවක් ගෙවීමටද, රුපියල් 50,000ක සහන මිල යටතේ පොලිස් කොස්තාපල්වරුන්ට සහ පොලිස් සැරයන්ට යතුරු පැදි ලබා දීමටද යෝජනා කරන ලදී.

විශ්‍රාමිකයින් සඳහා 2015 වර්ෂය සඳහා යෝජනා කළ වැටුප් ව්‍යුහයට ගළපමින් විෂමතා ඉවත් කිරීමටද, ස්වයං රැකියා සලසා ගැනීම සඳහා රුපියල් 50,000ක ණය මුදලක් විශ්‍රාම වැටුප ලබා ගන්නා බැංකුවෙන් ඇප රහිතව ලබා ගැනීමටද, මසකට රුපියල් 2,500ක අන්තර් දීමනාවක් ලබා දීමටද, එක් එක් සේවකයාගේ වැටුප හා විශ්‍රාම වැටුප් ගළපමින් සකස් කළ පසු අදාළ වැටුප් විෂමතා හා විශ්‍රාමික හිඟ වැටුප් සමඟ 2015 ජූලි මස සිට මාණ්ඩලික නොවන රාජ්‍ය සේවකයින්ටත් 2015 සැප්තැම්බර් මස සිට මාණ්ඩලික විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන්ටත් ගෙවීමට යෝජනා කරන ලදී.

මෙකී යෝජනා සියල්ල සම්මත වූ අතර, ඒ අනුව රාජ්‍ය සේවකයන්ට සහන සලසා දීමට මෙම රජයද බැඳී සිටී.

මැතිවරණයට පෙර ඉදිරිපත් කරන ලද දින සියයේ වැඩසටහන යටතේ රාජ්‍ය සේවකයින් සඳහා රුපියල් 10,000ක වැටුප් වැඩි වීමක් ලබා දීම සහ එකී මූලික පියවර ලෙස වහාම ක්‍රියාත්මක වන පරිදි පෙබරවාරි මස රුපියල් 5,000ක දීමනාවක් ලබා දීමටත්, සියලුම දීමනා ඇතුළත් කොට ඒකාබද්ධ වැටුප් නිර්ණය කිරීමෙන් අනතුරුව හිඟ මුදල්ද සහිතව ඉතිරි වැටුප් ගෙවීම් ලබා දීම හා මෝටර් බයිසිකල් ලබා දීමේදී අසාධාරණයන්ට ලක් වූ රජයේ සේවකයින් ගැන සොයා බලා ඒ අයටද එම සහන ලබා දීමටත් පොරොන්දු වී ඇත.

ඒ අනුව පහත සඳහන් ප්‍රශ්නවලට මා පිළිතුරු බලාපොරොත්තු වෙමි.

1. 2014 ඔක්තෝබර් මස 24වෙනි දින මෙම පාර්ලිමේන්තුවේ සම්මත කරන ලද අය වැය ලේඛනය ප්‍රකාර රාජ්‍ය සේවකයින්ට හා විශ්‍රාමිකයින්ට ලබා දීමට පොරොන්දු වූ සහන වැටුප් දීමනාවන් එලෙසම ලබා දීමට මෙම රජය කටයුතු කරන්නේද?
2. දින සියය ඇතුළත ක්‍රියාවට නංවන ක්ෂණික සහන වැඩසටහන තුළින් ඇත්ත වශයෙන්ම රාජ්‍ය සේවකයින්ට හා විශ්‍රාමිකයින්ට ලබා දෙන ප්‍රතිලාභයන්හි ස්වරූපය පැහැදිලි කර දෙන්නෙහිද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වන විට මුදල් ඇමතිතුමා ලංකාවේ නැති වුණත් මෙම ප්‍රශ්නයට මම පිළිතුරු දෙන්නම්. ඊට අමතරව තවත් කරුණු ඕනෑ නම් ඇමතිතුමා ඔබතුමාට ලබා දෙයි. විශේෂයෙන්ම අලුතින් දෙන දීමනා පිළිබඳව මේ අවුරුද්දේ පෙබරවාරි 11 වන දින, අංක 05/2015 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මඟින් සඳහන් කර තිබෙනවා. මම කාරණයක් කියන්නම්. ඔබතුමා සඳහන් කරපු මඟින්ද රාජපක්ෂ අය වැයෙන් සාමාන්‍ය රජයේ සේවකයාට ශතයක්වත් හම්බ වුණේ නැහැ. නමුත් කථා කළේ අවුරුදු 15ක්, අවුරුදු 20ක්, අවුරුදු 100ක් රජයේ සේවයේ හිටියා නම් රුපියල් 1,000කින්, 2,000කින් වැඩි කරනවා කියා. පසු ගිය අය වැයෙන්වත්, ඊට ඉස්සෙල්ලා අය වැයෙන්වත්, ඊටත් ඉස්සෙල්ලා අය වැයෙන්වත් සාමාන්‍ය රජයේ සේවකයාට ශතයක්වත් ලැබුණේ නැහැ. අන්තිමට ආණ්ඩුවෙන් ඉවත් වෙලා ජනාධිපතිවරණයට ඉදිරිපත් වූ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා යටතේ තමයි හම්බ වුණේ.

පළමුවැනි වතාවට රජයේ සේවකයාට රුපියල් 5,000ක් පෙබරවාරි මාසයේ හම්බ වෙනවා. රාජ්‍ය සේවයේ හැමෝටම හම්බ වෙනවා. ඒ එක්කම මම කියන්න කැමැතියි, පුද්ගලික අංශයටත් සහන ලබා දෙන්නේ කොහොමද කියා සාකච්ඡා කරන්න දැන් වැටුප් මණ්ඩල සියල්ලම කැඳවා තිබෙන බව. ඒ වාගේම යතුරුපැදි ගැනත් අපි ක්‍රියා කර ගෙන යනවා. තව ලැබිලා තිබෙන සහන මොනවාද? ඇත්ත වශයෙන්ම අද රජයේ

සේවකයන්ට ස්වාධීන අධිකරණයක් තිබෙනවා. ඕනෑම රජයේ සේවකයෙකුට අද ලැබිලා තිබෙන ලාභයක් ඒ. අද ඉන්ධන මිල අඩු වෙලා තිබෙනවා. ඉන්ධන මිල අඩු වුණු නිසා අනෙක් භාණ්ඩවල මිල අඩු වෙලා තිබෙනවා. ගෑස් මිල අඩු වෙලා තිබෙනවා. කිරි පිටි මිල අඩු වෙලා තිබෙනවා. ටින් මාළු මිල අඩු වෙලා තිබෙනවා. පාන් පිටි මිල අඩු වෙලා තිබෙනවා. පාන්, සීනි, මුංඇට, හාල්මැස්සන්, ඇතුළු අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය 13ක මිල අඩු වෙලා තිබෙනවා.

යුද්ධය අවසාන කළාට පසුව බඩු මිල අඩු කරනවා කිව්වාට රාජපක්ෂ රෙජීමයට ඒක කරන්න බැරි වුණා. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා යටතේ අපිට සුමාන දෙකකින් මේ ඔක්කෝම කරන්න පුළුවන් වුණා. මීට ඉස්සෙල්ලා මේක කරන්න බැරි වුණේ ඇයි? රොජර් ෆුඩ් සමාගමට සල්ලි දුන්න නිසාද? දූෂණ සිදු කරපු නිසාද? අන්න ඒවා තමයි අපිට අහන්න තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි, රජයේ සේවකයන්ගේ දරුවන් විශ්වවිද්‍යාලයේ ඉන්නවා නම්, සරසවි මහපොළ ශිෂ්‍යාධාරය රුපියල් 5,000 දක්වා වැඩි කර තිබෙනවා. රජයේ සේවකයන් ගොවිතැන් කරනවා නම්, මෙවර වී කිලෝව රුපියල් 50කටයි මිල දී ගන්නේ. රජයේ සේවකයන් අල වගා කරනවා නම්, අර්තාපල්වල සහතික මිල රුපියල් 80 දක්වා වැඩි කර තිබෙනවා. මේ අයට කිරි පට්ටි තිබෙනවා නම්, කිරි ලීටරයක මිල රුපියල් 10කින් වැඩි කර තිබෙනවා. මේ ඇති වෙලා තිබෙන විශාල කැසිනෝ උවදුරෙන් රජයේ සේවකයන්ගේ භාර්යාවන්, ස්වාමිපුරුෂයන්, දරුවන් සියලු දෙනා ආරක්ෂා කිරීම සඳහා ප්‍රධාන කැසිනෝ ව්‍යාපාර තුනේ බලපත්‍ර අහෝසි කර තිබෙන බව මම කියන්න කැමැතියි. රජයේ සේවකයන්ගේ දරුවන් එතනෝල්වලින්, කුඩුවලින් ආරක්ෂා කරන්න දැන් අපි නීතිය ක්‍රියාත්මක කර ගෙන යන බව මම කියන්න කැමැතියි. මේ රජයේ සේවකයාගේ භාර්යාව, ස්වාමිපුරුෂයා, නැත්නම් දරුවන් ඇඟලුම් කර්මාන්තශාලාවක වැඩ කරනවා නම්, අපි කියන්න කැමැතියි ඒ අයට GSP Plus සහනය ලබා දෙන්න වැඩ කටයුතු කරනවා කියා. ඇත්ත වශයෙන්ම මේ ගොල්ලන් ණය වෙලා තිබෙනවා නම්, උපරිම ලක්ෂ දෙකක වටිනාකමින් උකස් කර ඇති රන් භාණ්ඩ සඳහා ගෙවිය යුතු අධික පොලිය සහ දඩ මුදල් කපා හැර තිබෙනවා. ඒ වාගේම විවිධ මූල්‍ය ආයතන මඟින් දෙන ලද පොරොන්දු, Credit Card යෝජනා හා පිරමිඩ් ක්‍රමය මඟින් රැවටීමට ලක්වීම නිසා පැටවී ඇති ණය පිට ණය කපා හැරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග අරගෙන තිබෙනවා. අද කිසි බයක් නැතුව සුදු වැන් එකක් ගැන හිතන්නේ නැතුව රජයේ සේවකයන්ට ක්‍රියා කරන්න පුළුවන්.

මෙතුමන්ලා අපි ඔක්කොම කථා කරන්නේ නැවතත් ස්වාධීන කොමිෂන් සභා ඇති කරන්න ඕනෑ කියායි. එතකොට ස්වාධීන රාජ්‍ය සේවා කොමිසමක් ඇති කරනවා. ස්වාධීන අධිකරණ සේවා කොමිසමක් ඇති කරනවා. ස්වාධීන පොලිස් කොමිසමක් ඇති කරනවා. අල්ලස් ගන්න එක නැති කිරීමට ස්වාධීන අල්ලස් කොමිසමක් ඇති කරනවා. ලැබෙන ප්‍රතිලාභ සමහරක් ගැනයි මම සඳහන් කළේ. තව සඳහන් කරන්න විශාල ලැයිස්තුවක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ සියල්ලම කියන්න යන්නේ නැහැ. මේ ඔක්කෝම මේ රටේ රජයේ සේවකයන්ටත්, ජනතාවටත් ලැබෙන ප්‍රතිලාභ. මේ රටේ ජනතාවට ලැබෙන විශාලම ප්‍රතිලාභය තමයි යහ පාලනය. ඒ වාගේම රටේ ජනතාවට අනාගතය ගැන ස්ථිර බලාපොරොත්තුවක් ඇති වුණා.

අප අද අහන්න ඕනෑ ප්‍රශ්න මොනවාද? මහින්ද රාජපක්ෂ රෙජීමයට මේවා දෙන්න බැරි වුණේ ඇයි? මහින්ද රාජපක්ෂ රෙජීමය මොකක්ද කළේ? ඒ කාලයේ මොකක්ද සිදු වුණේ? ඇයි මේ සහන නොදී සිටියේ? මොනවාටද මේ මුදල් ගියේ? සුමාන දෙකකින් මේ සහන දෙන්න මේ ආණ්ඩුවට පුළුවන් නම්, අවුරුදු 5ක් තුළ ඒවා දෙන්න ඒ ආණ්ඩුවට බැරි වුණේ ඇයි? මෙන්න මේ ප්‍රශ්න තමයි මේ සභාවේ මන්ත්‍රීවරුන් අද අහන්න ඕනෑ කියා මා කියන්න කැමැතියි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මීළඟට, ස්ථාවර නියෝග 23 (2) යටතේ ප්‍රශ්නය, ගරු අනුර දිසානායක මහතා.

II

සාගර ආරක්ෂක සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයන් මුහුණ පා ඇති ගැටලු

கடல் பாதுகாப்புச் சேவையிலுள்ள இலங்கையர் எதிர்நோக்கும் பிரச்சினைகள்

PROBLEMS FACED BY SRI LANKANS IN MARITIME SECURITY SERVICE

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 23 (2) යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

පසු ගිය කාලයේ ආරක්ෂක අමාත්‍යාංශය විසින් ගන්නා ලද අත්තනෝමතික තීරණ හේතුවෙන් සාගර ආරක්ෂක සේවයේ නියුතුව සිටින ශ්‍රී ලාංකිකයන් විශාල සංඛ්‍යාවකට මුහුණ පෑමට සිදුවී ඇති ගැටලුකාරී තත්ත්වය පිළිබඳව මෙම සභාවේ අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

සෝමාලියානු මුහුදු කොල්ලකරුවන්ගෙන් වෙළෙඳ නෞකා ආරක්ෂා කර ගැනීම සඳහා ජාත්‍යන්තර මුහුදු නීතිවලට අනුකූලව, ජාත්‍යන්තර සමුද්‍ර සංවිධානයේ අධීක්ෂණය යටතේ 2008 වසරේ සිට ජාත්‍යන්තර මුහුදේ නෞකා ආරක්ෂක රාජකාරි සඳහා ජාත්‍යන්තර ආයතන ලොව පුරා ස්ථාපිත කිරීමට අවසරය ලබා දී තිබුණා. 2009 වසරේ සිට ශ්‍රී ලංකා සන්නද්ධ සේවාවන්හි සේවය කර නීත්‍යානුකූලව ඉවත් වූ හා නීත්‍යානුකූලව විශ්‍රාම ලැබූ ශ්‍රී ලාංකික සෙබළුන්හට මුහුදු ආරක්ෂකයන් - sea marshals - ලෙස එම රැකියාවලට ඇතුළු වීමට අවස්ථාව ලැබුණා. මේ වෙනුවෙන් ඔවුන්හට විදේශීය නෞකා ආරක්ෂක සමාගම් විසින් ඉතා විශාල මුදල් ප්‍රමාණයක් - ඇමෙරිකානු ඩොලර් 2,000කට 2,500කට ආසන්න මාසික වැටුපක්- ගෙවීවා. එම සමාගම්වල රැකියා කොන්දේසි අනුව මෙම සාගර ආරක්ෂක නිලධාරීන්ගේ සියලු වියදම් විදෙස් ආයතනයන් විසින් දැරූ අතර රක්ෂණාවරණය ලෙස එක් නිලධාරියකු ජීවිතක්ෂයට පත් වුවහොත් ඇමෙරිකානු ඩොලර් 250,000ක වන්දි මුදලක් හා සෞඛ්‍යාවරණය වෙනුවෙන් ඇමෙරිකානු ඩොලර් 100,000ක මුදලක් ද හදිසි අනතුරක දී මුහුදේ සිට ගොඩ බිම වෙත රැගෙන ඒම සඳහා ඇමෙරිකානු ඩොලර් 25,000ක්ද -හෙලිකොප්ටරයකින් වෙන්න පුළුවන්, වේගවත් බෝට්ටුවකින් වෙන්න පුළුවන්, ඔහුව ගෙන ඒමට ඉඩ කඩ ලබා දී තිබුණා- ඒ ආදි වශයෙන් ජාත්‍යන්තර නාවික ක්ෂේත්‍රයේ සාගර ආරක්ෂක නිලධාරියකුහට හිමි සියලු වරප්‍රසාද පහසුකම් හිමිව තිබුණා. එසේම මෙමඟින් ඉතා විශාල විදේශ විනිමයක් රටට ලබා ගැනීමට අවස්ථාව ලැබුණා.

මේ අතර, 2013 රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ඩී.එම්.එස්. දමයන්ති ජයරත්න මහත්මියගේ -එතුමියගේ දරුවන් ඉගෙනගන්නේ කොහේද, ඉගෙන ගන්න යැව්වේ කවුද, ආදායම් මොනවාද, ඒ තරම් දේපළ කොහෙන්ද යනාදිය සම්බන්ධයෙන් එතුමිය ගැන විශේෂයෙන් සොයන්න කියා කියනවා- අත්සනින් යුතු යොමු අංක MODUD/CS/AGMS/SM හා 2013.06.18වන දිනැති ලිපියෙන් හා යොමු අංක MODUD/CS/AGMS/SM හා 2013.07.24 දිනැති ලිපියෙන් නෞකා

[ගරු අනුර දිසානායක මහතා]

ආරක්ෂක රාජකාරි සඳහා ජාත්‍යන්තර ආයතනවලට විශේෂ නියෝගයක් පැනවූවා. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය විසින් ජාත්‍යන්තර ආරක්ෂක සංවිධානවලට විශේෂ නියෝගයක් යවනු ලැබුවා. මෙම නියෝගයට අනුව සියලු විදේශීය සමුද්‍ර ආරක්ෂක සමාගම් රක්නා ආරක්ෂක ලංකා හා ඇවන්ට්ගාඩ් මැරිටයිම් සර්විසස් යන සමාගම්වල ලියා පදිංචි විය යුතුව තිබුණා. සමාගම් ගණනාවක් මේ කාර්යය කරමින් තිබුණා. විශාල මුදලක් ඔවුන් අත් පත් කරගනිමින් තිබුණා. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ උපදෙස් මත එහි සිටි අතිරේක ලේකම්වරිය රක්නා ආරක්ෂක ලංකා සමාගමටත්, ඇවන්ට්ගාඩ් සමාගමටත් පමණක් ඒ අවසරය ලබා දෙන්න කටයුතු කළා. එසේම ඔවුන්ගේ ආයතනයන්හි සේවය කරන සියලු ශ්‍රී ලාංකික සාගර ආරක්ෂක නිලධාරින් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය නිර්දේශ කරන සමාගම් දෙකට අන්තර්ග්‍රහණය කරන ලෙස නියෝග කෙරුණා. ඒ වන විටත් වැඩ කරමින් සිටි අය ආපසු ලංකාවට කැඳවලා මේ සමාගම් දෙකෙහි පමණක් ලියා පදිංචි විය යුතුයි, එසේ කිරීමෙන් පමණක් රටෙන් බැහැරව යා යුතුයි කියලා තීරණයක් ගත්තා. මා එම ලිපිවල පිටපත් **සභාගත*** කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

එම නියෝගයට අනුව විදේශීය සමාගම් කිහිපයක් මෙම ආයතන වෙත ලියා පදිංචි වුණා. එසේ තමන්ගේ සේවකයන් මෙම සමාගම් දෙකට අන්තර්ග්‍රහණය කළ විදේශ ආයතන නැවත එම සේවකයන්ට මසකට ඇමෙරිකානු ඩොලර් 2,500ත් 4,000ත් අතර මුදලක් ගෙව්වා. මෙම ආයතන දෙකට එක සෙබළකු වෙනුවෙන් මාසයකට ඇමෙරිකානු ඩොලර් 2,500ත්-4,000ත් අතර මුදලක් ගෙව්වා. මෙම මුළු මුදල රක්නා ආරක්ෂක ලංකා ආයතනය විසින් ලබා ගත් නමුත් සාගර ආරක්ෂක නිලධාරියකුගට රක්නා ආරක්ෂක ලංකා ආයතනය වේතනය වශයෙන් ගෙවනු ලැබුවේ ඇමෙරිකානු ඩොලර් 950ත්-1,000ත් අතර ප්‍රමාණයක්. එම විදේශීය සමාගමෙන් ඇමෙරිකානු ඩොලර් 2,500ත්- 4,000ත් අතර ප්‍රමාණයක් ගන්නවා.

හැබැයි, වැඩ කරපු සේවකයාට හම්බ වුණේ කීයද? ඇමෙරිකන් ඩොලර් 950ත්-1,000ත් අතර ප්‍රමාණයක්. මෙම සමාගම් දෙකට එක සෙබළෙකුගෙන් ඇමෙරිකන් ඩොලර් 1,500කටත්, 2,000කටත් වඩා අතිරේක ආදායමක් එක මාසයක් තුළ විතරක් ලැබුණා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒකෙන් තමයි විවිධ අය මිලදී ගන්න හැකියාව ලැබුණේ. ඒකෙන් තමයි හිටපු නාවික හමුදාපතිවරු තිදෙනාම ඔහුගේ රැකියාලාභීන් බවට පත් කර ගත්තේ. ඒ අනුව තමයි විදේශීය රටක නාවික හමුදාපතිවරයෙකු පවා ඇවන්ට් ගාඩ් මෙරිටයිම් සර්විසස් සමාගමේ සේවකයෙකු බවට පත් කර ගෙන තිබෙන්නේ. මේ රටේ ඇත්ත සෙබළුන්ට අයිති ධනස්කන්ධයක් මේ සමාගම් දෙක කොල්ල කෑවා.

ඒ විතරක් නොවෙයි. වැටුප් පතක් මා ඉදිරිපත් කරන්නම්. ඒ වැටුප් පතේ මොනවාද තිබෙන්නේ? ඒ වැටුප් පත්වලට වංචනික ලෙස මූලික වැටුප ලෙස රුපියල් 10,000ක් ඇතුළත් කර ඇති අතර, එම මුදලින්ද EPF සහ ETF ලෙස ඔවුන්ගෙන් අඩු කළ මුදල්ද මෙතෙක් ගිණුම්වලට බැර කර නැහැ. ඔවුන්ට වැටුප වශයෙන් ඩොලර් 1,000ක් දුන්නත් ශ්‍රී ලංකා මුදලින් එය රුපියල් 130,000ක් වනවා. හැබැයි, මූලික වැටුප ලෙස නම් කළේ රුපියල් 10,000යි. ඒකෙන් තමයි EPF සහ ETF ගෙව්වේ. අපට ලැබී තිබෙන තොරතුරු අනුව ඒකත් මේ වෙන කොට ඇතුළු කර නැහැ. වැටුපේ ඉතිරිය ලෙස රුපියල් 117,000කට ආසන්න මුදලක් ගෙවා ඇත්තේ 'මුහුදු දීමනා' වශයෙනුයි. වැටුප රුපියල් 127,000යි. නමුත්, 'මූලික වැටුප' ලෙස රුපියල් 10,000ක් දමනවා. 'මුහුදු දීමනා' කියලා රුපියල් 117,000ක් දමනවා. මෙසේ විදේශීය ආයතනවලින් ලබා ගන්නා ලද මුදලින් ඉතිරි ඇමෙරිකන් ඩොලර් 1,500ත්-3,000ත් අතර මුදලක් සමාගම් දෙකක ලාභය ලෙස විදේශ ගිණුම්වලට බැර කර ගනු ලැබුවා. එසේම සාගර ආරක්ෂක නිලධාරියෙකු මිය යාමකදී විදේශීය ආයතන මඟින් ගෙවනු ලැබූ ඇමෙරිකන් ඩොලර් 250,000ක රක්ෂණාවරණය (දළ වශයෙන් රුපියල් ලක්ෂ 325ක් පමණ) රුපියල් ලක්ෂ 60ක් දක්වා අඩු කළා. රක්නා ආරක්ෂක ලංකා ආයතනයයි, ඇවන්ට් ගාඩ් මෙරිටයිම් සර්විසස් සමාගමයි කියන මේ ආයතන දෙක හොරා කෑවා විතරක් නොවෙයි, මළ මිනීවලිනුත් හොරා කෑවා.

එම රක්ෂණාවරණය රුපියල් ලක්ෂ 60ක් දක්වා අඩු කර රුපියල් 50,000ක මාසික ගෙවීමක් ඊළඟ භාරකරු වෙත ගෙවීමේ ගිවිසුමකට එන ලෙසට ශ්‍රී ලාංකීය සාගර ආරක්ෂක නිලධාරින්ට බල කර තිබුණා. කෙනෙකු මැරුණාම ඒ රක්ෂණ වන්දිය අයිති වන්න ඕනෑ, ඔහුට. ඒක තමයි ඔහුගේ රක්ෂණාවරණය. ඒකත් මෙම ආයතන දෙක අරගෙන තිබුණා. රුපියල් ලක්ෂ 325ක් වැනි මුදලකින් රුපියල් ලක්ෂ 60කට ආසන්න මුදලක් තමයි ඒ සේවකයන්ට ගෙව්වේ. මළ මිනීවලිනුත් හොරකම් කරපු ආයතන දෙකක් තමයි, රක්නා ආරක්ෂක ලංකා ආයතනයයි, ඇවන්ට් ගාඩ් මෙරිටයිම් සර්විසස් සමාගමයි.

මේ තත්ත්වය තුළ විදේශීය නාවුක සමාගම්වලට ආරක්ෂක අමාත්‍යාංශය විසින් ගොඩ නඟන ලද ඒකාධිකාරය වන රක්නා ආරක්ෂක ලංකා ආයතනයට හා ඇවන්ට් ගාඩ් මෙරිටයිම් සර්විසස් සමාගමට ගෙවීමට සිදු වුණු කොමිස් මුදල ඉතා අධික වූ නිසා එම සමාගම් රක්නා ආරක්ෂක ලංකා ආයතනය හරහා ශ්‍රී ලංකා ආරක්ෂක නිලධාරින් සේවයට ගැනීම නතර කර දැමුවා. තව සමාගම් ගොඩක් තිබුණා. මේ සමාගම් දෙකට විතරක් දුන්නේ ඇයි? ඒ මුදල් ගනුදෙනු වුණේ කොහෙන්ද කියලා මේ පාර්ලිමේන්තුව දැන ගන්න ඕනෑ. මෙහෙම මේ ගොල්ලන්ට මේ රැකියා ලබා දෙන්න බැහැ කියලා අපට හම්බ වුණු වෙළඳ පොළක් අත් හැර දැමුවා. මෙරට ආයෝජනය කළ විශාල විදෙස් ආයතන ප්‍රමාණයක් ආසියානු කලාපයේ වෙනත් රටවලට ඔවුන්ගේ ව්‍යාපාර රැගෙන ගියා. සමහර අය බංග්ලාදේශයෙන් මේ සඳහා සේවකයින් ගෙන යනවා. දැන් පාකිස්තානයෙනුත් ගෙන යනවා. සමාගම් දෙකකට ඒකාධිකාරිත්වයක් ගොඩ නැඟීම හරහා අපට ලැබී තිබුණු ඒ වෙළඳ පොළත් අපට නැති කළා. දේශීය වශයෙන් ක්‍රියාත්මකව තිබූ කුඩා ප්‍රමාණයේ සාගර ආරක්ෂක සමාගම් කිහිපයක්ද මේ නිසා වැසී ගියා. සාමාන්‍ය වශයෙන් පටන් ගත් සමාගම් නවයක් විතර දේශීයව තිබුණා. මේ හා සම්බන්ධ එක් පුද්ගලයෙකු මට හම්බ වුණා. ඔහු තමයි මේ ව්‍යාපාරය හොයා ගෙන ආවේ. මේ සමාගම් දෙකට පමණක් මේ ඒකාධිකාරිත්වය පිරිනැමීම හරහා ඔහුගේ ව්‍යාපාරයත් වසා දමන්න සිද්ධ වුණා. එහි ප්‍රතිඵලය වූයේ තමන් විසින්ම රැකියා සොයා ගත් 800කට අධික ශ්‍රී ලාංකික සාගර ආරක්ෂක නිලධාරින්හටද, වෙනත් දේශීය සාගර ආරක්ෂක ආයතනයන්හි රැකියා කළ ශ්‍රී ලාංකීය සාගර ආරක්ෂක නිලධාරින් 300කට අධික ප්‍රමාණයකටද රැකියා අහිමිවීමයි. ඇයි ඒ? මෙම ආයතන දෙකේ ක්‍රියා කලාපය නිසා වැඩ කරමින් සිටි අයට එන්න වුණා. අනික් සමාගම් වහලා එතැනත් 300කට විතර රැකියා අහිමි වුණා. එසේම වක්‍රානුකූලව වෙනත් දේශීය ආයතනයන්හි ඊට අදාළ සේවා සැපයූ 500කට අධික ප්‍රමාණයකටද මේ තීරණය නිසා රැකියා අවස්ථා අහිමි වුණා.

ශ්‍රී ලංකා නාවික හමුදාව මඟින් රජයේ භාණ්ඩාගාරයට, නැව් නියෝජිතයන්, හෝටල්, ප්‍රවාහන ගුවන් සේවා, ආගමන විගමන,

---

* **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

රේගුව, වරාය අධිකාරිය වැනි රාජ්‍ය හා පෞද්ගලික අංශවලට ලැබෙන කෝටි ප්‍රකෝටි ගණන් වූ විදේශ ආදායම් අහිමි වීමටද ආරක්ෂක අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයා ඇතුළු ඉහළ නිලධාරින් විසින් ගත් මෙම තීරණය බලපෑවා.

දේශ ප්‍රේමීත්වය පිළිබඳ සළුපිළි පටලවාගෙන, යුද්ධ ජයග්‍රහණය පිළිබඳ සළුපිළි පටලවාගෙන මේ රටට ලැබුණු ඒ අතිශය මහත් ධනය කොල්ලකෑවා. තමන්ගේ හිතවාදී සමාගම් දෙකකට ඒවා පවරා දුන්නා.

මේ අනුව පැන නඟින පහත ගැටලුවලට පිළිතුරු අදාළ අමාත්‍යවරයා විසින් මෙම සභාව හමුවේ තබනු ඇතැයි අපේක්ෂා කරනවා.

1. ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යනු ලබන සාගර ආරක්ෂක ආයතන බොහොමයක් තිබියදී විනිවිදභාවයකින් හා ටෙන්ඩර් කැඳවීමකින් තොරව ආයතන දෙකකට පමණක් රජ්‍ය අනුග්‍රහය මත අවසර ලබා දීමේ පදනම කවරේද?

   එවැනි සමාගම් ගණනාවක් තිබුණා. ඇයි මේ සමාගම් දෙකට විතරක් අවසර ලබා දුන්නේ? ඒක මේ පාර්ලිමේන්තුව දැන ගන්න ඕනෑ. ඒ සඳහා ටෙන්ඩර් කැඳෙව්වා ද? ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළාද? තෝරා ගැනීමේ පටිපාටියක් අනුගමනය කළා ද? ඒ කිසිවක් නැහැ. ධම්මිකා ජයරත්නගේ හිතුමනාපයට, ආරක්ෂක ලේකම්වරයාගේ නියෝගයට අනුව මේ ලිපි දෙක මඟින් මේ සමාගම් දෙකට විතරක් අයිතිය ලබා දුන්නා.

2. රක්නා ලංකා හා ඇවන්ට්ගාඩ් මැරිටයිම් සර්විසස් ආයතනය විශේෂ වරප්‍රසාද මත දකුණු ආසියා කලාපයේ රටවල සාගර ආරක්ෂක නිලධාරින් අඩු මුදලකට මෙරටට ගෙන්වා - බංග්ලා දේශයෙන්, පාකිස්තානයෙන් - ඔවුන් විදේශ ආයතන සඳහා ලබා දී ශ්‍රී ලාංකිකයන් ගේ රැකියා අහිමි කර විදේශිකයන්ගේ සේවා ලබා ගැනීමට රජය අවසර ලබා දුන්නා ද? එසේ නම්, ඔවුන් රජයට අය විය යුතු බදු හෝ ගාස්තු ගෙවා තිබේද? ඒක දැන ගන්න ඕනෑ. දැන් එහෙම ඒ සමාගම් දෙකෙන් සේවකයන් යවනවා.

3. සියලුම ශ්‍රී ලාංකික සාගර ආරක්ෂක නිලධාරින් හට ලබා දීමට අවශ්‍ය රැකියා අවස්ථා මෙම දේශීය ආයතන දෙක තුළ නොමැති වීම හේතුවෙන් රැකියා අවස්ථා ලබාගැනීමට පොරොත්තු ලේඛනයේ බලා සිටීමට සිදුවීම පිළිබඳව වග කිව යුත්තේ කවුරුන්ද?

   මේ ආයතන දෙක තුළ ඒ තරම් රක්ෂා තිබුණේත් නැහැ. වෙන දා ඒ අය රැකියා සොයා ගෙන යනවා, සමාගම් හරහා. දැන් ඒ අයට මේ සමාගම්වල පොරොත්තු ලේඛනයේ ඉන්න සිද්ධ වෙලා තිබෙනවා, රක්ෂාවක් සොයා දෙනතුරු. එවැනි තීරණයක් ගන්නට හේතු වුණේ ඇයි?

4. ආරක්ෂක අමාත්‍යාංශ නියෝග හේතුවෙන් 2013.06.18 වන දින සිට වෙනත් රටවල සාගර ආරක්ෂක නිලධාරින්ගේ සේවාව ලබා ගැනීම මත රැකියා අහිමි වූ සහ පොරොත්තු ලේඛනයන්හි රැඳී සිටීමට සිදුව ඇති අප රටෙහි සාගර ආරක්ෂක නිලධාරින් හට වන්දි මුදල් ලබා දීමට පියවර ගනු ලබන්නේ ද?

   අද ඔවුන්ගේ ජීවිතයත් කඩා වැටෙනවා. ඔවුන්ගේ ආදායම් මාර්ග අහිමි වුණා. ඔවුන්ගේ රක්ෂා අහිමි වුණා, මෙම සමාගම් දෙකට ඒකාධිකාරීත්වය පැවරීම නිසා. ඔවුන්ට වන්දි මුදලක් දෙන්න කටයුතු කරනවාද කියලා දැන ගන්න කැමැතියි.

5. මෙම සමාගම් දෙක විසින් සාගර ආරක්ෂක නිලධාරින් දහස් ගණනක් විදේශ ආයතන වෙත විකුණා සහ කුලියට දී ඉපැයූ අතිවිශාල විදේශ විනිමය විදේශ ගිණුම්වලට බැර කිරීමෙන් ලබා ගත් අතිවිශාල මුදලෙන් රජයට හිමිවිය යුතු බදු මුදල් රජයට ගෙවනු ලැබුවේද? ඒවා නීත්‍යානුකූල ලෙස ගිණුම් ගත වී ඇත්ද? මෙමඟින් රාජ්‍ය හා මුදල් ආයෝජන පනත යටතේ වංචා හෝ දූෂණයක් සිදු වී තිබේද?

   මේ තමයි නූතන වහල් සේවය. රක්නා ලංකා සමාගමයි, ඇවන්ට්ගාඩ් සමාගමයි කළේ නූතන වහල් සේවය. මිනිස්සු මිලදී අරගෙන විකුණනවා. ඒ මුදලින් වැඩි පංගුවක් ඒ සමාගම් තියා ගන්නවා. ඒ සේවකයන්ට සොච්චම් මුදලක් දෙනවා. මේ සමාගම් දෙක නූතන වහල් වෙළඳාමේ යෙදුණා. ඒ සමහර මුදල් ඒ රටවල්වලම තැන්පත් කළා. ඒ සමාගම් සල්ලි දෙනකොට ඒ රටවල්වලම තැන්පත් කළා. එයින් ශතයක් මෙහාට ආවේ නැහැ. අඩුම තරමින් ආදායම් බද්දක්වත් පිරිවැටුම් බද්දක්වත් ලංකාවට ලැබුණේ නැහැ. අපේ රාජ්‍ය මුදල් පරිහරණය පිළිබඳව තිබෙන පනත් අනුව මේවා ගණනය කරන්න පුළුවන්.

6. අමාත්‍යාංශ නියෝග අනුව සමාගම් දෙකකට අන්තර් ග්‍රහණය කළ සේවකයන්ට සිදු වී ඇතැයි පැවසෙන අසාධාරණකම් හා ඔවුන් මුහුණපාන ගැටලු පිළිබඳව විමසා බැලීම සඳහා රජය ගන්නා වූ පියවර කවරේද?

   මෙතැන අසාධාරණයක් සිදු වෙලා තිබෙනවා. ඒකට රජය ගන්නා පියවර මොකක්ද?

7. ආරක්ෂක අමාත්‍යාංශය මඟින් ගන්නා ලද තීරණය සමාලෝචනය කර - මේ ආයතන දෙකකට විතරක් අධිකාරිත්වයක් ලබා දීම - අප රටේ සාගර ආරක්ෂක නිලධාරින් හට නිදහසේ එම රැකියාව කර ගෙන යෑමට හා ආයෝජකයන් හට පෙර පරිදි අප රට සමඟ ගනුදෙනු කිරීමට ඉඩ සලසන්නේද?

   මේ ඒකාධිකාරිත්වය බිඳිනවාද කියලා දැන ගන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

   ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අද ඇවන්ට්ගාඩ් සමාගමේ ප්‍රශ්නය පැන නැඟුවේ එහි මුහුදු ආරක්ෂක සේවකයන් පිළිබඳවයි. හැබැයි, ඒ වාගේම අවි ආයුධ ගබඩාවක් පවත්වා ගෙන යෑමේ ප්‍රශ්නයත් තිබෙනවා. එය ජාත්‍යන්තර මුහුදේ පවත්වා ගෙන යන අවි ආයුධ ගබඩාවක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේගේ දිස්ත්‍රික්කයේ, ගාලු වරායේ අවි ආයුධ ගබඩාවක් පවත්වාගෙන යනවා. ඒ වාගේම, රක්නා ලංකා ආයතනයේ අවි ආයුධ ගබඩාවක් BMICH ආයතනයේ පවත්වා ගෙන යනවා. මම මේක ඉතා වගකීමෙන් කියනවා. මම මේ ගැන මහජන සාමය සම්බන්ධයෙන් කටයුතු කරන අමාත්‍යවරයාටත් කිව්වා. රංගල කියන කැම්ප් එකේ කන්ටේනරයක් ඇතුළේ අදත් රක්නා ලංකා ආයතනයේ අවි ආයුධ තැන්පත් කර තිබෙනවා. අවි ආයුධ නිදැල්ලේ හසුරුවන ආයතන දෙකක් ගොඩ නඟලා තිබෙනවා. මේවා මඟින් ජාතික ආරක්ෂාවට බරපතළ තර්ජනයක් ඇති කර තිබෙනවා. මේ පිළිබඳව ඉදිරියේ දී මම -

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ස්වයංක්‍රීය ආයුධත් තියාගෙන ඉන්නවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්. එහෙම ආයුධ තමයි තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අද මතු කළේ ඇවන්ට්ගාඩ් සමාගමත්, රක්නා ලංකා සමාගමත් එක් වෙලා අපේ රටේ මුහුදු ආරක්ෂක සේවකයන්ගේ වැටුප කොල්ල කාපු විධියයි.

[ගරු අනුර දිසානායක මහතා]

මම නැවත ප්‍රශ්න කරනවා, එම ආයතන දෙක අපේ රටේ නීති විරෝධී ලෙස අවි ආයුධ රැස් කර තිබුණු ප්‍රමාණය, මුහුදු ගබඩාවල තැන්පත් කර තිබුණු ප්‍රමාණය, හමුදා කඳවුරු ඇතුළේ, කන්ටේනර් ඇතුළේ තැන්පත් කර තිබුණු ප්‍රමාණය ගැන. මම ඒ පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ නැවත ප්‍රශ්න නඟන්න සූදානම්. ස්තූතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේ ප්‍රශ්නයට හෙට උත්තරයක් දෙනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මංගල සමරවීර මහතා

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේ වාර්තාව කල් දැමීම: විදේශ කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය
ஐக்கிய நாடுகள் மனித உரிமைகள் பேரவையின் அறிக்கை ஒத்திவைப்பு: வெளிநாட்டலுவல்கள் அமைச்சரினது கூற்று
POSTPONEMENT OF REPORT OF UNITED NATIONS HUMAN RIGHTS COUNCIL : STATEMENT BY MINISTER OF FOREIGN AFFAIRS

ගරු මංගල සමරවීර මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு மங்கள சமரவீர - வெளிநாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. Mangala Samaraweera - Minister of Foreign Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පෙබරවාරි 19 වැනි දා විපක්ෂ නායකතුමා විසින් ස්ථාවර නියෝග 23(2) යටතේ කරන ලද ප්‍රකාශය සම්බන්ධයෙන් මේ අවස්ථාවේදී මගේ පිළිතුර ලබා දෙන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාවලිය නිසාත්, අවුල් සහගත වූ විදේශ ප්‍රතිපත්තිය නිසාත්, එම රජය විසින්ම එකඟ වන ලද ජාත්‍යන්තර වගකීම් ඉටු කිරීමට දිගින් දිගටම අපොහොසත් වූ නිසාත් අප රටේ අභ්‍යන්තර කටයුතුවලට මැදිහත් වීමට අවශ්‍ය දොරටු පසු ගිය රාජපක්ෂ රජය විසින් ජාත්‍යන්තරයට විවෘත කර දුන්නා.

එපමණක් නොවෙයි, 2009 මැයි මාසයේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහලේකම් බෑන් කී මූන් මහතා සහ එවකට හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා හමු වුණු අවස්ථාවේදී, රාජපක්ෂ ජනාධිපතිවරයා විසින් ජාත්‍යන්තර ප්‍රමිතීන් අනුව යුද අපරාධ සම්බන්ධයෙන් පරීක්ෂණයක් තැබිය යුතුයි කියලා එකඟත්වයක් පළ කළා. නමුත්, එවකට විපක්ෂයේ හිටපු අප දිගින් දිගටම කියා හිටියේ, අප රටට එරෙහිව මානව අයිතීන් කඩ කිරීමේ චෝදනා හෝ යුද අපරාධ චෝදනා ඇත්නම් ඒවා පරීක්ෂා කළ යුත්තේ ස්වාධීන දේශීය අධිකරණ පද්ධතියක් තුළ බවයි. එපමණක් නොව, මෙවැනි චෝදනාවලට වරදකරුවන් ඇත්නම් ඒ අයට දඬුවම් කළ හැකි නීති පද්ධතියක් අප රට සතු බවද ඒ අවස්ථාවේදී අප ප්‍රකාශ කළා. එදා අප සිටි ස්ථාවරය අදත් වෙනස් වී නැති බවට මා මුලින්ම ප්‍රකාශ කරන්න කැමැතියි.

ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කඩවීම සම්බන්ධයෙන් එල්ල වී ඇති චෝදනා පිළිබඳ සොයා බැලීමට විශ්වාසවන්ත දේශීය පරීක්ෂණයක් සිදු කළ යුතුය යන ස්ථාවරයේ අපි ඉන්නවා. පසු ගිය ජනාධිපතිවරණය වෙනුවෙන් අප ඉදිරිපත් කළ "වෙනසකට එක්වෙමු. මෛත්‍රී පාලනයක් 100 දිනකින් අලුත් රටක්." කියන ලියැවිල්ලේ දින සියයක් ඇතුළත ක්‍රියාවට නංවන සහන වැඩසටහන් අතරේ 93වැනි වගන්තිය යටතේ අපි මෙසේ සඳහන් කළා:

> "ජාත්‍යන්තර යුද අපරාධ අධිකරණය ස්ථාපිත කළ රෝම ප්‍රඥප්තියට ශ්‍රී ලංකාව අත්සන් තබා නැති නිසා එවැනි චෝදනා වෙතොත් ඒ පිළිබඳ යුක්තිය පසිඳලීමේ කාර්යය දේශීය ස්වාධීන අධිකරණයක් යටතේ සිදු කිරීම."

අපේ අගමැතිතුමාගේ දූරදර්ශී නුවණට පිං සිද්ධ වෙන්න ජාත්‍යන්තර යුද අපරාධ අධිකරණය ස්ථාපිත කළ රෝම ප්‍රඥප්තියට ශ්‍රී ලංකාව අත්සන් නොකළ නිසා, එවැනි චෝදනා වෙතොත් ඒ පිළිබඳ යුක්තිය පසිඳලීමේ කාර්යය දේශීය ස්වාධීන අධිකරණයක් යටතේ සිදු කරන බව අප ඒ ප්‍රකාශනයෙන් කියා තිබෙනවා. ඒ අනුව අප මෙවැනි දේශීය යාන්ත්‍රණයක් පිහිටු වීමට කටයුතු කරන්නේ ජාත්‍යන්තරයට ලබා දුන් පොරොන්දුවක් අනුව නොව, අප රටේ ජනතාවට පසු ගිය ජනාධිපතිවරණයේදී ලබා දුන් පොරොන්දුවක් ඉෂ්ට කිරීමක් වශයෙන් බව මා පැහැදිලිවම ප්‍රකාශ කරන්න ඕනෑ. අපි හැම විටම වග කියන්නේ ජාත්‍යන්තර ප්‍රජාවට නොව, මේ රටේ ජනතාවටයි. කෙසේ වෙතත්, ජාත්‍යන්තර ප්‍රජාව සමඟ යළි සුහදශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් ලබා ගත හැකි වාසි සියල්ල අප රටේ ජනතාව වෙත ලබා දීමත් අපේ මූලික අරමුණයි.

මේ වන විට එවැනි පරීක්ෂණයක් සිදු කිරීමට අවශ්‍ය ස්වාධීනතාවෙන් අපේ අධිකරණ පද්ධතිය නැවතත් පොහොසත්ව සිටිනවා. ලෝකය පිළිගන්නා දක්ෂ විනිසුරුවරුන් අපට ඉන්නවා. නීතිවිරෝධී ලෙස ධූරයේ රැඳී සිටි අග විනිසුරුවරයා ඉවත් කර, එම ගරු තනතුර දැරීමට අවශ්‍ය සියලු සුදුසුකම් සහිත ගෞරවනීය පුද්ගලයෙක් රටේ අධිකරණ පද්ධතියේ ප්‍රධානියා හැටියට මේ වන විට පත් කර තිබීම තුළින් ඒ විශ්වාසය නැවත වතාවක් ගොඩ නැඟී තිබෙනවා. මේ නිසාම 'කැන්ගරු උසාවියක' තත්ත්වයකට පත් වී තිබූ අප අධිකරණ පද්ධතිය නැවතත් දේශීය වශයෙනුත්, ජාත්‍යන්තර වශයෙනුත් ඒ කෙරෙහි ඇති විශ්වාසය යළි තහවුරු කර තිබෙන බව අප සතුටින් කියනවා. දේශීය ස්වාධීන අධිකරණයක් මේ සඳහා පිහිටුවීමේදී අවශ්‍ය ජාත්‍යන්තර තාක්ෂණික සහයෝගය ලබා ගන්නත් අපි සූදානම්. එක්සත් ජාතීන්ගේ සංවිධානය සමඟ විතරක් නොවෙයි, එක්සත් ජාතීන්ගේ මානව අයිතීන් කවුන්සිලය සමඟ පමණක් නොව, සෙසු ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධාන සමඟ සහයෝගයෙන් ගනුදෙනු කරන්නත් අපි ලැහැස්ති බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

මානව හිමිකම් කඩවීම පිළිබඳව සොයා බැලීමට හා ඒ පිළිබඳව විශ්වාසවන්ත දේශීය පරීක්ෂණයක් සිදු කිරීමට අවශ්‍ය යන්ත්‍රණය ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් දැනටමත් අපි සාකච්ඡා කරමින් සිටිනවා. ඒ සඳහා අපට තව සුළු කාලයක් අවශ්‍යයි. පසු ගිය රජය ජාත්‍යන්තර ප්‍රජාව හමුවේ පොරොන්දු වූ ආකාරයට මෙවැන්නක් සඳහා උනන්දුවක් දැක්වූවා නම් ඇත්තටම මේ ප්‍රශ්නය මෙතරම් දුර ගමන් කරන්නේ නැහැ. මෙතැනදී අපට ජාත්‍යන්තරය අමතක කර කටයුතු කිරීමේ හැකියාවක් නැහැ. කුඩා රටක් හැටියට හුදකලා ගමනක් අපට නැහැ. බැහැර කිරීම වෙනුවට ලෝකය වැලඳගැනීම අපේ ප්‍රතිපත්තියයි. ඒ නිසා

ජාත්‍යන්තරයත් සමඟ ගනුදෙනු කරන්න අපි සූදානම්. ජාත්‍යන්තරයත් එක්ක ගනුදෙනු කිරීමෙන් ප්‍රතිලාභ හිමි වෙන්නේ අපේ රටටත්, අපේ රටේ ජනතාවටත් බව අපි මතක් කරන්න ඕනෑ. ශ්‍රී ලංකාවට පිටතින් දියුණු ලෝකයක් ඇති බව අපි විශ්වාස කරනවා. ඒ වාගේම මේ රට දියුණු කිරීමට, ඒ දියුණු ලෝකයේ සහයෝගය අවශ්‍යයි කියන කාරණයත් අපි රජයක් හැටියට පිළිගන්නවා.

අපේ විදේශ ප්‍රතිපත්තිය තීරණය වෙන්නේ දෘෂ්ටිවාදයන් මත පදනම්ව නොවෙයි. පැහැදිලිවම එය තීරණය වෙන්නේ මේ රටේ ජනතාවගේ අවශ්‍යතා මතයි. මෙන්න මේකයි, සරලවම කිව්වොත් අපේ විදේශ ප්‍රතිපත්තිය. අපේ විදේශ ප්‍රතිපත්තිය ඒ තරම් සරල එකක්. අපේ විදේශ ප්‍රතිපත්තිය, මේ රටේ ජනතාවගේ අවශ්‍යතාවට සරිලන විදේශ ප්‍රතිපත්තියක්; ප්‍රායෝගික විදේශ ප්‍රතිපත්තියක්.

විශ්වසනීය, දේශීය පරීක්ෂණයක් සිදු කිරීම මඟින් අපේ ආරක්ෂක අංශවලට, හමුදාවන්ට අහිමිව තිබුණු පිළිගැනීම, ගෞරවය යළි ලබා ගත හැකිය. ලෝකයේ ඕනෑම හමුදාවක වැරදි කරන අය ඉන්න පුළුවන්. සියයට 100ක් සම්පූර්ණ මිනිසුන් කිසිම තැනක කිසිම ආයතනයක නැහැ. ඒ නිසා වැරැද්දක් වෙලා තිබෙනවා නම් ඒ පිළිබඳව සොයා බැලීම ලජ්ජාවට කරුණක් නොවෙයි; භය වෙන්න කාරණයක් නොවෙයි. ඒක පාවාදීමක් නොවෙයි. ප්‍රේමවතී මනම්පේරි සාතනය, ක්‍රිශාන්ති කුමාරස්වාමි සාතනය සම්බන්ධව සිදු කළ පරීක්ෂණය වැනි අතීත උදාහරණ මේ රටේ තිබෙනවා. ඒ නිසා එක අතකින් මේක අලුත් දෙයක් නොවෙයි. ඒ නිසා අපේ වීරෝදාර හමුදාවගේ කීර්ති නාමය කෙලෙසන, එමෙන්ම කීර්ති නාමය කෙලෙසීමට අණ දුන් අය කවුදැයි හෙළි කිරීම තුළින් අප ත්‍රිවිධ හමුදාවේ සහ පොලීසියේ කීර්ති නාමය යළි යථා තත්ත්වයට පත් කර ගැනීමට අප රජයට පුළුවන් වෙනවා.

මීට පෙර සිටි පාලකයන් එක් පවුලක බල අවශ්‍යතාව වෙනුවෙන් සමස්ත ආරක්ෂක අංශවලම කීර්ති නාමය, ගෞරවය බොහොම නිර්ලජ්ජිත විධියට පාවා දුන්නා. ඒ තුළ අපේ ආරක්ෂක අංශ, හමුදාවන් දිහා ලෝකය බැලුවේ බොහොම පසුගාමී විධියටයි. රාජපක්ෂ රෙජීමයේ අවසන් කාලයේදී අපේ රණ විරුවන් එළවලු විකුණන, පාරවල් අතුගාන, ටුවරිස්ට් හෝටල් පවත්වා ගෙන යන වහල් සේවයක් බවට පත් වුණා. අපි උත්සාහ කරමින් සිටින්නේ ඒ අහිමි වුණු, බිඳ වැටුණු කීර්ති නාමය නැවතත් අපේ ත්‍රිවිධ හමුදාවට ලබා දීමටයි; ඒ කීර්ති නාමය යළි ගොඩනැංවීමටයි.

එක්සත් ජාතීන්ගේ සාම හමුදාවන් සඳහා බඳවා ගැනීම් සිදු කරද්දී නැවත වතාවක් අපේ හමුදා නිලධාරීන්ට, සෙබළුන්ට ඒ අවස්ථාව ලබා ගැනීම සඳහාත් සාකච්ඡා අප මේ වන විටත් පවත්වා ගෙන යනවා. මම මුලින් කිව්වා වාගේ කොළඹ පේවිමන්ට් හද, හදා, තණකොළ ගලව ගලවා, එළවලු විකුණ, විකුණා හිටපු අපේ වීරෝදාර රණ විරුවන්ට ජාත්‍යන්තර පිළිගැනීමක් ලබා දීමට දැනටමත් අප කටයුතු කරමින් සිටිනවා. මේ හරහා ලෝකයේ ඕනෑම තැනකට ගිහින් තම හැකියා පෙන්වීමේ අවස්ථාව අපේ හමුදා සාමාජිකයන්ට වැඩි කල් නොගොස් ලැබෙනවා කියලා අප විශ්වාස කරනවා.

අපි ත්‍රිවිධ හමුදාවේ නැති වූ කීර්ති නාමය යළි ලබා දීම මෙන්ම, අප රජයේ ඒකායන අධිෂ්ඨානය වී ඇත්තේ සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාවට මෙන්ම බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි හා ඉස්ලාම් ආගම අදහන සියලු ජනතාවට ශ්‍රී ලාංකිකයන් හැටියට අභිමානවත්ව ජීවත් විය හැකි අලුත් ශ්‍රී ලංකාවක් නිර්මාණය කිරීමයි.

මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා පත් වී ඇත්තේ ද එක ජන කොටසකගේ ඡන්දයෙන් පමණක් නොව, සමස්ත ශ්‍රී ලාංකිකයන්ගේ ඡන්දයෙන් ය. දශක ගණනාවකට පසුව අද අපට ශ්‍රී ලාංකිකයන්ගේ ජනාධිපතිවරයෙක් සිටින බවට ආඩම්බරයෙන් ප්‍රකාශ කරන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවැනි පසු බිමක් තුළ හිටපු ජනාධිපතිතුමා කියපු කථාවක් පසු ගිය දා පුවත් පත්වල දුටු විට මා පුදුම වුණා. උතුරු නැගෙනහිර ජනතාවගේ ඡන්ද අයිතිය ලබා දුන්නේ තමන් බවත්, උතුරු නැගෙනහිර ජනතාව ඡන්දය නොදුන්නා නම් දිනන්නේ තමන් බවත් මහින්ද රාජපක්ෂ මහත්තයා පසු ගිය 17වැනි දා තංගල්ල නගර සභා ශාලාවේ තිබුණු වෘත්තීය සමිති සම්මන්ත්‍රණයක දී කියා තිබෙනවා. ඇත්ත වශයෙන්ම ඒ ප්‍රකාශය අනුව හිටපු ජනාධිපතිවරයා කියා සිටින්නේ, එතුමාට ජය ගත හැක්කේ ඊළමක් තිබෙන ලංකාවක පමණක් බවයි. මොකද, මේ රටේ සියලුම පුරවැසියන්ට ඡන්ද අයිතිය තිබෙනවා. ඒ අයගේ ඡන්ද අයිතිය නැති වෙන්නේ මේ රට දෙකඩ වුණොත් විතරයි. අන්න එහෙම නම් මම හිටපු ජනාධිපතිවරයාගෙන් අහනවා, "ඔබතුමා දැන් පිළිගන්නවාද, මෙතැනදී කියන්නේ, එක්සත්, නොබෙදුණු ශ්‍රී ලංකාවක් තුළ මහින්ද රාජපක්ෂට නැවතත් බලයට එන්න බැහැ කියන එකයි" කියා. මේ තුළින්වත් සැබෑ ඊළාම්වාදීන් කවුදැයි කියා මේ ගරු සභාව හඳුනා ගනු ඇතැයි කියා මා හිතනවා.

හිටපු ජනාධිපතිවරයා ඇතුළු මේ රට අනතුරේ හෙළීමට මාන බලන සිංහල දේශ ප්‍රේමීත්වයෙන් තම නිරුවත වසා ගන්නා ඊළාම්වාදීන් පරාජය කර, සංහිඳියාවක් මේ රට තුළ ඇති කිරීමට අපි මේ හිමිව ඇති අවස්ථාව උපරිම ලෙස ප්‍රයෝජනයට ගත යුතුයි. පසු ගිය ජනාධිපතිවරණ ප්‍රතිඵලයත් සමඟ ජාතිවාදයට, ආගම්වාදයට තවදුරටත් මේ රටේ ඉඩක් නොමැති බවට ජනතාව පාඩමක් ලබා දී තිබෙනවා. ඒ සංඥාව හිටපු ජනාධිපතිතුමා වාගේම විපක්ෂයත් තේරුම් ගන්න ඕනෑ.

අන්තවාදයට තවදුරටත් අපි ඉඩ දිය යුතු නැහැ. ශිෂ්ට ලෝකය ඒවා බැහැර කරනවා. ඒවායින් වින්ද දුක් පීඩා දැන් හොඳටම ඇති. ඒ නිසා සිංහල අන්තවාදය මෙන්ම, දෙමළ හා මුස්ලිම් අන්තවාදයත් අපි සියලු දෙනාම බැහැර කරන්න ඕනෑ. විශේෂයෙන්ම ශ්‍රී ලාංකිකයන් හැටියට මේ රටේ අනාගතය හා දියුණුව වෙනුවෙන් අපි සියලු දෙනාටම ඉතා ධනාත්මක මැදිහත්වීමක් මේ මොහොතේ සිදු කළ හැකියි. ඒ සඳහා ස්වර්ණමය අවස්ථාවක් අද එළඹ තිබෙනවා. නිදහසින් පසුව තවමත් අපට බිහි කර ගත නොහැකි වූ ශ්‍රී ලාංකික අනන්‍යතාව නිර්මාණය කර ගැනීමට සුදුසුම මොහොත අද එළඹ තිබෙනවාය කියලා මා හිතනවා. දශක ගණනාවකට පස්සේ රටේ සියලු ජන කොටස් නියෝජනය කරන ජනාධිපතිවරයෙක් රටට ලැබී තිබෙනවා. ඒ නිසා මේ අවස්ථාවෙන් අපි උපරිම ප්‍රයෝජනය ලබා ගැනීම වැදගත්.

ජනවාරි 08 වැනි දින සිදු වූ දේදුනු විප්ලවය තවත් අර්ථ ගන්වමින් එයට තවත් වටිනාකම් එක් කරමින් යහ පාලනය, සමාජ සාධාරණත්වය, ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන ශිෂ්ට රටක් බිහි කිරීම උදෙසා මේ රටේ සියලු ජන කොටස්හි සහාය සමඟින් ඉදිරියට යන්න අප රජය සූදානම් බවත් මේ අවස්ථාවේ දී ප්‍රකාශ කරනවා.

ගරු විපක්ෂනායකතුමාගේ ප්‍රකාශයේ අවසානයේ තිබූ ප්‍රශ්න කිහිපයට පිළිතුරු මම මෙම ආකාරයට සපයන්න කැමැතියි.

01. ඔව්. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස්වරයා වෙත මා විසින් යවන ලද ලිපිය මේ අවස්ථාවේදී මම සභාගත කරන්නට කැමැතියි. එම ලිපිය මම යැවේ ඉංග්‍රීසි භාෂාවෙන්. එම ඉංග්‍රීසි ලිපියත්, එහි සිංහල පරිවර්තනය සහ දෙමළ පරිවර්තනයත් -භාෂා

[ගරු මංගල සමරවීර මහතා]

තුනෙන්ම සකසන ලද ලිපි- මම මෙම අවස්ථාවේදී හැන්සාඩ්ගත කිරීම සඳහා **සභාගත*** කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මෙම ලිපියේ ඇති වැදගත්කම නිසා සම්පූර්ණ ලිපියම හැන්සාඩ් වාර්තාවේ පළ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

02. දින සියයේ වැඩසටහනේ 93 වැන්නේ මෙසේ සඳහන් වෙයි.

"ජාත්‍යන්තර යුද අපරාධ අධිකරණය ස්ථාපිත කළ රෝම ප්‍රඥප්තියට ශ්‍රී ලංකාව අත්සන් තබා නැති නිසා එවැනි චෝදනා වෙතොත් ඒ පිළිබඳ යුක්තිය පසඳලීමේ කාර්යය දේශීය ස්වාධීන අධිකරණයක් යටතේ සිදු කිරීම"

ඒ අනුව, අප රජය දේශීය ස්වාධීන යන්ත්‍රණයක් සකස් කිරීමට බලාපොරොත්තු වන්නේ ජනතාවට ලබා දුන්න තවත් පොරොන්දුවක් ඉටු කිරීමට මිස ජාත්‍යන්තරයට ලබා දුන් පොරොන්දුවක් ඉටු කිරීමට නොවන බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට කැමැතියි.

03. අදාළ ලිපිය මම දැනටමත් සභාගත කර තිබෙනවා.

04. විශ්වාසනීය ස්වාධීන යන්ත්‍රණයක් දේශීය වශයෙන් ස්ථාපිත කිරීම තුළින් යම් යම් පුද්ගල කණ්ඩායම් තුළ ඇති අවිශ්වාසය තුරන් කිරීමට හැකි වෙනු ඇතැයි මම විශ්වාස කරමි. මේ සම්බන්ධයෙන් අප රජය කෙරෙහි විශ්වාසය තබමින් කටයුතු කරන ලෙස විශේෂයෙන්ම අපේ උතුරේ සිටින සහෝදර සහෝදරියන්ගෙන්, පළාත් සභාවල පළාත් සභා මන්ත්‍රීවරුන්ගෙන්, දේශපාලනඥයන්ගෙන් සහ අපේ සහෝදර ජනතාව ඇතුළු අපගේ සියලු පාර්ශ්වයන්ගෙන් අප ඉල්ලා සිටිනවා. අප කෙරෙහි විශ්වාසය තබලා කටයුතු කරන්න. අප කියපු හැම දෙයක්ම ඒ ආකාරයටම ඉටු කරනවා.

05. ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් පසු ගිය ජනාධිපතිවරණ අවස්ථාවේ දී ප්‍රකාශයට පත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් පොරොන්දු වූ ආකාරයට අවශ්‍ය ක්‍රියා මාර්ග ගනු ඇත.

ඇත්ත වශයෙන්ම ඒ සම්බන්ධයෙන් පසු ගිය කාලය තුළ -මේ දින 38 තුළ- අප රජය ඉටු කළ පොරොන්දු සම්බන්ධයෙන් විශාල විස්තරයක් අගමැතිතුමා ඔබතුමන්ලාට ලබා දුන්නා.

ඒ අනුව රටේ ප්‍රජාතන්ත්‍රවාදී ආයතන ශක්තිමත් කිරීම, ප්‍රකාශනයේ නිදහස තහවුරු කිරීම, නීතියේ පාලනය ශක්තිමත් කිරීම, යහ පාලන භාවිතාව, ජාතික මානව හිමිකම් කොමිසම ශක්තිමත් කිරීමට අවශ්‍ය කරන ක්‍රියා මාර්ග ගැනීම මෙන්ම, මානව හිමිකම් මහ කොමසාරිස්වරයාට ආමන්ත්‍රණය කරන ලද ලිපියේ සඳහන් අනෙකුත් කාරණා සම්බන්ධයෙන්ද මේ වෙනකොට ක්‍රියා කරන්නට කටයුතු ආරම්භ කොට ඇති බවද ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
වරප්‍රසාද ප්‍රශ්න. ගරු අජිත් කුමාර මහතා.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

වරප්‍රසාද : දෙපානම කාර්යාලයට බලහත්කාරයෙන් ඇතුළුවීම
சிறப்புரிமை: தெபானம காரியாலயத்தினுள் அத்துமீறி நுழைந்தமை
PRIVILEGE: INTRUSION INTO OFFICE AT DEPANAMA

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වරප්‍රසාද උල්ලංඝනය වීම පිළිබඳ ප්‍රශ්නයක් ඉදිරිපත් කිරීමට මා හට අවස්ථාව දීම ගැන ගරු කථානායකතුමාටත්, ඔබතුමාටත්, මේ ගරු සභාවටත් ස්තුතිවන්ත වෙනවා.

පෙබරවාරි මස 19වැනි දා රාත්‍රී 7.00ට පමණ පන්නිපිටිය, දෙපානම, කැන්දහේනවත්තේ පළමු මාවතේ, අංක 42/31දරන ස්ථානයේ පිහිටි මාගේ නිල කාර්යාලයට ආගමන විගමන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් යැයි පවසාගත් තිදෙනෙකු හා පොලිස් නිල ඇඳුමින් සැරසුණු පස් දෙනෙකු බලහත්කාරයෙන් ඇතුළු වී තිබෙනවා. එම අවස්ථාවේ මාගේ කාර්යාලයේ මාගේ මාධ්‍ය ඒකකයේ සහ කාර්යාල කාර්ය මණ්ඩලයේ තිදෙනෙක් සිටි අතර, ඔවුන්ගෙන් අනන්‍යතාව විමසා තිබෙනවා. ඒ පැමිණි එක් අයෙකු පවසා ඇත්තේ ඔවුන් ආගමන විගමන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් බවයි.

මෙහිදී මාගේ කාර්ය මණ්ඩලය අනන්‍යතාව තහවුරු කරන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා ඇතත්, ඔවුන් එය ප්‍රතික්ෂේප කර ඇත. එහි එක් නිලධාරියෙක් මීට පෙර ද මාගේ කාර්යාලයට පැමිණි අයෙකු වන අතර, ඔහු බණ්ඩාර නැමැත්තෙකු බව මාගේ කාර්යාලයේ කාර්ය මණ්ඩල සහෝදරයන් මා වෙත ප්‍රකාශ කරන ලදී.

ඔවුන් පැමිණියේ කුමන කරුණකටද යන්න මාගේ කාර්යාලයේ සිටි අය විමසා ඇති අතර එම බණ්ඩාර නමැති අය ප්‍රකාශ කර ඇත්තේ කුමාර් ගුණරත්නම් සොයා ගැනීමට පැමිණි බවයි. ඒ අවස්ථාවේ කුමාර් ගුණරත්නම් නමැති අය මෙම ස්ථානයේ නොමැති බවත්, මෙය අජිත් කුමාර මන්ත්‍රීවරයාගේ කාර්යාලය බවත්, යමක් විමසීමට ඇත්නම් මන්ත්‍රීවරයාගේ දුරකථනයට අමතන ලෙසත් දන්වමින් එම නිලධාරියාට මාගේ දුරකථන අංක කාර්යාලයේ සහෝදරයින් විසින් ලබා දී ඇත.

නමුත් ඔවුන් මා වෙත ඇමතුමක් ලබා දෙනු වෙනුවට කාර්යාලය පරීක්ෂා කිරීමට අවශ්‍ය බව ප්‍රකාශ කර ඇත. එහිදී ඔවුන්ට කාර්යාලයට ඇතුළුවීම සඳහා අධිකරණ නියෝගයක් හෝ වෙනත් කිසිදු නීත්‍යානුකූල ලියවිල්ලක් ඇත්දැයි විමසා ඇතත්, ඔවුන් ඒ කිසිවක් මාගේ කාර්ය මණ්ඩල සහෝදරයින්ට ඉදිරිපත් කර නැත.

ඉන් පසු ඔවුන් කාර්යාලය පරීක්ෂා කිරීමට සූදානම් වීමේදී කාර්ය මණ්ඩල සහෝදරයින් සිය විරෝධය දක්වා ඇත. එහිදී අත් අඩංගුවට ගන්නා බව හා තවත් දෑ ප්‍රකාශ කරමින් මාගේ කාර්ය මණ්ඩල සහෝදරයින් පුටුවල හිඳුවා තර්ජනය කරමින් කාර්යාලයේ සියලු කාමර හා මුළුතැන්ගෙය පරීක්ෂාවට ලක් කර ඇත.

මේ අවස්ථාවේදී මා වෙත දුරකථන ඇමතුමක් ලබා දීමට කාර්ය මණ්ඩල සහෝදරයන් විසින් උත්සාහ ගෙන ඇති අතර, කිසිවෙකුට ඇමතුම් නොගන්නා ලෙස පැමිණි අය තර්ජනයක් ද කර ඇත. පසුව මාගේ කාර්ය මණ්ඩල සහෝදරයන්ගෙන්

බලහත්කාරයෙන් ප්‍රකාශයක්ද ලබා ගෙන ඇත. ප්‍රකාශ ලබා ගැනීමෙන් අනතුරුව පැමිණි අය පිටව ගිය පසු මගේ කාර්ය මණ්ඩල සහෝදරයන් මා වෙත දුරකථනයෙන් මෙම සිදු වීම දැන්වූ අතර, පසුව මාගේ උපදෙස් මත ඔවුන් විසින් මේ සම්බන්ධයෙන් මහරගම පොලිස් ස්ථානයේ පැමිණිලි අංක CIB 3/120/154 යටතේ පැමිණිල්ලක්ද කර ඇත. තවද, ඊයේ රාත්‍රී මා විසින් මේ පිළිබඳව පොලිස්පතිතුමාට ෆැක්ස් මඟින් ලිඛිත පැමිණිල්ලක් ද කළෙමි. එම ලිපියද **සභාගත*** කරමි.

මෙයට අමතරව අද උදෑසන මා විසින් මහරගම පොලීසියට පැමිණිලි අංක CIB 2/94/262 යටතේද පැමිණිල්ලක් කළෙමි. මා විසින් පැමිණිල්ල සිදු කිරීමට පොලිස් ස්ථානයට ගිය අවස්ථාවේදී මහරගම පොලීසියේ ස්ථානාධිපතිතුමාගෙන් මා කළ විමසීමේදී ඔහු ප්‍රකාශ කළේ මෙවැනි පරීක්ෂා කිරීමක් පිළිබඳව හෝ ඒ සඳහා තම පොලිස් ස්ථානයේ සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලීමක් හෝ පොලිස් දෙපාර්තමේන්තුව විසින් තමන්ට ඉදිරිපත් කර නොමැති බවයි. මේ පිළිබඳව කිසිවක් නොදන්නා බව එතුමා ප්‍රකාශ කළා. සාමාන්‍ය ක්‍රමවේදය අනුව යම් වැටලීමක් හෝ පරීක්ෂා කිරීමක් සිදු කිරීමේදී අදාළ ප්‍රදේශයේ පොලිස් ස්ථානය දැනුවත් කළ යුතු මුත්, එවැනි ක්‍රියා මාර්ගයක් මෙහිදී අනුගමනය කර නැත. ඒ පිළිබඳව ද මා තුළ මතු වන්නේ බරපතළ සැකයකි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් මාධ්‍ය වෙත ප්‍රකාශයක් නිකුත් කර තිබෙනවා, පොලිස් මාධ්‍ය ප්‍රකාශක ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි අජිත් රෝහණ මහතා. ඔහුගේ ප්‍රකාශයෙනුත් මේ පිළිබඳව බරපතළ ගැටලුවක් මතු වෙනවා. එතුමා පවසා ඇත්තේ අදාළ සිදුවීමට පොලීසියේ කිසිදු පොලිස් නිලධාරියෙකුගේ සම්බන්ධයක් නොමැති බවයි. පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයාගේ මෙම ප්‍රකාශය වෙබ් අඩවි ගණනාවකත්, මාධ්‍යවලත් පළ වී තිබුණා. මම මේ අවස්ථාවේ sinhala.adaderana.lk වෙබ් අඩවියේ පළ වූ ප්‍රවෘත්තිය ඔබතුමාට **සභාගත***කරනවා.

එහි මෙසේ සඳහන් වෙනවා:

"කෙසේ වුවද මේ ගැන පොලිස් මාධ්‍ය ප්‍රකාශක ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි අජිත් රෝහණ මහතාගෙන් විමසා සිටි අවස්ථාවේදී ඒ මහතා කියා සිටියේ ඔය කියන සිද්ධිය හා පොලීසියේ නිලධාරින්ගේ කිසිදු සම්බන්ධයක් නැති බවයි."

පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයාගේ මෙම ප්‍රකාශය සිදු කරන්නේ වගකීම් සහගතව නම්, එයින් අදහස් වන්නේ පොලිස් නිල ඇඳුමින් සැරසුණු ආයුධ සන්නද්ධ කල්ලියක් ද මේ මොහොත වන කොට මේ පාලනය යටතේ ක්‍රියාත්මක වන බවයි. එය ඉතා බරපතළ කරුණක් වන අතර, පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයාගේ ප්‍රකාශය සත්‍යයක් නම් වහාම ඔවුන් කවුරුන්ද යන්න පිළිබඳව පරීක්ෂණයක් පවත්වා හෙළිදරව් කරගත යුතුයි. මෙබඳු තත්ත්වයක් පවතින්නේ නම් එය මාගේ දේශපාලන කටයුතුවලට හා මාගේ අදහස් දැක්වීමට වාගේම මාගේ ජීවිතයට බරපතළ තර්ජනයක් හා මාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමක්. පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා කියන විධියට පොලීසියේ නොවන කණ්ඩායමක්, කිසිදු අවසරයකින් තොරව, ආයුධ සන්නද්ධව, පොලිස් නිල ඇඳුමක් ඇඳගෙන මාගේ නිල කාර්යාලයට පැමිණීම බරපතළ ප්‍රශ්නයක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වන මාගේ කාර්යාලයට මේ ආකාරයට නීති විරෝධී අයුරින් ඇතුළුවීම, අවහිර කිරීම, බලහත්කාරී තර්ජනය කිරීම මඟින් හෘදය සාක්ෂිය අනුව මා දරන දේශපාලන මතවාදයක් වෙනුවෙන් පෙනී සිටීම හා ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වීමට එරෙහිව වත්මන් පාලනය විසින් ප්‍රජාතන්ත්‍ර විරෝධී ලෙස මැදිහත් වෙන බව පෙනෙනවා. මෙම ක්‍රියාවලිය දැඩි අප්‍රසාදයකින් යුතුව ප්‍රතික්ෂේප කරන අතරම, මෙය මාගේ දේශපාලනය කිරීමේ අයිතිය හා මහජනතාව විසින් මා වෙත පවරා ඇති වගකීම් ඉටු කිරීමට අදාළව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස මා හට හිමි වරප්‍රසාද කඩ කිරීමක් බවද සිහිපත් කරනු කැමැත්තෙමි.

පසු ගිය ජනාධිපතිවරණ කාලයේ සහ මේ මොහොතේ වර්තමාන පාලකයන් ප්‍රජාතන්ත්‍රවාදය හා යහපාලනය වෙනුවෙන් පෙනී සිටි බව දිවුරා ප්‍රකාශ කරමින් සිටින තත්ත්වයක් තුළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වන මා හට මෙවැනි තත්ත්වයකට මුහුණ දීමට සිදු වන්නේ නම්, පසු ගිය ආණ්ඩු සමයේදී මෙන්ම වර්තමාන පාලකයන්ගේ බලය යටතේද රටේ සාමාන්‍ය ජනතාවට අත්වන ඉරණම පිළිබඳව ඉතා පැහැදිලිය.

එබැවින් මෙම සිදුවීමට අදාළව නීති විරෝධී ලෙස හා අයුක්ති සහගත ලෙස මැදිහත් වූ පුද්ගලයන් කවුරුන්ද යන්න සහ ඔවුන්ට එම නියෝග ලබා දුන්නේ කවුරුන්ද යන්න පිළිබඳව පරීක්ෂණයක් පවත්වා ඔවුන්ට එරෙහිව නීතිය හා යුක්තිය ක්‍රියාත්මක කිරීමට මැදිහත් වන ලෙස ඉල්ලා සිටිමි.

මාගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන ලෙසත්, විශේෂයෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස මහජනතාව විසින් මා හට පවරා ඇති වගකීම් ඉෂ්ට කිරීමට ඒ වරප්‍රසාදය, ඒ අයිතිය ලබා දෙන ලෙසත් මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පළමු වැනි සිදුවීම නොවෙයි. පසු ගිය රජය කාලයේත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් කියලා පරීක්ෂණයක් කිරීම සඳහා කිසිදු දැනුම් දීමක් නැතුව මා ඉගෙන ගත් පාසලට ඇවිල්ලා තිබුණා. තවමත් ඒ පිළිබඳ පරීක්ෂණයකුත් නැහැ. මට මෙවැනි සිද්ධියක් වුණු පළමු වැනි අවස්ථාව මෙය නොවෙයි. වරප්‍රසාද කඩවීම් සම්බන්ධ මෙවැනි සිද්ධි ගණනාවක් තිබෙනවා. විශේෂයෙන්ම පසු ගිය රජය සමයේදීත් ආරක්ෂක හමුදා සහ පොලීසිය විසින් කරපු අත්තනෝමතික ක්‍රියා පිළිබඳව මා මේ පාර්ලිමේන්තුවට වාර්තා කරලා තිබෙනවා. ඒ කිසිවක් ගැන තවම පරීක්ෂණයක් නැහැ. ඒ වාගේම මේකත් මේ නව රජය පත් වුණාට පස්සේ ඇති වූ අලුත් තත්ත්වයක්. ඒ නිසා විශේෂයෙන්ම මා මේ සඳහා පාර්ලිමේන්තුවේ මැදිහත් වීම ඉල්ලා සිටිනවා.

මා මේ කාරණයත් ඔබතුමාගේ විශේෂ අවධානයට යොමු කරනවා. අද දින කල් තැබීමේ යෝජනාවක් මා ඉදිරිපත් කරලා තිබෙනවා. එයත් මේ ප්‍රශ්නයට බලපෑවාද කියලා මම දන්නේ නැහැ. ඒ වාගේම පසු ගිය අය වැය ඡන්ද විමසීම අවස්ථාවේදීත් මේ පාර්ලිමේන්තුවේ මම විතරක් එයට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළා. මේවා පිළිබඳ ප්‍රශ්න තිබෙනවාද කියලා මම දන්නේ නැහැ.

අද මා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන කල් තැබීමේ යෝජනාව පැයකට සීමා කරලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් විපක්ෂ නායකතුමාගේත්, සියලු පක්ෂ නායකයන්ගේත් අවධානය යොමු කරනවා. මේ රටේ බරපතළ ප්‍රජාතන්ත්‍ර විරෝධී තත්ත්වයක් නිර්මාණය කරන්න, විශේෂයෙන්ම ආණ්ඩුවට එරෙහි මත දක්වන අයට එවැනි තත්ත්වයක් නිර්මාණය කරන්න උත්සාහ කරනවා. ඒ නිසා අද කල් තැබීමේ යෝජනාව සඳහා පැය දෙකක කාලයක්වත් ලබා දෙන්න කියලා මා මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා. වරප්‍රසාද ප්‍රශ්නය සම්බන්ධයෙන් කඩිනම් පරීක්ෂණයක් පවත්වන්න කියලාත් මා ඉල්ලා සිටිනවා.

බොහොම ස්තූතියි.

**** පුස්තකාලයේ තබා ඇත.***

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඒ පිළිබඳව කටයුතු කරනවා.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Hon. Deputy Speaker, I move,

"That notwithstanding the provisions of Standing Order No. 7 and the motion agreed to by Parliament on 07.04.2011, the hours of sitting this day shall be 1.30 p.m. to 8.30 p.m. At 7.30 p.m. Standing Order No. 7(5) shall operate."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රධාන කටයුතු, අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1. දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියැවීම. ගරු වෛද්‍ය රාජිත සේනාරත්න මහතා.

Order, please! මේ අවස්ථාවේ දී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු ගරු උදිත් ලොකුබණ්ඩාර මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු උදිත් ලොකුබණ්ඩාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு உதித் லொக்கு பண்டார அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. UDITH LOKUBANDARA *took the Chair.*

දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත
புகையிலை மற்றும் மதுசாரம் மீதான தேசிய அதிகாரசபை (திருத்தம்) சட்டமூலம்
NATIONAL AUTHORITY ON TOBACCO AND ALCOHOL (AMENDMENT) BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

[අ.භා. 2.53]

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதார மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health and Indigenous Medicine)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත දැන් දෙවන වර කියැවිය යුතු ය" යි මා යෝජනා කරනවා.

මේ පිළිබඳව ඉතිහාසයක් තිබෙනවා. එම නිසා එහි ඉතිහාසයත්, පසු බිමත් පිළිබඳව ප්‍රකාශ කරමින් මෙම පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට මා ලැහැස්තියි. ශ්‍රී ලංකාව ලෝක සෞඛ්‍ය සංවිධානයේ දුම්කොළ පාලනය පහසු කිරීම පිළිබඳ සම්මුතියට, -WHO Framework Convention on Tobacco Control කියන සම්මුතියට- 2003 වසරේ නොවැම්බර් මස 11වැනිදා ප්‍රථම ආසියාතික රට වශයෙන් අත්සන් තැබුවා. මෙය 2005 වසරේ සිට බලාත්මක වුණා. එදා රටවල් 40ක් පාර්ශ්වකරුවන් වුණු මෙම සම්මුතියට රටවල් 153ක් පාර්ශ්වකරුවන් වශයෙන් ඇතුළත් වුණා.

ශ්‍රී ලංකාව 2006 අංක 27 දරන දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත නමින් ජාතික මට්ටමින් දුම්කොළ පාලනය කිරීම සඳහා පනතක් 2006 ජූලි මාසයේ 05වැනිදා පාර්ලිමේන්තුවේ දී සම්මත කර ගත්තා. එහි අරමුණ වුණේ "මහජන සෞඛ්‍ය ආරක්ෂා කිරීමේ අදහසින් දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහාද, දුම්කොළ නිෂ්පාදනය හා මධ්‍යසාර නිෂ්පාදනය, අළෙවිය හා පරිභෝජනය තක්සේරු කිරීමෙන් හා සමීක්ෂණය කිරීමෙන් දුම්කොළ හා මධ්‍යසාර ආශ්‍රිත හානි තුරන් කිරීම සඳහා සහ තැනැත්තන්, විශේෂයෙන් ළමුන් දුම් පානයට හා මධ්‍යසාර පාවිච්චියට යොමු වීම අධෛර්වත් කිරීමේ විධිවිධාන ඇතුළත් කිරීම පිණිස ඔවුන් දුම්කොළ නිෂ්පාදනවලට සහ මධ්‍යසාර නිෂ්පාදනවලට ප්‍රවේශ වීමට ඇති ක්‍රියාමාර්ග හීන කිරීමේ ක්‍රියාමාර්ග සැලසීම සඳහා දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියක් පිහිටුවීම පිණිස විධිවිධාන සැලැස්වීම" යි.

ඒ අනුව තමයි මේ දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පිහිටුවන්නට විධිවිධාන සැලැස්වුවේ. දුම්කොළ පාලන සම්මුතියේ 11වන වගන්තිය අනුව මෙම සම්මුතිය ස්ථිර වෙන්නට අවුරුදු තුනක් ගත වෙනවා. 2005 වර්ෂයේ දී තමයි මේ සම්මුතිය වලංගු නීතියක් බවට පත් වුණේ. 2008 වසරේ දී තමයි මේ සම්මුතිය පිළිබඳ රෙගුලාසි අපේ රටේ ක්‍රියාත්මක වන්නට තිබුණේ. දුම්කොළ භාවිතය, දුම් පානය පිළිබඳව රූපමය සෞඛ්‍ය අවවාද දුම් වැටි අසුරණවල ප්‍රදර්ශනය කරන්නට තිබුණේ 2008 වර්ෂයේ දීයි. නමුත් ඒ කටයුතු එම කාලයේ දී ක්‍රියාත්මක වුණේ නැහැ.

පසු ගිය රජයේ සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් මේ පිළිබඳව පත් කරන ලද තාක්ෂණික කමිටුව සහ දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය යන ඒ දෙකෙන්ම ලබා දුන් නිර්දේශ අනුව 2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතේ 30, 34 වන වගන්ති ප්‍රකාරව දුම් වැටි අසුරණවල ප්‍රදර්ශනය කළ යුතු රූපමය සෞඛ්‍ය අවවාද පිළිබඳ රෙගුලාසි සකස් කර කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළා. ඒ වෙලාවේ කැබිනට් මණ්ඩලයේ අපිත් හිටියා. එදා මේ පිළිබඳව සංවාදයක් ඇති වුණා. එහිදී අපේ හිටපු ගරු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහත්මයා මේ පනතට විරුද්ධව දිගින් දිගටම කරුණු සැල කළ ආකාරය ඒ අවස්ථාවේ එහි සිටි සියලුම ඇමතිවරුන්ට මතක ඇති කියලා මා හිතනවා. "මේක සංචාරක ව්‍යාපාරයට බලපානවා; මේක මේ රටේ ආර්ථිකයට බලපානවා ; බදු ක්‍රමයට බලපානවා" කියමින් ඒ පිළිබඳව දීර්ඝ ලෙස කරුණු දැක්වුවා. එවකට හිටපු ජනාධිපතිතුමාත් ඒක අල්ලා ගෙන කිව්වා, "මේ වාගේ ඒවා ගෙන ආවොත් මේ රටට සුද්දෙක් එන එකක් නැහැ, සිගරට් එකක් බොන්න බැරි රටකට සුද්දෙක් එනවාද" කියලා. ඒ වෙලාවේ මමත්, ගරු චම්පික රණවක ඇමතිතුමාත්, අපි දෙදෙනාම මේ පනතට එකඟව අපේ අදහස් ප්‍රකාශ කළා. මම පැහැදිලිවම කිව්වා, "ගරු ජනාධිපතිතුමනි, මේකේ දුම් බීම තහනම් කරලා නැහැ. මේකෙන් අවවාදයක් කරලා තිබෙන්නේ. තමන්ගේ පෙනහැල්ල, තමන්ගේ අනෙකුත් අවයව විනාශ කර ගන්නට කැමැති නම් ඕනෑ කෙනෙකුට බොන්න පුළුවන්. හැබැයි මේවා විනාශ වෙන හැටි පෙන්වලා දීලා තිබෙනවා" කියලා. නමුත් ඒවා කිසි දෙයක් ඇහුවේ නැහැ. ඒ කිසි දෙයක් අහන්නේ නැතිව එදා පැවැති කැබිනට් මණ්ඩලය බලය පාවිච්චි කරලා, ඒ ඓතිහාසික කැබිනට් පත්‍රිකාව සම්මත කරන්නට ඉඩ දුන්නේ නැහැ.

අපේ හිටපු සෞඛ්‍ය ඇමතිතුමා - වර්තමාන ජනාධිපතිතුමා- එතැනින් නැවතුණේ නැහැ. එතුමා 2012 වර්ෂයේ අගෝස්තු මාසයේ 8වැනිදා මේ රූපමය සෞඛ්‍ය අවවාද ඇතුළත් රෙගුලාසි ගැසට් පත්‍රයේ පළ කළා. එතුමා එය පළ කළේ, "2012 අංක 1 දරන දුම්කොළ නිෂ්පාදන ලේබල් කිරීමේ සහ ඇසුරුම් කිරීමේ නියෝග" වශයෙන් හඳුන්වලායි. එතුමා එම අවවාද පනතක් වශයෙන් ගෙනෙන්නේ නැතිව ගැසට් කළා. එම රෙගුලාසි ගැසට් කරලා, ඒවා ක්‍රියාත්මක කිරීමට දුම්කොළ සමාගම්වලට මාස තුනක කාලයක් ලබා දුන්නා. නමුත් දුම්කොළ සමාගම් එම රෙගුලාසි ක්‍රියාත්මක කළේ නැහැ. දුම්කොළ සමාගම් ඇවිත් සාකච්ඡා කරලා තවත් මාස තුනක් කල් ඉල්ලා ගත්තා. ඒ අනුව ගැසට් පත්‍රය සංශෝධනය කරලා 2013 මාර්තු මාසයේ පළමුවැනිදා වෙනතුරු දුම්කොළ සමාගම්වලට කල් දුන්නා, මේ රූපමය අවවාද ලබා දෙන්න.

2013 පෙබරවාරි මාසයේ 15වැනි දා මේ අලුත් රෙගුලාසිය පිළිබඳ ගැසට් නිවේදනය නිකුත් කළා. ඒ නිකුත් කරපු ගැසට් නිවේදනයට විරුද්ධව 2013. 02.20 වැනිදා දුම්කොළ සමාගම් අභියාචනාධිකරණය ඉදිරියට ගිහින් අතුරු තහනම් නියෝගයක් ඉල්ලුවා, මේක කරන්න ඉඩ දෙන්න එපා කියලා. නමුත් එය ප්‍රතික්ෂේප වුණා. එය ප්‍රතික්ෂේප වුණාට පසුව එක්තරා දිනයක අපේ හිටපු සෞඛ්‍ය ඇමතිතුමාට - වර්තමාන ජනාධිපතිතුමාට- හිටපු ජනාධිපතිවරයාගෙන් කැඳවීමක් ලැබුණා, ජනාධිපති නිල නිවසට පැමිණෙන්න කියලා. එතුමා උදේ වරුවක එහි ගියා. ඒ අවස්ථාවේ ජනාධිපති නිල නිවසේ දුම්කොළ සමාගමේ සභාපතිවරයා ඇතුළු ඔක්කොම නිලධාරීන් වාඩි වෙලා සිටියා. ඒ අය එක පැත්තකින් තියලා, අපේ හිටපු සෞඛ්‍ය ඇමතිතුමාව හතරවැනි තට්ටුවේ දී ප්‍රශ්න කරනවා වාගේ ප්‍රශ්න කිරීමකට ලක් කළා. එතකොට පැමිණිලිකරුවන් වුණේ කවුද? දුම්කොළ සමාගම. වගඋත්තරකරු වුණේ අපේ වර්තමාන ජනාධිපතිතුමා වන හිටපු සෞඛ්‍ය අමාත්‍යවරයා. එතැන දී ඒ දුම්කොළ සමාගමේ අය මීටර් දෙකහමාරක විතර දිග තීරුවක් ගෙනැවිත් පෙන්වා අසා තිබෙනවා, "මේ තිබෙන්නේ මේවායේ අඩංගු ද්‍රව්‍ය, මේවා සියල්ලම මේ පැකට්ටුවේ සඳහන් කරන්නේ කොහොමද?" කියලා. එතකොට හිටපු ජනාධිපතිතුමාත් මේ සියල්ලම එක පැකැට්ටුවක සඳහන් කරන්නේ කොහොමද කියලා අසමින්, ඔවුන් කියපු දේවල් සියල්ලම අනුමත කරමින් තමයි කථා කර තිබුණේ. ඒ අවස්ථාවේ අපේ වර්තමාන ජනාධිපතිතුමා කියලා තිබෙනවා, "සිගරට්වල තිබෙන දේවල් ගැන සඳහන් කරන්න නොවෙයි කියලා තිබෙන්නේ, මෙහි ප්‍රදර්ශනය කරන්න කියලා තිබෙන්නේ රූපමය අවවාද. මේ රූපමය අවවාද අපේ රටේ විතරක් නොවෙයි අනෙක් රටවලත් ප්‍රදර්ශනය කර තිබෙනවා" කියලා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ පෙන්වපු බෝඩ් එකේ මොනවාද තිබිලා තියෙන්නේ?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඒ පෙන්වා තිබෙන්නේ සිගරට්වල තිබෙන නරක ද්‍රව්‍යවල ලැයිස්තුවක්. ඒවා සිගරට් පැකට් එකක සඳහන් කරන්න බැහැ කියන එකයි කියලා තිබෙන්නේ. එතකොට අපේ හිටපු සෞඛ්‍ය ඇමතිතුමා කියා තිබෙනවා, "ඒක නොවෙයි කරන්න තිබෙන්නේ. වෙන රටවල වාගේ අපේ රටේත් සිගරට් පෙට්ටියේ රූපමය සෞඛ්‍ය අවවාද ප්‍රදර්ශනය කිරීමටයි කියන්නේ. මේ දුම් වැටි පාවිච්චි කිරීමෙන් ඇති වන ප්‍රතිවිපාක පිළිබඳව පින්තූර ඇතුළත් සෞඛ්‍ය අවවාද සඳහන් කරන්න" කියලා. එතකොට හිටපු ජනාධිපතිතුමා අසා තිබෙනවා,"අනෙක් රටවලට නැති රුදාවක් අපට ඇති වෙලා තිබෙන්නේ මොකද?" කියලා.

තවදුරටත් එතුමා අහලා තිබෙනවා, "ඉන්දියාවේ නැහැ. පාකිස්තානයේ නැහැ. අනික් රටවල සියයට 40යි තිබෙන්නේ. සියයට 80ක් මොකටද?" කියලා. එතකොට අපේ හිටපු සෞඛ්‍ය ඇමතිතුමා කියා තිබෙනවා, "ඉන්දියාවේ, පාකිස්තානයේ මිනිසුන් මැරෙන එක ගැන ඒ රටේ ආණ්ඩුවට ප්‍රශ්නයක් නැත්නම් මට ඒ ගැන කරන්න දෙයක් නැහැ. නමුත් මේ හේතුව නිසා අපේ රටේ දවසකට මිනිසුන් 25දෙනෙක් මැරෙනවා. එම නිසා සෞඛ්‍ය ඇමතිවරයා වශයෙන් මට මේක ප්‍රශ්නයක්. ඒ අයට ප්‍රතිකාර කිරීමට රුපියල් කෝටි ගණන් වියදම් කරනවා. මිනිස්සු මිය යනවා. අපේ පැත්තෙන්, සෞඛ්‍ය අමාත්‍යාංශය පැත්තෙන් ඔවුන්ට කිසිම අවවාදයක් ලැබෙන්නේ නැති නිසා තමයි මා මේක ගෙනාවේ" කියලා. එතකොට හිටපු ජනාධිපතිතුමා කියා තිබෙනවා, "නැහැ, නැහැ. ඒක ඕනෑ නම් ගෙනෙනවා" කියලා අනික් පැත්ත හැරිලා දුම්කොළ සමාගමේ කට්ටියට කිව්වා, "ඔය තිබෙන්නේ උසාවිය. ඔය ගොල්ලන් උසාවියට යන්න" කියලා. ඒ ගොල්ලෝ උසාවියට ගියා. තමුන්නාන්සේලා ඔක්කොම දන්නවා, අපේ රටේ තිබුණු උසාවිය මොකක්ද කියලා. අතුරු තහනම් නියෝගයක් ඉල්ලා සිටීම ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව හිටපු ජනාධිපතිතුමාගේ ඉල්ලීම මත ඔවුන් ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. ඒ උසාවියේදී ඔවුන්ගේ ඉල්ලීම අනුමත වෙලා තහනම් නියෝගය ලැබුණා. ඔවුන් නැවත අභියාචනාධිකරණයට ගියා, මේ පිළිබඳව තීන්දුව ගන්න. තහනම් නියෝගයක් දුන්නා, සෞඛ්‍ය ඇමතිවරයාට මීට පස්සේ මේ ගැන ක්‍රියා කරන්න බැහැයි කියලා. මේ පිළිබඳව අවසාන තීන්දුවක් ලැබෙන තුරු තහනම් නියෝගයක් දීලා 2014 මැයි මාසයේ 12වන දා අභියාචනාධිකරණයෙන් තීන්දු කළා, මේකේ සියයට 50 සිට සියයට 60 දක්වා අවවාද අඩංගු කරන්න කියලා. ඒ ගොල්ලෝ ඉල්ලීම කළේත් සියයට 60යි. සියයට 80ක් බැහැ, සියයට 60ක් අවවාද අඩංගු කරන්නම් කිව්වා. ඔවුන්ගේ ඉල්ලීමටත් අඩු කරලා තීන්දුව දුන්නා. ඊට පස්සේ වෙන කරන්න දෙයක් නැහැ. හිටපු සෞඛ්‍ය ඇමතිතුමාට -වර්තමාන ජනාධිපතිතුමාට- තිබුණේ -

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
පනත නීතිගත කළාද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
පනත් කෙටුම්පත ගෙනෙන්න දුන්නේ නැහැ නේ. කැබිනට් මණ්ඩලයෙන් එය ප්‍රතික්ෂේප කළා. අද මට වාගේ එතුමාට පනත් කෙටුම්පතක් ගෙනෙන්න ලැබුණේ නැහැ. එදා හිටපු ජනාධිපතිවරයා ඇතුළු කැබිනට් මණ්ඩලය එය ප්‍රතික්ෂේප කළා. අපි දෙදෙනෙක් පමණක් කථා කළා. හැබැයි අපරාදේ කියන්න බැහැ, බැසිල් රාජපක්ෂ හිටපු ඇමතිවරයාත්, තවත් ඇමතිවරයකුත් හැරෙන්නට අනික් කිසිම ඇමතිවරයෙක් හිටපු ජනාධිපතිවරයා වෙනුවෙන් කථා කළේ නැහැ. අනික් සියලුම ඇමතිවරු නිශ්ශබ්දව සිටියා. එදා එතැනින් ඒක ලොප් වුණා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අනික් ඇමතිතුමා කවුද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
සරත් අමුණුගම හිටපු ඇමතිතුමා. මෙවැනි පනත් කෙටුම්පතක් ගෙන ඒමෙන් ඇති විය හැකි ආදීනව පිළිබඳව ඒ දෙදෙනා තමයි කථා කළේ. ඒ අනුව සියයට 50 සිට සියයට 60 දක්වා අවවාද අඩංගු කරන්න පුළුවන්. ඒ වෙලාවේත් හිටපු සෞඛ්‍ය ඇමතිතුමා ඒකේ උපරිමය සියයට 60 දක්වා වැඩි කරන්න රෙගුලාසි ගෙන ඒම සඳහා 2014 මැයි මාසයේ 27වන දා නැවත ගැසට් පත්‍රයක් ඉදිරිපත් කළා. ඒකට එරෙහිවත් දුම්කොළ සමාගම නැවතත් ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. ඒ අය ශ්‍රේෂ්ඨාධිකරණයට ගියේ මේ සඳහා මාස 3ක කාලයක් මදි, තව කල් ඕනෑ කියලා කියන්න. එවකට සිටි සෞඛ්‍ය ඇමතිතුමා දැන ගත්තා, මේ නඩුව ගියොත් මේ නඩුවත් පරාද වෙනවා, ඊට වඩා හොඳයි ඔවුන් සමඟ එකඟතාවකට එන එක කියලා. උසාවියේදී දුම්කොළ සමාගමේ නීතිඥවරයා කිව්වා අමාත්‍යාංශයත් සමඟ කථා කරලා අපි මේ පිළිබඳව එකඟතාවකට එන්න ලැහැස්තියි කියලා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නීතිඥවරයා මාරු වුණාද? දුම්කොළ සමාගම වෙනුවෙන් ඒ කාලයේ කථා කර කර හිටිය නීතිඥවරයා මාරු වුණාද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඉස්සෙල්ලා අපේ ශ්‍රේෂ්ඨාධිකරණයේ සිටි අග්‍ර විනිශ්චයකාරවරයාම පත් වෙලා හිටියා, ඒ සමාගම වෙනුවෙන්. ඉන් පසුව නඩුව ඇහුවෙත් එතුමා. [බාධා කිරීමක්] ඔව්, ඒක තමයි අපි කියන්නේ. එහෙම නඩු අහන්නේ නැහැ සාමාන්‍යයෙන්, ඉස්සර නම්. ඔය අග්‍ර විනිශ්චයකාරවරු මොනවාද කරන්නේ? මට මතකයි ජී.පී.එස්. ද සිල්වා අග්‍රවිනිශ්චයකාරවරයාට මගේ ගෙදර රාත්‍රී භෝජන සංග්‍රහයකට ආරාධනා කළ අවස්ථාවේ, එතුමා මගෙන් ඇහුවා තව කවුද එන්නේ කියලා. මම කිව්වා, මේ මේ දේශපාලනඥයින් එනවා කියලා. එතුමා කිව්වා, "අනේ බැහැ. මම එහෙම එන්නේ නැහැ. වෙනත් දවසක මම ඔබතුමාගේ ගෙදර එන්නම්. එහෙම නැත්නම් අපේ ගෙදර කෑම කන්න එන්න. අපි දෙන්නා පෞද්ගලිකව කථා කරමු" කියලා. මම එදත් මේ කථාව කිව්වා. එතුමා මගේ ළඟටයි දිගටම ප්‍රතිකාර සඳහා ආවේ. නඩු නිමිත්තක් තිබෙන කෙනෙක් ඒ භෝජන සංග්‍රහයට සහභාගි වෙයි කියලා ඒ විධියටයි එදා ඒ අග්‍ර විනිශ්චයකාරවරයා හැසිරුණේ.

කෙසේ හෝ අන්තිමට කර ගන්න දෙයක් නැතිව එවකට සිටි සෞඛ්‍ය ඇමතිතුමා අසරණ වුණා. කෙසේ හෝ මේ කටයුත්ත කරන්නත් ඕනෑ නිසා එතුමා දුම්කොළ සමාගමේ නීතිඥවරුන් සමඟ කථා කර ගෙන මාස තුන වෙනුවට මාස හයක කාලයක් දීමට එකඟ වුණා. එහෙම නැතිව ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා නම් මාස හයකදීවත් මේක කර ගන්න ලැබෙන්නේ නැහැ. ඒ එකඟතාව අනුව ඔවුන්ට මේ රූපමය අවවාද ලබා දෙන්නට තිබුණේ 2015 ජනවාරි මාසයේ 01වෙනි දාටයි. ඒ වන විට ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් විතරයි. ඒ වන විට අපි සියලු දෙනාම ආණ්ඩු පක්ෂයෙන් එළියට බැහැලා. ඒ දිනයේ සිට එය ක්‍රියාත්මක වුණා. ඒ තීන්දුවට අනුව තිබුණා, 2015.01.31 දිනෙන් පසු දැනට වෙළෙඳ පොළේ පවතින රූපමය සෞඛ්‍ය අවවාද අඩංගු නොවන තොග විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම, ගබඩා කිරීම, බෙදා හැරීම සහ ප්‍රවාහනය නොකළ යුතුයි කියලා. 2015 ජනවාරි මාසයේ 01 වෙනිදාට තිබුණු තීන්දුව අනුවයි එය ක්‍රියාත්මක කරන්නට තිබුණේ. ඒ අනුව ගැසට් නිවේදනය නිකුත් කළා. දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත් කෙටුම්පතේ 23වෙනි වගන්තියට අනුව පාර්ශ්වකාරයින්ගේ එකඟතාව මත මාර්ගෝපදේශනයන් සකස් කළා, මෙය කරන්නේ කොහොමද කියලා. ඇත්තටම කියනවා නම්, මේ වන විට ලෝකයේ බොහෝ රටවල් plain packaging ප්‍රවණතාව අනුවත් මෙය ක්‍රියාත්මක කරන්නට ගියා. ඕස්ට්‍රේලියාව දැනටත් ඒක ක්‍රියාත්මක කරනවා. ඇත්තටම එදා හිටපු ජනාධිපතිවරයාට මේක තේරුණේ නැති වුණාට, මේ කාලපරිච්ඡේදයේදී තමයි අනෙක් රටවල් එකින් එක මේ තහනම පටන් ගත්තේ.

2012 වර්ෂයේදී බංග්ලාදේශය රූපමය අවවාද සියයට 40ක් ඇතුළත් කළා. මේක තමයි පෙන්නුවේ හිටපු ජනාධිපතිවරයා. ඒ දුම්කොළ සමාගම් කිව්වා බංග්ලාදේශයේ විතරයි තහනම් කරලා තිබෙන්නේ, ඒකෙත් සියයට 40යි කියලා. ඒක හින්දා තමයි අපේ හිටපු සෞඛ්‍ය ඇමතිවරයාගෙන් හිටපු ජනාධිපතිවරයා ඇහුවේ ඒ රටේ සියයට 40යි නම් අපි සියයට 80ක් දාන්නේ ඇයි කියලා. නමුත් මතක තියා ගන්න, අපි රූපමය අවවාද ගෙනාවට පස්සේ 2013 වර්ෂයේදී තායිලන්තය සියයට 85ක් ගෙනාවා. 2014 වර්ෂයේ මෝදි අගමැතිතුමාගේ ආණ්ඩුව යටතේ ඉන්දියාව සියයට 85ක් රූපමය අවවාද ගෙනාවා. නේපාලයේ සියයට 90ක් රූපමය අවවාද ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේම ලෝක තත්ත්වය දෙස බැලුවොත් උරුගුවේ සියයට 80ක් ඇතුළත් කර තිබෙනවා. බෲනායිවල සියයට 75යි. ඕස්ට්‍රේලියාවේ එක් පැත්තක සියයට 82.5යි, තවත් පැත්තක සියයට 75යි, අනෙක් පැත්තේ සියයට 99ක් වශයෙන් පැකැට්ටුවේ පැති තුනක රූපමය අවවාද තිබෙනවා. මේ වාගේ ලෝක ප්‍රවණතාවක් රූපමය අවවාද සම්බන්ධයෙන් ආවා. ඒ ප්‍රවණතාව එන්න කලින් ජාත්‍යන්තර වශයෙන් දුම්කොළ පාලනය සම්බන්ධයෙන් ලංකාව තිබුණේ 47 වන ස්ථානයේ. මේ ගත්ත ක්‍රියා මාර්ගය නිසා අපි 47 වන ස්ථානයේ ඉඳලා ලෝකයේ දෙවැනි ස්ථානයට පත් වුණා. කීර්තිමත් තත්ත්වයට පත් වුණා. මම හිතන්නේ පසු ගිය කාලයේ ජාත්‍යන්තර වශයෙන් කීර්ති නාමයක් ලැබුණා නම්, ඒ අවස්ථා එකකදී නැත්නම් දෙකකදී පමණයි ලැබුණේ. අනෙක් සෑම එකකම ජාත්‍යන්තර වශයෙන් අපි පරාජයට පත් වුණා. ජාත්‍යන්තරය ඉදිරියේ අපේ රට බෙලහීන තත්ත්වයකට පත් වුණා. ජාත්‍යන්තර වශයෙන් අපිට කීර්තියක් ලැබුණු අවස්ථාවක් තමයි මේ අවස්ථාව. ඒ අනුව හිටපු සෞඛ්‍ය ඇමතිතුමාට මේ කරපු ශ්‍රේෂ්ඨ කර්තව්‍ය වෙනුවෙන් ලෝක සෞඛ්‍ය සංවිධානය මඟින් විශාල ප්‍රදානයක් ලබලා දුන්නා. අපි ඒකට සහභාගි වුණා. හිටපු ජනාධිපතිතුමාත් ඒකට සහභාගි වුණා. මේ කරපු දේවල්වලට ලෝක සෞඛ්‍ය සංවිධානය මඟින් එතුමාට විශාල කීර්ති නාමයක් ලබා දුන්නා.

මේ රූපමය අවවාදවල තිබෙන වැදගත්කම මොකක්ද? සිගරට් පැකට්වල තිබෙනවා අකුරින් ලියපු අවවාද. කැනඩාවේ පර්යේෂණයක් කරලා තිබෙනවා. ඒ පර්යේෂණය අනුව මිනිස්සු 1,700 වාරයක් සිගරට් පැකට්වුවේ තිබෙන අකුරින් ලියපු අවවාද කියෙව්වත් ඒ අවවාදය එච්චර පිළිපැදීමක් නැහැ. නමුත් ඒ පර්යේෂණයේ තිබෙනවා අකුරින් ලියපු අවවාදය දහස් වතාවක් කියවනවාට වඩා වැඩි බලපෑමක් මේ එක රූපමය අවවාදයක තිබෙනවා කියලා. ඒකෙන් තැති ගන්නා මිනිස්සු දුම්බීමෙන් ඉවත් වෙනවා. ඒක තමයි මේ රූපමය අවවාදවල තිබෙන වැදගත්කම.

දුම්බීම නිසා හෘදය රෝග ඇති වෙනවා, පිළිකා ඇති වෙනවා. ඒ විතරක් නොවෙයි, passive smoking නිසා ගැබිනි මව්වරුන්ට නොමේරූ දරුවන් බිහි වෙනවා. අපි සිගරට් බොනවා, දුම් බොනවා. ඒක නිසා අනික් අයට ලෙඩ රෝග හැදෙනවා. මට මතකයි, එදා සෞඛ්‍ය අමාත්‍යවරයා වශයෙන් සිටි ගරු නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමා ප්‍රසිද්ධ ස්ථානවල දුම්පානය තහනම් කරමින් එදා මේ පනත් කෙටුම්පත ගෙනාවා. එදා මම විපක්ෂයේ ඉඳගෙන ඒ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් විනාඩි 45ක කාලයක් කථා කළා. ඒ සම්බන්ධයෙන් එදා මම එතුමාට ස්තුති කර, රජයට ස්තුති කර විපක්ෂයේ හිටියා. එදා මම විනාඩි 45ක් කථා කර කිව්වා, "මේක ඓතිහාසික පනත් කෙටුම්පතක්" කියා. ඒ තමයි පළමුවෙනි පියවර. අපි දුම් බොන්නේ නැහැ. නමුත් අනික් පුද්ගලයන් දුම්බොනකොට අපි ඒ දුම් බීලා පෙණහල්ලේ ලෙඩ හදා ගන්නවා. ඒකට කියන්නේ passive smoking. ඒ වාගේ තත්ත්වයක් තිබෙනවා. අද ලංකාවේ ජනතාවගෙන් පහෙන් එකකට තිබෙන්නේ බෝ නොවන රෝග. එකක් තමයි දුම් බීමෙන් ඇති වන රෝග. මේ සඳහා අපි රුපියල් කෝටි ගණනක් වැය කරනවා. සමහරු කථා කරන්නේ දුම්කොළ සමාගමෙන් ලැබෙන බදු ප්‍රමාණය කොපමණද කියායි. අපිට මෙපමණ බදු මුදල් ලැබෙනවා කියායි. නමුත් ඒ ගොල්ලන්ගෙන් අපිට ලැබෙන බදු ප්‍රමාණයට වඩා අපේ ජනතාවට හැදෙන ලෙඩවලට අපි කෝටි ගණනක මුදලක් වියදම් කරනවා. එහෙම ගත්තාම මේ ගහන බදුවලට වඩා වැඩි මුදල් ප්‍රමාණයක් අපේ රෝහල් නඩත්තු කරන්නට, රෝගීන්ට ප්‍රතිකාර ලබා දෙන්නට අපි වැය කරනවා. මේවා ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15 වන ව්‍යවස්ථාවේ (7) අනු ව්‍යවස්ථාව යටතේ මෙහෙම සඳහන් වෙනවා:

> "12 වන ව්‍යවස්ථාවන්, 13 වන ව්‍යවස්ථාවේ (1) වන හා (2) වන අනුව්‍යවස්ථාවලින් සහ 14 වන ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති සියලුම මූලික අයිතිවාසිකම් භුක්ති විඳිය හැක්කේද, ක්‍රියාත්මක විය හැක්කේද, රාජ්‍ය ආරක්ෂාවද, රටේ යථා පැවැත්මද, තහවුරු කිරීම පිණිසත්, මහජන සෞඛ්‍ය හෝ සදාචාරය ආරක්ෂා කිරීම පිණිසත්, අන්‍යයන්ගේ අයිතිවාසිකම් හා නන් වැදෑරුම් නිදහස නිසි පරිදි පිළිගන්නා බවට සහ ඊට නිසි පරිදි ගරු කරන බවට වග බලා ගැනීම පිණිසත්, ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පොදු සුබසාධනය සඳහා යුක්තිසහගතව අවශ්‍ය දෑ සපුරාලීම පිණිසත්, නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමාකිරීම්වලට යටත්වය. මෙම අනු ව්‍යවස්ථාවේ කාර්ය සඳහා "නීතිය" යන්නට මහජන ආරක්ෂාව පිළිබඳව තත්කාලයේ අදාළ වන නීතිය යටතේ සාදන ලද නියෝග ද ඇතුළත් වන්නේ ය."

ඒ අනුව ඊට පක්ෂපාත ආකාරයට නීති සැකසීමට අවසර පවතින බවද තවදුරටත් ප්‍රකාශ කරනවා.

අද අපි ගෙන එන මේ සංශෝධන මඟින් සිගරට් පැකැට්වුවේ පැති තුනක සියයට අසූවක රූපමය අවවාද ඇතුළත් කරනවා. ඒ විතරක් නොවෙයි. මාස 6කට වරක් මේ යොදන රූපමය අවවාද වෙනස් කර, roster කරන්න ඒ සමාගම්වලට නියෝග ලබා දෙනවා. මේවා සිගරට්වලට විතරක් නොවෙයි, බීඩි සහ සුරුට්වු පැකට්වලටත් අදාළ වෙනවා. ඒ ආකාරයට පැකට්වල සඳහන් කරනවා වාගේම මේවා වෙළඳාම් කරන හැම තැනකම අවවාදාත්මක billboards දමන්නට ඕනෑ. එහෙම නොදමන හැම කෙනෙකුටම රුපියල් 50,000ක දඩයකුත් වසරක සිර දඬුවමකුත් මේ ගෙනෙන නීති රෙගුලාසිවලින් නියම වෙනවා. ඒ නිසා අපි අද ඉතාමත් ඓතිහාසික පනත් කෙටුම්පතක් තමයි ගෙනෙන්නේ.

පසු ගිය රජයේ හිටපු ජනාධිපතිතුමා දුම් පානය වළක්වන්නට ක්‍රියා කළා. ඊළඟට ජාතික ඖෂධ ප්‍රතිපත්ති පනත් කෙටුම්පත බලමු. මේ සඳහා පෙරේදා සුප්‍රිම් උසාවිය මඟින් අනුමැතිය ලැබුණා. මෙහෙම හිරවෙලා තිබුණු ඔක්කෝම දැන් අපි ගෙනෙනවා. අපේ හිටපු සෞඛ්‍ය අමාත්‍ය එනම් වර්තමානයේ අපේ අතිගරු ජනාධිපතිතුමා ගෙනාපු ඖෂධ පනත එන පාර්ලිමේන්තුවට මම ගෙනෙනවා. මගේ ගුරුවරයා වූ මහාචාර්ය සේනක බිබිලේ මහතා එදා නිර්මාණය කරපු, පසුව ලෝක සෞඛ්‍ය සංවිධානය පිළිගත්තා වූ නමුත් අපේ රටේ නො පිළිගත්තා වූ ජාතික ඖෂධ ප්‍රතිපත්ති පනත් කෙටුම්පත මම එන පාර්ලිමේන්තුවට ගෙන එනවා. ඒ අනුව මෙම ඓතිහාසික පනත් කෙටුම්පත් දෙක සම්මතවීමත් සමඟින් අපේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විශාල විප්ලවයක් වෙයි කියා මම බලාපොරොත්තු වෙනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, බොහොම ස්තූතියි.

මීළඟට විරුද්ධ පාර්ශ්වයේ නායක ගරු නිමල් සිරිපාල ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් ලබා දී තිබෙනවා.

[අ.භා. 3.15]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Nimal Siripala de Silva - Leader of the Opposition)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රූපමය අවවාද ඇතුළත් කරමින් දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතට සංශෝධන ගෙන එන මේ අවස්ථාවේදී එකී සංශෝධනයන් පිළිබඳව අපේ පූර්ණ සහයෝගය හා ප්‍රසාදය ලබා දෙන බව පළමුවෙන්ම ප්‍රකාශ කරන්න කැමැතියි. විශේෂයෙන්ම හිටපු සෞඛ්‍ය ඇමතිවරයා ලෙසත්, ලෝක සෞඛ්‍ය සංවිධානයේ සභාපති පදවියට මෙන්ම එහි විධායක සභාවේ සභාපති පදවියට පත් වූ ප්‍රථම ආසියානු ජාතිකයා ලෙසත් මට ලෝක සෞඛ්‍ය සංවිධානය තුළ දුම් වැටි හා මදසාර පිළිබඳ ක්ෂේත්‍රයේ විශාල සේවාවක් කිරීමේ අවස්ථාව ලැබුණා.

විශේෂයෙන්ම නෝර්වේ අග්‍රාමාත්‍ය වශයෙන් කටයුතු කළ ග්‍රෝ හාර්ලම් බෘන්ඩ්ලන්ඩ් මැතිනිය ලෝක සෞඛ්‍ය සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල්වරිය බවට පත් වුණාට පස්සේ එම විධායක සභාවේ මා ගත කළ අවුරුදු 10 තුළම විවිධ ක්ෂේත්‍රයන්හි - සභිකයකු ලෙස, උපසභාපතිවරයා ලෙස, පසු කාලයක සභාපතිවරයා ලෙස- කටයුතු කර මේ පිළිබඳව ලෝක සෞඛ්‍ය සංවිධානය තුළ ආරම්භ කරන ලද මූලික කටයුතුවලදී එතුමියට විශාල සහයෝගයක් ලබා දීමේ අවස්ථාව මට හිමි වුණා. මෙය ඉතාම වැදගත්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද, ලෝක සෞඛ්‍ය සංවිධානය වැනි ස්ථානයක පවා දුම් කොළ සමාගම්වලට එරෙහිව ගෙන ගිය සටන ලේසි වුණේ නැහැ. ලෝක සෞඛ්‍ය සංවිධානයේ විධායක සභාවේ සාමාජිකයන් අතර පවා මේ

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

පිළිබඳව විවිධ මත ඇති වුණා. ඖෂධ සමාගම් මෙන්ම දුම් කොළ සමාගම් ඒ සඳහා විවිධ බලපෑම් ඇති කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මතක ඇති, මෙවැනි පනත් කෙටුම්පතක් ගෙනෙන්න හදපු එංගලන්තයේ මාග්‍රට් තැචර් මහත්මියටත් ඖෂධ සමාගම්වලින්, ඒ වාගේම දුම් කොළ සමාගම්වලින් ඇති වූ බලපෑම නිසා එය අත හැර දමන්න සිදු වූ බව. ඒ කාලයේ අපි තැචර් මහත්මියට කිව්වේ "Iron Lady" කියායි. දේශපාලන ලෝකයේ යකඩ ගැහැනිය කියායි එතුමියට කිව්වේ. නමුත් ඒ යකඩ ගැහැනියත් අභිභවා දුම් කොළ සමාගම් මේ කාරණාවලදී වැඩ කටයුතු කර තිබෙනවා. මේක තමයි ඉතිහාසය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකාවට මේ ක්ෂේත්‍රයේ ඉතාම කීර්තිමත් වූ ඉතිහාසයක් තිබෙනවා. මා ලෝක සෞඛ්‍ය සංවිධානයේ විධායක සභාවේ සිටි කාලයේ තමයි එක්සත් ජාතීන්ගේ සංවිධානය දුම් වැටි, මත්පැන්වලට එරෙහිව කටයුතු කිරීමට අදාළ වූ අන්තර්ජාතික ගිවිසුමට අත්සන් කරන්න කියා ලෝකයේ රටවලට ආරාධනා කළේ. ලෝකයේ රටවල් අතුරින් 4වැනියාට තමයි අප අත්සන් කළේ. ලෝකයේ රටවල් එකසිය ගණන අතරින් 4වැනියාට අත්සන් කර අපි කීර්තියක් දිනා ගත්තා. ආසියාවේ පළමුවැනි රට හැටියට එයට අත්සන් කර අපි කීර්තියක් දිනා ගත්තා. අපේ රට සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ විවිධ දර්ශක අනුව ආසියාකරයේ කැපී පෙනෙන රටක් වනවා වාගේම අපේ ජනතාවට ලබා දී තිබෙන පහසුකම් සහ නිදහස් සෞඛ්‍ය සේවාව මත ලෝකයේ සෞඛ්‍ය තත්ත්වය අතින් විශාල කීර්තියක් ද අත් කර ගෙන තිබෙනවා. ඒ වාගේම දුම් කොළ, දුම් වැටි හා සම්බන්ධ ක්ෂේත්‍රයට අදාළ මේ වැඩ කටයුතු ඉදිරියට ගෙන යෑම පිළිබඳව ද අපි මුල සිටම විශාල කීර්තියක් අත් කර ගෙන සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රූපමය අවවාද පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් ශ්‍රීපවන් විනිශ්චයකාරතුමාත්, සිසිර ද ආබaa විනිශ්චයකාරතුමාත්, ප්‍රියන්ත ජයවර්ධන විනිශ්චයකාරතුමාත් ලබා දුන් තීන්දුව මා ළඟ තිබෙනවා. මේ තීන්දුව එදා Court of Appeal එක මඟින් දුන්නු තීන්දුවට වඩා හාත්පසින් වෙනස් වූ තීන්දුවක්. ඒ අවස්ථාවේදී අධිකරණය ප්‍රකාශයට පත් කළා, trademark rights තිබෙන නිසා රූපමය අවවාද සම්බන්ධයෙන් සියයට 80 දක්වාම යන්න බැහැ; රූපමය අවවාද පළ කරනවා වාගේම ඒ සමාගම්වලටත් තමන්ගේ දේවල් පළ කරන්න අයිතියක් තිබෙන්න ඕනෑ කියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ නඩු තීන්දුව ගැනත් මම කියන්න ඕනෑ. මම මේ නඩු තීන්දුව ඉතාම ඕනෑකමින් අධ්‍යයනය කළා. මෙහිදී ජාතික ප්‍රතිපත්තියට - national policy එකට- මුල් තැනක් ලබා දෙමින්, ජාතික ප්‍රතිපත්තිය පිළිබඳව පාර්ලිමේන්තුව -රජය- ගෙන එන තීරණය ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් වෙනස් නොකළ යුතුය කියන පදනම මත තමයි මෙය අනුමත කළේ. ඒක සාධනීය ලක්ෂණයක්. ඒ නිසා අපි මේ තීන්දුව ශ්‍රේෂ්ඨාධිකරණයෙන් බලාපොරොත්තු වුණා. ශ්‍රේෂ්ඨාධිකරණයට අපි ගරු කරනවා. මොකද, අපි හැම වෙලාවේම පාර්ලිමේන්තුවේ ස්වාධීනතාව පිළිබඳව කථා කරන අය; පාර්ලිමේන්තුවේ ස්වාධීනතාවට කිසි ආකාරයකින් බාධාවක් පමුණුවන්න එපාය කියන අය. ඒ නිසා පාර්ලිමේන්තුව දෙන තීන්දු අනික් පැත්තට හැරවීමත් වැරදියි. ඒ වාගේම පාර්ලිමේන්තුව මඟින් -මේ රටේ ජනතා නියෝජිතයින් මඟින්- ඉදිරිපත් කරනු ලබන ජාතික ප්‍රතිපත්ති ශ්‍රේෂ්ඨාධිකරණය අනුමත කළ යුතුයි. ඒ සංකල්පය මේ නඩු තීන්දුව තුළින් මනාව පෙන්වා දීලා තිබෙනවා. ඒ ගැන අපි සතුටු වනවා. මොකද, ශ්‍රේෂ්ඨාධිකරණය එක්ක, අධිකරණය එක්ක ව්‍යවස්ථාදායකය වශයෙන් අපට හැප්පීමට වුවමනාවක් නැහැ. එහෙම වුණොත් මේ රට ඉදිරියට ගෙන යෑමට පුළුවන්කමක් නැහැ. මේ රට ඉදිරියට ගෙන යෑමට නම්, අපි ඒ කියන සහජීවනයෙන් කටයුතු කළ යුතුයි. හැබැයි, සහජීවනයෙන් කටයුතු කිරීමේදී අපේ වැඩ කටයුතුවලට ඒ අය ඇඟිලි ගහන්න ගියොත්, ඒ අයගේ වැඩ කටයුතුවලට අපි ඇඟිලි ගහන්න ගියොත්, ඒ සහජීවනය ඉදිරියට ඇති වන්නේ නැහැ. ඒ නිසා මේ සංශෝධනය ගෙන ඒමත් සමඟම නීතිඥයකු වශයෙන් මා කියන්න ඕනෑ, ආණ්ඩුක්‍රම හා සම්බන්ධ නීති ක්ෂේත්‍රයේ ඉතා ඉදිරියට ගිය නඩු තීන්දුවක් හැටියට මේ නඩු තීන්දුව අපට දක්නට ලැබෙන බව. ඒක අපට දක්නට ලැබෙන සාධනීය ලක්ෂණයක්.

රූපමය අවවාද පිළිබඳව -විශේෂයෙන්ම passive smoking පිළිබඳව- සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍ය රාජිත සේනාරත්න මහතා කිව්වා. දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත් කෙටුම්පත ඒකමතිකව සම්මත කරන්න අපට පුළුවන් වුණා. මේ පාර්ලිමේන්තුව තුළදී කවුරුත් ඒකට විරුද්ධ වුණේ නැහැ. ඒකත් අපේ ජයග්‍රහණයක්. ඊට පස්සේ ප්‍රසිද්ධ ස්ථානවල දුම් බීම වැළැක්වීම යනාදී වශයෙන් අපි හුඟක් වැඩ කටයුතු කළා. ඒ වාගේම වයස අවුරුදු 18ට අඩු අයට දුම් වැටි විකිණීම තහනම් කිරීම සම්බන්ධ නීතියක් අපි ගෙනාවා. මේ තුළින් දුම් වැටි පාවිච්චි කිරීමට එරෙහිව මේ රටේ විශාල මතයක් ගොඩ නැඟුණා. අපි survey එකක් කරලා බැලුවා නම්, වෙනදාට වඩා දුම් වැටිවලට ඇබ්බැහි වන තරුණ ජනතාව ඉතාම අඩුයි කියලා දැන් පෙනෙනවා. ඉස්සර දුම් වැටි පාවිච්චි කිරීම, දුම් බීම ජීවිතයේ style එකක් හැටියට, cult එකක් හැටියට හුඟක් තරුණ තරුණියන් හිතුවා. නමුත්, දැන් ඒ තත්ත්වය වෙනස් වෙලා තිබෙනවා. දුම් වැටි විරෝධී ව්‍යාපාර කර ගෙන යන අපේ රටේ රාජ්‍ය නොවන සංවිධානවලට ඒ ගැන අපි විශේෂයෙන්ම ස්තුති කරන්න ඕනෑ. මට විශේෂයෙන්ම මේ අවස්ථාවේදී ඕල්කට් ගුණසේකර මැතිතුමා මතක් වනවා. මේ පිළිබඳ පැහැදිලි ජන මතයක් ඇති කිරීම සඳහා එතුමන්ලා මේ ක්ෂේත්‍රයේදී විශාල සේවාවක් කළා. ඒ නිසා මෙය අපට සතුටු වන්න පුළුවන් අවස්ථාවක්. ඒ වාගේම අපි මෙතැනින් නතර වන්න වුවමනාවක් නැහැ.

එපමණක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ලෝක බැංකුව මඟින් ආසියාවේ හා තුන්වන ලෝකයේ රටවල දුප්පත්කමට හේතුව මොකක්ද කියන කාරණය පිළිබඳව සමීක්ෂණ රාශියක් කරලා තිබෙනවා. මේ සමීක්ෂණවලදී ඉතා පැහැදිලිවම පෙන්වා දීලා තිබෙනවා, දුප්පත්කමට හේතුව ආදායම් මාර්ග නැතිකම නොවෙයි කියන කාරණය. බොහෝ අඩු ආදායම්ලාභී පවුල්වල අය තමන්ගේ ආදායම දුම් වැටි සහ මත්පැන් සඳහා වියදම් කිරීමට ඇබ්බැහි වීම තුළින් තමයි දුප්පත්කම තවතවත් වැඩි වන්නේ. මොන තරම් ප්‍රතිලාභ ලබා දුන්නත් මේ දුප්පත්කම අඩු වන පාටක් නැහැ. මේ තත්ත්වය ලංකාවේත් ඇති වෙලා තිබෙනවා. සමෘද්ධිලාභී පවුල් අරගෙන බලන්න. අද සමහර සමෘද්ධිලාභී පවුල්වලට කොපමණ සමෘද්ධිය දුන්නත්, ආණ්ඩුවෙන් මොනවා දුන්නත්, රජයෙන් මොන උපකාර කළත් අද ඔවුන් ඒ මුදල් දුම් වැටිවලටයි, මත්පැන්වලටයි, කසිප්පු බොන්නයි තමයි වියදම් කරන්නේ. ඒ නිසා සවි බල ගැන්වීමක් කරන්න බැහැ. ඔවුන් සවි බල ගැන්වීම කිරීම අමාරුයි. දැන් අපට ඒ දුම් වැටිවලට, මත්පැන්වලට ඇබ්බැහි වුණු උදවිය එතැනින් ගලවා ගැනීම එතරම් ලෙහෙසි වන්නේ නැහැ.

එම නිසා දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් තමයි මේ ඉදිරිපත් කර තිබෙන්නේ. දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් තුළින් අපේ තරුණ පරපුර, පාසල් දරු දැරියන් මෙයින් අප ගලවා ගන්නට ඕනෑ. මේ අනුව කාලයක් යනකොට අනාගත පරම්පරාව මත් ද්‍රව්‍යවලට ගොදුරුවීම වළක්වා ගන්නට පුළුවන්. දුම් බීමට පෙළඹුණු, මත්පැන් බීමට පෙළඹුණු වයසක අයට - ඔවාට පුරුදු වුණු මිනිහාට- ඔවා නැතිවම බැරිවෙනවා. ඒක හරි අමාරුයි. ඒක වෙනම ප්‍රශ්නයක්. නමුත් අපි ඊළඟ පරපුර දුම්පානයෙන් සහ අධික මත්පැන් පානයෙන් ගලවා ගත යුතුයි. එවැනි ජාතික ව්‍යාපාරයක් අවශ්‍යයි. ඒ සඳහා අවශ්‍ය වන පසු බිම මෙම පනත මඟින් සැලසෙනවාය කියන එක ප්‍රකාශ කරන්නට ඕනෑ.

දීර්ඝ කාලීන වශයෙන් රටක ආර්ථික සංවර්ධනය උදෙසා, ඒ වාගේම ජනතාවගේ ආර්ථික වර්ධනය උදෙසා මේ පනත උපයෝගී වෙනවා. දුම් වැටි හා මත්පැන්වලට ඇබ්බැහිවීම වැළැක්වීම තුළින්, තමන්ට ලැබෙන මුදල ඉතිරි කර ගෙන ඒවා තමන්ගේ පවුලේ සාමාජිකයන්ගේ සුභ සිද්ධිය වෙනුවෙන් කැප කිරීම සඳහා අවස්ථාවක් ලැබෙනවා. එම නිසා හුදෙක් මේ පනත තුළින් ශාරීරික සෞඛ්‍යය පිළිබඳව විතරක් නොවෙයි, රටේ ආර්ථික දේහය, ආර්ථික සෞඛ්‍යය පිළිබඳවත් හොඳ, ශක්තිමත් පදනමක් දැමීමට අපට අවස්ථාව ලැබෙනවා. එම නිසා විශේෂයෙන්ම සෞඛ්‍ය සම්පන්න ජනතාවක් ඇති කිරීමට මෙම පනත උපයෝගී වෙනවා. දැන් අපට ශ්‍රී ලංකාව පිළිබඳව ආඩම්බර වන්නට පුළුවන්. අපේ ජීවත්වීමේ ආයු කාලය - life expectancy - දීර්ඝ වෙලා තිබෙනවා. අපේ රටට නිදහස ලැබෙනකොට මේ රටේ ජනතාවගේ ආයු කාලය අවුරුදු 50යි. අද වෙනකොට මේ රටේ ජනතාවගේ ආයු කාලය අවුරුදු 74යි; 76 යි. ලෝකයේ බොහෝ දියුණු වූ රටවල ජනතාවගේ ආයු කාලයට ළං කරමින් අපේ රට ඉදිරියට ගිහින් තිබෙනවා. මේ තත්ත්වය වඩාත් වර්ධනය කර ගැනීමට නම්, ජනතාව පිළිකා රෝග වැනි රෝගවලට ගොදුරු වීම අනිවාර්යයෙන්ම වළක්වන්නට ඕනෑ.

පිළිකා රෝගය පිළිබඳව ගත්තොත්, පිළිකා රෝගීන් වෙනුවෙන් සෑම රජයකින්ම විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරන්නට සිදු වී තිබෙන බව හිටපු සෞඛ්‍ය අමාත්‍යවරයෙකු හැටියට මා දන්නවා. ඊට හේතුව, පිළිකා රෝගවලට ගෙනෙන ඖෂධවල මිල ගණන් ඉතාම වැඩියි. එසේ වුණත් කෙනෙකු රෝගී තත්ත්වයට පත් වුණායින් පස්සේ, දුම් බීම නිසා රෝගය හැදුණාය නැත්නම් වෙන දෙයක් නිසා රෝගය හැදුණාය කියා ඒ රෝගියා අපට වෙන් කරන්නට පුළුවන්කමක් නැහැ; කොන් කරන්නට පුළුවන් කමක් නැහැ; ප්‍රතිකාර නොදී ඉන්නට පුළුවන්කමක් නැහැ. අනිවාර්යයෙන්ම ප්‍රතිකාර කරන්නට ඕනෑ.

බීමත්ව රිය පදවා ගෙන ගිහින් වාහන හප්පා ගෙන අද Accident Ward එකට කොපමණ සංඛ්‍යාවක් එනවාද? කොපමණ සංඛ්‍යාවක් ICUවල ඉන්නවා ද? අපේ ජාතික ධනයෙන් විශාල මුදල් ප්‍රමාණයක් එක එක්කෙනාගේ බීමත්කම නිසා ප්‍රතිකාරවලට වැය කරන්නට සිද්ධ වෙලා තිබෙනවා. එම නිසා ඒවා වැළැක්වීම තමයි ඉතාමත්ම යෝග්‍ය වෙන්නේ. එම නිසා මේ සංශෝධනය ගෙන ඒම පිළිබඳව අපි ස්තුතිවන්ත වෙනවා. මේ පිළිබඳව ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සෞඛ්‍ය ඇමතිවරයා වශයෙන් ඉන්න කාලයේ සිටම ගත් උත්සාහය අපි අගය කරනවා. ඒ උත්සාහය මල් ඵල ගැන්වීමට සහයෝගය දීමට අපට අවසථාවක් ලැබීම ගැන සතුට ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 3.30]

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අද දවසේ මේ විවාදයට සම්බන්ධ වෙන්නේ ඉතාමත් සතුටකින් සහ අභිමානයකින්. 2006 අංක 27 දරන දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත සංශෝධනය කිරීම සඳහා විවාද කරන මේ අවස්ථාවේදී මට මතක් වෙනවා, මේ පිළිබඳව පාර්ලිමේන්තුවේ අවස්ථා පහකදී මම කථා කර තිබෙන බව.

හැන්සාඩ් වාර්තාවේ මගේ කථා සඳහන් වී තිබෙන දිනයන් මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ. 221වන කාණ්ඩයේ 4වන කලාපයේ 2013 නොවැම්බර් 25වන දා හැන්සාඩ් වාර්තාවේ 632 තීරුවේ සිට ඉදිරියට සඳහන් වෙනවා. 222වන කාණ්ඩයේ 11වන කලාපයේ 2013 දෙසැම්බර් 13වන දා හැන්සාඩ් වාර්තාවේ 2139 තීරුවේ සිට ඉදිරියට සඳහන් වෙනවා. 223වන කාණ්ඩයේ 8වන කලාපයේ 2014 පෙබරවාරි 19වන දා හැන්සාඩ් වාර්තාවේ 923වන තීරුවේ සිට ඉදිරියට සඳහන් වෙනවා. 223 කාණ්ඩයේ 10වන කලාපයේ 2014 පෙබරවාරි 21වන දා හැන්සාඩ් වාර්තාවේ 1166 තීරුවේ සිට ඉදිරියට සඳහන් වන අතර, තවත් එක් අවස්ථාවක මා මේ පිළිබඳව කථා කර තිබෙනවා.

මා දුම් වැටි ගැන කථා කරන්නට කලින් මද්‍යසාර පිළිබඳව කථා කරන්නට කැමතියි. පාර්ලිමේන්තුවේ අවසාන වශයෙන් තිබෙන 2010 වර්ෂයේ සංඛ්‍යාලේඛන අනුව, මද්‍යසාර නිසා අක්මාව ආශ්‍රිත රෝගීන් වර්ෂයකට 9,183 ක් රෝහල් ගත වෙලා තිබෙනවා.මද්‍යසාර නිසා මානසික ලෙඩුන් බවට, පිස්සන් බවට - තම අතින් සල්ලි දීලා, තම අතින් කාලා - 7492ක් පත් වෙලා තිබෙනවා. මෙන්න ආසියාවේ ආශ්චර්යය. අක්මාව ආශ්‍රිත රෝගවලින් 2010 දී විතරක් මිය ගිය සංඛ්‍යාව 973ක්. තමන්ගේ අතින් බීලා, අනුන්ගෙන් බීලා, පිනට බීලා, සතුට වැඩිකමට බීලා, මළ ගෙයක් වුණාම දුකට බීලා, 2011 දී රිය අනතුරු නිසා මිය ගිය සංඛ්‍යාව 2,721යි.

මත්පැන් නිසා අංශභාග රෝගයට ගොදුරුවන කෙනකුට දින තුනක් ප්‍රතිකාර කරන්න ලංකාවේ රෝහලක් රුපියල් 5,800ක් වියදම් කරනවා. මද්‍යසාර නිසා හෘදය අකර්මණ්‍යතා ඇති වුණු රෝගියකුට දින හතරකට ප්‍රතිකාර කරන්න අපේ ජාතික ධනයෙන් රුපියල් 9,100ක් වියදම් කරනවා. දුකට බීපු, සතුටට බීපු, සල්ලි වැඩිකමට බීපු, සල්ලි නැතිකමට බීපු, ඇහේ මහන්සියට බීපු උන් සනීප කරන්න මේ රටේ ජනතාවගේ බදු සල්ලිවලින් එක් නෙකුට රුපියල් 9,100ක් ගෙවනවා. ඒ වාගේම හෘදයට රුධිරය සැපයීම අඩුවීම නිසා කරන ප්‍රතිකාරවලට එක්කෙනෙකුට වියදම දවසකට රුපියල් 6000යි. මේ තමයි, මද්‍යසාර නිසා ඇති වී තිබෙන තත්ත්වය.

දැන් අපි දුම් කොළවලට එමු. වසරකට රටේ සමස්ත රෝහල්වල ඇඳන් සංඛ්‍යාවෙන් සියයට 15ක් වෙන් කරන්නේ දුම් වැටි සහ දුම් කොළ ආශ්‍රිත රෝගවලින් පීඩාවට පත්වන අය වෙනුවෙන්. දැන් මා ඉදිරිපත් කරන්නේ හිටපු සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමා පාර්ලිමේන්තුවේදී මගේ ප්‍රශ්නයකට දුන් පිළිතුරක්. පිළිකා හෝ දුම් වැටි ආශ්‍රිත වෙනත් රෝග සඳහා එක් පුද්ගලයකුට දළ වශයෙන් කරන වියදම රුපියල් මිලියනයයි. ඒ, අපේ සල්ලිවලින්. හාල්වලට, පරිප්පුවලට, ලාම්පුතෙල්වලට, උම්බලකඩ කෑල්ලට, පොඩි එකාට අරන් දෙන ටොෆියට, ලොසින්ජරයට, කොපි පොතට, පෑනට ජනතාව ගෙවන බද්දෙන් තමයි ඒ මුදල ගෙවන්නේ. එහෙම නැත්නම් ඒ මුදල සඳහා මේ මොහොතේ උපන්, ඊළඟ මොහොතේ උපදින දරුවාත් ලෝකයට ණයකාරයන් කරලා ගන්න ණය ආධාරවලින් -අපේ භාණ්ඩාගාරයේ සල්ලිවලින්- රුපියල් මිලියනයක් ගෙවන්න ඕනෑ. අපි, රටේ සමස්ත ජනතාව මේ මෝඩයන්ගේ සිගරට් ඉරීම සහ දුම්කොළ භාවිතය වෙනුවෙන් එතරම් මුදලක් ගෙවන්න ඕනෑ. මේක සාධාරණද කියලා මම අහනවා.

දුම් වැටි සහ දුම් කොළ ආශ්‍රිත රෝග නිසා වාර්ෂිකව ලංකාවේ පුද්ගලයන් 20,000ක් මිය යනවා. ඒ ගණන දවස් 365න් බෙදුවාම දවසකට මැරෙන සංඛ්‍යාව 54.7යි. අපි ගණන්වලදී යම් ගණනක් ආසන්න පූර්ණ සංඛ්‍යාවට වටයනවා. 54.7 ආසන්න අගයට වටයපුවාම එන අගය 55යි. ඒ කියන්නේ දුම් වැටි සහ දුම් කොළ ආශ්‍රිත රෝගවලින් දවසකට මැරෙන සංඛ්‍යාව 55යි.

මේ රටේ තිබුණා, තිස් අවුරුදු යුද්ධයක්. අපි කථා කරන අද පෙබරවාරි 20වැනි දා. පසු ගිය තිස් අවුරුදු යුද්ධය තුළ පෙබරවාරි 20වැනිදාවල් 30ක් තිබිලා තිබෙනවා. ඒ දවස් 30 තුළ එල්ටීටීඊ

[ගරු බුද්ධික පතිරණ මහතා]

සංවිධානයෙන් මරපු සංඛ්‍යාවේ සාමාන්‍යය - average - බැලුවොත් 40යි. දළ වශයෙන් 40යි. හැබැයි, දුම් කොළ සමාගමේ දුම් වැටි ආශ්‍රිතව, බීඩි ආශ්‍රිතව, සුදු බීඩි ආශ්‍රිතව වෙනත් දුම් කොළ නිෂ්පාදන ආශ්‍රිතව හැම දවසකම මැරෙන සංඛ්‍යාව 55යි. ලොකුම ත්‍රස්තවාදීන් බවට පත් වුණේ එල්ටීටීඊ එක. ඒ ගැන අපට ප්‍රශ්නයක් නැහැ. එල්ටීටීඊ එක මිනීමරු ත්‍රස්තවාදීන්. ඔවුන් අපේ පක්ෂයේ නායකයන් ගණනාවක් මැරුවා. එල්ටීටීඊ එක ගැන අපේ විවේචනයේ වෙනසක් නැහැ. හැබැයි මම කියන්නේ, ඊට වඩා දුම් කොළ සමාගම භයානක බවයි. හැබැයි, "ගන්න අපේ දේ" කියලා සිංහ ඔළුවකුත් දමලා පත්‍රයේ දැන්වීම් දමන්නේ ලංකා දුම් කොළ සමාගමෙන්. මුන්ට ලංකාවක් නැහැ. මේ අවජාතක දුම් කොළ සමාගම දවසකට 55 දෙනෙක් මරනවා. එහෙම නම් අපි මිනීමරු එල්ටීටීඊ සංවිධානයටත් වඩා ඔවුන්ට දඬුවම් දෙන්න ඕනෑ. ඔවුන්ට අපි බදු සහන දෙනවා. ඔවුන්ට අපි ඉඩම් දෙනවා. දවසකට 55 දෙනෙක් මරන මේගොල්ලන්ටද අපි ඉඩම් දෙන්න ඕනෑ? ඔවුන් දිනකට එල්ටීටීඊ සංවිධානයටත් වඩා 15 දෙනෙක් මරනවා. එහෙම නම් අපේ රටේ සහන දෙන්න ඕනෑ දුම් කොළ සමාගමටද, එහෙම නැත්නම් ගමේ ගොවියාටද? ඒ ගැන අපේ හෘදය සාක්ෂියෙන් ප්‍රශ්න කරන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ විධියට දුම් කොළ සමාගම ආකාර තුනකින් මේ රටට කොකා පෙන්වනවා. පළමුවැනි එක මිනීමරු ත්‍රස්තවාදියකු විධියට. මම ඒක සංඛ්‍යා ලේඛන සහිතව මේ ගරු සභාවට හොඳට පෙන්වලා දුන්නා. දෙවැනි එක, දුම් කොළ සමාගම කියන්නේ නොම්මර එකේ බදු කොල්ලකාරයෙක්. එහෙම වෙන්නේ කොහොමද කියලා මම කියන්නම්. තුන්වැනි එක, දුම් කොළ සමාගම කියන්නේ අධිකරණය හමුවේ නඩු පැවරිය හැකි 2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතේ 36(1) (ආ) වගන්තිය කඩ කරන සංවිධානයක්. ඒක කොහොමද වෙන්නේ කියලා මම කියන්නම්.

දුම් කොළ සමාගම එල්ටීටීඊ ත්‍රස්තවාදියාටත් වඩා මිනීමරු ත්‍රස්තවාදියකු වන්නේ ඇයි කියන පළමුවන කාරණය මා පැහැදිලි කළා. දුම් කොළ සමාගම කොහොමද බදු වංචාකාරයකු බවට පත් වෙලා තිබෙන්නේ කියන දෙවන කාරණය මා දැන් පෙන්වන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගරු සභාවේ ඉදිරි පේළිවල ඉන්නවා ජ්‍යෙෂ්ඨ ඇමතිවරු, මන්ත්‍රීවරු. ඒ අයගේ පුංචි කාලයේ ඉඳලා අහලා තිබෙන විධියටත්, අපි හැම දාම අහලා තිබෙන විධියටත් නිෂ්පාදන වියදම නිසා දුම් කොළ සමාගම සිගරට්ටුවක මිල වැඩි කළා කියලා නොවෙයි සඳහන් කරන්නේ. නිෂ්පාදන වියදම වැඩි නිසා සිගරට් මිල වැඩි වුණා කියලා පත්තරයක කොහේවත් පළ කරන්නේ නැහැ. අපට අහන්න ලැබෙන්නේ, අපට පත්තරවලින් කියවන්න ලැබෙන්නේ, "දුම් කොළ සමාගම නිෂ්පාදනය කරන සිගරට් මත බදු වැඩි කළා" කියලායි. එහෙමයි පළ වෙන්නේ.

මහාචාර්ය කාලෝ ෆොන්සේකා මැතිතුමා තමයි භෞතවේදය පිළිබඳව මගේ ආචාර්යවරයා. මා එතුමාට ගරු කරනවා. මා හිතන විධියට අපේ පාර්ලිමේන්තුවේ ඉන්න 225ක් මන්ත්‍රීවරුන් අතරින් මහාචාර්ය කාලෝ ෆොන්සේකා මැතිතුමාගෙන් ඉගෙන ගත්ත එකම ශිෂ්‍යයා මා වෙන්න ඇති. එතුමා 2011 සැප්තැම්බර් මාසයේ ප්‍රවෘත්ති සාකච්ඡාවක් පැවැත්වූවා. එතැනට ආවා, ආචාර්ය නිශාන් ද මෙල් මහතා. ඔහු දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ උපදේශකවරයෙක්. ඔහු පෙන්වා දුන්නා, ඔහු කරපු අධ්‍යයනයක ප්‍රතිඵලයක්. ඒ අනුව, අවුරුදු 10ක කාලයක් රටේ සමස්ත බදු ආදායමෙන් ප්‍රතිශතයක් විධියට බලනකොට සිගරට් මත බද්ද සියයට 10.6 සිට ක්‍රමිකව අඩු වී තිබෙනවා. කොහොමද අඩු වන්නේ? 2000 වර්ෂයේදී සිගරට්ටුවක් සඳහා වූ බදුවල ප්‍රතිශතය 10.6යි. 2001 දී 9.5යි, 2002 දී 9.3යි, 2003 දී 8.7යි, 2004 දී 8.3යි, 2005 දී 7.9යි, 2006 දී 7යි, 2007 දී 6.2යි, 2008 දී 6.4යි, 2009 දී 6.1යි, 2010 දී 5.6යි, 2011 දී 6.1යි, 2012 දී 5.8යි. ඒ අනුව, 2000 වර්ෂයේ ඉඳලා මේ බදු ප්‍රතිශතය 5.8 දක්වා අඩු වෙලා තිබෙනවා. මෙහෙම වන්නේ කොහොමද?

ඇත්තටම සිගරට්ටුවක බදු වැඩි වුණා කියලා දුම් කොළ සමාගම කිව්වාට, ඒ බදු වැඩි වීමේ සමස්ත ප්‍රතිඵලය භාණ්ඩාගාරයට එන්නේ නැහැ. එයින් කොටසක් දුම් කොළ සමාගම pickpocket ගහනවා. මේ කරුණ මා පාර්ලිමේන්තුවේදී කිව්වාම දුම් කොළ සමාගම මට කිව්වා, "උඹ පුළුවන් නම් එළියට ඇවිල්ලා ඒක කියපං" කියලා. මා එළියට ගිහිල්ලාත් ඒක කිව්වා, පුළුවන් නම් මරපන්, පුළුවන් නම් මට විරුද්ධව නඩු දමාපන් කියලා. හැබැයි, අද වන තුරු දුම් කොළ සමාගම මා පාර්ලිමේන්තුවෙන් එළියේ කියපු දෙයට විරුද්ධවත් කට ඇරියේ නැහැ. මට විරුද්ධව නඩු දමනවා කියලා විතරක් "Ceylon Today" පත්තරයට නිවේදනයක් නිකුත් කළා. ඒ නිසා ඉතා පැහැදිලියි, ආචාර්ය නිශාන් ද මෙල් කරපු අධ්‍යයනය අනුව, මේ රටේ දුම් කොළ සමාගම භාණ්ඩාගාරයට යන්න ඕනෑ සල්ලි රුපියල් බිලියන 100ක් ගසා කාලා තිබෙන බව; හොරා කාලා තිබෙන බව; pickpocket ගහලා තිබෙන බව; යටි මඩි ගහලා තිබෙන බව. සංඛ්‍යා ලේඛන ඇතිවයි මා මේවා කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රුපියල් බිලියන 100ක් කියලා කිව්වාට මේ ගණන කාටවත් තේරෙන්නේ නැහැ. මා කියන්නම්, මේ රුපියල් බිලියන 100ක් කියන්නේ කොපමණද කියලා. මේ රටේ සිදු වුණ මහා වැට් බදු වංචාවේ ප්‍රමාණය රුපියල් බිලියන 3.52යි. හැබැයි, සිගරට් සමාගම අවුරුදු 10කදී භාණ්ඩාගාරයට අහිමි කරපු මුදල රුපියල් බිලියන 100යි. එතකොට දැන් ඒ වංචාවේ තරම හිතා ගන්න පුළුවන්.

මහවැලිය හදන්න ගියේ රුපියල් බිලියන 73යි. දුම් කොළ සමාගම අවුරුදු 10ක් තුළ අපෙන් උදුරා ගන්න ප්‍රමාණය රුපියල් බිලියන 100යි. එහෙමනම් මහවැලිය හදන්න ගියාටත් වඩා මුදලක් අවුරුදු 10කදී දුම් කොළ සමාගම අපෙන් උදුරා ගෙන තිබෙනවා.

ඒ වාගේම මේ රටේ පාසල් දරුවන්ට නිල ඇඳුම් දෙන්න අවුරුද්දකට යන්නේ රුපියල් බිලියනයයි. ඒ කියන්නේ, එක ළමයකුට අවුරුද්දට uniforms 100ක් දෙන සල්ලි සිගරට් කොම්පැනිය අපෙන් උදුරා ගෙන තිබෙනවා. මේවා භාණ්ඩාගාරයට යන්න තිබුණු සල්ලි. අපේ රටේ සමෘද්ධි සහනාධාරය දෙන්න යන්නේ රුපියල් බිලියන 9යි. සමෘද්ධි සහනාධාරය දස ගුණයකින් වැඩි කරන සල්ලි දුම් කොළ සමාගම අපට අහිමි කර තිබෙනවා.

දක්ෂිණ අධිවේගී මාර්ගය පින්නදුවේ ඉඳලා මාකුඹුර දක්වා හදන්න ගිහිල්ලා තිබෙන්නේ රුපියල් බිලියන 44යි. ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමනි, ඒ මාර්ග ගාල්ල දිස්ත්‍රික්කය දක්වා හදන්න ගිය සල්ලි ප්‍රමාණය වාගේ දෙගුණයකට වැඩි සල්ලි ප්‍රමාණයක් සිගරට් කොම්පැනිය භාණ්ඩාගාරයට අහිමි කරලා තිබෙනවා.

මා තව කියන්නම්. ඒ වාගේම මත්තල ගුවන් තොටුපොළ පළමුවැනි අදියර ඉදි කරන්න ගිය මුදල රුපියල් බිලියන 21යි. ගුවන් තොටුපොළවල් පහක් හදන සල්ලි දුම් කොළ සමාගම අපට අහිමි කර තිබෙනවා. මාගම්පුර වරායේ දෙවන අදියරට ගිහිල්ලා තිබෙන්නේ රුපියල් බිලියන 90යි. මාගම්පුර වරායේ දෙවන අදියරට ගිය සල්ලි ප්‍රමාණයට වඩා සල්ලි ප්‍රමාණයක් දුම්කොළ සමාගම අපට අහිමි කර තිබෙනවා.

අපේ රටේ පොහොර සහනාධාරයට යන්නේ රුපියල් බිලියන 20යි. පොහොර සහනාධාරය පස් ගුණයකින් වැඩි කරන සල්ලි මේ සිගරට් කොම්පැනිය අපෙන් උදුරා ගෙන තිබෙනවා. එහෙම නම් එක පැත්තකින් සිගරට් කොම්පැනිය ත්‍රස්තවාදයට වඩා භයානක මනුෂ්‍ය ඝාතකයෙක්. අනෙක් පැත්තෙන්, බිලියන 100ක් ගසා කාපු, වැට් බදු වංචාවට වඩා වංචා කරපු ආර්ථික ඝාතකයෙක්.

පාර්ලිමේන්තුවේදී මීට කලින් මම පෙන්නුවා, හාල් මිල වැඩි වීමේ pattern එක මොකක්ද කියලා; අර්තාපල්වල මිල වැඩි වීමේ pattern එක මොකක්ද කියලා. ඒ pattern එක ගැන බලනකොට සිගරට් මිල වැඩි වීමේ pattern එක යන්නේ රුවිතෙට. මේ රටේ උද්ධමනය අනුව භාණ්ඩ මිල වැඩි වීමේ pattern එක අනුව බැලුවාම හරි නම් අද වනකොට සිගරට් එකක මිල රුපියල් 38ක් විතර වෙන්න ඕනෑ. හැබැයි සිගරට් එකක් ඊට වඩා අඩු මිලකට දෙන්නේ කොහොමද? ආණ්ඩුවෙන් මේ සම්බන්ධව දැන්වීම් දමනවා. මහ බැංකුවේ සමහර නිලධාරීන් මේකට සම්බන්ධයි, සමහර මාධ්‍යවේදීන් මේකට සම්බන්ධයි, සමහර මාධ්‍ය ආයතන මේකට සම්බන්ධයි, සමහර දේශපාලනඥයින් මේකට සම්බන්ධයි. අපි භය නැතිව කියනවා, පසු ගිය කාලයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ ඉඳලා අලුත්කඩේ උසාවියේ කළු කෝට් ඔක්කොම කළු දුම් කොළවලට වැහිලයි තිබුණේ කියන එක. අලුත්කඩේ උසාවියේ කිහිප දෙනෙක් හැරෙන්න, හිටපු මහ එකාගෙ ඉඳලා බොහෝ දෙනකුගේ කළු කෝට් කළු දුම් කොළවලින් වැහිලායි තිබුණේ: කටවල්වල කළු දුම් කොළ හිර වෙලායි තිබුණේ. ඒ වාගේම රටේ රාජ්‍ය නායකයන්ගේත් කටේ කළු දුම් කොළ හිර වෙලායි තිබුණේ. ඒ සල්ලිවලට කටවල් වැහිලා තමයි, 'බොග්, බොග්' ගගා හිටියේ. ඒ සල්ලි නිසා තමයි මේ පනත්වලට සංශෝධන ගෙනෙන්න පරක්කු වුණේ. ඒකයි ඇත්ත. මේ රටේ දේශපාලකයින්, මහ බැංකුවේ නිලධාරීන් සහ අලුත්කඩේ සමහර විනිශ්චයකාරයන්ගේ කටවල්වල කළු දුම් කොළ හිර වෙලා කථා කර ගන්න බැරුවයි සිටියේ. ඒ නිසායි අද අපි සන්තෝෂ වෙන්නේ.

තුන් වන කාරණය මේකයි. දුම් කොළ සමාගම කොහොමද, මම කියපු විධියට 2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතේ අංක 36 (1)(අ) වගන්තිය කඩ කරලා තිබෙන්නේ? මේ අවස්ථාවේදී සෞඛ්‍ය ඇමතිතුමා මේ ගරු සභාවේ ඉන්නවා. හරි නම් දුම්කොළ සමාගම හෙට වුණත් උසාවියට ගෙනෙන්න පුළුවන්ය කියා මම එතුමාට කියනවා. ඇයි මම එහෙම කියන්නේ? පනත අනුව මේක ඉතා පැහැදිලියි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. 2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතේ 36(1)(අ) උප වගන්තිය උල්ලංඝනය කරමින් තිබෙනවා. කොහොමද, උල්ලංඝනය කර තිබෙන්නේ? 36(1) (අ), (ආ) උප වගන්තිවල මේ විධියට සඳහන්ව තිබෙනවා:

"(අ) යම් අධ්‍යාපනික, සංස්කෘතික, සමාජ හෝ ක්‍රීඩා සංවිධාන ප්‍රවර්ධන යම් ක්‍රියාකාරකම් හෝ උත්සව අවස්ථාවන් සම්බන්ධයෙන්;

(ආ) ඒ දුම්කොළ නිෂ්පාදනයේ හෝ මද්‍යසාර නිෂ්පාදනයේ නිෂ්පාදකයා, ආනයනකරු හෝ බෙදා හරින්නා විසින් හෝ ඒ වෙනුවෙන් යම් මූල්‍යාධාරයක් හෝ වෙනත් සහායක් ඒ සංවිධානය, ක්‍රියාකරකම හෝ උත්සව අවස්ථාව සඳහා දී තිබෙන බව පෙන්නුම් කරන හෝ දැනුවත් වන ආකාරයෙන් යොදා නොගත යුතු ය. "

පනතේ එහෙමයි තිබෙන්නේ. එහෙම යොදා ගන්නවා නම් දෙන දඬුවම පිළිබඳව 36 (2) උප වගන්තියේ මේ විධියට කියා තිබෙනවා:

"(2) (1) ... මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පනස්දහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය."

ඒකෙන් කියන්නේ මේ රටේ දුම් කොළ කොම්පැනිවලට, සිගරට් කොම්පැනිවලට, බියර් කොම්පැනිවලට CSR - Corporate Social Responsibility - funds පාවිච්චි කරන්න බැහැ කියන එකයි. මම ඒ ගැන කියන්නම්.

මාන්කුලම පොලීසිය හැදුවා. දුම් කොළ කොම්පැනිය තමයි මාන්කුලම පොලීසිය හැදුවේ. මේ පනත අනුව දුම් කොළ කොම්පැනියට මාන්කුලම පොලීසිය හදන්න බැහැ. කවුද, ඒ පොලීසිය විවෘත කරන්නේ? ඒ එවකට හිටපු අග්‍රාමාත්‍ය දි.මු. ජයරත්න මැතිතුමා. ඒවායේ ඡායාරූප තිබෙනවා. මම ඒ ඡායාරූප මේ ගරු සභාවේදී සභාගත කර තිබෙනවා. 2013 දෙසැම්බර් 13 වැනි දා හැන්සාඩ් වාර්තාවේ 2143 තීරුවේ ඒ බව සඳහන්ව තිබෙනවා.

මේ පනත අනුව මාන්කුලම පොලීසිය හදන්න දුම් කොළ කොම්පැනියට සල්ලි දෙන්න බැහැ. හැබැයි, දීලා තිබෙනවා. ඒක එතැනින් නැවතිලා නැහැ. 2013 අගෝස්තු මාසයේ පළමුවැනි දා දුම් කොළ සමාගම 'දිනමිණ' පුවත් පතේ දැන්වීමක් පළ කර තිබෙනවා. ජනමාධ්‍ය ඇමතිතුමා මේ අවස්ථාවේදී මේ ගරු සභාවේ ඉන්නවා. මම එතුමාට කියනවා, ඒ ගැන පරීක්ෂණයක් කරන්නය කියා. මොකක්ද, 2013 අගෝස්තු මාසයේ 01 වැනිදා ඒ පුවත් පත් දැන්වීමෙන් කියා තිබෙන්නේ?

"ලංකා දුම්කොළ සමාගම වාණිජ පරමාර්ථයෙන් ඇරඹුණත් අද ඔවුන්ගේ කෘෂි සංවර්ධන වැඩසටහන ප්‍රශංසනීය කාර්ය භාරයක."

"වාණිජ පරමාර්ථයෙන් ඇරඹුණත් ප්‍රශංසනීය කාර්යභාරයක" කියලා කියනවා. දවසට 55 දෙනෙක් මරන එකද, ප්‍රශංසනීය කාර්ය භාරය? දවසකට 55 දෙනෙක් මරන මිනීමරුවායි ආණ්ඩුවේ පත්තරවලයි මේ දැන්වීම් දමන්නේ. අවුරුදු 10ක් රුපියල් බිලියන100ක් ගසා කාපු ආර්ථික ඝාතකයා. මේවා කළේ කවුද? කාගේ අනුග්‍රහයෙන්ද? කවුද මේවාට උල් පන්දම් දුන්නේ? මේවා ගැන හොයන්න ඕනෑ. ඒකයි අපි කියන්නේ.

ඒ විතරක් නොවෙයි, එන එන කෘෂිකර්ම ඇමති අල්ලා ගන්නවා. මහින්ද යාපා අබේවර්ධන හිටපු කෘෂිකර්ම ඇමතිතුමා දැන් මේ ගරු සභාවේ සිටියා. මේක කියාගෙන එනකොටම නැඟිටලා ගිහිල්ලාද මම දන්නේ නැහැ. ඇහෙන තැනක හිටියොත් එතුමා මේ ගරු සභාවට ඒවිය කියා මම බලාපොරොත්තු වෙනවා. මම මේ ගැන කියා ගෙන යන්නම්.

හැම ආණ්ඩුවකම කෘෂිකර්ම ඇමතිවරුන් යටතේ CSR ව්‍යාපෘති නාමයෙන් දුම් කොළ සමාගම තමන්ට ඕනෑ දේවල් කරලා තිබෙනවා. මම ඒ ගැන කියන්නම්. හේමකුමාර නානායක්කාර හිටපු කෘෂිකර්ම ඇමතිතුමා- එතුමා දැනට ආණ්ඩුකාරවරයෙක්. ඒක හරි.- යටතේ CSR ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබෙනවා.

අනුර කුමාර දිසානායක මැතිතුමා පරිවාස ආණ්ඩුවේ කෘෂිකර්ම ඇමතිවරයා වශයෙන් කටයුතු කරද්දී වැව් හදන්න දුම් කොළ කොම්පැනිය සල්ලි දීලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි,-

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
කොච්චර දීලා තිබෙනවාද?

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගණන ඔබතුමා සොයා ගන්න.

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
ගණන හරියට කියන්න.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
සමාජ සේවා අමාත්‍යාංශයට දීලා නැහැ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
නැහැ, නැහැ, සමාජ සේවා අමාත්‍යාංශයට දීලා නැහැ. ෆිලික්ස් පෙරේරා මැතිතුමාට මම ගරු කරනවා. අහගන්න. මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා යටතේ දුම් කොළ සමාගම වැලිගම ක්‍රියාත්මක වුණා. මාතර දිස්ත්‍රික්කයේ වැලිගම මැතිවරණ කොට්ඨාසයේ මේ අය CSR ව්‍යාපෘති ක්‍රියාත්මක කළා. හැබැයි, මේවා ගැන සොයා බලන්නේ නැහැ. මෙන්න මේකයි ඇත්ත තත්ත්වය. දුම් කොළ සමාගම එන එන කෘෂිකර්ම ඇමතිව අල්ලා ගන්නවා. ගාමිණී ජයවික්‍රම පෙරේරා ඇමතිතුමා අද කෘෂි කර්මාන්ත විෂය බාරවත් කටයුතු කරනවා කියලා මම හිතනවා. ගරු දුමින්ද දිසානායක මහතාටත් යම් වගකීමක් තිබෙනවා. අපි විශ්වාස කරනවා, මේ ආණ්ඩුවවත් මේ දුම් කොළ සමාගමේ උප්පරවැට්ටිවලට, මායම්වලට යට වෙන එකක් නැහැ කියලා.

මේ අවස්ථාවේදී ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා මේ ගරු සභාවට එනවා. මම හිතනවා, මම එතුමාගේ නම සඳහන් කළ නිසා එතුමා මගේ කාල වේලාව අරගන්නේ නැතුව මේ සම්බන්ධව පසුව උත්තරයක් දෙයි කියලා. මේ මෑතක් වන තෙක් දුම් කොළ සමාගම වැලිගම මැතිවරණ කොට්ඨාසයේ කටයුතු කළා. මම මේවා ගැන අදාළ ලේඛන සභාගත කරලා තිබෙනවා. [බාධා කිරීමක්]- ඔබතුමාගේ වේලාවේදී මේවාට උත්තර දෙන්න.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
අපි කෘෂිකර්ම කටයුතු සිදු කළේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ආ! කෘෂිකර්ම කටයුතු කරලා තිබෙන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හොර හරක් පටවා ගෙන යන ලොරියේ ඉස්සරහ ගහලා තිබෙන්නේ "බුදු සරණයි - දෙවි පිහිටයි" කියලා. නමුත් ඇතුළේ ඉන්නේ හොර හරක්. ඒ වාගේම තමයි දුම් කොළ සමාගම දවසට 55දෙනෙකු මරලා ගොවීන්ට සල්ලි දෙනවා. මේ දෙපිටකාටටු වැඩේ මොකක්ද?

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ඒ දුන්නේ ගොවීන්ට.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අනේ! අනේ! මරණ ගණනට පව් කමා කර ගන්නද? ගොවීන්ටලු දුන්නේ. නැහැ, ඉඩම් ටිකට කෙළින්න දුන්නේ. ඒකයි ඇත්ත. ජනාධිපතිගේ ඉඳලා, අග විනිසුරුගේ ඉඳලා කවුරුත් මේ දුම් කොළ කොම්පැනියට යට වුණා. මේවා සංඛ්‍යා ලේඛන එක්කයි මම කිව්වේ. මම කියන්නේ, මේවා කොළ පාට ආණ්ඩුවකින් කළත් වැරදියි; නිල් පාට ආණ්ඩුවකින් කළත් වැරදියි; රතු පාට ආණ්ඩුවකින් කළත් වැරදියි. මේ දුම් කොළ කොම්පැනිවලට යට වෙනවා කියන්නේ ඉතාම වැරදි දෙයක්. එම නිසා අපි ඉතා පැහැදිලිව කියනවා, -

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
දුම් කොළ සමාගම වහන්නේ නැත්තේ ඇයි?

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
කොහේද, දුම් කොළ සමාගම වසා තිබෙන්නේ? - [බාධා කිරීමක්] - අනේ, අනේ! වාඩිවෙන්න ගරු මන්ත්‍රීතුමා. නිල්, කොළ දෙගොල්ලම එකතු වෙලා කළත් ඒවා වැරදියි. එම නිසා අපි පැහැදිලිව කියනවා, මේ දුම් කොළ සමාගම ආකාර තුනකින් මේ රටේ ජනතාවගේ ජන ජීවිතයට පහර එල්ල කර තිබෙනවා කියන එක.

මීට කලින් මේ ගරු සභාවේදී මේ සම්බන්ධයෙන් උත්තරයක් දුන්නා. දුම් කොළ සමාගම පොළොන්නරුව සහ මාතලේ දිස්ත්‍රික්කවල දුම් කොළ වගා කරන ගොවීන්ගේ දරුවන්ට පොත් පත් ලබා දෙනවා; පෑන්, පැන්සල් දෙනවා. මේවා වැරදියි. මම කියන්නේ ඒකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියන්නේ මේ 'දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත' යටතේ මෙහෙම කරන්න බැහැ කියන එකයි. මේක දඬුවම් ලැබිය හැකි වරදක්. මම ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න ඇමතිතුමාගෙන් ඉල්ලනවා, කරුණාකරලා අද දිනයේ මේ පිළිබඳව කථා කළ පසුව දුම් කොළ සමාගමට, බියර් සමාගම්වලට CSR ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න හදනවා නම්, ඒ අය විවිධ සමාජ සේවා සංවිධානවලට මුදල් ආධාර දීලා එහෙම නැත්නම් රාජ්‍ය අමාත්‍යවරුන් සම්බන්ධ කර ගෙන මුදල් ආධාර දීලා -

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ස්කාගාර වසා දමන්න.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
හරි, හරි. අවුරුදු දහයක් ඇමතිකම් කරලාත් වසා ගන්න බැරුවද, දැන් අපට කියන්නේ? ලජ්ජයි! වාඩිවෙන්න. ලජ්ජයි! අපේ සීයාගේ වයසේ. කරන්න බැරුව දැන් මඟුලද කියවන්නේ? ලජ්ජයි! ලජ්ජයි! වාඩිවෙන්න, වාඩිවෙන්න, වාඩිවෙන්න. ලජ්ජයි! මම වාගේ නවක මන්ත්‍රීවරයෙක් එක්ක බලද්දී ඔබතුමා හිටපු ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙක්. ලජ්ජයි! ලජ්ජයි! වාඩිවෙන්න. වාඩිවෙන්න. ලජ්ජයි! අවුරුදු දහයක් කළේ මොනවාද? පොල් ගෑවාද? මෙතැන කියවන්න එනවා. දුම් කොළ සමාගම්වල සල්ලිවලට යට වුණු

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ඒ සල්ලිවලින් යැපිලා දැන් මෙතැන කියවන්න එනවා. ලජ්ජයි! ලජ්ජයි! මේ රටේ දවසට 55දෙනෙකු මරණ මිනීමරුවන් වෙනුවෙන් කටවල් ඇරෙනවා. ලජ්ජයි! ලජ්ජයි!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාව ගෙනෙන්නේ රටට ආදරයෙන්. පක්ෂ භේදයෙන් තොරව සියලු දෙනා එකතු වෙන්නේ ඒ අරමුණ වෙනුවෙන්. එම නිසා මෙය මේ මොහොතේ ඉපදිලා ඉන්න දරුවන් වෙනුවෙන් පමණක් ගත්ත තීන්දුවක් නොවෙයි, ඊළඟ මොහොතේ උපදින්න ඉන්න දරුවා වෙනුවෙනුත් ගන්නා තීන්දුවක්; රටේ ජනතාව වෙනුවෙන් ගන්නා තීන්දුවක්. මේක ඓතිහාසික තීන්දුවක්. මේ වාගේ තීන්දු ගණනාවක් තව එනවා. ඒකයි යහ පාලන ආණ්ඩුවක තිබෙන වෙනස. ඒකයි යහ පාලන ආණ්ඩුවක තිබෙන පරිවර්තනය. මහාචාර්ය සේනක බිබිලේට ඖෂධ ප්‍රතිපත්තිය ගෙනෙන්න බැරි වුණා. මහාචාර්ය සේනක බිබිලේ මරා ගත්තා. අදටත් ඒ මරණය අභිරහසක්.

ඇත්තටම මේ දවස් සියයේ වැඩ පිළිවෙළ යටතේ සැබෑ සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන් විධියට අද ගන්නේ තවත් එක විප්ලවීය පියවරක්. ඒ විප්ලවීය පියවර තුළින් අපි බලාපොරොත්තු වෙන්නේ, මේ රටේ උරුමය ඊළඟ පරම්පරාවට පවරන්නට තිබෙන සාධනීය පියවරක්. ඒ නිසා මම ඉතාමත් පැහැදිලිව කියනවා, "අපි මේ පනත් කෙටුම්පත ගෙනාවට වැඩක් නැහැ. පනතෙන් විතරක් මේ තීන්දුව ගන්න බැහැ" කියලා. සමහර අය අහනවා, තමුන්ට තිබෙන මුදල අනුව සාමාන්‍යයෙන් සිගරට් එක, දෙක ගන්න අය ඉන්නවා. සිගරට් පෙට්ටියේ රූපමය අවවාද ගහපුවාම, සිගරට් එක, දෙක ගන්න කෙනා රූපමය අවවාද දකින්නේ නැහැ නේද; සිගරට් පෙට්ටියක් සල්ලිවලට ගන්න කෙනා විතර නේ දකින්නේ කියලා. ඒක ලස්සන තර්කයක්. මම ඒ වෙනුවෙන් නිර්මාණශීලී යෝජනාවක් කරනවා. [බාධා කිරීමක්] අයියෝ, අහ ගෙන ඉන්න කෝ. වාඩි වෙන්න. [බාධා කිරීමක්] අනේ, ඔබතුමා වාඩි වෙන්න කෝ. ඔබතුමා මගේ සීයාගේ වයසේ. වාඩි වෙන්න. නවක මන්ත්‍රීවරයෙකුට බාධා කරන්න ලජ්ජා නැද්ද? මම තුනේ පන්තියේ ඉන්න කොටයි -1983 දී- ඔබතුමා පාර්ලිමේන්තුවට ආවේ. මම නවක මන්ත්‍රීවරයෙක්. ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙක් නවක මන්ත්‍රීවරයෙකුට බාධා කරන එකට ලජ්ජා වෙන්න ඕනෑ.

ගරු සෞඛ්‍ය ඇමතිතුමනි, සිගරට් එක, දෙක ගන්න පුද්ගලයා ඒ රූපමය අවවාද දකින්නේ නැහැ. ඒ නිසා මම ඔබතුමාට නිර්මාණශීලී යෝජනාවක් කරනවා. ගරු ඇමතිතුමනි, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල රටේ තිබෙනවා. ඒවා හරහා සිගරට් විකුණන හැම කඩයක්ම ලියා පදිංචි කරන්න. ලියා පදිංචි කිරීමේ ගාස්තුවක් අය කරන්න. එතකොට සෞඛ්‍ය අමාත්‍යාංශයට අමතර ආදායමකුත් ගන්න පුළුවන්. සිගරට් "ලූස්" වශයෙන් විකුණනවා නම්, ඒ කියන්නේ එක හෝ දෙක විකුණනවා නම් ඒ කඩවල්වල රූපමය අවවාද පැහැදිලි ලෙස පෙනෙන්නට, මෙන්න මෙපමණ වපසරියක ප්‍රදර්ශනය කරන්න කියන්න. සිගරට් විකුණනවා නම් ඒ කඩේ රූපමය අවවාද ප්‍රදර්ශනය කරන්න ඕනෑ. ඒ කඩ ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ ලියා පදිංචි කරන්න ඕනෑ. ලියා පදිංචි කිරීමේ ගාස්තුවක් ගන්න. ඒකෙන් රජයට මුදලක් එනවා. සිගරට් එක, දෙක ගන්න කඩයට එන පුද්ගලයාත් එතකොට අර රූපමය අවවාද දකිනවා. ඒ රූපමය අවවාදත් මාස කීපයකට සැරයක් වෙනස් කරන්න පුළුවන් යාන්ත්‍රණයක් හදන්න. එවිට මේ ප්‍රශ්නයට විසඳුමක් එනවා. මොකද, ගොඩක් අය නගන තර්කයක් මේක. ඒ නිසා මම හිතනවා මගේ නිර්මාණශීලී යෝජනාව සෞඛ්‍ය ඇමතිතුමා ආදරයෙන් භාර ගනීවි කියලා.

සිගරට් පෙට්ටියක මුදල කීයද කියා මා දන්නේ නැහැ. සිගරට් එකක මිල රුපියල් 31ක්, 32ක් වන නිසා රුපියල් 300කට වැඩි ඇති. ඒ නිසා මම යෝජනා කරන්නේ, සිගරට් එකක් හෝ දෙකක් විකුණන සියලුම කඩ ලියා පදිංචි කරන්න කියලායි. එසේ ලියා පදිංචි කළාම ඒ ප්‍රශ්නයටත් අපිට විසඳුමක් ලැබෙන බව මම මේ අවස්ථාවේ සිහිපත් කරනවා. ඒ ගමන්ම මම තවත් කාරණයක් මේ අවස්ථාවේ මතක් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක් දෙන්න. මේ කාරණාවත් කියා මා කථාව අවසන් කරන්නම්. ගරු සෞඛ්‍ය ඇමතිතුමා මේ කාරණය ගැන සඳහන් කළා.

මේ විෂය ගැන කථා කරන කොට අපි තවත් අවධානය යොමු කළ යුතු දෙයක් තිබෙනවා. බලන්න "ෆුඩ් සිටි" එකට ගියොත්, කඩයකට ගියොත් සිගරට් පෙට්ටි ටික තියන්නේ ටොෆි, ලොසින්ජර, චොක්ලට් තියෙන තැන. පුංචි දරුවන් එන තැන තමයි තියෙන්නේ. සෞඛ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට මම යෝජනා කරනවා වෙලාවක් තිබෙනවා නම් අද හවසට, නැත්නම් හෙට - ඔබතුමාට යන්න වෙලාවක් නැත්නම් නිලධාරියෙක් යවන්න.- ප්‍රධාන කඩවල්වලට, ඒ වාගේම "ෆුඩ් සිටි"වලට ගිහින් බලන්න කියලා. ටොෆි, චොක්ලට්, ලොසින්ජර තියෙන තැන්වල තමයි සිගරට් පෙට්ටි ටික තියෙන්නේ. පොඩි දරුවා ටොෆි, ලොසින්ජර ගන්න යන කොට වැඩිහිටියෝ ඇවිල්ලා සිගරට් පෙට්ටිය ගන්නවා පොඩි දරුවෝ දකිනවා. කුඩා දරුවන්ගේ පලතුරු, කුඩා දරුවන් සඳහා වෙන් වන රස කැවිලි, එහෙම නැත්නම් ටොෆි, ලොසින්ජර තියෙන තැන්වල සිගරට් පෙට්ටි තබන්නට පුළුවන් විධියටයි සිගරට් කොම්පැනි ඒ අවශ්‍ය දේවල් හදලා තිබෙන්නේ. ඒ නිසා කරුණාකර ඒ තැන්වලින් ඒවා ඉවත් කරන්න අවශ්‍ය නීතිමය පියවර ගන්න. ඒකට පනත් ඕනෑ නැහැ. ඒ සඳහා අවශ්‍ය තත්ත්වය නිර්මාණය කරන්න කියා ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගරු සභාවේදී මේ විෂය සම්බන්ධයෙන් හය වැනි වතාවටත් කරුණු ඉදිරිපත් කරන්නට අවස්ථාව ලැබීම පිළිබඳවත්, දින සියයේ ආණ්ඩුවේ පළමුවැනි දින 40 ගෙවෙන්නට කලින්ම පසු ගිය කාලයේ තිරිංග දාපු, පසු ගිය කාලයේ යට වූ, සමහර වෙලාවට අධිකරණය යට වූ, දේශපාලන නායකයෝ යට වූ, නිලධාරින් යට වූ, ඇතැම් මාධ්‍ය යට වූ, -මම ඒකත් වග කීමක් ඇතිව කියනවා. සිගරට් ගැන අපි කරන කථා වුවමනාවෙන් සියලුම මාධ්‍යවේදීන් නොවුණත්, සියලුම මාධ්‍ය ආයතන නොවුණත්, ඇතැම් මාධ්‍ය ආයතන, ඇතැම් මාධ්‍යවේදීන් ලියන්නේ නැහැ. එම නිසා ඒ පිළිබඳවත් අපි අවධානය යොමු කරවනවා.- මේ පනත් කෙටුම්පතට දැක් වූ දායකත්වයට සියලු පාර්ශ්වයන්ට අපේ ස්තුතිය පුද කරනවා. බොහොම ස්තුතියි. තෙරුවන් සරණයි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

මීළඟට ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.55]

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත ඉදිරිපත් කර එය අනුමත කිරීමට සූදානම් වන මේ වෙලාවේ, වර්තමාන සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍ය ගරු රාජිත සේනාරත්න මැතිතුමාට සහ

[ගරු ශාන්ත බණ්ඩාර මහතා]

එම කාර්ය මණ්ඩලයට අප විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා, ඉතා කඩිනමින් මෙම පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න කටයුතු කිරීම සම්බන්ධයෙන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ මෙම ගරු සභාවේ දී මා රීති ප්‍රශ්නයක් නඟලා කිව්වා, යම් පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනකොට, ඒ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ අමාත්‍යාංශ උපදේශක කාරක සභාවේ සාකච්ඡා කරලා ඉදිරිපත් කළ යුතුයි කියා. එවිට ගරු අධිකරණ අමාත්‍යතුමා කිව්වා, "හරිහැටි දන්නේ නැතිව මන්ත්‍රීවරු කථා කරලා කාලය නාස්ති කරනවා" කියලා. හැබැයි, මම කියන්නට කැමැතියි අපි මීට දින දෙකකට කලින් මෙම පාර්ලිමේන්තුවේ සම්මත කරන ලද ධීවර පනත් කෙටුම්පතත් පාර්ලිමේන්තුවේ උපදේශක කාරක සභාවක සාකච්ඡාවට බඳුන් වුණේ නැහැ. ඊයේ පනත් කෙටුම්පත මීට වර්ෂයකට පෙර සාකච්ඡාවට බඳුන් වුණ එකක්. අද දින සාකච්ඡාවට ගැනෙන මෙම පනත් කෙටුම්පතත් පාර්ලිමේන්තුවේ උපදේශක කාරක සභාවේ සාකච්ඡා වෙලා නැහැ. මෙයින් අදහස් කරන්නේ මෙයට විරෝධයක් පළ කිරීමවත්, වෙන මොනම හේතුවක්වත් නොවෙයි. මේ සම්බන්ධව පක්ෂ නායක රැස්වීම්වල යම් තීන්දුවක් ගත්තා නම් -යම් වෙනත් තීන්දුවක් ගත්තා නම් එහෙම නැත්නම් මේ දිනවල උපදේශක කාරක සභා රැස්වෙන්නේ නැති නිසා අත්‍යවශ්‍යවම කළ යුතු කාර්යයක් නම්; අපිත් පිළිගන්නවා කරන්න ඕනෑ කාර්යයන්- ඒවා පිළිබඳ පාර්ලිමේන්තුව දැනුවත් කිරීම් වටිනවා කියලා මම හිතනවා. පසු පෙළේ ඉන්න මන්ත්‍රීවරයෙක් හැටියට රීති ප්‍රශ්නයක් ගෙනාවාම, "දන්නේ නැතිව කථා කරන්න එපා" කියලා ඇමතිවරයෙක් කියනවාට වඩා -එය මාධ්‍ය තුළ පවා පළ වුණා- නිවැරැදි ක්‍රමවේද භාවිත කරන්නය කියලා විශේෂයෙන්ම අප කියනවා.

මේ ගන්නා හොඳ, යහපත් හැම තීරණයකටම අප සහයෝගය ලබා දෙනවා. නමුත් මේ ගන්නා වූ තීන්දු තීරණ ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වෙලා තිබෙනවා. අපි කියන්නේ ඒවා කඩිනමින් ක්‍රියාත්මක කරන්න අවශ්‍ය කටයුතු කරන්න කියලායි. පසු ගිය අතුරු අය වැයෙන් භාණ්ඩවල මිල අඩු කරන්න තීන්දු කළා. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවම ග්‍රාමීය ප්‍රදේශවල ඒ භාණ්ඩවල මිල ගණන් අඩු වෙලා නැහැ. අද උදේ වරුවේ ග්‍රාමීය ප්‍රදේශවල කිහිප දෙනෙක් අපට කථා කළා. උකස් තැබූ රත්තරන් බඩු සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා. බැංකුවල උකසට තැබූ රුපියල් ලක්ෂ දෙක දක්වා වටිනාකමින් යුත් ස්වර්ණාභරණ මත අය කරන පොලිය ඉවත් කරනවා කියලා අතුරු අය වැයේ දී කිව්වාට තවම ඒ සම්බන්ධ චක්‍රලේඛ බැංකුවලට යවලා නැහැ. ඒ සම්බන්ධව ක්‍රියාත්මක වෙලා නැහැ. එම නිසා බැංකු එම වෙන්දේසි තාවකාලිකව අවලංගු කරලා තිබෙනවා. එක පැත්තකින් බැංකුව අපහසුතාවකට ලක් වෙලා තිබෙනවා. අනිත් පැත්තෙන් ඒ බඩු උගසට තැබූ අහිංසක ජනතාව අපහසුතාවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ පාර්ලිමේන්තුවෙන් සම්මත කරලා ගන්නා වූ තීරණ ජනතාව වෙනුවෙන් කඩිනමින් ක්‍රියාත්මක කරන්න ඕනෑ කියන එක අපි මේ වෙලාවේ විශේෂයෙන් මතක් කරන්න කැමැතියි.

මේ වෙලාවේ දී අපි කියන්න ඕනෑ, මෙම පනත් කෙටුම්පත ගෙන ඒම සඳහා හිටපු සෞඛ්‍ය අමාත්‍යතුමා-වර්තමාන ජනාධිපති අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා - විශාල කැප කිරීමක් කළ බව. අප දැක්කා, ඒක අවංක උත්සාහයක් බව. ග්‍රාමීය ප්‍රදේශයකින් ආපු මහජන නියෝජිතයෙක් හැටියට, දේශපාලන අත් දැකීම් තිබෙන පරිණත මහජන නියෝජිතයෙක් හැටියට එතුමා අවංකවම එම කාර්ය භාර්ය කළා. මේ රටේ එක් අවුරුද්දකට 2,000කට වඩා වැඩි පිරිසක් දුම් වැටි භාවිතය නිසා ජීවිතක්ෂයට පත් වෙනවා. එම නිසා එතුමාට ඒ ගැන අවංකවම ඕනෑකමක් තිබුණා. මේ සම්බන්ධව විවිධ ක්ෂේත්‍රවලින් දැඩි බලපෑම් එල්ල වුණා. විවිධ අභියෝග එල්ල වුණා. ඒ බව අපි දන්නවා. හැබැයි, එම අභියෝග සියල්ල ජයග්‍රහණය කර ගෙන එතුමා ආපු ඒ ගමනේදී ජනතාව වෙනුවෙන් අද මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගේන්න පුළුවන් ශක්තිය නිර්මාණය කරලා තිබෙනවා. එම නිසා අද ඉදිරිපත් කර තිබෙන "දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත" සඳහා විපක්ෂයේ මන්ත්‍රීවරුන් ඇතුළු සමස්ත මන්ත්‍රීවරුන්ගේ පූර්ණ සහයෝගය ලැබෙන බව නොඅනුමානයි.

යාපනය ප්‍රදේශයේ ජනතාව දුම් කොළ භාවිතයට එහෙම නැත්නම් දුම් වැටි භාවිතයට වැඩිපුරම නැඹුරු වෙලා සිටින බව අපි දන්නවා. එම ප්‍රදේශයත් ඇතුළුව ලංකාව පුරාම ඉන්න ජනතාව ගත්තොත් වැඩියෙන්ම දුම් වැටිවලට හුරු පුරුදු වෙලා, ඇබ්බැහි වෙලා ඉන්නේ කොයි වයස් කාණ්ඩවල අයද, මොන ප්‍රතිශතයක්ද කියලා ඉදිරියේදී කියන්න මා අදහස් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම දුම් වැටි සහ මත්පැන් භාවිතය නිසා පවුලේ ආර්ථිකය කඩා වැටෙනවා පමණක් නොවෙයි, පුද්ගලයින්ගේ සෞඛ්‍ය තත්ත්වය ඒ වාගේම අපේ අනාගත පරම්පරාව දුර්වල තත්ත්වයට පත් වෙනවා. මේ හේතුව නිසා රටක් හැටියට අපි විශාල වශයෙන් ආපස්සට යනවා. ශ්‍රී ලංකාවේ අවුරුද්දකට 20,000ක් මැරෙනවා. ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා කිව්වා වාගේ, යුද්ධ කාලයේදී මැරුණු ප්‍රමාණයටත් වඩා මිනිසුන් ප්‍රමාණයක් මේ දුම් වැටි භාවිතය නිසා - මත්පැන් පැත්තකින් තියන්න -පමණක් මරණයට පත් වෙනවා. ඒ නිසා මේවා අවම කරන්න කටයුතු කරන්න. මේවා සම්පූර්ණයෙන් නැති කරන්න අපට බැරි වෙයි. නමුත් අපි මහජන නියෝජිතයන් හැටියට මේවා අවම කිරීම සඳහා අනිවාර්යයෙන්ම කටයුතු කළ යුතුව තිබෙනවා.

ලංකාවේ දුම් වැටි භාවිතය වැඩියෙන්ම සිදු වන යාපනය දිස්ත්‍රික්කයේ සියයට 42.9ක් දුම් වැටි පාවිච්චි කරනවා. නුවර සියයට 38.7යි. කොළඹ සියයට 30.4යි. මේ විධියට හැම දිස්ත්‍රික්කයකම විශාල ප්‍රමාණයක් දුම් වැටි පාවිච්චිය සිදු වෙනවා. යාපනය දිස්ත්‍රික්කය දුම් වැටි පාවිච්චි කිරීමෙන් පළමුවැනියා වනකොට, මත්පැන් පානයෙන් පළමුවැනියා වන්නේ කොළඹ දිස්ත්‍රික්කයයි.

කොළඹ දිස්ත්‍රික්කයේ මත්පැන් පානය කරන ප්‍රමාණය ගත්තොත් විශේෂයෙන් බියර් කියන ද්‍රව්‍ය දළ වශයෙන් එක අවුරුද්දකට ලීටර් කෝටි 20,359ක් පාවිච්චි කරනවා. තව ලක්ෂ ගණන්වලින් තිබෙන ඒවා ගැන කියන්න ගියොත් වෙලාව ගත වන නිසා මම කියන්නේ නැහැ. කෝටි ගණන් තිබෙන ඒවා විතරයි කියන්නේ. ඒ වාගේම වයින් වර්ග පාවිච්චි කරනවා, ලීටර් කෝටි 166ක්. ඒ වාගේම විස්කි පාවිච්චි කරනවා, ලීටර් කෝටි 29ක්. තව ලක්ෂ ගණන් ඒවා ගැන කියනවා නම් ගොඩක් විස්තර තිබෙනවා. බ්‍රැන්ඩි පාවිච්චි කරනවා, ලීටර් කෝටි 86ක්. ඒ වාගේම ජින් පාවිච්චි කරනවා, ලීටර් කෝටි 44ක්. රම් කියන වර්ගය පාවිච්චි කරනවා, ලීටර් කෝටි 20ක්. ඒ වාගේම වොඩ්කා කියන වර්ගය පාවිච්චි කරනවා, ලීටර් කෝටි 7ක්. සාමාන්‍ය අනෙක් අරක්කු පාවිච්චි කරනවා, ලීටර් කෝටි 1,390ක්. මේ එක අවුරුද්දකට කොළඹ දිස්ත්‍රික්කයේ විතරක් පාවිච්චි කරන ප්‍රමාණය. ගම්පහ දිස්ත්‍රික්කය තමයි මත්පැන් පානය කිරීම තුළින් දෙවැනි ස්ථානය ගන්නේ.

අපේ විපක්ෂ නායකතුමාත් සඳහන් කළා වාගේ මේ මත්පැන් පානය කිරීම, දුම් වැටි පානය කිරීම තමයි අපේ රටේ දුප්පත්කම අඩු කරන්න තිබෙන බාධාවන්ගෙන් ප්‍රධානම එක වෙලා තිබෙන්නේ. ඒ නිසා පුළුවන් තරම් මේ වාගේ රූපමය සෞඛ්‍ය අවවාද ගෙනැල්ලා මේ පිළිබඳව ජනතාව දැනුවත් කිරීමත්, ජනතාව තුළ මේ පිළිබඳව කථා බහක් ඇති කරවමින්, මේවාට තරුණයන් සහ අනෙක් පිරිස යොමු වීම පුළුවන් තරම් අඩු කිරීම

සඳහා අප සියලු දෙනාම එකට අත්වැල් බැඳගෙන කටයුතු කළ යුතුව තිබෙනවා.

දැන් බලන්න, මේ දුම් වැටි භාවිතයට වයස් කාණ්ඩ අනුව යොමු වෙලා තිබෙන ආකාරය. වයස අවුරුදු 15-24 අතර සිටින තරුණ පිරිස ගත්තොත් ඒ අයගෙන් සියයට 26.6ක් දුම් වැටි පාවිච්චි කරනවා. ලංකාවේ වයස අවුරුදු 25-39 අතර සිටින පිරිස ගත්තොත් එයින් දුම් වැටි පාවිච්චි කරන ප්‍රමාණය සියයට 36.9යි. ඒ වාගේම අවුරුදු 40ට වැඩි පිරිස ගත්තාම ඒ අයගෙන් සියයට 38.9ක් දුම් වැටි පාවිච්චි කරනවා. ඒ නිසා මේ තත්ත්වය රටට විශාල හානියක්. දුම් වැටි පාවිච්චි කරන පිරිසෙන් සියයට 50කට වඩා වැඩි ප්‍රමාණය මේ රටේ තරුණ ජවයයි; තරුණ ශක්තියයි. ඒ නිසා මේ සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කරලා මේ වාගේ පනත් කෙටුම්පතක් ගෙන ඒම තුළින් අපට මේ ප්‍රමාණය අඩු කර ගන්න කටයුතු කරන්න පුළුවන් වෙයි කියලා මා විශ්වාස කරනවා. මේ ප්‍රතිශතය සියයට සියයක්ම අඩු කරන්න බැරි වෙයි. හැබැයි යම් ප්‍රමාණයක් දක්වා අඩු කර ගන්න අපට පුළුවන් වෙයි කියන එකත් මතක් කරන්නට ඕනෑ.

උදාහරණයක් හැටියට අරගෙන බැලුවොත්, 2013 අවුරුද්දේ සිගරට්වලින් රුපියල් මිලියන 62,920ක්, මත්පැන්වලින් රුපියල් මිලියන 70,189ක් රාජ්‍ය ආදායමට එකතු වෙලා තිබෙනවා. හැබැයි මේ රාජ්‍ය ආදායමට ලැබුණු මුදලට වඩා, මත්පැන් සහ දුම් වැටි පාවිච්චි කරන අය රැක බලා ගැනීම සඳහා වූ රාජ්‍ය වියදම වැඩි වෙලා තිබෙනවා. පිළිකා රෝගය නිසා වන්නට පුළුවන්, නැත්නම් හෘදයාබාධයක් නිසා වන්නට පුළුවන්, යම් අයකු රෝහල්ගත කරපු වෙලාවේ ඉඳලා ඒ අයට ලබා දෙන බෙහෙත් හේත්, ඒ සියලු දේවල් වෙනුවෙන් මේ නිදහස් සෞඛ්‍ය සේවාව තුළ විශාල වැය බරක් දරන්නට සිදු වෙනවා. ඒ නිසා අවසාන වශයෙන් ගත්තාම, මේ දුම් වැටි සහ මද්‍යසාර පාවිච්චි නිසා ඇති වන ප්‍රතිවිපාක අපේ රටේ ජාතික ආර්ථිකයට තිබෙන ප්‍රබල තර්ජනයක් කියන එකත් අපි මතක් කරන්න කැමැතියි.

විශේෂයෙන්ම සෞඛ්‍ය ඇමතිතුමා හැටියට රාජිත සේනාරත්න මැතිතුමා ඒ කාර්ය මණ්ඩලයත් එක්ක, නීති අංශ එක්ක, ඒ සියලු දෙනාත් එක්ක සාකච්ඡා කරලා ඉතාම කඩිනමින් මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙන ඒමට කටයුතු කිරීම ගැන අපි නැවත වතාවක් එතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ -අතිගරු ජනාධිපතිතුමාගේ- සිහිනයක් වෙලා තිබුණු; විශාල බලාපොරොත්තුවක් වෙලා තිබුණු මේ පනත් කෙටුම්පත සම්මත කර ගැනීමේ කටයුත්ත කඩිනමින් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අපේ ගෞරවනීය ස්තුතිය පළ කරමින්, ඒ සඳහා අපේ පූර්ණ සහයෝගය ලබා දෙනවා කියන එකත් මතක් කරමින් මා නිහඬ වෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. මීළඟට, ගරු ඉරාන් වික්‍රමරත්න නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.06]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நெடுஞ்சாலைகள், உயர்கல்வி மற்றும் முதலீட்டு ஊக்குவிப்பு பிரதி அமைச்சர்)
(The Hon. Eran Wickramaratne - Deputy Minister of Highways, Higher Education and Investment Promotion)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත යටතේ මමත් කරුණු කිහිපයක් එකතු කරන්නට කැමැතියි. මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම කාලීන යයි කියන්නත් බැහැ. මේක මීට ප්‍රථමයෙන් මේ ගරු සභාවට ගෙනැල්ලා අනුමත කර ගන්න තිබුණු සංශෝධනයක්. නමුත් නොයෙකුත් හේතු නිසා ඒ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න බැරි වුණා. විශේෂයෙන්ම දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා - වර්තමාන ජනාධිපතිතුමා - ගෙන ගිය සටන සහ එතුමා ඒ සඳහා දැරූ වෑයම ගැන අද මේ ගරු සභාවේ කථා කළා. ඒ වාගේම ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා එතුමාව වර්ණනා කරමින් කථා කළ ආකාරයත් අපි අහගෙන හිටියා. ඒක බොහොම හොඳයි. මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට මෙපමණ කාලයක් ගත වීම අවාසනාවන්ත තත්ත්වයක්. ඒ වාගේම -

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! Will an Hon. Member propose the Hon. Perumal Rajathurai to take the Chair?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

I propose that the Hon. Perumal Rajathurai do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු පෙරුමාල් රාජදුරයි මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, மாண்புமிகு உதித் லொக்குபண்டார அவர்கள் *அக்கிராசனத்தினின்று அகலவே,* மாண்புமிகு பெருமாள் ராஜதுரை அவர்கள் *தலைமை வகித்தார்கள்.*
Whereupon THE HON.UDITH LOKUBANDARA *left the Chair, and* THE HON. PERUMAL RAJATHURAI *took the Chair.*

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

දුම් කොළ සමාගම් මේ සටන ගෙන යන්නේ ලංකාවේ විතරක් නොවෙයි. මේ ජාත්‍යන්තර බහුජාතික සමාගම් ලෝකය වටේම මෙවැනි සටනක් ගෙන යනවා. ඇත්තටම දුම් කොළ සමාගමේ ලාභය බැලුවොත් 2008 - 2013 දක්වා අවුරුදු පහක කාලය තුළ රුපියල් කෝටි 460 ඉඳලා රුපියල් කෝටි 1,534ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම ශුද්ධ ලාභය රුපියල් කෝටි 276 ඉඳලා රුපියල් කෝටි 914ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. තව විධියකට කිව්වොත් අවුරුදු පහක කාලය තුළ දී ශුද්ධ ලාභය සියයට 250කින් වැඩි වෙලා තිබෙනවා. අවුරුද්දකට සියයට 40කට, සියයකට 50කට වාගේ ප්‍රමාණයකින් තමයි ශුද්ධ ලාභය වැඩි වෙලා තිබෙන්නේ. දුම් කොළ සමාගමේ වාර්තාවලින්ම උපුටා ගත් සංඛ්‍යා ලේඛන අනුව තමයි මම මේ සඳහන් කරන්නේ.

මහ බැංකු වාර්තාව අනුව ඒ කාල පරිච්ඡේදය තුළ සෞඛ්‍ය සඳහා වැය වුණු රජයේ වියදම රුපියල් කෝටි 745 සිට රුපියල් කෝටි 1,195ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. දුම් කොළ සමාගමේ ලාභය සියයට 40කට, සියයට 50කට වැඩි වනකොට අපි සෞඛ්‍ය සඳහා වියදම් කරන ප්‍රමාණය සියයට 10කින් නැත්නම් ඊට ආසන්න ප්‍රමාණයකින් තමයි වැඩි වෙලා තිබෙන්නේ.

ඇත්තටම මේ ගණන් හිලව් දිහා බලනකොට ඒ පිළිබඳව එක එක විධියට කථා කරන්නට පුළුවන්. සමහර වෙලාවට ඇත්තටම

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

ඒ දත්ත එහෙම සසඳන්න පුළුවන්ද, බැරිද කියලා සමහර අය හිතන්න පුළුවන්. නමුත් මේ විවාදය තුළ දී නොයෙකුත් මන්ත්‍රීවරුන් එක එක ගණන් හිලවු අරගෙන ඒවා එක එක ආකාරයට සසඳනවා මා දැක්කා. මේ ගණන් හිලවු පිළිබඳව හැම පැත්තෙන්ම බලන එක සුදුසුයි කියලා මා හිතනවා. මොකද, ලාභය දිහා බැලුවාම මේ රටේ ප්‍රධාන දුම් කොළ සමාගමකට තිබෙන්නේ එක දුම් කොළ සමාගමක් පමණයි. ඒ සමාගම ලබන ලාභයේ ප්‍රමාණය දිහා බැලුවාම අනෙක් සමාගම් බොහොම කුඩා සමාගම්. ඒ නිසා මේ සමාගම එක්ක තමයි අපි මෙය සසඳන්නට ඕනෑ.

සෞඛ්‍ය සඳහා අපි වියදම් කර තිබෙන මුදල් ප්‍රමාණය බොහොම අඩුයි. පසු ගිය දශකය තුළ දී සෞඛ්‍ය සහ අධ්‍යාපනය යන දෙකටම රාජපක්ෂ රෙජීමය වියදම් කර තිබුණේ හුඟක් අඩු මුදලක් බව අපි දන්නවා. දළ දේශීය නිෂ්පාදනයෙන් වෙන් කරන ප්‍රමාණය ක්‍රම ක්‍රමයෙන් අඩු වෙලා, සෞඛ්‍ය සහ අධ්‍යාපනයට වෙන් කර තිබුණේ බොහොම අඩු මුදල් ප්‍රමාණයක්. ඒ වාගේම රජයට දුම් කොළ සමාගමෙන් නැත්නම් සිගරට්වලින් ලැබෙන ආදයම දිහා බැලුවොත් එය රුපියල් කෝටි 372 සිට රුපියල් කෝටි 585ක් දක්වා ඉහළ ගිහිල්ලා තිබෙනවා. එහෙම නැත්නම් අවුරුදු පහක කාලය ගත්තොත්, දුම් කොළ සමාගමෙන් ලැබෙන ආදායම සියයට පනහකින් වැඩි වෙලා තිබෙනවා. වසරක කාලය ගත්තොත්, දුම් කොළවලින්, නැත්නම් සිගරට්වලින් ලබා ගත් ආදායම සියයට 8ක් පමණ වෙනවා. කොයි විධියට බැලුවත් ලංකාවේත්, ලෝකය වටේමත් තිබෙන දුම් කොළ සමාගම් ඒ අයගේ ලාභය වැඩි කර ගෙන තිබෙන ආකාරය අපිට පෙනෙනවා. සෞඛ්‍ය සඳහා වැඩි මුදලක් වැය කරන්න රජයට සිදු වෙලා තිබෙනවා.

නමුත් අපේ රට වාගේ ආදායම අඩු රටක වියදම අඩුයි. ඒ කියන්නේ අය වැයෙන් වෙන් කරන මුදල ඇත්තටම හුඟාක්ම අඩුයි. ඒ නිසා අපට මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. අපි අහන්න ඕනෑ ප්‍රශ්න කිහිපයක්ම තිබෙනවා. සෞඛ්‍යයට වියදම් කරන මුළු මුදල අනුව ශුද්ධ ලාභය ප්‍රතිශතයක් හැටියට ගත්තොත්, මේ අවුරුදු පහක කාලය තුළදී එය සියයට 3.7 ඉඳලා සියයට 7.6 දක්වා වැඩි වෙලා තිබෙනවා. තව විධියකට කිව්වොත්, සෞඛ්‍යයට වියදම් කරන මුදල අනුව බලන විට මේ අවුරුදු පහක කාලය තුළදී ලාභය දෙගුණයක් වෙලා තිබෙනවා. ඒ අතරතුරේදී සෞඛ්‍යයට වියදම් කරන ප්‍රමාණය ශීඝ්‍රයෙන්ම අඩු වෙලා තිබෙනවා. ලාභය බදු ආදායමේ ප්‍රතිශතයක් හැටියට බැලුවොත් අවුරුදු පහක කාලය තුළදී එය සියයට 7 සිට සියයට 16 දක්වා දෙගුණයකට වඩා වැඩි වෙලා තිබෙන බව අපට පෙනෙනවා. ඇත්තටම මේ සඳහා වග කියන්න ඕනෑ දුම් කොළ සමාගම නොවෙයි. මේ සඳහා රජයයි වග කියන්න ඕනෑ. මොකද, බදු ප්‍රතිපත්තිය හරහා මේක නිරාකරණය කර ගන්න රජයට අවස්ථාව තිබුණා. නමුත් රජය ඒක නිරාකරණය කර ගත්තේ නැහැ.

අද මන්ත්‍රීවරුන් කථා කරන කොට දුම්කොළ සමාගමටත්, ඒ වාගේම මැති ඇමැතිවරුන්ටත්, නිලධාරින්ටත් නොයෙකුත් චෝදනා එල්ල කළා. ලෝකය වටෙන්ම මේ චෝදනා තිබෙනවා. බහු ජාතික සමාගම්, විශේෂයෙන්ම දුම් කොළ හා මද්‍යසාර සමාගම් මේ ආකාරයට ක්‍රියා කරනවා කියලා නොයෙකුත් චෝදනා තිබෙනවා. අපට හරියට ප්‍රතිපත්තියක් නැති නිසා මේ චෝදනා සත්‍යයයි කියලා නිගමනය කරන්න පුළුවන්. අවුරුද්දේ යම් කිසි කාල සීමාවකදී - නිශ්චිත දවසක - අපි මේ දුම් කොළ පිළිබඳව, විශේෂයෙන්ම මද්‍යසාර පිළිබඳව ගන්නා බදු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්නට ඕනෑ. We must have time consistency. මේ ප්‍රතිපත්තියට එනකොට නිශ්චිත කාල පරිච්ඡේදයක් තිබෙන්න ඕනෑ.

2013 ජූලි මාසයේදී අපි මේ සම්බන්ධයෙන් යම් යම් තීරණ ගත්තා. 2014 ඔක්තෝබර් 09 වැනිදාත් යම් යම් තීරණ ගත්තා. ඔක්තෝබර් 24 වැනිදා තවත් තීරණ ගත්තා. බදු පිළිබඳව මේ වාගේ තීරණ අරගෙන බදු ප්‍රතිශතය වැඩි කරන්නේ අපේ ආදායම වැඩි කර ගන්නයි. නමුත් බදු ප්‍රතිශතය වැඩි කරන කොට අපි එය සිගරට්වුවේ මිල සමඟ සසඳා බලන්නට ඕනෑ. අපි බදු වැඩි කළ සමහර අවස්ථා තිබෙනවා. නමුත් සමාගමට ලැබුණු ලාභයේ ප්‍රතිශතයට වඩා අපට ලැබුණු ලාභයේ ප්‍රතිශතය අඩුයි. අපි මේ ගැන සමබරව බලලා නැහැ. රජයට ආදායම ලබන අරමුණෙන් බැලුවත්, ඒකත් ඉෂ්ට වෙලා නැහැ කියලා සඳහන් කරන්නට වෙනවා.

සිගරට් පරිභෝජනය -භාවිතය- දෙස බැලුවොත්, 2013 වසරේදී බිලියන 4ක් තිබුණා. 2012 වසර සමඟ බලන විට 2013 වර්ෂයේදී සියයට 6.7ක පසුබෑමක් තිබුණා. 2005 ඉඳලා 2009 වෙනකල් බැලුවොත් සිගරට් භාවිතයේ සියයට 14ක පසුබෑමක් තිබුණා. නමුත් 2010, 2011 වර්ෂ දෙස බැලුවාම සිගරට් භාවිතයේ වැඩි වීමක් තිබුණා. මම මේ සඳහන් කරන්නේ, දුම්කොළ භාවිතය සම්බන්ධයෙන් බැලුවාම දුම් කොළවලට පනවන බදු ප්‍රතිපත්තිය හරියාකාරව සිදු නොවුණු බවයි.

හිටපු කෘෂිකර්ම ඇමතිතුමා නැඟිටලා තර්කයක් ඉදිරිපත් කළා, "ඔබතුමන්ලා මෙහෙම විවේචනය කරනවා නම්, දුම් කොළ සමාගම වහලා දමන්නේ නැත්තේ ඇයි?" කියලා. වසවිස ගන්නවා නම් ඕනෑම රටක ඒ වසවිස තහනම් කරන බව අපි දන්නවා. නමුත් සමහර වෙලාවට වසවිසවලින් ප්‍රයෝජනයක් තිබෙනවා. ඒවා ගන්නා ප්‍රමාණය අනුව ප්‍රයෝජනයක් තිබෙන්නට පුළුවන්. ඒවා ලබා දෙනවා නම් ඒ සඳහා පාලනයක් තිබෙන්නට ඕනෑ. බෙහෙතක් වුණත් හරි ප්‍රමාණයට ගත්තේ නැත්නම් ඒක වසවිසක් වෙන්න පුළුවන්. ඒක පාලනය කරන්න ක්‍රමයක් තිබෙනවා. ඒක අනුමත කරන්නට සුදුසු පුද්ගලයන්ට ඒ බලය දීලා තිබෙනවා. දුම් කොළ කියන්නේ වස විසක්. නමුත් මේක මේ දශකයේ ප්‍රශ්නයක් නොවෙයි. මේක අවුරුදු දහස් ගණනක ඉඳලා තිබෙන ප්‍රශ්නයක්. ඒවා තහනම් කරන්නේ නැති වුණාට අපි ඒවායේ භාවිතය අවම කර ගෙන යන්නට ඕනෑ. මේ පිළිබඳව රජයට පැහැදිලි ප්‍රතිපත්තියක් තිබෙන්නට ඕනෑ. අපට තිබෙන ප්‍රතිපත්තිය රජයේ ආදායම වැඩි කරන එක නොවෙයි. අපේ ප්‍රතිපත්තිය විය යුත්තේ ඇත්තටම දුම් කොළ භාවිතය, නැත්නම් සිගරට් භාවිතය අඩු කිරීමයි.

ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා කථා කරන කොට සඳහන් කළා, ඔහුට දුම් කොළ සමාගමෙන් යම් කිසි තර්ජනයක් ඇති වුණා කියලා. ඒක මේ ගරු සභාව තුළත්, මේ ගරු සභාවෙන් පිටත් ඔහු සඳහන් කර තිබෙනවා. ඇත්තටම එහෙම එකක් සිදු වෙලා තිබෙනවා නම් ඒක ගැන සොයා බලන්න ඕනෑ. ඒක ගැන සොයා බලන්න. කිසිම කෙනෙකුට තර්ජනයක් කරන්න බහු ජාතික සමාගමකට පුළුවන්කමක් නැහැ. විශේෂයෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට තර්ජනය කරන්නට බැහැ. මුදලට යට නොවන මන්ත්‍රීවරු මේ ගරු සභාව තුළ සිටිනවා. අපි දන්නවා, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා සඳහන් කළා වාගේ මේ එක එක සමාගම්වලයි, බහු ජාතික සමාගම්වලයි CSR කියලා, නැත්නම් "සමාජ සමාගම් වගකීම" කියලා වැඩසටහන් තිබෙනවා කියලා. මේ පනතින් ඒක කරන්නට බැරි වෙනවා. නමුත් මම මේ පනතටත් වැඩිය ඉදිරියට යන ප්‍රතිපත්තියක් යෝජනා කරන්නට කැමැතියි. සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා අද මේ ගරු සභාවේ සිටිනවා. ඒ නිසා ඔහු ඉදිරිපිටදීම මේ යෝජනාව ඉදිරිපත් කරන්න මම කැමැතියි. අපි දුම් කොළ ගැන කථා කරනකොට, ඒකේ දිශානතිය ගැන හිතනකොට, තව අවුරුදු 10කින් වෙන්නට පුළුවන් ඇත්තටම අපි යන්නට ඕනෑ දුම් කොළ භාවිතය අවම කරන ප්‍රතිපත්තියටයි. සමහර රටවල මේ කටයුත්ත කරලා තිබෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Deputy Minister, please wind up now.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මම කථාව අවසන් කරන්නම්.

ඕස්ට්‍රේලියාව ගත්තොත්, plain packaging කියලා ප්‍රතිපත්තියක් ඔවුන් ඉදිරිපත් කරලා තිබෙනවා. Plain packaging ප්‍රතිපත්තිය අනුව සිගරට් පැකට්ටුවේ brand එකත් බොහොම අඩුවෙන් දාන්න තමයි නීතියෙන්ම තීරණය කර තිබෙන්නේ. ඒ විධියට සිගරට් පැකැට්ටුවේ තිබෙන ආකර්ෂණ බලය අවම කරන්නට ඒ රටවල් ක්‍රියා කර ගෙන යනවා. ඒ රටවල් එක්ක සසඳනකොට අපි අඩු ආදායම් සහිත රටක් වෙන්නට පුළුවන්. නමුත් අපි අපේ ආකල්පවලින් අඩු වෙන්නට ඕනෑ නැහැ. අපි අඩු ආදායම් රටක් වුණත් අපට මේ වගේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන්න පුළුවන්. ඒ නිසා මම සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා අනාගතයේදී බදු ප්‍රතිපත්තිය හරහා පමණක් නොවෙයි, ඒ වාගේම අද ඉදිරිපත් කළ දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පතිනුත් ඉදිරියට ගිහිල්ලා plain packaging වගේ ප්‍රතිපත්තියකට අපි යා යුතුයි කියලා. එම යෝජනාව කරමින් මම නිහඬ වෙනවා. ස්තූතියි.

[4.20 p.m.]

ගරු ඊ. සරවනපවන් මහතා
(மாண்புமிகு ஈ. சரவணபவன்)
(The Hon. E. Saravanapavan)
Hon. Presiding Member, this National Authority on Tobacco and Alcohol (Amendment) Bill, which we are debating today, should have been brought in long time back.

According to the WHO Report, 600,000 non-smokers are dying from breathing second-hand smoke. The most alarming part of this is the statistics given in the research papers I have here with me, which states that the Jaffna District - a little while ago, a Member spoke about it - has recorded the highest percentage of current tobacco usage in Sri Lanka, which is 42.9 per cent, districtwise. No wonder, we have a Cancer Hospital in Jaffna which is always full; not only that but even the Cancer Hospital at Maharagama is always full. A notable feature here is that 30 per cent of them belong to the 15 - 24 years age group while a little over 30 per cent belong to the 25 -39 years age group. So, I think the Hon. Minister of Health and Indigenous Medicine has brought in this Bill at the right time.

புகைபிடிக்கும் பெரும்பாலானோரைப் புகையிலை அல்லது சிகரட் கொலைசெய்கின்றது. அதுமாத்திரமன்றிப் புகை பிடித்தல் பழக்கம் இல்லாதோரையும் இது பாதிக்கின்றது. இதற்குக் காரணம் மற்றவர்களின் பொறுப்பற்ற நடவடிக்கை யாகும். உலகளாவிய ரீதியில் 10 வீதமான இளைஞர்களின் மரணத்திற்குக் காரணமாக அமைவது இந்தப் புகைபிடித்தல் பழக்கமாகும். வருடாந்தம் உலகில் சுமார் 6 மில்லியன் மக்கள் புகையிலைப் பாவனை தொடர்பான நோய்களினால் இறக்கின்றனர். அதுமாத்திரமன்றி, புகையிலைப் பழக்கமற்ற 6 இலட்சம் பேர் புகைபிடிப்பவர்களால் பாதிக்கப்பட்டு இறக்கின்றனர். அதாவது மற்றவர்கள் புகைபிடிக்கும்போது அப்புகையைச் சுவாசிப்பதால் இவ்விழப்பு ஏற்படுகின்றதென WHO தனது அறிக்கையில் குறிப்பிடுகின்றது. இலங்கையில் எதிர்வரும் இரண்டு தசாப்தங்களில் புகைத்தலினால் ஏற்படக்கூடிய மரணங்களில் சடுதியான அதிகரிப்பு நிகழக் கூடும் என உலக சுகாதார ஸ்தாபனம் எச்சரித்திருக்கின்றது. இதனைத் தடுப்பதற்கு முன்னெச்சரிக்கைகள் மற்றும் பாதுகாப்பு நடவடிக்கைகள் உடனடியாக ஆரம்பிக்கப்பட வேண்டும். இல்லையேல் வரவிருக்கும் உயிரிழப்புக்களைத் தவிர்க்கமுடியாத அவலநிலை ஏற்படும்.

சுகாதார சேவைப் பணிப்பாளராக இருந்த வைத்திய கலாநிதி மஹிபால அவர்கள் கூறுகையில், சிகரெட் மற்றும் புகையிலைமூலம் இலங்கையில் எதிர்வரும் இரண்டு தசாப்தங்களில் ஆண்டுக்குச் சுமார் 40,000 வரையிலான இறப்புக்கள் நிகழக்கூடும் எனக் குறிப்பிட்டுள்ளார். தற்போது இலங்கையில் ஆண்டுக்கு 20,000 மரணங்கள் பல்வேறுபட்ட சுகாதாரக் காரணங்களினால் ஏற்படுகின்றன. புகைபிடிப்பதன் மூலம் நாளொன்றுக்கு 57 பேர் மரணிக்கின்றனர். மேலும் 600 பேர் நாளாந்தம் மாரடைப்பு நோய் என வைத்தியசாலையில் அனுமதிக்கப்படுகின்றனர். புகைபிடிப்பதன்மூலமும் மதுப் பாவனைமூலமும் குடல்புற்றுநோய் மற்றும் வாய்ப்புற்றுநோய் இலங்கையில் அதிகரித்தவண்ணமுள்ளது. இந்த நிலையைப் போக்குவதற்குப் புகையிலை மற்றும் மதுப்பாவனையைச் சடுதியாகக் குறைக்கக்கூடிய நடவடிக்கைகள் உடன் ஆரம்பிக்கப்பட வேண்டும்.

இலங்கையில் சுமார் 39 வீதமான ஆண்களும் 2.6 வீதமான பெண்களும் புகைபிடிக்கும் பழக்கத்திற்கு உட்பட்டவர்களாகக் காணப்படுகின்றனர் என Tobacco Control in Sri Lanka (2009) எனும் அறிக்கை குறிப்பிடுகின்றது. 2009இன் பின்னர் யாழ்ப்பாணத்தில் மதுபாவனை அதிகரித்துள்ளது. அதாவது, சாராயம் - arrack பாவனை 2009இல் 5 இலட்சம் லீற்றராக இருந்து 2010இல் 1.6 மில்லியன் லீற்றராக உயர்ந்தது. இது 2013இல் 2 மில்லியன் லீற்றராக அதிகரித்தது. பியர் பாவனை யாழ்ப்பாணத்தில் 4 மில்லியனை எட்டியுள்ளது. பியர் மற்றும் சாராயம் இரண்டையும் சேர்த்தால் 6 மில்லியன் லீற்றர் அங்கே நுகரப்படுகின்றது. அதற்கப்பால் கள்ளு - toddy 5 மில்லியன் லீற்றர் நுகரப்படுகின்றது. எல்லாவற்றையும் சேர்த்தால் கிட்டத்தட்ட 110 இலட்சம் லீற்றர் மதுபான வகை நுகரப்படுகின்றது. ஆனால் யாழ். மாவட்டச் சனத்தொகை 6,10,600 ஆகும். ஆகவே, ஆண்டு ஒன்றுக்கு சராசரித் தனிநபர் மது நுகர்வு 18.15 லீற்றர். Per capita consumption of alcohol in Jaffna is 18.15 litres. யாழ். குடாநாட்டில் மதுபாவனை அதிகரித்துக்கொண்டிருக்கும் நிலையில், கடந்த 2013ஆம் ஆண்டு மட்டும் 40,56,999 லீற்றர் பியரும் 20,18,434 லீற்றர் சாராயமும் அருந்தப்பட்டுள்ளதாக மதுவரித் திணைக்களத்தின் தரவுகளில் குறிப்பிடப்பட்டுள்ளது.

யாழ். மாவட்டத்தில் 2009ஆம் ஆண்டு போர் நிறை வடைந்த பின்னர் மது மற்றும் புகையிலைப் பாவனையானது சடுதியாக அதிகரித்துள்ளமையானது அங்கு பாரிய பிரச்சினை யாகவுள்ளது. இளைஞர்கள் மட்டுமல்லாமல் பாடசாலை மாணவர்கள், தனியார் கல்லூரி மாணவர்கள் என மது பாவனையாளர்களின் பரப்பு விரிவாக்கப்பட்டுள்ளதாக ஆய்வுகள் சுட்டிக்காட்டியிருக்கின்றன. இதன்படி பாடசாலை மாணவர்களுடைய மதுபாவனை அதிகரித்துள்ள நிலையில், அதனைத் தடுப்பதற்குப் பூரணமான நடவடிக்கை இதுவரையில் எடுக்கப்படவில்லை எனத் தொடர்ச்சியாகச்

[ගරු ඊ. සරවනපවන් මහතා]

சுட்டிக்காட்டப்பட்டு வருகின்றது. இந்நிலையில், மறுபக்கம் சில தரப்புகளினால் பாடசாலை மாணவர்களுக்கிடையில் மதுப் பாவனை ஊக்குவிக்கப்படுவதாகவும் குற்றச்சாட்டுக்கள் எழுப்பப்படுகின்றன. இத்தரவுகளின் அடிப்படையில் யாழ். மாவட்டத்தில் 2009ஆம் ஆண்டு சாராயமானது 567,756 லீற்றர் அருந்தப்பட்டுள்ளது. ஆனால், அதன் பின்னர் 2010 ஆம் ஆண்டு அது 16,20,398 லீற்றராக மாறி, 2013ஆம் ஆண்டு 20,18,434 லீற்றராக அதிகரித்துள்ளதாகத் தரவுகள் குறிப்பிடுகின்றன. இதேபோன்றே 'பியர்' மற்றும் கள்ளு போன்ற மதுபானங்களின் பாவனையும் 2009ஆம் ஆண்டின் பின்னர் மூன்று மடங்காக அதிகரித்திருப்பதாகத் தகவல்கள் சுட்டிக்காட்டியிருக்கின்றன. 2014ஆம் ஆண்டு நிறைவடைந்துள்ள நிலையில் அவ்வருடமும் அதன் பாவனை முன்னரைவிட அதிகளவில் இருக்குமென எச்சரிக்கப் பட்டுள்ளதுடன், இந்த விடயம் தொடர்பாகப் பொறுப்பு வாய்ந்த தரப்புக்களின் முழுமையான கவனம் தேவை எனவும் சுட்டிக் காட்டப்பட்டுள்ளது.

இதேவேளை இலங்கையின் மொத்தத் தேசிய வருமானத்தில் சுமார் 12 வீதம் புகையிலைப் பொருட்கள் விற்பனைமூலம் கிடைப்பதுடன் இலங்கையிலுள்ள புகையிலை உற்பத்தி மற்றும் விற்பனை நிறுவனங்களைக் கடந்த அரசாங்கத்தில் அங்கத்துவம் பெற்ற அமைச்சர்கள் சிலர் கையகப்படுத்தியிருப்பது ஒரு முக்கிய விடயமாகும். இந்நிலையில் இலங்கையின் மற்றைய மாகாணங்களை விடவும் வடக்கில் மதுபானம் மற்றும் புகையிலைசார் உற்பத்திகள் அதிகளவில் விற்பனை செய்யப்படுவதுடன் அவற்றை அருந்தவும் கொள்வனவு செய்யவும் மக்களுக்கு அதிகளவு தூண்டுதல் வழங்கப்படுவதாகவும் பல நிறுவனங்கள் மற்றும் அமைப்புக்கள் கூறி வருகின்றன.

வடக்கு, கிழக்கில் மதுப்பாவனை மற்றும் புகைபிடித்தல் பழக்கமானது என்றுமில்லாதவாறு அதிகரித்த வண்ணமுள்ளதுடன் இது பாரிய சமூக, கலாசார, குடும்பப் பொருளாதாரப் பிரச்சினைகளையும் தோற்றுவித்துள்ளது. உதாரணமாக, இலங்கை மதுவரித் திணைக்கள அறிக்கையின்படி யாழ். மாவட்டத்தில் மட்டும் நாள் ஒன்றுக்குச் சுமார் 15,000 லீற்றருக்கும் அதிகமான மதுபானம் நுகரப்படுவதாகக் குறிப்பிடப்படுகின்றது. இவ்வாறான திடீர் அதிகரிப்பானது சமூகத்தில் பாரிய தாக்கத்தை ஏற்படுத்தவல்லதாகும். ஒட்டுமொத்தமாக நோக்குகின்றபோது கடந்த வருடம் சாராயம் மற்றும் 'பியரி'ன் நுகர்வு சுமார் 6 மில்லியன் லீற்றராகவும் கள்ளு 5 மில்லியன் லீற்றராகவும் காணப்படுகின்றது. ஆனால், சனத்தொகையானது சுமார் 6 இலட்சமாகவுள்ள ஒரு மாவட்டத்தில் ஆண்டுக்கு 11 மில்லியன் லீற்றர் மதுபான வகைகள் நுகரப்படுவதாயின் சராசரியாக ஒருவர் ஆண்டு ஒன்றுக்கு 18.33 லீற்றர் மதுபானம் என்ற தலா நுகர்வாக அல்லது மாதம் ஒன்றுக்கு நபர் ஒருவர் 1.53 லீற்றர் மதுபானம் நுகர்வதாக இத்தரவுகள் புலப்படுத்துகின்றன. இப்போக்கானது தலைகீழான பொருளாதார நகர்வினையே காட்டுகின்றது.

இலங்கையில் ஆண்டு ஒன்றுக்குச் சராசரியாகத் தனிநபர் ஒருவரின் மதுபான நுகர்வு 11.2 லீற்றர் என உலக சுகாதார ஸ்தாபனம் எச்சரித்துள்ளது. இது ரஷ்யா போன்ற நாடுகளுக்கு அடுத்த நிலையில் உள்ளது. ஆனால், யாழ் மாவட்டத்தின் நிலை - 18.33 லீற்றர் என்ற அளவு -மிக மோசமானதாகவே உள்ளதென ஆய்வாளர்கள் சுட்டிக்காட்டுகின்றனர். இவ்வாறான போக்கானது யுத்த காலப் பகுதியிலோ அதற்கு முந்திய காலப் பகுதியிலோ காணப்படவில்லை. இவ்வாறான போக்கை யுத்தத்தின் பின்னரான, அதாவது 2009 இன் பின் அரசாங்கத்தின் சட்டம், ஒழுங்கு நடைமுறைக்கு வந்த பின்னர், ஏற்பட்ட விளைவுகளாகக் கொள்ளலாம். அதேநேரம் இந்நிலைமை மேலும் மோசமடையக்கூடிய சாத்தியமே காணப்படுகின்றது. பிரதான மதுப் பாவனையாளர்களாக இளம் வயது வாலிபர்களே அதிகம் காணப்படுகின்றனர். இதற்குச் சான்றாகக் குறித்த ஒரு பாடசாலையில் நடைபெற்ற கிரிக்கெட் போட்டியின்போது இடம்பெற்ற கைகலப்பில் உயிரிழப்பு ஏற்பட்டதைக் கூறலாம். இது மிக வருந்தத்தக்கதாகும்.

மதுபாவனையிலிருந்து மீள்வதற்கான சிகிச்சை நிலையம், புனர்வாழ்வு நிலையம் மற்றும் துறைசார் ஆளணியினர் போன்ற தேவைப்பாடுகளை யாழ். மாவட்டம் வேண்டி நிற்கின்றது. இதற்கு முன்னுரிமையளித்து நாட்டின் இளைஞர்களை நல்ல முறையில் வழிநடத்த வேண்டிய பொறுப்பு அரசாங்கத்திற்குரியதாகும். 2013 டிசம்பரில் Alcohol and Drug Information Centre இனால் மேற்கொள்ளப்பட்ட ஆய்வின்படி, இலங்கையில் இரண்டாவது அதிகூடிய மதுப் பாவனையைக் கொண்டதாக முல்லைத்தீவு மாவட்டம் காணப்படுகிறது. அதாவது அங்கு 34.4 சதவீதமான மக்கள் மதுப்பழக்கம் கொண்டவர்களாகக் குறிப்பிடப்பட்டிருப்பது கவலை தருவதாகவுள்ளது. ஏற்கெனவே, யுத்தத்தால் மிக மோசமாகப் பாதிக்கப்பட்ட மக்களிடையே காணப்பட்ட வேலையின்மை, வறுமை, சமூக மற்றும் உளத் தாக்கங்களே இந்நிலைமைக்குக் காரணமாகக் கொள்ளப்படுகின்றது. சட்டம் ஒழுங்கு, சமூகநலத்திட்டம், வறுமையை ஒழித்தல் என்பவற்றின்மூலம் இந்நிலைமையை மாற்றமுடியும். வறுமை மட்டமானது, கிளிநொச்சியில் 12.7 வீதமும் மன்னாரில் 20.1 வீதமும் முல்லைத்தீவில் 28.8 வீதமுமாகக் காணப்படுகின்றது. வேலையின்மையானது, கிளிநொச்சியில் 09 வீதமும் மன்னாரில் 8.1 வீதமும் முல்லைத்தீவில் 20 வீதமுமாகக் காணப்படுகின்றது.

தொன்மையான வரலாற்றையும் கலாசாரப் பாரம்பரியத் தையும்கொண்ட எமது தாய்நாட்டின் பெருமைக்குரிய பண்பாட்டு விழுமியங்களைப் பாதுகாத்து மெருகூட்டி, கால மாற்றத்துக்கேற்ப இன்றுவரை அதன் அடிப்படை மாறாது வளர்த்தெடுக்கப்பட வேண்டும் என்பதில் நீங்கள் அனைவரும் என்னுடன் ஒன்றுபடுவீர்கள் என்பதால், நான் திடமான நம்பிக்கையுடன் இந்த விபரங்களைச் சமர்ப்பித்துள்ளேன். ஆய்வின் பிரகாரம் கிடைத்த மதிப்பீட்டின்படி எங்களுடைய பிரதேசத்திலுள்ள அத்தனை பேரையும் - அது இளைஞர்களாக இருந்தாலென்ன, முதியவர்களாக இருந்தாலென்ன மதுப் பழக்கம், புகைப்பிடித்தல் உட்பட எல்லாவற்றிலிருந்தும் காப்பாற்ற வேண்டும். கடந்த அரசாங்கத்தின் ஆட்சிக் காலத்தில் வெகுவேகமாக அதிகரித்த மதுப்பாவனை, ஏனைய தடைசெய்யப்பட்ட போதைப்பொருள்களின் பாவனை என்பன எமது சமூக ஒழுங்கில் பாரிய பாதிப்புக்களை ஏற்படுத்தி யமையை நீங்கள் அறிவீர்கள். இந்த துரதிருஷ்டவசமான நிலைமையின் தாக்கத்திலிருந்து நாடு இன்னும் முற்றாக விடுபடவில்லை என்பதை மிகவும் மன வேதனையுடன் நான் இங்கு தெரிவித்துக்கொள்கிறேன்.

Sir, during 2009 - 2010, liquor licences were given for the North and the East. In 2009, 40 licences were given and in 2010, it was 51. It is an unusual practice. I do not think that licences have been given like this in any part of the country. One has to study this as to how many liquor licences have been given for the last three years. The

statistics are there. Everywhere, in every nook and corner in Jaffna, you find a licensed taverns. We have a number of liquor shops with licences in the vicinity of the University of Jaffna, schools, temples, and all over. This has to be considered very seriously and you will have to withdraw their licences. These licences were given for big money, for making business. It maybe true that the revenue from liquor, cigarettes, et cetera is higher in the budget - nearly 3 per cent - but that does not mean that that should be encouraged for making revenue. They are giving targets to the Excise Department. It does not mean that they must go and do marketing there and sell those to the public. If you compare the sales in the Jaffna District with the other districts, it is higher in the Jaffna District. The records are available.

வடபகுதி பனை வளம் மிகுந்தது என்பதை நீங்கள் அறிவீர்கள். பனை உற்பத்திகளைச் சரியாகப் பயன்படுத்து வதன்மூலம் கணிசமான வருவாயை ஈட்டமுடியும். பனம்பொருள் உற்பத்தியில் கள்ளு ஒரு பிரதான இடத்தை வகிக்கிறது. தை, மாசி, பங்குனி மாதங்களில் பனங்கள்ளு அபரிமிதமான அளவில் உற்பத்தியாகும். இதில் ஒரு பகுதி போத்தலில் அடைத்து விற்கப்பட்டாலும், பெருமளவு கள்ளு பாவனைக்கு உட்படுத்தப்படாமல் வெளியே ஊற்றப்பட்டு விரயமாக்கப்படுகின்றது. அதேவேளை, வடமராட்சியிலுள்ள திக்கம் என்ற இடத்தில் கள்ளிலிருந்து சாராயத்தை வடிக்கும் ஒரு தொழிற்சாலை இருந்தபோதிலும், அங்கு உற்பத்தி மேற்கொள்ளப்படுவதில்லை.

Sir, we have three distilleries in Jaffna. They are in Thikkam, Warani and in Walikamam. The distillery in Thikkam was not operating and people lost their jobs. But, I understand that last week they were given the licence to continue. That is good news. The present Government has given permission to run the distillery in Thikkam again. Therefore, a number of jobs will be created. We have been asking for this for more than two years. Some private sector people were trying to get into it to make more money. Fortunately, people prevented it and now the Government has given the licence. We must appreciate that.

எனவே, எமது பனை உற்பத்திகளைச் சரியான முறையில் பயன்படுத்துவதன்மூலம் பொருளாதார அபிவிருத்தியை ஊக்குவிப்பதுடன், அத்தொழில் சம்பந்தப்பட்ட மக்களின் வாழ்வாதாரத்தை மேம்படுத்த முடியும் என்பதையும் நான் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

அதேவேளையில் மதுப்பாவனை, போதைவஸ்துப் பாவனை போன்றவற்றிலிருந்து மாணவர்கள் உட்பட இளைஞர்களைப் பாதுகாக்கவேண்டிய அவசிய தேவை எமக்குண்டு. போதைவஸ்து வியாபாரிகளையும் இளைஞர் களையும் மதுப்பழக்கத்துக்கு அடிமையாக்கும் வகையில் தூண்டுதல் கொடுக்கும் தெருவோரக் கூட்டங்களையும் சல்லடைபோட்டுத் தேடிப்பிடித்து, பொலிஸார் அவர்களைத் தண்டனைக்கு உட்படுத்தி, அவற்றைக் கட்டுக்குள் கொண்டுவரவேண்டும். இவ்விடயத்தில் பொலிஸார் தீவிரமாகச் செயற்படுவார்களேயானால் பொதுமக்கள் துணிந்து ஒத்துழைப்பை வழங்குவார்கள். எப்படியிருப்பினும், ஆட்சி மாற்றம் ஏற்பட்ட பின்பு இந்த இனம் தெரியாத நபர்களெனக் கூறப்பட்ட, சகல தீமைகளுக்கும் தலை கொடுக்கும் நபர்கள் அரங்கிலிருந்து காணாமல்போய் விட்டனர். ஆனாலும் கொள்ளைகளிலும் கொலைகளிலும் ஈடுபட்டு சுகபோகம் அனுபவித்த இந்த நபர்கள் ஓய்ந்து விடப்போவதில்லை. அவர்கள் தருணத்துக்காகக் காத்துக் கிடந்து வேறொரு வடிவத்தில் வந்து தங்கள் கைங்கரியங் களைத் தொடர்வார்கள். அதற்கு அவர்கள் இந்த மதுவையே ஓர் ஆயுதமாக பயன்படுத்தக்கூடும். எனவே, மதுப் பாவனையைக் கட்டுக்குள் கொண்டுவரவும் மதுபோதையால் ஏற்படும் சமூகச் சீர்கேடுகளை முற்றாக இல்லாமற் செய்யவும் போதைப்பொருள் விற்பனை, பாவனை என்பவற்றை முற்றாகவே நாட்டில் இல்லாமல் செய்யவும் புதிய அரசு உரிய நடவடிக்கைகளைக் காத்திரமான முறையில் மேற்கொள்ள வேண்டுமெனக் கேட்டுக்கொள்கிறேன். பொலிஸார் இதில் தீவிரமாக இறங்கும்போது, பொதுமக்களும் அச்சமின்றி ஒத்துழைப்பை வழங்குவார்கள் என்பதை மீண்டும் வலியுறுத்திக் கூறுகின்றேன்.

இதேபோன்று புகைபிடித்தலாலும் பாரிய தீங்குகள் விளைகின்றன. பொது இடங்களில் புகைபிடிக்கக்கூடாது என்பது சட்டமாக இருந்தபோதிலும்கூட புகைபிடிப்போர் தொகை குறைந்தபாடில்லை. இதுமட்டுமன்றி இளைய தலைமுறையினர் இதற்கு அடிமையாகும் வேகம் அதிகரித்துச் செல்கின்றது. எனவே, பொது இடங்களில் புகைபிடித்தல் கூடாது என்பதும் 18 வயதுக்குக் குறைந்தோர் மதுபானம், போதைப்பொருள், புகைத்தல் போன்ற பழக்கங்களுக்கு ஆளாகக்கூடாது என்பதையும் கடுமையான முறையில் நடைமுறைப்படுத்துவதற்கு அரசாங்கம் சட்டத்தின்மூலம் நடவடிக்கை எடுக்கவேண்டுமெனக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன். எமது தொன்மை வாய்ந்த வரலாற்றுப் பெருமைமிக்க பண்பாட்டு விழுமியங்கள், போதைப் பொருள்களாலும் அவற்றின் பக்கவிளைவுகளாலும் அழிக்கப்பட்டுவிட அனுமதிக்கக்கூடாது எனக் கேட்டுக் கொண்டு, எனது உரையை நிறைவுசெய்கிறேன். நன்றி.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Then, the Hon. Ajith Mannapperuma. You have 12 minutes.

[අ.භා. 4.40]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ප්‍රථමයෙන්ම මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

දුම් වැටි හා මද්‍යසාර භාවිතය නිසා ඇති වන ගැටලු මේ රටේ සංවර්ධනයට සෘජුවම බලපානවා. මේ රටේ සංවර්ධනය කියන්නේ මිනිසුන්ගේ ගුණාත්මකභාවයයි; quality එක ඉහළ නැංවීමයි. මිනිසුන්ගේ ගුණාත්මකභාවය - quality එක - ගැන හිතන්නේ නැතිව, වරායවල්, ගුවන් තොටුපොළවල්, පාරවල් හරිගස්සලා, ඒක තමයි සංවර්ධනය කියලා පෙන්වලා, මිනිස් ජීවිත කබලෙන් ළිපට ඇද දමපු අවස්ථා පසු ගිය රජය කාලයේ අප දැක්කා.

අපේ රටේ බොහෝ අය මිය යන්නේ කොහොමද? මේ රටේ බෝ නොවන රෝග බොහොමයක් පවතිනවා. අප දන්නවා මේ බෝ නොවන රෝගවලට විශේෂයෙන්ම වැරැදි ආහාර පුරුදු, දුම් පානය, ව්‍යායාම නොමැතිකම, මද්‍යසාර භාවිතය හා මානසික

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

ආතතිය හේතුවන බව. මෙයින් වැඩි රෝග ප්‍රමාණයක් හට ගන්න මේ දුම් පානය සහ මද්‍යසාර භාවිතය විශේෂයෙන්ම හේතු වනවා කියන එක අප දන්නවා; අසා තිබෙනවා. පිළිකා, හෘදයාබාධ, රුධිර පීඩනය, දියවැඩියාව ආදියත් බෝ නොවන රෝගවලට අයත් වෙනවා. මේ රෝග විශේෂයෙන්ම දුම් පානය හා මද්‍යසාර භාවිතය නිසා ඇති වන ඒවායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දුම් පානය සහ මද්‍යසාර භාවිතය නිසා වසරකට ශ්‍රී ලාංකිකයන් 20,000කට අධික පිරිසක් මිය යනවා. ලෝක සෞඛ්‍ය සංවිධානයත් මේ බව ප්‍රකාශ කර තිබෙනවා. ඒ වාගේම NATA ආයතනය මඟිනුත් එය තහවුරු කර තිබෙනවා. අපේ රටේ වැඩිම සංඛ්‍යාවක් මිය යන්නේ, මිය ගියේ යුද්ධයෙන් නොවෙයි. මේ දුම් පානය හා මද්‍යසාර භාවිතය නිසායි. මේ දුම් පානය නිසා දවසකට 50කට, 60කට ආසන්න සංඛ්‍යාවක් මිය යනවා. මේ විධියට දවසකට 50ක්, 60ක් මිය යන කොට දුම් කොළ සමාගම්වලට, නැත්නම් මේ ආයතනවලට වෙළෙඳ පොළේ ස්ථාවරය තබා ගන්න නොහැකි වෙනවා. ඒකට හේතුව තමයි, දවස ගණනේ ඒ අයගේ customersලා 50ක්, 60ක් මිය යෑම. එතකොට ඒ අය දැඩි උත්සාහයක යෙදෙනවා මේ අය රඳවා ගන්න. ඒ සංඛ්‍යාව වැඩිදියුණු කර ගන්නත් ඔවුන් උත්සාහ කරනවා; රඳවා ගන්නත් උත්සාහ කරනවා. දවසකට පුද්ගලයන් 75ක්, 100ක් මේ සඳහා යොමු කර ගන්න අලුත් අලුත් වැඩ පිළිවෙළවල් මේ දුම් කොළ සමාගම් යෝජනා කරනවා; ඒවා ක්‍රියාත්මක කරනවා. විශේෂයෙන්ම මේ අලුත් වැඩ පිළිවෙළවල් තුළින් මේ අය ග්‍රහණය කර ගන්න උත්සාහ කරන්නේ තරුණ ළමයින්. තරුණයන්, ළමයින් වැනි අය තමයි ග්‍රහණය කර ගන්න ඔවුන් විශේෂයෙන්ම උත්සාහ ගන්නේ. අලුත් customersලා 100ක්, 150ක් හදා ගන්නත්, මේ ඇබ්බැහි වෙලා ඉන්න කණ්ඩායම රැක ගන්නත් මේ අය විවිධ වැඩ පිළිවෙළවල් ලෝකය පුරාවට ක්‍රියාත්මක කරනවා.

සාමාන්‍යයෙන් දුම් වැටියක් රුපියල් 30ක් විතර වෙනවා. දුම් පානය කරන කෙනෙක් දුම් වැටි 10ක් නම් ලෙහෙසියෙන්ම බොනවා. ඊට වඩා බොන අයත් ඉන්නවා. දුම් වැටි 10ක් බොන අය දවසකට රුපියල් 300ක් දුම් වැටි සඳහා පමණක් වියදම් කරනවා. සෞඛ්‍යයට අහිතකර මේ ක්‍රියාවලිය සඳහා, දුම් වැටි පානය සඳහා පුද්ගලයෙක් රුපියල් 9,000කට අධික මුදලක් මාසයකට වැය කරනවා. මේ සල්ලි ඔහුගේ දරුවාගේ අධ්‍යාපනයට, ඔහුගේ දරුවාගේ සෞඛ්‍ය ගැටලුවලට, ඔහුගේ දරුවාගේ පෝෂණය වෙනුවෙන් වියදම් කරන්න පුළුවන්. එක අතකින් දුම් පානය නිසා මේ පුද්ගලයා ලෙඩ වෙනවා. අනෙක් පැත්තෙන් ඒ පවුල ආර්ථික වශයෙන් කඩා වැටෙනවා.

දුම් පානය හා මද්‍යසාර නිසා වසරකට පවුල් 20,000කට ගෘහමූලිකයා අහිමි වෙනවා. වසරකට පවුල් 20,000ක ගෘහමූලිකයා අහිමි වුණාම, කාන්තාවට, මේ පවුලේ අම්මාට තමයි පවුල නඩත්තු කරමින් ඉදිරියට අරගෙන යන්න සිද්ධ වන්නේ. එතකොට ඇය සමාජය ඉදිරියේ අසරණ වෙනවා. තම දරුවන් රකින්නේ කොහොමද යනාදී වශයෙන් ආර්ථික, සමාජයීය ලොකු ගැටලුවකට මුහුණ පාන්න ඇයට සිද්ධ වෙනවා. ඒ වාගේම, දරුවන්ට භව්හරණක් නැති වනවා. දුම් පානය නිසා අවුරුද්දකට ගෘහමූලිකයන් 20,000ක් අපේ පවුල්වලින් නැති වෙලා යන විට, ඒ දරුවන්ද දැඩි අසරණතාවකට පත් වෙනවා.

එදා ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සෞඛ්‍ය ඇමතිවරයා වශයෙන්, මේ රට ආසියාවේ ආශ්චර්යය කරා ගෙන යන්නට, ආසියාවේ ආශ්චර්යවත් රට බවට පත් කරන්නට දැඩි වෙහෙසක් ගත්තා. එදා වරාය හැදුවා, පාර හැදුවා, ගුවන් තොටුපොළ හැදුවා, මිනිසුන් ණයකරුවන් කළා. නමුත් මේ රට ආශ්චර්යය කරන්න පුළුවන් ඒවායින් නොවෙයි. ඒ සඳහා මේ රටේ අවුරුද්දකට විනාශ වෙලා යන පවුල් 20,000 බේරා ගන්න ඕනෑ. ඒ සඳහා තමයි ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ආණ්ඩුවෙන් එළියට බැස්සේ. පැවැති ව්‍යුහය තුළ, පසු ගිය රජය තුළ මේ වැඩේ කරන්න ලැබෙන්නේ නැහැ කියලා තමයි ගරු රාජිත සේනාරත්න ඇමතිතුමා එක්ක එකතු වෙලා ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ආණ්ඩුවෙන් එළියට බැස්සේ. එහෙම නම්, අද මේ සංශෝධන පනත ක්‍රියාත්මක කිරීමේ -මේ සංශෝධන ක්‍රියාත්මක කිරීමේ- හැකියාව සහ අවස්ථාව මෛත්‍රී- රනිල් රජය තුළින් ගරු රාජිත සේනාරත්න අමාත්‍යතුමාට හිමි වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම දුම් පානය නිසා වර්ෂයකට මේ රටේ පවුල් 20,000ක් අතර මං වනවා නම්, දවසකට පවුල් 60ක් 70ක් අතරමං වනවා නම්, දුම් පානයට එක්වන පුරුද්ද වළක්වා ගන්න ඉලක්කයක් තිබෙන්න ඕනෑ. එතකොට සංවර්ධන ඉලක්කයක් ඔස්සේ අපේ රටේ යහ පාලනයක් ඇති වේවි. රටක සංවර්ධනය පැත්තෙන් බැලුවත් එතැන සම්බන්ධයක් තිබෙනවා. ඒ නිසා, දුම්පානයේ නිරත පුද්ගලයන් එයින් ගලවා ගන්න ඕනෑ. ඒ වාගේම, ඒ සඳහා අලුතින් එකතු වන අය වළක්වා ගන්න ඕනෑ. ඒ තුළින් රට තුළ විශාල ප්‍රගතියක් ඇතිකර ගන්න පුළුවන්.

රටකට සෞඛ්‍ය සම්පන්න ජනතාවක් අවශ්‍ය වනවා. රටේ ජනතාව ලෙඩුන් නම්, රටේ ජනතාව රුධිර පීඩනයෙන් පෙළෙනවා නම්, රටේ ජනතාව දියවැඩියා රෝගයෙන් පෙළෙනවා නම්, රටේ ජනතාව පිළිකා රෝගයෙන් පෙළෙනවා නම් අපට මේ රට සමෘද්ධිමත් රටක් බවට පත් කරන්න බැරිව යනවා. එහෙම නම් රජයක ප්‍රධාන ඉලක්කයක් බවට පත් කරන්න ඕනෑ, දුම් පානය සහ මත් ද්‍රව්‍ය නිවාරණය කිරීම.

දුම් කොළ සමාගම් වෙළෙඳ උපක්‍රම යොදා ගන්නේ කුඩා දරුවන් ආකර්ෂණය කර ගන්නයි; තරුණයන් ආකර්ෂණය කර ගන්නයි. ඒ සඳහා තමයි ඒ ගොල්ලෝ පසු ගිය කාලයේ වෙවාරන්න සිගරට් පැකට් නිකුත් කළේ. ඒවා ඉතා ලස්සනයි; ආකර්ෂණීයයි. ආදි කාලයේ අපි ඒවායේ තේරුම දන්නේ නැහැ. අපිත් ඒවාට රැවටුණා. අපේ පාසල්වල ගුරුවරු ඒවාට රැවටුණා. කුඩා දරුවන්ගේ දෙමවුපියෝ ඒවාට රැවටුණා. කුඩා දරුවන් සිගරට් පැකට්වලින් කරන විවිධ ක්‍රීඩාවලට පෙළඹුණා. ඒවා සමාජය තුළට එකතු වුණා. ඒ කාලයේ සිගරට් පැකට්වලින් කරන ක්‍රීඩා තිබුණා. මොකද, ඒ සිගරට් පැකට් එක එතරම් ලස්සනයි. එතරම් ආකර්ෂණීයයි, ඒ සිගරට් පැකට් එක. ඒ වාගේම කුඩා දරුවන් සිගරට් පැකට් එකතු කරන සමාජයක් තිබුණා. මොකද, ඒ පැකට් එතරම් ආකර්ෂණීයයි; ලස්සනයි. මේ අසුරනය - packaging එක- ඉතා ලස්සනයි. ඒ වාගේම පාසල්වල අත්වැඩවලට ඒවා යොදා ගත්තා. සමහර විට ගුරුවරයා කියනවා, පාසලේ අත්වැඩවලට සිගරට් පැකට් අරගෙන එන්න කියලා. පාසලේ අත්වැඩ කරන්න පටන් ගත්තා, සිගරට් පැකට්වලින්. මේ ආකර්ෂණය තුළ අපට ඒවා ඉතාම සමීප දෙයක් බවට පත් වුණා. ඒ විතරක් නොවෙයි. සමහර වැඩිහිටියෝ සිගරට් පැකට් එක අනෙක් අයට පෙනෙන්න සාක්කුවේ දමා ගෙන යනවා අපි දැක තිබෙනවා. ඒක හරි අභිමානයක්, සමාජයේ ලොකුකමක් කියලා හිතපු කාලයක් තිබුණා. ඔක්කොටම පෙනෙන්න සිගරට් පැකට් එක අතේ අරගෙන යනවා. ඇයි? එය එතරම් විචිත්‍ර සිගරට් පැකට් එකක්, ලස්සන සිගරට් පැකට් එකක්, ආකර්ෂණීය සිගරට් පැකට් එකක්. ඒක පෙන්වා ගෙන අනික් අය හම්බ වෙන්න යනවා, ඉදිරියට යනවා. ඒකෙන් අභිමානයක් නිර්මාණය කර ගත්තා. ඒ කාලයේ මේ රටේ ජනතාවට එවැනි මානසිකත්වයක් ඇති කරලා තිබුණා.

මෙය ලෝකයේම තිබුණු ප්‍රශ්නයක්. එම නිසා ලෝක සෞඛ්‍ය සංවිධානය 2008 වර්ෂයේදී ප්‍රඥප්තියක් සම්මත කර ගත්තා. 2008 වර්ෂයේදී Framework Convention on Tobacco Control - FCTC - එකට ශ්‍රී ලංකාව අත්සන් කළා. FCTC ප්‍රඥප්තියේ 11වන වගන්තියේ විශේෂයෙන් නිර්දේශ කරලා තිබුණා, "දුම්

බොන්නන්ට අප්‍රසන්න වන ආකාරයෙන් රූපමය අවවාද සිගරට් පැකට්වල ඇතුළත් කිරීමට කටයුතු කරන්න"යි කියලා. සිගරට් පැකට් එකේ ඉස්සරහ පැත්තේ, පිටි පස්ස පැත්තේ තමයි අවවාද සහ රූපමය අවවාද ඇතුළු කරන්න පුළුවන් වන්නේ. ඇත්තටම ජාතිය ගලවා ගන්න, ජාතිය වෙනුවෙන් ඒ කටයුත්ත ඉෂ්ට කරන්න ගිහින් තමයි එදා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට එතුමාගේ ඇමති ධුරයයි, පක්ෂයේ මහ ලේකම් ධුරයයි අත්හැරලා එක්සත් ජාතික පක්ෂයත් එක්ක අත්වැල් බැඳ ගෙන එළියට එන්න සිද්ධ වුණේ.

විශේෂයෙන්ම මෙම රූපමය අවවාද දුම් පානය අධෛර්යවත් කරන අවවාද වෙන්න ඕනෑ; දුම් පානය නිසා ඇති වන සෞඛ්‍ය ගැටලු පෙන්වන, දුම් පානය අප්‍රිය කරන අවවාද වෙන්න ඕනෑ. ජනතාව අප්‍රිය කරන කැත පින්තූර මේවාට යොදන්න ඕනෑ. එතකොට අර කියපු විධියට අභිමානයට සාක්කුවේ දමා ගෙන යන්නේ නැහැ; කාටවත් පෙනෙන්න අභිමානයට සිගරට් පැකට් එක අරගෙන යන්නේ නැහැ. එතකොට, ඒක හරි නැහැ; ගෙන යන්න බැහැ, මෙය සමාජයට පෙන්නන්න බැරි දෙයක් කියලා තේරුම් ගන්නවා. ඒ වාගේම, පාසල් දරුවන් මේ සිගරට් පැකට් එකතු කරන්නේ නැහැ. පාසල් දරුවන් මේ සිගරට් පැකට් එකෙන් සෙල්ලම් කරන්න යන්නේ නැහැ. ඒවා පාසල් දරුවා ආකර්ෂණය වන දෙයක් බවට පත් වන්නේ නැහැ. එහෙම නම් ඒ ක්‍රමවේදය අනුගමනය කරන්න අපට සිද්ධ වනවා.

අද මේ පනත් කෙටුම්පත තුළින් සම්මත කර ගන්නේ සිගරට් පැකැට්ටුවේ පෘෂ්ඨය මත මතු පිට - ඉදිරිපස හා පිටුපස- සියයට 80ක් රූපමය අවවාද ඇතුළත් කරන්නයි. මේ රූපමය අවවාද විශාල වන්න ඕනෑ. මෙය සියයට 60ක් දක්වා අඩු කරලා හරි යන්නේ නැහැ; සියයට 40ක් දක්වා අඩු කරලා හරි යන්නේ නැහැ. මා හිතන හැටියට සියයට 80ක් කියන එකත් මදියි. මෙය සියයට 80ක් කළ යුතුමයි. එහෙම නොකළොත් මෙය නිකම් නාම මාත්‍රිකව කරන දෙයක් විතරක් බවට පත් වනවා. සියයට 80ක් වශයෙන් සඳහන් කර තිබුණත්, සියයට 60ක් වශයෙන් සඳහන් කර තිබුණත් මෙහි අකුරුවලිනුත් පැහැදිලිව අවවාද දීලා තිබෙනවා. එතකොට රූපය තිබෙනවා. එය කැත රූපයක්; අප්‍රසන්න රූපයක්; මේ තුළින් හැදෙන ලෙඩ රෝග ගැන විස්තර කරන රූපයක්. ඒ වාගේම අවවාදයක් අකුරෙන් ලියලාත් තිබෙනවා. මේ රූප ඇතුළත් කරන ප්‍රමාණය සිගරට් පැකැට්ටුවෙන් සියයට 60ක් වුණොත්, එහෙම නැත්නම් සියයට 80ට වඩා අඩු වුණොත් මේ රූපය පොඩියටයි පෙනෙන්නේ. එතකොට ඒක ඇඟට දැනෙන දෙයක් වන්නේ නැහැ. එම නිසාම තමයි ඕස්ට්‍රේලියාව, නවසීලන්තය වැනි රටවල් මෙය plain packaging system එකකට දියුණු කර තිබෙන්නේ. පැකැට්ටුවේ මුළු පෘෂ්ඨයේම තිබෙන්නේ රූපමය අවවාද. Trademark එක, කොම්පැනියේ නම ගහන්න තැනක් නැහැ. ඒවා වෙන කොහේ හෝ ගහ ගන්න ඕනෑ. පැකැට්ටුවේ පෘෂ්ඨයේ ඒවා සඳහන් කරන්න බැහැ. පෘෂ්ඨයේ සම්පූර්ණයෙන්ම රූපමය අවවාද ඇතුළත් කරලා දුම් පානයෙන් ඇතිවන අප්‍රසන්න ප්‍රතිවිපාක පෙන්වා දෙන්න ඕනෑ.

දුම්කොළ හා මද්‍යසාර භාවිතය පිළිබඳව ක්‍රියාත්මක වන ආයතනයක් අප රටේ තිබෙනවා. ඒ තමයි National Authority on Tobacco and Alcohol - NATA. 2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත යටතේ තමයි NATA එක ඇති කරලා තිබෙන්නේ. අපි දැක්ක විධියට පසු ගිය කාලයේ මේ ආයතනයෙන් මේ ගැටලු ගැන එච්චර අවධානයක් යොමු වුණේ නැහැ. මේ ගැටලු ගැන හරියට ක්‍රියාත්මක වුණේ නැහැ. මේ ආයතනය පැත්තකින් තියලා නාමිකව තිබුණා විතරයි. ඒ ආයතනයට ක්‍රියාත්මක වෙන්න හැකියාවක් තිබුණේ නැහැ. මේ ආයතනය සඳහා විටින් විට සභාපතිවරුන් පත් වුණා. නමුත් ඒ ආයතනයට හරියට staff එකක් හිටියේ නැහැ; වැඩ කරන්න කාර්ය මණ්ඩලයක් පත් කරලා තිබුණේ නැහැ. ඒ වාගේම මේ ආයතනයට වැඩ කරන්න මුදල් තිබුණේ නැහැ. මුදල් නැතිව වැඩ කරන්නේ කොහොමද? මේ ආයතනයට වාහනයක් තිබුණේ නැහැ. මේ වාගේ ප්‍රශ්න හරහා මේ NATA එක අසරණ කරලා තිබුණ බව අපි දැක්කා. නමුත් අපි බලාපොරොත්තු වෙනවා, නව රජයේ නව ප්‍රතිපත්ති අනුව, අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ දැක්ම අනුව, සෞඛ්‍ය ඇමතිතුමාගේ දැක්ම අනුව ඉදිරියේදී මේ ආයතනය ශක්තිමත් ආයතනයක් බවට පත් කරන්නට. ඒ කාරණය විශේෂයෙන්ම මා මතක් කර සිටිනවා.

මේ අවස්ථාවේදී මම තව කාරණයක් කියනවා. දුම් කොළ සහ මද්‍යසාරවලින් අපි විශාල බදු ප්‍රමාණයක් අය කරනවා. ඒක ප්‍රමාණවත් නැහැ. නමුත් විශාල බදු ප්‍රමාණයක් අය කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් අවසන් කරන්න.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි දෙකක කාලයක් ලබා දෙන්න.

ඒ අය කරන බදුවලින් අඩු තරමින් සියයට 2ක් මේ NATA එකට දෙන්න පුළුවන් නම් ඒ අයත් මේ වැඩේ කර ගෙන යයි. එහෙම නැතිව මේ ආයතනය නාමික ආයතනයක් හැටියට තිබුණාට වැඩක් නැහැ.

විශේෂයෙන්ම "Healthy Lanka" ආයතනය වාගේ පෞද්ගලික ආයතන තිබෙනවා. ඒවා ස්වේච්ඡා සංවිධාන. මේ ආයතනවලින් විශාල වැඩසටහන් කරලා තිබෙනවා. මා ළඟ තිබෙනවා, The Foundation for Innovative Social Development - FISD - විසින් නිකුත් කරන ලද සමීක්ෂණ වාර්තාවක්. මේ ආයතනයේ සමීක්ෂණ වාර්තාවෙන් කියලා තිබෙනවා, NATA ආයතනයේ කටයුතු ශක්තිමත් කරන්න ඕනෑ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, The Foundation for Innovative Social Development විසින් නිකුත් කළ "Research Report on the Sale of Alcohol and Cigarettes to Minors" නමැති සමීක්ෂණ වාර්තාව මම **සභාගත*** කරනවා.

අපේ නීතියේ තිබෙනවා, අවුරුදු 21ට වඩා අඩු අයට දුම් වැටි විකිණීම තහනම් කියලා. නමුත් මේ සමීක්ෂණ වාර්තාවේ තිබෙනවා, ඒ විධියේ නීති තිබුණාට අපේ රටේ අවුරුදු 21ට අඩු දරුවන්ට දුම් වැටි ගන්න පුළුවන් ප්‍රවණතාව සියයට 75ක් වන බව. ඒ වාගේම මද්‍යසාර ලබා ගැනීමේ ප්‍රවණතාව සියයට 90ක් වන බව කියනවා. මේවා සම්බන්ධයෙන් කටයුතු කරන්නට ශ්‍රී ලංකාවේ පොලීසිය තිබෙනවා. ඒ වාගේම, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් ඉන්නවා, මේවාට අදාළ නීති ක්‍රියාත්මක කරන්න. ඒ වාගේම සුරාබදු සම්බන්ධයෙන් ක්‍රියා කරන ආයතන තිබෙනවා. නමුත් අද මේ රාජ්‍ය ව්‍යුහය ක්‍රියාත්මක වෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සංශෝධන පනත් කෙටුම්පත ගෙනැල්ලා මේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් සෞඛ්‍ය අමාත්‍ය ගරු රාජිත සේනාරත්න මැතිතුමාට

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

ජාතියේ ප්‍රණාමය පිරිනමන ගමන්, අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට -පක්ෂය මාරු කරලා හෝ ප්‍රජාතන්ත්‍රවාදය තිබෙන දේශපාලන ව්‍යුහයකට එකතු වෙලා- එතුමාගේ සංකල්පය අනුව මේ කටයුත්ත ඉටු කිරීම ගැන ශුභාශිංසනය පළ කරනවා.

රාජ්‍ය නිලධාරි යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමටත්, NATA එක සහ මේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීමටත් මේ හා සමානව කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා. එහෙම නොවුණොත් මේ සිහිනය සැබෑ වෙන්නේ නැහැ කියන කාරණයත් මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 4.54]

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාගෙන් අවසරයි. අද අපි සාකච්ඡා කරන්නේ අප රටේ ජනතාවට බලපාන ඉතාම වැදගත් ප්‍රශ්නයකට සම්බන්ධ පනත් කෙටුම්පතක් පිළිබඳවයි. ඒ වාගේම පුද්ගලයන්ට පමණක් නොවෙයි අප ආර්ථිකයටත්, සමාජයේ පවුල්වලටත් හානියක් වන ප්‍රශ්නයක් පිළිබඳවයි. විශේෂයෙන්ම අපට දුම් පානය පාලනය කිරීමට විශාල සටනක් ගෙන යන්න සිදු වෙලා තිබෙනවා, බහු ජාතික සමාගම්වල ප්‍රචාරක යාන්ත්‍රණය හරහා ජනතාව ඇබ්බැහිවීමකට ඇද ගැනීමේ බලයට විරුද්ධව.

මෙවැනි අවස්ථාවකදී මේ පනත සංශෝධනය කිරීමෙන්, දුම් පානයේ ප්‍රතිවිපාක ගැන වැඩි අවබෝධයක් ඇති වෙන්න, ඒ වාගේම ජනතාව තුළ දුම් පානය ගැන භයක්, සැකයක් ඇති වෙන්න අවශ්‍ය ප්‍රදර්ශනය ඒ packet එකේ ඇති කිරීමට, නැත්නම් ඒ සිගරට් තිබෙන භාජනයේ ඇති කිරීමට මහ සැලැස්වීම වැදගත් පියවරක් කියලා අපි කවුරුත් සලකනවා. මෙසේ වෙනස් කිරීම ඓතිහාසික අවස්ථාවක්.

දුම් බීමට ඇබ්බැහිවීම අප සමාජය තුළින් නැති කරලා ඒ හරහා ඇති වන හානිය අවම කිරීමට ක්‍රියාත්මක කිරීම පහසු දෙයක් නොවෙයි. මේ කාර්ය වඩාත් සාර්ථකව ඉදිරියට ක්‍රියාත්මක කරපු තරමටම එහි සාර්ථක ප්‍රතිඵලත් ලැබේවි. නමුත් ඒක පමණක් සෑහෙයි කියලා හිතාගෙන කටයුතු කළොත් අපි වැටෙන්නේ වැරැදි තැනකටයි. අපි කවුරුත් දන්නවා, මේ සිගරට් තුළ Nicotine කියන රසායනික ද්‍රව්‍ය තිබෙන නිසා දුම්පානයට ඇබ්බැහිවීමක් සිද්ධ වනවා කියලා. ඒ ඇබ්බැහිවීම වැඩි වෙන්න, වැඩි වෙන්න සිගරට් පානය කිරීම වැඩි වෙනවා. එක පැත්තකින් ඒ තුළින් වියදම වැඩි වනවා. එය පවුලේ ආර්ථිකයට බලපානවා. සමහර විට මේ ඇබ්බැහිවීමේ පුරුද්ද නිසා ඒ පුද්ගලයා තමන්ගේ ආදායමෙන් අඩක් පමණ දුම්පානය සඳහා වැය කරනවා. ඒ නිසා විශේෂයෙන්ම පවුලේ ළමයින්ට සහ මවට විශාල ප්‍රශ්නයක් ඇති වනවා. ඒ එක්කම සෞඛ්‍ය ප්‍රශ්නත් තිබෙනවා. කාලයක් ගියාට පස්සේ දුම්පානය තුළින් විශාල සෞඛ්‍ය ප්‍රශ්න ඇති වෙනවා කියලා අපි දන්නවා. මෙහි භයානකකම පැහැදිලි කරනවා නම්, පෙනහැලි පිළිකා මරණවලින් සියයට 95කටම හේතුව වෙන්නේ දුම් පානයයි. සියලු පිළිකා වර්ගවලින් සියයට 43කට හේතුව වන්නේ දුම් පානයයි. මුඛයේ පිළිකා ඇතිවීමට හේතු වනවා පමණක් නොවෙයි, ශබ්දය පිටවන vocal cordsවලට, දුම් සෘජුව බලපාන උගුර, ගලනාලය වැනි ශරීරයේ කොටස්වලටත්, මුඛයට දුරින් පිහිටි අවයවවලටත්, උදාහරණයක් හැටියට මුත්‍රා බොක්කට වුණත් පිළිකා ඇති වීමට දුම්පානය හේතු වනවා.

අපි කල්පනා කරලා බැලුවොත් වෙනත් රෝග තත්ත්වයන් රාශියක් ඇතිවීමටත් මේ දුම්පානය හේතු වෙන බව පෙනෙනවා. හෘදයාබාධ ඇති වෙනවා. උදාහරණයක් හැටියට ගත්තොත්, ඇමෙරිකාවේ heart attacks නැත්නම් ලේ මදිකම නිසා ඇති වන හෘදයාබාධවලින් සියයට 20ක්ම සිද්ධ වන්නේ දුම්පානය නිසා. ඒ වාගේම රුධිර නාලවලට මේක බලපානවා. ඒ තුළින් strokes නැත්නම් cerebrovascular accidents ඒ කියන්නේ අංශභාග රෝග ඇතිවීමත් සිද්ධ වනවා. ඒ සම්බන්ධයෙන් බැලුවාම ලංකාවේ ඒ පිළිබඳව හරි සංඛ්‍යා ලේඛන නැහැ. ඒ නිසා මම ඇමෙරිකාවේ සංඛ්‍යා ලේඛන කියන්නම්.

ඇමෙරිකාවේ මේ රෝග තත්ත්වයන්ගෙන් සියයට 15ක්ම ඇති වී තිබෙන්නේ දුම්පානය නිසායි. මේ නිසා ශරීරයේ විවිධ බරපතළ තත්ත්වයන් සහ ලෙඩ රෝග තත්ත්වයන් ඇති වෙනවා. මිය යෑම පමණක් නොවෙයි, කාලයක් රෝහල්ගත වෙලා ප්‍රතිකාර ලබා ගැනීමටත් මෙය හේතු වනවා. ඒ නිසා මෙය සෞඛ්‍ය සේවයට බරක් පමණක් නොවෙයි, වියදමත් වැඩිවන තත්ත්වයක් වනවා.

දුම් පානය නිසා පෙණහලු පිළිකා පමණක් නොවෙයි, විවිධ ආසාධන තත්ත්වයන් ද ඇති වනවා. එකක් තමයි chronic bronchitis කියන රෝගී තත්ත්වය. ඒ රෝගී තත්ත්වය කල් පවතිනකොට පෙණහැල්ලේ ඔක්සිජන් සහ කාබන්ඩයොක්සයිඩ් හුවමාරු කිරීමේ කොටස්වල දියවීමක් සිද්ධ වනවා. ඒකට ඉංග්‍රීසි භාෂාවෙන් කියනවා, emphysema කියලා. ඒ තත්ත්වය හේතුකොටගෙන මරණය පවා සිද්ධ වනවා. එසේ සිදු වන මරණවලින් සියයට 82ක්ම සිද්ධ වන්නේ දුම් පානය හේතුකොටගෙනයි.

ඇදුම තිබෙන ලෙඩුන්ගේ ඇදුම තත්ත්වයත් දුම් පානය නිසා වැඩි වනවා. ගර්භිණී මවකගේ සෞඛ්‍යයටත් දුම් පානය බලපානවා. ඒ වාගේම ගර්භිණී කාලය තුළ දුම් පානයෙන් ලැබෙන්න ඉන්න දරුවාගේ වර්ධනයටත් බාධාවක් ඇති වනවා. පර්යේෂණ මඟින් පෙන්වා දී තිබෙනවා, මව දුම්පානය කරනවා නම් ඇයට ඉපදෙන දරුවන්ගේ බර හුඟක් අඩු වන බව.

දුම් පානය ආමාශයටත් තදින් බලපානවා. Gastric and duodenal ulcers වැඩි වීමටත් මෙය හේතුවක් වනවා. මේ ලෙඩ රෝග තත්ත්වයන් අපේ රටේ සෞඛ්‍ය ප්‍රශ්න අතරේ ප්‍රධාන ප්‍රශ්නයක් බවට පත්වෙලා තිබෙනවා.

දුම් පානය ලිංගික ක්‍රියාකාරිත්වයටත් බලපාන බව අපි දන්නවා. මානසික රෝගී තත්ත්වයන් තිබෙන අයට දුම්පානය කිරීමේ වැඩි වුවමනාව ඇති වනවා. ඒ නිසා ඒ අය තුළත් අතුරු ආබාධ වැඩි වන තත්ත්වයක් තිබෙනවා. මේ හැර, සෘජුව දුම් පානය කරන අයට ඇති වන රෝග තත්ත්වයන් පමණක් නොවෙයි, දුම් පානය කරන අය අවට සිටින දුම් පානය නොකරන අයටත් මේ නිසා ප්‍රශ්න ඇති වනවා. ඉංග්‍රීසි භාෂාවෙන් මේකට passive smoking කියලා කියනවා. ඒ හේතුවෙන් මේ කියන ලද රෝග තත්ත්වයන් පවා ඇති වෙන්න පුළුවන්. ප්‍රමාණය අඩු වුණාට සැලකිය යුතු රෝගී තත්ත්වයක් සිද්ධ වනවා. මේ ආකාරයට බැලුවාම දුම් පානය නිසා සෞඛ්‍ය පැත්තෙන් අප සමාජයට විශාල හානියක් සිද්ධ වන බව අපට පිළිගන්න පුළුවන්.

පසු ගිය අවුරුදු 10 දී ලංකාවේ බෝ නොවන රෝගවල ප්‍රමාණය සෑහෙන්න වැඩි වෙලා තිබෙනවා. සියයට 5 සිට සියයට 36 දක්වා ඒ ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. JICA ආයතනය මඟින් කරන ලද සමීක්ෂණයකින් පෙනී ගොස් තිබෙනවා, ලංකාවේ බෝ නොවන රෝගවල වැඩි වීමට ප්‍රධාන හේතුවක් වෙලා තිබෙන්නේ දුම් පානයයි කියලා. අපේ සමාජය දිහා බැලුවාමත් බෝ නොවන රෝග ඇති පිරිස සෑහෙන්න වැඩි වීමට දුම් පානය හේතුවක් වනවාය කියන එක අපට පිළිගන්න සිදු වෙනවා. දුම් පානය නිසා ඇති වන රෝගාබාධ හේතුවෙන්

දිනපතා 60දෙනකුගේ පමණ ජීවිත නැති වෙනවා. මීට අවුරුදු දෙකකට පෙර සංඛ්‍යා ලේඛන අරගෙන බැලුවාම, ඒ අනුව අවුරුද්දකට 22,600ක් පමණ මිය ගිහින් තිබෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, please wind up your speech now.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
Sir, I have been given an extra five minutes by the Hon. Dinesh Gunawardena.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
But, you have only two minutes left.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
He gave me extra time. The Hon. Dinesh Gunawardena gave me his time.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
You have already taken 12 minutes.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
I had 10 minutes to begin with and then the Hon. Dinesh Gunawardena gave me his time also.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
No, from the start of your speech, you have taken 12 minutes.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
What I am trying to tell you is, the Hon. Dinesh Gunawardena was scheduled to speak but now he has transferred his time to me. Therefore, please give me that extra time also.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
He has given only five minutes to you and the balance five minutes will be given to the Hon. Felix Perera.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
Okay, sorry. Then, I will conclude soon.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මත්පැන් ප්‍රශ්නය පිළිබඳව අප ගන්නා පියවර සම්බන්ධයෙන් කල්පනා කර බලනකොට බීර සහ අරක්කු සම්බන්ධයෙන් යම් නීති ක්‍රියාත්මක කරන්නට ඉදිරිපත් වුණත්, කසිප්පු පිළිබඳව විශාල ප්‍රශ්නයක් තිබෙනවා. ඒ වාගේම සිගරට් ගැන කල්පනා කරලා කටයුතු කරනවා වාගේම අප අවධානය යොමු කළ යුතු තවත් ප්‍රශ්නයක් තිබෙනවා. ඒ තමයි බීඩි ප්‍රශ්නය. සිගරට් වෙනුවට දැන් පාවිච්චි කරන ලාභම දුම් වැටි වර්ගය තමයි බීඩි. ඒ ගැනත් ඉදිරි කාලයේ දී අපේ අවධානය යොමු කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සිගරට් පාවිච්චි කරන අය ඊට ඇබ්බැහි වූ ප්‍රමාණය අනුව, තමන්ගේ ආදායම අනුව සිගරට් පැකට් හැටියට ගැනීමේ ප්‍රවණතාව වැඩි වෙනවා කියලා අපි දන්නවා. මේ ගෙන එන නීතිය ක්‍රියාත්මක කිරීම ඒ අයගේ සිගරට් භාවිතය අඩු කරන්නට ගත හැකි වැදගත් පියවරක් වෙනවා. නමුත් දුම් පානය මුලින්ම පටන්ගන්නා අය සිගරට් අඩු ප්‍රමාණයක් භාවිත කිරීමෙන් තමයි එය පටන්ගන්නේ. ඒ අය ගිහිල්ලා සිල්ලර කඩවලින් loose සිගරට් හැටියට ඒවා ලබා ගන්නවා. එහෙම ලබා ගන්න කොට තිබෙන ප්‍රශ්නය තමයි, සිගරට් පැකැට්ටුවේ මතු පිට ප්‍රදර්ශනය කර තිබෙන දුම් වැටි භාවිතය මඟින් සෞඛ්‍යයට ඇති වන අනතුර ගැන කිසිම අවබෝධයක් ඒ පුද්ගලයාට නොලැබෙන එක.

ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා කලින් කියපු කාරණය මමත් අනුමත කරනවා. සිගරට් අළෙවි කරන හැම පුද්ගලයකුම ලියා පදිංචි කළ යුතුයි. එසේ ලියා පදිංචි කරපු හැම පුද්ගලයාම දුම් පානය පිළිබඳ අනතුරු ඇඟවීමේ notice එකක් පින්තූර සහිතව තමන්ගේ වෙළඳ සැලේ ප්‍රදර්ශනය කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කවුරුත් දන්නවා දුම් කොළ සමාගම අවුරුදු පතා විශාල ලාභයක් ලබන බව. රුපියල් බිලියන 83ක පමණ ලාභයක් ලබනවා. ඒ කියන්නේ රුපියල් මිලියන 83,000ක් ලාභය හැටියට අවුරුදුපතාම ලබා ගන්නවා. ඒ කියන්නේ දවසකට රුපියල් මිලියන 230ක්. අපේ බදු ආදායමෙන් සියයට 3ක් පමණ අපි මේ තුළින් ලබා ගන්නවා. නමුත් ඊට වැඩි බදු අය කිරීමක් මේ අයගෙන් ලබා ගත යුතුයි කියලා මම හිතනවා. එලෙස විශාල බදු ආදායමක් ලබා ගත්තොත් තමයි දුම් පානය නිසා සෞඛ්‍ය හානිවලට ගොදුරු වන ජනතාවට නිසි සෞඛ්‍ය ප්‍රතිකාර ලබා දීම සඳහා අපේ සෞඛ්‍ය සේවය වැඩිදියුණු කළ හැකි වන්නේ. ඒ සඳහා යෙදවීමට මේ අයගෙන් වැඩි බදු මුදලක් ලබා ගැනීම අවශ්‍යයි කියලා මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තූතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
The next speaker is the Hon. Karuppaiah Velayudam. You have 12 minutes.

[பி.ப. 5.11]

ගරු කරුපයියා වේලායුදම් මහතා (වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கருப்பையா வேலாயுதம் - பெருந்தோட்டக் கைத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Karuppaiah Velayudam - State Minister of Plantation Industries)
I thought I had been allotted 15 minutes, Sir.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2006ஆம் ஆண்டின் 27ஆம் இலக்க புகையிலை மற்றும் மதுசாரம் மீதான தேசிய அதிகாரசபைச் சட்டத் திருத்த

[ගරු කරුපයියා වේලායුදම් මහතා]

විවාதத்தில் கலந்துகொண்டு சில கருத்துக்களை முன்வைப்பதற்குச் சந்தர்ப்பம் கிடைத்ததையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன். இத்திருத்தச் சட்டமூலமானது, புகையிலை உற்பத்தி, இறக்குமதி மற்றும் விற்பனை போன்ற செயற்பாடுகளை மேற்கொள்ளும்போது, அதனால் ஏற்படும் சுகாதாரக் கேடுகள், மரணத்தை அதிகரிக்கும் அபாயகரமான நச்சுத்தன்மை போன்ற விளைவுகளை எச்சரிக்கை செய்வதோடு, அதைப் பாவிப்பதனால் ஏற்படும் சுகாதாரக் கேடுகளை விளக்கி, பொதுமக்களுக்கு அறிவூட்டும் வகையில், அவ்வுற்பத்திப் பொருட்கள் அடைக்கப்பட்டிருக்கும் பெட்டிகளில் முன்னும் பின்னும், அதன் இரு பக்கங்களிலும், தெளிவாக விளங்கிக்கொள்ளும்வகையில் label இடப்பட வேண்டியதன் அவசியத்தை வலியுறுத்திநிற்கின்றது. அத்துடன் இச்சட்டத் திருத்தக் கூறுகளைக் கடைப்பிடித்து அமுல்நடத்தத் தவறுகின்றவர்களுக்கு - உற்பத்தியாளர்கள், விற்பனையாளர்களுக்கு - எதிராக நீதிமன்றத்தில் வழக்குத் தாக்கல் செய்யப்பட்டு, குற்றவாளியாகக் காணப்படும்பட்சத்தில் 50 ஆயிரம் ரூபாய் தண்டப்பணமும் ஒரு வருடத்திற்கு மேற்படாதவாறு சிறைத்தண்டனையையும் அனுபவிக்க நேரிடும் என்பதை வலியுறுத்துகின்றது.

இலங்கையின் மரண எண்ணிக்கையைப் பார்க்கின்றபொழுது, அதிகளவான மரணங்கள் புகையிலை பாவித்தல் மற்றும் புகைப்பிடிப்பதால் ஏற்படுகின்ற நச்சுத்தன்மையால் ஏற்படுகின்றதெனப் புள்ளிவிபர அறிக்கைகள் கூறுகின்றன. இலங்கையில் வருடத்திற்கு 40,000 பேர் புகையிலை பாவனையின்மூலம் மரண அபாயத்திற்கு முகம்கொடுத்துவருவதாகக் குறிப்பிடப்படுகின்றது. அவ்வாறே, வருடந்தோறும் புகையிலை பாவனையினால் 20,000 பேர் மரணித்து வருகின்றனர். இது மிகவும் மோசமான நிலைமை என்பதை நாங்கள் விளங்கிக்கொள்ள வேண்டும். இலங்கையில் புகையிலை பாவிப்பதன்மூலம் 13.3 சதவீதமானவர்கள் வாய்ப்புற்று நோயாலும் தொண்டைப் புற்றுநோயாலும் பாதிக்கப்பட்டு வருகின்றனர். வருடந்தோறும் சுமார் 20,000 பேர் புகையிலை காரணமான நோயினால் மரணிப்பதாகவும் நாளாந்தம் குறைந்தபட்சம் 20 பேர் இருதய நோயினால் மரணிப்பதாகவும் தெரிவிக்கப்படுகின்றது. அதேவேளை, நாளாந்தம் 600க்கு மேற்பட்டவர்கள் இருதய நோய் காரணமாக வைத்தியசாலையில் அனுமதிக்கப்படுகின்றனர்.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

අනතුරුව ගරු පෙරුමාල් රාජදුරයි මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு பெருமாள் ராஜதுரை அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. PERUMAL RAJATHURAI *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. Member, you may continue.

ගරු කරුපයියා වේලායුදම් මහතා
(மாண்புமிகு கருப்பையா வேலாயுதம்)
(The Hon. Karuppaiah Velayudam)

எனவே, இந்த விதமாக மக்களுக்கு நச்சுத்தன்மையை ஏற்படுத்தி பலவிதமான சுகாதாரக் கேடுகளையும் விளைவிக்கும் இத்தகைய பொருட்களால் மக்கள் பல்வேறு அசௌகரியங்களுக்கு முகங்கொடுக்கின்றனர். பொறுப்புள்ள அரசாங்கம் என்ற வகையில் அம்மக்களைப் பாதுகாப்பதற்கு உரிய நடவடிக்கைகளை எடுக்கமுனைவது பாராட்டத் தக்கதாகும்.

2007ஆம் ஆண்டு சிகரெட் வரிமூலம் அரசாங்கத்திற்கு கிடைத்த வருமானம் 31,437 மில்லியன் ரூபாயாகும். 2013ஆம் ஆண்டு அத்தொகை 62,920 மில்லியன் ரூபாயாக, இரு மடங்கு அதிகரித்திருக்கிறது. அதேபோன்று, 2007ஆம் ஆண்டு மதுபானத்தின்மூலம் அரசுக்கு கிடைத்த வரி 23,723 மில்லியன் ரூபாயாகும். 2013ஆம் ஆண்டு அது 70,189 மில்லியன் ரூபாயாக மும்மடங்கு உயர்ந்துள்ளது. 2014ஆம் ஆண்டு புகையிலை உற்பத்தி மூலம் அரசாங்கத்திற்கு 73.6 பில்லியன் ரூபாய் வருமானமாகக் கிடைத்திருக்கிறது. ஆயினும், இந்த வருமானத்தை மாத்திரம் மையமாகக்கொண்டு செயற்படாது இலவச மருத்துவ வசதிகளை ஏற்படுத்துவதற்கு எத்தனை மில்லியன் ரூபாயை - அந்த வருமானத்துக்கும் அதிகமான தொகையை - வருடந்தோறும் அரசாங்கம் இழந்து வருகின்றது என்பதையும் கணக்கிற்கொள்ளவேண்டும்.

2013ஆம் ஆண்டு 4,035 மில்லியன் சிகரெட்டுகள் உற்பத்தி செய்யப்பட்டுள்ளன. அதன்மூலம் அரசாங்கத்துக்கு கிடைத்த வருமானம் 58.5 பில்லியன் ரூபாயாகும். இலங்கையில் புகையிலை பாவிப்பதன் காரணமாக வாய்ப்புற்று நோய் அதிகரித்துக் காணப்படுகின்றது. இலங்கையின் 10 மாவட்டங்களில் மேற்கொள்ளப்பட்ட ஆய்வினூடாக யாழ்ப்பாணத்தில் 42.9 சதவீதமானவர்களும், களுத்துறையில் 24.6 சதவீதமானவர்களும், கொழும்பில் 30.4 சத வீதமானவர்களும், புகையிலை பாவனைக்கு அடிமையாகி உள்ளார்களெனத் தெரியவருகின்றது. 2004ஆம் ஆண்டு 34.5 மில்லியன் லீற்றராக இருந்த சாராய உற்பத்தி 2007ஆம் ஆண்டு 82.8 மில்லியன் லீற்றராக அதிகரித்திருக்கிறது. 2013ஆம் ஆண்டு 164.5 லீற்றர் மில்லியனாக அது மேலும் உயர்ந்திருக்கிறது. 2004ஆம் ஆண்டு மதுபான விற்பனை அனுமதிக் கட்டணம், நீதிமன்றத் தண்டப்பணம் போன்றவற்றினூடாக 291 மில்லியன் ரூபாய் அரசுக்கு வரியாகக் கிடைத்தது. அத்தொகை 2013ஆம் ஆண்டு 1,600 மில்லியன் ரூபாயாக அதிகரித்திருக்கிறது. இத்தகைய வருமானங்களினால் கடந்த கால அரசாங்கங்கள் மதுபானம் அல்லது புகைத்தல் சம்பந்தமான கட்டளைகளைத் தளர்த்துவதற்கான அல்லது அவற்றின் பாவனையைத் தடுப்பதற்கான நடைமுறைகளை மேற்கொள்ளத் தவறியிருந்தன. அதனால்தான் அன்றைய சுகாதார அமைச்சராக இருந்த இன்றைய ஜனாதிபதி அவர்கள் கொண்டுவந்த இந்த திருத்தச் சட்டமூலம் அவரால் அன்று முன்னெடுக்க முடியாதவாறு தடை விதிக்கப்பட்டது.

2013ஆம் ஆண்டு ரம், பியர், கள்ளு, சாராயம் போன்ற உற்பத்திகளில் சாராயம் மாத்திரம் 12,97,95,927 லீற்றர் அருந்தப்பட்டுள்ளதாக அறிக்கைகள் தெரிவிக்கின்றன. பெருந்தோட்டத்துறையில் மது அருந்துபவர்களின் எண்ணிக்கை அதிகரித்துக் காணப்படுகின்றது. பெருந்தோட்டத்துறை சனத்தொகையில் 78 சதவீதமானவர்கள் மது அருந்துவதாகக் கணக்கெடுக்கப்பட்டுள்ளது. பெருந்தோட்டத்துறை மக்களின் மொத்த வருமானத்தில் 40 சதவீதம் மதுபானத்திற்கே செலவிடப்பட்டுவருவதாகவும் அறியமுடிகின்றது. தீபாவளி

போன்ற உற்சவ காலங்களில் இந்த மதுப்பாவனை மிகவும் அதிகமாகக் காணப்படுவதை நாங்கள் அவதானித் திருக்கிறோம்.

மதுப் பாவனையைக் கட்டுப்படுத்தி அதிலிருந்து மக்களைக் காப்பாற்ற வேண்டிய அரசியற்கட்சித் தலைவர்கள், அதற்கு மாறாக தேர்தல் காலங்களில் தங்களுடைய வாக்குகளை அதிகரித்துக்கொள்ள வேண்டுமென்ற நோக்கோடு மக்கள் மத்தியிலே மதுப் பழக்கத்துக்கு உற்சாகமூட்டி இலவசமாக மதுப்பாவனையை ஊக்குவித்து, அவர்களுடைய நிலைமையை மேலும் மோசமாக்கி வருகின்றார்கள். இவ்வாறு மதுபானத்துக்கு அடிமையாகின்ற நிலையை வலுப்படுத்தி வருகின்றமை வேதனைக்குரியதொன்றாகும். எனவே, மக்களை வழிநடத்தவேண்டிய அரசியல் தலைவர்கள், வேட்பாளர்கள் அவர்களைத் தவறான வழிக்கு இட்டுச்செல்வதை எதிர்காலத்திலாவது நிறுத்திக்கொள்வது சமூகத்துக்கு அவர்கள் செய்யும் மிகப்பெரிய பணியாகும்.

நுவரெலியா மாவட்ட அரசாங்க அதிபர் மது விற்பனை சம்பந்தமாகக் குறிப்பிடுகையில், அங்கு 216 மது விற்பனை நிலையங்கள் இருப்பதாகவும் இலங்கையில் நுவரெலியா மாவட்டத்திலேயே அதிகூடிய அளவில் மதுவிற்பனை நிலையங்கள் இருப்பதாகவும் அங்குள்ளவர்கள் வருடத்திற்கு 5,800 மில்லியன் ரூபாய் பெறுமதியான சாராயம் போன்ற மதுபானங்களை அருந்திவருவதாகவும் தெரிவித்திருக்கின்றார். ஆனால், நுவரெலியா மாவட்ட அபிவிருத்திக்காக 1,500 மில்லியன் ரூபாயே வருடந்தோறும் செலவிடப்பட்டு வருவதைக் காணக்கூடியதாக இருக்கின்றது. அங்கே அனுமதிபெற்ற மது விற்பனை நிலையங்களுக்கு மேலதிகமாகச் சட்டவிரோதமான கசிப்பு விற்பனை நிலையங்கள் போன்ற இன்னோரன்ன சாராய விற்பனை நிலையங்கள் பல உண்டு என ஆய்வாளர்கள் கூறுகின்றார்கள். இலங்கையில் அதிகளவு மதுவுக்கு அடிமைப்பட்ட சமூகமாக மலையக சமுதாயமே உள்ளதெனப் பல ஆய்வுகளும் சுட்டிக்காட்டுகின்றன.

அதுமட்டுமன்றி, 15-19 வயதுக்குட்பட்ட பாடசாலை மாணவர்கள் மதுப்பானம், புகைத்தல் ஆகிய பழக்கங்களுக்கு அடிமையாகியுள்ளார்கள் என்பதை வருத்தத்துடன் குறிப்பிட வேண்டியுள்ளது. பெருந்தோட்டத்துறையில் காணப்படுகின்ற அனுமதிபெற்ற மற்றும் அனுமதியற்ற மதுபான விற்பனை நிலையங்களை மூடுவதற்கு அரசு முன்னுரிமை கொடுக்கவேண்டும். அதாவது, பெருந்தோட்டங்களுக்கு மத்தியிலேயே பல இடங்களில் மதுபானக் கடைகளுக்கு அனுமதி வழங்கப்பட்டுள்ளது. இது மேலும் அவர்களை அந்த ரீதியில் ஊக்குவிப்பதற்கு - தூண்டுவதற்கு காரணமாக இருக்கின்றது. நுவரெலியா, பதுளை, பசறை, மடுல்சீமை போன்ற பகுதிகளில் தோட்டத்தை மையமாகக்கொண்டு பல மதுபானக் கடைகள் இருக்கின்றன. அதற்கு அரசாங்கம் அனுமதி வழங்கியிருக்கின்றது. எனவே, தோட்டத்தின் மையத்திலிருக்கின்ற மதுபானக் கடைகளுடைய licence களை இரத்துச்செய்து அவற்றை அங்கிருந்து அப்புறப்படுத்தி, பெருந்தோட்டத்துறை மக்களை அதிகமான மதுப் பாவனையிலிருந்து காப்பாற்றுவதற்கான நடவடிக்கைகளைச் சம்பந்தப்பட்ட அமைச்சுக்கள் மேற்கொள்ள வேண்டுமென்று நான் இந்தச் சபையிலே கோரிக்கை விடுக்க விரும்புகின்றேன்.

அண்மையில் நான் மடுகஸ்தலாவ என்ற கிராமத்துக்குச் சென்றிருந்தேன். அது தோட்டங்களை அண்மித்த ஒரு பகுதி. அங்கு கூடியிருந்த தமிழ் மக்களும் தோட்டப்புற மக்களும் சிங்கள மக்களும் என்னிடம் விடுத்த ஒரேயொரு கோரிக்கை, "எங்களது இன்னோரன்ன அபிவிருத்திகளைப் பற்றிப் பேசுவதைவிட, எல்டெப் தோட்டத்துக்கு மத்தியிலிருக்கின்ற மதுபானக் கடையை மூடுவதற்கு நடவடிக்கை எடுங்கள்!" என்பதுதான். அந்தளவுக்கு இன்று அந்தச் சமூகமும் மாற்றமடைந்திருக்கின்றது. இன்று சில பகுதிகளிலுள்ள ஒருசில 'பார்' களிலே மாதாந்தம் செலுத்தும்வகையில் கடன் அடிப்படையிலே மது விநியோகம் நடைபெறுகின்றது. இதனால் நினைத்தவுடன் அவர்கள் அங்கு சென்று அதனைப் பெற்றுக்கொள்கிறார்கள். எனவே, அவற்றை மூடுவதற்கு அரசாங்கம் உடன் நடவடிக்கையெடுக்க வேண்டும்.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
உங்களுடைய நேரம் முடிவடைந்துவிட்டது.

ගරු කරුපයියා වේලායුදම් මහතා
(மாண்புமிகு கருப்பையா வேலாயுதம்)
(The Hon. Karuppaiah Velayudam)
இன்னும் ஒரு நிமிடம் தாருங்கள்.

மேலும், சமுர்த்தி உதவி பெறுபவர்கள், அரசாங்கத்தின் நிதியுதவியில் வாழ்கின்றவர்கள் அந்தப் பணத்தைப் பெற்றவுடன் அதில் அதிகளவைச் செலவழிப்பது இவ்வாறான புகைத்தல், மதுபானம் பாவித்தல் போன்றவற்றுக்கே! இதனால், சமூகத்திலே வறுமைநிலை ஏற்படுகின்றது; குடும்பத்திலே சச்சரவுகள் நிலவுகின்றன; இனங்களுக் கிடையிலே அடிக்கடி முரண்பாடுகள் ஏற்படுகின்றன. இவற்றைத் தவிர்ப்பதற்கு இந்த அதிகரித்த மதுபாவனையைத் தடைசெய்ய வேண்டும்.

எனவே, இதற்கு இந்தச் திருத்தச் சட்டமூலத்தைக் கொண்டுவந்திருக்கின்ற எங்களது சுகாதார அமைச்சர் அவர்கள் எடுக்கின்ற முன்னெடுப்புக்கள் மிக முக்கியமானவை. இந்தச் சட்டமூலம் இன்றைய நிலைக்கு மிகமிக அவசியமானது என்பதை நான் வலியுறுத்துகின்றேன். புகையிலைமூலம் கிடைக்கின்ற வருமானத்தைவிட இரட்டிப்பு மடங்கான பணத்தினை மருந்துகளுக்காகச் செலவிடவேண்டியிருக் கின்றது. இவற்றை உணர்ந்து இந்த மதுப் பாவனையைக் குறைக்கக்கூடிய ரீதியில் நடைமுறைச் சட்டங்கள் உருவாக்கப்படவேண்டும். குறிப்பாகக் கிராமங்கள், தோட்டங்கள் போன்றவற்றிலே நினைத்தவுடன் சாராயத்தைப் பெற்றுக்கொள்கின்ற வசதிகளைக் குறைக்கவேண்டும். இதனூடாக சமூகத்திற்கு குறிப்பாக இளைஞர்கள் மத்தியிலே நல்ல விழிப்புணர்வை ஏற்படுத்தவேண்டும்.

பாடசாலை மாணவர்கள் நாளாந்தம் மதுப்பழக்கத்திற்கு உள்வாங்கப்பட்டு வருகின்றார்கள். இது ஒரு சமூகப் பேரழிவை ஏற்படுத்துகின்ற நிகழ்வாக இருக்கின்றது. எனவே, இவற்றிலிருந்து இவர்களைக் காப்பாற்றவேண்டியது ஒரு பொறுப்புள்ள அரசாங்கத்தின் கடமையாகும். எனவே, இந்தத் திருத்தச் சட்டமூலம் காலத்திற்கு உகந்ததாக இருக்கிறது எனத் தெரிவித்துக்கொள்வதோடு, அரசாங்கம் பல மட்டங்களிலும் மதுப்பாவனை சம்பந்தமான விழிப்புணர்வுக் கருத்தரங்குகளை மேற்கொள்ள நடவடிக்கை எடுக்கவேண்டுமென்றும் கேட்டுக் கொள்கிறேன். முன்னைய அரசாங்கம் இதனை முன்னெடுப்பதற்குத் தடைவிதித்திருந்தமை, அதற்கு ஆர்வம் காட்டாமல் இருந்தமை ஏனென்று எனக்கே புரியவில்லை. அந்தவகையில் அது மிகவும் வேதனைக்குரியதென்று கூறி, இச்சந்தர்ப்பத்தினை வழங்கியமைக்கு நன்றி தெரிவித்து, விடைபெறுகின்றேன்.

[අ.භා. 5.25]

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනතාව හංසයාට කතිරයක් ගහලා ආණ්ඩු පක්ෂය හැටියට පත් කර ගත් අයට දින සියයේ වැඩ පිළිවෙළ සාර්ථක කර ගැනීම සඳහා අපිත් එකතු වෙලා ලොකු වගකීමක් භාර දුන්නා. නමුත් අද මේ පනත් කෙටුම්පත ගෙනා ගරු ඇමතිතුමාත් මේ ගරු සභාව තුළ නැහැ, ගරු අගමැතිතුමාත් නැහැ, ගරු සභානායකතුමාත් නැහැ, මැති ඇමතිවරුනුත් නැහැ. ඒ ගැන මම බොහොම කනගාටු වෙනවා. එම නිසා ජනතාව දුන් වගකීම දින සියයෙන් නොවෙයි, දින දාහකින්වත් ඉටු කරන ඕනෑකමක්, වගකීමක් තිබෙනවාය කියා මා හිතන්නේ නැහැ.

ගරු ඇමතිතුමාට මා කියන්නට කැමැතියි, මේ දිනවල සෞඛ්‍ය අමාත්‍යාංශයට අභියෝගයක් තිබෙන බව. මැලේරියා රෝගයට සමාන රෝගයක් පැතිරී යන බව කියනවා. විවිධ විද්‍යුත් නාලිකා තුළින් ඒ බව විකාශය කරනවා මට ඇහුණා. අපි මැලේරියා රෝගය මේ රටෙන් තුරන් කරලා අවුරුදු තුනක් වෙනවා. මේ අලුත් මැලේරියා රෝගය කායිලන්තය, ඉන්දියාව හා තවත් රටවල් කිහිපයක පැතිර ගිහින් තිබෙනවා. මේ රෝගයට තිබෙන බෙහෙත ඔරොත්තු දෙන්නේ නැති බව කියනවා. එවැනි අභියෝගයක් තිබෙන මොහොතකදීයි මම මේ කාරණය ගරු සෞඛ්‍ය අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරන්නේ. මැලේරියා රෝගය මර්දනය කිරීමේ අභියෝගයෙන් අපි ජය ගත්තාට මේ අලුත් මැලේරියා රෝගය, මේ වසංගතය අපේ රටටත් එන්නට පුළුවන්. ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා මේ ගරු සභාවේ නැති නිසා එතුමාගේ හිස් පුටුවට මම මේ කාරණය කියනවා. එසේ නැත්නම් මේ සභා ගර්භයේ නිලධාරි කුටියේ සිටින මහත්වරුන්ට මම කියනවා, ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා මේ ගැන දැනුවත් කරන්නය කියා. රටට අභියෝගයක් වශයෙන් තිබෙන මේ කාරණය පිළිබඳව මහජන නියෝජිතයකු හැටියට මා මතක් කරන අවස්ථාවේ ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා සභාව තුළ නොමැති වීම ගැන මම බොහොම කනගාටු වෙනවා. ජනවාරි 8 වන දා ජනතාව කතිරයක් ගහලා මේ වගකීම භාර දීම ගැන මා කියන්නේ එපමණයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා, එදා සෞඛ්‍ය අමාත්‍යතුමා හැටියට සිටි කාලයේ මතින් තොර රටක් බිහි කිරීම අරමුණු කර ගෙන ප්‍රකාශයට පත් කළ පොත් පිංවේ, "නූතන මානව ශිෂ්ටාචාරයේ වෙසෙන අපි ලබා ඇති ජයග්‍රහණ බොහෝය. විවිධ ජයග්‍රහණයන් නිතිපතා මානව සංහතියට එක් වෙමින් පවතී. එසේ වුවද, මිනිසාගේ පරාජය සහ විනාශය ඉක්මන් කරන දෑ මිනිසා විසින්ම නිර්මාණය කර තිබීමද අතිශය කනගාටුදායකය. මත් උවදුරද එවන් භයංකර නිර්මාණයක් වශයෙන් සමස්ත ලෝකයම අද වනවිට පිළිගෙන ඇත" යනුවෙන් සඳහන් වනවා. ඒ අදහස ඉතාම වැදගත්. ඒ වාගේම එම පොතේ, "මෙම වැඩසටහන 'මතින් තොර රටක් බිහි කිරීමේ ජාතික වැඩසටහන 2014' ලෙස නම් කර ඇත. මෙම ජාතික වැඩසටහනට අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා දෙන මග පෙන්වීම සහ නායකත්වය මම ඉතාම අගය කරමි" යනුවෙනුත් සඳහන් වනවා. ගරු ඇමතිතුමා මෙම විවාදය ආරම්භයේදී විවිධ දේවල් කිව්වා.

සියයට අසූවක pictorial warnings සහිත සිගරට් පැකට් එක සමාජයට ගේන්න කටයුතු කරද්දී එදා සෞඛ්‍ය ඇමති ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත් එක්ක නියෝජ්‍ය ඇමතිවරයා හැටියට මමත් අභියාචනාධිකරණයේ බංකුවේ වාඩි වෙලා සිටි අතීතය මට මතකයි. එම නිසා මා මේ අවස්ථාවේදී බොහොම සතුටු වෙනවා. කෙසේ වෙතත් ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා, මේ දුම් කොළ උවදුරෙන් ජනතාව බේරා ගැනීමේ අභියෝගය භාර ගෙන කටයුතු කළ නිසා ලෝක සෞඛ්‍ය සංවිධානයට අයත් රටවල් 194 අතරින් 2013 ලෝක දුම් වැටි විරෝධි දිනයේ ජගත් විශිෂ්ටතා සම්මානය එතුමාට පිරිනැමුණා. ආදර්ශවත් සක්‍රිය නායකත්වයත්, දුම් කොළ ආශ්‍රිතව හට ගන්නා බෝ නොවෙන රෝග මර්දනය සඳහා කැප වී කටයුතු කිරීමත්, දුම් කොළ පාලන පනත සඳහා වූ සංශෝධන සහ දුම් වැටි ඇසුරුම්වල රූපමය අවවාද ඇතුළත් කිරීමට නීති රෙගුලාසි සකස් කිරීමත් ආදී කරුණු මීට හේතු පාදක වුණු බව කියනවා. සෞඛ්‍ය අමාත්‍යවරයා හැටියට ඒ වගකීම භාරගෙන ඒ විධියේ වැඩ කිරීම නිසා තමයි එතුමා අද ජනාධිපතිවරයා හැටියට පත් වෙලා තිබෙන්නේ. එම නිසා මම අලුත් සෞඛ්‍ය අමාත්‍යතුමාටත් කියනවා, ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ආදර්ශයට අරගෙන වගකීමෙන් කටයුතු කරන්නය කියා. විශේෂයෙන් අපි කරුණු කියන විටදීවත් මේ පාර්ලිමේන්තුව තුළ ආණ්ඩු පක්ෂයෙන් කවුරුවත් නැහැ. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සෞඛ්‍ය අමාත්‍යවරයාව සිටි කාලයේ කටයුතු කළ ආකාරය ආදර්ශයට ගත යුතුයි. එතුමා අගමැතිවරයකුත් නොවී අද ජනාධිපති ධුරයට පත් වීම අපි අගය කරනවා. එතුමා නිසා තමයි මේ දින සියයේ වැඩ පිළිවෙළට අත් උස්සලා සහාය දීමට අපි කටයුතු කරන්නේ. මේ පාර්ලිමේන්තුවේ වැඩි බලයක් තිබෙන්නේ අපිටයි. එකසිය හතළිහක් අද හතළිහ දිහා බලාගෙන ඉන්නවා. එකසිය හතළිහක බලයක් තියාගෙන කටයුතු කරන අපගේ ඒ විශ්වාසය ජනතාව වෙනුවෙන් තහවුරු කරන්නටය කියා ඔය ඉදිරි පෙළේ හිස්ව තිබෙන ආසනවල වාඩි ගන්නා කොටසට මම කියනවා.

මේ පනත් කෙටුම්පත ඉතාම කාලෝචිත පනත් කෙටුම්පතක්. මේ කරුණුවලට ඇහුම්කන් දෙන්න, මේවා සටහන් කර ගන්න, මේවාට උත්තර දෙන්න ඇමතිතුමා දැන් මේ ගරු සභාවේ නැහැ. හැන්සාඩ් වාර්තාවෙන් තමයි ඇමතිතුමාට මේ අපි කියන දේවල් බලා ගන්න වෙන්නේ.

ඇත්ත වශයෙන්ම ප්‍රචාරය මඟින් නව පරපුරත් දුම් පානයට යොමු කර ගන්නවා. ඒක නැති කරන එක තමයි මේ පනත් කෙටුම්පතේ වැදගත්කම. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සියයට 80 දක්වා රූපමය අවවාද ඇති කිරීම නිසා තවත් කොටසක් දුම් පානයට ඇබ්බැහි වීම වළක්වා ගන්න අපට පුළුවන්කම ලැබෙනවා. ඒක නිසා මෙය ඉතාම වැදගත්. උසාවිය අභියෝග කරන්නේ නැතිව ඒ පනතට මේ සංශෝධනය ගෙන එන්න පුළුවන්කම ලැබීම ගැන අපි සන්තෝෂ වෙනවා.

සිගරට් සහ මද්‍යසාර බදු ලෙස රජය ජාතික ආදායමෙන් සියයට 12ක් ලබා ගන්නවා. නමුත් රජය සෞඛ්‍ය අමාත්‍යාංශයට වෙන් කරන මුදල් ප්‍රතිපාදනවලින් සියයට 22ක් සිගරට් සහ මද්‍යසාර නිසා මිනිස් සිරුරේ ඇති වන්නා වූ හානිවලට ප්‍රතිකාර කිරීම සඳහා වැය කරනවා. කෙනෙක් කියනවා නම් සිගරට්වලට බදු අය කරන එක හොඳයි කියලා, ඒ බද්දෙන් වැඩක් නැහැ. මම නියෝජ්‍ය ඇමතිවරයා හැටියට ඉන්න කාලයේ මට මතකයි, අපේ රජයෙන් රුපියල් බිලියන 187ක් විතර සෞඛ්‍ය අමාත්‍යාංශයට වෙන් කළා කියලා. එයින් සියයට 22ක් වෙන් වන්නේ මේ සිගරට් සහ මද්‍යසාර නිසා ඇති වන රෝගවලට ප්‍රතිකාර කරන්නයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දුම් වැටි නිසා ඇති වන හානිකරභාවය බලන්න. දුම් වැටියක දිග සෙන්ටි මීටර් කිහිපයක් වුණාට, එය ඉතා කුඩා දෙයක් වුණාට මේ තුළ මිනිස් සිරුරට අහිතකර විෂ රසායන ද්‍රව්‍ය 4000ක් පමණ අඩංගු වෙලා තිබෙනවා. ඒ නිසා හිටපු සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යවරයා හැටියට මම සමාජයට කියන්න කැමැතියි, පෞරුෂය රැක ගන්න, අභිමානවත් බව පෙන්වන්න ඔබ උරන මේ සෙන්ටි මීටර් කිහිපයක් දිග දුම් වැටිය තුළ ඔබේ ශරීරයට අහිතකර විෂ රසායන ද්‍රව්‍ය 4000ක් තිබෙන බව. දුම් පානය වස බොනවා හා සමානයි. මෙහි පිළිකා ඇති කරන රසායන ද්‍රව්‍ය 43ක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඔබතුමා හොරෙන්වත් දුම්

බොන්නේ නැති බව මම දන්නවා. ඒක වැදගත්. මොකද, දුම් වැටියක් පාවිච්චි කරනවා නම් විස රසායනික ද්‍රව්‍ය 4000ක් ශරීරය තුළට යනවා. ඒ වාගේම පිළිකා ඇති කරන රසායන ද්‍රව්‍ය 43ක් ශරීරය තුළට යනවා. මේ සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය හොඳින් කරුණු පෙන්වා දී තිබෙනවා. අපේ අතිගරු ජනාධිපතිතුමා සෞඛ්‍ය ඇමතිවරයා හැටියට ඉන්න කාලයේ මේ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කරන්න සෞඛ්‍ය අමාත්‍යාංශය "මතින් තොර රටක්" කියන ප්‍රචාරක දැන්වීමක් ගැහුවා. මිනිස්සු මරණයට පත් කරන රෝග, විදුරුමස් රෝග, ඇසේ සුද, ආසාතය, කන් ඇසීම දුර්වල වීම, මුඛ පිළිකා, ස්වරාල පිළිකා, පියයුරු පිළිකා, වඳ භාවය, මුත්‍රාශ පිළිකා, ආමාශයේ තුවාල, නිදන් ගත ස්වසන රෝග, රුධිර සංසරණය අඩු වීම, අක්මා රෝග වැනි රෝග විශාල සංඛ්‍යාවක් මේ පෞරුෂය පෙන්වන්න තත්පර කිහිපයක් තුළ උරන සිගරට් එක තුළ තිබෙනවා. ඒ නිසා ඒක ඉතාම නරක දෙයක්. දුම් පානය වැළැක්වීම සඳහා වත්මන් ජනාධිපතිතුමා එදා උසාවියට ගිහිල්ලා කළ කටයුත්ත ඉදිරියට ගෙන යමින් ගරු සෞඛ්‍ය ඇමතිතුමා මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගැනීමට කටයුතු කිරීම අපි අගය කරනවා.

මේ සම්බන්ධයෙන් යම් යම් අය විවිධ මත ඉදිරිපත් කරන්න පුළුවන්. "මේ පැකට් එක විසි කරනවා, සිගරට් එකයි ගන්නේ, ඒ නිසා මේ තුළින් ප්‍රයෝජනයක් ඇති වන්නේ නැහැ"යි කියන්න පුළුවන්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ දැනුවත් කිරීම හේතුවෙන් ස්වීඩනයේ ජනතාවගේ දුම් වැටි භාවිතය සියයට 5 දක්වා අඩු වෙලා තිබෙනවා. ස්වීඩනය කියන්නේ දියුණු රටක්. එහෙම නම් මේ ප්‍රචාරණ කටයුත්ත ඉතාම වැදගත් වෙනවා. ඒ තුළින් සමාජයේ දුම් වැටි පානය අඩු කරන්නට, ඒ සඳහා අලුතින් යොමු වන කොටස අඩු කරන්නට පුළුවන් වෙනවා. ලෝකයේ මරණවලින් සියයට 63ක් සිදු වන්නේ බෝ නොවන රෝගවලිනුයි. ඒ බෝ නොවන රෝග වැලඳීමේ වැඩි ප්‍රවණතාවක් මේ දුම් පානය තුළ තිබෙනවා. දුම් පානය අඩු කර ගත්තොත් පිළිකා වැනි රෝග අඩු වීමෙන් සියයට 63ක් වන ඒ මරණ අනුපාතය අවම කර ගෙන අපේ ජීවන චක්‍රය දීර්ඝ කර ගන්න පුළුවන්කම ලැබෙනවා. ඒ නිසා මේක ඉතා වැදගත් වෙනවා.

තව එක දෙයක් කියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාත් මමත් නියෝජනය කළ එක්සත් ජනතා නිදහස් සන්ධාන රජයේ අපේ ගරු නිමල් සිරිපාල ද සිල්වා හිටපු ඇමතිතුමා තමයි 2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත ගෙනාවේ. මේ පනත ගෙන ඒම තුළ දුම් කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් හදා ගෙන තිබෙනවා.

ඒ වාගේම අපි දුම් කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියක් ඇති කර තිබෙනවා. ඒ අධිකාරියේ නිර්ණායක අනුව තමයි අද මේ සිගරට් හෝ වෙනත් දුම් කොළ නිෂ්පාදන අඩංගු සෑම පැකැට්ටුවක, ඇසුරුමක හෝ කාඩ්බෝඩ් පෙට්ටියක ම ඉදිරිපස සහ පිටුපස දෙපැත්තේ ම ඉහළ මතුපිට පෘෂ්ඨයේ සියයට 80ක ප්‍රදේශයක් ආවරණය වන පරිදි මුද්‍රිත දැන්වීම යොදන්න ඕනෑය කියා සංශෝධනයක් ගෙනෙන්නේ.

2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතේ 31.(1) උප වගන්තියේ තිබෙනවා, වයස අවුරුදු 21ට අඩු අය සිගරට් භාවිතය, නැත්නම් සිගරට් විකිණීමට, ප්‍රදර්ශනයට හෝ මොනවත් දේකට යොදා ගන්න බැහැ කියා. එම පනතේ 31. (2) උප වගන්තියේ තිබෙනවා, ඉහත 31 (1) වන උප වගන්තියේ සඳහන් විධිවිධාන උල්ලංඝනය කළොත් රුපියල් 4,000ක දඩයකට යටත් විය යුතු ය කියා.

මේ පනතේ 32 වගන්තියේ මේ සම්බන්ධයෙන් මහ ජනයාට ඇති ප්‍රවේශය පිළිබඳව සඳහන් වනවා. ඒ කියන්නේ අපට යම් කිසි යන්ත්‍රයකට කාසි ඇතුළු කර ලබා ගත හැකි සමහර බීම වර්ග තිබෙනවා. ඒ වාගේ මහ ජනයා ප්‍රවේශ වන තැන්වල දුම් කොළ නිෂ්පාදන හෝ මද්‍යසාර නිෂ්පාදන ප්‍රදර්ශනය කරන්න බැහැ. ඒ වාගේම එදා මේ පනත යටතේ දුම් කොළ මාධ්‍ය ප්‍රචාරණය අපි නවත්වා තිබෙනවා. ඒ දේවල් සඳහා අනුග්‍රහය දැක්වීම නැවැත්වීම තුළිනුත් අපි විශාල සමාජ මෙහෙවරක් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම අවසාන වශයෙන් කියන්නේ මේ කටයුත්ත අපි එක්සත් ජනතා නිදහස් සන්ධාන රජය යටතේ ආරම්භ කළ බවයි. අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා එදා සෞඛ්‍ය අමාත්‍යතුමා හැටියට මේ සම්බන්ධයෙන් ලොකු කැප කිරීමක් කළා. ඒ කැප කිරීමේ ප්‍රතිඵලය අද මේ පාර්ලිමේන්තුව තුළින් ජනතාවට ලැබීම ගැන අපි සතුටු වනවා. ඒ පිළිබඳව එතුමාට අපි ස්තුතිවන්ත වනවා. අපි අත උස්සා ඡන්දය දීපු එකේ ප්‍රතිලාභ ඒ අනුව ලැබෙනවා.

මම නැවත වතාවක් මතක් කරන්නේ ඒ ප්‍රතිඵලය ජනතාව අතරට යවන්න පුළුවන් වන්නේ මේ ගරු ඇමතිතුමන්ලා, මන්ත්‍රීතුමන්ලා මේ ගරු සභාවේ රැඳී සිට අපි කියන අදහස්වලට ඇහුම් කන් දුන්නොත් පමණයි කියන කාරණයයි. ආණ්ඩු පාර්ශ්වයේ ඉදිරි පෙළේ එක අසුනකවත් කවුරුත් නැහැ. ඒ සම්බන්ධයෙන් අපි කනගාටු වනවා. එහෙම නම්, ජනවාරි අටවැනි දා ජනතාව ලබා දුන් විශ්වාසය නැවත වතාවක් දින සියයේ වැඩ පිළිවෙළින් ක්‍රියාත්මක කරන්නේ කොහොමද කියන එක ගැන මතක් කරමින් මම නිහඬ වනවා. ස්තුතියි.

[පි.ප. 5.37]

ගරු පෙරුමාල් රාජදුරයි මහතා
(மாண்புமிகு பெருமாள் ராஜதுரை)
(The Hon. Perumal Rajathurai)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, புகையிலை மற்றும் மதுசாரம் மீதான தேசிய அதிகாரசபை (திருத்தம்) சட்டமூல விவாதத்திலே உரையாற்றுவதற்குச் சந்தர்ப்பமளித்ததற்காக உங்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். குறிப்பாக, ஒவ்வொரு சிகரெட் பெட்டியின் அட்டையிலும் 80 சதவீதத்துக்கு எச்சரிக்கைப் படங்கள் இருத்தல் வேண்டும்; அது உடல்நல ஆபத்துக்களையும் தீங்குகளையும் விதந்துரைக்கக்கூடியவாறு சுட்டிக் காட்டப்படுதல் வேண்டும்; அந்த எச்சரிக்கைப் படங்கள் 6 மாதங்களுக்கு ஒருமுறை மாற்றியமைக்கப்படுதல் வேண்டும்; இதற்கான அதிகாரசபையின் இறுவட்டுக்களின் படங்களைப் பயன்படுத்த வேண்டும் போன்ற அடிப்படையான அம்சங்களுடன் இந்தத் திருத்தச் சட்டமூலம் இன்று சபையிலே விவாதத்துக்கு எடுத்துக்கொள்ளப்பட்டிருக்கின்றது.

புகையிலை உற்பத்திகள் பொதுவாக மனித உடலுக்குக் கேடு விளைவிக்கின்றன என்பது தெரிந்ததுதான். மனித உயிருக்குப் பேராபத்தை ஏற்படுத்தும் பொருட்களில் மிகவும் கொடியதாக சிகரெட் அல்லது போதைப்பொருட்களை நாங்கள் அடையாளம் காண்கின்றோம். ஒவ்வொரு வருடமும் உலகளாவிய ரீதியிலே 6 மில்லியன் பேர் புகையிலைப் பாவனைமூலம் ஏற்படும் நோயினால் மரணத்தைத் தழுவுகின்றனர்; மேலும் புகைபிடிப்பவர்களின் அருகில் நிற்பதால் ஏற்படும் பாதிப்பினாலும் ஏறத்தாழ 6,00,000 பேருக்கு மரணம் ஏற்படுகின்றது. இலங்கையிலே சராசரியாக நாளொன்றுக்கு 57 பேர் இதனால் பாதிக்கப்பட்டு இறக்கின்றார்கள். வருடமொன்றுக்கு ஏறத்தாழ 20,000 பேர் புகையிலை பாவனையினால் உயிரிழக்கின்றார்கள் என்பது தகவலாகும். இலங்கையிலே ஒரு நாளைக்கு சிகரெட்டுக்காக 208 மில்லியன் ரூபாய் பொதுமக்களால் செலவழிக்கப்

[ගරු පෙරුමාල් රාජදුරයි මහතා]

படுகின்றது. கடந்த 2011ஆம் ஆண்டு இலங்கைப் புகையிலைக் கம்பனியின் நிகர வருமானம் 761 கோடியைத் தாண்டி நிற்கின்றது.

நாங்கள் பெருந்தோட்டப் பகுதியைப் பிரதிநிதித்துவப் படுத்தும் பாராளுமன்ற உறுப்பினர்கள் என்ற வகையிலே, அங்குள்ள பிரதேசங்களின் புவியியல் காலநிலைத் தன்மையும் இந்தப் போதைப்பொருட்களைப் பாவிப்பதில் இளைஞர் களிடம் தாக்கத்தைச் செலுத்துகின்றது என்பதை அறிவோம். இந்த நிலையிலே, கடந்த மாதம் தலவாக்கலையில் மரணித்த இளைஞன் 'பாபுல்' விற்பனையாளர் என்றும் அவரிடம் கஞ்சா இருந்ததாகவும் கூறி, பொலிஸார் துரத்தியதன் பயனாக அவர் கொத்மலை ஓயாவில் பாய்ந்து தன்னுயிரை மாய்த்துக் கொண்டதை நாங்கள் ஊடகங்கள் வாயிலாக அறிந்தோம். அதனை யாரும் மறந்துவிட முடியாது. புகையிலை மற்றும் மதுசாரம் தொடர்பான இந்தத் திருத்தச் சட்டமூலமானது பெரும்பாலும் பெருந்தோட்ட மக்களால் வரவேற்கப்படக்கூடிய தொன்று. பொதுவாக இந்தச் சட்டமூலத்தைக் கடந்த காலங்களிலேயே அமுல்படுத்தியிருந்தால் நூற்றுக்கணக்கான இளைஞர்களைக் காப்பாற்றியிருக்கலாம்.

பெரும்பாலும் தெரிந்தும் தெரியாமலும் இளைஞர் களிடையே காணப்படுகின்ற இத்தகைய புகையிலை மற்றும் மதுசாரக் கலாசாரம் அரசியல்வாதிகளாலும் ஊக்குவிக்கப் படுகின்றது என்பதுதான் உண்மை. தேர்தல் காலங்களில் மக்களின் வாக்குகளைக் கபடத்தனமாக ஏமாற்றி வாங்குவதற் காக பிரதேச சபை உறுப்பினர் முதற்கொண்டு மாகாண சபை உறுப்பினர் வரையும் ஏன், பாராளுமன்ற உறுப்பினர்கள்கூட, நேரடியாகவும் மறைமுகமாகவும் மதுபானங்களை விநியோகித்து வருகின்றார்கள்.

பெரும்பாலும் மலையகப் பகுதிகளிலே ஹற்றன், பொகவந்தலாவ, தலவாக்கலை, நுவரெலியா, கொட்டகலை போன்ற பகுதிகளில் மதுபானக் கடைகளின் எண்ணிக்கை யானது மிகவும் அதிகம். உதாரணமாக பொகவந்தலாவ நகரை எடுத்துக்கொண்டால், அங்கு வாகனங்களுக்கு எரிபொருள் நிரப்புவதற்கு ஓர் எரிபொருள் நிரப்பும் நிலையத்தைக்கூட எம்மால் காணமுடியாது. ஆனால், மனித உயிர்களைக் கொல்லும் பல மதுபானக் கடைகளை அந்த நகரிலே நாங்கள் காண்கின்றோம். கடந்த மாதங்களில் ஹற்றனிலுள்ள 'செனன்' தோட்டத்தில் மதுபானக் கடை யொன்றை மூடுமாறு கோரி அங்குள்ள பெண் தொழிலாளர் களால் ஒரு பாரிய ஆர்ப்பாட்டமொன்று முன்னெடுக்கப் பட்டது. இவ்வாறான ஆர்ப்பாட்டங்கள் சமூக ஆர்வலர்களால், பாதிக்கப்பட்ட பெண்களால், இளைஞர்களால், பாடசாலை மாணவர்களால், அவ்வப்போது முன்னெடுக்கப்பட்டு வந்தாலும்கூட அம்மதுபானக் கடைகளின் எண்ணிக்கையைக் குறைக்க முடியாதிருப்பது துரதிருஷ்டமே.

தொற்றா நோய்கள் எனக்கூறப்படுகின்ற - non-communicable diseases - உடல்நிறை அதிகரித்தல், இரத்த அழுத்தம், புற்றுநோய், நுரையீரற்புண் போன்ற பல நோய்கள் புகையிலை மற்றும் மதுசாரப் பழக்கவழக்கங்களால் ஏற்படுகின்றன என்று சுகாதார அறிக்கைகள் கூறுகின்றன. நுவரெலியா மாவட்டத்தைப் பொறுத்தவரையில் கிராமப் புறங்களையும் நகரப்புறங்களையும்விட, தோட்டப் புறங்களிலேயே புகையிலை மற்றும் மதுபானப் பாவனை அதிகமாகக் காணப்படுகின்றது. பொலிஸ் பிரிவுகளில் தாக்கல் செய்யப்படுகின்ற வழக்குகள் பெரும்பாலும் மதுபானப் பாவனை மற்றும் விற்பனை தொடர்பானவைகளாகவே இருக்கின்றன. பெருந்தோட்ட மக்களின் நாளாந்த வாழ்க்கை யில் பல பிரச்சினைகளுக்கு அடிப்படைக் காரணமாகவும் இம்மதுபான மற்றும் புகையிலைப் பாவனை காணப்படுகின்றது.

சில சமுதாய விஷமிகள் பாடசாலை மாணவர்களையும் இவ்வாறான கெட்ட செயல்களுக்குப் பயிற்றுவிப்பது கண்டிக்கப்படக்கூடியதொன்றாகும். குறிப்பாக இலங்கை யிலே பல இலட்சக்கணக்கான தொழிலாளர் படையொன்று மாதாந்தச் சம்பளமின்றி நாட்சம்பளத்திற்குத் தொழில் புரிவதால், இத்தோட்ட மக்களின் செலவினத்தைக் குறைப் பதற்கு இச்சட்டமூலம் ஒரு சிறந்த யுக்தியாக நோக்கப்படும் என்பதில் எவ்வித ஐயமும் இல்லை எனலாம். நகர்ப்புறங்களிலே இளைஞர்கள் மற்றும் பெண்கள் புகையிலை மற்றும் பான்பராக் போன்ற பல போதை தரக்கூடிய பொருட்களை விற்பனை செய்வதைத் தடுக்க வேண்டும். சிறுகைத்தொழில் மற்றும் தொழில்முயற்சிகள் தொடர்பான அமைச்சுக்களின்மூலம் நல்லமுறையில் சமூகத்திற்குப் பயன்தரக்கூடிய கௌரவமான தொழில்களை இளைஞர்கள் செய்வதற்கு ஊக்குவிக்கவேண்டும் என்பது எனது எதிர்பார்ப்பாகும்.

எமது நாடு இலவச சுகாதாரத்தினைச் சிறப்பாக அமுல்படுத்துவதற்கு இம்மதுபாவனை, புகையிலைப் பாவனை போன்றவை முட்டுக்கட்டையாக உள்ளன. காரணம் மதுபாவனையினால் பாதிக்கப்படுகின்றவர்களுக்குச் சிகிச்சைக்காக ஆண்டுதோறும் பல மில்லியன் ரூபாயை இலங்கை அரசாங்கம் செலவு செய்கின்றது. அத்துடன் குறிப்பாக நுகர்வோர்களால் இவற்றின் பாவனைக்காகச் செலவழிக்கப்படும் தொகை நாளொன்றுக்கு 208 மில்லியன் ரூபாய் என இலங்கைப் புகையிலைக் கம்பனியின் அறிக்கை கூறுகின்றது. எனவே, அபிவிருத்தியடைந்து வரும் எமது நாடு இத்தகைய ஒரு பாரிய தொகையை இதற்காகச் செலவிட்டால் சிறந்த அபிவிருத்தியைப் பெறமுடியாது என்பது நாம் அறிந்ததே. புத்தபிரானின் பௌத்த தர்மத்தின்படி பஞ்ச மாபாதகங்களுள் அடங்குகின்ற கள்ளுண்ணல், சூது போன்றவை தீய பழக்கங்கள். அவை மக்களால் விலக்கப்பட வேண்டியவை என்று கூறப்பட்டுள்ளது. அரச சார்பற்ற நிறுவனங்களும் தமது செயற்றிட்டங்களில் சுகாதாரத் திற்காகவும் புகையிலை மற்றும் மதுபான பாவனையை மக்களிடமிருந்து அகற்றி அவர்களது வாழ்வாதாரத்தை அதிகரிக்கவும் பல மில்லியன்களை ஒதுக்குகின்றன. இந்து சமுத்திரத்தின் முத்து என்று வர்ணிக்கப்படும் நாடு எமது இலங்கை. ஆனால் இன்று போதைப்பொருள் கைமாற்றப்படும் முக்கிய இடமாக இது மாறியுள்ளமை எமக்கு வெட்கத்தைத் தரக்கூடியது. இதுவா ஆசியாவின் ஆச்சரியம்? என மக்கள் கேள்வி கேட்கின்றார்கள்.

மக்களின் உயிர்களைப் பறிக்கும் இந்தப் போதைவஸ்து களைப் பிரபல அரசியல்வாதிகள் மற்றும் அவர்களது ஆதரவாளர்கள் பயமின்றித் தொடர்ந்து விற்பனை செய்து வருகின்றனர். எனவே, இதனை அரசாங்கம் எவ்வித பாகுபாடுமின்றி நிறுத்த வேண்டும்.

போதைப்பொருள்கள் கடத்தல் தொழிலில் முக்கிய பெரும்புள்ளிகளுக்கு தொடர்பு இருப்பதனால், அவற்றை முன்வந்து தடுப்பதற்கு மக்கள் மத்தியிலே பயவுணர்வு காணப்படுகின்றது. இந்த நிலை கொழும்பில் மட்டுமல்ல, பெருந்தோட்டப் பகுதிகளிலும் காணப்படுகின்றது. அங்கு குறிப்பிட்ட அரசியல்வாதிகளால் போதைப்பொருள் வியா

பாரங்களுக்கு இளைஞர்கள் பயன்படுத்தப்படுவது வேதனைக் குரிய விடயமாகும். அரசியல் செய்வதற்காக மக்களின் நன்மதிப்பைச் சம்பாதிக்கத் திரைமறைவிலே இதற்கு உடந்தையாகச் செயற்படுபவர்களால் போதைப்பொருள் பாவனை விஸ்தரிக்கப்படுகின்றது. மலையகப் பகுதிகளிலும் கள்ளச் சாராயம் மற்றும் போதைப் பொருட்களைத் தடுப்பதற்கான நடவடிக்கைகளை அரசாங்கம் பொலிஸாரின் உதவியுடன் முன்னெடுக்க வேண்டும். அதேநேரம் நீதித்துறைச் சுதந்திரத்தை உறுதிப்படுத்த வேண்டும். கடந்த காலங்களிலே போதைப் பொருள் வர்த்தகர்களால் பொலிஸார் மற்றும் அரசியல்வாதிகளுக்கு நேரடியாகவும் மறைமுகமாகவும் வெகுமதிகளும் கப்பங்களும் வழங்கப்பட்டன. மக்களை வழிநடத்தும் அரசியல்வாதிகளே நாட்டை ஏமாற்றுபவர்களாக இருக்கும்போது, மக்களை யார் காப்பாற்றுவது?

மலையகப் பிரதேசங்களிலே மதுபானக் கடைகளால் பெருமளவான தேர்தல் பிரசாரங்கள் வாராந்த இறுதி நாட்களில் முன்னெடுக்கப்படுகின்றன. அவர்கள் மக்களைக் குடிபோதைக்கு அடிமையாக்கி, அரசியல் விழிப்புணர்வுகளைச் சிதைத்து அரசியல்வாதிகளின் இருப்பைத் தக்கவைத்துக் கொள்ள முனைகின்றனர். பணம் இருந்தால் அரசியல் செய்யலாம் என்ற போக்குக் காரணமாக மதுபானக் கலாசாரம் மலையக மக்களைக் கட்டிப்போடுகின்றது. எனவே, இந்தச் சட்டமூலத்தினால் மலையகப் பெருந்தோட்ட மக்களின் அரசியல் வளர்ச்சியிலும் சிந்தனையிலும் குடிகொண்டிருக் கின்ற போதைப் பொருள் அரசியல் கலாசாரம் நீங்க வேண்டும் என்பதே எனது இலக்கு.

கடந்த காலங்களில் இலங்கையில் நூற்றுக்கணக்கான கிலோ ஹெரோயின் மற்றும் கஞ்சா போன்றவை சுங்க மற்றும் பொலிஸ் அதிகாரிகளினால் கைப்பற்றப்பட்டன. எனினும், கடந்த ஆட்சியிலே அவற்றுக்கான விசாரணைகள் மந்தகதியிலேயே முன்னெடுக்கப்பட்டன. சந்தேக நபர்கள் பொலிஸாரால் கைதுசெய்யப்படுவதும் பின்பு பிணையில் விடுதலை செய்யப்படுவதும் வழமையாக இருந்தது. ஆனால், கைப்பற்றப்பட்ட போதைப்பொருட்களுக்கு என்ன நடந்தது? அவை எங்கே? என்றெல்லாம் கேள்விகள் எழுகின்றன. அவை பல மில்லியன் ரூபாய் என மதிப்பிடப்பட்டுள்ளன. அதற்கு யார் பொறுப்புக் கூறுவது? கொழும்பைத் தளமாகக் கொண்டு இயங்கும் சில அரசியல்வாதிகளால் போதைப்பொருட்கள் கைமாற்றப்படுகின்றன என்று ஊடகங்கள் மற்றும் பொலிஸா ருக்குப் பலமுறை தகவல்கள் கிடைத்தும் அது தொடர்பான விடயங்களிலே கடந்த அரசாங்கம் என்ன நடவடிக்கையை மேற்கொண்டது என்பது புரியாத புதிராகவே இருக்கின்றது. எனவே, அது தொடர்பான விசாரணைகளை அரசு துரிதப்படுத்த வேண்டும். அதில் அரசியல் தலையீடு இல்லாமல் இருப்பது சிறந்ததாகும்.

மத்திய வருமானமுடைய நாடுகளின் வரிசையிலே இலங்கை பயணிக்கும்பொழுது போதைப்பொருள் மற்றும் புகையிலை மதுபானக் கலாசாரங்கள் தொடர்பான விடயங்களால் அதன் பெயருக்குக் களங்கம் வரலாம். ஆனால், இவ்வாறான சட்டமூலங்கள் ஊடாக நாம் சர்வதேச சமவாயங்களின் ஒப்பந்தங்களை மதிப்பதன்மூலம், அவற்றை ஏற்று அமுல்படுத்துகின்ற ஒரு நல்ல நாடு என்று பார்க்கப்படுகின்ற ஒரு நிலையை உருவாக்க வேண்டும். புகையிலை மற்றும் மதுசாரம் மீதான தேசிய அதிகாரசபைத் திருத்தச் சட்டமூலத்தினால் குறிப்பாக மக்களின் வீணான செலவினத்தைத் தடுக்கலாம்; அபாய எச்சரிக்கைகள் மற்றும் கட்டுப்பாடுகள் போன்றவற்றால் மக்கள் சற்று விழிப்புணர்வடைவார்கள்; ஏழை மக்கள் மதுப் பாவனையைக் குறைத்துக்கொள்ள நடவடிக்கை எடுக்க முடியும்; குறிப்பாக பெருந்தோட்டப் பெண்கள் மற்றும் கிராமப்புறப் பெண்களால் இச்சட்டமூலம் வெகுவாக வரவேற்கப்படும்; உலக நாடுகளின் வரிசையிலே இலங்கையின் சுகாதாரம் மேன்மையடையும்; வீணான மரணங்களைத் தடுக்கலாம்; இளைஞர்கள் கெட்ட பழக்கங்களுக்குத் துணைபோவதைத் தடுக்கலாம்; மதுப் பாவனை குறையுமானால் மதுபான நிலையங்களின் எண்ணிக்கையும் குறையக்கூடிய வாய்ப்பு இருக்கின்றது. அத்துடன், மதுபானங்களை நம்பி அரசியல் நடத்துகின்ற அல்லது பிழைப்பு நடத்துகின்ற கூட்டம் குறையும். இந்தத் திருத்தச் சட்டமூலத்தினால் வீட்டு வன்முறைகள் - domestic violence குறையக்கூடிய சந்தர்ப்பங்கள் இருக்கின்றன. மேலும், மதுவுக்காகச் செலவிடுகின்ற தொகையைப் பிள்ளைகளின் கல்விக்காகச் செலவிடக்கூடியதாக இருக்கும்; இளைஞர் களைச் சிறப்பாக ஒழுங்குபடுத்தலாம்; இறுதியிலே ஓர் ஆரோக்கியமான மனித வளத்தைக்கொண்ட சமுதாயத்தைக் கட்டியெழுப்பலாம் என்று கூறி, இந்த விவாதத்திலே எனக்கும் கருத்துக்களைக் கூறச் சந்தர்ப்பமளித்த உங்களுக்கு மீண்டும் நன்றி தெரிவித்து, விடைபெறுகின்றேன். நன்றி, வணக்கம்

[අ.භා. 5.47]

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින ඉදිරිපත් කර තිබෙන මෙම පනත් කෙටුම්පත ගැන කථා කරන්න ලැබීම ගැන මා සන්තෝෂ වනවා. මොකද, ජනාධිපතිවරණයේදී මේ කාරණයත් මාතෘකාවක් විධියට උපයෝගී කර ගෙන තමයි වත්මන් අතිගරු ජනාධිපතිතුමා වේදිකාවල කථා කළේ. වෛද්‍යවරයකු වුණු ගරු රාජිත සේනාරත්න මහත්මයා ඒ සම්බන්ධයෙන් ප්‍රමුඛත්වයක් ගෙන ක්‍රියා කිරීම ගැන මා ස්තුතිවන්ත වෙනවා.

ඇත්තටම නීරෝගී ජන සමාජයක් උදෙසා මෙය කාලීන සංශෝධනයක් විධියටයි අප දකින්නේ. ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් මේ වෙලාවේ එළියට ගිහිල්ලා වෙන්න ඇති. කවුරුවත්ම මේ වෙලාවේ මේ ගරු සභාවේ නැහැ.

කෙසේ වෙතත්, රූපමය අවවාදවලින් විතරක් මේ කාර්යය කරන්න පුළුවන්ද කියන එක තමයි මට තිබෙන ප්‍රශ්නය. මේ දුම් වැටි තහනම රූපමය අවවාදවලින් පමණක් කරන්න පුළුවන් ද කියන එක ගැන ප්‍රශ්නයක් තිබෙනවා. භාවිතය අඩු කරන්න දැනුවත් කරන්න පුළුවන්. නමුත් එතැනින් පමණක් මේ දේ නතර කරන්න පුළුවන්ද කියන එක ගැන ප්‍රශ්නයක් තිබෙනවා. මේක සමාජ විද්‍යාත්මක ප්‍රශ්නයක්. පළමුවෙන්ම බලන්න ඕනෑ දුම් බොන්නේ කවර පුද්ගලයින් ද කියන එක. ඒක තමයි මූලික දේ. දෙවනුව පාරිභෝගික ප්‍රමාණය අඩු කර ගන්න ඕනෑ. ඒක විශේෂයෙන්ම කර ගන්න ඕනෑ. මනෝ විද්‍යාඥයකු කිව්ව කථාවක් මට මේ වෙලාවේ මතක් වෙනවා. මා සමාජ සේවා ඇමතිවරයා වශයෙන් සිටියදී, එතුමා මට ඒ ගැන පැහැදිලි කරලා දුන්නා. මවු කිරි නොබී හැදෙන දරුවන් දුම් පානය සඳහා පෙළැඹීමක් වන බව මනෝ විද්‍යාඥයින්ගේ මතයක්. ළදරුවකුගේ ජීවය ප්‍රධානම වශයෙන් තෘප්තිමත් වන්නේ මවු කිරි බීමෙන් සහ අපද්‍රව්‍ය බැහැර කිරීමෙන්. ඒ කියන්නේ, මල මුත්‍ර බැහැර කිරීමෙන්. මවගෙන් කිරි උරා බීමට අවකාශය නොලැබෙන දරුවන් කුඩා කල නොලබන එම තෘප්තිය තරුණ වියේදී දුම් පානය මඟින් සපුරා ගන්නා බව ඒ අය උපකල්පනය කර තිබෙනවා. ඒ පිළිබඳව ලොකු විස්තරයක් මට කිව්වා. මට ලැබී තිබෙන්නේ සීමිත කාලයක් නිසා වැඩි විස්තර ප්‍රකාශ කරන්න බැහැ. නමුත් මේ කාරණය ගැන බලන්න ඕනෑ.

[ගරු ෆිලික්ස් පෙරේරා මහතා]

සමහර මවුවරු සිරුරේ හැඩය වෙනස් වේවි කියන භය නිසා මවු කිරි දෙන්නේ නැහැ. නිසි පෝෂණයක් නැතිකමිනුත් මවු කිරි දෙන්නේ නැහැ. මවු කිරි දීම හිතා මතාත් ප්‍රතික්ෂේප කරනවා. වෙලාව නැතිකම, රැකියාවට යාම වැනි කරුණුත් එක්තරා හේතු බවට පරිවර්තනය වෙලා තිබෙනවා. නමුත් අපි අහලා තිබෙනවා, දරුවකු බිහි වුණාම පළමුවෙන්ම හොඳට මවු කිරි දුන්නොත් කොලස්ට්‍රම් කියන ද්‍රව්‍යය හොඳට ලැබෙන නිසා ඒ ළමයාට ඕනෑම රෝගයකට ඔරොත්තු දීමේ හැකියාව තිබෙනවා කියන එක. මා හිතන විධියට මේ ස්ථානයේ අමාත්‍යාංශයේ නිලධාරින් ඇති. පරීක්ෂා කර බලන්න. එහෙම තමයි කියලා තිබෙන්නේ. ජීවිතය පුරාවටම ලෙඩ රෝගවලට එරෙහිව සටන් කිරීම සඳහා ප්‍රතිශක්තීකරණයක් ඒ තුළ තිබෙනවා.

අනෙක තමයි ආතතිය. අපි දැකලා තිබෙනවා බොහෝ දෙනකු ආතතියක් ඇති වුණාම -ඒක සමාජ විද්‍යාත්මක ප්‍රශ්නයක්- සිගරට් එකක් බීලා කල්පනා කරනවා. දුම් වැටිය උරලා දුම ඇරලා තමයි මනසින් බොහෝ දේවල් කල්පනා කරන්න පෙළැඹෙන්නේ. මෙවැනි කරුණු කාරණා ගොඩක් තිබෙනවා. ඒ නිසා උපදේශනයත් අවශ්‍යයි. පුංචි කාලයේ ඉඳලාම මේක අවශ්‍යයි.

මම අද එද්දී හිස් සිගරට් පැකට් එකක් අරගෙන ආවා. මේ සිගරට් පැකට් එකේ රූපමය අවවාදය ඇතුළත් කර තිබෙන්නේ පැකට් එකේ පියනටත් -කැඩෙන කොටසටත්- එක්කයි. මෙම පැකට්ටුවේ පහළට වෙන්න හොඳට ඉඩ තිබෙනවා. මේ ඉඩ පාවිච්චි කරන්න පුළුවන්. නැත්නම් මේක ප්‍රායෝගික වෙන්නේ නැහැ. මේ සිගරට් බීම එක පැත්තක්. මේකෙදී තවත් ප්‍රශ්නයක් තිබෙනවා. මා අතේ මේ තිබෙන්නේ ගෝල්ඩ්ලීෆ් කියන සිගරට් පැකට් එක. තව ගෝල්ඩ් සීල් කියන filter එක ගෙනෙනවා. මීගමුවේ හැම තැනම තිබෙනවා. දැන් අපි සිගරට් ගන්න ගියාම පැකට් පිටින් ගන්නේ නැහැ නේ. පැකට් එක කඩලා තුනක්, හතරක් ඉල්ලනවා. සිගරට් එකක් රුපියල් 30ක් වෙනවා. සමහර වෙලාවට රුපියල් 150ක් දීලා පහක් ගන්නවා. එතකොට කොහොමද මේ රූපමය අවවාදය ඒ පුද්ගලයාට දෙන්නේ. එතකොට සිගරට් එක කටේ, පෙට්ටිය කඩේ. ඔක තමයි ඇත්ත තත්ත්වය.

ඊළඟට, ගෝල්ඩ් සීල් කියන සිගරට් එක ගෙනැල්ලා මේ පැකට්වලටත් පුරවලා විකුණන ක්‍රමයක් තිබෙනවා. ඒකෙන් මොකක්ද වෙන්නේ? ඒකෙන් වෙන්නේ එක පැත්තකින් බදු ආදායම සම්පූර්ණයෙන් නැතිව යන එකයි. වැරදි වැඩකුත් වෙනවා. විශාල ලාභයක් ඒ අය ගන්නවා. ඒ නිසා මේ ක්‍රමය සම්පූර්ණයෙන්ම වෙනස් කරන්න ඕනෑ. අධික නීති-රීති ගෙනැල්ලා හොරෙන් සිගරට් ගෙන්වන අයටත් දඬුවමක් දෙන්න කියලා මා කියනවා. ඔක තමයි මගේ එක යෝජනාවක් වන්නේ.

ඊළඟට, දුම් පානයේදී අපි ආශ්වාස කරන, ඇතුළට ඇද ගන්නා දුමත් සමඟ නිකොටින්, තාර වැනි අහිතකර දේත් ශ්වසන පද්ධතියට ඇතුළු වෙනවා. උදාහරණයක් වශයෙන් මේක අවම කරන්න තමයි filter එකක් දාලා තිබෙන්නේ. නමුත් බීඩිවල filters තිබෙනවා ද? සුරුට්ටුවල තිබෙනවා ද? අද මිනිස්සු බීඩි මිටියක් ගන්නේ. සුරුට්ටු වෙනම ගන්නවා. සිගරට්වලට වාගේ රසකාරක නොදැම්මත් ඒවා ගැනත් කල්පනා කරන්න ඕනෑ. අද දුම් පානය වැඩි වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, නීති විරෝධී අරක්කු ගැන බලනවා වාගේ මේවා ගැනත් කල්පනා කරලා බලන්න ඕනෑ. මේ පනත් කෙටුම්පත ඉතා හොඳ එකක්.

ඔක්සිජන් අඩු වීම නිසා තමයි ඉන්ද්‍රියයන්ගේ ක්‍රියාකාරිත්වය අඩු වෙන්නේ. ශරීරයේ අභ්‍යන්තර ඉන්ද්‍රියයන්වල තාර කොටස් තැන්පත් වුණාම පිළිකා හැදෙනවා.

දුම් කොළ නිෂ්පාදනවලින් 2007 දී ලැබුණු ආදායම රුපියල් මිලියන 31,437යි. 2008 දී රුපියල් මිලියන 37,288යි. 2009 දී රුපියල් මිලියන 37,601යි. 2010 දී රුපියල් මිලියන 40,675යි. 2011 දී රුපියල් මිලියන 49,000යි. 2012 දී ආදායම රුපියල් මිලියන 58,653ක් වෙලා තිබෙනවා. එහෙම බලනකොට ආදායම වැඩි වෙලා තිබෙනවා. හැබැයි, බොන දුම් වැටි ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. ආදායම වැඩි වෙලා, බොන දුම් වැටි ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, 2007 දී තිබුණු දුම් වැටි ප්‍රමාණය මිලියන 4,670යි. 2013 වෙද්දී ඒ ප්‍රමාණය මිලියන 4,035ට බැහැලා තිබෙනවා. නමුත් ආදායම වැඩි වෙලා තිබෙනවා.

දුම් වැටියක් බොන තැනක හිටියාම ඒ දුම අනික් අයටත් ආශ්වාස ප්‍රශ්වාස කරන්න වෙනවා. විශේෂයෙන්ම, තාත්තා කෙනෙක් දරුවන් ඉන්න තැන සිගරට් බිව්වාම, ඒ දරුවන්ටත් මේ දුම් ඉබේම ශරීරගත වෙනවා. ඒ නිසා මේවා නැති කරන්න පුළුවන්ද කියන එකත් කල්පනා කරන්න ඕනෑ. සමහර රටවල කුඩු බොන එක නවත්වන්න ගංජා බොන්න ඉඩ දීලා තිබෙනවා. වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාගෙන් ඇහුවොත් ඒ කොහේද කියලා කියයි. එතුමාත් ඒ ගැන මට ප්‍රකාශ කළා. ඇත්තටම ඇමෙරිකාවේ ප්‍රාන්ත දෙකක ඒ විධියට ඉඩ දීලා තිබෙනවා. ඔලන්දයේ ඉඩ දීලා තිබෙනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඔබතුමාගේ මතය මොකක්ද?

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මගේ මතය නොවෙයි, මම මේ කියන්නේ මේ සමාජයේ හැටි. සමාජ විෂමතාව ගැනයි මම කියන්නේ. නීතිඥවරයකු වශයෙන් ඔබතුමා මතක තියා ගන්න සමාජ විෂමතාවක් තිබෙනවාය කියන එක. සුද්දෝ මේ රටට එන්නේ මොකටද? මත්පැන් නැත්නම් සුද්දො එනවාද? සිගරට් එකක් බොන්න බැරි නම් සුද්දෙක් එනවාද? සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න කියලා අපි කියනවා. එත් ඒ වාගේ ප්‍රශ්නත් තිබෙනවා.

ඊළඟට, මත්පැන් ගැන කථා කරනකොට, රුසියාවේ කවුද වොඩ්කා බොන්නේ නැත්තේ? හැම කෙනෙක්ම බොනවා. ඒකයි ඇත්ත. බියර් බිව්වාම මොකද වෙන්නේ? විශේෂයෙන්ම, බියර්වල ප්‍රෝටීන් තිබෙනවා. බියර්වල අඩු මත්ද්‍රව්‍ය ප්‍රමාණයක් තිබෙන නිසා හුඟක් දෙනෙක් බොනවා. නමුත් ප්‍රෝටීන් වැඩි වුණාම ඒක වකුගඩු රෝගවලට මුල් වෙනවා. සෞඛ්‍ය ඇමතිතුමාට මම කියන්නම්. අනුරාධපුරයේ විතරක් වකුගඩු රෝගීන් 27,000ක් ඉන්නවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා වෛද්‍යවරයෙක්. ඒ අය මරණය පෙනී පෙනී ඉන්නවා. බියර් බීලා නොවෙයි ඒ. වතුරවලින් ඒ වාගේම වගාවට දමන පොහොර ප්‍රමාණය වැඩිවීමෙන් තමයි ඒක වෙන්නේ. සෞඛ්‍ය ඇමතිතුමා වශයෙන් ඔබතුමා ඒ හැම පැත්තම බලලා හොඳ පියවරක් ගන්න. කිසි දවසක අපි ඒවාට විරුද්ධ වෙන්නේ නැහැ. අපි ඒවාට ප්‍රශංසා කරනවා. ඒ සඳහා අලුත් ක්‍රමවේද තිබෙනවා.

වකුගඩු රෝගය නිසා වසරකට 40,000කට අධික ප්‍රමාණයක් මිය යෑමේ අවදානමක් තිබෙනවා. අනුරාධපුරයේ, "වකුගඩු රෝඩ්" කියලා පැත්තක් තිබෙනවා. ඒ පැත්තේ ඉන්න අය මරණය පෙනී පෙනී තමයි ජීවත් වෙන්නේ.

අනික් අතට දුම් බීම නිසා හෘදය රෝග අවදානමත් වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම දුම් කොළ මුඛ පිළිකාවලටත් මුල් වෙලා තිබෙනවා. පිළිකා රෝගීන් අතරින් සියයට 13.3ක් මුඛ පිළිකා රෝගීන්. හුණු එක්ක බුලත් විට කෑවාම ඒකෙනුත් මුඛ පිළිකා

හැදෙනවා නේ. පිළිකා හැදෙන්න දුම් බොන්නම ඕනෑ නැහැ. මේවාත් ප්‍රශ්න. සාක්ෂරතාව සියයට 97ක් විතර වෙන අපේ රටේ මේ ප්‍රශ්නවලින් මිදෙන්න කරන්න තිබෙන හොඳම දේ තමයි පාසල්වලදී දරුවන් දැනුවත් කරන උපදේශනය ලබා දෙන එක. ගරු ඇමතිතුමනි, ඒ උපදේශනය ලබා දෙන්න නම් ඔබතුමාට පුළුවන් සමාජ සේවා අමාත්‍යාංශයත් එක්ක එකතු වෙලා වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න. දැනුවත් කිරීමෙන් තමයි මේ දුම් පානය අඩු කරන්න පුළුවන්. ඒ මිස, තහනමෙන් විතරක් ඒක කරන්න බැහැ. සිගරට් පැකට් එකේ මේ රූප මුද්‍රණය කිරීමෙන් විතරක් ඒක කරන්න බැහැ.

"ගෝල්ඩ් ලීෆ්" වාගේම "ගෝල්ඩ් සීල්" කියලා සිගරට් වර්ගයකුත් තිබෙනවා. "ගෝල්ඩ් සීල්" මීගමුවේ පිරිලා; බේරුවලත් තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා නියෝජනය කරන ප්‍රදේශයේත් තිබෙනවා. ඒවා මේ පැකට්වල දමලා තමයි විකුණන්නේ. එහෙම වුණාම ඒ හොරකම කරන්න ඒ ගොල්ලන්ට නීතියෙන් ලැබෙන ආවරණයක් ලැබෙනවා. මේවා ගැන බලන්නේ කොහොමද? ගරු ඇමතිතුමනි, ඔබතුමාට විතරක් මේ කටයුත්ත කරන්න බැහැ. සමාජයේ අනික් කොටසුත් එකතු කර ගෙන හොඳ ක්‍රියා මාර්ගයක් ගන්න, අපි ඒ ගැන ස්තුතිවන්ත වෙනවාය කියන එකත් ප්‍රකාශ කරන්න ඕනෑ.

දැනට වයස අවුරුදු 15 - 24 අතර සිටින අයගේ ප්‍රමාණය සියයට 26යි. වයස අවුරුදු 25- 39 අතර අයගේ ප්‍රමාණය සියයට 35යි. වයස අවුරුදු 40ට වැඩි අයගේ ප්‍රමාණය සියයට 36.7යි. ඒ සියයට 36.7න් වැඩි පිරිසක් -සියයට 42.9ක්- ඉන්නේ යාපනයේ. ඇයි යාපනයේ මිනිස්සු බීච්චේ? ඒ කාලයේ යුද්ධය තිබුණා. ඒ නිසා මිනිසුන්ට ප්‍රශ්න තිබුණා. මිනිස්සු බීඩි බොනවා, සිගරට් බොනවා. මිනිස්සු ඒ තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ ආතතිය නිසා. ඒක වෙනස් කරන්න කටයුතු කරන්න කියලා මා ඉල්ලනවා.

පුද්ගලයන්ගෙන් සියයට 70ක් දිනපතා දුම් කොළ ආශ්‍රිත නිෂ්පාදන භාවිතයට ගන්නා බව සමීක්ෂණයක් කළොත් අපට පෙනෙනවා.

විශේෂයෙන්ම හොර අරක්කු ගැනත් කියන්න ඕනෑ. සීනි මිල අඩු කළාම දැන් මොනවාද වෙලා තිබෙන්නේ? සීනි මිල අඩු කළාම එක පැත්තකින් මිනිස්සු කසිප්පු පෙරන්න පටන් අරගෙන. ඒවා තහනම් කරන්න; ඒවා අල්ලන්න. දැන් මම නියෝජනය කරන ආසනය කසිප්පු ස්කාගාරයක් වෙලා. ඒ වාගේම අල්ලපු ආසනයත් කසිප්පු ස්කාගාරයක් වෙලා. දැන් හැම තැනම කසිප්පු. ඔන්න අද තත්ත්වය. මේ නිසා මොකක්ද වෙන්නේ?

දැන් සාමාන්‍ය අරක්කුවල මද්‍යසාරය තිබෙන්නේ සියයට 33යි. ඉතිරි ටික වතුර. ඊතේන්, මීතේන් කියලා මද්‍යසාර වර්ග දෙකක් තිබෙනවා. හරියට ප්‍රමිතියට පෙරුවේ නැත්නම් මීතේන් ප්‍රමාණය වැඩි වනවා. මීතේන් කියන්නේ වස. ඊතේන් කියන්නේ බොන්න පුළුවන් - potable - දේ. මේවා අරගෙන යන්නේ මොකේද? නීත්‍යානුකූලව මේ ව්‍යාපාරවල යෙදෙන මිනිස්සු අරක්කු ටික, බියර් ටික ලොරියෙන් අරගෙන යද්දී හොර අරක්කු අරගෙන යන්නේ BMW එකේයි, Benz එකේයි. ඇයි ඒ? පොලීසිය රවටන්න. හොර අරක්කු ටික ගෙන යන්නේ BMW එකේයි, Benz එකේයි. නීත්‍යානුකූල අරක්කු ටික අරගෙ යන්නේ ලොරියේ. මේවා ඔක්කෝම සමාජ ප්‍රශ්න. මේ සමාජ ප්‍රශ්න අපට එක දවසින් විසඳන්න බැහැ. මේ සමාජ ප්‍රශ්න පිළිබඳව කතිකාවතක් ඇති කරලා, පාසලේ සිට උපදේශනය පටන් අරගෙන කටයුතු කළොත් අපේ පරමාර්ථ ඉෂ්ට කර ගන්න පුළුවන්.

අද මිය යන සංඛ්‍යාවෙන් වැඩි සංඛ්‍යාවක් මිය යන්නේ බෝ නොවන රෝගවලින්. නමුත්, අපේ සෞඛ්‍යය ක්ෂේත්‍රය පිළිබඳව අපි අද සන්තෝෂ වන්න ඕනෑ. මේ ආණ්ඩුවට පමණක් නොවෙයි, ගිය ආණ්ඩුවටත් අපි ඒ පිළිබඳව ස්තුතිවන්ත වන්න ඕනෑ.

අද ජීවිත අපේක්ෂාව වැඩි වෙලා තිබෙනවා. පිරිමි පාර්ශ්වයේ ජීවිත අපේක්ෂාව සියයට 72කින් සහ කාන්තා පාර්ශ්වයේ ජීවිත අපේක්ෂාව සියයට 76කින් පමණ වැඩි වෙලා තිබෙනවා. මම සමාජ සේවා අමාත්‍ය ධුරයේ කටයුතු කරන කාලයේ ඒ ගැන තක්සේරුවක් කරලා බැලුවා. එහෙම වෙලා තිබෙන්නේ අපි සෞඛ්‍යයට ලබා දෙන ප්‍රතිපාදන සහ නොමිලේ කරන සේවාව නිසායි. එම නිසා ඒ අමාත්‍යාංශයට තවත් ප්‍රතිපාදන වැඩි කරන්න ඕනෑ. අපි බෙහෙත්වලට ප්‍රතිපාදන වෙන් කරනවාට වඩා සෞඛ්‍ය ක්ෂේත්‍රයට ප්‍රතිපාදන වෙන් කළොත්, දැනුවත් කිරීම්වලට ප්‍රතිපාදන වෙන් කළොත් වඩාත් ප්‍රයෝජනවත් වෙනවා.

දැන් බලන්න, වී නිෂ්පාදනයේදී කරන දේ. අපි ගොයම්වලට දමන පොහොර ප්‍රමාණය බලන්න. වී නිෂ්පාදනයේදී ආසියාවේ අපි තමයි වැඩියෙන්ම පොහොර දමන්නේ. මේකට හේතුව මොකක්ද? ඒ පොහොරවලින් ගොයම් ගහට අල්ලන ප්‍රමාණයක් තිබෙනවා. භූගත වෙන ප්‍රමාණයකුත් තිබෙනවා. ඒ වැඩි ප්‍රමාණය පරිභෝජනය වුණාම තමයි අපේ ජීවිත අකාලයේ ලෙඩ රෝගවලට පාත්‍ර වෙන්නේ. අද වන විට chemicals ගහන්නේ නැති හාල්වලට ලොකු ඉල්ලුමක් තිබෙනවා. උදාහරණයක් වශයෙන් කිව්වොත් අද කළු හීනටි, කුරුළු තුඩ හා මඩ තාවුළු කියන හාල් වර්ග තුනට ලොකු ඉල්ලුමක් තිබෙනවා. ඒ හාල්වල මිල රුපියල් 200යි, 250යි. විදයම් කරන්න පුළුවන් මිනිස්සු ඒ හාල් ගන්නවා. ජපානයේ sashimi මාළු wasabi sauce එක්ක කන්නේ - අමු මාළු කනවා වාගේ - රුපියල් 8,000ක්, 10,000ක් දීලා. ඒ වාගේ තමයි, සල්ලි තිබෙන මිනිහාගේ ජීවිතය හොඳයි. දුප්පතා තමයි මිලෙන් අඩු ඒවා ගන්නේ. වැඩියෙන්ම සිගරට් බොන්නේත් අඩු ආදායම් ලබන මිනිස්සු කියන එක අපි කියන්න ඕනෑ. මේ වාගේ කරුණු කාරණා රැසක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟට අපි තමුන්නාන්සේලාට කියන්න ඕනෑ, මේ රටේ ජනතාව අද බොහෝ දේවල් පාවිච්චි කරනවා කියන එකත්. විශේෂයෙන්ම කොකාකෝලා. දැන් බලන්න, පුංචි ළමයෙකුගේ දතක් කොකාකෝලා වීදුරුවකට දැම්මාම පසු දා උදේ වෙන කොට දත දිය වෙලා. සාමාන්‍යයෙන් වතුර ගෙන යන ජල නළයක් හදිසියේවත් block වුණොත් ලොකු කොකාකෝලා බෝතලයක් හොඳට සොලවලා ඒ නළයට දැම්මාම ශුද්ධ වෙලා යනවා. ඒ තරම් power එකක් තිබෙනවා. නමුත් ඒ කොකාකෝලා තහනම් කරලා නැහැ නේ. සමහර රටවල කොකාකෝලාත් තහනම් කරලා තිබෙනවා. මේවා ගැනත් බලන්න. සෞඛ්‍ය හොඳට හදා ගන්න ඕනෑ නම්, මේ ප්‍රායෝගික ප්‍රශ්න දිහාත් බලන්න. වෙස් වලා ගත්ත advertisementsවලින් මිනිසුන් රවටාගන්න දෙන්න හොඳ නැහැ කියන එක තමයි මගේ මතය. තවත් බොහෝ දේවල් කියන්න තිබෙනවා.

ඊළඟට, විශේෂයෙන්ම මේ කසිප්පු ජාවාරම ගැන නම් බලන්න ඕනෑ. කුඩු ජාවාරම ගැනත් කියන්න ඕනෑ. සිගරට් එකක් බීලා, අඩියක් ගහලා ඉන්න එක වෙනම එකක්. නමුත් කුඩුකාරයා මොකක්ද කරන්නේ? කුඩු ටික ඊයම් කොළයක ඔතලා lighter එකක් අරගෙන යාන්තම් heat කරලා, ඒ එන දුම අදිනවා. ඒ දුම ඇද්දාට පස්සේ තේරෙන්නේ නැහැ. ළමයෙක් කුඩු ගැහුවොත් නිදා ගන්නවා. එතකොට අම්මා හිතන්නේ ළමයා නිදි කියලා. නමුත් ටික කාලයකින් ගෙදර බඩු හොරකම් කරන කොට තමයි තේරෙන්නේ ළමයා කුඩුකාරයෙක් කියලා.

මම සමාජ සේවා ඇමති වශයෙන් කටයුතු කරන කාලයේදී අපි එක දෙයක් ග්‍රහණය කර ගත්තා. සමහර පාසල්වල cigarette lighters toilet එකේ වැටිලා තිබුණා. ඒ පාසල් මොනවාද කියලා මම කියන්න කැමැති නැහැ. Cigarette lighters මොකටද toilet එකට ගෙන යන්නේ? මේක තමයි ඇත්ත. සමහර සංගීත සංදර්ශන අවසන් වෙලා පසු දා උදයේ භූමිය ශුද්ධ පවිත්‍ර කරන කොට lighters දහයක්, පහළොවක්, විස්සක් තිබෙනවා. ඒ

[ගරු ෆිලික්ස් පෙරේරා මහතා]

අමතකවීමක් නොවෙයි. Lighters වලින් කුඩු රත් කරලා දුම් ඇද්දාට පස්සේ lighter එක බිම වැටිලා. ඔන්න යථාර්ථය. මේවා ගැනත් කල්පනා කරන්න කියලා මම ගරු රාජිත සේනාරත්න ඇමතිතුමාට කියනවා. මේ හැම ප්‍රශ්නයක් ගැනම බලන්න. විශේෂයෙන්ම මේ කුඩු උවදුර නැති කරන්න ඕනෑ. කුඩු උවදුර නැති කරන්න සමහර රටවල් කරලා තිබෙන්නේ ගංජාවලට පොඩි ඉඩක් දීලා තිබෙන එකයි. ගරු තිස්ස කරල්ලියද්ද මැතිතුමාත් ඒ දවස්වල දේශීය වෛද්‍ය ඇමතිවරයා වශයෙන් කටයුතු කළ කාලයේ ඒ ගැන කථා කරලා තිබෙනවා. සමහර රටවල ගංජාවලට පොඩි ඉඩක් දීලා තිබෙනවා. මම කියන්නේ නැහැ, ඉඩක් දෙන්න කියලා. නමුත් මේක තමයි තත්ත්වය.

ඊළඟට, පිට රටින් එන විස්කි බොන මිනිස්සු අසනීප වෙනවා අඩුයි. අනිත් ඒවා බොන මිනිස්සු අසනීප වෙනවා වැඩියි. මේකට හේතුවක් තිබෙනවා. හේතුව තමයි, ඒවා වැරදි විධියට පෙරීමේදී නිපදවෙන මීතේන් ප්‍රමාණයේ වැඩිවීම. මෙන්න මේවා ගැනත් කල්පනා කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

දැන් මගේ කථාව අවසන් කරන්න වෙනවා. මොකද, බොහෝ වේලාවක් ගත වුණා. උත්සවයකටත් මම වෙලාව දා ගෙන තිබෙනවා.

මම කියන්නේ, මේ (සංශෝධන) පනත් කෙටුම්පත හොඳයි: මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම ගැන අපි සතුටු වනවා; ඒ ගැන ප්‍රශංසා කරනවා. තමුන්නාන්සේලා මේ කාරණය පාවිච්චි කළා, පසු ගිය ජනාධිපතිවරණයේ දී. ඒ ගැන ජනතාව අවධානයෙන් හිටියා. නමුත් පනතක් වශයෙන් ප්‍රමුඛත්වය දීලා දින සියයේ වැඩ පිළිවෙළේ පළමුවෙන්ම මේ කාර්ය කිරීම ගැනත් මගේ ප්‍රශංසාව පිරිනමමින්, මේ සංශෝධනවලට අපේ එකඟතාව ලබා දෙන බව ප්‍රකාශ කරනවා.

සිගරට් පැකට් එකේ අවවාද සඳහන් කිරීම පමණක් නොවෙයි, මේ ගැන ඊටත් වඩා ටිකක් ගැඹුරින් විද්‍යාත්මක පැත්තෙනුත් කල්පනා කරන්න කියලාත් ඉල්ලා සිටිනවා.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (ආහාර සුරක්ෂිතතාව අමාත්‍යතුමා)
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - உணவுப் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. Gamini Jayawickrama Perera - Minister of Food Security)

සිගරට් පැකට් එක ඇතුළට "අලි ඩොං" කෑල්ලක් දැම්මා නම් හරි.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
"අලි ජෝන්" ද කියන්නේ?

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අලි ඩොං.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

හක්කපටස් දැම්මා නම් ඊට වඩා හොඳයි. ඕනෑ නම් හක්කපටස් කෑල්ලකුත් දාන්න. අලියා ආබාධිත වෙන්නේ, හක්කපටස් වැදිලා නේ. සිගරට් පැකට් එකේ ගහලා තිබෙනවා, "ජෝන් ප්ලේයර්" කියලා. ඒ කියන්නේ, අපේ ජෝන් මහත්තයාවත් හැම සිගරට් පැකට් එකෙන්ම මතක් කර තිබෙනවා.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ මිත්‍රයා හීනෙනුත් කියනවා ලු, "ජෝන්, ජෝන්" කියලා. ඇඳට ගිහින් නෝනාටත් කියනවා ලු, "ජෝන්, ජෝන්" කියලා.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
නැහැ, නැහැ.

[අ.භා. 6.05]

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
එහෙම නම් "ජෝන් ප්ලේයර්" කිය කියා ඉන්නේ මොකද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ඉදිරිපත් කළ මේ ඉතාම අර්ථවත් පනත් කෙටුම්පත ගැන ෆිලික්ස් පෙරේරා මහතා හදවතින්ම, අවංකවම කථා කළා. ඒ ගැන මා සතුටු වනවා. මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කිසිම වාද විවාදයක් නැතුව ඔබතුමන්ලා මෙයට සහාය දෙන බවත් අපි දන්නවා.

එදා තමුන්නාන්සේලා මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළ අවස්ථාවේ -අපි විපක්ෂය පැත්තේ ඉඳලාත්- අපි සියලු දෙනාම එක්කාසු වුණා. ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සෞඛ්‍ය ඇමති විධියට ඒ අවස්ථාවේදී සිටියේ දකුණු පැත්තේ පළමුවන ආසනයේ. ඒ පනත් කෙටුම්පත ගෙනා වෙලාවේ අපි සියල්ලෝම කිසිම වාද විවාදයක් නැතුව සිගරට් පැකට් එකේ රූපමය අවවාද ඇතුළත් කිරීමට 'දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත් කෙටුම්පත' ඒකච්ඡන්දයෙන් අනුමත කළා. එදා ඒකච්ඡන්දයෙන් අනුමත කළේ, සිගරට් හෝ වෙනත් දුම් කොළ නිෂ්පාදන අඩංගු සෑම පැකට්ටුවක, ඇසුරුමක හෝ කාඩ්බෝඩ් පෙට්ටියක සියයට 80කින් යුතු ප්‍රතිශතයක් ආවරණය වන පරිදි සෞඛ්‍ය අවවාදයක්ද සමඟ පැහැදිලිව මුද්‍රණය කර, ප්‍රකටව පෙනෙන ලෙස ප්‍රදර්ශනය කිරීමට ඉඩ සැලැස්වීමටයි. නමුත් අභිරහසක් ලෙස මොකක්ද ඒකට වුණේ? අප තුළ කුතූහලයක් ඇති කරමින් එක පාරටම තවත් සංශෝධනයක් ගෙනාවා, එම රූපමය ප්‍රතිශතය 65කට අඩු කරන්න කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමන්ලා කවුරුවත් සිහිනෙන්වත් හිතුවේ නැතුව ඇති, සෞඛ්‍ය ඇමතිතුමා ජනපති අපේක්ෂක විධියට එයි කියලා. එතුමා ගොවි පුත්‍රයෙක්. මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමා ගොවි ජනපද ඇති කරලා-

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! Hon. Deputy Speaker will now take the Chair.

අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* MR. DEPUTY SPEAKER *took the Chair.*

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමා, කථාව කරන්න.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට හිතෙන හැටියට ඔබතුමාට ඊයේ රෑ "වාද පිටිය"ට ගිහින් හුඟක් මහන්සි ඇති. මගේ නාලන්දේ මිත්‍රයා, අපි එකම කොම්පැනියේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම ඔබතුමන්ලා කවුරුවත් හිතුවේ නැහැ, ගොවි පුත්‍රයෙක් ජනාධිපති වෙයි කියලා. එදා ඩොනමෝර් ආණ්ඩු කාලයේ, මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමා ජනපද ඇති කරද්දී, අපේ අය කැලෑ එළි කරලා, වැව් රාජ්‍ය නැවත හදලා ඒ ජනපදවල ජනතාව ගිහින් පදිංචි කරද්දී ජෝෂ්ඨ වාමාංශිකයන් මොකක්ද, ප්‍රකාශ කළේ? "මොකටද සිංහල මිනිසුන් ගිහින් පදිංචි කරවන්නේ? සිංහල මිනිසුන් කාක්කෝ වාගේ ඉන්න මැලේරියා මදුරුවන්ට පූජා කරනවා; ඒ මිනිස්සු මැරෙනවා. ඒ පළාත්වල පදිංචියට කම්කරුවන් ලෙස දකුණු ඉන්දියාවෙන් දෙමළ අය ගෙනෙන්න" කිව්වා.

කෙනෙකු නායකයකු වශයෙන් පත් කරන්නට ඔහුට පැහැදිලි දර්ශනයක් තිබෙන්න ඕනෑ. තමාගේ රටේ හා ජාතියේ අනාගතය වෙනුවෙන් රට ගෙනි යන මාර්ගය ගැන දැක්මක් තිබෙන්න ඕනෑ. නායකයෙක් කියන්නේ, මොන බාධක ආවත්, නොසැලී හිමින් සීරුවේ යන ගමනක් ඇති කෙනෙක්. ඒක තමයි කෘතහස්ත නායකත්වය කියන්නේ.

එදා මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමා ඇති කළ ජනපදයක, දරුවෝ දොළොස් දෙනෙකු හිටපු ගොවි පවුලක එක ගොවි පුත්‍රයෙක් අපේ වත්මන් ජනාධිපතිතුමා. නියරවල් රැහැපු, හරකා බානගෙන් කුඹුර හාපු, ඒ ගොවි පුත්‍රයා අධිෂ්ඨානයෙන් ක්‍රියා කරලා, ග්‍රාම සේවකයකු ලෙසට සේවය කර තිබෙනවා. එතුමා පොළොන්නරුවේ Royal Central College එකටයි ගිහින් තිබෙන්නේ. එතුමා කළ කථාවකට මා සවන් දී ගෙන හිටියා. එතුමා ප්‍රකාශ කළා, "ග්‍රාම සේවකයකු ලෙස සිට මා එදා සේවයෙන් අස් වෙද්දි, අද වර්තමාන ආරක්ෂක ලේකම් එතකොට ඒ පළාතේ දිසාපති වශයෙන් සේවය කළා" කියලා. "ඇයි, ඔබ අද සේවයෙන් අස් වෙන්නේ?" කියලා එතුමාගෙන් දිසාපතිතුමා ඇහුවාලු. "මට රටට සේවයක් කරන්න පුළුවන්" කියලා මෙතුමා කිව්වාලු. "එතකොට ඔබට ජීවත් වෙන්න ආදායමක් නැහැ නේ" කියලා ඇහුවාලු. "ඔව්. මට ජීවත් වෙන්න ආදායමක් නැහැ තමයි" කියලා කිව්වාලු. එතුමා කිව්වාලු, "නැවත සලකා බලන්න" කියලා. ඒ කථාවට සවන් දී ගෙන හිටියා නම් ඒ ගොවි පුත්‍රයා අද මෙවැනි තත්ත්වයකට පත් වෙන්නේ නැහැ. අපි කවුරුත් අවංක වෙන්න ඕනෑ. මෙය වාද භේදයක් නොවෙයි. කියමනක් තිබෙනවා, "මඩ සෝදා ගත් කල ගොවියා රජකමටත් සුදුසුයි" කියලා. ඒ උත්තම ගොවි පුත්‍රයා තමයි, අද ජනාධිපති ධුරයට පත් වෙලා තිබෙන්නේ. එතුමා නිහතමානීව කිව්වා, "අවුරුදු 800කට පසුව, ඒ රජ යුගයෙන් පසුව, ජනතාව පොළොන්නරුවෙන් පත් කළ රාජ්‍ය නායකයා මමයි" කියලා.

එදා එතුමා අවංකවම මේ පනත් කෙටුම්පත ගෙනාවා. එයට අපි සියලු දෙනාම ඡන්දය දුන්නා. දෙවන වතාවේදී එම පනතට සංශෝධන ගෙන එද්දි එතුමාගේ මුහුණ ඇඹුල් වෙලා ගිය හැටි මම එදා දැක්කා. එතුමා බොහොම නිශ්ශබ්දව බිම බලා ගෙන ඉන්න හැටි මම දැක්කා. එදා ඇතිවුණු ඒ වේදනාව, ඔබතුමන්ලා අපි කවුරුවත් සිතුවේ නැති විධියට, මේ රටේ ජනතාවට වෙනසක් ඇති කිරීමට මේ රටේ ජනාධිපති බවට පත් වීමට මූලික වුණා. ඒ ආකාරයට ගොවි පුත්‍රයාට ජනාධිපති කෙනකු වන්න පුළුවන්නම් ඒ තමයි වාසනාවන්තකම.

මාගේ සහෝදර ගරු මැති ඇමතිතුමන්ලා හොඳට මෙය මතක තියා ගන්න. කැබිනට් මණ්ඩලයේ දී එතුමාගේ කටුක අත් දැකීම් ගැන එතුමා බොහොම වේදනාවෙන් කිව්වා. එතුමා කිව්වා " 'දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත' මේ ආකාරයෙන් මම ගෙනාවා. මම මේ පනත් කෙටුම්පත දෙවැනි වතාවේදී ගෙනාවාම අරලියගහ මන්දිරයේදී අපහාසාත්මක ලෙස බැණලා මට අපහාස කළා" කියලා. එතුමා කැබිනට් මණ්ඩලයේ දී බොහොම වේදනාත්මකව එය කිව්වා. අහිරහසක්ව පැවැති ඖෂධ පනත ගැනත් එතුමා බොහොම වේදනාත්මකව කිව්වා. එම නිසා දින සියයක් තුළ වෙනසක් ඇති කරනවා කියලා අපි ජනතාවට කිව්වා. මේ වෙනසක් කරනවා කියන තැන ඉඳන් තමයි මෙම ඓතිහාසික පනත -අද ජනාධිපති වෙලා ඉන්න එදා සෞඛ්‍ය ඇමති විධියට ඉදිරිපත් කළ පනත් කෙටුම්පත- අපි මේ ඉදිරිපත් කරන්නේ. අපි සියලු දෙනාගේම ආශීංසනය තුළින් නැවතත් සියයට 85ක රූපමය අවවාද ප්‍රදර්ශනය කිරීමට අවසර ලබා දීමට මේ පනත් කෙටුම්පත ඒකච් ඡන්දයෙන් අනුමත කරමු.

වාසුදේව නානායක්කාර මැතිතුමාටත්, ඔබතුමන්ලාටත් මතක ඇති, 1970-1977 යුගය. මම ඒ යුගය ටිකක් මතක් කරලා දෙන්නම්. ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය මම බොහොම ගරු කරන කෙනෙක්; ප්‍රතිපත්තියක් තිබෙන හොඳ කෙනෙක්. මම එතුමියට බොහොම ගරු කරනවා. මම ඒ කාලය දැක්කේ බොහොම කටුක කාලයක් විධියටයි. අඟහරුවාදා, සිකුරාදා බත් කෑම තහනම් කෙරුවා. තමුන්නාන්සේලා දන්නවා ඇති, හාල් සේරු දෙකක් පාරේ ගෙනියන්න දුන්නේ නැහැ. එලොව පෙනෙන රෙදි කෑල්ලක් ඇඳ ගෙන යන්න වෙලා තිබුණේ. භාණ්ඩාගාරයේ සල්ලි නැහැ, හිස්. භාණ්ඩාගාර නිලධාරින් Ceylon Tobacco Company එකට ගිහිල්ලා ඒ සමාගමෙන් සල්ලි අරගෙන ඇවිල්ලා එදා රට ගෙන ගියේ. එවැනි ඒකාධිකාරයක් තිබුණු මහා බලවත් විදේශ සමාගමක් තමයි ලංකාවේ තිබුණු Ceylon Tobacco Company එක.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ හස්තයෙන් කරකවලා අඹරලා දමපු අපේ ජනාධිපතිතුමා කැබිනට් මණ්ඩලයේ දී මුල් පුටුවේ සිට බිම බලාගෙන කථා කළ ඒ වේදනාව අපි දැක්කා. අපිත් වේදනාත්මකව එතුමාගේ ඒ කථාවට සවන් දී ගෙන සිටියා. එතුමා ඖෂධ පනත ගැනත් කිව්වා. අපි ගේනවා, ඖෂධ පනතත්. මේ රටේ අහිංසක ජනතාව සූරා කන්න දෙන්න බැහැ. මට කලින් කථා කරපු ජා-ඇල මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ රට සමාජයේ විනාශකාරී තත්ත්වයකට යන්නේ.

මම මේ කථාව කරන්න කලින් අද මට සිදු වුණා, මගේ ආසනයේ මා පටන් ගත් වික්‍රමශීලා මධ්‍ය මහා විද්‍යාලයේත්, 1987 පටන් ගත්ත පන්නල මධ්‍ය මහා විද්‍යාලයේත් උත්සව දෙකකට සහභාගි වෙන්න. එයට අධ්‍යාපන ඇමති අකිල විරාජ් කාරියවසම් මැතිතුමාත් ආවා. එම උත්සව දෙකටත් ගිහිල්ලා මම බොහොම වේගයෙන් ආවේ මේ ගැන කථා කරන්න අවසාන මොහොතේ දී හෝ මට අවස්ථාවක් ලැබේවි කියලා. මොකද, එම ආසනයට ගිහිල්ලා ඇවිල්ලා මට සතුටුයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි. රටකට හරියන්න නම් රටක සමාජයක තිබෙන බාහිර ආටෝපය අපි ඈත් කරන්න ඕනෑ. මේ රටේ සංස්කෘතියක් තිබෙනවා; අවුරුදු 5,000ක් පැරණි බෞද්ධ දර්ශනයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඡන්දයට ඉස්සෙල්ලා පැවති අවසාන පාර්ලිමේන්තු රැස්වීම් වාරයේදී ඔබතුමා නියෝජ්‍ය සභාපතිතුමා වශයෙන් කාරක සභා අවස්ථාවේ ඉන්න වෙලාවක මා කථා කළා ඔබතුමාට මතක ඇති. මම විපක්ෂයේ ඉදිරි පෙළ

[ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා]

ඉඳගෙන කථා කරන වෙලාවේ කිව්වා, "මේ ඡන්දය කියන්න එපා, තිබ්බොත් ජනාධිපතිතුමාට ඉතිහාසයේ වේදනීය තත්ත්වයකට පත් වෙනවා. එතුමාට කළු ලපයක් ඇති වෙනවා" කියලා. මම ඒක කිව්වේ නිකම් නොවෙයි. මගේ හිතට ආපු යම් ගුප්ත දෙයක් ඔබතුමාට ඒ විධියට කිව්වේ. ඔබතුමාට ඒක මතක ඇති. මම ඊයේ, පෙරේදා දවසකත් ඔබතුමාට ඒක මතක් කළා.

ඒ මොකද? මේ රටේ ජනතාව අමතක කරන්න හොඳ නැහැ. මේ රටේ ජනතාව උතුම් කියන එක අපි අමතක කරන්න හොඳ නැහැ. හොඳ මිත්‍රයෝ මෙතැන ඉන්නවා. මෙතැන අවංක අය ඉන්නවා. තමන්ගේ ජනතාව අමතක කරලා, ධන නිධානවලට මුල් තැනක් දීලා, තමන්ගේ පරම්පරාවට මුල් තැනක් දෙන්න යනවා නම්, අන්න විනාශය ආරම්භ වෙනවා. මම දැක්කා, සිද්ධ වුණ දේවල්.

මම මේ දේවල් කිව්වාට කමක් නැහැ. කැබිලිත්ත දේවාලය සම්බන්ධ සිද්ධියක් ගැන මම විපක්ෂය පැත්තේ ඉඳගෙන කථා කෙරුවා. කැබිලිත්තේ තිබෙන කතරගම දෙවියන්ගේ රූප ඔක්කෝම -එක එක්කෙනා පූජා කරපු ඒවා- වනජීවී නිලධාරින්ට කියලා පෝර බෑග්වලට දාලා වෙනත් තැනකට ගිහිල්ලා දැම්මා. ගරු සුමේධා ජයසේන මන්ත්‍රීතුමියනි, ඔබතුමියත් ඒ ගැන දන්නවා ඇති. මම මෙතැනදී හිටපු වනජීවී ඇමතිතුමාට කිව්වා, "ඔය ශාපය වදිනවා. ඇයි, මේ වාගේ මෝඩ වැඩ කෙරුවේ" කියලා. හිටපු වනජීවී ඇමතිතුමා කියනවා, "අනේ! මම නොවෙයි කළේ, මගේ නිලධාරින්" කියලා. මම කිව්වා, "නිලධාරින්ට දොස් කියන්න එපා" කියලා. බලන්න, අසුබ ලකුණුවල පෙරනිමිති. මාස දෙකයි ගත වුණේ.

කවුරුත් හිතා ගන්න ඕනෑ, බලය තාවකාලිකයි කියලා. අපිත් හිතා ගන්නම්. ඔබත් හිතා ගන්න ඕනෑ. ජනතාවයි මූලික වෙන්න ඕනෑ. තමන්ගේ ආගම අනුව ජීවත් වෙන්න ඕනෑ. මේ සමාජයේ මත් කුඩු තිබුණා. ඒවා හැම තැනම ව්‍යාප්ත වුණා. ඒවායින් සමාජය විනාශ වෙලා යනවා. මේ භේදකාරී තත්ත්වය වෙනස් කළේ නැත්නම් මේ සමාජය තිරිසන් සමාජයක් වේවි. අපට ඕනෑ එවැනි දෙයක් කරන්නද? අපි කථා කරන්න ඕනෑ වන්නේ, මේ වාගේ ලස්සන ගොඩනැඟිලි ගැනද? නැහැ. මනුෂ්‍යත්වය අගයන, මනුෂ්‍ය ධර්මය තුළ ජීවත් වන සමාජයක් අපි බිහි කරන්න ඕනෑ. මෙන්න මේකයි, මුල් සිද්ධාන්තය වෙන්න ඕනෑ. මෛත්‍රී යුගය කියන්නේ අන්න ඒකයි.

මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා බිම බලාගෙන වේදනාවෙන් අපට මෙහෙම කථාවක් කිව්වා. මම මේවා කියන්න ඕනෑ, මේ ගරු සභාවේ. ඒවා රහස් නොවෙයි. එතුමා මොකක්ද කිව්වේ? අවුරුදු 20ක් එතුමා ඇමති ධුර දැරුවාලු. කෘෂිකර්ම ඇමති විධියට හිටියාලු. වාරි මාර්ග ඇමති විධියට හිටියාලු. සෞඛ්‍ය ඇමති විධියට හිටියාලු. වී ගැන කථා කරද්දී එතුමා මොකක්ද කිව්වේ? කැබිනට් මණ්ඩලයට මම යෝජනාවක් ඉදිරිපත් කළා. අපි පොරොන්දුවක් වුණා, ගොවි ජනතාවට වී කිලෝවකට රුපියල් 50ක සහතික මිලක් දෙනවා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කරද්දී එතුමා මූලාසනයේ ඉඳගෙන මෙහෙම කියනවා. එතුමා කියනවා, "මම මෙච්චර කල් -අවුරුදු 20ක්- ඉවසීමෙන් කරන්න දෙයක් නැතුව බිම බලාගෙන හිටියා. වී ගැන කථා කරද්දී, හාල් ගැන කථා කරද්දී මම කවදාවත් කථා කරන්න ගියේ නැහැ. මේවා ගැන අද මම කථා කරනවා. මම අද රටේ ජනාධිපති. මේ රටේ ජනාධිපති විධියට, ඒ දේවල්වලදී මගේ ඥාතිකම්, සහෝදරකම් කිසි දෙයක් නැහැ. මම මේවා ඔක්කෝම ඈත් කෙරෙව්වා. පරිසරයටත් අත ගහන්න දෙන්නේ නැති වෙන්න මම ඒ අමාත්‍යාංශයත් මගේ යටතට ගත්තා." කියලා.

මේ රටට ඕනෑ, කථාවට විතරක් කියන, ක්‍රියාවෙන් නොකරන නායකත්වයන්ද? නැහැ. මේ රටට ඕනෑ, අර්ථයෙන්, ප්‍රතිපත්තියෙන් ක්‍රියාත්මක වෙන අවංක හදවතක් තිබෙන නායකයන්. එවැනි සමාජ රටාවකට අපි ඔක්කෝම එක්කාසු වෙන්න ඕනෑ. මෙන්න මේ තුළයි අද අපි ක්‍රියාත්මක වෙන්නේ. මේ දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත ඓතිහාසික-

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
විනාඩිය ප්‍රමාණවත්. මම අද රැස්වීමට ආවේ පුදුම වේගයකින්.

දුම් කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත සම්මත වුණාට පස්සේ එය ඓතිහාසික පනතක් වෙනවා. අපි දන්නවා, දුම් කොළ සමාගම්, ධනපති සමාගම් අපව පරද්දන්න -හංසයා පරද්දන්න- බිලියන ගණන් වියදම් කරපු බව. බිලියන ගණන් වියදම් කෙරුවත් ජනතාව නැමුණේ නැහැ. ජනතාව පෙන්නුවා, තමන්ගේ ඡන්දය නැමති ඒ උත්තම ආයුධය. අවි ආයුධයට වඩා බලවත් ආයුධයෙන් ජනතාව අපට වරම දුන්නා.

අපි ඔක්කෝම එකතු වෙලා මේ දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත විතරක් නොවෙයි, විධායක ජනාධිපති ක්‍රමයත් නැති කරලා ආසන මන්ත්‍රීකම ගෙනෙන්න ඕනෑ. මේ රටේ දූෂණය, භීෂණය, වංචාව අපි ඔක්කෝම එළි කරනවා. අවංක අයට ප්‍රශ්නයක් නැහැ. අපි සහතිකයක් දෙනවා, කාගෙන්වත් පළිගන්නේ නැහැ කියලා.

අගමැතිතුමා යටතේ නීතිඥයින්, පොලීසියේ විශේෂඥයින් ඇතුළු කණ්ඩායමක් පත් කරලා දැන් වැඩ ආරම්භ කරලා තිබෙනවා. ඔබතුමන්ලා කියන විපක්ෂය නොවෙයි; රතු, කොළ, කහ, නිල් කියලා නොවෙයි. හැම දෙයක් ගැනම හොයලා මේ රටේ යහ පාලනයක් ඇති කරන්න, ශ්‍රී ලංකාද්වීපයක් විධියට, ශ්‍රී ලාංකිකයින් විධියට මේ සමාජය තුළ ආඩම්බරයෙන් කියන්න පුළුවන් දැහැමි සමාජයක් බිහි කරන්න පුළුවන් මාර්ගය අපි මෙතැනින් ආරම්භ කරනවා. අපි ඔක්කොම එක්කාසු වෙමු. එක්කාසු වෙලා මේ ඓතිහාසික පනත් කෙටුම්පත අනුමත කරලා දෙමු. පන්සල, පල්ලිය සහ කෝවිල කියන මේ සියල්ල එකතු වෙලා තරුණ පරම්පරාවට අපි මේ කාරණය පිළිබඳව අවබෝධ කරලා දෙමු. සමාජයෙන් මේ දුම් වැටිය ඈත් කරමු. සමාජය යහ මඟට ගෙනෙමු.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව තත්පරයක් ලබා දෙන්න. මගේ නිවුන් සහෝදරයා මා එක්ක ක්‍රිකට් ගැහුවා. හොඳ fast bowler කෙනෙක්. ඒ කණ්ඩායමේ අයගෙන් කීප දෙනෙකු හොඳට සිගරට් බීවා. ඔවුන්ට හති වැටෙනවා. ඒ අයට play කරන්න බැහැ. මම ඒවා දැක්කා. අරක්කුවලට වඩා භයානක තත්ත්වයක් සිගරට්වල තිබෙන බව මම දැක්කා. ඒ නිසා මේවා ඔක්කොම අපි සමාජයෙන් ඈත් කරමු. අරක්කුත් නවත්වන්න ඕනෑ. මම අරක්කුවලටත් විරුද්ධයි. මේවා සියල්ල තුළින් සමාජය විනාශ වනවා. ආණ්ඩුවට කෝටි ගණනක් ලැබුණත්, එයින් සමාජය විනාශ වෙලා, ජනතාව රෝගීන් බවට පත් වනවා. ඒ ක්‍රමය අපි වෙනස් කරමු. මට මේ පිළිබඳව කථා කරන්න නියමිත වේලාව ලබා දීම සම්බන්ධයෙන් මම ගරු නියෝජ්‍ය කථානායකතුමාටත් ස්තුතිවන්ත වනවා. බොහොම ස්තුතියි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හදිසි වරප්‍රසාද ප්‍රශ්නයක්.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු වාසුදේව නානායක්කාර මහතා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හදිසි වරප්‍රසාද ප්‍රශ්නයක්. ගරු ජයන්ත කැටගොඩ මන්ත්‍රීතුමා දැන් ටික වෙලාවකට ඉස්සෙල්ලා ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාට telephone මඟින් කථා කරලා කිව්වා, ඔහුගේ ගේ අවට පිරිසක් ඇවිල්ලා ඉන්නවා, ඒ අය සමාන ආකාරයකට ඇඳ පැළඳගෙන ඉන්න පිරිසක්, ඔහු ඉන්නා වූ මන්ත්‍රී ධුරයෙන් අස් විය යුතු බවට ඔහුට බල කරමින් ඉන්නවාය කියලා. [බාධා කිරීමක්] එතුමා ගේ ඇතුළේ. එතුමා ගේ ඇතුළේ ඉඳගෙන telephone කළේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඒ පිළිබඳව අවධානය යොමු කොට මා සහ ගරු කථානායකතුමා පොලිස්පතිතුමාගේ අවධානයට ඒ කාරණය යොමු කළා. පොලිස්පතිතුමා විසින් එතුමාගේ ආරක්ෂාව පිළිබඳවත්, නිවසේ ආරක්ෂාව පිළිබඳවත් පියවර ගෙන ඇති බවට ගරු කථානායකතුමා සහ මා දැනුවත් කර තිබෙනවා. මා මේ අවස්ථාවේදී ඒ පිළිබඳව මේ ගරු සභාව දැනුවත් කරනවා.

මීළඟට ගරු මහින්ද අමරවීර මහතා.

[අ.භා. 6.21]

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතාමත්ම ඓතිහාසික, වැදගත් පනත් කෙටුම්පතක් පිළිබඳව කථා කරන්න ලැබීම පිළිබඳව සතුටු වනවා. ඒ වාගේම මේ පනත් කෙටුම්පත පිළිබඳවත්, ගරු ජනාධිපතිතුමා පිළිබඳවත් ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමා කරපු කථාව මම සම්පූර්ණයෙන්ම අනුමත කරනවා. එතුමා හැම දාම ඉතාමත් හොඳින් කාරණා වටහාගෙන කටයුතු කරන අමාත්‍යවරයෙක් බව මම හොඳින්ම දන්නවා. ඒ වාගේම මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සෞඛ්‍ය අමාත්‍යවරයා විධියට හිටපු අවධියේ මම සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යවරයා විධියට හිටියා.

මම දන්නවා, ඒ කාලය තුළ එතුමා මොන තරම් මේ කාරණය සම්බන්ධයෙන් මහන්සි වුණාද කියලා. දුම් පානය වළක්වන්න එතුමා විශාල උනන්දුවක් දැක්වුවා. පෞද්ගලිකව දින ගණනාවක් මේ වෙනුවෙන් මහන්සි වුණා. නිලධාරින් නැතිව වෙනමම මේ ගැන කථා කළා. මා එක්කත් කථා කළා. ඇති වුණු සිද්ධීන් පිළිබඳවත්, එතුමා කනගාටුවට පත් වුණු අවස්ථාවන් සම්බන්ධවත් මා සමඟ කථා කළා. ඒ කාරණය මම මේ අවස්ථාවේ සඳහන් කරන්න ඕනෑ.

අද මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නත්, මේ පෙරළිය ඇති කරන්නත් මම හිතන්නේ මේ කාරණය එක හේතුවක් වුණා කියලායි. මෛත්‍රීපාල සිරිසේන අමාත්‍යතුමා ජනාධිපති අපේක්ෂකයා විධියට ඉදිරිපත් වෙන්න හේතු කීපයක් තිබුණා. මේ කාරණය එයින් එක හේතුවක්. අනික් හේතුව තමයි ජාතික ඖෂධ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න බැරි වීමේ හේතුව. එතුමා එළියට එන කොට එතුමා එක්කම ආපු, එතුමා සමඟ සමීපවම හිටපු රාජිත සේනාරත්න ඇමතිතුමා තමයි අද මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ. එතුමාටත් අපි සුබ පතනවා. මම හැම දාම කියන දෙයක් තමයි, එතුමාගේ දේශපාලන ස්ථාවරය කුමක් වුණත්, එතුමා මොන පක්ෂයට ගියත්, මොන නායකයා ළඟ හිටියත් වෙනස් වුණේ නැහැ කියන කාරණය. කථා කරන්න ඕනෑ තැන එතුමා ඒ වෙනුවෙන් කථා කළා. අපිට සමහර වෙලාවට කරන්න බැරි වුණු දේවල් එතුමා කළා. ඒ පිළිබඳව මන්ත්‍රීවරයෙකු විධියට වාගේම මහජන නියෝජිතයෙකු විධියට අපි එතුමාට සුබ පතනවා. එතුමන්ලා ගත්ත තීන්දුව නිවැරදි වුණා. ඒ තීන්දුවේ ප්‍රතිඵලයක් විධියට තමයි අද මේ පනත් කෙටුම්පත ගෙන එන්නේ කියන කාරණය මම මේ අවස්ථාවේ සඳහන් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දුම් පානය, දුම් වැටි පිළිබඳව කථා කරනකොට අපට පාසල් ගිය කාලය සිහිපත් වෙනවා. අපි පාසල් ගිය කාලයේ බලපු චිත්‍රපටවල හිටපු වීරයා තමයි සිගරට් එක බිව්වේ. ඒක දැකලා පාසල්වල හිටපු ශිෂ්‍යයන් වීරයා වෙන්න සිගරට් එක බොන්න පටන් ගත්තා. එතකොට අනෙක් අය ඒ ශිෂ්‍යයා දිහා බැලුවේත් වීරයෙක් විධියටයි. හැබැයි පසු කාලීනව ඒ තත්ත්වය සම්පූර්ණයෙන් වෙනස් වුණා. පසු කාලය වන විට චිත්‍රපටයේ දුෂ්ටයා තමයි සිගරට් එක බොන්න පටන් ගත්තේ. පසු කාලීනව මේ තත්ත්වය වෙනස් කරන්නට, ඒ කියන්නේ චිත්‍රපටයක දුෂ්ටයා සිගරට් එක බොන මට්ටමට එය වෙනස් කරන්නට මේ රටේ ජනතාව, ආණ්ඩු, බහු ජන සංවිධාන වාගේම මේ රටේ තිබුණු දුම් වැටිවලට විරෝධී විවිධ සංවිධාන මුල් වුණා කියන එකත් අපි දන්නවා. ඒ සියලු සංවිධානවලටත් අපි අපේ ප්‍රශංසාව පළ කරන්නට ඕනෑ. ඒ අයත් මේ කාරණය වෙනුවෙන් විශාල කැප කිරීමක් සිදු කළා, මහන්සියක් ගත්තා.

සිගරට් පැකට්ටුව මතුපිට සෞඛ්‍ය අවවාද සහිත ඡායා රූප පළ කිරීම හොඳයි. එවැනි දැනුවත් කිරීමක් කරන එක ඉතාමත් හොඳයි. දුම් පානය වැළැක්වීම සඳහා පසු ගිය රජයන් විසින් ගත් හැම තීන්දුවක් පිළිබඳවම අපි සතුටු වන්න ඕනෑ. ඒක රජයට ආදායමක් අහිමි වීමට සෘජුවම බලපාන කාරණයක්. එක යුගයක මහා භාණ්ඩාගාරය සිගරට්වලින් එන ආදායම දිහා බලා ගෙන හිටියා කියලා ගාමිණී ජයවික්‍රම පෙරේරා ඇමතිතුමා කිව්වා. ඒ අවදානම ගෙන තමයි සියලුම රජයන් මේ කාරණාවලට අත ගහලා තිබෙන්නේ. අද මේ රජයත් ඒ අවදානම දරන බව අපි හොඳටම දන්නවා.

පසු ගිය කාලයේ සිගරට් සමාගම්වලින් ක්‍රීඩාවට අනුග්‍රහය දක්වා තිබෙනවා. නමුත් මෑත කාලයේ දී ජනතාවගේ ඉල්ලීම මත ඒ අනුග්‍රාහකත්වය ලබා නොගෙන සිටීමට රජයට තීන්දු ගන්න සිදු වුණා. ඊට පසුව සිගරට්වලින්, අරක්කුවලින්, බියර්වලින් ක්‍රීඩාවට අනුග්‍රාහකත්වය ලබා ගන්නා අවස්ථා මෑත කාලීනව අපට දකින්න ලැබුණේ නැහැ. ඒ පිළිබඳව අපි ඒ සියලු පාර්ශවවලට ප්‍රශංසා කරන්නට ඕනෑ.

තව කාරණයක් පිළිබඳවත් කියන්නට ඕනෑ. මේ රටේ සිගරට් නිෂ්පාදනය කරන අයගෙන් නිල වශයෙන් කරන ඒ කටයුතු සඳහා බද්දක් අය කරනවා. හැබැයි බදු ගෙවන්නේ නැතුව මේ රටට සිගරට් විශාල ප්‍රමාණයක් ගෙන එනවා. බදු ගෙවන්නේ නැතුව විශාල වශයෙන් හොරෙන් සිගරට් ගෙන එන බව අප හොඳින්ම දන්නවා. සිගරට් කන්ටේනර් පිටින් ගෙනෙනවා; කෝටි ගණන් ගෙනෙනවා. හැබැයි යම් ආකාරයකට රේගුවේ සමඟර නිලධාරින්ගේ සම්බන්ධතා මත තමයි මේවා ගෙනෙන්නේ කියන එක පිළිබඳවත් අපට තොරතුරු ලැබිලා තිබෙනවා.

[ගරු මහින්ද අමරවීර මහතා]

කන්ටේනර් කිහිපයක් ගෙනාවාම ඒවායින් එකක් අල්ලාගෙන දඩ ගහනවා. සිගරට් ටික පුළුස්සා දමනවා. හැබැයි ඒවා ගෙන ඒම වැළැක්වීම සඳහාත් වෙනම වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. සිගරට් පැකට්ටුවේ මතුපිට සෞඛ්‍ය අවවාද සහිත ඡායාරූප පළ කිරීම ආදී දේවල් සමහර වෙලාවට මේ රටින් ගෙනෙන සිගරට් පැකට්වල නැති වෙන්නත් පුළුවන්. ඒවා වෙනම පරිහරණය වෙනවා. ඒ පිළිබඳවත් අවධානය යොමු කිරීම අත්‍යවශ්‍යයෙන්ම කරන්න ඕනෑ.

දුම් වැටි භාවිතය අඩු කරන්නට කටයුතු කළාම ඒ මඟින් රජයට ලැබෙන tax එක අඩු වීම තුළින් රජයේ ආදායම අඩු වීමක් සිදු වෙනවා තමයි. හැබැයි ඒක ප්‍රශ්නයක් නොවෙයි. රජයට ඒක ලොකු ආයෝජනයක් විධියට සලකන්න පුළුවන්. මොකද, මේ දුම් වැටි පාවිච්චිය නිසා විශාල පිරිසක් ලෙඩ රෝගවලට ගොදුරු වෙනවා. රජයේ රෝහල්වලින් නොමිලේ තමයි ඒ ලෙඩ රෝගවලට ප්‍රතිකාර ලබා දෙන්නේ. අපේ රටේ තිබෙන විශේෂත්වයක් තමයි සියලුම රජයේ රෝහල්වලින් අවශ්‍ය බෙහෙත් තවමත් නොමිලේ ලබා දීම. සෙම්ප්‍රතිශ්‍යාවක් ඇති වෙලා රෝහලකට ප්‍රතිකාර ගන්න ගියත්, bypass සැත්කමකට ගියත් අපේ රෝහල්වල මුදල් අය කිරීමක් සිදු වන්නේ නැහැ. ඒ නිදහස් සෞඛ්‍ය සේවාව නිසා අද අපේ රටේ ජනතාවගේ ආයු කාලය වැඩි වෙලා තිබෙන බවත් සඳහන් කරන්නට ඕනෑ. ඒ වාගේම අද අපේ රටේ ළදරු මරණ අනුපාතය ඉතාමත් අඩු මට්ටමකට පත් කර ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ පැවැති විවිධ රජයන් ඒ වෙනුවෙන් කරපු කැප කිරීම නිසායි. මේ රජයත්, මේ අමාත්‍යතුමාත් ඒ ආයෝජනය, එහෙම නැත්නම් ඒ කටයුතුවලට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම සිදු කරයි කියලා මා විශ්වාස කරනවා.

තවත් කාරණයක් පිළිබඳව අපි මේ වෙලාවේ සාකච්ඡා කළ යුතු වෙනවා. සෞඛ්‍ය අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරවන්න කැමැතියි, සිගරට්වලින්, මත්පැන්වලින් සිදු වෙන හානිය වාගේම කෘත්‍රිම ආහාර පාන වර්ග ලබා ගැනීම තුළින් දරුවන්ට ඇති වන ලෙඩ රෝග පිළිබඳව. විශේෂයෙන්ම අද බෝ නොවන රෝග විශාල වශයෙන් වැඩි වෙලා තිබෙනවා.

ඒවායේ මට්ටමක් නැහැ. දියවැඩියාව, නැත්නම් අධික රුධිර පීඩනය, කොලස්ටරෝල් වාගේ ලෙඩ රෝග හැදෙන්නේ වැඩිහිටියන්ට කියලායි අපි ඉස්සර අහලා තිබුණේ. දැන් පාසල් දරුවන්ට පවා මේ ලෙඩ රෝග හැදෙන තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒකට එක හේතුවක් තමයි අපේ කාර්ය බහුලතාව සහ අපේ ආහාර රටාවේ ඇති වෙලා තිබෙන වෙනස.

අද පාසලකට ගිහිල්ලා ඒ පාසලේ ආපනශාලාවේ විකුණන දේවල් මොනවාද කියලා බලන්න. මෙය ගරු අමාත්‍යතුමාගේ දැඩි අවධානය යොමු කළ යුතු කාරණයක්. සමහර පාසල්වල ආපනශාලා තිබෙනවා, එහි එක දවසකට ඩෝනට්ස් 3,000ක් පමණ විකිණෙනවා. දවසකට කොකා කෝලා වැනි පැණි බීම බෝතල් දහස් ගණනක් විකිණෙන ආපනශාලා පාසල් තුළ තිබෙනවා. විවිධ පැණි රස ආහාර, විවිධ රසකාරක යෙදවූ ආහාර පාසල්වල ඇති ආපනශාලා තුළ තිබෙනවා. එතකොට දරුවා පාසලට ගිය තැන ඉඳලාම, එතැනින් ඊළඟට ටියුෂන් පන්තියට ගියාමත්, ඒ හැම තැනකදීම මේ රසකාරක යෙදවූ විවිධ කෑම ගැනීමට පුරුදු වෙනවා. කුඩා කාලයේ ඉඳලාම මේ ආහාර පානවලට හුරු වීම නිසා ඔවුන් බෝ නොවන ලෙඩ රෝගවලට ලක් වෙනවා.

අද ආහාර පාන පිළිබඳව විවිධ වෙළෙඳ දැන්වීම් තිබෙනවා. රූපවාහිනිය දිහා බැලුවාම දරුවන්ට ආශා හිතෙන විධියට, දරුවන් ඉල්ලා සිටින තරමට සමහර කෑම බීමවලට ප්‍රචාරයන් ලබා දෙනවා. වෙළෙඳ දැන්වීම් හරහා සොසේජස් වර්ග පෙන්නලා කියනවා, ඒ සොසේජස් කෑවොත් තමයි ක්‍රිකට් ගහන්න පුළුවන් කියලා; ක්‍රීඩා කරන්න පුළුවන් වෙන්නේ කියලා. අපේ ගම්වල දරුවෝ ගෙදර ඇති කරන කිකිළි දමන බිත්තරය කඩේට ගෙනිහිල්ලා විකුණලා සොසේජස් පැකට් එකක් ගෙනැල්ලා කන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. තව කට්ටියක් කියනවා, මාරි බිස්කට් කෑවාම මොළේ වැඩෙනවා කියලා. ඉතින් අපේ දරුවෝ ගෙදර හැදෙන කෙසෙල් ගෙඩිය, පැපොල් ගෙඩිය කන්නේ නැහැ. ඒ දරුවන්ගේ අම්මලා ඒවා කඩේට ගෙන ගිහිල්ලා විකුණලා බිස්කට් පැකට් එක දරුවන්ට ගෙනැල්ලා දෙන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒක තමයි ඇත්ත කථාව. ගෙදර තිබෙන කිරි ටික බොන්නේ නැහැ. ගෙදර තිබෙන කිරි ටික ගෙනිහිල්ලා විකුණලා දාලා වෙළෙඳ දැන්වීමේ පෙන්වන කිරි පැකට් එක ගෙනැල්ලා බොන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මේක තමයි ඇති වෙලා තිබෙන තත්ත්වය. ඒ නිසා අපි ඒ දැනුවත් කිරීම කරනවා.

විශේෂයෙන්ම රූපවාහිනියෙන්, ඒ වාගේම ගුවන් විදුලියෙන් විකාශය වන වෙළෙඳ දැන්වීම්, පුවත් පත්වල පළ වන වෙළෙඳ දැන්වීම් පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශය අනිවාර්යයෙන්ම අවධානය යොමු කළ යුතුව තිබෙනවා. විශේෂයෙන්ම ඒවායේ පෙන්වන ගුණ අගුණ එම නිෂ්පාදනවල තිබෙනවාද, හිතකර දේවල්ද ඒවායින් වෙන්නේ, අහිතකර දේවල්ද ඒවායින් වෙන්නේ කියන එක පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ. අපට ජනමාධ්‍ය ආයතනවලට චෝදනා කරන්න බැහැ. ඒ අයට වෙළෙඳ දැන්වීම් ලැබුණාම ඒවා භාර ගන්නවා. ලබා දෙන වෙළෙඳ දැන්වීම ඒ විධියටම පළ කරනවා. සමහර කෑම බීමවල ඒ කියන ගුණ අගුණ නැහැ. සමහර ඒවා එක එක රෝග වැළැක්වීම සඳහා හොඳයි කියලා කියනවා. දැන් සමහර බෙහෙත් වර්ග පවා දැන්වීම් පළ කර විකුණන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒවායේ කියනවා, වෛද්‍යවරයකුගේ නිර්දේශ අවශ්‍ය වෙන්නේ නැහැ, මේක අහවල් ෆාමසි එකෙන් ගන්න පුළුවන්, මේක පාවිච්චි කළාම මේ ආකාරයේ ලෙඩ රෝග සුව වෙනවා කියලා. ඒ පිළිබඳවත් අවධානය යොමු කිරීම අත්‍යවශ්‍යයි කියන කාරණය පිළිබඳව මම ගරු අමාත්‍යතුමාගේ අවධානයට යොමු කර වන්නට කැමැතියි.

ගරු ඇමතිතුමනි, මේ එක්කම ඔබතුමාට තවත් පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන්න වාසනාව ලැබෙනවා. ඒ තමයි මේ රටේ ජනතාව අපේක්ෂා කළ, මේ රටේ සමස්ත ජනතාවගේ ප්‍රාර්ථනය වුණු, ඒ වාගේම වර්තමාන ජනාධිපතිතුමා සෞඛ්‍ය අමාත්‍යවරයා විධියට සිටියදී සකස් කළ ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමේ අවස්ථාවත් ඔබතුමාට තමයි හිමි වෙන්නේ. මේ කාර්යයන් පහසු කාර්යයන් නොවෙයි. මේවා කරන කොට හැප්පෙන්න වෙන්නේ ලෙහෙසි කණ්ඩායම් එක්ක නොවෙයි කියන එක අපි දන්නවා. මේ රටේ තිබෙන ආයුධ සපයන සමාගම් වාගේම බලවත් මේ රටේ තිබෙන බෙහෙත් සපයන සමාගම්. එම සමාගම් රටවල දේශපාලන නායකයෝ තෝරන මට්ටමට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම මිනිස්සුන්ගේ ජීවිත විනාශ කරන්න පුළුවන් මට්ටමට පත් වෙලා තිබෙනවා. පාතාලය මෙහෙයවන්න පුළුවන් මට්ටමට මේ සමාගම් පත් වෙලා තිබෙන බව අපි දන්නවා. ලෝකයේම තත්ත්වය ඒකයි. ලංකාවට ඒක අලුත් දෙයක් නොවෙයි. ලංකාවටත් ඒ තත්ත්වය තිබෙනවා. අපි දන්නවා, මේවා පහසු කාර්යයන් නොවන බව.

දුම්කොළ සමාගම් පිළිබඳව මේ ගත් රැඩිකල් තීන්දුව, නැත්නම් එඩිතර තීන්දුව වාගේම ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත සම්මත කිරීමේදීත් ඒ තීන්දුවම ගන්න ඔබතුමන්ලාට ශක්තිය ලැබෙන්න කියලා අපි ප්‍රාර්ථනා කරනවා. ඒක අපහසුයි. අපි දන්නවා, ඒක ලෙහෙසි වැඩක් නොවන බව. ඒකට අනිවාර්යයෙන්ම විවිධ බාධා එල්ල වෙනවා. නමුත් ඒ මොන බාධා ඇති වුණත් රටේ අහිංසක ජනතාව වෙනුවෙන් මේ වැදගත් තීන්දුව ගනිව් කියලා අපි විශ්වාස කරනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
අපි දන්නවා, ඔබතුමන්ලාට අභියෝග තිබෙන බව. මා නියෝජ්‍ය සෞඛ්‍ය අමාත්‍යවරයා විධියට හිටපු කාලයේ කොච්චර නම් අභියෝග තිබුණාද, කොච්චර නම් වර්ජනවලට මුහුණ දෙන්න වුණාද, කොච්චර නම් අපවාදවලට මුහුණ දෙන්න සිදු වුණාද, කොච්චර අවලාදවලට මුහුණ දෙන්න සිදු වුණාද කියලා මම දන්නවා. හැබැයි, ඒ මොන අවලාද නැඟුවත්, මොන අපවාද අහන්නට ලැබුණත් ඔබතුමන්ලා ගන්නා නිවැරදි තීන්දු එක්ක මේ රටේ සමස්ත ජනතාව ඉන්නවාය කියලා මම විශ්වාස කරනවා. ඒ වාගේම මේ සිටින මහජන නියෝජිතයෝ තමුන්නාන්සේලාත් එක්ක පක්ෂ, පාට භේදවලින් තොරව මේ වාගේ හොඳ කාරණාවලට සහයෝගය ලබා දෙනවා කියන විශ්වාසය පළ කරමින්, මේ පනත් කෙටුම්පතට අපි එක අතක් නොවෙයි අත් දෙකම ඔසවා සහයෝගය ලබා දෙන බවත් සිහිපත් කරමින් මා නිහඬ වෙනවා. ස්තූතියි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බොහොම ස්තූතියි. මීළඟට, ගරු ලසන්ත අලගියවන්න මහතා.

[අ.භා. 6.35]

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතට සංශෝධන ගෙන එන මේ අවස්ථාවේදී වචන කිහිපයක් කථා කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව පුරවැසියෙකු විධියට පෞද්ගලිකව ඉතාමත් සතුටු වෙනවා. සාමාන්‍යයෙන් අපේ රටේ ජනගහනයෙන් අවුරුද්දකට 125,000ක් පමණ මිය යනවා. මෙයින් වැඩිම කොටසක් -යුද්ධය පැවැති කාලයේ වර්ෂයකට මිය ගිය ප්‍රමාණයට වඩා- මිය යන්නේ දුම් පානයේ සෘජු බලපෑම නිසායි. ඒ වාගේම, අවුරුදු ගණනාවක් තිස්සේ රිය අනතුරු නිසා වාර්ෂිකව 2,500ත් - 3,000ත් අතර ප්‍රමාණයක් මිය යනවා. මම හිතන හැටියට ස්වාභාවික මරණවලට අමතරව වැඩිම ප්‍රමාණයක් මිය යන්නේ දුම් පානය නිසායි. මුළු ලෝකයේම ප්‍රවණතාව මේකයි.

මීට දශක කිහිපයකට පෙර කොලරාව, පාචනය වැනි බෝ වන රෝග පිළිබඳව අභියෝගයට අප මුහුණ දුන්නා. නමුත් මුළු ලෝකය වාගේම අපේ රටත් අද බෝ නොවන රෝග පිළිබඳ අභියෝගයට මුහුණ පා තිබෙනවා. ඊට ප්‍රධානතම හේතුව වන්නේ සමස්ත රෝගීන්ගේ සංඛ්‍යා ලේඛන අනුව සියයට 72ක්ම බෝ නොවන රෝගවලින් පෙළීමයි. විශේෂයෙන්ම මේ සඳහා වැඩිම බලපෑමක් ඇති කරන්නේ දුම් පානය සහ මද්‍යසාර කියන එක අමුතුවෙන් සඳහන් කිරීමේ අවශ්‍යතාවක් නැහැ.

මේ පිළිබඳව අපේ රටේ අවසාන වතාවට 2008 වර්ෂයේ සෞඛ්‍ය අමාත්‍යාංශය සමීක්ෂණයක් කර තිබෙනවා. ඒ අනුව පිරිමින්ගෙන් සියයට 22ක් දුම් පානය කරන බවට වාර්තා වෙලා තිබෙනවා. කාන්තාවන්ගෙන් සියයට දශම 9ක් පමණයි ඒ ප්‍රමාණය වාර්තා වී තිබෙන්නේ. සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් මේ දිනවල කර ගෙන යන ඒ සමීක්ෂණයේ ප්‍රතිඵල තව මාසයකින් පමණ එළිදක්වන බව අපට දැන ගන්නට ලැබී තිබෙනවා. ඒ නව සමීක්ෂණයේ ප්‍රතිඵල අනුව දුම් පානය පිළිබඳව පෙරට වඩා අඩු ප්‍රතිශතයක් ඇතැයි යන විශ්වාසයක් ප්‍රායෝගිකව අපට තිබෙනවා. පැවැති සියලුම රජයයන් දුම් පානය වැළැක්වීම සඳහා විවිධ උත්සාහයන් ගත්තා; විවිධ නීති-රීති හඳුන්වා දුන්නා. විශේෂයෙන්ම 2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත මඟින් මෙය මුල් කර ගෙන නීති-රීති කිහිපයක් අලුතින් ගෙනාවා. ඒ අනුව වයස අවුරුදු 21ට වඩා අඩු අයට දුම් වැටි විකිණීම තහනම් කළා, ස්වයංක්‍රීය යන්ත්‍ර මඟින් අළෙවි කිරීම තහනම් කළා, ප්‍රචාරක දැන්වීම තහනම් කළා, ප්‍රසිද්ධ ස්ථානවල දුම්බීම තහනම් කළා, නොමිලයේ බෙදා හැරීම තහනම් කළා.

පාසැල් ක්‍රීඩා සහ ක්‍රීඩා සඳහා දුම්කොළ සමාගම් විසින් විශාල වශයෙන් ප්‍රචාරක අනුග්‍රහයන් ලබා දුන්නා. පසු ගිය කාලයේ "ක්‍රිස්ටල් ක්‍රිකට් තරගාවලිය" කියලා ප්‍රසිද්ධ තරගාවලියක් තිබුණා. 2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳව ජාතික අධිකාරිය පනත මඟින් ඒවා නීතියෙන් තහනම් කළා.

සමස්තයක් විධියට අද මේ රටේ ජනතාව පෙරට වඩා ආගම දහමට නැඹුරු වෙලා තිබෙන බව අප පිළිගත යුතුයි. අපේ රටේ සමාජය පිරිහිලා, සංස්කෘතිය පිරිහිලා කියලා කවුරු කොහොම කථා කළත් ඒ හා සමානවම හෝ ඊට වඩා වැඩි වේගයකින් හෝ ධනාත්මක පැත්තේ අප සිටිය යුතුයි. ඒ වාගේම පෙරට වඩා අද තරුණ පරපුර දුම් පානයෙන් ඈත් වෙලා තිබෙනවා. මේ තත්ත්වය තුළ අපේ රටේ මුළු ජනගහනයෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් දුම් පානයෙන් ඈත් වෙලා තිබෙනවා; අඩු වෙලා තිබෙනවා කියා අපට විශාල විශ්වාසයක් තිබෙනවා.

දුම් පානය කරන පිරිමින් සහ කාන්තාවන් සංඛ්‍යාව අඩු වෙලා තිබෙනවා. මේ ප්‍රමාණය අප තව තවත් අඩු කර ගත යුතුයි. ලෝකයේ සමහර දියුණු රටවල් වාගේ, මේ සංඛ්‍යාව ඉතාම පහළ මට්ටමකට ගෙන ඒමට කටයුතු කිරීම තමයි අපේ යුතුකම හා වගකීම වන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපට තිබෙන ප්‍රධානම ප්‍රශ්නයක් තමයි, මේ බෝ නොවන රෝග පිළිබඳ අභියෝගය. අප දුම් වැටිවලින් ලැබෙන බදු ආදායම පිළිබඳව කථා කරනවා. නමුත්, ඒ බදු ආදායම ලබා ගනිද්දි, දුම් පානය නිසා වන වියදම ඊට වඩා සිය දහස් ගුණයකින් දරන්න අපට සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා අපි මොනම ආකාරයකටවත් ඒ දේවල් වෙනුවෙන් තීන්දු තීරණ ගන්න හොඳ නැහැ. මද්‍යසාර සහ දුම් වැටි වෙනුවෙන් ලැබෙන බදු ආදායම පිළිබඳව අප කිසිදු අවධානයක් යොමු කළ යුතු වන්නේ නැහැ. මේවා පානය කිරීම නිසා මේ රට තුළ ඊට වඩා සිය දහස් ගුණයක වියදමක් අප දරනවා. එම නිසා මෙවැනි නීති-රීති ගෙන ඒම ඉතාම කාලෝචිතයි. විශේෂයෙන්ම මෙවැනි කාලෝචිත අවශ්‍යතාවක් හඳුනා ගෙන, මේ ආකාරයෙන් කඩිනමින් නීති-රීති ගෙන ඒමට කටයුතු කිරීම ගැන වර්තමාන ජනාධිපති ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටත්, වර්තමාන සෞඛ්‍ය අමාත්‍ය ගරු රාජිත සේනාරත්න මැතිතුමාටත් අප ස්තූතිවන්ත වෙන්න ඕනෑ.

අපේ ගරු මහින්ද අමරවීර මන්ත්‍රීතුමා සඳහන් කළ පරිදි විශේෂයෙන්ම කෘත්‍රිම ආහාර වර්ගත් මේ බෝ නොවන රෝග වැලඳීමට බෙහෙවින් හේතු වෙනවා. මේ පාර්ලිමේන්තුවේ උපදේශක කාරක සභා ගණනාවකටම අවුරුදු දෙකහමාරක්

[ගරු ලසන්ත අලගියවන්න මහතා]

තුනක් තිස්සේ මම මේ කාරණය ඉදිරිපත් කළා. විශේෂයෙන්ම අපේ රටට ආනයනය කරන පලතුරුවලට මිශ්‍ර කරන රසායනික ද්‍රව්‍ය නිසා අද අපේ රටේ ජනතාව සෞඛ්‍යමය වශයෙන් විශාල ප්‍රශ්නවලට මුහුණ පානවා. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට, ඒ වාගේම සෞඛ්‍ය අමාත්‍යාංශයේ අදාළ බලධාරින්ට උපදේශක කාරක සභාවලදී අප මේ පිළිබඳව කරුණු ඉදිරිපත් කළා. නමුත්, ඒ කිසිදු ආයතනයක් හෝ අමාත්‍යාංශයක් ඒවා නියාමනය කිරීම සඳහා නීති -රීති ගෙන එනවා කියලා හෝ ඒ සඳහා කටයුතු කරනවා කියලා හෝ අපට දැන ගන්න ලැබුණේ නැහැ. බෝ නොවන රෝග පිළිබඳව අප වැඩි වැඩියෙන් අවධානයක් යොමු කළ යුතු මේ අවස්ථාවේ, මේ දුම් වැටි පිළිබඳව නීති-රීති ගෙන එනවා වාගේම සිගරට් පැකැට්ටුවේ ඒ රූපමය අවවාද ඇතුළත් කිරීමත් ඉතාම කාලෝචිතයි. ඒ සංශෝධනය ගෙනැත් ඒ නීතිය ක්‍රියාත්මක කිරීම ඉතාම වටිනා කාර්ය භාරයක්.

රසායනික ද්‍රව්‍ය මිශ්‍ර කර ආනයනය කරනු ලබන පලතුරු අද අප රටේ විශාල පිරිසක් පරිභෝජනය කරනවා. මේ පලතුරු වර්ගත් දුම් වැටි හා මත් ද්‍රව්‍ය හා සමානයි කියන කාරණයයි මම පෞද්ගලිකව දකින්නේ. ඒ නිසා මේ පිළිබඳවත් අප විශේෂ අවධානයක් අනිවාර්යයෙන්ම යොමු කළ යුතුව තිබෙනවා.

ජනතාව දැනුවත් කිරීම තුළින් අපට මේ බෝ නොවන රෝග වැළඳීම අවම කර ගන්න පුළුවන්. අපේ ජීවිතයට නිවැරදි හුරු පුරුදු ඇතුළත් කර ගත්තොත් මේ ලෙඩ රෝගවලින් ඈත් වෙන්න පුළුවන්කමක් ලැබෙනවා. විශේෂයෙන්ම බෝ වන රෝග වළක්වා ගැනීමට අපහසුතාවක් තිබුණත්, බෝ නොවන රෝග සම්බන්ධයෙන් දැනුවත් කිරීම තුළින් සහ නීති-රීති හඳුන්වා දීම තුළින් අනිවාර්යයෙන්ම ඒ අභියෝගය ජය ගන්න පුළුවන්කමක් ලැබෙනවා. ලෝකයේ දියුණු රටවල් හා සමානවම අද අපේ රටේ සෞඛ්‍යය දියුණු තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒක නැහැයි කියන්න පුළුවන්කමක් නැහැ. විශේෂයෙන්ම ළදරු මරණ අනුපාතය, මාතෘ මරණ අනුපාතය, ආයු කාලය වැනි කරුණු දිහා බැලුවාම සෞඛ්‍ය පැත්තෙන් අපේ රට ලෝකයේ දියුණුම රටවල් හා සමාන මට්ටමකට දියුණු වෙලා තිබෙනවා. ඒ සඳහා ප්‍රධාන රෝහල්වල විශේෂඥ වෛද්‍යවරුන් දායක වුණා වාගේම ගමේ පවුල් සෞඛ්‍ය සේවිකාව කරන සේවය මා හිතන හැටියට මොනම ආකාරයකටවත් අවතක්සේරු කරන්න පුළුවන්කමක් නැහැ. අපේ රටේ සෞඛ්‍ය මේ මට්ටමට දියුණු වීම සඳහා විශේෂයෙන්ම වෛද්‍යවරුන්ගේ සේවය, රෝහල්වලට යන්ත්‍ර සූත්‍ර, භෞතික සම්පත්, ගොඩනැඟිලි ලැබීම වාගේම ගමේ පවුල් සෞඛ්‍ය සේවිකාවගෙන් අපේ රටේ සෞඛ්‍ය සේවයට ලැබෙන සේවය අපි ඉතාමත් උසස් මට්ටමින් අගය කළ යුතුව තිබෙනවා. සමස්තයක් විධියට අපේ රටේ සෞඛ්‍යය දියුණු මට්ටමකට ගෙන ඒමට එය ප්‍රධාන සාධකයක් බවට පත් වෙලා තිබෙනවා. එම නිසා මේ කරුණු පිළිබඳව අප සියලුදෙනාගේම අවධානය යොමු කර මේ පාර්ලිමේන්තුව තුළින් නීති-රීති ගෙන එනවා වාගේම එම නීති-රීති ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී ඊට අදාළ සියලු දෙනාම වග කීමකින් කටයුතු කළ යුතුව තිබෙනවා. නීති-රීති, පනත් ගෙන ඒම තුළින් පමණක් ප්‍රශ්න සඳහා විසඳුම් ලැබී අවසානයි කියා කියන්න පුළුවන්කමක් නැහැ.

මේ ගෙනෙන නීති ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම තමයි අද තිබෙන අභියෝගය විධියට අපි දකින්නේ. විශේෂයෙන්ම නීති විරෝධී මත් ද්‍රව්‍ය, දුම් වැටි වැනි දෑ අපේ රටින් සදහටම තුරන් කිරීම සඳහාත්; ඒ වාගේම මේ තුළින් ජනතාවට සිදු වන හානිය සම්පූර්ණයෙන්ම නැති කිරීම සඳහාත් විපක්ෂයේ මන්ත්‍රීවරුන් විධියට අපේ සම්පූර්ණ සහයෝගය, දායකත්වය ලබා දෙන බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරමින් මා නිහඬ වනවා. ස්තූතියි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

බොහොම ස්තූතියි. ඊළඟට ගරු අජිත් පී. පෙරේරා නියෝජ්‍ය ඇමතිතුමා.

[අ.භා. 6.48]

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - வெளிநாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Ajith P. Perera - Deputy Minister of Foreign Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා වන මේ මොහොතේ දුම් බීමේ ආදීනව, දුම් වැටි විකිණීමේ ව්‍යාපාරය, ඒ වාගේම ඒ හා සම්බන්ධව විවිධ සංඛ්‍යා ලේඛන සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුව තුළ දීර්ඝව සාකච්ඡා වුණා. ඒ කාරණා පිළිබඳව මගේ එකඟත්වය පළ කරන අතර එම කරුණු නැවත නැවත කීමට මා බලාපොරොත්තු වන්නේ වන්නේ නැහැ. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම පනත් කෙටුම්පතට පාදක වුණු නීතිමය ක්‍රියාදාමය, දේශපාලන ක්‍රියාදාමය සහ අධිකරණමය ක්‍රියාදාමය මේ රටේ ඉතිහාසයේ ලියවෙනවා.

මෙම පනත් කෙටුම්පතට පාදක වුණු රූපමය අවවාදය සියයට 80ක් දක්වා විය යුතුයි කියන කරුණු අන්තර්ගත වූ සවිස්තරාත්මක රෙගුලාසිය ඇතුළත් වුණා. මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් වුණා. මේ පාර්ලිමේන්තුව තුළ ඒ පිළිබඳව වාද කරලා, දැනුවත් වෙලා, ඒකමතිකව ඒ පනත් කෙටුම්පත සම්මත කළා. නමුත් ඒ වන විටත් මේ රටේ දුම්කොළ සමාගම -මේ රටේ නීත්‍යානුකූලව දුම් කොළ වෙළෙඳාමේ යෙදෙන්නේ එක සමාගමක් පමණයි.- යම් යම් නීතිමය ක්‍රියා මාර්ග සඳහා පියවර ගෙන තිබුණා. නමුත් මේ පාර්ලිමේන්තුවට ඇති බලය ප්‍රකාරව, අමාත්‍යවරයා විසින් දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත යටතේ රෙගුලාසි ඉදිරිපත් කළ විට ඒ පිළිබඳව නඩුවක් විභාග වුණත් නැතත්, ඒ රෙගුලාසි විවාද කොට බාර ගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම කළ හැකියි. ඒ අනුව මෙම පාර්ලිමේන්තුව එම රෙගුලාසි, -ඉතාම වැදගත් වූ රෙගුලාසි, ඉතාම විද්‍යානුකූල වූ රෙගුලාසි- ලෝකයේ ඇතැම් රටවල් දැනටමත් සම්මත කර ගෙන ක්‍රියාත්මක කරන්නා වූ ඒ ප්‍රමිතීන් අනුමත කළා. මමත් ඒ විවාදයේදී කථා කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ සාමාන්‍යයෙන් ක්‍රියාත්මක නොවන, මේ රටේ නීති ක්‍රියාදාමයට සාමාන්‍යයෙන් අපේක්ෂා නොකරන සුවිශේෂ ආකාරයේ නඩුකර අධිකරණයේ පැවරෙනවා. එම නඩුකර පැවරීමත්, එම නඩුකරවලදී ලබා ගන්නා වූ නියෝග පිළිබඳවත් දේශපාලන වේදිකාවේදී, මේ පාර්ලිමේන්තුවේදී මීට පෙර කථා කර තිබෙනවා. විධායකයත්, අධිකරණයත්, ආත්මාර්ථකාමී ව්‍යවසායකයෝත් එක්ව මේ රටේ මහජන යහපතට එරෙහි ක්‍රියාදාමයක යෙදෙන බව අපි කාටත් තේරුණා. ලක්ෂ ගණනක් මළත්, රෝගී වුණත්, ප්‍රතිකාර උදෙසා මේ රටේ මහ ජනතාවගේ ධනය රුපියල් බිලියන ගණනක් වියදම් වුණත් දුම් කොළ සමාගමේ ප්‍රතිලාභ, ඔවුන්ගෙන් ලැබෙන රුපියල් හෝ ඩොලර්වලට යට වෙන දේශපාලනඥයෝ මේ රටේ හිටියා; විනිශ්චයකාරවරයොත් මේ රටේ හිටියා. ඒක තමයි සත්‍ය තත්ත්වය. සාමාන්‍ය කාර්ය පටිපාටියට ඔබ්බෙන් ගොස් නඩුකර පැවරීමත්, අධිකරණය සතු බලය ඉක්මවා යමින් ප්‍රතිපත්තිමය කාරණා පිළිබඳව තීරණය කිරීමත් අපි දුටුවා. ප්‍රතිපත්තිමය කාරණා පිළිබඳ තීරණය කිරීමේ බලය තිබෙන්නේ විධායකයට සහ ව්‍යවස්ථාදායකයට. සියයට 20ද, 30ද, 40ද, 50ද ,60ද, 70ද,

80ද එහෙම නැත්නම් සියයට 100ක්ම ද කියන කාරණා, ප්‍රතිපත්ති. ප්‍රතිපත්තියේ හරි වැරැද්ද පිළිබඳ තීරණය කරන්නට අධිකරණයට හැකියාවක් නැහැ. අධිකරණය ජනතාවගේ නියෝජිතයන් නොවෙයි. අධිකරණයට ජනතාව ගැන වගකීමකුත් නැහැ, ජනතාවට අධිකරණය කෙරෙහි පාලනයකුත් නැහැ. ඒ නිසා මේ කාරණය ගැන විතරක් නොවෙයි, ඕනෑම විෂයක් පිළිබඳව ප්‍රතිපත්තියේ හරි වැරැද්ද ප්‍රශ්නයේදී නම් මේ රූපමය අවවාද සියයට 80ක් තිබෙන්නට ඕනෑද, සියයට 70ක් තිබෙන්නට ඕනෑද, සියයට 60ක් තිබෙන්නට ඕනෑද, සියයට 55ක් තිබෙන්නට ඕනෑද, එහෙම නැත්නම් ඕනෑම නැද්ද කියන කාරණා, ප්‍රතිපත්තිමය කාරණායි.

ප්‍රතිපත්තිය පිළිබඳ තීරණය කිරීම පනත් කෙටුම්පතක් නම් පාර්ලිමේන්තුවටත්, ඒක ගැසට් නිවේදනයක් නම් විධායකයේ නියෝජිතයා වන අමාත්‍යවරයාටත් අයිති කාර්යයක්. අමාත්‍යවරයා සතු රාජකාරි අධිකරණය භාර ගන්න බැහැ. ඒවා පිළිබඳ කාරණා නඩුවල විෂය විය යුතුත් නැහැ. ඒ ගැසට් නිවේදනය ගෙන ඒමේ යම් කාර්ය පටිපාටිමය දෝෂයක් තිබුණා නම්, ඒ ගැසට් නිවේදනය විසින් ආවරණය කරන පරාසය අමාත්‍යවරයාගේ බල පරාසය ඉක්මවා ගිය කාරණයක් නම් එවිට එම ගැසට් නිවේදනය හෝ ඉන් කොටසක් අහෝසි කරන්නට හෝ බල ශූන්‍ය කරන්නට අධිකරණයට හැකියාව තිබෙනවා. නමුත් මෙහිදී සිදු වුණේ ඒක නොවෙයි. මේ ප්‍රශ්නය මතු වුණාම මේ රටේ දුම් වැටිවලට එරෙහිව හිතන, පතන, කථා කරන අපිට මේ පිළිබඳව කථා කරන්න සදාචාරාත්මක අයිතියකුත් තිබෙනවා.

ජීවිතයේ කිසිම දවසක දුම් වැටියක් පානය නොකළ කෙනෙක් හැටියට මේ පිළිබඳව කථා කරන්න මට විශේෂ අයිතියක් තිබෙනවා. නමුත් දුම් වැටි පානය කළා කියලා මේ ප්‍රශ්නය ගැන කථා කරන්න තිබෙන අයිතිය නැති වෙන්නේ නැහැ කියලා මම විශ්වාස කරනවා. ඒ අයිතිය මම පිළි ගන්නවා. නමුත් මට විශේෂ අයිතියක් තිබෙනවා මේ කාරණාව ගැන කථා කරන්න. මේ ප්‍රශ්නය පිළිබඳව අධිකරණ නඩු තීන්දුව ඉදිරිපත් වුණාම එවකට සෞඛ්‍ය ඇමතිතුමා -ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා- ඉතා අසරණ තත්ත්වයකට පත් වුණු වේලාවේ "ද අයිලන්ඩ්" පුවත් පතේ ශමින්ද්‍ර ෆර්ඩිනැන්ඩු මැතිතුමා මට දුරකථනයෙන් කථා කරලා ඇහුවා,"හරිම අසාධාරණයක් වෙලා තිබෙන්නේ, මේ ගැන කුමක්ද කළ හැක්කේ" කියලා. මම එවිට එතුමාට ප්‍රකාශ කළා "කරන්න තිබෙන්නේ එක දෙයයි. ඒ තමයි මෙම ගැසට් නිවේදනයේ අන්තර්ගත කාරණා පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පතක් ලෙස ඉදිරිපත් කොට සම්මත කර ගැනීම" කියලා. එය කළ හැකියි. මොකද පාර්ලිමේන්තුවේ පූර්ණ ඒකමතියක් තිබුණා. එම නිසා එය කර ගත යුතුයි කියා මම කිව්වා. "ද අයිලන්ඩ්" පුවත් පතේ ප්‍රධාන පුවත ලෙස මගේ මතය පළ වුණා. මම ඒ කාරණය පිළිබඳව සඳහන් කරන්නේ මේ ගැසට් නිවේදනය පනත් කෙටුම්පතක් දක්වා පැමිණි ක්‍රියාදාමය තුළ මුල්ම අවස්ථාවේ මගේ දායකත්වයක් තිබෙනවා කියන කාරණය මේ රටේ ඉතිහාසය තුළ හැන්සාඩ් වාර්තාවේ වාර්තාගත විය යුතු නිසා පමණයි.

මම හිටපු සෞඛ්‍ය අමාත්‍යතුමා වන වත්මන් ජනාධිපති අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටත් මේ පිළිබඳව දැනුම් දුන්නා, මෙවැනි විසඳුමක් ගත හැකියි කියා. නමුත් ඊට පස්සේ තවත් බොහෝ දේ සිද්ධ වුණා; දේශපාලනය පිළිබඳ ලොකු වෙනස්කම් සිද්ධ වුණා. පසු ගිය කාලය තුළ විධායකයේ ප්‍රධානියා වූ හිටපු ජනාධිපතිවරයා දරන මතය සමඟ වෙන කිසිවෙකුට තරග කරන්නට නොහැකි, වාද කරන්නට නොහැකි, ත්‍රාසජනක වාතාවරණයක් රටේ ගොඩ නැගිලා තිබුණා; භයානක වාතාවරණයක් රටේ ගොඩ නැගිලා තිබුණා. මෙවැනි කාරණාවලදී ජනාධිපතිවරයාගේ මතයට එරෙහිවීම ජීවිතයත් මරණයත් අතර ප්‍රශ්නයක් බවට රටේ පත් වෙලා තිබුණා. එවැනි තත්ත්වයක් තුළ මේ පනත් කෙටුම්පත පිටුපසට ගියා. නමුත් ජාතියේ පිනකට ඒ විෂයභාර අමාත්‍යවරයා -අසාධාරණයට ලක් වුණු අමාත්‍යවරයා, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා- මහජනතාවගේ ඡන්දයෙන් මේ රටේ ජනාධිපතිවරයා වුණා. ඒ නිසාම එදා මම මුල් අවස්ථාවේදී යෝජනා කළ පරිදි මෙම කාරණා පනත් කෙටුම්පතක් ලෙස අද පාර්ලිමේන්තුවේ සම්මත කර ගැනීමට හැකි වන පරිදි ඉදිරිපත් වෙලා තිබෙනවා. මේ සඳහා කිසිවෙක් විරුද්ධ වෙන එකක් නැහැ කියලා මම විශ්වාස කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ ඉතිහාසයේ මිනිසුන්ගේ අයිතිවාසිකම් පිළිබඳව වූ මේ ක්‍රියාදාමය ටිකෙන් ටික විකාශනය වෙමින් පවතිනවා. අපි පසු ගිය ජනාධිපතිවරණයේදී මේ රටේ ජනතාවට වුණු පොරොන්දුව, ජනතාව පිළිගත්ත පොරොන්දුව අනුව යමින් අපිට ජාතික ඖෂධ ප්‍රතිපත්තිය තව සති දෙකක කාලයක් ඇතුළත මේ රටේ සම්මත කර ගැනීමට හැකි වෙයි කියන කාරණය මම විශ්වාස කරනවා. ඒ වාගේම මේ රටේ රාජ්‍ය පරිපාලනය තුළ මූලාමය දූෂණ සිදුවීම වළක්වන රාජ්‍ය විගණනය උදෙසා බලය පවරන ජාතික විගණන පනත සම්මත කර ගැනීමට අපිට හැකි වෙයි කියලා මම විශ්වාස කරනවා. ඒ වාගේම මේ රටේ පුරවැසියන්ගේ අයිතිවාසිකම් ශක්තිමත් කරන, මේ රටේ පුරවැසියන්ට රාජ්‍ය පරිපාලනය තුළ වූ තොරතුරු ලබා ගැනීමට ඉවහල් වන්නා වූ, තොරතුරු දැන ගැනීමේ පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුවේ සම්මත කර ගන්න පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම වැදගත් පනත් කෙටුම්පතක් අපි ඊයේ සම්මත කර ගත්තා. මේ රටේ ඉතාමත් වැදගත් ක්ෂේත්‍රයක් වන අපරාධ යුක්තියට අදාළව සාක්ෂිකරුවන්ගේ සහ වින්දිතයන්ගේ අයිතිවාසිකම් පිළිබඳව පනත් කෙටුම්පතක් අපි ඊයේ සම්මත කර ගත්තා. එනම් අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පතයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ජයග්‍රහණයන් අපට ලබා ගන්න පුළුවන්කම ලැබුණේ ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ නායකත්වයෙන් යුතුව අපි කළ සාමකාමී අරගළය නිසායි. එම නිසා මේ අරගළය ඉදිරියට ගෙන යන්නට අවශ්‍ය සහාය විපක්ෂයේ ඉන්න අපේ බුද්ධිමත්, උගත් මන්ත්‍රීවරුන්ගෙන් තවදුරටත් ලැබෙයි කියන අපේක්ෂාවෙන් මම නතර වෙනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 6.59]

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම වැඩි වේලාවක් ගන්නේ නැහැ. මේ විවාදයේදී පැන නැඟුණු ප්‍රශ්න කිහිපයකට උත්තර දීලා, මම මේ පනතට සංශෝධන ඉදිරිපත් කරනවා. මේ විවාදයේදී පැන නැඟුණු එක ප්‍රශ්නයක් තමයි සිගරට් ලිහිල්ව - loose ලෙස - විකිණීම; පැකැට්වලින් තොරව සිගරට් විකුණනකොට මේ රූපමය අවවාදය පිළිබඳව පැන නඟින ප්‍රශ්නය. නමුත් සිගරට් විකුණන හැම තැනකම මේ රූපමය අවවාදය ප්‍රදර්ශනය කිරීමට අපි බලාපොරොත්තු වනවා. ඒවා නොකරන අයට නියම කරන දඩය සහ සිර දඬුවම් මේ සංශෝධනයේ පැහැදිලිවම සඳහන් වනවා. ඒ නිසා ඒක ඒ තරම් ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. ඒ වාගේම සෞඛ්‍යයට වියදම් කරන මුදල පිළිබඳවත් ප්‍රශ්න ඉදිරිපත් වුණා. අපි දැනට සෞඛ්‍යයට වියදම් කරන්නේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.7යි. නමුත් මේ වසර අවසානයේදී ඉදිරිපත් කිරීමට නියමිත අය වැය ලේඛනයෙන් පැහැදිලිවම එය සියයට 3ක් දක්වා වැඩි කිරීමට අපි පොරොන්දු වෙලා තිබෙනවා.

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

ඒ නිසා සෞඛ්‍යයට එන වාරයේ අය වැය ලේඛනයෙන් වැඩි මුදලක් වෙන් වනවා. එසේ වෙන් කරනු ලබන්නේ මේ රටේ ජනතාවගේ සෞඛ්‍යය සම්බන්ධ ප්‍රශ්න විසඳීම සඳහායි. තුන්වෙනි කාරණය ජාතික ඖෂධ ප්‍රතිපත්තිය. ඊයේ හවස තමයි අපිට එහි සිංහල සහ දෙමළ පරිවර්තන ලැබුණේ. එහෙම නැතිනම් මම හිටියේ අද එය පාර්ලිමේන්තුවට පිළිගන්වන්නටයි. එන පාර්ලිමේන්තු වාරයේදී එය පිළිගන්වලා ඒ පාර්ලිමේන්තු වාරයේදීම අපි ජාතික ඖෂධ ප්‍රතිපත්තියත් සම්මත කර ගන්නවා. බොහොම ස්තූතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.
ඛිනා විටුක්කප්පට්ටු, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.
Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." -[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

තීරණිත්කප්පට්ටු.
"சட்டமூலம் முழுப்பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன]

Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Rajitha Senaratne.]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் ஆராயப்பட்டது.
[பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered in Committee.
[MR. DEPUTY SPEAKER in the Chair.]

1 වන වගන්තිය.- (ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය)
வாசகம் 1.- (சுருக்கப் பெயரும் நடைமுறைக்கு வரும் திகதியும்)
CLAUSE 1.- (*Short Title and date of operation*)

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"1 වන පිටුවේ, 5 වන සහ 6 වන පේළි ඉවත් කරන්න."

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

1 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
1ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 1, as amended, ordered to stand part of the Bill.

2 වන වගන්තිය.- (2006 අංක 27 දරන පනතේ 34 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම)
வாசகம் 2.- (2006ஆம் ஆண்டின் 27ஆம் இலக்கச் சட்டத்தின் 34ஆம் பிரிவை மாற்றீடு செய்தல்)
CLAUSE 2.- (*Replacement of section 34 of Act, No.27 of 2006*)

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

1 වන පිටුවේ, (1) 15 වන පේළියේ සිට 25 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

"ඇතුළත් වන -

(අ) සෑම පැකැට්ටුවක, ඇසුරුමක හෝ කාඩ්බෝඩ් පෙට්ටියක ම, ඉදිරිපස සහ පිටුපස යන දෙපැත්තේ ම ඉහළ මතුපිට පෘෂ්ඨය මත, 34අ වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, නියම කරනු ලැබිය හැකි පරිදි වූ සෞඛ්‍ය අවවාද; සහ

(ආ) සෑම පැකැට්ටුවක්, ඇසුරුමක් හෝ කාඩ්බෝඩ් පෙට්ටියක් මත ම, එහි ඇති එක් එක් දුම්කොළ නිෂ්පාදනයේ අඩංගු තාර සහ නිකොටින් ප්‍රමාණය නිශ්චිතව දැක්වෙන ලේබලයක් හෝ ප්‍රකාශයක්,

පැහැදිළිව මුද්‍රණය කර ප්‍රකටව පෙනෙන ලෙස ප්‍රදර්ශනය කිරීමට සලස්වා තිබිය යුතු ය."

(2) 26 වන පේළිය සහ 27 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

(2) "දුම්කොළ නිෂ්පාදන අඩංගු සෑම පැකැට්ටුවක, ඇසුරුමක හෝ කාඩ්බෝඩ් පෙට්ටියක ම, (1) (අ) උප වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි වන සෞඛ්‍ය අවවාද සහ (1) (ආ) උපවගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි වන ලේබලයක් හෝ ප්‍රකාශයක්, පැහැදිළිව මුද්‍රණය කර ප්‍රකටව පෙනෙන ලෙස ප්‍රදර්ශනය කර ඇත්නම් මිස, යම් තැනැත්තකු විසින්, දුම්කොළ නිෂ්පාදන අඩංගු පැකැට්ටුවක්,ඇසුරුමක් හෝ කාඩ්බෝඩ් පෙට්ටියක් විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම, සැපයීම, බෙදා හැරීම හෝ ගබඩා කිරීම නො කළ යුතු ය."

(3) 2 වන පිටුවේ 1 වන පේළියේ සිට 10 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කරන්න:-

(4) 11 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

"(3) (1) වන උපවගන්තියේ හෝ (2) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන."

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
2ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 2, as amended, ordered to stand part of the Bill.

3 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියට 34අ වගන්තිය ඇතුළත් කිරීම)

வாசகம் 3.- (முதன்மைச் சட்டவாக்கத்தில் 34அ என்னும் புதிய பிரிவை உட்புகுத்துதல்)

CLAUSE 3.- (*Insertion of new section 34A in the principal enactment*)

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

3 වන පිටුවේ (1) 1 වන පේළියේ සිට 5 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

"(2)සිගරට සහ වෙනත් දුම්කොළ නිෂ්පාදන භාවිතය මඟින් සිදු විය හැකි සෞඛ්‍යයට අනතුරුදායක තත්ත්වයන් සහ හානිකර බලපෑම් පිළිබඳ ඉහත උප වගන්තියේ සඳහන් කර ඇති සෞඛ්‍ය අවවාදවල, නියම කර ඇති ආකාරයෙන් දක්වා තිබිය යුතු ය."

(2) 18 වන පේළිය සහ 19 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

"ඇති සෞඛ්‍ය අවවාද, සෑම ශ්‍රේණියකම නියමිත සෞඛ්‍ය අවවාද යටතේ වූ සියලු නියමිත වර්ගවල."

(3) "3 වන පිටුවේ, 23 වන පේළියේ සිට 25 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'අධිකාරියෙන් පමණක් නිකුත් කරනු ලබන නියමිත සෞඛ්‍ය අවවාද ඇතුළත් සංයුක්ත තැටිය භාවිත කළ යුතු ය.' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

3 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

3ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 3, as amended, ordered to stand part of the Bill.

4 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

4ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 4 ordered to stand part of the Bill.

5 වන වගන්තිය.- (අන්තර්කාලීන විධිවිධාන)

வாசகம் 5.- (நிலைபெயர்கால ஏற்பாடுகள்)

CLAUSE 5.- (*Transitional provisions*)

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"4 වන පිටුවේ, 1 වන පේළිය සහ 2 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'දැනට පවතින දුම්කොළ නිෂ්පාදන තොගවල නිෂ්පාදකයන්ට.' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

5 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

5ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 5, as amended, ordered to stand part of the Bill.

6 වන වගන්තිය.- (ව්‍යාවර්තන)

வாசகம் 6.- (பேணல்கள்)

CLAUSE 6.- (*Savings*)

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"4 වන පිටුවේ, 6 වන පේළියේ සිට 10 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

"6. මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයට පෙරාතුව, ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සමඟ කියවිය යුතු 30 වන වගන්තිය යටතේ සාදන ලද නියෝග මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට, මේ පනත ක්‍රියාත්මක වන දින සිට අඛණ්ඩව බලාත්මක ව පවතින්නේ ය.' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

6 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

6ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 6, as amended, ordered to stand part of the Bill.

7 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

7ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 7 ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.

Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported with Amendments.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මම යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

Question put, and agreed to.
Bill, as amended, accordingly read the Third time, and passed.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

මීළඟට සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු අජිත් කුමාර මහතා.

ශ්‍රී ලංකාව තුළ සමාජ කටයුතුවල නිරතවීමේ අයිතිය
இலங்கையில் சமூக நடவடிக்கைகளில் ஈடுபடுவதற்கான உரிமை
RIGHT TO ENGAGE IN SOCIAL ACTIVITIES IN SRI LANKA

[අ.භා.7.06]

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පසු ගිය කාලයේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ප්‍රශ්න ගණනාවක් උද්ගත වී තිබිණි. ආණ්ඩු පක්ෂයට වඩා වෙනස් මත දරන දේශපාලන ක්‍රියාකාරීන්ට, මාධ්‍යවේදීන්ට, කලාකරුවන් ඇතුළු තවත් බොහෝ දෙනෙකුට ජීවිත තර්ජන එල්ල විණි. සුදු වෑන් කල්ලි හරහා සිදු කරන පැහැර ගැනීම්, අතුරුදන් කිරීම් හා දේශපාලන සාතන සාමාන්‍යකරණය වන තත්ත්වයක් ගොඩනැඟී තිබිණි. ඇතැම් අය අතුරුදන් වූ අතර, තවත් අය සාතනයට ලක් විය. තවත් ඇතැම් අයට ජීවිතය බේරා ගැනීම සඳහා විදේශගතවීමට සිදු විය. මේ වන විටත් එලෙස රටින් පිටවූ මාධ්‍යවේදීන්, දේශපාලන ක්‍රියාකාරීන් විශාල ප්‍රමාණයක් වෙනත් රටවල ජීවත් වෙමින් සිටී.

පැවැති ප්‍රජාතන්ත්‍ර විරෝධී තත්වය හමුවේ ඔවුන්ට ජීවිත බේරාගෙන රටින් පිටවීම සඳහා විවිධ ක්‍රම අනුගමනය කිරීමට සිදු විය. ඒ අතරින් ඇතැම් අයට රටෙන් පිටවීම සඳහා පවතින ආගමන විගමන නීතියට පටහැනිව ක්‍රියා කිරීමට ද සිදු විය. මෙසේ දේශපාලන හේතු මත හා පැවැති ප්‍රජාතන්ත්‍ර විරෝධී තත්ත්වය නිසා රටෙන් පිටවූ සියලු දෙනාටම නැවත ලංකාවට පැමිණෙන ලෙස නව ආණ්ඩුව බලයට පත් වූ විගස විවෘත ආරාධනාවක් කළේය. නමුත් එසේ ලංකාවට පැමිණෙන්නන් සඳහා ඔවුන් මුහුණ පෑ ජීවිත අවදානම සහ ඔවුන්ට රටෙන් පිටවීමට සිදු වූ ක්‍රමවේදයන් ද සලකා නීතිමය රැකවරණයක් ලබා දීමට කිසිදු ක්‍රමවේදයක් මේ දක්වා සකස් කර නැත.

පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ දේශපාලන මණ්ඩල සහික කුමාර් ගුණරත්නම් සහෝදරයා ද එලෙස පැවැති ප්‍රජාතන්ත්‍ර විරෝධී තත්වත්ය හමුවේ විදේශගතවීමට බල කෙරුණු වාමාංශික ක්‍රියාධරයෙකි. ඔහු ලංකාවට පැමිණීමෙන් අනතුරුව ඔහුට රටෙන් පිටවීමට සිදු වූ දේශපාලන හේතු කිසිවක් නොසලකා ආගමන විගමන නීති ක්‍රියාත්මක කිරීමේ මුවාවෙන් ඔහුගේ දේශපාලනය කිරීමේ අයිතිය උදුරා ගැනීමට හා ඔහුව රටින් පිටුවහල් කිරීමට කටයුතු කෙරෙමින් තිබේ. මේ සඳහා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය, ආගමන විගමන දෙපාර්තමේන්තුව ඇතුළු රාජ්‍ය ආයතන ගණනාවක් උපයෝගී කර ගනිමින් තිබේ. මර්දනය නිසා විදේශගත වූ සියල්ලන්ට නැවත ලංකාවට පැමිණෙන ලෙස කළ ආරාධනය හා මෙම ක්‍රියාමාර්ග අතර විශාල පරස්පරයක් ඇත.

කුමාර් ගුණරත්නම් සහෝදරයාටත් ඒ ආකාරයට පසු ගිය කාලයේ විදේශගත වීමට සිදු වූ සියලුදෙනාටත් නැවත ලංකාවට පැමිණීමේ හා ලංකාවේ දේශපාලන කටයුතුවල නිරත වීමේ අයිතිය හිමි විය යුතුය. එහෙත් එම අයිතිය ආරක්ෂා කිරීමේදී පවතින නීති රීතිවලින් එයට එල්ල වන බාධාවන් ඉවත් කිරීම සඳහා කඩිනම් පියවරක් ගැනීම අවශ්‍ය වේ.

එබැවින් පසු ගිය කාලයේ පැවැති මර්දනකාරී හා ප්‍රජාතන්ත්‍ර විරෝධී තත්වය තුළ විවිධ ක්‍රම උපයෝගී කර ගනිමින් ලංකාවෙන් පිටවීමට සිදු වූ සියලු දෙනාගේ අයිතීන් ආරක්ෂා කෙරෙන ක්‍රමවේදයක් සකස් කළ යුතු යැයි ද, ඔවුන් සියලු දෙනාට නීතිමය රැකවරණයක් හා ලංකාව තුළ ජීවත්වීමේත් දේශපාලන හෝ මාධ්‍ය කටයුතුවල නිරතවීමේත් පූර්ණ අයිතිය ලබා දිය යුතු යැයි ද මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය කාලයේ මේ රට තුළ ප්‍රජාතන්ත්‍ර විරෝධී තත්ත්වයක් තිබුණා. ඒ ප්‍රජාතන්ත්‍ර විරෝධී තත්ත්වය හමුවේ විවිධ දේශපාලනඥයන්ට, දේශපාලන ව්‍යාපාරවලට, වෘත්තිකයන්ට, කලාකරුවන්ට, මානව හිමිකම් සංවිධානවලට, ජනමාධ්‍ය ආයතනවලට ආදි වශයෙන් විවිධ අයට විවිධ තර්ජන තිබුණා. ඒක රහසක් නොවෙයි. විශේෂයෙන් මේ රට මිලිටරීකරණය කිරීමේ ක්‍රියා මාර්ග ගණනාවක් ගනිමින් තිබුණා. සුදු වෑන් සංස්කෘතියක් තිබුණා. පැහැර ගැනීම්, අතුරුදහන් වීම්, දේශපාලන සිරකරුවන් ඝාතනය කිරීම් ආදි වශයෙන් පළිගැනීම් ගණනාවක් කෙරුණා. අපි ඒ පිළිබඳව පසු ගිය කාලයේ දීර්ඝව මේ ගරු සභාවේ කථා කළා. විශේෂයෙන් ඒ වෙලාවේ විපක්ෂයේ සිටි එක්සත් ජාතික පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ, අපි, ඒ වාගේම මහින්ද රාජපක්ෂ ආණ්ඩුව තුළ සිටි පාර්ශ්ව පවා මේ පිළිබඳව දැවැන්ත විවේචනයන් එල්ල කළා. ඒ විවේචනයම පසු ගිය දිනවල වූ බල මාරුව සඳහාත් බලපෑවා. ඒ විවේචනයේ මූලික ඉදිරිපත් කිරීම තමයි, "ප්‍රජාතන්ත්‍ර විරෝධී පාලනය පෙරළමු. යහ පාලනය ගෙනෙමු." කියන එක.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Order, please! කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු අතාවුද සෙනෙවිරත්න මහතාගේ නම යෝජනා කරන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු අතාවුද සෙනෙවිරත්න මහතා දැන් මූලාසනය ගත යුතු ය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අතාවුද සෙනෙවිරත්න මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அதாவுத செனெவிரத்ன அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. ATHAUDA SENEVIRATNE *took the Chair.*

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

යහ පාලනය වෙනුවෙන්, ප්‍රජාතන්ත්‍ර විරෝධී පාලනය වෙනුවට ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් වෙනුවෙන් මේ වෙලාවේ ආණ්ඩුවේ සිටින පාර්ශ්වයත් එදා බරපතළ සාකච්ඡාවක් කළා. විශේෂයෙන් ඔවුන් පසු ගිය මැතිවරණ කාලයේ ආරාධනා කළා පසු ගිය ප්‍රජාතන්ත්‍ර විරෝධී තත්ත්වය හමුවේ විදේශගත වූ අයට නැවත එන්න කියලා.

ගාල්ල දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රී, ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා වන අපේ හිතවත් ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා මේ අවස්ථාවේදී මේ සභාවේ රැඳී සිටීම පිළිබඳව මම විශේෂයෙන් සතුටු වනවා. එතුමා ජනවාරි මාසයේ 19 වෙනි දා වැඩ භාර ගත් වෙලාවේ කරපු ප්‍රකාශයක් "Daily News" පුවත් පතේ තිබෙනවා, "Please come back and work" කියලා. මම ඒ පුවත් පත් දැන්වීම් කොටස හැන්සාඩ් වාර්තාවට ඇතුළු කිරීම සඳහා **සභාගත*** කරනවා.

ඒ වාගේම, එතුමා මල්වතු පාර්ශ්වයේ මහනාහිමි හමු වූ වෙලාවේ මහනුවරදී කළ ප්‍රකාශයක් 2015.01.26 වෙනි දා "ලක්බිම" පත්තරයේ මෙසේ වාර්තා කරනවා.

> "පසු ගිය ප්‍රජාතන්ත්‍ර විරෝධී පාලනය හමුවේ රට අත් හැර ගිය මාධ්‍යවේදීන් ඇතුළු මේ රටේ මාධ්‍යවේදීන් සියලු දෙනාට රටට එන්න ආරාධනා කරනවා."

එතුමා එහෙම ආරාධනා කිරීමක් කරනවා. නමුත්, දැන් මොකක්ද වන්නේ? දැන් රටට එන්න බලා ගෙන මාධ්‍යවේදීන්, කලාකරුවන්, වෘත්තිකයන්, ඒ වාගේම දේශපාලනඥයන් විදේශ රටවල ඉන්නවා. විශේෂයෙන් සරණාගතයන් විධියට දේශපාලන රැකවරණ ලබමින් ඉන්න, ලංකාවට -මව් බිමට- එන්න කැමැත්තෙන් ඉන්න මාධ්‍යවේදීන් ඒ ගාස්තු ගෙවා ගන්න බැරිව නේපාලයේ සිටින බව අපි දැක්කා. නමුත්, දැන් මොකක්ද වන්නේ? ඒ අයට එන්න කියලා එහෙම අත වනන අතරේ ආපහු ඒ අයට මොකක්ද කරන්නේ? ඒ නිසා මේ සම්බන්ධයෙන් තිබෙන තත්ත්වය හරි පැහැදිලියි. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය කියලා දොරටුවක් විවෘත කරන්න යෝජනා කරපු අයගෙන් අපි මේ දේ අහනවා. ඔබතුමන්ලා ආරාධනා කරන්නේ දේශපාලනය නොකරන අයට එන්න කියලාද? එහෙම නැත්නම්, ඔබතුමන්ලාට එරෙහි දේශපාලනය නොකර, ඔබතුමන්ලා කැමැති පාරේ යන අයට එන්න කියලාද? ඒ සම්බන්ධයෙන් තමයි මම මේ යෝජනාව ඉදිරිපත් කළේ.

මේ සමාජයේ සිටින අප හැම දෙනාම බලාපොරොත්තු වුණා, ඒ වාගේම අපි ඉල්ලුවා, ප්‍රජාතන්ත්‍ර විරෝධී සුදු වැන් සංස්කෘතියත් එක්ක කවුරු හරි මේ රටෙන් බැහැර වුණා නම්, ඔහු ගියේ මොන ක්‍රමයටද කියලා නීති පොත් පෙරළ පෙරළා හොයන්නේ නැතිව ඔවුන්ට මේ රටට ඇවිල්ලා ඔවුන්ගේ දේශපාලනය, වෘත්තිය කටයුතු, ජනමාධ්‍ය කටයුතු කරන්න ඉඩකඩ දෙන්න කියලා. එය මේ රටේ කවුරුත් යෝජනා කළා; මේ ආණ්ඩුවත් යෝජනා කළා. නමුත් දැන් මොකක්ද වන්නේ?

කුමාර් ගුණරත්නම් සහෝදරයා ලංකාවට ඇවිල්ලා ඉන්නවා. ඔහු ලංකාවෙන් ගියේ මොකද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔහු ලංකාවෙන් ගියේ දේශපාලනය කිරීම නිසා ඇති වූ ප්‍රශ්න එක්ක. එහෙම නැතිව ඔහු මේ රටේ ව්‍යාපාර කරලා නැහැ. ඔහු මේ රටේ වෙනත් අපරාධ කරලා නැහැ. ඔහු දේශපාලනය කළා. දේශපාලනය කරපු නිසා ඔහුට මොකක්ද වුණේ? කාලාන්තරයක් තිස්සේ ඔහු මර්දනයට ලක් වුණා. මට ඒකට ඕනෑ තරම් උදාහරණ ඉදිරිපත් කරන්න පුළුවන්. නමුත්, දැන් මේ සභාවේ ඒ සඳහා වෙලාව නැහැ. ඔහුට දේශපාලන වශයෙන් ප්‍රහාරයක්, තර්ජනයක් තිබුණාය කියන එක ඔප්පු වුණා. 2012 අප්‍රේල් මාසයේ හත්වැනි දා පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ සමුළුවට දවස් දෙකකට කලින් සුදු වෑන් එකකින් ඇවිල්ලා ඔහු පැහැර ගත්තා. මම මේ වෙලාවේ එක් දෙයක් මතක් කරනවා. ඒ පැහැර ගැනීම වුණු වෙලාවේ එවකට විපක්ෂ නායකතුමා වූ රනිල් වික්‍රමසිංහ මැතිතුමා, කරු ජයසූරිය මැතිතුමා, රවි කරුණානායක මැතිතුමා එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් ඒ පැහැර ගැනීමට විරුද්ධව මැදිහත් වුණා. අපි එතුමන්ලාට ස්තුතිවන්තව එය මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට තවත් පුවත් පතක කොටසක් ඉදිරිපත් කරනවා. 2012 අප්‍රේල් 09 වෙනි සඳුදා "ලක්බිම" පත්තරයේ මෙසේ වාර්තා වනවා:

> "පැහැරගෙන යෑම් සහ අතුරුදහන්වීම් දෛනික ජීවිතයේ අංගයක් වෙලා"

එවකට විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමා එදා එසේ ප්‍රකාශ කළා. එතුමා මොකක්ද මේ කියන්නේ? එතුමා එදා එම පුවත් පතට මෙසේ කියනවා:

> "ජන අරගළ ව්‍යාපාරයේ ක්‍රියාකාරී නායකයන් දෙපළක් වූ ප්‍රේමකුමාර ගුණරත්නම් මහතා සහ දිමුතු ආටිගල මහත්මියගේ අතුරුදන්වීම සම්බන්ධව අපගේ බලවත් සැලකිල්ල යොමු වී ඇත."

මේ කුමාර් ගුණරත්නම් කියන්නේ කවුද? ඔහු පැහැර ගත්තා. ඔහු පැහැර ගත්තේ වංචාවක් කළ නිසාද? එහෙම නැත්නම් නීති කඩලාද? නැහැ. ඔහු පැහැර ගත්තේ දේශපාලනය කරපු නිසා. මෙතුමන්ලා ඒ වෙනුවෙන් පෙනී සිටියා. මෙතුමන්ලා ඒ ගැන කථා කළා. අපි ඒක ස්තුතිපූර්වකව මතක් කරනවා. එදා විපක්ෂ නායක අද අගමැතිතුමා. එතුමා ඒ සම්බන්ධයෙන් කථා කළා. එදා කරු ජයසූරිය මැතිතුමා කථා කළා. ඒ පිළිබඳව පරීක්ෂණයක් කරනවා කියලා නියෝජ්‍ය පොලිස්පති අනුර සේනානායක මැතිතුමාගේ මූලිකත්වයෙන් පරීක්ෂණ කණ්ඩායම් තුනක් ගියා කිව්වා. නමුත්, ඒ පරීක්ෂණයේ ප්‍රතිඵල අදටත් නැහැ. මහජන සාමය පිළිබඳ ඇමතිතුමනි, ඔහු පැහැර ගත් එක පිළිබඳව පරීක්ෂණයේ ප්‍රතිඵල අදටත් නැහැ. ඒ පරීක්ෂණය පටන් ගන්න කියලා මම ඔබතුමාට මතක් කරනවා. කුමාර් ගුණරත්නම් පැහැර ගත් සිද්ධිය සම්බන්ධ පරීක්ෂණ ආරම්භ කරන්නේ නැතිව, ඔහුට ලංකාවට එන්න කියලා ආරාධනා කළ ආණ්ඩුවම ඔහු ලංකාවට ආවාට පස්සේ වහාම පිට වන්න කියලා නීති පොත් පෙරළන්නේ ඇයි? ඔහුට එන්න කියලා පිහියෙන් අනිනවා. ඒ නිසා අද ලංකාවට එන්න ඉන්න අයට ප්‍රශ්නයක් තිබෙනවා.

මාධ්‍යවේදියෙකු වන සනත් බාලසූරිය මහත්මයා 2015 පෙබරවාරි 15 වෙනිදා "ජනරළ" පුවත් පතේ පිටුවක් පුරා ලියා තිබුණා, "තොටුපළේ සිට එන්න කියලා අත වනනවා" කියලා. එන්න කියා අත වනලා ඔබතුමන්ලා මොකක්ද මේ කරන්න

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු අජිත් කුමාර මහතා]

හදන්නේ කියලා එතුමා ප්‍රශ්න කරනවා. දැන් කියනවා, කුමාර් ගුණරත්නම් ලාංකිකයෙක් නොවෙයි ලු. කුමාර් ගුණරත්නම් ලාංකිකයෙක් නොවෙයිද? 1982 ඉඳලා අපි කවුරුත් ජනතා විමුක්ති පෙරමුණ කියන දේශපාලන ව්‍යාපාරයේ වැඩ කළා. ඔහු ඒ සඳහා පරිත්‍යාගශීලීව වැඩ කළා. ඔහු ලාංකිකයෙක් නොවෙයිද?

මම මේ අවස්ථාවේ හැන්සාඩ් වාර්තාවට ඇතුළු කිරීම සඳහා මේ වාර්තා ටික ඉදිරිපත් කරනවා. මෙන්න, ප්‍රේමකුමාර් ගුණරත්නම්ගේ උප්පැන්න සහතිකය. මෙන්න, 1970දී ඔහු පළමුවැනි ශ්‍රේණියට ඇතුළත් වූ සහතිකය. මෙන්න, ඔහු ශිෂ්‍යත්වය සමත් වූ සහතිකය. මෙන්න, ඔහු විශ්වවිද්‍යාලයට ඇතුළත් වූ වෙලාවේ දීපු identity card එකේ ඡායා පිටපත. මෙන්න, ඔහුගේ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව සහතිකය. මෙන්න, විපක්ෂ නායක අනුර බණ්ඩාරනායක මැතිතුමාට ප්‍රේමකුමාර් ගුණරත්නම් සහ රංජිදම් ගුණරත්නම් අතුරුදහන් වූ වෙලාවේ ඉදිරිපත් කරපු ලිපිය. මෙන්න, විපක්ෂ නායක අනුර බණ්ඩාරනායක මැතිතුමා ඒ සම්බන්ධයෙන් එවූ ලිපිය. මෙන්න, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ක්‍රියාන්විත මූලස්ථානයෙන් එවපු ලිපිය. ප්‍රේමකුමාර් ගුණරත්නම් කියන්නේ ලාංකිකයෙක් කියලා සහතික කරන්න ඕනෑ තරම් කරුණු තිබෙනවා.

මෙන්න විදෙස් ගමන් බලපත්‍රය. මේ සියලු ලේඛන තොග පිටින්, මිටි පිටින් ඉදිරිපත් කරන්නට පුළුවන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එසේ නම් ඔහු ලාංකිකයෙක්. ඊළඟට ඔහුගේ උපාධි සහතික, O/L, A/L සහතික මේ සියල්ල මම හැන්සාඩ් වාර්තාවට එකතු කරන්න **සභාගත*** කරනවා.

ඔහු ලාංකිකයෙක්. ඔහුට ලංකාවෙන් පිට වෙන්න සිදු වුණේ, මේ රටේ තිබුණු ප්‍රජාතන්ත්‍ර විරෝධී තත්ත්වය නිසා. ඔහු 2015 ජනවාරි මාසයේ 01වන දා ලංකාවට එනකොට ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට මමයි ගියේ, පාලකවරයා හමු වෙන්න. මාස ගණනක් තිස්සේ ඔහුට visa නිකුත් නොකර ඉන්නකොට visa ඉල්ලන්න ගියාම එතුමා කිව්වා, "Visa දෙන්නම්. ඔහු කලින් ආපු වෙලාවේ visa කාලය ඉකුත් වෙච්ච නිසා, දඩය ගෙවන්න." කිව්වා. "දඩය ගෙවන්නම්, ලියුමක් දෙන්න" කිව්වා. මා එම ලියුම හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

එම ලියුමේ පැහැදිලිව කියනවා, ඔහු ලංකාවෙන් ගියෙත් දේශපාලනය නිසා, ඔහු ලංකාවට ආපසු එන්නේත් දේශපාලනය නිසා කියලා. මේ, රටේ නීතිය ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙලාවක් ය කියා මෙතුමන්ලා කියනවා. ඔහු ලංකාවෙන් ගියෙත් දේශපාලනය කරන නිසා, එන්නේත් දේශපාලනය කරන නිසා කියලා ඒ ලියුමේ කිව්වා. Visa දුන්නා. දැන් අහනවා, " ඇයි, ලංකාවේ දේශපාලනය කරන්නේ?" කියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔහු දේශපාලනය කළ නිසා පැහැර ගත්තේ. ඔහු දේශපාලනය කළ නිසා තමයි ඔහුට තාඩන, පීඩන එල්ල වුණේ. එම නිසා ඔහුගේ වැඩය දේශපාලනය කරන එක. ඔහුව ඕනෑ ඒකට. ඔහු ලාංකිකයෙක්. එම නිසා මොකද කළේ?

මේ පිළිබඳව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට ප්‍රකාශය දෙන්නට කිව්වාට පස්සේ දවස් දෙකක් ගිහිල්ලා - මාත් ගිහිල්ලා- ප්‍රකාශ දුන්නා. ඒකේත් ඔහු කිව්වා, "මම ලාංකිකයෙක්. මම ලංකාවේ ඉන්න ඕනෑ. මට ඕස්ට්‍රේලියාවේ ඉන්න ඕනෑ නැහැ. ඕස්ට්‍රේලියාවට යන්න වුණේ මේ රටේ තිබුණු මර්දනය නිසා" කියලා. එම නිසා දැන් නීති පොත් පෙරළා සොයන්න එපා. ගියේ මොකද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? ඒ වෙලාවේ කුමාර් ගුණරත්නම් කියා පාස්පෝට් එකක් හදා ගෙන, visa හදා ගෙන, බෑග් එකට බඩු ටික දාගෙන, ගමන් මල්ලත් එල්ලා ගෙන යන්න පුළුවන් නිදහසක් තිබුණා නම් අපි යනවා නේ. එහෙම නම් යන්න ඕනෑත් නැහැ නේ. එහෙම ගියේ, නිසි විධියට යන්න බැරි නිසා නේ. ඔය ගිය අය බොහෝ දෙනෙක් එහෙමයි ගියේ. එක්කෝ බෝට්ටුවෙන් ගියේ, එක්කෝ නම් මාරු කරලා ගියේ, එක්කෝ හොර පාස්පෝට් එකකින් ගියේ. මෙතුමන්ලා කිව්වා, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය තිබුණේ නැහැ කියලා. දැන් කියනවා,"ප්‍රජාතන්ත්‍රවාදය නොවෙයි, නීතියේ ප්‍රශ්නයක් ය" කියලා. එසේ නම් ඔබතුමන්ලා පිළිගන්නවා ද, එදා ප්‍රජාතන්ත්‍රවාදය තිබුණේ නැහැ කියා? ප්‍රජාතන්ත්‍රවාදය තිබුණේ නැහැ කියා පිළිගන්නවා නම් ඒ ප්‍රජාතන්ත්‍ර විරෝධී තත්ත්වය ඇතුළේ රටෙන් ගිය අයට එන්න දැන් බාධා කරන්නේ ඇයි? නීති පොත් පෙරළන්නේ ඇයි?

ඊට පස්සේ මේ පිළිබඳව අපි කී දෙනකුට කිව්වා ද? මම හැමෝටම කිව්වා. මම අගමැතිතුමාට දෙවරක් කිව්වා; ලිඛිතව දුන්නා. ගරු ජෝන් අමරතුංග ඇමතිතුමාට ලිඛිතව දුන්නා. තවම එතුමාගෙන් උත්තරයක් නැහැ. ඊට පස්සේ එතුමාට පුද්ගලිකව කිව්වා. විදේශ කටයුතු ඇමතිතුමාට දෙවරක් කිව්වා. නියෝජ්‍ය අමාත්‍ය ගරු අජිත් පී. පෙරේරා මැතිතුමාට මා මේ පිළිබඳව කාරුණිකව කිව්වා. ඊළඟට සභානායක ගරු ලක්ෂ්මන් කිරිඇල්ල අමාත්‍යතුමට කිව්වා. අධිකරණ අමාත්‍යතුමාට හා අධිකරණ නියෝජ්‍ය අමාත්‍යතුමාට කිව්වා. මා විතරක් නොවෙයි, මේ ආණ්ඩුව බලයට පත් කරන්න මහන්සි වුණු , ඒ වෙනුවෙන් කථා කළ අපේ ගෞරවනීය මාදුළුවාවේ සෝභිත ස්වාමීන් වහන්සේ මේ පිළිබඳව ජනාධිපතිතුමාට, අගමැතිතුමාට ලියුම් යැව්වා. උන්වහන්සේ මොකක් ද කියා තිබෙන්නේ? උන්වහන්සේ විතරක් නොවෙයි. ආචාර්ය නිර්මාල් රංජිත් දේවසිරි මහතා, චන්ද්‍රගුප්ත තේනුවර ජ්‍යෝෂ්ඨ කථිකාචාර්යතුමා, කලාකරුවන්, විද්වතුන්, මානව හිමිකම් සංවිධාන නියෝජිතයන් ගණනාවක් අත්සන් කර ජනාධිපතිතුමාට ලියුමක් යැව්වා. මොනවා ද කියා තිබෙන්නේ?

"වත්මන් රජයේ නියෝජිතයන් මාධ්‍යවලට පළ කළ අදහස්වල දී එවැනි පිරිස්වලට නැවත රටට ආරාධනා කරනු ලැබූ අතර එම ආරාධනය තුළින් ඉහත සඳහන් ප්‍රජාතන්ත්‍ර ලැදි ජනතාවගේ බලාපොරොත්තු වෙත යම් සාධනීය බලපෑමක් සිදු කෙරුණි. ... ඔවුන්ට මේ රටට පැමිණ දේශපාලනය කිරීමට ඇති අයිතිය තහවුරු කිරීම වත්මන් පාලනය වෙත පැවරී ඇති වගකීමක් බව අපි අවධාරණය කරමු. මේ මොහොත වන විට ඔහු - කුමාර් ගුණරත්නම් - ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක වෙමින් ඇති නීතිමය ක්‍රියාමාර්ගය මඟින් ඔහු අත් අඩංගුවට ගෙන රඳවා තබා ගැනීම හෝ ඔහු රටින් නැවත පිටුවහල් කිරීම හෝ වැනි උත්සාහයක් පවතින්නේ නම් එය ඉහත සඳහන් කළ ප්‍රජාතන්ත්‍රවාදී බලාපොරොත්තු බිඳ දැමීමක් වනු ඇත."

ආදී වශයෙන් මාදුළුවාවේ සෝභිත ස්වාමීන් වහන්සේ ඇතුළු කීප දෙනෙක් අත්සන් කර ජනාධිපතිතුමාට ලියුමක් යැව්වා. මේ කියන්නේ නීති පොත් පෙරළන්න කියා නොවෙයි, මෙතුමන්ලාම කියපු විධියට ඔවුන්ට දේශපාලනය කිරීමේ අයිතිය දෙන්න කියායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක කුමාර් ගුණරත්නම්ගේ ප්‍රශ්නයක් විතරක් නොවෙයි. මේ රටෙන් පිට වෙච්ච සිය ගණනාවකට දැන් තීන්දු කරන්න තියෙනවා, ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් තිබෙනවාය කියා මෙතුමන්ලා

**** පුස්තකාලයේ තබා ඇත.***

** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

කියනකොට ඒ යටතේ ලංකාවට එනවා ද නැද්ද කියන ප්‍රශ්නය. ඔවුන්ට ඒ ප්‍රශ්නය ඇවිල්ලා තිබෙනවා. මාධ්‍යවේදීන් අපට කථා කර කියනවා, "මේ විධියට ආවොත් මේ ගොල්ලෝ නීති පොත් පෙරළලා අපවත් හිරේ විලංගුවේ දමාවි" කියා. එම නිසා ඒ ප්‍රශ්නය ඇවිත් තිබෙනවා. මේ රටේ තිබෙන සියලුම මාධ්‍ය සංවිධාන - නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, ශ්‍රී ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය, මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනය, දෙමළ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය, ප්‍රජාතන්ත්‍රවාදය උදෙසා මාධ්‍ය ව්‍යාපාරය -පසු ගිය දා වැඩ කළේ කා වෙනුවෙන් ද කියා. තමුන්නාන්සේලා දන්නවා, "මේ වැඩය වැරදියි" කියා මේ සියලුම මාධ්‍ය සංවිධාන අත්සන් කර ජනාධිපතිතුමාට ලියුමක් යවා තිබෙනවා කියා.

එම නිසා මා විතරක් නොවෙයි, -මා පුද්ගලිකවත් ඉල්ලුවා.- මේ සියලුම දෙනාත් ඉල්ලුවා, "මේක කුමාර් ගුණරත්නම්ගේ ප්‍රශ්නයක් විතරක් නොවෙයි. මේ, ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය උල්ලංඝනය වෙලා, ඒ මර්දනය හමුවේ මේ රටෙන් බැහැර වෙච්ච අයට සිදුවෙන ප්‍රශ්නයක්. මේ ප්‍රශ්නය විසඳන්න රජය නීති පොත් පෙරළන්නේ නැතිව, දේශපාලන තීරණයක් අර ගෙන ඒක වෙනස් කරන්න මැදිහත් වෙන්න" කියා.

ඒ විතරක් නොවෙයි, කුමාර් ගුණරත්නම් සහෝදරයා හැම තිස්සේම කිව්වා, "මම ඕස්ට්‍රේලියාවේ පුරවැසිභාවය අතහරින්න ලැහැස්තියි" කියලා. ඒක ලිඛිතව දුන්නා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි, ලංකා පුරවැසි පනත යටතේ ඒ පිළිබඳව බලය තිබෙන්නේ අමාත්‍යවරයාටයි; ඒ සම්බන්ධයෙන් සිටින වර්තමාන අමාත්‍යවරයා ජෝන් අමරතුංග මැතිතුමායි. එම පනතේ 8වැනි වගන්තිය යටතේ, "පරම්පරාගත ලංකා පුරවැසි තත්ත්වය නැවත ලද බවට සහතිකයක් ඉල්ලීම" කියන කරුණ යටතේ අපි ආයාචනයක් කළා; ඉල්ලීමක් කළා. මේ වන තෙක් ඒකට උත්තරයක් නැහැ. ඒ වගන්තිය යටතේ මේ අවස්ථාව දෙන්න පුළුවන්. එතුමන්ලා එන්න කියන අයට දෙන්න පුළුවන් ක්‍රමයක් නීතිය ඇතුළේ තිබෙනවා. ඒ නිසා දැන් දේශපාලන තීරණයක් ගැනීමේ වගකීම මේ රජයට ඇවිල්ලා තිබෙනවා. ඒකෙන් ගැලවෙන්න බැහැ. පසු ගිය කාලයේ කියපු යහ පාලනය, ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් ක්‍රියාත්මක වෙන්න අවස්ථාව දැන් ඇවිල්ලා තිබෙනවා. එහෙම නැත්නම් අපට අහන්න වෙනවා, "තමුන්නාන්සේලාගේ යහ පාලනය, ප්‍රජාතන්ත්‍රවාදය කෝ?" කියන ප්‍රශ්නය. ඒක විවෘත කරන්නේ තමුන්නාන්සේලාට එකඟ දේශපාලනයක් කරන අයට විතරද; තමුන්නාන්සේලා කැමැති පාරේ යන අයට විතරද? තමුන්නාන්සේලාගේ දේශපාලනය විවේචනය කරන්න ඉන්න, විවේචනය කරපු, කරන අයට ඒ පාර විවෘත නැද්ද? ඒකද මේ ක්‍රියාත්මක කරන්නේ කියලා අපි බරපතළ විධියට ප්‍රශ්න කරනවා. අපි විතරක් නොවෙයි, මේ පාලකයන් බලයට ගෙනාපු සංවිධාන, මාධ්‍ය, කලාකාරුවන්, විද්වතුන්, ස්වාමීන් වහන්සේලා අද ඒ ප්‍රශ්නය අහනවා. හෙට අනිද්දාට ඒ ප්‍රශ්නය තව වැඩියෙන්, මීට වඩා සද්දෙට ඇහේවි. ඒ නිසා තමුන්නාන්සේලා මේකට උත්තරයක් දිය යුතුයි.

අපි මේ කාරණයත් විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. මේ පිළිබඳව අපි ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා මූලික කරුණු තුනක් කිව්වා. ඕස්ට්‍රේලියාවේ වුණත් ඔහු ලාංකික පුරවැසිභාවය අතහරින්න සූදානම් වුණේ නැහැයි කියන එක කිව්වා. ඊළඟට ඕස්ට්‍රේලියාවේ පුරවැසිභාවය ලංකාවේ පුරවැසිභාවයට ප්‍රශ්නයක් නම් ඒක අතහරින්න ලැහැස්තියි කිව්වා. ඒ වාගේම සරණාගතයකුට වුණත් අයිතියක් තිබෙනවා, රටක පුරවැසිකම නැතත් මැදිහත් වෙන්න. මේ කරුණු කිව්වා. නමුත් ආණ්ඩුව, රජය වෙනුවෙන් රජයේ නීතිඥවරයා කරුණු දක්වමින් කිව්වේ මොකක්ද? ශ්‍රේෂ්ඨාධිකරණයත් සැලකුවේ ඒ කාරණය විතරයි. ඒ සැලකුව කරුණ මොකක්ද? අපි ඉදිරිපත් කළ කරුණු ප්‍රතික්ෂේප කළේ නැහැ. ඔහු මෙහෙම කරුණක් කිව්වා. ආගමන විගමන පනත සහ පුරවැසි පනතේ වගන්ති ගණනාවක් උද්ධෘත කරමින් රජයේ නීතිඥවරයා කරුණු කිහිපයක් කිව්වා. ඒ කිව්වේ මොකක්ද? මෙහි බලය තිබෙන්නේ ඇමතිවරයාට. ඇමතිවරයා තමයි තීන්දු කරන්නේ. වීසා දීර්ඝ කරනවාද, පුරවැසිකම දෙනවාද කියලා තීන්දු කරන්නේ ඇමතිවරයා. ඔහු ඒ ප්‍රශ්නය අහපු එක හොඳයි. අපි කියනවා, මේක තීරණය කරන්න අමාත්‍යවරයාට බලය තිබෙනවා කියලා. දැන් අමාත්‍යවරයා ඒක පැත්තකට විසි කරනවා. එහෙම කරන්නේ ඇයි කියලා අපි දන්නේ නැහැ. ඔබතුමන්ලාම කියපු කරුණු දැන් ඔබතුමන්ලාම උල්ලංඝනය කරමින්, කඩමින් ඉන්නවා.

ඒ නිසා මේක කුමාර් ගුණරත්නම්ගේ විතරක් ප්‍රශ්නයක් නොවෙයි. මේක මේ රටේ පැහැර ගැනීම්වලට, සාතනවලට, තර්ජනවලට බයේ රට ගිය අයගේ ප්‍රශ්නයක් විතරක් නොවෙයි. තව ප්‍රශ්න ගණනාවක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ අවස්ථාවේ විශේෂයෙන් මතක් කරනවා, පෝද්දල ජයන්ත, සනත් බාලසූරිය, ශාන්ත ආදී වශයෙන් මාධ්‍යවේදීන් ගණනාවක් විදේශගත වෙලා ඉන්නා බව. එතුමන්ලා ගැන තමයි ජනමාධ්‍ය ඇමතිතුමා කියන්නේ. ඒ සියලු දෙනාට එන්න ආරාධනා කරනවා. ඒ වාගේම පසු ගිය කාලයේ අපි දැක්කා, දේශපාලන සිරකරුවන්, අතුරුදහන් වූවන්, පැහැර ගත්තවුන්, මරා දැමූවන් පිළිබඳ ප්‍රශ්න ගණනාවක් මේ රටේ තිබුණ බව. ඇයි, දේශපාලන සිරකරුවන් වැඩි වුණේ? ඇයි, මිනිස්සු පැහැර ගත්තේ? ඇයි, මිනිස්සු මරා දැම්මේ? ඇයි, ලලිත්ලා, කුගන්ලා අතුරුදහන් වුණේ, ලසන්තලා, ප්‍රගීත්ලා සාතනය වුණේ? ඒ පසු ගිය කාලයේ තිබුණු ප්‍රජාතන්ත්‍ර විරෝධී තත්ත්වයන් නිසා. ඒ මූලය, එකම මූලයක් තිබුණේ. ප්‍රජාතන්ත්‍රවාදයට විරුද්ධව කටයුතු කිරීම කියන එකම මූලයක් තිබුණේ. ඒ එකම මූලය විසින් පැන නැඟුණු ප්‍රශ්න තමයි තිබුණේ. දැන් තමුන්නාන්සේලා දේශපාලන සිරකරුවන් ගැන කථා කරන්නේ නැහැ; අතුරුදහන් වූවන් ගැන කථා කරන්නේ නැහැ; මරා දැමූවන් ගැන කථා කරන්නේ නැහැ; පැහැර ගත්තවුන් ගැන කථා කරන්නේ නැහැ; මර්දන ඉස්සරහ මේ රටින් විදේශ ගත වුණු අය ආපසු එන කොට බාධා කරනවා. එහෙම නම් තමුන්නාන්සේලා කල්පනා කරන්නේත් පරණ වැඩේ ඒ විධියටම කරන්නද? යහ පාලනය කියලා කරන්න හදන්නේ ඒකද? කරුණාකරලා මේ රටේ දේශපාලනය කිරීමේ අයිතිය කුමාර් ගුණරත්නම්ට විතරක් නොවෙයි, උතුරේත්, දකුණේත්, නැඟෙනහිරත්, බටහිරත් ඇතුළු සිව් කොණේම මිනිස්සුන්ගේ වර්ගය, ලිංග භේදය, ආගම් කිසිවක් නොසලකා ඕනෑම කෙනකුගේ දේශපාලනය කිරීමේ අයිතිය දෙන්න. කුමාර් ගුණරත්නම් කියන්නේ ලාංකිකයෙක් බව මුළු ලෝකයම දන්නවා. එහෙම දැන දැන ඇයි, මේ විධියට වංචා කරන්නේ? ඇයි, ඔහුට විරුද්ධව මෙහෙම නීතිය ක්‍රියාත්මක කරන්නේ? ඇයි, ඔහු පස්සෙන් පොලිස් බල ඇණි යවන්නේ?

ඊයේ මගේ කාර්යාලයටත් පොලීසිය පැන්නා. පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා කියනවා, පොලීසියෙන් ආවේ නැහැයි කියලා. ඇයි, කාර්යාලවලට පැනලා තර්ජනය කරන්නේ? ඇයි, බලහත්කාරකම් කරන්නේ? අර්ජුන් මහේන්ද්‍රන් කියන සිංගප්පූරු ජාතිකයකුට පුරවැසිභාවය දෙන කොට ඔබතුමන්ලා මේවා සෙව්වේ නැද්ද? ඔහු මහ බැංකුවේ අධිපති කරන කොට මේ ප්‍රශ්නය ඇහුවේ නැහැ. මේ රටේ ප්‍රධාන මූල්‍ය ආයතනයක ප්‍රධානියා බවට අර්ජුන් මහේන්ද්‍රන් පත් කරන කොට ඔහු කොහේ පුරවැසියෙක්ද කියලා ඇහුවේ නැහැ. මේ රටේ හිටපු මිනිහෙක්; දේශපාලනය නිසා මර්දනයට ලක් වෙච්ච මිනිහෙක්; ඒ මර්දනය නිසා මොකක් හරි ක්‍රමයකින් ජීවිතය බේරා ගත් මිනිහෙක් නැවත දේශපාලනය කරන්න "මට ඕස්ට්‍රේලියාව එපා, ලංකාවට එන්න දීපන්" කියන කොට අහනවා, පුරවැසිභාවය මොකක්ද කියලා. කොහොමද ගියේ කියලා අහනවා.

[ගරු අජිත් කුමාර මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නය නීතියෙන් බේරන්න බැහැ. මේක යුක්තිය පිළිබඳ ප්‍රශ්නයක්. ඒ නිසා නීතිය විතරක් නොවෙයි, යුක්තියත් සලකන්න ඕනෑ. යුක්තිය සැලකුවේ නැත්නම් මිනිස්සු ශ්‍රේෂ්ඨාධිකරණය යුක්තිය පසිඳලනතුරු ඉන්නේ නැහැ. ශ්‍රේෂ්ඨාධිකරණය නීතිය බලාවි. අධිකරණවල නීතිය බලාවි. ඔබතුමන්ලා පනත්වල රිංගාගෙන බලාවි. හැබැයි, ජනතාව යුක්තිය පසිඳලයි පාරේ. ඒ නිසා මේ ආණ්ඩුවට දවස් සියයක් ගත වෙන්නත් කලින් දින සියයේ වැඩසටහන පළමුවැනි වැඩේ විධියට තමුන්නාන්සේලා කරලා තිබෙන්නේ කුමාර් ගුණරත්නම් අත් අඩංගුවට අරගෙන පිටුවහල් කරන එක නම් අපි අහනවා තමුන්නාන්සේලා කිව්වේ ඕකද කියලා. ඒ නිසා කරුණාකර, කියාපු දේයි කරන දේයි අතර වෙනසක් තිබෙනවා කියලා පෙන්වන්න එපා. කියාපු දේම කරන්න. එහෙම කරලා කුමාර් ගුණරත්නම් සහෝදරයා ඇතුළු මේ රටේ සියලු දෙනාට දේශපාලනය කිරීමේ අයිතිය දෙන්න. අර සියලු මාධ්‍යවේදීන්ට එන්න ඉඩ කඩ හදලා දෙන්න. සියලු විදෙස්ගත වුණු අයට එන්න ඉඩ දෙන්න. දේශපාලන සිරකරුවන් නිදහස් කරන්න. පැහැර ගත්ත අය ගැන පරීක්ෂණ කරන්න. ඝාතනය වූවන් ගැන පරීක්ෂණ කරන්න. සුදු වැන් සංස්කෘතිය වෙනත් විධියකට ගෙනෙන්න එපා. තමුන්නාන්සේලා දැන් මේ මොකක්ද කරන්නේ? නීතියට මුවා වෙලා මර්දනය කරන්න හදනවා. ඒකට ඉඩ දෙන්න එපා. අද වර්තමාන ආණ්ඩුවේ, රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ආණ්ඩුවේ අවංකවම මේ වෙනුවෙන් අරගළ කරපු, කථා කරපු මන්ත්‍රීවරුන්ගේ හෘද සාක්ෂිය මේ කියන කාරණයට එකඟ වේවි. මේක කරන්නේ කිහිප දෙනකුගේ උවමනාවටද, එහෙම නැත්නම් මේක රජයේ ප්‍රතිපත්තියද කියලා දන්නේ නැහැ. ඒක බලා ගන්න වෙන්නේ ඉදිරියේ ක්‍රියාකාරිත්වයත් එක්කයි. ඒ නිසා කරුණාකර, මේ රටේ දේශපාලනය කිරීමේ, මත වාදයක් දැරීමේ අයිතිය ආරක්ෂා කරන්න කියලා මා විශේෂ ඉල්ලීමක් කරනවා. කුමාර් ගුණරත්නම් සහෝදරයාට විරුද්ධව මේ වෙලාවේ කරන ක්‍රියාදාමය නවත්වලා ඔහුට ඔබතුමන්ලාගේ නීතියේ හැටියට අවස්ථාව දෙන්න පුළුවන්කම තිබියදී, ඒ අවස්ථාව නොදී ඉන්න එපා. ඒ අවස්ථාව දෙන්න. ඒක ඔහුට දෙන අයිතියක් නොවෙයි. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් අරගළ කරපු ප්‍රජාතන්තය වෙනුවෙන් පෙනී සිටින සියලු දෙනා වෙනුවෙන් දෙන අවස්ථාවක් කියන එක මතක් කරමින් ඒ සඳහා මේ පාර්ලිමේන්තුවේ අවධානය යොමු කරමින් ඒ සඳහා මැදිහත් වෙන්න කියලා මා ඉල්ලා සිටිනවා, ප්‍රජාතන්ත්‍රවාදයේ නාමයෙන්. බොහොම ස්තූතියි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මේ යෝජනාව ස්ථිර කරනවා. මට වෙලාව කොච්චර තිබෙනවා ද? මොකද, මා විනාඩි දෙකක් දෙන්න ඕනෑ ගරු රෙජිනෝල්ඩ් කුරේ මන්ත්‍රීතුමාට.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

විනාඩි 10කට කිට්ටු කාලයක් තිබෙනවා.

[අ.භා.7.26]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

හොඳයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කියන්න ඕනෑ බොහෝ කරුණු හෝ සියලුම කරුණුම පාහේ ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා කියන්න යෙදුණා. නීත්‍යානුකූලව රටින් පිට වී යාමට බැරි තත්ත්වයන් යටතේ මේ රටින් ගිය හැටදහසක් විතර මිනිස්සු ඉන්දියාවේ ඉන්නා බව අපි දන්නවා. ඒ ඉන්දියාවේ ඉන්නා හැටදහසක් පුද්ගලයින් හා ඔවුන්ගේ පවුල්වලට අලුතින් එකතු වුණු සාමාජිකයනුත් ඇතුළත්ව ලංකාවට ගෙන්වා නැවත පදිංචි කිරීම පසු ගිය ආණ්ඩුව කාලයේත් කරනු ලැබුවා. එහිදී හම්බ වුණු දරුවන්ට අවශ්‍ය පුරවැසිභාවයත් ලබා දීලා ලංකාවට ගෙන්වූවා. ඊට පහසුකම් සැලැස්සුවා වෙන්නායිවල තිබෙන තානාපති කාර්යාලය.

ඒ වාගේම මේ කුමාර් ගුණරත්නම් මහතාත් මේ රටින් පිට වී ගියේ නීත්‍යානුකූල මාර්ගයකින් නොවෙයි. නමුත් නීත්‍යානුකූල මාර්ගයකින් පිට වී යාමට බැරි තත්ත්වයක් යටතේ මේ රටින් පිටවී ගිය නිසා ඔහුගේ ලාංකීය පුරවැසිභාවය, ලාංකීය පාරම්පරික අයිතිය එතුමාට අහිමි කරන්නට පුළුවන්කමක් නැහැ. ඒ නිසා මේ අවස්ථාවේ ඇමතිතුමාට තිබෙන අභිමතය, අධිකරණමය ඥානයෙන් යුතුව - judiciously - ප්‍රයෝජනයට ගනිමින් තීරණයක් ගත යුතු වනවා.

ශ්‍රේෂ්ඨාධිකරණය වුණත් මේකේ අභිමතය තිබෙන්නේ ඇමතිතුමාටයි කියලා කිව්වාට, අභිමතය කොහොමද භාවිත කරන්නේ කියන එක, එය භාවිත කරන තත්ත්වයන් හා පසුබිම අනුව විමසා බලන්නට ශ්‍රේෂ්ඨාධිකරණයට හේතු තත්ත්වයන් තිබුණා කියලයි මා හිතන්නේ. නමුත් ශ්‍රේෂ්ඨාධිකරණය ඒ පසුබිම් හා පසුතලය හොයන්න ගියේ නැහැ. මේකේ ඇත්ත කථාව මේකනේ. පසු ගිය ඡන්දයේදී ඔබතුමන්ලාට උදව් කරපු මිනිහෙක් නොවෙයි කුමාර් ගුණරත්නම් කියන්නේ. ඔබතුමන්ලාගේ පැත්තට උදව් කරපු උදවියගේ සමහර පාර්ශ්වකරුවන්ට විරුද්ධව මතවාද ගොඩ නැඟූ කෙනකු තමයි කුමාර් ගුණරත්නම් කියන්නේ. එතුමා අයිති පෙරටුගාමී සමාජවාදී පක්ෂයටයි. එතුමා වෙනම තරග කළා. ඔවුන්ට තිබුණු ප්‍රධාන ප්‍රතිවිරෝධය කුමක්ද කියලා ඔබතුමන්ලාත් දන්නවා.

පසු ගිය ජනාධිපතිවරණයේදී ඔබතුමන්ලාට උදව් කරමින් සහාය වූ කණ්ඩායමක් ඔබතුමන්ලාට මේ කෙරෙහි බලපෑමක් කළාය කියා මේ රටේ ඉතා සාධාරණ මතයක් තිබෙනවා. ඒක අසත්‍යයක්ය කියා ඔබතුමන්ලාට කියන්න පුළුවන්කමක් නැහැ. ඔබතුමන්ලාට ඉඳගන්න කකුල් දෙකක් නැහැ. එතුමා මේ රටේ පාරම්පරික ලාංකිකයෙක්. මේ රටේ ඉස්කෝලයකට ගිහින් ඉගෙන ගෙන උපාධියක් ලබා ගත්තු, මේ රටේ හැදිච්ච, යම් අමාරු තත්ත්වයන් යටතේ පණ බේරා ගෙන මේ රටෙන් පැනපු එතුමා අන්තිමට මේ රටට ඇවිල්ලා තිබෙනවා. එසේ ඒමට යම්කිසි ගමන් බල පත්‍රයක් අවශ්‍ය නිසා, ඒ පැනලා හිටපු කාලයට ඉන්න යම්කිසි ආවරණයන් වුවමනා නිසා ඔහු ඕස්ට්‍රේලියාවේ පුරවැසිභාවය ලබා ගෙන තිබෙනවා. ඔහු මේ රටට ඇවිල්ලා, ඒ රටේ පුරවැසිභාවය අත් හරින්න වුවමනා කඩදාසි පුරවා, ඕස්ට්‍රේලියානු තානාපති කාර්යාලයට ගෙන ගොස් දෙන්නට ඕස්ට්‍රේලියානු තානාපති කාර්යාලයට දැනුම් දීලා, තමුන්නාන්සේලාට ඇවිල්ලා කිව්වා, "මම මගේ ලාංකීය පුරවැසිභාවය ඉල්ලනවා"ය කියා. සද්භාවයෙන් කරන ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට, ඔහුට එල්ල කළ හැකි වෙනත් කිසිම හේතුවක්, චෝදනාවක්, දෝෂාරෝපණයක් ඇත්තේ නැහැ. දෙබිඩි කථා කරන්න එපා; බඩේ බිජු තියා ගෙන කථා කරන්න එපා. මම තමුන්නාන්සේලාට කියනවා, ඇත්ත කථාව එළියට දමලා කථා කරන්නය කියා.

කුමාර් ගුණරත්නම්ගේ ප්‍රශ්නයේදී දේශපාලන වශයෙන් තමුන්නාන්සේලා මෙහෙයවෙනවා. තමුන්නාන්සේලා කියන යහ පාලන සද්භාවයේ රූපය තමුන්නාන්සේලාගේ ඇතුළෙන් කුණු වෙලා ඕජස් ගලනවා. තමුන්නාන්සේලාගේ යහ පාලනය රෙද්ද පල්ලෙන් බේරෙනවා. තමුන්නාන්සේලා මේ වෙලාවේ මේ පිළිබඳව ක්‍රියා කරන ආකාරය ලෝකයම බලා ගෙන ඉන්නවා. ඒක මතක තියාගන්න. යහ පාලනයයි කියා ගෙන

තමුන්නාන්සේලා අද මේ කර ගෙන යන අනිකුත් ක්‍රියාවන් අතරේ මෙවැනි පළිගැනීම්වලට, දඬයම්වලට -victimization වලට- මේ වාගේ වෙනස්කම් කිරීම්වලට තමුන්නාන්සේලා පෙළඹෙනවා. පාස්කරලිංගම් ගියේ කොහොමද? දැන් පාස්කරලිංගම් කවුද? තමුන්නාන්සේලාගේ අගමැතිතුමාගේ උපදේශකයා. ඔහු ආවේ කොහොමද? ඔහු ඒ තානාන්තරයට පත් වෙන්නේ කොහොමද? තමුන්නාන්සේලා ඇයි මේ විධියේ දෙපිටකාටටු ආකාරයකට ක්‍රියා කරන්නේ? හුදෙක් දේශපාලන වශයෙන් තමුන්නාන්සේලාගේ විරුද්ධවාදියෙක් දඬයම් කිරීමට, දේශපාලන විරුද්ධවාදී මතයක් උඩ කුමාර් ගුණරත්නම්ට ලංකාවේදී ලැබිය යුතු ලාංකීය පුරවැසිකමේ අයිතිය තමුන්නාන්සේලා ප්‍රතික්ෂේප කරන්නේ අන්තිම ජඩ විධියටයි. ඒ බව මම කියන්න ඕනෑ. ඒ නිසා අඩු ගණනේ තමුන්නාන්සේලා හෙට දිනයේදීවත් මේ ගැන නැවත කල්පනා කරනවා නම් හොඳයි කියා මම කියනවා.

එදා කුමාර් ගුණරත්නම් මේ රටෙන් පිට කරලා යවන වෙලාවේ අපේ ආණ්ඩුව කාලයේ, මම ඒ පැත්තේ හිටියත් මම ඒකට විරුද්ධව මගේ අදහස කිව්වා. එතුමා මේ රටට නැවත ආවායින් පසුව නැවත මේ රටේ ඉන්නට ලැබුණු කාලයේ තමුන්නාන්සේලා ඇස් පියාගෙන ද හිටියේ? එතුමා කොච්චර කාලයක් මේ රටේ හිටියාද? ඒ කාලයේ තමුන්නාන්සේලාගේ ආණ්ඩුවක් නොවෙයි තිබුණේ. ඒ නිසා තමුන්නාන්සේලාට ඒ ගැන යමක් කරන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒ හිටපු කාලය අපේ ආණ්ඩුවක් තිබුණු කාලයයි. අපේ ආණ්ඩුව කුමාර් ගුණරත්නම්ගේ පැමිණීම ගැන විරුද්ධත්වයක් නොදැක්වූ බව අපි දන්නවා. ඒවා රහස් නොවෙයි. ඊට පසුව තමුන්නාන්සේලාගේ ආණ්ඩුවක් ආපු හැටියේ එතුමාගේ ඕස්ට්‍රේලියානු ගමන් බල පත්‍රයයි, වීසා කාලයයි පිළිබඳ ප්‍රශ්නය තමුන්නාන්සේලා එළියට ඇදලා දඬයම පටන් ගත්තා. ඒකයි ඇත්ත කථාව. තමුන්නාන්සේලා දේශපාලනය අනුව හිතන්නේ නැහැ; අපි ඔක්කොම සාධාරණවයි හිතන්නේ; අපට පක්ෂ භේදයක් නැහැ; අපට විරුද්ධවාදීකමක් නැහැ; අපි විරුද්ධවාදින්ගෙන් පළි ගන්නේ නැහැයි කියා තමුන්නාන්සේලා මේ විධියේ ලොකු සුදු හුණු ගෑමක් කර ගෙන යනවා, තමන්ගේ ප්‍රතිරූපයට. අජිත් පෙරේරා නියෝජ්‍ය අමාත්‍යතුමා වාගේ අය එදා කථා කරපු ස්වරයේ හඬ අද ගොළු වෙලා. ඒ හැම එකකින්ම තේරෙන්නේ තමුන්නාන්සේලා අද ඉන්නේ කොතැනකද කියන එකයි. කන්න ඕනෑ වුණාම කබරගොයා, තලගොයා බවට පරිවර්තනය කර ගන්න තමුන්නාන්සේලාගේ මේ ආණ්ඩු පාලන ප්‍රතිපත්තිය, මේ ආකල්පය මේ රටත්, මේ ලෝකයත් හෙළා දකින බව මතක තියා ගන්න. මගේ කථාව මෙතෙකින් අවසන් කරනවා. මගේ වෙලාවෙන් කොටසක් ගරු රෙජිනෝල්ඩ් කුරේ මන්ත්‍රීතුමාට දෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට, ගරු අජිත් පී. පෙරේරා මහතා.

[අ.භා.7.34]

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - வெளிநாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Ajith P. Perera - Deputy Minister of Foreign Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා මා ගැන සඳහන් කරපු නිසාත්; ඒ වාගේම ඒ කියන කරන දේ ගැන සඳහන් කරපු නිසාත්, මේ විවාදයේ කථා කිරීමට මට විශේෂ අයිතියක් ගොඩනැඟුනා. එසේ නැතත් මම කථා කරන්නයි සිටියේ, ගරු වාසුදේව නානායක්කාර මැතිතුමනි. මූලධර්ම අනුව මේ රටේ පුරවැසියන්ට මේ රටේ දේශපාලනය කිරීමට තිබෙන අයිතියත්, මේ රටේ උපන් මිනිසුන්ට මේ රටට නැවත එන්න තිබෙන අයිතියත් අප පිළිගන්නවා. ඒ අයිතිය ගැන කිසිම වාදයක් තිබෙන්න බැහැ. ඒක මම විපක්ෂයේ සිටියත් එකයි, ආණ්ඩුවේ සිටිනකොටත් එකයි. එම නිසා ඒ මූලධර්මය ගැන සාකච්ඡා අවශ්‍ය නැහැ. මේ පිළිබඳව අජිත් කුමාර මන්ත්‍රීතුමා මා සමඟ කථා කළා. අපි මේ කාරණය සම්බන්ධයෙන් ඇති වෙලා තිබෙන තත්ත්වයන් ගැන සාකච්ඡා කළා. ඒ කථා කළ හැම දෙයක්ම ප්‍රසිද්ධියේ කියන්න අවශ්‍ය නැහැ. සමහර දේවල් පෞද්ගලිකයි, සමහර දේවල් ප්‍රසිද්ධයි. මේ රටේ ඉපදුණු පුද්ගලයෙකුට මේ රට තුළ නීත්‍යානුකූලව කටයුතු කර ගෙන යෑමට අවශ්‍ය කරන වාතාවරණය නොතිබීම සහ ඒ නිසා මතු වෙලා තිබෙන දුෂ්කරතාව ගැන අපි කනගාටු වෙනවා. ඒ සම්බන්ධයෙන් කිසිම අඩු වැඩියක් නැහැ. අපිට විරුද්ධව දේශපාලනය කළත් නැතත්, දේශපාලනයට සම්බන්ධයක් නැතත් ඒක තමයි මූලධර්මය. ඒ නිසා ඒ ගැන ප්‍රශ්නයක් නැහැ.

ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, ඔබතුමා තලගොයා, කබරයා ගැන මතක් කරලා යම් යම් දේවල් කිව්වා. ඔය කුමාර් ගුණරත්නම් මහතා ලංකාවට පැමිණි මුල් අවස්ථාවේ ඒ මහත්මයාව පැහැර ගෙන යන්න සුදු වෑන් එක එව්වේ ඔබතුමාගේ මිත්‍ර - ඔබතුමා විසින් නැවත අගමැතිවරයා වශයෙන් පත් කර ගැනීමට අපේක්ෂා කරන - මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුවයි. එතුමා විධායකයේ ප්‍රධානියා නිසා - [බාධා කිරීමක්] අහගන්න, අහගන්න. මම මේවා කියන්නේ වාර්තා වෙන්නයි. එතුමා විධායකයේ ප්‍රධානියා වූ නිසාත්, එතුමා ආරක්ෂක ඇමතිවරයා වූ නිසාත් අජිත් කුමාර මහත්මයාගේ නායකයාව සුදු වෑන් එක එවා පැහැර ගෙන යන්න කටයුතු කළේ; පැහැර ගෙන ගියේ; නීති විරෝධීව රඳවා ගෙන සිටියේ වෙන කවුරුවත් යටතේ නොවෙයි. ඕස්ට්‍රේලියානු තානාපති කාර්යාලය මැදිහත් වෙලා ඒ මනුෂ්‍යයාගේ ජීවිතය බේරා ගන්න කටයුතු කරන තෙක් ඔහු ජීවිතය පිළිබඳ අනතුරකට මුහුණ දීලා තිබුණේ වෙන කවුරුත් යටතේ නොවෙයි, මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුව යටතේයි. එහෙම පැහැර ගෙන ගිහින් මරා දමපු මිනිසුන් ගැන ඔබතුමා දන්නවා ඇති.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
දන්නවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

එහෙම පැහැර ගෙන ගිහින් කකුල් කඩපු මිනිසුන් ගැන ඔබතුමා දන්නවා ඇති. එහෙම පැහැර ගෙන ගිහින් තර්ජනය කිරීම නිසා ජීවිතය බේරා ගන්න රටෙන් පැන ගිය මිනිසුන් ගැන ඔබතුමා දන්නවා ඇති. ඒ නිසා මහින්ද රාජපක්ෂ මහත්මයාගේ පාලන කාලයේ මේ රට අතහැර ගිය අයටත්, ඊට කලින් අපේ ආණ්ඩුව පැවති කාලයේ මේ රට අතහැර ගිය අයටත්, ඊටත් කලින් වෙන මොනයම් හෝ හේතුවක් නිසා එසේ ගිහින් තිබෙනවා නම් ඒ අයටත්, සිංහල වුණත්; දෙමළ වුණත්; මුස්ලිම් වුණත්; මොන දේශපාලන මතය දැරුවත් නැවත මේ රටට එන්නට තිබෙන අයිතිය අප පිළිගන්නවා. ඒ වාගේම මේ ආණ්ඩුවේ තනතුරු දරන අතරතුරම අපි ඒ වෙනුවෙන් පෙනී සිටිනවා. ඒක අමතක කරන්න එපා. එම නිසා සැහැල්ලුවට ලක් කරලා "රෙද්ද පල්ලෙන් බේරෙනවා" වාගේ කථා කියන්න එපා. මොකද, ඔහොම කථා කළාම අප වාගේ මිනිසුන්ට මේ ආණ්ඩුව ඇතුළේ සටන් කරන්න තිබෙන අයිතිය නැති වෙනවා. ඒ අවස්ථාව නැති වෙනවා. ගරු වාසුදේව නානායක්කාර මැතිතුමනි, ප්‍රායෝගික දේශපාලනයේ තිබෙන කාරණා ඔබතුමාත් දන්නවා. එම නිසා මේ ප්‍රශ්න ගැන සංවේදී මිනිසුන්, මේ ප්‍රශ්න ගැන වෙනස් විධියකට බලන මිනිසුන්

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

මේ ආණ්ඩුව ඇතුළේත් ඉන්නවා කියන කාරණය ඔබතුමා තේරුම් ගත යුතුයි. වාසුදේව නානායක්කාර මැතිතුමනි, ඔබතුමා බොහොම පළපුරුදු දේශපාලනඥයෙක්. මා පාසල් යන්න පටන් ගන්න අවධියේත් ඔබතුමා මේ පාර්ලිමේන්තුවේ සිටියා. එම නිසා මේවා දිහා පරිස්සමට බලන්න. හැමෝම එක ගොඩට දමලා "මේ ඔක්කෝම එකයි" කියලා ඔහොම කියන කොට මේ බල දේශපාලනය තුළ සමහර දේවල් කියන්න, සමහර දේවල් කරන්න අපටත් සිදු වෙනවා.

මේ ප්‍රශ්න ගැන අපේ සංවේදීකමක් තිබෙනවා. යම් යම් අය අතර මේවා ගැන හිතන විධියේ වෙනස්කම් තිබෙනවා. ඒ කාරණා ගැන ඔබතුමාත් හොඳටම හිතන්න ඕනෑය කියලා මම හිතනවා. අජිත් කුමාර මන්ත්‍රීතුමාව පෞද්ගලිකව ඇඳා ගන්නේ නැතුව මේ ප්‍රශ්නය ගැන කථා කරන්න. එතුමාගේ නඩුව එතුමා කිව්වා. එතුමාට හොඳ නඩුවක් තිබෙනවා. ඒ නඩුවේ ප්‍රශ්නත් තිබෙනවා. විෂය භාර අපේ ගරු ඇමතිතුමා ඒ පිළිබඳව තිබෙන තත්ත්වය පැහැදිලි කර දුන්නා. නමුත් එක දෙයක් කියන්න ඕනෑ. විශේෂයෙන්ම විදේශ කටයුතු අමාත්‍යාංශය හැටියටත් අප මේ ප්‍රශ්නය පිළිබඳව විශේෂ අවධානය යොමු කර තිබෙනවා. ඔබතුමා කියපු ආකාරයටම මේ රටෙන් නීත්‍යානුකූලව පිට වී ගිහින් නැවත මේ රටට එන්න බැරිව සිර වී සිටින මිනිසුන්ටත්, නීති විරෝධිව මේ රටින් පැන ගිහිල්ලා වෙනත් රටවල රැඳී සිටින අයටත් - සමහරවිට ඒක දේශපාලනික හේතුවක් වෙන්නත් පුළුවන්; ආර්ථික හේතුවක් වෙන්නත් පුළුවන්. සමහර අය ආර්ථික හේතු මතත් ගියානේ. - ඒ සියලු දෙනාටම මේ රටට ඒමට අවශ්‍ය කරන දේශපාලනික පරිසරය සහ නීතිමය වටපිටාව සකස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුයි. ප්‍රශ්න තිබෙනවා. දැන් මෙතැන ඇති වෙලා තිබෙන ප්‍රශ්නය මොකක්ද?

දැන් මේ ඔක්කෝම පටලවාගෙන කථා කරන්නේ. එතුමාගේ දේශපාලනය කැමැති නැති අයටත් තර්කයක්, වාදයක් හදා ගන්න අවස්ථාව ලැබිලා තිබෙන්නේ, ඒ පුද්ගලයාගේ අනන්‍යතාව පිළිබඳ ප්‍රශ්නය නිසායි. ඒ නඩුවේ ඉදිරිපත් වුණු කාරණා මා දන්නේ නැහැ. මා දන්නා එකම දේ, නඩුව අසාර්ථක වුණා කියන එකයි. මුලින් දීපු අත් හිටුවීමේ නියෝගය ගැන මම ඇත්තටම සතුටු වුණා. සාමාන්‍යයෙන් අත් හිටුවීමේ නියෝගයක් දෙන්නේ නඩුවක බැලූ බැල්මට සාධක - *prima facie* - තිබෙන කොටයි. පසුව නඩුව නිෂ්ප්‍රභ වනවා දැක්කාම මට කනගාටුවක් ඇති වුණා. මොකද, මේ ප්‍රශ්නය ඉතාම පහසුවෙන් අධිකරණමය ක්‍රියාදාමයක් හරහා විසඳා ගන්න තිබුණා. නමුත් ඒ ප්‍රශ්නය අමාත්‍යවරයාට තිබෙන බලය මත විසඳා ගැනීමට අවකාශ තිබුණාද, ඒ අවකාශය තිබියදී අධිකරණය වෙත යන්න පොඩ්ඩක් ඉක්මන් වුණාද කියන කාරණය මට තේරෙන්නේ නැහැ. මොකද, එහි පසු බිම හා අවස්ථාගත කරුණු මා නොදන්නා නිසා. ඒ කුමක් වුණත් මේ ප්‍රශ්නයට අදාළ කුමාර් ගුණරත්නම් මහත්මයාටත්, ඒ වාගේම මේ හා සමාන ප්‍රශ්නවලට මුහුණ දීලා ඉන්න මාධ්‍යවේදීන් ඇතුළු විශාල පිරිසකටත්, ආර්ථික හේතූන් මත මේ රටින් ගිය මිනිසුන්ටත් - ආර්ථික හේතූන් මත ජපානයට ගිය කට්ටිය, ඕස්ට්‍රේලියාවට ගිය කට්ටිය, යුරෝපයට ගිය කට්ටිය ඉන්නවා. ඒ අයටත් ලංකාවේ උරුමය පිළිබඳව දැන් ප්‍රශ්නයක් තිබෙනවා.- ද්විත්ව පුරවැසිභාවය ඉල්ලන්න බැහැ. ඒ පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, අනන්‍යතාව වෙනස්. මේ ප්‍රශ්නයට විසඳුමක් ඕනෑ. මගේ යෝජනාව නම්, මේ ප්‍රශ්නයට විසඳුම් දීම සඳහා ඉතා ඉක්මනින්ම පනත් කෙටුම්පතක් ගෙනා යුතුයි කියන එකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ අනන්‍යතාව-

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒ ඇමතිතුමාගේ අභිමතය.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මගේ මතය අහන්න කෝ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔබතුමා කට්ටි පනින්න හදනවා නේ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
කට්ටි පනින්නේ මොකටද?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Supreme Court එක මොකක්ද කිව්වේ? ඇමතිතුමාගේ අභිමතය.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පටු දේශපාලනය පැත්තෙන් කල්පනා කරන කොට ඒක එක කථාවක්. නැත්නම් මේ විවාදයට සම්බන්ධ වෙන්න මට ඕනෑ නැහැ. ගරු ඇමතිතුමා උත්තරයක් ලෑස්ති කර ගෙන ඉන්නවා. මගේ මතය මේ පාර්ලිමේන්තුවේ කියලා හැන්සාඩ්ගත කරන්නේ ජනමාධ්‍යවේදීන්ට ඇහෙන්නයි; රටට ඇහෙන්නයි; මගේ පක්ෂයේ නායකයාට ඇහෙන්නයි. මොකද, මේ ප්‍රශ්නය විසඳෙන්න ඕනෑ නිසායි. මේක කුමාර් ගුණරත්නම්ගෙන් ඉවර වෙනවාද?

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
මේක කුමාර් ගුණරත්නම්ගේ විතරක් නොවෙයි, සියලු දෙනාටම අදාළ ප්‍රශ්නයක්.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඇත්ත. ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමනි, මා ඔබතුමාට එකඟයි. ඔබතුමාගේ ස්වරයට, ඔබතුමා කියපු කාරණාවලට මා එකඟයි. ඒකයි මම කියන්නේ.

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
රජයක් විධියට ක්‍රමවේදයක් හදන්න.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
හරියට හරි. අන්න ඒකයි කළ යුත්තේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා මේ වැදගත් විවාදය ඕනෑ නැති පැත්තකට අරගෙන ගියා. අපටත් ඕනෑ මේ ප්‍රශ්නය විසඳන්නයි. ඒ මනුෂ්‍යා දේශපාලනය කළාය කියලා මේ ආණ්ඩුව පෙරළෙනවාද? නැහැ. ඒ මනුෂ්‍යා දේශපාලනය කළාම මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය

ශක්තිමත් වෙනවා. ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා මේ පාර්ලිමේන්තුවේ විකල්ප මතයක් දරනවා. පසු ගිය දා ඉදිරිපත් කළ අතුරු අය වැයට එතුමා පමණයි විරුද්ධව ඡන්දය දුන්නේ. එතුමාට කොන්දක් තිබුණා, එයට විරුද්ධව ඡන්දය දෙන්න. ප්‍රජාතන්ත්‍රවාදය තුළ අපි එය අගය කරන්නට ඕනෑ. අපි රූකඩ නොවෙයි. තනතුරු ලැබුණයි කියලා අපි ඔබතුමන්ලා වාගේ නගුට අස්සේ ගහගෙන ඉන්නේ නැහැ. අපට ආත්ම ගරුත්වයක් තිබෙනවා, ඒක මතක තබා ගන්න. තනතුරු දීලා තිබෙන්නේ රටට වැඩ කරන්නයි. ඒ නිසා අහගෙන ඉන්න.

මේ විධියට අනන්‍යතාව නැති වුණු දහස් ගණනක් මිනිසුන් ඉන්නවා. හොර passportවලින් විදේශගත වුණු අය, හොර උප්පැන්න සහතික හදා ගෙන විදේශගත වුණු අය ඉන්නවා. පිට රටවල වෙනත් නම්වලින් ජීවත් වන මිනිසුන් ඉන්නවා. රජය දැන් ද්විත්ව පුරවැසිභාවය පිළිබඳ ප්‍රතිපත්තියක් ප්‍රකාශයට පත් කර තිබෙනවා. ඒ ද්විත්ව පුරවැසිභාවය පිළිබඳ ප්‍රතිපත්තිය රජය ප්‍රකාශයට පත් කළාට ඒ අයට ලංකාවට ඇවිල්ලා ලංකාවේ භූමියත් එක්ක සම්බන්ධ වෙන්න බැහැ. මොකද, දැන් තිබෙන passport එකේ නමයි, ඔවුන් ලංකාවේ භාවිත කරන නමයි වෙනස්. ඒ අතරතුර තිබෙන්නේ වෙනත් පැහැදිලි කරන්න බැරි කූට ලේඛන. ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමනි, ඒ නිසා මම කියන්නේ -

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

පුරවැසි පනතේ 8වැනි වගන්තිය යටතේ අපි අයදුම්පතක් යොමු කරලා තිබෙනවා. ඒ යටතේ ඇමතිවරයාට කටයුතු කරන්න පුළුවන්. අලුත් නීතියක් අවශ්‍ය නැහැ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කළ නිශ්චිත පුද්ගලයකු පිළිබඳ ප්‍රශ්නයට ඇමතිතුමා පිළිතුරු දෙයි. මම ඒ ගැන කියන්නේ නැහැ. නමුත් මගේ ආණ්ඩුවෙනුත්, කාගෙනුත් මම අහන්නේ ප්‍රතිපත්තිය මොකක්ද කියන එකයි. මේ ප්‍රශ්නයට මැදි වුණු දහස් ගණනක් වෙනුවෙනුත්, මේ ප්‍රශ්නයට මැදිහත් නොවුණු සියලු දෙනා වෙනුවෙනුත් - අවස්ථාවක් මතු වුණු වෙලාවේ මම මේ කියන්නේ - මේ පිළිබඳව පනත් කෙටුම්පතක් ගෙනා යුතුයි කියන එකයි මම කියන්නේ. අපි විදේශ කටයුතු අමාත්‍යාංශය විධියට කියන්නේ, විදේශගත වෙලා ඉන්න පුද්ගලයන්ට ලංකාවට පැමිණෙන්න ඉඩ දෙන්න ඕනෑ කියන එකයි. එහෙම දේශපාලන පරිසරයක් මේ රටේ තිබෙනවා කියලා කියනවා. එහෙම නම් ඒ අනන්‍යතාව අහිමි වුණු මිනිසුන්ට අවශ්‍ය කරන නීතිමය පරිසරය හදලා දෙන්න ඕනෑ. ඒ සඳහා අවශ්‍ය වන හදිසි පනත් කෙටුම්පතක් ආණ්ඩු පක්ෂයත්, විපක්ෂයත් එකතු වෙලා ගෙනා යුතුයි. ඒක බොහොම සරල පනත් කෙටුම්පතක් වෙන්න ඕනෑ. ඒ ගැන ලොකු විවාදයක් තිබෙන්න බැහැ. ඉතාම ඉක්මනින් අපි ඒ පනත් කෙටුම්පත හදලා මේ කාරණය ඉෂ්ට කර ගනිමු. යම් අවාසනාවකට කුමාර් ගුණරත්නම් මහත්මයාට මේ රටෙන් එළියට යන්න වුණත්, එතුමාට සතියකින්, දෙකකින්, තුනකින් නැවත ලංකාවට ඇවිල්ලා ලංකාවේ දේශපාලනය කරන්න අවශ්‍ය කරන ඒ නීතිමය වාතාවරණය හදලා දෙන්න අවශ්‍ය කරන ඒ නව පනත් කෙටුම්පත ඉක්මනින් ගෙනෙන්න.

එක එක පුද්ගලයන්ට තමන්ගේ අභිමතය අනුව කටයුතු කරන්න භාර දෙන්නේ නැතිව එහෙම කරමු. අභිමතය පිළිබඳව ප්‍රශ්නයේදී මෙතැන අනතුරක් තිබෙනවා. ඒකයි මම කියන්නේ. තමන්ගේ අනන්‍යතාව අහිමි වුණු, මේ භූමියත් එක්ක තිබෙන නීතිමය සම්බන්ධතාව අහිමි වුණු දහස් ගණනක් මිනිසුන්ට නැවත මේ රටේ පුරවැසිභාවය ලබා ගන්න, රටේ දේශපාලනය කරන්න, රටේ ව්‍යාපාර කරන්න, රටේ සාමාන්‍ය විධියට ජීවත් වෙන්න අවශ්‍ය නීතිමය වාතාවරණය හදලා දෙන්න අපි ඒ දේ කරමුයි කියන කාරණය මතක් කරමින්, මේ ප්‍රශ්නය විසඳා ගන්න අවශ්‍ය ප්‍රඥාව හා අවබෝධය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නතර වෙනවා. බොහොම ස්තූතියි.

[අ.භා.7.44]

ගරු රෙජිනෝල්ඩ් කුරේ මහතා
(மாண்புமிகு ரெஜினோல்ட் குரே)
(The Hon. Reginold Cooray)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අහලා තිබෙනවා කියමනක්, "ජනනී ජන්ම භූමීශ්ච ස්වර්ගාදපි ගරී යසී" කියලා. ඒ කියන්නේ, "යම් කිසි කෙනෙකුට ස්වර්ග රාජ්‍යයටත් වඩා තමන් උපන්නා වූ ජන්ම භූමිය වටිනවා"ය කියන එකයි. එතකොට ජන්ම භූමියෙන් ජනිත වූ භූමි පුත්‍රයෙක් වියෝ වීම, මව් කුසයෙන් දරුවා වියෝ වීම වාගේ උහුලන්නට බැරි අස්වාභාවික විකෘති දෙයක්. එවැනි තත්ත්වයක් යටතේත් මේ රටේ උපන්න මිනිස්සු විවිධ කාරණා මත තමන්ගේ ජන්ම භූමිය අත්හැර යනවා. මීට වඩා හොඳ සුරපුරක් සොයා ගෙන, නිල්ල සොයා ගෙන නීති විරෝධීව හා නීත්‍යානුකූලව විදේශගත වන අය ඉන්නවා. ඒ වාගේම තවත් සමහර අය ඉන්නවා, තමන් දරන්නා වූ දේශපාලන මතවාදය හෝ වෙන යම් කාරණයක් නිසා හෝ ජීවිතයට ඇති තර්ජන හේතුවෙන් ජීවිතය බේරා ගැනීම සඳහා මව් බිමෙන් වියෝ වී ඇත් වී යන උදවිය. ඒ වාගේම ලෝක ඉතිහාසයේ, ලංකා ඉතිහාසයේ තිබෙනවා, නීතියේ දඬුවමක් විධියට රජයක් විසින් සමහර උදවිය රටින් පිටුවහල් කළ බව. ලංකා සම සමාජ පක්ෂයත් එක්ක සම්බන්ධ වෙලා වැඩ කරපු බ්‍රේස්ගර්ඩ්ල් කියන දේශපාලනයේ යෙදුණු විමුක්තිකාමියාව පිටුවහල් කරන්න සුදු ආණ්ඩුව කටයුතු කළා. සුදු ආණ්ඩුව කටයුතු කළා ශ්‍රී වික්‍රම රාජසිංහ, ඇහැළේපොළ වැනි අයව පිටුවහල් කරන්න. ඒ, ඔවුන් කරන ලද වරදකට නොවෙයි. ඔවුන් මේ රටේ ජනතාවගේ විමුක්තිය උදෙසා, ස්වාධීනත්වය උදෙසා, නිදහස උදෙසා කරපු සටනේ ප්‍රතිඵලයක් හැටියට ඔවුන්ට ලැබුණු ත්‍යාගය තමයි රටින් පිටුවහල් කිරීම.

කුමාර් ගුණරත්නම් මහත්මයා සම්බන්ධයෙන් තිබෙන කාරණය ගැන සාකච්ඡා කරද්දි අපට උදාහරණ කිහිපයක් තිබෙනවා. පසු ගිය කාලය තුළ ආණ්ඩුවේ භීෂණයට ඔරොත්තු දෙන්න බැරිව මේ රටින් පිට වුණු අය ඉන්නවා. විමුක්ති ව්‍යාපාර යැයි කියා ගත්තු ඇතැම් උදවිය නිසා, ඡන්දය දාන අයගේ අත කපපු උදවිය නිසා, විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණේ භීෂණය නිසා මේ රටේ ජීවත් වෙන්න බැරිව සරණාගතයන් හැටියට පිට රට ගිය අය ඉන්නවා. ඒ වාගේම මේ රටේ ද්‍රවිඩ රාජ්‍යයක් ගොඩනගන්න තවත් විමුක්ති සංවිධානයක් හැටියට පටන් ගෙන පැසිස්ට්වාදයෙන් කෙළවර කරපු ඒ භීෂණය නිසා මේ රටින් පිටව ගිය අයත් ඉන්නවා. මේ නොකී කරණා නිසා ශ්‍රී ලංකාව තුළින් පිට වී විදේශගත වුණු, පිටුවහල් කරපු අය අනන්තයි, අප්‍රමාණයි.

ලංකා ඉතිහාසයේ කවදාවත් නොතිබුණු -පෙර නොවූ විරු- අපූරු දේශපාලන සන්දර්භයක් හා සංස්කෘතියක්, ආකෘතියක් ප්‍රථම වතාවට දැන් ගොඩ නැගී තිබෙන වෙලාවේ යහ පාලනය කියන කාරණය අපි උඩටම අරගෙන තිබෙනවා. ඒ යහ පාලනය තුළ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය පිළිබඳ විශාල ඉඩකඩක් ගැන අපි කථා කරනවා. එම නිසා ඉතිහාසයේ තිබුණු සියලු වැරැදි නිවැරැදි කිරීමේ ගෞරවනීය කාර්ය භාරය කරන්න පැවරුණු මෙම දින 100 ඇතුළත මේ වාගේ ප්‍රශ්නයක් ආවාම, ඒ කටයුත්ත කළ

[ගරු රෙජිනෝල්ඩ් කුරේ මහතා]

යුත්තේ ඒ දින 100 වැඩ පිළිවෙළේ ගෞරවය, කීර්ති කදම්භය පැතිරෙන විධියටයි, ගුණ සුවඳ පැතිරෙන විධියටයි කියලා මම අවංකවම විශ්වාස කරනවා. මේ පිළිබඳව විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය අජිත් පී. පෙරේරා මැතිතුමා කිව්වා වාගේ, නීති රීති සකස් කිරීම අවශ්‍යයි. නමුත් එම නීති රීති සකස් කිරීමේ අවශ්‍යතාවේ බරපතළකම හොඳින් දැනෙන්න, උද්දීපනය වෙන්න මතු කරන ලද එක අවස්ථාවක් තමයි මේ කුමාර් ගුණරත්නම් මහතාගේ සිද්ධිය. එම සිද්ධිය අනිත් දේවල්වලට වඩා බරපතළ විධියට බලපා තිබෙනවා.

මේ රටේ මාධ්‍යවේදීන්ට නැවත එන්නට කියලා ආරාධනා කරලා තිබෙනවා. විදේශගත වෙච්ච සියලුම අයට එන්න කියපු මේ වකවානුව තුළ මෙතුමාගේ කාරණය සම්බන්ධයෙන් අපි අපේ දේශපාලන පරිඥානය හා දේශපාලන බලය අනුව නීතිය ඇතුළේ යම් කිසි ඉඩකඩක් තිබෙනවා නම් ඒක භාවිත නොකිරීම යම් කිසි අඩු ලුහුඬුවක් වෙනවාය කියලායි මම කියන්නේ. නීති රීති සකස් කරන්න. සමස්තය පිළිබඳව ඒ කටයුතු කරන්න. දීර්ඝ කාලීන වැඩ පිළිවෙළකට මුල පුරන්න. නමුත් මේ අවස්ථාවේදී මේ කටයුත්ත කිරීම කල් හැරීම හොඳ නැහැ කියන එකයි මගේ අවංක විශ්වාසය.

අපි දන්නවා, මීට වඩා වැරැදි වැඩ කරපු අය අද ආණ්ඩුවල ඇමතිවරු වෙලා ඉන්නවා. විදේශගත වෙලා ඇවිල්ලා ආපහු පක්ෂ නායකයෝ වෙලා ඉන්නවා. සෝමවංශ අමරසිංහ මහත්තයා නොයෙකුත් චෝදනාවලට, නොයෙකුත් ප්‍රශ්නවලට අල්ලා ගන්න හිටපු කෙනෙක්. එතුමා පැනලා ගියා. පැනලා ගිහිල්ලා නැවත ඇවිල්ලා පක්ෂයක සභාපති වෙලා, එහි දේශපාලන කටයුතු මෙහෙයවමින් කටයුතු කරනකොට අපි ඒ ගොල්ලන්ට ඉඩ දීලා හිටියා. පැරැණි වැරැදි අවුස්සාගෙන ඒ ගොල්ලන්ට දඬුවම් කරන්න ගියේ නැහැ. එසේ නොකිරීම තුළ අද මේකට වර්ගවාදී ස්වරූපයකුත් ඇතුළත් කරන්න ඉඩ තිබෙනවා. සෝමවංශ අමරසිංහ මහත්තයාලා මෙහෙම ඇවිල්ලා ඒ ගොල්ලන් නිදහසේ දේශපාලනය කරනවා, නමුත් කුමාර් ගුණරත්නම් සම්බන්ධයෙන් මෙහෙම කටයුතු කරනවා කියලා අපට ඇති වෙලා තිබෙන චෝදනාවලට තව වැරැදි අර්ථ කථනයකුත් එකතු වෙන්න පුළුවන්. ඒ නිසා ඓතිහාසිකව මේ නිර්මාණය කරන ලද අවස්ථාවේදී පුළුවන් තරම් හොඳ උදාහරණ, ආදර්ශ රටට දායාද කළ යුතු වකවානුවක් අද උදා වෙලා තිබෙනවා කියලා මා කල්පනා කරනවා. ඒ නිසා ඇමතිතුමාට තිබෙන අභිමතානුසාරි බලය පාවිච්චි කරන්න.

මට මතකයි, ජනතා විමුක්ති පෙරමුණ විධායක ජනාධිපති ක්‍රමයේ වැරැදි තිබෙනවා කියපු ආකාරය. විධායක ජනාධිපති ක්‍රමය ගැන බරපතළ විධියට විරුද්ධව කථා කරපු ඒ අය අවුරුදු දෙකක එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව තිබෙන වෙලාවේ, ඒ ආණ්ඩුව විසුරුවා හරින්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට බල කරනකොට, ජනතා විමුක්ති පෙරමුණ ගෙනාපු එක තර්කයක් තමයි, "මේ දුෂ්ට විධායක ජනාධිපති ක්‍රමයේ බලය එක වරක්වත් රටේ සේවය සඳහා යොදවන්න මේ ආණ්ඩුව විසුරුවා හරින්න" කියපු එක. ඒ වාගේ වෙනසක් කරන්න ඒ ගොල්ලන් ඉල්ලා සිටියා. ඒ නිසා අද මේ කාරණය සම්බන්ධයෙන් මා මේ ඉල්ලීම කරනවා. මේ රටට ඇවිල්ලා ජනාධිපති අපේක්ෂකයෙක් වෙන කොට ප්‍රශ්නයක් වුණේ නැහැ, තරඟ කරන කොට ප්‍රශ්නයක් වුණේ නැහැ, දේශපාලන මතවාදයක් ගෙන යන කොට ඒක ප්‍රශ්නයක් වුණේ නැහැ, මේවා ඔක්කෝම ඉවර වුණාට පස්සේ මේ කටයුතු කරන්නේ නරක, වැරැදි දේශපාලන පසු බිමක් උඩය කියන කළු ලපය තියා ගන්න එපා කියන ඉල්ලීම කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

[අ.භා.7.51]

ගරු ජෝන් අමරතුංග මහතා (මහජන සාමය, ආපදා කළමනාකරණය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு ஜோன் அமரதுங்க - மக்கள் ஒழுங்கு, அனர்த்த முகாமை மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் அமைச்சர்)

(The Hon. John Amaratunga - Minister of Public Order, Disaster Management and Christian Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තේරෙනවා, අපේ මිත්‍රයා -අජිත් කුමාර මන්ත්‍රීතුමා- මොන තරම් මහන්සි වෙනවාද කියලා ඔහුගේ නායකයා වෙනුවෙන්. මම කනගාටු වෙන්නේ මේ කාරණය නිසායි. එතුමා මේ පිළිබඳව සුප්‍රිම් උසාවියටත් ගිහිල්ලා මේ කරුණු කාරණා ඉදිරිපත් කරලා ඒක නිශ්ප්‍රභ කරලා තිබෙනවා. දැන් මගේ අත පය බැඳලා. උසාවි නොගිහින් අපි එක්ක කථා බහ කරලා බේරුම් කර ගත්තා නම් ඒක වෙනම දෙයක්. [බාධා කිරීමක්] තමුන්නාන්සේ කථා කෙරුවා නේ. මම දැන් කථා කරන්නේ. මේ මගේ අවස්ථාව. [බාධා කිරීමක්] ඉන්න කෝ. උසාවි නියෝගයක් තිබෙද්දී ඇමතිවරයාට උසාවිය අබිබවා යන්න බැහැ. ඒකයි මෙතැන තිබෙන තර්කය. ඒකයි කනගාටුව. නැත්නම් අපි ලැහැස්තියි, ශ්‍රී ලාංකිකයෙකුට උදවු කරන්න. ඔයිට වඩා ප්‍රශ්න තිබුණු අය ලංකාවට ඇවිල්ලා තිබෙනවා. තව අයත් එන්න බලාගෙනත් ඉන්නවා. රටේ විවිධ ආකාරයේ කැරලි කෝලාහල, මිනී මැරුම් කරලා රටෙන් පිටුවහල් වෙලා ඉන්න අයත් එන්න බලාගෙන ඉන්නවා. ඒකත් අපි වෙනම බලා ගනිමු. අනෙක් එක මම අජිත් කුමාර මැතිතුමාගෙන් මේ කාරණය අහන්න කැමැතියි. කුමාර් ගුණරත්නම් කියන්නේ කවුද? එතැනින් ගියාම නොයෙල් මුදලිගේ කියන්නේ කවුද? මට මෙතැන පොඩි පටලැවිල්ලක් තිබෙනවා. නම් දෙකක් තිබෙනවා. මම දැන ගන්න කැමැතියි, පාස් පෝට් දෙකක් තිබෙනවාද, මේ පුද්ගලයෝ දෙන්නෙක්ද, නැත්නම් එක්කෙනෙක්ද කියලා.

ගරු අජිත් කුමාර මහතා

(மாண்புமிகு அஜித் குமார)

(The Hon. Ajith Kumara)

ගරු ඇමතිතුමනි, පාස්පෝට් දෙකක් නොවෙයි, පාස්පෝට් 4ක් තිබෙනවා.

ගරු ජෝන් අමරතුංග මහතා

(மாண்புமிகு ஜோன் அமரதுங்க)

(The Hon. John Amaratunga)

හතරක් තිබෙනවා? ඒකම වැරැද්දක් නේ.

ගරු අජිත් කුමාර මහතා

(மாண்புமிகு அஜித் குமார)

(The Hon. Ajith Kumara)

ඇයි එහෙම කරන්න වුණේ? කුමාර් ගුණරත්නම්ට ලංකාවේ වැඩ කරන්න බැරි නිසා-

ගරු ජෝන් අමරතුංග මහතා

(மாண்புமிகு ஜோன் அமரதுங்க)

(The Hon. John Amaratunga)

ඇයි, ඒ නියම නමින් ආවේ නැත්තේ?

ගරු අජිත් කුමාර මහතා

(மாண்புமிகு அஜித் குமார)

(The Hon. Ajith Kumara)

ඔබතුමා දන්නේ නැද්ද, කුමාර් ගුණරත්නම් නමින් ගියා නම් යන්න බැහැ කියලා. කුමාර් ගුණරත්නම් කියලා යන්න ගියා නම් යන්න දෙන්නේ නැති බව ඔබතුමාට තේරෙන්නේ නැද්ද? මහින්ද රාජපක්ෂ ආණ්ඩුව ගැන ඔබතුමන්ලා කිව්වේ මොකක්ද? ගෝඨාභයගේ මර්දනය ගැන ඔබතුමන්ලා කිව්වේ මොකක්ද? ඔබතුමාට ඒක මතක නැහැ. ඔබතුමා අර 'පීකේ' චිත්‍රපටිය බලන්න. [බාධා කිරීමක්]

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
තමුන්නාන්සේ කථා කළා නේ. මම උත්තර දෙන්නේ නැතිව වාඩි වෙනවා, ඕනෑ දෙයක් කර ගන්න කියා. සීමාවක් තිබෙන්න ඕනෑ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමනි, ජෝන් අමරතුංග ඇමතිතුමාට කථා කරන්න ඉඩ දෙන්න.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඔබතුමාට උත්තරය ඕනෑ නැත්නම් මම නිකම් ඉන්නවා. නම් දෙකක් තිබෙන එකත් මට පටලැවිල්ලක්. මම ආගමන විගමන කොමසාරිස්තුමාගෙන් ඇහුවා, "නොයෙල් මුදලිගේ කියන මහත්තයා කවුද, කුමාර ගුණරත්නම් කියන මහත්තයා කවුද?" කියා. ඔය නිසා වෙන්න ඇති උසාවිය තමුන්නාන්සේලාගේ ඉල්ලීමත් නිෂ්ප්‍රභා කරන්න ඇත්තේ. ඔබතුමන්ලා උසාවියට නොගිහිල්ලා හිටියා නම් මේ පිළිබඳව කථා බහ කර, සාධාරණව අපිට එය විසඳා ගන්න තිබුණා. දැන් මගේ අභිමතාර්ථය ගැන කථා කරනවා. මොන අභිමතාර්ථයක්ද? උසාවි තීන්දුවක් තිබියදී මම ඒක උල්ලංඝනය කළොත් උසාවියට අරගෙන ගිහිල්ලා මට දඬුවම් කරන්න පුළුවන්. මේ තත්ත්වය උඩ තමුන්නාන්සේගේ ඔය නායකයා පිළිබඳව කරන ලද ඉල්ලීමට මේ වෙලාවේ කටයුතු කරන්න අවස්ථාවක් නොලැබීම ගැන අපි කනගාටු වනවා. දැන් අපේ අජිත් පී. පෙරේරා මහත්මයාත් බොහොම ලස්සනට ඒ කාරණය පැහැදිලි කළා. මම දන්නේ නැහැ, අපේ වාසුදේව නානායක්කාර මැතිතුමා නම් කියනවා, මෙය යහ පාලනයේ ප්‍රශ්නයක් කියා. නමුත් ඒ වෙලාවේ මහින්ද රාජපක්ෂ සුදු වැන් එකේ දාලා පිටත් කර හැරියා, - [බාධා කිරීමක්] මේ ආණ්ඩුව තිබුණු නිසා අඩු තරමේ අද ඒ පුද්ගලයාට ඇවිල්ලා උසාවියට යන්නවත් නිදහස තිබුණා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒක මම පිළිගත්තා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඔබතුමා එය පිළිගත්ත එක හොඳයි. තමුන්නාන්සේ ඒ කාරණය පිළිගැනීම සම්බන්ධයෙන් මම සන්තෝෂ වනවා. මම කියන්න හදන්නේ ඒක නොවෙයි. මේ ආණ්ඩුව යටතේ ඒ පුද්ගලයාට උසාවියට යන්න පවා නිදහස තිබුණා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒක නිසා තමුන්නාන්සේ ගේට්ටුව වැහුවා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මම ගේට්ටුව වහලා නැහැ. තමුන්නාන්සේ අධිකරණයට චෝදනා කරන්නේ ඇයි? ස්වාධීන අධිකරණයක් හදන්න අපි උත්සාහ කරන කොට එදා දේශපාලනය කර තිබුණු අධිකරණය -

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
You are speaking against your conscience.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
You are talking through your hat. You do not know what you are saying. You have to be reasonable in your arguments. You cannot give false interpretations to what has taken place. That is my point.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෙනෙකුට පුරවැසිභාවය පරම්පරාවෙනුත් ලබා ගන්න පුළුවන්. ඒ වාගේම ලියාපදිංචි වීමෙනුත් පුරවැසිභාවය ලබා ගන්න පුළුවන්. ඒවාට නීති - රීති තිබෙනවා. 1948 අංක 18 දරන පුරවැසිභාවය පිළිබඳ පනත සහ 1987 අංක 45 දරන පුරවැසිභාවය පිළිබඳ (සංශෝධන) පනත අනුව රෙගුලාසි සහ නීති තිබෙනවා. ඒ අනුව තමයි අපි කටයුතු කරන්නේ.

ඒ වාගේම ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය අවසන් වන අවස්ථා ද මෙම පනත මඟින් සඳහන් කර තිබෙනවා. මම ඒ කාරණයත් මතක් කරන්න ඕනෑ. ශ්‍රී ලාංකික පුරවැසිභාවය අත්හැරීම හේතුවෙන්, වෙනත් රටක පුරවැසිභාවය ලබා ගැනීම හේතුවෙන්, ලියාපදිංචියෙන් පුරවැසියකු විය හැකි අයකු ඒ සඳහා ලියාපදිංචි නොවීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය අවසන් විය හැකියි. මේවා තමයි අපේ රටේ තිබෙන නීතිය.

තවද මෙම පනතට අනුව මෙරට පුරවැසියකු වෙනත් රටක පුරවැසිභාවය ලබා ගැනීමේදී ශ්‍රී ලාංකික පුරවැසිභාවය අහෝසි වෙනවා. ඒක වෙලා තිබෙනවා නේ. ශ්‍රී ලාංකික පුරවැසිභාවය අහෝසි වී ඇති අවස්ථාවක එම පුරවැසිභාවය අහෝසි වූ පුද්ගලයාට නැවත ලංකාවට පැමිණීමට ද පනත සහ එහි රෙගුලාසි මඟින් පහත දක්වා ඇති අයුරින් අවස්ථාවන් සලසා තිබෙනවා. මම මේ පනත ගැන පොඩි අවබෝධයක් අපේ අජිත් කුමාර මන්ත්‍රීතුමාට ලබා දෙන්න ඕනෑ. මේ කාරණය සම්බන්ධයෙන් එතුමා හුඟක් මහන්සි වීම ගැන මම කනගාටු වනවා.

එක කාරණයක් තමයි, විදේශිකයෙකු ලෙස වීසාවක් ගෙන පැමිණීම. ඔහු ඇවිල්ලා තිබෙන්නේ විදේශිකයෙකු හැටියට වීසාවක් අරගෙන. ඔහු ඕස්ට්‍රේලියානු පාස්පෝට් එකක් තිබෙන පුද්ගලයෙක්. දෙවැනි කාරණය තමයි, ශ්‍රී ලංකාවේ ද්විත්ව පුරවැසිභාවය - dual citizenship - ලබා ගැනීම. මේක මෙතුවක් කල් තිබුණු දෙයක් නේ. ඒවා හොරෙන් කාටවත් දෙන්නේ නැහැ කියා නවත්වලා පිටු පස්සේ දොරෙන් දෙදාහකට දීලා තිබෙනවා. මම දන්නේ නැහැ, මේ පුද්ගලයාටත් ගන්න බැරි වුණේ ඇයි කියා. තුන්වැනි කාරණය තමයි, විදේශ රටෙහි පුරවැසිභාවය අත්හැර නැවත ලංකාවේ පුරවැසිභාවය ලබා ගැනීම. මේවා තමයි නීතිය. [බාධා කිරීමක්] තමුන්නාන්සේ වාඩි වෙන්න කෝ. එහෙනම් මම උත්තර දෙන්නේ නැහැ, නිකම් ඉන්නවා. ඉවරයි නේ. මට කථා කරන්න දෙන්නේ නැත්නම් මම වාඩි වෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ගරු ඇමතිතුමාට එතුමාගේ කථාව අවසන් කරන්න දෙන්න. [බාධා කිරීමක්] ඔබතුමා විනාඩි 25ක් විතර කථා කළා නේ.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
තමුන්නාන්සේට උත්තරයක් ඕනෑ නම් මට කථා කරන්න ඉඩ දෙන්න. නැත්නම් මම වාඩි වෙනවා. මම නැගිටලා යනවා යන්න.

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ඇමතිතුමා උත්තර දෙන්න. මම කිව්වේ ඒක ඉල්ලා තිබෙනවා කියා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඉල්ලා තිබෙන එක තමයි මේ කියන්න හදන්නේ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමා සමඟ ඒ ගැන වෙනම සාකච්ඡා කරන්න.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
උසාවි නොගියා නම් ඉල්ලා තිබුණු එක දෙන්න තිබුණා. උසාවි ගිහිල්ලා ඒක නිෂ්ප්‍රභා කළා. අපට තිබෙන ප්‍රශ්නය ඒකයි. ඒක තේරුම් ගන්න ඕනෑ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒක වෙනම ගරු ඇමතිතුමා සමඟ සාකච්ඡා කර ගන්න. මෙතුමාගේ පැහැදිලි කිරීමට දැන් ඉඩ දෙන්න.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මම තමුන්නාන්සේට කියනවා, ආයෙත් වතාවක් සුප්‍රිම් උසාවියට ගිහිල්ලා ඉල්ලීමක් කරන්න කියා.

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දැන් වාඩි වෙන්න. දැන් මෙතුමාගේ කථාව අවසන් කරන්න ඉඩ දෙන්න. ඔබතුමාට ඕනෑ නම් එතුමා සමඟ පෞද්ගලිකව පසුව සාකච්ඡා කර ගන්න.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම උත්තර දෙන්නේ නැහැ. වැඩක් නැහැ. මෙතුමා කියන දේ අහ ගන්නේ නැත්නම් එතුමාටම කථා කරන්න දීලා ඉන්නවා. [බාධා කිරීමක්]

මම දැන් පෙන්නුවේ නීතියේ තිබෙන තත්ත්වය. ඕස්ට්‍රේලියානු ගමන් බලපත්‍ර අංක N1016123 භාවිතා කරමින් නොයෙල් මුදලිගේ යන අය දින 30කට වලංගු සංචාරක වීසාවක් මඟින් 2015.01.01 දින ලංකාවට පැමිණ තිබෙනවා. දැන් මේ නොයෙල් මුදලිගේ සහ කුමාර් ගුණරත්නම් කියන්නේ එක් පුද්ගලයෙක්ද කියායි මම ඇහුවේ. ගුණරත්නම් සමඟ මම වැඩිය ආශ්‍රය කර නැති නිසායි ඇහුවේ. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමාට කථා කරන්න ඉඩ දෙන්න.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මෙතැන තිබෙන්නේ හරි අර්බුදකාරි ප්‍රශ්නයක්.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අර්බුද මවනවා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මොකක්ද කියා මට තේරෙන්නේ නැහැ. දින 30කට වලංගු වූ වීසාවක් අර ගෙනයි ඇවිල්ලා තිබෙන්නේ. එතකොට ඔහුගේ ඉල්ලීම ප්‍රකාරව එම වීසාව මඟින් ඔහුට අවසර දී තිබෙන්නේ ඥාතීන් හමු වීමට සහ හිතමිත්‍රාදීන් හමු වීමට පමණයි. ඒ කටයුත්ත සඳහා තමයි ඒ වෙලාවේ ලංකාවට එන කොට වීසා එක දීලා තිබුණේ. ඔහු විසින් ලංකාවට පැමිණි පසු ඊට පරිබාහිරව කටයුතු කරමින් දේශපාලන කටයුතුවල නිරත වී ඇති බව දෙපාර්තමේන්තුවේ සාක්ෂි සහිතව වාර්තා වී තිබෙනවා. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවෙන් මට දීලා තිබෙන විස්තර අනුවයි මම මේ කියන්නේ. ඒ අනුව ආගමන විගමන පනතේ විධිවිධාන, රෙගුලාසි සහ අදාළ වීසා කොන්දේසි උල්ලංඝනය කරමින් රට තුළ රැඳී සිටීම හේතුවෙන් සිදු කරන ලද විමර්ශන අවසානයේදී ඔහු මේ රටින් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පැවතිණි. ඔහුව අත් අඩංගුවට අර ගෙන පිටුවහල් කරන්න හේතු තමයි මේ පෙන්වා තිබෙන්නේ. මේ ක්‍රියාව අභියෝගයට ලක් කරමින් මේ පුද්ගලයා උසාවියට නඩුවක් ඉදිරිපත් කර තිබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණය වෙත මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කර තිබෙනවා. වැරදීමකිනුයි මම ඇපැල් උසාවිය කිව්වේ. ඇපැල් උසාවියට ඉදිරිපත් කළා නම් ශ්‍රේෂ්ඨාධිකරණයට ඇපැලක් ඉදිරිපත් කර හෝ අපට මේක හදා ගන්න තිබුණා. ඉහළම උසාවියට ගිහිල්ලා. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 2015.02.18 වන දින එය ප්‍රතික්ෂේප කරන ලදී. මේකයි මෙතැන තිබෙන ප්‍රශ්නය. නැත්නම් වෙන හේතුවක් නැහැ.

කුමාර් ගුණරත්නම් නැත්නම් නොයෙල් මුදලිගේ කියන්නේ මගේ කවුරුවත් නොවෙයි. එතුමන්ලාගේ විරුද්ධත්වයකුත් නැහැ. මොන කැරලිකාර වැඩ පිළිවෙළක් කළත් ඒක අපට ප්‍රශ්නයක් නැහැ. නමුත් මේ ක්‍රියාමාර්ගය සම්බන්ධව උසාවි ගිහිල්ලා, එය නිෂ්ප්‍රභා වුණා. මම මේ ප්‍රශ්නයට විසඳුමයි දෙන්නේ. ද්විතීයික පුරවැසිභාවය පිරිනැමීම සම්බන්ධයෙන් දැනට පවතින ක්‍රමවේදය සංශෝධනය කරමින් අදාළ පරිපාලන විධිවිධාන සකස් කරමින් පවතිනවා. පසු ගිය කාලයේ පිටි පස්සා දොරෙන් 2,000කට වඩා ද්විතීයික වීසා දීලා තිබෙනවා; පුරවැසිභාවය දීලා තිබෙනවා. අනෙක් අයට කිව්වේ, "අපි දෙන්නේ නැහැ, කාටවත් දෙන්නේ

නැහැ" කියා. වැඩියෙන්ම දීලා තිබෙන්නේ ද්‍රවිඩයන්ටයි, මුස්ලිම් ජනතාවටයි, ඕස්ට්‍රේලියාවේ සහ ඇමෙරිකාවේ සිටින අයට. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේත් ඒ ආණ්ඩුවේ සිටියා. ඒ කාලයේ හැමෝම අපෙන් අහනවා, "ද්විතීයික පුරවැසිභාවය දෙන්නේ නැත්තේ ඇයි, ඒක නවත්වලා තිබෙන්නේ ඇයි?" කියා. කිසිම ක්‍රමවේදයක් නැතුව මහින්ද රාජපක්ෂගේ ආණ්ඩුව තුණ්ඩු කෑල්ලට 2,000කට වඩා ද්විතීයික වීසා දීලා තිබෙනවා. මගේ ළග ඒ ලැයිස්තුව තිබෙනවා. තවත් සමහර අය ඉල්ලුම් කර, සල්ලිත් ගෙවලා තිබෙනවා.

ඒවා ලබා ගන්න ඒ දවස්වල ක්‍රමවේදයක් තිබුණා. ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරන්න ඕනෑ. ඒ වාගේම ඉල්ලුම් කරන්න සුදුසු කොන්දේසි තිබුණා. ඊට පස්සේ කමිටුවක් පත් කර තිබුණා. ඒ කමිටුව ඉදිරියට ගිහිල්ලා ඔහුගේ සුදුසුකම් පරීක්ෂා කර තමයි වීසා දුන්නේ.

පසු ගිය කාලයේ ඒවා මොකුත් නැතුව, කාටවත් පුරවැසිභාවය දෙන්නේ නැහැ කියමින් පිටුපස දොරෙන් තුණ්ඩුවලට පුළුවන් තරම් පුරවැසිභාවය දීලා තිබෙනවා. රුපියල්වලට දුන්නාද, ඩොලර්වලට දුන්නාද, කොහොම කළාද කියලා මම දන්නේ නැහැ. මම මේ අවස්ථාවේ කනගාටුවෙන් වුණත් ඒකත් මතක් කරනවා.

කෙසේ වුවත්, ද්විතීයික පුරවැසිභාවය පිරිනැමීම සම්බන්ධයෙන් දැනට පවතින ක්‍රමවේදය සංශෝධනය කරමින් අදාළ පරිපාලන විධාන සකස් කරමින් තිබෙනවා. ඒකයි අද පවතින තත්ත්වය ගැන මම කිව්වේ. නවත්වලා තිබෙන එක අපි නැවත පටන් ගන්න හදනවා. කුමාර් ගුණරත්නම් මහත්මයා සහ නොයෙල් මුදලිගේ කියන්නේ දෙන්නෙක් නම් මේ යටතේ ඒ දෙන්නාටම පුරවැසිභාවය ලබා ගන්න පුළුවන්. මම දන්නේ නැහැ නම් දෙකක් දීලා තිබෙන්නේ කොහොමද කියලා.

මෙම නව සංශෝධන ක්‍රමවේදය අනුව විවිධාකාර වූ හේතුන් මත ඔය කියපු විධියට විදේශගත වෙලා විදේශ රටවල පුරවැසිභාවය ලබා ගැනීම නිසා ශ්‍රී ලාංකික පුරවැසිභාවය අහිමි වූ පුද්ගලයන්ට -අන්න, මේ පුද්ගලයාත් ඒ ගණයට වැටෙනවා- නැවත ශ්‍රී ලාංකික පුරවැසිභාවය ලබා ගැනීමේ හැකියාව ඉදිරියේදී හිමි වෙනවා. මේ ක්‍රමවේදය ළඟදීම ක්‍රියාත්මක කරනවා. අපි මේ සඳහා හරියාකාරව කමිටුවක් පත් කරලා කවුද මේ සඳහා ඇතුළත් කරගන්න සුදුසු සහ නුසුදුසු කියලා සොයා බලනවා. එතකොට ඔය පුද්ගලයාට ආපහු එන්න පුළුවන්. අජිත් කුමාර මන්ත්‍රීතුමා නිකම් කෑ ගහන්න එපා, අපරාදෙනේ තමුනාන්සේ පෙට්‍රල් පුච්චගන්නේ.

ඉහත ක්‍රමවේදය ක්‍රියාත්මක වීම මඟින් පාර්ලිමේන්තු මන්ත්‍රී අජිත් කුමාර මහතා සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරන යෝජනාව මඟින් මතු කරන ගැටලු විසඳාගන්න පුළුවන්. මේක බොහොම පොඩි ප්‍රශ්නයක්. මේ ද්විතීයික පුරවැසිභාවය ලබා දීමේ ක්‍රමය අපි ළඟදීම ක්‍රියාත්මක කරනවා. හැබැයි නිකම් නොවෙයි, කීයක් හරි ගෙවන්න වෙයි. ඒ පනත මඟින් ඉල්ලන සුදුසුකම් සපුරා තිබෙන්නට ඕනෑ. මේ රටේ නීතියක් තිබෙන්න ඕනෑ; නීතියේ ආධිපත්‍යයක් තිබෙන්නට ඕනෑ. එහෙම නැතුව ආවාට ගියාට මේවා කරන්න බැහැ. මේ රටේ ප්‍රශ්න ඇති කරන මිනිස්සු, එහෙම නැත්නම් මිනී මරලා, විවිධාකාර මං කොල්ල කෑම්වලට සම්බන්ධ මිනිස්සු ආපහු ඇවිල්ලා මේ රටේ ප්‍රශ්න ඇති කරලා තිබෙනවා නම් අපට මේ දේ කරන්න බැරි වෙන්න පුළුවන්. ඒකේ කොන්දේසි මාලාවක් දාලා තිබෙනවා, මේ මේ සුදුසුකම් තිබෙන්න ඕනෑ, මෙච්චර මුදලක් ගෙවන්න ඕනෑ කියලා. ඒවාට අනුකූලව පුරවැසිභාවය ගන්න පුළුවන්. මම හිතනවා කුමාර් ගුණරත්නම් කියන්නේ බොහොම යහපත් පුද්ගලයෙක් වෙන්න ඇති; කිසිම චෝදනාවකට සම්බන්ධ නැති පුද්ගලයෙක් වෙන්න ඇති කියලා. ඒ නිසා කලබල වෙන්න එපා, අවස්ථාව තිබෙනවා. මට දැන් මේක නවත්වන්න බැහැ, උසාවියේ නඩුවක් පවතින නිසා. දැන් මේක නවත්වන්න ගියොත් සුප්‍රිම් උසාවිය මට විරුද්ධව ruling එකක් දාලා මගේ නීතිඥකමත් නැති කරලා දාලා, මගේ මන්ත්‍රීකමත් නැති කරලා දාන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක නිසා මගේ අත බැඳලා තිබෙනවාය කියන එක බොහොම කනගාටුවෙන් වුණත් මම මතක් කරනවා. මෙම කාරණයට අජිත් කුමාර මන්ත්‍රීතුමා බොහොම මහන්සි වෙනවා. අපේ වැරැද්දකින් නොවෙයි මේක නවත්වලා තිබෙන්නේ. අපි ලැහැස්තියි ශ්‍රී ලාංකිකයින්ට පුරවැසිභාවය ලබා දෙන්න. නමුත් ඒ සඳහා ක්‍රමවේදයක් තිබෙනවා; මේ රටේ නීතියක් තිබෙනවා. අපි නීතියේ ආධිපත්‍ය සුරකින්නයි යන්නේ. පසු ගිය කාලයේ තමයි කිසි දෙයක් අහන්නේ බලන්නේ නැතුව බෙල්ලෙන් අල්ලලා සුදු වැන් එකක දාලා, අහස් යානයේ දාලා රටින් පිටත් කළේ. එහෙම පිටත් කරපු පුද්ගලයන්ට තමයි අද ලංකාවට ඇවිල්ලා උසාවි ගිහිල්ලා නඩුවකුත් කියන්න නිදහස ලැබිලා තිබෙන්නේ. ඒක තමයි වටිනාකමක් හැටියට පිළිගන්න ඕනෑ.

මෙම යෝජනාව ගෙනාපු අජිත් කුමාර මන්ත්‍රීතුමාට මම කියනවා, ආපහු ගිහිල්ලා ද්විතීයික පුරවැසිභාවය - dual citizenship එක - එහේ ඉඳලා ඉල්ලුම් කරන්න කියා ඒ පුද්ගලයාට කියන්න කියලා. එතැනදී අපි support එකක් දෙන්නම්. එතුමාගේ තත්ත්වය අර කියන රෙගුලාසිවලට අනුකූල නම්, එහි තිබෙන කොන්දේසිවලට අනුකූල නම් ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ. මට ඕනෑ ඕනෑ හැටියට visa දෙන්නත්, මට ඕනෑ ඕනෑ හැටියට විවිධ උදවිය ලංකාවට ගෙන්වන්නත් මට බලයක් නැහැ. ආගමන විගමන නීති රීති අනුව තමයි මම කටයුතු කරන්න ඕනෑ. අපි නීති රීති අනුව කටයුතු කරන්නේ නැත්නම් නැවත මහින්ද රාජපක්ෂ යුගයට යනවා වාගේ වැඩක් වෙනවා. ඒකට මම සූදානම් නහැ; අපේ ආණ්ඩුව සූදානම් නැහැ. අපේ රට නීති ගරුක රටක් බවට පරිවර්තනය කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු ඇමතිතුමා පැහැදිලි කිරීම දැන් ප්‍රමාණවත්. වේලාව ගතවෙලා තිබෙන්නේ.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

හොඳයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එහෙම නම් මගේ කථාව අවසාන කරන්නම්. මම කියන්නේ මේකයි. අවසානයේදී කුමාර් ගුණරත්නම් මහත්මයාටත් ද්විතීයික පුරවැසිභාවය ලබා ගැනීමේ ප්‍රශ්නයට විසඳුම තිබෙනවා. ඒ සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරන්න. ඒ වෙලාවේදී අපි ඒ සඳහා උදවු කරන්නම්. ඒ කියන්නේ ඒ සඳහා ඇති කොන්දේසිවල කිසිම පටහැනිභාවයක් නැත්නම් ද්විතීයික පුරවැසිභාවය ලබා ගන්න පුළුවන්. ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 8.10ට, 2015 මාර්තු 03 වන අඟහරුවාදා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.

அதன்படி பி.ப. 8.10 மணிக்கு பாராளுமன்றம், 2015 மார்ச் 03, செவ்வாய்க்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Adjourned accordingly at 8.10 p.m. until 1.00 p.m. on Tuesday, 03rd March, 2015.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

232 වන කාණ්ඩය - 12 වන කලාපය
தொகுதி 232 - இல. 12
Volume 232 - No. 12

2015 මාර්තු 03වන අඟහරුවාදා
2015 மார்ச் 03, செவ்வாய்க்கிழமை
Tuesday, 03rd March, 2015

පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන :
පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු අත් අඩංගුවට ගැනීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය :
"සීඅයිඑෆ්එල්" මූල්‍ය සමාගම වසා දැමීම නිසා ගනුදෙනුකරුවන් මුහුණ පා ඇති ගැටලු
ස්විට්සර්ලන්තයේ HSBC බැංකු ශාඛාවේ ලාංකිකයන් සතු ගිණුම්

සාගර අරක්ෂක සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයන් මුහුණ පා ඇති ගැටලු :
සභානායකතුමාගේ ප්‍රකාශය

ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත :
පළමුවන වර කියවන ලදි

සේවක අර්ථසාධක අරමුදල පනත:
නියෝග

කල් තැබීමේ යෝජනාව:
නව රජයේ අධ්‍යාපන ප්‍රතිපත්තිය

பிரதான உள்ளடக்கம்

அறிவிப்புக்கள்:
பாராளுமன்ற உறுப்பினரொருவரைக் கைது செய்யும்போதான நடைமுறை

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல் மூல வினா:
"சீஐஎப்எல்" நிதி நிறுவனம் மூடப்பட்டமையால் வாடிக்கையாளர் எதிர்நோக்கும் பிரச்சினைகள்
சுவிற்சர்லாந்து HSBC கிளையிலுள்ள இலங்கையர் கணக்குகள்

கடல் பாதுகாப்புச் சேவையிலுள்ள இலங்கையர் எதிர்நோக்கும் பிரச்சினைகள்:
சபை முதல்வரினது கூற்று

தேசிய மருந்துகள் ஒழுங்குபடுத்தும் அதிகாரசபைச் சட்டமூலம் :
முதன்முறை மதிப்பிடப்பட்டது

ஊழியர் சகாய நிதியச் சட்டம் :
ஒழுங்குவிதிகள்

ஒத்திவைப்புப் பிரேரணை:
புதிய அரசின் கல்விக் கொள்கை

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Procedure to be followed on arrest of a Member of Parliament

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Problems faced by customers due to closure of CIFL Company
Accounts of Sri Lankans at HSBC Swiss Branch

PROBLEMS FACED BY SRI LANKANS IN MARITIME SECURITY SERVICE:
Statement by Leader of the House

NATIONAL MEDICINES REGULATORY AUTHORITY BILL:
Read the First Time.

EMPLOYEES' PROVIDENT FUND ACT:
Regulations

ADJOURNMENT MOTION:
Education Policy of new Government

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2015 මාර්තු 03වන අඟහරුවාදා
2015 மார்ச் 03, செவ்வாய்க்கிழமை
Tuesday, 03rd March, 2015

අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

I
තේරීම් කාරක සභා රැස්වීම
தெரிவுக்குழுக் கூட்டம்
MEETING OF COMMITTEE OF SELECTION

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ රැස්වීමක් 2015 මාර්තු මස 03 වන දින අඟහරුවාදා එනම් අද දින පස් වරු 2.00ට මාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින්, එයට පැමිණ සහභාගි වන ලෙස එම ගරු සභික මන්ත්‍රී සියලු දෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

II

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු අත් අඩංගුවට ගැනීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත
பாராளுமன்ற உறுப்பினரொருவரைக் கைது செய்யும்போதான நடைமுறை
PROCEDURE TO BE FOLLOWED ON ARREST OF A MEMBER OF PARLIAMENT

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

2015 ජනවාරි මස 30 වෙනි දින පාර්ලිමේන්තුවේදී විරුද්ධ පාර්ශ්වයේ නායක ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විසින්, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු තිස්ස අත්තනායක මහතා පොලිස් අත් අඩංගුවට ගෙන ඇති බවත්, ඒ බව කථානායකවරයාට දැනුම් දීමට කටයුතු කර නොමැති බවත් ප්‍රකාශ කර සිටි අතර, මේ පිළිබඳව විවිධ අදහස් සභාවේ පළ වූ අතර, අධිකරණ නියෝජ්‍ය අමාත්‍ය ගරු සුජීව සේනසිංහ මහතා විසින් මෙම තත්ත්වය පිළිබඳව අදහස් දක්වමින්, යම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු අත් අඩංගුවට ගැනීමේදී ඒ බව කථානායකවරයාට දැනුම් දිය යුතුද යන්න පිළිබඳව මාගේ මතය ප්‍රකාශ කරන මෙන් ඉල්ලීමක් කරන ලදී.

1953 අංක 21 දරන පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ 1 වන කොටසේ සඳහන් ආකාරයට, එම පනත කඩ කිරීමකදී හැර කිසිම මන්ත්‍රීවරයෙකු පාර්ලිමේන්තුවේ යම් රැස්වීමකට හෝ සභා වාරයකට ගමන් කරන අතරතුරදී හෝ පැමිණ සිටියදී හෝ එහි සිට පෙරළා පැමිණෙන අතරතුරදී හෝ සිවිල් නඩු කටයුතුවලට විෂය විය හැකි යම් ණයක් හෝ කරුණක් සම්බන්ධයෙන් ඔහු සිරභාරයට ගැනීමට, රඳවා තැබීමට හෝ හිරිහැර කරනු ලැබීමට යටත් නොවන බව පැහැදිලිව දක්වා තිබේ.

එතෙකුදු වුවත්, කිසියම් අපරාධ නඩු කටයුත්තක් සම්බන්ධයෙන් යම් මන්ත්‍රීවරයෙකු පොලිස් අත් අඩංගුවට ගැනීම වළක්වාලන ප්‍රතිපාදන කිසිවක් මෙකී පනතේ අඩංගු නොවන අතර, එවැනි අවස්ථා සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ කථානායකවරයාට දැනුම් දීම සම්ප්‍රදායක් වශයෙන් මෙපමණ කලක් පවත්වා ගෙන ආ බව මාගේ පූර්වගාමීන් විසින් මෙම ගරු සභාවට කර ඇති ප්‍රකාශ පිළිබඳව අධ්‍යයනය කිරීමේදී මොනවට පැහැදිලි වේ.

විශේෂයෙන්ම හිටපු කථානායකවරුන් වන ස්ටැන්ලි තිලකරත්න සහ කේ.බී. රත්නායක යන මහත්වරුන් විසින් මෙම සභාවට මේ සම්බන්ධයෙන් ඉතා වැදගත් පැහැදිලි කිරීම් කර ඇති බව මා විසින් නිරීක්ෂණය කරන ලදී. 1958, 1960, 1961 හා 1971 යන වර්ෂවලදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පොලිස් අත් අඩංගුවට ගත් අවස්ථා කීපයක් පිළිබඳව මම තතු විමසා බැලුවෙමි. ඒ සෑම අවස්ථාවකදීම එවැනි අත් අඩංගුවට ගැනීම් පිළිබඳව අග්‍රාමාත්‍යවරයා විසින් හැකි ඉක්මනින් කථානායකවරයාට දැනුම් දීමට කටයුතු කර ඇති අතර, එවැනි ලිඛිත දැනුම් දීමකින් අනතුරුව සභාව රැස් වූ පළමු අවස්ථාවේදීම ඒ බව කථානායකවරයා විසින් සභාවට දැනුම් දීම සාමාන්‍ය සම්ප්‍රදාය වී ඇති බව පැහැදිලි විය. මෑත කාලයේදී ද එවැනි අත් අඩංගුවට ගැනීම් පිළිබඳව කථානායකවරයාට දැනුම් දීමට බොහෝ අවස්ථාවල කටයුතු කර ඇතත්, අවස්ථා ගණනාවකදීම එසේ දැනුම් දීමට කටයුතු කර නොමැති බව ද මේ පිළිබඳව වැඩිදුරටත් කරුණු අධ්‍යයනය කිරීමේදී නිරීක්ෂණය කළෙමි.

1971 මැයි මස 05වැනි දින එවකට අග්‍රාමාත්‍ය ධුරය දැරූ ගරු සිරිමා ආර්.ඩී. බණ්ඩාරනායක මැතිනිය විසින් කථානායකවරයා අමතමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් පොලිස් අත් අඩංගුවට ගත් අවස්ථාවේදී ඒ බව කථානායකවරයාට වාචිකව දැනුම් දී තිබුණද, ලිඛිතව දැනුම් දීමට කටයුතු නොකිරීම පිළිබඳව සිය කනගාටුව ප්‍රකාශ කරමින්, එයින් කිසිසේත්ම මෙම ගරු සභාවට අගෞරවයක් කිරීමට චේතනාවක් තමා තුළ නොතිබුණු බවද දැනුම් දී ඇත.

1958 ජූනි මස 24වන දින මෙවැනි අවස්ථාවක් සම්බන්ධයෙන් අදහස් දක්වමින් එවකට අග්‍රාමාත්‍ය ගරු එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා විසින් මන්ත්‍රීවරයකු අත් අඩංගුවට ගැනීම පිළිබඳව කථානායකවරයාට දැන්වීමේදී සිදු වූ දින පහක හයක ප්‍රමාදය වෙනුවෙන් සභාවට සිය කනගාටුව ප්‍රකාශ කොට ඇති අතර, එවැනි දැන්වීමක අවශ්‍යතාව එතුමා විසින්ම සභාවට පැහැදිලි කොට ඇත. එනම් එමඟින් ගරු කථානායකතුමාට අත් අඩංගුවට පත් වී ඇති ගරු මන්ත්‍රීවරයාට ඊළඟ රැස්වීම් දිනයට පාර්ලිමේන්තුවට පැමිණීමට හැකි වන සේ කටයුතු සැලසීමටයි. ඉහත සඳහන් කළ අතීත සිදු වීම් සියල්ලෙන්ම පැහැදිලි වන්නේ කවර හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු අත් අඩංගුවට ගත් වහාම හැකි ඉක්මනින් ඒ බව මෙම ගරු සභාවට දැන්වීමට කටයුතු කිරීමේ සම්ප්‍රදායක් අතීතයේදී පැවත ඇති බවයි. එමඟින් මෙම ගරු සභාවේ වරප්‍රසාද ආරක්ෂා කර දෙනවා පමණක් නොව, ඇතැම් අවස්ථාවලදී දේශපාලන කරුණු මත විරුද්ධ පක්ෂ මන්ත්‍රීවරුන් විශාල පිරිසක් අත් අඩංගුවට ගැනීම වළක්වාලන බවද අප රටේ සිටි කීර්තිමත් කෘතහස්ත දේශපාලනඥයකු වූ ආචාර්ය එන්.එම්. පෙරේරා මහතා විසිනුත් පෙන්වා දෙනු ලැබ තිබේ.

[ගරු කථානායකතුමා]

මෙවැනි තත්ත්වයන් සම්බන්ධයෙන් බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ ක්‍රියාත්මක වන ආකාරය මවිසින් විමසා බලන ලදී. "අර්ස්කින් මේ" අනුව අපරාධ චෝදනා සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු අත් අඩංගුවට ගත් වහාම ඒ බව කථානායකවරයාට දැනුම් දීමට ඇති අයිතිය සභාව සතු වරප්‍රසාදයක් වේ. අපගේ අසල්වැසි රාජ්‍යය වන ඉන්දියාවේද මෙවැනි අපරාධ චෝදනා සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු අත් අඩංගුවට ගත් විගස අදාළ බලධාරීන් විසින් එහි රඳවා තබා ගැනීමට හේතු වූ කාරණා පිළිබඳව කථානායකවරයා දැනුවත් කිරීමට ක්‍රියා කරන අතර පාර්ලිමේන්තුව රැස් වූ වහාම ඒ බව සභාවට දැනුම් දීමට කටයුතු කරයි.

මෙම සියලු කරුණු මැනෙවින් සලකා බැලීමේදී මෙම ගරු සභාවේ සහ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද සුරක්ෂිත කිරීම සඳහා මෙපමණ කාලයක් සම්ප්‍රදායක් වශයෙන් පවත්වාගෙන ආ පරිදි මන්ත්‍රීවරයෙකු අත් අඩංගුවට ගත් වහාම හෝ ඊට ප්‍රථමයෙන් ඒ බව කථානායකවරයාට දැනුම් දීමේ සම්ප්‍රදාය තවදුරටත් එලෙසින්ම පවත්වාගෙන යාම සුදුසු බව මාගේ මතය වන බව මෙම ගරු සභාවට දන්වනු කැමැත්තෙමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

2013 වර්ෂය සඳහා අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව සහ වාර්ෂික ගිණුම්.- [ස්වදේශ කටයුතු හා ධීවර අමාත්‍ය ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - வெகுசன ஊடக, பாராளுமன்ற அலுவல்கள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Mass Media and Parliamentary Affairs and Chief Government Whip)

ගරු කථානායකතුමනි, ආහාර සුරක්ෂිතතාව අමාත්‍යතුමා වෙනුවෙන් මම 2012 වර්ෂය සඳහා පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අදාළ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

2013 වර්ෂය සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.- [රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍ය සහ බුද්ධ ශාසන අමාත්‍ය ගරු කරු ජයසූරිය මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු රවි කරුණානායක මහතා (මුදල් අමාත්‍යතුමා)
(மாண்புமிகு ரவி கருணாநாயக்க - நிதி அமைச்சர்)
(The Hon. Ravi Karunanayake - Minister of Finance)

ගරු කථානායකතුමනි, 2013 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අදාළ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

2013 වර්ෂය සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.- [වාරිමාර්ග හා කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පිළිගන්වන ලද වාර්තාව
சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள்
REPORTS PRESENTED

මඩහපොළ ශ්‍රී රත්නපාලාරාම විහාරස්ථ සාසන හා බෞද්ධ අධ්‍යාපන සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
மடஹபொல ஸ்ரீ ரத்னபாலராம விகாரையின் பௌத்த கல்வி அபிவிருத்தி மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
MADAHAPOLA SRI RATNAPALARAMAYA RELIGIOUS AND BUDDHIST EDUCATIONAL DEVELOPMENT FOUNDATION (INCORPORATION) BILL

ගරු චන්දිම වීරක්කොඩි මහතා (නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා)
(மாண்புமிகு சந்திம வீரக்கொடி - பிரதிச் சபாநாயகரும் குழுக்களின் தவிசாளரும்)
(The Hon. Chandima Weerakkody - Deputy Speaker and Chairman of Committees)

ගරු කථානායකතුමනි, "මඩහපොළ ශ්‍රී රත්නපාලාරාම විහාරස්ථ සාසන හා බෞද්ධ අධ්‍යාපන සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත" පිළිබඳ 'ඒ' ස්ථාවර කාරක සභාවේ වාර්තාව හා එහි කාර්ය සටහන් මම ඉදිරිපත් කරමි.

"වාර්තාව

'මඩහපොළ ශ්‍රී රත්නපාලාරාම විහාරස්ථ සාසන හා බෞද්ධ අධ්‍යාපන සංවර්ධන පදනම' නමැති පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක විසින් කරන ලද සංශෝධන සහිතව කාරක සභාව සලකා බැලූ අතර, මෙයට අමුණා ඇති පුනර් මුද්‍රණයේ දැක්වෙන යථෝක්ත සංශෝධන සහිතව පනත් කෙටුම්පතට එකඟ වී ඇත.

මෙම පනත් කෙටුම්පතට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබේ."

පනත් කෙටුම්පත "ඒ" ස්ථාවර කාරක සභාව විසින් වාර්තා කරන ලද පරිදි 2015 මාර්තු 4 වන බදාදා සලකා බලනු ලැබේ.
சட்டமூலம், நிலைக்குழு 'ஏ' இனால் அறிக்கை செய்யப்பட்டவாறு 2015 மார்ச் 4ஆந் திகதி புதன்கிழமை பரிசீலிக்கப்படவிருக்கிறது.
Bill, as reported by Standing Committee "A.", to be considered upon Wednesday, 04th March, 2015.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)

ගරු කථානායකතුමනි, පහත සඳහන් පෙත්සම් දෙක මම පිළිගන්වමි.

(1) ගාල්ල, ගොනාමුල්ල, කොපිහේනවත්තෙහි පදිංචි ඩබ්ලිව්.ජී. පියසේන මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) බද්දේගම, වැනියරවෙල, 2වන පටුමග, මෙත්සිරි පෙදෙස, අංක 44 දරන ස්ථානයෙහි පදිංචි එච්.එම්. මුදිතා සාගරී මෙනවියගෙන් ලැබුණු පෙත්සම.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා (විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பாலித ரங்கே பண்டார - மின்வலு மற்றும் எரிசக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Palitha Range Bandara - State Minister of Power and Energy)

ගරු කථානායකතුමනි, මැදිරිගිරිය, නව නගරය, යාය 06, අංක 18/2 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.එම්.පී.බී. වීරසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - வெளிநாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Ajith P. Perera - Deputy Minister of Foreign Affairs)

ගරු කථානායකතුමනි, පරගස්තොට, දැල්කඩ, ඉහළ පාර, අංක 312 දරන ස්ථානයෙහි පදිංචි එස්.ඩී.එස්. මනෝහර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු තිස්ස අත්තනායක මහතා
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)

ගරු කථානායකතුමනි, අලව්ව, පහළ වලකුඹුර, බදුවත්තෙහි පදිංචි ඩී.එම්. ප්‍රියන්ත මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු වික්ටර් ඇන්ටනි මහතා
(மாண்புமிகு விக்டர் அன்டனி)
(The Hon.Victor Antony)

ගරු කථානායකතුමනි, බංගදෙණිය, වෙහෙරකැලේ පදිංචි ඩබ්ලිව්.එම්.ජේ. පීටර් ප්‍රනාන්දු මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, අකුරැස්ස, කොරටුවහේන, හේනේගම, පළමු පටුමග, "හේමාලි" නිවසෙහි පදිංචි මානගේ හේමසිරි මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු උපේක්ෂා ස්වර්ණමාලි මහත්මිය - පැමිණ නැත.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු කථානායකතුමනි, දොම්පෙ, ගුරුවල, අංක 125/1 දරන ස්ථානයෙහි පදිංචි එම්.ඒ. අමිල ප්‍රියංකර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු කරුපයියා වේලායුදම් මහතා (වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கருப்பையா வேலாயுதம் - பெருந்தோட்டக் கைத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Karuppaiah Velayudam - State Minister of Plantation Industries)

Hon. Speaker, I present the following petitions:

1. A petition from Mr. R.B.S.S.K. Jamarasinghe of No. 84, D.S. Wijesinghe Mawatha, Katubedda, Moratuwa;
2. A petition from Mr. W.P.N. Botheju of No. 128 B, Rukmale, Ogodapola, Veyangoda;
3. A petition from Mrs. L.W. Wathsala Lakmala Liyanage of No. 336, Pahala Imbulgoda, Imbulgoda;
4. A petition from Mr. R.A.D.S.C. Rajapaksha of No. 74/2, Kandewaththa, Wathurugama;
5. A petition from Mr. W.B.T. Ariyarathne of Yatiwaldeniya, Paththampitiya, Rambukkana;
6. A petition from Mr. H.E.G. Wijebandara of Sri Lanka Insurance Corporation Limited, Kahawatta Branch;
7. A petition from Mr. M.B. Bulankulama of Sri Lanka Insurance Corporation Limited, Kekirawa Branch;
8. A petition from Mr. C.S.G. Aluthgamage of Sri Lanka Insurance Corporation Limited, Eheliyagoda Branch;
9. A petition from Mr. R. Kongahawaththa of No. 26/C, Biyagama Road, Rathupaswala, Nedungamuwa;
10. A petition from Mr. K.L.P.G. Prasanna of Sri Lanka Insurance Corporation Limited, Avissawella Branch;
11. A petition from Mrs. H.D.M.J. Karunarathne of No. 57, Sri Somananda Mawatha, Horana;
12. A petition from Mr. U.M.J. Kumara of Delgedara, Anukkane, Kuliyapitiya;
13. A petition from Mr. P.A. Gamage of Sri Lanka Insurance Corporation Limited, Avissawella Branch;
14. A petition from Mrs. J.A.S.N. Jayakody of No. 240, Batepola, Wathurugama; and
15. A petition from Mrs. N.R.P. De S. Wijerathne of Sri Lanka Insurance Corporation Limited, Fort Branch, Colombo.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 1 - 4399/'13-(2), ගරු බුද්ධික පතිරණ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

2011 සහ 2012 වර්ෂවල රාජ්‍ය ආදායම සහ ණය වාරික : විස්තර
2011, 2012ஆம் ஆண்டுகளில் அரச வருமானம் மற்றும் கடன் தவணைப் பணம்: விபரம்
NATIONAL INCOME AND LOAN INSTALMENT IN 2011 AND 2012 : DETAILS

4581/'13

2. ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) 2011 සහ 2012 වර්ෂවල රාජ්‍ය ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම වර්ෂ දෙක වෙනුවෙන් රජය ලබා ගෙන තිබෙන ණය සඳහා ගෙවන ලද පොලී ප්‍රමාණය හා ණය වාරිකය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම වර්ෂ වෙනුවෙන් ගෙවන ලද ණය වාරික හා පොලී වාරිකවල එකතුව වාර්ෂික රාජ්‍ය ආදායමේ ප්‍රතිශතයක් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2011ஆம் 2012ஆம் ஆண்டுகளில் அரச வருமானம் தனித்தனியே எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி இரண்டு ஆண்டுகளுக்காகவும் அரசாங்கம் பெற்றுள்ள கடன்களுக்காக செலுத்தப்பட்ட வட்டித் தொகை மற்றும் கடன் தவணைப் பணம் வருடாந்தம் தனித்தனியே எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி ஆண்டுகளுக்காக செலுத்தப்பட்ட கடன் மற்றும் வட்டித் தவணைகளின் கூட்டுத்தொகை வருடாந்த அரச வருமானத்தின் சதவீதமாக எவ்வளவு என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance:

(a) Will he inform this House -

(i) the value of the national income for the years 2011 and 2012 separately;

(ii) separately, the amount of the interest and the loan instalment paid annually for the loans obtained by the Government for the aforesaid years; and

(iii) the total of the loan instalment and the interest paid in each of the aforesaid years as a percentage of the national income of the relevant year?

(b) If not, why?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ) (i)

	2011	2012
රාජ්‍ය ආදායම	රුපියල් බිලියන 974	රුපියල් බිලියන 1,094

(ii)

	2011	2012
ණය සඳහා ගෙවන ලද පොලී ප්‍රමාණය	රුපියල් බිලියන 353	රුපියල් බිලියන 409
ගෙවන ලද ණය වාරිකය	රුපියල් බිලියන 542	රුපියල් බිලියන 603

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට 2015 වර්ෂයේ අද වන තුරු ණය පොලී සහ වාරික සම්බන්ධයෙන් තිබෙන තත්ත්වය දැනගන්න අවශ්‍ය නම්, ඒ ප්‍රමාණ මෙසේයි. ණය පොලිය රුපියල් බිලියන 688යි. ණය වාරිකය රුපියල් බිලියන 802යි.

(iii)

	2011	2012
ගෙවන ලද ණය වාරිකය හා ගෙවන ලද පොලී ප්‍රමාණවල එකතුව වාර්ෂික රාජ්‍ය ආදායමේ ප්‍රතිශතයක් ලෙස	91.9%	92.5%

(ආ) පැන නොනඟී.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙසේයි.

ගරු ඇමතිතුමා දීපු පිළිතුර අනුව, 2011 වසරේ රුපියල් බිලියන 974ක් ආදායම හැටියට ලබා ගන්නකොට, බිලියන 900කට ආසන්න ප්‍රමාණයක් ණය සහ පොලී වාරිකය හැටියට ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම, 2012 වසරේ බිලියන 1094ක් ආදායම හැටියට උපයනකොට බිලියන 1000කට ආසන්න ප්‍රමාණයක් ණය සහ පොලී වාරිකය වශයෙන් ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, රටක ආදායමෙන් සියයට 90ක් ණය සහ පොලී වාරික ලෙස ගෙවන්න සිදු වී තිබෙනවා නම, ඒ රටේ පවතින්නේ ස්ථාවර ආර්ථිකයක් ද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු මන්ත්‍රීතුමනි, ඒක බොහොම භයානක තත්ත්වයේ ආර්ථිකයක්. ඇත්ත වශයෙන්ම ඔබතුමා බොහොම ඕනෑකමින් අහන නිසා මේ සංඛ්‍යා සැබෑ වාර්තා සමඟ සංසන්දනය කරන්න ඕනෑ. 2015 වසරේ අපේ රටේ ආදායම ඇස්තමේන්තු කළේ බිලියන 1524ක් ලෙසයි. එය අපේ අතුරු අය වැය තුළින් රුපියල් බිලියන 1498කට සංශෝධනය වුණා. අපේ ණය වාරික හා පොලී ප්‍රමාණය රුපියල් බිලියන 1480කට විතර ඇස්තමේන්තු වෙලා තියෙන්නේ. රුපියල් කෝටි පන්ලක්ෂයක මුදල් ප්‍රමාණයක් මේ රටට ණය හැටියට දීලා තිබෙනවාය කියලා අද පත්තරයක තිබෙනවා. මේ මුදල් අමාත්‍යාංශයේ ගිණුම්ගත වෙලා තිබෙන ආකාරය ගැන අපට ප්‍රශ්නයක් තිබෙනවා. මේ සම්බන්ධ සැබෑ තත්ත්වය අපේ ගරු අගමැතිතුමා සහ කැබිනට් මණ්ඩලයට හෙළිදරවු කරලා යථා කාලයේදී ඒ ගැන මේ සභාවත් දැනුවත් කරන්නම්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමා මේ ඉදිරිපත් කළේ රජය මුදල් අමාත්‍යාංශය හරහා ණය ලබා ගැනීම සහ මුදල් අමාත්‍යාංශය හරහා ණය පොලිය ගෙවීම පිළිබඳවයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
රජය රටක් වශයෙන් අරගෙන තිබෙන ණය.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නමුත්, ඊට අමතරව ලංකා විදුලිබල මණ්ඩලය විසින් ලංකා බැංකුවෙන් ණය අරගෙන තිබෙනවා; ඛනිජ තෙල් සංස්ථාව විසින් ලංකා බැංකුවෙන් ණය අරගෙන තිබෙනවා; මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සහ තවත් ආයතන විසින් රටේ වෙනත් පෞද්ගලික සහ රාජ්‍ය බැංකුවලින් ණය අරගෙන තිබෙනවා. ඔබතුමා මේ කියන එකතුවට එම ණයත් ඇතුළත්ද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැත. මේක සම්පූර්ණයෙන්ම රජයේ මුදල් ඇමතිවරයා වශයෙන් අය වැයක් තුළින් කථා කරලා ගත් ණය. අර ආයතන ණය ගත්තේ නැහැ. ණය ගන්න කියලා ආණ්ඩුවක් වශයෙන් කිව්වා. ඒ නිසා ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් ඩොලර් මිලියන 600ක් අරගෙන තිබෙනවා. ඒ වාගේම ලංකා විදුලිබල මණ්ඩලය අරගෙන තිබෙන්නේ කීයද කියලා සැබෑ තත්ත්වය කියන්න ඇත්ත වශයෙන්ම මම දන්නේ නැහැ. වරාය අධිකාරිය වාගේ ආයතන තුනක් ඒ වාගේ ණය අරගෙන තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවට තමයි, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව මූල්‍ය බලතල පැවරිලා තිබෙන්නේ. දැන් ගරු ඇමතිතුමා දෙන පිළිතුර අනුව පෙන්නුම් කරනවා, මුදල් අමාත්‍යාංශය හරහා පමණක් අරගෙන තිබෙන ණය සහ ණය පොලී වාරික ගෙවීම රාජ්‍ය ආදායමෙන් සියයට 90 ඉක්මවමින් තිබෙන බව. ඊට අමතරව අනෙක් ඒවා ගත්තොත්, මාර්ග සංවර්ධන අධිකාරිය, ඛනිජ තෙල් සංස්ථාව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් ආයතනය, ලංකා විදුලිබල මණ්ඩලය, පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, - මිල්කෝ ආයතනය ණය මුදලක් ගන්න උත්සාහ කරනවා මා දැක්කා.- මේ ආදී රාජ්‍ය ආයතන ගණනාවකුත් වෙන වෙනම ණය අරගෙන තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ අය වැය ලේඛනය පිළිබඳ විවාදයේ දී සාකච්ඡා කරනු ලබන්නේ ඍජු මුදල් අමාත්‍යාංශය හරහා ණය ලබා ගැනීම සහ ගෙවීම ගැන විතරයි.

අනෙක් කිසිදු ආයතනයක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් වෙන්නෙත් නැහැ; ණය ලබා ගැනීම සඳහා ඇති සීමාවට ඇතුළත් වෙන්නෙත් නැහැ. ඒ නිසා මේ ආයතන පසු ගිය කාලය පුරාවටම කර ඇති දේ තමයි පාර්ලිමේන්තුව සතුව තිබෙන මූල්‍ය වගකීම, මූල්‍ය පාලන බලය මුළුමනින්ම පාර්ලිමේන්තුවෙන් ගිලිහෙන ආකාරයට කටයුතු කර තිබීම. ඒ නිසා මේ පිළිබඳව පාර්ලිමේන්තුවේ පුළුල් විවාදයක් පැවැත්විය යුතුයි. මොකද, ලංකා විදුලිබල මණ්ඩලය ණය ගන්නවා; අය වැය ලේඛනයේ සඳහන් වෙන්නේ නැහැ. Ceylon Petroleum Corporation එක ණය ගන්නවා; අය වැය ලේඛනයේ සඳහන් වෙන්නේ නැහැ. රාජ්‍ය ආයතන හැටියට වරාය අධිකාරිය ණය ගන්නවා; අපේ ණය සීමාවට අදාළ වෙන්නේ නැහැ. අප අය වැය ලේඛනයෙන් වසරකට ගත යුතු ණය සීමාවක් පිළිබඳ සම්මත ක්‍රමවේදයක් ලබා දීලා තිබෙනවා. නමුත් එය ඉක්මවා වෙනත් ආයතනවලින් ණය අරගෙන තිබෙනවා. ඒ නිසා මෙය ව්‍යවස්ථාවෙන් පාර්ලිමේන්තුවට පවරා දී තිබෙන මූල්‍ය බලය මුළුමනින්ම උල්ලංඝනය කිරීමක්. මේ පිළිබඳව පුළුල් විවාදයක් මේ පාර්ලිමේන්තුවේ පවත්වන්න අවශ්‍යයි කියන යෝජනාව තමයි ගරු කථානායකතුමනි, මා කරන්නේ. මුදල් අමාත්‍යවරයාගෙන් මා අහන්න කැමැතියි, එවැනි විවාදයක් මේ පාර්ලිමේන්තුව තුළ පවත්වන්න සූදානම්ද කියලා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්, අපි ආණ්ඩුවක් වශයෙන් ඕනෑ වෙලාවක ඊට සූදානම්. ඒකෙදී නිසියාකාරව කටයුතු කර, අපි සූදානම් සියලු දේම හෙළිදරවු කරන්න. හැබැයි, අතුරු සම්මත ගිණුම ගැන සාකච්ඡා කරන වෙලාවේ අගමැතිතුමා මට නිර්දේශ කළා, එදාට තිබුණු මූල්‍ය තත්ත්වය මොකක්ද කියලා මේ පාර්ලිමේන්තුවට අවංකව හෙළිදරවු කරන්න කියලා. එවකට තිබුණු මූල්‍ය තත්ත්වය බිලියන 8,535යි. නමුත් contingent liabilities අනුව දැන් වන විට මේක බිලියන 9,300ට විතර වැඩි වෙලා තිබෙනවා. අපට හෙළිදරවු වෙනවා, ගිවිසුම අත්සන් කරලා තිබෙනවා, හැබැයි, කැබිනට් අනුමැතියක් ලබා නොගැනීම හෝ මුදල් අමාත්‍යාංශයට නොකියා අත්සන් කරපු ඒවා ගණනාවක් තිබෙන බව. ඒ නිසා, සැබෑ තත්ත්වය දවසින් දවස වෙනස් වන නිසා මට කියන්න පුළුවන් වන්නේ මේ මොහොත ගැන විතරයි. හැබැයි, විවාදයක් තුළින් යම් අවස්ථාවකදී අපි සැබෑ තත්ත්වය ඔබතුමන්ලාට හෙළිදරවු කරනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අපට ගරු අගමැතිතුමාගෙන් දැන ගන්නට පුළුවන්ද, ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ විවාදයක් පවත්වනවාද කියලා?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්, අගමැතිතුමා කිව්වා, මේ සම්බන්ධයෙන් පුළුල් විවාදයකට ලැස්තියි කියලා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் கொள்கை உருவாக்கம், பொருளாதார அலுவல்கள், சிறுவர், இளைஞர் மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremasinghe - Prime Minister, Minister of Policy Planning, Economic Affairs, Child, Youth and Cultural Affairs)
ඔව්, අපි ලැස්තියි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හොඳයි, අපි ඉක්මනින් දන්වන්නම්. බොහොම ස්තුතියි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා අපෙන් මේ ප්‍රශ්නය ඇහුවත්, මහින්ද රාජපක්ෂ ආණ්ඩුවෙන් කරපු අපරාධ ගැන තමයි අපි මේ ඔබතුමන්ලාට උත්තර දෙන්නේ. දවස් 53ක හෙළිදරවු කිරීමකින් තමයි අපි මේවා කියන්නේ. මේවා මහින්ද රාජපක්ෂ ආණ්ඩුව කාලයේ වෙච්ච දේවල්. ඒ මිසක් මේවා අපි කරපු දේවල් නොවෙයි. අපි බාර ගත්තු විධියට, ඔබතුමන්ලාට හෙළිදරවු කිරීමක් විතරයි කරන්න තිබෙන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 3 - 4773/'14 (2), ගරු අශෝක් අබේසිංහ මහතා.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதார மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health and Indigenous Medicine)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කාන්තාවන් සඳහා පොලී රහිත ණය යෝජනා ක්‍රමය : විස්තර
பெண்களுக்கான வட்டியற்ற கடன் வழங்கும் திட்டம் : விபரம்
INTEREST-FREE LOAN SCHEME FOR WOMEN : DETAILS

5114/'14

4. ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) 2014 වර්ෂයේ අය වැය යෝජනාවලට ඇතුළත් වූ කාන්තාවන් සඳහා පොලී රහිත ණය ලබා දීමේ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කර තිබේද;

(ii) එසේ නම්, එම යෝජනා ක්‍රමය ආරම්භ කළ දිනය කවරේද;

(iii) එම යෝජනා ක්‍රමය යටතේ ණය ලබා ගත හැකි ආකාරය කවරේද;

(iv) ණය ලබා ගැනීම සඳහා කාන්තාවන් විසින් සම්පූර්ණ කළ යුතු සුදුසුකම් කවරේද;

(v) ඒ සඳහා ඇපකරුවන් හෝ ඇපකරයන් අවශ්‍ය වේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) දැනට එම පොලී රහිත ණය මුදල් ලබා දී ඇති කාන්තාවන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) ඉහත සඳහන් ණය යෝජනා ක්‍රමය මේ වන විට ක්‍රියාත්මක නොවන්නේ නම්, එයට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2014ஆம் ஆண்டின் வரவு செலவுத்திட்ட பிரேரணைகளில் உள்ளடக்கப்பட்ட பெண்களுக்கான வட்டியற்ற கடன் வழங்கும் திட்டம் அமுல்படுத்தப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி திட்டம் ஆரம்பிக்கப்பட்ட திகதி யாதென்பதையும்;

(iii) மேற்படி திட்டத்தின்கீழ் கடன் பெற்றுக் கொள்ளக்கூடிய முறை யாதென்பதையும்;

(iv) கடன் பெறுவதற்காகப் பெண்கள் பூர்த்திசெய்ய வேண்டிய தகைமைகள் யாவையென்பதையும்;

(v) அதற்கு பிணையாளர்கள் அல்லது பிணைகள் அவசியமா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) தற்போது மேற்படி வட்டியில்லாக் கடன் வழங்கப்பட்டுள்ள பெண்களின் எண்ணிக்கை ஒவ்வொரு மாவட்டத்தின் அடிப்படையில் வெவ்வேறாக எவ்வளவென்பதை அவர் இச்சபையில் சமர்ப்பிப்பாரா?

(இ) மேற்படி கடன் திட்டம் தற்போது அமுல்படுத்தப் படுவதில்லையெனில் அதற்கான காரணங்கள் யாவையென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Finance :

(a) Will he state-

(i) whether the interest-free loan scheme for women that formed part of the Budget Proposals of 2014 has been implemented;

(ii) if so, the date on which that loan scheme commenced;

(iii) the manner in which loans could be obtained under that loan scheme;

(iv) the qualifications that women should possess to obtain the loans; and

(v) whether guarantors or sureties are required for that?

(b) Will he table the number of women who have obtained those interest-free loans as at present in relation to each district separately?

(c) If the above mentioned loan scheme is not operational at present, will he inform this House of the reasons for that?

(d) If not, why?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2014 අය වැය යෝජනා පරිදි කාන්තාවන් සඳහා පොලී රහිත ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබේ.

(ii) 2014 මාර්තු මස 8 වැනි දා. (ජාත්‍යන්තර කාන්තා දිනය.)

(iii) ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මඟින් එම ණය ලබා ගත හැක.

(iv) කාන්තාවක විසින් මෙහෙයවන ව්‍යාපෘතියක්/ ව්‍යාපාරයක්/ නිෂ්පාදන ක්‍රියාවලියක්/ සේවා සැපයීමක් අලුතින් ආරම්භ කිරීම හෝ වැඩිදියුණු කිරීම

විශේෂයෙන් සම්ප්‍රදායානුකූල ව්‍යාපෘතිවලින් බැහැර නිර්මාණශීලී ව්‍යාපෘතීන්.

(v) ඇපකර හෝ ඇපකරුවන් අවශ්‍ය නැත.

(ආ) දිස්ත්‍රික්ක අනුව කාන්තාවන් සඳහා ණය ලබා දී ඇති ආකාරය ඇමුණුමෙහි සඳහන් වේ. ඇමුණුම **සභාගත*** කරමි.

(ඇ) මෙම යෝජනා ක්‍රමය 2014/2015 යන වසර දෙක සඳහාම ක්‍රියාත්මක වේ.

(ඈ) පැන නොනඟී.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු කථානායකතුමනි, මෙම යෝජනා ක්‍රමය පසු ගිය - 2014 - අය වැය සඳහා යෝජනා කර ක්‍රියාත්මක කරනවා කියලා කිව්වාට, ප්‍රායෝගිකව විනිවිදභාවයකින් මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වුණේ නැහැ. එම නිසා ඉදිරි කාලය තුළදී විනිවිදභාවය තුළ මෙය ක්‍රියාත්මක කරන ලෙසත්, ඒ සඳහා ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරන ලෙසත් මම ගරු මුදල් අමාත්‍යතුමාගෙන් විශේෂයෙන් ඉල්ලා සිටිනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු මන්ත්‍රීතුමනි, අනිවාර්යයෙන්ම ජනවාරි මස 08 වැනි දා සිට, නිර්දේශපාලනීකරණය තුළින් අප ඒ කටයුතු කර ගෙන යනවා.

ඉන්දියාවේ රඳවා ගෙන සිටින ශ්‍රී ලාංකික ධීවරයන් : රජයේ මැදිහත්වීම
இந்தியாவில் தடுத்துவைக்கப்பட்டுள்ள இலங்கை மீனவர்: அரச தலையீடு
SRI LANKAN FISHERMEN HELD IN CAPTIVE IN INDIA: GOVERNMENT INTERVENTION

5192/'14

5. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ස්වදේශ කටයුතු හා ධීවර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (4):

(අ) (i) ශ්‍රී ලාංකික සහ ඉන්දියානු ධීවරයන්ගේ ගැටලු සම්බන්ධයෙන් මෑතකදී පැවති සාකච්ඡාවල ප්‍රගතිය කවරේද;

(ii) එම ධීවර ගැටලු සම්බන්ධයෙන් රජයේ මැදිහත්වීම කවරේද;

(iii) මේ වන විට ඉන්දියාවේ අන්ද්‍රා ප්‍රදේශයේ රඳවාගෙන සිටින ශ්‍රී ලාංකික ධීවරයින් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන් මුදා ගැනීමට රජය විසින් කර ඇති මැදිහත්වීම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ධීවරයින්ට ලබා දුන් ඉන්ධන සහනාධාරය නවතා තිබේ නම්, ඒ වෙනුවට හඳුන්වා දෙනු ලැබූ විකල්ප පැකේජයක් තිබේද;

(ii) එසේ නම්, එය කවරේද;

(iii) එම සහනාධාර පැකේජය සහ ඉන්ධන සහනාධාර ක්‍රමය අතර වෙනස කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

உள்நாட்டலுவல்கள் மற்றும் கடற்றொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை - இந்திய மீனவர்களின் பிரச்சினைகள் குறித்து அண்மையில் இடம்பெற்ற பேச்சுவார்த்தைகளின் முன்னேற்றம் யாது;

(ii) மேற்படி மீனவர் பிரச்சினை தொடர்பில் அரசாங்கத் தரப்பினரின் தலையீடு யாது;

(iii) தற்போது இந்தியாவின் ஆந்திரா பிரதேசத்தில் தடுத்து வைக்கப்பட்டுள்ள இலங்கை மீனவர்களின் எண்ணிக்கை யாது;

(iv) இவர்களை விடுவிப்பதில் அரசாங்கத்தினால் மேற்கொள்ளப்பட்டுள்ள தலையீடு யாது;

என்பதை அவர் குறிப்பிடுவாரா?

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

(ஆ) (i) மீனவர்களுக்கு வழங்கப்பட்ட எரிபொருள் மானியம் நிறுத்தப்பட்டிருப்பின், இதற்குப் பதிலாக அறிமுகப்படுத்தப்பட்ட மாற்றுத் தீர்வுப் பொதியொன்று உள்ளதா;

(ii) ஆமெனில், அது யாது;

(iii) மேற்படி நிவாரணப் பொதிக்கும் எரிபொருள் மானியத்துக்கும் இடையிலான வேறுபாடு யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Home Affairs and Fisheries:

(a) Will he state-

(i) the extent of the progress of discussions that took place recently regarding the issues concerning Sri Lankan and Indian fishermen;

(ii) the nature of the intervention of the Government with regard to the aforesaid issues;

(iii) the number of Sri Lankan fishermen that are held captive in Andra Pradesh, India at present; and

(iv) the nature of the intervention of the Government in order to get them released from captivity?

(b) Will he inform this House-

(i) if the fuel subsidy given to the fishermen has been stopped, whether an alternate package has been introduced to them;

(ii) if so, what that package is; and

(iii) of the difference between the package and the fuel subsidy system?

(c) If not, why?

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා (ස්වදේශ කටයුතු හා ධීවර අමාත්‍යතුමා)

(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா - உள்நாட்டலுவல்கள் மற்றும் கடற்றொழில் அமைச்சர்)

(The Hon. M. Joseph Michael Perera - Minister of Home Affairs and Fisheries)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට සකස් කර තිබෙන පිළිතුරුවල කෙටි විස්තරයක් සහ දීර්ඝ විස්තරයක් තිබෙනවා. කාල වේලාව ඉතුරු කර ගැනීමට අවශ්‍ය නිසා මම ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාට මේ විස්තර සියල්ලම ලබා දෙන බව මතක් කරන්න කැමැතියි. ඒ අනුව එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඒකාබද්ධ කමිටුවේ දෙවන සාකච්ඡාව 2014.08.29 දින පැවති අතර එම සාකච්ඡාවේදී පහත තීරණයන්ට එළඹිණි.

a. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ධීවර කර්මාන්තය ආශ්‍රිතව ද්විපාර්ශ්වික සහයෝගිතා වැඩි දියුණු කර ගැනීම සඳහා ඇති අවස්ථා පිළිබඳ අවධානය යොමු කිරීම.

b. දෙරටේ ධීවර කටයුතුවලට අදාළ පර්යේෂණ සංවර්ධනය හා එම ආයතන ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ඉඩප්‍රස්තා වැඩි කිරීමට දෙරටේ නියෝජිතයින් එකඟ විය.

c. දෙරටේ ධීවර කටයුතු සඳහා ඒකාබද්ධ යාන්ත්‍රණයක් සකස් කිරීමටත් නියෝජිතයින් සාකච්ඡා කරන ලදී.

d. දෙරටේ ධීවර කර්මාන්තය ආශ්‍රිත ගැටලුවලදී ද්විපාර්ශ්වික සාකච්ඡා තුළින් එකී ගැටලු විසඳා ගැනීම සඳහා යන්ත්‍රණයක් සකස් කිරීමේ අවශ්‍යතාව පිළිබඳව දෙරටේ නියෝජිතයින් එකඟ විය.

e. දැනට තමිල්නාඩු ප්‍රාන්තය විසින් ක්‍රියාත්මක කරනු ලබන ඒකාබද්ධ විමර්ශන කමිටුව -Joint Interrogation Commission-ක්‍රියාත්මක කරනු ලබන ආකාරයට ශ්‍රී ලංකාවේ ධීවරයින් අනෙකුත් ප්‍රාන්තවල ද ඒ හා සමාන ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට ඉන්දීය නියෝජිතයින් එකඟත්වය පළ කරන ලදී.

f. දෙරටේ ධීවරයින් සඳහා පුහුණුවීම් කටයුතු විශේෂයෙන් ඉන්දීය ධීවරයින් ටූනා ගැඹුරු මුහුදු ධීවර කර්මාන්තය සහ විද්‍යාත්මක පර්යේෂණ ආයතන සමඟින් ඒ පිළිබඳ කටයුතු ඒකාබද්ධව පැවැත්වීම.

g. විශේෂයෙන් ධීවර කර්මාන්තයේදී දෙරටේ හවුල් ව්‍යාපාර ආරම්භ කිරීමේ කටයුතු පිළිබඳ සාකච්ඡා විය.

h. මීළඟ සාකච්ඡාව කොළඹ දී පැවැත්වීමට ද යෝජනා වූ අතර ඉහත කටයුතු පිළිබඳ ඉතාමත් සාර්ථක එකඟතාවයන්ට පැමිණියේය.

(ii) රජයේ මැදිහත්වීම තුළ ධීවර සමිතිවලට ඉඩ දුන්නා ඉන්දියාවේදී සහ මෙහෙදී ඒ ගොල්ලන්ගේ ගැටලුව පිළිබඳව සාකච්ඡා කරලා තීරණයකට එන්න. නමුත් තවම අවසාන තීරණයකට ඇවිල්ලා නැහැ.

ශ්‍රී ලංකා නාවික හමුදාව හා එක්ව අත් අඩංගුවට ගැනීම් හා නීති කටයුතු සිදු කිරීමත්, ඉන්දීය ගැනියන් නිදහස් කිරීමටත්, යාත්‍රා රාජසන්තක කිරීමටත් තීරණය කර ඇති අතර ශ්‍රී ලංකා ධීවර කාර්මිකයින් දැනුවත් කිරීමත් එසේම (VMS) මඟින් සියලුම යාත්‍රා සුපරීක්ෂණය සිදු කිරීම.

(iii) කිසිවෙක් නොමැත.

(iv) රජය ඉතා විශාල මැදිහත්වීමක් කර තිබෙනවා. අත්අඩංගුවට පත් වූ ධීවරයින් විදේශ කටයුතු අමාත්‍යාංශය, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය සහ ඉන්දියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය හා නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලය එක්ව නිදහස් කර ගැනීම සඳහා කටයුතු කරන ලදී.

(ආ) (i) ඔව්.

(ii) විකල්ප ඉන්ධන සහනාධාර ක්‍රමය යටතේ මාස 12ක ඉන්ධන සහනාධාර මුදලට සමාන වටිනාකමක් ඇති ධීවර ආම්පන්න ධීවරයාගේ කැමැත්ත පරිදි ඔවුන්ට ලබා දේ.

(iii) මට පෙනෙන්න නම් වෙනසක් නැහැ. නමුත් ඉන්ධන පාවිච්චි කළ සමහර බෝට්ටුවලට මේ සහනාධාරය ලැබිලා නැහැ. අපි දැන් ඒවා සොයා ගෙන යනවා. සොයා ගෙන ගිහිල්ලා ඒ අයටත් මේ සහනාධාරය දෙන්න අවශ්‍ය කටයුතු කරනවා. ඉන්ධන සහනාධාරය අඛණ්ඩව මාසිකව නිකුත් කළ අතර එය අවසන් දිනයක් දක්වා නොතිබුණි. විකල්ප ඉන්ධන සහනාධාර ක්‍රමය එක් වරක් අදාළ ආම්පන්න නිකුත් කිරීමෙන් අනතුරුව අවසන් කෙරේ.

(ඇ) පැන නොනඟී.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, මගේ අතුරු ප්‍රශ්න පැන නඟින්නේ ලබා දුන් උත්තරය මතයි. එහි යම් ගැටලු ටිකකුත් තිබෙනවා. මෙය හතරවැනි වතාවටත් ඉදිරිපත් කරලා, අද පස්වැනි වතාවටත් ඇසුව ප්‍රශ්නයක්. ඇත්තටම පසු ගිය රජය කාලයේ ඇති වුණු ඉන්දියාවේ ප්‍රශ්නයත් එක්කයි මේක මතු වුණේ. නමුත් දැනට තිබෙන තත්ත්වයත් එක්ක විශේෂයෙන්ම පසු ගිය දවස්වල උද්ඝෝෂණයකුත් තිබුණා, මියැන්මාරයට ගිය අපේ ධීවර බෝට්ටු 3ක ධීවරයන් 15 දෙනෙකු එහි රඳවා ගෙන ඉන්නවා; එතැන උසාවි ක්‍රියාවලියකුත් සිදු වෙලා ඒ අය වැරදිකරුවන් කර තිබෙනවා; නමුත් රජය පැත්තෙන් මැදිහත්වීමක් නැහැ කියලා.

මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, මියැන්මාරයේ රඳවාගෙන සිටින ධීවරයින් සම්බන්ධයෙන් ධීවර අමාත්‍යතුමා හැටියට ඔබතුමා යම් පියවරක් අරගෙන තිබෙනවා ද කියලා. මොකද, ඒ අය පුද්ගලික කටයුත්තකට මියැන්මාරයට ගියා නොවෙයි. එම නිසා ධීවර කර්මාන්තයට ගිහිල්ලා එහේදී අත් අඩංගුවට ගත්තා ද නැද්ද කියන එක සම්බන්ධයෙන් වෙනම විවාදයක් තිබෙන්නේ. නමුත් ධීවර කර්මාන්තයේ යෙදුණු ධීවරයන් සම්බන්ධයෙන් ඔබතුමා අරගෙන තිබෙන ක්‍රියා මාර්ගය මොකක්ද කියලා මම දැන ගන්න කැමැතියි.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

ගරු කථානායකතුමනි, මේ පිළිබඳව විදේශීය නියෝජිතයන් සමඟ කථා කර තිබෙනවා. මෙය ඉන්දියාවත් එක්ක සාකච්ඡා කරලා විසඳා ගන්නවා තරම් ලෙහෙසි නැහැ. නමුත්, අවසාන වතාවටත් අපි සාකච්ඡා කරමින් ගනුදෙනු කරමින් පවතිනවා. මම හිතනවා රාජතාන්ත්‍රික මැදිහත්වීමක් තුළ මේ අයව ඉක්මනටම අපට මුදා ගන්නට හැකි වෙයි කියලා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

එම ප්‍රශ්නයට අදාළව විශේෂ අවධානය යොමු කරන්න කියලා මම ඔබතුමාගෙන් නැවතත් ඉල්ලා සිටිනවා. ඒ වාගේම ඉන්දියාවේ ආන්ද්‍රා- [බාධා කිරීමක්]

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා එම ප්‍රශ්නය වෙනම ඇහුවොත් මට තවත් පැහැදිලි කිරීමක් කරලා ඒ සම්බන්ධයෙන් පිළිතුරක් ලබා දෙන්න පුළුවන්. මොකද මෙතැන මියැන්මාරය ගැන අහලා නැහැ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ආන්ද්‍රා ප්‍රදේශය සම්බන්ධයෙන් පමණක් නිසා තමයි මගේ ප්‍රශ්නයට ඔබතුමා "නැත" කියන පිළිතුර ලබා දුන්නේ. නමුත් මම දන්නා තරමට, ඉන්දියාවේත් තවදුරටත් අපේ ධීවරයෝ ඉන්නවා. ඒ මොහොතේ මෙම ප්‍රශ්නය පැන නැඟුණේ ඉන්දියාවේ ආන්ද්‍රා ප්‍රදේශයේ නිසායි මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කළේ. නමුත්, ආන්ද්‍රා ප්‍රදේශයේ පමණක් නොවෙයි, පොදුවේ ගත් විට ඉන්දියාවේදී අත් අඩංගුවට පත් වුණු අපේ ධීවරයෝ තවත් ඉන්නවා. ඒ අය සම්බන්ධයෙනුත් ඔබතුමාගේ අවධානය යොමු කරන්නය කියලා මම ඉල්ලීමක් කරනවා.

මාගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. පසු ගිය කාලයේ මතු වුණු තවත් ලොකු ගැටලුවක් තිබෙනවා. යුරෝපා සංගමයෙන් අපට ධීවර තහනමක් පැනෙවුවා. ඒ තහනම පනවන්නට හේතු වුණේත් විදේශීය නැව් අපේ මුහුදු සීමාවට පැමිණීමේ ප්‍රශ්නය නිසයි.

විදේශීය නැව් ඇවිල්ලා අපේ මුහුදු සීමාවේ මාළු අල්ලනවා. එම ආක්‍රමණයත් එක්ක ඇති වුණු ප්‍රශ්නය ගැන ඔබතුමන්ලා සාකච්ඡා කරලා, මේ වනකොට යම් ප්‍රමාණයක පාලනයක් ඇති කරලා තිබෙනවා. නැව් අටකට අපේ මුහුදේ මාළු අල්ලන්න තිබෙන ඉඩකඩ තහනම් කරලා තිබෙනවා; නතර කරලා තිබෙනවා. ධීවර සමිති එක්ක කරපු සාකච්ඡාවේ දී ඔබතුමා එකඟ වෙලා තිබෙනවා, ඒ අයගෙන් ටූනා මාළු කිලෝ එකක් රුපියල් 600ක තොග මිලකට ධීවර සංස්ථාවට මිලදී ගන්න. එසේ මිලදී ගැනීම සඳහා ප්‍රතිපාදන තිබෙනවාද? භාණ්ඩාගාරයෙන් ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්නේ කවදාද? ඔබතුමන්ලාගේ පැත්තෙන් ඒ මිලදී ගැනීමේ කටයුතු ආරම්භ කරන්නේ කවදා ඉඳලාද?

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

ගරු මන්ත්‍රීතුමනි, එම ධීවර සංවිධානවල, සමාගම්වල නියෝජිතයන් එක්ක මේ ටූනා මාළු පිළිබඳව අපි දීර්ඝ වශයෙන් කථා කළා. ඒ වාගේම ඒ මාළු පිට රට යවන කොම්පැනි එක්කත් කථා කරලා එකඟතාවකට ආවා. ඔබතුමා කිව්වා වාගේ පළමුවැනි වර්ගය -හොඳම වර්ගය- කිලෝවකට රුපියල් 600 ගණනේ ගෙවා මිලදී ගන්න අප එකඟ වුණා. ඒ අනුව ධීවර සංස්ථාවෙන් එම මාළු මිලදී ගැනීමේ කටයුත්ත හෙට ඉඳලා ආරම්භ කරනවා. ඒ වාගේම ඔබතුමා ඒකටම සම්බන්ධ කරලා මුදල් ප්‍රශ්නයක් ගැනත් ඇහුවා. මුදල් ප්‍රශ්නයක් තිබෙන බව ඇත්ත. අතිවිශාල මුදල් ප්‍රශ්නයක් තිබෙනවා. නමුත් අපි භාණ්ඩාගාරය එක්ක කථා කරලා ඒ සඳහා කටයුතු කරනවා. ඒ වැඩේ කෙරෙනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම කලින් ලියා පදිංචි වුණු නැව් අටේ ප්‍රශ්නය සඳහා විසඳුමක් ලැබුණාට, ලංකාවේ සමාගම් හරහා ලියා පදිංචි වුණු තවත් විදේශ යාත්‍රා - ඒවා නැව් මට්ටමේ ඒවාද කියලා මට තේරෙන්නේ නැහැ. - අපේ රටේ මුහුදු සීමාව ආක්‍රමණය කරලා ධීවර කටයුතු කරනවා. ඒ නිසා ඇත්තටම අපේ මාළු සම්පත, විශේෂයෙන්ම කුඩා මසුන් සම්පත පවා විශාල වශයෙන් විනාශ වෙමින් තිබෙනවා. ඒ නිසා අපේ ධීවරයාට බරපතළ ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා.

අපේ ධීවර කර්මාන්තය විනාශ වන තත්ත්වයක් තිබෙන්නේ. මේ විදේශ යාත්‍රාවලින් සිදු වන ආක්‍රමණය - ඇත්තටම මේකත් එක විධියක ආක්‍රමණයක්. - වළක්වන්න ඔබතුමා ගෙන තිබෙන පියවර මොනවාද, දැනට ගන්නට බලාපොරොත්තු වන පියවර මොනවාද?

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

ගරු මන්ත්‍රීතුමනි, විදේශ ආක්‍රමණය කියලා කියනකොට මෙහි කොටස් දෙකක් තිබෙනවා. ඉන්දියාවෙනුත් ධීවරයින් අපේ රටට මාළු අල්ලන්න එනවා. ඉන්දියාවේ ධීවරයන් අපේ රටට ඇවිල්ලා අපේ මුහුදු පතුලේ trawling කරන නිසා මාළුන්ට විශාල වශයෙන් හානි සිදු වෙලා තිබෙනවා. ඒක තමයි මම ඉස්සෙල්ලාත් කිව්වේ ඒ ගැන ජාත්‍යන්තර මට්ටමෙන් සාකච්ඡා පවත්වලා, ධීවරයින් එක්ක එකතු වෙලා ඒ පිළිබඳ වැඩ පිළිවෙළක් අප ඉදිරියට ගෙන යනවාය කියලා. නමුත් මම හිතන විධියට ඔබතුමා

[ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

අහන්නේ ඒ කාරණය පිළිබඳව නොවෙයි. ඔබතුමාගේ ප්‍රශ්නයට පළමුවැනි පිළිතුර තමයි, විදේශ නැව්වලට අපේ මුහුදේ මාළු අල්ලන්න අවසරයක් දීලා නැහැ කියන එක. ඒක බොහොම පැහැදිලියි. අපේ ධීවරයන් තුළ එහෙම සැකයක් තිබුණා. ඒ සැකය නිසාම මාළු අල්ලන්නට කියලා දීලා තිබුණු අවසර පත්‍රය අවළංගු කරන්න අපට සිදු වුණා. ඒ එක්කම BOI එකේ register වුණු සහ පෞද්ගලික අංශයේ register වුණු ආයතන කීපයක් තිබෙනවා. ඒගොල්ලන් මාළු මෙහාට ගෙන්වලා process කරලා පිට රට යවනවා. අහස් යානාවලිනුත් ගෙනෙනවා; නැව්වලිනුත් ගෙනෙනවා. නමුත් එහෙම මාළු ගෙනෙන්නේ අපේ පරීක්ෂාව යටතේයි. එහෙම ගෙනෙන මාළුවලින් විදේශ විනිමය උපයන මාර්ගයක් අපේ ධීවරයන්ට බලපෑමක් නොවන විධියට අප ක්‍රියාත්මක කරනවා. ඉදිරියටත් ඒ අවසරය ඉල්ලුවොත් අපට දෙන්න පුළුවන්. හැබැයි, ඒ අත්සන් කරලා තිබෙන නීති - රීතිවලට යටත්වයි.

හුදකලා පාසල් ළමා මිතුරු පරිසරයකට සංවර්ධනය කිරීම : විස්තර

தனிமைப்படுத்தப்பட்ட பாடசாலைகளை சிறுவர்நேயப் பாடசாலைகளாக அபிவிருத்திசெய்தல் : விபரம்

DEVELOPMENT OF ISOLATED SCHOOLS INTO CHILD-FRIENDLY ENVIRONMENT: DETAILS

4529/'13

6. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) හුදකලා පාසල් ළමා මිතුරු පරිසරයකට සංවර්ධන කරන බවටත්;

(ii) එම පාසල්වලට ඇතුළත් කර ගන්නා සෑම දරුවෙකුටම නොමිලේ ධාන්‍ය, බිත්තර සහ කිරි සහිත ආහාර සැපයීමටත්;

(iii) එම පාසල් දරුවන් සඳහා පාවහන් යුගලක් හා වර්ෂය මැදදී අමතර නිල ඇඳුමක් නොමිලේ ලබා දෙන බවටත්;

2013 අය වැයෙන් යෝජනා කළ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වන විට සංවර්ධනය කර ඇති ළමා මිතුරු පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත (අ) (ii) හා (iii) හි සඳහන් යෝජනා මේ වන විට ක්‍රියාත්මක වන්නේද;

(iii) එසේ නම්, එම යෝජනා ක්‍රියාත්මක වන පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම යෝජනා ක්‍රියාත්මක නොවන්නේ නම්, ඊට හේතු කවරේද;

(v) එසේ නම්, ඉහත යෝජනා ක්‍රියාත්මක කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2013 வரவு - செலவுத் திட்டத்தின் மூலம்,

(i) தனிமைப்படுத்தப்பட்ட பாடசாலைகள் சிறுவர் நேய சூழலுடையதாக அபிவிருத்தி செய்யப்படு மெனவும்;

(ii) மேற்படி பாடசாலைகளுக்கு அனுமதிக்கப்படு கின்ற ஒவ்வொரு பிள்ளைக்கும் இலவசமாக தானியம், முட்டை மற்றும் பாலுடனான உணவை வழங்குவதாகவும்;

(iii) மேற்படி பாடசாலைப் பிள்ளைகளுக்கு ஒரு சோடி பாதணிகளையும் வருட மத்தியில் மேலதிக சீருடையொன்றையும் இலவசமாகப் பெற்றுத் தருவதாகவும்

முன்மொழியப்பட்டதென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) தற்போது அபிவிருத்தி செய்யப்பட்டுள்ள சிறுவர்நேயப் பாடசாலைகளின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) மேற்படி (அ) (ii) மற்றும் (iii)இல் குறிப்பிடப்பட்டுள்ள முன்மொழிவுகள் தற்போது நடைமுறைப்படுத்தப்படுகின்றதா என்பதையும்;

(iii) ஆமெனில், மேற்படி முன்மொழிவுகள் நடைமுறைப்படுத்தப்படுகின்ற பாடசாலை களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iv) மேற்படி முன்மொழிவுகள் நடைமுறைப்படுத்தப் படவில்லையெனில், அதற்கான காரணங்கள் யாவையென்பதையும்;

(v) அவ்வாறெனில், மேற்படி முன்மொழிவுகள் நடைமுறைக்கு வரும் திகதி யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Is he aware that there was a Budget Proposal in the Budget 2013 to -

(i) develop isolated schools into a child-friendly environment;

(ii) give free food containing cereal, eggs, and milk to every child admitted to those schools; and

(iii) provide a pair of shoes and an additional uniform in the middle of the year for the students of those schools?

(b) Will he inform this House -

(i) the number of child friendly schools that have been developed by now;

(ii) whether the proposals mentioned in above (a) (ii) and (iii) are being implemented by now;

(iii) if so, the number of schools in which the aforesaid proposals are being implemented;

(iv) if the aforesaid proposals are not being implemented, the reasons for that; and

(v) if so, the date on which the aforesaid proposals will be implemented?

(c) If not, why?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு அகில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

(අ) (i) ඔව්.
(ii) ඔව්.
(iii) ඔව්.

(ආ) (i) 6,331යි.
(ii) ඔව්.
(iii)

වැඩසටහන	පහසුකම් ලබන පාසල් සංඛ්‍යාව		
	හුදකලා	දුෂ්කර, අති දුෂ්කර	අනෙකුත් පාසල්
වසර මැද අතිරේක නිල ඇඳුම් කට්ටලය ලබා දීම	770	3324	-
නොමිලේ පාවහන් ලබා දීම	770	3324	-
ධාන්‍ය හා බිත්තර ඇතුළත්ව ආහාර ලබා දීමේ වැඩසටහන	770	3324	3703
නැවුම් කිරි ලබා දීම	-	-	302

(iv) අදාළ නොවේ.
(v) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු අමාත්‍යතුමනි, පැහැදිලි, විස්තරාත්මක පිළිතුරක් ලබා දීම ගැන මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, පසු ගිය වකවානුවේ ගොඩනඟපු පාසල් කිහිපයක් තිබෙනවා. ඔබතුමාට නිලධාරි මහත්වරුන් දීලා තිබෙන - පසු ගිය කාලයේ හිටපු ලේකම්තුමා ඇතුළු ඉහළ මට්ටමේ තනතුරුවල සිටි නිලධාරීන් කිහිප දෙනෙක් වෙනස් වෙලා ඇති. - මේ පිළිතුරේ සඳහන් සංඛ්‍යා ලේඛන අනුවම මෙය සිදු වුණා කියලා වගකීමක් සහිතව කියන්න, ඔබතුමා ඒ ගැන පසු විපරමක් කළාද?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමනි, මේ ගැන මුල ඉඳලාම සොයා බලන්න ගියොත් සෑහෙන කාලයක් ගත වෙනවා. නිලධාරි මහත්වරුන් දීපු පිළිතුර තමයි මම මේ ඉදිරිපත් කළේ. නමුත් ඉදිරියේ දී මේ පිළිබඳව සම්පූර්ණයෙන් සොයා බලන්න කටයුතු කරනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මම ඊළඟ අතුරු ප්‍රශ්නයටත් ඔබතුමාගෙන් පිළිතුරක් දැන ගන්න කැමැතියි. ජාතික පාසල්වල මුදල් එකතු කිරීම පිළිබඳව ඔබතුමා දැඩි තීන්දුවක් අරගෙන තිබෙනවා. ඒ ගැන අපි ඔබතුමාට ගරු කරනවා. ඒ අතරේ පළාත් සභා පාසල්වලත්, ඇතැම් ජාතික පාසල්වලත් මුදල් එකතු කරනවා. උදාහරණයක් හැටියට කියන්නම්, මේ මොහොත වන විටත් මාතර සුජාතා බාලිකා විද්‍යාලයේ දරුවන්ට මුදල් එකතු කරන්න කියලා දැනුම් දීලා තිබෙනවා. අඩුම ගණනේ receipt එකක්වත් දෙන්නේ නැහැ; වාචිකව කියන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පිළිතුරට අදාළව අතුරු ප්‍රශ්න අහන්න.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඒ නිසා පළාත් සභා පාසල්වල මුදල් එකතු කිරීම පිළිබඳවත් අමාත්‍යාංශයට මැදිහත් වීමක් කරන්න පුළුවන්ද? ජාතික පාසල්වල සිදු වන මේ දේවල් සම්බන්ධයෙනුත් ගන්න පුළුවන් ක්‍රියා මාර්ගය මොකක්ද?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, මගේ පිළිතුරට අදාළ නොවුණත් ජනතාව දැනුවත් විය යුතු ප්‍රශ්නයක් බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා ඇහුවේ. අපි මේ චක්‍රලේඛය ගෙන එන්න ප්‍රධාන හේතුව වුණෙත් පසු ගිය කාලයේ පාසල්වල ඉවක් බවක් නැතුව මුදල් එකතු කිරීමයි. කොළඹ එක් පාසලක වසරක් තුළ දරුවන්ගෙන් රුපියල් 3000, රුපියල් 5000, රුපියල් 8000 ආදී වශයෙන් රුපියල් ලක්ෂ 1,400ක් එකතු කරලා තිබුණා. ඒ මුදල් එකතු කරලා වියදම් කළ ක්‍රමය පිළිබඳව දැනුම් දෙන්න ඒ පාසලට බැරි වුණා. ඒ කියන්නේ එම මුදල් වියදම් කළ ආකාරය සම්බන්ධයෙන් කරුණු කියන්න බැරි වුණා. ඒ නිසා තමයි අපි මේ චක්‍රලේඛය ගෙන ආවේ. ගරු කථානායකතුමනි, රජයෙන් දෙන මුදල් ප්‍රමාණය මදි නම් මුදල් එකතු කරන්න පුළුවන්. එසේ කිරීමේදී ජාතික පාසලක් නම් රේඛීය අමාත්‍යාංශයේ අවසරය ගන්න ඕනෑ. ඒ සඳහා ඉතාම කෙටි ක්‍රියාවලියක් තිබෙන්නේ. තාක්ෂණික කමිටුවක් තිබෙනවා. මුදල් එකතු කරන්නේ කුමන කාර්යයන් සඳහාද කියන එක පැහැදිලි කරලා ඒක කරන්න කියලායි අපි කියන්නේ. මුදල් එකතු කරන්නේ නැතුව දැනට පාසල් ගෙන යන්න බැහැ. ඒ වාගේම අලුත් රජයේ අරමුණ අනුව අධ්‍යාපනය සඳහා කරන වෙන් කිරීම පියවරෙන් පියවර වැඩි කිරීමේදී පාසල්වලට පුළුවන් තරම් මුදල් ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. හැබැයි, සමහර පිරිසක් මේවාට මුවා වෙමින්, මේ චක්‍රලේඛය දිගින් දිගටම උල්ලංඝනය කරමින් කටයුතු කරනවා. ඒ නිසා තමයි මේ පියවර අරගෙන තිබෙන්නේ.

බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා අහපු විධියට පළාත් පාසලක් නම්, පළාත් ලේකම්වරයාගේ අනුමැතියට යටත්ව මුදල් එකතු කරන්න කියලායි අපි දැනුම් දීලා තිබෙන්නේ.

අපි මේ සම්බන්ධයෙන් පළාත් ලේකම්වරු, පළාත් අධ්‍යක්ෂවරු, කලාප අධ්‍යක්ෂකවරු සියලු දෙනාම දැනුවත් කළා. ඒ වාගේම, ජාතික පාසල්වල සියලුම විදුහල්පතිවරුන් දැනුවත් කළා. මෙසේ තිබියදීත් සමහර අය හිතාමතාම මේ දේ කරනවා. මේ සම්බන්ධව අපට එකවරම පියවරක් ගන්න බැරි වෙච්. මොකද, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා පළාත් සභා තවම වෙනත් විධියකටයි කටයුතු කරන්නේ. නමුත් රාජ්‍ය ප්‍රතිපත්තියක් ගත්තාම එය හැමෝම පිළිපැදිය යුතුයි කියලා අපි විශ්වාස කරනවා. අපි ක්‍රම ක්‍රමයෙන් මෙය පාලනය කරන්න බලාපොරොත්තු වෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 7-4775/'14-(2), ගරු අශෝක් අබේසිංහ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය ඇහුවේ නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අතුරු ප්‍රශ්න තුනක් ඇහුවා. ප්‍රශ්නයක් ඇහුවාම ඒකට දෙන පිළිතුරට අනුවයි අතුරු ප්‍රශ්නය අහන්නේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මම අතුරු ප්‍රශ්න දෙකයි ඇහුවේ. තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න මට පොඩි අවස්ථාවක් ලබා දෙන්න.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමා වෙන වෙන ඒවා නේ අහන්නේ. වෙන ඒවා අහලා කාලය වැය කරන්න බැහැ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු ඇමතිතුමා ආසාවෙන් උත්තර දෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම බැහැ. යම් කිසි සම්ප්‍රදායක් තිබෙනවා. ඒ විධියට කටයුතු කරමු. නියමිත වේලාවත් එක්කයි අපට වැඩ කරන්න වෙන්නේ. [බාධා කිරීමක්] එහෙම නම් කෙටියෙන් අහන්න.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු අධ්‍යාපන ඇමතිතුමනි, ළමා මිතුරු පරිසරයකට සංවර්ධනය කරන හුදෙකලා පාසල්වලට ඇතුළත් කරන ළමයින් සඳහා කිරි, බිත්තර සහිත ආහාර වේලක්, පාවහන් සහ අමතර නිල ඇඳුමක් ලබා දීම සිද්ධ වෙනවා. මේ පාසල්වලට යන්නේ දුෂ්කරතා තිබෙන ළමයින් බව ඇත්ත. හැබැයි, ජාතික පාසල් ඇතුළු අනෙක් පාසල්වලත් මේ වාගේම දරුවන් ඉන්නවා. ආර්ථික වශයෙන් බැලුවාම අර පාසල්වල දරුවන් සහ මේ දරුවන් අතර වෙනසක් නැහැ. පාසල බොහොම සශ්‍රීකයි. හැබැයි, දුප්පත් පවුල්වල දරුවෝ ඒ පාසල්වලත් ඉන්නවා. ඒ දරුවන් වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශයට ඇති දැක්ම මොකක්ද?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මේ සම්බන්ධයෙන් රජයේ අවධානය යොමු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම කැබිනට් මණ්ඩලයේදීත් සාකච්ඡා කරලා තිබෙනවා, මේ රටේ පාසැල් දරුවන්ගෙන් සියයට 25ක්, 30ක් එක්කෝ මන්දපෝෂණයෙන් නැත්නම් විටමින් ඌනතාවෙන් පෙළෙනවා කියලා. ගරු ජනාධිපතිතුමා ගරු අගමැතිතුමා සමඟ සාකච්ඡා කරලා මේ ගැන කටයුතු කරන්න කැබිනට් අනු කාරක සභාවකුත් පත් කර තිබෙනවා. නිල ඇඳුම්වලට ගිය වියදම් දැන් සම්පූර්ණයෙන් අඩු වන නිසා -විශේෂයෙන්ම ඒවාට සිදු වුණු දේවල් මම මෙතැන කියන්න යන්නේ නැහැ- අඩුම ගණනේ පළමු වසරේ සිට පහ වසර දක්වා අධ්‍යාපනය ලබන දරුවන්ට ආහාර වේලක් ලබා දීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා අවශ්‍ය කටයුතු සකස් වෙමින් පවතිනවා. ඉදිරියේදී ඒ සඳහා අනුමැතිය ලැබේවි කියලා අපි විශ්වාස කරනවා.

ඖෂධවේදීන් පුහුණු කිරීම: ක්‍රමවේදය
மருந்தாளர்களைப் பயிற்றுவித்தல்: முறைமை
TRAINING OF PHARMACISTS: METHODOLOGY

4775/'14

7. ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වී ඇති ඖෂධ අළෙවි සැල් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙරට සිටින ලියාපදිංචි ඖෂධවේදීන් සංඛ්‍යාව සහ ඖෂධ බෙදාහරින්නන් සංඛ්‍යාව කොපමණද;

(iii) අප රටට අවශ්‍ය ඖෂධවේදීන්ගේ සංඛ්‍යාව කොපමණද;

(iv) ඖෂධවේදීන් පුහුණු කිරීම සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මක වේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதார மற்றும் சுதேச மருத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் காணப்படும் பதிவு செய்யப்பட்ட மருந்தகங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) இந்நாட்டில் இருக்கின்ற பதிவு செய்யப்பட்ட மருந்தாளர்களின் எண்ணிக்கை மற்றும் மருந்து விநியோகஸ்தர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) எமது நாட்டுக்குத் தேவையான மருந்தாளர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iv) மருந்தாளர்களைப் பயிற்றுவிப்பதற்கான முறைமையொன்று நடைமுறையில் உள்ளதா என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Indigenous Medicine:

(a) Will he inform this House -

(i) the number of registered pharmacies available in Sri Lanka;

(ii) the number of registered pharmacists and the number of distributors of pharmaceutical drugs available in the country;

(iii) the number of pharmacists required for the country; and

(iv) whether a proper methodology is in effect for training pharmacists?

(b) If not, why?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 3279කි.

(ii) මෙරට ලියාපදිංචි ඖෂධවේදීන් සංඛ්‍යාව 8906ක් වන අතර, ඖෂධ බෙදාහරින්නන් සංඛ්‍යාව 780කි.

(iii) මෙම අමාත්‍යාංශය යටතේ පවතින ආයතන සඳහා ඖෂධවේදීන් 1,079ක් සහ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ යටතේ පවතින ආයතන සඳහා ඖෂධවේදීන් 772ක් අවශ්‍ය වේ.

(iv) ඔව්.

(ආ) පැන නොනඟී.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ගරු ඇමතිතුමනි, ශ්‍රී ලංකාවේ ලියා පදිංචි වී ඇති ඖෂධ අළෙවිසැල් සංඛ්‍යාව කීයක් කියාද ඔබතුමා කිව්වේ?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
3,279යි.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
මෙරට සිටින ලියා පදිංචි ඖෂධවේදීන් සංඛ්‍යාව කොපමණද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
රේඛීය අමාත්‍යාංශය යටතේ ලියා පදිංචි වී ඇති ඖෂධවේදීන් සංඛ්‍යාව 1,079යි. පළාත් සභා යටතේ ලියා පදිංචි වී ඇති ඖෂධවේදීන් සංඛ්‍යාව 772යි.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ගරු ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ලියා පදිංචි වුණු ඖෂධ අළෙවිසැල් තුන්දහස් ගණනක් තිබෙනවා. මේ ඖෂධ ශාලාවක අනිවාර්යයෙන්ම ඖෂධවේදියෙක් සිටිය යුතුයි කියා නීතියක් තිබෙනවා. ඖෂධවේදීන් එක්දහස් ගණනකින් මේ අළෙවිසැල් පවත්වා ගෙන යන්න බැහැ නේ. ඒ සඳහා ඔබතුමන්ලා යම්කිසි ක්ෂණික වැඩ පිළිවෙළක් යොදන්න අදහස් කරනවාද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
රට පුරාම ලියා පදිංචි වුණු ඖෂධවේදීන් සංඛ්‍යාවක් වෙනම සිටිනවා. ලියා පදිංචි මුළු ඖෂධවේදීන් සංඛ්‍යාව 8,906යි. ඖෂධ බෙදා හරින්නන් සංඛ්‍යාව 780යි. එයින් ඖෂධවේදීන් 1,079ක් හා ඖෂධ බෙදා හරින්නන් 772ක් රජයට අයත් අයයි.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
මේ ඖෂධවේදීන් පුහුණු කිරීම සඳහා පවතින ක්‍රමවේදය මොකක්ද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඔවුන් පුහුණු කිරීමට පාසල් දෙකක් තිබෙනවා. එම පාසල් දෙකේ අවුරුද්දකට ඖෂධවේදීන් 200 දෙනෙක් පුහුණු කරනවා. ඔවුන්ගේ පුහුණු කාලය අවුරුදු 2යි.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
බොහොම ස්තූතියි, ගරු ඇමතිතුමනි.

පලස්තීන රජයට මූල්‍යමය ආධාර: විස්තර
பலஸ்தீன அரசுக்கு நிதியுதவிகள்: விபரம்
FINANCIAL AID TO GOVERNMENT OF PALESTINE : DETAILS

5091/'14

8. ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) පසු ගිය වර්ෂ 5 තුළ දී ශ්‍රී ලංකා රජය විසින් පලස්තීන රජය වෙත යම් මූල්‍යමය ආධාර කිරීමක් හෝ ව්‍යාපෘති සඳහා ආධාර කිරීමක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම ආධාරවල මූල්‍ය වටිනාකම කොපමණද;

(iii) එම රට වෙත යම් ඉදි කිරීම ව්‍යාපෘතියක් ලබා දී තිබේ නම්, එම ඉදි කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගනු ලැබූ ආකාරය කවරේද;

(iv) එම මූල්‍ය ආධාර හෝ ව්‍යාපෘති ආධාර ලබා දීමේ අරමුණ කවරේද;

(v) ශ්‍රී ලංකා රජය විශාල විදේශ ණය ප්‍රමාණයක් ගෙවීමට තිබිය දී ඉහත පරිදි වෙනත් රටකට ආධාර ලබා දීම නිශ්ඵල ක්‍රියා මාර්ගයක් නොවන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கொள்கை உருவாக்கம், பொருளாதார அலுவல்கள், சிறுவர், இளைஞர் மற்றும் கலாசார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

[ගරු අනුර දිසානායක මහතා]

(அ) (i) கடந்த 5 வருடங்களில் இலங்கை அரசினால் பலஸ்தீன அரசுக்கு ஏதேனும் நிதியுதவிகள் அல்லது கருத்திட்டங்களுக்கான உதவிகள் செய்யப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், இவ் உதவிகளின் நிதி ரீதியான பெறுமதி எவ்வளவு என்பதையும்;

(iii) அந்நாட்டுக்கு ஏதேனும் நிர்மாணிப்புக் கருத்திட்டங்கள் வழங்கப்பட்டிருப்பின் இந் நிர்மாணப் பணிகளுக்கான ஒப்பந்தக்காரர்கள் தேர்ந்தெடுக்கப்பட்ட முறை யாது என்பதையும்;

(iv) இந் நிதியுதவி அல்லது கருத்திட்ட உதவிகள் வழங்கப்பட்டதன் நோக்கம் யாது என்பதையும்;

(v) இலங்கை அரசு பெருமளவில் வெளிநாட்டுக் கடன்களைச் செலுத்த வேண்டியிருக்கையில் மேற்குறிப்பிட்டவாறு வேறு நாடொன்றுக்கு உதவியளித்தல் பயனற்றதொரு செயற்பாடு அல்லவா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Policy Planning, Economic Affairs, Child, Youth and Cultural Affairs:

(a) Will he inform this House-

(i) whether the Government of Sri Lanka has made any financial aid or aid for projects to the Government of Palestine over the last five years;

(ii) if so, the financial value of such aid;

(iii) if any construction project has been assigned to that country, the manner of selection of contractors for that project;

(iv) the objective of making that financial aid or aid for projects; and

(v) whether making an aid to a foreign country as mentioned above, when Sri Lanka has to pay back a huge amount of foreign loans, is not a fruitless effort?

(b) If not, why?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) ගාසා තීරයේ මහින්ද රාජපක්ෂ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම සඳහා ඇමෙරිකන් ඩොලර් මිලියනයක චෙක් පතක් ප්‍රදානය කර ඇත.

(iii) ඉදි කිරීම ව්‍යාපෘතියකට එළඹී නැත.

(iv) මහින්ද රාජපක්ෂ නමින් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් ගාසා තීරයේ ඇති කිරීම.

(v) මට ලැබෙන වාර්තා අනුව නම් මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ නම ගාසා තීරයේ ඉතාම ජනප්‍රිය නමක්. [බාධා කිරීමක්] ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා හිනා වෙන්නේ ඇයි? ගරු මන්ත්‍රීතුමනි, මේවා විතරක් නොවෙයි. විදේශ ණය අරගත්තේ තවත් බර දමන්න නේ. ඒ විදේශ ණයවලින් මාළිගා හදන කොට මෙහෙත් ගිහින් සල්ලි දමන එක පුදුමයක්ද? යාපනයේ තරු හතක මාළිගාවක් තිබෙනවා. පානම හදන්න ගිය මාළිගාවේ කාමර 57ක් තිබුණා.

විශේෂයෙන්ම ප්‍රභුවරුන්ගේ නිවාඩු නිකේතන - VIP නිවාඩු නිකේතන- 3ක් පිහිනුම් තටාක තුනක් සමඟ දැනට හදලා තිබෙනවා. අඩි 100ක් දුර ගියොත් මුහුදට පනින්න පුළුවන්. බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවට වඩා විශාල සම්මන්ත්‍රණ ශාලාවක් අරලියගහ මන්දිරයේ හදා ගෙන යනවා. මේවායින් ප්‍රයෝජනයක් ගන්නේ නැත්තේ සම්පූර්ණයෙන්ම ඔබතුමන්ලාට, රටේ ජනතාවට බර දමන්නයි. ඔය නාස්තිය නැවැත්වූ නිසා අඩු ගණනේ දැන් සහනයක් දෙන්න හැකි වෙලා තිබෙනවා. මේ ණය මුදල් ගෙවන්නේ කොහොමද කියන එක තව ප්‍රශ්නයක්.

(ආ) පැන නොනඟී.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. පලස්තීනයේ ගාසා තීරයේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය වෙනුවෙන් රුපියල් කෝටි 13ක් ලබා දීලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මීට පෙර මුදල් ඇමතිතුමාගේ පිළිතුරෙන් හෙළිදරවු වුණා, ණය පොලී වාරිකය ගෙවන්න රටේ මුළු ආදායම ප්‍රමාණවත් නැහැයි කියා. රටේ ණය පොලී වාරිකය ගෙවීමට ප්‍රමාණවත් නොවන ආදායමක් තිබෙන රටක ගාසා තීරයේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් ඉදි කිරීම වෙනුවෙන් මුදල් වෙන් කිරීම සාධාරණද කියා ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු මන්ත්‍රීතුමනි, එය සාධාරණ නැහැ. මාළිගා හදන එකත් සාධාරණද? මොකක්ද, සාධාරණයක් තිබුණේ? දැන් විතරයි සාධාරණයක් වෙන්නේ. ඒවා මගෙන් අහන එක හරිම අසාධාරණයි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Friendly match එකක්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
Friendly නොවෙයි. ගරු කථානායකතුමනි, friendly නොවෙයි, friendly ලෙස හොරා කාපුවා. හොඳට තේරුම් ගන්න ඕනෑ. මිත්‍රත්වයන් ආරක්ෂා කරමින්, මේ පාර්ලිමේන්තුවට වසන් කරමින්, තොරතුරු ඉදිරිපත් නොකරමින් හොරා කාපු ප්‍රමාණය මේ විධියට හෝ එළියට එන එක හොඳයි. තේරුම් ගන්න. [බාධා කිරීම්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. දෙවන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. අපි මේ පිළිබඳව යෝජනාවක් පාර්ලිමේන්තුවෙන් සම්මත කර ගත යුතුව තිබෙනවාය කියා මා හිතනවා. පසු ගිය කාලයේ අපේ රටේ ක්‍රීඩා පිටි, වරායවල්, පාරවල් මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ නමින් නම් කර තිබෙනවා. ලංකාවේ විතරක් නොවෙයි, පලස්තීනයේ පුහුණු පාසලක් එසේ නම් කර තිබෙනවා. ගරු කථානායකතුමනි, අගමැතිතුමාගෙන් මා දැන ගන්න කැමැතියි, ජීවතුන් අතර සිටින කිසිවකුගේ නමින් පාරක් හෝ ගොඩනැඟිල්ලක් හෝ ආයතනයක් හෝ නම් කිරීම නොකළ යුතුයි කියන ස්ථාවරයක් ගන්න සූදානම්ද කියා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ජීවතුන් අතර සිටියදී පමණක් නොවෙයි අපි මැරුණාට පසුවත් නම් කරන්නට එපා. ඩඩ්ලි සේනානායක මැතිතුමා, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා තමන්ගේ නමින් මොනවත් නම් කළේ නැහැ නේ. බණ්ඩාරනායක මැතිතුමාත් නම් කළේ නැහැ. එතුමාගේ අභාවයෙන් පසුව සම්මන්ත්‍රණ ශාලාව හදලා නම් කළා. මේ සියල්ලම මහින්ද චින්තනය වෙනස් කර තිබෙනවා. මම නියෝජනය කළ බියගම ආසනයේවත්, කොළඹවත් ප්‍රතිපත්තියක් හැටියට නම පාවිච්චි කරන්නට මම ඉඩ දෙන්නේ නැහැ. එහෙම වුවමනා නැහැ. අප ජනතාවට සේවය කර ගෙදර යන්නයි තිබෙන්නේ. මගේ සල්ලිවලින් හැදුවා නම් මගේ නම දැම්මාට කමක් නැහැ. එසේ නොවන ඒවා මගේ නමින් නම් කරන්නේ කොහොමද?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මාගේ තුන්වෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. මම දැන ගන්නට කැමැතියි මෙම ඇමෙරිකානු ඩොලර් මිලියනය- [බාධා කිරීමක්] නැහැ, මේවා මාස 4කට 5කට කලින් දාපුවා. [බාධා කිරීමක්] ගරු කථානායකතුමනි, ඇත්තටම සිදු වුණේ මෙයයි. මේවාට උත්තර දෙන්න හිටපු කෙනා ගියා. ඒකයි ඇත්තටම වුණේ. දැන් මම ඔබතුමාගෙන් දැන ගන්නට කැමැතියි, පලස්තීන වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය වෙනුවෙන් ඇමෙරිකානු ඩොලර් මිලියනය වෙන් කිරීම සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතියක් ලබාගෙන තිබෙනවාද කියා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු මන්ත්‍රීතුමා, පලස්තීන රාජ්‍ය සහ ලංකාව අතර අවබෝධතා ගිවිසුමක් තිබෙනවා. ඒ වාගේම අපේ හිටපු විදේශ කටයුතු ඇමතිතුමා ඒ පිළිබඳව කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබෙනවා. කිසිම සැකයක් නැහැ, ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා ඒ සඳහා සහයෝගය ලබා දෙන්න ඇති.

මම මේ ගරු සභාවට කියනවා, මම දුන්නේ file එකේ තිබෙන උත්තර නොවෙයි කියා. මම මේ ප්‍රශ්නය ගැන දැනගෙන සිටියේත් නැහැ. මම මෙතැනට පැමිණෙද්දි ප්‍රශ්න අංක 8ට අදාළ file එක මගේ මේසය උඩ තියලා තිබුණේ නැහැ. පසුව තමයි මට file එක ලැබුණේ.

අනෙක් කාරණය, මේක friendly match එකක් නොවෙයි, පිළිතුරු දෙන එකක්.

මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමායි, හිටපු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමායි, හිටපු චන්ද්‍රිකා කුමාරතුංග ජනාධිපතිවරියයි තුන්දෙනාවම එකතු කරන්නට ඔබතුමන්ලා ගෙන යන ව්‍යාපාරයට, friendship එකට මගේ සම්පූර්ණ සහයෝගය දෙනවා කියා මේ අවස්ථාවේදී මම කිසිම සැකයක් නැතිව ප්‍රකාශ කරනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මගේ නිරීක්ෂණත් ඉදිරිපත් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. කරුණාකරලා මගේ නිරීක්ෂණත් එක්ක බලන්න.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
මම මේ සභාවේ මගේ කනගාටුව ප්‍රකාශ කරනවා. එතුමා තමයි මේ ඔක්කෝම ඇති කළේ. දැන් මේ friendly match එක තිබෙන්නේ එතුමායි මායි අතරේ. අපි දෙන්නා friendly match එකක් දැන් ගහන්නේ. ඒක නිසා සටන් කරන්න දෙයක් නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 10 - 5424/'14 - (2) ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා (අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்துும பண்டார - உள்ளக போக்குவரத்து அமைச்சர்)
(The Hon. R.M. Ranjith Madduma Bandara - Minister of Internal Transport)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා. අපි මේ සම්බන්ධයෙන් කොමිටියක් පත් කරලා තිබෙනවා. එහි වාර්තාව ලබන සතියේ මට ලැබෙනවා. එම නිසා පිළිතුර ලබා දෙන්න සති දෙකක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

සුව දිවි මධ්‍යස්ථාන : විස්තර
சுவ திவி நிலையங்கள் : விபரம்
SUWA DIVI CENTRES : DETAILS

4776/'14

11. ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ප්‍රජා සෞඛ්‍ය නගා සිටුවීම සඳහා මෙතෙක් පිහිටුවා ඇති "සුව දිවි මධ්‍යස්ථාන" සංඛ්‍යාව කොපමණද;

[ගරු අශෝක් අබේසිංහ මහතා]

(ii) ඒවා අතරින් දැනට ක්‍රියාත්මක මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටුවා ඇති සුව දිවි මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iv) දැනට කුරුණෑගල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වන එකී මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(v) මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටුවීමට ඉලක්ක ගත සුව දිවි මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(vi) දැනට එම දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන සුව දිවි මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) සුව දිවි මධ්‍යස්ථානවල ප්‍රමාණවත් සායන සංඛ්‍යාවක් පවත්වනු ලබන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதார மற்றும் சுதேச மருத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ)(i) சமுதாய ஆரோக்கியத்தை கட்டியெழுப்புவதற்காக இற்றைவரை தாபிக்கப்பட்டுள்ள "சுவ திவி" நிலையங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) இவற்றில் தற்போது இயங்கி வருகின்ற நிலையங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) குருநாகல் மாவட்டத்தில் தாபிக்கப்பட்டுள்ள சுவ திவி நிலையங்களின் எண்ணிக்கை யாதென் பதையும்;

(iv) குருநாகல் மாவட்டத்தில் தற்போது இயங்கி வருகின்ற மேற்படி நிலையங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(v) கண்டி மாவட்டத்தில் தாபிப்பதற்கு இலக்கிடப் பட்டுள்ள சுவ திவி நிலையங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(vi) தற்போது மேற்படி மாவட்டத்தில் இயங்கி வருகின்ற சுவ திவி நிலையங்களின் எண்ணிக்கை யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) சுவ திவி நிலையங்களில் போதியளவு பிணி ஆய்வுகள் மேற்கொள்ளப்படுகின்றனவா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Indigenous Medicine:

(a) Will he state -

(i) the number of "Suwa Divi Centres" set up in order to enhance community health;

(ii) of them, the number of centres functional at present;

(iii) the number of "Suwa Divi Centres" established in the Kurunegala District;

(iv) the number of such centres functional at present in the Kurunegala District;

(v) the number of "Suwa Divi Centres" scheduled to be set up in the Kandy District; and

(vi) the number of "Suwa Divi Centres" functional at present in that district?

(b) Will he inform this House whether a sufficient number of clinics are conducted in those "Suwa Divi Centres"?

(c) If not, why?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 774යි.

(ii) 742යි.

(iii) 99යි.

(iv) 98යි.

(v) 46යි.

(vi) 27යි.

(ආ) සෑම සුව දිවි මධ්‍යස්ථානයක්ම සතියකට එක් දවසක් සායන කටයුතු පවත්වයි. මීට අමතරව කාර්යාල සහ ජංගම සුව දිවි සායන අවශ්‍ය පරිදි සිදු කරනු ලැබේ.

(ඇ) පැන නොනඟී.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. සුව දිවි මධ්‍යස්ථාන සඳහා වෛද්‍යවරු අනුයුක්ත කිරීමට යම්කිසි තීරණයක් අරගෙන තිබෙනවාද? වෛද්‍යවරු අනුයුක්ත වෙලා තිබෙනවාද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මේ වෛද්‍ය සායන සතියකට වරක් පමණයි පවත්වන්නේ. වෛද්‍යවරයෙක්, හෙදියක් සහ අවශ්‍ය කාර්ය මණ්ඩලය එදිනට සහභාගි වෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 12- 4813/'14 - (1), ගරු බුද්ධික පතිරණ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்துும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මේ සම්බන්ධයෙන් දැනටමත් අපි නීතිපතිවරයාගෙන් උපදෙස් ඉල්ලා තිබෙනවා. එම නිසා මෙම ප්‍රශ්නයට පිළිතුර දීමට මම සති දෙකක් කල් ඉල්ලනවා. මොකද, මෙතැන විශාල ප්‍රශ්නයක් තිබෙනවා ගරු කථානායකතුමනි. එම නිසා පිළිතුර දීමට සති දෙකක් කල් ඉල්ලනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පිළිතුර දීමට සති දෙකක් කල් ඉල්ලනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, කමක් නැහැ. සති දෙකක් කල් අරගෙන හරි මට හොඳ උත්තරයක් ලැබෙනවා නම් ඒ ඇති.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 13 - 5092/'14 - (1) ගරු අනුර දිසානායක මහතා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා. [බාධා කිරීමක්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
නැහැ. මේක friendly match එකක් නොවෙයි.

පිළිතුරු දීම සඳහා මට ලැබී තිබෙන මෙම ලිපි ගොනුවේ තිබෙන කාරණා ගැන මම සෑහීමකට පත් වෙන්නේ නැහැ. ඒ නිසා මම මෙම ප්‍රශ්නයට අලුතින් පිළිතුරක් ලබා දෙන්නම්.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයේ සේවක පිරිස : වන්දි මුදල්
ஆற்றுப்பள்ளத்தாக்கு அபிவிருத்திச் சபை ஊழியர்கள் : இழப்பீடு
RIVER VALLEYS DEVELOPMENT BOARD EMPLOYEES: COMPENSATION

5500/'14

15.ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ එක් සේවකයෙකුට අවම වශයෙන් රු 96,000/- ක හා උපරිම වශයෙන් රු. 265,000/- ක වන්දි මුදලක් ගෙවා 1990.03.31 දින සිට එම ආයතනය වසා දමන බව එවකට පැවති රජයේ විෂය භාර අමාත්‍යවරයා විසින් 1990.03.23 දින පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළ බවත්;

(ii) එසේ ප්‍රකාශ කළත්, එම සේවකයින්ට ගෙවා ඇත්තේ රු. 50,000/- ක මුදලක් පමණක් බවත්;

(iii) එම තත්ත්වය යටතේ ඔවුන් ඉතා අසරණ වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ සේවය කළ ඉහත සඳහන් සේවක පිරිසට ඉතිරි වන්දි මුදල් ගෙවීමට කටයුතු කරන දිනය කවදාද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එවකට ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය සතුව පැවති නිල නිවාසවල අයිතිය, එම අවස්ථාවේ එහි පදිංචිව සිටි සේවකයින්ට ලබා දෙන බවටත්, නිවාස නොමැති සෙසු සේවකයින්ට ඉඩම් ලබා දෙන බවටත් කළ ප්‍රකාශය අනුව, මේ වන විට සියලුම සේවකයින්ට නිවාස හෝ ඉඩම් ලබා දී අවසන් කර තිබේද;

(ii) එසේ නම්, එම නිවාස හෝ ඉඩම් සඳහා මේ වන විට හිමිකම් ඔප්පු ලබා දී අවසන් කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஆற்றுப்பள்ளத்தாக்கு அபிவிருத்திச் சபையின் ஊழியரொருவருக்கு குறைந்தபட்சம் 96,000 ரூபா மற்றும் அதிகபட்சம் 2,65,000 ரூபா என்ற ரீதியில் இழப்பீட்டுத் தொகையைச் செலுத்தி 1990.03.31ஆம் திகதியிலிருந்து மேற்படி நிறுவனம் மூடப்படுமென அப்போதைய அரசாங்கத்தின் விடயத்துக்கு பொறுப்பான அமைச்சரினால் 1990.03.23ஆம் திகதியன்று பாராளுமன்றத்தில் அறிவிக்கப்பட்டதென்பதையும்;

(ii) அவ்வாறு அறிவிக்கப்பட்டபோதிலும் மேற்படி ஊழியர்களுக்கு 50,000 ரூபா மாத்திரமே செலுத்தப்பட்டதென்பதையும்;

(iii) மேற்படி நிலைமையின்கீழ் இவர்கள் பெரும் நிர்க்கதி நிலைக்கு உள்ளாகியுள்ளார்கள் ன்பதையும்

அவர் அறிவாரா?

(ஆ) ஆற்றுப்பள்ளத்தாக்கு அபிவிருத்திச் சபையில் சேவையாற்றிய மேலே குறிப்பிட்ட ஊழியர்களுக்கு எஞ்சிய இழப்பீட்டுத் தொகையைச் செலுத்துவதற்கு நடவடிக்கை எடுக்கப்படும் திகதி யாதென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) அப்போதைய ஆற்றுப்பள்ளத்தாக்கு அபிவிருத்திச் சபைக்குச் சொந்தமாக இருந்த உத்தியோகபூர்வ இல்லங்களின் உரிமை, அச்சந்தர்ப்பத்தில் அங்கு குடியிருந்த ஊழியர்களுக்கு வழங்கப்படுமென்றும், வீடுகள் இல்லாத ஏனைய ஊழியர்களுக்கு காணிகள் பெற்றுக்கொடுக்கப்படுமென்றும் அறிவிக்கப் பட்ட கூற்றின் பிரகாரம், இன்றளவில் சகல ஊழியர்களுக்கும் வீடுகள் அல்லது காணிகள் வழங்கி முடிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி வீடுகள் அல்லது காணிகளுக்கு இன்றளவில் உறுதிப்பத்திரங்கள் வழங்கி முடிக்கப்பட்டுள்ளதா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

asked the Minister of Finance:

(a) Is he aware that-

(i) a statement was made in Parliament on 23rd March, 1990 by the then Minister in charge of that Board to the effect that the River Valleys Development Board will be closed down with effect from 31st March, 1990 having paid a compensation ranging from Rs. 96,000 to Rs. 265,000 to each of its employees;

(ii) in spite of the statement made, only an amount of Rs. 50,000 had been paid to those workers; and

(iii) they have been rendered destitute under the aforesaid circumstance?

(b) Will he inform this House of the date on which action will be taken to pay the compensation in arrears to those workers who had worked in the River Valleys Development Board?

(c) Will he state -

(i) whether provision of houses and lands to all the workers has been completed by now, as per the statement made to the effect that ownership of official quarters which belonged to the River Valleys Development Board by then would be transferred to the workers residing in them at the moment and that land would be provided to the other workers who are without houses; and

(ii) if so, whether the provision of title deeds for the aforesaid houses and lands has been completed by now?

(d) If not, why?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි:

(අ) (i) ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය වසා දමා දැනට වසර 24ක් ගතව ඇති බැවින් අදාළ තොරතුරු කඩිනමින් සොයා ගැනීම දුෂ්කර වී ඇත. එම නිසා මෙම ප්‍රශ්නයට අදාළ තොරතුරු හා දත්ත ලබා ගෙන ඊට අදාළ පිළිතුරු යථා කාලයේදී (මාසයක පමණ කාලයක් ඇතුළත) ලබා දීමට කටයුතු කරන බව මෙම සභාවට දන්වමි.

(ii) ඔව්.

(iii) ඔව්.

අනික් ප්‍රශ්නවලට පිළිතුරු දීමට අපිට දත්ත සොයා ගැනීමට අපහසු වුණත් මට අවශ්‍ය වුණේ නැහැ, මේ සභාවට ඇවිත් මාස දෙකක් ඒ සඳහා කල් ඉල්ලා සිටින්න. ඒ නිසා ඒ තිබෙන දත්ත තුළින් මේ අවස්ථාවේදී පිළිතුරු දෙනවා. ඔබතුමා ගිය සුමානයේ ජාතික ඉතිරි කිරීමේ බැංකුව සම්බන්ධයෙන් ප්‍රශ්නයක් ඇසුවා. එහිදී ඔබතුමා ඇසූ එක ප්‍රශ්නයක් තමයි දැනට අලුතෙන් කී දෙනෙක් බඳවාගෙන තිබෙනවාද කියලා. ඡන්දය සඳහා නාම යෝජනා භාර දුන්නාට පස්සේ 233 දෙනෙක් බඳවා ගෙන තිබෙනවා. ඡන්ද කොමසාරිස්ගේ ප්‍රකාශය අනුව ඒවා අනවසර පත් කිරීම් ලෙස තමයි නම් කරලා තිබෙන්නේ. ඒ සියලුම අය විභාගයකින් නොවෙයි බඳවා ගෙන තිබෙන්නේ. හිතුමතයට පත්කරලා තිබෙනවා. එම බැංකුවේ සේවකයන්ගේ අතිරික්තයකුත් තිබෙනවා කියන එකත් ප්‍රකාශ කරන්න කැමැතියි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දෙවන වටය.

ප්‍රශ්න අංක 9-5115/'14- (1) ගරු අජිත් මාන්නප්පෙරුම මහතා.[බාධා කිරීමක්] නැත.

ප්‍රශ්න අංක 14-5117/'14-(1) ගරු අජිත් මාන්නප්පෙරුම මහතා.[බාධා කිරීමක්] නැත.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්න. ගරු අනුර දිසානායක මහතා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

I

"සීඅයිඑෆ්එල්" මූල්‍ය සමාගම වසා දැමීම නිසා ගනුදෙනුකරුවන් මුහුණ පා ඇති ගැටලු
"சீஐஎப்எல்" நிதி நிறுவனம் மூடப்பட்டமையால் வாடிக்கையாளர் எதிர்நோக்கும் பிரச்சினைகள்
PROBLEMS FACED BY CUSTOMERS DUE TO CLOSURE OF CIFL COMPANY

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වනවා. මහ බැංකුවේ බලපත්‍රලාභී මූල්‍ය සමාගමක් ලෙස පැවැති CIFL බැංකුව වසා දැමීම නිසා එහි 4000කට වැඩි ගනුදෙනුකරුවන්ට මුහුණපෑමට සිදු වී ඇති ගැටලුකාරී තත්ත්වය පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කරනු කැමැත්තෙමි.

1978 අංක 78 දරන මූල්‍ය සමාගම් පනතින් ද, 2007 අංක 07 දරන සමාගම් පනතින් නීතිමය ආවරණය ලබමින් ද, 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියා පදිංචි වෙමින් ද CIFL මූල්‍ය සමාගම බලපත්‍රලාභී මූල්‍ය සමාගමක් ලෙස ක්‍රියාත්මක වුණා.

කොළඹ 07, ධර්මපාල මාවතේ අංක 181/ඒ යන ස්ථානයේ පිහිටි ප්‍රධාන කාර්යාලය කේන්ද්‍රගත කරගනිමින් මහනුවර, ගාල්ල, අනුරාධපුරය, යාපනය යන නගරවල ශාඛා කාර්යාල වශයෙන් ද තලවකැලේ, මහියංගනය, පොළොන්නරුව, කුරුණෑගල හා ගම්පහ යන නගරවල සේවා මධ්‍යස්ථාන වශයෙන් ද දීප ව්‍යාප්ත ජාලයකින් යුතුව මෙම මූල්‍ය සමාගම විහිදී තිබුණා.

මෙම මූල්‍ය සමාගම මඟින් ස්ථාවර තැන්පතු ද, ඉතුරුම් පහසුකම්, ළමා ඉතුරුම් පහසුකම්, කල්බදු කුලී සින්නක්කර පහසුකම්, ක්ෂුද්‍ර මූල්‍ය ණය, ඉඩම් හා නිවාස ණය, උකස් සේවා ආදි සේවා රැසක් ක්‍රියාත්මක වූ අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ පිළිගත් මූල්‍ය ආයතනයක් වීම නිසා හා රජයේ වග කිව යුතු බලධාරින්ගෙන් ලැබෙන නොමඳ මැදිහත්වීම නිසා ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින 4,159 දෙනෙක් පමණ මෙම ආයතනයේ තැන්පත්කරුවන් බවට පත් වුණා. එහි ව්‍යාප්තිය කෙතරම්ද යත්, 2012/13 ගිණුම් වාර්තාවලට අනුව එහි වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 3.5ක්ව පැවැතුණා. ඒ කියන්නේ, එහි වත්කම් ප්‍රමාණය රුපියල් කෝටි 350 ඉක්මවන ප්‍රමාණයකින් තිබුණු බවයි.

කෙසේ නමුත් මෙම මූල්‍ය සමාගම එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ දුර්වල කළමනාකාරිත්වය, නීති විරෝධි මූල්‍ය ආයෝජන හේතුවෙන් 2013 වසර වන විට බිඳ වැටීමට ලක් වුණා. 2006 වසරේ සිටම වරින් වර මෙම මූල්‍ය ආයතනය තුළ මූල්‍ය අක්‍රමිකතා පෙන්නුම් කළ ද ශ්‍රී ලංකා මහ බැංකුව හා මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව දැක්වූ නොසැලකිල්ලත්, පක්ෂග්‍රාහීව කටයුතු කිරීමත් හේතුවෙන් ඒ පිළිබඳව විධිමත් පියවරක් ගැනුණේ නැහැ. මෙතැන තමයි ප්‍රශ්නය පැන නඟින්නේ. මෙම තත්ත්වය මෙම ආයතනය බිඳ වැටීමට හේතුවූ බව සී.අයි.එෆ්.එල්. තැන්පත්කරුවන්ගේ විශ්වාසයයි.

2013 පෙබරවාරි මාසය තුළදී සීඅයිඑෆ්එල් පීඑල්සී සමාගමේ තැන්පත්කරුවන්ට නියමිත පොලී ප්‍රතිලාභ හා කල් පිරුණු තැන්පතු නිදහස් කිරීමට අපොහොසත් වන විට තැන්පත්කරුවන් තුළ දැඩි උණුසුම් තත්ත්වයක් ඇති වුණා. මේ පිළිබඳව සමාගම් බලධාරින් විවිධ ප්‍රකාශ කරමින් සුළු මූල්‍ය දුර්වලතාවන් පවතින බව පවසමින් සිදුවූ අපහසුතාව පිළිබඳව කනගාටුව පළ කරමින් තැන්පත්කරුවන් අස්වසාලීමට කටයුතු කරනු ලැබුවා. 2013 වසරේ මැයි මාසයේදී ශ්‍රී ලංකා මහ බැංකුව මැදිහත් වී "රොස්කෝ මෙලනි" නම් ආයෝජකයෙකු සීඅයිඑෆ්එල් ගැටලුවට විසඳුමක් ලෙස හඳුන්වා දෙනු ලැබුවා. "ටච් වුඩ්" ව්‍යාපාරයේ අයිතිකරුවන් වූ මොවුන් රුපියල් බිලියන 1.2ක් මෙම ආයතනයේ ආයෝජනය කළ බවත්, 2013 ජූනි 30 දිනට හිඟ පොලී ප්‍රතිලාභ ගෙවීම් ආරම්භ කරන බවත්, සැප්තැම්බර් වන විට සියලු ප්‍රතිලාභ ගෙවා අවසන් කරන බවත් ඔහු විසින් සහතික කරනු ලැබුවා. නමුත් ඉන් මසකට පසුව ශ්‍රී ලංකා මහ බැංකුව, සීඅයිඑෆ්එල් අධ්‍යක්ෂ මණ්ඩලය, තැන්පත්කරුවන් ආදි කිසිවෙකුට නොදන්වා මොහු රටින් පළා ගියා. මෙම පුද්ගලයා ජාත්‍යන්තර ජාවාරම්කරුවකු බව පසුව අනාවරණය වුණා. ඒ අහිංසක තැන්පත්කරුවන්ගේ මුදල් ගිලගන්න ඉඩ කඩ විවෘත කළේ කොහොමද?

මෙම ක්‍රියාකාරිත්වයන් හේතුවෙන් සීඅයිඑෆ්එල් පීඑල්සී සමාගමේ තැන්පත්කරුවන් බරපතළ ගැටලු රැසකට මුහුණ දී සිටිනවා. ජීවිතයේ සැඳෑ සමය කිසිවෙකුට හෝ අත නොපා ජීවත් වීමට බලාපොරොත්තු තබා ගනිමින් මුදල් තැන්පත් කර මාස්පතා ලැබෙන පොලී මුදලින් වෛද්‍ය ප්‍රතිකාර ගත් අය, ශල්‍යකර්ම කිරීමට බලාපොරොත්තුවෙන් සිටි අය, දෛනික ජීවිතයේ මූලික අවශ්‍යතා ඉටු කර ගැනීමට සිටි අය ආදි වශයෙන් තැන්පත්කරුවන් දැඩි දුෂ්කරතා රැසකට අද මුහුණ පා සිටිනවා. මෙම තැන්පත්කරුවන් අතර එකී තැන්පත් මුදල් ලබා ගැනීමට නොහැකිව මානසික පීඩාවට පත්ව මිය ගිය පුද්ගලයන් ද සිටින අතර, වයෝවෘද්ධ තැන්පත්කරුවන් අතරින් මිය ගිය සංඛ්‍යාව 30ක් පමණ වනවා. මෙම ප්‍රශ්නය හේතුකොටගෙන 30දෙනකු පමණ මිය ගිහින් තිබෙනවා. ඒ නිසා පහත ගැටලුවලට ගරු ඇමතිතුමා පිළිතුරු ලබා දෙනු ඇතැයි මම බලාපොරොත්තු වෙනවා.

1. මෙලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ බලපත්‍රලාභී මූල්‍ය ආයතනයක් ලෙස මේ රටේ ජනතාවගේ ධනය ව්‍යාජ ලෙස ලබා ගනිමින් තැන්පත්කරුවන් 4,159කගේ තැන්පතු සඳහා 'වගවීමට' මූල්‍ය ශක්තියක් ඇති ආයතනයක් බවට පත් කිරීමට හෝ මෙම තැන්පත්කරුවන්ගේ තැන්පතු අදාළ පොලිය සමඟ නැවත ලබා දීමට රජය ගන්නා ක්‍රියා මාර්ගය කවරේද?
2. මෙම මූල්‍ය අක්‍රමිකතාවන්ට හවුල් වූ හෝ අධීක්ෂණය පැහැර හැරි ශ්‍රී ලංකා මහ බැංකුවේ අදාළ නිලධාරින්ද ඇතුළු සියලුදෙනාට තරාතිරම නොබලා නීතිමය ක්‍රියා මාර්ග ගැනීමට අපේක්ෂා කරන්නේද?
3. මූල්‍ය ආයතන ක්‍රියාකාරිත්වය පිළිබඳව මෙතෙක් නිකුත් කර ඇති අණ පනත් හා චක්‍රලේඛ යළි සමාලෝචනය කර වංචා දූෂණවලට ඉඩ කඩ සලසන සිදුරු වසා දමා මූල්‍ය ආයතන පිළිබඳ ජනතා විශ්වාසය තහවුරු කරන්නේ කෙසේද? ඒ සඳහා ගන්නා වූ පියවර කුමක්ද?

ගරු කථානායකතුමනි, පසු ගිය කාලය පුරාවටම මෙවැනි අවිධිමත් මූල්‍ය ආයතනවල මුදල් තැන්පත් කිරීම හේතුකොටගෙන අපේ රටේ තැන්පත්කරුවන් විශාල ප්‍රමාණයක් අසීරුතාවට පත් වෙලා සිටිනවා. සමහර අය සිය දිවි හානි කරගෙන තිබෙනවා. සමහර අයගේ පවුල් පවා විනාශයට පත් වෙමින් තිබෙනවා. සමහර අය මානසික රෝගින් බවට පත් වෙමින් තිබෙනවා. ඒ නිසා සී.අයි.එෆ්.එල්. ආයතනය පමණක් නොව මේ අක්‍රමිකතාවෙහි යෙදුණු මූල්‍ය ආයතන සියල්ල පිළිබඳ පරීක්ෂණ කොට ඒවායේ තැන්පත්කරුවන්ට සහනයක් ලබා දෙන්න ගරු ඇමතිතුමා කටයුතු කරනවාද කියලා දැනගන්න කැමැතියි. බොහොම ස්තූතියි ගරු කථානායකතුමනි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, අනුර දිසානායක මන්ත්‍රීතුමා මේ ප්‍රශ්නය ඉදිරිපත් කළාට, ප්‍රශ්නය අපට එවා නැහැ. නමුත්, මට උත්තර දෙන්න පුළුවන්. ඊයේ අපි ඒ තැන්පත්කරුවන් මුණ ගැහුණා. ඒ අනුව එතුමා ඇසූ මේ ප්‍රශ්නවලට මා දන්නා විධියට උත්තර දෙන්නම්.

ඔබතුමාගේ පළමුවැනි ප්‍රශ්නයට මට දෙන්න පුළුවන් උත්තරය, "ඔව්" කියන එකයි. මහ බැංකුවේ හිටපු අධිපති සහ මහ බැංකුව සම්පූර්ණයෙන්ම දේශපාලනීකරණය වෙලා තිබුණු නිසා ඒ මඟින් ලැබෙන්න තිබුණු රැකවරණය මේ ආයතනවලට ලැබුණේ නැහැ. මහ බැංකුවේ අධිපති අර්ජුන මහේන්ද්‍රන්ට අපි දැන් කියලා තිබෙනවා, මාර්තු මාසයේ පළමුවැනි දා සිට එතුමන්ලා සහතික කරන සියලුම මූල්‍ය ආයතනවල ආයෝජනය කරන හැම තඹ සතයක්ම අනිවාර්යයෙන්ම ආරක්ෂා කළ යුතුයි කියලා. අපි මීට පස්සේ ඒ නීතිය ක්‍රියාත්මක කරනවා. ඇත්ත වශයෙන්ම මේ මූල්‍ය ආයතනවල තැන්පත්කරුවන්ට මීට වඩා වැඩි පොලී ප්‍රමාණයක් ලබා ගත හැකි මාර්ගයක් ලෙසත් අපි ඒවා විවෘත කරලා තිබෙනවා.

දෙවන ප්‍රශ්නයට උත්තරය මෙයයි. මහ බැංකුවේ හිටපු තාඹුගල මහත්මිය තමයි මේ සම්බන්ධයෙන් වැඩියෙන්ම කටයුතු කළේ. එතුමිය තමයි අන්තිම මාස 15 තුළ ඒ කටයුතු සඳහා නායකත්වය දුන්නේ. දැන් අපි ඒ හා සම්බන්ධ කටයුතු ඉදිරියට කර ගෙන යනවා. මම ඊයේ ඒ තැන්පත්කරුවන් සියලු දෙනා මුණ ගැහුණා. අප හමුවුණු ඒ CIFL තැන්පත්කරුවන් ඉතාම ශුභවාදීව කථා කරපු නිසා අපට ඒ සම්බන්ධයෙන් වැඩි දෙයක් කිරීමේ අවශ්‍යතාවක් නැහැ. මාර්තු මාසය අවසාන වන්න පෙර KPMG ආයතනය මේ ආයතනයේ කටයුතු audit කරලා වාර්තා ඉදිරිපත්

[ගරු රවි කරුණානායක මහතා]

කරනවා. මේ වන තුරු මෙම ආයතනයේ ගිණුම් වාර්තා හෙළිදරව් කරලා නැහැ. ඒ ආයතනයේ තිබුණු සල්ලිවලට මොකද වුණේ කියන එක සම්බන්ධයෙන් financial transaction report එකක් පමණක් ඉදිරිපත් කරලා තිබෙනවා.

තුන්වෙනි ප්‍රශ්නයට පිළිතුර මෙයයි. ඒ සම්බන්ධ වාර්තා සහ ගිණුම් මාර්තු මාසයේ 31වෙනකොට CIFL තැන්පත්කරුවන්ට දුන්නාට පස්සේ පාර්ලිමේන්තුවටත් ලබා දෙන්නම්.

ඒ වාගේම මම තවත් කරුණක් කියන්න කැමැතියි. මේ තැන්පත්කරුවන්ගේ මෙතෙක් තිබෙන සම්පූර්ණ තැන්පත් මුදල රුපියල් මිලියන 3,251යි. තැන්පත්කරුවන් සංඛ්‍යාව 5,201යි. ඒ අයම කියන විධියට ඒ තිබෙන වත්කම් ලෙස දැනට හොයා ගන්න පුළුවන් වන්නේ රුපියල් මිලියන 502යි. ඉතින්, ඒ තැන්පත්කරුවන් පවා පුදුම වෙනවා, ඒ ගොල්ලන්ම විශ්වාස කරපු අය මෙහෙම කටයුතු කරලා තිබෙනවාද කියලා. අපි ඒ ගොල්ලන්ගෙන් අහපු එකම දේ තමයි, "ඇයි මේ වාගේ ආයතනයක මුදල් තැන්පත් කළේ?" කියන කාරණය. ඒ ගොල්ලන් දීපු අවංක පිළිතුර තමයි, "රටේ ජනාධිපති, දේශපාලනඥයන් වැනි අයගේ පින්තූර තියාගෙනයි මේ ආයතනය මුදල් එකතු කළේ, ඒ වාගේම මහ බැංකුවේ හිටපු අධිපතිම ගිහිල්ලා රැස්වීම්වල කථා කරලා කිව්වාලු, CIFL වැනි ආයතන තිබෙනවා, භය නැතිව ගිහිල්ලා ඒවායේ මුදල් තැන්පත් කරන්න" කියන එක. ඒක තමයි ඔවුන් දීපු උත්තරය. ඊට පස්සේ මේ සම්බන්ධයෙන් මහ බැංකුව මොනවාද කරලා තිබෙන්නේ?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
සමහර මන්ත්‍රීවරු ඒ දැන්වීම්වල හිටියා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්. ඒක ඇත්තයි. [බාධා කිරීමක්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
පසු ගිය කාලයේ ඒ දැන්වීම්වල හිටියේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තුන් දෙනෙක් ඉන්නවා. මා ඒ අය නම් කරන්නේ නැහැ. නමුත් එවැනි දේවල් කරන්න එපා. ඒක රටේ ආර්ථිකයට සුබවාදී නැහැ. මේ ආයතනයේ අධ්‍යක්ෂවරු පස් දෙනෙක් සිටියා. ඒ අයගෙන් දීප්ති කියන director කෙනෙක් විතරයි රටින් පැන ගිහින් තිබෙන්නේ. අනෙක් හතර දෙනා ලංකාවේ ඉන්නවා. ඒ අයගේ passports impound කර තිබෙනවා. මහ බැංකුවේ සේවක පිරිස ඊයේ කිව්වේ, "පොන්සි" ආර්ථික ක්‍රමයක් ලෙස මේ කටයුතු කර ගෙන ගිහින් තිබෙන බවයි. ඒක තමයි කරලා තිබෙන්නේ. මහ බැංකුවේ හිටපු අධිපති නිවාඩ් කබ්රාල් ගේ වැඩ පිළිවෙළක් අනුව තමයි මේ කටයුතු කරගෙන ගිහින් තිබෙන්නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
රොස්කෝ මෙලනි මේකේ ආයෝජකයෙක් හැටියට ඇවිල්ලා විශාල ව්‍යාකූලත්වයක් නිර්මාණය කළා. ඔහු ආයෝජනය කරනවාය කියලා විශ්වාස කරලා කටයුතු කළා. එහි තත්ත්වය කුමක්ද ගරු අමාත්‍යතුමනි?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අප දන්නා විධියට ඒ වාගේ කොම්පැනි දෙක-තුනක් ගෙනැල්ලා තිබෙනවා. නමුත් ඒවා ගැන විශ්වාසයක් නැති බව තමයි මහ බැංකුව ඊයේ වනකොට වාර්තා කරලා තිබෙන්නේ. ඊයේ ඒ අය කරපු දුක් සහගත කථාව නිසා අපි එකතු වෙලා බැලුවා, අඩු ගණනේ මේ අයට යම් විධියක ප්‍රතිශතයක් මහ බැංකුවෙන් එකතු කරන්න පුළුවන්ද කියලා. එහෙම නැත්නම් මේ ආයතනය වෙනත් කොම්පැනියක් එක්ක ඒකාබද්ධ කරන්නට පුළුවන්ද කියලා. එවැනි ගවේෂණයක් දැනට කර ගෙන යනවා.

ගරු කථානායකතුමනි, KPMG ආයතනයට මේ ආයතනයේ තොරතුරු අපි ඉදිරිපත් කළා. ඒකෙන් ලැබෙන විගණනය තුළින් තමයි ඉදිරියේදී මොනවා ද කරන්න පුළුවන් වන්නේ කියලා තීරණය කරන්නේ. හැබැයි, අපි ආණ්ඩුවක් වශයෙන් කියන්නේ මේ සම්බන්ධයෙන් මහ බැංකුවට වගකීමක් තිබුණාය කියන එකයි. මේ සියලුම දේවල් වුණේ, අවුරුදු තුන-හතරකට ඉස්සෙල්ලා. 2015 මාර්තු මාසයේ පළමුවන දා සිට මහ බැංකුව පිළිගත් මූල්‍ය ආයතනවල තැන්පත් කරන මුදල්වල සම්පූර්ණ රැකවරණය ආණ්ඩුවක් වශයෙන් අපි මහ බැංකුව තුළින් ලබා දෙනවාය කියන එක මේ අවස්ථාවේදී මතක් කරනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු වාසුදේව නානායක්කාර මහතාගේ ප්‍රශ්නය.

II

ස්විට්සර්ලන්තයේ HSBC බැංකු ශාඛාවේ ලාංකිකයන් සතු ගිණුම්

சுவிற்சர்லாந்து HSBC கிளையிலுள்ள இலங்கையர் கணக்குகள்

ACCOUNTS OF SRI LANKANS AT HSBC SWISS BRANCH

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ පහත සඳහන් ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවසර ලබා දීම ගැන ස්තුවන්ත වෙන අතර, මෙම ප්‍රශ්නය අදාළ අමාත්‍යවරයාට යොමු කරනවා.

2015.02.10 වෙනි දින "ඩේලි මිරර්" පුවත්පතේ පළ වූ පරිදි ස්විට්සර්ලන්තයේ HSBC බැංකු ශාඛාවෙන් පිට වී ඇති ලිපිගොනු රාශියක් අතර ලාංකිකයන් සතු ගිණුම් 129 ඇති බවත්, එම ගිණුම් ලාංකිකයන් අනු දෙදෙනෙකුට (92) අයත් බවත් පළ වී තිබිණ. මෙම ගිණුම්වල මුළු වටිනාකම ස්විස් ෆ්‍රෑන්ක් මිලියන 85 ක් පමණය. - මෙතැන වැරදීමකින් රුපියල් මිලියන 800ක් හැටියටයි සඳහන් වන්නේ.

ජනමාධ්‍ය ගවේෂණ කණ්ඩායමක් මේ ගැන විශ්ලේෂණය කොට යම් නිගමනවලට එළඹී ඇති බවද වාර්තා වේ. ඒ අනුව මෙකී ලාංකීය ගිණුම්කරුවන් අතර ව්‍යාපාරිකයන්, දේශපාලනඥයන් හා නිරූපිකාවන් සිටින බව ද පළ වේ.

මෙම ගිණුම් නීති විරෝධී ඒවා නොවූවද ස්විට්සර්ලන්තයේ නීතිවලින් ආවරණය වී මෙසේ තැන්පත් කොට ඇති අති විශාල මුදල් සම්භාරය ලංකාවේ යම්කිසි නීතියකට පටහැනිව ගොඩ ගසා ගනු ලැබීදැයි සොයා බැලීම ලාංකේය බලධාරින්ගේ වගකීම බව ද එම ජනමාධ්‍ය ගවේෂණ කණ්ඩායම පවසයි. ලංකා රජය තම පරීක්ෂණයන් සඳහා තොරතුරු ඉල්ලා සිටින්නේ නම් එම බැංකුව ඒ ගැන සහාය වීමට සූදානම් බවද සැලය. රජය මෙම ප්‍රවෘත්තිය ජනමාධ්‍යයන්හි පළ වීමට පෙර දැන සිටියේ ද, නැද්ද අපි නොදනිමු.

කෙසේ නමුත් ඉතා කඩිනමින් එම විස්තර හා තොරතුරු ලබා ගෙන ලංකාවේ ආදායම් බදු නීතිය සහ විදේශ විනිමය නීති හා වෙනත් යම් නීති කොයියම් ආකාරයකට හෝ උල්ලංඝනය කර ඇත්නම් කඩිනමින් ක්‍රියාත්මක වී රාජ්‍ය මුදල් ගැන වගකීම ඇති මෙම පාර්ලිමේන්තුවට ප්‍රකාශයක් කරන්නේද?

නොඑසේ නම් ඒ මන්දැයි ගරු රවි කරුණානායක මුදල් ඇමතිතුමාගෙන් මම අසා සිටිමි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Member, may I take the liberty of answering the first part of the Question in English because it contains some facts of a technical nature. I would appreciate if you would allow me to do so.

As per Section 15(1) of the Financial Transactions Reporting Act, No. 6 of 2006, the Financial Intelligence Unit has the power to receive reports from a law enforcement agency, a Government institution or agency or an agency of another country relating to suspicious transactions.

Relating to the newspaper article you referred to regarding Sri Lankans holding accounts in Switzerland, no such institution or law enforcement agency has reported any suspicious transaction to the FIU. According to the FIU, it is not in a position to initiate investigations under the provisions the Financial Transactions Reporting Act - FTRA. Further, I would like to highlight the fact that past experiences of the FIU with Switzerland show that they are not cooperative in providing assistance for investigation. Hon. Member, furthermore, this particular transaction was reported about five years ago and at that particular time, it was reported more vividly, even certain names came out. As a matter of fact, the Central Bank had information. Unfortunately, it is more outside the purview of observation because it has got to be done under the three specific areas: that is, on a report by a law enforcement agency or a Government institution or agency. Now, the media does not fall under this category. The structure of reporting to the FIU was changed in 2006 and I solicit the assistance of Parliament in this regard and would refer it to the President and the Prime Minister, that we should bring it within the ambit, enabling the FIU to look into any genuine information that is mentioned. We have also got information through different media that, though your Question mentions the total amount as Rs. 800 million, it is much more than that. But, as the FIU has the right only to look into it on reports coming in from the three institutions and agencies I mentioned, it is not permitted to do so legally. Secondly, the same information has come from the National Bank of Dubai and Ukraine, which carries a lot of political names.

I thank the Hon. Member for bringing this into open. I would take the liberty to instruct the Central Bank to call for information on all the names reported by the media and to answer the questions that the media had posed, even though it basically does not legally hold the right to complain. I would also extend the area of investigation into Ukraine and Dubai, which have reported of almost US Dollars 72 million.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
That is, in addition to the Swiss accounts, is it?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Yes, in addition to the Swiss accounts. I am sorry, it is not US Dollars 72 million, but US Dollars 720 million in two peoples' names. About another US Dollars 26 million is in the names of 14 Sri Lankans in one bank, the National Bank of Dubai.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
The Financial Intelligence Unit can bring out these facts and details on the basis of the sovereignty of our State.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Member, I would like to once again point out that the investigation has to be done on a report from the following institutions: a law enforcement agency or a Government institution or agency. So, the law prescribes the area of investigation.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
So, change the law.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Yes. That is what I basically ask your support for. I am sure, if all of you are very willing, that could be taken up.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Change the law. - [*Interruption*.]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Yes, I would certainly take it up at the Cabinet Meeting tomorrow and bring it in immediately. I thank you for bringing it up.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

Then, you will get money.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Your bringing it up at a time like this is helpful because it certainly helps the Ministry of Finance, which is completely depleted of money at this particular moment.

Also, I would greatly appreciate if any other matter is brought up because our Ministry is ready to answer your questions at any time. - [*Interruption*.] Yes. The right to information, even though it has been non-existent, will certainly be provided by the Ministry of Finance because I have been instructed by the President and the Prime Minister to answer any question at any time to show transparency of the Government.

Thank you.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු සභානායකතුමා.

සාගර ආරක්ෂක සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයන් මුහුණ පා ඇති ගැටලු: සභානායකතුමාගේ ප්‍රකාශය
கடல் பாதுகாப்புச் சேவையுள்ள இலங்கையர் எதிர்நோக்கும் பிரச்சினைகள்: சபை முதல்வரினது கூற்று
PROBLEMS FACED BY SRI LANKANS IN MARITIME SECURITY SERVICE : STATEMENT BY LEADER OF THE HOUSE

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Plantation Industries and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, 2015 පෙබරවාරි 20වැනි දින ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 23(2) යටතේ අසන ලද ප්‍රශ්නය සම්බන්ධයෙන් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මම පිළිතුරු ලබා දෙන්න කැමැතියි.

1.1. සාගර ආරක්ෂකයින් යෙදවීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය අවසර දී ඇත්තේ රක්නා ලංකා ආරක්ෂක සමාගමට පමණි. වෙනත් කිසිදු ආයතනයකට එම කාර්යය සඳහා අවසර දී නැත. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 1681/3 හා 2010.11.22 අනුව රක්නා ලංකා ආරක්ෂක ආයතනය ආරක්ෂක අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතනයක් ලෙස ප්‍රකාශිත සමාගම් පනත යටතේ ලියාපදිංචි, රජය සතු සමාගමක් වේ. ගැසට් පත්‍රය ඇමුණුම 01 ලෙස **සභාගත*** කරමි.

රක්නා ලංකා ආරක්ෂක සමාගම පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වූයේ පෞද්ගලික සහ රාජ්‍ය ආයතනයන්හි ආරක්ෂාව සඳහා විධිමත් විධාන ව්‍යුහයකින් හා සන්නිවේදන ජාලයකින් සමන්විත කවර හදිසි අවශ්‍යතාවකට හෝ මුහුණ දිය හැකි ආකාරයට ආරක්ෂාව සැපයීම සඳහා නිසි පුහුණුවක් ලබා ඇති පිරිස් බඳවා ගැනීම ඇතුළුව නිසියාකාර පරිපාලනය සහ සැපයුම්වලින් ද ආවේක්ෂණ ශක්‍යතාවයෙන්ද හෙබි වාණිජමය ආරක්ෂක සේවාවක් ක්‍රියාත්මක කිරීම වේ.

1.2 තවද, දේශීය වශයෙන් ආරක්ෂක සේවා සලසා ගැනීමේදී රාජ්‍ය හා පෞද්ගලික ආයතන විසින් සෑම අවස්ථාවක දීම රක්නා ලංකා ආයතනය වැනි රජය සතු ආරක්ෂක සේවා ආයතනවලට ප්‍රමුඛත්වය ලබා දිය යුතු බවට අමාත්‍ය මණ්ඩලය විසින් 2010.06.03 දින ගන්නා ලද තීරණයට අනුව මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් අංක දරන PF/R/3/Security හා 2010.08.12 දිනැති ලිපියෙන් චක්‍රලේඛ උපදෙස් නිකුත් කොට ඇත. ඇමුණුම 02 **සභාගත*** කරමි.

1.3 රක්නා ලංකා ආයතනය ආරම්භයේදී රාජ්‍ය හා පෞද්ගලික ආයතන සහ ඒවායේ දේපළ ආරක්ෂාව සඳහා විශ්‍රාමික හමුදා නිලධාරීන් ආරක්ෂක සේවයේ යොදවනු ලැබීය. ජාත්‍යන්තර මුහුදු කොල්ලකරුවන්ගේ වැඩි වීම නිසා සාගර ආරක්ෂක නිලධාරීන් ලෙස විශ්‍රාමික හමුදා නිලධාරීන් යෙදවීම රක්නා ලංකා ආරක්ෂක සමාගම මඟින් ආරම්භ කෙරිණි. ඔවුන් බඳවා ගැනීම හා පුහුණු කිරීම එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධව ජාත්‍යන්තර සමුද්‍රීය කටයුතු පිළිබඳ සංවිධානය - IMO - මඟින් නිකුත් කර ඇති 2012 මැයි 25 දිනැති MSC.1/Circ/1443 දරන චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව සිදු කෙරේ. ඇමුණුම 03 **සභාගත*** කරමි.

අධි අවදානම් මුහුදු කලාප තුළ ගමන් කරන නැව්වල ආරක්ෂා කටයුතු සඳහා යොදවනු ලබන සාගර ආරක්ෂක නිලධාරීන් තෝරා ගැනීම, නිෂ්කාසන හා පුහුණුව සම්බන්ධයෙන් පහත සඳහන් සුදුසුකම් සපුරාලිය යුතු බව උක්ත චක්‍රලේඛයෙන් අවධාරණය කර ඇත.

(i) අපරාධවලට සම්බන්ධව නොතිබීම
(ii) සතුටුදායක පෙර සේවා වාර්තා
(iii) සතුටුදායක හමුදා සේවාවල වාර්තා හා පොලිස් නිෂ්කාසන වාර්තා
(iv) කායික හා මානසික යෝග්‍යතාව තහවුරු කිරීම පිණිස වෛද්‍ය වාර්තා (මත් ද්‍රව්‍ය හා මත්පැන් භාවිතය පිළිබඳ)
(v) අඛණ්ඩ සේවා තත්ත්ව පරීක්ෂණ වාර්තා
(vi) සාගර ආරක්ෂා කටයුතු සඳහා යොදවන අවි ආම්පන්න ආදිය පිළිබඳ නිපුණතා සහතික පිළිගත් ආයතනයක් වෙතින් නිකුත් කර තිබීම.

1.4 එසේ වුවද, සමුද්‍ර ආරක්ෂක නිලධාරීන් පිට රට සමාගම් වෙත අනුයුක්ත කිරීම සඳහා රෙගුලාසි පනවා නොතිබූ නිසා පෞද්ගලික ආයතන බොහොමයක් මඟින් සාගර ආරක්ෂක නිලධාරීන් යෙදවීම පාලනයකින් තොරව සිදු විය. මේ නිසා හමුදාවලින් පැන ගිය පුද්ගලයින්ද අපරාධ වාර්තා ඇති අය හා ඇතැම් විට හමුදාවල සේවය කරන අතරතුර පැන ගොස් එම රැකියාවලට සම්බන්ධ වී ඇති බව

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

නිරීක්ෂණය විය. මෙම තත්ත්වය අඛණ්ඩව සිදු වූවා නම් ජාත්‍යන්තර වශයෙන් ශ්‍රී ලංකාවට රාජ්‍ය තාන්ත්‍රික සම්බාධක පැනවීමට ඉඩ තිබුණි. එම නිසා ඒ වන විට ලැබී තිබුණ බුද්ධි තොරතුරු සැලකිල්ලට ගෙන ආරක්ෂක අමාත්‍යාංශය විසින් අවිධිමත් ලෙස රැකියා සඳහා යොදවා සිටි අය ගෙන්වා ගැනීම සඳහා පිට රට සාගර ආරක්ෂක සමාගම් වෙත යොමුගත ලිපිය යොමු කරන ලදී.

2. නැත. අදාළ නොවේ.

3. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය විසින් යොමු කරන ලද යොමුගත ලිපියේ උපදෙස් පරිදි ජාත්‍යන්තර සාගර ආරක්ෂක සේවා සමාගම්වල සේවය තමන් විසින් සොයා ගනු ලැබූ ශ්‍රී ලාංකිකයන් 146 දෙනෙකු ශ්‍රී ලංකාවට ආපසු එවා ඇති අතර ඒ අයගෙන් 105 දෙනෙකු පමණක් රක්නා ලංකා ආරක්ෂක ආයතනය වෙත ලියාපදිංචි වීම සඳහා වාර්තා කර ඇත. ඔවුන්ගේ ආරක්ෂක නිෂ්කාසන නිසි ලෙස පරීක්ෂා කිරීම කරන ලද්දේ ඉහත සඳහන් IMO චක්‍රලේඛවල සඳහන් උපදෙස්වලට අනුකූලවය. ඉන්පසු ඔවුන් 105 දෙනා නැවත සේවයේ යොදවන ලදී. නමුත් ඉතිරි 41 දෙනා රක්නා ලංකා ආයතනයේ ලියාපදිංචි වී නොමැත.

4. ආරක්ෂක අමාත්‍යාංශ නියෝග හේතුවෙන් රැකියා අහිමි වූ පසුව රක්නා ලංකා ආරක්ෂක ආයතනයේ ලියාපදිංචි වූ සියලු දෙනාටම රැකියා ලබා දී ඇති බැවින් වන්දි මුදල් ගෙවීම අදාළ නොවේ.

5. රක්නා ලංකා ආරක්ෂක සමාගම බදු මුදල් ගෙවීම නිසි පරිදි සිදු කරනු ලබයි. 2011 සිට මේ දක්වා මිලියන 535කට වැඩි මුදලක් බදු මුදල් වශයෙන් රජයට ගෙවා ඇත. මෙය සිදු කරනුයේ සෑම මුදල් වර්ෂයක් අවසානයේ සිදු කරන විගණනයට අනුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු බවට තීරණය කරනු ලබන මුදලයි. මීට අමරතව ලාභාංශද මහා භාණ්ඩාගාරයට ගෙවනු ලැබේ. මෙතෙක් එසේ ගෙවා ඇති ලාභාංශ ප්‍රමාණය මිලියන 94කි.

6. අමාත්‍යාංශ නියෝග අනුව අන්තර්ග්‍රහණය කළ සේවකයන්ට අසාධාරණයක් සිදු වී තිබේද සහ එසේ නම් ඔවුන් මුහුණ පාන ගැටලු පිළිබඳ සොයා බැලීම සඳහා අධ්‍යයනයක් කර ලබන තොරතුරු අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වේ.

7. ඔව්.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත
தேசிய மருந்துகள் ஒழுங்குபடுத்தும் அதிகாரசபைச் சட்டமூலம்
NATIONAL MEDICINES REGULATORY AUTHORITY BILL

"ජාතික ඖෂධ ප්‍රතිපත්තියට අනුකූල වන ආකාරයට ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන ලියාපදිංචි කිරීම, බලපත්‍ර ලබාදීම, නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම සහ එකී ඖෂධ, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදනවලට අදාළ වෙනත් සියලු කරුණු සහ සායනික පරීක්ෂණ පවත්වන ආකාරය නියාමනය කිරීම සහ පාලනය කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු ජාතික ඖෂධ නියාමන අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන නියාමන අධිකාරියක් පිහිටුවීම සඳහා ද; ඖෂධ නියාමන අංශය, වෛද්‍ය උපකරණ නියාමන අංශය, සීමාස්ථ නිෂ්පාදන නියාමන අංශය සහ සායනික පරීක්ෂණ නියාමන අංශය ඇතුළු ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අංශ පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; ජාතික උපදේශක කමිටුවක් පිහිටුවීම සඳහා ද; 1980 අංක 27 දරන විලවුන්, උපකරණ සහ ඖෂධ පනත ඉවත් කිරීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍ය ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා විසිනි.

2015 මාර්තු මස 04 වන බදාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.

சுகாதார மற்றும் சுதேச மருத்துவ அமைச்சர் மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2015 மார்ச் 04, புதன்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. (Dr.) Rajitha Senaratne, Minister of Health and Indigenous Medicine; to be read a Second time upon Wednesday, 04th March, 2015 and to be printed.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

I

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I move,

"That notwithstanding the provisions of Standing Order No. 7 and the motion agreed to by Parliament on 09.07.2010, the hours of sitting on Wednesday, March 04th, 2015 shall be 9.30 a.m. to 7.30 p.m. At 6.30 p.m. Standing Order No. 7(5) shall operate."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I move,

"That this Parliament at its rising this day do adjourn until 9.30 a.m. on Wednesday, March 04th, 2015".

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රධාන කටයුතු. අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 - සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ නියෝග අනුමත කිරීම-

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
Sir, I rise to a point of Order.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ගරු කථානායකතුමනි, මම සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගේත්, ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් ඒ වාගේම සියලු පක්ෂ නායකයන්ගේත් අවධානයට පහත සඳහන් කරුණ යොමු කරනවා. ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත අද දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් වුණා. අපිට එය මේ වන තෙක් ලැබුණේ නැහැ.[බාධා කිරීමක්] -දැන් තමයි එය ලැබෙන්නේ.-

ගරු කථානායකතුමනි, මෙම පනත් කෙටුම්පත කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර තිබෙන්නේ පෙබරවාරි මස දෙවැනි දායි. හය වැනි දා අනුමත කර තිබෙනවා. ඒ අනුව මාසයකට වඩා වැඩි කාලයක් ගත වෙලා තිබෙනවා. නමුත් මේ පනත් කෙටුම්පත අප කිසි කෙනෙකු දුටුවේ නැහැ. අද තමයි අපි මේ පනත් කෙටුම්පත දකින්නේ. මෙම පනත් කෙටුම්පත උපදේශක කාරක සභාවේ සාකච්ඡාවට ගන්නවා කියලා දැනුම් දීමක් තවම නැහැ. හෙට මේ පනත් කෙටුම්පත විවාදයට ගන්නවා. අවුරුදු පනහකට ආසන්න කාලයක් තිස්සේ රටේ සාකච්ඡාවට භාජන වුණු මෙවැනි වැදගත් පනත් කෙටුම්පතක් පුළුල් මහජන සංවාදයකට පත් විය යුතුයි කියලා මම හිතනවා. එම නිසා සියලුම පක්ෂ නායකයන්ගේ අවධානයට යොමු කරනවා, මෙම පනත් කෙටුම්පත හෙට දින පාර්ලිමේන්තුවේදී සම්මත නොකොට විවාදය සඳහා මීට වෙනස් දිනයක් දෙන්න කියලා.

විශේෂයෙන්ම මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් ඉදිරිපත් කළ දින සියයේ වැඩසටහනෙහි සඳහන්ව තිබුණේ, මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ පෙබරවාරි මස 06 වැනි දා බවත්, එය සම්මත කරන්නේ මාර්තු මාසයේ 18 වැනි දා බවත්. එම නිසා ඔවුන්ගේ ප්‍රකාශනය අනුවම මෙයට තව කල් තිබෙනවා. ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න ඇමතිතුමනි, විශේෂයෙන්ම මෙය මේ රටේ වෛද්‍යවරුන්, වෘත්තිකයන්, වෘත්තිය සමිති සහ විවිධ සංවිධානවල බරපතළ ලෙස සාකච්ඡාවට ගත යුතු පනත් කෙටුම්පතක්. අපි කවුරුත් එයට දායක විය යුතුයි. මට වුණත්, මේ පාර්ලිමේන්තුවේ වෙනත් මන්ත්‍රීවරයෙකුට වුණත් අද ලැබෙන මේ පනත් කෙටුම්පත අධ්‍යයනය කර මෙයට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් නැහැ. ඒ අනුව මේ සඳහා සාධනීය අදහස් එකතු කිරීමට, අධ්‍යයනය කිරීමට ප්‍රමාණවත් කාලයක් නැති නිසා හෙට දින මෙය අවසන් කරන්නේ නැතුව, කාලාන්තරයක් තිස්සේ සාකච්ඡා වුණු මේ පනත් කෙටුම්පත අඩුම තරමේ ඔබතුමන්ලා පොරොන්දු වූ පරිදි මාර්තු මාසයේ 18 වැනි දිනවත් සාකච්ඡාවට ගන්න කියලා මම ඉල්ලා සිටිනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, මෙම පනත් කෙටුම්පත හදිසි පනත් කෙටුම්පතක් හැටියට හෙට දින විවාදයට ගන්න පක්ෂ නායකවරු එකඟ වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමා, කථා කරන්න.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු කථානායකතුමනි, මට හිතෙන හැටියට මෙතුමා මේ පනත් කෙටුම්පතේ ඉතිහාසය දන්නේ නැහැ. ඇත්තටම ජාතික ඖෂධ නියාමන අධිකාරිය නැමැති පනත් කෙටුම්පත කෙටුම්පත් කළේ වත්මන් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සෞඛ්‍ය ඇමතිවරයාව සිටියදීයි. 2014 ජූනි මාසයේ මේක මහ ජනයාට ඉදිරිපත් කර තිබෙනවා. අදහස් විමසලා, කමිටුවකුත් පත් කරලා, ඒ යෝජනාත් කෙටුම්පතට දාලා, කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළා. නමුත් කැබිනට් මණ්ඩලය ප්‍රතික්ෂේප කළා. මේ පනත් කෙටුම්පත ගැසට් කරලා, මහ ජනයාට ඉදිරිපත් කරලා සේරම කටයුතු කරලා ඉවරයි. කැබිනට් මණ්ඩලයේදී කඩාකප්පල් වුණු වැඩේ තමයි මම අද මේ ගෙනාවේ. අමුතුවෙන් පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළා නොවෙයි. පසු ගිය අවුරුද්දේ ජූනි මාසයේ Blood Bank එකේ දවසක් පුරා ජනාධිපතිතුමා සියලුම සංවිධාන එක්කාසු කර ගෙන මේ ගැන සාකච්ඡා කළා. මම දැන් කළේ, එතුමාට කැබිනට් මණ්ඩලයෙන් ඉඩ නොදුන් පනත් කෙටුම්පත ගෙනැල්ලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමයි. මූලධර්මය එකයි. වෙන කිසිම කථාවක් නැහැ. මේක ඊයේ-පෙරේදා ගෙනාපු එකක්වත්, හදිසියේ ඉදිරිපත් කළ පනත් කෙටුම්පතක්වත් නොවෙයි. ප්‍රමාද කළාට මට ප්‍රශ්නයක් නැහැ. මම මේ කරන්නේ පුළුවන් ඉක්මනට- [බාධා කිරීමක්]

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

කැබිනට් මණ්ඩලට ඉදිරිපත් කරන්නවත් අවස්ථාව ලැබුණේ නැද්ද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළා. ඔබතුමාට මතක ඇති, ප්‍රතික්ෂේප කළා නේ. ඒකට පක්ෂව මම කථා කළා, ගරු පාඨලී චම්පික රණවක ඇමතිතුමා කථා කළා. මම හිතන හැටියට ඔබතුමාත් කථා කළා. නමුත් කැබිනට් මණ්ඩලය -හිටපු ජනාධිපතිතුමා- මේකට ඉඩ දුන්නේ නැහැ. මේකටයි, දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පතටයි. මතකයි නේද, ඔබතුමන්ලා සහ අපි ඒ වෙනුවෙනුත් කථා කළා. නමුත් ඉඩ දුන්නේ නැහැ. එදා කඩාකප්පල් වුණු පනත් කෙටුම්පත තමයි මේ ගෙනෙන්නේ. මහාචාර්ය ක්‍රිෂාන්ත වීරසූරිය, මහාචාර්ය කොල්වින් ගුණරත්න, දොස්තර රාජා විජේසුන්දර 1970 ඉඳලා මේ වෙනුවෙන් සටන් කළා. 1970 ගණන්වල ඉඳලා ඒ කමිටුවේ මමත් වාඩි වුණා. මෙතැන ඉන්න අපේ වාසුදේව නානායක්කාර, මහාචාර්ය තිස්ස විතාරණ මන්ත්‍රීතුමන්ලාත් එදා ඒකට දායක වුණා. මහාචාර්ය සේනක බිබිලේ මහත්මයාට පස්සේ ආචාර්ය බාලසුබ්‍රමනියම් ඇතුළුව වෛද්‍යවරු 4 දෙනෙක් මේකට උනන්දු වුණා. ඔබතුමාට මතක ඇති ආචාර්ය බාලසුබ්‍රමනියම් පසු ගිය දිනක මිය ගියා. තුන් දෙනෙක් තවම ජීවමානව ඉන්නවා. මහාචාර්ය ක්‍රිෂාන්ත වීරසූරිය, මහාචාර්ය කොල්වින් ගුණරත්න, දොස්තර රාජා විජේසුන්දර. ඒ තුන්දෙනාවම මම සහභාගි කර ගත්තා. ඊයේ ජාතික රූපවාහිනියේ වැඩසටහනකට ඒ තුන් දෙනායි, මමයි වාඩි වුණා. ඒ ගොල්ලෝ ඉතාම හොඳට මේ ගැන පැහැදිලි කළා. මේක අලුත් දෙයක් නොවෙයි.

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

මම වාදයක් කළේ නැහැ. විවාදය තිබෙන්නේ හෙට. පක්ෂ නායකයන් සියලු දෙනාම එකඟ වූ නිසා තමයි දැන් මම ඉල්ලීමක් කරන්නේ. පසු ගිය අවුරුද්දේ ජූනි මාසයේ 21වැනිදා සාකච්ඡා කරලා, මේක වෙබ් අඩවියක ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළ කළා. මම විතරයි ඒ ගැන පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න කළේ. එතකොට වත්මන් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා එවකට සිටි සෞඛ්‍ය ඇමති විධියට එදා උත්තර දුන්නා. වැඩමුළුව තිබුණා. වැඩමුළුවේදී එකඟ වුණා, රට පුරා දැනුවත් කිරීම් හා සම්මන්ත්‍රණ පවත්වන්නත්, දෙමළ සහ සිංහල භාෂාවෙන් මේ පනත් කෙටුම්පත රටට දෙන්නත්.

ඒ වෙලාවේ වෙබ් අඩවියේ ඉංග්‍රීසි භාෂාවෙන් පළ වුණා. නමුත් ඉන් පසු සිදු වුණු සංශෝධන සහිත; ඒ එකඟ වූ සංශෝධන සහිත -

එයින් පසු සංශෝධන නැහැ ගරු ඇමතිතුමනි. එදා ඉදිරිපත් කරන ලද සංශෝධන ගණනාවක් එකතු වුණා. ඒ ගැන අපි අගය කරනවා.- පනත් කෙටුම්පත පළමුවෙන්ම අපේ අතට පත් වෙන්නේ දැන්. එම නිසා මෙයට විරුද්ධ වෙන්න නොවෙයි, අපි ඒ සඳහා අදහස් ඉදිරිපත් කරන්න ඕනෑ. 1990 වර්ෂය වන විට මමත් පාසල් ශිෂ්‍යයෙක්. මට 1970 දී සිට මෙයට සම්බන්ධ වෙන්න බැහැ. මොකද,1970 දී මට අවුරුදු 3යි. 1990 දීත් මා පාසල් ශිෂ්‍යයෙක්. කරාපිටිය ශික්ෂණ රෝහලේ හිටපු, සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය වෙනුවෙන් ක්‍රියාත්මක වුණු, වෛද්‍ය පීඨ සහෝදරයන් සමඟ මමත් එදා සිටම මෙම පනත් කෙටුම්පත වෙනුවෙන්, මෙම ප්‍රතිපත්තිය වෙනුවෙන් අරගළ කරපු කෙනෙක්. එම නිසා මම ඉල්ලා සිටිනවා මේ රටේ වෘත්තිකයන්, වෛද්‍යවරුන්, ඖෂධවේදීන් මේ සියලු ජනතාවගේ අදහස් ඉදිරිපත් කරන්න ඉඩ දෙන්න කියා. පක්ෂ නායකයන් එකඟ වුණු නිසා තමයි මම මේ කියන්නේ. ගරු ඇමතිතුමනි, මේ සඳහා මාර්තු මස 18 වෙනිදා වෙනකල් තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ සැවොම එකතු වෙලා වඩා හොඳ සාධනීය පනතක් සම්මත කර ගන්න ඕනෑ. මේ පනත් කෙටුම්පත කියෙව්වාට පසුව ගැටලුත් තිබෙනවා. මෙම ගැටලු සාකච්ඡා කර නිරවුල් කර ගන්න මෙම කාලය ප්‍රමාණවත් නැහැ. මෙම පාර්ලිමේන්තුව පිරිසිදු කරන්න, ශක්තිමත් කරන්න, මෙයට බලය දෙන්න ඕනෑ කියලා යෝජනාවක් තිබෙනවා. එවැනි තත්ත්වයක් යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් මම ඉල්ලීමක් කරන්නේ, මෙය සාකච්ඡා කරන්න තවදුරටත් කාලයක් ලබා දෙන්න කියලා. මෙම පනත් කෙටුම්පත හෙට වන විට සම්මත නොකළා කියලා කවුරුවත් රණ්ඩු වෙන්නේ නැහැ. ඒ සඳහා කාලයක් ලබා දෙන්න. ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක් ඉල්ලන්නේ. එයට ප්‍රජාතන්ත්‍රවාදී ඉඩකඩක් ලබා දෙන්න.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, ගරු මන්ත්‍රීතුමනි. ගරු සභානායකතුමා කථාකරන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, පක්ෂ නායක රැස්වීමේ දී මේ ගැන දීර්ඝ සාකච්ඡාවක් ඇති වුණා. අනෙක් එක සේනක බිබිලේ මැතිතුමා මෙම වාර්තාව ඉදිරිපත් කළේ අපි නීති විද්‍යාලයට යන කාලයේ. අවුරුදු 40ක් තිස්සේ අපි මේක සාකච්ඡා කරනවා. මට මතක හැටියට 1974 වර්ෂයේ වාගේ, සේනක බිබිලේ මැතිතුමා ජාතික ඖෂධ සංස්ථාවේ සභාපති ලෙස සිටියදී තමයි මෙම වාර්තාව ඉදිරිපත් කළේ. අවුරුදු 40ක් තිස්සේ - for nearly 40 years - මේ ගැන සාකච්ඡා කරලා තිබෙනවා. මේ වන විට පරම්පරා දෙකක කාලයක් වෙනවා. එම නිසා මෙය නැවත කල් දමන්න බැහැ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු කථානායකතුමනි, 2005 දී තමයි පළමුවෙන්ම මෙම පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න ක්‍රියාත්මක වුණේ. නමුත් මේ සඳහා නොයෙකුත් හේතූන් අරගෙන ඇවිල්ලා අද වන තුරු මෙය ක්‍රියාත්මක වුණේ නැහැ. මෙම පනත් කෙටුම්පත අපි සම්මත කර ගනිමු. තමුන්නාන්සේලාගේ යෝජනා තිබෙනවා නම් ඒවා ඉදිරිපත් කරන්න. ඒ යෝජනා වැදගත් ඒවා නම් මම ඕනෑම වෙලාවක ඒ සඳහා සංශෝධනත් ගෙනෙන්නම්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. ගරු ඇමතිතුමාගේ යෝජනාව මම හිතන්නේ බොහොම කාලෝචිතයි, බොහොම හොඳයි කියලා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
නැතිනම් මෙම පනත් කෙටුම්පත කවදාවත් ඉදිරිපත් කෙරෙන්නේ නැහැ. එම නිසා තමයි දවස් 100 වැඩසටහනේ එම කාලසටහනට මෙම පනත් කෙටුම්පත ඇතුළත් කළේ. මෙය ඉක්මනින්ම අවසන් කර ගන්න ඕනෑ නිසා. මොකද හැමදාම අපි කථා කළා. මමත් අහගෙන හිටියා 1970 ගණන්වල ඉඳලා. දක්ෂිණාංශික සහ වාමාංශික යන දෙගොල්ලන්ම අන්තවාදී විධියට කථා කරලා මෙම පනත් කෙටුම්පත ගෙන එන එක පහු කරලා දැම්මා. එය තමයි සිදු වුණේ. [බාධා කිරීමක්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. මෙය අවුරුදු ගණනක් තිස්සේ සාකච්ඡා වුණු පනත් කෙටුම්පතක්. මෙය හැමෝම දන්නා පනත් කෙටුම්පතක්. ඒ නිසා ඔබතුමාට පුළුවන්, ඔබතුමාගේ සංශෝධන ඉදිරිපත් කරන්න. ඇමතිතුමා ඒ පිළිබඳව අවධානය යොමු කරන්න එකඟයි. අපි දැන් අදට නියමිත මාතෘකාවට යනවා.

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
මේ ගැන කථා කරන්නේ නැතුව විපක්ෂයේ කවුරුත් නිශ්ශබ්දව ඉන්න එක ගැන මා කනගාටු වනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමා.

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
මේකේ තිබෙන්නේ සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය නොවෙයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, ගරු මන්ත්‍රීතුමාට ඒ පිළිබඳව විවාදයේ දී කරුණු දක්වන්න පුළුවන්. දැන් ගරු විජයදාස රාජපක්ෂ අමාත්‍යතුමා කථාව ආරම්භ කරන්න.

සේවක අර්ථසාධක අරමුදල පනත : නියෝග
ஊழியர் சகாய நிதியச் சட்டம்: ஒழுங்குவிதிகள்
EMPLOYEES' PROVIDENT FUND ACT: REGULATIONS

[අ.භා. 2.35]

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - நீதி மற்றும் தொழில் உறவுகள் அமைச்சர்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe - Minister of Justice and Labour Relations)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

"කලින් කල සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 46 වැනි වගන්තිය යටතේ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 මැයි මස 13 දිනැති අංක 1810/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය දන්වා තිබේ.)"

ගරු කථානායකතුමනි, සමාජ ආරක්ෂණ ක්‍රමයක් වශයෙන් ප්‍රචලිත සේවක අර්ථසාධක අරමුදල පිහිටුවීමේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ කිසිදු විශ්‍රාමික ප්‍රතිලාභයකට හිමිකම් නොමැති පෞද්ගලික සහ අර්ධ රාජ්‍ය අංශ සේවකයන්ට සේවාන්ත ප්‍රතිලාභ හිමි කර දීම සඳහා ප්‍රතිපාදන සැලැස්වීමයි. මෙලෙස ආරම්භ වූ මෙම සමාජ ආරක්ෂණ ක්‍රමය, ශ්‍රී ලංකාවේ මේ වන විට අති විශාල සේවක ජනතාවකට සිය ආත්මාභිමානයෙන් යුතුව සැදෑ සමය ගත කිරීමට හැකි විශ්‍රාම ප්‍රතිලාභ ක්‍රමයක් බවට පරිවර්තනය වී තිබෙනවා. මේ වන විට සේවක අර්ථ සාධක අරමුදල සඳහා දායක මුදල් ගෙවනු ලබන සක්‍රීය සේවක සංඛ්‍යාව මිලියන දෙකකට වැඩි වන අතර, අරමුදලේ මුළු වටිනාකම රුපියල් ට්‍රිලියන 1.4ක් පමණ වෙනවා.

2014 වර්ෂයේ දී සේවක අර්ථ සාධක අරමුදල් ලැබීම් රුපියල් බිලියන 92ක් දක්වා වර්ධනය වී ඇති අතර, ප්‍රතිලාභ නිකුත් කිරීම සඳහා රුපියල් බිලියන 64ක් වැය වූ බවට ශ්‍රී ලංකාවේ මහ බැංකු වාර්තාවලින් හෙළිදරවු කර තිබෙනවා. යටත් විජිත සමයේ දී සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ක්‍රම සමස්ත පෞද්ගලික අංශයේ සේවකයන්ටද ලබා ගැනීමේ අරමුණින් වෘත්තීය සමිති නායකයන් විසින් විවිධ විරෝධතා සහ වෘත්තීය අරගළ ආරම්භ කිරීම මෙරට සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමවේදය පිළිබඳව වූ ඓතිහාසික පසු බිම සැලකිල්ලට ගැනීමේ දී පෙනී යන වැදගත් කරුණක්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Order, please! තේරීම් කාරක සභාවේ රැස්වීමක් දැන් පැවැත්වෙනවා. සභික මන්ත්‍රීවරුන් ඒ සඳහා සහභාගි වෙන්න. මේ අවස්ථාවේ දී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.

අතන්පිරකු, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] *தலைமை வகித்தார்கள்.*

Whereupon MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *took the Chair.*

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කථා කරන්න, ගරු ඇමතිතුමා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙකී විරෝධතා සහ අරගළවල ප්‍රතිඵලයක් වශයෙන් 1944 වර්ෂයේ දී ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස් මහතාගේ ප්‍රධානත්වයෙන් සමාජ සේවා කොමිෂන් සභාව පත් කරන්නට යෙදුණා. මෙම කොමිෂන් සභාව විසින් 1947 වර්ෂයේදී එළි දක්වන ලද වාර්තාවට අනුව ලංකාවේ සේවා නියුක්ත ප්‍රජාව සඳහා විවිධ වූ සමාජ ආරක්ෂණ උපාය මාර්ගයන් නිර්දේශ කරන ලද අතර ඉන් එක නිර්දේශයක් වූයේ සේවක - සේව්‍ය දෙපාර්ශ්වය විසින් දායක වන්නා වූ ජාතික මට්ටමේ අර්ථ සාධක අරමුදලක් රැකියාවන්හි නියුක්ත වූ සමස්ත ප්‍රජාව වෙනුවෙන් බිහි කළ යුතුය යන්නයි. එම නිර්දේශයට අනුව සේවා නියුක්තිකයන්ට අනිවාර්ය වූ සේවක - සේව්‍ය දෙපාර්ශ්වය දායක වන්නා වූ අරමුදල් ලෙස 1958 දී ක්‍රියාත්මක කරන ලද මෙම අරමුදල 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත මගින් නීතිගත කර සංස්ථාගත කරන ලදී. මේ අවධියේ දී කම්කරු අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරන ලද්දේ ටී.බී. ඉලංගරත්න මැතිතුමායි. පසු කාලීනව 2008 වසරේ දී සේවක අර්ථ සාධක අරමුදලට වසර 50ක් පිරීම නිමිති කොටගෙන මෙම රෙගුලාසිවල ඇතුළත් වන්නා වූ සියයට 30ක පූර්ව ප්‍රතිලාභ ක්‍රමය යෝජනා කරන ලද්දේ එවකට කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍ය ගරු අතාවුද සෙනෙවිරත්න මැතිතුමන් බව මම ස්තුතිපූර්වකව මේ අවස්ථාවේදී සඳහන් කරනවා.

ඒ සමගම 2012 අංක 2 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත සම්මත කර ගැනීම සහ ඊට අදාළ රෙගුලාසි ගැසට් කිරීම සඳහා මූලිකව කටයුතු කරන ලද්දේ හිටපු කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ මැතිතුමා බවත් මම ස්තුතිපූර්වක මේ අවස්ථාවේ සඳහන් කරන්නට කැමැතියි. සේව්‍ය-සේවක දෙපාර්ශ්වයේ අන්‍යෝන්‍ය සහයෝගීතාව ඇතිව විනිවිදභාවයෙන් හා වගකීමෙන් යුතුව එම අරමුදලෙහි පරිපාලන කටයුතු කම්කරු දෙපාර්තමේන්තුව මඟින් හා මූල්‍ය කළමනාකරණ සහ ශ්‍රී ලංකා මහ බැංකුව මඟින්ද ක්‍රියාත්මක කිරීම තුළින් ශ්‍රී ලංකාව තුළ පිහිටුවා ඇති විශාලතම සමාජ ආරක්ෂණ අරමුදල බවට සේවක අර්ථ සාධක අරමුදල පත්ව තිබෙනවා. වර්තමානය වන විට සේවක අර්ථ සාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම් කටයුතු විමධ්‍යගත කිරීම තුළින් සාමාජිකයින් හට ප්‍රතිලාභ ලබා ගැනීම වඩාත් පහසු කොට ඇති අතර අරමුදලේ සාමාජිකයන් නැවත ලියා පදිංචි කිරීමේ ක්‍රමවේදය යටතේ ප්‍රතිලාභින් නිවැරැදිව හඳුනා ගැනීමටත්, ප්‍රතිලාභ ගෙවීමේ දී සිදු විය හැකි අපහසුතාවන් අවම කර ගැනීමටත් හැකි වාතාවරණයක් උදා කර ගැනීමට කටයුතු සිදු කරමින් පවතිනවා.

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනත සඳහා 1970, 1971, 1975, 1981, 1985, 1988 සහ 1992 යන වර්ෂවලදී සංශෝධනයන් සිදු කරන්නට යෙදුණු අතර, සියයට 30ක පූර්ව ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමයක් හඳුන්වා දීමේ අරමුණින් 2012 අංක 2 දරන සේවක අර්ථසාධක අරමුදල (සංශෝධන) පනත සම්මත කර ගැනීමට හැකි වීම සුවිශේෂී සන්ධිස්ථානයක් වශයෙන් අපි සලකනු ලබනවා. එම අරමුදලට වසර 50ක් පිරීම නිමිත්තෙන් මෙම සංශෝධන සිදු කරන ලද අතර, මෙමඟින් සාමාජිකයන් හට නව ප්‍රතිලාභ ලබා දීමේ ක්‍රමයක් ලෙස මෙම පූර්ව විශ්‍රාම ප්‍රතිලාභ ක්‍රමය හඳුන්වා දී තිබෙනවා.

සේවක අර්ථ සාධක අරමුදල යටතේ සේවාන්ත ප්‍රතිලාභ ගෙවීමට අමතරව නිවාස අරමුණු යටතේ සාමාජිකයන්ට නිවාස කාර්යන් සඳහා ණය මුදල් ලබා දීම දැනට සිදු කරන අතර, එවන් අරමුණු තවදුරටත් ව්‍යාප්ත කරමින් සාමාජිකයන් හට සේවා නියුක්තිය අතරතුර සිය ගිණුමෙහි තැන්පතුවලින් සියයට 30ක ප්‍රතිශතයක් ප්‍රතිලාභ වශයෙන් නිවාස කාර්ය සහ වෛද්‍ය ප්‍රතිකාර කාර්ය සඳහා හිමිකම් දැරීමට හැකි වන පරිදි මෙම සේවක අර්ථසාධක අරමුදල පනත සංශෝධනය කර තිබෙනවා. මේ ආකාරයට සේවකයන් 50කට වැඩි සංඛ්‍යාවක් සේවයේ යොදවන ලද ආයතන සඳහා විද්‍යුත් මාර්ගයෙන් දායක මුදල් එවීමට අවශ්‍ය නීති ප්‍රතිපාදන සලසා දී තිබෙනවා.

සේවක අර්ථ සාධක අරමුදල සඳහා ගොඩනැඟිල්ලක් ඉදි කිරීම පිණිස ප්‍රතිපාදන ලබා ගැනීමටද අවස්ථාව සලසා දී තිබෙනවා. ඊට අදාළ රෙගුලාසි 2013 මැයි මස 13 දිනැති අති

විශේෂ ගැසට් පත්‍රයෙන් ඉදිරිපත් කර තිබෙනවා. නමුත් ඒ සඳහා මේ දක්වා ගරු සභාවේ අනුමැතිය ලබා ගැනීමට නොහැකි වී තිබූ නිසා ප්‍රමාද වී හෝ මෙම කාර්ය ඉටු කිරීමට ලැබීම පිළිබඳව සතුට ප්‍රකාශ කරන්නට පුළුවන්. මෙම රෙගුලාසි අනුව සහ 2012 අංක 2 දරන සේවක අර්ථසාධක අරමුදල (සංශෝධන) පනත ප්‍රකාරව නිවාස කාර්ය සඳහා ප්‍රතිලාභ නිකුත් කිරීමේ දී සාමාජිකයාට අයත් ඉඩමක නිවසක් ඉදි කිරීම, නිවාසයක් ඉදි කිරීම සඳහා ඉඩමක් මිලදී ගැනීම, නිවාස දේපොළක් මිලදී ගැනීම, නිවාස දේපොළක් මත ඇති උකසක් බේරුම් කිරීම හෝ අනුමත බැංකුවකින් ලබා ගත් නිවාස ණයක ඉතිරි මුදල බේරුම් කිරීම යන කරුණු සඳහා අවස්ථාව සලසා දී තිබෙනවා. මේ දක්වා ඉහත ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වූයේ සේවක අර්ථ සාධක අරමුදල ඇපයට තබා බැංකු මඟින් ණය ලබා දෙන්නා වූ ක්‍රමයක් වශයෙනි.

මෙම ක්‍රමය මඟින් කිසියම් සාමාජිකයකු ණය නොගෙවූ අවස්ථාවකදී ණයට අදාළ පොලියට අමතරව දඩ මුදලක් ගෙවීමට සාමාජිකයන්ට සිදු වෙනවා. එම තත්ත්වය මඟ හැර කිසියම් සාමාජිකයකු විශ්‍රාම වයසට එළැඹීමට පෙර, එනම් පනතේ සඳහන් ලෙස කාන්තාවක් නම් වයස අවුරුදු 50 සහ පිරිමි අයෙකු නම් වයස අවුරුදු 55 වීමට පෙර ප්‍රතිලාභ මුදලින් සියයට 30ක කොටසක් ලබා ගැනීමට අවස්ථාව එළැඹිලා තිබෙනවා.

මෙම සංශෝධන පනත මඟින් වෛද්‍ය පහසුකම් සඳහා සියයට 30ක පූර්ව ප්‍රතිලාභ ලබා ගැනීමට සාමාජිකයාට මෙන්ම සාමාජිකයාගේ කලත්‍රයාට සහ දූ දරුවන්ට අවස්ථාව සැලසෙනවා. එහිදී හෘදය සැත්කම් -by-pass- ඇතුළු පිළිකා සැත්කම්, caesarean සැත්කම්, අනතුරක් සිදු වීම හේතු කොටගෙන දින 14කට නොඅඩු කාලයක් ගත වීම යන කරුණු ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ඉඩ කඩ සලසා දෙන අවස්ථාවන් ලෙස සැලකෙනවා.

2012 අංක 2 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත අනුව පහත සඳහන් කරුණු තුන සපුරන්නේ නම් සියයට 30ක ප්‍රතිලාභ ලබා ගැනීමට සාමාජිකයකු හෝ සාමාජිකාවක සුදුසුකම් ලබනවා.

1. සාමාජිකයාගේ සේවා කාලය වසර 10ක් වීම.
2. ගිණුමේ ශේෂය රුපියල් ලක්ෂ 3කට වැඩි වීම.
3. දැනට සේවයේ නියුක්ත සාමාජිකයකු වීම.

   එසේ අවශ්‍යතා සපුරන සාමාජිකයකුට රුපියල් මිලියන 2ක උපරිමයකට යටත්ව ප්‍රතිලාභ ලබා ගැනීමට අවස්ථාව සැලසෙනවා.

ඉහත දැක්වූ සංශෝධන පනතේ මෙම රෙගුලාසි ක්‍රියාත්මක කිරීමට අදාළ පෝරම සහ අනෙකුත් අවශ්‍ය ලේඛන පිළිබඳ කරුණු දක්වා තිබෙනවා. සේවක අර්ථසාධක අරමුදල් පනත අනුව ඉංග්‍රීසි හෝඩියේ "A" සිට "R" දක්වා ආකෘති පත්‍ර හඳුන්වා දී ඇති අතර, මෙම රෙගුලාසි සංශෝධනය මඟින් ප්‍රතිලාභ ලබා ගැනීමට අදාළ ආකෘති පත්‍රය "S" යනුවෙන් හඳුන්වා දෙනවා. තවද නිවාස දේපළ හෝ වෛද්‍ය හේතු මත ප්‍රතිලාභ ලබා ගැනීමේදී ඉදිරිපත් කළ යුතු අනෙකුත් ලේඛන විස්තරත් ඇතුළත් වෙනවා. විද්‍යුත් මාධ්‍ය මඟින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත දායක මුදල් එවීමට ඉංග්‍රීසි "EM" ආකෘති පත්‍රද, සේවා යෝජකයන් ලියා පදිංචි කිරීමට අදාළව ඉංග්‍රීසි "D" ආකෘති පත්‍රයද ඉදිරිපත් කළ යුතුව තිබෙනවා.

සාමාජිකයන්ගේ ඇඟිලි සලකුණු විද්‍යුත් මාර්ගයෙන් ලබා ගැනීමට අවශ්‍ය රෙගුලාසි යටතේ ජාතික හැඳුනුම්පත් අංකය සේවක අර්ථ සාධක අරමුදල් අංකය බවට පත් කිරීමටත් අදහස් කර තිබෙනවා. ජාතික හැඳුනුම්පත් අංකය නොමැති අවස්ථාවකදී සාමාජික අංකයක් ලබා දීමට අවශ්‍ය රෙගුලාසි පැනවීමට කම්කරු කොමසාරිස් ජනරාල්වරයාට මේ මඟින් බලය ලැබෙනවා.

නිවසක් ඉදි කිරීම සඳහා ඉඩමක් මිලදී ගැනීම සඳහා හෝ නිවසක් මිලදී ගැනීම සඳහා කටයුතු කිරීමේදී සේවා නියුක්තිකයාගේ නමින් පවතින ඉඩමේ හිමිකම් ඔප්පුව, අදාළ ප්‍රාදේශීය සභාව හෝ පළාත් පාලන ආයතනය විසින් අනුමත කරන ලද ඉදි කිරීමට නියමිත නිවසේ සැලසුම, ඉඩමේ අයිතිය තහවුරු කරමින් ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකුගෙන් ලබා ගන්නා සහතික පත්‍රයක්, සේවා නියුක්තිකයා ඉඩමේ හෝ නිවසේ අයිතිකරු නොවේ නම්, ඉඩම හෝ නිවස සේවා නියුක්තිකයාට විකිණීමට තමා කැමැති බවට විකුණුම්කරුගෙන් කැමැත්ත ලබා ගන්නා ලද ලිපියක්, ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද ඉඩම හෝ නිවස පිළිබඳ සේවා නියුක්තිකයාගේ හෝ විකුණුම්කරුගේ හිමිකම් ඔප්පුවේ පිටපතක්, හිමිකම් වාර්තාව සහ පෙළපත් සටහන ඉදිරිපත් කළ යුතුව තිබෙනවා.

නිවාස දේපලක් උකස්කරයකින් නිදහස් කර ගැනීම සඳහා උකස් ඔප්පුව, උකස්කරයේ වටිනාකම සහ ගෙවිය යුතු හිඟ මුදල, අදාළ බැංකු කළමනාකරු විසින් සහතික කරන ලද ගෙවිය යුතු හිඟ මුදල යනාදී දත්තයන් ලබා දීමට නියමිතව තිබෙනවා. අනුමත බැංකුවකින් ලබා ගත් නිවාස ණය මුදලක් ගෙවා නිම කිරීම සඳහා සේවා නියුක්තිකයා විසින් ලබා ගත් නිවාස ණය මුදල පිළිබඳ බැංකු කළමනාකරුගේ සහතික සහ අදාළ බැංකු කළමනාකරුගෙන් ණය මුදලක් වශයෙන් ලබා ගත් මුදල පිළිබඳ සහතිකය සහ අදාළ බැංකු කළමනාකරු විසින් සහතික කරන ලද ගෙවිය යුතු හිඟ මුදල ඉදිරිපත් කිරීමට නියමිතයි.

රජයේ රෝහලක සෞඛ්‍ය අධිකාරිගෙන් හෝ ඔහු විසින් බලය පවරා දෙන ලද යම් නිලධරයෙකුගෙන් ලබා ගන්නා සහතිකය හෝ පෞද්ගලික රෝහලක පරිපාලන කළමනාකරුගේ ලිපියක්ද සමඟ සේවක අර්ථ සාධක අරමුදලේ සාමාජිකයා, ඔහුගේ හෝ ඇයගේ කලත්‍රයා හෝ ළමුන් සඳහා ප්‍රතිකාර ලබා දුන් වෛද්‍යවරයාගේ සහතිකය ලබා දීම මඟින් වෛද්‍ය ප්‍රතිකාර සඳහා පහසුකම් ලබා ගත හැකිව තිබෙනවා.

මෙම රෙගුලාසි අනුමත කර ගැනීම මඟින් අපේක්ෂා කරනුයේ 2015 වර්ෂයේ අතුරු අය වැය මඟින් ප්‍රකාශිත පරිදි 2012 අංක 2 දරන සේවක අර්ථසාධක අරමුදල් සංශෝධන පනතින් හඳුන්වා දුන් පෙර සඳහන් කළ පූර්ව ප්‍රතිලාභ ක්‍රමය ක්‍රියාත්මක තත්ත්වයකට පත් කිරීමයි. ක්‍රියාත්මක තත්ත්වයේදී අවශ්‍ය වන්නා වූ ආකෘති පත්‍ර වැනි විස්තරාත්මක කරුණු, රෙගුලාසි මඟින් මෙම ගරු සභාවේ අනුමැතියට ඉදිරිපත් කර තිබෙනවා. මෙම රෙගුලාසි අනුමත කර අදාළ මානව සම්පත් සහ අනෙකුත් පහසුකම් කම්කරු දෙපාර්තමේන්තුව වෙත හා ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමට යම් කාලයක් ගත වනවා. ඉන් පසුව මෙම පනතේ සඳහන් ආකාරයට, සාමාජිකයන්ට සියයට 30ක උපරිම මුදලකට යටත්ව විශ්‍රාම කාලයට පෙර නිවාස අරමුණු සහ වෛද්‍ය ප්‍රතිකාර අරමුණු සඳහා ප්‍රතිලාභ ලබා ගැනීමට හැකියාව ලැබෙනවා. සාමාජිකයන්ට ප්‍රතිලාභ අත්වීම මඟින් ඔවුන් සේවක අර්ථ සාධක අරමුදල වෙත දක්වන බැඳීම තව තවත් පුළුල් වී, සේවක අර්ථ සාධක අරමුදලේ සාමාජිකයන් සංඛ්‍යාව මෙන්ම, මාසිකව එම අරමුදලට ලැබෙන දායක මුදල් ප්‍රමාණය ඉහළ යනු ඇතැයි බලාපොරොත්තු වෙනවා. ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

[අ.භා. 2.50]

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණ හා කම්කරු සබඳතා ඇමතිතුමා මෙම නියෝග ඉදිරිපත් කිරීම පිළිබඳව එතුමන්ට මගේ ගෞරවය සහ ස්තුතිය පුද කරනවා.

[ගරු ගාමිණී ලොකුගේ මහතා]

මෙය ඉතාම වැදගත් කටයුත්තක් හැටියටයි අපි සලකන්නේ. මේ අරමුණට එන්නට කාරණා කිහිපයක් මුල් වුණා. 1956 වසරේ සේවක අර්ථ සාධක අරමුදල ආරම්භ කළා. එහි විවිධ අංග තිබුණා.

සේවක අර්ථ සාධක අරමුදලින් සමාගම්වලට පෞද්ගලික අරමුදල් පවත්වා ගෙන යන්න පුළුවන්කම තිබුණා. ඒ නිසා මේ මුදල විවිධාකාරයෙන් බෙදිලා ගිහින් තිබුණා. හිටපු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා කම්කරු ඇමතිවරයා වශයෙන් කටයුතු කළ කාලයේදී නියෝගයක් කළා, මීට පස්සේ හැම අර්ථ සාධක මුදලක්ම ප්‍රධාන අරමුදලට එන්න ඕනෑය කියා. ඒ නිසා අර්ථ සාධක අරමුදල අද මේ රටේ තිබෙන ප්‍රධානම අරමුදල බවට පත් වෙලා තිබෙනවා. එහි වටිනාකම රුපියල් ට්‍රිලියන තුනකට වඩා වැඩි වෙලා තිබෙනවා. අද අර්ථ සාධක අරමුදලේ සාමාජිකයන්ට තමන්ගේ සාමාජික මුදල පිළිබඳව විශ්වාසයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මතකයි, මම කම්කරු හා කම්කරු සබඳතා ඇමතිවරයා වශයෙන් කටයුතු කළ කාලයේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය තුළ මේ වාගේ විශාල ප්‍රශ්නයක් ඇති වුණු ආකාරය. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ තමයි සේවක අර්ථසාධක අරමුදල තිබුණේ. ඒ අයගේ පාරිතෝෂික ගෙවීම්, අර්ථ සාධක මුදල් ආපසු ගෙවීම් පිළිබඳව ලොකු ගැටලුවක් මතු වෙලා, ඒ අරමුදල අපේ අමාත්‍යාංශයට පවරා ගෙන, ඒ දේවල් නිරවුල් කිරීමේ කටයුතු කරන්න අපට සිද්ධ වුණා. මා හිතන හැටියට ඒ කටයුත්ත තවත් ටිකක් නිරවුල් කරන්න තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම තවත් ප්‍රශ්නයක් මතු වුණා. මේ අර්ථ සාධක අරමුදල උකසට තියලා නිවසක් ගන්න ණයක් ගන්න පුළුවන්කම තිබුණා. ඒ ණය මුදල ගැනීමේදී අප දැකපු, අහපු කාරණයක් තිබුණා. ඒ අරමුදලේ මුදල් නොගෙවීම නිසා, සේවකයන් ඒකේ වාරික නොගෙවීම නිසා විශ්‍රාම යන දවසට එයාට සතයක්වත් ඉතුරු වන්නේ නැහැ; දඩ පොලියයි, පොලියයි ගත්තාම විශ්‍රාම යන කොට අර්ථ සාධක අරමුදලේ සතයක්වත් ඉතුරු වන්නේ නැති තත්ත්වයකට පත් වුණා. අද වුණත් ඒ බැංකුවලින් ගත්ත ණයවලට අරමුදලේ මුදල්වලින් රුපියල් මිලියන හත්සීය, අටසීය මාස්පතා ඒ බැංකුවලට ගෙවන තත්ත්වයක් තිබෙනවා. මේ කාරණාව දැකපු හිටපු කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍ය ආතාවුද සෙනෙවිරත්න මැතිතුමා මෙහෙම යෝජනාවක් කළා. ඒක තමයි, "ඒ අයගේ අවශ්‍යතාව සලකා සියයට 30ක මුදලක් අපි අරගෙන දෙමු, එතකොට එයා විශ්‍රාම යන දවසට සියයට 70ක මුදලක් එයාගේ ගිණුමේ ඉතුරු වෙනවා" කියන යෝජනාව. ඒ අනුව තමයි මේ පනත ගෙනාවේ.

මම කම්කරු හා කම්කරු සබඳතා ඇමතිවරයා වෙනකොට ඒ යෝජනාව ක්‍රියාත්මක වෙමින් තිබුණා. මම ඒ ඉතිරි කටයුත්ත කරලා ගැසට් කරන තත්ත්වයට ගෙනාවා. එතැනදී අපට ලොකු ගැටලුවක් මතු වුණා. ඒ අරමුදලේ මුදල් ගන්න නම් එයාට ලක්ෂ තුනක උපරිමයක් තියෙන්න ඕනෑ. ඒක විශාල වශයෙන් බලපාන්නේ වතු සමාගම්වලට; වතුවල වැඩ කරන අයටයි. ඒ නිසා ඒකට පිළියමක් හැටියට අප කල්පනා කළා, කෙනෙක් තුන් හතර පොළක වැඩ කළත්, ඒ එන මුදල් එක ගිණුමකට බැර කරන්න. එතකොට එයාගෙන් ලක්ෂ තුනකට වැඩිය අරමුදලට එකතු වෙනවා. එයාගේ identity card number එක අනුව එයා වැඩ කරපු හැම සමාගමකම තිබෙන ගිණුම් පහ, හය එක ගිණුමකට එන විධියේ ක්‍රමයක් අප ඇති කළා. ඒ මුදල් එක ගිණුමකට ආවාම එයා මේ ණය මුදල -සියයට තිහ- ගැනීමේ අවස්ථාවට ඇතුළු වෙනවා. ඒක වැඩියෙන්ම බලපාන්නේ වතු ක්ෂේත්‍රයේ කුඩා රැකියා කරන අයටයි. සමහර වෙලාවට කෙනෙක් බේකරියක වැඩ කරන්න පුළුවන්; තව අවුරුදු තුනක් වත්තක වැඩ කරන්න පුළුවන්. ඒ විධියට ඔවුන් විවිධ තැන්වල වැඩ කරලා සමහර වෙලාවට ගිණුම් පහක්, හයක් තිබෙනවා. අන්න ඒක අපට හරියට කරගන්න බැරි වුණු නිසා තමයි, මේ නියෝග ඉදිරිපත් කරන්න බැරි වුණේ. නැත්නම් මේවා ඉදිරිපත් කළ යුතු නියෝග.

ගරු ඇමතිතුමනි, අතිරේක අය වැය සම්මත කරලා මෙම නියෝග ඉදිරිපත් කිරීම අප ඉතාම වැදගත් කටයුත්තක් හැටියට සලකනවා වාගේම, ඒ ගැන මා තමුන්නාන්සේට ස්තුති කරනවා. අප ඒකට සහයෝගය දෙනවා කියාත් මා මේ අවස්ථාවේදී කියන්න ඕනෑ.

මෙම අමාත්‍යාංශයේ තව ප්‍රශ්න කීපයක් තිබෙනවා. අප ඒවා විසඳීමේ මූලික කටයුතු ආරම්භ කර තමයි තිබුණේ. මේ අමාත්‍යාංශයට ඇවිත් කවුරු හෝ පැමිණිල්ලක් කළොත්, ඒ පැමිණිල්ලට මොකද වන්නේ කියන එක එයාට කන්තෝරුවට ඇවිත් මිසක් සොයා බලන්න පුළුවන්කමක් නැහැ. ඇමෙරිකාවේ Labour Department එකත් සමඟ සාකච්ඡා කළාම ඒ අය අපට LISA කියා programme එකක් හදලා දුන්නා. අපේ අමාත්‍යාංශයේ හුඟක් නිලධාරින් ඒකට පුහුණු කළා. තවත් පුහුණු වෙන්න තිබෙනවා. ඒ හැමෝටම - කම්කරු නිලධාරින්ටත්, කම්කරු කාර්යාලයටත්- අප tablet එකක් දුන්නා. එතකොට එයා tablet එකේ පැමිණිල්ල ලිව්වාම, එතැන් සිට ඒ පැමිණිල්ල කොහේටද යන්නේ කියා පැමිණිලිකරුට website එක හරහා බලා ගන්න පුළුවන්. ඒක අප ආරම්භ කළා විතරයි.

ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේ හොඳට ප්‍රගුණ කර ඒ කටයුත්ත කළොත්, එයින් මේ රටේ සමස්ත වැඩ කරන පන්තියටම ප්‍රයෝජනයක් වෙයි කියා මා විශ්වාස කරනවා.

එය monitor කරන්න පුළුවන්. අපි ගිහින් කර්මාන්තශාලාවක් පරීක්ෂා කළාම ඒ සම්බන්ධයෙන් notes වෙබ්සයිට් එකට දමන්න ඕනෑ. එතකොට තමුන්නාන්සේටත්, මටත්, රටේ ඕනෑම කෙනකුටත් බලන්න පුළුවන්, එදා ඒ නිලධාරි මහත්මයා කර්මාන්තශාලාව පරීක්ෂා කරලා ඒ note එක කොහොමද දමලා තිබෙන්නේ කියා. ඊට පස්සේ ඒකෙන් ඇති වන ගැටලු, ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරන්නේ කොහොමද කියා කන්තෝරුවට එන්නේ නැතුව එළියේ ඉඳ ගෙන බලන්න පුළුවන්. ඒ කටයුත්ත ආරම්භ කළා විතරයි. මා හිතන හැටියට මා ඒ අමාත්‍යාංශය භාර දීලා එන කොට ඒ නිලධාරින් සියලුදෙනාටම tablets භාර දීලායි තිබුණේ. එදා පිළිගැනීමේ කථාවේදී මා කිව්වා, ඒක ශක්තිමත් කළොත් මේ රටේ වැඩ කරන පන්තියට, ආරවුල් තිබෙන උදවියට, විවිධ උදවියට කන්තෝරුවේ රස්තියාදු නොවී තමන්ගේ පැමිණිල්ල පිළිබඳව ගන්නා ක්‍රියා මාර්ග මොනවාද කියා බලන්න පුළුවන් කියා.

විවිධ ගැටලුවලට පැමිණිලි කරනවා. ඒ පැමිණිල්ල කරපු කෙනා අපේ කන්තෝරුවට ආවේ නැත්නම්, ඔහුට ලිපියක් ලැබුණේ නැත්නම් ඔහු දන්නේ නැහැ, මොකක්ද වෙන්නේ කියා. අංශ ප්‍රධානියාටත් වෙබ්සයිට් එක බලා ඒ කටයුත්ත කරන්න පුළුවන්. මොකද, මේ අමාත්‍යාංශය යටතේ තමයි සේවක අර්ථ සාධක අරමුදල තිබෙන්නේ.

අපි බැංකුවක ගිණුමක් විවෘත කළොත්, බැංකුවේ කළමනාකරුට telephone කර අපේ ගිණුමේ තැන්පතු ප්‍රමාණය කොපමණද කියා දැන ගන්න පුළුවන්. නමුත් වාර්ෂිකව Central Bank එකේ notice එක ලැබුණේ නැත්නම් අපේ සේවක අර්ථ සාධක අරමුදලේ තැන්පතු ප්‍රමාණය කොපමණද කියා බලන්න පුළුවන්කමක් නැහැ. ඇඟිලි mark එක තබා බලන ක්‍රමය ඇති වුණොත් ඔහුට බලන්න පුළුවන්, ඔහුගේ ගිණුමේ දැන් කොපමණ මුදල් තිබෙනවාද කියා. ගිය මාසයේ තමන්ගේ ගිණුමට මුදල් බැර වුණාද කියා බලන්න පුළුවන්. ඒ ක්‍රමය තවමත් හරියටම සාර්ථක වෙලා නැහැ. හැමදෙනාම සාමාජිකයන් වෙලා නැහැ. ඒ නිසා

තමයි අපි උත්සාහ කළේ ඒ ක්‍රමය ක්‍රියාත්මක කරන්න. ඇමතිතුමනි, තමුන්නාන්සේ මේක දෙන්න ගියත් එක කොටසකට මේ ගැටලුව මතු වෙනවා. එම නිසා ඒ කටයුතු ඉක්මනින් කරන්න කියලා මා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා. මේක හොඳ කටයුත්තක්; කළ යුතු කටයුත්තක්. අතාවුද සෙනෙවිරත්න මැතිතුමා තමයි මේ කාරණාව ඉදිරිපත් කළේ.

මෙහි ගැටලුවලට අපි විවිධාකාර වැඩ පිළිවෙළ ඇති කළා. ගරු ඇමතිතුමනි, මා විශ්වාස කරනවා, තමුන්නාන්සේ ඊටත් වඩා ශක්තිමත්ව මේ වැඩ පිළිවෙළ ඇති කර වැඩ කරන ජනතාවට, ශ්‍රම බලකායට පහසුකම් ලබා දෙයි කියා. එහෙම නැති වුණොත් ලිපි ගොනු විශාල වශයෙන් එකතු වෙනවා. මා බදාදා දින ජනතාව මුණ ගැහෙනවා. එවැනි අවස්ථාවකදී අවුරුදු 20ක් පරණ ලිපි ගොනුවක් මට ලැබුණා. ඒ මනුෂ්‍යයා මට ලිපියක් එවා තිබුණා, "මා දැන් විශ්‍රාම ගිහිල්ලාත් අවුරුදු 15ක් වෙනවා. මගේ පැමිණිල්ල තවම විභාග කර නැහැ" කියා. සොයා බැලුවාම ඒක ඇත්ත බව පෙනුණා. ඒ ලිපි ගොනුව කාර්යාලයේ තිබුණා. ඊට පස්සේ ඒ කාර්යාලයේ කෙනෙක් අල්ලස් ගැනීමේ හේතුව මත අල්ලා ගෙන යනවා මා දැක්කා. එවැනි සිදු වීම් තිබෙනවා. බදාදා දිනයට මහ ජනයා මුණ ගැසීමෙන් මා හුඟක් දේවල් ඉගෙන ගත්තා. කම්කරු කාර්යාලවල කම්කරු නිලධාරින්ගේ විවිධ ප්‍රශ්න පිළිබඳව දැන ගත්තා. අද මේ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කරන කොට අපටත් සතුටක් ඇති වනවා. මොකද, ඒ තුළින් වැඩ කරන පන්තියට සහායක් දෙන්න පුළුවන්.

ගරු ඇමතිතුමනි, ඒ එක්කම තමුන්නාන්සේට තව කාරණයක් කියන්න ඕනෑ. නිවාස ණය ගන්න අයගෙන් සියයට 30ක්, 40ක් ගෙදර යන්නේ ශතයක්වත් නැතුවයි. මොකද, වාරික මුදල් ගෙවේවේ නැත්නම්, ඒ ගිවිසුමට අනුව බැංකුවට බලය තිබෙනවා, ඒ සම්පූර්ණ මුදල් compound interest එකත් එක්ක අයකර ගන්න. මේ සියයට 30 අරගෙන ඒක බේරන්න මේ අයව උනන්දු කරවන්න පුළුවන් නම්, ඒ අය ගෙදර යන කොට අපි බලාපොරොත්තු වන අරමුණත් ඉෂ්ට වෙනවා, ඒ අයට යම්කිසි මුදලක් අතේ තබා ගෙන යන්නත් පුළුවන් වෙනවා. තමුන්නාන්සේ statistics අරගෙන බැලුවොත් පෙනෙයි, සියයට 20ක්, 30ක් තවමත් විශ්‍රාම යන්නේ සේවක අර්ථ සාධක අරමුදල ඇපයට තබා ගත්ත ණය මුදල කැපුවාට පස්සේ බොහොම සොච්චම් විශ්‍රාම වැටුපක් අරගෙනයි කියා. ඒ ගැනත් තමුන්නාන්සේගේ අවධානය යොමු කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

සේවක අර්ථ සාධක අරමුදල් නොගෙවීම නිසා සිතාසි භාර දෙන්න බැරුව වරෙන්තු කළ රවි වෙත්තසිංහ නමැති ප්‍රධානියෙක් සිටියා. මා හිතන හැටියට ඔහුට වරෙන්තු කරපු නඩු 10ක් හෝ 15ක් තිබෙනවා. වෙනත් ගනුදෙනුවකට ඔහුව අත් අඩංගුවට ගෙන remand කර තිබෙන බව මා දැක්කා. එහෙම නම් දැන් මේ නඩු ටිකටත් ඔහුට සිතාසි භාර දීලා ඒ කටයුතුත් කරන්න පුළුවන් වෙනවා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

මේ සම්බන්ධයෙන් තමයි ඔහුව අත් අඩංගුවට ගෙන තිබෙන්නේ.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)

නැහැ, නැහැ. ඒකට නොවෙයි, අත් අඩංගුවට ගෙන තිබෙන්නේ. [බාධා කිරීමක්] ඉස්සෙල්ලා ඉඩමක ප්‍රශ්නයක් තිබුණේ. අපි කිහිප අවස්ථාවකදීම උත්සාහ කළා. විවිධ passport වලින් ඇවිල්ලා යනවා ලු.

නමුත් වෙත්තසිංහ නොවෙයි යන්නේ. [බාධා කිරීමක්] ඒක හොඳයි, එහෙම අත් අඩංගුවට ගත්තා නම් හොඳයි. [බාධා කිරීමක්] එහෙම අත් අඩංගුවට ගත්තා නම් හොඳයි. මොකද, විශාල මුදලක් අය කර ගැනීමට තිබෙනවා. CTB එක වාගේ ආයතනවලට පොඩි ගණනක් නොවෙයි විශාල මුදලක් අය කර ගැනීමට තිබෙනවා. මේ කාරණය දැක්කාම මට හිතුණා අද ඒ ගැන මතක් කරන්නට ඕනෑ කියලා. මම පත්තරේ දැක්කේ ඉඩම් ගනු දෙනුවකට අත් අඩංගුවට ගත්තා කියලායි. [බාධා කිරීමක්] ඔව්, 150ටත් වැඩියි, overdue interest වාගේ ඒවාත් සමඟ ඊටත් වඩා වැඩියි. ඒ ගන්න තිබෙන සමහර මිනිසුන් දැන් මැරිලා. මේ කටයුතු පිළිබඳව අපි සතුටු වෙනවා. මම මීට වැඩිය කථා කරන්නට යන්නේ නැහැ. නමුත් මම තව එක කාරණයක් තමුන්නාන්සේලාට මතක් කරන්නට ඕනෑ.

තමුන්නාන්සේලා යහ පාලනය පටන් ගත්තාට පසුව, හුඟාක් ආයතනවල සේවකයින්ට විවිධ ප්‍රශ්න තිබෙනවා. මට අද උදේ දැන ගන්නට ලැබුණා දුම්රිය දෙපාර්තමේන්තුවට තාක්ෂණ සහායක කියලා කාන්තාවන් -සේවකයින්- ගණනාවක් අරගෙන තිබෙන බව. ඒ අය ස්ථිර සේවකයින්. දැන් ඒ අයව කොළඹින් මාරු කරලා එක එක railway stationsවල වැසිකිළි සෝදන්නට දාලා; සමහර තැන්වල පාර හරහා තිබෙන පොල්ල උස්සන්නට දාලා. මම හිතන විධියට ඒවා සාධාරණ දේවල් නොවෙයි. විනිවිද භාවය තිබෙන විධියට කටයුතු කරන්නට ඕනෑ. ඒ වාගේම මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයින් 162කට ප්‍රශ්නයක් තිබෙනවා. [බාධා කිරීමක්] නැහැ, මම ඒගොල්ලන්ට කිව්වා, කම්කරු ආරවුල් හැටියට තමුන්නාන්සේලාට පැමිණිලි කරන්න කියලා. [බාධා කිරීමක්] මම ඒ ලැයිස්තුව දෙන්නම්. අපි ඒ පිළිබඳ ලැයිස්තුවක් සකස් කරනවා. මම ඒක තමුන්නාන්සේට දෙන්නම්.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයින් 162 ක් terminate කරන්න, -සේවය අවසන් කරන්න- ලිපි ගහනවා. මේ සිකුරාදා ඒ අයගේ සේවය අවසන් වෙනවා. අපි එන විට ඒ පිරිස මේ පාරේ පිකටින් කර කර සිටියේ. මම ඉල්ලීමක් කරනවා, මේ සේවකයින් 162 terminate කරන්නේ නැතිව තව මාස 3ක් පමණ යන්න ඇරලා, විධිමත්ව පත්වීම් ලබා දීලා නැත්නම් ඒ ගැන පරීක්ෂණයක් කරන්න කියලා. එහෙම නැතිව එක පාරටම terminate කළාම ඒ අයට යැපීම් මාර්ගයක් නැතිව යනවා.

ගරු සුජීව සේනසිංහ මහතා (අධිකරණ හා කම්කරු සබඳතා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சுஜீவ சேனசிங்க - நீதி மற்றும் தொழில் உறவுகள் பிரதி அமைச்சர்)
(The Hon. Sujeewa Senasinghe - Deputy Minister of Justice and Labour Relations)

ගරු මන්ත්‍රීතුමා, ඒ උද්ඝෝෂණය කළේ බැංකු සම්බන්ධයෙන් CBSL එක-

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)

නැහැ.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

මම පිකටින් දෙක ගාවම වාහනය නවත්වලා කථා කරලා ආවේ. ඔබතුමන්ලාගේ කාලයේ මහ බැංකුවේ තිබුණු වංචා සම්බන්ධයෙන්, ඒ ආයතන ටික සම්බන්ධව තමයි -[බාධා කිරීමක්]

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
මාර්ග සංවර්ධන අධිකාරියේ තව සේවකයින් 162ක්, කාන්තාවෝ සහ ළමයි -[බාධා කිරීමක්]

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔබතුමන්ලා අපට ඒ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන්න. මම ඇමතිතුමාට කිව්වාම ඇමතිතුමා කිව්වා ඒ විධියේ කිසි දෙයක් සිදු වෙලා නැහැ කියලා. එහෙම දෙයක් තිබෙනවා නම් අපට නමත් සමඟ ඉදිරිපත් කරන්න.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
අපි audit එකක් කරලා, විස්තර ඉදිරිපත් කරන්නම්. තමුන්නාන්සේලාට මේවා මතක් කළේ, එතකොට මේවා තමුන්නාන්සේලා ඉදිරිපත් කරනවාය කියන නිසායි. මොකද, රට පුරාම මේ වාගේ සිදුවීම් වෙනවා. ලංකා ගමනා ගමන මණ්ඩලයේ, -ගරු රංජිත් මද්දුම බණ්ඩාර ඇමතිතුමා හිටියා නම් මම පෞද්ගලිකව මේ ගැන කථා කරන්න හිටියේ- DSව අයින් කරලා peon කෙනෙකුව DS කරනවා. නම් වශයෙන් තිබෙනවා. මම අභ්‍යන්තර ප්‍රවාහන ඇමතිතුමාට කියන්න හිටියේ, -මොකද, අපි සියලු දෙනාම වෘත්තිය සමිති කළ අය- ආණ්ඩුවක් පැරදිලා වෙනත් ආණ්ඩුවක් එන විට වෘත්තිය සමිති නියෝජිතයින් පිළිබඳව ඒ විධියට කටයුතු කිරීම සාධාරණ නැහැ කියලා. කම්කරු අමාත්‍යාංශයට මේ සියල්ලමට මැදිහත් වෙන්න පුළුවන්.

ලේක්හවුස් ආයතනයේත් ප්‍රශ්න තිබෙනවා. මම ලේක්හවුස් ආයතනයේ පිරිසව නම් කම්කරු කොමසාරිස්තුමාව හමුවෙන්න ඇරියා. මේ විධියට විවිධ තැන්වල ප්‍රශ්න තිබෙනවා. කම්කරු අමාත්‍යාංශයට සහ කම්කරු කොමසාරිස්තුමාට තමයි මේවාට මැදිහත් වෙලා, පාර්ශ්වයන් දෙක කැඳවලා සමතයට පත් කිරීමට නීතිමය බලය තිබෙන්නේ.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
තමුන්නාන්සේලාගේ පාලන කාලයේදී එක්සත් ජාතික පාක්ෂිකයන්ටත් මේ වාගේම අසාධාරණකම් ගොඩක් සිදු වෙලා තිබෙනවා. මේ වන විට අපි ඒවා ඉදිරිපත් කරලා තිබෙනවා. ඡන්ද පෙත්සම් සම්බන්ධයෙන් විශේෂයෙන්ම ඔබතුමන්ලාගේ අවධානය යොමු කරවනවා. අවුරුදු 20ක් වැනි කාලයක් තුළ පාලනයේ තිබූ බිඳ වැටීම නිසා තමයි මේ වාගේ ප්‍රශ්න ඇති වෙලා තිබෙන්නේ.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
නැහැ. නැහැ. ඒ කාලයේ එක්සත් ජාතික පක්ෂයේ වෘත්තිය සමිති කළේත් මම. [බාධා කිරීමක්] තමුන්නාන්සේට මම එක කාරණයක් කියන්නම්. ඒකෙත් හිටියා දේශපාලන පළිගැනීම් කරපු කට්ටියක්. නමුත් ඒකට උත්තරයක් දුන්නේ නැහැනේ. අපි කොච්චර මහන්සි වුණාද ඒ කාලයේ ඒක අරගෙන දෙන්න. දේශපාලනඥයන් කොමිටි පත් කළා. ඒවා පත් කළාට කළේ නැහැනේ. පළිගැනීම්වලට ලක් වුණු ගුරුවරු විශාල සංඛ්‍යාවක් හිටියා. මේ පක්ෂ දෙකේම දේශපාලන පළිගැනීම් තිබුණා. [බාධා කිරීමක්] ඒක කරන්න ඕනෑ. මම ඒකේ වරදක් කියන්නේ නැහැ. හැබැයි ඒකට විනිවිද පෙනෙන ක්‍රමයක් ඇති කරලා කරන්න ඕනෑ. එහෙම නැතිව උදෑසන ගිහිල්ලා DS පුටුවෙන් අයින් කරලා, වෙන කෙනෙක් වාඩි කරවන එක නොවෙයි ක්‍රමය. ඒකට විනිවිද පෙනෙන ක්‍රමයක් ඇති කරන්න ඕනෑ.

එක යුගයක එක්සත් ජාතික පක්ෂයත් දේශපාලන පළිගැනීම් හරි ගැස්සුවා. ඒකට කොමිටියක් පත් කරලා, විභාග කරලා ඒක හරි ගැස්සුවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් ඒක කළා. කොමිටියක් පත් කරලා සාධාරණය, අසාධාරණය සොයා බලා ඒක කළා. මැයි මස 8වැනි දා වැඩ වර්ජනයට ගිය අය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කොමිටියක් පත් කරලා ඒවා ගැන සොයා බලා, ඒවාට ඕනෑ කැබිනට් තීන්දු අරගෙන ඒ කටයුතු කළා. ඒකේ වරදක් නැහැ. එහෙම නැතිව කවුරු හරි peon කෙනෙක් ගෙනිහිල්ලා DS කරලා වාඩි කරවන ක්‍රමය වැරදියි කියලායි අපි කියන්නේ. [බාධා කිරීමක්] මම තමුන්නාන්සේට දෙන්නම්. අපි කියන්නේ දේශපාලන පළිගැනීමක් කර තිබෙනවා නම්, ඒකට නීත්‍යානුකූල ක්‍රමයක් ඇති කරලා, කොමිටියක් පත් කරලා, ඒක දේශපාලන පළිගැනීමක් ද කියලා හොයලා බලලා ඒකට සාධාරණයක් කරන්න කියලායි. ඒකේ වරදක් නැහැ. මම සිටි කාලවල මේ පක්ෂ දෙකේම මම ඒක කරලා තිබෙනවා. එහෙම නැතිව ඒ වෙලාවට ගිහින් අරයාට ගහලා එලවලා මෙයාව ඒ පුටුවේ වාඩි කරවන එක නොවෙයි ක්‍රමය. තමුන්නාන්සේලාට විශේෂයෙන්ම ඒකට වගකීමකුත් දෙනවා යහ පාලනය කියලා. [බාධා කිරීමක්]

ගරු නියෝමාල් පෙරේරා මහතා
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සිදුවීමම හලාවත ඩිපෝවේ සිදු වුණා. නියෝජ්‍ය ඇමතිතුමා මේවා සම්බන්ධයෙන් විස්තර ඉල්ලපු නිසා මම මේ කියන්නේ. හලාවත ඩිපෝවේ බණ්ඩාර කියලා ඩිපෝ කළමනාකරුවෙක් හිටියා. ඔහුව කොන්දොස්තර කර පත් කරලා තිබෙනවා. ඒ ගැන පොඩ්ඩක් පරීක්ෂණයක් කරලා බලන්න. නුසුදුසු අයට නුසුදුසු තනතුරු දීලා තිබෙනවා. [බාධා කිරීමක්]

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
මම තමුන්නාන්සේලාත් එක්ක මීට වඩා තර්ක විතර්ක කරන්න යන්නේ නැහැ. මම කිව්වේ මේ රටේ සිද්ධ වෙන දේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන්ව තිබෙන කාලය අවසාන වේගෙන යනවා. [බාධා කිරීමක්]

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ටින්කරින් බාස්, ඉංජිනේරුවා වුණු කාලයකුත් තිබුණා. අපි දෙගොල්ලන්ම දේශපාලනය කරනවා; ඡන්දවලින් දිනනවා; පරදිනවා. නමුත් හැමදාම මේ ක්‍රමය තියන්න නරකයි. දිනන්න පුළුවන්, පරදින්න පුළුවන්. නමුත් වැඩ කරන පන්තියේ අය කැමැති දේශපාලන පක්ෂයකට එකතු වෙනවා; දේශපාලන වෘත්තීය සමිතිවලට එකතු වෙනවා. ඒ නිසා ඒ අයට ඒකෙන් කරදරයක් වෙන්න ඉඩ තියන්න බැහැ. ඒක යහපාලනයේ අංගයක් නොවෙයි. මම මීට වඩා කථා කරන්නේ නැහැ. තමුන්නාන්සේලා මේ නියෝග ඉදිරිපත් කිරීම ගැන ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
The next speaker is the Hon. R. Yogarajan. You have 13 minutes.

[3.10 p.m.]

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

Hon. Deputy Speaker, today, we are debating Regulations under the EPF Act, which are long overdue. I am speaking after the former Minister of Labour and Labour Relations, who brought these Regulations to Parliament. Those were initiated by the previous Minister of Labour Relations and Manpower, the Hon. Athauda Seneviratne. After all these years and two powerful Ministers, who are both trade unionists, it took a long time for the Regulations to be passed, so that the workers could benefit from it.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)

I will explain why those got delayed.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

Hon. Member, I have asked you about this so many times by meeting you at the Ministry, at the Consultative Committee and even privately. You always told me that you are keen to implement it, but your Government did not allow you to do that - you did not say it; I am saying it - because they needed the EPF money, probably for other transactions.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

To run the Government.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

On one side, it was to run the Governmen; on the other, they had their other deals to manipulate the stock market. There were people who were pumping and dumping and making big money. Those who started with a million rupees are billionaires today. So, they used the EPF. But, you brought these in good faith; the Hon. Athauda Seneviratne initiated those.

I can remember, at one NLAC meeting, the Central Bank came and made a presentation and said that you must have a unique number so that the EPF number does not differ for a single person, and they suggested to create a new number. But, at that meeting, it emerged - I also contributed to some extent - that the National Identity Card number is a unique number given to persons in this country and that it should be used as the unique number. The process has continued. I know, Labour Officers have gone to all the estates and have tallied the different EPF numbers with the National Identity Card number. They are ready to implement it, but your Government, Hon. Lokuge, could not do it. You had to bring these Regulations and today, we have to pass them.

You know very well that from 2013, it has been in the Order Book. But, you could not persuade the then Leader of the House or the Chief Government Whip to get a date for debating these Regulations. We are confident that we can run this economy without the workers' money, the EPF money. That is why we have boldly brought forward this. The workers can withdraw 30 per cent of their savings in the EPF for good purposes. One is, for health assistance. If they have to go for an operation, either a kidney transplant or a heart operation, they can have some funds from that. Further, more development-oriented, future-oriented cause for which you can take this money is for building houses. These are the two matters from which the worker is going to benefit, but you could not give this benefit. Though you passed this in December 2011, for the whole of 2012, you could not do it and in 2013, you just managed to bring in the Regulation but could not get it passed in this House. We have done it today. Give us the credit for it. And, we also give you the credit for initiating this measure.

Today, people in the plantations, their one request, one hope, one ambition is to have a house of their own; a separate house, not a line room. This was adopted as one of the promises in the 100-day Programme that was proposed by His Excellency President Maithripala Sirisena with the backing of the UNP during the last election. We are now getting ready to release lands for people to build their own houses. This is a positive measure to help people build their own houses in the plantations using their own money. So, this delay has drawn our people aback by four years. From 2011 up to 2014, they had to wait. But, it is a good thing that it has come up today and we will benefit; the workers will benefit. The Hon. Minister of Justice and Labour Relations and his Deputy are present here. The people in the plantation areas still have difficulties in withdrawing their EPF monies. They have to go behind brokers which they find very difficult.

I wish to suggest in this House, to the two Ministers, to take action to streamline the application process for withdrawal of the EPF money when a plantation worker retires. In some cases, workers could not withdraw the EPF monies because their names were not spelt properly or written properly by the management. In other cases, the form filled by the management on behalf of the worker is not done in a proper manner. There is one issue which I raised with the Hon. Minister at one of the Consultative Committee Meetings, but it has still not been corrected. I also wrote a letter to him. It is about the Assistant Labour Commissioner's office in Hatton.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

With the specific number, can it not be solved?

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

Yes, to some extent. That will help a lot to solve this issue. But, the attitude of the EPF Department: the Commissioner in charge of the EPF and the Assistant Commissioners down the line, has to be changed. I request the Hon. Minister to come and visit the office of the Assistant Labour Commissioner in Hatton. They say that if you do not come and take a number before 8.00 a.m, you cannot hand over the application on that particular day. I do not know why they stipulate this shut-off time and only on two days of the week, they accept applications. So, to hand over the application they have a ceiling, which is 8 o'clock.

People come in the night and sleep at the Assistant Labour Commissioner's office to hand over their EPF applications in the morning. This is a very pathetic situation. If the same number of hours are given for people to submit applications, whether you go on from 8 o'clock to 12 o'clock or whether you shut off at 8 o'clock, it is not going to make a difference. The officers there do not seem to understand this and even though I have pointed it out and explained to them, they refuse to change it. After the new Government came to power, I have not gone there and spoken to them. I request the Hon. Minister to - [*Interruption*.]. Even now it is happening.- [*Interruption*.]. I brought it to his attention only today. I am sure he will take some action to get this streamlined in such a way that people are able to get their EPF dues without difficulty.

Today, the general feeling among our people is that governments support the owners or the proprietors. Maturata Plantations has not deposited their EPF payments since 2011. I have taken this up several times, but no action has been taken against them. If you do file charges and take them to courts, they will honour their commitment. They have already deducted the money from the workers' salaries. They are using that money for their business activities. They are not bothered about paying it to the EPF Department, where the worker would have his savings secure. This is a very important matter.

The JEDB and the SLSPC also, for several years now, have not made EPF deposits. In the past, your Government said that you were going to fell trees to make these payments. They did not even do that. I would not want trees to be felled for this purpose but for the benefit of the workers I did say, "Even that would not be bad if you can do it". But, up to now, it was not done. I am sure - [*Interruption.*] No. There are so many workers who have died without claiming the EPF. Even their children are unable to claim the EPF today because monies have not been deposited by the JEDB and the SLSPC. There are some companies who are not doing that.

Then, Sir, the EPF law is being flouted by some of these plantation companies, which are public companies. They project themselves as great corporate entities, but they employ workers on a casual basis without payment of EPF. When they pay on a casual basis, they do not pay the minimum wage; they pay only the basic salary. They are not entitled to the Rs. 30 allowance or the attendance incentive. This is a total flouting of the Collective Agreement and also the stipulations of the Wages Board. So, still the so-called big public companies are flouting the law without any respect for it. This has to be looked into, Hon. Minister. This is for your attention.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Hon. Member, you are left with only one more minute.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

Okay, Sir. Labour laws have to be enforced equally to all. Big companies get away after flouting the law; this has to be looked into.

Thank you.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

මීළඟට, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා.

[අ.භා. 3.23]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින ඉදිරිපත් කරලා තිබෙන මේ නියෝග වන්නේ, සේවක අර්ථ සාධක අරමුදලට තමන් දායක වුණ මුදලින් සියයට 30ක ප්‍රමාණයක්, එහෙම නැත්නම් කොටසක් අතරමැදදී ණයක් හැටියට, නැත්නම් අතරමැද කොටසක් හැටියට ලබා ගෙන, -ඒක ණයක් නොවෙයි.- ඒ මුදල තමන්ගේ ජීවිතයට එකතු කර ගන්න කෙනකුට ලැබෙන අවස්ථාවක් පිළිබඳවයි. පාර්ලිමේන්තුවේ අපි කාටවත් ඇත්තටම මේ පිළිබඳ විවාදයක් නැහැ. මේක ඉතාම හොඳ දෙයක්. මෙතෙක් තිබුණ ගැටලුව තමයි මේක ප්‍රමාදවීම. මේක ප්‍රමාද වුණේ ඇයි කියලා එතැන තිබුණු ප්‍රශ්නය තමයි දැන් අපි හොයන්න ඕනෑ. මොකද, රජයේ වැඩ පිළිවෙළක් හැටියට ඔබතුමන්ලාට මේ ගේන්න වෙලා තිබෙන කාරණය මීට කලින් ගත්තා වූ තීරණයක්; මීට කලින් ප්‍රමාද කරපු තීරණයක්. එසේ ප්‍රමාද කරන්න වුණ හේතුව මොකක්ද? සේවක අර්ථ සාධක අරමුදලේ ප්‍රතිලාභීන්ට එම අරමුදලෙන් ප්‍රතිලාභයක් ලබා දෙනවා වෙනුවට, ඒකෙන් ප්‍රතිලාභ ලබාපු තව බොහෝ පිරිස් හිටියා. ඒ අය ගත්තොත් ඉතා සුළු පිරිසක් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රතිලාභ හිමි නැති අය. ඒ කියන්නේ සේවක අර්ථ සාධක අරමුදලෙන් ප්‍රතිලාභ ලබන්න සුදුසුකම් නැති අය තමයි මෙපමණ කාලයක් සේවක අර්ථ සාධක අරමුදල කොටස් වෙළෙඳ පොළේ ආයෝජනය කරලා ප්‍රතිලාභ ලැබුවේ. කොටස් වෙළෙඳ පොළේ ඇත්තටම ඩීල්කාරයෝ හිටියා. මේ පිළිබඳව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට අපි පැමිණිල්ලක් ඉදිරිපත් කරලා තිබෙනවා. පසු ගිය කාලයේ දැවැන්ත වංචා සිද්ධ වුණා. සේවක අර්ථ සාධක

අරමුදල කොටස් වෙළෙඳ පොළේ ආයෝජනය කරලා ප්‍රතිලාභ ලැබිය යුතු නැති අය පසු ගිය කාලයේ ප්‍රතිලාභ ලබා ගෙන තිබෙනවා. මම ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා, අන්න ඒක පිළිබඳවත් පරීක්ෂණයක් පවත්වන්න කියලා. ඔබතුමන්ලාට විශේෂයෙන් ම කරන්න පුළුවන් කටයුත්තක් ඒක.

මෙහිදී තිබෙන වැදගත් ම දේ තමයි අපේ අධිකරණ ඇමතිතුමාට මේ කාරණය සම්බන්ධ වීම. අධිකරණ ඇමතිතුමාටම පුළුවන්, අධිකරණ ක්‍රියා මාර්ගයක් හැටියට මේ දේ කරන්න. ගරු අධිකරණ හා කම්කරු සබඳතා නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මේ ගැන මොනවා හරි කියන්න.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඒ සම්බන්ධයෙන් වාර්තාවක් අපි ඉල්ලා තිබෙනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඇත්තටම ගන්න ඕනෑ එකක්. මේක ඉතා හොඳ දෙයක්. මොකද, මේක තමයි බරපතළම ප්‍රශ්නය. මහන්සියෙන් වැඩ කරලා මේ සේවක අර්ථ සාධක අරමුදලට දායක වුණ අයට මේ අරමුදලේ ප්‍රතිලාභය මෙච්චර කල් ලැබුණේ නැහැ. ඒ නිසා අපි මේ යෝජනාව අගය කරනවා. මේ යෝජනාව හොඳයි. ප්‍රශ්නය තිබෙන්නේ මේ යෝජනාව මෙතෙක් කාලයක් ප්‍රමාද කළේ ඇත්ත ප්‍රතිලාභීන් වෙනුවට මේ අරමුදලෙන් හොරා කාපු අය හිටිය නිසායි. අන්න ඒ හොරා කාපු අයගේ ගමන දැන් නවත්වන්න ඕනෑ. හිටපු මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල්ගේ passport එක විතරක් නොවෙයි නවත්වන්න ඕනෑ. මේ අරමුදල තමන්ගේ අරමුදලක් කර ගෙන, අරමුදලක් නොවෙයි, සේවක අර්ථ සාධක අරමුදල බූදලයක් කර ගෙන මේක හොරා කාපු උදවිය බොහෝ දෙනෙක් ඉන්නවා. ඒ අය පිළිබඳව පරීක්ෂණයක් පවත්වන්න; ඒ පිළිබඳව හොයා බලන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මේ වැඩ කරන ජනතාව අදාළ කර ගනිමින් ඉදිරිපත් කරලා තිබෙන මේ නියෝග ගැනත් කරුණු කිහිපයක් කථා කරන්න ඕනෑ. මේ ගැන මීට පෙර යෝගරාජන් මන්ත්‍රීතුමා කථා කළා. යෝගරාජන් මන්ත්‍රීතුමනි, ඔබතුමා වැදගත් කාරණා කිහිපයක් මතු කළා.

අපි දන්නවා, මෙවර ඉදිරිපත් කළ අය වැය ලේඛනයේ මතු වුණ ප්‍රධාන ගැටලු කිහිපයක් තිබෙනවා කියලා, වැටුප් වැඩි කිරීමේදී දීමනා ද වැටුප් ද වැඩි වුණේ කියන එක සම්බන්ධයෙන්. හැබැයි, වැඩියෙන් ම වැඩ කරලා, අඩුවෙන්ම මේ සේවක අර්ථ සාධක අරමුදලට දායක වෙන පිරිසක් තමයි වතුකරයේ ජනතාව. අඩුවෙන්ම දායක වෙනවා කියලා මම කියන්නේ ඇයි? ඒ අයගේ දෛනික වැටුප රුපියල් හාරසිය පනහයි. එතකොට රුපියල් හාරසිය පනහකින් තමයි ඒ අයගෙන් අරමුදලට දායකත්වය කැපෙන්නේ. ඒක ඉතාම සොච්චම් මුදලක්. එතකොට ඒ අය ණයක් ගන්න ගියොත් හරි, අතරමැදදී සියයට 30ක මේ ප්‍රතිලාභය ලබන්න ගියොත් ඒ අයට කීයද ලැබෙන්නේ? ඒ නිසායි මම කියන්නේ රජය මේ ගැන හිතන්න ඕනෑ කියලා. වතුකරයේ වැඩ කරන ජනතාව තමයි ඇත්තටම වැඩ කරන ජනතාව. ඔවුන් තමයි ඇත්තට මේ රටට දහඩිය හෙළන මිනිස්සු. ඒ අයගේ දෛනික වැටුප අඩුම තරමින් රුපියල් 800ක්වත් කරන්න ඕනෑ.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
රුපියල් 1,000ක් කරන්න ඕනෑ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
නැහැ, ඒක තමයි මම කියන්නේ කල්පනා කරලා බලන්න. හේතුව මොකක්ද දන්නවා ද? අද සාමාන්‍ය කම්කරුවකුට කෑම බීම දීලා අපි ගෙදරක වැඩට හෝ මොන යම් දෙයකට හෝ සම්බන්ධ කර ගත්තොත් රුපියල් 1,200ක් දෙන්න ඕනෑ. අද මේසන් බාස් ළඟ වැඩ කරන අත් උදවු දෙන කෙනාට නවාතැන් දීලා, කෑම බීම සහිතව රුපියල් 1,200ක් දෙන්න ඕනෑ. මේසන් බාස්ට තමයි රුපියල් 1,500ක් හම්බ වෙන්නේ. රුපියල් 1,200ක් දෙන්න ඕනෑ, අත් උදවු දෙන කෙනාට. අත් උදවු දෙන කෙනාටත් වඩා වැඩියෙන් දවසේ වැඩ කරන අය තමයි වතුකරයේ වැඩ කරන කම්කරුවෝ. නමුත් ඒ අයට තවමත් හම්බ වෙන්නේ පරණ ගණන්. එම නිසා මේ නව රජයත් වතු කම්කරුවන්ට පරණ හැන්දෙන් බෙදන්න එපා කියලා මම ඉල්ලා සිටිනවා. ඔබතුමන්ලා මේ ගැන අවධානය යොමු කරන්න. විශේෂයෙන්ම වතුකරයේ වැඩ කරන අයගේ වැටුප් වැඩි කරන්න, ඒක නීතිගත කරන්න.

ඊළඟ ප්‍රශ්නය තමයි පෞද්ගලික අංශයේ සේවකයන්ට රුපියල් 2,500ක දීමනාවක් දෙන්න කියලා ඔබතුමන්ලාගේ අතුරු අය වැයෙන් යෝජනාවක් ඉදිරිපත් කළා කියන එක. නමුත් මම දන්නා තරමට හාම්පුතුන් මේ ගැන අහන්නේ නැහැ. ප්‍රශ්නය තිබෙන්නේ, හාම්පුතුන්ට මේ ගැන කියන්න, පෞද්ගලික අංශයේ වැඩ කරන සේවකයන්ට රුපියල් 2,500කින් වැටුප් වැඩි කරන්න කියන එක අහන්න තිබෙන නීතිමය රාමුව මොකක්ද කියන එක. නමුත් අපිට මතකයි, 2005 වර්ෂයේ දී, අපි එක්සත් ජනතා නිදහස් සන්ධානයට සම්බන්ධ වුණ අය වැයේදී, අපි අමතරව පනතක් ගෙනාවා, "2005 අංක 36 දරන අයවැය සහන දීමනාව පනත" කියලා. බලන්න, 2005 අංක 36 දරන අයවැය සහන දීමනාව පනත තිබෙනවා. ඒ අයවැය සහන දීමනාව පනත යටතේ තමයි අපි කිව්වේ පෞද්ගලික අංශයට රුපියල් 1,000ක් වැටුප් වැඩි කරන්න කියන එක. එතකොට ඒක පනතක්. හාම්පුතුන්ට ඒක පිළි නොගෙන ඉන්න බැහැ. ඊළඟට වෘත්තීය සමිතිවලට අවස්ථාවක් ලැබෙනවා, ඒ පනතේ ප්‍රතිපාදන අනුව පඩිපාලක සභාවේ දී, නැත්නම් ඒ වෘත්තීය හාම්පුතුන් සමඟ එකතු වන අවස්ථාවන්වල දී, හාම්පුතුන්ගේ සම්මේලනවල දී ඒ පිළිබඳව සාකච්ඡා කරන්න. ඒ නිසා ගරු ඇමතිතුමනි, මම යෝජනා කරන්නේ ඒකයි.

අය වැය යෝජනාවලට පණ දෙන්න නම් අය වැය යෝජනා සම්බන්ධයෙන් නීතිමය බලයක් හදන්න ඕනෑ. එහෙම නැත්නම් මේ අය වැය, කථාවක් විතරක් වෙනවා. 2005 දී පාර්ලිමේන්තුවට ගෙනැල්ලා අපි හැදුවා, සේවකයන්ගේ අයවැය සහන දීමනාව පනත. 2005 දී ගෙනාපු ඒ පනත-

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ආයතන 43ක් වේතන මණ්ඩලයට අපි දැනට ඉදිරිපත් කර තිබෙනවා. ඒ හරහා අපට බල කළොත් අපට පුළුවන්, ඒ වැටුප අනිවාර්යයෙන් ම ලබා දෙන්න.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, එය වෘත්තීය සමිති මට්ටමින් කරන්න අපට පුළුවන්. නමුත් ඒ සම්බන්ධයෙන් යම් නීතිමය හැකියාවක්, බලයක් හදනවා නම්, ඒ සඳහා යම් ක්‍රියා මාර්ගයක් තිබෙනවා. එය වඩා හොඳයි කියා අපි හිතනවා. ඒක එක කාරණයක්.

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

ඊළඟ කාරණය අනියම්, ආදේශක කම්කරු සේවකයන් ස්ථිර කිරීම සම්බන්ධවයි. ඒ සම්බන්ධයෙන් දැනට ගැටලු ගොඩක් මතු වෙලා තිබෙනවා. මොකද, පසු ගිය අය වැයේ තිබුණු යෝජනාව තමයි, දින 180ක සේවා කාලයක් සම්පූර්ණ කරපු අයගේ -තාවකාලික, අනියම්, ආදේශක පදනමින් සිටින කම්කරුවන්ගේ- සේවය ස්ථිර කරන්න කියන එක. මා කියන්නේ මෙය කණ්ඩායම් දෙකක් කියායි. එක පිරිසක් තමයි, මෑන් පවර් සේවාවේ වැඩ කරන අය. අනෙක් පිරිස, ඒ ආයතනවලට ම බඳවාගත්තු අයයි. ලංකා විදුලිබල මණ්ඩලයට වෙන්න පුළුවන්, වෙනත් ආයතනවලට වෙන්න පුළුවන් බඳවාගත්තු අය ස්ථිර කිරීම ගැන ගැටලුවක් නැහැ. ඒ නිසා මම යෝජනා කරන්නේ, ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටින්නේ මෙයයි. පසු ගිය අය වැය යෝජනාව අනුව දින 180ක සේවා කාලයක් සම්පූර්ණ කරපු අය ස්ථිර කරන්න පුළුවන්. යම් යම් ප්‍රශ්න තිබෙනවා තමයි. දැන් තවත් තැන්වල වෙනත් ගැටලු මතු වෙලා තිබෙනවා. ඒ අතරින් එක් ගැටලුවක් කෙරෙහි මම ඔබතුමන්ලාගේ අවධානය යොමු කරවන්නම්.

වාරිමාර්ග අධ්‍යක්ෂතුමා වාරි ඉංජිනේරුවන්ට, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට, ප්‍රාදේශික නේවාසික ඉංජිනේරුවන්ට චක්‍රලේඛයක් යවා තිබෙනවා. ඒ චක්‍රලේඛයේ සඳහන් කර තිබෙන්නේ මොකක්ද දන්නවාද? "වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතුව සිට දින 180ක අඛණ්ඩ සේවා කාලය සම්පූර්ණ කළ අනෙකුත් සුදුසුකම් සපුරා ඇති සියලු සේවක මහත්ම මහත්මීන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 යටතේ ස්ථිර කර ඇත." කියලායි එහි සඳහන් වන්නේ. ඒ අය ස්ථිර කර ඇති බව කියනවා. හැබැයි එසේ ස්ථිර කළ නොහැකි, එසේ ස්ථිර කරන්න බැරි පිරිසකුත් -අනියම් කම්කරුවන් හැටියට සේවයට ගන්නා අය- ඉන්නවා නේ. ඒ අය සියලුදෙනාගේ සේවය 2015 ජනවාරි මස සිට අත් හිටුවන්න කියනවා. එතකොට මතු වන ගැටලුවක් තිබෙනවා. ඒ මොකක්ද? උදාහරණයක් විධියට වාරිමාර්ග දෙපාර්තමේන්තුව ගනිමු. ඒ ආයතනයේ දින 180 සේවා කාලය සම්පූර්ණ කරපු පිරිස ස්ථිර කරන එක එක කාරණයක්. එය මේ චක්‍රලේඛයට අනුව හරි. හැබැයි වාරිමාර්ග දෙපාර්තමේන්තුව වාගේ ආයතන තිබෙනවා, ඒ ආයතනවල වැඩ කටයුතු ටික කරගෙන යන්න, ඒවායේ සිටින සේවකයන් ප්‍රමාණවත් නොවන, එසේ සේවකයන් මදි තැන් තිබෙනවා. ඒ තැන්වලට අවශ්‍යතාවන්ට අනුව යම් පිරිසක් සම්බන්ධ කරගන්න ඕනෑ. හැබැයි දැන් තිබෙන ප්‍රශ්නය මොකක්ද? ඒ අය ස්ථිර කළාට පස්සේ වෙනත් අය ගන්නේ නැහැ කියලා නියෝගයක් කොහේවත් නැහැ. අවශ්‍යය තැන්වලට අනියම් පදනමින් බඳවාගන්න බැහැ කියා චක්‍රලේඛයක් කොහේවත් නැහැ. නමුත් මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. ඒ චක්‍ර ලේඛයේ කියන්නේ, "මේ අනුව 2015 ජනවාරි මස සිට checkrolls නිකුත් කිරීම සම්පූර්ණයෙන් අත්හිටුවන අතර නඩත්තු හා මෙහෙයුම් වැටුප් වැය ශීර්ෂය යටතේ මොන යම් හෝ හේතුවක් මත වැටුප් ගෙවීම සඳහා කම්කරුවන් බඳවාගැනීම අත්හිටුවා ඇති බැව් කාරුණිකව දැනුම් දෙමි." කියලායි. එවිට සිදු වන දේ මොකක්ද? සේවකයන්ගේ පැත්තෙන් හිතලා, වැඩ කරන අයගේ පැත්තෙන් හිතලා ඒ ආයතනවල සිටින එවැනි අය ස්ථිර කළා. හැබැයි දැන් අනෙක් පැත්තෙන්, අවශ්‍යතාව මත හෝ, මොනයම් හේතුවක් මත හෝ බඳවාගන්නා එක නවත්වා තිබෙනවා. එහෙම කරන්න කියා සඳහන් චක්‍රලේඛයක් කොහේටවත් ආවේ නැහැ. මේ තිබෙන්නේ අදාළ නිලධාරින් -මෙයට අනුව නම්, වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා- චක්‍රලේඛයට අමතරව එකතු කරගත්තු දේවල්. ප්‍රාදේශීය ඉංජිනේරුවන් අපට නඟන මැසිවිල්ල තමයි, "අපේ ආයතන දැන් පවත්වාගෙන යන්න බැහැ." කියන එක. සමහර ආයතන තිබෙනවා සේවක අතිරික්තයක් තිබෙන. හැබැයි සමහර ආයතන තිබෙනවා ඒවායේ අවශ්‍යතාවන් මත සේවකයන් බඳවාගත යුතු. නමුත් එසේ බඳවා ගැනීමට තිබෙන ක්‍රමයත් මේ චක්‍රලේඛය නිසා දැන් ඇහිරෙනවා. ඒ නිසා මම හිතනවා, මේ ක්‍රියාවලිය ඉතා ඉක්මනින් විධිමත් කිරීමේ වගකීමක් කම්කරු අමාත්‍යාංශයේ මේ විෂයය භාර ගරු ඇමතිතුමාට, ඒ වාගේම ඔබතුමන්ලාට තිබෙනවා කියා. ප්‍රායෝගික තත්ත්වය ගත්තොත්, පසු ගිය කාලයේ විශාල ප්‍රමාණයක් බඳවාගෙන තිබෙන බව අපි දන්නවා. අපේ ගරු ඉරාන් වික්‍රමරත්න නියෝජ්‍ය ඇමතිතුමා දැන් මේ ගරු සභාවේ සිටිනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Order, please! Will an Hon. Member propose the Hon. R. Yogarajan to take the Chair?

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,"ගරු ආර්. යෝගරාජන් මහතා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ආර්. යෝගරාජන් මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஆர். யோகராஜன் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. R. YOGARAJAN *took the Chair.*

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණ හා කම්කරු සබඳතා නියෝජ්‍ය ඇමතිතුමා මේ අවස්ථාවේ මේ ගරු සභාවේ ඉන්නවා.

ආයෝජන මණ්ඩලයේ සේවය කරන බොහෝ අයගෙන් සේවක අර්ථ සාධක අරමුදල සම්බන්ධයෙන් මැසිවිලි ගොඩක් මට ඉදිරිපත් වුණා. පසු ගිය ජනවාරි මාසය වන කොට -ඒ කියන්නේ ජනාධිපතිවරණයට කලින් දෙසැම්බර් මාසයේ 14 වෙනිදා විතර- මාතර දිස්ත්‍රික්කය පුරාම casual workers or trainees හැටියට පත්වීම් දීලා තිබෙනවා. ඒ වාගේම management assistants හැටියට පත්වීම් දීලා තිබෙනවා. ඒ පත්වීම් ලිපිවල දින පිළිබඳව මොකක්වත් සඳහනක් නැහැ. නමුත්, විශාල පත්වීම් සංඛ්‍යාවක් දීලා තිබෙනවා. අද ඒ ළමයි හරි අසරණ වෙලා. මොකද, විශේෂයෙන් ඒ අය තරුණ ළමයි. තමන්ගේ ජීවිතයේ රැකියාවක් ආරම්භ කරපු අය; ඔවුන්ගේ පළමුවෙනි රැකියාව. ඒ අයට දීලා තිබෙන පත්වීම් ලිපිය ගත්තොත් එහෙම, ඇත්තටම ඒ පත්වීම් management trainees or casual workers කියන මොකක්වත් නොවෙයි, BOI එකේ රස්සාවක් කියලා තමයි ඒ පත්වීම් දීලා තිබෙන්නේ. එහෙම නේ දෙන්නේ. නමුත්, පත්වීම් ලිපිය කියවා ගෙන යන කොට තමයි තේරෙන්නේ ඒවා ජනාධිපතිවරණයේ ප්‍රතිඵල නිකුත් කරන තුරු දීපු පත්වීම් කියලා. ඒ පත්වීම් මාස තුනේ පත්වීම්. බ්‍රොයිලර් කුකුළන්ටත් ඊට වඩා වයසයි.

ඇත්ත වශයෙන්ම කියනවා නම්, බ්‍රොයිලර් කුකුළෙකුගේ වයසට වඩා අඩු කාලයකින් අවසන් වන පත්වීම් තමයි පසු ගිය ජනාධිපතිවරණය කාලයේ දීලා තිබෙන්නේ. එතකොට සිදු වන්නේ මොකක්ද? අදාළ ඇමතිවරයා හෝ නියෝජ්‍ය ඇමතිවරයා

තමන් නියෝජනය කරන අමාත්‍යාංශයට අදාළව නොවෙයි, දිස්ත්‍රික්කයට අදාළවයි ඒ පත්වීම් දීලා තිබෙන්නේ. එවැනි පත්වීම් ලැබූ ළමයි අනූ ගණනක් පමණ ඉන්නවා. මම අධිකරණ හා කම්කරු සබඳතා නියෝජ්‍ය ඇමතිතුමා එක්ක මේ සම්බන්ධයෙන් කථා කරද්දි ඇහුවා, මේ අයට මොකක්ද කරන්නේ කියලා. මොකද, ඒ ළමයින්ගේ ජීවිත බලාපොරොත්තුව ගත්තොත් එහෙම ඒ ළමයි ඇවිල්ලා තිබෙන්නේ රස්සාවකට. ඒ පත්වීම් ලිපිවලම තිබෙනවා, මේ පත්වීම් ලිපි මේ අය ස්ථිර කිරීමට කිසිදු හේතුවක් වන පත්වීම් ලිපියක් නොවෙයි කියලා. මම ඒ ළමයින්ගෙන් ඇහුවා, "මේ ඔයගොල්ලන් රවටන්න ගෙනාපු පත්වීම් ලිපියක් කියලා තේරුණේ නැද්ද?" කියලා. "නැහැ, නැහැ. ජනාධිපතිවරණයෙන් අපි අනිවාර්යයෙන් දිනනවා, දිනුවාට පස්සේ ස්ථිර කරනවා."ය කියලා කිව්ව බව එතකොට ඒ ළමයි අපට කිව්වා. ජනාධිපතිවරණයෙන් දිනුවාට පස්සේ ස්ථිර කරන පත්වීම් තමයි මේ දීලා තිබෙන්නේ. නමුත්, ඒ අයත් මේ රටේ දරුවෝ. ඔවුන්ගේ සුදුසුකම් සොයා බලා නැහැ. මම ඔබතුමන්ලාගෙන් ඉල්ලන්නේ ඒ අයගේ සුදුසුකම් සොයා බලා සුදුසු දෙයක් කරන්න කියලායි. මොකද, මේ අතර සුදුසුකම් තිබෙන අයත් ඉන්නවා. ඒ අතරේ උසස් පෙළ සමත් වූ අය ඉන්නවා, උපාධිධාරීන් ඉන්නවා. මෙවැනි විවිධ මට්ටම්වල අය මේ අතර ඉන්න පුළුවන්. ඒක හරි. ඒ අයගේ සුදුසුකම් සොයා බලා ඔවුන් සම්බන්ධයෙන් මොනයම් හෝ ක්‍රමවේදයක් හදන්න ඕනෑ. ඔබතුමන්ලාගේ ආයතනවලට මේ සියලු දෙනාම ගන්න පුළුවන්ය කියලා මම කියන්නේ නැහැ. මම උදාහරණයක් කිව්වේ.

හැම රාජ්‍ය ආයතනයකම පත්වීම් වපුරා තිබෙන්නේ; පත්වීම් තවාන් දමා තිබෙන්නේ. ඇත්තටම ඒක තමයි අද වෙලා තිබෙන්නේ. මාසයේ පත්වීම්, මාස දෙකේ පත්වීම්, trainee පත්වීම් වැනි විවිධ පත්වීම් පසු ගිය කාලය පුරාම දීලා තිබෙනවා. ඒක තමයි ඇත්ත දේ. අද රක්නා ලංකා ආයතනයේ සේවකයෝ ඇවිල්ලා අඬනවා. තවත් ආයතනවල සේවකයෝ ඇවිල්ලා අඬනවා. සමහර ඇමතිවරු ඔවුන්ගේ සහෝදරයෝ දමා මාර්ග සංවර්ධන අධිකාරියේ -RDA එකේ- ව්‍යාපෘති හදා තිබෙනවා. තොරතුරු සොයා බලන කොට මේ සම්බන්ධයෙන් ගෙවීම් කරලා තිබෙන්නේ චීන සමාගමට නොවෙයි, සහෝදර සමාගමට. එහෙමයි වෙලා තිබෙන්නේ. මැන්පවර් එක සහෝදරයෝ අරගෙන තිබෙන්නේ ඇයි? අලුතෙන් හදන මාතර - බෙලිඅත්ත රේල් පාරේ ප්‍රශ්නයක් තිබෙනවා. මැන්පවර් කොම්පැනිය කියලා කියන්නේ මොකක්ද?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව අවසන් කරනවා.

අදාළ ඇමතිවරයාගේ සහෝදරයා තමයි මැන්පවර් කොම්පැනිය කර ගෙන ගිහිල්ලා තිබෙන්නේ. දැන් කියන්නේ "මතුගම කොම්පැනිය" කියලා. මම කියන්නේ මේ තත්ත්වය වළක්වන්න ඕනෑය කියලායි. අඩුම තරමින් මේ සඳහා මොකක් හෝ ක්‍රමවේදයක් අවශ්‍යයි. මොකද, ඒ හැම දෙනාම අපේ රටේ ජනතාව. මේ වන කොට මේ සම්බන්ධයෙන් වැඩිම පීඩනයක් සහිත අමාත්‍යාංශය තමයි, කම්කරු අමාත්‍යාංශය. රජයේ සේවකයින්ගේ ප්‍රශ්න තිබෙනවා, පෞද්ගලික අංශයේ සේවකයින්ගේ ප්‍රශ්න තිබෙනවා. ඒ වාගේම අනියම් සේවකයින්ගේ ප්‍රශ්න සහ වතුකරයේ සේවකයින්ගේ ප්‍රශ්න තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම අර්ථ සාධක ලබන අයට මේක හුස්ම පොදක්; බෙල්ල මිරිකී සිටි අයට මේක හුස්ම පොදක්. මේක මීට වඩා වැඩිදියුණු කරලා ඉදිරියට පවත්වා ගෙන යන්න.

සේවක අර්ථ සාධක අරමුදල කියන්නේ මෙතෙක් කාලයක් දූෂණයට ලක් වුණු ඒවායෙන් එකක්. ගරු අධිකරණ හා කම්කරු සබඳතා නියෝජ්‍ය ඇමතිතුමනි, විශේෂයෙන්ම මම ඔබතුමාගේ අවධානය මේ සඳහා යොමු කරනවා. මේ පිළිබඳව පාර්ලිමේන්තුවේ වැඩියෙන්ම කථා කරපු කෙනෙකු හැටියට ඔබතුමාට ඒ පිළිබඳවත් සොයා බලන්න කියමින් මේ නියෝග අගය කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

[අ.භා. 3.39]

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා (ස්වදේශ කටයුතු හා ධීවර අමාත්‍යතුමා)
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா - உள்நாட்டலுவல்கள் மற்றும் கடற்றொழில் அமைச்சர்)
(The Hon. M. Joseph Michael Perera - Minister of Home Affairs and Fisheries)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ ගෙන ආ නියෝග සම්මත කරන්න අද පාර්ලිමේන්තුවට අවසර ලැබීම ගැන මම සතුටු වනවා.

ඉතා අමාරුවෙන් සියලුම පක්ෂ එකඟත්වයෙන් තමයි මේ සංශෝධනය එදා ගෙනාවේ. නමුත් මේ නියෝග ගේන්න ගිහිල්ලා මම හුඟක් දෙනෙකුත් එක්ක රණ්ඩු කළා. ආණ්ඩුව අන්තිමේදී කිව්වේ මොකක් ද කියලාවත් ඇත්ත වශයෙන්ම අපිට මතකත් නැහැ; ඒ ගොල්ලන්ට මතකත් නැහැ. මේකේ අර්ථය හැටියට මා දකින්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුවට ඕනෑකමක් තිබුණේ නැහැ කියන එකයි. එසේ නැත්නම් මේ අර්ථ සාධක අරමුදලේ සල්ලි ටික එදිනෙදා ජීවත්වෙන්න, පඩි ගෙවන්න පාවිච්චි කර තිබුණා. ඒ නිසා මේ කාරණය මඟ හැරියා. මේ පනත සංශෝධනය සඳහා ගෙන එද්දී ඒක දේශපාලන වාසියක් විධියට ගෙනාවත්, යථාර්ථය තේරුම් අර ගෙන මේ නියෝග පාර්ලිමේන්තුවට ගෙන ඒම අවස්ථාවාදීව වුවමනාවෙන්ම කල් මැරුවා. පාර්ලිමේන්තුවේ මේ ගැන අපි කිහිප විටක්ම කථා කළා. පිළිතුරක් දුන්නේ නැහැ. බොරු උත්තර දෙමින් සිටියා. අන්තිමේදී මේ සේවකයන්ට තමන්ගේ අයිතිය ලබා ගන්න මෙය සම්මත කරන්නය කියා අපේ නායක ගරු අග්‍රාමාත්‍යතුමා මේ පාර්ලිමේන්තුවේදී එදා විශේෂ ප්‍රකාශයක් කළා. සමහර දෙනෙක් මේක අසාර්ථක ව්‍යාපාරයක් හැටියට දැක්කා.

මට මතකයි, මා කම්කරු ඇමතිවරයා වශයෙන් සිටි කාලයේ යෝජනාවක් ගෙනාවා, මේ අරමුදලේ තමන් සතුව තිබෙන මුදලින් සියයට 75ක් ඇපයක් නැතිව ණයක් හැටියට ගන්න පුළුවන් කියලා. අපි ඒ යෝජනාව සම්මත කළා. අදත් අපට කථා කර හුඟ දෙනෙක් කියනවා," තමුන්නාන්සේ නිසා අද අපි අමාරුවෙන් හෝ ගෙයක ජීවත් වෙනවා" කියා. අපි ඒ අවස්ථාවේ ඔවුන්ට ඒ දොර විවෘත කළා. අද අපේ සේවක අර්ථ සාධක අරමුදල, සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල යන මේ අරමුදල් දෙක ගත්තාම ඒ මුදල් ප්‍රමාණය තිබෙන්නේ බිලියන ගණන්වලින්. මිලියන ගණන්වලින් නොවෙයි, බිලියන ගණන්වලින්. මේකට දායක වන විශේෂ කම්කරු පිරිසක් ඉන්නවා. ඒ අයගෙන් මිලියන 15ක් විතර මේ මුදල ආවරණය වෙනවා.

ගරු අතාවුද සෙනෙවිරත්න හිටපු ඇමතිතුමා පාර්ලිමේන්තුවේදී මේ කාරණාව සම්බන්ධව මා එක්ක එකඟ වුණා. මේ මුදල හිමි අහිංසකයින්ට හෘදයාබාධයක් හැදුණොත් operate කර ගන්න විධියක් නැහැ. රජයෙන් මේක කරන්නට බැහැ. මේ ළඟදීත් මට කෙනෙක් හමු වුණා, ඔහුට stent එකක් දාන්න කියලා. ඒක ගන්න විශාල මුදලක් වැය වනවා. නමුත් මේ මනුෂ්‍යයා ජීවත් වෙලා ඉන්නවා; ඔහු රැකියාවක් කරනවා. අර්ථ සාධක අරමුදල් තැන්පතුවේ එතුමාගේ මුදල් තිබෙනවා. නමුත් සිදු වන්නේ මොකක්ද, ඒ අය මැරෙන එක විතරයි. වෙනත් උදව්වක්

[ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

නැහැ. ඒ වාගේම ගෙයක් හදා ගන්න විධියක් නැතිව අනුන්ගේ ඉඩම්වල, කුලිය ගෙවා ගෙන ජීවත් වෙන විශාල පිරිසක් ඉන්නවා. දැන් මේ අරමුදලේ මුදල් තිබෙන හැම සාමාජිකයෙකුටම තමන්ට අවශ්‍ය නම් ඉඩම් කෑල්ලක් ගන්න අවස්ථාවක් තිබෙනවා. තව අවුරුදු දෙක තුනක් ගියාම ඕනෑ නම් ඒ ඉඩම් කෑල්ල වැඩි ගණනකට විකුණලා තමන්ට ඒ මුදල් ලබා ගන්න අවස්ථාව තිබෙනවා. ඒ වාගේම ගෙයක් හදාගෙන ඔහු විශ්‍රාම යන්නේ ගෙයක අයිතිකාරයෙක් විධියට. අද ගෙවල් කුලි ගෙවන මිනිහෙකු විධියට තමයි ගෙයක පදිංචි වෙලා ඉන්නේ.

මේ කාරණා දෙක අපි හොඳට දැකලා, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවෙන් එදා මම කම්කරු ඇමතිවරයා වෙලා ඉන්නකොටම අපි මෙයට අදාළ පනත් කිහිපයක් සම්මත කළා. එකක් සේවක අර්ථ සාධක අරමුදල සම්බන්ධව. අනෙක් එක සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල සම්බන්ධව. අද මේ රටේ තිබෙන ප්‍රධාන අරමුදල් දෙකක් හැටියට ගන්නේ සේවක අර්ථසාධක අරමුදලයි, සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලයි. සේවක අර්ථ සාධක අරමුදල ඇති කිරීම පිළිබඳව ටී.බී. ඉලංගරත්න මැතිතුමා අපි සිහිපත් කළ යුතුයි. එතුමා ඒ පනත මේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සම්මත කරන අවස්ථාවේදී අද අප මේ කරන දෙය කළ යුතුයි කියන එක එතුමා ගේ කථාව තුළ ගැබ්වෙලා තිබෙන බව හැන්සාඩ් වාර්තාව අරගෙන බැලුවොත් පෙනී යනවා. මේ අවස්ථාවේදී මුළුමනින්ම මේක කරන්න බැහැ. නමුත් තවත් දුර යන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක බොහොම කෙටියෙන් කියනවා නම් මේ අයිතිකරුවෝ කොටස්කරුවෝ හැටියට පත් කරන්න පුළුවන්. ඒක තමයි මේ සංශෝධනයේ ඇත්තම අදහස. අද පොඩි ව්‍යාපාරයක් කරන්න ණයක් ගන්නේ, ඒ වාගේම ඉඩමක් ගන්න ණයක් ගන්නේ ණයකාරයෙක් හැටියටයි. අද ඉදිරිපත් කරන මේ සංශෝධනවල තිබෙන විශේෂත්වය මේකයි. අවුරුදු 55ක් ගිහිල්ලා තමන්ගේ deposit එකේ තිබෙන මුදල් ගන්න පුළුවන් අවස්ථාව වනකොට එක්කෝ ඔහු මැරිලා. එහෙම නැත්නම් ඒ ගෙදර ජීවත් වෙන්න පුළුවන් ශක්තියක් නැහැ; ජීවත් වෙන්න බැහැ. මේ පනතේ රෙගුලාසි ටික සම්මත කළාට පසුව එතැනින් අලුත් සමාජයක් ඇති වෙනවා. මේ අවස්ථාවේ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා ගරු සභාවේ ඉන්නවා. මම ඔබතුමාට යෝජනා කරනවා, මේක සම්මත කර ගත් හැටියේම වෙනම කොමිටියක් පත් කරන්න කියලා. මමත් උදවු කරන්නම්. මේ අරමුදලේ සාමාජිකයන් අතරින් යම් කෙනකුට හෘදය රෝගයක් ඇති වුණු අවස්ථාවක ඒ සඳහා සැත්කමක් කර ගන්නට අවශ්‍ය වුණොත්, ඉල්ලුම් පත්‍රයක් යොමු කිරීමෙන් පසුව ඒ අවශ්‍ය මුදල් දෙන්න අපට පුළුවන්. ඒ සඳහා අවුරුදු ගණන් ගත වන්නේ නැහැ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මාසයකින් දෙකකින්, අවුරුද්දකින් දෙකකින් මේ වැඩේ ඉවර කරන්න පුළුවන්. සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ, සේවක අර්ථ සාධක අරමුදලේ සාමාජිකයන්ගෙන් කෙනකුට හෘදය රෝගයක් ඇති වූ අවස්ථාවක ඒ සඳහා operation එකක් කර ගන්න, නැත්නම් stent දමන්න අවශ්‍ය වුණොත් කොළ අරගෙන කොහේවත් යන්න සිදු වන්නේ නැහැ. ජනාධිපති අරමුදලින් සල්ලි ගන්න ඕනෑ වන්නේත් නැහැ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, තමුන්නාන්සේ ළඟට එන්න ඕනෑත් නැහැ. [බාධා කිරීමක්] මේ අරමුදලේ සල්ලිවලින්. තැන්පත් මුදලින් සියයට 30ක් ලබා ගත්තාම ඒ මුදලින් ඒක කරන්න පුළුවන්. ඒක තමයි insurance එක. එච්චරයි.

රජයේ ඉඩම් බෙදනකොට දුප්පත් අයට බෙදනවා නම්, මේ අරමුදලේ සාමාජිකයාත් දුප්පත් කෙනෙක් තමයි. රජයේ සේවකයාත් මේකට අයත් වෙනවා. අපි වෙනසක් කරමු. අද රුපියල් ලක්ෂ පහකට විතර පොඩි ඉඩම් කැබැල්ලක් ගත්තොත්, ඔහු retire වෙන වෙලාවට ඒක රුපියල් ලක්ෂ විසිපහක විතර වටිනාකමක් තිබෙන ඉඩමක්. අපි ගන්නේ මේ තැන්පත් මුදලින් සියයට 30යි. ඒ සේවකයා විශ්‍රාම යනකොට අවුරුදු 50ක් 55ක් පැනලා. එහෙම නම් ඒ වන විට ඔහුගේ ඉඩමේ වටිනාකම අතිවිශාලයි. විශ්‍රාම යනකොට ගෙයක් හදලා තිබුණා නම් දරුවෙකුට දැවැද්දට දෙන්න තිබුණා. මෙන්න මේ කාරණා පදනම් කර ගෙන එදා අදහස් ප්‍රකාශ කළ ටී.බී. ඉලංගරත්න මැතිතුමාව අපි ස්තුතිපූර්වකව අද සිහිපත් කරනවා. එතුමාගේ ඒ බලාපොරොත්තුව ඉෂ්ට කරන්නට අද පුළුවන් වෙලා තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවකටයි. මේ රෙගුලාසි ටික සම්මත කරන්න කියලා අපි පාර්ලිමේන්තුවේ කොපමණ කථා කළාද? ඒකට මහින්ද රාජපක්ෂගේ ආණ්ඩුව ඉඩ දුන්නේ නැහැ. ගරු අතාවුද සෙනෙවිරත්න මන්ත්‍රීතුමනි, කම්කරු නායකයෙක් හැටියට තමුන්නාන්සේටත් එදා ඒක කරන්න බැරි වුණා. ඔබතුමා කළේ නැහැයි කියලා නොවෙයි මා කියන්නේ. ඔබතුමාටත් කරන්න බැරි වුණා. මොකද, ඊට ඉහළින් නියෝග තිබුණා. ඔබතුමා බොහොම උනන්දු වුණා. ඔබතුමා මේ ගරු සභාවේ කළ කථාව අහද්දී මේ පිළිබඳව ඔබතුමා කොපමණ උනන්දු වුණාද, මහන්සි වුණාද කියන එක මට මතක් වුණා. ඒවා ඔක්කොම යටපත් වුණා. ඒ වාගේම ගරු ගාමිණී ලොකුගේ හිටපු ඇමතිතුමාත් මේකට හුඟාක් උනන්දු වුණා. නමුත් කරන්න බැරි වුණා. මේ ගැන ඇහුවාම ඒවා මේවා පටලවමින් ලොකු උත්තර තමයි දුන්නේ. ඇයි ඒ? මේක කැබිනට් මණ්ඩලයට ගෙනාපු කථාවක් නොවෙයි. එහෙම කිසිම දෙයක් පාර්ලිමේන්තුවට ගෙනැල්ලා නැහැ. අද ගරු වාසුදේව නානායක්කාර හිටපු ඇමතිතුමා කථා කළා. "ඔය පැත්තේ ඉන්න කොට මම නම් ඕකට සම්මාදම් වෙලා නැහැ, පුළුවන් නම් Cabinet Minute එකේ මගේ observations බලන්න" කියලා කිව්වා. එතුමා ඒකට සහභාගි වුණේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේ තමයි මේ පනතට රෙගුලාසි ගෙනාපු වෙලාවේ පසු ගිය ආණ්ඩුව කථා කළේ; වැඩ කළේ මන්ත්‍රීවරුන්ගේවත්, ඇමතිවරුන්ගේවත් කීම අහලා නොවෙයි. තනි මතයකට; තනි පුද්ගලයකුගේ මතයට තමයි ඒක සම්මත නොකර න්‍යාය පත්‍රයේ තිබ්බේ. එහෙම නම් අද අපි අලුත් මාර්ගයක් ගැන හිතන්න වෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ වැඩ පිළිවෙළ හරියට හැදුවොත් අවුරුද්දක් තුළ ඉඩම් හිමි අය ලක්ෂයක් ඇති වෙනවා. එය පොඩි වැඩක් නොවෙයි. ඒකටත් ඕනෑ නම් තව පොඩි ණයක් ගන්නය කියන්න. මේ ගන්නේ තමන්ගේම මුදලින්. වෙන කොහේවත් තිබෙන මුදලකින් නොවෙයි. මේ ඉඩම ගත්තාට පසු අවුරුදු කිහිපයක් යනකොට ඒ මුදල වාගේ පස් ගුණයක, හය ගුණයක වටිනාකමක් තිබෙන ඉඩමක අයිතිකරුවකු බවට පත් වෙනවා. මේ සල්ලි කම්කරුවාගේ සල්ලි. ඒ වාගේම මෙතැන තිබෙනවා හාම්පුතාගේ සල්ලිත්. ඒ ඔක්කෝම අරගෙන අලුත් කම්කරු ව්‍යාපාරයක් අපට හදන්න පුළුවන්. සෑම කෙනකුටම ඉඩමක් ලැබෙන ආයෝජනයක් කරන්න පුළුවන් වැඩ පිළිවෙළක් මෙතැන හදන්න පුළුවන්. එදා ටී.බී. ඉලංගරත්න මැතිතුමා වාගේම ගරු අතාවුද සෙනෙවිරත්න මැතිතුමාත්, ගරු ගාමිණී ලොකුගේ මැතිතුමාත් මේ පිළිබඳව මහන්සි වුණා. නමුත් එතුමන්ලාට ඉඩක් නොලැබුණු ඒ ඉතිහාසය වෙනස් කරලා, අපේ වත්මන් ගරු ජනාධිපතිතුමාගේත්, අගමැතිතුමාගේත් මතය අනුව අද මේ නියෝග ඉදිරිපත් කිරීම තුළින් කම්කරු ජනතාව වෙනුවෙන් අලුත් වැඩ පිළිවෙළක් ඉතිහාසයට එක් වෙනවා.

ගරු ඇමතිතුමනි, මා ඔබතුමාගෙන් ඉල්ලනවා මේ සඳහා වෙනම ආයතනයක් ඇති කරන්න කියලා. හෘදය සැත්කමකට ලක්විය යුතුව සිටින මේ අරමුදලේ කම්කරු සාමාජිකයන් කවුද, ඉඩමක් කඩමක් නැතිව ඉන්න සාමාජිකයින් කවුද කියලා ඒ විස්තර ටික සොයලා ගන්න. මේ වැඩ පිළිවෙළ යටතේ ඒ කාරණා ටික ඉතා ඉක්මනින් විසඳුවොත් කොයි අමාත්‍යාංශයකටත් වඩා මේ අමාත්‍යාංශය ඉතා ඉහළින් සැලකිල්ලට භාජනය වෙනවා. තැන්පතු මුදලින් සියයට 30ක්

මේ අරමුදලට ලබා ගන්න කොට එයින් ලක්ෂ හතක, අටක පිරිසක් අර කලින් සඳහන් කළ බලාපොරොත්තු ඉෂ්ට කරගන්න පුළුවන් පිරිසක් බවට පත් වෙනවා. ඒ වාගේම තමන්ගේ අර්ථ සාධක අරමුදල ගැන, මේ අරමුදලට දායක වීම පිළිබඳව දැඩි උනන්දුවක් දක්වන පිරිසක් බවට පත් වෙනවා. දැන් මේක කවුරුවත් ගණන් ගන්නේ නැහැ. ඇයි ඒ? මුදල් කපා ගත්තාට වයස අවුරුදු 55ක් වුණාට පසුව තමයි ඒ ගැන බලන්නේ. සමහර පුද්ගලයන් වයස අවුරුදු 55ක් වන තුරු ජීවත් වන්නෙත් නැහැ. ඒ නිසා විශ්‍රාමිකයන් වෙනුවෙන් අද ඉදිරිපත් කරන තිබෙන මේ වැඩ පිළිවෙළ තමන්ට වාගේම තමන්ගේ දරුවන්ගේ අනාගතයට උදව් වන, උපකාරී වන අලුත් බලාපොරොත්තුවක් බවට පත් වෙනවා. එතකොට මේ අරමුදලට දායක මුදල එකතු කර දෙන්න ඒ අයගෙත් උනන්දුවක් ඇති වනවා. ඒ කියන්නේ තමන්ගේ මුදල ගෙවන්නත්, ඒ වාගේම හාම්පුතා නොගෙවනවා නම් ඒ පිළිබඳව සොයා බලා කරුණු පැහැදිලි කර දීලා ඒ කටයුතු කරන්නත් උනන්දුවක් ඇති වනවා. ඒ වාගේම මේ අරමුදල ශක්තිමත්ව තිබිය යුතුයි කියන කාරණයත් මා ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරවනවා. ඒ සඳහා මේ සේවකයන්ගේ දායකත්වය ඉතා වැදගත් වෙනවා. මා ළඟ තිබෙන වාර්තාවේ තිබෙන්නේ මිලියන 15කට ආසන්න සාමාජික සංඛ්‍යාවක් මෙහි ඉන්නවා කියන එකයි. මිලියන 15කට ආසන්න සංඛ්‍යාවක්. පොඩි ගණනක් නොවෙයි.

බැංකු මූලාශ්‍රවලට අනුව එකසියහතළිස් නවලක්ෂ අසූහත්දහසකට ආසන්න පිරිසක් මෙම අර්ථ සාධක අරමුදලේ ගිණුම් හිමියන් බවට පත් වෙනවා. මේක පොඩි වැඩක් නොවෙයි. ඒ වාගේම ක්‍රියාකාරී ගිණුම් හිමි සංඛ්‍යාවත් එන්න එන්නම වැඩි වෙනවා. ඒ වාගේම 2013 වසරේදී පමණක් රුපියල් මිලියන 80,484ක් සාමාජික මුදල් වශයෙන් ආපසු ගෙවා තිබෙනවා. මේ වාගේ අරමුදලක් කොහේ තිබෙනවාද කියලා මා දන්නේ නැහැ. 2013 වසරේ දී රුපියල් මිලියන 50,423ක් ප්‍රතිලාභ වශයෙන් ගෙවීමට සේවක අර්ථ සාධක අරමුදල පියවර ගෙන තිබෙනවා.

මහ බැංකු වාර්තාවෙන් ලබා ගත් තොරතුරුවලිනුයි මා මේ පැහැදිලි කිරීම කළේ. එතකොට විශ්‍රාම යනකොට ලබන මුදල සියයට 70යි. මේ ගන්න මුදල ඒ සියයට 70ට එකතු කළොත් කොපමණ වටිනාකමක් තිබෙනවාද? ඒ මුදල ඉඩමක් බවට පරිවර්තනය වුණොත් අවුරුදු 55 වන කොට කොපමණ වටිනාකමක් තිබේවිද? ඒ නිසා තමයි අපි මහන්සි වුණේ. එක්සත් ජාතික පක්ෂය හැටියට, එක්සත් ජාතික පක්ෂයේ නායකතුමා හැටියට ආණ්ඩුවක් පිහිටුවන්න ඉස්සෙල්ලා බොහොම පැහැදිලිව කිව්වා, මේ රෙගුලාසි ගෙනැල්ලා සම්මත කරගෙන සියලු දෙනාගේම සහයෝගය ලබාගෙන මෙය ක්‍රියාත්මක කරනවා කියලා. අවාසනාවකට ඒක ඉෂ්ට කරන්න පසු ගිය ආණ්ඩුවට ඉඩ ලැබුණේ නැහැ.

අද අපි ඉතිහාසයේ තවත් පිටුවක් පෙරළන අවස්ථාවක්. ගරු අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍යතුමනි, අවුරුද්දක් තුළ නිවාස ලක්ෂයක් හැදීමේ වැඩ පිළිවෙළ යටතේ මහා වගකීමකින් යුතුව ඒ ජනතාව, ඒ නිවාසවල අයිතිකරුවන් කරවීමට දරන වෑයම තුළ ඔබතුමාගේ නමත් ඉතිහාසගත වෙනවාය කියන එක මම මතක් කරන්න කැමැතියි.

මට මේ අවස්ථාවේදී ඉතිහාසයේ තවත් දෙයක් මතක් වෙනවා. එදා මම කම්කරු උප ඇමතිවරයා හැටියට සිටියේ. කැප්ටන් සී.පී.ජේ.සෙනෙවිරත්න මැතිතුමා තමයි ඇමතිතුමා වශයෙන් සිටියේ. එතුමා මේ සේවක අර්ථ සාධක අරමුදල් එක්කාසු කිරීම ආදී ඒ වැඩ කොටස් ඔක්කොම එදා උප ඇමතිවරයා හැටියට හිටපු මට භාර දුන්නා. ඒ අනුව මම විශේෂ දෙයක් කළා. එහිදී කම්කරු දෙපාර්තමේන්තුවේ හිටපු, සේවක අර්ථ සාධක අරමුදලට අයත් වන රජයේ සේවකයන්, cupboard ඕනෑය; ඉඩ ඕනෑය; පුටු ඕනෑය ආදී වශයෙන් මගෙන් ඉල්ලීමක් කළා. මම කිව්වා, කීයක්වත් දෙන්නේ නැහැ, මොකුත් දෙන්නේ නැහැ, ඔයගොල්ලන් files හදලා වැඩ කරන්න, මම අලුත් ක්‍රමයක් හදනවාය කියා. ඒ තමයි, incentive ක්‍රමය. ඒ ක්‍රමය තුළ සමහර අය incentive එක විතරක් රුපියල් 25,000ක් ගත්තා. ඒ විධියට වැඩ කරන ජනතාවට ධෛර්යය දුන්නා.

අපේ ආර්ථිකය ගැන කථා කරනකොට වෙනස් වීම් කළ යුතු තැන් පිළිබඳව කථා කරන කොට මෙතැනදී අලුත් දෙයක් මතක් කළ යුතුව තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ සේවය කරන අයට පළමුවරට, ආපසු අය කිරීමක් නොකර attendance bonus හැටියට අවුරුද්ද ඉවර වෙනකොට මාසයක සම්පූර්ණ පඩිය ලබා දීමට මම කටයුතු කළා. වෙන කොහේවත් එහෙම දීලා නැහැ. ඒක රජයේ සේවකයන්ටත් කර ගන්න පුළුවන් දෙයක්. අවුරුද්ද අවසන් වෙනකොට ඒ අය හරිම අමාරු තත්ත්වයකින් තමයි ඉන්නේ. ඒ නිසා ඒ මුදලින් ළමයින්ට පොත් ටික ගන්න පුළුවන්. අවුරුද්ද අවසාන වෙනකොට ඒ සේවකයන් ඒ මුදල අරගෙන මට ස්තුති කරලා යනවා. ඒකත් bonus එකක් වාගෙයි. එහෙම කියනකොට අපට ලොකු සතුටක් ඇති වෙනවා. ඒ වාගේම අනෙකුත් රජයේ සේවකයන්ටත් මේක හම්බ වුණොත් හොඳයි. අද රජයේ සේවකයන්ට හම්බ වෙන්නේ salary advance, festival advance වාගේ ආපහු ගෙවන දේවල් නේ. ඒ නිසා රජයේ සේවකයන්ටත් අවුරුද්ද අවසානයේදී attendance bonus ගෙවන ක්‍රමයක් ඇති කළොත් ඒ මුදලින් ඒ අයගේ ළමයින්ට පාසල් පොත් ටික අරගෙන දෙන්න පුළුවන්. ඒ වාගේම අලුත් අවුරුද්දට අවශ්‍ය වියදම් සඳහා ඒ මුදල පාවිච්චි කරන්න පුළුවන්.

අපේ ගරු ඇමතිතුමා අලුතින් යමක් හිතන්න පුළුවන් කෙනෙක්. අර්ථ ශාස්ත්‍රඥයන්ගේ ක්‍රමයට යට වෙන්නේ නැතිව අලුත් නිර්මාණයක් කරන්න පුළුවන් ඇමතිවරයෙක්. එතුමා මේ වැඩ පිළිවෙළ තවත් ශක්තිමත් කරලා ඉදිරියේදී මේ මහා බලගතු අරමුදල, එහි සාමාජිකයන්ගේ ප්‍රයෝජනය සඳහා යොදවන්නට එතුමාට ශක්තිය, ධෛර්යය ලැබේවායි කියා මා ප්‍රාර්ථනා කරනවා.

තවත් ප්‍රශ්න කිහිපයක් ගැන කථා කරන්න තිබෙනවා. නමුත් කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙන නිසා මම ඒ ගැන කථා කරන්න යන්නේ නැහැ. කම්කරු ජනතාව හැටියට අද ඒ අයට ලැබෙන පඩිය රුපියල් 2,500කින් වැඩි කරන්න ඕනෑය කියා අපි යෝජනා කළා. තවම මේක සිද්ධ වෙලා නැහැ. අත ගගා ඉන්නවා. මම කම්කරු ඇමතිවරයා වශයෙන් සිටි කාලයේදී හදිසි නීතිය යටතේ ගැසට් කරලා පඩි වැඩි කළා. එතකොට ඔය මණ්ඩල එකක්වත් නැහැ. ඒක දෙන්න පුළුවන්ද කියා මම ටිකක් සොයා බැලුවා. ඒ ආයතනවල අයිතිකරුවන් ඇවිල්ලා කිව්වා, ඒක දෙන්න පුළුවන්ය කියා. නමුත් අපි යන්නේ පඩිපාලක සභාව හරහායි. එහෙම ගියාම හරි ජරමර. ඒක නිසා අපි හදිසි නීතිය යටතේ අවශ්‍ය වෙලාවට පඩි වැඩි වීම කළා. ඒක අඩු කළේ නැහැ. ඒ නිසා ඒ විධියේ වැඩ පිළිවෙළකට යන්නය කියා අදත් මම මේ රජයට යෝජනා කරනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

තවත් විධියක් තිබුණා නේ. පනතක් ගෙනැල්ලා නීතිගත කළා, මෙච්චර ගණනකින් වැටුප් වැඩි විය යුතුයි කියා. ඒ අනුවත් වුණා නේ.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

ඒකත් වුණා. මම කිව්වේ හදිසි නීතිය ගැන නොවෙයි, ඒ යටතේ කළාය කියලා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
හදිසි නීතිය ප්‍රකාශයට පත් කළා නේ.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
හදිසි නීතිය යටතේ තමයි අපි තවමත් ඉන්නේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒක ඉවත් කළා නේ.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මේ රටේ අත්‍යවශ්‍ය දේවල්වලට අපි හැම දාම හදිසි නීතිය පාර්ලිමේන්තුවට ගෙනැල්ලා ප්‍රකාශයක් කරනවා.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நெடுஞ்சாலைகள், உயர்கல்வி மற்றும் முதலீட்டு ஊக்குவிப்பு பிரதி அமைச்சர்)
(The Hon. Eran Wickramaratne - Deputy Minister of Highways, Higher Education and Investment Promotion)
ඒක ඉවත් කරන්න ඕනෑ. දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් ඉවත් කරන්න ඕනෑ, හදිසි නීතියක් හැටියට.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු වාසුදේව නානායක්කාර මැතිතුමාගේ කීමත් මම අහනවා. කොහොම හරි මේක කරන්න පුළුවන්. හැබැයි, එක ක්‍රමයයි තිබෙන්නේ. එසේ කරන කොට ආයතනය කඩා නොවැටෙන්න අවශ්‍ය කරන සහයෝගය රජයෙන් ලබා දෙන්න ඕනෑ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
අපි වැඩ කරන අය ගැන විතරක් බැලුවොත් ආයතනය දියුණු වෙන්නේ නැහැ. ඒ අය වෙනුවෙන් අපි incentive ක්‍රමයක් ඇති කරන්න ඕනෑ. දැනට නොයෙකුත් ක්‍රම තිබෙනවා. ඒවා විධිමත් කරන්න ඕනෑ. ඒ වාගේම ඒ වැඩ පිළිවෙළට සම්බන්ධ වන කර්මාන්තවල නියුතු අයට යම් විධියකින් සහයෝගය ලබා දෙන්න අපට පුළුවන්. කැසිනෝ ගහන්න දෙන සහන ගැන අප කවුරුත් දන්නවා නේ. බදු ඔක්කෝම අයින් කරලා මේ රටේ තිබෙන කර්මාන්තශාලාවලට සහන දුන්නොත් මීට වඩා හොඳ වේතනයක්, ජීවන තත්ත්වයක් මේ රටේ කම්කරු ජනතාවට ලබා දෙන්න පුළුවන්. මෙය රජයේ සේවකයාටත් ආදේශ කර ගන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි දෙක තුනක කාලයක් ලබා දෙන්න. මම ගරු ඇමතිතුමාගේ කාලයෙන් විනාඩි දෙක තුනක් ඉල්ලා ගන්නම්.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මම ඔබතුමාට කාලය ලබා දෙන්නම්.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
Thank you. අද අග්‍රහාර රක්ෂණ ක්‍රමය තිබෙනවා. රජය අග්‍රහාර රක්ෂණ ක්‍රමයට රජයේ සේවකයෙකුගෙන් මාසයකට රුපියල් 125ක් කපනවා. එම රක්ෂණ ක්‍රමයේ මුදල් කොහේ යනවාද කියලා සොයා ගන්න බැහැ. ඇස් කණ්ණාඩි දෙනවා; නොයෙක් නොයෙක් දේවල් කරනවා. මහා පරිපාලනයක් තිබෙනවා. නමුත් අපි මෙය වෙනස් කරලා එක රක්ෂණ ක්‍රමයක් මේ රටේ වැඩ කරන ජනතාවට සකස් කර දිය යුතුයි. අපි පොරොන්දුවක් දීලා තිබෙනවා. රාජ්‍ය අංශයට, පෞද්ගලික අංශයට, ස්වයංරැකියා කරන අයට, ඒ වාගේම ධීවරයන්ට රක්ෂණ ක්‍රමයක් ඇති කර දිය යුතුයි. අපි දැන් ධීවරයන්ට විශ්‍රාම ගියාම මාසයකට රුපියල් දහසක් පමණ ලබා දෙන රක්ෂණ ක්‍රමයක් ඇති කර තිබෙනවා. ගොවීන්ටත් තිබෙනවා. ගොවීන්ගේ රක්ෂණ ක්‍රමය කඩා ගෙන වැටුණා. නමුත් ධීවරයන්ගේ රක්ෂණ ක්‍රමය කඩා ගෙන වැටුණේ නැහැ. මම යෝජනා කරන්නේ අපේ පොරොන්දුව අනුව ඉතා ඉක්මනින් මේ රටේ හැම කෙනෙකුටම රක්ෂණාවරණයක් ලබා දෙන්න කියලායි. අපි සෞඛ්‍ය අංශය බෙදා දීලායි තිබෙන්නේ. සෞඛ්‍ය අංශය පෞද්ගලික අංශයට බෙදා දීලා ඉවරයි. පෞද්ගලික අංශය ගත්තොත් හැම ගමකම දොස්තර මහත්තයෙක් ඉන්නවා. බෙහෙත් ගන්න ගියාම තුණ්ඩුවක් ලියා දෙනවා, ඩිස්පෙන්සරියෙන් බෙහෙත් ගැනීමට. ඒ වාගේ මේ හැම කෙනෙකුටම බය නැතුව ගිහින්, "මේ මගේ අයිතිය" කියලා පෙන්වා සෞඛ්‍යයට රක්ෂණයක් ලබා ගන්න පුළුවන් ක්‍රමයක්, health insurance එකක් ලබා දිය යුතුමයි. සුළු මුදලක් ගෙවන්න වෙයි. ඒකට කමක් නැහැ. රජයෙනුත් මුදලක් දමන්න. එතකොට රජයට එන බරත් අඩු වෙනවා. එහෙම අඩු කරලා health insurance ක්‍රමයක් ලබා දීමට අප යෝජනා කර තිබෙන දෙය ඉක්මනට ක්‍රියාත්මක කරන්නය කියලා මම ඉල්ලා සිටිනවා.

මම මීට වඩා කථා කිරීමට බලාපොරොත්තු වෙන්නේ නැහැ. ගරු ඇමතිතුමාටත් තිබෙන්නේ සුළු වේලාවක්. ගරු ඇමතිතුමනි, ඔබතුමා වාසනාවන්තයෙක්. ලක්ෂ ගණනක් වන කම්කරු ජනතාවගේ ආර්ථිකයට අනාගතයට බලපාන ඒ බලාපොරොත්තු ඉෂ්ට කිරීමට ඔබතුමාට ලැබුණු මේ වරම ගැන මගේ සතුට ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
The next speaker is the Hon. Athauda Seneviratne.

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කථාව ආරම්භ කරමින් -

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ඊළඟට කථා කරන්න අවස්ථාව තිබෙන්නේ මට නේද?

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
ගරු දි.මු. ජයරත්න මැතිතුමනි, දැන් කථා කිරීමට අවස්ථාව තිබෙන්නේ ඔබතුමාටද?

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු අතාවුද සෙනෙවිරත්න මැතිතුමාගේ නමයි කිව්වේ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මම ගරු අතාවුද සෙනෙවිරත්න මහතාගේ නම කිව්වා. ගරු දි.මු. ජයරත්න මැතිතුමනි, ඔබතුමා පැමිණි බව මා දැක්කේ නැහැ. දැන් ඔබතුමා කථා කරන්න.

[අ.භා. 4.03]

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම ගැන සන්තෝෂ වන ගමන් එය සකස් කිරීම ගැන හිටපු කම්කරු ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. මේ ගැන හැඟීමක් තිබෙන, දක්ෂ, ඒ වාගේම හොඳ ආගමානුකූල චින්තනයක් තිබෙන නව අධිකරණ හා කම්කරු සබඳතා ඇමතිතුමාට මෙම වැඩ පිළිවෙළ හොඳින් ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා.

කම්කරුවන් සම්බන්ධයෙන් කථා කරන කොට කියන්න ඕනෑ, ලෝකය පුරාම කම්කරුවන් හැටියට සිටියේ සම්පූර්ණයෙන්ම අනුන් යටතේ සේවය කරන වහලුන් බව. ඒකට විරුද්ධව වීම ආරම්භ වුණේ ඇමෙරිකාවේ චිකාගෝ නගරයේදී. අදටත් ලෝකයේ එය සමරනවා. අපිත් මැයි මාසයේ 1වැනිදා කම්කරුවන්ව එකතු කරලා, ඔවුන්ව ධෛර්යවත් කිරීම සඳහා කම්කරු දිනය සමරනවා. එංගලන්තයේත් ඒක ඇති වුණා. කාල් මාක්ස්තුමා සාමාන්‍ය ජනතාවගේ සාධාරණ ජීවත්වීම උදෙසා ධනපති පන්තියේ දේවල් සමානාත්මතාවයෙන් බෙදී යන ආකාරයේ ක්‍රියා මාර්ග ආරම්භ කළා. ලෝකය පුරා එලෙස ක්‍රියාත්මක වේගෙන යන කොට 1815 මාර්තු 2වැනිදා ඉඳන් 1948 වන තෙක් අපේ රට යටත්විජිතයක් වශයෙන් තමයි තිබුණේ. නිදහස ලැබීමෙන් පසුව 1956 දක්වා කම්කරු ජනතාවට සාමාන්‍ය තත්ත්වයෙන් තමයි ජීවත් වෙන්න සිදු වුණේ. 1956 දී එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා සහ, වෙද, ගුරු, ගොවි, කම්කරු කියන පංච මහා බලවේගය එකතු කර ඒ රජය පිහිටෙව්වා. සහ, වෙද, ගුරු කියන්නේ සමාජයේ දියුණු තත්ත්වයක සිටි පිරිසක්. එදා ගොවි, කම්කරු ජනතාව පහළින් සිටියේ. ඒ අය සංවර්ධනය කිරීම සඳහා, ඔවුන්ව සැපවත්ව ජීවත් කරවීම සඳහා ක්‍රියා මාර්ග හා වැඩ පිළිවෙළ සකස් කළා.

දිවංගත ටී.බී. ඉලංගරත්න මැතිතුමා එදා කම්කරු ඇමතිතුමා හැටියට සිටියා. එතුමා මුදල් ඇමතිවරයා හැටියටත් හිටියා. එතුමා තමයි රජයේ සේවකයන්ට දෛනික වේතනයක් ලබා දීමේ වැඩ පිළිවෙළ සකස් කළේ. ඒ වාගේම පෞද්ගලික අංශයේ සේවකයන් වෙනුවෙන් සේවක අර්ථ සාධක අරමුදල ආරම්භ කළේත් එතුමායි. ඉන් පසුව පැවැති ආණ්ඩු, ඇමතිවරු ඒක තව තවත් දියුණු තත්ත්වයට පත් කරලා ක්‍රියාත්මක කර ගෙන ආවා. නමුත් දැන් නුහක් ආයතන සේවක අර්ථ සාධක අරමුදල සඳහා වූ දායක මුදල් ගෙවනවා අඩුයි. රජයට සම්බන්ධ ආයතන වුණත් සේවකයන්ට රුපියල් කෝටි ගණනක පාරිතෝෂික මුදල් ගෙවන්න තිබෙනවා. මේ ගැනත් කල්පනාකාරීව බලා කම්කරු ජනතාව වෙනුවෙන් ඒ මුදල් ඒක රාශි කිරීමේ වැඩ පිළිවෙළක් රජය ක්‍රියාත්මක කරන්න අවශ්‍යයි. ඒ වාගේම පෞද්ගලික ආයතනත් බොහෝ විට කම්කරුවන්ට ගෙවිය යුතු සේවක අර්ථ සාධක අරමුදලේ දායක මුදල් නොගෙවන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. මම ඊයේ-පෙරේදා පත්තරේ තිබෙනවා දැක්කා, "අම්බුළුවාව ආයතනය සේවක අර්ථ සාධක අරමුදලේ දායක මුදල් ගෙවන්නේ නැහැ" කියා. මම ඒ ගැන සොයා බැලුවා. ඒ ආයතනය ලියා පදිංචි කළ දවසේ ඉඳන් මේ දක්වාම සේවක අර්ථ සාධක අරමුදල් ගෙවා තිබෙනවා කියා එම නිලධාරින් ප්‍රකාශ කළා.

සේවක අර්ථ සාධක අරමුදලේ දායක මුදල තීරණය වෙන්නේ සේවකයා ලබන පඩිය -පඩියෙන් සියයට ගණනක්.- අනුවයි. දැන් කම්කරුවන්ට ලැබෙන පඩිය එදිනෙදා ජීවත්වීමටවත් මදි. රජයේ සේවකයන්ට රුපියල් 10,000කින් පඩි වැඩි කරනවා කියා මේ රජය පසු ගිය ජනාධිපතිවරණයේදී පොරොන්දු වුණා. හැබැයි, රුපියල් 10,000ක් පඩි වැඩි කළේ නැහැ. හිටපු ජනාධිපතිතුමා පසු ගිය අය වැයෙන් රුපියල් 3,000ක් වැඩි කළා. ඒ රුපියල් 3,000ත් ඇතුළුව තමයි රුපියල් 10,000 දෙන්නේ. ඒ කියන්නේ, දැන් රුපියල් 5,000ක් දීලා රුපියල් 2,000ක් පස්සේ දෙන්නම් කියනවා. ඒ වුණාට මම කියන්න කැමැතියි, ජනතාවට දීපු පොරොන්දු අනුව ඒ රුපියල් 3,000ට අමතරව රුපියල් 10,000ක්ම වැඩි කරලා රුපියල් 13,000ක් දෙන්න කියා. මොකද, ජන්දයට ඉස්සෙල්ලා රජයේ සේවකයෝ බලාපොරොත්තු වුණේ, "අපට රුපියල් 10,000ක් හම්බ වෙනවා" කියා. එතකොට ඒ ගොල්ලෝ දන්නවා, රුපියල් 3,000ක් අනුමත කර තිබෙන බව. රුපියල් 13,000ක් ලබා ගන්න පුළුවන් කියන එකයි ඔවුන්ගේ චින්තනය වුණේ. ඒ චින්තනයට අනුව, දීපු පොරොන්දු ඒ ආකාරයෙන්ම ඉෂ්ට කරන්න කියා මම විශේෂයෙන්ම රජයෙන් ඉල්ලීමක් කරනවා.

අද සාමාන්‍ය කම්කරුවාට ලැබෙන පඩිය ජීවත් වෙන්න මදි. රජයේ සේවක පිරිසට ඒ මුදල් එකතු කිරීම හොඳයි. ඒකත් ඇතිද කියන්න බැහැ. සාමාන්‍ය වතු කම්කරුවකුට රුපියල් 300ක්, 350ක් පමණ වැඩි කරනවා. ඒ ගොල්ලන් රුපියල් 450ක්වත් කරන්න කියා ඉල්ලනවා. නමුත් අප කම්කරුවකුට දවසකට රුපියල් 1,000ක් ගෙව්වා. වතු කම්කරුවකුට ඒ ගණන ගෙවනවා. ඒ මිනිසුන් ජීවත් වෙන්නේ කොහොමද? වතු කම්කරුවාගේ පඩිය වැඩි කරන්න ඕනෑ. ලංකාවට වැඩියෙන්ම ආදායම ලැබෙන්නේ තේවලින්. ඒ වැඩ කරන කම්කරුවන්ට සාධාරණය ඉෂ්ට කරන්න ඕනෑ. මේ රජය එක ආසනයකට ගෙවල් 300ක් දෙනවා කියා තිබෙනවා. වතු කම්කරුවෝ තවමත් ජීවත් වෙන්නේ ලැයිම්වල. ඒක වැරැදියි. ලැයිම් කියන්නේ කාමර 10ක්, 15ක් පමණ එකට තිබෙන කාමර පේළියක්. නිදා ගන්න, කෑම හදන්න, දරුවන් හදා ගැනීම ආදී සියලුම දේවල් කරන්නේ එතැනයි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කළ වෙලාවෙන් තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
මෙන්න මේ තත්ත්වය නැති කරන්න ගම්මාන හදන්න ඕනෑ. එදා මම ඉඩම් ඇමතිවරයා හැටියට සිටිනකොට එම යෝජනාව කළා, ගම්මාන හදලා ගමේ ඉඳලා වැඩ කරන්න එන්න වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ කියා. ඒ අනුව, මම වතු කිහිපයක ගම්මාන හැදුවා. ඒගොල්ලෝ බොහොම හොඳින් ජීවත් වෙනවා. කම්කරු ජනතාවත් සාධාරණ ලෙස ජීවත් වෙන්න ඕනෑ. ඒ ගොල්ලෝ ලංකාවේ පුරවැසියෝ. ඒ ආකාරයේ වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. පඩියත් ඒ හා සමානව වැඩි කරන්න ඕනෑ කියා මම විශේෂයෙන්ම මතක් කරනවා. අද ජල සම්පාදන අංශය, රේල්ලුව, පුද්ගලික බස් අංශය ඔක්කොම පාරට බැහැලා මහා මාර්ගවල වැඩ කරන කම්කරුවන්ට ලැබෙන පඩි සම්බන්ධවයි, සැලකිලි සම්බන්ධවයි කලබල කරනවා; රජය මේ අයට සලකන්න ඕනෑ කියා කියනවා. ගොවි, කම්කරු ජනතාව තමන්ගේ දහඩිය මහන්සියෙන් තමන්ගේ ශක්තිය තුළින් ජාතිය

[ගරු දි.මු. ජයරත්න මහතා]

නගා සිටුවන්නේ; ජාතියට දෙයක් වෙන්න ඕනෑ කියා යමක් කරන්නේ.

එම නිසා ඒ අයට සාධාරණව ජීවත් වෙන්න ඕනෑ කරන මාර්ග සකස් කිරීම රජයේ පරම යුතුකමක්. එම වැඩ පිළිවෙළත් ක්‍රියාත්මක කරන්න ඕනෑ කියන එකත් මම රජයට මතක් කරන්න කැමැතියි. මේ වාගේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතු අතරම, අපේ කර්මාන්තශාලා තිබුණා. 1948 ඩොනමෝර් කොමිෂන් සභාව රට දෙකට බෙදන්නට කථා කරනකොට, සියයට 50ක් ඕනෑ කියා පොන්නම්බලම් මහත්තයා කියනකොට, එයාට කිව්වා, කර්මාන්තශාලාවක් දෙන්නම් කියා. ඒ අනුව උතුරු පළාතේ යාපන දිස්ත්‍රික්කයේ කර්මාන්තශාලා දෙකක් ඇති කළා. ඒ වාගේ තත්ත්වයක් 1948 වර්ෂයේ චින්තනයේත් තිබුණා. එතකොට දැන් ඒ කර්මාන්තශාලා කොහේද? ඒවා ක්‍රම ක්‍රමයෙන් නැති වෙලා ගිහිල්ලා. දැන් තරුණ පරපුර උදැල්ලෙන්, කැත්තෙන්, පොරොවෙන් වැඩ කරන්න කැමැති නැහැ. තරුණ පරපුර එන්නේ නැහැ. කර්මාන්තශාලාවල මැෂින්වලින් වැඩ කරන්න වෙනවා. කුඹුරු වැඩත් මැෂින්වලින් කරන්න වෙනවා. තේ දළු අතින් කඩන්නත් බැහැ. දියුණු රටවල තේ දළු කඩන්නේ මැෂින්වලින්. එවැනි තත්ත්වයක් ඇති වෙලා තිබෙන නිසා කර්මාන්තශාලා ඉදි කරලා මැෂින්වලින් ක්‍රියා කිරීමට පටන් ගන්න ඕනෑ. නැතිනම් අපට ලෝකයත් එක්ක ඉදිරියට යන්න බැරි වෙනවා. ඒ විධියේ වැඩ පිළිවෙළක් පිළියෙල කරන්න. [බාධා කිරීමක්] කාලය අවසන් බව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා සඳහන් කරනවා. මේ වාගේ විවාදයකදී විනාඩි 5යි, 10යි කථා කරන්න තිබෙන්නේ. විනාඩි 5කින්, 10කින් දෙකෝටි විසිහත් ලක්ෂයක ජනතාව වෙනුවෙන් කොහොමද කථා කරන්නේ? කොහොමද ඒගොල්ලන්ගේ ප්‍රශ්න ඉදිරිපත් කරන්නේ? මේ ගරු සභාව තිබෙන්නේ ඒකට නොවෙයිද?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
එහෙම කරන්නේ අපි නොවෙයි.

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
මේ ගරු සභාව පවත්වාගෙන යන්න රුපියල් කෝටි ගණනක් වියදම් කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලබා දුන්නේ මම නොවෙයි. ඔබතුමාගේ පක්ෂයෙන් තමයි එම කාලය ලබා දුන්නේ.

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ජනතාවගේ ප්‍රශ්න ඉදිරිපත් කරන්න විධියක් නැහැ. කථාව විනාඩි 5කට විනාඩි 10කට සීමා කරනවා. මුල් කාලයේ පාර්ලිමේන්තු රැස්වීම් පස් වරු 2.00ට පටන් ගත්තාම අපි එළිය වැටෙන තුරු කථා කරනවා. පැය 8ක්, 10ක් කථා කර තමන්ගේ අදහස් ඉදිරිපත් කරනවා. දැන් මෙතැනදී එක එක්කෙනාට විරුද්ධව චෝදනා ඉදිරිපත් කිරීම විතරයි කෙරෙන්නේ. සාධාරණව කරුණු ඉදිරිපත් කරන්න විධියක් නැහැ. මම මේ ආණ්ඩුවෙන් ඉල්ලනවා, මන්ත්‍රීවරුන්ට තමන්ගේ අදහස් ප්‍රකාශ කරන්න වුවමනා කරන කාලය ලබා දෙන්න කියා. එහෙම නැතිව ලෙවකන විධියට මේ වැඩ පිළිවෙළ සම්බන්ධව කථා කරන්න පුළුවන්කමක් නැහැ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට කාලය ලබා දීලා තිබෙන්නේ ඔබේ පක්ෂයේ සංවිධායකතුමා.

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
පාර්ලිමේන්තුව තිබෙන්නේ කථා කරන්නයි. [බාධා කිරීමක්] කථා කරන්න කෝ වෙලාවක්? හැම දාම විනාඩි පහක් ගියාම කථාව අවසන් කරන්න කියනවා. මොනවාද කියන්නේ? ඔබතුමා ආණ්ඩුවට ඉදිරිපත් කරන්න, මන්ත්‍රීවරුන්ට තමන්ගේ අදහස් ප්‍රකාශ කරන්න සාධාරණ කාලයක් දෙන්න කියලා. එහෙම නැති වුණෝතින් මේ පාර්ලිමේන්තුවෙන් ප්‍රයෝජනයක් නැති වෙනවා. අපි දවසකට පාර්ලිමේන්තුව සඳහා කෝටි ගණනක් වියදම් කරනවා. වියදම් කරලා, ලෙව කාලා යනවා. ඒකෙන් ප්‍රයෝජන ගන්නට පුළුවන්කමක් නැහැ. මීට වඩා තව හුඟක් කථා කරන්න තිබුණත් වෙලාව ඉවරයි කියන නිසා මම කථාව නතර කරනවා. නමුත් මම අදහසක් හැටියට මේ කාරණය ඉදිරිපත් කරනවා. කෝ! මන්ත්‍රීවරුන් තුන් දෙනායි නේ දැන් මේ සභාවේ ආණ්ඩුව වෙනුවෙන් ඉන්නේ. කොහොමද අපි අදහසක් ඉදිරිපත් කරන්නේ? මන්ත්‍රීවරුන් තුන් දෙනායි ආණ්ඩුව වෙනුවෙන් මේ සභාවේ දැන් ඉන්නේ. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් 64 දෙනෙකු ඉන්නවා. 64න් තුන් දෙනායි දැන් ඉන්නේ. වැඩි පිරිසක් ඉන්නවා නම් ආණ්ඩුවට මේ කාරණා ඉදිරිපත් කරන්න අපට පුළුවන්. දැන් ඒක කියා ගන්නවත් විධියක් නැහැ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තූතියි, ගරු මන්ත්‍රීතුමා.

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
පාර්ලිමේන්තුවේ වැඩ වාගේම මේ රටේ ගොවි, කම්කරු ජනතාවගේ ජන ජීවිතය සාර්ථක කිරීම සඳහාත් වැඩ පිළිවෙළක් සකස් කරන්න කියන එක මම බොහොම ගෞරවයෙන් ඉල්ලනවා. කථික ලැයිස්තුවේ මගේ නම තිබෙන්නේ දෙකට. මම දන්නේ නැහැ, ඔබතුමා වෙන නමක් කොහොම ගත්තාද කියලා. ඒක මට තේරෙන්නේ නැහැ. මගේ නම දෙකටයි තිබෙන්නේ. ඔබතුමාට අයිතියක් තිබෙනවා, පළමුවැනියෙන්ම නැඟිටින කෙනාට කථාව කරන්න ඉඩ දෙන්න. ඒක නොවෙයි කරන්නේ. මේ සභාව Standing Ordersවලට විරුද්ධවයි ක්‍රියා කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා වැරැදියි කියලා කියන්න බැහැ. නමුත් කථික ලැයිස්තුවේ මගේ නම තිබෙන්නේ දෙකටයි. ඒකයි මම නැඟිට්ටේ. බොහොම ස්තූතියි.

[අ.භා. 4.16]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - கொள்கை உருவாக்கம், பொருளாதார அலுவல்கள், சிறுவர், இளைஞர் மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Harsha De Silva - Deputy Minister of Policy Planning, Economic Affairs, Child, Youth and Cultural Affairs)
අපේ හිටපු අගමැතිතුමා හිතේ වේදනාවකින් කථා කළේ. එතුමාට කැපිල්ලක් තිබෙන බව එතුමාගේ කථාව තුළින් මුළු

රටටම පෙන්වලා දුන්නා. එතුමාට කථා කරන්න දුන්නේ විනාඩි පහයි කිව්වා. කථික ලැයිස්තුවේ එතුමා දෙවැනියට දාලා තිබුණාට මොනයම් හේතුවක් නිසා හෝ ඔහුට ඉස්සරහින් තව කවුරු හරි - අපේ අතාවුද හිටපු ඇමතිතුමා- දාන්න උත්සාහ කළා කියලා කිව්වා. එතුමා කලකිරිලා වාගේයි ඉන්නේ. සමහර විට විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා, විපක්ෂ නායකවරයා ඔහුට සලකන ක්‍රමය නිසා වෙන්න ඇති. ඒකට ඉතින් අපට කරන්න දෙයක් නැහැ, හිටපු ගරු අගමැතිතුමනි. අපට දීලා තිබෙන වෙලාව අපි පාවිච්චි කරලා මේ සභාවේ කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා.

රුපියල් 10,000කින් පඩි වැඩි කරනවා කියලා කිව්වාට 10,000කින් පඩි වැඩි කළේ නැහැ කියලා හිටපු ගරු අගමැතිතුමා - අපේ ගරු මන්ත්‍රීතුමා-චෝදනාවක් ඉදිරිපත් කළා. ඇත්ත වශයෙන්ම විපක්ෂයේ ඉන්න කොට අපි දිගින් දිගටම කිව්වේ පඩිය රුපියල් 10,000කින් වැඩි කරන්න ඕනෑය කියලායි. අපි රුපියල් 10,000කින් පඩි වැඩි කරන්න ඕනෑය කියලා ඉල්ලපු අවස්ථාවේදී තමයි එවකට තිබුණු රජය රුපියල් 3,000කින් පඩිය වැඩි කළේ. රුපියල් 10,000ක් වෙන්න නම් ඉතුරු රුපියල් 7,000 වැඩි කරන එක තමයි අපේ වග කීම. ඒක තමයි අපි කළේ. අපි දිගින් දිගටම කිව්වේ රුපියල් 10,000කින් පඩි වැඩි කරන්න ඕනෑය කියලායි. හිටපු ගරු අගමැතිතුමා මේ කියන කථාව කිසි විධියකටවත් අපට පිළිගන්න හැකියාවක් නැහැ. නැවතත් අපි -

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මට පොඩි පැහැදිලි කර ගැනීමක් කර ගන්න අවශ්‍යයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ගිය රජයෙන් වැඩි කළ රුපියල් 2,200 දීමනාවත් ඕකට එකතු වෙනවාද? තමුන්නාන්සේලා ඒකත් දෙනවාද?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු මන්ත්‍රීතුමනි, අද වෙන කොට රජයේ සේවකයෙකුගේ අවම වැටුප රුපියල් 30,450ක් වෙනවා. ඒ කියන්නේ මූලික පඩිය, සියයට 20 දීමනාව ඇතුළු එකතු වෙන සියලු දීමනා සහ රුපියල් තුන්දාහේ ගිය මාසයේ ලැබුණු වැඩි කිරීම, මේ මාසයේ වැඩි කළ පන්දාහ එක්ක රුපියල් 30,450ක විතර ප්‍රමාණයක් අවම වැටුප වශයෙන් ලැබෙනවා. ඒක තමයි යථාර්ථය.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

ඔබතුමා කියන ඔය සංඛ්‍යා ලේඛන වැරැදියි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

නැහැ. මගේ සංඛ්‍යා ලේඛනවල කිසි වැරැද්දක් නැහැ. කිසිම විධියක වැරැද්දක් නැහැ. ඔබතුමාට මම කියනවා, ඒ ගණන හදලා බලන්න කියලා. ඒක වැරැදියි නම් ඔබතුමාට මේ ප්‍රශ්නය නැවතත් ඉදිරිපත් කරන්න පුළුවන්. ඒකට අපි උත්තරයක් දෙන්නම්. සියලුම දීමනා සමඟ රාජ්‍ය අංශයේ සේවකයෙකුට ලැබෙන වැටුප රුපියල් 30,000 ඉක්මවලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉදිරිපත් කරලා තිබෙන නියෝගවලින් අපි උත්සාහ කරන්නේ රටේ වැඩ කරන ජනතාවට ලබා දිය යුතු සහන ලබා දීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නයි. මට මේ අවස්ථාවේ එක කාරණයක් මතක් වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දවසක් අපි මුදල් හා ක්‍රම සම්පාදන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ හිටියා. ඒ, වැඩි කාලයක් නැහැ, මීට මාස තුන, හතරකට කලින්. එවකට මුදල් ඇමතිවරයා හැටියට හිටපු ජනාධිපති ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ඒ උපදේශක කාරක සභාවට ඇවිල්ලා හිටියා. එතුමාගෙන් මම ඒ අවස්ථාවේදී ප්‍රශ්නයක් ඇහුවා. "ගරු ජනාධිපතිතුමනි, මුදල් ඇමතිවරයා හැටියට ඔබතුමා 2012 අවුරුද්දේ මේ ගරු සභාවේ සම්මත වුණු සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනතට අනුව පොරොන්දු වෙලා තිබෙන අර්ථ සාධක අරමුදලෙන් සියයට 30 දෙන්නේ නැත්තේ ඇයි?" කියලා එතුමාගෙන් මම ඇහුවා. එතකොට එවකට හිටපු ජනාධිපතිතුමා මට කිව්වා, "ඒක මට ඕනෑ වෙලාවට ඕනෑ නම් දෙනවා. නැත්නම් නොදී ඉන්නවා"ය කියලා. එදා තමයි එතුමා සහ මම අතර යම්කිසි මත භේදයක් ඇති වුණේ. මම කිව්වා, "ගරු ජනාධිපතිතුමනි, ඒක ඒකාධිපති ක්‍රමවේදයක්. එහෙම කරන්න බැහැ. මේක පාර්ලිමේන්තුවෙන් සම්මත වුණු පනතක්. ඒ සම්මත වුණු පනත අනුව පොරොන්දු වෙලා තිබෙන දේ ඔබතුමා දෙන්න බැහැ කියලා කියන්නේ කොහොමද?" කියලා. එවැනි ක්‍රමවේදයකට තමයි ඒ කාලයේ මේ රට පාලනය වුණේ. ඒ විධියට තමයි අවුරුදු ගණනක් තිස්සේ අර්ථ සාධක අරමුදල් නොගෙවා රජයේ ආයතනවල වැඩ කළේ.

අපේ ගරු ආර්.එම්. රංජිත් මද්දුමබණ්ඩාර ඇමතිතුමාත් එක්ක මම දවසක් බස් වගයක් බෙදන්න උඩහමුල්ල බස් ඩිපෝ එකට ගියා. එතැන හිටපු Depot Manager සහ Accountant මට කිව්වා, ඔහු මේ වන කොට හතර වතාවක් හිරේ ගිහිල්ලා තිබෙනවාය කියලා. මම ඇහුවා, " හතර වතාවක් හිරේට ගියේ මොනවා කරලාද?" කියලා. සේවකයින්ට EPF ගෙවලා නැතිව කියලා ඔහු කිව්වා. අවුරුදු ගණනක් තිස්සේ -අවුරුදු දහයක් විතර- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකයින්ට EPF ගෙවලා නැහැ. EPF ගෙවන්නේ නැති වුණාම හිරේ දමන්නේ කවුද? එතැන වැඩ කරන Depot Manager. මොකද, ඔහු තමයි උසාවියට යන්නේ. ඒ මහත්තයා මට කියනවා, "අනේ! අපේ නියෝජ්‍ය ඇමතිතුමනි, මට වෙච්ච වැඩේ බලන්න. මගේ EPF එකවත් ගෙවලා නැහැ. නමුත් මම හතර වතාවක් හිරේ ගිහිල්ලා තිබෙනවා, EPF ගෙවන්නේ නැතිව" කියලා. රජයේ ආයතනයක EPF ගෙවන්නේ නැත්නම් ඒ ආයතනවල අධ්‍යක්ෂවරු වැඩ කටයුතු කරගෙන යන්නේ කොහොමද? පෞද්ගලික ආයතනයක EPF ගෙවේවේ නැත්නම් අල්ලලා හිරේ දමනවා. මෙන්න මේ විධියට තමයි මේ රට පාලනය කරලා තිබෙන්නේ.

එවකට විපක්ෂයේ හිටපු මන්ත්‍රීවරු හැටියට අපි අහපු ප්‍රශ්නවලට පිළිතුරු නොදී බොරු කියලා පැනලා ගියා. අද භාණ්ඩාගාරය දිහා බලනකොට අපිට පෙනෙනවා, මොකක්ද මේකට වෙලා තිබෙන්නේ කියලා. අර්ථ සාධක අරමුදල සම්පූර්ණයෙන්ම පාවිච්චි කළේ මොනවාටද? "Temple Trees" ඉස්සරහ හෝටලයක් හදනවා, හයිට් රීජන්සි හෝටලය කියලා. කොටසක් රුපියල් 30ක් වූ කොම්පැනියකට තමයි ඒ ආයතනය බාර දීලා තිබෙන්නේ. Golden key එකේ, කඩා වැටිච්ච Ceylinco depositorsලාගේ සල්ලි තිබුණේ ඒ ආයතනයේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ආයතනයට රුපියල් මිලියන 7,500ක ලංසුවක් ඇවිල්ලා තිබුණා. ඒ ලංසුව පාවිච්චි කළා නම් ඒ depositorsලාට ඒ සල්ලි දෙන්න තිබුණා. මොකක්ද කළේ? ඒ කටයුත්ත කරනවා වෙනුවට ගාමිණී සෙනෙරත් ඇතුළු තවත් දෙදෙනෙකු ඉන්න, ඊට සති කීපයකට කලින් පටන් ගත්ත, කොටසක වටිනාකම රුපියල් 30ක් පමණක් වූ ආයතනයකට ඒ ලංසුව ලබා දුන්නා. ඒ ලංසුව දීලා මොකක්ද කළේ? ඒ ලංසුව දීලා අර්ථසාධක අරමුදලින් රුපියල් බිලියන 5ක් - රුපියල් කෝටි 500ක් - ගත්තා. රුපියල් කෝටි 500ක් අරගෙන මොකද කළේ? ගාමිණී සෙනෙරත් ඇතුළු තුන් දෙනෙකුගේ ආයතනයට මෙන්න මේ හෝටලය ලබා දෙන්න කියලා කිව්වා. එවකට තට්ටු 12කට හදලා තිබුණු හෝටලය දැන් තට්ටු 40 ගණනකට හදා ගෙන යනවා. මේවා අමූලික දූෂණ; අමූලික වංචා. වැඩ කරන ජනතාවගේ මුදල් හොරකම් කිරීමේ ව්‍යාපාරයක් තමයි ගාමිණී

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

සෙනෙරත්ලා එක්ක එකතු වෙලා කළේ. දැන් ආ ගිය අතක් නැහැ. පැනලා ගිහිල්ලා. කෝ, මහ බැංකුවේ අධිපතිවරයා? ඔහුගේ යටතේ නොවෙයිද, අර්ථ සාධක අරමුදල තිබුණේ? පාස්පෝට් එකත් දැන් අරගෙන තිබෙන නිසා පැනලා යන්න බැරි වෙලා තිබෙනවා. අමූලික දූෂණ, වංචා නිසා තමයි වැඩ කරන ජනතාවට ඔවුන්ට ලැබිය යුතු ප්‍රතිලාභයවත් මේ අර්ථ සාධක අරමුදල හරහා දෙන්න බැරි වුණේ. ඒක තමයි එවකට හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මුදල් ඇමතිවරයා හැටියට මට කිව්වේ, "මට ඕනෑ නම් දෙනවා, ඕනෑ නැත්නම් දෙන්නේ නැහැ" කියලා. මොකද, දෙන්න ක්‍රමයක් නැහැ. මේක හෝදාපාළුවට ලක් වෙලා තිබෙනවා. මේකෙන් සම්පූර්ණයෙන්ම අයුතු විධියට ප්‍රයෝජන අරගෙන තිබෙනවා.

2012 පනතින් වුණු පොරොන්දුව තමයි දැන් ඉෂ්ට කරන්න සූදානම් වන්නේ. අපේ ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමාගේ නියෝගයට අනුව, වැඩ කරන, අර්ථ සාධක අරමුදල් හිමි ඒ සියලුම ජනතාවට හැකියාවක් - අවස්ථාවක් - තිබෙනවා, "S" ආකෘතිය පුරවලා, ඒ "S" ආකෘතිය හරහා ගෙයක් ගන්න, එහෙම නැත්නම් තමන්ගේ සෞඛ්‍ය වැඩ කටයුත්තක් සඳහා - operation එකක් කරන්න නම් - අර්ථ සාධක අරමුදලෙන් සියයට 30ක් ලබා ගන්න.

ඇයි මේ දේ මෙපමණ කල් කළේ නැත්තේ? මෙපමණ අවුරුදු ගණනක් තිස්සේ මේ දේ කළේ නැත්තේ ඇයි? මහා ලොකුවට බොරුවට කථා කරනවා, "වැඩ කරන ජනතාව ගැන කථා කරන්නේ අපි තමයි, වැඩ කරන ජනතාවගේ දුක දන්නේ අපි තමයි" කියලා. නමුත් ඇත්ත වශයෙන්ම වැඩ කරන ජනතාව ගැන කිසි විධියකින්වත් උනන්දු වුණේ නැහැ. වැඩ කරන ජනතාවගේ පඩි වැඩි කළේ නැහැ. අවම වශයෙන් Cost of Living Index එකවත් ගැසට් කළේ නැහැ. අපි දැන් ඒ සියලුම දේ කරන්න බැඳිලා ඉන්නවා. වැඩ කරන ජනතාව වෙනුවෙන් අපි ඒ සියලුම දේ ලබා දෙනවා. ඒ සියලුම දේ ලබා දෙන්න අපි දැනටමත් වැඩ කටයුතු පටන් අරගෙන තිබෙනවා.

අපි කිව්වා වාගේම අද වෙන කොට රුපියල් 10,000කින් රජයේ සේවකයන්ගේ පඩි වැඩි කරන්නට මූලික පියවර අරගෙන තිබෙනවා. පෞද්ගලික අංශයේ හැමෝටම අපි කියලා තිබෙනවා, කරුණාකරලා අවම වශයෙන් රුපියල් 2,500කින්වත් සේවකයන්ගේ පඩි වැඩි කරන්න කියලා. මම පෞද්ගලිකව ඔවුන් සමඟ කථා කළා. ඒ සමහර අය කිව්වා, "ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අපි ජනවාරි මාසයේදී සේවකයන්ගේ පඩි වැඩි කළා. ආණ්ඩුවෙන් කියනකල් ඉන්නේ නැහැ, පඩි වැඩි කරන අවස්ථාවලදී අපි වැඩි කරනවා" කියලා. අපි ඒක පිළිගන්නවා. පෞද්ගලික අංශයේ වැඩ කරන ජනතාව දන්නවා, ඔවුන්ගේ පඩි දිගින් දිගටම, අවුරුද්දෙන් අවුරුද්ද යම් කිසි ප්‍රමාණයකින් වැඩි වෙන බව. නමුත් පඩි වැඩි නොවුණු කට්ටියත් ඉන්නවා. ඒ නිසා පඩි පාලක සභා 40ක් එක්ක මේ දවස්වල සාකච්ඡා කර ගෙන යනවා. ඇන්ටන් මාකස් ඇතුළු වෘත්තීය සමිති කැඳවුම්කරුවන් ලියුම් ලියලා කියනවා, "පඩි පාලක සභා හරහා යන කොට අවම වැටුප විතරයි වැඩි වෙන්නේ, අනෙක් වැටුප් වැඩි වෙන්නේ නැහැ, ඒ පිළිබඳවත් සොයා බලා වැඩ කටයුතු කරන්න" කියලා. අපි ඔවුන් කියන දේවල් අහනවා. වැඩ කරන ජනතාව දහස් ගණනක් වෙනුවෙන් ඔවුන් පෙනී සිටිනවා. ජාතික කම්කරු උපදේශක සභාවේ සාමාජික වෘත්තීය සමිති වෙනුවෙන් අපට ලියුම් එවලා තිබෙනවා, ලංකා වෘත්තීය සමිති සම්මේලනය, ලංකා වෙළෙඳ, කර්මාන්ත හා පොදු සේවක සංගමය, ලංකා කම්කරු සම්මේලනය, අන්තර් සමාගම් සේවක සංගමය, නිදහස් වෙළෙඳ කලාප පොදු සේවා සේවක සංගමය, එක්සත් කම්කරු සම්මේලනය, ලංකා වතු සේවා සංගමය, එක්සත් වතු කම්කරු වෘත්තීය මධ්‍යස්ථානය යනාදී වශයෙන් වෘත්තීය සමිති දහයක්. ඔවුන්ගේ අදහස් අපි ලබා ගන්නවා. අපි ඒ අදහස් ලබා ගෙන ඒ සේවායන් සමඟ සාකච්ඡා කරමින් ඉන්නවා, කොහොමද මේ වැඩේ කරන්නේ කියලා. මේ වැඩේ තුවක්කුවක් පෙන්වලා බලෙන් හෝ හදිසි නීතිය යටතේ අපට කරන්න පුළුවන් දෙයක් නොවෙයි. අපි මේ දෙපැත්තම බලන්න ඕනෑ.

ඒ කෙසේ වෙතත්, ජීවත්වීම සඳහා අපි දැනට ජනතාවට බොහෝ දේ ලබා දීලා තිබෙනවා. බඩු මිල සැහෙන දුරට අඩු වෙලා තිබෙනවා. ඩීසල් ටිකක් ගැහුවොත්, පෙට්‍රල් ටිකක් ගැහුවොත්, පාන් ගෙඩියක් ගත්තොත්, සීනි ටික ගත්තොත්, කිරි පිටි ටික ගත්තොත්, සැමන් ටින් එක ගත්තොත් මේවායේ මිල සැහෙන දුරට අඩු වෙලා තිබෙනවා. අපේ නෝනා මහත්මයා කඩේට ගිහිල්ලා ඇවිල්ලා මට කිව්වා, "හර්ෂ, මේ වෙන කොට අපේ ජීවන මිල යම් කිසි විධියකට අඩු වෙලා තිබෙන බව මට දැනෙනවා" කියලා. නාරාහේන්පිට මාකට් එකෙන් බඩු ගන්න කොට තේරෙනවා, බඩුවල මිල අඩු වෙලා තිබෙන බව.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Deputy Minister, you have only one more minute.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
හොඳමයි.

බඩු මිල අඩු වෙලා නැහැ කියලා කවුරු හරි කියනවා නම්, ඒක අසත්‍ය කථාවක්. ටෙලිවිෂන් එක බලන අය, මේ ගරු සභාවේ ඉන්න මන්ත්‍රීවරු, ඇමතිවරු ඇතුළු හැමෝම දන්නවා, බඩු මිල යම් කිසි ප්‍රමාණයකට අඩු වෙලා තිබෙනවා කියලා. මෙතැන දෙපැත්තක් තිබෙනවා. එක පැත්තකින් අපි බඩු මිල අඩු කරනවා. අනෙක් පැත්තෙන් ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා ඔවුන්ගේ පඩි වැඩි කරනවා. එවකට පැවැති රජය කළ යුතුව තිබුණු වැඩ කටයුතු හා කාලයක් තිස්සේ නොකළ වැඩ කටයුතු සම්බන්ධයෙන් අපි වහාම කටයුතු කරනවා.

අපේ ආණ්ඩුව පත් වුණාට පස්සේ අපි මේ පාර්ලිමේන්තුවේදී රැස් වෙන තුන් වන, නැත්නම් හතර වන සතිය. හැකි ඉක්මනින් මේ අර්ථ සාධක අරමුදලේ සියයට 30 ලබා දීම සඳහා මූලික වැඩ කටයුතු ආරම්භ කරන්න "s" ආකෘති පත්‍රය පිරවිය යුත්තේ කොහොමද කියන නියෝග අද ඉදිරිපත් කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාල වේලාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තූතියි.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
හර්ෂ ද සිල්වා ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් එක ප්‍රශ්නයක් අහනවා. RDA එකේ සේවක පිරිසක් අද පාරේ වාඩි වෙලා ඉන්නවා. ඒ අය නැවත සේවයේ පිහිටුවන්න ඔය වාගේ හැඟීමකින් කටයුතු කරන්න බැරිද?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නයට සෘජු පිළිතුරක් දෙන්නම්. ඒ සමහර අයගේ රස්සා අහිමි වෙලා තිබෙන්නේ, කිසිම විධියක ලියකියවිල්ලක් නැතුව, කොන්දේසියක් නැතුව, ගිවිසුමක් - agreement - නැතුව වැඩ පටන් අරගෙන තිබුණා නම් විතරයි. යම් යම් විධියට අතපසු වෙලා තිබෙන වැඩ නැවත වහාම

පටන් ගන්න කියලා අපේ අමාත්‍යාංශය හරහා නිර්දේශ යවලා තිබෙනවා. රජයේ සංවර්ධන ව්‍යාපෘති නැවැත්වීම නිසා ඒ ගොල්ලන්ගේ රැකියා නැති වෙලා තිබෙනවා කියලා කවුරු හරි කියනවා නම්, ඒක ඇත්ත කථාවක් නොවෙයි.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගිවිසුම් අත්සන් කරපු සියලුම සංවර්ධන වැඩ ඉදිරියට ක්‍රියාත්මක කරනවාද?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
පටන් අරගෙන තිබෙන වැඩ කටයුතු භාගෙට කරලා තිබෙනවා නම් ඒවා නැවත පටන් ගන්නවා. ඒවාගේ විශාල ප්‍රශ්න තිබෙනවා. සාමාන්‍යයෙන් ගමේ සිද්ධ වන වැඩ කටයුතු එන සතිය වෙන කොට ආරම්භ වෙනවා. කිසිම විධියකින් ඒවා නවත්වලා නැහැ.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ඔබතුමා ඒ සේවක ප්‍රශ්නය ගැනත් බලන්න.

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, what is your point of Order?

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත පිළිබඳ උපදේශක කාරක සභාව හෙට පැවැත්වෙනවා කියලා තමයි අපි දැනුවත් වුණේ. කලින් එහෙම අදහසක් තිබුණා. නමුත් මේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත පිළිබඳ සංශෝධන ඉදිරිපත් කිරීමට සාකච්ඡා කරන්න උපදේශක කාරක සභාව හෙට පැවැත්වෙන්නේ නැහැ. ඒ පිළිබඳව මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා. මේක බරපතළ ප්‍රශ්නයක්. හෙට ඉතාම සීමිත කාලයකදී තමයි මේ ගැන විවාද කරන්නේ. ඒ නිසා අඩුම ගණනේ උපදේශක කාරක සභාව කැඳවන්න කටයුතු කරන්න. එය කැඳවන්න කටයුතු කරලා නැහැ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
එය ගරු කථානායකතුමාගේ අවධානයට යොමු කරනවා.

The Hon. Athauda Seneviratne, please.

[අ.භා. 4.31]

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පළමුවෙන්ම යම් කරුණක් ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි. ඒ වාගේම ජනාධිපතිතුමාගේ අවධානයටත් යොමු කරන්න කැමැතියි. මේ වෙන කොට කම්කරු දෙපාර්තමේන්තුවට අවුරුදු එකසිය ගණනක් වෙනවා. ගරු ඇමතිතුමනි, සුදු මහත්තුරු වතුකරයේ වැඩට ඉන්දියාවෙන් කම්කරුවන් ගෙනඅා කාලයේ පටන්ගත් පැරණිම දෙපාර්තමේන්තුවක් තමයි කම්කරු දෙපාර්තමේන්තුව. ලක්ෂ 70ක පමණ පිරිසක් කම්කරු අමාත්‍යාංශයෙන් සේවය ලබන්න සිටිනවා. මම කියන්නේ නැහැ ඔබතුමා අදක්ෂ ඇමතිවරයෙක් කියලා. ඔබතුමා දක්ෂ ඇමතිවරයෙක්; තරුණ ඇමතිවරයෙක්. නමුත් ප්‍රශ්නය මෙකයි. මේ සියලු දේවල් කරන්න කාලය අවශ්‍යයි, මහන්සි වෙන්න අවශ්‍යයි. ඕනෑම පුද්ගලයෙකුට කළ හැකි සීමාවක් තිබෙනවා. ඒ නිසා මේ පැරණි දෙපාර්තමේන්තුව නැවත අලුත් කරයි කියා බලාපොරොත්තු වෙමින් කම්කරු දෙපාර්තමේන්තුව විශේෂ ඉල්ලීමක් කරලා තිබෙනවා. ඒ නිසා මම විශේෂයෙන් මේ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරනවා. ඔබතුමාට මේ කටයුත්ත තනිවම කරන්න බැරි වෙන්න පුළුවන්. නමුත්, කම්කරු දෙපාර්තමේන්තුවේ වැඩ පිළිවෙළක් ගැන මේ සභාවේ කථා කරන වෙලාවේ ඒ කරුණ ජනාධිපතිතුමාගේ අවධානයට යොමු කරනවා.

මම මතක් කරන්න කැමැතියි, මේ වැඩ පිළිවෙළ ගැන අපි කල්පනා කළේ එක්දහස් නමසිය හතළිස් ගණන්වල සිට බව. ඒ වාගේම, සේවකයන්ගේ සුබසාධන වැඩ පිළිවෙළ ඇති කිරීම පිළිබඳව කමිටුවකුත් පත් කරලා සාකච්ඡා කරන්න යෙදුණා. එහි ප්‍රතිඵලයක් හැටියට, ඒ ඉදිරිපත් කිරීම් අනුව, ඒ වාගේම ඔබතුමා මතක් කළා වාගේ සර් අයිවර් ජෙනින්ස් මහත්මයාගේ ප්‍රධානත්වයෙන් නිකුත් කළ කමිටු වාර්තාවකුත් තිබෙනවා. ඒ අනුව, 1956 දී එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමාගේ නායකත්වයෙන් ටී.බී. ඉලංගරත්න මැතිතුමා කම්කරු ඇමතිවරයා වශයෙන් පත් කරලා, සේවක අර්ථ සාධක අරමුදල ඇති කිරීමේ පනත් කෙටුම්පත 1958 දී ඉදිරිපත් කරන්න යෙදුණා.

මේ පනත බොහොම වැදගත් පනතක්. මේ රටේ අතිවිශාල ජන කොටසකට සේවයක් වන පනතක්. කම්කරු ජනතාව සුඛිත මුදිත වෙන්න ඕනෑ. ඒ වාගේම ඔවුන්ට ජීවත් වීමට වියදම් කරන්න මුදල් තිබෙන්න ඕනෑ.ඒ අය නිරෝගී සම්පන්නව මේ රටේ නිෂ්පාදනයට දායක වන අය වෙන්න ඕනෑ. ඒක නිසා මේ දෙපාර්තමේන්තුව හරහා කෙරෙන වැඩ කටයුතු අපි ඉතාම වැදගත් කොට සලකන්න ඕනෑ.

ඉලංගරත්න මැතිතුමා 1946 දී රජයේ ලිපිකරු සේවා සංගමයේ සාමාජිකයෙක්. එතුමා රජයේ ලිපිකරුවෙක්. එතුමා එතැනින් දොට්ට වැටුණේ 1946 දී කරන ලද වැඩ වර්ජනයේ ප්‍රතිඵලයක් හැටියටයි. ඒ වාගේම එම වැඩ වර්ජනයේදී රජයේ ලිපිකරු සේවා සංගමයේ සභාපතිවරයාට වෙඩි තියලා ඔහු මරණයට පත් වුණා.

මැතිවරණ නිසා ඒ කාලයේ ඉඳලාම ධනේෂ්වර පන්තිය වැඩ කරන ජනතාවට සහන සලසනවා. මැතිවරණ නිසා තමයි මේ සියලු දේවල් පිළිබඳව කථා කරන්නේ. මැතිවරණය නොතිබුණා නම් රුපියල් 10,000 පඩි වැඩි වීමක් එන්නේ නැහැ. ගිය ආණ්ඩුව රුපියල් 3,000ක් වැඩි කළා. ඒ වාගේම මේ ආණ්ඩුව රුපියල් 10,000ක් වැඩි කරනවා කිව්වේ ඡන්දය බලාගෙනයි. දැන් බඩු මිල අඩු කරනවා කියන්නේත් හෙට අනිද්දා ඡන්දයක් එයි කියන බලාපොරොත්තුවෙන්.

ඡන්දය තමයි ඉතාම වටින්නේ. ඡන්දය හොඳින් පරිස්සම් කර ගන්න ඕනෑ, ඡන්දය හොඳින් දෙන්න ඕනෑ. මම මතක් කරනවා, කම්කරු පන්තිය නිතරම මර්දනයට ලක් වෙනවා කියන කාරණයත්. මේ රටේ විතරක් නොවෙයි, අනෙක් රටවලත් මේ තත්ත්වය තමයි තිබෙන්නේ.

කම්කරුවන් වෙනුවෙන් 1958 වර්ෂයේ ඇති කළ මේ පනතට අවුරුදු 50 පිරෙන්නේ 2008 වසරට. ඒ නිසා මම සාකච්ඡාවක් කැඳෙව්වා. සේවක අර්ථ සාධක අරමුදල ගැන මිනිස්සු නිතර

[ගරු අතාවුද සෙනෙවිරත්න මහතා]

හිතන්නේ නැහැ. ඔවුන්ට වයස අවුරුදු 60 පිරුණාම සේවක අර්ථ සාධක අරමුදල් ලබා ගන්න තමයි අවශ්‍ය ලියුම්-කියුම් හොයන්නේ. කොතැනද වැඩ කළේ, දායක මුදල් කැපිලා තිබෙනවාද, සේවය ස්ථිර කර තිබෙනවා ද, නම වෙනස් ද, එහෙම නම් affidavits දෙන්න වෙයිද, අංකය වෙනස්ද මේවා ඔක්කෝම හොයන්නේ අන්තිම වෙලාවේයි. ඒ නිසා මේ අයට උනන්දුවක් ඇති වෙන ආකාරයට, නිතර වුවමනා කරන ආයතනයක් බවට මේ ආයතනය පත් කරන්න ඕනෑ කියලා මම කල්පනා කළා. ඒ අනුවයි මම තවත් යෝජනා කිහිපයක් ගෙනාවා. අවස්ථාවේ හැටියට ප්‍රයෝජනවත් වන ප්‍රධාන කරුණු දෙකක් තමයි මම මේ ඉදිරිපත් කළේ.

ගෙවල් හදා ගන්න ආයතනවලින් අපි ණය ලබා දෙනවා. සේවක අර්ථ සාධක අරමුදල ඇපයට තබලා ණය මුදලක් ලබා ගන්නට එක කාලයක වැඩ පිළිවෙළක් සකස් කළා. නමුත් එය හරියට ක්‍රියාත්මක වුණේ නැහැ. සේවක අර්ථ සාධක අරමුදලින් ඒ ණය මුදල කපා ගත්තාම සමහරවිට මුදල ගෙවලත් නැහැ. පොලියත් සමඟ දඩ මුදලකුත් කපා ගත්තාම ඒ සේවකයාට ලොකු අපහසුතාවක් ඇති වෙනවා. මේ මුදල් ඒ සේවකයාගේ. සේවක අර්ථ සාධක අරමුදල කියන්නේ එම සේවකයා. අවුරුදු 60කින් හෝ ඒ මුදල ලබා ගන්නේ එම සේවකයා. ඒ පුද්ගලයා වයසට ගොස් විශ්‍රාම යන විට ගෙවල් හදා ගන්න මුදල් දීලා වැඩක් නැහැ. ඒ මුදල් ලබා දෙන වෙලාවේ දී විශේෂයෙන්ම දරුවාගේ ප්‍රශ්නයකට, දුවට කසාදයක් බන්දලා දෙන්න, එහෙම නැත්නම් තව වැඩ පිළිවෙළක් කරන්න වියදම් කරන්නයි සිද්ධ වන්නේ. මේ දේවල්වලට එයින් මුදල් දුන්නාම ඒ ගත්ත මුදල තවත් බෙදිලා යනවා. එම නිසා ඒ පුද්ගලයා ජීවත් වන කාලයේ, හැකියාව තිබෙන කාලයේ, තරුණ කාලයේ හෝ මැද වියේදීවත් ගෙයක් හදා ගන්න මුදල් ලබා දීම වැදගත් හැටිය මම කල්පනා කරලා ඒ ගැන කොමිටියේ සාකච්ඡා කළා. ඉන් පසුවයි මේ මුදලින් සියයට 30ක් ලබා දෙමු කියලා අපි කිව්වේ.

එදාට වඩා අද ලෙඩ රෝග වැඩියි. නිතරම ශල්‍යකර්මවලට යොමු වෙනවා. හෘදයාබාධ, cancer වැනි නොයෙක් ලෙඩ රෝග ඇති වෙනවා. මේවාට ප්‍රතිකාර සඳහා අවශ්‍ය මිල මුදල් හොයා ගන්න බොහෝ දෙනාට අමාරුයි. තමන්ගේ සේවක අර්ථ සාධක අරමුදලේ මුදල් තැන්පත් වෙලා තියෙද්දි එයින් මුදල් ගන්න පහසුකම් නැතිව ඒ පුද්ගලයා මරණයට පත් වුණාට පස්සේ ඒ මුදල් දරුවන්ට අයිති වෙනවා. ඒ නිසා ඒ පුද්ගලයාගේ ජීවිතය බේරා ගන්න මුදල් දුන්නොත් ඊට වඩා හොඳයි කියලා කල්පනා කරලා, ඒ අනුවයි මේ යෝජනා දෙක ඉදිරිපත් කළේ.

මම තවත් යෝජනාවක් ඉදිරිපත් කළා, විශේෂයෙන්ම accidents ගැන. අනතුරු කොයි වෙලාවේ, කොතැන වෙනවාද, කාට වෙනවාද දන්නේ නැහැ. ඒ නිසා සෑම මාසයකම රුපියල් 20ක් වෙන් කරලා මේ වැඩ පිළිවෙළට යොමු කරන්න රක්ෂණ ක්‍රමයකුත් ඇති කළා. එහෙම වුණා ම සෑම දාම මේ ගැන බලනවා, දිනුමක් ලැබුණාද බලනවා. මේ ගැනත් අවධානය යොමු කරන්න, සේවක අර්ථ සාධක අරමුදලේ වටිනාකම ඇති වන ආකාරයේ වැඩ පිළිවෙළක් ඇති කරන්න කල්පනා කළා.

සේවක අර්ථ සාධක අරමුදල පිළිබඳව අදාළ පුද්ගලයාට බලා ගැනීමේ ක්‍රමයක් ඇති කරන්නටත් මම කල්පනා කළා. දැන් තිබෙන නවීන විද්‍යුත් මාධ්‍ය අනුව, mobile phones සෑම අයෙකුගේම අතේ තිබෙනවා. මේ සෑම අයෙකුටම අදාළ වෙබ් අඩවියේ තම අංකය සඳහන් කරලා තමන්ගේ සේවක අර්ථ සාධක අරමුදල ගැන බලා ගැනීමට වැඩ පිළිවෙළක් සකස් කර දුන්නොත්, එම අයට කාර්යාලයට එන්නට ඕනෑ නැහැ. මුදල් කීයක් තැන්පත්ව තිබෙනවාද, මේ මාසයේ මුදල තැන්පත් වුණාද, තම ස්වාමියා - කොම්පැනියේ ලොකු මහත්තයා- අදාළ මුදල් යවා තිබෙනවාද කියා එම පුද්ගලයාට ඒ තුළින් බලා ගන්නට පුළුවන්කම තිබෙනවා. අන්න ඒ වැඩ පිළිවෙළ හදා දීමෙන් මේ පහසුකම් ඇති කර ගන්න ක්‍රමයක් අපි ආරම්භ කළා.

මහ බැංකුවේ නිලධාරින් සේවක අර්ථ සාධක අරමුදලට unique number එකක් සූදානම් කර ගෙන ආවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාත් ඒ ගැන මතක් කළා. ඒ unique number එක දිග number එකක්. ඒකට ඉලක්කම් ගොඩක් තිබෙනවා. "තමුන්නාන්සේලා මේ ගැන කියන්නේ මොකක්ද?" කියලා මම ඒ අයගෙන් ඇහුවා. බොහෝ දෙනා කිව්වා, "බොහොම හොඳ ක්‍රමයක් හදලා" කියලා. මම කිව්වා, "මම නම් මේ ක්‍රමය ප්‍රතික්ෂේප කරනවා, මම යෝජනා කරන්නේ මේකයි: හැම කෙනකුටම හොඳ අංකයක් තිබෙනවා, ඒක තමයි තමන්ගේ ජාතික හැඳුනුම්පතේ අංකය, අන්න ඒ අංකය මේ සඳහා යොදා ගනිමු" කියලා. ඒ විධියට අර්ථසාධක අරමුදලේ තමන්ගේ ඒ තැන්පතුව වෙනුවෙන් ජාතික හැඳුනුම්පතේ අංකය දමන්න කියලා තීන්දු කරලා, එදා ඒ කටයුතු කරන්න අපට පුළුවන් වුණා.

ඊළඟට මට මතක් කරන්න තිබෙන්නේ මේ කාරණයයි. මේ සේවක අර්ථසාධක අරමුදල් නො ගෙවන ව්‍යාපාරිකයන් ඉන්නවා. අලුතින් පටන් ගත්ත ව්‍යාපාරවල බොහෝ අය මේ අරමුදල් ගෙවන්නේ නැහැ. ඒ නිසා අපේ නිලධාරි මහත්වරු මේ කටයුතු සඳහා පිටත් කර යවන්න ඕනෑ. ඒ අය ඒ ස්ථානවලට යවලා අර්ථසාධක අරමුදල් ඔවුන්ගෙන් ලබා ගැනීමට ඒ ව්‍යාපාරිකයන් පොළඹවන්න ඕනෑ.

වතු කම්කරුවන්ගේ නිවාස ගැන මෙතුමන්ලා කථා කළා. මම වැවිලි කර්මාන්ත නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් කටයුතු කළ කාලයේ තමයි පළමුවෙන්ම වතු කම්කරුවන්ට නිවාස හැදීම ආරම්භ කළේ. ඒ කාලයේ ඒ පිළිබඳ ඇමතිතුමා වශයෙන් කටයුතු කළේ රත්නසිරි වික්‍රමනායක මැතිතුමායි. එතුමා ඒ කටයුතුවලට වැඩිය යන්නේ එන්නේ නැහැ. මම රට පුරාම තිබෙන වතුවලට ගිහින් මේ පිළිබඳව සියලු තොරතුරු සොයාගෙන, වෘත්තීය සමිති සියල්ලම කැඳවලා, ඒ අයගේ කැමැත්ත ලබාගෙන සාකච්ඡා කළා. එක වෘත්තීය සමිතියක් මේ වැඩ පිළිවෙළට කැමැති වුණේ නැහැ. නමුත්, එක වෘත්තීය සමිතියක් කැමැති නැති වුණාට කමක් නැහැ, වැඩි දෙනා කැමැතියි කියලා එහෙම වැඩ පිළිවෙළක් ඇති කරන්න අප සාකච්ඡා කර ගත්තා. ඒ අනුව එවකට සිටි ජනාධිපතිනි අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය සමඟ සාකච්ඡා කරලා, වතු කම්කරුවන්ට පර්චස් හත, හත දීලා තනි නිවාසයක් හදාගන්න වැඩ පිළිවෙළකට එතුමියගේ අනුමැතිය ලබා ගත්තා. ඒ කාරණාවේ දීත් ජාතිවාදය අවුස්සයි කියලා හිතුණු නිසා ඒ අනුමැතිය ලබා ගත්තාට පසුව මම කිව්වා, " සිංහල කම්කරුවන්ටත්, දෙමළ කම්කරුවන්ටත්, ඒ වාගේම වෙනත් ජාතීන්වල අය කම්කරුවන් වශයෙන් සේවය කරනවා නම් ඒ සියලු අයටත් මේ සහනය ලැබෙනවා, ඒ නිසා කොටසකට විතරක් නොවෙයි, මේක හැම දෙනාටම ලැබෙන දෙයක්" කියලා. ඒ සඳහා අනුමැතිය අරගෙන, සියලු වෘත්තීය සමිති BMICH එකට කැඳවලා, මේ නිවාස වැඩ පිළිවෙළ ආරම්භ කිරීමේ මහෝත්සවය පවත්වන්න යෙදුණා. අන්න ඒ විධියට තමයි තනි නිවාස හැදීම පටන් ගත්තේ. ඒ අනුව සෑම වත්තකම ඒ කාලයේ ගෙවල් 25ක් විතර හැදුවා. අප ඒ වතුවල සමූපකාර නිවාස සමිතිත් පටන් ගත්තා. ඒ වාගේම අපි Plantation Housing and Social Welfare Trust එකක් පටන් ගත්තා. ඒ මඟින් මේ කටයුතුවලට ආධාර දෙන්න වාගේම, තවත් හුඟක් කාර්යයන් මෙහෙය වීමත් කරන්න යෙදුණා. ඒ වැඩ පිළිවෙළ ඉදිරියට කරගෙන යනවා. ඒක කලින් කලට වෙනස් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ නිවාස හදා දීම ගැන කථා කරන කොට මට කරුණු දෙකක් කියන්න තිබෙනවා. අපේ හිටපු ඇමති තොණ්ඩමන් මැතිතුමාගේ සමිතියක හොඳ දක්ෂ ළමයෙක් සිටියා. අප ඉල්ලුම් පත්‍ර කැඳෙව්වාම ඒ ළමයා සම්මුඛ පරීක්ෂණයට පැමිණියා. ඇයට ඉංග්‍රීසි භාෂාවත් පුළුවන්; දෙමළ

භාෂාවත් පුළුවන්; සිංහල භාෂාවත් පුළුවන්. භාෂා තුනම type කරන්නත් පුළුවන්, ලඝුලේඛනයත් පුළුවන්. ඒ නිසා අපි ඇයව සේවයට බඳවා ගත්තා. ඒ ළමයා හොඳට රස්සාව කරගෙන හිටියා. දවසක් ඒ ළමයා මාත් එක්ක කිව්වා, "අනේ සර්, මට කසාදයක් බඳින්න විධියක් නැහැ" කියලා. මම ඇහුවා, "ඒ මොකද?" කියලා. "මනමාලිය හැටියට මාව බලන්න එනවා, නමුත්, මට බඳින්න විධියක් නැහැ, තේ වත්තේ කිව්වාම ඒ මනාලයන් ආපහු යනවා" කියලා ඒ ළමයා කිව්වා. ඒ නිසා මා කල්පනා කළා, මේ සෑම වත්තක ම නිවාස වැඩ පිළිවෙළක් සකස් කළොත් හොඳයි කියලා. ජනපදයක් වාගේ හදලා, ඒකට අවශ්‍ය වන පහසුකම් -පාරවල්, වෙළෙඳසැල්, ක්‍රීඩා පිට්ටනි, community centres සහ තවත් අවශ්‍ය දේවල් හදලා ඒවායේ TV තියලා, ක්‍රීඩා භාණ්ඩ තියලා ඒ අයට නව ජීවිතයක් ආරම්භ කරන්න හැකි වටපිටාවක් සකස් කළොත් හොඳයි කියලා මට හිතුණා. ඒ එක පැත්තක්.

අනික් කාරණය මේකයි. මේ වතුවල ඉගෙන ගන්න ළමයි ඔක්කොම වත්ත අතහැරලා යනවා. ඉදිරි කාලයේදී වතුවල වැඩ කරන්න කම්කරුවන් ඉතිරි වන්නේ නැහැ. වත්ත කිව්වාම මහා මදිකමක් කියලා ඒ අයට හිතෙනවා. ඒ නිසා මේ වැඩ පිළිවෙළ සකස් කළ යුත්තේ මේ වෙනස් වන දැනුමත් එක්කයි. සියලුම වතුවල පාසල් තිබෙනවා. ඒවායේ දැන් අලුතින් විද්‍යාගාර ඉදි කර තිබෙනවා. මහා විද්‍යාල, මධ්‍ය මහා විද්‍යාල මට්ටම දක්වා පාසල් දියුණු කර තිබෙනවා. හිටපු ජනාධිපතිතුමා මේ පාසල්වල නව විද්‍යාගාර ආරම්භ කළා. ඒවා හරිගස්සලා දැන් අධ්‍යාපනය දියුණු කර තිබෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
ඒ අනුව මේ වැඩ පිළිවෙළ හරිගස්සන්න කටයුතු කරන්න යෙදුණා. ඒ වැඩ පිළිවෙළ සාර්ථක කරලා අලුත් සමාජයක් හදන්න ඕනෑ. ඒ අයට වතුවල ජීවත් වෙන්න, වතුවල වැඩට යන්න හොඳ පඩි තිබෙන්නත් ඕනෑ, හොඳ පහසුකම් තිබෙන්නත් ඕනෑ. නව යුගයක දැනුම අනුව ඔවුන්ට ඒවා නොලැබුණොත්, කෝපයට පත් වෙලා අඩ දබරත්, සමාජ අර්බුදත් හදන්න පටන් ගන්නවා. අපි ඒ කාලයේ කළ යුතු වැඩක් හැටියට මේ වැඩ පිළිවෙළ වතුවල ආරම්භ කළා. ඒ වාගේම සේවකයන්ට හොඳ පඩිත් තිබෙන්න ඕනෑය කියා මා මතක් කරන්න ඕනෑ.

රාජ්‍ය සේවකයන්ට පඩි වැඩි කිරීම ආණ්ඩුවට කරන්න පුළුවන්. ව්‍යාපාරිකයන්ගෙන් බදු අය කරලා, නිෂ්පාදකයින්ගෙන් බදු අය කරලා පඩිය මෙච්චරයි, මෙච්චරයි කියලා ඕනෑ ගණනක් තීන්දු කරලා ඒක බෙදා හරින්න පුළුවන්. වෙන වැඩ නොකළත් ඒ වැඩේ කරන්න පුළුවන්කම තිබෙනවා. නමුත් පෞද්ගලික අංශයේ එහෙම කරන්න බැහැ. පෞද්ගලික අංශය විවිධයි. ඒ කියන්නේ පෞද්ගලික අංශයේ තරු පහේ හෝටල් තිබෙනවා, ඊළඟ හෝටල් තිබෙනවා, ඊළඟට තවත් හෝටල් තිබෙනවා. තවත් පොඩි හෝටල් තිබෙනවා, restaurants තිබෙනවා, තේ කඩ තිබෙනවා. මේ සියල්ලේම සේවකයෝ වැඩ කරනවා. මේ සියල්ලන්ටම එක පඩියක් නියම කළාම සේවකයන්ට රක්ෂාවත් නැති වෙනවා; නොයෙක් තත්ත්වයන් ඇති වෙනවා. එම නිසා තමයි පඩි පාලක සභාවට ඉදිරිපත් කරලා, දෙපාර්ශ්වය කැඳවා සාකච්ඡා කරලා, ලාභ තත්ත්වයන් බලා ඒ කටයුතු කරන්න තිබෙන්නේ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
රුපියල් 10,000කින් පඩි වැඩි කිරීම දෙන්න. ඒක දෙන්න. මොකද, රුපියල් 5,000 දෙන්නේත් හෙට අනිද්දා මැතිවරණයක් පැවැත්වෙන නිසායි. එහෙම නැත්නම් මේ රුපියල් 5,000 දෙන්නේත් නැහැ. මොකද, මුදල් අමාරුයි. රුපියල් කෝටි ප්‍රකෝටි ගණනක් දෙන්න ගියාම අමාරුයි. ඒ දෙන්නේත් මැතිවරණය නිසායි. මැතිවරණය පහු වුණාට පස්සේ අනික් රුපියල් 5,000 පොරොන්දුව කවදා දෙයිද කියලා කියන්න බැහැ. එම නිසා මෙවර මැතිවරණයට ඉස්සෙල්ලා රුපියල් 10,000ම දීලා මැතිවරණයට යන්න. මේ කාරණා මතක් කරමින්, අපේ ඇමතිතුමා ගන්නා උත්සාහය ගැන එතුමාට බොහොම ස්තූතිවන්ත වෙමින් මගේ කථාව අවසාන කරනවා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
Sir, can I have one minute to make a clarification?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Yes, Hon. Wijeyadasa Rajapakshe.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
අපේ ගරු අතාවුද සෙනෙවිරත්න මැතිතුමාට ස්තූතිවන්ත වෙනවා. එතුමා ආරම්භ කරපු හොඳ වැඩ පිළිවෙළවල් රාශියක් තිබෙනවා. ඒ එකක්වත් අපි නතර කරලා නැහැ. ඒවා දිගටම ඉදිරියට ගෙන යනවා. පෞද්ගලික අංශයේ වැටුප් වැඩි කිරීම පිළිබඳව මට වඩා ඔබතුමාට අත් දැකීම් තිබෙනවා, තේරෙනවා. එක ක්‍රමයකට කරන්න බැරි නිසා මේ දිනවල අපි පඩි පාලක සභාව කැඳවා ඒ උදවියත් එක්ක සාකච්ඡා කරනවා. ඊට අමතරව සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ පනත යටතේ වැටුප් වැඩි කිරීමටත් මේ දිනවල කටයුතු කර ගෙන යනවා. අපි හිතනවා, සති දෙකක්, සති තුනක් විතර යන කොට ඒ පිළිබඳව නිගමනයකට එන්න පුළුවන් කියලා. බොහොම ස්තූතියි.

[අ.භා. 4.47]

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
සේවක අර්ථ සාධක අරමුදල පනත යටතේ නියෝග ගෙන එන වෙලාවේ පෞද්ගලික අංශයේ සේවකයින් පිළිබඳව කරුණු කිහිපයක් කිව්වා. අමාත්‍යතුමා එක කරුණක් ගැන පැහැදිලි කිරීමක් කළා. මේ රටේ පෞද්ගලික අංශයේ තමයි වැඩිම ශ්‍රම බලකායක් ඉන්නේ. මේ අවුරුද්දට අදාළ අය වැය ලේඛන දෙකකදී රාජ්‍ය සේවය සහ පෞද්ගලික අංශය පිළිබඳව අපට කරුණු අහන්න ලැබුණා. එකක් තමයි, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයා ඉදිරිපත් කළ 2015 අය වැය ලේඛනය. අනික් එක තමයි, ඉන්පසුව ඉදිරිපත් කළ අතුරු අය වැය ලේඛනය. මේ අය වැය ලේඛන දෙකේම පෞද්ගලික අංශයේ අවම වැටුපක් පිළිබඳව සාකච්ඡා කළා. ඇමතිතුමා දැනුත් කිව්වේ ඒ ගැන කරුණක්. ඒ ගැන තවත් නිරවුල් කර ගත යුතුයි. එක කාරණයක් තමයි, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයා එතුමාගේ අය වැය ලේඛනය ඉදිරිපත් කරද්දී පෞද්ගලික අංශයේ අවම වැටුප රුපියල් 10,000 දක්වා වැඩි කිරීමට යෝජනා කළා. ඒ වාගේම රවි කරුණානායක මුදල් අමාත්‍යවරයා එය රුපියල් 2,500කින් වැඩි කරන්න යෝජනා කළා. එතකොට එක කාරණයක් අවිනිශ්චිතයි, රුපියල් 10,000, රුපියල් 12,500 වනවාද කියලා. ඒක නිරවුල්

[ගරු අජිත් කුමාර මහතා]

කර ගන්න ඕනෑ කාරණයක්. ඒ ප්‍රශ්නයට නිශ්චිත උත්තරය ඉදිරිපත් කරන්න මගේ වෙලාවෙන් විනාඩියක් ඔබතුමාට ඉතුරු කරන්නම්. ඒ වාගේම විපක්ෂයට වෙන් කර තිබෙන කාලයත් ඉතුරු වෙලා තිබෙනවා. විපක්ෂයේ මන්ත්‍රීවරු එන්නේත් නැහැ. ගරු ඇමතිතුමනි, ඒකෙන් විනාඩියක් හෝ විනාඩි දෙකක් ගන්න පුළුවන් වෙයි. මෙම සිද්ධියට අදාළ ස්ථානය මා කියන්නේ නැහැ. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා අවම වැටුප රුපියල් 10,000ක් කියා යෝජනා කළාට පස්සේත් නීතියට සම්බන්ධ ස්ථානයකත් -මා පෞද්ගලිකව ඔබතුමාට ඒ ස්ථානය කියන්නම්- එහි වැඩ කරපු ළමයකුට දුන්නේ රුපියල් 7,500යි. ඒක තවමත් එහෙමයි. නීතිය පිළිබඳ කටයුතු කරන ස්ථානයකයි එහෙම කළේ. මා පෞද්ගලිකව ඔබතුමාට ඒ ස්ථානය කියන්නම්.

එතකොට, තත්ත්වය මේක නම් මේ සඳහා තිබෙන නීතිය මොකක්ද? මම අද පත්තරවලින් කියෙව්වා සේවකයින් 1,000, 1,500 පාරට බැහැලා උද්ඝෝෂණය කරනවා කියලා. අය වැයක් ප්‍රකාශයට පත් වුණාට පසු සාමාන්‍ය ක්‍රමය තමයි අය වැයෙන් බද්දක් දැම්මොත්, -අලවලට හෝ ලූනුවලට හෝ පරිප්පුවලට හෝ - ඊට පසු දින සිට එකතු කරනවා. මේ පාර තිබුණු විශේෂත්වය තමයි අඩු කළ ඒවා අඩු නොවීම. සිමෙන්ති මිල අඩු වෙන්න, කිරි පිටි මිල අඩු වෙන්න සෑහෙන්න කල් ගියා. සමහර භාණ්ඩවල මිල අඩු වෙන්න කල් ගියා වාගේම සමහර භාණ්ඩවල මිල අඩු වෙලාත් නැහැ. වැඩි වීම් වැඩි වෙන්නෙත් නැහැ, ජනතාව පැත්තට හම්බ වෙන ඒවා. අය වැයක් ඉදිරිපත් කළාම එයට තිබෙන බලය මොකක්ද? ඊට පසු දින සිට ක්‍රියාත්මක කරන්නට බැරි නම්, ඔබතුමන්ලා උත්තරීතර යැයි නිතර කියන මේ පාර්ලිමේන්තුවට තිබෙන බලය මොකක්ද? එහෙම නම් මොකක්ද ඒ සඳහා හදන ක්‍රමවේදය? දැන් පෞද්ගලික අංශයේ සේවකයාගේ අවම වැටුම රුපියල් 12,500ක් කරනවාලු. අපි ඒක පිළිගන්නේ නැහැ, එය ප්‍රමාණවත් නැහැ. මොකද, මහ බැංකුව පසු ගිය අවුරුද්දේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ කාලයේ කිව්වා 4 දෙනෙකුගෙන් යුතු පවුලකට මාසයක් ජීවත් වෙන්න රුපියල් 53,000ක් ඕනෑ කියලා. ආණ්ඩු පක්ෂයේ සිටින අපේ ගරු හර්ෂ ද සිල්වා නියෝජ්‍ය ඇමතිතුමා වාගේ අය ඒ පිළිබඳව කථා කළා, ඒක තමයි වෙන්න ඕනෑ කියලා. එහෙම තිබියදී හිටපු ජනාධිපතිතුමාත්, දැන් මුදල් අමාත්‍ය ගරු රවි කරුණානායක මැතිතුමාත් දෙන්නාම වැඩි කරලා තිබෙන්නේත් රුපියල් 12,500යි. ඒක එහෙම වැඩි වෙනවාද කියලා අහන්නත් ඕනෑ, රුපියල් 12.500 දක්වා? ඒකත් ප්‍රමාණවත් නැති තත්ත්වයකදී ඔබතුමන්ලා දෙගොල්ලම යෝජනා කරලා තිබෙන රුපියල් 12,500 පෙබරවාරි මාසයේදී ඒ අයට හම්බ වෙනවාද? හම්බ වෙන්නේ නැහැ. එහෙම නම් එය හම්බවෙන්න ගේන ක්‍රමය මොකක්ද? "ඒක මෙහෙමයි, ටිකක් කල් යන්න ඕනෑ" වාගේ කථා වැඩක් නැහැ. ඔබතුමන්ලා අය වැයක් ඉදිරිපත් කරන විට අපි හිතනවා අත් දැකීම් තිබෙන, පරිපාලනය, නීතිය පිළිබඳව දැනුමක් තිබෙන රජයක් විධියට මේ සියලුම ගැටලු දැනගෙන තමයි ඉදිරිපත් කරන්නේ කියලා. එහෙම නම් මේ ප්‍රතිපත්තිමය තීරණය ක්‍රියාත්මක කරන්නට පුළුවන් ක්‍රමය මොකක්ද? ඒක කියන්න. එහෙම නම් arrears එක්ක දෙන්න ඕනෑ. අතුරු අය වැය සම්මත වුණේ පෙබරවාරි මාසයේ නිසා ඒ නීතිය සකස් කරලා එන්නේ දෙසැම්බර් මාසයේ වුණත් පෙබරවාරි මාසයේ ඉඳලාම ඒවා දෙන්න ඕනෑ; දිය යුතුයි. මොකද, ඒ වැඩි වීම බලාගෙන තමයි ජනතාව ජීවිතය හදා ගන්නේ. එහෙම නොවෙනවා නම් මේ කියූ කථාව පට්ටපල් බොරුවක් බවට පත් වෙනවා. ඒ එක කාරණයක්.

දෙවෙනි කාරණය මෙයයි. මේ අර්ථ සාධක අරමුදලෙන් ණයක් දෙනවා පොලියට. රාජ්‍ය සේවකයාට ණය දෙන්නේ සියයට 4 පොලියට. නමුත් මේ අර්ථ සාධක අරමුදල එහෙම නැහැ. දැන් ගරු අතාවුද සෙනෙවිරත්න මැතිතුමාත් ඒ ගැන කිව්වා. මේක වෙන කාගේවත් එකක් නොවෙයි, සේවකයා වෙනුවෙන්, ඔවුන්ගේ දහඩිය මහන්සියෙන් තැන්පත් කළ එකක්. ඒ නිසා තමයි පසු ගිය රජය කාලයේ ඒක මං කොල්ල කන්න නීතිය ගේන්න හදන විට දැවැන්ත අරගළයක් සිදු වුණේ; මරාගෙන මැරුණේ. වෙඩි තියද්දී ජීවිතය නැති වෙන බව දැන ගෙන ගියේ ඒකයි. ඒ නිසා මේක ඉතාම බරපතළ ප්‍රශ්නයක්. ඔවුන්ට ඉතාම සහන ක්‍රමයකට, -රාජ්‍ය සේවකයන්ට වාගේ- කඩිනම් ක්‍රමයකට ණයක් ලබා දීම අත්‍යවශ්‍ය කාරණයක් වෙනවා. ඒකට මොකක්ද කරන්නේ?

අනෙක් කාරණය තමයි ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමාත් කාර්යාල හා සාප්පු සේවකයන්ගේ අයිතීන් ගැන කිව්වා. හැම දාම මම උදේට එන විට, හවසට යන විට ගාල්ල නගරයේ වාගේම තවත් නගරවල දකිනවා, සමහර ළමයි වැඩට එන්නේ උදේ 6.00ට. ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමනි, උදේ 7.00ටත් කලින්, -කඩේ අරින්නත් කලින්- සාප්පුවල, කාර්යාලවල ගේට්ටුව ළඟ ඉන්නවා. ගෙදර යන්නේ රෑ වෙලා. බොහෝ අය වැඩ කරන්නේ පැය 8ක් නොවෙයි පැය 12ක්. පැය 12ක් වැඩ කරලා සමහර වෙලාවට පැය 14ක් 15ක් ගමනටත් සමඟ ගත කරනවා. මේ අයගේ ජීවිතවල තත්ත්වය මොකක්ද? ඒ නිසා ඉතා බරපතළ බෙදවාචකයකට මේ රටේ කාර්යාල හා සාප්පු සේවකයෝ මුහුණ දීලා සිටිනවා. ඉතාම සොච්චම් වැටුපක් ඒ අය ලබන්නේ. ඔබතුමන්ලා ඕනෑම කෙනෙකුට පුළුවන් නිකම් ඒ ළමයෙකුගෙන් දෙන්නෙකුගෙන් අහලා බලන්න දෛනික වැටුප කීයද, මාසික වැටුප කීයද කියලා. ඒ වැටුපෙන් ජීවත් වෙන්න බැහැ. අපිට හිතා ගන්න බැහැ කොහොමද ජීවත් වෙන්නේ කියලා. බන්දුල ගුණවර්ධන න්‍යාය අනුව නම් ජීවත් වෙන්න පුළුවන්. ඒකයි ප්‍රශ්නය. ඒ න්‍යාය ඔබතුමන්ලා අනුමත කරන්නේ නැහැ. ඒ න්‍යාය අනුමත නොකරන නිසා තමයි ඔබතුමන්ලා මේ සඳහා යෝජනා ගෙනාවේ. එහෙම නම් ඒ අයට මොකක්ද වෙන්නේ කියලා විධිමත් ක්‍රමයක් ඕනෑ.

වෙලාව පිළිබඳව තිබෙන ප්‍රශ්නය නිසා මම අනෙක් කාරණයත් අහනවා. පසු ගිය අය වැයේදී හිටපු ජනාධිපතිතුමා කිව්වා අර්ථ සාධක අරමුදලට ස්වාමියා විසින් කරන දායකත්වය සියයට 14ක් කරනවා කියලා. මේක පාර්ලිමේන්තුවේදී සම්මත වුණා. දැන් ඒකට මොකක්ද වෙන්නේ? ඒක එහෙමම යනවාද? සියයට 14ක් දක්වා කළ වැඩි වීම, -සියයට 2කින් වැඩි කිරීම- මේ පාර්ලිමේන්තුවේදී සම්මත වුණා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒක සංශෝධනය කළේ නැහැ නේ, approve වෙන්න?

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ඒක තමයි. ඒකට මොකද වෙන්නේ, ඒක එහෙම්මම ක්‍රියාත්මක වෙනවාද? අනෙක් කාරණය මෙයයි. මගේ වෙලාවෙන් මම ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමාට පිළිතුරු දීම සඳහා විනාඩියක් ඉතිරි කරනවා.

විශ්‍රාම වැටුප් මං කොල්ල කෑම පිළිබඳව පසු ගිය රජය ගෙනාපු පනත් කෙටුම්පත ගැන බලන්න. මම එක නිදර්ශනයක් කියන්නම්. සමහර විට මේ ආණ්ඩුව අණපනත් ගෙන එනකොටත් ජනතාව, පාර්ලිමේන්තුව, විවිධ අදහස් දක්වන අය ගැන කිසි සැලකිල්ලක් නැතිව ඉදිරිපත් කරනවා. ඒකට හොඳම උදාහරණය තමයි හෙට විවාදයට ගැනීමට නියමිත ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත. විපක්ෂය මේකට මොන විධියට එකඟ වුණාද කියලා මම දන්නේ නැහැ. මේ අද ඉදිරිපත් කළ පනත් කෙටුම්පතක්, බහුතර බලයක් තිබෙන විපක්ෂය හෙට විවාද කර සම්මත කරන්නට එකඟ වෙලා තිබෙනවා. බහුතර

බලයක් තිබෙන මේ රටේ විපක්ෂය, ඒ බහුතර බලය ජනතාව වෙනුවෙන් පාවිච්චි කරන්න තිබෙන එක අවස්ථාවක් ඉතාම නරක විධියට මඟ හැරලා තිබෙනවා. ඒ ගැන කියන්න තව ඊට වඩා වචන තිබෙනවා. මම ඒවා කියන්නේ නැහැ. ඉස්සරහට යනකොට ඒවාත් කියන්න වෙයි. විපක්ෂයට බහුතර බලයක් තිබියදී ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් ඒ බලය පාවිච්චි කරන්නට තිබෙන අවස්ථාව ඉතාමත් නරක විධියට නැති කරගෙන තිබෙනවා. අද ඉදිරිපත් කළ පනත් කෙටුම්පතක් හෙට සම්මත කරගන්න කටයුතු කර තිබෙනවා. ඒ සම්බන්ධයෙන් උපදේශක කාරක සභාවක්වත් නැහැ.

පසු ගිය රජයත් ජනතාවට බලපාන එවැනි බරපතළ පනත් කෙටුම්පතක් ගෙනාවා. ඒ තමයි සේවා නියුක්තකයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත. ඒ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනෙන්න කලින් අමාත්‍ය මණ්ඩලය සම්මත කළා. ඒකට විරුද්ධව Supreme Court එකටත් ගියා. Supreme Court එකෙනුත් ඒක සම්මත වුණා. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලායි තිබුණේ. නමුත් 2012 ජනවාරි18 වැනිදා ඒ පනත් කෙටුම්පත ඉල්ලා අස්කර ගන්නට සිදු වුණා. විධායකය අනුමත කරපු, ශ්‍රේෂ්ඨාධිකරණය අනුමත කරපු, 162ක බහුතරයක් සිටින පාර්ලිමේන්තුවක් ස්ථිරවම අනුමත කරන්නට තිබුණු පනත් කෙටුම්පත ජනතාව විසි කළා. ජනතා බලය කියන්නේ මොකක්ද? අපි හැමදාම කියනවා, ජනතා බලය තමයි පළමුවැනි එක කියලා. පරමාධිපත්‍ය බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවේවත්, ව්‍යවස්ථාදායකයේවත්, විධායකයේවත්, අධිකරණයේවත් නොවෙයි. පරමාධිපත්‍ය බලය තිබෙන්නේ ජනතාව අතේයි. එහෙම නම් ඒ බලය තිබෙන්නේ ජනතාව අතේ කියන එක විශේෂයෙන් මතක තබා ගන්න. ජනතාවට හානි කරනවා නම්, විපක්ෂය තමන්ගේ කටයුත්ත හරියට කරන්නේ නැත්නම්, ආණ්ඩු පක්ෂය තමන්ගේ කටයුත්ත හරියට කරන්නේ නැත්නම්, ජනතාව ඒ බලය තමන්ගේ අතට භාර ගනීවි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් කළ වෙලාවෙන් තව විනාඩියක කාලයක් තිබෙන්නේ.

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

පසු ගිය මැතිවරණය තිබුණේ ජනතාවගේ අතේ. එක්සත් ජාතික පක්ෂය හෝ වෙනත් කවුරුවත් කළ සෙල්ලමක් නිසා නොවෙයි ජනතාව බලය මාරු කළේ. ජනතාවත් තීරණයක් ගත්තා. එහෙම නම් පසු ගිය රජය ඉදිරිපත් කළ ඒ පනත් කෙටුම්පත විසි කරන්න සිදු වුණේ ඇයි? ඒ පිළිබඳව දක්වපු මහජන විරෝධයේ දී රොෂේන් චානක සහෝදරයාට ජීවිතය පරිත්‍යාග කරන්නට සිදු වුණා. තවත් ගණනාවක් ආබාධිත වුණා. දැන් ඔබතුමන්ලාගේ රජය ඒ පනත් කෙටුම්පත ඒ විධියටම ගෙනෙනවාද? එහෙම නැත්නම් ගෙනෙන්නේ කොහොමද? ඒ ගෙනෙනවා නම් ගෙනෙන්නෙත් අද මේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත ඉදිරිපත් කළා වාගේම කිසිදු සංවාදයක් නැතිව ද?

මේ කාරණය ගැනත් අහන්න ඕනෑ. ඒ මියගිය රොෂේන් චානක සහෝදරයා ගැන පසු ගිය කාලයේ ගොඩාක් අය කථා කළා. දැන් මේ හොරු අල්ලන ඒවා, අනම් මනම් ඔක්කෝම තිබෙනවානේ. කඩදාසි file අරගෙන කොමිෂන්වලට යනවා. නමුත් මේ රොෂේන් චානක සිද්ධිය සම්බන්ධයෙන් මොකක්ද වෙන්නේ? ඒ රොෂේන් චානකගේ ඝාතනයට වගකිව යුතු ඒ අවස්ථාවේ හිටපු පොලිස්පතිවරයා ඉල්ලා අස් වුණා. ඊට පසුව මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයා විසින් එතුමාව බ්‍රසීලයේ තානාපති කළා. එවැනි පුද්ගලයෙක් ලංකාවෙන් ආපසු පැනලා යන කොට ඒ අයගේ passport එක නවත්වන්න තමුන්නාන්සේලාට බැරි වුණා. ඊළඟට, ඒ ප්‍රශ්නය පිළිබඳව විභාග කරපු මහානාම තිලකරත්න වාර්තාවට මොකද වුණේ? මේ පාර්ලිමේන්තුවේ නම් සඳහන් කරන්න මා කැමැති නැහැ. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් හැන්සාඩ් වාර්තා පිරෙන්න ඒ ගැන ප්‍රශ්න අහලා තිබෙනවා. විශේෂයෙන්ම 2012 ජනවාරි මස 18 වැනිදා හැන්සාඩ් වාර්තාව පිරෙන්න ඒ ප්‍රශ්නය පිළිබඳව අහලා තිබෙනවා. ජනතා විමුක්ති පෙරමුණ ප්‍රශ්න අහලා තිබෙනවා. කෝ, දැන් ඒ සම්බන්ධයෙන් මොනවාද වෙන්නේ?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය අවසානයි. කථාව අවසන් කරන්න.

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

එම නිසා ඔබතුමන්ලා ඒකට උත්තරයක් දෙන්න ඕනෑ. එහෙම උත්තර දෙන්නේ නැතිව කඩදාසි කෑලි පෙන්වමින් හොරු අල්ලනවා, හොරු අල්ලනවා කියලා හොරු අල්ලන්නෙත් නැතිව හොර බඩු විතරක් අල්ලලා මේ සෙල්ලම කරන්න බැහැ. මේ ප්‍රශ්නවලට උත්තර දෙන්න ඕනෑ. විශේෂයෙන්ම මේ සම්බන්ධයෙන් මා ඔබතුමාගෙන් පිළිතුරු බලාපොරොත්තු වෙනවා. පෞද්ගලික අංශයේ සියයට 14ක් කරපු ETF අරමුදලට මොකද වෙන්නේ, පෞද්ගලික අංශයේ වැටුප් වැඩිවීම සම්බන්ධයෙන් මොකද වෙන්නේ කියන කාරණා ගැන මා ඔබතුමාගෙන් පිළිතුරු බලාපොරොත්තු වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 4.58]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நெடுஞ்சாலைகள், உயர்கல்வி மற்றும் முதலீட்டு ஊக்குவிப்பு பிரதி அமைச்சர்)
(The Hon. Eran Wickramaratne - Deputy Minister of Highways, Higher Education and Investment Promotion)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ නියෝග පිළිබඳව සාකච්ඡා කරන මේ මොහොතේ දී, මේ නියෝග ඉදිරිපත් කිරීම මෙච්චර ප්‍රමාද වුණේ ඇයි කියන එක ගැනත් අපි පොඩ්ඩක් හිතන්න ඕනෑ. නමුත් මේ රජයේ අපේ ඇමතිතුමා බොහොම කෙටි කාලයක දී ඒ නියෝග පාර්ලිමේන්තුවට ගෙනැවිත් තිබෙනවා. ඒ මඟින් එම අරමුදලේ සාමාජිකයින්ට විශාල ප්‍රතිලාභ ලැබෙනවා. විශේෂයෙන්ම නිවාස ඉදි කරන්න බලාගෙන සිටින අයටත්, ඒ වාගේම නිවසක් තිබෙන කෙනෙක් යම් විධියකින් ඒ නිවස උකස් කර තිබෙනවා නම්, එම උකස නිදහස් කර ගන්නත් හැකියාව ලැබෙනවා. එහෙම නැත්නම් දැනටමත් ණය මුදලක් ලබාගෙන නිවසක් ගොඩනඟලා තිබෙනවා නම්, ඒ ණය මුදල ආපසු ගෙවා දමන්නට හැකියාව ලැබෙනවා. ඊට අමතරව වෛද්‍ය ප්‍රතිකාර සඳහාත් ඒ අර්ථ සාධක අරමුදලේ තිබෙන ශේෂයෙන් සියයට 30ක් භාවිත කරන්නට පුළුවන්කම ලැබෙනවා.

අර්ථ සාධක අරමුදල හරහා ලබා දෙන නිවාස ණය පහසුකම් බැලුවොත්, විශේෂයෙන්ම 2001 සිට 2012 වසර වෙනකම් සාමාන්‍යයෙන් 11,000ත් - 20,000ත් අතර ප්‍රමාණයක් තමයි අර්ථ සාධක අරමුදල හරහා ණය ලබාගෙන තිබුණේ. මේ අර්ථ සාධක අරමුදලේ සාමාජිකයන් ගණන එක්ක බලපුවාම ඇත්තටම ඒක බොහොම සුළු ප්‍රතිශතයක් වෙනවා. අද ගෙනැල්ලා තිබෙන මේ නියෝග සම්මත වුණාට පසුව මේ අරමුදලෙන් එක් වසරක් තුළ දී මීට වැඩිය පස් ගුණයකින් නිවාස ණය ලබා ගන්න පුළුවන් වෙයි කියලා මා හිතනවා.

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

බොහොම කෙටි කාලයක දී මේ නියෝග පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම ප්‍රශංසනීයයි. නමුත් කෙටි කාලයක දී මේ නියෝග පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනකොට; පනත් කෙටුම්පත් ඉදිරිපත් කරනකොට, සමහර විට ඒවා විවාද කරන්න ලැබෙන කාල වෙලාව අඩුයි කියලා හුඟක් අය අද කථා කළා. මම හිතන විධියට එක පැත්තකින් ඒ විවේචනය සාධාරණයි. අනෙක් පැත්තෙන් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන සමහර පනත් කෙටුම්පත් සැහෙන කාලයක් - සමහර ඒවා අවුරුදු 10ක් වාගේ කාලයක් - මේ රටේ සාකච්ඡාවට ලක් වුණු ඒවා වෙනවා. කම්කරු අර්ථසාධක අරමුදලේ විගණන වාර්තාවලින් අපට අන්තිමට ලැබුණේ 2011 වසරේ වාර්තාවයි. ඒක ලැබුණෙත් මීට මාස කිහිපයකට උඩදීයි. ඒ කියන්නේ 2010 වසර වෙනකම් විතරයි වාර්තා ලැබිලා තිබුණේ. 2011 විගණන වාර්තාව ලැබුණේ ළඟදීයි. 2012, 2013, 2014 වසරවල විගණන වාර්තා ලැබිලා නැහැ. තව මාසයකින් පමණ 2015 වසරේ වාර්තාවත් ලැබිය යුතුව තිබෙනවා.

මේ රටේ තිබෙන විශාලම අරමුදල කළමනාකරණය කිරීම පිළිබඳව විශාල ගැටලුවක් තිබෙනවා. මේ සම්බන්ධයෙන් තිබෙන චෝදනා ගැන මට අහන්න ලැබිලා තිබෙනවා. සමහර අය කියනවා, අර්ථ සාධක අරමුදල සම්බන්ධයෙන් විගණන වාර්තා ඉල්ලනකොට ඒ ගොල්ලන්ගෙන් එක එක ප්‍රශ්න අහනවා කියලා. "කවුද කථා කරන්නේ, කොයි ආයතනයෙන්ද කථා කරන්නේ, මොකටද මේක අවශ්‍ය වන්නේ?" වාගේ නොයෙක් ප්‍රශ්න අහනවා කියලා චෝදනා තිබෙනවා. මේ වාගේ දේවල් පසු ගිය කාලයේ දී සිදු වුණත්, අනාගතයේ දී මෙවැනි දේවල් සිදු වන්නට බැහැ කියන එක මම මේ ගරු සභාවේ දී සඳහන් කරන්න කැමැතියි. මොකද මේ අර්ථ සාධක අරමුදලේ විගණන වාර්තා මේ රටේ ඕනෑම කෙනෙකුට කිසිවකුගේ ප්‍රශ්න කිරීමකින් තොරව ලබා ගන්නට පුළුවන්කම තිබෙන්නට ඕනෑ.

තොරතුරු දැන ගැනීමේ අයිතිය සඳහා වන පනත් කෙටුම්පත ඉදිරි සති කිහිපයේ දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වන්නෙත් මේ රටේ පුරවැසියන්ට පහසුවෙන් තොරතුරු ලබා ගැනීම සඳහායි. අපේ දේශපාලන සංස්කෘතිය තුළ, ඒ වාගේම රාජ්‍ය ව්‍යුහය තුළ තොරතුරු සඟවන්න තමයි සාමාන්‍යයෙන් අපි ඉගෙන ගෙන තිබෙන්නේ. ඒක අපේ ක්‍රියාකලාපයේ කොටසක් වෙලා තිබෙනවා. නමුත් දැන් අපි මේක වෙනස් කරන්නට ඕනෑ. සෑම කෙනාටම තොරතුරු දැන ගන්න පුළුවන් අයිතියක් තිබෙනවා. ඒ ආකාරයෙන් තමයි සියලු රාජ්‍ය තන්ත්‍රය ක්‍රියාත්මක වෙන්න ඕනෑ කියන එක මම මේ අවස්ථාවේ දී මතක් කරනවා.

සෑම ක්ෂේත්‍රයකම විශ්‍රාම යෑමට වයසක් තිබෙනවා. ඒ පිළිබඳව අද මේ පාර්ලිමේන්තුවේ කථා කරනකොට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත් විශ්‍රාම යා යුතු වයසක් තිබිය යුතුද නැද්ද කියන ප්‍රශ්නය මට පැන නැඟුණා. හිටපු අගමැතිතුමා අද මේ ගරු සභාවේ කථා කළා. අවාසනාවකට එතුමා ඇවිල්ලා එක එක චෝදනාවන් කළා. කථානායක පුටුවටත් චෝදනා කළා. කථා කරන්න අවශ්‍ය වෙලාව දුන්නේ නැහැ, අදහස් ප්‍රකාශ කිරීම පිළිබඳව සාධාරණත්වයක් නැහැ කියලා චෝදනා කළා. හිටපු අගමැතිතුමා තමයි මේ චෝදනාවන් කළේ. එතුමා තවත් චෝදනාවක් කළා, යම් යම් තැන්වලින් සිදු විය යුතු ක්‍රියාදාමයන් ඉටු වන්නේ නැහැ කියලා. මහා මාර්ග ගැනත් එතුමා කථා කළා. මේ කටයුතු සිදු වන්නේ නැහැ කියලා චෝදනා කළා.

තවත් සමහර මන්ත්‍රීවරුත් ඒ ගැන සඳහන් කළා. ඒ කරපු චෝදනාවලට උත්තරයක් හැටියට යම්කිසි පැහැදිලි කිරීමක් කරන්න මම කැමැතියි. මාතෘකාවෙන් පොඩ්ඩක් පිට වුණත්, චෝදනා කරපු නිසා පිළිතුරු දෙන්න සිදු වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කලින් මා පෙන්වා දුන්නා වාගේ පසු ගිය රජය සේවක අර්ථ සාධක අරමුදලේ -මේ රටේ කම්කරු ජනතාවට අයිති ඒ අරමුදලේ- විස්තර හෝ විගණන වාර්තා හෝ නොදීපු රජයක්. එපමණක් නොවෙයි. සේවක අර්ථ සාධක අරමුදලෙන් සියයට 6ක්, සියයට 8ක් හැම අවුරුද්දේම කොටස් වෙළඳ පොළට යොමු කරනවා. කොටස් වෙළඳ පොළට යොමු කරන ඒ මුදල් සම්බන්ධයෙන් විශාල ගැටලු, ප්‍රශ්න තිබෙනවා; හොරකම, වංචාව තිබෙනවා. ඒ ගැන අපි දිගින් දිගටම කථා කර තිබෙනවා. ට්‍රිලියනවලින් කථා කළොත්, අද එම අරමුදලේ තිබෙනවා රුපියල් ට්‍රිලියන 1.3ක් විතර. කොටස් වෙළඳ පොළේ පමණක් ආයෝජනය කළ ප්‍රමාණය සියයට 6ක් ලෙස ගත්තොත් රුපියල්වලින් කෝටි 18,000ක් පමණ වෙනවා. ඒ රුපියල් කෝටි 18,000 ගැන තීරණ ගත්තා. ඒ තීරණ ගත්තේ Monetary Board එකෙන්. ඒ මුදල් ආයෝජනය කළා. ඒවා සම්බන්ධයෙන් හොරකම්, වංචා සිදු වුණා. මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලනවා ඒ හොරකම්, වංචා සම්බන්ධයෙන් කඩිනමින් ක්‍රියා කරන්න කියලා. 2011 විගණන වාර්තාවෙහි සඳහන් කර තිබෙනවා රුපියල් කෝටි 1,170ක් ව්‍යාපාර -කොම්පැනි- 58ක ආයෝජනය කරලා අලාභ සිදු වෙලා තිබෙනවා කියලා. ඒ වාගේම කම්කරු ජනතාවගේ මේ අරමුදලින් රුපියල් මිලියන 500ක් මිහින් ලංකා එකට ආයෝජනය කළා. කවුද ඒ තීරණය ගත්තේ? කෝ ඒවායේ වාර්තාව? Investment committees තිබුණා. අපට ඒ investment committeesවල වාර්තා බලන්න ඕනෑ. කවුද ඒවායෙන් ලාභයක් ලැබුවේ කියන එක බලන්න ඕනෑ. එහි සඳහන් කර තිබෙන finance company එකක් ගැන විතරයි මා මෙතැනදී කථා කරන්නේ. එයට විශාල මුදලක් දුන්නා. ඒ දුන්නේ ඒ finance company එකේ ගනුදෙනුවේදීයි. එහි කොටසක සාමාන්‍ය මිල රුපියල් 40 ඉක්මවා ගියා. නමුත් ඒ finance company එකේ කොටසක වෙළඳ පොළ මිල ඇත්තටම රුපියල් 24යි. ඒ වාගේම, අලාභ ලබපු ව්‍යාපාරවලට අර්ථ සාධක අරමුදලේ මුදල් විශාල ලෙස ආයෝජනය කළා. ඔබතුමන්ලා දන්නවා පුද්ගලයන් හැටියට අප කොටස් වෙළඳ පොළේ මුදල් ආයෝජනය කරනවා නම් අලාභ ලබන ආයතනවලට මුදල් දමන්නේ නැහැ කියා. එතුමන්ලාට පැවරී තිබුණේ වගකීමක්. සේවක අර්ථසාධක අරමුදලේ භාරකාරත්වය පමණයි එතුමන්ලාට තිබුණේ. නමුත් 2010 වාර්තාවේ සඳහන් වන්නේ මොකක්ද? Monetary Board එක ගැනයි මා මේ කථා කරන්නේ. ඔවුන් 2010 මැයි 31වන දා hotel company එකකට විශාල මුදල් ප්‍රමාණයක්, එනම් රුපියල් මිලියන 810ක් ආයෝජනය කරලා විශාල වශයෙන් අලාභ ලැබුවා. ඒවා හේතුකොටගෙන විශාල අලාභ සිදු වී තිබුණා. මේ වාගේ ආයතන ලැයිස්තුවක්ම තිබෙනවා. ඒවා ගැන කථා කරන්න වෙලාව නැහැ. මා මෙහිදී ප්‍රශ්නයක් මතු කරනවා. මේ තොරතුරු යට ගහලා තිබෙන්නේ මේ විමර්ශනය නතර කරන්නයි. විගණන වාර්තාවක් නැහැ. විගණන වාර්තා නැතිව කොහොමද මේවා ගැන සොයා බලන්නේ කියා මම අහන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මහාමාර්ග ගැනත් කථා කෙරුණා. උතුරු අධිවේගී මාර්ගය කියා මාර්ගයක් තනන්න තීරණයක් තිබුණා. ඒ මාර්ගය කොටස් 10කට කඩලා තිබෙනවා. ඒ කොටස් 10න් ප්‍රධාන කොටස පළමුවැනි කොටසයි. ඕනෑම රටක, ඕනෑම තැනක මහාමාර්ගයක් තනන කොට අගනුවරින් පිට වන තැන සහ අගනුවරට ඇතුළු වන තැන තමයි පළමුවැනි කොටස. ඒ තමයි ජනාකීර්ණ ප්‍රදේශයක තදබදය තිබෙන තැන. ඒ තදබදයට විසඳුමක් හැටියට තමයි ඕනෑම මහාමාර්ගයක් තනන්නේ. උතුරු අධිවේගී මාර්ගයේ ඒ කොටස කොන්ත්‍රාත් දුන්නේ නැහැ. නමුත් ඊට පසු කොටස් -ජනාකීර්ණ නැති ප්‍රදේශවල කොටස්- තරගකාරී පටිපාටියකට නොව නිකම් එක එක ව්‍යාපාරිකයන්ට අඩ ගහලා කොන්ත්‍රාත් දුන්නා. එක කොටසක් දුන්නු අඩුම කොන්ත්‍රාත්තුව රුපියල් බිලියන 39යි; අනෙක් එක රුපියල් බිලියන 50යි. මොහොතක් සිතා බලන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අප මාසයක් තිස්සේ අය වැය ගැන වාද විවාද කරනවා. අපි Consultative Committee එකේදී රැස් වෙනවා. එය මාධ්‍යයේ සාකච්ඡා වෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Deputy Minister, you have only one more minute.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තව ටික වේලාවකින් කථාව අවසන් කරනවා. උසස් අධ්‍යාපනය වෙනුවෙන් 2015 දී අපි අනුමත කළේ රුපියල් බිලියන 41යි. නමුත් කොන්ත්‍රාත්කරුවන් ගෙනැල්ලා, ව්‍යාපාරිකයන් ගෙනැල්ලා එක මහාමාර්ගයක එක කොටසකට පමණක් රුපියල් බිලියන 39ක් හෝ 40ක් හෝ 50ක් දෙනවා.

අද මේ ගරු සභාවට ඇවිල්ලා අපෙන් ප්‍රශ්න කරනවා, ඒ මහාමාර්ගවල කටයුතු සම්පූර්ණ කරන්නේ නැත්තේ ඇයි, මිනිස්සු මහාමාර්ගවල වාඩි වෙලා ඉන්නේ ඇයි කියලා. ඒ විතරක් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවට ඒ තොරතුරු සැඟෙව්වා. පාර්ලිමේන්තුවේ අය වැය ඉදිරිපත් කරන කොට පෙන්වන්නේ කොටසයි. රුපියල් බිලියන 400කට මහාමාර්ගයක් ගොඩ නඟනවා නම්, ඒ අවුරුද්දට අදාළ කොටස හැටියට ඒ පොඩි ප්‍රමාණය පමණයි හුඟක් වෙලාවට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ. මේ වාගේ කොන්ත්‍රාත්තුවකට ඇතුළු වෙලා තිබෙනවාය කියලා අපි දන්නේවත් නැහැ. අපි ඒවා හොයා ගෙන තිබෙන්නේ දැනුයි. පාර්ලිමේන්තුවට සඟවලා තමයි මේ දේවල් කළේ. අර්ථ සාධක අරමුදලේත් විශාල හොරකමක් තිබෙනවා. ඒ අරමුදලේ රුපියල් කෝටි 18,000ක් කොටස් වෙළෙඳ පොළට දමන විට එතැන සියයට 10ක වංචාවක් තිබුණා නම්, එතැන රුපියල් කෝටි 180ක වංචාවක් වෙනවා. ඒ මුදල අධ්‍යාපනය, සෞඛ්‍යය කියන මේ ඕනෑම ප්‍රධාන අමාත්‍යාංශයකට වියදම් කරන මුදල් ප්‍රමාණයට වැඩිය විශාල ප්‍රමාණයක්. මෙතැනට ඇවිල්ලා යහ පාලනය ගැනත්, ඒක ක්‍රියාත්මක නොවීම ගැනත් අපට ඇඟිල්ල දිගු කරන්න හදනවා. මේ හොර, බොරු, වංචාව නතර කරන්න දවස් 50කින් අපි විශාල දෙයක් කරලා තිබෙනවා. ඒ වාගේම මේ තොරතුරු සියල්ලක්ම ඉදිරිපත් කරන්න කියලා රජයේ නිලධාරීන්ට මම නැවත මතක් කරනවා. ස්තූතියි.

[අ.භා. 5.11]

ගරු වීරකුමාර දිසානායක මහතා
(மாண்புமிகு வீரகுமார திசாநாயக்க)
(The Hon. Weerakumara Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සේවක අර්ථ සාධක අරමුදල සම්බන්ධයෙන් කෙරෙන මේ සාකච්ඡාවේදී ඉතාම වැදගත් වන කරුණ තමයි, වර්තමාන ආණ්ඩුව පසු ගිය කාල සීමාවේ රජයේ සේවකයා පිළිබඳව, ඒ වාගේම පෞද්ගලික අංශයේ සේවකයා පිළිබඳව දක්වපු අවධානය. අද පෞද්ගලික අංශයේ සේවකයන්ගේ විශාල ඉල්ලීමක් තිබෙනවා, ඔවුන්ගේ වැටුප් ප්‍රශ්න ගැන. මම හිතන හැටියට ඒක මම වාගේම ඔබතුමන්ලාත් දන්නවා. ඔවුන්ගේ වැටුප් පිළිබඳව සහ ඔවුන්ගේ සේවක සුරක්ෂිතතාව පිළිබඳව අද ඇතැම් ගැටලු මතු වෙලා තිබෙනවා. ඒ වාගේම පසු ගිය දිනවල සම්මත වුණු අය වැය නිසා ක්‍රියාත්මක වන සමහර බදු ක්‍රම සහ ප්‍රතිපත්ති නිසා අද ඇතැම් පෞද්ගලික අංශයේ ආයතන විශාල ගැටලුවලට මුහුණ දීලා තිබෙනවා. ඒ ආයතනවල හිමිකරුවන් අද ඒ සම්බන්ධයෙන් විවිධ අදහස් දක්වමින් ඉන්නවා. ඒ ව්‍යවසායකයින් මුණ ගැසී සාකච්ඡා කළොත් ඔබතුමන්ලාට ඒ කරුණු පිළිබඳව යම් අවබෝධයක් ලබා ගන්න පුළුවන්කම ලැබේවි. අපි ඒ පිළිබඳව විශේෂයෙන්ම ඔබතුමන්ලාගේ අවධානය යොමු කරවනවා.

අද දේශපාලන හේතු මත රජයේ ආයතනවල සේවකයින්ට ස්ථාන මාරුවීම් ලබා දීලා තිබෙනවා. සමහර ආයතනවල සේවකයන්ට අද රැකියාවට පවා එන්න නොදෙන තත්ත්වයක් උද්ගත වෙලා තිබෙනවා. ඒ නිසාම සමහර අයගේ රැකියා අහිමි වන තත්ත්වයකුත්, සමහර අයට රැකියාවලින් එළියට යන්න වුණු තත්ත්වයකුත් මතු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම අපි මේ ගැන ගරු සභාවට සිහිපත් කරනවා.

අද ගරු මන්ත්‍රීතුමන්ලා පසු ගිය ආණ්ඩුවේ වැරදි මතු කළා. මේ දේවල් නිරන්තරයෙන්ම කථා කරනවා. වැරදි ගැන සාකච්ඡා කළාට ප්‍රශ්නයක් නැහැ. සංවර්ධනයේ අඩු පාඩු තිබෙනවා නම්, ඒ සම්බන්ධයෙන් කථා කළාට ප්‍රශ්නයක් නැහැ. පසු ගිය දවස්වල හැමෝම වංචා, දූෂණ ගැන කථා කර කර මාධ්‍ය සන්දර්ශන විශාල ප්‍රමාණයක් පැවැත්වූ බව අපි දැක්කා. අපි පසු ගිය දිනවල යම් සිදුවීමක් පිළිබඳව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ගිහිල්ලා එහි සභාපතිතුමියට කථා කරපු වෙලාවේ එතුමියගේ පැත්තෙන් ඉදිරිපත් කරපු කරුණ තමයි, අනේ මේ හිස් files නම්; එක කොළයක් තිබෙන files නම් ගෙනැත් දෙන්න එපාය කියන එක.

අපිට ගෙනැත් දෙනවා නම් හරියට තොරතුරු සහිතව file එක ගෙනැවිත් දෙන්න. එසේ නැත්නම් මේ දීලා තිබෙන ඔක්කොම files බැලුවාම ඒවායේ කොළ කැල්ලක් විතරයි තිබෙන්නේ. කිසිම තොරතුරක් නැහැ. අපිට පරීක්ෂණයක් මොකක්වත් කර ගන්නට බැහැ කියා කිව්වා. එහෙම තත්ත්වයක් තිබෙන්නේ. අද කිසිම දෙයක් පිළිබඳව විමර්ශනයක් සිදු නොවී, පුළුවන් තරම් වංචා දූෂණ, වංචා දූෂණ කියා ගෙන යනවා. පාරවල් හැදුවා, වංචා දූෂණ සිදු වුණාය කියා මේ ගරු සභාවේදී කියනවා. අනෙක් පැත්තෙන් මොකක් හෝ ව්‍යාපෘතියක් පෙන්වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය දවස්වල මේ පාර්ලිමේන්තුව ඉස්සරහ නගරය ඉතාම ලස්සනට හදලා තිබුණා. අද ඒ ගස් ටික මැරිලා යනවා මම දැක්කා. වර්තමාන ආණ්ඩුවේ දර්ශනයේ, දැක්මේ ප්‍රශ්නයකුත් තිබෙනවා. එදා පාර්ලිමේන්තුව ඉස්සරහ වට රවුම ලස්සනට හදලා තිබුණා. [බාධා කිරීම්] ගිහින් බලන්න එපායැ. වට රවුම හැරෙනකොටම පළමුවෙන්ම ඉස්සරහ පාර මැද්දේ තිබෙන ගස් පේළියේ ගස් දෙක තුන දැන් මැරෙමින් යනවා. [බාධා කිරීමක්] ලස්සන මල් ගස් වවා තිබුණා. [බාධා කිරීමක්] පාර්ලිමේන්තුවට උදේ සවස එන කඩුවෙල ආසනයේ අපේ ගරු මන්ත්‍රීතුමා ඔය ගස් ටික මැරෙනවා දැක නැත්නම් ඔබතුමාගේ ඉතිරි ටික ගැන අමුතුවෙන් කියන්න දෙයක් නැහැ. මගෙන් ප්‍රශ්න අහන්න එපා. ගිහින් බලන්න. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ගිහින් බලන්න. [බාධා කිරීමක්] ඇත්ත ද කියා ගිහින් බලන්න. ඕනෑ නම් අපි දෙදෙනාත් එක්ක පාර්ලිමේන්තු රැස්වීම් ඉවර වෙලා යමු. [බාධා කිරීමක්] මේ හිටවපු ගස් ටිකෙන් යහපාලනයේ ස්වභාවය ටිකෙන් ටික පෙනෙනවා. [බාධා කිරීමක්] ඔබතුමන්ලා අරලිය ගහ මන්දිරයේ මල් පෝච්චි ටික ගලවනවා. ගස් ටික ගලවනවා. ඒ තමයි යසපාලනය [බාධා කිරීමක්]

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මල්පෝච්චි ටික maintain කරන්න දවසකට ලක්ෂ තුනහමාරක් යනවා.

ගරු වීරකුමාර දිසානායක මහතා
(மாண்புமிகு வீரகுமார திசாநாயக்க)
(The Hon. Weerakumara Dissanayake)
කමක් නැහැ. රජ මාළිගාව තිබෙන්නට ඕනෑ රජ මාළිගාව විධියට. පැල්පත තිබෙන්නට ඕනෑ පැල්පත විධියට. රාජ්‍ය නායකයා ඉන්න තැන. [බාධා කිරීමක්] ඔබතුමා ඒක සොයා

[ගරු වීරකුමාර දිසානායක මහතා]

ගන්න. ඔබතුමාට උත්තර දෙන්න නොවෙයි මම කථා කරන්නේ. රාජ්‍ය නායකයා ඉන්න තැන. ඔබතුමා එහෙම නම් රනිල් වික්‍රමසිංහ මහත්මයාටත් කෙහෙන් හෝ රුපියල් විසිපන්දාහකට විතර ගෙයක් අරගෙන දෙන්නකෝ ඔච්චර දුක් විඳගෙන ඔතැනට යන්න ඕන යැ. ඔය වැඩ ටික කර ගන්න, රුපියල් විසිපන් දාහකට, පනස් දාහකට කොළඹින් ගෙයක් අර ගෙන දෙන්න කෝ. අරලිය ගහ මන්දිරය වහන්න. අපි අරලිය ගහ මන්දිරය දෙමු විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට නේවාසිකාගාරයකට.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! There is a point of Order being raised by the Hon. Sujeewa Senasinghe.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
අගමැති රනිල් වික්‍රමසිංහ මහත්මයා ඉන්නේ තමන්ගේ පෞද්ගලික නිවසේයි.

ගරු වීරකුමාර දිසානායක මහතා
(மாண்புமிகு வீரகுமார திசாநாயக்க)
(The Hon. Weerakumara Dissanayake)
අපි අරලියගහ මන්දිරය දෙමු, විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට නේවාසිකාගාරයකට. හොඳ නැද්ද? කැමතිද ?

ඔච්චර අමාරුවක් නම්, ඒක දෙන්න කැමැති ද? ඔබතුමා කථා කරන්න. විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට නේවාසිකාගාරයකට දෙන්න කැමැති ද?

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔබතුමා ඉන්නේ කොහේ ද මේ දවස්වල?

ගරු වීරකුමාර දිසානායක මහතා
(மாண்புமிகு வீரகுமார திசாநாயக்க)
(The Hon. Weerakumara Dissanayake)
ඇයි, මම ඉන්න තැන කියන්න ඕනෑ ද? ඔබතුමා කැමැති ද? ඒක විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට නේවාසිකාගාරයකට දෙන්න. බොරු කයිවාරු ගහනවා. බොරුවට මාධ්‍යවලට කියනවා, අච්චරයි, මෙච්චරයි කියා. ඒක දෙන්නකෝ කාට හෝ මහජනයාට පාවිච්චි කරන්න. එහෙම දෙන්නේ නැත්නම් ඒ ආයතනය එහෙම තියාගෙන ඉන්න ඕනෑ නැහැ. පත්තුවෙන විදුලිබිලත් පාඩුයි. ඒකේ අනෙක් නඩත්තු කටයුතු කිරීමත් පාඩුයි. ඒක පාවිච්චි කරන්නේ නැත්නම් වහන්න. භාවිත නොකරන ආයතනයක් බවට පත් කරන්න. [බාධා කිරීමක්] එහෙම නැතිව ඒක තියාගෙන මාධ්‍යවලට පෙන්වනවා. ඇතුළේ ගිහිල්ලා, ඒකේ සැප පහසුකම් ටික ඔක්කොම ගන්නවා. අර ගෙන එළියට පෙන්වනවා,"මේවාය" කියා. ඕකනේ කරන්නේ? අරලිය ගහ මන්දිරයට ගිහින් ඒ ටිකත් ගන්නවා. ජනාධිපති මන්දිරයට ගිහින් ඒ ටිකත් ගන්නවා. ජනාධිපති ලේකම් කාර්යාලයට ගිහින් ඒ සියලු පහසුකම් විදිමින් බොරුවට රටට පෙන්වනවා, මෙන්න මෙහෙම මල් වවලා කියා. මල් පෝච්චි ටික ගලවනවා. ඇතුළේ ෆුල් වුන් එකේ කට්ටිය ඉන්නවා. ඇතුළේ ඔක්කොම කර ගන්නවා. එම නිසා මන්ත්‍රීතුමා රටට බොරු කරන්න එපා. හරිද? ඒවා දියුණු වෙනවාට අපි කැමැතියි. රටේ සංවර්ධනයක් ඇති වෙලා පාර්ලිමේන්තුව මෙහෙම තියෙන කොට අපිට ගෞරවයෙන් ඇවිල්ලා ඉන්න පුළුවන්කම තිබෙනවා. මේ අපේ පාර්ලිමේන්තුවය කියා පෙන්වන්න පුළුවන්.

ජනාධිපති, මහින්ද රාජපක්ෂ ද, රනිල් වික්‍රමසිංහ ද, මෛත්‍රීපාල සිරිසේන ද කියන එක නොවෙයි. මේ රටේ තිබෙන්න ඕනෑ, ප්‍රධාන තැන් ටික තිබෙනවා. මහ බැංකුවට ගියාම මහ බැංකුවේ ශ්‍රවණාගාර ගොඩනැඟිල්ල මේ පාර්ලිමේන්තුවට වඩා හොඳට තිබෙනවා. එහෙම තැන් රටේ තිබෙනවා. අපේ වයඹ පළාත් සභාවට ගියාම, පසු ගිය කාලයේ ඒ පළාත් සභා ගොඩනැඟිල්ල ඉතා හොඳට හදලා තිබෙන බව පෙනුණා. අපි උතුරු මැද පළාත් සභා ගොඩනැඟිල්ල ඉතා හොඳට හදලා තිබෙනවා. සමහර ප්‍රාදේශීය සභා ගොඩනැඟිලි අපි ඉතා හොඳට හැදුවා. රටේ රාජ්‍ය ආයතන මිනිස්සුන්ට ඉන්න, මහජනයාට ගෞරවයෙන් කටයුතු කරන්න පුළුවන් තැන් වෙන්න ඕනෑ. ඒවා බොරුවට පෙන්වමින් එහාට මෙහාට යනවා. ඒ නිසා මේ රටේ කම්කරුවාගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න ඔබතුමාට වගකීමක් තිබෙනවා.

අර කිව්ව දින සියය ගෙවෙන්නේ කොහොමද? මේ දින සියය ගෙවෙන්නේ පසු ගිය ආණ්ඩුවේ files එකතු කරලා. දින සියයේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනවා නොවෙයි, පසු ගිය ආණ්ඩුවේ files එකතු කරන්න අපි දින සියයක අලුත් ආණ්ඩුවක් හැදුවා. පසු ගිය ආණ්ඩුවේ files එකතු කරන එක තමයි වැඩේ. එහෙම නම් ගෙනෙන්න. මොකක් හෝ පාරක් හැදීමේ දෝෂයක් තිබෙනවා නම් ඒකට වග කියන්න නිලධාරි තට්ටුවකුත් ඉන්නවා. ඒගොල්ලන්ගේ නම් ටිකත් කියන්න. අහවල් ලේකම් වැරදියි, මේ ලේකම් වැරදියි , මේ නිලධාරියා වැරදියි, අහවල් ඉංජිනේරුවා වැරදියි, එහෙම කියන්න ඕනෑ. එහෙම නැතිව මේ රටේ දේශපාලනඥයෙක් විතරක් බොරුවට අල්ලලා, අනෙක් අය ආරක්ෂා කරන්න, තමන්ගේ පැවැත්ම ආරක්ෂා කර ගන්න කටයුතු කරන්නේ නැතිව, බොරුවට රටේ ජනතාව මුළා නොකර එක්කෝ දින සියයේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න කියන එකයි අපි කියන්නේ. එහෙම නැත්නම් ආණ්ඩුව අපට දීලා තමුන්නාන්සේලා මේ පැත්තට එන්න. බොහොම ස්තූතියි.

[අ.භා. 5.21]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලයක් ප්‍රමාද වෙමින් තිබුණු සේවක අර්ථ සාධක අරමුදල පනත යටතේ නියෝග අද සම්මත කරන්නට ලැබීම අපි කාටත් සතුටට කරුණක්. ප්‍රමාද වෙමින් තිබීම අපි කාටත් දුකට කරුණක්. එසේ මගේ කථාව ආරම්භ කරමින් මා මේ කරුණු කිව යුතුයි.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේත් මේ ගරු සභාවේත් නිතරම මතක් කර තිබෙන දෙයක් තමයි සේවක අර්ථ සාධක අරමුදලේ යම් ප්‍රමාණයක් -සියයට 8ක්- අලාභ වන සමාගම්වල ආයෝජනය කර තිබෙන බව. ඒ, දේශපාලන විශ්වාසයන් මත, පෞද්ගලික හැඳුනුම්කම් මත. එහෙමත් නැත්නම් වෙනත් අයථා හේතු මත. මේවා තමයි චෝදනා. මම නොවෙයි, ඒවා කියන්නේ. ඒ නිසා මූල්‍ය මණ්ඩලය තීන්දු කර තිබෙනවා මේවා යම් යම් සමාගම්වල ආයෝජනය කරන්න. ඒ නිසා සේවක අර්ථ සාධක අරමුදලට අලාභයක් වුණා. අලාභයක් වුණාය කියන්නේ ඒවායේ වටිනාකම අඩු කොටස්, වටිනාකම වැඩි මුදලකට දීලා ගැනීම නිසා. එසේ වුණු පාඩුව ගණන් බලා විගණන වාර්තාවලත් පෙන්වා

තිබෙනවා. දැන් මේක අපි කිය කියා ඉඳලා වැඩක් නැහැ. මේකට ප්‍රතිකර්මයක් කරන්න ඕනෑ. මූල්‍ය මණ්ඩලය කියන එකේ ඉන්නේ මිනිස්සු නේ. පෘථග්ජන මිනිස්සු ඉන්නේ. ඒ මූල්‍ය මණ්ඩලයේ අද ඉන්න හොඳ මිනිහා, හෙට නරක් වෙන්න පුළුවන්. අද හොඳ මිනිස්සු පත් කරනවා. හෙට නරක මිනිස්සු එනවා. ඔය විධියට මිනිහාගේ හොඳ නරකකම උඩ මේ තරම් වැදගත් දෙයක් රඳවා තිබීම සුදුසු නැහැයි කියන එකයි අපි කියන්නේ. ඒ නිසා මේ සඳහා මොකක් හෝ යන්ත්‍රණයක් ඕනෑ. මේවායේ අයිතිකාරයෝ මේ සේවකයෝ. ඒ නිසා සේවක අර්ථ සාධක අරමුදල ගැන සොයා බැලීමට, එහි ආයෝජන කටයුතු ගැන සොයා බැලීමට මේ සේවකයින්ගෙන් සමන්විත අධීක්ෂණ මණ්ඩලයකට බලයක් දෙන්නේ නැත්තේ ඇයි?

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඒ වාගේම තීන්දු ගැනීමට.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
තීන්දු ගැනීමටත් බලයක් දෙන්න ඕනෑ. අඩු ගණනේ අධීක්ෂණයට බලයක් දුන්නොත් යම් යම් අඩු පාඩු පෙන්වා ඒ සේවක නියෝජිතයන්ට කියන්න පුළුවන්, මේවායේ ආයෝජනය කරන්න එපා, මේ ආයෝජනය කළ ඒවා වැරදියි, ඒවා වෙනස් කරන්න ආදී වශයෙන්. තමන්ගේ අරමුදල එය පවත්වා ගෙන යන ආකාරය, එය මෙහෙයවන ආකාරය, එය ආයෝජනවලට හරවන ආකාරය ගැන අධීක්ෂණය කරන්න මේ සේවකයන්ට දැන් කිසිම බලයක් නැහැ. අර පනතේ වගන්ති ටික විතරයි තිබෙන්නේ. ඒකේ තිබෙනවා blue-chip companies වලයි ආයෝජනය කරන්න ඕනෑ කියා. ඒකත් නොවෙයි කර තිබෙන්නේ. ඉතින්, මම කියන්නේ මේ ආණ්ඩුව ඒ පැත්තටත්, ඒ ආණ්ඩුව මේ පැත්තේ විපක්ෂයටත් මාරු වෙන වෙලාවට මේ හොඳ මිනිස්සුයි, නරක මිනිස්සුයි කියා මිනිස්සුන්ගේ හොඳ නරක අනුව මේක බලන්න බැහැයි කියන එකයි.

මේකට වුවමනා ව්‍යුහය හදන්න. මූලික වශයෙන්ම එය හැදෙන්න ඕනෑ මේ අරමුදලේ අයිතිය තිබෙන උදවියගේ බලය නියෝජනය වන ආකාරයටයි. එසේ කිරීම තුළින් පමණයි මෙය වැරදි පාරක යන එක වළක්වා ගන්න පුළුවන් වන්නේ. අපේ අරමුදලේ මුදල් අපට තිබෙන හොඳම විධියට, අපට වැඩිම ප්‍රතිලාභ ලැබෙන විධියට අපි මෙහෙයවිය යුතුයි කියන හැඟීම තිබෙන්නේ මේ සේවකයින්ටයි. අද ඒක භාර වෙලා තිබෙන්නේ තනිකර නිලධාරි කණ්ඩායමකට විතරයි. මෙන්න මේ වෙනස කරන්න ඔබතුමන්ලාගේ ආණ්ඩුව ක්‍රියා කරනවාද, නැද්ද කියලා කරුණාකර අද අපට දෙන පිළිතුරේදී ඔබතුමන්ලා කියනවා ඇතැයි මා විශ්වාස කරනවා.

දෙවනුව නොවිධිමත් අංශය පිළිබඳව මා කථා කරන්න කැමැතියි. අතිවිශාල නොවිධිමත් අංශයක් -සියයට 60ක්- තිබෙනවා. දැන් මේ අර්ථ සාධක අරමුදල් ගෙවන ප්‍රමාණය අරගෙන බැලුවාම නොවිධිමත් අංශයේ සේවය කරන විශාල පිරිසකගේ අර්ථ සාධක අරමුදල් ගෙවීමක් සිදු වන්නේ නැහැ. මෑන් පවර් සේවා ආයතනවල අර්ථ සාධක අරමුදල් ගෙවීමක් නැහැ. දැන් මේ රටේ කම්කරුවන්ගෙන් පෞද්ගලික අංශයේ සේවය කරන භාගයකටත් වඩා පිරිසකට ඇත්තටම සේවක අර්ථ සාධක අරමුදලේ වාසියක් ලැබෙන්නේ නැහැ. මේ ගැන හොයා බලන්නට මේ තිබෙන යන්ත්‍රණය මදි. ඔය ඉන්න කම්කරු නිලධාරින්ට මුළු ලංකාවම පීරාගෙන ඕක බලන්න බැහැ. වෘත්තීය සමිති තමුන්නාන්සේලාගේ විශ්වාසයට ගන්නේ නැත්තේ ඇයි? දැනට අර්ථ සාධක අරමුදල් නොගෙවන සේවා ස්ථාන පිළිබඳව වාර්තා කරන්න වෘත්තීය සමිතිවලට භාර දෙන්න. වෘත්තීය සමිති රට පුරා විහිදිලා තිබෙනවා. තමන්ගේ සේවක අර්ථ සාධක අරමුදල් වැඩි කර ගන්න වෘත්තීය සමිතිවලට වුවමනාවක් තිබෙනවා. ඒ නොගෙවන හැම ආයතනයක් ගැනම තොරතුරු වාර්තා පත්තරෙන් කැඳවන්න. පත්තරෙන් විවෘත කැඳවීමක් කරන්න. ඒකට යම් කිසි ප්‍රතිලාභ ගෙවීමක් කරන්න. දැන් අපි දන්නවා, ආදායම් බදු දෙපාර්තමේන්තුවේ ආදායම් බදු නොගෙවන යම් උදවිය ගොඩ ගසා ගෙන තිබෙන ලාභ ආදායම් බදු දෙපාර්තමේන්තුවට වසන් කරන කොට ඒ පිළිබඳ තොරතුරක් දුන්නොත්, ඒ තොරතුරු දුන්නු අයට ප්‍රතිලාභයක් ලැබෙනවා කියා. ඒ වාගේ තමුන්නාන්සේලා ප්‍රතිලාභයක් යෝජනා කරන්න. මේ තොරතුරු දීලා, ඒ නිසා යම් අයකු අර්ථ සාධක අරමුදලට ඇතුළු කර ගන්නට අවස්ථාව ලැබුණොත් ඒ තොරතුරු දුන්නු මිනිහාට ප්‍රතිලාභයක් දෙන ක්‍රමයක් තමුන්නාන්සේලා ඇති කළ යුතුයි. එසේ කළොත් අද තිබෙන අර්ථ සාධක අරමුදල දෙගුණයක් වෙන්න පුළුවන්. එහෙම වුණොත් ඒකේ ප්‍රයෝජනය රජයටත් තිබෙනවා. ඒකේ ප්‍රයෝජනය මේ රටේ මූල්‍ය වෙළෙඳ පොළටත් ලැබෙනවා. ඒ නිසා අපි කම්කරුවාගේ පැත්තෙනුත් මේ කාරණය ගැන කල්පනා කරලා මේ හැම කම්කරුවකුටම අර්ථ සාධක අරමුදලේ වාසිය ලැබෙන ක්‍රමයක් හැදිය යුතුව තිබෙනවා.

ඊළඟට, මා තව කාරණයක් අහන්න කැමැතියි. මහින්ද රාජපක්ෂ මහත්මයාගේ අවසාන අය වැයෙන් සේවක අර්ථ සාධක අරමුදලට සේව්‍යයාගෙන් ලැබිය යුතු මුදල සියයට 14ට වැඩි කළා. මේ අර්ථ සාධක අරමුදලට සේව්‍යයා විසින් ගෙවිය යුතු ඒ සියයට 14 තවම ගෙවෙන්නේ නැහැ. ඒ සියයට 14 ගෙවීමට -කලින් ගෙවිවේ සියයට 12යි. ඒක සියයට 14 දක්වා වැඩි කළා- වුවමනා කරන විධිවිධාන සලස්වා නැහැ. ඒ විධිවිධාන සලස්වන්න අවශ්‍ය කටයුතු ඔබතුමන්ලා කරනවාද, නොඑසේ නම් අය වැයෙන් ඉදිරිපත් කළ ඒ යෝජනාව තමුන්නාන්සේලා ඉවත දමනවාද කියලා අපට කියන්නට ඕනෑ. තමුන්නාන්සේලා අද පපුවට ගහ ගෙන "කම්කරුවා වෙනුවෙන්, දුප්පතා වෙනුවෙන් මෙන්න අපි දෙන සහන" කියලා කෑ ගහන මේ වෙලාවේ අපට කරුණාකර කියන්න රුපියල් 2,500 වැඩි කරන්න තමුන්නාන්සේලා බලාපොරොත්තු වන්නේ කොහොමද කියලා. තමුන්නාන්සේලා රුපියල් 2,500 වැඩි කරන්න බලාපොරොත්තු වන්නේ පඩිපාලක සභාවෙන්. මේක තමයි ලොකුම විහිළු කථාව. පඩිපාලක සභාව තිබෙන්නේ පඩි වැඩි කරන්න නොවෙයි. පඩි පාලක සභාව තිබෙන්නේ අවම පඩිය තීන්දු කරන්නයි. අද ඉන්න සේවකයින්ගෙන් දැනට අවුරුද්දක් සේවය කරපු කෙනෙකු අවම වැටුපට වඩා ගන්නවා. එහෙම නම් මේ ඉන්න සේවකයින් අතරින් සියයට 90ක්ම අවම වැටුපට වඩා ගන්නවා. අවම වැටුපට වඩා ගන්නවා නම්, ඒ අයගේ වැටුප 2,500කින් වැඩි කරන්න බැහැ. ඒකයි මා පෙන්වන්නේ. ඒ නිසා මේ වැඩි කළ රුපියල් 2,500 ලබා දීමට ඔබතුමන්ලා යොදන ක්‍රමෝපාය කුමක්ද කියා මේ සභාවට කියනු ඇතැයි අප බලාපොරොත්තු වෙනවා.

ඊළඟට, විශ්‍රාම වැටුපක් ගැන යෝජනාව ආවා. ඒ ගැන බොහෝ කථා කළා. ඒක ආවේත් පසු ගිය වතාවේ මහින්ද රාජපක්ෂ මැතිතුමා ඉදිරිපත් කළ අය වැයෙන්. මේ අය උපයා දී තිබෙන වටිනාකම් අනුව බලා, විශේෂයෙන්ම විදේශ විනිමය උපයන කර්මාන්ත ශාලාවල ඒ අය වෙනුවෙන් විශ්‍රාම වැටුප් ක්‍රමයක් හදන්න යෝජනා කළා. ඒ යෝජනාව ක්‍රියාවට නහන්නට ඔබතුමන්ලා බලාපොරොත්තු වෙන්නේ කෙසේද කියා පැහැදිලි කළොත් එය මේ සභාවට වටිනා තොරතුරක් වෙනවා.

ඊළඟට, මේ ආයෝජනවලින් ඇති වී තිබෙන ලාභය මත බෝනස් ගෙවීමේ ක්‍රමයක් ගැන යෝජනා වුණා. ආයෝජන මණ්ඩලය ඇති කර තිබෙන තැන්වල තිබෙන්නා වූ ලාභය මත බෝනස් ගෙවීමේ ක්‍රමයක් ගැන යෝජනාවක් ඉදිරිපත් වුණා. මීට අමතරව රුපියල් 10,000ක අවම වැටුපක් යෝජනා කළා. ඒ රුපියල් 10,000ක අවම වැටුප ගැසට් කරලා, මේ රටේ කම්කරුවන් තමන්ගේ වැටුප පිළිබඳව හාම්පුතුන් සමඟ ගනු

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

දෙනු කරන කොට, පෞද්ගලික අංශයේ නීත්‍යානුකූල අවම වැටුප රුපියල් 10,000යි කියා අපට කියන්න පුළුවන් තත්ත්වයක් ඇති කරන්න මහින්ද රාජපක්ෂ මහතා ගෙනාපු යෝජනාව ක්‍රියාවට නඟන්න පුළුවන් විධියට පඩිපාලක සභාව අන්න එතැනදී රුපියල් 10,000ක අවම වැටුප් යෝජනාවට කැඳවාගෙන එන්නය කියා අපි තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා.

අවසන් වශයෙන් මම තවත් කරුණක් මතක් කරන්න ඕනෑ. කාගේ හරි අර්ථ සාධක අරමුදලක් ගැන වංචාවක් කළාම, වංචා විමර්ශන අංශයෙන් ඒ ගැන නඩු කියලා, නඩු හබය ඉවර වෙලා එහි තීන්දුව එනකම් ඒ වංචාවට ගොදුරු වුණු මිනිහාට තමන්ගේ අර්ථ සාධක අරමුදලේ ප්‍රතිලාභය ලැබෙන්නේ නැහැ. ඒ වාගේම මේ අර්ථ සාධක අරමුදල්වල ප්‍රතිලාභ ගන්න ගියාම හාම්පුතුන්ගෙන් විඳින්න වෙන හිරිහැරය කියා නිම කරන්න බැහැ. ඒ නිසා හාම්පුතුන් නිවැරදි විධියට පෝරමය පුරවා එව්වේ නැත්නම් ඒ අයට නියම කරන දඩයක් තිබිය යුතුයි. නිසි වේලාවට වයස සම්පූර්ණ කරන සේවකයන්ගේ පෝර්මය සේව්‍යයාට විතරයි පුරවන්න පුළුවන්. එය පුරවා එවීම ප්‍රතික්ෂේප කරනවා නම්, අර්ථසාධක අරමුදල බැර නොකළාම දඩයක් නියම කර තිබෙනවා වාගේ -දඬුවමක් තිබෙනවා වාගේ- ඔහුට විරුද්ධව දඬුවම් කරන ක්‍රමයක් ඇති කරන්නය කියා මා ඉල්ලනවා. ඒ වාගේම තමුන්නාන්සේලා දන්නවා, අර්ථ සාධක අරමුදල් නොගෙවා පැහැර හරින අය කොච්චර ඉන්නවාද කියා. එසේ පැහැර හරින අය එමඟින් මොකක්ද කරන්නේ? කම්කරුවාගෙන් අර්ථ සාධක අරමුදලට අඩු කර ගත යුතු මුදල අඩු කරනවා. තමන්ගෙන් අර්ථ සාධක අරමුදලට ගෙවිය යුතු මුදල ගෙවන්නෙත් නැහැ. කම්කරුවාගෙන් අඩු කර ගත්තු මුදල තමන්ගේ අයුතු ප්‍රයෝජනට, වත්තේ ප්‍රයෝජනයට, ව්‍යාපාරයේ ප්‍රයෝජනයට, ප්‍රාග්ධනයේ ප්‍රයෝජනයට ගන්නවා. එතකොට ඒක වංචාවක් නොවෙයිද? අපි කවුරුත් කථා කරනවා, අර්ථ සාධක අරමුදල් වංචාව ගැන. ඒවා කාගේ මුදල්ද? ඒවා රජයේ මුදල්. තමන්ගේ අරමුදල් දායකත්වය නොගෙවීම වංචාවක් නොවෙයිද? ඒ කාගේ අරමුදල්ද වංචා කරන්නේ?

ඒක රජයේ භාරකාරත්වයේ තිබෙන අරමුදලක්. රජයේ ආදායමටත් දායක වන අරමුදලක්. කම්කරුවාගෙන් අඩු කර ගන්නා මුදල අර්ථ සාධක අරමුදලට බැර නොකළොත් ඒක කෙළින්ම වංචාවක්. මේ වංචාවන් ගැන නීතිපතිතුමාගේ දෙපාර්තමේන්තුවට ගියාම කියන්නේ ඒවා ඔක්කොම එක එක්කෙනාගේ ගෙවීම්, එකතු කිරීමේ ප්‍රශ්නයක්ය කියායි. යම් යම් අයගෙන් අය විය යුතු ගෙවීම් ලබා ගැනීම සඳහා මාර්ගයක් තිබෙනවා. ඒ තමයි, ඔවුන්ට නඩු දැමීම. ඔව්, ඒක ඇත්තයි. නඩු දමලා, අත් අඩංගුවට අරගෙන ඉන්න ලටෙක් එකේ රවි වෙත්තසිංහ මහතාගෙන් කම්කරුවන්ට රුපියල් මිලියන ගණනක් අය වෙන්න තිබෙනවා. ඒ සම්බන්ධයෙන් දමපු නඩු තවමත් උසාවිවල පල් වෙනවා. දැන් තමයි එතුමා ආපහු ලංකාවට ඇවිල්ලා අත් අඩංගුවට පත් වෙලා තිබෙන්නේ. මම කියන්නේ මීට වඩා කෙටි ක්‍රමයක් අවශ්‍යයි කියන එකයි. ඒ නඩු වෙනුවෙන් මම උසාවියට ගිය වාර ගණන මම දන්නවා. ඒ නඩු දිග්ගැස්සෙමින් යනවා. හාම්පුතා එන්නේ නැහැ. ඒ නිසා අන්තිමට මේ කම්කරුවන්ට අත පිස දමාගෙන ගෙදර යන්න වෙනවා. ඒ නිසා මේ ගැන මීට වඩා දැඩි රීතියක්, දැඩි නීතියක් අවශ්‍යයි. කෙනෙකුගේ වැටුපෙන් අඩු කර ගත්ත මුදල ඒ අරමුදලට බැර කළේ නැත්නම් ඒක අමු වංචාවක්. එවැනි අවස්ථාවකදී වංචාවක පදනමින් ඔහුට විරුද්ධව ක්‍රියා කරන්නය කියා ඉල්ලනවා. ඒ වාගේම මේ අර්ථ සාධක අරමුදලේ ප්‍රතිලාභ ලැබීමේ කාර්යදාමය මීට වඩා ළිහිල්, මීට වඩා සෘජු හා මීට වඩා පහසු ක්‍රමයකට හරවන්නය කියා ඉල්ලමින් මගේ වචන ස්වල්පය හමාර කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

The next speaker is the Hon. Hunais Farook. Before he starts, will an Hon. Member propose the Hon. Mohamed Aslam to take the Chair?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

I propose that the Hon. Mohamed Aslam do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ආර්. යෝගරාජන් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු මොහමඩ් අස්ලම් මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு ஆர். யோகராஜன் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு மொஹமட் அஸ்லம் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. R. YOGARAJAN *left the Chair, and* THE HON. MOHAMED ASLAM *took the Chair.*

[පි.ප. 5.35]

ගරු හුනෙයිස් ෆාරූක් මහතා
(மாண்புமிகு ஹுனைஸ் பாறூக்)
(The Hon. Hunais Farook)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, EPF - ஊழியர் சகாய நிதியச் சட்டத்தின்கீழான ஒழுங்குவிதிகள் தொடர்பாக விவாதிப்பதில் மகிழ்ச்சியடைகின்றேன். இன்று அரச உத்தியோகத்தர்களைப் பொறுத்தமட்டில், அவர்களுக்கு அல்லது அவர்களது குடும்பத்தில் உள்ளவர்களுக்கு பணம் தொடர்பிலான பிரச்சினை ஏதாவது வரும்பொழுது அதனைக் கடனாகவோ அல்லது யாரிடமாவது பணத்தைக் கைமாற்று வகையிலோ வாங்கி அந்தப் பிரச்சினையை நிறைவேற்றக்கூடிய தன்மை இருக்கின்றது. ஆனால், தனியார் துறையில் வேலை செய்கின்றவர்களுக்கு அது மாற்றமாக இருக்கின்றது. தனியார் துறையில் வேலை செய்கின்ற ஒருவர் தனக்கு ஒரு கஷ்டம், துன்பம் ஏற்படும்போது அதாவது தனக்கோ அல்லது தனது பிள்ளைகளுக்கோ அல்லது தனது துணைவிக்கோ பணம் தொடர்பிலான ஒரு பிரச்சினை வரும்போது அல்லது ஒரு நோயைக் குணப்படுத்துவதற்கு நிதியைப் பெறுவதற்காக கடன்பெறச் செல்லும்போது பல சிக்கல்கள் ஏற்படுகின்றன. அரச உத்தியோகம் செய்கின்றவர்களுக்கு இருக்கின்ற அந்த மதிப்பினால் அவர்களுக்குக் கடன் கொடுப்பதற்கு யாரும் தயங்குவதில்லை. அந்தவகையில் தனியார் துறையில் வேலை செய்கின்றவர்களைக் கவனிப்பதற்கு யாருமில்லாத ஒரு துர்ப்பாக்கிய நிலை காணப்படுகின்றது. அதேபோன்று அவர்கள் வீடு கட்டுவதற்கோ, தாம் வசிக்கின்ற வீட்டைத் திருத்துவதற்கோ தேவையான நிதியைக் கடனாக யாரிடமாவது கேட்டுச்செல்கின்றபோது அதனைப் பெற முடியாத நிலையே காணப்படுகின்றது. ஆனால், இந்தச் சட்ட ஒழுங்குவிதிகள்மூலம் ஒருவருடைய அல்லது அவரது பிள்ளைகளுடைய அல்லது அவரது துணைவியுடைய வைத்தியத் தேவைக்காக EPF நிதியை மீளப்பெறலாம். அதன்படி தனியார் துறையில் வேலை

செய்கின்ற ஒருவர் தனது வீட்டைக் கட்டுவதற்கோ அல்லது தனக்குரிய அந்த வீட்டைத் திருத்தி அமைப்பதற்கோ பணம் தேவைப்படும்போது அவரது EPF பணத்தினை மீளப் பெறுவதற்கு இந்தச் சட்ட ஒழுங்குவிதி வழிவகுக்கின்றது.

இந்த அரசின் 100 நாள் வேலைத்திட்டத்தைப் பொறுத்த மட்டில், இன்று ஆட்சிக்கு வந்திருக்கின்ற புதிய அரசாங்கமானது நாட்டில் நடைமுறையிலுள்ள சிக்கல்களை மிகவும் அவதானமாக அணுகியபடியே அத்திட்டங்களை முன்னெடுத்துவருவதை நாங்கள் காணக்கூடியதாக இருக்கின்றது. எனவே, இந்த நேரத்தில் மாண்புமிகு நிதி அமைச்சர் அவர்களுக்கு ஒரு வேண்டுகோளை விடுப்பது பொருத்தமாக இருக்குமென நினைக்கின்றேன். இந்த 100 நாள் வேலைத் திட்டத்தின்மூலம் சுமார் 13 அத்தியாவசியப் பொருட்களுக்கு விலை குறைக்கப்பட்டிருக்கின்றது. இந்த விலைக்குறைப்பானது கிராம மட்டத்திலுள்ள அல்லது அடிமட்டத்திலுள்ள மக்களைச் சென்றடைந்திருக்கின்றதா என்பதை அவதானிக்க வேண்டியிருக்கின்றது. உதாரணமாக, எரிபொருளுக்கு விலை குறைக்கப்பட்டிருந்தாலும் முச்சக்கரவண்டியில் பயணம் செய்கின்றவர்களுக்கு அதனது வாடகை குறைக்கப்பட்டிருக்கின்றதா அல்லது வாகனங்களை வாடகைக்கு அமர்த்துபவர்களுக்கு வாடகைக் கூலி குறைக்கப்பட்டிருக்கின்றதா என்பவை பற்றிப் பரிசீலிக்க வேண்டியிருக்கின்றது.

இதேபோன்று, கோதுமை மாவின் விலை குறைக்கப் பட்டிருப்பதால் கிராமப்புறங்களிலுள்ள தேநீர்க்கடைகளில் விற்கப்படுகின்ற ரொட்டி மற்றும் ஏனைய தீன்பண்டங்களுக் கான விலைகள் குறைக்கப்பட்டுள்ளதா என்பதைப் பரிசீலிக்க வேண்டும். அவ்வாறே, சீனிக்கு விலை குறைக்கப் பட்டிருப்பதன்மூலம் தேநீருக்கான அல்லது பால்தேநீருக்கான விலை குறைக்கப்பட்டிருக்கின்றதா என்பதையும் நிச்சயமாகப் பார்க்க வேண்டும். அந்தவகையில் விலை குறைக்கப் பட்டிருக்கின்ற பொருட்களைக்கொண்டு தயாரிக்கப்படுகின்ற உணவுப்பொருட்களின் விலைகள் தேநீர்க் கடைகள், ஹோட்டல்கள் என்பவற்றில் குறைக்கப்பட்டுள்ளதா என்பதைப் பரிசீலித்து, அதைச் சரியாக நடைமுறைப் படுத்துவதன்மூலம்தான் என்ன நோக்கத்துக்காகப் பொருட்களின் விலைகள் குறைக்கப்பட்டிருக்கின்றதோ, அந்த நோக்கத்தின் நூறு வீத உச்சப் பயனை நாங்கள் அடையலாம். எனவே, உடனடியாக இதனை அமுல்படுத்தும்படி மாண்புமிகு நிதியமைச்சர் அவர்களுக்கு வேண்டுகோளொன்றை விடுக்கின்றேன். பயனாளிகள் அனுபவிக்கும் விடயங்களைப் பரிசீலனை செய்யவேண்டிய கடப்பாடு மாண்புமிகு நிதியமைச்சர் அவர்களுக்கு இருக்கின்றது என்பதை இந்த நேரத்தில் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

கடந்த அரசாங்கத்தினால் நகரப்புறங்களை மையமாக வைத்துப் பல அபிவிருத்தித் திட்டங்கள் செய்யப்பட்டன. அதனை நாங்கள் ஏற்றுக்கொள்ள வேண்டும். ஆனால், கிராமப்புறங்களின் அபிவிருத்தியில் குறைபாடுகள் உள்ளன. கடந்த சில வாரங்களாக நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற வன்னி மாவட்டத்தின் கிராமங்கள்தோறும் சென்று அங்குள்ள குறைகளை அவதானித்தேன். அங்கு ஒரு கிராமத்திலிருந்து வேறு கிராமத்துக்குப் பிள்ளைகள் பாடசாலைக்குச் செல்லமுடியாத அளவுக்குப் பாதைகள் மிகவும் மோசமான நிலையில் காணப்படுகின்றன.

அதேபோன்று, கிராமங்களிலுள்ள பாடசாலைகளைப் பார்க்கும்போது, வளப்பற்றாக்குறை மிகவும் அதிகமாகக் காணப்படுகின்றது. வன்னி மாவட்டத்தைப் பொறுத்தமட்டில், அங்கு தேசியப் பாடசாலைகள் மிகவும் குறைவாகவே இருக்கின்றன. மாகாணசபைக்குரிய பாடசாலைகளே அங்கு அதிகமாகக் காணப்படுவதனால் வளப்பற்றாக்குறை, ஆசிரியர் பற்றாக்குறை போன்ற பல குறைபாடுகள் காணப்படுகின்றன. எனவே, அங்குள்ள பாடசாலைகளில் க.பொ.த.ப. சாதாரண தர மற்றும் உயர்தரங்களில் நல்ல பெறுபேறுகளைப் பெறுகின்ற பாடசாலைகளை நாங்கள் கவனத்திற்கொண்டு, அவற்றினைத் தேசியப் பாடசாலைகளாக ஆக்குவதன்மூலம் உண்மையில் அந்தப் பிரதேசத்தின் கல்வியை வளர்ச்சிபெறச் செய்யலாம். அதேநேரம் மத்திய அரசாங்கம் கல்விக்காக ஒதுக்குகின்ற பணத்தின்மூலம் அங்குள்ள பாடசாலைகளின் வளங்களை நாங்கள் அதிகரிக்கக்கூடிய சந்தர்ப்பமும் இருக்கின்றது.

வன்னி தேர்தல் மாவட்டத்தில், மன்னார், வவுனியா, முல்லைத்தீவு ஆகிய மூன்று மாவட்டங்கள் இருக்கின்றன. சுகாதார சேவையைப் பொறுத்தமட்டில், அங்கு தேசிய வைத்தியசாலை ஒன்றுமே இல்லை. மன்னாரிலோ, வவுனியா விலோ, முல்லைத்தீவிலோ மத்திய அரசாங்கத்திற்குக் கீழுள்ள வைத்தியசாலைகள் எதுவுமில்லை. எனவே, இதுவொரு பாரிய குறையாக அங்கு காணப்படுகின்றது. மத்திய அரசாங்கத்தின் ஆளுகைக்குட்பட்ட வகையில் குறைந்தது ஒரு மாவட்டத்தி லாவது ஒரு வைத்தியசாலையை நிறுவவேண்டிய தேவை இருக்கின்றது. முல்லைத்தீவு என்பது பாரிய நிலப்பரப்பைக் கொண்ட ஒரு பிரதேசம். அதேபோன்று வவுனியா, மன்னார் ஆகிய மாவட்டங்களும் நிலப்பரப்பும் சனச்செறிவும் மிக்க பிரதேசங்களாகும். இந்த மூன்று மாவட்டங்களிலும் மூவின மக்களும் ஒன்றாகக் கலந்துவாழ்கின்றார்கள். அத்தோடு அவை யுத்தத்தால் பாதிக்கப்பட்ட பிரதேசங்கள். அங்கே மனவுளைச்சல் போன்ற பல நோய்களுக்கு உள்ளாக்கப்பட்ட மக்கள் வாழ்கின்றார்கள். எனவே, மாகாணசபைமூலம் அங்குள்ள சுகாதார தேவையைப் பூர்த்திசெய்ய முடியாது. மாகாண அமைச்சினால் ஒதுக்கப்படுகின்ற நிதிமூலம் அங்குள்ள வளங்களைச் சீர்செய்ய முடியாத நிலையிருக் கின்றது. வைத்தியர் பற்றாக்குறை, ஆளணிப் பற்றாக்குறை, வைத்திய சேவைக்கான பொருட்களின் பற்றாக்குறை என்பன அங்கு காணப்படுகின்றன. எனவே, குறைந்தது ஒரு மாவட்டத்திலேனும் மத்திய அரசாங்கத்துக்குக் கீழான ஒரு வைத்தியசாலையை உருவாக்குவதன்மூலம் அந்த மாவட்டங் களுக்கான வைத்திய தேவையை ஓரளவுக்கு நிவர்த்தி செய்யலாம்.

இந்த நாட்டில் முப்பது வருட காலமாக நீடித்துவந்த யுத்தம் இறுதியில் முடிவடைந்தது வன்னி மாவட்டத்தில் என்பது உலகமே அறிந்த விடயம். எட்டு மாதங்களுக்குள் 1,42,000 பேர் கொல்லப்பட்ட ஒரு பிரதேசமாக வன்னிப் பிரதேசம் இருப்பதாக அண்மையில் ஒரு மதப் பெரியார் சொன்னார். அவ்வாறு பேரழிவுக்குட்பட்ட பிரதேசத்தில் வைத்திய சேவை என்பது முக்கியமான தேவையாக இருக்கின்றது. எனவே, மன்னார், வவுனியா, முல்லைத்தீவு ஆகிய ஒவ்வொரு மாவட்டத்திலும் மத்திய அரசாங்கத்துக்குக் கீழான ஒவ்வொரு வைத்தியசாலையை அமைக்க வேண்டுமென்று கேட்டுக் கொள்வதோடு, அந்த மாவட்டங்களில் தேசியப் பாடசாலைகளை மேலும் அதிகரிக்கவேண்டுமென்றும் கேட்டு, வாய்ப்பளித்தமைக்கு நன்றி தெரிவித்து விடைபெறுகின்றேன்.

[අ.භා. 5.43]

ගරු ගීතාංජන ගුණවර්ධන මහතා
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී විශේෂයෙන්ම 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ, -2012 අංක 2 දරන සේවක අර්ථසාධක අරමුදල

[ගරු ගීතාංජන ගුණවර්ධන මහතා]

සංශෝධිත පනත යටතේත්- ඉදිරිපත් කරන නියෝග පිළිබඳව පැවැත්වෙන මෙම විවාදයට මහජන එක්සත් පෙරමුණේ මන්ත්‍රීවරයකු වශයෙන් මා හට එක්වීමට ලැබීම වැදගත් කොට සලකනවා.

විශේෂයෙන්ම 1956 දී සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු යන පංච මහා බලවේගය ජයග්‍රහණය කරමින් බිහි වුණු මහජන එක්සත් පෙරමුණු ආණ්ඩුවේ ගරු ටී.බී. ඉලංගරත්න අමාත්‍යතුමා 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනත ඉදිරිපත් කරමින්, දශක පහකට වැඩි කාලයක් තම විශ්‍රාම දිවිය පිළිබඳව විශ්වාසයක් හෝ බලාපොරොත්තුවක් නොමැතිව අසරණ වූ වැඩ කරන ජනතාවට විශාල ශක්තියක් ලබා දෙන ලදි. තම සේවා යෝජකයාගෙන් සියයට 12ක් හා සේවකයාගෙන් සියයට 8ක් ලබා ගෙන ගොඩ නැඟෙන එම අරමුදල, ආරම්භයේ සිටම ලබා දී ඇති පහසුකම් වර්ධනය කරමින් ඔවුන්ගේ සෞඛ්‍ය, හදිසි අනතුරු සහ අනෙකුත් ශල්‍යකර්ම සඳහා මෙන්ම ඔවුන්ගේ නිවාස පහසුකම් දියුණු කර ගැනීම සඳහා ද දායක වෙමින් මේ වන විට රුපියල් ට්‍රිලියන 1.3කට වැඩි අරමුදලක් බවට පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වන විට මෙම අරමුදලේ සක්‍රිය සාමාජිකත්වය මිලියන 2.4ක් වන අතර, එයින් රුපියල් 12,000ට අඩු ආදායම් ලබන ප්‍රතිශතයත්, රුපියල් 20,000ට අඩු ආදායම් ලබන ප්‍රතිශතයත්, රුපියල් 20,000-50,000ත් අතර ආදායම් ලබන ප්‍රතිශතයත් සලකා බැලිය යුතුයි. මේ පිළිබඳව ජාත්‍යන්තර කම්කරු සංවිධානය - ILO, ශ්‍රී ලංකා මහ බැංකුව - CBSL - සහ කම්කරු දෙපාර්තමේන්තුව - Labour Department - මෑතක දී කරන ලද අධ්‍යයනවලින් මෙම වර්ගීකරණය පිළිබඳව තොරතුරු විශ්ලේෂණයක් කර තිබෙන බව අපි දන්නවා. එම නිසා අප මෙයින් ගත යුතු පණිවුඩය නම් මෙම අරමුදල වෙහෙස මහන්සි වී වැඩ කරන බහුතරයක් ජනතාවගේ දායකත්වය තුළින් ගොඩ නැඟී ඇති බවයි. 70කට වැඩි ප්‍රතිශතයක් ඇති පනස්දහසක් දක්වා ආදායම් ලබන මේ කොටස පිළිබඳව විශේෂයෙන් අවධානය යොමු කරන්න ඕනෑ. එම නිසා මෙම ප්‍රතිලාභ ලබා දීමේ දී අප දැඩි වගකීම් සහගතව කටයුතු කළ යුතු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2013 මහ බැංකු වාර්තාවේ සඳහන් පරිදි මෙම අරමුදලේ ක්‍රියාකාරි සාමාජික සංඛ්‍යාව මිලියන 2.4ක් සහ සමස්ත වත්කම රුපියල් ට්‍රිලියන 1.3ක් පමණ වන අතර, සේවා යෝජකයින් සංඛ්‍යාව 70,000ක් පමණ වනවා. එබැවින් මෙම අරමුදලේ වත්කම්, සාමාජික අයිතිවාසිකම් හා වරප්‍රසාද සාධාරණව මා මීට පෙර කියපු ඒ කාණ්ඩවල ඒ ඒ දායකත්වය හා සාමාජික වර්ගීකරණය සලකා බලමින් එම සමස්ත සාමාජිකත්වයට ගැළපෙන ආකාරයෙන් ලබා දීම සඳහා විශාල වගකීමක්. මෙතෙක් වාණිජ බැංකු හරහා කළ දේ අද පළමුවැනි වරට මේ අරමුදලින් සෘජුව ලබා දීමට කටයුතු කිරීම පිළිබඳව අප වගබලා ගත යුතුව තිබෙනවා. අද දින මෙම නියෝග යටතේ ප්‍රතිලාභි ගිණුමෙන් සියයට 30ක්- රුපියල් මිලියන දෙකක උපරිමයකට යටත්ව- නිවාස හා සෞඛ්‍ය කටයුතු සඳහා ලබා ගැනීමට හැකි වනවා.

මෙතෙක් වාණිජ බැංකු මඟින් ක්‍රියාත්මක කළේ පොලියක් සහිතව ණය මුදලක් ලබා දීමයි. නමුත් පොලී රහිත සෘජු ලබා දීමක් බවට මෙය පරිවර්තනය වීමෙන් ඉල්ලුමට ඇති වන පීඩනය ගැන අපගේ විශේෂ අවධානය යොමු වනවා. අපේ ඇමතිතුමාත් මේ පිළිබඳව සඳහන් කළා. ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව අනුව 2013 වර්ෂයේ අරමුදලේ සමස්ත දායකත්වය රුපියල් බිලියන 80.5ක් වන අතර, සමස්ත ප්‍රතිගෙවුම රුපියල් බිලියන 50.2ක් පමණ වූ බව පෙනුණි. ඒ අනුව අරමුදලේ මාසික දායකත්වය රුපියල් බිලියන 6.5ක් පමණ බව පෙනෙනවා. ඒ අතර මාසික ප්‍රතිගෙවුම් වටිනාකම රුපියල් බිලියන 4.2ක් පමණ වනවා. එබැවින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී අරමුදලේ දායකත්වය හා ප්‍රතිගෙවුම් අතර තිබෙන සීමා පිළිබඳව අපි දැඩි අවධානයක් යොමු කළ යුතු බව ඉතාම ඕනෑකමින් පෙන්වා දිය යුතු වනවා. මේ පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවේ 2013 වාර්ෂික වාර්තාවේ 8.14 සංඛ්‍යා සටහන ඇතුළත් 232 පිටුව හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා මා **සහාගත*** කරනවා.

විශේෂයෙන්ම වැඩි බහුතරයක් වන රුපියල් 20,000ට වඩා අඩු වැටුප් ලබන සක්‍රිය සාමාජිකයන් කෙරෙහි අපට ඇති බැඳීම හා වගකීම වෘත්තීය සමිති නායකයයන් හැටියටත්, වෘත්තීය සමිති ක්‍රියාකාරිකයන් හැටියටත් ඔවුන් වෙනුවෙන් සඳහන් කළ යුතුව තිබෙනවා. මේ සේවකයින් විශ්‍රාම යෑමේදී ඔවුන් වෙත ලබා දෙන ප්‍රතිලාභ ආරක්ෂා කර ගැනීමටද, අරමුදල තුළින් ඔවුන් වෙත ලැබෙන වරප්‍රසාද ආරක්ෂා කිරීමටද අපි කැප වෙනවා. සේවක අර්ථ සාධක අරමුදලෙන් ලැබෙන අවසාන ප්‍රතිලාභයෙන් ඔවුන්ගේ ඉදිරි විශ්‍රාම දිවිය කළමනාකරණය කර ගත යුතුව ඇති බව අපි මතක් කරන්න ඕනෑ. සේවක අර්ථ සාධක අරමුදලේ - EPF එකේ - සියලු ප්‍රතිලාභ ලබා ගත්තායින් පස්සේ ඔවුන්ට ඉන් ඉදිරියට ආවරණයක් නැති වනවා. එම නිසා ඒ පිළිබඳවත් අපි ඉදිරි වැඩසටහනකට යොමු විය යුතුව තිබෙනවා. මන්ද යත්, සේවක අර්ථ සාධක අරමුදල ආරම්භ කළ මුඛ්‍ය අරමුණ වන්නේ, විශ්‍රාම වැටුප් නොලබන වැඩ කරන ජනතාවගේ විශ්‍රාම දිවිය ගොඩනඟා ගැනීමට අත්වැලක් සැපයීමයි. මෙම අරමුණ ඉටු කර ගැනීමට හා එම අරමුදල ආරක්ෂා කිරීමට 1956 දරුවන් හැටියට හා මහජන එක්සත් පෙරමුණ හැටියට අපි කැපවී සිටිනවා කියන ටික ඉතාම ඕනෑකමින් මතක් කරන්න ඕනෑ.

මේ අවස්ථාවේ ආයෝජන ප්‍රතිලාභ ගැනත් මා මතක් කරන්න ඕනෑ. වාසුදේව නානායක්කාර ගරු මන්ත්‍රීතුමාත් මේ ගැන පැහැදිලි කළා. ආයෝජන ප්‍රතිලාභ - investment return - ගැන විවිධ අදහස් සහ විවිධ විවේචන අපි කවුරුත් ඉදිරිපත් කරනවා. පසු ගිය කාල පරිච්ඡේදය තුළම ඒ විවේචන කෙරුණා. එයට අපි ඇස යොමු කරනවා පමණක් නොවෙයි, අපේ හඬ ඒ වෙනුවෙන් නඟනවා පමණක් නොවෙයි, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඒ ගැන ස්වාධීන මණ්ඩලයක් මඟින් හෝ ආයතනයක් මඟින් විශ්ලේෂණය කරලා මේ ගරු සභාවට වාර්තා කරලා නිවැරදිව සත්‍ය වාර්තා කර ගැනීම අපේ යුතුකමක්. 1980 ඉඳලා 2000 දක්වා කාලය තුළ EPF එකේ මුදල් ආයෝජනය කර ඇති ආකාරය පිළිබඳව මෙම වාර්තාවේ දැක්වෙනවා. The Institute of Policy Studies of Colombo and the International Labour Organization together have published a document titled, "Research Studies: Demographic Transition and Pension, Series No. 3 August 2003 - Assessment of the Employees' Provident Fund in Sri Lanka"

ඒ දශක දෙක තුළ කරන ලද ආයෝජන පිළිබඳවත්, එහි නිවැරදිභාවය සහ සත්‍ය තත්ත්වය පිළිබඳවත් මෙම වාර්තාවේ කියනවා. මෙම Report එකේ "Return on Investments" කියන කොටස යටතේ 11 වෙනි පිටුවේ ඉතා පැහැදිලිව මේ පිළිබඳව විශ්ලේෂණයක් කරනවා. එහි අවසාන ඡේදයට පමණක් මම තමුන්නාන්සේලාගේ අවධානය යොමු කරනවා.

**** පුස්තකාලයේ තබා ඇත.***

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

I quote:

"The EPF enjoys considerable economies of scale in managing its assets, resulting in very low administrative charges - certainly much lower than what a privately managed fund would charge. Combined with its improving performance in the past decades, leads to a conclusion that the investment returns of the EPF are in fact good and unlikely to be improved upon by radical changes."

නමුත්, මෙම තත්ත්වය එදා තිබුණු තත්ත්වයයි. ඔබ අද කියන තත්ත්වය පිළිබඳව අප නැවත වරක් මෙවැනි ස්වාධීන ආයතනවලට -මහ බැංකුවත්, කම්කරු දෙපාර්තමේන්තුවත් නොවන, එයට සම්බන්ධ නොවුනු ස්වාධීන ආයතන දෙකකට හෝ තුනකට- මෙම විශ්ලේෂණය කරන්න භාර දීම ඉතා වැදගත් වෙනවා. ඒ තුළින් අපට විශ්වසනීය චිත්‍රයක් ලබා ගන්නට පුළුවන් වෙනවා. කම්කරුවන් වෙනුවෙන්, වැඩ කරන ජනතාව වෙනුවෙන්, වෘත්තීය සමිති වෙනුවෙන් අප පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හා මහජන නියෝජිතයින් හැටියට එය දැන ගත යුතු කාරණයක් වෙනවා. එම නිසා අප මෙම විවාදය දිගින් දිගටම ගෙන යන්නේ නැතිව මෙවැනි විශ්ලේෂණයකට, මෙවැනි අධ්‍යයනයකට, මෙවැනි පරීක්ෂණයකට ඉක්මනින්ම ලක් කිරීම අප කාටත් කරන සාධාරණීකරණයක් කියන එක ඉතාම ඕනෑකමින් මතක් කරන්න ඕනෑ. මම ඊට වඩා දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

මහජන එක්සත් පෙරමුණ වශයෙන් කම්කරු අයිතිවාසිකම් වෙනුවෙන් දිගටම පෙනී සිටි පක්ෂයක් හා සංවිධානයක් හැටියට අපි මතක් කරන්න ඕනෑ, අද විපක්ෂයේ ඉඳගෙන මෙම කාර්ය භාරයට සහයෝගය දක්වනවා වාගේම පසු ගිය දශකයක කාලය තුළ මහජන එක්සත් පෙරමුණ හැටියට, එක්සත් ජනතා සන්ධාන මන්ත්‍රීවරුන් හැටියට පාර්ලිමේන්තුව තුළ සිටිමින් අපි ඔවුන් වෙනුවෙන් පෙනී සිටියාය කියන කාරණයත්. ඒ වාගේම 1956 ජයග්‍රහණය සඳහා ද කටයුතු කළා. අර්ථ සාධක අරමුදල ඇති කිරීම සහ ජනසතුව වෙනුවෙන් ද අපි කටයුතු කළා. වරාය, ලංගමය එදා විකුණන්නට හදන කොට එයට එරෙහිව කටයුතු කළා. එවැනි ආයතන වෙන්දේසියේ දැමීමට ඉඩ නොදී ආරක්ෂා කළා. ඒ, මේ රටට එම සම්පත ඉතිරි කරන්නටයි. අද වන විට ඔබ පාලනය කරන රජයට තිබෙන දැවැන්තම ආයතන ටික වන ලංකා බැංකුව, මහජන බැංකුව, අර්ථ සාධක අරමුදල සහ මේ මූල්‍ය ආයතනත්, ඒ වාගේම වරාය වැනි රාජ්‍ය ආයතන සහ අනෙකුත් දැවැන්ත ආයතන ටිකත් ඉතිරි වෙලා තිබෙන්නේ 1956 ඉඳලා පත්වුණු හැම වමේ රජයක්ම ඒවා ආරක්ෂා කරපු නිසායි. විවිධ පාට තිබෙන්න ඇති. නමුත් ඒ ආයතන ආරක්ෂා කිරීමට කටයුතු කළා. ඒ වාගේම විරුද්ධ පක්ෂයක් හැටියට සියලු ප්‍රගතිශීලී වමේ දේශපාලන පක්ෂ, වෘත්තීය සමිති ඒ ආයතන රැක ගන්නට කටයුතු කිරීමේ ප්‍රතිඵලයක් හැටියටයි අදත් ඒ ආයතන පවතින්නේ; හෙටත් ඒ ආයතන පවතින්නේ. ඒ ආයතන ආරක්ෂා කිරීමට අප කැප වෙනවා කියන එක මතක් කරමින් මම නිහඬ වෙනවා. ස්තූතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට ගරු චන්ද්‍රසිරි ගජදීර මැතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලබා දෙනවා.

[අ.භා. 5.56]

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැදගත් නියෝග මාලාවක් සභාගත කරන මේ අවස්ථාවේ දී වචන කිහිපයක් කථා කරන්න අවස්ථාව ලැබීම සම්බන්ධයෙන් මම සන්තෝෂ වෙනවා. මෙම සේවක අර්ථ සාධක අරමුදල සම්බන්ධයෙන් දීර්ඝ ඉතිහාසයක් තිබෙනවා. කම්කරු ඇමතිතුමා මේ ගැන පැහැදිලි කිරීමක් කරයි කියලා මෙම කථාවලදී අපට පැහැදිලි වුණා. එය අප කවුරුත් දන්නා පරිදි අපේ රටේ වැඩ කරන පන්තිය ගෙන ගිය දීර්ඝ කාලීන අරගළයක ප්‍රතිඵලයක්. ඒ අනුව තමයි අර්ථ සාධක අරමුදල, විශ්‍රාම වැටුප, පැය 8 වැඩ දිනය මේ යනාදී වශයෙන් අයිතිවාසිකම් වැඩ කරන පන්තියට ලැබුණේ. මෙය අපේ රටේ පමණක් නොවෙයි, එක යුගයකදී එය ජගත් ක්‍රියාවලියක් වුණා. එම නිසා මෙම සේවක අර්ථ සාධක අරමුදල හෝ විශ්‍රාම වැටුප් දීමනාවේ හිමිකම් ලබා ගැනීම, පැය 8 වැඩ දිනය යනාදී මේවා කවුරුවත් බන්දේසියක තියලා දුන්නු ඒවා නොවෙයි. දිවි පුදා වැඩ කරලා, සටන් කරන පන්තියේ අරගළවල ප්‍රතිඵල. එවැනි තත්ත්වයන් කාලීන වශයෙන් විවිධ අවස්ථාවන්වල ලෝක තත්ත්වයන් එක්ක සංවර්ධනය වෙනවා. අද වන විටත් මුළු ලෝකයේම ඇති නැති පරතරය වැඩි වේගෙන එනවා. රටවල් ඇතුළේ අසහනය ගොඩනැඟෙමින් තිබෙනවා.

ඒ සමඟම ඒවාට එරෙහිව වූ බලවේග පෙළ ගැහෙනවා. මේක අද ලෝක තත්ත්වයක්. ඒ නිසා මම මේ කාරණය කියන්න කැමැතියි. ඒ හේතු මතම තමයි, අද ලෝකය පුරාම රටවල වැඩි වැටුප් ඉල්ලාගෙන යන උද්ඝෝෂණ, සුබසාධන සේවා, ප්‍රමාණවත් විශ්‍රාම දීමනා, ප්‍රමාණවත් රක්ෂණ දීමනා ඇතුළු විවිධ අයිතිවාසිකම් ඉල්ලන්නේ. ඒ නිසා මේ ලොව පුරා ඇති වන ධනපති ආර්ථික සංවර්ධනයත් එක්ක ඇති නැති පරතරය වර්ධනය වෙන කොට ඒකට පිළියම් හොයන්න ඕනෑ. ඒක නිසා තමයි 1947 සර් අයිවර් ජෙනින්ස් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් විශේෂ කමිටුවක් පත් කළේ. ඇත්ත වශයෙන් මේ කමිටුව මඟින් කරපු නිර්දේශයක් උඩ තමයි සේවක අර්ථ සාධක අරමුදල සැලසුම් කෙරුවේ. මොකද එදා සේවක අර්ථ සාධක අරමුදල සැලසුම් කළේ ඒ ඇති වුණ විශාල, කම්කරු පන්ති අරගළයට මුහුණ දෙන්නයි. ඉන්දියාව, ලංකාව විතරක් නොවෙයි මේ තදාසන්න රටවල -දියුණු කම්කරු පන්තියක් තිබුණු රටවල- ඒ ගෙන ගිය උද්ඝෝෂණවල ප්‍රතිඵලයක් විධියට මේ වාගේ සමාජ ප්‍රතිසංස්කරණ ආවා.

විශේෂයෙන් මම කියන්න කැමැතියි, අදට ගැළපෙන විධියට මේ පනත් කෙටුම්පත, කෙටුම්පත් කෙරුවේ පසු ගිය රජය කාලයේය කියලා. ඕනෑම කෙනෙකුගේ වාසියට දා ගත්තාට කමක් නැහැ. මම විශේෂ ගෞරවයක් හිමි කරන්න ඕනෑ ගාමිණී ලොකුගේ හිටපු ඇමතිතුමාට. මොකද 2013 මැයි මස 13වැනි දා එතුමා මේකට අදාළ ගැසට් නිවේදනය සැකසුවේ, විවිධ වෘත්තීය සමිති නායකයෝත් එක්ක සාකච්ඡා කරලා. කාලීන වශයෙන් තිබුණු ප්‍රශ්න අධ්‍යයනය කරලා යම් සමාජ සුබසාධන ක්‍රියාවලියක් විධියට පෞද්ගලික අංශයේ සේවකයන්ගේ ඉල්ලීම් පිළිබඳ සැලකිල්ලක් දක්වලා තමයි මේ ගැසට් නිවේදනය කෙටුම්පත් කෙරුවේ. ඒක යම් ආකාරයකින් ප්‍රමාද වුණා.

මම ස්තූතිවන්ත වෙනවා, වත්මන් රජයේ කම්කරු ඇමතිතුමාට. එතුමා අමාත්‍යාංශ රාශියක් භාරව ඉන්නවා. මොකද අධිකරණ අමාත්‍යාංශය ඇතුළේ තමයි දැන් කම්කරු අමාත්‍යාංශයත් තිබෙන්නේ. එතුමාට මහා විශාල කාර්ය භාරයක් කරන්න තිබෙනවා. ඒ කාර්ය භාරය තිබෙද්දීත් එතුමා මේ ගැසට් නිවේදනය සභාගත කරලා අද අපට මේ සංවාදය කරන්න අවස්ථාව ලබා දීලා තිබෙනවා.

මේ තිබෙන කරුණුවලට අපේ විරුද්ධත්වයක් නැහැ. නමුත් මේවා වඩාත් සංවර්ධනය කළ යුතු වන්නේ කෙසේද කියන එක ගැන මේ ගරු සභාවේ වැදගත් අදහස් ගණනක් මතු වුණා. ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා කථා කළා; අපේ අජිත් කුමාර මන්ත්‍රීතුමා කථා කළා; ගරු ගීතාංජන ගුණවර්ධන මන්ත්‍රීතුමා කථා කළා. මේක වඩාත් සංවර්ධනය කරන්නේ කොහොමද කියන එක

[ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා]

ගැන තමයි මේ පාර්ලිමේන්තුවේදී අද අපි සාකච්ඡා කරන්නේ. නැතුව මේකට බාධා කරන්න නොවෙයි. මේක ජාතික වශයෙන් අවශ්‍යතාවක්. අපි දන්නවා, අද මුහුණ දෙන සමාජ ගැටලුත් එක්ක මේ රටේ පෞද්ගලික අංශය, රාජ්‍ය අංශය මේ හැම අංශයකම තෘප්තියක් නැහැ කියලා. ඒ නිසා හැම ක්ෂේත්‍රයකම සේවක උද්ඝෝෂණ මතු වෙමින් තිබෙනවා. ඒ නිසාම තමයි හැම මැතිවරණයක් වෙලාවකටම මේ වැටුප් වැඩි වීම, වෙනත් දීමනා ලබා දීම, සහන සුබසාධනය පිළිබඳ නොයෙක් වගන්ති ඉදිරිපත් කරලා එය මැතිවරණය ප්‍රකාශනවලටත් අන්තර්ගත කරන්නේ.

මේ වර්තමාන තත්ත්වය යටතේ අද අරගෙන බැලුවත් -අපි කවුරුත් කථා කෙරුවා.- සේවක කලකිරීමක්, නොසන්සුන්කමක් තිබෙන බව පෙනෙනවා. අය වැය දෙකකදී සේවකයන්ට දෙන්න පොරොන්දු වුණ වැටුප් වර්ධක තමන්ගේ පඩිපතට එකතු කරන්නේ නැතුව වැඩ කරන පන්තිය විසින් කියන, එල්ලා දෙන දීමනාවක් විධියට දීම තුළ තමන්ට ඒකෙන් නියම ඵලය ලැබෙන්නේ නැහැ කියන ප්‍රශ්නය එක පැත්තකින් රාජ්‍ය සේවකයෝ අතර තිබෙනවා. අනෙක් පැත්තෙන් විශ්‍රාමිකයෝ අතර ප්‍රශ්නයක් තිබෙනවා. මොකද විශ්‍රාමිකයන්ගේ විෂමතා වෙනස් කරන තෙක් කලින් රජයේ අය වැය ලේඛනයෙන් ඔවුන්ට දීමනාවක් දුන්නා. මේ අය වැය ලේඛනයෙන් ඊට වඩා වැඩි දීමනාවක් යෝජනා කරලා එය ඔවුන්ගේ මූලික විශ්‍රාම වැටුපට එකතු නොවන තත්ත්වයක් තිබෙනවාය කියන අසහනය හා කලකිරීම ඔවුන් තුළ තිබෙනවා.

ඒ වාගේම පෞද්ගලික අංශයේ සේවකයන් වෙනුවෙන් යෝජනා කළ වැටුප් වැඩි වීම පිළිබඳවත් තවම නිශ්චිත ස්වභාවයක් නැහැ. ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමා මේ ගැන කළ පැහැදිලි කිරීම සම්බන්ධයෙන් මා එතුමාට ස්තුතිවන්ත වනවා. මේවා කියපු හැටියේම දෙන්න බැහැ. එහි ප්‍රායෝගිකත්වය අපට තේරෙනවා. හැබැයි, ඒකට හොඳ උත්තරයක් අපේ අජිත් කුමාර මන්ත්‍රීතුමා ලබා දුන්නා. මෙහෙම අය වැය ලේඛන සකස් කරනකොට, මේ සහන දෙන්නේ කොහොමද කියන එක ගැන අධ්‍යයනයකින් තොරව වෙනත් ප්‍රතිඵල අපේක්ෂාවෙන් ගන්නා හදිසි ක්‍රියා මාර්ග නිසා ඇමතිතුමාවත් අමාරුවේ වැටෙනවා. දැන් මේකට අලුත් සංවාදයක් ආරම්භ කර තිබෙනවා. ආපසු මුල ඉඳලා යන්න වනවා. මේ වැටුප් වර්ධකයන් ලබා දෙන්නේ කොහොමද, පෞද්ගලික අංශය තෘප්තිමත් කරන්නේ කොහොමද කියන කාරණා ගැන වෙනම සංවාදයක් කරන්න සිද්ධ වෙලා තිබෙනවා. පෞද්ගලික අංශයේ හෝ වේවා, රාජ්‍ය අංශයේ හෝ වේවා මේ ශ්‍රම බලකාය තෘප්තිමත් කරන්නේ නැතිව රටක ආර්ථික සංවර්ධනය ඉදිරියට ගෙන යන්න බැරි බව මම කියන්න කැමැතියි. ඒක සියලුම ක්ෂේත්‍රවලට එක හා සමානයි. විශේෂයෙන්ම වැවිලි ක්ෂේත්‍රයේ නිරත කම්කරු පන්තියේ අපේක්ෂා ඉෂ්ට කිරීම කළ යුතුයි. ඔවුන්ට නිවාස හදලා දෙනවාය කියලා කිව්වා. නිවාස හදනවා නම් හොඳයි. ඒකට විරුද්ධ වන්න අපට කිසිදු හේතුවක් නැහැ. ඔවුන්ට නිවාස හදලා දෙනවා නම් හොඳයි. ඒක කරන්න අවශ්‍යයි. රටක ශ්‍රම සාරය උරා ගන්නා ඒ වැඩ කරන පන්තියේ ජනතාවට හැඟීමකින් යුක්තව තමන්ගේ ක්ෂේත්‍රයේ නියැලෙන්න පුළුවන් හැකියාව ගොඩනැඟීම ඇත්ත වශයෙන්ම වැදගත් කරුණක්.

තවත් විකල්ප කාරණයක් කෙරෙහි අවධානය යොමු කරවන්න මා කැමැතියි. අද ග්‍රාමීය විරැකියාවෙන් සිටින කොටස් විශාල වශයෙන් නාගරික ක්ෂේත්‍රයට එකතු වෙනවා. සමහර අයට ඒ ලබන වැටුප ප්‍රමාණවත් නැහැ. සුළු සොච්චම් දීමනාවකට නගරයට ඇවිල්ලා විවිධ ආයතනවල සේවය කරන තරුණ පිරිස් ඉන්නවා. ඒ නිසාම තමයි ග්‍රාමීය කෘෂි කර්මාන්තය සංවර්ධනය කළ යුතුව තිබෙන්නේ. ග්‍රාමීය කෘෂි කර්මාන්ත ආර්ථිකයේ පෝෂණයක් ඇති කරන්න පුළුවන් නම්, ඒක වඩා ඵලදායී ලෙස ඉස්සරහට ගෙනි යන්න පුළුවන්කමක් තිබෙනවා නම්, නගරයට සංකේන්ද්‍රණය වන ඒ ශ්‍රමික ගහනය අඩු කරන්න පුළුවන් වෙනවා.

විශේෂයෙන්ම මේ කාරණය කෙරෙහිත් මා ඔබතුමන්ලාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. පසු ගිය අය වැය ඉදිරිපත් කරපු අවස්ථාවේ දී කිව්වා, නොයෙකුත් සහනාධාර දෙනවාය කියලා. සහතික මිල ක්‍රම ගැන කිව්වා. නමුත් ඒවා භාවිතයේ නැහැ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. භාවිතයේ නැහැ කියලා කියන්නේ මේකයි. අපි දෙන ලද සහතික මිල පිළිබඳව, තේ කිලෝවකට රුපියල් 80ක් ගෙවනවා; වී කිලෝවකට රුපියල් 50ක් ගෙවනවා; රබර්වලටත් නිසි විධියට ගෙවීම් කරනවා; අනෙකුත් ක්ෂේත්‍රවලටත් ඒ විධියටම ගෙවීම් කරනවා කියලා මේ ගරු සභාවේ සිටින යම් කෙනෙකුට කියන්න බැරිකමක් තිබෙනවා නම් එය ප්‍රායෝගිකත්වය තේරුම් නොගැනීමේ හේතුවක්.

අවසාන වශයෙන්, මේ කාරණය ගැනත් මා මතක් කරන්න කැමැතියි. මේවා ඔක්කොම එකට එකතු වුණු කරුණු. එක පැත්තකින් ග්‍රාමීය කෘෂි කර්මාන්තයේ තිබෙන ප්‍රශ්නය, නාගරික කම්කරු පන්තියේ - වැඩ කරන පන්තියේ - ප්‍රශ්නයෙන් වෙන් කරන්න බැහැ. මේවා ඔක්කොම එකට එකතු වුණ ප්‍රශ්න. සමස්ත ප්‍රශ්න විසඳන එක කෙසේ වෙතත්, අවශ්‍යතාවේ ප්‍රමාණයට ඒ සහන ලබා දෙන්න නොහැකි වුණත්, හැකියාවේ ප්‍රමාණයට, ක්‍රමවත් විධියට, අවශ්‍ය වූ සහන කඩිනමින් ලබා දෙන්න ගරු ඇමතිතුමා පියවර ගැනීම ගැන එතුමාට ස්තුතිවන්ත වනවා. ඒ වාගේම ගාමිණී ලොකුගේ ඇමතිතුමා පසු ගිය කාලයේ මේ වෘත්තීය සමිති එක්ක සාකච්ඡා කරලා ගත්ත පියවරත්, විශේෂයෙන්ම ටී.බී. ඉලංගරත්න මැතිතුමා එදා වමේ නායකයින් හා එක්ව ගෙන ගිය උද්ඝෝෂණ සහ අරගළවල ප්‍රතිඵල නෛතික ක්‍රියාවලියක් විධියට පරිවර්තනය කරන්න එතුමා ගත්ත උත්සාහයත් අගය කරමින් මගේ වචන ස්වල්පය මම අවසන් කරනවා.

[අ.භා. 6.07]

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය ඉතාමත් වැදගත් යෝජනාවක්. අපේ රජය මඟින් මේ පනත් කෙටුම්පත සකස් කරලා තිබුණත්, අද මේ වැඩේ ඉක්මන් කරලා අපේ නව අමාත්‍යවරයා සිදු කළ සත් ක්‍රියාව සම්බන්ධයෙන් මම එතුමාට සුබ ප්‍රාර්ථනා කරනවා. අපි ඉතාම සන්තෝෂයෙන් මෙම නියෝග අනුමත කරනවා. වැඩ කරන ජනතාවට මේ යුගයේ ලබා දෙන්න පුළුවන් උපරිම ශක්තිය, ධෛර්යය ලබා දීම අපේ වගකීමක් හා යුතුකමක් විය යුතු බව මේ වෙලාවේ අපි කල්පනා කරන්න ඕනෑ. ඒ වාගේම වැඩ කරන ජනතාව ගැන කථා කරනවා නම්, මේ සේවක දඩයම් කිරීමත් නතර කළොත් හොඳයි කියන එක මේ අවස්ථාවේ දී මතක් කරනවා.

මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයන් අද උද්ඝෝෂණය කරනවා. ඒ වාගේම BOI ආයතනයේ සේවය කරන අපේ ප්‍රදේශයේ සේවකයන් රාශියක් ඉවත් කරලා තිබෙනවා. ඒ අය වහාම ගෙදර යවලා තිබෙනවා. මාර්ග සංවර්ධන අධිකාරිය, BOI ආයතනය ඇතුළු තවත් ආයතන කිහිපයක සේවකයන් ගෙදර යවලා ඉතා අසරණ තත්ත්වයකට පත් කරලා තිබෙනවා. මේ පළි ගැනීම වහාම නවත්වන්න. මේක අපේ රට මහා විනාශයකට ඇදගෙන යන වැඩ පිළිවෙළක් වෙනවා. ඒ සේවකයන්ව ඉවත් කරලා මේ රජයේ හිතවතුන් පත් කිරීම පිළිබඳවත් මේ දවස්වල කථා වෙනවා. ඒක ඉතාමත්ම අවාසනාවන්ත තත්ත්වයක් කියන එක තමයි මට කියන්න තිබෙන්නේ. මේ වැඩේ නවත්වනවා නම් ඒක මේ රටේ කම්කරුවාට, වැඩ කරන ජනතාවට කරන දැවැන්ත සේවාවක් හැටියට මම මේ වෙලාවේ සඳහන් කරන්න කැමැතියි.

අර්ථ සාධක අරමුදලට විශාල දායකත්වයක් ලබා දෙන අපේ රටේ තේ වතුවල හා රබර් වතුවල වැඩ කරන කම්කරුවන් ගැනත් තමුන්නාන්සේලාගේ අවධානය යොමු කළේ නැත්නම් මේ උදව්යගෙන් ලැබෙන මේ දායකත්වය හෙට අනිද්දා වෙන කොට නැති වෙලා යාවි. මොකද, දැන් ඉතා අමාරුවෙන් තමයි මේ කර්මාන්ත කර ගෙන යන්නේ. ඇත්ත වශයෙන්ම දැන් තේ කර්මාන්තය කඩාගෙන වැටිලායි තිබෙන්නේ. පසු ගිය දෙසැම්බර් මාසයට සාපේක්ෂව මේ වන විට අමු දලු කිලෝවකට ගෙවන මුදල රුපියල් 16කින් අඩු වෙලා තිබෙනවා. මේ නිසා ඒ කර්මාන්තය පවත්වා ගෙන යන්න බැහැ. එතකොට මේ සේවක සංඛ්‍යාව කොයි වෙලාවක හරි පාරට වැටෙයි. තමුන්නාන්සේලා පොරොන්දු වුණා, රුපියල් 80ක සහතික මිලක් ගෙවනවා කියලා. රබර් කිලෝවක් සඳහා රුපියල් 350ක් ගෙවනවා කිව්වා. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ ආණ්ඩුව කාලයේ රුපියල් 300ක සහතික මිලක් ගෙව්වා. තමුන්නාන්සේලා ඡන්දය ගැනීමේ වුවමනාවෙන් රුපියල් 350ක් ගෙවනවා කියලා කිව්වා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි තේවලට රුපියල් 80කුත්, රබර්වලට රුපියල් 350කුත් දෙනවා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
කවදා ඉඳලාද දෙන්නේ?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඉතාමත් ඉක්මනින් දෙනවා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ඉතාමත් ඉක්මනින් නොවෙයි, ජනවාරි මාසයේ ඉඳලා ක්‍රියාත්මක වන පරිදි දෙනවාද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි ඉතාමත් ඉක්මනින් දෙනවා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ජනවාරි මාසයේ ඉඳලා ක්‍රියාත්මක වන පරිදි දෙනවාද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
තමුන්නාන්සේලා රුපියල් 300ක් ගෙව්වේ එක මාසයයි නේ.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
මාස දෙකක් ගෙව්වා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
රුපියල් 300ක් ගෙව්වේ මාස දෙකයි.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ජනවාරි මාසයේ ඉඳලා ක්‍රියාත්මක වන පරිදි දෙනවාද?

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔබතුමන්ලා ගොවි විශ්‍රාම වැටුප අවුරුදු තුනක් ගෙව්වේ නැහැ.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
මම ඇහුවේ ඒ ගැන නොවෙයි. තමුන්නාන්සේලා දෙනවාය කියපු මුදල ජනවාරි මාසයේ ඉඳලා ක්‍රියාත්මක වන පරිදි ගෙවන්න. නැත්නම් මේ කර්මාන්තය පවත්වා ගෙන යන්න බැරි වෙනවා. එහෙම වුණොත් ඒ අයගෙන් අර්ථ සාධක අරමුදලට ලැබෙන දායකත්වය සම්පූර්ණයෙන් නැති වෙයි. ඒ ගැන කල්පනා කරලා ඔබතුමන්ලා එහෙම ගෙවනවා නම් මම බොහොම ස්තුතිවන්ත වෙනවා. එහෙම නම් අපි හරි සතුටුයි. මේ සිංහල අලුත් අවුරුද්දට කලින් ගෙවන්න. අවුරුද්දට කලින් ගෙවලා ඉවර කරන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අවුරුද්දට කලින් අපි ඒක ගෙවනවා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
බොහොම ස්තුතියි. ඒ එක ප්‍රශ්නයක්. එතුමා එය විසඳීම ගැන මම ස්තුතිවන්ත වෙනවා.

ඊළඟට, විශ්‍රාමිකයන්ගේ හිඟ වැටුප. අපේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ අය වැය ලේඛනය අනුව මේ ජනවාරි මාසයේ ඉඳලා එය ගෙවන්න කටයුතු කරලා තිබුණා. දැන් ඒක ගැන කථාවක් නැහැ. ඒක කෙරෙන්නේ නැහැ. මේ විශ්‍රාමිකයන් මිය යන්න කලින් මේ වැඩේ කරලා දෙන්න. මොකද, ඒ තරම් දුකෙන් ඒ මිනිසුන් ඉන්නේ. මේ වැටුප් විෂමතාව තුළ සමහර උදව්යට රුපියල් ලක්ෂ 7ක්, 8ක් ලැබෙන්න තිබෙනවා. එතකොට ඒක ගෙවන්නේ නැතිව රුපියල් 3,000ක් දීලා මේ උදව්ය තාවකාලිකව සෑහීමකට පත් කරන්න උත්සාහ කරනවා. කවදාවත් මේක හරි යන්නේ නැහැ. ඒ මනුෂ්‍යයෝ මැරෙන්න කලින් ඒ මුදල් ලබා දෙන්න. ඒ මුදල් ලබා දීලා ඒ මිනිසුන් සතුටට පත් කරන්න. ඒ මිනිසුන් රට වෙනුවෙන් මහන්සි වුණු උදව්ය; රට වෙනුවෙන් තමන්ගේ ශ්‍රමය දිය කරපු උදව්ය; රට වෙනුවෙන් තමන්ගේ උපරිම දායකත්වය ලබා දුන් උදව්ය.

[ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා]

ඒ නිසා මේ වෙලාවේ අපි තමුන්නාන්සේලාගෙන් ඉල්ලන්නේ, "මේ අපරාධය කරන්න එපා" කියලායි. හිටපු ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ ජනවාරියේ ඉඳලා ඒක ගෙවන්න මුදල් වෙන් කරලා තිබුණේ. ජූලි මාසය වෙන කොට ඒක ගෙවලා අවසාන කරන්න තමයි සැලසුම් කරලා තිබුණේ. ඒකයි එතුමා දින නියම කළේ, මේක අවසන් කරන කල් මේ විධියේ ගෙවීමක් කරමු කියලා. ඒක ක්‍රියාත්මක කරන්න. අමතක කරන්න එපා. එහෙම කළොත් ඒක අපේ රටට වැඩ කරපු ජනතාවට කරන බරපතළ අපහාසයක්. මම ඒ ප්‍රශ්නයටත් තමුන්නාන්සේලාගෙන් උත්තර බලාපොරොත්තු වෙනවා. සේවකයෝ ඉවත් කිරීම නොවෙයි, සේවකයෝ අලුතින් බඳවා ගැනීමත් නොවෙයි වැදගත් වෙන්නේ. වැඩ කරපු මිනිස්සුන්ට ජීවත් වෙන්න තිබෙන්නේ තව කෙටි කාලයයි. ඒ කෙටි කාලය තුළ හිඟ විශ්‍රාම වැටුප ගෙවලා, වැටුප් විෂමතාව නැති කරන්න. අපේ පසු ගිය අය වැය ලේඛනයේ කිව්වේ, "2015 ජනවාරි වෙන කොට වැටුප් විෂමතාව ඉවත් කරලා හිඟ වැටුප් ගෙවන්න කටයුතු කරනවා" කියලායි. ඒ වෙනුවෙන් මුදල් වෙන් කරලා තිබුණා. වුවමනා සියලුම දේවල් කරලා තිබුණේ. වැටුප ගණනය කිරීමේ ප්‍රමාදයක් විතරයි තිබුණේ. ඒ ප්‍රමාදය නිසා තමයි මාස 6ක් කල් දුන්නේ එම ගණනය කිරීම කරලා මුදල ගෙවන්න. දැන් ඒක නතර කරලා තිබෙනවා. මේ විධියට ජනතාව රවට්ටන්න හදන්න එපා. ඡන්දය බලාගෙන විතරක් මේක කරන්න එපා. රටට සේවයක් කරන්න. රටේ ජනතාවට දෙන්න පුළුවන් උපරිම දායකත්වය දෙන්න. තමුන්නාන්සේලා මේ දිනවල කරන්නේ, අප්‍රේල් 23වැනිදායින් පස්සේ ඡන්දයක් එනවා, ඒ නිසා ජනතාවගේ ඡන්දය උදුරා ගන්නේ කොහොමද කියලා බලන එකයි. එහෙම කරන්න එපා. ඒ මොකුත් නැතුව ජනතාව තමුන්නාන්සේලාට ඡන්දය දුන්නානේ. ඉතින් ඇයි තවත් ඔය විධියට කටයුතු කරන්නේ? ජනතාව විශාල බලාපොරොත්තු ඇතිව තමුන්නාන්සේලාට ඡන්දය දීලා තමුන්නාන්සේලාව බලයට පත් කළා. ඒක නැවත නැවත වෙනස් කරන්න වුවමනා නැහැ. ඡන්දය දිය යුතුයි කියලා ජනතාවට දැනුනොත් අනිවාර්යයෙන්ම ඡන්දය දෙයි. ඒක ගැන අපි පුදුම වෙන්නේ නැහැ. අපි මෙච්චර දේවල් කළා; පාරවල් හැදුවා. "පාරවල් කන්නද" කියලා අහන තරමට අපි පාරවල් හැදුවා. ඒවා කරලා අවසානයේ අපි පැරදුණා. ඒ නිසා මෙහෙම කරන්න එපා. තමුන්නාන්සේලාට දීලා තිබෙන මේ කාලය තුළ රට සංවර්ධනය කරා ගෙන යන්න. රටේ ජනතාවට සේවයක් කරන්න පුළුවන් තැනට මේ රට ගෙන එන්න. අපි ඒක තමුන්නාන්සේලාගෙන් බලාපොරොත්තු වෙනවා. මේ රටේ ජනතාවත් ඒක බලාපොරොත්තු වෙනවා.

සේවක අර්ථ සාධක අරමුදල් පනතින් සිදු වන සේවය ඉතාම වැදගත් වෙනවා. මොකද, අද එන්න එන්නම මුදලේ අගය අඩු වෙනවා. මේ ආණ්ඩුව බලයට පත් වෙන කොට ඇමෙරිකානු ඩොලර් එකක් රුපියල් 130යි. අද රුපියල් 135යි. මේ වෙනස නිසා රුපියලේ අගය එන්න එන්න අඩු වෙනවා. අපට තේරෙන හැටියට තව මාස 3ක් යන කොට ඇමෙරිකානු ඩොලරය රුපියල් 140 දක්වා ඉහළ යනවා. එහෙම වෙන කොට රුපියලේ අගය අඩු වෙනවා. රුපියලේ අගය අඩු වෙන කොට සේවක අර්ථ සාධක අරමුදලින් දෙන මුදලේ අගයත් අඩු වෙනවා. ඒ මුදලින් කරන්න පුළුවන් සේවාවන් නැති වෙලා යනවා.

ගරු ඇමතිතුමනි, ඊළඟට තමුන්නාන්සේට මම කියනවා, මේ සේවක අර්ථ සාධක අරමුදල් ගන්න ගියාම ඇති වන ප්‍රශ්න ඉවත් කරන්න කියලා. සමහරුන්ගේ හැඳුනුම් පතේ අංකයක් වැරදියි කියනවා, නැත්නම් හැඳුනුම් පතේ නම වැරදියි කියනවා. සමහරුන්ට හැඳුනුම් පතක් ඇත්තෙත් නැහැ. මම දන්නා එක් සේවකයෙක් ඉන්නවා, ඒ මනුස්සයාට හැඳුනුම් පත් 3ක් ඇවිල්ලා තිබෙනවා. වතු තුනක වැඩ කළා. ඒ වතු තුනෙන්ම ලියලා හැඳුනුම් පත් 3ක් ඇවිල්ලා.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඒක වැරදියිනේ.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ඒක තමයි මම කිව්වේ. මම ඒක මේ ගරු සභාවේ කිව්වා කියලා ඒ මනුස්සයා ගෙනැල්ලා හිරේ දාන්න එපා. ඒ අහිංසක මනුස්සයා හිරේ දාන්න එපා. තමුන්නාන්සේලාට ඔය විධියේ තොරතුරක් ආවොත් හනික ගිහිල්ලා ඔහුව ගෙනැල්ලා හිරේට දානවා. ඒවා තමයි විසඳුම්. මම ඒක කිව්වේ දැනගන්නයි. මෙහෙම දේවල් රටේ සිද්ධ වෙනවා. [බාධා කිරීමක්] අහිංසක මිනිස්සු අරගෙන ගිහිල්ලා හිරේ දාලා දෙන්න පුළුවන් දස වද දෙනවා. ඒක නොවෙයි යහ පාලනය. යහ පාලනය කියන්නේ, එහෙම එකක් වෙලා තිබෙනවා නම් ඒක නිවැරදි කරන එකයි. වැරැද්දක් කරලා තිබෙනවා නම් ඒ වැරැද්ද නිවැරදි කර දීමයි. [බාධා කිරීමක්] සුජීව සේනසිංහ නියෝජ්‍ය ඇමතිතුමා, තමුන්නාන්සේ තවමත් ඒකෙන් දේශපාලන වාසි ගන්න බලනවා නේ. දැන් ඒක ඉවරයි නේ. දැන් ඇප දීලා ඉවර කළා නේ. ඇයි දැන් නැවත ඒකෙන් ප්‍රයෝජන ගන්නේ? [බාධා කිරීමක්] තව එනවා, තව එනවා. තමුන්නාන්සේලාට මේ දේශපාලනයේ ඇති තණ්හාවේ කෙළවරක් නැහැ.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
දැන් ඒක හරිද?

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ඉතින් තමුන්නාන්සේලා ඇප දුන්නා නේ.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඒ කළ වැඩේ හරිද, වැරදිද?

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
හරි නිසා නේ ඇප දුන්නේ.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඉතින් ඒක සාධාරණද?

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ඉස්සෙල්ලාම තමුන්නාන්සේ සාධාරණ වෙන්න. උසාවියෙන්නේ ඇප දුන්නේ. ඉතින් දැන් මොනවාද කියන්නේ? දැන් ඉඳගන්න. තමුන්නාන්සේලා ඒ අසරණ මනුස්සයා, ලෙඩින් හිටිය මනුස්සයා ගෙනිහිල්ලා ලෙඩ ඇඳ පිටින් හිරේ දාලා, ඉතිහාසයේ කරන්න පුළුවන් ඉතාමත් අවලම් වැඩක් කළා. අවසානයේ තමුන්නාන්සේලාම ඇප දුන්නා.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
අපි කොහොමද ඇප දෙන්නේ?

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

ඇප දුන්නා තමුන්නාන්සේලා. කවුද හැඳුනුම්පත වැරැද්දුවේ? අර අහිංසක දෙමළ මනුස්සයාට හැඳුනුම්පත් තුනක් තිබුණේ ඒ මනුස්සයා ගිහිල්ලා ගෙනැල්ලාද? නැහැ. ඒක කොහේ හරි වැරැද්දක්. [බාධා කිරීමක්] මූලසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කිසි තේරුමක් නැතිව බූත කථා කරනවා. මොනවාද මේ කියන්නේ? අර මනුස්සයාගේ වරදින්ද ඒක හැදුවේ? කන්තෝරුවෙන් වරද්දලා යවලා තියෙන්නේ. [බාධා කිරීමක්] වරද්දලා ඇරියාම, ලෙඩ ඇඳේ හිටිය මනුස්සයා ගෙනැල්ලා ලෙඩ ඇඳ පිටින් හිරේට දැම්මා. මොන කැත වැඩක්ද කළේ? ඉතාම අශෝභන වැඩක් ඒ කළේ. අන්තිමේ ඒක වැරදියි කියලා තේරුණාම, ඇප දීලා නිකම් හිටියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විධියේ වැඩ රටේ තිබෙනවා. හැඳුනුම්පත් දෙක තුන තිබෙන උදවිය ඉන්නවා. මම කිව්වේ ඒකයි. [බාධා කිරීමක්] අර අහිංසක දෙමළ මනුස්සයා ගෙනැල්ලා හිරේ දමන්න එපා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කාලය වැඩිපුරත් අරගෙන තිබෙනවා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

ඔබතුමා මගේ කාලය අවසානයි කියන නිසා මම මීට වඩා කථා කරන්නේ නැහැ. අපි කවුරුත් එකතු වෙලා අපේ රට මීට වඩා හොඳ තැනකට ගෙන යන්න මහන්සි වෙමුයි කියා ඉල්ලමින් මගේ වචන ස්වල්පය හමාර කරනවා.

[අ.භා. 6.19]

ගරු සුජීව සේනසිංහ මහතා (අධිකරණ හා කම්කරු සබඳතා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சுஜீவ சேனசிங்க - நீதி மற்றும் தொழில் உறவுகள் பிரதி அமைச்சர்)
(The Hon. Sujeewa Senasinghe - Deputy Minister of Justice and Labour Relations)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැදගත් නියෝගයක් අද දින ඉදිරිපත් කර තිබෙන්නේ. අවුරුදු ගණනක් තිස්සේ මේ සම්බන්ධයෙන් කළ කාර්ය භාරය වෙනුවෙන් ගරු ඇමතිතුමාට සහ නිලධාරි මණ්ඩලයට ස්තුති වන්ත වෙනවා. හිටපු ගරු ඇමතිතුමනි, සාපේක්ෂව බැලුවොත් ඔබතුමාට මතක ඇති, ඔබතුමා මගෙන් ඇහුවා, ඇත්තටම අපේ ආණ්ඩුවක් ආවොත් දූෂණය නවතීද, දූෂණයට ලක් වූවන්ට දඬුවම් ලබා දෙයිද කියලා. ඔබතුමා ඉතාම නිහතමානී, ඒ වාගේම නීතියට ගරු කරන මන්ත්‍රීවරයෙක් වශයෙන් මේ ප්‍රශ්න අපෙන් ඇහුවා. ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම diplomatic passport එකක් හදන විට උපන් දිනය සම්බන්ධයෙන් වැරදි තොරතුරක් ඇතුළත් වෙලා තිබෙනවා නම්, වගකියන ඇමතිවරයෙකුගේ භාර්යාවක් වශයෙන් එය දැනුම් දීම යුතුකමක්. අඩුම ගණනේ පොලීසියකට, ඒ සම්බන්ධ නිලධාරියෙකුට දැනුම් දීලා තිබෙනවාද මේකේ වරදක් තිබෙනවා කියලා? ගරු මන්ත්‍රීතුමනි, passport දෙකේ වෙනස් තොරතුරු තිබෙන්නේ. විශේෂයෙන්ම උපන් දිනය සම්බන්ධයෙන් තොරතුරු ලබා දෙන්නේ ඒ ඉල්ලුම් පත්‍රය පුරවන පුද්ගලයා. කවුද කියන එක නොවෙයි ප්‍රශ්නය. ලෙඩ වුණාට අහිංසක වෙන්නේ නැහැ. [බාධා කිරීමක්] ගරු ගජදීර මන්ත්‍රීතුමා බාධා කරන්න එපා. ගරු මහින්ද යාපා අබේවර්ධන මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට උත්තරයක් දෙන්නේ. මම කාගේවත් නමක් සඳහන් කළේ නැහැ. එතුමා ඒ ගැන ඇහුවේ නැත්නම් මම කථා කරන්නේ නැහැ. විශේෂයෙන්ම ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා කම්කරුවන් ගැන කථා කරද්දී - [බාධා කිරීමක්] නැහැ. ID ගැන කථා කරද්දී තමයි ඒ ගැන කිව්වේ. ඔබතුමා හින්ට් එකක් ගැහුවේ. මේක ඒ පැත්තේ දේශපාලන ප්‍රශ්නයක්. එතුමා බේරා ගන්න මම කථා කළේ.

විශේෂයෙන්ම ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කම්කරුවන් ගැන කථා කරද්දී ගොවි විශ්‍රාම වැටුප අවුරුදු තුනකට ඔබතුමන්ලාට ගෙවා ගන්න බැරි වුණා. දැන් සිහි විකල් වෙලා වාගේ ඔබතුමන්ලා කෑ ගහනවා, කම්කරු අයිතිවාසිකම් ගැන. මහින්ද රාජපක්ෂ මහත්මයා එක්ක ඔබතුමන්ලා කම්කරුවා ගැන මොකක්ද කළේ? අවුරුදු 10ක් සිටියා. ගොවි විශ්‍රාම වැටුප ගැන ඔබතුමන්ලා කථා කළාද? ඔබතුමන්ලා අවුරුදු 3ක් ගොවි විශ්‍රාම වැටුප දුන්නේ නැහැ. ඔබතුමන්ලාගේ අමාත්‍යාංශය භාර අරගෙන ඒ කාර්ය භාරය කර ගෙන ගියා. කම්කරුවා ඇස් දෙකෙන්වත් දැක්කේ නැහැ.

ගරු මන්ත්‍රීතුමනි, අපි ලබා දුන්න පොරොන්දු අනුව මාස කිහිපයක් තුළ පනත් කීයක් ගෙනාවාද? ඔබතුමන්ලාට හිතා ගන්න බැරි පනත් අපි කීයක් ගෙනාවාද? [බාධා කිරීමක්] කවුරු හැදුවත් ගරු මන්ත්‍රීතුමනි, ගෙනෙන්න බැරි වුණා. මහින්ද රාජපක්ෂ මහත්මයා ගෙනෙන්න දුන්නේ නැහැ. මේ දූෂිත පාලනය නිසා හොරු ආරක්ෂා කරන්නට ඔබතුමන්ලා ගත්ත ප්‍රයත්නයක් ඒක.

විශේෂයෙන්ම අගමැතිතුමාගේ කාර්යාලය සම්බන්ධයෙන්, ජනාධිපතිතුමාගේ කාර්යාලය සම්බන්ධයෙන් මන්ත්‍රීවරයෙක් කථා කළා. ඒ ගෙවල්වල තල් මසුන් හිටියා. මෝරු ඉන්නවා ඇතුළේ. හැම ජාතියෙන්ම බල්ලෝ, හැම ජාතියෙන්ම කුරුල්ලෝ ඉන්නවා. ඉදිරිපස මල් පෝච්චි ටික maintain කරන්න විතරක් දවසකට රුපියල් ලක්ෂ තුනහමාරක් යනවා.

අගමැතිතුමා ගැන ඔබතුමන්ලා ඇහුවා. අගමැතිතුමාට කාර්යාලයක් තිබෙන්න ඕනෑ මේ රටේ. ජනාධිපතිතුමාට කාර්යාලයක් තිබෙන්න ඕනෑ. හැබැයි, එතුමන්ලා නිල නිවාසය වශයෙන් මොකක්ද තෝරා ගත්තේ? ජනාධිපතිතුමා තෝරා ගත්තා ඉතා කුඩා නිවසක්. අගමැතිතුමා ඉන්නේ එතුමාගේ පෞද්ගලික නිවසේ. අපි කියන්නේ සාපේක්ෂ වශයෙන්. ඔබතුමන්ලා අපි මන්ත්‍රීවරුන් වශයෙන් යම් ප්‍රමාණයක් වරප්‍රසාද බුක්ති විඳිනවා. හැබැයි ගරු මන්ත්‍රීතුමනි, අපට ආරක්ෂක භටයින් දෙන්නයි, නැත්නම් එක්කෙනෙයි ඉන්නේ. අපි ඇමතිවරු. අපි නිල නිවසක් ලබා ගෙන නැහැ. අපේ පෞද්ගලික නිවෙස්වලයි අප ඉන්නේ. අප සාපේක්ෂව, ඔබතුමන්ලා-

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
මමත් පසු ගිය අවුරුදු දහයේ හිටියේ මගේ ගෙදර.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

ඔබතුමා ගැන අප දන්නවා. අප ඔබතුමාට ආදරය කරන නිසා කියන්නේ. ඔබතුමා වාගේ හිටියේ නැහැ අනෙක් ඇමතිවරු. කිහිප දෙනෙක් ඉන්න ඇති. ඔබතුමා දන්නවා හිටපු ජනාධිපතිතුමා ජීවත් වුණු හැටි, හිටපු ජනාධිපතිතුමාගේ දරුවන් ජීවත් වුණු හැටි. මේ රට කාබාසිනියා කරලා තිබුණේ. දවස් 40ක් ගත වෙන කොට අප ඒ මහ විශාල දූෂණය නැවැත්තුවා. ඔබතුමන්ලා කියනවා, අප සමහර සංවර්ධන ව්‍යාපෘති නවත්වලාය කියා. එහෙම නවත්වලා නැහැ.

අපේ පක්ෂය කම්කරුවා ගැන වග කියන පක්ෂයක්. අප කම්කරුවාගේ ආදායම ලබා දෙන්න බලාපොරොත්තු වන්නේ රටේ සංවර්ධනය තුළිනුයි. මහවැලි ව්‍යාපාරය, ඇඟලුම්

[ගරු සුජීව සේනසිංහ මහතා]

කර්මාන්තය, ජනසවිය, මහපොළ වැනි වැඩ පිළිවෙළවල් අප ක්‍රියාත්මක කළේ ආසියාව බඩ ගාන කාලයේයි.

ගරු මහින්ද යාපා අබේවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා පසු ගිය අවුරුදු 20 තුළ මොනවාද කළේ? අලුත් කර්මාන්තයක් මේ රටට ගෙනාවාද? අඩුම ගණනේ කර්මාන්තයක් මේ රටට ගෙනාවා නම් අපට කම්කරුවාගේ පඩිය සම්බන්ධයෙන්, අර්ථ සාධකය සම්බන්ධයෙන් කථා කරන්න පුළුවන්, කම්කරුවාට දියුණුවක් ලබා දුන්නාය කියා. ඔබතුමන්ලා හැම දාම කම්කරු අරගළ ගැන කථා කරනවා. අවුරුදු 40කට, 50කට කලින් හිටපු කම්කරුවා නොවෙයි, අවුරුදු 20කට පසුව සිටින්නේ. දැන් ඉන්න කම්කරුවාගේ පියා කම්කරුවෙක් නොවෙන්න පුළුවන්. සමහර විට ඒ දරුවාගේ පියා කම්කරුවෙක් වෙන්න පුළුවන්. හැබැයි, දැන් විශාල ධනපතියෙක් බවට පත් වෙලා සිටිනවා වෙන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතික පක්ෂය මේ රටේ සංවර්ධනය සඳහා විශාල කාර්ය භාරයක් කර තිබෙනවා. අප ඉදිරි අනාගතයේදීත් ඒ කටයුතු කරනවා. බලන්න, අප බලයට පැමිණි ගමන් සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ නියෝග ගෙනාවා. හිටපු ගාමිණී ලොකුගේ ඇමතිතුමා, ඊට කලින් සිටි අතාවුද සෙනෙවිරත්න ඇමතිතුමා අවුරුදු ගණනාවක් තිස්සේ මේ කාර්යය කරන්න උත්සාහ කළා. හැබැයි, ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන්, ඔබතුමන්ලාගේ නායකයාගෙන් ඊට අවස්ථාවක් ලැබුණේ නැහැ. දැන් මේ නව රජයේ ජනාධිපතිතුමා සහ අගමැතිතුමා ඒ සියලු දේවල් කරන්න කටයුතු කරමින් සිටිනවා.

අද මේ ඉදිරිපත් කර තිබෙන නියෝග ඉතාම වැදගත් වෙනවා. ඒ කම්කරුවන් බලාපොරොත්තු වන සියලු පහසුකම් ලබා දෙන්න අද මේ සංශෝධන අප ඉදිරිපත් කර තිබෙනවා. ඔවුන්ට සියයට 30ක මුදලක් ලබා ගන්න පුළුවන්. ඒ මුදලින් නිවසක්, ඉඩමක් මිලදී ගන්න පුළුවන්. අපේ ජෝශප් මයිකල් පෙරේරා ඇමතිතුමාත් මේ කාරණය යෝජනා කළා. ඉදිරියේදී ඉඩම් හඳුනාගෙන, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය හරහා ඒ කම්කරුවන් වෙනුවෙන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නත් අප බලාපොරොත්තු වෙනවා.

මම අද උදේ උතුරු කොළඹ නිවාස ප්‍රශ්නය පවතින ඒ ප්‍රදේශයට ගියා. ඔබතුමන්ලා කිසිම මානුෂික හැඟීමකින් තොරව වර්ග අඩි 700ක්, 800ක් වුණු ගෙවල්වලින් වර්ග අඩි 300ක ස්ථානයකට ජනතාව ඇදලා දමන කොට, ඒ සම්බන්ධයෙන් අප මානුෂික හැඟීමෙන් යුතුව සලකා බැලිය යුතුයි නේද? ඒ ස්ථානවල සිටින්නේ මේ රටේ කම්කරුවන්; දුප්පත් ජනතාව.

ඔබතුමන්ලා කියනවා අප ධනවාදී පක්ෂයක්, ධනවාදී ආර්ථික ක්‍රමයක් තමයි ක්‍රියාත්මක කරන්නේ කියා. හැබැයි, ගරු මහින්ද යාපා අබේවර්ධන මන්ත්‍රීතුමනි, මේ රටේ අනාගතය වෙනුවෙන් ගෙනාපු සියලුම දේවල් හැම වෙලාවේම ගෙනාවේ අපයි. විධායක ජනාධිපති ක්‍රමය බලන්න. ඔබතුමන්ලා කියනවා, විධායක ජනාධිපති ක්‍රමය නැත්නම් යුද්ධය අවසන් කරන්න බැහැ කියා. කවුද විධායක ජනාධිපති ක්‍රමය ගෙනාවේ? ඒකත් ගෙනාවේ අපියි. විවෘත ආර්ථිකය ගෙනාවේ කවුද? ඒකත් ගෙනාවේ අපියි. අපේ සටන් පාඨ ආකර්ෂණීය නැහැ. හැබැයි, එක්සත් ජාතික පක්ෂය හැම වෙලාවේම රට වෙනුවෙන්, කම්කරුවා වෙනුවෙන්, දුප්පත් ජනතාව වෙනුවෙන් වැඩ කළා.

ඔබතුමන්ලා කිව්වා, පෞද්ගලික අංශයටත් රුපියල් 2,500ක පඩි වැඩි වීමක් දෙන්න කියා. විශේෂයෙන්ම රජය වෙනුවෙන්, කම්කරු දෙපාර්තමේන්තුව වෙනුවෙන් අප නියෝජනය කරන ඒ නිලධාරින් ඒ වේතන මණ්ඩලය, පඩි පාලක සභා දැනුවත් කරලා, ඒ සේවකයන් එක්ක එකතු වෙලා ඒ පඩිය වැඩි කරන්න කියා බල කරමින් සිටිනවා. ගරු මන්ත්‍රීතුමනි, උණක් හට ගත්තාම අප බෙහෙත් බොන්නේ දවසින් දවසයි. නැත්නම් වේලෙන් වේල. ඔබතුමන්ලා අවුරුදු ගණනක් තිස්සේ විනාශ කරපු ආර්ථිකය, විනාශ කරපු නීති ක්‍රමය, විනාශ කරපු ප්‍රජාතන්ත්‍රවාදය අපට දවස් තුන හතරෙන් හදන්න බැහැ. අප ඒ කාර්ය භාරය කරමින් සිටිනවා. මේ වෙන කොට -දවස් 40ක්, 45ක් ඇතුළත- අප ජනතාවට විශාල වශයෙන් සහන ලබා දුන්නා. මේ විනාශ කරපු රටේ, මේ විනාශ කරපු ආර්ථිකයේ, ඔබතුමන්ලා කාබාසිනියා කරපු ප්‍රජාතන්ත්‍රවාදය තුළ ඉඳගෙන අප දවස් කීපයක් යන කොට ජනතාවට විශාල වශයෙන් සහන දුන්නා. ගරු මහින්ද යාපා අබේවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාට ඒ වෙනස දැනෙන්නේ නැති වෙන්න පුළුවන්.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
අද හාල් කිලෝ එකක් රුපියල්100යි.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔබතුමන්ලා අර බල්ලෝ උඩු බුරනවා වාගේ එක දෙයක් අල්ලාගෙන කථා කරනවා. ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් වෙනම විවාදයක් ඔබතුමා එක්ක තියන්නම්.

අපට ඉදිරි අනාගතයේදී නැති වන ජනතාව තමයි ගොවි ජනතාව. එක්සත් ජාතික පක්ෂය විසින් කරන ශීඝ්‍ර සංවර්ධනයත් එක්ක තව අවුරුදු 5ක්, 10ක් යනකොට ගොවි ජනතාව හොයා ගන්න බැරි වෙයි. එතකොට අප රුපියල් 75,000ක, 80,000ක ආදායමක් ලබා ගන්න පුළුවන් කර්මාන්ත මේ රටට ගෙනෙනවා. මේ රටේ අපේ නිර්මාණ පටන් ගන්නවා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
තමුන්නාන්සේලා මුං ඇට ගොවියා ඉවර කළා; උඳු ගොවියා ඉවර කළා.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු මන්ත්‍රීතුමනි, අප බඩුවල මිල අඩු කරන කොට ඔබතුමන්ලාට ඇහේ රුදාව හැදෙනවා. අප යම්කිසි ගොවියෙක් ආරක්ෂා කරන්න හැදුවොත් ඔබතුමන්ලාට ඇහේ රුදාව හැදෙනවා. එහෙම කරන්න බැහැ නේ, ගරු මන්ත්‍රීතුමනි. අප සාපේක්ෂව ගන්න ඕනෑ. හාල්වල මිල වැඩි කරන්න අපට අවශ්‍යතාවක් නැහැ. ගොවි ජනතාව සන්තෝෂයෙන් ඉන්නවා නම් එච්චරයි අපට ඕනෑ.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
අද ගොවියාගේ වී ටික විකුණා ගන්න බැහැ.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා විකුණාගන්න බැරි කරපු ඒ වින්නැහිය තමයි මේ වෙලා තිබෙන්නේ. ඔබතුමන්ලා එහෙන් හාල් ගෙනාවා. ගෙනැත් මෙහේ හංගලා තිබ්බා, ගොවි ජනතාව විනාශ කරන්න.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
කවුද?

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
කවුද? ඔබතුමන්ලාගේ හිටපු ඇමතිතුමා.

අප කම්කරුවා වෙනුවෙන් විශාල කාර්ය භාරයක් කරනවා. සේවක අර්ථසාධක අරමුදල වෙනුවෙන් පමණක් නොවෙයි, අප ඒ කටයුතු කරන්නේ. විශේෂයෙන්ම යෝගරාජන් මන්ත්‍රීතුමාත් මේ කාරණය යෝජනා කළා. ගරු මහින්ද යාපා අබේවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා නින්දෙන් ඇහැරුණා වාගේ, හිටි ගමන් -එක සැරේට- කම්කරුවන්ගේ අයිතිවාසිකම් ගැන කථා කරනවා. වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා අවුරුදු කීයක් තිස්සේ ආණ්ඩුවේ හිටියාද? ඒ වුණාට අද වේගවත් කථාවක් කළා. ඔය කථාව මහින්ද රාජපක්ෂ මහත්තයා ඉස්සරහා කරන්න බැරි වුණේ ඇයි? රාජපක්ෂලා දැක්කාම ඒ කාලයේ මේ ඇමතිවරුන්ගේ, මන්ත්‍රීවරුන්ගේ කකුල් වෙවිලනවා. දැන් එක පාරටම හිරෙන් එළියට දැම්මා වාගේ අයිතිවාසිකම් ගැන කථා කරනවා. ඒ ගැන අපට සන්තෝෂයි. ඒ නිලධාරි මහත්වරුන් ගැනත්, හිටපු ඇමතිවරුන් දෙදෙනා ගැනත් අපි කුහකත්වයෙන් කථා කරන්නේ නැහැ. ඒ ඇමතිවරුනුත් මේ සම්බන්ධයෙන් යම්කිසි කාර්ය භාරයක් කළා. එහෙම නැත්නම් කම්කරුවන් ණය වෙනවා. තමන් මිය යන කොට ණය වෙලායි මිය යන්නේ. නිවසක් ලබා ගන්න, එහෙම නැත්නම් ළමයින්ගේ අධ්‍යාපනය සඳහා සේවක අර්ථ සාධක අරමුදලෙන් සියයට 30ක් ලබා ගන්න පුළුවන් නම් හොඳයි. [බාධා කිරීමක්] නැහැ. ඒක අපි දෙනවා. ඔබතුමන්ලාට ජ්‍යෙෂ්ඨ ඇමති ධුර දීලා ඔබතුමන්ලා අමාරුවෙන් හිටියා නේ. අපි ඒ වාගේ කැත වැඩ කරන්නේ නැහැ. හිටපු ඇමතිතුමනි, ඔබතුමා හොඳ හොඳ වැඩ කරන්න පුළුවන් ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙක්. අපි සියලු දෙනාටම ඇමති ධුර ලැබෙයි. ඒ වුණාට ඔබතුමන්ලාට නියෝජ්‍ය ඇමති ධුර දීලා ඔබතුමන්ලා බලු කරලා දැම්මා නේ මහින්ද රාජපක්ෂ මහත්මයා. අපට දුක ඔබතුමන්ලා ගැනයි. මෙතුමන්ලායි, අපියි දේශපාලනයට ඇවිල්ලා තවම පොඩි කාලයයි. හැබැයි, ඔබතුමන්ලා දේශපාලනයට ඇවිල්ලා අවුරුදු ගණනක් වෙනවා. හිටපු ඇමතිතුමනි, ඔබතුමා රාජපක්ෂලාට කොච්චර බැන්නාද, ඔබතුමා ජ්‍යෙෂ්ඨ ඇමතිවරයකු කළාය කියා. අපි ඔබතුමා වෙනුවෙන් සටන් කළා. අපි එහෙම කරන්නේ නැහැ. අපේ නායකයා එහෙම කරන්නේ නැහැ, හිටපු ඇමතිතුමනි.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
එතුමා බොහොම ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්. ඒ වාගේම කම්කරුවන් වෙනුවෙන් හැම දාම ඒ ව්‍යාපාරයේ යෙදී සිටින කෙනෙක්.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
බොහොම ස්තුතියි. [බාධා කිරීමක්] හිටපු ඇමතිතුමනි, මගේ වෙලාව. [බාධා කිරීමක්] හිටපු ඇමතිතුමනි, ඔය ප්‍රෞඪත්වය, ඔය ගාම්භීරත්වය මහින්ද රාජපක්ෂ මහත්මයා ඉස්සරහ තිබුණේ නැත්තේ ඇයි? [බාධා කිරීමක්] ඔබතුමාට නැඟිටලා කථා කරන්න තිබුණා නේ. [බාධා කිරීමක්] තමන්ගේ පවුලට මෙච්චර ඇමති ධුර දීලා, ඔබතුමන්ලාට ජ්‍යෙෂ්ඨ ඇමති ධුර දෙන කොට ඔබතුමා ලජ්ජා නැතුව නිකම් ඉඳගෙන සිටියා නේ. ඔබතුමාට කථා කරන්න තිබුණා නේ. ජ්‍යෙෂ්ඨ ඇමති ධුර දීලා - [බාධා කිරීමක්] ඔබතුමන්ලා සෙල්ලම් කාසි බවට පත් කර තිබුණේ. නමින් ජ්‍යෙෂ්ඨ ඇමති කළා. ජ්‍යෙෂ්ඨ ඇමතිවරුන්ගෙන් අහන්න කෝ, ඒ කාලයේ සිටියේ කොහොමද කියා. ඔබතුමන්ලා මොනවාද කළේ? බැසිල් රාජපක්ෂට, ගෝඨාභය රාජපක්ෂට, නාමල් රාජපක්ෂට මේ ආර්ථිකයෙන් සියයට 65ක් වෙන් කළා. හිටපු ඇමතිතුමනි, ඔබතුමන්ලා මොනවත් කළේ නැහැ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත වේලාව අවසානයි.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
විශේෂයෙන්ම අපි කියනවා, සංවර්ධනය වෙනුවෙන් -

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Deputy Minister, you have to wind up your speech before 6.30 p.m.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, give me a few minutes and I will wind up.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Does the House agree to give him five minutes?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Deputy Minister, you can proceed with your speech.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
බොහොම ස්තුතියි. [බාධා කිරීමක්] හිටපු ඇමතිතුමනි, බාධා කරන්න එපා. විනාඩි 5යි තිබෙන්නේ. බාධා කරන්න එපා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
සේවක දඩයම ගැනත් කියන්න, විනාඩි 5ක් දුන්නා නේ.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

හිටපු ඇමතිතුමනි, විශේෂයෙන්ම අවුරුදු 20ක් ඔබතුමන්ලා මොකද කළේ? මහින්ද යාපා අබේවර්ධන මන්ත්‍රීතුමා කියන එකට ජනතා විමුක්ති පෙරමුණේ අපේ මන්ත්‍රීතුමා උත්තරයක් දුන්නා. BOI එකෙන් මාතරින් දුන්න පත්වීම මොකක්ද කියලා නැහැ. හිටපු ඇමතිතුමනි, දවස් දෙකකට, දවස් තුනකට පත්වීම දුන්නා. කැත වැඩක් කළේ. මොකක්ද කළේ? පත්වීම් ලිපියේ කිසිම සඳහනක් නැහැ, පත්වීම මොකක්ද කියා. රංජිත් මද්දුම බණ්ඩාර ඇමතිතුමාට කථා කරලා මා ඒ ගැන ඇහුවා. එවැනි කිසිම සේවක දඩයමක් සිදු වෙලා නැහැ. අඩු පාඩු වෙන්න පුළුවන්, මන්ත්‍රීතුමනි. අපි පිළිගන්නවා, සියයට 100ක්ම අපි නිවැරදි නොවෙන්න පුළුවන් කියා. හැබැයි, අවුරුදු 20ක් ඔබතුමන්ලා මොනවාද කළේ? ඒ කරපු දඬුවම් ගැන ඔබතුමන්ලා කථා කළාද? ඒ සඳහා ඔබතුමන්ලා යම් පිළිවෙතක් අනුගමනය කළාද? නැහැ. මොකක්ද, ඔබතුමන්ලා කළේ? ඔබතුමන්ලා තනිකර කළේ දේශපාලනයයි. අද ගම්වල එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයින් බුරුතු පිටින් දේශපාලන පළිගැනීම් කමිටුවල ඉන්නවා. ඔබතුමන්ලා ඔවුන් එළවා දැම්මා; ඒ මැනේජර්වරු එළවා දැම්මා; ඒ සියලු දෙනා එළවා දැම්මා. මොකක්ද, ඔබතුමන්ලා කළේ? එතකොට ක්‍රියා කළාද? නැහැ. හැබැයි අපි එහෙම කර නැහැ. අපේ අමාත්‍යාංශයෙන් අහන්න, ඇමතිතුමාගෙන් අහන්න, මගෙන් අහන්න - [බාධා කිරීමක්] රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා, සැර වෙන්නේ නැතුව හෙමින් කථා කරන්න කෝ. [බාධා කිරීමක්]

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ඇයි නැත්තේ?

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

ගරු මන්ත්‍රීතුමා, විශේෂයෙන්ම මේ රටේ දූෂණය සිද්ධ වන කොට, මේ රටේ නීති කඩන කොට, ඇමතිවරු තනිකර නීතිය අතට ගන්න කොට ඔය කථා කරන කවුරුත් එදා කෑ ගැහුවේ නැහැ. එහෙම ප්‍රශ්නයක් තිබෙනවා නම්, අමාත්‍යවරයෙක් එහෙම කර තිබෙනවා නම් ඒ සම්බන්ධයෙන් අපව දැනුවත් කරන්න. විජයදාස රාජපක්ෂ මහත්මයාගේ අමාත්‍යාංශයේ -මගේ අමාත්‍යාංශයේ-, ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමාගේ අමාත්‍යාංශයේ, එහෙම නැත්නම් කාගේ හෝ අමාත්‍යාංශයක එවැනි දෙයක් සිද්ධ වෙලා තිබෙනවා නම් ඔබතුමන්ලා අපට ඒ කරුණු ඉදිරිපත් කරන්න. වැරැද්දක් වෙලා ඇති. [බාධා කිරීමක්] නැහැ, මන්ත්‍රීතුමනි. වැරැද්දක් වෙලා ඇති. සේවකයන් සම්බන්ධයෙන් අපි පළමුවන පිම්ම තැබුවා පමණයි. යෝගරාජන් මන්ත්‍රීතුමා අපට යම්කිසි අදහසක් ඉදිරිපත් කළා. සේවක අර්ථ සාධක අරමුදල් ලබා ගැනීමේ ප්‍රශ්න තිබෙනවා නම් අපි ඒ ගැන කටයුතු කරනවා.

විශේෂයෙන්ම රවි වෙත්තසිංහ මහත්මයා ගැන සඳහන් කළා. අපි ආපු ගමන් මොකක්ද කළේ? රවි වෙත්තසිංහ මහත්මයාගේ රාජගිරියේ ඉඩම සම්බන්ධයෙන් දැන් ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. අරාබි සමාගමකට දැන් පොඩි ඩීල් එකක් දමා ගෙන යනවා ලු. මේ ඉන්න හොරු ටික එහෙන් මෙහෙන් කැරකිලා ආපසු හොරකම් කරන්න ලෑස්ති වුණාය කියා අපට ආරංචි වෙලා තිබෙනවා. මේ කාරණය රවුෆ් හකීම් මහත්මයාගේ අවධානයට යොමු කරනවා. එතුමා මේ ගැන දන්නවාද කියලා අපි දන්නේ නැහැ. විශේෂයෙන්ම වෙත්තසිංහ මැතිතුමාට තිබෙන සියලු නඩු සම්බන්ධයෙන් මෝසම් දාලා, මේ වන විට විශාල මුදලක් - කොළඹ අධිකරණයේ ලක්ෂ 50ක් සහ තවත් ලක්ෂ 120ක්- අය කර ගන්නට නීතිය ක්‍රියාත්මක කරලා තිබෙනවා. [බාධා කිරීමක්] හරි, මහින්ද යාපා අබේවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමා Port City deal එක දැම්මා තමයි. චීනයට භාගයක් දෙන්න හැදුවා. හරි. [බාධා කිරීමක්] Deals නැහැ. ඒවාට deals නැහැ. අපි තිබුණු deals අයින් කරනවා. දැම්ම deals ගැන අපි දන්නවා. ඔබතුමායි මට කිව්වේ. රාජපක්ෂලා දාපු deals ගැන ඔක්කොම මම දන්නවා. ඔබතුමා මට ඒ තොරතුරු දීලා තිබෙන්නේ. අපි ඒ deals ලිහනවා. [බාධා කිරීමක්] මහින්ද යාපා අබේවර්ධන මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ඔබතුමාට මතක් කර සිටිනවා, අපි අද මේ ආකාරයට සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ නියෝග ගෙනැල්ලා කළේ ඔබතුමන්ලාට අවුරුදු ගණනාවක් කර ගන්න බැරි වුණු දෙයක් බව. ඒ විතරක් නොවෙයි. තොරතුරු දැන ගැනීමේ පනත් කෙටුම්පත, ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 19වෙනි සංශෝධනය අපි ගෙනෙනවා. අපි ආණ්ඩු කරන්න පටන් අරගෙන ගත වුණේ දවස් 50ක්, 60ක් පමණයි මහින්ද යාපා අබේවර්ධන මන්ත්‍රීතුමනි. ඒවා ඔබතුමන්ලාට අවුරුදු ගණනාවක් කර ගන්න බැරි වුණු දේවල්. විශේෂයෙන්ම ඇමතිතුමන්ලා සහ නිලධාරි මහත්වරුන් අද වන විට ඒවා සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම අපරාධයක විත්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත තමුන්නාන්සේලා අවුරුදු ගණනාවක් තිස්සේ ගෙනාවේ නැහැ. අපි පසු ගිය දින එය සම්මත කර ගත්තා. අපි මේ රටට අවශ්‍ය යහ පාලනය, ප්‍රජාතන්ත්‍රවාදය සහ නීතිය සම්බන්ධයෙන් අත්තිවාරම දැමුවා. අපි ඒ අත්තිවාරම දැම්මාට පසුව බඩු මිල අඩු කළා; පඩි වැඩි කළා.

සහතික මිල සම්බන්ධයෙන් පොඩි පොඩි අඩු පාඩුකම් ඇති. නමුත් වී මිල දී ගැනීමේදී, තේ මිල දී ගැනීමේදී, රබර් මිල දී ගැනීමේදී අනාගතයේදී අපි අවශ්‍ය ප්‍රතිපාදන සලසනවා ගරු මහින්ද යාපා අබේවර්ධන මන්ත්‍රීතුමනි. නමුත් පොඩි කාලයක් ගතවෙයි. අපිට පොඩි කාලයක් දෙන්න. අපි මේ ලෙඩවලට බෙහෙත් කළා පමණයි. නමුත් කාලයක් යන විට අපි ඔබතුමන්ලා බලාපොරොත්තු වන, අවශ්‍ය සියලු වෙනස්කම් ඇති කරනවා. [බාධා කිරීමක්] හරි, අපි අනිවාර්යයෙන් කලින් කරනවා. මොකද, අපි ඡන්දයකට යන නිසා. තව මාසයක් යන විට, -ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා ඔබතුමාට දුන්නු පොරොන්දුව වාගේ- අපි මේ සියලුම දේවල් ගේනවා. ඒ වාගේම අපි මේ රටට කර්මාන්ත 2,000ක් 3,000ක් ගෙනැල්ලා මේ රට සංවර්ධනය කරනවා. රට සංවර්ධනය වන විට විශේෂයෙන් කම්කරුවා බලාපොරොත්තු වන ආදායම, කම්කරුවා බලාපොරොත්තු වන විශාල සංවර්ධනය මේ රටේ ඇති වෙනවා. එය ඇති වන විට මේ රටේ ජනතාව එක්සත් ජාතික පක්ෂය කෙරෙහි තැබූ විශ්වාසය දිගින් දිගටම ඉදිරියටත් පවත්වාගෙන යයි. ගරු රනිල් වික්‍රමසිංහ මහත්මයා හොරකම් කරලා නැහැ. ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා හොරකම් කරලා නැහැ. අපේ නායකයෝ හොරකම් කරලා නැහැ. ඒ විධියට ආදර්ශයක් දුන්නු නායකයෝත් සමඟ අපි මේ රට අනාගතයේදී සංවර්ධිත රටක් බවට පත් කරනවා. ඒ වාගේම මේ රටේ නීතිය, යහ පාලනය, ප්‍රජාතන්ත්‍රවාදය ඇති කරනවා. විශේෂයෙන්ම ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමාත් මමත් නියෝජනය කරන අමාත්‍යාංශයේ වගකීම් අකුරටම ඉටු කරලා මේ රටේ අනාගතයට අවශ්‍ය අත්තිවාරම අපි දමනවා කියන කාරණය මේ අවස්ථාවේදී ප්‍රකාශ කර සිටිනවා. බොහොම ස්තූතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That the Parliament do now adjourn".

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
සභාව කල් තැබීමේ යෝජනාව, ගරු වයි.ජී. පද්මසිරි මහතා.

නව රජයේ අධ්‍යාපන ප්‍රතිපත්තිය
புதிய அரசின் கல்விக் கொள்கை
EDUCATION POLICY OF NEW GOVERNMENT

[අ.භා. 6.35]

ගරු වයි.ජී. පද්මසිරි මහතා
(மாண்புமிகு வை.ஜி. பத்மசிறி)
(The Hon. Y.G. Padmasiri)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපන ක්ෂේත්‍රයේ මතු වී ඇති ගැටලු කිහිපයක් පිළිබඳව අදාළ වග කිව යුත්තන් වන ආණ්ඩුවේ සහ අධ්‍යාපන අමාත්‍යතුමාගේ ක්ෂණික අවධානය යොමු කිරීම සඳහා සභාව කල් තබන අවස්ථාවේ පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"පාසල් දහසේ ව්‍යාපෘතිය යටතේ දිවයිනේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම අඩු වශයෙන් පාසල් 03ක්වත් ද්විතීයික පාසල් වශයෙන් සංවර්ධනය කිරීමට පසු ගිය රජය විසින් කටයුතු කළ අතර ඒ සෑම පාසලකටම දෙමහල් මහින්දෝදය විද්‍යාගාරය බැගින්ද, සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම එයින් එක් පාසලකට තෙමහල් මහින්දෝදය තාක්ෂණ විද්‍යා පීඨය බැගින්ද ඉදි කර ඒ සඳහා අදාළ වටිනා උපකරණද සපයා තිබේ.

මේ වන විට මෙම පාසල් විවෘත කිරීමේ වැඩ පිළිවෙළ නතර වී ඇත. ද්විතීයික පාසල්වලට අනුබද්ධ ඒ හා සම්බන්ධ ළමා මිතුරු ප්‍රාථමික පාසල් 05ක දරුවන් 06වන ශ්‍රේණියට ඇතුළත් කර ගැනීමේ වැඩ පිළිවෙළ නතර වී ඇත. නැතහොත් අදාළ උපදෙස් විදුහල්පතිවරුන්ට ලබා දී නැත. මේ නිසා දෙමාපියන් සහ දරුවන් මහත් අපහසුතාවකට පත්ව බැරෑරුම් ප්‍රශ්නයකට මුහුණ පා සිටිති.

නව රජයේ අධ්‍යාපන ප්‍රතිපත්තිය කුමක්ද? ද්විතීයික පාසල් ක්‍රමය හා ඒ හා සම්බන්ධ ළමා මිතුරු ප්‍රාථමික පාසැල් ක්‍රමය ඉදිරියට රැහෙන යන්නේද? මේ සම්බන්ධ ආණ්ඩුවේ දින 100 වැඩ පිළිවෙළ තුළින් ලැබෙන විසඳුම් මොනවාද? යන්න සම්බන්ධයෙන් මෙම සභාව දැනුවත් කරන මෙන් ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සෑම වර්ෂයකම මුල් කාර්තුවේදී පළමුවෙනි වසරට දරුවන් ඇතුළත් කර ගැනීමේ ප්‍රශ්නයත්, ඒ වාගේම කලින් වසරේ පවත්වන පස්වෙනි වසර ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රතිඵල අනුව හයවෙනි වසරට ජනප්‍රිය පාසල්වලට දරුවන් ඇතුළත් කර ගැනීමේ ප්‍රශ්නයත්, ශිෂ්‍යත්ව කඩ ඉම් ලකුණට ආසන්න ලකුණු ලබා ගත් දරුවන් සඳහා දෙමාපියන් වෙනත් පාසල් සොයා වෙහෙස මහන්සි වීමත් සාමාන්‍යයෙන් දක්නට ලැබෙන දෙයක්.

මේ වර්ෂයට තවත් කරුණු කිහිපයක් එකතු වෙලා තිබෙනවා. පසු ගිය රජයේ හිටපු ජනාධිපති ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වය යටතේ පැවැති, වත්මන් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ද ඇතුළත් වූ ආණ්ඩුවෙන් ඉතාම වැදගත්, වටිනා වැඩ පිළිවෙළක් මේ රටේ අනාගත පරපුර වෙනුවෙන් ක්‍රියාත්මක වුණා. ඒ, පාසල් දහසේ ව්‍යාපෘතියයි. මේ වැඩ පිළිවෙළ පිළිබඳව මන්ත්‍රීවරුන් හැටියට අපි ඉතාමත්ම සතුටට පත්වෙලා හිටියා. විශේෂයෙන් රටේ ජනතාව රජයේ විවිධ ව්‍යාපෘති යටතේ -මාර්ග සංවර්ධනය කිරීම, විදුලි පහසුකම් දියුණු කිරීම, ජල පහසුකම් දියුණු කිරීම වාගේ දේවල් යටතේ- දියුණුවක් ලබනවා අපි දැක්කා. නමුත් ඒ සැමටම ඉහළින් අපි අගය කළා, අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇති කළ වෙනස්කම්. 1945 දී සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා මධ්‍ය මහා විද්‍යාල ක්‍රමය ඇති කර නිදහස් අධ්‍යාපන ක්‍රමය ආරම්භ කළා. එහි නිම් වළලු පුළුල් කරමින් පසු ගිය රජය උසස් පෙළ විෂය ධාරා තුනට තාක්ෂණ විෂය ධාරාවත් එකතු කරමින්, තාක්ෂණ විෂය ධාරාව හඳුන්වා දුන්නා. මේ රටේ දරු පරපුරට අනාගතයේදී රැකියා ලබා ගැනීමේ පහසුවත්, ඒ වාගේම විද්‍යා හා තාක්ෂණ විෂයයෙන් රට දියුණු කිරීමට අවශ්‍ය දැනුම් සම්භාරයෙන් පිරි අලුත් පරපුරක් බිහි කර ගැනීමට මේ අධ්‍යාපන ක්‍රමය ඉවහල් වෙනවා කියන විශ්වාසයක් අප තුළ ඇති වුණා.

ගරු කථානායකතුමා විසින් පත් කළ විශේෂ අධ්‍යාපන කාරක සභාව තිස් හතළිස් වතාවක් පමණ රැස්වෙලා විද්වතුන්ගෙන්, ඒ වාගේම නොයෙකුත් විශාරදයින්ගෙන් කරුණු එකතු කරමින්, සාක්ෂි ලබා ගනිමින් නව අධ්‍යාපන වැඩ පිළිවෙළක් සකස් කළා. එහි එක් අංශයක් තමයි මේ ද්විතීයික පාසල් ක්‍රමය. ඒ යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට අඩු තරමින් මහින්දෝදය විද්‍යාගාර සහිත ද්විතීයික පාසල් තුනක්වත් ලබාදීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වුණා. සමහර ප්‍රදේශවලට 4ක්, 5ක් ලැබුණා. එතැනදී අප නියෝජනය කරන ප්‍රදේශයේ -වතුකරයේ- දෙහිඕවිටට සහ යටියන්තොටට පමණක් ද්විතීයික පාසල් දෙකක් ලැබුණා. ඒ වාගේම මුස්ලිම් දරුවන් සඳහා එක් පාසලක් ලැබුණා. ඒ අනුව පාසල් 16ක් පමණ අපේ ප්‍රදේශයට ලැබෙන කොට දිස්ත්‍රික්කයටම ද්විතීයික පාසල් 70කට ආසන්න ප්‍රමාණයක් ලැබුණා. ඒ වාගේම කෑගල්ල පැත්තේ ද්‍රවිඩ මුස්ලිම් ජනතාවගේ දරුවන් සඳහා තවත් පාසල් ප්‍රමාණයක් වැඩි වුණා. කන්නන්ගර මැතිතුමාගෙන් මුළු දිස්ත්‍රික්කයටම ලැබුණේ මධ්‍ය මහා විද්‍යාල 3යි. මේ ක්‍රමය යටතේ අංගසම්පූර්ණ විද්‍යාගාර සහිතව ඊට වඩා වැඩි පාසල් ප්‍රමාණයක් ලැබුණා. මේවා අප ලැබූ හොඳ ප්‍රතිඵල හැටියට විශේෂයෙන්ම අපි දකිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 35,000ක් පමණ දරුවෝ 2014 වර්ෂයේ සිට තාක්ෂණික විෂය ධාරාව උසස් පෙළ පන්තිවල හදාරන්න පටන් ගත්තා. ඒ අය 2016 දී උසස් පෙළ විභාගයට පෙනී සිටින්නට නියමිතයි. අපිට පාර්ලිමේන්තුවේදී ඒ දවස්වල දැනගන්න ලැබුණා, 2016 දී විශ්වවිද්‍යාලවලට ඇතුළත් වෙන ඒ දරුවන්ට විශ්වවිද්‍යාලවල වෙනමම පාඨමාලා සකස් කරගෙන යනවා කියලා. ඒ අනුව 2020 දී තාක්ෂණ උපාධිධාරීන් ප්‍රථම කණ්ඩායම අපිට දකින්න ලැබෙනවා; අපේ දෙමව්පියන්ට දකින්න ලැබෙනවා. මෙන්න මෙවැනි වැඩ පිළිවෙළක් මේ අධ්‍යාපන ක්‍රමය තුළ ඇති කරලා තිබෙනවා. ඒ නිසා අපි බලාපොරොත්තු වෙන්නේ වැඩ නිම කර ඇති මේ විද්‍යාගාර විවෘත විය යුතුයි කියලායි. මේ වැඩ පිළිවෙළ ඉස්සරහට යන්න ඕනෑ. ඒකයි දෙමව්පියන්ගේ ප්‍රාර්ථනාව.

පසු ගිය කාලයේ 1-5 පන්ති තිබෙන ප්‍රාථමික පාසල් විශාල සංවර්ධනයකට ලක්වුණා. 1,500ක් පමණ පාසල් UNICEF ආයතනයේ ආධාර ඇතිව ළමා මිතුරු පාසල් හැටියට වැඩි දියුණු කළා. අපේ ප්‍රදේශවලත් ඒ වාගේ ළමා මිතුරු පාසල් රාශියක් ඇති වුණා. ඒ වාගේම පාසල් 5,000කට රුපියල් ලක්ෂ 5 බැගින්

[ගරු වයි.ජී. පද්මසිරි මහතා]

ලැබුණා. ළමයින් 50ට අඩු ප්‍රාථමික පාසල් දියුණු කිරීමට තවත් වැඩ පිළිවෙළක් ආවා. මම ජීවත් වෙන ප්‍රදේශයේ දෙහිඕවිට කලාපයේ පමණක් අවුරුදු 7,8ක් පමණ වැසී තිබූ පාසල් 7ක්, 8ක් නැවත විවෘත වුණා. නම් වශයෙන් කියනවා නම් වල්ගම්පත, ඉඳුරාන, මාවරැල්ල ආදී ප්‍රදේශවල දැන් පාසල් විවෘත වෙලා පන්ති 1,2,3 වශයෙන් දියුණු වෙලා පවත්වාගෙන යනවා. නැවත ඒ පාසල්වලට ළමයින් ඇතුළු කරන්න දෙමව්පියන් උනන්දු වෙලා තිබෙනවා. මෙන්න මේ වැඩ පිළිවෙළ යටතේ අපි බලාපොරොත්තු වෙන්නේ, පාසැල් ජීවිතයේදී අපට නොලැබුණු සම්පත් වර්තමාන සහ අනාගත දරු පරපුරට ලබාදීමයි.

මහින්දෝදය විද්‍යාගාර තුළ කාමර හතරක් තිබෙනවා. ඒවා තමයි පරිගණක කාමරය, ගණිතාගාරය, භාෂාගාරය සහ දුරස්ථ අධ්‍යාපන ඒකකය. මේවා අපි අහැටවත් දැකලා නොතිබුණු දේවල්. ඒ නිසා අපේ ඊළඟ පරපුර අපට වඩා උසස් අධ්‍යාපනයක්, උසස් දැනුමක් ඇති පිරිසක් බවට පත් කරන එක තමයි අපි කාගේත් බලාපොරොත්තුව. මේ පාසල්වලට දැනටමත් පරිගණක ඇතුළු නොයෙකුත් උපකරණ ලැබිලා තිබෙනවා. ඉතින් මේවා වහගෙන ඉන්න වුවමනාවක් නැහැ. දැන් මේවා පටන්ගැනීමේ අවශ්‍යතාවයි තිබෙන්නේ.

මහින්දෝදය තාක්ෂණ විද්‍යා පීඨ දැන් එක කොට්ඨාසයකට එක බැගින් 251ක් හදාගෙන යනවා. ඒ තුන් මහල් ගොඩනැඟිල්ල දරුවන්ට තාක්ෂණ විෂය හැදෑරීමට ඉතා ප්‍රයෝජනවත් වනවා. විද්‍යාව හැදෑරීමට වැදගත් වනවා වාගේම, පාසල් හැර ගිය අයටත් ඒවායින් ප්‍රයෝජන ගන්න පුළුවන් කියන එක තමයි අපට දැන ගන්න ලැබිලා තිබෙන්නේ. ඒ නිසා මේ වැඩ පිළිවෙළ අඩපණ කරන්නේ නැතුව ඉදිරියට ගෙනියන්න ඕනෑය කියන තදබල ඉල්ලීම අපේ රටේ දෙමව්පියන් වෙනුවෙන්, දරුවන් වෙනුවෙන් අපි කරන්න කැමැතියි.

ඒ එක්කම දැන් 6වන වසර සම්බන්ධයෙන් ගැටලුවක් ඇති වෙලා තිබෙනවා. ඒ තමයි ද්විතීයික පාසල්වලට, තෝරා ගත් පාසල් 5ක් හෝ යම් ප්‍රමාණයක් එකතු කිරීමේ වැඩ පිළිවෙළ. ඉඩකඩ පහසුකම් තිබෙන ප්‍රමාණය අනුව මේ අවුරුද්දේ ඒ කටයුත්තෙන් යම් ප්‍රමාණයක් කරන්න පුළුවන් වෙයි. ඒ සඳහා ගොඩනැඟිලි අපහසුකම් තිබෙනවා. ඒ අවශ්‍ය ගොඩනැඟිලි ඉදිරි කාලයේ හදන්න වෙයි. නමුත් අපි මේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යනවා නම්, දැනට තිබෙන පහසුකම් යටතේ යම් ප්‍රමාණයක හෝ දරුවන් පිරිසක් පෝෂිත පාසල්වල හයවන වසරට ඇතුළත් කර ගැනීමේ කටයුතු පටන් ගන්න ඕනෑ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මෙන්න මේ වැඩ පිළිවෙළ ස්ථිරවම ක්‍රියාත්මක වෙනවා ද, එහි යම්කිසි අඩු පාඩුවක් තිබෙනවා නම් ඒවා නිවැරදි කර ගන්නවා ද කියන කාරණා පිළිබඳව වත්මන් රජයේ ප්‍රතිපත්තිය සහ ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ අරමුණු හා ප්‍රතිපත්ති මේ සභාවට පැහැදිලි කරන්න කියලා ඉල්ලා සිටිනවා. මොකද, ආණ්ඩු මාරුවන පිළිවෙළට අධ්‍යාපන ප්‍රතිපත්තිය වෙනස් කළ යුතු නැහැ. අනෙකුත් ප්‍රතිපත්තිවලට වඩා අධ්‍යාපන ප්‍රතිපත්තිය ගොඩක් වෙනස්. ඒ නිසා ආවේගශීලීව යම් යම් වෙනස් කිරීම්වලට යන්නේ නැතුව අධ්‍යාපනය පිළිබඳව ඉතාම ගැඹුරින් සලකා බලමින් අපි කටයුතු කරන්න ඕනෑ. මේ වැඩ පිළිවෙළ අවුරුද්දක් දෙකක් තිස්සේ කල්පනා කරමින් හදපු වැඩ පිළිවෙළක්. විපක්ෂයේ මන්ත්‍රීවරු ඒ දවස්වල මේ වැඩ පිළිවෙළට සහභාගි වුණේ නැහැ. මම ඒ කමිටුවට පත් කර නොසිටියත් මා තුළ තිබුණු විශේෂ උනන්දුව නිසාම ඒ පැවැති රැස්වීම් තිස් ගණනින් වැඩි ගණනකට සහභාගි වුණා. ඒ රැස්වීම්වලට සහභාගි වෙන්න වෙන්න මේ වැඩ පිළිවෙළෙහි ඇති අගය වැටහුණා වාගේම මේ අධ්‍යාපන ක්‍රමය පිළිබඳව මගේ අදහස්ද දියුණු වුණා. ඒ නිසා විශේෂයෙන් මා ඉල්ලා සිටිනවා මේ අධ්‍යාපන ක්‍රමය, එනම් ද්විතීයික පාසල් ක්‍රමය හා බැඳි වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යා යුතු බව. මේ පිළිබඳව ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තිය පැහැදිලි කරන්න කියලා ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට, යෝජනාව ස්ථිර කිරීම සඳහා ගරු එස්.සී. මුතුකුමාරණ මන්ත්‍රීතුමා.

[අ.භා. 6.46]

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වර්තමානයේ අධ්‍යාපනයේ තිබෙන තත්ත්වය බලලා ගරු වයි.ජී. පද්මසිරි මන්ත්‍රීතුමා ගෙනා මේ යෝජනාව මම ස්ථිර කරනවා. මේ යෝජනාව ස්ථිර කරලා, මමත් ඒ ගැන වචන ස්වල්පයක් කථා කරනවා.

අපි මේ රටේ රැකීරක්ෂා ප්‍රශ්නය විසඳිය යුතු වෙනවා. අපේ රටේ බහුතරයක් පිරිස සාමාන්‍ය පෙළ අසමත් වෙනවා. ඔවුන්ගේ අනාගතය දියුණු කර ගැනීම සඳහා, ඔවුන්ට අනාගතයක් ගොඩ නැංවීම සඳහා, ඔවුන්ට අවශ්‍ය කරන පාරවල් සකස් කරදීම සඳහා වර්තමානයේ ජීවත් වන අපට යම්කිසි වගකීමක් තිබෙනවා. පසු ගිය අවුරුදු දෙක තුන තුළ අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේදී මේ වැඩ පිළිවෙළ පිළිබඳව දීර්ඝ ලෙස සාකච්ඡා කළා. අපේ වර්තමාන ඇමතිතුමාත්, ඒ සාකච්ඡාවලට විටින් විට සහභාගි වුණා කියලා මට මතකයක් තිබෙනවා. ඒ අනුව මේ වැඩ පිළිවෙළ ගෙනාවා.

කලින් තිබුණු අධ්‍යාපන ක්‍රමය තුළ සාමාන්‍ය පෙළ කරලා, උසස් පෙළ කරලා බොහෝ දුරට විශ්වවිද්‍යාලයට ගියේ, උපාධිධාරීන් බහුතරය බිහි වුණේ කලා ක්ෂේත්‍රයෙන් බව අපි දැක්කා. විශේෂයෙන් පිටිසර ප්‍රදේශවල අපේ දරුවන්ට අධ්‍යාපනය ලැබීමේ හැකියාවක් හා ශක්තියක් තිබුණාට ඔවුන්ට අවශ්‍ය කරන පහසුකම් නැහැ. හොරොව්පතාන වාගේ ඈත ගමක් අරගෙන බැලුවාම, ඒ ගමේ ළමයින්ට විද්‍යාව ඉගෙනගන්න අවශ්‍ය කරන පහසුකම් ඒ අවට පාසල්වල නැහැ. ඔවුන් ඒ සඳහා එක්කෝ අනුරාධපුර නගරයට යන්න ඕනෑ. එහෙම නැත්නම් හොරොව්පතාන නගරයට යන්න ඕනෑ. ඒ දරුවන් සඳහා අවශ්‍ය කරන මූලික පහසුකම් සැපයීම පිණිස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක පාසල් 3ක් ද්විතීයික පාසල් ලෙස නම් කරලා, ඒ සෑම පාසලකටම මහින්දෝදය විද්‍යාගාරය බැගින් ලබා දීලා ඒ විද්‍යාලය දියුණු කිරීමට තමයි උත්සාහ ගත්තේ. දැන් ඒ වැඩ පිළිවෙළ ආරම්භ කරලා මුල් අවස්ථාවේ තිබෙන්නේ. ඒ වැඩ පිළිවෙළ තුළින් අපි බලාපොරොත්තු වෙනවා, සාමාන්‍ය පෙළ විභාගය අසමත් ළමයා සාමාන්‍ය පෙළ පන්තියෙන් පසුව පාසලෙන් ඉවත් නොකර, ඔහුට මොනයම් හෝ හැකියාවක් තිබෙනවා නම් ඒ හැකියාව ප්‍රගුණ කරගෙන විශ්වවිද්‍යාල මට්ටම දක්වා යෑම සඳහා අවශ්‍ය කරන පහසුකම් ලබා දීමට. ඒක තමයි මහින්දෝදය තාක්ෂණ විද්‍යා පීඨය මඟින් බලාපොරොත්තු වුණේ. ඒ නිසා මේ යෝජනාව ඇත්ත වශයෙන් ඉතාම වැදගත් යෝජනාවක්. ඒ වාගේම මේ වැඩ පිළිවෙළ ද ඉතාම වැදගත් වැඩ පිළිවෙළක්. මේ වැඩ පිළිවෙළ මේ රට පාලනය කරන එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවකට හෝ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවකට හෝ වෙනත් ඕනෑම ආණ්ඩුවකට හෝ අපේ රටේ අනාගත පරම්පරාව වෙනුවෙන් දෙන්න පුළුවන් උපරිම දායාදයක්. ඒ නිසා වර්තමාන අධ්‍යාපන ඇමතිවරයාගෙන් මම ඉල්ලීමක් කරනවා මේ සම්බන්ධව එතුමාගේ අවධානය යොමු කරන්න කියලා.

ආණ්ඩු මාරු වන විට ආණ්ඩුවෙන් ආණ්ඩුවට මේ රටේ අධ්‍යාපන ක්‍රමය වෙනස් වෙන්න ගියොත් මේ රටේ අනාගත පරම්පරාවේ අධ්‍යාපනය කඩා වැටෙනවා. වෙනත් ඕනෑම දෙයක් වෙනස් කළාට ප්‍රශ්නයක් නැහැ. නමුත් අධ්‍යාපනය සම්බන්ධයෙන් ජාතියක් වශයෙන් අපි එකම අරමුණක් කරා යන්න ඕනෑ. ගරු අධ්‍යාපන අමාත්‍යතුමනි, තරුණ ඇමතිවරයකු වශයෙන් ඔබතුමාට හොඳ අනාගතයක් තිබෙනවා; ලොකු බලාපොරොත්තුවකුත් තිබෙනවා; ලොකු කාලයකුත් තිබෙනවා. ඒ නිසා මේ වැඩ පිළිවෙළ පිළිබඳව දේශපාලන කෝණයෙන් නොබලා වැඩ කරන්න. මේ කරගෙන යන වැඩ පිළිවෙළේ යම් යම් අඩු පාඩු තිබෙනවා නම් අපි සියලු දෙනා ඒවා ගැන සොයා බලා ඒ අඩු පාඩු නිවැරදි කර ගන්න ඕනෑ.

1 සිට 5 ශ්‍රේණිය දක්වා ඇති පාසල්වල දරුවන් ද්විතීයික පාසලක 6වන ශ්‍රේණියට ඇතුළත් කිරීමට අවශ්‍ය කරන පහසුකම් ලබා දීමට කටයුතු කරන්න ඕනෑ. සමහර පාසල්වල මහින්දෝදය විද්‍යාගාරයට අවශ්‍ය භාණ්ඩ ගෙනැවිත් තිබෙනවා. නමුත් ඒ විද්‍යාගාර විවෘත කිරීමක් දැන් කෙරෙන්නේ නැහැ. සමහර විට කියන්න පුළුවන් ඒකට මුදල් නැහැ කියලා. නමුත් මෙය වෙනම project එකක් හරහායි කෙරෙන්නේ. ඒ මහින්දෝදය විද්‍යාගාර නිර්මාණය කිරීම පිළිබඳව කිසිම චෝදනාවක් ඇවිල්ලා නැහැ. ඒ නිසා තමයි අපේ හිටපු ඇමතිතුමා ෆයිල් එකත් අරගෙන එතුමාම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ගියේ, මේ ගැන සොයා බලන්න කියලා. ඒ නිසා ගරු ඇමතිතුමනි, මම මෙහිදී ඉල්ලීමක් කරනවා. පාර්ලිමේන්තුවේ සියලු මන්ත්‍රීවරු, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් පමණක් නොවෙයි, මේ රටේ ඉන්න උගත්තු, දැන උගත්කම් තිබෙන අය, අත් දැකීම් තිබෙන අය, බුද්ධිමතුන්, ස්වාමීන් වහන්සේලා, අනෙක් ආගමික නායකයන් ඇතුළු සියලුදෙනා එකතු වෙලා අවුරුදු කීපයක් සාකච්ඡා කරලා ගෙන ආ මේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන්න කියලා.

මේ කාලයේ පවතින, පාසල්වලට ළමයින් ඇතුළත් කිරීම සම්බන්ධ ගැටලු පිළිබඳව ඉතා ඉක්මනින් සොයා බලා ඒවාට විසඳුම් ලබා දෙන ලෙස ගරු ඇමතිතුමාගෙන් අපි ඉල්ලනවා. මේ කටයුතු ගැන දේශපාලන කෝණයකින් නොබලා ජාතික යුතුකමක් වශයෙන් සලකා, අපේ අනාගත පරම්පරාව වෙනුවෙන් මේ කාර්ය භාරය ඉතා ඉක්මනින්, මේ දින සියය ඇතුළතවත් කරන්න කියා ඉල්ලා සිටිනවා. එය හරියට කළොත් ඉස්සරහට යන්න පුළුවන් වෙයි.

[අ.භා. 6.52]

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු වයි.ජී. පද්මසිරි මන්ත්‍රීතුමා, සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව හැටියට ඉදිරිපත් කළා, පසු ගිය රජය අධ්‍යාපනය පිළිබඳව දැඩි අවධානයක් යොමු කිරීමේ ප්‍රතිඵලයක් හැටියට අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීපු මහින්දෝදය විද්‍යාගාර ඉදි කිරීමේ සහ මහින්දෝදය තාක්ෂණ විද්‍යා පීඨ ඉදි කිරීමේ වැඩ පිළිවෙළ අඛණ්ඩව පෙරට ගෙන යන ලෙසට. ඒ වැඩ පිළිවෙළේ අංගයක් ලෙස තාක්ෂණ විද්‍යාපීඨ විවෘත කිරීමට සහ ඉදි කිරීමට යෝජනා කළ වැඩ පිළිවෙළ පෙරට ගෙන යෑම තුළින් මේ රටේ අධ්‍යාපනයේ මහා විප්ලවයක් කරන්න පුළුවන්ය කියන අදහස පෙර දැරි කර ගෙන එම වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන ලෙස මෙම යෝජනාවෙන් අධ්‍යාපන අමාත්‍ය ගරු අකිල විරාජ් කාරියවසම් මැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

පසු ගිය රජය, විශේෂයෙන්ම අධ්‍යාපන අමාත්‍ය ධුරය දරපු ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා ඉදිරිපත් කළ සංකල්පමය වැඩ පිළිවෙළ අනුව මහින්දෝදය විද්‍යාගාර වැඩ පිළිවෙළ ආරම්භ කෙරුවා. අප එය ඉතා අගය කරනවා. ඒ වැඩ පිළිවෙළ තුළින්, නගරයට පමණක් සීමා වෙලා තිබුණු තාක්ෂණය, පරිගණක විද්‍යාගාර, භාෂාගාර, ගණිතාගාර කියන මේ සියල්ලගෙන් සමන්විත දෙමහල් ගොඩනැඟිලි එක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට අවම වශයෙන් දෙකක්වත් ලැබෙන ආකාරයට ලබා දෙන්න යෝජනා කරලා ඒවා ඉදි කළා. දැන් ඒවා ඉදි කරලා අවසන්. සමහර තැන්වල මේවා විවෘත කරලා සිසු දරු දැරියෝ එම ගොඩනැඟිලි පරිහරණයට ගන්නවා. මේ සඳහා අවශ්‍ය සියලු විද්‍යුත් උපකරණ සමහර තැන්වලට ලැබී තිබෙනවා. නමුත්, සමහර ගොඩනැඟිලි තවම විවෘත කරලා නැහැ. ඒ නිසා එම ගොඩනැඟිලි විවෘත කරලා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අයිතිය සඳහා ඒවා ලබා දිය යුතුව තිබෙනවා.

පසු ගිය දවස්වල අධ්‍යාපන ඇමතිතුමාගේ ප්‍රකාශයක් විධියට පුවත් පත්වල පළ වූ ප්‍රකාශයක් මම දැක්කා. මම කියන දේ වැරදි නම්, ගරු අකිල විරාජ් කාරියවසම් මැතිතුමා එය නිවැරදි කරාවි. මේ විද්‍යාගාරවලට දමා තිබෙන 'මහින්දෝදය විද්‍යාගාර' කියන නම හොඳ නැහැ, එම නම වෙනස් කරන්න ඕනෑය කියලා එතුමා ප්‍රකාශ කර තිබුණා. මේ වැඩ පිළිවෙළ සඳහා අවශ්‍ය කරන රුපියල් බිලියන ගණනක මුදලක් ජාතික අය වැයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයට වෙන් කරලා දුන්නේ හිටපු ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා. මහින්දෝදය විද්‍යාගාර වැඩ පිළිවෙළ හොඳයි, හැබැයි, නම හොඳ නැහැ කියලායි කියන්නේ. 'මහින්දෝදය' කියන නම වෙනස් කළ පමණින් මේ වැඩ පිළිවෙළේ ගුණාත්මකභාවය වැඩි වනවා නම්, ඒ නම වෙනස් කළාට කමක් නැහැ. හැබැයි, අපි අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. තමන්ට තිබෙන දේශපාලන පරමාර්ථ, අරමුණු මුදුන් පමුණුවා ගන්න මහින්ද රාජපක්ෂ කියන නම මේ රටෙන් ඉවත් කරන්න හදනවා නම්, ඒක තමුන්නාන්සේ දරන බොහොම අසාර්ථක බොළඳ උත්සාහයක්. ඒකට ඕනෑ නමක් දමා ගන්න. 'මහින්දෝදය' හොඳ නැත්නම්, මේ සඳහා මම යෝජනා කරනවා, 'අකිලෝදය විද්‍යාගාරය' කියලා නම දමා ගන්න කියලා. ඒකට අපේ විරුද්ධත්වයක් නැහැ. මොකක් හරි 'දෝදයක්' දමා ගන්න. එහෙම දමා ගෙන හරි මේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන්න ඕනෑ.

ඊළඟට ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගේ අවධානයට තවත් කරුණක් යොමු කරනවා. මේ වන කොට පාසල් පද්ධතිය තුළ පළමු වසරට දරුවන් ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන් බරපතළ අර්බුදයක් මතු වෙලා තිබෙනවා. ඒ ඔබතුමා විසින් නිකුත් කළ චක්‍රලේඛයක් නිසා. අප නියෝජනය කරන්නේ කොළඹ -අගනුවර- සිට හැතැප්ම සියයකට වඩා දුර බැහැර ප්‍රදේශ. මේ ප්‍රදේශවල නගර ආශ්‍රිතව තිබෙන ළමා මිතුරු පාසල් හැටියට වැඩිදියුණු කරපු ඇතැම් පාසල්වලට දැඩි ඉල්ලුමක් තිබෙනවා. මේ පාසල්වල පන්තියකට දරුවන් 40ට වැඩියෙන් මොනම හේතුවක් නිසාවත් ඇතුළත් කර නොගත යුතුයි කියලා ඔබතුමා දැනුම් දීමක් කරලා තිබෙනවා.

මම උදාහරණයක් කියන්නම්. ඇමතිතුමනි, මේක චෝදනාවක් නොවෙයි. ඔබතුමා මෙය සටහන් කර ගෙන සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් විමසීමක් කරලා බලන්න. මා නියෝජනය කරන මැතිවරණ කොට්ඨාසය රක්වාන. රක්වානේ තිබෙන ප්‍රධානම ප්‍රාථමික පාසල රාහුල ප්‍රාථමික පාසලයි. රාහුල ප්‍රාථමික පාසලේ එක වසර පන්ති හයක් තිබෙනවා. ඒ එක් පන්තියකට ළමයි 40 ගණනේ ඇතුළත් කර ගන්න පුළුවන්කම තිබුණත්, තමුන්නාන්සේ දීලා තිබෙන නියෝගයක් අනුව එක පන්තියක ඉන්නේ ළමයි 31යි, අනෙක් පන්තියේ 32යි, අනෙක් පන්තියේ 33යි. මේ පන්තිවලට ඊට වැඩිය ළමයි ඇතුළත් කර ගන්න බැහැ. විදුහල්පතිවරයා කියනවා, "ප්‍රාථමික අංශයේ අධ්‍යක්ෂවරයාට log entry එකක් ගහලා ගිහිල්ලා තිබෙනවා, ඒ නිසා ළමයි ගත්තොත් මට ගෙදර යන්න වනවා. ඒ නිසා මට ළමයි ගන්න බැහැ" කියලා. හැබැයි, මේ සඳහා සීමාවකුත් දමා තිබෙනවා, 'මේ සීමාවෙන් පිට ළමයි ගන්න බැහැ' කියලා. ගරු ඇමතිතුමනි, නගරබද වාගේ නොවෙයි, ගම්බද.

[ගරු ටී. රංජිත් ද සොයිසා මහතා]

සමහර වෙලාවට ගම මැදින් ගංගාවක් තිබෙනවා. ඒ ගංගාවෙන් මෙහා කෙළවර සීමාවට තිබෙනවා. එතකොට ගඟෙන් එහා පැත්තේ එහා කෙළවරේ ඉන්න ළමයින්ට ඒ පාසලට එන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා මම උදාහරණයක් කියන්නේ. 2015 මාර්තු මාසය වෙන කොටත් රාහුල ප්‍රාථමික විද්‍යාලයේ ඉගෙන ගන්න පන්තියක් නැතිව ළමයි 200ක් ඉන්නවා. මම හිතන හැටියට ඒක යහ පාලනය කියන සංකල්පය තුළ එච්චර හොඳ දෙයක් නොවෙයි. ඒ දරුවන් අතර කුමන දේශපාලන මත දරන දෙමව්පියන්ගේ දරුවන් ඉන්නවාද කියලා අපි දන්නේ නැහැ. ඒ දරුවන්ගේ දෙමව්පියන් යූඑන්පීද, ශ්‍රීලංකාද, ජේවීපීද, මොකක්ද කියන්න අපි දන්නේ නැහැ. නමුත් තමන්ගේ දරුවාට පාසලක් නොලැබීම තුළ ඒ දරුවන්ගේ දෙමව්පියෝ බරපතළ විධියට රජයට දෝෂාරෝපණය කරනවා. ඒ දෝෂාරෝපණය කිරීම තුළ අපි දකින්නේ, මේ යහ පාලන සංකල්පය තුළ ඊට වඩා හොඳ දෙයක් මිනිස්සු බලාපොරොත්තු වුණු බවයි.

අපි කියන්නේත් දේශපාලනඥයන්ගේ ලැයිස්තුවලට පාසල්වලට ළමයින් ගන්න එපා කියලායි. නමුත් දේශපාලනඥයෝ පාසල්වලට දාන හැම ළමයාම දේශපාලනඥයින් නිසා හැදිච්ච ළමයිනුත් නොවෙයි. හැබැයි, ඒ දෙමව්පියන්ට තමන්ගේ දරුවා පාසලට ඇතුළත් කිරීමට අයිතියත් තිබෙනවා නම් ඒ අයිතියත් අහිමි කිරීමක් ඔබතුමාගේ අධ්‍යාපන අමාත්‍ය ධුර කාලය තුළ සිද්ධ වී තිබෙනවා නම් ඒක මේ රටේ දරුවන්ට සිදු වී තිබෙන බරපතළ අසාධාරණයක් විධියටයි මම සඳහන් කරන්නේ. මගේ ප්‍රදේශයේ ඇති වී තිබෙන ප්‍රායෝගික ප්‍රශ්නයක් නිසායි, මෙය බරපතළ අසාධාරණයක් විධියට මම මේ කාරණය ඔබතුමාගේ අවධානයට යොමු කළේ.

මේ තාක්ෂණ විද්‍යාගාර වැඩ පිළිවෙළ ඉතාම හොඳ වැඩ පිළිවෙළක්. ගමට තාක්ෂණය ගෙන ගිහින්, කලා විෂය ධාරාවන්ගෙන් පමණක් අධ්‍යාපනය ලැබූ දරුවන්ට විද්‍යා විෂයයන්ගෙන් උසස් අධ්‍යාපනය ලබා උපාධියක් දක්වා පෙරට යන්නට තිබුණු අවස්ථාව අහිමි කිරීමක් මේ තුළින් සිදු වෙන බව අපි දකිනවා. මොන ආණ්ඩුව, මොන සංකල්පය ඉදිරිපත් කළත්, ඉදිරිපත් කළ කරුණු ඉතාම හොඳ සාධනීය දේවල් නම් එය පෙරට ගෙන යාමේ වගකීමක් අධ්‍යාපනය විෂය භාර ඇමතිවරයා හැටියට ඔබතුමාට පැවරී තිබෙනවා. ගරු මුතුකුමාරණ මන්ත්‍රීතුමා කිව්වා වාගේ, මහාචාර්ය ගුණවර්ධන කමිටුවේ කරුණු විමසීමේ අවස්ථා ගණනාවකට ඔබතුමාත්, මාත්, පද්මසිරි හිටපු නියෝජ්‍ය ඇමතිතුමාත් -අපි තුන් දෙනාම- සහභාගි වුණා; කරුණු ඉදිරිපත් කළා; වාද විවාද කළා. ඒ තුළින් ඇති කර ගත් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනාවලිය ක්‍රියාත්මක කරන්න. එහි අඩු පාඩුකම් තිබෙනවා නම්, නැවත ඔබතුමා සාක්ෂි විමසීමක් කරන්න. ඒවා ගැන සොයා බලා මහාචාර්ය ගුණවර්ධන කමිටු වාර්තාව අනුව අධ්‍යාපනය පෙරට ගෙනියන්න කටයුතු කරනවා ඇති කියා අප විශ්වාස කරනවා. එහෙම නැතිව දේශපාලනඥයන්ගේ නම්වලින් පාසල් නම් කරන්න තහනම්ය කියනවා. ඒවා දේශපාලඥයින්ගේ සල්ලි නොවෙයි. මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමාගේ සිට බණ්ඩාරනායක අගමැතිතුමා, ඩඩ්ලි සේනානායක අගමැතිතුමා, ජේ.ආර්.ජයවර්ධන ජනාධිපතිතුමා, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය, සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා මේ හැම නායක නායිකාවකගේ නමින්ම පාසල් නම් කර තිබෙනවා. ඒ ගොල්ලෝ කිව්වේ නැහැ, "මගේ නම දාන්න" කියා. කෘතවේදී ජනතාව ඒ නම් දා ගෙන තිබෙනවා. ඉදිරියේ දී ලංකාවේ කිසිම පාසලක් කිසිම රාජ්‍ය නායකයකුගේ නමින්, දේශපාලනඥයකුගේ නමින් නම් කරන්නේ නැද්ද, එහෙම කරන්න තීරණයක් අර ගෙන තිබෙනවාද, එසේ නැත්නම් මහින්ද රාජපක්ෂගේ නම පමණක් ද ඉවත් කරන්නේ කියා මා දැන ගන්නට කැමැතියි.

ගරු අමාත්‍යතුමනි, අපි දෙන්නා පෞද්ගලිකව බොහොම හිතවත්. ගරු ඇමතිතුමා, තව ඉස්සරහට යන්න පුළුවන්, තරුණ දේශපාලනඥයකු හැටියට මේ තිබෙන වෛරී දේශපාලනයෙන් ඔබතුමා ඈත් වුණොත් හොඳයි. එහෙම නැතිව, 'කෝකටත් තෛලය' වාගේ, 'හැම දෙයකටම සිද්ධාලේප' කිව්වා වාගේ, කොයිකටත් 'මහින්ද රාජපක්ෂ', 'හොරකම, වංචාව, දූෂණය', "විසි අවුරුද්දක් මොකක් ද කළේ?" ඕක තමයි අහන ප්‍රශ්නවලට උත්තරය. ඒවා නෙවෙයි, අහන ප්‍රශ්නයට උත්තර විය යුත්තේ. මිනිසුන්ට ඔය උත්තර දීලා හරියන්නේ නැහැ.

තමුන්නාන්සේලා මේ රටේ පාලන බලය භාර ගත්තේ දින සියයක් ඇතුළත මේ රටේ මහා විප්ලවයක් කරනවා, යහ පාලනයක් ඇති කරනවා කියලායි. දින සියයෙන් දැන් දින 50ක් - හරියට භාගයක්- ගිහිල්ලා ඉවරයි. එම නිසා දැන් ආපසු එහෙන් මෙහෙන් තෙපර බාන්න දෙයක් නැහැ. "පෝය දවස්වලට මෙච්චරයි, රාමසාන්වලට මෙච්චරයි, නත්තල්වලට මෙච්චරයි, සෙනසුරාදා ඉරිදා මෙච්චරයි, වැඩ කරන්න තිබෙන්නේ දවස් මෙච්චරයි" කියා ඒවා හරියන්නේ නැහැ. එහෙම කියා තිබුණේ නැහැ, මෛත්‍රී යහ පාලන වැඩ පිළිවෙළේ. මෛත්‍රී යහ පාලන වැඩ පිළිවෙළේ කිව්වේ දින සියයයි කියලා. ඒකට ඔක්කොම අයිතියි. නැත්නම් දැන් කියන්න පුළුවන්, "අපිට අච්චර නිවාඩු දින තිබුණා. මෙච්චර නිවාඩු තිබුණා. දවස් දොළහයි වැඩ කරන්න තිබුණේ" කියලා. එහෙම එකක් නැහැ. දැන් දින 50ක් ඉක්ම ගිහින්. තව දින 50යි තමුන්නාන්සේලාට වැඩ කරන්නට තිබෙන්නේ. ඒ දින 50 ඇතුළත මේ රටේ මිනිසුන්ට යහ පාලන වැඩ පිළිවෙළෙන් පොරොන්දු වුණ දේවල් කරලා පෙන්වන්න. එහෙම නැතිව ඒවා මේවා කිය කියා, මහින්ද රාජපක්ෂට දොස් කියලා, තව රාජපක්ෂලාට දොස් කියලා, හිටපු ආණ්ඩුවේ ඇමතිවරුන්ට දොස් කියලා හරියන්නේ නැහැ. සුජීව සේනසිංහ නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා වාගේ, තමුන්නාන්සේලා කරපු දෙයක් නැහැ, මේ සියලු දෙයක්ම අපි තමයි කරලා තියෙන්නේ. අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කියනවා, මේ දින සියයයේ ආණ්ඩුවට ගෙවල් හදනවා කිව්වාට අත්තිවාරමක්වත් දා ගන්නවත් කාලය නැහැ. කුඹුරු හදනවා කිව්වාට එක කන්නයක් වැඩ කරගන්නවත් කාලය නැහැ කියලා. ඕක දන්නේ නැතිව ද, ඔය කට්ටියත් එක්ක එකතු වෙලා දින සියයේ ආණ්ඩුවක් හැදුවේ, එහෙම නම්? මොකක්වත් කර ගන්න බැරි බව දන්නේ නැතිව ද එහෙම කළේ?

ඒ කිව්වා වාගේම අපි දන්නවා, මේ දින සියයේ ආණ්ඩුව අසාර්ථකයි කියලා. මේ දින සියයේ ආණ්ඩුවට කරනවාය කිව්ව දේවල් කරන්න බැහැ; කරන්න පුළුවන් දේවල් තමයි කරන්නේ. පසු ගිය ආණ්ඩුව කරන්න පටන් ගත්ත හොඳ වැඩ ටික නවත්වා දාලා, තමුන්නාන්සේලාගේ න්‍යාය පත්‍රයක් ඉස්සරහට ගෙනෙන එක කරනවා. හැබැයි, ඒ න්‍යාය පත්‍රයට වුණත් අපි එකඟතාව ප්‍රකාශ කරනවා. අපි ඒ න්‍යාය පත්‍රයට සහයෝගය දෙනවා, ජනතාවාදී හොඳ වැඩ පිළිවෙළවල් ගෙනෙන්න. එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුවට, එහි නායකයින්ට, එහි හිටපු නායකයින්ට ඕනෑ තරම් අපහාස කරන්න; පරිභව කරන්න; දෝෂාරෝපණය කරන්න; ඔවුන් උසාවි ගෙන යන්න; හිර ගෙවල්වලට දමන්න. හැබැයි ඒ මොනවා කළත් ජනතාවාදී වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න. ජනතාවට එරෙහිව පියවරක් ගන්න එපා. තමුන්නාන්සේලාට ඡන්දය දීලා ආණ්ඩුවක් බලයට පත් කළේ ඒකටයි. එහෙම නැතිව ෆයිල් උස්සා ගෙන අරහේ ගිහිල්ලා, මෙහේ ගිහිල්ලා උසාවි දමනවා. දවස් දෙකෙන් එළියට දෙනවා. මේකේ වැරැද්දක් නැහැයි කියනවා. කමක් නැහැ, තව දමන්න. හැබැයි, මතක තියා ගන්න තමුන්නාන්සේලා මොන තරම් අභියෝග කරලා, මොන තරම් තර්ජන ගර්ජන එල්ල කරලා කොච්චර කටවල් වහන්න හැදුවත් ඉතාම ශක්තිමත් විරුද්ධ පක්ෂයක් හැටියට යහ පාලන ආණ්ඩුවේ දින 100 ලිඛිත පොරොන්දුවට අමතරව ගන්නා වූ සියලු තීන්දු තීරණවලට 136 දෙනෙක් නොවෙයි, එක්කෙනෙක් හිටියත් ඒවාට විරුද්ධ වීමට

මේ විරුද්ධ පක්ෂයට කොන්ද පණ තිබෙනවා. ඒ නිසා හිතන්න එපා, මහ ලොකු බලයක් හම්බ වුණා කියලා. අපි 100 දැමූ අත්තිවාරමේ 20ක් යනවා කියලා තමයි කථා කරන්නේ. අපි බලමු, 100 යයිද, 20 යයිද, 200 යයිද කියන එක. දීපු පොරොන්දු ගැන මොකුත් කථාවක් දැන් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මාතෘකාවෙන් ටිකක් පිට ගියා. කොහොම වුණත් මම ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. පාසල්වල මුදල් එකතු කිරීම පිළිබඳව ඔබතුමා නිකුත් කළ මේ චක්‍රලේඛය ඔබතුමා ගරු ඇමතිතුමා හැටියට පත් වෙලා නිකුත් කළ පළමුවැනි චක්‍රලේඛය වෙන්න ඇති. ඒ කියන්නේ 2015 අංක 5 දරන චක්‍රලේඛය. මේ චක්‍රලේඛය තුළ බරපතළ අර්බුදයක් අද පාසල් තුළ ඇති වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
මට තව විනාඩියක කාලයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ චක්‍රලේඛය නිසා බරපතළ ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. එක පැත්තකින් කියනවා, සල්ලි එකතු කිරීම තහනම් කියලා. අනෙක් පැත්තෙන් කියනවා අදාළ කාර්යයට, අදාළ බලධාරියාගේ අනුමැතිය සහිතව සල්ලි එකතු කරන්න පුළුවන් කියලා. මේකෙන් පාසල්වල මුදල් එකතු කිරීම නීත්‍යානුකූල කරලා තිබෙනවා. තමුන්නාන්සේ නැති බරක් දෙමවුපියන් මත පටවලා තිබෙනවා. ඒ නිසා අද පාසල් පරිපාලනය අවුල් ජාලයක් වෙලා තිබෙනවා. සනීපාරක්ෂක කම්කරුවෙක් ගන්න බැරිව වැසිකිළි උතුරනවා. ගේට්ටුවට මුරකාරයෙක් දමන්න බැරිව හොරකම් කෙරෙනවා. වත්ත පිටිය ශුද්ධ කරන්න කම්කරුවෙක් නැතිව ඒවා වල් බිහි වෙලා. සල්ලි එකතු කරන්නේ නැතිව නිවාසාන්තර තරගයක් පවත්වන්න බැහැ. හැබැයි, ඒ එක්කම මේ චක්‍රලේඛයේ කියනවා අදාළ බලධාරින්ගේ අනුමැතිය ඇතිව ඒගොල්ලන්ගේ නිර්දේශය ඇතිව මුදල් එකතු කරන්න පුළුවන්. මොකක්ද, ගරු අධ්‍යාපන ඇමතිතුමනි, මේ චක්‍රලේඛයේ තේරුම? මෙවැනි චක්‍රලේඛ නිකුත් කිරීම තුළ ඔබතුමා දින 50 ඇතුළත අධ්‍යාපනය ටිකක් වැරදි පැත්තට ගිහිල්ලා තිබෙනවා. ඉතිරි දින 50දීවත් මෙය නිවැරදි කර ගෙන හරි තැනකට අධ්‍යාපනය ගෙන යන්න කියලා මේ රටේ ජනතාව වෙනුවෙන් ඉල්ලීමක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට ගරු අකිල විරාජ් කාරියවසම් ඇමතිතුමා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට වෙලාව කොච්චර තිබෙනවාද?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
විනාඩි 25යි.

[අ.භා. 7.05]

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு அகில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මම සන්තෝෂ වෙනවා, මේ වාගේ සභාව කල් තැබීමේ විවාදයකදී අධ්‍යාපන අමාත්‍යාංශය මේ කෙටි කාලය තුළ ගත් පියවරවල් පිළිබඳව ප්‍රකාශ කිරීමටත්, හසරක් නොදැන මේ නඟන ප්‍රශ්නවලට උත්තර දෙන්නටත් ලැබීම ගැන. ඒ එක්කම මම මේකත් කියනවා. දැන් දිගින් දිගටම වැරදි වෙලා හරි දේ කරන කොට ඒක පෙනෙන්නේත් වැරදි දෙයක් විධියටයි. ඒක තමයි අධ්‍යාපනයට මේ වෙලා තිබෙන්නේ. මේ ප්‍රශ්නයට අමාත්‍යාංශයෙන් ලබා දී තිබෙන පිළිතුර මම කියන්නම්.

2015.03.03 වන දින සභාව කල් තබන අවස්ථාවේ දී පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වයි.ජී. පද්මසිරි මැතිතුමා විසින් ද්විතීයික පාසල් දහස සහ ළමා මිතුරු පාසල් සංවර්ධනය කිරීමේ වැඩ සටහනට අදාළව ඉදිරිපත් කළ ප්‍රශ්නාවලියට අදාළව තමයි මේ පිළිතුර ලැබී තිබෙන්නේ. "පාසල් දහසේ වැඩසටහන යටතේ ද්විතීයික පාසල් වශයෙන් සංවර්ධනය කරන පාසල් විවෘත කිරීමේ වැඩ පිළිවෙළ නතර වී ඇත" කියලා මේ ප්‍රශ්නයේ සඳහන් වනවා. එයට පිළිතුර වන්නේ "මෙම වැඩ පිළිවෙළ නතර වී නොමැත" යන්නයි. විද්‍යාගාර ඉදි කිරීමේ කටයුතු නිම වී උපකරණ සපයා ඇති පාසල්වල එම විද්‍යාගාර සිසු අයිතියට පත් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. මෙම රජය බලයට පත් වීමෙන් පසු මෙම පාසල්වල විද්‍යාගාර විවෘත කිරීම් සිදු කොට ඇත. එසේ විවෘත කරන ලද පාසල් නාම ලේඛනය **ඇමුණුම 1*හි** දක්වා ඇත. ඉදිරියේදී විවෘත කර සිසු අයිතියට පත් කිරීමට නියමිත විද්‍යාගාර සහිත පාසල්වල ලේඛනය **ඇමුණුම 2*හි** දක්වා ඇත. පසු ගිය කාලයේ මමත් විවෘත කළා. දැන් අපි යන්නේ නැහැ. අපේ රාජ්‍ය ඇමතිතුමා ඉන්නවා. එතුමාත් පසු ගිය කාලයේ යාපනයේ ඒවා විවෘත කිරීම් දිගටම කළා. මම පැහැදිලිව කියනවා, ඉදිරි මාසය තුළ ඉතාම ඉක්මනින් මේ විද්‍යාගාර විවෘත කරලා අවසන් කරනවාව කියලා. අපි මේ හැම එකටම යන්න බලාපොරොත්තුවකුත් නැහැ. ඉදිරි කෙටි කාලය තුළ ඒ ඒ ප්‍රදේශවල ඇමතිවරයෙක් හෝ බලයලත් කෙනකු ලවා මේවා ඔක්කොම විවෘත කරලා අවසන් කරනවා.

තවම විවෘත කිරීම නොකර තිබෙන්නේ උපකරණ ලැබී නැති නිසයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උපකරණ නැතිව ගොඩනැඟිල්ල විතරක් විවෘත කරලා වැඩක් නැහැනේ. උපකරණ ටික ලැබුණාට පසුව විවෘත කරනවා. ඒ ගැන කිසිම සැකයක් තියා ගන්න එපා. ඉතාම ඉක්මනින් විවෘත කරනවා.

ඊළඟට අහලා තිබෙන්නේ, "ද්විතීයික පාසල්වලට අනුබද්ධ ඒ හා සම්බන්ධ ළමා මිතුරු ප්‍රාථමික පාසල් 05ක දරුවන් 06 වන ශ්‍රේණියට ඇතුළත් කර ගැනීමේ වැඩ පිළිවෙළ නතර වී ඇත. නැතහොත් අදාළ උපදෙස් විදුහල්පතිවරුන්ට ලබා දී නැත. මේ නිසා දෙමාපියන් සහ දරුවන් මහත් අපහසුතාවකට පත්ව බැරෑරුම් ප්‍රශ්නයකට මුහුණ පා සිටිති. නව රජයේ අධ්‍යාපන ප්‍රතිපත්තිය කුමක්ද? ද්විතීයික පාසල් ක්‍රමය හා ඒ හා සම්බන්ධ ළමා මිතුරු ප්‍රාථමික පාසල් ක්‍රමය ඉදිරියට රැගෙන යන්නේද?" කියලයි.

** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.*
ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.
Document not tendered.

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

පිළිතුර මේකයි. එසේ පෝෂිත පාසල්වල දරුවන් ද්විතියික පාසල්වල 6වන ශ්‍රේණියට ඇතුළත් කිරීම නතර වී නැහැ. එබැවින් දෙමාපියන් හා දරුවන් මහත් අපහසුතාවට පත් වී ඇතැයි කියන නිගමනයට එක පැත්තකින් එළැඹිය නොහැකිය කියලා කියන්න පුළුවන්. අනෙක් පැත්තෙන් පොඩි ප්‍රශ්නයකුත් තිබෙන බව කියන්න ඕනෑ. ඒකට හේතුව මා කියන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය කාලයේ මේ ද්විතියික පාසල් සංකල්පය, පෝෂිත පාසල් සංකල්පය ගෙන ඒමේදී භූගෝලීය පසු බිම ඇතුළු හැම දෙයක්ම පරීක්ෂා කර බලා කටයුතු කළ යුතුව තිබුණා. මා දන්නා විධියට අමාත්‍යාංශ නිලධාරිනුත් එසේ කිරීමට උපදෙස් දුන්නා. හැබැයි, එක් එක් කෙනාගේ න්‍යාය පත්‍රවලට එහෙම නැත්නම් දේශපාලනඥයින්ගේ වුවමනාවට, "මේ ද්විතියික පාසල මෙතැනින් අයින් කරන්න ඕනෑ, මේ පෝෂිත පාසල මෙතැන තියන්න ඕනෑ" කියලා වැඩ කරන්න යාම තුළ දැන් මේක අවුල් ජාලයක් වෙලායි තිබෙන්නේ. ඒ නිසා තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ද්විතියික පාසල්, පෝෂිත පාසල් සම්බන්ධ ප්‍රශ්නය අවුල් වෙලා තිබෙන්නේ. මේ වන කොට මා සියලු පළාත් අධ්‍යාපන ලේකම්වරු, පළාත් අධ්‍යක්ෂවරු, කලාප අධ්‍යක්ෂවරු අපේ අමාත්‍යාංශයට කැඳවලා සියලුම අයට උපදෙස් දුන්නා, අමාත්‍යාංශයේ AC කාමරවල ඉඳගෙන තීරණ ගන්න එපා, ගිහිල්ලා ස්ථානීය පරීක්ෂණයක් කරන්න, ඒ ප්‍රදේශවල ඉන්න දෙමාපියන්, ගුරුවරුන්, විදුහල්පතිවරුන් මේ ඔක්කෝම එක්ක සාකච්ඡා කරලා අඩු පාඩු වෙලා තිබෙන ප්‍රදේශ ටික හඳුනා ගෙන ප්‍රතිව්‍යුහගත කිරීමක් - restructure - කරන්න කියලා. මොකද, පසු ගිය ආණ්ඩුව එක එක් කෙනාට ඕනෑ විධියට මේවා කරන්න ගිහිල්ලා තමයි මේ කටයුතු ඇන ගෙන තිබෙන්නේ. ඒ නිසා ඉතාම ඉක්මනින් ප්‍රතිව්‍යුහගත කිරීමක් කිරීමට උපදෙස් දීලා තිබෙනවා. අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ලිපියක් යවලාත් තිබෙනවා form එකක් සහිතව, මෙය ඉතා ඉක්මනින් ප්‍රතිව්‍යුහගත කරලා දැනුම් දෙන්නය කියලා. ඊළඟට - [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. මා කථා කරලා ඉවර වුණාට පස්සේ ඔබතුමා ප්‍රශ්නය අහන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පිළිතුරේ ඉතිරි ටික මා කියන්නම්. ද්විතියික පාසල් දහසක් වැඩි දියුණු කරන ලද්දේ ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල විවිධ භූගෝලීය සමාජීය, ආර්ථික සන්දර්භයන් තුළයි. යම් යම් ගැටලුකාරී තත්ත්වයන් මතු වී ඇත්නම් එවන් පාසල් සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කොට අදාළ ගැටලු විසඳීමට කටයුතු යොදා තිබෙනවා. තව දුරටත් ගැටලු පවතින පාසල් සම්බන්ධයෙන් සිදු කළ යුතු ප්‍රතිව්‍යුහගත කිරීම් හඳුනා ගෙන ඒවාට විසඳුම් ලබා දෙමින් ද්විතියික හා පෝෂිත පාසල් සහිත සමස්ත පාසල් ජාලය වඩාත් කාර්යක්ෂම හා ඵලදායි තත්ත්වයට ගෙන ඒම නව රජයේ ප්‍රතිපත්තිය වෙනවා. මෙම වැඩසටහන යටතේ තාක්ෂණික විද්‍යාගාර හා තාක්ෂණික විද්‍යාපීඨ ඉදි කිරීම හා උපකරණ සැපයීම ප්‍රමුඛ වශයෙන් සිදු වෙනවා. නමුත් නව රජයේ මෙම වැඩසටහන යටතේ මෙම පාසල්වල සමස්ත සංවර්ධනාත්මක කටයුතු සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කොට ඊට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගෙන තිබෙනවා.

ඊළඟට අහලා තිබෙනවා, මේ සම්බන්ධ ආණ්ඩුවේ දින සියයේ වැඩ පිළිවෙළ තුළින් ලැබෙන විසඳුම් මොනවාද කියලා. දැනටමත් අධ්‍යාපන අමාත්‍යාංශය පළාත් අධ්‍යාපන බලධාරින් සමඟ එක්ව ඒ වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් සමාලෝචනය කොට ස්ථානීය ගැටලු හඳුනා ගෙන මේ පාසල්වලට විසඳුම් ලබා දීමට කටයුතු යොදා තිබෙනවා. එසේම ද්විතියික පාසල් දහස යටතේ ඉදි කොට ඇති සියලුම විද්‍යාගාර වහාම සිසු අයිතියට පවරන්න කටයුතු කර තිබෙනවා. මේක තමයි අමාත්‍යාංශයේ පිළිතුර.

මෙහිදී චෝදනා ගණනාවක් එල්ල වුණා. මා අධ්‍යාපන අමාත්‍යාංශයේ වැඩ භාර ගන්න කොට දේශපාලන ලැයිස්තුවලින් ගුරුවරු පණස්දහසක් බඳවා ගන්න වැඩ කටයුතු කර තිබුණා. මේක අපි සම්පූර්ණයෙන් නැවැත්තුවා. විපක්ෂය දැන් කියනවා අපි අධ්‍යාපනය අතින් වැරදි තීරණ ගන්නවා කියලා. මටත් තිබුණා, අපේ දිස්ත්‍රික්කවලිනුත් දමාගෙන අපේ ඇමතිවරුනුත් සම්බන්ධ කරගෙන මේ කටයුත්ත කරන්න. නමුත් අපි ඒක නවත්වා තිබෙනවා සම්පූර්ණයෙන්. අපි ඉදිරියේදී ගුරුවරයකු වශයෙන් බඳවා ගන්නේ එක්කෝ උපාධිධාරියෙක්. නැත්නම් විද්‍යා පීඨයක, ගුරු විද්‍යාලයක හරියට පුහුණුවක් ලබාපු කෙනකු පමණයි. මේ පාපය කරන්න අපි ලැස්ති නැහැ.

අනවශ්‍ය විධියට මුදල් එකතු කිරීම නවත්වන්න අපි චක්‍රලේඛයක් ගෙනාවා. මගේ හිතවත් ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා කිව්වා වාගේ අපි ඒ චක්‍රලේඛය ගෙනාවා. ඒක ගෙනෙන්න හේතුව මොකක්ද? ඔබතුමන්ලා ඔක්කෝම දන්නවා, මේ රටේ පාසල්වලට ළමුන් ඇතුළත් කර ගැනීමේදී සල්ලි ගන්නා බව. ඔය චක්‍රලේඛ ඔක්කෝම තිබුණානේ. එක් කෙනකුවත් එයට විරුද්ධව පාරට බැස්සේ නැහැනේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජයේ පාසල්වල දරුවන්ගෙන් වසර ආරම්භයේදීත් මුදල් ගන්නවා; වසර මැදදීත් මුදල් ගන්නවා. කොළඹ එක්තරා ප්‍රධාන පෙළේ පාසලක, ශිෂ්‍ය ශිෂ්‍යාවන් හත්අට දහසක් ඉන්න පාසලක ඔබතුමන්ලා විශ්වාස කරන්න, එක අවුරුද්දකදී ලක්ෂ 1,200ක් 1,400ක් වැනි මුදලක් එකතු කරලා තිබෙනවා.

ජනවාරිවල රුපියල් 5,000ක් ගන්නවා; මාර්තුවල රුපියල් 3,000ක් ගන්නවා; ජූලිවල තවත් රුපියල් 6,000ක් ගන්නවා. ඒ විධියට රුපියල් කෝටි ගණන් දරුවන්ගෙන් එකතු කළා. මේ චක්‍රලේඛය මඟින් විදුහල්පතිවරුන්ට, පාසල් සංවර්ධන සමිතිවලට මුදල් එකතු කිරීම අපි පැහැදිලිවම තහනම් කර තිබෙනවා. ඒ වාගේම අප ඒ සඳහා අනුමැතිය දෙන අවස්ථාත් තිබෙනවා. මුදල් එකතු කිරීම එක පාරට සම්පූර්ණයෙන්ම නවත්වලා පාසල් පවත්වාගෙන යන්න බැහැ. පසු ගිය ආණ්ඩුවෙන් අධ්‍යාපනය සඳහා වෙන් කළ මුදල් ප්‍රමාණය එන්න එන්නම අඩු කළා. පසු ගිය රජය කාලයේ අධ්‍යාපනය සඳහා වෙන් කරපු මුදල් ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 1.8යි. අපේ අරමුණ වන්නේ පියවරෙන් පියවර එය සියයට 6ක් දක්වා ගෙන යන්නයි. ඒ නිසා අපි ඒ චක්‍රලේඛයේ පැහැදිලිව සඳහන් කර තිබෙනවා, මේ වසර අවසානයේ වැඩිපුර මුදල් දෙන තෙක්, රජයෙන් දෙන මුදල් ප්‍රමාණය ප්‍රමාණවත් නොවන විට ජාතික පාසලක් සඳහා යම් මුදලක් එකතු කරන්නේ නම් ඒ සඳහා රේඛීය අමාත්‍යාංශයේ තාක්ෂණික කමිටුවේ අනුමැතියත්, පළාත් සභාවලට අයත් පාසලක් නම් පළාත් ලේකම්වරයාගේ අනුමැතියත් ගත යුතුයි කියලා. අපි ඒ කමිටු ටික හරියට හදලා තිබෙනවා. ජාතික පාසලක විදුහල්පතිවරයෙක් ආවොත් එක දවසකින් එය අනුමත කරවා ගෙන යන්න පුළුවන්, මෙන්න මේ මේ කටයුතු සඳහා මුදල් එකතු කරනවාය කියලා. එතකොට අපි බලනවා, ඒක සාධාරණද කියලා. චීන මහා ප්‍රාකාරය වාගේ තාප්පයක් හදන්න හෝ වෙනත් අනවශ්‍ය දෙයක් සඳහා දරුවන්ගෙන් සල්ලි එකතු කරන්න බැහැ. අත්‍යවශ්‍ය දේවල් සඳහා පමණක් අපි ඒ කටයුත්ත කරන්න ඉඩ දීලා තිබෙනවා.

දැන් මේක එක එක විධියට අර්ථ කථනය කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාසල්වල පහසුකම් ගාස්තු සඳහා අය කරන රුපියල් 80ක් වැනි පොඩි මුදල හෝ තමන්ගේ දරුවන් වෙනුවෙන් ගෙවා ගන්න බැරි යම් දෙමවුපියෙකු සිටී නම්, ඒ අයගේ ආදායම් මට්ටම පිළිබඳව ප්‍රදේශයේ ග්‍රාම සේවා නිලධාරිවරයා සහතික කළොත් ඒ දෙමවුපියන්ගෙන් සත පහක්වත් අය කරන්න බැහැ කියා ඒ චක්‍රලේඛයේ පැහැදිලිව සඳහන් කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ඒ දරුවා මානසිකව යම්කිසි පීඩාවකට හෝ අවමානයකට ලක් කරන්න බැහැ

කියලාත් ඒ චක්‍රලේඛයේ සඳහන් කර තිබෙනවා. එය ඉතා ශක්තිමත් චක්‍ර ලේඛයක්. මේක නිසා පසු ගිය කාලයේදී හිතුමතේට ඉවක් බවක් නැතිව අවිධිමත්ව කරපු එකතු කිරීම් නතර වෙලා තිබෙනවා.

මා අමාත්‍ය තනතුර භාර ගනිද්දී අධ්‍යාපන අමාත්‍යාංශයේ විමර්ශන ඒකකයේ නිලධාරීන් 6 දෙනායි හිටියේ. අපි ඒ සංඛ්‍යාව 50 දක්වා වැඩි කර තිබෙනවා. වාහන දීලා තිබෙනවා; වෙනත් පහසුකම් ලබා දීලා තිබෙනවා. ඕනෑම අමාත්‍යාංශයක විමර්ශන ඒකකය ක්‍රියාත්මක නැත්නම්, විමර්ශන හරියාකාරව සිදු වන්නේ නැත්නම්, අනෙක් දේවල් බලාපොරොත්තු වන්න බැහැ.

පසු ගිය කාලයේ දී මේ රටේ දූෂිතම ආයතනය ලෙසට අධ්‍යාපන අමාත්‍යාංශය ගැන තමයි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට වැඩියෙන්ම පැමිණිලි ආවේ. ඊට කලින් පොලීසිය තමයි ඒ තැන අරගෙන තිබුණේ. ඇයි එහෙම වුණේ? විනයක් ක්‍රියාත්මක වුණේ නැති නිසායි. මැරිලා ඉපදුණා වාගේ දැන් මෙතුමන්ලා කථා කරනවා. අපි විපක්ෂයේ සිටියදීත් අවුරුදු 10ක්, 12ක් මේ ගැන කථා කර තිබෙනවා. අපට මේ රටේ අධ්‍යාපනය විනාශ කරන්න ඉඩ දෙන්න බැහැ. ඒ නිසා තමයි මේ චක්‍රලේඛය නිකුත් කළේ.

ඊළඟට, ගණිතය විෂය සම්බන්ධයෙනුත් කියන්න ඕනෑ. පසු ගිය කාලයේ දී බන්දුල ගුණවර්ධන හිටපු ඇමතිතුමා මේ සම්බන්ධව යමක් කියා තිබුණා. මා පෞද්ගලිකව එතුමා එක්ක වෛරී දේශපාලනයක් කරන්නේ නැහැ. පුද්ගලයකු විධියට මා එතුමාට ගරු කරනවා. එතුමා පත් කරපු සමහර නිලධාරීන් තමයි මගේ පෞද්ගලික මාධ්‍ය ඒකකයේ තවමත් සිටින්නේ. තවමත් එතුමා පත් කරපු cameraman ඉන්නවා, වීඩියෝ කරන තැනැත්තා ඉන්නවා. මම ඒ ගොල්ලන්ව මාරු කළේ නැහැ. ඒ ගොල්ලන් දක්ෂයෝ කියලා මම හිතනවා. වෛරී දේශපාලනයක් කරනවා නම් එතුමා පත් කරපු නිලධාරීන් set එකම මම අයින් කරන්න එපා යැ. ඒ නිලධාරීන්ව මට පෞද්ගලිකව පත් කර ගන්න පුළුවන්නේ. මා එහෙම කරලා නැහැ. යහ පාලනය පිළිබඳ හොඳම උදාහරණය ඔන්න. අපි හැසිරෙන හැටි එහෙමයි. අපට පුද්ගලයන් පිළිබඳව ප්‍රශ්නයක් නැහැ. එහෙම නැත්නම් වෙන ප්‍රශ්නයකුත් නැහැ. මේ රටේ අධ්‍යාපනය හදන්නයි අපට ඕනෑ. ඒ අධ්‍යාපන ක්‍රමය තුළින් තමයි අපිත් ඉස්සරහට ආවේ. ඒ නිසා මේ අධ්‍යාපන ක්‍රමය නංවන්න අපටත් යුතුකමක් තිබෙනවා.

හිටපු අමාත්‍යවරයා පහුගිය කාලයේ දී කියා තිබුණා, A/L කරන්න ගණිතය විෂයය සමත් වෙන්න අවශ්‍ය නැහැ කියලා. ඊළඟට මම ඇවිල්ලා මේ චක්‍රලේඛ සියල්ලම අරගෙන බැලුවාම, මේ චක්‍ර ලේඛ එකකට එකක් පටහැනියි කියලා මට පෙනී ගියා. සමහර නිලධාරීන් ඒ ගැන දන්නෙත් නැහැ. නිලධාරීන්ටත් ඒ ප්‍රශ්නය තිබුණා. සමහර නිලධාරීන්ම මට කියා තිබෙනවා, එහි අවුලක් තිබුණා, ඒ දේශපාලනඥයාගේ බලපෑම මත එහෙම කරන්නට සිදු වුණා කියලා. එම චක්‍රලේඛයේ කියා තිබෙන්නේ, "දෙවරකට නොවැඩි වාර ගණනක දී ගණිතය විෂය සමත් විය යුතුයි" කියලායි. එහෙම තමයි චක්‍ර ලේඛයේ තිබෙන්නේ. ගණිතය සමත් වෙන්න ඕනෑ නැහැ කියලා කිව්වාට චක්‍ර ලේඛයේ එහෙම කියලා නැහැ. ඊට පසුව මොකද වුණේ? මේ වනකොටත් සමහර දරුවන් ගණිතය විෂය සමත් වෙලා නැතිවත් A/L කරන්න පටන් ගෙන තිබෙනවා. මට දැන් ඒ දරුවන් අමාරුවේ දමන්න පුළුවන්ද? ඊට පසුව අපි දැන් ඒ සම්බන්ධයෙන් යම් ක්‍රියා මාර්ගයක් ගත්තොත් මොකක්ද වෙන්නේ? ඒක අපි ඒ දරුවන්ට කරන අවමානයක් වෙනවා. චක්‍ර ලේඛ ප්‍රකාරව තමයි අපි කථා කරන්න ඕනෑ. ඊට පසුව විභාග කොමසාරිස්වරයාත් සමඟ කථා කරලා අපි තීරණයක් ගත්තා. මම අදත් ඒ පිළිබඳව සාකච්ඡා කළා. පසුගිය තීරණය අනුව මේ අවුරුදු දෙක ඒ විධියටම කරගෙන යන්න දෙනවාය කියලා අපි පැහැදිලි තීරණයක් ගත්තා. මේ වසරේ අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ ප්‍රතිඵල ලැබුණාට පසුව අපි ඒ චක්‍ර ලේඛය වෙනස් කරනවා. සමහර විෂයන් හැදෑරීම සඳහා ගණිතය විෂය අවශ්‍ය වෙනවා. එහි තිබෙන අන්දමට කලා විෂය ධාරාව සඳහා ගණිතය විෂය අවශ්‍ය නැහැ; තාක්ෂණික විෂය ධාරාව සඳහා ගණිතය විෂය අවශ්‍ය නැහැ; සෞන්දර්ය විෂය ධාරාව සඳහා ගණිතය විෂය අවශ්‍ය නැහැ. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි කලා විෂය ධාරාව යටතේ ආර්ථික විද්‍යාව තිබෙනවා, තර්ක ශාස්ත්‍රය තිබෙනවා.

ගණිතය නැතුව ඒ විෂයන් හදාරන්නේ කොහොමද? කලා විෂය ධාරාව හැදෑරූ අය තමයි මේ රටේ අමාත්‍යාංශවල රාජ්‍ය පරිපාලන නිලධාරීන් විධියට කටයුතු කරන්නේ. SLAS සමත් නිලධාරීන් තමයි අමාත්‍යාංශයේ මූල්‍ය කටයුතු පිළිබඳව ප්‍රධානියා වශයෙන් කටයුතු කරන්නේ. ඒ වාගේම අධ්‍යාපන පරිපාලන සේවයේ SLEAS සමත් නිලධාරීන් කටයුතු කරනවා. එතකොට අධ්‍යාපන පරිපාලන සේවය සඳහා ගණිතය සමත් නොවුණු අය ගියොත් මොකද වෙන්නේ? නීතිඥවරයකු වෙන්න නම් කලා විෂය ධාරාව හදාරලා එතැනින් පසුව නීතිය හදාරනවා. නීතිඥයකු වශයෙන් අඩුම තරමේ ගණිතය විෂයට "S" පාස් එකක්වත් නැතුව යැව්වොත් මොකක්ද වෙන්නේ? හිතෙන හිතෙන විධියට අධ්‍යාපනය වෙනුවෙන් කාගේවත් චින්තන ක්‍රියාත්මක කරන්න අපි ලැහැස්ති නැහැ. අධ්‍යාපනඥයන් ඉන්නවා, ළමා මනෝ විද්‍යාඥයන් ඉන්නවා, මේ විෂය පිළිබඳව හසළ දැනුමක් තිබෙන අය ඉන්නවා, ගුරුවරුන්, විදුහල්පතිවරුන් ඉන්නවා. මේ ඔක්කෝම එක්ක සාකච්ඡා කරලායි අපි තීරණ ගත යුත්තේ. අපි වැරදි තීරණයක් ගත්තොත් මේ රටේ ලක්ෂ හතළිහක් පමණ වන පාසල් දරුවන්ගේ අනාගතයයි නැති වෙන්නේ. අපි වැරැදි ගොඩක් මැද ඉඳගෙන මේවා හදනකොට මේ වැරැදි හොඳින් පෙනෙනවා.

ඒ වාගේම තමයි තාක්ෂණික විද්‍යාගාර ඇති කිරීම. අපි තාක්ෂණික විෂය ධාරාව දිගටම කරගෙන යනවා. මේ අමාත්‍යාංශයේ නිලධාරීන්ගෙන් අහලා බලන්න, මම අමාත්‍යාංශයට ආපු ගමන් කිව්වේ මෙය හොඳ වැඩක් කියලායි. අපි මේක දිගටම කරගෙන යනවා, අඩු පාඩුවක් වෙන්න දෙන්නේ නැහැ කියලයි මම කිව්වේ. ඒ සඳහා සල්ලිත් වෙන් කරනවා. ඒකේ ප්‍රශ්නයක් නැහැ. හැබැයි, තාක්ෂණික විද්‍යාගාරවල ගොඩනැඟිලි හදපු ආකාරය ගැන නම් ප්‍රශ්න තිබෙනවා. ඒවා සම්බන්ධව කිසිම ටෙන්ඩර් පරිපාටියක් නැහැ. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ නියෝග මත තමයි ඒවා ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ. සමහර ඒවා හදලා තිබෙනවා, නමුත් ඒවාට ගිය වියදම වාගේ තුන් ගුණයක වියදමක් ඇතුළත් කර තිබෙනවා. ඒ වාගේ ප්‍රශ්න තිබෙනවා. ඒ වාගේම සොරකම් සිදු වෙලා තිබෙනවා. සමහර විට බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා ඒ සම්බන්ධව දන්නේත් නැතිව ඇති. නමුත් අපට ඒ ගැන කථා කරන්න අයිතියක් තිබෙනවානේ. එම නිසා සැකයක් තබා ගන්න එපා. දේශපාලනය හෝ වෙනත් කිසිම හේතුවක් මත අබ මල් රේණුවකවත් වැරදි තීන්දුවක් ගන්නේ නැහැ. [බාධා කිරීමක්] ගරු එස්.සී. මුතුකුමාරණ මන්ත්‍රීතුමනි, මුලින් ඔබතුමාගේ කථාව මා අහගෙන සිටියා නේ. දැන් මා දෙන උත්තරය අහගන්න.

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේගේ කථාවේ මට ගැටලුවක් තිබෙනවා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මොකක්ද?

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
තමුන්නාන්සේ කිව්වා, ගණිතය විෂය සම්බන්ධ චක්‍රලේඛය අයින් කරනවා කියලා. මෙතෙක් කාලයක් ගණිතය අසමත් ළමයෙකුට උසස් පෙළ විභාගයට ලියන්න ඉඩ දුන්නේ, ඒ ළමයා අවුරුදු දෙක ඇතුළත ගණිතය විෂය සමත් වුණොත් පමණයි. ඒකත් ඔබතුමා අයින් කරනවාද?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මොකක්ද?

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
උසස් පෙළ ලියන්න ගණිතය අනිවාර්යයි.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මම අයින් කරලා නැහැ, ගරු මන්ත්‍රීතුමනි. මම නොවෙයි අයින් කළේ. ඔබතුමන්ලාගේ හිටපු ඇමතිතුමා තමයි ගණිතය විෂය අයින් කරලා තිබෙන්නේ. අහලා බලන්න කෝ. A/L කිරීමට ගණිතය අවශ්‍ය නැත කියලා හිටපු ඇමතිතුමා කියලා තිබෙනවා. මම එහෙම කිව්වේ නැහැ. එහෙම කරනවාට මම කැමැති නැහැ. මම විපක්ෂයේ සිටිද්දී කිව්වේත් ඒකයි. ගණිතය ඕනෑ කරන විෂයන් තිබෙනවා. මම කියන්නේ හැම විෂයටම නොවෙයි. සංගීතයට, කලාවට, නර්තනයට ගණිතය විෂය අවශ්‍ය වන්නේ නැහැ.

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
ගරු ඇමතිතුමනි, මම අහන්නේ මේකයි. සාමාන්‍ය පෙළ විභාගයෙන් පසුව උසස් පෙළ ලියනකොට ගණිතය විෂය අනිවාර්යයෙන් අවශ්‍යයි. එතකොට අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ දී ගණිතය සමත් නොවුණු ළමයෙක් උසස් පෙළ ඉගෙන ගන්නවා, ඊළඟ වාරයේ දී සාමාන්‍ය පෙළ විභාගයේ ගණිතය pass කර ගන්නා තෙක්. ඒ අවස්ථාව නැති කරලාද තිබෙන්නේ?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
චක්‍රලේඛයේ තිබෙන්නේ දෙවතාවකට නොඅඩු වාර ගණනකදී සමත් විය යුතුයි කියලායි. හැබැයි, ඒ චක්‍රලේඛයම නැවත උල්ලංඝනය වෙනවා, දෙවැනි වතාවේ දී ගණිතය කරන්න ඉස්සෙල්ලා උසස් පෙළ register වෙන්න ඕනෑය කියන එක මත. එතැනදීත් චක්‍රලේඛය උල්ලංඝනය වෙනවා. මමත් නීතිඥයෙක් නේ. මේ චක්‍රලේඛ සෙල්ලම මට තේරෙනවා. මේ සියල්ලම මම කියවලායි තිබෙන්නේ. හැබැයි, මේ එකකට එකක් පටහැනියි. ඔබතුමන්ලා වෙලාවක ඇවිල්ලා බලන්න. අපි අධ්‍යාපනය සමඟ සෙල්ලම් කරන්න ලැහැස්ති නැහැ. ඔබතුමා බලාගෙන ඉන්න. මේ සම්බන්ධව පවතින හැම දෙයක්ම විනිවිදව පෙනෙන අයුරින් අපි කටයුතු කරනවා.

විද්‍යාගාරවලට දමා තිබෙන නම් පිළිබඳවත් මට තව චෝදනාවක් එල්ල කළා. අනේ අපට නම්වල ප්‍රශ්නයක් නැහැ. අපි ඇවිල්ලා කිව්වේ, මෙතැනින් ඉදිරියට කටයුතු කරන ආකාරය ගැනයි. මම මෙම අමාත්‍යාංශයේ වැඩ භාර ගත්තාට පසුව, මහින්ද රාජපක්ෂ විද්‍යාල හතක් නැවත නම් කරන්න මගේ අත්සනට ආවා. ඒ පරණ නම් දමපු ඒවා. මම ඒවාට අත්සන් කළේ නැහැ. හිටපු ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ඒ තරම් සේවයක් කරලාත් එතුමාගේ නමින් තිබෙන්නේ එකම එක විද්‍යාලයයි. ඒ දුම්මලසූරිය ජේ.ආර්. ජයවර්ධන විද්‍යාලය. ඒ වාගේම කන්නන්ගර මැතිතුමාගේ නම වෙන්න පුළුවන්, මේ විධියට දේශපාලනඥයන්ගේ නම් පාසල්වලට විතරක් නොවෙයි, විද්‍යාගාරවලටත් දමා ගෙන, දමා ගෙන ගියොත් මොකද වෙන්නේ? පාඩුව අපට නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි නේ මෙතැන් සිට බලයේ ඉන්නේ. අපි පරණ නම් මොනවත් අයින් කළේ නැහැ. මින් ඉදිරියට අපි නම් දමන්නේත් නැහැ. අපි විවෘත කරන ඒවාට නම් දමන්නේත් නැහැ. අපි හදන ඒවාට නම් දමන්නේත් නැහැ. කාගේ හෝ නමක් දමන්න ඕනෑ නම් අපි ඒ නම දැමිය යුතුද, සුදුසුද කියන ඒ සියලු කාරණා තෝරා බේරාගෙන, ඒ සඳහා විශේෂ අනුමැතිය ලබාගෙන ඒ නම් දමන්න ඉඩ දෙනවා. අනාගතයේ දී අනුරාධපුර දිස්ත්‍රික්කයේ පාසලකට ගරු එස්.සී. මුතුකුමාරණ මන්ත්‍රීතුමාගේ නම දමන්න සුදුසු නම්, අපි එතුමාගේ සුදුසුතාව මත එතුමා අධ්‍යාපනයට කොපමණ සේවයක් කර තිබෙනවාද යන්න සොයා බලා එසේ නම දමන්න බලාපොරොත්තු වෙනවා. එම නිසා මේක වැරැදියට තේරුම් ගන්න එපා. අපි තුට්ටු දෙකේ දේශපාලනයක් කරනවා නොවෙයි. කාගේවත් නම්වල ප්‍රශ්නයක් නොවෙයි. එහෙම නම් හිටපු අමාත්‍ය බන්දුල ගුණවර්ධන මැතිතුමාගේ සේවකයන් මගේ කාර්ය මණ්ඩලයේ ඉන්න බැහැනේ. අපේ යහ පාලනය එහෙමයි. එම නිසා මේ පිළිබඳව තේරුම් ගන්න.

ඊළඟට, පාසල්වලට ළමුන් ඇතුළත් කර ගැනීම සම්බන්ධව බලන්න. ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මැතිතුමාත් ළමුන් ඇතුළත් කර ගැනීමේ ප්‍රශ්නයක් ගැන මට කිව්වා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇතුළත් කර තිබෙන ළමයින්ගේ ලැයිස්තු ටික මම පෙන්වන්නම්. කොළඹ ප්‍රධාන පාසල්වලට ඔක්කොම ළමයි ගිහින් තිබෙන්නේ එක්කෝ කාල්ටන් පෙර පාසලෙන්, නැත්නම් ජනාධිපති මන්දිරයෙන් එවපු ලැයිස්තු තුනකින්, නැත්නම් මහ ඇමතිවරුන්ගේ ලැයිස්තුවලින් සහ දේශපාලනඥයන්ගේ ලැයිස්තුවලින්. ප්‍රධාන පාසල්වලට අහිංසක දෙමවුපියන්ගේ දරුවන් ගිහින් තිබෙන්නේ ටික දෙනායි. මේවා ඔක්කෝම වහ ගෙන හිටියා. මටත් කියන්නේ - [බාධා කිරීමක්]

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
මේ කියන්නේ අමූලික බොරු.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු මන්ත්‍රීතුමා, මම නිකම් ආවාට ගියාට කියනවා නොවෙයි. කරුණු හොයලා බලලා, ඒවා අවබෝධ කර ගෙනයි මම මේ කියන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශපාලනයෙන් ළමයින් ඇතුළත් කර- [බාධා කිරීමක්] අහ ගන්න, අහ ගන්න. කලබල වෙන්න එපා. වාඩි වෙන්න. [බාධා කිරීමක්] ඔබතුමා දැම්මේ නැහැ. බන්දුල ඇමතිතුමා දැම්මෙත් නැහැ. ඒක හරි. [බාධා කිරීමක්] ඔබතුමා දැම්මෙත් නැහැ. හැබැයි, පිරිසක් එකතු වෙලා ළමයි ටික දමා ගත්තා. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, කරුණාකරලා වාඩි වෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අපි දේශපාලනඥයන්ගේ ලැයිස්තුවලින් පාසල්වලට ළමයින් ඇතුළත් කර ගන්නේ නැහැ. එතකොට අපිට නේ පාඩු. බලයේ ඉන්නේ අපි නේ. දැන් මහ ඇමතිවරු එක පන්තියකට ළමයින් පහළොස් දෙනෙක් දාලා තිබෙනවා. පාසලක පන්ති හයක් තිබුණොත් ඒ වාගේ හය ගුණයක් දමා තිබෙනවා. එහෙම තමයි ළමයින් ඇතුළත් කළේ. අපි

මේවා නැවැත්තුවොත් පාඩුව අපට නේ. ඇයි, දැන් මේ සීමා කරන්නේ? එක එක විධියට ඇතුළත් කරලා එක පන්තියක ළමයින් 50ක් හෝ 60ක් ඉන්නවා.

බලන්න ඉස්සර ගම්වල දරුවන්ට පහේ ශිෂ්‍යත්ව විභාගය පාස් වුණාම කොළඹ ප්‍රධාන පාසල්වලට, නැත්නම් නගරවල ප්‍රධාන පාසල්වලට එන්න පුළුවන්කම තිබුණා. අද කොහොමද? අද එක, දෙක, තුන, හතර ශ්‍රේණිවලට ළමයි පුරවලා. ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 190ක් ගත්තත් යන්න බැහැ. 180ක් ගත්තත් යන්න බැහැ. පාසල්වල ඉඩ තිබුණාම ගම්වල ඉන්න දක්ෂයන්ට හොඳ පාසල්වලට ඇවිල්ලා අනාගතය හදා ගන්න පුළුවන්කම තිබුණා. අද ගමේ දක්ෂයෝ ගමටම සීමා වෙලා විනාශ වෙනවා. අපි මේ හැම තීරණයක්ම විනිවිද පෙනෙන ආකාරයටයි අරගෙන තිබෙන්නේ. ඉතාම හොඳ තීරණ. අපි කාලයක් තිස්සේ අධ්‍යාපන ක්ෂේත්‍රය ගැන අධ්‍යයනය කරමින් ගත්ත තීරණ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හෝමාගම පැත්තේ එක විද්‍යාලයක් තිබෙනවා, එහි සමාන්තර පන්ති 17ක් තිබෙනවා. මම ඒ විද්‍යාලයට කිසි විටෙකත් අගෞරවයක් කරන්නේ නැහැ. කොළඹ තිබෙන සමහර පාසල්වල සාමාන්තර පන්ති 15ක් තිබෙනවා. ඔය කියන විධියට මෙහෙම ළමයින් ඇතුළත් කරන්න ගියොත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමාන්තර පන්ති 20ක්, 25ක් හදන්න වේවි. එතකොට වටේ තිබෙන අනෙක් පාසල් වැහෙනවා. අපේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය කොටසකට විතරක් සම්පත් දීලා, කොටසක් විතරක් දියුණු කරන එක නොවෙයි. අපට අවශ්‍ය සියලුම පාසල් දියුණු කරන්නයි; හැම පාසලකටම සම්පත් දෙන්නයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය කාලයේ මෙච්චර දේවල් කළා කියලා මෙතුමන්ලා මහ ලොකුවට කථා කරනවා. මා ළඟ තිබෙනවා පාසල්වල තිබෙන අඩු පාඩු පිළිබඳ විස්තර. මම කියන්නම් අපේ පාසල්වල තත්ත්වය මොකක්ද කියලා. අපේ රටේ පාසල් 10,000ක් තිබෙනවා. ඒවායින් 781කට විදුලි බලය නැහැ. 1,535කට පිරිසිදු වතුර ටිකක් නැහැ දරුවන්ට බොන්න. ඒ වාගේම සාමාන්‍ය පෙළ පන්තිවලට අවශ්‍ය lab එකක් නැති, බීකරයක් නැති, අඩුම ගණනේ test tube එකක් දැකලා නැති පාසල් තිබෙනවා 3,892ක්. ඒ වාගේම වැසිකිළියක් නොමැති පාසල් තිබෙනවා පන්සිය ගණනක්. මේවා මම කියන ඒවා නොවෙයි. මම බොරු කියනවා ද කියලා ඕනෑ නම් අමාත්‍යාංශයෙන් හොයලා බලන්න. එක වැසිකිළියක් තිබෙන පාසල් දෙදහස් ගණනක් තිබෙනවා. ඒ ළමයින්ට එක වැසිකිළියක් ප්‍රමාණවත්ද? මෙන්න තත්ත්වය. අපට ඕනෑකම තිබෙන්නේ ඉතාම ඉක්මනින් මූලික අවශ්‍යතා ටික දෙන්නයි. ඊට පස්සේ ගුණාත්මක අධ්‍යාපනය දියුණු කරන්න අවශ්‍ය පියවර ගන්න ඕනෑ.

අද ගුරුවරු කොච්චර හිඟද? මෙච්චර කල් බැලුවාද ගුරුවරුන්ගේ හිඟය පිළිබඳව? අද අතිරික්ත ගුරුවරු 10,000කට වඩා ඉන්නවා. හැබැයි, ගණිතය, ඉංග්‍රීසි, විද්‍යාව කියන විෂයයන්වලට ගුරුවරු නැහැ. මේ වන කොට මම උපදෙස් දීලා තිබෙනවා, ඒ ඒ ප්‍රදේශ අනුව ඒ ඒ විෂයයන්ට හිඟ ගුරුවරු පිළිබඳව වහාම සමීක්ෂණයක් කරන්න කියලා. ඊට පස්සේ අපි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පදනම් කර ගෙන බඳවා ගැනීම් කරනවා. නැත්නම් මොකක්ද වෙන්නේ? ජාතික මට්ටමෙන් ගත්තාම, පළාත් මට්ටමෙන් ගත්තාම ගත්ත දවසේ ඉඳලා මාරුවීම් ඉල්ලනවා. එතකොට ගුරුවරු නැහැ. අන්තිමට මොකද වෙන්නේ? දුර ඉඳන් එන නිසා ඒ ගුරුවරුන්ගේ මනස නිරවුල් නැහැ. මානසික ශක්තියක් නැහැ. නිරවුල් මනසින් උගන්වන්න පුළුවන්කමක් නැහැ. දැන් අපි කලාපයක් ඉලක්ක කර ගෙන හැම විෂයයටම එක්කෙනා ගණනේ ගුරු සංචිතයක් ඇති කරනවා. අපි කියමු එක ගුරුවරියක් ප්‍රසූත නිවාඩු ගියා කියලා. ඒ වෙනුවට අර සංචිතයෙන් ගුරුවරයෙක් දාන්න පුළුවන්. එතකොට කොයි වෙලාවකවත් dearth එකක් නැහැ. එතකොට කොයි වෙලාවකවත් ගුරුවරයෙක් නැති වෙන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා ගැන අපට දවස් ගණන් කථා කරන්න පුළුවන්.

තව චෝදනාවක් කළා, පාසලක් නොලැබීම ගැන. බොහෝ විට පාසල් නැතුව ඉන්නේ ප්‍රධාන පාසල් ඉල්ලන අයයි. මේ ඔක්කොටම හොඳයි කියන ජනප්‍රිය ප්‍රධාන පාසල් දෙන්න බැහැ. ඒ නිසායි පාසල් නැතිව ඉන්නේ. ඒ ජනප්‍රිය පාසල් මතම යැපිලා ඉන්න අයට පාසලක් නැහැ තමයි. ඕනෑ තරම් පාසල් තිබෙනවා. ඉල්ලන්නේම ප්‍රධාන පෙළේ පාසල්. ඉතින් ඒ අයට පාසලක් නැහැ. හැබැයි, කලාප අධ්‍යක්ෂකවරයා හමු වෙලා අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කළොත් අනිවාර්යයෙන්ම අප බැඳිලා ඉන්නවා පාසලක් ලබා දෙන්න. ඒ ගැන කිසිම සැකයක් තියා ගන්න එපා. ඉල්ලන හොඳ පාසලම දෙන්න බැරි වෙයි. ඒක තමයි වෙන්නේ. වෙන ගැටලුවක් නැහැ. කොයි වෙලාවකවත් අපි පාසලක් නොදී ඉන්නේ නැහැ. අපි බලයට ඇවිල්ලා හොඳ තීන්දු තීරණ ගත්තා. ඒ ගැන වපර ඇඟින් බලන්න එපා. අධ්‍යාපනය හදනවා නම් අපි හදමු, විනාශ කරනවා නම් ඔක්කොම එකතු වෙලා විනාශ කරමු. මම මේ උඩුගම් බලා පීනන්නේ. මෙය ලෙහෙසි වැඩක් නොවෙයි. මෙතැන මාපියාවක් තිබෙන්නේ. කාලයක් තිස්සේ ගොඩ නැගුණු එක එක දේවල් මෙතැන තිබෙන්නේ. මෙය ලෙහෙසි වැඩක් නොවෙයි. නමුත් අපි බැඳිලා ඉන්නවා, අපට යුතුකමක් තිබෙනවා අධ්‍යාපනය හදන්න. මේ සැරේත් ඒක කරන්න බැරි වුණොත් ආයෙත් කරන්න බැහැ,

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ආකාරයෙන් වැඩ කරගෙන යන්න මට ජනාධිපතිතුමාවත්, අගමැතිතුමාවත් බලපෑමක් කළේ නැහැ. අපට ස්වාධීනව තීරණ අරගෙන මේ වැඩ කටයුතු කරන්න අවස්ථාව ලබා දීලා තිබෙනවා. ඉස්සර නම් අරයා ඇඟිලි ගැහුවා, මෙයා ඇඟිලි ගැහුවා. දැන් එහෙම නැහැ. ගරු රාජිත සේනාරත්න ඇමතිතුමා දන්නවා, අපි ගන්න හැම තීරණයක්ම හොඳට හිතලා බලලා තමයි ගන්නේ කියලා. තරුණ මන්ත්‍රීවරයෙක් වුණු පළියට ආවාට ගියාට තීරණ ගන්නේ නැහැ. පසු ගිය දශක කිහිපය තුළම මම දැක්කා මුහුකුරා ගිය අය අරගෙන තිබෙන පියවර මොනවාද කියලා. පසු ගිය කාලයේ අධ්‍යාපනයට හොඳ ඇමතිවරු සිටියා කියලා මම කියනවා. සමහර ඇමතිවරු හොඳ චේතනාවෙන් වැඩ කළා. පසු ගිය කාලයේ වැරැදි තීන්දු තීරණ ගත් නිසා අධ්‍යාපනය විශාල වශයෙන් ආපස්සට යෑමක් සිදු වුණා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ගුරුවරු පුහුණු කරන්න ඕනෑ. ඒ වාගේම අවශ්‍ය ගුරුවරුන් බඳවා ගන්න ඕනෑ. විදුහල්පති තනතුරට හොඳ ශ්‍රේණිධාරීන් ඉන්දෙද්දි, දේශපාලන පදනම මත බඳවා ගත්තා. අපි ඉදිරියේදී කිසිම විදුහල්පතිවරයෙක් ඒ ආකාරයෙන් බඳවා ගන්නේ නැහැ. කැබිනට් පත්‍රිකා එකක්වත් දමන්නේ නැහැ. ඔහොම නොවෙයි, එක එක්කෙනාගේ හිතවත්කම් මත එක්කෙනෙක්වත් අපි දමන්නේ නැහැ. විදුහල්පති ශ්‍රේණිධාරීන් ඉන්නවා, අධ්‍යාපන පරිපාලන සේවයේ අය ඉන්නවා. ඒ අයගෙන් තමයි අපි විදුහල්පතිවරුන් බඳවා ගන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ හැම එකක් සම්බන්ධවම ඕනෑම විධියකින් අපෙන් ප්‍රශ්න කරන්න. අප සතුටු වෙනවා අපේ ගරු මන්ත්‍රීතුමා මේ සම්බන්ධයෙන් යෝජනාවක් ගෙන ඒම ගැන. ද්විතීයික පාසල් සංකල්පය අපි හදපු එකක් නොවෙයි. ඒක පසු ගිය කාලයේ ගත්ත වැරැදි තීන්දු තීරණ මත හදපු සංකල්පයක්. දැන් අපි ඒවා ප්‍රතිව්‍යුහගත කරන්නයි යන්නේ.

තාක්ෂණික විද්‍යාගාර පහසුකම් ලබා දීම හොඳ වැඩ පිළිවෙළක්. එය දිගටම ක්‍රියාත්මක කරනවා. මේවා සඳහා මුදල් වැඩියෙන් වෙන් කරනවා. පාසල්වල නම් පිළිබඳව ගැටලුවක් තියා ගන්න එපා. අපේ ගරු මන්ත්‍රීතුමාට සාධාරණ පිළිතුරක් ලැබුණා කියලා මම හිතනවා. ඕනෑ දෙයක් තිබෙනවා නම් අපෙන් අහන්න. අප ඕනෑම වෙලාවක උත්තර දෙන්න ලෑස්තියි. මොකද අප වැඩ කරන්නේ විනිවිද පෙනෙන විධියටයි. පසු ගිය කාලයේ ඇමතිවරු අමාත්‍යාංශවල මහජන දින දුන්නාද? මම පසු ගිය කාලයේම මහජන දින දුන්නා අභියාචනා ඉදිරිපත් කරන්න. අභියාචනා දහස් ගණනක් ඇවිල්ලා තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ නිවාඩු දිනවලත් -සෙනසුරාදා, ඉරිදා දිනවලත්- නිලධාරීන් කාර්යාලයට ඇවිල්ලා අභියාචනා එකින් එක එකින් එක බලනවා. වැඩි ලකුණු තියෙද්දි -

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, දැන් අවසන් කරන්න.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
අවසන් කරනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

වැඩි ලකුණු තිබෙද්දි අසාධාරණයක් සිදු වෙලා තිබෙනවා නම් ඒ අයට සාධාරණය ඉෂ්ට කරමින් පවතිනවා. වෘත්තීය සමිතිවලට අවුරුදු පහකින්වත් දිනයක් දීලා තිබුණේ නැහැ. මම අධ්‍යාපන අමාත්‍යාංශය භාර ගත් ගමන් වෘත්තීය සමිතිවලට කිව්වා, ප්‍රශ්න තිබෙනවා නම් කියන්න කියලා. මොකද අපි නිවැරැදි මාර්ගයේ යනවා නම්, වෘත්තීය සමිතිවල සාමාජිකයෝ හමු වෙන්න බැරිකමක් නැහැ. වෘත්තීය සමිතිවල අදහස් අරගෙන අපි සමහර ඒවා ක්‍රියාත්මක කළා. මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, එක එක කැලි අල්ලා ගෙන දේශපාලන වාසි ගන්න අධ්‍යාපනයට හානි කරන්න එපා කියලා. අපි විපක්ෂයේ ඉන්නකොටත් හැම විටම අධ්‍යාපනයේ ගුණාත්මක බව ආරක්ෂා කරන්න කටයුතු කළා. ලක්ෂ හතළිහක් පමණ මේ රටේ අධ්‍යාපනය ලබන දරුවන්ගේ අනාගතය වෙනුවෙන් අපි මේ වන විට ගෝලීය අවශ්‍යතා මත විෂයමාලාව වෙනස් කරන්න අවශ්‍ය පියවර ගනිමින් යනවා. අප ඉදිරි අවුරුදු කිහිපය තුළ අධ්‍යාපනය සම්බන්ධයෙන් ඔබට සතුටු වෙන්න පුළුවන් ආකාරයේ සැබෑ වෙනසක් කරලා පෙන්වනවා කියන එක මේ අවස්ථාවේදී ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු වයි.ජී. පද්මසිරි මහතා
(மாண்புமிகு வை.ஜி. பத்மசிறி)
(The Hon. Y.G. Padmasiri)
යෝජනාවට අදාළව ගරු ඇමතිතුමා දෙන ලද පිළිතුර සම්බන්ධව මම සෑහීමකට පත් වෙනවා. නමුත් මම එක කාරණයක් කියන්න ඕනෑ. මම දන්නා විධියට ද්විතීයික පාසල්වලට උපදෙස් ලැබිලා නැහැ. රුවන්වැල්ල රාජසිංහ මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පතිතුමාට මම ඊයෙත් කථා කළා. පෝෂිත පාසැල් එකතු කිරීම පිළිබඳවත්, ශිෂ්‍යත්ව දරුවන් ඇතුළත් කර ගැනීම පිළිබඳවත් තවම උපදෙස් ලැබිලා නැහැ කියන එක මම වගකීමෙන් කියන්න කැමැතියි.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
හොඳයි, ගරු මන්ත්‍රීතුමනි, ඒ ගැනත් අපි පරීක්ෂා කර බලන්නම්. ඒ ආකාරයේ අඩු පාඩුවක් තිබෙනවා නම්, කලාප අධ්‍යක්ෂවරයාට දැනුම් දෙන්න. ප්‍රශ්න තිබෙන තැන් පමණයි ප්‍රතිව්‍යුහගත කරන්න කිව්වේ. මොකද? මෙම වැඩ පිළිවෙළ සම්පූර්ණයෙන්ම අප නවත්වන්න බලන්නේ නැහැ. එහෙම කළොත් වෙන්නේ එක එක ආණ්ඩු ආවාම එක එක ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක වන එකයි. එතැන ප්‍රශ්නයක් තිබෙනවා නම් ඔබතුමා කලාප අධ්‍යක්ෂවරයාට කථා කරන්න. ප්‍රශ්නයක් තිබෙනවා, එය නිරාකරණය කරලා දෙන්න කියන්න. එහෙම නැත්නම් ඔබතුමා මට කථා කරන්න. මම වෙනම ප්‍රශ්නය විසඳලා දෙන්නම්.

එකල්හි වේලාව අ. භා.7.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 7.32ට, අද දින සභා සම්මතිය අනුව, 2015 මාර්තු 04 වන බදාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේය.

அப்பொழுது நேரம் பி.ப. 7.30 மணிக்குப் பிந்திவிட்டமையால் தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

அதன்படி, பி.ப. 7.32க்கு, பாராளுமன்றம், அதனது இன்றைய தீர்மானத்துக்கிணங்க, 2015 மார்ச் 04 புதன்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

It being past 7.30 p.m., MR. PRESIDING MEMBER *adjourned Parliament without Question put.*

Adjourned accordingly at 7.32 p.m. until 9.30 a.m. on Wednesday, 04th March, 2015, pursuant to the Resolution of Parliament of this Day.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

232 වන කාණ්ඩය - 13 වන කලාපය
தொகுதி 232 - இல. 13
Volume 232 - No. 13

2015 මාර්තු 04වන බදාදා
2015 மார்ச் 04, புதன்கிழமை
Wednesday, 04th March, 2015

පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන :
කථානායකතුමාගේ සහතිකය

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

"හිරු" රූපවාහිනිය සමඟ කළ සම්මුඛ සාකච්ඡාව :
ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රකාශය

වරප්‍රසාද:
නිදහස් මානසිකත්වයකින් කටයුතු කිරීමට බාධා කිරීම

උපදේශක කාරක සභා

උපදේශක කාරක සභාවලට නම් කිරීම

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:

රවිචන්ද්‍ර පදනම (සංස්ථාගත කිරීමේ) - [ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය] - පළමුවන වර කියවන ලදී

ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත :
දෙවන වර කියවා පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවට පවරන ලදී

කල් තැබීමේ විවාදය:
මහජන මුදල් වංචා කළ අයට එරෙහිව පියවර

பிரதான உள்ளடக்கம்

அறிவிப்புக்கள்:
சபாநாயகரது சான்றுரை

வினாக்களுக்கு வாய்மூல விடைகள்

'ஹிரு' தொலைக்காட்சியுடனான நேர்முகம்:
பிரதம அமைச்சரினது கூற்று

சிறப்புரிமை:
அமைதியான மனோநிலையில் செயற்படுவதற்கு இடையூறு விளைவித்தல்

ஆலோசனைக்குழுக்கள்

ஆலோசனைக் குழுக்களுக்கு நியமனங்கள்

தனி உறுப்பினர் சட்டமூலங்கள்:
ரவிச்சந்திர அமைப்பு (கூட்டிணைத்தல்) – [மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே] - முதன்முறை மதிப்பிடப்பட்டது

தேசிய மருந்துகள் ஒழுங்குபடுத்தும் அதிகாரசபைச் சட்டமூலம் :
இரண்டாம்முறை மதிப்பிடப்பட்டு, முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்பட்டது.

ஒத்திவைப்புப் பிரேரணை:
பொதுமக்களின் பணத்தை மோசடி செய்தோருக்கு எதிராக நடவடிக்கை

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Speaker's Certificate

ORAL ANSWERS TO QUESTIONS

INTERVIEW WITH "HIRU" TV:
Statement by Hon. Prime Minister

PRIVILEGE :
Obstruction in working peacefully

CONSULTATIVE COMMITTEES

NOMINATIONS TO CONSULTATIVE COMMITTEES

PRIVATE MEMBERS' BILLS:
Ravichandra Foundation (Incorporation) – [The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle – Read the First time

NATIONAL MEDICINES REGULATORY AUTHORITY BILL:
Read the Second time and referred to a Committee of the whole Parliament.

ADJOURNMENT MOTION:
Action against Perpetrators for Misappropriation of Public Funds

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2015 මාර්තු 04වන බදාදා
2015 மார்ச் 04, புதன்கிழமை
Wednesday, 04th March, 2015

පූ. භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වැනි ව්‍යවස්ථාව අනුව, 2015 මාර්තු මස 02 වැනි දින ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) නමැති පනත් කෙටුම්පතෙහිද, 2015 මාර්තු මස 03 වැනි දින දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (සංශෝධන) නමැති පනත් කෙටුම්පතෙහිද මා විසින් සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - வெகுசன ஊடக, பாராளுமன்ற அலுவல்கள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Mass Media and Parliamentary Affairs and Chief Government Whip)

ගරු කථානායකතුමනි, මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2012 වර්ෂය සඳහා මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනයේ වාර්ෂික වාර්තාව සහ වාර්ෂික ගිණුම් ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අදාළ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මම 2013/2014 වර්ෂය සඳහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අදාළ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, නැවත පදිංචි කිරීම, ප්‍රතිසංස්කරණය හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2012 වර්ෂය සඳහා පුනරුත්ථාපන අධිකාරියේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශය ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අදාළ උපදේශක කාරක ඉදිරිපත් සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු කරුපයියා වේලායුදම් මහතා (වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கருப்பையா வேலாயுதம் - பெருந்தோட்டக் கைத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Karuppaiah Velayudam - State Minister of Plantation Industries)

Hon. Speaker, I present the following petitions:

1. A petition from Mr. A.P.M.N.C. Samarajeewa of General Insurance Department, Sri Lanka Insurance Corporation Limited, No. 21, Vauxhall Street, Colombo 02;
2. A petition from Mr. J.M.N. Randunu of Sri Lanka Insurance Corporation Limited, Horawpatana Branch;
3 A petition from Mr. K.A.S.K. Dabarera of Sri Lanka Insurance Corporation Limited, Marawila Branch;
4. A petition from Mr. K.T.N. Priyadarshana of No. 152, Kossinna, Ganemulla;
5. A petition from Mr. M.C.K. Mayadunne of General Insurance Department, Sri Lanka Insurance Corporation Limited, No. 21, Vauxhall Street, Colombo 02;
6. A petition from Mr. N.J.A.S.S. Perera of No. 54/4, Parakrama Road, Peliyagoda;

[ගරු කරුපයියා චෙලායුදම් මහතා]

7. A petition from Mrs. A. Kumudu Prasadi of Fire Protection Department, Sri Lanka Insurance Corporation Limited, No. 21, Vauxhall Street, Colombo 02;

8. A petition from Mrs. B. Mallika Premathilaka of General Insurance Department, Sri Lanka Insurance Corporation Limited, No. 21, Vauxhall Street, Colombo 02;

9. A petition from Mrs. D.G.A. Rohini Sumanalatha of Sri Lanka Insurance Corporation Limited, Galgamuwa Branch;

10. A petition from Mrs. L.H.N.S. De Silva of Usmudulawa, Madampagama, Kuligoda;

11. A petition from Mrs. P.H. Kusumawathie of No. 145/C, Kuruwamulla, Wathuragama;

12. A petition from Mrs. S.W.S.M. Malathi Wasantha Senevirathne of Sri Lanka Insurance Corporation Limited, Kurunegala Branch; and

13. A petition from Mrs. Wasantha Padmini Fernando of No. 487, Samanpaya, Eriyawetiya, Kelaniya.

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)

ගරු කථානායකතුමනි, ගාල්ල, අරඹෙවෙල මාවත, අංක164/15 ඒ දරන ස්ථානයෙහි පදිංචි ටී.එල්. ද සිල්වා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

පොලිස් සේවයේ නිලධාරීන් : තෙවන දරු උපත් දීමනාව
பொலிஸ் சேவை உத்தயோகத்தர்கள்: மூன்றாவது குழந்தைக்கான கொடுப்பனவு
POLICE SERVICE PERSONNEL: ALLOWANCE AT BIRTH OF THIRD CHILD

4533/'13

1. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මහජන සාමය, ආපදා කළමනාකරණය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2011 අය - වැය මඟින් පොලිස් දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතුවූවන්ගේ පවුල්වල ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා එම පවුල්වල තුන්වැනි දරුවාගේ උපත වෙනුවෙන් රුපියල් ලක්ෂයක දීමනාවක් ලබා දෙන බවට යෝජනා කළ බව දන්නේද;

(ii) එම යෝජනාවට අනුව 2011, 2012, 2013 සහ 2014 වර්ෂවල එම දීමනාව ලබා දී ඇති පවුල් සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒ සඳහා රජය විසින් දරනු ලැබූ සමස්ත වියදම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පොලිස් දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු වූවන්ගේ පවුල්වල තුන්වැනි දරුවාගේ උපත සඳහා රුපියල් ලක්ෂයක දීමනාවක් ලබා දීම වැඩ පිළිවෙළ මේ වනවිට ක්‍රියාත්මක වන්නේද;

(ii) මේ වනවිටත් පොලිස් සේවයේ නියුතුවූවෙකු විසින් ඉහත මුදල ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

மக்கள் ஒழுங்கு, அனர்த்த முகாமை மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2011 வரவு-செலவு திட்டத்தின்மூலம் பொலிஸ் திணைக்களத்தில் கடமையில் ஈடுபட்டுள்ளவர்களின் குடும்பங்களின் பொருளாதாரத்தை வலுப்படுத்துவதற்காக அக்குடும்பங்களின் மூன்றாவது பிள்ளையின் பிறப்புக்காக ஓரிலட்சம் ரூபாய் கொடுப்பனவு வழங்கப்படுமென பிரேரிக்கப்பட்டுள்ளதென்பதையும்;

(ii) மேற்படி பிரேணையின் பிரகாரம் 2011, 2012, 2013, 2014ஆம் ஆண்டுகளில் மேற்படி கொடுப்பனவு வழங்கப்பட்டுள்ள குடும்பங்களின் எண்ணிக்கை வருட ரீதியாகத் தனித்தனியாக யாதென்பதையும்;

(iii) இதற்காக அரசாங்கத்தினால் ஏற்கப்பட்ட மொத்தச் செலவு யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) பொலிஸ் திணைக்களத்தில் கடமையில் ஈடுபட்டுள்ளவர்களின் குடும்பங்களின் மூன்றாம் குழந்தையின் பிறப்புக்காக ஓரிலட்சம் ரூபாய் கொடுப்பனவு வழங்கப்படுகின்ற வேலைத் திட்டம் தற்போதும் நடைமுறையில் உள்ளதா என்பதையும்;

(ii) தற்போதுகூட பொலிஸ் சேவையில் ஈடுபட்டுள்ள ஒருவர் மேற்படி கொடுப்பனவைப் பெறுவதற்காக பின்பற்றவேண்டிய நடைமுறை யாது என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Order, Disaster Management and Christian Affairs:

(a) Will he state -

(i) whether he is aware that it was proposed at the 2011 Budget to grant an allowance of one hundred thousand rupees for the birth of the third child of the families of those serving in the Police Department in order to strengthen the family economy; and

(ii) separately, on annual basis, the number of families that have received this allowance in the years 2011, 2012, 2013 and 2014 as per the said proposal; and

(iii) the overall expenditure borne by the Government for this purpose?

(b) Will he inform this House -

(i) whether the programme for granting an allowance of one hundred thousand rupees for the birth of the third child of those serving in the Police Department is in operation;and

(ii) the procedure to be adopted by those currently serving in the Police Service to receive the said allowance?

(c) If not, why?

ගරු ජෝන් අමරතුංග මහතා (මහජන සාමය, ආපදා කළමනාකරණය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மக்கள் ஒழுங்கு, அனர்த்த முகாமை மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் அமைச்சர்)
(The Hon. John Amaratunga - Minister of Public Order, Disaster Management and Christian Affairs)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) මෙම යෝජනාව 2011 වර්ෂයේ අය-වැය යෝජනා මඟින් ඉදිරිපත් වූ බැවින් 2012 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.

වර්ෂය	පවුල් සංඛ්‍යාව
2012	380
2013	600
2014	300
එකතුව	1280

(iii) රු.128,000,000.00 (රුපියල් මිලියන එකසිය විසිඅටයි)

(ආ) (i) ඔව්.

(ii) නිලධාරින්/නිලධාරිනියන් විසින් තුන් වන දරු උපත සිදු වීමෙන් පසු පොලිස් මූලස්ථානය මඟින් නිකුත් කර ඇති උපදෙස් පත්‍රිකාව අනුව සකස් කරන ලද අයදුම් පත්‍රය පොලිස් සුබසාධන කොට්ඨාසයේ අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් පසු පොලිස් මූලස්ථානයේ මුදල් අංශය මඟින් අදාළ මුදල දරුවා නමින් ඇති රාජ්‍ය බැංකු ගිණුමක තැන්පත් කරනු ලබයි.

(ඇ) පැන නොනගී.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාට මම ස්තූතිවන්ත වෙනවා. එතුමාගේ පිළිතුරේ සඳහන් වූ කාරණයකින් මගේ පළමු වැනි අතුරු ප්‍රශ්නය පටන් ගන්න මම කැමැතියි. එතුමා පොලිස් සුබසාධන කොට්ඨාස ගැන කථා කළා. ගරු කථානායකතුමනි, සමහර විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරින් බෙහෙත් ගන්න පොලිස් රෝහලට ආවාට වෛද්‍යවරයාට බෙහෙත් නියම කරන්න විධියක් නැහැ. මොකද, ඒ එන පොලිස් නිලධාරියා බෙහෙත් ටික ලියාගෙන ඇවිල්ලා "මේකට අත්සනක් ගහලා දෙන්න" කියලා කියනවා. මේක ඔහුගේ සෞඛ්‍යයට බලපාන දෙයක් තමයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, පොලිස් සුභසාධන කටයුතුවලට අදාළ කාරණයක් නිසායි මම මේ ප්‍රශ්නය අහන්නේ. මේ නිසා වෛද්‍යවරු යම් අපහසුතාවකට පත් වෙලා තිබෙනවා. රෝගියාගේ පැත්තෙන් බලන කොට ඔවුන්ගේ පෞද්ගලික මට්ටමින් ඒ ඉල්ලීම සාධාරණ තමයි. නමුත් ඒක වෛද්‍ය ආචාරධර්මවලට සහ වෛද්‍යවරුන්ගේ කටයුතුවලට බාධාවක්. මේ සම්බන්ධයෙන් අදාළ බලධාරින් එක්ක සාකච්ඡා කරලා ඇමතිතුමාට මැදිහත් වීමක් කරන්න පුළුවන්ද?

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

මෙතුමා ඉදිරිපත් කළේ වැදගත් ප්‍රශ්නයක්. ඒ පිළිබඳව මම සොයා බලන්නම්. මෙවැනි තත්ත්වයක් තිබෙනවා කියලා මම දැනුවත් වෙලා සිටියේ නැහැ. ඒ පිළිබඳව වහාම ක්‍රියාත්මක වෙන බව මේ අවස්ථාවේ සඳහන් කරනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මම අද ප්‍රශ්න දෙකයි අහන්නේ. බොහොම සාධාරණයි, ගරු කථානායකතුමනි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

බොහොම හොඳයි.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ඒ, යහ පාලනය යටතේ ඔබතුමාට සහයෝගයක් වශයෙන් වේලාව ඉතුරු කරලා දෙන්නයි. මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, පොලිස් සහායකවරුන්ට තවමත් වෘත්තීය තෘප්තිමත්භාවය ඇති වන විධියට ඒ අයගේ ප්‍රශ්නය විසඳිලා නැහැ. දෙවැනි එක තමයි, පොලිස් කොස්තාපල්වරුන්ට, පොලිස් සාජන්ට්වරුන්ට, උප පොලිස් පරීක්ෂකවරුන්ට, පොලිස්

[ගරු බුද්ධික පතිරණ මහතා]

පරීක්ෂකවරුන්ට, ප්‍රධාන පොලිස් පරීක්ෂකවරුන්ට සහ එතැනින් ඉහළ බොහෝ ශ්‍රේණිවල නිලධාරීන්ට තමන්ගේ උසස්වීම් ලබා ගැනීමට අවුරුදු ගණනක් ඉන්න වෙලා තිබෙනවා. සමහරු පොලිස් කොස්තාපල්වරුන් විධියට සේවයට බැඳිලා අවුරුදු 22ක්, 23ක් සේවය කරලා පොලිස් කොස්තාපල්වරුන් විධියටම තමයි විශ්‍රාම යන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඔවුන්ගේ හිර වුණු උසස්වීම් ලබා දීමට මේ දින 100 තුළ ගන්න පුළුවන් ක්‍රියාමාර්ගය මොකක්ද?

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, මෙතුමා කියන කාරණයේ සත්‍යයක් තිබෙනවා. පසු ගිය රජය කාලයේ පොලීසියට ලැබුණේ කුඩම්මාගේ සැලකිල්ලයි. ප්‍රතිපාදනත්, ඒ වාගේම පහසුකම් හැම දෙයක්ම වැඩිපුර ලැබුණේ හමුදාවටයි. ඒක නිසාම පොලිස් නිලධාරින්ගේ උසස්වීම්, ඒ අයගේ ස්ථාන මාරුවීම්, ඒ කිසි දෙයක් ප්‍රමිතියට සිද්ධ වුණේ නැහැ. ඒක කනගාටුදායක කාරණයක්. නමුත් අප මේ රජයේ කටයුතු භාර ගත්තාට පසුව ඒ අයගේ උසස්වීම් පිළිබඳව සම්මුඛ පරීක්ෂණ දැන් සිදු කර ගෙන යනවා. පොලිස් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අනුව සෑම ශ්‍රේණියකම අදාළ උසස්වීම් සඳහා දැන් සම්මුඛ පරීක්ෂණ කර ගෙන යනවා. වැඩි කාලයක් යන්නට ඉස්සෙල්ලා මෙතුමාගේ ප්‍රශ්නයට සාධාරණ පිළිතුරක් ලැබේවි කියා මම හිතනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
පොලිස් සහායකවරුන්ටත්-

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
සියලු දෙනාටම.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

එතුමා සමඟ මමත් එකඟ වෙනවා. පොලිස් රෝහලේ හුඟාක් අඩු පාඩුකම් තිබෙනවා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, අපි ඒවා හදා ගෙන යනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඒවා ගැන විශේෂයෙන් අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

අන්න ඒක නේ, ගරු කථානායකතුමනි අප කියන්නේ -[බාධා කිරීමක්]

මාලදිවයින් රජය වෙත ලබා දී තිබෙන ආධාර : මූල්‍ය වටිනාකම

மாலைதீவு அரசுக்கு உதவிகள் : நிதிப் பெறுமதி

AID TO MALDIVIAN GOVERNMENT: FINANCIAL VALUE

5093/'14

3. ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) පසුගිය වර්ෂ 5 තුළ දී, ශ්‍රී ලංකා රජය විසින් මාලදිවයින් රජය වෙත යම් මූල්‍යමය ආධාර කිරීමක් හෝ ව්‍යාපෘති සඳහා ආධාර කිරීමක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, එම ආධාරවල මූල්‍ය වටිනාකම කොපමණද;

(iii) එම රට වෙත යම් ඉදිකිරීම් ව්‍යාපෘතියක් ලබා දී තිබේ නම්, එම ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගනු ලැබූ ආකාරය කවරේද;

(iv) එම මූල්‍යමය ආධාර හෝ ව්‍යාපෘති ආධාර ලබා දීමේ අරමුණ කවරේද;

(v) ශ්‍රී ලංකා රජය විශාල විදේශ ණය ප්‍රමාණයක් ගෙවීමට තිබියදී, ඉහත පරිදි වෙනත් රටකට ආධාර ලබා දීම නිශ්ඵල ක්‍රියා මාර්ගයක් නොවන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கொள்கை உருவாக்கம், பொருளாதார அலுவல்கள், சிறுவர், இளைஞர் மற்றும் கலாசார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) கடந்த 5 வருடங்களில் இலங்கை அரசினால் மாலைதீவு அரசுக்கு ஏதேனும் நிதியுதவிகள் அல்லது கருத்திட்டங்களுக்கான உதவிகள் செய்யப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில் இவ் உதவிகளின் நிதி ரீதியான பெறுமதி எவ்வளவு என்பதையும்;

(iii) அந்நாட்டுக்கு ஏதேனும் நிர்மாணிப்புக் கருத்திட்டங்கள் வழங்கப்பட்டிருப்பின் இந் நிர்மாணப் பணிகளுக்கான ஒப்பந்தக்காரர்கள் தேர்ந்தெடுக்கப்பட்ட முறை யாது என்பதையும்;

(iv) இந்நிதியுதவி அல்லது கருத்திட்ட உதவிகள் வழங்கப்பட்டதன் நோக்கம் யாது என்பதையும்;

(v) இலங்கை அரசு பெருமளவில் வெளிநாட்டுக் கடன்களை செலுத்தவேண்டியிருக்கையில் மேற்குறிப்பிட்டவாறு வேறு நாடொன்றுக்கு உதவியளித்தல் பயனற்றதொரு செயற்பாடு அல்லவா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Policy Planning, Economic Affairs, Child, Youth and Cultural Affairs:

(a) Will he inform this House-

(i) whether the Government of Sri Lanka has made any financial aid or aid for projects to the Government of the Maldives over the last five years;

(ii) if so, the financial value of such aid;

(iii) if any construction project has been assigned to that country, the manner of selection of contractors for that project;

(iv) the aim of making that financial aid or aid for projects; and

(v) whether making aid to a foreign country, as mentioned above, when Sri Lanka has to pay back a huge amount of foreign loans, is not a fruitlful effort?

(b) If not, why?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் கொள்கை உருவாக்கம், பொருளாதார அலுவல்கள், சிறுவர், இளைஞர் மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரும்)

(The Hon. Ranil Wickremasinghe - Prime Minister, Minister of Policy Planning, Economic Affairs, Child, Youth and Cultural Affairs)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ) (i) සිදු කර තිබේ.

(ii) සහ (iii)

මෙම ප්‍රශ්නවලට එක විධියට කරුණු ටික ඉදිරිපත් කරන්නම්.

2011 නොවැම්බර් මාසයේ මාලදිවයිනේ පැවැති සාර්ක් සමුළුව සඳහා සූදානම් වෙමින් සිටි මාලදිවයින ජනරජයේ ආණ්ඩුව "Sunset Bridge" වෙතින් ආරම්භ වී අඩිඩු දූපතෙහි මරඩු සහ ෆේඩු හරහා දිවෙන කිලෝමීටර් 4. 8ක් දිගැති asphalt කොන්ක්‍රිට් මාර්ගය ඉදි කිරීම සඳහා ශ්‍රී ලංකාවේ සහාය ඉල්ලන ලදී. ඒ අනුව එම සහාය ලබා දෙන්නටත්, අවශ්‍ය ඉදි කිරීම් ද්‍රව්‍ය ශ්‍රී ලංකාවේ සිට මාලදිවයින වෙත ප්‍රවාහනය කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියට අවසර ලබා දීමට භූ විද්‍යා හා පතල් කාර්යාංශයට බලය පැවරීම සහ සෘජු කොන්ත්‍රාත් ලබා දීමේ ක්‍රමය භාවිත කරමින් එම කාලයේ මාලදිවයිනෙහි සේවයේ නියුතුව සිටි ශ්‍රී ලංකාවේ International Construction Consortium (Pvt.) Limited වෙතින් සහාය ලබා ගැනීම මඟින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියට බලය පැවරීම.

සහාය ලබා දීම කියන්නේ මොකක්ද කියලා මට හරියටම පැහැදිලි නැහැ.

ඒ අනුව මේ සමාගම ඇමෙරිකන් ඩොලර් 10,293,272.85කට මේ කාර්යය තක්සේරු කර තිබෙනවා. පසුව සාකච්ඡාවකින් පස්සේ මේ කොන්ත්‍රාත් මුදල ඇමෙරිකන් ඩොලර් 9,900,000.00 දක්වා අඩු කර තිබෙනවා. මේ ICC සමාගම ගිය ආණ්ඩුව සමඟ හුඟක් ළඟින් වැඩ කටයුතු කරලා විවෘත ටෙන්ඩර් නැතිව කොන්ත්‍රාත් ලබා ගත්ත සමාගමක්.

(iv) මාලදිවයින් රජය විසින් කරන ලද ඉල්ලීමක් අනුව.

1. ජාතීන් අතර අන්‍යෝන්‍ය අවබෝධය සහ ද්විපාර්ශ්වික සම්බන්ධතාව තවදුරටත් ශක්තිමත් කර ගැනීමට හා අනාගතයේදී දෙරට අතර වෙළෙඳ හා අළෙවි අවස්ථා වැඩිදියුණු කර ගැනීම.

2. දේශීය කොන්ත්‍රාත්කරුවන්ගේ ධාරිතාව ඉහළ නංවාලීමට ලැබෙන අවස්ථාවද සැලකිල්ලට ගෙන ඇත. මාලදිවයිනෙහි සේවයෙහි නියුක්ත ශ්‍රී ලාංකික කොන්ත්‍රාත්කරුවෙකු වෙත මෙම ව්‍යාපෘතිය ලබා දී ඇත.

(v) දෙරට අතර අන්‍යෝන්‍ය අවබෝධය සහ ද්විපාර්ශ්වික සම්බන්ධතාව ඉහළ නැංවීම මඟින් අනාගතයේදී මාලදිවයින තුළ ශ්‍රී ලංකාව සඳහා වෙළෙඳ පොළක් නිර්මාණය කර ගැනීම තුළින් ආර්ථික ප්‍රතිලාභ ළඟා කර ගැනීම රජයේ අරමුණ වී ඇත.

(ආ) පැන නොනඟී.

අනික් රටවල් වාගේ නොවෙයි, 1985 සිට අප විටින් විට මාලදිවයිනට ආධාර ලබා දීලා තිබෙනවා. සාමාන්‍යයෙන් මිනිස් බලය ලබා දීලා තිබෙන්නේ ගුරුවරු, වෛද්‍යවරු වශයෙන්. ඒ රටේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවලට අපි ගොඩනැඟිලි හදා දීලා තිබෙනවා. මාලදිවයිනේ පාරක් හදලා තිබෙන්නේ පළමුවෙනි වතාවට මේ අවස්ථාවේදී තමයි. අපට සිදු වූ දේ අනාගතයේදී මාලදිවයිනට නොවේවා කියලා මා බලාපොරොත්තු වෙනවා.

ගරු අනුර දිසානායක මහතා

(மாண்புமிகு அநுர திஸாநாயக்க)

(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

මාලදිවයින රජය මේ පාර ඉදි කිරීම වෙනුවෙන් ඩොලර් ලක්ෂ 99ක්, ආසන්න වශයෙන් ගත්තොත් රුපියල් ලක්ෂ 13,000ක් ලබා දී තිබෙනවා. අපේ රටේ පාරවල් ඉදි කරන කොට ටෙන්ඩර් කැඳවීමකින් තොරව කොන්ත්‍රාත් ලබා දුන්නා වාගේම, මාලදිවයිනේ පාර හැදීම සඳහා කොන්ත්‍රාත්තුව ලබා දී තිබෙන්නේත් කිසිදු ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කිරීමකින් තොරව. කිසිදු ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කිරීමකින් තොරව රුපියල් ලක්ෂ 13,000ක් පමණ වටිනා මෙම ව්‍යාපෘතිය ලබා දීම පිළිබඳව යම් පරීක්ෂණයක් සිදු කරනවාද කියලා ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා

(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)

(The Hon. Ranil Wickremasinghe)

ඇත්ත වශයෙන්ම අපි මාලදිවයින සලකන්නේ ලංකාවේ කොටසක් හැටියට. ඉතින්, ලංකාවේ ටෙන්ඩර් නැතුව කොන්ත්‍රාත් ලබා දෙනවා නම් මාලදිවයිනේත් ටෙන්ඩර් නැතුවයි කොන්ත්‍රාත්තුව දීලා තිබෙන්නේ. මාලදිවයින අපට ළඟින්ම තිබෙන සහෝදර රටක්. මේ ගැන මා පරීක්ෂා කර බලන්නම්.

ගරු අනුර දිසානායක මහතා

(மாண்புமிகு அநுர திஸாநாயக்க)

(The Hon. Anura Dissanayake)

මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු කථානායකතුමනි, අපේ රටේ නීතිය අනුව අපේ රටේ කළු ගල් පිට රටට ගෙන යන්න බැහැ. නමුත් මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් ලංකාවේ කළු ගල් නැව්වල පටවලා අරගෙන ගිහින්

[ගරු අනුර දිසානායක මහතා]

තිබෙනවා. අපි ණය මුදල දෙනවා වාගේම, ලංකාවේ කළු ගල් පවා නැව්වලින් ගෙන ගිහින් තිබෙනවා මාලදිවයිනේ පාරක් හදන්න. අපේ රටේ පරිසරය සම්බන්ධයෙන් එතෙක් තිබුණු නීති සියල්ල උල්ලංඝනය කරමින් තමයි මේ කළු ගල් ගෙන ගිහින් තිබෙන්නේ. ඒ පිළිබඳව පරිසර ඇගැයීම් වාර්තාවක් හෝ ඒ අදාළ ආයතනවලින් නිසි අවසරයක් හෝ ලබා ගෙන තිබේද කියා ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

මා ඒ ගැන සොයා බලන්නම්. විශේෂයෙන්ම මාලදිවයින ඇතුළු හැම රටක්ම මේ කටයුතුවලදී සිමෙන්ති බ්ලොක්ස් තමයි පාවිච්චි කරන්නේ. ඒ වාගේම වැලි ඕනෑ නම් ඒ රටවලින් තමයි සොයා ගන්නේ. ඒවා ලංකාවෙන් යවන්න බැහැ. [බාධා කිරීමක්] මන්ත්‍රීතුමා, කළු ගල් යවන එක මොකක්ද? ඩොලර් බිලියන ගණන් ගෙන යනවා නම් කළු ගල් ගෙන ගිය එක ගැන ඔබතුමා අඩන්නේ මොකද?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නය මේකයි. අපි මේ පාර්ලිමේන්තුවේදී විවිධ අණපනත් සම්මත කරනවා. කළු ගල් ලංකාවෙන් බැහැර කිරීමට අවසර ලබා නොදීම මේ පාර්ලිමේන්තුවේදීම සම්මත කරන ලද නීතියක්. පාර්ලිමේන්තුව තුළ සම්මත කරන ලද නීති කිසි සේත්ම නොසලකා හරිමින් තම තමන්ගේ සිතැඟි අනුව, තම තමන්ගේ ආශාව අනුව, තම තමන්ගේ සංකල්ප අනුව කටයුතු කරන්නට පාලකයන්ට අයිතියක් නැහැ. එසේ නම් මම ගරු අගමැතිතුමාගෙන් දැන ගන්නට කැමැතියි, මේ පාර්ලිමේන්තුවේදී සම්මත කරන ලද නීතිවලින් වැඩක් තිබේද කියලා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ගරු මන්ත්‍රීතුමනි, මීට ඉස්සෙල්ලා අපේ රටේ නීති අනුගමනය කළේ නැහැ, හුඟක් අවස්ථාවලදී. නීතියේ ආධිපත්‍යය ඇති කරලා තිබෙන්නේ දැන් විතරයි. ඒ නිසා මේ පිළිබඳව සම්පූර්ණ වාර්තාවක් මම මේ සභාවට ලබා දෙන්නම්.

කඩහපොල - රඹාවැව මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය : විස්තර

கடஹபொல - ரம்பாவெவ வீதி அபிவிருத்தி கருத்திட்டம் : விபரம்

KADAHAPOLA-RAMBAWEWA ROAD DEVELOPMENT PROJECT : DETAILS

5768/'14

6. ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කඩහපොල - රඹාවැව මාර්ග සංවර්ධන ව්‍යාපෘතියට අදාළ වන මාර්ගයේ දුර සහ පළල කොපමණද;

(ii) එම මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ගත වන කාල සීමාව කවරේද;

(iii) එම මාර්ගයේ ඉදිකිරීම්කරු තෝරාගනු ලැබුවේ ටෙන්ඩර් පටිපාටියක් මගින්ද;

(iv) එසේ නම්, තෝරාගනු ලැබූ ලංසුකරුගේ/ ආයතනයේ නම කවරේද;

(v) එම ව්‍යාපෘතිය සඳහා මුදල් ලබා ගන්නා මූලාශ්‍ර කවරේද;

(vi) එම මාර්ගයේ එක් කිලෝමීටරයක් ඉදිකිරීම සඳහා වන පිරිවැය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් මාර්ගයේ ඉදිකිරීම් කටයුතු සිදුකරන කාලය තුළ රථ වාහන පාලනය සඳහා වැඩ පිළිවෙළක් හඳුනාගෙන තිබේද;

(ii) එසේ නම්, සම්පූර්ණ ව්‍යාපෘතිය තුළින් ඒ සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී, අගතියට පත්වන පාර්ශ්වකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ අගතියට පත් වී ඇති අයට වන්දි ප්‍රදානය කර තිබේද;

(iii) එසේ නම්, වන්දි ලබා දුන් අයගේ විස්තර කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

நெடுஞ்சாலைகள், உயர்கல்வி மற்றும் முதலீட்டு ஊக்குவிப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) குருநாகல் மாவட்டத்தில், கடஹபொல - ரம்பாவெவ வீதி அபிவிருத்தி கருத்திட்டத்திற்கு உரியதான வீதியின் நீளம் மற்றும் அகலம் யாதென்பதையும்;

(ii) மேற்படி வீதியின் மறுசீரமைப்பு நடவடிக்கைகளுக்காக எவ்வளவு காலம் எடுக்கும் என்பதையும்;

(iii) மேற்படி வீதிக்கான நிர்மாணிப்பாளர் கேள்விப்பத்திர நடைமுறையின்மூலம் தேர்ந்தெடுக்கப்பட்டாரா என்பதையும்;

(iv) ஆமெனில் தேர்ந்தெடுக்கப்பட்ட விலைக் கேள்வியாளரின்/ நிறுவனத்தின் பெயர் யாதென்பதையும்;

(v) மேற்படி கருத்திட்டத்திற்கான நிதி பெற்றுக் கொள்ளப்படும் மூலங்கள் யாவையென்பதையும்;

(vi) மேற்படி வீதியின் ஒரு கிலோ மீற்றரை நிர்மாணிப்பதற்காக செலவாகும் பணத்தொகை எவ்வளவு என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேலே குறிப்பிடப்பட்ட வீதியின் நிர்மாணப் பணிகள் மேற்கொள்ளப்படுகின்ற காலப் பகுதியில் வாகனப் போக்குவரத்துக் கட்டுப்பாட்டுக்கான வேலைத்திட்டம் ஒன்று இனங்காணப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், முழுக் கருத்திட்டத்தின் ஊடாக அதற்காக ஒதுக்கப்பட்டுள்ள கிரயம் எவ்வளவென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) மேற்படி வீதி அபிவிருத்தி கருத்திட்டத்தை நடைமுறைப்படுத்தும்போது பாதிக்கப்படுகின்ற தரப்பினர்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) அவ்வாறு பாதிக்கப்பட்டவர்களுக்கு நட்டஈடு வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், நட்டஈடு வழங்கப்பட்டுள்ளவர்களின் விபரங்கள் யாவையென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Highways, Higher Education and Investment Promotion:

(a) Will he state -

(i) the length and width of the road relevant to the Kadahapola-Rambawewa Road Development Project in Kurunegala District;

(ii) the time frame required for rehabilitation of the said road;

(iii) whether the constructor of that road was selected through a tender procedure;

(iv) if so, the name of the bidder/institution selected;

(v) the source from which funds are obtained for the said project; and

(vi) the construction cost per kilometre of the said road?

(b) Will he inform this House -

(i) whether a programme to control traffic on that road while construction work is underway, has been identified; and

(ii) if so, the amount allocated for that purpose out of the total project cost?

(c) Will he also state-

(i) the number of parties aggrieved as a result of implementing that project;

(ii) whether the persons so aggrieved have been paid compensation; and

(iii) if so, the details of those who were paid compensation?

(d) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) දුර - කිලෝමීටර් 18.93

(කිලෝමීටර් 0.00 සිට කිලෝමීටර් 18.93 දක්වා)

පළල- මීටර් 10.2 (මාර්ග උරහිස සමඟ)

(ii) මාස 24කි. (2012.06.17 සිට 2014.06.17 දක්වා)

(iii) ඔව්.

(iv) ෂියැන් ඩගාන් රෝඩ් මැෂිනරි කම්පැනි චීන සමාගම (X'ian Dagan Road Machinery Company)

(v) චීන සංවර්ධන බැංකු ණය

(vi) රුපියල් මිලියන 103.01කි.

(ආ) (i) ඔව්.

මාර්ග සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති සඳහා ක්‍රියාත්මක කරන රථ වාහන පාලන සැලැස්ම අනුව සැලසුම් කර ඇත.

(උදා - මාර්ග සංඥා, මාර්ග බාධක, රාත්‍රී කාලය සඳහා භාවිත කරන විදුලි ලාම්පු)

(ii) රුපියල් මිලියන 16.1කි.

(ඇ) (i) මෙම මාර්ගය සංවර්ධන කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමක් සිදු කර නැත. මාර්ගය පුළුල් කිරීමේ කටයුතු සිදු කිරීමේදී ඉඩම් හිමියන් ඒ සඳහා ලබා දුන් භූමිය පමණක් භාවිත කර මාර්ගය සංවර්ධනය කර ඇත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(ඇ) පැන නොනඟී.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 8 - 4534/'13, ගරු බුද්ධික පතිරණ මහතා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, 8 වන ප්‍රශ්නය රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශයට අදාළ ප්‍රශ්නයක් නොවෙයි. මෙම ප්‍රශ්නය අදාළ අමාත්‍යාංශයට යොමු කරන්න කියා මා ඉල්ලා සිටිනවා. මේ ප්‍රශ්නය රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශයට අයිති නැහැ කියලා දැනුම් දීලා තිබෙනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මේ ප්‍රශ්නය අයිති ඒ අයට නොවෙයි කියනවා නම්, අයිති කුමන අමාත්‍යාංශයටද කියලා මම දැන ගන්න කැමැතියි. එහෙමනම් සභාලේකම් කාර්යාලය හරහා ගැළපෙන අමාත්‍යාංශයට යොමු කරන්න කියන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ප්‍රශ්නය නැවත යොමු කරන්න.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
නැවතත් මේ ප්‍රශ්නය යොමු කරන්න මට බැහැ. සභාලේකම් කාර්යාලය හරහා යොමු කරන්න.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සොයා බලා ඒ අනුව කටයුතු කරන්න.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ඖෂධ ලියා පදිංචි කිරීම: වත්මන් ක්‍රමවේදය
மருந்துகளைப் பதிவுசெய்தல் : தற்போதைய முறைமை
REGISTRATION OF PHARMACEUTICALS : PRESENT METHODOLOGY

4780/'14

9. ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මෙරට ලියා පදිංචි කර ඇති සමස්ත ඖෂධ සංඛ්‍යාව කොපමණද;

(ii) ඖෂධ ලියා පදිංචි කිරීම සඳහා ක්‍රියාත්මක වන වත්මන් ක්‍රමවේදය කවරේද;

(iii) ඖෂධ ලියා පදිංචි කිරීම පාලනය කිරීම සඳහා යම්කිසි ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதார மற்றும் சுதேச மருத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இந்நாட்டில் பதிவுசெய்யப்பட்டுள்ள ஒட்டு மொத்த மருந்துகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(ii) மருந்துகளைப் பதிவுசெய்வதற்குச் செயற்படுத்தப் படும் தற்போதைய முறைமை யாதென்பதையும்;

(iii) மருந்துகள் பதிவுசெய்யப்படுவதைக் கட்டுப் படுத்துவதற்கு ஏதேனுமொரு முறைமையை நடைமுறைப்படுத்துவதற்குத் திட்டமிடப்பட் டுள்ளதா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Indigenous Medicine:

(a) Will he inform this House-

(i) the total number of pharmaceuticals registered in this country;

(ii) the methodology that is in existence at present to register pharmaceuticals; and

(iii) whether there is a plan to implement a certain methodology to control the registration of pharmaceuticals?

(b) If not, why?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதார மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health and Indigenous Medicine)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 8,100 කි.

(ii) අයදුම්පත් භාර ගැනීම.

මූලික ඇගැයීමට ලක් කිරීම.

අහඹු ලෙස සාම්පල් පරීක්ෂාව.

ඖෂධ විශ්ලේෂක අනුකමිටුව මඟින් නිර්දේශ ලබා ගැනීම.

අනුමත ඖෂධ සඳහා ලියා පදිංචි සහතිකය ලබා දීම.

(වසර 05කට සහ වසරක් පාසා ආනයනික/ නිෂ්පාදක බලපත් නිකුත් කිරීම.)

(iii) මේ සඳහා නව ඖෂධ පනතට- අද පාර්ලිමේන්තුවට ගෙනාවාට පසුව- රෙගුලාසි ගෙන ඒමට යෝජනා වී ඇත. එමඟින් එක් ඖෂධයක් සඳහා වන නිෂ්පාදන වෙළෙඳ නාම - Brands - සංඛ්‍යාව සීමා කිරීමට පනතේ සඳහන්ව ඇත.

(ආ) පැන නොනඟී.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ගරු ඇමතිතුමනි, මෙරට ලියා පදිංචි කර ඇති සමස්ත ඖෂධ සංඛ්‍යාව කොපමණද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
8,100 යි.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ගරු කථානායකතුමනි, අද ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ විවාදයට ගැනෙන නිසා මේ සියල්ලටම ඒ ඖෂධ පනත් කෙටුම්පතෙන් පිළිතුරු ලැබිලා තිබෙනවා. එම නිසා මම අතුරු ප්‍රශ්න අහන්නේ නැහැ. අපට විවාදයේදී ඒ ගැන කථා කර ගන්න පුළුවන්.

රජයට උපදෙස් දීමට සේවය ලබාගත් විදේශීය සමාගම්: විස්තර

அரசுக்கு ஆலோசனைச் சேவை வழங்கும் வெளிநாட்டுக் கம்பனிகள் : விபரம்

FOREIGN COMPANIES PROVIDED ADVISORY SERVICES TO GOVERNMENT : DETAILS

5095/'14

10. ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පසු ගිය වර්ෂ 5 තුළ ශ්‍රී ලංකා රජයට, විදේශ කටයුතු අමාත්‍යාංශයට හෝ කවර හෝ තානාපති කාර්යාලයකට, විදේශ රටවල් තුළ මෙරට කෙරෙහි ධනාත්මක ආකල්ප ගොඩනැඟීම වෙනුවෙන් උපදෙස් ලබා දීම සඳහා කවර හෝ විදේශ සමාගමක සේවය ලබා ගෙන තිබේද;

(ii) එසේ නම්, එම සමාගමේ නම කවරේද;

(iii) එම සමාගම අයත් රට කවරේද;

(iv) එම සමාගම තෝරා ගනු ලැබූ ආකාරය කවරේද;

(v) එවැනි සමාගමක සේවය ලබා ගැනීමේ අරමුණු කවරේද;

(vi) ඉහත සඳහන් කටයුතු වෙනුවෙන් එකී සමාගමට ගෙවන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(vii) ඊට අදාළව මුදල් වැය කිරීම සිදු කළ වැය ශීර්ෂය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடந்த 5 வருடங்களில் இலங்கை அரசுக்கு, வெளிநாட்டு அலுவல்கள் அமைச்சுக்கு அல்லது ஏதேனும் தூதுவராலயத்துக்கு வெளிநாடுகளில் இந்நாடு தொடர்பான சாதகமான மனப்பாங்குகளைக் கட்டியெழுப்புவதற்காக ஆலோசனை வழங்குவதற்கு ஏதேனும் வெளிநாட்டுக் கம்பனியின் சேவை பெறப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில் அக்கம்பனியின் பெயர் யாது என்பதையும்;

(iii) இக்கம்பனி எந்த நாட்டுக்குரியது என்பதையும்;

(iv) இக்கம்பனி தேர்ந்தெடுக்கப்பட்ட முறை யாது என்பதையும்;

(v) இவ்வாறானதொரு கம்பனியின் சேவையைப் பெறுவதற்கான நோக்கம் யாது என்பதையும்;

(vi) மேற்குறிப்பிட்ட விடயத்துக்காக குறித்த கம்பனிக்கு செலுத்தப்பட்ட நிதித் தொகை எவ்வளவு என்பதையும்;

(vii) இதற்கான பணத்தொகை செலவிடப்பட்ட செலவுத் தலைப்பு யாது என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs:

(a) Will he inform this House-

(i) whether the service of any foreign company has been obtained to advise the Government of Sri Lanka, the Ministry of External Affairs or any embassy during the last 5 years on building the positive image of this country in foreign countries;

(ii) if so, the name of that company;

(iii) the country to which that company belongs;

(iv) the manner through which that company was selected;

(v) the aim of obtaining the service of such a company;

(vi) the amount of money paid to that company for the above-mentioned service ; and

(vii) the Head of expenditure through which money was spent in relation to that service?

(b) If not, why?

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - வெளிநாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Ajith P. Perera - Deputy Minister of Foreign Affairs)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) අදාළ සමාගම් 04ක් ඇති අතර එම විස්තර පහත දැක්වේ.

(අ) පැටන් බොග්ස් (LLP) (2010-2012)

(ආ) ක්‍රැන්ෆර්ඩ් ජොන්සන් රොබින්සන් PR (2010)

(ඇ) ස්ටීව් හෙජස් (2010)

(ඈ) මැජෝරිටි ගෘප් LLC (2013)

(iii) අයිතම ii හි (අ-ඈ) හි සඳහන් සමාගම් 04 ඇමෙරිකානු එක්සත් ජනපදයට අයත් සමාගම් වේ.

(iv) (අ) පැටන් බොග්ස් (LLP)

තානාපති ජාලිය වික්‍රමසූරිය විසින් විදේශ කටයුතු අමාත්‍යාංශයට කරන ලද නිර්දේශය මත තෝරා ගෙන ඇත.

(ආ) ක්‍රැන්ෆර්ඩ් ජොන්සන් රොබින්සන් PR

තානාපති බර්නාඩ් ගුණතිලක විසින් විදේශ කටයුතු අමාත්‍යාංශයට කරන ලද නිර්දේශය මත තෝරා ගෙන ඇත.

(ඇ) ස්ටීව් හෙජස්

සමාගම තෝරාගත් ආකාරය පිළිබඳ කිසිදු තොරතුරක් අමාත්‍යාංශය හෝ විදේශ දූත මණ්ඩලය සතු නොවන බවයි පෙනෙන්නේ.

(ඈ) මැජෝරිටි ගෘප් LLC

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

සමාගම තෝරාගත් ආකාරය පිළිබඳ කිසිදු තොරතුරක් අමාත්‍යාංශය හෝ විදේශ දූත මණ්ඩලය සතු නොවේ.

(v) මේ සමාගම් 4ක්ම අරගෙන තිබෙන්නේ ඇයි කියන කාරණය.

(අ) පැටන් බොග්ස් (LLP)

ශ්‍රී ලංකාව වෙනුවෙන් ඇමෙරිකා එක්සත් ජනපදයේ කොංග්‍රසය සමග මිත්‍ර සබඳතා ඇති කර ගැනීම.

ශ්‍රී ලංකාවට එරෙහිව යම් පනත් කෙටුම්පතක් හෝ යෝජනා සම්මුතියක් හෝ කොංග්‍රසයට ඉදිරිපත් කිරීමේ අවස්ථා වැළැක්වීම;

පුද්ගලයන් නීති විරෝධි ලෙස ප්‍රවාහනය කරන රටවල ලැයිස්තුවෙන් ශ්‍රී ලංකාව ඉවත් කරවාගැනීමට උපකාර කිරීම;

ශ්‍රී ලංකාවේ සංචාරය කිරීම සම්බන්ධයෙන් දක්වා ඇති මාර්ගෝපදේශ මාලාව ඉවත් කරවාගැනීමට උපකාර කිරීම;

එක්සත් ජනපද ව්‍යාපාරික නියෝජිත කණ්ඩායමක් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ කටයුතු සංවිධානය කිරීම.

(ආ) ක්‍රැන්ෆර්ඩ් ජොන්සන් රොබින්සන් PR

ශ්‍රී ලංකාව වෙනුවෙන් මාධ්‍ය ප්‍රචාරණ කටයුතු මෙහෙයවීම;

එක්සත් ජනපදයේ පුවත් පත් සමඟ, ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය වැඩිදියුණු කිරීමේ ව්‍යාපාරයක් දියත් කිරීම.

(ඇ) **ස්ටිව් හෙජස්**

පුනරුත්ථාපනය හා සංහිඳියාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය විසින් ආරම්භ කර ඇති කටයුතු පිළිබඳව පර්යේෂණ හා ප්‍රචාරණ කටයුතු;

මාධ්‍ය මඟින් හෝ වෙනත් ආකාරයෙන් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් මතු කළ ගැටලුවලට ප්‍රතිචාර දැක්වීම;

උසස් විදේශ නිලධාරින්ගේ සංචාර අතරතුර මාධ්‍ය කටයුතු පිළිබඳ සොයා බැලීම.

(ඈ) මැජෝරිටි ගෘප් LLC

අයහපත් යෝජනා සම්මුතීන් පිටු දැකීම සඳහා අනුග්‍රහය;

ශ්‍රී ලංකාව වෙනුවෙන් කොංග්‍රසයේ නියෝජිත මණ්ඩල සංවිධානය කිරීම;

කොංග්‍රසයේ සාමාජිකයන් සඳහා මුදල් රැස් කිරීමේ කටයුතු;

කැපිටල් හිල් සාමාජික රැස්වීම් සංවිධානය.

ඒවා තමයි මැජෝරිටි ගෘප් කියන ආයතනයට පැවරී තිබෙන වගකීම්. ගරු මන්ත්‍රීතුමනි, අප සතුව තිබෙන තොරතුරුවලට අනුව ඒ ආයතනයට ටිකක් විශේෂ වගකීම් තිබෙනවා.

(vi) (අ) පැටන් බොග්ස් (LLP):

2010 - ශ්‍රී ලංකා රු.35,685,906.88
ඇ.එ.ඩො. 315,000.00

2011 - ශ්‍රී ලංකා රු.46,913,476.71
ඇ.එ.ඩො. 420,000.00

2012 - ශ්‍රී ලංකා රු.12,992,860.05
ඇ.එ.ඩො. 105,000.00

(ආ) ක්‍රැන්ෆර්ඩ් ජොන්සන් රොබින්සන් PR

2010 - ශ්‍රී ලංකා රු.5,172,750.00
ඇ.එ.ඩො. 45,000.00

(ඇ) ස්ටිව් හෙජස්:

2010 - ශ්‍රී ලංකා රු.5,509,693.20
ඇ.එ.ඩො. 49,106.00

(ඈ) මැජෝරිටි ගෘප් LLC

2010 - ශ්‍රී ලංකා රු.46,732,602.00
ඇ.එ.ඩො. 354,000.00

(vii) (අ) පැටන් බොග්ස් (LLP):

විදේශ කටයුතු අමාත්‍යාංශ වැය ශීර්ෂ - 112 -2-3-1405

(ආ) ක්‍රැන්ෆර්ඩ් ජොන්සන් රොබින්සන් PR

අදාළ තොරතුරු විදේශ කටයුතු අමාත්‍යාංශයේ නොමැත.

(ඇ) ස්ටිව් හෙජස්

විදේශ කටයුතු අමාත්‍යාංශ වැය ශීර්ෂ - 112 -2-3-1405

(ඈ) මැජෝරිටි ගෘප් LLC

විදේශ කටයුතු අමාත්‍යාංශ වැය ශීර්ෂ - 112 -2-3-1405

(ආ) පැන නොනඟී.

ගරු මන්ත්‍රීතුමනි, මේ ආකාරයට තමයි, විදේශ කටයුතු අමාත්‍යාංශයේ තිබෙන තොරතුරු අනුව පෙනී යන්නේ. මේ ආකාරයෙන් මහජන සම්බන්ධතා පැවැත්වීම සහ වෙනත් ඔය කිව්ව කාරණා අනුවයි මේ ආයතන හතරකට ඔබතුමා කිව්ව කාල වකවානුව තුළ මේ මුදල් ගෙවීම් කර තිබෙන්නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, ආසන්න වශයෙන් ගත්තොත් ඇමෙරිකන් ඩොලර් ලක්ෂ 13 ඉක්මවන, ඒ කියන්නේ රුපියල් කෝටි 15ක් ඉක්මවන මුදලක් ඇමෙරිකා එක්සත් ජනපදය තුළ ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය වර්ධනය කරන්නත්, මාධ්‍ය ප්‍රචාරක ලබා ගැනීම වෙනුවෙනුත් වැය කර තිබෙනවා. මෙයින් සමාගම් දෙකක් තෝරා ගෙන තිබෙන්නේ, කිසිදු තෝරා ගැනීමේ පටිපාටියක්වත් නොදන්නා ආකාරයටයි.

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය නැංවීම වෙනුවෙන් සමාගම් හතරක් දායක කර ගෙන තිබුණත්, ඇමෙරිකා එක්සත් ජනපදය විසින් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සංවිධානය වෙත ශ්‍රී ලංකාවේ යුද අපරාධ පිළිබඳ පරීක්ෂණයක් පැවැත්විය යුතුයයි පසු ගිය කාලයේ යෝජනාවක් ගෙන එනු ලැබුවා. එසේ නම් සිදු වී තිබෙන දෙය තමයි අපි මුදල් නාස්ති කළාට, ඒ මුදල් වියදම් කරමින් අපි අපේක්ෂා කළ ප්‍රතිඵලය ඒ රටෙන් ලැබී නොමැති වීම. මෙම මුදල් වියදම් කළ එම ආයතනවලින් ලබා ගන්නා ලද කාර්යය පිළිබඳව සෑහීමකට පත් විය හැකි ද කියා මම ඔබතුමාගෙන් දැන ගන්නට කැමැතියි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම කිසිම ආකාරයකින් සෑහීමට පත් වන්නට බැහැ. ඒ වාගේම මේ ආයතනවල විශ්වාසනීයභාවය පිළිබඳවත්, ඒගොල්ලන්ගේ තිබෙන හැකියාවන් පිළිබඳවත් ලොකු ප්‍රශ්න තිබෙනවා. ඇත්ත වශයෙන්ම මේ කාල සීමාව තුළ මේ තරම් මුදල් ප්‍රමාණයක් වියදම් කිරීම සාධාරණීකරණය කරන්නට බැරි තරම් ප්‍රමාණයක් බව පෙනෙනවා. අනෙක් අතට බැලුවාම, රුපියල් කෝටි 15ක් වියදම් කරලාත් කරන්න බැරි වුණු දේවල් ගරු මංගල සමරවීර මැතිතුමා විදේශ කටයුතු ඇමතිවරයා වශයෙන් පත් වුණාට පසුව අපේ අමාත්‍යාංශය මේ මාස එකහමාර තුළ කර තිබෙන අතර, ඊට වඩා ධනාත්මක තත්ත්වයක් ඇති කර ගන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම මේ මුදල නාස්තියක් තමයි. ආපසු හැරිලා බැලුවාම, මේ විධියට මුදල් වියදම් කිරීම අමාත්‍යාංශය පැත්තෙන් නාස්තියක් වශයෙනුයි අපට පෙනෙන්නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මෙහි එක් ආයතනයක කාර්ය භාරය ලෙස සඳහන් කර තිබුණා, "කොංග්‍රසයේ මුදල් රැස් කිරීම" කියලා. ගරු කථානායකතුමනි, කොංග්‍රසයේ මුදල් රැස් කිරීම කියලා අපේක්ෂා කළේ කුමක්ද කියන එක මට තේරෙන්නේ නැහැ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

කොංග්‍රසයේ සාමාජිකයන් සඳහා මුදල් රැස් කිරීමේ කටයුතු.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, "කොංග්‍රසයේ මන්ත්‍රීවරුන් සඳහා මුදල් රැස් කිරීමේ කටයුතු". ඒ කියන්නේ කුමක්ද? ඒ කියන්නේ මෙහේ වාගේම විවිධ පිරිස්වලට පගා දීලා, සල්ලි දීලා, ඇමති වරදාන දීලා දිනා ගත්තා වාගේම, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සඳහා සල්ලි දීලා මන්ත්‍රීවරුන් ගත්තා වාගේම, අපේ රටට එරෙහිව එන යම් ක්‍රියා මාර්ග වැළැක්වීම වෙනුවෙනුත් කොංග්‍රසයේ මන්ත්‍රීවරුන් මිල දී ගන්න එහෙත් උත්සාහයක් දරා තිබෙනවාද?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු මන්ත්‍රීතුමනි, අප සතුව තිබෙන ලියවිලි අනුව ඇමෙරිකා එක්සත් ජනපදයේ කොංග්‍රසයේ සාමාජිකයන් සඳහා මුදල් රැස් කිරීමේ කටයුත්ත මොවුන් යොදා ගත් අරමුණක් විධියට සඳහන් වෙනවා.

ඇත්තටම මුදල් රැස් කරලා, මුදල් දීලාත් වැඩේ නොකෙරුණා ද කියලා කියන්න අපි දන්නේ නැහැ. ඒ වාගේම මුදල් රැස් කරලා නොදී හිටියා වෙන්නත් පුළුවන්. ඒ නිසා මෙක බරපතළ ප්‍රශ්නයක්. ඇත්ත වශයෙන්ම කිව්වොත් මැජෝරිටි ගෘප් එල්එල්සී කියන සමාගමට අදාළවයි මේ කාරණය තිබෙන්නේ. මේ මැජෝරිටි ගෘප් එල්එල්සී ආයතනය තෝරා ගත්ත ආකාරය පිළිබඳ කිසිම ලේඛනයක් නැහැ. ඒ වාගේම එකතු කරපු මුදල් පිළිබඳවත් කිසිම තොරතුරක් නැහැ. ඒ වාගේම මේ මුදල් කාට දුන්නා ද කියලා කිසි තොරතුරක් නැහැ. නමුත් මේ විධියට රජයේ අවසරයක් සහිතව මෙවැනි සමාගමකට මෙවැනි කාරණයක් පැවරුවාම අසීමිත ලෙස මුදල් එකතු කිරීමේ හැකියාවක් ඔවුන්ට ඇති වෙනවා. හැබැයි, එකක් පැහැදිලියි. මේ සමාගමෙන් කිසිම ප්‍රයෝජනයක් වෙලා නැති බව පැහැදිලියි. හැබැයි, මේ සඳහා අවසර දීපු ඇමතිවරයා, නියෝජ්‍ය ඇමතිවරයා, ඊටත් වඩා ඇමතිවරයා වාගේ හිටපු අධීක්ෂණ මන්ත්‍රීවරයා, ඒ පුද්ගලයන් මොනවා කළාද කියලා කිසිම තොරතුරක් අපේ අමාත්‍යාංශයේ නැහැ. ඒක ඉතාම කනගාටුදායක තත්ත්වයක්. ඇත්ත වශයෙන්ම ඇමෙරිකා එක්සත් ජනපදයට චෝදනා කරන්න බැහැ. අපි දන්නා ආකාරයට ඇමෙරිකා එක්සත් ජනපදය යම් ආකාරයක ඔවුන්ගේ පාලන කටයුතු පිළිබඳව යහ පාලන මූලධර්ම අනුගමනය කරන රාජ්‍යයක්. ඒ නිසා අයුතු ලෙස ඇමෙරිකානු කොංග්‍රසයේ සාමාජිකයන්ගේ සහය ලබා ගැනීමට උත්සාහයක් තිබිලා තිබෙන බව මෙතැන පෙනෙනවා. ඒ උත්සාහය අසාර්ථක වෙලා තිබෙනවා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ගරු කථානායකතුමනි, මේ පිළිතුරේ සඳහන් වුණා ඇමෙරිකානු කොංග්‍රසයේ සාමාජිකයන්ට මුදල් එක්රැස් කළා කියලා. දැන් ඒක සඳහන් වුණු නිසා ආණ්ඩුවට ඒක විභාග කරන්න සිදු වනවා. මොකද, ඇමෙරිකානු කොංග්‍රසයේ සාමාජිකයන්ට මුදල් දෙන එක ඇත්ත වශයෙන්ම ඇමෙරිකානු නීතියට පටහැනියි. ලංකාවේ වාගේ නොවෙයි. එහෙම නම් අපට ඒ තොරතුර ලැබුණා කියලා දැනුම් දෙන්න ඕනෑ. මොකක්ද හේතුව කියලා කියන්න ඕනෑ.

මේ සමාගම්වලින් එහෙම එකක් කර තිබෙනවා නම් මම ඒ ගැන නියෝගයක් දෙන්නම්. ඇමතිතුමා පැමිණියාම මේ ගැන විභාග කර බලා, නීතිය කඩ කිරීමක් සිදු වෙලා තිබෙනවා නම් විශේෂයෙන්ම ඒ පිළිබඳව අපි ඇමෙරිකාවටත් දැනුම් දෙන්න ඕනෑ. නියෝජ්‍ය ඇමතිතුමා කී ආකාරයට මේ ඔක්කොම වියදම් කළත් අන්තිමට අපි මේ මුදල් ටික දෙන්න ඕනෑ ජනතාවටයි. ජනතාව දුන් වරම අනුව තමයි මේ ඔක්කොම වෙනස් වෙන්න පටන් ගත්තේ.

මැජෝරිටි ගෘප් සමාගම ඒ කාලයේදී මහජන නියෝජ්‍ය සභාව පාලනය කළ රිපබ්ලිකන් පක්ෂයට කිසිම සම්බන්ධයක් තිබුණේ නැහැ. මම හිතන හැටියට ඩිමොක්‍රටික් පක්ෂයේ කොන්ග්‍රස් සාමාජිකයෙක් හිටියේ. වෙන එකක් තබා ඇත්ත වශයෙන්ම ඩිමොක්‍රටික් පක්ෂය පාලනය කරපු සෙනෙට් සභාවේ විදේශ කටයුතු කමිටුවේ සභාපතිතුමාවත්, රිපබ්ලිකන් පක්ෂයේ ඉන්න ප්‍රධාන නියෝජිතයාවත් කිසිම සම්බන්ධයක් තිබුණේ නැහැ. අපි ඒ ගොල්ලන් සියලු දෙනාම මුණ ගැහිලා තිබෙනවා, ඒ අය දන්නවා. කොහොම හරි මේ ගැන විභාග කරන්න තිබෙනවා.

මෙහෙම එකක් සිදු වුණාය කියා මේ පිළිතුර අනුව අපේ මේ සභාවේදී මතු වුණු නිසා, මම ඇමතිතුමා ආවාම කියන්නම්, ඒ ගැන සොයා බලන්න කියලා. ඒ මාර්ගයෙන් ඇමෙරිකාවේ නීතිය කඩලා තිබෙනවා නම් ඒ ගැන දැනුම් දිය යුතුව තිබෙනවා. වෙන එකක් නිසා නොවෙයි, ඇමෙරිකාවේ කොන්ග්‍රස් සාමාජිකයෙක් කෑමකට අරගෙන ගියොත් එතුමාට කියන්න සිදු වෙනවා, කවුද කෑමට අරගෙන ගියේ, ඇයි ආරාධනා කළේ කියලා. විශේෂ සමාගමක වැඩ කරන තමන්ගේ නෑදෑයෙක් ඉන්නවා නම් ඒකත් හෙළි කරන්න වෙනවා.

අන්න එහෙම ඉතා තද නීති ඇමෙරිකානු කොන්ග්‍රස් සභාවේ තිබෙන්නේ. මම දන්නේ නැහැ මේකෙන් සිදු වුණේ මොකක්ද කියලා. අපට මේ පිළිබඳව කථා කරලා බලලා කියන්න වෙයි.

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

පැටන් බොග්ස් සමාගම ඩිමොක්‍රටික් පක්ෂයට හුඟක් සම්බන්ධකම් තිබුණු සමාගමක්. පසුව ඒක ඉවත් කර තිබෙනවා. කොහොමත් එහි ප්‍රධාන අධ්‍යක්ෂතුමා මරණයට පත් වුණා. එම නිසා දැන් එතැනින් එම සහයෝගය ගන්න බැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි. ඇත්තටම අපට හිතෙනවා, ආණ්ඩුව අවුරුද්දෙන් අවුරුද්ද මාරු වෙනවා නම් හොඳයි කියලා. මොකද, එතකොට තමයි ගිය අවුරුද්දේ පැවැති ආණ්ඩුවෙන් කරපු දේවල් මේ අවුරුද්දේ පවතින ආණ්ඩුවෙන් දැන ගන්න පුළුවන් වන්නේ; ඒ වාගේම මේ ආණ්ඩුවෙන් කරන දේවල් ඊළඟ අවුරුද්දේ පත් වෙන ආණ්ඩුවෙන් දැන ගන්න පුළුවන් වන්නේ. ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවට පසු ගිය කාලය පුරාවටම මේ තොරතුරු වසන් කිරීමක් තමයි සිදු වී තිබෙන්නේ. මේ ආකාරයෙන් පිළිතුරු ලැබුණේ නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ව්‍යවස්ථා සංශෝධනයේදී ඒක කර ගන්න පුළුවන්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, මම දැන ගන්න කැමැතියි, මෙම සමාගම් වෙත මෙම මූල්‍ය ප්‍රතිපාදනයන් ලබා දීමට අමතරව විවිධ නීතිඥ සහායන් එම සමාගම් වෙත ලබා ගැනීම වෙනුවෙන් හෝ තානාපති කාර්යාල වෙත ලබා ගැනීම වෙනුවෙන් යම් මුදල් ප්‍රමාණයක් වියදම් කර තිබේද කියලා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු මන්ත්‍රීතුමනි, මුලින්ම සඳහන් කරන්න ඕනෑ, ඔබතුමා මෙම ප්‍රශ්නයට ලබා දුන් ප්‍රවේශය සම්බන්ධව. ඇත්ත වශයෙන්ම ඔබතුමා කියන කාරණය නිවැරදියි. ආණ්ඩු මාරු වෙන කොට කලින් පැවැති ආණ්ඩුවේ අඩු පාඩුකම් පෙන්වා දෙනවා. ඒ වාගේම ඔබතුමන්ලා හැම දාමත් විපක්ෂයේ ඉන්නේ නැතුව ආණ්ඩු බලයට සම්බන්ධ වෙනවා නම් අපටත් ඔබතුමන්ලාව ප්‍රශ්න කරන්නට පුළුවන්කම ලැබෙනවා. එම නිසා අපි ප්‍රාර්ථනා කරනවා, ආණ්ඩුවක් තුළ ඔබතුමන්ලා දකින්නට ලැබේවායි කියලා. ඔබතුමා ඇසූ ප්‍රශ්නය හුඟක් වැදගත් එකක්.

ගරු මන්ත්‍රීතුමනි, විදේශ කටයුතු අමාත්‍යාංශයේ තිබෙන තොරතුරු අනුව පෙනෙනවා නඩු කටයුතු කියා සඳහන් කරලා 2009 දී ඇමෙරිකන් ඩොලර් 20,000ක්, 2011 දී ඇමෙරිකන් ඩොලර් 250,000ක්, 2011 දී ඇමෙරිකන් ඩොලර් 87,000ක්, 2012 දී ඇමෙරිකන් ඩොලර් 90,585.78ක්, 2013 දී ඇමෙරිකන් ඩොලර් 120,000ක් හා 2011 දී ඇමෙරිකන් ඩොලර් 150,000ක් වශයෙන් නීතිඥවරුන්ගේ සහාය ලබා ගැනීම කියන ශීර්ෂය යටතේ විශාල මුදල් ප්‍රමාණයක් ලබා ගෙන තිබෙන බව. ඒ මුදල් ලබා ගෙන තිබෙන වැය ශීර්ෂයන් වශයෙන් සඳහන් වන්නේ ජනාධිපති ලේකම් කාර්යාල වැය ශීර්ෂය 001-1-1-02502-02 සහ 001-1-21405යි. නැවත වරක් 001-1-21405 වැය ශීර්ෂය සඳහන් වනවා. ලොකු මුදලක් ලබා ගෙන තිබෙනවා. ඇත්ත වශයෙන්ම ගරු මන්ත්‍රීතුමනි, මේ ලේඛන අනුව අපට ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, මහජන සම්බන්ධතා වර්ධනය කිරීම කියන විෂයයයි, නීතිඥවරුන්ගේ සහාය ලබා ගැනීම කියන එකයි සම්පූර්ණයෙන්ම එකිනෙකට වෙනස් රාජකාරි. යම් කාරණයක් පිළිබඳව තානාපති කාර්යාලයට නීතිඥ සහාය අවශ්‍ය නම් පිළිගත් නීතිඥ සමාගමක සහාය සෘජුව පතන්න පුළුවන්. හැබැයි, මෙතැනදී නීතිඥ සමාගමක සහාය සෘජුව පතන්නේ නැතුව අතිවිශාල මුදල් ප්‍රමාණයක් ලබා දීලා තිබෙනවා මහජන සම්බන්ධතා කටයුතු සඳහා ලබා ගත්තා වූ සමාගම්වලට. මෙය බැලූ බැල්මටම ප්‍රශ්න සහගත බව මට පෙනී යනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, අරුම පුදුම වැඩක් තමයි වෙලා තිබෙන්නේ. ප්‍රතිරූපය නැංවීම වෙනුවෙන් සමාගම්වලට ඩොලර් ලක්ෂ 13කට ආසන්න ප්‍රමාණයක් ගෙවනවා. තවත් ඩොලර් ලක්ෂ 8කට ආසන්න ප්‍රමාණයක්, ඒ කියන්නේ රුපියල් කෝටි 10කට ආසන්න මුදල් ප්‍රමාණයක් ඇමෙරිකාවේ නීතිඥවරුන්ගේ සහාය පැතීම වෙනුවෙන් එම සමාගම් මඟින්ම වියදම් කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ රටේ ජනතාවට විශාල ප්‍රශ්න ගණනාවක් මතු වෙලා තිබියදී මුදල් කෝටි ප්‍රකෝටි ගණනින් මේ ආයතනය විනාශ කර තිබෙනවා. එම නිසා සියලු වියදම් සිදු වූ ආකාරය පිළිබඳව ගරු නියෝජ්‍ය ඇමතිතුමා සොයා බලා මේ පාර්ලිමේන්තුවට වර්තාවක් ඉදිරිපත් කරනවා ද කියා දැන ගන්න කැමැතියි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අදහස සම්බන්ධව ගරු අග්‍රාමාත්‍යතුමාත් මෙම අවස්ථාවේදී විශේෂයෙන් කාරණයක් සඳහන් කළා. ගරු අග්‍රාමාත්‍යතුමාගේ උපදෙසත්, ඔබතුමාගේ ප්‍රශ්නයත් පිළිබඳ දැනුම් දීලා මේ එක් එක් සමාගම තෝරාගත් ආකාරය, කටයුතු කරපු ආකාරය, ඔවුන්ගේ විෂය පථය, නීතියට පටහැනිව කටයුතු කර තිබෙනවා ද කියන කාරණා සහ ඔබතුමා සඳහන් කළ ආකාරයට අනෙකුත් තොරතුරු පිළිබඳව සොයා බලා කටයුතු කිරීම අනිවාර්යෙන්ම යහ පාලනය අගය කරන ආණ්ඩුවක් විධියට අපට කරන්නට සිදු වෙනවා. එම නිසා මෙම ප්‍රශ්නය නැගීම සම්බන්ධයෙන් ඔබතුමාට මම ස්තුතිවන්ත වෙනවා. බොහොම ස්තුතියි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 12 -4781/'14-(1), ගරු අශෝක් අබේසිංහ මහතා.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 13- 4819/'14-(1), ගරු බුද්ධික පතිරණ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ලෝක ආහාර සංවිධානයට පරිත්‍යාග කළ සහල්: විස්තර
உலக உணவு அமைப்புக்கு அன்பளிப்புச் செய்யப்பட்ட அரிசி : விபரம்
RICE DONATED TO WORLD FOOD PROGRAMME : DETAILS

5096/'14

14.ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2014 අය වැය ලේඛනය මගින් ලෝක ආහාර සංවිධානය වෙත පරිත්‍යාග කරනු ලබන බවට යෝජනා කළ සහල් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අනුව, මේ වන විට පරිත්‍යාග කර ඇති සහල් ප්‍රමාණය කොපමණද;

(iii) එම සහල් තොගය මිලදී ගනු ලැබුවේ කුමන ආයතනයක් වෙතින්ද;

(iv) එම සහල් තොගය වී අළෙවි මණ්ඩලය විසින් මිලදී ගනු ලැබුවේ නම්, ඒ සඳහා වී අළෙවි මණ්ඩලය විසින් වැය කළ මුදල කොපමණද;

(v) එම සහල් තොගය සඳහා වී අළෙවි මණ්ඩලය වෙත ලබා දී ඇති මුදල කොපමණද;

(vi) ඒ අනුව එම සහල් මෙට්‍රික් ටොන් එකක් සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

உணவுப் பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2014ஆம் ஆண்டின் வரவு செலவுத்திட்டத்தின் மூலம் உலக உணவு அமைப்புக்கு அன்பளிப்புச் செய்வதாக முன்மொழியப்பட்ட அரிசியின் தொகை எவ்வளவு என்பதையும்;

(ii) அதன் பிரகாரம், இற்றைவரை அன்பளிப்புச் செய்யப்பட்டுள்ள அரிசித்தொகை எவ்வளவு என்பதையும்;

(iii) இந்த அரிசித் தொகை எந்நிறுவனத்திலிருந்து கொள்வனவு செய்யப்பட்டது என்பதையும்;

(iv) மேற்படி அரிசித் தொகை நெல் சந்தைப்படுத்தல் சபையினால் கொள்வனவு செய்யப் பட்டிருப்பின், இதற்காக நெல் சந்தைப்படுத்தல் சபை செலவு செய்த பணத்தொகை யாதென்பதையும்;

(v) மேற்படி அரிசித் தொகைக்காக நெல் சந்தைப்படுத்தல் சபைக்கு வழங்கப்பட்டிருந்த நிதித்தொகை எவ்வளவு என்பதையும்;

(vi) அதன் பிரகாரம், ஒரு மெட்ரிக் தொன் அரிசிக்காக செலவு செய்யப்பட்ட பணத்தொகை எவ்வளவு என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Food Security:

(a) Will he inform this House -

(i) the quantity of rice that was proposed to be donated to the World Food Programme as a donation by the Budget 2014;

(ii) the quantity of rice that has been donated so far in accordance with that proposal;

(iii) the institute from which that stock of rice was purchased;

(iv) if that stock of rice was purchased by the Paddy Marketing Board, the amount of money spent by the Paddy Marketing Board on that;

(v) the amount of money made available to the Paddy Marketing Board to purchase that stock of rice; and

(vi) the amount of money spent on a metric tonne of such rice?

(b) If not, why?

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (ආහාර සුරක්ෂිතතාව අමාත්‍යතුමා)
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - உணவுப் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. Gamini Jayawickrama Perera - Minister of Food Security)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) මෙට්‍රික් ටොන් 50,000

(ii) මෙට්‍රික් ටොන් 2,568.81

(iii) එම වී තොගය වී අළෙවි මණ්ඩලය වෙතින් ලබා ගන්නා ලදී.

(iv) මුළු මුදල රුපියල් 195,453,751.61කි. (රුපියල් එකසිය අනූපන් මිලියන හාරසිය පනස් තුන් දහස් හත්සිය පනස් එකයි ශත හැට එකකි.)

[ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා]

(v) එම වී තොගයේ සම්පූර්ණ වටිනාකම රුපියල් 195,453,751.61 වන අතර මෙම මුදල වී මිලදී ගැනීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් වී අළෙවි මණ්ඩලය වෙත ලබා දුන් මුදල්වලින් භාණ්ඩාගාරය සඳහා තවදුරටත් අය විය යුතු මුදලින් අඩු කර ගන්නා ලදී.

(vi) සම්බා රුපියල් 42,500යි. නාඩු රුපියල් 39,050යි. (වී අළෙවි මණ්ඩලයේ වාර්තා අනුව)

(ආ) අදාළ නොවේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේදී 2014 අය වැය ලේඛනය ඉදිරිපත් කරමින් එවකට මුදල් අමාත්‍යවරයා කිව්වා, ලෝක ආහාර සංවිධානය වෙනුවෙන් මෙට්‍රික් ටොන් 50,000ක සහල් පරිත්‍යාගයක් අපි කරනවා කියා. හැබැයි දැන් පෙනී යමින් තිබෙන්නේ මෙට්‍රික් ටොන් 50,000ක පරිත්‍යාගයක් වෙලා නැහැ, මෙට්‍රික් ටොන් 2,500කට ආසන්න සහල් ප්‍රමාණයක් තමයි යවලා තිබෙන්නේ කියා. අය වැය ලේඛනය සකස් කිරීමේදී රටේ තිබෙන හාල් තොග පිළිබඳ ප්‍රමාණය, අපට පරිත්‍යාග කළ හැකි ප්‍රමාණය පිළිබඳව නිසි ඇගයීමකින් තොරවද මේ මෙට්‍රික් ටොන් 50,000 කියන එක දැම්මේ? මොකද, ඒක පාර්ලිමේන්තුවේ කියපු කථාවක්. මම දැක්කා, මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් ඒ පරිත්‍යාගය පිළිබඳව කියන කොට මේසවලට ගහනවා.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

ගරු කථානායකතුමනි, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ඒ නියෝජිත මහත්වරු සති දෙකකට විතර ඉස්සෙල්ලා මාව හම්බ වුණා. අපේ රටවල් අතර ප්‍රතිපත්ති තීරණයක් තිබෙනවා. සාමාජික සෑම රටක්ම එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර සංවිධානයට මෙවැනි ආහාර තොගයක් පරිත්‍යාග කරන්න බැඳිලා සිටිනවා. අපේ ලංකාවේ ආපදාවක් -සුනාමියක් හෝ, පෑවිල්ලක් හෝ, මහ ගං වතුරක් හෝ- වුණා නම් ලෝක ආහාර සංවිධානය තම සාමාජික රටවලින් ලබා ගත් ධාන්‍ය වර්ග ඒ රටෙන් මෙහාට පරිත්‍යාග කරනවා. එතුමන්ලා කථා කරද්දී මට කරුණු පෙන්නුවේ, අපි තව මෙට්‍රික් ටොන් 10,000ක් දෙන්න බැඳිලා සිටිනවා කියා. අපේ ලේකම්තුමා ඇතුළු අපි කථා වුණේ, එවැනි බැඳීමක් තිබෙනවා නම් අපි ඒක දිය යුතු දෙයක්ය කියන එකයි. මොකද, සාමාජික රටක් විධියට අපි ඒක කරන්න ලෝක ආහාර සංවිධානයට බැඳී සිටිනවා. සහල් මෙට්‍රික් ටොන් 50,000 ගැන මම යමක් කියන්න ඕනෑ. ගරු කථානායකතුමනි, අය වැයෙන් මෙච්චර ප්‍රමාණයක් දෙනවා කිව්වාට රටේ බොහොම කනගාටුදායක තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා.

පසු ගිය අවුරුද්දේ විශාල පෑවිල්ලක් ඇති වුණාය කියා සහල් මෙට්‍රික් ටොන් 225,000ක් ගෙන්වා තිබෙනවා. ඒ කියන්නේ ඇමෙරිකානු ඩොලර් මිලියන 45ක -දසලක්ෂ අසූඅටදාහක- සහල් ගෙන්වා තිබෙනවා. මේ ගෙන්වීම තවමත් වනවා. ඒක හරි කනගාටුදායක තත්ත්වයක්. බංග්ලාදේශයෙන් සහ ඉන්දියානු රජයෙන් පොන්නි සම්බා හා නාඩු තව මෙට්‍රික් ටොන් ලක්ෂයක් ගෙනෙන්න තිබෙනවා. මමත් පොන්නි සම්බාවලට හරි ආසයි. ඒ අවස්ථාවේ අපි බලයට ඇවිල්ලා තිබුණේ නැහැ. අපේ රජය බාර ගන්න කොට ලංකා සතොස ආයතනයේ බඩු තිබුණේ නැහැ. ඒ ගැන අහද්දී කිව්වා, ඉවරයි කියා. නමුත් මම ආහාර සුරක්ෂිතතාව පිළිබඳ අමාත්‍යවරයා වුණාට පසුව දැක්කා, වේයන්ගොඩ ලංකා සතොස වැනි ගබඩාවල ගුල්ලෝ ගහලා සහල් මෙට්‍රික් ටොන් 65,000ක් නරක් වෙලා තිබෙන ආකාරය. තවත් සහල් මෙට්‍රික් ටොන් ලක්ෂයක් අපේ රටට එන්න තිබෙනවා. වෙළෙඳ පොළේ සහල් කිලෝවක මිල රුපියල් 54යි. නමුත් ලංකා සතොස කිලෝ එකක් අරගෙන තිබෙන්නේ රුපියල් 60ට. සහල් මෙට්‍රික් ටොන් 2,25,000ක් අපේ රටට ගෙන්වා තිබෙනවා. මේ රටේ සම්පත් විනාශ වුණා. මම නිලධාරින්ගෙන් ඇහුවා, "සහල් මෙට්‍රික් ටොන් 65,000ක් ගුල්ලෝ ගහන තුරු හිටියේ ඇයි, මේවා ඡන්ද කාලයේදීවත් බෙදුවේ නැත්තේ ඇයි?" කියා. සතොස කියන ආයතනයේ සහල් බෙදීමට වාහන එකසිය ගණනක් තමයි කොන්ත්‍රාත්තුව වශයෙන් අරගෙන තිබුණේ. එතකොට මම ඇහුවා, "මේවා බෙදුවේ නැත්තේ ඇයි?" කියා.

ගරු කථානායකතුමනි, ඒ ඔක්කොම ලොරිවලින් ලංකාවේ ඡන්ද පෝස්ටර් බෙදීම කළා මිසක් ආහාර ද්‍රව්‍ය බෙදුවේ නැහැ. මම ඇහුවා, "කුලියට වාහන අරගෙන හෝ මේවා බෙදුවේ නැත්තේ ඇයි?" කියා. ඒ ප්‍රශ්නයට උත්තර දෙන්න ලංකා සතොස ආයතනයේ නිලධාරින්ට බැරි වුණා. මේවා නිකම් හෝ හරියට බෙදලා ජනතාවට කන්න දුන්නා නම් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා දිනනවාය කියා මම කිව්වා.

අනුර දිසානායක මන්ත්‍රීතුමනි, මෙවැනි බේදනීය තත්ත්වයන් අපේ රටේ සිදු වෙලා තිබෙනවා. ඒක ඇත්ත. විශාල වංචාවන්, ගසා කෑම් සිදු වෙලා තිබෙනවා. රටේ සම්පත් විනාශ වෙලා තිබෙනවා. දසලක්ෂ 88,000ක පොන්නි සම්බා වැනි දේවල් තවම අපේ රටට ගෙනෙනවා. නමුත් අපේ රජය මිල පාලනයක් කරනවා. සම්බා කිලෝවකට රුපියල් 50ක සහතික මිලක් අපි දීලා තිබෙනවා. නාඩුවලට රුපියල් 45ක සහතික මිලක් ලබා දීලා තිබෙනවා. අගමැතිතුමා සහ අපේ ජනාධිපතිතුමා පැහැදිලිව කිව්වා, "පෑවිල්ල සහ ගංවතුර නිසා ගොවියා අවුරුදු ගණනාවක් දුක් වින්දා; ඒ නිසා මේ ගොවියාගේ ආර්ථිකය දියුණු කරන්න ඕනෑ" කියා. අපටත් ලොකු ප්‍රශ්න තිබෙනවා, ගරු කථානායකතුමනි. අනුර දිසානායක මන්ත්‍රීතුමා මේ ප්‍රශ්නය අහපු එක හොඳයි. ගමේ ගොවියෝ අපේ රටේ නිෂ්පාදනයට සියයට 70ක දායකත්වයක් සපයනවා. ගොවියා ආරක්ෂා කරන්න ඕනෑ. ගමේ ආර්ථිකය දියුණු වෙන්න නම් ගොවියාගේ ආර්ථිකයත් දියුණු වෙන්න ඕනෑ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න ඉඩ දෙමුද?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

තවම වී මිල දී ගන්නේ නැහැ. [බාධා කිරීමක්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගාමිණී ජයවික්‍රම පෙරේරා ඇමතිතුමනි, කලබල වෙන්න එපා. මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි. මම එතුමාගෙන් ඇහුවේ සහල් ලෝක ආහාර සංවිධානයට ලබා දීම පිළිබඳවයි. එතුමා හාල් ගුල්ලෝ කාපුවා, අරවා මේවා ගොඩාක් කිව්වා. ඒකට කමක් නැහැ. ඒවා අපි පස්සේ දවසක සාකච්ඡා කරමු.

ගරු කථානායකතුමනි, අපේ රටේ සාමාන්‍යයෙන් සහල් නිෂ්පාදනය පිළිබඳව යම් පූර්ව වාර්තාවන් සකස් කරනවා. ඒ පූර්ව වාර්තාවන් අනුව අපට නිගමනයකට එන්න පුළුවන්, අපට සහල් මෙට්‍රික් ටොන් 50,000ක් වැනි විශාල තොගයක් ලබා දෙන්න

පුළුවන්ද, බැරිද කියා. ගරු කථානායකතුමනි, අනික් පැත්තෙන් ගත්තාම ලෝක ආහාර සංවිධානය සහ ශ්‍රී ලංකාව අතර තිබෙන බැඳීම අනුව අපි කිසිසේත්ම සහල් මෙට්‍රික් ටොන් 50,000ක් ලබා දිය යුතු නැහැ. ඒක අපේ quota එක නොවෙයි. ඒ අපේ quota එක වාගේ තුන් ගුණයක්. රටේ සහල් හිඟයක් තිබියදී සාමාන්‍ය ජනතාවට සහල් මිල දී ගන්න විශාල මුදලක් වැය කරන්න සිද්ධ වී තිබියදී, රටේ සහල් මිල ඉහළ යමින් තිබියදී ලෝක ආහාර සංවිධානයට අපි විසින් ලබා දීපු quota එක, අපි විසින් ලබා දිය යුතු තුන් ගුණයක පංගුවක එකඟතාවට පැමිණීමට හේතු කවරේද කියා ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

රටට සේවාවක් ලබා දිය හැකි, අපේ රටේ නිදහස් සෞඛ්‍ය සේවාව ශක්තිමත් වන, ජනහිතකාමී මේ පනත් කෙටුම්පත සම්මත කිරීමෙන් පසු පොදු මහ ජනතාවට ලැබෙන ප්‍රතිලාභ රාශියක් තිබෙනවා. ප්‍රමිතියෙන් යුත් ඖෂධ, ඒ වාගේම ඖෂධවලට බලපාන මිල පාලනය කිරීම වැනි කරුණු රාශියක් ඇතුළත් රටේ පොදු මහ ජනතාවට බලපාන ඉතා වැදගත් පනත් කෙටුම්පතක් තමයි මෙය. එවැනි පනත් කෙටුම්පතක් අතුරුදහන් වුණාම ගරු කථානායකතුමනි, ඒ අවස්ථාවේ සෞඛ්‍ය අමාත්‍යවරයා විධියට සිටි මමත්, ඒ සම්බන්ධයෙන් රට තුළ ඇති වූ ජනමතයත්, මේ පාර්ලිමේන්තුව තුළ ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය එවකට සාකච්ඡා කළ කරුණුත් පදනම් කර ගෙන නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව අයත්ව සිටි බලධාරින්ට මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන්න අවස්ථාව තිබුණා. නමුත්, 2015 ජනවාරි මාසයේ අටවැනි දා මම ජනාධිපති ධුරයට පත් වන තෙක්ම ගෙවී ගිය අවුරුදු පහකට ආසන්න කාලය තුළ මේ සම්බන්ධයෙන් කිසිදු පරීක්ෂණයක් කෙරුණේ නැහැ. නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ තිබුණා නම්, මම ඒ පරීක්ෂණය කරනවා. නමුත්, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව අයත්ව තිබුණේ කාටද කියලා කවුරුත් දන්නවා. ඒ තුළින් ඇති වූ ඉතාම අවාසනාවන්ත තත්ත්වය එක් අතකින් මේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඇති වූ බේදවාචකයක්. අවුරුදු 40කට ආසන්න කාලයක් තිස්සේ ජනතාව මෙය බලාපොරොත්තු වුණා.

මහාචාර්ය සේනක බිබිලේ මැතිතුමා සම්බන්ධයෙන් වාර්ෂිකව අපි ගුණ සමරු රැස්වීම් පවත්වනවා. මේ අවුරුදු හතළිස් ගණන තුළම ගුණ සමරු පවත්වන විට හැම ආණ්ඩුවකම, හැම සෞඛ්‍ය ඇමතිවරයෙක්ම මේ ඖෂධ පනත පිළිබඳව කථා කර තිබුණා. එවැනි බලාපොරොත්තු රාශියක් ඇතිව තමයි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමේ කටයුතු සිදු කිරීමට අවස්ථාව ලැබුණේ. නමුත් ඒ අවාසනාවන්ත තත්ත්වය කෙසේ හෝ අවසන් වෙලා මේ පනත් කෙටුම්පත අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ලැබීම මේ රටේ ජනතාව ලැබූ වාසනාවක්.

මේ දින සියයේ වැඩ පිළිවෙළ තුළ මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර, අද දින විවාද කර සම්මත කිරීමට අවශ්‍ය කටයුතු කිරීම සම්බන්ධයෙන් විශේෂයෙන්ම වර්තමාන සෞඛ්‍ය අමාත්‍ය ගරු රාජිත සේනාරත්න මැතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම පසු ගිය දිනවල අමාත්‍ය මණ්ඩලයට මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කර අමාත්‍ය මණ්ඩලයෙන් සම්මත කර ඉන් පසුව අද මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගැනීමට අවස්ථාව උදා කිරීම ගැන ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලයට මම ස්තුතිවන්ත වෙනවා.

පාර්ලිමේන්තුව නියෝජනය කරන ආණ්ඩු පක්ෂයේ වේවා, විපක්ෂයේ වේවා, සියලු දෙනාටම මගේ ගෞරවය පුද කරනවා. මේ පනත් කෙටුම්පත සම්මත කර ගැනීමට තමුන්නාන්සේලා සෑම කෙනෙකුගේම සහයෝගය ලැබේය කියා මා විශ්වාස කරනවා. ඒ තුළ මේ පනත් කෙටුම්පතෙන් අපි බලාපොරොත්තු වන අරමුණු ඉටු කර ගැනීමට අපි සියලු දෙනාම කටයුතු කිරීම අත්‍යවශ්‍ය දෙයක්.

මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් පසුව ගරු කථානායකතුමනි, මේ පනත් කෙටුම්පතේ තිබෙන අඩු පාඩුකම් පිළිබඳව විවේචන කිහිපයක් මේ දිනවල මාධ්‍ය තුළින් මා දැක්කා. අඩු පාඩුකම් තිබෙනවා නම් එක පැත්තකින් කාරක සභා අවස්ථාවේ අපට ඒවා සංශෝධනය කර ගන්න පුළුවන්. අනෙක් පැත්තෙන් මේ පනත් කෙටුම්පත අද සම්මත වෙලත් ඉන් පසුවත් පෙනෙන විශේෂ අඩු පාඩු මොනවා හෝ තිබෙනවා නම්, ඒ සඳහා සංශෝධන මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න පුළුවන්. එම නිසා මේ පනත් කෙටුම්පත මේ ආකාරයෙන් අපට මේ ගරු සභාවට ඉදිරිපත් කර සම්මත කර ගන්නට ලැබීම ඉතාමත් වැදගත් දෙයක් වාගේම මුළු මහත් ජාතියේම වාසනාවක් කොට මම සලකනවා.

ඖෂධ සහ මේ පනත් කෙටුම්පතේ වැදගත්කම පිළිබඳව කථා කරන විට ඖෂධ ගෙන්වීම, අලෙවිය, බෙදා හැරීම යන මේ කටයුතුවලදී අපේ රට තුළ සිදුවන විවිධ අක්‍රමිකතා දූෂණ පිළිබඳව මුළු රටේම පොදු මහජනතාව දන්නා වූ කාරණයක්. ඖෂධ සංස්ථාව පිළිබඳව කථා කරන විට, පසු ගිය අවුරුදු කිහිපයේම ගරු කථානායකතුමනි, ඖෂධ සංස්ථාවේ දූෂණ සහ වංචා පිළිබඳව ඇති වෙච්ච දුර්ගන්ධය මට තවත් දැනෙනවාය කියා මට හිතෙනවා.

ඖෂධ සංස්ථාවට අත තියන්න සෞඛ්‍ය අමාත්‍යවරයා විධියට මට ඉඩක් ලැබුණේ නැහැ. ඖෂධ සංස්ථාවේ සභාපතිවරයා විධියට හිටියේත් හිටපු ජනාධිපතිතුමාගේ වෛද්‍යවරයා. ඒ නිසා ඔහු හැසිරුණේත් ජනාධිපතිවරයෙක් විධියටයි. ඒ තමයි මහාචාර්ය ජයරත්න මහත්මයා. මම අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහත්මයා සමඟ අරලියගහ මන්දිරයේදී සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ ඖෂධ සංස්ථාවල ප්‍රගති සමාලෝචන රැස්වීම්වලදී ඖෂධ සංස්ථාවේ තත්ත්වය පිළිබඳව, දූෂණ, වංචා සම්බන්ධයෙන් පැහැදිලි කරන කොට එවකට රැස්වීමේ මූලාසනයේ සිටි මහින්ද රාජපක්ෂ මහත්මයා අවස්ථා කිහිපයකදීම මට කිව්වා "මේ දූෂණ වංචා ගැන මේකේ කථා කරන්න වුවමනාවක් නැහැ ඇමතිතුමා, මේවා Auditor-General බලා ගනී. ඒ නිසා ඒවා කථා කිරීම අවශ්‍ය වන්නේ නැහැ" කියලා. නිලධාරින් ඉදිරියේ ඇමතිවරයාට ඒ

[අතිගරු මෛත්‍රීපාල සිරිසේන මහතා]

විධියේ ප්‍රකාශයක් කළාම ගරු කථානායකතුමනි, ඇමතිවරයා මොන තරම් අසරණභාවයට පත් වෙනවාද කියන කාරණාව මේ ගරු සභාවේ ඉන්න මැති-ඇමතිකම් කරන කවුරුත් දන්නවා.

දූෂණ, වංචා පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශය සම්බන්ධයෙන්, ඖෂධ සංස්ථාවේ කටයුතු සම්බන්ධයෙන් එවකට අරලියගහ මන්දිරයේ පැවැති ප්‍රගති සමාලෝචන රැස්වීම්වල මම කරුණු ඉදිරිපත් කළ අවස්ථාවලදී ඊළඟට මට දුන්න අවවාදය තමයි, "මේ සියලු නිලධාරීන් මේ විධියට සැක කරන්න එපා. ඒගොල්ලන්ට අවශ්‍ය විධියට නිදහසේ වැඩ කරන්න දෙන්න. වංචා, දූෂණ තිබෙනවා නම් Auditor-General බලා ගනී. ඒ නිසා ඇමතිවරයා මේවාට අතගහන්න ඕනෑ නැහැ"යි කියන එක. එහෙම කිව්වාම ඊට පස්සේ මේ දූෂණ වංචාවලට සම්බන්ධ නිලධාරීන් පිනුම් ගහ ගහ, උඩ පැන පැන වංචා දූෂණ කරන්න පටන් ගත්තා. ඒගොල්ලන් තේරුම් ගත්තා, ඇමතිවරයාට බලයක් නැහැයි කියලා.

මම හිතන විධියට දෛවෝපගත සිද්ධියක් අද ජනාධිපතිවරයා විධියට මම මේ විවාදයට සහභාගි වන එක. ඒ මොකද, මේ සම්බන්ධයෙන්, මෙයට අකුල් හෙළපු අය කවුරුවත් හිතුවේ නැහැ, මේ පනත් කෙටුම්පත මේ ආකාරයෙන් සම්මත කරන්න ලැබෙයි කියලා.

ඖෂධ සංස්ථාව වාගේම, ඖෂධ සහ සුවඳ විලවුන් අධිකාරියත් තිබෙනවා. අද මේ පනත යටතේ හැදෙන අලුත් අධිකාරියට ඒ ආයතන සියල්ලම යටත් වෙනවා. ඖෂධ සහ සුවඳ විලවුන් අධිකාරිය, මේ අමාත්‍යාංශය යටතේ තිබෙන ඉතාම දූෂිත අනෙක් ආයතනය. මම මේ සම්බන්ධයෙන් කරුණු කියන්නේ ඕනෑම අවස්ථාවක සාක්ෂි සාධක සියල්ල ඉදිරිපත් කරන්න හැකියාව ඇතිවයි. නමුත් මේ කිසි ආයතනයකට අත ගහලා මේවා වෙනස් කරන්න මට බලයක් හෝ ශක්තියක් ඒ වෙලාවේ තිබුණේ නැහැ. සෞඛ්‍ය අමාත්‍යාංශය සම්පූර්ණයෙන්ම පාලනය වුණේ ඇමතිවරයාට ඕනෑ විධියට නොවෙයි. මේ ගරු සභාවේ ඉන්න පසු ගිය අවුරුදු පහේ අමාත්‍ය ධුර දරාපු හැම ඇමතිවරයකුම - වර්තමාන විපක්ෂ නායකතුමා ඇතුළු- තමන්ගේ හෘදය සාක්ෂියට අනුව දන්නවා, ඇමතිවරු විධියට අමාත්‍යාංශවල ස්වාධීනව, අපක්ෂපාතීව තමන්ගේ දැනුම, අත් දැකීම්, බුද්ධිය, නිර්මාණශීලීභාවය පාවිච්චි කරලා කටයුතු කරන්න හැකියාවක් තිබුණාද කියන එක. ඒ හැම කෙනකුම දන්නවා. ඒ සහෝදර ඇමතිවරු, අපි එකට වාඩි වෙලා හමු වන බොහෝ අවස්ථාවලදී අපි මේවා සාකච්ඡා කළා. "කෝ, ඇමතිවරු විධියට අපට නිදහසක්; කෝ, මේ අමාත්‍යාංශවල අපට අවශ්‍ය ස්වාධීනත්වය" කියලා අපි සාකච්ඡා කළා. ඒ තත්ත්වය තුළ තමයි විශේෂයෙන්ම මේ පසු බිම් ගොඩ නැඟුණේ.

ගරු කථානායකතුමනි, මා අද නම් ඉතාම සතුටු වෙනවා එදා ඒ තත්ත්වය ඇති වුණු එක ගැන. ඒවා නිවැරදි වුණා නම් මා ජනාධිපති වෙන්නේ නැහැ. ඒවා ඒ විධියට සිද්ධ වුණු නිසා තමයි මට ජනාධිපති ධුරයට පත් වෙන්න පුළුවන්කම ලැබුණේ. නමුත් මේ ගරු සභාවේ ඉන්න පසු ගිය රජයේ මගේ සහෝදර ඇමතිවරු මේවා නිවැරදි කරන්න බොහෝ උත්සාහ ගත්තා. හෘදය සාක්ෂියට එකඟව කථා කරන්න උත්සාහ කළා. නමුත් ඒ කිසි කෙනකුට ඉඩක් තිබුණේ නැහැ. මේ ඖෂධ පනතේ ඉතිහාසය පිළිබඳව මා කථා කළේ, අනෙකුත් ආයතනවල තිබුණු ඒ තත්ත්වයන් විශේෂයෙන්ම සැලකිල්ලට අරගෙන ඒ පසු බිම් සම්බන්ධයෙන් මේ කරුණු ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව නිසයි.

ඊළඟට, මේ පනත් කෙටුම්පත අද ඉදිරිපත් වන මේ වෙලාවේ මා සඳහන් කරන්නට ඕනෑ, අපි මොන විධියේ නීති - රීති හැදුවත්, මොන විධියේ බලතල දුන්නත්, මොන විධියේ ආයතන පිහිටු වූවත් මේ ආයතනවලට පත් වෙන පුද්ගලයින්ගේ චරිත ලක්ෂණ අනුව තමයි මේ ආයතනවල ක්‍රියාකාරිත්වය ඇති වෙන්නේ කියන එක. අද මේ පනත් කෙටුම්පත සම්මත වුණාට පස්සේ ඇති වෙනවා ජාතික ඖෂධ නියාමන අධිකාරිය. ජාතික ඖෂධ නියාමන අධිකාරියට පත් වන සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ චරිත ලක්ෂණ තුළ තමයි මේ පනත් කෙටුම්පතින් රටේ ජනතාවට බලාපොරොත්තු වන අරමුණු සහ පරමාර්ථ ඉෂ්ට වෙන්නේ. එතැනටත් කලින් වාගේ වංචාවට, දූෂණයට, අක්‍රමිකතාවට හුරු පුරුදු වුණු පිරිස ඇතුළු වුණොත් අපි මේ පනත් කෙටුම්පතින් බලාපොරොත්තු වන දේ ඉෂ්ට වන්නේ නැහැ. ඒ නිසා ගරු සෞඛ්‍ය ඇමතිතුමා මේ සඳහා පත් කරන සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලය ගැන ඉතාම හොඳින් සොයා බලා ඒ පත් කිරීම් කරනු ඇතැයි මා විශ්වාස කරනවා.

අපට රටක් විධියට මේ තුළින් බලාපොරොත්තු වන අරමුණු ඉටු කර ගැනීමේදී වාණිජ්‍ය ආයතන, විශේෂයෙන්ම ඖෂධ සමාගම් ගැන සැලකිලිමත් වන්න ඕනෑ. අපි කවුරුත් දන්නවා, මේ ගරු සභාවේත් කියලා තිබෙනවා, ලෝකයේ තිබෙන ජාවාරම් ව්‍යාපාර අතර අවි ආයුද ජාවාරමට පමණයි ඖෂධ ජාවාරම දෙවැනි වන්නේ කියලා. ඒ නිසා දේශීය වශයෙන් මෙන්ම, විදේශීය වශයෙනුත් අප බලාපොරොත්තු වන තත්ත්වයන් සැලකිල්ලට අරගෙන අතීතයේ අප ලද පාඩම් අනුව අපි මේ කටයුතු ඉටු කරන්න ඕනෑ.

පසු ගිය කාල සීමාවේ දී සෞඛ්‍ය ඇමතිවරයා වශයෙන් මා කටයුතු කළ අවස්ථාවේ ශ්‍රී ලංකා රජය විධියට පළමු වතාවට ඉන්දියාවට ගිහින් ඉන්දියාවේ සෞඛ්‍ය ඇමතිවරයා හමු වුණා. මොකද, ලංකාවට ගෙන්වන බටහිර ඖෂධවලින් සියයට 80ක්ම ලංකාවට ගෙන්වන්නේ ඉන්දියාවෙනුයි. ඒ ඖෂධවල ප්‍රමිතිය සහ බාල ඖෂධ ලබා දීම කියන ප්‍රශ්නය පිළිබඳවත්, කලට වේලාවට ඖෂධ නොලැබීම සහ ප්‍රමිතියෙන් තොර ඖෂධ ලබා දීම යන මේ තත්ත්වයන් යටතේ ඇති වන බොහෝ කරුණු කාරණා ගැනත් ඉන්දීය රජය සමඟ සාකච්ඡා කළා. අපි යම් උත්සාහයක් ගත්තා, සමාගම් එක්ක සාකච්ඡා කර ඒ තත්ත්වයන් නිවැරදි කර ගන්න.

පළමු වතාවට, බංග්ලාදේශ රජය සහ ශ්‍රී ලංකා රජය, බංග්ලාදේශයෙන් ඖෂධ ලබා ගැනීමේ ගිවිසුමක් අත්සන් කළා. බංග්ලාදේශයේ ඉතාමත් උසස් ප්‍රමිතියෙන් යුතු රජයේ ඖෂධ නිෂ්පාදනාගාර තිබෙනවා. ඒ ආයතනවලින් ඖෂධ ලබා ගන්න තමයි ඒ ගිවිසුම අත්සන් කළේ.

ගරු කථානායකතුමනි, මේ තත්ත්වය සැලකිල්ලට ගත්තාම මේ පනත් කෙටුම්පතෙන් බලාපොරොත්තු වන අරමුණු ඉටු කර ගැනීමට නම් අපේ රට තුළ බටහිර ඖෂධ නිෂ්පාදනය කිරීම සඳහා ප්‍රමුඛත්වය දෙන්නට ඕනෑ. ඒ සම්බන්ධයෙන් ආයෝජන මණ්ඩලය ගන්නා වූ ක්‍රියා මාර්ගත්, රජයක් විධියට ඉදිරියේ දී අප ගන්නා වූ ක්‍රියා මාර්ගත් තුළින් අපට හැකි සෑම අවස්ථාවකදීම මේ බටහිර ඖෂධ අප රටේම නිෂ්පාදනය කරන්නට අප බලාපොරොත්තු වෙනවා. ඒ තුළින් තමයි බොහෝ දුරට මේ පනත් කෙටුම්පතෙන් බලාපොරොත්තු වන කරුණු ඉෂ්ට කර ගැනීමට අපට පුළුවන්කම ලැබෙන්නේ. මේ පනත් කෙටුම්පත අද සම්මත වුණාය කියලා ඉදිරි පැය 24ක් තුළ මේ බලාපොරොත්තු වන ප්‍රතිලාභය ජනතාව අතරට යන්නේ නැහැ. මේ පනත් කෙටුම්පත සම්මත වීම තුළින් බලාපොරොත්තු වන අරමුණු ඉටු කර ගැනීමට යම් කාල සීමාවක් ගත වෙනවා. ඒ කාල සීමාව තුළ ජාතික ඖෂධ නියාමන අධිකාරිය පිහිටුවීමත් එක කාර්යක්.

අපේ රටේ ඖෂධ තත්ත්ව ප්‍රමිතිය සම්බන්ධයෙන් දැනට තිබෙන පර්යේෂණාගාරය ප්‍රමාණවත් වන්නේ නැහැ. මේ පනත් කෙටුම්පත තුළම සඳහන් වන විධියට, මේ අරමුණු ඉටු කර

ගැනීම සඳහා විශේෂයෙන්ම විදේශ ආධාර, තාක්ෂණික දැනුම ලබා ගෙන තත්ත්ව පර්යේෂණාගාරවල ශක්තිය වැඩිදියුණු කිරීම ආදී කටයුතු කිරීම අවශ්‍ය වෙනවා.

අනෙක් අතට රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ නිෂ්පාදන කටයුතු වර්ධනය කිරීම අත්‍යවශ්‍ය වෙනවා. JICA ආයතනයෙන් ලබා ගෙන තිබෙන ආධාර සමඟ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියක් මේ වන විටත් ක්‍රියාත්මක වෙනවා. නමුත් එය විශාල වශයෙන් නිෂ්පාදන වැඩිදියුණු කර ගැනීමේ අවස්ථාවක් නොවෙයි. එම නිසා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේත් නිෂ්පාදන කටයුතු වර්ධනය කිරීම අත්‍යවශ්‍යයි.

ඊළඟට, දේශීය වශයෙන් බටහිර ඖෂධ නිෂ්පාදනය සඳහා පෞද්ගලික අංශය දිරිමත් කිරීමත්, ඒ සඳහා අවශ්‍ය කරන විශේෂඥ දැනුම ලබා ගෙන විදේශීය ආයෝජන හා දේශීය ආයෝජන සමඟ ඒ වැඩිදියුණු කිරීම් සිදු කිරීමත් අත්‍යවශ්‍ය වෙනවා. අනෙක් පැත්තෙන් මේ ආයතන විධිමත් කිරීම, ශක්තිමත් කිරීම අවශ්‍ය වෙනවා. ඒ වාගේම ඖෂධ බෙදා හැරීමේ දී කෙරෙන කළමනාකරණයේ සහ පරිපාලනයේ අඩු පාඩු සකස් කර ගැනීමත් අවශ්‍ය වෙනවා. එම නිසා මේ සියලු තත්ත්වයන් සැලකිල්ලට ගත් විට, ඖෂධ ප්‍රතිපත්තියට අදාළ ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත අද මේ පාර්ලිමේන්තුවේ දී සම්මත කිරීම තුළින් බලාපොරොත්තු වන අරමුණු ඉෂ්ට කර ගැනීම සඳහා මේ ගරු සභාවේ සියලු දෙනාම දක්වන සහයෝගය සම්බන්ධයෙන් මම මාගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා.

ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පතේ ඉතිහාසයට අදාළ කරුණු සහ මම මුහුණ දුන් අත් දැකීම්, මේවා දීර්ඝව කථා කළ යුතු දේවල් ගරු කථානායකතුමනි. නමුත් මම ඒ සඳහා කාලය ගන්නේ නැහැ. අද දවසේ තිබෙන කාල වේලාව අනුවයි මම මේ කරුණු කිහිපය ගැන සඳහන් කළේ. මේ සඳහා කැප වුණු සියලු දෙනාට නැවතත් මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා. එමෙන්ම මේ රටේ පොදු ජනතාවගේ නිදහස් සෞඛ්‍ය සේවාව ශක්තිමත් කරමින්, සෞඛ්‍ය සංරක්ෂණය සඳහා අප බලාපොරොත්තු වන අරමුණු ඉෂ්ට කර ගැනීමට මේ පනත් කෙටුම්පත තුළින් සියලු ආකාරයෙන්ම හැකියාව ලැබේවා කියා මා ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම මේ අධිකාරියට පත් වන සියලු දෙනාම කැපවීමෙන් හා අධිෂ්ඨානශීලී භාවය තුළින් ගන්නා වූ සෑම පියවරක්ම සාර්ථක කර ගැනීමට හැකි වේවා කියා ප්‍රාර්ථනා කරන අතර, පොදු ජනතාවට, නැති බැරි මිනිසුන්ට - දුගී දුප්පත් ජනතාවට - වැඩි සහන ලබා දීම සඳහා මේ කාර්ය අපි ඉටු කරමුය කියන ඉල්ලීම කරමින්, සියලු දෙනාටම ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න ඇමතිතුමනි, ඔබතුමා ලේඛන ඉදිරිපත් කරමින් කථා කරනවාද?

[පූ.භා. 11.04]

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඔව්, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, අද මගේ ජීවිතයේ ඉතාම සතුටු දවසක්. මම විශ්වවිද්‍යාලයේ වෛද්‍ය ශිෂ්‍යයකු විධියට සිටින කාලයේ මගේ ගුරුවරයා වූ මහාචාර්ය සේනක බිබිලේ මහතාගේ ප්‍රාර්ථනාවක් වූ මේ ඖෂධ ප්‍රතිපත්තිය ඔහුගේ ගෝලයකු වූ මා අතින් අද මේ ගරු සභාවට ඉදිරිපත් කිරීමට හැකි වීම ගැන මා ඉතාම සතුටු වෙනවා. අද මේ ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පතේ නිර්මාතෘවරයා වෙන කවුරුවත් නොවෙයි, මේ ගරු සභාවේ සිටින අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමායි. එතුමා නැවතුණු තැන සිට ඉදිරියට ගෙන යාම විතරයි මට අවශ්‍ය වුණේ.

ඒ වාගේම දින සියයේ වැඩ පිළිවෙළ තුළ දී කොහොම හරි මේ පනත් කෙටුම්පත සම්මත කර ගැනීමටත් මට අවශ්‍ය වුණා. නැත්නම් මේක කවදාවත් කෙරෙන්නේ නැහැ. ඒක මම දන්නවා. මොකද, ඉතිහාසයේ පැවැති නොයෙකුත් රජයන් මේ පනත් කෙටුම්පත ගෙන ඒමට මේ විධියේම උත්සාහයන් ගෙන තිබෙනවා. නමුත් නොයෙකුත් බලපෑම් යටතේ ඒ කිසි දෙයක් සිදු වුණේ නැහැ.

මේ සඳහා ඉතිහාසයක් තිබෙනවා. 1970 දී සමගි පෙරමුණු රජය මේ රටේ බලයට පත් වුණා. අපි එදා ශිෂ්‍ය ව්‍යාපාරය නියෝජනය කරමින් ඒ රජය බලයට පත් කරන්න කටයුතු කළා. එදා නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා එක පැත්තකිනුත්, අපි එක පැත්තකිනුත් ඉදිරිපත් වෙලා සමගි පෙරමුණ හදලා මැතිනියව බලයට පත් කර වාමාංශික ආණ්ඩුවක් බිහි කරන්නට සටන් පාඨ කියමින් ඒ කාලයේ කටයුතු කරපු ආකාරය මට මතකයි. 1970 දී රාජ්‍ය ඖෂධ ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා දෙදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කිරීමට එවකට පැවැති කැබිනට් මණ්ඩලය තීන්දුවක් ගත්තා. ඒකට පත්වුණු එක්කෙනෙක් තමයි, කොමියුනිට්ස් පක්ෂයේ නායක දොස්තර එස්.ඒ. වික්‍රමසිංහ මැතිතුමා. එතුමාත් මේ පිළිබඳව දීර්ඝව ලිපි ලේඛන පළ කර තිබුණා; මේ පිළිබඳව අදහස් ඉදිරිපත් කර තිබුණා. දෙවැනි කෙනා තමයි මහාචාර්ය සේනක බිබිලේ මැතිතුමා. එතුමා ලංකා සමසමාජ පක්ෂයේ සාමාජිකයකු වශයෙන් සිටි කෙනෙක්. එතුමාත් යෝජනා ඉදිරිපත් කර තිබුණා. ඒ ලියවිල්ල මා ළඟ තිබෙනවා. අද සමහර අය මහාචාර්ය සේනක බිබිලේගේ ප්‍රතිපත්තිය කියවන්නේ නැතුව; ඒකේ මොනවාද තිබෙන්නේ කියලා දන්නේ නැතුව; අතේ කොළ කෑල්ලක්වත් නැතුව සුරංගනා ලෝකයක ඉඳගෙන ඒ ගැන කථා කරනවා. ගරු එස්.බී. දිසානායක මන්ත්‍රීතුමාටත් මතක ඇති, අපි සමාජවාදය ආරම්භ කළ කාලය. එදා මනෝරාජික සමාජවාදය තමයි අපි සමාජවාදය කියලා දැක්කේ. නමුත් ඇත්තටම බලනකොට මනෝරාජික නොවෙයි, මේක බොහොම යථාර්ථවාදී සමාජවාදයක්.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
විද්‍යාත්මක යථාර්ථවාදී සමාජවාදය.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
විද්‍යාත්මක යථාර්ථවාදී සමාජවාදය අපි පොත් කියවන කොට ඉගෙන ගත්තා. නමුත් අපි තරුණයෝ විධියට මෙයට ඇදිලා ආවේ මේ මනෝරාජිකභාවයෙන්. ඒ වාගේම තමයි සේනක බිබිලේගේ ප්‍රතිපත්තියත් සමහර අය මනෝරාජික විධියට අද බලාපොරොත්තු වනවා. මහාචාර්යවරයකු විධියට එතුමාත්, වෛද්‍යවරයකු විධියට දොස්තර එස්.ඒ. වික්‍රමසිංහ මැතිතුමාත් බොහොම ප්‍රායෝගික, විද්‍යාත්මක හා යථාර්ථවාදීව මෙහි තිබෙන තත්ත්වයන් ගැන කල්පනා කර බලා තිබෙනවා. මතක තබා ගන්න, මෙහි වෙනසක් තිබෙනවා කියන එක. එදා තිබුණේ සංවෘත ආර්ථිකයක්. එතුමා කරුණු දෙකක් යෝජනා කර තිබුණා. මේ ලියවිල්ල ඉංග්‍රීසි භාෂාවෙන් තිබෙන නිසා මම ඉංග්‍රීසි භාෂාවෙන්ම කියවන්නම්. එක යෝජනාවක් තමයි, “single agency for purchase of all

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

medicines". ඒ අනුව සියලුම ඖෂධ නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම සිදු කරන්නේ එක් ආයතනයක් විතරයි. ඒක තමයි රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව.

එහි පළමු වෙනි සභාපතිවරයා විධියට එතුමා පත් වුණා. එදා ලංකා සමසමාජ පක්ෂය ආණ්ඩුවෙන් එළියට යන වෙලාවේ තමයි මහාචාර්ය සේනක බිබිලේ මැතිතුමාත් ඒ ආණ්ඩුවෙන් එළියට ගියේ. එදා තරුණ වෛද්‍යවරයෙක් විධියට වමේ පක්ෂයත් එක්ක මමත් ඒ ආණ්ඩුවෙන් එළියට ගියා. එදා ඇත්තටම තිබුණේ bulk purchase කියන එක. සම්පූර්ණයෙන්ම තොග වශයෙන් තමයි ගේන්නේ. එදා ඒ ගැන සොයා බැලුවාම දැන ගත්තා වැඩියෙන්ම ඖෂධ ගෙනාවේ සමාජවාදී රාජ්‍යයක් වන පෝලන්තයෙන් කියලා. සමාජවාදී රාජ්‍යයන්වලින් මේ ඖෂධ ආනයනය කරන්නය කියලා එතුමා යෝජනා කළා. එතුමා ඒ සමාජවාදී රාජ්‍යයන්වල නම් පවා කිවුවා.

"1970 - Wickremasinghe - Bibile Report (Management of Pharmaceuticals in Ceyon)" කියන වාර්තාවේ එතුමා ඒ ගැන කියන්නේ මෙහෙමයි:

> "Our recommendation is that the bulk of pharmaceuticals should be obtained from the socialist countries that have a well developed pharmaceutical industry such as Hungary, the G.D.R., Poland, Romania, Bulgaria, Czechoslovakia and the U.S.S.R."

නමුත්, අද වන විට මේ එක රටක්වත් සමාජවාදී රටවල් නොවෙයි. මේ සියලු රටවල් සමාජවාදයෙන් ඉවත් වෙලා තිබෙන්නේ. එම නිසා මේවා අපට ඒ විධියටම ගලපන්නට බැහැ. එම නිසා අද SPC එකෙන් පමණක් රටට ඖෂධ ගෙන එන්නට බැහැ. විවෘත ආර්ථිකය තුළ පෞද්ගලික අංශයටත් ඒ සඳහා ඉඩ ලබා දීලා තිබෙනවා. නමුත් අපේ ප්‍රධානම වැයම තමයි විශාල වශයෙන් රාජ්‍ය ඖෂධ සංස්ථාව ශක්තිමත් කරලා, මුළු මහත් රාජ්‍ය අංශයට අවශ්‍ය ඖෂධ එතැනින් ගෙනෙන්නට කටයුතු කිරීම.

දෙවැනි කාරණය තමයි, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව බිහි වීම. මේ රටේ හැම ඖෂධයක්ම, ගෝස්, ප්ලාස්ටර් වැනි හැම material එකක්ම අද වන විට පිට රටින් ගෙන්වනවා. වෛද්‍ය උපකරණත් ගෙන්වනවා. අඩුම ගණනේ වෛද්‍ය උපකරණ ටික හෝ ලංකාවේ නිෂ්පාදනය කිරීම තමයි මගේ බලාපොරොත්තුව වන්නේ. මෙය තමයි මහාචාර්ය සේනක බිබිලේ මහතාගේත් අවශ්‍යතාව වුණේ. එතුමා කියනවා මේ සඳහා single agency එකක් හදන්න කියලා. එතුමා SPC එක හැදුවා. එතුමාගේ වාර්තාවේ තවදුරටත් මෙසේ සඳහන් වනවා: "(a) Bulk purchase and large packs; (b) Reduction in the number of preparations". අද එකම ඖෂධයේ brand names සිය ගණනක් තිබෙනවා. එතුමා කියන්නේ ඒක අඩු කරන්න කියලායි. මේ පනත් කෙටුම්පතින් ඒක කරනවා. ඉදිරියේදී අලුතෙන් එන සියලුම ඖෂධවලට එහෙම සීමා කිරීමක් කරනවා. මෙම අධිකාරියෙන් බලනවා අලුත් ඖෂධයක් අවශ්‍යද, ඒක තවදුරටත් ඕනෑද කියලා. මේ තිබෙන ප්‍රමාණය ප්‍රමාණවත් නම් ලංකාවේ විකුණන්නට එම ඖෂධ ලියා පදිංචි කරන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, ඒ වාගේම, "Changes in the patent laws - no product patent replaced process patent" කියන කාරණයත් අපි මෙම පනත් කෙටුම්පත යටතේ ඉදිරියට ගෙන එනවා. තවත් කාරණයක් විධියට එතුමා කියනවා, "Prescribing by generic names etc." කියලා. "Generic names" කියන්නේ "A necessary step and one that we recommend strongly is the use of official names and not trade names for drugs." "Recommend strongly…." කියලා එතුමා කියනවා. ඊට පස්සේ එතුමා 07වැනි පිටුවේදී මෙසේ කියනවා:

> ".....doctors should prescribe by official names and there will be no confusion among prescribers and patients".

"Doctors should prescribe" කියලා කියන්නේ ඖෂධ නාමයෙන්ම - generic නාමයෙන්ම- බෙහෙත් ලියන්න කියලායි. අන්න එතැනදී අපි පොඩි වෙනසක් දක්වනවා. මොකද වෛද්‍යවරුන්, Ceylon College of Physicians ඇතුළු අනෙක් කට්ටිය ප්‍රශ්නයක් නඟලා තිබෙනවා, "අද තිබෙන තත්ත්වය අනුව අපට quality lab එකක් හරියට නැහැ, quality එක පිළිබඳව අපට ප්‍රශ්න තිබෙනවා, අපේ බොහෝ samplesවල quality එක බැලුවාට එළියට එන ඒවායේ ප්‍රමිතියක් නැති වෙන්න පුළුවන්, ඒ නිසා අවශ්‍ය නම් brackets ඇතුළේ වෙළෙඳ නාමය ලියන්න වෛද්‍යවරයාට පුළුවන්" කියලා ඒ ගොල්ලෝ එහෙම කියනවා.

අපි quality lab එක ළඟදී හදනවා. මේ lab එක අමාත්‍යාංශයෙන් එළියට අරගෙන ස්වාධීන කරනවා. ඒ lab එක විශේෂඥයන්ට භාර දෙනවා. මම මේ වන කොට කථා කර ගෙන තිබෙනවා, මේකට විදේශ රටවල ආණ්ඩුවලින් මුදල් ලබා ගන්න. ඒ සඳහා ඒ ගොල්ලන් කැමැත්ත දක්වලා තිබෙනවා. ඒ මුදල් අරගෙන ඉතාම ඉක්මන් දිනක මේ lab එක world-standard lab එකක තත්ත්වයට පත් කරනවා. පත් කරපු හැටියේ generic namesවලින් විතරක් ඖෂධ prescribe කිරීමට මම නැවත සංශෝධනයක් මේ පාර්ලිමේන්තුවට ගේනවා. එහෙම ගෙනාවාම brackets ඇතුළේ ලියලා තිබෙන branded names අයින් කරන්න පුළුවන් වෙනවා.

එම වාර්තාවේ සඳහන් වනවා, "Expanding the National Formulary Committee (Prescriber) to keep the doctors abreast" කියලා. අදත් මේ "Prescriber" කියන එක SPC එක මාර්ගයෙන් අපට මාසිකව ලබා දෙනවා. මේක expand කරන්න ඒ ක්‍රියා මාර්ගය ගන්නවා. එම වාර්තාවේ තවදුරටත් සඳහන් වනවා, "Expanding quality testing facilities for drugs" කියලා. ඒක තමයි මම කිව්වේ quality lab එක හදනවා කියලා.

එහි තවදුරටත් "Promote local manufacture - private sector also encouraged here" කියා සඳහන් වනවා. ඒ කියන්නේ මේ රටේම ඖෂධ නිෂ්පාදනය කරන්න කියන එකයි. එතැනදී එතුමා කියනවා, මේ රටේ පෞද්ගලික අංශයටත් ඒකට සහභාගි වෙන්න කියලා. සමහරු හිතා ගෙන ඉන්න විධියට, මහාචාර්ය බිබිලේ සුරංගනා ලෝකයක හිටියේ නැහැ. මේ රටේ සියලුම ඖෂධ මේ රටේම හදා ගන්න ඕනෑය කියලා තමයි මමත් කල්පනා කරන්නේ. මම විදේශ රටවල අයටත් කියලා තිබෙනවා, අපට උදව් කරන්න කියලා. අපේ රටේ ඖෂධ නිෂ්පාදනය කළාම අපේ රටේ වෙළෙඳ පොළට විතරක් නොවෙයි, නිදහස් වෙළෙඳ ප්‍රතිපත්තිය යටතේ - FTA එක යටතේ - ලොකු වෙළෙඳ පොළක් තිබෙන ඉන්දියාව, පාකිස්තානය වාගේ රටවලටත් බදු නිදහසක් ඇතුව යවන්න පුළුවන්. ලංකාවේ ඖෂධ හදන්නට බොහෝ අය ඇවිල්ලා අද අපිත් එක්ක කථා කරනවා. මේ ටික තමයි ඇත්තටම මහාචාර්ය සේනක බිබිලේ මහතා බලාපොරොත්තු වුණු එතුමාගේ වාර්තාවේ සාරාංශය. ඕනෑම මන්ත්‍රීවරයෙකුට කියවීම සඳහා මම මේ ලියවිල්ල හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

**** පුස්තකාලයේ තබා ඇත.***

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

ගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක ජනාධිපතිතුමියගේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ -අද විපක්ෂයේ ඉන්න තමුන්නාන්සේලා බලයට පත් වුණාට පස්සේ- නැවත 1996 දී National Medicinal Drug Policy එකක් ගෙනෙන්ට තීන්දුවක් ගත්තා. ඒ තීන්දුව අරගෙන ඒකට දොස්තර ලූෂන් ජයසූරිය, මහාචාර්ය කොල්වින් ගුණරත්න, දොස්තර රෙජී පෙරේරා, මහාචාර්ය අනෝජා ප්‍රනාන්දු, දොස්තර ඩෙස්මන් ප්‍රනාන්දු සහ ස්වයිල් මහත්මයා ඇතුළු අයගෙන් සමන්විත කොමිටියක් පත් කළා. ඒකෙන් "Regulatory Authority, procurement, promotion and advertising, rational use, self-medication and health promotion and drug trials" යන කරුණු ඉදිරිපත් කළා. මේ පිළිබඳව ඖෂධ ප්‍රතිපත්තියක් හදන්නයි ඒ ඉදිරිපත් කළේ. නමුත් ඒක ඉදිරියට ගියේ නැහැ. ඒකත් කෙරුණේ නැහැ. ඊට පස්සේ අපේ නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා සෞඛ්‍ය ඇමතිවරයා වශයෙන් ඉන්න කොට 2005 දී National Medicinal Drug Policy එකක් ගෙනාවා. ඒකෙත්, "selection of essential medicines, pricing mechanism for medicines and devices, supply systems and donations, regulation and quality assurance, quality use of medicines, viable local pharma industry, development of human resources, policy to be reviewed every five years" යන සංකල්පයන් මත ඖෂධ ප්‍රතිපත්තියක් ගෙනෙන්න කියලා තිබුණා. 2007 දී මේ පිළිබඳව අමාත්‍ය මණ්ඩල අනුමැතියකුත් ලැබිලා දොස්තර බෙලිගස්වත්ත මහත්තයාගේ සභාපතිත්වයෙන් නිලධාරි කණ්ඩායමකුත් පත් කළා. ඇත්තටම වර්තමාන ජනාධිපති හිටපු සෞඛ්‍ය ඇමතිවරයාගේ කාලයේ මෙය ඉතාම වේගවත්ව ඉදිරියට ගමන් කළා.

දැන් සමහරු කියනවා, මේක මහජනයාට ඉදිරිපත් කළේ නැහැ කියලා. 2014 ජූනි මාසයේදී රෝගීන්ට සම්බන්ධ සංවිධාන, වෛද්‍ය සංවිධාන, ඖෂධ නිෂ්පාදන සමාගම්, බෙදා හැරීමේ සමාගම්, pharma trade එකේ කට්ටිය, සිවිල් සංවිධාන නාරාහේන්පිට අලුත් ලේ බැංකුවට කැඳවලා මේ කාරණය සම්බන්ධයෙන් එතුමා දවසක්ම කථා කළා. එතැනින් පැන නැඟුණු කරුණු අනුව තමයි මේ නව පනත් කෙටුම්පත අද දෙවැනි වර කියවීම සඳහා ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ නිසා මේ පනත් කෙටුම්පත කාගෙන්වත් කරුණු අහන්නේ නැතිව ඉදිරිපත් කළ එකක් නොවෙයි. මේ සියලුම කරුණු මේ පනත් කෙටුම්පතට අඩංගු කරලා තිබෙනවා.

වර්තමාන පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමේ කටයුත්ත වෙනුවෙන් අපි මණ්ඩලයක් පත් කර ගත්තා. මම ඒ මණ්ඩලයට ඉතාම ස්තුතිවන්ත වනවා. එතුමන්ලා රාජකාරි කටයුතු වාගේම හවස් වරුවේ නිවාසවල තිබෙන කටයුතුත් අත් හැර මේ සම්බන්ධයෙන් කැප වුණා. මම සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය ඇමතිතුමා වුණාට පස්සේ ඔවුන්ට කිව්වා, දවස් සියයක් ඇතුළත මේක කරන්න ඕනෑය කියලා. මාර්තු මාසයේ 18 වැනිදාටත් ඉස්සෙල්ලා මට අද මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න ලැබුණේ එතුමන්ලාගේ සම්පූර්ණ කැපවීම නිසයි. ඒ නිසා මම ඒ අයට ස්තුතිවන්ත වනවා.

ඒ අයගේ නම් ටිකත් මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි. එක්කෙනෙක් තමයි වෛද්‍ය පාලිත අබේකෝන් මැතිතුමා. එතුමා ලෝක සෞඛ්‍ය සංවිධානයේ ඉඳලා අද අපේ රටට ඇවිල්ලා ඉන්නවා. එතුමා ලෝක සෞඛ්‍ය සංවිධානය වෙනුවෙන් කීර්තිමත් සේවයක් කරපු පුද්ගලයෙක්. එතුමා සභාපතිවරයා වශයෙන් කටයුතු කළා. ඒ වාගේම මහාචාර්ය ලාල් ජයකොඩි මැතිතුමා සහභාගි වුණා. එතුමා වෛද්‍ය ඖෂධවේදය - Pharmacology - පිළිබඳව ඉන්න මහාචාර්යවරයා. ඖෂධවේදය පිළිබඳ මහාචාර්ය ප්‍රියදර්ශනී ගලප්පත්ති මැතිතුමිය, වෛද්‍ය ආනන්ද විජේවික්‍රම මහතා සහභාගි වුණා. මහාචාර්ය ටියුලි ද සිල්වා පිළිබඳව තමුන්නාන්සේලා දන්නවා. වෛද්‍ය තාක්ෂණ හා සැපයීම් අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වෛද්‍ය ශ්‍රියාණි දිසානායක සහ ප්‍රධාන නීති නිලධාරි ඒ.ආර්. අහමඩ් මහත්මිය යන සාමාජිකයින්ගෙන් මණ්ඩලය සමන්විත වුණා. ඇත්තටම ඒ අයට උදව්වට විශ්‍රාමික ඖෂධවේදිනි චින්තා අබේවර්ධන මහත්මිය සහ ඖෂධවේදි ක්‍රිෂාන්ත ද සිල්වා මහත්මයා පැමිණියා.

ඔබතුමන්ලාට මතක ඇති, 1976 දී කොටසක් රජයෙන් එළියට බැස්සාට පස්සේ මේ ප්‍රශ්නය අමතක වුණු බව. නමුත් ඒ වෙලාවේදීත් යම් කොටසක් මේ කටයුත්ත කරන්න කැප වුණා. 1977 දී ජේ.ආර්. ජයවර්ධනගේ ආණ්ඩුව බලයට පත් වුණාය කියලා මෙය අත් හැරියේ නැහැ. මහාචාර්ය බාලසුබ්‍රමනියම්, මහාචාර්ය ක්‍රිෂාන්ත වීරසූරිය යන අය මේ සම්බන්ධයෙන් ක්‍රියා කළා. මහාචාර්ය ක්‍රිෂාන්ත වීරසූරිය කියන්නේ අපිත් එක්ක එකට මහාචාර්ය සේනක බිබිලේගෙන් Pharmachology ඉගෙන ගත්ත කෙනෙක්. එතුමා පසු කාලයකදී Pharmacology පිළිබඳ මහාචාර්යවරයා වුණා. එතුමාත් දැඩි කැපවීමකින් මේ කාරණය ඉෂ්ට කරන්න ඉදිරිපත් වුණත් චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ආණ්ඩුවෙනුත් මේ කටයුත්ත නොකෙරන කොට ඔහු කලකිරීමට පත් වුණා. එතුමා පසු ගිය කාලයේ ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිලයක් අරගෙන ලෝකයට හෝ සේවයක් කරන්න ඕනෑ කියලා ලංකාවෙන් යන්න ගියා. මහාචාර්ය ක්‍රිෂාන්ත වීරසූරිය මැතිතුමාත් මම ඒ කමිටුවට කැඳෙව්වා. මේ ඖෂධ ප්‍රතිපත්තිය ගෙනෙන්න දැඩි කැපවීමෙන් ක්‍රියා කරපු තව කෙනෙක් තමයි, මහාචාර්ය කොල්වින් ගුණරත්න මැතිතුමා. එතුමා ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංගගේ කාලයේදී ඖෂධ සංස්ථාවේ සභාපතිවරයා වෙලා මහාචාර්ය සේනක බිබිලේ අනුස්මරණ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙනෙන්න කටයුතු කළා. එතුමාත් මම ඒ කමිටුවට කැඳෙව්වා. ඒ වාගේම දොස්තර රාජා විජේතුංග මාත් එක්ක එක අවුරුද්දේ පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ ඉගෙන ගත්ත කෙනෙක්. 1971 කැරැල්ලට අහු වෙලා එතුමාට සිරබත් කන්න වුණා. එතුමායි, මමයි දෙදෙනාම මහාචාර්ය සේනක බිබිලේගෙන් තමයි ඉගෙන ගත්තේ. එතුමා පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයෙක් වෙලා ඉඳලා පසුව රාජ්‍ය ඖෂධ සංස්ථාවට ගියත් visiting lecturer කෙනෙක් විධියට සතියට දෙසැරයක් ඇවිල්ලා අපට lectures දුන්නා.

මේ හතර දෙනා දිගින් දිගටම ලංකාවේ ඖෂධ ප්‍රතිපත්තියක් ඇති කරන්න ඕනෑය, එය යටපත් නොවී, මිය යන්නට නොදී රැක ගත යුතුය කියන අදහසේ හිටියා. මට මතකයි, ඒ වෙලාවේදී වාමාංශික ඇමතිවරු වාගේම තිස්ස විතාරණ මැතිතුමාත් ඔවුන් කැඳවපු ඒ රැස්වීමට සහභාගි වුණා. අපි ඔක්කොම මේ රැස්වීමට සහභාගි වුණා. නමුත් මේවා කවදාවත් කෙරුණේ නැහැ. අන්තිම කාලය වන කොට මේක සිහිනයක් බවට පත් වුණා. මම ඒ අයගේ සහයෝගයත් ලබා ගත්තා. මම ඒ අයගේ නම් කියන්න ඕනෑ. ඒ මිනිස්සු තමයි, වත්මන් අතිගරු ජනාධිපතිතුමාට මේ පනත් කෙටුම්පත ගෙනෙන්නට හුඟක් උදවු කළේ. ඔවුන්ගේ අදහසුත් විමසලා මම ඒ අයවත් මේ වෙලාවේදී සම්බන්ධ කර ගත්තා. ඉතිහාසය පුරා - මහාචාර්ය සේනක බිබිලේගේ ඉඳලා - මෙය ඉදිරියට ගෙන යෑම සඳහා ඔවුන්ට විශාල අවබෝධයක් තිබුණා. ඇත්තටම මේ අධිකාරියට දහතුන් දෙනෙකුගේ මණ්ඩලයක් පත් වෙනවා. මේ අධිකාරියට ස්වාධීන පැවැත්මක් තිබෙනවා. මෙම අධිකාරිය සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් බාහිර, ස්වාධීන මණ්ඩලයක් විධියට තමයි ක්‍රියාත්මක වෙන්නේ.

ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පතේ අරමුණු 3 වන වගන්තිය යටතේ මෙන්න මෙහෙම සඳහන් වෙනවා:

> "(අ) ප්‍රත්‍යක්ෂ, ආරක්ෂාකාරී සහ නිවැරදි තත්ත්වයෙන් යුතු ඖෂධ, ප්‍රත්‍යක්ෂ, ආරක්ෂාකාරී සහ නිවැරදි තත්ත්වයෙන් යුතු වෛද්‍ය උපකරණ සහ ප්‍රත්‍යක්ෂ, ආරක්ෂාකාරී සහ නිවැරදි තත්ත්වයෙන් යුතු සීමාස්ථ නිෂ්පාදන සාධාරණ මිලකට මහජනතාවට ලබා දෙන බවට තහවුරු කිරීම;"

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

සීමාස්ථ නිෂ්පාදන කියන්නේ borderline products. හැම සුවඳ විලවුන් වර්ගයක්ම නොවෙයි. Fairness cream කිව්වාම, ඒවායේ වෛද්‍ය ප්‍රශ්න තිබෙනවා. අන්න ඒවා මේ යටතට ගන්නවා. අනෙක් ඒවා ඉවත් කරනවා. ඒ වාගේම සුරක්ෂිතව හා නිවැරදිව ඖෂධ භාවිත කිරීමට පෙළඹවීම සහ දේශීය නිෂ්පාදකයන් දිරිගැන්වීම ද අරමුණුවල අන්තර්ගත වෙනවා.

මේ අධිකාරියට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා නිල බලයෙන් පත් වෙනවා. ඒ වාගේම ප්‍රධාන විධායක නිලධාරියෙක් පත් වෙනවා. භාණ්ඩාගාරයේ ලේකම් හෝ ඔහුගේ නියෝජිතයෙක් පත් වෙනවා. ඒ තුන් දෙනා වාගේම වෛද්‍ය ක්‍රමයේ ප්‍රධාන ක්ෂේත්‍ර හතරක් නියෝජනය කරමින් physician කෙනෙක්, surgeon කෙනෙක්, paediatrician කෙනෙක් හා VOG කෙනෙක් පත් වෙනවා. ඒ ප්‍රධාන කාණ්ඩ හතරෙන් හතර දෙනක් පත් වෙනවා. වෛද්‍ය ඖෂධවේදය - Pharmacology - පිළිබඳ මහාචාර්යවරයෙක් පත් වෙනවා. ඒ වාගේම pharmacy පිළිබඳ මහාචාර්යවරයෙක් හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙක් පත් වෙනවා. ඒ වාගේම කළමනාකරණය, නීතිය, ගිණුම්කරණය හා සෞඛ්‍ය ක්ෂේත්‍රයන්හි ප්‍රවීණතාව ලද වෘත්තිකයන් හතර දෙනෙකුත් පත් වෙනවා. මොකද අපට කිව්වා, සාමාන්‍ය වෛද්‍යවරුන්ගෙනුත් එක් කෙනෙක් පත් කරන්න කියා.

විශේෂඥවරුන් ගැන ඒ ගොල්ලන්ගෙන් නොයෙකුත් complaints තිබුණා, “අපිත් මේකට බොහොම ආසයි. නියම විධියට මේ කටයුතු කර ගෙන යන්න අපි තමයි කැමැති. ඒ නිසා අපෙනුත් එක් කෙනෙක් පත් කරන්න.” කියා. ඒ නිසා ඒ අයගෙනුත් හතර දෙනෙක් පත් කළා. ඇත්තටම ඒ අධිකාරියේ සභාපතිවරයා පත් කරන්නට මට තමයි බලතල තිබුණේ. මම අවසානයේදී කිව්වා, "මට එහෙම තනි අයිතියක් අවශ්‍ය නැහැ" කියා. මම ඒ amendment එක අද පසුව ඉදිරිපත් කරනවා. “The Minister shall, with the consultation of the members of the Authority, appoint one of them” මෙම සංශෝධනයෙන් මගේ - අමාත්‍යවරයාගේ- තනි බලයට නොවෙයි, ඒ ගොල්ලන්ව consult කරලා, ඒ ගොල්ලන්ගේ අනුමැතිය ඇතුව එක් කෙනෙක්ව පත් කිරීම දක්වා මම බලතල අඩු කර ගත්තා. මම කිව්වා, "මේ අධිකාරිය සම්බන්ධයෙන් ඇමතිවරයාට තිබෙන බලතල පුළුවන් තරම් අඩු කරන්න" කියා.

ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පතේ 6 වන වගන්තියේ සාමාජිකයන්ගේ සම්බන්ධතා සටහනය සඳහන් වෙනවා. මෙහිදීත් අපි තව amendment එකක් ඉදිරිපත් කරනවා. මෙහි සාමාජිකයන් කිසි කෙනෙකුට අධිකාරියේ සාමාජිකයකු වීම නතර වූ දිනයේ සිට අවුරුදු තුනක් යනකල් ඖෂධ ක්ෂේත්‍රය සම්බන්ධ රැකියාවකට යන්න බැහැ. නමුත් ඒක අපි අද amend කර ඉදිරිපත් කරනවා, පසුව අවුරුදු තුනක් විතරක් නොවෙයි, එන්න අවුරුදු තුනකට පෙරත් කිසි කෙනෙක් වාණිජ ක්ෂේත්‍රයේ ඉන්න බැහැ කියා.

මෙම පනත් කෙටුම්පතේ 14 වැනි වගන්තියේ අධිකාරියේ බලතල සහ කර්තව්‍යය සඳහන් වෙනවා. 7 වන වගන්තියේ සාමාජිකයකු වීම සඳහා නුසුදුසුකම් සඳහන් වෙනවා. මෙම අධිකාරියට උපදෙස් දීම සඳහා තවත් විශේෂඥවරුන් 23 දෙනෙකුගෙන් යුක්ත උපදේශක මණ්ඩලයක් -advisory board එකක්- පත් වෙනවා. ඇත්තටම මේ මඟින් ගන්නා වූ ඕනෑම තීන්දුවක් සම්බන්ධයෙන් ඕනෑම ක්ෂේත්‍රයක අයෙකුට -ව්‍යාපාරිකයෙකුට හෝ- ඇවිල්ලා අභියාචනා කිරීම සඳහා අභියාචනා මණ්ඩලයක් පත් කර තිබෙනවා. එහි සභාපතිවරයා වශයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විශ්‍රාමික විනිසුරුවරයෙක් පත් කරනවා. ඒ එක්කම සෞඛ්‍ය ලේකම්වරයා සහ විශ්‍රාමික විශේෂඥ වෛද්‍යවරයෙක් සාමාජිකයින් වශයෙන් පත් වෙනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම 118 වැනි වගන්තියේ තිබෙනවා, "වර්තමානයේ කිසිදු අධිකාරියකින් නියාමනය නොවූ හඳුන්වා දීමේ මිල - introductory price - නියම කිරීම අධිකාරිය විසින් පත් කරන ලද මිල කමිටුවේ පැහැදිලි කාර්ය භාරයක් ලෙස දක්වා ඇත" කියා. මෙය වැදගත් වගන්තියක්. මෙන්න මේක තමයි මහාචාර්ය සේනක බිබිලේ මහතාට අවශ්‍ය වුණේ. මිලෙහි යම් පාලනයක් තිබෙන්න ඕනෑ. වෛද්‍ය විද්‍යාව සියලු දෙනාටම අවශ්‍ය වන දෙයක්. වෛද්‍ය ක්ෂේත්‍රයේ කටයුතු කරන කොට, දොස්තරකම කරන කොට මුදලුත් ඕනෑ. නමුත් මූලික වශයෙන් මෙයින් සිදු වන්නේ සේවයක්. ඒක නිසා තමයි "රජකම නැත්නම් වෙදකම" කියන්නේ. මේ ක්ෂේත්‍රයට එන වාණිජ ව්‍යාපෘති කරන හැම කෙනාම දැන ගන්න ඕනෑ, මුදල් ඉපයීම වාගේම මෙය සේවයක් බව. මොකද, මේ මඟින් මිනිසුන්ගේ ජීවිත බේරා ගන්නවා. ඒ අනුව introductory price එක -අලුතෙන් price එකක් නියම කරන කොට ඒ price එක- නියාමනය කිරීමේ බලතල මේ අධිකාරියට ගෙන තිබෙනවා. මිල නියාමනය කිරීම තුළින් වෙළෙඳ ආර්ථිකයක් ඇති වීම ගැන සමහරු විවේචනය කරනවා.. අද සමහරු කථා කරනවා, මේක බොහොම සංවෘත ආර්ථික වැඩ පිළිවෙළක් කියා. ඇමෙරිකාවේ අද සියයට 85ක් generic name එකෙන් තමයි ඖෂධ නියම කරන්නේ. එතකොට එංගලන්තයේ සියයට 75කට වැඩි ප්‍රමාණයක් වෛද්‍යවරුන් generic name එක තමයි පාවිච්චි කරන්නේ. දියුණු ලෝකයේ විවෘත ආර්ථිකයේ දේවස්ථාන වශයෙන් සලකන මේ රටවලත් වෛද්‍යවරුන්ගෙන් සියයට 75ක්, සියයට 85ක් generic name එක තමයි භාවිත කරන්නේ.

ඒ නිසා මේ බලය අපි තියා ගන්නවා. එක එක්කෙනාට ඕනෑ ඕනෑ විධියට මිල වැඩි කරන්නට බැහැ. මේවායින් තමයි වෛද්‍යවරු පිට රට යන්නේ, වෛද්‍ය සම්මන්ත්‍රණ පවත්වන්නේ. මතක තියාගන්න, මම අවුරුදු 15ක් දන්ත වෛද්‍ය සංගමයේ ලේකම්වරයා වශයෙන් සිටියත් මම කිසිම දවසක "ලිවර් බ්‍රදර්ස්" හෝ වෙනත් කිසිම ආයතනයකින් පිට රට යන්න ticket එකක් ගත්තේ නැහැ. ඒවාට විරුද්ධව මම නැඟී සිටියා. නමුත් ඒ වෙලාවේ අපි තනි වුණා. සුළු කොටසක් තමයි ඒවාට විරුද්ධ වුණේ. බොහෝ වෛද්‍යවරු ඒවාට සම්බන්ධ වුණා. අපි ප්‍රතිපත්තියක් වශයෙන් කිසිම දවසක ගුවන් ටිකට් පතක් ලබා ගත්තේ නැහැ. අනෙක් හැමෝම ටිකට් පත් ගත්තා. මම මගේ අතේ වියදමින් ඒ ජාත්‍යන්තර සම්මන්ත්‍රණවලට පවා හැමදාම ගමන් කළා.

ඊළඟට, 141 වැනි වගන්තිය බලමු. ඒකේ තමයි "රීති සකස් කිරීම" තිබෙන්නේ. දැනට පවතින විලවුන් සහ ඖෂධ උපකරණ පනත මඟින් නියාමනය නොවූ සීමාස්ථ නිෂ්පාදන, ඒ කියන්නේ මම කලින් කිව්ව borderline products, fairness cream වාගේ දේවල් සහ nutraceuticals -විටමින් වර්ග- පිළිබඳව රීති සකස් කරන්න ඕනෑ. මේ පනත් කෙටුම්පත ගෙනාවාට හරියන්නේ නැහැ, මේවා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය රීති මම ඉදිරියේදී නැවත ගෙනෙනවා. ඒකේ පරිච්ඡේද 7ක් තිබෙනවා. පළමුවැනි පරිච්ඡේදය යටතේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය පිළිබඳ රීති. දෙවන පරිච්ඡේදය යටතේ ජාතික උපදේශක කමිටුව සහ අධිකාරියේ අනෙකුත් අංශ පිහිටුවීම පිළිබඳ රීති. තුන්වන පරිච්ඡේදය යටතේ ඖෂධවලට අදාළ සියලු කරුණු නියාමනය කිරීම සහ පාලනය කිරීමේ රීති. හතරවන පරිච්ඡේදය යටතේ වෛද්‍ය උපකරණවලට අදාළ සියලු කරුණු නියාමනය කිරීම සහ පාලනය කිරීම පිළිබඳ රීති. පස්වන පරිච්ඡේදය යටතේ සීමාස්ථ නිෂ්පාදනවලට අදාළ සියලු කාරණා නියාමනය සහ පාලනය

කිරීම පිළිබඳ රීති. හයවන පරිච්ඡේදය යටතේ ඖෂධවලට, වෛද්‍ය උපකරණවලට සහ සීමාස්ථ නිෂ්පාදනවලට අදාළ විධිවිධාන සම්බන්ධ රීති. හත්වන පරිච්ඡේදය යටතේ විවිධ විධිවිධාන ගෙන ඒමට අපේක්ෂා කරනවා.

මේ වාගේම තමයි, ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරයක් -world-standard quality lab එකක්- පිහිටුවීම. ඉස්සෙල්ලා තිබුණු NDQAL එක වෙනුවට NMQAL එකක් මෙම අධිකාරිය යටතේ අපි පිහිටුවනවා. එහෙම පිහිටුවලා ඊට පස්සේ අපි clinical trials සඳහා ජාතික උපදේශන කමිටුවේ අංශ පිහිටුවනවා. මේ සඳහා නැවතත් මම පනත් කෙටුම්පතක් ගෙනෙනවා. මේක මෙම පනත් කෙටුම්පත මඟින් cover වුණාට මේක ප්‍රමාණවත් නැහැ. මේ clinical trials කිරීම සහ ඒවායේ තිබෙන දේවල්, ඖෂධ මිලට ගැනීම සඳහා සහ ඖෂධ ගෙන ඒම ක්‍රියාත්මක කරන්නේ කොහොමද කියා තවත් පනත් කෙටුම්පතක් තව නොබෝ දිනකින් මම මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඒකත් වෙනම නියාමනය කිරීමකට භාජනය කරනවා. එකක් තමයි clinical trials, අනික් එක සියලුම ඔසුසැල් නියාමනය කිරීම සහ පාලනය කිරීම සිදු වෙනවා. ඒ වාගේම ලංකාව තුළ ගුණාත්මකභාවයන් යුත් ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදනය කිරීම නියාමනය කිරීම හා ප්‍රවර්ධනය කිරීම ඒකෙන් බලාපොරොත්තු වෙනවා.

ඊට පසු මෙහිම සඳහන් විධියට ඖෂධ ඇගැයීමේ කමිටුවක් පත් වෙනවා. ඒ සඳහා සාමාජිකයින් 9දෙනෙක් පත් වෙනවා. වෛද්‍ය උපකරණ ඇගැයීමේ කමිටුව සඳහා සාමාජිකයින් 19 දෙනෙක් පත් වෙනවා. සීමාස්ථ ඖෂධ නිෂ්පාදන - borderline products - නියාමනයට වෙනමම සාමාජිකයින් පත් වෙනවා. මෙහිදී Pharmacoeconomic Analysis මාර්ගයෙන් තමයි මිල නියම කිරීම සිදු වෙන්නේ. ඖෂධය කොච්චර වටිනවාද, market prices මොනවාද කියා බලා, දරාගත හැකි prices මොනවාද කියා බලා තමයි මිල නියම කිරීම සිදු වෙන්නේ. ඒ වාගේම 56වැනි වගන්තියෙන් තමයි එම ඖෂධයේ වාර්ගික නාමයත්, එහි brackets ඇතුළේ වෙළෙඳ නාමයත් සඳහන් කිරීම ඉදිරිපත් වෙන්නේ. ඊට පස්සේ අපට නියෝග සකස් කිරීමට සිදු වෙනවා. ඒ සඳහා මෙම පනත් කෙටුම්පතේ 111වන වගන්තිය යටතේ මෙහෙම සඳහන් වෙනවා:

> "යම් ව්‍යසනයකදී හෝ හදිසි අවස්ථාවකදී යම් ඖෂධයක්, වෛද්‍ය උපකරණයක් හෝ සීමාස්ථ නිෂ්පාදනයක් ත්‍යාග වශයෙන් භාර ගැනීම සඳහා එවැනි සමාන අවස්ථාවලදී ඖෂධ, වෛද්‍ය උපකරණ හෝ සීමාස්ථ නිෂ්පාදන භාර ගැනීමට හෝ ලබා ගැනීමට අදාළව නිකුත් කරන ලද ලෝක සෞඛ්‍ය සංවිධානයේ මාර්ගෝපදේශ සැලකිල්ලට ගනිමින් අමාත්‍යවරයා විසින් මාර්ගෝපදේශ නියම කරනු ලැබිය හැකිය."

මොකද, නොයෙකුත් ප්‍රදාන තිබෙනවා. ප්‍රදාන ගන්න කොට මේ පනත් කෙටුම්පතේ රීතිවලින් කියනවා, "මේ මේ අයගෙන් ප්‍රදානයන් ගන්න බැහැ. වාණිජ ක්ෂේත්‍රයේ සිටින කිසි කෙනෙකුගෙන් ප්‍රදානයන් ගන්න බැහැ" කියා. නමුත් හදිසි අවස්ථාවකදී WHO ක්‍රමවේදයට අනුව, එහි තත්ත්වයන් අනුව ඒවා ලබා ගන්නේ කෙසේද කියන එකත් මෙහි සඳහන් වෙනවා.

හදිසි අවස්ථාවන්වලදී ජීවිතයක් ආරක්ෂා කර ගැනීම, පවතින තත්ත්වය පාලනය සහ වසංගත තත්ත්වයන්වලදී මෙන්ම හදිසි තත්ත්වයන්වලදී ඖෂධ, ඖෂධීය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන මෙරටට ආනයනය කිරීම සඳහා අධිකාරිය විසින් අවසර ලබා දෙනවා. මෙම පනත් කෙටුම්පතේ තිබෙන කරුණුත් එක්ක මේ වගේ අවස්ථාවල කොහොමද ක්‍රියා කරන්න ඕනෑ කියා නීති රීති හදාගන්නට ඕනෑ.

අනික් එක තමයි, ශ්‍රී ලංකාවට ආනයනය කරන සියලුම ඖෂධ, උපකරණ සහ විලවුන්වල සියයට 75ක් රාක්කගතව තැබිය හැකි ජීව කාලයක් වරායට ඇතුළු වීමේදී තිබෙන්නට ඕනෑ. ඒ කියන්නේ, මෙරට වරායට ඇතුල් වෙන විට එම නිෂ්පාදනවල මුළු expiry period එකෙන් සියයට 75ක් තිබෙන්නට ඕනෑ. මේ සියල්ලම තිබෙනවා. 2005 වර්ෂයේ ඉදිරිපත් කළ "ශ්‍රී ලංකාව සඳහා වූ ජාතික ඖෂධ ප්‍රතිපත්තිය" කෙටුම්පත මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා.

මෙහිදී Ceylon College of Physicians ලිපියක් එවමින් වැදගත් කරුණු හතක් ඉදිරිපත් කර තිබුණා. ඒ සියලුම කරුණු එයට ඇතුළත් කළා. ඔවුන් එහි කියා තිබෙනවා, management, law, accountancy, health කියන ක්ෂේත්‍රවලින් university academicsලා විතරක් පත් කරන්න කියලා. අප එයට එකඟ වුණේ නැහැ. අනෙක් ඒවා අපි ඇතුළත් කර තිබෙනවා. සමහර ඒවාට regulations ගෙනෙන්න කියා තිබෙනවා. ඒ සියල්ලම වාගේ අප අනුමත කළා. ඒ අය එම ලිපියේ මෙසේ කියා තිබෙනවා:

> "The Ceylon College of Physicians thanks the Minister and the Director General of Health Services for giving us the opportunity to voice our opinion on this important Act pertaining to use of medicines in Sri Lanka and we hope that our recommendations would be incorporated…"

මේ Bill එක ඉදිරිපත් කිරීම ගැන, පැරණිම Medical Specialists' Association එක විධියට CCP එක ඉතාම ස්තුතිවන්ත වෙලා තිබෙනවා. ඒ වාගේම-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමා, ඔබතුමා තව කොපමණ වේලාවක් ගන්නවාද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු කථානායකතුමනි, විනාඩි පහක කාලයක් ලබා ගන්නවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවේදී මේ පනත් කෙටුම්පත ගැන අර්ථ දක්වලා තිබෙන එම විනිශ්චයකාරවරුන්ට අප ස්තුතිවන්ත වෙනවා. එම ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවේ මෙසේ සඳහන් වනවා:

> "This Bill is patient-centric, in that to make good quality affordable medicines, medical devices and borderline products continuously available to the patients in the society with adequate checks and balances. We observed that the Bill is designed with the best interest of the general public in mind, in line with the policy objectives of the Government."

ඒ විතරක් නොවෙයි, එතුමන්ලා එම ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවේ තවත් තැනකදී ඉදිරිපත් කරනවා, අපේ මේ පනත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යටත් වෙන්නේ නැති වුවත් ඇයි මෙයට එකඟ වන්නේ කියලා. I quote:

---

* ***පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

"This court observes that public health by itself is not specifically mentioned in the Directive Principles of State Policy in Article 27 of the Constitution."

ඒ කියන්නේ public health ගැන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබුණේ නැති වුණත්.

ඊළඟට,

"Yet, it is quite significant that adequate and affordable health facilities such as the core substance included in the Bill, providing and regulating safe drugs for affordable prices available at safe places as well as regulating the manufacturing of medicines, medical devices and borderline products…"

යනුවෙන් සඳහන් වෙනවා. එතුමන්ලා මෙහි ඇති ජාතික වැදගත්කම සලකා, මෙයට එකඟතාව ප්‍රකාශ කරලා මේ තීන්දුව ලබා දීලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, අද සවස් වරුවේ මම මෙය තවත් ශක්තිමත් කිරීම සඳහා සංශෝධන ඉදිරිපත් කරනවා. ඒ වාගේම අධිකරණය අපට ලබා දීලා තිබෙන කරුණුත් අප ඉදිරිපත් කරනවා. ගරු ජනාධිපතිතුමා සඳහන් කළ ආකාරයට, මේ පනත් කෙටුම්පත අප ඉදිරිපත් කරන්නේ බොහොම විවෘත මනසකින්. මෙතැනින් මෙහි දොරවල් වහන්නේ නැහැ. අද සවස් වරුවේ සංශෝධන ඉදිරිපත් කරනවා. ගරු වාසුදේව නානායක්කාර හිටපු ඇමතිතුමා අපට සංශෝධනයක් ඉදිරිපත් කරලා තිබෙනවා, මෙය භාෂා තුනෙන්ම සඳහන් කරන්න කියලා. අප ඒකත් ඇතුළත් කරනවා. ඒක හොඳයි. එවිට සාමාන්‍ය මනුෂ්‍යයාටත් අප කරන වැඩ පිළිවෙළ දැන ගන්න පුළුවන්. ඉංග්‍රීසි භාෂාවෙන් සඳහන් වී තිබුණාම කිසිවක් තේරෙන්නේ නැහැ. ෆාමසියේ සිටින පුද්ගලයා කියන දේ පමණයි තේරෙන්නේ. අඩු ගණනේ ඒවායේ නම සිංහල, දෙමළ භාෂාවලින් ලිව්වාම ඒ අය දන්නවා, අනෙක් නම හෝ ලියන්න. අනෙක් අදහසුත් මෙතැනදී ඉදිරිපත් කරන්න පුළුවන්. එහෙම ඉදිරිපත් කරන්න බැරි වුණොත් ඉදිරියේදී හෝ ඉදිරිපත් කරන්නට අප ක්‍රියා කරනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මේක අපි තිබෙන තත්ත්වයෙන් ගුණාත්මක වශයෙන් -[බාධා කිරීමක්]

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඔබතුමාගේ ඒවා මට තවම ලැබුණේ නැහැ. ඒ ටික එවන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඉදිරි පියවරක්නේ. අප එය පිළි ගන්නවා. හැබැයි, සාකච්ඡා කර ඇතුළත් කළ යුතු සමහර යෝජනා තිබෙනවා. ඔබතුමාගේ එකඟතාව තිබෙනවා නම් පමණක්, අද දිනයේ සම්පූර්ණ වශයෙන් විවාදය පවත්වලා, තව එක් දිනයක -මම කියන්නේ ඊළඟ පාර්ලිමේන්තු සතියේම නොවෙයි, ඊට කලින් වුණත් කමක් නැහැ- පැය දෙකක් වාගේ වෙන් කර පැයක වාගේ කාලයක් කාරක සභා අවස්ථාවට යොමු කරලා, මේ පනත් කෙටුම්පත සම්මත කර ගන්න අවස්ථාව ලබා ගන්නවා නම් හොඳයි කියලා මම අදහසක් හැටියට ඉදිරිපත් කරනවා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
අනුර දිසානායක මන්ත්‍රීතුමා, අප අද මෙම පනත් කෙටුම්පත සම්මත කර ගනිමු. ඔබතුමන්ලාගේ යෝජනා ගෙනෙන්න. ඒ සෑම හොඳ යෝජනාවක්ම මෙතැන එකඟතාව අනුව මම සංශෝධන වශයෙන් ඉදිරිපත් කරන්නම්. 18වැනි දිනට වුණත් එම සංශෝධන ඉදිරිපත් කරන්නම්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ කියන්නේ, ගරු ඇමතිතුමනි? මට තේරුණේ නැහැ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
නැත්නම් මේ පනත් කෙටුම්පත සම්මත කර ගැනීම කෙරෙන්නේ නැහැ. ඉතිහාසය බැලුවොත් අපට පෙනෙනවා හැම දාම මේ පනත් කෙටුම්පත සම්මත කිරීම ප්‍රමාද වෙලා තිබෙන බව. අද අපි මේ පනත් කෙටුම්පත සම්මත කරමු. අනුර දිසානායක මන්ත්‍රීතුමා, ඔබතුමන්ලාගේ අදහස් ගෙනෙන්න. සංශෝධනය කරන්න අවශ්‍ය දේවල් ඉදිරිපත් කරන්න. ඒ සංශෝධන මම අනික් සභා වාරයේදී ඉදිරිපත් කරන්නම්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එහෙම කරන්න පුළුවන්ද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
පුළුවන්. සංශෝධන ගෙනෙන්න පුළුවන්. අදත් මම සංශෝධන ඉදිරිපත් කරනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒක වෙන ක්‍රියාවලියක් නේ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
අද තවත් මන්ත්‍රීතුමන්ලා සංශෝධන ඉදිරිපත් කරනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු ඇමතිතුමනි, කාරක සභා අවස්ථාවේදී අපට සංශෝධන ඇතුළු කරන්න පුළුවන්. නමුත්, පනත් කෙටුම්පත සම්මත වුණාට පස්සේ, ඒ පනතට නැවත සංශෝධන ගෙනෙනවා නම් පනත සම්මත වීමට පෙර කාරක සභා අවස්ථාවේ ඒවා ඉදිරිපත් කරන තරම් පහසු නැහැ. ඒ කාරණයයි මම මේ කියන්නේ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
අපහසු වුණත් මම එය කරන්නම්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒක නැවත පනත සංශෝධනය කිරීමක්. එතකොට නැවත විවාදයක්, වෙනත් අවස්ථාවක් කියලා තමයි මම හිතන්නේ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
සංශෝධන හොඳ නම් විවාද කරන්නේ නැතිව pass කරන්න පුළුවන් නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඇත්තටම-

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඉතින්, ඔබතුමා අද සංශෝධන ඉදිරිපත් කරන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු ඇමතිතුමනි, මේ පනත් කෙටුම්පත ඊයේ තමයි අපේ අතට හරියටම හම්බ වුණේ. වෙන වෙන පනත් කෙටුම්පත් අපේ අතේ තිබුණා. ඒ නිසා හරි එක මොකක්ද, මේක අවසන් පනත් කෙටුම්පතද කියලා විවාදයක් තිබුණා. ඊයේ දවසේ තමයි අපට මේ පනත් කෙටුම්පත හම්බ වුණේ. එතකොට, අපේ කණ්ඩායම් එක්ක සාකච්ඡා කරලා, නැවත සංශෝධන හදා ගන්න කාලයක් යනවා. දැන් අපට වෙනත් හේතු හා මූලික අදහස් තිබෙනවා. නමුත්, ඒවා දැන් පනතේ සංශෝධනවල කොතැනටද ඇතුළු වන්නේ, කොහොමද ඇතුළු කරන්නේ කියන එක නීතිමය කාර්යයක් නේ. අන්න ඒක කර ගැනීමේ බාධාව තමයි තිබෙන්නේ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඒ අදහස් ටික ඒ විධියට ඉදිරිපත් කරන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අදහස් කිව්වාට ඒවා නීතියෙන් සම්මත වන්නේ නැහැ නේ, ගරු ඇමතිතුමනි.

මම කැමැතියි, සිකුරාදා දිනයේ හෝ මේ සඳහා අවස්ථාවක් දෙනවා නම්. ප්‍රශ්නයක් නැහැ. අද පස් වරු 2.30ට පක්ෂ නායක රැස්වීම පැවැත්වෙනවා, ගරු කථානායකතුමනි. අද ඒ ගැන සාකච්ඡා කරලා, සිකුරාදා දිනයේ අපට කාරක සභාවේදී අවස්ථාව දෙන්න, සංශෝධන ටික ගැන සාකච්ඡා කරන්න. ඉන් අනතුරුව අපි සිකුරාදා පනත සම්මත කරමු, ඔබතුමාගේ එකඟතාව තිබෙනවා නම්.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
එතකොට මේ සතියේම මේ කටයුත්ත අවසන් කරන්න අපට පුළුවන්ද?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අද සවස 2.30ට පක්ෂ නායක රැස්වීම පැවැත්වෙනවා. සිකුරාදා දිනයේ තිබෙන්නේ කල් තැබීමේ විවාදයක්, ගරු ඇමතිතුමනි.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
එම විවාදය නවත්වලා එදාට මේ සංශෝධන ගනිමු කියලාද ඔබතුමා කියන්නේ?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැහැ, දවසම අවශ්‍ය නැහැ. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා මොකක්ද මේ ගැන කියන්නේ?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Nimal Siripala de Silva - Leader of the Opposition)
සිකුරාදා දිනයේ පස් වරු 1.30ට තමයි පාර්ලිමේන්තුව රැස් වන්නේ. එදා උදේ 9.30ට රැස් වෙලා උදේ වරුවේ කාරක සභාව ගන්නවාට අපේ විරුද්ධත්වයක් නැහැ. එතකොට සිකුරාදාම කාරක සභා අවස්ථාවත් අරගෙන ඒ සංශෝධන සම්මත කරලා, අපේ කල් තැබීමේ විවාදයත් කර ගෙන යන්න පුළුවන්.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
හොඳයි. කමක් නැහැ. එහෙම නම් එය ස්ථිරයි නේද?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්. [බාධා කිරීමක්]

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මොකද, පෙරටුගාමී සමාජවාදී මන්ත්‍රීතුමන්ලා දැන් මේ ගරු සභාවේ නැහැ. ඒකයි මට බය තිබෙන්නේ.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
Committee Stage එක විතරයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමාට සාධාරණ සැකයක් -[බාධා කිරීමක්]

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
නැහැ. මම කිව්වේ හැම දෙනාගේම එකඟත්වය ඕනෑ නිසායි.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඇමතිතුමා, අපි කල් දමන්නේ Committee Stage එක විතරයි. මූලික පනත් කෙටුම්පත සම්මත කරලා Committee Stage එක අප එදාට දමනවා. හැබැයි, සිකුරාදා උදය වරුවේ පාර්ලිමේන්තුව රැස් වෙන්න ඕනෑ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඒක හරි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අද පක්ෂ නායක රැස්වීම පැවැත්වෙනවා. ඒකෙදි අප මේ ගැන කථානායකතුමා එක්ක කථා කරලා තීන්දු කර ගනිමු.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
හොඳයි.

ගරු කථානායකතුමනි, මගේ කථාව තව මොහොතකින් අවසන් කරනවා.

යෝජිත මෙම පනත් කෙටුම්පත මනා තුලනයකින් යුතුව, කේන්ද්‍ර කර ගත් රෝගීන් සහ මහ ජනතාවට ගුණාත්මක ඖෂධ, වෛද්‍ය උපකරණ හා සීමාන්තික නිෂ්පාදන අඛණ්ඩව ලබා ගැනීමට ඇති හැකියාව සලසනවා මෙන්ම ප්‍රමාණවත් සංචරණ හා තුලනයක් සහිතව නියාමන අධිකාරියේ ක්‍රියාකාරිත්වය, විනිවිදභාවය සහතික කරන්නක් බව මාගේ හැඟීමයි.

වඩා කාර්යක්ෂමව ඖෂධ ලියා පදිංචි කිරීමට හා ඖෂධ සම්බන්ධ සියලු පටිපාටි වඩා හොඳින් නියාමනය කිරීමට හැකි වන පරිදි අධිකාරියේ ස්වාධීනත්වය හා පුළුල් සෞඛ්‍ය ප්‍රතිපත්තිමය ගැටලු අතර තුලනයක් පවත්වා ගනිමින් සහ සාමාන්‍ය ජනතාවගේ උපරිම සුඛසිද්ධිය සිත්හි දරාගෙන මෙම කෙටුම්පත සකස් කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේදී අපේ වර්තමාන ජනාධිපතිතුමාට -හිටපු සෞඛ්‍ය අමාත්‍යවරයාට- මගේ ගෞරවය හා ආචාරය පුද කරනවා. මේ කාර්යය මේ තරම් දුර ගෙනැත්, මේ තරම් ඉක්මනට මේක හදන්නට කෙටුම්පත් ලැහැස්ති කර, ඒ කරුණු මට ලබා දීලා, ඒ කටයුතු සියල්ල කරන්න තරම් එතුමාගේ කශේරුකාව ශක්තිමත් වීම මම ඉතාම අගය කරනවා. ඒ නිසා අද දින මේ පනත් කෙටුම්පත සම්මත කරලා, කාරක සභාවේදී ඉතා ඉක්මන් දිනක සංශෝධනත් සම්මත කරලා අප මේ පනත නීතිගත කරනවා.

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඉදිරියේදී මේ වෙනුවෙන් හුභක් වැඩ කටයුතු කරන්න තිබෙනවා. මේ පනත් කෙටුම්පත සම්මත කළාය කියලා හැම දෙයක්ම එකපාරටම වෙන්නේ නැහැ. ගරු ජනාධිපතිතුමා කිව්වා වාගේ, මේකට රීති හදන්න වෙනවා; තව පනත් ගේන්න වෙනවා; labs හදන්න තිබෙනවා. මේ ඔක්කොම කරන්න තිබෙනවා. අද මේ ගරු සභාවේ සියලු පාර්ශ්වයන් මේ හැම දේකටම උදවු කළා වාගේ, ඉතිරි කටයුතු සඳහාත් ඔබතුමන්ලාගේ සහයෝගය දෙන්න කියා මා ඉල්ලා සිටිනවා. දිවංගත දොස්තර එස්.ඒ. වික්‍රමසිංහ මැතිතුමාටත්, මහාචාර්ය සේනක බිබිලේ මැතිතුමාටත් ඉන්නා තැනක සිට මේ සියලු සද් කාර්යයන් දකින්න ලැබෙනවා නම් එතුමන්ලා බෙහෙවින් සතුටු වේවි. තරුණයෙක් විධියට එතුමන්ලා ආශ්‍රය කරපු මම අද විශාල ආශ්වාදයක් ලබනවා. ඒ වාගේම වාසුදේව නානායක්කාර, එස්.බී. දිසානායක, තිස්ස විතාරණ වැනි මන්ත්‍රීතුමන්ලාත් එතුමන්ලාගේ ගෝලයන්.

ඒ ශ්‍රේෂ්ඨ මානව හිතවාදීන් දෙදෙනාටත්, ඒ ශ්‍රේෂ්ඨ මිනිසුන් මේ රටට දායාද කරපු අයටත්, මේ සද් කාර්යය කිරීමට උර දුන් අපේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටත් අද විශාල ආශ්වාදයක් ලැබේවි. ජනාධිපතිතුමා චීන කොමියුනිස්ට් පක්ෂයෙන් දේශපාලනය ආරම්භ කළේ. එස්.බී. දිසානායක මැතිතුමා සෝවියට් කොමියුනිස්ට් පක්ෂයෙන් දේශපාලනය ආරම්භ කළේ. අනික් කට්ටිය නව සමසමාජ පක්ෂයෙන් දේශපාලනය ආරම්භ කළේ. සමහර අය තවමත් එතුමන්ලාගේ මතවාදයේ ඉන්නවා. මමත් වමේ ව්‍යාපාරයේ ලංකා සමසමාජ පක්ෂයෙන් දේශපාලනය ආරම්භ කළේ. කෙසේ වෙතත්, ඒ සියලුදෙනාට විශාල ආශ්වාදයක් ලැබේවි, මෙම පනත් කෙටුම්පත ක්‍රියාත්මක වන දවසට. ඒ දවස ඉතා ඉක්මනින් උදා වේවා!යි කියා ප්‍රාර්ථනා කරමින්, මේ සද් කාර්යයට උපකාර කරපු ඒ මහාචාර්යවරුන් ඇතුළු ඔබ තමුන්නාන්සේලා සියලුදෙනාටම ස්තුතිවන්ත වෙමින් මා නිශ්ශබ්ද වනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ස්තුතියි.

ඊළඟට ගරු නිමල් සිරිපාල ද සිල්වා මන්ත්‍රීතුමා.

Order, please! ඊට පෙර ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනය ගන්නවා ඇත.

අනතුරුව* කථානායකතුමා *මූලාසනයෙන් ඉවත් වූයෙන්,* නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] *මූලාසනාරූඪ විය.

அதன்பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.

Whereupon MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *took the Chair.*

[පූ.භා. 11.41]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Nimal Siripala de Silva - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට මෙන්ම, වසර 10ක් ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළ මටත් අද දවස ඉතාම ප්‍රීතිමත් දවසක්. මොකද, මේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත පිළිබඳව මූලික කටයුතු මගේ කාලයේදී ආරම්භ කරලා, එහි ඉතිරි කටයුතු නිම කිරීම තමයි මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට භාර වුණේ. එතුමා ඒ පිළිබඳ දීර්ඝ විස්තරයක් කළා. ඒ ගැන මා ඉතාම සන්තෝෂ වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලෝක සෞඛ්‍ය සංවිධානයේ සභාපතිවරයා වශයෙන් හා එහි විධායක කමිටුවේ සාමාජිකයකු වශයෙන් ලෝක සෞඛ්‍ය සංවිධානය තුළ ශ්‍රී ලංකාවට විශාල ගෞරවයක් අත්කර දුන් විශේෂිත කාරණයක්

තමයි, සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය. තුන්වන ලෝකයේ රටවලින්, අප්‍රිකාව හා ලතින් ඇමෙරිකාව වැනි රටවලින් පැමිණි සෑම නියෝජිතයකුම සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය පිළිබඳව අධ්‍යයනය කරලා තිබුණා. ඒ අය ලෝක සෞඛ්‍ය සංවිධානය තුළ විශාල මතයක් ගෙන ගියා, විශේෂයෙන්ම තුන්වන ලෝකයේ රටවලට, දියුණු වෙමින් පවතින රටවලට සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය ඉතා අවශ්‍ය ඖෂධ ප්‍රතිපත්තියක් බවට. නමුත් බහුජාතික සමාගම් ඒකට කැමැති වුණේ නැහැ. අපි ඒ පිළිබඳව ලෝක සෞඛ්‍ය සංවිධානයේ විධායක සභාව තුළත්, ලෝක සෞඛ්‍ය සම්මේලනය තුළත් විවිධ අවස්ථාවලදී විවාද කළා. ඒ අවස්ථාවේදී ඖෂධ නිෂ්පාදනය කරන බටහිර සමාගම්වල බලපෑම නිසා ලෝක සෞඛ්‍ය සංවිධානයටත් ඇමෙරිකාව, එංගලන්තය, ස්විට්සර්ලන්තය වැනි රටවලින් විශාල බලපෑමක් ඇති වුණා, එවැනි ඖෂධ ප්‍රතිපත්තියකට ලෝක සෞඛ්‍ය සංවිධානය නතු නොවිය යුතුයි කියලා.

අපේ ජනාධිපතිතුමා කිව්වා වාගේම, රාජිත සේනාරත්න මැතිතුමා කිව්වා වාගේම මා ලෝක සෞඛ්‍ය සංවිධානයේ සභාපතිවරයා වශයෙන් ඉන්න කොට තමයි ක්‍රිෂාන්ත වීරසූරිය මැතිතුමා ලෝක සෞඛ්‍ය සංවිධානයේ ඉන්දියාවේ කාර්යාලයේ සේවය කළේ. ඊට පස්සේ එතුමා ජිනීවා නුවරට ගිහින් ලෝක සෞඛ්‍ය සංවිධානයේ ඒ අංශය භාරව වැඩ කළා. මගේ උපදේශකවරයකු වශයෙන් අපේ පාලිත අබේකෝන් මැතිතුමා ඒ සමස්ත කාලය පුරාම මාත් එක්ක ලෝක සෞඛ්‍ය සංවිධානය වෙත ගියා. එතුමා මේ අංශය පිළිබඳව උපදෙස් රාශියක් මට දුන්නා. ඒ වාගේම මා මහාචාර්ය කොල්වින් ගුණරත්න මැතිතුමා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපතිවරයා වශයෙන් පත් කළා. ඒ වාගේම ටියුරින් ද සිල්වා මැතිතුමා මාත් එක්ක ත්‍රිසිංහල ශිෂ්‍ය සංවිධානයේ විධායක කාරක සභාවේ හිටපු මහාචාර්යවරයෙක්. මේ ඖෂධ ප්‍රතිපත්තිය පිළිබඳව ශ්‍රී ලංකාවේ පමණක් නොවෙයි, ලෝක සෞඛ්‍ය සංවිධානය තුළත් සුවිශේෂී බලපෑම්වලට යට වුණු ප්‍රතිපත්තියක් තමයි තිබුණේ. නමුත් අපි අද සන්තෝෂ වනවා, ලංකාවේ ළදරු මරණ අනුපාතිකය, මාතෘ මරණ අනුපාතිකය යන මේ කාරණා තුළින් ලංකාවට ගෞරවයක් ලැබෙනවා වාගේම, සේනක බිබිලේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම තුළිනුත් සෞඛ්‍ය ක්ෂේත්‍රය පිළිබඳව ජාත්‍යන්තරය තුළ ශ්‍රී ලංකාවට ගෞරවයක් ලැබීම ගැන. ඒ ගෞරවය අපේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ලබා දීමට අපට අවස්ථාවක් ලැබීම ගැන අපි සතුටු වනවා.

ඒ නිසා විපක්ෂය වශයෙන් අපි මේ පනත් කෙටුම්පතට පූර්ණ සහයෝගය ලබා දීමට තීරණය කරලා තිබෙනවා. ඒ ගැන කිසිම සැකයක් නැහැ. ඒ සහයෝගය ලබා දෙන අතරම, අපි ගරු රාජිත සේනාරත්න අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා මේ පනත් කෙටුම්පතේ තිබෙන සමහර කාරණා පිළිබඳව දැනටමත් අප විසින් යෝජනා කරන ලද සහ විවිධ වෘත්තීය සංවිධාන මඟින් යෝජනා කරන ලද සමහර සංශෝධන භාර ගෙන තිබීම ගැන. අමාත්‍යවරයාට ඒකාධිකාරයක් තබා ගන්නේ නැතිව, සමස්ත මණ්ඩලය විසින් යෝජනා කරනු ලබන පුද්ගලයෙක් මේ අධිකාරියේ සභාපතිවරයා බවට පත් කිරීම වැනි කාරණා පිළිබඳව එතුමා එකඟත්වයට පැමිණීම ඉතාම වැදගත්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පනත් කෙටුම්පතේ ඉතාම වැදගත් වගන්තිය හැටියට මම දකිනේ 56වන වගන්තියයි. එයින් කියන්නේ, වෛද්‍යවරයෙකු විසින් යම් ඖෂධයක් නියම කිරීමේදී ඒ තුණ්ඩුවේ - prescription එකේ- අනිවාර්යයෙන්ම ඒ ඖෂධය ඖෂධීය නාමයෙන් ලිවිය යුතුයි. මීට පෙර ශ්‍රී ලංකාවේ එහෙම නීතියක් තිබුණේ නැහැ. එක එක වෛද්‍යවරයාට කැමැති පරිදි වෙළෙඳ නාමයෙන් ඖෂධ ලියන්න පුළුවන්. එතකොට අනිවාර්යයෙන්ම රෝගියාට සිද්ධ වනවා ඒ තුණ්ඩුව pharmacy එකට දීලා වෙළෙඳ නාමයෙන් දෙන ඖෂධය මිලදී ගන්නට. එතකොට, එකිනෙක වෙළෙඳ නාමවලින් පවතින ඖෂධ අතර තිබෙන මිල ගණන්වල වෙනස සමහර විට එකට දස ගුණයක්, එකට විසිපස් ගුණයක්, සිය ගුණයක් වෙන්න පුළුවන්. රෝගියාගේ -බෙහෙත් ගන්නා කෙනාගේ- හිත තුළ තිබෙන්නේ වෛද්‍යවරයා ලියපු එක තමයි හරි දේ, ඒක කීය දීලා හෝ ගන්න ඕනෑ කියලා. නමුත් මේ පනත් කෙටුම්පත තුළින් රෝගියාට යමක් තෝරා ගැනීමේ නිදහසක් හා අයිතියක් - patient's choice - දීලා තිබෙනවා. ඒ අනුව අද ශ්‍රී ලාංකීය වෛද්‍ය ක්ෂේත්‍රයේ රෝගී සත්කාර සේවාව මේ පනත් කෙටුම්පත මඟින් අලුත් මාවතකට යොමු කරලා තිබෙනවා කියන කාරණය අපි ඉතාම කැමැත්තෙන් ප්‍රකාශ කරන්නට ඕනෑ.

මම ගරු රාජිත සේනාරත්න මැතිතුමා සමඟ එකඟ වෙන තවත් කාරණයක් තිබෙනවා. සේනක බිබිලේ ප්‍රතිපත්තිය කියලා අපට පරණ ගතානුගතික ක්‍රමයටම නූතන සමාජය තුළ යන්නට පුළුවන්කමක් නැහැ. එදා සමාජවාදය ප්‍රගුණ කරපු රටවල් බොහොමයක් අද එයින් ඉවතට ගිහින් ධනවාදී සහ විවෘත ආර්ථිකයට යොමු වෙලා තිබෙනවා. අපි මේ නව ප්‍රවණතා තේරුම් ගන්නට ඕනෑ. සමහර අය ඒ පැරණි දේවල්වලම එල්ලිලා ඉඳලා, ඒක තමයි හරි කියලා හිතනවා. නමුත් මුළු ලෝකයම වෙනස් වෙලා තිබෙනවා. අද කියුබාව වාගේ රටවල් පවා වෙනස් වෙලා තිබෙනවා. චීනය ගැන බලන්න. ඒ රට සමාජවාදයේ තෝතැන්න. අද ඒ රටවල් මොන තරම් දුරට වෙනස් වෙලා ආර්ථික ප්‍රගමනයක් ලබා තිබෙනවාද? සේනක බිබිලේ ප්‍රතිපත්තිය තුළත් එවැනි කාලීන වෙනස්කම් කරලා මේ පනත් කෙටුම්පත සකස් කිරීමට ලැබීම අපේ සතුටට කාරණයක් බව ප්‍රකාශ කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අපේ රටට අවශ්‍ය ඖෂධ මේ රටේම නිෂ්පාදනය කිරීම පිළිබඳව ගැටලු දෙකක් තිබෙනවා. අද චීනය සහ ඉන්දියාව අමු ද්‍රව්‍ය - raw materials - විශාල වශයෙන් නිෂ්පාදනය කරන රටවල්. ඒ නිසා ඒ රටවල ඖෂධ නිෂ්පාදනය කිරීමේදී ලාභ මිලකට ඒ අමු ද්‍රව්‍ය ලබා ගන්න පුළුවන්. හිටපු සෞඛ්‍ය ඇමතිවරයකු වශයෙන් මම දන්නවා, State Pharmaceuticals Manufacturing Corporation එක අනුව බලන විට, අපි ඉල්ලන අමු ද්‍රව්‍යවල මිල ගණන් ඉතාම වැඩියි. එතකොට අපට ඉන්දියාවේ හෝ චීනයේ මිල ගණන් එක්ක තරග කිරීමට අමාරු වෙනවා raw materials වල මිල ගණන් ඉහළ නිසා. අපට මේ ප්‍රශ්නයත් තිබෙනවා.

බංගලාදේශයේ මිලියන 180ක ජනතාවක් ඉන්නවා. ඉන්දියාවේ බිලියන 1.2ක ජනතාවක් ඉන්නවා. ඒක නිසා දේශීය වෙළෙඳ පොළ - local market එක- ඉතාමත් ප්‍රසාරණය වෙලා තිබෙනවා. නමුත් අපේ රටේ සිටින්නේ මිලියන 20ක ජනතාවක්. ඒ නිසා අද නිෂ්පාදන ක්ෂේත්‍රයේ දී විශේෂයෙන්ම විශාල ප්‍රමාණයෙන් නිෂ්පාදන - bulk production - කරනවා නම්, ඒ සඳහා මුදල් වැය කරන අයට ඉතා සුළු margin එකක් තියලා ලාභයක් ලබා ගන්න පුළුවන්. මෙන්න මේ කියන ප්‍රශ්නය තිබෙනවා. ඒ නිසා අපට අවශ්‍ය සියලුම ඖෂධ ලංකාවේ නිෂ්පාදනය කරන්න පුළුවන්කමක් නැහැ. නමුත් අපට විශාල වශයෙන් අවශ්‍ය වන මූලික ඖෂධ ගණනාවක නිෂ්පාදන ධාරිතාව ලංකාවේ වැඩි කර ගන්නට ඕනෑ. මොකද, සමහර දේවල් අපට අවශ්‍ය වෙන්නේ ඉතා සුළු ප්‍රමාණයක්. ඒවා අනිවාර්යෙන්ම අපට පිට රටින් මිලදී ගැනීමට සිදු වෙනවා. මෙන්න මේ කාරණයත් අපි විශේෂයෙන්ම කල්පනා කරන්න ඕනෑ.

එදා සේනක බිබිලේ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය මේ රටේ ස්ථාපිත කරන ලද රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව තුළින් තමයි අද විශාල විකුණුම් ජාලයක්

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

ඇති කර ඔසු සැල් ගණනාවක් ලංකාව පුරාම ඇති වී තිබෙන්නේ. ඒ තුළින් නියම ප්‍රමිතියෙන් යුතුව ඖෂධ දෙනවා පමණක් නොවෙයි, ඒ සඳහා ඖෂධවේදීන් - pharmacists - පුහුණු කළා. මට මතකයි, මම සෞඛ්‍ය ඇමතිවරයා වශයෙන් ඉන්නා කාලයේ ඖෂධ සංස්ථාව මඟින් වියදම් කරලා ලංකාවේ පෞද්ගලික වෛද්‍ය ආයතනය සඳහා අවශ්‍ය external pharmacistලා 1,500කට වැඩි ප්‍රමාණයකට අපි පාඨමාලා පවත්වලා ඔවුන් ඒ ප්‍රමිතියට ගෙනැල්ලා ඒ කාරණයත් ඉෂ්ට කළ බව. ඒ නිසා ඖෂධ සංස්ථාව ඇත්ත වශයෙන්ම අපි රැක ගත යුතුයි. ඖෂධ සංස්ථාව නොතිබුණා නම් බහුජාතික සමාගම්වලට මේ රටේ ජනතාව සූරා කෑමට තිබෙන ඉඩ කඩ මීටත් වඩා වැඩි වනවා. ඇත්ත වශයෙන්ම ඖෂධ නීතිගත සංස්ථාව තිබුණු නිසා, එය එක්තරා ආකාරයක buffer එකක් හැටියට, cushion එකක් හැටියට ක්‍රියා කළ නිසා අපට සාධාරණ මිල ගණනකට හොඳ ඖෂධ විශේෂයෙන්ම ඖෂධ නාමයෙන් දෙන ඖෂධ විශාල ප්‍රමාණයක් ලබා දීමේ හැකියාව ඇති වුණා. ඒ නිසා මම සෞඛ්‍ය ඇමතිතුමාට කියා සිටිනවා, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවත්, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවත් කියන මේ දෙකම වඩාත් ශක්තිමත් කිරීමේ වැඩ පිළිවෙළකට අනිවාර්යෙන්ම යා යුතු බව.

අද ඖෂධ ගැනීමේදී අපි සාමාන්‍යයෙන් බලන්නේ ප්‍රත්‍යක්ෂභාවය - efficacy , ආරක්ෂිත බව - safety, තත්ත්වය - quality කියන කාරණයි. දැන් අලුත් සංකල්ප දෙකක් මේ පනත් කෙටුම්පතට ඇතුළත් කරලා තිබෙනවා. ඒ තමයි පිරිවැය ඵලදායීතාව සහ අවශ්‍යතාව - cost effectiveness and need. මේ දෙක මේ පනත් කෙටුම්පතේ දකින්නට ලැබෙන අලුත් ලක්ෂණ දෙකක්.

මේ පිළිබඳව දැන් යම් ආකාරයක විවාදාත්මක ප්‍රශ්නයක් පැන නැඟිලා තිබෙනවා. ඖෂධවල cost effectiveness සහ අවශ්‍යතාව -need- කියන දෙක පිළිබඳව විවිධ interpretations තිබෙනවා. The terms “need” and "cost effectiveness" are arbitrary and subjective, and do not define clearly; so far left with different interpretations. එම නිසා සෞඛ්‍ය ඇමතිතුමනි, අතිශයින්ම වැදගත් දේ තමයි මේක තීන්දු කරන කණ්ඩායම unbias කණ්ඩායමක් බවට පත් වෙන්නට ඕනෑ. මේක තීන්දු කරන කණ්ඩායම අපක්ෂපාතී කණ්ඩායමක් බවටත්, need and cost effectiveness සම්බන්ධයෙන් arbitrary විධියට, ඒකාධිපති විධියට interpretation එකක් දෙන්නේ නැතිව සාධාරණත්වයෙන් කල්පනා කරලා ඒ පිළිබඳව තීන්දුව දීම ඉතා වැදගත්. එම නිසා අපේ අතිගරු ජනාධිපතිතුමා කිව්වා වාගේම මේ නීති-රීති මොනවා ගෙනාවත් මේ රාමුව තුළ වැඩ කටයුතු කරනු ලබන ඒ පුද්ගලයින් විශේෂයෙන්ම මේ ආකාරයෙන් හැසිරෙන්නට ඕනෑ. ඔවුන් යම් ඖෂධයක් ලියා පදිංචි කිරීම කිසිම හේතුවක් නැතිව "No need" කියලා ප්‍රතික්ෂේප කරනවා නම්, එහෙම නැත්නම් cost effectiveness base කර ගෙන ප්‍රතික්ෂේප කරනවා නම්, සාධාරණත්වයෙන් කටයුතු කිරීම ඉතාම වැදගත් වෙනවා. මොකද, අද මේ රටේ සමස්ත වෛද්‍ය ක්ෂේත්‍රයෙන් සියයට 50ක් පමණයි රජයේ ක්ෂේත්‍රයට එන්නේ. ඒ වාගේම සියයට 50ක් පමණ පෞද්ගලික වෛද්‍ය සේවාවන් සඳහා යනවා. අපි ඖෂධ වර්ග - pharmaceutical items - රුපියල් බිලියන 30ක පමණ රාජ්‍ය ක්ෂේත්‍රයට ගෙන්වනවා. ඒ වාගේම තවත් රුපියල් බිලියන 30ක පමණ ප්‍රමාණයක් පෞද්ගලික රෝහල් සහ පෞද්ගලික ක්ෂේත්‍රයට ගෙන්වනවා. ඒක නිසා මේක 50:50 යන දෙයක්.

ඒ නිසා පෞද්ගලික ක්ෂේත්‍රයටත් ඖෂධ අවශ්‍ය වනවා. උදාහරණයක් වශයෙන් යම් කෙනකුට යම් සුවිශේෂී ඖෂධයක් ලබා ගන්න අවශ්‍ය නම් ඒ තිබෙන අයිතිය කොහොමද සුරකින්නේ කියන කාරණය පිළිබඳවත් යම් ආකාරයක අගය කිරීමක් කළ යුතුයි කියලා මම කියනවා. ඒ නිසා ඒ පිළිබඳවත් ඔබතුමා ඉදිරියේදී ගෙන එන regulationsවල දී කල්පනා කරලා කටයුතු කිරීම ඉතාමත් වැදගත් වනවා.

අද සුළු ප්‍රශ්නයක් තිබෙනවා, සුවඳ විලවුන් - cosmetics - මේ පනත් කෙටුම්පතින් ඉවත් කිරීම පිළිබඳව. මෙම ක්ෂේත්‍රයේ සිටින අයට මේ පිළිබඳ සැකයක් ඇති වෙලා තිබෙනවා, සුවඳ විලවුන් කියන මේ කාරණය මේ පනත් කෙටුම්පතෙන් ඉවත් කළාට පස්සේ whether this is going to open floodgates කියලා. ඒ කියන්නේ සුවඳ විලවුන්වලට කිසිම ආරක්ෂණයක් නැතුව, රැකවරණයක් නැතුව ඕනෑ දෙයක් ගෙන්වන්න Customs එකෙන් ඉඩ දුන්නොත් ඒ තුළින් රටේ ඇති විය හැකි තත්ත්වය පිළිබඳ ඔබතුමා පොඩ්ඩක් කල්පනා කරලා බලන්න. මේ පිළිබඳව ටිකක් ගැඹුරින් කල්පනා කරලා ඉතා ඉක්මනින් කටයුතු කරන්න ඕනෑ. මොකද සුවඳ විලවුන් ක්ෂේත්‍රය පිළිබඳවත් විවිධ විද්වතුන් විශාල ප්‍රශ්න රාශියක් මතු කරලා තිබෙනවා. College of General Practitioners, GMOA, Ceylon College of Physicians කියන මේ තුන්ගොල්ලම ඔබතුමා වෙත යවන ලද එම ඉදිරිපත් කිරීම්, මටත් ඉදිරිපත් කරලා තිබෙනවා. ඔබතුමා ඒවායින් සමහර කාරණා පිළිබඳ අවධානය යොමු කරලා අවශ්‍ය amendments ගෙනැත් තිබීම ගැන මම සන්තෝෂ වෙනවා. අපේ ගරු තිස්ස විතාරණ මැතිතුමාත්, ගරු වාසුදේව නානායක්කාර මැතිතුමාත් අපිත් සමඟ සාකච්ඡා කරලා ඒ සඳහා අවශ්‍ය සංශෝධන රාශියක් ගෙනැත් තිබෙනවා. ඒ පිළිබඳවත් කල්පනා කරලා, ඒවා පිළිගන්න කියන කාරණයත් ඉදිරිපත් කරමින්, විපක්ෂය හැටියට අපි මේ පනත් කෙටුම්පතට පක්ෂව ඡන්දය ලබා දෙනවා. කොහොම හරි සිකුරාදා වනකොට ඔබතුමාත් අපේ අතිගරු ජනාධිපතිතුමාත් සතුටට පත් වන ආකාරයට අපි මේ පනත් කෙටුම්පත සම්මත කර දෙන බව ප්‍රකාශ කරමින් මාගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තූතියි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මීළඟට ගරු සජිත් ප්‍රේමදාස මහතා.

[පූ.භා. 11.58]

ගරු සජිත් ප්‍රේමදාස මහතා (නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - வீடமைப்பு மற்றும் சமுர்த்தி அமைச்சர்)
(The Hon. Sajith Premadasa - Minister of Housing and Samurdhi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිදහස් සෞඛ්‍ය ඉතිහාසයේ ඓතිහාසික දවසක් හැටියට අද දවස සනිටුහන් වනවා. වාමාංශික, දක්ෂිණාංශික භේදයකින් තොරව අපේ රටේ සුවහස් ගණනක් වූ - ලක්ෂ දෙසියයකට අධික වූ- පොදු ජනතාවගේ සුබසිද්ධිය උදෙසා ජනතාවාදී, ජනහිතකාමී, ප්‍රගතිශීලී ඖෂධ පනත් කෙටුම්පතක් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ චින්තනය පරිදි සහ ගරු රාජිත සේනාරත්න ඇමතිතුමාගේ මෙහෙයවීමෙන් ක්‍රියාත්මක වන මේ අවස්ථාවේ සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය පිළිබඳව පුන පුනා මේ උත්තරීතර සභාවේ අදහස් ඉදිරිපත් කරපු මහජන නියෝජිතයෙක් හැටියට මම දැඩි ලෙස සතුටු වනවා. ගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් මේ ක්‍රියාත්මක කරන ජනහිතකාමී වැඩසටහන පිළිබඳව මම සතුටු වනවා.

අපි ඉතිහාසය දිහා පොඩ්ඩක් බැලුවොත් පැහැදිලි වනවා, සේනක බිබිලේ මැතිතුමා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පීඨාධිපති

සහ ඖෂධවේදියකු හැටියට 1966 ලංකා රෝහල් සූත්‍ර සංග්‍රහය හරහා ප්‍රථම වතාවට ජාතික ඖෂධ ප්‍රතිපත්තිය පිළිබඳව රටට නිර්මාණ ඉදිරිපත් කළ බව. වෛද්‍ය එස්.ඒ. වික්‍රමසිංහ මැතිතුමාත්, මහාචාර්ය බිබිලේ මැතිතුමාත් ජාතික ඖෂධ ප්‍රතිපත්තියක් සඳහා වූ වික්‍රමසිංහ-බිබිලේ වාර්තාව 1971 දී එළි දැක්වුවා.

විශේෂයෙන්ම ලංකාවට ගැළපෙන අත්‍යවශ්‍ය ඖෂධ 232ක ලැයිස්තුවක් එළි දක්වලා ඒවායේ මිල අධික ලෙස ඉහළ යෑම වැළැක්වීම, නිෂ්පාදනය, බෙදා හැරීම, ගබඩා කිරීම ගුණාත්මකභාවයෙන් යුතුව ක්‍රියාත්මක කිරීම යනාදි සංකල්ප තුළින් බිබිලේ-වික්‍රමසිංහ ජාතික ප්‍රතිපත්තිය එළි දක්වන්නට කටයුතු කළත්, එදාත් ඒ වැඩසටහන ක්‍රියාත්මක වන්නට අතිශය බාධා සහිත තත්ත්වයක් නිර්මාණය වුණා. 1991 සහ 1996 කාල වකවානුව තුළදීත් මේ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්නට උත්සාහ කළා. 2005 දීත් "මහින්ද චින්තන" යටතේ මේ ඖෂධ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනවාය කියලා රටට පොරොන්දුවක් ලබා දුන්නා. 2007 දී මහාචාර්ය ක්‍රිෂාන්ත වීරසූරිය මහතාගේ මෙහෙයවීමෙන් ජාතික ස්ථාවර කමිටුවකුත් පත් කළා. නැවත වරක් 2010 දී "මහින්ද චින්තන ඉදිරි දැක්ම" මඟින්, ඖෂධ පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා කියන පොරොන්දුව දෙවන වතාවටත් ඉදිරිපත් කළා. ඒ හැම අවස්ථාවකදී ම මේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිළිබඳව විවිධ බාධා එල්ල වුණා. අපේ රටේ ධන බලය තිබුණු, ඒ වාගේම මූල්‍ය ශක්තිය තිබුණු, කෝටි ප්‍රකෝටිපතියන් බවට පත් වෙලා හිටපු අයගේ සල්ලිවලින් නිර්මාණය වූ ඖෂධ මාෆියාව ඒ ජාතික ඖෂධ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්න බාධා රැසක් ඉදිරිපත් කළා.

2011 වසරේ මේ රටේ ජාතික ඖෂධ ප්‍රතිපත්තියක් සැබැවින්ම නිර්මාණය කිරීම උදෙසා ජාතික ඖෂධ ප්‍රතිපත්තියේ දෙවන පිතෘවරයා හැටියට, එවකට සෞඛ්‍ය අමාත්‍යවරයාව සිටි, වර්තමාන ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මේ වැඩසටහන ක්‍රියාත්මක කරන්න දැඩි උත්සාහයක් ගත්තා. එතුමා ගත් පියවර ගණනාවක් සම්බන්ධයෙන් මේ සභාව දැනුවත් කරන්න මම කැමැතියි. 2012 වසර ආරම්භයේදී එතුමා කිව්වා, "2012 වසර සෞඛ්‍ය සඳහා වැදගත් වසරක්. අනිවාර්යයෙන් ඖෂධ ප්‍රතිපත්තිය එළි දක්වනවා." කියලා. එවකට සෞඛ්‍ය ඇමතිතුමාව සිටි මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා කිව්වා, නව ජාතික ඖෂධ ප්‍රතිපත්තියේ කෙටුම්පත පෙබරවාරි මාසයේ නීතිපති දෙපාර්තමේන්තුවට යවලා මාර්තු මාසයේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා කියලා. එවකට සෞඛ්‍ය ඇමති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට මාර්තු මාසයේදී කියන්නට සිද්ධ වුණා, "මාර්තු මාසයේ නොවෙයි, තවත් මාස තුනකින් මේක ඉදිරිපත් කරනවා." කියලා. අවසානයේ 2014 දී, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා එවකට ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට ජාතික ඖෂධ ප්‍රතිපත්තිය එළි දක්වලා ඒ වැඩසටහන ක්‍රියාත්මක කරන්න එතුමාට භාර දුන්නා. ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සෞඛ්‍ය අමාත්‍යවරයා වූ දවසේ ඉඳලා මේ වැඩසටහන ක්‍රියාත්මක කරන්න, ජාතික ඖෂධ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන්න දරපු හැම වෑයමක් ම ව්‍යර්ථ කරන්නට එවකට ජනාධිපතිතුමා ප්‍රමුඛ රජය කටයුතු කළා. අපි දක්ෂිණාංශික, වාමාංශික දේශපාලනය ගැන කථා කරනවා. වාමාංශික දේශපාලනයේ නිරත වන ඉතාම ප්‍රබුද්ධ ඇමතිවරුන් පිරිසක් පසු ගිය රජයේ සිටියා. නමුත් ඒ ජාතික ඖෂධ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්න මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා උත්සාහ දරන කොට එතුමාට ලබා දිය යුතු ශක්තිය ඔය වාමාංශික පාර්ශ්වවලින් පමණක් නොව, දක්ෂිණාංශික හෝ වේවා, මධ්‍යස්ථ පාර්ශ්ව හෝ වේවා කාගෙන්වත් ලැබුණේ නැහැ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ශක්තිය දුන්නේ නැතිවා නොවෙයි. ශක්තිය මදි වුණා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු නිමල් සිරිපාල ද සිල්වා හිටපු ඇමතිතුමා ප්‍රකාශ කරනවා අපට ඇහුණා මේ වැඩසටහන, මේ අලුත් වැඩ පිළිවෙළ හරියට ක්‍රියාත්මක කරන්න නම් සාමූහිකත්වය රකින්නට ඕනෑය, ඒකාධිපතිභාවය මැඩ පවත්වන්නට ඕනෑය කියා. බොහොම හොඳ යෝජනායි නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා ඉදිරිපත් කළේ.

මේ සාමූහිකත්වය නොතිබීම හේතුවෙන් පසු ගිය රජය කාලයේ ඒකාධිපතිවාදය රජ වුණු නිසා තමයි මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට මේ ඖෂධ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්න ඉඩ නුදුන්නේ. කෙටුම්පත සකස් කරලා නීතිපති දෙපාර්තමේන්තුවෙන්, "ඒක කෝ" කියලා අහන කොට නැති වෙලා; අතුරුදහන් වෙලා; හමස් පෙට්ටියට ගිහිල්ලා; කම්ප්‍යුටරයෙන් අතුරුදහන් වෙලා කියනවා. මේ ක්‍රියාවලිය යන අතරතුර ඖෂධ සමාගම්වලින් රුපියල් ලක්ෂ 25 ගණනේ එකතු කරනවා. ඒ අනුව රුපියල් කෝටි ගණනක මුදලක් එකතු කළා. මේ රුපියල් කෝටි ගණනින් එකතු කළ මුදල් වැය කළේ පසු ගිය ජනාධිපතිවරණයේදීද? එහෙම නැත්නම් මේ මුදල් උපයෝගී කර ගත්තේ මොනවාටද කියලා මම අහන්න කැමැතියි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] தலைமை வகித்தார்கள்.

Whereupon MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR*] took the Chair.*

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Yes, Hon. Sajith Premadasa, you may continue.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය රජය ප්‍රගතිශීලී රජයක් වුණා නම්, පසු ගිය රජය ජනතාවාදී, ජනහිතකාමී රජයක් වුණා නම්, පසු ගිය රජය පොඩි මනුස්සයා ගැන හිතුවා නම්, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඒ ඖෂධ ප්‍රතිපත්තිය එළිදක්වන්න දරපු සෑම වෑයමක්ම පරාජය කළේ ඇයි කියලා අපි අහන්න කැමැතියි. ඒ පනත් කෙටුම්පතේ තොරතුරු ඇතුළත්ව තිබුණු කම්ප්‍යුටරය අතුරුදහන් වුණේ කොහොමද? විශ්‍රාම ගිය තෙරේසා මැතිනියත් සමඟ ඒ පනත් කෙටුම්පත ගෙදර ගියේ කොහොමද? නීතිපති දෙපාර්තමේන්තුවෙන් එය අතුරුදහන් වුණේ කොහොමද? පසු ගිය රජය ඖෂධ මාෆියාවට යට වුණාද, හැම කොම්පැනියකින්ම එකතු කරපු රුපියල් ලක්ෂ 25ට යට වුණාද, ඒ එකතු කරපු සල්ලිවලට රට පාවා දුන්නාද, රටේ ජනතාව තුට්ටු දෙකට විකිණුවාද කියලා මම අහන්න කැමැතියි. මේකේ සත්‍යය

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

මොකක්ද? මේ සම්බන්ධයෙන් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා දරපු සෑම වෑයමක්ම විනාශ කළා. ඒ මොකක් නිසාද? එහෙම කළේ ඖෂධ මාෆියාවට යට වෙලා, ඖෂධ අලුගෝසුවන්ට යට වෙලා.

අද දවස අප හැමෝටම සතුටුදායක දවසක්. මොකද, වර්තමාන රජය ඖෂධ මාෆියාවට, ඖෂධ අලුගෝසුවන්ට යට වෙලා නැහැ. අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඇතුළු අප මේ සම්බන්ධයෙන් ප්‍රගතිශීලී තීන්දුවක් අරගෙන තිබෙනවා. සෞඛ්‍ය ඇමතිවරයා හැටියට එතුමාට ඉටු කරන්නට බැරි වුණු ඒ පොරොන්දුව, ඒ ජනතා විශ්වාසය අද මෛත්‍රී යුගයක් තුළින් එතුමාගේ නායකත්වයෙන් ක්‍රියාත්මක වනවාය කියන එක බොහොම සන්තෝෂයෙන් මම ප්‍රකාශ කරනවා.

මහාචාර්ය සේනක බිබිලේ මැතිතුමා සහ වෛද්‍ය එස්.ඒ. වික්‍රමසිංහ මැතිතුමා එළිදක්වපු ප්‍රතිපත්ති පිළිබඳව දැන් අපි හොයා බලන්න ඕනෑ. "The Management of Pharmaceuticals in Ceylon" කියන වාර්තාවේත්, ඒ වාගේම, "Case Studies in the Transfer of Technology: Pharmaceutical Policies in Sri Lanka" කියන ලිපියේත් බොහොම පැහැදිලිව ඒ ප්‍රතිපත්ති සඳහන් වෙලා තිබෙනවා. මොනවාද මේ ප්‍රතිපත්ති? "පෞද්ගලික සහ රාජ්‍ය අංශය යන අංශ දෙකෙහිම භාවිතය පිණිස රටට ආනයනය කරන ඖෂධ සහ ඖෂධ නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය සියල්ල රජය මඟින් පමණක් ආනයනය කිරීම සහ විවෘත ටෙන්ඩර් පටිපාටිය මඟින් තොග වශයෙන් මිලදී ගැනීම. පුද්ගලික ඖෂධ සමාගම් මඟින් සිදු කරන ඖෂධ ප්‍රචාරණ කටයුතු සම්පූර්ණයෙන්ම නැවැත්වීම සහ ඖෂධ සම්බන්ධයෙන් වෛද්‍යවරු, සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සහ මහ ජනතාව අඛණ්ඩව දැනුවත් කිරීමේ කටයුතු මුළුමනින්ම රාජ්‍ය ආයතන මඟින් සිදු කිරීම." මෙන්න සේනක බිබිලේ ප්‍රතිපත්තිය.

"අත්‍යවශ්‍ය ඖෂධ වර්ග ලැයිස්තුගත කිරීම හා ඊට ඇතුළත් නොවන ඖෂධ වර්ග ආනයනය සීමා කිරීම. රාජ්‍ය ඖෂධ සම්බන්ධයෙන් සිදු කරන කටයුතුවලදී මෙන්ම වෛද්‍යවරු ඖෂධ නියම කිරීමේදී වෙළඳ නාම වෙනුවට ඖෂධ නාමය පමණක් භාවිත කිරීම." යනුවෙනුත් එහි සඳහන් වනවා.

මෙන්න මේ හේතු නිසා තමයි දශක ගණනාවක් මුළුල්ලේ මේ ප්‍රතිපත්තිය විනාශ කරන්න විවිධ දේශපාලන බලපෑම් එල්ල වුණේ. මේ සේනක බිබිලේ ප්‍රතිපත්තිය පසු ගිය කාල වකවානු තුළදී ක්‍රියාත්මක වුණා නම්, මේ රටේ ජනතාවට මීට වැඩිය ගුණාත්මකභාවයෙන් යුක්තව අඩු මුදලට හොඳ ඖෂධ ලබා ගැනීමේ ඉඩ ප්‍රස්ථාව සැලසෙනවා.

මා පැහැදිලිව කියන්නට කැමතියි, 1977 දී පටන් ගත් එක්සත් ජාතික පක්ෂ යුගයත් මේ ඖෂධ පනත ක්‍රියාත්මක නොකිරීමේ වගකීම භාර ගන්නට ඕනෑ බව. ඒ වරද පිළිගන්නට ඕනෑ. ඒ වරද අපි විවෘතව පිළිගන්නවා. විශේෂයෙන්ම මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ රජය යටතේ මෙවන් ප්‍රගතිශීලී පියවරක් ගැනීමට හැකි වීම ගැන අපි සතුටු වෙනවා.

සේනක බිබිලේ ප්‍රතිපත්තියේ සඳහන් වන කරුණු මොනවාද? ඖෂධ සඳහා විධිමත් මිල පාලනයක් ඇති කිරීම, ඖෂධ සම්බන්ධ සියලු කටයුතු සඳහා අවශ්‍ය මානව සම්පත් ප්‍රවර්ධනය කිරීමේ කටයුත්ත ක්‍රියාත්මක කිරීම, රට තුළ භාවිත වන සියලු ඖෂධවල ප්‍රමිතිය සහතික කිරීම සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම, ඖෂධවල ඵල ප්‍රයෝජන මහජනතාවට ලැබීම අවහිර වන ආකාරයෙන් ඖෂධ සමාගම්වල අවශ්‍යතා ආරක්ෂා වීම පිණිස ක්‍රියාත්මක වන පේටන්ට් බලපත්‍ර ඇතුළු ඇතැම් විවිධ ගිවිසුම් යළි සලකා බැලීම සහ අත්‍යවශ්‍ය අවස්ථාවලදී ඒවා නොසලකා ලාභදායී වූ මූලාශ්‍රවලින් ඖෂධ ආනයන කටයුතු සිදු කිරීම. මේ කාරණා සියල්ලක්ම ක්‍රියාත්මක කරන්නට අද අපේ රජය බැඳී සිටිනවා. අද සම්මත වන මේ නව පනත් කෙටුම්පත හරහා විශේෂයෙන්ම මේ රටේ පුරවැසියා ආරක්ෂා කරන්නට සියලු විධි විධාන යොදා තිබෙනවා. ඒ වාගේම අද අපේ රජය හොඳ ප්‍රගතිශීලි තීන්දුවක් ගෙන තිබෙනවා. විවිධ පක්ෂ, විපක්ෂවලින් ලැබෙන හොඳ යෝජනා - ප්‍රායෝගිකව පොදු ජනතාව ශක්තිමත් කරවන යෝජනා - අදාළ සංශෝධනවලට ලක් කර නීති කෙටුම්පත් කරන්නට අවශ්‍යයි කියන කාරණය අපේ රජය පිළි ගෙන තිබෙනවා. බලන්න, කොයි තරම් වැදගත්ද කියලා; බලන්න, කොයි තරම් ශක්තිමත්ද කියලා; බලන්න, කොයි තරම් විනිවිදභාවයෙන් යුක්තද කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම මෙහි ඉතිහාසය ගැන කථා කරනවා නම්, 2011 වසර දක්වා වසර හයක් පුරාවට ඇති වාර්තා ගෙන බැලුවොත්, බාල ඖෂධ ගෙන්වපු සමාගම් 74ක් තිබුණා. හැබැයි ඒ සමාගම් 74න් චින්තන වකවානුව තුළ අසාදුගත ලේඛනවලට ඇතුළත් කළේ සමාගම් පහක් පමණයි. සමාගම් 74ක් සොරකම් කළා, සමාගම් 74ක් බාල ඖෂධ ගෙනාවා. Blacklist කළේ සමාගම් පහයි; B. Braun International, Bafna Pharmaceuticals, Shandong Zibo, Shin Poong Pharm and Vysali Pharmaceuticals කියන සමාගම් පමණයි. මේ ඔක්කොම වාර්තා මා ළඟ තිබෙනවා.

දැන් බලන්න, මහාචාර්ය රවීන්ද්‍ර ප්‍රනාන්දු මැතිතුමා කියනවා, " ඖෂධ විෂ වීම හේතුවෙන් වසරකට 10,000ක් රෝහල් ගත කරනවා" කියලා. වසරකට ඖෂධ විෂ වීම හේතුවෙන් සියයකට වැඩි ප්‍රමාණයක් මිය යනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2012 ඔක්තෝබර් මාසයේ දී ගාල්ල, කරාපිටිය රෝහලේ මොකක්ද සිදු වුණේ? දැරියකට සෙෆ්ට්‍රිඇක්සෝන් කියන ප්‍රතිජීවක ඖෂධය ලබා දීමේ දී බාල තත්ත්වයේ ඖෂධයක් ලබා දීම නිසා එම දැරිය මිය ගියා. බාල තත්ත්වයේ රුබෙල්ලා එන්නතක් ලබා දීම නිසා මාතර ප්‍රදේශයේ දැරියක් මිය ගියා. කාන්තාවකට සිසේරියන් සැත්කමකින් පසුව Amoxicillin-clavulanic acid සහ Meropenem කියන බාල ප්‍රතිජීවක ඖෂධ දෙකක් ලබා දීම නිසා ඇයගේ ජීවිතය අහිමි වුණා. බලන්න, මේ නව පනත් කෙටුම්පත සම්මත වීමත් සමඟ මේ සියල්ලක්ම නතර වෙනවා. හොරකම, වංචාව, දූෂණය නතර වෙනවා. බාල බෙහෙත් ගෙන්වන එක නතර වෙනවා. ජනතාවට ගුණාත්මක බෙහෙත් අඩු මුදලකට ලබා දෙන්නට අපේ රජය ඉඩප්‍රස්ථාව සලසනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ වාමාංශික දේශපාලන ප්‍රවාහයේ ප්‍රවීණ නායකයින් තුන් දෙනෙක් දැන් මේ ගරු සභාවේ මගේ කථාව අහගෙන සිටිනවා. 2012 වර්ෂයේ ඖෂධ ආනයනය සහ රෝගීන් සූරාකෑම පිළිබඳව පොඩි වාර්තාවක් මා ඔබතුමන්ලාට ඉදිරිපත් කරන්නට කැමැතියි. දැන් ඔබතුමන්ලා මට කියන්න, පසු ගිය මහින්ද චින්තන රජය මේ වැරැදි, නිවැරදි කරන්නට කටයුතු නොකළේ ඇයි? දැන් බලන්න, Cetirizine Dihydrochloride කියන ඖධය ගෙන්වන්නේ රුපියල් 88යි. විකුණන්නේ රුපියල් 396යි. ලාභය කීයද? සියයට 347යි. Montelukast chewable tablet කියන බෙහෙත ගෙන්වන්නේ රුපියල් 440ට, විකුණන්නේ රුපියල් 2645යි. වැඩිවීම සියයට 500යි. Fulvoetan Tefu Perazono ගෙන්වන්නේ රුපියල් 108ට, විකුණන්නේ රුපියල් 960යි. වැඩිවීම සියයට 788යි. Liunarzint tablet ගෙන්වන්නේ රුපියල් 97ට, විකුණන්නේ රුපියල් 923යි. වැඩිවීම සියයට 851යි. Sildenafil Citrate ගෙන්වන්නේ රුපියල් 15ට, විකුණන්නේ රුපියල් 99යි.

වැඩිවීම සියයට 539යි. Domperidone ගෙන්වන්නේ රුපියල් 58ට, විකුණන්නේ රුපියල් 401ටයි. වැඩිවීම සියයට 591යි. ඉතින් ඔබතුමන්ලා මට කියන්න, එදා සෞඛ්‍ය ඇමතිවරයා හැටියට මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජාතික ඖෂධ ප්‍රතිපත්තියක් ගෙන එන්නට හදනකොට; 2012 දී මේ වාගේ මිල ගණන් වැඩිවීම් සිද්ධ වෙනකොට; ඒ ජාතික ඖෂධ ප්‍රතිපත්තිය ස්ථාපනය කරන්නට මීට වඩා ප්‍රගතිශීලී පියවරක් ගන්න තමුන්නාන්සේලාට බැරි වුණේ ඇයි කියලා. ඒ කාල වකවානුව තුළ; ඔය ආශ්චර්ය ක්‍රියාත්මක වුණාය කියන යුගයක් තුළ බෙහෙත් විකුණලා තිබෙන්නේ ගෙන්වූ මුදලට වඩා සියයට 347ක්, සියයට 500ක්, සියයට 788ක්, සියයට 851ක්, සියයට 539ක්, සියයට 591ක් වැඩි මිලකටයි. මේක ඇත්ත කථාවක්. [බාධා කිරීමක්] ගරු තිස්ස විතාරණ මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාවේ දී කරුණු පැහැදිලි කරන්න. මා ඔබතුමාට ගරු කරනවා. මට මේ කථාව ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන්න. මේ මිල වැඩි වීම සාධාරණීකරණය කරන්නේ කොහොමද, ගරු ඇමතිතුමනි?

ඇත්ත වශයෙන්ම අපේ රටට අවශ්‍ය වන්නේ ඖෂධ වර්ග 2500ත් - 3000ත් අතර ප්‍රමාණයක්. නමුත් ඖෂධ වර්ග 15,000ක් අපේ රටට ගෙන්වනවා. ගරු ඇමතිතුමනි, වෛද්‍යවරයකු හැටියට ඔබතුමා දන්නවා ඇති, අපේ රටට ඇමොක්සිලින් බෙහෙත් වර්ග 150ක් ගෙන්වන බව. ඇමොක්සිලින් බෙහෙත් වර්ග 150ක් අපේ රටට අවශ්‍යද? ඒ කළ දේ හරිද? පසු ගිය රජය මේ වැරදි දැක දැක නිහඬව ඖෂධ මාෆියාවට, ඖෂධ අලුගෝසුවන්ට කත් ඇදපු එක හරිද? ඒ ඖෂධ සමාගම්වල මිල මුදල්වලට යටත් වුණු එක හරිද? අතිගරු ජනාධිපතිතුමාම කිව්වා, හැම සමාගමකින්ම රුපියල් ලක්ෂ 25 ගණනේ ලබා ගෙන තිබෙන බව. ඒක රාජ්‍ය කප්පමක්. මේ රාජ්‍ය කප්පම ගියේ කොහේටද? මේ රාජ්‍ය කප්පම ගියේ කවුරු ළඟටද? මේ රාජ්‍ය කප්පම ගත්තේ කවුද? ඒවා අප දැන ගන්නට ඕනෑ.

ඒ විතරක් නොවෙයි, අපේ ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව පිළිබඳව ප්‍රකාශ කළා. නමුත් බලන්න, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව ගැන 2010 වාර්ෂික වාර්තාවෙන් කියන්නේ මොකක්ද? රුපියල් 9,24,000ක් වටිනා Chlorpromazine tablets 1750ක තොගයක් මිල දී ගැනීම සිද්ධ කළේ sample පරීක්ෂාව මාස දෙකක් කල් තියලායි. ඒ කියන්නේ මාස දෙකක් ප්‍රමාද වුණා. Sample පරීක්ෂාව මාස දෙකක් ප්‍රමාද කරලා, ඒ වන විටත් රුපියල් 7,57,680ක් වටිනා ඒකක 1435ක ඖෂධ ප්‍රමාණයක් රෝගීන්ට නිකුත් කරලා හමාරයි. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ මහා ලොකු කෙරුවාව, එහි පැටිකිරිය මෙන්න. ඒ විතරක් නොවෙයි, ඔසුසල් 26ක යල් පැනපු ඖෂධ, තත්ත්වයෙන් බාල සහ පළුදු වූ ඖෂධ ලක්ෂ 13ක් තිබුණා. ඖෂධ ගබඩා කරන්න කුලිය වශයෙන් මේ ආයතනය රුපියල් ලක්ෂ 13ක් ගෙවලා තිබෙනවා. මොනවා ගබඩා කරන්නද? ප්‍රතික්ෂේප කළ බෙහෙත් ගබඩා කරන්න. රුපියල් මිලියන 243ක ප්‍රතික්ෂේප කළ බෙහෙත් ගබඩා කරන්න. ඒ සඳහා රුපියල් ලක්ෂ 13ක කුලියකුත් ගෙවනවා. කවුද මේවා කියන්නේ? 2010 රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව. මම නොවෙයි කියන්නේ.

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. රුපියල් මිලියන 102ක් වැය කරලා Cefuroxime Sodium injection ඒකක 29,00,000ක් අර ගෙන තිබෙනවා. පරීක්ෂණ කටයුතු කරන කොට මේවායේ වීදුරු කටු තිබිලා තිබෙනවා. හැබැයි, කොච්චර වීදුරු කටු තිබුණත් ඉවක් බවක් නැතිව ඒකක ලක්ෂ 28ක් රෝගීන්ට නිකුත් කළා. ඒ විතරක් නොවෙයි. ඉතිරි වුණා ඒකක 47,591ක්. ඒවායේ වටිනාකම ලක්ෂ 18ක්. නමුත් මේ සංස්ථාව සැපයුම්කරුවන්ගෙන් ඒවා අය කර ගන්නට කටයුතු කරලා නැහැ. මෙන්න අද රටේ තත්ත්වය. මෙන්න ඖෂධ සංස්ථාවේ තත්ත්වය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බහුජාතික සමාගම් අද ඖෂධ වෙළෙඳ පොළේ බල අධිකාරිය වපුරලා හමාරයි. මේවා ග්‍රහණයට අරගෙන හමාරයි. මොනවද මේ අය කරන්නේ? මේ අය බහුතරයක් කරන්නේ ඉතාම අඩු මුදලට බාල බෙහෙත් නිෂ්පාදනය කරන එකයි. අඩු මුදලට බාල බෙහෙත් නිෂ්පාදනය කරලා පාරිභෝගිකයාට අළෙවි කරන්නේ වැඩි මිලටයි. මේකයි අද තත්ත්වය. එතකොට අධික ලෙස මුදල් වියදම් කරලා රෝගීන් බලාපොරොත්තු වනවා ගුණාත්මක සේවාවක්. අනේ! අහිංසක රෝගියා ගිහිල්ලා ගන්නවා අර බාල බෙහෙත් ටික. මිල පාලනයේ කිසිම යන්ත්‍රණයක් ක්‍රියාත්මක වුණේ නැහැ. මිල පාලනයේ යන්ත්‍රණයක් ගෙන එන සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ගෙනෙන්න හදන කොට හැම වෙලාවේම බාධා කළා. හැම වෙලාවේම අවහිර කළා. දේශාභිමානය ගැන කයිවාරු ගහනවා. දේශාලය ගැන කයිවාරු ගහනවා. රට, ජාතිය, ආගම සුරකින්නට ඕනෑයි කියලා කයිවාරු ගහනවා. දේශප්‍රේමීත්වය ගැන පපුවට ගගහා කථා කරනවා. හැබැයි, රටට ගෙන්වන බාල බෙහෙත් ටික නතර කරන්න කිසිම කටයුත්තක් කළේ නැහැ. ගෙන්වපු බෙහෙත් ටික සියයට ලක්ෂ වාරයක් වැඩි කරලා විකුණන කොට ඒවා නතර කරන්න කටයුතු කළේ නැහැ. නිකම් බොරුවට පම්පෝරි දේශාභිමානය. ඒකයි පසු ගිය කාලයේ සිද්ධ වුණේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම ඖෂධ සඳහා වෙන් කරන මුදල් හැම අවුරුද්දේම වැඩි වුණා. 2005 වර්ෂයේ මිලියන 7100යි; 2011 වර්ෂයේ 16,000යි; 2012 වර්ෂයේ 17,000යි; 2013 වර්ෂයේ 25,000යි; 2014 වර්ෂයේ 35,000යි. 2015 වර්ෂයේ 40,000යි. ඖෂධ වෙනුවෙන් කෝටි ප්‍රකෝටි ගණන් මුදල් වියදම් කරනවා. හැබැයි කොච්චර වියදම් කළත් මදි. මොකක්ද හේතුව? ගෙන්වන්නේ බාල බෙහෙත්. අත්‍යවශ්‍ය ඖෂධ ගෙන්වන්නේ නැහැ. ප්‍රමිතියෙන් තොර බෙහෙත් ගෙන්වන්නේ. වැඩි මිලට බෙහෙත් ගෙන්වන්නේ. ඖෂධ මාෆියාව රජ කළා. ඖෂධ මාෆියාව මේ රටේ දේශපාලන නායකත්වයත් තුට්ටු දෙකට ගත්තා. ඖෂධ අලුගෝසුවන්ගේ අණසකවලට පසු ගිය රජය යටත් වෙලා තිබුණා. නමුත් ඒ ග්‍රහණයෙන් අද මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා රටේ ජනතාවත්, රටේ පොඩි මිනිහාවත් ගොඩ අරගෙන තිබෙනවායි කියන එක මා මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න කැමැතියි.

විශේෂයෙන්ම මම තවත් කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න කැමැතියි. දැන් බලන්න, ගරු ඇමතිතුමනි, පසු ගිය කාලයේ සිදු වුණු දේ. මා මේ කියන්නේ 2013 දී වුණු සිද්ධියක්. මහරගම පිළිකා රෝහලට ගෙන්වන ලියුකේමියාවට දෙන බෙහෙතක් තිබෙනවා, Oncaspar කියලා. ඒ Oncaspar කියන බෙහෙත සමාගම් දෙකකින් ගන්න පුළුවන්. ඒ බෙහෙත එක සමාගමක් විකුණනවා, රුපියල් 2,37,000ට. තව සමාගමක් විකුණනවා රුපියල් 3,25,000ට. මේක සාධාරණද? මේක හරිද? ඇයි පසු ගිය රජය මේවා දැක දැක නිහඬව සිටියේ? මේ අසාධාරණත්වය ඉදිරියේ ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජාතික ඖෂධ ප්‍රතිපත්තියක් නිර්මාණය කරන කොට පසු ගිය රජය එතුමාගේ කකුලෙන් ඇද්දේ ඇයි? එතුමාගේ කෙටුම්පත හොරා කෑවේ ඇයි? ඒක මං කොල්ලකෑවේ ඇයි? ඇයි, කම්පියුටර් අතුරුදහන් වුණේ? ඇයි, කම්පියුටර්වල තිබෙන දත්ත ටික නැති වුණේ කියලා මා අහන්න කැමැතියි. මොනවාද මේවට දෙන උත්තර? අද සමහර අය කියනවා දින සියයේ වැඩසටහන කෙරෙන්නේ නැහැයි කියලා. මේ කරන්නේ දින සියයේ වැඩසටහන තමයි. මේ ජාතික ඖෂධ ප්‍රතිපත්තිය අද දවසේ එළි දැක්වීම ඓතිහාසික පියවරක්; නිර්මල පියවරක්; රටේ පොඩි මිනිහා වෙනුවෙන් ක්‍රියාත්මක කරපු පියවරක්. නමුත් පසු ගිය රජයට කොන්දක් තිබුණේ නැහැ, කශේරුකාවක් තිබුණේ නැහැ ඖෂධ මාෆියාවේ මුදල් බලය පරාජය කරලා පොඩි මිනිහා රජ කරවන්න. එහෙම තිබුණේ නැහැ. මොකද, ඖෂධ අලුගෝසුවන්ගේ සල්ලිවලට පහුගිය රජය යට වෙලායි තිබුණේ. ඒකයි ඇත්ත කථාව.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ඒ විතරක් නොවෙයි. පසු ගිය කාලයේ සිද්ධ වුණ දේවල් ගැන තවත් තොරතුරු ගණනාවක් මට ඉදිරිපත් කරන්න පුළුවන්. 2013 දී මාරවිල මූලික රෝහලේ දැඩි සත්කාර ඒකකයේ මොකක්ද සිද්ධ වුණේ? Meropenem කියන එන්නත් කුප්පියේ තිබී මොනවාද අහු වුණේ? බෙහෙත් නොවෙයි වීදුරු කැබලි තමයි තිබුණේ. ඒ වාගේම කලුබෝවිල රෝහලේදී Cloxacillin කියන එන්නත් කුප්පියේ තිබී මොනවාද අහු වුණේ? වීදුරු කැබලි. රත්නපුර ශික්ෂණ රෝහලේ රෝගීන් සඳහා භාවිත කළ Aciclovir Sodium එන්නත් කුප්පියෙන් මොනවාද අහු වුණේ? වීදුරු කැබලි. බලන්න, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට එදා මේ ඖෂධ ප්‍රතිපත්තිය ගෙනෙන්න ඔබතුමන්ලා ඉඩ දුන්නා නම්, එදා එතුමාගේ කකුලෙන් ඇද්දේ නැත්නම් මෙවැනි ජාතික විනාශකාරී දේවල් සිදු වන්නේ නැහැ කියන එක මම මේ අවස්ථාවේදී වගකීමෙන් ප්‍රකාශ කරනවා.

රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව 2012 දී Cloxacillin injection එන්නත් කුප්පි 1,09,000ක් ගෙන්නුවා. ගරු වාසුදේව නානායක්කාර මැතිතුමනි, මොකක්ද සිද්ධ වුණේ? ප්‍රාදේශීය මිල දී ගැනීම් කියා වෙනමම තවත් එන්නත් කුප්පි ලක්ෂ 11ක් ගෙන්වා තිබෙනවා. මේ නිසා සෞඛ්‍ය අමාත්‍යාංශයට රුපියල් ලක්ෂ 253ක පාඩුවක් සිද්ධ වෙලා තිබෙනවා. ඔක්කොම හොරකම කළේ. ඔක්කොම ප්‍රෝඝාව කළේ. ඖෂධ මාෆියාව විවිධ දේශපාලනඥයින් ආරක්ෂා කරමින්, විවිධ දේශපාලනඥයින් පෝෂණය කරමින්, විවිධ දේශපාලන නායකයන්ට රැකවරණය ලබා දෙමින්, පසු ගිය කාලයේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා හිටපු කාල වකවානුව තුළ එක වැඩක්වත් කරන්න දුන්නේ නැහැ. පොදු ජනතාවට එක සහනයක්වත් ලබා දෙන්න ඉඩ දුන්නේ නැහැ. මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමාටත් වඩා ඉහළින් නිලධාරින් පත් කළා. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ක්‍රියාත්මක කරන්නට යෙදුණු ඒ කටයුත්ත සහමුලින්ම අකර්මණ්‍ය කළා. ඒ ජනතාවාදී සහන ටික සහමුලින්ම ඉවත් කරලා දැම්මා. පහු ගිය කාලයේ ඒක තමයි සිද්ධ වුණේ. මම අහන්න කැමැතියි, පහු ගිය කාලයේ මේ වාගේ දුර්දාන්ත සිද්ධීන් වෙනකොට ආණ්ඩුවේ හිටපු වාමාංශික නායකයන් නිහඬව සිටියේ ඇයි කියලා. අපි දන්නවා වාමාංශික දේශපාලන ප්‍රවාහයන් හැම වෙලාවේම පෙනී සිටින්නේ පොඩි මිනිස්සු වෙනුවෙන්, පොඩි මිනිසුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් කියලා. අපි දන්නවා, අපේ ඩිව් ගුණසේකර මැතිතුමා, වාසුදේව නානායක්කාර මැතිතුමා, තිස්ස විතාරණ මැතිතුමා බොහොම ප්‍රගතිශීලී ස්ථාවර දරා තිබෙනවා. එහෙම නැහැයි කියා අපි කියන්නේ නැහැ. ඔබතුමන්ලා හොඳ ශක්තිමත් ස්ථාවර දරා තිබෙනවා. නමුත් සේනක බිබිලේ ප්‍රතිපත්තිය එළි දක්වන්න මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට මීට වඩා ලොකු ශක්තියක් ලබා දෙන්න ඔබතුමන්ලාට අවස්ථාව තිබුණා නේද කියා මම අහන්න කැමැතියි. හිටපු ජනාධිපතිතුමා ප්‍රමුඛ අතකොළුවන් කොටියාසයක් එතුමාගේ කකුලෙන් අදිනකොට, එතුමාගේ වාර්තා අතුරුදහන් කරවන කොට, එතුමාගේ කම්පියුටර් උස්සන කොට, කම්පියුටර්වල තිබුණු තොරතුරු මකා දමන කොට ඔබතුමන්ලා හඬක් නැගුවේ නැත්තේ ඇයි? ඔබතුමන්ලාට තිබුණා, මීට වඩා ප්‍රගතිශීලී ස්ථාවරයකට ඇවිල්ලා, රට වෙනුවෙන් දියත් කරපු මේ වැඩසටහන්වලට මීට වඩා ධනාත්මක, ගුණාත්මක ශක්තියක් ලබා දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසාන වශයෙන් මම සඳහන් කරන්න කැමැතියි, අද මේ එළිදක්වන ජාතික ඖෂධ ප්‍රතිපත්තිය හරහා නව ස්වාධීන ඖෂධ අධිකාරියක් බිහි කරනවාය කියන එක. ඖෂධ ලියා පදිංචි කිරීමේදී දැනට පවතින ක්‍රමවේදය වඩාත් නිවැරදි කරනවා. විශේෂයෙන්ම මෙය ක්‍රියාවට නංවන්න සුදුසුකම් සහිත ස්වාධීන විද්වත් කමිටුවක් පත් කරනවා. මෙහි අරමුණ ඖෂධයක් ලියා පදිංචි කිරීමේදී එහි ගුණාත්මකභාවය, ආරක්ෂාකාරීභාවය, එහි තත්ත්වය සහ මිල කෙරෙහි දැඩි අවධානයක් යොමු කිරීමයි. බලන්න, එය කොයි තරම් ප්‍රගතිශීලී පියවරක්ද කියා. බලන්න, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා නිර්මාණය කර තිබෙන්නේ කොයි තරම් වැදගත් ගමනක්ද කියා. විපක්ෂයේ පාර්ශ්වවලින් යෝජනා එනකොට පහුගිය කාලයේ ඇමතිවරු කළා වාගේ අපේ රාජිත සේනාරත්න ඇමතිතුමා කට වහන්න යන්නේ නැහැ. එදා මොකක්ද සිද්ධ වුණේ? පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් එකසිය හැට ගණනක බලයක් තියා ගෙන විපක්ෂය නිහඬ කරන්න හැදුවා. අද මොකක්ද අපේ ඇමතිතුමා කරන්නේ? අද මොකක්ද සෞඛ්‍ය ඇමතිතුමා කරන්නේ?

අද අපේ සෞඛ්‍ය ඇමතිතුමා විපක්ෂයේ හඬටත් සවන් දෙනවා. ඔබතුමන්ලාගේ යෝජනා රටට හොඳ නම්, ජනතාවට හොඳ නම් ප්‍රගතිශීලී නම් එතුමා පිළිගන්නවා. අන්න ප්‍රජාතන්ත්‍රවාදය. අද දින මේ ගරු සභාවේ නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා කථා කළා. එතුමා කිව්වා, "මේ වෙන දෙය හොඳයි. කරුණාකර මේ වෙන දේ පිළිබඳව හොඳ පරිස්සමින් ඉන්න. මේකට ඒකාධිපතිත්වය රිංගන්න ඉඩ දෙන්න එපාය" කියා. මොන විහිළුවක්ද? අපේ ආණ්ඩුව ඒකාධිපති ආණ්ඩුවක් නොවෙයි. ඒකාධිපති ආණ්ඩුව තිබුණේ ජනවාරි 08 වැනි දාට ඉස්සෙල්ලායි. ගරු ඩිව් ගුණසේකර මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේලාගේ කාලයේ තමයි එහෙම තිබුණේ. තමුන්නාන්සේලාගේ කාලයේ තමයි, ඒකාධිපතිත්වය, ආඥාදායකත්වය, තනි පාලනය, තනි මතය, තනි ගමන පැවතුණේ. ඒවා ක්‍රියාත්මක වුණේ, තමුන්නාන්සේලාගේ කාලයේයි. අද අපි ප්‍රජාතන්ත්‍රවාදීයි. බලන්න, කෙතරම් ලස්සනට විපක්ෂයේ හඬට අපි සවන් දෙනවාද; තමුන්නාන්සේලාගේ යෝජනාවලට අපි සවන් දෙනවාද කියා. තමුන්නාන්සේලාගේ ප්‍රගතිශීලී යෝජනා සංශෝධනවලට ඇතුළත් කිරීමට අපි මැළි වෙන්නේ නැහැ. ඩිව් ගුණසේකර මැතිතුමනි, අද තමයි මේක සම්මත කර ගන්න තිබුණේ. නමුත් බොහොම නම්‍යශීලීව අතිගරු ජනාධිපතිතුමාත්, ගරු ඇමතිතුමාත් විපක්ෂයේ අනුර දිසානායක මැතිතුමා යෝජනාවක් කරන කොට එකඟ වුණා. ඒ වාගේ දේවල් පසු ගිය කාලයේ සිදු වුණාද? ඒ ගැන පොඩ්ඩක් කියන්න කෝ. ඒ වාගේ දේවල් සිදු වුණාද? නිකමටවත් සවන් දුන්නාද? නැහැ. අර 160ක් පමණ වූ මන්ත්‍රීවරුන් ටික නැඟිටුවා කළේ මොකක්ද? විපක්ෂය නිහඬ කරවන එක තමයි කළේ. නමුත් අපි එහෙම කරන්න යන්නේ නැහැ.

අපට තිබෙන්නේ ප්‍රගතිශීලී රජයක්. අපට තිබෙන්නේ සැබැවින්ම ක්‍රියාවෙන් ජාතිමාමක, දේශමාමක, දේශ ප්‍රේමී, රාජ ද්‍රෝහී නොවන රජයක්. අපේ රටේ පුරවැසියන්ට හොඳ බෙහෙත්, ගුණාත්මක බෙහෙත් අඩු මුදලට ලබා දෙනවාය කියන එක තමයි, ගරු මන්ත්‍රීතුමනි දේශ ප්‍රේමීත්වය කියන්නේ. ඔය නිකම් බොරුවට වේදිකාවලට නැඟ යටිගිරියෙන් කෑ ගැසුවාට දේශ ප්‍රේමීත්වයක් රජ වෙන්නේ නැහැ. බොරුවට පපුවට ගහ ගෙන, රටේ ස්වෛරීත්වය, ස්වාධීනත්වය, ස්වාධිපත්‍යය, ඒකීයභාවය ගැන කයිවාරු ගැසුවාට රට සුරැකෙන්නේ නැහැ. රට ආරක්ෂා වෙන්නේ නැහැ. එදා සිදු වුණේ මොකක්ද? වේදිකාවේදී දේශ හිතෛශීත්වය ගැන පම්පෝරි ගහනවා. පස්සා දොරෙන් ඖෂධ මාෆියාව රටත් එක්ක එකතු වෙලා රටේ ජනතාවගේ සල්ලි ටික හොරා කනවා. සියයට 900කින් බෙහෙත් මිල වැඩි කර රටේ ජනතාවට ලබා දෙනවා. එදා, ඉස්සරහ දොරෙන් දේශ ප්‍රේමීත්වය; පස්සා දොරෙන් රාජ ද්‍රෝහිත්වය. ඒකයි සිදු වුණේ. අපේ රජය එහෙම කරන්නේ නැහැ. අපේ රජයට ඉස්සරහ දොරත්, පස්සා දොරත් කියන දෙකම එකයි. අපි ළඟ දිව දෙකේ දේශපාලනයක් නැහැ. අපි ළඟ කථා දෙකක් නැහැ. අපි පැහැදිලිවම අතිගරු ජනාධිපතිතුමාගේත්, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය ඇමතිතුමාගේත්

නායකත්වයෙන් යුතුව මේ සෞඛ්‍ය ක්ෂේත්‍රය සහමුලින්ම සර්ව සාධාරණ, මේ රටේ ජනතාවට පරිණත සෞඛ්‍ය සේවාවක් ලබා දෙන, මේ රටේ ජනතාවට අඩු මිලට ගුණාත්මක බෙහෙත් ලබා දෙන යුගය මේ නව පනත් කෙටුම්පත හරහා ක්‍රියාත්මක කරන්නට සැදී පැහැදී සිටිනවාය කියන එක මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

අපේ මේ ගමනේ ඉලක්කය මොකක්ද? අපේ මේ ගමනේ ඉලක්ක ගණනාවක් තිබෙනවා. අපට අවශ්‍ය ඖෂධ සඳහා ඖෂධීය නාමය පමණක් භාවිත කිරීම. අපට අවශ්‍ය ප්‍රමිති පරීක්ෂණයකින් තොරව ඖෂධ ලියා පදිංචි නොකිරීම. අපට අවශ්‍ය නියම හෝ අනියම් ආකාරයෙන් කෙරෙන ඖෂධ ප්‍රචාරණය තහනම් කිරීම. අපට අවශ්‍ය එක් ඖෂධීය නාමයකට අදාළව භාවිත කළ හැකි ඖෂධ සංඛ්‍යාව සීමා කිරීම. අපට අවශ්‍ය ඖෂධ ආනයනය සඳහා රාජ්‍ය ආයතනවල සෘජු මැදිහත්වීම. අපට අවශ්‍ය ඖෂධ සමාගම්වල අනුග්‍රහය ලබා ගෙන ප්‍රිය සම්භාෂණ, සෞඛ්‍ය වැඩ මුළු හෝ වෙනත් එවැනි කටයුතු සිදු කිරීම නීත්‍යානුකූලව තහනම් කිරීම. අපට අවශ්‍ය ඖෂධ පිළිබඳව ව්‍යාජ තොරතුරු සපයන සමාගම්, කල් ඉකුත් වූ හා තත්ත්වයෙන් බාල ඖෂධ සපයන සමාගම් හා වංචනික ලෙස ඖෂධ වෙළඳාම සිදු කරන සමාගම් තහනම් කිරීම සහ ඔවුන්ගෙන් දඩ අය කිරීම. අපට අවශ්‍ය ඖෂධ ප්‍රතිපත්තිය සකස් කරන්නන්, එහි කාලීන වෙනස්කම් සිදු කරන්නන් නම් වශයෙන් හෙළිදරව් කිරීම හා ඖෂධ හා බැඳෙන සමාගම් පිළිබඳව තොරතුරු හා මිල පාලන ක්‍රමය පිළිබඳව තොරතුරු දැන ගැනීමට මහජනතාවට ඇති අයිතිය මූලික අයිතියක් ලෙස පිළිගැන්වීම. මෙන්න මේ අදහස් තමයි, අපේ නව පනත් කෙටුම්පතේ ගැබ් වෙලා තිබෙන්නේ. විනිවිදභාවය, විවෘතභාවය, ප්‍රජාතන්ත්‍රවාදය වාගේම රටේ ජන සමූහයාගේ සුබ සිද්ධිය උදෙසායි, මේ පනත් කෙටුම්පත නිර්මාණය වෙලා තිබෙන්නේ. පසු ගිය කාලයේ වාගේ අණපනත් නිර්මාණය වෙන්නේ, පාලකයන් පෝෂණය කරන්න නොවෙයි; පාලකයෝ රැක ගන්න නොවෙයි; පාලකයින්ගේ සුබ විහරණය උදෙසා නොවෙයි. සැබැවින්ම මේ රටේ සාමාන්‍ය ජනතාව ගැන හිතලායි මේ පනත් කෙටුම්පත නිර්මාණය කර තිබෙන්නේ.

මේ තරම් දවස්, මේ තරම් කල් බෙහෙත්වලට ගිනි ගණන් ගෙවපු, බෙහෙත්වලට සියයට නවසියයක් මුදල් ගෙවපු කාලය මේ පනත් කෙටුම්පතින් අවසන්. ඉදිරියේදී මේ රටට රුපියල් 40ට බෙහෙත් ගෙන්වා රුපියල් 1,000ට විකුණපු කාලය ඉවරයි. ඒක අවසන්. මින් ඉදිරියට ජනතාවගේ සල්ලි ගසා කාපු කාලය අවසන්. මින් ඉදිරියට හොර බෙහෙත් ගෙන්වපු කාලය අවසන්. මින් ඉදිරියට බාල බෙහෙත් ගෙන්වපු කාලය අවසන්. මින් ඉදිරියට සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අක්‍රමිකතා සිදුවීම සහමුලින්ම අවසන්. ඒවා අවසන් කරන්නට හොඳ, පිරිසිදු ඇමතිවරයෙක් සෞඛ්‍ය අමාත්‍ය ධුරය හොබවනවා. එතුමා මුදල් හොයන ඇමතිවරයෙක් නොවෙයි; ගසා කන ඇමතිවරයෙක් නොවෙයි; හොරා කන ඇමතිවරයෙක් නොවෙයි. එතුමා සැදීපැහැදී සිටින්නේ මේ රටේ ජනතාවට පරිණත සෞඛ්‍ය සේවාවක්, පරිණත සෞඛ්‍ය පද්ධතියක් ක්‍රියාත්මක කරන්නටයි. [බාධා කිරීමක්] ගරු ඩී‍ව් ගුණසේකර මන්ත්‍රීතුමනි, මොකක්ද කිව්වේ? මටත් ඇහෙන්න කියන්න. මා එතුමාව මුරුංගා අත්තේ තබනවා නොවෙයි. මම ඇත්ත කථා කරන්නේ.

ගරු ඩී‍ව් ගුණසේකර මහතා
(மாண்புமிகு டீயூ குணசேகர)
(The Hon. DEW Gunasekara)
අලුත් පෙරමුණක්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එහෙම අලුත් පෙරමුණක් නැහැ. මේක හොඳට මතක තබා ගන්න. මේක සැබෑ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සැබෑ UNP පෙරමුණක්. මේක කාඩ්බෝඩ් ශ්‍රී ලංකා පෙරමුණක් නොවෙයි. මේක කාඩ්බෝඩ් UNP පෙරමුණකුත් නොවෙයි. අලුතෙන් පෙරමුණු හදන්න අපට අවශ්‍ය නැහැ. ගරු ඩී‍ව් ගුණසේකර මන්ත්‍රීතුමනි, අපි පෙරමුණු හදලා ඡන්දය දිනලා තිබෙන්නේ. එහෙම නම් ඔබතුමා මේ පැත්තට එන්න. ඔබතුමා එන්න support එකට. ඇත්තටම ඔබතුමා support කරන්න ඕනෑ නේ. ගරු මන්ත්‍රීතුමනි, රුපියල් 80ට බෙහෙත් ගෙන්වලා රුපියල් 900ට බෙහෙත් විකුණපු කාලය දැන් ඉවරයි. ඒවා කළේ පසු ගිය කාලයේ. ඒ කාලය ඉවරයි. මුදල් ගසා කාපු කාලය ඉවරයි; හොරා කාපු කාලය ඉවරයි. ඔබතුමන්ලා නිර්මල බුදු දහම වාගේ අදහන ප්‍රතිපත්ති රජයන කාලය අද ඇවිල්ලායි තිබෙන්නේ. ඒ නිසා ඔබතුමාට සදාචාරාත්මක අයිතියක් නැහැ හොරා කාපු පුද්ගලයෝ එක්ක ඔය පැත්තේ තවදුරටත් රැඳී සිටින්න. සැබෑ වාමාංශිකයන් හැටියට, සැබෑ වමේ දේශපාලනඥයන් හැටියට, ඇත්ත වශයෙන්ම පොදු ජනතාවගේ හිතසුව පිණිස, පොදු ජනතාවගේ බඩකට ගැන හොඳ අවබෝධයක් තිබෙන ඔබතුමන්ලාට මා ආරාධනා කරනවා මේ පැත්තට එන්න කියා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත තුළින් අපි සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඓතිහාසික, මුළු රටේම ජනතාවට ඵලදායි හා ශුභවාදී මෙන්ම ප්‍රගතිශීලි විපර්යාසයක් ඉෂ්ට සිද්ධ කරනවා. ඒක අපි කරන්නේ පොඩි මනුස්සයා වෙනුවෙන්. ඒක අපි කරන්නේ සාමාන්‍ය ජනතාව වෙනුවෙන්. මින් ඉදිරියට ඖෂධ සමාගම්වලට, ඖෂධ මාෆියාවට, ඖෂධ අලුගෝසුවන්ට මේ රටේ සෞඛ්‍ය ප්‍රතිපත්තිය හසුරුවන්නට ඉඩ ප්‍රස්ථාවක් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ජනාධිපතිත්වය තුළ, රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ අග්‍රාමාත්‍ය වගකීම තුළ, සෞඛ්‍ය අමාත්‍ය රාජිත සේනාරත්න මැතිතුමාගේ මෙහෙයවීම තුළ හොරුන්ට තැනක් නැහැ. අලුගෝසුවන්ට තැනක් නැහැ. ඖෂධ මාෆියාවට තැනක් නැහැ කියමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 12.38]

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට හිතෙන්නේ අද අප රටේ දේශපාලනයේ ඉතාම වැදගත්, ඒ වාගේම ඓතිහාසික අවස්ථාවක් කියායි. මේ අවස්ථාවට සම්බන්ධ වෙලා වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මට විශාල සතුටක් ඇති වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මුලින්ම මගේ අවංක ආදර ස්තුතිය මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට පළ කරන්න ඕනෑ. මොකද, අද එතුමා ගරු සභාවට පැමිණ මූලික කථාව කර, මේ ඉදිරිපත් කළ පනත් කෙටුම්පත සම්බන්ධව හොඳ අදහස් මාලාවක් ඉදිරිපත් කරමින්, මේක ලොකු සටන් මැද, අපහසුතා මැද ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට බැඳීමක් තිබෙනවාය කියා පෙන්වූවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම මට විශාල සතුටක් ඇති වෙනවා, වර්තමාන සෞඛ්‍ය ඇමති දොස්තර රාජිත සේනාරත්න මැතිතුමා අපේ වමේ පක්ෂයෙන් යම් ආභාසයක් ලබා ගෙන, සේනක බිබිලේ මැතිතුමාගේ ශිෂ්‍යයෙක් හැටියට එතුමාගේ දර්ශනය ගැන වුවමනාවක්, කැක්කුමක් ඇතිව අද මේ පනත් කෙටුම්පත ක්‍රියාත්මක කිරීමේ වගකීම තමන්ගේ කරපිටට අරගෙන ඉදිරියට අප රටේ අලුත් ඡේදයක් ආරම්භ කිරීම සඳහා මේ වැදගත් අංශයේ මූලික පියවරක් ආරම්භ කිරීම ගැන.

ඒ ගැන සඳහන් කරන ගමන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. එක්සත් ජාතික පක්ෂයේ සජිත් ප්‍රේමදාස ඇමතිතුමාගේ

[ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා]

කථාවෙන් කළේ වෙලා තිබෙන දේ සම්පූර්ණයෙන්ම විකෘති කරලා කණපිට හැරවීමක්. සේනක බිබිලේගේ මේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එක්ක වාමාංශික පක්ෂය සම්බන්ධ වෙලායි. එදා සේනක බිබිලේට සහාය දුන්න අය අතරේ (දොස්තර) එස්.ඒ. වික්‍රමසිංහ පමණක් නොවෙයි, ටී.බී. සුභසිංහ ඇමතිවරයාත් හිටියා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ලේකම්වරයා හැටියට කටයුතු කළේ එතුමායි. එතුමාත් අපේ වමේ පක්ෂයේ කෙනෙක්. ලෝක ඉතිහාසයේ ප්‍රථම වරට අඩු දියුණු රටකට පුළුවන් වුණා, මේ සියලු ප්‍රගතිශීලී බලවේග එක් කර ගෙන, තමන්ගේ රටේ දුප්පත් අසරණ රෝගීන් වෙනුවෙන්, බහු ජාතික සමාගම්වලට විරුද්ධව පහර දීලා සියලුම අවශ්‍ය බෙහෙත් නිසි ආකාරයට ලබා දෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න. ඒ යුගයේ දී, අපේ රෝහල් තුළ සියලු අත්‍යවශ්‍ය ඖෂධ නොමිලේ ලබා දෙන්න පුළුවන්කම ලැබුණා. එපමණක් නොවෙයි, ලෝකයේ තිබෙන අවම මිලට පිටින් ගන්න වුණත් පුළුවන් තත්ත්වයක් ඇති කළා. ඒක නැති කළේ-,

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු මන්ත්‍රීතුමනි, තව වැඩි කාලයක් යන්නට පෙර සියලුම ඖෂධ රෝහලෙන් ගන්නටත්, සියලුම පරීක්ෂණයන් රෝහලෙන් කර ගන්නටත් අවස්ථාව සලසා දෙනවා.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)

එය ඉෂ්ට කර ගන්න පුළුවන් වෙන්න කියලා මම ප්‍රාර්ථනා කරනවා. එය කිරීම සඳහා සම්පූර්ණ සහයෝගය අපි ලබා දෙනවා. නමුත් මම මතක් කරන්න ඕනෑ, මෙය පහසු දෙයක් නොවෙයි කියලා. මෙය දරුණු යුද්ධයක්. එය තේරුම් ගන්නත් ඕනෑ. එක්සත් ජාතික පක්ෂය 1975 වර්ෂයේදී යෝජනා කළ පරිදි ඇමෙරිකාවේ තානාපති, ජර්මනියේ තානාපති ඒගොල්ලන් ඔක්කොම ඇවිල්ලා කිව්වා සේනක බිබිලේත්, සම සමාජ පක්ෂයත් ඒ ආණ්ඩුවෙන් පිට කරලා දාන්න, එතකොට පමණයි ආධාර ලබා දෙන්නේ කියලා. - එදා තිබුණේ ආර්ථික අර්බුදය, තෙල් අර්බුදය, ඒ වාගේම ආහාර අර්බුදය හරහා රට පෙළෙන අවස්ථාවක්- ඒ නිසා තමයි 1975 දී සම සමාජ පක්ෂය ආණ්ඩුවෙන් පිට කරලා දැම්මේ. UNP එක තමයි එදා ඒ කටයුත්ත කළේ. [බාධා කිරීම]

එදා සිට සේනක බිබිලේ ප්‍රතිපත්තියෙන් ලැබුණු සියලු සහන නැති කරලා දැම්මේ එක්සත් ජාතික පක්ෂයයි. ඒ, අධිරාජ්‍යවාදී බහු ජාතික සමාගම්වල වුවමනාවන් ඉෂ්ට කිරීම සඳහායි.

එතැනින් තමයි දිගටම ලැබුණු ප්‍රයෝජනය නැති කරලා දැම්මේ. අඩු මිලට බෙහෙත් ලබා ගන්නත් ඒ වාගේම නොමිලයේ සියලු බෙහෙත් හැම රෝගියෙකුටම ලබා ගන්නත් පුළුවන් තත්ත්වයක් රජයේ රෝහල්වල තිබුණා. ඒ තත්ත්වය නැති කරලා දැම්මේ 1977 - 1994 කාලයේදීයි. [බාධා කිරීමක්] අපි කියන්නේ මේකයි. අපි මේ කාරණය තේරුම් ගන්න ඕනෑ. කොයි පැත්තේ හිටියත්, හොඳ අදහස් තිබුණත්, හොඳ වුවමනාවන් තිබුණත් කුඩා රටක් හැටියට අපට මේ සටන ගෙන යන්න සිදු වෙලා තිබෙන්නේ ලෝකයේ අධිරාජ්‍යවාදී ලොකු බල කණුවක් වන ඇමෙරිකාව ප්‍රධාන බහු ජාතික සමාගම් එක්කයි. ඒ බහු ජාතික සමාගම් එක්ක ගෙන යන සටන සාර්ථක කර ගැනීමට මාර්ගය ලෝකයට පෙන්වලා දුන්නේ සේනක බිබිලේ මැතිතුමායි. මම ආඩම්බර වෙනවා, අපේ ලංකා සමසමාජ පක්ෂයේ සාමාජිකයෙක් වූ එතුමා ඒ මාර්ගය පෙන්වලා දීපු එක ගැන. එතුමාම ඉදිරිපත් වෙලා අපේ රටේ තමයි ප්‍රථම වරට ඒක ක්‍රියාත්මක කළේ. නමුත් ඒ ක්‍රියාත්මක කරපු දේ නැති කළේ විශාල ප්‍රතිගාමී බලවේගයක්. ඒ ප්‍රතිගාමී බලවේගය මේ හැම දෙනාටම බලපෑම් කරනවා.

එක්සත් ජාතික පක්ෂය ඒ ගොල්ලන්ගේ අතකොළුව හැටියට කටයුතු කරනවා වාගේම එතැනින් එහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ යම් අයට වුණත් බලපෑම් කරලා තිබෙනවා. ඒවාට යම් පිරිසක් යට වෙලා තිබෙනවා. ඒක ලංකාවේ විතරක් නොවෙයි, ලෝකය වටේම වෙලා තිබෙන දෙයක්. මේක නිරන්තර ගැටුමක්; නිරන්තර සටනක්. ඒ සටන ජය ගැනීම පහසු දෙයක් කියලා හිතාගෙන නම් අපට මේ ගමන ආරම්භ කරලා ඉදිරියට සාර්ථකව ගෙන යන්න පුළුවන් වන්නේ නැහැ. එහි තිබෙන අපහසුතාව තේරුම් අරගෙන තමයි අපි කටයුතු කළ යුත්තේ.

දැන් මම සේනක බිබිලේ මොනවාද කළේ කියලා පැහැදිලි කිරීමට උදාහරණයක් දීලා මේ කාරණය ඉදිරිපත් කළොත් තමුන්නාන්සේලාට වැටහෙයි, එදා මොනවාද කළේ, අද මොනවාද අපි කළ යුත්තේ කියලා. Valium නමින් ඖෂධයක් තිබෙනවා. ඒක හිත අවුල් වෙන කොට සන්සුන්භාවයක් ඇති කිරීමට පාවිච්චි කරන ඖෂධයක්. මේක tranquilizer එකක්. Valium කියන ඒ පෙත්ත -මිලි ග්‍රෑම් පහේ පෙත්ත- බහු ජාතික සමාගමක් වූ ස්විට්සර්ලන්තයේ රෝෂ් සමාගම ශත 92කට තමයි එදා ලංකාවේ අළෙවි කළේ. සේනක බිබිලේ තීන්දු කළා, පිට රට බහු ජාතික සමාගම් ඇවිල්ලා මේ රටේ ලොකු ප්‍රචාරයක් කරලා, වෛද්‍යවරුනුත් මේකට ගොදුරු කර ගෙන, රෝගීනුත් මේකට යට කර ගෙන කරන මේ වැඩේට හරස් වෙන්න ඕනෑය කියලා. මොකක්ද එතුමා කළේ? එදා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රධානත්වයෙන් වමත් සම්බන්ධ වෙලා තිබුණු ඒ ආණ්ඩුවට එතුමා යෝජනා කළා, "අපේ රටට අවශ්‍ය සියලු බෙහෙත් පෙති වර්ග, බෙහෙත් වර්ග සඳහා අපි තොග වශයෙන් ලෝක වෙළෙඳ පොළෙන් ටෙන්ඩර් කැඳවීමක් කරමු. නමුත් ටෙන්ඩර් කැඳවීම කරන කොට ඖෂධීය නම පාවිච්චි කරලා කරමු. එතකොට මිල හුඟක් අඩුවෙන් තමයි ගෙවන්න සිද්ධ වෙන්නේ. වෙළෙඳ නාම පාවිච්චි කළොත් ඒක හුඟක් වැඩියි." කියලා. මම මේ උදාහරණයෙන් පෙන්වන්නම්, ඒක කොහොමද කළේ කියලා. Valiumවල ඖෂධීය නම Diazepam.

ඒ Diazepam නමින් මුළු රටේම රජයේ අංශය, පෞද්ගලික අංශය කියන මේ ඔක්කොම අයගේ අවශ්‍යතාව එකතු කර ගෙන ලෝකයෙන්ම ඉල්ලුම් කළා. එතකොට මේ රෝස් සමාගමම ශත 92කට විකුණන පෙත්තේ මිල ශත 51කට බැස්සුවා. Generic නම පාවිච්චි කරලා - Valium නොවෙයි, Diazepam කියන නමින්- ඒ ටෙන්ඩර් කැඳවීම කරපු නිසා ඉන්දියාවේ රැන්බැක්සි කොම්පැනිය ඒ පෙත්ත ශත දෙකකට දෙන්න ඉදිරිපත් වුණා. විශේෂ දක්ෂකම් ඇති ලෝක ප්‍රසිද්ධ සමාගම් තිබෙනවා, හොඳ නිෂ්පාදන ක්‍රමවේද උපයෝගි කරන සමාගම්වලට සහතික පත්‍ර ලබා දෙනවා - Certificate of Good Manufacturing Practices. ඒ කියන්නේ, ඒ නිෂ්පාදන ආයතනවල නිෂ්පාදන ක්‍රමවේදය ගිහිල්ලා හොයලා බලලා සහතික ලබා දෙනවා. ඒ certificate එකත් ඉන්දියාවේ රැන්බැක්සි කොම්පැනිය ලබා ගත්තා. ඒ අයට හොඳ certificate එකක් ලැබුණා.

පරීක්ෂණ පවත්වන්නත් සේනක බිබිලේ ක්‍රමවේදයක් මහ රෝහලේ තිබෙනවා. මගේ මිත්‍ර Dr. H.R. Wickremasinghe තමයි Pathology Laboratory එක බාරව හිටියේ. එතැනත් පොඩි unit එකක් පටන් ගත්තා, පරීක්ෂණ පවත්වන්න. මේවා කරලා තමයි මේ බෙහෙත් පෙති ගෙන්වා ගත්තේ. මේ ආකාරයට රෝස් සමාගම ශත 92කට විකුණන පෙත්ත ශත දෙකකට ගෙනාවා. එහි ගුණාත්මකභාවය කිසිම වෙනසක් තිබුණේ නැහැ. මේ මිලට දිගටම මේ පෙති ගන්න පුළුවන් වනවා. දැන් වුණත් ගිහිල්ලා

Diazepam නමින් ඒ පෙත්ත ඉල්ලුවොත් ශත ගණනකට ගන්න පුළුවන්, රුපියල් දෙකයි ශත ගණනක් ගෙවන්නේ නැතිව. මේකයි මේකේ රහස. ඒ ක්‍රමවේදය තමයි එදා ප්‍රගතිශීලී වමට බර ආණ්ඩුවක් බලයේ හිටපු නිසා ක්‍රියාත්මක කළේ. ඒ තත්ත්වය තුළින් අපට මොකක්ද කරන්න පුළුවන් වුණේ? සේනක බිබිලේ අත්‍යවශ්‍ය ඖෂධ ලැයිස්තුවක් හැදුවා. ඒ අනුව, අපේ රජයේ රෝහලකට ලෙඩෙක් ගියාම හැම රෝගයකටම අවශ්‍ය ඖෂධ ඒ රජයේ රෝහලෙන් ලබා ගන්න පුළුවන්කම තිබෙනවා, ඒ අත්‍යවශ්‍ය ඖෂධ ලැයිස්තුවේ තිබෙන ඖෂධවලින්. අත්‍යවශ්‍ය ඖෂධ ලැයිස්තුව ගෙන්වන්නේ generic නම් පදනම් කර ගෙනයි. ඒ ආකාරයට ඒ ලැයිස්තුව සකස් කරලා, මම කියපු පිළිවෙළට ටෙන්ඩර් කළාම මොකක්ද වෙන්නේ? අපේ රටේ තොග වුවමනාව ලොකුයි. ඒ නිසා ඒ ටෙන්ඩරය ලබා ගැනීම සඳහා බහුජාතික සමාගම් සහ නොයෙකුත් නිෂ්පාදන කර්මාන්තශාලා ඔක්කොම ලොකු තරගයක යෙදෙනවා. තරගය ඇති වන්නේ ඒගොල්ලන්ගේ පැත්තෙන්. ඒ කියන්නේ නිෂ්පාදකයන්ගේ පැත්තෙන්. ඒ තරගය හේතු කොටගෙන තමයි අපට අවම මිලට බෙහෙත් ලබා ගන්න පුළුවන් වන්නේ. 1970 - 75 කාලයේදී සමසමාජ පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, කොමියුනිස්ට් පක්ෂයත් එක් වෙලා හදපු සහාග ආණ්ඩු කාලයේ අපේ රටේ දුප්පත්ම රෝගියෙකුට වුණත් ඕනෑම රෝහලකට ගිහිල්ලා ලෙඩකට නොමිලේ ඒ බෙහෙත් ගන්න පුළුවන් වුණා. කොහේ වුණත් කමක් නැහැ, පිටින් බෙහෙත් ගන්න අය, පෞද්ගලික අංශයෙන් බෙහෙත් ගන්න අය හිටියා නම් ඒ අයටත් බෙහෙත් ගන්න පුළුවන් වන විධියට සේනක බිබිලේ රාජ්‍ය ඖෂධ සංස්ථාව - SPC - හැදුවා.

ඒ සංස්ථාව හදලා, ඒ සංස්ථාවෙන් පෞද්ගලික අංශයට බෙදලා දුන්නා, අඩු මිලට බෙහෙත්. ඒක නිසා pharmacies වල වුණත් බෙහෙත්වල මිල අවම මට්ටමක තමයි තිබුණේ. ඒ කාලයේ මේ වැඩේ ලංකාවේ සාර්ථකව ක්‍රියාත්මක කළාට පස්සේ, ලෝක සෞඛ්‍ය සංවිධානය, UNIDO එකේ හිටපු ගාමිණී කොරයා ඇතුළු මේ ගොල්ලන් ඔක්කෝම එකතු වෙලා මේ ක්‍රමය ලෝකය වටේ ව්‍යාප්ත කරන්න පටන් ගත්තා. දැන් ලෝකයේ රටවල් 90කට වඩා මේ ක්‍රමය ක්‍රියාත්මක කරනවා. මේ සම්බන්ධයෙන් සාර්ථකව කටයුතු කරපු සේනක බිබිලේගේ ජීවිතයත් නැති වුණේ සමහර විට ඒ සටන නිසායි. ඒ ගැන මම කනගාටු වෙනවා.

1977 එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව බලයට ආවාට පස්සේ මේවා ඔක්කෝම නැති කරලා දැම්මා. පෞද්ගලික අංශයේ සමාගම්වලට බලය දුන්නා, පිට රටවලින් ඕනෑ තරම් බෙහෙත් ගෙනෙන්න; ඕනෑ ගණනක් ගෙවලා බෙහෙත් ගෙනෙන්න. එතකොට රාජ්‍ය අංශයට තොග වශයෙන් බෙහෙත් ගැනීමේ ක්‍රමවේදය කඩා වැටුණා. විවිධ අය ඒකට සම්බන්ධ වුණා. රෝගීන්ගේ වුවමනාව මුල් කර නොගෙන පටු වාසි ගැන කල්පනා කිරීම නිසා ඒ පැවැති හොඳ ක්‍රමය ක්‍රමානුකූලව කඩා වැටුණා.

එදා මිල නියම කිරීමේ යම් වැඩ පිළිවෙළක් දියත් කළා. වරායට එන කොට යම් බෙහෙතක මිලක් තිබෙනවා නම්, ඒ මිලෙන් රෝගියාට ගෙවන්න සිද්ධ වන මිලේ සීමාවක් ඇති කළා. ඒවා ඔක්කෝම නැති කළා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, you have only one more minute.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
I have got 10 minutes from the Hon. Douglas Devananda.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
You had 20 minutes.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
Yes, plus another 10 minutes.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
But, no one informed the Chair about that.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
I am taking 10 minutes from the Hon. Douglas Devananda's time. He mentioned about that.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
No, he did not inform me.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
When he left he said, “Make use of my 10 minutes.”

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
But, I am going to speak during that time.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
He asked me to speak. He gave me that 10 minutes.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
But, he did not inform the Chair.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
I am very sorry about this. Please ask the Secretary-General. He came here and told me that I have got an extra 10 minutes.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Okay, you may carry on. You can use the time allotted to the Hon. (Dr.) Rohana Pushpa Kumara, not the Hon. Douglas Devananda.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
Okay.

ඉතින් මේ තත්ත්වය අනුව දැන් මේ ඉදිරිපත් කරලා තිබෙන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් මම සතුටු වෙනවා. මෙය සකස් කිරීමට මමත් සම්බන්ධ වුණා. ඒ කියන්නේ පසු ගිය ආණ්ඩුව කාලයේදී මේ සම්බන්ධ අනු කමිටුවක් පත් කළා. මමත් ඒ අනු කමිටුවේ සිටියා. අපි ඒ නිලධාරින්ට මේ කරුණු ඉදිරිපත් කළා. නමුත් දැන් අපට තවත් කරුණු කිහිපයක්ම ඉෂ්ට කරන්න තිබෙනවා. අපේ රටට අඩුම මිලට හොඳ ගුණාත්මකභාවයක් ඇති, සෞඛ්‍යයට හානි නොවන ඖෂධ ලබා ගැනීම සඳහා අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක විය යුතුයි. සෞඛ්‍ය ඇමතිතුමා ඉදිරිපත් කරලා තිබෙන මේ පනත් කෙටුම්පත අනුව ඒක සිද්ධ වෙයි කියන විශ්වාසය මට තිබෙනවා.

වැදගත් අලුත් දෙයක් මේ පනත් කෙටුම්පතට ඇතුළු කරලා තිබෙනවා. ඒ තමයි, ගුණාත්මකභාවය පමණක් නොවෙයි, ලියා පදිංචි කරන්න යන අවස්ථාවේදී මිලත් සාධකයක් හැටියට පාවිච්චි කරන්න යෑම.

විශේෂයෙන් ලෝකයේ කලාපයෙන් කලාපයේ මිල වෙනස් වෙන්න පුළුවන්. මේ කලාපයේ රටවල අහවල් ඖෂධය මොන මිලටද අළෙවි වෙන්නේ කියලා සොයා ගන්න පුළුවන්. එතකොට ඒ හා සමාන මිල සීමා නියම කරලා ඒ සීමාවලට ඇතුළු වෙන කොට විතරයි ලියා පදිංචි කරන්න පුළුවන් වන්නේ. ඒක හරියට ක්‍රියාත්මක වුණොත් රෝගියකුට හොඳ ප්‍රමිතියක් ඇති බෙහෙත් සාධාරණ මිලකට අප රට තුළ ලබා ගැනීමේ හැකියාවත් ඇති කරන්න පුළුවන් වේවි. ඒ කටයුත්ත කරන ගමන් කල් ඇතුව අවශ්‍ය ප්‍රමාණය සියල්ලම ලබා ගෙන හරියට ගබඩා කරන්න ඕනෑ. ඇමතිතුමා කිව්වා වාගේ, එකවර නොවෙයි විටින් විට ලබා ගෙන හරියාකාරව ශීතකරණයේ තබාගෙන කල් පවතින විධියට ගබඩා කරන ගමන් ඒවා හොඳ ප්‍රමිතියෙන් තිබෙනවාද කියන එක අපි සොයා බලන්නට ගන්නට ඕනෑ. ටෙන්ඩර් ලබා දෙන අවස්ථාවේදී ඉදිරිපත් කරන ඖෂධ හොඳ ප්‍රමිතියකින් තිබෙන්නට පුළුවන්. නමුත් පසුව එවන කාණ්ඩවල ඒ ප්‍රමිතිය අඩු වෙන්න පුළුවන්. ඒක නිසා හැම batch එකම -හැම කොටසම- නිවැරදිව පරීක්ෂා කර බලන්න ඕනෑ.

ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරයක් පිහිටුවීමට ඔබතුමාගේ පනත් කෙටුම්පතට ඇතුළු කර තිබීම පිළිබඳව මම සන්තෝෂ වෙනවා. ඒක අත්‍යවශ්‍ය දෙයක්.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු මහාචාර්යතුමා, මේ මුළු ලංකාවටම වසරකට Metformin මිලියන 600ක් ගෙන්වනවා. SPC එක ඒ මිලියන 600ම ගෙන්වන්නේ එක සැරේමයි. එතකොට අවුරුද්ද අවසන් වෙන කොට ඉතිරි වන ඒවා expire වනවා. දැන් මාසෙන් මාසෙට batches ගෙන්වන්න තමයි මම කටයුතු කරන්නේ. එතකොට check කරන එකත් ලෙහෙසියි.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
හැම batch එකම test කරන්නත් ඕනෑ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
හැම batch එකම test කරනවා. ඒ කියන්නේ අවුරුද්දටම order එක දෙනවා. හැබැයි, ඒ ගොල්ලෝ store කරලා අපට ඒ batches supply කරන්න ඕනෑ.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
අන්න හරි. ඒ ආකාරයට කරන එක හොඳයි. මේවා සියල්ලක්ම කරන්න පුළුවන්. සිකුරාදාට Committee Stage එක තිබෙන නිසා මම ඉදිරිපත් කරලා තිබෙන සංශෝධන ගැන මම එදාට කථා කරන්නම්. මෙතැනදී මම ඔබතුමාට කියන්නේ මේ වගේ හොඳ ක්‍රමවේදයක් ඇති කළත්, එතැන හොඳ මිනිස්සු සිටියේ නැත්නම්, එතැන අවංක මිනිස්සු සිටියේ නැත්නම් වැඩේ කෙරෙන්නේ නැහැ කියන එකයි. ඒ නිසා මම කියනවා, අපි සාමාජිකත්වය දරන සේනක බිබිලේ අනුස්මරණ කමිටුව ඔබතුමාට සම්පූර්ණ සහාය දෙන්න ලැහැස්තියි කියන එක. ඒකේ මමත් ඉන්නවා; ක්‍රිෂාන්ත වීරසූරියත් ඉන්නවා; කොල්වින් ගුණරත්නත් ඉන්නවා; කාලෝ ෆොන්සේකාත් ඉන්නවා. අපි සියල්ලෝම සම්පූර්ණ සහාය දෙන්නම්.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු මහාචාර්යතුමා, මෙතැනදී නම් කියන්නේ නැතුව කථා කරමු. නැත්නම් තව තව සංවිධාන ඇවිල්ලා මට කියයි, ඒ ගොල්ලන්වත් ගන්න කියලා.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
මට තේරෙනවා.

අපි මේ කටයුත්ත හරියාකාරව කළොත් අපට මේ ගමන සාර්ථකව ඉදිරියට යන්න පුළුවන් වෙයි. එය කිරීමේදී මෙතැන තිබෙන යම් අඩු පාඩුකම් පිළිබඳව අපි බලන්න ඕනෑ. අධිකාරියක් තමන්ට තිබෙන බලය, තීන්දු ගැනීමේ හා ප්‍රතිපත්ති හැදීමේ බලය CEOටයි, ඊට පහළ Division Headsලාටයි පැවරිය යුතුයි කියලා මෙතැන යෝජනා කරලා තිබෙනවා. ඒක කරන එක නම් වැරැදියි. එතකොට මේ register කිරීම, ඉවත් කිරීම, මේ වාගේ තීන්දු සියල්ලක්ම අනිවාර්යයෙන්ම ඒ අධිකාරිය විසින් ගත යුතුයි. වෙන කාටවත් ඒ බලය දෙන්න බැහැ. අපි සංශෝධන ඉදිරිපත් කරන්නේ අමාත්‍යතුමා අමාරුවේ දාන්න නොවෙයි. ඔබතුමාට සහාය දෙන්නයි අපි බලන්නේ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඔබතුමා ඉදිරිපත් කර තිබෙන සංශෝධන අද මම ඉදිරිපත් කරන සංශෝධනවලත් තිබෙනවා. ඒවායේ නැති ඔබතුමාගේ අනෙකුත් සංශෝධන අපි ගන්නවා.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
බොහොම හොඳයි. මෙතැනදී අපේ ජනතාව වෙනුවෙන් යුද්ධයකටයි අපි දැන් පිවිසිලා සිටින්නේ. අපි එකට මේ සටන ඉදිරියට ගෙන යමු.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
පුළුල් පෙරමුණක් හදා ගනිමු.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
ඒකත් හොඳයි. අපට නම් ඕනෑ කරන්නේ ප්‍රගතිශීලි පෙරමුණ. එය අපේ රටේ ඉදිරි ගමනක් යන පෙරමුණක්; අධිරාජ්‍යවාදයට විකුණන පෙරමුණක් නොවෙයි; අප රට පාවා දෙන පෙරමුණක් නොවෙයි; ජනතාව පාවා දෙන පෙරමුණක් නොවෙයි.

අපි ඒ ආකාරයට කල්පනා කර එකට ක්‍රියා කළ යුතුයි. මෙහිදී හොඳ අයත් ඉන්නවා; නරක අයත් ඉන්නවා. අපි හොඳ අය තෝරා ගෙන මේ ගමන යා යුතුයි. මහාචාර්ය සේනක බිබිලේ ප්‍රතිපත්ති එකවරම හරියාකාරව ක්‍රියාත්මක කරන්න බැහැ. ක්‍රමානුකූලවයි එතැනට යන්නට ඕනෑ.

ඖෂධීය නම පමණක් පාවිච්චි කිරීම තවම ක්‍රියාත්මක කර නැති බව මා දැක්කා. මා එය පිළි ගන්නවා. අද තිබෙන තත්ත්වය අනුව, ඒ ඖෂධවල ප්‍රමිතියේ තිබෙන අඩු පාඩුකම් නැති කරන්නේ නැතිව අපට ඒ කාර්යය කරන්න බැහැ. එතැනට යන්නට අපට ඉලක්කයක් තිබෙන්න ඕනෑ. ඒ සඳහා අවශ්‍ය දියුණුව අප ඇති කරන්න ඕනෑ; රසායනාගාරවල දියුණුව ඇති කරන්න ඕනෑ. ඒ සියල්ල කිරීමෙනුයි අපට ඒ ගමන යන්න පුළුවන් වන්නේ. අපේ රටේ ජනතාව දැන් ඉතාම දරුණු තත්ත්වයකටයි මුහුණ දෙමින් සිටින්නේ. මේ පනත් කෙටුම්පත ක්‍රියාත්මක කළොත් ජනතාව ඒ තත්ත්වයෙන් බේරා ගන්න අපට පුළුවන් වෙයි. රෝහල්වලට ගියාම, එතැනින් දෙන වට්ටෝරුවේ සඳහන් බෙහෙත්වලින් වැඩි ප්‍රමාණයක් රෝහලේ නැහැ.

ඒ බෙහෙත් වට්ටෝරුව අරගෙන රෝහලෙන් පිටට ගියාම මොනවාද වෙන්නේ? ඒ බෙහෙත් සඳහා ගිනි ගණනක් ගෙවන්න සිදු වෙනවා. නමුත්, ඒ බෙහෙත් තොගයම මිලට ගන්නත් බැහැ. ඒ බෙහෙත් ලබා නොගත්තොත් මොන වාගේ ප්‍රශ්නද මතු වෙන්නේ කියලා අපි වෛද්‍යවරු හැටියට දන්නවා. ඒ නිසා මේ ක්‍රමය වෙනස් කරන්නට ඕනෑ. එය කිරීමට අපි කටයුතු කරමු. එය කළොත් අපේ රෝගීන් පෙළෙන මේ තත්ත්වයෙන් ගොඩ එන්නට පුළුවන් වෙයි. එය කිරීම සඳහා ගරු ජනාධිපතිතුමාත් සමඟ ගරු රාජිත සේනාරත්න මැතිතුමා එකතු වී කරන මේ වැදගත් සේවයට අපගේ උපරිම සහයෝගය ලබා දෙනවාය කියා පොරොන්දු වෙමින්, මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

[අ.භා. 1.08]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම ජාතික ඖෂධ නියාමන අධිකාරිය පිහිටුවීම පිළිබඳව පනත් කෙටුම්පත දෙවන වර කියැවීම සඳහා ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේ, ඒ පිළිබඳව වචන කිහිපයක් කථා කරන්නට අවස්ථාවක් ලබා දීම පිළිබඳව ඔබතුමන්ට බෙහෙවින්ම ස්තුතිවන්ත වනවා.

ජාතික වශයෙන් වැදගත් ගැටලුවක් මතු වූ අවස්ථාවලදී පනත් ගෙනැල්ලා තිබෙන බව අප දැක තිබෙනවා; කමිටු හදා තිබෙනවා අප දැක තිබෙනවා; ඊට අවශ්‍ය වන නීති සම්පාදන කර තිබෙන බව අප දැක තිබෙනවා. නමුත්, ඒ පනත් ස්ථාපිත කිරීමෙන්, ඒ නීතිවලින් අපේක්ෂා කරන ලද කාර්ය භාරය ඉටු වුණාද කියන සැකය මේ රටේ ජනතාව තුළ පැන නැඟී තිබෙනවා.

විශේෂයෙන්ම 2007 දී ගෙන එන ලද, අංක 11 දරන මදුරුවන් බෝවීම වැළැක්වීමේ පනත -ඩෙංගු මර්දන පනත් කෙටුම්පත- සඳහන් කරන්න පුළුවන්. ඒ පනත් කෙටුම්පත 2007 දී අප සම්මත කළා. පනත් කෙටුම්පත සම්මත වන විට අපේ රටේ 2007 වසරේ වාර්තා වූ ඩෙංගු රෝගීන්ගේ සංඛ්‍යාව 7,327යි. නමුත්, 2014 වසර වන විට එය 47,246ක් ලෙස හය ගුණයකින් වැඩි වුණා. 'ඩෙංගු මර්දන පනත් කෙටුම්පත' සම්මත කර අවුරුදු හතක් යන විට, පෙර සිටි ඩෙංගු රෝගීන්ගේ සංඛ්‍යාව හය ගුණයකින් වැඩි වුණා. ඒ නිසා මේ පනත්වලින්ම, නීතිවලින්ම මෙය බේරා ගත හැකි වේවි කියලා අප කිසිසේත්ම විශ්වාස කරන්නේ නැහැ. කෙසේ වුවත්, යම් නීතිමය රැකවරණයක්, ආවරණයක් සලසා දීම වැදගත් කාර්යයක් ලෙස අප සලකනවා.

අප දන්නවා, ලෝකය පුරාම ප්‍රධාන වශයෙන් ජාවාරම් තුනක් තිබෙන බව. එයින් එකක් තමයි, අවි ආයුද ජාවාරම. දෙවැනි එක ඖෂධ ජාවාරමයි. තුන්වැන්න බීජ ජාවාරමයි. අද ලෝකයේ සමහර රාජ්‍යයන් සෘජු වශයෙන්මද, සමහර රාජ්‍යයන් වක්‍රවද මේ ජාවාරම්වල හවුල්කරුවන් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා ඖෂධ වෙළෙඳාමත් ලෝකයේ ජාවාරමක් බවට පත් වෙනවා. මේ නවීන ඖෂධ නිෂ්පාදනය පටන් ගැනෙන්නේ 19වන සියවසේ පමණ සිටයි.

ඖෂධ හා වෛද්‍ය උපකරණ යනු රෝගාබාධ වැළැක්වීම හෝ ප්‍රතිකාර සඳහා නවීන වෛද්‍ය විද්‍යාව විසින් යොදා ගන්නා විවිධ උපාය, උපක්‍රමවල ප්‍රධාන අංගයක්. නව ඖෂධ සොයා ගැනීම සහ නිෂ්පාදනය ආරම්භ වුණේ 19වන සියවසේ අග භාගයේ සිටයි. මිනිස් වර්ගයා විසින් දසදහස් ගණන් වූ අනේකවිධ නිෂ්පාදන, නිමැවුම් කර තිබෙනවා. ඒ නිමැවුම් අතර ඉතාම වැදගත්, අනර්ඝතම නිමැවුමක් හැටියට අපට මේ ඖෂධ හඳුන්වන්න පුළුවන්. මුල් යුගයේ සොයා ගත් ප්‍රතිශක්තිකරණ ඖෂධත්, ප්‍රතිජීවක ඖෂධත් ලෝකයේ ජනගහනය වැඩි වෙන්න හේතු සාධක වුණා. ඒ වාගේම ලෝකයේ මිනිසුන්ගේ ජීවන කාලය වැඩි කරන්න එය සාධකයක් බවට පත් වුණා. උදාහරණයක් හැටියට ගත්තොත්, ගිය සියවසේ මිනිස් ජනගහනය හතර ගුණයකින් වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම ආයු කාලය අවුරුදු 20කින් වැඩි වෙලා තිබෙනවා. මේ මහා ප්‍රතිඵල අත්පත් කර ගන්න ඖෂධවලත්, ඒ හා බැඳුණු උපකරණවලත් වර්ධනය හේතු සාධක වෙලා තිබෙනවා කියලා අප විශ්වාස කරනවා.

මිනිස් වර්ගයා විසින් සොයා ගත් වෙනත් නිමැවුම් මෙන් නොව, ඖෂධ සම්බන්ධයෙන් අද වන විට ජාතික ප්‍රතිපත්ති, පනත්, ආයතන වැනි විවිධාකාරයේ රාජ්‍ය මැදිහත්වීම් ලෝකය පුරා දකින්න පුළුවන්කම තිබෙනවා. යහපත් සෞඛ්‍ය තත්ත්වයකින් ජීවත් වීමට මිනිසුන්ට තිබෙන මූලික අයිතිය ඒ හැම පනතකම, හැම යෝජනාවකම ප්‍රධාන ලෙසින් අඩංගු විය යුතුයි කියලා අප කල්පනා කරනවා.

සෑම පුරවැසියෙකුටම යහපත් සෞඛ්‍ය තත්ත්වයක් ලබා ගැනීමේ මූලික අයිතියක් තිබෙනවා. වෙනත් පාරිභෝගික භාණ්ඩ වාගේ නොවෙයි, ඖෂධවල ගුණාත්මකභාවය මැන ගැනීම සඳහා නියමිත ක්‍රමවේදයක් නැහැ. උදාහරණයක් හැටියට ගත්තොත්, අපේ ගැමියෙකුට හාල් හපලා කියන්න පුළුවන්, ඒ හාල් හොඳද, නරකද කියලා. කරවල ඉඹලා කියන්න පුළුවන්, ඒ කරවල හොඳද, නරකද කියලා. හැබැයි, සාමාන්‍ය පුරවැසියෙකුට ඖෂධ පිළිබඳ ගුණාත්මකභාවය මැන ගන්න, තෝරා බේරා ගන්න හැකියාවක් නැහැ. එම නිසා එයත් මේ ක්ෂේත්‍රයේ පවතින ප්‍රධාන ගැටලුවක් හැටියට අප හඳුනා ගන්න ඕනෑ.

[ගරු අනුර දිසානායක මහතා]

නවීන ඖෂධ සොයා ගත් මුල් යුගයේ ඖෂධ සොයා ගැනීම සහ නිෂ්පාදනය සිදු වූයේ එකල පැවැති ප්‍රධාන රෝගාබාධ සහ වසංගතවලින් මිනිස් ජීවිත බේරා ගැනීමේ පවිත්‍ර චේතනාවෙන්. එකල සොයා ගත් ඖෂධ වර්ග ප්‍රමාණය සංඛ්‍යාත්මකව අඩු වූ අතර, ලබා දුන් ප්‍රතිඵල එකල පැවැති සෞඛ්‍ය තර්ජනවලට සාපේක්ෂව ඉතා ඉහළ අගයක් විය. එහෙත් පසුකාලීනව - විශේෂයෙන්ම හැට, හැත්තෑව දශකයේ- ගෝලීය වශයෙන් සිදු වූ ආර්ථික ක්‍රමයේ වෙනස්කම් සමඟ ඖෂධ තවත් එක් වෙළෙඳ භාණ්ඩයක් බවට පත් වෙලා තිබෙනවා. නව ඖෂධ සොයා ගැනීම, ඒ සඳහා කරන පරීක්ෂණ අධික මුදලක් හා කාලයක් වැය වන ක්‍රියාවලියක් වූ අතර, එය සෘජුවම ඒ වන විටත් ධනේශ්වර රාජ්‍යයන්ගේ ඒකාධිකාරියක් බවට පත් වෙලා තිබුණා. තම අභිමතය පරිදි මිල ගණන් තීරණය කිරීමෙන් නොනැවතී, ලාභය තර කර ගැනීමේ විවිධාකාර උපාය, උපක්‍රම ක්‍රියාත්මක කරන්න ඇතැම් ඖෂධ සමාගම් යොමු වෙන්න පටන් ගත්තා. ඖෂධ සමාගම්වල එවැනි අත්තනෝමතික ක්‍රියාකාරීත්වයන් සම්බන්ධයෙන් ලොව පුරා විවිධ ප්‍රකාශ නිකුත් වෙන්න පටන් ගත්තා. මිනිසුන්ගේ මූලික පැවැත්ම සමඟ ගැට ගැසී තිබෙන ඉතාම වැදගත් භාණ්ඩ ප්‍රභේදයක් වන ඖෂධවල මේ ඒකාධිකාරීත්වය පිළිබඳව, මේ බහුජාතික සමාගම් අසීමිත ලාභයක් උපයා ගැනීම සඳහා දරන ප්‍රයත්න පිළිබඳව, ඒවා ලෝකය පුරා වෙළෙඳ ආධිපත්‍ය තහවුරු කර ගැනීම පිළිබඳව ලොව පුරා විශාල සංවාදයක් මතු වෙන්න පටන් ගත්තා. ඖෂධ සම්බන්ධ ප්‍රතිපත්ති තීරණ ගන්නා දේශපාලඥයන් සහ නිලධාරීන් එම යන්ත්‍රණයේදී තමන්ට අවශ්‍ය පරිදි එකඟ කරවා ගැනීමට මේ සමාගම් සමහර අවස්ථාවල උත්සුක වුණා.

වර්තමාන ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ කථාවට මා ඇහුම් කන් දුන්නාම තේරුම් ගියා, ලංකාව තුළත් ඖෂධ මාෆියාවට, ඖෂධ වෙළෙඳ අධිකාරීත්වයට මොන තරම් බලයක් තිබුණාද කියලා. කැබිනට් මණ්ඩලයේ සාමාජිකයකුටත්, ඒ විෂයයට අදාළ අමාත්‍යවරයාටත් ඉක්මවා යන බලයක් මෙම සමාගම් වෙත පැවරී තිබෙනවා. අපට හිතකර ඖෂධ සමාගම් මාෆියාවක් පිළිබඳව අපට නිතර අසන්නට ලැබෙනවා. ගෝලීය ඖෂධ කර්මාන්තය යම් රටකට මාෆියාවක් බවට පත් වන්නේ එක් එක් රටවල අනුගමනය කරන ප්‍රතිපත්තිය අනුවයි. ලෝකයේ රටවල් 100කට අධික සංඛ්‍යාවක් ඉතා බුද්ධිමත්ව මෙම කර්මාන්තයෙන් ප්‍රයෝජන ගනිමින් සිටිනවා. ආර්ථිකය සම්බන්ධයෙන් හෝ සෞඛ්‍ය සේවාව සම්බන්ධයෙන් කිසිදු සැලැස්මක් නොමැති ඕනෑම රටක එම කර්මාන්තය මාෆියාවක් වීම වළක්වන්න බැහැ. මේක මාෆියාවක් වන්නේ නිකම්ම නොවෙයි. ඖෂධ පිළිබඳවත්, ඒ වාගේම ඖෂධ කර්මාන්තය පිළිබඳවත් හොඳ ප්‍රතිපත්තියක් සකස් කර ගන්න බැරි වුණොත්, හොඳ ක්‍රියාවලියක් සකස් කර ගන්න බැරි වුණොත් අනිවාර්යයෙන්ම ඖෂධ මාෆියාවන් සඳහා ඉඩකඩ විවෘත වන එක වළක්වන්න බැහැ. ඖෂධ මාෆියාවෙන් මිදෙන්න නම් අපට හොඳ ප්‍රතිපත්තියක්, ඖෂධ කර්මාන්තයක් සමඟ නිර්ණායක ක්‍රියාවලියක් අවශ්‍ය වෙලා තිබෙනවා. ඒ වාගේම ඇතැම් රටවල් සතුව ලිඛිතව ඖෂධ ප්‍රතිපත්ති ඇති අතර ඇතැම් ඒවායේ ඒ ඒ රටවල ක්‍රියාත්මක සෞඛ්‍ය ප්‍රතිපත්ති තුළ ඖෂධ සම්බන්ධ වැඩ පිළිවෙළ ගැබ් වී තිබෙනවා. ඒ සෞඛ්‍ය ප්‍රතිපත්ති තුළම තමයි ඖෂධ පිළිබඳ ප්‍රතිපත්තියත් ගැබ් වෙලා තිබෙන්නේ.

විශේෂයෙන්ම කියුබාව වැනි රටක් ගත්තොත් එරට සෞඛ්‍ය සේවාව මුළුමනින්ම රාජ්‍ය මැදිහත් වීමෙන් සිදු වන බැවින් ඖෂධ සැපයීමද ඒ අනුව රාජ්‍ය මැදිහත් වීමෙන් සිද්ධ වනවා. ඒක ඔවුන්ගේ ප්‍රතිපත්තියයි. ඒ සෞඛ්‍ය සේවාව රාජ්‍ය වග කීමක්. එම නිසා ඔවුන්ගේ ඖෂධත් මුළුමනින්ම රාජ්‍ය වග කීමක් බවට පත් වෙලා තිබෙනවා. එබැවින් මිල පාලනය කිරීමේ හෝ ඖෂධ සමාගම් ඇතුළු පෞද්ගලික අංශය පාලනය කිරීමේ මෙවැනි අණ පනත් ඒ රටට අවශ්‍ය වෙලා තිබුණේ නැහැ. 1950 පමණ වන විට ශ්‍රී ලංකාවේ සහ කියුබාවේ ආර්ථික සෞඛ්‍ය තත්ත්වයන් බොහෝ දුරට සමානව තිබුණා. අද වන විට කියුබාව තම ඖෂධ අවශ්‍යතාවෙන් සියයට 70ක් පමණ රජයේ ඖෂධ කර්මාන්තයෙන් නිපදවා ගන්නා අතර ඖෂධ අපනයනය ප්‍රධාන මෙන්ම තිරසාර ආදායම් මාර්ගයක් බවට පත් කර ගෙන තිබෙනවා. පිළිකා ඖෂධ, ප්‍රතිශක්ති එන්නත් වැනි නවීන ඖෂධ සොයා ගන්නා රටක් බවට කියුබාව සංවර්ධනය වී ඇති අතර ජෛව තාක්ෂණ ක්‍රමයෙන් නිපදවන ඖෂධ අපනයනයෙන් පමණක් වාර්ෂිකව ඩොලර් බිලියන 1ක් පමණ උපයා ගන්නවා. හැබැයි 1950 දශකය වන කොට අපි හා සමාන සෞඛ්‍ය තත්ත්වයක් තිබුණු රටක්. ශ්‍රී ලංකාවේ සමස්ත සෞඛ්‍ය සේවාව සඳහා රජය වාර්ෂිකව වැය කරන මුදලට සමාන මුදලක් කියුබාව ඖෂධ නිෂ්පාදනයෙන් වාර්ෂිකව උපයා ගන්න සමත් වෙලා තිබෙනවා.

ඇමෙරිකා එක්සත් ජනපදයේ මීට වඩා වෙනස් තත්ත්වයක් තිබෙනවා. ඇමෙරිකා එක්සත් ජනපදය ඖෂධ මිල පාලනය විවෘත වෙළෙඳ පොළේ නියාමනයන්ට අනුව සිදු වීමට ඉඩ ලබා දී ඇති අතර පෞද්ගලික සමාගම් මඟින් නව ඖෂධ සොයා ගැනීම දිරිමත් කිරීමට එමඟින් බලාපොරොත්තු වනවා. එරට ඖෂධ පාලන අධිකාරිය ප්‍රමිතිය සම්බන්ධයෙන් සොයා බලනවා. සෞඛ්‍ය රක්ෂණයෙන් ආවරණය වන මිලියන ගණන් ජනතාවක් ඒ රටවල සිටිනවා. විශේෂයෙන්ම ඕස්ට්‍රේලියාව වැනි රටක් ඉතා විධිමත්, ශක්තිමත් හා ප්‍රාණවත් ඖෂධ ප්‍රතිපත්තියක් ක්‍රියාවට නඟා ගන්න සමත් වෙලා තිබෙනවා. ලෝකය පුරා විවිධ රටවල් ඒ ඒ රටවල තිබෙන පැවැත්ම, ස්වභාවය, ආර්ථික ස්වභාවය, නිෂ්පාදන ස්වභාවය මතත් තමන්ගේ රටේ ජනතාවගේ මූලික අයිතියක් බවට පත් වී තිබෙන සෞඛ්‍ය අයිතිය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් විවිධ ක්‍රියා මාර්ගවලට සහ ප්‍රතිපත්තිවලට අවතීර්ණ වෙන්න සමත් වෙලා තිබෙනවා.

ගරු රාජිත සේනාරත්න මැතිතුමාගේ කථාව මා විටින් විට ඇහුවා. ඒ කථාව අනුව මා දැක්කා, මේකේ ඉතිහාසය. අපේ රටේ බටහිර වෛද්‍ය ක්‍රමය විධිමත්ව ස්ථාපිත වීම ආරම්භ වූයේ ඉංග්‍රීසි පාලන යුගයේ 1920 - 1940 අතර කාලයේදීයි. 1960වන විට ප්‍රධාන නගර ආශ්‍රිතව රෝහල් සහ ග්‍රාමීය පළාත් ආශ්‍රිතව ආරෝග්‍ය ශාලා සැලකිය යුතු ලෙස ව්‍යාප්ත වන්න පටන් ගත්තා. යටත් විජිත යුගයේ අග භාගයේ මෙරට ව්‍යාප්ත වෙමින් තිබූ වසංගත රෝගවලට හා දුර්භික්ෂවලට සුදු ජාතිකයින් මෙන්ම ඔවුන්ගේ ආර්ථිකයට සම්බන්ධ වූ කම්කරුවන්ද සිය දහස් ගණනින් ගොදුරු වීම සෞඛ්‍ය සේවාව විධිමත්ව ආරම්භ කිරීමට ඔවුන් පෙලඹවූ ප්‍රධාන හේතුවක් වුණා. නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමය තුළින් බලයට පැමිණි ජාතික හා ප්‍රාදේශීය දේශපාලනඥයින්ගේ මැදිහත් වීම මත පසු කාලීනව දිවයිනේ බොහෝ දුෂ්කර ප්‍රදේශවලට රෝහල් පද්ධතියක්, නිවාරණ සෞඛ්‍ය සේවාවක් ව්‍යාප්ත වුණා. පෞද්ගලික සෞඛ්‍ය සේවාව ප්‍රධාන නගරවලට සීමා වූ සුළු පරිමාණ සේවාවක් බවට තමයි පත් වෙලා තිබුණේ. නමුත් 1950 දශකය වන විටත් ඖෂධ සම්බන්ධයෙන් විධිමත් වැඩ පිළිවෙළක් හා ප්‍රතිපත්තියක් තිබුණේ නැහැ. ශ්‍රී ලංකාවෙන් බිහි කළ ශ්‍රේෂ්ඨතම විද්වතකු වූ මහාචාර්ය සේනක බිබිලේ මහතා ඖෂධ සම්බන්ධයෙන් ප්‍රතිපත්තිවලට මැදිහත් වීම ආරම්භ කරන්නේ මේ යුගයේදීයි.

රාජ්‍ය සෞඛ්‍ය සේවාව තුළ අවිධිමත් සහ අනවශ්‍ය ලෙස භාවිත කරමින් තිබූ ඖෂධ ප්‍රමාණය අත්‍යවශ්‍ය ඖෂධ 500කට පමණ සීමා කිරීමට 1950 අග භාගයේ දී ඔහුගේ දායකත්වය ලබා දුන්නා. විවිධ ඖෂධ නිර්මාණය වෙලා තිබුණා. නමුත් ඔහු සමීක්ෂණයක් කරලා, අපේ රටට අත්‍යවශ්‍ය ඖෂධ වර්ග 500ක් පමණ හඳුන්වා දුන්නා. ඖෂධ සබුද්ධිකව භාවිත කිරීමේ අරමුණින් ඔහු විවිධ ක්‍රියාමාර්ග සකස් කරන්නට සමත් වුණා.

රාජ්‍ය අංශයේ විවිධ වෙළෙඳ නාමවලින් ඖෂධ නියම කිරීම සිදු වූ අතර එයින් ඉතා ව්‍යාකූල තත්ත්වයක් නිර්මාණය වුණා. ඊට පිළිතුරක් ලෙස ඖෂධ නාමය පමණක් භාවිත කරමින් ඖෂධ සපයා ගැනීමට සහ ඖෂධ නියම කිරීමට එතුමා නිර්දේශ කළා. 1959 දී පමණ රාජ්‍ය අංශයේ ඖෂධ කළමනාකරණය විධිමත් කිරීමට හැකි වූ අතර, අදටත් රාජ්‍ය සෞඛ්‍ය සේවාව තුළ ඖෂධ සම්බන්ධයෙන් යම් විශ්වාසනීයත්වයක්, විධිමත් භාවයක් පවතී නම් එහි පදනම ඇති වූයේ, 1959 දී පමණ ඇත කාලයේ දී සේනක බිබිලේ විද්වතාණන් ගනු ලැබූ ආරම්භය නිසායි.

මේ තත්ත්වය තවත් වර්ධනය වන්නට පටන් ගත්තා. අපි දන්නවා, 1960 දශකයේ දී ලෝක ආර්ථික අවපාතයක් පැවැති බව. ඒ ආර්ථික අවපාතයත් අපට විශාල ලෙස බලපෑවා. ඒ නිසා ඖෂධ වෙනුවෙන් අපෙන් විශාල මුදල් කන්දක් පිට රට යවන එක වැළැක්වීමේ වුවමනාවක් ඇති වුණා. ගෙවුම් ශේෂයේ හිඟයක් පැන නැඟුණා. ඒ හේතුකොට ගෙන 1965 - 70 කාලයේ දී ඖෂධ ආනයනයට වෙන් කරන ලද මුදල කැපුවා. ඒ අනුව ඖෂධ ආනයනය වෙනුවෙන් රුපියල් මිලියන 33ක් වෙන් කරලා තිබුණා නම් එය රුපියල් මිලියන 24ක් දක්වා අඩු වුණා.

ජනගහනය සහ රෝගාබාධ ඉහළ යාම හේතුවෙන් ඖෂධ සඳහා ඉල්ලුම ඉහළ ගියද ආර්ථික අර්බුදය හමුවේ ඖෂධ සැපයුම සීමා කරන්නට සිදු වුණා. මෙම අර්බුදයට විසඳුම් සෙවීම සඳහා එවකට අගමැතිව සිටි ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය විසින් 1970 ඔක්තෝබර් මස 17වැනි දින මහාචාර්ය සේනක බිබිලේ සහ මන්ත්‍රීවරයකුව සිටි වෛද්‍ය එස්.ඒ. වික්‍රමසිංහගෙන් සමන්විත ද්විපුද්ගල කමිටුවක් පත් කළා. මේ කමිටුවෙන් වැදගත් නිර්දේශ ගණනාවක් ඉදිරිපත් කළා. ඒකයි වැදගත් කාරණය. මෙම විද්වතුන් දෙදෙනා සිදු කළ පළමු කාර්ය වූයේ ඖෂධ සම්බන්ධයෙන් පැවති තත්ත්වය විද්‍යානුකූලව හැදෑරීම හෙවත් තත්ත්ව වාර්තාවක් පිළියෙළ කිරීමයි. ඔවුන් විසින් ඖෂධවල තත්ත්වය, භාවිත වන ස්වභාවය, ඖෂධවල තිබෙන ගුණාත්මකභාවය, ඖෂධ විසිරී තිබෙන ආකාරය පිළිබඳව තත්ත්ව වාර්තාවක් සකස් කළා. එවකට ඖෂධ සැපයීම භාරව තිබූ Civil Medical Stores ආයතනයේ වසර 12ක ක්‍රියාකාරීත්වය, ඖෂධ සමාගම්වල ක්‍රියාකාරීත්වය, ඖෂධ සඳහා රජයේ සහ පෞද්ගලික අංශය මඟින් කරන වියදම, දේශීයව සිදු කරන ඖෂධ නිෂ්පාදනය ඇතුළු පැතිකඩ රාශියක් මොවුන් විසින් අධ්‍යයනය කළා. අනතුරුව 1971 මාර්තු මාසයේ පිටු 18කින් යුතු වාර්තාවක් සේනක බිබිලේ මහත්මයා විසින් එළි දැක්වූවා.

ඇත්තටම එහි තිබෙන්නේ නිර්දේශ ගණනාවක්. පසුව ඒක ජාතික ප්‍රතිපත්තියක් ලෙස අර්ථ කථනය වුණා, විවිධ දේවල් කිව්වා. නමුත් ඔවුන් ඒ පරීක්ෂණයේ ප්‍රතිඵලයක් හැටියට වාර්තාවක් ඉදිරිපත් කළා. ඒ වාර්තාව මුළුමනින්ම සකස් වී තිබුණේ රාජ්‍ය අංශය මැදිහත් වී සෞඛ්‍ය සේවාව පවත්වාගෙන යා යුතුයි කියන නිර්දේශය මතයි. 1970 දී අපේ රට පැවතුණේ එහෙමයි. පෞද්ගලික අංශය විසින් ආනයනය කරමින් සිටි ඖෂධ ප්‍රමාණය, රජය විසින් ලෝක වෙළෙඳ පොළේ තරගකාරී මිල ගණන් ප්‍රයෝජනයට ගෙන ඖෂධ නමින් ආනයනය කළේ නම් සියයට 60ක විදේශ විනිමයක් ඉතිරි කර ගත හැකි බව ඔවුන් පෙන්වා දුන්නා. ඒ කියන්නේ පෞද්ගලික අංශය විසින් ආනයනය කරමින් සිටි ඖෂධ ප්‍රමාණය රජය විසින් ලෝක වෙළෙඳ පොළේ තරගකාරී මිල ගණන් ප්‍රයෝජනයට ගනිමින් විධිමත් ටෙන්ඩර් පටිපාටියක් හරහා ගෙන්වා ගැනීමට පුළුවන් නම්, අපේ රටින් ගිය මුදල්වලින් සියයට 60ක විදේශ විනිමයක් ඉතිරි කර ගැනීමට පුළුවන් බව ඔවුන් පෙන්වා දුන්නා. එසේම ඒ ඉතිරි වන විදේශ මුදල්වලින් යම් ඖෂධ ප්‍රමාණයක් ජනතාවට ලබා දෙන්නට හැකියාවක් තිබෙන බවත් ඔවුන් පෙන්වා දුන්නා. ඒ වාගේම අත්‍යවශ්‍ය ඖෂධ ලැයිස්තුගත කිරීම, එම ඖෂධ ආනයනයට සහ නිෂ්පාදනයට ප්‍රමුඛතාව ලබා දීම සහ අත්‍යවශ්‍ය නොවන ඖෂධ සීමා කිරීම මඟින් අනවශ්‍ය ලෙස වැය වන පිරිවැය ඉතිරි කර ගැනීමට මෙන්ම ඖෂධ කළමනාකරණය සම්බන්ධයෙන් රට තුළ පවතින ව්‍යාකූලත්වය මඟ හැරීම ගැනත් එම වාර්තාවෙන් පෙන්වා දුන්නා. ඒවා වැදගත් සාධක.

නිමි ඖෂධ මෙන්ම දේශීය වශයෙන් ඖෂධ නිෂ්පාදනයට අවශ්‍ය අමු ද්‍රව්‍ය රජය විසින් තොග වශයෙන් මිලදී ගැනීම තවත් ප්‍රයෝජනවත් යෝජනාවක් හැටියට ඔවුන් ඉදිරිපත් කළා. ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කර තිබූ පෞද්ගලික ඖෂධ කර්මාන්තශාලා මඟින් නිෂ්පාදනය කිරීමට නිර්දේශ කෙරුණේ අත්‍යවශ්‍ය ඖෂධ පමණයි. ඔවුන්ට ඕනෑ ඕනෑ ඒවා හදන්න ඔවුන් නිර්දේශ කළේ නැහැ. ඖෂධ ලැයිස්තුවේ සඳහන්, එමෙන්ම රජය මඟින් අවස්ථානුකූලව ඉල්ලා සිටින ඖෂධ ඒ පෞද්ගලික කර්මාන්තශාලා විසින් හදා දෙන්නට ඕනෑ. නමුත් අමු ද්‍රව්‍ය ලබා දිය යුත්තේ රජයෙන් කියලා ඔවුන් නිර්දේශ කළා. මෙම වැඩ පිළිවෙළට අනුගත නොවන පෞද්ගලික කර්මාන්තශාලා ජනසතු කළ යුතු බවටද යෝජනා කෙරුණා. මේ ඖෂධ වෙළෙඳ පොළේ තිබුණු පෞද්ගලික අධිකාරිත්වය බිඳලා, එය රාජ්‍ය මැදිහත්වීම සහිත රාජ්‍ය වැඩ පිළිවෙළකට අනුගත කරන්නත්, රාජ්‍ය වැඩ පිළිවෙළට අනුගත නැත්නම් එය රජය වෙත පවරා ගැනීමත් තමයි ඔවුන්ගේ යෝජනාව තුළ මූලික ලෙසම සඳහන් වෙලා තිබුණේ.

රාජ්‍ය අංශය මඟින් ඖෂධ නිෂ්පාදනය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව පිහිටුවීම, තත්ත්ව පාලන යාන්ත්‍රණයක් ඇති කිරීම, ඖෂධ සඳහා අවශ්‍ය මානව සම්පත් පුහුණු කිරීම, මිල පාලනය, පේටන්ට් නීති වෙනස් කිරීම මඟින් ලාභදායී ජාත්‍යන්තර මූලාශ්‍රවලින් නව ඖෂධ මිලදී ගැනීම, පෞද්ගලික අංශය මඟින් සිදු කරන ඖෂධ ප්‍රචාරණය නැවැත්වීම සහ රාජ්‍ය ආයතන මඟින් සෞඛ්‍ය වෘත්තිකයන්ව නිල වශයෙන් දැනුවත් කිරීම ආදී යෝජනා මෙම වාර්තාවේ සඳහන් වුණා. දැන් මොකක්ද වෙන්නේ? මොකක් හරි සමාගමක් බෙහෙතක් අරගෙන එනවා, දොස්තර මහත්වරු ටික හම්බ වෙනවා, බෙහෙත බෙදා ගෙන යනවා. නමුත් ඒ ප්‍රවර්ධන කටයුතු, ප්‍රචාරණ කටයුතු රජය විසින් තමයි අදාළ වෛද්‍යවරුන්ට ගෙන යා යුත්තේ කියන නිර්දේශ ඉදිරිපත් කරනු ලැබුවා. එම නිසා සේනක බිබිලේ මහත්මයා නමැති ඒ ශ්‍රේෂ්ඨ විද්වතාණන්ගේ ඖෂධ ප්‍රතිපත්තිය මුළුමනින්ම සකස් වෙලා තිබුණේ රාජ්‍ය අංශයට සෞඛ්‍ය සේවය පවරා ගන්නවා යැයි කියන නිර්දේශ මතයි.

මෙම වාර්තාවෙන් පසු මහාචාර්ය සේනක බිබිලේ මහතා යටතේ ඖෂධ සම්බන්ධයෙන් විප්ලවීය පියවර රාශියක් ගනු ලැබූ අතර, අපේක්ෂා කළ ආකාරයටම ඖෂධ ආනයනය සහ භාවිතය වඩාත් විධිමත් වූ අතර, මිල ගණන් ද පහත හෙළීමට සමත් වුණා. එම වැඩ පිළිවෙළට එවකට පැවැති ආණ්ඩුවේ වාමාංශික මතවාදයේ පසුබැසීම මෙන්ම ඇතැම් වෘත්තිකයන්, ඖෂධ සමාගම් සහ ඒවායේ මව් රටවලින් එල්ල වූ බාධාවන් පිළිබඳව අපි බොහෝ අවස්ථාවල දැක තිබෙනවා. මේක නිකම්ම කරන්න පුළුවන් වුණු කාර්යක් නොවෙයි.

මහාචාර්ය සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය ලෙස මෙය හඳුනා ගන්නේ මේ ආකාරයටයි. 1950 දශකයේ සිට 1970 දශකය පමණ වන තෙක් එතුමාගේ මැදිහත්වීමෙන් ඖෂධ සම්බන්ධයෙන් අප රටේ සිදු වූ ප්‍රතිපත්තිමය විප්ලවයන්ගේ සමස්තය, ඔහුගේ වැඩ පිළිවෙළ ඉතාමත් විද්‍යාත්මක වූ අතර ආර්ථික සහ සෞඛ්‍යමය ප්‍රතිලාභ රටට අත්පත් කර ගැනීමට හේතු සාධක වුණා. ඖෂධ නිෂ්පාදනය සම්බන්ධයෙන් ඔහු ස්ථාපිත කළ යාන්ත්‍රණය එක්සත් ජාතික පක්ෂ රජය සහ පසු කාලීන ආණ්ඩු විසින් අත් නොහැර සංවර්ධනය කළේ නම් අද වන විට කලාපයේ

[ගරු අනුර දිසානායක මහතා]

ඖෂධ අපනයනය කරන ප්‍රමුඛ රටක් බවට ශ්‍රී ලංකාව පත් වන්නට ඉඩ කඩ තිබුණා. නමුත් අවාසනාවකට මෙන් සිදු වුණේ මොකක්ද? දිගු කාලයක් තිස්සේ කරන ලද පර්යේෂණවල ප්‍රතිඵල, දිගු කාලයක් තිස්සේ සිදු කරන ලද මහා අත් දැකීම්වල ප්‍රතිඵල විසින් අප අත්පත් කර ගන්නා ලද වැඩ පිළිවෙළ, 1977 දී බලයට පත් වුණු එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව විසින් අත් හැර දැම්මා. ඊට පසුව තමයි අපේ සෞඛ්‍ය මේ තිබුණු තත්ත්වයේ උඩු යටිකුරු වීමක් බවට පත් වෙන්න පටන් ගත්තේ. එදා මහාචාර්ය සේනක බිබිලේ ක්‍රියාත්මක කළ - විශේෂයෙන්ම මේ පනත් කෙටුම්පතත් එක්ක අපි සංසන්දනය කරමු. - මේ වැඩ පිළිවෙළ කොපමණ ප්‍රමුඛ ද කියනවා නම්, පසු කාලීනව ලෝකයේ රටවල් රාශියක් මෙන්ම ලෝක සෞඛ්‍ය සංවිධානය, එක්සත් ජාතීන්ගේ සංවිධානයට සම්බන්ධ වෙනත් සංවිධාන මෙන්ම නොබැඳි ජාතීන්ගේ සංවිධානයද ඔහුගේ සංකල්ප සහ වැඩ පිළිවෙළ පිළිගැනීමට ලක් කළා.

අද වන විට ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ඖෂධ ප්‍රතිපත්තීන් සකස් කර ගැනීම සඳහා දෙනු ලබන උපදෙස්, ලේඛන ආදියේ හරය එදා මහාචාර්ය සේනක බිබිලේ මැතිතුමා ක්‍රියාත්මක කළ වැඩ පිළිවෙළේ සංකල්පයන්ට බොහෝ සමාන වන අතර, වෙනසකට ඇත්තේ එම සංවිධානයේ නිර්දේශ ධනේශ්වර ආර්ථිකයන් සහිත රටවල වැඩ පිළිවෙළට සමාන ආකාරයෙන් සකස් කිරීම පමණයි. අදත් සේනක බිබිලේ ශ්‍රේෂ්ඨ විද්වතාණන් විසින් ඉදිරිපත් කරන ලද සංකල්ප මත පදනම තමයි මේ හැදෙන්නේ. හැබැයි, අද ලෝක සෞඛ්‍ය සංවිධානය වැනි ආයතන මේ ධනේශ්වර ආර්ථිකයට ගැළපෙන විධියට ඒවායේ වෙනස් කම් සිදු කරලා තිබෙනවා.

දැන් මේ නව පනත් කෙටුම්පත සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමක් ලෙස අපට පිළිගන්න පුළුවන්ද? අපට එතැනයි ප්‍රශ්නය තිබෙන්නේ. නව පනත් කෙටුම්පත මේ තිබෙන තත්ත්වය යම් ප්‍රමාණයකට කළමනාකරණය කරන්න, යම් ප්‍රමාණයකට ගුණාත්මකභාවයකට ගෙනෙන්න, යම් ප්‍රමාණයකට ජනතාවගේ ඖෂධ වෙළෙඳ පොළේ මාපියාවෙන් ගලවා ගන්න හේතු සාධක වෙලා තිබෙන බව මා පිළි ගන්නවා. හැබැයි මේක මූලික හරය වශයෙන් සේනක බිබිලේ ප්‍රතිපත්තියේ හැඳින්වීම නිවැරදිද කියන ප්‍රශ්නය අපට පැන නඟිනවා. අලුත් පනත් කෙටුම්පත මහාචාර්ය සේනක බිබිලේ මහතාගේ ප්‍රතිපත්තියට අනුව සකස් කළ එකක් යැයි පැවසීම සාවද්‍යයි කියන එකයි අපේ අදහස. එතුමා සිය අදහස් සහ යෝජනා ඉදිරිපත් කළේ සහ ඒ වෙනුවෙන් ක්‍රියාකාරීව මැදිහත් වූයේ ඖෂධවල අදාළ අවසාන වගකීම රජය විසින් දරන ආකාරයටයි. [බාධා කිරීමක්] ඔබතුමා කියන කාරණයට මම එන්නම්. නව පනත් කෙටුම්පත මඟින් ඖෂධ වෙළෙඳ පොළක හෙවත් පෞද්ගලික සෞඛ්‍ය සේවාවක පැවැත්ම පිළිගන්නා අතර එහි සිදු වන ප්‍රචාරණය, වෙළෙඳාම වැනි කටයුතුවලට යම් සීමා පැනවීමේ සහ නියාමනය කිරීමේ බලයක් ඖෂධ අධිකාරියට ලබා දෙනවා. ඕක නේ තිබෙන්නේ. ඉස්සෙල්ලා රජය විසින් මුළුමනින්ම මේ ක්‍රියාවලියට ඇතුළත් වෙනවා. දැන් තමුන්නාන්සේලා විසින් පෞද්ගලික සෞඛ්‍ය සේවාවක, පෞද්ගලික ඖෂධ වෙළෙඳ පොළක පැවැත්ම පිළිගන්නවා, ඒකට නියාමනය කරන්න අධිකාරියක් හදනවා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ඒක මිල නියාමනය කිරීම. එතකොට ප්‍රචාරණය කරන ඒවා ඔක්කොම සීමා වෙනවා. මිල නියාමනය කිරීම මෙතැනට අරගෙන නැහැ. ඒකට තමයි පෞද්ගලික අංශයේ ප්‍රශ්න තිබෙන්නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඖෂධ සමාගම්වල වෙළෙඳ ප්‍රචාරණය මුළුමනින්ම නැවැත්වීම විප්ලවීය වෙනස්කමක්. ඒක කරන්න පුළුවන්ද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු මන්ත්‍රීතුමනි, එතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන්නේ සියලුම බෙහෙත් වර්ග සමාජවාදී රටවල්වලින් ලබා ගන්න ඕනෑ කියන එකයි. මම මේ සභාවට එතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ගෙනාවා. මම ඒ ගැන කථා කළා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මා ළඟ ප්‍රතිපත්ති ප්‍රකාශනය තිබෙනවා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

එතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයයි මේ පනත් කෙටුම්පතයි සංසන්දනය කරන්න. අපට තහනම් කරන්න බැහැ ප්‍රචාරණය කිරීම. නමුත් අපි මිල නියම කළාම - [බාධා කිරීමක්] මෙන්න, CIF value එක, මෙන්න මෙපමණයි ඔය ගොල්ලන්ට කරන්න පුළුවන් කියලා කිව්වාම නිකම්ම මිල සීමා වෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඒ ප්‍රතිපත්තියේ හරය ගත්තොත් එදා එය රඳා පැවතුණේ වෙනම සමාජ ආර්ථික දේහ ප්‍රතිපත්තියක් මත පදනම්වයි. සේනක බිබිලේ නම් වූ ඒ ශ්‍රේෂ්ඨ විද්වතාණන් එසේ යෝජනා කරන්නේ ඒ පැවැති ආර්ථික ප්‍රතිපත්තිමය පැවැත්ම මත පදනම්වයි. හැබැයි, අද අපේ රටේ ආර්ථිකය අනුව ඖෂධ ප්‍රතිපත්තියේ මහා වෙනස්කම් සිද්ධ වෙලා තිබෙනවා. මෙන්න මේකට අනුරූපී වන පරිදි තමයි තමුන්නාන්සේගේ යෝජනාවත් තිබෙන්නේ. ඒකයි මම කියන්නේ. එතකොට ඖෂධ සම්බන්ධයෙන් ප්‍රතිසංස්කරණයක් ඉදිරිපත් වන දේශපාලන ආර්ථික සන්දර්භය ඉතාමත් වැදගත් වනවා. එකල පැවැති සමඟි පෙරමුණ ආණ්ඩුව මුහුණ දුන් ආර්ථික අර්බුදය විසින් ඇති කළ තෙරපුම, ප්‍රතිපත්තිගරුක සහ අදූෂිත දේශපාලනය, වාමාංශික දේශපාලන ආර්ථික නැඹුරුව සේනක බිබිලේ මහතාගේ විප්ලවීය දේශපාලන දැක්ම සහ විෂය පිළිබඳ ප්‍රාගුණ්‍ය එවැනි වැඩ පිළිවෙළක් ඉදිරිපත් කිරීමටත්, ක්‍රියාත්මක කිරීමටත් පසුබිම සකස් කළා. එහෙත් අද පවතින්නේ එදා මහාචාර්ය සේනක බිබිලේ වැඩ පිළිවෙළට පහසුකම් සැපයූ සන්දර්භය නොව එම වැඩ පිළිවෙළ අත්හැර දැමීමට මුල් වූ 1977න් ඇරඹී දේශපාලන - ආර්ථික ක්‍රමයමයි. සැබැවින්ම ඊටත් වඩා අන්තයට ගිය අවස්ථාවක් දැන් පවතිනවා. එතකොට එතුමා ඒ ඉදිරිපත් කරපු දේශපාලන - ආර්ථික සන්දර්භය හා දැන් මේ ඖෂධ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන දේශපාලන සන්දර්භය අතරත් වෙනස්කමක් තිබෙනවා.

ඊළඟට, මම ඔබතුමාට කියන්න කැමැතියි ඖෂධ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ දැනට පවතින ප්‍රධාන ගැටලු පිළිබඳව. අපට ප්‍රතිපත්ති හදන්න පුළුවන්. නීති හදන්න පුළුවන්. අණපනත් සම්මත කර ගන්න පුළුවන්. හැබැයි, ප්‍රධාන ගැටලු අතර තිබෙන, රාජ්‍ය සෞඛ්‍ය සේවාව තුළ ඖෂධ හා උපකරණ අවශ්‍ය වන

ස්ථානවලට අඛණ්ඩ සැපයුමක් නොමැති වීම, බෙහෙත්වල, උපකරණවල අඛණ්ඩ සැපයුමක් නොමැති වීම ජනතාවට බලපාන්නේ කොහොමද කියලායි මම බලන්නේ. ජනතාවට ඒ අවශ්‍යතාවය ඉටු විය යුතුව තිබෙනවා. ඖෂධ හිඟ වන්නේ කිසිදු පූර්ව දැනුම්දීමකින් හෝ පෙර සූදානමකින් තොරවයි. අද රෝහල්වල ඖෂධ හිඟය පවතිනවා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
තව වැඩිකල් යෑමට පෙර ඒකට විසඳුම සපයනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හොඳයි, ගරු ඇමතිතුමා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඒකට අවශ්‍ය software එක මම දැන් ලෑස්ති කර ගෙන යනවා. ඒ අනුව හිඟයක් නැතුව සියලුම ඖෂධ සපයන්න කටයුතු කරනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ඖෂධවල ප්‍රමිතිය සම්බන්ධයෙන් කිසිදු විශ්වාසයක් නැහැ. මෙහෙම ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. ඖෂධ තත්ත්ව පාලන රසායනාගාරය ඇතුළුව යම් තත්ත්ව පාලන යන්ත්‍රණයක් තිබුණත් එම යන්ත්‍රණයේ ක්‍රියාකාරිත්වය, අසීමාන්තිකව මෙරටට ගෙන්වන ඖෂධ හා උපකරණ ප්‍රමාණය හා සැසඳීමේදී කිසිසේත්ම ප්‍රමාණවත් වන්නේ නැහැ. ඔබතුමාත් ඒක පිළිගන්නවා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මේ පනත් කෙටුම්පතෙන් යෝජනා කර තිබෙන පරිදි ඒවා ප්‍රශ්න කරලා අපි ඉදිරියේදී world standard එකට ගේනවා. ඊට පස්සේ brand names පාවිච්චි කිරීම සම්පූර්ණයෙන් තහනම් කරලා generic name එකෙන් විතරක් ඖෂධය හඳුන්වනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
දැන් පවතින ගැටලු තමයි පෞද්ගලික අංශයේ ඖෂධ හා උපකරණවල මිල පාලනයක් නොමැති බැවින් එකම රසායන නමින් යුත් ඖෂධ විවිධ වෙළඳ නාමවලින් නිකුත් කිරීම. දැන් ඔබතුමා නිශ්චිත ලෙස මිල නියම කිරීමක් කරනවා. ඒක කෙරෙනවා නේ ඇමතිතුමා. අනවශ්‍ය හෝ අත්‍යවශ්‍ය නොවන ඖෂධ, උපකරණ සහ ආසන්න නිපැයුම් දස දහස් ගණනක් වෙළඳ පොළ ආක්‍රමණය කිරීම තවත් ගැටලුවක් වෙලා තිබෙනවා. එකම වර්ගයේ ඖෂධ දහස් ගණනක් තිබෙනවා. එතකොට අපට බැරිද අඩුම තරමින් අත්‍යවශ්‍ය ලේඛනයක් ප්‍රකාශයට පත් කරන්න? ඒ සඳහා ඔබතුමා සූදානම්ද? [බාධා කිරීමක්] ඔව්. දැන් ඒ ගැටලුවට තමයි මම එන්නේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒක තමයි ප්‍රධාන කාර්ය භාරය.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එමෙන්ම ඖෂධ, උපකරණ සහ ආසන්න නිපැයුම්වල ප්‍රමිති පාලනය සහ කළමනාකරණය ව්‍යාකූල වන අතර, අවභාවිතයට එය හේතුවක් වී තිබෙනවා. මෑත කාලයේ වසරකට රුපියල් මිලියන 50,000කට ආසන්න පිරිවැයක් දරමින් රටට ඖෂධ ආනයනය කර ඇති බව මහ බැංකු වාර්තාවලින් පැහැදිලි වනවා. සමහර ඒවා අත්‍යවශ්‍ය නොවන ඒවා බවට පත් වී තිබෙනවා. ඒ වාගේම ඇතැම් වෘත්තිකයින් විසින් ඖෂධ අත්තනෝමතික ලෙස නියම කිරීම, සුදුසුකම් රහිත පුද්ගලයින් ඖෂධ නියම කිරීම, පෞද්ගලික ඖෂධශාලා පවත්වා ගෙන යන පුද්ගලයින් තම අභිමතය පරිදි හෝ පාරිභෝගික ඉල්ලීම පරිදි ඖෂධ නිර්දේශ කිරීම වැනි තත්ත්වයන් ගැටලුවක් ලෙස නිර්මාණය වෙලා තිබෙනවා. ශක්තිමත් ජාතික ඖෂධ කර්මාන්තයක් නොමැති හෙයින් ආනයනය මත යැපීමට සිදු වීම තවත් ගැටලුවක්. එය රට දේශපාලන සහ ආර්ථික වශයෙන් අස්ථාවර වීමට වුවද බලපාන්නට පුළුවන්. ඒ කරුණත් ගැටලුවක් හැටියට අපේ ඖෂධ වෙළඳ පොළේ තිබෙනවා.

අනෙක් ගැටලුව, නිවාරණ සේවාව ඇතුළු සමස්ත සෞඛ්‍ය සේවාවේ ප්‍රතිපත්තිමය බිඳ වැටීම, නිර්බාධක වෙළඳ පොළ ආර්ථික රටාව, ආහාර පාන රටාවේ පිරිහීම, අවිධිමත් කාර්මීකරණය, වැඩිහිටි ජනගහනය වැඩි වීම ඇතුළු කරුණු ගණනාවක් හේතුවෙන් රටේ රෝගාබාධ ප්‍රමාණය වැඩි වීම සහ ඖෂධවලට ඇති ඉල්ලුම වැඩි වීමයි. මේවා තමයි අපි ඖෂධ වෙළඳ පොළේ ප්‍රධාන වශයෙන් හඳුනා ගන්නා ගැටලු හැටියට තිබෙන්නේ.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ අලුතින් ඉදිරිපත් කරපු පනත් කෙටුම්පත මඟින් මෙන්න මේ කරුණු පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා. එකක් තමයි, ඖෂධ පිළිබඳව දැනට පවතින තත්ත්වය සම්බන්ධයෙන් ඖෂධ ප්‍රතිපත්තිය පිළිබඳ උපදේශක සභාව හෝ ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් නිශ්චිත කාලයක් තුළ තත්ත්ව වාර්තාවක් පාර්ලිමේන්තුවට සහ මහ ජනතාවට ඉදිරිපත් කළ යුතුය කියන කාරණය.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
පනත් කෙටුම්පතේ තිබෙනවා ජාතික උපදේශක කමිටුව පිළිබඳ කාරණය.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මා කියන්නේ, එමඟින් අවුරුදු තුනකට සැරයක් හෝ තත්ත්ව වාර්තාවක් ඉදිරිපත් කරන්න කියලායි. අපට අවශ්‍ය වන බෙහෙත් මොනවාද, ඒවා අපට ඕනෑ වන්නේ කොපමණ පරාසයකින් ද යනාදිය පිළිබඳව තත්ත්ව වාර්තාවක් මාස තුනකට සැරයක් හෝ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියලායි අප කියන්නේ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු මන්ත්‍රීතුමා, prescriber එක දෙනවා. අපි ඔය ඔක්කෝම දත්ත වෛද්‍යවරුන්ට දෙනවා. ඕනෑ නම් එය පාර්ලිමේන්තුවටත් එවන්න අපට පුළුවන්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට පුළුවන් නම් සෑම මාස තුනකට වරක් හෝ -මාස තුන ප්‍රමාණවත් නැත්නම් මාස හයකට වරක් හෝ - ඖෂධ සම්බන්ධ වැඩ පිළිවෙළේ ප්‍රගතිය ලිඛිත වාර්තාවක් මඟින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියා අපි යෝජනා කරනවා. දැන් මේ පනත් කෙටුම්පත සම්මත කරගන්න පුළුවන්. හැබැයි අඩුම තරමින් මෙහි ක්‍රියාවලිය මොකක්ද කියලා මාස කීපයකට වරක් -මාස හයෙන් හයට හෝ- පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කරන එක සුදුසුයි. ගරු ඇමතිතුමනි, ඔබතුමාම කී පරිදි මේ පනත් කෙටුම්පත සම්මත වූ පමණින් හෙටම මේ සියල්ල සිද්ධ වන්නේ නැහැ. ඒ නිසා මේ සඳහා යම් පසු ක්‍රියාවලියක් ඕනෑ. මොකද, පනත් කෙටුම්පත සම්මත කර ගැනීම සම්බන්ධයෙන් බාධා තිබුණා නම් එය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මොන තරම් බාධා ඒවිද කියන එක පිළිබඳව අපට සාධාරණ සැකයක් මතු වෙනවා. ඒ නිසා මෙහි ක්‍රියාකාරිත්වය පිළිබඳව මාස තුනකට හෝ හයකට හෝ වරක් පාර්ලිමේන්තුවට ලිඛිත වාර්තාවක් ගරු ඇමතිතුමා ඉදිරිපත් කරන්න ඕනෑ කියා අපි යෝජනා කරනවා. ඒ වාගේම, ජාතික ඖෂධ නියාමන අධිකාරිය වරින් වර මුහුණ දෙන නෛතික, පරිපාලන, මූල්‍යමය ප්‍රතිපත්තිමය ගැටලු විසඳීමට රජය සාමූහික වගකීමෙන් සහාය ලබා දිය යුතුයි. අපි මේ පනත හදලා ඖෂධ අධිකාරියට මේ බලය දුන්නාට නෛතික, පරිපාලන, මූල්‍ය ප්‍රතිපත්තිමය ගැටලු විසඳීමට බාධාවක් තිබෙනවා. ඒ නිසා අඩුම තරමින් පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවට හෝ මාස තුනකට සැරයක්වත් විශේෂ කොට මේ අධිකාරිය කැඳවලා ඔවුන් මුහුණ දී තිබෙන ගැටලු, රටේ ඖෂධ ක්ෂේත්‍රයේ මතු වී තිබෙන ගැටලු පිළිබඳව සාකච්ඡා කරලා නිසි අධීක්ෂණයක්, මෙහෙයවීමක් කිරීම අවශ්‍යයි කියන යෝජනාවත් අපට තිබෙනවා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ඒ සියලු ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා විශේෂඥයන් 23දෙනකුගෙන් යුත් සභාවක් පත් කරලා තිබෙනවා. ඕනෑ නම් ඒ අයගේ වාර්තාවක් අපට ඉදිරිපත් කරන්න පුළුවන්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒකත් හොඳයි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රාජ්‍ය අංශයේ ඖෂධ නිෂ්පාදනය උනන්දු කිරීම සඳහා රජය වාර්ෂිකව ප්‍රතිපාදන වෙන් කිරීම් පිළිබඳ සැලැස්මක් ඉදිරිපත් කිරීම කළ යුතුය කියාත් අපි යෝජනා කරනවා.

ඖෂධ යනු ජනතාවගේ සෞඛ්‍ය උන්නතිය සඳහා යොදා ගන්නා එක් ක්‍රමවේදයක් පමණයි. සමස්ත සෞඛ්‍ය සේවාව ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තියකට අනුව ප්‍රතිසංවිධානය කිරීමකින් ඖෂධවලින් ලැබෙන ප්‍රයෝජනය වඩාත් විධිමත්ව ජනතාවට ලබා ගත හැකියි. මුළු සෞඛ්‍ය ප්‍රතිපත්තියම විධිමත් කරන්නේ නැතිව බෙහෙත් විතරක් විධිමත් කිරීම ප්‍රමාණවත් වන්නේ නැහැ. ඒ නිසා සෞඛ්‍ය ප්‍රතිපත්තියේම විධිමත්භාවයක අවශ්‍යතාව තිබෙනවා.

ඖෂධ සම්බන්ධ පනතකින් හෝ ඖෂධවලට අදාළ පරිපාලන ක්‍රමවේදයකින් නිසි ප්‍රතිඵල නොලැබීමට තවත් හේතුවක් වන්නේ සෞඛ්‍ය වෘත්තිකයන්ට, සමාජ ක්‍රියාකාරිකයන්ට සහ පොදුවේ මහ ජනතාවට ඒවා පිළිබඳ පැහැදිලි අදහසක් නොමැති වීමයි. අපට පනත් කෙටුම්පත් සම්මත කරන්න පුළුවන්. අඩුම තරමින් මේ පිළිබඳව මහ ජනතාව දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළක්, ක්‍රමවේදයක් අපි ආරම්භ කරන්න ඕනෑ. ඒ පිළිබඳව කටයුතු කරන්න ඔබතුමාගේ පනත් කෙටුම්පතේ අංශයක් තිබෙනවා. ඒ අංශය විශේෂ සැලකිල්ලක් කරලා මේ පිළිබඳව අවධානය යොමු කරනු ඇතැයි කියා අපි විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ කාරණයත් කියලා කථාව අවසන් කරනවා. ලෝකයේ මාෆියාවන් අතර ප්‍රධාන මාෆියාවක් බවට ඖෂධ මාෆියාව පත් වී තිබෙනවා. එය අපේ රෝගි ජනතාව ගිලගෙන තිබෙනවා. එය යම් ප්‍රමාණයකට හෝ අවම කිරීම සඳහා -මා කියන්නේ නැහැ එය මුළුමනින් විසඳේවි කියලා- ඖෂධ සමාගම් වෙත යම් බාධාවන්, යම්කිසි barrier එකක්, නීතිමය රෙගුලාසි ප්‍රමාණයක් පැනවීම පිණිස දරන මේ ප්‍රයත්නයට ස්තුතිවන්ත වෙමින් මම නතර වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 1.40]

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ප්‍රථමයෙන් අපි බෙහෙවින් සතුටු වෙනවා වත්මන් ජනාධිපතිතුමා එදා එක්සත් ජනතා නිදහස් සන්ධාන රජයේ සෞඛ්‍ය අමාත්‍යවරයා හැටියට සිටිද්දී එළි දක්වන්න සූදානම් වූ මේ ජාතික ඖෂධ ප්‍රතිපත්තිය වෛද්‍යවරයකු වන අපේ නව සෞඛ්‍ය අමාත්‍යතුමා මඟින් ඉදිරිපත් කිරීම ගැන. මොකද, මෙය සමාජ අවශ්‍යතාවක්. මෙය සමාජයේ හැම කොටසක්ම වත්මන් කාල සීමාව තුළ ඉල්ලපු දෙයක්. මෙයත් හරියට විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න, මැතිවරණ ක්‍රමය ආසන ක්‍රමයට සකස් කරන්න කියා ඉල්ලනවා වාගේ දෙයක්. මොකද, ඉෂ්ට නොවන නමුත් මෙය සමාජ අවශ්‍යතාවක්.

ඉතිහාසය ගත්තොත් විශේෂයෙන්ම වාමාංශික, නැත්නම් සන්ධාන රජයන්වලින් තමයි රෝගියාගේ පැත්ත බලා තිබෙන්නේ. මොකද, එදා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය මේ සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය ඉදිරියට ගෙන යන්න, මේ රටේ ඖෂධ නිෂ්පාදනය කරන්න "රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව" පිහිටවූවා. මම හිතන හැටියට ඒ ආයතනය අදටත් ක්‍රියාත්මක වනවා. නමුත්, සියයට සියයක්ම නොවෙයි. පසු ගිය කාල වකවානුවේත් අපි ජපන් ආධාර මුදල් ලබා ගෙන එහි ධාරිතාව වැඩි කරන්න කටයුතු කළා. එවැනි තත්ත්වයක් තුළ මෙම "ජාතික ඖෂධ නියාමන අධිකාරිය" පිහිටුවීම ඉතාම වැදගත් වනවා.

අපි පළමුවෙන්ම කථා කරන්න ඕනෑ, මෙහි තිබෙන වැදගත් අංශයක් වන මිල පාලනය පිළිබඳවයි. ඖෂධ ප්‍රතිපත්තියකදී ඉතා වැදගත් වන අංශයක් තමයි, එහි මිල පාලනය කියන්නේ. ඒක මේ පනත් කෙටුම්පතට ඇතුළත් වෙලා තිබෙනවා. කලින් මිල පාලනයක් තිබුණා. නමුත්, ඒ මිල පාලනය පසු ගිය එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ අහෝසි කළා. එහි ආනයනික මිලට යම් කිසි ලාභ ප්‍රතිශතයක් එකතු කර රෝගීන්ට ඒ බෙහෙත් ලබා ගන්න පුළුවන් ක්‍රමයක් හදා තිබීමයි. නමුත්, පසු ගිය එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ සිටි වෙළෙඳ ඇමතිවරයා ඒ ක්‍රමය අහෝසි කර දමපු නිසා මේ රටේ ජනතාවට ඒ වරප්‍රසාදය භුක්ති

විඳින්න බැරි වුණා. නමුත්, අද මේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය යටතේ එය ක්‍රියාවට නැඟීම ගැන අප සතුටු වනවා. මොකද, ඒක අත්‍යවශ්‍ය වනවා. ඒක මේ පනත් කෙටුම්පතේ පැහැදිලිවම සඳහන් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පනත් කෙටුම්පතේ 118 වගන්තිය බලමු. එහි සඳහන් වන්නේ "මිල නියම කිරීමේ කමිටුව" පිළිබඳවයි. ඒකේත් වෙනසක් තිබෙනවා. ප්‍රධාන වශයෙන්ම එය අදාළ වන්නේ බෙහෙත්වලට පමණක් නොවෙයි. වෛද්‍ය උපකරණවලටත් මෙය අදාළ වීම ඉතාම වැදගත් වනවා. මොකද හේතුව, කලින් ඒ ප්‍රතිපත්තිය ඉල්ලුවේ බෙහෙත්වලට පමණයි. නමුත්, මේ තුළින් වෛද්‍ය උපකරණවලටත් මිල පාලනයක් ලැබීම වැදගත් කරුණක් වනවා. හේතුව, රෝගියාගේ පැත්තෙන් සලකා බලන කොට බෙහෙත් වාගේම වෛද්‍ය උපකරණවලිනුත් වන සේවාව ඉතාම වැදගත්. ඒ නිසා හොඳ ගුණාත්මක නිෂ්පාදනයක් සාධාරණ මිලට ලබා ගැනීම සහ ඒ වෛද්‍ය උපකරණ සේවාවත් රෝගියාට ලබා ගැනීමේ හැකියාව ලැබෙනවා. ඒ නිසා මෙම පනත් කෙටුම්පතේ 118 වගන්තිය යටතේ මේ කරුණු දෙකම ඇතුළත් වීම වැදගත් කරුණක් වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම මෙහි තිබෙන තවත් වැදගත් වගන්තියක් තමයි, 56.(1). මේ පනත් කෙටුම්පතේ සඳහන් වන වැදගත්ම දේ එයයි. යම් බෙහෙතක් ලබා ගැනීමේදී ගොඩක් රෝගීන්ට මුහුණ දෙන්න වන ගැටලුවක් තමයි මේ. අපේ සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය ඇමතිතුමාත් දන්ත වෛද්‍යවරයෙක්.

මේ පනත් කෙටුම්පතේ 56.(1) වගන්තියේ පැහැදිලිව මෙසේ සඳහන් වනවා:

> "සෑම වෛද්‍ය වෘත්තිකයකු, දන්ත වෛද්‍යවරයකු හෝ පශු වෛද්‍යවරයකු විසින් නිකුත් කරනු ලබන සෑම ඖෂධ වට්ටෝරුවකම එම ඖෂධයේ වාර්ගික නාමය ලිවිය යුතුය."

ඒක අනිවාර්යයි. නමුත්, අපි දන්නා කාලයේ සිට මෙය නීතිමය තත්ත්වයක් බවට පත් වුණේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම 56.(2) වගන්තියේ මෙසේ සඳහන් වනවා:

> "වෛද්‍ය වෘත්තිකයා, දන්ත වෛද්‍යවරයා හෝ පශු වෛද්‍යවරයාට අවශ්‍ය වන අවස්ථාවක දී ඔහු විසින් නිකුත් කරන ඖෂධ වට්ටෝරුවේ වාර්ගික නාමයට අමතරව එම ඖෂධයේ විශේෂිත වෙළඳ නාමයක් ද සඳහන් කරනු ලැබිය හැකිය."

ඒක ඇත්ත. මෙම වගන්තිය මඟින් එම නිදහස දීලා තිබෙනවා. මගේ දරුවාට අසනීප වෙලා මම දොස්තර මහත්තයා හම්බ වන්න ගියා කියමු කෝ. මම බෙහෙත් වර්ගයේ නම කියන්න කැමැති නැහැ. දොස්තර මහත්තයා කියන්න පුළුවන්, "මෙන්න මේ බෙහෙත බොන්න" කියා. එතකොට සමහර විට මම හෝ දොස්තර මහතා හම්බ වන්න ගිය පුද්ගලයා කියන්න පුළුවන්, "නැහැ. දොස්තර මහත්තයා මේ බෙහෙත නොවෙයි, මට මෙන්න මේ බෙහෙත දෙන්න" කියා. ඒ නිදහස මෙම වගන්තිය මඟින් දීලා තිබෙනවා. එක්කෝ යුරෝපීය රටක නිෂ්පාදනයක්, එහෙම නැත්නම් ඉන්දියාවේ නිෂ්පාදනයක්, බංග්ලාදේශයේ නිෂ්පාදනයක් මිලට ගන්න මේ තුළින් හැකි වෙලා තිබෙනවා. ඒක වැදගත්. අපට සාම්ප්‍රදායිකව එක දේකට කොටු වෙලා ඉන්න බැහැ. මොකද හේතුව, අද නිදහස් වෙළඳ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වනවා. එහෙම නැත්නම්, පුළුවන් කෙනෙකුට තමන් කැමැති පෞද්ගලික ආරෝග්‍යශාලාවකට අද යන්න පුළුවන්. අද වෛද්‍ය ක්‍රමය ගත්තත් නිදහස් සෞඛ්‍ය සේවාව තිබුණාට පුළුවන් අය පෞද්ගලික ආරෝග්‍යශාලාවලට යනවා. අපට ඒක නවත්වන්න බැහැ. පෞද්ගලික ආරෝග්‍යශාලාවලිනුත් සෞඛ්‍ය සේවාව සඳහා ලොකු දායකත්වයක් දෙනවා. අන්න ඒ වාගේ තත්ත්වයක් මේ පනත් කෙටුම්පත මඟින් ඇති කර තිබෙනවා.

ඒ වාගේම 56.(3) වගන්තියේ මෙසේ සඳහන් වනවා:

> "වෛද්‍ය වෘත්තිකයකු, දන්ත වෛද්‍යවරයකු හෝ පශු වෛද්‍යවරයකු විසින් නියම කරනු ලබන ඖෂධය සඳහා වාර්ගික නාමයක් නොමැති සංයෝග ඖෂධයක් වන අවස්ථාවකදී ඔහු විසින් නිකුත් කරන ඖෂධ වට්ටෝරුවෙහි එම ඖෂධයේ වෙළඳ නාමය පමණක් සඳහන් කරනු ලැබිය හැකි ය."

ඒ කියන්නේ ඖෂධීය නාමය - generic name - නැත්නම්, එම ඖෂධයේ වෙළඳ නාමය සඳහන් කරන්න මෙම වගන්තිය මඟින් අද වෛද්‍යවරයාට නිදහස දීලා තිබෙනවා. ඒක වැදගත්. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේක ප්‍රායෝගික තත්ත්වයට ගෙනෙන්න. අදාළ බුද්ධිමතුන් මේ සඳහා දායකත්වය ලබා දීලා තිබෙනවා.

අද අලුත් රෝග අපේ රටේ පැතිරෙනවා. විශේෂයෙන් පිළිකා රෝගය බලන්න. අය වැයෙන් සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා රුපියල් බිලියන 187ක් වෙන් කරනවා. එම මුදලෙන් රුපියල් බිලියන 40ක් යන්නේ බෙහෙත් සඳහා. එයිනුත් රුපියල් මිලියන 1,650ක් යන්නේ පිළිකා රෝගය සම්බන්ධ බෙහෙත් සඳහායි.

එතකොට ඖෂධ සම්බන්ධයෙන් ලොකු මුදලක් යනවා. ඒ වැය කරන මුදලින් ගුණාත්මක හොඳ බෙහෙතක් ලබා දෙන්නට පුළුවන් නම් එය වැදගත් වෙනවා. ඖෂධීය නාමයක් නැති වෙලාවේ වෛද්‍යවරයාට හැකියාවක් තියෙනවා, වෙළෙඳ නාමයෙන් ඒ බෙහෙත ලියා දෙන්න. මොකද, රෝගියා ගැන හිතලා ඒ කටයුත්ත ඔහු කරන්නට ඕනෑ.

මේ පනත් කෙටුම්පතේ මූලිකම දේ, තමයි වෛද්‍ය උපකරණ, නිෂ්පාදන සාධාරණ මිලකට ලබා දීම. සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තියේත් ඒක තිබුණා. කාටවත් මේක නැහැ කියා කියන්නට බැහැ. මෙම පනත් කෙටුම්පතේ 56.(5) වන වගන්තියේ මෙසේ තිබෙනවා:

> "පාරිභෝගිකයාට තමාගේ කැමැත්ත පරිදි අදාළ ඖෂධයක් මිලදී ගැනීමට හැකිවන පරිදි ඔසුසලේ ඇති, එම වර්ගීය ඖෂධයට අදාළ විවිධ වෙළඳනාම සහිත ඖෂධ සහ ඒවායේ මිල ගණන් ඖෂධවේදියා විසින් පාරිභෝගිකයාට දැනුම් දිය යුතුය."

ගරු ඇමතිතුමනි, ඒ කාරණය වැදගත් වෙනවා. මේ කාරණය කවුරුත් අගය කරන දෙයක්. මොකද, වෛද්‍යවරයා ඖෂධීය නාමය ලියන්නත් ඕනෑ. ඒ වාගේම ඖෂධීය නාමය සහ ඒ ඔසුසලේ තිබෙන සියලුම අදාළ ඖෂධ වර්ග පෙන්වන්නත් ඕනෑ. ඒ වාගේම ඒ ඖෂධයේ මිල ගණන් පෙන්වන්නටත් ඕනෑ. එතකොට බෙහෙත ගන්න කෙනාට තමන්ගේ අතේ තිබෙන මුදලේ හැටියට බෙහෙත ලබා ගන්නට පුළුවන් වෙනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் *அக்கிராசனத்தினின்று அகலவே,* பிரதிச் சபாநாயகர் அவர்கள் *தலைமை வகித்தார்கள்.*

Whereupon MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* MR. DEPUTY SPEAKER *took the Chair.*

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කථා කරන්න ගරු මන්ත්‍රීතුමා.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ විධියට කිරීම ඉතාම වැදගත් වෙනවා. මොකද, බෙහෙත ලියන එක විතරක් නොවෙයි. ඖෂධසල්වලින් බෙහෙත් ගැනිමේදී පාරිභෝගිකයා දැනුවත් කරන්න ඕනෑ. ඒ වාගේම මෙහිදී අප ලෙඩුන් හා ආයතනවල අනෙකුත් අයත් දැනුවත් කරන්නට ඕනෑ, මෙහෙම දෙයක් තිබෙනවාය කියා. නීතියක් ගෙනාවාට වැඩක් නැහැ. ගමේ සිටින අහිංසක පාරිභෝගිකයාව දැනුවත් කරන්න ඕනෑ. ඔබ ගන්න බෙහෙත වෛද්‍යවරයා මෙහෙම ලියා දෙන්න ඕනෑ. බෙහෙත් ගන්න ඔසු සලට ගිහින් බෙහෙත් වර්ගයට අදාළ බෙහෙත් වර්ග කීයක් තිබෙනවා ද, ඒවායේ මිල ගණන් මොනවා ද කියා සොයා බැලීමේ අයිතියක් පාරිභෝගිකයාට තිබෙන බවත් දැනුවත් කරන්න ඕනෑ. නැත්නම් මොකක් ද වෙන්නේ? වෛද්‍යවරයා බෙහෙත ලියා දෙනවා. බෙහෙත ලියූ කොළ කැල්ල ඔසු සලට ගිහින් දෙනවා. එහෙම දුන්නාට පසු වෙළඳ ව්‍යාපාරිකයා වැඩිම මිල ඇති බෙහෙත රෝගියාට දෙන්න පෙලඹෙනවා. ඖෂධවේදියාට මේ පනත මගින් අනිවාර්යයෙන්ම නියම කර තිබෙනවා, විවිධ නම්වලින් තිබුණත් අදාළ ඖෂධ වර්ගයට ඇති මිල ගණන් සහ ඖෂධ වර්ග පිළිබඳව පාරිභෝගිකයා දැනුවත් කිරීමට.

එසේ කරන්නේ නැත්නම්, ඒකත් වරදක් බව මෙම පනත් කෙටුම්පතේ 57. වන වගන්තියේ මෙන්න මෙහෙම සඳහන් වෙනවා:

> " මෙම පනතේ මේ කොටසේ නිශ්චිතව දක්වා ඇති විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලැබිය යුතුය."

ඒකට දඬුවමකුත් දෙන්නට පුළුවන්. මොකද, සාමාන්‍ය සිද්ධාන්තය තමයි නීතිය නොදැන සිටීම ඒ නීතියෙන් ගැලවීමට හේතුවක් නොවෙයි කියන එක. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් නීතිඥයෙක්. නමුත් මේකේදී අප ප්‍රජාව දැනුවත් කරන්නට ඕනෑ. මේ පනත් කෙටුම්පත සම්මත කරනවා වාගේම ඒ සම්මත වන පනතෙන් නියම ප්‍රයෝජන ගන්නට නම් පාරිභෝගිකයා දැනුවත් කරන්නට ඕනෑ. පාරිභෝගිකයා දැනුවත් කළාම වෛද්‍යවරයාගෙන් ඔහුට ඉල්ලන්නට පුළුවන් "මට බෙහෙතේ නමත් ලියා දෙන්න, බෙහෙත වර්ග කිහිපයකින්ම ලියා දෙන්න" කියා. එතකොට බෙහෙත් සලට ගිහින් ඔහුට ඉල්ලන්න පුළුවන්, මෙන්න මේ බෙහෙත් වර්ගවලින් අඩුම මිලට තිබෙන බෙහෙත් වර්ගය තමන්ට දෙන්න කියා. එහෙම දුන්නේ නැත්නම් දඬුවම් කරන්නත් පුළුවන්. පාරිභෝගික ප්‍රජාව, රෝගීන් අප දැනුවත් කරන්නට ඕනෑ. එසේ කළොත් තමයි මෙයින් නියම ප්‍රයෝජන ගන්නට පුළුවන් වන්නේ. අපි පනතක් සම්මත කර ගත්තාට වෛද්‍යවරයා ලියන්නේත් එක බෙහෙත නම් පාරිභෝගිකයා මේ ගැන දන්නේ නැතිව බෙහෙත් සලට ගිහින් ඒක දුන්නාම ඔහුට ලැබෙන්නේ මිල ගණන් වැඩි බෙහෙතක් මිස මිල අඩු බෙහෙතක් නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහි තවත් වැදගත් දෙයක් තිබෙනවා. මෙම පනත් කෙටුම්පතෙහි 31.(1) උප වගන්තියෙන් ජාතික උපදේශක කමිටුවේ සංයුතිය ගැන සඳහන් වෙනවා. 31. (1) උප වගන්තියේ (අ) සිට (ප) දක්වා තමයි තිබෙන්නේ. ජාතික උපදේශක කමිටුවට පත් කිරීම් කරනකොට සේනක බිබිලේ අනුස්මරණ කමිටුවේ නියෝජිතයෙකුත් මේ කමිටුවට පත් කළොත් හොඳයි කියා මම යෝජනා කරනවා. සේනක බිබිලේ අනුස්මරණ කමිටුවත් මේ කටයුතුවලට ජාතික වශයෙන් දායකත්වයක් දක්වනවා. එම නිසා සේනක බිබිලේ අනුස්මරණ කමිටුවේ නියෝජිතයෙකුත් මේ කමිටුවට ඇතුළත් කරන ලෙස මම යෝජනා කරනවා. එය මේ ජාතික උපදේශක කමිටුවේ සංයුතියට ඉතාම වැදගත් වෙනවා.

මේ පනත් කෙටුම්පතේ ඊළඟට වැදගත් වෙන දෙයක් තිබෙනවා. අපි දන්නවා, අපි මොන දේ කළත් වැඩක් වෙන්නේ නැහැ කියා. මොකද, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව මේ බලතල විමධ්‍යගත වෙලා තිබෙන්නේ පළාත් ආයතනවලටයි. අපට නියම විධියට ඖෂධ ගබඩා කිරීමට සෑහෙන ඖෂධ ගබඩා ප්‍රමාණයක් තිබෙන බවක් අපි දකින්නේ නැහැ. රෝහල්වලට ගියාම අපි සමහර විට දකිනවා, ගෙනෙන බෙහෙත් හෝ සේලයින් බෝතල් ටික රෝහලේ verandah එකේ තිබෙන බව.

නිෂ්පාදකයා දන්වා තිබෙනවා, ඒ බෙහෙත් වර්ගය මෙන්න මේ වාගේ තැන්වල තියන්න ඕනෑ කියලා. නමුත් ඒ ප්‍රමිතියට නොවෙයි ගබඩා කරන්නේ. දිස්ත්‍රික් මට්ටමින් ගත්තොත් ඖෂධ ගබඩා තිබෙනවා. අපි ජාතික ඖෂධ ප්‍රතිපත්තියක් හදලා දැනට දිස්තික් මට්ටමින් තිබෙන ඖෂධ ගබඩා අලුත් කරලා -නවීකරණය කරලා- ඒ ගබඩා පහසුකම් වැඩි කරන්න ඕනෑ. මේවා අයිති වන්නේ පළාත් සභාවටයි කියලා හිතන්නේ නැතිව ඒ සඳහා ප්‍රතිපත්තියක් හදන්න. ඒ අනුව හැම දිස්ත්‍රික්කයකටම පූර්ණ පහසුකම් සහිත ඖෂධ ගබඩා ඇති කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම මම දැක්ක තවත් දෙයක් තිබෙනවා. පසු ගිය කාලයේ මම සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යවරයා හැටියට කටයුතු කරන කොට වෛද්‍ය සැපයීම් අංශයේ සාකච්ඡාවලට යනවා. සමහර දේවල් ඇණවුම් කළාම ඒවා අපට කෙළින්ම ලැබෙනවා. නමුත් ඒ ඇණවුම අනුව ලැබෙන බෙහෙත් ලබා ගන්න කොළඹට යන්නේ නැතිව පළාත් මට්ටමට, ප්‍රාදේශීය මට්ටමට බෙදා හරින්න ක්‍රමවේදයක් හදන්න පුළුවන් නම් ඒක ඉතාම වැදගත් වෙනවා. මොකද, ඒකෙන් වියදම අඩු කර ගන්න පුළුවන් වෙනවා. එහෙම නැත්නම් හැම එකකටම පළාත් සභාවට එන්න ඕනෑ. එහෙම නැත්නම් කොළඹට ඇවිල්ලා ඒ ඇණවුම් කළ බෙහෙත් ගෙන යන්න ඕනෑ. මේ අවශ්‍ය බෙහෙත් වර්ගවල නිර්ණායකයන්, අවුරුදු තුනෙන් තුනට හරි වෙනස් වෙන්න පුළුවන්. ඒ සඳහා තිබෙන හොඳම දේ තමයි, අපි දැනට අනුගමනය කරන ක්‍රමවේදය. අපි පළාත් මට්ටමින් අදහස් ගන්නවා. දිස්ත්‍රික් මට්ටමින් වෛද්‍ය අධ්‍යක්ෂවරුන්ගෙන් වාර්ෂිකව බෙහෙත් පාවිච්චිය ගැන අදහස් ගන්නවා. ඒක යථාවත් කරලා අවශ්‍ය බෙහෙත් වර්ග මොනවාද කියන එක තේරුම් ගෙන කටයුතු කරන්න ඕනෑ. වෛද්‍ය සායන වෙනම පවත්වනවා. එතකොට අපට මේ අවශ්‍යතාව හරියට තේරුම් අරගෙන පාරිභෝගිකයන්ට නියමිත මිලට බෙහෙත් ලබා ගන්න අවස්ථාව ලබා දෙන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටපු මහලේකම්වරයා අද ජනාධිපතිතුමා වෙලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිවරයා හැටියට කටයුතු කරන මොහොතක වැඩි ජනතා නියෝජනයක් තිබෙන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් හැටියට මේ ආණ්ඩුවේ දින සියයේ වැඩසටහන යටතේ කරන මේ කාර්යය සැබෑවක් කරන්න, මෙය එළිදක්වන්නට අපේ සක්‍රීය දායකත්වය ලබා දෙන්නට පුළුවන් වීම ගැන මම සතුටු වෙනවා. ස්තුතියි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මීළඟට, ගරු සුජීව සේනසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා.

[අ.භා. 1.53]

ගරු සුජීව සේනසිංහ මහතා (අධිකරණ හා කම්කරු සබඳතා නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு சுஜீவ சேனசிங்க - நீதி மற்றும் தொழில் உறவுகள் பிரதி அமைச்சர்)

(The Hon. Sujeewa Senasinghe - Deputy Minister of Justice and Labour Relations)

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හිටපු සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිවරයා මේ සම්බන්ධයෙන් ගොඩක් ධනාත්මක අදහස් ප්‍රකාශ කළා. ඒ ගැන බොහොම සන්තෝෂයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක වැදගත් පනත් කෙටුම්පතක්. මේක රටේ අවශ්‍යතාවක්. අවුරුදු ගණනාවක් තිස්සේ තිබුණු දැවෙන ප්‍රශ්නයකට විසඳුම් වශයෙන් මෙය ගෙන ඒම ගැන විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා සෞඛ්‍ය අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරද්දී විශාල උනන්දුවක් දක්වලා, රටේ සියලුම ජනතාවගේ සුබ සිද්ධිය සඳහා, සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බිහි කිරීම සඳහා ප්‍රධාන කාර්යයක් වශයෙන් සලකා විශාල වෙහෙස මහන්සියක් දරලා මේ ජාතික ඖෂධ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් කටයුතු කළා. මේ ජාතික ඖෂධ ප්‍රතිපත්තිය ඉදිරියට ගෙන ඒමට තිබුණු බාධක සම්බන්ධයෙන් අද එතුමා මේ පාර්ලිමේන්තුව දැනුවත් කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ගරු වෛද්‍ය රාජිත සේනාරත්න ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා වෛද්‍ය වරයෙක් වශයෙන් එතුමා තුළ තිබෙන හැකියාව, එතුමා තුළ තිබෙන දැනුම, එතුමාගේ උගත්කම, පරිණතභාවය මේ සියලුම දේවල් පාවිච්චි කරලා අද ඖෂධ සම්බන්ධයෙන් රටේ තිබෙන සංකීර්ණ ප්‍රශ්නය විසඳන්න කටයුතු කිරීම ගැන. මම හිතන හැටියට මේක සියයට සියයක්ම මේ ප්‍රශ්නය විසඳන ප්‍රතිපත්තිය නොවෙන්න පුළුවන්. හැබැයි, යම්කිසි ආකාරයක ප්‍රවේශයක් වශයෙන් ඉදිරියේදී අපට මේ ප්‍රතිපත්තිය පාවිච්චි කරන්න පුළුවන්ය කියා මම හිතනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ සාමාන්‍ය ජනතාව තුළ ඖෂධ සම්බන්ධයෙන් තිබෙන දැනීම ගැන කථා කරනවා නම්, රෝහලකට ගියාම, එහෙම නැත්නම් වෙනත් පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානයකට ගියාම වෛද්‍යවරයා ලියා දෙන තුණ්ඩුව අර ගෙන ගිහිල්ලා ඒකට ලබා දෙන ඕනෑම බෙහෙතක් බොන්න පුරුදු වෙලා ඉන්නවා. අපි internet එකේ බලන්නේ නැහැ, මේ බෙහෙතේ තිබෙන ගුණ අගුණ මොනවාද කියලා. මේ බොහෙත බිව්වොත් හොඳ වෙන්නේ කොහොමද කියන එක ගැන කිසිම දැනීමකින් තොරව වෛද්‍යවරයා දුන්න පලියට ගෙදර ගිහිල්ලා බෙහෙත බොනවා.

විශේෂයෙන්ම මෑත කාලයේ ඉන්දියාවේ ආක්‍රමණයත් එක්ක ඒ වාගේම ආසියාවේ ශත වර්ෂය කියලා හඳුන්වන මේ යුගයේ ඉන්දියාව, මලයාසියාව, සිංගප්පූරුව වාගේ රටවල් බොහෝ දුරට මේ ඖෂධ නිෂ්පාදනය කරන්න පටන් ගත්තා. ඉතිහාසය දෙස බැලුවොත්, ඉතිහාසයේ මේ ඖෂධ සම්බන්ධයෙන් මෙතරම් ලොකු ප්‍රශ්නයක් තිබුණේ නැහැ. බොහෝ දුරට මේ ඖෂධ නිෂ්පාදනය කළේ ජර්මනිය, එංගලන්තය, ප්‍රංශය, ඇමෙරිකාව වාගේ රටවල්. මේ ඖෂධ සම්බන්ධයෙන් කරන පර්යේෂණ, ඒවා සම්බන්ධයෙන් තිබෙන තත්ත්වය ඉතා උසස් අන්දමින් පවත්වා ගන්න මේ රටවල් බොහෝ වෙලාවට උනන්දු වුණා. හැබැයි, අන්තිම දශකය -අන්තිම අවුරුදු පහළොවක, විස්සක වාගේ කාලය - තුළ වතුර ගලා ගෙන එනවා වාගේ මේ රටට ඖෂධ ගලා එන්න පටන් ගත්තා. ඇත්තටම මේ පනත් කෙටුම්පත නොගෙනෙන්න මේ රටේ ජනතාවට විශාල ප්‍රශ්නයකට මුහුණ පාන්න සිදු වනවා.

මගේ දෙමාපියන් වුණත් වයස අවුරුදු 70 පසු කරලා ඉන්න උදවිය. මගේ දෙමාපියන් වෙනුවෙන් මම බෙහෙත් ගොඩක් ගන්නවා. අපි පාර්ලිමේන්තුවේ වෛද්‍ය මධ්‍යස්ථානයෙන් මේ බෙහෙත් ගන්න ගියාම ලියාපු බෙහෙත නැති වුණාම වෛද්‍යවරයා එහෙම නැත්නම් වෛද්‍යවරිය අපෙන් අහනවා "මේ ලියාපු බෙහෙත නැහැ, ඒ වෙනුවට වෙන බෙහෙතක් දෙන්න ද?" කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ බෙහෙත් විවිධ නම්වලින් එනවා. ඒවා මොන ගුණාංගවලින් සමන්විතද, ඒ බෙහෙත්වල අඩංගු වන්නේ මොනවාද කියන එක සම්බන්ධයෙන් අපට වැටහීමක් නැහැ. මේ බෙහෙත හොඳයි, මේක බීලා බලන්න කියලා දොස්තර මහත්මයා කිව්වාම ජනතාව ඒ බෙහෙත බොනවා. හැබැයි, මේ වාගේ පාලනයක් ඇති වෙද්දී ගරු ඇමතිතුමා සඳහන් කළ පරිදි, විශේෂ දැනුමක් තිබෙන විශේෂඥ වෛද්‍යවරු ඒ වාගේම අනෙකුත් මීට අදාළ නිලධාරි මහත්වරු පාවිච්චි කරලා, අපි බොන බෙහෙත මොන සුදුසුකම් මත නිර්මාණය කරලා ද, මොන ආයතනය මඟින් මොන පදාර්ථ ඇතිව නිර්මාණය කරලා ද, මේ බෙහෙතෙන් ලැබෙන ගුණාංගය මොකක්ද කියන මේ සියලු දේ සම්බන්ධයෙන් විශ්වාසය ගරු ඇමතිතුමා විසින් ගෙනෙන මේ පනත් කෙටුම්පත මත රඳවලා තිබෙනවා. එතකොට ලෙඩාට තීන්දු කරන්න වෙන්නේ නැහැ බෙහෙතේ අගය. බෙහෙතේ අගය තීන්දු කරන්නේ වෙනම මණ්ඩලයක් විසිනුයි. විශේෂඥ වෛද්‍යවරු පස් දෙනකු ඉන්නවා කිව්වා. ඒ වෛද්‍ය ආයතනවලට අදාළ නිලධාරින් හතර දෙනකු ඉන්නවා කිව්වා. ඒ ආකාරයට 23දෙනකුගෙන් සමන්විත විශේෂ කණ්ඩායමක් පරීක්ෂණ කරලායි මේ තත්ත්වය සම්බන්ධයෙන් අපට වාර්තා ලබා දෙන්නේ. එවිට අපට ඒ විශ්වාසය තිබෙනවා. එතකොට රෝගියාට, රටේ ජනතාවට ඒ බෙහෙතේ අගය තීන්දු කරන්න අවශ්‍ය වන්නේ නැහැ. ඒ ලැබෙන බෙහෙත අනිවාර්යයෙන්ම සියයට සියයක්ම අංග සම්පූර්ණව අපට ලබා දෙනවා කියන විශ්වාසය රටේ ජනතාවට ඇති වනවා. එතකොට බෙහෙත බොන්න ඉස්සරින් ලෙඩ හොඳ වෙනවා. මොකද, ගොඩක් වෙලාවට ලෙඩ රෝග ඇති වන්නේ අයහපත් මානසිකත්වය තුළිනුයි. ගරු රාජිත සේනාරත්න ඇමතිතුමා දන්නවා, වෛද්‍යවරු කියන්නේ මනස හදා ගන්න ඕනෑය කියලායි. දැන් මේකෙදී අප ලබා ගන්නා බෙහෙතේ ගුණාංග සම්බන්ධයෙන් අපට විශාල විශ්වාසයක් තිබෙනවා. ඒක සියයට සියයක්ම නොවෙන්න පුළුවන්. හැබැයි, සියයට 98ක්, සියයට 99ක් මේ බෙහෙතෙන් අපට ලැබෙන සුවය සම්බන්ධයෙන් විශ්වාසය ඇති වුණාම, ජනතාවට තමන්ගේ සෞඛ්‍යය සම්බන්ධයෙන් විශාල විශ්වාසයක් ඇති කර ගන්න පුළුවන්.

ගරු ඇමතිතුමනි, තව කාරණයක් අපි ඔබතුමාගේ අවධානයට යොමු කරවනවා. මේ සම්බන්ධයෙන් මේ රටේ තිබෙන අවශ්‍යතාවන් අපි පෙළගස්වා බැලුවොත් මේ කරපු පුණ්‍ය කාර්යය සම්බන්ධයෙන් ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට -අපේ ජනාධිපතිතුමාට- මේ අවස්ථාවේදී අපේ ප්‍රසංශාව රට වෙනුවෙන් පුද කරන්න ඕනෑ. එතුමා මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් විශාල උත්සාහයක් ගත්තා. මේ පනත් කෙටුම්පත නැති වුණා; හොයා ගන්න බැරි වුණා. හැබැයි, අන්තිමට එතුමා ජනාධිපති වෙලා මේ පනත් කෙටුම්පත ගෙනෙන්න සූදානම් කරලා ඒ කාර්යය භාර දුන්නේ තමන්ගේ දකුණු අත වාගේ ඉන්න සගයා වන අපේ ගරු රාජිත සේනාරත්න ඇමතිතුමාටයි. කෙළින් කථා කරන, හරියට වැඩ කරන ඇමතිවරයකු වශයෙන් එතුමාට මේ සම්බන්ධයෙන් විශාල කාර්ය භාරයක් කරන්න පුළුවන්. අපි විශ්වාස කරනවා එතුමා ඒ කාර්ය භාරය කරාවි කියලා. [බාධා කිරීමක්] කවදාවත් නැහැ. විමල් වීරවංශ මන්ත්‍රීතුමනි, ඔබතුමා එහෙම කිව්වාට ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටත්, ගරු රාජිත සේනාරත්න මැතිතුමාටත් මා වචනයක් හෝ කියලා හැන්සාඩ් වාර්තාවක සඳහන් වනවා නම් පෙන්වන්න. එහෙම වුණොත් මා මේ කියන දේවල් ඉල්ලා අස්කර ගන්නවා.

ගරු මන්ත්‍රීතුමනි, මම කියන දේවල් ඉල්ලා අස් කර ගන්නා පුද්ගලයෙක් නොවෙයි. ගහට ගැහුවා වාගේ කියන එක එහෙමම හිටිනවා.

[ගරු සුජීව සේනසිංහ මහතා]

එවැනි ජන නායකයන් දෙදෙනෙක් ආශ්‍රය කරලා, එක් කෙනෙක් ජනාධිපතිවරයා බවට පත් කරලා, අනික් එක්කෙනා එතුමාගේ දකුණු අත බවට පත් කරලා, ශක්තිමත් ආණ්ඩුවක් බිහි කරලා, අපි බලාපොරොත්තු වන යහ පාලනය ඇති කරන්න කටයුතු කරනවා. ඒ සඳහා එතුමන්ලා දරන උත්සාහය ගැන මම ආඩම්බර වෙනවා.

විශේෂයෙන් ජනාධිපතිතුමාගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් අද කැන්ටීන් එකේදීත් කථා කළා. එදා මේ රටේ තිබුණු තත්ත්වය යටතේ, රතු මාලය, රතු සාටකය දැක්කාම කකුල් වෙවිලන්න පටන් ගත්තා. ඒ කාලය ගැන මම හිටපු ඇමතිවරුන්ට මතක් කරලා දුන්නා. දැන් එතුමන්ලාට ඒවා අමතක වෙලා. මම කිව්වා, "දැන් එහෙම දෙයක් නැහැ" කියලා. ජනාධිපතිතුමා කැන්ටීන් එකේ හිටියා, අපි දන්නේත් නැහැ. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් මමත් කථා කරමින් හිටියේ. එතකොට මම ඔබතුමාටත් සඳහන් කළා, රතු සාටකයට, රතු මාලයට මේ රටේ ජනතාව තුළ තිබුණු භය ගැන; ඔබතුමන්ලා තුළ තිබුණු භය ගැන; නීතිඥතුමන්ලා තුළ තිබුණු භය ගැන. [බාධා කිරීමක්] ඔබතුමන්ලා නැහැ කියයි. හැබැයි අපි දන්නවා. වාසුදේව නානායක්කාර මැතිතුමන්ලා නම් කෙළින් කටයුතු කළා කියලා අපි දන්නවා. ඔබතුමාත් පොඩි ෆයිට් එකක් දීලා තිබුණා පවුල් පාලනයක් තිබෙනවා කියලා. ඒක පත්තරේ තිබුණා. ආණ්ඩුව ඇතුළේ ඉන්න කොට සටන් කරන්න අමාරුයි. හැබැයි, ඔබතුමන්ලා මොනවා හරි සටනක් කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනෙක් සමහර මන්ත්‍රීවරුන්ට, ඇමතිවරුන්ට කථා කරන්න බැරි, එතුමන්ලාගේ කටවල් වහන ඒකාධිපති වියරුවෙන් ක්‍රියාත්මක වුණු ආණ්ඩුවක් තමයි තිබුණේ. අපි ඒ ක්‍රමය වෙනස් කළා. අපි ඒක අගය කරනවා. අද කැන්ටීන් එක ළඟ හිටපු ආරක්ෂක භටයන් තමයි කිව්වේ ජනාධිපතිතුමා ඇතුළේ ඉන්නවා කියලා. වෙන දා ජනාධිපතිතුමා එනවා කියනකොට පාර්ලිමේන්තුව වෙවිලන්න පටන් ගන්නවා; පාර්ලිමේන්තුවේ නිලධාරින් වෙවුලන්න පටන් ගන්නවා. හැබැයි, අද එහෙම ක්‍රමයක් නැහැ. අපි ඒක අගය කරනවා. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන්ලා, රාජිත සේනාරත්න මැතිතුමන්ලා පිහිටවපු මේ ආණ්ඩුවේ එවැනි බියක් සැකක් නැහැ. ජනාධිපතිතුමාට දිය යුතු ගෞරවය අපි දෙනවා. එතුමා නිහතමානී ලෙස මේ රටේ නායකයා වශයෙන් රටේ පරිපාලනය ගෙන යන්න කටයුතු කරන එක අපි අගය කරනවා.

එතුමා මහන්සි වෙලා හදපු මේ ඖෂධ ප්‍රතිපත්තිය තමන්ගේ දකුණු අත වාගේ ඉන්න පුද්ගලයාට -රාජිත සේනාරත්න මැතිතුමාට- බාර දීලා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මම ආඩම්බර වෙනවා. විශේෂයෙන්ම අද උදේ එතුමා කථා කරනකොට මම ආඩම්බර වුණා. විශේෂයෙන්ම, රාජිත සේනාරත්න මැතිතුමාට එතුමා දෙන ඒ ශක්තිය සම්බන්ධයෙන් අපට ආඩම්බරයක් ආවා, අපි බිහි කරපු ජනාධිපතිතුමා නේද ඉතා සංයමයෙන් යුතුව, නිහතමානී ලෙස මේ විධියට තමන්ගේ කාර්ය භාරය කරන්නේ කියලා. සමහර විට එතුමා දේශපාලනය නොකර ඉඳීවි. සමහර විට එතුමා දේශපාලනය කරන එකත් සුදුසු නැහැ. එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයා තමයි. හැබැයි, රටේ අනාගතය වෙනුවෙන් අපි සියලු දෙනාම කටයුතු කළ යුතුයි. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් තමයි අපිත් බලාපොරොත්තු වෙන්නේ.

රටට කරපු මේ විනාශය ගැන බලනකොට සමහර අය කියනවා, මෙක විනාශයක් නොවෙයි කියලා. ඒකාධිපති වියරුව ගැන අපි කථා කළා; ඔබතුමන්ලා කථා කළා. ස්වාධීන කොමිෂන් සභා හරහා දේශපාලන අධිකාරියට බලය නැති වෙනකොට සමහර විට නිලධාරි මහත්වරු ඔළුව උස්සලා, ඒ අය ඒකාධිපති වියරුවෙන් ක්‍රියා කරලා ඒක රටට ඇණයක් වෙන්න පුළුවන්. එහෙම වෙන්නත් පුළුවන්. හැබැයි, මේ රටේ ජනතාව බලාපොරොත්තු වුණ ඒ ස්වාධීන කොමිෂන් සභා අනාගතයේදී අපි ඇති කරනවා.

විශේෂයෙන්ම ඖෂධ සම්බන්ධයෙන් රාජිත සේනාරත්න ඇමතිතුමන්ලා මේ ගත්ත පියවර රටේ ඉදිරි අනාගතයට දමන අත්තිවාරමක්. සෞඛ්‍ය සම්පන්න ජනතාවක් ගොඩ නැගීමේ කාර්ය භාරයට පෙර හුරුවක් බවට මේ පනත් කෙටුම්පත පත් වෙනවා.

වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ පනත් කෙටුම්පත අධ්‍යයනය කර තිබෙන බව මම දන්නවා. මේ අපට අවශ්‍ය කරපු දෙයක්. මගේ පවුලේ වෛද්‍යවරු ඉන්නවා. මගේ සහෝදරයා, සහෝදරයාගේ බිරිඳ, සහෝදරයාගේ දරුවන් ඔක්කොම වෛද්‍යවරු.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වුණත් අපට ප්‍රශ්නයක් තිබෙනවා, ගරු ඇමතිතුමනි. ලංකාවේ වෛද්‍ය වෘත්තිය සම්බන්ධයෙන් කිසිම දෙයක ගණන් හිලවු නැහැ. පෞද්ගලික රෝහලකට ගියාම මට රුපියල් ලක්ෂ හතර හමාරක බිලක් දැම්මා. මෙහෙන් අපට ඉන්ෂුවරන්ස් එකක් හම්බ වෙනවා නේ. ඒ ඉන්ෂුවරන්ස් එක තිබෙන නිසා මම check-up එකක් කරගන්න ගියා. දණ හිසට පොඩ්ඩක් තට්ටු කරලා කිව්වා, දණ හිසේ පොඩි අප්සෙට් එකක් තිබෙනවා කියලා. මම ඇඳේ ඉන්දෙව්වා. දොස්තර මහත්මයා ආවා. විනාඩි භාගයක්වත් කථා කළේ නැහැ. දණ හිසට මොකක්දෝ කරන්න තිබෙනවා කියලා ඉංග්‍රීසි භාෂාවෙන් මොකක්දෝ වචනයක් කිව්වා. ඒක මට තේරුණේත් නැහැ. එයා ගියාට පස්සේ කිව්වා, "හෙට ගන්නවා" කියලා. මම දැනගෙන හිටියේ නැහැ, ශල්‍යකර්මයක්ද නැද්ද කියලා. අනික් දවසේ මම ඇහුවා, "Can I talk to you for a second? I want to know what you are doing" කියලා. එතකොට තත්පර 40ක් මා සමඟ කථා කළා. කලින් දවසේ තත්පර 20යි කථා කළේ. "There is a small surgery"- සමාවෙන්න, surgery කියන වචනය කිව්වේත් නැහැ. "There is a procedure" කිව්වා. "Is it a surgery?" කියලා මම ඇහුවා. "Yes, yes, a small one" කියලා ගියා. අනික් දවසේ ගියාම මගේ ඔළුවේ ඉඳන් වහලා, මම ශල්‍යකර්මයකට ලෑස්ති කළා. ශල්‍යකර්මයේදී, පොඩි කැමරාවක් යවලා බැලුවාලු දණ හිසට මොනවාද වෙලා තිබෙන්නේ කියලා. බිල රුපියල් ලක්ෂ හතරහමාරයි. මම රෝහලෙන් ඇහුවා, "මෙච්චර බිලක් එනවා; කරන්නේ මෙන්න මේකයි කියලා ඔබතුමන්ලා මට කිව්වාද?" කියලා. ඒ වාගේ කටයුතුවලදී අද අපේ රටේ ප්‍රතිපත්තියක් නැහැ, ගරු ඇමතිතුමනි.

විශේෂයෙන්ම රාජිත සේනාරත්න ඇමතිතුමා කිව්වා, පළමුවෙන්ම ඖෂධ සම්බන්ධයෙන් මේ ප්‍රතිපත්තිය හදනවා කියලා. එංගලන්තයේ, ඇමෙරිකාවේ, ප්‍රංශයේ නම් යම්කිසි ශල්‍යකර්මයක් කරනකොට ඒ ශල්‍යකර්මයට නියමිත ගණනක් තිබෙනවා. දණහිස සම්බන්ධයෙන් කරන ශල්‍යකර්මයක් නම් ඒකට අය කරන ගණනක් තිබෙනවා. දණහිස සම්බන්ධයෙන් කරන ශල්‍යකර්මය සඳහා එංගලන්තයේ අය කරන්නේත් රුපියල් එක්ලක්ෂ හැටදහසක් වාගේ මුදලක්. ඒකට ඉංග්‍රීසි භාෂාවෙන් මොකක්ද එකක් කියනවා. ඒ ශල්‍යකර්මය කැමරාවක් යවලා බලලා කරන එකක්.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
A keyhole surgery.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

නැහැ, මන්ත්‍රීතුමනි. ඒ ශල්‍යකර්මයට වෙන නමක් කියනවා. මට ඒක මතක නැහැ. මතක් වුණු ගමන් මම කියන්නම්. අපේ දුප්පත් මනුෂ්‍යයෙක් පෞද්ගලික රෝහලකට ගියොත් මොකද වෙන්නේ? ඊයේ අපේ මන්ත්‍රීවරයෙකුගේ අම්මා කෙනෙක් හුස්ම ගන්න අපහසු වෙලා ඒකට දුම් අල්ලන්න රෝහලකට ගියා. ඇය රෝහලෙන් එළියට එන කොට බිල රුපියල් ලක්ෂ තුනහමාරක්. ඒක දකින ලෙඩා එළියට එනකොට මැරෙනවා. මේ රටේ මේවා ගැන කිසිම ප්‍රතිපත්තියක් නැහැ. ජනතාව වෙනුවෙන් කථා කරපු මහින්ද රාජපක්ෂ මහත්තයා මේවා තඹ දොයිතුවකට ගණන් ගත්තේ නැහැ. අඩු තරමින් මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට මේ පනත් කෙටුම්පත ගෙනෙන්න ඉඩ දුන්නේ නැහැ.

මම ඊයේ කිව්වා, ජනාධිපති මන්දිරයේ මෝරු හිටියා කියලා. ඒත් නැහැ කියලා කියනවා. නමුත් මෝරු හිටියා. රුපියල් ලක්ෂපහමාරක් වටිනා කොකටු කියලා කුරුළු ජාතියක් හිටියා. තව හිටියා, රුපියල් ලක්ෂ හතහමාරක් පමණ වටිනා කුරුල්ලන්. රුපියල් ලක්ෂ තිහක් වටිනා කුරුල්ලන් පවා ඇතුළේ හිටියා. මැකෝ, කොකටු වැනි කුරුල්ලන්. කොටියෝ, මුගටියෝ වැනි හැම සතෙක්ම හිටියේ ජනාධිපති මන්දිරයේ. වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා එතැනට ගියා නම් බලන්න තිබුණා. අන්තිමට රුපියල් දසදහසක් පමණ වටිනා Boxer බල්ලෙක් අස්සක ඉඳලා හමු වුණාලු. එච්චරට බල්ලෝ හිටියා. මගේ යාළුවෙකුගේ ගෙදරත් ජනාධිපතිතුමා හදන විධියේ බල්ලෙක් හිටියා. පොඩි මී පැටවු වාගේ බල්ලෙක්. බූල් තිබෙන බල්ලෙක්. එක සතෙක් රුපියල් ලක්ෂ තිස්පහක්, හතළිහක් වෙනවා. මෙන්න මේ වාගේ දේවල්වලට තමයි අපේ හිටපු ජනාධිපතිතුමා උනන්දු වුණේ. තමන්ගේ දරුවෝ, තමන්ගේ සහෝදරයෝ මේවා ගැන තමයි උනන්දු වුණේ. මේ රටේ ඖෂධ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් මේ රටේ දුප්පත් ජනතාව සම්බන්ධයෙන් කිසිම උනන්දුවක් දැක්වූයේ නැහැ. හැබැයි, මෛත්‍රීපාල සිරිසේන මහත්තයා බලයට ආපු ගමන්ම දින සියයක් තුළ මේ කරන කටයුතු අපි අගය කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කිසිම ආණ්ඩුවක් මේවා කරලා නැහැ. අපට මේවා කරන්න අමාරුයි. මේ කරන කාර්ය භාරය දේශපාලනඥයන් වශයෙන් අපට අවාසියි. ස්වාධීන කොමිෂන් පත් කරමින් ස්වාධීනව මේ කටයුතු කරන කොට අපට දේශපාලනය කරන්න බැරි වෙනවා. අපට බලපෑම් කරන්න බැරි වෙනවා. අපට ඒකත් පාඩුවක්. අපි ඒකත් කියන්න ඕනෑ. අපි ඒවා කරන්නේ රටේ ජනතාව ඒවා බලාපොරොත්තු වෙන නිසායි. මේවා කරපු ගමන්ම මේවායේ ප්‍රතිඵල නොලැබෙන්න පුළුවන්. මේ ස්වාධීන ක්‍රමය අපට දරා ගන්න බැරි වෙන්න පුළුවන්. මේ ස්වාධීන ක්‍රමය තුළ රජයේ නිලධාරින් බලවත් වෙන්න පුළුවන්. හැබැයි, ගරු මන්ත්‍රීතුමනි, මේ ගෙනෙන අණපනත් තුළින් අවුරුදු දහයකින් හෝ අවුරුදු පහළොවකින් හෝ මේ රටේ අප බලාපොරොත්තු වන ප්‍රජාතන්ත්‍රවාදය, යහ පාලනය, නීතියේ ස්වාධීනත්වය අපට ළඟා කර ගැනීමට පුළුවන් වෙයි.

මම විශේෂයෙන්ම ගරු රාජිත සේනාරත්න ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මම එතුමා එක්ක කථා කළා; සාකච්ඡා කළා. එතුමා විශේෂයෙන්ම උනන්දුවක් දක්වනවා, මේ රටේ ඖෂධ නිෂ්පාදනය කිරීම සම්බන්ධව. මම එතුමාගෙන් ඒ ගැන ඇහුවා. එතුමා කිව්වා, "මෙන්න මෙහෙමයි නිෂ්පාදනය කරන්නේ, මෙයින් රුපියල් බිලියන 25ක පමණ ආදායමක් රටට ලබා ගන්න පුළුවන්, විශේෂයෙන්ම රෝහල්වලට අවශ්‍ය උපකරණ, කතුරු, පිහි යනාදි මේ සියල්ල මේ රටේ නිෂ්පාදනය කරන්න - මගේ අමාත්‍ය ධුරය තව අවුරුදු හතරක්, පහක් තිබුණොත් - මගේ කාලය තුළ අනිවාර්යයෙන්ම කටයුතු කරනවා" කියලා. එහෙම වුණොත් අපට කොපමණ විදේශ විනිමයක් ඉතුරු කර ගන්න පුළුවන්ද? ඒ සහන කොපමණ ප්‍රමාණයක් ජනතාවට ලබා දෙන්න පුළුවන්ද? එතුමා ඒ ගැන කිව්ව ගමන්ම, මම අපේ ව්‍යාපාරික ප්‍රජාව එක්ක කථා කරලා ඒ දේවල් මේ රටේ නිෂ්පාදනය කිරීමට අදහස් ඉදිරිපත් කළා. ගරු ඇමතිතුමා කිව්වා, "සුජීව, මේ දේවල් රටේ නිෂ්පාදනය කරනවා නම් කිසිම පැකිළීමක් තියා ගන්න එපා. සියලු වැඩ ටික ඉබේම සිදු වෙයි. ඒ සඳහා අපේ උපරිම සහයෝගය ලබා දෙනවා." කියලා. එතුමා ඒ සම්බන්ධව කිසිම ප්‍රශ්නයක් ඇසුවේ නැහැ. කාගේද, කොහේද කියලා ඇසුවේ නැහැ. "රටේ නිෂ්පාදනය කරනවා නම්, ඒ වාගේම ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව උසස්ම ඖෂධ කියලා ඔබතුමන්ලා සහතිකයක් දෙනවා නම් ඒ අයට කිසිම බාධාවක් නැහැ. උපරිම සහයෝගය ලබා දෙනවා, පගා, කොමිෂන් මොනවත් නැහැ. ඔබතුමා ඒ ආයෝජන ගෙනෙන්න" කිව්වා. "විසිතුන්දෙනෙකුගෙන් සමන්විත ඉතා දක්ෂ නිලධාරි මඩුල්ලක් ඉන්නවා. ඒ නිලධාරින් ඒවා අනුමත කරාවි" කිව්වා. මේ රටේ අපේ භූමිය පාවිච්චි කරලා, අපේ යන්ත්‍රෝපකරණ පාවිච්චි කරලා මේ ඖෂධ, මේ ආම්පන්න අපේ රටේ නිෂ්පාදනය කිරීමට පටන් ගත්තොත් රැකියා 25,000ක් - 30,000ක් වාගේ ප්‍රමාණයක් නිර්මාණය කරන්න පුළුවන්, ගරු මන්ත්‍රීතුමනි. අපි ඒක කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම ඒ සම්බන්ධයෙන් මගේ ලොකු විශ්වාසයක් තිබෙනවා. රාජිත සේනාරත්න මැතිතුමා තව අවුරුදු දෙක, තුනක් යනතෙක් මේ අමාත්‍ය ධුරයේ කටයුතු කළොත් එතුමා බලාපොරොත්තු වෙන ඒ කාර්යයේ ප්‍රතිඵල ඉදිරි අනාගතයේදී රටට ලබාගන්න පුළුවන් වෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි හැම තිස්සේම මේ ගැන කථා කළා. අපි අවුරුදු විස්සක් මේ රටේ කර්මාන්ත ආරම්භ කළේ නැහැ. අපි මේ රටේ three-wheelers හැදුවේ නැහැ; අපි මේ රටේ බස් රථ හැදුවේ නැහැ; අපි මේ රටේ කෝච්චි හැදුවේ නැහැ. අපි මේ රටේ මොනවත් හැදුවේ නැහැ. අපි ට්‍රැක්ටරයක්වත් මේ රටේ හැදුවේ නැහැ. අපි ඔබතුමන්ලාට පොරොන්දුවක් දෙනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Deputy Minister, your time is over.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, give me half a minute.

අවුරුදු දෙක තුනක් යනකොට මේ රටේ ජනතාව බලාපොරොත්තු වෙන ඒ සියලු කර්මාන්ත - කර්මාන්ත 3,000ක්, 4,000ක් - අපි මේ රටට ගෙනෙනවා. විශේෂයෙන්ම වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමන්ලා නියෝජනය කරන කම්කරු පන්තියට රුපියල් 70,000ක, රුපියල් 80,000ක වැටුපකට වැඩ කරන්න පුළුවන් වාතාවරණය අපි ඇති කරනවා. එතකොටත් ප්‍රශ්න ඇති වෙයි. ඒ කර්මාන්ත තුළ ඒ කම්කරුවන්ගේ අවශ්‍යතා වෙනුවෙන් ඔබතුමන්ලාට සටන් කරන්න සිදු වෙයි. හැබැයි, ඒ ඉහළ මට්ටමකින්. රුපියල් 75,000ක්, 80,000ක් වැටුප් ගන්නා කම්කරුවා වෙනුවෙන් තමයි ඔබතුමන්ලාට සටන් කරන්න සිදු වෙන්නේ. ඒ අයිතිවාසිකම් වෙනුවෙන් තමයි සටන් කරන්න සිදු වෙන්නේ.

එම නිසා අපි විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා, මෙම ඖෂධ ප්‍රතිපත්තියත් එක්කම සියලු කම්කරුවන්ට ඉදිරියේ දී රක්ෂණ ක්‍රමයක් ඇති කරලා දෙන්න කියලා. සමහර වෙලාවට ආණ්ඩුවේ ඉස්පිරිතාලයෙන් operation එක කර ගන්න බැරි වෙන්න පුළුවන්. ඒ අවස්ථාවේදී ඔවුන්ට ලැබෙන සහයෝගය ඉතාම වටිනවා. රැකියාවක් කරන්න බැරි නම් ඔවුන්ට ආදායම් ලැබෙන

[ගරු සුජීව සේනසිංහ මහතා]

මාර්ගයක් ඇති වන ක්‍රමයකුත් අපේ රටේ කම්කරු ජනතාව වෙනුවෙන් ඇති කළ යුතුයි. ගරු රාජිත සේනාරත්න මැතිතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශයට අදාළ නොවුණත් අපේ රටේ දුප්පත් ජනතාව වෙනුවෙන් ඔබතුමා ඒ සම්බන්ධයෙනුත් කටයුතු කරයි කියා මා බලාපොරොත්තු වනවා.

රටේ ජනතාව වෙනුවෙන් අද මේ ගෙනා ඖෂධ ප්‍රතිපත්තියට විශේෂයෙන්ම අපේ ජනාධිපතිතුමාටත්, රාජිත සේනාරත්න ඇමතිතුමාටත්, අපේ අගමැතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා. ගරු මන්ත්‍රීවරුනි, මේ රටේ ඉදිරි අනාගතය වෙනුවෙන් ඔබතුමන්ලා ලබා දෙන සහයෝගය අපි ඉතාමත් ආදරයෙන් භාර ගන්නවා කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 2.11]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Plantation Industries and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම මහාචාර්ය සේනක බිබිලේ මැතිතුමා ජාතික වීරයෙක් පමණක් නොවෙයි, ජාත්‍යන්තර වීරයෙක් හැටියට අපට සලකන්න පුළුවන්. මොකද, මට මතකයි, 1970 ගණන්වල අපි නීති විද්‍යාලයේ ඉන්න කාලයේ තමයි මේ ඖෂධ ප්‍රතිපත්තිය එතුමා ලංකාවට පමණක් නොවෙයි, මුළු ලෝකයටම හඳුන්වා දුන්නේ. 1970 සමඟි පෙරමුණු රජය කාලයේ එතුමා රාජ්‍ය ඖෂධ සංස්ථාවේ සභාපතිවරයා හැටියට සිටියා. ඒ කාලයේදී තමයි මේ ඖෂධ ප්‍රතිපත්තිය මුළු ලෝකයටම හඳුන්වා දුන්නේ. මීට කලින් කිසිම කෙනෙක් ඖෂධ ප්‍රතිපත්තිය ගැන මේ ආකාරයට හිතලා නැහැ. මේක ඉතා සරල දෙයක්. මහා පරිමාණයේ සමාගම්, ජාත්‍යන්තර ඖෂධ සමාගම් ජනතාවගෙන් මුදල් ගසා කන හැටි ඔහු ලෝකයට පෙන්වා දුන්නා.

මේ පනත් කෙටුම්පතින් වෙන්නේ ඉතාම සරල දෙයක්. මොකක්ද වෙන්නේ? ඕනෑම බෙහෙතක ඖෂධ නාමයක් තිබෙනවා. ඒ ඖෂධ නාමයෙන් බෙහෙත් තොග ගණන් මිලදී ගන්න කොට ඉතාම අඩු මිලකට ගන්න පුළුවන්. ඒ එක පෙත්තක් ශතයකට, දෙකකට හදන්න පුළුවන්. නමුත් ජාත්‍යන්තර සමාගම් මොකක්ද කරන්නේ? තොග පිටින් බෙහෙත් අරගෙන ඒකට වෙළෙඳ නාමයක් දානවා. ඒ වෙළෙඳ නාමය මුළු ලෝකය වටේ ප්‍රචාරය කරන්න කෝටි, ප්‍රකෝටි ගණනක් මුදල් වැය කරනවා. අවසාන වශයෙන් ශත දෙකකට, තුනකට හදන්න පුළුවන් බෙහෙතක් ඒ සමාගමේ වියදම් එකතු කළාම බෙහෙත් පෙත්ත සාමාන්‍යයෙන් දෙන්නේ ශත අනූවකට පමණ. එතුමා ඒක පෙන්වා දුන්නා. ඔහු කිව්වා, මුළු ලෝකයේම ඖෂධ නාමයෙන් බෙහෙත් 350ක් තිබෙනවා; ඒ 350 වෙළෙඳ නාමයක් නැතුව ඖෂධ නාමයෙන්ම ලංකාවට ගෙනාවා නම් ඉතාම අඩු මුදලකට මේ බෙහෙත් අපේ රටේ ජනතාවට ලබා දෙන්න පුළුවන් කියලා. ඒ විධියට ඔහුගේ මතය ඉදිරිපත් කළා. ඒක එක්සත් ජාතීන්ගේ සංවිධානය පිළිගත්තා. එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් මේ ක්‍රියාදාමයට ඔහුට සම්මානත් ලැබුණා. 1970 ගණන්වල මුල් භාගයේ ආරම්භ කළ මේ ක්‍රියාදාමය අපේ රටේ පිළිගන්න අවුරුදු 40ක් ගියා. ඇත්ත වශයෙන්ම අපි ඒ ගැන කනගාටු වන්න ඕනෑ. අද ලෝකයේ රටවල් 90ක් සේනක බිබිලේ මහතාගේ ඖෂධ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනවා. නමුත් එය ආරම්භ කළ ශ්‍රී ලංකාවේ අවුරුදු 40ක් ගියා, ඒ ක්‍රමය ක්‍රියාත්මක කරන්න.

ඇත්ත වශයෙන් ඔහු ඖෂධ ප්‍රතිපත්තිය ආරම්භ කළ නිසා ඔහුට සිදු වුණේ කුමක්ද? ඔබතුමන්ලා internet එකේ තිබෙන Wikipedia බලනවා නම් ඒකේ තිබෙනවා පෙනේවි, ඔහුගේ නම, උපන් දිනය සඳහන් වනවා වාගේම ඔහුගේ මරණයට හේතුව - cause of death- දාලා තිබෙන්නේ සැක සහිතයි - mysterious - කියලා බව.

ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමන්ලාට මතක ඇති, හැත්තෑ ගණන්වල කාලය. බටහිර ඉන්දීය කොදෙව්වල -මම හිතන්නේ ජැමෙයිකාවේ- ජාත්‍යන්තර සම්මේලනයකට ගිය අවස්ථාවක තමයි ඔහු හදිසියේම මිය ගියේ. ඔහුට කිසිම අසනීපයක් තිබුණේ නැහැ. ජාත්‍යන්තර නිරීක්ෂකයන් පවා පිළිගන්නවා, ඔහුගේ මරණය අභිරහසක් කියලා. මොකක්ද, ඒ අභිරහස? ජාත්‍යන්තර ඖෂධ සමාගම්වලට විරුද්ධව ක්‍රියා කළ නිසා ඔහුගේ මරණය සිදු වෙන්නට ඇති බවත්, ඒ පිටුපස මෙම සමාගම් සිටිනවා කියන එකත් තහවුරු කරලා තිබෙනවා.

එක්සත් ජාතික පක්ෂයේ අගමැතිවරයෙක් ආණ්ඩුවේ ඉන්න අවස්ථාවේදි මෙම පනත ක්‍රියාත්මක කිරීම ඉතාමත් වටිනවා. මොකද? මහාචාර්ය සේනක බිබිලේ මැතිතුමා මෙය ආරම්භ කළා වුණත්, 1994 වර්ෂයෙන් පසු අවුරුදු 20ක් පමණ මේ රටේ වාමාංශික සමාජවාදී ආණ්ඩු තිබුණා. සේනක බිබිලේ මහතා වාමාංශිකයෙක්. ඔහු වාමාංශික ව්‍යාපාරයට විශාල වශයෙන් දායකත්වයක් ලබා දුන්න කෙනෙක්. ඒ වාගේම 1994න් පසු බලයට පත් වුණු වාමාංශික රජයන්ටවත් එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්න බැරි වුණා. එම නිසා ප්‍රමාද වෙලා හරි දෙගොල්ලෝම -ආණ්ඩු පක්ෂයෙනුත්, විපක්ෂයෙනුත්- එකතු වෙලා මේ පනත් කෙටුම්පතය සහාය දීලා මේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙන් මම හිතන්නේ අපේ රටේ අහිංසක ජනතාවට විශාල සේවයක් වන බවයි. ඒ සම්බන්ධයෙන් දෙපැත්තේම සිටින ගරු මන්ත්‍රීවරුන්ට මාගේ ස්තුතිය පුද කර සිටිනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මීළඟට, ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා.

[අ.භා. 2.17]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපට වාමාංශිකයින් හැටියට දැනෙන්නේ අප්‍රමාණ සතුටක්. ඒ, අද දවස දැනට දීර්ඝ කාලයකට පෙර වාමාංශික ව්‍යාපාරය තුළින් මතු වී ආ නායකයකු වන වෛද්‍ය සේනක බිබිලේ මැතිතුමා, වෛද්‍ය එස්.ඒ. වික්‍රමසිංහ මැතිතුමා වැනි අපගේ ඒ නායකයන්ගේ අදහස් අනුව සංකල්පනය වූ ජාතික ඖෂධ ප්‍රතිපත්තියක නීතිය නීතිගත වෙන දවස වන නිසා. එහෙයින් අද දවස අප කාටත් බොහෝ සෙයින්ම සතුටු විය හැකි දිනයක්.

මම කල්පනා කළා, මෙම කාරණය ගැන විමසන්න. මොකද, අවුරුදු 40ක් වෙනකල් මේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වුණේ නැහැ. මෙම පනත් කෙටුම්පත ගේන්න හැදුවා, නමුත් එය ප්‍රමාද වෙවී යට ගියා. 1970 වර්ෂයේ මෙය ක්‍රියාත්මක වන්න පටන් ගත්තා. පනත් කෙටුම්පතක් නැතිවම රාජ්‍ය මැදිහත්වීමෙන් ක්‍රියාත්මක වන්න පටන් ගත්තා. නමුත්, තිස්ස විතාරණ මැතිතුමා කිව්වා වාගේ අධිරාජ්‍යවාදීන්ගේ බලපෑම් ආවා. ඒ ක්‍රියාත්මක කරපු ආණ්ඩුව කඩලා, ඒ ක්‍රියාත්මක කරපු උදවිය ආණ්ඩුවෙන් දොට්ට

දැම්මෙව්වා. ඒ ආකාරයෙන් සිදු වුණා. ඒවා තමයි ඒ ඉතිහාසයේ ආරම්භයේ අත් දැකීම්. පනත් කෙටුම්පතක් හැටියට මේ කාරණය නැවතත් ගෙන ඒම දිගටම වැළැක් වූවා; වැළැක් වුණා; ප්‍රමාද වුණා; යට ගැහුණා. මේ ආකාරයෙන් නොයෙකුත් දේවල් වෙවී කථාව දිග් ගැහි, දිග් ගැහී මෙච්චර කාලයක් ආවා. එහෙම ඇවිල්ලා, අවුරුදු 40කට පසුව මේ පනත් කෙටුම්පත එළි දකිනවා. ඒකම වැදගත් දෙයක්. ක්‍රියාවට නැංවීමේ කථාව තව ඉදිරියට තියෙයි. එම පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුවේ ගරු සභාවට ඉදිරිපත් වෙලා නීතිගත වෙන්නට ගිය කාලය දෙස බලන විට මෙලෙස ඉදිරිපත් කිරීමම සතුටක් වනවා. "අහලා ගියත් මදැයි" කියලා ගමේ කියමනක් තිබෙනවා නේ.

මෙය ක්‍රියාත්මක වෙන ආකාරය බලන විට තමයි මෙහි අනෙකුත් සැබෑ කටයුතු අපට හෙළි වී පෙනෙන්න පටන් ගන්නේ. අවුරුදු 40ක් පමා වුණු එක කොහොමද, මේ ආකාරයෙන් මෙහෙම මතු වෙලා ආවේ? ඒකේ ප්‍රධාන චරිතයක් තමයි අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා. එතුමා සෞඛ්‍ය ඇමතිතුමා හැටියට ඉන්න කාලයේ ඒ පිළිබඳ කළා වූ මෙහෙවර; මෙහෙය; ප්‍රයත්නය නිසා මේක ගෙන එන්න පුළුවන්කම ලැබුණා.

අනික් ප්‍රධාන කාරණය ගරු රාජිත සේනාරත්න සෞඛ්‍ය අමාත්‍යතුමා මේ කාර්යයේ භාරකාරත්වය අද අතට ගැනීම. මෙපමණ කාලයක් ප්‍රමාද වෙලා අද හෝ මෙය එළිදකින්නට, පාර්ලිමේන්තුවට ගෙන එන්නට හැකිවීමට මේ චරිත දෙකේ එකතු වීම හේතුවක් වී තිබෙනවා. එපමණක් නොවෙයි. ගිය වර ජනාධිපතිවරණය පැවතුණු කාලයේ මෙය එක්තරා ප්‍රබලම කරුණක් හැටියට මතු කරන්නට යෙදුණා. අර බඩු මිල වැඩියි කියලා මතු කරනවා වාගේම මතු කරන්න යෙදුණා. ඒ ජනාධිපතිවරණය අවසාන වෙන කොට එක්තරා විධියකට එය ජනතා මතයේ බලපෑමෙන්ම ඉදිරිපත් වීමට බල කෙරෙන තැනකට පත් වෙලා තිබෙනවා. මම මේ දිය යුතු ප්‍රශංසාව නොදෙනවා නොවෙයි. ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට, ගරු රාජිත සේනාරත්න ඇමතිතුමාට ඒ ප්‍රශංසාව අපි ලබා දෙනවා. මේක එතුමන්ලා දෙදෙනාගේ සංයෝගයෙන් එළිදැක්වුණු දෙයක්. නමුත් මේකේ එන්නේ එක්තරා දේශපාලන සන්දර්භයක් තුළ. මොකක්ද ඒ සන්දර්භය? ඒ තමයි ගිය පාර ජනාධිපතිවරණය. ඒ ජනාධිපතිවරණයත් එක්ක මේ පනත් කෙටුම්පතත් අනෙකුත් තවත් දේවල් අතරේ බැඳී තිබුණා. ඒකේ ප්‍රතිඵලයක් හැටියට අද මේ පනත් කෙටුම්පත එළිදකින බව පෙනෙනවා. මම මේ කියන්නේ අකමැත්තෙන් මේක ගෙනාවාය කියන එක නොවෙයි. මේ තත්ත්වය, ඉඩකඩ පැදුණේ එහෙමයි. එතුමා ජනාධිපති වෙන්න ඕනෑ. රාජිත සේනාරත්න ඇමතිතුමා සෞඛ්‍ය ඇමති වෙන්න ඕනෑ. ඒ සන්දර්භය තුළයි මේක මතු වෙන්නේ. චරිත දෙකක සංයෝගයේ ප්‍රතිඵලයක් හා පවතින දේශපාලන ඓතිහාසික සන්දර්භයේ ප්‍රතිඵලයක් හැටියට මම මේක හඳුන්වන්න කැමැතියි.

මීළඟට මම කල්පනා කළේ, අපි මේ පනත් කෙටුම්පතේ තිබෙන වටිනාකම තක්සේරු කරන්නේ කොහොමද කියන එක ගැන යමක් කියන්නයි. මේ නීතියේ වටිනාකම තක්සේරු කරන්නේ කොහොමද? එය කරන්න පුළුවන් වන්නේ, එය ක්‍රියාවට නැඟෙන ආකාරය පරීක්ෂණයට ලක් කිරීම තුළින්. ඒකට අපි ගන්නවා එක නිර්ණායකයක්. ඒ තමයි ෆාමසිවලින් ගන්න බෙහෙත්වල මිල ගණන් අඩු වෙනවාද කියන එක. අපි මේ පනත් කෙටුම්පත ගැන දීර්ඝ කාලයක් සාකච්ඡා කරද්දී අපි කථා කළේ මේ පනත් කෙටුම්පත ගෙනැල්ලා ක්‍රියාත්මක වෙන කොට අද තිබෙන වෙළෙඳ පොළේ බෙහෙත්වල මිල ගණන් සියයට 50කින් අඩු වෙයි කියලා. මට මතකයි, අද ජීවතුන් අතර නැති බාලසුබ්‍රමනියම් අපේ වෛද්‍ය හිතවතා අපට එහෙම කිව්වා. එතුමා කිව්වා, බෙහෙත්වල මිල ගණන් සියයට 50කින් විතර අඩු වෙයි කියලා. "ක්ෂණිකව නොවෙයි, මෙය ක්‍රියාවට නැඟී ඉදිරියට යන කොට මේ ප්‍රයත්නය කොයි තරම් දුරට සාර්ථකද කියලා ඔබතුමාට වුවමනා නම් බලා ගන්න පුළුවන්, බලන්න තිබෙන්නේ බෙහෙත්වල මිල අඩු වෙලාද කියන එකයි" කියා එතුමා කිව්වා. මෙන්න මේ කාරණය අපේ ප්‍රධානම දර්ශකය හැටියට අරගෙන අපට අද ඉදිරිපත් කර තිබෙන, අනිද්දාට සම්මත කරන පනත් කෙටුම්පත ගැන විමර්ශනයක් කළ හැකියි.

මගේ යුතුකමක් වෙනවා, මේ කාරණයත් මතක් කරදීම. මම වෛද්‍ය බාලසුබ්‍රමනියම් මහතා ගැන කථා කළා. මේ ලෝකයේ තිබෙනවා, ජනතා සෞඛ්‍ය ව්‍යාපාරය කියලා එකක්; People's Health Movement කියලා එකක්. මෙය ලංකාව තුළත් එක්තරා විධියකට ස්ථානගත කරනු ලැබුවේ බාලසුබ්‍රමනියම් වෛද්‍යාචාර්යතුමා. ඔහුට පසුව තවත් තවත් වෛද්‍යවරු - විනායා ආරියරත්න මහතා- එකතු වෙලා ජනතා සෞඛ්‍ය සංසදය කියලා එකක් ලංකාවේ හැදුවා. මේ ජනතා සෞඛ්‍ය සංසදය වාගේම Patients' Rights Movement කියලා එකකුත් හැදුණා.

මම මෙතැනදී මේ කාරණය කියන්න ඕනෑ. බෙනඩික්ට් කියන දෑස නොපෙනෙන ඒ ජනමාධ්‍යවේදියා විශාල මෙහෙවරක් කළා, මේ පිළිබඳව ජන මතයක් ලංකාවේ ඇති කරන්න. මේ පනත් කෙටුම්පත ගෙන එන එක පමා වෙන කොට ඉතාමත් තද කතු වැකි "ඩේලිමිරර්" පුවත් පතේ ලියන්නට බෙනඩික්ට් මහතා යෙදුණා. එක පාරටම මේ පනත් කෙටුම්පත ආවා නොවෙයි. අවුරුදු 40ක කාලයක් තිස්සේ ප්‍රබල ජන මතයක් ගොඩ නැඟුණා. ඒකට ඉවහල් වුණා, විවිධ කණ්ඩායම්; විවිධ සංවිධාන; සිවිල් සමාජ සංවිධාන. අන්තිමට මේක ප්‍රබලම ජන මතය බවට පත් වුණා. හරියට විධායක ජනාධිපතිවරයා අයින් කළ යුතුයි කියන තරම්ම ප්‍රබල ජන මතයක් වුණා, මේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත ගෙන ආ යුතුයි කියන එක.

අනෙක් කාරණය මේකයි. අපි People's Health Movement එකේ සමුළුවකට බංග්ලාදේශයට ගියා. එහිදී අපට Dr. Chowdhury හමු වුණා. මම හිතන හැටියට අපේ ගරු රාජිත සේනාරත්න ඇමතිතුමාත් මේ කාරණය ගැන දන්නවා. Dr. Chowdhury, එර්ෂාඩ් ජනාධිපතිතුමා යටතේ මේ ප්‍රතිපත්තිය ඒ රටේ ක්‍රියාත්මක කළා. අද අපි බංග්ලාදේශයෙන් ඖෂධ විශාල ප්‍රමාණයක් ගෙන්වනවා. ඇත්තටම බංග්ලාදේශයේ මේ ඖෂධ ප්‍රතිපත්තිය එදා ක්‍රියාත්මක කරන්න පුළුවන් වීම නිසා ජාතික ඖෂධ ප්‍රතිපත්තිය අතිනුත්, ඖෂධ නිෂ්පාදනය අතිනුත් අපට වඩා පිමි ගණනාවක් ඉදිරියට බංග්ලාදේශය ගිහින් තිබෙනවා. මම හිතන හැටියට අපේ ඇමතිතුමාගේ අදහස තිබෙන්නේත් අපේ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව හා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාව මුළුමනින්ම මේ ක්‍රියාදාමයේ ප්‍රබල මධ්‍යස්ථානයක් බවට පත් කර ගන්නයි. ඒ පිළිබඳව අපි එතුමාට ඇත්තටම සුබ පතනවා. මෙහි තිබෙනවා, ලැදිකම් ඝට්ටනය - conflict of interest. මේක ප්‍රධානම කාරණයක්. මේ වාගේ ආයතනයක් හදන කොටත්, මේ ආයතනයේ විවිධ අනුමණ්ඩල හදන කොටත්, ඒවා මඟින් මේ කියන්නා වූ අනුමැතිය ලබා දෙන කොටත්, යම් ප්‍රතික්ෂේප කිරීම් කරන කොටත්, මේ හැම එකක් අස්සේම ලැදිකම් ඝට්ටනයක් - conflict of interest - තිබෙනවාය කියලා ඕනෑම කෙනෙකුට කියන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා තමයි මේ පනත් කෙටුම්පතින් අලුත් සංශෝධනයකුත් කරන්න පිළි අරගෙන තිබෙන්නේ. මේ ආයතනයේ සේවය කරන අය, පත් වන සාමාජිකයින් සාමාජිකත්වය දැරීමෙන් අවුරුදු තුනකට පසුව පමණක් නොවෙයි, මේ සාමාජිකත්වයට එන්නට අවුරුදු තුනකට පෙරත් ඖෂධ නිෂ්පාදන හෝ ඖෂධ වාණිජ ක්‍රියාදාමයේ කිසිම සම්බන්ධයක් තබා ගන්න ඔවුන්ට පුළුවන්කමක් නැහැ. එමෙන්ම

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

ඔවුන්ගෙන් ඒ පිළිබඳ ප්‍රකාශන නැවත නැවත ලබා ගැනීමට දී තිබෙන්නා වූ නියමයන් ඒ වාගේම වැදගත් වනවා. ඇත්තටම මේවා ඔක්කොම තිබෙන්නේ මේ පෘථග්ජන ලෝකයේ බව අපි දන්නවා. ඒ නිසා ගරු ඇමතිතුමාගේ කාර්ය භාරය ලේසි වන්නේ නැහැ. අපි කවුරුත් දන්නවා, මේ පෘථග්ජන ලෝකයේ කොච්චර නීති රීති තිබුණත් අන්තිමට මේ නීති රීතිවල සඵලතාව තීන්දු වන්නේ මේවාට අපි පත් කරන පුද්ගලයින් අනුව බව.

රාජිත සේනාරත්න ඇමතිතුමනි, ඔබතුමාත්, අපේ ජනාධිපතිතුමාත් එකතු වීම නිසා මේ පනත් කෙටුම්පත අද සම්මත වීමට පාර්ලිමේන්තුවට ඉදිරිපත් වුණා වාගේම ඊට ගැළපෙන පුද්ගලයින්ගෙන් මේ ආයතන සමන්විත වීමත් ඉතා වැදගත් වනවා. මම මේ අවස්ථාවේ අනෙක් කාගේවත් නම් කියන්නේ නැහැ. නමුත් මම විශේෂයෙන් බාලසුබ්‍රමනියම් මහත්තයාගේ නම කිව්වේ මේ ජන මතය ඇති කිරීමට මූලික වූ කෙනෙකු හැටියට එතුමා අප අතර ඉඳලා මිය ගිය නිසයි.

සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය ගැන හුඟක් දෙනා කථා කළා. මේ පනත් කෙටුම්පතින් සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය පිළිබිඹු වනවාද කියන ප්‍රශ්නය මතු වුණා. සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තියේ හරය මේ පනත් කෙටුම්පතේ තිබෙනවාය කියලායි මම හිතන්නේ. පළමුවැනි කාරණය තමයි, ප්‍රත්‍යක්ෂ භාවය - efficacy. දෙවැනි කාරණය, සුරක්ෂිතභාවය. තුන්වැනි කාරණය තමයි, එහි තිබෙන්නා වූ ගුණාත්මක අගය. ප්‍රත්‍යක්ෂ භාවය, ගුණාත්මක අගය හා සුරක්ෂිතභාවය. සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තියේ තිබෙන ඊළඟ කාරණය තමයි, වැයට ප්‍රමාණවත් වටිනාකමක් - cost effectiveness - තිබෙනවාද කියා බැලීම. ඒ කියන්නේ මිල පිළිබඳ ප්‍රශ්නයයි. මෙන්න මේ කාරණා මේක තුළ අඩංගුයි. රාජ්‍ය අංශයෙන් සියලුම බෙහෙත් ආනයනය කරලා, බෙදා හැරලා එක ප්‍රමිතියක බෙහෙත්, එක මිල මට්ටමක බෙහෙත් මුළු ලංකාව පුරාම තිබෙන ආකාරයකට - එදා සංකල්පනය කරපු විධියට- අද ඖෂධීය නාමයෙන් - generic name - අපට පරිවර්තනය වෙන්න පුළුවන්කමක් නැහැ කියලා මම කියනවා. ඒ පිම්ම පනින්න අද දුර වැඩියි. ඇමතිතුමා කිව්වා, ඖෂධීය නාමයෙන්ම - generic name - පමණක් බෙහෙත් වට්ටෝරු ලියන තැනට ඉදිරි කාලයේදී මේ වැඩ පිළිවෙළ ගෙනෙන්න එතුමා බලාපොරොත්තු වනවාය කියලා. එහෙම ඒ වැඩ පිළිවෙළ ගෙනෙන්න නම් ඊට වුවමනා ව්‍යුහය සකස් වී තිබෙන්න ඕනෑ; යාන්ත්‍රණයක් සකස් වී තිබෙන්න ඕනෑ. අනිකුත් කටයුතු සම්පාදනය වීමත් සමඟම තමයි ඖෂධීය නාමයෙන් පමණක් බෙහෙත් නියම කිරීම කරන්න පුළුවන් වන්නේ. ඒ හරහා අපට විශාල සංස්කෘතියක් අවශ්‍ය වනවා. එය මේ ඖෂධීය නාමයට ගරු කරන සංස්කෘතියක් විය යුතුයි.

ඒ සංස්කෘතිය අපේ වෛද්‍ය පරපුර අතරත්, ඒ වාගේම අපේ ඖෂධවේදී පරපුර අතරත්, ඒ වාගේම මේ රටේ ජනමතය අතරත් අපි ගොඩනැඟිය යුතු දෙයක්. ඒ තමයි මේ ඖෂධීය නාමය පිළිබඳව අප දක්වන ගරුත්වය පිළිබඳ සංස්කෘතිය. මම හිතන විධියට එවැනි සංස්කෘතියකින් ඇති වන උනන්දුව හා ආකල්පය එක්කයි අපට මේ කියන කාරණා වඩාත් හොඳින් ඉටු කර ගන්නට පුළුවන් වන්නේ. ඇත්තටම මේ ප්‍රශ්නය තිබෙන්නේ කුමක් අතරද? ලාභය හා සේවය අතර. ලාභයද, සේවයද? වාමාංශික අපි කියන්නේ, බෙහෙත් වර්ග තිබෙන්න ඕනෑ සේවය සඳහා කියලායි. සෞඛ්‍ය ප්‍රතිකාර තිබෙන්න ඕනෑ සේවය සඳහායි. ඒ වාගේම බෙහෙත් නිෂ්පාදනය කරන්න ඕනෑ සේවය සඳහායි. ඒක තමයි අපේ ස්ථාවරය. සමාජය උදෙසා, ඒ වෙනුවෙන් රජයේ මැදිහත් වීම අවශ්‍යයි. මේක සමාජය වෙනුවෙන් රාජ්‍ය මැදිහත් වීමක්. නමුත් මේකත් එක්කම අද ලෝකයේ තිබෙන යථාර්ථය මතු වෙනවා. එනම්, ලාභය පිළිබඳ ප්‍රශ්නය.

ලංකාවේ සෞඛ්‍ය සේවය ගත්තාම රාජ්‍ය සෞඛ්‍ය සේවය එදා ඉඳන්ම මේ රටේ ප්‍රබලව පවතිනවා. මේ රාජ්‍ය සෞඛ්‍ය සේවය ඇත්තටම ප්‍රබල තත්ත්වයකින් වර්ධනය වුණා නම්, අද මේ තරම් අසීරු අභියෝගයකට මුහුණ දෙන්නට අපට සිදු වන්නේ නැහැ. ඒ වෙනුවට සිදු වුණේ පෞද්ගලික අංශයේ වර්ධනයක්. පෞද්ගලික වෛද්‍ය සේවයේ වර්ධනයක් සිදු වුණා. ජනතාව ක්‍රමයෙන් රාජ්‍ය සෞඛ්‍ය සේවයෙන් පෞද්ගලික සෞඛ්‍ය සේවයට හැරී යාමක් සිදු වුණා. පසු ගිය අවුරුදු තිහක පමණ කාලය තුළ මෙය සිදු වුණා. මේ කාලය තුළ රටේ ඇති වුණු ආර්ථිකයේ අලුත් අත්හදා බැලීම් හා විවෘත ආර්ථිකයකට දොරවල් ඇරීම ආදී කරුණුත් එක්කයි එය සිදු වුණේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බොහොම ස්තූතියි, ගරු මන්ත්‍රීතුමා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මට තව විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ලාභය හා සේවය අතර ප්‍රශ්නයේ දී, ලාභය කියන එක තිබෙන්නේ වෙළෙඳ පොළ සමඟ බව අපි මතක තියා ගන්න ඕනෑ. සේවය තිබෙන්නේ රාජ්‍ය හා සමාජය සමඟයි. මේ කාරණයේ දී සමාජවාදී ක්‍රම අවසාන වෙලා නැහැ කියන එක මගේ මිත්‍ර රාජිත සේනාරත්න මැතිතුමාට කිව යුතුයි. ඒ පරණ සමාජවාදී ක්‍රම කියලා අපි හඳුනාගත් දේවල් සමාජවාදී ක්‍රම නොවෙයි. ඒකයි අද හෙළිදරවු වී තිබෙන සත්‍යය. අපට යන්න තිබෙන්නේ අද ඉඳලා අනාගතයේ දී අපි ගොඩනඟන සමාජවාදී ක්‍රමයකටයි. ඒ සමාජවාදී ක්‍රමයට අපි යන්නේ වෙළෙඳ පොළ ක්‍රියාකාරිත්වයේ උපරිම වර්ධනයෙන් පසුවයි. එයින් මතුව වෙළෙඳ පොළට විසඳා ගත නොහැකි ප්‍රශ්න පිළිබඳව මනුෂ්‍ය සංහතිය වෙනුවෙන් ඊළඟට මැදිහත් වන්නේ සමාජයේ ක්‍රියාකාරිත්වයයි. මේ අතරතුර කාලයේ දී රජය මැදිහත් වීමෙන් මේ ප්‍රතිපත්ති මාලාව තුළින් සමාජය වෙනුවෙන් යම් මෙහෙවරක් ඉටු කරන්නට වෑයමක් දරා තිබෙනවා. ඒ වෙනුවෙන් ඇති කර තිබෙන ව්‍යුහය, ඒ වෙනුවෙන් ඇති කර තිබෙන ප්‍රතිපාදන පාදක කර ගෙන තවත් නොයෙකුත් අනු විධි විධාන රාශියක් හා තවත් අනු මණ්ඩල රාශියක් ඉදිරි කාලයේ දී මේ සඳහා ක්‍රියාත්මක කරන්න සිදුවෙයි. මේ පිළිබඳ අවසාන පරීක්ෂණය අපට බලන්න පුළුවන්. කම්කරු නීතිය තිබෙනවා; ඉතා හොඳ කම්කරු නීතියක් ලංකාවේ තිබෙනවා. නමුත් ක්‍රියාත්මක වෙනවාද? ගරු ඇමතිතුමනි, ඒ වගේම මේ ප්‍රතිපත්තියත් නීතියක් හැටියට සම්මත වෙනකොට මේක ක්‍රියාත්මක භාවයට පෙරළීමේ මහා අභියෝගයට ඔබතුමා මුහුණ දිය යුතු බව මතක් කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 2.34]

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික ඖෂධ ප්‍රතිපත්තියක් සකස් කිරීම සම්බන්ධයෙන් පසු ගිය කාලයේ දී බොහෝ දුරට සාකච්ඡා පැවැත්වුණා. නොයෙක් විධියේ මතිමතාන්තර ඇති වුණා. නව ජනාධිපතිතුමා හිටපු සෞඛ්‍ය ඇමතිවරයා හැටියට නොයෙක් අවස්ථාවල මේ ගැන ප්‍රකාශ කරලා තිබෙනවා. කොහොම නමුත් මෙය ඉදිරිපත් කරන්න බැරි වුණා. නමුත් නව සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාට මේ පනත් කෙටුම්පත අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නට පුළුවන් වීම ගැන අපි සන්තෝෂ වෙනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා අධ්‍යාපනය ලබන කාලයේ සිටම තරුණයකු හැටියටත්, බොහොම දක්ෂ ශිෂ්‍යයකු හැටියටත් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අනෙකුත් තරුණ ශිෂ්‍යයන් සමඟ ක්‍රියාකාරීව කටයුතු කළ ආකාරය මා දන්නවා. ඊට පසුව ඔබතුමා දේශපාලන ක්ෂේත්‍රය තුළත් ඒ වාගේ ක්‍රියාකාරීව කටයුතු කර තිබෙනවා. මේ වාගේ ශ්‍රේෂ්ඨ පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ඔබතුමාට පුළුවන් වීම ගැන අපි සන්තෝෂ වෙනවා. මෙය හොඳින්ම ක්‍රියාත්මක කරන්නට ඔබතුමාට ශක්තිය ලැබෙනවා කියන විශ්වාසය මටත්, ඒ වාගේම ජනතාවටත් තිබෙනවා.

"ආරෝග්‍ය පරමා ලාභා" කියලා ප්‍රකාශ කරනවා. ඒ ආරෝග්‍ය තත්ත්වය සාමාන්‍ය මනුෂ්‍යයාට පමණක් නොවෙයි සියලු සත්වයන්ට බලපානවා. සියලු සත්වයන් කෙරෙහි බලපාන විශේෂ කාරණයක් තමයි නීරෝගී භාවය. ඒ නීරෝගී භාවය හරියාකාරව සකස් කර ගැනීමට දීර්ඝ කාලයක් තිස්සේ ලෝකයේ නොයෙක් නොයෙක් විධියේ ක්‍රියා මාර්ග තිබුණා. ආදි කාලයේ දී ඒ සඳහා බෙහෙත් හේත්, යන්ත්‍ර සූත්‍ර, ක්‍රියාත්මක කළා. ඉන් පසුව ක්‍රමක්‍රමයෙන් විද්‍යානුකූලව ජාතික ඖෂධ වැඩ පිළිවෙළක් සකස් වුණා. එය විද්‍යානුකූලව සකස් වුණු අවස්ථාවලදීම දේශීය වෛද්‍ය ක්‍රමයත් සකස් වුණා. විශේෂයෙන් ඉන්දියාවේ දඹදිව සකස් වුණු දේශීය වෛද්‍ය ක්‍රමය ලෝකයටම ප්‍රචාරය වුණා. ඒක ශ්‍රී ලංකාවටත් ඇවිල්ලා ශ්‍රී ලංකාව තුළත් බොහොම දියුණුවට ක්‍රියාත්මක වුණා. මෙම දේශීය වෛද්‍ය ක්‍රමයේ තිබුණු තත්ත්වයක් තමයි, නොයෙක් නොයෙක් විධියේ යන්ත්‍ර සූත්‍ර මාර්ගයෙන් ඒවා විද්‍යානුකූලව සකස් කරලා, ඒවා වෙනස් විධියට ජනතාවට හඳලා දෙන්න පුළුවන් වීම. මේවා ද්‍රව වශයෙන් තමයි සෑහෙන්න කාලයකට උඩදී තිබුණේ. බෝතල්වල තමයි බෙදා හැරියේ. ටින්වල ගෙනැල්ලා බෝතල්වලින් ලෝකය පුරා බෙදා හැරියා. ඒ වුණත් අද එය සම්පූර්ණයෙන් වෙනස් වෙලා දැන් සාමාන්‍ය බෙහෙත් පෙති බවට පත් කරලා තිබෙනවා. ඒ නිසා දැන් බෙහෙත් බොන තත්ත්වය අඩු වෙලා ඒ බෙහෙත් ගිලින තත්ත්වයට සකස් කර තිබෙනවා. එතකොට විද්‍යානුකූලව මේ තත්ත්වය ක්‍රමක්‍රමයෙන් වෙනස් වීගෙන ඇවිල්ලා, අද මේ තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

දේශීය වෛද්‍ය ක්‍රමයත් ක්‍රමක්‍රමයෙන් අහෝසි වන තත්ත්වයට පත්වේගන යන බවක් පෙනෙනවා. අපේ අතීතයේ හිටපු අයවලුන් කවදාවත් ඉංග්‍රීසි බෙහෙත් ගන්න කැමැති වුණේ නැහැ. මා පොඩි කාලයේ මතකයි, අසනීපයක් වුණාම ඒ අය ගස්වල මුල්, කොළ, මල්, පොතු. ඒවා ඔක්කෝම අරගෙන තම්බලා, පත අට එකට හින්දලා බොන එක තමයි හුඟක් දුරට කළේ. ලෙඩ රෝග සෑම එකකටම ඒ වාගේ ප්‍රතිකාර තමයි කළේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Order, please! මේ අවස්ථාවේ දී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු ගරු අශෝක් අබේසිංහ මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු අශෝක් අබේසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අශෝක් අබේසිංහ මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் *அக்கிராசனத்தினின்று அகலவே,* மாண்புமிகு அசோக் அபேசிங்க அவர்கள் *தலைமை வகித்தார்கள்.*

Whereupon MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. ASHOK ABEYSINGHE *took the Chair.*

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)

දැන් අපේ ආයුර්වේද මධ්‍යස්ථාන තිබුණත්, ඒ කාලයේ සෑම ගමකම වාගේ වෙද මහත්මයෙක් සිටියා. ඒ අය තමයි බෙහෙත් හේත් ලබා දුන්නේ. දැන් ඒ ක්‍රමය වෙනස් වෙලා තිබෙනවා. දැන් ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන සකස් කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ අංශයත් ඔබතුමාට භාර නිසා ඔබතුමා ඒ මධ්‍යස්ථානත් පරීක්ෂා කර බලනවා නම් හොඳයි. දැන් ඒ බෙහෙත් වර්ග හදලා බෝතල්වල අසුරලා තිබෙනවා. හුඟක් ඒවායේ කලින් තිබුණා වාගේ ස්වභාවික රස ගතිය නැහැ; ඒ තිත්ත ගතිය නැහැ. ඒවාට නොයෙක් විධියේ පැණි වර්ග, රස වර්ග දාලා පාවිච්චි කිරීමට පහසු ලෙස සකස් කරලා තිබෙනවා. ඒක හොඳද කියලා මම හරියට දන්නේ නැහැ. නමුත් හුඟක් දෙනෙක් කියනවා, ඉස්සර තිබුණු තත්ත්වයේ ගුණාත්මකභාවයක් නැහැ කියලා. මේ සම්බන්ධයෙනුත් කල්පනා කර බලා, ආයුර්වේදයත් හොඳ තත්ත්වයකට ගෙන ඒම සඳහා කටයුතු කළොත් හොඳයි කියලා මම කල්පනා කරනවා.

ගරු ඇමතිතුමනි, අද ඔබතුමා දෙවන වර කියැවීම සඳහා ඉදිරිපත් කර තිබෙන මෙම පනත් කෙටුම්පතේ ඖෂධ, වෛද්‍ය උපකරණ ලියා පදිංචි කිරීම, ඒ වාගේම පරිපාලනය සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරියක් පිහිටුවීම, ජාතික ඖෂධ නියාමන අංශ පිහිටුවීම, ජාතික උපදේශක කමිටුවක් පිහිටුවීම ගැන සඳහන් වෙනවා. මේවා බොහොම හොඳයි. මේ වාගේ තත්ත්වයක් තුළ සෑම අංශයක්ම මේ සඳහා උපයෝගී කර ගෙන තිබෙන බව අපට පෙනෙනවා. ඒ වාගේම අප ඉදිරිපත් කර තිබෙන සංශෝධනත් ඔබතුමා පිළිගෙන තිබෙනවා. මේ ක්‍රමය බොහොම හොඳයි. මේක හරියාකාරව ක්‍රියාත්මක කරයි කියලා අපි විශ්වාස කරනවා.

මට තව එක් කාරණයක් ගැන කියන්න වුවමනා කරනවා. ලංකාවේ ආයතන විශාල සංඛ්‍යාවක් තිබෙනවා. ගරු ඩිව් ගුණසේකර මැතිතුමාගේ සභාපතිත්වයෙන් තිබෙන පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට එම ආයතන කැඳවනවා. ඒ ආයතන හුඟක් ක්‍රියා කරලා තිබෙන්නේ වැරැදි විධියටයි. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ අනුව එම ආයතනවල පරීක්ෂණ වැඩි ප්‍රමාණයක් හරියාකාරව ක්‍රියාත්මක කරලා නැහැ. එතුමා පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. මෙවැනි කමිටු පාර්ලිමේන්තුවෙන් පත් කරනවා. නොයෙක් ආකාරයේ කමිටු පත් කරලා ඒවාට අදාළ වැඩ කොටස් භාර දෙනවා. එහෙම භාර දුන්නත් ඒවා හරියාකාරව ක්‍රියාත්මක නොවන බවක් පෙනෙනවා. මේ ගැන අප කල්පනාකාරි වන්නට ඕනෑ. අප එය සකස් කරන්නේ කොහොමද කියන්න මා දන්නේ නැහැ. ඒක හරි අමාරු කාර්යයක්. සෑම දාම අපට අහන්න ලැබෙන්නේ, පුවත් පත්වල දකින්න ලැබෙන්නේ, ටීවී එකේ දකින්න ලැබෙන්නේ හොරකම්, වංචා, දූෂණ, කුඩු ගැනයි. මේ විධියේ තත්ත්වයකුයි ලංකාවේ තිබෙන්නේ. මොන යම් හෝ හොඳ තත්ත්වයක් තිබෙනවාය කියා අහන්න නැති තරමට අද පත් වෙලා තිබෙනවා. නොයෙකුත් ආයතන පිහිටුවා තිබුණත්, අනාගතයේදී කොයි විධියට පරිපාලනය කරලා මේ කටයුතු හරියට කරන්න පුළුවන් වෙයිද කියන්න බැරි තත්ත්වයකයි තිබෙන්නේ.

නිදර්ශනයක් හැටියට මම එක කරුණක් කියන්න කැමැතියි. අපට එක එක ආයතන තිබෙනවා. පරිසර අමාත්‍යාංශය වැනි

[ගරු දි.මු. ජයරත්න මහතා]

අමාත්‍යාංශ තිබෙනවා. පසු ගිය කාලයේ යම් අවශ්‍යතාවකට ගලක් කඩා ගන්න ඕනෑ වුණාම දුප්පත් පුද්ගලයෙක් යොදා ගෙන ගල් ටිකක් කඩලා ගේ හදා ගත්තා. හරක් මඩුවට ඒවා දමා ගත්තා. වැලි ටිකක් ගන්න ඕනෑ වුණාම ගඟට, ඇලට ගිහින් වැලි ටිකක් ගොඩ දා ගත්තා. එයින් ප්‍රයෝජනයක් ගත්තා. අවශ්‍ය වුණාම පස් ටිකක් කපා ගත්තා. එයින් ගඩොල් කැටයක් හැදුවා, උළු කැටයක් හැදුවා. එහෙම දේවල් කර ගත්තා. ගරු රාජිත සේනාරත්න ඇමතිතුමනි, අද හරිම ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ. මාත් එක්ක කථා කළ පුද්ගලයෙක් කිව්වා, ගලක් කඩන්න පරිසර අමාත්‍යාංශයෙන් licence එක ගන්න අවුරුද්දකුත් මාස තුනක් ගත වුණාය, ඒ නිසා ඒ අවශ්‍යතාව කර ගන්න බැරි වුණාය කියලා. දැන් ඒ මනුස්සයා ලංකාවෙනුත් පිට වෙලා ගිහින් වෙන රටක ඉන්නවා. දැන් පස් ටිකක් ගන්න වුවමනා වුණොත් ඒක කරන්න පුළුවන්කමක් නැහැ. කොහොමද දුප්පත් මනුස්සයෙක් ඒක කරන්නේ? කාර්යාල ගණනාවකට යන්න සිද්ධ වෙනවා. එහෙම ගිහිල්ලාත් ඒක කර ගන්න බැරි වෙනවා. වැලි ටිකක් ගොඩ දමා ගන්නත් බැරි වෙනවා. මෙන්න මෙවැනි තත්ත්වයක් අද තිබෙන්නේ. කොස් ගහක් කපනවා නම් අවසරයක් ගන්න ඕනෑ. ඒ වෙනුවෙන් මාස ගණනක් එහාට මෙහාට යන්න වෙනවා. මේවාට මිල මුදල් කොහෙන්ද හොයා ගන්නේ? බස් එකේ යන්නේ කොහොමද? මේ වෙනුවෙන් කාලය වැය කළාම කොහොමද ඒ පුද්ගලයා ජීවත් වන්නේ? මෙහෙම තත්ත්වයකුයි අද ඇති වෙලා තිබෙන්නේ. ඔබතුමාට නම් මේ තත්ත්වය හොඳින් පාලනය කරන්න පුළුවන් කියලායි මම හිතන්නේ. අප මේවා ගැන කල්පනා කර බලන්න ඕනෑ. මිල මුදල් තිබෙන, යන්න එන්න පුළුවන් දක්ෂයන්ට ඒවා ප්‍රශ්නයක් වන්නේ නැහැ. සාමාන්‍යයෙන් පොඩි මනුස්සයාටයි මෙවැනි ප්‍රශ්න ඇති වන්නේ.

රෝගයක් සෑදීම, ඒ රෝගයෙන් දුක් විඳීම, සදාකාලික දුකට පත් වීම නිසා මනුෂ්‍යයාට ඇති වන වේදනාව මොන තරම්ද කියන්න බැහැ. ඒ තරම් වේදනාවක් කිසිම පුද්ගලයෙකුට ජීවිතයේ කිසිම දිනක ඇති වන්නේ නැහැ. මේ වැඩ පිළිවෙළ හරියාකාරව - කලට වේලාවට නියම විධියට- ක්‍රියාත්මක කරන්න බැරි වුණොත් දුප්පත් මනුස්සයාට සිදු වන්නේ මොකක්ද කියා කල්පනා කරන්න ඕනෑ. මෙවැනි දේවල් සිදු වී ඇති නිසයි මා මෙය මතක් කරන්නේ.

බොහෝ දෙනෙක්, "අනේ ඇමතිතුමා, අපට ගලක් කඩා ගන්න විධියක් නැහැ. ඒ ගැන කථා කරන්න." කියලා කියනවා. නමුත් එය ටෙලිෆෝන් කර කිව්වත් ලෙහෙසියෙන් කෙරෙන්නේ නැහැ. මේ වාගේ තත්ත්වයන් ගැනත් කල්පනා කර බලන්න ඕනෑ. බෙහෙතක් දෙන එක කලට වේලාවට සිදු විය යුතුයි. Injection එකක් ගහන්න ඕනෑ වුණාම කලට වේලාවට සිදු විය යුතුයි. කලට වේලාවට බෙහෙත් දෙන්න ඕනෑ වාගේම, කලට වේලාවට බෙහෙත් බොන්න ඕනෑ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත වෙලාවෙන් තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
කලට වේලාවට operation එක කරන්න ඕනෑ. එහෙම නොවුණොත් ජීවිතක්ෂයට පත් වනවා. මේ තත්ත්වය ගැන අනෙක් දේට වඩා සොයා බැලිය යුතු බවයි මා කියන්නේ. මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනවා වාගේම, අද රෝහල්වල පවතින තත්ත්වය ගැනත් බලන්නට සිද්ධ වනවා. ඔබතුමා පත් වුණු ගමන් මේ දේවල් ගැන කියනවා කියලා හිතන්න එපා. අතීතයේ තිබුණු තත්ත්වයත් මේකයි. ඔබතුමාට බරපතළ වැඩ කොටසක් ක්‍රියාත්මක කරන්නට තිබෙනවා. එසේ වුණත්, රජයත් සමඟ ධෛර්යයෙන් යුතුව එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නට හැකි වේවි කියා මම කල්පනා කරනවා.

හුඟක් රෝහල් තිබෙනවා. නමුත්, ඒ රෝහල්වල ඇඳන් නැහැ. රෝගීන් බොහොමයක් බිම පැදුරු දමාගෙන තමයි නිදා ගන්නේ. මේ තත්ත්වය රෝගියෙකුට හොඳද කියලා අපට හිතන්න වෙනවා. රෝහල්වල ඉඩත් නැහැ. දුප්පත්ම අය තමයි මේ රෝහල්වලට යන්නේ. පෞද්ගලික රෝහල් තිබෙනවා. ඒවාට ගිහින් මිල මුදල් ගෙවලා තමන්ගේ රෝගයට ප්‍රතිකාර ගන්න පුළුවන්. නමුත් සාමාන්‍ය ජනතාවට එහෙම කර ගන්න පුළුවන්කමක් නැහැ. අද එවැනි තත්ත්වයක් තමයි තිබෙන්නේ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ඒ අය රෝහලේ නතර වෙලා හිටියත් බෙහෙත් ගන්න තුණ්ඩුවක් තමයි දෙන්නේ. රෝහලෙන් බෙහෙත් ගන්න විධියක් නැහැ, පිටින් තමයි ඒ අයට බෙහෙත ගන්න වන්නේ. ලේ පවා පරීක්ෂා කරන්න වන්නේ පිටතට ගිහිල්ලායි. ලේ පරීක්ෂා කර ගෙන ඒ වාර්තාව දොස්තර මහත්තයාට ගෙනැත් දෙන්න වෙනවා. ඒ වාගේම බෙහෙත් වර්ග පිටින් ගන්න සිද්ධ වෙනවා. රෝහල්වල තිබෙන බෙහෙත් ප්‍රමාණය අඩු නිසා, පිටින් ඒවා ගන්න දුප්පත් අයට හුඟක් අමාරුකම් තිබෙන නිසා, අඩු ගණනේ ආදායම් නැති අයටවත් සහනදායී වැඩ පිළිවෙළක් සකස් කර දෙන්න උත්සාහ කරනවා නම් හොඳයි කියලා මා කල්පනා කරනවා.

මම දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වුණා. නමුත් වෙලාව අවසානයි කියලා මූලාසනයෙන් කියනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා අද මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා, අගමැතිතුමාගේත් සහයෝගය ඇතිව මෙය ක්‍රියාත්මක කරන්න සූදානම් වීම ගැන ඔබතුමාට අපේ අවංක ආදර ස්තුතිය පුද කරනවා. මේ වැඩ පිළිවෙළ සාර්ථක අන්දමින් ක්‍රියාත්මක කරලා දුප්පත්, අසරණ ජනතාවට අනාගතයේදී යහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් යුතුව ජීවත් වීමට පුළුවන් ආකාරයේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න, නීරෝගී සමාජයක් ගොඩනඟන්න ඔබතුමාට සියලු දෙනාගේම ආශිර්වාදය ලැබේවායි කියා මා ප්‍රාර්ථනා කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට, ගරු ඉරාන් වික්‍රමරත්න නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 17ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.47]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நெடுஞ்சாலைகள், உயர்கல்வி மற்றும் முதலீட்டு ஊக்குவிப்பு பிரதி அமைச்சர்)
(The Hon. Eran Wickramaratne - Deputy Minister of Highways, Higher Education and Investment Promotion)
මට කථා කරන්න අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ජාතික ඖෂධ නියාමන අධිකාරිය

පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කරන මේ ඓතිහාසික අවස්ථාවට සහභාගි වෙන්න ලැබීම මා ලද භාග්‍යයක් කොට සලකනවා.

අද මට මහා මාර්ගවලට සම්බන්ධතාවක් තිබෙනවා. "මහා මාර්ග කථා" කියලාත් කතන්දර තිබෙනවා. ඒ මහා මාර්ග කථාවක් මම කියන්නම්. රනිල්, මෛත්‍රී ජනාධිපති කළා. මෛත්‍රී, රනිල් අගමැති කළා. මේක ඓතිහාසික අවස්ථාවක්. විශේෂයෙන්ම ඓතිහාසික පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන්න පුළුවන් වීම නිසා ඒ අවස්ථාවට අපේ ගරු රාජිත සේනාරත්න ඇමතිතුමාත් ඇතුළු වෙනවා.

2013 අප්‍රේල් මාසයේ 23වැනි දා පාර්ලිමේන්තුවේ එවකට සිටි සෞඛ්‍ය ඇමතිතුමාගෙන් මම සෞඛ්‍ය ක්ෂේත්‍රය පිළිබඳව ප්‍රශ්නයක් ඇහුවා. 2013 අප්‍රේල් 23වැනි දින හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 1761හි මම ඊට අදාළව අහපු පළමුවැනි අතුරු ප්‍රශ්නයෙහි මෙසේ සඳහන් වනවා:

"ගරු ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මෙම තීරණ ගැනීමේදී යම් කිසි ඒකාධිපති ස්වභාවයක් තිබෙනවා...."

"...ඒ වාගේම පසු ගිය කාලයකදී ඔබතුමාත් සඳහන් කරලා තිබෙනවා, මෙතැන යම් කිසි මාෆියාවක් ක්‍රියාත්මක වෙනවා කියලා. ඒ පිළිබඳව ඔබතුමාගේ අදහස් ප්‍රකාශ කරනවා නම් මම කැමැතියි."

ඒ අවස්ථාවේදී ගරු මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමා මෙසේ පිළිතුරු දුන්නා:

"ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ කරුණු සත්‍යයි. ඒ කරුණු මම පිළිගන්නවා."

2013 අප්‍රේල් 23වැනි දින පළ වූ හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 1762හි මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙසේ සඳහන් වෙනවා:

"ගරු කථානායකතුමනි, මගේ අවසාන අතුරු ප්‍රශ්නය -තුන්වන අතුරු ප්‍රශ්නය- පුළුල් ප්‍රශ්නයක්. සේනක බිබිලේ කොමිෂන් වාර්තාව ඉදිරිපත් කරලා කලින් කල අපට කිව්වා, ඖෂධ ප්‍රතිපත්තිය පිළිබඳව පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න යනවාය කියා. එතුමාගේ ගුණානුස්මරණ කථාවේදීත් ඔබතුමා ඒ ගැන සඳහන් කළා. ඊට පසුව කිව්වා, එය නීතිපති දෙපාර්තමේන්තුවටත් ගියාය කියා. ඖෂධ ප්‍රතිපත්තිය පිළිබඳව ඒ පනත් කෙටුම්පත හිර වෙලා තිබෙන්නේ කොතැනද, එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙන්නේ කවදාද කියා මා අහනවා."

එම ප්‍රශ්නයට ගරු මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමා දුන් පිළිතුර මෙසේයි:

"ගරු කථානායකතුමනි, මේ ගරු සභාවේදීත්, ඊට පිටස්තරවත් මම මේ සම්බන්ධයෙන් ප්‍රකාශ කර තිබෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශය විධියට ජාතික ඖෂධ ප්‍රතිපත්තියට අදාළව පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළ යුතුය කියා මීට අවුරුදු දෙකකට කලින් තමයි -විශේෂයෙන්ම ජාතික ඖෂධ ප්‍රතිපත්තිය ගැන කථා කිරීමේදී ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාත් අමාත්‍යවරයා වශයෙන් සිටි කාලයේ 2006 දී තමයි - රජය අනුමත කර තිබෙන්නේ.මහාචාර්ය සේනක බිබිලේ මැතිතුමාගේ ප්‍රතිපත්තියට අනුකූලව තමයි ජාතික ඖෂධ ප්‍රතිපත්තිය සකස් වෙලා තිබෙන්නේ."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2013 අප්‍රේල් මස 23වන දින හැන්සාඩ් වාර්තාවේ 1763වන තීරුවේ තවදුරටත් මෙසේ සඳහන් වනවා:

"මා ඇත්ත කියන්නට ඕනෑ. මොකද, බොහෝ වෙලාවට සෞඛ්‍ය අමාත්‍යාංශයට මේ ගැන නොයෙකුත් දෝෂාරෝපණ එනවා. සම්පූර්ණයෙන්ම සකස් කර අවසන් වෙලා තිබුණු පනත් කෙටුම්පත අතුරුදහන් කරලා තිබෙනවා, අතුරුදහන් වෙලා තිබෙනවා. ඊට පස්සේ අප නැවතත් කිව්වා, මේ පනත් කෙටුම්පත සකස් කළ යුතුය කියා. ඒ සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ අදාළ ලිපිගොනු, ලිපිලේඛන සියල්ලම අපි භාර දුන්නා. මේ වන විට නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව මේ පනත් කෙටුම්පත සකස් කරමින් යනවා. මා නිතර මේ ගැන සොයා බලමින් සිටින්නේ."

එදා ඔය ප්‍රශ්නයට ලැබුණු පිළිතුරෙන් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ගැන මට යම්කිසි පැහැදීමක් ඇති වුණා. එදා අපි පුදුමයට පත් වුණා. එදා වන කල් අපි හිතුවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ දෙවන බලවත්ම පුද්ගලයා එතුමාය කියලායි. මේ උත්තරය දුන්නාට පස්සේ තමයි අපට පැහැදිලි වුණේ, ඇමතිවරුන්ට ඉහළින් යම්කිසි හස්තයක් ක්‍රියාත්මක වනවා, ඒ අයට මේ කිසිවක් නිදහසේ කරන්න ඉඩ දෙන්නේ නැහැයි කියා. ඒ පැහැදීමෙන් තමයි අපි එතුමාව අපේ පොදු අපේක්ෂකයා බවට පත් කර අද අපේ ජනාධිපතිවරයා බවට පත් කර ගෙන තිබෙන්නේ. ඉතින්, මෙය ඓතිහාසික මොහොතක් වනවා. මට ප්‍රථමයෙන් කථා කළ ඇමතිවරුන්ගෙන්, මන්ත්‍රීවරුන්ගෙන් ප්‍රකාශ වුණා, මේවා සේනක බිබිලේ මහාචාර්යතුමා ඉදිරිපත් කළ අදහස් කියා. ඒ වාගේම එස්.ඒ. වික්‍රමසිංහ මැතිතුමාත් ඒකට සම්බන්ධ වෙලා තිබෙනවා. ලංකා සමසමාජ පක්ෂයටත් ප්‍රගතිශීලී ඉතිහාසයක් තිබුණාය කියා මතක් කරන්නට කැමැතියි. මොකද, මේ ප්‍රතිපත්ති පිළිබඳව අවුරුදු 40ක් තිස්සේ නොයෙකුත් වතාවන්වල මේ පාර්ලිමේන්තුවේත්, මේ පාර්ලිමේන්තුවෙන් පිටතදීත් සාකච්ඡා වෙලා තිබෙනවා. නමුත් මෙය පනත් කෙටුම්පතක් හැටියට ගෙනෙන්න පාර්ලිමේන්තුවට ශක්තියක් තිබුණේ නැහැ.

ඒ විතරක් නොවෙයි. Patients' Rights Movement එකේ කටයුතු කරපු අයවත් මා මතක් කරන්න ඕනෑ. බෙනඩික්ට් නැමැති මාධ්‍යවේදියාව විශේෂයෙන්ම මතක් කරන්නට ඕනෑ. ඔහු කලින් කලට ඔහුගේ පැන පාවිච්චි කරමින් මේ රටේ ඉන්න අසරණ රෝගි ජනතාව වෙනුවෙන් නොයෙක් වතාවල මේ කාරණය මතු කළා. ඔහුට අත දුන්නා, විනා ආරියරත්න, ක්‍රිස්ටීන් පෙරේරා මහත්මිය වැනි අය. ඒ අයවත් මේ වෙලාවේ අපි මතක් කරන්නට ඕනෑ.

අද මේ ප්‍රතිපත්තිය ඉදිරිපත් කරන වෙලාවේදී කරුණු කිහිපයක් ගැන කෙටියෙන් හෝ කථා කරන්නට මා කැමැතියි. ඉස්සෙල්ලාම කියන්න ඕනෑ, ජාතික ඖෂධ නියාමන අධිකාරියට කරන පත් කිරීම් ගැන. මා හිතන හැටියට මේ පත් කිරීම් ගැන පනත් කෙටුම්පතේ විස්තර කර තිබෙනවා. ඊට අමතරව අපේ රාජිත සේනාරත්න ඇමතිතුමා අද වැදගත් ප්‍රකාශනයක් කළා. එතුමා කිව්වා, "පනත් කෙටුම්පත් සකස් කරන කොට ඇමතිවරයා දිහා බලා පනත් කෙටුම්පත් හදන්න හොඳ නැහැයි" කියා. ඒක ඇත්තයි. බොහෝ විට අපේ රටේ කළමනාකාර ක්‍රියාවලිය රඳා පවතින්නේ පත් වන පුද්ගලයා මතයි. එම නිසා එය ශක්තිමත් කරන්න එතුමා අද සංශෝධන ඉදිරිපත් කරනවාය කියා කිව්වා. ඒ කියන්නේ මේ පත් කිරීම් පුළුවන් තරම් ස්වාධීන කරන්නයි. මේ අධිකාරියට කරන පත් කිරීම් පිළිබඳව විතරක් නොවෙයි, ඊට වඩා පුළුල් අදහසක් මා ඉදිරිපත් කරන්නේ. මා හිතන හැටියට රාජ්‍ය සේවයේ පත් කිරීම් කරන කොට පළමුවන මූල ධර්මය, සුදුසුකම වන්නට ඕනෑ අධ්‍යාපනයයි, අත් දැකීමයි. අධ්‍යාපනයටයි, අත් දැකීමටයි අමතරව පුද්ගල වාසිය නැති -conflict of interest එකක් නැති- ලැදිකම්, සටිටන නැති අයව පත් කරන්නට ඕනෑ. උදාහරණයක් හැටියට ඇමති කෙනෙකු ඒ ඇමතිතුමාගේ පවුලේ අයවත්, බොහොම ළඟින් ආශ්‍රය කරන අයවත්, ඒ අමාත්‍යාංශයට හෝ ඒ අමාත්‍යාංශයට අදාළ සංස්ථාවලට පත් නොකළ යුතුයි. ඇත්තටම මේ ප්‍රතිපත්ති අපි අනුගමනය නොකරන නිසා මේ ගැන කල්පනා කර අනාගතයේදී යම්කිසි පොදු තීරණයක් ගෙන මෙය නීතිගත කරන්න සිදු වනවා.

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

පක්ෂපාතීත්වයට තමයි අඩුම තැන දෙන්නට ඕනෑ. ඒ නිසා අද ගරු ඇමතිතුමා මතු කළ කියමන මම නැවත මතක් කරනවා. අපි ව්‍යුහය හදන්නට ඕනෑ. ඇමතිවරයාගේ බලාපොරොත්තු නොවෙයි. ව්‍යුහය හදලා හැම රජයකම පත්වීම්වලට මේක අලුතෙන් ක්‍රියාත්මක කරන්නට ඕනෑ.

අපි දැන් සිටින්නේ මේ පාර්ලිමේන්තුවේ අවසාන දවස්වලයි. ඒ නිසා හුඟක් සංශෝධන පාර්ලිමේන්තුවට එනවා. අපට අලුත් සංස්කෘතියක් හදා ගන්නට පුළුවන්. අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරනවා. ඒ වාගේම මේ කෙටි කාලය තුළදී අපි තවත් පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. රාජ්‍ය සේවා කොමිෂන් සභාව පිහිටුවලා, ඒක ඉදිරියට ගෙනැල්ලා ඒ ප්‍රතිපත්ති ඒ තුළ අන්තර්ගත කළ යුතුයි කියා මම හිතනවා.

ඊට අමතරව අද සඳහන් වුණා, සේනක බිබිලේ ප්‍රතිපත්තිවලින් වැදගත්ම ප්‍රතිපත්තියක් ගැන. ඖෂධයක වෙළෙඳ නාමය වෙනුවට වෛද්‍යවරුන් ඖෂධ නාමය සඳහන් කළ යුතුයි කියන කාරණය සේනක බිබිලේ මහාචාර්යතුමාගේ අදහසයි. අපි දන්නවා, අද දින ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පතේ ඒ අදහස සම්පූර්ණයෙන්ම ගැබ් වෙලා නැහැ කියා. ගරු සෞඛ්‍ය ඇමතිතුමා සඳහන් කළා, එතුමා අනාගතයේදී මේ පනත් කෙටුම්පතට ඒ සඳහා සංශෝධනයක් ගෙන ඒමට ලැහැස්තියි කියා. ඒ සංශෝධනය ගෙනෙන්නේ ඖෂධ නාමය විතරක් සඳහන් කිරීම සඳහායි. මම ගරු සෞඛ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. අපි අවුරුදු දෙකක කාල සීමාවක් තුළ මේ සංශෝධනය ගෙන එන්නට තීරණයක් ගත්තොත් හොඳයි කියා. එහෙම නැතිව ඒ සංශෝධනය තව අවුරුදු 40කට ගෙනාවේ නැත්නම් මේ පනත් කෙටුම්පතේ තිබෙන ප්‍රධානම කරුණක් යටපත් වන්නට පුළුවන්. මම ඒ ඉල්ලීම ගරු සෞඛ්‍ය ඇමතිතුමාගෙන් කරනවා.

මේ පනත් කෙටුම්පත සම්මත කිරීමෙන් රෝගියාට තිබෙන ප්‍රධානතම ප්‍රායෝගික වාසිය තමයි ඖෂධවල මිල පහළ යාම. අපි දන්නවා, හුඟාක් බෙහෙත්වල මිල සියයට 10ක් 20ක් 30ක් නොවෙයි විශාල ගණන්වලින් වැඩියි කියා. ඒ කියන්නේ ආනයනය කරන මිලක් තිබෙනවා; විකුණන මිලක් තිබෙනවා. මම වෛද්‍යවරයෙක් නොවෙයි. මේ බෙහෙත් ද්‍රව්‍යවල නම් හරියට කිව්වේ නැත්නම්, කරුණාකරලා මට සමාවන්න. Cetirizine Dihydrochloride කියන බෙහෙත රුපියල් 88කට ආනයනය කර රුපියල් 400කට ආසන්න මිලකට විකුණනවා. ඒ කියන්නේ විකුණන මිල 5 ගුණයකින් වැඩියි. ඊට අමතරව Montelukast කියන tablet එක රුපියල් 440ට ආනයනය කර රුපියල් 2,645කට වෙළෙඳ පොළේ විකුණනවා. ඒ කියන්නේ හය ගුණයක්, -සියයට 600ක්- වැඩියෙන් විකුණනවා. Fulvoetan Tefu Perazono රුපියල් 108කට ආනයනය කර රුපියල් 960කට විකුණනවා. ඒ කියන්නේ විකුණුම් මිල 9 ගුණයක් වැඩියි. මේ වාගේ හුඟාක් බෙහෙත් තිබෙනවා. Sildenafil Citrate තිබෙනවා. ඒක 6 ගුණයක් වැඩියෙන් විකුණනවා. Domperidone තිබෙනවා. මේක හැම කෙනාම ගන්නා බෙහෙතක්. රුපියල් 58කට ආනයනය කර රුපියල් 400 ගණනේ විකුණනවා. 5 ගුණයක්, 6 ගුණයක්, 7 ගුණයක්, 9 ගුණයක් වැඩියෙන් තමයි මේ බෙහෙත් විකුණන්නේ.

මම මෙතැනට මගේ පෞද්ගලික අත් දැකීම එකතු කරන්නට ඕනෑ. මගේ මව වකුගඩු රෝගියෙක්ව සිටියා. ඇය අවුරුදු 5කට උඩදී මිය ගියා. ඇය රෝගීව සිටි කාලයේ මම ඇයව නැවත නැවත වාරයක් ශ්‍රී ජයවර්ධනපුර රෝහලට අරගෙන ගියා. රෝහලට අරගෙන ගියාම ලේ පිරිසිදු කිරීමට ගෙවන්නට තිබෙන මුදල්වලට හැර බෙහෙත් හේත්වලට ගෙවන්නට ඕනෑ. අවුරුදු 5කට උඩදී දවසකට Erythropoietin එක එන්නතක් ගැහුවොත් රුපියල් 10,000ක් ගෙවන්නට ඕනෑ. සාමාන්‍යයෙන් වකුගඩු රෝගියෙක් ඉන්නවා නම් ඒ වකුගඩු රෝගියාව බලාගන්නට ඒ කාලයේ පවුලකට මාසයකට රුපියල් 40,000ක් 50,000ක් ඕනෑ. අවුරුදු 5කට පසුව මම හිතන විධියට ඒක තව හුඟක් වැඩි ඇති. ඒ වියදමෙන් වැඩි කොටසක් යන්නේ ලබා දෙන්නට තිබෙන බෙහෙත් හේත් සඳහායි. අපට පුළුවන් වුණා, අවුරුදු 13ක් ඇයව රෝද පුටුවේ තියාගෙන රෝහලට රැගෙන යන්නට. නමුත් අපිත් සමඟ දෙමාපියන් අරගෙන ආපු අනෙක් පුතාලා දුවලාව මම මාස 6කට 7කට පසුව දැක්කේ නැහැ. මොකද, ඒ අයට හැකියාව තිබුණේ නැහැ ඒ වාගේ විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කර ගෙන ඒ දෙමාපියන්ගේ ජීවිතය රැක ගන්නට. ඒ අයට ඒ භාග්‍ය තිබුණේ නැහැ.

අපේ ගරු ඇමතිතුමා අද ඉදිරිපත් කරන මේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත මේ රටේ පාර්ලිමේන්තු ඉතිහාසයේ වැදගත්ම පනතක් කියලා අපට සඳහන් කරන්න පුළුවන්. සාමාන්‍ය පොදු ජනතාවට, විශේෂයෙන්ම රෝගී අයට ප්‍රායෝගිකව මෙයින් විශාල සහනයක් ලැබෙනවා. නමුත් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා අපට මතක් කළා වාගේ මේ පනත් කෙටුම්පත අද අපි සම්මත කර ගත්තා කියලා හෙට හැම එකක්ම අඩු වෙන්නේ නැහැ. අපි ඉන්ධන මිල අඩු කළා; භාණ්ඩ මිල අඩු කළා; බදු පහළට ගෙනාවා. නමුත් සති හතරකට පස්සේ, අදත් පාරිභෝගිකයාට ඒකේ සම්පූර්ණ ලාභය ලැබිලා නැති බව මේ සභාවේ හැම කෙනෙකුටම පැහැදිලියි. නොයෙකුත් ප්‍රශ්න, ගැටලු තිබෙනවා. ඒ වාගේම සාමාන්‍ය ජනතාවට ලබා දිය යුතු ප්‍රතිලාභ ලබා නොදෙන වෙළෙන්දන් සෑම තැනම ඉන්නවා. එම නිසා අතිගරු ජනාධිපතිතුමා මතක් කළා වාගේ අපි මේ පනත සම්මත කර ගත්තාය කියලා හැම එකක්ම දවසින් දෙකින් වෙනස් වෙන්නේ නැහැ. නමුත් අපි ගමන ආරම්භ කරලා තිබෙනවා. ඒ වාගේම රජයක් හැටියට අපි මේ පිළිබඳව තදින් ක්‍රියා කරන්නට බලාපොරොත්තු වෙනවා. පනත් කෙටුම්පතක් සම්මත වුණාට පස්සේ ඒ පනත ක්‍රියාත්මක කරන්න අපි තදින් නීතිය ක්‍රියාත්මක කරනවා.

විශේෂයෙන්ම වාණිජ කොම්පැනිවල මතයක් තිබෙනවා මිල තීරණය කරන එක අපි වෙළඳ පොළට තියන්න ඕනෑ කියලා. අද ගරු සෞඛ්‍ය ඇමතිතුමා පැහැදිලි කළා, වෙළඳ පොළ තිබෙන රටවල්වලත් ප්‍රධාන බෙහෙත් හේත්වල මිල අධිකාරිය තීරණය කරනවා කියලා. ඒ නිසා මේ පනත් කෙටුම්පතේ 118.(3) උප වගන්තියෙහි සඳහන් කරනවා, "අධිකාරිය විසින් නව ඖෂධ ද්‍රව්‍යයන්ගේ මිල තීරණය කිරීමේ කාර්ය සඳහා කලාපයේ මිල ගණන්, නව නිෂ්පාදනයේ ප්‍රතිලාභ සහ පිරිවැය ඵලදායිකත්වය සැලකිල්ලට ගත යුතු ය" කියලා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙන්නේ.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසන් කරනවා. මම මේ පිළිබඳව කියන්න හේතුව මේකයි. මේ ඖෂධ වෙළඳාම කරන ව්‍යාපාර දැනගෙන ඉන්නට ඕනෑ, හැම එකක්ම තමන්ට කැමැති කැමැති විධියට තමන්ට එකතු වෙලාවත් කරන්න බැහැ කියන කාරණය. මොකද, මේක රට ගැන, මිනිස්සුන්ගේ සෞඛ්‍යය ගැන, ජීවිත ගැන තිබෙන ප්‍රශ්නයක්. ඒක නිසා මේ අධිකාරිය විසින් මේ මිල පාලනය සිදු වෙන්නට ඕනෑමයි.

මගේ අවසාන කරුණ මෙයයි. රාජ්‍ය ඖෂධ නිෂ්පාදනය අපි වැඩි කරන්නට ඕනෑ. ඒ ගැන කථා කරන්න වේලාවක් නැති නිසා අපේ රජයෙන් මම ඉල්ලීමක් කරනවා, මේ කාර්යය අපි ඉදිරියට ගෙන යන්නට නම් විශේෂයෙන්ම විද්‍යාත්මකව මේවා හදා බැලීමටයි, ඒ තාක්ෂණයටයි -researchවලට- වැඩිපුර ආයෝජනයක් කරන්න කියා. ඒ ආයෝජනය නැත්නම් අපට මේ දේ ඉෂ්ට කරන්නට බැරි වෙනවා. ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 15ක් තිබෙනවා.

[අ.භා. 3.03]

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත විවාදයට ගනු ලබන අවස්ථාවේදී කරුණු කිහිපයක් මේ ගරු සභාවේ අවධානයට යොමු කරන්න මම කැමැතියි. ගරු රාජිත සේනාරත්න සෞඛ්‍ය අමාත්‍යතුමා කලක් වෘත්තීය සමිති නායකයෙක් හැටියට කටයුතු කළා. ඒ කාලයේත් සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය ගැන එතුමා ඉතා ඕනෑකමින් අදහස් දැක්වූවා අපට මතකයි. අපේ රටේ දැනට තිබෙන මීට අදාළ නීති-රීතිවලට සාපේක්ෂව බැලුවොත් එක්තරා ඉදිරි වර්ධනයක් මේ පනත් කෙටුම්පත මඟින් සිදු කොට තිබෙන බව අපි පිළිගන්නවා. හැබැයි සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය සියයට සියයක් නූතන ලෝකයේ ඒ අයුරින්ම ගළපන්න පුළුවන් වෙයි කියන මනෝරාජික අදහසක මම නැතත්, ඒ ඖෂධ ප්‍රතිපත්තිය ඇතුළේ තිබුණු ප්‍රධාන වැදගත් සාධක ගණනාවක් පිළිබඳව අවශ්‍ය ප්‍රමාණයට තද අවධානය මෙයින් ලක් වෙලා නැහැ කියන කරුණත් ගරු සෞඛ්‍ය ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි. ඔබතුමන්ලා පත් කරන මේ අධිකාරියේ සාමාජික සංඛ්‍යාව 13ක් වෙනවා. ඒකෙන් 9 දෙනෙක් විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරනවා. මේ පනත අනුව ඖෂධ අනුමත කිරීමත් මේ අධිකාරියට තමයි පැවරෙන්නේ.

ඒ කියන ප්‍රමිතීන්ට අදාළව, ඒ කියන සුදුසුකම්වලට අදාළව වුවත් වැඩි සාමාජික සංඛ්‍යාවක් විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කිරීම නිසා සාධාරණ සැකයක් මතු වෙන්න පුළුවන්. බහුතර සාමාජික සංඛ්‍යාවක් පත් කිරීම සිදු වන්නේ විෂය භාර අමාත්‍යවරයා විසින් නිසා ඖෂධ අනුමත කිරීමේ කටයුත්තට දේශපාලන බලපෑමක් එල්ල කිරීමේ හැකියාවක්, -ඒක ඔබතුමා විෂය භාර අමාත්‍යවරයා හැටියට, පුද්ගලයෙක් හැටියට කරනවාද, නැද්ද කියන එක නොවෙයි මම කියන්නේ. නමුත් අවශ්‍ය නම් එබඳු පුද්ගලයෙක් ඒ අමාත්‍ය ධුරයේ ඉන්නවා නම්- ඒකට ඉඩක් මේ මඟින් නිර්මාණය වෙලා තිබෙනවා. ඕනෑ නම් ඖෂධ අනුමත කිරීමේ කාර්යයට පවා දේශපාලන වශයෙන් බලපෑමක් කරන්න ඉඩක් මේ මඟින් නිර්මාණය වෙලා තිබෙනවා. ඒවා කරන ඇමතිවරුත් මේ රටේ බිහි වෙන්න පුළුවන්; නොකරන ඇමතිවරුත් මේ රටේ බිහි වෙන්න පුළුවන්. මගේ ප්‍රශ්නය ඇමතිවරයා ගැන නොවෙයි. ඒ ඉඩ මේ පනත් කෙටුම්පත මඟින් ඉදිරිපත් වී තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඖෂධ අනුමත කිරීම වැනි කාර්ය භාරයකට උරදෙන රාජ්‍ය ආයතනයක් නිර්මාණය වෙනකොට එහි ප්‍රධාන බල මණ්ඩලයේ, මුදුනේ සභාපතිවරයා ප්‍රමුඛ කොට ගත් 13ක් වන සාමාජික සංඛ්‍යාවෙන් 9ක්ම විෂය භාර අමාත්‍යවරයා ඒ අදාළ නිර්ණායක අනුව පත් කිරීම ඒ තරම් සුදුසු හා සාධාරණ දෙයක් හැටියට මම පිළිගන්නේ නැහැ.

මේ පනත් කෙටුම්පත සැදීමේදී තමුන්නාන්සේලා එක්තරා ආකාරයකට මීට අදාළ විශේෂඥ හැකියාවක් තිබෙන වෛද්‍යවරු සංඛ්‍යාවක් සමඟ සාකච්ඡා කරලා තිබෙන බව අපි දන්නවා. හැබැයි, දැන් අපි කල්පනා කරලා බලන්න ඕනෑ එක දෙයක් තිබෙනවා. මේ පනත් කෙටුම්පත තමුන්නාන්සේලා කඩිනමින් මේ ගරු සභාවට ගෙනාවා. මේ සම්බන්ධයෙන් සාර්ථක අධ්‍යයනයක නියැලෙන්න අපට ප්‍රමාණවත් කාලයක් ලැබුණේ නැහැ. අද උදේ තමයි උපදේශක කාරක සභාවටත් දැම්මේ. ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත ප්‍රශස්ත පනත් කෙටුම්පතක් නම්, මේක මීට වඩා ප්‍රශස්ත ආකාරයට ගෙන ආ හැකිව තිබුණා. හොඳ සමාජ සංවාදයක් ඇති වෙන්න ඉඩකඩ හැරලා, උපදේශක කාරක සභාවේදීත් අපට ප්‍රමාණවත් කාලයක් දීලා, මේ ගැන අපට හොඳ සාකච්ඡාවක් කරලා එහෙම ගේන්න තිබුණා. [බාධා කිරීමක්]උපදේශක කාරක සභාව තිබුණේ නැහැ. අද උදේ තිබෙනවා කියලා කිව්වා. මම නම් -[බාධා කිරීමක්] නැහැ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
සාමාජික සංඛ්‍යාව 9යි. 9 න් 5ක් පත් වෙන්නේ එක එක අංශවලින්. මහාචාර්යවරු -

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
නමුත් ඇමතිතුමා තමයි ඔවුන් නම් කරන්නේ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඒ වුණාට මහාචාර්යවරු පත් වෙන්නේ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඒකයි මම කිව්වේ. යම් යම් නිර්ණායකවලට යටත්ව වුණත් අමාත්‍යවරයා විසින් පත් කරන 9 දෙනෙක් ඉන්නවා.[බාධා කිරීමක්] නැහැ. නිල බලයෙන් පත්වෙන 4 දෙනෙක් ඉන්නවා. ඒවාට ඔබතුමාට කිසිම බලපෑමක් කිරීමේ හැකියාවක් නැහැ. ඒ පුද්ගලයා මෙසේ විය යුතුයි; මෙසේ විය යුතුයි කියලා එක එක නිර්ණායක තිබෙනවා. ඔබතුමාටත් පත් කරන්න වෙන්නේ ඒ රාමුව ඇතුළේ තමයි. හැබැයි, අවසාන වශයෙන් ගත්තොත් ඔබතුමා පත් කරන 9 දෙනෙක් ඉන්නවා. ඒකයි මම මතු කරන ප්‍රශ්නය. ඔබතුමා කියන්නේ "අමාත්‍යවරයා"; ඔබතුමා නොවෙයි. "ඒ" ද, "බී" ද, "සී" ද කියලා නොවෙයි, අමාත්‍යවරයා. මම කියාගෙන ආවේ උපදේශක කාරක සභාව තිබුණා නම්, අපට ටිකක් මීට වඩා බොහොම සද්භාවයෙන් සාකච්ඡා කරලා, තව අවශ්‍ය නම් මේ පනත් කෙටුම්පතේ හොඳ තිබෙනවා නම් ඒවා තව වැඩි කර ගන්න තිබුණා. ඒ වාගේ අවස්ථාවක් තිබුණා. මම දන්නේ නැහැ මොන කරුමයටද කියලා, මේ පනත් කෙටුම්පත ආවේ හරියට අර අමාරුවේ වැටුණු ගැහැනු ළමයෙක්ව බන්දලා දෙනවා වාගේයි. ඒ විධියට තමයි මේ පනත් කෙටුම්පත ආවේ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඔක්කෝම සාකච්ඡා කරලා, 2014 ජුනි මාසයේ අපේ හිටපු අමාත්‍යවරයා දවසක වැඩ මුළුවක් පවත්වා, මේ සියලුම අංශ එක්ක කථා කරලා ගත්ත අදහසුත් එක්කාසු කරලා හදලා තිබුණු පනත් කෙටුම්පත තමයි මම මේ ඉදිරියට ගෙන යන්නේ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු ඇමතිතුමනි, ඒ වුණාට -[බාධා කිරීමක්] පරණ පනතමද මේ එන්නේ කියලා අපි විපක්ෂයේ සිටින අය හැටියට දන්නේ නැහැ නේ. ඔබතුමන්ලාට ඒ අවබෝධය තිබෙනවා. එදා දීපු පනත් කෙටුම්පතයි, අද පනත් කෙටුම්පතයි සංසන්දනය කරලා බැලුවොත් නේ අපට ඒ අවබෝධය ලැබෙන්නෙත්. එතකොටයි ඒක අපට ප්‍රත්‍යක්ෂ වන්නේ. මම කියන්නේ අපට ඒකවත් ප්‍රත්‍යක්ෂ කර ගන්න ප්‍රමාණවත් කාලයක් මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ලැබුණේ නැහැ කියලායි. ඒක ලැබිය යුතුව තිබුණා. අමාරුවේ වැටුණු දරුවෙක් -ගැහැනු ළමයෙක්- බන්දලා දෙන විධියට මේක නොකළ යුතුව තිබුණා. ඒ කෙසේ වෙතත් දැන් මෙතැන තිබෙන ප්‍රධාන ප්‍රශ්නය මම කියන්නම්. අපි දන්නවා, යුද අවි ජාවාරම සහ ඖෂධ ජාවාරම කියලා ලෝකයේ ප්‍රධාන ජාවාරම් දෙකක් තිබෙන බව. ඖෂධ ව්‍යාපාරය කියලා කියන්නේ ඉතා බැරෑරුම් ලෙස විශාල සමාගම් ජාලයක් විසින් මෙහෙයවනු ලබන ව්‍යාපාරයක්. ඒ නිසා තමයි සේනක බිබිලේ වැනි අය මේ දැවැන්ත සමාගම්වල අවශ්‍යතාවයි, මහජන අවශ්‍යතාවයි අතර ගැටීමක් තිබෙන නිසා ඒ ගැටීම බොහෝදුරට තුලනය කරන්න එහෙම නැත්නම් ඒ ගැටීමෙන් වඩා වාසිදායක තත්ත්වය රෝගියාට අරගෙන දෙන්න මේ විධියේ ප්‍රතිපත්තියක් 70 දශකය පමණ ඇතදී ඉදිරිපත් කළේ.

එහිදී ප්‍රධාන වශයෙන් බලාපොරොත්තු වුණා, ඖෂධයක ගුණාත්මකභාවය පිළිබඳ කාරණය. ගරු ඇමතිතුමනි, වෙළෙඳ පොළේ විවිධ වෙළෙඳ නාමවලින් ඖෂධ තිබෙනවා. ඒ වාගේම ඖෂධීය නාමයෙනුත් ඖෂධ තිබෙනවා. හැබැයි, ඒවා එක හා සමාන ඖෂධ කියා සැලකුවාට ඒවායෙන් රෝගියාට වන බලපෑමේ වෙනස්කම් තිබෙනවා. සමහර වෙලාවට වෛද්‍යවරු කියනවා, "මේවා ඉන්දියාවේ බෙහෙත්. ඉන්දියාවේ බෙහෙත්වලට වඩා හොඳයි යුරෝපයේ හදන බෙහෙත්." කියලා. ඉතින්, සල්ලි නැති මනුස්සයාට වෛද්‍යවරයා ඉන්දියාවේ බෙහෙත ලියා දෙනවා. හැබැයි, වෛද්‍යවරයාට පෙනෙනවා නම් මේ පුද්ගලයාට යම්කිසි ආර්ථික හැකියාවක් තිබෙනවා කියලා, ඉන්දියාවෙන් හදලා එවන වෙළෙඳ නාමය සහිත බෙහෙතට වඩා යුරෝපයෙන් එන බෙහෙතේ ගුණාත්මක බලපෑම වැඩි බව ඔහු හොඳින්ම දන්නා නිසා එම බෙහෙත ලියා දෙන අවස්ථා තිබෙනවා. එය අපේ ඖෂධ වෙළෙඳ පොළේ තිබෙන විසමතාව නිසා ඇති වෙලා තිබෙන තත්ත්වයක්. ඒ නිසා වඩා වැදගත් වන්නේ ඖෂධවල ගුණාත්මකභාවය බිඳ වැටෙන අවස්ථාවල ගනු ලබන ක්‍රියා මාර්ගයි. ඉතා වැදගත් වන්නේ එයයි. නමුත් ගරු අමාත්‍යතුමනි, ඒ ඖෂධවල ගුණාත්මක තත්ත්වය පිළිබඳ ප්‍රශ්නවලට ප්‍රබල බලපෑමක් කිරීමේ හැකියාවක් මේ අධිකාරිය සතුව නිර්මාණය වෙලා තිබෙනවා කියලා මට නම් පෙනෙන්නේ නැහැ. යම්කිසි තත්ත්වයක් තිබෙනවා තමයි, එවැන්නක් නැහැ කියලාම කියනවා නොවෙයි. හැබැයි, ඖෂධවල ගුණාත්මක තත්ත්වය පිළිබඳව තිබෙන ප්‍රශ්න නිරාකරණය කරන්න මීට වඩා මැදිහත් වෙන්න පුළුවන්. ගුණාත්මක තත්ත්වය බිඳ වැටීම් බහුලව සිදු වන විට ඒවායේ ලියා පදිංචිය ආරක්ෂා කරගන්න හැකි වී තිබෙන සමහර නීතිමය දුර්වලතා තිබෙනවා. ඒ දුර්වලතා මකලා, රිංගන්න තිබෙන හිල් වහපු ස්වභාවයක් මේ පනත් කෙටුම්පත මඟින් අපට පැහැදිලිව පෙනෙන්නේ නැහැ. සමහර වෙලාවට මේ කෙටි කාලය තුළ මේ පනත් කෙටුම්පත අධ්‍යනය කරපු නිසා අපට නොපෙනන කාරණයක් මෙහි තිබෙනවාද දන්නේත් නැහැ. එහෙම වෙලා නම් ඒකටත් වග කියන්න ඕනෑ මේ පනත් කෙටුම්පත ගෙනාපු විධියම තමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟ ප්‍රශ්නය මේකයි. පැරණි පනත යටතේ ඖෂධ දසදහස් ගණන් ලියා පදිංචි කරන්න සමාගම්වලට හැකි වුණා. හැබැයි, එහෙම කරන්න හැකි වුණේ ගුණාත්මක තත්ත්වය එක්තරා ආකාරයකට සනාථ කිරීමෙන් පසුව. නමුත් අද මේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ බලධාරින්ට වෙලා තිබෙන්නේ කසළ ගොඩකට අත දාලා හොඳ ඖෂධයක් සොයාගන්නවා වාගේ අතට හසු වූ ටිකක් ගන්නයි. ඒ තරම් ඖෂධ විශාල ප්‍රමාණයක් එකම ලෙඩේ වෙනුවෙන් ලියා පදිංචි වෙලා තිබෙනවා. ඒ සමාගම් විශාල ප්‍රමාණයම තරගකාරි අරගළයක යෙදෙනවා, තමන්ගේ ඖෂධය වඩා වැඩියෙන් අළෙවි වන ඖෂධය බවට පෙරළාගන්න. මේ තරගයෙන් වන අනර්ථකාරි බලපෑමට තමයි මහ ජනයා ගොදුරු වෙලා තිබෙන්නේ. මේ තරගය යම්කිසි ආකාරයකට පාලනය කරන්න, එහෙම නැත්නම් එකම රෝගයකට මෙතරම් බෙහෙත් විශාල සංඛ්‍යාවක්, සමාගම් විශාල ප්‍රමාණයකින් ඕනෑද නැද්ද කියන ප්‍රශ්නයට උත්තර සොයන්න ප්‍රමාණවත් බලපෑම්සහගත මැදිහත් වීමක් මේ පනත් කෙටුම්පත හරහා නිර්මාණය වෙලාය කියා මට නම් පෙනෙන්නේ නැහැ ගරු ඇමතිතුමනි.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

පැහැදිලිවම පෙනෙන්න තිබෙනවා. මෙහි තමයි තිබෙන්නේ ඖෂධ නියාමනය පිළිබඳව. ජාතික ඖෂධ නියාමන අධිකාරියට තීන්දු කරන්න පුළුවන් එක වර්ගයකට ඖෂධ වර්ග කීයක් ද ඕනෑ කියලා. ඒ වාගේම, අලුතින් එන ඒවා ප්‍රතික්ෂේප කිරීමේ බලයත් ලබා දීලා තිබෙනවා. එතකොට අලුතින් එකක් register කරන්න බැරි වනවා.

ගරු මන්ත්‍රීතුමනි, දෙවැනි කාරණය හැටියට ඔබතුමා ගුණාත්මකභාවය ගැන කිව්වා. ඒ සඳහා වෙනම lab එකක් තිබෙනවා. තවම ඒ lab එකේ නිසි standard එකක් නැහැ. මම උදේ වරුවේත් මේ ගැන ප්‍රකාශ කළා. අපි ඉදිරියේදී එය world standards වලට අනුව හදනවා. ඒ ආකාරයට lab එක හදපු ගමන් අපි ඒ brand names ඔක්කෝම අයින් කරනවා. Generic name එක විතරයි ඊට පසුව භාවිත කරන්න පුළුවන්.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

එසේ කිරීමේදී මට ප්‍රශ්නයක් මතු වෙනවා ගරු ඇමතිතුමනි. මෙය මගේ නොදන්නාකමට අහන ප්‍රශ්නයක් වෙන්න ඇති. ඔබතුමා ඔය කියන තත්ත්වය හැදුවාට පස්සේ වෙළෙඳ පොළට එන්නේ ඖෂධීය නාමය සහිත ඖෂධ පමණක්ද? එහෙම නැත්නම්, ඒ සමඟම වෙළෙඳ නාම සහිතව එන ඖෂධත් වෙළෙඳ පොළේ තිබෙනවාද? ඔබතුමා කියපු ඒ තත්ත්වය හැදුවාම ඇති වන තත්ත්වය ගැනයි මා අහන්නේ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

එතකොට generic name එක විතරයි තිබෙන්නේ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

එතකොට වෙළඳ පොළේ තිබෙන්නේ එය විතරද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ඔව්, ගරු මන්ත්‍රීතුමා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

තමුන්නාන්සේලා කියන විධියට අවුරුදු දෙකකින් ඒ තත්ත්වයට පරිවර්තනය වෙනවා නම් අපට බලාපොරොත්තු තියාගන්න පුළුවන් සැලකිය යුතු වශයෙන් මෙයින් බලපෑමක් වෙනවා කියලා. දැනට මේ තිබෙන තත්ත්වය අනුව මට නම් පෙනෙන්නේ මෙහෙමයි. අර කියපු විධියේ ප්‍රබල වෙනස්කම් වුණොත් ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. හැබැයි, මේ නීතිමය රාමුව තුළ පමණක්, දැනට තිබෙන තත්ත්වය අනුව පමණක් මෙය ඉදිරියට ගියොත් මට නම් පෙනෙන්නේ මෙයයි. අද සමහර ඖෂධ සමාගම් වෛද්‍යවරුන් විවිධාකාරයෙන් සමීප කරගන්නවා; සම්බන්ධ කරගන්නවා. ඊට පස්සේ වඩා වැඩියෙන් සලකන සමාගම්වල ඖෂධ වැඩියෙන් අළෙවි වන ආකාරයට කටයුතු කරන්න සමහර වෛද්‍යවරු සමහර විට උනන්දු වෙනවා. මෙය රහසක් නොවෙයි. නමුත් හැම වෛද්‍යවරයකුම ඖෂධ සමාගම්වල ගොදුරක් බවට පත් වෙලා නැහැ. හැබැයි මේ තිබෙන තත්ත්වය යටතේ නම් සිදු වන්නේ මොකක්ද? වෛද්‍යවරයා ඖෂධීය නාමය ලියනවා. ඕනෑ නම් ඊට අතිරේකව ඔහු වෙළෙඳ නාමයකුත් ලියනවා. තමුන්නාන්සේලා කියන විධියට යම්කිසි කාලයක් දක්වා වෙළෙඳ නාම ලියන්න පුළුවන්. ඖෂධීය නාමයයි, වෙළෙඳ නාමයයි අරගෙන ගියාම ෆාමසියේ කෙනාට ඕනෑ නම් පුළුවන්කම තිබෙනවා, ඒ ඖෂධීය නාමයට අදාළ බෙහෙත තියාගෙන එය නැහැ කියන්න. එහෙම නැත්නම්, ඒ ලියපු වෙළෙඳ නාමය වෙනුවට ඒ හා සමාන වෙනත් වෙළෙඳ නාමයක් තිබෙන පෙත්තක් ගන්න කියලා යෝජනා කරන්න ඔහුට පුළුවන්. ඔබතුමන්ලා කියනවා වාගේ මෙහි යම් යම් නීති තිබෙනවා ඒවා පාලනය කරන්න. හැබැයි ඒවා ප්‍රමාණවත් නැහැ කියලායි මා කියන්නේ.

බෙහෙත ගන්න යන්නේ ලෙඩා. ලෙඩාට බැහැ, බෙහෙත ගැන ෆාමසියේ අයත් එක්ක සණ්ඩු සරුවල් වෙන්න. එහෙම නැත්නම් මේ පනත අර ගෙන ගිහිල්ලා පනතේ වගන්ති ගැන කථා කර කර ඉන්න බැහැ. ඒක ප්‍රායෝගිකව වෙන්නේ නැහැ. දැන් පසු ගිය අය වැයෙන් සිමෙන්ති මිල අඩු කළාය කිව්වාට වෙළෙඳ පොළට ගියාම සිමෙන්ති මිල අඩු වෙලා නැහැ නේ. එහෙම ප්‍රශ්න ටිකක් තිබෙනවා. ඒ සඳහා තමුන්නාන්සේලාට මොනවා හරි පැහැදිලි කිරීම් ඇති. මෙතැනදී රෝගියාත් ඒ වාගේ ප්‍රායෝගික ප්‍රශ්නයකට මුහුණ දෙනවා. වෛද්‍යවරයාට බෙහෙත් හරහා යම්කිසි බලපෑමක් කරන්න කලින් ඉඩ තිබුණා නම්, වෙළෙඳ නාම ප්‍රවර්ධනය කිරීමේ ඕනෑකමක් වෛද්‍යවරයාට තිබුණා නම්, මේ පනත් කෙටුම්පත හරහා වෛද්‍යවරයා සතු ඒ හැකියාව අවම වෙනවා වාගේම, ඒ හැකියාව සහ බලය ඖෂධ වෙළෙඳාම කරන ෆාමසි එකේ ඉන්න අයට වෙනත් අනියම් ආකාරයකින් ආරෝපණය වෙනවා; ලැබෙනවා. සමහරවිට ඖෂධ සමාගම්වලින් ඔවුන් සන්තර්පනය කරන්න මැදිහත් වන ප්‍රමාණය වැඩි වන්න පුළුවන්. එතැනදී ඔවුන්ට හැකියාවක් ඇති වෙනවා, තමන්ට ප්‍රවර්ධනය කරන්න අවශ්‍යයි කියන වෙළෙඳ නාම සහිත බෙහෙත ප්‍රවර්ධනය කරන්න. හැබැයි, ඔබතුමා කියන විධියට වසර දෙකකින් පසුව ඒ කියන තත්ත්වය නැති වෙනවා නම් ඒ අවුල, අවදානම නැති වෙනවා. ඒක අපට පිළිගන්න වෙනවා. හැබැයි, මම කියන්නේ දැනට මේ අවදානම තිබෙන බවයි.

මා මතු කළ ප්‍රශ්නය අනුව ඔබතුමා පැහැදිලි කළා ගුණාත්මක තත්ත්වය වර්ධනය කරන්න, එහෙම නැත්නම් ඖෂධවල ගුණාත්මකභාවය පිළිබඳ ප්‍රශ්නවලට මැදිහත් වෙන්න යම් යම් පියවර ගන්නවාය කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අන්තර්කාලීන ලියා පදිංචිය, ගුණාත්මක තත්ත්වය බිඳ වැටුණාම ඒ සම්බන්ධයෙන් ඉතාම දැඩි පියවර ගැනීමේ හැකියාව, ගුණාත්මක තත්ත්වයේ බිඳ වැටීම් අසාදු ලේඛනගත කරන්න තිබෙන හැකියාව, මෙන්න මේ ඖෂධවල ගුණාත්මක තත්ත්වයේ මේ වාගේ දෙයක් ඇති වෙලා අපි මේ සමාගම් අසාදු ලේඛනයට ඇතුළත් කර තිබෙනවා කියලා ඒ තොරතුරු මහජනතාවට ප්‍රසිද්ධ කරන්න හැකියාව තිබෙන්න ඕනෑ. සෞඛ්‍ය අමාත්‍යාංශය ටිකක් ආන්දෝලනාත්මක ප්‍රශ්නවලට ලක් වුණු අවස්ථාවල නම් ඒ විධියට කටයුතු කරලා තිබෙනවා. අපේ රටේ මහ බැංකුව වුණත් කාගේ හරි සල්ලි ටිකක් නැති වුණාම නේ, නීති විරෝධී මූල්‍ය ආයතන ගැන දැනුවත් කිරීම පටන් ගන්නේ. ඒ වාගේ සිදු වන අවස්ථා තිබෙනවා. නමුත්-

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

-ඒ පැත්ත පිළිබඳව මේ පනත් කෙටුම්පතේ තිබෙන අවධානය අඩුයි. මට තව තිබෙන්නේ විනාඩියක කාලයක් නිසා මම ඉතාම ඕනෑකමින් කියන්න බලාපොරොත්තු වන කොටස ඔබතුමාගේ අවධානයට යොමු කරන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැදගත්ම දේ මේකයි. මෙය සේනක බිබිලේ මහත්මයා අනුගමනය කරපු සෞඛ්‍ය ප්‍රතිපත්තිය හා ඇසුරින් සකස් කළ පනත් කෙටුම්පතක් නම් ප්‍රධාන වශයෙන්ම වෙන්න ඕනෑ කරුණු කිහිපයක් තිබෙනවා. මම ඉතා ඉක්මනින් ඒ කරුණ අවධාරණය කරන්නම්. මම මුලින් මතු කළ, ඖෂධවල ගුණාත්මක තත්ත්වය ආරක්ෂා කිරීම පිළිබඳ ප්‍රශ්නය තිබෙනවා. ඒ වාගේම ඒ ගුණාත්මක තත්ත්වය බිඳ වැටෙන තැන්වලට අදාළව ගනු ලබන ප්‍රශස්ත පියවර අවශ්‍ය වෙනවා. දැනට තිබෙන පියවර ප්‍රමාණවත් නැහැයි කියන එක අපි කවුරුත් පිළිගන්නවා. මේ පනත් කෙටුම්පතෙනුත් ඊට වඩා එහාට යන පියවර අරගෙන තිබෙනවාය කියලා අපට පෙනී යන්නේ නැහැ. අනෙක් කාරණය තමයි-

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කළ කාලය අවසන්.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

විනාඩියක් ගියේ නැහැ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගියා. කමක් නැහැ, කථා කරන්න.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

හොඳයි, ඔබතුමාගේ අනුකම්පාව යටතේ තව විනාඩියක් දෙන්න.

මේ තුළින් රෝගියා සූරාගෙන කන්න ඖෂධ සමාගම්වලට තිබෙන හැකියාව සැලකිය යුතු වශයෙන් අවම වෙලා තිබෙන බවක් පෙනෙන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමා සඳහන් කළ

[ගරු විමල් වීරවංශ මහතා]

තත්ත්වය අනාගතයේ හැදෙනවා නම් ඒ සුරක්ෂිත වාතාවරණය හැදෙයි කියන බලාපොරොත්තුව අපට තිබෙනවා. කෙසේ වෙතත් ආන්දෝලනයට ලක් වුණු මේ පනත් කෙටුම්පත මම කිව්ව ඌණ පූරණ සහිතව හෝ ගෙන ඒමට හැකි වීම පිළිබඳව සතුටු වන බව සඳහන් කරමින් මා මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු මන්ත්‍රීතුමනි, මේ කටයුතු සම්පූර්ණ වූ දවසට බොහෝ වෛද්‍යවරු generic නාමය ලියනවා. මෙහි කියා තිබෙන්නේ අවශ්‍ය වූ විටෙක පමණයි brand name එක ලියන්නේ කියලා. ඒක එකක්. අනෙක, මට පත් කරන්න පුළුවන් හතර දෙනායි. අනෙක් professionalsලා එන්නේ ඒ professional bodiesවලින්. Deanගේ අනුමැතිය ඇතිව තමයි professorsලා එන්නේ. මට ඕනෑ කෙනෙක් පත් කරන්න බැහැ. ඒක rotate වෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

මිළඟට, ගරු ඩීව් ගුණසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.20]

ගරු ඩීව් ගුණසේකර මහතා
(மாண்புமிகு டீயூ குணசேகர)
(The Hon. DEW Gunasekara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත දෙවන වර කියැවීම සඳහා ඉදිරිපත් කළ මේ ඓතිහාසික අවස්ථාවේ අපේ හිතවත් ගරු රාජිත සේනාරත්න ඇමතිතුමාට අපේ සතුට, ප්‍රසාදය, ස්තුතිය ප්‍රථමයෙන්ම පිරිනමා සිටිනවා.

මේ පනත් කෙටුම්පතේ නිර්මාතෘවරයා වශයෙන් සලකන ජනාධිපති ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා කාලාන්තරයක් තිස්සේ බොහොම උද්‍යෝගීව, වෙහෙස මහන්සි වී ඉටු කරන්න බලාපොරොත්තුවෙන් සිටි කාර්ය භාරයක් අද ඉෂ්ට කරන්න ලැබීම ගැන එතුමා සතුටු වනවා ඇති. මෙය ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අපිත් එතුමාට ස්තුතිවන්ත වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සංකල්පය ඉදිරිපත් කරපු දොස්තර සේනක බිබිලේ, දොස්තර එස්.ඒ. වික්‍රමසිංහ යන දෙදෙනා මේ සංකල්පය මත මේ ප්‍රතිපත්තිය කෙටුම්පත් කරන කොට මට අවස්ථාව ලැබුණා, එතැනට යෑමට. බොරැල්ලේ, Bawa Place හි පිහිටි දොස්තර වික්‍රමසිංහ මැතිතුමාගේ ගෙදර කාමරයේ මෙය කෙටුම්පත් කරන අවස්ථාවේ තමයි පළමු වතාවට දොස්තර වික්‍රමසිංහ මහත්මයා විසින් සේනක බිබිලේ මැතිතුමාව මට හඳුන්වා දුන්නේ. ඒ 1970 කාලයේ.

අපේ රටේ පාර්ලිමේන්තුව විසින් විවිධ අවස්ථාවල ඉදිරිපත් කරපු විප්ලවකාරී අණ පනත් අරගෙන බලන කොට, ප්‍රගතිශීලී අණ පනත් අරගෙන බලන කොට පෙනෙනවා, විශේෂයෙන් 1956න් පස්සේ කුඹුරු පනත, බස් ජනසතුව, වතු ජනසතුව වාගේ පනත් ගොඩක් ගෙනැවිත් ඇති බව. ඊට සමාන හා නො දෙවෙනි පනත් කෙටුම්පතක් තමයි මේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත. ඒ නිසා තමයි මේ අවස්ථාව ඓතිහාසික අවස්ථාවක් වන්නේ. ගරු රාජිත සේනාරත්න ඇමතිතුමාටම මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලැබීම එතුමාගේ දේශපාලන ජීවිතයේ ඉතාම තෘප්තියට පත් වන අවස්ථාවක් වනවා ඇති. ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා එදා සෞඛ්‍ය ඇමතිතුමා වශයෙන් ඉන්න කාලයේ හැම වර්ෂයකම විශේෂ ආරාධිතයකු ගෙන්වා සේනක බිබිලේ ගුණානුස්මරණ සම්මන්ත්‍රණයක් පැවැත් වූවා. 2013 වර්ෂයේ පැවැති සම්මන්ත්‍රණයට එතුමා මට ආරාධනා කළා, දේශනයක් කරන්න කියලා. මා කිව්වා "මා වෛද්‍යවරයකු නොවෙයි, ඒ සඳහා සුදුසු කෙනකුට ආරාධනා කරන්න" කියලා. නමුත් එතුමා මට ඒකට ආරාධනා කළා. මොකද, මේ සංකල්පය සේනක බිබිලේ කියන පුද්ගලයා ගෙනාවේ වෛද්‍යවරයකු වශයෙන් නොවෙයි. වෛද්‍යවරු ඕනෑ තරම් හිටියා නේ. එතුමාට මෙවැනි දෙයක් ඇති කරන්න පුළුවන් වුණේ ඔහුගේ තිබුණු දේශපාලන චින්තනය නිසයි. සේනක බිබිලේ ආර්ථික විද්‍යාව පිළිබඳව, සමාජ විද්‍යාව පිළිබඳව දැක්මක් තිබුණු පුද්ගලයකු නිසා, මම වමේ නායකයකු නිසා මාව ඔහු තෝරා ගත්තා කියලා කිව්වා, ඒ විශේෂ දේශනයට. මම ඒ දේශනය කරපු අවස්ථාවේ තමයි පළමු වතාවට මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ප්‍රකාශයට පත් කළේ, සම්පාදනය කරපු පනත් කෙටුම්පත අතුරුදහන් වෙලායි කියන කාරණය. පසුව එතුමා මාත් එක්ක සාකච්ඡා කරන කොට මා එතුමාට කියා සිටියා, "මේ කුඹුරු පනත වාගේ නොවෙයි, බස් ජනසතු පනත වාගේ නොවෙයි, මේකෙදී ඊට වඩා ප්‍රවේසම් වෙන්න ඕනෑ. ඔබතුමා හැප්පෙන්න යන්නේ මහා විශාල කර්මාන්තයක් එක්කයි. ඒ නිසා මේකෙදී තනියම සටන් කරන්න බැහැ. මේ පිළිබඳව ජනමතයක් රට තුළ, අද සමාජය තුළ ඇති කරන්න ඕනෑ. ඒ නිසා අපි අමාත්‍යාංශයෙන් පිට මහ ජනතාව එක්ක මේ සම්බන්ධයෙන් ව්‍යාපාරයක් කර ගෙන යමු, නැත්නම් පසු බසින්න වනවා" කියලා. මා එදා එතුමාට ඒක පෞද්ගලිකව කිව්වා.

මේ පනත් කෙටුම්පතේ තිබෙන ස්වභාවය එයයි. සේනක බිබිලේ මැතිතුමා මේ සංකල්පය ඉදිරිපත් කරලා අවුරුද්දක් තුළ රාජ්‍ය ඖෂධ සංස්ථාව පිහිටෙව්වා. ඒකෙන් අලුත් සංකල්පය ප්‍රතිපත්තියක් බවට හදලා ප්‍රතිපත්තිය නීතියක් බවට හරවලා අප රට තුළ පමණක් නොවෙයි, ජාත්‍යන්තර වශයෙනුත් මේක පිළිගැනීමේ තත්ත්වයකට පත් වුණා. 1976 බණ්ඩාරනායක මැතිනියගේ නායකත්වය යටතේ නොබැඳි ජාතීන්ගේ සම්මේලනය පැවැති වෙලාවේ අග්‍රාමාත්‍යතුමිය එතුමාට ආරාධනා කළා, නොබැඳි ජාතීන්ගේ සම්මේලනයට මේ සංකල්පය ඉදිරිපත් කරන්න කියලා. ඒ හරහා නොබැඳි ජාතීන්ගේ සමුළුවටත් මේ සංකල්පය ගියා. ඊට පස්සේ එතුමාට ආරාධනා කළා, WHO එකෙන්, 1977 දී. එතුමා ඒ අවස්ථාව වන විට අභාවප්‍රාප්ත වෙලා.

මේ සංකල්පය අර ගෙන ගියා, ඊට පස්සේ හිටිය දොස්තර බාලසුබ්‍රමනියම්. ඒ වාගේම ඔස්මන්ඩ් ජයරත්න මැතිතුමා මේ පිළිබඳ මතවාදය රට තුළ අර ගෙන ගියා. ඔහුගේ මිත්‍රයෝ කණ්ඩායමක් හිටියා, කාලෝ ෆොන්සේකා වැනි අය. ඔවුන් මේ මතය මැරෙන්නට නොදී දිගින් දිගටම ඉදිරියට අර ගෙන ගියා. 1980 වන කොට මේ මතය WHO එකෙන් පිළිගත්තා.

දොස්තර බිබිලේ ඉදිරිපත් කළ මේ කාරණයෙහි ඓතිහාසික පසුබිම ටිකක් කියන්න වනවා. අවාසනාවකට ඒ වනකොට වමේ පක්ෂ ආණ්ඩුවෙන් ඉවත් වෙලා ගියා. බලන්න, ඒ පක්ෂ ආණ්ඩුවෙන් යන කොට ඔහුත් රාජ්‍ය ඖෂධ සංස්ථාවේ සභාපතිකමෙන් ඉවත් වුණා. ඉවත් වෙලා මාස ගණනයි හිටියේ. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරාධනාවක් මත ඔහු ලංකාවෙන් ඝානාවලට ගියා. ඒ ගියේ විශේෂඥයෙක් විධියට මේ සංකල්පය ලතින් ඇමෙරිකාවට ඉදිරිපත් කරන්න. එහේ ගිහින් ඔහු මාස ගණනයි හිටියේ. ඇත්ත වශයෙන්ම එතුමාගේ මරණය ඒක ඝාතනයක් කිව්වාට කමක් නැහැ, සාක්ෂි, මරණය සිදු වෙච්ච පසුබිම බලන කොට. රාත්‍රී භෝජන සංග්‍රහයක දී වස දී ඔහුව මැරෙව්වා. ඒ වෙන කවුරුවත් නොවෙයි, drug mafia එකයි.

මේ සංකල්පය ප්‍රතිපත්තියක් බවට හැරවිලා, ශ්‍රී ලංකාව තුළ නීතියක් බවට පත් වෙලා, තුන්වන ලෝකයටත් ගිහින්, ඊළඟට ලොව පුරා ගමන් කළාට පස්සේ ලොකු කර්මාන්ත අයිතිකරුවන් මේ පුද්ගලයා ගැන බියට පත් වුණා.

ගරු ඇමතිතුමනි, මහාචාර්ය සේනක බිබිලේ මැතිතුමා අපේ රටේ විශේෂයෙන් වෛද්‍ය ක්ෂේත්‍රයේ විද්වතෙක් හැටියටයි සලකන්නේ. ඇත්ත තමයි දොස්තර වික්‍රමසිංහ මැතිතුමා ඔහුත් එක්ක සහාය වුණා; දේශපාලන සගයෙක් විධියට ඔහුත් එක්ක එකට වැඩ කළා. නමුත් මූලික වශයෙන් මෙම ඖෂධ ප්‍රතිපත්තියේ නිර්මාතෘවරයා වශයෙන් අපි සලකන්නේ සේනක බිබිලේ මැතිතුමායි. ඔහු ලොවට ඉදිරිපත් කළ සංකල්පය ලෝකයේ රටවල් 110ක අද අඩු වැඩි වශයෙන් ක්‍රියාත්මක වනවා. එම නිසා ඔබතුමාගේ අමාත්‍යාංශයට මා යෝජනාවක් කරනවා, එතුමාගේ පිළිරුවක්වත් තියන්න ඕනෑය කියා. ජීවතුන් අතර ඉන්න කට්ටියගේ නොවෙයි, මොකද, අපේ රට ලෝකයට හඳුන්වා දුන් එක් පුද්ගලයෙක් තමයි දොස්තර සේනක බිබිලේ මැතිතුමා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ඓතිහාසික පසුබිමේ ඉඳගෙන තමයි අපි මේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත ගැන සාකච්ඡා කරන්නට ඕනෑ. මා ඉතාමත් සන්තෝෂ වනවා, අපි මේ කථා කරන අවස්ථාවේ මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළ ගරු රාජිත සේනාරත්න ඇමතිතුමා ගරු සභාවේ ඉන්නවා. මේක එහෙමත් කෙනකුට තමයි කරන්නට පුළුවන්. මේක අභියෝගාත්මක කාර්ය භාරයක්. මම ඔබතුමාව භය කරනවා නොවෙයි. මේ ප්‍රශ්නය ඉදිරියේ තිබෙන අභියෝග ගැන තේරුම් අරගෙන කටයුතු කරන්න අවශ්‍යයි. මේක එතරම් සරල දෙයකුත් නොවෙයි. හැබැයි ස්ථිරසාරව හෙමින් - සාමාන්‍යයෙන් ඔබතුමා ඉක්මන් තීරණ ගන්නවා. ඉක්මන් තීරණ ගන්න යන්න එපා.- පැහැදිලිව, සාමූහිකව කටයුතු කරන්න. අපි පැත්තකින් ඉන්නවා, තමුන්නාන්සේට සහයෝගය දෙන්න. පළමුව කළ යුතු දෙය මේ පිළිබඳව සමාජය, රට දැනුවත් කිරීමයි. විශේෂයෙන් වෛද්‍ය වෘත්තිය දැනුවත් කරන්න. එය කිරීම අවශ්‍යයි. මොකද, වෛද්‍යවරුන්ගේ සහයෝගය මේකට ලබා ගත්තේ නැත්නම් මෙය ක්‍රියාත්මක කිරීම අමාරු වනවා.

මොකද, දොස්තර බිබිලේ මේ සංකල්පය ඉදිරිපත් කළ ලෝකය නොවෙයි අද තිබෙන්නේ. එදා තිබුණු ලෝක රටාව නොවෙයි අද. එදා සමාජවාදී ලෝකයත් තිබුණා, ඒ වාගේම ධනවාදී ලෝකයත් තිබුණා, මේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්නට පහසුයි. බෙහෙත් නියම කළාම බෙහෙත් ගන්න තරගකාරී තත්ත්වයක් තිබුණා. විශේෂයෙන්ම බටහිර ලෝකයේ නිෂ්පාදනය වූ ඒ බෙහෙත් ද්‍රව්‍ය භූගෝලීයව සීමාසහිත රටවල් ගණනකටයි ගියේ. ලෝකයේ රටවලින් තුනෙන් එකකට ගියේ නැහැ, තුනෙන් දෙකක තමයි තිබුණේ. ඒ වාගේ තත්ත්වයන් යටතේ තමයි එදා ඔහු මේ සංකල්පය ඉදිරිපත් කරන්නේ. නමුත් අද එය ඒ ආකාරයෙන්ම ඉදිරිපත් කරන්න බැහැ. අද ඒ ලෝක රටාව ඇත්තේ නැහැ.

ඔහු 1977 දී ලතින් ඇමෙරිකාවට යනකොට එදා 1977 වකවානුවේ ලෝකයේ තත්ත්වය ගැන සිතා බලන්න. 1977 වකවානුව කියන්නේ ලෝක රටාව වෙනස් වන වකවානුවක්. 1977 වකවානුව තැචර්, රේගන් බලයට එන අවස්ථාව; මෙහේ අපේ ජේ. ආර්.ජයවර්ධන මහත්මයා බලයට එන වකවානුව; නව ලිබරල් වාදය ආර්ථික ප්‍රතිපත්තියක් විධියට ආර්ථික න්‍යායක් විධියට ලෝකයට ඉදිරිපත් කර, ඒක ලතින් ඇමෙරිකානු රටවල ක්‍රියාවට නැංවීමට උත්සාහ කරන වකවානුව. අද ඒ රටාව වෙනස් වෙලා තිබෙනවා. නමුත් බිබිලේගේ ඒ ප්‍රතිපත්තිවල මූලික හරය ගත්තාම කාරණා හයක් තිබෙනවා. ගරු සෞබ්‍ය අමාත්‍යතුමා කථා කරන වෙලාවේ මා මේ ගරු සභාවේ සිටියේ නැහැ. සමහරවිට එතුමා මේ කාරණය සඳහන් කරන්න ඇති. නමුත් මම යළිත් වරක් ඒ කාරණා දෙක, තුන කියන්න බලාපොරොත්තු වෙනවා. මේ ප්‍රතිපත්තිය සකස් කර තිබෙන්නේ මූලික වශයෙන් කාරණා 6ක් පදනම් කර ගෙනයි. පළමු වැනි එක තමයි, අත්‍යවශ්‍ය ඖෂධ ලැයිස්තුගත කිරීම. ඖෂධ ආනයනය කිරීම සහ බෙදා හැරීම රජයට පැවරීම, ශ්‍රී ලංකාව තුළ ඖෂධ නිෂ්පාදනය කිරීම, ඖෂධ පිළිබඳ දැනුම සහ තොරතුරු බෙදා හැරීම, ඖෂධ පිළිබඳ පේටන්ට් අයිතිය අහෝසි කිරීම ආදී වශයෙන් කාරණා 6ක් මෙයට අන්තර්ගත කර තිබෙනවා. ඒ අනුව එතුමා විශේෂයෙන්ම රාජ්‍ය ඖෂධ සංස්ථාව හරහා ඖෂධ ආනයනය කිරීමේ කාර්යය ක්‍රියාවට පරිවර්තනය කළා.

ගරු රාජිත සේනාරත්න ඇමතිතුමා අදට ගැළපෙන ආකාරයට මේ පනත් කෙටුම්පත සකස් කර තිබෙනවා. බොහෝ දෙනා මටත් දුරකථන මාර්ගයෙන් කිව්වා, පුවත් පත්වලත් පළ වෙලා තිබුණා, මේක සේනක බිබිලේ ප්‍රතිපත්තිය නොවෙයි කියා. පනතක් හදනකොට ප්‍රතිපත්තිය පනතට දමන්න පුළුවන්කමක් නැහැ. සංකල්ප හරහා තමයි ප්‍රතිපත්ති එන්නේ. ප්‍රතිපත්ති තමයි නීතියට හරවන්න ඕනෑ. නීතියෙන් සියලු දෙය ඇතුළු කරන්න බැහැ. ඒක නිසා තමයි රෙගුලාසි ගෙනෙන්න ඇමතිතුමාට බලතල තිබෙන්නේ. විවිධ අවශ්‍යතාවන් පැන නැඟුණාම රෙගුලාසි ගෙනෙන්න ඕනෑ. මෙවැනි කාරණා මත තමයි මේ පනත් කෙටුම්පත සකස් කර තිබෙන්නේ. මම ඉස්සෙල්ලා කිව්වා වාගේ මේ පිළිබඳ ඉදිරියේදී ඇති වන අභියෝගාත්මක කාරණා කීපයක් තිබෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු ඩී.ඩී. ගුණසේකර මහතා
(மாண்புமிகு டீயூ குணசேகர)
(The Hon. DEW Gunasekara)
අද වනකොට පරිසරය වෙනස් වෙලා තිබෙනවා. ඒක තේරුම් ගන්න ඕනෑ. ඊළඟට මෙහි විශේෂයෙන්ම සඳහන් කර තිබෙන දෙයක් තමයි දැනුම ඇති කිරීම. වෘත්තීය වෛද්‍යවරුන්ගේ සහයෝගයක් නැතිව මේක ක්‍රියාත්මක කරන්න අමාරුයි. එහෙම බලනකොට ඉදිරියේදී මෙය ක්‍රියාත්මක කරනකොට ඖෂධ නාම වුණත් භාවිතයට එනවා. අපි නොයෙකුත් ඖෂධ නාම පාවිච්චි කරනවා නේ. අවුරුද්දක්, හමාරක් යනකොට ගමේ ගොඩේ මිනිස්සුත් මේ ඖෂධ නාම ඔක්කොම පාවිච්චි කරාවි. අද වෙළෙඳ නාමයෙන් ඖෂධ වර්ග 10,000ක් විතර තිබෙනවා. එදා කිව්ව විධියට 200ක් විතර ඇති. අද එදාට වැඩියි. ඕනෑ නම් ඒක 500ක්ය කියමු.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
370යි.

ගරු ඩී.ඩී. ගුණසේකර මහතා
(மாண்புமிகு டீயூ குணசேகர)
(The Hon. DEW Gunasekara)
370ක් නම් ඒවායේ නම් ටික අපි කාටත් කටපාඩම් වේවි. ඒක නිසා ක්‍රියාවට නංවනකොට ඒක එච්චර අමාරු වෙන්නේ නැහැ. නමුත් මම හිතන්නේ ඒකේදී භාෂා ප්‍රශ්නයක් ඇති වෙන්න පුළුවන්.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු ඩිව් ගුණසේකර මහතා
(மாண்புமிகு டீயூ குணசேகர)
(The Hon. DEW Gunasekara)

ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා විශේෂයෙන්ම සිංහල හා දෙමළ භාෂාව ගැන සඳහන් කර තිබෙනවා. ඒ නිසා ඒක සැලකිල්ලට ගන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් සංශෝධන ඉදිරිපත් කරන්න අප බලාපොරොත්තු වෙනවා. මේක ඓතිහාසික අවස්ථාවක්. වමේ නායකයෝ දෙදෙනක්; බුද්ධිමත් නායකයෝ දෙදෙනෙක්; රට පිළිගත්තු නායකයෝ දෙදෙනෙක් වුණු මහාචාර්ය සේනක බිබිලේ මහතා සහ දොස්තර ඇස්.ඒ. වික්‍රමසිංහ මහතා එක්කාසු වෙලා ඉදිරිපත් කරපු මේ සංකල්පය අද ලොව පුරා පිළිගෙන තිබෙනවා. අවුරුදු 45ක් ප්‍රමාද වෙලා වුණත් මෙය අදට ගැළපෙන ලෙස ක්‍රියාවට නැංවීමේ කාර්ය භාරය ගරු ඇමතිතුමනි, ඔබතුමා වෙත පැවරී තිබීම ගැන අපි සන්තෝෂ වෙනවා. අපට ඒ ගැන විශ්වාසයක් තිබෙනවා. අනෙක් ඒවා මොනවා වුණත් ඔබතුමාගේ දේශපාලන ජීවිතය ඉතිහාසයට එක් කිරීමට නම් කිසිම ප්‍රශ්නයක් නැතිව, නොබියව, නොපැකිළව,එඩිතරව මෙය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙසට ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි. මීළඟට, ගරු හර්ෂ ද සිල්වා නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 17ක කාලයක් තියෙනවා.

[අ.භා. 3.34]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - கொள்கை உருவாக்கம், பொருளாதார அலுவல்கள், சிறுவர், இளைஞர் மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Harsha De Silva - Deputy Minister of Policy Planning, Economic Affairs, Child, Youth and Cultural Affairs)

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා කරපු පළමු කථාවේදී මම කිව්වා, මම දේශපාලනය කරන්න ආපු ප්‍රධාන හේතුව ගැන. මම එය තීරණය කළේ මගේ අම්මා මැරෙනකොට එතුමියගේ වයස අවුරුදු 40යි. ඒකට හේතුව වුණේ, ඒ දවස්වල පිළිකා රෝගය සුව කරන්න අවශ්‍ය ඖෂධ නොතිබීමයි. එතකොට අපි පොඩි ළමයි. අද වනකොට මගේ නංගි විශේෂඥ වෛද්‍යවරියක් හැටියට කටයුතු කරනවා. ඒ ගැන මම සන්තෝෂ වෙනවා.

ඇය රජයේ සේවකයෙකු හැටියට දැන් අවුරුදු ගණනාවක් තිස්සේ රෝගීන් සුව කිරීමේ සේවය කරනවා. අපි කල්පනා කරන්න ඕනෑ, ඇයි මේ බෙහෙත් නැත්තේ කියලා. වෙළඳ පොළ හරහා ඒ ඖෂධ සඳහා පවතින ඉල්ලුම හා සැපයුම කළමනාකරණය වෙනවා නම්, සාධාරණ මිලකට ජනතාවට ඒ ඖෂධ ලබා ගන්න පුළුවන් නම් මේ ප්‍රශ්නය ඇති වෙන්නේ නැහැ. මම සමහර විට පොඩ්ඩක් වෙනස් මතයක් දරන්න ඉඩ තිබෙනවා. නමුත් මම හිතනවා, අපි අද මේ සම්මත කර ගන්නා වූ පනත් කෙටුම්පත දිහා පුළුල් ලෙස බලන්න ඕනෑය කියලා. එදා, මහාචාර්ය සේනක බිබිලේ වෛද්‍යාචාර්යතුමා මේ පනත් කෙටුම්පත ගෙනෙන්න උත්සාහ කළ කාලයේ ගරු ඩිව් ගුණසේකර මන්ත්‍රීතුමා කිව්වා වාගේ සමාජවාදී ක්‍රමවේදයක් තිබුණේ. රජයෙන් තමයි සියලුම ඖෂධ ගෙන්වීම කළේ. නමුත් අද තිබෙන්නේ ඒ ක්‍රමය නොවෙයි. අද තිබෙන්නේ වෙළඳ පොළ ක්‍රියාවලියක්. අපි සේනක බිබිලේ සංකල්පය එදාට වඩා යම් කිසි වෙනස් කිරීමක් හරහා තමයි අද මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ. මොකද, එදා තිබුණු පනත් කෙටුම්පතම අද ඉදිරිපත් කළා නම් අද තිබෙන ආර්ථික ක්‍රමවේදයට අනුව ඒක පරස්පරයක් වෙනවා. එහෙම නම් අපි මෙහෙම කල්පනා කරමු. වයස අවුරුදු 14ක්, 15ක් පමණ වන දරුවෙක් සිටිනවා කියලා හිතමු. ඒ දරුවාට අවුරුදු 40ක් පමණ වන අම්මා කෙනෙක් ඉන්නවා නම් ඒ අම්මාට පිළිකාවක් හෝ වෙනත් ලෙඩක් හැදිලා තිබෙනවා නම් ඒ දරුවා පුළුවන් වෙන්න ඕනෑ, වෙළෙඳ පොළෙන් ඒ ඖෂධ අරගෙන ඒ අම්මා සුව කර ගන්න. සමහර විට රජයේ රෝහල්වලින් නිකම් බෙහෙත් ලබා දෙන අවස්ථාත් තිබෙනවා. බොහෝ අවස්ථාවල බෙහෙත් නිකම් දෙන්නේ නැති බවත් අපි කවුරුත් දන්නවා. එසේ වෙළෙඳ පොළෙන් ඖෂධ අරගෙන ඒ අම්මාව හොඳ කර ගන්න හැකියාවක් අපට නිර්මාණය කරන්න පුළුවන් නම්, ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න ඇමතිතුමනි, අපි කළ යුත්තේ එයයි.

දැන් මෙතැන මූලිකම ගැටලුව වෙලා තිබෙන්නේ මිල තීරණය කිරීම සම්බන්ධයි. ඖෂධවල මිල තීරණය කරන්නේ කවුද? මොකද, වෙළෙඳ පොළ ආර්ථිකයක මිල හරහා තමයි ඉල්ලුම හා සැපයුම කළමනාකරණය වෙන්නේ. ඖෂධයක දැන් විකිණෙන මිල රුපියල් 40යි නම්, හෙට සිට එම ඖෂධය රුපියල්4ට විකුණන්න ඕනෑය කියලා අපි කිව්වොත්, එතකොට මොකද වෙන්නේ? සිදු වෙන්නේ ගුණාත්මකභාවයෙන් යුතු ඒ ඖෂධය වෙළඳ පොළේ නැති වන එකයි. ඒ වෙනුවට ගුණාත්මකභාවයක් නැති, යම් කිසි ප්‍රමිතියක් නැති ඖෂධයක් සමහර විට විකිණෙන්න ඉඩ තිබෙනවා. දොස්තර මහත්මයෙකුගෙන් ඇසූ විට, මගේ සොහොයුරිය වෛද්‍යවරියක් නිසා එතුමියගෙන් ඇසුවාම ඇය මට කියන්නේ, "අයියේ, මෙන්න මේ බෙහෙත අරගෙන වැඩක් නැහැ. ඒ බෙහෙතේ කිසිම reaction එකක් නැහැ" කියලායි. මේ පනත් කෙටුම්පතේ තිබෙන මූලිකම දෙය තමයි ප්‍රත්‍යක්ෂ, ආරක්ෂාකාරී සහ නිවැරදි තත්ත්වයෙන් යුතු ඖෂධ සාධාරණ මිලකට මහජනතාවට ලබා දෙන්න කටයුතු කිරීම. ඒක තමයි මේ කරන්න හදන්නේ. මේ පනත් කෙටුම්පතෙහි පිටු ගණනාවක් තිබුණාට ඒ දෙය කරන්න තමයි මේ උත්සාහ කරන්නේ. එතකොට ජනතාවට, ඒ රෝගියාට හැකියාව තිබෙන්න ඕනෑ, ඒ ඖෂධය ලබා ගැනීමට. මේකේ කථාව එපමණයි. නමුත් අද වෙන්නේ මොකක්ද? වකුගඩු රෝගය ගැන බලමු. සල්ලි තිබෙනවා නම් ඒ අවශ්‍ය කරන ඖෂධ ලබා ගෙන සුව වෙන්න පුළුවන්. සල්ලි නැත්නම් ඖෂධය ලබා ගන්න බැරි වෙන නිසා මිය යන්න සිදු වෙනවා. නමුත් එදා මගේ මෑණියෝ මිය යන කොට තිබුණු තත්ත්වය ඒක නොවෙයි. මම මේ කථාව කියන්නේ ඒකයි. කොපමණ මුදලක් වියදම් කරන්න හැකියාව තිබුණත් ඒ ඖෂධ මේ රටේ තිබුණේ නැහැ. ඒ නිසා අපේ ගරු රාජිත සේනාරත්න සෞඛ්‍ය ඇමතිතුමා අද කරලා තිබෙන්නේ පුණ්‍ය කර්මයක්.

අද මෙම පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ගරු සභාව අමතා කළ කථාව මම අහගෙන සිටියා. අවුරුදු ගණනාවක් තිස්සේ මේ පනත් කෙටුම්පත ඉදිරිපත් නොකර තිබීම නිසා එදා මම වැනි තවත් දරුවන්ට ඔවුන්ගේ අම්මලා අහිමි වුණා නම් ඒක පාප කර්මයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා පනත් කෙටුම්පත් සම්මත කර ගෙන මේ කරන්නේ මොකක්ද ? අපි මේවාට මෙච්චර මහන්සි වන්නේ, මෙපමණ දහලන්නේ ඇයි? ජනතාවට ගුණාත්මකභාවයෙන් යුතු සමාජයක් නිර්මාණය කර දෙන්නයි. එක්සත් ජාතික පක්ෂයේ අපේ ආර්ථික ප්‍රතිපත්ති යම් විධියකට වෙනස් කරන බව මේ වනකොට රටට හෙළි කර තිබෙනවා. රැඩිකල් ප්‍රතිපත්තිය හරහා සමාජ ආර්ථික ක්‍රමවේදයක් මේ රටට ගෙනෙන්න අපි කැප වෙලා ඉන්නවා. මේ සමාජ ආර්ථික ක්‍රමවේදය කියලා කියන්නේ මොකක්ද? ඒක මේ පනත් කෙටුම්පතට එකතු වන්නේ කොහොමද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සම්පත් බෙදී යාමේදී, ඉල්ලුම හා සැපයුම

කළමනාකරණය කිරීමේදී ලෝකයේ මේ වනකොට ක්‍රියාත්මක වන එකම ක්‍රමවේදය තමයි, වෙළෙඳ පොළ ක්‍රමවේදය. වෙළෙඳ පොළ හරහා තමයි මේ සියලු කාර්යන් සිදු වන්නේ. නමුත් බොහෝ අවස්ථාවල දී වෙළෙඳ පොළ ක්‍රමවේදයෙන් අපි බලාපොරොත්තු වන ධනාත්මක පිළිතුරු අපට ලැබෙන්නේ නැහැ. සමහර වෙලාවට වෙළෙඳ පොළ කඩා ගෙන වැටෙනවා. ඒකට කියනවා, market failure කියලා. ඉල්ලුමයි, සැපයුමයි අවශ්‍ය විධියට කළමනාකරණය කර ගන්න වෙළෙඳ පොළ අසමත් වෙනවා. එතැනදී තමයි රජය මැදිහත් වන්න ඕනෑ. ඒක තමයි මේ කරන්න හදන්නේ. මේ කරන්න හදන්නේ වෙළෙඳ පොළේ තිබෙන ඖෂධ සම්පූර්ණයෙන්ම නැති කරලා දාලා අලුත් ක්‍රමයකට ඖෂධ ලබා දෙන වැඩ කටයුත්තක් නොවෙයි. වෙළෙඳ පොළ නියාමනය කරලා ඒ හරහා ජනතාවට සමාජ සහ ආර්ථික යුක්තියක් - social and economic justice - ලබා දෙන්න හදන එකයි මේ කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රට ගැන එච්චර කථා කරපු, දේශීය දේශීය කියලා කියපු, පොඩි මිනිහා ගැන කථා කරපු පසු ගිය රජය මේ පනත් කෙටුම්පත ගෙනාවේ නැත්තේ ඇයි? මේ රටේ ජීවත් වන ජනතාව ගැන ඇත්තෙන්ම ඔවුන්ට කැක්කුමක් තිබුණා නම් මේ පනත් කෙටුම්පත මේ වන තෙක් කොහේ හරි file එකක් අස්සේ හැංගිලා තියෙන්නේ නැහැ; මේ වනවිටත් ඒක සම්මත වෙලා. ඒක ආවේ නැත්තේ ඇයි? මම කනගාටුවෙන් හෝ කියන්නට ඕනෑ, ඒක ආවේ නැත්තේ එවකට හිටපු රජය ඇත්ත වශයෙන්ම ජනතාව ගැන නොවෙයි, තමන්ගේ පොකට් එක ගැන උනන්දු වුණු නිසයි. ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා අද රුපියල් කෝටි 100 කථාවක් ගැනත් කිව්වේ ඒ නිසයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ දින සියයේ වැඩ පිළිවෙළ තුළ මේ පුණ්‍ය කර්මය ඉටු කරමින් එම ක්‍රියාවලිය ඉස්සරහට අරගෙන යනකොට අපි කල්පනා කළ යුතු බොහෝ දේ තිබෙනවා. ගරු ඩිව්. ගුණසේකර මන්ත්‍රීතුමා කිව්වා, සානාවේ දී සේනක බිබිලේ වෛද්‍යාචාර්යතුමාව සාතනය කළේ කොහොමද කියලා. ඖධෂ මාෆියාව ගැන කථා කළා. අදත් ඖෂධ මාෆියාව ලෝකයෙන් තුරන් වෙලා නැහැ. කුඩු මාෆියාව වාගේම තමයි ඖෂධ මාෆියාවත්. අපි ප්‍රවේශම් වන්නට ඕනෑ. සමහර වෙලාවට ඔවුන් මේක hijack කරලා ජනතාව අපහසුතාවට පත් කරන්න පුළුවන්. මම අපේ ගරු ඇමතිතුමාට අවධාරණය කරනවා, hijack කරන්න නම් ඉඩ තබන්න එපා කියලා. මම ගරු ඇමතිතුමාගෙන් ඇහුවා, "දැන් අපි ඖෂධ වර්ග 200ක් පමණක් සීමා කරනවාද?" කියලා. එතුමා කිව්වා, "නැහැ. එහෙම කරන්න අවශ්‍යතාවක් නැහැ. දැනට ඖෂධ ප්‍රමාණයක් තිබෙනවා. නමුත් අලුතෙන් ලියා පදිංචි වනවා නම් එහිදී ඒවායේ ගුණාත්මකභාවය, ප්‍රත්‍යක්ෂභාවය සහ මිල සාධාරණද කියන එක හොයලා බලන්න ඕනෑ" කියලා.

එහෙමනම්, ඒවාට එකඟ වෙනවා නම් තමයි එම ලියා පදිංචිය ලබා දෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැන වැදගත්ම කාරණය නම්, එම මිල තීරණය කිරීමේදී හෝ මිල ලියා පදිංචි කිරීමේ දී එය මීට කලින් අවස්ථාවලදී අපි කල්පනා කරපු දෙයක් නොවීමයි. මම හිතනවා, මම වැරැදි නම් ගරු ඇමතිතුමා විසින් එය නිවැරැදි කරයි කියලා. එහෙම නේද ගරු ඇමතිතුමනි? එතකොට මෙම ලියා පදිංචි කිරීම සිදු කිරීමේ දී මිල එක අංගයක් හැටියට සලකන්න නියාමන අධිකාරියට හැකියාව ලැබෙනවා. ඒඩ්ස් රෝගය සම්බන්ධයෙන් මේ දිනවල ඖෂධ ආයතන ඩොලර් කෝටි ගණනක් වියදම් කරනවා. ඔවුන් කියන්නේ ඒ ආකාරයෙන් ඩොලර් වියදම් කරලා, ඔවුන්ට patent එක නැතිනම් යම් කිසි කාලයක් හෝ මෙම වෙළෙඳාම කර ගෙන යන්න බැහැ කියන එකයි. ඒ අයට research and developmentවලට සල්ලි යොදවන්න බැහැ කියන එකයි. එතකොට research and development කරන්න රජයට හැකියාවක් නැතිනම් - රජය කියලා කියන්නේ අපේ රජය පමණක් නොවෙයි, ඇමෙරිකාව වේවා, එංගලන්තය වේවා, චීනය වේවා, ඕස්ට්‍රේලියාව වේවා ලෝකයේ සියලුම රාජ්‍යයන්. අය වැය හරහා ලබා දෙන්න මුදල් නැත්නම්, ඒ ඖෂධ කොම්පැනි මුදල් වියදම් කරලා මේවා research කරන බව අප අමතක කරන්න හොඳ නැහැ. ඔවුන් බලාපොරොත්තු වන්නේ එයින් ලාභයක් ලබා ගන්නයි. එතැනදී තමයි වෙළෙඳ පොළ හරහා සාමාන්‍ය ජනතාවට සිදු වෙන අසාධාරණය නැවැත්වීම සඳහා නියාමනය අවශ්‍ය වන්නේ. එතැනදී සේනක බිබිලේ වෛද්‍යාචාර්යතුමා පළමුවෙන්ම ගෙනෙන ලද ප්‍රතිපත්තිය ඉතාම හොඳට සංශෝධනය කරලා අද ලෝකයට, අද රටට ගැළපෙන විධියට මේ ප්‍රතිපත්තිය ඉදිරිපත් කරලා තිබෙනවා.

මම අද එනකොට තර්ස්ටන් පාරේ පෝස්ටර් අලවලා තිබෙනවා දැක්කා, "මේ සේනක බිබිලේ ප්‍රතිපත්තිය නොවෙයි, මේක හකුලා ගනිව්" කියලා. ඔවා කියන අය අද ආර්ථිකය ගැන අබමල් රේණුවකවත් දැනුමක් ඇතිවද මේ කථා කරන්නේ? අපට ඕනෑ ඕනෑ විධියට මේ ප්‍රතිපත්තීන් ගෙනැල්ලා, තිබෙන ආර්ථික ක්‍රමවේදයක් අස්සේ ඔබන්නට බැහැ. අපි මේකත් එක්කම යන්නට ඕනෑ. එවකට හිටපු රජයට මෙම වෙළෙඳ පොළ ආර්ථික ක්‍රමවේදය වෙනස් කරන්න ඕනෑ කියලා හිතුනා නම් වෙනස් කරන්න ඕනෑ තරම් කාලයක් තිබුණා. නමුත් වෙනස් කළේ නැහැ. එහෙම නම් hijack කරන්නේ නැතිව අපේ අලුත් පනත් කෙටුම්පත ක්‍රියාත්මක කරන්නේ කොහොමද කියන එක පිළිබඳව අපි අවධානය යොමු කරන්නට ඕනෑ.

මෙතැනදී මම තව එක දෙයක් කියන්නට කැමැතියි. වෙළෙඳ නාමය වෙනුවට ඖෂධ නාමය පමණක් සඳහන් කරන අවස්ථාවේ දී, එහෙම නම් වෙළෙඳ පොළේ වෙළෙඳ නාම තිබෙන්න හැකියාවක් නැහැ. මම මේ කියන දේ ගැන පොඩ්ඩක් හිතන්න. දැන් තිබෙන්නේ වෙළෙඳ නාම නම්, වෙළෙඳ නාම වෙනුවට ඖෂධ නාම පමණක් prescription එකේ ලියලා දෙනවා නම්, එහෙම නම් මොනවාද දෙන්නේ? හැම වෙළෙඳ නාමයකටම ඖෂධ නාමයක් - generic name - තිබෙන්නට ඕනෑ. අපට ඒ තත්ත්වයට හෙට එන්න බැහැ. ඒ සඳහා කාලයක් ගත වෙනවා. ඉතින් මේ රටේ ජනතාව ඉවසීමෙන් කටයුතු කරන්නට ඕනෑ. අපි switch එකක් දැමුවාම ලැබෙනවා වාගේ මේ සියලු ප්‍රතිලාභ හෙට වනකොට ලැබෙයි කියලා හිතන්න එපා. දින සියයකින් ලැබෙයි කියලා හිතන්න එපා. නමුත් රජයෙන් කරන්නට යන මෙම පුණ්‍යකර්මයට විපක්ෂයේ සියලුම දෙනා සහයෝගය පළ කරනවා කියලා මම දන්නවා. මෙයට විරුද්ධව කිසිම කෙනෙක් ඡන්දය ලබා දෙයි කියලා මම හිතන්නේ නැහැ. ඒ ගෞරවය මුළු පාර්ලිමේන්තුවටම හිමි වෙනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා මෙය පටන් ගත්තේ - ඇත්ත වශයෙන්ම පටන් ගත්තා නොවෙයි, අවසන් කළාත් නොවෙයි. සේනක බිබිලේ වෛද්‍යාචාර්යතුමා පටන් ගත් දෙයක් යම් කිසි දුරකට ගෙනැල්ලා අද වන විට රාජිත සේනාරත්න වෛද්‍යාචාර්යතුමා මෙය ඉදිරිපත් කරලා තිබෙනවා. වෙළෙඳ පොළ ක්‍රියාදාමයක් ඇතුළේ ඖෂධ වෙළෙඳාම නියාමනය කිරීම සඳහා - මා මුලින් සඳහන් කළා වාගේ ජනතාවට ප්‍රත්‍යක්ෂ, ආරක්ෂාකාරී හා නිවැරැදි තත්ත්වයෙන් යුතු ඖෂධ සාධාරණ මිලකට ලබා දීම සඳහා - ගෙනාපු පනත් කෙටුම්පතක් හැටියට තමයි මම මෙය දකින්නේ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
හොඳයි. මම පටන් ගත්ත කාරණයෙන්ම මගේ කථාව අවසන් කරන්නම්.

මින් ඉදිරියට තරුණ අම්මලා තමන්ගේ කුඩා දරුවන් අනාථ වන්නට හැරලා මිය ඇදෙන තත්ත්වයකට නොයවා, සාමාන්‍ය මිනිසුන්ගේ ජීවිත කාලය දිග් කර ගන්නත්, ලෙඩක් හැදිලා ඉන්නවා නම් ඒ ලෙඩෙන් සුවය ලබන්නත් අද අපේ රජය කරපු මේ පුණ්‍ය කර්මය දායක වෙයි කියලා අපි බලාපොරොත්තු වනවා. බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඊළඟට, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි පහළොවක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.51]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෙවන වර කියැවීම සඳහා අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් වන සුවිශේෂ වැදගත්කමක් ඇති ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත සම්මත කිරීමට මා පළමු කොට අපේ සහයෝගය පළ කරන බව කියන්න කැමැතියි. ඒ වාගේම මේ වැදගත් වෙනස ඇති කිරීම සඳහා ඉටු කළ කාර්ය භාරය වෙනුවෙන් ගරු ඇමතිතුමාටත්, එවකට සෞඛ්‍ය අමාත්‍යවරයා හැටියට කටයුතු කළ අතිගරු ජනාධිපතිතුමාටත් මගේ ගෞරවය සටහන් කරන්න කැමැතියි. මෙය දවසකින් දෙකකින් බිහි වූවක් නොවෙයි. වෛද්‍යාචාර්ය එස්.ඒ. වික්‍රමසිංහ මැතිතුමාත්, වෛද්‍යාචාර්ය සේනක බිබිලේ මැතිතුමාත් මේ කටයුත්ත ආරම්භ කළා. එය යම් තාක් දුරට අභියෝගාත්මක පෙරළියක් බවට පරිවර්තනය කිරීමට දැරූ උත්සාහය නිසාම සේනක බිබිලේ මැතිතුමාගේ ජීවිතය පවා තර්ජනයට ලක් වුණා.

අද ධනවාදී ලෝකය මූල්‍ය සම්භාරය ලබා ගන්නා ප්‍රධානතම කොටස් දෙකක් තමයි, අවි ආයුද වෙළෙඳාම සහ ඖෂධ වෙළෙඳාම. ඒ නිසා ඒවා වෙළෙඳාමේදී කිසි ලෙසකින් හෝ වෙනසක් ඇති කිරීම සඳහා දරන උත්සාහයන්ට ඉඩ නොදීමට වග බලා ගන්නා ඔවුන් සාතනයන්ට පවා පෙලඹෙනවා. ලෝකය වෙනස් වන බවත්, ධනවාදය වෙනදාට වඩා අභියෝගයට ලක් වී තිබෙන බවත්, මිනිස්කම හා මිනිස් සමාජය වේගයෙන් තමන්ගේ අයිතිවාසිකම් කියා පාන ලෝකයකට රටින් රටට ගමන් කරන බවත් බොහෝ විට ධනවාදී සමාජය තේරුම් ගන්නේ නැහැ. මේ වැදගත් වෙනස ඇති කිරීම සඳහා මූලාරම්භයක් මේ පනත් කෙටුම්පතින් ලැබෙනවා.

ඖෂධයක වෙළෙඳ නාමය හා ඖෂධ නාමය අතර නිරන්තරයෙන් ඇති ගැටලු පිළිබඳව අපි දන්නවා. වෛද්‍යවරයා නිසා පමණක් නොවෙයි, අපි වට කර ගත් ආර්ථික රටාවේ දැවැන්ත බලපෑම නිසාත් ඒ ගැටලු ඇති වන බව සටහන් කළ යුතුයි. මේ ගැටලු නිරාකරණය කර ගැනීමට ඉදිරි කාලයේදී මේ පනත් කෙටුම්පත මඟින් තවත් විධිවිධාන ගෙන ඒම අවශ්‍ය වන බව අපි විශ්වාස කරනවා. ගරු ඇමතිතුමනි, විශේෂයෙන් දැන්වීම් පළ කිරීම සඳහා ඇතුළත් කර තිබෙන වගන්ති තවත් ශක්තිමත් කළ යුතුය කියා මම හිතනවා. බොහෝ විට වෙළෙඳ ව්‍යාපාර, නිෂ්පාදන ව්‍යාපාර, සමාගම්, බහුජාතික සමාගම් වෛද්‍යවරයා ළඟටම ඇවිල්ලා මෙම දැන්වීම් ප්‍රවර්ධනය කරනවා. ඔවුන් මේ සඳහා journals, magazines භාවිත කරනවා.

අද ඊටත් වඩා දියුණු ලෝකයකයි අපි ඉන්නේ. Websites internet මඟින් ලෝකයේ වෛද්‍යවරුන් මේ අලුත් ප්‍රවාහයට තොරතුරු සොයනවා. ඒ වාගේම ඒවාට ගොදුරු වෙනවා. ඒ නිසා ඉදිරි කාලයේදී මේ වගන්ති පිළිබඳව තවත් සාකච්ඡා කොට ඒව ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවක් තිබෙන බව මම විශේෂයෙන්ම සඳහන් කරන්න කැමැතියි. විශේෂයෙන්ම 55.(1) උප වගන්තියෙහි ශක්තිමත්භාවය ඉදිරි කාලයේදී මීට වඩා වැඩි කිරීම තුළින් අප මුහුණ දෙන එක අභියෝගයක් ජයග්‍රහණය කරන්නට පුළුවන් වේවිය කියා මා හිතනවා.

ගරු ඇමතිතුමාත් දන්නවා, අපි මේ මහා විපර්යාසයක් ගැන කථා කළත් අදත් අපේ සමාජයේ වැඩි දෙනා අපේ දේශීය වෛද්‍යවරයා ළඟට ගියාම සල්ලි දෙන්නේ නැහැ, බුලත් කොළය තමයි දෙන්නේ කියලා. සල්ලි දීලා බෙහෙත් කර ගන්න ක්‍රමය ආවේ සුද්දාගේ කාලයෙන් පසුවයි. සුද්දෝ තමයි මේ ගිලින පෙති වාගේ ඔවුන්ගේ නිෂ්පාදන අපට විකිණීම ආරම්භ කරමින් බටහිර වෛද්‍ය ක්‍රමය නීතිගත කළේ. ඒ බටහිර වෛද්‍ය ක්‍රමය නීතිගත කරන කොට මූල්‍ය ප්‍රතිපාදනයන් පිළිබඳ නීතියක් තිබුණේ නැහැ. එය අපි ඇති කර ගත්ත සම්ප්‍රදායයක් නිසා අද අපි මේ ගැටලුවට මුහුණ දෙනවා. ඖෂධ නාමය ඉදිරිපත් කිරීම තුළින් ඖෂධවල මිල අඩු කර ගැනීමට පුළුවන් ක්‍රමවේදයක් ඇති වී සැබෑ ලෙසම රෝගියාගේ පසුම්බියට විශාල සහනයක් ලැබෙනවා වාගේම වඩා හොඳ ඖෂධයක් තෝරා ගන්නටත් පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා.

නිදහස් සෞඛ්‍ය සේවයත්, නිදහස් අධ්‍යාපනයත් අපේ රටේ ආඩම්බරයයි. එය විනාශ කරන්නට කුමන රජයන් උත්සාහ දැරුවත් කිසි ලෙසකින් එය සපල වී නැහැ. පොදු ජනතාවට තිබෙන ලොකුම ශක්තිය එයයි. එය ආරක්ෂා කරන්න ගත්ත තවත් වැදගත් පියවරක් හැටියට අපි මෙය සලකනවා. ඖෂධ, උපකරණ ආදී මේ සියලු දේ සඳහා රුපියල් මිලියන 40,000ක් පමණ අපි මේ පාර්ලිමේන්තුවෙන් අනුමත කරනවා. මෙය යම් ක්‍රමවේදයකට පරිවර්තනය කිරීමේ අභියෝගය දිගටම තිබුණා. මේ රටේ ටෙන්ඩර් ක්‍රමවල අයිතිය කියා පාන නිලධාරිවාදය ඇති කරපු දේවල් වෙනසකට භාජනය කරන්නට මේ අධිකාරියට පුළුවන් වෙයි කියන විශ්වාසය අපට තිබෙනවා. ඒ අධිකාරියට එසේ ක්‍රියා කිරීමට පුළුවන් වන්නේ මේ අඩු පාඩුකම් ඇති වගන්තිවලට ශක්තිය දීමෙනුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ඖෂධ නිෂ්පාදනය ඉතාම වැදගත්. නමුත් ඖෂධ නිෂ්පාදනයට අප ලබා දුන් ඉඩ කඩ මදි. මේ පනත් කෙටුම්පත අනුව ඖෂධ නිෂ්පාදනයට අවතීර්ණ විය හැකි අවස්ථාව වැඩි වෙනවා. එය වැඩි කර ගත හැකියි. නමුත් එය වැඩි වෙන කොට දේශීය කර්මාන්තකරුවාට, දේශීය ව්‍යාපාරිකයාට ඉඩක් ඇති වන ආකාරයට අපි ඒ ගැන කල්පනා කරනවා නම් හොඳයි. මොකද, මේ පනත් කෙටුම්පත අනුව Sri Lanka Chamber of Pharmaceutical Industry එක නිෂ්පාදනයට කිසි ආකාරයකින් සම්බන්ධ වෙන්නේ නැහැ. කෙළින්ම විදේශ සමාගමක් එන විට දේශීයත්වය මත අපේ රටේ ව්‍යාපාරික පැලැන්තිය හවුල් කර ගැනීමේ වැදගත්කම අපි දකින පැත්තෙන් සඳහන් කරන්න ඕනෑ. බංග්ලාදේශයේ ඇති වී තිබෙන්නේ එවැනි තත්ත්වයක්. බංග්ලාදේශය අපට වඩා හුඟාක් ඉදිරියෙන් ඉන්නවා. මට මතකයි, දැනට අවුරුදු තුනකට පමණ ප්‍රථම බංග්ලාදේශයේ අග්‍රාමාත්‍යතුමිය හමු වූ වෙලාවේදී එතුමිය අපිව ඒ ඖෂධ නිෂ්පාදනය කරන තැන්වලට යැව්වා. ඔවුන් අපට වඩා හුඟාක් ඉදිරියෙන් ඉන්නේ. නමුත් ඒ බෙහෙත් වර්ග ගෙනෙන්න අපි ඉඩ දුන්නේ නැහැ. මේ මාෆියාව රෝගියාට ඒකේ සහනය ගන්න ඉඩ දුන්නේ නැහැ. ඇමතිතුමාත් සඳහන් කළා, ඒ වාගේම අපේ ජනාධිපතිතුමාත් ඒ ගැන සඳහන් කළා. ඒ මාෆියාව කඩන්නේ නැත්නම්, ලෝකයේ රටවල් නිෂ්පාදනය කරන වැදගත් බෙහෙත්

වර්ග අපේ රටට ගන්න බැහැ. නමුත් ආසියාවේ හා පොදු රාජ්‍ය මණ්ඩලීය අනෙක් රටවල ඒවා භාවිත කරනවා. මේ වාගේ දේවල් ඇති කිරීමට - [බාධා කිරීමක්] දැන් ගෙනෙනවා. මම මේ කියන්නේ කලින් තිබුණු තත්ත්වයයි.

මම මේ කාරණයත් ඔබතුමාට කියන්න ඕනෑ. ඒක වැදගත් බෙහෙත් වර්ගයක්. විශේෂයෙන්ම පිළිකා රෝහලට වැදගත්ව තිබුණු ඒ බෙහෙත් වර්ගය ගෙනෙන්න අවුරුදු කීයක් ගත කරන්න සිද්ධ වුණාද? බංග්ලිදේශය සූදානම්ව සිටියා, බංග්ලිදේශයේ ව්‍යාපාරිකයෝ සූදානම්ව සිටියා. නමුත් ඉඩ දුන්නේ නැත්තේ අමාත්‍යාංශවල සහ ආයතනවල ඉන්න මාෆියාවයි. ඒ නිසා අපි මේ බරපතළ ප්‍රශ්නයට මුහුණ දෙන කොට; නිෂ්පාදනයට අවතීර්ණ වෙන කොට බංගලිදේශය පමණක් නොව දේශීය ආයතන හා දේශීය ව්‍යාපාරික පෙළැන්තිය මේ සම්බන්ධයෙන් වූ Sri Lanka Chamber of Pharmaceutical Industry එක සම්බන්ධ කර ගැනීම ඉතාම අවශ්‍යයි.

ගරු ඇමතිතුමනි, ඊළඟට ඔබතුමාගේ මේ බලය, මේ අධිකාරියට යනවා. අපි අද නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා පැරණි යන්ත්‍රෝපකරණ ගෙනෙනවා. මේක තමයි වැදගත්ම දේ. අපි නිෂ්පාදනය ශක්තිමත් කරනවා නම් අද යුගයේ දියුණුතම යන්ත්‍රෝපකරණ සවි කරන්න ඕනෑ. නැත්නම් අපේ රට පිට රට පැරණි නිෂ්පාදනාගාරවල තෝතැන්නක් බවට පරිවර්තනය වෙනවා. ඒ නිසා මේ ක්ෂේත්‍රයෙන් අපට ලබන්නට පුළුවන් ප්‍රගතිය අපේ ජනතාවට ලබා ගන්න බැරි වෙන්නට පුළුවන්.

මගේ කථාව අවසන් කිරීමට ඉස්සෙල්ලා මේ කාරණයත් කියන්න ඕනෑ. අපේ රට බහුවිධ වෛද්‍ය ක්‍රමය පාවිච්චි කරනවා. අපට ඒක පිළිගන්න වෙනවා. ආයුර්වේදයේ ඒ බහුවිධ වෛද්‍ය ක්‍රමය ඔබතුමාගේ උපදේශක සභාව පිළිඅරගෙන තිබෙනවා. නමුත් එතැන පමණයි පිළිඅරගෙන තිබෙන්නේ. මා කිසි ලෙසකින් මේකට ආයුර්වේදය ඇතුළු කරන්න කථා කරන්නේ නැහැ. නමුත් ආයුර්වේදයට -දේශීය වෛද්‍ය ක්‍රමයට- ඒ වාගේම අපේ රටේ තිබෙන සිද්ධ, යුනානි, හෝමියෝපති වෛද්‍ය ක්‍රමවලට මෙතැනින් ආරක්ෂාවක් තිබෙන්නට ඕනෑ. ආරක්ෂාවක් ලබා දෙන්න බැරි වුණොත් ඔවුන්ට වැටෙන්නේ තහංචියයි. ඒ තහංචිය වැටෙන්න ඉඩ තියන්න එපාය කියන ටික ඉතාම ඕනෑකමින් මේ අවස්ථාවේ කියන්න ඕනෑ.

මොකද, අපි දන්නවා වැල්මී අරගෙන ගිහිල්ලා වැල්මී "x" හදලා එවනවා. අපි වැල්මී "x" පාවිච්චි කරනවා. වැල්මී සාරය අරගෙන ගිහිල්ලා තමයි මෙහි ප්‍රධාන නිෂ්පාදනය සිදු කරන්නේ. මේ වාගේ උදාහරණ ඕනෑ තරම් ගෙනෙන්න පුළුවන්. මේ වාගේ විවිධ ඖෂධ තිබෙනවා. නමුත් මේ ක්ෂේත්‍ර ආරක්ෂා කරන වගන්ති අපි ඇති කර ගන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම පාරිභෝගික ජනතාවගේ ආරක්ෂාව විධිමත් කිරීමට මේ පනත ක්‍රියාත්මක කිරීමේදී රෝගියාට සහනයක් සහ ව්‍යාපාරිකයාට සහනයක් නොවන ක්‍රමය ගැන ප්‍රබුද්ධත්වයෙන් කටයුතු කරයි කියා අපි බලාපොරොත්තු වෙනවා. අපි ඉතාම පැහැදිලිව එක් කාරණයක් කියන්න ඕනෑ. පසු ගිය කාල පරිච්ඡේදය තුළ රෝග වැළැක්වීම වෙනුවට රෝග නිවාරණයට බර පැටවුණු ගමන් මාර්ගයක තමයි අපි ගමන් කර තිබෙන්නේ. එය සෞඛ්‍ය ක්ෂේත්‍රයට ඉතාම වැදගත්. රෝග වැළැක්වීම පිළිබඳ අවධානය අඩු වී තිබෙන තත්ත්වය යළි ශක්තිමත් කරලීමේ ක්‍රියාදාමයට අවතීර්ණ වීමේ වැදගත්කම මේ අවස්ථාවේදී මම සඳහන් කරන්නට කැමැතියි.

පසු ගිය රජයේ අඩු පාඩුකම් හුඟක් කියැවුණා. හැම රජයකින්ම අඩු පාඩුකම් සිද්ධ වෙලා තිබෙන නිසා නේ මේ පනත් කෙටුම්පත එන්න මෙපමණ කල් ගියේ. ආණ්ඩු කීයක් තිබුණාද, ආණ්ඩු කීයකින් පසුවද මේ පනත් කෙටුම්පත ආවේ. ඒවාට හරස් වන බලවේග රාශියක් ක්‍රියාත්මක වන බව අපට කියන්න පුළුවන්.

ගරු ඇමතිතුමනි, විශේෂයෙන් මම මේ අවස්ථාවේදී ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවේ Clause 49 (1) c) පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරවන්නට කැමැතියි. එහි දක්වා තිබෙන අදහස් ඉතාම වැදගත්. මොකද, injury එකක් පිළිබඳව බොහොම සියුම් ලෙස ඇති විය හැකි බරපතළ තත්ත්වයක් අධිකරණය ඒ නඩු තීන්දුවේ වගන්තිවලින් ප්‍රකාශ කර තිබෙනවා. ඒක ඉතාම වැදගත්. ඒ පිළිබඳව ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් ලබා ගත් වචනයක් නිර්වචනය සඳහා භාවිත කිරීම හා ශ්‍රේෂ්ඨාධිකරණය පෙන්වා දී තිබෙන මෙම සංශෝධනය ඉතාම වැදගත්. රජය එය ඉදිරිපත් කිරීමට එකඟතාව පළ කිරීම ගැන මම සතුටු වෙනවා. මොකද, බොහෝ ඖෂධ විවිධ වර්ගයන්ගෙන් තිබෙන නිසා පසු කාලයක ඒ ඖෂධවල ප්‍රතිවිපාකවලට සහනයක් හෝ වන්දියක් කෙසේ ලැබෙනවාද කියන ප්‍රශ්නය අද ඉතාම වැදගත්. අද සෞඛ්‍ය ක්‍රමය රාජ්‍ය නිදහස් සෞඛ්‍ය ක්‍රමය වෙනුවට වේගයෙන් ගමන් කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ට වෙන් කළ වෙලාවෙන් තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මට විනාඩියක කාලයක් ඇති. මම කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පෞද්ගලීකරණයට භාජනය වන වෛද්‍ය ක්‍රමයකුයි වේගයෙන් ගමන් කරන්නේ. සෑම ආණ්ඩුවක්ම ක්‍රියා කරන්නේ පෞද්ගලීකරණයට. ඒ ගැන අබ මල් රේණුවක වෙනසක් නැති බව, මහජන එක්සත් පෙරමුණ වෙනුවෙන් මා කියනවා. එය නොවෙයි සිදු විය යුත්තේ. අපේ රටේ ජනතාවට හෝ දියුණු වන ධනවාදී ආර්ථිකයට අනිවාර්යයෙන්ම-ධනවාදය හෝ දියුණු කරන්න- හොඳ, නීරෝගී සෞඛ්‍ය තත්ත්වයක් අවශ්‍ය වනවා.

ගරු ඇමතිතුමනි, අද මේ සෞඛ්‍ය ක්‍රමය සමඟ අපේ රක්ෂණ ක්‍රම සියල්ලේම ඇති බැඳියාව පිළිබඳව යළි අප ගවේෂණයක යෙදෙන්නට ඕනෑ. එසේ නොවුණහොත් මුළු මහත් නිදහස් සෞඛ්‍ය සේවයම පෞද්ගලීකරණයට ගොදුරු වන රක්ෂණ භාවිතවකට පරිවර්තනය විය හැකියි.

විශේෂයෙන් සඳහන් කරනවා, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ශක්තිය වැඩි කරන්නට අවශ්‍ය බව. ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු නියෝජ්‍ය ඇමතිතුමන් ආණ්ඩුව ගෙන යන්නේ ධනවාදී වෙළඳ පොළ ආර්ථිකයක් මත බවට දැන් ප්‍රකාශ කළා. ධනවාදී වෙළඳ පොළ ආර්ථිකය, සුබවාදී මහජන ආරක්ෂාව සඳහා වූ ක්‍රියාදාමය ඉතාම වැදගත් සිද්ධාන්තයක්ය යන්න යළි අප මතක් කරමින්, මේ පනත් කෙටුම්පතට අපේ සහයෝගය ලබා දෙන බව කියා සිටිනවා. අපට ලබා දුන් ප්‍රතිඥා පරිදි, තවත් ඇති කළ යුතු සංශෝධනයන් ඉදිරි කාලයේදී ගෙන එමින්, ජනතාවගේ පැත්ත සහ වෛද්‍ය ක්‍රමයේ පැත්ත ශක්තිමත් කරන්නට අපි කටයුතු කරමු.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ස්තුතියි. මීළඟට, ගරු වෛද්‍ය රමේෂ් පතිරණ මන්ත්‍රීතුමා. ඔබතුමන්ට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.07]

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම වැදගත් පනත් කෙටුම්පතක් පිළිබඳව විවාදය මේ සභාවේ පැවැත්වෙන මොහොතේ සභාව අමතා වචන කිහිපයක් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මා ඉතාම සතුටට පත් වනවා.

විශේෂයෙන්ම ජාතික ඖෂධ නියාමන අධිකාරිය ස්ථාපනය කිරීම වෙනුවෙන් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන්ගේ යෝජනාවක් අනුව, සෞඛ්‍ය අමාත්‍ය ගරු රාජිත සේනාරත්න මැතිතුමා කාලෝචිත වූ මෙම පනත් කෙටුම්පත මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා. මේ පනත් කෙටුම්පත පිළිබඳව ගරු රාජිත සේනාරත්න ඇමතිතුමන් වාගේම, මේ උත්තරීතර සභාවේ කථා කළ මැති ඇමතිවරුන් රාශියක් දීර්ඝ ලෙස අදහස් දැක්වූවා. මේ රටේ දුක් විඳින ජනතාව වෙනුවෙන් - විශේෂයෙන්ම තමන්ගේ ආර්ථික මට්ටම අනුව තත්ත්වයෙන් ඉහළ, ගුණාත්මක බෙහෙත් සාධාරණ මුදලකට ලබා ගැනීම වෙනුවෙන්- ඉතාම සාධනීය පියවරක් හැටියට ඉදිරිපත් කළ මේ පනත් කෙටුම්පත පිළිබඳව විශේෂයෙන්ම වෛද්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ පුද්ගලයෙක් හැටියට, මගේ ස්තුතිය ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට වාගේම ගරු සෞඛ්‍ය ඇමතිතුමන්ට මේ අවස්ථාවේදී පුද කරන්න කැමැතියි.

මේ යටතේ ඉතාම වැදගත් පියවරක් හැටියට නව අධිකාරියක් ස්ථාපනය වන බව අප දන්නවා. විශේෂයෙන්ම, ස්වාධීනව ක්‍රියා කරන්නට හැකි වන පරිදි ඖෂධ ලියා පදිංචියේ සිට නැවත ලියා පදිංචිය අලුත් කිරීම, ගුණාත්මකභාවය ආරක්ෂා වන ආකාරයෙන් වෙළෙඳ පොළට ඖෂධ නිකුත් කිරීම වාගේම, මිල නියාමනය කිරීම ඇතුළු කරුණු රාශියක් ආවරණය වන පරිදි විශේෂඥ දැනුම ලබා ගෙන, මේ රටේ ජනතාවට හොඳ ඖෂධ ලබා දීමේ වැඩසටහනක් ඉදිරි කාලයේදී මේ පනත් කෙටුම්පත හරහා ක්‍රියාත්මක කරන්නට අවශ්‍ය කටයුතු සිදු වෙයි කියා අප බලාපොරොත්තු වනවා.

මීට අවුරුදු 40කට පමණ පෙර, මහාචාර්ය සේනක බිබිලේ මැතිතුමන් මේ පනත ඉදිරිපත් කරන්නට මූලික වුණු සාධක ඉදිරිපත් කළා වාගේම, අවුරුදු 40කට පසුව මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළත්, මෙහි සාධනීය පියවර ඉදිරියට ගොස් ජනතාවට සැබෑ සේවාවක් මේ හරහා ලබා දෙන්නට තවත් කෙටි කාලයක් ගත වෙයි කියා අප හිතනවා. එම නිසා, ගරු සෞඛ්‍ය ඇමතිතුමා මෙහිදී සඳහන් කළ ආකාරයට, මේ පියවර ඉදිරියට ගෙන ගොස්, වඩාත් ශක්තිමත් සෞඛ්‍ය සේවාවක් සහ වඩාත් හොඳ ඖෂධ - තත්ත්වයෙන් ඉහළ ගුණාත්මක ඖෂධ- සාධාරණ මුදලකට ලබා ගැනීමේ හැකියාව මේ පනත හරහා මේ රටේ ජනතාවට ලැබෙයි කියන විශ්වාසය අපේ සිත් තුළ තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විවිධ රජයන් මඟින් මෑත ඉතිහාසය තුළ මේ රටේ ඖෂධ වෙනුවෙන් වාර්ෂිකව රුපියල් බිලියන 35ක්, 40කට ආසන්න මුදල් ප්‍රමාණයක් වැය කළා. පෞද්ගලික ඖෂධ සඳහාත්,පෞද්ගලික රෝහල් සඳහා ජනතාව තමන්ගේ අතින් වියදම් කරන මුදල රුපියල් බිලියන 45ක් 50ක් වනවා.

එහෙම බැලුවාම මේ ඖෂධ සඳහා සියයට 60කට ආසන්න මුදල් ප්‍රමාණයක් පෞද්ගලික අංශයෙන් තමයි වියදම් වන්නේ. මෙහිදී ඖෂධ භාවිත කරන රෝගීනුත්, ඖෂධ නියම කරන වෛද්‍යවරයාත්, ඖෂධ ලියා පදිංචිය ඇතුළු බෙදා හැරීමේදී ඖෂධවේදින් ඇතුළු විශාල කණ්ඩායමකුත් පාර්ශ්වකරුවන් හැටියට සම්බන්ධ වෙනවා.

මෙහිදී මතු වන ඉතාම වැදගත් කාරණය තමයි, මෙතෙක් කල් සමහර විට වෙළෙඳ නාමයන්ගෙන් පමණක් නියම වූ ඖෂධ මීට පසුව අනිවාර්යයෙන්ම බෙහෙතේ කාණ්ඩය අනුව, වර්ගීකරණය - generic name එක - අනුව රෝගියාට ලබා දෙන්නට වෛද්‍යවරුන්ට සිදු වීම. එය ඉතාම හොඳ, සාධනීය ඉදිරි පියවරක් ලෙස අප දකිනවා. අවශ්‍ය නම් වෙළෙඳ නාමය සඳහන් කරන්න පුළුවන් බවත්, ඉදිරි කාලයේදී ඒ සඳහා සංශෝධනයක් ගෙනැත්, ගුණාත්මක ඖෂධ පමණක් වෙළෙඳ පොළේ තිබෙන තත්ත්වයක් යටතේදී ඖෂධයේ නාමයෙන් පමණක් එම ඖෂධ ලබා දීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් වන බවත් ඇමතිතුමා සඳහන් කළා. අපට ඉතාම සතුටුයි, එවැනි වැඩසටහනක් සකස් වීම පිළිබඳව. මේ හරහා ඉදිරි කාලයේදී රාජ්‍ය අංශයේ වාගේම, පෞද්ගලික අංශයේ ඖෂධ පිළිබඳ ගැටලුව අවම වෙයි කියන විශ්වාසය අපට තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ලබා දී තිබෙන සීමිත කාලය තුළදී මම මේ කාරණයත් කිව යුතුයි. මෑත ඉතිහාසයේ ඖෂධ සම්බන්ධයෙන් අප දැකපු ප්‍රධාන ගැටලුව තමයි, රජයේ රෝහල්වල විටින් විට ඖෂධ හිඟයක් මතු වීම. අනික් ප්‍රධානතම කාරණය තමයි, රජයේ රෝහල්වල තිබෙන ඖෂධවල ගුණාත්මකභාවය පිළිබඳව ගැටලු පැන නැඟිලා, විවිධ අවස්ථාවලදී එම ඖෂධ නිෂ්කාශනය කරන්න -බැහැර කරන්න- සිදු වීම. මේක තමයි ප්‍රධානතම ගැටලුව. මේ හා බැඳුණු සාධක කිහිපයක් තිබෙනවා. ඒ කරුණු පිළිබඳව කථා කළා. හැබැයි, මා හිතන විධියට රජයේ ටෙන්ඩර් ප්‍රතිපත්තිය අනුව ඖෂධ ලබා ගැනීමේදී දැනට තිබෙන තත්ත්වයන් යටතේ අවම ලන්සුවට ඖෂධ ලබා දීමේ ප්‍රතිපත්තියක් බොහෝ දුරට ක්‍රියාත්මක වෙනවා. ඒක රජය පැත්තෙන් බැලුවාම හරි. හැබැයි, මෙහිදී ගුණාත්මක තත්ත්වය පිළිබඳව බොහොම පැහැදිලි ගැටලුවක් මතු වෙනවා. ලියා පදිංචියේදී හොඳ ඖෂධ ඉදිරිපත් කරලා, ටෙන්ඩර් පටිපාටියේදී -මූලික අවස්ථාවේදී- විමර්ශනයට හොඳ ඖෂධ ඉදිරිපත් කරලා වෙළෙඳ පොළට කාණ්ඩ කීපයකින් ඖෂධ ලබා දීමේදී දෙවැනි, තුන්වැනි, හතරවැනි කාණ්ඩ එන කොට සමහර විට තත්ත්වයෙන් බාල ඖෂධ ලබා දීමේ ප්‍රවණතාවක් අප දැක තිබෙනවා. ඒ සඳහා හොඳ වැඩසටහනක් අවශ්‍යයි. පළමුවෙනි කාණ්ඩය විතරක් නොවෙයි, විවිධ batches මාස ගණනාවකට පසුව එන කොට, ඒ සියලුම කාණ්ඩ සඳහා හොඳ පරීක්ෂණ යාන්ත්‍රණයක් අවශ්‍යයි. මා හිතන විධියට ඒක තමයි, මේ රටේ ඖෂධ පිළිබඳව විසඳන්න තිබෙන ප්‍රධාන ගැටලුව.

ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරයේ - National Drug Quality Assurance Laboratory එකේ - තිබෙන අඩු පාඩු පිළිබඳව අප මීට පෙර අවස්ථාවකත් සඳහන් කළා. ප්‍රධාන ඖෂධ කාණ්ඩ වශයෙන් analyse කරලා, පරීක්ෂණයට ලක් කරන්න පමණක් නොවෙයි, මූලික අවස්ථාවේදී ඉදහිට කරන පරීක්ෂණවලටවත් - random checkingවලට- අවශ්‍ය සම්පත් මේ ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරයේ නැහැ. එහි මානව සම්පත්වල විශාල ඌනතාවක් තිබෙනවා. ඒ ඒ කටයුතු සඳහා ඖෂධවේදින් තව විශාල සංඛ්‍යාවක් අවශ්‍යයි; රසායන විද්‍යාඥයන් විශාල සංඛ්‍යාවක් අවශ්‍යයි; උපකරණ විශාල ප්‍රමාණයක් අවශ්‍යයි. මේ ආයතනය "National Medicines Quality Assurance Laboratory" කියලා නම් කරලා අලුත් ආයතනයක් බවට පරිවර්තනය කරන්න දැන් ඇමතිතුමා යෝජනා කර තිබෙනවා. මේ රටේ ඖෂධ ප්‍රතිපත්තිය සාධාරණ විධියට ක්‍රියාත්මක කරන්න නම් අප මූලිකව ඉෂ්ට කළ යුතු කරුණ වන්නේ මෙන්න මේ ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය ඉහළ මට්ටමකට නංවා ගැනීමයි කියන කාරණය මා සඳහන් කරනවා.

ගරු ඇමතිතුමාගේ කථාවේදී කිව්වා, ඒ සඳහා විදේශ ආයෝජන ලබා ගෙන ඉතාම ඉහළ මට්ටමේ රසායනාගාරයක් මේ

රටේ ස්ථාපනය කරන්න කටයුතු කරන බව. අප එතුමාට කියනවා එය ඉතාම වටිනා කාරණයක් බව. එම කරුණ ඉෂ්ට කරන්නේ නැතිව අනික් කුමන කරුණකින්වත්, ගුණාත්මකභාවයෙන් ඉහළ ඖෂධ මේ රටේ වෙළෙඳ පොළේ තිබෙන බව අපට නිශ්චිත වශයෙන්ම සහතික කර ගන්න බැහැ.

ගරු ඇමතිතුමා මේ පනත් කෙටුම්පතේ මෙන්න මේ කාරණයත් සඳහන් කර තිබෙනවා. ඖෂධයේ කාණ්ඩ නාමයෙන් - generic name එකෙන්- prescribe කළාට පස්සේ, ඒ අදාළ වෛද්‍යවරයාගේ වට්ටෝරුව - prescription එක - pharmacy එකකට අරගෙන ගියාම ඒ අදාළ pharmacy එකට වග කීමක් තිබෙනවා මේ රටේ රෝගීන්ට දැනුම් දෙන්න, "මෙන්න මේ අදාළ කාණ්ඩයෙන් මේ බෙහෙත් වර්ග තිබෙනවා, මේ මුදලට මේවා ලබා ගන්න පුළුවන්" කියලා. හැබැයි, මේ රටේ ඖෂධවේදින් 2,500කට 3,000කට ආසන්න ප්‍රමාණයක් තමයි ඉන්නේ. ඒ කියන්නේ ඉතාම අඩු පිරිසක්. බොහෝ ඖෂධ වෙළෙඳසැල්වල දැනටත් ප්‍රමාණවත් ඖෂධවේදීන් සේවයෙහි යෙදවිලා නැහැ. ඒ නිසා මේ හා සමගාමීව ඖෂධවේදින් පුහුණු කරන්න පිළිගත් මට්ටමේ ක්‍රියා මාර්ගයක් ඉදිරිපත් කරන්න අවශ්‍යයි. තවත් ඖෂධවේදින් 2,500කට, 3,000කට ආසන්න ප්‍රමාණයක් අපේ රටට අවශ්‍ය වනවා.

අනික් පැත්තෙන්, වෛද්‍යවරයා නියම කරන බෙහෙත වෛද්‍යවරයාගේ අනුදැනුමකින් තොරව ඖෂධවේදියා මඟින් ලබා දෙන්නට යෝජනා කරනවා නම් කිසියම් විධියකට එයත් ගැටලුකාරි තත්ත්වයක් බව අපි අවබෝධ කර ගත යුතුයි. මොකද, රෝගියාගේ තත්ත්වය අනුව, ඔහුගේ ආර්ථික ශක්තිය අනුව, ඔහුට තිබෙන රෝගි තත්ත්වය අනුව වඩාත්ම හොඳ සාධනීය ඖෂධය මොකක්ද කියන කාරණය දන්නේ වෛද්‍යවරයායි. එම නිසා ඖෂධ වට්ටෝරුවේ තිබෙන ඖෂධයක් වෙනස් කරනවා නම් ඖෂධවේදියාගේ කැමැත්තට නොව වෛද්‍යවරයාගේ කැමැත්ත අනුව වෙනස් කළ යුතුයි කියන කාරණය මා මේ අවස්ථාවේදී සිහිපත් කරනවා.

ඒත් එක්කම මේ හා බැඳුණු කාරණා පිළිබඳ දැනුම් දීමේදී මා හිතන හැටියට ඉදිරි කාලයේදී අපි තෝරා ගත් ඖෂධ සඳහා ටෙන්ඩර් ක්‍රියා මාර්ගය අනුගමනය කරන කොට ඖෂධ ලබා ගැනීම සඳහා අවම ලංසුව පිළිබඳව කථා කරන්නේ නැතුව භාවිතයේ තිබෙන ඖෂධවලින් ඖෂධ 5ක් හෝ ඖෂධ 10ක් තෝරා ගෙන, ඒ ඖෂධ අතරින් භාවිතයේදී දීර්ඝ කාලයක් තිස්සේ හොඳින් පාවිච්චි කරලා වෛද්‍යවරුන් අතර හොඳ නමක් දිනා ගෙන තිබෙන, භාවිත කිරීමෙන් පසු රෝගීන් හොඳ ප්‍රතිඵල ලබා ගත් ඖෂධ සඳහා මේ අවස්ථාව ලබා දෙනවා නම් අපට වෙළෙඳ පොළේ තිබෙන ගැටලු අවම කර ගැනීමට හැකියාව ලැබෙනවාය කියන කාරණයත් මේ අවස්ථාවේදී සිහිපත් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒත් එක්කම අපි ඉතාම සතුටු වනවා, දේශීය යන්ත්‍රණයක් හරහා ඖෂධ නිෂ්පාදනය වැඩිදියුණු කරන්න අවශ්‍ය ප්‍රතිපත්ති සැකසෙමින් පැවතීම පිළිබඳව. මේ කාරණය පිළිබඳව ලංකාවේ දීර්ඝ කාලයක් තිස්සේ කථා කළා. හැබැයි ගැටලුවක් තිබෙනවා. ඉන්දියාවේ, බංග්ලාදේශයේ, පාකිස්තානයේ මිලියන 300ක හෝ මිලියන 400ක ජනතාවකට, එහෙම නැත්නම් බිලියනයක ජනතාවකට අවශ්‍ය ඖෂධ නිෂ්පාදනය කරන කොට නිෂ්පාදන පිරිවැය ඉතාම පහත මට්ටමක තිබෙනවා. ලංකාවේ මිලියන 20ක ජනතාවකට බෙහෙත් නිෂ්පාදනය කරනවා නම් විශාල ගැටලුවකට මුහුණ දෙන තත්ත්වයක් ඇති වෙයි කියා මා හිතනවා. එහෙම නම් ඒ සඳහා රජයෙන් නිෂ්පාදකයින්ට කිසියම් සහනාධාරයක් ලබා දිය යුතුයි. එහෙම නැත්නම් ඖෂධ අපනයනය කිරීම සඳහා අවශ්‍ය වෙළෙඳ පොළ සකස් කර දිය යුතුයි. එහෙම නැති වුණොත් මේ ව්‍යායාමය අසාර්ථක වනවා. එම නිසා තමයි මෙතෙක් කල් සුළුවෙන් හෝ ඖෂධ නිෂ්පාදනය පටන් ගත් කර්මාන්තකරුවන්ට මේ කටයුතු ඉදිරියට කර ගෙන යන්න බැරි වුණේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මෙම සීමිත කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තූතිවන්ත වනවා. මේ සාධනීය පියවරත් එක්ක ඉදිරියට ගිහින්, තත්ත්වයෙන් උසස්, ගුණාත්මක බෙහෙත් ජනතාවට සාධාරණ මුදලකට ලබා දෙන්න අපි සෑමදෙනාම කටයුතු කරමුය කියන ඉල්ලීම කරමින් මා නිහඬ වනවා. බොහොම ස්තූතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ස්තූතියි. ඊළඟට ගරු අජිත් පී. පෙරේරා නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 17ක කාලයක් තිබෙනවා.

ඊට පෙර කවුරුන් හෝ මන්ත්‍රීවරයෙක් ගරු මොහමඩ් අස්ලම් මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
"ගරු මොහමඩ් අස්ලම් මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු අශෝක් අබේසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු මොහමඩ් අස්ලම් මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு அசோக் அபேசிங்க அவர்கள் *அக்கிராசனத்தினின்று அகலவே,* மாண்புமிகு மொஹமட் அஸ்லம் அவர்கள் *தலைமை வகித்தார்கள்.*

Whereupon THE HON. ASHOK ABEYSINGHE *left the Chair, and* THE HON. MOHAMED ASLAM *took the Chair.*

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා කථා කරන්න.

[අ.භා. 4.19]

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - வெளிநாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Ajith P. Perera - Deputy Minister of Foreign Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ඇමතිතුමනි, ඖෂධ පිළිබඳ ඉතා වැදගත් විවාදයක් පැවැත්වෙන මෙම අවස්ථාවේදී ඖෂධ මිල වාගේම ඖෂධ කළමනාකරණය පිළිබඳ කාරණය ඉතා වැදගත් වනවා. සමහර වෙලාවට අමාත්‍යාංශයේ ගබඩාවල ඖෂධ තිබෙනවා. හැබැයි නියමිත වෙලාවට, නියමිත රෝහලට, අදාළ වාට්ටුවට, අදාළ වෛද්‍යවරයාගේ, හෙදියගේ අවධානයට ඒ ඖෂධය ලක් වන්නේ නැහැ. එහෙම නැත්නම් අවශ්‍ය වෙලාවට ඒ මොහොතට ඒ ඖෂධය නැහැ. ඒ පිළිබඳව අපට බොහෝ ප්‍රායෝගික අත් දැකීම් තිබෙනවා. අපේ හිතවතුන්ට, අසල්වැසියන්ට, ඥාතීන්ට ඒ පිළිබඳව ගැටලු මතු වුණාම අපි ඒ

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

පිළිබඳව සොයා බලනවා. ඊට අමතරව මට මේ ගැන විශේෂ අත් දැකීමක් ලැබුණා. ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමාත් ඇතුළුව එක්සත් ජාතික පක්ෂයේ අපේ ගවේෂණ චාරිකා මන්ත්‍රී කණ්ඩායම දැන් මාස කිහිපයකට කලින් කළුතර නාගොඩ මහ රෝහලේ කරපු ගවේෂණයේදී අපට පෙනී ගියා, ඒ රෝහලේ ඖෂධ කළමනාකරණය පිළිබඳව තිබෙන ක්‍රමවේදය ඉතාමත් දුර්වලයි කියන එක. යොදා ගන්නා පරිගණකවල මෘදුකාංගවල තිබෙන දෝෂයක් හෝ එහෙම නැත්නම් ඒ ජාලය හැබෑ ලෙසම ජාලගත නොවීම පිළිබඳ ප්‍රශ්නයක් හෝ මේ රටේ මේ මොහොතේත් තිබෙනවා. ඒ නිසා මේ රටේ ඖෂධ අවශ්‍යතාව ඒ ඒ මොහොතේ, -මාසයෙන් මාසයට, සතියෙන් සතියට, දිනයෙන් දිනයට- යම් එක් මධ්‍යස්ථානයක වාර්තාගත වන ආකාරයටත්, ඒ එක් එක් රෝහලේ ඒ මාසයේ, ඒ සතියේ, ඒ දිනයේ මතු වන්නා වූ ඖෂධ පිළිබඳ අවශ්‍යතාවන් පරිගණකගත කරනු ලබන කළමනාකරණ ක්‍රමවේදයක් මඟින් ලබා ගෙන අදාළ රෝහල වෙත අපහසුතාවකින් තොරව ළඟා වෙන ආකාරයේ යම් කළමනාකරණ වැඩ පිළිවෙළක් තිබිය යුතුයි. මේක බරපතළ ප්‍රශ්නයක්.

අපි සාමාන්‍යයෙන් කථා කරන්නේ ඖෂධ මිල ගැන. අපි සාමාන්‍යයෙන් කථා කරන්නේ ඖෂධවල ගුණාත්මකභාවය පිළිබඳව. නමුත්, ඒ ඖෂධය නියම වෙලාවට, අවශ්‍ය කෙනාට ළඟාවීම පිළිබඳ ප්‍රශ්නය බැරෑරුම් ප්‍රශ්නයක්. ඒක පොදුවේ මේ රාජ්‍ය කළමනාකරණයම පිළිබඳ ප්‍රශ්නයක්. ඖෂධයත්, රෝගියාත්, වෛද්‍යවරයාත් සම්බන්ධ වන මේ ක්‍රියාදාමයේදී අදාළ විනාඩිය, පැය, දිනය අතිශයින් වැදගත් කාරණයක්. ඒ නිසා, ඉතාම වැදගත් පනත් කෙටුම්පතක් සම්මත කර ගන්නා වෙලාවේ, ඉතාම ප්‍රගතිශීලී පනත් කෙටුම්පතක් සම්මත කර ගන්නා වෙලාවේ මතක් කළ යුතු කාරණය මෙයයි. ගරු සෞඛ්‍ය ඇමතිතුමනි, අපේ රටේ ඖෂධ කළමනාකරණය පිළිබඳව, එනම් මිලදී ගැනීම, තොග ගබඩා කිරීම, එතැන් සිට ප්‍රාදේශීය රෝහල් දක්වා ඖෂධ බෙදා හැරීම, ඒ ඒ රෝහලෙන් තමන්ට අවශ්‍ය ඖෂධ පිළිබඳ තොරතුරු මධ්‍යගත ස්ථානයකට ළඟා කිරීම කියන කාරණා පිළිබඳව විශේෂම අවධානයක් යොමු විය යුතුයි. ඒ පිළිබඳ ක්‍රමවේදයක් සකස් කළ යුතුමයි. එහෙම කළොත් තමයි අද සම්මත කර ගන්නා වූ මේ ප්‍රගතිශීලී ප්‍රතිපත්තිය සාර්ථක කර ගැනීමට අපට හැකියාවක් ලැබෙන්නේ. එහෙම නැත්නම් ඖෂධ හිඟයි, අවශ්‍ය වෙලාවට නැහැ, මේ මොහොතේ නැහැ කියන ඒ පරණ සාමාන්‍ය දුක්ගැනවිල්ලම අහන්න සිදු වෙනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා කථා කරමින් සඳහන් කළා, සෞඛ්‍ය රක්ෂණය පිළිබඳව ඇති වන්නා වූ වර්ධනය විසින් නිදහස් සෞඛ්‍ය පිළිබඳ අයිතිවාසිකම ගිල ගැනීම පිළිබඳ බියක් එතුමා තුළ තිබෙනවා කියලා. අපේ රටේ තිබෙන නිදහස් සෞඛ්‍ය පිළිබඳ අයිතිවාසිකම ඉතා සුවිශේෂී දෙයක් බව ඇත්ත. මම හිතන හැටියට මෙවැනි නිදහස් සෞඛ්‍ය පිළිබඳ අයිතිවාසිකම් ලෝකයේ රටවල් කිහිපයක පමණයි තිබෙන්නේ. අපි මේ නිදහස් සෞඛ්‍ය අයිතිවාසිකම ලබා දීමදී අදාළ රෝගියාගෙන් හෝ පුරවැසියාගෙන් ඒ වෙනුවෙන් කියා විශේෂයෙන් අය කිරීමක් කරන්නේ නැහැ. ඒ වෙනුවෙන් විශේෂ බද්දක් අය කරන්නේත් නැහැ. ඒ වෙනුවෙන් වෙනත් ආකාරයක බැඳීමක් ලබා ගන්නේත් නැහැ. එවැනි වට පිටාවක් තුළ රෝගීන්ට අද අවශ්‍ය වන්නේ රෝහලක් සහ ඖෂධ පමණක් නොවෙයි. අද රෝගීන්ට අවශ්‍ය වන්නේ වෛද්‍යවරයෙක් සහ හෙදියක් පමණක් නොවෙයි. අද රෝගීන්ට අවශ්‍ය වෙනවා, රෝහලෙන් ගුණාත්මක සේවාවක් ලබා ගැනීමට. මේ අභියෝගය ජය ගැනීමේදී සෞඛ්‍ය රක්ෂණය පිළිබඳ කාරණය පසෙකට දමන්න පුළුවන්කමක් නැහැ. මේ නිදහස් සෞඛ්‍ය අයිතිවාසිකම මේ විධියටම තිබියදී, රජය සැලකිය යුතු මුදලක් ඒ වෙනුවෙන් ආයෝජනය කරද්දී, වර්තමාන රජය ඒ ආයෝජනය කළ මුදල දෙගුණයක්, එනම් සියයට 3 දක්වා වර්ධනය කිරීමට පසු ගිය අතුරු අය වැයෙන් පොරොන්දු වෙලා තිබියදීත් අද පෞද්ගලික සෞඛ්‍ය සේවය ඉතා වේගයෙන් වර්ධනය වෙමින් පවතිනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පෞද්ගලික රෝහල්වලින් ලැබෙන සේවයේ මිල ඉතා අධිකයි. මධ්‍යම පාන්තිකයකුට පමණක් නොවෙයි ඉතා ධනවත් පුද්ගලයකුට වුණත් සති දෙකක්, සති තුනක්, මාසයක් පෞද්ගලික රෝහලක රෝහල්ගත වී සිටීම ඉතාම අසීරු කාරණයක්. තමන්ගේ දෙමව්පියන් මහලු වියට පත් වෙලා රෝගී වන විට, තමන්ගේ දරුවෝ රෝගී වන විට දිගු කාලයක් පෞද්ගලික රෝහලක රෝහල්ගත වෙලා ඉන්නට තිබෙන අවස්ථාව පිළිබඳ කාරණය දරා ගැනීමට තරම් අමාරුයි. නමුත් එහෙම තිබියදීත් අද මේ රටේ පුරවැසියෝ තමන්ගේ ඉඩ කඩම් විකුණලා හෝ, කන කර විකුණලා හෝ, යාන වාහන විකුණලා හෝ දරුවාට, අම්මාට, තාත්තාට ප්‍රතිකාර කරනවා. ඇයි එහෙම කරන්නේ? අද රජයේ රෝහල්වලින් ලැබෙන ඒ සේවාවේ ගුණාත්මකභාවය පිළිබඳව තිබෙන ප්‍රශ්නය නිසා.

අනෙක් අතට, අපේ රටේ මධ්‍යම පන්තිය ප්‍රමාණයෙන් වර්ධනය වන මොහොතේ, ඒ මධ්‍යම පන්තිය ගමේ රෝහලට, නගරයේ තිබෙන මහ රෝහලට ගිහිල්ලා අනෙක් රෝගීන් එක්ක එකට ප්‍රතිකාර ලබන්න අකමැති නම්, ඔවුන්ට හැකි පමණට පෞද්ගලික රෝහල්වලින් ප්‍රතිකාර ලබා ගැනීමට හැකි වන පරිදි සාධාරණ වූ සෞඛ්‍ය රක්ෂණ ක්‍රම වර්ධනය වීම මම අනුමත කරනවා; අපේක්ෂා කරනවා. නමුත් අද තිබෙන සෞඛ්‍ය රක්ෂණ ක්‍රම බොහොමයකින් ඒ රක්ෂණය ලබා ගන්නා තැනැත්තාට යම් රෝගයක් ඇති වූ අවස්ථාවකදී ඔවුන් බලාපොරොත්තු වුණ සහනය ලැබෙන්නේ නැහැ. අසනීප වෙනකම් අපි හිතාගෙන ඉන්නවා, අපට සෞඛ්‍ය රක්ෂණයක් තිබෙනවා කියලා. හැබැයි, රෝහල්ගත වෙලා බිල ගෙවන්නට උත්සාහ කරනකොට තමයි අපට තේරෙන්නේ අපේ අවශ්‍යතාව ඒ සෞඛ්‍ය රක්ෂණයෙන් ඉටු වෙලා නැහැ කියන කාරණය. අපි ඒ වෙනුවෙන් විශාල premium එකක් ගෙවලා තිබෙනවා. හැබැයි, අවසානයේදී අප බලාපොරොත්තු වන සේවයක් ලැබෙන්නේ නැති තත්ත්වයක් අපට පෙනෙනවා. ඒ නිසා මේ රටේ සෞඛ්‍ය රක්ෂණය පිළිබඳ ඒ ප්‍රතිපත්ති අපි දිරිමත් කළ යුතුයි. හැකියාව තිබෙන අයට පෞද්ගලික රෝහල්වලින් ඒ සේවාව ලබා ගැනීමට අවස්ථාව ලබා දිය යුතුයි. හැබැයි, ඒ සෞඛ්‍ය රක්ෂණ පිළිබඳව, ඒවායේ ඇති කොන්දේසි පිළිබඳව, ඒ ගිවිසුම් තුළ ඇති සැඟවුණු කොන්දේසි පිළිබඳව සොයා බැලීම සඳහා රජය යම් විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයි.

සමහර වේලාවට ඒ රක්ෂණ පිළිබඳ මිනිසුන් යම් දුෂ්කරතාවන්ට පත් වෙච්ච අවස්ථාවලදී නීතිඥයන් වන අප මුණ ගැහිලා ඒ පිළිබඳව අපේ උපදෙස් පතනවා. අත් දැකීමෙන් අපි ඒවා දන්නවා. එම නිසා මා විශ්වාස කරනවා, සෞඛ්‍ය රක්ෂණ පිළිබඳව යම් ආකාරයක විමර්ශනය කිරීමේ වගකීමක් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට, විශේෂයෙන්ම ආණ්ඩුවට තිබෙනවා කියලා. අපි පෞද්ගලික රෝහල්වලට සේවය සැපයුවේ නැති වුණාට මේ සෞඛ්‍ය රක්ෂණය පිළිබඳ කාරණය වැදගත් කාරණයක්. හැබැයි, ඒ සෞඛ්‍ය රක්ෂණය තුළ ඇති හැකි අය ඇති හැකි පමණට ඒ සේවය ලබා ගන්නා අතරතුර නිදහස් සෞඛ්‍ය පිළිබඳව වූ ඒ උත්තරීතර අයිතිවාසිකම සියයට සියයක් තහවුරු කරලා, වර්ධනය කරලා, පෝෂණය කරලා පවත්වා ගෙන යෑම සඳහා ධෛර්යය දිය යුතුයි කියන කාරණයයි මම මේ කියා සිටින්නේ. නමුත් මේ මුළු රටේම සෞඛ්‍ය උදෙසා සෞඛ්‍ය රක්ෂණයක් හඳුන්වා දිය යුතුයි, මුළු රටේම සෞඛ්‍ය පෞද්ගලීකරණය කළ යුතුයි කියන ඒ මතය තුළ මම මොහොතකටවත් නොමැති බව කියන්න ඕනෑ. මමත් නැහැ, මගේ පක්ෂයත් ඒ මතයේ නැහැ.

අපි දැක්කා ලෝකයේ සෞඛ්‍ය රක්ෂණය පිළිබඳව අලුත් අත් දැකීම් ඇති වෙන හැටි. අමෙරිකා එක්සත් ජනපදය ලෝකයේ ප්‍රබලතම රාජ්‍ය වුණත්, එරට පුරවැසියෝ මේ සෞඛ්‍ය සේවාව ලබා ගැනීම පිළිබඳව විශාල දුෂ්කරතාවකට මුහුණ දුන්නා. ඇමෙරිකා එක්සත් ජනපදය ලෝකයේ ධනවත්ම රාජ්‍යය, බලවත්ම රාජ්‍යය වුණත් එහි ඇති-නැති පරතරය අතිවිශාලයි. ඉතාම දුප්පත් කළු ජාතිකයන් සහ ස්පාඤ්ඤ සම්භවය සහිත ජාතිකයන්, මැක්සිකානු සම්භවය සහිත ජාතිකයන් විශාල පිරිසක් ඇමෙරිකා එක්සත් ජනපදයේ සිටිනවා. ධනවත් සුදු ජාතිකයෝත් ඉන්නවා. දුප්පත් සුදු ජාතිකයෝත් ඉන්නවා. මේ අය අතර තිබෙන මේ පරතරය තුළ ඉතා විශාල විෂමතාවක් තමයි තිබුණේ. එහිදී රාජ්‍ය මැදිහත් වෙලා යම් ආකාරයක රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දුන්නා. ඒ පිළිබඳව විවිධ මත තිබෙනවා. මුළු රටටම රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීම පිළිබඳ අමෙරිකානු අත් දැකීම අපට මෙතැනදී අදාළ වන්නේ නැහැ. මොකද, නිදහස් සෞඛ්‍ය අයිතිවාසිකම තහවුරු කරපු, සැලකිය යුතු දුරකට ගුණාත්මක අතින් ඉහළ සෞඛ්‍ය තත්ත්වයක් මේ රටේ ස්ථාවර කරපු, විශේෂයෙන්ම ගර්භිණී මාතාවන්, ළදරුවන් පිළිබඳ වූ ඒ දර්ශක ලෝකයේ ඉතාම ඉහළම මට්ටමකට අරගෙන ආපු ජාතියක් අපි. එම නිසා අපි ඒ අමෙරිකානු අත් දැකීමට යා යුතු නැහැ. නමුත් මම යෝජනා කරන්න කැමැතියි, තමන්ට හැකි පමණින් දායක වෙන්න පුළුවන් විධියට, අවශ්‍ය අයට තෝරා ගැනීමට හැකි විධියට අපේ රටේ සෞඛ්‍ය රක්ෂණ ක්‍රම හඳුන්වා දිය යුතුයි කියලා. අවශ්‍ය නම් ඒ සඳහා ඇමෙරිකා එක්සත් ජනපදයේ තිබෙන මේ අත්දැකීමත් සලකා බැලීමට හැකියාව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම විශේෂ ප්‍රශ්න කිහිපයක් මම නියෝජනය කරන කළුතර දිස්ත්‍රික්කයේ තිබෙනවා. ගරු සෞඛ්‍ය ඇමතිතුමනි, ඔබතුමාත් දන්නා කළුතර, නාගොඩ මහ රෝහල ඉතා බරපතළ ලෙස පසුගාමී තත්ත්වයක තිබෙන්නේ. කළුතර, නාගොඩ මහ රෝහල විවිධ හේතු නිසා බලධාරින්ගේ අවධානයට ලක් නොවී තිබෙන රෝහලක්.

අප මීට මාස කිහිපයකට කලින් මේ රෝහලේ ගවේෂණ චාරිකාවක නිරත වුණා; එහි නිලධාරින් සමඟ සාකච්ඡා කළා; වෛද්‍යවරුන් සමඟ සාකච්ඡා කළා; රෝහල පුරාම ඇවිදලා ඒ කරුණු සොයා බැලුවා. කළුතර නාගොඩ මහ රෝහල වැඩි දියුණු කිරීම සඳහා විටින් විට යෝජනා ක්‍රම ඉදිරිපත් වෙලා තිබෙනවා. හැබැයි, මොනයම් හෝ හේතුවක් නිසා සෑම වෙලාවේම මේ නාගොඩ මහ රෝහල දියුණු කිරීම සඳහා වූ ඒ යෝජිත, අනුමත වුණ යෝජනා ක්‍රියාත්මක නොවුණු තත්ත්වයක් තිබෙනවා. මේ රෝහලේ සැලැස්මත් ඒ වාගේමයි.

අනෙක් කාරණය, කළුතර නාගොඩ මහ රෝහලට හදිසි අනතුරු වාට්ටුවක අවශ්‍යතාව තිබෙනවා. මාගේ මිත්‍ර ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා දක්ෂිණ අධිවේගී මාර්ගයේදී අනතුරට ලක් වුණාම එතුමාව අරගෙන ආවෙත් මේ රෝහලට කියලා අපි දන්නවා. හැබැයි, හදිසි ශල්‍ය කර්මයක්, කරන්නට පුළුවන් ආකාරයේ පහසුකම් සහිත හදිසි අනතුරු වාට්ටුවක් කළුතර මහ රෝහලේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා හොඳින් දන්නවා, කළුතර, නාගොඩ මහ රෝහල කියන ස්ථානයට රෝගීන් අතිවිශාල සංඛ්‍යාවක් නිරතුරුව එන බව. නිල වශයෙන් ඇඳන් 850ක් පමණ එහි තිබෙනවා. නමුත් ඕනෑම දවසක රාත්‍රී වනකොට රෝගීන් 1,100ක් 1,200ක් මෙම රෝහලේ ඉන්නවා. ඒ වාගේම ගරු ඇමතිතුමනි, දැඩි සත්කාර ඒකකයේ තිබෙන්නේ ඇඳන් 4 ක් පමණයි. මේ තරම් විශාල රෝහලක මේක ඉතාම බරපතළ තත්ත්වයක්. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ අතපසු වෙලා, අමතක වෙලා තිබෙන මේ කළුතර නාගොඩ මහ රෝහල ගොඩනැඟීම සඳහා කටයුතු කළ යුතුයි කියන කාරණයයි. මොකද, මේ රෝහල පිහිටා තිබෙන්නේ කොළඹත් නොවෙයි, ඉතාම දුර බැහැරත් නොවෙයි කියන කාරණය මත අන්තිමේදී අමතක වීමට ලක්වෙලා තිබෙනවා. ඉතා දුරබැහැර ප්‍රදේශවල ඇති රෝහල් දියුණු වෙලා තිබෙන බව අපි දන්නවා.

අම්පාර මහ රෝහල ඉතාම හොඳ දියුණු තත්ත්වයක තිබෙනවා. ඒ ගැන අපි ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම කොළඹ මහ රෝහලත් ඉතාම හොඳින් දියුණු වනවා. හැබැයි, මේ අතරමැද තිබෙන අපේ කළුතර නාගොඩ මහ රෝහල හැම වෙලාවේම අමතක වීමට ලක් වෙලා තිබෙනවා. මොකද, මේ රෝහල අයිති වන්නේ මධ්‍යම ආණ්ඩුවට. ගරු ඇමතිතුමනි, ඔබතුමාත් නියෝජනය කරන්නේ කළුතර දිස්ත්‍රික්කය. ඒ නිසා කළුතර නාගොඩ මහ රෝහල දියුණු කිරීම උදෙසා අපි විශේෂ බරක් යොදලා, විශේෂ ආධාර හෝ ලබා ගෙන එය කළ යුතුයි කියන කාරණය මම ඔබතුමාගේ අවධානයට ලක් කරනවා. ඒක අත්‍යවශ්‍ය දෙයක්.

අවසාන වශයෙන්, මේ යෝජනාව පිළිබඳ අපේ ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා ඊයේ දිනයේ අරගෙන ආ විරෝධතාව පිළිබඳව මම යමක් කියන්නට අවශ්‍යයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර වෙලාවට අපි ලෝකයෙන් බලාපොරොත්තු වන්නා වූ සියලු දේවල් අපට ලැබෙන්නේ නැහැ. 1970 කියපු දේවල් ඒ ආකාරයෙන්ම මේ 2015ට අදාළ කර ගන්න අවශ්‍යත් නැහැ. හැබැයි, මහාචාර්ය සේනක බිබිලේ මැතිතුමා එදා දුරදක්නා නුවණින් යුතුව මහා ප්‍රඥාවන්ත විධියට ඒ ඖෂධ ප්‍රතිපත්තිය ගොඩ නඟනකොට, එදා කියපු ඒ මූලධර්ම අපට ආරක්ෂා කර ගන්න පුළුවන් නම්, ඒ අනුව නවීන කාලයට ගැළපෙන්නා වූ මේ අවශ්‍යතාවන් සලකා මේ නවීන නීති හදන්න ඕනෑ කාලයේ අපි ඒ අදාළ පියවර ගත යුතුව තිබෙනවා. සමහරුන්ට අවශ්‍යයි, අන්තිම මොහොතේ හරි මේ පනත් කෙටුම්පත සම්මත වන එක නතර කරන්න. සමහරුන්ට අවශ්‍යයි, මේ පනත් කෙටුම්පත සම්මත කළත් ඒ පනතේ ඇති විශ්වාසනීයභාවය පිළිබඳ සැක සංකා පහළ කරන්න. සමහරු මේ පනත් කෙටුම්පතට විරුද්ධ වන්න තරම් හිතේ භයියක් නැති වුණත්, මේ පනතේ තිබෙන විශ්වාසනීයභාවය අඩු කරන්නට වක්‍ර ලෙස කටයුතු කරනවා. අජිත් කුමාර මන්ත්‍රීතුමා සාමාන්‍යයෙන් ප්‍රගතිශීලිව අදහස් දක්වන කෙනෙක්. නමුත් ඉතාම ප්‍රගතිශීලි නීතියක් ඉතා අසීරුවෙන් සම්මත කරන්නට යන මේ මොහොතේ නම් අජිත් කුමාර මන්ත්‍රීතුමාගේ විරෝධතාව එතුමා දැනුවත්ව හෝ නොදැනුවත්ව පසුගාමී තැනකටයි අපව අරගෙන යන්නේ.

අතිගරු ජනාධිපතිතුමා කිව්වා, අපට මේක ගැන කථා කරන්න පුළුවන්; මේ මොහොතේ අපට සමහර සංශෝධන කර ගන්න පුළුවන්; එහෙම නොවේ නම් පසුව වුණත් යම් අඩුපාඩු තිබෙනවා නම් භාවිතය තුළ අපි ඒවා හදා ගනිමු කියලා. නමුත් මූලික නීතිය සම්මත කරගත යුතුයි කියන කාරණය එතුමා සඳහන් කළා. අද රට පුරා පෝස්ටර් ගහලා, මේක සලකා බලන්න වෙලාවක් නැහැයි කියලා ප්‍රශ්නයක් මතු කරලා මේ පනත් කෙටුම්පතේ විශ්වාසනීයභාවය ප්‍රශ්නයකට ලක් කරන්න උත්සාහ කරන එක ඉතාම වැරැදියි කියන කාරණය නම් මම කියන්නට ඕනෑ. සමහර වෙලාවට සෑම දේකටම විරුද්ධවීම පහසු නිසාත්, ඒ විරුද්ධවීම තුළ ලැබෙන ජනප්‍රියතාව, ඒ ලැබෙන වටිනාකම නිසාත් මේ ආකාරයට ක්‍රියා කරනවා වන්නට පුළුවන්.

"මේ පාර්ලිමේන්තුවේ මම විතරයි හැම දේකටම විරුද්ධ, අන් සියලු දෙනා එක මතයකයි ඉන්නේ" කියන අදහස ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා තුළ, එහෙම නැත්නම් එතුමාගේ පක්ෂය තුළ තිබෙනවා වන්නට පුළුවන්. විරෝධාකල්ප ඉතා සතුට ගෙන දෙන කාරණයක්. ඒ තුළින් ලොකු වින්දනයක් ලබාගන්න පුළුවන්. හැබැයි පරෙස්සමෙනුයි ඒ විරෝධතා ඉදිරිපත් කරන්න ඕනෑ.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

මොකද, මේ වාගේ වටිනා පනත් කෙටුම්පතක විශ්වාසවන්තභාවයට ගහන ඒ පහර මේ පනත මේ රටේ භාවිතය පිළිබඳ කාරණයේදී නරක අතට බලපාන්න ඉඩ තිබෙනවා.

අජිත් කුමාර මන්ත්‍රීතුමනි, මෙය හදිසි පනත් කෙටුම්පතක් ලෙස ගෙන ඒම පිළිබඳව, මෙහි තිබෙන්නා වූ දුෂ්කරතාව පිළිබඳව ඔබතුමා ගෙන එන තර්කයෙහි යම් සත්‍යතාවක් තිබෙන නමුත් දීර්ඝ කාලයක් කථා කරලා ගෙන ආ බොහෝ සෙයින් වටිනා මේ පනත් කෙටුම්පත ඉක්මනින් සම්මත කර ගැනීම පිළිබඳව දක්වන මේ විරෝධය තුළ අනිවාර්යයෙන් වාසිය ලබන්නේ ජාවාරම්කරුවන් සහ මේ පනත් කෙටුම්පත සම්මත කළත් එය ක්‍රියාත්මක කිරීම වැළැක්වීමට ප්‍රාර්ථනා කරන අයයි. අපි විවිධ පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුවේ සම්මත කර තිබෙනවා නේ. හැබැයි ඒ පනත්වලට අවශ්‍ය කරන යාන්ත්‍රණය ගොඩ නැඟුණේ නැත්නම්, ඒ පත්වීම් ටික කළේ නැත්නම්, අතිගරු ජනාධිපතිතුමා කිව්වා වාගේ නිසි පුද්ගලයන් පිරිස පත් වුණේ නැත්නම් අනිවාර්යයෙන් සිද්ධ වන්නේ ඒ පනත ක්‍රියාත්මක නොවී තවත් අවුල්සහගත තත්ත්වයට පත් වීමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමාට විකල්ප මතයක් දරන්න තිබෙන අයිතියට ගරු කරන ගමන් මේ පනත් කෙටුම්පතේ විශ්වසනීයභාවය නැති කිරීම උදෙසා කටයුතු කරන්න එපා කියා මම ඉල්ලා සිටිනවා. මොකද, මේ පනත පිළිබඳ කාරණය අපේ රටේ ජනතාව පසු ගිය ජනාධිපතිවරණයේදී මූල ධර්මයක් වශයෙන් අනුමත කරපු, අප වෙත පවරපු වගකීමක්. ජනතාව අප වෙත පවරා තිබෙනවා, මේ පනත් කෙටුම්පත දින සියයක් තුළ සම්මත කිරීම සඳහා. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය මිනිත්තු 10යි.

[අ.භා. 4.37]

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ රෝගී පීඩිත ජනතාව දශක හතරකට ආසන්න කාලයක් බලාපොරොත්තුවෙන් සිටි ඉතාම සාධනීය පනත් කෙටුම්පතක් ජාතික ඖෂධ නියාමන අධිකාරිය නමින් අද ඉදිරිපත් කර තිබෙනවා, අපේ සෞඛ්‍ය ඇමතිතුමා වන ගරු රාජිත සේනාරත්න මැතිතුමා. මේ වෙනුවෙන් අපේ හිටපු සෞඛ්‍ය ඇමතිතුමා වූ අතිගරු ජනාධිපතිතුමා විශාල වෙහෙසක් ගත්තා. ඒ වෙහෙස ගත්තත් එතුමාට සෞඛ්‍ය ඇමතිවරයා හැටියට අපේ ආණ්ඩුව කාලයේ එය ඉදිරිපත් කිරීමට නොහැකි වීම ගැන අපි කනගාටු වෙනවා. මෙවැනි ප්‍රගතිශීලී පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමට මූලික පදනම හැටියට, මූලික හරය හැටියට මූලික වශයෙන් ගෙන තිබෙන්නේ අපේ සේනක බිබිලේ මහාචාර්යතුමා සෞඛ්‍ය සම්බන්ධයෙන්, ඖෂධ සම්බන්ධයෙන් ඉදිරිපත් කළ ප්‍රතිපත්තියයි. එතුමා වෙල්ලස්සේ වීරයකු හැටියටත්, මේ රටේ ජාතික වීරයකු හැටියටත් අපි සලකනවා. මොකද, එතුමාට ඒ සඳහා ජීවිතයෙන් වන්දි ගෙවන්නත් සිද්ධ වුණා කියලා ගරු ඩිව් ගුණසේකර මැතිතුමා අද කියනවා අපට ඇහුණා. ඒ වාගේම, අපිත් එය අසා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වාගේ විශිෂ්ට ගණයේ පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීම ගැනත්, මේ පනත් කෙටුම්පතේ සංයුතිය ගැනත් අපි සතුටු වෙනවා. විවිධ ක්ෂේත්‍රවල නිපුණතාව ඇති, මහාචාර්යවරුන්, ආචාර්යවරුන්, වෛද්‍යවරුන් සහ අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්තුමා ඇතුළුව විවිධ ක්ෂේත්‍රවල නිලධාරීන් පත් කිරීමට නම් කර තිබෙනවා. ඒ නිසා දේශපාලන බලපෑම, ඇඟිලි ගැසීම අවම වන ආකාරයෙන් ඔබතුමා මෙය සකස් කර තිබෙනවා ගරු ඇමතිතුමනි. අපි ඒ සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. හැබැයි අප කල්පනා කරන්න ඕනෑ මේකයි. සේනක බිබිලේ සෞඛ්‍ය ප්‍රතිපත්තියෙන් බලාපොරොත්තු වූ ප්‍රධානම කාරණාව තමයි දුප්පත් රෝගී ජනතාවට අඩු මුදලකට, විශ්වාසවන්තව සහ ඖෂධීය නාමයෙන් බෙහෙත් ලබා ගැනීම. ගරු ඇමතිතුමනි, මෙය කන්දක් විළි ලා මී පැටියකු වැදුවා වාගේ නොවන්න නම්, ඔබතුමාගේ කථාවේදී කිව්වා වාගේ මේ පනත හා සම්බන්ධ යන්ත්‍රණය ශක්තිමත් කරලා තවත් ඉදිරියට ගෙන යන වැඩ පිළිවෙළකට අවතීර්ණ වන්න සිදු වනවා. එහෙම වුණොත් තමයි නිසි ප්‍රතිලාභ ජනතාවට ලැබෙන්නේ. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට පෞද්ගලිකවත් ස්තුතිවන්ත වනවා. මොකද, පසු ගිය පළාත් සභා මැතිවරණයේදී මගේ දිස්ත්‍රික්කයට ආපු අපේ කැබිනට් ඇමතිවරුන් අතරින් ඔබතුමා විතරයි මගේ පුතාට ඡන්දයක් දෙන්න කියලා කිව්වේ. මම ඒ අතිනුත් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. එවැනි කශේරුකාවක් තිබුණු ඔබතුමාට මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න ලොකු ශක්තියක් තිබුණා කියලායි මා හිතන්නේ. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ ගැන ඉතාම සාධනීය ලෙසයි බලන්නේ. අපි දන්නවා, ගම්වල ජීවත් වන අපේ අහිංසක ජනතාව දරුවකුට අසනීප වුණාම සිලි බෑග් එකක රෙදි ටිකක් දාගෙන ඉස්පිරිතාලයට යන බව. එහෙම ගියාම ඔවුන්ට මුහුණ දෙන්න සිදු වන තත්ත්වය කනගාටුදායකයි. එක්කෝ ඒ ලෙඩාව බදුල්ලට මාරු කරනවා.

එහෙම නැත්නම් නුවරට මාරු කරනවා, ගාල්ලට මාරු කරනවා, අම්පාරට මාරු කරනවා. ගරු ඇමතිතුමනි, මම ප්‍රධාන ඇමතිවරයා හැටියට පත් වන කොට ඌව පළාතේ තිබුණේ එවැනි තත්ත්වයක්. අපට ඒකේ වෙනසක් කරන්න පුළුවන්කම ලැබුණා. පසු ගිය රජය කාලයේ මම ඌව පළාතේ ප්‍රධාන ඇමතිවරයා හැටියටත් කටයුතු කළා. එසේ කටයුතු කරපු කාලයේ අපට දියතලාව රෝහල wall oxygen සහිත ඉතා හොඳ රෝහලක් බවට පත් කරන්න හැකි වුණා. ඒ වාගේම මහියංගනය රෝහලත් දියුණු කරන්න අපට පුළුවන්කම ලැබුණා. මට ලැබුණු ප්‍රතිපාදනවලින් රුපියල් මිලියන 113ක් මහියංගනය රෝහලට මම වෙන් කළා.

ඒ වාගේම හිටපු සෞඛ්‍ය ඇමතිතුමා වන නිමල් සිරිපාල ද සිල්වා මහතාත් මේ අවස්ථාවේදී අපි මතක් කරන්න ඕනෑ. ඉතාම විශිෂ්ට විධියට සෞඛ්‍ය ක්ෂේත්‍රය පිළිබඳව අවබෝධයෙන් එතුමා කටයුතු කළා. එතුමා Cancer Hospital එකක් හැදුවා. ඒ වාගේම තට්ටු තුනකින් සමන්විත ආකාරයට බිබිල රෝහල වැඩිදියුණු කළා. ගරු රාජිත සේනාරත්න ඇමතිතුමනි, එම රෝහල බලන්න යන්න මම අද ඔබතුමාට ආරාධනා කළා. ඒ වාගේම සියඹලාන්ඩුව රෝහල, මොනරාගල රෝහල දියුණු කරන්න අපට පුළුවන්කම ලැබුණා. හැබැයි, ඒ රෝහල් සඳහා අපට දැන් අවශ්‍ය වන්නේ විශේෂඥ වෛද්‍යවරු, බෙත්-හේත් සහ වෛද්‍ය උපකරණයි. මේ ආයෝජනය කරපු මුදලේ නිසි ප්‍රතිලාභ දුප්පත් ජනතාවට ලබා ගන්න පුළුවන් අවස්ථාව ඔබතුමා ලබා දෙනවා නම් හොඳයි. ඌව පළාතේ ප්‍රධාන ඇමතිවරයා හැටියට මම කටයුතු කළ කාලයේ පළාතේ සෞඛ්‍ය ඇමතිවරයා හැටියට කටයුතු කළේ දොස්තර පුෂ්පකුමාර මහතායි. අපේ බුද්ධදාස ඇමතිතුමාත් සෞඛ්‍ය ඇමති ධුරයේ කෙටි කාලයක් කටයුතු කළා. අපි ඔක්කෝම එකතු වෙලා ඌව පළාතේ සෞඛ්‍ය ක්ෂේත්‍රය දියුණු කළා.

අපේ අජිත් පී. පෙරේරා නියෝජ්‍ය ඇමතිතුමා අද මෙක්සිකෝව ගැන කථා කළා. නමුත්, නාගරික සහ ගම්බද ප්‍රදේශවල ජනතාවට තිබෙන මේ විෂමතාව අපි දැක්කා. මේ විෂමතාව මහ හැර ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ප්‍රතිඵල පහළ මට්ටමේ ග්‍රාමීය ජනතාවට ලබා ගැනීම තමයි මේ පනත් කෙටුම්පතේ අරමුණ. ඒක ඉෂ්ට කරන්න ඔබතුමාට ශක්තිය, ධෛර්ය, වාසනාව ලැබෙන්න කියලා අපි ප්‍රාර්ථනා කරනවා.

හැටේ දශකයත්, අදත් අතර ලොකු වෙනසක් තිබෙන බව අපි දන්නවා. ගරු ඇමතිතුමනි, බහුතර වෛද්‍යවරු තමන්ගේ අධ්‍යාපනය යාවත්කාලීන කර ගන්නේ ඖෂධ සමාගම්වලින් ලබා දෙන ශිෂ්‍යත්ව අරමුදල් නිසා බව අපි දන්නවා. තමන් ඉගෙන ගත් දෙයින් දිගටම වෙද හෙදකම් නොකර ඔවුන්ගේ දැනුම යාවත්කාලීන කරන්න නිතර නිතර පිට රටවල පැවැත්වෙන සම්මන්ත්‍රණවලට සහ වැඩමුළුවලට අපේ වෛද්‍යවරුන්ට සහභාගි වන්න සිද්ධ වනවා. ඒ වෛද්‍යවරුන්ට ජාත්‍යන්තර සම්මන්ත්‍රණවලට සහ වැඩමුළුවලට සහභාගි විය හැකි ආකාරයට රජයෙන් යම් ශිෂ්‍යත්ව ක්‍රමයක් හදනවා නම් ඉතා වැදගත් කියලා මම හිතනවා. එහෙම වුණොත් අපේ සෞඛ්‍ය තත්ත්වය අලුත් ලෝකයත් එක්ක බද්ධ කරලා මීට වඩා ඉස්සරහට ගෙන යන්න පුළුවන්; සෞඛ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අලුත් දැනුම අපේ රටට ගේන්න පුළුවන්. ඒක නිසා අද මෙහි වගකීම අපි පිළිගන්නවා. බහුජාතික සමාගම් සහ අනෙකුත් සමාගම් විසින් තමයි ඒ දායකත්වය ලබා දෙන්නේ.

ඒ එක්කම අද අපේ අලුත් සමාජයේ බොහෝ දෙනා මේ සන්නාමවලට - brandsවලට - පුරුදු වෙලා තිබෙනවා. එහෙම පුරුදු වෙලා තිබෙන්නේ මොකද? එදා හැටේ, හැත්තෑවේ දශකවල හිටපු ජනතාව අද අපේ රටේ නැහැ. අද සිටින ජනතාව හොඳම බෙහෙත, හොඳම brand එක ගන්න ඕනෑය කියන තැනයි ඉන්නේ. මෙතැන දෙපැත්තක් තිබෙනවා. එකක් තමයි, විදේශ රටවලින් දැන් අපේ රටට සංචාරකයෝ එනවා. විශේෂයෙන් මාලදිවයින වාගේ රටවලින් අපේ රටට ප්‍රතිකාර ගන්න විශාල විජාතිකයෝ ප්‍රමාණයක් එනවා. ඒකට අපි කියනවා, "health tourism" කියලා. එතකොට මේ අංශය දියුණු කරන්න අපි හිතන තැනට වඩා වෙන තැනක ඉඳලා කටයුතු කරන්න අපට සිද්ධ වනවා.

පසු ගිය දවස්වල බුත්තල ප්‍රදේශයේ ෆාමසි එකකින් බෙහෙතක් අරගෙන පාවිච්චි කරලා ලෙඩෙක් මැරුණා. පොලීසි ගිහිල්ලා ඒ රාජකාරි වන කොට එතැන ලොකු ප්‍රශ්නයක් ඇති වුණා. මේ විධියට බහුතර ෆාමසිවල, ඔසුසල්වල, බෙහෙත්ශාලාවල වැඩ කරන්නේ පළපුරුදු නැති අය; බෙහෙත් ගැන දැනුමක් නැති අය. ගරු ඇමතිතුමනි, මේ ගැන සොයා බලන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලනවා. මේකෙන් පීඩා විඳින්නේ ගම්බද ජනතාව.

ඒ විතරක් නොවෙයි. අද හොර වෛද්‍යවරු විශාල ප්‍රමාණයක් අපේ රටේ ඉන්නවා. ඒ හොර වෛද්‍යවරුන්ගෙන් විශාල වශයෙන් ප්‍රතිකාර ලබන්නේ ගම්බද ජනතාව. ගරු ඇමතිතුමනි, ඒ නිසා ෆාමසිවල වැඩ කරන අයගේ සුදුසුකම්, ඔවුන්ට තිබෙන හැකියාවන් පිළිබඳව එක් පැත්තකින් විමර්ශනය කරන ගමන් මේ හොර වෛද්‍යවරු නැති කරන වැඩ පිළිවෙළකුත් සකස් කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලනවා. කොපමණ හොඳ වෛද්‍යවරු හිටියත්, සමහර විට අපේ ගම්බද ප්‍රදේශවල ජීවත් වන අයට ඒ සම්බන්ධයෙන් දැනුමක් නැහැ. අපේ ගම්බද ප්‍රදේශවල ජීවත් වන අය පුරුදු වුණු වෛද්‍යවරයා ළඟටම යනවා. සමහර විට ඒ වෛද්‍යවරයා හොර වෛද්‍යවරයෙක් වෙන්න පුළුවන්. ඒ නිසා අපේ ගම්බද ජනතාව මෙයින් ආරක්ෂා කළ යුතුය කියලා අප කල්පනා කරනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ විශේෂ අවධානය අපි මේ සඳහා යොමු කරනවා.

බලන්න, විවිධ මිල ගණන් යටතේ එකම බෙහෙත මිලදී ගන්න අද තිබෙනවා. දැන් Meropenem injection එකක් රුපියල් 400ටත් තිබෙනවා, රුපියල් 4,000ටත් තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාත් එය දන්නවා. මේකේ ගුණාත්මකභාවය අපි දන්නේ නැහැ. අද අපේ විරුද්ධ පාර්ශ්වයේ නායක ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාගෙනුත් කියැවුණා, අපි බෙහෙත් නිෂ්පාදනයට යන එක ගැන. මිල ගණන්වලට තරගයක් දෙන්න අපේ තිබෙන ජාතික වෙළෙඳ පොළ ප්‍රමාණවත් නැහැ කියන කාරණය මෙතැනදී කියැවුණා. අපේ රටේ තිබෙන පිරිසිදුකම, අපේ රටේ ජනතාවගේ අධ්‍යාපනය, හැකියාව ගැන බලන විට ඉන්දියාවට, බංග්ලාදේශට වඩා අපට විජාතික වෙළෙඳ පොළවල් ග්‍රහණයට හසු කර ගන්නට පුළුවන් ප්‍රමාණය වැඩියි කියා මම කල්පනා කරනවා. එවැනි තත්ත්වයක් තුළ විජාතික ඖෂධ සමාගම්වලින් හෝ අපේ රටේ ඖෂධ නිෂ්පාදනය සඳහා ඔබතුමාට යම් පියවරක් ගන්නට පුළුවන් නම් ඒක ඉතා වැදගත්ය කියා මා හිතනවා. අප ගැන අප අවතක්සේරුවකින් සිතන්නේ නැතිව අපට කරන්නට පුළුවන් දේවල් හුඟක් තිබෙනවා. ඒ දේවලට අපි යොමු විය යුතුයයි මා කල්පනා කරනවා. පසු ගිය කාලයේ ඉන්දියානු බෙහෙත් ගැන අපට නොයෙකුත් විවේචන එල්ල වුණා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
නොයෙකුත් තත්ත්වයන් ඇති වුණා. ඒ තත්ත්වයන්වලට අපි මුහුණ දෙන්නට කටයුතු කරන්නට ඕනෑය කියා මා හිතනවා. ඒ වාගේම ගරු ඇමතිතුමනි, මේ කටයුත්ත ගැන අවධානය යොමු කරන ලෙස මා ඔබතුමාට ආරාධනා කරනවා. බිබිලේ රෝහල ළමා සහ මාතෘ චිකිත්සාගාරයක් හැටියටයි අප ආරම්භ කළේ. පසු ගිය දිනවල ළමයින් 23ක් එහි ඉපදුණා. ඉතාම සාර්ථක දරු උපත්. මොනරාගල දිස්ත්‍රික්කයේ ළදරු මරණ සංඛ්‍යාව අපි අඩු කර ගෙන තිබෙනවා. ඒ ප්‍රවාහන පහසුකම් හා අපේ රෝහල් පද්ධතිය යාවත්කාලීන වුණ නිසා. එම නිසා මෙම රෝහල් පරීක්ෂා කර, මෙම රෝහල්වලට අවශ්‍ය වෛද්‍ය උපකරණ, ශල්‍යාගාර උපකරණ සහ විශේෂඥ වෛද්‍යවරු , nursesලා යන සියලු අංශවලින් මේ රෝහල අංග සම්පූර්ණ කරන්නට - දින සියය ඇතුළත ඔබතුමාට කරන්නට පුළුවන් ද බැරි ද කියා අපි දන්නේ නැහැ. - දින සියය හෝ ඉන් ඔබ්බට ගිහින් මේ කටයුත්ත කරන්නට ඔබතුමාට ශක්තිය ධෛර්ය, වාසනාව ලැබේය කියා විශ්වාස කරනවා. බොහොම ස්තූතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
The next speaker is the Hon. Ajith Kumara. You have 12 minutes.

[අ.භා. 4.47]

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කිරීමට ඊට වඩා කාලය ඇති කියා මා හිතනවා.

[ගරු අජිත් කුමාර මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත ගැන අදහස් කිහිපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම ගැන මම ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන් 1970 දශකයේ යුගයේ මිනිසා විධියට පසු ගිය කාලයේ හඳුන්වා දුන් මහාචාර්ය සේනක බිබිලේ මැතිතුමා මේ රටේ ජාතික ඖෂධ ප්‍රතිපත්තියක් සම්බන්ධයෙන් විශාල කතිකාවතක් මතු කළා. මේ පාර්ලිමේන්තුව තුළ කථා කළා වාගේම ඔහු විශේෂයෙන් පීඩිත ජනතාව ඇසුරු කළ කෙනෙකු විධියටත්, ඔවුන්ගේ දුක්ඛ දොමනස්සයන් දැකපු කෙනෙකු විධියටත් අපි දකිනවා. ඒ අත් දැකීම්වලට අමතරව සමසමාජ වාමාංශික ව්‍යාපාරයේ කොමියුනිස්ට් පක්ෂයේ දේශපාලන ඇසුර ලබා වාමාංශික අදහස් තිබුණු කෙනෙකු විධියටත් ඒ දර්ශනය අනුව ඔහුට එහෙම කල්පනාවක් තිබුණු බවත් අපි දකිනවා. එම නිසා එතුමා ඒ වෙනුවෙන් ඉතාම සරලව අවංකව කැප වුණා. එහි ප්‍රතිඵලයක් විධියට කොමියුනිස්ට් පක්ෂයේ කීර්තිමත් නායකයෙක් වුණ එස්.ඒ. වික්‍රමසිංහ මැතිතුමාත්, බිබිලේ මැතිතුමාත් එකතු වී හැදුව වාර්තාව 1971 මාර්තු මාසයේ 23 වන දා එවකට සිටි අග්‍රාමාත්‍යතුමියට භාර දුන්නා. ඒ වාර්තාව අනුව 1971 සැප්තැම්බර් මාසයේ 22 වනදා ප්‍රථම සභාපතිවරයා ලෙස බිබිලේ මහත්මයා පත් වුණු ශ්‍රී ලංකා ඖෂධ සංස්ථාව බිහි වුණා. ඒ ගැන ඉතාම විචිත්‍රවත් විධියට දෙනගම සිරිවර්ධනයන් "යුගයේ මිනිසා" යන කෘතිය නිර්මාණය කර තිබෙනවා. මේ පනත් කෙටුම්පත කියවා නැති, එය අධ්‍යයනය කරන්නට වෙලාවක් නැති මන්ත්‍රීතුමන්ලා බිබිලේ මැතිතුමාගේ කල්පනාව සරලව තේරුම් ගන්න අඩුම ගණනේ මේ කෘතියවත් කියෙව්වත් ඇති. 1992 වර්ෂයේ ඒ පොත එළි දක්වන වෙලාවේ පාසල් ශිෂ්‍යයෙක් විධියට මේ ඖෂධ ප්‍රතිපත්තිය වෙනුවෙන් මා ඊයේ කිව්වා වාගේම කරාපිටිය රෝහලේ වෛද්‍ය පීඨයේ සහෝදරවරුත් එක්ක අපි කණ්ඩායමක් විධියට යම් මතවාදි මැදිහත් වීමක් කළා.

මේ ප්‍රතිපත්තියේ මූලික කරුණු කිහිපයක් එතුමා මතු කළා. විශේෂයෙන් බිබිලේ මැතිතුමාගේ ඖෂධ ප්‍රතිපත්තිය ගැන අපට අදහසක් නැහැ, අවබෝධයක් නැහැ වාගේ කරුණුත් සභාවේ මතු වුණු නිසාත්, මේ ගරු සභාවේ ඉන්න සමහර අයට ඒ ඖෂධ ප්‍රතිපත්තිය ගැන ඇත්තටම අදහසක් තිබෙනවා ද කියා ඔවුන්ට අදහසක් ගන්න කෙසේ වෙතත් මේ පාර්ලිමේන්තුවෙන් එපිට ඉන්න ජනතාවට තේරුම් ගන්න පුළුවන් වෙන්න මා උපුටා දැක්වීමක් කරන්න කැමැතියි. දැනට ක්‍රියාත්මක වන වර්තමාන ඇත්ත පත්‍රයට -මේක අපේ පත්‍රයක් නොවෙයි. කොමියුනිස්ට් පක්ෂයේ නිල පුවත්පතක්- මහාචාර්ය කාලෝ ෆොන්සේකා මැතිතුමා මහාචාර්ය සේනක බිබිලේ මැතිතුමා ගැන ලිපි ගණනාවක් ලිව්වා.

මහාචාර්ය කාලෝ ෆොන්සේකා මැතිතුමා මේ ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත ගැන විශාල කථිකාවක් ගොඩනඟන්න සක්‍රීයව මැදිහත් වුණු කෙනෙක්. ඔහු ඒ ලිපි තුළින් 1971 මාර්තු 23 වැනිදා දුන් වාර්තාවේ කරුණු කිහිපයක් උපුටා දක්වනවා. බිබිලේ මැතිතුමාගේ ජීවිත පරිත්‍යාගයෙන් ඔට්ටු වුණු බිබිලේ ප්‍රතිපත්තියේ අරමුණ මොකක්ද? "අත්‍යවශ්‍ය ඖෂධ ලැයිස්තුවක් සම්පාදනය කර අනවශ්‍ය ඖෂධ රටට ආනයනය නොකිරීම. ඖෂධීය නම්වලින් මිස වෙළෙඳ නම්වලින් ඖෂධ භාවිත නොකිරීම. ශ්‍රී ලංකාවේ ඖෂධ නිෂ්පාදනය බෙදා හැරීම, ගෙන්වීම රජය මැදිහත්ව කරන්න ආරම්භ කිරීම. විශේෂයෙන් ඖෂධ ගෙන්වීම සහ බෙදා හැරීම. ඖෂධ පිළිබඳ දැනුම සහ තොරතුරු වෛද්‍ය වෘත්තිකයන්ට සහ මහජනතාවට නිවැරදිව සන්නිවේදනය කිරීම රජයේ වගකීමක් බවට පත් කිරීම. ඖෂධ පිළිබඳ ජේටන්ට් අයිතිය අහෝසි කිරීම. රටට ගෙන්වන ඖෂධවල ගුණාත්මකභාවය විද්‍යාත්මකව තහවුරු කිරීම සඳහා රසායනාගාර පිහිටුවීම." මේ මහාචාර්ය කාලෝ ෆොන්සේකා මැතිතුමා විසින් ඒ යුගයේ මිනිසා - මහාචාර්ය සේනක බිබිලේ මැතිතුමා - පිළිබඳව 2015 පෙබරවාරි මාසයේ "ඇත්ත" පත්‍රයට ලියපු ලිපියක උපුටා දැක්වීමක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම පනත් කෙටුම්පතට අදාළ මේ ප්‍රතිපත්ති, සංකල්ප පිළිබඳව අවුරුදු හතළිස් ගණනක් කිස්සේ සාකච්ඡා වුණා. මේකෙන් තේරුම් ගත යුතු එක දෙයක් තිබෙනවා. මේ උත්තරීතරය කියන පාර්ලිමේන්තුවට මේ රටේ ලක්ෂ ගණනක් වූ පීඩිත ජනතාව වෙනුවෙන් පනත් කෙටුම්පතක් සම්මත කර ගන්න ගිය කාලය කොපමණද කියන එක. ඒකෙන් එක කරුණක් පැහැදිලි වෙනවා. මේ පාර්ලිමේන්තුව වැඩියෙන්ම උත්සුක වෙලා තිබෙන්නේ මේ රටේ පීඩිත ජනතාව වෙනුවෙන් පනත් සම්මත කරන්න නොවෙයි, සමාගම් ආරක්ෂා කරන්නයි කියන කාරණය. ඒක මේ රටට හෙළිදරවු කරන්න ඕනෑ. මේ පනත් කෙටුම්පත සම්මත කර ගැනීමට මෙපමණ ප්‍රමාද වුණු එකෙන් හෙළිදරවු වන්නේ ඒකයි. ප්‍රාග්ධන හිමියෝ, කොම්පැනිකාරයෝ ආරක්ෂා කරන්න තමයි මේ රටේ පාර්ලිමේන්තුව කටයුතු කර තිබෙන්නේ. ජනතාව වෙනුවෙන් කටයුතු කරන්න උත්සාහ කරලා නැහැ. අවුරුදු ගණනාවක් මේ පනත් කෙටුම්පත සාකච්ඡා කරන්න සිදු වුණේ ඒකයි. එක පැත්තකින් ඒ සඳහා ප්‍රවේශයක් ගැනීම පිළිබඳව; පාර්ලිමේන්තුවේ මේ සාකච්ඡාව ආරම්භ වීම පිළිබඳව අපි සතුටු වෙනවා.

නිදහස් අධ්‍යාපන පනත ගැනත් සාකච්ඡා වෙනවා, අපි දැක්කේ මෙහෙම තමයි. විශේෂයෙන්ම වමේ ව්‍යාපාරය, උඩකැන්දවල සිරි සරණංකර හාමුදුරුවෝ, කොමියුනිස්ට්, සමසමාජ ව්‍යාපාරය නිදහස් අධ්‍යාපන පනත වෙනුවෙන් අරගළ කරලා, මැදිහත් වෙලා ඒකත් පාර්ලිමේන්තුවේ සම්මත කරද්දී විවිධ බාධා තිබුණා. සේනක බිබිලේ ප්‍රතිපත්තිය ලංකාවේ විතරක් නොවෙයි ලෝකයම පිළිගත්තා. ලංකාවේ හැර ලෝකයේ රටවල ඒක ක්‍රියාත්මක වෙනවා. එතුමා උපන් රටේ හැර ලෝකයේ රටවල ක්‍රියාත්මක වෙනවා. ඔහු ඒ සඳහා ජීවිතයෙන් වන්දි ගෙව්වා. අන්තිමට මොකක්ද වුණේ? එදා ඒ සමාගම් ප්‍රබලයි. අද ඊටත් වඩා ප්‍රබලයි. එදා ඔහුට කැරිබියන් දූපත්වල දී ඝාතනය වන්නට සිදු වුණා. නමුත් මේ ගෙන එන පනත් කෙටුම්පත නිසා කාටවත් එහෙම අතුරු ආන්තරාවක් වෙයි කියලා මම හිතන්නේ නැහැ. මට එහෙම හිතෙන්නේ නැහැ. මොකද, දැන් ඒ පනත් කෙටුම්පත ඇවිල්ලා තිබෙනවා. ඒ සාකච්ඡා වුණු පනත් කෙටුම්පත ඇවිල්ලා තිබෙනවා. මේක 2005 දී ආවා, 2014 දී ආවා. 2005 දී මේ පනත් කෙටුම්පත අඩු පාඩුකම් සහිතව සාකච්ඡාවට ගත්තා. එහි බරපතළ ප්‍රශ්න තිබුණා. 2014 දී නැවතත් මේ පනත් කෙටුම්පත ආවා. දැන් නැවතත් 2015 දී ඇවිල්ලා තිබෙනවා. 2005 දිත්, 2014 දිත් ගැටලු තිබුණා. 2015ත් ගැටලු තිබෙනවා. ඒ ගැටලු සාකච්ඡා කළ යුතුයි. 2014 දී මේ පනත් කෙටුම්පත ගෙනාපු වෙලාවේ මේ පාර්ලිමේන්තුවේ 2014 ජූලි මාසයේ 4වැනිදා මම ප්‍රශ්නයක් ඇහුවා. මොකද, මේ ගැන ඇම්මක් තිබුණු නිසා. මේ පනත් කෙටුම්පත පිළිබඳව 21වැනිදා වෙබ් අඩවියට දමලා තිබුණේ ඉංග්‍රීසි භාෂාවෙන් ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාව. මම ඇමතිතුමාගෙන් අහපු ප්‍රශ්නය මොකක්ද? "මේ රටේ සිංහල සහ දෙමළ රාජ්‍ය භාෂාව වන්නේය. එසේ නම් ඇයි මේ පනත් කෙටුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් විතරක් වෙබ් අඩවියට දැම්මේ?" කියලා මා ඇහුවා. දැන් ඇමතිතුමා කියන විධියට සංවාදය හැදුණේ එහෙමයි. ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් වෙබ් අඩවියට දැම්මා.

වත්මන් ජනාධිපතිතුමා, හිටපු සෞඛ්‍ය ඇමතිතුමා විධියට අද ගරු සභාවේ ප්‍රකාශයක් කළා. මගේ ප්‍රශ්නයට උත්තරය හැන්සාඩ් වාර්තාවේ තිබෙනවා. ජූලි මාසයේ 4වැනිදා හැන්සාඩ් වාර්තාව බලන්න. එදා එතුමා කිව්වා "අනිද්දාට පදනම් ආයතනයේ

රැස්වීමක් තිබෙනවා. ඒකට එන්න. ඒකෙදී සාකච්ඡා කරමු" කියලා. හැබැයි, පදනම් ආයතනයේ නොවෙයි තිබුණේ ලේ බැංකුවේ. එතුමා ඒ වනකොට දැන ගෙන සිටියේ නැහැ, පදනම් ආයතනයේද, ලේ බැංකුවේද රැස්වීම තිබෙන්නේ කියලා. ඒකත් එතුමා දැන ගෙන සිටියේ නැහැ. කොහොම වුණත් ජූලි 5වැනිදා නාරාහේන්පිට ලේ බැංකුවේ තිබුණු සාකච්ඡාවට අපි ගියා. ඒ වාර්තා තිබෙනවා. එදා සංශෝධන ගණනාවක් ඇමතිතුමා ඉදිරිපත් කළා.

සංශෝධන සැලකිය යුතු ප්‍රමාණයක් භාර ගැනීම ගැන අපි සතුටු වෙනවා. එහිදීත් ඖෂධීය නාමය සහ අළෙවි නාමය වරහන් ඇතුළේ තිබෙන කථාවක් තිබුණා. එවකට හිටපු සෞඛ්‍ය ඇමතිතුමා එතැනදී පොරොන්දු වුණා, "ඉංග්‍රීසි භාෂාවෙන් පළවුණු එක සිංහල සහ දෙමළ භාෂාවලිනුත් දෙනවා, ඒ වාගේම දිස්ත්‍රික්ක පුරා සම්මන්ත්‍රණ පවත්වනවා, සාකච්ඡා කරන්න ඉඩකඩ දෙනවා" කියලා. එතැනට විවිධ සංවිධාන ගණනාවක් ආවා. ලොකු උද්‍යෝගයකින් මැදිහත් වුණා. එදා ඉදිරිපත් කළ, එතුමා එකඟ වුණු එක සංශෝධනයක් තිබුණා. ඒ අවස්ථාවේ හිටපු මාධ්‍යවේදීන්, සංවිධාන මේකට සාක්ෂි දරනවා. ඖෂධ නාමයට අමතරව වරහන් ඇතුළේ වෙළෙඳ නාමය තිබෙනවා කියලා ඒ වෙලාවේ එතුමා දැන ගෙන සිටියේ නැහැ. එතුමා කිව්වා එහෙම එකක් නැහැයි කියලා. ඒක එතුමාට ඉදිරිපත් කළා.

එතුමාට කරුණු පෙන්නුවාට පසුව එතුමා කිව්වා, මේක වෙන්න බැහැ, මේක වෙනස් කරනවා කියලා. ඒක තමයි සාකච්ඡා වුණේ. ඒ සාකච්ඡාවට සම්බන්ධ වුණු පුද්ගලයින් ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සංකල්පය පිළිබඳවයි පුළුල් ලෙස සාකච්ඡා වුණේ. මෙය පනත් කෙටුම්පතක් විධියට වගන්ති (අ),(ආ),(ඇ),(ඈ) සහ 31 වගන්තිය, 51 වගන්තිය ආදී වශයෙන් ඉදිරිපත් වී නීතිමය ලියවිල්ලක් විධියට කොහේවත් සාකච්ඡා වුණේ නැහැ. නීතිමය ලියවිල්ලක් විධියට සාකච්ඡා වෙන්න ඊයේ තමයි මේක පාර්ලිමේන්තුවට ඉදිරිපත් වුණේ. මේක ඉදිරිපත් වුණේ හදිසි පනත් කෙටුම්පතක් විධියටයි.

විශේෂයෙන් 2015 ජනාධිපතිවරණයේ දී ජනාධිපති ධුර අපේක්ෂක, වර්තමාන ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ප්‍රධාන මාතෘකාවක් වුණේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත සම්මත කර ගැනීම, විධායක ජනාධිපති ක්‍රමය සම්බන්ධයෙන් ව්‍යවස්ථා සංශෝධනයක් සිදු කිරීම ආදී කරුණුයි. එහිදී දින සියයේ වැඩ පිළිවෙළක් ඉදිරිපත් කළා. මේ දින සියයේ වැඩ පිළිවෙළ අනුව පෙබරවාරි මාසයේ 06 වැනිදා ජාතික ඖෂධ ප්‍රතිපත්තිය කැබිනට් මණ්ඩලයෙන් අනුමත කොට පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම කළ යුතුයි. එහෙම වුණේ නැහැ. ඒ අනුව පෙබරවාරි මාසයේ 06 වැනිදා ඉදිරිපත් කරලා මාර්තු මාසයේ 18 වැනිදා ජාතික ඖෂධ ප්‍රතිපත්තිය සම්මත කර ගන්න ඕනෑ. ඒකට තව කල් තිබෙනවා. එතකොට මේකෙන් කියන්නේ මොකක්ද? දැන් මේක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා කියන්නේ රටට ඉදිරිපත් කළා කියන එකයි. මේකෙන් කියන විධියට මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා දවස් 35ක් මේ රටේ සාකච්ඡා වනවා. මෙච්චර කල් සංකල්පයක් වී තිබුණු පනත් කෙටුම්පත වගන්ති, වාසගම් (අ),(ආ),(ඉ),(ඊ) විධියට, "(a)", "(b)", "(c)", "(d)" විධියට රටේ සාකච්ඡා වනවා. ඒ කියන්නේ, පනත් කෙටුම්පත. නමුත් එහෙම වුණේ නැහැ. දැන් මොකක්ද වුණේ? දැන් අපට කියනවා, මේක සෑහෙන්න සාකච්ඡා වුණාය කියලා. නැහැ, එහෙම වුණේ නැහැ. මේ පනත් කෙටුම්පත සාකච්ඡා වුණේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කළ යුතුයි කියන සංකල්පයක් ගැන දැන් සාකච්ඡා වනවා. "දඩස්" ගාලා හෙට වනකොට කවුරු හෝ පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළොත්, අනිද්දාට ඒක සම්මත කරන්න පුළුවන්ද? ඒ සංකල්පය ගැනයි දැන් සාකච්ඡා වන්නේ. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්නේ මොන විධියටද, මොනවාද ඉවත් වන්නේ කියලා වගන්ති විධියට එන්න ඕනෑ. එතකොට තමයි අපට පුළුල් සාකච්ඡාවක් කරන්න පුළුවන් වන්නේ. (අ) යන්නට පක්ෂ වෙනවා ද, (ආ) යන්නට විරුද්ධ වෙනවාද කියලා බලන්න ඕනෑ. එහෙම නැතිව සංකල්පයක් ගැන කථා වුණා කියලා පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරලා එක දවසින් සම්මත කරන එක සාධාරණීකරණය කරන්න බැහැ. දැන් මේ පනත් කෙටුම්පත ඉදිරිපත් වුණේ කොහොමද? හදිසි පනත් කෙටුම්පතක් විධියටයි. පසු ගිය කාලයේ මේ රටේ පාර්ලිමේන්තුවට හදිසි පනත් කෙටුම්පත් ආවේ කොහොමද? දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වැනි සංශෝධන ඇවිල්ලා හදිසි පනත් කෙටුම්පත් විධියට සම්මත කර ගත්තා. නමුත් මොකක්ද මේකේ තිබෙන හදිසිය? මේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තව සුමානයකින් එක පාරටම මේවාට විරුද්ධ වෙනවාද? මා හිතන්නේ නැහැ, මේ රටේ ජනතාවට හිතෙෂී පනත් කෙටුම්පතක් ගෙනාවොත් මේ පාර්ලිමේන්තුව ඊට විරුද්ධ වනවා කියලා. විරුද්ධ වන්නේ නැහැ. එහෙම විරුද්ධ වුණොත්, ඒ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ගමේ දී, දිස්ත්‍රික්කයේ දී, මහජන ඡන්දයේ දී ජනතාව අතර ප්‍රශ්නයකට මැදි වෙනවා. එහෙම කරන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුවට වර්තමාන රජය හොඳ පනත් කෙටුම්පතක් ගෙනෙනවා නම්, ඒ පනත් කෙටුම්පත සම්මත වීම වළක්වන්න කවුරු හෝ කටයුතු කරනවා නම් ඒක ගැන ඒ අයගෙන් ප්‍රශ්න කරන්න ඕනෑ මෙතැන දී නොවෙයි. දිස්ත්‍රික්කයේ දී, ඊළඟ ඡන්දයේ දී ජනතාව ඒ ගැන ප්‍රශ්න කළ යුතුයි. මේවා සම්බන්ධයෙන් වෙනදාට වඩා ජනතාවගේ මැදිහත් වීමක් තිබෙනවා කියලා මා හිතනවා. ජනතාව මේවා ගැන උනන්දුවෙන් බලා ගෙන ඉන්නවා. එහෙම වෙන්නට ඕනෑ.

දැන් මේ පනත් කෙටුම්පත ගෙනාවේ කොහොමද? මේ තිබෙන්නේ පෙබරවාරි මාසයේ 02වැනිදා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළ පත්‍රිකාවක්. දැන් අහන්න එපා, මේක හම්බ වුණේ කොහොමද කියලා. කොහොම හරි හම්බ වුණා. මේක ගරු රාජිත සේනාරත්න මැතිතුමාගේ ආවරණ ලිපියත් එක්ක කැබිනට් මණ්ඩලයට පෙබරවාරි මාසයේ 02වැනිදා ඉදිරිපත් කළා. කැබිනට් මණ්ඩලය ඒක 06 වැනිදා අනුමත කළා. ඊට පසුව සුප්‍රීම් උසාවියට ගියා. ඊයේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් වන තුරු මේක වහලයි තිබුණේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ කෙටුම්පත වහලයි තිබුණේ. සංකල්පය ඇරලා තිබුණා. සංකල්පය තිබෙනවා. මහාචාර්ය සේනක බිබිලේ මැතිතුමා ඉදිරිපත් කරපු ඒ මූලික අදහස දිගටම තිබුණා.

දැන් මේක පාර්ලිමේන්තුවට හදිසි පනත් කෙටුම්පතක් විධියට ඊයේ ගෙනාවා. ඉස්සරහා මන්ත්‍රී පිවිසුම ළඟ පුවරුවේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව අවලංගුයි - “cancelled”- කියලා ගහලා තිබුණා. අද උදේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව පැවැත්වුණා. උපදේශක කාරක සභාවේදී විනාඩි පහක් මේ ගැන සාකච්ඡා කරන්න හම්බ වුණේ නැහැ. ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ මන්ත්‍රීවරුන් දහදොළොස් දෙනකුගෙන් මා ඇහුවා මේ පනත් කෙටුම්පත කියෙව්වාද කියලා. ඊයේ රාත්‍රී එළි වෙනකනුත් මා මේක කියෙව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොතක් අලුතින් මුද්‍රණය කළාට පසුව කපාපු නැති කොළ තිබෙනවා නේ. ඒ වාගේ කැපුණේ නැති කොළ කපන්නත් විනාඩි 15ක් 20ක් ගත වෙනවා. මේ පනත් කෙටුම්පතේ වගන්ති 142ක් තිබෙනවා. ගරු ඇමතිතුමාගෙන් විමල් වීරවංශ හිටපු ඇමතිතුමා ප්‍රශ්නයක් ඇහුවාම ඒ කාරණය නැවත තහවුරු කර ගන්න නිලධාරින්ගෙන් අහන්න වුණා. ඒකේ වරදක් නැහැ. ඇයි? මේකේ වගන්ති කට පාඩම් නැහැ. මූලික දේවල් ඔක්කෝම මතක තියා

[ගරු අජිත් කුමාර මහතා]

ගන්න බැහැ. ඉතින් මේ රටේ අවුරුදු හතළිස් ගණනක් මරාගෙන මැරෙන සටනක් කරපු ඖෂධ ප්‍රතිපත්තියක් ඊයේ පනත් කෙටුම්පතක් විධියට ගෙනැල්ලා අද සම්මත කරන එක කොච්චර සාධාරණ ද?

මා මේ ප්‍රශ්නය ඇහුවාම ඒකට හම්බ වුණු උත්තරය මොකක්ද? විපක්ෂයේ තිස්ස විතාරණ මැතිතුමාත්, වාසුදේව නානායක්කාර මැතිතුමාත් ගෙනාපු සංශෝධන ඉදිරිපත් කරන්න අද බැහැ කියලා ඒකට කල් ගත්තා. ඇයි? ඒක තාක්ෂණික වශයෙන් හදන්නත් වෙලාවක් ඕනෑ නිසා. එහෙම නැතිව මගේ කරුණු පිළිගෙන නොවෙයි. ඒක එක පැත්තකින් [බාධා කිරීමක්] කමක් නැහැ. කොහොම වුණත් ඒ ඉදිරිපත් කරපු සංශෝධනයත් නීති කෙටුම්පත් අංශයට ගිහිල්ලා අනුමත කරලා, හදලා බලන්න කාලයක් ඕනෑය කියන එක නේ පිළිගෙන තිබෙන්නේ. මූලික අදහස ඒක නේ? එහෙම හරි ඒක ගත්තු එක මම අගය කරනවා. මේක ඔබතුමා ගැන කරන පෞද්ගලික විවේචනයක් නොවෙයි. ඒක එහෙම තේරුම් ගන්න එපා. ඔබතුමා ඒක එහෙම තේරුම් නොගනීවිය කියා මා හිතනවා. කොහොම වුණත් මමත් මේ ගැන දේශපාලන මතවාදී අරගළයක් කරපු කෙනෙක් විධියටයි මේ ගැන කියන්නේ ඇමතිතුමනි. මේ වෙනුවෙන් ප්‍රශ්න අහන්න ජනතා විමුක්ති පෙරමුණ මේ ගරු සභාවේ නැහැ. මම දන්නේ නැහැ, ඔවුන් මේ පනතට පක්ෂව ඡන්දය දෙනවාද නැද්ද කියා. ඔවුන් අද අමුතු ජාතියේ සෙල්ලමක් කරනවා. ජනාධිපතිවරණයේදීත් කළේ ඒකයි. ඔවුන් ආණ්ඩුව නියෝජනය කරනවා. කැබිනට් එකටත් ඉහළින් තමයි විධායක සභාව තිබෙන්නේ. ඒකෙදි මේ පනත් ගැන, මේවායේ මූලික අදහස් කථා කරනවාද නැද්ද කියන්න මම දන්නේ නැහැ. මේවාට ඡන්දය විමසන වෙලාවේදී සභාවේ ඇත්තෙත් නැහැ, හැංගෙනවා. මම දන්නේ නැහැ, ඒ ගොල්ලන්ගේ අදහස මොකක්ද කියා.

ජනතා විමුක්ති පෙරමුණු ඉතිහාසයේ ලංකාවේ වැඩිම ලකුණු අරගෙන රෝයල් කොලීජියෙන් තේරිච්ච වෙනුර එදිරිසිංහලා, ත්‍රිමාවිතානලා මේ රටේ නිදහස් සෞඛ්‍යයක් වෙනුවෙන්, නිදහස් අධ්‍යාපනයක් වෙනුවෙන් අරගළ කරලා මැරුණා. මේ රටේ වෘත්තිකයෝ සෞඛ්‍ය සහ නිදහස් අධ්‍යාපනය වෙනුවෙන් දැවැන්ත කැප කිරීමක් කරලා තිබෙනවා. එහෙව් රටක මේවාට නිකම්ම කොළේ වහලා යන්න දෙන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම කියනවා, මේ ක්‍රමවේදය වැරදියි කියලා. ඒ ගැන කාරුණිකව නිහතමානී වෙන්න. විරුද්ධ වුණත්, පක්ෂ වුණත් මේ පනත අද සම්මත වේවි. හැබැයි ඉදිරියේදී හරි ප්‍රජාතන්ත්‍රවාදයේ නාමයෙන් ඔබතුමන්ලා තොරතුරු දැන ගැනීමේ අයිතිය ගැන කථා කරන්න. මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් කී දෙනෙක් මේ පනත් කෙටුම්පත කියෙව්වාද කියා මම අහනවා. ඔට්ටු තියලා මේ පනත් කෙටුම්පතේ අසවල් අසවල් තැන්වල තිබෙන්නේ මොකක්ද කියා ඇහුවොත් කියන්න බැහැ. මම ඒක වැරැද්දක් විධියට දකින්නේ නැහැ. එහෙම කියන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කොහොමද කියන්නේ? ඊයේ උදේ මෙය ඉදිරිපත් කළේ. ප්‍රශ්න පත්‍රයක් වාගේ නොවෙයි මේක. මේක බරපතළ නීතිමය ලියවිල්ලක්. ඊයේ උදේ ඉදිරිපත් කළාම, කොහොමද වගන්ති 147ක් කියවන්නේ? මම ඉල්ලන්නේ මගේ අයිතිය විතරක් නොවෙයි. මේ රටේ වෘත්තිකයන්, වෘත්තිය සමිති, විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගම්, වෛද්‍ය සංගම් තිබෙනවා. මේ පිළිබඳව මහාචාර්ය සේනක බිබිලේ අනුස්මරණ පදනම මාධ්‍ය සාකච්ඡාවක් කැඳවලා කිව්වා, "මේ සංකල්පය පනතක් හැටියට ආපු එක හොඳයි, අපි ඒකට සාධනීය ප්‍රතිචාර දක්වනවා, හැබැයි අපි ඒ පනත් කෙටුම්පත දැක්කේ නැහැ" කියා.

මම එක් වෛද්‍යවරියකගෙන් ඇහුවා, දැකපු නැති පනතක් හොඳයි කියන්නේ කොහොමද කියා. විරුද්ධ පක්ෂයේ සියලු නායකයන් මේක දවසකින් ගෙනෙන එකට එකඟ වුණා. මේ පාර්ලිමේන්තුවේ බහුතර විපක්ෂයක් ඉද්දි එහෙම කළේ ඇයි? විපක්ෂයට බරපතළ වගකීමක් තිබෙනවා, මේ රටේ ජනතාව වෙනුවෙන් ගෙනෙන පනතක දී ඒ පනත සාධාරණ විවාදයකට භාජනය කරන්න. මේ රටේ අනිකුත් අයටත් ඒ පනත් කෙටුම්පත වෙනුවෙන් කථා කරන්න අවස්ථාව දෙන්න ඕනෑ. විපක්ෂය ඒ අයිතිය නැති කළා. පාර්ලිමේන්තුවේ බහුතර විපක්ෂයක් ඉඳලත්, ඒ අයිතිය නැති කරපු සියලු දෙනාට මම මගේ කනගාටුව, විරෝධය ප්‍රකාශ කරනවා. කරුණාකර ඒක එහෙම කරන්න එපා. මහජනතාව වෙනුවෙන් මේක සාකච්ඡා කරන්න අවස්ථාව දෙන්න. පනත් කෙටුම්පත සම්මත කරලා ඉවර වෙලා ඊටපසුව සංශෝධන ගැන කථා කරන්න යන්න එපා. කලින් පළාත් පාලන සංශෝධන පනත් කෙටුම්පතේදීත් ඒක කළා. පසුව සංශෝධන ගෙනෙනවාය කිව්වා. තවම ගෙනල්ලා නැහැ.

"බිබිලේ ප්‍රතිපත්තිය" කියන්නේ මොකක්ද? හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කිව්වා, එක්සත් ජාතික පක්ෂයේ ආර්ථික දැක්ම අනුව බිබිලේ ප්‍රතිපත්තිය වෙනස් කරන්න වෙනවාය කියා. එතුමා ඒක කියපු එක ගැන මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. "බිබිලේ ප්‍රතිපත්තිය" කියන්නේ මොකක්ද? "ඇත්ත" පුවත් පතේ මේ පිළිබඳ මූලික කාරණය ඉදිරිපත් කළා. ඒ පිළිබඳ ලිපි කිහිපයක් මා **සභාගත*** කරනවා.

මේ පනත් කෙටුම්පතේ මොනවාද තිබෙන්නේ? මේ පනත් කෙටුම්පත ගෙනා ක්‍රමය වැරදියි. මෙතුමන්ලා ප්‍රජාතන්ත්‍රවාදය, යහ පාලනය ගැන කථා කරලා, පාර්ලිමේන්තුව ශක්තිමත් කරනවාය කියලා පාර්ලිමේන්තුවේ තිබෙන ව්‍යුහයකුත් අක්‍රිය කර තිබෙනවා. උපදේශක කාරක සභා ව්‍යුහය අක්‍රිය කර තිබෙනවා. නිලධාරින් ගෙන්වලා අපට ප්‍රශ්න අහන්න තිබුණු තැන, ඇයි මෙහෙම වෙන්නේ කියා අහන්න තිබුණු තැන, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමාගෙන් මේ පනත කෙටුම්පත් කිරීම ගැන ප්‍රශ්න අහන්න තිබුණු තැන, ඒවා නිරවුල් කර ගන්න තිබුණු තැන නැති කළා. උත්තරීතරයි කියා පිළිගන්නා පාර්ලිමේන්තුව, විධායකය අහෝසි කරලා ශක්තිමත් කළ යුතුයි කියන පාර්ලිමේන්තුව මෙතුමන්ලා දුර්වල කළා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ඔබතුමා කියන විධියටද මේ පාර්ලිමේන්තුවේ ඔක්කොම ගෙනෙන්න ඕනෑ? එහෙම නම් විපක්ෂයේ ඔක්කොම වැරදියි, ආණ්ඩු පක්ෂයත් වැරදියි, තමුන්නාන්සේ විතරයි මේකෙදි හරි. අනික් ඔක්කොටම මේක කියවලා දැන ගන්න පුළුවන්. තමුන්නාන්සේට බැරි නම් ඉතින් මොනවා කරන්නද? එහෙම නම් තමුන්නාන්සේ කියන විධියට මුළු පාර්ලිමේන්තුවම තීන්දු ගන්න ඕනෑ. ඒකෙ තිබෙන ප්‍රජාතන්ත්‍රවාදය මොකක්ද කියන්න.

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ඔබතුමා මගේ වෙලාව ගන්නවා. මම දන්නවා, රාජිත සේනාරත්න ඇමතිතුමා ලෝකයේ වාමාංශික ව්‍යාපාරය ගැන දන්නා කෙනෙක් බව. බහුතරය අනුව තීරණ ගැනීම වාගේම

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

සුළුතරයට ඒ මතය දරන්නට ඉඩ දීමත් ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික ලක්ෂණයක්. මුළු ලෝකයේම ප්‍රජාතන්ත්‍රවාදය ගැන සාකච්ඡා වෙනවා. ඒ නිසා මගේ මේ සුළුතර මතය ගැනත් අහන්නකෝ. මම දන්නේ නැහැ, මම මේක කිව්වාය කියා මේ පාර්ලිමේන්තුවේ ඔබතුමන්ලා මේක පිළිගනීවිද කියලා. ඔබතුමන්ලාම කියපු සංකල්පය අනුව පාර්ලිමේන්තුව තුළ මේක සාකච්ඡා කරන්න සාධාරණ ඉඩක් දෙන්න තිබුණා. [බාධා කිරීමක්] ඔබතුමාට වැරදිලා. තීරණ ගන්නේ බහුතරයෙන්. හැබැයි, සුළුතරයේ අදහසට ඉඩ තිබෙන්න ඕනෑ. ඒක ඔබතුමා දන්නවා. ඔබතුමාගේ වාසියට විවිධ වෙලාවට අර්ථ නිරූපණ දෙන්න එපා. දැන් මේ පනත් කෙටුම්පතේ අඩංගුව මොකක්ද? පාර්ලිමේන්තු ක්‍රමය ශක්තිමත් කරද්දී උපදේශක කාරක සභාවක් තිබෙන්න ඕනෑ.

අපට ඔබතුමාගෙන් ප්‍රශ්න අසනවාට වඩා නිලධාරියෙකු සමඟ මුහුණට මුහුණ ප්‍රශ්න අහන්න තිබුණු අවස්ථාව, මේවා නිරවුල් කර ගන්න තිබුණු අවස්ථාව එතැනයි. දැන් ඔබතුමන්ලාම කියනවා, මේ පනත් කෙටුම්පතට ඉදිරියේදී තව සංශෝධන ගෙනෙන්න ඕනෑය කියලා. ඇයි, ඉදිරියේදී ගෙනෙන්නේ? අදම ගෙනැල්ලා අපට ඉවර කරන්න තිබුණානේ. අපරාදේ නේ. දැන් පනත් කෙටුම්පතේ අඩංගුව මොකක්ද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඔය කියන වාගේ හුඟක් දේවල් කරන්න ගිහිල්ලා නේ අවුරුදු 45ක් ගත වුණේ. මෙම පනත් කෙටුම්පත ගෙනාවාට පසුව ඔබතුමන්ලාගේත් සංශෝධන ඉදිරිපත් කරන්න. එතකොට ආපසු ගෙනෙන්නම්.

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ගරු ඇමතිතුමනි, වැඩේ කෙරුණාට පසුව සංශෝධන ගෙනැල්ලා වැඩක් නැහැ නේ. මම කියන්නේ මූලික දෙය. ඔබතුමා තේරුම් ගන්න. මම කියන්නේ මගේ අයිතිය ගැන විතරක් නොවෙයි.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
තමුන්නාන්සේලාටත් තව දවස් දෙකක කාලයක් තිබෙනවා නේ

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
මගේ අයිතිය විතරක් නොවෙයි, මේ රටේ අනිකුත් ජන සමාජයට - [බාධා කිරීමක්] - ජනතා විමුක්ති පෙරමුණ කරන දෙය වෙන දෙයක් නේ. එතුමන්ලාට විධායක සභාවේත් යෝජනා දෙන්න පුළුවන් නේ. සාකච්ඡා කරන්න පුළුවන්. මම කියන්නේ මගේ අයිතිය ගැන විතරක් නොවෙයි. එදා ලේ බැංකුවේ තිබුණු සාකච්ඡාවට දැවැන්ත පිරිසක් සම්බන්ධ වුණා. මේ රටේ මේ ගැන උනන්දුවෙන් සිටින පිරිසක් සිටිනවා. මගේ අයිතිය ගැන විතරක් නොවෙයි මම කියන්නේ. ඒ සියලුම දෙනාගේ අයිතිය වෙනුවෙන් මම කථා කරන්නේ.

මේ පනත් කෙටුම්පතේ අඩංගු දේවල් මොනවාද? මේ පනත් කෙටුම්පත කියවා ගන්නට ලැබුණු වේලාව අනුව මම මේ පනත් කෙටුම්පතේ අඩංගු දේ කියන්නම් කෝ. බිබිලේ මැතිතුමාගේ ප්‍රතිපත්තියේ මූලිකම අදහස තමයි, ඖෂධ නියම කිරීම, අත්‍යවශ්‍ය ඖෂධ ලැයිස්තුවක් සම්පාදනය කිරීම. 56. (1), (2), (3) සහ (4) වගන්ති යටතේ මේ කාරණය ගැන සඳහන් වෙලා තිබෙනවා. බිබිලේ මැතිතුමා යෝජනා කළා කියලා අපේ මහාචාර්ය කාලෝ ෆොන්සේකා මැතිතුමා ඖෂධ 232ක ලැයිස්තුවක් ගැන කියනවා. දැන් කාලෝ ෆොන්සේකා මැතිතුමාම කියනවා, 500ක විතර ලැයිස්තුවක් ඕනෑය කියලා. මට ඇසුණා, 300ක ගණනක් මේ ගරු සභාවේ කියනවා. ඒ විෂය පිළිබඳව අපි ප්‍රවීණයන් නොවෙයි. කොහොම වුණත් 300ක හෝ 500ක ලැයිස්තුවක් ගැන කියනවා. නමුත් කාලෝ ෆොන්සේකා මැතිතුමා කියනවා, 15,000ක් විතර බෙහෙත් වර්ග ලංකාවට ගෙන්වනවා කියලා. ගරු රාජිත සේනාරත්න මැතිතුමනි, ඔබතුමාට මේ පිළිබඳව අදහසක් ඇති. මම ඒ ගැන දන්නේ නැහැ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
8,100යි.

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
8,100ද? එහෙම නම් ලංකාවට අවශ්‍ය බෙහෙත් වර්ග 300ක් වුණත්, බෙහෙත් වර්ග 8,000ක් ගෙන්වනවා. බිබිලේ මැතිතුමාගේ ප්‍රධාන යෝජනාව ඖෂධ ලැයිස්තුවක් හදන එක.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මෙම පනත් කෙටුම්පතෙහි එය යෝජනාවක් විධියට ඇතුළත් කර තිබෙනවා. මෙමඟින් තමයි, එය නියාමනය කර අඩු කරන්නේ. ප්‍රධානම දෙය ඒකනේ.

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
හොඳයි. ඉන්න මම කියනකම්. ඊළඟට, මිල තීරණය කිරීම.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
තමුන්නාන්සේ ඔය කාලෝ ෆොන්සේකා මැතිතුමාගේ ලැයිස්තුවක් ගැන කිව්වා නේ. මෙම පනත් කෙටුම්පතෙහි ඒ ගැනත් තිබෙනවා. හරියට කියෙව්වා නම් දැන ගන්න පුළුවන්.

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
හොඳයි. ඊළඟට, මිල තීරණය කිරීම. මෙම පනත් කෙටුම්පතෙහි 56. (1) උප වගන්තියේ සඳහන් වෙනවා, ඖෂධයක වාර්ගික නාමය ඖෂධ වට්ටෝරුවේ ලිවිය යුතු බව. දැන් ගරු ඇමතිතුමා කිව්වා, අවුරුදු දෙකකින් ඖෂධ නාමය විතරක් ගෙනෙනවා කියලා. එහෙම නම් අවුරුදු දෙකකින් ගෙනෙන එක ගැනත් පනත් කෙටුම්පතට ඇතුළත් කරන්න තිබුණානේ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
අවුරුදු දෙකකින් කියලා කිව්වේ නැහැ.

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ඒකත් පනත් කෙටුම්පතට දමන්න තිබුණා නේ. ඇයි එහෙම දැම්මේ නැත්තේ?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ප්‍රශ්නයක් තිබෙනවා. බෙහෙත් ලියන්නේ තමුන්නාන්සේලා නොවෙයි නේ, වෛද්‍යවරුන්නේ. එතකොට වෛද්‍යවරුන් ඒක කරන්නේ නැත්නම් බොරුවට පනත් ගෙනැල්ලා වැඩක් නැහැ. ඒවා අප්‍රායෝගික වැඩ. අජිත් කුමාර මන්ත්‍රීතුමාවත්, මමවත්, මේ ඩිව් ගුණසේකර මහතාවත් නොවෙයි මේක කරන්නේ.

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ඇමතිතුමනි, ඔබතුමා කථා කරන කොට මගේ වේලාව ඉවර වෙනවා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
එතකොට මෙහාට ගෙනෙන ඖෂධවල quality එක සම්බන්ධයෙන් ඒ ගොල්ලන්ට ප්‍රශ්නයක් තිබෙනවා. එම නිසා quality assurance lab එකක් අලුතින් සකස් කිරීමට තමයි මේවා ස්වාධීන කරලා තිබෙන්නේ. අපි ඒක world standardsවලට ගොඩනඟනවා. එදාට අපි generic name එක විතරක් ඇති කරනවා. මොකද, එතකොට quality එක assured.

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
හොඳයි. ඒ ඔබතුමාගේ අදහස නේ. මගේ වේලාව අවසන් වුණා

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ගරු ඇමතිතුමා මගේ කාලයත් අර ගත්තා. ඒකයි වුණේ. මේ පනත් කෙටුම්පත ගැන කථා කරන විට, ඇමතිවරයාට තිබෙන බලතල ගැන විශේෂ කථාවක් කියැවුණා. ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්ව කරුණ, කරුණක් විධියටත් වැරදියි. ගරු විමල් වීරවංශ මැතිතුමා කිව්වා, ඇමතිවරයාට දස දෙනෙක් පත් කරන්න පුළුවන් කියලා. එහිදී ඔබතුමා කිව්වා නැහැ, හතරයි කියලා. මේ පනත් කෙටුම්පතේ අන්තිම කොටස බලන්න. ඒ අනුව ඔබතුමාට පුළුවන්, කළමනාකරණය, නීතිය, ගණකාධිකරණය හෝ සෞඛ්‍ය යන ක්ෂේත්‍රවල විශිෂ්ටත්වයක් දක්වා ඇති වෘත්තිකයන් හතරදෙනෙකුත් පත් කිරීමට. එහෙම කිව්වත් අට දෙනෙකු පත් කරන්න පුළුවන්. පත් කිරීම්, ඉවත් කිරීම් සියල්ල ඇමතිතුමාට කරන්න පුළුවන්. ප්‍රශ්නය තිබෙන්නේ එතැනයි. ඊට පසුව තිබෙන අභියාචන මණ්ඩලයත් පත් කරන්නේ ඇමතිතුමා. ඒ සියල්ල සිදු කරලා ඒ ඔක්කෝම පිළිබඳව අවසාන තීරණය ගන්නේත් ඇමතිතුමායි. අද දින මේ ගරු සභාවේ ජනාධිපතිතුමාත් කථා කර තිබුණා. ඒ වේලාවේ මම සිටියේ නැහැ. එතුමාත් කියා තිබුණා, ඇමතිවරයා අනුව මේවා වෙනස් වෙන්න පුළුවන් කියලා. ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, මේ රටේ පසු ගිය කාලයේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ලැබුණු චෝදනාවලින් වැඩිපුරම චෝදනා ගොනු කර තිබුණේ ඇමතිවරුන් සම්බන්ධව කියලා. ඔබතුමාට විරුද්ධවත් එක චෝදනාවක් ගොනු කර තිබුණා. ඔබතුමා ඒ සම්බන්ධව ප්‍රකාශයක් කර තිබුණා. ඔබතුමාට විරුද්ධව එම චෝදනාව මුලින්ම ඉදිරිපත් කළේ, ධීවර අමාත්‍යාංශයේ වැය ශීර්ෂය දවසේ හඳුන්නෙත්ති මන්ත්‍රීවරයායි. ඒ පැමිණිල්ල මත -

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා දැන් අවසන් කරන්න.

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ඔබතුමාගේ ප්‍රශ්නයක් නොවෙයි. එහෙම තිබෙන කොට ඇමතිවරයෙකුට මෙහෙම බලයක් දෙනවාද?

ඊළඟට, මේ නියෝග සෑදීම සම්බන්ධව මම අහන්න කැමැතියි. නියෝග සෑදීමේ බලය ඇමතිවරයාට දීලා තිබෙනවා. වෙන පනත් කෙටුම්පත්වල නම් නියෝග සෑදීමේ බලය ඇමතිවරයාට තිබුණත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා කියලාත් සඳහන් වෙනවා. නමුත් මේ පනත් කෙටුම්පතේ කිසිම තැනක නැහැ, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා කියලා. වගන්ති ගණනාවක් තිබෙනවා. මිල තීරණය කිරීම, මිල පාලනය කිරීම, මණ්ඩල පිළිබඳව තීරණ ගැනීම් සියල්ල නියෝගවලින් කරන්නේ. ඒ නියෝග පිළිබඳව මේ පනත් කෙටුම්පතේ පැහැදිලිව සඳහන් වෙලා නැහැ. ඒ වාගේම ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවාද කියලා පැහැදිලිත් නැහැ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඒක පනත් කෙටුම්පතෙන් ගෙනෙන්න බැහැ.

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ඒක හරි. ඒක මට තේරෙනවා. මම අසන්නේ ඒක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවාද කියලායි.

වෙන පනත් කෙටුම්පත්වල සඳහන් වෙනවා, ඇමතිවරයාට නියෝග හදන්න පුළුවන්, ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ඕනෑය කියලා. නමුත් මේ පනත් කෙටුම්පතේ එහෙම නැහැ. එම නිසා ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නියෝග පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවාද කියලා මේ පනත් කෙටුම්පතේ සඳහන් වෙලා නැහැ. ඒකයි මම කිව්වේ, මේක කියවන්න ඕනෑ කියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගැන තව කරුණු ගොඩක් කියන්න තිබෙනවා. නමුත් මම අහන්නේ, ඔබතුමන්ලා බිබිලේ මැතිතුමාගේ නම පාවිච්චි කර මොකක්ද මේ කරන්නේ කියායි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය අවසානයි.

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කරුණ කියා මගේ කථාව අවසන් කරනවා.

ඔබතුමන්ලා "බිබිලේ, බිබිලේ, බිබිලේ" කියමින්, "බිබිලේ ප්‍රතිපත්තිය" කියා තහවුරු කරන්න හදනවා බිබිලේ ප්‍රතිපත්තිය නොවන එකක්. ඒ කියන්නේ, කන්දක් විලිලා මී කුණක් තමයි මේ වදන්න හදන්නේ. ඒ නිසා මා කරුණිකව ඉල්ලනවා, මේ පිළිබඳව මීට වඩා පුළුල් සංවාදයක්-

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු මන්ත්‍රීතුමා, ඒක පිළිගන්න පුළුවන්කමක් නැහැ.

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
මගේ අදහස නේ කිව්වේ. ඔබතුමා පිළිගන්න, නොගන්න එක ගැන ප්‍රශ්නයක් නැහැ. මේ පනත් කෙටුම්පත ගැන අධ්‍යයනය කළාම මට දැනුණ දේ තමයි මම කිව්වේ. මම විතරක් නොවෙයි. මේ රටේ වෘත්තිකයන්, සංවිධාන ගණනාවක් ඒක කියනවා. මේ පිළිබඳව සාකච්ඡා කරන්න කියා ඔබතුමාට ලියුම් එවා තිබෙනවා නේ. ඒවා හම්බ වුණා ද කියා මම දන්නේ නැහැ. ඒ නිසා කරුණාකර මීට පස්සේවත් පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පත් ඉදිරිපත් කරන කොට හදිසි පනත් කෙටුම්පත් විධියට ගෙනෙන්නේ නැතුව අවුරුදු 40ක් තිස්සේ සාකච්ඡා කළ පනත් මහජන සංවාදයකට ගෙනෙන්න. මේ ආදර්ශයම ඔබතුමන්ලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයටත් ගෙනෙන්න ලෑස්ති වෙයි. එහෙම කරන්න එපා. මහ ජනතාව, මහජන ව්‍යාපාර, වෘත්තීය සමිති හා සියලු ජන කණ්ඩායම් මේවාට සම්බන්ධ කර ගන්න. බොහොම ස්තූතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට, ගරු ටී.බී. ඒකනායක මැතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.11]

ගරු ටී. බී. ඒකනායක මහතා
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත විවාද වන මේ මොහොතේ දී මටත් අදහස් දක්වන්න අවස්ථාව ලැබීම ගැන ස්තූතිවන්ත වනවා.

සෑහෙන කාලයක් මුළුල්ලේ සාකච්ඡාවට භාජනය වෙමින්, ලොප් වෙමින්, මතු වෙමින් ආපු මේ කාරණාවේ මුල්ම සාකච්ඡාව 1966 ආරම්භ වෙලා රෝහල් සූත්‍ර සංග්‍රහය ලෙස එළි දක්වන්න යොදලා, දෙවැනි වරට ඖෂධ ප්‍රතිපත්තිය ගෙනාවේ 1970 දීයි. සේනක බිබිලේ මහාචාර්යතුමාත්, අපේ වික්‍රමසිංහ මැතිතුමාත් 1971දී ඖෂධ වර්ග 236ක් පිළිබඳ කාරණය ක්‍රියාත්මක කළාම ඒ සියල්ලම 1978දී ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ආරම්භ කළ විවෘත ආර්ථිකය නිසා අවසාන වුණා. ඒ සියල්ලම අතර මහ දමලා විවෘත ආර්ථිකයකට මේ ඖෂධ යටත් කරන්න සිද්ධ වුණා. මේ සඳහා 1991 මෙන්ම, නැවත වරක් 1996දී කැබිනට් අනුමැතිය ලැබුණත් ඒක ක්‍රියාත්මක කරන්න ලැබුණේ නැහැ.

මහාචාර්ය බිබිලේ මැතිතුමාගේ ප්‍රතිපත්තියේ අඩංගු ප්‍රධාන කරුණු අපි කියන්නට ඕනෑ. ඒ තමයි, පෞද්ගලික සහ රාජ්‍ය අංශය කියන දෙකේම භාවිතය පිණිස රටට අවශ්‍ය කරන ඖෂධ සහ නිෂ්පාදන, අවශ්‍ය අමුද්‍රව්‍ය සියල්ලම රජය විසින් පමණක් ආනයනය කිරීම සඳහා විවෘත ටෙන්ඩර් පටිපාටියක් මඟින් තොග මිලදී ගැනීම. පෞද්ගලික ඖෂධ සමාගම් විසින් සිදු කරන ලද ඖෂධ ප්‍රචාරණ කටයුතු සම්පූර්ණයෙන් නැවැත්වීම හා ඖෂධ සම්බන්ධයෙන් වෛද්‍යවරු, සෞඛ්‍ය කාර්ය මණ්ඩලය, මහ ජනතාව අඛණ්ඩව දැනුවත් කිරීමේ කටයුතු මුළුමනින්ම රාජ්‍ය ආයතන විසින් සිදු කිරීම. අනවශ්‍ය ඖෂධ වර්ග ලැයිස්තුගත කිරීම, ඊට ඇතුළත් නොවන ඖෂධ වර්ග ආනයනය සීමා කිරීම. රජයේ ඖෂධ සම්බන්ධයෙන් සිදු කරන කටයුතුවලදී මෙන්ම වෛද්‍යවරු ඖෂධ නියම කිරීමේදී වෙළෙඳ නාමය, ඖෂධ නාමය වශයෙන් භාවිත නොකිරීම. ඖෂධවල ඵල ප්‍රයෝජනය මහ ජනතාවට ලැබෙන, ඖෂධ සමාගම්වල අවශ්‍යතා ආරක්ෂාවීම පිණිස ක්‍රියාත්මක වන පේටන්ට් බලපත්‍රය ඇතුළු ඇතැම් විධිවිධාන, ගිවිසුම් යළි සලකා බැලීම සහ අත්‍යවශ්‍ය අවස්ථාවලදී ඒවා නොසලකා ලාභදායි මූලාශ්‍ර ඖෂධ ආනයනය කිරීමට කටයුතු කිරීම. ඖෂධ සඳහා විධිමත් මිල පාලනයක් ඇති කිරීම. ඖෂධ සම්බන්ධයෙන් සියලු කටයුතු සඳහා අවශ්‍ය මානව සම්පත් ප්‍රවර්ධනය කිරීම. රට තුළ භාවිත වන සියලු ඖෂධවල ප්‍රගතිය සහතික කිරීම සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම. ඒ ක්‍රමවේදයට යම් වැඩ පිළිවෙළක් යෙදිය යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ඖෂධ ප්‍රතිපත්තියට විවේචන එල්ල වෙමින් පවතිනවා. ඒ තමයි, නව ඖෂධ ප්‍රතිපත්තිය තුළ සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය අන්තර්ගත නොවීම. පත් වූ නව රජය විසින් රජයේ රෝහල් සඳහා අත්‍යවශ්‍ය ඖෂධ ලබා දෙන බවට සහතිකයක් ලබා නොදීම. ඖෂධ තත්ත්ව පාලනය පිළිබඳ කරුණු ඉදිරිපත් කර තිබුණද ඒවා උල්ලංඝනය වුවහොත් ගනු ලබන ක්‍රියා මාර්ග ගැන කිසිදු සඳහනක් නොමැති වීම. අවස්ථාව අනුව වඩාත් සුදුසු ඖෂධ ඖෂධීය නාමය ද සහිත වෙළෙඳ නාමයකින් නිර්දේශ කිරීමේ අයිතිය වෛද්‍යවරුන්ට ලබා දීම. මේ නිසා ඖෂධ ප්‍රතිපත්තියක් පැවතියද තමන්ට කැමැති ආකාරයෙන් වෙළෙඳ පොළ හැසිරවීමේ අයිතිය බහු ජාතික සමාගම්වලට නිරන්තරයෙන් ලබා දීම.

මෙම ක්‍රමවේදය තුළ ඖෂධ ගෙන්වීම, බෙදා හැරීම සඳහා ශ්‍රී ලංකාව තුළ නිෂ්චිත ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුයි. විශේෂයෙන්ම බාල වර්ගයේ ඖෂධ ආනයනය කිරීම ගනිමු. පසු ගිය වසර ගණනාව තුළ බාල වර්ගයේ ඖෂධ සමාගම් ලෙස හඳුනා ගත් සමාගම් විශාල සංඛ්‍යාවක් තිබෙනවා. සමාගම් 74කට ආසන්න සංඛ්‍යාවක් ඉන්දියානු සමාගම්, මැලේසියානු සමාගම්, සිංගප්පූරු සමාගම්, පිලිපීන සමාගම්, සයිප්‍රස් සමාගම්, චීන සමාගම්, කොරියානු සමාගම්, තායිලන්ත සමාගම් වාගේම පාකිස්තාන සමාගම් මෙම ක්‍රමවේදයට ඇතුළත් වෙලා තිබෙනවා. මේ හේතුව නිසාම ඖෂධ විෂ වී රෝහල් ගත වන පුද්ගලයින්ගේ සංඛ්‍යාව විශාල වශයෙන් වැඩි වෙලා තිබෙනවා.

කොළඹ විශ්වවිද්‍යාලයේ අධිකරණ වෛද්‍ය අංශයේ මහාචාර්ය රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා සඳහන් කරන ආකාරයට ඖෂධ විෂ වීම හේතුවෙන් වසරකට පුද්ගලයින් දහදාහක පමණ සංඛ්‍යාවක් රෝහල් ගත වෙනවා. එහිදී මිය යන පුද්ගල සංඛ්‍යාව 100කට වඩා වැඩි බව සඳහන් කර තිබෙනවා. අප යම් යම් වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේ දී විශේෂයෙන්ම සලකා බැලිය යුතු කාරණා කිහිපයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒවා කියන්න කාලය ප්‍රමාණවත් නැහැ. විශේෂයෙන්ම කියන්නට ඕනෑ, කරාපිටිය රෝහලේ මිය ගිය දැරිය ගැන; රුබෙල්ලා එන්නත ලබා දීම නිසා මාතර මිය ගිය දැරිය ගැන වාගේම නිට්ටඹුවේ කාන්තාවකට ප්‍රතිජීවක ඖෂධ ලබා දීමේදී අවසාන සිදුවීම

[ගරු ටී. බී. ඒකනායක මහතා]

ක්‍රියාත්මක කිරීම ගැන. ඖෂධ ගෙන්වන ව්‍යාපාරිකයින් එම ඖෂධවලින් සියයට 800ක පමණ ලාභ ලබා අළෙවි කරන බව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට අනාවරණය වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගැන හැම දාම කථා කරනවා. ඉතාමත් අමාරුකම් තුළ හෝ මේක මොන ආකාරයෙන් හෝ එළිදක්වන්න, යම්කිසි ප්‍රමිතියක් රාමුවක් තුළ එළිදක්වන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න අපේ රාජිත සේනාරත්න ඇමතිතුමාට පුළුවන් වෙලා තිබෙනවා. ශ්‍රී ලංකාවට ගෙන්වන බොහෝ ඖෂධයන් කල් ඉකුත්වීම නිසාත්, කල් ඉකුත්වීමට ආසන්න දිනවල පැවැතීම නිසාත් ගෙන්වීමේදී ආනයනකරුවන්ට විශාල ලාභයක් අත්වනවා. ඒ ආකාරයට අඩු මිලට වෙළෙඳ පොළෙන් ලබා ගන්නා බෙහෙත් වර්ග කල් ඉකුත් වීමේ ආසන්න දිනය කිට්ටු කර ගෙන්වා ගෙන, කෙටි කාලයකින් එම කාලය ඉකුත්වීම නිසා ශ්‍රී ලංකාව තුළ විශාල වශයෙන් ගැටලු මතු වෙලා තිබෙනවා. ඒ සඳහා උදාහරණ රාශියක් කියන්න තිබෙනවා. එම නිසා මෙම තත්ත්වය තුළ විශේෂයෙන්-,

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මන්ත්‍රීතුමා, වරායට එන විට shelflife එක සියයට 75ක් තිබෙන්නට ඕනෑ. මේක වගන්තියේ තිබෙනවා.

ගරු ටී. බී. ඒකනායක මහතා
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
එම නිසා පසු ගිය කාලයේ ගෙන්වූ ඖෂධ මෙට්‍රික් ටොන් 19,000ක් පුත්තලමේ හොල්සිම් ලංකා ආයතනයට යවලා විනාශ කර තිබෙනවා. ඉතිහාසය පුරා මේ වාගේ විනාශ කරපු ඖෂධ ප්‍රමාණයන් විශාල වශයෙන් තිබෙනවා. ඒවාට ගෙවපු -

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන ඒවා නිවැරැදියි. ඔබතුමා කිව්ව පරිදි පසු ගිය අවුරුද්දේ මිලියන සිය ගණනක ඒවා තිබෙනවා. එම නිසා මම තීන්දු කර තිබෙනවා, අවුරුද්දටම මුළු එකම ගෙන්වන්නේ නැතිව මාසයකට වරක් order එක දීලා මාසයකට වරක් ගෙන්වනවා කියා. මම මේ ගැන ඉන්දියානු සෞඛ්‍ය ඇමතිතුමා සමඟත් සාකච්ඡා කළා. ඔවුන්ගේ ආණ්ඩුවයි, අපේ ආණ්ඩුවයි එකතු වෙලා මෙම වැඩ පිළිවෙළ ගෙන යන්න. මොකද, ඉන්දියාවෙන් තමයි සියයට 80ක් එන්නේ.

ගරු ටී. බී. ඒකනායක මහතා
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
විශේෂයෙන්ම මෙම වැඩ පිළිවෙළ යටතේ රජයේ රෝහල්වලට අවශ්‍ය ඖෂධ පිළිබඳ විධිමත් තොරතුරු පරිගණකගත කර යාවත්කාලීන නොකිරීමෙන් සිදු වන අවාසිය රුපියල් කෝටි ගණනක්. විශේෂයෙන් ඖෂධ අපතේ යාම, වැඩි මිලට ඖෂධ ලබා ගැනීමට සිදු වෙනවා. එම නිසා අපි කියන්නේ රෝහල් සඳහා අවශ්‍ය ඖෂධ වර්ග මොනවාද, ලබා දිය යුතු ප්‍රමාණය කොපමණද; ඖෂධ කල් ඉකුත් වී ඇති දිනය කවදාද; හිඟ ඖෂධ ආදිය පිළිබඳව තොරතුරු රැස් කරමින් රෝහල්වල යම් කිසි දත්ත ගබඩාවක් ආරම්භ කරන්න ඕනෑ කියායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම නියෝජනය කරන යාපහුව මැතිවරණ කොට්ඨාසයට අයත් පොල්පිතිගම රෝහල මීට වසර දෙකකට කලින් දිස්ත්‍රික්කයේ හොඳම රෝහල වුණා. වර්තමාන ජනාධිපතිතුමා සෞඛ්‍ය ඇමතිතුමා විධියට හිටපු කාලයේ අපි ඒ රෝහලට ගියාම අපි දැක්කා, ඒ වෛද්‍යවරු හා කාර්ය මණ්ඩලය බෙහෙත් හේත් එක්තරා විද්‍යාත්මක ක්‍රමයක් තුළ ගබඩා කරලා තිබුණා. ඒ ගබඩා කිරීම විනිවිදභාවයෙන් යුතුව ක්‍රියාත්මක කිරීම නිසා ඒ රෝහලට විශාල ලකුණු ප්‍රමාණයක් හම්බ වෙලා තිබුණා. පොල්පිතිගම වාගේ ඈත දුෂ්කර රෝහලක ඒක කරන්න පුළුවන් නම් අනෙක් රෝහල්වල කරන්න බැරිකමක් නැහැ. ඒ සඳහා ඕනෑකම අවශ්‍යයි. ඒ වාගේම එය ක්‍රියාත්මක කිරීමට යම් සංයුතියක් අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශීය වෛද්‍ය අංශයටත් මේ වාගේම ක්‍රමවේදයක් අපි හැදිය යුතුයි. ගරු ඇමතිතුමනි, ඒකත් ඔබතුමාට අයිති අංශයක් නිසායි මම ඒ කාරණය කියන්නේ. මොකද බටහිර වෛද්‍ය ක්ෂේත්‍රයේත් කිසිම උගත්කමක් නැති, අධ්‍යාපනයක් නැති වෛද්‍යවරු ඉන්නවාය කියන එක පුවත් පත්වල, සම්මන්ත්‍රණවල කොපමණ කථා කළත් ඒ පිළිබඳව හෙළිදරවු කිරීමක් නැහැ. ඒ අය උසාවියට ගෙන ගිහිල්ලා ඒ බොරු සහතික අවලංගු කිරීමේ ක්‍රමවේදයක් නැහැ. ඒකත් අපි මෙයට ඇතුළු කරන්න ඕනෑ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු ටී. බී. ඒකනායක මහතා
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
දේශීය වෛද්‍ය අංශයේත් මේ කාර්යය ක්‍රියාත්මක කරන්නට ඕනෑ. අපි දන්නවා, රට පුරා ඒ අංශය තුළත් විශාල වංචා සිද්ධ වෙලා තිබෙන බව. විශේෂයෙන්ම අපේ පාර්ලිමේන්තුවේ වෛද්‍ය අංශය ගැනත් කියන්නට ඕනෑ. එහි වෛද්‍යවරුන් ඇතුළු ඒ සේවක සේවිකාවන් හොඳ කළමනාකරණයෙන් යුක්තව ඒ කාර්ය ක්‍රියාත්මක කරනවා. හැබැයි, සමහර අවස්ථාවලදී සැපයීම් අංශයෙන් අපේ පාර්ලිමේන්තුවේ වෛද්‍ය අංශයට අවශ්‍ය බෙහෙත් හේත් ලබා දීමේ පමාවක් තිබෙනවා. ඒ ගැනත් ඔබතුමා සොයා බැලිය යුතුයි. මොකද මන්ත්‍රීවරුන් 225දෙනාගේම සෞඛ්‍යය ගැන ක්‍රියා කරන්නේ එම වෛද්‍ය මධ්‍යස්ථානය නිසා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දීර්ඝ කාලයක් තිස්සේ අපි ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙලා සිටි ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පතේ තිබෙන අඩු පාඩුකම් අපි නියාමනය කරමින් ක්‍රියාත්මක කරමු. මේ ඉතාමත් වැදගත් කාලීන කාර්යය සඳහා අපේ සහයෝගය ලබා දෙනවා. බොහොම ස්තූතියි.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට නිවැරැදි කිරීමක් කරන්නට ඕනෑ. අජිත් කුමාර මන්ත්‍රීතුමා කිව්වා, ගැසට් කිරීම පිළිබඳව කිසිම නියෝගයක් මේ පනත් කෙටුම්පතේ නැහැ කියලා. ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පතේ 142. (4) උප වගන්තිය බලන්න. එහි මෙසේ තිබෙනවා:

"අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක්ම එය ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු මාස තුනකට නොඅඩු කාලසීමාව දී අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය....."

ඔබතුමා පෝස්ටර් ගහන වෙලාවේ මේක කියෙව්වා නම් ඔය ප්‍රශ්නය එන්නේ නැහැ. අනෙක් කට්ටිය ඔක්කෝම කියවලා ඇවිල්ලා තිබෙන්නේ. ඒ ගොල්ලන් පෝස්ටර් ගැහුවේ නැහැ නේ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.23]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අද හැම දෙනාම පක්ෂ භේදයකින් තොරව මේ පනත් කෙටුම්පත ගැන ප්‍රශංසා කරද්දී අපේ අජිත් කුමාර මන්ත්‍රීතුමා බොහොම වෛරයෙන්, ද්වේෂයෙන් වාගේ කථා කළා. කොහොම වුණත් එතුමා අවසානයේදී ඇහුවේ, මේ පනත් කෙටුම්පත මෙච්චර ඉක්මනට ගෙනාවේ ඇයි කියන එකයි. එතුමාටත් පැය 24ක් තිබුණා මේ පනත් කෙටුම්පත ගැන අධ්‍යයනය කරන්න. ඊයේ හවසයි අපට මේ පනත් කෙටුම්පත හම්බ වුණේ. අද හවස වෙන කොට පැය 24ක් ගත වෙලා ඉවරයි. එතුමාට ඒක හොඳට අධ්‍යනය කරන්න පැය 24කට වඩා වැඩි කාලයක් තිබුණා. ගරු ඇමතිතුමා කිව්වා වාගේ එතුමා පෝස්ටර් ගහමින් හිටියා මිසක් මේ පනත් කෙටුම්පත කියවන්න උනන්දු නොවුණු එක තමයි ප්‍රශ්නය තිබෙන්නේ. ඒ වාගේම එතුමා අවසාන වශයෙන් කිව්වා, මේ පනත් කෙටුම්පත හොඳයි, ගෙනාපු ක්‍රමය වැරැදියි කියලා. බළලා මැටියෙන් හැදුවත් මීයෝ අල්ලනවා නම් ප්‍රශ්නයක් නැහැ, ගරු මන්ත්‍රීතුමනි. මෙතෙක් කල් මීයෝ අල්ලන බළලෙක් හදා ගන්න බැරිකම තමයි අපට තිබුණු එකම ප්‍රශ්නය. නමුත් මෙපමණ කාලයකට පස්සේ හරි මෙවැනි පනත් කෙටුම්පතක් නිර්භයව ගෙන ඒම ගැන -නිර්භයව ඉදිරිපත් කිරීම ගැන- ගරු රාජිත සේනාරත්න ඇමතිතුමාට අප ස්තුතිවන්ත වෙනවා. "මේක කියවපු අය ඉන්නවා නම් මම ඔට්ටුවක් අල්ලනවා" කියලා අජිත් කුමාර මන්ත්‍රීතුමා කිව්වේ, දැන් තිබෙන්නේ ගිය ආණ්ඩුව කියලා හිතාගෙන වෙන්න ඇති. පසු ගිය ආණ්ඩුවේ තමයි ඔට්ටුවට හා සූදුවට ඉඩ තිබුණේ. කැසිනෝ ව්‍යාපාරවලට විරුද්ධව අපි කථා කළා. ඒ සඳහා විශාල බදු පනවලා තිබෙනවා. ඔබතුමා ඔට්ටු අල්ලන්න එනවා නම් ඒ බද්දත් ගෙවලා එන්න කියලා මා සඳහන් කරනවා.

ගරු විමල් වීරවංශ හිටපු ඇමතිතුමාට පොඩි ප්‍රශ්නයක් -සැකයක්- ඇති වෙලා තිබුණා. එතුමාගේ සැකය සාධාරණයි. මේ පනත් කෙටුම්පත සම්මත වුණාට පස්සේ පත් කරන කමිටුවට ඇමතිවරයා විසින් නව දෙනෙක් පත් කරනවා කියලා එතුමා ප්‍රකාශ කළා. නමුත් ඇමතිතුමා ඒක නිවැරැදි කළා, දහතුන් දෙනාගෙන් ඇමතිවරයා විසින් හතර දෙනෙකුට වඩා පත් කරන්නේ නැහැ කියලා. එතුමාගේ සැකය සාධාරණයි. මොකද පසු ගිය රජය තමන්ගේ ඥාතීන්, හිතවතුන්, -අයියලා, මාමලා, බාප්පලා, පුංචි අම්මලා මේ ඔක්කෝම- පත් කළා. නමුත් මේ මෛත්‍රී පාලනය තුළ කිසිම දවසක ඥාති සංග්‍රහයකට ඉඩ දෙන්නේ නැහැ කියන එක විශේෂයෙන්ම එතුමාට සඳහන් කරනවා වාගේම එවැනි ඇමතිවරු නැවතත් පත් නොවන්නට අපි අවශ්‍ය ව්‍යවස්ථා සංශෝධනය ඉදිරියේදී මේ රටට ඉදිරිපත් කරනවා කියන එකත් විශේෂයෙන්ම සඳහන් කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව ගරු මොහොමඩ් අස්ලම් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு மொஹமட் அஸ்லம் அவர்கள் *அக்கிராசனத்தினின்று அகலவே,* குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் *தலைமை வகித்தார்கள்.*

Whereupon THE HON. MOHAMED ASLAM *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *took the Chair.*

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මෙතරම් ඉක්මනට මේ පනත් කෙටුම්පත ගෙනාවේ ඇයි කියන ප්‍රශ්නය තමයි අජිත් කුමාර මන්ත්‍රීතුමාට තිබුණේ. ඇත්තටම මේ පනත් කෙටුම්පත ගෙනෙන්න ගිහිල්ලා තමයි මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට තමන්ගේ සෞඛ්‍ය ඇමතිකම පමණක් නොවෙයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිකමත් දාලා එන්න සිද්ධ වුණේ. මෙය ඒ තරම් භයානක ක්‍රියාවක්. මොකද, මෙය ලෝකයේ බලවත් වෙලා ඉන්න බහුජාතික සමාගම්වල ඖෂධ මාෆියාවට එරෙහිව කරන සටනක්. මේ ජයග්‍රහණය අතිවිශේෂ ජයග්‍රහණයක්. තමන්ගේ ජීවිතය පවා පරදුවට තියලා තමයි රාජිත සේනාරත්න මැතිතුමා මේ පනත් කෙටුම්පත අද මේ ගරු සභාවට ගෙනාවේ කියන කාරණයත් මම සඳහන් කරනවා. කාල වේලාව පුළුවන් තරම් කෙටි වන තරමට තමයි මේ ක්‍රියාවලිය පැවතෙන්නේ. මෙම පනත් කෙටුම්පත ගෙනෙන්න අවුරුදු 45ක් තිස්සේ කටයුතු කළා. නමුත් කාටවත් මේ වන තුරු මේ පනත් කෙටුම්පත ගෙනෙන්න බැරි වුණා. ඒ ගැන කථා කළා විතරයි.

අපේ දිනේෂ් ගුණවර්ධන හිටපු ඇමතිතුමා නම් මේ පිළිබඳව ප්‍රශංසා කරලා කථා කළා. Machines ගැන පොඩි සැකයක් තිබෙනවා, ඖෂධ හදන්න කල් ඉකුත් වුණු පරණ machines ඖෂධ සංස්ථාවට ගෙනේද දන්නේ නැහැ කියලා එතුමා කිව්වා. එතුමාගේ සැකයත් සාධාරණයි. මොකද, නොරොච්චෝලේ ගල් අඟුරු විදුලි බලාගාරය දිහා බලන කොට පෙනෙනවා, පසු ගිය ආණ්ඩු කාලයේ පරණ machines ගෙනැල්ලා මුළු පාරිභෝගික ජනතාවම අතර මං කළ ආකාරය. විදුලි නිෂ්පාදන ක්ෂේත්‍රයේ ලොකු අර්බුදයක් ඇති කළා. නමුත් එවැනි machines අපේ පාලන කාලය තුළ මේ රටට ආනයනය කරන්නේ නැහැ කියන සහතිකය ලබා දෙනවාය කියලා අපි විශේෂයෙන් සඳහන් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලොව ලාභදායකම ව්‍යාපාරය තමයි ආයුද වෙළෙඳාම. ඊට සම කළ හැකි තවත් ව්‍යාපාරයක් ඇත්නම් ඒ ඖෂධ වෙළෙඳාමයි. මම එහෙම කියන්න හේතුවක් තිබෙනවා. වැඩිහිටියෙකු තමුන්ට ලැබෙන ආදායමින් වැඩිම මුදලක් වියදම් කරන්නේ බෙත්-හේත්වලට කියලා අපි දන්නවා. නිදහස් සෞඛ්‍ය සේවයක් තිබෙන රටේ පසු ගිය කාලයේ තිබුණු වාතාවරණය ඒකයි. වැඩිහිටියන් ජීවත් කරවීමටත්, තමුන්ගේ වැටුපෙන් වැඩි කොටසක් බෙත්-හේත් සඳහා වැය නොකර එය සරල දෙයක් බවට පත් කරන්නත්, විශේෂයෙන්ම ජීවන බර අඩු කරන්නත් තමයි මෙවැනි පනත් කෙටුම්පතක් දින සියය තුළ ගෙනැල්ලා කටයුතු කරන්න අපි උත්සාහ කරන්නේ. යුද ගිනි ඇවිළෙන තරමට ආයුද ව්‍යාපාරිකයින්ට වාසිදායකයි. ඒ වාගේම රටක ජනතාව ලෙඩ වන තරමට මේ ඖෂධ ව්‍යාපාරිකයින්ට වාසිදායකයි. වර්තමාන තත්ත්වය ගත් විට දවසකට මේ රටේ දියවැඩියා රෝගය සඳහා අවශ්‍ය බෙහෙත් පමණක් රුපියල් කෝටි දෙක ඉක්මවා විකිණෙනවා. ඔන්න ඕක තමයි මේ රටේ තිබෙන වර්තමාන තත්ත්වය. ඖෂධ මාෆියාව කොතෙක් දුරට ව්‍යාප්ත වෙලා තිබෙනවාද කියලා කිව්වොත්, ලෙඩ සුව වනවා වෙනුවට බෙහෙත්වල ගණන ඇහුවාම, බෙහෙත්වල තිබෙන ප්‍රශ්න දිහා බැලුවාම, කල් ඉකුත් වුණු බෙහෙත් වෙළෙඳ පොළේ තිබෙනවා දැක්කාම මම හිතනවා,

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

ඖෂධ නිසා මරණයට පත් වුණු, බෙහෙත් ටික ගන්න සල්ලි නැතිව, ප්‍රමිතිය තිබෙන බෙහෙත් ටික ගන්න බැරිව මරණයට පත් වුණු අය අනන්තයි, අප්‍රමාණයි කියලා.

අපේ රමේෂ් පතිරණ ගරු මන්ත්‍රීතුමාත් ප්‍රකාශ කළා, පසු ගිය කාලයේ වාර්තා අනුව ඖෂධ විෂ වීම හේතුවෙන් වසරකට දහදාහක් පමණ දෙනා රෝහල්ගත කර තිබෙනවාය කියලා. එයින් සිය දෙනෙකු මිය යනවා. පසු ගිය කාලයේ ගාල්ල කරාපිටිය රෝහලේ දැරියක් මිය ගියේ ප්‍රතිජීවක ඖෂධයක් වන Ceftriaxone ලබා දීම නිසායි. ඒ වාගේම මාතර ප්‍රදේශයේදී රුබෙල්ලා එන්නත ලබා දීමෙන් පසුව දැරියක් මිය ගියා. ඒ වාගේම නිට්ටඹුව රෝහලේ සිසේරියන් සැත්කමට භාජනය වූ මවක් මිය ගියේත් ප්‍රතිජීවක ඖෂධයක් වන Amoxicillin-clavulanic Acid සහ Meropenum ඖෂධය ලබා දීම නිසායි. අපේ රටේ ඉතිහාසය ගත් විට මේ වාගේ සිද්ධීන් බොහොමයක් සිදු වෙලා තිබෙනවා. ඖෂධ මාෆියාකරුවන්ට කළ නොහැකි දෙයක් නැහැ. ඕනෑම දෙයක් කරලා තමන්ගේ ඖෂධ මාෆියාව මේ රට තුළ ව්‍යාප්ත කර ගෙන ඉන්න තමයි ඔවුන් බලන්නේ. ජාවාරම ජයට කර ගෙන යෑමට එරෙහි වන්නන්ගේ ජීවිත පවා නැති කරන්නට ඔවුන් උත්සාහ කරනවා; කටයුතු කරනවා. ඉතිහාසය ගත් විට සේනක බිබිලේ මහාචාර්යතුමා පවා ඝාතනයට ලක් වුණේ මෙම පනත් කෙටුම්පත ගෙන ඒම වෙනුවෙන් හඬ නැඟූ නිසා කියන කාරණයත් අපි අහලා තිබෙනවා. ඖෂධ මාෆියාවට සහාය දෙන්නන් යස ඉසුරු ලබනවා. ඒ වාගේම ඒකට එරෙහි වන්නන් දෙවරක් හිතා බලන්න වනවා. මොකද, මේ ප්‍රබල සංවිධානය තුළින් ඔවුන්ගේ ජීවිතවලට තර්ජනයක් වෙන්න පුළුවන්. ඒ නිසා මේ කටයුත්තට එරෙහි වනවා නම් දෙවරක් නොවෙයි, ඊටත් වඩා වැඩි වාර ගණනක් ඒ ගැන හිතන්නට ඕනෑ. මෙතෙක් කාලයක් බලවතුන්ගේ - ව්‍යාපාරිකයින්ගේ- ග්‍රහණයට හසු වෙලා මේ පනත් කෙටුම්පත හමස් පෙට්ටියේ තිබුණේ.

රනිල්-මෛත්‍රී ආණ්ඩුව පසු ගිය දින 50 තුළ මෙවැනි ප්‍රතිපත්ති රටේ ජනතාවට ඉදිරිපත් කළා. ඉදිරිපත් කරලා අවශ්‍ය නීති-රීති සැකසුවා. හමස් පෙට්ටියේ තිබුණු මෙවැනි ප්‍රතිපත්ති ගණනාවක් ඉදිරිපත් කළා. ඒකෙන් එකක් තමයි දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත. ඒකත් බහු ජාතික සමාගම්වල අධිකාරියට එරෙහිව තමයි අපි ගෙනාවේ, ජනතාවගේ සුබ සිද්ධිය සඳහා. විශේෂයෙන්ම මෙම පනත් කෙටුම්පත් දෙකම නිර්භයව කරළියට ගෙනාවේ රාජිත සේනාරත්න ගරු ඇමතිතුමා. මේ පනත් කෙටුම්පත් දෙකම එතුමා ගෙනාවා. එතුමා අව්‍යාජ, අවංක නායකයෙකු නිසාම එය කළ හැකි වුණා. යුක්තිය හා සාධාරණත්වය වෙනුවෙන් එතුමා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන ඇමතිකම පවා පැත්තකට දමලා, එය පරිත්‍යාග කරලා ආණ්ඩුවෙන් එළියට ආවා. ඉතින් එහෙම කෙනෙකුට තමයි මෙවැනි පනත් කෙටුම්පතක් ගෙනෙන්න පුළුවන් වෙන්නේ.

ගරු රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමාත්, අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාත් අපට අමතක කරන්න බැහැ. එතුමන්ලා අවංක, මානව හිතවාදී, ධනයට බලයට නොනැමෙන පාලකයන් වීමද මේ පනත් කෙටුම්පත ගෙන ඒමට හැකි වීමට හේතු වුණාය කියන එකත් විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා හිටපු සෞඛ්‍ය ඇමතිවරයා වශයෙන් පසු ගිය කාලයේ මේ පනත් කෙටුම්පත ගෙනෙන්න උත්සාහ කළත්, ජනාධිපතිවරයා, නැත්නම් ඉහළින් සිටි පාලකයන් ඒ සඳහා එතුමාට ඉඩ දුන්නේ නැහැ. ඒ නිසා එතුමා දැඩි සිත් තැවුලකට පත් වුණා. නමුත් රාජිත සේනාරත්න ඇමතිතුමා මේ පනත් කෙටුම්පත ගෙනෙන්න නිර්භයව ඉදිරිපත් වුණා. ඒ වාගේම අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේත්, අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේත් ආශිර්වාදය මේවාට ලැබුණා. එතුමන්ලා මේ කටයුතු block කරන්න ගියේ නැහැ. ඉතින්, ඒ ගැන අපි සන්තෝෂ වෙනවා. නව රජය පත් වෙලා ගත වූ දින 50ක් වැනි මේ කාලය තුළ ඓතිහාසික තීන්දු ගණනාවක්ම ගත්තා. මෙතෙක් කල් හමස් පෙට්ටියේ තිබුණු මෙවැනි පනත් කෙටුම්පත් ගණනාවක්ම ඉදිරියට ගෙනාවා. ඒ නිසා "හංසයා" ලකුණ ඉදිරියේ කතිරය ගහපු ජනතාවට සන්තෝෂ වෙන්න පුළුවන්, අපේ කතිරය හරියට වැඩ කරලා තිබෙනවාය කියලා. අද වෙන කොට අපේ බලාපොරොත්තු හරියට ඉෂ්ට කරලා, අවුරුදු ගණනක් තිස්සේ කරළියට ගෙනෙන්න බැරි වෙලා තිබුණු, මේ රටේ ජනතාවගේ යහපත වෙනුවෙන් ගෙනෙන්න තිබුණු පනත් කෙටුම්පත් දැන් දැන් එළියට එන්න පටන් ගෙන තිබෙනවා කියලා ඔවුන්ට සතුටු වෙන්න පුළුවන්. මේ දින සියයේ පොරොන්දු පත්‍රයේ පොරොන්දු කෙමෙන් කෙමෙන් ඉෂ්ට වෙනවාය කියලා මම හිතනවා. ඒ කියන්නේ, ජනතාව දැන් යහ පාලනයේ අරුණලු දකිනවා. විශේෂයෙන්ම මේ රට වෙනස් රටක් බවට පත් වෙනවාය කියන එක ජනතාවට තේරෙනවා.

පසු ගිය රජය කාලයේ අවුරුදු ගණනක් බහු ජාතික සමාගම්වලට බය වෙලා, එහෙම නැත්නම් රටේ යහ පාලනය ඉස්මතු වෙයි කියලා බය වෙලා හමස් පෙට්ටියේ තබා තිබුණු පනත් කෙටුම්පත් මේ දින සියයේ වැඩ පිළිවෙළ තුළ කරළියට එද්දී තම හෘදය සාක්ෂිය යටපත් කර ගෙන හිටපු අවංක ඇමතිවරු පසු ගිය කාලයේ මේ සභාව ඉදිරියේ ජාතියෙන් සමාව ඉල්ලපු අවස්ථා අපි දැක්කා. ඉතින් අපි ඒ පිළිබඳව ඔවුන්ට නිහතමානීව ආචාර කරනවා. තමුන්ගේ පාලන කාලයේ අකමැත්තෙන් වුණත් සිදු වූ වැරදි ගැන කනගාටුව ප්‍රකාශ කිරීම ගැන අපි විශේෂයෙන්ම එතුමන්ලාට ස්තූතිවන්ත වෙනවා.

මෛත්‍රී-රනිල් ආණ්ඩුව ගත කරන මේ දින සියය - දින සියයේ වැඩසටහන - මේ රටේ යහ පාලනය උදෙසා, නැත්නම් පිවිතුරු සමාජයක් උදෙසා නිර්භයව ජාතිය ගොඩ නැඟීමට තීන්දු ගන්නා ඓතිහාසික කාල පරිච්ඡේදයක් වශයෙන් ඉතිහාසයට එක් වෙනවාය කියලා මා හිතනවා. දින සියයේ වැඩසටහන කිව්වාට දින පනහක් ගත වෙන්නටත් මත්තෙන් පුදුමාකාර වෙනසක්, පෙරළියක් මේ රටේ ඇති කරලා තිබෙනවාය කියන එකත් විශේෂයෙන් සඳහන් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ශ්‍රී ලංකාව වසර ගණනාවක සිටම මේ ඖෂධ මාෆියාවට යට වී සිටියා. දරුවා ලැබෙන්න ඉන්න අම්මා කෙනෙක් කුසේ සිටින දරුවා වෙනුවෙන් බෙහෙත් ටික බොන කොට මව් කුසේ උන් ඒ දරුවාත් මේ ඖෂධ මාෆියාවට ගොදුරු වුණා. ඒ වාගේම ඒ දරුවා මේ ලෝකෙට බිහි වෙලා මිය යන මොහොත දක්වාම මේ ඖෂධ මාෆියාවට ගොදුරු වෙලා ඉන්නවාය කියන එක විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. මේ තත්ත්වය දැකලා තමයි මීට අවුරුදු හතළිහකට කලින් මහාචාර්ය සේනක බිබිලේ මැතිතුමා ඖෂධ ප්‍රතිපත්තියක් මේ රටට අවශ්‍යයි කියලා හඬ නඟා කිව්වේ. එතුමා ඒ සඳහා අවශ්‍ය පසු බිම සකස් කළා; ඒ සඳහා අවශ්‍ය කෙටුම්පත් සකස් කළා. ඒ සඳහා සටන් කළා. ඒ සටනේ ප්‍රතිඵලයක් වශයෙන් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව බිහි වුණා.

රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව බිහි වුණත්, අද මේ රටට ගෙන්වන ඖෂධ වර්ග 1,500කට ආසන්න සංඛ්‍යාවක් තිබෙනවා. අවුරුදු 40ක්, 45ක් ගත වුණත් අද වෙනකල් ඖෂධ වර්ග 50ක් නිෂ්පාදනය කරගන්න රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට බැරි වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මේ රටේ පෞද්ගලික අංශයටත් ඖෂධ වර්ග 50 ඉක්මවා නිෂ්පාදනය කර ගැනීමට නොහැකි වෙලා තිබෙනවා.

මෙතෙක් පහළ වූ සියලුම සෞඛ්‍ය ඇමතිවරු, සියලුම රජයේ නිලධාරින්, සියලුම රජයේ නායකයන් අවුරුද්දක් පාසා මහාචාර්ය සේනක බිබිලේ මැතිතුමාගේ ගුණ අනුස්මරණය කළා. එතුමා අපට හොඳ ප්‍රතිපත්තියක් ගෙනාවා. නමුත් සේනක බිබිලේ ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවන්න මේ කිසිම කෙනෙකුට කොන්ද පණ තිබුණේ නැහැ. වර්තමාන රජයට පමණයි එය ක්‍රියාවට නැංවීම සඳහා කොන්ද පණ තිබුණේ කියන එකත් විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, please wind up.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
Give me one more minute, please.

විශේෂයෙන්ම මේ පනත් කෙටුම්පත ගෙන ඒමෙන් මෛත්‍රී-රනිල් රජයේ අමාත්‍ය රාජිත සේනාරත්න මැතිතුමා අද කරන කැපවීම ජාතික ඖෂධ ප්‍රතිපත්තියක් වෙනුවෙන් ජීවිතය පූජා කළ මහාචාර්ය සේනක බිබිලේ මහතාගේ සිහිනය යථාර්ථයක් වනු ඇත. අප තව දුරටත් කැප වෙමින් මෙම පනතට අදාළ අවශ්‍යතා සම්පූර්ණ කරමින් මෙම ඖෂධ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළ යුතුයි. එවිට බාල බෙහෙත් ගෙනැවිත්, කල් ඉකුත් වූ බෙහෙත් ගෙනැවිත් අධික ලාභ ලබමින් රෝගීන් අසරණ කළ ඖෂධ ජාවාරම්කරුවන්ට මෙම පනත නිර්විත්දනයක් වනු ඇත.

[අ.භා. 5.37]

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත පිළිබඳව කථා කිරීමට අවස්ථාවක් ලැබීම පිළිබඳව මා ඉතා සන්තෝෂ වෙනවා. විශේෂයෙන්ම මේ රටේ ජනතාවගේ මුදල්වලින් විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබලා, ඒ වාගේම පශ්චාත් වෛද්‍ය උපාධිය හදාරලා, විශේෂඥ වෛද්‍යවරියක හැටියට මේ රටේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ අවුරුදු 24ක් සේවය කරලා, ජනතා වරමින් පාර්ලිමේන්තුවට ඇවිල්ලා මේ පනත් කෙටුම්පත සම්මත කර ගන්නා අවස්ථාවේදී එයට සහයෝගය දැක්වීමට අවස්ථාවක් ලැබීම පිළිබඳව මා බොහොම සන්තෝෂ වෙනවා. මොකද, මේ රටට ඉතාම වැදගත් පනත් කෙටුම්පතක් තමයි අද ඉදිරිපත් කරලා තිබෙන්නේ. අපේ රටේ ඖෂධ ප්‍රතිපත්තියක් හදලා අවුරුදු ගණනාවක් ගත වුණත්, ඒ ප්‍රතිපත්තිය හරහා නීති රාමු සකස් කරලා ජනතාවට ගුණාත්මක හා ආරක්ෂිත ඖෂධ අවශ්‍ය වෙලාවට ලබා ගැනීමේ ක්‍රමවේදය ශක්තිමත් කරන්න බැරි වුණ නිසා මෙම පනත් කෙටුම්පත ඉතාම වැදගත් බව විශේෂයෙන්ම අපි මතක් කරන්න ඕනෑ.

මේ ප්‍රතිපත්තිය ආරම්භ කළේ 1960 ගණන්වල වුණත්, දොස්තර එස්.ඒ. වික්‍රමසිංහ මහත්මයාත්, මහාචාර්ය සේනක බිබිලේ මහත්මයාත් එකතු වෙලා 1970 දී තමයි මේ ජාතික ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාව තුළ හඳුන්වලා දුන්නේ. එදා හඳුන්වා දුන් ජනතාවට ආරක්ෂිත ඖෂධ අඩු මිලට -පහසු මිලට- ලබා දීමේ ප්‍රතිපත්තිය මුළු මහත් ලෝකය පුරාම ප්‍රසිද්ධ වුණා. විශේෂයෙන්ම සංවර්ධනය වන රටවල් පවා එය වැලඳ ගත්තා. ශ්‍රී ලංකාවේ නම වාගේම, මහාචාර්ය සේනක බිබිලේ කියන නම ජාත්‍යන්තරයට ගියා. එදාත් බහුජාතික සමාගම්වලින් එතුමාට ලොකු පීඩනයක් එල්ල වුණා. විශේෂයෙන්ම එතුමා හඳුන්වා දුන් වැඩසටහන තුළින් රටවල්වල ඖෂධ පිළිබඳ ඒකාධිකාරය බිඳ දමලා ජනතාවට දීපු සහනය නිසා එතුමාට ලොකු බලපෑමක් එල්ල වුණා. පසුව එතුමා ඝානාවේදී අභිරහස් ලෙස මිය ගියා. මිය ගියත් සේනක බිබිලේ කියන නාමය මේ රටේ විතරක් නොවෙයි, මුළු මහත් ලෝකය පුරාම අදටත් ප්‍රසිද්ධ වෙලා තිබෙනවා.

ඇත්තටම මෙම පනත හඳුන්වා දෙන්න අඩිතාලම දැමූ මහාචාර්ය සේනක බිබිලේ මැතිතුමාටත්, දොස්තර එස්.ඒ. වික්‍රමසිංහ මැතිතුමාටත් එහි ගෞරවය හිමි වෙන්න ඕනෑ. අපි ඇත්තටම ඒ ගැන සන්තෝෂ වෙනවා. මේ පනත් කෙටුම්පත යටතේ ජාතික ඖෂධ නියාමන අධිකාරියක් ස්ථාපිත වෙනවා. ඒ යටතේ විවිධ පුද්ගලයන්ගෙන් සැදුම්ලත් ජාතික උපදේශන කමිටුවක්, විශේෂයෙන්ම විශේෂඥ වෛද්‍යවරුන්ගෙන්, ඒ ක්ෂේත්‍ර නියෝජනය කරන විවිධ වෘත්තිකයන්ගෙන් සැදුම්ලත් ජාතික උපදේශන මණ්ඩලයක් පිහිටුවනවා. ඒ වාගේම ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන හා අදාළ සියලු කරුණු නියාමනය කරන්න, පාලනය කරන්න අවශ්‍ය කරන ක්‍රමවේදය මේ පනත් කෙටුම්පතට ඇතුළත් කර තිබෙනවා. ඒ වාගේම සාමූහික විධිවිධාන, ඔසුසල් නියාමනය කියන සියලුම අංශ මේ ප්‍රතිපත්තිය තුළ ඉතාම පැහැදිලිව සඳහන් වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම ශල්‍ය වෛද්‍ය විශේෂඥවරු, කායික හා ළමා රෝග විශේෂඥවරු වාගේම නාරි හා ප්‍රසව විශේෂඥවරු, වෛද්‍ය සංගම්වල නියෝජිතයෝ මෙම ජාතික උපදේශන කමිටුවේ ඉන්නවා. ඖෂධවලට අදාළ කරුණු නියාමනය කිරීමේදීත්, වෛද්‍ය උපකරණ නියාමනය කිරීමේදීත් විශේෂයෙන්ම එම කමිටුවලට ශ්‍රී ලංකා ළමා විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංගමයේ නියෝජිතයෙකුත් පත් කිරීම ඉතාම සුදුසුයි කියා මම යෝජනා කරනවා. මොකද, දරුවන්ට ලබා දෙන ඖෂධ මාත්‍රාවල සහ වැඩිහිටියන්ට ලබා දෙන ඖෂධ මාත්‍රාවල වෙනස්කම් තිබෙනවා; උපකරණවලත් වෙනස්කම් තිබෙනවා. ඒ නිසා මේ උපදේශක මණ්ඩලවලට ඔවුන්ගේ නියෝජනයක් තිබෙනවා නම් ඉතාමත් හොඳයි කියා මම විශ්වාස කරනවා.

අවශ්‍ය වේලාවට ගුණාත්මක ඖෂධ නොමැති වීම ගැන මේ රටේ ලොකු ප්‍රශ්නයක් තිබුණා. විශේෂයෙන්ම, රජයේ රෝහල්වලට අවශ්‍ය ඖෂධ නියමිත වේලාවට ලැබෙන්නේ නැහැ. මේ පනත් කෙටුම්පත හරහා එය නියාමනය කර, ඒ තිබෙන ඖෂධවල ගුණාත්මකභාවය පිළිබඳ ගැටලු සියල්ලටම විසඳුම් ලබා දී, අවශ්‍ය කරන ගුණාත්මක බෙහෙත් රජයේ රෝහල්වලින් පමණක් නොවෙයි, ඔසුසල්වලිනුත් ලබා ගැනීමේ ක්‍රමවේදය ඉදිරියට ක්‍රියාත්මක වෙයි කියා අප හිතනවා. ඖෂධයක් ලබා ගත්තත්, ඒ ඖෂධවල නියමිත මාත්‍රාව තිබෙනවාද, අවශ්‍ය සංයෝජක තිබෙනවාද කියන bioequivalence studies කරන්නට, තත්ත්ව පරීක්ෂාවට, අවශ්‍ය කරන පහසුකම තවම ශ්‍රී ලංකාවේ හොඳින් ස්ථාපිත වී නැහැ. මේ පනත් කෙටුම්පත හරහා ස්ථාපිත කරන තත්ත්ව පරීක්ෂණ laboratories දියුණු වී, නවීන පහසුකම්වලින් සමන්විත පරීක්ෂණ කිරීමට ඔවුන්ට හැකියාව ලැබෙයි කියා අප හිතනවා.

සෑම රෝගියකුටම prescription එකක් ලැබෙන්නට ඕනෑ කියා අප විශ්වාස කරනවා. අද සමහර රෝගීන් ෆාමසියට ගිහින් අවශ්‍ය කරන බෙහෙත් ලබා ගන්නවා. පාවිච්චි කරන ඖෂධය මොකක්ද, මාත්‍රාව මොකක්ද, වාර ගණන කීයද කියා ඔවුන් දන්නේත් නැහැ. ඒ නිසා සෑම වෙලාවේම මේ prescription එක අත්‍යවශ්‍ය කිරීම ඉතාම වැදගත් වනවා.

[ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය]

අප සාකච්ඡා කළා, ඖෂධය ලියන්නට ඕනෑ ඖෂධීය නාමයෙන් මිසක් වෙළෙඳ නාමයෙන් නොවෙයි කියා. නමුත් එතැනදී ගැටලුවක් ඇති වනවා. මොකද, අද මේ රටේ ෆාමසිවල, රෝහල්වල තිබෙන ඖෂධවල ගුණාත්මකභාවය පිළිබඳ ප්‍රශ්න තිබෙනවා. ඒ නිසා තමයි සමහර වෛද්‍යවරුන්ට වෙළෙඳ නාමයෙන් ඖෂධය ලියන්නට සිදු වී තිබෙන්නේ. වෙළෙඳ නාමයෙන් ලියන විට සමහරවිට ඖෂධවල මිල වැඩි වනවා. එකම වර්ගයේ බෙහෙත් වර්ග හුඟක් වෙළෙඳ පොළේ තිබෙනවා. උදාහරණයක් ගත්තාම, Amoxicillin කියන බෙහෙත සඳහා වර්ග එකසිය ගණනක් තිබෙනවා. ඒ නිසා වෛද්‍යවරයා ඖෂධීය නාමයෙන් ලිව්වත්, ෆාමසියට ගියාම ඔසුසලේ සිටින පුද්ගලයා තමන්ගේ අවශ්‍යතාව මත වැඩිපුර මුදල් ලබා ගැනීමට, එහෙම නැත්නම් ඒ සමාගම්වල තිබෙන බලපෑම්වලට වැඩි මුදලට ඒවා අළෙවි කරන්නට පුළුවන්. ඒ නිසා මෙයට අප ක්‍රමවේදයක් සකස් කරන්නට ඕනෑ.

සමහරවිට වෛද්‍යවරුන්ට ලාභම බෙහෙත ලියන්න බැහැ. ඖෂධීය නාමයෙන් ලාභම බෙහෙත ලිව්වත්, එහි ගුණාත්මකභාවය තහවුරු කරන්න අපට බැරි වනවා. රෝගියාට ඉක්මන් සුවය ලබා දීම සඳහා ගුණාත්මකභාවය පිළිබඳ තහවුරු වුණු වෙළෙඳ නාමය තිබෙන බෙත්-හේත් ලිවීමටයි වෛද්‍යවරුන් උත්සාහ කරන්නේ. නමුත්, මෙම පනත් කෙටුම්පත සම්මත කළ වහාම ඖෂධීය නාමයෙන් බෙහෙත් ඇණවුම් කිරීම අනිවාර්ය කරන්න බැහැ. මේ ක්‍රමවේදය සකස් වන තෙක් ඒ සඳහා යම් කාලයක් ලබා දිය යුතු වනවා.

මේ බෙහෙත් වර්ග දීම පමණක් නොවෙයි, මේ ක්‍රමය හරහා අතුරු ආබාධ නියාමනය කිරීමේ ක්‍රමවේදයකුත් සකස් කර තිබීම ගැන අප ඉතාම සන්තෝෂ වනවා. විශේෂයෙන්ම, එන්නත් ලබා දීමේදී මෙය සිදු වනවා. එන්නත්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමටත් සෞඛ්‍ය අමාත්‍යාංශයට හැකි වී තිබෙනවා. එම නිසා මේ පනත් කෙටුම්පත හරහා අතුරු ආබාධ නියාමනය කිරීම තුළින් ඒ ඖෂධවල ගුණාත්මකභාවය වැඩිදියුණු කර, රෝගීන්ට සහනයක් ලබා දීමට හැකි වනවා සේම රෝග සුවවීම ඉක්මන් කර ගන්නත් පුළුවන් වනවා.

ඖෂධවල ගුණාත්මකභාවය තහවුරු කිරීම ඉතාමත් වැදගත් වනවා. අද රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව හරහා ලෝකය පුරාම ටෙන්ඩර් ඉදිරිපත් කර අවශ්‍ය කරන බෙහෙත් ඇණවුම් කර ලංකාවට ගෙන්වා ගන්නවා. නමුත්, ඒ ගෙන්වා ගන්නා බෙහෙත්වල ගුණාත්මකභාවය පිළිබඳ ප්‍රශ්න තිබෙනවා. ලියා පදිංචි කිරීම සඳහා ඔවුන් ලබා දෙන සාම්පල්වල ගුණාත්මකභාවය හොඳ වුණත්, ඇණවුම භාර ගත්තාට පසුව ලබා දෙන බෙහෙත්වල ගුණාත්මකභාවය random checksවලදී තහවුරු කළත් රෝහල්වල ගබඩාවලින් ඒවා හුඟක් ඉවත් කර තිබෙන බව අප දැක තිබෙනවා. මේ ආකාරයට රජයේ රෝහල්වල ඒවා හඳුනා ගත්තත්, පෞද්ගලික ෆාමසිවලට ගෙනෙන ගුණාත්මකභාවයෙන් අඩු බෙහෙත් හඳුනා ගැනීමට හැකියාවක් නැහැ.

පෞද්ගලික සේවයේ පුහුණුව ලැබූ වෛද්‍යවරුන් වාගේම සමහරවිට නුපුහුණු වෛද්‍යවරුන්ද වෛද්‍ය ක්ෂේත්‍රයේ නියැලී සිටිනවා. සමහරවිට ඔවුන් රට තුළට ගුණාත්මකභාවයෙන් අඩු, ලාභ බෙහෙත් වර්ග හොරෙන් ගෙන එනවා අප දැක තිබෙනවා.

ඒ නිසාත් සමහර වෙලාවට රෝගීන්ට බලවත් අසාධාරණයක් සිද්ධ වනවා. මේ සඳහාත් තිබෙන ඉඩකඩ ඇහිරීම සඳහා නීතිය තදින්ම ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය බවත් අප මතක් කරන්න ඕනෑ.

රෝගියා පෞද්ගලික වෛද්‍යවරයෙක් ළඟට ගියත් සමහර විට බෙහෙත් කොටසයි දෙන්නේ. ඉතිරි බෙහෙත් ටික ඔහුට ෆාමසියකින් තමයි ගන්න වන්නේ. තමන් පාවිච්චි කරන්නේ මොන ඖෂධයද කියන කාරණය දැන ගන්න රෝගියාට අයිතියක් තිබෙනවා. ඒ නිසා ආරක්ෂිත, ප්‍රත්‍යක්ෂ, ගුණාත්මක බෙහෙත් ලබා දීමේදී වෛද්‍යවරයා දැනුවත් වීම වාගේම, රෝගියා දැනුවත් කිරීම සඳහාත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ඉතාම වැදගත් බව මා මතක් කරනවා.

වර්තමානයේ මේ රටට ඉතාම වැදගත් වන මේ පනත් කෙටුම්පත අද මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිළිබඳව අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටත්, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍ය ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මැතිතුමාටත් මගේ ස්තුතිය පුද කරමින්, මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 5.47]

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වසර 45කට ආසන්න කාලයක් තිස්සේ සාකච්ඡා වෙමින් පැවැති මේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත පිළිබඳව මේ රටේ විශාල ආන්දෝලනයක් තිබුණා. ඉතා දීර්ඝ කාලයක් තිස්සේ සාකච්ඡා වෙමින් තිබිලා, මේ කාලයට සරිලන අන්දමට මෙම පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිළිබඳව විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමාටත්, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාටත් රජය හා මහ ජනතාව වෙනුවෙන් අප ස්තුතිවන්ත වෙනවා. මේ පනත් කෙටුම්පත සම්මත කර ගැනීම හරහා අප බලාපොරොත්තු වන්නේ මේ රටේ සෞඛ්‍ය සේවාව ගුණාත්මක තත්ත්වයට පත් කිරීමයි. තත්ත්වයෙන් බාල නොවන, ප්‍රමිතියෙන් යුත් ඖෂධ මේ රටට ගෙන්වලා, ඒවා මේ රටේ බෙදා හැරීම කරලා ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවීම තමයි මෙම පනතින් බලාපොරොත්තු වන්නේ.

වසරක් පාසා රුපියල් කෝටි 13,000ක්, 14,000ක් -දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 1.5ක් පමණ - පමණ සෞඛ්‍ය ක්ෂේත්‍රය වෙනුවෙන් වෙන් කරලා, බෙහෙත් ද්‍රව්‍ය මේ රටට ගෙන්වීම සඳහා රුපියල් කෝටි 4,000ක් පමණ වෙන් කරනවා. මෙවැනි අතිවිශාල මුදලක් වෙන් කරන සෞඛ්‍ය සේවාවේ ගුණාත්මකභාවයක් ඇති කිරීම සඳහා මෙම පනත ඉවහල් වේ යැයි අප කල්පනා කරනවා. රටේ සමස්ත සෞඛ්‍ය වියදමින් සියයට 45ක් පමණ රජය දරමින්, ජනතාව විසින් තම පෞද්ගලික වියදමින් සියයට 55ක් පමණ දරමින් ගෙන යන මේ සෞඛ්‍ය සේවාව, සාමාන්‍යයෙන් ලෝක තත්ත්වයන්ද සලකා බලලා, ඉදිරියේදී රජයේ වියදම සියයට 70ක් දක්වා වැඩි කරලා, සාමාන්‍ය ජනතාවගේ වියදම සියයට 30 දක්වා අඩු කරන තත්ත්වයකට ගෙන එන්න මෙම පනත උපකාරී වෙයි කියලා මා හිතනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම පනත තුළින් ප්‍රමිතියෙන් යුත් ඖෂධ මේ රටේ ජනතාවට ලබා දෙන්න අප බලාපොරොත්තු වෙනවා. සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා මේ වෙලාවේ මේ ගරු සභාවේ හිටියා නම් හොඳයි. මෙන්න මේ කාරණය ගැන මම එතුමා දැනුවත් කරන්න කැමැතියි. විශේෂයෙන්ම ප්‍රමිතියෙන් තොර බෙහෙත් ද්‍රව්‍ය මේ රටේ ජනතාව අතට පත් වෙන්න හේතුව වෙලා තිබෙන්නේ මොකක්ද? මම උදාහරණයක් කියන්නම්. අපේ මේ පාර්ලිමේන්තුවේ තිබෙන වෛද්‍ය මධ්‍යස්ථානය වායුසමීකරණය කරලා නැහැ. එතකොට බෙහෙත් ද්‍රව්‍ය ගබඩා කිරීම සම්බන්ධයෙන් විශාල ප්‍රශ්නයක් මතු වෙනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* MR. DEPUTY SPEAKER *took the Chair.*

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බෙහෙත් ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සහ ගබඩා කිරීම මේ පනත තුළින් නියාමනය කළ යුතුම වෙනවා. ඒ මක් නිසාද? විශේෂයෙන්ම පෞද්ගලික අංශයේ නම් එම බෙහෙත් ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම වායුසමීකරණය කරන ලද වාහන තුළින් සිදු වෙනවා. ඒ වාගේම ඔසුසල්ද වායුසමීකරණය කර තිබෙන නිසා එම තත්ත්වයන් යටතේ ඒ බෙහෙත් ද්‍රව්‍ය ගබඩා කිරීමත් සිදු වෙනවා. නමුත්, රජයේ පැත්තෙන් මේ තත්ත්වය ඉදුරාම වෙනස් වෙනවා. රජයේ බෙහෙත් ගබඩාවලින් බෙහෙත් අරගෙන යන්නේ සාමාන්‍ය රථවලයි. එසේ අරගෙන යෑම තුළ ඒ බෙහෙත් ද්‍රව්‍යවල ගුණාත්මකභාවය අනිවාර්යයෙන්ම අඩු වෙනවා. මේ පාර්ලිමේන්තුවේ තිබෙන වෛද්‍ය මධ්‍යස්ථානය මම උදාහරණයක් වශයෙන් තමයි ගත්තේ. අඩු තරමේ මේ පාර්ලිමේන්තුවේ තිබෙන වෛද්‍ය මධ්‍යස්ථානයවත් වායුසමීකරණය කරලා අප පෙන්වන්න ඕනෑ, අපේ මේ පාර්ලිමේන්තුව තුළින්ම මේ කටයුත්ත ඉදිරියට ගෙන යන්න පුළුවන් කියලා.

මෙම අවස්ථාවේදී ඇමතිතුමා මේ ගරු සභාවට පැමිණෙන එක හොඳයි. මා කියමින් සිටියේ පාර්ලිමේන්තුවේ වෛද්‍ය මධ්‍යස්ථානය වායු සමීකරණය කරලා නැහැයි කියන එකයි. බෙහෙත් තත්ත්වයෙන් බාල වීමට එක හේතුවක් තමයි හැම වෙලාවේම storage condition එක නැති වීම. විශේෂයෙන්ම රජයේ බෙහෙත් ප්‍රවාහනය කිරීමේදී වායු සමීකරණ වාහන නොමැති වීම මෙයට විශාල ලෙස බලපානවා. එම නිසා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ පනත් කෙටුම්පත සම්මත වුණාට පසුව මේ සම්බන්ධයෙන් යම්කිසි ක්‍රියා මාර්ගයක් ගන්නය කියලා.

ඒ විතරක් නොවෙයි. බෙහෙත් ද්‍රව්‍යවල මිල පිළිබඳව හර්ෂ ද සිල්වා මැතිතුමාත් කිව්වා. අද මෙම ගරු සභාවේ කථා කළ ඇමතිවරු වැඩි පිරිසක් බෙහෙත්වල මිල පිළිබඳව කථා කළා. බෙහෙත් මිල සඳහා අනිවාර්යයෙන්ම මිල සූත්‍රයක් ඇති කළ යුතුයි. හිටපු ජනාධිපති ප්‍රේමදාස මැතිතුමාගේ කාලයේදී 1980 ගණන්වල ඖෂධ පිළිබඳව මිල සූත්‍රයක් ඇති කරලා තිබුණා. එම අවස්ථාවේදී CIF අනුව රුපියල් 100ක් වන ඖෂධයක් මහ ජනතාව අතරට යද්දී මිල සූත්‍රය අනුව රුපියල් 160ක් වැනි මුදලකට තමයි නියම කර තිබුණේ. අවුරුදු 25කට පමණ පෙර එසේ මිල නියම කර තිබුණත් අද වන විට සාමාන්‍යයෙන් රුපියල් 100ක් මිල බෙහෙතක් රුපියල් 180ක් වැනි මිලකට මහ ජනතාව අතරට යන ලෙසට මිල සූත්‍රයක් සකස් කළොත් හොඳයි කියා මා හිතනවා. එය අනිවාර්යයෙන්ම කළ යුතු වෙනවා. එවැනි තත්ත්වයක් නොමැති වීම තමයි මෙම බෙහෙත්වල මිල ඉතා අධික වෙන්න හේතු වෙලා තිබෙන්නේ.

සාමාන්‍යයෙන් මෙහිදී ඔසු සල් හිමියාට සියයට 17ක් පමණ ප්‍රමාණයකුත්, බෙදා හරින්නන්ට සියයට 10ක් පමණ ප්‍රමාණයකුත්, මේ රටට ආනයනය කරන අයට සියයට 50ක් පමණ ප්‍රමාණයකුත් නියම කරලා නීතිගත කිරීම තුළින් මෙම බෙහෙත් මිල ඉහළ යෑම අනිවාර්යයෙන්ම වළක්වා ගන්න පුළුවන්. ඒ පිළිබඳව අමාත්‍යතුමාගේ අවධානය යොමු කරලා, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සමඟත්, ආහාර සුරක්ෂිතතාව අමාත්‍යාංශය සමඟත් සාකච්ඡා කරලා මේ බෙහෙත්වල මිල පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරනවා නම් හොඳයි. එහෙම කළොත් පමණයි, ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත තුළින් ජනතාවට අවශ්‍ය දේ දුන්නා වෙන්නේ.

මේ පනත් කෙටුම්පතේ තිබෙනවා, ජාතික ඖෂධ නියාමන අධිකාරියට පත් වන සාමාජිකයින් ඉන් ඉවත් වුණාට පස්සේ අවුරුදු 3ක් යන කල් ඖෂධ සමාගම්වල සේවය කරන්න බැහැයි කියලා. නමුත් ඇමතිතුමා අද සංශෝධනයක් ඉදිරිපත් කරනවා, මුලින් අවුරුදු 3ක් සිටි අය මෙම අධිකාරියට පත් නොකළ යුතුයි කියලා. මෙය ඉතා හොඳ සංශෝධනයක් කියලා මා මේ අවස්ථාවේදී කියා සිටිනවා. ඒ සම්බන්ධයෙන් විශේෂයෙන්ම ගරු ඇමතිතුමාට මා ස්තුතිවන්ත වනවා.

අපේ තිස්ස විතාරණ හිටපු ඇමතිතුමා කිව්වා, ජනතාව දැනුවත් කිරීම ගැන. ඒ සම්බන්ධයෙන් මටත් අත් දැකීම් තිබෙනවා. මේ පිළිබඳව අනිවාර්යයෙන්ම ජනතාව දැනුවත් කිරීම කළ යුතුයි. වෛද්‍යවරයකු බෙහෙත් වට්ටෝරුවක් දුන්නාට පස්සේ ඔසු සලේ -ෆාමසි එකේ- ඉන්න ඖෂධවේදියාට එතුමාගේ අභිමතය පරිදි ඖෂධයක් දෙන්න පුළුවන්. මමත් ඒ ගැන එතරම් කැමැත්තක් නැහැ. මොකද, වෙළෙඳ නාමය හෝ ඖෂධ නාමය සඳහන් කිරීම වෛද්‍යවරයාගේ අභිමතය අනුවයි සිදු විය යුත්තේ. විශේෂයෙන් මට මතකයි, 1980 ගණන්වල එක්තරා වෛද්‍යවරයෙක් බෙහෙත් වට්ටෝරුව ලියන්නේ වෙළෙඳ නාමයෙන් නොවෙයි, ඖෂධීය නාමයෙන්. මට මතකයි, එතුමා "Diazepam" කියන බෙහෙත් වර්ගය මිලිග්‍රෑම් 2 පෙති 7ක් වට්ටෝරුවකට දීලා තිබුණු බව. ඒ වෙලාවේ බෙහෙත් පෙත්තක වටිනාකම ශත 05යි. එතකොට පෙති 7 වටිනාකම ශත 35යි. ඒ කාලයේදී රෝගියා පරීක්ෂා කරන්න වෛද්‍යවරයාගේ ගාස්තුව රුපියල් 60යි. ඒ අවස්ථාවේදී ඒ බෙහෙත්වලට මිල ශත 35ක් කියලා කිව්වාම, -ඒ වෙලාවේ මා අපේ ෆාමසි එකේ සිටියා- ඒ රෝගියා ඒ තුණ්ඩුව අරගෙන ඉරලා දැම්මා. ඉරලා දමා කිව්වා, "මා රුපියල් 60ක් දීලා ගියේ ශත 35ක බෙහෙත් ගන්නද කියලා". Roche Pharmaceuticals නමැති company එකේ හදන "Valium" කියන බෙහෙත ඒ වෙලාවේ රුපියල් 2ක් විතර වනවා. "Diazepam" සහ "Valium" කියන බෙහෙත් වර්ග දෙකම එක සමානයි. ඒ අවස්ථාවේදී ඒ බෙහෙත ලියා තිබුණා නම් එවැනි සිද්ධියක් වන්නේ නැහැ. එම නිසා වර්ග දෙකකින් එන්නේ එකම බෙහෙතයි කියන එක පිළිබඳව රෝගින් දැනුවත් කිරීම අත්‍යවශ්‍ය වනවා.

මෙම පනත් කෙටුම්පත සම්මත කළ ගමන්ම ඒ සියල්ලම සිද්ධ වන්නේ නැහැ. නමුත් ඉදිරියේදී ඒ පිළිබඳව ජනතාව දැනුවත් කිරීම අත්‍යවශ්‍ය වනවාය කියලා මා හිතනවා. ප්‍රමිතියෙන් තොර බෙහෙත් ද්‍රව්‍ය ලංකාවට එන එක වැළැක්වීම සහ බෙහෙත් ද්‍රව්‍යවල මිල පිළිබඳව ජනතාව දැනුවත් කිරීමයි අවශ්‍ය වන්නේ. තමන්ගේ අතේ තිබෙන මුදලට සරිලන සේ අවශ්‍ය බෙහෙත් මිල දී ගැනීමේ හැකියාව මේ පනත තුළින් ඇති කිරීම ඉතාම හොඳ දෙයක්.

ඒ විතරක් නොවෙයි. අපේ සෞඛ්‍ය ඇමතිතුමාට කියා සිටිනවා, පෞද්ගලික ආරෝග්‍යශාලා නියාමනය කිරීම සඳහා යම්කිසි වැඩ පිළිවෙළක් තිබිය යුතුයි කියලා.

[ගරු අශෝක් අබේසිංහ මහතා]

පෞද්ගලික ආරෝග්‍යශාලා ලෙඩුන් සූරාකන තත්ත්වයක් තිබෙනවා. මම මීට පෙරත් මේ කාරණය ගැන පාර්ලිමේන්තුවේදී කිව්වා. ඇපලෝ රෝහලට හෘදය රෝගියෙක් ඇතුළත් වෙලා දවස් කීපයකට පසුව ඒ රෝගියා මිය ගියා. ඔහුට ප්‍රතිකාර සඳහා රුපියල් ලක්ෂ 9ක් විතර වැය වී තිබුණත් ඉන් පසු ඒ මෘත දේහය ලබා දීමට ඒ රෝහලෙන් රුපියල් ලක්ෂ 16ක් ඉල්ලා, එය ලබා දෙන තුරු මෘත දේහය නොදී සිටින තත්ත්වයක් තිබුණා. ඒ නිසා මේ පනත් කෙටුම්පත තුළ අනිවාර්යයෙන්ම පෞද්ගලික ආරෝග්‍යශාලා නියාමනය කිරීමේ රෙගුලාසි අඩංගු විය යුතුයි. මොකද, පෞද්ගලික ආරෝග්‍යශාලා තුළින් ජනතාවට විශාල අපහසුතාවන් විදින්නට වෙනවා. මම හිතනවා ඉදිරියේදී ගරු සෞඛ්‍ය ඇමතිතුමා ඒ පිළිබඳව යම් කිසි ක්‍රමවේදයක් සකස් කරයි කියලා.

විශේෂයෙන් මම ගරු සෞඛ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ මෙයයි. අපි මේ පනත් කෙටුම්පත සම්මත කර ගැනීමෙන් බලාපොරොත්තු වන්නේ, -මම මුලින් කිව්වා වාගේ- ජනතාවට ගුණාත්මකභාවයන් යුතු බෙහෙත් ද්‍රව්‍ය ලබාදීලා, මේ රටේ ජනතාවට හොඳ සෞඛ්‍ය සේවාවක් ලබා දීමයි.

රුපියල් කෝටි 13,500ක් කියන්නේ විශාල මුදලක්. මම හිතනවා, ඉදිරි වර්ෂවලදී අපේ රජය තුළින් නිදහස් සෞඛ්‍ය සේවය සඳහා මීට වැඩි මුදලක් වෙන් කරයි කියලා. ඒ විධියට අති විශාල මුදලක් වෙන් කරලා අපේ ග්‍රාමීය රෝහල්වල තිබෙන අඩු පාඩු ඉවත් කළ යුතුයි. විශේෂයෙන්ම ගරු ටී.බී. ඒකනායක මන්ත්‍රීතුමා කිව්වා වාගේ පොල්පිතිගම වාගේ රෝහල්වල තිබෙන අඩු පාඩු නැති කළ යුතුයි. ඒ වාගේම රටේ තිබෙන සෑම රෝහලකම බෙහෙත් ගබඩා කිරීම නිසි පරිදි සිදු කළ යුතු වෙනවා. අපි දැකලා තිබෙනවා රෝහල්වල ගමන් කරන කොරිඩෝවල පවා බෙහෙත් තැන්පත් කරලා තිබෙන බව. එවැනි තත්ත්වයන් තුළ බෙහෙත්වල ගුණාත්මකභාවය අඩුවීම වළක්වන්නට බැහැ. අපි මේ පනත් කෙටුම්පත සම්මත කර ගැනීමෙන් බලාපොරොත්තු වන්නේ ජනතාවට ප්‍රතිලාභ ලබා දීම නම්, ඒ කාරණය ඉටු විය යුතු බව ප්‍රකාශ කරමින්, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[පි.ප. 5.57]

ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා (නියෝජ්‍ය කාරක සභාපතිතුමා)

(மாண்புமிகு முருகேசு சந்திரகுமார் - குழுக்களின் பிரதித் தவிசாளர்)

(The Hon. Murugesu Chandrakumar - Deputy Chairman of Committees)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, தேசிய மருந்துகள் ஒழுங்குபடுத்தும் அதிகாரசபைச் சட்டமூல விவாதத்திலே உரையாற்ற நேரம் கொடுத்தமைக்காக நான் உங்களுக்கு நன்றி தெரிவிக்கின்றேன். உண்மையிலே இது எவ்வளவோ காலத்துக்கு முன்பு கொண்டுவந்திருக்கப்பட வேண்டிய ஒரு சட்டமூலமாகும். இப்பொழுது காலந்தாழ்த்தியாவது இந்த விடயத்தைப் புதிய அரசு தனது 100 நாள் வேலைத்திட்டத்துக்குள் உள்வாங்கிக்கொண்டதையிட்டு சம்பந்தப்பட்ட அமைச்சர் மாண்புமிகு ராஜித சேனாரத்ன அவர்களுக்கு எனது பாராட்டுக்களைத் தெரிவிக்க விரும்புகின்றேன்.

இந்தச் சட்டமூலம் நிறைவேற்றப்படுவதனால் பயனடையப்போவது இந்த நாட்டிலே வாழும் ஏழை மக்கள்தான்! ஒவ்வொரு குடும்பமும் அவர்களது மருத்துவ செலவுக்காகப் பாரிய தொகையினை ஒதுக்கவேண்டி யிருக்கின்றது. இன்றைய காலகட்டத்தில் மருத்துவ செலவுகள் அதிகரித்துச்செல்கின்ற நிலைமையில் இந்தச் சட்டமூலம் ஏழை மக்களுக்கு ஆறுதல் அளிக்குமென்று நான் நம்புகின்றேன். ஏனெனில், இலவச மருத்துவமானது இன்று வியாபார மாக்கப்பட்ட நிலைமையைப் பார்க்கின்றோம். பல்தேசியக் கம்பனிகள் இந்த விடயத்தில் அவற்றின் நலன்களுக்காக அதிகாரத்தில் இருப்பவர்களிடம் ஆதிக்கம் செலுத்தி பெருந்தொகையான பணத்தினைக் கொள்ளையடிக்கின்ற நிலைமையினால் இலவச மருத்துவம் கேள்விக்குறியாகி யிருக்கின்றது. அந்த வகையில், இந்த விடயத்தில் பல்தேசியக் கம்பனிகளைக் கட்டுப்படுத்தி மக்கள் நியாயமான விலையில் மருந்துகளையும் வேறு மருத்துவ உபகரணங்களையும் பெறக்கூடிய சூழலை ஏற்படுத்துவதற்கு இந்தச் சட்டமூலம் வழிவகுத்திருப்பது பாராட்டக்கூடியது.

இந்தச் சட்டமூலத்தைக் கொண்டுவருவதற்காக அன்று தான் எதிர்நோக்கிய நெருக்கடிகள் பற்றி மேதகு ஜனாதிபதி அவர்கள் இன்று இதற்கான விவாதத்தை ஆரம்பித்து உரையாற்றும்போது குறிப்பிட்டார். அத்தகைய நெருக்கடிகளைக் கடந்து இப்பொழுது இந்தச் சட்டமூலம் அவசரமாகப் பாராளுமன்றத்திற்கு கொண்டுவரப்பட்டிருக் கின்றது. காலத்துக்குக் காலம் இந்த விடயம் பற்றிப் பேசப்பட்டு வந்தாலும் குறிப்பாக மாண்புமிகு நிமல் சிறிபால த சில்வா அவர்கள் சுகாதார அமைச்சராக இருந்த காலத்திலும் தற்போதைய ஜனாதிபதி அவர்கள் சுகாதார அமைச்சராக இருந்த காலகட்டத்திலும் இச்சட்டமூலத்தைப் பாராளுமன்றத்தில் சமர்ப்பிக்க முடியாமல்போனது. இப்போது மாண்புமிகு அமைச்சர் ராஜித சேனாரத்ன அவர்கள் அந்தப் பொறுப்பை எடுத்திருப்பதன் பின்னர்தான் இதில் இருக்கக்கூடிய சவால்களை எங்களால் புரிந்துகொள்ள முடிகின்றது.

மக்களுக்கு நன்மை பயக்கக்கூடிய இதுபோன்ற பல சட்டமூலங்களை நிறைவேற்றாமல் காலத்தை இழுத்தடிப்பது மக்களுக்குச் செய்யும் மிகப் பெரிய துரோகமாகும் என்றுதான் நான் நினைக்கின்றேன். பந்தயக் கார்களை வரிச் சலுகைக்கு ஊடாக இறக்குமதி செய்வதற்கு இந்தப் பாராளுமன்றத்திலே அவசர அவசரமாகச் சட்டமூலங்கள் கொண்டுவரப் பட்டிருக்கின்றன. ஆனால், மக்களுக்கு நன்மை பயக்கும் இவ்வாறான திட்டங்களைச் செயற்படுத்துவதற்கு இன்று எவ்வளவோ சவால்கள் இருப்பதை நாங்கள் பார்க்கின்றோம்.

இன்று பெரும்பாலான அரச வைத்தியசாலைகள் நவீன உபகரணங்கள், நல்ல நிபுணத்துவம் பெற்ற மருத்துவர்கள் மற்றும் வசதிகளுடன் இயங்கினாலும் ஏழை மக்களுக்கு அவற்றின்மூலம் நன்மை கிடைப்பது அரிதாகவே இருக்கின்றது. இன்று தனியார் வைத்தியசாலைகளில் சிகிச்சை பெற்றால்தான் நோயைக் குணப்படுத்தலாம் என்ற ஒரு வகையான உணர்வு மக்களுக்கு மத்தியில் காணப்படுகின்றது. எவ்வளவு ஏழைகளாக இருந்தாலும் அவர்கள் தங்களது நோயை விரைவாகக் குணப்படுத்தவேண்டும் என்ற நோக்கத்துக்காக அதிக தொகையினை அந்த வைத்தியத்துக்காகச் செலவு செய்கின்றார்கள். எனவே, இலவச மருத்துவமானது நியாயமாக மக்களைச் சென்றடைவது உறுதிப்படுத்தப்பட வேண்டும். மிகுந்த சவால்கள் இருந்தபோதிலும் மாண்புமிகு சுகாதார மற்றும்

சுதேச மருத்துவ அமைச்சர் அவர்கள் இந்தச் சட்டமூலத்தை நிறைவேற்றி நடைமுறைப்படுத்த வேண்டும் என்பதை நான் இங்கு வலியுறுத்துகின்றேன்.

அண்மைக் காலமாகப் புற்றுநோய், இருதயக் கோளாறு போன்ற நோய்களுக்கான வைத்தியச் செலவு மிகவும் அதிகமாக இருக்கின்றது. இன்று புற்றுநோய் ஆஸ்பத்திரிகளை நாங்கள் உருவாக்கினாலும் இருதயச் சிகிச்சைக்காகப் பல ஆஸ்பத்திரிகள் மற்றும் பல நிபுணர்கள் இருந்தாலும்கூட இந்த நோய்களைக் குணப்படுத்துவதற்கு மக்கள் ஏராளமான நிதியைச் செலவு செய்ய வேண்டிய துர்ப்பாக்கிய நிலைமை இருக்கின்றது. ஆகவே, அந்த நிலைமைகளைப் மாற்றுவதற்கும் மாண்புமிகு அமைச்சர் அவர்கள் நடவடிக்கை எடுக்க வேண்டும்.

இந்தப் புதிய அரசு அதிகாரத்துக்கு வந்தபின்பு பல முக்கிய சட்டமூலங்கள் இந்தப் பாராளுமன்றத்திலே எல்லோருடைய ஆதரவுடனும் நிறைவேற்றப்பட்டிருக்கின்றன. குறிப்பாக ஒதுக்கீட்டுச் சட்டமூலம், புகையிலை மற்றும் மதுசாரம் மீதான தேசிய அதிகாரசபைச் சட்டமூலம், கடற்றொழில், நீர்வாழ் உயிரின வளங்கள் சட்டமூலம் போன்றவற்றைக் குறிப்பிடலாம். இன்று தேசிய மருந்துகள் ஒழுங்குபடுத்தும் அதிகாரசபைச் சட்டமூலம் இந்த அவையிலே விவாதத்துக்கு எடுக்கப்பட்டிருக்கின்றது. அதனை இந்தச் சபையிலுள்ள எல்லோரும் ஒன்றுகூடி ஒரேகுரலில் ஆதரித்து நிறைவேற்றுவதற்கு முன்வந்திருக்கின்றார்கள். இந்த ஒத்துழைப்பானது எல்லா விடயங்களிலும் இருக்குமானால் நாட்டில் பல பிரச்சினைகளுக்கு விரைவில் தீர்வு கண்டுவிடலாம். இந்தப் பாராளுமன்றம் மற்றைய விடயங்களில் ஒற்றுமையாக இருப்பதுபோன்று, இந்த நாட்டில் நீண்ட காலமாகத் தீராத பிரச்சினையாக இருக்கின்ற தமிழ் மக்களின் பிரச்சினையைத் தீர்ப்பதற்கும் அவர்களது அடிப்படைக் கோரிக்கைகளை நிறைவேற்றுவதற்கும் இந்த ஒற்றுமையான சூழலைப் பயன்படுத்திக்கொள்ள முடியும் என்று நான் கருதுகின்றேன்.

மாண்புமிகு அமைச்சர் அவர்களுக்கு நான் இந்தச் சந்தர்ப்பத்திலே இன்னுமொரு முக்கியமான விடயத்தையும் தெரிவிக்க விரும்புகின்றேன். அதாவது, வைத்தியர்களால் வழங்கப்படும் மருந்துச் சிட்டைகளில் - prescription - அதிகமானவை கிறுக்கிய எழுத்துகளைக் கொண்டதாகத்தான் இருக்கின்றன. அவற்றை நோயாளிகள் மாத்திரமல்ல, பல மருந்தகங்களிலே இருக்கின்ற மருந்தாளர்கள் - pharmacists - கூட விளங்கிக்கொள்ள முடியாத நிலைமை இருக்கிறது. எனவே, அது கணினிமயப்படுத்தப்பட வேண்டும். வெளிநாடுகளில் அந்தச் சிட்டை கணினிமயப்படுத்தப் பட்டதாக இருப்பதை நாங்கள் பார்க்கின்றோம். அதாவது, அந்தச் சிட்டையில் மருந்துக்குரிய எல்லா விபரங்களும் தெளிவாக இருக்கும். ஆனால், இங்கே அப்படி அல்ல. ஆகவே, இந்த முறைமையை இலங்கையிலும் கொண்டுவருவதற்குரிய நடவடிக்கைகளை எடுக்க வேண்டும் என்பதையும் நான் இங்கு வலியுறுத்துகின்றேன்.

இன்று பல மருந்தகங்களிலே pharmacist பயிற்சி முடித்துச் சான்றிதழ் பெற்றவர்கள் இருப்பதில்லை. குறிப்பாக, எங்களது பிரதேசங்களில் - வட பகுதியிலே பல pharmacy களில் pharmacist அனுமதிப்பத்திரம் இல்லாதவர்கள் வேலை செய்வதை நாங்கள் அவதானிக்கின்றோம். இதனால், தவறான மருந்துகள் நோயாளிகளுக்கு விநியோகிக்கப்படக்கூடிய ஒரு துர்ப்பாக்கிய நிலைமை அங்கு இருக்கின்றது. ஆகவே, pharmacist களால் மட்டுந்தான் மருந்து விநியோகம் செய்ய முடியுமென்ற இறுக்கமான சட்ட நடைமுறைகள் பின்பற்றப்பட வேண்டும் என்பதை நான் வலியுறுத்துகின்றேன்.

உண்மையிலே ஒவ்வொரு மருந்துக்குரிய விலை ஒவ்வொரு இடத்திலும் ஒவ்வொரு விதமாக இருக்கின்றது. சில இடங்களிலுள்ள pharmacyகளுக்குப் போனால், "உங்களுக்கு உள்ளூர் மருந்து வேண்டுமா? அல்லது வெளிநாட்டிலிருந்து இறக்குமதி செய்யப்பட்ட மருந்து வேண்டுமா" என்று அவர்கள் கேட்கின்றார்கள். உள்ளூர் மருந்து என்றால் விலை குறைவென்றும் வெளிநாட்டிலிருந்து இறக்குமதி செய்யப்பட்ட மருந்து என்றால் விலை அதிகம் என்றும் சொல்லப்படுகின்றது. மருந்தில் என்ன வேறுபாடு என்று எனக்குத் தெரியவில்லை. வியாபார நோக்கத்துக்காக அவர்கள் தாங்களே விலைகளை நிர்ணயித்துக்கொள்ளும் நிலைமையைப் பார்க்கின்றோம். இது நியாயமற்றது.

பல அரச மருத்துவமனைகளில் குறிப்பிட்ட சில நோய்களுக்கு மட்டுந்தான் மருந்துகள் இருக்கின்றன. ஏனைய மருந்துகளை வெளியில் வாங்கிப் பயன்படுத்த வேண்டு மென்று அரச வைத்தியசாலைகளில் கடமையாற்றுகின்ற வைத்தியர்களால் நோயாளிகளுக்கு அறிவுறுத்தல் வழங்கப்படுகின்றது; இது நியாயமற்றது. இலவச வைத்தியம் என்று சொன்னால், அது விலை அதிகமான மருந்தாக இருந்தாலும், அதுவும் அங்கு வழங்கப்படவேண்டும்; அந்த நடைமுறை கொண்டுவரப்படவேண்டும். இன்று பல பல்தேசியக் கம்பனிகள் மருந்துகளுக்கான விலைகளைத் தாமே நிர்ணயித்து, பணத்தைக் கொள்ளையடிக்கும் நிலைமையை மாற்றி, அரச இலவச வைத்தியசாலைகளை நோயாளிகள் அதிகம் பயன்படுத்தும் ஒரு நடைமுறையை இந்த நாட்டிலே அறிமுகப்படுத்தவேண்டும். ஏனென்றால், இலவச வைத்திய சேவை என்பது உலகத்தில் எல்லா நாடுகளிலும் கிடைப்பதில்லை. இலங்கை போன்ற மூன்றாம் உலக நாடுகளில் - வறுமைக்கோட்டின்கீழ் வாழும் அதிக மக்கள் தொகையைக் கொண்ட நாடுகளில் - இலவச வைத்திய சேவையை நம்பித்தான் அதிகமான மக்கள் இருக்கின்றார்கள். ஆனால், இன்று தனியார் வைத்தியசாலைகள் மிகவும் வேகமாக வளர்ந்துகொண்டு செல்லும் நிலைமையே காணப்படுகின்றது.

சில மருத்துவர்கள் இலாபம் ஈட்டும் நோக்கில், இலவச வைத்தியம் பெறவரும் நோயாளிகளை தனியார் மருத்துவ மனைக்கு வருமாறு தூண்டுகின்றார்கள்; அங்குதான் நல்ல சிகிச்சை அளிக்கமுடியும் என்ற நம்பிக்கையை ஊட்டுகின்றார்கள். நான் இங்கு எல்லா மருத்துவர்களையும் குறைகூற விரும்பவில்லை. சில வைத்தியர்கள் இதன்மூலம் சம்பாதிக்க முனைகின்றார்கள். இந்த நிலைமைகள் மாற்றப்படவேண்டும். அரச மருத்துவமனைகளில் வைத்தியம் செய்யும் வைத்தியர்கள் தனியார் வைத்தியசாலைகளில் சேவையில் ஈடுபடுவதைத் தடுக்க முடியாவிட்டாலும், ஏதாவது கட்டுப்பாடான பொறிமுறையொன்று இருக்கவேண்டும். ஏனென்றால், சில வைத்தியர்கள் அரச மருத்துவமனைகளில் வைத்திய சேவையை வழங்கவேண்டிய நேரங்களில் தனியார் வைத்தியசாலைகளில் பணிபுரிவதை நாங்கள் பார்க்கக் கூடியதாக இருக்கின்றது. இது மிகவும் சவாலான விடயமென்று எனக்குத் தெரியும். ஆனால், இலவச வைத்தியமானது எல்லா மக்களுக்கும் சென்றடைவதை உறுதிப்படுத்தவேண்டிய பொறுப்பு சுகாதார அமைச்சுக்கு இருக்கின்றது. எனவே, அதைத் திறம்படச் செய்யவேண்டும் என்பதை நான் இங்கு வலியுறுத்தி, எனக்குச் சந்தர்ப்பம் அளித்தமைக்கு மீண்டும் நன்றி கூறி, விடைபெறுகின்றேன். நன்றி, வணக்கம்.

[අ.භා. 6.09]

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ ඉතාම වැදගත් වූ පනත් කෙටුම්පත සම්මත කරන්න සහාය ලබා දෙමින් කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මම විශේෂයෙන්ම සතුටු වනවා. ජාතික ඖෂධ ප්‍රතිපත්තියට අනුව ජාතික ඖෂධ නියාමන අධිකාරිය පිහිටුවීම සහ ඒ හා සම්බන්ධ වැදගත් තීන්දු රාශියක් අද දවසේදී ගන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය කාලයේ විවිධ අවස්ථාවලදී ඖෂධ පිළිබඳව අපි කථා කළා. සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේදී දිගින් දිගටම අපි මේවා සම්බන්ධව කථා කළාම අවසානයේ ඒ විෂය භාර අමාත්‍යවරයා සහ ඒ නිලධාරින් "මේ නිසා තමයි අපි කියන්නේ ජාතික ඖෂධ ප්‍රතිපත්තියක් හදන්න ඕනෑ කියලා" කියන තැනට ඇවිල්ලා නවතිනවා. ඒ වාගේම වෛද්‍ය උපකරණ සම්බන්ධයෙන්, බලපත්‍ර ලබා දීම සම්බන්ධයෙන්, ඖෂධ ආනයනය කිරීම සම්බන්ධයෙන්, සායනික පරීක්ෂණ පැවැත්වීම සම්බන්ධයෙන් රටේ විශාල ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. විවිධ ප්‍රදේශවල සිදු වන මේ ගැටලුකාරි තත්ත්වයන් අපි ජනමාධ්‍ය තුළින් විටින් විට දකිනවා. සමහර වෛද්‍යවරුන් ඔවුන්ට අදාළ නැති වෛද්‍ය ප්‍රතිකාර ලබා දෙන්න යනවා. ඒ වාගේම එවැනි සායනික මධ්‍යස්ථාන පවත්වාගෙන යනවා. මේවා සම්බන්ධව නියාමන ක්‍රමවේද තිබුණේ නැති නිසා විශාල වශයෙන් ජනතාවයි අපහසුතාවට පත් වුණේ. ජනතාව තමයි දුක් වින්දේ. මේ රටේ අහිංසක ජනතාව වෙනුවෙන් මේ උත්තරීතර පාර්ලිමේන්තුව තුළ අද මේ ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත සම්මත කරන්න ලැබීම ඔවුන් ලබපු විශාල භාග්‍යයක් හැටියටයි මම දකින්නේ.

ඖෂධ වෙළඳාම ලෝකයේ තිබෙන ප්‍රධානම වෙළඳාම් අතරින් එකක්. මෙහි විශාල මාෆියාවක් තිබෙනවා. ඒක කාටවත් නැහැ කියන්න බැහැ. මේ පනත් කෙටුම්පත් ගෙනෙන්න මෙපමණ ප්‍රමාද වුණේ ඇයි? මේ තත්ත්වය තේරුම් ගත්ත මහජන නියෝජිතයෝ පසු ගිය කාලයේ හිටියේ නැද්ද? මේ තත්ත්වය තුළ අපේ රටේ ජනතාව අසරණ වෙනවා, ජනතාව දුක් විඳිනවා, අපි රටක් හැටියට ආපස්සට යනවා කියලා දැන ගත්ත, අවබෝධ කර ගත්ත මහජන නියෝජිතයෝ හිටියේ නැද්ද? හිටියා. හැබැයි, ඒ අයට මේ පිළිබඳව තීන්දු තීරණ ගන්න බැරි වුණා. 1966 දී තමයි මූලික වශයෙන්ම මේ යෝජනාව එන්නේ. ඖෂධවේදියෙකු වාගේම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ පීඨාධිපති වශයෙන් කටයුතු කළ මහාචාර්ය සේනක බිබිලේ මැතිතුමාට අපි විශේෂයෙන් ගරු කරන්න ඕනෑ. එතුමා මේ පිළිබඳව පළමුවෙනි වාර්තාව එළිදක්වලා, මේ පිළිබඳව ප්‍රථම වතාවට ලංකාව තුළ හඬක් නැඟුවා. ඊට පසුව වෛද්‍ය එස්.ඒ. වික්‍රමසිංහ මැතිතුමාත් සමඟ එකතු වෙලා මේ පිළිබඳව විශාල වැඩ පිළිවෙළක් දියත් කළා. 1970දීත් මේ පිළිබඳව කථා කළා. හැබැයි, අපි දන්නවා 1978 එක්සත් ජාතික පක්ෂ රජයේ විවෘත ආර්ථික ප්‍රතිපත්තියත් එක්ක ඒවා ඔක්කෝම සම්පූර්ණයෙන්ම වළ දැමුවා කියලා. ඒකත් අපි මතක් කරන්නට ඕනෑ. දිගින් දිගටම මේ පිළිබඳව සාකච්ඡා කර ගෙන ඇවිල්ලා, වර්තමාන අතිගරු ජනාධිපති, හිටපු සෞඛ්‍ය අමාත්‍ය මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා 2011 ඉඳලා 2015 වෙනකම් මේ වෙනුවෙන් විශාල අරගළයක්, සටනක් ගෙන ගියා. එතුමා යම් යම් අවස්ථාවල දැඩි පීඩනයන්ට ලක් වෙනවා අපි දැක්කා. එතුමා දැඩි අභියෝගවලට ලක් වුණා.

මීට සතියකට පමණ පෙර අපි සම්මත කරපු දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (සංශෝධන) පනතට අනුව දුම්වැටි අඩංගු ඇසුරුම්වල සෞඛ්‍යමය රූපමය අවවාද ඇතුළත් කිරීමට යෑමේදී තිබුණු අභියෝග, ඒ වාගේම මේ ඖෂධ පනත ගෙන ඒම සම්බන්ධයෙන් තිබුණු අභියෝග අපි දැක්කා. ඇත්තෙන්ම එවැනි අභියෝග ආවේ මේවා පිටුපස පැහැදිලිවම මුදල් ගනුදෙනු රාශියක් සිදු වුණු නිසායි. මේවා පිළිබඳව විශාල මාෆියාවක් තිබුණා. මේ තුළ විශාල වශයෙන් ජාවාරම්කරුවන් ව්‍යාප්ත වෙලා සිටියා. දේශීය වශයෙන් විතරක් නොවෙයි විදේශීය වශයෙනුත් යම් පුද්ගලයින් මේවාට සම්බන්ධ වෙලා ඉන්න බව අපි දන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාව එක දවසකට රුපියල් කෝටි 40ක ඖෂධ මිලදී ගන්නවා. අපි වැඩියෙන්ම ඖෂධ මිලදී ගන්නේ දියවැඩියාව රෝගය සඳහායි. අද අපේ රටේ අංක එකට ඖෂධ භාවිත කරන්නේ දියවැඩියාව සඳහායි. ඊළඟට අධි රුධිර පීඩනය සඳහායි. ඒ කියන්නේ හෘදය රෝග සම්බන්ධවයි. දෙවැනි තැනට වැඩිම ඖෂධ පාවිච්චි කරන්නේ ඒ වෙනුවෙනුයි. ඊළඟට වැඩිම ඖෂධ භාවිත කරන්නේ රූපලාවණ්‍ය හා ඒ ආශ්‍රිත කටයුතු වෙනුවෙනුයි. මෙපමණ වැය බරක් දරලාත් ඔවුන් බලාපොරොත්තු වන ආකාරයේ ඖෂධ ලබා ගැනීමට හැකියාවක් ලැබුණේ නැහැ.

අපේ රටට ඖෂධ ගෙන ඒමේදී වැඩියෙන්ම ගෙනැල්ලා තිබෙන්නේ කල් ඉකුත් වීමට ආසන්න ඖෂධයි. මම උදාහරණයක් හැටියට කියන්නම්, පසු ගිය අවුරුදු 6ක කාලය තුළදී කල් ඉකුත් වීමට ආසන්න ඖෂධ මෙට්‍රික් ටොන් 19,000ක් ගෙනැල්ලා තිබෙනවා. මේ කල් ඉකුත් වූ බෙහෙත් විනාශ කරන්නේ පුත්තලමේ හෝල්සිම් කියන සිමෙන්ති කර්මාන්තශාලාවේයි. පසු ගිය අවුරුදු 6ක කාලය තුළ පමණක් මෙට්‍රික් ටොන් 19,000ක් කල් ඉකුත්වීමට ආසන්නව තිබුණු ඖෂධ අපේ රටට ගෙනාව නිසා ඒවා විනාශ කරන්නට සිදු වුණා. බෙහෙත්වල මිලට අමතරව මේ බෙහෙත් විනාශ කිරීම සඳහා පමණක් රජය රුපියල් 2,230,825ක් වියදම් කළා. මේවා ජාතික අපරාධ. මේ තීන්දු තීරණ නිවැරදිව නොගැනීම නිසා අපේ රටේ ජාතික ආර්ථිකයට මොන තරම් පහරක් වැදිලා තිබෙනවාද?

බාල ඖෂධ ගැන කථා කිරීමේදී, අපි විශේෂයෙන්ම ස්තුතිවන්ත වන්නට ඕනෑ අපේ රටේ මාධ්‍යයට. මොකද, මේ බාල ඖෂධ ගෙනැල්ලා ඒවා පාවිච්චි කිරීම ගැන, වැරදි විධියට රෝගීන්ට ඖෂධ ලබා දීලා ඔවුන් මිය යන ආකාරය ගැන, ඒ වාගේම ඔවුන් ප්‍රශ්නවලට, ගැටලුවලට මුහුණ දෙන ආකාරය ගැන මාධ්‍ය තුළින් අපේ අවධානය වැඩි කළා. වැරදි ආකාරයට ඖෂධ පාවිච්චිය නිසා අපේ රටේ එක අවුරුද්දකට 10,000කට වැඩි පිරිසක් රෝහල්ගත කරනවා. වැරදි ආකාරයට ඖෂධ පාවිච්චිය නිසා සිය දෙනෙක්වත් ජීවිතක්ෂයට පත් වෙනවා. හැබැයි, අපට මේ ගණන් හිලවු එන්නේ නැහැ. රෝහල් ගත වුණාම දන්නවා, වැරැදි ආකාරයට බෙහෙත් පාවිච්චි කර, වැරැදි නිර්දේශ මත බෙහෙත් දීලා, වෛද්‍යවරයෙකුගේ අඩු පාඩුවක් නිසා හෝ බෙහෙත්වල අඩු පාඩුවක් නිසා බව. රෝහල් ගත වුණාම ඔවුන් ගණනය වෙනවා. හැබැයි, එහෙම වන්නේ නැතිව ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මොන තරම් රෝග ප්‍රමාණයක් නිදන් තත්ත්වයේ තිබෙනවාද? ඒ රෝග නිදන් වෙලා. ඒ රෝග ලක්ෂණ පහළ වෙන්නේ තවත් අවුරුදු 5කින් නැත්නම් අවුරුදු 10කින්. එතකොට මොකක්ද වුණේ කියා දන්නේ නැහැ. මොන ආකාරයෙන් ද ජීවිතක්ෂයට පත් වුණේ -මිය ගියේ- කියා දන්නේ නැහැ. මේ වාගේ ප්‍රශ්න ගණනාවක් තිබෙනවා.

පසු ගිය කාලයේ අපේ රටට බාල වර්ගයේ ඖෂධ ගෙනාපු ආයතන ගණන 74යි. නමුත් කියන්න කනගාටුයි, ඒකෙන් ආයතන 5ක් විතරයි තහනම් කරන්න කටයුතු කර තිබෙන්නේ. සමහර අය කිව්වා, "මේ පනතේ අඩු පාඩු ගොඩාක් තිබෙනවා" කියා. මේක පුළුල්ව කථා කරන්න ඕනෑ. හැබැයි, අපි කථා කර කර හිටියොත් මේ කරන වැඩ ටිකවත් කරන්න හම්බ වෙන්නේ නැහැ. ගමේ කථාවක් තිබෙනවා, සියලුම දේවල් සම්පූර්ණ කර

විවාහ වෙන්න යනකොට එයා වයසට ගිහිල්ලා ඉවරයි කියා. ඒ නිසා කොහොම හරි විවාහ වෙලා ඊට පස්සේ එකින් එක, එකින් එක අඩු පාඩු හදාගෙන යන එක තමයි හොඳම ක්‍රමය වන්නේ. ඒ නිසා මේ පනතේ යම් යම් අඩු පාඩු තිබෙනවා නම් අපට පුළුවන් පාර්ලිමේන්තුවට නැවත සංශෝධන ගෙනෙන්න. ඒ වෙනුවෙන් පුළුල් දැක්මක් තිබෙන විෂය භාර අමාත්‍යවරයෙක් සිටිනවා. එතුමා ඒ පිළිබඳව විශේෂයෙන්ම අවධානය යොමු කර තිබෙනවා.

මම කියාගෙන ආවේ ශක්තිජනක ආහාර, පෝෂ්‍ය ආහාර, විටමින්, වේ ප්‍රෝටීන් වාගේ ඒවා ගැනයි. ඒවා නියාමනය වන ක්‍රමයක් අපේ රටේ තිබුණේ නැහැ. පාසල් දරුවෝ, සමහර ක්‍රීඩා උපදේශකවරු, ක්‍රීඩා පුහුණුකරුවන් විටමින් වර්ග, වේ ප්‍රෝටීන් වර්ග පාවිච්චි කිරීම සම්බන්ධව වෛද්‍යමය වශයෙන් ඔවුන් දැනුවත් නැහැ. මේවා පාවිච්චි කිරීම නිසා සමහර ක්‍රීඩකයන්ගේ දක්ෂතාවයන් වැළලී යනවා. එවැනි තත්ත්වයන් අපි දැක තිබෙනවා. ඒ සම්බන්ධව ගරු සෞඛ්‍ය අමාත්‍යතුමාගේ අවධානය යොමු කරනවා. විශේෂයෙන්ම තහනම් උත්තේජක සම්බන්ධයෙන් ක්‍රීඩා අමාත්‍යාංශය වෙනමම වැඩ පිළිවෙළක් ගෙන යනවාට වඩා එය නියාමනය කිරීමේ කටයුත්ත මේ පනත යටතේම ක්‍රියාත්මක කිරීම තුළින් අපේ දක්ෂතා ඇති ක්‍රීඩකයන්ගේ අනාගත සිහින බොඳවීම වැළැක්වීමට අපට අවස්ථාවක් ලැබෙනවයි කියන එක ඉතාම ගෞරවයෙන් යුතුව මතක් කරන්න ඕනෑ.

මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා කිව්වා, "මෙතෙක් කල් කර ගන්න බැරි වුණු, අපේ රටේ ජනතාව වෙනුවෙන් නීතිමය වශයෙන් ගත යුතු යම් යම් තීන්දු තීරණ, පාර්ලිමේන්තුවේ සම්මත කර ගත යුතු ඒ පනත් කෙටුම්පත් සඳහා කැපවීමක් කරනවා" කියා. ඒක අද යථාර්ථයක් බවට පත්වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මේ වේලාවේදී අපි එතුමාට ස්තුතිවන්ත විය යුතුයි. මොකද, අද එතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා ආරම්භක වශයෙන් මේ පිළිබඳව කථා කර මේ කටයුතු ඉදිරියට ක්‍රියාත්මක කර ගන්න අවශ්‍ය නායකත්වය ලබා දෙනවා. විෂය භාර ගරු රාජිත සේනාරත්න අමාත්‍යතුමා, අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය සමඟ එකතු වෙලා ඉතාම කෙටි කාලයක් තුළ -මේවා හදිසි පනත් කෙටුම්පත් කියා විවේචනය කළාට අපි දන්නවා, දීර්ඝ කාලයක් තිස්සේ සාකච්ඡා කරපු දෙයක් බව.- ඉතාම යුහුසුළුව ජනතාව වෙනුවෙන්, රට වෙනුවෙන් මේ පනත ගෙන ඒම සම්බන්ධව අපි ස්තුතිවන්ත වෙනවා. සමහර අය කියන්නේ මහාචාර්ය සේනක බිබිලේ මැතිතුමාගේ අදහස, එතුමා එදා කළ නිර්දේශ, එතුමාගේ වාර්තාව එහෙම පිටින් මේකේ ඇතුළත් කර නැහැ කියා. එහෙම ඇතුළත් කරන්න බැහැ. එහෙම ඇතුළත් කරන්න බැරි වෙනත් හේතුවක් නිසා නොවෙයි. 1966 හිතපු විධියට නොවෙයි, 1970 හිතපු විධියට නොවෙයි, 1980 හිතපු විධියට නොවෙයි අද ඒ විවිධ ක්ෂේත්‍රයන්හි තත්ත්වයන් වෙනස් වෙලා තිබෙනවා. එදා ඖෂධ භාවිත කරපු ප්‍රමාණයට වඩා, එදා අපේ රටේ තිබුණු රෝගී තත්ත්වයන්ට වඩා වෙනස් තත්ත්වයන්, ඒ ඖෂධ භාවිතය නිසා වෙනස් තත්ත්වයන් ඇති වෙලා තිබෙනවා. ඒකට අනුව තමයි මේ පනත සකස් විය යුත්තේ.

කවුරුන් හෝ කෙනකු කියනවා නම් "සේනක බිබිලේ, සේනක බිබිලේ කියා කිව්වාට මේක සේනක බිබිලේගේ ම එකක් නොවෙයි." කියා, අපි එය පිළිගන්නවා. අපි එය පිළිගන්න ඕනෑ. මොකද, මෙය මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා, රාජිත සේනාරත්න මැතිතුමා ඇතුළු විශාල කණ්ඩායමකගේ දායකත්වයෙන් ගෙන ආ එකක්. සේනක බිබිලේ මැතිතුමා විසින් ආරම්භ කරන ලද අඩි තාලමෙහි විවිධ හැඩ තලයන්ගෙන් යුතුව ගොඩනඟපු ගොඩනැඟිල්ලක් හැටියටයි අප මේ පනත් කෙටුම්පත දකින්න ඕනෑ. ඒ ගැන ඊර්ෂ්‍යාවෙන්, වෛරයෙන්, ක්‍රෝධයෙන් කතා කිරීම නොව මෙහි තිබෙන ජාතික වැදගත්කම පිළිබඳවයි කතා කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වෙලාවේ අප කියන්න ඕනෑ, පීඩනයට පත් වන, අපහසුතාවට පත් වන අපේ ජනතාව වෙනුවෙන් මේ ආකාරයේ තීන්දු තීරණ රාශියක් අප ගත යුතුව තිබෙනවා කියා. නමුත් අප ගමේ ගියාම අද සමහර අය අහන්නේ, "ඔබතුමන්ලා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවකට සහයෝගය දෙනවාද?" කියායි. අපි එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවකට සහයෝගය දෙන්නේ නැහැ. මේ ආණ්ඩුවේ ප්‍රධානියා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමායි. එක් පැත්තකින්, එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයා. ඒක වෙනම කථාවක්. එතුමාගේ යහපත් වූ වැඩ පිළිවෙළට අපි දායකත්වය ලබා දෙන්නේ එහි ප්‍රතිලාභය ජනතාවට යන නිසායි. ජනතාවට ප්‍රතිලාභයක් ලැබෙන ආකාරයට, ජනතාවගේ යහපත වෙනුවෙන් එහෙම කටයුතු කරන්නේ නැත්නම් අප මොන දේශපාලන පක්ෂය නියෝජනය කළත් ඒ මහ ජන නියෝජිතත්වයෙන් ඇති වැඩක් නැහැ කියන එක අපි මතක් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික ආණ්ඩුවක් පිළිබඳව කථා කරද්දී සමහර අයට ගැරඩියාට භූමි තෙල් දමනවා වාගෙයි. හැබැයි, අපි ජාතික ආණ්ඩුවකට කවදා හෝ යනවා නම් යන්න ඕනෑ ජාතික වැදගත්කමකින් යුතු ප්‍රශ්න ගණනාවක් මේ රටේ ජනතාව වෙනුවෙන් විසඳා දීම සඳහායි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන කථා කරද්දී, එකී ව්‍යවස්ථා සංශෝධනය මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන තනි පක්ෂයකට විතරක් කරන්න පුළුවන්ද කියා අප අහන්න කැමැතියි. කිසිදු පක්ෂයකට එහෙම කරන්න පුළුවන්ද? කිසිදු පක්ෂයකට එහෙම කරන්න බැහැ. මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම ගැනත් කථා කරනවා. මේ පාර්ලිමේන්තුව තුළ තනි පක්ෂයකට ඒක කරන්න පුළුවන්ද? එහෙම කරන්න බැහැ. පිටතින් එන මානව හිමිකම් අභියෝගවලදී වෙන්න පුළුවන්, විවිධ අවස්ථාවල ප්‍රශ්නවලට මුහුණ දුන් අපේ රටේ ජාතින් අතර සංහිඳියාව ඇති කිරීමේදී වෙන්න පුළුවන්, මේ වාගේ ජාතික වැදගත්කමකින් යුතු ප්‍රශ්නවලදී තීන්දු තීරණ ගන්න තනි දේශපාලන පක්ෂයකට හැකියාව ලැබෙන්නේ නැහැ. ඒ නිසා මේ රටේ සමස්ත දේශපාලන පක්ෂ එකතු වෙලා ජනතාව වෙනුවෙන් සහ රට වෙනුවෙන් තීන්දු තීරණ ගන්න ඕනෑ. ඒ ප්‍රබුද්ධ දේශපාලනයට අප වහ වහා ආ යුතුය කියන එක මා මේ වෙලාවේදී මතක් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. විශේෂයෙන්ම නැවත වතාවක් අපි ස්තුතිවන්ත වෙනවා, වර්තමාන අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ- [බාධා කිරීම්] අපේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට. [බාධා කිරීමක්] කලබල වෙන්න එපා. ඒ නම කියැවෙනවා. මොකද, අවුරුදු 10ක් තිස්සේ කියපු නම නේ එය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට වාගේම විෂය භාර අමාත්‍යතුමාටත්, මේ වෙනුවෙන් කැපවූ සියලු දෙනාටත් අපේ ගෞරවය පුද කරනවා. ගමෙන් ආපු මහ ජන නියෝජිතයන් හැටියට අපි අද බෙහෙවින් සතුටු වෙනවා, රටේ ජනතාව වෙනුවෙන් සම්මත කරන මෙවැනි පනත් කෙටුම්පතකට අවශ්‍ය සහයෝගය ලබා දෙන්න අවස්ථාව ලැබීම පිළිබඳව. බොහොම ස්තුතියි.

පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.

சட்டமூலம் இப்போது இரண்டாம் முறையாக மதிப்பிடப்பட வேண்டுமென்ற வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.

Question that the Bill be read a Second time put, and agreed to.
Bill accordingly read the Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය :

''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු රාජිත සේනාරත්න මහතා]

තීරමානිකප්පට්ටු.

"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன]

Resolved:

"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Rajitha Senaratne]

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)

(The Hon. (Dr.) Rajitha Senaratne)

කාරක සභා අවස්ථාව මාර්තු 6 වන සිකුරාදා දක්වා කල් තබනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

කාරක සභාව 2015 මාර්තු 06 වන සිකුරාදා පවත්වනු ලැබේ.

குழு, 2015 மார்ச் 06, வெள்ளிக்கிழமை நடைபெறும்.

Committee Stage on Friday, 06th March, 2015.

කල්තැබීම

ஒத்திவைப்பு

ADJOURNMENT

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)

(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

வினா எடுத்தியம்பப்பெற்றது.

Question proposed.

නියෝජ්‍ය කථානායකතුමා

(பிரதிச் சபாநாயகர் அவர்கள்)

(The Deputy Speaker)

මීළඟට, සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු අජිත් මාන්නප්පෙරුම මහතා. Before that, will an Hon. Member propose the Hon. Athauda Seneviratne to take the Chair?

ගරු පාඨලී චම්පික රණවක මහතා (විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා)

(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க - மின்வலு மற்றும் எரிசக்தி அமைச்சர்)

(The Hon. Patali Champika Ranawaka - Minister of Power and Energy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු අතාවුද සෙනෙවිරත්න මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අතාවුද සෙනෙවිරත්න මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அதாவுத செனெவிரத்ன அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. ATHAUDA SENEVIRATNE *took the Chair.*

මහජන මුදල් වංචා කළ අයට එරෙහිව පියවර

பொதுமக்களின் பணத்தை மோசடி செய்தோருக்கு எதிராக நடவடிக்கை

ACTION AGAINST PERPETRATORS FOR MISAPPROPRIATION OF PUBLIC FUNDS

[අ.භා. 6.26]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

(மாண்புமிகு அஜித் மான்னப்பெரும)

(The Hon. Ajith Mannapperuma)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පසු ගිය රාජ්‍ය පාලනයේ මහජන මුදල් දූෂණය හා වංචා කරමින් රට පරිහානියට පත් කළ බව වර්තමාන ආණ්ඩු පක්ෂය පුනපුනා එදා මැතිවරණ වේදිකාවේ කියා සිටියේය.

ඒ සම්බන්ධයෙන් කරුණු සොයා රටේ සිදුවූ මහජන මුදල් වංචා හා දූෂණයන් ජනතාවට හෙළි කර දූෂකයන්ට හා වංචාකාරයන්ට දඬුවම් කිරීම සම්බන්ධයෙන් දැනට රජය ගෙන ඇති හා ගෙන යන පියවර කුමක්ද? "

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම ක්‍රියාව සම්බන්ධයෙන් රජය ගෙන ඇති ක්‍රියා මාර්ග කඩිනම් කරන ලෙස මා මේ උත්තරීතර සභාවට යෝජනා කරමි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ යෝජනාව ගෙනෙන්න හේතු වුණු කරුණු කීපයක් තිබෙනවා. මෛත්‍රී - රනිල් සුසංයෝගයෙන් පත් වූ නව රජය පත් වෙලා දින කීපයක් යනකොටම මේ රටේ බඩු මිල අඩු කළ ආකාරය අපි දැක්කා. අත්‍යවශ්‍ය භාණ්ඩ 10ක මිල අඩු කරනවා කිව්වාට, භාණ්ඩ 13කම මිල අඩු කළා. ඒ අනුව ඩීසල්, පෙට්‍රල්, ගෑස් වැනි දේවල්වල මිල අඩු වුණා. රාජ්‍ය සේවකයින්ගේ පඩි වැඩි කළා. තවත් නොයෙකුත් ආහාර ද්‍රව්‍යවල මිල අඩු කළා. මේ දේවල් කළේ වෙන කිසිම දෙයක් නිසා නොවෙයි. මේ රටේ සිදු වූ වංචා හා දූෂණ මේ කෙටි කාලය තුළ නැවැත්වීම තුළිනුයි මේ දේවල් කළේ. මෙවැනි කෙටි කාලයකදී ලැබුණු ප්‍රතිලාභවලින් මෙවැනි විපර්යාසයක් -මෙවැනි හාස්කමක්- කරන්න පුළුවන් වුණා නම්, මෙතෙක් කල් මේ රටේ විශාල වංචා හා දූෂණ සිදු වෙලා තිබෙනවාය කියලා එයින් අපට තේරෙනවා.

පසු ගිය කාලයේ ජනතාවට සුරංගනා ලෝක මවා පාරවල් හැදුවා; විවිධ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක ක්‍රියා කළා. අනේ! ආණ්ඩුව වෙනස් වුණා විතරයි, පාරවල් හද හදා හිටපු කොන්ත්‍රාත්කරුවන් ඒවා අතරමඟ නවත්වා දමා පැනලා ගියා. ගොඩනැඟිලි හද හදා හිටපු කොන්ත්‍රාත්කරුවන් ගොඩනැඟිලි හැදීම අතරමඟ නවත්වා දමා පැනලා ගියා. අපි මේකට හේතුව හොයා බැලුවා. මේ කොන්ත්‍රාත්තු සිදු වුණේ, මේ රටේ හිටපු දේශපාලන ප්‍රබලයන් මේ කොන්ත්‍රාත්තු භාර දුන්නේ කිසිම නීත්‍යානුකූල පදනමකට නොවෙයි; නීත්‍යානුකූල ක්‍රමවේදයකට නොවෙයි කියලා මේ කොන්ත්‍රාත්කරුවන් දන්නවා. නිකම් කට වචනයට කළ කොන්ත්‍රාත් තමයි ගොඩක් තිබුණේ. නමුත් ඒවාට අධික මිල ගණන් ගෙව්වා. මේවායේදී අදාළ කොන්ත්‍රාත්කරුට ලැබෙනවාට වඩා වැඩි මුදලක් බලධාරීන් ඔවුන්ගේ සාක්කුවට දමා ගත්තා. "මේ යහ පාලනය නිසා මේක කරන්න වෙන්නේ නැහැ, මේ ක්‍රියාදාමය ඉදිරියට ගෙන යන්න බැරි වනවා" කියලා භය වූ කොන්ත්‍රාත්කරුවන් එම කොන්ත්‍රාත් අතරමඟ නතර කළා. ඒ තුළින් මේ රටේම සංවර්ධන ව්‍යාපාර ඇන හිටියා; අහිංසක

ජනතාව අපහසුතාවට පත් වුණා. බොහෝ මාර්ගවල වැඩ කටයුතු භාගයක් අවසන් වී තිබියදී නතර කළා. දැන් ඒ මාර්ගවල දූවිල්ල පිරිලා. දැන් දූවිල්ල නිසා මිනිස්සු අපහසුතාවට පත් වෙලා. නමුත් කොන්ත්‍රාත්කරුවන් පැනලා ගිහිල්ලා. ඒ විතරක් නොවෙයි. මේ ව්‍යාපෘතිවල සේවය කළ සේවකයෝ අසරණ වෙලා. ඒ අයට බලාපොරොත්තු වූ දීමනාව හෝ පඩිය ලැබෙන්නේ නැති තත්ත්වයට පත් වෙලා. මොකද, අදාළ කොන්ත්‍රාත්කරු හොයා ගන්න බැරි තත්ත්වයක් දැන් ඇති වෙලා තිබෙනවා. මේවා ඔක්කෝම වංචාව හා දූෂණය නිසා සිදු වූ දේවල්.

පසු ගිය කාලයේ ලොරිවල සිමෙන්ති කොට්ට ගෙනියනවා වාගේ කුඩු කිලෝ ගණන්, containers ගණන් ගෙනියලා අහු වුණු ආකාරය අපි දැක්කා. ඒ වාගේම පසු ගිය දිනවලදී නීති විරෝධී විධියට මේ රටට එතනෝල් ගෙන්වන ආකාරයත් අපි දැක්කා. ඒවා පොලීසියෙන් හොයා දුන්නා. ඒ වාගේම විවිධ අවස්ථාවලදී කුඩු ගෙනෙන අයව අල්ලා දුන්නා. නමුත් මේවා කළ අයට නීතියෙන් දඬුවම් ලැබුණාද? මේ දේවල් සඳහා නීති ක්‍රියාත්මක කිරීම කඩිනම් කරන්න ඕනෑය කියන එක තමයි මම විශේෂයෙන් අද යෝජනා කළේ.

ඒ විතරක් නොවෙයි. තවත් නොයෙකුත් පොඩි පොඩි දේවල් අරගෙන බලන්න. පසු ගිය දවස්වල විවිධ මාධ්‍යවලින් මේවා අනාවරණය වුණා. Hiru TV ප්‍රවෘත්ති ඔස්සේ විකාශය වූ "CIA" වැඩසටහනින් ගොඩක් දේවල් ජනතාවට ඉදිරිපත් කළා. අද ඖෂධ ප්‍රතිපත්තිය කරළියට ගෙනැල්ලා තිබෙනවා. මේ රටේ කල් ඉකුත් වූ ඖෂධ අනවශ්‍ය ලෙස ගබඩා කර තිබුණු ආකාරය, ඖෂධ ගබඩා කිරීමට සුදුසු නැති තැන්වල ගබඩා කර තිබුණු ආකාරය, ගබඩා තුළ ඉඳගෙන ඖෂධවල ඇති කල් ඉකුත් වීමේ ලේබලය වෙනස් කරලා බොරු ලේබලයක් ගහලා, වෙනත් දිනයක් ගහලා ජනතාවට එම ඖෂධ issue කරන ආකාරය, වැරදි විධියට ඖෂධ ප්‍රවාහනය කරන ආකාරය ආදී වශයෙන් මේවා ඔක්කෝම පෙන්වා දුන්නා. නමුත් එවකට පැවැති රජය මේ ජාවාරම්කරුවන්ට එරෙහිව ක්‍රියා මාර්ග ගත්තේ නැහැ. ඒ නිසාම තමයි ජනතාව දැඩි බලාපොරොත්තුවකින් යුතුව නව රජය බිහි කළේ. "අපට මොකුත් එපා, මේ හොරුන්ව අල්ලා දඬුවම් දෙන්න" කියන එක තමයි ජනතාව කිව්වේ. මේ හොරු කරළියට ගෙනැල්ලා දඬුවම් දෙන තෙක් ජනතාව අද ඇසි පිය ගහන්නේ නැතිව බලාගෙන ඉන්නවා.

බොහෝ හොරකම් නැවැත්වීම නිසා මේ දින සියය තුළ ජනතාවට ප්‍රතිලාභ ලැබුණු ආකාරය අපි දැක්කා. ඒ වාගේම මේ හොරු කරළියට ගෙන ඒම පිළිබඳව, හොරුන්ට දඬුවම් දීම පිළිබඳව මන්දගාමී ස්වරූපයකුත් අපි දකිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා තමයි මම මේ යෝජනාව ඉදිරිපත් කළේ. අපගේ රජය ඉතා කඩිනමින් මේ වංචා නැවැත්වූවා. ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති වෙලා ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැතිවරයා බවට පත් වෙලා බොහෝ පක්ෂ එකතු වෙලා අලුත් කැබිනට් එකක් හදා ගෙන ක්ෂණිකව මේ හොරකම්, වංචා නැති කළා. ඒ වාගේම මේ හොරකම්, වංචා කළ අයට දඬුවම් දෙන කල් මේ රටේ ජනතාව බලාගෙන ඉන්නවා. ඒ නිසා මේ ගරු සභාවට මම විශේෂයෙන්ම යෝජනා කරන්නේ ඒ පියවර ඉතා කඩිනම් කරන ලෙසයි. නව රජය තුළින් මේ අය සම්බන්ධයෙන් ගත් පියවර මොනවාද, ඒ පියවර කඩිනම් කරන්නේ කොහොමද කියාත් මම අහනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට ගරු අශෝක් අබේසිංහ මහතා.

[අ.භා. 6.31]

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා විසින් ගෙනෙන ලද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව මම ස්ථිර කරනවා.

දූෂණයෙන්, භීෂණයෙන් තොර යහපාලනයක් ඇති කිරීම වෙනුවෙන්, වෙනසක් වෙනුවෙන්, ඒ වාගේම දින සියයේ වැඩසටහන ජයග්‍රහණය කරවීම සඳහා පසු ගිය ජනාධිපතිවරණයේදී අපි ජනතාවගෙන් ජන වරමක් ඉල්ලා සිටියා. දූෂණයෙන්, භීෂණයෙන් තොර යහපාලනය සහ දින සියයේ වැඩසටහන සඳහා ජනතාව පසු ගිය ජනාධිපතිවරණයේදී ඒ ජන වරම ලබා දුන්නා. ඒ ජනවරම උපයෝගි කර ගෙන ඉදිරියේදී නව රජය වැඩ කරන්නට තීරණය කර තිබෙනවා. මේ රජය මහ මැතිවරණයකින් පත් වුණු රජයක් නොවෙයි. විධායක බලය නිසාම පත් වුණු රජයක් නිසා දින සියයක් තුළ පොරොන්දු වූ කරුණු ඉෂ්ට කරන්නට අපි තීරණය කර තිබෙනවා. ඒ දින සියය තුළ ක්‍රියාත්මක කරන්නට පොරොන්දු වූ කරුණු සියයෙන් දැනටත් කරුණු හැටකට ආසන්න ප්‍රමාණයක් ඉටු කර අවසානයි.

ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා විසින් ගෙනෙන ලද යෝජනාව ඉතාම කාලෝචිතයි. මොකද, පසු ගිය රජය විසින් මහා මාර්ග සෑදීමේදී කළ දූෂණ පිළිබඳව අපි දන්නවා. දක්ෂිණ අධිවේගී මාර්ගය සෑදීමේදී එක කිලෝ මීටරයකට රුපියල් ලක්ෂ 8,000ක් වියදම් කරද්දී, කටුනායක අධිවේගී මාර්ගයට එක කිලෝ මීටරයකට රුපියල් ලක්ෂ 20,700ක් වියදම් කරද්දී, වට රවුම් මාර්ගයට කිලෝ මීටරයට රුපියල් ලක්ෂ 67,000ක් වියදම් කරද්දී මා එදා මේ කාරණය පාර්ලිමේන්තුවේදී පෙන්වා දුන්නා. ඉන්දියාවේ මං තීරු හයක අධිවේගී මාර්ගයේ එක කිලෝ මීටරයකට වියදම ලක්ෂ 4250යි. ඒ වාගේම නයිරෝබි නුවර මංතීරු අටේ අධිවේගී මාර්ගයේ එක කිලෝමීටරයකට වියදම ලක්ෂ 4500යි. අපි එක කිලෝ මීටරයකට රුපියල් ලක්ෂ 67,000ක් වියදම් කළ බවට පෙන්වා තිබෙනවා. මෙවැනි සොරකම් අනිවාර්යයෙන්ම රටට හෙළි කළ යුතුයි.

වර්තමාන විදුලිබල හා බලශක්ති අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා එදා විදුලිබල අමාත්‍යාංශයේ කෝටි 150ක වංචාවක් පිළිබඳව ප්‍රකාශ කළා. එතනෝල් විශාල ප්‍රමාණයක් මේ රටට හොරෙන් ආනයනය කර තිබෙන බවත්, හිටපු ඇමතිවරයෙක් එයට සම්බන්ධ බවත් අද වෙනකොට පත්තරවල තිබෙනවා මම දැක්කා. පසු ගිය රජය ආරක්ෂක අමාත්‍යාංශයේ ගොඩනැඟිල්ලක් තැනීම සඳහා රුපියල් කෝටි හාර දාහක මුදලක් වෙන් කර තිබෙනවා. ආරක්ෂක අමාත්‍යාංශයේ ඒ ගොඩනැඟිල්ලේ භූමි ප්‍රමාණය වර්ග අඩි තිස් ලක්ෂයක් කියා අපට ආරංචි වෙලා තිබෙනවා. වර්ග අඩි තිස් ලක්ෂයක් කියන්නේ පෙන්ටගනයටත් වඩා විශාල භූමි ප්‍රමාණයක්. මෙය මේ රටට ඔරොත්තු දෙන තත්ත්වයක්ද? මේ තත්ත්වය තුළ මේ රටට කර තිබෙන විනාශය කොපමණද?

අපේ රටේ ආදායම ගැන බැලුවාම, අපේ රට ගෙන තිබෙන ණයවලට වාරික සහ පොලී ගෙවන්න අපේ රටේ ආදායම මදියි. අපේ ණය වාරික සහ පොලිය රටේ ආදායමට වඩා අඩුයි කියා පසු ගිය රජය මේ රටට බොරු දත්ත පෙන්නුවා. දැන් බලද්දී ණය වාරික සහ පොලිය රටේ ආදායමට වඩා වැඩි තත්ත්වයක් තිබෙන බවයි අපට පෙනීයන්නේ. මොකද, රටේ සමස්ත ඇස්තමේන්තු ගත ආදායමට වඩා අඩු ආදායමක් තමයි රටට ලැබෙන්නේ. අපේ රට ණය ගෙන තිබෙන ප්‍රමාණයට 2015 වර්ෂයට පමණක් පොලිය වශයෙන් රුපියල් කෝටි 41,000කුත්, ණය වාරික

[ගරු අශෝක් අබේසිංහ මහතා]

වශයෙන් රුපියල් කෝටි 85,000කුත් එකතුව රුපියල් කෝටි එක් ලක්ෂ විසිහය දාහක් ණය වාරික හා පොලිය වශයෙන් ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා.

රජයේ සේවකයන් 14 ලක්ෂයකට පඩි ගෙවන්න රුපියල් කෝටි 55,000ක් ඕනෑ. විශ්‍රාමිකයන් පන්ලක්ෂ අසූ දහසකට විශ්‍රාම වැටුප් ගෙවන්න රුපියල් කෝටි 15,000ක් ඕනෑ. එතැනම රුපියල් කෝටි 70,000ක් ඕනෑ. වැටුප් ගෙවීමට, ණය වාරික සහ පොලී ගෙවීමට රුපියල් කෝටි එක් ලක්ෂ අනූ හය දාහක් අවශ්‍යයි. රුපියල් කෝටි එක් ලක්ෂ විසිපන් දාහක්, එක්ලක්ෂ තිස් පන්දාහක් වැනි ආදායමක් තුළ අපේ රට ඉදිරියට යන්නේ කොහොමද? මෙවැනි මහා පරිමාණ වංචා කරද්දී මේ රට ඉදිරියට යන්නේ කොහොමද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා නියෝජනය කරන කුරුණෑගල දිසත්‍රික්කයේ, කුරුණෑගල - නාරම්මල මාර්ගය කාපට් කිරීමේදී -පාර දෙපැත්තට කොන්ක්‍රිට් දමන්න කියුබික් මීටරයකට සාමාන්‍යයෙන් ගෙවන්නේ රුපියල් 14,000යි- රුපියල් 48,000 ගණනේ බිල් ඉදිරිපත් කර මුදල් ලබා ගෙන තිබුණා. එක කොන්ක්‍රිට් කියුබික් මීටරයකට රුපියල් 48,000 ගණනේ ලබා ගෙන තිබුණා. ඒ වාගේම එක කිලෝ මීටරයකට රුපියල් ලක්ෂ 50කට වැඩියෙන් මුදල් ගෙවා තිබුණා. මේවා අල්ලන්න ඉතා ලෙහෙසියි. මේවා RDA එකට ඉදිරිපත් කරලා, chartered accountant කෙනෙක් දාලා මේවා සොයා බලන්න පුළුවන්. මොකද මේවා හුඟක් bank-funded road projects. Unsolicited Proposals විධියට, කිසිම ටෙන්ඩර් පටිපාටියකින් තොරව මේ පාරවල් හදන්න අරගෙන, බැංකු මඟින් කරන ව්‍යාපෘතිවලින් විශාල වශයෙන් මුදල් සොරකම් කර තිබෙනවා. ඒ bank-funded road projectsවල තිබෙන දූෂණ සොයා බලන්න. ඒක සාමාන්‍යයෙන් එතරම් අමාරු දෙයක් නොවෙයි. මේවා කවුද කළේ කියා සොයා බලා ඒ හොරුන්ට දඬුවම් දෙන ලෙස මා ඉල්ලා සිටිනවා. විශේෂයෙන් ජනතාව ඒක බලාපොරොත්තු වෙනවා. ජනතාව මේ දින සියය තුළ බලාපොරොත්තු වෙන්නේ, මේ රටට විශාල වශයෙන් ජාතික ධනය අහිමි කළ පසු ගිය රජය කාලයේ සිටි නිලධාරින් සහ දේශපාලනඥයන් අල්ලාගෙන මේ රටේ ජනතා අධිකරණය හමුවට ගෙන ඒමයි. බොහොම ස්තූතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට, ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා.

[අ.භා. 6.36]

ගරු පාඨලී චම්පික රණවක මහතා (විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க - மின்வலு மற்றும் எரிசக்தி அமைச்சர்)
(The Hon. Patali Champika Ranawaka - Minister of Power and Energy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ සභාව කල් තැබීමේ යෝජනාව, ගරු අශෝක් අබේසිංහ මන්ත්‍රීතුමා ස්ථිර කළා. එතුමා මතු කරන ගැටලුව අද මේ රටේ තිබෙන දැවෙන ගැටලුවක්. මේ දූෂණ වංචා සම්බන්ධයෙන් රජය ප්‍රමාණවත් පියවර ගෙන නැහැ, ඒවා යට ගහනවා කියන විධියේ දුක්ගැනවිල්ලක් අපේ ජනතාව අතර නැහෙමින් තිබෙනවා. නමුත් ආණ්ඩුව මේ පිළිබඳව යම් යම් පියවර අරගෙන තිබෙනවා. පියවර ගැනීමේ යම් යම් පමාවක් තිබෙන බව ඇත්ත. ඒ වාගේම, පියවර නොගත්ත පාර්ශ්ව තිබෙන බවත් ඇත්ත.

පසු ගිය කාලයේ, විශේෂයෙන්ම 2010න් පස්සේ මේ රටේ සිදු වුණේ ආණ්ඩුවලින් සාමාන්‍ය පරිමාණයෙන් කවදත් සිදු වුණු දූෂණ නොවෙයි. අතීතයේ මේ රටේ ක්‍රියාත්මක වුණු මහා පරිමාණ ව්‍යාපාර වන මහවැලි ව්‍යාපාරය වැනි ව්‍යාපාරවලත් මහා පරිමාණයෙන් දූෂණ සිදු වූ බවට චෝදනා එල්ල වෙලා තිබෙනවා. නිදහසින් පස්සේ එදා පිහිටවූ පළමුවැනි ආණ්ඩුවේ, ඩී.එස්. සේනානායක මැතිතුමාගේ ආණ්ඩුවේ ජී.ජී. පොන්නම්බලම් මැතිතුමාට දූෂණ චෝදනා එල්ල වුණා. බණ්ඩාරනායක ආණ්ඩුවටත් චෝදනා එල්ල වුණා. ඒ විධියට චෝදනා එල්ල වුණාට මහා පරිමාණ දූෂණ චෝදනා එල්ල වුණේ මහවැලි ව්‍යාපාරය සම්බන්ධයෙන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2010-2015 කාලයේ වරාය, ගුවන් තොටුපොළ මෙන්ම විදුලිබල ක්ෂේත්‍රයේ වූ යෝධ ව්‍යාපෘති හරහා සහ විශේෂයෙන්ම මහාමාර්ග හා දුම්රිය මාර්ග ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් නැංවීම පිළිබඳව ගෙන ගිය ව්‍යාපෘතිවල මහා පරිමාණ දූෂණ සිදු වූ බවට චෝදනා එල්ල වුණා; කරුණු ඉදිරිපත් වුණා. අපිත් ඒ කරුණු සනාථ කරන තොරතුරු ඉදිරිපත් කළා. මගේ මතය නම් මේ කාලය තුළ ඇති වූ ඒ දූෂණය අතීතයේ පැවැති ආණ්ඩුවලදී ඇති වුණා වාගේ සාමාන්‍ය දූෂණයක් නොවෙයි. "මෙගා" දූෂණයකුත් නොවෙයි. එය ජාතික මං කොල්ලයක්. ඒ ජාතික මං කොල්ලයේ තරම අපට පෙනුණා, අවසාන වශයෙන් ආර්ථික දත්ත තිබෙන 2013 වසරේ රටේ ජනතාවගේ පවුලේ ආදායම වැඩිවීම සියයට දශම තුනක් වීමෙන්. හැබැයි, රටේ ආර්ථික වර්ධන වේගය සියයට 7.4ක් වුණා. අතීතයේ අපේ ලංකාවේ තිබුණ ප්‍රවණතාව වුණේ ආර්ථික වර්ධන වේගය වැඩි වන වේගයට සමාන වේගයකින් පවුලේ ආදායමත් වැඩිවීමයි. පවුලේ ආදායම වැඩිවීම සියයට දශම තුනක් වන විට ආර්ථික වර්ධන වේගය සියයට 7.4ක් කියන්නේ, කවුරු හරි කෙනෙක් මැදින් ඉඳ ගෙන මේ ධනය කොල්ල කෑ බවයි. ඒක භයානක, බරපතළ ජාතික මං කොල්ලයක්. 2013 වසරේදී නම් ඒ ගණන බිලියන 700ට ආසන්නයි. මොරටු විශ්වවිද්‍යාලයේ සිවිල් ඉංජිනේරු අංශයේ ප්‍රවාහන ක්ෂේත්‍ර විශේෂඥයන්ට අනුව මහාමාර්ග ක්ෂේත්‍රය පමණක් රුපියල් බිලියන 200ක පමණ මුදලක් අතිරේකව ලබා ගෙන තිබෙනවා.

ජනතාව මේ පිළිබඳව දැඩි අධිෂ්ඨානයක හිටියා. ඒ නිසාම මේ ආණ්ඩුව පත් වුණාට පස්සේ ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පූර්ණ බලැති දූෂණ විරෝධී කමිටුවක් පත් කළා. ඒකට විවිධ දේශපාලන පක්ෂවල නියෝජිතවරුන්ගේ සහභාගිත්වය ලබා ගත්තා. අගමැතිතුමා එය නියෝජනය කරනවා. මමත් එහි නියෝජිතයෙක්. ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාර දිසානායක මහත්මයා, දෙමළ ජාතික සන්ධානයේ නායක ආර්. සම්පන්දන් මහත්මයා, මුස්ලිම් කොංග්‍රසයේ නායක රවූෆ් හකීම් මහත්මයා ඇතුළු මේ පාර්ලිමේන්තුවේ වැදගත් දේශපාලන පක්ෂවල නායකයන් ගණනාවක් එම කමිටුවට පත් කර ගෙන ඒ කමිටුව මඟින් පියවර ගණනාවක් ගත්තා.

එයින් පළමුවැනි දේ තමයි, මේ යටතේ දූෂණ මර්දන ලේකම් කාර්යාලයක් ස්ථාපිත කිරීම. ඒ ලේකම් කාර්යාලයට අවශ්‍ය කරන අරමුදල්, ලේකම් කාර්යාලයට අවශ්‍ය කරන සේවක මණ්ඩල ආදිය ලබා දීලා 2015.02.19වැනි දින එහි වැඩ කටයුතු ආරම්භ කළා. ඒ මඟින් අල්ලස් දූෂණ හා බරපතළ මූල්‍ය අපරාධවලට අදාළ තොරතුරු රැස් කරලා, අපරාධවල ස්වභාවය අනුව ඒවා

පරීක්ෂා කරන්න අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දෙනවාද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට දෙනවාද, විගණකාධිපති හා මූල්‍ය අපරාධ විමර්ශන අංශවලට දෙනවාද කියලා තීරණය කරලා, ඒ දූෂණ සම්බන්ධයෙන් කටයුතු කරන්න අපි තීරණය කළා. ඊට අමතරව නියෝජ්‍ය පොලිස්පති රවි වෛද්‍යලංකාර මහත්මයා යටතේ බරපතළ මූල්‍ය අපරාධ විමර්ශනය කිරීම සඳහා වෙනම ඒකකයක් දැන් පිහිටුවා තිබෙනවා. ඒ මඟින් දැන් විවිධ ආයතන හා පුද්ගලයන් ගණනාවක් සම්බන්ධයෙන් විමර්ශන ආරම්භ කර තිබෙනවා.

ඒ වාගේම මේවාට හසු නොවී කටයුතු කරන්න පුළුවන් තත්ත්වයක් අපි හඳුනා ගෙන තිබෙනවා. ඒ නිසා මේ වෙනුවෙන්ම වූ විශේෂ ජනාධිපති කොමිසමක් අපි යෝජනා කරලා තිබෙනවා. ඒ සඳහා වූ වගකීම් සහ බලතල සම්බන්ධයෙන් විශේෂ කැබිනට් පත්‍රිකාවක් මා විසින් ඉදිරිපත් කර තිබෙනවා, සාමාන්‍ය නීතිය යටතේ, සාමාන්‍ය ක්‍රියාදාමය යටතේ පහසුවෙන් විමර්ශනය කළ නොහැකි ඇතැම් ගැටලු විසඳා ගැනීම සඳහා එම විමර්ශන කොමිසමට පූර්ණ බලතල ලබා දෙන්න.

අපේ විදේශ කටයුතු ඇමතිතුමාගේ මැදිහත් වීමෙන් සහ මුදල් ඇමතිතුමාගේ මැදිහත් වීමෙන් විදේශගත ධනය පරීක්ෂා කිරීම සඳහා ලෝක බැංකුවේ "StAR" ආයතනයේ - Stolen Asset Recovery Initiative - සහයෝගය ලබා ගැනීමටත් අපි තීරණය කරලා කටයුතු කර ගෙන යනවා. මෙහිදී අපි විවිධාකාරයෙන් තොරතුරු ලබා ගැනීම් කරනවා. සියලුම අමාත්‍යාංශවල ඇමතිවරුන්ට දැනුම් දී තිබෙනවා, ඒ ඒ අමාත්‍යාංශවල සිදු වුණා යැයි කියන දූෂණ, වංචා පිළිබඳව සොයා බලා ඒ පිළිබඳ වාර්තාවක් දූෂණ විමර්ශන ලේකම් කාර්යාලයට ලබා දෙන්න කියලා.

අපේ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ සිද්ධ වූ ප්‍රධාන වංචා දෙකක් තිබෙනවා. එකක්, ගල් අඟුරු නැව් 05ක් ගෙන එනවාය කියලා පෞද්ගලික සමාගමක් සමඟ කරපු ගනු දෙනුව. දැන් ඒ ගැන විමර්ශනය කර ගෙන යනවා. මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේත් ලොකු ආන්දෝලනයක් ඇති වුණා, ඒ හරහා බිලියන 150ක පමණ විශාල මුදලක් නැති වෙලා තිබෙනවාය කියලා. කියන්න සතුටුයි, අපේ පොලිස් දෙපාර්තමේන්තුව එම ප්‍රශ්නය පිළිබඳව දැන් ඉතා වේගයෙන් ක්‍රියා කරලා අවශ්‍ය පිරිස් අත් අඩංගුවට ගැනීම් කර ගෙන යන බව. මේ ජාවාරම පිටුපස සිටි ව්‍යාපාරිකයන් ඒ වාගේම දේශපාලනයට සම්බන්ධ අය, නිලධාරින් තරාතිරම නොබලා අත් අඩංගුවට ගැනීම සඳහා දැන් ක්‍රියා කරනවා.

අපේ අමාත්‍යාංශයට අදාළව තෙල් සංස්ථාවේ තවත් වංචාවක් සිදු වුණා, බෝයාවක් සම්බන්ධ ගැටලුවක් ඇති වුණු වෙලාවේ නැවක් කුලියට ගැනීම සම්බන්ධයෙන්. ඒ සම්බන්ධයෙනුත් ඉතා වේගයෙන් අපේ පොලිස් නිලධාරින් ක්‍රියාත්මක වෙලා තිබෙන බව මා ඉතා සතුටින් කියන්න කැමැතියි. අපේ අමාත්‍යාංශය ගැන කියනවා නම් ඒ අමාත්‍යාංශයේ වූ සියලුම දූෂණ පිළිබඳව විමර්ශනය කරන්න බලගතු ත්‍රිපුද්ගල කමිටුවක් පත් කර තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, ඒ අයගේ වාර්තාව මේ මාසයේ මැදදී ලබා ගෙන, ඉන් පසුව ඒ අය සම්බන්ධයෙන් නීතිමය ක්‍රියා මාර්ග ගන්න දූෂණ විමර්ශන කොමිටියට භාර දෙන්න.

සෑම අමාත්‍යාංශයකම වුණු සිදු වීම් පිළිබඳව දැන් සොයා බලා ගෙන යනවා. ඇතැම් ඇමතිවරු දැනටමත් තමන්ගේ වාර්තා ලබා දීලා තිබෙනවා. ඒ සඳහා පියවර ගැනීම සිදු කර ගෙන යනවා.

මේ විශේෂ ජනාධිපති කොමිසම මඟින් අපි බලාපොරොත්තු වනවා විදේශ මුදල් ගනු-දෙනු පිළිබඳව පළමුවෙන්ම අවධානය යොමු කරන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම සිදු වෙලා තිබෙන කරුණු දෙකක් තිබෙනවා. එකක් තමයි, ආයෝජන මඟින් හා අපේ ප්‍රාග්ධන ගිණුම විවෘත කිරීමේ ප්‍රතිඵලයක් විධියට විදේශීය කළු සල්ලි ශ්‍රී ලංකාව තුළට ශීඝ්‍රයෙන් ගලා ඒමේ තත්ත්වයක් තිබීම. විශේෂයෙන්ම කැසිනෝ ව්‍යාපාරය ආදී ව්‍යාපාර හරහා වාගේම නීති විරෝධී උණ්ඩියල් ආදී ක්‍රමවේද හරහා විදේශීය කළු සල්ලි ශ්‍රී ලංකාවට අරගෙන ඇවිල්ලා මේ රටේ ආර්ථිකය අපට පාලනය කරන්න බැරි තත්ත්වයක් දක්වා ගමන් කරවන ක්‍රියාදාමයක් සිද්ධ වෙලා තිබෙනවා. අපි ඒ ගැන විමර්ශනය කරනවා.

ඊළඟට, රටේ සිදු වුණු මහා පරිමාණ ව්‍යාපෘති හරහා විදේශවලදීම උපයා ගත් ධනය විදේශවලම තැන්පත් කිරීමේ ක්‍රියාවලියක් සිද්ධ වෙලා තිබෙනවා. මේ පිළිබඳ තොරතුරු රැසක් අප අතට පත්වෙලා තිබෙනවා. සමහර විදේශීය බැංකු මේ සම්බන්ධයෙන් අප ආණ්ඩුවත් සමඟ ගනු-දෙනු කිරීමට එකඟ වෙලා තිබෙනවා. සමහර ඒවා එකඟ වෙලා නැහැ. ඒ නිසා ඒවා සම්බන්ධයෙන් දැන් කටයුතු කර ගෙන යනවා. විශේෂයෙන්ම ඇතැම් ව්‍යාපාරිකයන්, දේශපාලනයට සම්බන්ධ ඇතැම් අය නොයෙකුත් හේතු පෙන්වා විදේශ ගත වෙලා ඒ බැංකුවල තැන්පත් කරපු තමන්ගේ මුදල් වෙනත් බැංකුවලට මාරු කරපු බවට වන තොරතුරු අප සතුව දැන් තිබෙනවා. ඒවා පිළිබඳවත් විධිමත් විමර්ශනයක් කරනවා.

ඊළඟට, අපි කලින් සිටම සඳහන් කරපු, මෙගා ව්‍යාපෘති හරහා සිදු කරන ඒ මහා වංචා සම්බන්ධයෙනුත් අපි අවධානය යොමු කර තිබෙනවා. එහිදී ප්‍රධාන වශයෙන්ම වරාය නගරය පිළිබඳව විශේෂ වාර්තාවක් අපි ලබා ගත්තා ආර්ථික සංවර්ධන කමිටුවෙන්. එම වාර්තාවෙන් ලබා දී තිබෙන නිගමන ක්‍රියාත්මක කිරීම ආරම්භ කරලා තිබෙනවා, එහි නීතිමය ස්වභාවය පිළිබඳව, එහි මූල්‍යමය ස්වභාවය පිළිබඳව, එහි පාරිසරික ඇගයීම පිළිබඳව. ඒවා රටේ වර්තමාන නීතියට අනුකූලව සිදු නොවුණු බවට අපි සෑහීමකට පත් වෙලා තිබෙන නිසා එම ක්‍රියාවලිය තාවකාලිකව නතර කරලා, ඒවායේ නීත්‍යනුකූල තත්ත්වය සකසා ගැනීම සඳහා අවස්ථාවක් ලබා දෙන්න කටයුතු කර ගෙන යනවා.

ඒ විතරක් නොවෙයි. දැනට කොන්ත්‍රාත් ලබා දීලා තිබෙන උතුරු අධිවේගී මාර්ගයත්, දකුණු අධිවේගී මාර්ගයත් -මාතර සිට හම්බන්තොට දක්වා වූ කොටස- දුම්රිය මාර්ගයත්, මහා මාර්ගයත් අපි විශේෂඥයන් ලවා නැවත වතාවක් පරීක්ෂා කරවා එහි අගය සොයා ගැනීම සඳහා කටයුතු කරනවා. මා ප්‍රකාශ කරන්න ඕනෑ, උතුරු අධිවේගී මාර්ගයේ වියදම දැනට යෝජිත වියදමින් සියයට 45ක් පමණක් බව අපට මොරටුව විශ්වවිද්‍යාලයේ විශේෂඥයින් දැනුම් දීලා තිබෙන බව. දැනට කොන්ත්‍රාත් භාර දීලා තිබෙන එම මහා පරිමාණ ව්‍යාපෘති සම්බන්ධයෙනුත් ඒ ක්‍රියාවලිය යනවා පමණක් නොවෙයි, මේ සෑම ව්‍යාපෘතියකටම අවශ්‍ය කරන පිල් සලකුණු මිල - benchmark cost - සොයා ගැනීම සඳහාත් කටයුතු කරනවා. ඒ වාගේම ඒවා සඳහා දායක වුණු තාක්ෂණික ඇගැයීම් කමිටු සහ අනික් ඇගැයීම් කමිටුවල හිටපු නිලධාරින්ට නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා අපි කටයුතු කරනවා. මේක ඉතාම සංකීර්ණ ක්‍රියාවලියක්. උදාහරණයක් කියනවා නම්, තෙල් සංස්ථාවේ බෝයාව පිළිබඳ ගනුදෙනුව සහ හෙජින් ගනුදෙනුව පිළිබඳව කාරණා සොයා බලන කොට files 1,200ක් පරිශීලනය කරන්න අපට සිද්ධ වුණා. ඒවායේ ඇතැම් පිරිස් උත්සාහ කළා, මේ දින සියය පහු වන කල් ඉන්න පුළුවන්ද කියලා බලන්න. එහෙම නැහැ. අපි ඒ අයට පැහැදිලි නියෝග ලබා දීලා තිබෙනවා, කෙටි කලකින් මේ සියලුම filesවල විස්තර ලබා දෙන ලෙසට. සමහර files අතුරුදහන් වෙලා තිබෙනවා, සමහර files අස්ථානගත කරලා තිබෙනවා. නමුත් ඒ සියලුම නිලධාරින්ට විරුද්ධව අපි කටයුතු කරනවා. දැනට මේ මෙගා ව්‍යාපෘති සම්බන්ධයෙන් නැවත ඇගැයීම සිදු කර ගෙන යනවා.

[ගරු පාඨලී චම්පික රණවක මහතා]

පහළ මට්ටමේ සිට ඉහළ මට්ටම දක්වා පුද්ගලයන්ගේ අතිරේක ඉපැයීම් පිළිබඳ විස්තර ලැබිලා තිබෙනවා. අමාත්‍යාංශ මට්ටමින් පමණක් නොවෙයි, විවිධ ආයතන මඟින් දූෂණ විරෝධි පෙරමුණට, දූෂණ විරෝධි හඬ ආදී සිවිල් ආයතනවලින් සමහර විට පුද්ගලයන් මඟින් දැනට පැමිණිලි දෙදහසකට ආසන්න සංඛ්‍යාවක් ලැබිලා තිබෙනවා. ඒවායින් චෝදනාගත කරන්න පුළුවන් පැමිණිලි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ආදිය මඟින් දැන් පරීක්ෂා කර ගෙන යනවා. ඒ සඳහා අවශ්‍ය කරන නිලධාරීන් අපි පත් කර ගෙන තිබෙනවා. ඒවා සම්බන්ධයෙන් විධිමත් පියවර අපි ලබා ගන්නවා. ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරන්න නිර්භීතව ඉදිරිපත් වීම ගැන මේ රටේ ජනතාවට අපි ස්තුතිවන්ත වෙනවා.

අපේ රටේ පසු ගිය කාලයේ සිදු වෙලා තිබෙන විශාලතම ක්‍රියාවලියක් තමයි, ආරක්ෂක හේතුන් සහ තවත් කරුණු පෙන්වමින් ඉඩම් මං කොල්ල කෑමේ ව්‍යාපාරය, කප්පම් ගැනීමේ ව්‍යාපාරය, අසරණ පුද්ගලයින්, වෘත්තීයවේදීන් ආදීන් සතුව තිබුණු ඉඩම් ඉතාම සහාසික ආකාරයට කොල්ල කෑම් පිළිබඳ සිදු වීම්. මෙවැනි සිදුවීම් අතිවිශාල සංඛ්‍යාවක් වාර්තා වෙලා තිබෙනවා. ඒ වාගේම ආරක්ෂක තත්ත්වයන් සඳහා අවශ්‍යයි කියලා ගැසට් කරලා අත්පත් කර ගත් ඉඩම් පසුව පෞද්ගලික කටයුතු සඳහා, ව්‍යාපාර කටයුතු සඳහා භාර දීමේ ක්‍රියාවලියක් සිදු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම කොළඹ නගරයේ සහ නාගරික ප්‍රදේශවල තිබෙන වටිනා ඉඩම් ඉතාම කොල්ලකාරී ආකාරයට හිතවතුන්ට සහ ව්‍යවසායකයන්ට, විදේශගත පිරිස්වලට ලබා දීමේ ක්‍රියාවලියක් වෙලා තිබෙනවා. මෙතැනදී ඉතාම පැහැදිලිව, විශේෂයෙන්ම කොටුවේ තිබුණු ක්‍රිෂ් සමාගම සම්බන්ධ වූ ඉඩම පිළිබඳව කාරණය අපි සලකා බලා තිබෙනවා. එය ඉන්දියාවේ ඉතාමත් අපකීර්තිමත් පුද්ගලයින් පිරිසකගේ ගනුදෙනුවක් බව දැන් හෙළි වෙලා තිබෙනවා. ඒ ගැනත් අපි කටයුතු කර ගෙන යනවා.

මෙහි දුර්වලතා ගැනත් අපි කියන්නට ඕනෑ. එකක් මේ පවතින නීතියේ ඇති දුර්වලතා. අපි සියලු දෙනාම දන්නවා, 1987 - 1989 කාලයේ මිනිසුන් අතිවිශාල සංඛ්‍යාවක් නීති විරෝධි ආකාරයට ඝාතනය කළ බව. හැබැයි ඒ ඝාතකයන් සියලු දෙනාටම දඬුවම් දෙන්න තරම් අපේ නීතිය ප්‍රමාණවත් වුණේ නැහැ. සූරියකන්ද සිදු වීමට පමණයි, -ඇඹිලිපිටියේ ශිෂ්‍ය ඝාතනයට පමණයි- දඬුවම් ලබා දීමට ඉදිරිපත් වුණේ. ඒ හැරෙන්න රට පුරා සිදු වුණු මහා ඝාතනවලට දඬුවම් ලැබීමක් සිද්ධ වුණේ නැහැ. ගරු අධිකරණ ඇමතිතුමා ප්‍රකාශ කළා, අපරාධ නඩුවලින් සියයට 96ක්ම නිදහස් වනවා; දඬුවම් ලැබෙන්නේ සියයට 4කට පමණයි කියලා. ඒ අනුව අපේ නීතියේ බරපතළ හිඩැසක්, බරපතළ ක්‍රියාවලියක් තිබෙනවා. ඒක මේ දූෂණ මර්දනයටත් බලපා තිබෙනවා. මේ ක්‍රියාවලිය පවතින නීතියට අනුකූලව කරන්න ගියාම එහි පමා වීම් සිද්ධ වනවා. පමා වීම කියන්නේ යුක්තිය යටපත් වීමක් සිද්ධ වනවා. බොහෝ දුරට විශාල වශයෙන් අපරාධකරුවන් නිදහස් වීමේ ප්‍රවණතාවක් ඇති වෙලා තිබෙනවා.

අපට යම් යම් අංශවලින් දැන් චෝදනා එල්ල වෙමින් තිබෙනවා, දූෂිතයන්ගේ බලපෑම්වලට යටත් වෙලා, ඇතැම් විට දූෂිතයන්ගේ මුදල් අරගෙන මේ චෝදනා යටපත් කරනවාය කියා. ඒවා ගැනත් දැන් ආණ්ඩුව පරීක්ෂා කරනවා. විශේෂයෙන්ම ඇවන්ට් ගාර්ඩ් සමාගමේ සිද්ධිය සම්බන්ධයෙන් එවැනි චෝදනා එල්ල වෙලා තිබෙනවා. ඒ පිරිස් පිළිබඳවත් අපි ක්‍රියා කරන බව ප්‍රකාශ කරන්න ඕනෑ.

දේශපාලනමය අතකොළුවක් හැටියට, දේශපාලනමය වශයෙන් යම් යම් වාසි ලබා ගැනීම සඳහා උපාය මාර්ගික අවශ්‍යතාවක් හැටියට දූෂණ විරෝධී ක්‍රියාවලිය පාවිච්චි කරන්න අපි ඉඩ තබන්නේ නැහැ. යම් යම් දේශපාලන පක්ෂ දෙකඩ කරන්න, එහෙම නැත්නම් යම් යම් දේශපාලන පක්ෂ ස්ථාවර කරන්න, දේශපාලන ප්‍රතිසංස්කරණවලදී යම් යම් පිරිස්වලට පාර්ලිමේන්තුවේ ඡන්දය ලබා ගැනීම සඳහා දූෂණ විරෝධි ක්‍රියාවලිය දේශපාලන අතකොළුවක් හැටියට පාවිච්චි කරන්න අපි ඉඩ තබන්නේ නැහැ. මේ ගැන විමසුමෙන් සිටීම ගැන අපි ජනතාවට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මාධ්‍යවලට අපි ස්තුතිවන්ත වෙනවා. මේ දින සියය ඇතුළත අපේ බලාපොරොත්තුව මෙවැනි සිදු වීම් නැවත ඇති නොවන ආකාරයට බලගතු දූෂණ විරෝධි කොමිසමක් පත් කරන්නයි. තාක්ෂණික විගණනය කරන්න පුළුවන්, කළමනාකරණය විගණනය කරන්න පුළුවන්, මූල්‍ය විගණනය කරන්න පුළුවන් බලගතු ව්‍යවස්ථාපිත ආයතනයක් හැදීමයි අපි අවසාන වශයෙන් කල්පනා කර ගෙන යන්නේ.

විශේෂයෙන්ම ඇවන්ට්ගාර්ඩ් සමාගම සම්බන්ධයෙන් විශාල වශයෙන් කරුණු දක්වනවා. අපි ඉතාම පැහැදිලිව කියනවා, අවි ආයුද නීති විරෝධි ආකාරයට ලබා දීලා තිබෙනවා නම්, එම අවි ආයුද නීති විරෝධි ආකාරයට ගබඩා කර තිබෙනවා නම් සහ නීති විරෝධි ආකාරයට මුදල් උපයා තිබෙනවා නම් තරාතිරම නොබලා ඒ අයට දඬුවම් දීමට අපි සූදානම් කියන එක. ඒ වාගේම "ඇවන්ට් ගාර්ඩ් සමාගම සම්බන්ධ සිද්ධිය මේ ආණ්ඩුවේ "වෝටර්ගේට්" සිද්ධියක් බවට පත්වීමට අප ඉඩ තබන්නේ නැහැ. කවර තරාතිරමක අයෙකු සම්බන්ධයෙන් වුණත් එයට දඬුවම් දීමට අපි ඉදිරිපත් වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කටයුතු සම්බන්ධයෙන් සියලු දෙනා තුළම පවතින උනන්දුව ගැන ඒ සියලු දෙනාටම අපේ ස්තුතිය පිරිනමනවා. ඒ වාගේම මේ ක්‍රියාවලිය ඉදිරියට ගෙන යෑමට අපේ සියලුම පාර්ශ්වවල ශක්තිමත් එකඟතාව ඉතාම අවශ්‍ය බව ප්‍රකාශ කරමින්, මේ යෝජනාව ඉදිරිපත් කළ ගරු මන්ත්‍රීතුමා ඇතුළු පිරිසටත් මාගේ ස්තුතිය පිරිනමමින් මම නිහඬ වෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.50ට, අද දින සභා සම්මතිය අනුව, 2015 මාර්තු මස 06වන සිකුරාදා අ. භා.1.30 වන තෙක් කල් ගියේය.

அதன்படி பி.ப. 6.50 மணிக்கு பாராளுமன்றம், அதனது இன்றைய தீர்மானத்துக்கிணங்க, 2015 மார்ச் 06 வெள்ளிக்கிழமை பி.ப. 1.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Adjourned accordingly at 6.50 p.m. until 1.30 p.m. on Friday, 06th March, 2015, pursuant to the Resolution of Parliament of this Day.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

232 වන කාණ්ඩය - 14 වන කලාපය
தொகுதி 232 - இல. 14
Volume 232 - No. 14

2015 මාර්තු 06 වන සිකුරාදා
2015 மார்ச் 06, வெள்ளிக்கிழமை
Friday, 06th March, 2015

පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:

ඉන්දීය අග්‍රාමාත්‍යතුමා පාර්ලිමේන්තුව ඇමතීම

2015 මාර්තු මස13 වන දින විශේෂ ආරක්ෂක විධිවිධාන

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය තුළ කෙරෙන දේශපාලන පළිගැනීම්

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට අනුයුක්තව සිටි උපාධිධාරින් මුහුණ පා ඇති ගැටලු

කාන්තාවන්ට හා ගැහැනු දරුවන්ට එරෙහි හිංසනය පිටුදැකීම සඳහා වන විපක්ෂ නායක කොමිෂන් වාර්තාව : කාන්තා කටයුතු අමාත්‍යතුමියගේ ප්‍රකාශය

ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත:

සංශෝධිතාකාරයෙන් තුන් වන වර කියවා සම්මත කරන ලදී

කල්තැබීමේ යෝජනාව:

පසු ගිය රජය ආරම්භ කළ සංවර්ධන ව්‍යාපෘති ඇනහිටීම

பிரதான உள்ளடக்கம்

அறிவிப்புக்கள் :

இந்தியப் பிரதமர் பாராளுமன்றத்தில் உரையாற்றுதல்

2015 மார்ச் 13ஆந் திகதி விசேட பாதுகாப்பு ஒழுங்குகள்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல் மூல வினா :

இலங்கைப் போக்குவரத்துச் சபையில் நிகழும் அரசியல் பழிவாங்கல்

பொருளாதார அபிவிருத்தி அமைச்சுடன் இணைக்கப் பட்ட பட்டதாரிகள் எதிர்நோக்கும் பிரச்சினைகள்

பெண்கள் மற்றும் சிறுமிகளுக்கு எதிரான வன்முறைகளைத் தடுப்பது பற்றிய எதிர்க்கட்சித் தலைவர் ஆணைக்குழு அறிக்கை : மகளிர் அலுவல்கள் அமைச்சரினது கூற்று

தேசிய மருந்துகள் ஒழுங்குபடுத்தும் அதிகாரசபைச் சட்டமூலம் :

திருத்தப்பட்டவாறு, மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது

ஒத்திவைப்புப் பிரேரணை :

முன்னைய அரசு ஆரம்பித்த அபிவிருத்தித் திட்டங்கள் இடைநிறுத்தம்

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Prime Minister of India to Address Parliament
Special Security Arrangements on 13th March, 2015

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:

Political Revenge in Sri Lanka Transport Board

Problems faced by Graduates attached to Ministry of Economic Development

INTERIM REPORT OF THE LEADER OF THE OPPOSITION'S COMMISSION ON THE PREVENTION OF VIOLENCE AGAINST WOMEN AND THE GIRL CHILD : Statement by Minister of Women's Affairs

NATIONAL MEDICINES REGULATORY AUTHORITY BILL:
Read the Third Time and passed as amended

ADJOURNMENT MOTION:
Stalling of Development Projects initiated by former Government

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2015 මාර්තු 06 වන සිකුරාදා
2015 மார்ச் 06, வெள்ளிக்கிழமை
Friday, 06th March, 2015

අ. භා. 1.30ට පාර්ලිමේන්තුව රැස් විය.
නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் பி.ப. 1.30 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.30 p.m.,
MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

I

ඉන්දීය අග්‍රාමාත්‍යතුමා පාර්ලිමේන්තුව ඇමතීම
இந்தியப் பிரதமர் பாராளுமன்றத்தில் உரையாற்றுதல்
PRIME MINISTER OF INDIA TO ADDRESS PARLIAMENT

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ඉන්දීය අග්‍රාමාත්‍ය අතිගරු ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා, ශ්‍රී ලංකාවේ රාජ්‍ය අමුත්තෙකු වශයෙන් මෙරට පැමිණි විට, 2015 මාර්තු මස 13 වැනි සිකුරාදා අපර භාග 3.15ට පාර්ලිමේන්තුව අමතන ලෙස ගරු කථානායකතුමා විසින් එතුමා හට ආරාධනා කර ඇති බව මෙම සභාවට දන්වා සිටිනු කැමැත්තෙමි.

මෙම උත්සව අවස්ථාවට පැමිණ සහභාගි වන ලෙස සියලුම ගරු මන්ත්‍රීවරුන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

II

2015 මාර්තු මස 13වන දින විශේෂ ආරක්ෂක විධිවිධාන
2015 மார்ச் 13 ஆந் திகதி விசேட பாதுகாப்பு ஒழுங்குகள்
SPECIAL SECURITY ARRANGEMENTS ON 13TH MARCH, 2015

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ඉන්දීය අග්‍රාමාත්‍ය අතිගරු ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා විසින් 2015 මාර්තු මස 13 වැනි සිකුරාදා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඇමතීමට අදාළව පහත සඳහන් විශේෂ ආරක්ෂක විධිවිධාන ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා බව සියලුම ගරු මන්ත්‍රීවරුන් වෙත මෙයින් දැනුම් දෙනු කැමැත්තෙමි:-

2015 මාර්තු මස 12 වැනි බ්‍රහස්පතින්දා සහ 13 වැනි සිකුරාදා ගරු මන්ත්‍රීවරුන්ගේ විවේක කාමර, ඇඳුම් අල්මාරි ද, ඇතුළුව සමස්ත පාර්ලිමේන්තු ගොඩනැඟිල්ලම, ආරක්ෂක පරීක්ෂාවට ලක් කරනු ඇත.

2015 මාර්තු මස 13 වැනි සිකුරාදා

(අ) මෙදින මහජන ගැලරිය ආරාධිත අමුත්තන් සඳහා පමණක් සීමා කරනු ඇත.

(ආ) ආරාධිත අමුත්තන් හැරුණු විට මෙදින පාර්ලිමේන්තුවට වෙනත් අමුත්තන් කැටුව නොපැමිණෙන ලෙස ගරු මන්ත්‍රීවරුන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

(ඇ) මෙදින පාර්ලිමේන්තු රථ ගාල වසා තබන බැවින් ගරු මන්ත්‍රීවරුන් පැමිණෙන වාහන අදාළ රථ ගාල් වෙත යොමු කරනු ලැබේ.

(ඈ) තම කලත්‍රයා කැටුව පැමිණෙන ගරු මන්ත්‍රීවරුන්ට මෙදින කාර්ය මණ්ඩල පිවිසුමේ දී තම වාහනයෙන් බැස පාර්ලිමේන්තු ගොඩනැඟිල්ලට පිවිසිය හැකිය.

(ඉ) මෙදින, තමන් විසින්ම, තම රථය පදවාගෙන එන ගරු මන්ත්‍රීවරුන්ගේ වාහන නියමිත රථගාල වෙත ධාවනය කර ගාල් කිරීම පිණිස කාර්ය මණ්ඩල සහ මන්ත්‍රී පිවිසුම්වල පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයට අයත් රියැදුරන් රාජකාරියේ යොදවනු ලැබේ.

එබැවින්, මෙදින රියැදුරෙකු කැටුව තම වාහනයෙන් පාර්ලිමේන්තුවට පැමිණෙන ලෙස ගරු මන්ත්‍රීවරුන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

(ඊ) මෙදින රථවාහන පොලීසිය සහ සමීප පොලිස් ස්ථාන මඟින් විශේෂ රථවාහන සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - வெகுசன ஊடக, பாராளுமன்ற அலுவல்கள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Mass Media and Parliamentary Affairs and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් 2012 වර්ෂය සඳහා ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආරක්ෂක කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කාන්තාවන්ට සහ ගැහැනු දරුවන්ට එරෙහි හිංසනය පිටුදැකීම සඳහා වන විපක්ෂ නායක කොමිෂන් වාර්තාව.- [ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු අබ්දුල් හලීම් මහතා - පැමිණ නැත.

ගරු කරුපයියා වේලායුදම් මහතා - පැමිණ නැත.

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා - පැමිණ නැත.

ගරු උපේක්ෂා ස්වර්ණමාලි මහත්මිය - පැමිණ නැත.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ධීවර වරායන් ප්‍රතිසංස්කරණය: අය වැය යෝජනාව
கடற்றொழில் துறைமுகங்கள் புனரமைத்தல்: வரவு செலவுத்திட்ட முன்மொழிவு
RECONSTRUCTION OF FISHERIES HARBOURS : BUDGET PROPOSAL

4537/'13

1. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ස්වදේශ කටයුතු හා ධීවර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) 2013 අය වැය යෝජනා යටතේ සිලාවතුර, ගන්දර, ගුරුනගර්, තලමැටියාව, මිරිස්ස, හික්කඩුව, බේරුවල, ගාල්ල සහ හම්බන්තොට යන ධීවර වරායන් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා යෝජනා කළ බව දන්නේද;

(ii) එම එක් එක් ධීවර වරාය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වෙන් කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත (i) යෝජනාව යටතේ මේ වන විට ප්‍රතිසංස්කරණය කර ඇති ධීවර වරායන් කවරේද;

(iv) 2013 අය වැය යෝජනාව අනුව මෙතෙක් ප්‍රතිසංස්කරණය කර නොමැති ධීවර වරායන් කවරේද;

(v) අය වැය මඟින් මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර තිබියදීත්, ඉහත (iv)ට අදාළ වරායන් ප්‍රතිසංස්කරණය නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

உள்நாட்டலுவல்கள் மற்றும் கடற்றொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2013 வரவுசெலவு திட்டத்தின்கீழ் சிலாவத்துறை, கந்தர, குருநகர், தலமெட்டியாவ, மிரிஸ்ஸ, ஹிக்கடுவ, பேருவளை, காலி, மற்றும் அம்பாந்தோட்டை ஆகிய கடற்றொழில் துறைமுகங்களின் புனரமைப்பு முன்மொழியப் பட்டதை அறிவாரா என்பதையும்;

(ii) மேற்படி ஒவ்வொரு கடற்றொழில் துறைமுகத்தையும் புனரமைப்பதற்கு ஒதுக்கப்பட்டுள்ள பணத் தொகை வெவ்வேறாக யாதென்பதையும்;

(iii) மேற்படி (i) முன்மொழிவின்கீழ் இற்றைவரை புனரமைக்கப்பட்டுள்ள கடற்றொழில் துறை முகங்கள் யாவையென்பதையும்;

(iv) 2013 வரவு-செலவுத் திட்டத்தின் பிரகாரம் இற்றை வரை புனரமைக்கப்படாதுள்ள கடற்றொழில் துறைமுகங்கள் யாவையென்பதையும்;

(v) வரவு செலவு திட்டத்தினால் நிதி ஏற்பாடுகள் செய்யப்பட்டுள்ளபோதிலும் இற்றைவரை மேற்படி (iv) க்கு ஏற்புடையதான துறை முகங்கள் புனரமைக்கப்படாமைக்கான கார ணங்கள் யவையென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Home Affairs and Fisheries:

(a) Will he inform this House -

(i) whether he is aware that the Budget of 2013 proposed to reconstruct the fisheries harbours of Silawathura, Gandara, Gurunagar, Thalamatiyawa, Mirissa, Hikkaduwa, Beruwala, Galle and Hambantota;

(ii) separately, of the amount of money set aside for the reconstruction of each such harbour;

(iii) the fisheries harbours that have been reconstructed under the proposal of (i) above by now;

(iv) the number of fisheries harbours that have not yet been reconstructed under the 2013 Budget proposals; and

(v) despite allocations have already been set aside, of the reasons for not reconstructing the harbours in the (iv) above?

(b) If not, why?

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා (ස්වදේශ කටයුතු හා ධීවර අමාත්‍යතුමා)
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா - உள்நாட்ட லுவல்கள் மற்றும் கடற்றொழில் அமைச்சர்)
(The Hon. M. Joseph Michael Perera - Minister of Home Affairs and Fisheries)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) කලමැටිය - රුපියල් 1,007,275,983.84
ගාල්ල - රුපියල් 100,000,000.00
හම්බන්තොට - රුපියල් 200,000,000.00

සිලාවතුර, ගන්දර හා ගුරුනගර් යන ධීවර වරායන් ඉදි කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර නැත.

(iii) දැනට කලමැටිය ධීවර වරායේ ඉදි කිරීම කටයුතු කර ගෙන යන අතර හම්බන්තොට ධීවර වරායේ අඩු පාඩු, safe navigation, siltation ප්‍රශ්නවලට විසඳුම් සෙවීම සඳහා උපදේශකවරුන් පත් කර ඇත. දියකඩනය නැවත සැලසුම් කිරීමක් හා ගාල්ල වරායේ නව ජැටියක් ද ඉදි කිරීමට සැලසුම්කරණය සඳහා වරාය අධිකාරියට භාර දී ඇත.

(iv) මිරිස්ස

බේරුවල

හික්කඩුව.

(v) මිරිස්ස, බේරුවල හා හික්කඩුව වරායන් සඳහා මුදල් වෙන් කර ඇත. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ හා අධීක්ෂණය කිරීමේ ඒකකය වෙතින් එම ඉදි කිරීම කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇතත් අපේක්ෂිත අන්දමින් අක්මුදල් නොලැබීම ව්‍යාපෘතිවල අඛණ්ඩ ක්‍රියාත්මකවීමට බලපා ඇත.

ධීවර වරාය ඉදි කිරීම සඳහා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2014 වර්ෂයේ රුපියල් මිලියන 1,453ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කර ගනු ලැබුවද වර්ෂය තුළ අක්මුදල් වශයෙන් ලැබුණේ රුපියල් මිලියන 453ක් පමණි. ඒ අනුව 2014.12.31 දින වන විට ව්‍යාපෘතියේ නිරවුල් නොවූ බිල්පත්වල වටිනාකම රුපියල් මිලියන 333කි.

(ආ) පැන නොනඟී.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමු අතුරු ප්‍රශ්නය විධියට මම මේ කාරණය ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි. අපි දන්නවා, උතුරේත්, නැඟෙනහිරත් ඒ වාගේම දකුණේත් වරායන් වෙනුවෙන් තමයි වැඩි මුදලක් වෙන් වෙලා තිබෙන්නේ කියලා. සිලාවතුර, ගන්දර, ගුරුනගර්, කලමැටියාව, මිරිස්ස, හික්කඩුව, බේරුවල, ගාල්ල සහ හම්බන්තොට යන ධීවර වරායන් වෙනුවෙන් මේ මුදල් වෙන් වෙද්දී ඒවායින් කොටසකටයි මුදල් ලැබිලා තිබෙන්නේ. කොටසකට මුදල් ලැබිලා නැහැ. මේ ධීවර වරායන් සඳහා මේ ආකාරයෙන් ක්‍රම දෙකකට සැලකීම පිළිබඳව අමාත්‍යාංශය අරගෙන තිබෙන්නේ මොන වාගේ ක්‍රියා මාර්ගයක්ද? ඉතුරු මුදල් ටික ලබා ගෙන මේ කටයුත්ත නිමා කරනවාද, නැත්නම් අර මුදල් නොලැබුණු ධීවර වරායන්වල වැඩ කටයුතු අත ඇරලාම දානවාද, ගරු ඇමතිතුමනි?

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

ගරු මන්ත්‍රීතුමනි, මුදල් වෙන් කළාට එකවර ඒ මුදල් ලැබෙන්නේ නැහැ. කොටස්, කොටස් වශයෙන් තමයි අවස්ථාවෙන් අවස්ථාවට මුදල් ලැබෙන්නේ. ඒ වැඩ කටයුතු කිරීමේදී සමහර ප්‍රශ්න මතු වෙලා තිබෙනවා. ඒ නිසා සමහර වරායන්වල වැඩ කටයුතු ප්‍රමාද වෙනවා. ඒ එක්කම කරපු වැඩවලටත් මුදල් නිසි ආකාරයට ලැබිලා නැහැ. ඒ නිසා අපි දැන් ඒ පිළිබඳව කථා කරගෙන යනවා. ඒවා ඉක්මනින් ආරම්භ කිරීමට කටයුතු කරනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ධීවර වරායන් සඳහා වෙන් කරන ලද මුදල්වලින් ආරම්භ කරපු ව්‍යාපෘති නිමා වෙන කාලය සහ ඉතුරු ව්‍යාපෘති වෙනුවෙන් මුදල් ලබා ගෙන එකී ව්‍යාපෘති මාස කීයකින් නිමාවට පත් කරන්න පුළුවන්ද කියලා ඔබතුමාට කියන්න පුළුවන්ද?

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

ගරු මන්ත්‍රීතුමා, ඒකට මට අද උත්තරයක් දෙන්න බැහැ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. දිගින් දිගටම අපේ රටේ ධීවරයින් විදේශ රටවල මුහුදු සීමා උල්ලංඝනය කිරීම නිසා අත් අඩංගුවට ගන්නවා. විශේෂයෙන් ඉන්දියාවෙන් වාගේම මියන්මාරයෙන් මේ ප්‍රශ්නය ධීවරයින්ට බලපා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමන්ලා ක්‍රියාත්මක වනවාට අමතරව අධ්‍යාපනිකව ධීවර ප්‍රජාව මේ පිළිබඳව දැනුවත් කිරීමට අමාත්‍යාංශය අරගෙන තිබෙන ක්‍රියා මාර්ග මොනවාද? ධීවරයින් අත් අඩංගුවට ගත්තාම ඔවුන් මුදා ගැනීම කියන එක ද්විතීයික කාරණයක්. ඒ නිසා මුහුදු සීමාව උල්ලංඝනය කිරීම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළකට අමාත්‍යාංශය අවධානය යොමු කරලා තිබෙනවාද කියලා ඔබතුමාගෙන් මම දැනගන්න කැමැතියි.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

ඒ කාරණය කෙරෙහි අවධානය යොමු කරලා තිබෙනවා. ඒ පිළිබඳව දීර්ඝ විස්තරයක් කරන්න තිබෙනවා. අපේ උපදේශක කාරක සභාවේදී ඔබතුමා මුණ ගැහුණොත් මට ඒ පිළිබඳව විස්තර කරන්න පුළුවන්. එහෙම නැත්නම් ඒ පිළිබඳව අපි සකස් කර තිබෙන වාර්තාව -වැඩ පිළිවෙළ- ඔබතුමාට දෙන්න පුළුවන්.

ජාතික ඉතිරි කිරීමේ බැංකුව : කුලී පදනම මත සිටින කාර්යාල කාර්ය සහායකවරුන්
தேசிய சேமிப்பு வங்கி : கூலி அடிப்படையில் சேவையிலுள்ள அலுவலக உதவியாளர்கள்
NATIONAL SAVINGS BANK : OUTSOURCED OFFICE ASSISTANTS

4654/'13

2. ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ කුලී පදනම මත සේවයේ යොදවා ඇති කාර්යාල කාර්ය සහායකවරුන් ස්ථිර සේවයට අනුයුක්ත කිරීම පිණිස සේවක මණ්ඩල කළමනාකරුගේ අංක 7/2012 හා 2012.02.14 දිනැති ලිපිය මඟින් විස්තර හා අයදුම් පත් කැඳවූ බවත්;

(ii) ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය මඟින් ඊට අදාළව විභාගයක් 2012.03.18 දින පැවැත්වූ බවත්;

[ගරු අනුර දිසානායක මහතා]

(iii) අවශ්‍ය සුදුසුකම් සපුරා සිටි 218 දෙනෙකු එම විභාගයට පෙනී සිටි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත විභාගයෙන් සමත්වූවන් ස්ථිර සේවයට අනුයුක්ත කිරීම පිණිස ඔවුන් සේවය කළ ශාඛා හා අංශ ප්‍රධානීන් වෙතින් ඔවුන්ගේ ක්‍රියාකාරිත්ව ඇගැයීම් වාර්තා කැඳවූයේද;

(ii) එසේ නම්, එම වාර්තා කැඳවූ දින වකවානු කවරේද;

(iii) එම වාර්තා මත මේ වන විට ගෙන ඇති පියවර කවරේද;

(iv) එම සේවකයින් ස්ථිර සේවයට අනුයුක්ත කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தேசிய சேமிப்பு வங்கியில் கூலி அடிப்படையில் சேவையில் அமர்த்தப்பட்டுள்ள அலுவலக உதவியாளர்களை நிரந்தர சேவையில் இணைப்பதற்காக பணியாட்டொகுதி முகாமையாளரின் 7/2012ஆம் இலக்க 2012.02.14ஆம் திகதிய கடிதத்தின்மூலம் விபரங்களும் விண்ணப்பங்களும் கோரப்பட்டன என்பதையும்;

(ii) இலங்கை வங்கியாளர் நிறுவனத்தினால் இதற்கான பரீட்சையொன்று 2012.03.18ஆம் திகதி நடத்தப்பட்டதென்பதையும்;

(iii) தேவையான தகைமைகளைப் பூர்த்திசெய்திருந்த 218 பேர் மேற்படி பரீட்சைக்கு தோற்றினார்கள் என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி பரீட்சையில் சித்திபெற்றவர்களை நிரந்தர சேவையில் இணைப்பதற்காக இவர்கள் சேவையாற்றிய கிளை மற்றும் பிரிவுத் தலைமை அதிகாரிகளிடம் இவர்களது செயலாற்றுகை மதிப்பீட்டு அறிக்கையொன்று கோரப்பட்டதா என்பதையும்;

(ii) ஆமெனின், மேற்படி அறிக்கை கோரப்பட்ட திகதி யாதென்பதையும்;

(iii) மேற்படி அறிக்கையின் அடிப்படையில் இன்றளவில் எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iv) மேற்படி ஊழியர்களை நிரந்த சேவையில் இணைக்கும் திகதி யாதென்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance:

(a) Is he aware that -

(i) particulars and applications were called by letter No. 7/2012, dated 14th February, 2012 of the Personnel Manager, in order to absorb the outsourced office assistants who are employed in the National Savings Bank to its permanent cadre;

(ii) the Institute of Bankers of Sri Lanka held an examination on 18th March, 2012 in that regard; and

(iii) 218 persons, who had fulfilled necessary qualifications, sat for the aforesaid examination?

(b) Will he inform this House -

(i) whether performance assessment records were called from the heads of the sections and the branches where they worked, so as to absorb the individuals who passed the examination, to the permanent service;

(ii) if so, when such records were called;

(iii) the measures that have been taken based on the aforesaid records; and

(iv) the date on which the aforesaid employees will be absorbed into the permanent cadre?

(c) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) කුලී පදනම මත බාහිර මිනිස්බල සැපයුම් ආයතන මඟින් බැංකුවට අනුයුක්තව සේවය කළ කාර්යාල කාර්ය සහායක ඇතුළුව සියලුම සේවා කාණ්ඩ පිළිබඳ (ආරක්ෂක සේවාවන් හැර) විස්තර සේවක මණ්ඩල කළමනාකරුගේ අංක 07/2012 දරන 2012.02.14 දිනැති උපදෙස් ලිපිය මඟින් ආකෘති පත්‍රයකට අනුව කැඳවා ඇත.

(ii) කාර්යාල කාර්ය සහායක තනතුරෙහි 2012.02.28 දිනට වසර 03ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද හා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිට ඇති සේවකයින් කොන්ත්‍රාත් පදනම මත කාර්යාල කාර්ය සහායක තනතුරට බඳවා ගැනීම සලකා බැලීම පිණිස ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය මඟින් 2012.03.18 දින ලිඛිත පරීක්ෂණයක් පවත්වන ලදී.

(iii) අවශ්‍ය අවම සුදුසුකම් සපුරා තිබූ 218දෙනෙකු ඉහත කී විභාගයට පෙනී සිට ඇත.

(ආ) (i) ඉහත සඳහන් සේවකයින් අනුයුක්තව සිටි අංශයන්හි අංශ ප්‍රධානීන්ගෙන්ද, ශාඛාවල කළමනාකරුවන්ගෙන්ද ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය ඇගයීම් පිළිබඳ වාර්තා කැඳවන ලදී.

(ii) සේවක මණ්ඩල කළමනාකරුගේ 2012.05.04 දිනැති ලිපිය මඟින් ඉහත අංක (ආ)(i)හි සඳහන් වාර්තා 2012.05.25 දිනට ප්‍රථම සේවක මණ්ඩල කළමනාකරු වෙත ලැබීමට සලස්වන ලෙස අදාළ අංශ ප්‍රධානීන් / ශාඛා කළමනාකරුවන් වෙත දන්වා ඇත.

(iii) මේ සේවකයින් සම්බන්ධයෙන් ඉදිරි පියවර ගැනීමට කටයුතු කර නොමැත.

(iv) එවකට කටයුතු කළ සභාපතිතුමා 2012.05.21 දින ඉල්ලා අස් වීමෙන් පසු නව අධ්‍යක්ෂ මණ්ඩලයක් ජාතික ඉතිරි කිරීමේ බැංකුවට පත් කරන ලද අතර, ඒ පිළිබඳව තව දුරටත් කටයුතු කර නොමැත.

(ඇ) පැන නොනඟී.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
දැන් ඔබතුමාට -

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු මන්ත්‍රීතුමනි, ඊට වඩා වැඩි විස්තර නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්. ගරු අමාත්‍යතුමනි, මට අතුරු ප්‍රශ්න කිහිපයක් අහන්න තිබෙනවා. ඉන් පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්නම්. මේ ඉල්ලුම් පත්‍ර කැඳෙව්වේ 2012.02.14වැනි දින. විභාගය තිබුණේ 2012.03.18වැනි දින.

ඒ අය අතරින් සුදුසුකම් සපුරා තිබූ අයගෙන් ඇගැයීම් වාර්තා කැඳෙව්වේ 2012 පස්වැනි මාසයේ. නමුත් තවමත් ඒ අය බඳවාගෙන නැහැ. විභාග පවත්වලා තිබෙනවා; සුදුසුකම් ලබාගෙන තිබෙනවා; ඇගැයීම් වාර්තා කැඳවාගෙන තිබෙනවා. නමුත් අවුරුදු 3කට අධික කාලයක් ගත වෙලා තිබුණත් තවම ඒ අය බඳවාගෙන නැහැ. එසේ බඳවා නොගැනීමට හේතු කවරේද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඒ ගැන සොයා බලා උත්තර දෙන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය කාලයේ මේ වාගේ හුහක් විභාග පවත්වලා, සම්මුඛ පරීක්ෂණත් පවත්වලා තිබුණත් බඳවා ගැනීම් කරලා නැහැ. අලුත් අධ්‍යක්ෂ මණ්ඩල පත්වෙලා ඒවා විධිමත් විධියට කරන්න තමයි බලාපොරොත්තු වෙන්නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය කොන්ත්‍රාත් පදනම මත විශාල කාලයක් වැඩ කරලා තිබෙනවා. ඒ අයගෙන්ම අයදුම් පත් කැඳවලා තමයි විභාගය පවත්වලා තිබෙන්නේ. තමන්ගේ රැකියාව ස්ථිර කර ගැනීමත්, ඒ වාගේම තමන්ගේ රැකියාවේ යම් උසස්වීම් ලබා ගැනීමත් ඕනෑම පුරවැසියෙකුගේ බලාපොරොත්තුවක්. ඔවුන් රස්සාවට බැඳෙනවා, කාලාන්තරයක් තිස්සේ එකම තැන ඉන්නවා. නමුත් ස්ථිර වෙලාත් නැහැ, උසස්වීම් පටිපාටියකුත් නැහැ. මෙවැනි විශාල පිරිසක් මේ ආකාරයේ අසාධාරණයකට ලක් කරලා තිබෙන්නේ ඇයි?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
පසු ගිය පාලනයේ තිබුණු අඩු පාඩු නිසා එහෙම වෙලා තිබෙනවා. ඒවා නිවැරදි කිරීමට තමයි දැන් අපේ නව රජයට සිද්ධ වෙන්නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මේ 218දෙනා ගැන මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි. ඔවුන් ඉතාම සාධාරණ ලෙස රැකියාවට බැඳිලා, සම්මුඛ පරීක්ෂණවලට මුහුණ දීලා, විභාග පාස් වෙලා, සේවා ඇගැයීම් අරගෙන ඉන්න පිරිසක්. ඉතින් ඒ 218දෙනා ස්ථිර කිරීම වෙනුවෙන් තවත් දිගු කාලයක් අදින්න ඕනෑකමක් නැහැ. ඒ සඳහා අවුරුදු 3කට වඩා වැඩි කාලයක් ඇදිලා තිබෙනවා. ඔය මොනවා කරන්නත් ඔබතුමන්ලාට තව දින 50යි ඉතිරි වෙලා තිබෙන්නේ. අඩුම තරමින් ඒ දින 50 ඇතුළතවත් මේ පිරිස ස්ථිර කිරීමට තීරණයක් ගන්නවාද කියලා මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු මුදල් අමාත්‍යතුමා සමඟ සාකච්ඡා කර, අදාළ තීරණ ගැනීමට බලාපොරොත්තු වනවා.

පන්නල - කුලියාපිටිය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය: විස්තර

பன்னல - குளியாப்பிட்டி வீதி அபிவிருத்தி கருத்திட்டம் : விபரம்

PANNALA-KULIYAPITIYA ROAD DEVELOPMENT PROJECT : DETAILS

5769/'14

5. ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පන්නල - කුලියාපිටිය මාර්ග සංවර්ධන ව්‍යාපෘතියට අදාළ මාර්ගයේ දුර සහ පළල කොපමණද;

(ii) එම මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ගත වන කාල සීමාව කවරේද;

(iii) එම මාර්ගයේ ඉදි කිරීමකරු තෝරාගනු ලැබුවේ ටෙන්ඩර් පටිපාටියක් මඟින්ද;

(iv) එසේ නම්, තෝරා ගනු ලැබූ ලංසුකරුගේ/ ආයතනයේ නම කවරේද;

(v) එම ව්‍යාපෘතිය සඳහා මුදල් ලබා ගන්නා මූලාශ්‍ර කවරේද;

(vi) එම මාර්ගයේ එක් කිලෝමීටරයක් ඉදි කිරීම සඳහා වන පිරිවැය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් මාර්ගයේ ඉදි කිරීම කටයුතු සිදුකරන කාලය තුළ රථ වාහන පාලනය සඳහා වැඩ පිළිවෙළක් හඳුනාගෙන තිබේද;

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

(ii) එසේ නම්, සම්පූර්ණ ව්‍යාපෘතිය තුළින් ඒ සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී අගතියට පත්වන පාර්ශ්වකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ අගතියට පත් අයට වන්දි ප්‍රදානය කර තිබේද;

(iii) එසේ නම්, වන්දි ලබා දුන් අයගේ විස්තර කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

நெடுஞ்சாலைகள், உயர்கல்வி மற்றும் முதலீட்டு ஊக்குவிப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) குருநாகல் மாவட்டத்தில், பன்னல - குளியாப்பிட்டி வீதி அபிவிருத்தி கருத்திட்டத்திற்கு உரியதான வீதியின் நீளம் மற்றும் அகலம் யாதென்பதையும்;

(ii) மேற்படி வீதியின் மறுசீரமைப்பு நடவடிக்கைகளுக்காக எவ்வளவு காலம் எடுக்கும் என்பதையும்;

(iii) மேற்படி வீதிக்கான நிர்மாணிப்பாளர் கேள்விப் பத்திர நடைமுறையின்மூலம் தேர்ந்தெடுக்கப் பட்டாரா என்பதையும்;

(iv) ஆமெனில் தேர்ந்தெடுக்கப்பட்ட விலைக்கேள்வியாளரின்/நிறுவனத்தின் பெயர் யாதென்பதையும்;

(v) மேற்படி கருத்திட்டத்திற்கான நிதி பெற்றுக் கொள்ளப்படும் மூலங்கள் யாவையென்பதையும்;

(vi) மேற்படி வீதியின் ஒரு கிலோ மீற்றரை நிர்மாணிப்பதற்காக செலவாகும் கிரயம் எவ்வளவு என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ)(i) மேலே குறிப்பிடப்பட்ட வீதியின் நிர்மாணப் பணிகள் மேற்கொள்ளப்படுகின்ற காலப்பகுதியில் வாகனப்போக்குவரத்துக் கட்டுப்பாட்டுக்கான வேலைத்திட்டமொன்று இனங்காணப் பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், முழுக் கருத்திட்டத்தின் ஊடாக அதற்காக ஒதுக்கப்பட்டுள்ள பணத்தொகை எவ்வளவென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) மேற்படி வீதி அபிவிருத்திக் கருத்திட்டத்தை நடைமுறைப்படுத்தும்போது பாதிக்கப்படுகின்ற தரப்பினர்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) அவ்வாறு பாதிக்கப்பட்டவர்களுக்கு நட்டஈடு வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், நட்டஈடு வழங்கப்பட்டுள்ளவர்களின் விபரங்கள் யாவையென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Highways, Higher Education and Investment Promotion:

(a) Will he state -

(i) the length and width of the road relevant to the Pannala-Kuliyapitiya Road Development Project in Kurunegala District;

(ii) the time frame required for rehabilitation of the said road;

(iii) whether the constructor of that road was selected through a tender procedure;

(iv) if so, the name of the bidder/institution selected;

(v) the source from which funds are obtained for the said Project; and

(vi) the construction cost per kilometre of the said road?

(b) Will he inform this House -

(i) whether a programme to control traffic on that road while construction work is underway, has been identified; and

(ii) if so, the amount allocated for that purpose out of the total project cost?

(c) Will he also state -

(i) the number of parties aggrieved as a result of implementing that Project;

(ii) whether the persons so aggrieved have been paid compensation; and

(iii) if so, the details of those who were paid compensation?

(d) If not, why?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நெடுஞ்சாலைகள், உயர்கல்வி மற்றும் முதலீட்டு ஊக்குவிப்பு பிரதி அமைச்சர்)

(The Hon. Eran Wickramaratne - Deputy Minister of Highways, Higher Education and Investment Promotion)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) පන්නල -කුලියාපිටිය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පන්නල- කුලියාපිටිය සහ හෙට්ටිපොල- කුලියාපිටිය යන මාර්ග දෙකම ප්‍රතිසංස්කරණය කරනු ලබන බැවින්, එම ව්‍යාපෘතියට අදාළ විස්තර පහත පරිදි වේ.

පන්නල -කුලියාපිටිය මාර්ගය

මාර්ගයේ දිග - කිලෝ මීටර් 11.28

මාර්ගයේ පළල - මීටර් 9.4 (මාර්ග උරහිස සහිතව)

හෙට්ටිපොල- කුලියාපිටිය මාර්ගය

මාර්ගයේ දිග - කිලෝ මීටර් 15.69

මාර්ගයේ පළල - මීටර් 9.4 (මාර්ග උරහිස සහිතව)

(ii) මාස 24 (2013.01.09 සිට 2015.01.08 දක්වා)

(iii) කොන්ත්‍රාත්කරු වන නෙම් කන්ස්ට්‍රක්ෂන් ආයතනය විසින් ලබා දුන් යෝජනාවකට අනුව ලංකා බැංකුව මඟින් ලබා ගත් ණය ආධාර යටතේ මේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

(iv) නෙම් කන්ස්ට්‍රක්ෂන් සමාගම.(N E M Construction Company)

(v) ලංකා බැංකුව.

(vi) රුපියල් මිලියන 73.5

(ආ) (i) ඔව්. මාර්ග සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති සඳහා ක්‍රියාත්මක කරන ලද රථ වාහන පාලන සැලැස්ම අනුව සැලසුම් කර ඇත. (උදා:මාර්ග සංඥා, මාර්ග බාධක, රාත්‍රී කාලය සඳහා භාවිත කරන විදුලි ලාම්පු ආදිය)

(ii) ඉහත මාර්ග කොටස් දෙක සඳහා මසකට රුපියල් මිලියන 2.197ක් පමණ.

(ඇ) (i) මෙම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමක් සිදු කර ඇත. මාර්ගය පුළුල් කිරීමේ කටයුතු සිදු කිරීමේදී ඉඩම් හිමියන් ඒ සඳහා ලබා දුන් භූමිය පමණක් භාවිත කර මාර්ගය සංවර්ධනය කර ඇත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(ඈ) පැන නොනඟී.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා සඳහන් කළ මාර්ගයේ පන්නල සිට කුලියාපිටිය දක්වා වූ කොටසේ පළමු කිලෝමීටර් පහේ ඉදි කිරීම කටයුතු ඔබතුමා ඔය සඳහන් කළ ව්‍යාපෘතිය කිරීමට වසරකට පෙර සිදු කළා. හැබැයි, නැවත වසරකින් පසුව ඔය දෙවැනි ව්‍යාපෘතියේදී -පන්නල සිට කුලියාපිටිය දක්වා ව්‍යාපෘතියේදී- ඒ කිලෝමීටර් පහේ නැවතත් කාපට් ඇතිරුවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ විධියට පසු ගිය කාලයේ අවුරුද්දෙන් අවුරුද්ද කිසිදු ක්‍රමවේදයකින් තොරව පාරවල කාපට් උඩ කාපට් දැම්මා. පසු ගිය කාලයේ කරන ලද මාර්ග ව්‍යාපෘතිවල මේ විධියට විශාල වශයෙන් දූෂණ සිදු වුණු බව අපි දන්නවා. මේ සම්බන්ධයෙන් අරගෙන තිබෙන ක්‍රියා මාර්ග මොනවාද, ඔබතුමන්ලාගේ අමාත්‍යාංශය විසින් මේ දක්වා සොයා ගෙන තිබෙන දූෂණ හා වංචා මොනවාද කියලා මා ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මාර්යේ කාපට් එකක් උඩ තව කාපට් එකක් දැම්මාද, නැද්ද කියන එක ගැන මට අදහසක් නැහැ. නමුත්, ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා කියපු නිසා මම ඒ ගැන සොයා බලන්නම්. දූෂණය ගැන කථා කරපු නිසා මම කියන්න ඕනෑ, මේ සමහර පාරවල් හදලා තිබෙන්නේ බැංකු ණය අරගෙන බව. බැංකු ණය ගන්නකොට මුළු පාරටම තිබෙන වියදම ගන්නවා. නමුත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන්නේ, ඒ වසරේදී ගෙවන්න තිබෙන මූල්‍ය ප්‍රමාණයයි, ඒ වසරේදී ගෙවන්න තිබෙන පොලී ප්‍රමාණයයි පමණයි. ඇත්තටම පාර්ලිමේන්තුව කැප වෙලා තිබෙනවා, විශාල වග කීමක් අරගෙන තිබෙනවා. නමුත් පාර්ලිමේන්තුවට හෙළිදරවු කරලා තිබෙන්නේ ඒ කොටස පමණයි. ඒ බැංකු ණය ගන්න කොට බොහෝ විට මුදල් අමාත්‍යාංශයෙන් guarantee එකක් දීලා තිබෙනවා. ඒ guarantee එක පිළිබඳව පාර්ලිමේන්තුවට දැන ගන්න ලැබෙන්නේත් අවුරුද්ද මැද දී වරක් පමණයි. මේ වාගේ දේවල් බොහොමයක් අපි සොයා ගෙන තිබෙනවා. ඒවා පිළිබඳව තවම ක්‍රියා කරලා නැහැ. නමුත් ක්‍රියා කරන්න බලාපොරොත්තු වනවා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. ඔබතුමා සඳහන් කරපු මාර්ගයේ කුලියාපිටිය සිට හෙට්ටිපොල දක්වා මාර්ගයේ අන්තිම කිලෝමීටර් දෙක ඉදි කරන්න බැරි වෙලා තිබෙනවා, ඒ සඳහන් කරපු මුදල ප්‍රමාණවත් නැහැයි කියලා. මේ වන විට අන්තිම කිලෝමීටර් දෙක ඉදි කරලා නැහැ. ඒකේ වැඩ නතර කරලා තිබෙනවා. මා කියන්නේ, යම්කිසි ගිවිසුමකට එළඹුණා නම් ඒ සමස්ත මාර්ගයම ඉදි කරලා ඉවර කරන්න ඕනෑ කියලායි. ඒ මාර්ගයේ විතරක් නොවෙයි, ගිරිඋල්ල - දංකොටුව මාර්ගයේත් අන්තිම කිලෝමීටර් තුන ඉදි කරලා නැහැ, මුදල් මදි කියලා. යම්කිසි ගිවිසුමකට එළැඹිලා අන්තිම කිලෝමීටර් 2ක් ඉතුරු වුණේ, හිටපු රජය මේ කිලෝමීටර් 2 කෙළවරවලින් කෑවාද කියලා මා ඔබතුමාගෙන් අහනවා. ඔබතුමා ඒ ගැන සොයා බලා තිබෙනවාද කියා මා අහනවා.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගිවිසුම අනුව අනිවාර්යයෙන්ම කිලෝමීටර් 11.28 සම්පූර්ණ කරන්න ඕනෑ. ඒක සම්පූර්ණ කරලා නැත්නම් අපි ඒ ගිවිසුම ප්‍රකාරයටම අධිකරණ මාර්ගයකට යනවා. ඒ ගිවිසුම සම්පූර්ණ කරලා නැත්නම් අනිවාර්යයෙන්ම අධිකරණයෙන් දඬුවම් දෙයි.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාගේ තුන්වෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. පසු ගිය කාලයේ මාර්ග ව්‍යාපෘතිවල සමාගම් කිහිපයක මාෆියාවක් තිබුණා. සමාගම් අතළොස්සක කොන්ත්‍රාත්කරුවන්ට පමණක් මාර්ගවල කොන්ත්‍රාත් කරන්නට පුළුවන් විධියට අවශ්‍ය ලිය කියවිලි හදලා, අවශ්‍ය නීති රීති හදලා, සාමාන්‍ය මධ්‍යම ප්‍රමාණයේ කොන්ත්‍රාත්කරුවන්ට මාර්ගවල කොන්ත්‍රාත්තු ගන්න බැරි විධියට කටයුතු කරලා තිබුණා, විශේෂයෙන් මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශයේ හිටපු ලේකම්තුමා ඇතුළු කණ්ඩායමක්. මේ සඳහා ඇමතිවරුත් සම්බන්ධ වෙලා සිටියා. ඉදිරියේදීත් කිහිප දෙනකුට පමණක් මෙම කොන්ත්‍රාත් ලබා ගන්නට පුළුවන් තත්ත්වය පවත්වාගෙන යාමට ඔබතුමන්ලා කටයුතු කරනවාද, එහෙම නැත්නම් සුදුසුකම් ලබන, මේ ක්ෂේත්‍රයේ ව්‍යාපාර කටයුතු කරන රටේ සියලුම දෙනාට ව්‍යාපාර කරන්න අවශ්‍ය කටයුතු සකස් කරලා දෙනවාද?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ඔබතුමා කියන කාරණය අපි පිළිගන්නවා. මම එක උදාහරණයක් දෙන්නම්. උතුරු අධිවේගී මාර්ගයේ පළමුවෙනි කොටස හැරෙන්නට දෙවෙනි, තුන්වෙනි, හතරවෙනි, පස්වෙනි සහ හයවෙනි කොටස් විශාල කොන්ත්‍රාත්තුකරුවන්ට ආරාධනා

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

කරලා කිසිම ටෙන්ඩර් පටිපාටියක් නැතිව, තරගකාරී පටිපාටියක් නොමැතිව ඒ අයට කොන්ත්‍රාත් දීලා තිබෙනවා. පළමුවෙනි කොටස දීලා නැහැ. ඕනෑම කෙනකුට තේරෙනවා, මහා මාර්ගයක් ගොඩ නඟන විට ජනාකීර්ණම, තදබද වැඩිම ප්‍රදේශයේ - සාමාන්‍යයෙන් අගනුවරින් පිටවීම සහ අගනුවරට ඇතුළුවීම වැනි ස්ථානවල- කොන්ත්‍රාත්තුව තමයි මුලින්ම දෙන්න ඕනෑ කියලා. විශේෂඥයකු වන්නට ඕනෑ නැහැ, ඒක ඕනෑම කෙනෙක් දන්නවා. නමුත් ඒක නොදී අනෙක් කොන්ත්‍රාත්තු දීලා තිබෙනවා. මේවා තරගකාරී පටිපාටියෙන් තොරවයි දීලා තිබෙන්නේ. අපි ඒ එක කොන්ත්‍රාත්තුවක්වත් ක්‍රියාත්මක කරන්නේ නැහැ කියලා සඳහන් කරනවා. මොකද, අපි දන්නවා, එතැන දූෂණයක් තිබෙනවා කියලා. ඒ කොන්ත්‍රාත්තු ක්‍රියාත්මක කරන්නේ නැහැ. නමුත් අපි දූෂණය නැති අනෙක් සියලුම සංවර්ධන කටයුතු කරගෙන යනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 7-4538/'13-(1), ගරු බුද්ධික පතිරණ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදේශ රැකියා අමාත්‍යතුමිය වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

බැංකු සහකරුවන් බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ: ක්‍රමවේදය
வங்கி உதவியாளர் ஆட்சேர்ப்புக்கான நேர்முகப்பரீட்சை: முறைமை
INTERVIEWS FOR RECRUITMENT OF BANKING ASSISTANTS : METHODOLOGY

5265/'14

9. ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ජාතික ඉතිරි කිරීමේ බැංකුවට බැංකු සහකාර (ලිපිකරු) ශ්‍රේණියට සේවකයන් බඳවා ගැනීම පිණිස 2014 මැයි මස 31, ජූනි මස 01 සහ ජූනි මස 07 සහ 08 යන සති අන්තවල සම්මුඛ පරීක්ෂණ පැවැත් වූයේද;

(ii) එසේ සම්මුඛ පරීක්ෂණ පැවැත් වූයේ නම්, ඒ සඳහා ගැසට් මඟින් හෝ පුවත් පත් මඟින් දැන්වීම් පළ කර අයදුම් පත් කැඳවීමක් සිදු කළේද;

(iii) එලෙස විවෘත අයදුම් පත් කැඳවීමක් සිදු නොකළේ නම්, සම්මුඛ පරීක්ෂණයට කැඳවීම පිණිස අපේක්ෂකයින් තෝරා ගත් ක්‍රමවේදය කවරේද;

(iv) එම පිරිස ඌව පළාත් සභා මැතිවරණයට පෙර බඳවා ගැනීමට සැලසුමක් තිබුණේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தேசிய சேமிப்பு வங்கிக்கு, வங்கி உதவியாளர் (எழுதுநர்) தரத்திற்குப் பணியாளர்களை ஆட்சேர்ப்பதற்காக 2014 மே மாதம் 31, யூன் மாதம் 01 மற்றும் யூன் மாதம் 07, 08 ஆகிய வார இறுதி நாட்களில் நேர்முகப் பரீட்சை நடத்தப் பட்டதா என்பதையும்;

(ii) நேர்முகப் பரீட்சை நடத்தப்பட்டிருப்பின், அதற்காக வர்த்தமானப் பத்திரிகை மூலம் அல்லது பத்திரிகை மூலம் விளம்பரம் செய்யப்பட்டு விண்ணப்பங்கள் கோரப்பட்டதா என்பதையும்;

(iii) அவ்வாறு பகிரங்கமாக விண்ணப்பங்கள் கோரப்படவில்லையெனில், நேர்முகப் பரீட்சைக்கு அழைப்பதற்காக விண்ணப் பதாரிகள் தெரிவு செய்யப்பட்ட முறைமை யாதென்பதையும்;

(iv) மேற்படி ஆட்களை ஊவா மாகாண சபைத் தேர்தலுக்கு முன்னர் ஆட்சேர்ப்பதற்கு திட்டமிடப்பட்டிருந்ததா என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance:

(a) Will he inform this House -

(i) whether interviews were held on the weekends of 31st May, 1st June and 07th and 08th June, 2014 for the recruitment of employees to the grade of Banking Assistants (Clerks) of the National Savings Bank;

(ii) if interviews were held, whether applications were called through notices published in the gazette or newspapers;

(iii) if such open applications were not called, what was the methodology adopted in calling candidates for the interview; and

(iv) whether there was a plan to recruit this group prior to the Uva Provincial Council Election?

(b) If not, why?

ගරු රවි කරුණානායක මහතා (මුදල් අමාත්‍යතුමා)
(மாண்புமிகு ரவி கருணாநாயக்க - நிதி அமைச்சர்)
(The Hon. Ravi Karunanayake - Minister of Finance)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ) (i) ඔව්.

(ii) නැත.

(iii) බැංකුවේ බැංකු සහකාර I තනතුර සඳහා අපේක්ෂක ලැයිස්තුවක් තමා වෙත ලැබී ඇති බව සභාපතිනිය විසින් 2014.05.08 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අධ්‍යක්ෂවරුන් වෙත දන්වා ඇති අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම තනතුර සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් මුල පිරීමට එකඟතාව පළ කර ඇත. ලද අයැදුම්පත් පරීක්ෂා කර බැලීමෙන් අනතුරුව බැංකු සහකාර I තනතුරට අදාළ බඳවා ගැනීමේ පටිපාටියට අනුව සුදුසුකම් ඇති අයැදුම්කරුවන් තෝරා ගැනීම පිණිස සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවන ලදී.

(iv) නැත.

(ආ) බැංකු සහකාර I තනතුර සඳහා අවසන් වරට බඳවා ගැනීම් සිදු කරනු ලැබුවේ 2012 දී වන අතර, 2014 වර්ෂයේ පැවති පුරප්පාඩු සලකා බලා බැංකු සහකාර තනතුර සඳහා ඉහත කී බඳවා ගැනීම් සිදු කරන ලදී.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඒ කියන්නේ තමුන්නාන්සේලා බඳවා ගෙන තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙසේයි. කලින් ප්‍රශ්නයේදී අහපු ප්‍රශ්නය තමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විභාග පවත්වලා, සම්මුඛ පරීක්ෂණ කැඳවලා, සේවා ඇගයීම් විස්තර කැඳවලා අවුරුදු තුනක් යනකම් බඳවා ගන්නේ නැතිවීම සම්බන්ධයෙන්.

මේ ප්‍රශ්නය තිබෙන නිසා තමයි, පත්තර දැන්වීමක් දමන්නෙත් නැහැ. අයදුම් පත් කැඳවන්නෙත් නැහැ. තෝරාගත්ත නාම ලේඛනයකට මේ බැංකුවේ රස්සා දෙනවා. එතකොට විධිමත් ක්‍රමවේදයට මේ බැංකුවේ රස්සාව නැතුව යනවා. අවිධිමත් ක්‍රමවේදයට රස්සාව ලැබෙනවා. ඒ නිසා ඔබතුමාගෙන් විශේෂයෙන් දැන ගන්න කැමැතියි, බැංකුවක් වැනි ආයතනයක මේ අවිධිමත් බඳවා ගැනීමේ පටිපාටිය අනුගමනය කරන ලද සභාපතිවරයා හෝ අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ හෝ ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද කියා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ස්තුතියි ගරු මන්ත්‍රීතුමනි. මා නැවත මතක් කරන්න අවශ්‍යයි මේ කථා කරන්නේ මීට පෙර තිබුණු පාලනයක් අපි බාර අරගෙන සිටින අවස්ථාවකයි. ඔබතුමා ප්‍රශ්න කරන්නේ එවකට පැවැති මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේ කටයුතු සම්බන්ධයෙන්. අපි අනිවාර්යයෙන් ඔබතුමා කිව්ව පරිදි මේ සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් කරලා ගත යුතු ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරන්නම්. ඒක මම ඔබතුමාට දැනුවත් කරන්නම්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. මම නැවතත් අහන්නේ මෙයයි. ඔබතුමා කලින් ප්‍රශ්නය අහනකොට හිටියා නම් හොඳයි. [බාධා කිරීමක්] ඔව්. එතුමා පිළිතුරු දුන්නා. එහිදී පැන නැඟුන ප්‍රශ්නය තමයි මා කලින් කරපු විස්තරය. හැබැයි, ඒ ගොල්ලෝ දැන් අවුරුදු තුනක් විතර යනකම් බඳවාගෙන නැහැ. ඒ ගොල්ලෝ නියමිත ක්‍රියාපටිපාටියට බඳවා ගත යුතු අය. ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, ඒ බඳවා නොගත් පිරිස බඳවා ගැනීම සඳහා ඉක්මනින් කටයුතු කරනවාද කියලා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු මන්ත්‍රීතුමනි, මේකේ තිබෙන පුදුම දේ තමයි එකම ඇමති, එකම ලේකම්, නමුත් ඒ ආයතන දෙක වෙනස් විධියට ක්‍රියාත්මක කර තිබීම. ඉතින් අපට කරන්න තිබෙන්නේ මෙයයි. දැන් මේ බැංකුවත් කඩා වැටිලායි තිබෙන්නේ. මේ බාර අරගෙන තිබෙන ආයතන තුළ මේ වාගේ විෂමතාවක් තිබුණා නම්, අපි ඉදිරියේදී මෙහි පුනර්ජීවනයක් ඇති කරනවා. මේක වෙනත් විධියකට re-position කරන්න හදනවා. මොකද මේ යන විධියට ගියොත් මේ බැංකුව ඉතාමත් අස්ථාවරභාවයකට පත්වෙනවා.

මා මේ කියන්නේ ඔබතුමා අහපු පළමුවැනි ප්‍රශ්නය ගැනයි. මා මෙසේ කියන්නේ, ඔබතුමා ඒ ප්‍රශ්නයත් සමඟ සංසන්දනය කිරීමක් කරපු නිසායි. ඒ අයට යම්කිසි ප්‍රශ්නයක් ඇති වෙලා තිබුණොත් ඒ සම්බන්ධයෙන් සාධාරණයක් ඉෂ්ට කරන්න අපි බැඳී සිටිනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙසේයි. 2014 මැයි මස 31, ජූනි මස 01 සහ ජූලි මස 07 සහ 08 කියන සති අන්තවල සම්මුඛ පරීක්ෂණයක් කැඳවා තිබෙනවා. නමුත් සම්මුඛ පරීක්ෂණයකට යන්න නම්, එක්කෝ ඒ දරුවන් ඉල්ලුම් පත්‍ර දමන්න ඕනෑ. ඒ දරුවන් ඉල්ලුම් පත්‍ර දමන්න නම් බඳවා ගන්නවා කියා පත්තර දැන්වීමක් හෝ ගැසට් නිවේදනයක් නිකුත් කරලා තිබෙන්න ඕනෑ. නමුත් ඒ බඳවා ගැනීම පිළිබඳ ගැසට් නිවේදනයකුත් නැහැ, බඳවා ගැනීම පිළිබඳ පත්තර දැන්වීමකුත් නැහැ, පුරප්පාඩුවක් ඇති වී තිබෙන බව ප්‍රසිද්ධ කොට දැන්වීම් ප්‍රකාශයට පත් කරලාත් නැහැ. එසේ නම් ඒ සම්මුඛ පරීක්ෂණය කැඳවීම වෙනුවෙන් ඒ කණ්ඩායම තෝරා ගනු ලැබුවේ කවර පදනමකින්ද? කවුද ලැයිස්තුව එව්වේ? මේ හිටපු ඇමතිවරුනුත් ඒ ගැන දන්නවා ඇති. උපරිම වුණොත් මේ හිටපු ඇමතිවරුන්ටත් ඒවායෙන් එකක් හෝ දෙකක් දෙන්න ඇති. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඒ ගැන දැනගන්න කැමැතියි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු මන්ත්‍රීතුමනි, මම අගය කරනවා මේ සම්බන්ධයෙන් හෙළිදරව් කිරීමට අවස්ථාව ලබා දීම ගැන. ඔව්, සෑම බැංකුවකටම වෙනත් වෙනත් ස්ථාවරයනුයි පාවිච්චි කරලා තිබෙන්නේ. මෙහි මූලිකම කාරණය වන්නේ, ඒ අය විභාගයක් මඟින් බඳවාගෙන නොතිබීමයි. විභාගයක ස්වරූපයක් පෙන්වලා හිතුමතයට බැංකු ක්ෂේත්‍රයේ එක් එක් තැන්වලට ඇදගෙන තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, දැනට ඒ අය බඳවාගෙන තිබෙන නිසාත්, යම් කාල පරිච්ඡේදයක් ඒ අය වැඩ කර තිබෙන නිසාත් මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි, -

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඒ අය කවුරුන් වුවත් රක්ෂාලාභීන් නේ. බඳවා ගත් සේවකයන් ඉවත් කිරීමක් ගැන නොවෙයි මා කියන්නේ. ඒ අයට රැකියාවක් ලබා ගැනීමට අධ්‍යාපන සුදුසුකම වාගේම, පුහුණුව වාගේම, සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු ලබා ගැනීම වාගේම නිල් බලකායේ සාමාජිකයකු වීමත් අනිවාර්ය වී තිබුණා. ඒක ඒ දරුවන්ගේ වැරැද්දක් නොවෙයි. ඒක තමයි බඳවා ගැනීමේ පටිපාටියේ අලුත් වගන්තිය. ඔහු හෝ ඇය නිල් බලකායේ

[ගරු අනුර දිසානායක මහතා]

සාමාජිකයකු බවට පත් විය යුතුයි. ඒ නිසා ඒ දරුවන් කැමති වුණත්, අකමැති වුණත් රස්සාවට බඳවා ගැනීමේ ක්‍රමවේදයේ එක් කඩ ඉමක් තිබෙනවා, නිල් බලකායේ සාමාජිකයකු බවට පත් වන්න; ඒ නිසා කැමැත්තෙන් හෝ අකමැත්තෙන් ඒ දරුවන්ට එහි සාමාජිකත්වය ගන්න සිදු වුණා. ඒ නිසා මෙතැන තිබෙන්නේ ඒ දරුවන්ගේ ප්‍රශ්නයක් නොවෙයි. මෙතැන තිබෙන්නේ නියමිත පරිදි බැංකු සේවයට බඳවා ගැනීමේ පටිපාටිය උල්ලංඝනය කරමින් බඳවා ගන්නා ලද නිලධාරි සම්බන්ධ ප්‍රශ්නයක්. විශේෂයෙන්ම එහි සභාපතිවරයා, අධ්‍යක්ෂ මණ්ඩලය, ඒ ලැයිස්තුව එවන ලද පුද්ගලයා, ඒවා අනුමත කරන ලද පුද්ගලයන් පිළිබඳව තමයි ක්‍රියා මාර්ගයක් ගත යුතු වන්නේ. ගරු ඇමතිතුමනි, ඒ පිළිබඳව ඔබතුමා ගනු ලබන ක්‍රියා මාර්ගය පිළිබඳව මම දැනගන්න කැමැතියි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මම මීට පෙර කිව්ව පරිදි අනිවාර්යයෙන්ම ඒ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් යොමු කරනවා. ඒ අධ්‍යක්ෂ මණ්ඩලයත්, සභාපතිත් ඇතුළුව මේ සම්බන්ධයෙන් කරලා තිබෙන වැරැද්ද පාර්ලිමේන්තුවට හෙළිදරව් කර ඊට පස්සේ ඒකට දිය යුතු නිසියාකාර දඬුවම් මොනවාද කියලා තීරණය කරන බව මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

එසේ ප්‍රකාශ කරන ගමන්ම මම තවත් කරුණක් මතක් කරන්න කැමැතියි. මේ සභාවට එන්න ඉස්සෙල්ලා මට දුරකථනයෙන් ඇමතුවා, අද Rural Bank එකේ පළමුවැනි Board Meeting එක තිබෙනවාය කියලා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

Rural Bank එකේද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Rural Bank එකේ headquartersවල. ඒ කියන්නේ බැංකු නවයක් තිබෙනවා - regional banks. පළමුවැනි වතාවට ඒකේ Board Meeting එක තිබෙන්නේ අද. ඒ බැංකුවෙන් රුපියල් කෝටි 2,300ක මුදල් ප්‍රමාණයක් කිසිම ඇපයක් නැතිව යම් කිසි පිරිසකට මැතිවරණයට පෙර දීලා තිබෙනවා කියලා අපි දැනුවත් වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වාගේ දේවල් තුළින් ඉතාමත් භයානකකාරී තත්ත්වයක් බැංකු ක්ෂේත්‍රයේ ඇති වෙලා තිබෙනවා. මම මෙතැනදී පෙන්වූයේ සමහරු කරන විෂමතා තුළ මේ වාගේ ඒවාත් තිබෙන බවයි. ණය ගන්න එක විතරක් නොවෙයි, ණය දෙන එකත් කිසිම ඇපයක් නැතිව දීලා තිබෙනවා.

ඒගොල්ලන් කියලා තිබෙනවා, මෙයින් බැංකුවේ ඉදිරි ගමනට බාධාවක් ඇති වෙලා තිබෙනවා කියලා. මා කිව්වා, අපේ ගරු අගමැතිතුමාගෙනුත් ඒ පිළිබඳව අහලා ඒ තොරතුරු අනුව මොනවාද කරන්න පුළුවන් කියන එක තීරණය කරන්නම් කියලා. මොකද, මේ ණය නවත්වනවාද, දෙනවාද, කියන එක ගැන ඒගොල්ලන්ට නිර්දේශයක් අවශ්‍යයි. අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අනුමත කළොත් ඒක නෛතික වෙනවා. ඔබතුමා මේ ප්‍රශ්නය ඉදිරිපත් කළ නිසායි මම ඒ ගැනත් සඳහන් කළේ.

හෙට්ටිපොල - කුලියාපිටිය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය : විස්තර
ஹெட்டிபொல - குளியாப்பிட்டி வீதி அபிவிருத்தி கருத்திட்டம் : விபரம்
HETTIPOLA - KULIYAPITIYA ROAD DEVELOPMENT PROJECT: DETAILS

5770/'14

10. ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හෙට්ටිපොල - කුලියාපිටිය මාර්ග සංවර්ධන ව්‍යාපෘතියට අදාළ මාර්ගයේ දුර ප්‍රමාණය සහ පළල කොපමණද;

(ii) එම මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ගත වන කාල සීමාව කවරේද;

(iii) එම මාර්ගයේ ඉදි කිරීමකරු තෝරාගනු ලැබුවේ ටෙන්ඩර් පටිපාටියක් මඟින්ද;

(iv) එසේ නම්, තෝරාගනු ලැබූ ලංසුකරුගේ/ ආයතනයේ නම කවරේද;

(v) එම ව්‍යාපෘතිය සඳහා මුදල් ලබා ගන්නා මූලාශ්‍ර කවරේද;

(vi) එම මාර්ගයේ එක් කිලෝමීටරයක් ඉදි කිරීම සඳහා වැය වෙන පිරිවැය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් මාර්ගයේ ඉදි කිරීම කටයුතු සිදුකරන කාලය තුළ රථ වාහන පාලනය සඳහා වැඩ පිළිවෙළක් හඳුනාගෙන තිබේද;

(ii) එසේ නම්, සම්පූර්ණ ව්‍යාපෘතිය තුළින් ඒ සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී අගතියට පත්වන පාර්ශ්වකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ අගතියට පත් අයට වන්දි ප්‍රදානය කර තිබේද;

(iii) එසේ නම්, වන්දි ලබා දුන් අයගේ විස්තර කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

நெடுஞ்சாலைகள், உயர்கல்வி மற்றும் முதலீட்டு ஊக்குவிப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) குருநாகல் மாவட்டத்தில், ஹெட்டிபொல - குளியாப்பிட்டி வீதி அபிவிருத்தி கருத்திட்டத்திற்கு உரியதான வீதியின் நீளம் மற்றும் அகலம் யாதென்பதையும்;

(ii) மேற்படி வீதியின் மறுசீரமைப்பு நடவடிக்கைகளுக்காக எவ்வளவு காலம் எடுக்கும் என்பதையும்;

(iii) மேற்படி வீதிக்கான நிர்மாணிப்பாளர் கேள்விப் பத்திர நடைமுறையின்மூலம் தேர்ந்தெடுக்கப் பட்டாரா என்பதையும்;

(iv) ஆமெனில் தேர்ந்தெடுக்கப்பட்ட விலைக்கேள் வியாளரின்/நிறுவனத்தின் பெயர் யாதென் பதையும்;

(v) மேற்படி கருத்திட்டத்திற்கான நிதி பெற்றுக் கொள்ளப்படும் மூலங்கள் யாவையென் பதையும்;

(vi) மேற்படி வீதியின் ஒரு கிலோ மீற்றரை நிர்மாணிப்பதற்காக செலவிடப்படும் தொகை எவ்வளவு என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேலே குறிப்பிடப்பட்ட வீதியின் நிர்மாணப் பணிகள் மேற்கொள்ளப்படுகின்ற காலப் பகுதியில் வாகனப்போக்குவரத்துக் கட்டுப் பாட்டுக்கான வேலைத்திட்டமொன்று இனங் காணப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், முழுக் கருத்திட்டத்தின் ஊடாக அதற்காக ஒதுக்கப்பட்டுள்ள பணத்தொகை எவ்வளவென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) மேற்படி வீதி அபிவிருத்திக் கருத்திட்டத்தை நடைமுறைப்படுத்தும்போது பாதிக்கப்படுகின்ற தரப்பினர்களின் எண்ணிக்கை எத்தனை யென்பதையும்;

(ii) அவ்வாறு பாதிக்கப்பட்டவர்களுக்கு நட்டஈடு வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், நட்டஈடு வழங்கப்பட்டுள்ளவர்களின் விபரங்கள் யாவையென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Highways, Higher Education and Investment Promotion:

(a) Will he state -

(i) the length and width of the road that is relevant to the Kuliyapitiya-Hettipola Road development project of the Kurunegala District;

(ii) the period of time that will be spent for the renovation work of the aforesaid road;

(iii) whether the constructor of the aforesaid road was selected through a tender procedure;

(iv) if so, the name of the bidder/ institution that was selected;

(v) the sources from which funds will be obtained for the aforesaid project; and

(vi) the cost for constructing one kilometre of the aforesaid road?

(b) Will he inform this House -

(i) whether a traffic control plan has been identified for the duration of construction work on the aforesaid road; and

(ii) if so, the amount of money allocated for the above purpose through the entire project?

(c) Will he also state -

(i) the number of parties that will be affected through the implementation of the aforesaid project;

(ii) whether compensation has been paid to those affected parties; and

(iii) if so, the details of those who have been paid compensation?

(d) If not, why?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) හෙට්ටිපොල - කුලියාපිටිය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පන්නල - කුලියාපිටිය හා හෙට්ටිපොල - කුලියාපිටිය යන මාර්ග දෙකම ප්‍රතිසංස්කරණය කරනු ලබන බැවින්, එම ව්‍යාපෘතියට අදාළ විස්තර පහත පරිදි වේ.

පන්නල - කුලියාපිටිය මාර්ගය

මාර්ගයේ දිග - කි.මී. 11.28

මාර්ගයේ පළල - මීටර් 9.4 (මාර්ග උරහිස සහිතව)

හෙට්ටිපොල - කුලියාපිටිය මාර්ගය

මාර්ගයේ දිග - කි.මී.15.69

මාර්ගයේ පළල - මීටර් 9.4 (මාර්ග උරහිස සහිතව)

(ii) මාස 24 (2013.01.09 සිට 2015.01.08 දක්වා)

(iii) කොන්ත්‍රාත්කරු වන නෙම් කන්ස්ට්‍රක්ෂන් ආයතනය විසින් ලබා දුන් යෝජනාවකට අනුව ලංකා බැංකුව මඟින් ලබා ගත් ණය ආධාර යටතේ මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

(iv) නෙම් කන්ස්ට්‍රක්ෂන් සමාගම (NEM Construction Company)

(v) ලංකා බැංකුව

(vi) රුපියල් මිලියන 73.5

(ආ) (i) ඔව්.

මාර්ග සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති සඳහා ක්‍රියාත්මක කරන රථවාහන පාලන සැලැස්ම අනුව, සැලසුම් කර ඇත.

(උදා- මාර්ග සංඥා, මාර්ග බාධක, රාත්‍රී කාලය සඳහා භාවිතා කරන විදුලි ලාම්පු ආදිය)

(ii) ඉහත මාර්ග කොටස් දෙක සඳහා මසකට රු. මිලියන 2.197ක් පමණ

(ඇ) (i) මෙම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමක් සිදු කර නැත. මාර්ගය පුළුල් කිරීමේ කටයුතු සිදු කිරීමේදී ඉඩම් හිමියන් ඒ සඳහා ලබා දුන් භූමිය පමණක් භාවිතා කර මාර්ගය සංවර්ධනය කර ඇත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(ඈ) පැන නොනඟී.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 11-4589/'13-(1), ගරු බුද්ධික පතිරණ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විෂය භාර අමාත්‍යතුමියගෙන් මට කරුණු කිහිපයක් අහන්න තිබෙනවා. ඒ නිසා මේ ප්‍රශ්නය වෙනත් දවසක අහන්න මම කැමැතියි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමියගෙන්ම අහන්න ඕනෑද?

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඔව්. විෂය භාරව ඉන්නේ ගරු ඇමතිතුමිය නේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමාට - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට - කැමැති නැද්ද?

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු ඇමතිතුමාට කැමැතියි. නමුත් ඇමතිතුමා විෂය භාර ඇමතිවරයා නොවන නිසා මට ඕනෑ කරන උත්තරය ලැබෙන්නේ නැහැ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම විදේශ රැකියා අමාත්‍යතුමිය වෙනුවෙන් ඒ ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

විශ්‍රාම වැටුප් විෂමතාව : ඉවත් කිරීම
ஓய்வூதிய முரண்பாடுகள்: நீக்குதல்
PENSION ANOMALIES : REMOVAL

5447/'14

14. ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමා සහ බුද්ධ ශාසන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2006.01.01 දිනට පෙර විශ්‍රාමලත් රජයේ සේවකයින්ගේ වැටුප් විෂමතාව ඉවත් කරන බවට `ආදරණීය ජොෂ්ඨ පුරවැසියනි' යන හිසින් යුතුව, රජය මඟින් දැන්වීමක් පළ කරනු ලැබුවේද;

(ii) 2010 පැවැති ජනාධිපතිවරණයේදී හිටපු ජනාධිපතිවරයාගේ අත්සන සහිතව පළකර තිබූ එම දැන්වීමේ පහළින් `මම කියන දේ කරන, කරන දේ කියන කෙනෙක් වෙමි.' යනුවෙන් සඳහන් වූ නමුත්, එම වැටුප් විෂමතාවය මේ දක්වා ඉවත් නොකිරීමට හේතු කවරේද;

(iii) මේ පිළිබඳව 2012.11.29 වැනි දින පාර්ලිමේන්තුවේ නැගූ ප්‍රශ්නයකට පිළිතුරු ලබා දෙමින් ඉතා ඉක්මනින් එම වැටුප් විෂමතාවය ඉවත් කරනු ඇති බවට ප්‍රකාශයක් කළ බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම විශ්‍රාම වැටුප් විෂමතාවය ඉවත් කිරීමට කටයුතු කරන දිනය කවදාද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

அரசாங்க நிர்வாக, மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் சனநாயக ஆட்சி பற்றிய அமைச்சரும் புத்தசாசன அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2006.01.01ஆம் திகதிக்கு முன்னர் ஓய்வுபெற்ற அரச ஊழியர்களின் சம்பள முரண்பாட்டை நீக்குவதாக "அன்புக்குரிய மூத்த பிரசைகளே" எனும் தலைப்பில் அரசினால் அறிவித்தலொன்று வெளியிடப்பட்டதா என்பதையும்;

(ii) 2010ஆம் ஆண்டு நடைபெற்ற ஜனாதிபதித் தேர்தலின்போது முன்னாள் ஜனாதிபதியின் கையொப்பத்துடன் கூடியதாக வெளியிடப்பட்ட மேற்படி அறிவித்தலின் கீழே "நான் சொல்வதைச் செய்கின்ற, செய்வதைச் சொல்லுகின்ற ஒருவன்" என குறிப்பிடப்பட்டிருந்தபோதிலும், இற்றைவரை மேற்படி சம்பள முரண்பாடு நீக்கப்படாமைக்கான காரணம் யாதென்பதையும்;

(iii) இது சம்பந்தமாக 2012.11.29ஆம் திகதி பாராளுமன்றத்தில் எழுப்பிய வினாவுக்கு விடையளிக்கின்றபோது, மிக விரைவில் இச்சம்பள முரண்பாட்டை நீக்குவதாக அறிவிக்கப்பட்டதென்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) மேற்படி சம்பள முரண்பாட்டை நீக்குவதற்கு நடவடிக்கை மேற்கொள்ளப்படும் திகதி யாதென்பதை அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils, Local Government and Democratic Governance and Minister of Buddha Sasana:

(a) Will he inform this House -

(i) whether an advertisement was published by the Government under the heading "Beloved Senior Citizens" stating that the salary anomalies of the Public servants who had retired before 01st January, 2006 would be removed;

(ii) the reasons as to why the aforesaid salary anomalies have not been removed so far despite the fact that the said advertisement was published during the 2010 presidential election period carrying the signature of the former president with the caption "I say what I do, and do what I say" at the bottom of that advertisement; and

(iii) whether he is aware that, in response to a question that was raised in this Parliament on 29.11.2012, a statement was made in this House which said that the aforesaid salary anomalies will be removed very soon?

(iv) Will he state the date on which action will be taken to rectify the aforesaid salary anomalies?

(b) If not, why?

ගරු කරු ජයසූරිය මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍ය සහ බුද්ධ ශාසන අමාත්‍යතුමා)
(மாண்புமிகு கரு ஜயசூரிய - அரசாங்க நிருவாக, மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் சனநாயக ஆட்சி பற்றிய அமைச்சரும், புத்தசாசன அமைச்சரும்)
(The Hon. Karu Jayasuriya - Minister of Public Administration, Provincial Councils, Local Government and Democratic Governance and Minister of Buddha Sanasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

(අ) (i) පළ කර ඇත.

(ii) 2015 අය වැය යෝජනාවලින්ද, නව අය වැය යෝජනාවලින්ද එම ගැටලුව සඳහා විසඳුම් යෝජනා කර ඇත.

(iii) ප්‍රකාශ කර ඇත.

(ආ) විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කිරීමට අදාළ චක්‍රලේඛය නිකුත් කළ විට එම කාර්යය ඉටු කරනු ඇත.

(ඇ) අදාළ නොවේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2010 පළමුවැනි මාසයේ 11 වැනිදා පුවත් පත් දැන්වීම මා ළඟ තිබෙනවා.

ජනාධිපතිවරණය පැවැත් වූයේ 2010 පළමුවැනි මාසයේ 26වැනිදා. 2010 පළමුවැනි මාසයේ 11 වැනිදා පුවත් පත් දැන්වීමක් පළ කර තිබුණා. එහි අවසානයේ "මෙයට හිතවත්, මහින්ද රාජපක්ෂ" කියලා සඳහන් කර තිබෙනවා. එම පුවත් පත් දැන්වීම මා ළඟ තිබෙනවා. 2010.01.11 දින "දිවයින" පුවත් පතේ පළ වූ එම දැන්වීමේ වැටුප් විෂමතාව ගැන මෙහෙම සඳහන් කර තිබෙනවා :

"2006ට පෙර විශ්‍රාම ලැබූ සියලුම රජයේ සේවකයින්ගේ විශ්‍රාම වැටුප 2006 වැටුප් ක්‍රමයට ගැළපෙන අයුරින් සකස් කොට මීළඟ අය වැයේ සිට ක්‍රියාත්මක කරමි."

මේ දැන්වීම පළ කර තිබෙන්නේ, 2010 ජනවාරි මාසයේ. ඊළඟ අය වැය කියන්නේ 2011 වර්ෂයට ඉදිරිපත් කරන අය වැය. එම දැන්වීමේ අවසානයේ මෙසේ සඳහන් කර තිබෙනවා:

"මේ හුදෙක් පොරොන්දු මල්ලක් නොවේ, ඔබේ සැදැසමය ප්‍රීතියෙන් ගෙවනු දකින්නට කැමැති හෘදයාංගම ප්‍රාර්ථනයෙනි."

එතකොට මේ දැන්වීම අනුව රජයේ සේවකයන්ගේ විශ්‍රාම වැටුප් විෂමතාව 2011 ජනවාරි මාසයේ සිට ඉවත් විය යුතුව තිබෙනවා. නමුත් ඊට පසුවත් අය වැය ලේඛන 05කට වඩා වැඩි ප්‍රමාණයක් ඉදිරිපත් කර තිබෙනවා. නමුත් 2006 වසරේ විශ්‍රාම ලබා ගත් මේ විශ්‍රාමිකයන්ගේ වැටුප් විෂමතාව අවසන් කරන්න තවමත් සමත් වෙලා නැහැ. ඒ නිසා මා ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, එදා හිටපු ජනාධිපතිවරයා ලෙස ගරු මහින්ද රාජපක්ෂ මහතා මේ දැන්වීම අනුව පළ කරන ලද එකඟතාව වර්තමානයේ බිඳින්න හේතු වූයේ කවරේද කියලා.

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා අපේ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඔබතුමාට වාගේම අපටත් මේ ප්‍රශ්නය ගැන විශාල හැඟීමක් තිබෙනවා. ඒ වාගේම අපේ කැපවීමක් තිබෙනවා. අතීතයේ ලබා දුන් පොරොන්දු සම්බන්ධයෙන් මේ අවස්ථාවේ දී මට පැහැදිලි කිරීමට නොහැකි වුණත්, මානුෂික ප්‍රශ්නයක් වශයෙන් මේ කාරණය සම්බන්ධයෙන් අපේ ගරු අග්‍රාමාත්‍යතුමාත්, මුදල් අමාත්‍යතුමාත් දීර්ඝ වශයෙන් සාකච්ඡා කර තිබෙන බව ගරු සභාවට සඳහන් කරන්නට කැමැතියි. ඒ වාගේම පසු ගිය අය වැය ලේඛනයේ දී පොරොන්දුවක් දී තිබෙනවා, අගෝස්තු මාසය වන විට මේ ප්‍රශ්නය අවසන් කරන්නට බලාපොරොත්තු වෙනවාය කියලා. ඒ සම්බන්ධයෙන් වැඩ කටයුතු ආරම්භ කර තිබෙන බව මා ඔබතුමාට සඳහන් කරන්න කැමැතියි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ දැන්වීමේ ඊට අමතරව තිබෙනවා, "මම කියන දේ කරන, කරන දේ කියන කෙනෙක් වෙමි." කියලා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

කවුද ඒ කියන්නේ?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා. එහෙම දැන්වීමක් දමලා, ඡන්දයට සති දෙකකට කලින් විශේෂයෙන්ම විශ්‍රාමිකයන්ව අරලියගහ මන්දිරයට කැඳවා, සුපුරුදු දන්සැල පවත්වලා, මේ ප්‍රකාශය කරනවා මා දැක්කා. මේ විධියට විශ්‍රාමිකයන් රවටා, අවුරුදු 5ක් තිස්සේ මේ ක්‍රියාදාමය ඉටු නොවීමට රාජ්‍ය භාණ්ඩාගාරයේ මුදල් පිළිබඳ ප්‍රශ්නයක් මතු වී තිබුණේද කියලා මා දැනගන්න කැමැතියි.

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ පරිදි හිටපු ජනාධිපතිතුමා ලබා දුන් පොරොන්දු ගැන මට ප්‍රකාශයක් කරන්න අපහසුයි. මට ඒ ගැන කියන්න හැකියාවක් නැහැ. නමුත් මා කලින් කී පරිදිම මේක අපේ හදවත් තුළ තිබෙන ප්‍රශ්නයක්. ඒ වාගේම ඉවර කරන්න ඕනෑ ප්‍රශ්නයක්. අය වැය ලේඛනයෙන් ප්‍රකාශ කළ පරිදි අපේ කාලය තුළ එය ඉෂ්ට කරන්නට බලාපොරොත්තු වන බව මා වගකීමෙන් යුතුව සඳහන් කරනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු ඇමතිතුමාගේ එකඟතාව තිබෙන්නේ, 2006 වසරට පෙර විශ්‍රාම ගිය අයගේ විශ්‍රාම වැටුප් විෂමතාව මේ වසරේ අගෝස්තු මාසය වනකොට ඉවත් කරන්නයි. [බාධා කිරීමක්] ඔව්, මේ වනකොට ඒ අයගෙන් විශාල ප්‍රමාණයක් මිය ගිහිල්ලාත් තිබෙනවා.

දැන් ප්‍රශ්නය තිබෙන්නේ, අගෝස්තුවේදීත් ඔබතුමාම ඇමති වේවි ද කියන එකයි. මොකද, ජූනි මාසයේ ඡන්දයක් එනවා නම් ඡන්දයෙන් පස්සේ එන ආණ්ඩුවට තමයි ඒ කාර්ය භාරය පැවරෙන්නේ. ඒකනේ වෙන්නේ. එතකොට ඒ ආණ්ඩුවේ ඔබතුමාලාම වාඩි වේවි ද, ඔබතුමාටම ඔය ඇමතිකම ලැබේවි ද කියන ප්‍රශ්නයත් පැන නඟිනවා. එම නිසා මම ඔබතුමාගෙන් දැන ගන්නට කැමතියි, එක්කෝ ගැසට් නිවේදනයක් හරහා, එසේ නැත්නම් චක්‍රලේඛනයක් හරහා මේක නීතියක් හැටියට ස්ථාපිත කිරීම කරන්නට ඔබතුමා පියවර ගන්නවා ද කියන එක.

අවශ්‍ය නම් විශ්‍රාම වැටුප වැඩි කිරීම අගෝස්තු මාසයේ සිට ලබා දෙන්න. අඩුම තරමේ කවර පාලනයක් ආවත් වෙනස් කරන්නට බැරි විධියට මේ ඉතිරි දින කිහිපය ඇතුළත චක්‍රලේඛනයක් හැටියට හෝ, ගැසට් නිවේදනයක් හැටියට හෝ මේ තත්ත්වය නීතිගත කරන්නට බැරිද කියා මා ඔබතුමාගෙන් දැන ගන්නට කැමැතියි.

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා කියන පරිදි අනාගත රජයේ ඒ ඇමති පදවි දරන්නේ කවුද කියන එක මට මේ අවස්ථාවේ කියන්නට බැහැ. අපේ ඇමති පදවි ඉල්ලා ගත්තු දේවල් නොවෙයි. කෙසේ වුණත් මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න අපට වගකීමක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා, ඒ කටයුත්ත අප දැනට ආරම්භ කරලා යි තිබෙන්නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඒ සම්බන්ධයෙන් ඔබතුමා යම් කිසි සාකච්ඡාවක්-

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

අපි ඒ කාරණය සාකච්ඡාවට භාජනය කරලායි තිබෙන්නේ. ඒ ගැන අපි අවධානය යොමු කරනවා. ඔබතුමාට වාගේ ම අපිටත් මේ ගැන හැඟීමක්, කැක්කුමක් තිබෙන බව මම කියන්නට කැමතියි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

දෙවන වටය.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ රෝහල් : ආපන ශාලා හා රථ ගාල්

குருநாகல் மாவட்ட வைத்தியசாலைகள் : உணவகங்கள் மற்றும் வாகனத் தரிப்பிடங்கள்

HOSPITALS IN KURUNEGALA DISTRICT: CAFETERIAS AND VEHICLE PARKS

4782/'14

3. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු අශෝක් අබේසිංහ මහතා වෙනුවට)
(மாண்புமிகு புத்திக பதிரண - மாண்புமிகு அசோக் அபேசிங்க சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Ashok Abeysinghe)

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇති සමස්ත රෝහල්වල පවත්වා ගෙන යනු ලබන ආපන ශාලා හා රථ ගාල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආපන ශාලා හා රථ ගාල් සඳහා ටෙන්ඩර් කැඳවීමේ බලතල සතුව ඇති ආයතන හෝ පාර්ශ්ව කවරේද;

(iii) එම බලතල මධ්‍යම රජය හෝ පළාත් සභාව සතු නම්, රජයේ ආයතනවල ආපන ශාලා හා රථ ගාල් සඳහා ටෙන්ඩර් කැඳවීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදයම එකී රෝහල් සඳහා ද අනුගමනය කරනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதார மற்றும் சுதேச மருத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) குருநாகல் மாவட்டத்திலுள்ள அனைத்து வைத்தியசாலைகளிலும் பேணிவரப்படுகின்ற உணவகங்கள் மற்றும் வாகனத் தரிப்பிடங்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(ii) மேற்படி உணவகங்கள் மற்றும் வாகனத் தரிப்பிடங்களுக்காக கேள்விப்பத்திரங்களைக் கோருவதற்கான அதிகாரத்தைக் கொண்டுள்ள நிறுவனங்கள் அல்லது தரப்புகள் யாவை என்பதையும்;

(iii) மேற்படி அதிகாரங்கள் மத்திய அரசாங்கத் திற்கோ அல்லது மாகாண சபைக்கோ உரித்தாயுள்ளதெனில், அரச நிறுவனங்களின் உணவகங்கள் மற்றும் வாகனத் தரிப்பிடங் களுக்கு கேள்விப்பத்திரங்களைக் கோரும்போது பின்பற்றப்படுகின்ற முறைமை மேற்படி வைத்தியசாலைகள் தொடர்பாகவும் பின்பற்றப் படுகின்றதா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Indigenous Medicine:

(a) Will he inform this House -

(i) the total number of cafeterias operated and vehicle parks existing in all the hospitals in the Kurunegala District;

(ii) of the party who has the authority to call tenders for these cafeterias and vehicle parks; and

(iii) whether the same procedure followed in calling tenders for cafeterias and vehicle parks at government institutions is followed in respect of the cafeterias and the vehicle parks at the hospitals concerned, if the authority rests with the Central Government or the Provincial Councils?

(b) If not, why?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதார மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)

(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health and Indigenous Medicine)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) ආපන ශාලා සංඛ්‍යාව 18

රථගාල් සංඛ්‍යාව 07

(ii) කුරුණෑගල ශික්ෂණ රෝහලේ ආපනශාලාව සමුපකාර ආපනශාලාවක් වන අතර, ටෙන්ඩර් කැඳවීම සමුපකාර කොමසාරිස්ගේ අනුමැතිය අනුව සිදු කෙරේ. පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ ඇති රෝහල්වල ආපනශාලා හා රථගාල් සඳහා දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ යටතේ අදාළ ආයතන ප්‍රධානියා විසින් ටෙන්ඩර් කැඳවීම සිදු කරයි.

(iii) ඔව්.

(ඇ) පැන නොනඟී.

ඉන්ධන ගැලපුම් ගාස්තුව : ප්‍රතිශතය

எரிபொருள் சீராக்கல் கட்டணம் : சதவீதம்

FUEL ADJUSTMENT CHARGE : PERCENTAGE

5209/'14

4. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු අජිත් මාන්නප්පෙරුම මහතා වෙනුවට)

(மாண்புமிகு புத்திக பதிரண - மாண்புமிகு அஜித் மான்னப்பெரும சார்பாக)

(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Ajith Mannapperuma)

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1) :

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලය ගෘහස්ථ පාරිභෝගික විදුලි බිල්පතට ඉන්ධන ගැලපුම් ගාස්තුව එකතු කරන්නේද;

(ii) එසේ නම්, ඉන්ධන ගැලපුම් ගාස්තුව ලෙස අය කරනු ලබන මුදල ප්‍රතිශතයක් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සුරතල් මත්ස්‍ය කර්මාන්තය සඳහා ලබා ගන්නා විදුලිය වෙනුවෙන් ගාස්තු අය කිරීමේ දී ඒවා කර්මාන්තවලට අදාළ වන සේ අය කරනු ලබන්නේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iii) පාසල් සඳහා විදුලි ගාස්තු අය කිරීම කුමන වර්ගීකරණයක් යටතේ සිදු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

மின்வலு, எரிசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை மின்சார சபை வீட்டு மின் பாவனை யாளர் கட்டணப் பட்டியலில் எரிபொருள் சீராக்கல் கட்டணத்தை சேர்த்துக்கொள்கின்றதா என்பதையும்;

(ii) ஆமெனில், எரிபொருள் சீராக்கல் கட்டணமாக அறவிடப்படுகின்ற பணத்தொகை எத்தனை சதவீதம் என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) அலங்கார மீன் வளர்ப்புக் கைத்தொழிலுக்காகப் பெறப்படுகின்ற மின்சாரத்திற்காக கட்டணம் அறவிடுகின்றபோது மேற்படி கட்டணம் கைத் தொழில்களுக்கு ஏற்புடையவாறு அறவிடப் படுகின்றதா என்பதையும்;

(ii) இன்றேல், அதற்கான காரணங்கள் யாவை யென்பதையும்;

(iii) பாடசாலைகளுக்கான மின்கட்டணம் அற விடுதல் எந்த வகைப்படுத்தலின் கீழ் நடைபெறு கின்றதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

ஜ

asked the Minister of Power and Energy:

(a) Will he state -

(i) whether the Fuel Adjustment Charge is added to the domestic electricity bill by the Ceylon Electricity Board; and

[ගරු බුද්ධික පතිරණ මහතා]

(ii) if so, the amount of money charged as the Fuel Adjustment Charge, as a percentage?

(b) Will he inform this House -

(i) whether the rates charged by electricity bills relating to the ornamental fish industry is as same as the rates charged for the electricity bills relating to the other industries;

(ii) if not, the reasons for that; and

(iii) under which category electricity bills are prepared for schools?

(c) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා වෙනුවන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) වර්තමානයේ ගෘහස්ත පාරිභෝගික විදුලි බිල්පතට ඉන්ධන ගැලපුම් ගාස්තුව එකතු නොකරයි.

(ii) අදාළ නොවේ.

(ආ) (i) ඔව්. සුරතල් මත්ස්‍ය කර්මාන්තය සඳහා අදාළ කර ගනු ලබන අයකුම කාණ්ඩය, අනෙකුත් කර්මාන්ත සඳහා අදාළ වන විදුලි අයකුම කාණ්ඩයම වේ.

(ii) අදාළ නොවේ.

(iii) විදුලි අයකුම ව්‍යුහයෙහි රජයේ අධ්‍යාපන ආයතන කාණ්ඩය යටතේ (GV) පාසල් සඳහා විදුලි බිල්පත් සකස් කිරීම සිදු කෙරේ.

(ඇ) අදාළ නොවේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 6-5774/'14 - (1), ගරු පාලිත තෙවරප්පෙරුම මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු පාලිත තෙවරප්පෙරුම මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 8-4783/'14 - (1), ගරු අශෝක් අබේසිංහ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අශෝක් අබේසිංහ මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 12-4784/'14 - (1), ගරු අශෝක් අබේසිංහ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අශෝක් අබේසිංහ මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කොට්ටාව - මාතර අධිවේගී මාර්ගය : පෞද්ගලික බස් රථ
கொட்டாவை - மாத்தறை அதிவேக நெடுஞ்சாலை : தனியார் பேருந்துகள்
KOTTAWA-MATARA EXPRESSWAY: PRIVATE BUSES

5211/'14

13. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු අජිත් මාන්නප්පෙරුම මහතා වෙනුවට)
(மாண்புமிகு புத்திக பதிரண - மாண்புமிகு அஜித் மன்னப்பெரும சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Ajith Mannapperuma)
අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) කොට්ටාව - මාතර අධිවේගී මාර්ගයේ මගී ප්‍රවාහනය සඳහා යොදවා ඇති පෞද්ගලික බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) 2013.08.06 දින "ලංකාදීප" ඇතුළු පුවත් පත්වල පළ කරනු ලැබූ ටෙන්ඩර් දැන්වීමට අනුව එම බස් රථ තෝරා ගනු ලැබුවේද;

(iii) නොඑසේ නම්, එම බස් රථ තෝරා ගැනීම සඳහා අනුගමනය කළ විධිමත් ක්‍රියා මාර්ගය කවරේද;

(iv) ඉහත සඳහන් පුවත් පත් දැන්වීමට අනුකූලව ක්‍රියා නොකළේ නම්, එසේ කිරීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත සඳහන් අධිවේගී මාර්ගයේ මගී ප්‍රවාහනය සඳහා තෝරා ගනු ලැබූ පෞද්ගලික බස් රථවල ලියා පදිංචි අංක සහ එම බස් රථවල හිමිකරුවන්ගේ නම් කවරේද යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) ජාතික ප්‍රවාහන කොමිෂන් සභාවේ වත්මන් ක්‍රියාකාරී අධ්‍යක්ෂගේ නම කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

உள்ளகப் போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொட்டாவை - மாத்தறை அதிவேக நெடுஞ்சாலையில் பயணிகள் போக்குவரத்திற்காக ஈடுபடுத்தப்பட்டுள்ள தனியார் பேரூந்துகளின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) 2013.08.06ஆம் திகதிய "லங்காதீப" உள்ளிட்ட பத்திரிகைகளில் பிரசுரிக்கப்பட்ட கேள்விப் பத்திர அறிவித்தலுக்கமைய அந்த பேரூந்து வண்டிகள் தெரிவு செய்யப்பட்டனவா என்பதையும்;

(iii) இன்றேல், அந்த பேரூந்துகளைத் தெரிவு செய்வதற்காகப் பின்பற்றிய முறைசார்ந்த வழிமுறை யாதென்பதையும்;

(iv) மேற்கூறிய பத்திரிகை அறிவித்தலுக்கமைய செயற்படாவிடின், அவ்வாறு செயற்பட்டமைக்கான காரணம் யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) மேற்கூறிய அதிவேக நெடுஞ்சாலையில் பயணிகள் போக்குவரத்திற்காக தெரிவுசெய்யப்பட்ட தனிநபர் பேரூந்து வண்டிகளின் பதிவு இலக்கங்கள் மற்றும் அந்த பேரூந்துகளின் உரிமையாளர்களின் பெயர்கள் யாவை என்பதை அவர் இச்சபைக்குச் சமர்ப்பிப்பாரா?

(இ) தற்போதைய தேசிய போக்குவரத்து ஆணைக்குழுவின் செயற்பாட்டுப் பணிப்பாளரின் பெயர் என்ன என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Internal Transport:

(a) Will he state -

(i) the number of private buses deployed for passenger transport on the Kottawa - Matara expressway;

(ii) whether those buses were selected as per the Tender notice published in the newspapers including "Lankadeepa" on 06th August, 2013;

(iii) if not, the formal method adopted to select those buses; and

(iv) if the buses were not selected in conformity with the above newspaper advertisement, the reasons for doing so?

(b) Will he table the registered numbers and the names of the owners of the busses selected for passenger transport on the above-mentioned expressway?

(c) Will he inform this House of the name of the Working Director of the National Transport Commission?

(d) If not, why?

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා (අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்துும பண்டார - உள்ளக போக்குவரத்து அமைச்சர்)
(The Hon. R.M. Ranjith Madduma Bandara - Minister of Internal Transport)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 112

(ii) නැත.

(iii) 2014.09.19 දිනැති අමප/14/1061/535/004-1 අංක දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ පවත්නා ක්‍රමවේදය අනුව (ඇමුණුම අංක 01*)

(iv) එවකට සිටි සභාපතිතුමාගේ වාචික උපදෙස් පරිදි කටයුතු කර ඇත.

(ආ) ඔව්, ඇමුණුම අංක 02*හි දක්වා ඇත.

(ඇ) අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත ගාමිණී රත්නායක මහතා පත් කෙරෙනු ඇත.

(ඈ) පැන නොනඟී.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ස්ථාවර නියෝග 23 (2) යටතේ ප්‍රශ්න. ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

I

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය තුළ කෙරෙන දේශපාලන පළිගැනීම්
இலங்கை போக்குவரத்துச் சபையில் நிகழும் அரசியல் பழிவாங்கல்
POLITICAL REVENGE IN SRI LANKA TRANSPORT BOARD

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Nimal Siripala de Silva - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ මෙම ප්‍රකාශය කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

2015 ජනවාරි මස 08වන දින පැවති ජනාධිපතිවරණයෙන් පසුව බලයට පත් වූ එක්සත් ජාතික පක්ෂ රජය විසින් රාජ්‍ය ආයතන විශාල සංඛ්‍යාවක සිය දේශපාලන ප්‍රතිවාදීන්ට එරෙහිව සේවා කප්පාදුව හා පළිගැනීම් රාශියක් සිදු කර ඇති බවත්, තවදුරටත් සිදු කරන බවත් වාර්තා වේ.

විශේෂයෙන්ම ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය තුළ බරපතළ දේශපාලන පළිගැනීම් හා නීතියට හා යහ පාලනයට කිසිදු ගරු කිරීමකින් තොරව නියමිත සුදුසුකම් සහිතව කාලයක් තිස්සේ විවිධ තනතුරුවල කටයුතු කළ පුද්ගලයින් නීති විරෝධි ලෙස ඉවත් කොට සුදුසුකම් නොමැති ජාතික සේවක සංගමයේ සාමාජිකයින් හා ක්‍රියාකාරින් පත් කරමින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හා එක්සත් ජනතා නිදහස් සන්ධානයේ වෘත්තීය සමිති ක්‍රියාකාරින්ගෙන් දිගින් දිගටම පළිගැනීම් සිදු කරයි. මෙසේ අලුතින් පත් කරන හා පත්වීම් ලබා දෙන ලද එක්සත් ජාතික පක්ෂ ක්‍රියාකාරින්ගෙන් සමහරකට විනය පරීක්ෂණ හා අධිකරණයේ නඩු පවා තිබෙන බවත් වාර්තා වී තිබෙන අතර, පහත දැක්වෙන සිද්ධීන් මඟින් ඒවා වඩාත් තහවුරු කරයි.

1. මීතොටමුල්ල ඩිපෝව හා හෝමාගම ඩිපෝවේ කළමනාකාර ලෙසත්, කොළඹ ප්‍රාදේශීය ප්‍රධාන ධාවන කළමනාකාර ලෙසත් කටයුතු කොට ඇති උපාධිධාරියෙකු වන රුහුණු ප්‍රාදේශීය කාර්යාලයේ සේවය කරන රුහුණු ප්‍රධාන ප්‍රාදේශීය කළමනාකාර (I ශ්‍රේණියේ) පණ්ඩුක ස්වර්ණහංස මහතා එම තනතුරින් ඉවත් කොට අපොස (සා.පෙළ) පමණක් සමත් V වන ශ්‍රේණියේ නිලධාරියෙකු වන ඩබ්ලිව්.ඩී. වසන්ත යන අය එම තනතුරට පත් කිරීම.

2. කළුතර පොකුරු බස් සමාගමේ සභාපති ලෙස වසර 5ක පළපුරුද්දක් ඇති අපොස(උපෙළ) සමත් ලලිත් එඩ්වඩ් මහතා ගම්පහ ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රධාන ප්‍රාදේශීය කළමනාකාර 1 ශ්‍රේණිය, තනතුරින් ඉවත් කොට ඒ වෙනුවට කොන්දොස්තරවරයෙකු වශයෙන් සේවය කරන කාලය තුළදී ප්‍රවේශපත් විෂමාචාරයක් සිදු කොට ඇති අපොස(සාපෙළ)පමණක් සමත් ජී.වී. කරුණාරත්න විධායක නිලධාරි 3 බී ශ්‍රේණියේ නිලධරයෙකු ගම්පහ ප්‍රධාන ප්‍රාදේශීය කළමනාකරු ලෙස වැඩ ආවරණය කිරීමට පත් කිරීම.

3. ඩිපෝ කළමනාකාර ලෙස වසර 8ක පළපුරුද්ද හා මධ්‍යම බස් කාර්යාලයේ කළමනාකාර ලෙස පළපුරුද්ද ඇති, 50 වන සංවත්සරයේදී තම සේවා ස්ථානය හොඳම සේවා ස්ථානය බවට පත් කළ අපොස(උපෙළ) සමත් කළුතර ප්‍රාදේශීය කාර්යාලයේ සේවය කළ ප්‍රධාන ප්‍රාදේශීය කළමනාකාර 1 ශ්‍රේණියේ තිලක් වික්‍රමසිංහ මහතා එම තනතුරින් ඉවත් කොට අපොස(සාපෙළ) පමණක් සමත් 3 ඒ ශ්‍රේණියේ නිලධාරි එච්.බී.කියු. ෆොන්සේකා යන අය එම තනතුරට පත් කිරීම හා 8 වසර පමණක් සමත් 4 ශ්‍රේණියේ නිලධාරි බී.එස්.පෙරේරා යන අය කොළඹ ප්‍රධාන ප්‍රාදේශීය කළමනාකාර ලෙස පත් කිරීම.

4. ශ්‍රී ලංකා ජාතික කාර්මික අභ්‍යාස ආයතනයේ සිවු අවුරුදු පාඨමාලාව හා කළුතර පොකුරු බස් සමාගමේ වසර 5ක් පමණ සභාපති ලෙස කටයුතු කර ඇති අපොස(උපෙළ) සමත් ප්‍රධාන ප්‍රාදේශීය කළමනාකාර 1 ශ්‍රේණියේ ජගත් රංජන් පෙරේරා මහතා සබරගමුව ප්‍රධාන ප්‍රාදේශීය කළමනාකාර තනතුරින් ඉවත් කොට ඒ වෙනුවට අපොස (සාපෙළ) සමත් විනය විභාග නිලධාරි 3 බී ශ්‍රේණියේ ඩබ්.ඒ.ඩී. වෙත්තසිංහ යන අය එම තනතුරට පත් කිරීම.

5. කෑගල්ල ඩිපෝවේ කළමනාකාර හා මානව සම්පත් කළමනාකාර විනය ලෙස කටයුතු කර පළපුරුද්දක් ඇති ප්‍රධාන කළමනාකාර 1 ශ්‍රේණියේ පී.සී.ආර්. චන්ද්‍රසිරි මහතා වයඹ ප්‍රධාන ප්‍රාදේශීය කළමනාකාර තනතුරින් ඉවත් කොට, ඒ වෙනුවට 8 වසර පමණක් සමත් සේවයෙන් නිදහස් වී මන්ත්‍රීවරයෙකුගේ කාර්යාලයේ සේවය කොට ඇති 4 වන ශ්‍රේණියේ නිලධාරි එස්.ඒ. රාජරත්න යන අය එම තනතුරට පත් කිරීම.

6. රඹුක්කන ඩිපෝවේ ඩිපෝ කළමනාකාර සහ මහනුවර ප්‍රාදේශීය ධාවන කළමනාකාර ලෙස කටයුතු කොට පළපුරුද්දක් ඇති උපාධිධාරී එල්.එච්.ආර්. ප්‍රියදර්ශන මහතා මහනුවර ප්‍රධාන ප්‍රාදේශීය කළමනාකාර 1 ශ්‍රේණියේ තනතුරින් ඉවත් කොට ඒ වෙනුවට අපොස (සාපෙළ) පමණක් සමත් විනය නිලධාරි 4 වන ශ්‍රේණියේ එච්.එම්.ඩබ්ලිව්. අබේරත්න යන අය පත් කිරීම.

7. හඟුරන්කෙත ඩිපෝ කළමනාකාර ලෙස හා නුවර ප්‍රාදේශීය කළමනාකාර ලෙස කටයුතු කළ පළපුරුදු උපාධිධාරි නුවරඑළිය ප්‍රධාන ප්‍රාදේශීය කළමනාකාර 2 ශ්‍රේණියේ ඩී.එම්. දසනායක මහතා එම ශ්‍රේණියෙන් ඉවත් කොට අපොස (සාපෙළ) පමණක් සමත් තම සේවා කාලය තුළ රථ ඇණිය බස් රථ 50ක් දක්වා පහළ බස්සවා ඇති ප්‍රාදේශීය ඉංජිනේරු කළමනාකාර 2 ශ්‍රේණියේ ඩී.එම්.ඩී. දිසානායක එම තනතුරට පත් කිරීම.

8. වසර 10ක කාලයක් පොළොන්නරුව ඩිපෝවේ ඩිපෝ කළමනාකාර ලෙස රජරට ප්‍රාදේශීය ධාවන කළමනාකාර ලෙස කටයුතු කොට පළපුරුදු අපොස (උපෙළ) සමත් රජරට ප්‍රාදේශීය කළමනාකාර 1 ශ්‍රේණියේ මර්වින් ප්‍රනාන්දු මහතා එම තනතුරින් ඉවත් කොට අපොස (උපෙළ) සමත් ප්‍රවේශ පත්‍ර විෂමාචාර යට ගැසීම් හේතුවෙන් ශ්‍රේණියෙන් පහත හෙළා මේ වන විටත් දඬුවම් විඳිමින් සිටින ජ්‍යෙෂ්ඨ විනය නිලධාරි 3 ශ්‍රේණිය සිසිර සොයිසා යන අය එම තනතුරට පත් කිරීම.

9. ජා-ඇළ ඩිපෝවේ වසර 5ක් ඩිපෝ කළමනාකාර ලෙස සේවය කොට ඇති අපොස (උපෙළ) සමත් ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන ජංගම කළමනාකාර ලෙස කටයුතු කළ ඒ.ඒ. ඉන්ද්‍රසේන මහතා එම තනතුරින් ඉවත් කොට තලංගම ඩිපෝවේ උද්‍යාන කම්කරු ලෙස සේවය කොට ඇති ඕල්ටනේටරයක් සොරා ගැනීම නිසා මාස හයක සේවා තහනමකට ලක් වී ඇති 8 වසර පමණක් සමත් බී.සී. පෙරේරා යන අය එම තනතුරට පත් කිරීම ආදි අයථා පත් කිරීම් රැසක් සිදු කොට ඇත. එසේම පහත දැක්වෙන ආකාරයට විෂමාචාර ක්‍රියාවන් සිදු කිරීම හේතුවෙන් විනය ක්‍රියාමාර්ග ගෙන සේවයෙන් පහ කොට ඇති පහත දැක්වෙන නිලධාරින් නැවත සේවයේ පිහිටුවීම.

මුදල් වංචාවන් සම්බන්ධයෙන් සේවයෙන් පහ කොට ඇති ජී.ඩී. ලලිත් කුමාර යන අය වයස 60 ඉක්මවා තිබියදීත් විශ්‍රාම දිනය සඳහන් නොකර සේවා බණ්ඩනයකින් තොරව සේවයේ පිහිටුවීම. මුදල් වංචා සම්බන්ධයෙන් සේවයෙන් පහ කොට ඇති කේ.ඩබ්.ඒ. ප්‍රේමලාල් යන අය සේවා බණ්ඩනයකින් තොරව නැවත සේවයේ පිහිටුවීම. මුදල් වංචා සම්බන්ධයෙන් සේවයෙන් පහ කොට ඇති කේ.ජී.ඩී.එන්. ජයන්ත යන අය සේවා බණ්ඩනයකින් තොරව නැවත සේවයේ පිහිටුවීම. රුපියල් ලක්ෂ විසිනවයක අබලි යකඩ රහසිගත ලෙස විකිණීමට අනුබල දීම හේතුවෙන් සේවයෙන් පහ කොට එල්ටීබීටී 3290 නඩු අංකය යටතේ කම්කරු විනිශ්චය සභාවේ විභාග වෙමින් පවතින නඩුවේ වූදිත එච්.එම්.එන්. විජේරත්න යන අය නඩුවේ තීන්දුව ලබා දීමටත් පෙර සේවා බණ්ඩනයකින් තොරව නැවත සේවයේ පිහිටුවීම.

ඉහත රුපියල් ලක්ෂ විසිනවයක අබලි යකඩ රහසිගත ලෙස විකිණීමට අනුබල දීම සම්බන්ධයෙන් සේවයෙන් පහ කොට ඇති දීපිකා සමන්ති මල්ලිකාරච්චි (එල්ටීබීටී 3291) කේ.ඒ. කරුණාසේන (එල්ටීබීටී 3289) යූ.ජේ. පලිහක්කාර (එල්ටීබීටී 3288) යන අයවලුන් කම්කරු විනිශ්චය සභාවේ අදාළ නඩුව විභාගවෙමින් පවතිද්දී සේවා බණ්ඩනයකින් තොරව නැවත සේවයේ පිහිටුවීම.

තවද, පී. සිසිර යන අය සේවා කාලය තුළ බිමත්ව සිටීම සම්බන්ධයෙන් සේවයෙන් පහකොට අභියාචනාධිකරණයේ 2/358/2003 නඩුව විභාග වෙමින් පවතිද්දී ප්‍රධාන විනය නිලධාරි තැන විසින් අභියාචනය ඉල්ලා අස් කර ගන්නා ලෙස නියෝග කර සේවය ප්‍රතිෂ්ඨාපනය කිරීම.

මුදල් වංචාවක් වසන් කිරීම සම්බන්ධව සේවයෙන් පහ කොට අභියාචනාධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතින සිසිර සොයිසා යන අය ශ්‍රේණියෙන් පහත හෙළූ දිනයේ සිට වැටුප් සහිතව නියමිතව ශ්‍රේණියේ පිහිටුවා නඩුව සමථයකට පත් කර ගැනීමෙන් තොරව අදාළ ගෙවීම් සිදු කිරීම යනාදිය සිදු කොට ඇත.

එහෙයින් යහ පාලනය ඉටු කරන බවට පොරොන්දු වූ මෙම රජය ඉහත කී නීති විරෝධී ක්‍රියාවන් වහා නතර කොට නීති විරෝධී ලෙස දී ඇති එම පත්වීම් අවලංගු කොට සුදුසු පුද්ගලයින්ට සේවා ස්ථානයේ ඒ පරිදිම කටයුතු කිරීමට හා දේශපාලන පළිගැනීම්වලින් තොරව සියලු සේවකයින්ට රාජකාරි කටයුතු කිරීමට ඉඩකඩ සලසා දෙන්නේ දැයි මෙම සභාවට දන්වන්නේද?

විශේෂයෙන්ම ගරු අග්‍රාමාත්‍යතුමනි, මා මේ කරුණු සහිතව මේ ඉදිරිපත් කළේ යහ පාලනය පිළිබඳව ඔබතුමන්ලා දෙන ලද එම පොරොන්දු අමු අමුවේම ශ්‍රී ලංගම විසින් උල්ලංඝනය කර තිබෙන බව ඔබතුමන්ලාටත් ඒ වාගේම සමස්ත රටේ ජනතාවටත් පෙන්වා දීම සඳහායි. මෙවැනි තවත් සිද්ධීන් විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ නිසා ඔබතුමා වහාම අදාළ අමාත්‍යවරයාට උපදෙස් දෙන්න, මේ පිළිබඳව පරීක්ෂා කර බලා සාධාරණය ඉටු කර දෙන්න කියා. බොහොම ස්තූතියි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Plantation Industries and Leader of the House of Parliament)

Hon. Deputy Speaker, we will answer it on the next day.

II

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට අනුයුක්තව සිටි උපාධිධාරින් මුහුණ පා ඇති ගැටලු

பொருளாதார அபிவிருத்தி அமைச்சுடன் இணைக்கப்பட்ட பட்டதாரிகள் எதிர்நோக்கும் பிரச்சினைகள்

PROBLEMS FACED BY GRADUATES ATTACHED TO MINISTRY OF ECONOMIC DEVELOPMENT

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තූතිවන්ත වෙනවා. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට අනුයුක්තව සිටි 16,000කට වැඩි උපාධිධාරින්ට මේ වන විට මුහුණ පෑමට සිදු වී ඇති ගැටලුකාරී තත්ත්වය පිළිබඳව මෙම සභාවේ අවධානය යොමු කරනු කැමැත්තෙමි.

2012 වසරේ මාර්තු 31 දක්වා රැකියා විරහිත උපාධිධාරින්ගෙන් අයදුම් පත් කැඳවා තෝරා ගන්නා ලද උපාධිධාරින් රජය විසින් අභ්‍යාසලාභී පදනමින් සේවයට බඳවා ගනු ලැබුවා. ඔවුන්ට එම කාලය තුළ රුපියල් 10,000ක දීමනාවක් ලබා දෙනු ලැබූ අතර ඉන් උපාධිධාරින් 16,700ක පමණ ප්‍රමාණයක් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ රට පුරා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කෙරුණා. ඒ, ආර්ථික සංවර්ධන නිලධාරි තනතුරු නාමය යටතේයි.

2015.01.18 දිනැති අමාත්‍යාංශ පිළිබඳ ගැසට් නිවේදනය මඟින් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය අහෝසි කරනු ලැබුවා. මේ අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සේවය කළ ආර්ථික සංවර්ධන නිලධාරින්ට වග කියන අමාත්‍යාංශයක් නොමැති වුණා. ඉන් අනතුරුව රැකියාලාභී උපාධිධාරි සංගමය හා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්වරයා ඇතුළු නිලධාරින් සමඟ පැවති සාකච්ඡාවකින් පසු ආර්ථික සංවර්ධන නිලධාරින් ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතට අනුයුක්ත කිරීමට තීරණයක් ගෙන තිබුණා. කෙසේ වුවද මේ අතර අමාත්‍ය මණ්ඩලය මඟින් එම නිලධාරින් සමෘද්ධි හා නිවාස අමාත්‍යාංශයට අනුයුක්ත කිරීමට තීරණය කර තිබෙනවා. එම තීරණය අනුව අදාළ තීරණය ප්‍රාදේශීය ලේකම්වරුන්ට දන්වා යවා තිබෙනවා.

එම තීරණයත් සමඟ එම නිලධාරින් වෘත්තීය අවිනිශ්චිතභාවය හේතුවෙන් දැඩි නොසන්සුන් තත්ත්වයකට පත්ව තිබෙනවා. පැවති රජය යටතේ එම උපාධිධාරින්ගේ වෘත්තීය ගරුත්වය නොසලකා හැරුණා. ආණ්ඩුවේ සෘජු දේශපාලන වුවමනාවන් වෙනුවෙන් මෙම නිලධාරින්ව යොදා ගත්තා.

සමහර දවස්වල canvassing ව්‍යාපාරවලට බලහත්කාරයෙන් මෙම නිලධාරින් ගෙන ගියා. අපට මතකයි, ඌව පළාත් සභා මැතිවරණයේදී මේ නිලධාරින්ට නාම ලේඛන හදලා, අත්සන් පත්‍ර සකස් කරලා, එම මැතිවරණ ව්‍යාපාරය වෙනුවෙන් යොදවා ගත් ආකාරය. ඔවුන්ට පැවරී තිබුණු රාජකාරිවලට අමතරව පැවති ආණ්ඩුවේ දේශපාලන වැඩ කටයුතු කිරීම වෙනුවෙන් මෙම නිලධාරින් යොදා ගත් අවස්ථා බොහොමයක් තිබුණා. එසේ තිබියදී එම තීරණයත් සමඟ එම නිලධාරින් වෘත්තීය අවිනිශ්චිතභාවය හේතුවෙන් දැඩි නොසන්සුන් තත්ත්වයකට පත්ව තිබෙනවා.

[ගරු අනුර දිසානායක මහතා]

ග්‍රාම නිලධාරි වසම්වලට අනුයුක්ත කර සිටි උපාධිධාරින් අතර ඉතිහාසය, ජන සන්නිවේදනය, පුරාවිද්‍යාව වැනි විෂයයන් යටතේ උපාධි ලබා ගත් පිරිස් ද, සෞන්දර්යය විෂයයන් යටතේ උපාධි ලබා ගත් පිරිස් ද, වාණිජ්‍යවේදී උපාධිධාරින් ද සිටිනවා. ඔවුන්ට පැවරී තිබුණු රාජකාරිය ඔවුන් ඉගෙන ගත් විෂයයන්ට නොගැළපෙන ඒවා බවත්, ඒවා ඵලදායී නොවූ බවත් ප්‍රසිද්ධ කරුණක්. මේ අයගේ වුවමනාවක් බවට පත් වෙලා තිබුණේ ඡන්ද කාලවලදී canvassing වැඩ කටයුතුවලට එම නිලධාරින් ගෙන්වා ගැනීම පමණයි.

ඔවුන්ට පැවරුණු රාජකාරි අතර පැළ තවාන්වලට ගොස් පැළ පැටවීම, නැවත ප්‍රා.ලේ. කාර්යාලයෙන් එම පැළ බා ගැනීම, නැවත එම පැළ ගෙවල් ගණනේ බෙදීම, ඇට පැකට් බෙදීම, 2013 වසරේ හා 2014 පැවති විවිධ මැතිවරණවලදී ආණ්ඩු පක්ෂයේ අපේක්ෂකයින්ගේ ප්‍රචාරණ වැඩ කටයුතු වෙනුවෙන් කටයුතු කිරීම, ආණ්ඩුවේ මැයි දිනවලට අනිවාර්යයෙන් සහභාගී වීම වැනි රාජකාරිද වුණා. එම උපාධිධාරින් කිසිදු සේවා තෘප්තියකින් නොසිටි බව ඉතා පැහැදිලියි. ඔවුන් ඉල්ලා සිටියේ සේවා තෘප්තියක් සහිතව උපාධියට සුදුසු සාධාරණ වෘත්තීය තත්ත්වයක්. මොවුන් මුහුණ දී සිටි වෘත්තීය බේදවාචකය කෙතරම්ද කියනවා නම් 100 දිනක් ඇතුළත ක්‍රියාවට නංවන ක්ෂණික සහන වැඩසටහනේ අංක 03 යටතේ සඳහන් වන්නේ ඔවුන් සඳහා මෛත්‍රී පාලනයක් යටතේ ලබා දීමට යෝජනා කෙරුණු විසඳුමයි.

කෙසේ නමුත් දැන් සිදු වී ඇත්තේ, යළිත් වතාවක් එම උපාධිධාරින්ගේ වෘත්තීය ගරුත්වය හැල්ලු කරන තීන්දුවක් ගැනීම බවට ඔවුන් තුළ සැකයක් මතු වී තිබෙනවා.

නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශයේ බිම් මට්ටමේ සෘජු වගකීම සහිත නිලධාරින් වන්නේ සමෘද්ධි සංවර්ධන නිලධාරින්ය. 1994 වර්ෂයේදී ඔවුන් එම තනතුරට බඳවා ගැනීමේදී විවිධ අධ්‍යාපන මට්ටම් සහිත පිරිස් ඒ සඳහා බඳවා ගත්තා. එම නිසා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් අනුයුක්ත කරන ලද නිලධාරින්ට, විශ්වවිද්‍යාලවල උපාධිධාරින්ට මේ නව තත්ත්වය තුළ සිදු විය හැක්කේ සමෘද්ධි සංවර්ධන නිලධාරියාට සමාන්තරව කටයුතු කිරීමකට වඩා සමෘද්ධි සංවර්ධන නිලධාරින් යටතේ රාජකාරි කිරීමට ඔවුන්ට සිදු වීමයි. මේ නිසා මේ වන විට ඇතැම් ආර්ථික සංවර්ධන නිලධාරින් වෙනත් අමාත්‍යාංශවල පුරප්පාඩු සඳහා ද යොමු වීම කෙරෙහි උනන්දු වී තිබෙන අතර, විශාල පිරිසක් පසු වන්නේ දැඩි අවිනිශ්චිතභාවයකයි.

මේ තත්ත්වය තුළ පැන නගින පහත සඳහන් ගැටලුවලට පිළිතුරු අදාළ අමාත්‍යවරයා විසින් සභාව හමුවේ තබනු ඇතැයි බලාපොරොත්තු වෙනවා.

1. ආර්ථික සංවර්ධන නිලධාරින් ලෙස අනුයුක්ත කර සිටින මෙම උපාධිධාරින්ගේ දැනුමෙන් ප්‍රයෝජනයක් ගත හැකි වන පරිදි මෙම උපාධිධාරින් අදාළ වෙනත් වෘත්තීන් හා සේවා ස්ථාන සඳහා අනුයුක්ත කර ගැනීමට හැකියාවක් නොමැත්තේද?

2. ඒ සඳහා ගුරු සේවය හා වෙනත් අමාත්‍යාංශ සතුව දැනට පවතින පුරප්පාඩු ගණනය කිරීමක් සිදු කර තිබේද?

3. ආර්ථික සංවර්ධන නිලධාරින් නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශයට අනුයුක්ත කරන්නේ නම්, සමෘද්ධි සංවර්ධන නිලධාරියාට වඩා ඉහළ මට්ටමෙන් ලබා දිය හැකි රාජකාරි මෙනවාද? ඔවුන් ස්ථානගත කරන්නේ කුමන මට්ටමේ තනතුරකටද? ඔවුන්ගේ රාජකාරි මොනවාද?

4. දින සියයේ ක්ෂණික සහන වැඩසටහන යටතේ අංක 3හි සඳහන් කරන උපාධිධාරින්ගේ වෘත්තීය මට්ටම සෑහීමකට පත් විය හැකි සේවාවක් බවට පත් කිරීම සඳහා ගනු ලැබ ඇති හා ගැනීමට අදහස් කරන ක්‍රියාමාර්ග මොනවාද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තූතියි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා (නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - வீடமைப்பு மற்றும் சமுர்த்தி அமைச்சர்)
(The Hon. Sajith Premadasa - Minister of Housing and Samurdhi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ නගන ලද ප්‍රශ්නයට පිළිතුරු ලබා දීමේදී පසු බිම් තොරතුරු හැටියට මම මෙම කරුණු දක්වන්න කැමැතියි. නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශයේ ප්‍රධාන විෂය පථය ලෙස ග්‍රාමීය හා ප්‍රාදේශීය අංශයන්හි ආර්ථික ප්‍රතිපත්ති, උපාය මාර්ග සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම, දිළිඳුකම පිටු දැකීම හා ග්‍රාමීය දිවි පෙවෙත වැඩි දියුණු කිරීමේ ක්‍රමෝපාය, ග්‍රාමීය අංශයේ යටිතල පහසුකම් සංවර්ධනය හා ග්‍රාමීය නිවාස සංවර්ධනය යන අංශ ඇතුළත් වී තිබෙනවා. ඉකුත් පාලන සමයේදී රැකියා නොමැති උපාධිධාරින් රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ වැඩසටහන යටතේ ආර්ථික සංවර්ධන නිලධාරින් ලෙස 16,000ක පමණ පිරිස් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා ග්‍රාම නිලධාරි වසම් මට්ටමෙන් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට අනුයුක්තව සේවයේ යොදවා තිබුණි. ඉකුත් පාලනය යටතේ ඔවුන්ට ගෞරවාන්විතව රැකියාවක් කිරීමේ අවස්ථාව අහිමි වී තිබුණි. උපාධිධරයන් වූ මෙම නිලධාරින් සිල්ලර වැඩවලට යොදා ගත්තා මිස සියල්ලන්ටම පොදු නිශ්චිත කාර්ය භාරයක් මෙන්ම රාජකාරි ඉටු කිරීම සඳහා සුදුසු පරිසරයක් සකස් වී තිබුණේ නැත.

විශ්වවිද්‍යාලයක තෙවසරක සාමාන්‍ය උපාධියක් හෝ සිව් වසරක විශේෂ උපාධියක් හෝ ලබා ගත් මෙවැනි උපාධිධාරින් පැළ අදින්න, පැළ බාන්න, ඇට වර්ග බෙදන්න වැනි කාර්යයන් හෝ දේශපාලන වහල්භාවයට යොදා ගැනීම සඳහා මා කිසිසේත් අපේක්ෂා නොකරමි. අපගේ මුඛ්‍ය අරමුණ වූයේ මෙම උගත් පිරිස ගම සංවර්ධනය කිරීමේ වැඩසටහනේ නියමුවන් ලෙස නිශ්චිත කාර්ය භාරයක් පවරා ඔවුන්ගේ ගෞරවයද ඉතා ඉහළින් සුරැකෙන පරිදි සේවය ලබා ගැනීමයි. එබැවින් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය අහෝසි කරන විට එම අමාත්‍යාංශයට අනුයුක්තව සිටි ඌන උපයෝගී මානව සම්පතක් වූ 13,000ක් පමණ ආර්ථික සංවර්ධන නිලධාරින් කිසිදු අමාත්‍යාංශයකට අනුයුක්ත කර නොතිබූ බැවින් නව වැඩ පිළිවෙළ යටතේ ශ්‍රී ලංකාව තුළ සිදු කෙරෙන ග්‍රාමීය සංවර්ධන ක්‍රියාවලිය සඳහා උගත්, පළපුරුදු මෙම උපාධිධාරි නිලධාරින් ප්‍රධාන හවුල්කාර නියෝජිතයින් ලෙස යොදවා ගැනීම අපගේ අපේක්ෂාව විය. අනෙකුත් ගම් මට්ටමේ නිලධාරින්ගේ රාජකාරිවලට පරිබාහිරව ඔවුන්ගේ වෘත්තීය අනන්‍යතාව හා අභිමානය සුරැකෙන ගෞරවාන්විත තනතුරක් බවට පරිවර්තනය කොට මෙම අනුයුක්ත කිරීම ක්‍රියාත්මක කිරීම අපගේ අරමුණ විය. මෙම මූලික අභිප්‍රායයන් පදනම් කරගෙන නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශයේ ලේකම්තුමා එම නිලධාරින් අනුයුක්ත කරගැනීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත යොමු කරන ලද 2/1/19/114 හා 2015.02.02 යන ලිපිය මඟින් ඉල්ලීමක් කරන ලදී. ඒ අනුව රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය මඟින් ආර්ථික සංවර්ධන නිලධාරින් මෙම අමාත්‍යාංශය වෙත අනුයුක්ත කරන ලදී.

ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා අහන ලද ප්‍රශ්නවලට උත්තර පහතින් සඳහන් කර ඇත.

1. වෙනත් වෘත්තීන් හා සේවා ස්ථාන සඳහා අනුයුක්ත කර ගැනීමේ හැකියාවක් තිබේ. ඒ වාගේම මෙම උපාධිධාරීන් අදාළ වෙනත් වෘත්තියක් හා සේවා ස්ථානයක් වෙත අනුයුක්ත කිරීම මගේ අමාත්‍යාංශයෙන් පරිබාහිර වූ කාර්යයක් වේ.

2. මෙම කාර්යය මගේ අමාත්‍යාංශයට අදාළ නොවන අතර, එය රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශයට අදාළ කාර්යයක් වේ. එසේ වුවද, අප අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ග්‍රාමීය සංවර්ධන) රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් සමඟ මෙම ගැටලුව පිළිබඳව සාකච්ඡා කරන ලදී.

* ඒ අනුව එම අමාත්‍යාංශයේ ලේකම් විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත දැනට පවතින පුරප්පාඩු පිළිබඳව ගණනය කිරීමක් සිදු කරන ලෙසත්, ඉදිරි සති 03 ඇතුළත එය අවසන් කිරීමට කටයුතු කරන ලෙසත් උපදෙස් දී ඇත.

3. 1. ග්‍රාමීය මට්ටමේ, බිම් මට්ටමේ රාජකාරි කටයුතු ඉටු කරන රාජ්‍ය නිලධාරීන් කිහිප දෙනෙකු සිටී. දිවි නැඟුම දෙපාර්තමේන්තුවේ කටයුතු සෘජුවම දිවි නැඟුම සංවර්ධන නිලධාරීන්ට පැවරෙන අතර, නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශයේ අරමුණු අනුව ග්‍රාමීය හා ප්‍රාදේශීය සංවර්ධනයෙහි නව වැඩ පිළිවෙළක් හා කාර්යභාරයක් සැලසුම් කර ඇත. මෙහිදී මෙම අංශයේ අමාත්‍යාංශයේ සෘජු නිලධාරියා ලෙස ආර්ථික සංවර්ධන නිලධාරීන් හට බලය පැවරෙන අතර, එමඟින් කිසිදු අවස්ථාවක දිවි නැඟුම සංවර්ධන නිලධාරියා යටතේ සේවය නොකරන අතර, ආර්ථික සංවර්ධන නිලධාරියාට වෙන් වූ වෘත්තීය ගෞරවය ආරක්ෂා වන පරිදි රැකියාව කරගෙන යෑමේ අවස්ථාව සහ ඉඩ ප්‍රස්ථාව සැලසේ.

* මෙමඟින් පෙර පැවැති තත්ත්වයට වඩා ඉහළ තෘප්තිකර මෙන්ම ගෞරවනීය තත්ත්වයක් මෙම නිලධාරීන්ට ලබා දීම මා අපේක්ෂා කරන්නෙමි.

2 අපේක්ෂා කරනු ලබන රාජකාරි:

(1) ග්‍රාමීය සංවර්ධනයට අදාළ ව්‍යාපෘති හඳුනා ගැනීම, සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය, පසු විපරම, කළමනාකරණය හා නඩත්තුව සඳහා ජනතා සහභාගිත්වය ලබා ගැනීමට කටයුතු කිරීම හා ව්‍යාපෘති යෝජනා නිර්දේශ කිරීමේ නියමුවා ලෙස කටයුතු කිරීම.

(2) ගම සංවර්ධනය කිරීමේ වැඩ පිළිවෙළේදී සියලුම දේශීය හා විදේශීය ව්‍යාපෘතිවල සම්බන්ධීකරණ කාර්යයන් සිදු කිරීම.

(3) සංවර්ධන වැඩ සටහනට අදාළ ගැටලු හඳුනා ගැනීම හා ඒවාට විසඳුම් ලබා දීම සඳහා අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.

(4) රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණයේදී එම ආයතනවලින් සපයන සේවා වසමට/ ප්‍රතිලාභීන්ට ලබා ගැනීම.

(5) ප්‍රජාමූල සංවිධාන විසින් කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති සඳහා මාර්ගෝපදේශ සැපයීම.

(6) ප්‍රජාමූල සංවිධාන සමඟ ඒකාබද්ධව වැඩ සටහන් සැකසීම, ක්‍රියාත්මක කිරීම හා ඒ සඳහා අවශ්‍ය කටයුතු අදාළ ආයතන සමඟ සම්බන්ධව කටයුතු කිරීම.

(7) ගැටලු හඳුනා ගැනීම හා වසමේ පොදු කටයුතුවලදී නායකත්වය ගෙන කටයුතු කිරීම.

(8) හදිසි ආපදා අවස්ථාවලදී අවශ්‍ය සේවා ලබා දීම.

(9) ඉදිරියේදී සිදු විය හැකි ගැටලු හෝ ආපදා තත්ත්ව හඳුනා ගෙන ඒවා වළක්වා ගැනීම සඳහා සුදුසු වැඩ පිළිවෙළක් යෙදීම.

(10) ගමේ ප්‍රශ්න හඳුනා ගෙන එම ගැටලු ජනතාව සමඟ සහයෝගයෙන් හා සහජීවනයෙන් සාකච්ඡා කර විසඳුම් ලබා දීම.

(11) දිළිඳු හා අසරණ ප්‍රජාව හඳුනා ගැනීම හා ඒ අය සමාජ සුබසාධන වැඩ සටහන්වලට සම්බන්ධ කිරීම.

(12) සමාජ හා ආර්ථික විෂමතාවලට ලක්ව ඇති ජන සමූහ හඳුනා ගැනීම, ඔවුන් සංවර්ධන ක්‍රියාවලියට දායක කර ගැනීම හා ඔවුන්ට සංවර්ධනයේ ප්‍රතිලාභ ලබා ගැනීමට ඉඩ සැලසීම

(13) ආගමික හා සංස්කෘතික කටයුතුවලට සම්බන්ධ වීම හා සහාය වීම, නායකත්වය ලබා දීම, මඟ පෙන්වීම හා එම කටයුතු ක්‍රියාත්මක කිරීමට දායකත්වය ලබා දීම.

4. උපාධිධාරීන්ගේ වෘත්තිය මට්ටම සෑහීමකට පත් විය හැකි සේවාවක් බවට පත් කිරීම උදෙසා පහත සඳහන් කරන පියවර අප ගන්න බලාපොරොත්තු වෙනවා.

- වෘත්තිමය නිපුණතා හා හැකියා පදනම් කරගෙන ඔවුන්ට අදාළ ක්ෂේත්‍ර වෙත ස්ථාන මාරුවීම් ලබා ගැනීම සඳහා මෙම අමාත්‍යාංශයෙන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී.
- යහ පාලනයේ මූලික න්‍යාය සංකල්පයක් වන සේවා දායකයන් තෘප්තිමත් වන ආකාරයට සේවා පවත්වා ගෙන යෑමේදී ඔවුන්ගේ අපේක්ෂා හා අවශ්‍යතා පිළිබඳව නිසි තක්සේරුවක් තිබීම අත්‍යවශ්‍ය වේ.
- ඒ අනුව මෙම අමාත්‍යාංශයේ සංවර්ධන නිලධාරීන් ලෙස රාජකාරි කිරීමට කැමැති නිලධාරීන්හට නිසි ගෞරවය ලබා දෙමින් අමාත්‍යාංශයේ පුළුල් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා දායක කරගැනීම මගේ අරමුණයි.
- මේ වන විට ශ්‍රී ලංකා සංවර්ධන නිලධාරීන්ගේ සංගමය, නිදහස් උපාධිධාරී සංගමය හා ගම් මට්ටමේ උපාධිධාරීන්ගේ අදහස් හා යෝජනා ලබා ගැනීම සඳහා අතිරේක ලේකම් (ග්‍රාමීය සංවර්ධන) සමඟ 2015.03.04 දින සාකච්ඡාවක් පවත්වන ලද අතර, එහිදී ලබාගත් අදහස් හා ඉදිරියේදී ඔවුන් විසින් ලිඛිතව ඉදිරිපත් කිරීමට එකඟ වූ යෝජනා අනුව අප අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා.
- 2015 පෙබරවාරි මාසයේ 25වැනි දා පළ වූ "ලංකාදීප" පුවත් පතේ "සංවර්ධන නිලධාරීන් බාල්දු කරන්න එපා" යන මැයෙන් පළවූ ප්‍රවෘත්තිය සම්බන්ධයෙන් ඊට අදාළව රැකියාලාභී උපාධිධාරීන්ගේ සංගමයේ ප්‍රධාන ලේකම් චන්දන සූරියආරච්චි මහතාට 2015.03.04 දිනයේදී සාකච්ඡාවක් පැවැත්වීම සඳහා ආරාධනා කළ අතර, ඒ සඳහා ඔහු මෙතෙක් පැමිණියේ නැත.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

අද වෙනතුරු අමාත්‍යාංශයේ කිසිම සාකච්ඡාවකට එතුමා සහභාගි වෙලාත් නැහැ.

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාගේ දැන ගැනීම පිණිස මම කියන්න කැමැතියි, අද දවසේත් සවස පහමාරට ආර්ථික සංවර්ධන නිලධාරින් පිරිසක් සමඟ අප සාකච්ඡාවක් පවත්වන බව. එහිදී ඒ අය ඉදිරිපත් කරන යෝජනාවලට සවන් දීලා, ඒ අයගේ අභිප්‍රායයන් ඉටු වන ආකාරයට, ඔවුන්ගේ ආත්ම අභිමානය ශක්තිමත් කරවමින් කොන්ද කෙළින් තියාගෙන ගෞරවනීය ලෙස ජනතාවට සේවය කරන්න පුළුවන් රාජකාරි ලැයිස්තුවක් ඔවුන් වෙනුවෙන් නිර්මාණය කරන්නට කටයුතු කරන බවට මම මේ ගරු සභාවට පොරොන්දු වෙනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ස්තූතියි, ගරු ඇමතිතුමනි.

මීළඟට අමාත්‍යාංශ නිවේදන. ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ ඇමතිතුමිය.

කාන්තාවන්ට හා ගැහැනු දරුවන්ට එරෙහි හිංසනය පිටුදැකීම සඳහා වන විපක්ෂ නායක කොමිෂන් වාර්තාව: කාන්තා කටයුතු අමාත්‍යතුමියගේ ප්‍රකාශය

பெண்கள் மற்றும் சிறுமிகளுக்கு எதிரான வன்முறைகளைத் தடுப்பது பற்றிய எதிர்க்கட்சித் தலைவர் ஆணைக்குழு அறிக்கை : மகளிர் அலுவல்கள் அமைச்சரினது கூற்று

INTERIM REPORT OF THE LEADER OF THE OPPOSITION'S COMMISSION ON THE PREVENTION OF VIOLENCE AGAINST WOMEN AND THE GIRL CHILD : STATEMENT BY MINISTER OF WOMEN'S AFFAIRS

ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය (කාන්තා කටයුතු අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி)சந்திராணி பண்டார ஜயசிங்க - மகளிர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Chandrani Bandara Jayasinghe - Minister of Women's Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මම නැඟී සිටින්නේ කාන්තාවන්ට හා දැරියන්ට විරුද්ධව ඇති ප්‍රචණ්ඩත්වය පිළිබඳව වූ වාර්තාව මේ සභාවට ඉදිරිපත් කිරීමටයි. මේ විෂය පිළිබඳව ගැඹුරින් විග්‍රහයක් කිරීම පිණිස එවකට විපක්ෂ නායක වූද, අද අගමැති වන ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින් කොමිෂන් සභාවක් පත් කළා. ගරු කථානායකතුමාද එදා මෙම කොමිෂන් සභාව පත් කිරීම ගැන එකඟ වුණා.

මෙම කොමිෂන් සභාවේ සභාපතිනිය ලෙස පාර්ලිමේන්තුවේ හිටපු මහ ලේකම් ප්‍රියාණි විජේසේකර මහත්මියත්, උප සභාපතිනිය ලෙස කුමුදුනි සැමුවෙල් මහත්මියත් ඇතුළු තවත් සාමාජිකයන් 08දෙනකුගෙන් යුත් කණ්ඩායමක් පත් වුණා.

කාන්තාවන්ට විරුද්ධව ඇති ප්‍රචණ්ඩත්වය පසු ගිය අවුරුදු ගණනාව තුළ ඉතාම උග්‍ර තත්ත්වයකට පත්ව තිබුණා. මෙය මුළු රටටම ලජ්ජා විය යුතු කාරණයක්. මේ පිළිබඳව මෙතෙක් ආණ්ඩුව විසින් දැක්වූ නොසැලකිලිමත් බව ඉතාම අසතුටුදායකයි. අපට මතකයි, කාන්තා දූෂණය පිළිබඳ ප්‍රශ්නය විසඳීම තම කාර්යයක් නොවන බව 2014 දී ළමා සංවර්ධන හා කාන්තා කටයුතු ඇමතිතුමා මේ සභාවේදී ප්‍රකාශ කළ බව. මෙවැනි ආකල්පයක් ආණ්ඩුවේම ඇමති කෙනෙක් දක්වා තිබීම ස්ත්‍රී දූෂකයන්ට කරන අනුබල දීමක් හැටියටයි මට පෙනුණේ. මේ තත්ත්වය වෙනස් කිරීමට ජාතික ප්‍රමුඛත්වයක් දිය යුතු වුණා.

මෙම වාර්තාවේ නීතිමය, ප්‍රතිපත්තිමය හා සමාජයීය කාරණා විග්‍රහ කර ඇත. තවද ලිංගික අපචාර පිළිබඳව වෙනම ගැඹුරින් සලකා බලා නිර්දේශ ද ඉදිරිපත් කර ඇත. ඊටත් අමතරව කාන්තාවන්ට විඳීමට සිදු වන විවිධ අඩන්තේට්ටම් නැති කිරීමට පාර්ලිමේන්තුවට ගත හැකි ක්‍රියා මාර්ග ගැනද මෙම වාර්තාව මඟින් දක්වා තිබෙනවා.

එබැවින් මෙහි ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ආණ්ඩුවේ සෑම අංශයක් විසින්ම සහයෝගය දී අපගේ ජනගහනයෙන් සියයට 52ක් වන කාන්තාවන්ට යුක්තිය ඉටු කිරීමට මෙම වාර්තාවේ ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙස ආණ්ඩුවෙන් ඉල්ලමින් මම මේ වාර්තාව මෙම සභාවට ඉදිරිපත් කරමි. බොහොම ස්තූතියි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රධාන කටයුතු ආරම්භ කිරීමේදී යෝජනා.

පාර්ලිමේන්තුවේ කටයුතු
பாராளுமன்ற அலுவல்
BUSINESS OF THE PARLIAMENT

I

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I move,

"That the Government Business do have precedence this day."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I move,

"That the Business of Parliament on Friday, March 13th, 2015 be exempted from the provisions of Standing Order No. 7 and the motion agreed to by Parliament on 07.04.2011."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

I

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I move,

"That notwithstanding the provisions of Standing Order No. 7 and the motion agreed to by Parliament on 04.03.2015, the hours of sitting this day shall be 1.30 p.m. to 7.30 p.m. At 3.30 p.m. Standing Order No. 7(5) shall operate."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I move,

"That notwithstanding the provisions of Standing Order No. 7(1) and the motion agreed to by Parliament on 09.07.2010, the Parliament shall sit on Friday, March 13th, 2015."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

III

මතු පළ වන යෝජනාව ඊළඟට න්‍යාය පත්‍රයෙහි තිබිණ :
அடுத்து ஒழுங்குப்பத்திரத்தில் பின்வரும் பிரேரணை இருந்தது:
The following Motion stood next on the Order Paper:

"That this Parliament at its rising this day do adjourn until 3.00 p.m. on Friday, March 13th, 2015."

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Hon. Deputy Speaker, there is an Amendment to the above Item, the time to read as 3.15 p.m. Accordingly, I move,

"That this Parliament at its rising this day do adjourn until 3.15 p.m. on Friday, March 13th, 2015."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රධාන කටයුතු, අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 117, ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත - කාරක සභාව.

ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත
தேசிய மருந்துகள் ஒழுங்குபடுத்தும் அதிகாரசபைச் சட்டமூலம்
NATIONAL MEDICINES REGULATORY AUTHORITY BILL

කාරක සභාවෙහිදී සලකා බලන ලදී -
[නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் ஆராயப்பட்டது.
[பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered further in Committee. -
*[*MR. DEPUTY SPEAKER *in the Chair.]*

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු සභාපතිතුමනි, අපි මෙම පනත් කෙටුම්පත පෙරේදා සම්මත කර ගන්නේ නැතිව අද දිනයට යොදා ගත්තේ වැදගත් සංශෝධන කිහිපයක් ඉදිරිපත් කිරීම සඳහායි. නමුත් මා එදින පැවැත්වූ පක්ෂ නායක රැස්වීමට සහභාගි වූයේ නැහැ. එහිදී යම් එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා පෙරේදා සවස 6.30ට පෙර සංශෝධන බාර දිය යුතුයි කියලා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඒත් මම කිව්වා ඒවා පරක්කු වුණාට කමක් නැහැ කියලා. මම නිලධාරින්ට ඒ සංශෝධන දුන්නා. අද පාර්ලිමේන්තුවට අපේ නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින් පැමිණ සිටිනවා. නිලධාරින් සමඟ කථා කරලා සංශෝධන පිළිගන්න පුළුවන්ද කියලා මට දැනුම් දෙන්න කිව්වා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
දැන් කාරක සභා අවස්ථාවේදී වගන්තියෙන් වගන්තිය සම්මත කර ගන්නා විට අපි මොකක්ද කරන්නේ? තුන්වෙනි වගන්තියට මගේ සංශෝධනයක් තිබෙනවා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
කමක් නැහැ, අපට පුළුවන්නේ විශේෂ විධියට ඒ වගන්තිය move කරන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එහෙම අවස්ථාවක් නැහැ නේ ගරු ඇමතිතුමා. ගරු ඇමතිතුමනි, ඒ සඳහා අවස්ථාවක් ලැබෙන්නේ නැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
කාරක සභාවේදී එකඟවෙන සංශෝධන අපි පිළිගන්නවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැහැ. ප්‍රශ්නය තිබෙන්නේ ඒක නොවෙයි. අපි සංශෝධන දුන්නේ අද දවල්. ඒක මම පිළිගන්නවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඇමතිතුමා කිව්වා, අද දවස තුළ දෙන්න පුළුවන් කියලා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
පෙරේදා පක්ෂ නායක රැස්වීමේදී තීන්දුවක් අරගෙන තිබෙනවා, පෙරේදා සවස 6.30ට පෙර සංශෝධන දෙන්න කියලා. අපට ඒ අවබෝධය තිබුණේ නැහැ. ඒ නිසා අපි ඒ සංශෝධන ලබා දුන්නේ අද දවල්. මා සතුව එම සංශෝධන ටික තිබෙනවා. මම ගරු ඇමතිතුමාටත් ඒවා ලැබෙන්න සැලැස්වූවා. දැන් තිබෙන ප්‍රශ්නය මේකයි. ගරු ඇමතිතුමා මේ සංශෝධන පිළිබඳව නිලධාරින් සමඟ සාකච්ඡා කරලාත් නැහැ. දැන් අපි මේ පනත් කෙටුම්පත වගන්තියෙන් වගන්තිය සම්මත කරන්න යනවා. එතකොට කොහොමද මේ සංශෝධන ඇතුළු කරන්නේ?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
පිළිගන්න පුළුවන් ඒවා-

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
පිළිගන්න පුළුවන්ද බැරිද කියලා දැන් කියන්න බැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
පිළිගන්නා සංශෝධන ගරු ඇමතිතුමා පිළිගනියි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැහැ, නැහැ. ඒක නොවෙයි ප්‍රශ්නය.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේ අවස්ථාව කල් දමන්නට බැහැ නේ, ගරු මන්ත්‍රීතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු ඇමතිතුමාට පිළිගන්න පුළුවන්ද, බැරිද කියන්න තරම්-

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
පනත් කෙටුම්පත සම්මත කිරීම කල් දමන්න බැහැ නේ, ගරු මන්ත්‍රීතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමනි, ඔබතුමා පොඩ්ඩක් ඉන්න කෝ. ගරු රාජිත සේනාරත්න ඇමතිතුමා ප්‍රශ්නය මොකක්ද කියලා දන්නවා. [බාධා කිරීමක්] ඔබතුමා ඉන්නකෝ පොඩ්ඩක්. ඇමතිතුමා ප්‍රශ්නය මොකක්ද කියලා දන්නවා. [බාධා කිරීමක්] මේ සංශෝධන පිළිගන්නවාද, නැද්ද කියලා අවබෝධයක් ලබා ගන්න ගරු ඇමතිතුමාට වෙලාවක් ලැබුණේ නැහැ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඒක තමයි ප්‍රශ්නය. දහවල් 12.45ට තමයි සංශෝධන ලැබිලා තිබුණේ. මට දැනුයි ඒවා ලැබුණේ. අපේ නිලධාරි මහත්වරු ඇවිල්ලා ඉන්නවා. වෛද්‍යවරුත් ඇවිල්ලා ඒ අයත් සමඟ සාකච්ඡා කරලා ඒවාට එකඟ වෙන්න ඕනෑ. නීති කෙටුම්පත් සම්පාදක මණ්ඩලයට වාගේම නීතිපති දෙපාර්තමේන්තුවටත් මේ සංශෝධන ලබා දෙන්න ඕනෑ. ඒ අයත් මේ සංශෝධන සඳහා එකඟ වෙන්න ඕනෑ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින් ඇවිල්ලා ඉන්නවාද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
දැනුයි ආවේ. ඒ නිලධාරින් මේ දේවල් කියවන්න ඕනෑ නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒක නේ. පනත් කෙටුම්පතක් සම්මත කරන දවසේ ඒ නිලධාරින් වේලාසනින් එන්න ඕනෑ නේ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඇවිල්ලා ඉන්නේ. සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන්නත් කලින් ඇවිත් ඉන්නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කරන්න ඕනෑ ප්‍රධානම වැඩේ ඒක නේ. එහෙනම් ගරු ඇමතිතුමා මොකක්ද කරන්නේ?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු මන්ත්‍රීතුමා, මම කියන්නම්. ඔබතුමා ඒ ටික වෙනමම සංශෝධන වශයෙන් ඉදිරි කාලයේදී ඉදිරිපත් කරන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒක කෙරෙන්නේ නැහැනේ ගරු ඇමතිතුමා. ඒක නැවත ඉදිරිපත් කෙරෙන්නේ නැහැ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
එහෙම කරන්න. අපි එකඟ වෙන ටික මම ආපහු -[බාධා කිරීමක්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
දැන් ඔබතුමා පුළුවන් නම් අපිට කියන්න ප්‍රතිපත්තිමය ලෙස මේ කියන දේවලට එකඟ වන්න පුළුවන් ද, බැරිද කියලා?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මට තේරෙන හැටියට සමහර ඒවා කළ හැකියි. මම එහෙම කරන්න කැමැති නැහැ. මොකද, මම මේක විද්වත් මණ්ඩලයක් එක්ක කළේ.

සභාපතිතුමා
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු මන්ත්‍රීතුමා, ඉදිරියේදී ඔබතුමා සංශෝධන ඉදිරිපත් කරලා - [බාධා කිරීමක්]

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මොකද මෙතැනදී අජිත් කුමාර ගරු මන්ත්‍රීතුමාත්-[බාධා කිරීමක්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ප්‍රශ්නය තිබෙන්නේ නැවත මේක ඉදිරියේදී එන්න නම් මේ පනතට නැවත සංශෝධනයක් එන්න ඕනෑ. මම හිතන හැටියට ඒක කෙරෙන වැඩක් නොවෙයි. මේ පාර්ලිමේන්තුවේම අපි සම්මත කළා, පළාත් පාලන පනත් කෙටුම්පත. පළාත් පාලන මැතිවරණ පනත් කෙටුම්පත සම්මත කරන වේලාවේදීත් අපි දැක්ක දෙයක් තමයි, ඉදිරියේදී සංශෝධන ඉදිරිපත් කරන්න ඒ.එල්.එම්. අතාවුල්ලා හිටපු ඇමතිතුමා ඉඩ දෙනවා කියලා එකඟතාවකට ආවා. හැබැයි කවදාවත් ඒ පනතට සංශෝධන මේ පාර්ලිමේන්තුවට ආවේ නැහැ. දැන් සිදු වෙන්නෙත් ඒකම තමයි. මම දන්නේ නැහැ, ඔබතුමාගේ නිලධාරි මහත්වරුන්ට මේක ඉක්මනින් කරන්න පුළුවන්ද කියලා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
සිකුරාදා දිනය දුන්නෙත් ඔබතුමාගේ ඉල්ලීම පිට. නමුත් මේ යෝජනා අපිට හම්බ වුණේ නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්, ඒක තමයි ප්‍රශ්නය තිබෙන්නේ.

සභාපතිතුමා
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු ඇමතිතුමනි, අපි කියා සිටින්නේ මේ පනත් කෙටුම්පත මේ විධියට දැන් අනුමත කරමු කියලායි. එන සතියේ ඔබතුමා සෞඛ්‍ය පිළිබඳ උපදේශක කාරක සභාව කැඳවන්න. එතැනදී නීතිපති කාර්යාලයේ නිලධාරීන් සියලු දෙනා කැඳවලා ඔබතුමාට, රජයට එකඟ වන්නට පුළුවන් කාරණා ටික අරගෙන ඒකට සංශෝධනයක් මේ දින සියය අවසන් වෙන්න කලින් ගෙනෙන්න. එපමණයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු සභාපතිතුමනි,-

සභාපතිතුමා
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු අනුර දිසානායක මහතා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එතුමාගේ පක්ෂයේ අදහස ඒ කිව්වේ. එතුමාට ඒ තීරණය ගන්න පුළුවන්. කිසිසේත්ම එතුමා අපේ විපක්ෂ නායකතුමා නොවෙයි. මම ඒකත් කියන්න එපා යැ. ඒ නිසා අපි වෙනුවෙන් උත්තර බඳින්න හෝ අපි වෙනුවෙන් එකඟතාවකට එන්න එතුමාට අවශ්‍ය නැහැ.

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඒ අපේ විපක්ෂ නායකතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්, ඒක තියා ගන්න. ඒක පරිස්සම් කරලා තියා ගන්න. මම මේ කියන්නේ - [බාධා කිරීම්]- පොඩ්ඩක් ඉන්නකෝ- එතුමායි මමයි අතරේ විසඳා ගන්න ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමා දන්නවා, මේ පනත් කෙටුම්පත සම්මත කර ගන්න පෙරේදා අපේ පැත්තෙන්ම තමයි මම ඒ ඉල්ලීම ඉදිරිපත් කළේ කියන එක. ඉල්ලීම ඉදිරිපත් කළේ සංශෝධන කිහිපයක් ඉදිරිපත් කිරීමට මට අවස්ථාව දෙන්න කියලා. ඇත්තටම මම දැනගෙන හිටියේ නැහැ, පෙරේදා දිනයේ සවස 6.30 පෙර මේ සංශෝධන ලබා දිය යුතුයි කියලා. ඒ ගැන මට අවබෝධයක් තිබුණේ නැහැ.

මහ ලේකම්තුමා උදේ කියනකොට තමයි මම මේ ගැන දන්නේ. අපිට පුරුදු විධිය, අපේ සාමාන්‍ය සම්ප්‍රදාය වී තිබුණේ පාර්ලිමේන්තුව රැස්වීමට පෙර සංශෝධන ලබා දීම තමයි. ඒ අනුව මම මේ සංශෝධන මධ්‍යාහ්න 12.00 හෝ 12.30ට ආසන්න වේලාවකදී මහ ලේකම්තුමාගේ කාර්යාලයට එව්වා. එතකොට තමයි එතුමාගේ කාර්යාලයෙන් මා දැනුවත් කළේ පෙරේදා සවස 6.30ට පෙර මේ සංශෝධන ලබා දිය යුතුයි කියන එකඟතාවකට ආපු බව. එතෙක් එවැනි එකඟතාවක් ගැන අපි දන්නේ නැහැ. ඒ නිසා අපේ අවශ්‍යතාව තිබුණේ [බාධා කිරීම්] ඉතින් දන්නේ නැහැ නේ. ඒක තමයි මම මේ කියන්නේ. [බාධා කිරීම්]

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
නැහැ. දන්වලාත් තිබෙනවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔබතුමාත් ජාතික විධායක සභාවේ ඉන්නවා නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඊට වඩා සපෝට් ඔයගොල්ලෝ. මේ මන්ත්‍රීවරු 60 දෙනකුගෙන් සමන්විත ආණ්ඩුවක් පවත්වාගෙන යන්නේ ඔයගොල්ලෝ හින්දායි. නැත්නම් හැටේ ආණ්ඩුවක් තියන්න බැහැ. 60ක ආණ්ඩුවක් පාර්ලිමේන්තුවේ තිබෙන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සහාය තිබෙන නිසායි. මේක සහාග ආණ්ඩුවක්. [බාධා කිරීම්] ජාතික විධායක සභාවට වඩා. සහාග ආණ්ඩුවක් හැටියටයි තිබෙන්නේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි, යූඑන්පී එකයි

[ගරු අනුර දිසානායක මහතා]

අතර. නැත්නම් කොහොමද, මේ ආණ්ඩුව තිබෙන්නේ? මේ ආණ්ඩුව පවතින්නේ නැහැ, නැතුව. ජාතික විධායක සභාව නිසා නොවෙයි, මේ ආණ්ඩුව තිබෙන්නේ. මේ සභාග ආණ්ඩුව ශ්‍රී ලංකා එකෙයි, එක්සත් ජාතික පක්ෂයේයි. ඒක හොඳින් තේරුම් ගන්න. [බාධා කිරීම්] මේ කාලයකින් හැදුණු හොඳ ශ්‍රී ලංකා - යූඑන්පී සභාග ආණ්ඩුවක්.- [බාධා කිරීම්]

සභාපතිතුමා
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
Order, please! ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ අදහස් ප්‍රකාශ කරලා ඉවරද?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු සභාපතිතුමනි, අදහස් ඉදිරිපත් කරන්න දෙන්නේ නැහැ නේ. මේ ආණ්ඩුවේ පාර්ශ්වයක් වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අපට කරදර කරනවා. [බාධා කිරීම්]

සභාපතිතුමා
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
මීළඟට, ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා.

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ගරු සභාපතිතුමනි, මම කාරුණිකව ඉල්ලා සිටිනවා, මේ වචන දෙක තුන අහගෙන ඉන්න කියලා. පක්ෂ නායක රැස්වීමේදී, -පක්ෂ නායක රැස්වීම කියන්නේ මම සහභාගි වන එකක් නොවෙයි. සියලු පක්ෂවල නායකයන්, අනුර දිසානායක මැතිතුමා ඒ වාගේම විපක්ෂ නායකතුමා සම්බන්ධ වන පක්ෂ නායක රැස්වීමේදී- තමයි න්‍යාය පත්‍රය තීරණය කළේ තුන් වෙනි දා මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා හතර වෙනි දා සම්මත කරන්න ඕනෑ කියලා. මම ඒකට මුල සිටම ගරු රාජිත සේනාරත්න ඇමතිතුමාටත්, මේ සභාවටත් විරෝධය පෑවා. මම තුන්වෙනි දා මේ සභාවේදී ඒක කිව්වා. ගරු සභාපතිතුමනි, මා එය ප්‍රකාශ කළේ මේ ප්‍රශ්නය මතුවෙන නිසායි. ගරු ඇමතිතුමා පෙරේදා එනම් හතර වෙනිදා විවාදයේදී කිව්වා, සංශෝධන එතුමාට දෙන්න කියලා. මම අද උදේ ප්‍රශ්න, දුෂ්කරතා ගොඩක් තියාගෙන උදේ 9.30 වෙනකොට පාර්ලිමේන්තුවට පැමිණියා. මම මහ ලේකම්තුමාගේ කාර්යාලයට අවස්ථා දෙකක ගියා. එතුමා හිටියේ නැහැ. මම හිතන හැටියට අද විශේෂ සාකච්ඡාවක් තිබුණේ. අද මේ සංශෝධන දෙන්න පුළුවන්ද කියලා එතුමා විමසුවා.

මොකද, අමාත්‍යතුමා ගිය සතියේ කිව්වා, සංශෝධන දෙන්න කියලා. එහෙත් සංශෝධන දෙන්න අවස්ථාවක් ලැබුණේ නැහැ. මහ ලේකම්තුමා දැනුම් දුන්නා, සංශෝධන අද භාරගන්න බැහැ කියලා. ස්ථාවර නියෝග අනුව සංශෝධන දෙන්න පුළුවන් නියමිත, නිශ්චිත සීමාවක් නැහැ. හරි නම්, කාරක සභාව අවස්ථාවේදීත් සංශෝධන ඉදිරිපත් කරන්න අයිතියක් ගරු මන්ත්‍රීවරුන්ට තිබෙනවා. කොහොම වුණත්, වෙනදා තිබුණු සම්ප්‍රදාය අනුවත්, ගරු ඇමතිතුමා කියූ පරිදිත්, අද දවසේ උදය වරුවේ සංශෝධන දෙන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. මේ පාර්ලිමේන්තුවේ විපක්ෂය විධියට සෘජුව ආණ්ඩුවට සහයෝගය දෙන අයගේ හෝ වෙනත් සංවිධානවල ඉඳගෙන -විධායක සභාවේ හෝ වෙනත් කොහේ හෝ ඉඳගෙන- සහයෝගය දෙන අයගේ හෝ කොහේහරි ඉඳගෙන වෙනත් ක්‍රමවලට සහයෝගය දෙන අයගේ හෝ කාගේ හෝ මැදිහත් වීමෙන් මේ වෙන්න යන්නේ බරපතළ ප්‍රශ්නයක් ගරු සභාපතිතුමනි. ගරු රාජිත සේනාරත්න ඇමතිතුමා කියනවා, ප්‍රශ්නයක් නැහැ, මේ පනත් කෙටුම්පත පැය 24න් අධ්‍යයනය කරන්න පුළුවන් කියලා. අද උදේත් වෛද්‍යවරු, විවිධ වෘත්තිකයන් මේ පිළිබඳව හොඳ අදහස් මට ඉදිරිපත් කළා. මේ පනත් කෙටුම්පතේ තිබෙන හොඳ දේවල් හොඳයි කියමින් එතුමන්ලා මා වෙත අදහස් ඉදිරිපත් කළා. ඒ ඉදිරිපත් කරපු සමහර තර්කවල මා ඉදිරිපත් කරපු තර්ක සමඟ පරස්පරයක් තිබෙනවා. හැබැයි ඒ ගැන සාකච්ඡා කරන්න තියා හිතන්නවත් වෙලාවක් නැහැ. මම උදාහරණයක් ගන්නම්. මේ රටේම ප්‍රසිද්ධ වුණේ ඇමතිතුමා 10දෙනකු පත් කරනවා කියලායි. ගරු ඇමතිතුමා එදා මේ ගරු සභාවේදී එය නිවැරැදි කළා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු සභාපතිතුමනි, දැන් තිබෙන්නේ මේ සංශෝධන ටික ඉදිරිපත් කරන කටයුත්ත ලෑස්ති කරන එකයි. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ සංශෝධනය මේ දැනුයි මගේ අතට ලැබුණේ. මට පුළුවන්ද, දැන් ආපු එකකට දැන් එකඟ වෙන්න?

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ඔබතුමා ආවේ දැන් නේ. [බාධා කිරීම්]

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මම ඇවිල්ලා හුඟක් වෙලා. [බාධා කිරීම්]

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
මට සවන් දෙන්න කෝ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මම මෙතැනට ඇවිල්ලා හුඟක් වෙලා. මම පස් වරු 1.30ට වාචික පිළිතුරු දෙන ප්‍රශ්නයකටත් උත්තර දුන්නා.

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
මට සවන් දෙන්න කෝ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඔබතුමා කොහේද කලින් ආවේ? දැන් ඇවිල්ලා තිබෙන්නේ ඔබතුමායි.

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ඔබතුමන්ලා ඇයි මට කථා කරන්න දෙන්නේ නැත්තේ?

සභාපතිතුමා
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා.

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ගරු සභාපතිතුමනි, මම අවසන් කරනවා. මම මේ සංශෝධන භාර දෙන්න ඕනෑ මහ ලේකම්තුමාටයි. ඒවා එතුමාට භාර දෙන්න

ගියාම එතුමා හිටියේ නැහැ. ඊට පස්සේ එතුමා එය ප්‍රතික්ෂේප කළා. [බාධා කිරීමක්] ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, අද දෙන්න පුළුවන් කියලා.

සභාපතිතුමා
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා,

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
මම අවසන් කරන්නම්, ගරු සභාපතිතුමනි. [බාධා කිරීම්] කරුණාකර මා මතු කරන ප්‍රශ්නයට සවන් දෙන්න. මට විනාඩියක් දෙන්න. මෙතැන අනෙක් කවුරුත් කියන ඒවා අහගෙන සිටියා නේ. සුළුතරයේ අදහසක් කියන කෙනකුට සවන් දෙන්න.

සභාපතිතුමා
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
කියන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ගරු සභාපතිතුමනි, මම අවසන් කරන්නම්. පැයක කාලයක් තිබෙනවා නේ.

ගරු සභාපතිතුමනි, ඒක තමයි මම රටටම කිව්වේ, ගරු ඇමතිතුමා කියන හොඳ දේවල් පිළිගන්නත්, ඒ තර්කය සාධාරණීකරණය කර ගන්නත් ඒ ගැන පරීක්ෂා කර බලන්න කාලයක් ඕනෑ කියා. මම උදාහරණයක් හැටියට කිව්වා නේ, ගරු ඇමතිතුමාට 10දෙනකු පත් කරන්න පුළුවන් කියලා වැරැදි අදහසක් තිබුණාය කියන කාරණය. ගරු ඇමතිතුමාට 10දෙනකු පත් කරන්න බැහැ. 4දෙනකුයි පත් කරන්න පුළුවන්. හැබැයි ඇමතිතුමාට 10දෙනා ඉවත් කරන්න පුළුවන්. ඒවා ගැනත් සංවාද කරලා තවත් සංශෝධන එකතු කරන්න සාධාරණ කාලයක් ඕනෑ කියන එකයි මා කිව්වේ. අවුරුදු 40ක් කථා වුණු පනත් කෙටුම්පත දවස් එකහමාරෙන් සම්මත කරලා අවසන් කරන්න හදනවා. ඒ නිසා මේ සංශෝධන ඉදිරිපත් කරන්න වෙලාව දෙන්න.

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
මේක කල් දමන්න බැහැ. [බාධා කිරීම්]

ගරු අජිත් කුමාර මහතා
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
නවත්වලා හරි වෙලාව දෙන්න. [බාධා කිරීම්] විපක්ෂ නායකතුමා ඇතුළු පිරිස ආණ්ඩුවත් එක්ක මොන එකඟතාවකට ආවත් ඒක අපට අදාළ නැහැ. [බාධා කිරීම්] ඒක එතුමාගේ වැඩක්. හැබැයි මේ රටේ අපට අයිතිය තිබෙන්න ඕනෑ- [බාධා කිරීම්] එතුමන්ලා එකඟ වුණ එක අපට අදාළ නැහැ නේ.

සභාපතිතුමා
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු මන්ත්‍රීතුමා, කරුණු දක්වා අවසන්ද?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

සභාපතිතුමා
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු විරුද්ධ නායකතුමා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
එදාම මෙය සම්මත කළ යුතුයි කියලා කිව්වා. නමුත් විපක්ෂයේ අපි පොරොන්දුවක් දුන්නා, "අපි මේ පනත් කෙටුම්පත අද සම්මත කරලා දෙනවා." කියලා. ගරු සභාපතිතුමනි, ඔබතුමා ඒ අනුව කටයුතු කරන්න කියා මම ඉල්ලා සිටිනවා. ඒ අනුව මේ පනත් කෙටුම්පතට අවශ්‍ය සංශෝධන තිබෙනවා නම්, පස්සේ සාකච්ඡා කරලා ගෙනෙන්න අපේ රාජිත සේනාරත්න ඇමතිතුමා එකඟ වෙලා තිබෙනවා. ඒ නිසා මේ අවස්ථාවේදී මේ පනත් කෙටුම්පත සම්මත කර ගන්න ඕනෑ. මේ පනත් කෙටුම්පත පිළිබඳව කවුරුත් අදහස් ප්‍රකාශ කළා. වැදගත් පනත් කෙටුම්පතක්ය කියලා කිව්වා. ඒ නිසා තවත් පමා නොවී අද මේ පනත් කෙටුම්පත සම්මත කරන්න කියලා මම ඉල්ලනවා.

සභාපතිතුමා
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
මේ සඳහා ගරු අමාත්‍යතුමාට සාධාරණ කාලයක් ලබා දිය යුතුයි. එම නිසා යෝජනා තිබේ නම්, වෙනම උපදේශක කාරක සභාවේදී සාකච්ඡා කර ඉදිරියේදී සංශෝධනයක් හැටියට ඒවා ඉදිරිපත් කරන්න. ඒ සඳහා ඉදිරියේදී අවස්ථාව ලබා ගන්න.

1 සිට 3 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
1ஆம் வாசகம் தொடக்கம் 3ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses1 to 3 ordered to stand part of the Bill.

4 වන වගන්තිය.- (අධිකාරියේ සංයුතිය.)
வாசகம் 4.- (அதிகாரசபையின் அமைப்பு.)
CLAUSE 4.- (*Constitution of the Authority.*)

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
ගරු ඇමතිතුමනි, මෙතැනදි මේ අධිකාරියට ඔබතුමා තෝරා තිබෙන පිරිස් වෘත්තිකයින් හැටියට ඉතාමත්ම හොඳයි. නමුත්, මේ 'සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය' ගැන වුවමනාවක් තිබෙන, ඒ වාගේම කැප වීමකින් ක්‍රියාත්මක කරන අය මේ අධිකාරියට ඇතුළු කරන්න පුළුවන් නම්, ඒක වැදගත් වෙයි කියලා අපි හිතනවා. ඒ අනුව තමයි මම මේ යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ.

Sir, I move,

"In page 4, clause 4 (b) (iv), insert after the final sentence ending with 'respectively':

'The health professional to be nominated by the Senaka Bibile Commemoration Committee.' "

සභාපතිතුමා
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු අමාත්‍යතුමා සංශෝධනය පිළිගන්නවාද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඒ සංශෝධනය පිළිගන්නේ නැහැ. මොකද, අපට එක එක සංවිධානවලින් මේ අධිකාරියට සාමාජිකයින් ගන්න බැහැ.

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, නිශ්ප්‍රභ විය.
திருத்தம் விடுக்கப்பட்டு நிராகரிக்கப்பட்டது.
Amendment put, and negatived.

4 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
4ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 4 ordered to stand part of the Bill.

5 වන වගන්තිය.- (අධිකාරියේ සභාපතිවරයා.)
வாசகம் 5.- (அதிகாரசபையின் தவிசாளர்.)
CLAUSE 5.- (*Chairman of the Authority*.)

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"4 වන පිටුවේ, 23 වන පේළිය සහ 24 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'අමාත්‍යවරයා විසින් අධිකාරිය විමසා අධිකාරියේ සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබිය යුතු ය.' ";

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

සභාපතිතුමා
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු තිස්ස විතාරණ මන්ත්‍රීතුමා 5 වන වගන්තියට සංශෝධන ඉදිරිපත් කරනවාද?

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
ගරු සභාපතිතුමනි, -

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු තිස්ස විතාරණ මන්ත්‍රීතුමා ඉදිරිපත් කිරීමට නියමිත සංශෝධනය මා ඉදිරිපත් කළ සංශෝධනයෙන් cover වනවා.

5 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
5ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 5, as amended, ordered to stand part of the Bill.

6 වන වගන්තිය.- (සාමාජිකයන්ගේ සම්බන්ධතා සටිටනය.)
வாசகம் 6.- (உறுப்பினர்களின் முரண்படும் அக்கறைகள்.)
CLAUSE 6.- (*Conflict of interests of the members*.)

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"5 වන පිටුවේ, 15 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:

'(3) අධිකාරියේ සාමාජිකයකු ලෙස පත් කරනු ලබන තැනැත්තා එසේ පත් කරනු ලැබීමට පෙරාතුවම අවුරුදු තුනක කාලයක් ඇතුළත ඖෂධ කර්මාන්තය සම්බන්ධ යම් රැකියාවක හෝ පත්වීමක නියුතු වී නොසිටි තැනැත්තකු විය යුතු ය.' ";

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

සභාපතිතුමා
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු තිස්ස විතාරණ මන්ත්‍රීතුමා 6 වන වගන්තියට සංශෝධන ඉදිරිපත් කරනවාද?

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
ඒක හරි.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
එය පැන නොනඟී.

6 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
6ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 6, as amended, ordered to stand part of the Bill.

7 සිට 11 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
7ஆம் வாசகத்திலிருந்து 11ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 7 to 11 ordered to stand part of the Bill.

12 වන වගන්තිය.- (අධිකාරිය විසින් රැස්වීම් සඳහා විශේෂඥයන්ට ආරාධනා කළ හැකි බව.)
வாசகம் 12.- (அதிகாரசபை, நிபுணர்களைக் கூட்டங்களுக்கு வரவழைத்தல்.)
CLAUSE 12.- (*Authority to invite experts to meetings.*)

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු සභාපතිතුමනි, පහත සඳහන් සංශෝධනය මම ඉදිරිපත් කරනවා.

"9 වන පිටුවේ, 28 වන පේළිය සහ 29 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

' (ආ) විශේෂඥයන්ගේ අදහස් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අභිමතය අධිකාරිය සතු විය යුතු ය.' ";

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සහා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

12වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

12ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 12, as amended, ordered to stand part of the Bill.

13 සිට 17 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

13ஆம் வாசகத்திலிருந்து 17ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 13 to 17 ordered to stand part of the Bill.

18 වන වගන්තිය.- (අධිකාරියේ අරමුදල.)

வாசகம் 18.- (அதிகாரசபையின் நிதியம்.)

CLAUSE 18.- (*Fund of the Authority.*)

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු සභාපතිතුමනි, පහත සඳහන් සංශෝධනය මම ඉදිරිපත් කරනවා.

"16 වන පිටුවේ, 7වන පේළියේ සිට 9 වන පේළිය දක්වා (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(ඇ) ණය, ප්‍රදානයන්, ත්‍යාග සහ පරිත්‍යාගයක් වශයෙන් අධිකාරිය වෙත ලැබෙන සියළු මුදල් ප්‍රමාණ; ' ";

ගරු තිස්ස විතාරණ මන්ත්‍රීතුමාගේ සංශෝධනයත් මේ හා සමාන නිසා මෙයට ඇතුළත්. ඒ නිසා එය පැන නඟින්නේ නැහැ.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)

අනිවාර්යයෙන්ම මේක රජයේ වගකීමක් හැටියට අවශ්‍ය මුදල් ලබා දිය යුතුයි.

සභාපතිතුමා
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

ගරු අමාත්‍යතුමාගේ සංශෝධනයට සහාව එකඟ ද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

සභාපතිතුමා
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

ගරු තිස්ස විතාරණ මහතා සංශෝධන ඉදිරිපත් කරන්න.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)

ඒක පිළිගන්නවා.

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සහා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

18 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

18ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 18, as amended, ordered to stand part of the Bill.

19 සිට 24 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

19ஆம் வாசகத்திலிருந்து 24ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 19 to 24 ordered to stand part of the Bill.

25 වන වගන්තිය.- (අධිකාරියේ බලතල පැවරීම.)

வாசகம் 25.- (அதிகாரசபையின் தத்துவங்களைக் கையளித்தல்.)

CLAUSE 25.- (*Delegation of powers of the Authority.*)

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු සභාපතිතුමනි, පහත සඳහන් සංශෝධනය මම ඉදිරිපත් කරනවා.

"18 වන පිටුවේ, 17 වන පේළියේ සිට 19 වන පේළිය දක්වා (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'යම් කොන්දේසිවලට යටත්ව අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයාට හෝ යම් අදාළ අංශ ප්‍රධානියෙකු වෙත එහි බලතල හෝ කර්තව්‍ය පවරා දෙනු ලැබිය හැකි අතර එම තැනැත්තා හෝ අදාළ අංශ ප්‍රධානියා විසින් අධිකාරියේ' ";

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සහා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

සභාපතිතුමා
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

ගරු තිස්ස විතාරණ මහතා, සංශෝධනය ඉදිරිපත් කරන්න.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)

ඒ කොටස එකතු කරනවාත් එක්කම මේ අධිකාරියට අයත් බලතල සම්පූර්ණයෙන්ම පහළ මට්ටමේ නිලධාරීන්ට පැවරීම නුසුදුසු බවයි මා කියන්නේ. විශේෂයෙන්ම "approvals, renewals, rejections and cancellations" කියන අංශ අධිකාරියේ ලොකුම වගකීම. අධිකාරියම ඒක භාර ගත යුතුයි.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
පහළ මට්ටමට යන්නේ නැහැ.

සභාපතිතුමා
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු ඇමතිතුමා ඒ සංශෝධනයට එකඟද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
"ප්‍රධාන විධායක නිලධාරියාට හෝ යම් අදාළ අංශ ප්‍රධානියෙක් වෙත"

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
ගරු ඇමතිතුමනි, මම කියන්නේ -

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඔබතුමා කියන්නේ ප්‍රධාන විධායක නිලධාරියාට පමණක් තියන්න කියලාද?

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
නැහැ, ප්‍රධාන විධායක නිලධාරියාට පමණක් නොවෙයි. ඒ කියන්නේ අධිකාරිය ගත යුතු තීන්දු තිබෙනවා. උදාහරණයක් හැටියට ප්‍රධාන නිලධාරියා හෝ අංශ භාර නිලධාරියෙක් අධිකාරියට යෝජනා කරන්න පුළුවන් අසවල් දේ සුදුසුයි කියලා. නමුත් අන්තිමේදී වගකීම භාර ගන්න තිබෙන්නේ අධිකාරියටයි.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඒක හරි. ඉතිරි ටිකෙන් ඒක වෙනවා. ඒක හරි.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
ඒ බලය වෙන කාටවත් පවරන්න බැහැ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මෙහි තිබෙනවා, "හෝ කර්තව්‍යයක් පවරා දෙනු ලැබිය හැකි අතර" කියලා. ඒ කියන්නේ පවරා දෙනවා.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
මට සැකයක් තිබෙනවා, එහෙම අධිකාරිය සතුව තිබෙන යම් වැදගත් තීන්දු ගැනීම පහළ මට්ටමේ උදවියට ගන්න පුළුවන් වේවිය කියලා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඔබතුමා කියන්නේ මේ බලතල කර්තව්‍යය පවරා දෙන්නය කියලා නේද? එහෙම නේද තිබෙන්නේ?

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
නැහැ, විවිධ බලතල තිබෙනවා. සමහර ඒවා පවරා දෙන්න පුළුවන්. උදාහරණයක් හැටියට යම් සමාගමක් ලියාපදිංචි කිරීම භාර ගන්නේ නැත්නම් ඒ තීන්දුව අධිකාරියෙන්ම තමයි භාර ගන්න ඕනෑ. ඒක පහළ මට්ටමේ නිලධාරින්ට භාර දෙන්න බැහැ. ඒ වාගේම නැවත කල් දීම - renewals - වාගේ වැදගත් තීන්දු අධිකාරියම තමයි සතු වෙන්න ඕනෑ. ඒවා පහළ මට්ටමේ නිලධාරින්ට භාර දෙන එක නුසුදුසුයි.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
සමා වෙන්න, මගේ ළඟ තිබෙන්නේ ඉංග්‍රීසි පිටපත. එහි සඳහන් වන්නේ මෙහෙමයි.

Clause 25 (1) states, I quote:

"The Authority may in writing and subject to such conditions as may be specified therein, delegate to the CEO and any division of the Authority..... "

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
But, it should not be all functions. It should be -

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
It should be delegated to the CEO.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
No. For instance, if there is a powerful, multinational supplier and if he is not accepted, then that decision must be taken by the Authority.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
That is there.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
No.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
You read the original Bill. It is there.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, may I intervene? Shall I read the relevant section?

සභාපතිතුමා
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
Yes.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Clause 10 (2) (a) states, I quote:

"All matters for decision by the Authority shall be dealt with at a meeting, of the Authority and shall be determined by the majority of the members present and voting."

So, the Authority decides finally.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
That should not be delegated.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
No, no. There is no delegation.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
That is really the issue here. Look into this please.

සභාපතිතුමා
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු ඇමතිතුමාගේ සංශෝධනයට යටත්ව ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවට එකඟ ද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

25 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

25ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 25, as amended, ordered to stand part of the Bill.

26 වන වගන්තිය.- (අමාත්‍යවරයා විසින් විධාන නිකුත්කළ හැකි බව.)
வாசகம் 26.- (அமைச்சரினாலான பணிப்புகள்.)
CLAUSE 26. - *(Directions by the Minister.)*

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"18 වන පිටුවේ, 26වන පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'26. (1) රාජ්‍ය ප්‍රතිපත්තිය බලාත්මක කිරීම සඳහා අධිකාරියේ බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ' "

ගරු සභාපතිතුමනි, මා හිතන විධියට මහාචාර්ය ගරු තිස්ස විතාරණ මැතිතුමාත් මේකම තමයි සංශෝධනය හැටියට ඉදිරිපත් කර තිබෙන්නේ.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
ඒ කියන්නේ, ඒක නිසියාකාරව කළ යුතුයි කියන එකයි මා කියන්නේ. අපි දැන් සම්පූර්ණයෙන් ඔබතුමාව විශ්වාස කරනවා. නමුත් අනාගතයේ කවුරු ඇමතිවරයා වේවිද කියලා අපට කියන්න බැහැ. ඒ නිසා ඇමතිතුමා දෙන නියෝගය අර කරන කටයුතු වඩාත් හොඳට කිරීම සඳහා ඉදිරිපත් විය යුතුයි. ඒක ඇතුළත් කළොත් හොඳයි. නැත්නම් වැරැදි ඒවාත් ඉදිරිපත් වෙන්න ඉඩ තිබෙනවා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඔබතුමා යෝජනා කරන්නේ—"so as to ensure the proper....."-

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
"Proper" කියන වචනය ඇතුළත් කිරීම අත්‍යවශ්‍යයි.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
හොඳයි.

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

26 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

26ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 26, as amended, ordered to stand part of the Bill.

27 සහ 28 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

27ஆம், 28 ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 27 and 28 ordered to stand part of the Bill.

29 වන වගන්තිය.- (යම් සිවිල් හෝ අපරාධ නඩුවක වියදම් අරමුදලින් ගෙවිය යුතු බව.)

வாசகம் 29.-(துடர்ச்சியிலான அல்லது குற்ற வழக்கிலான செலவுகள் நிதியத்திலிருந்து செலுத்தப்படுதல்.)

CLAUSE 29. - *(Expenses in suit or prosecution to be paid out of the Fund.)*

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"19 වන පිටුවේ, 17 වන පේළිය සහ 18 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.

'නීතියක විධිවිධාන යටතේ අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා හෝ වෙනත් යම් නිලධරයකු' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

29 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

29ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 29, as amended, ordered to stand part of the Bill.

30 වන වගන්තිය.- (ජාතික උපදේශක කමිටුව සහ අංශ පිහිටුවීම.)

வாசகம் 30.- (தேசிய மதியுரைக்குழு மற்றும் பிரிவுகளைத் தாபித்தல்)

CLAUSE 30. - *(Establishment of National Advisory Committee and divisions.)*

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "20 වන පිටුවේ, 12 වන පේළිය සහ 13 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'උපකරණ හෝ සීමාස්ථ නිෂ්පාදනවල තත්ත්වය පිළිබඳ තත්වාරක්ෂණ පරීක්ෂණ පිළිබඳ වගකිව යුතු ජාතික ඖෂධ.;' ";

(2) "21 වන පිටුවේ, 14 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'ලබන පරිදි අහිතකර ඖෂධ ප්‍රතික්‍රියා, තත්ත්වයෙන් බාල සහ ව්‍යාජ ඖෂධ සම්බන්ධයෙන්.' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendments put, and agreed to.

30 වන වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

30ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 30, as amended, ordered to stand part of the Bill.

31 වන වගන්තිය.- (ජාතික උපදේශ ක කමිටුවේ සංයුතිය.)

வாசகம் 31.- (தேசிய மதியுரைக் குழுவின் அமைப்பு.)

CLAUSE 31. - *(Constitution of the National Advisory Committee.)*

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "22 වන පිටුවේ, 16 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'31. (1) අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන ජාතික උපදේශක කමිටුව පහත දැක්වෙන; ' "

(2) "22 වන පිටුවේ, 22 වන පේළිය සහ 23 වන පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'(ඇ) භාණ්ඩාගාර ලේකම්වරයා විසින් නම් කරනු ලබන ඔහුගේ නියෝජිතයකු;' "

(3) "24 වන පිටුවේ, 14 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:-

'(බ) සේනක බිබිලේ අනුස්මරණ පදනමේ නියෝජිතයකු.' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendments put, and agreed to.

31 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

31ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 31, as amended, ordered to stand part of the Bill.

32 සිට 35 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

32ஆம் வாசகத்திலிருந்து 35ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 32 to 35 ordered to stand part of the Bill.

36 වන වගන්තිය.- (නියෝග.)

வாசகம் 36.- (ஒழுங்குவிதிகள்.)

CLAUSE 36. - *(Regulations.)*

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"25 වන පිටුවේ, 25 වන පේළියේ සිට 27 වන පේළිය දක්වා (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න :-

'36. අමාත්‍යවරයා, මෙම පනතේ මෙම කොටසේ විධිවිධානවලට බලාත්මකභාවය ලබා දීම.' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තම් විධිකරණ පිළිගත්තා.
Amendment put, and agreed to.

36 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

36ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clause 36, as amended, ordered to stand part of the Bill.

37 සිට 39 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

37ආම් වාසකත්තිලිරුන්තු 39 ආම් වාසකම් වරෙ සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clauses 37 to 39 ordered to stand part of the Bill.

40 වන වගන්තිය.- (නියෝග.)

வாசகம் 40.- (ஒழுங்குவிதிகள்.)

CLAUSE 40. - *(Regulations.)*

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"28 වන පිටුවේ, 4 වන පේළිය සහ 5 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න :-

'40. අමාත්‍යවරයා විසින් මෙම පනතේ මෙම කොටසේ' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තම් විධිකරණ පිළිගත්තා.
Amendment put, and agreed to.

40 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

40ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clause 40, as amended, ordered to stand part of the Bill.

41 සහ 42 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

41ආම්, 42ආම් වාසකංකළ් සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clauses 41 and 42 ordered to stand part of the Bill.

43 වන වගන්තිය.- (ඖෂධ ඇගයීම් කමිටුව.)

வாசகம் 43.- (மருந்துகள் மதிப்பீட்டுக் குழு.)

CLAUSE 43. - *(Medicines Evaluation Committee.)*

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"29 වන පිටුවේ,16 වන පේළියේ සිට 18 වන පේළිය දක්වා (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'(ආ) එම වාර්තාවේ ජාතික ඖෂධ ප්‍රතිපත්තිය ප්‍රකාරව ඖෂධවලට අදාළ ප්‍රතිලාභ, අවදානම, එම ඖෂධවල තත්ත්වය, ප්‍රත්‍යක්ෂභාවය ආරක්ෂාකාරී බව, අවශ්‍යතාවය, මිළ සහ අවශ්‍ය අවස්ථාවලදී එම ඖෂධවල ඖෂධ ආර්ථික විශ්ලේෂණ පිළිබඳව නිශ්චිතව දැක්විය යුතු ය.' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තම් විධිකරණ පිළිගත්තා.
Amendment put, and agreed to.

43 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

43ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clause 43, as amended, ordered to stand part of the Bill.

44 සිට 48 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

44ආම් වාසකත්තිලිරුන්තු 48ආම් වාසකම් වරෙ සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clauses 44 to 48 ordered to stand part of the Bill.

49 වන වගන්තිය.- (ඖෂධ නිෂ්පාදනය, ආනයනය, විකිණීම සහ බෙදාහැරීම නියාමනය කිරීම.)

வாசகம் 49.- (மருந்தை உற்பத்தி செய்தல், இறக்குமதி செய்தல், விற்பனை செய்தல் மற்றும் விநியோகித்தல் என்பனவற்றை ஒழுங்குபடுத்துதல்.)

CLAUSE 49. - *(Regulation of manufacture, importation, sale and distribution of medicine.)*

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"33 වන පිටුවේ, 1 වන පේළිය සහ 2 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න :-

'(ඇ) භාවිතකරුගේ සෞඛ්‍යයට හානිකර විය හැකි යම් අහිතකර ද්‍රව්‍යයක් අන්තර්ගත හෝ මතුපිට ඇති කිසිදු ඖෂධයක්; හෝ' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තම් විධිකරණ පිළිගත්තා.
Amendment put, and agreed to.

49 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

49ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clause 49, as amended, ordered to stand part of the Bill.

50 සිට 55 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

50ආම් වාසකත්තිලිරුන්තු 55ආම් වාසකම් වරෙ සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clauses 50 to 55 ordered to stand part of the Bill.

56 වන වගන්තිය.- (ඖෂධයක වාර්ගික නාමය ඖෂධ වට්ටෝරුවේ ලිවිය යුතු බව.)

வாசகம் 56.- (ஒரு மருந்தின் இனத்திற்குரிய பெயர் மருந்துப் பட்டோலையில் எழுதப்படுதல்.)

CLAUSE 56. - *(Generic name of a medicine to be written in the prescription.)*

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "35 වන පිටුවේ, 19 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'වට්ටෝරුවකම එම ඖෂධයේ ඖෂධීය නාමය ලිවිය යුතුය.;"

(2) "22 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'ඖෂධ වට්ටෝරුවේ ඖෂධීය නාමයට අමතරව එම ඖෂධයේ;"

(3) "25 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'වෛද්‍යවරයෙකු විසින් නියම කරනු ලබන ඖෂධය සඳහා ඖෂධීය;"

(4) "32 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'පාරිභෝගිකයාගේ කැමැත්ත සහ ඖෂධවේදියා විසින් වෙනත් වර්ගීය ඖෂධයක් පාරිභෝගිකයාට ලබා දිය හැක;"

(5) "36 වන පිටුවේ, 1 වන පේළිය සහ 2 වන පේළි ඉවත් කරන්න:"

(6) "4 වන සහ 5 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'මිල දී ගැනීමට හැකි වන පරිදි ඔසු සලේ ඇති, එම ඖෂධයට අදාළ විවිධ වෙළෙඳ නාම සහිත හෝ රහිත වර්ගීය ඖෂධ සහ ඒවායේ මිල ගණන්;'"

(7) "8 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'වර්ගීය ඖෂධයට අදාළ වෙළෙඳ නාම සහිත සහ රහිත ඖෂධ සඳහා ඒවායේ මිල; ' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendments put, and agreed to.

56 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

56ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 56, as amended, ordered to stand part of the Bill.

57 සිට 67තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

57ஆம் வாசகத்திலிருந்து 67ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 57 to 67 ordered to stand part of the Bill.

68 වන වගන්තිය.- (වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුව.)

வாசகம் 68.- (மருத்துவ உபகரணங்கள் மதிப்பீட்டுக் குழு.)

CLAUSE 68. - *(Medical Devices Evaluation Committee.)*

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"43 වන පිටුවේ, 10 වන පේළියේ සිට 13 වන පේළිය දක්වා (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'(ආ) එම වාර්තාවේ, ජාතික ඖෂධ ප්‍රතිපත්තිය ප්‍රකාරව වෛද්‍ය උපකරණවලට අදාළ ප්‍රතිලාභ, අවදානම්, එම වෛද්‍ය උපකරණවල ප්‍රත්‍යක්ෂභාවය, තත්ත්වය, ආරක්ෂාකාරී බව, අවශ්‍යතාව, මිල සහ අවශ්‍ය අවස්ථාවල දී එම වෛද්‍ය උපකරණවලට ඖෂධ ආර්ථික විශ්ලේෂණ පිළිබඳව නිශ්චිතව දැක්විය යුතුය.' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

68 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

68ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 68, as amended, ordered to stand part of the Bill.

69 වන වගන්තිය.- (එම්ඩීඊසී හි සංයුතිය.)

வாசகம் 69.- (மஉம குழுவின் அமைப்பு.)

CLAUSE 69. - *(Constitution of the MDEC.)*

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"45 වන පිටුවේ, 16 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:-

' (2) රැස්වීම් සඳහා ගණපූරණය විශේෂඥ මණ්ඩලයේ සාමාජිකයන් හැර හත්දෙනෙකු විය යුතු ය.

(3) නම් කළ සාමාජිකයකුගේ ධුර කාලය අවුරුදු තුනක් විය යුතු ය.' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendments put, and agreed to.

69 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

69ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 69, as amended, ordered to stand part of the Bill.

70 සිට 88 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

70ආම් වාසකත්තිලිරුන්තු 88ආම් වාසකම් වරෙ සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clauses 70 to 88 ordered to stand part of the Bill.

89 වන වගන්තිය.- (සීමාස්ථ නිෂ්පාදන ඇගයීම් කමිටුව.)

வாசகம் 89.- (எல்லைக்கோட்டு உற்பத்திப் பொருட்கள் மதிப்பீட்டுக்குழு.)

CLAUSE 89. - *(Borderline Products Evaluation Committee.)*

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)

(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"53 වන පිටුවේ, 15 වන පේළියේ සිට 18 වන පේළිය දක්වා (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(ආ) එම වාර්තාවේ ජාතික ඖෂධ ප්‍රතිපත්තිය ප්‍රකාරව සීමාස්ථ නිෂ්පාදනවලට අදාළ ප්‍රතිලාභ, අවදානම්, එම සීමාස්ථ නිෂ්පාදනවල ප්‍රත්‍යක්ෂභාවය, තත්ත්වය, ආරක්ෂාකාරී බව, අවශ්‍යතාව, මිල සහ අවශ්‍ය අවස්ථාවල දී එම සීමාස්ථ නිෂ්පාදනවල ඖෂධ ආර්ථික විශ්ලේෂණ පිළිබඳව නිශ්චිතව දැක්විය යුතු ය.' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

89 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

89ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clause 89, as amended, ordered to stand part of the Bill.

90 වන වගන්තිය.- (බීපීඊසී හි සංයුතිය.)

வாசகம் 90.- (எஉம குழுவின் அமைப்பு.)

CLAUSE 90. - *(Constitution of the BPEC.)*

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)

(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"54 වන පිටුවේ, 22 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:-

'(2) රැස්වීම් සඳහා ගණපූරණය විශේෂඥ මණ්ඩලයේ සාමාජිකයන් හැර පස්දෙනෙකු විය යුතු ය.

(3) නම් කරන ලද සාමාජිකයකුගේ ධුර කාලය අවුරුදු තුනක් විය යුතු ය.' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendments put, and agreed to.

90 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

90ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clause 90, as amended, ordered to stand part of the Bill.

91 සිට 100 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

91ආම් වාසකත්තිලිරුන්තු 100ආම් වාසකම් වරෙ සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clauses 91 to 100 ordered to stand part of the Bill.

101 වන වගන්තිය.- (සීමාස්ථ නිෂ්පාදන ලියාපදිංචි කිරීම ආදිය සඳහා වූ අවශ්‍යතා.)

வாசகம் 101.- (எல்லைக்கோட்டு உற்பத்திகளின் பதிவு முதலியவற்றுக்கான தேவைப்பாடு.)

CLAUSE 101. - *(Requirement to register &c. of borderline products.)*

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)

(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"59 වන පිටුවේ, 11 වන පේළිය සහ 12 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'(3) (1) වන හෝ (2) වන උපවගන්තිවල විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලැබේ.' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

101 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

101ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clause 101, as amended, ordered to stand part of the Bill.

102 සිට 105 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

102ආම් වාසකත්තිලිරුන්තු 105ආම් වාසකම් වරෙ සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clauses 102 to 105 ordered to stand part of the Bill.

106 වන වගන්තිය.- (වංක ක්‍රියාකාරකම් තහනම් කිරීම.)

வாசகம் 106.- (நேர்மையற்ற கையாளுகைகளைத் தடை செய்தல்.)

CLAUSE 106. - *(Prohibition of dishonest dealings.)*

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)

(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"62 වන පිටුව, 27 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'(4) ඖෂධවේදියකු විසින් යම් ඖෂධයක්, වෛද්‍ය උපකරණයක් හෝ සීමාස්ථ නිෂ්පාදනයක් නිකුත් කිරීමේ දී, පාරිභෝගිකයා විසින් ඉල්ලා සිටිනු ලබන භාෂාවකින් එකී ඖෂධය, වෛද්‍ය උපකරණය හෝ සීමාස්ථ නිෂ්පාදනය පිළිබඳ විස්තරයක් එකී පාරිභෝගිකයාට ලබා දිය යුතුය.' "

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

106 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

106ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 106 , as amended, ordered to stand part of the Bill.

107 සිට 118 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

107ஆம் வாசகத்திலிருந்து 118ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 107 to 118 ordered to stand part of the Bill.

119 වන වගන්තිය.- (ඖෂධල් පවත්වාගෙන යන සෑම තැනැත්තකු විසින්ම බලපත්‍රයක් ලබාගත යුතු බව.)

வாசகம் 119.- (வாகடகமொன்றைக் கொண்டு நடாத்தும் ஆள் ஒவ்வொருவரும் உரிமமொன்றைப் பெறுதல் வேண்டும்.)

CLAUSE 119. - *(Every person to carry on a Pharmacy to obtain a licence.)*

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)

(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"70 වන පිටුවේ, 4 වන පේළිය සහ 5 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'(ආ) ඉල්ලීම ප්‍රතික්ෂේප කර එම ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව වහාම හේතු දක්වමින් ලිඛිතව ඉල්ලුම්කරුට දැනුම් දිය හැකි ය.' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

119 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

119ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 119 , as amended, ordered to stand part of the Bill.

120 සහ 121 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

120ஆம், 121ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 120 and 121 ordered to stand part of the Bill.

122 වන වගන්තිය.- (අභියාචනා.)

வாசகம் 122.- (மேன்முறையீடுகள்.)

CLAUSE 122. - *(Appeals.)*

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)

(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"71 වන පිටුවේ, 10 වන පේළිය සහ 11 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'(ආ) අධිකාරිය විසින් එකී අභියාචනය පිළිබඳ තීරණය ප්‍රායෝගිකව හැකි ඉක්මනින් අභියාචක වෙත දැනුම් දිය යුතුය.' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

122 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

122ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 122 , as amended, ordered to stand part of the Bill.

123 වන වගන්තිය.- (අභියාචනා කමිටුව.)

வாசகம் 123.- (மேன்முறையீட்டுக் குழு.)

CLAUSE 123. - *(The Appeals Committee.)*

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)

(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"72 වන පිටුවේ, 19 වන පේළියේ සිට 22 වන පේළිය දක්වා (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කරන්න."

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

සභාපතිතුමා

(தவிசாளர் அவர்கள்)

(The Chairman)

123 වගන්තියට සංශෝධන ඉදිරිපත් කිරීම, ගරු තිස්ස විතාරණ මහතා.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා

(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)

(The Hon. (Prof.) Tissa Vitarana)

ගරු සභාපතිතුමනි, මා කියා සිටින්නේ අභියාචනා මණ්ඩලයට පත් කරනු ලබන තුන් දෙනාගෙන් එක් අයකු වන සෞඛ්‍ය ලේකම් ගැනයි. දැනට සිටින ලේකම්වරයා වෛද්‍යවරයෙක්. ඉදිරියේදී පත් වන කෙනා වෛද්‍යවරයෙක් නොවෙන්නත් පුළුවන්. එම නිසා මම හිතනවා අධ්‍යක්ෂ ජනරාල් එතැනට පත් කළොත් වඩාත් හොඳයි කියලා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)

(The Hon. (Dr.) Rajitha Senaratne)

අධ්‍යක්ෂ ජනරාල්වරයා ඉන්නවා අධිකාරියේ. එතකොට Appeal Board එකට ඔහුට එන්න බැහැ. ඒ නිසායි ලේකම්වරයාව පත් කරලා තිබෙන්නේ. ඊට ඉහළ පුද්ගලයෙක්ව පත් කරන්න ඕනෑ අමාත්‍යාංශයෙන්. අපි මේකට එකඟ නැහැ. ඔබතුමා ගෙන ආ අනෙක් සංශෝධනයට අපි එකඟ වෙනවා. ඒ කියන්නේ National Advisory Committee එකට Senaka Bibile Commemoration Committee එකෙන් representativeවරයෙක් පත් කරන්න.

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

திருத்தம் விடுக்கப்பட்டு நிராகரிக்கப்பட்டது.

Amendment put, and negatived.

123 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

123ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 123 , as amended, ordered to stand part of the Bill.

124 සිට 129 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

124ஆம் வாசகத்திலிருந்து 129ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 124 to 129 ordered to stand part of the Bill.

130 වන වගන්තිය.- (සාමාන්‍ය වැරැදි.)

வாசகம் 130.- (பொதுவான தவறுகள்.)

CLAUSE 130. - *(General offences.)*

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"79 වන පිටුවේ, 6 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

130 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

130ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 130 , as amended, ordered to stand part of the Bill.

131 වන වගන්තිය.- (මේ පනතේ විධිවිධාන උල්ලංඝනය කිරීම සඳහා වන දඬුවම්.)

வாசகம் 131.- (இச்சட்டத்தின் ஏற்பாடுகளை மீறுவதற்கான தண்டனை.)

CLAUSE 131. - *(Punishment for the contravention of the provisions of this Act.)*

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"79 වන පිටුවේ, 7 වන පේළියේ සිට 11 වන පේළිය දක්වා (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'131. (1) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් උල්ලංඝනය කරන සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු අතර වැරැදිකරු කිරීමේදී-' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

131 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

131ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 131 , as amended, ordered to stand part of the Bill.

132 සිට 142 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

132ஆம் வாசகத்திலிருந்து 142ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 132 to 142 ordered to stand part of the Bill.

143 වන වගන්තිය.- (නඩු පැවරීම.)

வாசகம் 143.- (வழக்கு நடவடிக்கைகளைத் தொடுத்தல்.)

CLAUSE 143.- (*Institution of proceedings*)

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"91 වන පිටුවේ, 25 වන පේළියේ සිට 29 පේළිය දක්වා (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'(2) මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදනු ලැබූ යම් නියෝගයක් යටතේ යම් තැනැත්තකු විසින් සද්භාවයෙන් කරනු ලැබූ හෝ එසේ කරන ලදැයි අදහස් කරනු ලැබූ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව යම් සිවිල් හෝ අපරාධ නඩුවක් පැවරීම හෝ වෙනත් නීති කෘත්‍යයක් සිදු කිරීම නොකළ යුතු ය.' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

143 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

143ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 143, as amended, ordered to stand part of the Bill.

144 සහ 145 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

144ஆம், 145ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 144 and 145 ordered to stand part of the Bill.

146 වන වගන්තිය. - (අර්ථනිරූපණය.)

வாசகம் 146.- (பொருள்கோடல்.)

CLAUSE 146.- (*Interpretation*)

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"99 වන පිටුවේ, 29 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න :-

'ආඥාපනතේ 29 වන වගන්තිය හෝ 41 වන වගන්තිය යටතේ වෛද්‍ය වෘත්තිකයකු වශයෙන්' "

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තීරුත්තම් විටුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.

Amendment put, and agreed to.

146 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

146ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 146, as amended, ordered to stand part of the Bill.

147 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

147ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 147 ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.

Enacting Clause and Title ordered to stand part of the Bill.

Bill reported with Amendments.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)

(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

කෙටුම්පතෙහි සෝදුපත්වල මුද්‍රණ දෝෂ, අංක දෝෂ හෝ -

ගරු අජිත් කුමාර මහතා

(மாண்புமிகு அஜித் குமார)

(The Hon. Ajith Kumara)

නැඟී සිටියේය.

எழுந்தார்.

rose.

නියෝජ්‍ය කථානායකතුමා

(பிரதிச் சபாநாயகர் அவர்கள்)

(The Deputy Speaker)

ගරු අජිත් කුමාර මහතා.

ගරු අජිත් කුමාර මහතා

(மாண்புமிகு அஜித் குமார)

(The Hon. Ajith Kumara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම බෙදීමක් ඉල්ලනවා.

ප්‍රශ්නය විමසන ලදී.

කටහඬවල් අනුව " පක්ෂ" මන්ත්‍රීන්ට ජය බව නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

வினா விடுக்கப்பட்டது.

குரல்களின்படி "ஆம்" மேலோங்கிற்று எனச் சபாநாயகர் அவர்கள் அறிவித்தார்கள்.

Question put.

MR. DEPUTY SPEAKER,, *having collected the Voices, declared that the "Ayes" had it.*

පාර්ලිමේන්තුව 43 වන ස්ථාවර නියෝගය යටතේ - පක්ෂව 68: විරුද්ධව 01 යනුවෙන් - බෙදුණේය.

பாராளுமன்றம் 43ஆம் நிலைக் கட்டளைப்படி பிரிந்தது: சார்பாக 68; எதிராக 01.

The Parliament divided under Standing Order No. 43: Ayes 68; Noes 01.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

Question put, and agreed to.

Bill, as amended, accordingly read the Third time, and passed.

කල්තැබීම

ஒத்திவைப்பு

ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)

(The Hon. Lakshman Kiriella)

I move,

"That the Parliament do now adjourn."

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

வினா எடுத்தியம்பப்பெற்றது.

Question proposed.

පසු ගිය රජය ආරම්භ කළ සංවර්ධන ව්‍යාපෘති ඇනහිටීම

முன்னைய அரசு ஆரம்பித்த அபிவிருத்தித் திட்டங்களின் இடைநிறுத்தம்

STALLING OF DEVELOPMENT PROJECTS INITIATED BY FORMER GOVERNMENT

[අ.භා. 3.28]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"2015 පෙබරවාරි මස 18 වන දින මා විසින් ස්ථාවර නියෝග 23(2) යටතේ පසු ගිය රජය මඟින් ආරම්භ කරන ලද ග්‍රාමීය මට්ටමේ සංවර්ධන ව්‍යාපෘතීන් මෙන්ම යටිතල පහසුකම් පුළුල් කිරීම ආරම්භ කරන ලද ව්‍යාපෘතීන් රාශියක් ආරම්භ කරන ලද බවත්, පසු ගිය ජනාධිපතිවරණයෙන් පසු එකී සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම ඇනහිට ඇති බවත්, මා මෙම සභාවේ අවධානයට යොමු කරන ලදී.

තවද ඉටු කරන ලද සංවර්ධන වැඩ කටයුතු වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන්ට හා විවිධ සංවිධානවලට ගෙවිය යුතු මුදල ගෙවීම රජය මඟින් පැහැර හැර ඇති බවත්, මෙකී මුදල් ගෙවීම සඳහා භාණ්ඩාගාරය මඟින් ප්‍රාදේශීය ලේකම්තුමන්ලා ඇතුළු දෙපාර්තමේන්තු ප්‍රධානින් වෙත මුදල් ලබා දී නොමැති බවත්, මා විසින් පෙන්වා දෙන ලදී.

තවද ස්වදේශ කටයුතු හා ධීවර අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද චක්‍රලේඛය තුළින් සංවර්ධන ව්‍යාපෘතීන් අත්හිටුවන ලෙස සියලු දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත දැනුම් දී ඇති බවත් මෙම ගරු සභාවේ අවධානය යොමු කරන ලදී.

පසු ගිය රජය මඟින් ආරම්භ කරන ලද දැවැන්ත ග්‍රාමීය සංවර්ධන වැඩ පිළිවෙළවල් හා යටිතල පහසුකම් සංවර්ධනය මෙසේ නතර කර තිබීම නිසා අද ශ්‍රී ලංකාව තුළ ඉදි කිරීම ක්ෂේත්‍රයේ පනස්දහසකට අධික පිරිසකට රැකියා හා ජීවනෝපායන් අහිමි වී ඇති අතර, ඔවුන් දැඩි දුෂ්කරතාවන්ට මුහුණ දී ඇත.

එසේම පසු ගිය රජය සමයේ ක්‍රියාත්මක කරන ලද පුළුල් සංවර්ධන වැඩසටහන් තුළින් බිහිවුණු සහ ගොඩනැඟුණු දේශීය සුළු, මධ්‍යම හා මහා පරිමාණ ඉදි කිරීම කර්මාන්තකරුවන්, තම ව්‍යාපාරයේ අභිවෘද්ධිය උදෙසා විශාල මුදලක් ආයෝජනය කොට මිලදී ගෙන ඇති යන්ත්‍රසූත්‍ර, උපකරණ හා අනෙකුත් පහසුකම් සහ ගොඩනැඟිලි එම සංවර්ධන ක්‍රියාවලිය ඇනහිටීම හේතුවෙන් ඵල රහිත ආයෝජනයන් බවට පත්වී එම ව්‍යාපාර බිඳවැටෙන තත්ත්වයකට මුහුණ පා ඇති අතර, ලබා ගෙන ඇති බැංකු ණය පහසුකම් ආපසු ගෙවීම සම්බන්ධයෙන්ද දැඩි අර්බුදකාරී තත්ත්වයකට මුහුණ පා ඇත.

තවද පසු ගිය රජය මඟින් ලබා දෙන ලද ප්‍රතිපාදනවලින් මිලදී ගන්නා ලද විවිධ භාණ්ඩ හා ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා තෝරා ගන්නා ලද පුද්ගලයින්ට ඒවා නොබෙදා ගබඩාවන්හි එකී භාණ්ඩ ගබඩා කර ඇති බවත්, එකී ප්‍රතිලාභීන්ට හිමි මුදල් ගෙවීම නතර කර ඇති බවත් වාර්තා වී ඇත. මෙය ඉතා ඛේදජනක තත්ත්වයකි.

තවද දැනට අවිච්ඡේද වී ඇති සංවර්ධන ව්‍යාපෘතීන් අඛණ්ඩව කරගෙන යන බවට 2015 පෙබරවාරි මස 19වන දින මෙම ගරු සභාවේදී ස්වදේශ කටයුතු හා ධීවර අමාත්‍යතුමා ප්‍රකාශ කළද, ගෙවිය යුතු පෙර හිඟ බිල්පත් ගෙවීම සඳහා අවශ්‍ය මුදල් ලබාදෙන බවට පැහැදිලි ප්‍රකාශයක් එතුමා නොකරන ලදී. තවද නව සංවර්ධන ව්‍යාපෘතීන් පිළිබඳව එතුමා ප්‍රකාශ කළේ මුදල් වෙන් කර ලබා දී තිබෙන ව්‍යාපෘතීන් පමණක් ක්‍රියාත්මක කරන බවයි. එහෙත් කිසිදු නව සංවර්ධන ව්‍යාපෘතියක් මෙතෙක් ආරම්භ කර නොමැති බව දිවයිනේ සෑම ප්‍රදේශයකින්ම වාර්තා වී ඇත.

ගරු අමාත්‍යතුමා විසින් කරන ලද එකී ප්‍රකාශය තුළින් පසු ගිය රජය මඟින් ආරම්භ කරන ලද ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතීන් අඛණ්ඩව කරගෙන යාම සඳහා තිරසාර සැලැස්මක් මෙම රජයට ඇති බව පැහැදිලිවම නොපෙනෙන හෙයින්ද, නව සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට මැළිකමක් දක්වන බව ප්‍රදර්ශනය වන හෙයින්ද, එහි ප්‍රතිඵලයක් වශයෙන් ග්‍රාමීය සංවර්ධන, යටිතල පහසුකම් සංවර්ධන ඇනහිට ඇති බව පැහැදිලිවම පෙනෙන හෙයින්ද, මේ තුළින් විරැකියාව ඉහළ ගොස් ඇති අතර, ඉදි කිරීම ක්ෂේත්‍රයන්ට සම්බන්ධ පුද්ගලයින්ගේ ජීවනෝපායන්ට බලවත් පහරක් සිදු වී ඇති බැවින්ද, මෙම ප්‍රශ්නය පිළිබඳව රජයේ දැඩි අවධානය යොමු කොට මෙකී සංවර්ධන ව්‍යාපෘතීන් ඉක්මනින් ක්‍රියාත්මක කිරීම සඳහා තිරසාර වැඩ පිළිවෙළක් දියත් කරන ලෙස රජයෙන් ඉල්ලා සිටිමි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පිළිබඳව අපගේ මන්ත්‍රීවරුන් විශාල සංඛ්‍යාවක් අද කරුණු ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවෙන් සිටිනවා. ඒ දිස්ත්‍රික්කවල ඇති වී තිබෙන මේ ඛේදජනක තත්ත්වය, ඒ සංවර්ධන වැඩ කටයුතු ඇණහිට තිබෙන ආකාරය පිළිබඳව එතුමන්ලා මේ ගරු සභාවේදී කරුණු ඉදිරිපත් කරනවා ඇති.

විශේෂයෙන්ම බදුල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් මම විශේෂයෙන්ම මේ කාරණය පිළිබඳව කියන්නට ඕනෑ. මගේ බදුල්ල මැතිවරණ කොට්ඨාසයේ හැගොඩ පාලම, හම්බාවෙළ පාලම වැනි පාලම් තුනක් අපි හදන්නට කටයුතු යොදලා, කොන්ත්‍රාත් දීලා, CECB ආයතනයට මුදල් දීලා, භාගෙට දැන් ඒ පාලම් හදාගෙන යනවා. මේ වැඩ බිම්වල තිබෙන කොටස් ගලවාගෙන ගිහිල්ලා තිබෙන නිසා දැන් මිනිසුන්ට පාරේ යන්න එන්නත් පුළුවන්කමක් නැහැ. මේ පාලම් ඉදි කිරීම වැඩ කටයුතු එක පාරටම අත් හැරලා තිබෙනවා. ඒ නිසා විශාල දුෂ්කරතාවකට මේ ජනතාවට මුහුණපාන්න සිදු වෙලා තිබෙනවා. ඒ වාගේම බදුල්ල දිස්ත්‍රික්කයේ ජාතික පාසල් සහ පළාත් සභා පාසල් ව්‍යාපෘති වන මඟින්දෝදය තාක්ෂණ විද්‍යාගාර 22ක් සඳහා එක් ව්‍යාපෘතියක් වෙනුවෙන් රුපියල් මිලියන 25ක් ගණනේ වැය කරන්න තීන්දු කර තිබෙනවා. 2015.03.31වන දිනට පෙර මේවායේ වැඩ අවසන් කිරීමට චක්‍රලේඛ මඟින් දැනුම් දීලා තිබෙනවා. මේ ව්‍යාපෘති සඳහා මුදල් වෙන් කර ඇති නමුත් ගෙවීම් කටයුතු නතර කරලා තිබෙනවා. මෙවැනි ව්‍යාපෘතීන් 250කට ආසන්න ගණනක් තිබෙන නිසා සමස්ත ලංකාවේම ජනතාව මෙම ගැටලුවට මුහුණ දී තිබෙනවා. පසු ගිය දා මම බදුල්ලට ගිය අවස්ථාවේදී මධ්‍යම පරිමාණ රජයේ දේශීය කොන්ත්‍රාත්කරුවන්ගේ සංගමය මා සමග විශේෂ සාකච්ඡාවක් පැවැත්වූවා. අපේ කලින් පැවති රජය දේශීය කොන්ත්‍රාත්කරුවන් ශක්තිමත් කරමින් ඔවුන්ට මේ මඟින්දෝදය විද්‍යාගාර සෑදීමේ අවස්ථාව ලබා දුන්නා. ඒ තුළින් දේශීය ඉදි කිරීම කර්මාන්තය අපි ශක්තිමත් පදනමකට ගෙනාවා. අද ඒ සියල්ල බිඳ වැටිලා තිබෙනවා. ඔවුන් මේ වනකොට ණය වෙලා සිටිනවා. ඒවායේ වැඩ කරන මේසන් බාස්ලා, විදුලි කාර්මිකයින්, කම්කරුවන් රැකියා නැති වන අවස්ථාවට පත් වෙලා සිටිනවා. මහා පරිමාණයේ සංවර්ධනය සඳහා පමණක් නොවෙයි, රටේ ආර්ථික සංසරණය සඳහා අවශ්‍ය වන මේ සංවර්ධන කටයුතුත් වහාම ඉටු කරන්නට ඕනෑ. අපි අපේ අය වැය ලේඛනයෙන් සෑම මැතිවරණ කොට්ඨාසයකටම කිලෝමීටර් 25ක් පමණ වූ කාපට් පාරවල් 25ක් ගණනේ ඉදි කිරීමට කටයුතු කළා. නමුත් ඒවා එකකවත් ඉදි කිරීම කටයුතු තවම ආරම්භ වෙලා නැහැ. ඒ වාගේම අපි ආරම්භ කරන ලද දැවැන්ත ජල යෝජනා ක්‍රම ඇතුළු තවත් දේවල් රාශියක් පිළිබඳව කටයුතු ආරම්භ කරලා නැති බව ප්‍රකාශ කරන්න කැමැතියි.

විශේෂයෙන්ම ග්‍රාමීය මාර්ග කාපට් කිරීමේ වැඩසටහන යටතේ බදුල්ල මැතිවරණ කොට්ඨාසයේ ඉලුක්තැන්න ගුරුගම්මානය, හින්නාරංගොල්ල පන්සල අසල සිට ගලේපට්ටිය දක්වා මාර්ගය, කැන්දගොල්ල ඉදිකඩ හන්දියේ සිට වැබැද්ද බෝධිය දක්වා මාර්ගය, ග්ලැනල්ගින්වත්ත ග්‍රැම්ස්ලැන්ඩ් කොටසට යන මාර්ගය, තෙල්බැද්ද මොරගොල්ල කොටස, නව නිවාස ගම්මාන හරහා වැවේබැද්ද ගමට පිවිසෙන හන්දිය දක්වා මාර්ගය, පුස්වැල්ගොල්ල ටැංකිය අසල සිට ප්‍රධාන ඇළ දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම, හැගොඩ ප්‍රධාන මාර්ගය අසල සිට ජිනානන්දගම, ආලිගබැද්ද, හෙලවත්ත, නෙළුම්ගම යන ගම්මානවලට පිවිසෙන මාර්ගය, අලිඅඹකැලේ හන්දියේ සිට කවුඩුබෝතැන්න බෝගහ හරහා මාර්ගය, තෙල්බැද්ද පරණ ස්ටෝරුව පාර මලංගමුව සංස්කෘතික මධ්‍යස්ථානය දක්වා මාර්ගය, තෙල්බැද්ද කංකාණි ලයිම හන්දියේ සිට මලංගමුව ප්‍රධාන මාර්ගයට යන මාර්ගය, නේත්‍රා ගාඩ්න්ස් ගම්මානයට යන මාර්ගය, කටුපැලැල්ල ගම යෙල්වටන්වත්ත මාර්ගය කාපට් කිරීමේ වැඩ කටයුතු අතර මඟ නැවතිලා තිබෙනවා. මේවා ග්‍රාමීය පාරවල් විතරක් නොව, වතුකරයටත් යන පාරවල්. ඒ වාගේම බණ්ඩාරවෙල දෙමළ මහා විද්‍යාලයේ සිව්මහල් ගොඩනැඟිල්ලේ වැඩ කටයුතුත් අතර මඟ නැවතිලා තිබෙනවා.

හල්දුම්මුල්ල ආයුර්වේද හරිත වැඩබිමේ කාන්තා විවේකාගාරය ඉදි කිරීම, ගිරාඳුරුකෝට්ටට හරිත වැඩබිම කළමනාකරු නේවාසිකාගාරය ඉදි කිරීම, බණ්ඩාරවෙල කහගොල්ල කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන ආයතනය සඳහා ශ්‍රවණාගාරයක් හා පර්යේෂණ විද්‍යාගාරයක් ඉදි කිරීම කටයුතුත් භාගෙට කරලා දැන් නතර කරලා තිබෙනවා. ධර්මදූත විද්‍යාලයේ තෙමහල් ගොඩනැඟිල්ල ඉදි කිරීම II අදියර, ධර්මදූත විද්‍යාලයේ 130'x25' ගොඩනැඟිල්ල ඉදි කිරීම I අදියර, දියතලාව වෙළෙඳ සංකීර්ණය ඉදි කිරීම, හාලිඇල ප්‍රාදේශීය සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ඉදි කිරීම, තණමල්විල සෞඛ්‍ය වෛද්‍ය මධ්‍යස්ථානය ඉදි කිරීම වැනි වැඩ කටයුතු රාශියක් නතර වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඉලුක්පැලැස්ස දොඩම්ගොල්ල මාර්ගය RDA එක මාර්ගයෙන් කම්කරු ශ්‍රමය යටතේ සිදු කරන ලද වැඩ කටයුත්තක්. මම කිව්වේ දැනට නතර වෙලා තිබෙන සංවර්ධන වැඩ කටයුතු අතරින් අතළොස්සක් පිළිබඳව පමණයි. අද සමහර පාරවල්වල යන්න බැරි වෙලා තිබෙනවා.

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම ඒ වැඩ බිම්වලට ගෙනගිහින් දමා තිබෙන ද්‍රව්‍ය එක එක් කෙනා අරගෙන යනවා; ඒවා විනාශ වී ගෙන යනවා. ඒ නිසා මේ පිළිබඳව රජයේ අවධානය වහා යොමු විය යුතුයි. මේ මඟින් ඇති වන නාස්තියත් වැළැක්විය යුතුයි. එයයි යහ පාලනය කියන්නේ. ජනතා අභිලාෂ මුදුන්පත් කර ගැනීම සඳහා පෙර පැවැති අපගේ රජය මඟින් කරන ලද මේ සංවර්ධන වැඩ කටයුතු අඛණ්ඩව කර ගෙන යන බවට තමුන්නාන්සේලා පොරොන්දුවක් දුන්නා. නමුත් ඒවා අඛණ්ඩව කර ගෙන යන බවක් අපට පෙනෙන්නේ නැහැ. ඒ නිසා මේ පිළිබඳව අවධානය යොමු කිරීම සඳහායි මේ යෝජනාව ඉදිරිපත් කළේ. ඒ නිසා මේ පිළිබඳව රජයේ අවධානය යොමු කරලා ඉක්මන් ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස අපි ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

විපක්ෂ නායකතුමනි, මූලාසනයේ සිටියත් මම මන්ත්‍රීවරයෙක් හැටියට මේ කාරණය සඳහන් කළ යුතුයි. ආරම්භ කරන ලද අහංගම වෙළෙඳ සංකීර්ණයේ වැඩ කටයුතු අතර මඟ නවතා දැමීමෙන් ඒ ප්‍රදේශයේ වෙළෙඳුන්ට විශාල ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඉමදුව නගර නිර්මාණය අතර මඟ නවත්වලා තිබෙනවා. ඒක ඒ ප්‍රදේශයටම විශාල ප්‍රශ්නයක්. හබරාදුව බස් නැවතුම් පොළ සකස් කිරීමේ කටයුතු නැවතීමත් ප්‍රශ්නයක්. ඒ පිළිබඳව නම් ගරු ඇමතිතුමා අවධානය යොමු කරලා තිබෙනවා. මුදල් වෙන් කරලා advance එකත් ගෙවලායි තිබෙන්නේ. මීට අමතරව ව්‍යාපෘති රැසක කටයුතු නැවතිලා තිබෙනවා. පැලැස්ස - තිත්තගල්ල මාර්ගයේ ගල් දමලා ඒ කටයුත්ත නවත්වලා තිබෙනවා. මේ වාගේ විශාල ප්‍රශ්න ප්‍රමාණයක් තිබෙනවා. ඒ පිළිබඳවත් ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න කියලා මා ඉල්ලා සිටිනවා, මූලාසනයේ ඉඳ ගෙන වුණත්.

යෝජනාව ස්ථිර කිරීම, ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා.

[අ.භා. 3.38]

ගරු තිලංග සුමතිපාල මහතා
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)

මෙම අතිශය වැදගත් යෝජනාව විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ගාලු දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට ගරු නියෝජ්‍ය කථානායකතුමාත් ඒ ගැන අදහසක් ඉදිරිපත් කිරීම ගැන මා සන්තෝෂ වෙනවා. මේ මුදල් අතිශයින්ම සංවර්ධනය සඳහාම වෙන් වූ මුදල්. එතැනයි මේ යෝජනාවේ වැදගත්කම තිබෙන්නේ. විපක්ෂ නායකතුමා සඳහන් කළේ බොහොම අතළොස්සක් පමණයි.

දහසකුත් දෙනාට දැන් රැකියා නැති වෙලා තිබෙනවා. ව්‍යාපෘතිවලට මුදල් ගෙවා ගන්න බැරුව තිබෙනවා. මට ලැබිලා තිබෙන සුළු වෙලාවේදී මම මේ යෝජනාවට යම් කරුණු ටිකක් එකතු කරන්න කැමැතියි. කොළඹ දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සඳහා රුපියල් මිලියන 4,295ක් වෙන් කළා. එහිදී ගම නැඟුම ව්‍යාපෘතිය යටතේ රුපියල් මිලියන 660කුත්, ග්‍රාමීය පාසල් සඳහා රුපියල් මිලියන 90කුත්, මහජන නියෝජිතයන් සඳහා රුපියල් මිලියන 350කුත්, විමධ්‍යගත අය වැය සහ පළාත් නැඟුම සඳහා රුපියල් මිලියන 2,232කුත්, ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහනට රුපියල් මිලියන 200කුත් වශයෙන් වෙන් කළා. මේවා, ප්‍රදේශයේ සංවර්ධන කමිටු පත් කරලා, හැම නගරයකටම, හැම ගමකටම ගිහිල්ලා ග්‍රාම නිලධාරි මහත්වරුන්, ආර්ථික සංවර්ධන නිලධාරින් එක්ක එකතු වෙලා සොයා බලා, බොහොම පිළිවෙළට තෝරා ගත් ව්‍යාපෘති. කොළඹ දිස්ත්‍රික්කයේ රුපියල් මිලියන 4,693න් දෙසැම්බර් 31වන විට වැඩ අවසන් කළ රුපියල් මිලියන 752ක ව්‍යාපෘතිවල බිල් පත් සඳහා මුදල් ගෙවලා නැහැ. රුපියල් ලක්ෂ 7,520කට අදාළ බිල් පත්වලට මුදල් ගෙවලා නැහැ. ගිවිසුම් අත්සන් කරලා වැඩ ආරම්භ කරන්න එකඟ වූ රුපියල් මිලියන 1,585ක ව්‍යාපෘතිවල වැඩ නැවතිලා තිබෙනවා. ඒ කියන්නේ කොළඹ දිස්ත්‍රික්කයේ පමණක් රුපියල් මිලියන 2,338ක් -රුපියල් ලක්ෂ 23,380ක්-. රුපියල් මිලියන 752ක වැඩ ඉවර කරලා බිල් පත් සඳහා මුදල් ගෙවලා නැති නිසා විශාල අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. අපේ විපක්ෂ නායකතුමා කිව්වා වාගේම මේවා සඳහා මුදල් වෙන් කරලා තමයි අපි පසු ගිය නොවැම්බර් මාසයේදී අය වැය යෝජනාව අනුමත කළේ. මේ සඳහා වෙලාවට සල්ලි ගෙවීමේ හැකියාවක් අපට තිබුණා. කොළඹ දිස්ත්‍රික්කයේ පමණක් පාසල් 1,400කට වඩා ප්‍රමාණයක් වෙනුවෙන් මුදල් වෙන් කරලා තිබුණා. දිවි නැඟුම ව්‍යාපෘති සඳහා එක ආසනයකට රුපියල් මිලියන 20 ගණනේ ආසන 15ට රුපියල් මිලියන 300ක් වෙන් කරලා තිබුණු බව මම කියන්න ඕනෑ. ඒකෙන් ස්වයං රැකියාවක් සඳහා රුපියල් 25,000ත්, රුපියල් 75,000ත් අතර මුදලක් අඩුම ගණනේ 12,000කට වඩා පිරිසකට ලබා දීමේ හැකියාවක් තිබුණා. ඒ අයට වෙන් කරන ලද මුදල්වලින් ශත පහක්වත් ලබා දීම ක්‍රියාත්මක වෙලා නැහැ. බඩු මුට්ටු ගෙනැල්ලා, උපදෙස් නැතුව ඒ තැන්වල තියා ගෙන බලා ගෙන ඉන්නවා. මම හිතන විධියට මේ මඟින් වර්තමාන රජයත්, හැම කෙනෙක්මත් අසීරුතාවට පත් වෙනවා. ඒ නිසා කරුණාකරලා ඒ සඳහා ඉක්මන් ක්‍රමවේදයක් හදන්න කියා මා කියනවා.

අපොස උසස් පෙළ විභාගයට ඉඳ ගන්න දරුවන්ගේ අත්‍යවශ්‍ය කරුණු සඳහා තමයි පාසල්වල මහින්දෝදය විද්‍යාගාර හදන්න පටන් ගත්තේ. ඒ නිසා මහින්දෝදය විද්‍යාගාර ආරම්භ කරන්නේ නැතුව ඒවාට අවශ්‍ය පහසුකම් දෙන්නේ නැත්නම්, අ.පො.ස. උසස් පෙළ විභාගයට මුහුණ දෙන්න අපේක්ෂාවෙන් ඉන්න දරුවන් විශාල අර්බුදයකට පත් වෙනවා. ඒ ගැන විශේෂ අවධානය යොමු කරන්න.

දැන් අපට කොළඹ දිස්ත්‍රික්කයේ මේ එකඟ වූ මුදල් මිලියන 750 ලැබුණේ නැත්නම්, ඒකත් අර්බුදයක්. මේ වන විට කොන්ත්‍රාත්කරුවන් 1,600කට වඩා පිරිසක් ණයට සල්ලි අර ගෙන, අතින් වියදම් කරලා මේ වැඩ කරලා තිබෙනවා.

පාසල් සංවර්ධනය සඳහා පාසල් සංවර්ධන කමිටුවෙන් මුදල් යොදවා අවසන් කරපු ව්‍යාපෘතිවලට මුදල් දීලා නැහැ. චක්‍රලේඛනවලින් පාසල්වලට දැන් කියලා තිබෙනවා සල්ලි එකතු කරන්න එපා කියලා. ඒ නිසා පාසල් විශාල අර්බුදයකට ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා මම බොහොම කාරුණිකව ඉල්ලා සිටිනවා, සංවර්ධනය සඳහා වෙන් කරන ලද මුදල් හැකි ඉක්මනට ලබා දෙන්න කියලා.

කොළඹ දිස්ත්‍රික්කයේ වැඩසටහන්වල රුපියල් මිලියන 1,585ක් අවිච්ඡේද වෙලා තිබෙනවා. ඒවා ගිය අවුරුද්දේ ජූනි මාසයේ 7වැනි දා සිට ක්‍රියාත්මක වුණු වැඩසටහන්. ඒවා නවත්වන්න එපා. ඒවා ඉරාන් චික්‍රමරත්න මහත්මයා, රෝසි සේනානායක මැතිනිය එදා විපක්ෂයේ ඉන්න කොට අපේ සංවර්ධන කමිටුවට ඇවිල්ලා අපි සාමූහිකව අනුමත කරපු ව්‍යාපෘති. තිඹිරිගස්යාය ප්‍රදේශයේ සිදුකර ඇති කටයුතු බැලුවාම ඒක ඒ අයට පෙනෙනවා. ඒවා අපි බොහොම පැහැදිලිව, විනිවිදභාවයෙන් කරපු වැඩ.

සංවර්ධනය නැවැත්තුවා කියන්නේ ගමේ සංවර්ධනයට එකතු වෙලා ඉන්න, සිමෙන්ති, ගඩොල්, වැලි අතපතගාන මේසන්වරුන්ගේ, වඩු කාර්මිකයන්ගේ, electriciansලාගේ

දෛනික ආදායම් කඩාගෙන වැටිලා තිබෙනවාය කියන එකයි. ඒ නිසා මුදල් හුවමාරු වීම නැවතිලා. මේවා ගම් මට්ටමේ, බිම් මට්ටමේ මිනිසුන් තමන්ගේ අතට සල්ලි බලාපොරොත්තුවෙන් කරපු වැඩ. ඒ අය ණය වෙලා භාරගත් වැඩ කොටස් තිබෙනවා. ඒ නිසා තමුන්නාන්සේලා කාරුණිකව මැදිහත් වෙලා මේ මුදල් ඉක්මනට ලබා දෙන්න.

මට මතකයි, රවි කරුණානායක මැතිතුමා කිව්වා, "හැකියාව තිබෙනවා, අවස්ථාව නැහැ" කියලා. එතුමාට දැන් අවස්ථාවක් දීලා තිබෙනවා හැකියාව පෙන්වන්න. සංවර්ධනය සඳහා වෙන් වුණු මුදල් ඒ අයට ලබා දීම ඉක්මන් කළේ නැත්නම් ඒ අයට වෙන දේවල්වලට යොමු වෙන්න විධියකුත් නැහැ. මොකද, ඒ අය දන්නා වෘත්තිය තමයි මේ කරන්නේ. ඒ අයගේ මුදල් හැකි ඉක්මනට ලබා දුන්නේ නැත්නම් සංවර්ධන ක්‍රියාදාමයම කඩාගෙන වැටෙයි.

ස්වයං රැකියා සඳහා අපි දිවි නැඟුමට මුදල් වෙන් කළා. මුදල් දෙන්න ඉස්සෙල්ලා අපි ඒ හැම කෙනෙකුටම පුහුණුවක් ලබා දුන්නා. ඒ පුහුණුව ලබා දීලා අපි ඒ අයට බලාපොරොත්තුවක් දුන්නා. ඒ බලාපොරොත්තුව නිසා ඒ අය තමන්ගේ ස්වයං රැකියාව ආරම්භ කරන්න අවශ්‍ය පසු බිම හදා ගත්තා. ඒ සියලු අයගේ කටයුතු දැන් කඩාගෙන වැටිලා තිබෙනවා. ඒක නිසා ඒ අය අසරණ තත්ත්වයට වැටෙන්න දෙන්න එපා. ඒ මිනිසුන්ගේ අපේක්ෂාව වුණේ දේශපාලන කර්තව්‍යයක් නොවෙයි, මේ රටේ ආර්ථිකයට ශ්‍රම දායකත්වය සහ දැනුම ලබා දීලා එහි කොටස්කරුවන් වෙන්නයි. ඒ නිසා දර්ශනයක් ඇතිව අනුමත කළ ඒ වැඩ පිළිවෙළ කඩාකප්පල් කරන්න දෙන්න එපා කියමින්, විපක්ෂ නායකතුමාගේ නායකත්වයෙන් කාලෝචිතව ඉදිරිපත් කරපු මේ යෝජනාව ස්ථිර කරනවා. මෙම කර්තව්‍ය සඳහා සහයෝගය ලබා දෙන්න කියා ඉල්ලමින් මා නිහඬ වෙනවා.

[අ.භා. 3.45]

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා (ස්වදේශ කටයුතු හා ධීවර අමාත්‍යතුමා)
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா - உள்நாட்டலுவல்கள் மற்றும் கடற்றொழில் அமைச்சர்)
(The Hon. M. Joseph Michael Perera - Minister of Home Affairs and Fisheries)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළමුවෙන්ම කියන්න ඕනෑ ඔබතුමාගේ දුක්ගැනවිල්ල ප්‍රශ්නයක් හැටියට මම පිළිගන්නේ නැති බව. මොකද, ඔබතුමාට එහෙම වරදින්නේත් නැහැ. ඒකට මම මීට ඉස්සෙල්ලා පිළිතුරක් දීලා තිබෙනවා. 2015 පෙබරවාරි 19වැනි දා නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා පාරවල් පිළිබඳ ප්‍රශ්නය මේ විධියටම ඇහුවා. එදා හැන්සාඩ් වාර්තාවේ 1077වැනි තීරුවේ මේ ප්‍රශ්නයම සඳහන් වෙලා තිබෙනවා.

"ගරු කථානායකතුමනි, සංවර්ධන වැඩ කටයුතු නවතා තැබීම පිළිබඳව ඊයේ මා ඉදිරිපත් කළ ප්‍රශ්නයටත් අද පිළිතුරු සපයනවා කිව්වා. ඒ පිළිතුර දුන්නොත් හොඳයි."

මම පිළිතුරු දෙමින් කියනවා;

"ගරු කථානායකතුමනි, විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා විසින් 2015.2.18 වැනි දින ස්ථාවර නියෝග 23(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. ඔව්.
2. ලබා දෙන්න මුදල් වෙන් කර නැත. මුදල් ගෙවලා නොවෙයි මේ වැඩ කර තිබෙන්නේ.
3. මුදල් වෙන් කර ලබා දී තිබෙන ඒවා කරනවා. නැත්නම් අලුත් වැඩ පිළිවෙළ යටතේ තමයි බලන්න වෙන්නේ."

ඒක හොඳයි නේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඒක හොඳයි ගරු ඇමතිතුමා. ඒත් ප්‍රශ්නයක්-

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
පිළිතුර තව තිබෙනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මම කියපු යෝජනා ක්‍රම තුනම මුදල් වෙන් කරපු යෝජනා ක්‍රම. සමහර ඒවාට advance පවා දීලා. ඒ නිසා ඒවා කඩිනම් කළොත් හොඳයි.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
දැන් ප්‍රශ්නයක් නැහැනේ ඉතින්. ඉතිරි ටික දීලා තිබෙනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඒ අය දැන් කලකිරිලා ඉන්නේ.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පිළිතුරෙන් මම මුලින්ම කිව්වේ ඒවා අවසන් කරනවා කියන එකයි.

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ගරු ඇමතිතුමනි, ගිවිසුම් අත්සන් කරලා තිබෙනවා. ඒවාත් නතර කරලා තිබෙන්නේ.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
පොඩ්ඩක් ඉන්න කෝ.

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ඒවා බාගෙට හදලා මේ වෙන කොට වැඩ නවත්වලා තිබෙන නිසා විශාල හානියක් වෙනවා.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මේකට උත්තරයක් එපාද? [බාධා කිරීමක්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමා, පිළිතුරු දෙන්න.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ප්‍රශ්නයක් ඇහුවාම උත්තර දෙන්න ඉඩ දෙන්නේ නැහැ.

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
අපට ගෙවල්වල ඉන්නත් නැහැ, මිනිස්සු ඇවිත් කෑ ගහනවා. ඊළඟට ඇවිත් ගල් ගහයි.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
හරියට කේන්ති ගිහිල්ලා. වාහන ඉල්ලලා තිබෙනවා නේ 17, 18 තියා ගත්ත අයගෙන්. වාහන 17, 18 තවම ළඟ තියාගෙන ඉන්නවා. ගල් ගහන්නේ ඒ නිසා. මිනිස්සු කෑ ගැහුවේ නැහැ තවම. කෑ ගහයි තවත්.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පිළිතුරු දෙන්න, ගරු ඇමතිතුමා.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මා එදා දීපු පිළිතුරේ ඉතිරි කොටස මෙහෙමයි.

"4. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ විශාල වැඩ කොටසක් මැතිවරණය වෙලාවේ කර ගෙන ගියා. මුදල් දුන්නේ නැහැ. සමහර ඒවා කළා. ඒ කරපු ඒවාට ගිවිසුම් අත්සන් කර තිබෙනවා නම් ගෙවනවා. ගිවිසුම් අත්සන් කර නැතිව කළ ඒවාට ගෙවන්න බැහැ, සල්ලි වෙන් වෙලා නැහැ; ගිවිසුම් අත්සන් කර, කොටසක් මඟ නතර කර තිබෙනවා නම් ටික කරනවා. එහෙම හොඳයි නේ."

මේ එදා අහපු ප්‍රශ්නය සහ ඒකට මම දුන්න උත්තරය. ඒ මත තමයි තමුන්නාන්සේ අද මේ විචාදය පටන් ගන්නේ.

මා තව කොටසක් කියා තිබෙනවා, ඒ පිටුවේම. එදා උත්තරය දුන්නා කෙටියෙන්. මීට වඩා මොකක්ද කියන්නේ? ඒ ගැන කියන්න දෙයක් නැහැ නේ? හැබැයි, අද ප්‍රශ්නයට තව කොටසක් එක්කාසු කර තිබෙනවා.

අපේ ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා 2015 පෙබරවාරි 19වැනි දා ඇහුවේ නැති තව කොටසක් අද ප්‍රශ්නයේ තිබෙනවා. ඒ තමයි, ඡන්දය වේලාවේදී බෙදන්න ගෙනෙන ලද බඩු පිළිබඳව. ඒවා පුළුවන් තරම් බෙදුවා, තව කොටසක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල, කච්චේරියේ සහ සමහර ඇමතිවරුන්ගේ ගෙවල්වල තිබෙනවා. ඒවා තවමත් තිබෙනවා. රජයේ කිසිදු අනුමැතියක් නොමැතිව ගෙනැල්ලා තිබෙන මේ බඩු බෙදන්න එපා කියලා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ලියුමක් යවලා නතර කළා. ඒක හරි. අපි දැන් කරුණු සොයා බලලා තීරණයක් අරගෙන තිබෙනවා. සමහර අය අතිනුත් මුදලක් දමලා ඒ භාණ්ඩ - machines එහෙම - ගෙනැල්ලා තිබෙනවා. එහෙම ගෙනැවිත් තිබෙන ඒවා ගැන සොයා බලා, ඒ අයට ලබා දෙනවා. ඒක හොඳයි නේද?

ඊළඟට, තවත් කොටසක් ඉතිරි වනවා. ඒවා ගෙනැල්ලා තිබෙන්නේ කොහෙන්ද, මුදල් ගෙවලාද කියන මේ කරුණු මොනවත් දන්නේ නැහැ. ඒවා පෞද්ගලිකව ගෙන්වපු භාණ්ඩ කියලා අපි හිතනවා. අපි ඒවාට සල්ලි ගෙවන්නේ නැහැ. අපි දැන් District Committees පත් කරනවා. District Committeesවලට ආණ්ඩු පක්ෂයෙනුත් විරුද්ධ පක්ෂයෙනුත් ඉන්නවා. තමුන්නාන්සේලා - අපි joint වෙලා ඒක කරන්නේ. ඒකෙන් මේ භාණ්ඩ ගැන සොයා බලලා අදාළ අයට ඒවා බෙදලා දෙන්න ක්‍රමයක් සකස් කරන්න පුළුවන්. අපි දැන් එක ආණ්ඩුවක නේ ඉන්නේ. විරුද්ධ පක්ෂයේ කිව්වාට එක ආණ්ඩුවක ඉන්නේ.

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
කොහේද එක ආණ්ඩුවක ඉන්නේ?

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඇයි ඒවා එපාද? එහෙමනම් අපි ඒවා බෙදන්නද? [බාධා කිරීම්] අපි බෙදන්නද? [බාධා කිරීම්] ඒ භාණ්ඩ ගෙනාවේ කවුද? ගෙනාවේ මොනවාටද? [බාධා කිරීම්]

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
ගිහින් බෙදන්න.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
තමුන්නාන්සේ තර්ජනය කරනවා නම් නොබෙදා ඉන්නම්. [බාධා කිරීම්] නොබෙදා ඉන්නම්. [බාධා කිරීම්] දැන් කිව්වා නේ. ඒ ගැන පැහැදිලි කරලා කිව්වා. ඒවා බෙදන්නේ නිකම්ම නොවෙයි. ඒවා කාටද ගෙනැත් තිබෙන්නේ කියන්න දන්නේත් නැහැ.[බාධා කිරීම්] භාණ්ඩ තිබෙනවා. [බාධා කිරීම්] තමුන්නාන්සේලා පිළිතුර අහගන්නේ නැත්නම්- [බාධා කිරීම්] තමුන්නාන්සේ ප්‍රශ්නයක් ඇහුවා. ඒකට උත්තර [බාධා කිරීම්] ඒකට උත්තරයක් ඕනෑ නැද්ද? ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා මගෙන් ප්‍රශ්නයක් ඇහුවා. දැන් මම ඒකට උත්තර දෙනවා. අපි ඔක්කෝම එක්කාසු වෙලා - [බාධා කිරීම්] ඒක තමයි, උත්තර දෙන්න ඉඩ දෙන්නේ නැහැ නේ. [බාධා කිරීම්] ඒ භාණ්ඩ කවුරු ගෙනාවාද, මොනවාට ගෙනාවාද, කාට දෙන්න ගෙනාවාද කියන්න අපි දන්නේ නැහැ. [බාධා කිරීම්] ඉන්න කෝ ඉතින්. මේවා ඡන්දය වෙලාවේ ගෙනාපු බඩු.

අපි District Committees පිහිටුවා තිබෙනවා. තමුන්නාන්සේලාගේ නායකයෝත් ඒ කමිටුවේ ඉන්නවා. ආණ්ඩුවේ නායකයෙකුත් ඉන්නවා. අපි එක්කාසු වෙලා- [බාධා කිරීම්]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඒ කටයුතු ඉක්මන් කළොත් හුඟක් වෙලාවට කර ගන්න පුළුවන් වෙයි.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ආණ්ඩුව පැත්තෙන් අපි නියෝජිතයන් පත්කර තිබෙනවා. දිස්ත්‍රික් කමිටුවට තමුන්නාන්සේලාගේ පැත්තෙන් ඉදිරිපත් කරන්නේ කවුද කියලා තීරණය කළාට පසුව බොහෝ විට මේ ප්‍රශ්න නිරාකරණය වෙයි.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
අපි එදා ඉඳන්ම ඒ කමිටුවේ ඉන්නවා.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
එහෙම බැහැ. බොහෝ විට මඟ ඇමතිවරයෙක් ඉන්නවා නම් එතුමා ඒකට පත් වෙනවා. නැත්නම් තමුන්නාන්සේලා යෝජනා

කරන්න. ඒ සියලු විස්තර එකතු කරලා ජනාධිපතිතුමා අපට දෙයි. ඒ විස්තර දුන්නාම අප ඒ කමිටුව පත් කරනවා. එතකොට කථා වෙලා මේ දේවල් බෙදන්න. ගෙනැත් තිබෙන ඒවා හරිද, තෝරලා තිබෙනවාද කියලා බලලා, ඒ කරුණු සත්‍ය නම් ඒ දේවල් බෙදන්න. එහෙම නැතිව ඒ භාණ්ඩ තියාගෙන ඉඳලා වැඩක් නැහැ නේ.

මෙතැන තව ප්‍රශ්නයක් තිබුණා. කුකුළු පැටවුන් ගෙනැත් තිබුණා; හරකුන් ගෙනැත් තිබුණා. කුකුළු පැටවුන් තියාගෙන කන්න දෙන්න බැහැ නේ. හරකුන්ටත් කන්න දෙන්න බැහැ නේ. ඒ සතුන් ගෙනාපු අයගේ නම් ගම් තිබෙනවා නම් දෙන්න කියලා අප කිව්වා. නැත්නම් හරකුන් එහෙම සත්වෝද්‍යානයට භාර දෙන්න කිව්වා. මොකද, අපට මේ සතුන් තියාගෙන ඉන්න අයිතියක් නැහැ නේ. මේ සතුන් කාට දෙන්න ගෙනාවාද කියලා විස්තරයක් නැහැ. ගරු විපක්ෂ නායකතුමනි, අප ඔබතුමාට පැහැදිලිව කියනවා, මේ තත්ත්වය බොහොම හොඳින් සලකා බලලා කාටවත් අසාධාරණයක් නොවෙන්න මේ වැඩ පිළිවෙළේදී අප වැඩ කටයුතු කර තිබෙන බව. විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන්ටවත්, මේ භාණ්ඩ ගේන්න මුදල් දීපු අයටවත් කිසිම අසාධාරණයක් නොවන ලෙස මේ කටයුත්ත කිරීමේ වගකීම අප භාර ගන්නවා. එය ඉතා ඉක්මනින් කරනවා. මේ කාරණය මේ පාර්ලිමේන්තුවේ මම ප්‍රකාශ කළාට පස්සේ, ඒ සියලුම දිස්ත්‍රික්කවලට මේ බව දැනුම් දෙනවා. එහෙම හොඳයි නේද, ගරු විපක්ෂ නායකතුමනි? අපි කථා කරමු. හොඳ නැත්නම් ඔබතුමන්ලා කියන්න.

තවත් ප්‍රශ්න කීපයක් තිබෙනවා. ඒවාත් අප එකතු වෙලා විසඳා ගන්න ඕනෑ. එක ප්‍රශ්නයක් තමයි, සමහර පාරවල් හදලා තිබෙනවා, හැබැයි කිසිම ගිවිසුමක් නැහැ. මේවාට ගිහින් තිබෙන්නේ පොඩි ගණන් නොවෙයි. සමහර ව්‍යාපෘතිවලට RDA එකේ සල්ලි වෙන් කරලා තිබෙනවා. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මේවා කරන්න කියලා යන යන තැන්වලදී සල්ලි වෙන් කරලා තිබෙනවා. හැබැයි, ඒවා කරලා තිබෙන්නේ බස්නාහිර පළාත් සභාවේ නිමල් ලාන්සා මැතිතුමාගේ අමාත්‍යාංශයෙන්. ඒ කාරණයත් හොඳට මතක තියාගන්න. තමුන්නාන්සේලාට දීපු සල්ලි මේ. බස්නාහිර පළාතෙන් ඇරියා ඒ පාරවල් හදන්න. ඒවා හදන්න පළාත් සභා තිබෙනවා; මන්ත්‍රීවරු ඉන්නවා. ගරු ලසන්ත අලගියවන්න මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේලා තුට්ටු දෙකටවත් ගණන් ගන්නේ නැතිව- [බාධා කිරීමක්] මේ ආණ්ඩුවේ පාරක් හදන්න මිනිහෙක් නැහැ. බස්නාහිර පළාත් සභාවේ නිමල් ලාන්සාව තමයි ඒකට තෝරා ගත්තේ.

ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා
(மாண்புமிகு உதித் லொக்குபண்டார)
(The Hon. Udith Lokubandara)
ඒ යන්ත්‍රෝපකරණ ගෙනිච්චා. ගෙන ගිහින් ඒවා පාවිච්චි කළා. එච්චරයි.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඇයි, තමුන්නාන්සේගේ පළාත් සභාවේ පොන්නයොද ඉන්නේ? මොනවාටද, නිමල් ලාන්සාට දුන්නේ? ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමනි, මම තමුන්නාන්සේගෙන් අහනවා මේවා කරන්න නිමල් ලාන්සාට දුන්නේ ඇයි කියලා. මේ ව්‍යාපෘතිවල ගණන් හිලවු කිසි දෙයක් නැහැ.

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
පළාත් පාලන ආයතනවලට දුන්නේ.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
පළාත් පාලන ආයතනවලට නොවෙයි. ඒ බස්නාහිර පළාතේ. හොරකම් කරපු මිනිසුන් හඳුනාගෙන, තමුන්නාන්සේලා මේ පාර්ලිමේන්තුවේ ඇත්ත කථා කරන්නේ නැත්නම් අප කොහොමද එකට වැඩ කරන්නේ?

ගරු තිලංග සුමතිපාල මහතා
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
ගරු ඇමතිතුමනි, මට තත්පරයක් දෙන්න.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඔව්, ඔබතුමා කියන්න. [බාධා කිරීම්]අනෙක් මන්ත්‍රීතුමන්ලා නිහඬ වෙන්න. අපි හොඳට විවාද කරමු.

ගරු තිලංග සුමතිපාල මහතා
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
මේ හැම කටයුත්තක්ම දිස්ත්‍රික් සංවර්ධන කමිටුවට ඉදිරිපත් කරනවා. ඒ සම්බන්ධයෙන් චක්‍රලේඛයක් තිබුණා. ඒ චක්‍රලේඛය අනුව රජයේ තිබෙන විධිවිධාන අනුව රජයේ ආයතනයකින් තමයි මේ මාර්ග ව්‍යාපෘති ක්‍රියාත්මක කළේ. ඒ නිසා බස්නාහිර පළාතේ පාරවල් බස්නාහිර පළාත් සභාවට භාර දුන්නා. ඒකෙදි ඒ ආයතනවල ඔබතුමා කියන විධියේ යම්කිසි අකටයුත්තක්, අකාර්යක්ෂමතාවක්, හොරකමක් වෙලා තිබෙනවා නම් ඒවා නවත්වන්න. යම් යම් ප්‍රශ්න තිබෙන ඒවා නවත්වන්න. නමුත්, හරියට කරපු ව්‍යාපෘතිවලට ගෙවන්නේ නැත්තේ ඇයි?

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු මන්ත්‍රීතුමනි, මම දැන් පැහැදිලිව කිව්වා නේ, හරියට කරලා තිබෙනවා නම් ගෙවනවා කියලා. මේ ප්‍රශ්න දෙකක්. තමුන්නාන්සේ කිව්වේ හරියට කර තිබෙන ඒවාට ගෙවන්න කියලා නේ. ඒවා ගෙවනවා. ප්‍රශ්නයක් නැහැ නේ.

ගරු තිලංග සුමතිපාල මහතා
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
ඒ ආයතනයට දුන්නාට නිමල් ලාන්සා ඇමතිතුමාට කිසිම contract එකක් දුන්නේ නැහැ.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
බස්නාහිර පළාත් සභාවට අයිති ඒවා විතරක් නොවෙයි, වෙන පළාත් සභාවලට අයිති ප්‍රදේශවලටත් ගිහින් ඒ කටයුතු කළා. ඒවායේත් පළාත් මාර්ග සංවර්ධන අධිකාරියක් තිබෙනවා. ගරු විපක්ෂ නායකතුමනි, තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ හිටපු එක ඇමතිවරයෙක්, ඔහුගේ සගයෙක් තියාගෙන මුළු රටේම පාරවලට සල්ලි වෙන් කරලා හැදුවේ එහෙමයි. ඒ කාරණය තේරුම් ගන්න. ඒක තේරුම් ගන්න බැරිව තමුන්නාන්සේලා දැනුත් කෑ ගහනවා නම් මට කරන්න දෙයක් නැහැ. මේක මුළු රටම දන්නා රහසක්. [බාධා කිරීමක්] මම තව ටිකකින් කියන්නම්. පොඩ්ඩක් ඉන්න, කලබල වෙන්න එපා.

[ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමනි, මා එදා කරපු ප්‍රකාශයේත්, ඔබතුමා අද අහන ප්‍රශ්නයේත්, ඔබතුමා එදා අහපු ප්‍රශ්නයේත් කිසි වෙනසක් නැහැ. ඒ ඔක්කොම එකයි. ඒ පිළිතුරමයි මා දෙන්නේ. වෙන කිසි වෙනසක් කරන්නේ නැහැ. හැබැයි මුදල් විශාල ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. ඒ මුදල්වල ප්‍රමාණය කබීර් හාෂිම් ඇමතිතුමාම කියයි. ඒ මුදල් ප්‍රමාණය අනුව ගමේ පාර හැදුවා. ප්‍රාදේශීය සභාව තිබුණා, නගර සභාව තිබුණා. නමුත් ඒ ගොල්ලෝ දන්නේ නැහැ, ඒ පාර හැදුවාය කියලා. ඒ පිළිබඳ ගණන් හිලවු මොකුත් නැහැ. ඒ පාරවල් හදලා තිබෙනවා. මේ පිළිබඳව තමුන්නාන්සේලාගේත් අවධානයට යොමු කරන්න. පාර හැදෙන එක හොඳයි. නමුත් ගමේ පාර හැදෙන්නේ ඒ පළාත් පාලන ආයතනයෙන් නොවෙයි. බස්නාහිර පළාත් සභාවේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරියෙන් - PRDA එකෙන් -

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

බස්නාහිර පළාත් සභාවෙන් ඇවිල්ලා හදන්නේ නැහැ. බස්නාහිර පළාතේ හදලා ඇති. අපේ දිස්ත්‍රික්කයේ නම් ඒ ප්‍රදේශවල තිබෙන සමිතිවල, සංවිධානවල සහ මධ්‍යම හා සුළු පරිමාණයේ කොන්ත්‍රාත්කරුවන්ට ටෙන්ඩර් දීලා තමයි ඒ සියලු දේවල්ම කරලා තිබෙන්නේ. අනික් ඒවා RDA එකෙන් කෙළින්ම සෘජු ශ්‍රමය යටතේ කරන ලද දේවල්.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

මේ කියන දෙය තමුන්නාන්සේලා පිළිගන්නේ නැත්නම් ටික දවසකින් ඒ කෙරුණු ඒවායේ විස්තර ඔක්කොම දෙන්නම්. [බාධා කිරීම්] මන්ත්‍රීවරු නැඟිටලා කථා කරන්න. උත්තර දෙන්නම්. [බාධා කිරීම්] මොකද, මේ මන්ත්‍රීවරුන් පිටි පස්සේ ඉඳගෙන කෑ ගහන්නේ? [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක පාර්ලිමේන්තුවක්ද? [බාධා කිරීම්] තමුන්නාන්සේ ප්‍රශ්නයක් ඇහුවා. මා උත්තර දුන්නා. [බාධා කිරීම්] ඕනෑ කෙනකුට නැඟිටලා ප්‍රශ්න අහන්න පුළුවන්. මා උත්තර දෙන්නම්.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Order, please! මන්ත්‍රීවරු ප්‍රශ්න අහන්න. ඇමතිතුමා පිළිතුරු දෙන්න.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

ඕනෑ කෙනකුට නැඟිටලා ප්‍රශ්න අහන්න කියන්න.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ඕනෑ කෙනෙක් නැඟිටලා ප්‍රශ්න අහන්න.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

අර මොක්කුද වාගේ එතැන ඉඳගෙන කෑ ගහන්නේ නැතුව ප්‍රශ්න අහන්න. [බාධා කිරීම්] මේ පාර්ලිමේන්තුවේ විනයක් නැහැ නේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, බාධා කරන්නේ නැතුව ඔබතුමන්ලා ප්‍රශ්න අහන්න. ගරු ඇමතිතුමා පිළිතුරු දෙන්න කැමතියි.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

මට කිසි බාධාවක් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ගරුත්වය ආරක්ෂා කර ගෙන ගරු මන්ත්‍රීවරයකුට ඕනෑ ප්‍රශ්නයක් අහන්න පුළුවන්. නැඟිටලා අහන්න. [බාධා කිරීම්] එහෙම නම් ඉඳගෙන අහන්න. [බාධා කිරීම්] රටට වැදගත් ප්‍රශ්නයක් - [බාධා කිරීම්] නිකම් නොවෙයි. [බාධා කිරීම්] ඉන්නකෝ. [බාධා කිරීම්] දැන් ප්‍රශ්නය අහලා ඉවරයි නේ. [බාධා කිරීම්] ගරු හිටපු අගමැතිතුමනි, දැන් ප්‍රශ්නයක් ඇහුවා. මා දැන් උත්තර දෙනවා. [බාධා කිරීම්]

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)

නීත්‍යානුකූලව අවසර දීලා වැඩ පටන් ගෙන තිබෙන ඒවා භාගෙට කරලා තිබෙනවා. එම නිසායි මා කියන්නේ.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

තමුන්නාන්සේට ඇහෙන්නේ නැතුවාට මට කරන්න දෙයක් නැහැ. මා උත්තරයක් දුන්නා. [බාධා කිරීම්]

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)

මොකක්ද, ආණ්ඩුවක් කියන්නේ? [බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ඇමතිතුමා, පිළිතුරු දෙන්න.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

ඒ ප්‍රශ්නයම අහනවා නේ. එතුමාට ඇහෙන්නේ නැතුව අහනවාද මා දන්නේ නැහැ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

දැන් ඔබතුමා උත්තර දෙන්න.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

උත්තර දී ගෙන යනවා නේ. උත්තර දෙන කොට නේ ආපසු අහන්නේ. හදලා තිබෙනවා නම් දෙනවා. ගිවිසුම් අත්සන් කරලා හදලා නැත්නම් දෙන්නේ නැහැ. භාගයට හදලා තිබෙන ඒවා සම්පූර්ණ කරනවා. එච්චරයි නේ තිබෙන්නේ. මොකක්ද, මේකේ තිබෙන වරද?

ඊට අමතරව මොනම ගිවිසුමක්වත් නැතුව සල්ලි වියදම් කරලා පාරවල් රාශියක් හදලා තිබෙනවා. ඒවා කොහොම හැදුවාද, මොන කොන්ත්‍රාත්කරුවන් හැදුවාද කියලා දන්නේ නැහැ. අපට තේරෙන විධියට තමුන්නාන්සේලා මෙච්චර සල්ලි වෙන් කරපු වෙලාවේත් මේ රටේ මහ ජනතාව ඡන්දයෙන් පිළිතුරු දුන්නා. අපේ ගරු කබීර් හාෂිම් ඇමතිතුමා කථා කරයි. එතුමා තමයි පාරවල් භාරව ඉන්නේ. පොඩි පොඩි දේවල් ගැනයි මා කිව්වේ. මහා පරිමාණයේ හොරකම් ටික එතුමා දැන් කියයි. පොඩ්ඩක් අහගෙන ඉන්න කියලායි මා යෝජනා කරන්නේ. කරුණාකරලා අහගෙන ඉන්න. අහගෙන ඉන්න බැරි නම් අපට තේරෙන්නේ කෑ ගහන මන්ත්‍රීවරුන් මේවාට සම්බන්ධයි කියලායි. ඒක තමයි අපට කියන්න තිබෙන්නේ. වෙන එකක් නොවෙයි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමනි, මට ප්‍රශ්නයක් අහන්න පුළුවන්ද?

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඔව්, පුළුවන්.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
හදන්න කලින් තිබෙන ගොඩනැඟිල්ල ඉවත් කරන්න ඕනෑ. එහෙම නැතුව හදන්න බැහැ නේ. ඒ අනුව අබලන් තත්ත්වයේ තිබුණු අහංගම වෙළෙඳ සංකීර්ණය ඉවත් කළා. ඉවත් කරලා වැඩ ආරම්භ කරන්න ගිවිසුම්ගත වුණා. දැන් ඒ වෙළෙන්දෝ ඉන්නේ තාවකාලික ස්ථානවල. එම නිසා ඒ කටයුත්තට ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරලා කඩිනමින් හදලා දෙන්න පුළුවන්ද?

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මම පිළිතුරක් දෙන්නම්. යම් ගොඩනැඟිල්ලක් හදන්න සූදානම් කළා නම් මුදල් වෙන් වෙන්න ඕනෑ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔව්.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඒ අනුව ඇස්තමේන්තු සකස් කරන්න ඕනෑ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔව්. ඒ සියල්ල කෙරිලා තිබෙන්නේ.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ටෙන්ඩර් කැඳවන්නට ඕනෑ. එහෙම කරලා තමයි තිබෙන ගොඩනැඟිල්ලක් කඩන්නේ. ඒ කටයුතු ටික ඒ ආකාරයට කෙරිලා තිබෙනවා නම් ගොඩනැඟිල්ල හදන්න පටන් ගත්තේ නැති වුණත්, ඒ සංවර්ධන කටයුත්ත ඉදිරියට ගෙන යන්නට මුදල් දෙනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
හරි, බොහොම ස්තුතියි. මුදලුත් වෙන් කරලා තිබෙන්නේ.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මුළු රටේම ඒවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේවා ගැන තොරතුරු සොයා ගන්නත් ඕනෑ නේ. සොයාගෙන හරි පිළිවෙළට කරගෙන යනවා. අපි තමුන්නාන්සේලාත් එකතු කරගෙනයි මේ කටයුතු කරගෙන යන්නේ, අපි තනියම නොවෙයි. ඒ market එක හදන්න ඕනෑ තමුන්නාන්සේලාත්, අපිත් සියලු දෙනාම එකතු වෙලායි.

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
ඔබතුමන්ලා කළු ගල් දෙන්න. [බාධා කිරීමක්]

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මෙතුමා ගල් ගැන කියනවා. මම දන්නේ නැහැ මොන ගල්ද කියලා. [බාධා කිරීමක්] විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා කියනවා, පසු ගිය රජය යටතේ ආරම්භ කරන ලද සංවර්ධන වැඩ සටහන් නතර කරලා තිබෙන නිසා විශාල ප්‍රමාණයකට රක්ෂා නැතිව ගියා කියලා. කිසි කෙනෙකුගේ රක්ෂා නැතිව යන්නේ නැහැ. අපි දැන් ඒවා පටන් ගන්නවා. ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමනි, මේ අය වැඩ කරලා තිබෙන්නේ, -මේ පාරවල්වල වැඩ පටන් අරගෙන කොන්ත්‍රාත්කරුවන් අරන් තිබෙන්නේ- ඉතාම සුළු මුදලකට. මේ ස්ථිර අය නොවෙයි, තාවකාලික කොන්ත්‍රාත්කරුවන්. මේ වැඩේ ඉවර වුණාම කොන්ත්‍රාත්තුව අවසානයි. ඒ කම්කරුවන් වෙනුවෙන් වෙන් කළ මුදල කොපමණද කියලාත් බලන්න; ඒ අයට ඒ මුදල් ගෙව්වාද කියලාත් බලන්න. මේක වැදගත් වෙනවා. මේක හොරා කන්න ඉඩ දෙන්න එපා. බොහෝ දෙනෙක් මේ වැඩට යොදා ගත්තේ කුඩු ගහන මිනිසුන්. ඒ අයට EPF, ETF මොනවත් ගෙවන්නේ නැහැ. මොනවා හරි දුන්නාම ඒ අය ඒක අරගෙන යනවා. ඒ විධියටයි ඒ අසරණ මිනිසුන්ව වැඩට යෙදෙව්වේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ඇස්තමේන්තුවේ කම්කරුවන්ට වෙන් කරන මුදලක් තිබෙනවා. ඒ මුදල වියදම් වන්නේ නැහැ. මේ සංවර්ධන කටයුතු නතර කළාම මේ අයට වැඩ නැහැ, ඒක ඇත්ත. නමුත් අපි පටන් ගත්තාම, ඒ අයට වැඩ දෙනවා. ඒ කම්කරුවන් ගැන තමුන්නාන්සේලා බලන්න, ඒ අහිංසක කම්කරුවන්ට ගෙවන්න තිබෙන මුදල් හරියට ගෙවා තිබෙනවාද කියලා. ඒක වැදගත් වෙනවා.

ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමනි, ඔබතුමා අහපු ප්‍රශ්නයට මම ප්‍රමාණවත් පිළිතුරක් දුන්නා කියලා මම හිතනවා. [බාධා කිරීමක්]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
නැහැ, නැහැ.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
තව මොකක්ද කියන්න.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ප්‍රශ්නය තිබෙන්නේ මෙයයි. නිසියාකාරව කරලා තිබෙන වැඩවල බිල් ගෙවන්නට සල්ලි යවලා නැහැ. ඔබතුමා කවදාද ප්‍රාදේශීය ලේකම්තුමන්ලාට සල්ලි යවන්නේ?

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඒ සඳහා අපිට ගෙවන්න කෙනෙක් ඕනෑ. ප්‍රාදේශීය ලේකම්තුමාට- [බාධා කිරීමක්]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
එහෙම නොවෙයි නේ කෙරෙන්නේ ගරු ඇමතිතුමා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින්- [බාධා කිරීමක්]

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මට කියන්න පුළුවන් හොඳ වචනවලින්.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
මේ ගිවිසුම් අත්සන් කරලා- [බාධා කිරීමක්]

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කරුණාකර මේ පාර්ලිමේන්තුව හරියට හසුරුවා ගන්න, ඔබතුමායි මූලාසනයේ ඉන්නේ. ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමනි, මොකක්ද කිව්වේ?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඇමතිතුමා, පැත්තකින් තියන්නකෝ අත්සන් කරලා නැති ගිවිසුම්. ඔබතුමා කියනවානේ අත්සන් කරලා නැහැ කියලා. අත්සන් කරලා නැති ඒවා පැත්තකින් තියන්නකෝ. ගිවිසුම් අත්සන් කරලා, නීත්‍යානුකූලව පටන් ගත්ත සංවර්ධන වැඩ සටහන් රාශියක් තිබෙනවා. ඒවාට ගෙවලා නැහැ. දැන් කවදාද ඔබතුමන්ලා මේවාට ගෙවන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට සල්ලි යවන්නේ? මෙතෙක් යවලා නැහැ.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු මන්ත්‍රීතුමා, තමුන්නාන්සේ දන්නවා, කොන්ත්‍රාත් එකක් අත්සන් කරලා ඒක පිළිගත්තාට පසුව mobilization කියලා ඒ අයට සියයට 20ක් ගෙවනවා. අපි ඒක ඉස්සෙල්ලා ගෙවන්නම්, මේ වැඩේ පටන් ගන්න ලැහැස්ති වුණාම.

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
වැඩේ කරලා ඉවරයි නේ.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
පොඩ්ඩක් ඉන්න කෝ. මම මේ අහපු ප්‍රශ්නයට උත්තර දෙන්නේ. වැඩේ කරගෙන යනවා නම් කරගෙන යන පිළිවෙළට තමයි මුදල් දෙන්නේ. ඔක්කොම එක පාරට දෙන්නේ නැහැ, කුමන රජයක්වත්. කරගෙන යන පිළිවෙළට තමයි කොටස් වශයෙන් මුදල් ගෙවන්නේ. ඒක දෙනවා. [බාධා කිරීමක්] ඒක දෙනවා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
නමුත්, මේ වන විට බිල්පත් දාලා තිබෙනවා. බිල්පත් සහතික කරලා තිබෙනවා. නමුත් ඒවාට ගෙවන්නට සල්ලි යවලා නැහැ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට. අපි කියන්නේ, ඒ මුදල් යවන්න කියලා. [බාධා කිරීමක්]

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
අපි මුදල් යවනවා.

ගරු කබීර් හාෂිම් මහතා (මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு கபீர் ஹாஷிம் - நெடுஞ்சாலைகள், உயர்கல்வி மற்றும் முதலீட்டு ஊக்குவிப்பு அமைச்சர்)
(The Hon. Kabir Hashim - Minister of Highways, Higher Education and Investment Promotion)
මම කියන්නම්. සමහර ඒවාට ගිවිසුම් අත්සන් කරලා තිබෙනවා, නමුත් නියමිත විධියට ටෙන්ඩර් පටිපාටියෙන් තොරවයි ඒවා දීලා තිබෙන්නේ. ඒවායේ ගණන් හිලව් වැරදියි; සාධාරණ නැහැ. ඒවා ගෙවන්න බැහැ රජයකට. ඒවා මහා පරිමාණයේ හොරකම්. මහා පරිමාණයේ හොරකම්, ඕවා ගෙවන්න බැහැ. ඒවා පරීක්ෂා කරලායි ගෙවන්නේ. මේවා කාගේ සල්ලි කියලාද හිතා ගෙන ඉන්නේ? [බාධා කිරීමක්]

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගෙවන ක්‍රමයට හරියට ගෙවනවා; නීත්‍යානුකූලව ගෙවනවා. කවුරුත් කලබල වෙන්න එපා.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු ඇමතිතුමනි, ඔබතුමා කියන දේ පිළිගන්නවා. ගිවිසුම් අත්සන් නොකර ඒ වැඩ කරලා තිබෙනවා නම් ඔබතුමන්ලා ඒ ගැන කටයුතු කරන්න. නමුත්, accountantsලා ළඟ දැනට අනුමත කළ බිල් තිබෙනවා, ගෙවන්න සල්ලි නැතිව.

ඒ සල්ලි ඉස්සෙල්ලා ගෙවලා තිබෙනවා නම් අනිත් ඒවා ගැන අපිට ප්‍රශ්නයක් නැහැ. මහා පරිමාණයේ ඒවා ගැන නොවෙයි අපි කථා කරන්නේ. මේ පොඩි පාරක ලක්ෂ පහක, දහයක බිල් තිබෙන ඒවා ගෙවන්නේ නැතිව ඇයි මේ නතර කරගෙන ඉන්නේ?

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඒවා නතර කරලා නැහැ, ගෙවනවා. මම ඒක ඔබතුමාට කිව්වානේ. තමුන්නාන්සේ දන්නවා ආණ්ඩුවේ Treasury එකෙන් සල්ලි ඉල්ලපුවාම ඒක එක එක අවස්ථාවටනේ යවන්නේ කියලා.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
එහෙම නැහැ.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඇයි නැත්තේ, මේ ගොඩනැඟිලි හදන්න ගත්තාම ඔක්කෝම සල්ලි එක පාරට දෙනවාද? නැහැනේ. ඔක්කෝම සල්ලි එකපාර ගෙවන්නේ නැහැ. සල්ලි ගෙවන්නේ නීත්‍යානුකූලව. ඔබතුමා අහන ප්‍රශ්නය ගැන මම දන්නේ නැහැ. ඒ බිල් ඉදිරිපත් කරලා තිබෙනවාද කියලා මම දන්නේ නැහැ. ඒවා ඉදිරිපත් කරලා තිබෙනවා නම් ගෙවන්නම්.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මේවා ඉදිරිපත් කරලා දිසාපතිවරු ළඟ තිබෙනවා.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
එහෙමනම් ගෙවන්නම්.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
කවදාද ගෙවන්නේ?

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
අනවශ්‍ය ප්‍රශ්නවලට, මට එකපාරටම කවදාද ගෙවන්නේ කියලා උත්තර දෙන්න බැහැ. තමුන්නාන්සේත් ඇමතිවරයෙක් හැටියට සිටියා නේ. කරුණාකර බොළඳ ප්‍රශ්න අහන්න එපා. දැන් පැහැදිලියි නේද? ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා මොකක්ද තව පැහැදිලි වෙලා නැත්තේ?

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-[බාධා කිරීමක්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
එතුමා එක්ක අපිට හොඳට කථා කරන්න පුළුවන්. එතුමා වැරැදි seat එකේ ඉන්නේ.

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සියල්ලම නිසි පරිදි ඇස්තමේන්තු කරලා, ඉංජිනේරුවන් සහතික කරලා ඊට පස්සේ පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය සභාවේ TA සහතික කරලා තමයි මේ ව්‍යාපෘති ඔක්කෝම කරලා තිබෙන්නේ. තමුන්නාන්සේ කියන එක ඇත්ත, ඒ ව්‍යාපෘතිවලට කොටස් වශයෙන් මුදල් ලැබෙන්නේ. අපේ කාලයේ කොටස් වශයෙන් ඒ මුදල් ලැබුණා. නමුත් සමහර ඒවා කෙරුවේ විශේෂයෙන්ම SD&CC, ඉංජිනේරු සංස්ථාව වාගේ රජයේ ආයතන. ඒවාත් ඒ ගොල්ලන්ගේ ඇස්තමේන්තු කර ගැනීමෙන් පස්සේ. ඒ නිසා ඒ කටයුතුවලට මුදල් නොලැබීමෙන් සියල්ලම පාහේ නැවතිලා තිබෙනවා. දැන් මම නියෝජනය කරන ආසනයේත් මාර්ග පද්ධති ගණනාවක් අවසන් වුණත්, මුදල් ලැබිලා නැහැ. අපි ඒ නිසා රණ්ඩු කර ගන්න ඕනෑ නැහැ. අපි ඔබතුමාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටින්නේ මෙයයි. ඒ මුදල් නියමිත පරිදි ලැබුණොත් ඒවා අවසන් කරන්න පුළුවන්. විවෘත කර ගන්නකොට අපි කොහොම හරි කරමු. කවුරු විවෘත කළත් ප්‍රශ්නයක් නැහැ.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මම ඒක පිළිබඳව ප්‍රශ්නයක් කිව්වේ නැහැ නේ. තමුන්නාන්සේලාගේ ජනාධිපතිවරයෙක්, අපේ අගමැතිවරයෙක් ඉන්නවා. ඉතින් පාර්ලිමේන්තුවත් හොඳට යනවනේ. අර වැඩෙත් කෙරෙන්න ඕනෑ.

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
මම වරදක් කිව්වේ නැහැ, කරුණාවෙන් ඉල්ලීමක් කළේ.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
තමුන්නාන්සේ කලබල වෙනව නේ. මම මොකුත් වරදක් කිව්වාද?

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
නැහැ, කියාගෙන ආවා.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
තමුන්නාන්සේලාගේ ජනාධිපතිවරයෙක්. අපේ අගමැතිවරයෙක්. ඉතින් පාර්ලිමේන්තුවේ සම්බන්ධ වෙලා හොඳට වැඩ ටික කරමු.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමා.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව කාලය තිබෙනවා නේද?

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමාගේ කාලය අවසානයි, ගරු ඇමතිතුමනි.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
නැහැ, වෙනත් ප්‍රශ්න නැහැ. මම අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

[பி.ப. 4.11]

ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා (නියෝජ්‍ය කාරක සභාපතිතුමා)

(மாண்புமிகு முருகேசு சந்திரகுமார் - குழுக்களின் பிரதித் தவிசாளர்)

(The Hon. Murugesu Chandrakumar - Deputy Chairman of Committees)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கடந்த காலங்களில் முன்னெடுக்கப்பட்ட அபிவிருத்திகள் தொடர்ச்சியாக முன்னெடுத்துச் செல்லப்பட வேண்டும் என்ற அவசியத்தை வலியுறுத்துவதற்கு நான் இந்தச் சந்தர்ப்பத்தைப் பயன்படுத்திக் கொள்கின்றேன். எங்களைப் பொறுத்தவரையில் வடக்கு, கிழக்கு மாகாணங்கள் நீண்டகால - கிட்டத்தட்ட 30 வருடகால - யுத்தத்தால் பாதிக்கப்பட்ட மக்கள் வாழும் பிரதேசங்களாகும். இந்தப் பிரதேசங்களிலே வாழும் எமது மக்கள் யுத்தம் முடிவுக்குக் கொண்டுவரப்பட்ட பின்னர் கடந்த 5 ஆண்டுகளில் அபிவிருத்திக்கூடாக தாங்கள் இழந்தவற்றை மீளக் கட்டியமைத்துக் கொண்டிருக்கும் இந்த வேளையில்தான் புதிய அரசு ஆட்சியமைத்திருக்கின்றது.

எங்களைப் பொறுத்தவரையில் எமது மக்களின் எதிர்பார்ப்பு என்னவென்றால், கடந்த காலங்களில் முன்னெடுக்கப்பட்ட அபிவிருத்தித் திட்டங்கள் எந்தத் தங்குதடையுமின்றித் தொடர்ச்சியாக முன்னெடுக்கப்பட வேண்டும் என்பதுதான். அதன்மூலம், யுத்தத்தில் இழந்த மக்களின் வாழ்வாதாரத்தையும் எங்களது பிரதேசங்களையும் மீளக் கட்டியெழுப்பலாம் என்ற நிலைமைதான் அங்கு காணப்படுகின்றது. ஏனென்றால், நாங்கள் இழந்தவை ஏராளம்! எங்களது முழுப்பிரதேசங்களுமே யுத்தத்தின் கோரப்பிடியில் சிக்குண்டு, மக்களின் வாழ்வாதாரம் உட்பட பிரதேசங்களின் அபிவிருத்திகளெல்லாம் அழிந்து போயின. ஆகவே, இந்த நிலைமையிலிருந்து எங்கள் பிரதேசங்கள் மீட்கப்பட வேண்டுமென்றால், ஒரு விசேட கருத்திட்டத்தின் அடிப்படையில்தான் அவை அபிவிருத்தி செய்யப்பட வேண்டும்.

கடந்த காலங்களில் அவ்வாறு மேற்கொள்ளப்பட்டதனால் எங்களது மக்களின் வாழ்வாதாரம் மேம்படுத்தப்பட்டது; பிரதேசத்தின் உட்கட்டுமான அபிவிருத்தியில் கணிசமான முன்னேற்றம் ஏற்படுத்தப்பட்டது. ஆனாலும் இவை போதுமானதாக இல்லையென்ற நிலைமைதான் அங்கு காணப்படுகின்றது. எனவே, அங்கு தொடர்ச்சியாக இன்னும் சில ஆண்டுகளுக்கு அபிவிருத்திப் பணிகள் முன்னெடுக்கப்படும்போதுதான் நாங்கள் தெற்கின் அபிவிருத்திக்குச் சமனாக வடக்கு, கிழக்கின் அபிவிருத்தியையும் ஒப்பிடக் கூடியதாக இருக்கும். வடக்கு, கிழக்கு மக்களைப் புறக்கணிக்க முடியாது. அவர்களும் தங்களுக்கான மேம்பாட்டுத் திட்டங்கள், அபிவிருத்தித் திட்டங்கள், வாழ்வாதாரத் திட்டங்களை எதிர்பார்த்துக் காத்திருக்கும் சமூகமாக இருக்கிறார்கள். அவர்களது அந்த எதிர்பார்ப்பும் நியாயமானது. எந்த அரசு ஆட்சிக்கு வந்தாலும் யுத்தத்தால் அழிந்துபோன மக்களின் வாழ்வாதாரத்தையும் பிரதேசங்களையும் கட்டியெழுப்ப வேண்டிய பொறுப்பு எல்லோரிடமும் இருக்கின்றது என்ற அடிப்படையில் நான் இந்த வேளையிலே எங்களது மக்களின் தேவைகளை இங்கு வலியுறுத்த விரும்புகின்றேன்.

குறிப்பாக, அங்கு வேலைவாய்ப்பு என்பது மிகப்பெரிய நெருக்கடியை உண்டாக்கியிருக்கின்றது. அந்த நெருக்கடியினால் இந்த அபிவிருத்தியில் ஒரு ஸ்தம்பித நிலைமை - ஒரு வெறுமைத் தன்மை - காணப்படுகின்ற பொழுது அந்த மக்கள் வேலையில்லாப் பிரச்சினையை எதிர்கொள்ள வேண்டியிருக்கிறது. இதனால் அவர்களது வாழ்வாதாரம் பாதிக்கப்பட்டுக் கொண்டிருக்கின்றது. ஆகவே, இதற்காக நாங்கள் அதிக அக்கறை செலுத்த வேண்டியவர்களாக இருக்கின்றோம்.

வடக்கு மாகாணத்தைப் பொறுத்தவரையில், கிட்டத்தட்ட 9,000 கிலோமீற்றர் வரையான உள்ளக கிராமிய வீதிகள் மிகவும் மோசமான நிலையில் இருக்கின்றன. கடந்த காலங்களில் சில வீதி அபிவிருத்திகள் மேற்கொள்ளப்பட்டாலும், 30 வருட யுத்த காலத்தில் எந்த அபிவிருத்தியும் எங்களது பிரதேசங்களில் நடைபெறாதிருந்ததை ஒரு பாரிய இடைவெளியாகத்தான் நாங்கள் பார்க்கின்றோம். ஆகவே, எங்களைப் பொறுத்தவரையில் ஒரு மணித்தியாலம்கூட எங்களது மக்கள் அபிவிருத்தியை இழந்து நிற்க முடியாது என்ற நிலைமைதான் அங்கு காணப்படுகின்றது. உள்ளக வீதிகள் மிகவும் மோசமாகப் பாதிக்கப்பட்ட நிலையிலுள்ளன. மழை காலங்களில் அந்த மக்களின் அவலம் சொல்லவே முடியாத அளவுக்குத் துயரமானது. இந்த விடயத்தில் பல முயற்சிகள் எடுக்கப்பட்டு வந்தன. ஆனால் இப்போதும் அவை நடைபெறுமா? தொடர்ந்து முன்னெடுக்கப்படுமா? என்ற கேள்வியெழுகின்றது. ஆகவே, இவ்விடயத்தில் தற்போதைய அரசும் அதிக அக்கறை செலுத்த வேண்டுமென்பதை நான் இங்கு வலியுறுத்துகின்றேன்.

கடந்த வருடம் அவுஸ்திரேலிய அரசாங்கம் உள்ளூராட்சி அமைப்புக்களினூடாக உட்கட்டுமான அபிவிருத்திக்கான நிதியை ஒதுக்கீடு செய்திருந்தது. ஒவ்வோர் உள்ளூராட்சிச் சபைகளுக்கும் 10 மில்லியன் ரூபாய் என்ற அடிப்படையில் வழங்கப்பட்டது. ஆனால், பல உள்ளூராட்சிச் சபைகள் அந்தத் திட்டங்களை முன்மொழிந்திருந்தாலும் அந்த நிதிகள் இன்னும் அவற்றுக்குக் கிடைக்காத நிலைமையிருக்கின்றது. ஆட்சி மாற்றத்தின் பின்னர் புதிய அரசின் எந்த அமைச்சுக்கூடாக அந்த நிதியைப் பெறலாம் என்ற கேள்விக்குறியோடு உள்ளூராட்சி அதிகாரிகள் காத்திருக்கிறார்கள். ஏனென்றால், கடந்த காலங்களில் பொருளாதார அபிவிருத்தி அமைச்சுக் கூடாகச் செயற்படுத்தப்பட்ட திட்டங்கள் இப்போது எந்த அமைச்சுக்கூடாக முன்னெடுக்கப்படுகின்றன? அல்லது அவை வேறு எந்தெந்த அமைச்சுக்களுக்கு மாற்றப்பட்டிருக்கின்றன? போன்ற கேள்விகள் எழுகின்றன. வெளிநாட்டு உதவித் திட்டங்கள் என்பன கடனாகவோ அல்லது கொடையாகவோ இருக்கலாம். அவை எந்த அமைச்சுக்கூடாக அமுல் படுத்தப்படும் என்ற தெளிவற்ற தன்மையொன்று காணப்படுகின்றது. ஆகவே, அந்தத் தெளிவற்ற தன்மையைப் போக்குவதற்கு அரசாங்கம் முன்வரவேண்டும் என்பதை நான் இங்கு வலியுறுத்துகின்றேன்.

இதேபோன்று பல குடிநீர்த் திட்டங்கள் அங்கு செயற்படுத்தப்பட்டிருக்கின்றன. மேலும் செயற்படுத்தப் படுவதற்கான திட்டங்களும் முன்மொழியப்பட்டிருந்தன. கிளிநொச்சி மாவட்டத்தைப் பொறுத்தவரையில், அங்கு பூநகரிக்குளத்தின் புனரமைப்புத் திட்டத்துக்கான மதிப்பீடு செய்யப்பட்டு, அதற்கான நிதியை ஆசிய அபிவிருத்தி வங்கிக்கூடாகப் பெறுகின்ற நிலைமை இருந்தபோது ஆட்சி மாற்றம் ஏற்பட்டது. அந்தத் திட்டம் மிகவும் முக்கியமானது என்பதால் பூநகரிப் பிரதேச மக்களின் குடிநீரானது இன்று கேள்விக்குறியாக இருக்கின்றது. ஆகவே, அவர்களது நீண்ட கால எதிர்பார்ப்பைப் பூர்த்தி செய்யவேண்டிய அவசியத்தை இங்கு நான் வலியுறுத்துகின்றேன். இதற்காக ஆசிய அபிவிருத்தி வங்கி கடந்த டிசம்பர் மாதம் 2,250 மில்லியன் ரூபாயை வழங்குவதற்கு முன்வந்திருந்தது. ஆகவே, புதிய அரசாங்கம் அந்தத் திட்டத்தைத் தொடர்ந்தும் அமுல் படுத்துவதில் கவனம் செலுத்தவேண்டும். இதேபோன்று பல

பாலங்கள் நிர்மாணிக்கப்படுவதற்கான இடங்கள் எல்லாம் தெரிவுசெய்யப்பட்டு அவை அமுல்படுத்தப்பட இருந்தன. ஆனால், இன்று அங்குள்ள மக்கள் மத்தியில் அவை தொடர்ந்தும் முன்னெடுக்கப்படுமா என்ற ஒரு சந்தேகத்தை ஏற்படுத்தியிருக்கின்றது.

மேலும், சமூகமயப்படுத்தப்பட்ட குடிநீர்த் திட்டமொன்று முன்னெடுக்கத் தீர்மானிக்கப்பட்டிருந்தது. கிளிநொச்சி மாவட்டத்திலே கிட்டத்தட்ட 7 கிராமங்கள் அதற்காகத் தெரிவு செய்யப்பட்டிருந்தன. அதாவது முழங்காவில், ஜெயபுரம், வலைப்பாடு, அறிவியல்நகர், கல்லாறு, காந்திக்கிராமம், சாந்தபுரம் போன்ற பிரதேசங்கள் அந்தக் குடிநீர்த் திட்டத்தின்கீழ் உள்வாங்கப்பட்டிருந்தன. அதற்கான எல்லா ஆரம்ப கட்ட நிதியையும் ஆசிய அபிவிருத்தி வங்கி வழங்கியிருந்தது. ஆனால், அந்தத்திட்டம் தொடர்ச்சியாக முன்னெடுக்கப்படுமா? என்ற நிலைமை தொடர்பான எந்தத் தீர்க்கமான நம்பிக்கையும் எங்களுக்கு வெளிப்படுத்தப்பட வில்லை. இதேபோன்று இரணைமடுக் குளத்தைப் புனரமைக்க வேண்டும் என்ற அங்குள்ள விவசாயிகளின் நீண்ட காலக் கோரிக்கை தொடர்பாக ஆசிய அபிவிருத்தி வங்கி 21,000 மில்லியன் ரூபாயை ஒதுக்கீடுசெய்திருந்தது. ஆனால், அந்தத் திட்டம் அமுல்படுத்தப்படுமா? அது தொடர்பான நம்பிக்கை ஊட்டப்படுமா? என்று நான் இந்த சபையிலே கேள்வியெழுப்ப விரும்புகின்றேன்.

அடுத்ததாக, கல்வி, சுகாதாரம் போன்றவை தொடர் பாகவும் திட்டங்கள் முன்னெடுக்கப்பட்டிருந்தன. பல பாடசாலை அபிவிருத்திகளுக்கான முன்மொழிவுகளுக்கு கொடை வழங்கும் பல நாடுகள் 2015இல் தாங்கள் ஒதுக்கீடு செய்வதாகக் கடந்த வருடம் எங்களுக்கு வாக்குறுதி யளித்திருந்தன. ஆனால், அந்தத் திட்டங்கள் புதிய ஆட்சி மாற்றத்திற்கூடாக மக்களை வந்தடையுமா? என்ற கேள்விக்குப் பதிலை நாங்கள் எதிர்பார்க்கின்றோம். அதுபோன்று பல ஆஸ்பத்திரிகள் 2015ஆம் ஆண்டு மேலும் மீள நிர்மாணிக்கப்படும் என்றும் உறுதிமொழிகள் வழங்கப் பட்டிருந்தன. ஆனால், அவற்றுக்கு என்ன நடக்கும் என்ற ஓர் அவநம்பிக்கையான சூழலொன்றை நாங்கள் எதிர்கொண்டிருக்கின்றோம்.

அவ்வாறே, பல பிரதேச செயலகங்கள் புதிதாக நிர்மாணிக் கப்படுமென கடந்த ஆட்சியின் வரவு செலவுத்திட்டத்திலே முன்மொழியப்பட்டு அதற்கான நிதிகளும் ஒதுக்கப் பட்டிருந்தன. ஆனால், இந்தப் புதிய ஆண்டிலே மக்களுக்கு அந்தப் பிரதேச செயலகங்களை நிர்மாணிப்பதற்கு புதிய அரசு அந்த ஒதுக்கீடுகளை வழங்குமா? என்பது தொடர்பான தெளிவற்ற தன்மையை நாங்கள் காண்கின்றோம். ஆகவே, இது தொடர்பாக அரசாங்கம் சரியான பதில்களை வழங்க வேண்டும் என்று நான் இந்த அவையிலே வலியுறுத்து கின்றேன்.

மேலும், கிளிநொச்சி மாவட்டத்திலுள்ள ஆனையிறவிலே இருக்கின்ற உப்பளம் கடந்த ஆட்சிக்காலத்தில் அபிவிருத்தி செய்யப்பட்டு வேலைகள் நடந்துகொண்டிருந்தன. ஆனால், புதிய அரசியல் மாற்றத்திற்கூடாக அந்த வேலைத்திட்டங்களில் ஒரு ஸ்தம்பித நிலையை நாங்கள் அவதானிக்கின்றோம். இத்திட்டங்கள் முன்னெடுக்கப்படுமா? அல்லது அப்படியே இருக்குமா? என்ற சந்தேகம் காணப்படுகின்றது. இவை முன்னெடுக்கப்படும்பொழுதான், ஆயிரக்கணக்கானவர்களுக்கு வேலைவாய்ப்பும் அந்தப் பிரதேசத்தில் அபிவிருத்தியும் சாத்தியமாகும். அதேபோல் பரந்தன் இராசாயனத் தொழிற் சாலையானது 2015ஆம் ஆண்டில் மீள ஆரம்பிக்கப்படும் என்று உறுதிமொழி வழங்கப்பட்டிருந்தது. ஆனால், அது தொடங்கப்படுமா? என்ற சந்தேகம் காணப்படுகின்றது. அது தொடங்கப்பட்டால் ஏராளமான மக்களுக்கு அங்கு வேலை வாய்ப்புக் கிடைக்கக்கூடிய சந்தர்ப்பம் இருக்கின்றது.

அதேபோல பல்கலைக்கழக நகரமயமாக்கல் திட்டத்தின்கீழ் கிளிநொச்சி வளாகம் உள்வாங்கப்பட்டது; அதற்கான நிதிகளும் கடந்த ஆட்சிக்காலத்தில் ஒதுக்கப் பட்டது. அது இந்தப் புதிய ஆட்சியில் நடைமுறைக்கு வருமா? என்ற கேள்வி எழுகின்றது. ஏனென்றால், ஏராளமான அபிவிருத்தித் திட்டங்கள் முன்னெடுக்கப்பட்டிருக்கின்றன. அதன் தொடர்ச்சிப்போக்கு இல்லாதுபோனால், முன்னெடுக் கப்பட்ட அபிவிருத்தித் திட்டங்களினூடாக மக்களின் வாழ்வாதாரமும் பிரதேசத்தின் அபிவிருத்தியும் ஒரு ஸ்தம்பித நிலையை அடையும். இது எங்கள் மக்களிடத்தில் விரக்தி மனப்பான்மையை ஏற்படுத்திவிடும். ஏனென்றால், மக்கள் புதிய அரசாங்கத்திடமிருந்து அதிகமாக எதிர்பார்க் கின்றார்கள். ஆகவே, அந்த எதிர்பார்ப்பைப் பூர்த்தி செய்வதற்கு புதிய அரசு முன்வரவேண்டுமென நான் இங்கு வலியுறுத்துகின்றேன். அதுதான் தமிழ் மக்களுக்கு உண்மையான மாற்றமாக இருக்கும். தென்னிலங்கையில் மேற்கொள்ளப்படும் அபிவிருத்திப் பணிகள் பற்றி உங்களுக்குள் சில விமர்சனங்கள் இருக்கலாம். ஆனால், அபிவிருத்தியின்போது நீங்கள் வடக்கு, கிழக்கை வேறு படுத்திப் பார்க்கவேண்டும். ஏனெனில், வடக்கு, கிழக்கு மக்கள் எக்காலத்திலும் அபிவிருத்தியிலிருந்து விலகி நிற்கமுடியாத சூழலில்தான் இருக்கின்றார்கள் என்று கூறி, விடைபெறுகின்றேன். நன்றி.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බොහොම ස්තුතියි ගරු මන්ත්‍රීතුමනි.

Order, please! කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු උදිත් ලොකුබණ්ඩාර මහතාගේ නම යෝජනා කරන්න.

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා දැන් මූලාසනය ගත යුතු ය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு உதித் லொக்குபண்டார அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. UDITH LOKUBANDARA *took the Chair.*

[අ.භා. 4.23]

ගරු තිස්ස කරල්ලියද්ද මහතා
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த)
(The Hon. Tissa Karalliyadde)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මන්ත්‍රීතුමාගේ අදහස් ප්‍රකාශ කිරීමෙන් පසුව කථා කරන්න මටත්

[ගරු තිස්ස කරල්ලියද්ද මහතා]

අවස්ථාවක් ලබා දීම පිළිබඳව මා ස්තුතිවන්ත වනවා. පළමුවෙන්ම කියන්නට ඕනෑ අපි රජය විවේචනය කිරීමක් නොවෙයි මෙතැනදී කරන්නේ කියලා. මහජනතාව බලා ගෙන ඉන්නවා. අපි රජයේ වැඩ කටයුතුවලට සහයෝගයක් දක්වන ගමන්ම අතපසු වුණු කරුණු කාරණා තිබෙනවා නම්, ඒවා පෙන්වා දෙනවා. ඒක අපේ යුතුකමක් හා වගකීමක් හැටියට මම දකිනවා.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ මැදවච්චිය, හොරොව්පතාන, කලාවැව, කැකිරාව, මිහින්තලය ඒ වාගේම නැේඟනහිර අනුරාධපුරය, බටහිර අනුරාධපුරය කියන ආසන හතම මා මෙහි දක්වන අදහස්වලට යොමු වෙනවා කියන එක ප්‍රකාශ කරන්නට ඕනෑ. පසු ගිය රජය කාලයේ අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් හිටපු ජනාධිපතිතුමා අපේ හිටපු අධ්‍යාපන ඇමතිතුමා වන බන්දුල ගුණවර්ධන මහතා සමඟ සාකච්ඡා කරලා, නගරයට තිබෙන සෑම පහසුකමක්ම ගමට ගෙන යාමේ වැඩසටහන යටතේ මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර විශාල සංඛ්‍යාවක් මේ රට පුරාම ඉදි කළා. මා නියෝජනය කරන මැදවච්චිය ආසනයේත් එවැනි විද්‍යාගාර 11ක් ඉදි කරලා එක පාසලක් පමණයි විවෘත කර ගන්න පුළුවන් වුණේ. දැන් ඒ ගොඩනැඟිලි ඉදි කරලා හමාර වෙලා තිබෙනවා. විද්‍යාගාරයට අවශ්‍ය උපකරණ ලබි ලහියේ ලබා දෙන්න කියන ඉල්ලීම පළමුවෙන්ම අපි මතක් කරන්නට ඕනෑ. මොකද මැතිවරණයක් පැවැති අවස්ථාවේ අපි ඒ වැඩ කටයුතුවලින් පොඩ්ඩක් බැහැර වුණා. එසේ නොමැති නම් මැතිවරණයට ඒකත් සම්බන්ධ කර ගත්තා කියන චෝදනාව අපිට එන්න තිබුණා. ඒ ගැන මම මුලින්ම සිහිපත් කරන්නට ඕනෑ.

දැවැන්ත මහා මාර්ග සංවර්ධනයක් රට පුරාම සිද්ධ වුණා. ඉතින් අපිට උසුළු විසුළුත් කළා. මේ කාපට් දාලා හදන පාරවල් කන්නද කියලාත් ඇහුවා. ග්‍රාමීය මට්ටමින් දැවැන්ත සංවර්ධනයන් කරමින් නීතිය අනුව, හරි ප්‍රමිතිය අනුව නිම කරපු මාර්ගවලත් ගෙවීම් කටයුතු අද අත්හිටුවා තිබෙනවා. මේවා ගැන වැඩි උනන්දුවක් දක්වන්නට වෙනවා. මොකද, අපිට මේවායින් කොහොමටවත් බැහැර වෙන්න බැහැ. අපේ රජය තිබෙන කාලයේ අපි ඒ සංවර්ධන ක්‍රියාවලියට ප්‍රතිපාදන හොයලා දුන්නා. දැන් ඒවාට ප්‍රතිපාදන නැහැයි කියලා කියන්න බැහැ. අඩු පාඩුවක් තිබෙනවා නම් ඒවා හොයලා බලලා නිසි ප්‍රමිතියට මාර්ග සංවර්ධනය වෙලා නොමැති නම් ඒවාට මුදල් හදල් ගෙවන්න අවශ්‍ය වෙන්නේ නැහැ. ඒක අපිත් කියනවා. ඒ ගැනත් දැඩි අවධානය යොමු කරන්න ඕනෑ.

අධ්‍යාපන ක්ෂේත්‍රය ගැන මම කථා කළා. තිස් අවුරුදු යුද්ධයකින් බැටකාපු ජනතාවකගේ දරුවෝ අධ්‍යාපනය ලබන බල ප්‍රදේශයක් මම නියෝජනය කරන්නේ. ඒ නිසාම ඉතාම ඕනෑකමින් මේ ගැන අවධානය යොමු කරන්න කියන ඉල්ලීම මම පුල පුලා කරන්නට ඕනෑ. අධ්‍යාපන ක්ෂේත්‍රය වාගේම මාර්ග පද්ධතිය ගැනත් බලන්න ඕනෑ. අපේ පළාත්වල යන්න එන්න මාර්ග තිබුණේ නැහැ. යුදමය වාතාවරණය තුළ ගමන් බිමන් ඇන හිටලා තිබුණා. ඔබතුමන්ලා පැහැදිලිව මෙක දන්නවා. ඒ නිසා රජයට දෙන සහයෝගය තුළ අපි මේවාත් බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම "iRoad" ව්‍යාපෘතියක් ආරම්භ කරන්න තිබුණා. ඒ "iRoad" ව්‍යාපෘතිය පරීක්ෂණයට යොමු වෙලා අනුමත වෙලා තිබෙනවා. මගේ ආසනයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 4ක මේ මාර්ග පද්ධතිය ආරම්භ කරන්න ඕනෑ. ඒවාත් ඇන හිටලා තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රඹුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තිබෙනවා ඉහළගම සිට මුස්ලිම් දිවුලවැව මාර්ගය, පිහිඹියගොල්ලැව අඹගහ වැව මාර්ගය, රඹුව පල්ලම්කුලම වෙහෙරගල මාර්ගය, ඒ වාගේම මැදවච්චිය කලාපයේ ඒ.9 කරහික්කඩ - ගුරුකන්දේගම මාර්ගය, පුහුදිවුල හන්දියේ ගල්කඩවල මාර්ගය. පදවිය ප්‍රදේශයේ මාර්ග 6ක් තිබෙනවා.

ත්‍රස්තවාදී ප්‍රහාරයට ලක්වූ කැබිතිගොල්ලැවේ කණුගහවැව - හේරත්හල්මිල්ලැව මාර්ගය, පුංචිමුදාගම - ඩී 6 - වහල්කඩ මාර්ගය, හල්මිල්ලවැටිය - යකාවැව මාර්ගය -බස් බෝම්බය පුපුරපු ප්‍රදේශය ආශ්‍රිත ගම්මානවල මාර්ග- ආදියෙහි වැඩ අපේ රජය කාලයේ ආරම්භ කරන්න නියමිතව තිබුණා. ඡන්දයත් එක්ක එය යට ගියා. ඒවායේ කටයුතුත් ආරම්භ කරන්න කියන ඉල්ලීම කරනවා. ඒ වාගේම අපි රුපියල් ලක්ෂ 307ක් වැය කරපු, කැබිතිගොල්ලැව නගරයේ ඉදි කරමින් පැවැති බස් නැවතුම් පොළේ, වෙළඳ සංකීර්ණයේ වැඩ දැන් ඇන හිට තිබෙනවා. ඒ වාගේම, මැදවච්චිය සති පොළ, මැදවච්චිය ළමා උද්‍යානය ආදියෙහි වැඩ කටයුතු අත් හිටුවා තිබෙනවා. පාලම් 1,000 වැඩසටහන යටතේ අපි පාලම් 10කට පමණ මුල් ගල් තබා තිබෙනවා, ගරු ඇමතිතුමනි. ඒවායේ වැඩ ආරම්භ කරලා නැහැ. කරගෙන ආපු වැඩ නැවතිලා තිබෙනවා. ඒ ගැනත් සොයා බලන්න කියන ඉල්ලීම කරනවා.

දිවයින පුරා බොහෝ පොලිස් ස්ථානවල මම ආරම්භ කළා ළමා හා කාන්තා කාර්යාංශ පැමිණිලි මධ්‍යස්ථාන. ඒවා ඉදි වෙමින් පවතිනවා. ඒවා ඉදි වෙලා ඉවර වුණාම රාජකාරි කටයුතු කරන්න ඒවා පවරා දෙන්න පුළුවන් වේවි කියා මම හිතනවා. ඒ වාගේම, වැඩිහිටි නිවාස ඉදි වෙනවා. ළමා රැකවරණ මධ්‍යස්ථාන, දිවා සුරැකුම් මධ්‍යස්ථාන, කාන්තා රැකවරණ මධ්‍යස්ථාන විශාල සංඛ්‍යාවකට අපි ප්‍රතිපාදන වෙන් කර දී තිබෙනවා. ඒ වැඩ කොටස් ටිකත් ආරම්භ කරන්න කියන කාරුණික ඉල්ලීම මම මේ ගරු සභාවේදී කරන්න ඕනෑ.

අපේ ප්‍රදේශවල ජනතාව නිරන්තරව වන අලින්ගේ ප්‍රහාරයන්ට ලක් වෙනවා. වන අලි නිසා ඒ ජනතාවගේ ගොවිතැන්බත් විනාශ වෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු තිස්ස කරල්ලියද්ද මහතා
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த)
(The Hon. Tissa Karalliyadde)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පදවිය, කැබිතිගොල්ලැව, මැදවච්චිය, රඹුව කියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල විදුලි වැටවල් ඉදි කිරීමේ මූලික වැඩ කටයුතු ආරම්භ කළා. ඒ වැඩ කටයුතුත් දැන් ඇන හිට තිබෙනවා. ඒවා ගැනත් දැඩි අවධානයක් යොමු කරන්න කියන කාරුණික ඉල්ලීම කරමින්, මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මා නවතිනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට, ගරු කබීර් හාෂීම් අමාත්‍යතුමා. ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.29]

ගරු කබීර් හාෂීම් මහතා (මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு கபீர் ஹாஷீம் - நெடுஞ்சாலைகள், உயர்கல்வி மற்றும் முதலீட்டு ஊக்குவிப்பு அமைச்சர்)
(The Hon. Kabir Hashim - Minister of Highways, Higher Education and Investment Promotion)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි. විශේෂයෙන් අද විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා මේ ගරු සභාවේදී

යම් චෝදනාවක් කළා ව්‍යාපෘති නැවතිලා තිබෙනවා කියලා. මේ යෝජනාව ඉදිරිපත් කරන කොට ඇත්තටම මම හිතුවේ විපක්ෂය ව්‍යාපෘති ගැනත්, ඒ වාගේම පොදු ජනයාගේ ප්‍රශ්න ගැනත් කථා කරනවා කියලායි. ඊට පසුව විවාදය යන විධිය දිහා බලන කොට, පසු පෙළ හිටපු මන්ත්‍රීවරුන් කථා කරපු විධිය ගැන බලන කොට මෙතැන නියෝජනය කරන්නේ ජනතා මතය නොව සමහර කොන්ත්‍රාත්කරුවන්ගේ මතය බවයි මට වැටහෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ව්‍යාපෘති නැවැත්වූවාය, වැඩ නැවැත්වූවාය කියන එක මම ප්‍රතික්ෂේප කරනවා. අපි ව්‍යාපෘති සහ සංවර්ධනය අනිවාර්යයෙන් කරනවා. අපි ඒ වෙනුවෙන් බැඳී සිටිනවා. විශේෂයෙන් එක්සත් ජාතික පක්ෂ රජය තරම් මේ රටේ සංවර්ධනයක් කරපු වෙනත් රජයක් නැහැ. අපි මහවැලිය හැදුවා; නිදහස් වෙළඳ කලාප හැදුවා; ඇඟලුම් කර්මාන්ත 200 හැදුවා. ඒ සියලු දේ හැදුවේ අපියි; අපේ කාලයේයි. අපි සෑම විටකම කියන්නේ රටක භෞතික යටිතල සංවර්ධනය විතරක් කරලා ප්‍රමාණවත් නැහැ කියලායි. විශේෂයෙන් මානව යටිතල සංවර්ධනය අත්‍යවශ්‍යයි. එය පසු ගිය අවුරුදු 20 තුළ රජයට අමතක වූ කොටසක්. මේ රටේ අධ්‍යාපනයට, සෞඛ්‍යයට, මානව සංවර්ධනයට අදාළ ප්‍රතිපාදන වෙන් කළේ නැති නිසා තමයි ඒ රජයට ගෙදර යන්න සිද්ධ වුණේ. ඒකත් එක හේතුවක්. අපි විශේෂයෙන් ඒක අමතක කරන්නේ නැහැ. කොන්ක්‍රීට්වලින්, යකඩවලින් විතරක් සංවර්ධනය කරන්න බැහැ. ඒ කරගෙන ආපු ව්‍යාපෘති නැවතිලාය, ඒවා ඔක්කෝම කරන්නය කියා හදිසියේ කිව්වාට ඒවායේ අඩු පාඩු තිබෙනවා; ඒවායේ ගැටලු තිබෙනවා; ඒවායේ මහා පරිමාණ දූෂණ තිබෙනවා. ඒ දූෂණ කරපු ඒවාට නිකම් මුදල් ගෙවන්න අපි හදිසි වන්නේ නැහැ. හොරුන්ට සල්ලි ගෙවන්න බැහැ. අපි බැඳිලා නැහැ ඒ අයට සල්ලි ගෙවන්න. ව්‍යාපෘතිවල ගිවිසුම් හරියාකාරව අත්සන් කරලා තිබෙන්න පුළුවන්. ටෙන්ඩර් පටිපාටියෙන් තොරව ගිවිසුම් අත්සන් කළාට, ඒ ගණන් හිලව්වල ලොකු ප්‍රශ්න තිබෙන කොට ඒ ගෙවීම් කරන්න බැහැ. ඒ නිසා සමහර අය බය වෙලා දැන් වැඩ නවත්වලා; බඩු මුට්ටු උස්සාගෙන ගිහිල්ලා. මම මහාමාර්ග ඇමතිවරයා. මම කිසිම තැනකදී කියලා නැහැ කිසිම වැඩක් නවත්වන්න කියලා. නමුත් හොරෙන් කරපු වැඩවලට නම් සල්ලි ගෙවන්නේ නැහැ කියා තිබෙනවා; වැරැදි ගණන්වලට සල්ලි ගෙවන්නේ නැහැ කියා තිබෙනවා. එතකොට හොරු ටික බඩු ටික අරගෙන යනවා. මම මොනවා කරන්නද? සාධාරණ විධියට අත්සන් කරලා තිබෙනවා නම්, මුදල් රෙගුලාසි අනුව, පරිපාලන රෙගුලාසි අනුව හැම දෙයක්ම හරියට අනුමත කර තිබෙනවා නම් බය වෙන්න ඕනෑ නැහැ. තමන්ට අයිතිය තිබෙනවා අමාත්‍යාංශයට ගිහිල්ලා මුදල් ටික ගෙවන්න කියා කියන්න. ඒ වාගේ කීපදෙනෙක් ආවා. අපි ඒ ගෙවීම් කරන්න මහා භාණ්ඩාගාරයේ අනුමැතියත් සමඟ මුදල් අරගෙන තිබෙනවා. මේ රජය වැඩ කරන්නේ නැහැ, ව්‍යාපෘති නවත්වලා තිබෙනවා කියන එක මම පිළිගන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම උදාහරණ කීපයක් ආශ්‍රයෙන් කියන්නම්, මේ ප්‍රශ්නයට මූලික වූ කාරණාව, මෙවැනි මතයක් ඇති වෙන්න කාරණාව. ඊළඟට මාතර දිස්ත්‍රික්කයේ තමයි "දැයට කිරුළ" වැඩසටහන පවත්වන්න නියම කරගෙන තිබුණේ. දැයට කිරුළ වැඩසටහන යටතේ වැලිගම ආසනයේ, වැලිගම මැතිවරණ කොට්ඨාසය තුළ පාරවල් තුනහතරක් හදන්න කියා තිබෙනවා. ඒවාට කිසිම අනුමැතියක් නැහැ. මාර්ග සංවර්ධන අධිකාරිය ඒකට අනුමැතිය දීලා නැහැ. කොන්ත්‍රාත්කරුවෝ ගිහිල්ලා ඒ පාරවල් හදනවා. ගණන් හිලව් හදලා තිබෙන්නේ කොන්ත්‍රාත්කරුවෝ. ඒ කොන්ත්‍රාත්කරුවෝ පාරවල් භාගෙට හදලා ගිහිල්ලා. ඒ ඇයි? ඒක නීත්‍යානුකූල නැති නිසයි. එතැනදි ගණන් හිලව් කථා කරන්න ඕනෑ. ඒ වාගේ ප්‍රශ්න තිබෙන කොට අපට ගිහිල්ලා ඒවාට ගෙවීම් කරන්න බැහැ. නමුත්, දැන් අපි තීරණයක් ගත්තා. ඒ පාරවල් භාගෙට හදා නවත්වා තිබෙනවා; බෝක්කු කඩා තිබෙන නිසා මිනිස්සුන්ට යන්න එන්න බැහැ. ඒ නිසා නැවතී තිබෙන තැන ඉඳලා ඒවාට අලුතෙන් ටෙන්ඩර් කැඳවා හෝ හරි විධියට වැඩ ආරම්භ කරන්න අපි තීරණය කළා. ඒකට පොඩි කාලයක් යනවා. හරි ක්‍රමයට කරනවා නම්, ඒ සඳහා පොඩි කාලයක් යනවා. ඒ වාගේම මැතිවරණ කාලයේ ඡන්දය දිනන්න ඕනෑ නිසාද දන්නේ නැහැ, හිටපු ජනාධිපතිතුමා රැස්වීමකට ගියාම මිනිස්සු ඇවිල්ලා කියනවා, "පාරවල් හැදිලා නැහැ" කියා. එතකොට ඇමතිවරු ගියාම මිනිස්සු කියනවා, "අහවල් පාර හදන්න" කියා. දේශපාලන උණුසුමත් එක්ක මේ දේවල් කියන කොට නිලධාරි භය වෙලා සමහර විට මාර්ග සංවර්ධන අධිකාරියට - RDA එකට- අයිති නැති ප්‍රාදේශීය සභා පාරවලුත් හදලා තිබෙනවා. මේවා කොන්ත්‍රාත්කරුවන්ට දීලා තිබෙන්නේ ටෙන්ඩර් කැඳවන්නේ නැතිව; ගණන් හිලවු කථා කරන්නේ නැතිව. ඒ ගොල්ලන් පාරවල් භාගෙට හදලා ඡන්දය පැරදුණු ගමන් ඒවායේ වැඩ නැවැත්වූවා. ඒවාට අපි මොනවා කරන්නද? මේ සඳහා වැරදි ක්‍රමයක් යෙදවූවා නම්, ඒ ගොල්ලන් ඒවාට වන්දි ගෙවන්න ඕනෑ. ඒවාට මුදල් ගෙවන්න අපි ලෑස්ති නැහැ. තමුන්නාන්සේලාගේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු ඉන්නවා. ඒ ගොල්ලන් කොන්ත්‍රාත් අරගෙන මේවා කෙරෙව්වා. ඒ ගොල්ලන් මුදල් අරගෙන ගෙදරට යන පාරවල් හැදුවා. ඒවාට අපි ගෙවන්නද? නැහැ. මහජන මුදල් ඒවාට දෙන්නේ නැහැ. අපි ඒවාට සූදානම් නැහැ. නමුත්, සාධාරණව ගෙවන්න තිබෙන ඒවාට අපි ගෙවනවා. අපි කවදාවත් ඒවාට ගෙවන්නේ නැතිව ඉන්නේ නැහැ. ඒ නිසාම තමයි මිනිස්සු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ජන වරමක් දුන්නේ. එතුමා රටේ යහ පාලනය ඇති කරනවා කිව්වා. මෙහෙම වැරදි විධියට ගත් ඒවාට ගෙවන්න අපට බැහැ නේ? දැන් සමහර මාර්ගවල වැඩ නැවතිලා තිබෙනවා. නමුත්, අපි ඒ නැවතිලා තිබෙන තැන ඉඳලා ඒවායේ වැඩ අලුත් ක්‍රමයකට; ටෙන්ඩර් පරිපාටිය අනුව කර ඒ වැඩ අවසන් කරන්න බැඳී සිටිනවා. අපි ඒ වැඩ කරනවා. මොකද, අපි මහ ජනතාව අපහසුතාවට පත් කරන්නේ නැහැ. ඒ නිසා තමයි අපි මේ දේවල් කරන්නේ. නමුත්, අපි කොන්ත්‍රාත්කරුවන්ට භය වෙන්නේ නැහැ.

මම එක උදාහරණයක් කියන්නම්. ඒක තවත් ලොකු ව්‍යාපෘතියක්. මහාමාර්ග අමාත්‍යාංශයෙන් කරපු එකක්. කලින් පැවැති ආණ්ඩුව අය වැය හිඟය පිළිබඳව හැම දාම ලොකු කයිවාරුවක් ගැහුවා නේ? ජී.එල්. පීරිස් ඇමතිතුමනි, ඔබතුමා ඒකට සාක්ෂි දරයි. අපේ අය වැය හිඟය සියයට 7ක් දක්වා අඩු කරනවා කියා ඔබතුමන්ලා අය වැය හිඟය අඩු කර ගෙන ආවා නේ. අපි හැම දාම කිව්වා, "ඒක අසත්‍යයක්" කියා. සැබෑ අය වැය හිඟය ඒක නොවෙයි කියා අපි කිව්වා.

මම එක උදාහරණයක් කියන්නම්. මගේ අමාත්‍යාංශය අය වැයෙන් වෙන් කරපු මුදල්වලට අමතරව මොකක්ද කර තිබෙන්නේ? දේශීය බැංකු ණය ක්‍රමය හරහා මාර්ග සංවර්ධනය කියා දේශීය බැංකුවලින් රුපියල් බිලියන 151ක ණය අරගෙන තිබෙනවා. නමුත්, ඒක අය වැයේ පෙන්වන්නේ නැහැ. අය වැය හිඟයට ඒක එන්නේත් නැහැ. That is outside the Budget allocation. රුපියල් බිලියන 151ක්. ඒකට කමක් නැහැ. පාරවල් හදන්න ඒ මුදල් ගත්තා කියමු කෝ. ඒ මුදල් ටික වියදම් කරන්නේ කොහොමද? තමන්ට හිතවත් කොන්ත්‍රාත්කරුවෝ හොයා ගන්නවා. කොන්ත්‍රාත්කරුවන්ට මේ මුදල් දීලා තිබෙන්නේ කොයි පදනමෙන්ද? කොන්ත්‍රාත්කරුවන්ට එන්න කියා, ඒ කොන්ත්‍රාත්කරුවන්ම තමයි පාරක් තෝරා ගන්නේ. ඔහු ගිහිල්ලා පාරක් තෝරා ගන්නවා. ඔහු පාරක් තෝරා ගෙන ඇවිල්ලා කියනවා, "මෙන්න මේ පාර තෝරා ගත්තා" කියා. ඒකේ BOQ එක හදන්නේ කොන්ත්‍රාත්කරුවා. ඇස්තමේන්තුව හදන්නේ කොන්ත්‍රාත්කරුවා. මේ වැඩය හරි ලස්සනයි. මේ වැඩයට තෝරා ගත් දේශීය බැංකු කීපයක් තිබෙනවා. මහා භාණ්ඩාගාරයෙන් අදාළ බැංකුවට සහතිකයක් - guarantee එකක්- දෙනවා, ඒ කොන්ත්‍රාත්කරුවාට ණය දෙන්න කියා. ඊට පස්සේ මම ඇහුවා, මේකට ටෙන්ඩර් ක්‍රමයක් නැද්ද කියා. හදන්න පාරක් තෝරන කොට කොන්ත්‍රාත්කරුවන් කීප දෙනෙකුගෙන් ටෙන්ඩර් කැඳවන්නේ නැද්ද කියා මම ඇහුවා. නැහැ, නැහැ, Cabinet

[ගරු කබීර් හාෂිම් මහතා]

Appointed Tender Board එකක් තිබෙනවා කිව්වා. මම කිව්වා, "එහෙම කෙරුවා නම්, බොහොම හොඳයි" කියා. මම ඇහුවා, එහෙම කොහොමද කරන්නේ කියා. නැහැ, නැහැ, Cabinet Appointed Tender Board එකට ඒ අදාළ කොන්ත්‍රාත්කරුවා යනවා, ගිහිල්ලා ඔහු කියනවා, "මේ අහවල් පාරට මගේ ඇස්තමේන්තුව රුපියල් කෝටි 200යි" කියා. එතකොට මම ඇහුවා, එක් කෙනෙක්ද යන්නේ කියා. "ඔව්, එක් කෙනායි" කිව්වා. එතකොට කොහොමද වැඩය කථා කරන්නේ කියා මම ඇහුවා. Cabinet Appointed Tender Board එකෙන් කියනවා, "හරි, රුපියල් කෝටි 200 වැඩියි. කෝටි 196ක් කරමු. කෝටි 4ක් අඩු කරමු." කියා. "ආ, හරි" කියා ගණන කථා කර ගත්තා කිව්වා. එපමණයි. ඒක හරි ක්‍රමයටද කරන්නේ, ඒක ඊට අඩුව කරන්න පුළුවන්ද, ඒක කරන්න පුළුවන් තව කොන්ත්‍රාත්කරුවෝ ඉන්නවාද කියා හොයලා නැහැ. "Unsolicited" විධියට ඒක කර තිබෙනවා. ඊට පස්සේ රුපියල් කෝටි 200ම දෙනවා. එහෙම තමයි ඒ කොන්ත්‍රාත්කරුවෝ බැංකු ණය අරගෙන තිබෙන්නේ. ඒක ගෙවන්න ඕනෑ අපි -රජය- නැත්නම් පොදු ජනයා.

මේ ණය ගෙවන්න ඕනෑ පොදු ජනයා. බැංකුවලින් ඒ ණය අරගෙන පාරවල් හදනවා කියා තෝරා ගත් කොන්ත්‍රාත්කරුවන්ට මුදල් දීලා තිබෙනවා. රට හැම තැනම තිබෙන මාර්ගවලින් කොටසක් හදනවා, කොටසක් හදලා නැහැ. ඒවා අපි දැන් හොයා ගෙන යනවා. ඒකට මම එක උදාහරණයක් කියන්නම්. ඒක කොහොමද කරන්නේ? ඒක මම මෙතැන සහතික කර කියන්නම්. මම තව ටික දවසකින් විස්තර ඇතුව මේක හෙළි කරනවා. එක කොන්ත්‍රාත්කරුවෙක් කොන්ත්‍රාත්තුවක් ගන්නවා. ඔහුගේ කොන්ත්‍රාත්තුව රුපියල් කෝටි 2,600යි. ඒක කොහේ හෝ පාරක කොන්ත්‍රාත්තුවක් වන්න පුළුවන්.

ලොකු නිලමේ කෙනෙක්. ඔහුගේ කොන්ත්‍රාත්තුව රුපියල් කෝටි 2,600යි. ඔහුට කොන්ත්‍රාත්තුව දෙනවා. කිසිම ටෙන්ඩර් එකක් නැහැ. නමුත් ඔහු මොකද කරන්නේ? ඒක subcontract කරනවා. ඔහු ඒ කොන්ත්‍රාත්තුව තව කෙනෙකුට දෙනවා. ඔහු කරන්නේත් නැහැ. තව පොඩි කොන්ත්‍රාත්කරුවෙකුට රුපියල් කෝටි 1,600කට දෙනවා. ඔහු කොන්ත්‍රාත්තුව ගත්තේ රුපියල් කෝටි 2,600 කට. Subcontract එක රුපියල් කෝටි 1,600යි. ඔහුට ශුද්ධ ලාභය කියද? එක කොන්ත්‍රාත්කරුවෙකුට රුපියල් කෝටි 1,000යි. තමුන්නාන්සේලා මේ ගරු සභාවට ඇවිත් කියනවා, "ගෙවීම් කළේ නැහැ" කියා. මේ ගෙවීම් කරන්න මෙපමණ සටන් කරන්නේ මේ කොන්ත්‍රාත්කරුවෝ වෙනුවෙන් නොවෙයි ද? අපි ඒවා ගෙවන්නට සූදානම් නැහැ. සාධාරණ විධියට වැඩ කර තිබෙනවා නම් විනිවිදභාවයක් ඇතිව හරියට වැඩ කර තිබෙනවා නම්, අපි ඒ ගෙවීම් කරනවා. එසේ නැත්නම් අපි ඒ ගෙවීම් කරන්නේ නැහැ. හොරට කරපු ඒවා නවත්වනවා.

මේක තමයි ප්‍රශ්නය. දින 54ක් තුළ මේවා ඔක්කොම සොයාගෙන හරි ක්‍රමයකට යහ පාලනය ඇති කරන්නයි යන්නේ. විවිධ අභියෝග මධ්‍යයේ - නිලධාරිනුත් ඉන්නේ අර පැත්තේ - ඒවා ඔක්කොම බලාගෙන තමයි අපි වැඩ කර ගෙන යන්නේ. ඇයි? මේවා අපි ගෙදර ගෙනියන්නද? මේවා පොදු ජනයගේ මුදල්. මේවා බේරා ගන්න ඕනෑ. අපි දැන් මානව සංවර්ධනය සඳහා වෙන් කරන මුදල් කොහෙන් ද ගන්නේ? නාස්තිය නතර කර; දූෂණය නතර කර ගන්නේ. එම නිසා මේවාට නිකම් ගෙවීම් කරන්න බැහැ.

අපි සමෘද්ධිය සියයට දෙසියයකින් වැඩි කරන්නේ, වැටුප් රුපියල් දහ දාහකින් වැඩි කරන්නේ. මැතිවරණ කොට්ඨාසයකට නිවාස 300ක් හදන්නේ, අධ්‍යාපනයට සියයට හයක් වැඩි කරන්නේ, රැකියා දශ ලක්ෂයක වැඩසටහනකට යන්න වැඩ පිළිවෙළ හදන්නේ, මේවාගේ හොරකම් කරපු මුදල් බේරා ගන්න ක්‍රමයක් සොයා ගෙන. හදිසියේ බලපෑම් කර කොන්ත්‍රාත්කාරයන්ට මුදල් ගෙවන්න කිව්වාම, අපි ඒකට බැඳිලා නැහැ. සමහර ව්‍යාපෘති පොඩ්ඩක් හිරවෙයි. රට හිර වෙන්නේ නැහැ. පොදු ජනයාට රිදෙන්නේ නැහැ. මේ කොන්ත්‍රාත්කරුවන්ට තමයි රිදෙන්නේ. එම නිසා අපි ඒකට හදිසි වෙන්නේ නැතිව නියමිත විධියට මේ දෙය කරන්න ඕනෑ.

තව එකක් මම කියන්නම්. අධිවේගී මාර්ග ගැන කතා කළා. ඒ කාලයේ අධිවේගී මාර්ග, ලොකු ලොකු පාරවල් හැදුවා. මිනිස්සුන්ට ඒ මුදල් ආවාද? හුඟක් අධිවේගී මාර්ග හදනකොට විශාල ගණනකින් -සියයට සියයකින්- කොමිස් ගැහුවා. එයින් රටට විශාල පාඩුවක් වුණා. දැන් උතුරු අධිවේගී මාර්ගය ගැන කථා කළා. අපි ඒ ව්‍යාපෘතිය නවත්වා නැහැ. උතුරු අධිවේගී මාර්ගය අපි ඉස්සෙල්ලාම හදන්නේ මහනුවරට. කොළඹ - මහනුවර අධිවේගී මාර්ගය. මොකද, කොළඹ - මහනුවර තිබෙන තදබදය නැති කරන්නට ඕනෑ. ඒක අපි කරනවා. නමුත් උතුරු අධිවේගි මාර්ගය හදනවාය කියා මොකක් ද කළේ? කොන්ත්‍රාත්කාරයෝ පස් හය දෙනෙකුට එන්නටය කියා ඒගොල්ලන්ට කොටස් බෙදා දුන්නා. තෑග්ගක් දෙනවා වාගෙයි. නත්තල් පප්පලා දෙනවා වාගෙයි දුන්නේ. " මෙන්න මෙපමණ ගණනකට ඔයා කොටසක් ගන්න. ඔයා කොටසක් ගන්න " කියා දුන්නා. භාණ්ඩාගාරයෙන් තඹ සතයක් මුදල් වෙන් කර නැහැ. හදන්න සල්ලි නැහැ. බොරුවට දුන්නා ඒ ගොල්ලන්ට. වැරදිලා ජනාධිපතිවරණයෙන් දිනලා තිබුණා නම් ඒ ගොල්ලන්ට කොහෙන් හෝ මුදල් සොයලා දෙනවා. [බාධා කිරීමක්]

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
පැහැදිලි කිරීමක් කර ගන්න පුළුවන් ද?

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ඔව්. අහන්න.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
තමුන්නාන්සේ දන්නවා, රත්නපුර - පැල්මඩුල්ල මාර්ගය. කහතුඩුව හැරවුමෙන් ආරම්භ වෙලා රත්නපුර පැල්මඩුල්ල දක්වා අධිවේගී මාර්ගයක් සැලසුම් කළා. ඒකට අවශ්‍ය ඉඩම් ද අත්පත් කර ගන්නට කටයුතු කළා. මම තමුන්නාන්සේගෙන් දැන ගන්නට කැමතියි, මේ අධිවේගී මාර්ගය තමුන්නාන්සේලා ඉදි කරනවා ද කියා.

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
මම කියන්නම්. උතුරු අධිවේගී මාර්ගය ගැන කියා ඉවර වෙලා මම ඒක කියන්නම්. උතුරු අධිවේගී මාර්ගයට රුපියලක්වත් වෙන් කර නැහැ. නමුත් කොන්ත්‍රාත්කාරයෝත් කථා කරලා ගණනත් හදා ගෙන.

මේවා Unsolicited Proposals. ටෙන්ඩර් නැතිව දීලයි තිබෙන්නේ. සල්ලිත් නැහැ දෙන්න. ජනාධිපතිවරණයෙන් දිනලා තිබුණා නම්, කොහෙන් හෝ ණයක් අරගෙන අර උදවියටම දෙනවා. මිනිසුන්ට නොවෙයි නේ සල්ලි යන්නේ. කොන්ත්‍රාත්කාරයෝ දහ දෙනෙකුට කෝටි 1,000යි, කෝටි 2,000යි ලාභ; ශුද්ධ ලාභ. ඒක අපි නතර කළා. අපි දැන් හරියාකාරව ටෙන්ඩර් පටිපාටිය අනුව open bidding process එකක් කර, ඒක BOT basis එකද, funded basis එකක් ද කියා

හරියට බලා, කොළඹ - නුවර අධිවේගී මාර්ගය වහාම ආරම්භ කිරීමට අපි සූදානම් වෙනවා. ඒ වගේම දකුණු අධිවේගි මාර්ගයේ ඉතිරි කොටස -මාතර සිට බෙලි අත්ත, බෙලිඅත්ත සිට හම්බන්තොට මාර්ගය- අපි නතර කරන්නේ නැහැ. නමුත් කොන්ත්‍රාත්කරුවන් සමඟ අපි නැවත negotiate කරනවා. නැවත සාකච්ඡා කරනවා. වියදම සියයට 20 අඩු කරන්නට පුළුවන්ය කියා අප හිතනවා. කෝටි ගණනක් අඩු කරන්නට පුළුවන්. රටට අපරාදේ. කාටද මේ මුදල් යන්නේ? මේ මුදල් චීන කෝම්පැනියකට යන්නේ. මේවා අපේ සල්ලි. හදිසි වෙලා ඕවා කරන්නට බැහැ. අපි සාකච්ඡා කරන්නට ඕනෑ. මේවාගේ දූෂණ එක තැනකය කියා මා පෙන්වන්නේ නැහැ. හැම තැනකම මේ තත්ත්වය තියෙනවා. මේක හදා ගන්නට ඕනෑ. අපි ලැහැස්තියි ඒක හරියට කරන්න.

ඔබතුමා ඇහුවා, රත්නපුර-පැල්මඩුල්ල අධිවේගී මාර්ගය ගැන. දැනට කර තිබෙන්නේ feasibility study එක පමණයි. Feasibility study report එකත් තවම එළියට ඇවිල්ලා නැහැ. ඒකට ගෙවීම් ටිකක් තිබෙනවා. ඒ feasibility වාර්තා හරියට සකස් කළාද කියලා මා දන්නේ නැහැ. නමුත් දැන් feasibility study report එකක් තිබෙනවා. ඉන් පසුව තමයි වන්දි ගෙවීම්, ඒ වාගේම ඒ තිබෙන අනෙක් වැඩ ටික කරන්න යන්නේ. නමුත් අනිවාර්යයෙන්ම අපි ඒක ඉදිරියේදී කරන්න බලාපොරොත්තු වෙනවා. මේ ලොකු කොන්ත්‍රාත්කාරයන්ට ගෙවන්න කලින් ඊට වඩා වැදගත් දෙයක් අපට කරන්න තිබෙනවා. දැනට මහාමාර්ග අමාත්‍යාංශය යටතේ පවරා ගත් ඉඩම්වලට වන්දි වශයෙන් රුපියල් බිලියන 40ක් ගෙවන්න තිබෙනවා. ඒ මුදල් ගෙවලා නැහැ. ඒකෙන් බහුතරයක් -වැඩි කොටසක්- පුංචි මිනිස්සුන්ගේ ඉඩම්. ලොකු ලොකු මිනිස්සුන්ට ගෙවීම් කරලා තිබෙනවා. නමුත් පුංචි මිනිස්සුන්ගේ ඉඩම්වලට වන්දි ගෙවලා නැහැ. මෙවර අපි භාණ්ඩාගාරයෙන් සල්ලි ඉල්ලා තිබෙන්නේ පුංචි මිනිස්සුන්ගේ වන්දි ගෙවන්න කියලායි. ඒ මිනිස්සුන්ගේ ඉඩම් බලෙන් ගත්තේ. පොලීසියෙන් දමලා, හමුදාව දමලා ඒ මිනිස්සුන්ගේ ගෙවල් කඩලා අයින් කළා. ඒවාට අපි වන්දි ගෙවනවා. ඒවාට ප්‍රමුඛත්වය දෙනවා. අපට වැදගත් වන්නේ කොන්ත්‍රාත්කාරයන්ට ගෙවන එක නොවෙයි; පුංචි මිනිස්සුන්ට උදවු කරන එකයි. මේ ඔක්කොම කරද්දී අපි දන්නවා, Highway Schedule of Rates - HSR - කියලා එකක් තිබෙන බව. ඒක වුණත් දැනට කිලෝ මීටරයක් හදන්න පුළුවන් ගණනත් වැඩි කරලායි හදලා තිබෙන්නේ. ඒ සාමාන්‍ය ගණන සියයට 30කින් වැඩි කරලා. ඒ rate එක උඩින් තව සියයට 30ක් ලාභයත් ගන්නවා. ඔක්කොම සියයට 40ක් ගන්නවා. එතකොට අර කොන්ත්‍රාත්කාරයාට යන ශුද්ධ ලාභය සියයට 60ක්, සියයට 70ක් වෙනවා. මේක හැම දාම කරන්න බැහැ. ඒ නිසා තමයි අපි මේවා හරියට බලලා ගෙවන්නේ. ප්‍රමාදයක් වෙනවා නම් වන්නේ, සංවර්ධනය හිර කරවන්න නොවෙයි; යහ පාලනය තහවුරු කරන්නයි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තූතියි, ගරු ඇමතිතුමා. මීළඟට ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.44]

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම මේ විවාදයේදී මූලිකවම කථා වුණු කාරණයක් තමයි අද ගම්වල ජීවනෝපාය සංවර්ධන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක නොවන බව. මොකද, පසු ගිය කාලයේ විශේෂයෙන්ම ගම්වල සමෘද්ධිලාභීන්ට, ඉතාමත්ම දුප්පත් - දිළිඳු- අයට ස්වයං රැකියාවක් කරන්න එහෙම නැත්නම් ජීවත් වීම සඳහා ආදායමක් ලබා ගන්න පුළුවන් වන විධියට විශාල වැඩසටහනක් ක්‍රියාත්මක කළා. සමහර අයට මහන මැෂින් දුන්නා. සමහර අයට වළං ආදිය හදන ආම්පන්න දුන්නා. අපේ ප්‍රදේශයේ අයට කිතුල් ගස් මදින්න අවශ්‍ය කරන උපකරණ සැපයුවා. ඒ වාගේම කුඩා කර්මාන්ත, අත් කර්මාන්ත කරන අයට අවශ්‍ය දේවල් සැපයුවා. ඒ වාගේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වුණා. ඒ එක්කම මැතිවරණය ආවාට පස්සේ කළේ මොකක්ද? මැතිවරණ කොමසාරිස්වරයා විසින් ඒ වැඩ පිළිවෙළ නැවැත්වුවා. නවත්වලා ඒ සියලු දෙනාටම කිව්වා මැතිවරණයෙන් පස්සේ ඒවා ලබා ගන්න පුළුවන් කියලා. සමෘද්ධි සංවර්ධන නිලධාරින්ගේ හා ප්‍රාදේශීය ලේකම්ගේ අධීක්ෂණය යටතේ, ඒ ඒ අයගේ නිපුණතාවන් අනුව, දක්ෂකම් අනුව, ඒ අයගේ සමාජ මට්ටම බලලා තමයි ඒවා දෙන්න තීන්දු කළේ. නමුත් දැන් වෙලා තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රාදේශීය නායකයෝ, ප්‍රාදේශීය නියෝජිතයෝ අද ඒවා දිගට හරහට බෙදනවා. අහු වුණු අහු වුණු එක්කෙනාට බෙදනවා. සමහර විට යම්කිසි කර්මාන්තයකට නියමිත උපකරණ ඒ කර්මාන්තය ගැන කිසිම දැනුමක් නැති අයට දෙනවා. අද ගම්බද ප්‍රදේශවල ඒ විධියේ විශාල අවුල් සහගත තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා තමයි, ගරු විපක්ෂ නායකතුමා එතුමාගේ කථාවේදී පැහැදිලි කළේ මේ වැඩ පිළිවෙළ නිවැරදි කරන්න, එහෙම නැත්නම් මේකෙන් කිසිම කෙනකුට කිසිම ප්‍රයෝජනයක් අත් වෙන්නේ නැහැයි කියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහාමාර්ග විෂය භාර ඇමතිතුමාට මම මෙහිදී විශේෂයෙන් එක කරුණක් කියන්න ඕනෑ. අපි කිසිම අවස්ථාවක කියන්නේ නැහැ, දූෂිත ආකාරයට වැරදි ආකාරයට යම් කිසි පාරක්, එහෙම නැත්නම් එවැනි යටිතල පහසුකම් ඉදි කිරීමක් කරන්න කටයුතු කර තිබෙනවා නම් ඒ අයට මුදල් ගෙවන්න කියලා. ඒක නොවෙයි අපේ පරමාර්ථය. ඒ විධියට දූෂිත ක්‍රමයට යම්කිසි කර්මාන්තයක් කර තිබෙනවා නම්, එහෙම නැත්නම් ඒ කර්මාන්තය වෙනුවෙන් අය විය යුතු මුදල් වැඩියෙන් ලබා ගන්න කටයුතු කර තිබෙනවා නම් මහජන මුදලින් ඒවා ගෙවන්න කියලා අපි රජයට කියන්නේ නැහැ. නමුත් අපි එකක් පිළිගන්න ඕනෑ. පසු ගිය අවුරුදු හය, හත තිස්සේ මේ රටේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ විශාල වැඩ පිළිවෙළක් තිබුණා. යන්න එන්න පාරක් නැති ප්‍රදේශවල පාරවල් හැදුණා. ගම්වල පාරවල්වලට කොන්ක්‍රීට් ලැබුණා. ඒ වාගේම ප්‍රධාන පාරවල් කාපට් කෙරුණා.

මේවා නැහැ කියලා කාටවත් කියන්න බැහැ. මේවා කෙරුණා. මේ අතරතුරේ යම් යම් දූෂණ කටයුතු සිද්ධ වුණා වෙන්න පුළුවන්. ඒ දූෂණ කටයුතු මොනවාද කියන එක හොයලා ඒවායින් මහජන මුදල් බේරා ගැනීම, ඒ වාගේම ඒ දූෂණ කටයුතු කළ අයට ලාභයක් නොලැබෙන විධියට කටයුතු කිරීම රජයේ වගකීමක්. ඒ ගැන කටයුතු කරනවා නම් ඒක හරි. නැත්නම් කියලා -ප්‍රකාශ කරලා- පමණක් නවත්වා ඇති වැඩක් නැහැ.

මා විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, මේ ආණ්ඩුව බලයට ආවාට පස්සේ ඒ ප්‍රදේශවල ක්‍රියාත්මක වුණු සියලුම වැඩ අද නතර වෙලා තිබෙන බව. ඒක තමයි අද අපේ දුක්ගැනවිල්ල. මොකද, ජනතාව ඇවිල්ලා ඒ ගොල්ලන්ගේ දුක්ගැනවිලි කියන කොට අපට විසඳුමක් නැති තත්ත්වයකට අද පත් වෙලා තිබෙනවා. අපේ ගම්වල කිසිම ප්‍රදේශයක අර එදා තිබුණු වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. පාරවල්වල වැඩ නතර වෙලා. පාලම්වල වැඩ නතර වෙලා. ඒ වාගේම ඉදි කිරීම නතර වෙලා. මේ වැඩ -මේ ව්‍යාපෘති- නතර වුණා පමණක් නොවෙයි, ඒ ව්‍යාපෘතිවලින් ජීවත් වුණු, ඒවා තුළ රක්ෂාව කළ උදවියට අද ජීවත් වෙන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා දන්නවා විශේෂයෙන්ම මෙසන් බාස්වරුන්ට, ඒ

[ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා]

වාගේ කර්මාන්ත කළ අයට අද ගම්වල කිසිම වැඩක් නැති බව. කිසිම තැනක ඒ කර්මාන්ත කෙරෙන්නේ නැහැ. මේ තත්ත්වය අද පැහැදිලිව දකින්න තිබෙනවා.

පසු ගිය කාලයේ අපේ රජය පාලම් 1000 වැඩසටහන කියලා වැඩසටහනක් ක්‍රියාත්මක කළා. මා හිතන හැටියට රත්නපුර දිස්ත්‍රික්කය තුළ පමණක් පාලම් 40ක හෝ 50ක වැඩ ආරම්භ වුණා. එයින් පාලම් තුන හතරක වැඩ පසු ගිය කාලයේ නිම කරලා ඒවා විවෘත කරන්නත් අපට පුළුවන්කම ලැබුණා. අනෙක් පාලම්වලින් සමහර ඒවායේ වැඩ අතරමග නතර වෙලා තිබෙනවා. සමහර ඒවා මුල් ගල් තැබූ තත්ත්වයෙන්ම තවම තිබෙනවා. එතකොට මේ වාගේ තත්ත්වයක් ඇති වුණාම ගම්වල මිනිසුන් තුළ ඇති වන අදහස මොකක්ද? "තමුන්නාන්සේලාත් ගිහිල්ලා මේ ආණ්ඩුවට උදවු කරනවා, තමුන්නාන්සේලාත් ඡන්දය දෙනවා. නමුත් අපට යන්න තිබෙන පාර හදා ගන්නවත් මේ රජය හරහා බැරි වෙලා තිබෙනවා. අපි කාලයක් තිස්සේ ඉල්ලා තිබුණු පාලම හදා ගන්නවත් අද බැරි වෙලා තිබෙනවා" කියන චෝදනාවට අපිත් ලක් වෙනවා. අන්න ඒ නිසා තමයි අපි මේ කාරණය මේ ගරු සභාවට ඉදිරිපත් කරලා සාකච්ඡා කරන්න මේ වාගේ විවාදයක් ඉල්ලුවේ.

විශේෂයෙන් මා නියෝජනය කරන රත්නපුර මැතිවරණ කොට්ඨාසයේ, කිලෝමීටර් 25ක් "iRoad" ව්‍යාපෘතිය යටතේ කාපට් කරන්න තිබෙනවා. ඒක ලෝක බැංකුවෙන් මුදල් ලැබෙන ව්‍යාපෘතියක්. ඒ කිලෝමීටර් 25ම ප්‍රධාන පාරවල්. නමුත් අද ඒ ව්‍යාපෘතිය නතර වෙලා තිබෙනවා. මා දන්නේ නැහැ, ඒක අනාගතයේදී කෙරෙයි ද කියලා. යම් යම් තැන්වලින් අපි ප්‍රශ්න කළාම අපට දන්වනවා, මේක අනාගතයේදී කෙරෙනවා කියලා. නමුත් කවදා මේක කෙරෙනවා ද කියලා අපි දන්නේ නැහැ. අද ජනතාව මේවා බලාපොරොත්තු වනවා. ගම්වල පාරවල් කාපට් කිරීම පසු ගිය දවස්වල අපි ආරම්භ කළා. ඒ කාපට් කිරීම නිසා අද මිනිස්සු ඉතාම පහසුවට ලෙහෙසියට ඒ පාරවල්වල ගමන් කරනවා. එවැනි පාරවල් නැති ප්‍රදේශවල අයත් අද බලාපොරොත්තු වනවා ඒ ගොල්ලන්ගේ පාරවල් දියුණු කරලා කාපට් කර ගන්න. මේවා නොලැබෙන කොට ජනතාව අසහනයට පත් වීම වැඩි වෙනවා. අන්න ඒකයි අපි කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රත්නපුරයේ මැතිවරණ කොට්ඨාස අටක් තිබෙනවා. ඒ මැතිවරණ කොට්ඨාස අටේම පාරවල්වල වැඩ නතර වුණු ස්වභාවයක් දකින්න තිබෙනවා. ඒ විතරක් නොවෙයි. පසු ගිය කාලයේ අධ්‍යාපන අමාත්‍යාංශය පාසල්වල විද්‍යාගාර ඉදි කළා. ඒ විද්‍යාගාරවලින් විද්‍යාව, ගණිතය, ඉංග්‍රීසි, තොරතුරු තාක්ෂණය කියන විෂයයන් උගන්වන්න අවශ්‍ය පහසුකම් සැලසීමයි කළේ. තෝරා ගත්ත පාසල්වල ඒ විද්‍යාගාරවලින් කිහිපයක් අද විවෘත කරලා ඒ විෂයන් ඉහළ මට්ටමකින් -ඉතාම හොඳින්- ඉගැන්වීමේ කටයුතු කරනවා. නමුත් විද්‍යාගාර 30ක් පමණ තවම විවෘත කරන්න බැරි වෙලා තිබෙනවා. ඒවාට අවශ්‍ය උපකරණ ලැබිලා නැහැ. ඒක ඉතාම පාපයක්. මොකද, අර ඉගෙනීම ලබන දරුවන්ගේ වයස යාම නවතින්නේ නැහැ. දේශපාලන වෙනස්කම් ඇති වුණා කියලා ඒවා නවතින්නේ නැහැ. ඔය කියන විශේෂ විෂයන්ගෙන් ඒ අයට වඩා හොඳ අධ්‍යාපනයක් ලබා ගැනීමට අවස්ථාව සලස්වා දෙන්නට ඕනෑ.

කුරුවිට නගරය කියන්නේ අවිස්සාවේල්ල - රත්නපුර මාර්ගයේ තිබෙන ප්‍රධාන උප නගරයක්; විශාල ජනකායක් ගැවසෙන ඒ වාගේම විශාල කඩ සාප්පු තිබෙන නගරයක්. මේ නගරය සංවර්ධනය කරන්න පසු ගිය දවස්වල පාර අයිනේ තිබුණු ගොඩනැඟිලි කඩලා, ඒ වාගේම පාරවල් කඩලා, අලුතින් කානු පද්ධතියක් ආරම්භ කරන්න කටයුතු කරලා වැඩ ආරම්භ වුණා. පසු ගිය කාලය තුළ වැඩ ආරම්භ වුණත් දැන් කිසිම දෙයක් කෙරෙන්නේ නැහැ. මේක ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මොකද, තිබුණු පහසුකම්වත් දැන් කුරුවිට මිනිස්සුන්ට නැහැ. කුරුවිට නගරයට යන එන, කුරුවිට නගරය පාවිච්චි කරන අයට අද ඒ පහසුකම් ඇත්තේම නැහැ. ඒ නිසා ඒ ගැන අවධානය යොමු කරන්න කියලා මා ඉල්ලනවා.

අද අපි මේ ප්‍රශ්නය යොමු කළේ එක අමාත්‍යාංශයක තිබෙන වැඩ කටයුතු සම්බන්ධයෙන්ම නොවෙයි, පොදු ප්‍රශ්නයක් වශයෙන්. ඒ නිසා මේ වෙලාවේ ඇමතිවරු දෙදෙනෙක්, තුන් දෙනෙක් හෝ මේ ගරු සභාවේ සිටියා නම් හොඳයි කියලා මා හිතනවා. මේ කාර්යයන් අයත් වෙන්නේ නාගරික සංවර්ධන අමාත්‍යාංශයට. නාගරික සංවර්ධන අමාත්‍යතුමා හෝ නියෝජ්‍ය ඇමතිතුමා දැන් මේ ගරු සභාවේ සිටින බවක් පෙනෙන්නේ නැහැ. කොහොම නමුත් මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ, කුරුවිට නගරයේ සංවර්ධන වැඩ කටයුතු ඉතා ඉක්මනට නැවත ආරම්භ කරලා නිම කිරීම ඉතා අවශ්‍යයි කියන එක.

රත්නපුර නගරයේ 1,500කට 2,000කට විතර වාඩි වෙන්න පුළුවන් අන්දමේ පහසුකම් සහිත, ආසන සහිත රැස්වීම් ශාලාවක්-

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත වෙලාව අවසන්.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
තව විනාඩි දෙකක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

දැයට කිරුළ වැඩසටහන යටතේ රත්නපුර නගරයේ විශාල රැස්වීම් ශාලාවක් ඉදි කරන්න අවශ්‍ය පියවර ගත්තා. ඉඩමක් හඳුනාගෙන ඒ කටයුතු කරනකොට තමයි පසු ගිය ජනාධිපතිවරණය ආවේ. ඒ කාර්යයත් නැවත ආරම්භ කරන්න කියලා මා ඉල්ලනවා.

ඒ වාගේම රක්වාන, කොළොන්න වැනි ආසනවල යටිතල පහසුකම්වල ඉතා විශාල අසතුටුදායක තත්ත්වයක් තිබෙනවා. ඒවා දියුණු කරන්න වැඩ ආරම්භ කරලා තිබෙනවා. පාරවල් ගණනාවක් හදලා තිබෙනවා. අනෙක් ඒවා බාගෙට හදලා තිබෙනවා. මේ සියල්ලේම කටයුතු ඉතා ඉක්මනින් අවසන් කරන්න කියලා ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 4.54]

ගරු නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මැතිතුමා කථාව නවත්වපු තැනින් මගේ කථාව ආරම්භ කරන්නට අදහස් කරනවා. විශේෂයෙන්ම පසු ගිය රජය කාල සීමාව තුළ රටේ ග්‍රාමීය සංවර්ධනය සහ ගම තුළ මුදල් සංසරණය වීම අප බොහෝ විට දැකපු කාරණයක්. රටේ හැම ගමකම, හැම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම, හැම ග්‍රාම නිලධාරි වසමකම සංවර්ධන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වුණා. එදා අමාත්‍යාංශ තුළ තිබුණු ප්‍රතිපාදන එක ප්‍රදේශයකට, එක ආසනයකට, එක දිස්ත්‍රික්කයකට සීමා වන්නේ නැතිව, රටේ හැම ගමකටම ව්‍යාප්ත වෙන්න පටන් ගත්තා. ගමේ බෝක්කු, ඇළ වේලි, වැව් අමුණු, ප්‍රජා ශාලා, බහුකාර්ය ගොඩනැඟිලි ආදී මේ බොහොමයක් දේවල් සංවර්ධන වෙනවාය කියන බලාපොරොත්තුව අපේ දෙමව්පියන් සහ දරුවන් තුළ තිබුණා.

අධිවේගී මාර්ග, මහා මාර්ග ඇතුළු මහා දැවැන්ත සංවර්ධන ව්‍යාපෘති වාගේම, පාසල් සංවර්ධන යෝජනා ක්‍රම යටතේ හැම පාසලකම වැසිකිළි කැසිකිළි සංවර්ධනය කිරීමේ වැඩ පිළිවෙළ එදා ආරම්භ කළා. මැතිවරණයෙන් පස්සේ මේ බොහෝ ව්‍යාපෘති නතර වෙලා තිබෙන බව අපි දැක්කා.

අපේ ගරු මහා මාර්ග අමාත්‍යතුමා මහා පරිමාණයේ ව්‍යාපෘතිවල කටයුතු නතරවීම ගැන කථා කළා. හැබැයි, ප්‍රාදේශීය මට්ටමින් බැලුවත් බොරළු දමා තලන ගමේ පටු පාරේ පටන් මහා පරිමාණ ව්‍යාපෘති දක්වාම සංවර්ධනය නතර වෙලා තිබෙනවා. සංවර්ධන කටයුතු නතරවීම කියන කාරණය දෙස පාරවල් හැදීමට පමණක් සීමා වෙන්නේ නැතිව පුළුල්ව බැලුවොත්, ඒ තුළින් සෘජු හා වක්‍ර රැකී රක්ෂා කරපු අයගේ -ගමේ යම්කිසි වෙළෙඳාමක් කරපු අයගේ, ගමේ යම්කිසි ව්‍යාපාරයක් කරපු අයගේ- ආර්ථිකයට යම්කිසි පහරක් වැදිලා තිබෙනවාය කියන එක ඔබ, අප කවුරුත් පිළිගත යුතු කාරණයක්. අපේ ගරු හර්ෂ ද සිල්වා නියෝජ්‍ය ඇමතිතුමා දැන් මේ ගරු සභාවේ ඉන්නවා. එතුමා දන්නවා, ගම තුළ මුදල් සංසරණය වුණාම තමයි ගමේ ආර්ථිකය දියුණු වෙන්නේ කියන එක. ගමට මුදල් ගියාම තමයි ගමේ ඉන්න දෙමව්පියන්ගේ ආර්ථිකය වර්ධනය කරන්න පුළුවන් කියන බලාපොරොත්තුව අපට ඇති කරගන්න පුළුවන් වෙන්නේ.

ගරු ඇමතිතුමා මානව සම්පත් සංවර්ධනය පිළිබඳවත් කථා කළා. අපි ඉතාම ආඩම්බරයෙන් ඒ ගැන කථා කරනවා. අපේ හිටපු අධ්‍යාපන ඇමති බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා දැන් මේ ගරු සභාවේ ඉන්නවා. මහින්දෝදය විද්‍යාගාර, තාක්ෂණ විද්‍යා පීඨ ගැන කථා කරනවා නම්, රටේ අනාගත මානව සම්පත වන ගමේ පාසල් දරුවන් සංවර්ධනය කරන්න තමයි එදා රජයෙන් මහින්දෝදය විද්‍යාගාර අපි පටන් ගත්තේ. එදා තාක්ෂණ විද්‍යාගාර, තාක්ෂණ විද්‍යා පීඨ අපි ආරම්භ කළේ ඒ නිසායි. හැබැයි, අද ඒවායේ වැඩ කටයුතු අක්‍රිය වෙලා තිබෙන බවක් අපට පෙනෙන්න තිබෙනවා; අපට ඇහෙන්න තිබෙනවා. ඒ වාගේම සමාජය තුළ ඒ පිළිබඳව කතිකාවතක් ගොඩ නැඟී තිබෙනවා. අනික් අතට ජීවන නිපුණතා සංර්ධනය සඳහා, ස්වයංරැකියා සඳහා ගමට ගිය මුදල්, ව්‍යවසායකයන් බිහි කරන්න ගමට ගිය මුදල් පසු ගිය කාල සීමාව තුළ නතර වුණ බවක් අපි දකිනවා. මහා පරිමාණ කොන්ත්‍රාත්කරුවන්ට ලැබෙන මුදල් ගැන නොවෙයි අපි කථා කරන්නේ. හැබැයි, සෘජු හා වක්‍රව ඔවුන්ගෙන් යැපෙන පිරිසක් ඉන්නවා. ඔවුන්ගෙන් subcontracts ගත්ත කොට්ඨාසයක් ඉන්නවා. ඒ වාගේම ඒ මුදල්වලින් යැපෙන කොටසක් ගමේ ඉන්නවා. ගමේ කඩේ ප්ලෙන්ටියක් විකුණපු කෙනෙකුගේ, බත් පැකට් විකුණපු කෙනෙකුගේ ආර්ථිකය කඩාගෙන වැටිලා තිබෙන කොට, අපේ පාක්ෂිකයන් හැටියට ඔවුන් ඇවිත් අපිත් එක්ක ඒ පිළිබඳව කථා කළාම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ උත්තරීතර සභාව තුළ ඒ පිළිබඳව කථා කරන්න අපට අයිතියක් තිබෙනවා. ඒ ගැන අපට අවංක වුවමනාවක් තිබෙනවා.

අනෙක් පැත්තෙන් ගත්තාම, අද පෞද්ගලික අංශයේ ආයතනවල ආදායම් අඩු වෙලා, රැකියා අහිමි වන තත්ත්වයක් ඇති වෙනවා වාගේම, රාජ්‍ය ආයතනවලත් දේශපාලන හේතු මත රැකියා අහිමි වන බොහෝ පිරිසක් ඉන්නවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේම අමාත්‍යාංශය යටතේ ඇති RDA එකේ කොන්ත්‍රාත් පදනම මත වැඩ කරපු එකසිය හැට දෙදෙනෙක් පසු ගිය කාලයේ උද්ඝෝෂණයක් කළා; building එක උඩටත් නැඟලා හිටියා. මා හිතන හැටියට ඒවා පිළිබඳව සානුකම්පිකව බැලුවොත් හොඳයි. මොකද, අද විපක්ෂය පැත්තේ වාඩි වෙලා ඉන්න අපේ ගරු මන්ත්‍රීතුමන්ලා ආණ්ඩු කරපු කාලයේ එදා විපක්ෂය පැත්තේ හිටපු ගරු මන්ත්‍රීතුමන්ලා දාපු අයත් ඒ අතර හිටියා. හැබැයි, කිසි දවසක පක්ෂයකින් හෝ නායකයන්ගෙන් පළිගන්න ආයතනයක වැඩ කරපු කෙනෙක් දේශපාල වශයෙන් මාරු කරන්න එදා උත්සාහ කළේ නැහැ. වෘත්තීය සමිතිවලට බලපෑම් කරන්න එදා උත්සාහ කළේ නැහැ. අද CTB එක ගත්තත්, දුම්රිය දෙපාර්තමේන්තුව ගත්තත් එම වෘත්තීය සමිති යම් කිසි මර්දනයකට, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට වැඩ කළ වෘත්තීය සමිති සාමාජිකයන් කලකිරීමට පත්වන ආකාරයට දේශපාලන පළි ගැනීමකට ලක් වෙලා තිබෙනවාය කියලා මා මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. තමුන්නාන්සේලා යහ පාලනය ක්‍රියාත්මක කරන්න. ඒ ගැන අපේ විරුද්ධත්වයක් නැහැ. හැබැයි, යහ පාලනය ක්‍රියාත්මක කරන මුවාවෙන් ගමේ සංවර්ධනය අඩාල කරන්න එපා, ගමේ ආර්ථිකය අඩාල කරන්න එපා කියන ඉල්ලීම තමයි අපි තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටින්නේ. ස්තූතියි.

[අ.භා. 4.59]

ගරු ගීතාංජන ගුණවර්ධන මහතා
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංවර්ධන කටයුතු පිළිබඳව රටේ ඇති වී තිබෙන අවිනිශ්චිත තත්ත්වය සහ ඒ ඒ ව්‍යාපෘති පිළිබඳව ඇති වී තිබෙන ආන්දෝලනයත් නිසා සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ලෙස අද ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අප නියෝජනය කරන කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රදේශවල සංවර්ධනය සඳහා රුපියල් මිලියන 4,813ක් වෙන් වුණා. "ගම නැඟුම" එක් ගමකට එක වැඩසටහන යටතේ රුපියල් මිලියන 660ක්, "ගම නැඟුම" වැඩසටහන යටතේ රුපියල් මිලියන 663ක්, ග්‍රාමීය පාසල්වල සනීපාරක්ෂක කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 90ක්, මහජන නියෝජිතයන්ගේ සංවර්ධන යෝජනා වෙනුවෙන් රුපියල් මිලියන 350ක්, විමධ්‍යගත අය වැය සඳහා රුපියල් මිලියන 100ක් හා පළාත් නැඟුම සඳහා රුපියල් මිලියන 2,232ක වෙන් කිරීමක් 2014.04.02වැනි දා දාතමින් නිකුත් කළ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ තිබුණා.

ඊට අමතරව "දිවි නැඟුම" වැඩසටහන යටතේ රුපියල් මිලියන 300ක්, ගොවිජන සේවා සංවර්ධන වැඩ කටයුතු සඳහා තවත් රුපියල් මිලියන 28ක්, පළාත් සහකාර කොමසාරිස් හරහා මේ ආශ්‍රිත ගම්මානවල පළාත් මාර්ග සංවර්ධනය සඳහා රුපියල් මිලියන 390ක් වෙන් වුණු චක්‍රලේඛයක් තුළින් තමයි අපි ඒ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කළේ.

බන්දුල ගුණවර්ධන මැතිතුමාත් මමත් එදා සම සභාපතිවරුන් හැටියට පාදුක්ක සංවර්ධන කමිටුවේ හිටියා. අපේ දිස්ත්‍රික්කයට වෙන් වුණු මුදලින් අපේ සංවර්ධන කමිටුවට රුපියල් මිලියන 145.4ක් ලැබුණා. සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙනුවෙන් රුපියල් මිලියන 277ක් ලැබුණා. ඒ අනුව අවිස්සාවේල්ල ආසනයට රුපියල් මිලියන 423ක් ලැබුණා. මම ඒ ගැන දීර්ඝව කියන්න කැමැති නැහැ. ඒ තුළත් ඒ ප්‍රභේදයන් අනුව, විශේෂයෙන්ම ඒ කොට්ඨාස දෙකේ සංවර්ධන ක්‍රියාවලිය දිගින් දිගටම අප ගෙන ගියා. මම විශේෂයෙන්ම මතක් කරන්නට ඕනෑ, ඒ තුළ ප්‍රධාන අධ්‍යාපන ව්‍යාපෘතීන් සඳහා දැවැන්ත ආයෝජනයක් පාදුක්ක සහ සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙක තුළ සිදු කළ බව. වග, රතනසාර විද්‍යාලයට රුපියල් මිලියන 10ක්, බෝපේ රාජසිංහ මහා විද්‍යාලයට රුපියල් මිලියන 10ක්, බෝපේ රාජසිංහ ප්‍රාථමික විද්‍යාලයට රුපියල් මිලියන 10ක්, පාදුක්ක සිරි පියරතන මධ්‍ය මහා විද්‍යාලයට රුපියල් මිලියන 10ක්, කහහේන, බොරලුගොඩ විද්‍යාලයට රුපියල් මිලියන 10ක්, කළුඅග්ගල ශාන්ත ජෝන් බොස්කෝ විද්‍යාලයට රුපියල් මිලියන 10ක්, සීතාවක රාජසිංහ මධ්‍ය මහා විද්‍යාලයට රුපියල් මිලියන 5.3ක් සහ හංවැල්ල රාජසිංහ මධ්‍ය මහා පාසලට රුපියල් මිලියන 5.3ක් යන ආකාරයට මුදල් වෙන් කරන්න අපට හැකියාව ලැබුණා.

අද වන විට අධ්‍යාපනය සම්බන්ධයෙන් ව්‍යාපෘති සඳහා පමණක් රුපියල් මිලියන 100කට වඩා අවිස්සාවේල්ල ආසනය

[ගරු ගීතාංජන ගුණවර්ධන මහතා]

තුළ මුදල් වෙන් කරලා තිබෙනවා. පළාත් සභාව හරහා, පළාත් ලේකම් හරහා, පළාත් අධ්‍යක්ෂ හරහා, අධ්‍යාපන ඉංජිනේරුවන් හරහා එම ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කරලා එම ව්‍යාපෘතීන් ආරම්භ කරලා තිබෙනවා. බොහෝ දුරට අද වන විට එම සංවර්ධන ව්‍යාපෘතීන්වල ප්‍රගතිය සියයට 80 ඉක්මවා ඇති බව වාර්තා වෙලා තිබෙනවා. එයින් ව්‍යාපෘති දෙකක් අද වන විට සම්පූර්ණ වෙලා තිබෙනවා. නමුත්, එහි ගෙවීම් තවමත් සම්පූර්ණ වෙලා නැහැ. ඒ සම්බන්ධයෙනුයි මම මෙම ඉල්ලීම කරන්නේ. ඒවා ආරම්භ කරලා, ඒවායේ ප්‍රගතිය අධීක්ෂණයක් යටතේ දිගටම සිදු වෙලා තිබියදී, අද වන විට මෙම සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව ශ්‍රී ලංකා ජාතික ඉදි කිරීම් සංගමය යටතේ කොන්ත්‍රාත්කරුවන්ගේ සංගමය විසින් මේ වියදම් නොලැබීම පිළිබඳ කාරණාව නිරාකරණය කර දෙන්න කියලා ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා ඇමතිතුමාට පෙබරවාරි 24 වෙනිදා දැනුම් දීලා තිබෙනවා. ඒ අනුව, එම ව්‍යාපෘති සම්පූර්ණ කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දුන්නොත් ඔවුන්ට නැවත එම ව්‍යාපෘති පටන් ගන්නට හැකි බව දැනුම් දීලා තිබෙනවා. එහි තිබෙන අවිනිශ්චිතභාවය, බස්නාහිර පළාතේ කොන්ත්‍රාත්කරුවන් 48 දෙනකු විසින් කියා තිබෙනවා.

ශ්‍රී ලංකා ජාතික ඉදි කිරීම සංගමයේ බස්නාහිර පළාත් සංගමයේ සභාපති, පන්තක දාබරේ ඉදිරිපත් කරපු මෙම ඉල්ලීම් සම්බන්ධව විශේෂයෙන්ම අවධානයට ගන්න ඕනෑ. මා එහෙම කියන්නේ, එම අධ්‍යාපන ව්‍යාපෘතීන් සියයට 80කට වඩා ප්‍රමාණයක් වැඩ සම්පූර්ණ කරන ලද පාසල් නිසායි. විශේෂයෙන්ම, ප්‍රදේශය හැටියටත්, ඒ වාගේම පළාත හැටියටත් මෙම කටයුතු සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන්න ඕනෑ.

වැඩ ආරම්භ කරලා ප්‍රමිතියට වැඩ අවසන් කරපු එම ව්‍යාපෘතීන් සම්පූර්ණ කිරීමටත්, මහජන අවශ්‍යතාවට ඒවා යොමු කර ගැනීමටත් අවශ්‍ය වනවා. අප ඉල්ලා සිටින්නේ, මෙම මුදල් නිදහස් කරන බවට අවශ්‍ය උපදෙස ඔවුන් වෙත ලබා දෙන්න කියලා. එවිට මෙම ව්‍යාපෘතීන් අවසන් කරන්න පුළුවන් වෙනවා. එම උපදෙස නැතිව ඔවුන්ට එය ආරම්භ කරන්න බැහැ. දිස්ත්‍රික් ලේකම්වරයා හරහා එම උපදෙස ලබා දුන්නොත්, පළාත් ලේකම්වරයා හරහා එම උපදෙස ලබා දුන්නොත් ඔවුන් ලැහැස්තියි, එම ව්‍යාපෘති නැවත ආරම්භ කරන්න. බොහොම ස්තූතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තූතියි ගරු මන්ත්‍රීතුමනි.

මීළඟට, ගරු ටී.බී. ඒකනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.06]

ගරු ටී. බී. ඒකනායක මහතා
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කුරුණෑගල දිස්ත්‍රික්කයේ මා නියෝජනය කරන යාපහුව මැතිවරණ කොට්ඨාසය තමයි විශාලත්වයෙන් වැඩිම මැතිවරණ කොට්ඨාසය. පසු ගිය රජයේ ආරම්භ කරන ලද ව්‍යාපෘතීන්වලින් එකක් තමයි මහව දුම්රිය මං සන්ධිය ව්‍යාපෘතිය. එක පැත්තකින් ත්‍රිකුණාමලයටත්, එක පැත්තකින් මඩකළපුවටත්, එක පැත්තකින් යාපනය දිසාවටත් යා හැකි මාර්ග බෙදී ඇති එම මං සන්ධියේ ගුවන් පාලමක් සඳහා අපි ටෙන්ඩර් කරලා, ටෙන්ඩර් ප්‍රදානය කරලා, පස් පරීක්ෂා කරලා වැඩ පටන් ගත්තා. නමුත් අද වන විට මහව ගුවන් පාලමේ වැඩ නැවතිලා තිබෙනවා. ඒ වාගේම නාගරික සංවර්ධන අධිකාරියේ සෘජු මැදිහත්වීම යටතේ මහව නගරය සැලසුම් සහගත නගරයක් ලෙස ක්‍රියාත්මක කිරීමේ වැඩ පිළිවෙළ අද නැවතිලා තිබෙනවා.

විශේෂයෙන් කාපට් පාරවල් පිළිබඳව පසු ගිය අවස්ථාවේ අපේ මන්ත්‍රීවරුන් පැහැදිලි කළා. ආරම්භ කළ ව්‍යාපෘති රාශියක පාලම් ටික සාදා, තැලවිලි ටික සාදා අවසන් වී තිබෙනවා. නමුත් ඒ මාර්ගවලින් පීල්ල - කාසිකොටේ මාර්ගය, තම්බුව - හෙනව - මොරොත්ත මාර්ගය, කෝන් වැව - මොරගස් වැව මාර්ගය, විලව - කුඹුක් වැව මාර්ගය යනාදි මාර්ග විතරක් නොවෙයි, රත්මලේ, බක්මී වැව සහ අඹගස් වැව මාර්ගවල වැඩ කටයුතුත් අද වන විට නැවතිලා තිබෙනවා. අපේ මහා මාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන විෂය භාර අමාත්‍යතුමා කිව්වා වාගේ මේවා ටෙන්ඩර් කර, එම ටෙන්ඩර් විධිමත්ව ප්‍රදානය කර, ගිවිසුම් අත්සන් කර ලබා දුන්න ව්‍යාපෘති. මේවා රටේ ජනතාවට ඉතාම වැදගත් වන ව්‍යාපෘති. දැන් මෙම ව්‍යාපෘති නැවතිලා තිබෙනවා.

මහව නගර ශාලාව ගැන සඳහන් කරනවා නම් එය සම්පූර්ණයෙන් ඉදිකර අවසන්. දැන් එම ගොඩනැඟිල්ලේ දොර, ජනෙල් සවි කරන්න පමණයි තිබෙන්නේ. එම ගොඩනැඟිල්ලේ අනිකුත් සියලු කටයුතු අවසන් වෙලා තිබෙනවා. නමුත් එහි වැඩ නවත්වා තිබෙනවා. වැඩ නැවැත්වීමට කොළඹින් නියෝග යවා තිබෙනවා.

වැව් සම්බන්ධව කථා කරනවා නම් පසු ගිය කාලයේ වර්ෂාවෙන් පසුව ආරම්භ කළ වැව් රාශියක කටයුතු නවත්වන්නය කියා ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට දන්වා තිබෙනවා. එසේ නැවැත්වීම තුළ එක පැත්තකින් කොන්ත්‍රාත්කරුවන් අපහසුතාවට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම අනිත් පැත්තෙන් ගොවීන් අපහසුතාවට පත් වෙලා තිබෙනවා. මොකද, භාගෙට කැපූ වැව්වල සොරොව් ගලවා, වාන ගලවා තිබීම නිසා ඒවා ක්‍රියාත්මක කරන්න විධියක් නැතුව තිබෙනවා. ඒ වාගේම හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ගිහින් දැදුරු ඔය ව්‍යාපෘතිය විවෘත කළා. එය අංග සම්පූර්ණ කළ ව්‍යාපෘතියක්. හැබැයි, එහි වම් ඉවුර ඇළ මාර්ගයේ සහ දකුණු ඉවුර ඇළ මාර්ගයේ වැඩ කර ගෙන ගිය එක නවත්වා තිබෙනවා. එසේ නැවැත්වීමත් එක්ක එහි ප්‍රවේශ වෙන මාර්ගවලින් ගමන් කරන මාර්ගවල යන්න බැරි තත්ත්වයක් මතුවී තිබෙනවා. එම නිසා දැදුරු ඔය ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කරන වැඩසටහන ලොකු අර්බුදයකට පත් වෙලා තිබෙනවා.

වර්තමාන ජනාධිපති අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින්ම ක්‍රියාත්මක කළ මොරගහකන්ද වාරි ව්‍යාපෘතියෙන් අපේ වයඹ පළාතේ යාපහුව, නිකවැරටිය, ගල්ගමුව සහ ආනමඩුව යන මැතිවරණ කොට්ඨාසවලට ජලය ලබාදීම සඳහා මොරගහකන්දෙන් වැව්මැඩිල්ලෙන් ජලය ලබා ගැනීමේ ව්‍යාපෘතියට අදාළ ආරම්භක වැඩ පිළිවෙළ සඳහා පොල්පිතිගම පොලීසිය අසළ ඒ ව්‍යාපෘති කාර්යාලය පටන් ගත්තා. මම ඒ සඳහා අවශ්‍ය ඉඩම ලබා දුන්නා. එහි අත්තිවාරම් දමා අවසානයි. කණු උස්සා තිබෙනවා. නමුත් ඒ කටයුතුත් නවත්වන්න කියා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසා මේවා පිළිබඳව රජයක් විධියට සොයා බලා, නීත්‍යානුකූලව ක්‍රියාත්මක කළ මේ අතිවිශාල සංවර්ධන වැඩසටහන ආරම්භ කිරීමට අවශ්‍ය නියෝගය ලබා දීමත්, ගෙවීම් කිරීමට අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කිරීමත් සම්බන්ධව අවධානයෙන් කටයුතු කරන්නය කියන ඉල්ලීමත් මේ අවස්ථාවේදී කරන්න කැමැතියි. බොහොම ස්තූතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තූතියි, ගරු මන්ත්‍රීතුමනි. මීළඟට, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.10]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - கொள்கை உருவாக்கம், பொருளாதார அலுவல்கள், சிறுவர், இளைஞர் மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)

(The Hon. (Dr.) Harsha De Silva - Deputy Minister of Policy Planning, Economic Affairs, Child, Youth and Cultural Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තූතියි. මුලින්ම කියන්න ඕනෑ, අපි තාවකාලිකව වැඩ අත්හිටුවන්න කියලා පෙබරවාරි මස 05වැනි දින නිකුත් කළ ලිපිය අදාළ වෙන්නේ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු හරහා කරගෙන ගිය ව්‍යාපෘතිවලට බව. නමුත් ඊට මාසයකට පසුව, මාර්තු මාසයේ 04වැනි දා නැවත ලිපියක් යොමු කර තිබෙනවා, සියලු දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු හරහා කරගෙන ගිය ඒ තාවකාලිකව අත්හිටවූ ව්‍යාපෘති කොන්දේසි දෙකකට යටත්ව වහාම නැවත පටන් ගන්න කියලා. මම ඒ ගැනත් කියන්න කැමැතියි. එයින් එක කොන්දේසියක් අනුව ඒ ලබා දීලා තිබෙන කොන්ත්‍රාත්තු හරියාකාරව ලබා දීලා නැත්නම්, දූෂිත කොන්ත්‍රාත්තු තිබෙනවා නම් ඒවා තවමත් අත්හිටුවා තිබෙනවා.

අනෙක් එක තමයි, ජනාධිපතිවරණය කාලයේ ඔරලෝසු, ගෑස් ලිප්, මහන මැෂින් යනාදි භාණ්ඩ බෙදීමට ගෙනැවිත් තිබුණා කියන එක. ඒවා බෙදීම තාවකාලික අත්හිටුවීමට යටත් වනවා. ඒ අනුව සියලුම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු හරහා කරගෙන ගිය, නමුත් තාවකාලිකව අත්හිටවූ සියලු ව්‍යාපෘති අර කොන්දේසි දෙකට යටත්ව පටන් ගැනීමට දැනුම් දීලා තිබෙනවා. අපේ ගරු ගීතාංජන ගුණවර්ධන මන්ත්‍රීතුමා කිව්වා, උපදෙස් ලබා දෙන්න කියලා. ඒ උපදෙස් ලබා දීලා තිබෙනවා. දිස්ත්‍රික් කාර්යාල හරහා ඒ උපදෙස් ලැබිය යුතු පුද්ගලයන්ට ලැබේවි. මම ඉතාම වගකීමෙන් කියනවා, අපේ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා එම තීරණය සම්බන්ධයෙන් ස්වදේශ කටයුතු අමාත්‍යාංශය දැනුවත් කර තිබෙන බව. ඒ අනුව ඔය ප්‍රශ්නයට පිළිතුර තමයි, දැන් මේ කිව්වේ. එතකොට සියලු දෙනාට පැහැදිලියි, යථා තත්ත්වය මොකක්ද කියලා. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු හරහා කරගෙන ගිය ව්‍යාපෘති හැර වෙන කිසිම ව්‍යාපෘතියක් තාවකාලිකව හෝ නවත්වන්න කියලා නැහැ. ඒකත් වගකීමෙන් කියනවා. "මේවා නවත්වන්න ආණ්ඩුවෙන් කියා තිබෙනවා " කියලා කවුරු හෝ කියනවා නම්, ඒක එහෙම නොවෙයි.

ගරු ශාන්ත බණ්ඩාර මහතා

(மாண்புமிகு சாந்த பண்டார)

(The Hon. Shantha Bandara)

Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා

(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Presiding Member)

ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු ශාන්ත බණ්ඩාර මහතා

(மாண்புமிகு சாந்த பண்டார)

(The Hon. Shantha Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා නියෝජ්‍ය අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි, විශේෂයෙන්ම මේ ගෙනැත් තිබෙන ස්වයංරැකියා උපකරණ පිළිබඳව සහ ඒවා බෙදන්න එපා කියලා මේ වෙන කොට දිස්ත්‍රික් ලේකම්වරුන් හරහා ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කර තිබෙන කාරණය. අපේ මූලාසනය මඟින් ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ අවධානය අපි මේ සම්බන්ධව යොමු කරවනවා. විශේෂයෙන්ම ටෙන්ඩර් කරලා නියමිත සුදුස්සන් තෝරා ගෙනයි මේ සියල්ල ගෙනැවිත් තිබෙන්නේ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා

(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Presiding Member)

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා නියෝජ්‍ය ඇමතිතුමනි, ගරු මන්ත්‍රීතුමාට ඒ ගැන පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය කර තිබෙන්නේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)

(The Hon. (Dr.) Harsha De Silva)

ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම මේ සම්බන්ධව කථා කිරීමේදී මට එක දෙයක් කියන්න අමතක වුණා. ඒ තමයි, ගෙනැවිත් තිබෙන උපකරණවලට ඒවා ලැබිය යුතු ප්‍රතිලාභීන්ගෙන් යම් කිසි මුදලක් අය කර ගෙන තිබෙනවා නම් ඒ භාණ්ඩත් බෙදන්න කියා තිබෙනවා.

ගරු ශාන්ත බණ්ඩාර මහතා

(மாண்புமிகு சாந்த பண்டார)

(The Hon. Shantha Bandara)

ක්‍රම දෙකකට ගෙනැවිත් තිබෙනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)

(The Hon. (Dr.) Harsha De Silva)

ඔව්, ක්‍රම දෙකකට. එක ක්‍රමයක් තමයි, ඔවුන්ගෙන් යම් කිසි මුදලක් අරගෙන තිබෙනවා නම් ඒ බඩුත් බෙදන්න කියලා තිබෙන එක. ඡන්දයට ගෙනාපු බඩු පිළිබඳවයි ප්‍රශ්නය තිබෙන්නේ. උදාහරණයක් හැටියට මම මේ කාරණය කියන්නම්. මම කෝට්ටේ නියෝජනය කරන සංවිධායකවරයා හැටියට අපේ පාර්ලිමේන්තුව හරහා මට ලැබෙනවා, විමධ්‍යගත අය වැයෙන් - DCB එකෙන්- ලක්ෂ 50ක්. එච්චරයි මට ලැබෙන්නේ. නමුත් එවකට ආණ්ඩුවේ සංවිධායකවරයාට -ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හෝ සන්ධානයේ සංවිධායකවරයාට- ලක්ෂ 300ක් ලැබෙනවා. ඊට අමතරව ඔහුට මිලියන 100, 200, 300 ලැබෙනවා, ආසනයේ වැඩ කර ගන්න. හරිම අසාධාරණ ක්‍රමවේදයක් තමයි එවකට රජය පවත්වාගෙන ගියේ. මම හිතන්නේ නැහැ, ප්‍රජාතන්ත්‍රවාදී රටක මන්ත්‍රීවරු හරහා ඔවුන්ගේ ප්‍රදේශවල සංවර්ධන වැඩ කටයුතු සිදු කළ යුත්තේ එහෙමයි කියලා. රජයට අමාත්‍යාංශ තිබෙනවා. ඒ අමාත්‍යාංශ හරහා වැඩ කරනවා. ඒවාට අපේ කිසි ගැටලුවක් නැහැ.

කෝට්ටේ මගේ ආසනයට ගිහිල්ලා බලන්න. හැම තැනම board ගහනවා. කාගේ හරි පින්තූරයක් ගහලා කියනවා, ඒ පුද්ගලයාගේ ව්‍යාපෘතියක්ය මේ ක්‍රියාත්මක වෙන්නේ කියලා. සාමාන්‍ය ජනතාව අපෙන් අහනවා, "මන්ත්‍රීතුමා ඔබතුමාට කරන්න බැරිද, මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුවේ මන්ත්‍රී කෙනෙක් නේද, මන්ත්‍රීතුමාට කරන්න බැරිද, අනෙක් පක්ෂයේ කට්ටියට විතරද කරන්න පුළුවන්?" කියලා. එවැනි ක්‍රමවේදයක් තමයි අරගෙන ගියේ. එවැනි අසාධාරණකම් වුණා. ඔය මුදල් පාවිච්චි කරලා ඡන්දයට බෙදන්න ගෙනැල්ලා තිබෙන බඩු නම් බෙදෙන්නේ නැහැ, ඡන්දය ඉවර වෙන කල්. බෙදෙන්නේ ප්‍රතිලාභීන්ගෙන් මුදල් ගත්ත ඒවා පමණයි. ඉතාමත්ම පැහැදිලිව මේ කාරණය කියන්න ඕනෑ. අපි කිසිම විධියකට සංවර්ධන වැඩ නවත්වන්න කියලා නැහැ. තාවකාලික අත්හිටුවීමක් කරලා

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

තිබුණා, සමහර ව්‍යාපෘතිවලට පමණක්. ඒකත් මාසයක් පමණයි, අත්හිටුවලා තිබුණේ. ඒ අත්හිටුවීමත් දැන් ඉවත් කරලා තිබෙනවා.

තවත් දෙයක් කියන්න ඕනෑ. ගරු කබීර් හාෂීම් ඇමතිතුමාත්, ගරු ජෝශප් මයිකල් ඇමතිතුමාත් මේ ගැන කිව්වා. අපි හිතමු, allocation එක තිබෙන්නේ රුපියල් මිලියන 10යි කියලා. රුපියල් මිලියන 10යි වෙන් කරලා තිබෙන්නේ. නමුත් කොන්ත්‍රාත්කරුට ටෙලිෆෝන් එකෙන් කියනවා, "ඔබතුමා මිලියන 30ක වැඩ පටන් ගන්න, අපි ගෙවන්නම්" කියලා. එතකොට ඔහු මිලියන 30ක වැඩ පටන් ගන්නවා. පාරවල්වලට ගල් දානවා. ඒ වැඩේ කරගෙන යනවා. දේශපාලනිකව පෙන්වන්න හදනවා, "මෙන්න, අපි මේ වැඩ කරගෙන යනවා. සංවර්ධනය කරගෙන යනවා" කියලා. ඊට පස්සේ ඔවුන් බිල් අරගෙන එනවා. බිල් අරගෙන ඇවිල්ලා අපි පොතේ බලන කොට වෙන් කිරීමක් -allocation එකක්- නැහැ. වෙන් කිරීම තිබෙන්නේ රුපියල් මිලියන 10කට පමණයි. රුපියල් මිලියන 20ක වැඩ කරලා තිබෙන්නේ, කිසිම ටෙන්ඩර් පටිපාටියකින්, කිසිම ක්‍රමවේදයක් අනුගමනය කිරීමකින් තොරවයි. එතකොට අපි කොහොමද ඒවාට ගෙවන්නේ? අපි කොහොමද ගෙවන්නේ, ගරු මන්ත්‍රීතුමනි? අපි කොහොමද ගෙවන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? මොකක්ද ඒකට කරන්නේ? ඔබතුමා මට කියන්න, ඒකට අපි මොකක්ද කරන්නේ කියලා. ලක්ෂ්මන් යාපා මන්ත්‍රීතුමනි, ඔබතුමා මට කියන්න එහෙම ඒවාට මොකක්ද කරන්නේ කියලා. අපි මොකක්ද කරන්න ඕනෑ? ටෙලිෆෝන් එකෙන් කියනවා, කරන්න කියලා. ඊට පස්සේ පාරවල -

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ගරු ඇමතිතුමනි, ඔබතුමා මගේ නම කිව්ව නිසා මම මේ පැහැදිලි කිරීම කරන්න ඕනෑ. ඒවා නීත්‍යානුකූලව ඔබතුමන්ලා කරන්න. ඔබතුමා කියන විධියට ඒවා කරන්න අවශ්‍යතාවක් නැහැ. බිල්පත් ඉදිරිපත් කරපු නීත්‍යානුකූල ඒවා ගෙවන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

මම ඒකට උත්තරය දුන්නා නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මිනිස්සු දන්නේ නැහැ නේ, මේක කළේ allocation එකක් තිබිලාද, නැද්ද කියලා. මිනිස්සු කියන්නේ, "බලන්න ඇමතිතුමා, අපේ පාරට භාගෙට තාර දාලා තිබෙනවා, ඉතුරු ටික දාන්න" කියලා. එහෙම නොකළොත් ඊට පස්සේ උද්ඝෝෂණ කරනවා. ඊට පස්සේ කියනවා, "දූවිලි යනවා. අපේ ළමයින්ට හුස්ම ගන්න බැහැ. ඉස්කෝලේ යන්න බැහැ." කියලා. නමුත් ඇත්ත වශයෙන්ම වෙලා තිබෙන්නේ, ඒක දූෂිත විධියට කරලා තිබෙන එකයි. මම දන්නේ නැහැ, මේවාට මොකක්ද කරන්නේ කියලා. අපේ අමාත්‍යාංශයට ඇවිල්ලා මේ ප්‍රශ්නය ගැන සියලුම දෙනාත් එක්කම කථා කළා. අපි කිව්වා, එහෙම නම් 2015 තිබෙන allocationවලින් මේවා කරන්න කියලා. වෙන මොනවා කරන්නද? ළමයින්ට ඉස්කෝලයට යන්නේ නැතුව ඉන්න බැහැ නේ, දූවිලි නිසා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

අනතුරුව ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு உதித் லொக்குபண்டார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] *தலைமை வகித்தார்கள்.*

Whereupon THE HON. UDITHA LOKUBANDARA *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි කිව්වා, ඒක කරන්න 2015 allocationවලින් තමයි ගන්න වෙන්නේ කියලා.

අත්සන් කරලා තිබුණත් ඒ කටයුතු පටන් අරගෙන නැත්නම් ඒවා අපට කරන්න හැකියාවක් බොහෝ විට ලැබෙන්නේ නැහැ. මොකද, මේ ව්‍යාපෘති කරගෙන යන්න මුදල් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, උදාහරණයක් හැටියට ගත්තොත් ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමාගේ ගම්පහ දිස්ත්‍රික්කයේ නාන ළිං ප්‍රතිසංස්කරණය කිරීමේ තොරතුරු ඇතුළත් file එකක් මම දැක්කා. මේ නාන ළිං ප්‍රතිසංස්කරණය කරන්න රුපියල් ලක්ෂ පහ ගණනේ වෙන් කරලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. කොහොමද මෙහෙම වෙන්නේ?

ලක්ෂ්මන් යාපා අබේවර්ධන මන්ත්‍රීතුමනි, නාන ළිඳක් ප්‍රතිසංස්කරණය කරන්න රුපියල් ලක්ෂ පහක් වැය වන්නේ කොහොමද කියලා ඔබතුමා මට කියන්න.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ TA කෙනෙකු ඉන්නවා; TO කෙනෙකුත් ඉන්නවා. ඒගොල්ලන්ගේ ඇස්තමේන්තුවලට අනුව තමයි ඒ වැඩ කටයුතු කරලා තිබෙන්නේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

හරියට හරි. දැන් මෙතැන ප්‍රශ්නය,-

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. (Dr.) Harsha De Silva, you have only one more minute.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

හැම නාන ළිඳකටම රුපියල් ලක්ෂ පහක් වැය වෙන්න බැහැ නේ. සමහර නාන ළිං ලොකු වෙන්න පුළුවන්, සමහර ඒවා පොඩි වෙන්න පුළුවන්. දැන් ගරු ගීතාංජන ගුණවර්ධන මන්ත්‍රීතුමා මේ කාරණය ගැන කියපු නිසා මමත් කියන්නම්. ශ්‍රී ලංකා ජාතික ඉදි කිරීම සංගමයේ සභාපතිතුමා ඇතුළු නිලධාරීන් පිරිසක් මම හමු වෙන්න ආවා. මම ඔවුන්ගෙන් ඇහුවා, "නාන ළිඳක් කපන්න නොවෙයි, පොඩ්ඩක් දිය සෙවෙල් ටික කඩලා, සිමෙන්ති ටිකක් දාලා ලස්සනට ප්‍රතිසංස්කරණය කරන්න කොපමණ මුදලක් වැය වෙනවාද?" කියලා. ඔවුන් මට කිව්වා, "ඇමතිතුමා, මේකට

රුපියල් 25,000ක්, රුපියල් 30,000ක්, වැඩිම වුණොත් රුපියල් 50,000ක් යාවි" කියලා. රුපියල් 50,000ක් වැය වන වැඩේට රුපියල් ලක්ෂ පහක් වෙන් කරලා තිබෙනවා. ඒ නිසා ඉතුරු රුපියල් ලක්ෂ ගණනට මොකද වුණේ කියන ප්‍රශ්නය එහිදී මතු වෙනවා.

ගරු ගීතාංජන ගුණවර්ධන මහතා
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
මම කිව්ව ලැයිස්තුවේ එහෙම නාම ලේඛනයක් නැහැ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
දාබරේ මහත්මයා, ප්‍රධානාදී මහත්මයා මාව හමු වෙන්න ආවා. මම ඔවුන්ට මේ කාරණය විස්තර කරලා දුන්නා. ඔබතුමා ගිහිල්ලා ඔවුන්ට මේ කාරණය පිළිබඳව කියන්න. මමත් ඊයේ අපේ සංවිධායකතුමා වන ලෙනාඩ් කරුණාරත්න සමඟ අවිස්සාවේල්ලට - ඔබතුමාගේ ආසනයට - ගියා. අවිස්සාවේල්ලේ පාරවල් තුනක් ඉදි කිරීම කටයුතු නවත්වලා තිබුණා. මම ඔවුන්ට කිව්වා, "එන සතිය විතර වන කොට ඔවුන්ට නැවත මේ මුදල් ලැබේවි. මේ වැඩේ කරගෙන යන්න" කියලා. ඒවා ප්‍රමිතියට අනුව ක්‍රියාත්මක කරලා තිබෙනවා නම් ගැටලුවක් නැහැ. නාන ළිං පිළිබඳව මේ ලැයිස්තුවේ සඳහන් වෙලා තිබුණේ නැහැ. මම මේ කොන්ත්‍රාත් සංගමයේ සභාපතිගෙන් ඇහුවා, "නාන ළිඳක් ප්‍රතිසංස්කරණය කරන්න කොයි තරම් මුදලක් වැය වේවිද?" කියලා. එතුමා කිව්වා, "වැඩිම වුණොත් රුපියල් 50,000ක් යාවි" කියලා. [බාධා කිරීමක්] තව තත්පර 30කින් මම මගේ කථාව නවත්වන්නම්. මම හිතන හැටියට ඔබතුමන්ලාගේ සියලු ප්‍රශ්නවලට උත්තර මා මෙතැනදී බැන්දා. අපි එකතු වෙලා සාධාරණව, පක්ෂ භේදයකින් තොරව ඒ කටයුතු කරගෙන යමු කියලා ඉල්ලා සිටිනවා. බොහොම ස්තූතියි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. (Prof.) Tissa Vitarana. You have seven minutes.

[අ.භා. 5.23]

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
Thank you, Mr. Deputy Chairman of Commitees. මම මේ මතු කරන්න යන්නේ විශේෂයෙන් යටියන්තොට කොට්ඨාසයේත්, ඒ අවට තුන් කෝරළයේත් - කෑගල්ල දිස්ත්‍රික්කයේ - දැන් මතු වෙලා තිබෙන ප්‍රශ්නයක් පිළිබඳවයි. අනිකුත් තැන්වල වාගේම ඒ ප්‍රදේශයේත් යටිතල පහසුකම් දියුණු කිරීම පැත්තෙන් ගත්තාම පටන් ගත්ත වැඩ කොටස යම් ප්‍රමාණයකින් දියුණු වෙලා තිබියදී එක පාරටම එහි වැඩ කටයුතු නතර කරලා තිබෙනවා. ගිය අවුරුද්දේ අන්තිම මාස දෙකේ වැහි තත්ත්වයත්, මැතිවරණ තත්ත්වයත් එක්ක මේ මුදල් අවිච්ඡේද වෙලා තිබෙනවාය කියලා අපි දන්නවා. පෙබරවාරි දක්වා ඒ මුදල යොදවන්න පුළුවන් කියලා දැනුම් දීලා තිබුණත්, ඒ මුදල පාවිච්චි කරන්න ඉඩක් නොලැබුණු නිසා ඒ වැඩ නතර වෙලා තිබෙනවා. මාසයක් වැඩ නතර කරන්න නියම කළාය කියා (ආචාර්ය) හර්ෂ ද සිල්වා මැතිතුමා කිව්ව කාරණය මේකට බලපාන්න ඇති කියලා මම හිතනවා. මේ මාසයේ 04 වැනිදා තමයි ආපසු ලිපියක් ඇරලා තිබෙන්නේ මේ කටයුතු නැවත ආරම්භ කරන්න කියලා. මම ඒ ගැන සන්තෝෂ වනවා. මම බලාපොරොත්තු වනවා, ඒ නතර කරලා තිබෙන වැඩ කටයුතු ඉදිරි කාලයේදී කෙරෙයි කියලා. ඒ කොට්ඨාසවල පාරවල් කාපට් කිරීම මහා පරිමාණ කාපට් කිරීමක් නොවෙයි. සමහර තැන්වල කිලෝමීටර් 2ක්, කිලෝමීටර් 3ක් බස් යන්න බැරි තත්ත්වයක් ඇතිවෙලා තිබෙනවා. මේ හේතුවෙන් ජනතාව දුක් විඳින නිසා තමයි අපි ඒ පාරවල් කාපට් කරන්න තීන්දු කළේ. දැන් ඒවාත් නතර වෙලා තිබෙනවා.

ගරු හර්ෂ ද සිල්වා නියෝජ්‍ය අමාත්‍යතුමනි, කරුණාකර මේ ගැන සොයා බලා පුළුවන් තරම් ඉක්මනට ඒ මුදල් පාවිච්චි කරන්න සලස්වන්න කියලා මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඒ වාගේම කිතුල්ගල, බුලත්කොහුපිටිය බස් නැවතුම්පොළ සංවර්ධනය කිරීමේ වැඩ පිළිවෙළත් නතර කරලා තිබෙනවා. ඒ එක්කම මාතෘ නිවාස සංවර්ධනය කිරීමේ වැඩ පිළිවෙළත් නතර කරලා තිබෙනවා. මේ පටන් ගත්ත වැඩ පහසුවෙන්ම ඉදිරියට කර ගෙන යන්න පුළුවන්කම තිබෙනවා.

තවත් ප්‍රශ්නයක් තිබෙනවා. මුදල් අනුමත කරලා තිබුණාට ඒ මුදල් ලැබිලා නැහැ. යම් ව්‍යාපෘතිවල වැඩ පටන් ගන්නවත් පුළුවන් වෙලා නැහැ. පාරවල් කාපට් කිරීම ගැන කථා කරන කොට මම කියන්න ඕනෑ, වැඩ පටන් ගන්න මුදල් release කරලා නැති තවත් පාරවල් හතරක් තිබෙන බව. කරුණාකර ඒවා ගැනත් සොයා බලන්න පුළුවන් නම් එය ඉතා වැදගත් වේවි. මේ ආකාරයට මේ සංවර්ධන වැඩ පිළිවෙළවල් ඉදිරියට ගෙන යන්නේ කොහොමද කියලා අපි බලන්න ඕනෑ.

පසු ගිය ආණ්ඩුව කාලයේ දී යටිතල පහසුකම් පිළිබඳව විතරක් නොවෙයි බැලුවේ. මානව සම්පත් අංශය ගැනත් බැලුවා. මම කියන්න සන්තෝෂයි, ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ උපදේශක කාරක සභාව හරහා තාක්ෂණ විෂය ධාරාව දියුණු කිරීමේ වැඩ පිළිවෙළකට යන්න අපට පුළුවන් වුණා. ඒ එක්කම රසායනාගාර ආදී අංශ සියල්ලමත් දියුණු කරන්නට තිබෙනවා. මේවා සම්බන්ධවත් තිබුණු ප්‍රගතියේ බැස්මක් මේ කාලයේ දී ඇති වෙලා තිබෙනවා කියලා අපට පෙනෙනවා. කරුණාකර මේවා ගැනත් සොයා බලන්න කියලා මම ඉල්ලීමක් කරනවා. යටිතල පහසුකම් දියුණු කරනවා වාගේම, මානව සම්පත් දියුණු කිරීම සම්බන්ධයෙනුත් බර දමලා අපි ඉදිරියේ දී කටයුතු කරන්නට අවශ්‍යයි.

සංවර්ධන වැඩ පිළිවෙළවල් ගැන කථා කරනකොට මට පෙනෙන දෙයක් තමයි, අය වැය හරහා යම් සහන ලබා දීම මුල් කර ගෙන අනෙකුත් සංවර්ධන කටයුතුවලට යොදවන්න තිබෙන මුදල් ඒ වෙනුවෙන් යොදවන්නට ඔබතුමන්ලාට සිදු වෙලා තිබෙන බව. මැතිවරණයක් ළඟම තිබියදී ජනතාවට යම් යම් සහන ලබා දෙන්න ඔබතුමන්ලාට අවශ්‍යතාවක් තිබුණත්, ඒ කටයුත්ත කරන ගමන් මේ සංවර්ධන කටයුතු ගැනත් බලන්න. සංවර්ධනයට යොදන බර අඩු කරලා, ඒ බර වෙන පැත්තකට දමන්න එපා.

ආර්ථික විද්‍යාඥයකු හැටියට ඔබතුමාට තේරෙනවා ඇති, අපි මධ්‍යම සංවර්ධන රටක් කියන උගුලෙන් අපට ගොඩ එන්නට පුළුවන් වන්නේ විද්‍යාව පදනම් කර ගෙන අපේ රටේ තාක්ෂණය දියුණු කිරීමෙන් බව. අපේ ශ්‍රම වියදම වැඩි වෙන්න, වැඩි වෙන්න අපි ඒ උගුලට යට වෙලා සංවර්ධන වේගය පහළ බහිනවා. ඒ තත්ත්වයට මේ රට වැටෙන්න ඉඩ දෙන්න එපා. කරුණාකර අපේ රටේ නියම සංවර්ධනයක් ඇති කිරීම සඳහා අවශ්‍ය විද්‍යාව හා තාක්ෂණය දියුණු කිරීම සම්බන්ධයෙන් යම් බරක් යොදවන්න. විද්‍යා හා තාක්ෂණ කටයුතු අමාත්‍යාංශය දැන් සම්පූර්ණයෙන්ම නැති කරලා තිබීම ගැන මම කනගාටු වෙනවා. COSTI ආයතනය ගැනත් මම ඔබතුමා සමඟ කථා කළා. COSTI ආයතනය තුළිනුත් අපි බැලුවේ පුළුවන් තරම් අපේ විද්‍යාවයි, තාක්ෂණයයි දියුණු කරලා ඒ හරහා මේ රටේ අමු ද්‍රව්‍යවලට උපරිම වටිනාකමක් එකතු කරන සංවර්ධනයක් ඇති කරන්නයි. මේ අවස්ථාවේ දී මා

[ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා]

ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. මේ ගැන මා කලිනුත් ඔබතුමාට මතක් කරලා තිබෙනවා. කරුණාකර මේ COSTI ආයතනය ඔබතුමාගේ භාරයට අර ගෙන දියුණු කරන්න බලන්න. එහෙම කරන්න පුළුවන්නම් එය ඉතාමත් වැදගත් වෙයි. බොහොම ස්තූතියි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The Hon. Shantha Bandara, please. You have five minutes.

[අ.භා. 5.30]

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය මාස දෙකක කාලය තුළදී අපේ රටේ ඉදි කිරීම ක්ෂේත්‍රය විශාල වශයෙන් කඩා වැටීමකට ලක් වීම නිසාත්, ඒ කරපු සංවර්ධන ව්‍යාපෘති නැවතීම නිසාත්, විශාල ජන කොට්ඨාසයකට අද දැවැන්ත ආර්ථික පීඩනයකට මුහුණ පාන්න සිදු වෙලා තිබෙන බව මා විශේෂයෙන්ම කියන්න කැමැතියි. උදාහරණයක් හැටියට කිව්වොත්, මේ ඉදි කිරීම ක්ෂේත්‍රය තුළ මේසන් බාස්වරුන් විශාල ප්‍රමාණයක් වැඩ කටයුතු කළ බව අපි දන්නවා. ඒ වාගේම විශාල පිරිසක් ඒ සඳහා අත් උදව් දුන්නා. සාමාන්‍යයෙන් ගම්වල කාන්තාවෝ, වැඩි වයස් උදව්ය, ඒ වගේ විවිධ අය ඒ අත් උදව් දීම සඳහා සහභාගි වුණා. එම ව්‍යාපෘති හරහා කොන්ත්‍රාත්කරුවාට විතරක් නොවෙයි ගමේ සියලු අංශවලට මුදල් ගලාගෙන ගියා. ව්‍යාපෘතිය කරන ප්‍රදේශයේ බත් කඩයක් තිබුණා නම්, වැඩි වශයෙන් බත් පැකට් ටිකක් විකුණා ගන්නත් පුළුවන්කම ලැබුණා. තේ කඩයක් තිබුණා නම්, ඒ තේ කඩේත් වෙළෙඳාම වැඩි වුණා. ඒ වාගේම අත් උදවු දෙන්න ගිය කෙනාගේ ගෙදරටත් යම් මුදලක් ලැබුණා.

විශේෂයෙන්ම ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා ඇමතිතුමාගේ අවධානයට මා මේ කාරණය යොමු කරවන්න කැමැතියි. ඒ වාගේම ගරු කබීර් හාෂීම් ඇමතිතුමාත් මේ කාරණය ගැන කිව්වා. එක කොන්ත්‍රාත්කරුවකු දිහා බලාගෙන රටේ තීන්දු තීරණ ගන්න එපා. සමහර විට එක තැනක වැරැද්දක්, අඩු පාඩුවක් සිදු වෙලා තිබෙන්න පුළුවන්. එක තැනක ඔය කියන්නා වූ දේ තිබෙන්නට පුළුවන්. හැබැයි, ඒ එක කොන්ත්‍රාත්කරුවකු දිහා බලාගෙන, ප්‍රදානය කරපු එක කොන්ත්‍රාත්තුවක් දිහා බලාගෙන රටේ සමස්තය පිළිබඳ තීන්දුවක් ගන්නවා නම් ඔබතුමන්ලා තමයි ඉතාම ඉක්මනින් ජනතාවගෙන් ඈත් වන මහජන නියෝජිත කණ්ඩායම බවට පත් වන්නේ. ඒ නිසා මේ තත්ත්වයට පත් වෙන්න එපා. මේවා දිහා ශුභවාදීව බලන්න. මේ වගේ හොඳ ව්‍යාපෘති ක්‍රියාත්මක වීම හරහා රටේ ජාතික ආර්ථිකය ශක්තිමත් වෙනවා. ඒ විතරක් නොවෙයි පවුල්වල ආර්ථිකය ශක්තිමත් වෙන්නත් එය විශාල වශයෙන් බලපාලා තිබෙනවා.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ගොඩගසා තිබෙන ස්වයංරැකියා උපකරණ දිහා බලන්න. ඒවා ඡන්දය කාලයට බෙදන්න ගෙනාවා නම් ඒවා ඡන්දය කාලයේ බෙදනවා. මැතිවරණය කාලයේ ඒ උපකරණ ලබා දීම මැතිවරණ නීති උල්ලංඝනය කිරීමක් බව අප පැහැදිලිවම දන්නවා. ඒ නිසා මැතිවරණ කාලයේ අපි ඒ උපකරණ බෙදා දුන්නේ නැහැ. ඒවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දැන් ගොඩගහලා තිබෙනවා. අව්වට වේලෙනවා, වැස්සට තෙමෙනවා. ප්‍රාදේශීය ලේකම්වරුන්ටත් අද ඒවා විශාල හිසරදහක් වෙලා තිබෙනවා. ඒ නිසා අපි කරුණාවෙන් කියන්නේ, මේවා දිහා දේශපාලන කෝණයෙන් බලන්න එපා කියලයි. අපේ ආර්ථික සංවර්ධන නිලධාරින්, එක්කෝ සමෘද්ධි සංවර්ධන නිලධාරින්, නැත්නම් ග්‍රාම නිලධාරින් හැම ගෙදරකටම ගිහිල්ලා පරීක්ෂා කර බැලීමෙන් පසුව තමයි ඒ උපකරණ ලබා දෙන්න සුදුසු ව්‍යවසායකයෙක්ද, සුදුසු පුද්ගලයෙක්ද කියලා තීන්දු කළේ. එහෙම දෙන්න ගෙනාපු ඒවා දැන් හිර කරගෙන තිබෙනවා. ඒ තුළින් මේ ආණ්ඩුව බලයට පත් වෙන්න වැඩියෙන්ම අවධානය යොමු කරපු සහ ජනතාවට කථා කරපු "යහ පාලනය" කියන එක ප්‍රාදේශීය වශයෙන්, පළාත් වශයෙන් බිඳ වැටෙන්න දෙන්න එපා කියන එකයි අපි කියන්නේ. ඒවා සාධාරණ විධියට කරන්න. සමහර සංවර්ධන ව්‍යාපෘතිවල වංචා දූෂණ තිබෙනවා නම් ඒවා පිළිබඳව සොයා බලන්න; ඒවා පිළිබඳව අවශ්‍ය තීන්දු තීරණ ගන්න. එහෙම නැතිව ටෙන්ඩර් පටිපාටි අනුගමනය කරලා නීත්‍යානුකූලව කර තිබෙන සංවර්ධන ව්‍යාපෘති තිබෙනවා. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු අනුමත කරලා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමත කරලා තමයි මේ ව්‍යාපෘති ආරම්භ කරලා තිබෙන්නේ. එහෙම ආරම්භ කරපු ව්‍යාපෘති හිර කරගෙන ඉන්න එපා. ඒ තුළ ජනතාව විශාල පීඩනයකට ලක් වෙලා තිබෙනවා.

මහා පරිමාණ ව්‍යාපෘති තිබෙනවා. දැන් බලන්න, Colombo Port City ව්‍යාපෘතිය. අපි අද උදේත් දැක්කා ඒකේ වැඩ කෙරෙනවා. Colombo Port City ව්‍යාපෘතියේ වැඩ කෙරෙනවා. ඒක හොඳයි. අපි කියන්නෙත් ඒකේ වැඩ කරන්න කියලා තමයි. ඒ වුණාට මාධ්‍ය සංදර්ශනයක් කරනවා, "ඒ ව්‍යාපෘතිය නවත්වලා තිබෙන්නේ" කියලා. පසු ගිය කාලයේ මැතිවරණ වේදිකාවේ මේ ගැන කිව්ව නිසා තමයි මෙහෙම කරන්න සිදු වෙලා තිබෙන්නේ. ඒවායේ වංචා දූෂණ ගැන කිව්වාට, හොයලා බැලුවාම ඇත්තටම එහෙම දෙයක් සිදු වෙලා නැහැ. ගලේ පහරපු බළලාට වෙච්ච වැඩේ තමයි වෙලා තිබෙන්නේ. අපි රටක් හැටියට ඉදිරියට යන කොට මේ සංවර්ධනය අවශ්‍යයි. ආණ්ඩු මාරු වුණාය කියලා ඒ සංවර්ධනයේ අවශ්‍යතාව නැති වන්නේ නැහැ. ඒ නිසා කරුණාකර මේවා දිහා ශුභ වාදීව බලා රටේ අනාගතය වෙනුවෙන් තීන්දු තීරණ ගන්න කියන එක අපි විශේෂයෙන් කියන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අධ්‍යාපන ඇමතිතුමා අපේ ප්‍රදේශවලට ගිහිල්ලා "මහින්දෝදය විද්‍යාගාර" විවෘත කරනවා. ඒවා අපේ හිටපු අධ්‍යාපන ඇමතිතුමා එක්කත් කථා කරලා බොහොම මහන්සියෙන් පසු ගිය කාලය තුළ ඉදි කරපු ඒවා. ගිය සතියේ නව අධ්‍යාපන ඇමතිතුමා මයුරපාද ජාතික පාසලට එන නිසා එම පාසලේ මහින්දෝදය විද්‍යාගාරය කියන නාම පුවරුවේ "මහින්දෝදය" කියන කැල්ල ඉවත් කරන්න කිව්වා. ඒක පේන්න බැහැ. "මහින්දෝදය" කියන කැල්ල ඉවත් කරන්න කියනවා. හැබැයි ඊට පසුව ඇවිල්ලා ඒවා විවෘත කිරීම සිදු කරනවා. බඩු දුන්නේත් අපි; ගොඩනැඟිල්ල හැදුවේත් අපි. "මහින්දෝදය" නම ඉවත් කිරීමද යහ පාලනය කියන්නේ?

අද සමහර අය කියනවා, පාසල්වලට මහජන නියෝජිතයන්ගේ නම් දමන්න එපා කියලා. දුම්මලසූරිය ජේ.ආර්. ජයවර්ධන මධ්‍ය මහා විද්‍යාලය තිබෙනවා. ඩී.එස්. සේනානායක විද්‍යාල කොපමණ නම් තිබෙනවාද? සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාල කොපමණ තිබෙනවාද? ඩඩ්ලි සේනානායක මැතිතුමාගේ නමින් කොපමණ පාසල් තිබෙනවාද? ආර්. ප්‍රේමදාස මහත්මයාගේ නමින් ක්‍රීඩාංගන තිබෙනවා. ඒ නිසා මේ වාගේ පටු තීරණවලට ඇවිල්ලා මේවාට අසාධාරණයක් කරන්න එපා කියන එකයි අපි කියන්නේ. ඒ වාගේම එම ප්‍රදේශවල මහජන නියෝජිතයන්ගේ ගෞරවයත් ආරක්ෂා වන පරිදි මේ කටයුතු කරන්න ඕනෑ. අපි කරලා අවසන් වුණු ඒවා විතරයි විවෘත කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ. නමුත් වැඩක් කරලා අවසන් කරලා, ඒවා ජනතාවට භාර දීලා ඒ සතුට සහ ඒ ගෞරවය ලබා ගන්න කියලා අපි විශේෂයෙන්ම මේ ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා.

[අ.භා. 5.35]

ගරු අචල ජාගොඩගේ මහතා
(மாண்புமிகு அச்சல ஜாகொடகே)
(The Hon. Achala Jagodage)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා විසින් ඉදිරිපත් කරන ලද මේ යෝජනාව පිළිබඳව අදහස් දැක්වීමට ඉඩකඩ ලබා දීම ගැන පළමුකොට මම ඔබතුමාට ස්තුති වන්ත වනවා.

මේ විවාදය ආරම්භ වන විටත් මම කල්පනා කළා මෙතරම් ප්‍රශ්න රැසක් රටේ තිබියදී, මේ මාතෘකාව විවාදයට ලක් කිරීමට යෝජනාවක් ලෙස ගෙන ආවේ ඇයි කියා. හැබැයි, යෝජනාව දිගට විවාදයට ගන්නා විට අදහස බොහොම පැහැදිලියි.

පසු ගිය කාලයේ ක්‍රියාත්මක වුණු සංවර්ධන ව්‍යාපෘති යනුවෙන් අපේ බොහෝ මන්ත්‍රීවරු -හැමෝම නොවෙයි- මාර්ග සංවර්ධන ව්‍යාපෘතියි හඳුනා ගෙන තිබුණේ. මාර්ග සංවර්ධන ව්‍යාපෘතීන් තුළ තිබෙන අර්බුදය අප කාටත් කොහොමත් පැහැදිලියි. මේ පාර්ලිමේන්තුවෙන් වෙන් වුණු මුදල් ප්‍රමාණයට අමතරව බැංකු ණය ලබා ගෙන, ඒ වාගේම කට වචනයට, අමාත්‍යාංශයේ නිලධාරීන් දුන්නු පොරොන්දුවලට ක්‍රියාත්මක වුණු කොන්ත්‍රාත්කරුවන් බොහෝ දෙනෙක් ප්‍රාදේශීය සභාවල මන්ත්‍රීවරුයි. ඔවුන් ක්‍රියාත්මක වී කරන ලද කොන්ත්‍රාත්වල මුදල් ප්‍රමාණය එකතු කර ගන්නට දැන් මේ උදවියට බැරි වෙලා තිබෙනවා. මම හිතන හැටියට මන්ත්‍රීවරුන් ගොඩක් දෙනෙකුට මේ අය ඇවිල්ලා කරදර කරනවත් ඇති. මේ මුදල් ගෙවා ගැනීමේ ප්‍රශ්නය විරුද්ධ පාර්ශ්වයේ නායකතුමාටත් හිසරදයක් බවට පත් වී ඇති නිසා, විශේෂයෙන්ම මේ යෝජනාව ගෙනෙන්නට ඇති කියා සිතනවා. පසු ගිය රජය ආරම්භ කළ "සංවර්ධන ව්‍යාපෘති" කියන පල් වචනය ඉදිරිපත් වන විට සෞඛ්‍ය පිළිබඳව, අධ්‍යාපනය පිළිබඳව, තව බොහෝ කරුණු පිළිබඳව වූ සංවාදයක් මේ විවාදය තුළ සිද්ධ වෙයි කියා මා සිතුවා. නමුත් මේ සංවාදය ඉතා පටු තැනකට ලක් වීම පිළිබඳව මා විශේෂයෙන්ම කනගාටු වනවා.

මේ විවාදයේදී විපක්ෂයෙන් වැදගත් කරුණක් ඉදිරිපත් වුණා. විශේෂයෙන්ම ගරු තිස්ස විතාරණ මන්ත්‍රීතුමා විද්‍යා හා තාක්ෂණය සම්බන්ධ ව්‍යාපෘතීන්වලට මුල් තැන දෙන්නය කියා අදහසක් ඉදිරිපත් කළා. ඒ කථාව ගැන කරුණු කියන්නට මම බලාපොරොත්තු වනවා. විද්‍යාවට, තාක්ෂණයට මුදල් වෙන් කරනවා වෙනුවට මහා මාර්ගවලට, ඉතාමත් පටු සීමාවල ව්‍යාපෘතීන්වලට පමණයි පසු ගිය කාලයේ මුදල් වෙන් වුණේ. ඒ පිළිබඳව එතුමා විසින්ම අදහස් ඉදිරිපත් කිරීම පිළිබඳව විශේෂයෙන්ම සතුටු වනවා.

අවසන් වරට කථා කළ ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා කිව්වා, පසු ගිය කාලයේ බෙදන්න ගෙන ආ බඩු විශාල ප්‍රමාණයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉතිරි වෙලා තිබෙනවා, ඒ බඩු ටික නාස්ති වෙන්න ඉඩ තිබෙන නිසා බෙදන්න කියලා. ඒ කාරණය ඇත්ත බව මම බොහොම පැහැදිලිව කියන්නට ඕනෑ. ඒ බඩු ජනතාවට බෙදා දෙන්නට ඕනෑ. හැබැයි, ඒ බඩු ගෙන ආවේ ඡන්දයට පෙර බෙදන්නය කියන සත්‍යය කාටවත් යටපත් කරන්න බැහැ. එතුමා කිව්වා, "ඡන්දයට බෙදන්න නොවෙයි ගෙනාවේ, එහෙම ගෙනාවා නම් බෙදන්න තිබුණා"ය කියා. එහෙම බෙදන්නට අවස්ථාව නොදුන්නේ මැතිවරණ කොමසාරිස්තුමා බව අප කවුරුත් දන්නවා. නිර්ලජ්ජිත ලෙස ඡන්ද ටික දිනා ගන්නට, පෞද්ගලිකව මිනිස්සුන්ට තෑගි විධියට දෙන්නයි මේ බඩු ටික අර ගෙන ආවේ කියන එක බොහොම පැහැදිලියි. එය ක්‍රියාත්මක කර ගන්නට බැරි වීම නිසා ඒ බඩු ටික එකතු වෙලා තිබෙනවා. නමුත් පටු දේශපාලන ප්‍රයෝජන ගන්න ලැහැස්ති නොවී, සැබෑ ලෙස ලැබිය යුතු පුද්ගලයන්ටම ඒ බඩු ලබා දෙන්නට ඉදිරි කාල සීමාව තුළ කටයුතු කරනවා කියන එකත් මම මේ වෙලාවේ විශේෂයෙන් සඳහන් කරන්නට ඕනෑ.

මේ යෝජනාව විවාදයට ගෙනෙන විට, පසු ගිය රජය විසින් ආරම්භ කරන ලද සංවර්ධන ව්‍යාපෘති මොනවාද කියා මම කල්පනා කළා. පසු ගිය රජය ආරම්භ කළ, අප නැවැත්වූ සංවර්ධන ව්‍යාපෘති මොනවාද කියා මම කල්පනා කළා. විශේෂයෙන්ම මෙතැනදී එක උදාහරණයක් ගැන සාකච්ඡා කරන්නට මම කැමැතියි. මොකක්ද මේ අය "සංවර්ධනය" ලෙස හඳුනා ගෙන තිබෙන්නේ? මට මතකයි පසු ගිය කාලයේ උතුරු දුම්රිය මාර්ගය පිළිසකර කළා. යාපනයට, කන්කසන්තුරයට දුම්රිය ධාවනය කරන්න අවශ්‍ය වන දුම්රිය මාර්ගය හැදුවා. "උතුරු - මිතුරු දුම්රිය ව්‍යාපෘතිය" යනුවෙන් ඒක නම් කළා. ඒක හොඳ දෙයක් නිසා අපත් ඒ ගැන බොහොම සතුටු වුණා. නමුත් මේ දේ ක්‍රියාත්මක වන්නේ කොහොමද කියා අප බලාගෙන සිටියා. උතුරේ දුම්රිය මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම කොටස් කිහිපයකට කරන්නයි පසු ගිය රජය තීරණය කළේ. එක කොටසක් ඕමන්තේ සිට පලෙයි දක්වාත්, තව කොටසක් පලෙයි සිට කන්කසන්තුරය දක්වාත්, ඊළඟට මැදවච්චියේ සිට මඩු දක්වාත්, මඩු සිට තලෛයිමන්නාරම දක්වාත් දුම්රිය මාර්ගය දීර්ඝ කරන්න සැලසුම් සකස් වුණා.

මේ සැලසුම් සකස් වෙන කොට එදා පලෙයි සිට කන්කසන්තුරේ දක්වා කිලෝමීටර් 56ක් දුර දුම්රිය මාර්ගය ගැන ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ එවකට සිටි සාමාන්‍යාධිකාරිතුමාගේ -අද අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම් ලලිතසිරි ගුණරුවන් මැතිතුමාගේ- පුවත් පත් ලිපියක බොහොම පැහැදිලිව සඳහන් වෙලා තිබෙනවා මා දැක්කා. එදා පලෙයි සිට කන්කසන්තුරේ දක්වා කිලෝමීටර් 56ක දුරින් යුතු දුම්රිය මාර්ගය -සමහර ද්විත්ව මාර්ග කොටස් එකතු වෙද්දි එය කිලෝමීටර් 70ක් විතර දීර්ඝ වන දුම්රිය මාර්ගයක්- හදන්න දුම්රිය දෙපාර්තමේන්තුව යම් මුදලක් ඇස්තමේන්තු කළා. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවන්ට ඒ දුම්රිය මාර්ගය හදන්න දුන්නොත් එය රුපියල් මිලියන 7,100කට හදන්න ඔවුන් ඇස්තමේන්තු කර තිබුණා. නමුත් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසානයේ මොකක්ද සිද්ධ වුණේ? ඒ ඔබතුමාගේ ප්‍රදේශය. ඉන්දියානු සමාගමක් මේ වන වන විට එම දුම්රිය මාර්ගය ඉදිකොට අවසන් කර තිබෙනවා. රුපියල් මිලියන 7,100ට ඇස්තමේන්තු කළ ඒ දුම්රිය මාර්ගය හදන්න දැන් රුපියල් මිලියන 21,000කට වඩා වැඩි මුදලක් වියදම් කර තිබෙනවා. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ හිටපු ඉංජිනේරුවන් සහ කම්කරුවන් මේ මාර්ගය හැදුවා නම් මේ මුදලින් තුනෙන් එකකට ආසන්න මුදලකින් තමයි මේ මාර්ගය හැදෙන්නේ. හැබැයි, ඒ දුම්රිය මාර්ගය හදන්න ඒ මුදල වාගේ තුන් ගුණයක් වියදම් කරන්න අද සිද්ධ වෙලා තිබෙනවා. පසු ගිය කාලයේ මේ රටේ කරපු සංවර්ධනය මේකද කියලා මම තමුන්නාන්සේලාගෙන් අහනවා. මේ මාර්ගයට තුන් ගුණයක් මුදල් වියදම් කළා. ඒ විතරක් නොවෙයි, ඒ මුදල ලබා ගත්තෙත් වාණිජ ණයක් විධියටයි. ඒ වාණිජ ණයට අද පොලිය ගෙවනවා. ඒ දුම්රිය මාර්ගය හදන්න සිල්පර කොට, රේල් පීලි ආදී සියල්ලමත් ගෙනාවේ පිට රටින්. දේශීය නිෂ්පාදනවලට එතැන ඉඩක් නිර්මාණය වුණේ නැහැ. කම්කරුවන් පවා විශාල සංඛ්‍යාවක් පිට රටින් අරගෙන ඇවිත් තමයි ඒ දුම්රිය මාර්ගය හැදුවේ. මේ රටට ලැබිය යුතු වාසි විශාල ප්‍රමාණයක් එදා ඒ තුළින් නැති වෙලා ගියා.

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අදාළව කළ තවත් කාර්යයක් මා දැන් කියන්නම්. කළුතර සිට මාතර දක්වා තිබෙන දුම්රිය මාර්ගය ගලවලා අලුතින් හැදුවා. ඒක එදා සුනාමිය ආපු වෙලාවේ මේ රටේ දුම්රිය දෙපාර්තමේන්තුවේ කම්කරුවන්, ඒ නිලධාරීන් එකතු වෙලා ශක්තිමත්ව හදපු දුම්රිය මාර්ගයක්. අලුතින් දුම්රිය මාර්ගයක් හදන්නම ඕනෑ නම් අඩුම තරමේ එය

[ගරු අචල ජාගොඩගේ මහතා]

ද්විත්ව මාර්ගයක් බවටවත් පත් කරන්න තිබුණා. හැබැයි, ඒ වෙනුවට මොකක්ද කළේ? අර කම්කරුවන් හදපු දුම්රිය මාර්ගය ගලවලා දැම්මා. ගලවලා ඩොලර් මිලියන 89ක් වියදම් කරලා ඒ දුම්රිය මාර්ගය හැදුවා. මාස හයක් ඒ දුම්රිය මාර්ගය වහලා තිබුණා. එහි අවසාන ප්‍රතිඵලය මොකක්ද? රුහුණු කුමාරි දුම්රිය විනාඩි 10කට කලින් කොළඹට ආවා. විනාඩි 10කට කලින් කෝච්චියක් කොළඹට ගේන්න, තිබුණු දුම්රිය මාර්ගය ගලවලා දමලා ඩොලර් මිලියන 89ක් වියදම් කරලා අලුත් දුම්රිය මාර්ගයක් හැදුවා. ඔන්න ඔය වාගේ සංවර්ධන ව්‍යාපෘති තමයි පසු ගිය ආණ්ඩුව මේ රටේ කරලා තිබුණේ.

ඊළඟට, මා කියන්නම් මාතර සිට බෙලිඅත්ත දක්වා වූ දුම්රිය මාර්ගය ගැන. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම දුම්රිය මාර්ගම තමයි උදාහරණ විධියට ගන්නේ. මාතර සිට බෙලිඅත්ත දක්වා වූ දුම්රිය මාර්ගයේ කිලෝමීටර් 28ක් දුර හදන්න කිලෝමීටරයකට යූඑස් ඩොලර් මිලියන 290 ගණනේ තමයි කොන්ත්‍රාත් අත්සන් කරලා අද ඒ කටයුත්ත සිද්ධ කරමින් තිබෙන්නේ. මෙවැනි සංවර්ධන ව්‍යාපෘති අපට අනුමත කරන්න පුළුවන්ද? මේකද සංවර්ධනය කියා කියන්නේ? මෙවැනි සංවර්ධන ව්‍යාපෘති නම් මේ රටට තවදුරටත් අවශ්‍ය වන්නේ නැහැ. මෙවැනි සංවර්ධන ව්‍යාපෘති නවත්වන එක මේ රජයේ වග කීමක්. මේවා "සංවර්ධනය" කියන වචනයෙන් එන ව්‍යාපෘති නොවෙයි. මේවා තමන්ගේ බඩ හදා ගන්න, තමන්ගේ පවුල් දේශපාලනය පළල් කර ගන්න, තමන්ගේ හිතවතුන්ගේ මඩි තර කරන්න හදා ගත්ත ව්‍යාපෘති. සංවර්ධන ව්‍යාපෘති ලෙස අප මේවා හඳුනා ගන්නවා නම් ඒක අප කරන බරපතළ දේශපාලන වැරැද්දක් කියන එක මා මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ.

ඔබතුමන්ලා කල්පනා කර බලන්න. සංවර්ධනය කියන්නේ මොකක්ද? අද අපේ රටේ අධ්‍යාපනයට සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? දැන් කිව්වා, "මහින්දෝදය විද්‍යාගාරවල බෝඩ් ලෑලිවල ප්‍රශ්න වුණා, අරක වුණා, මේක වුණා" කියලා. අද අපේ රටේ අධ්‍යාපනයට සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? අප අධ්‍යාපනය සංවර්ධනය කළාය කියලා මහා ලොකුවට කියන මේ උදව්ය අද අපේ රටේ විශ්වවිද්‍යාලවල තත්ත්වය ගැන කියන්නේ මොකක්ද? අද අපේ රටේ තිබෙන විශ්වවිද්‍යාලවල තත්ත්වය කොහොමද කියලා කල්පනා කර බලන්න. ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් අනුව ගත්තොත්, අද කොළඹ විශ්වවිද්‍යාලය 2,000න් පහළට ඇවිත් තිබෙන්නේ. පේරාදෙනිය විශ්වවිද්‍යාලය 3,000ට පහළ තැනක තිබෙන්නේ. ලෝකයේ විශ්වවිද්‍යාලවල මට්ටම් සමඟ ගත්තොත් අපේ රටේ විශ්වවිද්‍යාල පද්ධතිය සම්පූර්ණයෙන්ම කඩා වැටිලා තිබෙන්නේ. විශ්වවිද්‍යාලය කියන නම පාවිච්චි කරන්නවත් අයිතියක් නැති තැනට ඒවා කඩා වැටිලා තිබෙන්නේ. විද්‍යාත්මක පරීක්ෂණ කෙරෙන, විද්‍යාත්මක නිර්මාණ කෙරෙන, ලෝකයේ අලුත් සොයා ගැනීම් කෙරෙන විශේෂ වූ ආයතනයක් තමයි විශ්වවිද්‍යාලය කියා කියන්නේ. පසු ගිය කාල සීමාවේ ලෝකයේ බිහි වූ නිර්මාණවලට අපේ රටේ විශ්වවිද්‍යාල පද්ධතියේ දායකත්වය මොකක්ද? කිසිවක් සිද්ධ වෙලා නැහැ.

ලෝකයේ බිහි වූ නිර්මාණවලට අපේ විශ්වවිද්‍යාල පද්ධතියෙන් දායකත්වයක් නැති නිසා තමයි ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්වලදී අප පහළ මට්ටමට වැටිලා තිබෙන්නේ. ඒ තැනට විශ්වවිද්‍යාල තල්ලු වුණේ අපේ රටේ බුද්ධිමතුන් නැති නිසා නොවෙයි; ඒ තැනට තල්ලු වුණේ අපේ රටේ මහාචාර්යවරුන්ට, ආචාර්යවරුන්ට දැනුම නැති නිසා හෝ බුද්ධිය නැති නිසා නොවෙයි; ඒ තත්ත්වයට පත් වුණේ අපේ රටේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට දැනුම නැති නිසා නොවෙයි; විශ්වවිද්‍යාල සංවර්ධනය වෙනුවෙන් වෙන් කරපු මුදල් ප්‍රතිපාදන ප්‍රමාණය බින්දුවට වැටිලා තිබුණු නිසායි. විශ්වවිද්‍යාල පර්යේෂණවලට මුදල් වියදම් නොකරපු උදව්ය, ඒ වෙනුවෙන් මුදල් ප්‍රතිපාදන වෙන් නොකරපු උදව්ය අද කථා කරනවා, රටේ සංවර්ධනය කඩා ගෙන වැටිලා තිබෙනවාය කියා. ඒක කළේ අපි නොවෙයි, එදා එතුමන්ලාගේ වැඩ පිළිවෙළේ ප්‍රතිඵලයක් හැටියටයි එහෙම වුණේ.

සංවර්ධනය කියා මේ රටේ මොකක්ද කර තිබෙන්නේ? හොරකම, නාස්තිය, දූෂණය හැරෙන්න, මේ රටේ සංවර්ධනය කියා වෙන මොකක්ද කර තිබෙන්නේ? පෙරේදා අගමැතිතුමා මේ පාර්ලිමේන්තුවේ විශේෂ ප්‍රකාශයක් කරද්දී කිව්වා, "රට පුරාම ජනාධිපති මන්දිර හදමින් ජනාධිපති මන්දිරවලට රුපියල් කෝටි ගණන් වියදම් කරපු සංවර්ධනයක් තමයි පසු ගිය කාලයේ සිද්ධ කර තිබෙන්නේ" කියා. අපට ඒවා සංවර්ධනය විධියට හඳුනා ගන්න පුළුවන්ද? අපට ඒවා අනුමත කරන්න පුළුවන්ද? කල්පනා කර බලන්න.

අද අනුරාධපුරය, පොලොන්නරුව ප්‍රදේශවල වකුගඩු රෝගය පැතිරෙන්න පටන් ගෙන තිබෙනවා. ඒ ප්‍රදේශවල වකුගඩු රෝගීන් විශාල ප්‍රමාණයක් සිටිනවා. වකුගඩු රෝගීන්ට අවශ්‍ය වන රෝහල් හදන්න මුදල් ප්‍රතිපාදන වෙන් වුණේ නැහැ. වකුගඩු රෝගීන් වෙනුවෙන් රෝහල් හදන්න, ඔවුන් වෙනුවෙන් බෙහෙත් ලබා දෙන්න මුදල් ප්‍රතිපාදන වෙන් කරනවා වෙනුවට අන්තිමට රට පුරා හැදුවේ ජනාධිපති මන්දිරයි. ඒවා සංවර්ධනය විධියට අපට හඳුනා ගන්න පුළුවන්ද?

ඒ විතරක්ද? කල්පනාකර බලන්න. අද රටේ බොහෝදෙනෙක් තර්ක කරනවා, "උතුරු පළාත සංවර්ධනය කළා. උතුරු පළාතේ සංවර්ධන වැඩ පිළිවෙළක් තිබුණා. බස්නාහිර පළාත සංවර්ධනය කළා. පාරවල් හැදුවා. අරවා හැදුවා. මේවා හැදුවා." කියා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නාගරික සංවර්ධනය පිළිබඳව දන්නා, ඒ සම්බන්ධයෙන් අධ්‍යාපනය හදාරපු ඉංජිනේරු මහත්මයෙක් පසු ගිය දවසක මා මුණ ගැහිලා කිව්වා, "මේ කරපු සංවර්ධනය නාගරික සංවර්ධනය නොවෙයි. මේකට landscaping කියන වචනය පාවිච්චි කරන්න පුළුවන්" කියා. පසු ගිය කාලයේ කොළඹ සිද්ධ වුණේ landscaping සංවර්ධනයක්. උතුරේ සිද්ධ වුණේත් එහෙම සංවර්ධනයක්. උතුරේ සංවර්ධනයක් වුණා නම් උතුරේ දෙමළ ජනතාව පසු ගිය ආණ්ඩුව ප්‍රතික්ෂේප කළේ ඇයි? ඒ වෙන කිසිවක් නිසා නොවෙයි. ජනතාවට අවශ්‍ය කරන සංවර්ධනය කරන්න එතුමන්ලා සමත් වුණේ නැහැ. ජනතාවට අවශ්‍ය සංවර්ධන ව්‍යාපෘතීන් එතුමන්ලා හඳුනා ගත්තේ නැහැ. ජනතාවට අවශ්‍ය වෙලා තිබුණු ඇත්ත වුවමනාවන් හඳුනා ගෙන ඒ වුවමනාවලට පිළියම් කළේ නැහැ. ඒ වෙනුවට කොළඹ නගරයේ landscaping කර, උද්‍යාන පරිපාලනය කරන විධියට සකස් කළාය කියා ජනතාවගේ ප්‍රශ්න විසඳන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ.

සංවර්ධනය ජනතාවත් එක්ක ඉස්සරහට යන්න ඕනෑ දෙයක්. පසු ගිය කාලයේ මේ රටේ එවැනි සංවර්ධනයක් සිද්ධ වුණේ නැති බව අපි කවුරුත් දන්නවා. එම නිසා නැවතුණු සංවර්ධනයක් ගැන විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා කථා කරද්දී අපට ප්‍රශ්න කරන්න වෙන්නේ එතුමන්ලා මේ රටට කරපු සංවර්ධනය මොකක්ද කියායි. සංවර්ධනය වුණු දේවල් නම් අපි දන්නවා. ඇමති මණ්ඩලය නම් සංවර්ධනය වුණා. හිටපු ජනාධිපතිතුමාගේ පවුල් දේශපාලනය නම් සංවර්ධනය වුණා. පවුල්වල උදව්ය රාජ්‍ය ආයතන වසා ගෙන පවුල් ගහක් විධියට පැතිරිලා ඉන්නවා නම් අපි දැක්කා. ඒ සංවර්ධන ව්‍යාපෘතිය නම් මේ රජය නතර කර තිබෙන බව අපි බොහොම පැහැදිලිව කියන්න ඕනෑ. ඒක නතර කරන්න මේ රටේ ජනතාව තීන්දු ගත්ත නිසා තමයි පවුල් හදන සංවර්ධනය නතර කර, ඇමතිවරු තර කරන සංවර්ධනය නතර කර මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මේ රටේ ජනාධිපතිවරයා බවට පත් කළේ. එදා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති කරවලා දින සියයේ වැඩ පිළිවෙළක් ක්‍රියාවට නඟන්න මේ රටේ ජනතාව වරම දුන්නා. එදා ඒ ජන වරමෙන් පස්සේ විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂය ඒක පිළිගත්තා. දින සියයේ වැඩ පිළිවෙළ ක්‍රියාවට නඟන්න සහාය දෙනවාය කිව්වා. මේ දින

සියයේ වැඩ පිළිවෙළ යටතේ ජනතාවගේ ජීවිත සංවර්ධනය කරන්න අවශ්‍ය වන සියලු අභියෝග ජයග්‍රහණය කරන්න අවශ්‍ය වන මැදිහත් වීම මේ කෙටි කාලය ඇතුළත කරනවාය කියන එක බොහොම පැහැදිලිව මේ ගරු සභාවට කියන්න ඕනෑ.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු අචල ජාගොඩගේ මහතා
(மாண்புமிகு அச்சல ஜாகொடகே)
(The Hon. Achala Jagodage)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තව විනාඩි 2ක් දෙන්න.

ඒ අභියෝගය අපි සම්පූර්ණ කරනවා. අද විපක්ෂය මොකක්ද කරමින් ඉන්නේ? දින සියයේ වැඩ පිළිවෙළට සම්පූර්ණ සහයෝගය දෙනවාය කියා මුලදී කිව්වා. දින සියයේ වැඩ පිළිවෙළට සහාය දෙනවාය කියා දැන් විපක්ෂය කොහොමද සහාය දෙමින් ඉන්නේ? අදත් කියනවා, "බහුතර බලය එතුමන්ලාට තිබෙනවා" කියා. [බාධා කිරීමක්] ඒක ඇත්තයි. දින සියය කියන්නේත් වැඩ පිළිවෙළක්. ඒ වැඩ පිළිවෙළේ තිබෙන යෝජනා තමයි මේ ක්‍රියාවට නඟමින් තිබෙන්නේ. හැබැයි, පසු ගිය කාලයේ මොකක්ද කරමින් සිටියේ?

දින සියයේ වැඩ පිළිවෙළේ පළමුවන යෝජනාව පාර්ලිමේන්තුවට එන විට, කොන්දේසි ඉදිරිපත් වුණා; හිටපු ඇමතිවරුන්ට වාහන ඕනෑ, තෙල් ඕනෑ, වාහන දෙක දෙක ඕනෑ කියා. ඒ කොන්දේසි ක්‍රියාත්මක වුණේ නැත්නම් මේ යෝජනාවලට සහාය ලැබෙන්නේ නැහැ. ඊළඟ යෝජනාව එන විටත් කොන්දේසි එනවා. මොකක්ද කොන්දේසිය? විසුරුවන්න තිබෙන පළාත් පාලන ආයතන විසුරුවන්න බැහැ, අවුරුද්දක් කල් දමන්න ඕනෑ කියනවා. මේ විධියට කප්පම් දි දී මේ වැඩසටහන් ක්‍රියාවට නඟන්නට බැහැ. මම පිළිගන්නවා, පාර්ලිමේන්තුවේ බහුතරය විපක්ෂය බව. බහුතරය විපක්ෂය බවට පත් වෙලා තිබෙන්නේ අද මේ රටේ ජන මතය පාර්ලිමේන්තුව තුළින් නිරූපණය නොවන නිසායි; මේ රටේ ජන මතය වෙනස් එකක් නිසයි. ඒ ජන මතයට හිස නමලා තමයි එදා විපක්ෂය එකඟ වුණේ දින සියයේ-

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු මන්ත්‍රීතුමා, අද සම්මත වුණු ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත සේනක බිබිලේ මැතිතුමාගේ ඉඳන් මේ රටේ මිනිසුන්ගේ දශක තුන හතරක සිට තිබුණු බලාපොරොත්තුවක්. අද මේ පනත් කෙටුම්පතට ඡන්දය දෙන්න තමුන්නාන්සේලාගේ පක්ෂයේ ඇමතිවරුන් කී දෙනෙක් ආවාද? තමුන්නාන්සේ මතක තියා ගන්න, අපි සහයෝගය දෙන්නේ කප්පම් ගන්න නොවෙයි. ඒ වචනය ඉල්ලා අස් කර ගන්න. අපි මිත්‍රයෝ.

ගරු අචල ජාගොඩගේ මහතා
(மாண்புமிகு அச்சல ஜாகொடகே)
(The Hon. Achala Jagodage)
ඔබතුමා පෞද්ගලිකව කරන දේ නොවෙයි මම කියන්නේ, අද ප්‍රකාශයට පත් වන දේ පිළිබඳව මම කියන්නේ.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, your time is over.

ගරු අචල ජාගොඩගේ මහතා
(மாண்புமிகு அச்சல ஜாகொடகே)
(The Hon. Achala Jagodage)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම අවසන් කරනවා. මම රජයේ පාර්ශ්වය වෙනුවෙන් බොහොම පැහැදිලිව කියන්නට ඕනෑ, කිසිම සංවර්ධන ව්‍යාපෘතියක් නතර කරන්නට මේ රජය බලාපොරොත්තු වන්නේ නැති බව. කිසිම සංවර්ධන ව්‍යාපෘතියක් නතර නොකර වැඩ කරනවා විතරක් නොවෙයි. මේ රජය ඉදිරි කාලය තුළදී අලුතෙන් සංවර්ධන ව්‍යාපෘති පටන් ගන්නා බවත් සඳහන් කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Lakshman Yapa Abeywardena. You have six minutes.

[අ.භා. 5.52]

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින සභාව කල් තැබීමේදී විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා ඉතාම වැදගත් යෝජනාවක් ඉදිරිපත් කළා. අපේ හිටපු අමාත්‍ය ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මැතිතුමා සඳහන් කළා වාගේ ඉතාමත්ම වැදගත් පනත් කෙටුම්පතක් අපි මීට ටික වේලාවකට පෙර සම්මත කර ගත්තා. සම්මත කර ගන්නට මේ ගරු සභාවේ ඇමතිවරුන් 16 දෙනායි හිටියේ. විපක්ෂයෙන් විරුද්ධ වුණා නම් මේ පනත සම්මත වෙන්නේ නැහැ.

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
43න් 16 දෙනායි හිටියේ.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
අපි මේ පනතට සහයෝගය දුන්නා කියන්නේ හැම දේටම සහයෝගය දෙනවා කියන එක නොවෙයි. අවශ්‍ය දේට සහයෝගය දෙන්න අපි සූදානම්. සංවර්ධනය කියන එක ගමේ ජනතාවට දැනුණාද නැද්ද කියන කාරණය ගමේ ජනතාව දන්නවා. සංවර්ධනයේ මහා පරිමාණ දේවල් ගැන මේ ගරු සභාවේදී කථා කළා. කථා කළ මහ පරිමාණ සංවර්ධන වැඩසටහන්වල මොනවා හෝ වැරැද්දක් තිබෙනවා නම් ඒවා ගෙනෙන්න නියමානුකූලව, කවුද වැරදි කළේ කියා. ඒ ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ. මේ පාර්ලිමේන්තුවේදී වැරැද්දක් හැටියට හැම තිස්සේම සඳහන් කළේ මහා පරිමාණ පාරවල් සහ වෙනත් මහ පරිමාණයේ යෝජනා ක්‍රම සම්බන්ධවයි. නමුත් රුපියල් ලක්ෂ 20, 30 වාගේ, රුපියල් ලක්ෂ 100ට අඩු ව්‍යාපෘති සම්බන්ධව, -ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ TO සහ TA ගණන් හදලා, ඇස්තමේන්තු හදලා, රුපියල් ලක්ෂ 10ට වැඩි නම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිටින ඉංජිනේරුවා අනුමත කර, ගිවිසුම් අත්සන් කර, වැඩ කර- මුදල් ගන්නට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලත්, දිසාපති කාර්යාලවලත් අහිංසක මිනිසුන්ගේ බිල්පත් දහස් ගණනක් තිබෙනවා. සියලුම දේවල් නවත්වන්න, සියලුම ගෙවීම් නවත්වන්න කියා ස්වදේශ කටයුතු හා ධීවර අමාත්‍යාංශයෙන් චක්‍රලේඛයක් යවනවා. මේක කොපමණ සාධාරණද? මේ තිබෙන ඒවායින් සියයට 90ක් විතරම රුපියල් ලක්ෂ 100ට 200ට අඩු ඒවා. අපි කියන්නේ ඔය කියන ඒවා ටෙන්ඩර් නොකර දීලා තිබෙනවා නම් ඒ සම්බන්ධව ක්‍රියා

[ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා]

කරන්න. මේ ගරු ඇමතිවරුන් සියලු දෙනාම දන්නවා; ග්‍රාම සංවර්ධන සමිති, ග්‍රාමෝදය මණ්ඩල, ගොවි සමිති, වෙනත් සමාජ සමිති, යෞවන සමාජවලින් ගිවිසුම් අත්සන් කර කොන්ත්‍රාත් කළ සාමාන්‍ය ජනතාව විශාල පිරිසක් සිටින බව, -ග්‍රාම සංවර්ධන සමිතිය විසින් කොන්ත්‍රාත් කළ අය- මේ චක්‍රලේඛය නිසා මුදල් ලබා ගන්නට බැරිව. කැට ගල් අල්ලපු පාරවල්, වාරිමාර්ග යෝජනා ක්‍රම, සුළු ඇළවල් කැපූ ඒවාට චක්‍රලේඛයක් නිසා මුදල් දෙන්න බැරිව අද නතර වෙලා තිබෙනවා. මේ සියල්ලටම ඒ චක්‍රලේඛය අදාළ වෙනවා. ඒ චක්‍රලේඛය යැව්වාට පසුව දිසාපතිතුමාට තීන්දුවක් ගන්න විධියකුත් නැහැ, ප්‍රාදේශීය ලේකම්ට තීන්දුවක් ගන්න විධියකුත් නැහැ. ගම්වල අභිංසක මිනිසුන් සම්පූර්ණයෙන්ම අඩ පණ වෙලා සිටිනවා. මේ සංවර්ධන කටයුතු සම්බන්ධව ස්ථර 3ක් තිබුණා. ලොකු මිනිහා විතරක් නොවෙයි. පසු ගිය ආණ්ඩුව යටතේ යමක් හම්බ කර ගත්ත මිනිසුන් බහුතරයක් හිටියා. බලන්න, අද ටිපර් කීයක් ලීසිං ගෙවා ගන්නට බැරිව නවත්වලා තිබෙනවාද? අද ට්‍රැක්ටර් කීයක් බෝඩ් ගහලා විකුණන්න දමා තිබෙනවාද? අද පොඩි පොඩි කර්මාන්ත කීයක් නැති වෙලා තිබෙනවාද?

කැට ගල් අල්ලන මැෂින් එකක් ගත් මනුස්සයා -මෙවැනි ස්ථර- මේ රටේ ජීවත් වුණා. මේ එක එක ස්ථරවල ජීවත් වුණු ඒ ජනතාව හැම එක්කෙනාටම අද පහර වැදිලා තිබෙනවා. අපි කියන්නේ මේ ආණ්ඩුව පටන් ගත්ත දවසේ ඉඳලා කියන දූෂණය, වංචාව, හොරකම ආදී මේ ඔක්කෝම කිය කියා ඉන්නේ නැතිව ඒවා සොයන්න; ඒවා හොයලා වරදකරුවන්ට දඬුවම් දෙන්න කියලායි. කවුද එපා කියලා තිබෙන්නේ? කවුද ඒකට විරුද්ධ වෙලා තිබෙන්නේ? හැම දාම මේ ගැන කථා කරනවාට වඩා සංවර්ධනය කියන එකත් ගම් මට්ටමෙන් යන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එක ස්ථානයක් තිබෙනවා, ගිහිල්ලා බලන්න. දැයට කිරුළ වැඩසටහන පටන් ගන්න සූදානම් වුණු ගම්වල ඒ ප්‍රදර්ශනය නැවැත්වූවා කියලා හිතමු. වියදම වැඩි නිසා ඒ වැඩසටහන ඕනෑ නැහැ කියලා හිතමු. ඒ ගම්වල පාර කඩපු එක එහෙමම තිබෙනවා; තාප්පය කඩපු එක එහෙමම තිබෙනවා; බෝක්කුව කඩපු එක එහෙමම තිබෙනවා. ඔක්කෝම වැඩ බාගෙට නවත්වලා කොන්ත්‍රාත්කරුවන් සියලු දෙනාම ගිහිල්ලා. ඒ තැන්වල ගෙවල් හදාගෙන ඒවාට සූදානම් වුණු මිනිස්සුන්ගේ ආදායම් මාර්ග ඉවරයි. සමහර මිනිස්සු කෑමවලට බිල් නොගෙවා ගමෙන් ගිහිල්ලා තිබෙනවා. මේවා තමයි ආණ්ඩුවක් හොයන්න ඕනෑ. සියලු දේ එක චක්‍රලේඛයකින් සම්පූර්ණයෙන්ම නැවැත්වූවාම කොහොමද රටක් දුවන්නේ? ඒ නිසා මේ ගැන අපි හුඟාක් කල්පනා කරන්න ඕනෑ. පසු ගිය වකවානුව ඇතුළේදී සාමාන්‍ය ජනතාවට ග්‍රාමීය මට්ටමේ කුඩා පාරවල් විශාල ප්‍රමාණයක් හැදුණා; ඇළ මාර්ග හැදුණා. කිසිම දවසක එක ගමකට එක වැඩසටහනක් යටතේ කියලා මුදල් වෙන් වුණේ නැහැ. පසු ගිය කාල සීමාව ඇතුළත ඒක සිද්ධ වුණා. එසේ මුදල් වෙන් වුණාම කවදාවත් මන්ත්‍රීවරයෙකුට තමන්ට ඕනෑ තැනට විතරක් මුදල් දීලා අනෙක් තැන කපන්න බැරි වුණා. හැම ගමකටම ඒ මුදල් ගියා. ඒවා කළේ පොඩි මිනිස්සු. ඒවා මේ කියන මහා කොන්ත්‍රාත්කරුවන් කළේ නැහැ. ඒවා මේ කියන මහා පරිමාණයේ ජාවාරම්කරුවන් කළේ නැහැ. කීයක් හරි හම්බ කර ගත්ත මිනිස්සු ඒ හැම ගමකම හිටියා.

ජීවනෝපාය වැඩසටහන බලන්න. ඔරලෝසු බෙදුවායි කියලා දැන් මේ ගරු සභාවේ කථා කළා. විහිළුවක් නේ. ජීවනෝපාය වැඩසටහන යටතේ දීපු මුදල්වලින් ඔරලෝසු බෙදන්න පුළුවන්ද? ගිහිල්ලා බලන්න කියන්න එක දිසාපති කාර්යාලයකවත් එහෙම ඔරලෝසු අරගෙන තිබෙනවාද කියලා. ඒ මුදල්වලින් අරගෙන තිබෙන්නේ මොනවාද? සමහර තැන්වල මහන මැෂින් අරගෙන තිබෙනවා; ඉදිඇප්ප හදන මනුස්සයාට ඒ සඳහා අවශ්‍ය මැෂින් එක අරගෙන දීලා තිබෙනවා; මිරිස් කුඩු අඹරන මනුස්සයාට ඒ මැෂින් එක අරගෙන දීලා තිබෙනවා. තව පොඩි පොඩි දේවල් කොපමණ තිබෙනවාද? ඒ භාණ්ඩ ඔක්කෝම මිලදී අරගෙන තිබෙනවා. ඒ භාණ්ඩ මිලදී අරගෙන තිබෙන්නේ ආර්ථික සංවර්ධන නිලධාරින්, සමෘද්ධි නිලධාරින්, ග්‍රාම නිලධාරින් ආදී සියලු දෙනාගේම නිර්දේශ ඇතිවයි. ඒ නිර්දේශ අරගෙන ටෙන්ඩර් කැඳවලා, ඒ භාණ්ඩ අරගෙන අද ඒවා දිසාපති කාර්යාලවල, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල බෙදා ගන්න බැරිව ගොඩ ගැහිලා තිබෙනවා. ආසනයේ සංවිධායක ගිහිල්ලා ඒක කරනවා නම් කමක් නැහැ. කිසිම දෙයක් දන්නේ නැති කවුරු හරි සම්බන්ධීකරණ නිලධාරියෙක් ගිහිල්ලා ප්‍රාදේශීය ලේකම්ට කියනවා, වහාම මේක නතර කරන්න කියලා. ඒ මනුස්සයා දන්නෙත් නැහැ. අපේ ආණ්ඩුව ඉවත් වුණු ජනවාරි 9වෙනි දායින් පස්සේ දින 10ක් 15ක් මේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ගියේ කවුද? දේශපාලනඥයෙක් ගියා නම් කමක් නැහැ. ගිහිල්ලා කියනවා මේවා නතර කරන්න කියලා. මේ මිලදී ගැනීම් නීත්‍යානුකූල නම්, ටෙන්ඩර් කරලා මිලදී අරගෙන තිබෙනවා නම්, මිනිස්සු තෝරාගෙන තිබෙනවා නම්, ඒ මිනිස්සු හරියට වර්ග කරලා තිබෙනවා නම්, කරුණාකර ඒ මිනිස්සුන්ට මේ භාණ්ඩ දෙන්න. අද මේවා නිසා මුළු යන්ත්‍රණයම හිර වෙලා තිබෙනවා. මිනිස්සු මේකෙන් එක දෙයක් පමණක් නොවෙයි බලාපොරොත්තු වුණේ. අද මිනිස්සු විශාල බලාපොරොත්තුවකින් ඉන්නවා ඒවා යථා තත්ත්වයට පත් වේවි කියලා. විරුද්ධ පක්ෂයේ ඉන්නවා නම් අපිට තිබෙන හොඳම දේ තමයි සංවර්ධනය ගැන කථා නොකර ඉන්න එක. මේවා නොකෙරුණාම වැඩිය හොඳයි. නමුත් ඒක නොවෙයි ප්‍රතිපත්තිය. පසු ගිය කාලයේ මහජනතාවට යම් සේවයක් ගම් මට්ටමෙන් සිද්ධ වුණා. අපේ ප්‍රතිපත්තිය වෙලා තිබෙන්නේ ඒ සේවය ඉස්සරහට ගෙනයාමයි. මොකද කවුරු ඇමති වුණත්, කවුරු මන්ත්‍රී වුණත්, මහජනතාවයි අපි මෙතැනට එවලා තිබෙන්නේ. මහජනතාව අපි මේ ගරු සභාවට එවලා තිබෙන්නේ ඔවුන් වෙනුවෙන් කථා කරන්නයි. ඇමතිවරු දෙතුන් දෙනෙකුගේ කථා කිහිපයක් මම අහගෙන හිටියා. ඒ අය ඔක්කෝම කිව්වේ මහා පරිමාණයේ කොන්ත්‍රාත්කරුවන් ගැනයි. අපි ඒවාට උත්තර දෙන්නම් යම් යම් කාරණා සම්බන්ධයෙන් මොකක්ද ක්‍රියා පටිපාටිය කියලා. කරුණාකර ඒවා ඉදිරිපත් කරන්න. කරුණාකර මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ලක්ෂ දෙසීයට, තුන්සියයට අඩු ලැයිස්තු මොනවාද, ලක්ෂ එක්දහස් පන්සියය, දෙදහස, විසිදහස, ඒවා මොනවාද කියලා. "මෙන්න මේවා විතරයි අපි දැනට නතර කරන්නේ. මෙන්න මේවා අපි දැන් ක්‍රියාත්මක කරන්න දන්වලා තිබෙනවා" කියලා කරුණාකර මේ පාර්ලිමේන්තුවට කියන්න. එතකොට මේ තත්ත්වය නිවැරදි වෙයි. මම කනගාටු වෙනවා, වග කිව යුතු එකම ඇමතිවරයෙක්වත් මේ අවස්ථාවේ මේ ගරු සභාවේ නැතිවීම ගැන. එක්කෙනෙක්වත් නැහැ. ඉතින් අපි කාට කථා කරන්නද? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කල් තැබීමේ යෝජනාව ගෙනෙන්න කටයුතු කළේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමායි. ගම ඇතුළේ තිබෙන ප්‍රශ්නයක් ආණ්ඩුවේ හා විපක්ෂයේ හැම මන්ත්‍රීවරයාටම දැන් ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා කරුණාකර මේක නිවැරදි කරන්න කියලා ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා. ස්තූතියි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Piyasena Gamage. You have five minutes.

[අ.භා. 6.01]

ගරු පියසේන ගමගේ මහතා
(மாண்புமிகு பியசேன கமகே)
(The Hon. Piyasena Gamage)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ දිනවල සමස්ත රටම දැඩි අපහසුතාවට පත් වෙලා තිබෙන ප්‍රශ්නයක් පිළිබඳව

තමයි අද මේ ගරු සභාවේ කථා කරන්නට යෙදෙන්නේ. ලක්ෂ්මන් යාපා අබේවර්ධන මැතිතුමා සඳහන් කළා වාගේ දැන් මේ වේලාවේ අපි මේ ගැන කථා කළාට මේ ගරු සභාවේ මේවා අහන්න කෙනෙක් නැහැ. ඇමති කෙනෙක් නොවෙයි, අඩු ගණනේ මේ වේලාවේ ආණ්ඩු පක්ෂයේ එක මන්ත්‍රීවරයෙක්වත් මේ ගරු සභාවේ නැහැ.

සමස්ත රට පුරා පසු ගිය වසරේදී කරන ලද දැවැන්ත සංවර්ධනය වෙනුවෙන්, විශේෂයෙන් ගමට වැඩ කරලා ගම හදලා රට හදන්න ගත් ප්‍රයත්නයේදී විශාල මුදල් ප්‍රමාණයක් ගමට ලබා දුන්නා. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හරහා දිස්ත්‍රික්ක මට්ටමින් ඒ වාගේම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින්, ග්‍රාම නිලධාරි වසම් හරහා ක්‍රියාත්මක කරන්න විශාල මුදල් ප්‍රමාණයක් සෑම දිස්ත්‍රික්කයකටම වෙන් වුණා. මේ අවස්ථාවේදී මම ගාල්ල දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් වශයෙන් විශේෂයෙන්ම කියන්න ඕනෑ, ගාල්ල දිස්ත්‍රික්කය සඳහා 2014 වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 19ක් තුළ සංවර්ධන ව්‍යාපෘති හඳුනා ගෙන ක්‍රියාත්මක කරන්න රුපියල් මිලියන 3,917ක් වෙන් කරලා තිබුණු බව. මේ රුපියල් මිලියන 3,917 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 19 තුළ බෙදුණා. ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට රුපියල් මිලියන 120ක්,130ක් වාගේ ප්‍රමාණයක් ලැබුණා. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් කළ යුතු සංවර්ධන ව්‍යාපෘති අපේ ජන සභා හරහා හඳුනා ගෙන, ඒ යෝජනා අරගෙන ඒවා ක්‍රියාත්මක කරන්න මේ ලැබුණු මුදල්වලින් ඇස්තමේන්තු කළා. ප්‍රාදේශීය ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් ඒ කටයුතු කළා. සංවර්ධන කමිටුවේ සභාපතිවරයා මේ කටයුතුවලට සම්බන්ධ වුණා. ඒ සංවර්ධන කටයුතුවලට වැයවෙලා තිබෙන්නේ ලොකු ගණන්වලින් නොවෙයි, රුපියල් ලක්ෂ 2,3,5,6, 8,10 වැනි ප්‍රමාණයෙන්. වැඩිම වුණොත් රුපියල් ලක්ෂ 15යි. මේ වාගේ පොඩි ව්‍යාපෘති කරන්න තමයි මේ මුදල් ගත්තේ. ගමේ යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා ඉතාම වටිනා වැඩ කොටසක් මේ මුදල් යොදවලා ක්‍රියාත්මක කළා. මේ වෙන් කරන ලද මුදල්වලින් කොටසක් ඒ වැඩ කරපු ව්‍යාපෘතිවලට 2014 දෙසැම්බර් 31 මුදල් වර්ෂය අවසානය වනකොට ගෙවලා තිබෙනවා. ඉන් පසුව කරපු වැඩවලට මුදල් නොගෙවා තිබෙනවා. නමුත් ඒ සියලු වැඩ කරලා අවසන්. ග්‍රාම නිලධාරි කොට්ඨාස මට්ටමින් ඒ හඳුනා ගත්ත ව්‍යාපෘතිවල වැඩ නිම කරලා, ඒවා TA කෙනෙක් සහතික කරලා, ප්‍රාදේශීය ලේකම් සහතික කරලා, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට මුදල් ගෙවීම සඳහා එවලා තිබෙනවා. එසේ ගෙවීමට තිබෙන මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 2,307ක්. ඒ අනුව රුපියල් මිලියන 2,307ක් ගෙවීමට තිබෙනවා. මේ මුදල තමයි අපේ මිනිසුන්ට ලැබෙන්න තිබෙන්නේ. ඒ වැඩ සියල්ල කරලා ඉවරයි. අදාළ බිල් ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒත් මේ මුදල දීම නතර කරලා තිබෙනවා. ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් එවන ලද චක්‍රලේඛයක් මඟින් මේ මුදල් ගෙවීම පමණක් නොවෙයි, සියලු වැඩ සම්පූර්ණයෙන් නතර කරලා තිබෙනවා.

මීට අමතරව අවිච්ඡේද වැඩ තිබෙනවා. දැනට භාගයක් කරලා අවසන් වුණ වැඩ කොටස් තිබෙනවා. දැන් ඒ සියල්ල නතර කරලා තිබෙන්නේ. මේ ව්‍යාපෘති අතර සියයට 20ක මුදලක් ලබා දීපු ඒවාත් තිබෙනවා. නමුත් දැන් මේ එකක්වත් කර ගන්න බැරිව සියල්ල නතර වෙලා තිබෙනවා. එක පැත්තකින් වැඩ කරපු අයට මේ වැඩ සඳහා රුපියල් මිලියන 893ක් තව ගෙවන්න තිබෙනවා. අවිච්ඡේද වුණ ඒවා තිබෙනවා රුපියල් මිලියන 1361ක්. ගිය අවුරුද්දේ කර ගන්න බැරිව ඉතුරු වුණ අවිච්ඡේද වැඩ. ව්‍යාපෘති පටන් ගෙන භාගයක් කරලා තිබෙන ඒවා. ඉතින් මේ මුදල් දෙනවා කියලා කැබිනට් අනුමැතියත් තිබෙනවා. නමුත් ඒ පිළිබඳව මේ දක්වා කිසිම දැනුම් දීමක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට කරලා නැහැ; මුදල් දීලාත් නැහැ. අඩු ගණනේ නතර කළ වැඩ නැවත කර ගෙන යන්න කියලාවත් කියලා නැහැ.

රටේ සංවර්ධනය ගැන කථා කරන, නව ජවයක් යටතේ අපේ ආණ්ඩුවක් යනවා කියලා කථා කරන අපේ නව ආණ්ඩුවේ කැබිනට් අමාත්‍යවරු මෙහෙම කටයුතු කරමින් මේ මුදල් ප්‍රතිපාදන දුන්නේ නැත්නම් ඒක අපේ ගම්වල ඉන්න සුළු මිනිසුන්ටයි බලපාන්නේ. ඔවුන් කොන්ත්‍රාත්කාරයෝ නොවෙයි. ගමේ සමිතියක් තමයි මේ ගිවිසුම් අත්සන් කරලා තිබෙන්නේ. කවුරු හරි පොඩි වැඩක් කරන්න පුළුවන් කෙනෙක් තමයි මේ contracts කරලා තිබෙන්නේ. ඒ වැඩ කරපු කෙනාට, ගමේ ඒ සමිතියට දැන් මේ මුදල ලැබෙන්න ඕනෑ. නමුත් මේ මුදල ලබා ගැනීමට නොහැකිව අද විශාල පිරිසක් බොහොම අපහසුතාවට පත් වෙලා තිබෙනවා. මේ ව්‍යාපෘති සඳහා ගත්ත මුදල් ගෙවා ගන්න බැරුව මේ අය තමන්ගේ නිවස, කණකර අබරණ පවා උගස් කරලා තිබෙනවා. බැංකුවලට ණය වෙලා තිබෙනවා. පොඩි ව්‍යාපාරිකයෝ තමයි මේවාට මැදිහත් වෙලා තිබෙන්නේ. කුඩා පරිමාණයේ වාගේම මධ්‍ය පරිමාණ, මහා පරිමාණ වශයෙන් කොන්ත්‍රාත් කරපු අයටත් මේ විධියටම සිදුවෙලා තිබෙනවා.

මේ නිසා රට පුරා මහා පරිමාණයෙන් කොන්ත්‍රාත් කරපු සමාගම්වල කටයුතු කරපු 50,000කට වඩා අධික පිරිසකට අද රැකියා අහිමි වෙලා තිබෙනවා. කුඩා වශයෙන් නොවෙයි, මධ්‍ය පරිමාණ, මහා පරිමාණ වශයෙන් කොන්ත්‍රාත් වැඩ කරපු අය ළඟ හිටපු සේවකයන්ට වැඩ දීමේ හැකියාවක් අද නැති වෙලා තිබෙනවා. ඉතින් මේ තත්ත්වය යටතේ රැකියා නොමැති විශාල පිරිසක් අද ඉන්නවා. ඒ සේවය කරපු අයට පඩිත් නැහැ. අලුත් අයට රස්සාත් නැහැ. මෙවැනි තත්ත්වයක් අද උදා වෙලා තිබෙනවා. ඒ නිසා අද අපි මේ වෙලාවේ විශේෂයෙන් ස්වදේශ කටයුතු අමාත්‍යවරයාගෙන් ඉල්ලීමක් කරනවා, වැඩ කරලා අවසන් වෙලා ඒ බිල් ඉදිරිපත් කරලා තිබෙන අයගේ හිඟ මුදල් ගෙවීමට දිස්ත්‍රික් ලේකම්වරුන්ට ඒ අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන්න කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය කාලයේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හරහා අපේ ගම්වල ග්‍රාමීය පාලම් විශාල ප්‍රමාණයක් ඉදි කිරීම ආරම්භ කළා. ඒ ඉදි කිරීම් ආරම්භ කළත් මුදල් නැති නිසා දැන් ඒවා අතර මඟ නතර කරලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. අපේ හැම දිස්ත්‍රික්කයකම හැම මන්ත්‍රී කොට්ඨාසයකටම මාර්ග කිලෝමීටර් 25 ප්‍රමාණයෙන් කාපට් ව්‍යාපෘති ලැබුණා. ඒවායේ වැඩවලින් භාගයක් කරලා ඉතිරි ටික කරලා නැහැ. තවත් රුපියල් මිලියන 1,700ක් විතර ඒවාට ගෙවන්න තිබෙනවා. ඒ නිසා භාගයට වැඩ කරපු ඒ පාරවල් දැන් යන්න බැරි තත්ත්වයට පත් වෙලා තිබෙනවා. කරපු වැඩවලින් වැඩකුත් නැහැ. ඒ පාරවල් අද යන්න බැරි තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා අලුතින් වැඩ කරන්න ඉස්සර වෙලා, ඒ කරපු වැඩ ටික අවසන් කරන්න අවශ්‍ය ප්‍රතිපාදන රජය මඟින් ලබා දිය යුතුව තිබෙනවා. මේ වෙලාවේ අපි ඉල්ලා සිටින්නේ ඒකයි. ගාලු දිස්ත්‍රික්කයේ වාගේම අනෙක් හැම දිස්ත්‍රික්කයකම කරගෙන යමින් තිබූ ඒ ව්‍යාපෘති ගැන සොයා බලා අවශ්‍ය කටයුතු කරන්න. කථාව විතරක් තිබුණාට මදි. දැනුත් කිව්වා ප්‍රතිපාදන දෙනවා කියලා. දෙනවා කිව්වාට වැඩක් නැහැ. මේ රජය පත් වෙලා දැන් තුන්වන මාසයයි යන්නේ. කරුණාකර ඒ ප්‍රතිපාදන, වෙන් කරපු මුදල් ඒ විධියට ලැබෙන්න සලස්වන්න කියා මේ වෙලාවේ ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

[අ.භා. 6.08]

ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා
(மாண்புமிகு உதித் லொக்குபண்டார)
(The Hon. Udith Lokubandara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද පාර්ලිමේන්තුව පමණක් නොවෙයි, මුළු මහත් රටම ව්‍යාකූල වෙලා තිබෙන අවස්ථාවක්. අප දන්නා පාර්ලිමේන්තු සම්ප්‍රදායේ හැටියට පාර්ලිමේන්තු මැතිවරණයක් පැවැත්වූවාට පස්සේ, ඒ

[ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා]

මැතිවරණයේ ප්‍රතිඵලය පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගෙන් පිළිබිඹු වනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් පිළිබිඹු වන ප්‍රතිඵලය ඒ පාර්ලිමේන්තු කාල සීමාවට වලංගු වෙනවා. ඒ වලංගුතාව පාර්ලිමේන්තු මැතිවරණයකදී ජනතා අභිමතය මත යළිත් වතාවක් වෙනස් වෙනවා. නමුත් ඉතිහාසයේ පළමුවැනි වතාවට ජනතා පරමාධිපත්‍ය කුණු කූඩෙට වැටුණු අවස්ථාවක, තිස් අවුරුදු කුරිරු, ශාපලත් යුද්ධයක් නිම වෙලා අපේ මාතෘ භූමිය නව ගමනක් ආරම්භ කරපු, යම්කිසි ගමනක් යන්න පටන්ගත්තු අවස්ථාවක වූ සිද්ධියක් මත මුළු රටම එක තැනක හිර වෙලා, නැවතිලා තිබෙන වෙලාවක තමයි අපේ ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමාට සිද්ධ වන්නේ, උත්තරීතර පාර්ලිමේන්තුවට මේ යෝජනාව ගෙන එන්න. ඒ අන් කවරක් නිසාවත් නොවෙයි, රටේ සංවර්ධනය ඉදිරියට කරගෙන යෑමේ වගකීම විරුද්ධ පාර්ශ්වයේ නායකතුමාට භාර ගන්න සිදු වන තැනට අද මේ රට පත් වෙලා තිබෙන නිසා. මේක තමයි අද රටේ තත්ත්වය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අපටත් ප්‍රශ්න තිබෙනවා. අපේ හෘදය සාක්ෂියට, අපේ හදවතට තට්ටු කරලා ඇහුවොත්, මේ කය අද තිබෙන්න ඕනෑ මෙතැන නොවෙයි, මහනුවර. මේ කය මහනුවර තිබෙන්න ඕනෑ වුණාට විනයක් තිබෙන පක්ෂයක් හැටියට, පක්ෂයට අවනත වෙලා ඉන්න මන්ත්‍රීවරුන් කණ්ඩායමක් හැටියට අපි අද පාර්ලිමේන්තුවේදී කථා කරන්නේ අපේ පක්ෂයට ඡන්දය දීපු අපේ ජනතාවගේ ගැටලු පිළිබඳවයි. මේක තමයි යථාර්ථය; සත්‍යය. අද මේ ගරු සභාවේ කථා කරපු ඇමතිවරු, මේ විවාදයේදී පිළිතුරු දෙන්න මුලින්ම නැඟී සිටි ගරු ජෝශප් මයිකල් පෙරේරා අමාත්‍යතුමා මොනවාද කිව්වේ? එතුමාගේ කථාවේ කිසිම හරයක් තිබුණාද? උත්තරයක් තිබුණාද? ඔබට නියමිත කාලය මෙපමණයි කියලා පාර්ලිමේන්තුවේ කාලය දුන්නාට පස්සේ ඒ කාලය අවසන් වන තෙක් නිකම් "පව - පව" ගාලා යම්කිසි දෙයක් කියාගෙන කියාගෙන යන එක නොවෙයි කළ යුත්තේ. අපි පාර්ලිමේන්තුවෙන් බලාපොරොත්තු වන්නේ එය නොවෙයි.

අද අපට කනගාටුවට පත් වෙන්න සිදු වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි කොහොමද මේ පාර්ලිමේන්තුව ඉදිරියට ගෙන යන්නේ? දැන් මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ එකම එක මන්ත්‍රීවරයකුවත් නැහැ.

ගරු අචල ජාගොඩගේ මහතා
(மாண்புமிகு அச்சல ஜாகொடகே)
(The Hon. Achala Jagodage)
මම ඉන්නවා.

ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා
(மாண்புமிகு உதித் லொக்குபண்டார)
(The Hon. Udith Lokubandara)
එකම එක පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු පමණක් නියෝජනය වන විට මේක පාර්ලිමේන්තුවක්ද? මම ඔබතුමාගෙන් ඒ ප්‍රශ්නය අහනවා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මම තනිවම කථා කරනවා, හිස් පුටු ගොඩකට. මෙන්න මහා ලොකු පාර්ලිමේන්තුව! මෙන්න මහා ලොකු යහ පාලනය!! මේ පාලනය ගෙනෙනවා කියලා තමයි උඩ පැනගෙන කිව්වේ. පාර්ලිමේන්තුවට බලය ගෙනෙනවා කියලා මහා ලොකුවට කියපු අය අද කෝ?

අද මේ අවස්ථාවේ මේ ගරු සභාව ඇතුළේ එක මන්ත්‍රීවරයකුවත් නැහැ. ඔන්න, ගරු අජිත් පී. පෙරේරා නියෝජ්‍ය ඇමතිතුමා යාන්තම් ආවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මේ අවස්ථාවේදී සභාවට පැමිණීම පිළිබඳව මම ඔබතුමාට බොහොම ස්තුතිවන්ත වනවා. මොකද, නැත්නම් මට කථා කරන්න වන්නේ නැහැ. පාර්ලිමේන්තුවේ කටයුතු නවත්වා දමා අපට යන්න වනවා. එතුමා වාගේ ගරු නියෝජ්‍ය අමාත්‍යවරු එක් කෙනෙක් හරි ඉතිරි වෙලා ඉන්න එක ගැන අපි සතුටු වනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, නැවත වරක් ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම කියාගෙන ආවේ අපේ රටේ සංවර්ධනය අඩ පණ වීම පිළිබඳවයි. අපේ ගරු මන්ත්‍රීතුමන්ලාත් ඒ පිළිබඳව කථා කළා. හැබැයි, මෙතැන තිබෙන ශෝචනීය තත්ත්වය තමයි, අහන ප්‍රශ්නවලට උත්තර නොලැබීම. මේ දේවල් සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න අපි කැමැතියි. ඔබතුමා වැනි උගත් නියෝජ්‍ය අමාත්‍යවරු සහ අමාත්‍යවරු මේ ඇමති මණ්ඩලයේ ඉන්නවා. ගරු කබීර් හාෂිම් අමාත්‍යතුමා එතුමාගේ අමාත්‍යාංශයේ ගැටලු පිළිබඳව කථා කළා. එය ඉතාමත්ම හොඳයි. එතුමා ප්‍රශ්නවලට උත්තර දුන්නා. ඒ පිළිබඳව අපි සතුටු වනවා.

ගරු හර්ෂ ද සිල්වා නියෝජ්‍ය ඇමතිතුමා අද කථා කළා. මේ රට ගිය ගමන පිළිබඳව එතුමාට තවම අපැහැදිලියි. එය සාධාරණයි. නාන ළිඳක් සංවර්ධනය කිරීමට රුපියල් ලක්ෂ පහක් ගියේ කොහොමද කියලා එතුමා අහනවා. එතුමා එහෙම අහන එක සාධාරණයි නේ? එතුමා නාන ළිඳක් දැකලා නැහැ. එතුමා කවදාද පොදු ළිඳක නැවේ? අපි ගමේ මිනිස්සු. එතුමාට මේක මීට වඩා හොඳට පැහැදිලි වනවා, public baths කියලා කිව්වා නම්. ගරු අජිත් පී. පෙරේරා නියෝජ්‍ය ඇමතිතුමනි, මේ සම්බන්ධයෙන් ඔබතුමා දන්නවා. ඔබතුමා විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමා රට රාජ්‍යවලට යනවා. පොදු නාන ළිඳ කියන්නේ වගා ළිඳක් වාගේ වළක් හාරා එතැන බකට් එකක් තියා ගෙන නාන තැනක් නොවෙයි. පොදු නාන ළිඳ කියන්නේ ගමේ ඉන්න ජනතාව නාන්න පොදුවේ පාවිච්චි කරන ළිඳ. මේ ළිඳ සංවර්ධනය කරන කොට අපි කරන්නේ නිකම්ම නිකම් වළක් කපා වතුර ගන්න එක නොවෙයි. පොදු නාන ළිඳක් හදන කොට ඒවා සම්පූර්ණ කරන්නේ පිරිමින්ට, ගැහැනුන්ට කියලා කාමර වෙන් කරලා, වැසිකිළි පද්ධති වෙන් කරලා, වෙනම showers සවි කරලා, වෙනම changing rooms දීලා එම පහසුකම් සියල්ල සමඟයි.

මාතෘ සායන මධ්‍යස්ථාන පිළිබඳව බලන්න. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාට ආරාධනයක් කරනවා, අපේ හිවල්කඳුර, ගම්පහ මාතෘ සායන මධ්‍යස්ථානය බලන්න එන්න කියලා. එම මාතෘ සායන මධ්‍යස්ථානය පිළිබඳව මම ආඩම්බර වනවා. ඒක අපි හැදුවේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ මුදල්වලින්. තව මාතෘ සායන මධ්‍යස්ථාන හයකට ගිය වසරේ අපි මුදල් ප්‍රතිපාදන වෙන් කළා. ඒ මාතෘ සායන මධ්‍යස්ථානවල වැඩ කටයුතු දැන් මඟ නැවතිලා. අපේ ගමේ අම්මලාට හම්බ වන්නේත් දරුවෝ. ඔබතුමන්ලාගේ ගෙදර ඔබතුමන්ලාගේ පවුල්වල අම්මලා පෞද්ගලික රෝහල්වලට ගිහිල්ලා සල්ලි ගෙවා ලබන සැප සම්පත් අපේ ගමේ අම්මා කෙනකුට ලැබුණාම ඒක වැරදිද? ඒවා නාස්තිකාර වියදම් වන්නේ කෙසේද? ගමේ අම්මලාගේ දරුවෝ හැම දාම කිරන්න ඕනෑ සියඹලා ගහේ වීත්තයේ එල්ලලාද? ඒකද, ඔබ තමුන්නාන්සේලාගේ යහ පාලනය? ඒකද, ඔබ තමුන්නාන්සේලා කියන සාධාරණීකරණය? ඒ පිළිබඳව අප කනගාටු වනවා.

කොන්ත්‍රාත්කරුවන්ගේ ප්‍රශ්න පිළිබඳව කබීර් හාෂිම් ඇමතිතුමා කිව්වා. මේ අය මහා පරිමාණයේ කොන්ත්‍රාත්කරුවෝ ලු. ඇත්ත. දෙපැත්තටම සල්ලි දීපු නැති කොන්ත්‍රාත්කරුවෝ එක් කෙනෙක්, දෙන්නෙක් ඇති. ඒ ගොල්ලන් ගැන දැන් හොයනවා ඇති. හොයන්න. කමක් නැහැ. ඒ පිළිබඳව ප්‍රශ්නයක් නැහැ. මේ අය සම්බන්ධයෙන් අපටත් තොරතුරු එනවා. සමහර කොන්ත්‍රාත්කරුවන්ගේ බිල් ටික ගෙවිලා කියලා අපටත් ආරංචි වනවා. අපි මේ කථා කරන්නේ ඒකයි. එක කොන්ත්‍රාත්කරුවකු නරක් වන්නයි, අනික් කෙනා හොඳ වන්නයි බැහැ නේ? එහෙම වන්න බැහැ.

එම නිසා ඔබ තමුන්නාන්සේලා මීට වඩා වග කීමෙන් මේ දේවල් ගැන පොඩ්ඩක් හොයන්න කියලා විශේෂයෙන් මේ රජයේ අමාත්‍යවරුන්ගෙන් සහ නියෝජ්‍ය අමාත්‍යවරුන්ගෙන් මම ඉල්ලා සිටිනවා. හැම දේටම හොරා හොරා කියලා නිරුවත වහ ගන්න බැහැ.

තව ප්‍රශ්නයක් තිබෙනවා. හිටපු ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා 2014 වර්ෂයේදී මුදල් අමාත්‍යවරයා හැටියට වග කීමෙන් 2015 වර්ෂයට අය වැය හදලා ඉදිරිපත් කළා. ඒ අය වැය තුනෙන් දෙකක ඡන්දයකින් මේ උත්තරීතර සභාවේ දී සම්මත වුණා. තමුන්නාන්සේලාට මුදල් නැහැ කියන්න බැහැ.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා
(மாண்புமிகு உதித் லொக்குபண்டார)
(The Hon. Udith Lokubandara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තව විනාඩියක කාලයක් දෙන්න.

ඊට පස්සේ වර්තමාන ජනාධිපතිතුමා ඉදිරිපිට දිවුරුම් දීපු සුළුතර පක්ෂයක අමාත්‍යවරයෙක්, පොඩි estimate එකකින් කොත්තමල්ලි, කහවල මිල ගණන් පොඩ්ඩක් එහාට මෙහාට කළා. හැබැයි මුදල් නැහැ කියන්න බැහැ. මොකද, හිටපු අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ අය වැය ලේඛනයෙන් 2015 වර්ෂයට මුදල් වෙන් කර, අනුමත කරත් අවසන්. උම්බලකඩයක, කොත්තමල්ලි ටිකක මිල රුපියලකින් දෙකකින් ටිකක් එහාට මෙහාට වුණාය කියා, එහෙම නැත්නම් හිතාගෙන ඉන්න දේවල් ගැන කිය කියා, රටේ සංවර්ධනය පස්සට ගේන්න යන කොට අපි එතැනදී නැහැ.

අනෙක් කාරණය මෙයයි. ගරු අවල ජාගොඩ මන්ත්‍රීතුමා - මගේ යහළුවා- කියා සිටියා, දින සියයේ යහ පාලන වැඩ පිළිවෙළට අපි සහයෝගය දෙන්නම් කිව්වේ, අපේ ගරු මන්ත්‍රීතුමන්ලා වාහනවලටයි, පෙට්‍රල්වලටයි යට වෙලාය කියා. නැහැ. අපට එහෙම කිසිම අවශ්‍යතාවක් වුණේ නැහැ. [බාධා කිරීමක්] ඔබතුමා හොඳට මතක තියා ගන්න. ඔය කාටවත් තෙල් ගහ ගන්න බැරිකමකට අපි යහ පාලනයට අත උස්සන්න ගියේ නැහැ කියන එක.

ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා අපේ පක්ෂයේ සභාපතිතුමා. අපේ ගරු සභාපතිතුමාගේ වැඩ පිළිවෙළට අපි සහයෝගය දෙනවා. ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ කනෙන් රිංගලා, එතුමාටත් කොකා පෙන්වලා, රටට කොකා පෙන්වන්න අපි ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෝ හැටියට කීයටවත් ඉඩ දෙන්නේ නැහැ. රටේ ජනතාවගේ ජනමතය වෙනුවෙන් හැම දාම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පෙනී සිටින බව කියමින්, තෙරුවන් සරණින් තමුන්නාන්සේලා සියලු දෙනාටම සුභ අනාගතයක් වේවායි කියා පතමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට පොඩ්ඩක් අවසර දෙන්න. මගේ සම්බන්ධීකරණ කමිටුවල "අව්ච්ඡේද ලේඛන" මා **සභාගත*** කරනවා. ඒ වාගේම හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ කථාවට සම්බන්ධව එතුමාට සභාගත කරන්නට නොහැකි වුණු මේ ලියවිලිත් එතුමාගේ ඉල්ලීම පරිදි **සභාගත*** කරන්නටය කියා මා මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ඊළඟට, ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා.

Order, please! Before that, will an Hon. Member propose the Hon. Udith Lokubandara to take the Chair?

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - வெளிநாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Ajith P. Perera - Deputy Minister of Foreign Affairs)
I propose that the Hon. Udith Lokubandara do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு உதித் லொக்குபண்டார அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. UDITH LOKUBANDARA *took the Chair.*

[අ.භා. 6.20]

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඌව පළාතේ මන්ත්‍රීවරයකු වන මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කවුරුත් දන්නවා, පසු ගිය ජනවාරි මාසයේ 8වන දා මේ රටේ පැවැත් වූ ජනාධිපතිවරණයෙන් මේ රටේ ජනාධිපති හැටියට මෛත්‍රීපාල සිරිසේන මහතා මේ රටේ බහුතර ජනතාව විසින් තෝරා ගත්ත බව. ඒ ජනමතය මත මේ පාර්ලිමේන්තුවේ බහුතරය හැටියට සිටි ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරු වන අපි එක රැයින් එළි වෙනකොට අපේ ඇමතිකම් භාර දීලා විපක්ෂයේ ඇවිත් වාඩි වුණා. අපි ඇවිත් විපක්ෂයේ වාඩි වුණේ ඒ ජනමතයට ගරු කරලා; හිස නමලා. ජනාධිපති මැතිවරණ ප්‍රකාශයේ දී එතුමා ජනතාවට පොරොන්දුවක් දීලා තිබුණා, රනිල් වික්‍රමසිංහ මහතා මේ රටේ අගමැති හැටියට පත් කරනවා කියා. එතුමා අගමැති හැටියට පත් කළාම එතුමා ඇමති මණ්ඩලයක් තෝරා ගත්තා. ජනවාරි 09වන දා වනකොට අපි අපේ පක්ෂයේ ව්‍යවස්ථාව හැටියට නියත වශයෙන්ම වර්තමාන ගරු ජනාධිපතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති හැටියට පත් වුණා. ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෙක් විධායක ජනාධිපති හැටියට දිවුරුම් දුන්නොත් අපේ පක්ෂ ව්‍යවස්ථාවේ හැටියට ඔහු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති හැටියට පත් වනවා. ඒ අනුව අපි එතුමාව පිළි ගෙන අපේ පක්ෂයේ හිටපු සභාපතිතුමා අපේ පක්ෂයේ සභාපතිකම එතුමාට දුන්නා. සභාපතිකම දීලා මේ රටේ ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන්වත්, මන්ත්‍රී කණ්ඩායමත් වර්තමාන ගරු ජනාධිපතිතුමාට භාර දුන්නා.

හැබැයි, එතුමා මේ රටේ ජනාධිපති හැටියට ඉදිරිපත් කළ දින සියයේ වැඩ පිළිවෙළ අලුත් අත් දැකීමක්. මම ඒකට කිව්වේ අලුත්ම, අමුතුම දේශපාලන විචිත්‍ර චිත්‍රයක් කියලා. ඒක අලුත් දේදුන්නක්. හැබැයි, මේ දේදුන්න දින සියයෙන් මැකිලා යනවාද, ඊට කලින් මකා ගන්නවාද කියන එක තිබෙන්නේ

[ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා]

තමුන්නාන්සේලා අතේයි. මොකද, තමුන්නාන්සේලා හිතනවා අපි නිවට, නියාලු, කැඳ, කෝමාරිකා, සෙවල බණ්ඩක්කා වාගේ කියලා. අපි යටත් වෙලා තමුන්නාන්සේලාට අත උස්සනවා කියලා හිතනවා ඇති. එහෙම නම් ඒක ලොකු විහිළුවක්. මොකද, අපි 1989 පාර්ලිමේන්තුවට ආපු මිනිස්සු හැටියට තවමත් මෙතැන ඉන්නවා. ජනතා විමුක්ති පෙරමුණේ අවල ජාගොඩ මහත්තයලා තුවක්කුව දික් කරන කොට, එක්සත් ජාතික පක්ෂය අපට තුවක්කුව දික් කරන කොට මේ පාර්ලිමේන්තුවට ආපු මිනිස්සු අපි. ඒක නිසා අපි එහෙම නිවට වෙන්නේ නැහැ; යටත් වෙන්නේ නැහැ; නියාලු වෙන්නේ නැහැ. හැබැයි, ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයක් හැටියට

අපි ජන මතයට ගරු කරනවා. එවැනි පක්ෂයක් හැටියට අපි ජනතාවට ලැබෙන වරප්‍රසාද වෙනුවෙන් ඉතිහාසයේ පළමුවැනි වතාවට - අපේ නියෝජ්‍ය විදේශ කටයුතු ඇමතිතුමා මෙතැන ඉන්නවා.- ඔබතුමන්ලා ඉදිරිපත් කළ අය වැයට විරුද්ධව ප්‍රකාශ වුණේ එක ඡන්දයයි. අපි ඔක්කොම පක්ෂව ඡන්දය දුන්නා. අද අපේ සමහර ඇමතිවරු, මන්ත්‍රීවරු තම තමන්ගේ ගම්බිම්වල ඉඳලා තකහනියක් ආවා, මේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පතට ඡන්දය දෙන්න. මොකද, මේ දේශපාලන වුවමනාව අපේ හිතේ කැකැරෙනවා. ඒ නිසා පීඩිත පන්තියේ ජනතාවගෙන් පත් වී ආපු නියෝජිතයන් හැටියට; පංච මහා බලවේගයෙන් මතු වුණු මහජන නියෝජිතයන් හැටියට ඒක අපේ වගකීම. රටට වැඩ කරන එක ආණ්ඩුවක වගකීම. මේ රාජ්‍ය මාරු වෙන්න පුළුවන්. පුටු මාරු වෙන්න පුළුවන්. ජනතාවට ලබා දෙන සහන, සහනාධාර, ජනතාවට ලබා දෙන සංවර්ධනය පෙරට ගෙන යාම ඔබතුමන්ලාගේ වගකීමක්. අපි ඔබතුමන්ලාට මිතුරු ප්‍රතිවිරෝධතාවකින් මිස පැහැදිලිවම සතුරු ප්‍රතිවිරෝධතාවකින් හෝ එදිරිවාදීව නොවෙයි මේ කරුණු කාරණා පිළිබඳව මතක් කරන්නේ.

හිටපු ජනාධිපතිතුමාට "හොරා" කියනවා. අනෙක් ඔක්කොම අයට "හොරු" කියනවා. හිටපු ඇමතිවරු රහස් පොලීසියට ගෙන්වනවා. හිටපු ඇමතිවරුන්ගෙන් පැය ගණන් ප්‍රශ්න කරනවා. කමක් නැහැ. අපි කියන්නේ මේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී හිටපු ඇමතිවරු වැරදි කරලා තිබෙනවා නම් නීතිමය ලෙස -නෛතිකව- ක්‍රියා කරලා ඒවා තෝරලා, බේරලා ඒ සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්න. අපි ඒකට විරුද්ධ නැහැ. හැබැයි, මතක තියා ගන්න, මේ වාහන දෙකටයි, තෙල් ටිකටයි යටත් වෙලා අපි වැඩ කරන්නේ නැහැයි කියන එක. දින සියයේ වැඩ පිළිවෙළේ හවුල්කාරයෝ, පංගුකාරයෝ හැටියට කටයුතු කරන්න කියලා අපේ පක්ෂයේ සභාපතිතුමා අපට උපදෙස් දුන්නා. ඒ අනුව තමයි අපි ක්‍රියාත්මක වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ආසනය ගැන ඔබතුමා කිව්වා. මම ඔබතුමාගෙන් ඉල්ලනවා මගේ ආසනයේ ග්‍රාමීය සෞඛ්‍ය මධ්‍යස්ථානය, ග්‍රාමීය සොහොන් පිට්ටනිය, පිට්ටනිය, පාර, ඇළ, පැති බැම්ම, වැව, බස් නැවතුම්පොළ මේ හැම දෙයක්ම ඇතුළත්ව මහා දැවැන්ත සංවර්ධනයක් ගමට ගෙන යන්න අපට පුළුවන් වුණා. ඒ සංවර්ධනය අද ඇණහිටලා තිබෙනවා. අද ඒක හරියට brake bind වෙලා වාගේ. දින සියය ආවාම ඒක තව ටිකක් speed කරලා පස්වැනි ගියර් එකට දමලා යන්න ඕනෑ එක දැන් දුම් දමනවා.; ගඳ ගහනවා. Brake bindවෙලා රෝද හිර වෙලා. ඒකට වතුර ටිකක් දමන්නයි අපි මේ කථා කරන්නේ. එහෙම නැතිව තමුන්නාන්සේලාට විරුද්ධව කථා කරනවා නොවෙයි. නීති විරෝධී වැඩ තිබෙනවා නම් ඕනෑ එකක් සොයන්න. මම ලේඛනයක් **සභාගත*** කරනවා.

**** පුස්තකාලයේ තබා ඇත.***

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

පළාත් සභා මැතිවරණය වෙලාවේ අපේ බැසිල් රාජපක්ෂ ඇමතිතුමා ඉන්න කාලයේම මම නම් පාරට බැහැලා මිනිස්සුත් එක්ක කිව්වා තෝරලා බෙදන ඒවා නම් දෙන්න එපා කියලා. ඒක මුළු රටම දන්නවා. මට එදාම බැසිල් රාජපක්ෂ ඇමතිතුමා කථා කළා. මේ බඩු බෙදීම සඳහා යන්ත්‍රණය අපි හදා ගත්තේ මොන ආකාරයටද? රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන අනුව සෑම ප්‍රාදේශීය ලේකම් කෙනෙක්ම සෑම වසමකටම ගිහිල්ලා ඒ වසමේ ජංගම සේවාවක් පවත්වලා රජයෙන් ශත පහක්වත් වියදම් කරන්නේ නැතිව පක්ෂ, විපක්ෂ සියලු දේශපාලනඥයන්ට ආරාධනා කරලා, යුද්ධයෙන් පස්සේ මේ රටේ ඉතිරි වුණු මුදල ජනතාවට දෙන, ජනතාවගේ සහනවලට ලබා දෙන වැඩ පිළිවෙළක් තමයි සකස් කළේ. කරුණාකර අපේ ලැයිස්තුවලට බඩු බෙදන්න එපා. කරුණාකර රජයේ නිලධාරින් ජංගම සේවාවලින් තෝරපු අයට ඒ බඩු ටික දෙන්න. ඒකට සම්බන්ධ වෙන්න අපිට ඕනෑ නැහැ. අපට ඡන්ද ගන්න බඩු බෙදන්න ඕනෑ නැහැ. අපට ඡන්ද ගන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේ ශාඛා සංවිධාන, අපේ පක්ෂයේ යන්ත්‍රණය අපි හැම දාම polish කරලා, දැති රෝද ටික හොඳට කරකැවෙන්න ග්‍රීස්, තෙල් දාලා හදලයි තිබෙන්නේ. ඒක නිසා අපට මේවා අවශ්‍ය නැහැ.

බිබිල - මහියංගනය පාර හදන එක තමුන්නාන්සේලා නැවැත්තුවේ නැහැ. මා ඒ ගැන ස්තුතිවන්ත වෙනවා. බිබිල - අම්පාර පාර හදන එක නැවැත්තුවේ නැහැ. බිබිල - වෙන්කල්අඩි පාර හදන එක නැවැත්තුවේ නැහැ. පස්සර - මොනරාගල පාර හදන එක නැවැත්තුවේ නැහැ. ඒ ගැන මා ස්තුතිවන්ත වෙනවා. මා අද කථා කළා තමුන්නාන්සේලාගේ රජයේ මහාමාර්ග ඇමතිතුමාට. මා එතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. උදාහරණයක් විධියට බිබිල - පොතුබන්දන මාර්ගය, දුනුමැව මාර්ගය ගත්තොත්, ඒ මාර්ගයේ වසම් පහක පමණ ජනතාව ජීවත් වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර හදන්න පටන් ගන්න කොට ඉස්සෙල්ලාම කරන්නේ නිර්මිත හදන එකයි. නිර්මිත හදන්න බෝක්කු දෙක කැඩුවා. කිලෝමීටර් 10ක්, 15ක් දුර එන්න ඕනෑ. එතකොට ලෙඩ්ඩු, දරුවන් හම්බ වෙන්න ඉන්න අම්මලා, වෙනත් උවමනා කටයුතු සඳහා කඩපොළට යන අපේ අහිංසක ගැමියෝ, ගොවි ජනතාව මාස ගණනක් තිස්සේ දුක් විඳගෙනයි පාරේ ගමන් කරන්නේ. මොකද, බෝක්කු දෙක කඩලා මේ පාර හදන එක නවත්වලා. මේ ජනතාවට මේ පාර හදලා දෙන්න කියලා අපි ඉල්ලුවාම ගරු ඇමතිතුමා කිව්වා ඒක හදලා දෙනවා කියලා. මා ඒ ගැන එතුමාට ස්තුතිවන්ත වෙනවා.

මේ වාගේ බොහොමයක් පාරවල් තිබෙනවා, ABC දාලා. සියලු දේවල් කරලා, ABC දාලා නවත්වලා. දැන් ඒවා හැරී හැරී යනවා. දුහුවිල්ල මතු වෙනවා. ඒ නිසා මේවා ගැන සොයා බලා කටයුතු කරන එක හොඳයි කියලා මා හිතනවා.

ගරු අජිත් පී. පෙරේරා මැතිතුමනි, ඔබතුමා විදේශ කටයුතු නියෝජ්‍ය ඇමතිතුමා නේද? ඔබතුමා අධිකරණය පිළිබඳව හොඳ දැනුමක් තිබෙන කෙනෙක්. මා ඔබතුමාට කාරණයක් කියන්න කැමැතියි. අපි බිබිල උසාවිය හදන්න ඉඩම දුන්නා. මේක අපේ ආණ්ඩු කාලයේ මා විවෘත කරන්න ලැස්ති වුණාම මහෙස්ත්‍රාත්තුමිය සහ රෙජිස්ට්‍රාර් මට කථා කරලා කිව්වා, "මේකේ තව අඩු පාඩු ටිකක් තිබෙනවා. කරුණාකර, ඒ ටික හදන්න" කියලා. අපි පෞද්ගලික අය ගෙනැල්ලා, ඇතුළත කාපට් කරලා, landscape කරලා ඒ ඔක්කෝම ටික හදලා දුන්නා. අනේ! විවෘත කළා, මට කිව්වේත් නැහැ. හැබැයි, මේකේ බෝඩ් එකේ ඇමතිවරු දෙදෙනාගේ නම් ගහලා තිබෙනවා; ජනාධිපතිතුමාගේ නම නැහැ. මා දන්නේ නැහැ මේකට හේතුව මොකක්ද කියලා. එතුමා එපා කියලා තිබෙනවා ද, නැත්නම් අනවශ්‍ය නිසාද කියලා මා දන්නේ නැහැ.

ඊළඟට විශේෂයෙන්ම මේ මහා පරිමාණ සංවර්ධන වැඩ ගැනත් මා කථා කරන්න කැමැතියි. අපි උමා ඔය ව්‍යාපෘතිය ගැන - [බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි කීයද තිබෙන්නේ?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
වෙලාව ඉවරයි. විනාඩි 10යි ඔබතුමාට තිබුණේ.

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
හොඳයි, මා අවසන් කරන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා, අධිරාජ්‍යවාදීන් ඇවිල්ලා අපේ පරිසරය ගොඩක් වෙනස් කළ බව. ඩිලාන් පෙරේරා හිටපු ඇමතිතුමාගේ කොට්ඨාසයේ සමහර වනාන්තරවල ග්‍රැවල් පස තිබෙන්නේ. බොහොම ලිහිල් පස. ඒ පස් කැටෙන් කැටේ අතරින් වතුර ගිහිල්ලා ඒ වතුර බිබිලෙන්, එහෙම නැත්නම් වැල්ලවායෙන්, මොනරාගලින් මතු වන්නේ භූගත ජලය හැටියටයි. හැබැයි, ඔය කුරුකුදය ප්‍රදේශය -ගම්මානය -අද ගිලා බැහැලා තිබෙනවා, වැඩිපුර වැරදි විධියට පුපුරන ද්‍රව්‍ය පාවිච්චි කිරීම හේතුවෙන්. මේකෙදී "වත්ත බද්දට දීලා ඇස්සට දත නියවන්න" වෙලා තිබෙනවා. 1815 උඩරට ගිවිසුමෙන් යටත් වෙලා දැන් අවුරුදු 200ක් පිරිලා තිබෙනවා. 1818 කැරැල්ලෙන් පස්සේ ඒ එක්කම මුඩුබිම් පනත ගෙනැල්ලා පැන්සයට අක්කරය අරගැනීම තුළ, ඒ සරුසාර ගම්මානවල හිටපු අපේ උඩරට නැත්නම් ඌව පළාතේ, ඉහළ ඌවේ ජනතාවට පතුල් නිම්නවලට, රක්ෂිතවලට පදිංචියට යොමු වෙන්න සිද්ධ වුණා. ඒ, අධිරාජ්‍යවාදීන් ඒ අයගේ ඉඩම් ගත්ත නිසයි. හැබැයි, අද මේ ව්‍යාපෘතිය නවත්වන එක නොවෙයි, පළමුව කළ යුතු දේ වන්නේ. පැහැදිලිවම ඒ ජනතාවගේ ඉඩම් හෙක්ටයාර් 3,500ක් එතැන තිබෙනවා. දැන් "වත්ත බද්දට දීලා ඇස්සට දත නියවන්න" වෙලායි තිබෙන්නේ. මේ හෙක්ටයාර් 3,500 පවරා ගෙන මේ ජනතාවට ඒ ඉඩම්වල අයිතිය, භූමියේ අයිතිය ලබා දීලා උමා ඔය වැනි විශාල මුදලක් වියදම් කරපු ව්‍යාපෘතිය - Port City වෙන්න පුළුවන්; උමා ඔය වෙන්න පුළුවන්; ඒවායේ අඩු පාඩු තිබෙනවා නම් හදන්න.- වැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුයි කියලා මා පෞද්ගලිකව විශ්වාස කරනවා. බොහොම ස්තූතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තූතියි. මීළඟට, ගරු ලසන්ත අලගියවන්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 06ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.32]

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විනාඩි 06ක් වැනි කෙටි කාලයක් තිබෙන නිසා මා ඉතාම කෙටියෙන් කරුණු කිහිපයක් සඳහන් කරන්නම්.

විශේෂයෙන්ම පසු ගිය වර්ෂයේ ප්‍රතිපාදන මුදල්වලින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති ඇණ හිටීම සහ ප්‍රමාද වීම පිළිබඳව අද විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා සහාව කල් තැබීමේ යෝජනාවක් ඉදිරිපත් කළා. ඒ යෝජනාවට රජය පැත්තෙන් ගරු ජෝශප් මයිකල් පෙරේරා ඇමතිතුමාත්, ගරු කබීර් හාෂිම් ඇමතිතුමාත් පිළිතුරු ලබා දුන්නා. එවැනි පිළිතුරු ලබා දීම අලුත් දෙයක් නොවෙයි කියලා මා හිතනවා. ඒ ගැන අපි පුදුම වෙන්න අවශ්‍යතාවකුත් නැහැ. ඒ අය අවුරුදු 20ක් විපක්ෂයේ හිටපු නිසා වර්තමාන පරිපාලන ක්ෂේත්‍රය පිළිබඳව අත් දැකීම් විශාල ප්‍රමාණයක් ඒ අයගෙන් ඈත් වෙලා තිබෙන බව ඒ පිළිතුරු තුළින්ම අපට පෙනෙනවා. ඒ නිසා මේ සඳහා ස්ථිරසාර විසඳුමක් ලැබිය යුතුයි කියා මා යෝජනා කරනවා. බොහොම පැහැදිලිව කියනවා නම් ඒ නිලධාරින් කියන දෙය කියන්න මෙතුමන්ලාට තේරෙන්නේ නැහැ. ඒ නිසා ඉතා ඉක්මනින් උපදේශක කාරක සභා ටික කැඳවන්න. උපදේශක කාරක සභා කැඳෙව්වාම එතැන නිලධාරින් ඉන්නවා; අමාත්‍යාංශයේ ලේකම්තුමා ඉන්නවා; ඇමතිතුමා ඉන්නවා. එතැනදී අපි මේ ප්‍රශ්න ගැන කථා කරමු. අපට පිළිතුරු ලබා ගන්න පුළුවන්. අප මේ කාරණය කියන්නේ චෝදනාවක් විධියට නොවෙයි. බොහොම සද් භාවයෙන් තමයි අපි මේක කියන්නේ. ඔබතුමන්ලාට අත්දැකීම් නොමැති නිසා තමයි විශේෂයෙන්ම අද මේ රටේ සංවර්ධනය ඇණහිටලා තිබෙන්නේ.

ඔබතුමන්ලා අද අමාත්‍යාංශවල, ආයතනවල, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල අක්‍රමිකතා සෙවීම සඳහා තමයි කාලය වැය කරන්නේ. අපි ඒවා සෙවිය යුතුයි. එවැනි අක්‍රමිකතා සිදු කිරීම ගැන අපි හැම දාම විරුද්ධයි. ඒවාට විරුද්ධව අපි හැම දාමත් අත් දෙකම උස්සනවා. ඒ පිළිබඳව කිසිම ගැටලුවක් නැහැ. නමුත් ඔබතුමන්ලාගේ ආණ්ඩුව යටතේ මේ වනකොට ගම්වල පටන් ගෙන තිබෙන ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති මොනවාද කියලා මම අහන්න කැමැතියි. අපේ ප්‍රදේශවල නම් එක වැලි ඇටයකවත් සංවර්ධනයක් සිදු වෙලා නැහැ. පසු ගිය කාලයේ සිදු වූ අක්‍රමිකතා ගැන සොයන්න, ඒවාට දඬුවම් ලබා දෙන්න. ඒ කටයුතු කරනවා වාගේම මේ අවුරුද්දේ කළ යුතු සංවර්ධන වැඩත් පටන් ගන්නය කියලා මා යෝජනා කරනවා. ඒවායේ ගරුත්වය ඔබතුමන්ලා ගන්න. ඒ ගරුත්වය ඔබතුමන්ලා ගත යුතුයි. මේවා ජනතාවගේ මුදල්. ඒ හැරෙන්නට ආණ්ඩු පක්ෂයේවත්, අපේවත් සල්ලි නොවෙයි. ඒක අපි දන්නවා. පසු ගිය අවුරුද්දේ ආරම්භ කරන ලද ව්‍යාපෘති කිහිපයක් තිබෙනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල, දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල තිබෙන ස්වයං රැකියා උපකරණ ලබා දීම සඳහා නාම ලේඛන සකස් කර තිබෙනවා. ආර්ථික සංවර්ධන නිලධාරින් ගෙවල්වලට ගිහිල්ලා ඒ අයගේ සුදුසුකම් පරීක්ෂා කර බලා, එම පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කර තිබෙනවා. ඒ පිළිබඳ කටයුතු සියල්ලක්ම අවසන් කර තිබෙනවා. මේ ක්‍රියාපටිපාටිය පිළිබඳව ඔබතුමන්ලාට අත් දැකීම් නැහැ.

ඕනෑම අමාත්‍යාංශයකට රුපියල් මිලියන 100ක් වෙන් වෙලා තිබුණා නම්, හැම අවුරුද්දකම එම අමාත්‍යාංශය එයින් රුපියල් මිලියන 60යි, 70යි වියදම් කර තිබෙන්නේ කියලා අපි දන්නවා. එහෙම තමයි ඉතිහාසයේ හැම දාමත් සිදු වෙලා තිබෙන්නේ. ඒ නිසා පසු ගිය අවුරුදු කිහිපය තුළ කළේ මොකක්ද? රුපියල් මිලියන 100ක් වෙන් වුණාම රුපියල් මිලියන 150ක වැඩ පටන් ගත්තා. ඒක තමයි කරලා තිබෙන්නේ. එතකොට රුපියල් මිලියන 100ක් වියදම් කරන්න පුළුවන්. ඉතිරි රුපියල් මිලියන 50 ඊළඟ අවුරුද්දේ ප්‍රතිපාදන මුදල්වලින් යොදවා ඒ ව්‍යාපෘතිය අඛණ්ඩව කරගෙන යාම තමයි පසු ගිය කාල සීමාව තුළ දී විශේෂයෙන්ම සිදු වුණේ.

ගරු ජෝශප් මයිකල් පෙරේරා අමාත්‍යතුමා පරිණත දේශපාලනඥයකු වුණත්, අමාත්‍යවරයකු විධියට එතුමාගේ දැනුම පිළිබඳව අප කනගාටු වෙනවා. අපේ කබීර් හාෂිම් අමාත්‍යතුමාගේ පිළිතුර ගැන බැලුවාම, එතුමාට තවම ව්‍යාපෘති ලේඛනයවත් සොයා ගන්න පුළුවන්කමක් ලැබිලා නැහැ. එතුමා නිලධාරින්ට දෝෂාරෝපනය කරනවා. නිලධාරින්ට දෝෂාරෝපනය කරලා වැඩක් වෙන්නේ නැහැ. මේ සංවර්ධනය ඇණ හිටින්න දෙන්න පුළුවන් කමක් නැහැ. ජනතාව වෙනුවෙන් අපි ඒ කාර්යභාරය ඉටු කළ යුතුයි. අපි ඉල්ලීමක් කරනවා, ඉතාම ඉක්මනින් ප්‍රධාන අමාත්‍යාංශවල උපදේශක කාරක සභා කැඳවන්න කියලා. ඇමතිතුමාත් නිලධාරින් එක්ක වාඩි වෙන්න. එහිදී නඟන ප්‍රශ්නවලට අපි ඇවිල්ලා පිළිතුරු ලබා දුන්නාට පසුව සිදු වෙලා තිබෙන දේවල් පිළිබඳව ඇමතිතුමන්ලාටත් නිවැරදි අවබෝධයක් ලබා ගන්න පුළුවන්කමක් ලැබෙයි.

[ගරු ලසන්ත අලගියවන්න මහතා]

ඒ කාර්ය භාරය ඉතාම ඉක්මනින් ඉටු කරන්නය කියන ඉල්ලීම කරනවා. ඒ වාගේම කරුණාකර මේ අවුරුද්දේ සංවර්ධන කටයුතු ඉක්මනින් පටන් ගන්න. මේ වන තෙක් මොනම සංවර්ධනයක්වත් සිද්ධ වෙලා නැහැ. එම නිසා මේ අවුරුද්දේ සංවර්ධන කටයුතු කඩිනමින් ආරම්භ කරන්න කියන යෝජනාව කරමින් මා නිහඬ වනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි ගරු මන්ත්‍රීතුමා. මීළඟට, ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.38]

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය ජනාධිපතිවරණයෙන් පසුව මා මෙම ගරු සභාවේ කථා කරන මුල්ම අවස්ථාවයි මේ. අපේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටත්, මේ අවස්ථාවේ අප ඉදිරි පිට සිටින ගරු ගයන්ත කරුණාතිලක ජනමාධ්‍ය ඇමතිතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලයටත් මා සුබ පතනවා. අගමැතිතුමාටත් සුබ පතනවා. [බාධා කිරීමක්] ඔබතුමා ඇතුළු කිව්වාම අමාත්‍ය මණ්ඩලයම නේ.

අද අපි මේ පාර්ලිමේන්තුවේ දී ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත සම්මත කරගත්තා. තමුන්නාන්සේලාගේ පැත්තෙන් සිටියේ 18දෙනයි. පසුව ආපු අයත් එක්ක 18දෙනයි තමුන්නාන්සේලාගේ පැත්තේ සිටියේ. තමුන්නාන්සේලාගේ පැත්තෙන්ම තමුන්නාන්සේලාගේ පනත් කෙටුම්පත සම්මත කිරීම සම්බන්ධව විරෝධතාවක් තිබෙනවාද කියලා මට තේරෙන්නේ නැහැ. හැබැයි, අපේ අතිගරු ජනාධිපතිතුමා මේ පනත් කෙටුම්පත මීට කලින් පාර්ලිමේන්තුවට ගෙනෙන්න ලොකු උත්සාහයක් ගත් බව විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. එම පනත් කෙටුම්පත සම්මත කිරීමේ අවශ්‍යතාව එතුමාට වාගේම අපටත් තිබුණා. ඒ සඳහා පූර්ණ සහය ලබා දෙන්නත් අපි කටයුතු කළා.

මේ අවුරුද්දේ ජනවාරි මාසයේ 9වැනිදා පිහිටෙව්වේ ඔබතුමන්ලාගේ ආණ්ඩුවක් නොවෙයි. මේක මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ ආණ්ඩුවක්. ඒක තමුන්නාන්සේලා, අපි කවුරුත් පිළිගන්න ඕනෑ සත්‍ය කාරණයක්. මේක මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ ආණ්ඩුවක්. හැබැයි, එතුමා බලාපොරොත්තු වුණේ ජාතික ආණ්ඩුවක් පිහිටුවන්නයි. නමුත් සෙසු පක්ෂ එකතු නොවීම නිසාත්, එක්සත් ජාතික පක්ෂය කැබිනට් මණ්ඩලයට පත් වීම නිසාත් හුඟක් අය විශ්වාස කරනවා මේක එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් කියලා. එය හේතුපාදක කොට ගෙනම යම් යම් තැන්වල විවිධ පළිගැනීම් කරනවා; ස්ථාන මාරුවීම් කරනවා; රස්සාවලින් දොට්ට දමනවා. ජනමාධ්‍ය ඇමතිතුමනි, මා බොහොම ගරු කරන අමාත්‍යතුමෙක් හැටියට ඔබතුමාට කියන්නේ, එය එතරම් ප්‍රඥාගෝචර කරුණක් නොවන බවයි. ඔබතුමා යටතේ තිබෙන රජයේ මුද්‍රණාලය ගැන අපි කථා කරනවා නම්, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිතුමාව ඉවත් කරලා -

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
සුදුසුකම් නැතිව ලබා දුන් පත්වීමක් නිසා.

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
පත්තරේ දැන්වීමක් පළ කරලාද බඳවා ගත්තේ? අයදුම් පත් කැඳෙව්වාද? මා ඔබතුමාට බොහොම ගරු කරනවා, ඇමතිතුමනි. රජයේ මුද්‍රණාලයාධිපති තනතුරේ හිටපු කෙනාව ඉවත් කර තිබෙනවා. මා ඔබතුමාගෙන් අහන්නේ, එම තනතුරට බඳවා ගැනීමේ දී ප්‍රසිද්ධ දැන්වීම් පළ කරලා අයදුම් පත් කැඳෙව්වාද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
කිසිම දැන්වීමක් පළ නොකර දේශපාලන පත්වීමක් දීලා තිබුණා. දැන් සුදුස්සාට දුන්නා?

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
සුදුස්සා කියලා කියන්නේ කවුද?

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
තමුන්නාන්සේලා සුදුස්සා කියලා කියන්නේ කවුද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
කලින් දීලා තිබුණේ දේශපාලන පත්වීමක්.

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
ඒ සුදුසුකම තීරණය කරන්නේ කොහොමද? ඔබතුමන්ලා පත්තරේ දැන්වීමක් පළ කරලා, ඒ කටයුතු කරන්න. මේවාට නොවෙයි ජනතාව ඡන්දය දුන්නේ. යහ පාලනයක් සඳහායි ජනතාව ඡන්දය දුන්නේ. එහෙම නම් විනිවිද පෙනෙන ආකාරයට කටයුතු කරන්න. එතකොට කිසිම ප්‍රශ්නයක් නැහැ. ඔබතුමා කියන සුදුස්සා පත් කිරීමේ දී සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වූවාද?

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
කී දෙනෙක් ආවාද?

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
මම අහන්නේ, ඔබතුමා කියන සුදුස්සා පත් කිරීමේ දී සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වූවාද? කී දෙනෙක් ඉදිරිපත් වුණාද? [බාධා කිරීමක්] ඔබතුමාට අවස්ථාව තිබෙනවා නේ. ඔබතුමාගේ අවස්ථාවේ දී පිළිතුරු දෙන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
සම්මුඛ පරීක්ෂණයක් පවත්වලා සුදුසුකම් තිබෙන අය - [බාධා කිරීමක්]

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
කී දෙනෙක් interview එකට ආවාද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

අපි ආපු ගමන් එයාට දුන්නා. [බාධා කිරීමක්] කී දෙනෙක් interview එකට ආවාද කියලා කලින් හිටපු ඇමතිතුමාගෙන් අහන්න.

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)

ඔබතුමා ඒ ලේඛන සභාගත කරන්න කෝ. මම ඒක පිළිගන්නම්. ඔබතුමා ඉදිරි දිනක ඒ ලේඛන ගෙනැවිත් ඉදිරිපත් කරන්න. අපි ඔබතුමාට ගරු කරනවා නේ. [බාධා කිරීමක්] හොඳයි. අපි පසු ගිය අවුරුද්දේ පමණක් - [බාධා කිරීම්] ඉතින් අපි කියනවානේ. මම කියනවා අපි විරුද්ධවයි වැඩ කළේ කියලා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ඡන්දයක්වත් දුන්නේ නැහැ.

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)

අපි ඡන්දයක්වත් දුන්නේ නැහැ. පසු ගිය ඌව පළාත් සභා මැතිවරණයේදී මාගේ ආසනේ ජයග්‍රහණය කළේ වැඩි ඡන්ද 22,000කින්. ජනාධිපතිවරණයේ දී අපේ හිටපු ජනාධිපතිතුමා ජයග්‍රහණය කළේ වැඩි ඡන්ද 32,000කින්. ඒ සැරේටත් වඩා වැඩි ඡන්ද ප්‍රමාණයක් අරගෙන තිබෙනවා. අපි ඡන්දය ලබා දුන්නේ නැහැ. අපි ඒක කියනවා. ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මන්ත්‍රීතුමා කිව්වා වාගේ අපේ පක්ෂයේ ව්‍යවස්ථාව අනුව -

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு உதித் லொக்குபண்டார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. UDITH LOKUBANDARA *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *took the Chair.*

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)

අපි කිව්ව ආකාරයට ඒ අනුව කටයුතු කළා. ගිය අවුරුද්දේ පමණක් මාගේ මැතිවරණ කොට්ඨාසයේ රුපියල් මිලියන 650ක වැඩ කරලා තිබෙනවා. ඔබතුමා කරුණාකර මගේ මැතිවරණ කොට්ඨාසය ගැන සොයා බලන්න. ළිං හදන්න කටයුතු කර තිබෙනවා. පාරවල් සංවර්ධනය කරන්න කටයුතු කළා. මම ප්‍රාදේශීය ලේකම්වරුන්ට කිව්වේ motor grader යන්ත්‍ර සඳහා වැඩ කරන පැය ගණනට ගෙවන්න කියලායි; බොරළු ටික අදින load ගණනට ගෙවන්න කියලායි; පස් ටික තුනී කරන පැය ගණනට ගෙවන්න කියලායි; ඒවා තලන්න වතුර දානකොට ඒ වතුර බව්සර් ගණනට ගෙවන්න කියලායි. කොන්ත්‍රාත් ක්‍රමයට වැඩ කරනවා නම් අපි ඒ වාගේ තුන් ගුණයක ප්‍රමාණයට වැඩ කරලා තිබෙනවා. අපි "පුර නැඟුම" වැඩසටහන යටතේ වැල්ලවාය ප්‍රදේශයේ ආදාහනාගාරයක් ඉදි කිරීම සඳහා මුල් ගල් තියලා තිබෙනවා. දැනට එහි වැඩ පටන් අරගෙන ඒ අනුව කටයුතු කර ගෙන යනවා. ඒ කටයුතු කරන්නේ ආසියානු සංවර්ධන බැංකුවෙන් ගත්ත ණය ආධාර මතයි. තවම මොණරාගල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ රැස්වීමක් පැවැත්වූයේ නැහැ. දැන් තමයි අතිගරු ජනාධිපතිතුමා සම සභාපතිවරුන් පත් කරලා දිසාපතිවරුන්ට ලියුම් යවලා තිබෙන්නේ. එහෙම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමක් පවත්වන්නේ නැතිව පළාත් පාලන කොමසාරිස්වරයා දන්වනවා, මෙම ආදාහනාගාරයේ වැඩ නවත්වන්න කියලා. මේවා නැවැත්වුවාම ගිවිසුම් අත්සන් කරලා වැඩ කරලා තිබෙන ඒවාට අලාභය ගෙවන්නේ කොහොමද? ඒවා ගෙවන්න සිදු වෙන්නේ මහජන මුදලින්. සංවර්ධන වැඩ කටයුතු කරනකොට අපි සාකච්ඡා කරලා කරන්න ඕනෑ. තුන් හතර දෙනෙක් කිව්ව පළියට තමුන්නාන්සේලා සංවර්ධන කටයුතු නතර කරන්න උත්සාහ කරන්න එපා. ඒවා ජනතාවගේ පොදු අවශ්‍යතාවන්. උමා ඔය ව්‍යාපෘතිය සඳහා බදුල්ලට සෙනඟ ගියේ කොහෙන්ද? තිස්සමහාරාමයෙන් බස් 10ක්, 15ක් අරගෙන ගියා. අපි දැක්කා. සමහර පක්ෂ තමුන්නාන්සේලාව නටවනවා. මෙය තමයි ඇත්ත තත්ත්වය. අද වලිගය විසින් බල්ලා නටවනවා. මම දන්නේ නැහැ විධායක සභාව කියලා මොකක්ද එකක් තියාගෙන ඒගොල්ලන්ට ඕනෑ විධියට තමුන්නාන්සේලා කටයුතු කරනවා.

උමා ඔය ව්‍යාපෘතියේ ප්‍රශ්න තිබෙනවා නම් ඒ ගැන සොයා බලා කටයුතු කරන්න. නමුත් අද වෙලා තිබෙන්නේ මොකක්ද? එම ව්‍යාපෘතිය අද අත්හිටුවලා තිබෙනවා. පස් ටික ඇද්ද, ගල් ටික ඇද්ද ටිපර් කාරයින්ට අද රස්සාව නැති වෙලා. ඒ රියදුරන්ගේ රස්සාව නැති වෙලා. වැලි ටික ගත්ත මිනිසුන්ගේ රස්සාව නැති වෙලා. තිබෙනවා. ගල් ටික කඩපු මිනිසුන්ගේ රස්සාව නැති වෙලා. මේසන් වැඩ කරපු මිනිසුන්ගේ රස්සාව නැති වෙලා. අත්වැඩ දුන්න මිනිසුන්ගේ රස්සාව නැති වෙලා. උමා ඔය ව්‍යාපෘතිය යටතේ වැඩ කරපු මිනිසුන්ට boarding house පවත්වාගෙන ගියපු මිනිසුන්ගේ රස්සාව නැති වෙලා. ඒ පළාතේ පහළ නිමිනයේ ජනතාගේ සියලු බලාපොරොත්තු කඩ වෙලා. අර කවුද කියනවා මැතිවරණයකට ලැහැස්තියි කියලා. අපි මැතිවරණයකට ඕනෑ වෙලාවක ලැහැස්තියි. අපි අවුරුදු 21ක් තිස්සේ මැතිවරණ පැවැත්වුවා. ඒවා පුරුදු වෙන්න කරන ඒවා නොවෙයි. හෙට මැතිවරණයක් පැවැත්වුවත් අපි මැතිවරණයට ලැහැස්තියි. හෙට මැතිවරණයක් පැවැත්වුවත් අපි දිනන්නත් ලැහැස්තියි කියන එක තමුන්නාන්සේලාට මා මේ අවස්ථාවේදී මතක් කර සිටිනවා. අපි මැතිවරණ කල් දැමීමෙත් නැහැ. කල් දමන්න අවශ්‍යත් නැහැ. තමුන්නාන්සේට මා ගරු කරනවා. සමහර අය කියන්න පටන් අරගෙන තිබෙනවා, වාහන දෙකට, වරදානවලට අරකට මේකට වැඩ කරන්න ලැහැස්ති නැහැ කියලා. එහෙම කියපු අයට අප කියන්න කැමැතියි, එක ඇඟිල්ලක් දික් කරනකොට තමන්ගේ පැත්තට ඇඟිලි 4ක්ම දික් වෙනවා කියලා. මේ අවස්ථාවේදී මේ ගරු සභාවේ ඒ අය නොමැති වීම ගැන කනගාටු වෙනවා.

මෙම කෙටි අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මම ඔබතුමාට ස්තුතිය පළ කර සිටිනවා. ගරු ඇමතිතුමනි, මේවා විවේචන නොවෙයි. මේවා සාධාරණ කරුණු. මේවා සම්බන්ධව අප බුද්ධිමත්ව හිතලා සාධාරණ ලෙස කටයුතු කරන්න ඕනෑ. අප ඇත්ත යුක්තිය කථා කරන්න ඕනෑ. අප සියලු දෙනාගේම අඩු පාඩු හදාගෙන කටයුතු කළ යුතුයි කියලා යෝජනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Mahinda Amaraweera. You have six minutes.

[අ.භා. 6.47]

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මෙම විවාදය සිදු වෙන්නේ සංවර්ධන වැඩ බොහොමයක් නතර වීම සම්බන්ධවයි. මහ පාරේ ඇවිදින කෙනෙකුට, ගමේ ඉන්න ඕනෑම කෙනෙකුට පෙනෙනවා මේ ආණ්ඩුව වෙනස් වීමත් එක්කම මුළු රට පුරාම සම්පූර්ණ සංවර්ධන වැඩ පිළිවෙළ නතර වෙලා තිබෙන බව. පාරවල් හැදෙන එක, බෝක්කු හැදෙන එක, පාලම් හැදෙන එක වාගේම ප්‍රධාන ව්‍යාපෘති සියල්ලම මේ වන විට නතර වෙලා තිබෙනවා. මෙම ව්‍යාපෘති නතර වීම තුළ සේවකයින් 75,000කට වැඩි ප්‍රමාණයකට අද රැකියා නැති වෙලා තිබෙනවා. කොන්ත්‍රාත් කරන ප්‍රධාන ආයතන දෙකකින් විතරක් සේවකයින් 7,000ක් එළියට ගිහිල්ලා තිබෙනවා; ආයතන දෙකක පමණක් සේවකයින් 7,000ක ප්‍රමාණයක් අඩු කරලා තිබෙනවා.

ඊට අතිරේකව ගම් මට්ටමින් විවිධ අංශවලට දායකත්වය සැපයූ විශාල පිරිසකගේ රැකියා නැති වෙලා තිබෙනවා. ඒ වාගේම මේ වෙනුවෙන්ම ටිපර්, ඩෝසර් වාගේ වාහන lease කරලා අරගත්ත අය අද අන්ත අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. එක්සත් ජාතික පක්ෂ පාලන කාලය තුළ අපට තිබෙන්නේ ඒ වාගේ අම්හිරි අත් දැකීම්. 2001 වර්ෂයෙන් පසුව රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ආණ්ඩුව අවුරුදු දෙකක පමණ කාලයක් කටයුතු කළා. ඒ කාලය ඇතුළත කිසිම සංවර්ධනයක් සිදු වුණේ නැහැ. එක ලයිට් කණුවක් දැම්මේ නැහැ; වතුර ටැප් එකක් දැම්මේ නැහැ; බොරලු කැටයක් දැම්මේ නැහැ. ඒක තමයි එදා ඇති වුණු තත්ත්වය. අදත් එම තත්ත්වයම උදා වන බව අපට ඉතාම පැහැදිලිව පෙනෙන්නට තිබෙනවා. මේ වන විට සංවර්ධනය නතර වීම නිසා පෞද්ගලික ක්ෂේත්‍රයේ රැකියා අහිමි වුණා වාගේම, අනිත් පැත්තෙන් රජයේ රැකියාවල නිරත වී සිටි විශාල පිරිසකුත් එළියට දමා තිබෙනවා. මාර්ග සංවර්ධන අධිකාරියේ සේවයේ නිරත වී සිටි සේවකයින් 162ක් එළියට දැම්මා. ඊයේ ඒ ගොල්ලන් උපවාසයක් කළා. අද වෙනකොටත් ඒ අයට රැකියාවලට යෑමට අවස්ථාව ලබා දීලා නැහැ. ඒ වාගේම අනිකුත් ආයතනවලත් එහෙමයි. BOI එකේ 75 දෙනෙකුට රැකියා අහිමි කර තිබෙනවා. ඒ වාගේම අද දේශපාලන පළිගැනීම් විශාල වශයෙන් සිදු වීමට පටන් අරගෙන තිබෙනවා. ප්‍රවාහන අමාත්‍යාංශය තුළ සිදු වුණු දේශපාලන පළිගැනීම් විශාල ප්‍රමාණයක් අපට වාර්තා වෙනවා. ඉතිහාසයේ වෙන කවරදාටත් වඩා ප්‍රවාහන අමාත්‍යාංශය තුළින්ම එය සිදු වීම පිළිබඳව අප කනගාටු වෙනවා. මේ, ඔබතුමන්ලාට ආණ්ඩුවක් ඇවිල්ලා නොවෙයි. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා බලයට පත් වෙන කොට එතුමා දින සියයේ වැඩ පිළිවෙළ ඉදිරිපත් කළ නිසා, එතුමා අපේ පක්ෂයේ සභාපතිත්වය බාර ගත් නිසා තමයි, අද ඔබතුමන්ලා ආණ්ඩු කරන්නේ. මන්ත්‍රීවරුන් 127කට වැඩිය ඉන්න අපි, අද විරුද්ධ පක්ෂයේ ඉන්නවා. හතළිස් ගණනක් ඉන්න තමුන්නාන්සේලා කැබිනට් මණ්ඩලයේ ඉන්නවා. ලෝකයේ කොහේවත් රටක මෙහෙම ආණ්ඩුවක් නැහැ. ආණ්ඩු බලයක් නැතුව මේ වාගේ දේශපාලන පළිගැනීම් කරන්න සූදානම් වෙනවා නම් ආණ්ඩු බලයක් ආවොත් කොහොමට වේවිද කියන එක පිළිබඳව මේ රටේ ජනතාව තුළ විවිකිච්ඡාවක් තිබෙනවාය කියන එකත් අපි පැහැදිලිව සඳහන් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම තමයි, තමුන්නාන්සේලා අය වැය ලේඛනයෙන් දුන් පොරොන්දු ඉෂ්ට වෙන්නේ නැහැ කියන එක. ඒ වාගේම දින සියයේ වැඩසටහනේ වුණ බොහොමයක් පොරොන්දු ඉෂ්ට වෙන්නේත් නැහැ. අද මුදල් තත්ත්වය කොහොමද? තමුන්නාන්සේලාට විවිධ දේ කියන්න පුළුවන්. අපි කරගෙන ගිය සංවර්ධන වැඩ පිළිවෙළ, අපි ගම් මට්ටමට ගෙනිච්ච සංවර්ධන වැඩ පිළිවෙළ නතර කළේ ඇයි? තමුන්නාන්සේලාගේ නොහැකියාව තමයි ඒකෙන් පැහැදිලිව පෙනෙන්නේ.

දින සියයේ වැඩ පිළිවෙළට පොරොන්දු වුණා, රුපියල් 50 ගණනේ වී මිලදී ගන්නවා කියලා. ඒ වාගේම තේ දළු රුපියල් 70 - 80ත් අතර මිලකටත්, රබර් 350 ගණනේත් ගන්නවා කියලා පොරොන්දු වුණා. මම අහනවා, තමුන්නාන්සේලා ඒ මිලට ගන්න පටන් ගත්තාද කියලා. අද වන කොට වී කිලෝ එක රුපියල් 30කට පහළින් විකිණෙන්න පටන් අරගෙන තිබෙනවා. තවම වී මිලදී ගැනීම ක්‍රියාත්මක වෙලා නැහැ. ඒ වාගේම සිමෙන්ති මිල අඩු කරනවාය කියලා තමුන්නාන්සේලා කිව්වා. සිමෙන්ති මිල අඩු වෙලාද කියලා තමුන්නාන්සේලා කඩේට ගිහිල්ලා අහන්න. පැහැදිලිව පෙනෙන්න තිබෙනවා, එහෙම දෙයක් වෙලා නැහැ කියලා.

අපි මහජන නියෝජිතයෝ විධියට වාර්ෂිකව විශාල සංවර්ධන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා. අපට නොදුන්නත් කමක් නැහැ, අඩු ගණනේ ඔබතුමන්ලා හරි ආසන මට්ටමේ ඒක ක්‍රියාත්මක කරන්න. ගිය අවුරුද්දේ මගේ ආසනයේ සංවර්ධන වැඩට ලබා දුන්නු මිලියන 765ක මුදල්වලින් සංවර්ධන වැඩ කටයුතු අපි ක්‍රියාත්මක කළා. ඒ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් විතරක් ලබා දුන්නු මුදල්. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? ශත පහක් වියදම් වෙන්නේ නැහැ. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ඇමතිතුමා අගමැතිතුමා. අගමැතිතුමා මෙතැන ඉඳලා ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පතට ඡන්දය විමසන වෙලාවේ එහා පැත්තට ගිහිල්ලා හැංගිලා හිටියා. ඒ පනත් කෙටුම්පත සඳහා ඡන්දය පාවිච්චි කරන එක පිළිබඳව මුළු රටම බලාගෙන හිටියා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
හිටපු ඇමතිතුමා කොහේද ගිහිල්ලා හිටියේ?

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පතට ඡන්දය පාවිච්චි කරාවිය කියලා අද මුළු රටේම උනන්දුවක් තිබුණා. මේක ජනතාවගේ ඉල්ලීමක්. නමුත් මොකක්ද වුණේ? අගමැතිතුමා එහා පැත්තේ ඉන්නවා. මෙහාට ඇවිල්ලා ඡන්දය පාවිච්චි කරන්නේ නැහැ. මේ පාර්ලිමේන්තුවේ ඉඳගෙන ඡන්දය පාවිච්චි කරන්නේ නැහැ. නියෝජ්‍ය නායකතුමා මෙතැන කථා කරලා එළියට යනවා, ඡන්දය පාවිච්චි කරන්නේ නැහැ. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු 18 දෙනායි, මේ පනත් කෙටුම්පත සම්මත කරන්නට ඡන්දය දුන්නේ. මෙන්න රටේ වැදගත්ම පනත් කෙටුම්පතක් සම්මත කරන්නට ඡන්දය පාවිච්චි කරපු විධිය. අපි ඡන්දය දීලා තමයි ඒක සම්මත කළේ. ජනතාවගේ සුබසාධනය වෙනුවෙන්, සුබසිද්ධිය වෙනුවෙන් සිදුවන වැඩකටවත් අඩු ගණනේ එක්සත් ජාතික පක්ෂය උනන්දුවක් නැහැයි කියන එක තමයි ඒකෙන් පැහැදිලිව පෙනෙන්න තිබෙන්නේ.

දැයට කිරුළ වැඩසටහන දකුණු පළාත මුල් කරගෙන ක්‍රියාත්මක කරන්න සූදානම් කරලා තිබුණා. තමුන්නාන්සේලා මහා ලොකු ප්‍රචාරයක් දුන්නා, ඒකේ උත්සවය නවත්වනවා, ප්‍රචාරක වැඩ නවත්වනවා, නමුත් සංවර්ධන වැඩ ක්‍රියාත්මක වෙනවා කියලා. අද වෙන කොට කිසිම සංවර්ධන වැඩක් ක්‍රියාත්මක වෙලා නැහැ. අපි සැලසුම් කරලා තිබුණේ, මාර්තු මාසයේ 31 වන කොට සෑම මැතිවරණ කොට්ඨාසයක වැඩ අවසන් කරන්නයි. මගේ තංගල්ල මැතිවරණ කොට්ඨාසයට මිලියන 544ක් වියදම් කරන්න යෝජනා දීලා සියල්ල සූදානම් කරලායි තිබුණේ. නමුත් ඒක ක්‍රියාත්මක කරන්න සල්ලි ගිහිල්ලා නැහැ. මේක තමයි ඇත්ත කථාව.

තමුන්නාන්සේලා හැම වෙලාවේම කියනවා, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව වැඩ කරනවා කියලා. නමුත් මම පැහැදිලිව

කියනවා, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ යටතට ආවාම කවදාවත් වැඩ කරලා පෙන්නුවේ නැහැ කියලා. තමුන්නාන්සේ මේ පිළිබඳව අවධානය යොමු කරන්න. මේ විමධ්‍යගත මුදලවත් අපට ලබා දෙනවාය කියලා තවම කිසිම ලිපියක්වත් නැහැ. මිලියන 10ක් ලබා දෙනවාය කිව්වා. හැබැයි ශත පහක්වත් ලබා දෙන බවට තවම ලිඛිතව දැන්වීමක් කරලා නැහැ. මේ අවුරුද්දේ පෙබරවාරි මාසයත් ඉවරයි. වෙනදා නම් සාමාන්‍යයෙන් අපට ජනවාරි මාසය වෙන කොට ඒ සම්බන්ධ ලිපිය ඇවිල්ලා, චක්‍රලේඛ ඇවිල්ලා ඉවරයි. අපි බලාපොරොත්තු වෙන්නේ, මේ නතර වුණ සංවර්ධනය ආරම්භ කරන්න තමුන්නාන්සේලා කටයුතු කරනවා දකින්නයි. ඒ ගෙනෙන ඕනෑම හොඳ වැඩ පිළිවෙළකට, ඕනෑම හොඳ පනත් කෙටුම්පතකට, ඕනෑම හොඳ යෝජනාවකට අපි සහයෝගය ලබා දෙන්න සූදානම් කියන එක ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා. ස්තූතියි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Athauda Seneviratne. You have five minutes.

[අ.භා. 6.54]

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ආණ්ඩුව දින සියයේ වැඩ පිළිවෙළ සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කියන කරුණු ඉදිරිපත් කරගෙන බලයට ආවා. ඒ වාගේම අලුත් අය වැයක් ඉදිරිපත් කරනවාය කිව්වා. අය වැයක් ඉදිරිපත් කළා. අය වැය ඉදිරිපත් කර තිබියදීත්, ගිය අවුරුද්දේ ආරම්භ කරපු -පටන් ගත්ත- වැඩ අවසන් වුණු ඒවාට ගෙවන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට මුදල් ලැබිලා නැහැ. ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට මුදල් යවන්න අවශ්‍ය කටයුතු ඉක්මනින් කරන්න කියා අපි ඉල්ලා සිටිනවා. ඒ කොන්ත්‍රාත් වැඩ කටයුතු කරපු අය ඒ මුදල් ලබා ගැනීමට බලාපොරොත්තුවෙන් සිටිනවා. ඒ වාගේම භාගෙට කරපු වැඩ තිබෙනවා. අලුතින් ආරම්භ කරපු වැඩ තිබෙනවා. අලුතින් ආරම්භ කරපු වැඩ නතර කරන්න කියනවා. ඒ වැඩ කටයුතු නතර කරන්නේ නැතිව කරගෙන යන්න උපදෙස් දෙන්න, ඒවාට අවශ්‍ය මුදල් ලබා දෙන්න කියා මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා. පසු ගිය අපේ ආණ්ඩු කාලයේ විදුලිය නොමැති සියයට 96ක් ප්‍රදේශවලට අපි විදුලිය ලබා දීලා තිබෙනවා. ඒ විදුලිය ලබා දුන්නු ඒවා විවෘත කරන්න තමුන්නාන්සේලා යනවා. හැබැයි, අපේ පාඨලී චම්පික රණවක ඇමතිතුමා නම් යන්නේ නැහැ. අනෙක් අය පිටත් කර යවනවා. අපි කරපු වැඩ කටයුතු ඒ විධියට විවෘත කර ගත්තත්, අනුන්ගේ දරුවන්ට උප්පැන්න දුන්නත් කමක් නැහැ. ඒකට අපේ අකැමැත්තක් නැහැ. ඒ මඟින්වත් උප්පැන්න ලැබෙන්නේ නැතැයි. නමුත් අපි විශේෂයෙන් බලාපොරොත්තු වන්නේ අනෙක් වැඩ කටයුතු ආරම්භ කරගෙන ඉදිරියට යන්නයි.

බඩු මල්ලට සහනයක් දෙනවා කියපු ඒකත් අසාර්ථක වුණා. අය වැය ලේඛනයෙන් මුදල් දෙනවා කියපු කාරණයත් අසාර්ථක වෙලා තිබෙනවා. සමහර අවස්ථාවල අගමැතිතුමාත්, අනුර කුමාර දිසානායක -ජේවීපී එකේ ලොක්කා-, එක්සත් ජාතික පක්ෂයේ ලේකම්තුමාත් ප්‍රකාශ කර තිබුණා, "අප්‍රේල් 23 වැනිදා පාර්ලිමේන්තුව විසුරුවා හරිනවා, අපි ඡන්දයකට යනවා" කියා. තමුන්නාන්සේලා මැතිවරණ ප්‍රකාශයේදී කියා තිබුණු කාරණා දෙකක් අපි විශේෂ දෙයක් හැටියට ඉටු කරන්න කියා ඉල්ලුවා. එයින් කාරණයක් තමයි, විධායක ජනාධිපති ක්‍රමයේ බලය අඩු කිරීම වාගේම විධායක ජනාධිපති ක්‍රමයේ බලය වෙනස් කිරීම. අනෙක් කාරණය, මැතිවරණ ක්‍රමය වෙනස් කරන්න කියන ඉල්ලීම. දිස්ත්‍රික් මැතිවරණ ක්‍රමය වාගේම ඒ හා සම්බන්ධ මනාප ක්‍රමය කියන දෙක වෙනස් කරන්න කියන ඉල්ලීම අපි කළා. මෙන්න මේ කාරණා දෙකම එකට වෙනස් කර මැතිවරණයකට යන්න කියා තමයි අපි ඉල්ලන්නේ. හැබැයි, ජේවීපී එකයි, යූඑන්පී එකයි කියන පක්ෂ දෙකම එකට එකතු වෙලා මේ කටයුත්ත නොකර මැතිවරණයකට යන්න උත්සාහ කරන බව පෙනෙනවා.

මේ කටයුත්ත කඩාකප්පල් කරන්න එපාය කියා අපි තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා. මොකද, මේ වැඩ නොකෙරුණත් කමක් නැහැ. මේ මැතිවරණ ක්‍රමය මේ රටට මහා සාපයක්. මේ රටේ ග්‍රාමීය මට්ටමේ වාගේම දිස්ත්‍රික් මට්ටමේ ජනතාව මේ මැතිවරණ ක්‍රමයට සම්පූර්ණයෙන්ම විරුද්ධයි. ජනාධිපති ක්‍රමයේ බලතල වෙනස් කරනවාට වඩා ජනතාවගේ වුවමනාව තිබෙන්නේ දිස්ත්‍රික් මැතිවරණ ක්‍රමය වෙනස් කරන්නයි. අන්න ඒ කාර්යය මේ මැතිවරණයට පෙර ඉටු කරන්න. දවස් 100 මදි නම් දවස් 200ක් හෝ අරගෙන මේ කාර්යය ඉෂ්ට කරන්නයි වුවමනා තිබෙන්නේ. දවස් 100න් මේ කාර්යයන් කරන්න නොවෙයි අවශ්‍ය වන්නේ. දවස් 100 වාර්තාවක් නොවෙයි. දවස් 100න් කියා ජනතාවට වාර්තාවක් කියලා නැහැ. ඒක නිසා දවස් 100 වැඩ පිළිවෙළ අසාර්ථකයි. මෙන්න මේ කාරණා දෙකවත් ඉෂ්ට කර මේ රටේ පොදු ජනතාවට බලපාන, මේ රටේ කුළල් කා ගන්නා මේ මැතිවරණ ක්‍රමය වෙනස් කරන්න කියා අපි තමුන්නාන්සේලාට, ආණ්ඩුවට කියනවා. අපි සියලු දෙනාගේම -ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වාගේම අපේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ -සහයෝගය ලැබෙන්නේ හොඳ වැඩවලට පමණයි. දවස් සියයේ වැඩ පිළිවෙළ යටතේ කරන හොඳ වැඩවලට අපි සහයෝගය ලබා දෙනවා. මේ කටයුතු දවස් 100න් විතරක් අවසන් වන වැඩ කටයුතු නොවෙයි. මේ රටේ ඉතිහාසයට එකතු වන වැඩ කොටසක් තමයි, මේ මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම. අතීතය ගත් විට ජේ.ආර්. ජයවර්ධන මහත්තයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඉදිරිපත් කරපු කාලයේ ඉඳලාම, අපි වමේ පක්ෂ හැටියට පාරවල් මැද ඉඳගෙන උද්ඝෝෂණය කර මේ පිළිබඳව බලපෑම් කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම එක්සත් ජාතික පක්ෂයේ අයටත් මෙය තේරිලා හිටපු ලලිත් ඇතුලත්මුදලි ඇමතිතුමාත්, ගාමිණී දිසානායක මැතිතුමාත් පක්ෂයෙන් ඉවත් වෙලා ගිහිල්ලා වෙන පක්ෂයක් හදා ගෙන ඉල්ලා සිටියේත් මෙයයි. ඒ සඳහා අගමැතිතුමාගේ වැඩි උනන්දුවක්, ඕනෑකමක් නැති බව තමයි මට පෙනෙන්නේ. ඒක මේ රටට කරන විශාල හානියක්, විපතක්. ඒක නිසා මේ කාර්යය අනිවාර්යයෙන්ම ඉෂ්ට කර දෙන්න. අනුර දිසානායක මහත්මයාත්, අගමැතිතුමාත් දෙදෙනාම එකතු වෙලා මේ වැඩේ කඩාකප්පල් කරන්න යනවා කියා තමයි අපට පෙනෙන්නේ. මොකද, ඒ අය කියනවා, "පාරට බහිනවා" කියා. ඒ වාගේම එක්සත් ජාතික පක්ෂයේ ලේකම් කබීර් හාෂීම් මැතිතුමාත් කියනවා, "පාරට බහිනවා" කියා. පාරට බහින්න. අපි අනෙක් පැත්තෙන් පාරට බහින්නම්. මේ කාර්යය කරන්න කියා ඉල්ලන්නයි පාරට බහින්න ඕනෑ; නොකරන්න නොවෙයි; කල් දමන්න නොවෙයි. අපට වුවමනා කරන්නේ මේ කාර්යය ඉෂ්ට කරන්නයි. පාරවල් ගැන පමණක් නොව ඓතිහාසික වශයෙන් ඉතාම වැදගත් කාරණය හැටියට මෙන්න මේ කාරණයත් මම මතක් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. බොහොම ස්තූතියි.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Mahinda Yapa Abeywardena. You have five minutes.

[අ.භා. 7.02]

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ දින කිහිපය තුළ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව අපේ රටට කරපු විනාශය, අපේ රටට කරපු අලාභය තව අවුරුදු 10කින් හදන්න බැරි බව මම පළමුවෙන්ම මතක් කරන්න ඕනෑ. මේ කෙටි කාලය තුළ ඒ තරම් අලාභයක් සිදු වුණා. අපේ ආණ්ඩුව කර ගෙන ආපු සංවර්ධන වැඩ පිළිවෙළ සම්පූර්ණයෙන්ම නතර කළා. දැන් ගම්වල පාරවල් හැදෙන්නේ නැහැ. "දැයට කිරුළ" ව්‍යාපෘතිය යටතේ මාතර දිස්ත්‍රික්කයේ අපි ආරම්භ කරපු වැඩසටහන් එකක්වත් දැන් ක්‍රියාත්මක වෙන්නේ නැහැ, පාරවල් හැදෙන්නේ නැහැ. දැන් ඒවා මදුරු වළවල් බවට පත් වෙලා. ඉතින්, මේ ගොල්ලන් සංවර්ධන ව්‍යාපෘති නතර කරන්නේ කාගෙන් පළි ගන්නද කියා මට හිතා ගන්න බැහැ. අපෙන් පළි ගන්න බැහැ. ඊටත් වඩා භයානක අපරාධයක් මේ ගොල්ලන් කර ගෙන යනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආර්ථික සංවර්ධන නිලධාරින් ලෙස බඳවා ගත් ඉතාම කාර්යක්ෂමව වැඩ කරපු උපාධිධාරින් රාශියක් -දහසයදහස් නවසිය ගණනක්- ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ හිටියා. දැන් ඒ ගොල්ලන්ට කරන්න රාජකාරියක් නැහැ. දැන් ඒ ගොල්ලන් නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශයට අනුයුක්ත කර සිටිනවාය කියනවා. දැන් ඒ අයට රාජකාරියක් නැහැ. ඒ උදව්ය තමයි ගමේ සංවර්ධන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර ගෙන ගියේ. ඒ උදව්ය තමයි ඒවාට අදාළ සංඛ්‍යා ලේඛන හැදුවේ. ඒ උදව්ය තමයි මේ වැඩ පිළිවෙළ හදුනා ගෙන, කරන්න ඕනෑ කුමක්ද කියා හඳුනා ගෙන, ඒ සඳහා ඇස්තමේන්තු සකස් කර ඒ කටයුතු කළේ. දැන් ඒ මිනිසුන්ට කරන්න රාජකාරියක් නැහැ. මොකද, මේ රජය සංවර්ධන ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම නවත්වලා රජයේ නිලධාරින්ට නිකම් පඩි ගෙවනවා. ඒ අය දැන් නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශට අනුයුක්ත කර සිටිනවාය කියනවා. නමුත් ඒ ගොල්ලන්ට දෙන්න රාජකාරියක් නැහැ.

අපේ රජය යටතේ ඒ ගොල්ලන්ට දීපු රාජකාරි ලැයිස්තුව මම කියන්නම්. සංවර්ධනය සඳහා වන රාජ්‍ය ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම් සම්පාදනය සඳහා අවශ්‍ය ප්‍රාදේශීය මට්ටමේ දත්ත හා තොරතුරු විද්‍යාත්මකව එක්රැස් කිරීම හා පද්ධතිගත කිරීම, රජයේ සංවර්ධන වැඩසටහන් සඳහා අවශ්‍ය මූලික ඇගයීම් සිදු කිරීම, ග්‍රාමීය ජන සභා යෝජනා ලබා ගැනීම හා ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කිරීම, සංවර්ධන වැඩසටහන් පසු ඇගයීම, විපරම් කිරීම හා අධීක්ෂණය, සංවර්ධන වැඩසටහන්හි ප්‍රගතිය අධීක්ෂණය හා වාර්තා කිරීම, ග්‍රාමීය සංවර්ධනය සඳහා ක්‍රියාත්මක රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සම්බන්ධීකරණය, ග්‍රාමීය යටිතල පහසුකම් හා ජීවනෝපාය සංවර්ධනය සඳහා වන පහසුකාරක හා සම්බන්ධීකාරක ක්‍රියාවලිය, කොට්ඨාසය තුළ ආර්ථික හා සමාජයීය ප්‍රතිලාභ ලැබිය යුතු ප්‍රතිලාභීන් හඳුනා ගැනීම හා නිර්දේශ කිරීම, ග්‍රාම නිලධාරී වසමට හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අදාළ සංවර්ධන සැලැස්ම සැකසීමට අවශ්‍ය යෝජනා ලබා දීම, ග්‍රාම නිලධාරී වසමෙහි හා කොට්ඨාසයෙහි සංවර්ධන ප්‍රගතිය අධීක්ෂණය, පසු විපරම හා අමාත්‍යාංශයට වාර්තා කිරීම යනාදියයි. මේ වාගේ වැදගත් රාජකාරි රාශියක් ගම් මට්ටමේ ඉඳ ගෙන මේ නිලධාරී මහත්ම මහත්මීන් කළා. අද ඒ මිනිසුන් කිසි රාජකාරියක් නැතුව නිකම්ම එළියට දමා සිටිනවා. මේකෙන් අදහස් වෙන්නේ මොකක්ද? මේ රජයේ සංවර්ධන සැලැස්මක් නැති බවයි අදහස් වන්නේ. ගම් මට්ටමෙන් කර ගෙන ගිය වැඩ පිළිවෙළ සම්පූර්ණයෙන් නතර කර තිබෙනවා. ගමේ සංවර්ධන වැඩ විතරක් නොවෙයි, මාර්ග සංවර්ධනය කිරීම විතරක් නොවෙයි, ගමේ උදව්යට කීයක් හෝ ලබා ගන්න තිබුණු මාර්ගයත් අද සම්පූර්ණයෙන්ම අහුරලා තිබෙනවා. මේ විධියට කොපමණ කාලයක් මේ රට පවත්වා ගෙන යන්නද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මොන රජයක් බලයට පත් වුණත් මේ දින කිහිපය තුළ සිදු කරපු අලාභය නිවැරදි කරන්න තවත් අවුරුදු 10ක්වත් ගත වෙයි කියා මම කිව්වේ ඒකයි. ඒ වාගේම මේ උදව්ය දැන් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ඉවත් කර, නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශයට අනුයුක්ත කර සිටිනවා. නමුත් මේ උදව්යට කරන්න රාජකාරියක් නැහැ. නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශයට අනුයුක්ත කළා යයි පැවසෙන මේ නිලධාරින් 16,979 දෙනාට අයත් වන නිලධාරී කාණ්ඩ මොනවාද කියන එක ගැන කොහේවත් සඳහනක් නැහැ. නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය තුළ මෙම නිලධාරින් ස්ථානගත කරන්නේ කුමන රාජකාරි මට්ටමකින්ද? ඒ අයට කිසිම රාජකාරියක් නැහැ, නිකම් ඉන්නේ. පළි ගැනීමක් මේ කරන්නේ. මේ ගොල්ලෝ හිතනවා අපේ දේශපාලන හිතවතුන් මේ තනතුරුවල සිටියා කියලා. උපාධිධාරින් බඳවා ගත්තේ දේශපාලන හිතවත්කම උඩ නොවෙයි. එක්සත් ජාතික පක්ෂය තමයි ඒක කළේ. නිශ්චිත දිනයට සුදුසුකම් සපුරා සිටි සියලුම උපාධිධාරින්ගේ පක්ෂ භේදයක් බලන්නේ නැතුව අපේ රජය ඒ ගොල්ලන්ට රැකියා ලබා දුන්නා. අද එහෙම සැලැස්මක් මේ රජයට නැහැ. ඒකයි මම කියන්නේ මේ රටේ සංවර්ධන කටයුතු නතර කරලා කියලා. ඒ වාගේම ඔවුන් මෙම අමාත්‍යාංශයට අනුයුක්ත කිරීමේදී ඔවුන්ට ලබා දුන් රාජකාරි ස්වභාවය, වගකීම හා විෂය පථය කුමක්ද? එහෙම වැඩසටහනක් නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශයේ දැනට නැහැ.

වසමකට එක් නිලධාරියෙක් බැගින් සමෘද්ධි සංවර්ධන නිලධාරින් සිටියදීම මෙම නිලධාරියාද ගම තුළ ස්ථානගත කිරීම තුළ සමෘද්ධි හා ආර්ථික සංවර්ධන නිලධාරින් අතර ගැටුමක් ඇතිවීම වැළැක්වීමට ගන්නා පියවර කුමක්ද? මෙතෙක් මෙම නිලධාරින්ට සංවර්ධන ක්ෂේත්‍රයට අදාළව වගකීම් පවරා තිබූ බැවින් ඔවුන්ගේ ආසන්න අධීක්ෂණය හා වගකීම පවරා තිබූයේ සහකාර අධ්‍යක්ෂවරුන්ට හා දිස්ත්‍රික් ක්‍රමසම්පාදන සේවයටය. ඒ නිසා ලබා ඇති පළපුරුද්ද අනුව මෙම අමාත්‍යාංශය යටතේද ආර්ථික සංවර්ධන නිලධාරින්ගේ අධීක්ෂණය ඔවුන් වෙතම තැබීමට කටයුතු කරන්නේද? උපාධිධාරි සංවර්ධන නිලධාරින් ලෙස ඔවුන්ගේ වෘත්තීය ගරුත්වය හා අභිමානය සුරක්ෂිත වන පරිදි නිසි රාජකාරි පැවරුමක් ලබා දී සංවර්ධන නිලධාරි සේවයේ ක්ෂේත්‍ර නිලධාරින්ට අදාළ 6/2006 චක්‍රලේඛයට අනුව සියලු දීමනා හා වරප්‍රසාද ලබා දී වෘත්තීය ගැටලු විසඳීම ප්‍රමාද වන්නේ කවර හේතුවක් නිසාද? එම විසඳුම් දින 100 තුළ ඉටු කිරීමට රජය ගන්නා පියවර මොනවාද? මෙම නිලධාරින් අනුයුක්ත කිරීම දින සියය සඳහා දුන් පැලැස්තර විසඳුමක් නොවන බවට රජයෙන් ලැබෙන වගකීම කුමක්ද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිලධාරින් සංඛ්‍යාව තමයි මේ බර ඇද්දේ. පසු ගිය කාල සීමාව තුළ අපේ ගම්වල කෙරුණු දැවැන්ත සංවර්ධන වැඩ පිළිවෙළ කරගෙන ගියේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත වෙලා සිටි ආර්ථික සංවර්ධන නිලධාරින්. අද ඒ මිනිස්සුන්ව දේශපාලන වශයෙන් කපලා දාලා තිබෙනවා. ඒ මිනිස්සුන්ව ඉවත් කරලා තිබෙනවා. දැන් ඒ ගොල්ලන්ට කරන්න රාජකාරියක් නැහැ. ඒ අයව නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශයට අරගෙන තිබෙනවා. එතැනත් සමෘද්ධි සංවර්ධන නිලධාරින් ඉන්නවා. ඒ ගොඩට මේ ගොඩත් එකතු කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේකෙන් අදහස් වෙන්නේ මොකක්ද? මේකෙන් අදහස් වෙන්නේ, මේ රජයට සංවර්ධන සැලැස්මක් නැහැ කියන එකයි. මේ රජයට තිබෙන්නේ මඩ සැලැස්මක් විතරයි. පසු ගිය රජය කරගෙන ගිය වැඩ පිළිවෙළට මඩ ගැහීම විතරයි කරන්නේ. ඒ තුළින් නැවත වාරයක් බලයට එන්න පුළුවන්ද කියායි මේ උත්සාහ කරන්නේ.

ජනතාව මෙතුමන්ලාට බලය දුන්නේ නැහැ. අපේ ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා වාගේ, එතුමන්ලාට නොවෙයි බලය දුන්නේ, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටයි. මෙතුමන්ලා ණයට

මෙතැන ඉන්නේ. මෙතැනට ඇවිල්ලා ණයට කහිනවා. ඊළඟ මැතිවරණය එන්න ඕනෑ ඒ ගොල්ලන්ට බලයක් ගන්න. ඒ බලය මඩ ගහලාම ගන්න ඕනෑ. ඒ නිසා තමයි හිටපු ජනාධිපතිතුමාටත්, හිටපු රජයටත් සම්පූර්ණ මඩ ගැහීමේ ව්‍යාපාරයක් කරන්නේ. මේ අය කියන්නේ අමූලික අසත්‍ය. අමූලික අසත්‍ය ඉදිරියට දමාගෙන ඒකෙන් ජීවත් වන ආණ්ඩුවක් බවට මේ ආණ්ඩුව පත් වෙලා තිබෙනවා. ඒ ගැන අපි කනගාටු වෙනවා. තමුන්නාන්සේලා හොඳ මහත්වරු හැටියට මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලන්නේ මේ පහත් වැඩ කරන්න එපා, මේ පළි ගැනීම් කරන්න එපා, මේ රටේ සංවර්ධනය සඳහා තමුන්නාන්සේලාට දෙන්න පුළුවන් උපරිම දායකත්වය දෙන්න කියායි. විරුද්ධ පක්ෂයේ අපේ කණ්ඩායම වැඩි වුණත් ඒ වෙනුවෙන් අපට දෙන්න පුළුවන් උපරිම දායකත්වය තමුන්නාන්සේලාට ලබා දෙනවා කියා කියමින් මම මගේ වචන ස්වල්පය හමාර කරනවා.

[අ.භා. 7.08]

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு அஜித் பீ. பெரேரா - வெளிநாட்டலுவல்கள் பிரதி அமைச்சர்)

(The Hon. Ajith P. Perera - Deputy Minister of Foreign Affairs)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ විවාදයේදී විපක්ෂයේ සමහර ගරු මන්ත්‍රීතුමන්ලා අවංකව කථා කළා; සමහරු අර්ධ ලෙස අවංකව කථා කළා; සමහරු ගල් පැලෙන අසත්‍ය කිව්වා. විජයමුණි ද සොයිසා හිටපු අමාත්‍යතුමා මීට කලින් කථා කළා. එතුමා නියෝජනය කරන්නේ බිබිල ආසනය. බිබිල නගරයේ ඉඳලා හතර පැත්තට තිබෙන ප්‍රධාන පාරවල් හතරේම දැවැන්ත සංවර්ධන ව්‍යාපෘති කිසිම බාධාවක් නොමැතිව කරනවා කියලා එතුමා කිව්වා. ඒ නිසා මේ කිසිම දෙයක් කෙරෙන්නේ නැහැ කියලා සියල්ලම ලඝු කොට තර්ක කරපු ගරු මන්ත්‍රීතුමන්ලාට මම කියන්නේ, ඒ ස්ථාවරය වැරැදි බවයි. ඈත දුෂ්කර බිබිලේ ප්‍රධාන මාර්ග 4ක වැඩ කෙරෙනවා. මම නියෝජනය කරන කලුතර දිස්ත්‍රික්කයේ, ඊට යාබද කොළඹ දිස්ත්‍රික්කයේ ගාලු පාර සංවර්ධනය කිරීමේ කටයුත්ත කෙරෙනවා. අදටත් කිසිම බාධාවක් නැතුව ගාලු පාර සංවර්ධනය කිරීමේ ඒ බරපතළ ව්‍යාපෘතිය කෙරෙනවා. මම උදාහරණ කිහිපයක් මේ කියන්නේ. සියලුම ඉදි කිරීම් ව්‍යාපෘති නතර වෙලා කියලා මේ ප්‍රශ්නය ඒ මට්ටමට ලඝු කරලා කථා කිරීමේ කිසි ප්‍රායෝගික අර්ථයක් නැහැ. ඒක සම්පූර්ණ අසත්‍යක්. සමහර ව්‍යාපෘති නතර වී තිබෙනවා. මගේ ආසනයේ පළාත් සභාවලට අයිති අතුරු මාර්ග හතරක වැඩ අර කියූ විධියට ගල් දමා වලවල් හදා, කාපට් නොකර නතර වී තිබෙනවා. මේ ව්‍යාපෘති හතරෙන් තුනක ගිවිසුම් අත්සන් කර නැති බව, විශේෂයෙන් මේ කාරණය පිළිබඳ සොයා බැලූ විට මට පෙනී ගියා. ගිවිසුම් අත්සන් නොකර හිතේ විශ්වාසයට, බොහොම අක්‍රමවත් විධියට -තමන්ට ඕනෑ විධියට ගණන් මිනුම් දා ගෙන- කළ මේ වැඩ කටයුතුවලට මුදල් ලැබෙයිදෝ කියන ප්‍රශ්නය නිසා, ඒ ව්‍යාපාරිකයන් තවදුරටත් ආයෝජනයක් නොකර ඒ පාරවල් ඉදි කිරීම අත හැර දමා තිබෙනවා.

නීත්‍යානුකූල ගිවිසුම් සහිත තවත් එක් මාර්ගයක් තිබුණා. නමුත්, ඒ ව්‍යාපාරිකයාට එය කර ගෙන යාමට යම් දුෂ්කරතා මතු වී තිබෙනවා. මම ප්‍රශ්න කළාම ඔහු කිව්වා, -ඒ අදාළ මාර්ගය නොවෙයි- "ඊට කලින් කළ බරපතළ, ප්‍රධාන වැඩ තුනක සල්ලි ලැබෙන්න තිබෙනවා. ඒ නිසා මේ ගැන මට යම් අවධානමක්, සැකයක් මතු වී තිබෙන නිසා, මගේ ඒ වැඩ පිළිවෙළ -ඔහුගේ භාෂාවෙන් කිව්වොත් එම රෝල- කර ගෙන යන්නට නොහැකි ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා මම මෙය නතර කළා" යි කියා. මෙවැනි දේ නිසා ඇතැම් තැන්වල මාර්ග ඉදි කිරීම් කටයුතු නතර වී තිබෙන බව ඇත්ත. එසේ නතර වීමට හේතුව වර්තමාන රජයේ තිබෙන වැඩ පිළිවෙළ නොවෙයි. පසු ගිය ආණ්ඩුවත් එක්ක දූෂිත අන්දමට, අක්‍රමවත් අන්දමට ව්‍යාපාර කළ ඇතැමුන්ට, ජනාධිපතිවරණ පරාජයෙන් ඇති වී තිබෙන කම්පනයත් එක්ක, භූමියේ ඇති වී තිබෙන තත්ත්වයන්ට මුහුණ දෙන්නට පුළුවන්කමක් නැහැ. ඒක තමයි ප්‍රශ්නය. දැනට නතර වී තිබෙන, භාගයට හැදූ මාර්ගත් අප හදනවාය කියන පොරොන්දුව දෙමින්, අනෙකුත් මහා පරිමාණ සංවර්ධන යෝජනා ක්‍රම සියල්ලම අප ඉදිරියට කර ගෙන යනවා කියන කාරණය නැවත නැවත සනාථ කරන්නට කැමැතියි.

මහා පරිමාණ යෝජනා ක්‍රම අතරින් අප දැනට නතර කර තිබෙන්නේ, ඉතාම බරපතළ, දූෂිත ගිවිසුම් ඇති කර ගෙන තිබෙන උතුරු අධිවේගී මාර්ගය සෑදීම වැනි ව්‍යාපෘති එකක් හෝ දෙකක් පමණයි. ඒ නිසා ජනතාවට ඉවසීමෙන් ඉන්න කියා අප කියනවා. පසු ගිය ආණ්ඩුවේ තිබුණු විනිවිදභාවයක් නැති, අයුතු වැඩ පිළිවෙළ ඒ විධියටම ඉදිරියට ගෙන යන්න අපට හැකියාවක් නැහැ. අප එසේ කරන්නේත් නැහැ. ඒ නිසා විධිමත්ව, තිබෙන අඩු පාඩු යථා තත්ත්වයට පත් කර මේ කටයුතු කරනවාය කියන පොරොන්දුව දෙන්නට අප කැමැතියි.

මීට කලින් ගරු උදිත් ලොකුබණ්ඩාර මන්ත්‍රීතුමාත්, තවත් මන්ත්‍රීවරු ගණනාවක්ම මේ අතුරු අය වැය ලේඛනය සහ වර්තමාන රජය ලබා දුන් සහන සැහැල්ලුවට ලක් කරමින් කථා කළා. ජනාධිපතිවරණ පරාජයෙන් පසුව ඇති වී තිබෙන මානසික කම්පනය නිසා හට ගෙන තිබෙන ව්‍යාකූලභාවය ඉවත් කර ගැනීමට කරුණාකර වෛද්‍ය උපදෙස් පතන්න කියා, ඒ මන්ත්‍රීවරුන්ට මා ඉතාම ගෞරව සහිතව කියන්නට ඕනෑ. එහෙම නැත්නම් ඔය ක්‍රමයට මේ සමාජයේ ඇති වී තිබෙන වෙනස තේරුම් ගන්නට බැරි නම්, අද සිටින තත්ත්වයෙනුත් පහළට වැටී, දේශපාලන වශයෙන් විනාශමුඛයට යන්නටයි සිද්ධ වන්නේ.

අපේ රජය තමයි පෙට්‍රල් මිල අඩු කළේ. අපේ රජය තමයි ඩීසල් මිල අඩු කළේ. අපේ රජය තමයි භූමිතෙල් මිල අඩු කළේ. අපේ රජය තමයි ගෑස් මිල අඩු කළේ. ඒ සහන දැන් ජනතාවට ලැබී නැද්ද? අද petrol shed එකකට ගිහින් පෙට්‍රල් ටික ගහන කොට, ඩීසල් ටික ගහන කොට, කඩේට ගිහින් ගෑස් සිලින්ඩරය ගන්න කොට ඒවායේ මිලේ එදාට වඩා දැවැන්ත අඩුවක් නැද්ද? අඩුවක් තිබෙනවා. කරුණාකර ඒක පිළිගන්න. මේ රටේ සාමාන්‍ය මිනිහාට ඒක දැනෙනවා. මේ රටේ සාමාන්‍ය මිනිසුන්ට ඒක තේරෙනවා. මේ රටේ සාමාන්‍ය මිනිස්සු තමන්ගේ මෝටර් සයිකලයට පෙට්‍රල් ටික ගහන ගහන වාරයක් පාසා, petrol shed එකේ මීටරය කරකැවෙන කොට ඒ දිහා බලාගෙන මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටත්, එතුමා බලයට පත් කරපු එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ සන්ධානයටත් කෘතඥතා පූර්වකව පින් දෙනවා. ඒ යථාර්ථය තේරුම් ගැනීම අවශ්‍ය වෙනවා. විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුනි, ඔබතුමන්ලා අකමැති නම් ඒක තේරුම් ගන්නේ නැතිව ඉන්න. ඊළඟ පාර්ලිමේන්තු මැතිවරණය ළඟ ළඟම එනවා. එදාට සැබෑ තත්ත්වය දැන ගන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ අය වැයෙන් ආහාර පාන සඳහා දීපු සහන බොහොම සැහැල්ලුවට ලක් කරනවා. ආහාර වර්ග 13ක් සඳහා සෘජුව දීපු සහනවලින් ඒ අයට පෙනෙන්නේ කොත්තමල්ලි සහ කහ පමණයි. ඒ නිසා මේකට "කොත්තමල්ලි අය වැය" කියනවා. නමුත් අපි සීනි මිල අඩු කරපු එක ඒ අයට මතක් වන්නේ නැහැ. කිරි පිටි මිල අඩු කරපු එක මතක් වන්නේ නැහැ. සස්ටජන් ටින් එකේ මිල අඩු කරපු එක මතක් වන්නේ නැහැ. තිරිඟු පිටි මිල අඩු කරපු එක මතක් වන්නේ නැහැ. පාන් මිල අඩු වුණු එක මතක් වන්නේ නැහැ. මුංඇට මිල අඩු කරපු එක මතක් වන්නේ නැහැ. හාල් මැස්සන්ගේ මිල අඩු කරපු එක මතක් වන්නේ නැහැ. අධික ලෙස බදු අය කළ ටින් මාළුවල මිල අඩු කරපු එක මතක් වන්නේ නැහැ. ගරු නියෝජ්‍ය

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

කාරක සභාපතිතුමනි, මෙතුමන්ලා විහිළුවට වාගේ කියන්නේ කොත්තමල්ලි, උම්බලකඩ සහ කහ මිල අඩු වෙලා කියලා විතරයි. ඒවායේත් මිල අඩු වෙලා තමයි. අපි පොරොන්දු වුණේ භාණ්ඩ 10ක මිල අඩු කරනවා කියලායි. නමුත්, අපි ආහාර වර්ග 13ක මිල අඩු කළා. අඩු කරන්න පුළුවන් නිසා කොත්තමල්ලිවලත්, කහවලත්, උම්බලකඩවලත් මිල අඩු කළා. ගමේ මිනිහා උම්බලකඩ කෑවාම, අවුරුදු 20ක් විතර රාජ්‍ය බලය දරාගෙන, සැප පහසුවට ආණ්ඩුවේ වියදමින් ජීවත් වුණු අයට දැන් මොකක් හරි විශේෂ හිත් අමාරුවක් තිබෙනවාද? අද කොත්තමල්ලි බොන්නේ සැප පහසු ජීවිත ගත කරන අය නොවෙයි නේ. දරුවෙකුට උණක්, හෙම්බිරිස්සාවක් හැදුණාම අපේ ගම්වල මිනිස්සු කොත්තමල්ලි ටිකක් තම්බලා දෙනවා. තුනපහටත් කොත්තමල්ලි පාවිච්චි කරනවා. හැබැයි, අද ඒ මිල අඩු කරපු එකත් මෙතුමන්ලාට විහිළුවක්. ඇයි, එළවලුවලට, ව්‍යාඤ්ජනවලට කහ දමන එක නරකද? [බාධා කිරීමක්] ඒ මිලත් අඩු කළා. ඒකෙන් රුපියල හරි ඉතුරු වන්නේ අපේ ගම්වල ඉන්න අහිංසක, දුප්පත් මිනිහාට. මෙතුමන්ලාට හරි කේන්තියි ඒවාට. කහ මිල අඩු කළා. කොත්තමල්ලි මිල අඩු කළා. උම්බලකඩ මිල අඩු කළා. උළු මිල අඩු කළා. ඒ වාගේම තමුන්නාන්සේලා නොකියන තවත් වර්ග අටකත් මිල අඩු කළා. තමුන්නාන්සේලා ඒවා කියන්නේ නැහැ. ඔය සියල්ලටම වඩා අපට ලබා දෙන්න පුළුවන් වුණේ ඉන්ධන මිල අඩු කිරීම හරහා ලැබුණු සහනයයි. ඒ නිසා හතර දෙනෙක්, පස් දෙනෙක් ඉන්න ගමේ සාමාන්‍ය පවුලක ජීවන බර මාසිකව දළ වශයෙන් රුපියල් 7,500කින් විතර අඩු වෙලා තිබෙනවා. ඒක තමයි ගමේ මිනිහාගේ ගණන් හැදිල්ල.

අපි අය වැයෙන් දීපු සමහර සහන සමහර ප්‍රදේශවලට ළඟා වෙලා නැහැ. සමහර භාණ්ඩවල මිල අඩු වෙලා නැහැ. එහෙම ප්‍රශ්න තිබෙනවා. ඒවා අපි හදා ගන්න ඕනෑ. පැරණි මිලට භාණ්ඩ මිලදී ගෙන ඒවා විකුණන සිල්ලර වෙළෙන්දා තමන්ට වන පාඩුව අඩු කර ගන්න පුළුවන් තරම් උත්සාහ කරනවා. රජය මැදිහත් වෙලා ඒකට ප්‍රතිරෝධය දක්වලා, ඒ සහනය ගමේ මිනිහාට ලබා දෙන්න කටයුතු කරනවා. හැබැයි, දුප්පත්, අහිංසක මිනිහාට මහින්ද රාජපක්ෂ මැතිතුමා ලබා නොදීපු සහන අපි දෙන කොට, ඒක හැල්ලුවට ලක් කරන එක ගමේ ඉන්න දුප්පතා, මධ්‍යම පාන්තිකයා දකින්නේ ඒ අයට කරන අපහාසයක් විධියටයි. අන්න ඒ කාරණය තේරුම් ගන්න ඕනෑ.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
අද හාල් කිලෝ එක රුපියල් 100යි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
අද හාල් මිල ගැන බොහොම හිතේ අමාරුවෙන් කථා කරනවා. ඇත්ත. හාල් මිල වැඩියි. හැබැයි, අපි අමතක කරන්න නරකයි, අනුරාධපුරයේ, පොළොන්නරුවේ, අම්පාරේ, කුරුණෑගල, වවුනියාවේ ඉන්න ගොවීන් වවන ප්‍රධානම බෝගය නොවෙයි නම්, එකම බෝගය වී පමණක් බව. ඒ වී වගාවෙන් ලැබෙන ඵලදාවට අපි ලබා දෙන මුදල තමයි ඒ ගමට යන එකම මුදල.

අපේ පළාත්වල තේවලට, රබර්වලට මුදලක් ලැබුණාම එය ගමට යනවා වාගේ ඒ පළාත්වල මිනිසුන්ට ගමට මුදල් යන එකම ක්‍රමය වී විකිණීමයි. එම නිසා අපේ රජය, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ රජය, රනිල් වික්‍රමසිංහ මැතිතුමා අග්‍රාමාත්‍ය ධුරය දරන රජය ප්‍රතිපත්තියක් විධියට වී සඳහා දෙන සහතික මිල වැඩි කරලා තිබෙනවා. ඒ හරහා සහල් මිල වැඩි තත්ත්වයක තිබුණත්, අපි ඒ සහනය ලබා දෙන්න කටයුතු කරනවා. රජය කවදාවත් සම්පූර්ණ වී නිෂ්පාදනය මිල දී ගත්තේ නැහැ. හැම දාමත් මහින්ද රාජපක්ෂ මහත්මයාගේ රජය මිල දී ගත්තේ සම්පූර්ණ වී නිෂ්පාදනයෙන් සියයට 5ක් පමණයි. අද අපි මුදල් වෙන් කර තිබෙනවා, සම්පූර්ණ නිෂ්පාදනයෙන් සියයට 10කට වැඩි ප්‍රමාණයක් මිල දී ගන්න. ඒ හරහා අපි ලබා දෙන පණිවුඩය තුළ, තීරණය තුළ අපි අපේක්ෂා කරනවා, සාමාන්‍ය ගොවියාට ප්‍රමාණවත් මිලක් ලැබෙයි කියලා. ඒක තමයි අපි අනුගමනය කරන මූල ධර්මය. එහෙම නැතුව මුළු වී නිෂ්පාදනයම රජය මිල දී ගන්නවාය කියන කථාවක් කවදාවත් තිබුණේ නැහැ. ඒක ගැලපෙන්නේත් නැහැ. අපි පිළිගන්නවා, වී ගොවියාට හොඳ මිලක් ලැබිය යුතුයි කියලා. නමුත් අපි අනික් භාණ්ඩ හරහා ලබා දී තිබෙන සහන රටේ පුරවැසියන් සියලු දෙනාටම -රජයේ සේවකයන්ට වේවා, පෞද්ගලික අංශයේ සේවකයන්ට වේවා, ගොවියාට වේවා, කම්කරුවාට වේවා, දුප්පත්, පොහොසත් හැමදෙනාටම- එක විධියට ලැබෙනවා. පෙට්‍රල්, ලාම්පු තෙල්, ඩීසල්, ගෑස් සඳහා දෙන ඒ සහනය සියලුදෙනාටම එක හා සමානව ලැබෙනවා. ඒවා ගැන කවුරුත් කථා කරන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම දුන් පොරොන්දු ගැන මේ ගරු සභාවේ කථා කළා. මගේ අමාත්‍යාංශය වන විදේශ කටයුතු අමාත්‍යාංශයේ විෂය පථයට තමයි විදුලි සංදේශ සහ තොරතුරු තාක්ෂණ විෂයයත් අයිති වන්නේ. දින සියයේ වැඩ පිළිවෙළ යටතේ අපි පොරොන්දුවක් වෙලා තිබෙනවා, මේ රටේ ප්‍රසිද්ධ ස්ථානවලට නොමිලයේ අන්තර්ජාල පහසුකම්, තරුණයන්ට තේරෙන භාෂාවෙන් කිව්වොත් free Wi-Fi ලබා දෙනවාය කියලා. අපි මේ ව්‍යාපෘතිය පිළිබඳව ඉතාම ඉක්මනින් කටයුතු කරලා, මේ රටේ දුරකථන සේවා සපයන සියලුම සමාගම් මැදිහත් කර ගෙන, ICTA ආයතනයත් සම්බන්ධ කර ගෙන, ඔවුන්ගේ නායකත්වය යටතේ අපේ අමාත්‍යාංශයට පුළුවන්කම ලැබී තිබෙනවා, මේ රටේ ප්‍රසිද්ධ ස්ථාන 1,000ක් සඳහා නොමිලයේ අන්තර්ජාල පහසුකම් - free Wi-Fi - ලබා දෙන්න. මේක අපේ රටේ අන්තර්ජාල පහසුකම් භාවිත කිරීම පිළිබඳ විප්ලවීය වෙනසක් වෙනවා. වැදගත්ම දේ තමයි, මේ සඳහා රජයේ මුදලින් එකම එක රුපියලක්වත් වැය නොකරපු බව. මේ සම්පූර්ණ ව්‍යාපෘතිය සඳහා වන වියදම මේ රටේ පෞද්ගලික ව්‍යවසායකයන් විසින් දරනු ලබනවා. ඉදිරි සති දෙක තුළ මේ සවි කිරීම් පටන් ගන්නවා. මේ වන විට තාක්ෂණික ප්‍රශ්න සම්පූර්ණයෙන් විසඳා ගෙන අවසන්. ඒ වාගේම තමන්ගේ හැඳුනුම්පත් අංකය සහ තමන්ගේ දුරකථන අංකය භාවිත කරමින් මේ රටේ තිබෙන ඕනෑම මහජන පුස්තකාලයකදී ඕනෑම පුරවැසියකුට නොමිලයේ අන්තර්ජාල පහසුකම් ලබා ගන්න අපි අවස්ථාව ලබා දෙනවා. සෑම ප්‍රධාන දුම්රිය ස්ථානයකටම, සෑම ප්‍රධාන බස් නැවතුම් පොළකටම, සෑම රජයේ රෝහලකටම, මේ රටේ සෑම විශ්වවිද්‍යාලයකටම, ශ්‍රී ලංකා නීති විද්‍යාලයට, කාර්මික විද්‍යාලවලට නොමිලයේ අන්තර්ජාල - free Wi-Fi - පහසුකම් ලබා දෙනවා. තාක්ෂණික වශයෙන් කල්පනා කරන කොට මෙවැනි පහසුකමක් ලබා දෙන එක ඉතාම අසීරු අභියෝගයක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය දවස්වල ඉන්දියාවේ දිල්ලි ප්‍රාන්තයේ පැවැත්වූ මැතිවරණයෙන් ජයග්‍රහණය කරපු කෙජ්‍රිවාල් මහත්මයාගේ පක්ෂය ඡන්ද පොරොන්දුවක් දුන්නා, නව දිල්ලි නුවරට නොමිලයේ අන්තර්ජාල - free Wi-Fi - පහසුකම් දෙනවාය කියලා. අද ඔවුන් කියනවා, ඒ පොරොන්දුව ඉෂ්ට කරන්න ඔවුන්ට අවුරුද්දක් ගත වනවාය කියලා. නමුත් අපි දීපු පොරොන්දුව මේ දින සියය තුළ ඉෂ්ට කරනවාය කියන කාරණය කියන්න අවශ්‍යයි. අද සෑම අමාත්‍යවරයෙක්ම තමන්ට අදාළ වන විෂය ක්ෂේත්‍රවල තමන්ගේ ඉලක්ක සපුරාලමින් ඉන්නවා. දින සියයෙන් අපේ ප්‍රතිපත්ති අවසන් වන්නේ නැහැ. දින සියය කියන්නේ, මේ රටේ මූලික ප්‍රශ්න විසඳීමට අවශ්‍ය මූලික පදනම දැමිය යුතු කෙටි කාලයයි.

අද, මීට මොහොතකට කලින් ඉන්දියාවේ විදේශ අමාත්‍ය සුෂ්මා ස්වරාජ් මැතිනිය ලංකාවට පැමිණියා. කටුනායක ගුවන් තොටු පොළේ දී මා විසින් එතුමිය පිළිගැනීම සිදු කළා. එතුමිය මට මුණ ගැසුණු පළමුවෙනි මොහොතේ කියූ කාරණය තමයි, "ශ්‍රී ලංකාව විදේශ සම්බන්ධතා ක්ෂේත්‍රයේ දක්වා තිබෙන සුවිශේෂ සමත්කම විශ්මයජනකයි" කියන එක. "විශ්මයජනකයි" කියන අදහසයි එතුමිය කියුවේ. එතුමිය අපේ රටට සුභ පැතුවා. ගරු මංගල සමරවීර මැතිතුමාගේ දක්ෂතාව, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ සහ අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ දර්ශනය තුළ තිබෙන නියම නොබැඳි විදේශ පිළිවෙතක් අනුගමනය කිරීම තුළින් මේ රට ලෝකයේ ඉදිරියට යාමට මාර්ගය විවර කරගෙන තිබෙනවා කියන කාරණය ස්වරාජ් මැතිනිය මීට මොහොතකට පෙර මා වෙත පෞද්ගලිකවම ප්‍රකාශ කර සිටියා.

පසු ගිය ආණ්ඩුව අපේ අසල්වැසි ඉන්දියාව, -අපට යුද්ධය අවසන් කරන්න උදවු කළේ ඉන්දියාව. ඇත්ත කථාව ඒකයි.- තරහා කර ගත්තා; අපට යුද්ධය අවසන් කරන්න උදවු කළ ඇමෙරිකා එක්සත් ජනපදය තරහා කර ගත්තා; යුරෝපා හවුල සමඟ තිබුණු සබඳතා අතහැර දැමීම නිසා අපට GSP Plus සහනය නැති වුණා; අපට මත්ස්‍ය අපනයන තහනමකට මුහුණ දෙන්නට සිද්ධ වුණා. පසු ගිය ආණ්ඩුව රුසියාව සහ චීනය දෙසට නැඹුරු වුණා. අපි චීනය සහ රුසියාව අපේ රටට දීපු සහාය අගය කරනවා. ඒ රටවල් දෙක සමඟම අපේ තිබුණු සබඳතා ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යාමට සහ ඊටත් වැඩියෙන් පවත්වාගෙන යාමට අපි කටයුතු කරනවා. මේ මාසයේ අන්තිමට අතිගරු ජනාධිපතිතුමා චීනයේ සංචාරයක නිරත වෙනවා. ගිය සතියේ අපේ විදේශ ඇමතිතුමා චීන සංචාරයක නිරත වුණා. රුසියාව සමඟ අපේ සබඳතාත් ඉතාමත් හොඳ තත්ත්වයක පවතිනවා. ඒ වාගේම මාස 4ක් ඇතුළත මත්ස්‍ය අපනයන තහනම අයින් කරගෙන, අපට අහිමි වෙමින් ගිය ඩොලර් බිලියන ගණනක ඒ මහා ධනස්කන්ධය ඉතිරි කරලා අපේ ධීවරයා ආරක්ෂා කරනවා. මේ අවුරුද්ද අන්තිම වන විට GSP Plus සහනය නැවත ලබාගෙන අපේ ඇඟලුම් කර්මාන්තය නැවත ශක්තිමත් කරනවා වාගේම අපේ අනෙකුත් කර්මාන්තත් ශක්තිමත් කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒවා කරන්න පුළුවන් වුණේ මේ ආණ්ඩුවට විධිමත් වැඩ පිළිවෙළක්, දර්ශනයක් තිබෙන නිසායි.

පසු ගිය කාලයේත් විදේශ අමාත්‍යාංශයක් තිබුණා. දිවුරුම් දීලා පැය කිහිපයක් ඇතුළත ගරු මංගල සමරවීර ඇමතිතුමාත්, මමත් විදේශ කටයුතු අමාත්‍යාංශයට ගියා, වැඩ භාර ගන්නට. මොකද, පසු දින උදේ පාන්දරින් පාප්තුමා ලංකාවට පැමිණීමට නියමිතව තිබුණා. අපේ වගකීමක් ඒ කාරණා අඛණ්ඩව, හොඳින් පවත්වාගෙන යාම. අපි නැකැත් බැලුවේ නැහැ, වහාම ගිහින් වැඩ භාර ගත්තා. විදේශ කටයුතු අමාත්‍යාංශයට මම යන විට ඒ අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ, අධීක්ෂණ මන්ත්‍රීවරුන්ගේ කාමරවල තිබුණු දේවල් ගැන කියන්නට ලජ්ජා හිතෙනවා. මම ඒවා ගැන එතැනින් එහාට කියන්න යන්නේ නැහැ. පෞද්ගලිකව ඇහුවොත් කියන්නම්. අපි නිලධාරින්ගෙන් ඇහුවා, "මොනවාද මේකේ වුණේ?" කියලා. වෙලා තිබෙන්නේ විදේශ කටයුතු හැර ඉතිරි දේවල්. ධූරය දැරූ ඇමතිතුමා අපෙත් ගෞරවයට ලක් වුණු, බොහොම උගත්කම් තිබෙන, අපටත් වඩා ඉගෙන ගත්ත මහාචාර්යවරයෙක් බව ඇත්ත. නමුත් විදේශ සබඳතා කියන්නේ බොහොම කල්පනාවෙන්, බුද්ධිමත්ව, මිත්‍රශීලීව කරන්න ඕනෑ දෙයක්. මිත්‍රශීලීභාවය නැති තැන විදේශ සබඳතා නැත. අද අපේ ගරු මංගල සමරවීර ඇමතිතුමා සාර්ථකත්වය ලබා තිබෙන ප්‍රධානම කාරණය ඒකයි. ඒ මිත්‍රත්වය, මිත්‍රත්වය වර්ධන කර ගැනීමට තිබෙන හැකියාව, ප්‍රායෝගිකව කාරණා තේරුම් ගැනීමට තිබෙන හැකියාව නිසායි.

අපේ රජයට, අපේ අතිගරු ජනාධිපතිතුමාට ඉතාම පැහැදිලි දර්ශනයක් තිබෙනවා. එතුමා විදේශ රාජ්‍ය තාන්ත්‍රිකයන් අමතා කථා කරන සෑම මොහොතකම, ඒ කථාව අවසන්වීමත් සමඟම ලැබෙන ප්‍රතිචාර ඉතාම විශේෂයි. අපේ සමහර මහා පණ්ඩිත මන්ත්‍රීවරුන් අතිගරු ජනාධිපතිතුමා සිංහලෙන් රාජ්‍ය තාන්ත්‍රිකයන් ඇමතීම හැල්ලුවට ලක් කරනවා මම දුටුවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, චීනයේ ජනාධිපතිතුමාත්, චීනයේ අගමැතිතුමාත් ඔවුන්ගේ භාෂාවෙන් අමතන්නේ; ජපන් අගමැතිතුමා ඔවුන්ගේ භාෂාවෙන් අමතන්නේ. නමුත් වැදගත් වෙන්නේ, පරිවර්තන පහසුකම් තිබෙන මේ ලෝකයේ, මොනවාද කියන්නේ, දර්ශනය මොකක්ද, වැඩ පිළිවෙළ මොකක්ද, ප්‍රතිපත්තිය මොකක්ද කියන එකයි. අපේ අතිගරු ජනාධිපතිතුමාට මේ ලෝකයේ අන්තර්ජාතික සබඳතා පිළිබඳව, ලෝකය සමඟ ඇති කර ගත් ගිවිසුම්වලට අනුගත වීමේ අවශ්‍යතාව පිළිබඳව, මනුෂ්‍යත්වය සහ ප්‍රායෝගිකභාවයේ මූලධර්ම පිළිබඳව ඉතාම විශේෂ දැනුමක් තිබෙනවා. රාජ්‍ය තාන්ත්‍රිකයෝ අතිගරු ජනාධිපතිතුමා සමඟ කථා කරන සෑම අවස්ථාවකදීම ඉන් පසුව අපි සමඟත් කථා කරනවා.

ඉතාම ඉහළ අගය කිරීමකට එතුමා ලක් කරනවා. ඒ නිසා මතක තියා ගන්න ගමෙන් ආවත් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මේ රට පාලනය කිරීම පිළිබඳව තමන් ලබාපු පරිණතභාවය තුළින් මේ රට ඉදිරියට අරගෙන යනවා. ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාත්, අපිත් ඒ සඳහා සහාය දීලා මේ රට දියුණු ජාතියක් බවට, ලෝකය ඉදිරියේ කෙළින් ඉන්න පුළුවන් අභිමානවත් ජාතියක් බවට, නොබැඳි ජාතියක් බවට පත් කරනවා කියන කාරණය කියමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තූතියි.

එකල්හි වේලාව අ. භා. 7.30 වූයෙන් නියෝජ්‍ය කාරක සභාපතිතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අද දින සභා සම්මතිය අනුව, 2015 මාර්තු මස 13වන සිකුරාදා අ. භා. 3.15 වන තෙක් කල් ගියේය.

அப்பொழுது பி. ப. 7.30 மணியாகிவிடவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

அதன்படி பாராளுமன்றம், அதனது இன்றைய தீர்மானத்துக் கிணங்க, 2015 மார்ச் 13, வெள்ளிக்கிழமை பி. ப. 3.15 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

It being 7.30 p.m., MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *adjourned Parliament without Question put.*

Adjourned accordingly until 3.15 p.m., on Friday, 13th March, 2015, pursuant to the Resolution of Parliament of this day.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.